# ශුද්ධ බයිබලය

## නව ලොව පරිවර්තනය



ඉතාලිය
රෝමය
මැසිඩෝනියාව
පිලිප්පිය
ග්‍රීසිය
ඇතන්ස්
කොරින්තිය
එපීසය
සිසිලිය
පැට්මොස්
රෝඩ්ස්
මෝල්ටාව
ක්‍රීට්
මධ්‍යධරණී මුහුද
(මහ මුහුද)
ලිබියාව
උ
සැ. 0
500
කි.මී. 0
500


කළු මුහුද
කුඩා ආසියාව
අන්තියෝකිය (පිසිදියේ)
අරරත් කඳු
ඒදන් උයන?
ඇසිරියාව
මේදියාව
ටාසස්
හාරාන්
අන්තියෝකිය (සිරියාවේ)
නිනිවය
යුප්‍රටීස් ගඟ
ටයිග්‍රිස් ගඟ
සයිප්‍රසය
සිරියාව
සීදොන්
තීර්
දමස්කය
සිසේරිය
බැබිලෝනිය
ෂූෂන්
පොරොන්දු දේශය
යෙරුසලම
මෝවබ්
කල්දියාව
ඌර්
කාදෙෂ්
ඒදොම්
මෙම්ෆිස්
ඊජිප්තුව
සීනයි කන්ද
අරාබිය
නයිල් ගඟ
රතු මුහුද
bi12-SN

# ශුද්ධ බයිබලය
## නව ලොව පරිවර්තනය

1984දී පළ වූ සංශෝධිත ඉංග්‍රීසි අනුවාදය වන
*New World Translation of the Holy Scriptures* ඇසුරෙනි

“විශ්වයේ පාලකයාණන් වන යෙහෝවා [יהוה, ය්හ්වෙහ්] දෙවි
මෙසේ පවසන්නේය. ‘. . . මම අලුත් අහසක්ද අලුත්
පොළොවක්ද සාදන්නෙමි. පෙර කාලවලදී සිදු වූ
දේවල් නැවත කිසි දිනක මතකයට
නැඟෙන්නේ නැත.’”
—යෙසායා 65:13, 17; 2 පේතෘස් 3:13ද බලන්න.

© 2009
WATCH TOWER BIBLE AND TRACT SOCIETY
OF PENNSYLVANIA

100 Watchtower Drive
Patterson, NY 12563-9204
U.S.A.

*ශුද්ධ බයිබලය - නව ලොව පරිවර්තනය*

ප්‍රකාශකයෝ

WATCHTOWER BIBLE AND TRACT SOCIETY
OF NEW YORK, INC.
Wallkill, New York, U.S.A.

මුළු බයිබලයම හෝ එය කොටසක් ලෙස භාෂා
130කට වඩා වැඩියෙන් ලබාගත හැකියි.
ඒ භාෂා ගැන දැනගැනීමට www.jw.org/si වෙත පිවිසෙන්න.

‘නව ලොව පරිවර්තනයේ’ මුළු පිටපත් ගණන:
21,78,44,067කි

2017 මුද්‍රණය

මෙම බයිබලය විකිණීම සඳහා නොවෙයි.
මෙය යෙහෝවා දෙවිගේ සාක්ෂිකරුවන් ලෝක ව්‍යාප්තව
කරගෙන යන බයිබල් අධ්‍යාපනික සේවයේ එක් අංගයකි.

*New World Translation of the Holy Scriptures*
Sinhala (*bi12*-SN)

Made in Japan
ජපානයේ සම්පාදිතයි

4-7-1 Nakashinden,
Ebina City, Kanagawa-Pref,
243-0496
Japan

bi12-SN
170209

# පෙරවදන

ශුද්ධ බයිබලය යනු විශ්වයේ අධිපති යෙහෝවා දෙවිගෙන් ලැබී ඇති ලිඛිත වාර්තාවකි. දෙවි එය ලබා දී තිබෙන්නේ තමන් අරමුණු කරන දේ ගැන සියලුම ජනයා දැනගන්නවාට ඔහු කැමති නිසාය. එහි ඇති පණිවිඩය සියලුදෙනාගේම සිත්ගනී. එය ශුභාරංචියකි. මන්ද දෙවි තම පාලනය තුළින් එනම්, දේවරාජ්‍යය තුළින් ඉදිරියේදී මුළු පොළොවම පාරාදීසයක් බවට පත් කරන බවත් එම රාජ්‍යය මගින් සාමයෙන් පිරි ධර්මිෂ්ඨ සමාජයක් බිහි වන බවත් එහි සඳහන්ය. මිනිස් වර්ගයාට උරුම වී ඇති පව්කාරකමෙන් හා මරණයෙන් ඔවුන්ව ගැලවීමට දෙවි සපයා දී ඇති දේද බයිබලයෙහි සඳහන් වේ. එය නම් තම පුත්‍රයා වන යේසුස් ක්‍රිස්තුස්ගේ ජීවිත පූජාවයි.—යොහන් 3:16.

බයිබලය ලියනු ලැබුවේ හෙබ්‍රෙව්, ඇරමයික සහ ග්‍රීක යන භාෂාවලිනි. අද දින එම භාෂා ගැන දැනුමක් ඇත්තේ අතළොස්සකට පමණි. එහෙයින් ශුද්ධ බයිබලයේ තිබෙන ජීවනදායක පණිවිඩය සියලුම ජනයාට තමන්ගේම භාෂාවෙන් කියවීමට හැකි වීම සඳහා එය විවිධ භාෂාවලට පරිවර්තනය කිරීමට අවශ්‍ය වී තිබේ.

සිංහල භාෂාවෙන් පළ වී ඇති මෙම බයිබල් පරිවර්තනයට පදනම සපයන්නේ *නිව් වර්ල්ඩ් ට්‍රාන්ස්ලේෂන් ඔෆ් ද හෝලි ස්ක්‍රිප්චර්ස්* නමැති ඉංග්‍රීසි පරිවර්තනයේ 1984හි පළ වූ සංස්කරණයයි. මෙම පරිවර්තනයට හෙබ්‍රෙව්-ඇරමයික ලියවිල්ලේ පොත් 39ද ක්‍රිස්තියානි ග්‍රීක ලියවිල්ලේ පොත් 27ද ඇතුළත් කර තිබේ. (එම ග්‍රීක ලියවිල්ල 2004දී සිංහලෙන් පළ වූ පරිවර්තනයේ සංශෝධනයකි.) බොහෝදෙනෙකු එම කොටස් දෙක පරණ ගිවිසුම හා අලුත් ගිවිසුම ලෙස හැඳින්වූවත් බයිබලයේ කිසිම කොටසක් පරණ හෝ අලුත් ලෙස හැඳින්විය නොහැක. මන්ද බයිබලය පුරාම දිව යන්නේ එකම පණිවිඩයකි. එමනිසා මෙම පරිවර්තනයේ එම කොටස් දෙක ඒවා මුලින්ම ලියූ භාෂාවල නම්වලින් එනම්, හෙබ්‍රෙව්-ඇරමයික ලියවිල්ල සහ ක්‍රිස්තියානි ග්‍රීක ලියවිල්ල යන නම්වලින් හඳුන්වා ඇත. මුළු බයිබලයම අධ්‍යයනය කිරීමට පාඨකයාට උපකාර කිරීම සඳහා බයිබල් පදවලට යොමු දැක්වීම් 1,25,000කට වැඩි ගණනක්ද සූචියක්ද මෙහි ඇතුළත් කර තිබේ.

ශුද්ධ බයිබලය විශ්වයේ පාලකයාණන්ගේ ශ්‍රේෂ්ඨ අරමුණ පැහැදිලි කර දෙයි. එම අරමුණට ඔහුගේ අද්විතීය නාමය සම්බන්ධ වන නිසා එය මුල් හෙබ්‍රෙව් ලියවිල්ලේ 7,000 වාරයකට ආසන්න ප්‍රමාණයක් ඇතුළත් කර තිබේ. එම නාමය බයිබල් පරිවර්තනවලින් ඉවත් කිරීම දෙවිට කරන මහත් අගෞරවයකි. මෙම පරිවර්තනයේ ඇති ප්‍රධානතම ලක්ෂණය වන්නේ “යෙහෝවා” යන දෙවිගේ නාමය නියමිත ස්ථානවලට ඇතුළත් කර තිබීමයි. හෙබ්‍රෙව් ලියවිල්ලේ එය 6,973 වාරයක්ද ක්‍රිස්තියානි ග්‍රීක ලියවිල්ලේ එය 237 වාරයක්ද සඳහන්ය. ඒ පිළිබඳ වැඩි විස්තර උපග්‍රන්ථයේ ඇතුළත් කර තිබේ.

මෙම පරිවර්තනයට සම්බන්ධ වූ අය එහි ශ්‍රේෂ්ඨ කර්තෘට ඉමහත් ප්‍රේමයක් හා භක්තියක් දක්වන නිසා ඔහුගේ අදහස් හා ඔහු ප්‍රකාශ කර ඇති දේවල් හැකි තාක් දුරට නිවැරදි අයුරින් ඉදිරිපත් කිරීමට මහත් වෙහෙසක් දරා ඇත. එලෙසම ඔවුහු පාඨකයන් ගැනද සැලකිලිමත් වෙති. මන්ද මහෝත්තම දෙවිගෙන් සදහටම ආශීර්වාද ලබාගැනීමට නම් දේවවචනයේ නිවැරදි පරිවර්තනයක් තිබීම අත්‍යවශ්‍ය බව ඔවුහු අවබෝධ කරගෙන සිටිති. දෙවි පොරොන්දු වී ඇති පාරාදීස පොළොවේ සදාකාල ජීවනය ලබාගැනීමට මෙම පරිවර්තනය ඔබට උපකාරවත් වේවා! අපගේ අවංක පැතුම එයයි.—යෙසායා 65:17; 2 පේතෘස් 3:13.

—*ප්‍රකාශකයෝ*

# හැඳින්වීම

මෙම නව ලොව පරිවර්තනයට විශේෂ අංග කිහිපයක්ම ඇතුළත් කර තිබේ. බයිබලය ගැන අපට ඇති දැනුම තවත් වැඩි කරගැනීමට ඒවා උපකාරවත් වේ. ඒවා මතු දැක්වේ.

**පරිච්ඡේද හා පද:** මේ සඳහා ඉංග්‍රීසි නව ලොව පරිවර්තනයේ ප්‍රමිතිය අනුගමනය කර තිබේ. යෙහෝවා දෙවිගේ සාක්ෂිකරුවන් ලොව පුරා අනුගමනය කරන එකම අධ්‍යාපන ක්‍රමයට එය බෙහෙවින් දායක වේ. පද වෙන වෙනම දක්වනවා වෙනුවට එකම අදහස ඇති පද කිහිපයක් එක ඡේදයක් ලෙස මෙහි දක්වා ඇත. නමුත් කාව්‍යමය ස්වරූපයෙන් ලියා ඇති කොටස් වෙන වෙනම පද ලෙස දක්වා ඇත.

**පිටුවල සාරාංශය:** සෑම පිටුවකම පාහේ ඉහළින් ඉතා කෙටි සාරාංශයක් දක්නට ලැබේ. බයිබලයේ යම් තොරතුරු ඉක්මනින් සොයාගැනීමට ඒවා උපකාරවත් වේ.

**සූචිය:** බයිබල් වචනවල සූචියක් පිටුපස දක්වා ඇත. බයිබලයේ ඇතැම් වචන සහ ඒවා සඳහන්ව ඇති ස්ථාන එහි ලැයිස්තුගත කර තිබේ.

**උපග්‍රන්ථය:** බයිබලයේ මූලික ඉගැන්වීම් හා ඊට අදාළ වෙනත් කරුණු පැහැදිලි කිරීම සඳහා මෙය සකස් කර ඇත. ඊට බයිබලය ලියූ කාලයේ භාවිත කර ඇති මුදල්, මිනුම් සහ මාසද බයිබලයේ සඳහන් ස්ථානවල සිතියම්ද ඇතුළත් කර තිබේ. උපග්‍රන්ථයේ තොරතුරු පහසුවෙන් සොයාගැනීමට එහි පටුනක්ද ඇත. ශුද්ධ ලියවිල්ල ගැන වඩාත් පුළුල් අවබෝධයක් ලබාගැනීමටත් සත්‍ය ඉගැන්වීම් අන් අයට හොඳින් පැහැදිලි කර දීමටත් මෙය උපකාරවත් වේ.—1 පේතෘස් 3:15.

**යොමු දැක්වීම්:** බයිබල් පදයක ඇති යම් කරුණක් බයිබලයේ වෙනත් ස්ථානයක සඳහන්ව ඇත්නම් එය සොයාගැනීමට මේවා උපකාරවත් වේ. එවැනි යොමු දැක්වීම් 1,25,000කට වඩා වැඩි ගණනක් මෙහි ඇත. එම යොමු දැක්වීම් භාවිත කිරීමෙන් බයිබලයේ ඇති පොත් 66 එකට එකක් සම්බන්ධ වන අයුරු තේරුම්ගත හැක. එයින් මෙය දේවවචනය බව තවත් තහවුරු වේ.

පදයක ඇති යම් කරුණක් ගැන වෙනත් පදවල සඳහන්ව ඇත්නම් ඒ කරුණ අසල අංකයක් යොදා ඇත. ඒ පද එම අංකය යටතේ මැද තීරුවේ ලැයිස්තුගත කර ඇත. මැද තීරුවේ ප්‍රමාණවත් ඉඩකඩ නොමැති විට පිටුවේ පහළ දකුණු කෙළවරේද ඒවා සඳහන් වී තිබේ. එම යොමු දැක්වීම් පරිච්ඡේදයට අනුව වෙන වෙනම දක්වා ඇත.

එම යොමු දැක්වීම් මගින් සමාන අදහස්, සිදුවීම්, ස්ථාන, අමතර තොරතුරු, අනාවැකිවල ඉටුවීම්, උපුටා දැක්වීම්, සමාන වචන, නීතියේ සඳහන්ව ඇති දේවල් ග්‍රීක ලියවිල්ලෙහි ඉටු වී ඇති ආකාරය යනාදිය සොයාගත හැක. බයිබලය පිළිබඳ අපගේ දැනුම එමගින් තවත් පුළුල් වනු ඇත.

**පාදසටහන්:** යම් වැදගත්කමක් ඇති වචන පැහැදිලි කර දීමට මේවා භාවිත කර තිබේ. එවැනි වචනවල මූලික අර්ථය, එයට විකල්ප වචන හෝ අමතර විස්තර මෙහි සපයා ඇත. යම් වචනයක් ගැන උපග්‍රන්ථයේ සඳහන්ව ඇත්නම් ඒ පිළිබඳවද මෙහි සඳහන් කර ඇත.

එක් පදයක පාදසටහන් කිහිපයක් ඇත්නම් ඒවා වෙන වෙනම හඳුනාගැනීම සඳහා මතු දැක්වෙන සංකේත පිළිවෙළින් භාවිත කර තිබේ. *, #, △, ⊠, □, +.

---

**කෙටි යෙදුම්:** පාදසටහන්වල සහ වෙනත් ස්ථානවල භාවිත කර ඇති කෙටි යෙදුම් තේරුම්ගැනීමට වගුවක් පහත දැක්වේ. පුරාණ බයිබල් පිටපත්වල, වෙනත් අනුවාදවල සහ අමතර මූලාශ්‍රවල විස්තරද එහි ඇතුළත් කර තිබේ.

**א** (ආලෙෆ්) බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ඇති ක්‍රි.ව. 4වෙනි සියවසේ ලියූ කෝඩෙක්ස් සයිනයිටිකස් නම් ග්‍රීක ලියවිල්ල. හෙ.ලි., ග්‍රී.ලි.

A බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ඇති ක්‍රි.ව. 5වෙනි සියවසේ ලියූ කෝඩෙක්ස් ඇලෙක්සැන්ඩ්‍රිනස් නම් ග්‍රීක ලියවිල්ල. හෙ.ලි., ග්‍රී.ලි.

| | |
|---|---|
| Arm | ක්‍රි.ව. 5වෙනි සියවසේ ලියූ ආමේනියානු අනුවාදය. හෙ.ලි., ග්‍රී.ලි. |
| B | රෝමයේ වතිකානු නුවරේ ඇති ක්‍රි.ව. 4වෙනි සියවසේ ලියූ අංක 1209 දරන වතිකානු ග්‍රීක ලියවිල්ල. හෙ.ලි., ග්‍රී.ලි. |
| C | පැරිසියේ ඇති ක්‍රි.ව. 5වෙනි සියවසේ ලියූ කෝඩෙක්ස් එප්‍රේම් රෙස්ක්‍රිප්ටුස් නම් ග්‍රීක ලියවිල්ල. හෙ.ලි., ග්‍රී.ලි. |
| Ca | ඊජිප්තුවේ කයිරෝ නුවරේ ඇති ක්‍රි.ව. 895හි ලියූ කයිරෝ කෝඩෙක්ස් නම් හෙබ්‍රෙව් ලියවිල්ල. හෙ.ලි. |
| D | එංගලන්තයේ කැම්බ්‍රිජ්වල සහ පැරිසියේ ඇති ක්‍රි.ව. 5වෙනි සහ 6වෙනි සියවස්වල ලියූ කෝඩෙක්ස් බීසේ නම් ග්‍රීක සහ ලතින් ලියවිලි. ග්‍රී.ලි. |
| LXX | මුලදී ක්‍රි.පූ. 3වෙනි සහ 2වෙනි සියවස්වල ලියූ සෙප්ටුඅජින්ට් ලියවිල්ල. හෙ.ලි. (A. Rahlfs, Deutsche Bibelgesellschaft, Stuttgart, 1935). |
| M | B $19^{A}$ යන සංකේතය ඇති ලෙනින්ග්‍රෑඩ් කෝඩෙක්ස් ලියවිල්ලට ඇතුළත් මැසොරෙට්වරුන් පිළියෙල කළ හෙබ්‍රෙව් ලියවිල්ල. එය බිබ්ලියා හෙබ්‍රෙයිකා සහ බිබ්ලියා ෂ්ටුට්ගාටෙන්සියා යන හෙබ්‍රෙව් පිටපත්වලද ඇතුළත් කර තිබේ. |
| Sy, $Sy^{p}$ | සිරියැක් පෙෂිට්ටා නම් ඇරමයික බසින් මුලදී ක්‍රි.ව. 5වෙනි සියවසේ පිළියෙල කළ ක්‍රිස්තියානි ලියවිල්ල. (edited by S. Lee, London, 1826, and reprinted by United Bible Societies, 1979). |
| $Sy^{c}$ | මුලදී ක්‍රි.ව. 5වෙනි සියවසේ පිළියෙල කළ කුරෙටෝනියානු සිරියැක් ලියවිල්ල. (Edition: *The Curetonian Version of the Four Gospels*, by F. Crawford Burkitt, Vol. 1, Cambridge, England, 1904). |
| Vg | මුලදී ක්‍රි.ව. 400දී පමණ ජෙරෝම් පිළියෙල කළ ලතින් වල්ගේට් පරිවර්තනය. (*Iuxta Vulgatam Versionem*, Württembergische Bibelanstalt, Stuttgart, 1975). |

---

**කෙටි යෙදුම්:** අමතර කෙටි යෙදුම් කිහිපයක්ද මතු දැක්වේ.

| | | | |
|---|---|---|---|
| උපග්‍ර. | - උපග්‍රන්ථය | පෙර | - පෙර පදය |
| ක්‍රි.පූ. | - ක්‍රිස්තු පූර්ව | පි. | - පිටුව |
| ක්‍රි.ව. | - ක්‍රිස්තු වර්ෂ | ඡේ. | - ඡේදය |
| පරි. | - පරිච්ඡේදය | සෙ.මී. | - සෙන්ටිමීටර් |
| උදා. | - උදාහරණ | ග්‍රෑ. | - ග්‍රෑම් |
| ග්‍රී.ලි. | - ග්‍රීක ලියවිල්ල | කිලෝ | - කිලෝග්‍රෑම් |
| හෙ.ලි. | - හෙබ්‍රෙව් ලියවිල්ල | කි.මී. | - කිලෝමීටර් |
| මූ.අ. | - මූලික අර්ථය | ලී. | - ලීටර් |
| | | මී. | - මීටර් |

---

## අවසානය

වර්ෂ 2009 පළ වී ඇති මෙම නව ලොව පරිවර්තනයේ ඇතුළත් කර ඇති අමතර තොරතුරු බයිබලයේ පොත් 66ම එකිනෙකට සම්බන්ධ වී ඇති ආකාරය තේරුම්ගැනීමටත් සත්‍යය නමැති "පවිත්‍ර භාෂාව" හොඳින් අවබෝධ කරගැනීමටත් උපකාරවත් වෙයි. (ශෙපනියා 3:9) ඒවා යොදාගෙන බයිබලය ගැඹුරින් අධ්‍යයනය කරන විට යෙහෝවා දෙවිගේ ශුද්ධ වචනයට ගරුබිය දක්වන සියලුදෙනාගේ අවබෝධය තවත් පුළුල් වෙනවා නිසැකය. (යෙසායා 66: 2, 5) මෙම පරිවර්තනයේ ඇති සියලුම අංගවලින් උපරිම ප්‍රයෝජන ගෙන සත්‍ය ඉගැන්වීම් පිළිබඳ ඔබේ අවබෝධය පුළුල් කරගෙන, 'දෙවිගේ වදන් ජීවමාන බවත් බලවත් බවත්' තේරුම්ගැනීමට ඔබට හැකියාව ලැබේවා කියා අපි පතන්නෙමු. (හෙබ්‍රෙව් 4:12) යෙහෝවා දෙවිගේ වචනය වන බයිබලයෙන් නිරතුරුවම පෝෂණය වන තැනැත්තා මොන තරම් සන්තෝෂයක් අද්දකීද!—මතෙව් 5:3.

# ශුද්ධ ලියවිල්ලේ පොත්වල නම් සහ ඒවායේ අනුපිළිවෙළ:
# හෙබ්‍රෙව්-ඇරමයික ලියවිල්ල


| පොත | කෙටි යෙදුම | පිටුව |
|---|---|---|
| උත්පත්ති | උත් | 9 |
| නික්මයාම | නික් | 90 |
| ලෙවී කතාව | ලෙවී | 162 |
| ගණන් කතාව | ගණන් | 213 |
| ද්විතීය කතාව | ද්වි | 284 |
| යොෂුවා | යොෂු | 348 |
| විනිශ්චයකරුවෝ | විනි | 390 |
| රූත් | රූත් | 433 |
| 1 සාමුවෙල් | 1සාමු | 439 |
| 2 සාමුවෙල් | 2සාමු | 495 |
| 1 රාජාවලිය | 1රාජා | 542 |
| 2 රාජාවලිය | 2රාජා | 596 |
| 1 ලේකම් | 1ලේක | 648 |
| 2 ලේකම් | 2ලේක | 699 |
| එස්රා | එස්රා | 760 |
| නෙහෙමියා | නෙහෙ | 777 |
| එස්තර් | එස්ත | 804 |
| යෝබ් | යෝබ් | 816 |
| ගීතාවලිය | ගීතා | 873 |
| හිතෝපදේශ | හිතෝ | 1033 |
| දේශනාකාරයා | දේශ | 1076 |
| සලමොන්ගේ ගීතිකාව (ප්‍රේම ගී) | සල | 1089 |
| යෙසායා | යෙසා | 1095 |
| යෙරෙමියා | යෙරෙ | 1184 |
| විලාප ගී | විලා | 1283 |
| එසකියෙල් | එස | 1295 |
| දානියෙල් | දානි | 1384 |
| හොෂෙයා | හොෂෙ | 1409 |
| යෝවෙල් | යෝවෙ | 1423 |
| ආමොස් | ආමො | 1428 |
| ඔබදියා | ඔබ | 1438 |
| යෝනා | යෝනා | 1440 |
| මීකා | මීකා | 1443 |
| නාහුම් | නාහු | 1451 |
| හබක්කුක් | හබ | 1455 |
| ශෙපනියා | ශෙප | 1459 |
| හග්ගයි | හග් | 1463 |
| සෙකරියා | සෙක | 1466 |
| මලාකි | මලා | 1482 |


# ක්‍රිස්තියානි ග්‍රීක ලියවිල්ල


| පොත | කෙටි යෙදුම | පිටුව |
|---|---|---|
| මතෙව් | මතෙ | 1488 |
| මාක් | මාක් | 1543 |
| ලූක් | ලූක් | 1578 |
| යොහන් | යොහ | 1638 |
| ක්‍රියා | ක්‍රියා | 1684 |
| රෝම | රෝම | 1742 |
| 1 කොරින්ති | 1කොරි | 1770 |
| 2 කොරින්ති | 2කොරි | 1797 |
| ගලාති | ගලා | 1815 |
| එෆීස | එෆී | 1824 |
| පිලිප්පි | පිලි | 1834 |
| කොලොස්සි | කොලො | 1840 |
| 1 තෙසලෝනික | 1තෙස | 1846 |
| 2 තෙසලෝනික | 2තෙස | 1852 |
| 1 තිමෝති | 1තිමෝ | 1855 |
| 2 තිමෝති | 2තිමෝ | 1863 |
| තීතස් | තීත | 1868 |
| පිලෙමොන් | පිලෙ | 1872 |
| හෙබ්‍රෙව් | හෙබ්‍රෙ | 1873 |
| යාකොබ් | යාකො | 1892 |
| 1 පේතෘස් | 1පේතෘ | 1899 |
| 2 පේතෘස් | 2පේතෘ | 1906 |
| 1 යොහන් | 1යොහ | 1911 |
| 2 යොහන් | 2යොහ | 1917 |
| 3 යොහන් | 3යොහ | 1918 |
| යූද් | යූද් | 1919 |
| එළිදරව් | එළි | 1922 |

# උත්පත්ති

**1** පටන්ගැන්මේදී*[1] දෙවි[2] අහසත් පොළොවත්[3] නිර්මාණය[4] කළේය.

**2** පොළොව හිස්ව, පාළුව තිබුණේය. මහා ජල කඳට[5] ඉහළින් අන්ධකාරය විය. දෙවිගේ බලය ජලය[6] මතුපිට ක්‍රියාත්මක වෙමින්[7] තිබුණේය.

**3** දෙවි, “මම ආලෝකය ඇති කරමි” යයි කීවේය.[8] එවිට ආලෝකය ඇති විය.[9] **4** දෙවි ආලෝකය හොඳ බව දුටුවේය. ඉන්පසු දෙවි ආලෝකය හා අන්ධකාරය සඳහා වෙන වෙනම කාලවල් දෙකක් නියම කළේය.[10] **5** දෙවි ආලෝකය දවාල*[11] කියාද අන්ධකාරය රාත්‍රිය[12] කියාද හැඳින්වීය. සවස් විය. උදය විය. ඒ පළමුවන දවසය.

**6** පසුව දෙවි, “ජලය දෙපැත්තට බෙදී යන සේ[13] ඒ අතර අවකාශයක්[14] සාදන්නෙමි” යයි කීවේය. **7** මෙසේ දෙවි තමා කිවූ ලෙසම අවකාශය සෑදුවේය. බෙදූ ජලය අවකාශයට ඉහළින්ද[15] ඊට පහළින්ද සිටින සේ එය සෑදුවේය. **8** දෙවි අවකාශය අහස[16] කියා හැඳින්වීය. සවස් විය. උදය විය. ඒ දෙවන දවසය.

**9** දෙවි, “අහසට යටින් තිබෙන ජලය මම එක තැනකට රැස් කර වියළි බිම මතු වෙන්න සලස්වමි”[17] කියාද පැවසුවේය. එය එසේ සිදු විය. **10** දෙවි වියළි බිම පොළොව[18] කියාද එක තැනකට රැස් කළ ජලය මුහුද[19] කියාද හැඳින්වීය. දෙවි එය හොඳ බව දුටුවේය.[20] **11** දෙවි මෙසේද කීවේය. “මම තණකොළද බීජ සහිත පැළෑටිද[21] ඒ ඒ බීජ වර්ගයට අනුව පල දරන ගස්ද[22] පොළොව මත හටගන්න සලස්වමි.” එය එසේ සිදු විය. **12** මෙසේ පොළොවෙන් තණකොළද ඒ ඒ බීජ වර්ගයට අනුව බෝ වන පැළෑටිද පල දරන ගස්ද හටගත්තේය.[1] දෙවි එය හොඳ බව දුටුවේය. **13** සවස් විය. උදය විය. ඒ තුන්වන දවසය.

**14** දෙවි මෙසේද කීවේය. “දවාලත් රාත්‍රියත් වෙන් කරන පිණිස මම අහස්තලයෙහි ආලෝක වස්තූන් තබමි.[2] ඒවා ඍතු, දවස් හා අවුරුදු වෙන් කර හඳුනාගැනීම සඳහා ලකුණු ලෙස ක්‍රියා කරන්නේය.[3] **15** ඒ ආකාශ වස්තූන්ගෙන් පොළොවට ආලෝකයද ලැබෙන්නේය.”[4] එය එසේ සිදු විය. **16** දෙවි ප්‍රධාන ආලෝක වස්තූන් දෙකක් සෑදුවේය. දවාලට එළිය ලබා දෙන* පිණිස විශාල ආලෝක වස්තුවද රාත්‍රියට එළිය ලබා දෙන පිණිස කුඩා ආලෝක වස්තුව හා තාරකාද සෑදුවේය.[5] **17** මෙසේ පොළොවට ආලෝකය ලැබෙන පිණිස දෙවි ඒවා අහසෙහි තැබුවේය.[6] **18** ආලෝකය සහ අන්ධකාරය වෙන් කරන පිණිසද දවාලටත් රාත්‍රියටත් එළිය ලබා දෙන* පිණිසද දෙවි එසේ කළේය.[7] ඔහු එය හොඳ බව දුටුවේය.[8] **19** සවස් විය. උදය විය. ඒ හතරවන දවසය.

**20** එවිට දෙවි මෙසේ කීවේය. “ජලයේ පැතිර යන පිණිස මම නානාවිධ ජලජ ජීවීන්ව[9] සාදමි. ඉහළ අහසෙහි පියාසර කරන පිණිසද මම ජීවීන්ව[10] සාදමි.” **21** එවිට දැවැන්ත මුහුදු සතුන්වද[11] වෙනත් ජලජ ජීවීන්වද[12] දෙවි සෑදුවේය. ඒ ඒ වර්ගයට අනුව බෝ වන එම සතුන්

**1 පරි.**
**1** හෙබ්‍රෙ 1:10
**2** නික් 6:3; නික් 33:20; ද්වි 6:4; මාක් 10:18; යොහ 4:24; රෝම 1:20; 1කොරි 8:4; 1තිමෝ 1:11; 1තිමෝ 2:5; හෙබ්‍රෙ 9:24; 1යොහ 4:16; එළි 4:8
**3** යෝබ් 38:4; ගීතා 102:25; යෙසා 42:5; එළි 10:6
**4** ගීතා 148:5; යෙසා 45:18; එළි 4:11
**5** යෝබ් 38:30; හිතෝ 8:27
**6** ගීතා 104:6
**7** ගීතා 33:6; යෙසා 40:26
**8** ගීතා 33:9
**9** යෙසා 45:7
**10** යෝබ් 26:10; 2කොරි 4:6
**11** උත් 8:22
**12** යෙරෙ 33:20
**13** ගීතා 33:7; 2පේතෘ 3:5
**14** උත් 1:20
**15** උත් 7:11; හිතෝ 8:28
**16** උත් 27:28; ද්වි 4:17; 1රාජා 8:35
**17** යෝබ් 38:11; ගීතා 104:8; ගීතා 136:6
**18** ගීතා 24:1; ගීතා 95:5
**19** යෝබ් 38:8; හිතෝ 8:29
**20** ද්වි 32:4; 1තිමෝ 4:4
**21** උත් 1:29; ගීතා 72:16; මතෙ 13:32
**22** හග් 2:19; ලූක් 6:44; යාකො 3:12

**2 තීරුව**
**1** ලෙවී 19:19; ගීතා 104:14; ගලා 6:7
**2** ද්වි 4:19; ගීතා 148:3
**3** උත් 8:22; 1ලේක 23:31; ගීතා 104:19
**4** යෙරෙ 33:25; එස 32:8

**5** ගීතා 8:3; ගීතා 136:8; යෙරෙ 31:35; **6** යෙසා 13:10; **7** ගීතා 74:16; යෙසා 45:7; **8** ගීතා 104:31; **9** ලෙවී 11:10; **10** උත් 2:19; උත් 9:10; ද්වි 4:17; යෝබ් 12:7; **11** යෝබ් 7:12; ගීතා 148:7; **12** ලෙවී 11:46.

**උත් 1:1*** මෙහි සඳහන් වන්නේ විශ්වයේ මූලාරම්භය ගැනයි. **5*** මූ.අ., “දවස.” මෙහි සඳහන් වන්නේ සැන්දෑ වරුවේ කළුවර වැටීමට පෙර තිබෙන කාලය ගැනයි.

**උත් 1:16*** මූ.අ., “දවාල පාලනය කරන.” **18*** මූ.අ., “රාත්‍රිය පාලනය කරන.”

ජලය පුරාම පැතිර ගියේය. පියාසර
කරන සියලු ජීවීන්වද දෙවි සෑදුවේය.
ඒ සියලු ජීවීහුද ඒ ඒ වර්ගයට අනුව
බෝ වූහ.[1] දෙවි එය හොඳ බව
දුටුවේය. **22** දෙවි පියාසර කරන
ජීවීන්ට, “බෝ වී වැඩි වෙන්න” කියා
ආශීර්වාද කළේය. ජලජ ජීවීන්ටද,
“බෝ වී වැඩි වෙමින් මුහුද පුරා පැතිර
යන්න”[2] යයි ඔහු කීවේය. **23** සවස්
විය. උදය විය. ඒ පස්වන දවසය.
**24** ඉන්පසු දෙවි මෙසේ කීවේය.
“පොළොවේ[3] ජීවත් වන පිණිස ඒ ඒ
වර්ගයට අනුව බෝ වන ජීවීන්වද මම
සාදමි. ඒ ඒ වර්ගයට අනුව බෝ
වන හීලෑ[4] සතුන්ද කුඩා*[5] සතුන්ද
වනමෘගයන්ද[6] පොළොව මත බිහි
වෙන්න සලස්වමි.” එය එසේ විය.
**25** දෙවි පොළොවේ වනමෘගයන්වද
හීලෑ සතුන්වද සියලු කුඩා සතුන්වද
සෑදුවේය. ඒ සියලු සතුන් ඒ ඒ වර්ග-
යට අනුව බෝ වන ලෙස සෑදුවේය.[7]
දෙවි එය හොඳ බව දුටුවේය.
**26** දෙවි මෙසේද කීවේය. “අප[8]
හා සමාන[9] ගතිලක්ෂණ[10] ඇතුව
අපි මනුෂ්‍යයාව සාදමු. අපි මුහුදේ
මත්ස්‍යයන්වද අහසේ පියාසර කරන
ජීවීන්වද හීලෑ සතුන්වද ඔහු යටතේ
තබමු. මුළු පොළොවද ඒ මත සිටින
අන් සියලු සතුන්වද ඔහුට යටත්
කර දෙමු.”[11] **27** එවිට දෙවි මනුෂ්‍ය-
යාව සෑදුවේය. දෙවි මනුෂ්‍යයාව
සෑදුවේ ඔහුගේම ගතිලක්ෂණ ඇතු-
වයි.[12] පුරුෂයෙකු සහ ස්ත්‍රියක වශ-
යෙන් ඔවුන්ව සෑදුවේය.[13] **28** තවද
දෙවි ඔවුන්ට ආශීර්වාද කර[14] මෙසේ
කීවේය. “දරුවන් බිහි කර[15] ගණනින්
වැඩි වන්න. මුළු පොළොව පුරාම
මනුෂ්‍යයන්ව පදිංචි කර එය රැකබලා
ගන්න.[16] පොළොව මත සිටින සියලු
සතුන්වද මුහුදේ මත්ස්‍යයන්වද අහ-
සේ පියාසර කරන ජීවීන්වද ඔබ යට-
තේ තබාගන්න.”[17]

**29** දෙවි මෙසේද කීවේය. “පො-
ළොවේ සෑම තැනම වැඩෙන බීජ
සහිත සියලු පැළෑටිද පල දරන සියලු
ගස්ද[1] මා ඔබට දී තිබේ. ඒවා ඔබට
ආහාර පිණිස දෙන්නෙමි.[2] **30** පො-
ළොවේ සියලු වනමෘගයන්ටද අහ-
සේ පියාසර කරන සියලු ජීවීන්ටද
පොළොව මත සැරිසරන අනිකුත්
සියලු ජීවීන්ටද ආහාර පිණිස මම
සියලු පලා වර්ග දෙන්නෙමි.”[3] එය
එසේ සිදු විය.
**31** ඉන්පසු දෙවි තමා සෑදූ සියල්ල
දෙස බැලුවේය. ඒ සියල්ල ඉතා
හොඳින්[4] සාදා තිබුණු බව ඔහු දුටු-
වේය. සවස් විය. උදය විය. ඒ හයවන
දවසය.

**2** මෙසේ, අහසත් පොළොවත්
ඒවායේ ඇති සියල්ලත්* සාදා
නිම කරන ලද්දේය.[5] **2** හත්වන
දවස වන විට දෙවි එම වැඩ සියල්ල
නිම කළේය. හත්වන දවසේ සිට
ඔහු ඒ සියලු වැඩවලින් විවේක
ගත්තේය.[6] **3** දෙවි හත්වන දවසට
ආශීර්වාද කර එය ශුද්ධ දවසක් ලෙස
ප්‍රකාශ කළේය. මන්ද දෙවි තමා
පටන්ගත් වැඩ නිම කර හත්වන දව-
සේ සිට ඒ සියලු වැඩවලින් විවේක
ගත්තේය.[7]
**4** යෙහෝවා දෙවි අහසත් පො-
ළොවත් නිර්මාණය කළ දවස ගැන
මෙම වාර්තාවේ සඳහන් වේ.[8] ඒ දව-
සේදී ඔහු දේවල් සෑදූ අනුපිළිවෙළ
ගැනත් මෙහි විස්තර කර ඇත.
**5** ඒ කාලයේදී, පොළොවේ පඳු-
රක්වත් පැළෑටියක්වත් හටගෙන
තිබුණේ නැත. මන්ද ඒ වන විටත්
යෙහෝවා දෙවි පොළොව මතට වැසි[9]
වස්සවා තිබුණේ නැත. පොළොවේ
වගා කිරීමට මනුෂ්‍යයෙක් සිටියේද
නැත. **6** නමුත් දෙවි භූමිය තෙමන
පිණිස ජල වාෂ්ප[10] පොළොවෙන් ඉහ-
ළට නඟින්න සැලැස්වූවේය.[11]
**7** යෙහෝවා දෙවි භූමියේ[12] දූවිල්-
ලෙන්[13] මිනිසාව සාදා ඔහුගේ නාස්පුඩු

**1 පරි.**
**1** උත් 7:14, ලෙවී 11:14, ද්වි 14:13, 1කොරි 15:39
**2** නෙහෙ 9:6, ගීතා 104:25
**3** දේශ 3:20
**4** ද්වි 28:11, එළි 10:6
**5** උත් 6:7
**6** ගීතා 104:11, මාක් 1:13
**7** උත් 7:14, ගීතා 148:10
**8** උත් 11:7, හිතෝ 8:30, යොහ 1:3, කොලො 1:16
**9** උත් 5:1, ක්‍රියා 17:29, යාකො 3:9
**10** උත් 9:6, 1කොරි 11:7, කොලො 3:10
**11** උත් 9:2
**12** ගීතා 139:14
**13** මාක් 10:6, 1කොරි 11:9
**14** ගීතා 107:38
**15** උත් 9:1, ලෙවී 26:9
**16** උත් 2:15
**17** ගීතා 8:6, යෙසා 11:9, යාකො 3:7

**2 තීරුව**
**1** යෝබ් 36:31, ගීතා 145:16
**2** උත් 9:3, ගීතා 104:14, ක්‍රියා 14:17
**3** ගීතා 136:25, ගීතා 147:9, මතෙ 6:26
**4** ද්වි 32:4, ගීතා 104:24, 1තිමෝ 4:4

**2 පරි.**
**5** නෙහෙ 9:6, ගීතා 146:6, යෙසා 42:5, සෙක 12:1, ක්‍රියා 4:24
**6** නික් 31:17, හෙබ්‍රෙ 4:4
**7** නික් 20:11
**8** යෙසා 45:18
**9** මතෙ 5:45
**10** යෝබ් 36:27
**11** ගීතා 135:7
**12** යෝබ් 33:6, යෙසා 64:8
**13** උත් 3:19, ගීතා 103:14, දේශ 3:20, 1කොරි 15:47

උත් **1:24*** මුල් භාෂාවේ භාවිත කර ඇති වචනය යොමු දක්වන්නේ මීයන්, උරගයන්, කෘමීන් ඇතුළු බඩ ගා යන සතුන්ටය.

උත් **2:1*** මු.අ., “ඒවායේ සියලු සේනා.”

තුළට ජීවනයේ හුස්ම[1] හෙළුවේය.
එවිට මිනිසා ජීවමාන පුද්ගලයෙක්
විය.[2] **8** යෙහෝවා දෙවි, නැඟෙන-
හිර දෙසින් පිහිටි ඒදන්හි*[3] උයනක්
සාදා තමා සෑදූ[4] මිනිසාව එහි තැබු-
වේය. **9** යෙහෝවා දෙවි ඇසට ප්‍රිය
වූ කෑමට හොඳ වූ සියලු ගස් ඒ උය-
නේ හටගන්න සැලැස්වූවේය. ජීවන
වෘක්ෂයද[5] ‘හොඳ හා නරක හඳුනා-
ගැනීම’ යන නමින් හැඳින්වූ වෘක්-
ෂයද[6] ඔහු උයන මැද හටගන්න
සැලැස්වූවේය.

**10** උයනට ජලය සැපයීම සඳහා
ඒදන් වෙතින් ගඟක් ගලා ගියේය.
එය අතුගංගා හතරකට බෙදුණේය.
**11** පළමුවන අතුගංගාවේ නම
පීෂෝන්ය. රත්තරන් ඇති මුළු හවිලා
දේශය[7] වටා ගලා ගියේ ඒ ගංගාවය.
**12** ඒ දේශයේ රත්තරන් අනර්ඝය.[8]
ඩෙලියම් ලාටුද*[9] ඔනික්ස් ගල්ද[10]
එහි ඇත. **13** දෙවන ගංගාවේ නම
ගීහොන්ය. මුළු කූෂ් දේශය වටා
ගලන්නේ එම ගංගාවය. **14** තුන්-
වන ගඟෙහි නම හිද්දෙකෙල්ය.[11] එය
ඇසිරියාවෙන්[12] නැඟෙනහිර දෙසට
ගලා යයි. හතරවන ගඟ යුප්‍රටීස්ය.[13]

**15** යෙහෝවා දෙවි මිනිසාව ඒදන්
උයනෙහි පදිංචි කළේය.[14] උයන
බලාගන්නා පිණිසද එහි වගා කරන
පිණිසද මිනිසාව එහි තැබුවේය.[15]
**16** පසුව යෙහෝවා දෙවි මිනිසාට
මෙසේ අණ කළේය. “ඔබට උය-
නේ සියලු ගස්වලින් ඕනෑ තරම්
කන්න පුළුවන.[16] **17** නමුත් ‘හොඳ
හා නරක හඳුනාගැනීම’ යන නමින්
හැඳින්වෙන ගසෙන් ඔබ නොකෑ
යුතුය. මන්ද එයින් කෑ දවසේදීම ඔබ
අනිවාර්යයෙන්ම මැරෙන්නෙහිය.”[17]

**18** යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ කීවේය. “මිනිසා තනිව සිටීම
හොඳ නැත. ඔහුට ගැළපෙන සහකා-
රියකව සාදා දෙන්නෙමි.”[18] **19** යෙ-
හෝවා දෙවි සියලු වනමෘගයන්වද
අහසේ පියාසර කරන සියලු ජීවීන්වද
දූවිල්ලෙන් සෑදුවේය. පසුව ඒ එක් එක්
සත්වයාව මිනිසා වෙතට ගෙන ගොස්
උන්ට නම් තබන්න කියා දෙවි ඔහුට
කීවේය. මිනිසා එක් එක් සතාට[1] යම්
නමක් දුන්නේද ඒ නමින්ම උන්ව
හඳුන්වනු ලැබීය.[2] **20** මිනිසා සියලු
හීලෑ සතුන්ටද අහසේ පියාසර කරන
ජීවීන්ටද සියලු වනමෘගයන්ටද නම්
තැබුවේය. ඒ වන විටත් මිනිසාට
ගැළපෙන සහකාරියක් සිටියේ නැත.
**21** එබැවින් යෙහෝවා දෙවි මිනිසාව
තද නින්දකට[3] වැටෙන්න සැලැස්වූ-
වේය. ඔහු නිදා සිටියදී දෙවි ඔහුගෙන්
ඉළ ඇටයක් ගත්තේය. ඉන්පසු ඔහු
ඉළ ඇටය ගත් ස්ථානය වසා දැමු-
වේය. **22** පසුව යෙහෝවා දෙවි ඒ
ඉළ ඇටයෙන් ස්ත්‍රියක සාදා ඇයව
මිනිසා වෙතට ගෙනාවේය.[4]

**23** ඇයව දුටු විට මිනිසා මෙසේ
කීවේය.

“මේ මාගේ ඇටවලින් ඇටය,
මාගේ මාංසයෙන් මාංසයය.[5]
ඇයට ස්ත්‍රියයයි කියනු ලබන්-
නේය.
මන්ද ඇය මිනිසාගෙන් ගනු
ලැබීය.”[6]

**24** එබැවින් මිනිසෙක් තම පියා-
ගෙන්ද මවගෙන්ද වෙන් වී,[7] තම
බිරිඳට ඇලුම් වන්නේය. ඔවුහු දෙ-
දෙනා එක් කෙනෙකු මෙන් වන්-
නෝය.[8] **25** මිනිසා සහ ඔහුගේ
බිරිඳ නග්නව සිටියෝය.[9] නමුත්
ඔවුන්ට කිසි ලැජ්ජාවක් දැනුණේ
නැත.[10]

**3** යෙහෝවා දෙවි සෑදූ සියලු
සතුන්ට[11] වඩා සර්පයා[12] සූප-
රීක්ෂාකාරී[13] විය. ඌ ස්ත්‍රියට කතා
කර මෙසේ ඇසුවේය.[14] “උයනේ ගස්-
වලින් කන්න එපා කියා දෙවි ඔබට
පැවසූ බව ඇත්තද?”[15] **2** එවිට

**2 පරි.**
**1** උත් 7:22; යෝබ් 27:3; යෝබ් 33:4; යෙසා 42:5; ක්‍රියා 17:25
**2** එස 18:4; 1කොරි 15:45; 1පේත‍්‍ර 3:20
**3** උත් 2:15; උත් 3:23; යෙසා 51:3; එස 28:13
**4** උත් 1:26; ගීතා 139:14; රෝම 9:20
**5** උත් 3:24
**6** උත් 2:17; උත් 3:22
**7** උත් 25:18; 1සාමු 15:7
**8** උත් 13:2
**9** ගණන් 11:7
**10** නික් 25:7; 1ලේක 29:2; යෝබ් 28:16
**11** දානි 10:4
**12** උත් 10:11; මීකා 5:6
**13** උත් 15:18; ද්වි 11:24
**14** උත් 3:24; එස 28:13
**15** උත් 1:28; උත් 2:8; ගීතා 115:16
**16** උත් 2:9; උත් 3:2; ලෙවී 25:19
**17** උත් 3:19; ගීතා 146:4; දේශ 9:5; එස 18:4; රෝම 5:12; 1කොරි 15:22
**18** හිතෝ 31:11; 1කොරි 11:9; 1තිමෝ 2:13

**2 තීරුව**
**1** උත් 9:10
**2** උත් 1:26; උත් 9:2; ගීතා 8:6
**3** 1සාමු 26:12
**4** හිතෝ 18:22; හිතෝ 19:14; මාක් 10:9; 1තිමෝ 2:13
**5** උත් 29:14; විනි 9:2; 2සාමු 5:1; 2සාමු 19:12
**6** 1කොරි 11:8
**7** උත් 24:58; ගීතා 45:10; මාක් 10:7

**8** හිතෝ 5:18; මලා 2:16; මතෙ 19:5; රෝම 7:2; 1කොරි 6:16; 1කොරි 7:10; එෆී 5:31; හෙබ්‍රෙ 13:4; **9** උත් 3:7; **10** ගීතා 31:17; **3 පරි.** **11** උත් 1:24; **12** 2කොරි 11:3; එළි 12:9; එළි 20:2; **13** මතෙ 10:16; **14** උත් 2:22; ගණන් 22:28; **15** උත් 2:17.

**උත් 2:8*** තේරුම, “ප්‍රීතිය, සතුට.” **12*** ඩෙලි-
යම් යනු සුවඳවත් ලාටු වර්ගයකි. එය ලබාගන්-
නේ පත්‍ර අඩු කුඩා පඳුරු වර්ගයකිනි.

ස්ත්‍රිය සර්පයාට මෙසේ කීවාය. “උය-
නේ ගස්වල පලතුරු කන්න
අපිට පුළුවන්.[1] **3** නමුත් උයන මැද
තියෙන ගහේ[2] පලතුරු කන්න අපිට
බැහැ. ‘ඒ ගහට අත තබන්නවත්
එහි පලතුරු කන්නවත් එපා. එසේ
කළොත් ඔබ මිය යනවා’[3] කියා දෙවි
අපිට පැවසුවා.” **4** එවිට සර්පයා
ස්ත්‍රියට මෙසේ කීවේය. “ඔබ කවදා-
වත් මිය යන්නේ නැහැ.[4] **5** එයින්
කන දවසේම ඔබේ ඇස් ඇරෙන
බවත් ඔබ හොඳ හා නරක දැනගෙන
දෙවිට සමාන වන බවත් දෙවි දන්-
නේය.”[5]

**6** ස්ත්‍රියද, ඒ ගසේ පල කෑමට
හොඳ බවත් ඇසට ප්‍රිය බවත් දැක ඊට
ආශා වුණාය.[6] එබැවින් ඇය ගසෙන්
ගෙඩි කඩා කෑවාය. පසුව ඇය තම
ස්වාමිපුරුෂයාටත් එයින් කන්න දුන්-
නාය. ඔහුද එය කෑවේය.[7] **7** එවිට
ඔවුන් දෙදෙනාගේම ඇස් ඇරී, තමන්
නග්නව සිටින බව ඔවුහු දුටුවෝය.[8]
එබැවින් ඔවුහු අත්තික්කා කොළ
එකට අමුණා තම නග්නභාවය වසා-
ගත්තෝය.*[9]

**8** මද සුළඟ හමන වේලාවේදී උය-
නෙහි ඇවිදිමින් සිටි යෙහෝවා දෙවි-
ගේ කටහඬ ඔවුන්ට ඇසුණා.[10] එවිට
මිනිසා සහ ඔහුගේ බිරිඳ උයනේ
ගස් අතරට ගොස් යෙහෝවා දෙවි-
ගෙන් සැඟවුණෝය.[11] **9** යෙහෝවා
දෙවි කිහිප වතාවක්ම මිනිසාට හඬ-
ගසමින්, “ඔබ කොතැනද”[12] කියා
ඇසුවේය. **10** අවසානයේදී මිනිසා
මෙසේ කීවේය. “ඔබේ හඬ මට උය-
නේදී ඇසුණා. නමුත් මම නග්නව සිටි
නිසා භය වී සැඟවුණා.”[13] **11** එවිට
දෙවි මෙසේ ඇසුවේය. “ඔබ නග්නව[14]
සිටි බව ඔබට පැවසුවේ කවුද? මා
ඔබට නොකන්න කියා අණ කළ
ගසෙන් ඔබ කෑවාද?”[15] **12** මිනිසා
මෙසේ පිළිතුරු දුන්නේය. “ඔබ මට
දුන් ස්ත්‍රිය ගහෙන් ගෙඩියක් කඩා
මට දුන්නා. එබැවින් මමත් එය
කෑවා.”[1] **13** එවිට යෙහෝවා දෙවි,
“ඔබ කුමක්ද මේ කළේ” කියා ස්ත්‍රිය-
ගෙන් ඇසුවේය. ස්ත්‍රිය පිළිතුරු දෙ-
මින් මෙසේ කීවාය. “සර්පයා මාව
රැවටුවා. ඒ නිසා මම කෑවා.”[2]

**14** එවිට යෙහෝවා දෙවි සර්ප-
යාට[3] මෙසේ කීවේය. “ඔබ කළ මේ දේ
නිසා සියලු හීලෑ සතුන් අතරේද වන-
සතුන් අතරේද ඔබ ශාප ලද්දෙකි. ඔබ
බඩ ගා යමින් ඔබේ ජීවිත කාලය
පුරාම දූවිලි කන්නෙහිය.[4] **15** ඔබ[5]
සහ ස්ත්‍රිය[6] අතරද ඔබෙන් පැවත
එන්නන්[7] සහ ඇගෙන් පැවත එන
තැනැත්තා*[8] අතරද මම[9] සතුරු-
කම්[10] තබන්නෙමි. ඔහු[11] ඔබේ[12]
හිස[13] පොඩි කරන්නේය. ඔබ[14] ඔහු-
ගේ[15] විලුඹ[16] පොඩි කරන්නෙහිය.”

**16** ස්ත්‍රියට දෙවි මෙසේ කීවේය.
“ගැබිනි සමයේදී ඔබ අද්දකින වේද-
නාව[17] බොහෝ සෙයින් වැඩි වන්-
නේය. ඔබ වේදනා විඳිමින් දරුවන්
බිහි කරන්නෙහිය.[18] ඔබේ ස්වාමිපුරු-
ෂයා කෙරෙහි ඔබට අධික ඇල්මක්
ඇති වන්නේය. ඔහු ඔබව පාලනය
කරන්නේය.”[19]

**17** ආදම්ට ඔහු මෙසේ කීවේය.
“ඔබේ බිරිඳගේ හඬට සවන් දී,
‘නොකන්න’ කියා මා ඔබට අණ
කළ[20] ගසෙන් ඔබ කෑ බැවින් භූමිය
ශාප ලද්දේය.[21] ජීවිතාන්තය දක්වාම
දුක් ගැහැට විඳිමින් ඔබ වගා කරන්-
නෙහිය.[22] **18** කැලේ වැවෙන කටු
පඳුරු හා වල් පැළෑටි[23] අතරින්
ඔබට ආහාර සොයාගන්න සිදු වෙයි.
**19** භූමියෙන් ගන්නා ලද ඔබට,[24]
භූමියට හැරී යන තෙක්ම දහඩිය
මහන්සියෙන් කෑම සොයන්න සිදු
වෙයි. ඔබ දූවිලිය, දූවිල්ලටම හැරී
යන්නෙහිය.”[25]

**3 පරි.**
**1** උත් 2:16
**2** උත් 2:9
**3** නික් 19:12
**4** උත් 5:5 යොහ 8:44 1යොහ 3:8 එළි 21:8
**5** උත් 3:22 යෙසා 46:5 පිලි 2:6
**6** යාකො 1:14 1යොහ 2:16
**7** රෝම 5:12 2කොරි 11:3 1තිමෝ 2:14
**8** යෝබ් 1:21
**9** උත් 3:21
**10** ද්වි 4:33 ද්වි 23:14 ක්‍රියා 7:31
**11** ආනි 10:7 ආමො 9:3 හෙබ්‍රෙ 4:13 1යොහ 4:18
**12** මීකා 6:9
**13** නික් 3:6
**14** උත් 2:25
**15** උත් 2:17

**2 තීරුව**
**1** 1සාමු 15:24 යාකො 1:14
**2** 2කොරි 11:3 1තිමෝ 2:14
**3** උත් 3:1
**4** යෙසා 65:25 මීකා 7:17
**5** එස 28:14 එළි 12:9
**6** යෙසා 54:5 ගලා 4:26 එළි 12:1
**7** මතෙ 23:33 යොහ 8:44 1යොහ 3:10
**8** උත් 22:18 උත් 49:10 ගලා 3:16 ගලා 3:29
**9** යෙසා 35:4 යෙසා 43:11 හෙබ්‍රෙ 10:31
**10** උත් 22:17 යාකො 4:4 යූද් 9 එළි 12:7 එළි 12:17
**11** යොහ 18:37
**12** එළි 20:2
**13** එළි 20:10
**14** හෙබ්‍රෙ 2:14
**15** මීකා 5:1 මතෙ 27:50
**16** ක්‍රියා 3:15 පිලි 2:8
**17** 1ලේක 4:9
**18** උත් 35:16
**19** 1කොරි 7:28
**20** උත් 2:17 දේශ 12:13
**21** උත් 4:12; උත් 5:29; **22** ගීතා 127:2; හග් 1:6; **23** හෙබ්‍රෙ 6:8; **24** උත් 2:7; **25** යෝබ් 34:15; දේශ 3:20.

**උත් 3:7*** හෝ, “උකුළ වටා ප්‍රදේශය වසා-ගත්තෝය.”

**උත් 3:15*** මුල් භාෂාවේ භාවිත කර ඇති වචනය ‘පැවතෙන තැනැත්තන්’ ලෙසද පරිවර්තනය කළ හැක.

**20** ආදම් තම බිරිඳට ඒව යන නම
දුන්නේය.[1] ඇය මතු ජීවත් වන
සියලුදෙනාගේම මවය.[2] **21** යෙ-
හෝවා දෙවි ආදම්ට සහ ඔහුගේ
බිරිඳට දිග සම් වස්ත්‍ර සාදා දුන්නේය.[3]
**22** යෙහෝවා දෙවි මෙසේද කීවේය.
“මිනිසා දැන් අප මෙන් හොඳ හා
නරක කියන්නේ කුමක්ද කියා විනිශ්-
චය කරගෙන තිබේ.*[4] ඔහු සදහ-
ටම ජීවත් නොවන පිණිස ජීවන
වෘක්ෂයේ[5] පල කන්න ඔහුට ඉඩ
නොදිය යුතුයි.” **23** එසේ කියා, යෙ-
හෝවා දෙවි භූමියේ දූවිල්ලෙන් සෑදූ
මිනිසාව ඒදන් උයනෙන්[6] පිටතට
දැමුවේය. එහිදී ඔහුට වගා කිරීමට
සිදු විය.[7] **24** මෙසේ, දෙවි මිනි-
සාව උයනෙන් පිටතට එළවා දැමු-
වේය. දෙවි ජීවන වෘක්ෂයට යන
මඟ මුර කරන පිණිස ඒදන් උයනේ
නැඟෙනහිර පැත්තට වෙන්න[8] කෙ-
රුබ්වරුන්වද[9] දැවෙමින් නොනැවතී
කරකැවෙන කඩුවක්ද තැබුවේය.

**4** ආදම් ඔහුගේ බිරිඳ වූ ඒව සමඟ
සයනය කළේය. ඒව ගැබ්ගෙන[10]
පුතෙකු බිහි කළාය. ඔහුගේ නම
කායින්ය.[11] ඔහුව බිහි කළ අවස්ථා-
වේදී ඒව, “යෙහෝවා දෙවිගේ උපකා-
රය ඇතුව මම පිරිමි දරුවෙක්ව බිහි
කළා”[12] යයි කීවාය. **2** පසුව ඇය
කායින්ගේ සහෝදරයා වූ ආබෙල්ව[13]
බිහි කළාය.

ආබෙල් බැටළුවන් ඇති කරන්-
නෙක් විය.[14] නමුත් කායින් වගා
කරන්නෙක් විය.[15] **3** කල් යත්ම,
කායින් යෙහෝවා දෙවිට යාගයක්[16]
ඔප්පු කිරීම සඳහා තම අස්වැන්නෙන්
කොටසක් ගෙනාවේය.[17] **4** නමුත්
ආබෙල් ඔහුගේ රැළෙන් කුලුඳුල්[18]
සතුන් කිහිපදෙනෙකුව ගෙනාවේය.
උන්ගේ තෙල් කොටස්ද[19] ඔහු ගෙ-
නාවේය. යෙහෝවා දෙවි ආබෙල්
හා ඔහුගේ යාගය දෙස සතුටින්
බැලූ[20] නමුත්, **5** කායින් හා ඔහු-
ගේ යාගය දෙස සතුටින් බැලුවේ
නැත.[1] එබැවින් කායින් මහත් සේ
කෝපයට පත් විය.[2] ඔහුගේ මුහු-
ණද වෙනස් විය. **6** එවිට යෙහෝවා
දෙවි කායින්ගෙන් මෙසේ ඇසුවේය.
“ඔබ මෙතරම් කෝපයෙන් සිටින්නේ
මන්ද? ඔබේ මුහුණ පවා වෙනස් වී
තිබේ. **7** ඔබ යහමඟට හැරුණොත්
මම ඔබව පිළිගන්නේ නැද්ද?[3] නමුත්
ඔබ යහ මඟට හැරුණේ නැත්නම්
පාපය ඔබව හසු කරගැනීමට දොර-
කඩ ළඟ මාන බලමින් සිටින්නේය.[4]
ඔබ එයින් ජය ගන්නෙහිද?”[5]

**8** පසුව කායින්, “අපි කෙතට යමු”
කියා ආබෙල්ට කීවේය. ඔවුන් කෙ-
තේ සිටියදී කායින් ආබෙල්ට පහර
දී ඔහුව මරා දැමුවේය.[6] **9** පසුව
යෙහෝවා දෙවි, “ඔබේ සහෝදරයා
වන ආබෙල් කොහේද”[7] කියා කායින්-
ගෙන් ඇසුවේය. ඔහුද, “මම දන්නේ
කොහොමද? මම මගේ සහෝද-
රයාගේ රැකවලාද”[8] කියා ඇසීය.
**10** එවිට දෙවි මෙසේ කීවේය. “ඔබ
කුමක්ද මේ කළේ? ඔබේ සහෝදර-
යාගේ ලේ භූමියේ සිට මට හඬ-
ගසන්නේය.[9] **11** ඔබ මරා දැමූ[10]
ඔබේ සහෝදරයාගේ ලෙයින් නැහැවී
තිබෙන මේ ප්‍රදේශයෙන් මම ඔබව
පන්නා දමමි.[11] ඔබ ශාප ලද්දෙක්ය.
**12** ඔබට නිසරු පසක වගා කරන්න
සිදු වෙයි.[12] ඔබ ස්ථිර වාසස්ථාන-
යක් නොමැතිව ඉබාගාතෙ යන්නෙ-
හිය.”[13] **13** එවිට කායින් යෙහෝවා
දෙවිට මෙසේ කීවේය. “මගේ වරදට දී
තිබෙන දඬුවම මට දරාගන්න බැහැ.
**14** ඔබ අද මාව මේ ප්‍රදේශයෙන්
පන්නා දැමුවා. ජීවත් වීමට ස්ථිර
තැනක් නැති නිසා මට ඉබාගාතෙ[14]
යන්න වෙනවා. මින්පසු ඔබේ මුහුණ
මට දකින්න ලැබෙන්නෙත් නැහැ.[15]
ඒ නිසා මට කාව හරි මුණගැහු-
ණොත් ඔහු අනිවාර්යයෙන්ම මාව
මරා දමයි.”[16] **15** එවිට යෙහෝවා
දෙවි, “කවරෙකු හෝ ඔබව මරා දැමු-
වොත් ඔහු හත් වරක් ඔබේ ජීවිතය
වෙනුවෙන් වන්දි ගෙවිය යුතුයි”[17]
කියා කායින්ට කීවේය.

උත් **3:22*** මූ.අ., “අප මෙන් හොඳ හා නරක දන්නවා.”

**3 පරි.**
1 උත් 2:19; උත් 4:1
2 ක්‍රියා 17:26
3 උත් 3:7; එළි 3:18
4 උත් 3:5; පිලි 2:6
5 උත් 2:9
6 උත් 2:8
7 උත් 2:5; උත් 3:19
8 උත් 2:8; උත් 4:16
9 ගීතා 80:1; යෙසා 37:16; එස 10:4

**4 පරි.**
10 උත් 1:28
11 යූද් 11
12 උත් 3:16
13 මතෙ 23:35
14 උත් 46:34
15 උත් 3:23
16 ලෙවී 2:14
17 නෙහෙ 10:35
18 නික් 13:12
19 ලෙවී 3:9
20 හෙබ්‍රෙ 11:4

**2 තීරුව**
1 ආමො 5:22
2 හිතෝ 14:30; හිතෝ 15:18; හිතෝ 27:4
3 ලූක් 14:11; 1පේත‍්‍ර 5:6
4 හිතෝ 11:6; යාකො 1:14
5 දේශ 8:13; එස 18:27
6 මතෙ 23:35; 1යොහ 3:12; යූද් 11
7 ගීතා 10:13; හිතෝ 28:13
8 ගීතා 50:20; හිතෝ 17:17
9 උත් 18:20; 2රාජ 9:26; යෙසා 26:21; හෙබ්‍රෙ 12:24
10 උත් 9:5
11 එස්රා 7:26
12 උත් 3:17; ලෙවී 26:20; ද්වි 28:18
13 ද්වි 28:65; හිතෝ 28:17; හොෂෙ 9:17
14 ගීතා 36:11
15 යෝබ් 34:29; යෙසා 59:2; මීකා 3:4
16 රෝම 12:19
17 උත් 4:24; ද්වි 32:35; හෙබ්‍රෙ 10:30

මෙසේ, කායින්ව කිසිවෙකු මරා
නොදමන පිණිස යෙහෝවා දෙවි ඒ දේ
නියම කළේය.[1] **16** ඉන්පසු කායින්
යෙහෝවා දෙවි ඉදිරියෙන් ඉවත්ව
ගියේය.[2] ඔහු ඒදන්හි නැඟෙනහිර දෙ-
සින් පිහිටි, “පලායන්නන්ගේ දේශය”
වෙතට ගොස් පදිංචි විය.

**17** කායින් තම බිරිඳ සමඟ සය-
නය කළේය.[3] ඇය ගැබ්ගෙන
ඒනොක්ව බිහි කළාය. පසුව
කායින් නුවරක් ගොඩනැඟීමට පටන්-
ගත්තේය. ඔහු එම නුවරට ඔහු-
ගේ පුත් ඒනොක්ගේ නම තැබීය.[4]
**18** පසුව ඒනොක්ට දාව පුතෙක්
උපන්නේය. ඔහුගේ නම ඊරාද්ය.
ඊරාද් මෙහූයායෙල්ගේ පියා විය. මෙ-
හූයායෙල් මෙතූෂායෙල්ගේ පියා විය.
මෙතූෂායෙල් ලාමෙක්ගේ පියා විය.

**19** ලාමෙක් ස්ත්‍රීන් දෙදෙනෙකුව
විවාහ කරගත්තේය. පළමුවන
තැනැත්තියගේ නම ආදාය. දෙ-
වන තැනැත්තියගේ නම ෂිල්-
ලාය. **20** කල් යත්ම ආදා යාබල්ව
බිහි කළාය. කූඩාරම්වල ජීවත්
වෙමින්[5] සත්ව රැළවල් බලාගත්[6]
මුල්ම තැනැත්තා යාබල්ය. **21** ඔහු-
ගේ සහෝදරයාගේ නම යූබල්ය. ඔහු
වීණාවද[7] නළාවද[8] වාදනය කරන
සියල්ලන්ගේ ආදිපියාය. **22** ෂිල්ලා,
තූබල්-කායින්ව බිහි කළාය. ඔහු
තඹවලින් සහ යකඩවලින්[9] විවිධ
උපකරණ සැදුවේය. තූබල්-කායින්ගේ
සහෝදරිය නයමාය. **23** ලාමෙක්
ඔහුගේ භාර්යාවන් වූ ආදා සහ
ෂිල්ලාට මේ වචන කීවේය.

“මගේ භාර්යාවෙනි, මගේ හඬට
කන් දෙන්න.
මා පවසන දේට සවන් දෙන්න.
මට තුවාල කළ හෙයින් මිනිසෙ-
කුව මැරුවෙමි.
එසේය, මට පහර දුන් හෙයින්
තරුණයෙකුව මැරුවෙමි.
**24** කායින් නිසා හත් වරක් වන්දි
ගෙවන්නේ නම්[10]
ලාමෙක් නිසා හැත්තෑහත්
වරක් වන්දි ගෙවිය යුතුය.”

**25** ආදම් නැවතත් තම බිරිඳ
සමඟ සයනය කළේය. ඇය පුතෙකු
බිහි කර ඔහුට සෙත්*[1] යන නම තැබු-
වාය. “කායින් ආබෙල්ව මැරූ නිසා[2]
ආබෙල් වෙනුවට දෙවි මට තවත්
පුත්‍රයෙක්ව දුන්නා” යයි ඇය කීවාය.
**26** පසුව සෙත්ට දාව පුතෙක් උපන්-
නේය. ඔහු ඒනොෂ්[3] යන නම ඔහුට
තැබීය. ඒ කාලයේදී මනුෂ්‍යයෝ යෙ-
හෝවා දෙවිගේ නාමයට අවමන්
කරන්න පටන්ගත්තෝය.[4]

**5** ආදම්ගේ පෙළපත් වාර්තාව
මෙයයි. දෙවි තමාගේම ගති-
ලක්ෂණ[5] ඇතුව ආදම්ව සැදුවේය.
**2** දෙවි පුරුෂයෙකු සහ ස්ත්‍රියක
වශයෙන්[6] ඔවුන්ව සාදා[7] ඔවුන්ට
ආශීර්වාද කළේය. ඔහු ඔවුන්ව
හැඳින්වූයේ මනුෂ්‍යයන්[8] ලෙසය.

**3** ආදම් අවුරුදු එකසිය තිහක්
ජීවත් වූ පසු ඔහුගේ ස්වරූපයෙන්ම
ඔහුට දාව පුතෙක් උපන්නේය. ආදම්
ඔහුට සෙත්[9] යන නම තැබුවේය.
**4** සෙත් උපන් පසු ආදම් අවුරුදු අට-
සියයක් ජීවත් විය. ඒ කාලයේදී ඔහුට
දාව පුත්‍රයෝද දූවරුද උපන්නෝය.[10]
**5** ආදම් අවුරුදු නවසිය තිහක් ජීවත්
වී මිය ගියේය.[11]

**6** සෙත් අවුරුදු එකසිය පහක්
ජීවත් වූ පසු ඔහුට දාව ඒනොෂ්[12]
උපන්නේය. **7** ඒනොෂ් උපන් පසු
සෙත් තව අවුරුදු අටසිය හතක් ජීවත්
විය. ඒ කාලයේදී ඔහුට දාව පුත්‍රයෝද
දූවරුද උපන්නෝය. **8** සෙත් අවු-
රුදු නවසිය දොළහක් ජීවත් වී මිය
ගියේය.

**9** ඒනොෂ් අවුරුදු අනූවක් ජීවත්
වූ පසු ඔහුට දාව කේනාන්[13] උපන්-
නේය. **10** කේනාන් උපන් පසු
ඒනොෂ් තව අවුරුදු අටසිය පහළ-
වක් ජීවත් විය. ඒ කාලයේදී ඔහුට
දාව පුත්‍රයෝද දූවරුද උපන්නෝය.
**11** ඒනොෂ් අවුරුදු නවසිය පහක්
ජීවත් වී මිය ගියේය.

---

**උත් 4:25*** තේරුම, “වෙනත් කෙනෙකු වෙනුවෙන් ‘පත් කරන ලද’ තැනැත්තා.”

**4 පරි.**
**1** එස 9:6
**2** ගීතා 34:16
**3** උත් 5:4
**4** 2සාමු 18:18 ගීතා 49:11
**5** උත් 25:27 හෙබ්‍රෙ 11:9
**6** උත් 13:7 ද්වි 3:19
**7** ගීතා 33:2 1කොරි 14:7
**8** යෝබ් 21:12 ගීතා 150:4
**9** ද්වි 27:5 2සාමු 12:31 යෙසා 2:4
**10** උත් 4:15 ලෙවී 19:18

**2 තීරුව**
**1** උත් 5:3
**2** උත් 4:8 මතෙ 23:35 හෙබ්‍රෙ 11:4
**3** උත් 5:6 ලූක් 3:38
**4** නික් 20:7 2රාජා 19:16

**5 පරි.**
**5** උත් 1:26 1කොරි 11:7 යාකො 3:9
**6** උත් 1:27 මාක් 10:6
**7** උත් 1:27 උත් 2:23 ද්වි 4:32 යෙසා 45:12 මතෙ 19:4
**8** උත් 7:21 දේශ 3:21 ක්‍රියා 17:30 1කොරි 15:39
**9** උත් 4:25 1ලේක 1:1
**10** උත් 6:1
**11** උත් 2:17 උත් 3:19 ගීතා 146:4 හිතෝ 21:16 දේශ 6:6 දේශ 9:5 එස 18:4 රෝම 6:23 1කොරි 15:22
**12** උත් 4:26 ලූක් 3:38
**13** 1ලේක 1:2

**12** කේනාන් අවුරුදු හැත්තෑවක් ජීවත් වූ පසු ඔහුට දාව මහලලෙල්[1] උපන්නේය. **13** මහලලෙල් උපන් පසු කේනාන් තව අවුරුදු අටසිය හතළිහක් ජීවත් විය. ඒ කාලයේදී ඔහුට දාව පුත්‍රයෝද දූවරුද උපන්නෝය. **14** කේනාන් අවුරුදු නවසිය දහයක් ජීවත් වී මිය ගියේය.

**15** මහලලෙල් අවුරුදු හැටපහක් ජීවත් වූ පසු ඔහුට දාව යාරද්[2] උපන්නේය. **16** යාරද් උපන් පසු මහලලෙල් තව අවුරුදු අටසිය තිහක් ජීවත් විය. ඒ කාලයේදී ඔහුට දාව පුත්‍රයෝද දූවරුද උපන්නෝය. **17** මහලලෙල් අවුරුදු අටසිය අනූපහක් ජීවත් වී මිය ගියේය.

**18** යාරද් අවුරුදු එකසිය හැටදෙකක් ජීවත් වූ පසු ඔහුට දාව ඒනොක්[3] උපන්නේය. **19** ඒනොක් උපන් පසු යාරද් තව අවුරුදු අටසියයක් ජීවත් විය. ඒ කාලයේදී ඔහුට දාව පුත්‍රයෝද දූවරුද උපන්නෝය. **20** යාරද් අවුරුදු නවසිය හැටදෙකක් ජීවත් වී මිය ගියේය.

**21** ඒනොක් අවුරුදු හැටපහක් ජීවත් වූ පසු ඔහුට දාව මෙතූසලා[4] උපන්නේය. **22** මෙතූසලා උපන් පසු තව අවුරුදු තුන්සියයක් ජීවත් වූ ඒනොක් දිගටම සැබෑ දෙවි සමඟ ගමන් කළේය. ඒ කාලයේදී ඔහුට දාව පුත්‍රයෝද දූවරුද උපන්නෝය. **23** ඒනොක් ජීවත් වූ මුළු කාලය අවුරුදු තුන්සිය හැටපහක් විය. **24** ඒනොක් සැබෑ දෙවි[5] සමඟ දිගටම ගමන් කළේය.[6] පසුව දෙවි ඔහුව ගත්තේය. එබැවින් කිසිවෙකුට ඔහුව සොයාගන්න බැරි විය.[7]

**25** මෙතූසලා අවුරුදු එකසිය අසූහතක් ජීවත් වූ පසු ඔහුට දාව ලාමෙක්[8] උපන්නේය. **26** ලාමෙක් උපන් පසු මෙතූසලා තව අවුරුදු හත්සිය අසූදෙකක් ජීවත් විය. ඒ කාලයේදී ඔහුට දාව පුත්‍රයෝද දූවරුද උපන්නෝය. **27** මෙතූසලා අවුරුදු නවසිය හැටනවයක් ජීවත් වී මිය ගියේය.

**28** ලාමෙක් අවුරුදු එකසිය අසූදෙකක් ජීවත් වූ පසු ඔහුට දාව පුත්‍රයෙක් උපන්නේය. **29** ඔහු තම පුත්‍රයාට නෝවා*[1] යන නම තබමින් මෙසේ කීවේය. "යෙහෝවා දෙවි භූමියට ශාප කළ නිසා අපි අද වන තුරුත් දුක් මහන්සි වෙලා වැඩ කරනවා.[2] සමහරවිට මේ දරුවාගෙන්වත් අපිට සහනයක් ලැබේවි." **30** නෝවා උපන් පසු ලාමෙක් තව අවුරුදු පන්සිය අනූපහක් ජීවත් විය. ඒ කාලයේදී ඔහුට දාව පුත්‍රයෝද දූවරුද උපන්නෝය. **31** ලාමෙක් අවුරුදු හත්සිය හැත්තෑහතක් ජීවත් වී මිය ගියේය.

**32** නෝවා අවුරුදු පන්සියයක් ජීවත් විය. ඉන්පසු ඔහුට දාව ෂෙම්,[3] හාම්[4] සහ යාෆෙත්[5] යන පුත්‍රයෝ උපන්නෝය.

**6** පොළොවේ ජනගහනය ක්‍රමක්‍රමයෙන් වැඩි වෙන්න පටන්ගත්තේය. මනුෂ්‍යයන්ට දූවරුද සිටියෝය.[6] **2** ඒ කාලයේදී සැබෑ දෙවිගේ පුත්‍රයෝ*[7] මනුෂ්‍යයන්ගේ දූවරුන් ඉතා ලස්සන බව දුටුවෝය.[8] ඔවුහු හිතුමනාපෙට ස්ත්‍රීන්ව තෝරාගෙන ඔවුන්ව විවාහ කරගත්හ. **3** පසුව යෙහෝවා දෙවි මෙසේ කීවේය. "මම හැමදාමත්[9] මිනිසුන්ගේ ක්‍රියා නොඉවසන්නෙමි.[10] මන්ද ඔවුන් නිකම්ම දුර්වල මනුෂ්‍යයන් විතරයි.[11] ඔවුන්ට තව අවුරුදු එකසිය විස්සක් ජීවත් වෙන්න මම ඉඩහරින්නෙමි."[12]

**4** ඒ දවස්වලත් කලක් ගෙවුණු පසුත්, නෙෆිලිම්වරු* පොළොවෙහි සිටියෝය. ඒ කාලයේදී සැබෑ දෙවිගේ පුත්‍රයෝ මනුෂ්‍ය දූවරුන් සමඟ ලිංගික සම්බන්ධකම් පැවැත්වූහ. ඒ ස්ත්‍රීන්ට පුත්‍රයෝ බිහි වුණෝය. ඔවුහු පුරාණයේ විසූ බලවත් කීර්තිමත් මිනිස්සු වූහ.

**5 පරි.**
1 ලූක් 3:37
2 1ලේක 1:2 ලූක් 3:37
3 1ලේක 1:3 යූද් 14
4 1ලේක 1:3 ලූක් 3:37
5 උත් 6:9 ද්වි 13:4 යූද් 14 යූද් 15
6 ද්වි 8:6 විනි 2:22 ගීතා 15:2 හිතෝ 2:7 මීකා 6:8 කොලො 1:10 1තෙස 2:12 3යොහ 4
7 ද්වි 34:6 යොහ 3:13 හෙබ්‍රෙ 11:5
8 1ලේක 1:3 ලූක් 3:36

**2 තීරුව**
1 උත් 7:1 එස 14:14 මතෙ 24:37 හෙබ්‍රෙ 11:7 1පේතෘ 3:20 2පේතෘ 2:5
2 උත් 3:17
3 උත් 10:21 උත් 11:10 ලූක් 3:36
4 උත් 6:10 උත් 10:6
5 උත් 10:2 උත් 10:21

**6 පරි.**
6 උත් 1:28
7 යෝබ් 1:6 යෝබ් 38:7 2පේතෘ 2:4 යූද් 6
8 යෝබ් 31:1 යාකො 1:14
9 උත් 7:4
10 රෝම 9:22 1පේතෘ 3:20
11 ගීතා 78:39 යොහ 3:6
12 රෝම 9:22 1පේතෘ 3:20 2පේතෘ 3:9

උත් **5:29*** තේරුම, "විවේකය, සැනසීම." **6:2*** සෙප්ටුඅජින්ට් පරිවර්තනයේ ඇතැම් පිටපත්වල සඳහන් වන්නේ 'දේවදූතයෝ' කියායි. **4*** තේරුම, "බිමට ඇද වැටෙන සේ අන් අයට පහර දෙන්නෝ."

**5** මිනිසුන්ගේ දුෂ්ටකම් සෑම
තැනකම පැතිර තිබූ බවත් ඔවුන්ගේ
සිත් නිතරම[1] නපුරටම යොමු වී
තිබුණු බවත්[2] යෙහෝවා දෙවි දුටු-
වේය. **6** එබැවින් යෙහෝවා දෙවි-
ගේ සිතට මහත් වේදනාවක්
දැනිණ.[3] තමන් සෑදූ මිනිසුන් නිසා
ඔහු කනගාටුවට පත් විය.[4] **7** එබැ-
වින් යෙහෝවා දෙවි මෙසේ කීවේය.
“මම සෑදූ[5] මිනිසුන්ව පොළොවෙන්
නැති කර දමන්නෙමි. මිනිසුන්වද
හීලෑ සතුන්වද කුඩා සතුන්වද* අහ-
සේ පියාසර කරන ජීවීන්වද[6] මම
විනාශ කරන්නෙමි. මන්ද මා සෑදූ
මිනිසුන් නිසා මම කනගාටු වෙමි.”[7]
**8** නමුත් නෝවා කටයුතු කළ ආකා-
රය ගැන යෙහෝවා දෙවි සතුටු විය.
**9** නෝවාගේ ජීවිත කතාව
මෙයයි.

නෝවා ධර්මිෂ්ඨ මිනිසෙක් විය.[8]
ඔහුගේ කාලයේ ජීවත් වූ මනුෂ්‍ය-
යන්ට වඩා නිදොස්ව කටයුතු කළ
නෝවා සැබෑ දෙවි සමඟ ගමන්
කළේය.[9] **10** කල් යත්ම, නෝවාට
දාව පුත්‍රයෝ තුන්දෙනෙක් උපන්-
නෝය. ඔවුන්ගේ නම් ෂෙම්, හාම්
සහ යාෆෙත්ය.[10] **11** දෙවි පොළොව
දෙස බැලූ විට එය නාස්ති වී තිබුණු
බව ඔහුට පෙනුණේය.[11] පොළොව
සැහැසික ක්‍රියාවලින් පිරී තිබුණේය.[12]
**12** මිනිසාගේ හැසිරීම ඉතා පහත්
තත්වයක[13] තිබූ නිසා පොළොව දෙවි
ඉදිරියේ නාස්ති වී තිබුණේය.[14]
**13** ඉන්පසු දෙවි නෝවාට මෙසේ
කීවේය. “ජීවත් වන සියල්ලන්ව
විනාශ කිරීමට කාලය පැමිණ ඇත.[15]
මන්ද ඔවුන් නිසා මුළු පොළොවම
සැහැසික ක්‍රියාවලින් පිරී තිබේ.
එබැවින් මම පොළොව පිටටත්[16]
මනුෂ්‍යයන් පිටටත් විනාශයක් ගෙ-
නෙන්නෙමි. **14** ඔබ හොඳ ලීව-
ලින්* නැවක් සාදන්න.[17] නැව
ඇතුළේ කාමර සාදා එහි ඇතුළ්
පැත්ත හා පිට පැත්ත සම්පූර්ණ-
යෙන්ම තාරවලින් ආලේප කරන්න.[1]
**15** ඔබ එය මෙලෙස සෑදිය යුතුයි.
නැවෙහි දිග රියන්*[2] තුන්සියයක්ද
පළල රියන් පනහක්ද උස රියන්
තිහක්ද විය යුතුයි. **16** ඔබ නැවේ
වහලේ සිට රියනක් පහළට කවුළු-
වක්* සාදා නැවේ පැත්තකින් දොරටු-
වක් සාදන්න.[3] නැව තට්ටු තුනකින්
සෑදිය යුතුයි.

**17** “මම මහා ජල කන්දරාවක්
පොළොවට ඇද හැළෙන්න සලස්-
වන්නෙමි.[4] මම එසේ කරන්නේ අහස
යට ජීවත් වන සියල්ලන්ව*
විනාශ කරන පිණිසයි.[5] මනුෂ්‍යයන්
ඇතුළු සියලුම ජීවීහු මිය යන්නෝය.[6]
**18** එහෙත් මම ඔබ සමඟ ගිවිසුමක්
ඇති කරන්නෙමි. ඔබද ඔබේ භාර්යා-
වද ඔබේ පුත්‍රයන්ද ඔවුන්ගේ භාර්යා-
වන්ද නැවට ඇතුල් විය යුතුයි.[7]
**19** සියලු සත්ව වර්ගයන්ගෙන්[8] දෙ-
දෙනා බැගින් එනම්, පිරිමි සතෙකු
හා ගැහැනු සතෙකු බැගින් තෝරා
නැවට ඇතුල් කරන්න. ඔබේ ජීවිත
මෙන්ම උන්ගේ ජීවිතත් රැකෙන
පිණිස එසේ කරන්න.[9] **20** ඒ ඒ වර්-
ගයට අනුව[10] බෝ වන හීලෑ සතුන්-
ගෙන්ද පියාසර කරන ජීවීන්ගෙන්ද
අනිකුත් කුඩා සතුන්ගෙන්ද* දෙ-
දෙනා බැගින් තෝරා නැවට ගෙන
එන්න. උන්ගේ දිවි රැකෙන පිණිස
උන් ඔබ සමඟ නැවට ඇතුල් විය
යුතුයි.[11] **21** සියලු ආහාර වර්ගද
එකතු කර නැවට රැගෙන යන්න.[12]
ඒ ආහාර ද්‍රව්‍ය ඔබටත් සතුන්ටත්
කෑමට ගත හැකියි.”[13]

**22** දෙවි අණ කළ එක් දෙයක්වත්
අත් නෑර, නෝවා ඒ සියල්ල එලෙසම
ඉටු කළේය.[14]

**6 පරි.**
**1** උත් 8:21; යාකො 3:15
**2** දේශ 7:29; යෙරෙ 17:9; මතෙ 15:19
**3** ගීතා 78:40; ගීතා 95:10
**4** නික් 32:14; 1සාමු 15:11
**5** උත් 1:27; උත් 5:1; එළි 4:32
**6** උත් 7:3
**7** හොෂෙ 4:3
**8** උත් 7:1; එස 14:14; හෙබ්‍රෙ 11:7
**9** ගීතා 37:37; ලූක් 1:6; 2පේතෘ 2:5
**10** උත් 5:32
**11** හෙබ්‍රෙ 4:13
**12** ගීතා 11:5
**13** මතෙ 24:38; 2පේතෘ 2:5
**14** එළි 11:18
**15** එස 7:2; ආමො 8:2; 1පේතෘ 4:7
**16** උත් 7:4
**17** හෙබ්‍රෙ 11:7

**2 තීරුව**
**1** උත් 14:10; නික් 2:3
**2** උත් 7:20; එළි 3:11
**3** උත් 7:16
**4** උත් 1:7; උත් 7:6; මතෙ 24:39; 2පේතෘ 2:5
**5** උත් 7:15; දේශ 3:19
**6** උත් 7:21; ගීතා 104:29
**7** උත් 7:13; යෙසා 26:20
**8** උත් 8:17; 1කොරි 15:39
**9** 1පේතෘ 3:20
**10** උත් 1:25; උත් 7:14
**11** උත් 7:15
**12** උත් 1:30; යෙසා 11:7
**13** උත් 1:29
**14** නික් 40:16; හෙබ්‍රෙ 11:7; 1යොහ 5:3

---

උත් **6:7*** උත් 1:24හි පාදසටහන බලන්න. **14*** මෙහි සඳහන් වන්නේ මැලියම් සහිත ගසක ලී ගැනයි. එය සයිප්‍රස් වර්ගයට අයත් ගසක් විය හැකියි.

උත් **6:15*** රියනක් සෙන්ටිමීටර් 44.5කට සමානයි. **16*** හෙබ්‍රෙව් බසින්, ටසෝහා. එනම්, කවුළුවක් හෝ වහලක්. **17*** මූ.අ., “ජීවන හුස්ම ඇති සියල්ලන්.” **20*** උත් 1:24හි පාදසටහන බලන්න.

**7** පසුව යෙහෝවා දෙවි නෝවාට
මෙසේ කීවේය. “ඔබේ පවු-
ලේ සියලුදෙනා සමඟ[1] දැන් නැවට
ඇතුල් වන්න. මන්ද පොළොවේ සිය-
ලුම වැසියන් අතරින් ධර්මිෂ්ඨ ලෙස
හැසිරෙන්නේ ඔබ පමණයි.[2] **2** ඔබ
පවිත්‍ර වූ සියලු සතුන්ගෙන් හත්-
දෙනා බැගින් තෝරාගන්න. ගැහැනු
සතුන්වද පිරිමි සතුන්වද[3] තෝරාගත
යුතුයි. එහෙත් අපවිත්‍ර වූ සියලු
සතුන්ගෙන් දෙදෙනා බැගින් එනම්,
පිරිමි සතෙකු හා ගැහැනු සතෙකු
බැගින් තෝරාගන්න. **3** අහසේ
පියාසර කරන ජීවීන්ගෙනුත් හත්-
දෙනා බැගින් තෝරාගන්න. ගැහැනු
සතුන්වද පිරිමි සතුන්වද[4] තෝරා-
ගත යුතුයි. එසේ කළ යුතු වන්-
නේ උන් නොනැසී දිගටම පොළොව
පුරා තම වර්ගයා බෝ කරන පිණි-
සයි.[5] **4** මන්ද මම තව දවස් හත-
කින් පොළොව මතට වර්ෂාවක්[6] ඇද
හැළෙන්න සලස්වන්නෙමි. නොක-
ඩවා දහවල් හතළිහක්ද රාත්‍රී හතළි-
හක්ද[7] වර්ෂාව ඇද හැළෙන්නේය.
මෙසේ, මම සෑදූ සියලුම ජීවීන්ව
පොළොවෙන් නැති කරන්නෙමි.”[8]
**5** නෝවා, යෙහෝවා දෙවි තමාට
අණ කළ සියල්ල කළේය.

**6** මහා වර්ෂාව පොළොවට කඩා
හැළෙන විට නෝවාට වයස අවුරුදු
හයසියයක් විය.[9] **7** එම වර්ෂාව ඇද
හැළෙන්න පෙර නෝවාද ඔහුගේ
භාර්යාවද ඔහුගේ පුත්‍රයෝද ඔවුන්ගේ
භාර්යාවෝද නැවට ඇතුල් වූහ.[10]
**8** සියලු පවිත්‍ර සත්තුද සියලු අප-
විත්‍ර සත්තුද පියාසර කරන ජීවීහුද
අන් සියලු කුඩා සත්තුද[11] **9** නැවට
ඇතුල් වී නෝවා වෙතට ගියෝය.
දෙවි නෝවාට අණ කළ ලෙසම පිරිමි
සතෙකු බැගින්ද ගැහැනු සතෙකු
බැගින්ද උන්ව නැවට ඇතුල් කරන
ලදි. **10** දවස් හතකට පසු මහා
වැසි පොළොවට ඇද හැළෙන්න
පටන්ගත්තේය.

**11** නෝවාගේ ජීවිතයේ හයසිය-
වන අවුරුද්දේ දෙවන මාසයේ
දහහත්වන දිනයේදී අතිමහත් ජල
කඳේ* සියලුම දිය උල්පත් බිඳී ගිය
අතර අහසේ කවුළුද ඇරුණේය.[1]
**12** දහවල් හතළිහක්ද රාත්‍රී හතළි-
හක්ද[2] නොකඩවා මහා වැසි පො-
ළොවට ඇද හැළුණේය. **13** වර්ෂාව
පටන්ගත් එම දවසේදී, නෝවාද
ඔහුගේ පුත්‍රයන් වන ෂෙම්, හාම්
සහ යාෆෙත්ද[3] නෝවාගේ භාර්යා-
වද පුත්‍රයන්ගේ භාර්යාවෝද නැවට
ඇතුල් වූහ.[4] **14** ඒ ඒ වර්ගයට
අනුව[5] බෝ වන සියලු වනමෘග-
යන්ද හීලෑ සතුන්ද කුඩා සතුන්ද[6]
පක්ෂීන්ද[7] පියාපත් ඇති අනිකුත්
සතුන්ද[8] නැවට ඇතුල් කර තිබිණ.
**15** ඒ අවස්ථාවේදී සියලු සත්ව වර්ග-
යන් අතරින් දෙදෙනා බැගින් නැවට
ඇතුල් වී නෝවා වෙතට ගියෝය.[9]
**16** දෙවි ඔහුට අණ කළ ලෙසම සියලු
සත්වයන්ගෙන් පිරිමි සතාද ගැහැනු
සතාද බැගින් නැවට ඇතුල් කරන
ලදි. පසුව යෙහෝවා දෙවි දොර වැසු-
වේය.[10]

**17** මහා වර්ෂාව දවස් හතළිහක්
නොකඩවා පොළොවට කඩා හැළු-
ණේය. ජල මට්ටම එන්න එන්නම
වැඩි වෙත්ම නැවද ඉහළට නැඟී
පාවෙන්න පටන්ගත්තේය. **18** ජල
මට්ටම බොහෝ සෙයින් ඉහළ නැග්-
ගේය. නැව ජලය මත පාවී ගියේය.[11]
**19** පොළොව සම්පූර්ණයෙන්ම ජල-
යෙන් වැසී ගියේය. සියලු උස් කඳු
පවා ජලයට යට විය.[12] **20** කඳු
මුදුන්වලට වඩා රියන් පහළවක්
ඉහළින් ජල මට්ටම නැග්ගේය.[13]

**21** පොළොවේ ජීවත් වූ සියල්ලෝ
මිය ගියෝය.[14] පියාසර කරන ජීවී-
හුද හීලෑ සත්තුද වනමෘගයෝද
පොළොවේ බහුලව සිටි නානාවිධ
කුඩා ජීවීහුද මිනිස්සුද මිය
ගියෝය.[15] **22** මනුෂ්‍යයන් ඇතුළු
ගොඩබිම මත ජීවත් වූ සියලුම
ජීවීහු මිය ගියෝය.[16] **23** මෙසේ

**7 පරි.**
**1** හිතෝ 11:21
2පේතෘ 2:5
**2** ගීතා 91:14
ගීතා 101:6
මලා 3:18
හෙබ්‍රෙ 10:38
1පේතෘ 3:12
2පේතෘ 2:9
**3** ලෙවී 11:3
ද්වි 14:4
**4** උත් 8:19
**5** උත් 7:23
**6** උත් 2:5
යෝබ් 37:6
**7** උත් 7:12
**8** උත් 2:19
උත් 6:7
උත් 6:17
**9** උත් 8:13
**10** ලූක් 17:27
හෙබ්‍රෙ 11:7
**11** උත් 6:20

**2 තීරුව**
**1** උත් 1:7
උත් 8:2
**2** 1රාජා 19:8
**3** උත් 9:18
1ලේක 1:4
**4** උත් 6:18
1පේතෘ 3:20
2පේතෘ 2:5
**5** උත් 1:24
**6** උත් 6:7
**7** ලෙවී 11:14
**8** උත් 9:10
**9** උත් 6:17
ගීතා 146:4
දේශ 3:19
**10** යෙසා 26:20
**11** ගීතා 69:15
**12** යෝබ් 12:15
2පේතෘ 3:6
**13** ගීතා 104:6
**14** උත් 6:17
**15** ලූක් 17:27
**16** උත් 6:17
උත් 7:15
යෝබ් 27:3
දේශ 3:19
යෙසා 42:5

---

උත් **7:11*** එනම්, උත් 1:6 සහ 7හි විස්තර කර ඇති පෘථිවිය වටා තිබුණු ජල වියනයි.

දෙවි, මිනිසුන්වද මෘගයන්වද කුඩා සතුන්වද අහසේ පියාසර කරන ජීවීන්වද පොළොවෙන් නැති කර දැමුවේය.[1] බේරී ජීවත් වූයේ නෝවා සහ ඔහු සමඟ නැවේ සිටි සියල්ලන් පමණි.[2] **24** දවස් එකසිය පනහක් පුරා පොළොව සම්පූර්ණයෙන්ම ජලයෙන් වැසී තිබුණේය.

**8** නෝවාවද ඔහු සමඟ නැවේ සිටි සියලු වනමෘගයන්වද හීලෑ සතුන්වද[3] දෙවිට අමතක නොවීය.[4] කල් යත්ම, ඔහු පොළොව මත සුළඟක් හමන්න සැලැස්වූවේය. එවිට ජලය ටිකෙන් ටික බැස ගියේය.[5] **2** මහා ජල කඳේ දිය උල්පත්ද[6] අහසේ කවුළුද[7] වැසුණේය. ඉන්පසු අහසෙන් ඇද හැළුණු මහ වර්ෂාව නවත්වනු ලැබීය. **3** පොළොව මත තිබූ ජලය ටිකෙන් ටික බැස යන්න පටන්ගත්තේය. දවස් එකසිය පනහකට පසුව ජල මට්ටම සැහෙන්න අඩු වී තිබුණේය.[8] **4** හත්වන මාසයේ දහහත්වන දිනයේදී නැව[9] අරරත්[10] කඳුකරය මත නැවතිණ. **5** දහවන මාසය වන තෙක් ජලය ටිකෙන් ටික බැස ගියේය. දහවන මාසයේ පළමුවන දිනයේදී කඳු මුදුන් පෙනෙන්න පටන්ගත්තේය.[11]

**6** දවස් හතළිහකට පසු නෝවා තමා සෑදූ නැවේ කවුළුව[12] ඇරියේය. **7** ඉන්පසු ඔහු කපුටෙකුව[13] නැවෙන් පිටතට යැවීය. ඌ පිටතට ගොස් පියාසර කර හැරී ආවේය. ජලය හිඳී ගොස් පොළොව වියළෙන තෙක් ඌ කිහිප වතාවක්ම එසේ පියාසර කර හැරී ආවේය.

**8** පසුව පොළොවෙන් ජලය හිඳී ඇද්ද කියා බැලීමට ඔහු පරෙවියෙකුව[14] පිටතට යැවීය. **9** නමුත් ඒ වන විටත් පොළොව ජලයෙන් යට වී තිබුණු නිසා උගේ පය තබන්න තැනක් සම්බ නොවීය.[15] එබැවින් ඌ නැවත හැරී ආවේය. එවිට නෝවා පරෙවියාව තම අතට ගෙන නැව ඇතුළට ගත්තේය. **10** ඔහු දවස් හතක් බලා සිට නැවතත් පරෙවියාව පිටතට යැවීය. **11** හවස් වේලාවේදී පමණ පරෙවියා නැවට හැරී ආවේය. අමු ඔලීව කොළයක්[1] උගේ හොටේ තිබුණේය. පොළොවෙන් ජලය හිඳී ගොස් ඇති බව නෝවා එයින් දැනගත්තේය.[2] **12** ඔහු තවත් දවස් හතක් බලා සිට, නැවතත් පරෙවියාව යැවීය. නමුත් ඒ අවස්ථාවේදී ඌ හැරී ආවේ නැත.[3]

**13** නෝවාගේ ජීවිතයේ හයසිය එක්වන අවුරුද්දේ[4] පළමුවන මාසයේ පළමුවන දිනයේදී පොළොවේ ජලය හිඳී ගොස් තිබුණේය. නෝවා නැවේ වහලේ තිබූ කවුළුව ඇර බැලූ විට පොළොව මතුපිටින් ජලය හිඳී ගොස් තිබුණු බව ඔහු දුටුවේය.[5] **14** දෙවන මාසයේ විසිහත්වන දිනයේදී ජලය සම්පූර්ණයෙන්ම හිඳී ගොස් පොළොව වියළී තිබුණේය.[6]

**15** එවිට දෙවි නෝවාට මෙසේ කීවේය. **16** “ඔබේ භාර්යාව හා පවුලේ අනිකුත් සියලුදෙනා[7] සමඟ නැවෙන් පිටතට යන්න. **17** ඔබ යන විට ඔබ සමඟ සිටින සියලු පියාසර කරන ජීවීන්,[8] මෘගයන්[9] සහ සියලු කුඩා සතුන්වත් පිටතට ගෙන යන්න.[10] මන්ද උන් බෝ වී වැඩි වෙමින් පොළොව පුරා පැතිර යා යුතුය.”[11]

**18** එවිට තම භාර්යාව හා පවුලේ සියලුදෙනා[12] සමඟ නෝවා නැවෙන් පිටතට ගියේය. **19** සියලු මෘගයෝද කුඩා සත්තුද පක්ෂීහුද අන් සියලු සත්තුද තම තමාගේ වර්ගයට අනුව නැවෙන් පිටතට ගියෝය.[13] **20** පසුව නෝවා යෙහෝවා දෙවිට පූජාසනයක් සෑදුවේය.[14] ඔහු සියලු පවිත්‍ර සතුන්ගෙන්ද[15] සියලු පවිත්‍ර පක්ෂීන්ගෙන්ද[16] කිහිපදෙනෙකුව ගෙන පූජාසනය මත තබා දවන පූජා ලෙස උන්ව ඔප්පු කළේය.[17] **21** පූජාවෙන් නැඟී ආ සුවඳ යෙහෝවා දෙවිට ප්‍රසන්න විය.[18]

**7 පරි.**
**1** උත් 6:7
**2** හිතෝ 2:21, මතෙ 24:37, 1පේතෘ 3:20, 2පේතෘ 2:9, 2පේතෘ 3:6

**8 පරි.**
**3** උත් 6:20, හෙබ්‍රෙ 11:7
**4** උත් 19:29, නික් 2:24, 1සාමු 1:19, ගීතා 94:14
**5** ගීතා 33:7
**6** උත් 7:11, හිතෝ 8:28
**7** 2රාජා 7:2
**8** යෝබ් 38:11, යෙරෙ 5:22
**9** උත් 7:18
**10** 2රාජා 19:37
**11** උත් 7:20
**12** උත් 6:16
**13** උත් 6:20, ලෙවී 11:15, 1රාජා 17:4, යෝබ් 38:41
**14** ගීතා 55:6
**15** උත් 7:19

**2 තීරුව**
**1** නෙහෙ 8:15
**2** උත් 7:20, උත් 8:3
**3** යෙරෙ 48:28
**4** උත් 7:11
**5** උත් 1:9
**6** නික් 14:21
**7** උත් 7:7, 1පේතෘ 3:20, 2පේතෘ 2:5
**8** උත් 1:20, උත් 2:19, උත් 6:20
**9** උත් 1:25
**10** උත් 1:24, උත් 7:15, උත් 9:2, 1කොරි 15:39
**11** උත් 1:22, ගීතා 144:13
**12** උත් 6:10
**13** උත් 7:14, ගීතා 36:6
**14** උත් 12:7, උත් 22:9, උත් 26:25
**15** උත් 7:2, ලෙවී 20:25, ද්වි 14:4
**16** ද්වි 14:11
**17** ලෙවී 1:10, ලෙවී 1:14, ලෙවී 17:11, ද්වි 27:6

**18** ලෙවී 26:31; එස 20:41; එෆී 5:2; හෙබ්‍රෙ 13:16.

එබැවින් යෙහෝවා දෙවි මෙසේ සිතු-
වේය.[1] “මිනිසාගේ ක්‍රියා නිසා මම
නැවත කිසිදා භූමියට ශාප නොක-
රන්නෙමි.[2] මන්ද කුඩා කල පටන්
මිනිසාගේ සිත නපුරටම[3] යොමු වී
තිබේ.[4] මම මේ වතාවේදී ජීවත්
වන සියල්ලන්ව විනාශ කළ නමුත්
නැවත කිසිදා එසේ නොකරන්නෙමි.[5]
**22** පොළොව පවතින තාක් කල්, බීජ
වැපිරීම සහ අස්වැන්න නෙළීම සිදු
වනු ඇත. ශීතල සහ උණුසුමත් ගිම්-
හාන සෘතුව සහ ශීත සෘතුවත් දවාල
සහ රාත්‍රියත් සැමදා පවතිනු ඇත.”[6]

**9** දෙවි නෝවාටද ඔහුගේ පුත්‍රයන්-
ටද ආශීර්වාද කරමින් මෙසේ
කීවේය. “දරුවන් බිහි කර ගණ-
නින් වැඩි වෙන්න. මුළු පොළොව
පුරාම පදිංචි වෙන්න.[7] **2** පොළො-
වේ ජීවත් වන සියලු සතුන්වද අහ-
සේ පියාසර කරන සියලු ජීවීන්වද
අන් සියලු කුඩා සතුන්ව හා මුහුදේ
සියලු මත්ස්‍යයන්වද ඔබේ අතට භාර
දෙන්නෙමි.[8] මින් ඉදිරියටත් උන්
ඔබට මහත් බියකින් සිටිනු ඇත.
**3** සියලු පලා[9] වර්ගවලට අමතරව
දැන් පොළොවේ ජීවත් වන සතුන්වද
මම ඔබට ආහාර වශයෙන් දෙන්-
නෙමි.[10] **4** නමුත් ජීවය[11] වන ලේ[12]
සමඟ ඔබ මස් නොකෑ යුතුයි.[13]
**5** තවද ඔබේ ලේ වගුරුවන කවුරු
නමුත් මට ගණන් දිය යුතුයි. ඔබේ
සහෝදරයා ඔබේ ලේ වැගිරුවොත්
ඔබේ ජීවිතය වෙනුවෙන් ඔහු වන්දි
ගෙවිය යුතුයි.[14] සතෙකු ඔබව මරා
දැමුවොත් ඌවද මරා දැමිය යුතුයි.
**6** දෙවි මිනිසාව සෑදුවේ තමන්-
ගේම ගතිලක්ෂණ ඇතුවය. එබැ-
වින් යමෙකු විසින් මිනිසෙකුගේ ලේ
වගුරුවනු ලැබුවොත් ඔහුගේ ලේද
මිනිසෙකු විසින්ම වගුරුවනු ලබන්-
නේය.[15] **7** ඔබ දරුවන් බිහි කර
ගණනින් වැඩි වෙන්න. පොළොව
පුරාම පදිංචි වෙන්න.”[16]

**8** දෙවි නෝවාට සහ ඔහුගේ පුත්‍ර-
යන්ට තවදුරටත් මෙසේ කීවේය.
**9** “මම ඔබ සමඟත් ඔබෙන් පසුව
ඔබේ දරුවන්[1] සමඟත් ගිවිසුමක්[2]
පිහිටුවන්නෙමි. **10** පක්ෂීන්, හීලෑ
සතුන් හා වනමෘගයන් ඇතුළුව ඔබ
සමඟ නැවෙන් පිටතට ආ සියලු
සතුන් සමඟද උන්ගෙන් බිහි වන
පැටවුන් සමඟද මම ගිවිසුමක් පිහිටු-
වන්නෙමි.[3] **11** මා ඔබ සමඟ පිහිටු-
වන ගිවිසුම මෙයයි. ජීවත් වන
සියල්ලන්ව මින් මතු ජලගැල්මකින්
විනාශ නොකරන්නෙමි. පොළො-
වද නැවත කිසිදාක ජලගැල්මකින්
විනාශ නොකරන්නෙමි.”[4]

**12** දෙවි මෙසේද කීවේය. “මම ඔබ
සමඟත් ඔබ සමඟ සිටින සියලු
ජීවීන් සමඟත් පිහිටුවන ගිවිසුම ස්ථිර
කිරීමට ලකුණක් දෙන්නෙමි. මතු
පැමිණෙන සියලුම පරම්පරා දක්වා
සදහටම පවතින එම ලකුණ[5] මෙයයි.
**13** මම වලාකුළු අතරෙහි මගේ දේ-
දුන්න[6] තබන්නෙමි. එය පොළොව
සමඟ මා පිහිටුවා ඇති ගිවිසුමට ලකු-
ණක් වන්නේය. **14** මා පොළො-
වට ඉහළින් වැහි වලාකුළු ගෙනෙන
විට දේදුන්න ඒ අතරේ දිස් වනු
ඇත. **15** එවිට ඔබ සමඟත් ජීවත්
වන සියල්ලන්[7] සමඟත් පිහිටුවා
ඇති ගිවිසුම[8] මම අනිවාර්යයෙන්ම
සිහි කරන්නෙමි. මින් මතු කවදා-
වත් ජීවත් වන සියල්ලන්ව විනාශ
කරන තරම් ජලගැල්මක් නොවනු
ඇත.[9] **16** දේදුන්න වලාකුළු[10] අත-
රෙහි පායන විට පොළොවේ ජීවත්
වන සියල්ලන් සමඟ මා සදහටම[11]
ඇති කරගත් ගිවිසුම මට අනිවාර්ය-
යෙන්ම සිහි වෙයි.”[12]

**17** “පොළොවේ ජීවත් වන සියල්-
ලන් සමඟ මා ඇති කරගත් ගිවිසුම
ස්ථිර කරන ලකුණ එයයි”[13] කියා දෙවි
නැවතත් නෝවාට කීවේය.

**18** නැවෙන් පිටතට පැමිණි
නෝවාගේ පුත්‍රයෝ[14] නම් ෂෙම්, හාම්
සහ යාෆෙත්ය. හාම් කානාන්ගේ පියා
විය.[15] **19** පොළොව පුරා පැතිර ගිය

**8 පරි.**
**1** උත් 6:6
**2** උත් 3:17; උත් 5:29
**3** උත් 6:5; දේශ 7:20; මතෙ 15:19
**4** ද්වි 31:21; 1ලේක 28:9
**5** උත් 6:17; යෙසා 54:9
**6** උත් 1:14; දේශ 1:4; යෙරෙ 33:20

**9 පරි.**
**7** උත් 1:28; උත් 8:17
**8** උත් 1:26; යාකො 3:7
**9** උත් 1:29
**10** 1තිමෝ 4:3
**11** උත් 1:30; ලෙවී 17:11; ලෙවී 17:14
**12** ලෙවී 17:10
**13** ලෙවී 3:17; ලෙවී 7:26; ලෙවී 17:13; ද්වි 12:16; ද්වි 12:23; ක්‍රියා 15:20; ක්‍රියා 15:29; ක්‍රියා 21:25
**14** උත් 4:10; නික් 21:12; ගණන් 35:31; එළි 19:2
**15** නික් 20:13; ගණන් 35:12; ගණන් 35:30; ද්වි 19:6; 2සාමු 4:11; මතෙ 24:30; එළි 21:8
**16** උත් 1:28; උත් 10:32

**2 තීරුව**
**1** උත් 6:18; උත් 9:18
**2** උත් 9:15; යෙසා 54:9
**3** උත් 8:1; උත් 8:17
**4** උත් 8:21
**5** නික් 3:12
**6** එස 1:28; එළි 4:3
**7** 1කොරි 15:39
**8** ලෙවී 26:42; යෙසා 54:9
**9** උත් 8:21
**10** යෝබ් 38:36
**11** ගීතා 105:8; ගීතා 111:5
**12** ද්වි 7:9; හෙබ්‍රෙ 6:18
**13** උත් 9:13

**14** උත් 5:32; උත් 7:7; උත් 10:1; **15** උත් 10:6.

සියලු වැසියන් පැවත එන්නේ නෝ-
වාගේ පුත්‍රයන් තිදෙනාගෙන්ය.[1]

**20** ගොවිතැන්[2] කිරීමට පටන්ගත්
නෝවා මිදිවත්තක් වගා කළේය.[3]
**21** එක් දිනක් ඔහු වයින් බී මත්
වුණේය.[4] එවිට ඔහුගේ වස්ත්‍රය ගැලවී
කූඩාරම තුළ ඔහු නග්නව සිටියේය.
**22** පසුව කානාන්ගේ පියා වන හාම්[5]
තම පියා නග්නව සිටි බව දැක,[6]
පිටතට ගොස් තම සහෝදරයන් දෙ-
දෙනාට ඒ ගැන කීවේය.[7] **23** එවිට
ෂෙම් සහ යාෆෙත් තමන්ගේ කර පිට
රෙද්දක්[8] තබාගෙන පස්සෙන් පස්-
සට ගොස් තම පියාගේ නග්නභාවය
වසා දැමුවෝය. ඔවුහු තම පියා දෙස
හැරී නොබැලූ බැවින් ඔහුගේ නග්න-
භාවය නොදුටුවෝය.[9]

**24** මත් ගතිය සිඳුණු පසු නෝවා
අවදි විය. එවිට ඔහුගේ බාල පුත්‍රයා
කළ දේ ඔහුට දැනගන්න ලැබිණ.
**25** ඉන් අනතුරුව ඔහු මෙසේ
කීවේය.

“කානාන්ට ශාප වේවා![10]
ඔහු තම සහෝදරයන්ගේ දාස-
යන්ටත් දාසයෙකු වේවා!”[11]

**26** නෝවා මෙසේද කීවේය.

“ෂෙම්ගේ දෙවි වූ යෙහෝවාට
ප්‍රශංසා වේවා![12]
කානාන් ෂෙම්ගේ දාසයෙකු
වේවා![13]
**27** දෙවි යාෆෙත්ගේ දේශ සීමා විශාල
කරාවා!
යාෆෙත් ෂෙම්ගේ කූඩාරම්වල
වාසය කෙරේවා![14]
කානාන් ඔහුටද දාසයෙකු
වේවා!”

**28** මහා ජලගැල්මෙන් පසුව
නෝවා තව අවුරුදු තුන්සිය පනහක්
ජීවත් විය.[15] **29** නෝවා ජීවත් වූ
මුළු අවුරුදු ගණන නවසිය පනහක්
විය. පසුව ඔහු මිය ගියේය.[16]

# 10

නෝවාගේ පුත්‍රයන්[17] වන
ෂෙම්, හාම් සහ යාෆෙත්ගේ
පෙළපත් වාර්තාව මෙයයි.

මහා ජලගැල්මෙන් පසු ඔවුන්ට දාව
පුත්‍රයෝ උපන්නෝය.[1] **2** යාෆෙත්-
ගේ පුත්‍රයන්ගේ නම් ගොමෙර්,[2]
මාගොග්,[3] මාදයි,[4] යාවාන්,[5] තූබල්,[6]
මෙෂෙක්[7] සහ තීරස්[8] යන අයයි.

**3** ගොමෙර්ගේ පුත්‍රයන්ගේ නම්
අෂ්කෙනස්,[9] රිෆත්[10] සහ තොගර්-
මා[11] යන අයයි.

**4** යාවාන්ගේ පුත්‍රයන්ගේ නම්
එලිෂාහ්,[12] තර්ෂිෂ්,[13] කිත්තිම්[14] සහ
දොදානීම්[15] යන අයයි.

**5** ඔවුන්ගෙන් පැවත එන අය විවිධ
දූපත්වලට විසිර ගියෝය. තම තමන්-
ගේ භාෂාවට අනුවද තම තමන්ගේ
පවුල්වලට අනුවද තම තමන්ගේ
ජාතියට අනුවද තම තමන්ගේ දේශ-
යන්හි ඔවුහු විසිර ගියෝය.

**6** හාම්ගේ පුත්‍රයන්ගේ නම් කූෂ්,[16]
මිස්‍රයිම්,[17] පූට්[18] සහ කානාන්[19] යන
අයයි.

**7** කූෂ්ගේ පුත්‍රයන්ගේ නම්
සෙබා,[20] හවිලා, සබ්තා, රයමා[21]
සහ සබ්තෙකා යන අයයි.

රයමාගේ පුත්‍රයන්ගේ නම් ෂෙබා
සහ දෙදාන්ය.[22]

**8** කූෂ්ට නිම්රොද්[23] නමින්
හැඳින්වූ පුත්‍රයෙක්ද සිටියේය.
පොළොවේ බලවන්තයෙකු වූ මුල්ම
තැනැත්තා මොහුය. **9** යෙ-
හෝවා දෙවිට එරෙහිව නැඟී සිටි
ඔහු, බලවත් දඩයක්කාරයෙක් විය.
“යෙහෝවා දෙවිට එරෙහිව සිටි
බලවත් දඩයක්කාරයෙක් වූ නිම්-
රොද් මෙනි” යන කියමන ඇති
වූයේ ඒ නිසාය.[24] **10** ඔහු ෂීනාර්[25]
දේශයේ රාජ්‍යයක් පිහිටෙව්වේය.
ඊට බාබෙල්,[26] ඒරෙක්,[27] අක්කද්
සහ කල්නේ යන නගර ඇතු-
ළත් විය. **11** ඔහු ඒ දේශයේ
සිට ඇසිරියාවට[28] ගොස් නිනිවය,[29]
රෙහොබොත්-ඊර් සහ කාලා යන
නගර ගොඩනඟන්න පටන්ගත්-
තේය. **12** ඔහු නිනිවය සහ කාලා
අතර රෙසෙන් යන නගරය ගොඩ-

**9 පරි.**

**1** 1ලේක 1:4; 1පේතෘ 3:20
**2** උත් 2:15; 2තිමෝ 2:6
**3** ද්වි 20:6
**4** උත් 19:35; හිතෝ 23:35
**5** 1ලේක 1:8
**6** ලෙවී 18:7; එස 22:10
**7** හිතෝ 12:13; හිතෝ 17:9; එෆී 5:3
**8** උත් 37:34; නික් 22:27
**9** නික් 20:12; ලෙවී 19:32; යෙසා 58:7
**10** ලෙවී 18:3; ද්වි 7:1; ද්වි 27:16; රෝම 1:27
**11** යොෂු 17:13
**12** නික් 18:10; ද්වි 8:10; 1රාජා 1:48; 1ලේක 29:20; ලූක් 1:68
**13** යොෂු 9:23; විනි 1:28; 1රාජා 9:21
**14** 1ලේක 1:5
**15** උත් 7:6
**16** හෙබ්‍රෙ 11:7

**10 පරි.**

**17** 1ලේක 1:4; ලූක් 3:36

**2 තීරුව**

**1** උත් 9:19
**2** එස 38:6; ගලා 1:2
**3** එස 38:2
**4** 2රාජා 17:6; යෙසා 13:17
**5** සෙක 9:13
**6** යෙසා 66:19; එස 27:13
**7** ගීතා 120:5; එස 32:26
**8** 1ලේක 1:5
**9** යෙරෙ 51:27
**10** 1ලේක 1:6
**11** එස 27:14; එස 38:6
**12** එස 27:7
**13** 1රාජා 10:22; යෝනා 1:3
**14** යෙසා 23:1
**15** 1ලේක 1:7
**16** 1ලේක 1:8
**17** උත් 50:11
**18** යෙරෙ 46:9; නාහු 3:9
**19** ගණන් 34:2
**20** ගීතා 72:10
**21** එස 27:22

**22** 1ලේක 1:9; **23** 1ලේක 1:10; **24** ගීතා 35:4; **25** දානි 1:2; **26** උත් 11:9; **27** එස්රා 4:9; **28** මීකා 5:6; **29** යෝනා 3:3; මතෙ 12:41.

නැඟුවේය. ඒ නගර විශාල නුවරක්
ලෙස ගණන් ගනු ලැබීය.*
**13** මිස්‍රයිම්ගේ[1] පුත්‍රයන් නම්
ලූදිම්,[2] අනාමිම්, ලෙහාබිම්, නප්තු-
හිම්,[3] **14** පත්රුසිම්,[4] (පිලිස්තිව-
රුන්ගේ[5] ආදිපියා වූ) කස්ලූහිම්[6] හා
කප්තෝරිම්[7] යන අයයි.*
**15** කානාන්ගේ කුලුඳුල් පුත්‍රයා
සීදොන්ය.[8] කානාන්ට හෙත්[9]
යන නමින්ද පුත්‍රයෙක් සිටියේය.
**16** එමෙන්ම යෙබූසිවරුන්,[10] අමෝ-
රිවරුන්,[11] ගිර්ගාෂිවරුන්, **17** හිවී-
යවරුන්,[12] අර්කිවරුන්, සීන්වරුන්,
**18** අර්වාදිවරුන්,[13] ෂෙමාරිවරුන්
හා හමාතිවරුන්[14] යන අය
පැවතෙන්නේද කානාන්ගෙනි. පසුව
කානානිවරුන්ගේ පවුල් විසිර
ගියෝය. **19** කානානිවරුන්ගේ
දේශ සීමාව සීදොන් පටන් ගාසා[15]
අසල පිහිටි ගෙරාර්[16] දක්වාද සො-
දොම්, ගොමෝරාව[17] හා අද්මා[18] යන
නගර දක්වාද ලාෂා අසල පිහිටි
ෂෙබොයිම්[19] නගරය දක්වාද දිව
ගියේය. **20** තම තමන්ගේ පවුල්-
වලටද භාෂාවලටද ජාතීන්ටද අනුව
තම තමන්ගේ දේශවල ජීවත් වූ
හාම්ගේ පුත්‍රයෝ ඔවුහුය.
**21** වැඩිමලා වූ යාපෙත්ගේ සහෝ-
දරයා වූ ෂෙම්ටද දරුවෝ සිටියෝය.
ඒබර්ගෙන්[20] පැවත ආ සියලුදෙනා-
ගේම ආදිපියා ෂෙම්ය. **22** ෂෙම්ගේ
පුත්‍රයන්ගේ නම් ඒලාම්,[21] අෂූර්,[22]
ආර්පක්සද්,[23] ලුද් සහ ආරම් යන
අයයි.
**23** ආරම්ගේ පුත්‍රයන්ගේ නම්
ඌෂ්, හුල්, ගෙතෙර් සහ මෂ්[24] යන
අයයි.
**24** ආර්පක්සද්ගේ පුත්‍රයා ෂේ-
ලාය.[25] ෂේලාගේ පුත්‍රයා ඒබර්ය.
**25** ඒබර්ට පුත්‍රයෝ දෙදෙ-
නෙක් සිටියෝය. එක් කෙනෙ-
කුගේ නම පේලෙග්ය.*[1] ඔහුට
එම නම තැබුවේ ඒ කාලයේ
පොළොවේ යම් භේදයක් හටගත්
නිසාය.[2] ඔහුගේ සහෝදරයාගේ
නම යොක්තාන්ය.[3]
**26** යොක්තාන්ගේ පුත්‍රයන්
නම් අල්මෝදාද්, ෂෙලෙප්, හසර්-
මාවෙත්, යේරා,[4] **27** හදෝරාම්,
ඌසාල්, දික්ලා,[5] **28** ඔබාල්,
අබිමායෙල්, ෂෙබා,[6] **29** ඕෆීර්,[7]
හවිලා[8] සහ යෝබාබ්[9] යන අයයි.
**30** ඔවුන්ගේ වාසස්ථාන මේෂා
සිට සේෆාර් නම් වූ නැඟෙනහිර
දෙසින් පිහිටි කඳුකර ප්‍රදේශය දක්වා
පැතිර ගියේය.
**31** තම තමන්ගේ පවුල්වලටද
භාෂාවලටද ජාතීන්ටද අනුව තම
තමන්ගේ දේශවල ජීවත් වූ ෂෙම්ගේ
පුත්‍රයෝ ඔවුහුය.[10]
**32** නෝවාගේ පුත්‍රයන්ගෙන්
පැවත ආ පවුල් ඒවාය. මහා ජලගැල්-
මෙන් පසු පොළොව පුරා පදිංචි වූ
සියලු ජාතීන් පැවත ආවේ ඔවුන්ගේ
පවුල්වලිනි.[11]

**11** ඒ දවස්වලදී, මුළු පොළො-
වෙම තිබුණේ එක භාෂා-
වකි.* **2** මනුෂ්‍යයන් නැඟෙනහිර
දෙසට ගමන් කරමින් සිටියදී ඔවුන්ට
ෂීනාර්[12] දේශයේ තැනිතලාවක් සම්බ
විය. ඔවුහු එහි පදිංචි වූහ.
**3** ඔවුහු, “එන්න! අපි ගඩොල් කපා
ඒවා පුලුස්සා ගමු” යයි එකිනෙකාට
කීවෝය. ඔවුහු ගල් වෙනුවට
ගඩොල්ද බදාම වෙනුවට තාරද*
භාවිත කළෝය.[13] **4** පසුව ඔවුහු
මෙසේද කීවෝය. “එන්න! අපි නුවරක්
හදාගමු. එහි අහස උසට[14] කොතක්
ගොඩනඟා ගෙන අපටම කීර්ති නාම-
යක් හදාගමු.[15] එසේ නොකළොත්
පොළොව පුරාම විසිර යන්න අපට
සිදු වෙයි.”[16]

**10 පරි.**
**1** 1ලේක 1:8
**2** යෙරෙ 46:9
**3** 1ලේක 1:11
**4** එස 29:14
**5** යොෂු 13:3 යෙරෙ 47:4
**6** 1ලේක 1:12
**7** ද්වි 2:23
**8** යොෂු 13:6 මාක් 7:24
**9** උත් 25:10 උත් 27:46
**10** විනි 1:21
**11** උත් 15:16 ද්වි 3:8
**12** යොෂු 11:3
**13** එස 27:11
**14** 1රාජා 8:65 සෙක 9:2
**15** යොෂු 15:47 ක්‍රියා 8:26
**16** උත් 20:1
**17** උත් 13:10 උත් 19:24 2පේත෴ 2:6 යූද් 7
**18** ද්වි 29:23
**19** උත් 14:8
**20** උත් 11:17
**21** එස්රා 4:9 ක්‍රියා 2:9
**22** එස 27:23
**23** උත් 11:10
**24** 1ලේක 1:17
**25** උත් 11:12 ලූක් 3:35

**2 තීරුව**
**1** උත් 11:16
**2** උත් 11:9
**3** 1ලේක 1:19
**4** 1ලේක 1:20
**5** 1ලේක 1:21
**6** 1ලේක 1:22
**7** 1රාජා 9:28 1රාජා 10:11 1ලේක 29:4
**8** උත් 2:11 උත් 25:18
**9** 1ලේක 1:23
**10** උත් 10:5
**11** උත් 9:7 උත් 9:19 ක්‍රියා 17:26

**11 පරි.**
**12** උත් 10:10 දානි 1:2
**13** නික් 1:14 නික් 2:3
**14** ආමො 9:2
**15** ගීතා 49:11 දානි 4:30 යොහ 5:44
**16** උත් 9:1 ලූක් 1:51

---

උත් **10:12*** මූ.අ., “මෙය මහත් නුවර වේ.” සමහරවිට නිනිවය ඇතුළුව තව නුවරවල් තුනකට මෙය යොමු දක්වන්න ඇත. **14*** මෙම නම්වලින් මිස්‍රායිම්ගෙන් පැවත ආ ගෝත්‍ර හෝ ජාතීන් නියෝජනය කරනවා විය හැකියි.

උත් **10:25*** තේරුම, “බෙදීම.” **11:1*** මුල් භාෂාවේ, “සියලුදෙනාම කතා කළේ එකම වචන මාලාව” යන අදහසද ඇතුළත් කර තිබේ. **3*** හෙබ්‍රෙව් බසින්, බිටුමන්. බිටුමන් යන ද්‍රව්‍යය තාරවලට සමානය.

5 යෙහෝවා දෙවි මනුෂ්‍යයන්
දෙසට තම ඇස් යොමු කර
ඔවුන් ගොඩනැඟූ නුවරද කොතනද
පරීක්ෂා කර බැලුවේය.*[1] 6 ඉන්-
පසු යෙහෝවා දෙවි මෙසේ කීවේය.
“මේ මිනිස්සු එකම භාෂාව කතා
කරන,[2] එක සෙනඟක් මෙන් සිටිති.
ඔවුන් දැන් මේ ආකාරයට හැසිරෙ-
නවා නම් මින් ඉදිරියටත් තමන්
කැමති දේ කෙසේ හෝ ඉටු කර-
ගනීවි.[3] 7 ඒ නිසා ඔවුන් කතා
කරන දේ එකිනෙකාට නොතේරෙන
ලෙස අපි[4] ඔවුන්ගේ භාෂාව[5] අවුල්
කරමු.”[6] 8 යෙහෝවා දෙවි එසේ
කරමින් ඔවුන්ව පොළොව පුරා විසු-
රුවාහැරියේය.[7] එබැවින් ඔවුහු නුවර
ගොඩනැඟීමේ කාර්යය ක්‍රමක්‍රමයෙන්
අත්හැරියෝය.[8] 9 යෙහෝවා දෙවි
එම ස්ථානයේදී පොළොවේ වැසියන්
කතා කරමින් සිටි භාෂාව අවුල් කළ
නිසා එම නුවරට බාබෙල්*[9] යන නම
තබන ලදි. යෙහෝවා දෙවි එම ස්ථා-
නයේ සිට ඔවුන්ව පොළොව පුරාම
විසුරුවාහැරියේය.[10]

10 ෂෙම්ගේ[11] පෙළපත් වාර්තාව
මෙයයි.

ජලගැල්මෙන් අවුරුදු දෙකකට
පසුව ෂෙම්ට ආව ආර්පක්සද්[12] උපන්-
නේය. එවිට ෂෙම්ගේ වයස අවුරුදු
සියයක් විය. 11 ආර්පක්සද් උපන්
පසු ෂෙම් තව අවුරුදු පන්සියයක්
ජීවත් විය. ඒ අතරතුරේදී ඔහුට ආව
පුත්‍රයෝද දූවරුද උපන්නෝය.[13]

12 ආර්පක්සද් අවුරුදු තිස්පහක්
ජීවත් වූ පසු ඔහුට ආව ෂේලා[14] උපන්-
නේය. 13 ෂේලා උපන් පසු ආර්-
පක්සද් තව අවුරුදු හාරසිය තුනක්
ජීවත් විය. ඒ කාලයේදී ඔහුට ආව
පුත්‍රයෝද දූවරුද උපන්නෝය.

14 ෂේලා අවුරුදු තිහක් ජීවත් වූ
පසු ඔහුට ආව ඒබර්[15] උපන්නේය.
15 ඒබර් උපන් පසු ෂේලා තව අවු-
රුදු හාරසිය තුනක් ජීවත් විය. ඒ
අතරතුරේදී ඔහුට ආව පුත්‍රයෝද දූව-
රුද උපන්නෝය.

16 ඒබර් අවුරුදු තිස් හතරක්
ජීවත් වූ පසු ඔහුට ආව පේලෙග්[1]
උපන්නේය. 17 පේලෙග් උපන් පසු
ඒබර් තව අවුරුදු හාරසිය තිහක්
ජීවත් විය. ඒ අතරතුරේදී ඔහුට ආව
පුත්‍රයෝද දූවරුද උපන්නෝය.

18 පේලෙග් අවුරුදු තිහක් ජීවත් වූ
පසු ඔහුට ආව රෙව්[2] උපන්නේය.
19 රෙව් උපන් පසු පේලෙග් තව අවු-
රුදු දෙසිය නවයක් ජීවත් විය. ඒ
අතරතුරේදී ඔහුට ආව පුත්‍රයෝද දූව-
රුද උපන්නෝය.

20 රෙව් අවුරුදු තිස්දෙකක් ජීවත්
වූ පසු ඔහුට ආව සේරග්[3] උපන්නේය.
21 සේරග් උපන් පසු රෙව් තව අවු-
රුදු දෙසිය හතක් ජීවත් විය. ඒ අතර-
තුරේදී ඔහුට ආව පුත්‍රයෝද දූවරුද
උපන්නෝය.

22 සේරග් අවුරුදු තිහක් ජීවත් වූ
පසු ඔහුට ආව නාහෝර්[4] උපන්නේය.
23 නාහෝර් උපන් පසු සේරග් තව
අවුරුදු දෙසියයක් ජීවත් විය. ඒ අත-
රතුරේදී ඔහුට ආව පුත්‍රයෝද දූවරුද
උපන්නෝය.

24 නාහෝර් අවුරුදු විසිනවයක්
ජීවත් වූ පසු ඔහුට ආව ටේරා[5]
උපන්නේය. 25 ටේරා උපන් පසු
නාහෝර් තව අවුරුදු එකසිය දහනව-
යක් ජීවත් විය. ඒ අතරතුරේදී ඔහුට
ආව පුත්‍රයෝද දූවරුද උපන්නෝය.

26 ටේරා අවුරුදු හැත්තෑවක්
ජීවත් වූ පසු ඔහුට ආව ආබ්‍රම්,[6]
නාහෝර්[7] සහ හාරාන් උපන්නෝය.

27 ටේරාගේ පවුලේ විස්තර මතු
දැක්වේ.

ටේරාට ආව ආබ්‍රම්, නාහෝර් සහ
හාරාන් උපන්නෝය. හාරාන්ට
ආව ලොත්[8] උපන්නේය. 28 හාරාන්
තමා උපන් රට වන කල්දිවරුන්ගේ[9]
දේශය වූ ඌර්හි[10] මිය ගියේය. ඒ
වන විටත් තම පියා වන ටේරා
ජීවත්ව සිටියේය. 29 ආබ්‍රම් සාරයි[11]
සමඟ විවාහ විය. නාහෝර් හාරාන්-
ගේ දුව වන මිල්කා[12] සමඟ විවාහ

**11 පරි.**
1 උත් 18:21, ගීතා 11:4, හෙබ්‍රෙ 4:13
2 උත් 11:1
3 දේශ 7:29, 1කොරි 1:19
4 උත් 1:26, හිතෝ 8:30
5 උත් 10:5
6 යෝබ් 5:12, ගීතා 33:10, ගීතා 55:9
7 ද්වි 32:8, ලූක් 1:51
8 යෝබ් 12:14, ගීතා 127:1
9 යෙරෙ 50:1, 1පේතෘ 5:13
10 ගීතා 68:30, ලූක් 1:51
11 උත් 6:10, 1ලේක 1:4, ලූක් 3:36
12 උත් 10:22, 1ලේක 1:17
13 උත් 10:21
14 උත් 10:24, 1ලේක 1:18, ලූක් 3:35
15 උත් 10:21, 1ලේක 1:18

**2 තීරුව**
1 උත් 10:25, 1ලේක 1:19
2 1ලේක 1:25, ලූක් 3:35
3 ලූක් 3:35
4 1ලේක 1:26
5 උත් 11:32, ලූක් 3:34
6 උත් 12:7, උත් 15:6, උත් 17:5, උත් 18:19, යොහ 8:39, රෝම 4:11, ගලා 3:16, හෙබ්‍රෙ 11:17, යාකො 2:23
7 යොෂු 24:2
8 උත් 12:4, උත් 19:1, 2පේතෘ 2:7
9 2රාජා 24:2, ක්‍රියා 7:4
10 උත් 15:7, නෙහෙ 9:7
11 උත් 12:11, උත් 17:15, උත් 20:12, 1පේතෘ 3:6
12 උත් 22:20, උත් 24:15

---

**උත් 11:5*** මූ.අ., “යෙහෝවා දෙවි මනුෂ්‍යයන් ගොඩනැඟූ නුවරද කොතනද බලන පිණිස ගියේය.” **9*** තේරුම, “අවුල, වියවුල.”

විය. හාරාන් මිල්කාගේද ඉස්කාගේද
පියාය. **30** සාරයි කාලයක් තිස්සේ
දරුවෙකු නොලැබ වඳව සිටියාය.[1]

**31** ඉන්පසු ටේරා තම පුත් ආබ්‍රම්
සමඟ කල්දිවරුන්ගේ දේශය වන ඌර්
වෙතින් පිටත්ව ගියේය. ඔහුගේ මුනු-
පුරා වන හාරාන්ගේ පුත් ලොත්ද[2]
ආබ්‍රම්ගේ බිරිඳ වූ ඔහුගේ ලේලි
වන සාරයිද[3] ඔවුන් සමඟ ගියෝය.
ඔවුහු කානාන්[4] දේශය දෙසට ගමන්
කළෝය. කල් යත්ම ඔවුහු හාරාන්[5]
නුවරට පැමිණ එහි වාසය කළෝය.
**32** ටේරා ජීවත් වූ මුළු අවුරුදු ගණන
දෙසිය පහක් විය. ඔහු හාරාන්හිදී මිය
ගියේය.

**12** යෙහෝවා දෙවි ආබ්‍රම්ට
කතා කර මෙසේ කීවේය.
“ඔබේ දේශයෙන් පිට වී යන්න. ඔබේ
නෑදෑයන්වද ඔබේ පියාගේ නිවසද
අත්හැර මා ඔබට පෙන්වන දේශ-
යට යන්න.[6] **2** මම ඔබට ආශීර්-
වාද කර ඔබගෙන් මහත් ජාතියක්
බිහි කරන්නෙමි. ඔබේ නම ගෞරව-
යට පත් කරන්නෙමි. අන්‍යයන් ඔබ
මාර්ගයෙන් ආශීර්වාද ලබන්නේය.[7]
**3** ඔබට ආශීර්වාද කරන අයට
මම ආශීර්වාද කරන්නෙමි. ඔබට
ශාප කරන තැනැත්තාට මම දඬු-
වම් කරන්නෙමි.[8] පොළොවේ සියලු
ජාතීහු නිසැකවම ඔබ මාර්ගයෙන්
ආශීර්වාද ලබාගන්නෝය.”*[9]

**4** එවිට ආබ්‍රම් යෙහෝවා දෙවි
කී ලෙසම පිටත්ව ගියේය. ලොත්ද
ඔහු සමඟ ගියේය. ආබ්‍රම් හාරාන්
නුවරින්[10] පිටත්ව යන විට ඔහු-
ගේ වයස අවුරුදු හැත්තෑපහක් විය.
**5** ආබ්‍රම් තම භාර්යාව වූ සාරයි-
වද[11] තම සහෝදරයාගේ පුත්
ලොත්වද[12] හාරාන්හිදී එකතු කර-
ගත් බඩු බාහිරාදියද[13] දාසදාසීන්වද
රැගෙන කානාන් දේශය බලා පිටත්ව
ගියේය.[14] කල් යත්ම ඔවුහු කානාන්
දේශයට පැමිණියෝය. **6** ආබ්‍රම් ඒ
දේශයේ ෂීකෙම්[1] නම් ස්ථානය දක්-
වාම ගොස් මොරේගේ විශාල ගස්
අසල[2] නතර විය. ඒ කාලයේදී කානා-
නිවරුද දේශයේ සිටියෝය. **7** එවිට
යෙහෝවා දෙවි ආබ්‍රම් ඉදිරියේ දර්ශ-
නය වී මෙසේ කීවේය. “මම ඔබෙන්
පැවතෙන්නන්ට*[3] මේ දේශය දෙන්-
නෙමි.”[4] ඉන්පසු ආබ්‍රම් එතැනදී තමා
ඉදිරියේ දර්ශනය වූ යෙහෝවා දෙ-
විට පූජාසනයක් ගොඩනැඟුවේය.
**8** පසුව ඔහු බෙතෙල්[5] නම් ස්ථාන-
යට නැඟෙනහිරෙන් පිහිටි කඳුකර
පළාතට ගොස් කූඩාරම් ගසාගත්-
තේය. ඔහු සිටි ස්ථානයට බස්නාහි-
රෙන් බෙතෙල්ද නැඟෙනහිරෙන් ආයි[6]
නගරයද තිබිණ. ආබ්‍රම් එතැනදීත්
යෙහෝවා දෙවිට පූජාසනයක් ගො-
ඩනඟා[7] යෙහෝවා දෙවිට ස්තුති
ප්‍රශංසා කළේය.*[8] **9** ඉන්පසු ආබ්‍රම්
එතැනින් පිටත් වී නෙගෙබ්*[9] දෙසට
ගමන් කළේය. ඒ ගමන අතරතුරේදී
ඔහු තැනින් තැන කූඩාරම් ගසා ඒවා-
යේ වාසය කළේය.

**10** ඒ කාලයේදී දේශයේ සාග-
තයක් හටගත්තේය. සාගතය
උග්‍ර වූ නිසා[10] ඊජිප්තුවට ගොස්
ටික කලකට එහි ජීවත් වීමට[11]
ආබ්‍රම් තීරණය කළේය. **11** ඊජිප්-
තුවට ළඟා වෙත්ම ඔහු තම භාර්-
යාව වූ සාරයිට මෙසේ කීවේය.
“ඔබ ඉතා ලස්සන කාන්තාවක්.[12]
**12** ඔබ ලස්සන නිසා ඊජිප්තුවරුන්
ඔබට හොඳින් සලකයි. නමුත් මම
ඔබේ ස්වාමිපුරුෂයා කියා දැනගත්-
තොත් ඔවුන් මාව මරා දමයි. **13** ඒ
නිසා මා වෙනුවෙන් මේ දේ කරන්න.
ඔබ මගේ සහෝදරිය කියා ඔවුන්ට
කියන්න.[13] ඔබ එහෙම කිව්වොත්
මගේ ජීවිතය බේරගන්න පුළුවන්. ඔබ
නිසා ඔවුන් මට හොඳින් සලකයි.”[14]

**11 පරි.**
**1** උත් 16:2, උත් 18:11, රෝම 4:19, හෙබ්‍රෙ 11:11
**2** උත් 11:27
**3** උත් 12:5, උත් 16:1
**4** උත් 9:26, උත් 10:19, උත් 12:7, ගණන් 34:2, ක්‍රියා 13:19
**5** උත් 12:4, උත් 27:43, ක්‍රියා 7:2

**12 පරි.**
**6** යොෂු 24:3, ක්‍රියා 7:4
**7** උත් 13:16, උත් 15:5, උත් 17:5, උත් 22:17, හෙබ්‍රෙ 6:14
**8** උත් 27:29, නික් 23:22, ගණන් 24:9
**9** සෙක 8:23, ලූක් 1:73, ක්‍රියා 3:25, ගලා 3:8
**10** හෙබ්‍රෙ 11:8
**11** උත් 11:29
**12** උත් 11:31
**13** උත් 13:6, දේශ 5:19
**14** උත් 26:3

**2 තීරුව**
**1** ක්‍රියා 7:16
**2** උත් 35:4, ද්වි 11:30
**3** උත් 3:15, උත් 21:12, උත් 28:14, රෝම 9:7, ගලා 3:16
**4** උත් 13:15, උත් 15:7, උත් 17:8, ද්වි 34:4
**5** උත් 28:19, උත් 31:13
**6** උත් 13:3, යොෂු 7:2
**7** උත් 8:20, උත් 35:3
**8** උත් 26:25, හිතෝ 18:10, රෝම 10:13
**9** උත් 20:1, උත් 24:62
**10** උත් 26:1
**11** උත් 47:4, ද්වි 23:7, ගීතා 105:13, ක්‍රියා 7:6
**12** උත් 26:7
**13** උත් 12:19
**14** උත් 20:12

---

උත් **12:3*** මුල් භාෂාවේ භාවිත කර ඇති ක්‍රියා පදයෙන් අදහස් කරන්නේ එම ආශීර්වාදය ලබන්න නම් යමක් කළ යුතු බවයි.

උත් **12:7*** මුල් භාෂාවේ භාවිත කර ඇති වචනය ‘පැවතෙන තැනැත්තා’ ලෙසද පරිවර්තනය කළ හැක. **8*** මූ.අ., “යෙහෝවා දෙවිගේ නාමයට අයැදුවේය.” **9*** හෝ, “දකුණු දෙසට එනම්, පොරොන්දු දේශයේ දකුණු පළාතට.”

14 ඔවුන් ඊජිප්තුවට ඇතුල් වූ
වහාම සාරයි රුවැති කාන්තාවක් බව
ඊජිප්තුවරු දුටුවෝය. 15 පාරාවෝ
යටතේ සිටි පාලකයෝද ඇයව දැක
පාරාවෝ ඉදිරියේ ඇය ගැන වර්ණනා
කළෝය. එබැවින් ඇයව පාරාවෝගේ
නිවසට ගෙන යනු ලැබීය. 16 පාරා-
වෝ ඇය නිසා ආබ්‍රම්ට හොඳින්
සැලකුවේය. ආබ්‍රම්ට බැටළුවන්ද
ගවයන්ද බූරුවන්ද බූරුදෙනුන්ද ඔටු-
වන්ද සේවක සේවිකාවන්ද ලැබු-
ණේය.[1] 17 ආබ්‍රම්ගේ භාර්යාව වූ
සාරයි[2] නිසා යෙහෝවා දෙවි පාරා-
වෝට හා ඔහුගේ ගෙයි වැසියන්ට
දරුණු පීඩාවලින් පහර දුන්නේය.[3]
18 එවිට පාරාවෝ ආබ්‍රම්ව කැඳවා
මෙසේ ඇසුවේය. “ඔබ මට කුමක්ද මේ
කළේ? ඇය ඔබේ බිරිඳ කියා ඔබ මට
නොකීවේ මන්ද?[4] 19 ‘ඇය මගේ
සහෝදරිය’[5] කියා ඔබ මට කීවේ
ඇයි? මම ඇයව විවාහ කරගන්-
නයි හිටියේ! මෙන්න ඔබේ භාර්යාව.
ඇයව රැගෙන මෙතැනින් යන්න!”
20 පාරාවෝ අණ කළ පරිදි ඔහුගේ
සේවකයෝ ආබ්‍රම් සතු සියල්ල සමඟ
ආබ්‍රම්වද ඔහුගේ භාර්යාවද මඟට ගෙ-
නැවිත් ඇරලුවෝය.[6]

**13** ඉන්පසු ආබ්‍රම් ඔහුට තිබුණු
සියල්ල රැගෙන ඔහුගේ භාර්-
යාව සමඟ ඊජිප්තුවෙන් පිටත්ව
ගොස් නෙගෙබ්[7] දක්වා ගමන්
කළේය. ලොත්ද ඔහු සමඟ ගියේය.
2 ආබ්‍රම්ට සතුන් විශාල ප්‍රමාණ-
යක් සිටි අතර රන් රිදී තොගයක්ද
තිබිණ.[8] 3 පසුව ඔහු නෙගෙබ්
පළාතෙන් පිටත් වී බෙතෙල් දක්වා
ගියේය. ඒ යන අතරමඟ තැනින්
තැන කූඩාරම් ගසාගනිමින් ඔහු ජීවත්
විය. ඔහු කලින් බෙතෙල් සහ ආයි
අතර[9] කූඩාරම් ගසාගත් ස්ථානයටම
පැමිණියේය. 4 ආබ්‍රම්, තමා කලින්
පූජාසනයක් සාදා තිබුණු එම ස්ථා-
නයේදී[10] යෙහෝවා දෙවිට ස්තුති
ප්‍රශංසා කළේය.*[11]
5 ආබ්‍රම් සමඟ ගමන් කරමින්
සිටි ලොත්ටද බැටළුවන් හා ගවයන්
සිටියේය. ඔහුට කූඩාරම්ද තිබිණ.
6 බඩු බාහිරාදිය විශාල ප්‍රමාණ-
යක් ඔවුන්ට තිබූ බැවින් ඔවුන්
සියලුදෙනාටම එකට ජීවත් වීමට
තරම් ප්‍රමාණවත් ඉඩකඩ දේශයේ
නොතිබුණේය.[1] 7 මේ අතරතුරේදී
ආබ්‍රම්ගේ එඬේරුන් සහ ලොත්ගේ
එඬේරුන් අතර ආරවුලක් ඇති විය. ඒ
කාලයේදී කානානිවරු හා පෙරිස්සි-
වරු දේශයේ ජීවත් වූහ.[2] 8 ආබ්‍රම්
ලොත්ට[3] මෙසේ කීවේය. “අපි සහෝ-
දරයන්! ඒ නිසා අපි දෙන්නා අතරෙත්
අපේ එඬේරුන් අතරෙත් මේ විදිහට
දිගින් දිගටම ආරවුල් ඇති වීමට
ඉඩ නොදෙමු.[4] 9 අපි වෙන වෙනම
ජීවත් වෙමු. ඔබට මේ දේශයෙන්
ඕනෑම කොටසක් තෝරගන්න පුළු-
වන්. ඔබ වමට ගියොත් මම දකුණට
යන්නම්. ඔබ දකුණට ගියොත් මම
වමට යන්නම්.”[5] 10 එවිට ලොත්
යොර්දාන් දේශයේ ෂොවර්[6] දක්වා
ඇති ප්‍රදේශය දෙස බැලුවේය.[7] ඒ
දේශයේ කිසිඳු ජල හිඟයක් නැති බව
ඔහු දුටුවේය. එය යෙහෝවා දෙවි-
ගේ උයන[8] මෙන්ද ඊජිප්තුව මෙන්ද
විය. (එලෙස තිබුණේ යෙහෝවා
දෙවි සොදොම් සහ ගොමෝරාව
විනාශ කිරීමට පෙරය.) 11 ලොත්
මුළු යොර්දාන් දේශයම තෝරා-
ගත්තේය. ලොත් තමන්ට තිබුණු
සියල්ල රැගෙන නැඟෙනහිර දෙසට
ගියේය. මෙලෙස ඔවුහු එකිනෙකා-
ගෙන් වෙන්ව ගියෝය. 12 ආබ්‍රම්
කානාන් දේශයේ ජීවත් වුණේය.
නමුත් ලොත් ජීවත් වුණේ යොර්දාන්
දේශයේ නුවරවල් අසලය.[9] පසුව ඔහු
සොදොම් නුවර ළඟින් තම කූඩා-
රම් ගසාගත්තේය. 13 සොදොම්හි
ජීවත් වූ මිනිස්සු යෙහෝවා දෙවිට
විරුද්ධව බොහෝ සේ පව් කළ නපුරු
මනුෂ්‍යයෝ වූහ.[10]

14 ලොත් ආබ්‍රම්ගෙන් වෙන් වූ
පසු යෙහෝවා දෙවි ආබ්‍රම්ට
මෙසේ කීවේය. “ඔබ සිටින ස්ථානයේ

උත් 13:4* උත් 12:8හි පාදසටහන බලන්න.

**12 පරි.**
1 උත් 20:14; උත් 24:35
2 උත් 11:29; උත් 17:15; උත් 23:19
3 1සාමු 5:11
4 රෝම 7:3
5 උත් 20:2; උත් 20:12
6 ගීතා 105:14

**13 පරි.**
7 උත් 12:9; උත් 20:1
8 උත් 24:35; ද්වි 8:18
9 උත් 12:8; යොෂු 7:2
10 උත් 12:7
11 උත් 21:33; යෙසා 12:4; රෝම 10:13

**2 තීරුව**
1 උත් 36:7
2 උත් 10:19; උත් 15:18
3 උත් 11:27
4 ගීතා 133:1; හිතෝ 15:18; රෝම 12:10
5 හිතෝ 17:14; රෝම 12:18; හෙබ්‍රෙ 12:14
6 උත් 19:22
7 උත් 19:28
8 උත් 2:9; යෙසා 51:3; එස 36:35
9 උත් 19:29
10 උත් 18:20; උත් 19:5; රෝම 1:27; 2පේතෘ 2:6; යූද් 7

සිට උතුර දෙසත් දකුණ දෙසත්
නැඟෙනහිර දෙසත් බස්නාහිර දෙ-
සත්[1] බලන මෙන් ඔබෙන් ඉල්ලමි.
**15** මන්ද ඔබට පෙනෙන ඒ මුළු දේශ-
යම මම ඔබටත් ඔබෙන් පැවතෙන්-
නන්ටත් සදහටම උරුමයක් ලෙස
දෙන්නෙමි.[2] **16** මම ඔබෙන් පැව-
තෙන්නන්ව පොළොවේ දූවිලි මෙන්
වැඩි කරන්නෙමි. යමෙකුට පොළො-
වේ දූවිලි අංශු ගණන් කිරීමට හැකි වේ
නම් ඔබෙන් පැවතෙන අයවද ගණන්
කිරීමට හැකි වෙයි.[3] **17** නැඟි-
ටින්න. දේශයේ සතර දිශාවටම
යන්න. මන්ද මම එය ඔබට දෙන්-
නෙමි."[4] **18** ආබ්‍රම් දිගටම කූඩාරම්-
වල ජීවත් විය. පසුව ඔහු හෙබ්‍රොන්[5]
නගරයට ගොස් මම්රේහි විශාල ගස්[6]
අසල නතර වුණේය. එහිදී ඔහු යෙ-
හෝවා දෙවිට පූජාසනයක් ගොඩ-
නැඟුවේය.[7]

**14** ඒ කාලයේදී, ෂිනාර්හි[8] අම්-
රාෆෙල් රජද එල්ලාසාර්හි
අරියොක් රජද ඒලාම්හි[9] කෙදොර්ලා-
යොමෙර්[10] රජද ගොයිම්හි[11] තීදාල්
රජද එකතු වී, **2** සොදොම්හි[12] රජු
වූ බෙරාටද ගොමෝරාවේ[13] රජු වූ
බිර්ෂාටද අද්මාහි[14] රජු වූ ෂිනාබ්-
ටද ෂෙබොයිම්හි[15] රජු වූ ෂෙමෙ-
බෙර්ටද බෙලාහි රජුටද විරුද්ධව
සටන් කළෝය. (බෙලා නුවර ෂෝවර්
ලෙසත් හඳුන්වන ලදි.)[16] **3** ඔවුහු
සියලුදෙනාම* මිත්‍ර සන්ධානයක්[17]
ඇති කරගෙන යුද්ධ කරන පිණිස
සිද්දිම් තැනිතලාව[18] (එනම්, ලුණු
මුහුද)[19] වෙතට ගියෝය.

**4** කෙදොර්ලායොමෙර් රජු අවුරුදු
දොළහක් පුරා යටත් කරගෙන සිටි ඒ
රජවරු, දහතුන්වන අවුරුද්දේදී ඔහුට
විරුද්ධව කැරලිගසන්න පටන්ගත්හ.
**5** දහහතරවන අවුරුද්දේදී කෙදොර්-
ලායොමෙර් රජ සහ ඔහු සමඟ
එකතු වූ අනිකුත් රජවරු යුද්-
ධයට පිටත්ව ගියෝය. ඒ අතර-
තුරේදී ඔවුහු අෂ්ටෙරොත්-කර්නායිම්[1]
නම් ස්ථානයේ රෙෆායිවරුන්වද
හාම් නුවරේ ෂූෂිවරුන්වද ෂාවේ-
කිරියාතයිම් නම් ස්ථානයේ ඒමිව-
රුන්වද[2] පරාජයට පත් කළෝය.
**6** ඔවුහු හෝරිවරුන්ට[3] අයිති වූ සේ-
යිර්[4] නම් කඳුකර ප්‍රදේශයද යටත්
කරගනිමින් පාළුකරය කෙළවරේ
පිහිටි එල්-පාරාන්[5] දක්වාම ගියෝය.
**7** ඉන්පසු ඔවුහු ආපස්සට හැරී ඒන්-
මිෂ්පාත් ලෙසත් හැඳින්වෙන කාදෙෂ්[6]
නම් ස්ථානයට ගොස් අමලෙක්ව-
රුන්ට[7] අයිති මුළු ප්‍රදේශයම යටත්
කරගත්තෝය. ඔවුහු හෂෂොන්-
තාමාර්[8] නුවරේ පදිංචිව සිටි අමෝරි-
වරුන්වද[9] පරාජය කළෝය.

**8** ඒ අවස්ථාවේදී සොදොම්,
ගොමෝරාව, අද්මා, ෂෙබොයිම් හා
බෙලා (එනම්, ෂෝවර්) නම් නුව-
රවල රජවරුද සිද්දිම් තැනිතලා-
වට[10] ගොස් ඔවුන්ට විරුද්ධව සටන්
කිරීමට සූදානම් වූහ. **9** ඒලාම්හි රජු
වූ කෙදොර්ලායොමෙර්ටද ගොයිම්හි
රජු වූ තීදාල්ටද ෂිනාර්හි රජු වූ
අම්රාෆෙල්ටද එල්ලාසාර්හි රජු වූ
අරියොක්ටද[11] විරුද්ධව ඔවුහු පෙළ
ගැසී සිටියෝය. මෙසේ, රජවරු පස්-
දෙනෙක් රජවරුන් සතරදෙනෙකුට
විරුද්ධව ඒ තැනිතලාවේදී සටන්
කළෝය. **10** සිද්දිම් තැනිතලාව[12]
පුරාම තාර[13] වළවල් තිබිණි. සටනේදී
සොදොම් සහ ගොමෝරාවේ[14] රජව-
රුන්ද ඔවුන් සමඟ සිටි මිනිසුන්ද පලා
ගිය අතර ඔවුන්ගෙන් සමහරෙක්
තාර වළවලට වැටුණෝය. ඉතුරු
සෙනඟ කඳුකරයට පලා ගියෝය.[15]
**11** සටනෙන් ජය ගත් පිරිස සොදොම්
සහ ගොමෝරාවේ තිබූ සියලු බඩු
බාහිරාදිය හා ආහාර ද්‍රව්‍ය කොල්ල
කෑවෝය.[16] **12** ඒ දවස්වලදී ආබ්‍රම්-
ගේ ඥාති පුත්‍රයා වූ ලොත් ජීවත් වෙ-
මින් සිටියේ සොදොම් නුවරේය.[17]
එබැවින් ඒ පිරිස ලොත්වත් ඔහුට
අයිති සියල්ලත් පැහැරගෙන ගියෝය.

**13** පසුව ඔවුන්ගෙන් බේරී ආ
මිනිසෙක් හෙබ්‍රෙව්[18] ජාතිකයෙකු

---

උත් **14:3*** මෙහි සඳහන් වන්නේ 1වන ඡේදයේ නම් කර ඇති රජවරුන් ගැනය.

**13 පරි.**
**1** ද්වි 34:1
**2** උත් 12:7
උත් 15:18
උත් 24:7
නික් 33:1
**3** උත් 12:2
උත් 15:5
නික් 1:7
ද්වි 26:5
හෙබ්‍රෙ 11:12
**4** ද්වි 34:4
යොෂු 12:7
**5** උත් 23:2
**6** උත් 18:1
උත් 23:19
උත් 25:9
**7** උත් 12:7

**14 පරි.**
**8** උත් 10:10
**9** උත් 10:22
**10** උත් 14:17
**11** උත් 14:9
**12** උත් 10:19
උත් 13:12
2පේතෘ 2:6
**13** උත් 13:10
උත් 18:20
යූද් 7
**14** හොෂෙ 11:8
**15** ද්වි 29:23
**16** ද්වි 34:3
**17** විනි 20:11
**18** උත් 14:10
**19** ද්වි 3:17

**2 තීරුව**
**1** ද්වි 1:4
**2** ද්වි 2:10
**3** ද්වි 2:12
**4** උත් 36:8
**5** උත් 21:21
**6** ගණන් 20:1
**7** උත් 36:12
1සාමු 15:2
**8** 2ලේක 20:2
**9** උත් 10:16
**10** උත් 14:3
**11** උත් 14:1
**12** උත් 14:3
**13** උත් 11:3
නික් 2:3
**14** ද්වි 29:23
**15** උත් 19:30
**16** උත් 14:16
**17** උත් 19:1
2පේතෘ 2:7
**18** උත් 40:15
නික් 3:18

වූ ආබ්‍රම් වෙතට පැමිණ ඒ ගැන
දැනුම් දුන්නේය. ඒ කාලයේදී ආබ්‍රම්
කූඩාරම් ගසාගෙන සිටියේ අමෝරිව-
රයෙකු වූ මම්රේගේ විශාල ගස්
අසලය.[1] මම්රේට එෂ්කොල් හා
අනෙර්[2] නම් වූ සහෝදරයෝ දෙදෙ-
නෙක් සිටියෝය. ඒ සහෝදරයන්
තුන්දෙනාම ආබ්‍රම් සමඟ ගිවිසුමක්
ඇති කරගෙන සිටියෝය. **14** තම
ඥාති පුත්‍රයාව පැහැරගෙන ගිය බව[3]
ආබ්‍රම්ට දැනගන්න ලැබුණු විට,
ඔහුගේම නිවසේ උපන්,[4] සටනට
දක්ෂ වූ දාසයන් තුන්සිය දහඅට-
දෙනෙකුව තෝරාගෙන[5] ඔහු දාන්
දක්වා[6] එම කොල්ලකරුවන්ව ලුහු-
බැඳ ගියේය. **15** රාත්‍රියේදී ඔහු තම
දාස සේනාව කණ්ඩායම් කිහිපයකට
බෙදා[7] ඔවුන් සමඟ දමස්කයට උතු-
රෙන් පිහිටි හෝබා දක්වාම කොල්-
ලකරුවන්ව ලුහුබැඳ ගොස් පරාජය
කළේය. **16** ලොත්ගේ බඩු බාහිරා-
දිය ඇතුළුව කොල්ල කනු ලැබූ හැම
දෙයක්ම ආබ්‍රම් ආපසු ගත්තේය.[8]
ඔහුගේ ඥාති පුත්‍රයා වූ ලොත්වද
ස්ත්‍රීන් ඇතුළු මුළු සෙනඟවද ඔහු
බේරාගත්තේය.[9]

**17** ආබ්‍රම් කෙදොර්ලායොමෙර්
රජුවද ඔහු සමඟ සිටි අනික් රජව-
රුන්වද පරාජය කර නැවත ඔහු-
ගේ කූඩාරම් වෙතට ගමන්
කරමින් සිටියේය. ඒ අවස්ථාවේදී
ඔහුව හමු වීමට පැමිණි සොදොම්හි
රජුව ඔහුට ෂාවේ තැනිතලාවේදී
මුණගැසුණේය. (ෂාවේ තැනිතලාව
රජුගේ තැනිතලාව ලෙසත් හැඳින්-
වේ.)[10] **18** ඒ අවස්ථාවේදී මහෝත්-
තම දෙවිගේ පූජකයා[11] ලෙස කටයුතු
කරමින් සිටි සාලම් නුවරේ රජු
වූ[12] මෙල්කිසදෙක්[13] එතැනට රොටි
සහ වයින් ගෙනාවේය.[14] **19** ඔහු
ආබ්‍රම්ට ආශීර්වාද කර මෙසේ කීවේය.

“අහසත් පොළොවත් සෑදූ[15]
මහෝත්තම දෙවිගෙන් ඔබට
ආශීර්වාද ලැබේවා![16]
**20** ඔබේ සතුරන්ව ඔබේ අතට හසු
කර දුන්[17]
මහෝත්තම දෙවිට ප්‍රශංසා
වේවා!”[1]

එවිට ආබ්‍රම් තමා ළඟ තිබූ සියල්-
ලෙන් දසයෙන් කොටසක් ඔහුට දුන්-
නේය.[2]

**21** ඉන්පසු සොදොම්හි රජ, “මට
මිනිසුන්ව විතරක් දෙන්න. බඩු බාහි-
රාදිය ඔබ තියාගන්න” යයි ආබ්‍රම්ට
කීවේය. **22** ඒ මොහොතේදී, ආබ්‍රම්
සොදොම්හි රජුට මෙසේ කීවේය.
“මගේ අත ඔසවා අහසත් පොළො-
වත් සෑදූ මහෝත්තම දෙවි වන
යෙහෝවාගේ නමින් මෙසේ දිවු-
රනවා.[3] **23** ‘ආබ්‍රම්ව පොහොසත්
කළේ මමයි’ කියා ඔබ නොකියන
පිණිස ඔබට අයිති කිසිම දෙයක්
මම ගන්නේ නැහැ. නූල් පොටක්වත්
පාවහන් පටියක්වත් මම ඔබෙන්
ගන්නේ නැහැ.[4] **24** මගේ උපකාර-
යට පැමිණි අනෙර්ට, එෂ්කොල් හා
මම්රේට[5] විතරක් ඔවුන්ගේ පංගුව
දෙන්න.[6] ඔබ මගේ සේවකයන්ට
කන්න දුන්න දේ හැර වෙන කිසිම
දෙයක් මම ඔබෙන් ගන්නේ නැහැ.”[7]

**15** එම දේවල් සිදු වූ පසු, යෙ-
හෝවා දෙවි ආබ්‍රම්ට දර්ශ-
නයකින්[8] මෙසේ කීවේය. “ආබ්‍රම්,
බය නොවන්න.[9] මම ඔබට පලිහක්
මෙන් වන්නෙමි.[10] ඔබට බොහෝ
ආශීර්වාද ලැබෙන්නේය.”[11] **2** එවිට
ආබ්‍රම් මෙසේ කීවේය. “විශ්වයේ පාල-
කයාණන් වන යෙහෝවා දෙවියනි,
මට තවමත් දරුවෙක් නැහැ. ඔබ
දෙන ආශීර්වාද උරුම වෙන්නේ
කාටද? මගෙන් පසු උරුමක්කරු
වෙන්නේ දමස්කයේ එලියේසර්.”[12]
**3** ආබ්‍රම් මෙසේද කීවේය. “ඔබ තව-
මත් මට දරුවෙක්[13] දුන්නේ නැහැ.
ඒ නිසා මගේ උරුමක්කාරයා වන්-
නේ මගේ නිවසේ සේවකයෙක්!”[14]
**4** නමුත් යෙහෝවා දෙවි ඔහුට මෙසේ
පිළිතුරු දුන්නේය. “ඔබේ සේවකයා
ඔබේ උරුමක්කාරයා නොවන්නේය.
ඔබෙන්ම පැවත එන කෙනෙක් ඔබේ
උරුමක්කාරයා වන්නේය.”[15]

**14 පරි.**
1 උත් 10:16; උත් 13:18
2 උත් 14:24; ගණන් 32:9
3 උත් 11:27
4 උත් 17:12
5 1රාජා 20:27
6 විනි 18:29
7 උත් 32:7; විනි 7:16
8 1සාමු 30:19
9 නික් 15:13
10 2සාමු 18:18
11 ගීතා 83:18; හෙබ්‍රෙ 5:10
12 හෙබ්‍රෙ 7:1
13 ගීතා 110:4; හෙබ්‍රෙ 6:20; හෙබ්‍රෙ 7:3; හෙබ්‍රෙ 7:10
14 විනි 19:19
15 ගීතා 115:15; එළි 10:6
16 ගලා 3:14
17 ද්වි 28:7

**2 තීරුව**
1 1ලේක 29:10
2 උත් 28:22; හෙබ්‍රෙ 7:4
3 ද්වි 32:40
4 එස්ත 9:15
5 උත් 14:13
6 හිතෝ 3:27; 1තිමෝ 5:18
7 ක්‍රියා 20:33

**15 පරි.**
8 නික් 6:3; ගණන් 12:6
9 ගීතා 27:1; යෙසා 41:10; රෝම 8:31; හෙබ්‍රෙ 13:6
10 ද්වි 33:29; හිතෝ 30:5
11 උත් 17:6; හෙබ්‍රෙ 11:6
12 උත් 24:2
13 උත් 12:7; ක්‍රියා 7:5
14 නික් 2:10
15 උත් 21:12

**5** ඉන්පසු දෙවි ඔහුව කූඩාරමෙන්
පිටතට කැඳවා මෙසේ කීවේය. “අහස
දෙස බලා තාරකා ගණන් කරන මෙන්
මම ඔබෙන් ඉල්ලමි. ඔබට ඒවා
ගණන් කළ හැකි නම් එසේ කරන්න.[1]
ඔබෙන් පැවතෙන අයත් එලෙසම
වන්නෝය.”[2] **6** ආබ්‍රම් යෙහෝවා
දෙවි කෙරෙහි විශ්වාසය තැබුවේය.[3]
ඒ නිසා දෙවි ඔහුව ධර්මිෂ්ඨ කෙනෙකු
ලෙස ගණන් ගත්තේය.[4] **7** දෙවි
ආබ්‍රම්ට මෙසේද කීවේය. “මා යෙ-
හෝවා දෙවිය. ඔබට මේ දේශය
උරුමයක් ලෙස දෙන පිණිස ඔබව
කල්දිවරුන්ට අයත් ඌර් නම් නගර-
යෙන් පිටතට ගෙන ආවේ මමය.”[5]
**8** එවිට ආබ්‍රම් මෙසේ ඇසුවේය.
“විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවියනි, මේ දේශය උරුම
කරගන්න යන බව මම දැනගන්-
නේ කොහොමද?”[6] **9** දෙවි ඔහුට
මෙසේ පිළිතුරු දුන්නේය. “අවුරුදු
තුනක් වයසැති වැස්සියකද අවු-
රුදු තුනක් වයසැති එළුදෙනකද
අවුරුදු තුනක් වයසැති බැටළුවෙ-
කුද කොබෙයියෙකුද පරෙවි පැටවෙ-
කුද මා වෙතට රැගෙන එන්න.”[7]
**10** ආබ්‍රම් මේ සියලු සතුන්ව ගෙනැ-
විත් දෙකට කැපුවේය. ඔහු ඒ එක්
එක් සතාගේ කොටස් එකිනෙකට
ගැළපෙන සේ පේළියට තැබුවේය.
නමුත් කුරුල්ලන්ව ඔහු කොටස්-
වලට කැපුවේ නැත.[8] **11** පක්ෂීහු
එම මළ සතුන් මත වහන්න පටන්-
ගත්තෝය.[9] නමුත් ආබ්‍රම් උන්ව
එළවා දැමුවේය.

**12** ඉර බැස යැමට පෙර, ආබ්‍රම්
බර නින්දකට වැටුණේය.[10] භයා-
නක වූ මහත් අන්ධකාරයක් ඔහුව
වට කරගත් බව ඔහු සිහිනෙන්
දුටුවේය. **13** ඉන්පසු දෙවි ආබ්‍රම්ට
මෙසේ කීවේය. “ඔබෙන් පැවත එන්-
නන් තමන්ට අයිති නැති දේශ-
යක විදේශිකයන් ලෙස ජීවත් වෙයි
කියා මම ස්ථිර වශයෙන්ම ඔබට
කියමි.[11] ඔවුහු එම දේශයේ වැසියන්ට
දාසකම් කරන්නෝය. එම වැසියෝ
අවුරුදු හාරසියයක් පුරා ඔවුන්ට හිරි-
හැර කරන්නෝය.[1] **14** නමුත් ඒ
ජාතිය මම විනිශ්චයට ලක් කරන්-
නෙමි.[2] පසුව දාසකම් කළ ඔබේ
සෙනඟ වස්තු සම්භාරයක් ඇතුව
එම දේශයෙන් පිටත්ව යන්නෝය.[3]
**15** එහෙත් ඔබ යහපත් ජීවිතයක්
භුක්ති විඳ මහලු වියේදී[4] සමාදාන-
යෙන් මිය යනු ඇත. ඔබේ මුතුන්-
මිත්තන් මෙන් ඔබවද තැන්පත්
කරනු ලබයි. **16** එහෙත් හතර-
වන පරම්පරාවේදී ඔබෙන් පැවතෙන
අය නැවත මේ දේශයට පැමිණෙන්-
නෝය.[5] මන්ද අමෝරිවරුන්ගේ පාප-
තර ක්‍රියා පහත්ම අඩියට බසින්නේ ඒ
වන විටය.”[6]

**17** ඉර බැස ගිය පසු ඝන අන්-
ධකාරයක් ඇති විය. එවිට දුම් නඟින
උදුනක්ද ගිනි පන්දමක්ද ඔහුට පෙ-
නුණේය. ගිනි පන්දම සත්ව කොටස්
මැදින් ගියේය.[7] **18** ඒ දවසේදී යෙ-
හෝවා දෙවි ආබ්‍රම් සමඟ ගිවිසුමක්[8]
ඇති කරගනිමින් මෙසේ කීවේය.
“ඊජිප්තු ගඟේ සිට යුප්‍රටීස් නම් මහ
ගඟ[9] දක්වා විහිදෙන මේ දේශය
මම ඔබෙන් පැවතෙන්නන්ට දෙන්-
නෙමි.[10] **19** කේනිවරුන්,[11] කෙ-
නිෂ්ෂිවරුන්, කද්මොනිවරුන්,
**20** හිත්තීවරුන්,[12] පෙරිස්සිවරුන්,[13]
රෙෆායිවරුන්,[14] **21** අමෝරිවරුන්,
කානානිවරුන්, ගිර්ගාෂිවරුන් හා
යෙබූසිවරුන් ජීවත් වන ඒ මුළු දේශ-
යම මම ඔවුන්ට යටත් කර දෙමි.”[15]

**16** ආබ්‍රම්ගේ භාර්යාව වූ සාරයි ඒ
වන විටත් දරුවෙකු බිහි
කර තිබුණේ නැත.[16] සාරයිට හාගර්
නම් ඊජිප්තු ජාතික සේවිකාවක්
සිටියාය.[17] **2** සාරයි ආබ්‍රම්ට මෙසේ
කීවාය. “අනේ, මම කියන දේට
පොඩ්ඩක් සවන් දෙන්න. දරුවන්
ලැබීමේ ආශීර්වාදය යෙහෝවා දෙවි
මට දීලා නැහැ.[18] ඒ නිසා මා වෙනු-
වෙන් මේ දේ කරන්න. ඔබ මගේ
සේවිකාව සමඟ සයනය කර ඇගෙන්-
වත් මට දරුවෙක් ලබා දෙන්න.”[19]

**15 පරි.**
1 යෙරෙ 33:22
2 උත් 22:17; ද්වි 1:10; හෙබ්‍රෙ 11:12
3 රෝම 4:18; හෙබ්‍රෙ 11:8; යාකො 2:23
4 රෝම 4:13; රෝම 4:22; ගලා 3:6
5 උත් 11:31; නෙහෙ 9:7; ගීතා 105:11
6 විනි 6:17; ලූක් 1:18
7 ලෙවී 1:14
8 ලෙවී 1:17
9 ලෙවී 11:13
10 1සාමු 26:12
11 ද්වි 10:19; හෙබ්‍රෙ 11:13

**2 තීරුව**
1 උත් 21:9; නික් 1:14; නික් 3:7; ක්‍රියා 7:6
2 නික් 7:4; ගණන් 33:4
3 නික් 3:22; ගීතා 105:37
4 උත් 25:8
5 යොෂු 14:1; ක්‍රියා 7:7
6 1රාජා 21:26; 2රාජා 21:11; 1තෙස 2:16
7 1ලේක 21:26; යෙරෙ 34:18
8 උත් 17:19; උත් 22:17; ගලා 3:17
9 1රාජා 4:21
10 නික් 3:8
11 1සාමු 15:6
12 යොෂු 1:4
13 නික් 3:17
14 යොෂු 17:15
15 ද්වි 7:1

**16 පරි.**
16 උත් 15:3
17 උත් 12:16; ගලා 4:25
18 උත් 20:17
19 උත් 30:3

ආබ්‍රම් සාරයිගේ ඉල්ලීමට සවන් දුන්-
නේය.[1] **3** ඉන්පසු ආබ්‍රම්ගේ භාර්-
යාව වූ සාරයි තම ඊජිප්තු ජාතික
සේවිකාව වූ හාගර්ව තම ස්වාමිපුරු-
ෂයාට භාර්යාවක් ලෙස දුන්නාය.[2] ඒ
වන විට ආබ්‍රම් කානාන් දේශයේ
අවුරුදු දහයක් ජීවත් වී තිබිණ.
**4** ආබ්‍රම් හාගර් සමඟ සයනය කළ
පසු ඇය ගැබ්ගත්තාය. නමුත් හාගර්
තමන් ගැබ්ගෙන සිටින බව දැනගත්
විට ඇගේ ස්වාමිදූවව පහත් කොට
සලකන්න පටන්ගත්තාය.[3]

**5** එවිට සාරයි ආබ්‍රම්ට මෙසේ
කීවාය. "මගේ සේවිකාව වන හාගර්ව
ඔබට දුන්නේ මමයි. නමුත් ඇය ගැබ්-
ගත්ත නිසා දැන් මට අගෞරව
කරනවා. මට සිදු වී තිබෙන මේ අසා-
ධාරණයට ඔබ වග කිව යුතුයි. කවුද
හරි කවුද වැරදි කියා යෙහෝවා
දෙවිම විනිශ්චය කළාවේ!"[4] **6** එවිට
ආබ්‍රම් සාරයිට මෙසේ කීවේය.[5]
"ඔබේ සේවිකාව ඔබට භාරයි. ඔබට
හොඳයි කියා සිතෙන දෙයක් ඇයට
කරන්න."[6] එවිට සාරයි ඇයව ලැජ්ජා-
වට පත් කළාය. ඒ නිසා හාගර් ඇය
වෙතින් පලා ගියාය.[7]

**7** පසුව යෙහෝවා දෙවිගේ දූත-
යාට[8] කාන්තාරයේ ෂූර්[9] වෙතට යන
මඟෙහි තිබෙන දිය උල්පත අසල
හාගර්ව සම්බ විය. **8** ඔහුද, "සාරයි-
ගේ සේවිකාව වන හාගර්, ඔබ ආවේ
කොහේ සිටද? ඔබ යන්නේ කොතැ-
නටද" කියා ඇගෙන් ඇසුවේය. එවිට
ඇය, "මම මගේ ස්වාමිදූව වන සාරයි-
ගෙන් පලා යනවා" යයි කීවාය.
**9** එවිට යෙහෝවා දෙවිගේ දූතයා,
"ඔබේ ස්වාමිදූව වෙතට හැරී යන්න.
නිහතමානී වී ඇය කියන ලෙස
කටයුතු කරන්න"[10] යයි කීවේය.
**10** යෙහෝවා දෙවිගේ දූතයා ඇයට
මෙසේද කීවේය. "ගණන් කිරීමට
නොහැකි වන ලෙස ඔබෙන් පැව-
තෙන[11] අයව බොහෝ සෙයින් වැඩි
කරන්නෙමි."[12] **11** යෙහෝවා දෙවි-
ගේ දූතයා ඇයට මෙසේද කීවේය.
"ඔබ දැන් ගැබිනියක්. ඔබට පුත්‍ර-
යෙකු බිහි වෙයි. ඉෂ්මායෙල්*[1] යන
නම ඔහුට තබන්න. මන්ද දුකේදී
ඔබ කළ කන්නලව්වලට යෙහෝවා
දෙවි සවන් දුන්නේය.[2] **12** ඉෂ්මා-
යෙල් හීලෑ නැති අශ්වයෙක් මෙන්
වන්නේය. ඔහු සියල්ලන්ටම විරුද්-
ධව නැඟී සිටින්නේය. සියලුදෙ-
නාද ඔහුට විරුද්ධව කටයුතු
කරන්නෝය.[3] ඔහු කූඩාරම් ගසාගන්-
නේ තම සහෝදරයන් අසලය."[4]

**13** එවිට ඇය, "මා දෙස බලා
සිටින තැනැත්තාව මම ඇස්
දෙකෙන්ම දැක්කා" යයි සිතමින් තමා
සමඟ කතා කළ යෙහෝවා දෙ-
විට මෙසේ කීවාය. "ඔබ සියල්ල
දකින දෙවි කෙනෙක්."*[5] **14** ඇය
සිටි ස්ථානය අසල තිබූ ළිඳට බෙයර්-
ලහයි-රොයි*[6] කියා නම් තැබුවේ
ඒ නිසාය. ඒ ළිඳ පිහිටා තිබෙන්-
නේ කාදෙෂ් සහ බෙරෙද් අතරය.
**15** පසුව ආබ්‍රම්ට දාව හාගර් දරුවෙකු
බිහි කළ අතර එම දරුවාට ආබ්‍රම්
ඉෂ්මායෙල්[7] යන නම තැබුවේය.
**16** ඉෂ්මායෙල් ඉපදුණු විට ආබ්‍රම්ගේ
වයස අවුරුදු අසූහයක් විය.

**17** ආබ්‍රම්ට වයස අවුරුදු අනූ-
නවයක් වූ විට යෙ-
හෝවා දෙවි ඔහුට දර්ශනය වී මෙසේ
කීවේය.[8] "මා සියලු බලැති දෙ-
වියා.[9] මගේ කැමැත්තට එකඟව
ජීවත් වෙමින් ඔබ නිදොස් කෙනෙකු
බව ඔප්පු කර පෙන්වන්න.[10] **2** ඔබ
එසේ කළොත් ඔබෙන් පැවතෙන්-
නන්ව බොහෝ සෙයින් වැඩි කරන
බවට[11] ඔබ සමඟ ඇති කරගත් ගිවි-
සුම මම ස්ථිර කරන්නෙමි."[12]

**3** එවිට ආබ්‍රම් දණින් වැටී හිස
නැමුවේය.[13] දෙවි ඔහුට තවදුර-
ටත් කතා කරමින් මෙසේ කීවේය.
**4** "ඔබ සමඟ ඇති කරගත් මගේ
ගිවිසුම ස්ථිර කරන්නෙමි.[14] ඔබ

**16 පරි.**
1 උත් 21:12, එෆී 5:21
2 උත් 30:9
3 1සාමු 1:6
4 නික් 5:21, 1සාමු 24:12, ගීතා 43:1
5 හිතෝ 15:1, හිතෝ 15:18
6 හිතෝ 29:19
7 හිතෝ 15:12, දේශ 10:4, 1පේතෘ 2:20
8 උත් 22:11
9 උත් 25:18, නික් 15:22
10 දේශ 10:4, එෆී 6:5, තීත 2:9
11 උත් 17:20
12 උත් 25:13, 1ලේක 1:29, එෆී 6:8

**2 තීරුව**
1 උත් 17:18
2 ගීතා 22:24
3 උත් 37:28
4 උත් 21:20
5 2ලේක 16:9, හිතෝ 5:21, හිතෝ 15:3, හෙබ්‍රෙ 4:13
6 උත් 24:62
7 උත් 21:9, ගලා 4:24

**17 පරි.**
8 උත් 12:7
9 එළි 16:7
10 ගීතා 15:2, ගීතා 18:23
11 උත් 22:17, ඇවි 1:10, හෙබ්‍රෙ 11:12
12 ගීතා 105:8, ගලා 3:17
13 විනි 13:20, මතෙ 17:6
14 ගීතා 105:9

උත් **16:11*** තේරුම, "දෙවි සවන් දෙයි."
**13*** හෝ, "මා දෙස බලන දෙවි කෙනෙක්, අන් අය ඉදිරියේ පෙනී සිටින දෙවි කෙනෙක්."
**14*** තේරුම, "මා දෙස බලන ජීවමාන තැනැත්තාට අයිති ළිඳ."

බොහෝ ජාතීන්ගේ පියා වන්නෙහිය.[1]
**5** ඒ නිසා මෙතැන් පටන් ඔබේ නම
ආබ්‍රම්* නොව ආබ්‍රහම්ය.# මන්ද මම
ඔබව බොහෝ ජාතීන්ගේ පියා වීමට
සලස්වන්නෙමි. **6** මම ඔබට ආශීර්-
වාද කර ඔබ මාර්ගයෙන් බොහෝ
දරුවන් බිහි වන්න සලස්වන්නෙමි.
ඔබෙන් ජාතීහුද රජවරුද බිහි වනු
ඇත.[2]

**7** "මම ඔබ සමඟත්[3] පරම්පරා-
වෙන් පරම්පරාවට පැවතෙන ඔබේ
දරුවන් සමඟත්[4] මගේ ගිවිසුම පවත්-
වන්නෙමි. ඔබටත් ඔබෙන් පැවතෙන
තැනැත්තාටත්* මම දෙවි බව පෙන්-
වන පිණිස එම ගිවිසුම දිගු කාලයක්
පුරා පවත්වන්නෙමි.[5] **8** ඔබ විදේශි-
කයෙක් ලෙස ජීවත් වන මුළු කානාන්
දේශයම ඔබටත් ඔබෙන් පැවතෙන
ඔබේ දරුවන්ටත් උරුමයක් ලෙස
දෙන්නෙමි.[6] ඔවුහු බොහෝ කාලය-
කට එහි ජීවත් වන්නෝය. මම සැබෑ
දෙවි බව ඔවුන්ට ඔප්පු කර පෙන්වන්-
නෙමි."[7]

**9** දෙවි ආබ්‍රහම්ට මෙසේද කීවේය.
"ඔබත් පරම්පරාවෙන් පරම්පරාවට
පැවතෙන ඔබේ දරුවනුත් මගේ
ගිවිසුම පැවැත්විය යුතුයි.[8] **10** මා
ඔබ සියලුදෙනා සමඟත් ඔබෙන්
පැවතෙන ඔබේ දරුවන් සමඟත්
පිහිටුවන එම ගිවිසුම මෙයයි. චර්-
මච්ඡේදනය* කිරීමේ චාරිත්‍රය මම
ඔබට හඳුන්වා දෙමි.[9] ඔබ අතරේ
සිටින සියලු පුරුෂයන් ඒ චාරිත්‍රය
පැවැත්විය යුතුයි.[10] **11** ඔවුන් සිය-
ලුදෙනාම චර්මච්ඡේදනය කරගත
යුතුයි. එය ඔබ සමඟ මා පිහි-
ටුවා ඇති ගිවිසුමට ලකුණක් වන්-
නේය.[11] **12** දවස් අටක් වයසැති
ඔබේ සියලු පිරිමි දරුවන්ව චර්මච්-
ඡේදනය කළ යුතුයි.[12] ඔබේ සියලු
පරම්පරාවලදී ඔබේ නිවසේ උපන්
කෙනෙකු* වුවද විදේශිකයෙකුගෙන්
මිල දී ගත් ඔබේ පෙළපතට අයිති
නොවන කෙනෙකු වුවද චර්මච්ඡේද-
නය කළ යුතුයි. **13** ඔබේ නිවසේ
උපන් සියලු පුරුෂයන්ද ඔබේ මුදලින්
මිල දී ගත් සියලු පුරුෂයන්ද අනි-
වාර්යයෙන්ම චර්මච්ඡේදනය කර-
ගත යුතුයි.[1] ඔබේ ශරීරයේ පවතින
එම ලකුණෙන් නියෝජනය කරන්-
නේ මාගේ ගිවිසුමයි. එය බොහෝ
කාලයක් පුරා ඔබ පැවැත්විය යුතු
ගිවිසුමකි.[2] **14** චර්මච්ඡේදනය කර
නොගන්නා කවරෙකු වුවද තම සෙ-
නඟ ඉදිරියේ මරා දැමිය යුතුයි.[3]
මන්ද එසේ නොකිරීම මගේ ගිවිසුම
කඩ කිරීමකි."

**15** දෙවි ආබ්‍රහම්ට මෙසේද
කීවේය. "ඔබේ භාර්යාවගේ නම මෙ-
තැන් පටන් සාරයි* නොව සාරාය.#[4]
**16** මම ඇයට ආශීර්වාද කර ඇගෙන්
ඔබට පුතෙක් දෙන්නෙමි.[5] මම ඇයට
ආශීර්වාද කරන්නෙමි. ඇය විවිධ
ජාතීන්ගේද[6] රජවරුන්ගේද මව් වීමට
සලස්වන්නෙමි."[7] **17** එවිට ආබ්‍රහම්
දණින් වැටී සිනාසෙමින් මෙසේ සිතා-
ගත්තේය.[8] "මට දැන් අවුරුදු සියයක්
වෙනවා. මගේ වයසේ කෙනෙකුට
පියෙක් වෙන්න පුළුවන්ද? අවුරුදු
අනූවක් වන සාරා කොහොමද දරු-
වෙක් බිහි කරන්නේ?"[9]

**18** ඉන්පසු ආබ්‍රහම් සැබෑ දෙවිට
මෙසේ කීවේය. "ඔබේ ආශීර්වාදය
ඉෂ්මායෙල්ට දෙන්න!"[10] **19** එවිට
දෙවි මෙසේ කීවේය. "ඔබේ භාර්-
යාව වන සාරා අනිවාර්යයෙන්ම
ඔබට පුත්‍රයෙක් බිහි කරයි. ඔබ
ඔහුට ඊසාක්*[11] යන නම තැබිය
යුතුයි. මම ඔහු සමඟත් මගේ ගිවිසුම
පිහිටුවන්නෙමි. ඔහුගෙන් පැවතෙන
තැනැත්තා# සමඟත් එම ගිවිසුම
පිහිටුවා බොහෝ කාලයකට එය
පවත්වන්නෙමි.[12] **20** ඉෂ්මායෙල්

**17 පරි.**
1 උත් 13:16, රෝම 4:17
2 2රාජා 1:18
3 මීකා 7:20, ලූක් 1:72
4 නික් 19:5, මාක් 12:26
5 විනි 2:1, ගීතා 105:10
6 නික් 6:4, හෙබ්‍රෙ 11:9
7 ද්වි 14:2, ගීතා 105:11
8 නික් 19:5, ද්වි 11:13
9 උත් 21:4, ලූක් 2:21
10 උත් 34:15, යොෂු 5:2, රෝම 2:29
11 ක්‍රියා 7:8, රෝම 4:11
12 උත් 21:4, ලූක් 2:21, පිලි 3:5

**2 තීරුව**
1 නික් 12:44, ක්‍රියා 16:3
2 විනි 2:1, ගීතා 111:5
3 නික් 4:24, ගණන් 15:31, යොහ 7:23
4 උත් 11:29
5 උත් 18:10, රෝම 9:9
6 උත් 35:11
7 2ලේක 28:26
8 උත් 18:12, උත් 21:6, ලූක් 2:19
9 රෝම 4:19, හෙබ්‍රෙ 11:11
10 උත් 16:11
11 මතෙ 1:2, රෝම 9:7, ගලා 4:28
12 උත් 26:24, ගීතා 105:9, ලූක් 1:33, ගලා 4:28

---

**උත් 17:5*** තේරුම, "උසස් කරනු ලැබූවන්ගේ පියා." **5#** තේරුම, "සමූහයකගේ පියා." **7*** උත් 3:15හි පාදසටහන බලන්න. **10*** එනම්, පුරුෂ ලිංගයේ අග සම කපා ඉවත් කිරීම.

**උත් 17:12*** හෝ, "දාසයෙකුට උපන් පුත්‍රයෙක්." **15*** තේරුම, "විවාදශීලී." **15#** තේරුම, "කුමාරිකාව." **19*** තේරුම, "සිනහව." **19#** උත් 3:15හි පාදසටහන බලන්න.

සම්බන්ධයෙන් ඔබ කළ ඉල්ලීම-
ටද මම සවන් දුන්නෙමි. මම
ඔහුටත් ආශීර්වාද කර ඔහුගෙන්
විශාල පරම්පරාවක් ඇති කරන්-
නෙමි.[1] ඔහුගෙන් අධිපතීහු දොළොස්-
දෙනෙක් බිහි වන්නෝය. ඔහුගෙන්
මහත් ජාතියක් ඇති කරන්නෙමි.[2]
**21** එහෙත් මගේ ගිවිසුම මා පිහිටු-
වන්නේ ඊසාක් සමඟය.[3] ලබන අවු-
රුද්දේ මේ කාලය වන විටදී සාරා
ඔහුව බිහි කරන්නීය."[4]

**22** දෙවි ආබ්‍රහම් සමඟ කතා
කළ පසු එතැනින් ඉවත්ව ගියේය.[5]
**23** ඉන්පසු ආබ්‍රහම්, ඔහුගේ පුත්
ඉෂ්මායෙල්වද ඔහුගේ නිවසේ උපන්
සියලු පුරුෂයන්වද ඔහු මිල දී ගත්
සියලු පුරුෂයන්වද චර්මච්ඡේදනය
කළේය. දෙවි ඔහුට කී ලෙස ඒ දවසේ-
දීම ඔහු එසේ කළේය.[6] **24** ආබ්‍රහම්
චර්මච්ඡේදනය කරගත් විට ඔහු-
ගේ වයස අවුරුදු අනූනවයක් විය.[7]
**25** ඔහුගේ පුත් ඉෂ්මායෙල්වද චර්-
මච්ඡේදනය කළේය. එවිට ඉෂ්මා-
යෙල්ට වයස අවුරුදු දහතුනක් විය.[8]
**26** ඒ දවසේදීම ආබ්‍රහම් සහ ඔහුගේ
පුත් ඉෂ්මායෙල් චර්මච්ඡේදනය කර-
ගත්තෝය.[9] **27** නිවසේ උපන් සිය-
ලුදෙනා හා විදේශිකයන්ගෙන් මිල දී
ගත් සියලුදෙනා ඇතුළුව ඔහුගේ නිව-
සේ සිටි සියලු පුරුෂයන්වද ඔහු සමඟ
චර්මච්ඡේදනය කරනු ලැබීය.[10]

**18** එක් දිනක් අව් රශ්මිය
තදින්ම ඇනුණු වේලාවකදී,[11]
මම්රේහි[12] විශාල ගස් අසල කූඩාරම්
ගසාගෙන සිටි ආබ්‍රහම් ඉදිරියේ යෙ-
හෝවා දෙවි දර්ශනය විය.[13] ඒ අවස්-
ථාවේදී ආබ්‍රහම් තම කූඩාරමට ඇතුල්
වන ස්ථානය ළඟ හිඳගෙන සිටියේය.
**2** ඔහු තමා සිටි ස්ථානයට නුදු-
රින් පුරුෂයන් තුන්දෙනෙකු සිටගෙන
සිටිනවා දුටුවේය.[14] ආබ්‍රහම් ඔවුන්ව
දුටු විගස ඔවුන් ළඟට දුව ගොස්
හිස නමා ඔවුන්ට ආචාර කළේය.[15]
**3** ඉන්පසු ඔහු මෙසේ කීවේය. "යෙ-
හෝවා දෙවියනි, ඔබේ සේවකයා වන
මා ගැන ඔබ සතුටු වෙනවා නම්
ටික වේලාවකට මෙතැන නතර වී
සිටින්න.*[1] **4** ඔබේ පාද සෝදන්න
මම වතුර ටිකක් ගෙනත් දෙන්නම්.[2]
ඉන්පසු ගස යටට වී ටිකක් විවේක
ගන්න.[3] **5** මම ඔබට කන්න රොටි
ගෙනත් දෙන්නම්. කාලා ඔබේ විඩාව
නිවාගන්න.[4] ඊටපස්සේ ඔබේ ගමන
ඔබට යන්න පුළුවන්. ඔබේ සේවකයා
වන මා ඉන්න තැනට ඔබ ආවේ ඒක-
ටයි." එවිට ඔවුහු, "ඔබ කී ලෙසම
කරන්න" යයි කීවෝය.

**6** ආබ්‍රහම් කූඩාරම වෙතට දුව
ගොස් සාරාට මෙසේ කීවේය. "ඉක්-
මන් කර සිහින් පිටි සෙයා මිනුම්*
තුනක් අරගෙන, එය අනා රොටි
ටිකක් සාදන්න."[5] **7** ඉන්පසු ආබ්‍ර-
හම් රැළ වෙතට දුව ගොස් හොඳ
නහඹර වස්සෙකු ගෙන ඔහුගේ සේ-
වකයාට දුන්නේය. එය සූදානම්
කරන පිණිස ඔහු ඉක්මනින් ගියේය.[6]
**8** ඉන්පසු ඔහු වෙඬරුද* කිරිද තමා
පිළියෙල කරගත් මස්ද ගෙන ඔවුන්
ඉදිරියේ තැබුවේය.[7] ඔවුන් ගස යටට
වී කන අතරතුරේදී ආබ්‍රහම් ඔවුන්
ළඟින්ම සිටගෙන සිටියේය.[8]

**9** එවිට ඔවුහු, "ඔබේ භාර්යාව
වන සාරා කොහේද"[9] කියා ඔහු-
ගෙන් ඇසූහ. ආබ්‍රහම්, "ඇය කූඩාරමේ
ඉන්නවා"[10] කියා ඔවුන්ට කීවේය.
**10** ඔවුන්ගෙන් එක් කෙනෙක් ඔහුට
මෙසේ කීවේය. "ලබන අවුරුද්දේ මේ
කාලය වන විට මම නොවරදවාම ඔබ
වෙතට පැමිණෙන්නෙමි. ඒ වන විට
ඔබේ භාර්යාව වන සාරාට පුත්‍රයෙක්
සිටීවි."[11] එම මිනිසාට පිටුපසින් තිබූ
කූඩාරමේ සිටි සාරා, ඔහුගේ කතාවට
සවන් දෙමින් සිටියාය. **11** ඒ වන
විට ආබ්‍රහම් සහ සාරා සිටියේ වයස්ග-
තවය.[12] සාරාගේ ඔසප් වීමද නතර වී
තිබිණ.[13] **12** එබැවින් සාරා සිතින්
සිනාසී,[14] "දැන් හොඳටම වයසට

**17 පරි.**
1 උත් 16:10
උත් 21:13
උත් 25:13
2 උත් 21:18
1ලේක 1:29
3 උත් 26:3
නික් 2:24
හෙබ්‍රෙ 11:9
4 උත් 18:14
උත් 21:1
5 ද්වි 5:4
6 උත් 17:13
යොෂු 5:2
රෝම 2:29
7 ක්‍රියා 7:8
රෝම 4:11
8 උත් 16:16
9 ගීතා 119:60
10 නික් 12:44

**18 පරි.**
11 උත් 31:40
මතෙ 20:12
12 උත් 13:18
උත් 14:13
13 උත් 16:7
විනි 13:21
ක්‍රියා 7:2
14 උත් 19:1
උත් 22:4
15 උත් 23:7
රූත් 2:10

**2 තීරුව**
1 ක්‍රියා 16:15
2 උත් 24:32
1සාමු 25:41
යොහ 13:5
3 යොහ 6:10
4 ගීතා 104:15
5 උත් 19:3
නික් 12:39
6 ලූක් 15:23
7 ද්වි 32:14
2සාමු 17:29
8 ලූක් 12:37
රෝම 12:13
හෙබ්‍රෙ 13:2
9 උත් 17:15
10 උත් 24:67
උත් 31:33
11 උත් 21:2
මතෙ 3:9
රෝම 9:9
12 උත් 17:17
13 ලෙවී 15:19
රෝම 4:19
14 උත් 17:17

උත් **18:3*** මෙහිදී, ආබ්‍රහම් දෙවිගේ දූතයාට කතා කරන්නේ යෙහෝවා දෙවි සමඟ කතා කරනවා හා සමානවයි. **6*** සෙයා මිනුමක් ලීටර් 7.33කට සමානය. **8*** එනම්, බටර්වලට සමාන කෑමකි.

ගිහින් ඉන්න මටයි මගේ ස්වාමියාටයි
ඒ වගේ සතුටක් අද්දකින්න පුළුවන්ද”
කියා කීවාය.[1] **13** එවිට යෙහෝවා
දෙවි ආබ්‍රහම්ට මෙසේ කීවේය. “ ‘වය-
සට ගිහින් ඉන්න මම[2] කොහොමද
දරුවෙක් බිහි කරන්නේ’ යයි පවසමින්
සාරා හිනා වුණේ ඇයි? **14** යෙ-
හෝවා වන මට කළ නොහැකි දෙයක්
තිබේද?[3] ලබන අවුරුද්දේ හරියටම
මේ කාලයේදී මම නැවත ඔබ වෙතට
පැමිණෙන්නෙමි. ඒ වන විට සාරාට
පුත්‍රයෙක් සිටීවි.” **15** සාරා භය වී,
“මම හිනා වුණේ නැහැ” යයි කීවාය.
එවිට, “ඔබ හිනා වුණා” යයි දෙවි
කීවේය.[4]

**16** පසුව ඒ පුරුෂයෝ තුන්දෙනා
එතැනින් නැඟිට සොදොම්[5] නුවර
දෙස බැලුවෝය. ඔවුන්ව ඇරලවන
පිණිස ආබ්‍රහම් ඔවුන් සමඟ ටික දුරක්
ගියේය.[6] **17** එවිට යෙහෝවා දෙවි
මෙසේ කීවේය. “මා කිරීමට අදහස්
කරන දේ ආබ්‍රහම්ට නොකියා සිටින-
වාද?[7] **18** සැබවින්ම ආබ්‍රහම්ගෙන්
බලවත් ජාතියක් බිහි වන්නේය. ඔහු
මාර්ගයෙන් පොළොවේ සියලු ජාතීහු
ආශීර්වාද ලබාගන්නෝය.[8] **19** මම
ආබ්‍රහම්ව හොඳින් දැන හඳුනා ගෙන
සිටිමි. යෙහෝවා වන මා පෙන්වන
මාර්ගයේ ගමන් කිරීමටත් ධර්මිෂ්ඨ-
කම සහ යුක්තිය[9] ඉටු කිරීමටත් ඔහු-
ගේ පුත්‍රයන්ට හා ඔහුගෙන් පැවතෙන
සියලුදෙනාට උගන්වන පිණිස මම
ඔහුව තෝරාගත්තෙමි. යෙහෝවා
දෙවි වන මම ආබ්‍රහම්ට පොරොන්දු වූ
දේ අනිවාර්යයෙන්ම ඉටු කරන පිණිස
එසේ කළෙමි.”[10]

**20** යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ කීවේය. “සොදොම් සහ
ගොමෝරාවට විරුද්ධව නැඟෙන
චෝදනා අතිමහත්ය.[11] ඔවුන්ගේ
පාප ඉතා බරපතළය.[12] **21** එබැ-
වින් ඔවුන්ගේ ක්‍රියා සෝදිසි කර බැලී-
මට මම තීරණය කළෙමි.* එවිට මා
වෙතට පැමිණ තිබෙන චෝදනා
ඇත්තද බොරුද කියා මට දැනගැනී-
මට පුළුවන.”[1]

**22** ඉන්පසු ඒ පුරුෂයෝ එතැ-
නින් පිටත්ව සොදොම් බලා
ගියෝය. එහෙත් යෙහෝවා දෙවි[2]
දිගටම ආබ්‍රහම් ඉදිරියේ සිටියේය.[3]
**23** එවිට ආබ්‍රහම් දෙවිගෙන් මෙසේ
ඇසීය. “ඔබ ඇත්තටම දුෂ්ටයන්
සමඟ ධර්මිෂ්ඨයන්වත් නැති කර
දමනවාද?[4] **24** ඒ නුවර තුළ ධර්-
මිෂ්ඨ මිනිසුන් පනස්දෙනෙක් ඉන්-
නවා නම් ඔබ ඔවුන්වත් නැති
කරනවාද? ඔබ ඔවුන් වෙනුවෙන්වත්
ඒ නුවරට සමාව දෙන්නේ නැද්ද?[5]
**25** ඔබ ඒ දෙපිරිසම එකට විනාශ කර
දුෂ්ටයාටත් ධර්මිෂ්ඨයාටත්[6] එකම
දඬුවම දෙයි කියා මට හිතාගන්-
නවත් බැහැ![7] මුළු පොළොවෙම
විනිශ්චයකරු වන ඔබ සාධාරණය
ඉෂ්ට කරන්නේ නැද්ද?”[8] **26** එවිට
යෙහෝවා දෙවි මෙසේ කීවේය.
“සොදොම් නුවරේ ධර්මිෂ්ඨ මිනිසුන්
පනස්දෙනෙකු මට සම්බ වුණොත්
ඔවුන් වෙනුවෙන් මම මුළු නුවර-
ටම සමාව දෙන්නෙමි.”[9] **27** නමුත්
ආබ්‍රහම් මෙසේ කීවේය. “අනේ යෙ-
හෝවා දෙවියනි, මට සමාවෙන්න!
මම නිකම්ම නිකම් දූවිලි සහ අළු
වැනි මිනිසෙක්[10] වුණත් ඔබ සමඟ
කතා කරන්න තරම් නිර්භීත වුණා.
**28** ධර්මිෂ්ඨයන් හතළිස්පස්දෙනෙක්
ඉන්නවා නම් පස්දෙනෙක් අඩු නිසා
ඔබ මුළු නුවරම විනාශ කරනවාද?”
දෙවිද, “එහි හතළිස්පස්දෙනෙකු මට
සම්බ වුණොත් මම එය විනාශ
නොකරන්නෙමි”[11] යයි කීවේය.

**29** එහෙත් ආබ්‍රහම් නැවත මෙසේ
ඇසුවේය. “ඒ නුවරේ හතළිස්දෙනෙක්
සම්බ වුණොත් ඔබ එය විනාශ කරන-
වාද?” දෙවිද, “ඒ හතළිස්දෙනා වෙනු-
වෙන් මම එසේ නොකරන්නෙමි” යයි
කීවේය. **30** එහෙත් ආබ්‍රහම් තවදු-
රටත් මෙසේ කීවේය. “අනේ යෙ-
හෝවා දෙවියනි, මා සමඟ කෝප
නොවන්න.[12] මට තව ටිකක් කතා

---

උත් **18:21*** මූ.අ., “ඔවුන්ගේ ක්‍රියා බලන පිණිස යන්නෙමි.”

---

**18 පරි.**

1 ලූක් 11:27, හෙබ්‍රෙ 11:11, 1පේතෘ 3:6
2 යෙසා 40:29
3 මතෙ 19:26, ලූක් 1:37
4 ගීතා 44:21, හෙබ්‍රෙ 4:13
5 උත් 13:12
6 2සාමු 19:31, ක්‍රියා 20:38, රෝම 15:24
7 ගීතා 25:14, ආමො 3:7
8 උත් 12:3, සෙක 8:23, ගලා 3:14
9 2සාමු 22:25, ගීතා 15:2, හිතෝ 2:9, හිතෝ 21:3
10 ද්වි 4:9
11 හිතෝ 21:13, 2පේතෘ 2:8
12 උත් 9:25, උත් 13:13, යෙසා 3:9, යූද් 7

**2 තීරුව**

1 උත් 11:5, නික් 3:7, යොෂු 22:22, ගීතා 14:2
2 උත් 31:11, උත් 32:30, විනි 6:11
3 ගීතා 106:23
4 උත් 20:4, ගණන් 16:22, යෝබ් 34:19, යෙරෙ 15:1, මතෙ 13:49, රෝම 3:5
5 යෙරෙ 5:1
6 ගීතා 37:10, හිතෝ 29:16, මලා 3:18
7 ද්වි 32:4
8 යෝබ් 34:12, ගීතා 50:6, ගීතා 94:2, යෙසා 33:22, සෙක 7:9
9 යෙරෙ 5:1, එස 22:30
10 උත් 3:19, යෝබ් 30:19, ගීතා 113:7, 1කොරි 15:47
11 ගණන් 14:18, ගීතා 78:38, යෙසා 65:8
12 නික් 34:6, එස්රා 5:12, ගීතා 86:15, හෙබ්‍රෙ 12:29

කරන්න ඉඩ දෙන්න.[1] එහි තිස්-
දෙනෙක් සම්බ වුණොත් ඔබ මොන-
වාද කරන්නේ?” දෙවිද, “තිස්දෙනෙකු
සම්බ වුණොත් එය විනාශ නොක-
රන්නෙමි” යයි කීවේය. **31** එහෙත්
ආබ්‍රහම් නැවත කතා කරමින් මෙසේ
කීවේය. “අනේ යෙහෝවා දෙවියනි,
මම ඔබ සමඟ මෙලෙස දිගින් දිගටම
කතා කරන්න නිර්භීත වූ නිසා මට
සමාවෙන්න![2] එහි විසිදෙනෙක් සම්බ
වුණොත් ඔබ මොනවාද කරන්නේ?”
දෙවිද, “ඒ විසිදෙනා වෙනුවෙන් මම
එය විනාශ නොකරන්නෙමි”[3] යයි
කීවේය. **32** අන්තිමේදී ඔහු මෙසේ
කීවේය. “අනේ යෙහෝවා දෙවියනි,
මා සමඟ කෝප නොවන්න.[4] මට මේ
වතාවේ පමණක් කතා කරන්න අව-
සර දෙන්න.[5] එහි දහදෙනෙක් සම්බ
වුණොත් ඔබ මොනවාද කරන්නේ?”
දෙවිද, “ඒ දහදෙනා වෙනුවෙන් මම
එය විනාශ නොකරන්නෙමි”[6] යයි
කීවේය. **33** යෙහෝවා දෙවි[7] ආබ්‍ර-
හම් සමඟ කතා කළ පසු එතැනින්
ඉවත්ව ගියේය. ආබ්‍රහම්ද තම කූඩා-
රම වෙතට හැරී ගියේය.

**19** සවස් යාමේදී දේවදූතයෝ
දෙදෙනෙක් සොදොම් නුව-
රට පැමිණියෝය. ඒ අවස්ථාවේදී
සොදොම් නුවරේ දොරටුව අසල හිඳ-
ගෙන සිටි[8] ලොත්, ඔවුන් ළඟට ගොස්
හිස නමා ඔවුන්ට ආචාර කළේය.[9]
**2** ලොත් ඔවුන්ට මෙසේ කීවේය.
“අනේ මගේ ස්වාමිවරුනි, අද ඔබේ
සේවකයාගේ නිවසට ඇවිත් රාත්‍රිය
ගත කරන්න. ඔබට පාන්දරින්ම
නැඟිට ඔබේ ගමන යන්න පුළු-
වන්.[10] දැන් ඔබේ පාද සෝදන්න
මට ඉඩ දෙන්න.”[11] එවිට ඔවුහු,
“නැහැ, අපි අද රාත්‍රිය ගත කරන්නේ
ප්‍රධාන මංසන්ධියේ”[12] යයි කීවෝය.
**3** නමුත් ලොත් ඔවුන්ට පෙරත්ත
කළ නිසා[13] ඔවුහු ඔහු සමඟ ගියෝය.
ඔහු මුහුන් නොදැමූ රොටි පුලුස්සා,[14]
භෝජනයක් පිළියෙල කර[15] ඔවුන්ට
කන්න දුන්නේය. ඔවුහුද කෑවෝය.

**4** ඔවුන් නින්දට යෑමට පෙර
සොදොම් නුවරේ පුරුෂයෝ ලොත්-
ගේ නිවස වට කළෝය.[1] බාල
මහලු සියලුම පුරුෂයෝ එතැන රැස්ව
සිටියෝය.[2] **5** ඔවුහු ලොත්ට කෑග-
සමින් මෙසේ කීවෝය. “අද රෑ ඔබේ
නිවසට පැමිණි පුරුෂයන් දෙදෙ-
නාව එළියට එවන්න. අපට ඔවුන්
සමඟ ලිංගික සම්බන්ධකම් පවත්-
වන්න ඕනේ.”[3]

**6** පසුව ලොත් නිවසෙන් පිට-
තට ගොස් දොර වැසුවේය. **7** ඔහු
ඔවුන්ට මෙසේ කීවේය. “අනේ මගේ
සහෝදරයෙනි, දුෂ්ට විදිහට හැසි-
රෙන්න එපා.[4] **8** මගේ දූවරුන් දෙ-
දෙනා මෙතැන ඉන්නවා. ඔවුන්
කවදාවත් පුරුෂයෙක් එක්ක සයනය
කරලා නැහැ.[5] ඔබ කැමති නම් මම
ඒ දෙදෙනාව ඔබට දෙන්නම්.[6] නමුත්
මේ මිනිසුන්ට නම් කිසිම හිරිහැර-
යක් කරන්න එපා.[7] මගේ නිවසට
ඔවුන්ව ගෙනාවේ ඔවුන්ට රැකවර-
ණය දෙන්නයි.”[8] **9** එවිට ඒ සෙ-
නඟ, “අපි නුඹට සලකන්නේ මීටත්
වඩා දරුණු විදිහටයි! නුඹ පිටගම්කා-
රයෙක්![9] අපේ දේශයට ඇවිත් අපිව
විනිශ්චය කරන්න තරම්[10] නුඹට
තියෙන අයිතිය මොකක්ද? අහ-
කට පලයං” යයි කියමින් ලොත්ව
තල්ලු කර[11] දොර කඩාගෙන යෑමට
තැත් කළෝය.[12] **10** එවිට ඇතුළේ
සිටි පුරුෂයෝ දෙදෙනා* ලොත්ව
ගේ ඇතුළට ඇදගෙන දොර වසා-
ගත්තෝය. **11** ඉන්පසු ඔවුහු දෙ-
දෙනා දොරකඩ සිටි ලොකු කුඩා
සියලුදෙනාගේම[13] ඇස් අන්ධ වීමට
සැලැස්වූවෝය.[14] එබැවින් මුළු සෙ-
නඟම එහෙ මෙහෙ අතපත ගාමින්
නිවසේ දොර සෙවීමට බොහෝ වෙ-
හෙස දැරූහ.[15]

**12** ඉන්පසු ඒ මිනිස්සු දෙදෙනා
ලොත්ට මෙසේ කීවෝය. “ඔබේ
පවුලේ තවත් අය මෙහෙ ඉන්න-
වාද? ඔබේ පුත්‍රයන්වද දූවරුන්වද

**18 පරි.**
**1** හෙබ්‍රෙ 4:16
**2** යෝබ් 40:4
මතෙ 7:7
ලූක් 11:8
**3** ගීතා 9:12
ක්‍රියා 27:24
**4** විනි 6:39
හෙබ්‍රෙ 3:15
**5** නික් 4:10
ගීතා 86:6
**6** යෙසා 1:9
එස 14:16
**7** උත් 18:22

**19 පරි.**
**8** රූත් 4:1
එස්ත 2:19
**9** උත් 18:2
1සාමු 24:8
**10** විනි 19:9
1සාමු 29:10
**11** උත් 18:4
යෝබ් 31:32
යොහ 13:12
**12** විනි 19:15
**13** විනි 19:20
ලූක් 24:29
ක්‍රියා 16:15
**14** විනි 6:19
1සාමු 28:24
**15** උත් 18:8
2රාජා 6:23

**2 තීරුව**
**1** විනි 19:22
**2** හිතෝ 4:16
එෆී 4:19
**3** ලෙවී 18:22
ලෙවී 20:13
රෝම 1:27
1කොරි 6:9
යූද් 7
**4** රෝම 1:24
2පේතෘ 2:12
යූද් 10
**5** උත් 24:16
**6** විනි 19:24
**7** රෝම 1:26
2පේතෘ 2:9
**8** ද්වි 10:19
විනි 19:23
යෙසා 58:7
**9** නික් 22:21
**10** ක්‍රියා 7:27
1පේතෘ 4:4
**11** ගීතා 118:13
**12** හිතෝ 14:16
**13** යෙරෙ 8:10
**14** 2රාජා 6:18
ක්‍රියා 13:11
**15** දේශ 10:15
මතෙ 15:14

**උත් 19:10*** එනම්, මිනිස් වෙස් ගත් දේවදූතයන් දෙදෙනෙකි.

බැනාවරුන්වද රැගෙන මේ නුවරෙන්
පිටතට යන්න.[1] **13** අපි මේ මුළු
නුවරම විනාශ කරන්නයි යන්නේ.
මන්ද මේ සෙනඟට විරුද්ධව කළ
චෝදනාවලට යෙහෝවා දෙවි ඇහුම්-
කන් දී තිබෙනවා.[2] මේ නුවර විනාශ
කරන්නයි යෙහෝවා දෙවි අපිව මෙ-
හාට එව්වේ."[3] **14** එබැවින් ලොත්,
තම දූවරුන් සමඟ විවාහ වෙන්න සිටි
පුරුෂයන් වෙතට ගොස්, "යෙහෝවා
දෙවි මේ නුවර විනාශ කරන්නයි
යන්නේ. ඒ නිසා ඉක්මන් කර මෙ-
හෙන් පිට වෙන්න"[4] කියා ඔවුන්ට
නැවත නැවත කීවේය. නමුත් ඔහුගේ
බැනාවරු ඔහු කී දේ විහිළුවක් සේ
ගණන් ගත්තෝය.[5]

**15** අලුයම වූ විට දේවදූතයෝ
ලොත්ව හදිසි කරවමින් මෙසේ
කීවෝය. "ඔබේ භාර්යාවත් දූවරුන්-
වත් රැගෙන දැන්ම මෙතැනින් පිට
වෙන්න.[6] නැත්නම් මේ පව්කාර වැසි-
යන් පිටට දඬුවම ගෙනෙන විට
ඔබත් ඔවුන් සමඟම විනාශ වී යයි!"[7]
**16** නමුත් ලොත් එතැනින් පිට වී
යන්න ප්‍රමාද විය.[8] යෙහෝවා දෙවි
ඔහුට අනුකම්පා කළ නිසා[9] ඒ මිනිස්සු
දෙදෙනා ලොත්වත් ඔහුගේ භාර්යා-
වත් දූවරුන්වත් අතින් අල්ලාගෙන
නුවරින් පිටතට දුවගෙන ගියෝය.[10]
**17** නුවරේ මායිමට ඔවුන් පැමිණි
විට එක් පුරුෂයෙක් ඔවුන්ට මෙසේ
කීවේය. "ඔබ විනාශ නොවන පිණිස
දැන් පලා දුවන්න. මේ පළාතේ කො-
තැනකවත් නවතින්න එපා.[11] පිටුපස
බලන්නේ නැතුව[12] කඳුකරය දක්වාම
දුවන්න!"[13]

**18** එවිට ලොත් ඔවුන්ට මෙසේ
කීවේය. "අනේ යෙහෝවා දෙවි-
යනි, මට ඒක නම් කරන්න බැහැ.
**19** ඔබ මා ගැන සැලකිලිමත්
වී[14] මට බොහෝ සෙයින් ප්‍රේමය*[15]
පෙන්වා මගේ ජීවිතය බේරා දුන්නා.
එහෙත් මට කඳුකරයට නම් යන්න
කියන්න එපා. එහෙදී මට අනතුරක්
වෙලා මැරෙයිදෝ[1] කියා මට භයයි.
**20** අනේ, මම මේ ළඟ තියෙන
කුඩා නුවරට පලා යන්නද? එය
සුළු ඉල්ලීමක් නේද?[2] මම එතැනට
ගිහින් මගේ ජීවිතය රැකගන්නම්."
**21** එවිට දෙවි ඔහුට මෙසේ කීවේය.
"මම මේ වතාවේදීත් ඔබ කී දේ සැල-
කිල්ලට ගන්නෙමි.[3] ඒ නිසා ඔබ
සඳහන් කළ නුවර මම විනාශ නොක-
රන්නෙමි.[4] **22** ඉක්මන් කර ඒ නුව-
රට පලා යන්න. මන්ද ඔබ එතැනට
යන තෙක් මට කිසිවක් කළ නොහැ-
කියි."[5] ලොත් ඒ නුවරට ෂෝවර්*[6]
යන නම තැබුවේ ඒ නිසාය.

**23** ලොත් ෂෝවර් නුවරට පැමිණි
විට ඉර උදා වී තිබුණේය.[7] **24** එවිට
යෙහෝවා දෙවි සොදොම් සහ ගො-
මෝරාව විනාශ කිරීමට පටන්ගත්-
තේය. යෙහෝවා දෙවි එම නුවරවලට
අහසින් ගිනි සහ ගෙන්දගම් වැටෙන්න
සැලැස්වූවේය.[8] **25** දෙවි ඒ නුවර-
වල්ද ඒ අවට තිබූ මුළු ප්‍රදේශයද එහි
වැසියන්ද ගස් කොළන්ද සම්පූර්-
ණයෙන්ම විනාශ කළේය.[9] **26** මේ
අතරතුරේදී ලොත් පසුපස ගමන් කර-
මින් සිටි ඔහුගේ භාර්යාව පිටුපස හැරී
බැලුවාය. එවිට ඇය ලුණු කණුවක්
වූවාය.[10]

**27** ආබ්‍රහම් උදේ පාන්දරින්ම
නැඟිට, තමා කලින් යෙහෝවා
දෙවි සමඟ කතා කළ ස්ථානයටම
ගියේය.[11] **28** සොදොම් සහ ගො-
මෝරාව දෙසත් ඒ අවට මුළු ප්‍රදේශය
දෙසත් බැලූ විට ගන දුමක් නඟිනවා
ඔහු දුටුවේය. එය හරියට පෝරණුව-
කින් නඟින ගන දුමක් මෙන් විය.[12]
**29** ඒ ප්‍රදේශයේ තිබූ නුවරවල් විනාශ
කිරීමට පෙර, දෙවි ආබ්‍රහම් ගැන
සැලකිලිමත් වෙමින් ඒ ප්‍රදේශයේ
පදිංචිව සිටි ලොත්ව එතැනින් පිට-
තට යැවීමට පියවර ගත්තේය.[13]

**30** පසුව ලොත් ෂෝවර්හි[14] වාසය
කිරීමට භය වී ඔහුගේ දූවරුන්
සමඟ එතැනින් පිටත් වී කඳුකරයට

**19 පරි.**
1 ගණන් 16:26
1සාමු 15:6
යෙරෙ 51:6
2 උත් 13:13
උත් 18:20
යෙසා 3:9
3 1ලේක 21:15
ගීතා 11:6
මතෙ 13:41
4 ගණන් 16:45
එළි 18:4
5 2ලේක 36:16
ලූක් 17:28
6 ලූක් 17:31
7 ගණන් 16:26
8 රෝම 12:11
9 නික් 33:19
යෝවේ 2:18
10 යොෂු 6:23
2පේත 2:9
11 උත් 13:10
යෙරෙ 45:5
යෙරෙ 51:50
12 ලූක් 9:62
පිලි 3:13
13 මතෙ 24:16
හෙබ්‍රෙ 2:3
14 උත් 18:3
විනි 6:17
15 නික් 15:13
මීකා 7:18

**2 තීරුව**
1 ගීතා 6:4
මතෙ 8:25
2 2රාජා 3:18
3 ගීතා 34:15
4 උත් 19:30
5 හබ 2:3
2පේත 3:9
එළි 7:3
6 උත් 14:2
7 උත් 19:27
8 ද්වි 29:23
ගීතා 11:6
යෙසා 1:9
ආමො 4:11
ලූක් 17:29
2පේත 2:6
9 උත් 13:10
ගීතා 107:34
යෙරෙ 49:18
ශෙප 2:9
10 ලූක් 17:32
හෙබ්‍රෙ 10:38
11 උත් 18:22
12 යූද් 7
13 2පේත 2:7
14 උත් 19:22

උත් **19:19*** හෝ, "ඇදි ප්‍රේමය."

උත් **19:22*** තේරුම, "කුඩා."

ගොස් එහි ගුහාවක වාසය කළේය.[1]
**31** එක් දිනක් ඔහුගේ වැඩිමල් දිය-
ණිය බාල දියණියට මෙසේ කීවාය.
“අපේ පියා දැන් වයසට ගිහින්. අපිට
දැන් විවාහ වෙන්න එක පුරුෂයෙක්-
වත් ඉතුරු වී නැහැ.[2] **32** ඒ නිසා
අපේ පියාගේ නම ගෙනි යන්න අපි
මෙහෙම කරමු. අපි ඔහුට වයින්
බොන්න දී[3] ඔහු සමඟ සයනය
කරමු.”[4]

**33** එදින රාත්‍රියේ[5] ඔවුන් පියාට
වයින් බොන්න දුන් අතර වැඩි-
මල් දියණිය ඔහු සමඟ සයනය
කළාය. නමුත් ඔහු ඒ ගැන කිසි-
වක් දැන සිටියේ නැත. **34** පසුවදා
වැඩිමල් දියණිය ඇගේ සහෝදරියට
මෙසේ කීවාය. “ඊයේ රෑ මම අපේ
පියා සමඟ සයනය කළා. අද රෑත්
අපි පියාට වයින් බොන්න දෙමු.
ඊටපස්සේ ඔබත් ඔහු සමඟ සය-
නය කරන්න. ඔහුගේ නම ගෙනි
යන්න අපි එහෙම කරමු.” **35** එදින
රාත්‍රියේදීත් ඔවුහු තමන්ගේ පියාට
බොහෝ වයින් බොන්න දුන්නෝය.
ඉන්පසු බාල දියණිය ඔහු ළඟට ගොස්
ඔහු සමඟ සයනය කළාය. නමුත්
ඔහු ඒ කිසිවක් දැන සිටියේ නැත.
**36** ලොත් සමඟ සයනය කළ පසු
ඔහුගේ දූවරු දෙදෙනාම ගැබ්ගත්-
තෝය.[6] **37** කල් යත්ම වැඩිමල්
දියණිය පුත්‍රයෙකු බිහි කළාය. ඇය
ඔහුට මෝවබ්*[7] යන නම තැබු-
වාය. අද මෝවබ්වරුන්[8] ලෙස හඳුන්-
වනු ලබන ජනයාගේ පියා ඔහුය.
**38** බාල දියණියද පුත්‍රයෙකු බිහි
කළාය. ඇය ඔහුට බෙන්-අම්මි* යන
නම තැබුවාය. අද අම්මොන්වරුන්[9]
ලෙස හඳුන්වනු ලබන ජනයාගේ පියා
ඔහුය.

**20** ආබ්‍රහම් තමා සිටි ස්ථාන-
යෙන් පිටත් වී නෙගෙබ් පළා-
තට ගොස් කාදෙෂ්[10] සහ ෂූර්[11] අතර
කූඩාරම් ගසාගත්තේය.[12] පසුව ඔහු
ගෙරාර්[13] නම් ස්ථානයේද විදේශි-
කයෙකු ලෙස ජීවත් විය. **2** එහි-
දීත්, ඔහු තම භාර්යාව වූ සාරාව
හඳුන්වා දුන්නේ තමාගේ සහෝද-
රිය ලෙසය.[1] පසුව ගෙරාර්හි රජු වූ
අබිමෙලෙක් සාරාව තමා වෙතට
ගෙන්වාගත්තේය.[2] **3** එහෙත් දෙවි
රාත්‍රියේදී සිහිනයකින් අබිමෙලෙක්ට
පෙනී මෙසේ කීවේය. “ඔබ වෙනත්
කෙනෙකුගේ භාර්යාවක්[3] ගත් බැවින්
මිය යන්නේය.”[4] **4** එහෙත් අබිමෙ-
ලෙක් ඇයට අතවත් තබා තිබුණේ
නැති බැවින්[5] මෙසේ කීවේය. “යෙ-
හෝවා දෙවියනි, ඔබ වරදක් නොකළ
ජාතියක් විනාශ කරන්නේ ඇයි?[6]
**5** ඔහු මට කිව්වේ ඇය ඔහුගේ සහෝ-
දරිය කියායි. ඇය මට කිව්වෙත් ඔහු
ඇගේ සහෝදරයා කියායි. මම මේ දේ
කළේ නොදන්නාකමින්.”[7] **6** එවිට
සැබෑ දෙවි සිහිනයකින් ඔහුට මෙසේ
කීවේය. “ඔබ මේ දේ කළේ නො-
දන්නාකමින් කියා මමත් දනිමි.[8]
ඇයට අත තබන්න ඔබට ඉඩ නොදී[9]
මට විරුද්ධව පව් කිරීමෙන්[10] ඔබව
වැළැක්වූවේ ඒ නිසයි. **7** දැන් ඒ
මනුෂ්‍යයාගේ භාර්යාව ආපසු ඔහුටම
භාර දෙන්න. ඔහු අනාගතවක්තෘ-
වරයෙකු[11] වන නිසා ඔහු ඔබ වෙනු-
වෙන් මට කන්නලව් කරයි.[12] එවිට
ඔබේ ජීවිතය රැකෙයි. නමුත් ඔබ
ඇයව භාර නොදුන්නොත් ඔබ අනි-
වාර්යයෙන්ම මිය යන්නේය. ඔබත්
ඔබට අයිති සියලුදෙනාත් මිය යන්-
නෝය.”[13]

**8** අබිමෙලෙක් උදේ පාන්දරින්ම
නැඟිට තම සේවකයන් සියලු-
දෙනාවම කැඳවා ඒ සෑම දෙයක්ම
ඔවුන්ට කීවේය. ඔවුහු මහත් සේ භය
වූහ. **9** ඉන්පසු අබිමෙලෙක් ආබ්‍ර-
හම්ව කැඳවා මෙසේ කීවේය. “ඔබ
කුමක්ද මේ කළේ? ඔබ මාවත් මගේ
රාජ්‍යයත් මෙතරම් විශාල පාපයකට
හසු කරන්න තරම් මම ඔබට විරුද්-
ධව කළ වරද කුමක්ද?[14] ඔබ මට
කළේ ලොකු වරදක්.”[15] **10** අබිමෙ-
ලෙක් ආබ්‍රහම්ගෙන් මෙසේද ඇසීය.
“ඔබ මේ වගේ දෙයක් කළේ ඇයි?”[16]

---

උත් **19:37*** තේරුම, “පියාගෙන්.” **38*** තේ-
රුම, “මගේම ජනයාගෙන් පුත්‍රයෙක්.”

**19 පරි.**
**1** උත් 19:17
**2** උත් 38:8
**3** උත් 9:21
හබ 2:15
**4** ලෙවී 18:6
**5** 1තෙස 5:7
**6** ලෙවී 18:7
එස 22:10
**7** ද්වි 2:9
**8** රූත් 2:6
1ලේක 18:2
**9** ද්වි 2:19
විනි 11:4
නෙහෙ 13:1
ශෙප 2:9

**20 පරි.**
**10** ගණන් 13:26
**11** උත් 25:18
**12** උත් 13:18
**13** උත් 10:19

**2 තීරුව**
**1** උත් 12:13
උත් 20:12
**2** උත් 12:15
**3** ද්වි 22:22
**4** උත් 12:17
ගීතා 105:14
**5** ලෙවී 18:19
**6** උත් 18:25
**7** 1ලේක 29:17
ගීතා 26:6
**8** 1සාමු 16:7
හිතෝ 21:2
යෙරෙ 17:10
**9** හිතෝ 6:29
1කොරි 7:1
**10** උත් 39:9
**11** නික් 7:1
ගීතා 105:15
**12** ද්වි 9:20
යෝබ් 42:8
යාකො 5:16
1පේතෘ 3:12
**13** එස 3:19
**14** ලෙවී 20:10
හෙබ්‍රෙ 13:4
**15** හිතෝ 28:10
**16** උත් 12:18
උත් 26:10

**11** එවිට ආබ්‍රහම් මෙසේ කීවේය. “මේ
දේශයේ කිසිවෙකුට දෙවි කෙරෙහි
ගරුබියක් නැහැයි කියා මට හිතුණා.[1]
ඒ නිසා මේ සෙනඟ මගේ බිරිඳව ලබා-
ගැනීමට මාව මරා දමයි[2] කියා මම
භය වුණා. **12** අනික, ඇය ඇත්-
තෙන්ම මගේ සහෝදරිය. ඇය මගේ
මවගේ දුව නොවුණත් මගේ පියාගේ
දුව. මම ඇයව විවාහ කරගත්තා.[3]
**13** දෙවි මගේ පියාගේ නිවස අත්හැර
යන්න[4] කියා මට කියද්දී මම ඇයට
මෙහෙම කිව්වා. ‘ඔබ ඇත්තෙන්ම
මට ආදරේ*[5] නම් මා වෙනුවෙන් මේ
දේ කරන්න. අප යන සෑම තැනකදීම
මාව ඔබේ සහෝදරයා ලෙස හඳුන්වා
දෙන්න.’ ”[6]

**14** ඉන්පසු අබිමෙලෙක් බැටළු-
වන්ද ගවයන්ද සේවක සේවිකාවන්ද
ආබ්‍රහම්ට දී ඔහුගේ භාර්යාව වූ
සාරාව නැවත ඔහුට භාර දුන්නේය.[7]
**15** අබිමෙලෙක් මෙසේද කීවේය.
“මගේ දේශයේ ඔබට කැමති තැනක
ජීවත් වෙන්න පුළුවන්.”[8] **16** අබි-
මෙලෙක් සාරාට මෙසේ කීවේය. “මම
ඔබේ සහෝදරයාට[9] රිදී ෂෙ-
කෙල් දාහක් දෙනවා. ඔබව නින්දා-
වට පත් නොකළ බවට ලකුණක්[10]
වශයෙන් මෙතැන ඉන්න සියලුදෙනා
හා ඔබ සමඟ සිටින සියලුදෙනා ඉදි-
රිපිටම එය දෙනවා.” **17** ආබ්‍රහම්
අබිමෙලෙක් වෙනුවෙන් සැබෑ දෙවිට
කන්නලව් කළේය.[11] පසුව අබිමෙ-
ලෙක්වද ඔහුගේ භාර්යාවද ඔහුගේ
සේවිකාවන්වද දෙවි සුව කළේය.
එවිට අබිමෙලෙක්ගේ නිවසේ සිටි
සියලු ස්ත්‍රීහු නැවත දරුපල ලැබු-
වෝය. **18** මන්ද ආබ්‍රහම්ගේ භාර්-
යාව වූ සාරා නිසා යෙහෝවා දෙවි ඒ
සියලු ස්ත්‍රීන්ට දරුපල අහිමි කර
තිබිණ.*[12]

**21** යෙහෝවා දෙවි තමා කියා
තිබූ ලෙසම සාරාට ආශීර්වාද
කළේය. යෙහෝවා දෙවි තමා දුන්
පොරොන්දුව ඉටු කළේය.[1] **2** දෙවි
ආබ්‍රහම්ට කියා තිබූ ලෙසම සාරා
ගැබ්ගෙන[2] නියමිත කාලයේදී[3] පුත්‍ර-
යෙකු බිහි කළාය. ඒ වන විට ආබ්‍රහම්
මහලුව සිටියේය. **3** ආබ්‍රහම් සාරා-
ගෙන් බිහි වූ තම පුත්‍රයාට ඊසාක්[4]
යන නම තැබීය. **4** දෙවි ඔහුට
අණ කළ ලෙසම ආබ්‍රහම් තම පුත්
ඊසාක් ඉපදී දවස් අටකින් ඔහුව
චර්මච්ඡේදනය කළේය.[5] **5** ඊසාක්
ඉපදෙන විට ආබ්‍රහම්ට වයස අවු-
රුදු සියයක් විය. **6** එවිට සාරා,
“දෙවි මාව සතුටට පත් කළ නිසා
මම දැන් සිනාසෙනවා. මේ ගැන
ආරංචි වන හැමදෙනාම මා සමඟ
සතුටෙන් සිනාසෙයි”[6] කියා කීවාය.
**7** ඇය මෙසේද කීවාය. “ ‘සාරා කවදා
හරි දවසක ඇගේම දරුවෙකුට කිරි
පොවයි’ කියා හිතුවේ කවුද? කවුරු
හරි කෙනෙක් ආබ්‍රහම්ට ඒ වගේ දෙ-
යක් කියා තිබෙනවාද? නමුත් ආබ්‍ර-
හම් වයසට ගියාට පස්සෙත් මට
ඔහුගෙන් පුතෙක් ලැබුණා!”

**8** දරුවා කිරි වරන වයස දක්වා
වැඩුණේය.[7] ඊසාක් කිරි වැරූ දව-
සේදී ආබ්‍රහම් විශාල මංගල්‍යයක්
සූදානම් කළේය. **9** ඊජිප්තු ජාතික
හාගර්[8] ආබ්‍රහම්ට දාව බිහි කළ
පුත්‍රයා නිතරම ඊසාක්ව විහිළුවට ලක්
කරන බව[9] සාරා දුටුවාය. **10** එබැ-
වින් ඇය ආබ්‍රහම්ට මෙසේ කීවාය.
“මේ දාසියවයි ඇගේ පුතාවයි මෙ-
හෙන් එළවා දමන්න. ඔබේ උරුමය
අයිති වෙන්නේ මගේ පුත් ඊසාක්-
ටයි.[10] මේ දාසියගේ පුතා එක්ක නම්
ඔහුට උරුමය බෙදාගන්න දෙන්න
බැහැ.” **11** එහෙත් තම පුත්‍රයා[11]
ගැන කී දේ නිසා ආබ්‍රහම් දැඩි
ලෙස අමනාප විය. **12** දෙවි ආබ්‍ර-
හම්ට මෙසේ කීවේය. “ඔබේ දාසිය හා
ඇගේ පුත්‍රයා ගැන සාරා කියන දේවල්
නිසා ඇය සමඟ අමනාප නොවන්න.
ඇයට සවන් දෙන්න. මන්ද ඔබට
පොරොන්දු වූ තැනැත්තා* පැවත

---

උත් **20:13*** හෝ, “ඇලුම් ප්‍රේමය.” **18*** මූ.අ., “සියලු ගර්භ තදින් වැසුවේය.”

උත් **21:12*** උත් 3:15හි පාදසටහන බලන්න.

**20 පරි.**
1 යෝබ් 1:1, හිතෝ 8:13
2 උත් 12:12, උත් 26:7
3 උත් 11:29
4 උත් 12:1, ක්‍රියා 7:3
5 උත් 47:29, රූත් 3:10, 2සාමු 9:7, කොලො 3:12
6 උත් 12:13, එෆී 5:22
7 උත් 12:16
8 උත් 47:6
9 උත් 12:13, උත් 20:2
10 හිතෝ 12:16
11 හිතෝ 15:8, යාකො 5:16
12 උත් 12:17

**2 තීරුව**

**21 පරි.**
1 උත් 18:10
2 හෙබ්‍රෙ 11:11
3 උත් 17:21, උත් 18:14, 2රාජා 4:17, රෝම 9:9
4 උත් 17:19, යොෂු 24:3, රෝම 9:7
5 උත් 17:12, ලෙවී 12:3, ලූක් 2:21, යොහ 7:22, ක්‍රියා 7:8
6 උත් 18:12
7 1සාමු 1:22
8 උත් 16:4
9 උත් 15:13, ක්‍රියා 7:6, ගලා 4:29
10 උත් 15:4, යොහ 8:35, ගලා 4:30
11 උත් 17:18

එන්නේ ඊසාක්ගෙන්ය.[1] **13** දාසිය-
ගේ පුත්‍රයාත්[2] ඔබේ දරුවෙකු වන
බැවින් මම ඔහුගෙන්ද ජාතියක් බිහි
වීමට සලස්වන්නෙමි."[3]

**14** ආබ්‍රහම් උදේ පාන්දරින්ම
නැඟිට රොටි හා වතුර පිරවූ සම්
භාජනයක් හාගර්ගේ කර පිට තැබු-
වේය.[4] ඔහු ඇගේ පුතාවද[5] ඇයට භාර
දී ඇයව පිටත් කර යැවීය. බෙයර්-
ෂෙබා[6] පාළුකරයේ ඇවිදගෙන යන
විට ඇය අතරමං වූවාය. **15** සම්
භාජනයේ වතුර සම්පූර්ණයෙන්ම
ඉවර වූ විට[7] ඇය තම පුත්‍රයාව පඳුරක්
යට දමා, **16** ඊයක් විදින දුරකට
ගොස් හිඳගත්තාය. "අනේ, මගේ
පුතා මැරෙනවා මට බලන් ඉන්න
බැහැ"[8] යයි කියමින් ඇය මහා හයි-
යෙන් හැඬුවාය.[9]

**17** එවිට ළමයාගේ[10] හඬ දෙවිට
ඇසුණේය. දෙවිගේ දූතයා ස්වර්ග-
යේ සිට හාගර්ට හඬගසා මෙසේ
කීවේය.[11] "හාගර්, ඔබ අඬන්නේ ඇයි?
භය නොවන්න. ඔබේ දරුවාගේ හඬ
දෙවිට ඇසුණේය. **18** දැන් ඔබේ
පුත්‍රයා ළඟට ගොස් ඔහුට නැඟි-
ටින්න උදව් කරන්න. මම ඔහුගෙන්
මහත් ජාතියක් බිහි වන්න සලස්වන්-
නෙමි."[12] **19** ඉන්පසු දෙවි ඇයට
ළිඳක් පෙන්වූවේය.[13] ඇය ඒ වෙතට
ගොස් සම් භාජනයට වතුර පුරවා-
ගෙන ළමයාට බොන්න දුන්නාය.
**20** දෙවිගේ ආශීර්වාදය ළමයාට[14]
දිගටම ලැබුණේය. ඔහු පාළුකරයේ
ජීවත් වෙමින් වැඩුණේය. ඔහු දුනුවා-
යෙක් විය.[15] **21** පසුව ඔහු පාරාන්
පාළුකරයට[16] ගොස් එහි ජීවත් විය.
ඔහුගේ මව ඊජිප්තු දේශයෙන් ඔහුට
භාර්යාවක් සොයා දුන්නාය.

**22** අබිමෙලෙක් සහ ඔහුගේ
සේනාවේ ප්‍රධානියා වන ෆීකොල්
ආබ්‍රහම්ට මෙසේ කීවෝය. "ඔබ
කරන සෑම දෙයකදීම දෙවිගේ ආශීර්-
වාදය ඔබට ලැබෙනවා.[17] **23** ඒ
නිසා ඔබ මා සමඟත් මගේ දරුවන්
සමඟත් මතු පැමිණෙන මගේ පරම්ප-
රාවන් සමඟත්[18] ද්‍රෝහිව කටයුතු
නොකරන බවට දෙවිගේ නාමයෙන්
මට දිවුරන්න.[1] මා ඔබ සමඟ විශ්-
වාසවන්තව කටයුතු කළ ලෙසම[2]
ඔබත් මා සමඟ දිගටම විශ්වාසවන්-
තව* කටයුතු කරන්න. ඔබ විදේශික-
යෙක්[3] ලෙස ජීවත් වන මේ දේශයේ
වැසියන් සමඟත් විශ්වාසවන්තව
කටයුතු කරන්න." **24** එවිට ආබ්‍ර-
හම්, "මම ඔබ සමඟ විශ්වාසවන්තව
ක්‍රියා කරන බවට දිවුරා පොරොන්දු
වෙනවා"[4] යයි කීවේය.

**25** අබිමෙලෙක්ගේ සේවකයන්
බලහත්කාරයෙන්[5] ළිඳක් අල්ලාගෙන
තිබූ නිසා ආබ්‍රහම් අබිමෙලෙක්ව දැඩි
ලෙස විවේචනය කළේය. **26** එවිට
අබිමෙලෙක් මෙසේ කීවේය. "මේ
දේ කළේ කවුද කියා මම දන්-
නේ නැහැ. ඔබවත් ඒ ගැන මට
කිව්වේ නැහැ. අද වන තුරු මම
ඒ ගැන අහලා තිබුණේත් නැහැ."[6]
**27** ඉන්පසුව ආබ්‍රහම් අබිමෙලෙක්ට
බැටළුවන්ද ගවයන්ද දුන් අතර[7] ඒ
දෙදෙනා ගිවිසුමක් ඇති කරගත්-
තෝය.[8] **28** ආබ්‍රහම් තම රැළෙන්
බැටළුදෙනුන් හත්දෙනෙකුව වෙන්
කර තැබුවේය. **29** එවිට අබිමෙ-
ලෙක් ආබ්‍රහම්ට මෙසේ කීවේය.
"ඔබ මේ බැටළුදෙනුන් හත්-
දෙනාව වෙන් කර තැබුවේ මන්ද?"
**30** ආබ්‍රහම්, "ඔබ මගේ අතින් මේ
බැටළුදෙනුන්ව පිළිගන්න. මම මේ
ළිඳ හෑරූ බවට එය සාක්ෂියක්"[9]
යයි කීවේය. **31** ආබ්‍රහම් එතැනට
බෙයර්-ෂෙබා*[10] යන නම තැබුවේ,
ඔවුන් දෙදෙනා එතැනදී එකිනෙ-
කාට දිවුරුම් දුන් නිසාය. **32** ඔවුන්
බෙයර්-ෂෙබාහි ගිවිසුමක්[11] ඇති කර-
ගත් පසු අබිමෙලෙක් තම සේනාවේ
ප්‍රධානියා වූ ෆීකොල් සමඟ පිලිස්ති-
වරුන්ගේ[12] දේශයට හැරී ගියේය.
**33** පසුව ආබ්‍රහම් බෙයර්-ෂෙබාහි
කිහිරි ගසක්* පැළ කර සදාතන
දෙවි[13] වන යෙහෝවාට ස්තුති ප්‍රශංසා

**21 පරි.**
**1** උත් 17:19; රෝම 9:7; හෙබ්‍රෙ 11:18
**2** ගලා 4:22
**3** උත් 16:10; උත් 17:20; උත් 25:12
**4** ගීතා 119:60
**5** උත් 25:6
**6** උත් 22:19
**7** නික් 15:22; නික් 17:3; ගීතා 63:1
**8** එස්ත 8:6; යෙසා 49:15
**9** සෙක 12:10; ලූක් 7:13
**10** උත් 16:11; ගීතා 22:24; ගීතා 68:5; ගීතා 146:9
**11** උත් 16:7
**12** 1ලේක 1:29
**13** 2රාජා 6:17
**14** උත් 16:16; උත් 21:5
**15** උත් 27:3
**16** ගණන් 10:12
**17** උත් 20:17; උත් 26:28; රෝම 8:31; 1කොරි 14:25
**18** යොෂු 2:12; 1සාමු 20:42; යෙරෙ 4:2

**2 තීරුව**
**1** ද්වි 6:13
**2** උත් 24:14
**3** උත් 20:15; උත් 26:3
**4** උත් 14:22; හෙබ්‍රෙ 6:16
**5** උත් 26:15; උත් 26:20; නික් 2:17
**6** 2කොරි 7:11
**7** උත් 33:11; හිතෝ 17:8
**8** උත් 26:28; 1සාමු 18:3; ගලා 3:15
**9** උත් 31:52
**10** උත් 26:33
**11** උත් 26:28
**12** උත් 10:14; උත් 26:1; නික් 13:17
**13** ගීතා 90:2; යෙසා 40:28; යෙරෙ 10:10; 1තිමෝ 1:17

---

උත් **21:23*** හෝ, "ලැදි ප්‍රේමය." **31*** තේරුම, "දිවුරුමේ ළිඳ." **33*** එනම්, ටැමරිස්ක් ගසක්.

කළේය.*[1] **34** ආබ්‍රහම් විදේශික-
යෙක් ලෙස පිලිස්තිවරුන්ගේ දේශයේ
බොහෝ කාලයක් ජීවත් විය.[2]

**22** ටික කලක් ගෙවුණු පසු සැබෑ
දෙවි, ආබ්‍රහම්ගේ විශ්වාසය
කොතරම් ශක්තිමත්ද කියා සෝදිසි
කර බැලුවේය.[3] දෙවි ඔහුට, “ආබ්‍රහම්”
කියා හඬගැසුවේය. එවිට ආබ්‍රහම්,
“ඇයි මාගේ ස්වාමීනි” කියා ඇසුවේය.
**2** දෙවි තවදුරටත් මෙසේ කීවේය.
“ඔබ බොහෝ සෙයින් ආදරේ කරන[4]
ඔබේ එකම පුත්‍රයා වන ඊසාක්[5] සමඟ
මොරියා[6] දේශයට යන්න. මා එහිදී
ඔබට පෙන්වන කන්දට ගොස් ඔහුව
දවන පූජාවක් ලෙස ඔප්පු කරන්න.”[7]
**3** ආබ්‍රහම් පාන්දරින්ම නැඟිට තම
බූරුවාව ගමනට සූදානම් කළේය.
පසුව ඔහුගේ සේවකයන් දෙදෙනෙකු
හා ඊසාක් සමඟ ඔහු පිටත් වුණේය.[8]
ඔහු දවන පූජාව සඳහා දර පළාගෙන,
සැබෑ දෙවි ඔහුට යන්න කියූ ස්ථා-
නය වෙත ගමන් කළේය. **4** ඔහුගේ
ගමනේ තුන්වන දවසේදී දුර සිටම
ඔහු එම ස්ථානය දුටුවේය. **5** එවිට
ආබ්‍රහම් තම සේවකයන්ට[9] මෙසේ
කීවේය. “ඔබ බූරුවා සමඟ මෙතන
ඉන්න. මම දරුවාත් සමඟ එතැනට
ගිහින් නමස්කාර[10] කර එන්නම්.”
**6** ආබ්‍රහම් දවන පූජාව සඳහා
ගෙන ආ දර තම පුත් ඊසාක්ට දුන්-
නේය.[11] ඔහු පිහියක්ද ගිනි පන්දමක්ද
තමාගේ අතට ගත් පසු ඔවුහු දෙ-
දෙනාම ඒ ස්ථානය බලා පිටත්ව
ගියෝය.[12] **7** එවිට ඊසාක් තම පියා
වන ආබ්‍රහම්ට, “තාත්තේ”[13] කියා
හඬගැසුවේය. ආබ්‍රහම්ද, “ඇයි මගේ
පුතේ”[14] යයි ඇසුවේය. එවිට ඊසාක්
මෙසේ පැවසීය. “දවන පූජාව සඳහා
ගින්දරයි දරයි තියෙනවා. ඒත් බැට-
ළුවෙක් නැහැ!”[15] **8** එවිට ආබ්‍රහම්
මෙසේ කීවේය. “මගේ පුතේ, දවන
පූජාවට අවශ්‍ය බැටළුවා දෙවිම සප-
යයි.”[16] ඒ දෙදෙනා දිගටම ඇවිදගෙන
ගියෝය.

**9** බොහෝ වේලාවක් ගත වූ පසු
ඔවුහු සැබෑ දෙවි කියූ ස්ථානයට
පැමිණියහ. ආබ්‍රහම් එතැනදී පූජාස-
නයක්[1] ගොඩනඟා ඒ මත දර ගොඩ-
ගැසුවේය. ඉන් අනතුරුව ඔහු තම
පුත් ඊසාක්ගේ අත පය බැඳ පූජාසනය
උඩ තබා තිබූ දර මත ඔහුව තැබු-
වේය.[2] **10** ඉන්පසු තම පුත්‍රයාව
මරන්න[3] ආබ්‍රහම් පිහිය අතට ගත්-
තේය. **11** එවිට යෙහෝවා දෙවිගේ
දූතයා ස්වර්ගයේ සිට ඔහුට හඬගසා,[4]
“ආබ්‍රහම්! ආබ්‍රහම්” යයි කීවේය. ඔහුද,
“ඔබ මට කතා කළේ ඇයි ස්වාමීනි”
යයි ඇසුවේය. **12** එවිට දේවදූතයා
දෙවි වෙනුවෙන් කතා කරමින් මෙසේ
කීය. “දරුවාට අත තියන්න එපා.
ඔහුට කිසි අනතුරක් කරන්න එපා.[5]
මන්ද ඔබ ඔබේ පුත්‍රයාව, ඔබේ එකම
පුත්‍රයාව පවා මට දෙන්න පසුබට
නොවූ නිසා ඔබට මා කෙරෙහි ගරු-
බියක් ඇති බව මම දැන් දනිමි.”[6]
**13** එවිට ආබ්‍රහම් වට පිට බැලූ විට
ඔහුට නුදුරින් බැටළුවෙක් සිටිනවා
ඔහු දුටුවේය. උගේ අං පඳුරක පැටලී
තිබිණ. ආබ්‍රහම් ඒ බැටළුවාව රැගෙන
තම පුත්‍රයා වෙනුවට ඌව දවන පූජා-
වක් ලෙස ඔප්පු කළේය.[7] **14** ආබ්‍ර-
හම් ඒ ස්ථානයට යෙහෝවා-යයිරෙ*
යන නම තැබීය. “යෙහෝවා දෙ-
විට අයිති කන්දේදී සපයනු ලැබේ”[8]
යනුවෙන් කියමනක් තිබෙන්නේ ඒ
නිසාය.
**15** යෙහෝවා දෙවිගේ දූතයා
දෙවන වරටත් ස්වර්ගයේ සිට ආබ්‍ර-
හම්ට හඬගසා, **16** මෙසේ කීවේය.
“යෙහෝවා දෙවි ඔබට පවසන දේ මෙ-
යයි. ‘ඔබේ පුත්‍රයාව, ඔබේ එකම පුත්‍ර-
යාව පවා[9] ඔබ මට දෙන්න පසුබට
නොවූ නිසා මම මගේම නාමයෙන්
මෙසේ දිවුරන්නෙමි.[10] **17** මම ඔබට
අනිවාර්යයෙන්ම ආශීර්වාද කරන්-
නෙමි. මම ඔබෙන් පැවතෙන්නන්ව
අහසේ තාරකා මෙන්ද මුහුදු වෙර-
ළේ වැලි මෙන්ද බොහෝ සෙයින්

**21 පරි.**
1 උත් 12:8
උත් 26:25
2 හෙබ්‍රෙ 11:9

**22 පරි.**
3 යෝබ් 1:12
හෙබ්‍රෙ 4:15
හෙබ්‍රෙ 5:8
1පේත්‍රු 1:7
4 හිතෝ 4:3
හිතෝ 8:30
යොහ 3:16
යොහ 10:17
5 උත් 17:19
යොෂු 24:3
රෝම 9:7
6 2ලේක 3:1
7 ද්වි 12:14
8 උත් 26:5
ගීතා 119:60
9 උත් 12:16
10 ගීතා 95:6
මතෙ 4:10
11 යොහ 19:17
12 යෙසා 53:7
1පේත්‍රු 2:23
13 මතෙ 26:39
රෝම 8:15
14 යෙසා 58:9
යොහ 8:29
15 නික් 12:5
රෝම 8:36
16 යොහ 1:29
එෆී 5:2
හෙබ්‍රෙ 10:5
1පේත්‍රු 1:19

**2 තීරුව**
1 උත් 12:7
නික් 20:25
හෙබ්‍රෙ 13:10
2 මතෙ 27:2
යොහ 10:18
ක්‍රියා 8:32
පිලි 2:8
3 මතෙ 10:37
රෝම 8:32
හෙබ්‍රෙ 2:18
හෙබ්‍රෙ 11:17
යාකො 2:21
4 ගීතා 34:7
ගීතා 91:11
මතෙ 17:5
5 ගීතා 34:20
යොහ 19:36
6 උත් 26:5
හෙබ්‍රෙ 11:19
යාකො 2:21
1යොහ 4:10
1යොහ 5:3
7 ලෙවී 16:3
8 උත් 22:2
2ලේක 3:1
යෙසා 25:6
9 යොහ 3:16
රෝම 8:32
හෙබ්‍රෙ 11:17
10 ගීතා 105:9
යෙසා 45:23
හෙබ්‍රෙ 6:13

උත් **21:33*** උත් 12:8හි පාදසටහන බලන්න.

උත් **22:14*** තේරුම, “යෙහෝවා දෙවි සපයයි.”

වැඩි කරන්නෙමි.[1] ඔබෙන් පැවත
එන තැනැත්තා* ඔහුගේ සතුරන්ගේ
නුවර# අයිති කරගන්නේය.[2]
**18** ඔබ මගේ හඬට සවන් දුන් නිසා
ඔබෙන් පැවත එන තැනැත්තා[3] මාර්-
ගයෙන් පොළොවේ සියලු ජාතීහු
ආශීර්වාද ලබාගන්නෝය.' "*[4]

**19** ඉන්පසු ආබ්‍රහම් ඔහුගේ
සේවකයන් වෙතට හැරී ගියේය.
ඔවුහු බෙයර්-ෂෙබා[5] වෙතට ගමන්
කළෝය. ආබ්‍රහම් බෙයර්-ෂෙබාහි
ජීවත් විය.

**20** ටික කලක් ගෙවුණු පසු ආබ්‍ර-
හම්ට මේ පුවත ආරංචි විය.
"ඔබේ සහෝදරයා වන නාහෝර්ට[6]
මිල්කාගෙන්[7] පුත්‍රයන් ලැබී ඇත.
**21** ඔහුගේ කුලුඳුල් පුත්‍රයාගේ නම
ඌෂ්ය. ඌෂ්ගේ සහෝදරයාගේ නම
බූෂ්ය.[8] ආරම්ගේ පියා වන කෙමු-
වෙල්, **22** කෙසෙද්, හෂෝ, පිල්දාෂ්,
යිද්ලෆ් සහ බෙතුයෙල්[9] යන අයද
නාහෝර්ගේ පුත්‍රයන්ය." **23** බෙතු-
යෙල් රෙබෙකාගේ[10] පියාය. මිල්කා,
නාහෝර්ට දාව ඒ පුත්‍රයන් අටදෙනාව
බිහි කළාය. නාහෝර් ආබ්‍රහම්ගේ
සහෝදරයාය. **24** නාහෝර්ට රෙ-
යුමා නම් වූ උපභාර්යාවක්ද සිටි-
යාය. ඇය තේබා, ගහම්, තහෂ් සහ
මයකා[11] යන අයව බිහි කළාය.

**23** සාරා අවුරුදු එකසිය විසි-
හතක් ජීවත් වී මිය ගියාය.[12]
**2** කානාන්[13] දේශයේ හෙබ්‍රොන්[14] ලෙ-
සත් හැඳින්වෙන කිර්යත්-අර්බා[15] නම්
නුවරේදී ඇය මිය ගියාය. මිය ගිය
සාරා ළඟට ගොස් ආබ්‍රහම් හඬා වැල-
පුණේය. **3** ඉන්පසු ආබ්‍රහම් තම
බිරිඳගේ මළ සිරුර තිබූ තැනින්
නැඟිට හෙත්ගේ[16] පුත්‍රයන් වෙතට
ගොස් මෙසේ කීවේය. **4** "මම ඔබ
අතරේ ජීවත් වන විදේශිකයෙක්.[17]
මගේ බිරිඳගේ මළ සිරුර තැන්පත්
කරන්න සොහොන් බිමක් මට මිලට
දෙන්න."[1] **5** එවිට හෙත්ගේ පුත්‍ර-
යෝ ආබ්‍රහම්ට උත්තර දෙමින් මෙසේ
කීවෝය. **6** "මාගේ ස්වාමීනි,[2] ඔබ
අපි අතරේ දෙවි පත් කළ අධිපතියෙක්
වගේ.[3] ඔබේ බිරිඳගේ මළ සිරුර
තැන්පත් කරන්න අපේ සොහොන්
බිම්වලින් හොඳම එක තෝරාගන්න.[4]
ඔබ ඕනෑම සොහොන් බිමක් ඉල්-
ලන්න. අපි ඔබට එය නොදී ඉන්නේ
නැහැ."[5]

**7** එවිට ආබ්‍රහම් නැඟිට දේශයේ
වැසියන් වන හෙත්ගේ[6] පුත්‍රයන් ඉදි-
රියේ හිස නමා,[7] **8** ඔවුන්ට මෙසේ
කීවේය. "මගේ බිරිඳගේ මළ සිරුර
මේ ප්‍රදේශයේ තැන්පත් කරනවාට
ඔබ කැමති නම් ෂෝහර්ගේ පුත්
එෆ්‍රොන්ගෙන්[8] මේ ඉල්ලීම කරන්න.
**9** එෆ්‍රොන්ගේ ඉඩම කෙළවරේ
තිබෙන මක්පේලාහි[9] ගුහාව ඔහුගෙන්
ඉල්ලා දෙන්න. මම ඔබ සියලුදෙනා
ඉදිරියේ ඒ සොහොන් බිමේ වටිනාක-
මට සරිලන රිදී ප්‍රමාණය දී ඔහුගෙන්
එය මිල දී ගන්නම්."[10]

**10** ඒ අවස්ථාවේදී එෆ්‍රොන්ද
හෙත්ගේ පුත්‍රයන් සමඟ හිඳගෙන
සිටියේය. එබැවින් හිත්තීවරයෙකු
වූ එෆ්‍රොන්,[11] හෙත්ගේ පුත්‍රයන්ට
හා නුවර දොරටුවෙන් ඇතුළු වන
සියල්ලන්ට ඇසෙන සේ ආබ්‍රහම්ට
මෙසේ කීවේය.[12] **11** "මාගේ ස්වා-
මීනි, ගුහාවත් සමඟ ඒ මුළු ඉඩමම
මම ඔබට දෙන්නම්. මෙතැන රැස්ව
සිටින මගේ නෑදෑයන් ඉදිරියේ මම
එය ඔබට දෙන්නම්.[13] ඔබේ බිරිඳගේ
මළ සිරුර එහි තැන්පත් කරන්න."
**12** එවිට ආබ්‍රහම් දේශයේ වැසියන්
ඉදිරියේ හිස නමා, **13** ඔවුන් සියලු-
දෙනාට ඇසෙන සේ එෆ්‍රොන්ට මෙසේ
කීවේය. "මා කියන දේ අහන්න! ඉඩ-
මේ වටිනාකමට සරිලන රිදී ප්‍රමාණය
මම ඔබට දෙන්නම්. ඒක ගන්න.[14]
එවිට මගේ බිරිඳගේ මළ සිරුර එහි
තැන්පත් කරන්න මට පුළුවන්."

**14** එවිට එෆ්‍රොන් ආබ්‍රහම්ට මෙසේ
උත්තර දුන්නේය. **15** "මාගේ ස්වා-

**22 පරි.**
1 උත් 13:16; උත් 15:5; ක්‍රියා 3:25; ගලා 3:29; හෙබ්‍රෙ 6:14
2 2සාමු 11:23; ගීතා 2:8; අනි 2:44; හෙබ්‍රෙ 2:14; එළි 11:15
3 උත් 3:15; රෝම 9:7; ගලා 3:16
4 සෙක 8:23; ගලා 3:8
5 උත් 21:31
6 උත් 11:26
7 උත් 11:29
8 යෝබ් 32:2
9 උත් 25:20
10 උත් 24:15; රෝම 9:10
11 2සාමු 10:6

**23 පරි.**
12 උත් 17:17
13 උත් 12:5; ගීතා 105:11
14 උත් 35:27; ගණන් 13:22
15 යොෂු 14:15
16 උත් 10:15; උත් 23:20
17 උත් 17:8; හෙබ්‍රෙ 11:9

**2 තීරුව**
1 උත් 49:30; ක්‍රියා 7:5
2 උත් 43:20
3 උත් 21:22
4 යෙසා 53:9; යොහ 19:41
5 යොෂු 24:32
6 1ලේක 1:13
7 1පේත 2:17
8 උත් 25:9
9 උත් 49:30
10 උත් 23:15
11 උත් 50:13
12 උත් 34:20; ද්වි 16:18; රූත් 4:1
13 ද්වි 19:15; රූත් 4:4
14 උත් 14:23; රෝම 13:8

---

උත් **22:17*** උත් 3:15හි පාදසටහන බලන්න. **17#** මූ.අ., "දොරටුව." **18*** උත් 12:3හි පාදසටහන බලන්න.

මීනි, මේ අහන්න. ඉඩමේ වටිනාකම
රිදී ෂෙකෙල්* හාරසියයක්. එය අප
දෙදෙනාට එතරම් මුදලක් නොවෙයි.
ඔබ ගොස් ඔබේ බිරිඳගේ මළ සිරුර
එහි තැන්පත් කරන්න.”[1] **16** ආබ්‍ර-
හම් එෆ්‍රොන් කියූ දේට එකඟ විය.
ඉන්පසු ඔහු හෙත්ගේ පුත්‍රයන් ඉදිරි-
යේ සඳහන් කළ රිදී ප්‍රමාණය කිරා
එෆ්‍රොන්ට දුන්නේය. සම්මත බරට
අනුව සෑදූ රිදී ෂෙකෙල් හාරසියයක්
ආබ්‍රහම් කිරා දුන්නේය.[2] **17** මෙ-
ලෙස, මම්රේට ඉදිරියෙන් පිහිටි මක්-
පේලාහි තිබූ එෆ්‍රොන්ගේ ඉඩම, එහි
තිබූ ගුහාව සහ ඉඩමේ සියලු මායිම්-
වලට ඇතුළතින් තිබූ ගස්[3] ආබ්‍රහම්ට
අයිති බව ස්ථිර කරනු ලැබීය.[4]
**18** හෙත්ගේ පුත්‍රයන්ටත් නුවර දොර-
ටුව ළඟ සිටි සියලුදෙනාටත් පෙ-
නෙන සේ ආබ්‍රහම් එම ඉඩම මිල
දී ගත්තේය.[5] **19** ඉන්පසුව ආබ්‍රහම්,
කානාන් දේශයේ හෙබ්‍රොන්හි එනම්,
මම්රේට ඉදිරියෙන් පිහිටි මක්පේලා
නම් ඉඩමේ තිබූ ගුහාව තුළ තම
බිරිඳ වූ සාරාව තැන්පත් කළේය.[6]
**20** මෙසේ, සොහොන් බිමක් ලෙස
භාවිත කිරීමට ගත් ඉඩමද එහි තිබූ
ගුහාවද ආබ්‍රහම්ට අයිති බව හෙත්ගේ
පුත්‍රයන් විසින් ස්ථිර කරනු ලැබීය.[7]

**24** ආබ්‍රහම් බොහෝ වයස්-
ගතව සිටියේය. යෙහෝවා
දෙවි ඔහුට සෑම අතින්ම ආශීර්වාද
කර තිබිණ.[8] **2** එබැවින් ආබ්‍රහම්
තම නිවසේ සිටි සේවකයන් අතරින්
තමන් සතු සියල්ල භාරව සිටි වයසින්
වැඩිම සේවකයාට කතා කර මෙසේ
කීවේය.[9] “ඔබේ අත මගේ කළවයට
යටින් තබන්න[10] කියා මම කාරුණි-
කව ඉල්ලනවා. **3** කානානිවරුන්ට
අයිති මේ දේශයේ දූවරුන් අතරින්
මගේ පුතාට බිරිඳක් ගන්නේ නැති
බව[11] ස්වර්ගයෙත් පොළොවෙත් දෙවි
වන යෙහෝවාගේ නාමයෙන් මට
දිවුරා පොරොන්දු වෙන්න.[12] **4** ඔබ
මගේ දේශයේ ජීවත් වන මගේ නෑදෑ-
යන්[1] ළඟට ගිහින් මගේ පුත් ඊසාක්ට
බිරිඳක් සොයන්න.”

**5** එහෙත් සේවකයා ඔහුගෙන්
මෙසේ ඇසීය. “ඒ ස්ත්‍රිය මා සමඟ මේ
දේශයට එන්න අකමැති වුණොත් මම
මොනවාද කරන්නේ? ඔබ අත්හැර
ආ දේශයටම නැවතත් ඔබේ පුතාව
ගෙනි යන්නද?”[2] **6** ආබ්‍රහම් ඔහුට
මෙසේ උත්තර දුන්නේය. “නැහැ,
මොනම හේතුවක් හින්දාවත් මගේ
පුතාව ඒ දේශයට ගෙනි යන්න එපා.[3]
**7** ස්වර්ගයේ දෙවි වන යෙහෝවා
මගේ පියාගේ නිවසින් හා මගේ නෑදෑ-
යන්ගේ දේශයෙන් මාව පිටතට ගෙ-
නැවිත්,[4] ‘ඔබෙන් පැවතෙන[5] අයට
මම මේ දේශය දෙනවා’[6] කියා මට
දිවුරා පොරොන්දු වුණා.[7] ඒ නිසා
දෙවි ඔහුගේ දූතයාව ඔබට ඉදිරියෙන්
යවයි.[8] ඔබ අනිවාර්යයෙන්ම මගේ
පුතාට ඒ දේශයෙන්[9] බිරිඳක් සොයා-
ගනියි. **8** නමුත් ඒ ස්ත්‍රිය ඔබ සමඟ
එන්න අකමැති වුණොත් ඔබ මට දුන්
මේ දිවුරුමෙන් නිදහස් වෙනවා.[10]
නමුත් මගේ පුතාව ඒ දේශයට නම්
ගෙනි යන්න එපා.” **9** එවිට සේව-
කයා තම ස්වාමියා වූ ආබ්‍රහම්ගේ
කළවයට යටින් අත තබා ඔහු-
ගේ ඉල්ලීම ඉටු කරන බවට දිවුරා
පොරොන්දු වූවේය.[11]

**10** ඉන්පසු සේවකයා තම ස්වා-
මියාට අයිතිව තිබූ වටිනා දේව-
ලින් තෑගි රැගෙන තම ස්වාමියාගේ
ඔටුවන් දසදෙනෙකු සමඟ[12] මෙස-
පොතේමියාවේ නාහෝර් නුවර බලා
පිටත් විය. **11** ඔහු එම නුවරින්
පිටත තිබූ ළිඳක් අසලට පැමිණ
ඔටුවන්ට එතැන ගිමන් හරින්න
සැලැස්වූවේය.[13] ඒ වන විට සවස් වී
තිබිණ. ස්ත්‍රීන් සාමාන්‍යයෙන් වතුර
අදින පිණිස නුවරින් පිටතට ආවේ
ඒ වේලාවේදීය.[14] **12** සේවකයා ඒ
මොහොතේ මෙසේ යාච්ඤා කළේය.
“යෙහෝවා දෙවියනි, මගේ ස්වාමියා
වන ආබ්‍රහම්ගේ දෙවි ඔබයි.[15] ඒ
නිසා මගේ මේ ඉල්ලීම ඉටු කර

**23 පරි.**
**1** 2සාමු 2:5
**2** එස්රා 8:25
ක්‍රියා 7:16
**3** උත් 25:9
උත් 49:30
**4** රූත් 4:11
යෙරෙ 32:44
**5** යෝබ් 29:7
යෙරෙ 32:12
**6** උත් 25:10
උත් 50:13
**7** උත් 49:31
ක්‍රියා 7:5

**24 පරි.**
**8** උත් 13:2
ගලා 3:9
**9** උත් 15:2
උත් 41:40
1කොරි 4:2
**10** උත් 47:29
**11** උත් 28:1
ද්වි 7:3
1කොරි 7:39
2කොරි 6:14
**12** උත් 21:23

**2 තීරුව**
**1** උත් 22:20
**2** උත් 11:28
උත් 15:7
**3** හෙබ්‍රෙ 11:15
**4** උත් 12:1
හෙබ්‍රෙ 11:8
**5** උත් 26:4
ක්‍රියා 7:5
හෙබ්‍රෙ 11:18
**6** උත් 13:15
නික් 32:13
ද්වි 34:4
**7** මීකා 7:20
ලූක් 1:73
හෙබ්‍රෙ 6:13
**8** නික් 23:20
ගීතා 34:7
හෙබ්‍රෙ 1:14
**9** උත් 12:5
ක්‍රියා 7:4
**10** යොෂු 2:17
**11** උත් 24:2
උත් 47:29
**12** උත් 24:35
උත් 43:11
**13** හිතෝ 12:10
**14** නික් 2:16
1සාමු 9:11
යොහ 4:7
**15** උත් 32:9
1රාජා 18:36
මතෙ 22:32

උත් **23:15*** ෂෙකෙලයක් යනු ග්‍රෑම් 11.4කි.

මගේ ස්වාමියාට ඔබ බොහෝ සෙයින්
ප්‍රේම*[1] කරන බව අද ඔප්පු කර පෙන්-
වන්න කියා මම ඔබෙන් ඉතා බැගෑ-
පත්ව ඉල්ලනවා.[2] **13** නුවරේ දූවරු
වතුර අදින්න නුවරින් පිටතට එනවා.
ඔවුන් දැන් මේ දිය උල්පත ළඟට
එයි.[3] **14** ‘ඔබේ කළය ඇල කර මට
වතුර ටිකක් බොන්න දෙන්න පුළු-
වන්ද’ කියා මම ඒ එක් තරුණියක-
ගෙන් අහන්නම්. ඇයද, ‘බොන්න.
මම ඔබේ ඔටුවන්ටත් වතුර ඇද දෙන්-
නම්’ කියා පැවසුවොත්, ඔබේ සේව-
කයා වන ඊසාක්ට ඔබ තෝරා දෙන
තැනැත්තිය ඇයයි.[4] ඔබ මේ විදිහට
වෙන්න සැලැස්සුවොත් මගේ ස්වාමි-
යාට ඔබ බොහෝ සෙයින් ප්‍රේම*
කරන බව මම දැනගන්නවා.”[5]
**15** ඔහු යාච්ඤා කර අවසන් වෙන්-
නත් කලින්[6] රෙබෙකා නම් තරුණිය
වතුර කළයක් උරහිස මත[7] තබා-
ගෙන නුවරින් පිටතට ආවාය. රෙබෙ-
කාගේ පියාගේ නම බෙතුයෙල්ය.[8]
බෙතුයෙල්, ආබ්‍රහම්ගේ සහෝදරයා වූ
නාහෝර්ගේ[9] සහ ඔහුගේ භාර්යාව
වන මිල්කාගේ[10] පුත්‍රයාය. **16** ඉතා
රූමත්[11] තරුණියක වූ රෙබෙකා
කන්‍යාවකි.[12] ඇය දිය උල්පත වෙ-
තට බැස ඇගේ කළයට වතුර
පුරවාගෙන නැවත උඩට ආවාය.
**17** සේවකයා ඇය වෙතට දුව ගොස්,
“ඔබේ කළයෙන් මට වතුර උගුරක්
දෙන්න පුළුවන්ද”[13] කියා ඇසුවේය.
**18** ඇයද, “බොන්න මගේ ස්වාමීනි”
යයි කියමින් විගස ඇගේ කළය
පහත් කර ඔහුට බොන්න දුන්නාය.[14]
**19** ඇය ඔහුට වතුර බොන්න දුන්
පසු, “ඔබේ ඔටුවන්ටත් ඇති වන
තුරු බොන්න මම වතුර ඇද දෙන්-
නම්” යයි කීවාය.[15] **20** එසේ කිය-
මින් ඇය ඉක්මනට දිය ඔරුවට වතුර
වත් කර නැවත ළිඳ ළඟට දිව ගියාය.
ඇය නැවත නැවතත් එසේ දිව ගොස්
වතුර ඇද ඔහුගේ සියලු ඔටුවන්ට
බොන්න දුන්නාය.[1] **21** ඒ අතර-
තුරේදී සේවකයා විස්මයට පත්ව
ඇය දෙස බලාගෙන සිටියේය. යෙ-
හෝවා දෙවි ඔහුගේ ගමන සාර්ථක
කළාද නැද්ද කියා දැනගන්නා පිණිස
ඔහු නිහඬව සිටියේය.[2]
**22** ඔටුවන් වතුර බී අවසන් වූ පසු
ඒ මිනිසා ඇගේ නාසයට දමන පිණිස
ෂෙකෙල් භාගයක් බරැති රන් ආභර-
ණයක්ද[3] ඇගේ අත්වලට දමන පිණිස
ෂෙකෙල් දහයක් බරැති රන් වළලු[4]
දෙකක්ද අතට ගෙන, **23** මෙසේ
ඇසුවේය. “ඔබේ පියා කවුද? අපිට
අද රෑ ඉන්න ඔබේ පියාගේ ගෙ-
දර ඉඩ තියෙනවාද?”[5] **24** එවිට
ඇය මෙසේ කීවාය. “මම මිල්කා-
ගෙයි නාහෝර්ගෙයි[6] පුතා වන බෙතු-
යෙල්ගේ දුව.[7] **25** අපි ළඟ සතුන්ට
දෙන්න ඇති තරම් කෑම තියෙ-
නවා. පිදුරුත් තියෙනවා. රෑට නවා-
තැන් ගන්න තැනකුත් තියෙනවා.”[8]
**26** එවිට ඒ මිනිසා යෙහෝවා දෙවි
ඉදිරියේ දණින් වැටී,[9] **27** මෙසේ
කීවේය. “යෙහෝවා දෙවියනි, මගේ
ස්වාමියා වන ආබ්‍රහම්ගේ දෙවි වන
ඔබට ප්‍රශංසා වේවා![10] ඔබ නිතරම
මගේ ස්වාමියා සමඟ ඉතා ප්‍රේමණී-
යව* හා විශ්වාසවන්තව කටයුතු
කරනවා. යෙහෝවා දෙවියනි, මගේ
ස්වාමියාගේ සහෝදරයන්ගේ නිවස-
ටම යන්න ඔබ මට මඟ පෙන්නුවා.”[11]
**28** ඒ අතරතුරේදී තරුණිය ඇගේ
මවගේ නිවසට දුව ගොස් සිදු
වූ සියල්ල කීවාය. **29** රෙබෙකාට
ලාබන් නම් වූ සහෝදරයෙක් සිටි-
යේය.[12] ඔහු ඒ මිනිසාව හමු වන
පිණිස නුවර පිටත තිබූ දිය උල්පත
වෙතට දිව ගියේය. **30** තම සහෝ-
දරිය වන රෙබෙකාගේ අත්වල තිබූ
වළලු සහ නාසයේ තිබූ ආභරණය[13]
දුටු ලාබන් ඒ මිනිසා ගැන ඇය පැවසූ
වචන ඇසූ විගස ඔහුව හමු වීමට
පිටත් විය. එම මිනිසා දිය උල්පත
අසල ඔටුවන් ළඟ සිටගෙන සිටියේය.

---

උත් **24:12*** හෝ, “ලැදි ප්‍රේමය.” **14*** හෝ, “ලැදි ප්‍රේමය.”

උත් **24:27*** හෝ, “ලැදි ප්‍රේමය.”

---

**24 පරි.**

**1** 1සාමු 20:8, සෙක 7:9
**2** නෙහෙ 1:11, ගීතා 37:5, පිලි 4:6
**3** උත් 29:10
**4** හිතෝ 19:14
**5** විනි 6:17, විනි 18:5
**6** ගීතා 34:15, ගීතා 65:2, යෙසා 58:9, යෙසා 65:24, 1යොහ 5:14
**7** උත් 21:14
**8** උත් 22:23
**9** උත් 11:26
**10** උත් 11:29
**11** උත් 26:7
**12** අදි 22:20, 2කොරි 11:2
**13** යොහ 4:7
**14** මතෙ 10:42, මතෙ 25:35
**15** රෝම 12:13, 1පේත 4:9

**2 තීරුව**

**1** හිතෝ 31:17, හිතෝ 31:31
**2** ගීතා 107:43
**3** එස 16:12
**4** යෙරෙ 2:32, එස 16:11
**5** උත් 19:2, විනි 19:21
**6** උත් 11:29
**7** උත් 22:23
**8** උත් 18:4, උත් 19:3, උත් 43:24
**9** 1ලේක 29:20, නෙහෙ 8:6, ගීතා 95:6
**10** උත් 9:26, ගීතා 72:18, ලූක් 1:68
**11** ගීතා 100:5, මීකා 7:20
**12** උත් 25:20, උත් 29:10
**13** යෙසා 3:21, යෙරෙ 2:32, එස 16:11

**31** ලාබන් ඔහුට මෙසේ කීවේය. “යෙ-
හෝවා දෙවිගෙන් ආශීර්වාද ලැබූ
ඔබ[1] ඇයි මෙතැනට වෙලා ඉන්-
නේ? අපේ නිවසට එන්න. ඔබටයි
ඔබේ ඔටුවන්ටයි නවාතැන් ගන්න
තැනක් මම සූදානම් කර තිබෙනවා.”
**32** එවිට ඒ මිනිසා නිවස ඇතුළට
ගියේය. ඉන්පසු ලාබන් ඔටුවන්ව මුදා
උන්ට අවශ්‍ය කෑමද පිදුරුද දුන්නේය.
ඔහු ඒ මිනිසාගේ හා ඔහු සමඟ සිටි
අනික් මිනිසුන්ගේ පාද සේදීමට වතු-
රද දුන්නේය.[2] **33** ඉන්පසු ඔහුට
කෑම පිළිගන්වන ලදි. නමුත් ඒ
මිනිසා, “කෑමට පෙර මම පැමිණි
කාරණය ඔබට කියන්න ඕනේ” යයි
කීවේය. ලාබන්ද, “ඔබ පැමිණි කාර-
ණය කියන්න” යයි කීවේය.[3]
**34** එවිට ඔහු කාරණය දන්වමින්
මෙසේ පැවසුවේය. “මම ආබ්‍රහම්ගේ
සේවකයෙක්.[4] **35** යෙහෝවා දෙවි
මගේ ස්වාමියාට බොහෝ සෙයින්
ආශීර්වාද කර තිබෙනවා. මන්ද
දෙවි ඔහුට බැටළුවන්, ගවයන්, ඔටු-
වන්, බූරුවන්, රන් රිදී හා සේවක
සේවිකාවන් වැඩි වැඩියෙන් දී ඔහුව
හැම අතින්ම පොහොසත් කර තිබෙ-
නවා.[5] **36** මගේ ස්වාමියාගේ බිරිඳ
වූ සාරා ඇගේ මහලු වයසේදී ඔහුට
පුතෙක් බිහි කර දුන්නා.[6] ආබ්‍රහම්
ඔහුගේ මුළු දේපළ පවරන්නේ ඒ
පුතාටයි.[7] **37** මගේ ස්වාමියා ඔහු-
ගේ මේ ඉල්ලීම ඉටු කරන්න කියා මට
පොරොන්දු වෙන්න කිව්වා. ‘කානානි-
වරුන්ට අයිති මේ දේශයේ දූවරුන්
අතරින් මගේ පුතාට බිරිඳක් නො-
ගන යුතුයි.[8] **38** ඔබ මගේ පියාගේ
නිවසටත් මගේ නෑදෑයන්[9] වෙතටත්
ගොස් මගේ පුත්‍රයා වන ඊසාක්ට
බිරිඳක් සොයා දිය යුතුයි.’[10] **39** ඒ
අවස්ථාවේදී මම මගේ ස්වාමියාගෙන්
මෙසේ ඇසුවා. ‘ඒ ස්ත්‍රිය මා සමඟ
එන්න අකමැති වුණොත් මම මො-
නවාද කරන්නේ?’[11] **40** එවිට ඔහු
මට මෙසේ පැවසුවා. ‘මම යෙහෝවා
දෙවිගේ කැමැත්තට එකඟව ක්‍රියා
කරන නිසා[12] ඔහු තම දූතයාව[13] ඔබ
සමඟ එවා ඔබේ ගමන සැබවින්ම
සාර්ථක කරයි.[1] ඔබ මගේ නෑදෑයන්
අතරින්ද මගේ පියාගේ නිවසින්ද මගේ
පුත්‍රයාට බිරිඳක් සොයා දිය යුතුයි.[2]
**41** මගේ නෑදෑයන්ව හමු වූ පසු
මට දුන් දිවුරුමෙන් ඔබ නිදහස්.
ඔබට ඇයව භාර දෙන්න ඔවුන් අක-
මැති වුණොත් ඔබේ වගකීමෙන් ඔබ
නිදහස්.’[3]
**42** “මම අද දිය උල්පත ළඟට
පැමිණි විට මෙහෙම යාච්ඤා කළා.
‘යෙහෝවා දෙවියනි, මගේ ස්වාමියා
වන ආබ්‍රහම්ගේ දෙවි ඔබයි. ඔබ
මගේ ගමන සාර්ථක කරනවා නම්,[4]
**43** මේ දේ සිදු වෙන්න සලස්වන්න.
වතුර අදින්න නුවරින් පිටතට එන
තරුණියන්[5] දැන් මේ දිය උල්පත
ළඟට එයි. ඔවුන්ගෙන් එක් කෙනෙ-
කුට මම කතා කර, “ඔබේ කළයෙන්
මට වතුර ටිකක් බොන්න දෙන්න
පුළුවන්ද” කියා අහන්නම්. **44** ඇය,
“බොන්න. මම ඔබේ ඔටුවන්ටත්
වතුර ඇද දෙන්නම්” කියා පැවසු-
වොත් යෙහෝවා දෙවි වන ඔබ මගේ
ස්වාමියාගේ පුතාට තෝරා දෙන
බිරිඳ ඇයයි!’[6]
**45** “මම යාච්ඤා කර අවසන්
වෙන්නත් කලින්[7] පුදුම දෙයක්
වුණා. රෙබෙකා ඇගේ කළය උර-
හිස මත තියාගෙන නුවරින් පිටතට
ආවා. ඇය දිය උල්පත ළඟට ගොස්
වතුර අදින්න පටන්ගත්තා.[8] ‘මට
බොන්න වතුර ටිකක් දෙන්න පුළු-
වන්ද’[9] කියා මම ඇගෙන් ඇහුවා.
**46** ඇය එවෙලේම ඇගේ කළය පහත්
කර, ‘බොන්න.[10] ඔබේ ඔටුවන්-
ටත් මම වතුර ඇද දෙන්නම්’ කියා
මට කිව්වා. මම වතුර බිව්වාට
පස්සේ ඇය ඔටුවන්ටත් බොන්න
දුන්නා. **47** ඊටපස්සේ, ‘ඔබේ පියා
කවුද’[11] කියා මම ඇගෙන් ඇහුවා.
ඇයද, ‘මම මිල්කාගෙයි නාහෝර්-
ගෙයි පුතා වන බෙතුයෙල්ගේ දුව’
කියා උත්තර දුන්නා. ඊටපස්සේ,
මම ඇගේ නහයට ආභරණයකුත්
අත්වලට වළලු දෙකකුත් දැම්මා.[12]

**24 පරි.**
1 උත් 26:29, රූත් 3:10, ගීතා 115:15
2 විනි 19:21, ලූක් 7:44, 1තිමෝ 5:10
3 රෝම 12:11, එෆී 6:5
4 උත් 15:2
5 උත් 13:2, ගීතා 107:38
6 උත් 21:1, රෝම 4:19, හෙබ්‍රෙ 11:11
7 උත් 25:5
8 උත් 24:3, උත් 28:1, එස්රා 9:2, 1කොරි 7:39
9 උත් 22:20
10 උත් 24:4
11 උත් 24:5
12 උත් 48:15, 1රාජා 2:3, ගීතා 119:3, යෙසා 38:3, ක්‍රියා 9:31
13 නික් 23:20, හෙබ්‍රෙ 1:14

**2 තීරුව**
1 උත් 39:3, නෙහෙ 1:11, ගීතා 118:25
2 උත් 11:25
3 උත් 24:9, යොෂු 2:17
4 ගීතා 37:5
5 උත් 24:16
6 උත් 24:14, හිතෝ 18:22, හිතෝ 19:14
7 ගීතා 65:2, යෙසා 58:9, යෙසා 65:24, දානි 9:21
8 උත් 24:15
9 උත් 24:17
10 උත් 24:18
11 උත් 24:23
12 උත් 24:22, එස 16:11

**48** පසුව මම යෙහෝවා දෙවි ඉදිරියේ
දණින් වැටී ස්තුති කළා. මගේ ස්වා-
මියාගේ පුතාට ඔහුගේ සහෝදරයා-
ගේ දුවව තෝරාගන්න දෙවි මට මඟ
පෙන්නුවා.[1] ඒ නිසා මගේ ස්වාමියා
වන ආබ්‍රහම්ගේ දෙවි වන යෙහෝවාට
මම ප්‍රශංසා කළා.[2] **49** දැන් ඔබත්
මගේ ස්වාමියා සමඟ විශ්වාසවන්තව
කටයුතු කර ඔහුට කරුණාව* පෙන්-
වන්න[3] කැමතිද කියා මට කියන්න.
ඔබ දෙන පිළිතුරට අනුව මම කළ
යුතු දේ තීරණය කරන්නම්."[4]

**50** එවිට ලාබන්ද බෙතුයෙල්ද
මෙසේ උත්තර දුන්නෝය. "මේ දේ
සිදු වුණේ යෙහෝවා දෙවිගේ කැමැත්-
තට අනුවයි.[5] ඒ නිසා මේ ගැන
අපිට කිසිම දෙයක් කියන්න බැහැ.[6]
**51** රෙබෙකාව අපි ඔබට භාර දෙ-
නවා. යෙහෝවා දෙවි කියූ ආකාරය-
ටම ඔබේ ස්වාමියාගේ පුතා ළඟට
ඇයව ගෙන ගොස් ඔහුට විවාහ කර
දෙන්න."[7] **52** එම වචන ඇසූ විගස
ආබ්‍රහම්ගේ සේවකයා දණින් වැටී
යෙහෝවා දෙවිට ස්තුති කළේය.[8]
**53** ඉන්පසු ඔහු රන් භාණ්ඩද රිදී
භාණ්ඩද වස්ත්‍රද ගෙනැවිත් රෙබෙ-
කාට දුන්නේය. ඇගේ සහෝදරයා-
ටද මවටද ඔහු තෑගි දුන්නේය.[9]
**54** ඉන්පසු ඔහුද ඔහු සමඟ සිටි පිරි-
සද කා බී එහි රාත්‍රිය ගත කළෝය.
ඔවුහු පසුවදා උදෑසනින්ම අවදි වූහ.

"මගේ ස්වාමියා වෙතට නැවත
යන්න මට අවසර දෙන්න"[10]
යයි ආබ්‍රහම්ගේ සේවකයා කීවේය.
**55** එවිට රෙබෙකාගේ සහෝදරයාද
මවද මෙසේ කීවෝය. "ඇයට අප
සමඟ අඩුම තරමින් තව දවස් දහ-
යක්වත් ඉන්න දෙන්න. ඊටපස්සේ
ඇයට යන්න පුළුවන්." **56** නමුත්
ඔහු ඔවුන්ට මෙසේ කීවේය. "යෙ-
හෝවා දෙවි මගේ ගමනට ආශීර්වාද
කර තිබෙන නිසා මාව ප්‍රමාද කරන්න
එපා.[11] මගේ ස්වාමියා වෙතට යන්න
මට අවසර දෙන්න."[12] **57** එබැවින්
ඔවුහු මෙසේ කීවෝය. "අපි රෙබෙකාට
කතා කර ඇගෙන් මේ ගැන අහමු."[1]
**58** එවිට ඔවුහු රෙබෙකාව කැඳවා
ඇගෙන් මෙසේ ඇසුවෝය. "ඔබ මේ
මිනිසා සමඟ යන්න කැමතිද?" ඇයද,
"මම කැමතියි" කියා කීවාය.[2]

**59** එබැවින් ඔවුහු තම සහෝදරිය
වූ රෙබෙකාව,[3] ඇගේ කිරි මවද[4]
ආබ්‍රහම්ගේ සේවකයාද ඔහු සමඟ
සිටි පිරිසද සමඟ පිටත් කර යැව්-
වෝය. **60** ඔවුහු රෙබෙකාට ආශීර්-
වාද කරමින් මෙසේ කීවෝය. "අපේ
සහෝදරිය, ඔබ දහස් වර දසදහසක-
ගේ මව් වේවා! ඔබෙන් පැවතෙන්-
නෝ තම සතුරන්ගේ නුවර අයිති
කරගනිත්වා!"[5] **61** ඉන්පසු රෙබෙ-
කාද ඇගේ සේවිකාවෝද[6] ඔටුවන්
පිට නැඟ[7] සේවකයා පසුපස ගමන්
කළෝය. මෙසේ, සේවකයා රෙබෙ-
කාව ඇගේ නිවසෙන් රැගෙන ගියේය.

**62** නෙගෙබ්[8] පළාතේ ජීවත් වෙ-
මින් සිටි ඊසාක් බෙයර්-ලහයි-රොයි[9]
සිට ආවේය. **63** සවස් යාමේදී
ඊසාක් එළිමහනේ ඇවිද කල්පනා[10]
කරමින් සිටියේය. එවිට ඔහු දුර
ඈත සිට ඔටුවන් පැමිණෙනවා දුටු-
වේය. **64** රෙබෙකා ඊසාක්ව දුටු
විගස ඔටුවාගේ පිටෙන් බිමට බැස,
**65** "අපව හමු වෙන්න එන අර
තැනැත්තා කවුද" කියා සේවකයා-
ගෙන් ඇසුවාය. සේවකයාද, "ඒ මගේ
ස්වාමියා" යයි උත්තර දුන්-
නේය. එවිට ඇය සළුවෙන් තම හිස
වසාගත්තාය.[11] **66** සේවකයා තමා
කළ සියල්ල ඊසාක්ට පැවසුවේය.
**67** ඉන්පසු ඊසාක් රෙබෙකාව තම
භාර්යාව ලෙස භාරගෙන[12] ඔහුගේ මව
වූ සාරාගේ කූඩාරමට ඇයව රැගෙන
ගියේය.[13] ඔහු ඇය සමඟ ආදරයෙන්
බැඳුණේය.[14] ඉන්පසු තම මව නැති
දුක දරාගැනීමට ඊසාක්ට හැකි විය.[15]

**25** ආබ්‍රහම් කෙටූරා නම් වූ
ස්ත්‍රිය සමඟ විවාහ[16] විය.
**2** ඇය ඔහුට දාව සිම්රාන්, යොක්-
ෂාන්, මේදාන්, මිදියන්,[17] ඉෂ්බාක්
සහ ෂුවාහ්[18] යන පුත්‍රයන් බිහි කළාය.

**24 පරි.**
1 යෙසා 30:21 යෙසා 48:17
2 උත් 24:27 ලූක් 1:68
3 උත් 32:10 උත් 47:29 යොෂු 2:14
4 උත් 24:8
5 ගීතා 118:23 මාක් 12:11
6 උත් 31:24 යෙසා 46:10 ක්‍රියා 5:39
7 හිතෝ 18:22 හිතෝ 19:14
8 1ලේක 29:20 2ලේක 20:18
9 උත් 34:12
10 උත් 30:25 උත් 31:27
11 උත් 39:3 ගීතා 1:3 යෙසා 48:15
12 ගීතා 123:2 කොලො 3:22 1පේතෘ 2:18

**2 තීරුව**
1 යොහ 9:21
2 උත් 2:24 ගීතා 45:10
3 උත් 28:5
4 උත් 35:8
5 උත් 22:17 2සාමු 12:29
6 ගීතා 45:14
7 උත් 31:17 උත් 31:34
8 උත් 12:9 උත් 20:1 ගණන් 13:22 විනි 1:9 2සාමු 24:7 ඔබ 19
9 උත් 16:14 උත් 25:11
10 ගීතා 77:12 ගීතා 143:5
11 1කොරි 11:6
12 මතෙ 19:5
13 උත් 18:6 හෙබ්‍රෙ 11:9
14 උත් 26:8 එෆී 5:25
15 උත් 23:2 උත් 23:19

**25 පරි.**
16 රෝම 7:2
17 උත් 37:28 නික් 2:15 ගණන් 22:4 ගණන් 31:2 විනි 6:2
18 1ලේක 1:32 යෝබ් 2:11

උත් **24:49*** හෝ, "ළැදි ප්‍රේමය."

**3** යොක්ෂාන්ට ආව ෂෙබා[1] හා
දෙදාන්[2] බිහි වූහ.
දෙදාන්ගේ පුත්‍රයන් නම් අෂ්ෂු-
රිම්, ලෙටුෂිම් සහ ලෙයුම්මි යන
අයයි.*
**4** මිදියන්ගේ පුත්‍රයන් නම් ඒෆා,[3]
ඒෆෙර්, හනොක්, අබිදා සහ එල්-
දායා[4] යන අයයි.
මොවුන් සියල්ලෝම කෙටූරාගේ
පුත්‍රයෝය.
**5** ආබ්‍රහම් තමා සතු සියල්ල
ඊසාක්ට දුන්නේය.[5] **6** නමුත් ඔහු
තම උපභාර්යාවන්ගේ පුත්‍රයන්ට
තෑගි[6] දුන්නේය. ඔහු ජීවත්ව සිටියදීම
ඔවුන්ව තම පුත් ඊසාක්ගෙන් වෙන්
කර[7] නැගෙනහිර දේශයට[8] පිටත් කර
යැවීය. **7** ආබ්‍රහම් අවුරුදු එකසිය
හැත්තෑපහක් ජීවත් විය. **8** ඔහු මිය
යන තුරුම තෘප්තිමත් ජීවිතයක් ගත
කළේය. මිය ගිය පසු ඔහුගේ ආදිපිය-
වරුන් මෙන් ඔහුව තැන්පත් කරන
ලදි.[9] **9** ඔහුගේ පුත්‍රයෝ වූ ඊසාක්
සහ ඉෂ්මායෙල් මක්පේලාහි ගුහා-
වේ ඔහුව තැන්පත් කළෝය. එම
ගුහාව තිබුණේ මම්රේට ඉදිරියෙන්
පිහිටි හිත්තීවරයෙකු වූ ෂෝහර්ගේ
පුත් එෆ්‍රොන්ගේ ඉඩමේය.[10] **10** එය
හෙත්ගේ පුත්‍රයන්ගෙන් ආබ්‍රහම් මිල දී
ගත් ඉඩමකි. ආබ්‍රහම්වද ඔහුගේ භාර්-
යාව වූ සාරාවද තැන්පත් කරනු ලැබු-
වේ එම ඉඩමෙහිය.[11] **11** ආබ්‍රහම්
මිය ගිය පසුත් ඔහුගේ පුත් ඊසාක්ට
දෙවි දිගටම ආශීර්වාද කළේය.[12] ඒ
කාලයේදී ඊසාක් ජීවත් වෙමින් සිටියේ
බෙයර්-ලහයි-රොයි[13] අසල ප්‍රදේශ-
යකය.
**12** හාගර් නම් වූ සාරාගේ ඊජිප්තු
ජාතික සේවිකාව ආබ්‍රහම්ට ආව බිහි
කළ[14] පුත්‍රයා වන ඉෂ්මායෙල්ගේ[15]
පෙළපත් වාර්තාව මෙයයි.
**13** ඉෂ්මායෙල්ගේ පුත්‍රයන්ගේ
නම්ද ඒ ඒ නම්වලට අනුව පැවත ආ
පවුල්ද මෙසේ විය. ඉෂ්මායෙල්ගේ
කුලුඳුල් පුත්‍රයා නෙබායොත්ය.[1] ඔහු-
ගේ අනික් පුත්‍රයන් නම් කේදාර්,[2]
අද්බෙයෙල්, මිබ්සාම්,[3] **14** මිෂ්මා,
දූමා, මස්සා, **15** හදද්,[4] තේමා,[5]
යෙතූර්, නාෆිෂ් සහ කේදෙමා[6] යන
අයයි. **16** එක් එක් ගෝත්‍ර භාරව
සිටි අධිපතීන් දොළොස්දෙනෙකු වශ-
යෙන් කටයුතු කළ ඉෂ්මායෙල්ගේ
පුත්‍රයෝ ඔවුහුය.[7] ඔවුන් එක් එක්
කෙනාට අයිති වූ ජනපද හා කඳවු-
රුද[8] ඔවුන්ගේ නම්වලින් හඳුන්වන
ලදි. **17** ඉෂ්මායෙල් අවුරුදු එකසිය
තිස්හතක් ජීවත් වී මිය ගියේය. ඔහු-
වද තම ආදිපියවරුන් මෙන් තැන්පත්
කරන ලදි.[9] **18** ඔහුගෙන් පැවත
ආ සෙනඟ කූඩාරම් ගසාගෙන සිටි-
යේ ඔවුන්ගේ සහෝදරයන් අසලය.[10]
ඔවුහු හවිලා[11] සිට ඇසිරියාව දක්වා
විහිදෙන ප්‍රදේශයේ තැනින් තැන
කූඩාරම් ගසාගෙන සිටියෝය. හවිලා
තිබෙන්නේ ඊජිප්තුවට යාබදව පිහිටි
ෂූර්[12] නම් ප්‍රදේශය අසලය.
**19** ආබ්‍රහම්ගේ පුත් ඊසාක්ගේ
පෙළපත් වාර්තාව මෙයයි.[13]
ආබ්‍රහම් ඊසාක්ගේ පියා විය.
**20** පදන්-ආරම්හි සිරියානු ජාතික[14]
බෙතුයෙල්ගේ[15] දුව මෙන්ම සිරි-
යානු ජාතික ලාබන්ගේ සහෝදරිය වූ
රෙබෙකාව විවාහ කරගන්නා විට
ඊසාක්ට වයස අවුරුදු හතළිහක් විය.
**21** ඊසාක්ගේ බිරිඳ කලක් වඳව[16] සිටි
නිසා ඔහු ඉතා බැගෑපත්ව ඇය වෙනු-
වෙන් යෙහෝවා දෙවිගෙන් දිගින්
දිගටම අයැදීය.[17] ඔහු කළ ඉල්ලීම්-
වලට යෙහෝවා දෙවි සවන් දුන්
නිසා,[18] කල් යත්ම ඔහුගේ බිරිඳ වූ
රෙබෙකා ගැබ්ගත්තාය. **22** ඇගේ
කුසෙහි සිටි පුතුන් දෙදෙනා එකි-
නෙකා සමඟ පොරබදන්න[19] පටන්-
ගත් බැවින් ඇය මෙසේ කීවාය. "මේ
විදිහට දුක් විඳින්න වෙනවා නම්
ජීවත් වෙලා වැඩක් තියෙනවාද?"
ඉන්පසු ඇය ඒ ගැන යෙහෝවා දෙවි-
ගෙන් විමසුවාය.[20] **23** එවිට යෙ-
හෝවා දෙවි ඇයට මෙසේ කීවේය.

**25 පරි.**
1 1රාජා 10:1
2 යෙරෙ 25:23 එස 27:20
3 යෙසා 60:6
4 1ලේක 1:33
5 උත් 24:36 හිතෝ 13:22 හෙබ්‍රෙ 1:2
6 2ලේක 21:3
7 උත් 21:14 යොහ 8:35 ගලා 4:30
8 විනි 6:3
9 උත් 35:29 හිතෝ 9:11
10 උත් 23:9 උත් 49:30
11 උත් 23:19
12 උත් 17:19 උත් 26:13
13 උත් 16:14
14 ගලා 4:24
15 උත් 16:10

**2 තීරුව**
1 උත් 36:3 යෙසා 60:7
2 ගීතා 120:5 යෙරෙ 49:28 එස 27:21
3 1ලේක 1:29
4 1ලේක 1:30
5 යෝබ් 2:11 යෝබ් 6:19
6 1ලේක 1:31
7 උත් 17:20 ගීතා 117:1
8 1ලේක 6:54 නෙහෙ 8:16
9 උත් 25:8
10 උත් 16:12
11 උත් 2:11 1සාමු 15:7
12 උත් 16:7
13 උත් 22:2 මතෙ 1:2
14 ද්වි 26:5
15 උත් 22:23
16 1සාමු 1:5
17 ද්වි 4:29
18 2සාමු 21:14 2ලේක 33:13 ලූක් 1:13
19 රෝම 9:10
20 1සාමු 1:10

උත් **25:3*** හෙබ්‍රෙව් භාෂාවට අනුව මෙම නම්ව-
ලින් එම පුද්ගලයන්ගෙන් පැවත ආ සෙනඟවද
නියෝජනය කරනවා විය හැකියි.

“ඔබේ කුසේ[1] දරුවන් දෙදෙනෙක්
සිටින අතර ඔවුන්ගෙන් ජාතීන් දෙ-
කක් බිහි වනු ඇත.[2] ඔබේ කුසෙන්
බිහි වන ඒ ජාතීන් දෙක එකිනෙකා-
ගෙන් වෙන් වෙයි. එක් ජාතියක්
අනිකට වඩා බලවත් වනු ඇත.[3]
වැඩිමලා බාලයාට සේවය කරයි.”[4]

**24** ගැබිනි කාලය සම්පූර්ණ වූ විට
ඇගේ කුසෙන් නිවුන් දරුවෝ බිහි
වූහ.[5] **25** මුලින්ම බිහි වූ දරුවාව
පෙනුණේ ලොම්වලින් සෑදූ වස්ත්‍රයක්
ඇඳ සිටින්නාක් මෙනි.[6] මන්ද ඔහුගේ
ඇඟ පුරාම රත් පැහැයට හුරු රෝම
තිබිණ. එබැවින් ඔහුට ඒසව්*[7] යන
නම තබන ලදි. **26** ඔහුගේ සහෝ-
දරයා ඉපදෙන විට ඔහු ඒසව්ගේ
විලුඹ[8] අල්ලාගෙන සිටියේය. ඒ නිසා
ඔහුට යාකොබ්*[9] යන නම තබන
ලදි. රෙබෙකා ඔවුන්ව බිහි කළ විට
ඊසාක්ට වයස අවුරුදු හැටක් විය.

**27** දරුවෝ දෙදෙනා වැඩුණෝය.
ඒසව් නිතරම දඩයමේ ගිය දක්ෂ
දඩයක්කාරයෙක් විය.[10] එහෙත්
යාකොබ් ධර්මිෂ්ඨ මිනිසෙකි.[11]
ඔහු ජීවත් වූයේ කූඩාරම්වලය.[12]
**28** ඊසාක් ඒසව්ට ආදරය කළේය.
මන්ද ඒසව් ඊසාක්ට කන්න දඩ-
මස් ගෙනැවිත් දුන්නේය. නමුත් රෙ-
බෙකා ආදරය කළේ යාකොබ්ටය.[13]
**29** දවසක් යාකොබ් ධාන්‍ය ව්‍යංජන-
යක් පිසිමින් සිටියේය. එවිට දඩ-
යමේ ගොස් විඩාවට පත්ව සිටි
ඒසව් එතැනට ආවේය. **30** ඒසව්
යාකොබ්ට මෙසේ කීවේය. “ඔබ
පිසිමින් සිටින රතු පාට ව්‍යංජන-
යෙන් මට ටිකක් දෙනවාද? ඉක්-
මන් කරන්න, මට හරි මහන්සියි.
ඔය ව්‍යංජනයෙන් ටිකක් දෙන්න.”
ඔහුට ඒදොම්*[14] යන නම ලැබුණේ
මේ සිද්ධිය නිසාය. **31** ඒ අවස්-
ථාවේදී යාකොබ් ඒසව්ට මෙසේ
පැවසීය. “ඊට කලින් ඔබේ කුලුඳුල්-
කම මට විකුණන්න.”[15] **32** එවිට
ඒසව්, “මම බඩගින්නේ මැරෙන්න
යන වෙලාවේ මට මගේ කුලුඳුල්ක-
මෙන් ඇති ප්‍රයෝජනය කුමක්ද” යයි
කීවේය. **33** යාකොබ්ද, “මුලින්ම
ඔබේ කුලුඳුල්කම මට දෙනවා කියා
දිවුරා පොරොන්දු වෙන්න”[1] යයි
කීවේය. එබැවින් ඒසව් දිවුරමින්
කුලුඳුල් පුත්‍රයා වශයෙන් තමාට
හිමි වරප්‍රසාද යාකොබ්ට වික්කේය.[2]
**34** යාකොබ් ඒසව්ට රොටිද ධාන්‍ය
ව්‍යංජනයද දුන්නේය. ඔහු කා බී[3] අව-
සන් වූ පසු එතැනින් පිටත්ව ගියේය.
මෙසේ, ඒසව් තම කුලුඳුල්කම සුළු
කොට තැකුවේය.[4]

# 26

ආබ්‍රහම් ජීවත් වූ කාලයේදී
දේශයේ මුල්ම වරට ඇති වූ
සාගතයෙන්[5] පසුව තවත් සාගත-
යක් ඇති විය. එබැවින් ඊසාක් ගෙ-
රාර්හි සිටි පිලිස්තිවරුන්ගේ රජු වූ
අබිමෙලෙක් වෙත ගියේය.[6] **2** යෙ-
හෝවා දෙවි ඊසාක්ට කතා කර
මෙසේ කීවේය.[7] “ඊජිප්තුවට නොයා
මා ඔබට නියම කරන දේශයේ
කූඩාරම් ගසාගෙන ජීවත් වෙන්න.[8]
**3** ඔබ මේ දේශයේ විදේශිකයෙක්[9]
ලෙස ජීවත් වෙන්න. එවිට මම දිගටම
ඔබ සමඟ සිට ඔබට ආශීර්වාද
කරන්නෙමි. මම මේ මුළු දේශ-
යම ඔබටත් ඔබෙන් පැවත එන්-
නන්ටත්[10] දෙන්නෙමි. මම ඔබේ
පියා වන ආබ්‍රහම්ට දිවුරා පො-
රොන්දු[11] වූ ලෙසම කරන්නෙමි.
**4** මා ඔහුට දුන් පොරොන්දුව මෙයයි.
‘මම ඔබෙන් පැවතෙන්නන්ව අහ-
සේ තාරකා මෙන් බොහෝ සෙ-
යින් වැඩි කරන්නෙමි. මේ මුළු
දේශයම ඔබෙන් පැවත එන්නන්ට
දෙන්නෙමි.[12] ඔබෙන් පැවත එන
තැනැත්තා* මාර්ගයෙන් පොළොවේ
සියලු ජාතීහු ආශීර්වාද ලබාගන්-
නෝය.’#[13] **5** ආබ්‍රහම් මගේ හඬට
සවන් දෙමින් මා බලාපොරොත්තු වූ
ආකාරයටම මගේ ආඥාද පනත්ද

**උත් 25:25*** තේරුම, “රෝමවලින් වැසුණු.” **26*** තේරුම, “විලුඹ අල්ලාගත් නැත්නම් උදුරාගත්.” **30*** මූ.අ., “රතු.”

**උත් 26:4*** උත් 3:15හි පාදසටහන බලන්න. **4#** උත් 12:3හි පාදසටහන බලන්න.

**25 පරි.**
**1** ගීතා 139:15, දේශ 11:5
**2** උත් 36:31, ගණන් 20:14
**3** උත් 27:29, ද්වි 2:4
**4** 2සාමු 8:14, මලා 1:2, රෝම 9:12
**5** උත් 38:27
**6** උත් 27:11, 2රාජා 1:8, සෙක 13:4
**7** උත් 27:32, උත් 36:9, මලා 1:3
**8** හොෂෙ 12:3
**9** උත් 27:36, ක්‍රියා 7:14
**10** උත් 27:3
**11** ගීතා 37:37
**12** හෙබ්‍රෙ 11:9
**13** උත් 27:6, උත් 27:46
**14** උත් 36:1, ද්වි 2:4, මලා 1:4
**15** උත් 43:33, ද්වි 21:17, 1ලේක 5:1

**2 තීරුව**
**1** උත් 14:22, හෙබ්‍රෙ 6:16
**2** හෙබ්‍රෙ 12:16
**3** 1කොරි 15:32
**4** යෝබ් 21:15, යෝබ් 34:9

**26 පරි.**
**5** උත් 12:10
**6** උත් 26:26
**7** නික් 6:3, ගණන් 12:6, 1යොහ 4:12
**8** නික් 32:13
**9** උත් 20:1, හෙබ්‍රෙ 11:9
**10** උත් 12:7, උත් 15:18, රෝම 15:8, ගලා 4:28
**11** උත් 22:16, ගීතා 105:9, මීකා 7:20, හෙබ්‍රෙ 6:13
**12** උත් 15:5, ද්වි 34:4, හෙබ්‍රෙ 11:12
**13** උත් 12:3, උත් 22:18, ක්‍රියා 3:25, ගලා 3:8

නීතිද පැවැත්වූ නිසා,[1] මම ඒ පො-
රොන්දුව ඉටු කරන්නෙමි.” 6 එම-
නිසා ඊසාක් දිගටම ගෙරාර්හි ජීවත්
වුණේය.[2]
7 දේශයේ මිනිසුන් ඔහුගේ බිරිඳ
ගැන ඇසූ විට, “ඇය මගේ සහෝද-
රිය”[3] කියා ඔහු උත්තර දුන්නේය.
“ඇය මගේ බිරිඳ” කියා පැවසීමට ඔහු
භය විය. මන්ද ඔහුගේ බිරිඳ රූමත්
ස්ත්‍රියක වූ බැවින්,[4] “රෙබෙකා නිසා
මේ දේශයේ පුරුෂයන් මාව මරා
දමයි” කියා ඔහු සිතුවේය. 8 ඊසාක්
කාලයක් එම දේශයේ ජීවත් විය. එක්
දිනක් පිලිස්තිවරුන්ගේ රජු වූ අබිමෙ-
ලෙක් ජනේලයෙන් බැලූ විට ඊසාක්
තම බිරිඳ වූ රෙබෙකාව සෙනෙ-
හසින් වැලඳගන්නා ආකාරය දුටු-
වේය.[5] 9 ඔහු විගස ඊසාක්ව කැඳවා
මෙසේ ඇසුවේය. “රෙබෙකා ඔබේ
බිරිඳ නොවේද? ‘ඇය මගේ සහෝද-
රිය’ කියා ඔබ පැවසුවේ මන්ද?” එවිට
ඊසාක් ඔහුට මෙසේ පිළිතුරු දුන්-
නේය. “මම එහෙම කිව්වේ මට
භය හිතුණ නිසයි. මගේ බිරිඳව
ලබාගන්න සෙනඟ මාව මරා දමයි
කියා මම හිතුවා.”[6] 10 එවිට අබි-
මෙලෙක් ඔහුට මෙසේ කීවේය. “ඔබ
අපට කුමක්ද මේ කළේ?[7] ඔබ නිසා
අපේ අතින් බරපතළ පාපයක් සිදු
වෙන්න ඉඩ තිබුණා. මේ ගැන නොදැ-
නුවත්ව කවුරු හරි ඔබේ බිරිඳ සමඟ
සයනය කළා නම් කුමක්ද වෙන්-
නේ?”[8] 11 ඉන්පසු අබිමෙලෙක් තම
සෙනඟට මෙසේ අණ කළේය. “මේ
මිනිසාටවත් ඔහුගේ භාර්යාවටවත්
කවුරු හරි කෙනෙක් අත තැබුවොත්
ඔහුව මරා දමන්න!”
12 ඉන්පසු ඊසාක් ඒ දේශයේ
වගා කරන්න පටන්ගත්තේය.[9] යෙ-
හෝවා දෙවි ඔහුට දිගටම ආශීර්-
වාද කළ නිසා[10] ඒ අවුරුද්දේ ඔහු
වැපුරූ ප්‍රමාණය මෙන් සිය ගුණ-
යක්[11] අස්වැන්න නෙළාගත්තේය.
13 ඔහු ඉතා පොහොසත් වූ අතර දව-
සින් දවස ඔහුගේ ධනය වැඩි විය.[12]
ඔහු ශ්‍රේෂ්ඨයෙකු ලෙස ප්‍රසිද්ධ විය.
14 ඔහුට බැටළු රැළවල් සහ ගව
රැළවල් විශාල සංඛ්‍යාවක්ද මහත්
සේවක පිරිසක්ද සිටියෝය.[1] එබැවින්
පිලිස්තිවරු ඔහුට ඊර්ෂ්‍යා කරන්න
පටන්ගත්තෝය.[2]
15 ඊසාක්ගේ පියා වන ආබ්‍රහම්
ජීවත් වූ කාලයේදී ආබ්‍රහම්ගේ සේව-
කයන් විසින් ළිං කිහිපයක් හාරන
ලදි.[3] පිලිස්තිවරු ඒ සෑම ළිඳක්ම
වැලිවලින් පුරවා වසා දැමුවෝය.[4]
16 කලක් ගෙවුණු පසු, අබිමෙලෙක්
ඊසාක්ව කැඳවා මෙසේ කීවේය. “ඔබ
දැන් අපට වඩා ඉතා බලවත්.[5] ඒ
නිසා දැන් මේ ප්‍රදේශයෙන් යන්න.”
17 එබැවින් ඊසාක් එතැනින් පිටත්ව
ගෙරාර් නිම්නයට[6] ගොස් එහි කූඩා-
රම් ගසාගෙන ජීවත් විය. 18 ඊසාක්
තම පියා වන ආබ්‍රහම් ජීවත් වූ කාල-
යේදී හාරන ලද ළිං නැවත හැරුවේය.
මන්ද ආබ්‍රහම් මිය ගිය පසු පිලිස්තිව-
රුන් විසින් ඒවා වසා දමන ලදි.[7] ආබ්‍ර-
හම් ඒ සෑම ළිඳකටම නම්[8] තබා තිබූ
අතර ඊසාක්ද එම ළිං හැඳින්වූයේ එම
නම්වලිනි.
19 නිම්නයේ ළිං හාරමින් සිටි-
යදී ඊසාක්ගේ සේවකයන්ට පිරිසිදු
ජල උල්පතක් සම්බ විය. 20 එවිට
ගෙරාර්හි එඬේරු, “මේ වතුර අපේ”
යයි කියමින් ඊසාක්ගේ එඬේරුන්
සමඟ දබර කළෝය.[9] ඔවුන් එහිදී ඔහු
සමඟ වාද කළ නිසා ඔහු එම ළිඳට
ඒසෙක්* යන නම තැබීය. 21 ඉන්-
පසු ඔවුහු තවත් ළිඳක් හැරුවෝය. ඒ
ළිඳ නිසාත් ඔවුහු දබර කළෝය.
එබැවින් ඔහු එයට සිත්නා* යන
නම තැබීය. 22 පසුව ඔහු එතැනින්
වෙන තැනකට ගොස්[10] තවත් ළිඳක්
හැරුවේය. නමුත් ඒ ළිඳ ගැන ඔවුහු
වාද නොකළෝය. ඒ නිසා ඔහු එයට
රෙහොබොත්* යන නම තබමින්
මෙසේ කීවේය. “යෙහෝවා දෙවි දැන්
අපට බොහෝ ඉඩකඩද[11] දරුදැරි-
යන්ද[12] දී අපට ආශීර්වාද කළා.”

**26 පරි.**
1 උත් 17:23, හෙබ්‍රෙ 11:8, යාකො 2:21
2 උත් 26:17
3 උත් 12:13
4 උත් 24:16
5 උත් 24:67, හිතෝ 5:18, දේශ 9:9
6 උත් 20:11
7 උත් 12:18
8 උත් 20:9, උත් 39:9, හිතෝ 6:29, හෙබ්‍රෙ 13:4
9 උත් 8:22, යෙසා 55:10, 2කොරි 9:10
10 උත් 24:1, යෝබ් 42:12, ගීතා 3:8, ගීතා 67:6, හිතෝ 10:22, හෙබ්‍රෙ 6:7
11 1කොරි 3:6
12 උත් 24:35

**2 තීරුව**
1 උත් 12:16, යෝබ් 1:3
2 උත් 37:11, 1සාමු 18:9, හිතෝ 27:4, රෝම 1:29, තීත 3:3
3 උත් 21:30
4 හිතෝ 25:26
5 නික් 1:9, ගීතා 105:24
6 උත් 10:19, උත් 20:1
7 උත් 21:25
8 උත් 21:31
9 උත් 13:7
10 උත් 13:9, හිතෝ 17:14, රෝම 12:18
11 ලෙවී 26:9, ගීතා 18:19, ගීතා 118:5
12 උත් 17:6, උත් 28:3, එස 36:11

**උත් 26:20*** තේරුම, “දබරය.” **21*** තේරුම, “චෝදනාව.” **22*** තේරුම, “බොහෝ ඉඩකඩ ඇති තැන්.”

**23** පසුව ඔහු එතැනින් පිටත්ව
බෙයර්-ෂෙබා[1] වෙනට නැග්ගේය.
**24** ඒ රාත්‍රියේදී යෙහෝවා දෙවි ඔහුට
කතා කර මෙසේ කීවේය. “මා
ඔබේ පියා වන ආබ්‍රහම්ගේ දෙවිය.[2]
භය නොවන්න.[3] මන්ද මම ඔබ
සමඟ සිටිමි. මගේ සේවකයා වන
ආබ්‍රහම් නිසා මම ඔබට ආශීර්-
වාද කර ඔබෙන් පැවතෙන්නන්ව
බොහෝ සෙයින් වැඩි කරන්නෙමි.”[4]
**25** ඉන්පසු ඊසාක් එතැන පූජාසන-
යක් ගොඩනඟා යෙහෝවා දෙවිට
යාච්ඤා කළේය.*[5] ඔහු එතැන තම
කූඩාරම ගසාගත්[6] අතර ඔහුගේ සේ-
වකයෝ එතැන ළිඳක් හෑරුවෝය.

**26** පසුව අබිමෙලෙක් ගෙරාර් සිට
ඊසාක් සිටි තැනට පැමිණියේය.
අබිමෙලෙක්ගේ විශ්වාසවන්ත මිත්‍රයා
වූ අහුස්සත් සහ ඔහුගේ සේනා-
වේ ප්‍රධානියා වූ ෆීකොල්ද[7] ඔහු
සමඟ එතැනට ආවෝය. **27** එවිට
ඊසාක් ඔවුන්ට මෙසේ කීවේය. “ඔබ
මට වෛර කර මාව ඔබේ දේශ-
යෙන් පන්නා දැමුවා. ඇයි දැන් මාව
හමු වෙන්න ආවේ?”[8] **28** එවිට ඔවුහු
මෙසේ කීවෝය. “යෙහෝවා දෙවිගේ
ආශීර්වාද ඔබට තිබෙන බව[9] අපිට
පැහැදිලිව පෙනෙනවා. ඒ නිසා ඔබට
මෙහෙම කියන්න අපි තීරණය කළා.
‘අප සමඟ ගිවිසුමක් ඇති කරගන්න[10]
කියා ඔබෙන් කාරුණිකව ඉල්ල-
නවා. අපි ගිවිසුමක් ඇති කරගෙන
එහි කොන්දේසිවලට එකඟව ක්‍රියා
කරන්න එකිනෙකාට පොරොන්දු[11]
වෙමු. **29** අපි ඔබට සැලකුවේ යහ-
පත් විදිහටයි. ඔබට කිසි හානි-
යක් නොකර ඔබව සමාදානයෙන්[12]
පිටත් කර හැරියා. එබැවින් ඔබත්
අපට කිසි හානියක් කරන්නේ නැති
බවට පොරොන්දු වෙන්න. ඔබ යෙ-
හෝවා දෙවිගෙන් ආශීර්වාද ලත්[13]
තැනැත්තෙක් බව අපිට පැහැදිලියි.’ ”
**30** ඉන්පසු ඊසාක් ඔවුන්ට භෝජන-
යක් පිළියෙළ කළේය. ඔවුහුද කා බී[1]
තෘප්තිමත් වූහ. **31** පසුවදා උදෑ-
සන ඔවුහු පාන්දරින්ම නැඟිට එකි-
නෙකාට දිවුරුම් දුන්නෝය.[2] ඉන්පසු
ඊසාක් ඔවුන්ට යන්න හැරියේය. ඔවු-
හුද සමාදානයෙන් පිටත්ව ගියෝය.[3]

**32** එදිනම ඊසාක්ගේ සේවකයෝ
ඔහු වෙතට ඇවිත් තමන් හෑරූ ළිඳ[4]
ගැන මෙසේ පැවසුවෝය. “අපට වතුර
හම්බ වුණා!” **33** ඔහු එම ළිඳට
ෂීබා යන නම තැබීය. අද වන තුරු
එම නුවර බෙයර්-ෂෙබා[5] යන නමින්
හඳුන්වනු ලබන්නේ ඒ නිසාය.

**34** ඒසව්ගේ වයස අවුරුදු හතළි-
හක් විය. ඔහු හිත්තී ජාතික
බෙයේරිගේ දුව වූ යුදිත්වද හිත්තී
ජාතික[6] ඒලොන්ගේ දුව වූ බසෙ-
මත්වද විවාහ කරගත්තේය. **35** ඒ
ස්ත්‍රීන් දෙදෙනා නිසා ඊසාක්ට සහ
රෙබෙකාට ජීවිතය තිත්ත විය.[7]

**27** ඊසාක් මහලු වියේ පසු
විය. ඔහුගේ ඇස් නොපෙ-
නෙන තරමටම දුර්වල වී තිබිණ.[8]
දිනක් ඔහු තම වැඩිමල් පුත්‍රයා වන
ඒසව්ට, “මගේ පුතේ” කියා හඬගෑසු-
වේය.[9] ඒසව්ද, “ඇයි තාත්තේ” කියා
ඔහු ළඟට ගියේය. **2** ඊසාක් ඔහුට
මෙසේ කීවේය. “මේ අහන්න. මම දැන්
වයසට ගිහින්.[10] කවදා මැරෙයිද දන්-
නේ නැහැ.[11] **3** ඒ නිසා ඔබේ ඊතො-
පුවත් දුන්නත් රැගෙන දඩබිමට ගිහින්
දඩමස් ටිකක් ගේන්න.[12] **4** ඒ මස්
ටික මම ආස කරන විදිහට රසට
උයලා දෙන්න. මම එයින් කා සතුටු
වී මැරෙන්න කලින් ඔබට ආශීර්වාද[13]
කරන්නම්.”

**5** ඊසාක් තම පුත් ඒසව්ට කතා
කරමින් සිටියදී රෙබෙකා එය අසා-
ගෙන සිටියාය. පසුව ඒසව් තම
පියාට දඩමස් ගෙනෙන පිණිස දඩ-
බිමට ගියේය.[14] **6** එවිට රෙබෙකා
තම පුත් යාකොබ්ට[15] මෙසේ කීවාය.
“දැන් ටිකකට කලින් ඔබේ තාත්තා
ඔබේ සහෝදරයා වන ඒසව්ට කතා
කරනවා මට ඇහුණා. **7** ‘දඩමස්
ටිකක් ගෙනැවිත් මම ආස කරන විදි-

---

**26 පරි.**
**1** උත් 21:31
**2** උත් 17:1
උත් 28:13
නික් 3:6
මතෙ 22:32
ක්‍රියා 7:32
**3** උත් 15:1
ද්වි 31:8
ගීතා 27:1
හෙබ්‍රෙ 13:6
**4** උත් 17:19
ගීතා 105:9
ගලා 3:29
**5** උත් 12:8
රෝම 10:13
**6** උත් 4:20
හෙබ්‍රෙ 11:9
**7** උත් 21:32
**8** විනි 11:7
**9** උත් 21:22
උත් 39:5
යොෂු 3:7
සෙක 8:23
1කොරි 14:25
**10** උත් 21:27
උත් 31:44
**11** උත් 21:31
**12** හිතෝ 16:7
**13** උත් 12:2
උත් 22:17
ගීතා 115:15
යෙසා 61:9
මතෙ 25:34

**2 තීරුව**
**1** උත් 19:3
2රාජා 6:23
**2** උත් 14:22
උත් 21:23
1සාමු 20:17
**3** රෝම 12:18
හෙබ්‍රෙ 12:14
1පේතෘ 3:11
**4** උත් 26:18
**5** විනි 20:1
**6** උත් 36:2
ද්වි 7:3
**7** උත් 27:46
උත් 28:8

**27 පරි.**
**8** උත් 48:10
දේශ 12:3
**9** උත් 25:28
**10** යෙසා 46:4
**11** උත් 48:21
හිතෝ 27:1
දේශ 9:12
යාකො 4:14
**12** උත් 25:27
**13** උත් 48:9
උත් 49:28
හෙබ්‍රෙ 11:20
**14** උත් 27:30
**15** උත් 25:28

---

උත් **26:25*** මූ.අ., “යෙහෝවා දෙවිගේ නාමයට අයැදුවේය.”

හට ඒක රසට උයලා දෙන්න. මම
එයින් කා සතුටු වී මැරෙන්න කලින්
යෙහෝවා දෙවි ඉදිරියේ ඔබට ආශීර්-
වාද කරන්නම්'[1] කියා ඔහු ඒසව්ට
කිව්වා. **8** ඒ නිසා දැන් ඔබ මම
කියන විදිහට කරන්න.[2] **9** ගිහින්
රැළේ ඉන්න හොඳ එළු පැටවුන්
දෙන්නෙක්ව තෝරා මට ගෙනත්
දෙන්න. මම ඔබේ තාත්තා කන්න
ආස විදිහට ඒ මස් ටික රසට උයලා
දෙන්නම්. **10** ඔබ එය තාත්තාට
ගිහින් දෙන්න. ඔහු එයින් කා සතුටු වී
මැරෙන්න කලින් ඔබට ආශීර්වාද
කරයි."

**11** එවිට යාකොබ් තම මව වන
රෙබෙකාට මෙසේ කීවේය. "මගේ
සහෝදරයාගේ ඇඟ පුරාම රෝම
තියෙනවා. ඒත් මගේ ඇඟේ
එච්චර රෝම නැහැ.[3] **12** හදිස්සි-
යේවත් තාත්තා මාව අතගාලා[4] බැලු-
වොත් මම ඔහුව රවට්ටන්න හදනවා[5]
කියලා ඔහු හිතයි. එතකොට ඔහු මට
ආශීර්වාද කරනවා වෙනුවට මට ශාප
කරාවී."[6] **13** එවිට මව ඔහුට මෙසේ
කීවාය. "මගේ පුතේ, ඔබට කරන
ශාපය මා පිටට පැමිණේවා![7] ඔබ මම
කියන දේට සවන් දී[8] සතුන් දෙන්නාව
මට ගෙනත් දෙන්න." **14** එබැවින්
යාකොබ් උන්ව රැගෙන ඇවිත් ඔහුගේ
මවට දුන්නේය. ඇයද ඊසාක් ආස
කරන විදිහට එය රසට පිසුවාය.
**15** ඉන්පසු රෙබෙකා ඇගේ වැඩිමල්
පුත්[9] ඒසව්ගේ වස්ත්‍ර ගෙන ඇගේ බාල
පුත්[10] යාකොබ්ට ඇන්දුවාය. ඇය
ඔහුට ඇන්දුවේ ගෙයි තිබූ ඒසව්ගේ
හොඳම වස්ත්‍රයි.[11] **16** ඔහුගේ අත්
දෙක හා බෙල්ලේ රෝම නැති තැන්
ඇය එළු පැටවුන්ගේ හම්වලින් වැසු-
වාය.[12] **17** ඉන්පසු ඇය රසට පිළි-
යෙල කළ ව්‍යංජනය සමඟ රොටි
කිහිපයක් ඇගේ පුත් යාකොබ්ගේ
අතට දුන්නාය.[13]

**18** යාකොබ් තම පියා වෙතට
ගොස්, "තාත්තේ" කියා ඔහුට හඬගැ-
සුවේය. එවිට පියා, "ඔබ කවුද මගේ
පුතේ" කියා ඇසුවේය. **19** යාකොබ්

**27 පරි.**
1 උත් 27:31 උත් 49:1 ද්වි 33:1
2 උත් 27:13 උත් 27:43 හිතෝ 1:8 එෆී 6:1
3 උත් 25:25 උත් 27:23
4 උත් 27:21
5 යොෂු 9:6
6 ද්වි 11:26 ද්වි 23:5 ද්වි 30:1
7 උත් 43:9
8 උත් 27:8 හිතෝ 6:20
9 උත් 25:23
10 උත් 25:26
11 1සාමු 28:8
12 උත් 25:25 උත් 27:11
13 උත් 27:9

**2 තීරුව**
1 උත් 25:33 රෝම 9:12
2 උත් 27:4 හෙබ්‍රෙ 11:20
3 උත් 27:11
4 උත් 27:16
5 ද්වි 21:17 රෝම 9:11 හෙබ්‍රෙ 11:20
6 උත් 25:33
7 ද්වි 33:28 හිතෝ 10:6
8 උත් 48:10
9 උත් 25:27 උත් 27:15 සල 4:11

තම පියාට කතා කරමින් මෙසේ
කීවේය. "මම ඔබේ වැඩිමල් පුත්
ඒසව්.[1] මම ඔබ කියූ විදිහටම කළා.
දැන් වාඩි වී මම උයපු දඩමස් ටික
කන්න. ඊට පස්සේ මට ආශීර්වාද
කරන්න."[2] **20** එවිට ඊසාක් තම
පුත්‍රයාට මෙසේ කීවේය. "මගේ පුතේ,
ඔබ මේ තරම් ඉක්මනට දඩමස්
හොයාගත්තේ කොහොමද?" එවිට
යාකොබ්, "ඔබේ දෙවි වන යෙහෝවා
මට එය ලැබෙන්න සැලැස්සුවා" යයි
කීවේය. **21** එවිට ඊසාක් යාකොබ්ට
මෙසේ කීවේය. "පුතේ මා ළඟට
එන්න. ඔබව අතගා බලා ඔබ ඇත්ත-
ටම මගේ පුත් ඒසව්ද කියා මට
බලන්න ඕනේ."[3] **22** එවිට යාකොබ්
තම පියා වන ඊසාක් ළඟට ගියේය.
පියාද ඔහුව අතගා බලා මෙසේ
කීවේය. "ඔබේ කටහඬ යාකොබ්ගේ
වගෙයි. ඒත් අත් දෙක නම් ඒසව්ගේ
වගෙයි."[4] **23** ඔහුගේ සහෝදර වූ
ඒසව්ගේ අත් මෙන් ඔහුගේ අත් පුරාම
රෝම තිබුණ නිසා ඊසාක් ඔහුව
හඳුනාගත්තේ නැත. එබැවින් ඔහු
යාකොබ්ට ආශීර්වාද කළේය.[5]

**24** ඉන්පසු ඔහු මෙසේ ඇසු-
වේය. "ඔබ ඇත්තටම මගේ පුත්
ඒසව්ද?" ඔහුද, "ඔව්, මම ඒසව්"[6]
කියා උත්තර දුන්නේය. **25** එවිට
ඔහු මෙසේ කීවේය. "පුතේ, කෑම
ටික ළඟට ගේන්න. ඔබ දඩයමේ
ගිහින් ගෙනා මස් ටික කෑවට පස්සේ
මම ඔබට ආශීර්වාද කරන්නම්."[7]
එවිට යාකොබ් මස් ව්‍යංජනය පම-
ණක් නොව වයින්ද ඔහුගේ පියාට
ගෙනැවිත් දුන්නේය. පියාද කෑම
කා වයින් බීවේය. **26** ඉන්පසු ඔහු-
ගේ පියා වන ඊසාක් ඔහුට මෙසේ
කීවේය. "පුතේ දැන් මා ළඟට ඇවිත්
මාව සිඹින්න."[8] **27** යාකොබ් පියා
ළඟට ගොස් ඔහුව සිපගත්තේය.
එවිට ඊසාක්ට ඔහුගේ වස්ත්‍රවල සුවඳ
දැනී[9] ඔහුට මෙසේ ආශීර්වාද කරන්න
පටන්ගත්තේය.

"මගේ පුත්‍රයාගේ සුවඳ යෙහෝවා
දෙවි ආශීර්වාද කළ තණබිම්වල

සුවඳ මෙනි! **28** සැබෑ දෙවිගෙන්
ඔබට අහසෙන් පිනිද[1] පොළොවෙන්
සරු පසද[2] බොහෝ ධාන්‍යද අලුත්
වයින්ද[3] ලැබේවා! **29** ජාතීහු ඔබ
ඉදිරියේ හිස නමා ඔබට සේවය
කරත්වා![4] ඔබ ඔබේ සහෝදරයන්
කෙරෙහි අධිපතිකම් කරාවා! ඔබේ
මවගේ පුත්‍රයෝ ඔබට හිස නමත්වා![5]
ඔබට ශාප කරන සියල්ලන්ට ශාප
වේවා! ඔබට ආශීර්වාද කරන සියල්-
ලන්ට ආශීර්වාද වේවා!”[6]

**30** ඊසාක් යාකොබ්ට ආශීර්වාද
කර අවසන් වූ පසු ඔහු තම
පියා වෙතින් ඉවත්ව ගියේය. ඒත්
සමඟම ඔහුගේ සහෝදරයා වන ඒසව්
දඩයමේ[7] ගොස් ආවේය. **31** ඔහුද
කෑමක් රසට උයා ඔහුගේ පියා
වෙතට ගෙනැවිත් මෙසේ කීවේය.
“තාත්තේ, නැඟිට ඔබේ පුතා ගෙනා
දඩමස් ටික කන්න. ඉන්පසු ඔබට
පුළුවන් මට ආශීර්වාද[8] කරන්න.”
**32** එවිට ඔහුගේ පියා වන ඊසාක්,
“ඔබ කවුද” කියා ඇසුවේය. ඔහුද,
“මම ඔබේ වැඩිමල් පුත් ඒසව්”[9] කියා
උත්තර දුන්නේය. **33** එවිට ඊසාක්
බොහෝ සෙයින් භය වී වෙවුලමින්
මෙසේ කීවේය. “එහෙනම් දැන් ටික-
කට කලින් දඩයමේ ගිහින් මට දඩ-
මස් ගෙනැවිත් දුන්නේ කවුද? ඔබ
එන්න කලින් මම එයින් කා ඔහුට
ආශීර්වාද කළා. ඔහුට අනිවාර්ය-
යෙන්ම ඒ ආශීර්වාද ලැබෙයි.”[10]

**34** තම පියාගේ වචන ඇසූ විට
ඒසව් අතිශයින් ශෝක වී මහත් හඬින්
කෑගසමින්[11] ඔහුගේ පියාට මෙසේ
කීවේය. “අනේ තාත්තේ මටත් ආශීර්-
වාද කරන්න.”[12] **35** නමුත් ඊසාක්
මෙසේ කීවේය. “ඔබේ සහෝදරයා
මාව රවටා ඔබට ලැබිය යුතු ආශීර්-
වාදය ලබාගත්තා.”[13] **36** එවිට
ඒසව් මෙසේ කීවේය. “ඔහුට යාකොබ්
යන නම දුන්නේ ඒ නිසාම නොවේද?
ඔහු දෙවතාවක්ම මට අයිති දේ
උදුරගත්තා.[14] ඔහු මුලින්ම උදුර-
ගත්තේ මගේ කුලුඳුල්කම.[15] දැන්
මට ලැබෙන්න තිබුණු ආශීර්වාදයත්
ඔහු උදුරගත්තා.”[1] ඉන්පසු ඒසව්
ඊසාක්ගෙන් මෙසේ ඇසුවේය. “අනේ,
ඔබ මට ආශීර්වාදයක් ඉතුරු කළේ
නැද්ද?” **37** නමුත් ඊසාක් ඒසව්ට
මෙසේ උත්තර දුන්නේය. “මම ඔහුව
ඔබේ අධිපතියා හැටියට පත් කළා.[2]
ඔහුගේ සියලු සහෝදරයන් ඔහු-
ගේ සේවකයන් වෙනවා කියා මම
කිව්වා.[3] ධාන්‍ය සහ අලුත් වයින්
ඔහුට බහුලව ලැබෙන්න[4] කියාත් මම
ආශීර්වාද කළා. ඉතින් මගේ පුතේ,
ඔබට දෙන්න දැන් ආශීර්වාදයක්
ඉතුරු වී නැහැ.”

**38** එවිට ඒසව් මෙසේ කීවේය.
“අනේ තාත්තේ, මට දෙන්න එක
ආශීර්වාදයක්වත් ඉතුරු වී නැද්ද?
අනේ තාත්තේ මටත් ආශීර්වාද
කරන්න.”[5] එසේ කියා ඒසව් කෑගසා
අඬන්න පටන්ගත්තේය.[6] **39** එවිට
ඔහුගේ පියා වන ඊසාක් ඔහුට මෙසේ
කීවේය.

“ඔබ ජීවත් වෙන්නේ පොළොවේ
සරු පසද අහසේ පිනිද නැති තැන-
කය.[7] **40** ඔබේ සවිය ඔබේ කඩු-
වය.[8] ඔබේ සහෝදරයා ඔබව යටත්
කරගන්නේය.[9] නමුත් ඔබේ ඉවසීම
ඉක්මවූ දාට ඔබ පොරබැද ඔහුගෙන්
නිදහස් වන්නෙහිය.”*[10]

**41** තමාගේ පියා යාකොබ්ට කළ
ආශීර්වාදය නිසා ඒසව් යාකොබ්
සමඟ වෛර බැඳගත්තේය.[11] ඒසව්
තම සිතින්[12] මෙසේ කියාගත්-
තේය. “මගේ තාත්තා ගැන වැල-
පෙන කාලය දැන් අත ළඟයි.[13]
ඊටපස්සේ මම මගේ සහෝදරයා වන
යාකොබ්ව මරා දමනවා.”[14] **42** රෙ-
බෙකා ඇගේ වැඩිමල් පුත් ඒසව්ගේ
සිතේ තිබූ දේ ගැන දැනගත් විට
විගස යාකොබ්ව කැඳවා ඔහුට මෙසේ
කීවාය. “ඔබේ සහෝදරයා වන ඒසව්
ඔබෙන් පළිගන්නයි යන්නේ. ඔහු
ඔබව මරන්න හිතාගෙන[15] ඉන්නවා.
**43** ඒ නිසා මගේ පුතේ, මා කියන

**27 පරි.**
1 ද්වි 11:11, යෙසා 45:8, හොෂෙ 14:5
2 උත් 45:18, ගණන් 13:27
3 උත් 27:37, ද්වි 7:13, 2රාජා 18:32, ගීතා 104:15
4 2සාමු 8:1, ආනි 2:44
5 උත් 25:23, උත් 49:8
6 උත් 12:3, උත් 28:3, උත් 31:42, ගණන් 24:9, එස 25:12
7 උත් 27:3
8 හෙබ්‍රෙ 7:7
9 උත් 25:25, උත් 25:31, හෙබ්‍රෙ 12:16
10 රෝම 9:13
11 ලූක් 13:28
12 හෙබ්‍රෙ 12:17
13 ද්වි 21:17, මලා 1:2, ගලා 3:9
14 උත් 25:26, උත් 32:28, හොෂෙ 12:3
15 උත් 25:34, මතෙ 5:33, හෙබ්‍රෙ 6:16

**2 තීරුව**
1 උත් 27:28
2 උත් 25:23, උත් 27:29, රෝම 9:12
3 උත් 49:8
4 ද්වි 33:28, යෝවෙ 2:19
5 හෙබ්‍රෙ 12:17
6 යෙසා 65:14
7 යොෂු 24:4, හෙබ්‍රෙ 11:20
8 උත් 32:6, ගණන් 20:18
9 උත් 25:23, 2සාමු 8:14
10 2රාජා 8:20, 2ලේක 28:17
11 උත් 4:5, උත් 37:11, ආමො 1:11, 1යොහ 2:11
12 ගීතා 140:2, මාක් 7:21
13 උත් 35:29
14 උත් 4:8, 1යොහ 3:15
15 උත් 37:18, ගීතා 64:6, හිතෝ 6:17

උත් **27:40*** මූ.අ., “ඔහු ඔබ පිට තැබූ වියගහ කඩා දමන්නේය.”

දේට සවන් දෙන්න.[1] හාරාන්හි ජීවත්
වෙන මගේ සහෝදරයා වන ලාබන්[2]
ළඟට යන්න. **44** ඔබේ සහෝද-
රයාගේ කෝපය නිවී යන තුරු[3]
කාලයක් ඔහු සමඟ ජීවත් වෙන්න.
**45** ඔබේ සහෝදරයාගේ කෝපය නිවී
ඔබ කළ දේ ඔහුට අමතක වන තුරු
ඔබ එහෙ ජීවත් වෙන්න.[4] ඔබ ආපහු
පැමිණිය යුත්තේ කවදාද කියා දන්වා
මම ඔබට පණිවිඩයක් එවන්නම්.
එකම දවසේ ඔබ දෙදෙනාවම අහිමි
කරගන්න මම කැමති නැහැ.”

**46** රෙබෙකා ඊසාක්ට කිහිප වතා-
වක්ම මෙසේ කීවාය. “හෙත්ගේ දූව-
රුන් නිසා මට මගේ ජීවිතය එපා
වෙලා.[5] යාකොබ් කවදා හරි දවසක
ඒසව් කළා වගේ මේ දේශයෙන්
බිරිඳක් සොයාගත්තොත්[6] මගේ ජීවි-
තෙන් වැඩක් තියෙනවාද?”

**28** එබැවින් ඊසාක් යාකොබ්ව
කැඳවා ඔහුට ආශීර්වාද
කර මෙසේ කීවේය. “ඔබ
කානාන් දේශයේ දූවරුන්ගෙන් භාර්-
යාවක් තෝරාගන්න එපා.[7] **2** පදන්-
ආරම්හි සිටින ඔබේ මවගේ පියා
වන බෙතුයෙල්ගේ නිවසට ගිහින්
ඔබේ මවගේ සහෝදරයා වන
ලාබන්ගේ දූවරුන්ගෙන්[8] භාර්යාවක්
තෝරාගන්න. **3** සියලු බලැති දෙවි
ඔබට ආශීර්වාද කර ඔබ මාර්ග-
යෙන් බොහෝ දරුවන් බිහි වෙන්න
සලස්වයි. ඔබෙන් ජාතීන් සමූහ-
යක්[9] බිහි වෙයි. **4** දෙවි ආබ්‍රහම්ට
දුන් ආශීර්වාදය ඔබටත්[10] ඔබෙන්
පැවත එන්නන්ටත්[11] ලබා දෙයි. එවිට
දෙවි ආබ්‍රහම්ට දුන් දේශය[12] එනම්,
ඔබ විදේශිකයෙක් ලෙස ජීවත් වන
මේ දේශය[13] ඔබට උරුම වෙයි.”

**5** පසුව ඊසාක් ලාබන් ජීවත් වූ
පදන්-ආරම් නම් පළාතට යාකොබ්ව
පිටත් කර යැව්වේය. සිරියානු ජාතික
බෙතුයෙල්ගේ[14] පුත්‍රයා වූ ලාබන්,
යාකොබ්ගේ හා ඒසව්ගේ මව[15] වන
රෙබෙකාගේ සහෝදරයා[16] විය.

**6** ඊසාක්, යාකොබ්ට ආශීර්වාද
කර භාර්යාවක සොයාගන්නා පිණිස
පදන්-ආරම් වෙතට ඔහුව පිටත් කර
යැවූ බව ඒසව්ට දැනගන්න ලැබිණ.
යාකොබ්ට ආශීර්වාද කරන අවස්ථා-
වේදී, “කානාන් දේශයේ දූවරුන්-
ගෙන් භාර්යාවක් තෝරාගන්න එපා”[1]
කියා ඊසාක් ඔහුට අණ කළ බවත්
**7** යාකොබ් ඔහුගේ පියාට හා මවට
කීකරු වෙමින්[2] පදන්-ආරම් බලා
පිටත් වූ බවත් ඔහුට දැනගන්න
ලැබිණ. **8** එවිට ඔහුගේ පියා වන
ඊසාක් කානාන් දේශයේ දූවරුන්ට
අකමැති[3] බව ඒසව් තේරුම්ගත්-
තේය. **9** එබැවින් ඒසව් තමාට සිටි
භාර්යාවන්ට[4] අමතරව තවත් ස්ත්‍රි-
යක විවාහ කරගත්තේය. ඔහු ආබ්‍ර-
හම්ගේ පුත්‍රයා වන ඉෂ්මායෙල්ගේ
දියණිය වූ නෙබායොත්ගේ සහෝද-
රිය වන මහලත්ව විවාහ කරගත්-
තේය.

**10** මේ අතරතුරේදී යාකොබ්
බෙයර්-ෂෙබා සිට හාරාන්[5] බලා ගමන්
කළේය. **11** ඔහු එක්තරා ස්ථානය-
කට[6] පැමිණ එහි රාත්‍රිය ගත කරන්න
තීරණය කළේය. මන්ද ඒ වන විට
හිරු බැස තිබිණ. ඔහු එතැන තිබූ
ගලක් තෝරාගෙන ඒ මත හිස තබා
නිදාගත්තේය. **12** ඔහු නිදා සිටියදී
සිහිනයක්[7] දුටුවේය. පොළොවේ සිට
ස්වර්ගය දක්වා උස් වූ ඉණිමඟක් තිබූ
අතර දේවදූතයන් එම ඉණිමඟ දිගේ
නඟිමින් බසිමින්[8] සිටින ආකාරයත්,
**13** ඊට ඉහළින් යෙහෝවා දෙවි සිටින
බවත් ඔහු දුටුවේය.[9] දෙවි කතා කර-
මින් මෙසේ කීවේය.

“මා යෙහෝවා දෙවිය. මා ඔබේ
පියා වන ආබ්‍රහම්ගේද ඊසාක්ගේද
දෙවිය.[10] ඔබ දැන් නිදා සිටින ස්ථා-
නය හා මේ දේශය මම ඔබටත්
ඔබෙන් පැවතෙන අයටත් දෙන්-
නෙමි.[11] **14** සැබවින්ම ඔබෙන් පැව-
තෙන අය පොළොවේ දූවිලි[12] මෙන්
බොහෝ සෙයින් වැඩි වන්නෝය.
ඔබෙන් පැවත එන්නෝ දේශයේ
සතර දිශාවට[13] පැතිර යන්නෝය.
ඔබ මාර්ගයෙන්ද ඔබෙන් පැවත එන

**27 පරි.**
1 හිතෝ 1:8; කොලො 3:20
2 උත් 28:5
3 ගීතා 37:8
4 නික් 4:19; මතෙ 5:22
5 උත් 26:35; උත් 28:8
6 උත් 24:3

**28 පරි.**
7 උත් 24:37; නික් 34:15; 1රාජා 11:1; 1කොරි 7:39; 2කොරි 6:14
8 උත් 29:16
9 උත් 17:5; උත් 46:15; 1ලේක 2:1; රෝම 4:17
10 උත් 12:2
11 උත් 15:5; රෝම 9:7; ගලා 3:29
12 හෙබ්‍රෙ 11:9
13 උත් 12:7; උත් 15:13; උත් 17:8
14 උත් 25:20
15 උත් 25:28
16 උත් 24:29

**2 තීරුව**
1 උත් 28:1; 2කොරි 6:14
2 උත් 27:43; නික් 20:12; ලෙවී 19:3
3 උත් 24:3; උත් 27:46
4 උත් 36:2
5 උත් 11:31; උත් 27:43
6 උත් 28:19
7 ගණන් 12:6; යෝබ් 33:15
8 මතෙ 28:2; යොහ 1:51; හෙබ්‍රෙ 1:14
9 දානි 7:9
10 උත් 26:24; මාක් 12:26; ක්‍රියා 7:32
11 උත් 12:7; උත් 28:4; ගීතා 105:11; ක්‍රියා 7:5
12 උත් 13:16; 1රාජා 4:20
13 උත් 13:14

තැනැත්තා* මාර්ගයෙන්ද පොළොවේ
සියලු පවුල් සැබවින්ම ආශීර්වාද
ලබාගනු ඇත.#[1] **15** මම ඔබ සමඟ
සිට ඔබේ මුළු ගමනේදී ඔබව ආරක්ෂා
කර නැවත මේ දේශයට ගෙනෙන්-
නෙමි.[2] මම ඔබව අත් නොහරින්-
නෙමි. ඔබට දුන් පොරොන්දුව මම
අනිවාර්යයෙන්ම ඉටු කරන්නෙමි."[3]

**16** එවිට යාකොබ් අවදි වී මෙසේ
කීවේය. "සැබවින්ම යෙහෝවා දෙවි
මේ ස්ථානයේ සිටිනවා. එහෙත් මම
එය දැන සිටියේ නැහැ." **17** ඔහු
භය වී[4] මෙසේද කීවේය. "මෙය මොන
තරම් ගරුබිය[5] දනවන තැනක්ද!
මෙය දෙවිගේ ගෘහයයි![6] ස්වර්ග-
යේ දොරටුව තිබෙන්නේ මෙ-
තැනයි." **18** යාකොබ් පාන්දරින්ම
නැඟිට තමා හිස තැබූ ගල ගෙන
එය කණුවක් ලෙස එතැන සිටෙව්-
වේය. ඉන්පසු ඔහු ඒ මත තෙල්
වත් කළේය.[7] **19** ඔහු එතැනට බෙ-
තෙල්*[8] යන නම තැබීය. ඊට කලින්
ඒ නුවරේ නම ලූෂ්ය.[9]

**20** ඉන්පසු යාකොබ් පොරොන්දු-
වක්[10] දෙමින් මෙසේ කීවේය. "දෙවි
දිගටම මා සමඟ සිට මා යන
මේ ගමනේදී මාව ආරක්ෂා කර-
මින් මට කන්න රොටි සහ අඳින්න
වස්ත්‍ර දී,[11] **21** අනතුරක් නොමැ-
තිව මගේ පියාගේ නිවසට මට නැවත
යන්න සැලැස්සුවොත්, යෙහෝවා
දෙවි මගේ දෙවි[12] බව එයින් ඔප්පු
වෙයි. **22** කණුවක් ලෙස මම සිටවූ
මේ ගල දෙවිගේ ගෘහය[13] වනු ඇත.
ඔබ දෙන සියල්ලෙන් දසයෙන් කො-
ටසක්[14] මම අනිවාර්යයෙන්ම ඔබට
දෙන්නෙමි."

**29** ඉන්පසු යාකොබ් පෙරදිග
වැසියන්ගේ[15] දේශය වෙතට
පයින් ගියේය. **2** එසේ ගමන් කර-
මින් සිටියදී බැටළු රැළවල් තුනක්
තණබිම්මක ළිඳක් අසල ලැග සිටිනවා
ඔහු දුටුවේය.[1] එඬේරුන් සතුන්ට
වතුර ඇද දුන්නේ ඒ ළිඳෙන්ය. විශාල
ගලකින් ළිං[2] කට වසා තිබිණ.
**3** සියලුම සත්ව රැළවල් එතැනට
රැස් කළ පසු එඬේරු ළිං කටෙන් ගල
අහකට පෙරළා සතුන්ට වතුර ඇද
දුන්නෝය. ඉන්පසු ඔවුහු ඒ ගලෙන්
ළිං කට නැවත වසා දැමූහ.

**4** යාකොබ් ඔවුන්ගෙන් මෙසේ
ඇසුවේය. "සහෝදරවරුනි, ඔබේ
ගම කොහේද?" ඔවුහුද, "අපේ ගම
හාරාන්"[3] කියා උත්තර දුන්නෝය.
**5** යාකොබ් ඔවුන්ගෙන් මෙසේද ඇසු-
වේය. "ඔබ නාහෝර්ගේ[4] මුනුපුරා
වන ලාබන්ව[5] දන්නවාද?" ඔවුහුද,
"ඔව්, අපි ඔහුව අඳුරනවා" යයි
කීවෝය. **6** එවිට යාකොබ්, "ඔහු
සනීපෙන් ඉන්නවාද"[6] කියා ඇසුවේය.
ඔවුහුද, "ඔව්, ඔහු සනීපෙන් ඉන්-
නවා. බැටළුවන් එක්ක මේ පැත්-
තට එන අර තරුණිය ඔහුගේ දුව.[7]
ඇගේ නම රාකෙල්"[8] යයි කීවෝය.
**7** පසුව යාකොබ් ඔවුන්ගෙන් මෙසේ
ඇසුවේය. "තවමත් හවස් වෙලා
නැහැ නේද? රැළවල් එකතු කර-
ගන්න තව ගොඩක් වෙලා තියෙනවා.
බැටළුවන්ට වතුර බොන්න දෙන්-
නේ නැත්තේ ඇයි? උන්ට වතුර
දුන්නට පස්සේ උන්ව තණබිමට[9]
එක්කගෙන ගිහින් කන්න දෙන්න."
**8** එවිට ඔවුහු මෙසේ කීවෝය. "සිය-
ලුම සත්ව රැළවල් රැස් කර ළිං
කටෙන් ගල අහකට පෙරළන තුරු
අපිට බැටළුවන්ට වතුර බොන්න
දෙන්න අවසර නැහැ."

**9** යාකොබ් ඔවුන් සමඟ කතා කර-
මින් සිටින විට රාකෙල්[10] ඇගේ
පියාගේ බැටළුවන් සමඟ එතැනට
ආවාය. මන්ද පියාගේ බැටළුවන්
බලාගත්තේ ඇයයි.[11] **10** යාකොබ්-
ගේ මවගේ සහෝදරයා වූ ලාබන්-
ගේ දුව වන රාකෙල්වද ඔහුගේ
බැටළුවන්වද දුටු විගස යාකොබ්
ළිඳ ළඟට ගොස් ළිං කටෙන් ගල
අහකට පෙරළා ලාබන්ගේ බැටළු-

---

**28 පරි.**
**1** උත් 18:18; උත් 22:18
**2** උත් 35:6; උත් 46:4
**3** උත් 31:3; ගණන් 23:19; යොෂු 23:14; හෙබ්‍රෙ 6:18
**4** නික් 3:6; විනි 13:22; මතෙ 17:6
**5** ගීතා 47:2; ගීතා 66:5; ගීතා 68:35
**6** උත් 35:1; ගීතා 27:4
**7** උත් 31:13
**8** විනි 4:5; හොෂෙ 12:4
**9** උත් 35:6; යොෂු 16:2; විනි 1:23
**10** දේශ 5:4
**11** මතෙ 6:30
**12** නික් 15:2; ද්වි 26:17
**13** උත් 35:1
**14** උත් 14:20; ලෙවී 27:30; මලා 3:8

**29 පරි.**
**15** විනි 6:3; 1රාජා 4:30; යෝබ් 1:3

**2 තීරුව**
**1** උත් 30:40; සල 4:1
**2** උත් 24:11; නික් 2:15; යොහ 4:6
**3** උත් 27:43; ක්‍රියා 7:2
**4** උත් 24:24; උත් 31:53
**5** උත් 24:29
**6** උත් 43:27; 1සාමු 17:22
**7** නික් 2:16
**8** උත් 31:4; උත් 46:19; රූත් 4:11
**9** ගීතා 23:2; සල 1:7
**10** උත් 30:1; උත් 35:19
**11** නික් 2:16

---

**උත් 28:14*** උත් 3:15හි පාදසටහන බලන්න. **14#** උත් 12:3හි පාදසටහන බලන්න. **19*** තේ-
රුම, "දෙවිගේ ගෘහය."

වන්ට බොන්න වතුර ඇද දුන්නේය.[1]
**11** ඉන්පසු යාකොබ් රාකෙල්ව සිප,[2]
මහා හඬින් අඬන්න[3] පටන්ගත්තේය.
**12** ඔහු ඇගේ පියාගේ නෑදෑයෙකු[4]
වන බවත් රෙබෙකාගේ පුත්‍රයා වන
බවත් යාකොබ් රාකෙල්ට කීවේය.
එවිට ඇය දිව ගොස් තම පියාට ඒ බව
දැන්නුවාය.[5]

**13** ලාබන්ට ඔහුගේ සහෝදරියගේ
පුත්‍රයා වන යාකොබ් පැමිණ සිටින
බව ආරංචි වූ විගස ඔහු යාකොබ්ව
හමු වීමට දිව ගියේය.[6] ඔහු යාකොබ්ව
සිප වැලඳගෙන[7] ඔහුව තම නිවසට
ගෙන ගියේය. යාකොබ් ලාබන්ට
ඔහුගේ සියලු විස්තර කීවේය.
**14** ලාබන් ඔහුට මෙසේ කීවේය. "ඔබ
මගේම පුතෙක්."*[8] පසුව යාකොබ්
මාසයක් ලාබන් සමඟ ජීවත් විය.

**15** ඉන්පසු ලාබන් යාකොබ්ට
මෙසේ කීවේය. "ඔබ මගේ ඥාති-
යෙක්[9] නිසා කුලියක් නැතුව මට සේ-
වය කරන්න අවශ්‍ය නැහැ.[10] ඔබට
මම ගෙවිය යුතු කුලිය[11] කියන්න."
**16** ලාබන්ට දූවරු දෙදෙනෙක් සිටි-
යෝය. වැඩිමල් දියණියගේ නම
ලෙයාය.[12] බාල දියණියගේ
නම රාකෙල්ය. **17** රාකෙල්[13] ඉතා
රූමත්ය.[14] එහෙත් ලෙයාට එත-
රම් සිත්ගන්නාසුලු පෙනුමක් තිබුණේ
නැත.* **18** යාකොබ් රාකෙල් සමඟ
ආදරයෙන් බැඳී සිටියේය. එබැවින්
ඔහු ලාබන්ට මෙසේ කීවේය. "ඔබේ
බාල දුව වන රාකෙල් වෙනුවෙන් මම
ඔබට අවුරුදු හතක් සේවය කරන්-
නම්."[15] **19** ලාබන්ද, "ඇයව වෙ-
නත් පුරුෂයෙකුට දෙනවාට වඩා
ඔබට දෙන්න මම සතුටුයි.[16] දිග-
ටම මාත් එක්ක ජීවත් වෙන්න"
කියා ඔහුට කීවේය. **20** එබැවින්
යාකොබ් රාකෙල් වෙනුවෙන් අවුරුදු
හතක් සේවය කළේය.[17] නමුත් ඔහු
ඇයට ආදරය කළ නිසා[18] ඔහුට එය
ස්වල්ප දවසක් මෙන් විය.

**21** ඉන්පසුව යාකොබ් ලාබන්ට
මෙසේ කීවේය. "මම සේවය කරන්න
පොරොන්දු වුණු කාලය දැන්
අවසන්. මගේ බිරිඳ එක්ක ජීවත්
වෙන්න[1] මට දැන් අවසර දෙන්න."
**22** එවිට ලාබන් එහි සිටි සියල්ලන්ව
රැස් කර මංගල්‍යයක්[2] පැවැත්වූයේය.
**23** නමුත් රෑ බෝ වූ විට, සය-
නය කරන පිණිස යාකොබ් වෙතට
ලාබන් ගෙන ආවේ ඔහුගේ වැඩිමල්
දියණිය වන ලෙයාවයි. **24** ලාබන්
තම සේවිකාව වන ශිල්පාව[3] තම
දියණිය වන ලෙයාට සේවිකාවක
ලෙස දුන්නේය. **25** යාකොබ් උදෑ-
සන නැඟිට බලද්දී ඔහු සමඟ සිටියේ
ලෙයා බව දුටුවේය. එබැවින් ඔහු
ලාබන්ට මෙසේ කීවේය. "ඔබ කුමක්ද
මට මේ කළේ? මම ඔබට සේ-
වය කළේ රාකෙල් වෙනුවෙන්. ඇයි
ඔබ මාව මේ විදිහට රැවැට්ටුවේ?"[4]
**26** එවිට ලාබන් මෙසේ කීවේය. "අපි
සාමාන්‍යයෙන් වැඩිමල් තැනැත්තියව
විවාහ කර දෙන්න කලින් බාල
තැනැත්තියව විවාහ කර දෙන්නේ
නැහැ. **27** ලෙයාගේ මංගල සතිය
සම්පූර්ණ කරන්න.[5] ඉන්පසු මම
ඇගේ නංගීවත් ඔබට දෙන්නම්. ඔබ
ඇය වෙනුවෙන් තව අවුරුදු හතක්
මට සේවය කරන්න."[6] **28** එබැවින්
යාකොබ් ඔහු කියූ ලෙස ලෙයාගේ
මංගල සතිය සම්පූර්ණ කළේය. ඉන්-
පසු ලාබන් තම දියණිය වන රාකෙල්-
වද බිරිඳක් වශයෙන් යාකොබ්ට
දුන්නේය. **29** ලාබන් තම සේවිකාව
වන බිල්හාවද[7] තම දියණිය වන
රාකෙල්ට සේවිකාවක ලෙස දුන්-
නේය.

**30** යාකොබ් රාකෙල් සමඟ සය-
නය කළේය. ඔහු ලෙයාට වඩා
රාකෙල්ට ආදරය කළ[8] අතර
ඇය වෙනුවෙන් තව අවුරුදු හතක්
ලාබන්ට සේවය කළේය.[9] **31** ලෙ-
යාට එතරම් ආදරයක් නොලැබුණු
බව යෙහෝවා දෙවි දුටුවේය. එබැවින්
දරුවන් බිහි කරන්න ඇයට දෙවි-
ගෙන් ආශීර්වාද ලැබිණ.[10] නමුත්

---

උත් 29:14* මූ.අ., "ඔබ මගේම ඇට, මගේම මාංසය." 17* මූ.අ., "ලෙයාගේ ඇස්වල දීප්තියක් නොතිබිණ."

**29 පරි.**
**1** නික් 2:17
**2** උත් 33:4; උත් 45:15; ලූක් 15:20; රෝම 16:16
**3** උත් 43:30; උත් 45:2
**4** උත් 13:8; උත් 14:14
**5** උත් 24:28
**6** උත් 24:29
**7** ක්‍රියා 20:37
**8** විනි 9:2; 2සාමු 5:1
**9** උත් 27:43; උත් 28:5
**10** ද්වි 25:4; 1තිමෝ 5:18
**11** උත් 30:28; උත් 31:7
**12** උත් 30:19; උත් 46:15; රූත් 4:11
**13** උත් 30:25; උත් 35:16
**14** උත් 12:11; උත් 24:16; එස්ත 2:7
**15** උත් 31:41; උත් 34:12
**16** ගීතා 12:2
**17** උත් 30:26; හොෂෙ 12:12
**18** සල 8:6

**2 තීරුව**
**1** රූත් 4:13; හිතෝ 5:18; 1කොරි 7:3
**2** විනි 14:10; මතෙ 22:2; එළි 19:9
**3** උත් 16:1; උත් 30:9; උත් 46:18
**4** උත් 31:7; උත් 31:42; ලෙවී 19:11; මතෙ 5:37; 2කොරි 4:2
**5** ද්වි 24:5; ගීතා 19:5
**6** උත් 31:41
**7** උත් 30:3; උත් 35:22
**8** ද්වි 21:15
**9** හොෂෙ 12:12
**10** උත් 46:15; රූත් 4:11

රාකෙල් වඳව[1] සිටියාය. 32 ලෙයා
ගැබ්ගෙන පුත්‍රයෙකු බිහි කළාය.
එවිට ඇය, “යෙහෝවා දෙවි මම
විඳින දුක දිහා බැලුවා.[2] දැන්-
වත් මගේ ස්වාමිපුරුෂයා මට ආද-
රය කරාවි” යයි කියමින් ඔහුට
රූබෙන්*[3] යන නම තැබුවාය.
33 ඇය නැවත ගැබ්ගෙන පුත්‍රයෙකු
බිහි කළාය. “යෙහෝවා දෙවි මට
සවන් දුන්නා.[4] මට ආදරය නොලැ-
බුණු නිසා දෙවි මට තවත් දරුවෙක්
දුන්නා” කියා පවසමින් ඇය ඔහුට
සිමියොන්*[5] යන නම තැබුවාය.
34 ඇය නැවතත් ගැබ්ගෙන පුත්‍ර-
යෙකු බිහි කළාය. “මගේ ස්වාමිපුරු-
ෂයාට මම පුතුන් තුන්දෙනෙක් බිහි
කළ නිසා මේ වතාවේදී නම් ඔහු
මට ආදරේ කරයි” කියා ඇය පැවසු-
වාය. එබැවින් ඔහුට ලෙවී*[6] යන නම
තබන ලදි. 35 ඇය නව වතාවක්
ගැබ්ගෙන පුත්‍රයෙකු බිහි කළාය.
එවිට ඇය, “මේ වතාවේදී මම යෙ-
හෝවා දෙවිට ප්‍රශංසා කරනවා” යයි
කීවාය. එබැවින් ඇය ඔහුට යූදා*[7]
යන නම තැබුවාය. පසුව ඇය කාල-
යකට ගැබ්ගත්තේ නැත.

**30** යාකොබ්ට දරුවෙකු බිහි කර
දීමට නොහැකි වූ බැවින්
රාකෙල් තම සහෝදරියට ඊර්ෂ්‍යා
කරන්න පටන්ගත්තාය.[8] ඒ නිසා ඇය
යාකොබ්ට මෙසේ කීවාය. “ස්ත්‍රියකට
දරුවන් නැත්නම් ජීවත් වෙලා වැඩක්
තියෙනවාද? මට දරුවන් දෙන්න.
නැත්නම් මම මළ තැනැත්තියක්
වගේ.”[9] 2 එවිට යාකොබ් රාකෙල්
සමඟ අතිශයින් කෝප වී[10] මෙසේ
කීවේය. “ඔබට දරුවන් නොදී ඉන්නේ
මමද? දෙවි ඔබට ඒ ආශීර්වාදය දී
නැත්නම් මම මොනවා කරන්නද?”[11]
3 එබැවින් ඇය මෙසේ කීවාය.
“මම මගේ සේවිකාව වන බිල්හාව[12]
ඔබට භාර්යාවක් හැටියට දෙන්නම්.
එතකොට ඇගෙන්වත් මට දරුවන්
ලැබෙයි.”[1] 4 ඇය තම සේවිකාව
වන බිල්හාව භාර්යාවක ලෙස
යාකොබ්ට දුන්නාය. ඔහුද ඇය සමඟ
සයනය කළේය.[2] 5 බිල්හා ගැබ්-
ගෙන යාකොබ්ට ආව පුත්‍රයෙකු බිහි
කළාය.[3] 6 එවිට රාකෙල් මෙසේ
කීවාය. “දෙවි මගේ විනිශ්චයකරු
ලෙස ක්‍රියා කළා.[4] ඔහු මගේ හඬට
සවන් දී මට පුතෙක් ලබා දුන්නා.” ඒ
නිසා ඇය ඔහුට දාන්*[5] යන නම
තැබුවාය. 7 රාකෙල්ගේ සේවිකාව
වූ බිල්හා දෙවන වතාවටත් ගැබ්-
ගෙන යාකොබ්ට ආව පුත්‍රයෙකු බිහි
කළාය. 8 ඒ අවස්ථාවේදී රාකෙල්
මෙසේ කීවාය. “මගේ සහෝදරිය
එක්ක මහත් පොරබැදීමක් කර මම
ජය ගත්තා!” ඒ නිසා ඇය ඔහුට
නෆ්තලී*[6] යන නම තැබුවාය.

9 ලෙයාට කලකට දරුවන්
නොලැබුණු බැවින් ඇය තම සේවි-
කාව වන ශිල්පාව භාර්යාවක් ලෙස
යාකොබ්ට දුන්නාය.[7] 10 ලෙයාගේ
සේවිකාව වන ශිල්පාද යාකොබ්ට ආව
පුත්‍රයෙකු බිහි කළාය. 11 එවිට
ලෙයා, “මගේ ජීවිතයට හොඳ කාල-
යක් උදා වෙලා” යයි කීවාය. එබැවින්
ඇය ඔහුට ගාද්*[8] යන නම තැබු-
වාය. 12 ඉන්පසු ලෙයාගේ සේවි-
කාව වූ ශිල්පා දෙවන වතාවටත්
යාකොබ්ට ආව පුත්‍රයෙකු බිහි කළාය.
13 එවිට ලෙයා මෙසේ කීවාය. “මෙය
මොන තරම් ප්‍රීතියක්ද! දැන් දේශයේ
දූවරු මා ප්‍රීතිමත් තැනැත්තියක්
කියා පවසයි.”[9] එබැවින් ඇය ඔහුට
ආෂේර්*[10] යන නම තැබුවාය.

14 තිරිඟු අස්වැන්න නෙළන
කාලයේදී[11] රූබෙන්[12] කැලේ ඇවි-
දින්න ගියේය. එහිදී ඔහුට මැන්ඩ්‍රේක්

**29 පරි.**
1 උත් 30:22
2 උත් 30:20
1සාමු 1:6
ලූක් 1:25
3 උත් 35:22
උත් 37:22
උත් 49:3
නික් 6:14
1ලේක 5:1
එළි 7:5
4 උත් 30:6
ගීතා 34:15
5 උත් 34:25
උත් 42:24
උත් 49:5
1ලේක 4:24
එළි 7:7
6 උත් 34:25
උත් 49:5
නික් 6:16
ගණන් 3:12
1ලේක 6:1
එළි 7:7
7 උත් 35:23
උත් 37:26
උත් 38:15
උත් 44:18
උත් 49:8
1ලේක 2:3
එළි 5:5
එළි 7:5

**30 පරි.**
8 උත් 16:5
1සාමු 1:6
හිතෝ 14:30
තීත 3:3
9 ගණන් 11:15
1සාමු 1:10
යෙරෙ 20:18
10 එෆී 4:26
කොලො 3:19
11 1සාමු 1:5
ගීතා 127:3
හොෂෙ 9:11
12 උත් 29:29

**2 තීරුව**
1 උත් 16:2
උත් 50:23
රූත් 4:17
2 උත් 22:24
උත් 25:6
උත් 35:22
3 උත් 16:15
4 විනි 11:27
ගීතා 26:1
ගීතා 75:7
5 උත් 35:25
උත් 46:23
උත් 49:16
6 උත් 35:25
උත් 46:24
උත් 49:21
ද්වි 33:23
එළි 7:6
7 උත් 35:26
8 උත් 49:19
ගණන් 32:33
එළි 7:5

**9** සල 6:9; ලූක් 1:48; **10** උත් 35:26; උත් 46:17; උත් 49:20; ද්වි 33:24; එළි 7:6; **11** නික් 34:22; යොහ 4:35; **12** උත් 29:32.

උත් **29:32*** තේරුම, “මට පුතෙක් බිහි වුණා!” **33*** තේරුම, “සවන් දීම.” **34*** තේරුම, “බැඳීම.” **35*** තේරුම, “ප්‍රශංසා.”

උත් **30:6*** තේරුම, “විනිශ්චයකරු.” **8*** තේරුම, “මා කළ පොරබැදීම.” **11*** තේරුම, “හොඳ කාලයක් උදා වෙලා!” **13*** තේරුම, “ප්‍රීතිය.”

පල* සම්බ වූ අතර ඔහු එම පල තම
මව වන ලෙයාට ගෙනැවිත් දුන්නේය.
එවිට රාකෙල් ලෙයාට මෙසේ කීවාය.
"අනේ, ඔබේ පුතා ගෙනා මැන්-
ඩ්‍රේක්[1] ගෙඩි කිහිපයක් මටත් දෙන්න
පුළුවන්ද?" **15** ලෙයා ඇයට මෙසේ
උත්තර දුන්නාය. "ඔබ මගේ ස්වාමිපු-
රුෂයාව මගෙන් උදුරගත්තා[2] මදිවට
දැන් මගේ පුතා ගෙනා මැන්ඩ්‍රේක් ගෙ-
ඩිත් ගන්න හදනවාද?" එවිට රාකෙල්,
"ඔබේ පුතා ගෙනා මැන්ඩ්‍රේක් ගෙඩි
මට දුන්නොත් අද ඔබට යාකොබ්
සමඟ රාත්‍රිය ගත කරන්න පුළුවන්"
යයි කීවාය.

**16** සවස් යාමේදී යාකොබ් තණ-
බිමේ[3] සිට එන විට ලෙයා ඔහු වෙත
ගොස් මෙසේ කීවාය. "අද ඔබ රාත්‍රිය
ගත කරන්නේ මා සමඟයි. මගේ
පුතා ගෙනා මැන්ඩ්‍රේක් ගෙඩි දී මම
ඔබව කුලියට ගත්තා." එබැවින් ඔහු
එදින රාත්‍රිය ඇය සමඟ ගත කළේය.[4]
**17** දෙවි ලෙයාගේ කන්නලව්වලට
සවන් දුන්නේය. එබැවින් ඇය ගැබ්-
ගෙන පස්වන වතාවටත් යාකොබ්ට
දාව පුත්‍රයෙකු බිහි කළාය.[5]
**18** එවිට ලෙයා, "මම මගේ ස්වාමි-
පුරුෂයාට මගේ සේවිකාව දුන්න
නිසා දෙවි මට ආශීර්වාද කළා" යයි
කීවාය. ඇය ඔහුට ඉසකාර්*[6] යන
නම තැබුවේ ඒ නිසාය. **19** ලෙයා
නැවතත් ගැබ්ගෙන හයවන වතාව-
ටත් යාකොබ්ට දාව පුත්‍රයෙකු බිහි
කළාය.[7] **20** ඒ අවස්ථාවේදී ලෙයා
පැවසුවේ මෙයයි. "දෙවි ඇත්තෙන්ම
මට අගනා දායාදයක් දුන්නා. මම
මගේ ස්වාමිපුරුෂයාට පුතුන් හයදෙ-
නෙක්[8] බිහි කර දුන් නිසා ඔහු දැන්
මාව පිළිගනියි."[9] එබැවින් ඇය එම
පුත්‍රයාට සෙබුලුන්*[10] යන නම
තැබුවාය. **21** පසුව ඇය දියණියක
බිහි කර ඇයට දීනා*[11] යන නම
තැබුවාය.

උත් **30:14*** මැන්ඩ්‍රේක් නම් ඖෂධීය පැළෑටිය. **18*** තේරුම, "ඔහු කුලිය ගෙන එයි." **20*** තේරුම, "වාසස්ථානය." **21*** තේරුම, "විනිශ්චය කරනු ලැබ."

**30 පරි.**
1 සල 7:13
2 උත් 29:30
3 ලූක් 2:8
4 1කොරි 7:3
5 ගීතා 65:2 ලූක් 1:13
6 උත් 35:23 උත් 46:13 උත් 49:14 ද්වි 33:18 1ලේක 12:32 එළි 7:7
7 රූත් 4:11
8 උත් 35:23 උත් 46:15
9 උත් 29:32 ගීතා 127:3
10 උත් 46:14 උත් 49:13 ද්වි 33:18 එළි 7:8
11 උත් 34:1

**2 තීරුව**
1 උත් 29:31 1සාමු 1:6 ගීතා 113:9
2 යෙසා 54:1 ලූක් 1:25
3 උත් 35:24 උත් 45:4 ද්වි 33:13 ක්‍රියා 7:9 එළි 7:8
4 උත් 28:15 උත් 31:13
5 උත් 31:41 හොෂෙ 12:12
6 උත් 12:3 උත් 39:3
7 උත් 31:7 ලෙවී 19:13
8 උත් 31:38 එෆී 6:8
9 ගීතා 107:38
10 උත් 32:10 1තිමෝ 5:8

**22** කාලයක් ගෙවුණු පසු දෙවි
රාකෙල්ගේ කන්නලව්වලට සවන්
දී ඇයට දරුපල ලබා දුන්නේය.[1]
**23** ඇය ගැබ්ගෙන පුත්‍රයෙකු බිහි
කළාය. එවිට ඇය, "දෙවි මගේ නින්-
දාව පහ කළා"[2] යයි පැවසුවාය.
**24** ඇය ඔහුට යෝසෙප්*[3] යන නම
තබමින් මෙසේද කීවාය. "යෙහෝවා
දෙවි මට තවත් පුතෙක් ලබා දුන්නා."

**25** රාකෙල් යෝසෙප්ව බිහි
කළාට පසුව යාකොබ් ලාබන්
වෙතට ගොස් මෙසේ කීවේය. "මගේ
දේශයට නැවත යන්න මට අව-
සර දෙන්න.[4] **26** මගේ භාර්යාවන්
වෙනුවෙන් මම ඔබට සේවය කළා.
දැන් මට මගේ භාර්යාවන් සහ දරුවන්
රැගෙන මගේ දේශයට යන්න ඉඩ
දෙන්න. මම කොතරම් අවංකව ඔබට
සේවය කළාද කියා ඔබ හොඳින්
දන්නවා."[5] **27** එවිට ලාබන් ඔහුට
මෙසේ කීවේය. "මාත් එක්ක දිගටම
ජීවත් වෙන්න කියා මම ඔබෙන්
බැගෑපත්ව ඉල්ලනවා. ඔබ නිසා මට
යෙහෝවා දෙවිගේ ආශීර්වාදය තියෙ-
නවා කියා මට පැහැදිලි සාක්ෂි
ලැබුණා."[6] **28** ලාබන් තවදුරටත්
මෙසේ කීවේය. "ඔබ කැමති කුලියක්
මම ඔබට ගෙවන්නම්."[7] **29** එවිට
යාකොබ් ඔහුට මෙසේ කීවේය. "මම
ඔබේ රැළ හොඳින් රැකබලා ගෙන
ඔබට කොතරම් අවංකව සේවය
කළාද කියා ඔබ දන්නවා.[8] **30** මම
එන්න කලින් ඔබට ඒ තරම් දෙයක්
තිබුණේ නැහැ. නමුත් මම ආවට පස්-
සේ යෙහෝවා දෙවි ඔබට ආශීර්වාද
කර ඔබට තිබුණ දේ බොහෝ සෙයින්
වැඩි කළා.[9] දැන් මගේ පවුල වෙනු-
වෙන් යමක් කරන්න කාලය පැමිණ
තිබෙනවා."[10]

**31** එවිට ලාබන් මෙසේ ඇසීය.
"ඔබ මගෙන් මොනවාද බලාපො-
රොත්තු වෙන්නේ?" යාකොබ් මෙසේ
උත්තර දුන්නේය. "මම ඔබෙන්

උත් **30:24*** තේරුම, "වැඩි කරන්නා හෝ එකතු කරන්නා."

ගෙවීමක් බලාපොරොත්තු වෙන්නේ
නැහැ.[1] මගේ මේ ඉල්ලීම ඔබ ඉටු
කළොත් මම ඔබේ රැළ නැවත රැක-
බලා ගන්නම්.[2] **32** අද අපි ඔබේ මුළු
රැළම සෝදිසි කර බලමු. බැටළුවන්-
ගෙන් තිත් සහ පුල්ලි තියෙන උන්-
වද බැටළු පැටවුන්ගෙන් තද දුඹුරු
පැහැති උන්වද එළුදෙනුන්ගෙන් පුල්ලි
සහ තිත් තියෙන උන්වද අනික්
සතුන්ගෙන් වෙන් කරන්න. මින් ඉදි-
රියට ඒ වගේ සතුන් බිහි වුණොත්
උන්ව මගේ කුලියට[3] වශයෙන් දෙන්න.
**33** ඔබ යම් දවසක කුලිය වශයෙන්
මම ගත් දේ සෝදිසි කර බලන්න
ආවොත් මම අවංකකමින් ක්‍රියා කරන
බව ඔබ දකීවි.[4] තිත් සහ පුල්ලි නො-
මැති එළුදෙනුන්ද තද දුඹුරු පැහැති
නොවන බැටළු පැටවුන්ද මා ළඟ හිටි-
යොත් උන් සියල්ලම සොරකම් කළ
සතුන් ලෙස ගණන් ගත යුතුයි."[5]

**34** එවිට ලාබන් මෙසේ කීවේය.
"ඔබේ අදහස හොඳයි! ඔබ කිව්ව විදි-
හටම කරමු."[6] **35** ලාබන් එදිනම
ඉරි සහ පුල්ලි ඇති එළුවන්වද යන්-
තම් හෝ සුදු වැටුණු, තිත් සහ පුල්ලි
ඇති එළුදෙනුන්වද වෙන් කළේය. තද
දුඹුරු පැහැති සියලු බැටළු පැටවුන්-
වද ඔහු වෙන් කළේය. මේ සියලු
සතුන්ව ඔහුගේ රැළෙන් වෙන් කර
තම පුත්‍රයන්ට උන්ව බලාගන්න දුන්-
නේය. **36** රැළේ ඉතුරු සතුන්ව ඔහු
යාකොබ්ට බලාගන්න දී දින තුනක
දුරක් ගමන් කළේය. ඔහු එසේ කළේ
යාකොබ් සිටි ස්ථානයෙන් ටික දුරක්
ඈතින් සිටින පිණිසය.

**37** යාකොබ් ස්ටෝරැක්ස්,[7]
ආමන්ඩ්[8] සහ ප්ලේන්[9] යන ගස්-
වලින් අමු කෝටු ගෙන තැනින්
තැන සුදු තිත් සිටින සේ ඒවා-
යේ පොතු ගැලෙව්වේය.[10] **38** රැළ
වතුර බොන්න ආ විට ඔහු එම කෝටු
උන්ට පෙනෙන සේ දියඹරුවල තැබු-
වේය.[11] ඔහු එසේ කළේ කෝටු ඉදිරි-
යේ උන් සංසර්ගයේ යෙදෙන පිණිසය.
**39** සත්තු කෝටු ඉදිරියේ සංසර්ග-
යේ යෙදුණෝය. පසුව උන් ඉරි,

**30 පරි.**
1 ගීතා 118:8 හෙබ්‍රෙ 13:5
2 උත් 46:34 උත් 47:3 1සාමු 25:7 හොෂෙ 12:12
3 උත් 31:7 ද්වි 24:15 1රාජා 5:6 යෝබ් 7:2 යෙරෙ 22:13 1තිමෝ 5:18
4 මලා 3:5
5 නික් 22:1
6 උත් 31:8
7 හොෂෙ 4:13
8 ගණන් 17:8 දේශ 12:5
9 එස 31:8
10 ගණන් 21:18 සෙක 11:7
11 උත් 24:20

**2 තීරුව**
1 උත් 31:10
2 යෝබ් 39:4
3 නික් 2:16
4 උත් 31:9 උත් 32:5
5 උත් 32:5 උත් 36:7

**31 පරි.**
6 උත් 30:33 දේශ 4:4
7 උත් 30:27 1සාමු 18:9
8 උත් 28:15 උත් 32:9 උත් 35:27
9 යෙසා 41:10 රෝම 8:31 හෙබ්‍රෙ 13:5
10 උත් 30:27

තිත් සහ පුල්ලි සහිත පැටවුන් බිහි
කළෝය.[1] **40** යාකොබ් එම බැටළු
පැටවුන්ව වෙන් කළ පසු ලාබන්-
ගේ රැළේ සිටි ඉරි වැටුණු සහ
තද දුඹුරු පැහැති සතුන්ව දකින
සේ තම රැළේ සතුන්ව තැබුවේය.
ඔහු තම රැළ ලාබන්ගේ රැළ අතර
සිටින්න හැරියේ නැත. **41** ශක්ති-
මත් සතුන්[2] සංසර්ගයේ යෙදෙන
කාලයේදී යාකොබ් උන්ට පෙනෙන
සේ දියඹරුවල[3] කෝටු තැබුවේය.
එසේ කළේ උන් කෝටු ළඟ සංසර්ග-
යේ යෙදෙන පිණිසය. **42** නමුත්
සතුන් දුර්වලව සිටි විට ඔහු දියඹරු-
වල කෝටු තැබුවේ නැත. ලාබන්ට
සැමවිටම දුර්වල එවුන් ලැබුණේය.
නමුත් යාකොබ්ට ශක්තිමත් එවුන්
ලැබුණේය.[4]

**43** යාකොබ් තව තවත් දියුණු
විය. විශාල සත්ව රැළවල්ද සේ-
වක සේවිකාවන්ද ඔටුවන්ද බූරුවන්ද
ඔහුට අයිති විය.[5]

**31** කල් යත්ම ලාබන්ගේ පුත්‍ර-
යන් තමාට දොස් නඟන
බව යාකොබ්ට දැනගන්න ලැබිණ.
ඔවුන් තමා ගැන මෙසේ කියූ බව
ඔහුට ආරංචි විය. "අපේ තාත්-
තාට අයිති හැම දෙයක්ම යාකොබ්
අයිති කරගෙන. ඔහු මෙතරම් ධන
සම්පත් රැස් කරගෙන තියෙන්නේ
අපේ තාත්තාට අයිති දේවල්වලින්."[6]
**2** ලාබන්ද පෙර මෙන් තමා සමඟ
සුහද නැති බව යාකොබ්ට තේ-
රුම් ගියේය.[7] **3** කලක් ගෙවුණු පසු
යෙහෝවා දෙවි යාකොබ්ට මෙසේ
කීවේය. "ඔබේ පියවරුන්ගේ හා නෑදෑ-
යන්ගේ දේශයට නැවත යන්න.[8] මම
දිගටම ඔබ සමඟ සිටිමි."[9] **4** එවිට
යාකොබ් රාකෙල්ට සහ ලෙයාට පණි-
විඩයක් යවා තමා රැළ රැකබලා
ගෙන සිටි තැනට ඔවුන්ව ගෙන්වා-
ගත්තේය. **5** ඔහු ඔවුන්ට මෙසේ
කීවේය.

"ඔබේ පියාගේ මුහුණ දිහා බලද්දී
ඔහු ඉස්සර වගේ මා එක්ක සුහද
නැති බව මට තේරෙනවා.[10] ඒත්

මගේ පියාගේ දෙවි මගේ උපකාරයට
ඉන්න බව මම දන්නවා.[1] **6** මම
ඔබේ පියාට මගේ උපරිමයෙන් සේවය
කළ බව ඔබ හොඳින්ම දන්නවා.[2]
**7** ඒත් ඔබේ පියා මගෙන් අයුතු
ප්‍රයෝජන අරගෙන දහ වතාවක්ම
මගේ කුලිය වෙනස් කළා. ඒ මොන
දේ කළත් මට හානියක් කරන්න
දෙවි ඔහුට ඉඩ දුන්නේ නැහැ.[3]
**8** ඔහුද, 'ඔබේ කුලිය හැටියට රැළේ
තිත් වැටුණු සතුන්ව දෙන්නම්' කියා
පවසද්දී මුළු රැළම තිත් වැටුණු
සතුන්ව බිහි කළා. නමුත් ඔහු,
'ඉරි වැටුණු සතුන්ව ඔබට දෙන්නම්'
කියා පවසද්දී මුළු රැළම ඉරි වැටුණු
සතුන්ව බිහි කළා.[4] **9** දෙවි මේ විදි-
හට වෙන්න සලස්වා ඔබේ පියාට
අයිතිව තිබුණු රැළ මට දුන්නා.[5]
**10** රැළ පට්ටි ගැහෙන* කාලයේදී මම
සිහිනයක් දුටුවා.[6] එවිට එළුදෙනුන්
සමඟ එකතු වූ එළුවන්ට ඉරි, තිත්
සහ ලප තිබුණු බව මම දුටුවා.[7]
**11** ඉන්පසු සැබෑ දෙවිගේ දූතයෙක්
සිහිනයෙන් පෙනී මට 'යාකොබ්'
කියා හඬගැසුවා. මමද, 'ඇයි මාගේ
ස්වාමීනි'[8] කියා ඔහුගෙන් ඇහුවා.
**12** ඔහු* මට මෙහෙම කිව්වා. 'අර
බලන්න, රැළේ එළුදෙනුන් සමඟ
එකතු වන සියලුම එළුවන්ට ඉරි,
තිත් සහ ලප තිබේ. ලාබන් ඔබට
කළ සියල්ල මම දුටුවෙමි.[9] **13** බෙ-
තෙල්හිදී[10] ඔබට දර්ශනය වූ සැබෑ
දෙවි මමය. ඔබ එහිදී මට කණුවක්
කැප කර[11] පොරොන්දුවක්[12] දුන්නෙ-
හිය. දැන් නැඟිට මේ දේශයෙන්
පිටත්ව ඔබ උපන් දේශයට නැවත
යන්න.' "[13]

**14** එවිට රාකෙල් සහ ලෙයා ඔහුට
මෙසේ කීවෝය. "අපිට අපේ පියා-
ගේ නිවසෙන් උරුම වෙන්න දෙයක්
ඉතුරු වෙලා තියෙනවාද?[14] **15** ඔහු
හඳන්නේ අපිව විකුණගෙන කන්-
නයි.[15] අපිව සලකන්නේ විදේශිකයන්

**උත් 31:10*** හෝ, "සංසර්ගයේ යෙදෙන" **12*** දේවදූතයා මාර්ගයෙන් කතා කරන්නේ යෙහෝවා දෙවිය.

**31 පරි.**
**1** උත් 48:15
**2** උත් 30:29 එෆී 6:8 කොලො 3:23
**3** ගීතා 37:28 දේශ 8:12 යෙසා 54:17 1පේතෘ 3:13
**4** උත් 30:32
**5** හිතෝ 13:22
**6** ගණන් 12:6
**7** උත් 30:39
**8** යෙසා 6:8
**9** උත් 29:25 උත් 31:39 ද්වි 24:15
**10** උත් 12:8 උත් 35:15
**11** උත් 28:18 උත් 35:14
**12** උත් 28:22 ද්වි 23:21 දේශ 5:4
**13** උත් 37:1
**14** ගණන් 27:4
**15** උත් 31:41 හොෂෙ 12:12

**2 තීරුව**
**1** උත් 31:1
**2** උත් 31:3 උත් 32:9 ගීතා 45:10
**3** උත් 33:13
**4** උත් 30:43
**5** උත් 35:27
**6** උත් 31:14 උත් 31:30 උත් 35:2 යොෂු 24:2 එස 21:21 සෙක 10:2
**7** උත් 15:18
**8** ගණන් 32:1
**9** ගීතා 10:2
**10** උත් 25:20 ද්වි 26:5 හොෂෙ 12:12
**11** උත් 20:3 මතෙ 27:19
**12** උත් 24:50 ගණන් 24:13 ගීතා 105:15

හැටියටයි. **16** දෙවි අපේ පියාගෙන්
ගත් හැම දෙයක්ම අයිති වෙන්-
නේ අපටයි අපේ දරුවන්ටයි.[1] ඒ
නිසා දෙවි ඔබට කියූ හැම දෙයක්ම
කරන්න."[2]

**17** යාකොබ් තම දරුවන්ව සහ
තම භාර්යාවන්ව ඔටුවන් පිට නංවා-
ගෙන,[3] **18** පදන්-ආරම්හිදී හිමි කර-
ගත් තම මුළු රැළද තමා
රැස් කරගත් සියලු බඩු බාහිරාදියද[4]
රැගෙන කානාන් දේශයේ ජීවත් වන
තම පියා වන ඊසාක් වෙතට යන්න
පිටත් වුණේය.[5]

**19** ඒ වේලාවේදී ලාබන් තම බැට-
ළුවන්ගේ ලොම් කපන්න ගොස් සිටි-
යේය. ඒ අතරතුරේදී රාකෙල් තම
පියාගේ ටෙරෆිම් රූප සොරාගත්-
තාය.[6] **20** යාකොබ් ඥානවන්තව
කටයුතු කරමින් සිරියානු ජාතික
ලාබන්ට නොකියාම ඔහුගෙන්
පලා ගියේය. **21** ඔහු තමාට තිබුණු
සියල්ල රැගෙන ගඟෙන්*[7] එගොඩ
වී ගිලියද් නමැති කඳුකර පළාත[8]
බලා ගමන් කළේය. **22** ලාබන්ට ඒ
ගැන දැනගන්න ලැබුණේ යාකොබ්
පලා ගොස් දින තුනකට පසුවය.
**23** එවිට ලාබන් තමාගේ ඥාතීන්
කිහිපදෙනෙකු සමඟ යාකොබ්ව
ලුහුබැඳ ගියේය.[9] දවස් හතකට පසුව
ඔවුහු ගිලියද් නමැති කඳුකර ප්‍රදේශ-
යට පැමිණ යාකොබ් සිටි තැනට
ළඟා වූහ. **24** දෙවි රාත්‍රියේදී සිරි-
යානු ජාතික ලාබන්ට[10] සිහිනයකින්
පෙනී[11] මෙසේ කීවේය. "ඔබ යාකොබ්
සමඟ කතා කරන දේ ගැන පරෙස්සම්
වෙන්න."[12]

**25** යාකොබ් තම කූඩාරම ගසා-
ගෙන සිටියේ ගිලියද් නමැති කඳු-
කර ප්‍රදේශයේය. තම ඥාතීන් සමඟ
ඒ අසල කූඩාරම් ගසාගෙන සිටි
ලාබන් යාකොබ් සිටි තැනට ගියේය.
**26** ලාබන් යාකොබ්ට මෙසේ කීවේය.
"ඔබ මට කුමක්ද මේ කළේ? ඔබ මාව
රවටා කඩුවෙන් අල්ලාගත් වහලුන්

**උත් 31:21*** එනම්, යුප්‍රටීස් ගඟ.

වගේ මගේ දූවරුන්ව රැගෙන යන්-
නේ ඇයි?[1] **27** ඔබ මට නොකියා
හොර රහසින්ම පලා ගියා. ඔබව
සතුටින් පිටත් කර යවන්න මට
ඉඩ නොදුන්නේ ඇයි?[2] වීණා වාද-
නය හා රබන් හඬ මැද ගී ගයමින්
ඔබව පිටත් කර යවන්න තිබුණා
නේද?[3] **28** ඔබ මගේ දූවරුන්ව හා
මුනුපුරු මිනිපිරියන්ව සිඹගන්නවත්
මට අවස්ථාවක් දුන්නේ නැහැ.[4] ඔබ
ක්‍රියා කළේ මෝඩ විදිහටයි. **29** ඔබ
සියලුදෙනාට හානියක් කරන්න මට
හැකියාව තියෙනවා.[5] ඒත් ඊයේ රෑ,
‘ඔබ යාකොබ් සමඟ කතා කරන දේ
ගැන පරෙස්සම් වෙන්න’[6] කියා ඔබේ
පියාගේ දෙවි මට කිව්වා. **30** ඔබ
මෙහෙන් පිටත් වී යන්නේ ඔබේ පියා-
ගේ නිවසට යන්න මහත් ආශාවකින්
සිටින නිසා කියලා මම දන්නවා.
එහෙත් ඇයි ඔබ මගේ දේවතා රූප
සොරකම් කළේ?”[7]

**31** එවිට යාකොබ් උත්තර දෙමින්
ලාබන්ට මෙසේ කීවේය. “ඔබේ දූව-
රුන්ව ඔබ මගෙන් පැහැරගනියි කියා
භයෙන්[8] හිටිය නිසයි මම පිටත්ව
ආවේ. **32** ඒත් මෙතැන ඉන්න
කෙනෙක් ගාව ඔබේ දේවතා රූප
තියෙනවා නම් ඒ තැනැත්තාව මරා
දැමිය යුතුයි.[9] අපේ ඥාතීන් එක්කම
ගිහින් මා ළඟ තියෙන හැම දෙයක්ම
සෝදිසි කර බලන්න. ඒ රූප හම්බ
වුණොත් ආපහු ගන්න.”[10] රාකෙල් ඒ
රූප සොරකම් කළ බව යාකොබ්
දැන සිටියේ නැත.[11] **33** ලාබන්
යාකොබ්ගේ, ලෙයාගේ හා සේවි-
කාවන් දෙදෙනාගේ[12] කූඩාරම්වලට
ගොස් බැලූ නමුත් ඒවා සම්බ නොවීය.
අන්තිමට ඔහු ලෙයාගේ කූඩාරමෙන්
පිටතට ඇවිත් රාකෙල්ගේ කූඩාරමට
ගියේය. **34** රාකෙල් ටෙරපිම් රූප
ඔටුවන් පිට දමන සෑදලයේ ඇති කූඩ-
යට දමා ඒ මත හිඳගෙන සිටියාය.
ලාබන් මුළු කූඩාරමම සෝදිසි කර
බැලූ නමුත් ඔහුට ඒවා සම්බ නොවීය.
**35** ඒ අතරතුරේදී රාකෙල් ඇගේ
පියාට මෙසේ කීවාය. “මාගේ ස්වා-
මීනි,[1] මට සමාවෙන්න. දැන් මගේ
ඔසප් කාලය නිසා[2] මට ඔබ ඉදිරියේ
නැඟිටින්න බැහැ. මා සමඟ කෝප
වෙන්න එපා.” අස්සක් මුල්ලක් නැර
ඔහු දිගටම ටෙරපිම් රූප සෙවූ නමුත්
ඔහුට ඒවා සම්බ නොවීය.[3]

**36** එවිට යාකොබ් ලාබන් සමඟ
කෝප වී[4] ඔහුට මෙසේ බැණවැදු-
ණේය. “ඔබ අපරාධකරුවෙක්ව ලුහු-
බැඳගෙන එන විදිහට මාව ලුහුබැඳ
ආවේ ඇයි?[5] මම කළ වරද කුමක්ද?[6]
**37** ඔබ දැන් මගේ බඩු සියල්ල
සෝදිසි කළා. ඔබේ නිවසේ බඩුව-
ලින් එක දෙයක්වත් ඔබට හම්බ
වුණාද?[7] එහෙමනම් මගේ පවුලේ
අය හා ඔබේ පවුලේ අය ඉදිරියේ
ඒවා මෙතැනින් තියන්න.[8] ඔවුන්ට
අපි දෙදෙනාව විනිශ්චය කරන්න
ඉඩ දෙමු.[9] **38** අවුරුදු විස්සක්ම මම
ඔබ සමඟ ජීවත් වුණා. ඒ කාල-
යේදී, ඔබේ බැටළුදෙනුන්ටවත් එළු-
දෙනුන්ටවත් ගබ්සාවක් සිදු වුණේ
නැහැ.[10] මම කවදාවත් ඔබේ රැළේ
බැටළුවන්ව කෑමට ගත්තේ නැහැ.
**39** මරා දැමූ එක සතෙක්වත් ඔබ
ළඟට ගෙනාවේ නැහැ.[11] මමම ඒ
අලාභය විඳගත්තා. රාත්‍රියේදී හරි
දවාලේදී හරි සොරෙක් ඇවිත් සතෙ-
කුව සොරකම් කළා නම් ඒ පාඩුව ඔබ
මගේ අතින් අය කළා.[12] **40** අව්-
වට වේළිවේළී, රෑ සීතලේ ගැහිගැහී
මම ඔබට සේවය කළා. නින්දත්
මගෙන් පලා ගියා.[13] **41** අවුරුදු
විස්සක්ම මම ඔබත් එක්ක ඒ විදිහට
ජීවත් වුණා. ඔබේ දූවරුන් දෙදෙනා
වෙනුවෙන් අවුරුදු දහහතරක් හා
ඔබේ රැළ වෙනුවෙන් අවුරුදු හයක්
මම ඔබට සේවය කළා. ඔබ මගේ
කුලිය දහ වතාවක්ම වෙනස් කළා.[14]
**42** මගේ පියා ගරුබිය[15] දක්වන ආබ්‍ර-
හම්ගේ දෙවි[16] මගේ උපකාරයට නො-
සිටියා නම් ඔබ හිස් අතින් මාව පිටත්
කර යවන බව නිසැකයි. මම දුක්
වින්ද හැටිත් වෙහෙස මහන්සි වී වැඩ
කළ හැටිත් දෙවි දුටු නිසා ඔහු ඊයේ
රෑ ඔබට අවවාද කළා.”[17]

**31 පරි.**
1 උත් 2:24
2 ගීතා 98:5
3 නික් 15:20; යෝබ් 21:12; ගීතා 149:3
4 උත් 31:55
5 ගීතා 52:1; යොහ 19:10
6 උත් 31:7; උත් 31:24; ක්‍රියා 5:39
7 උත් 31:19; උත් 35:2; විනි 18:24; යෙසා 37:12; ක්‍රියා 19:26; 1කොරි 10:14
8 උත් 31:43
9 උත් 44:9
10 උත් 30:33
11 උත් 31:19
12 උත් 46:18; උත් 46:25

**2 තීරුව**
1 උත් 18:12; ලෙවී 19:3; එෆී 6:2
2 ලෙවී 15:19; එස 22:10
3 උත් 31:19; 2රාජා 23:24; සෙක 10:2
4 උත් 30:2; හිතෝ 19:11; එෆී 4:26
5 විලා 4:19
6 1සාමු 24:11; ගීතා 59:3
7 නික් 22:8
8 උත් 13:8
9 1සාමු 12:3; 1තිමෝ 5:19
10 උත් 30:27; යෝබ් 21:10
11 නික් 22:13; 1සාමු 17:34
12 හිතෝ 29:7; විලා 3:36
13 උත් 47:9; කොලො 3:23
14 උත් 31:7
15 උත් 31:53; යෙසා 8:13
16 උත් 28:13; උත් 31:29
17 උත් 31:24; ගීතා 31:7

**43** එවිට ලාබන් යාකොබ්ට මෙසේ
කීවේය. “මේ දූවරු මගේ දූවරුන්.
ඔවුන්ගේ දරුවෝ මගෙන් දරුවෝ.
මේ රැළත් මගේ. මේ හැම දෙ-
යක්ම මටත් මගේ දූවරුන්ටත් අයිති
දේවල්. ඔවුන්ටත් ඔවුන්ගේ දරුවන්-
ටත් විරුද්ධව මම කටයුතු කරන්නේ
කොහොමද? **44** අපි දෙන්නා ගිවිසු-
මක් ඇති කරගමු.[1] එය අපි දෙන්නා
අතර සාක්ෂියක්[2] වශයෙන් පැව-
තිය යුතුයි.” **45** එබැවින් යාකොබ්
ගලක් ගෙන එය කණුවක් ලෙස
සිටෙව්වේය.[3] **46** ඉන්පසු යාකොබ්
තම පවුලේ අයට මෙසේ කීවේය. “ගල්
ටිකක් එකතු කරන්න.” එවිට ඔවුහු
ගල් ටිකක් එකතු කර ඒවා ගොඩගැ-
සුවෝය.[4] ඔවුහු ඒ ගල් ගොඩ ළඟ
වාඩි වී කෑවෝය. **47** ලාබන් ඊට
යේගාර්-සාහදූතා* යන නම තැබූ
අතර යාකොබ් ඊට ගලෙයෙද්# යන
නම තැබීය.

**48** ඉන්පසු ලාබන් මෙසේ කීවේය.
“අද මේ ගල් ගොඩ ඔබත් මාත් ඇති
කරගත් ගිවිසුමට සාක්ෂියක් වෙයි.”
එයට ගලෙයෙද්[5] යන නම තැබුවේ ඒ
නිසාය. **49** යාකොබ් එයට මුරටැඹ
යන නමද තැබීය. එය එලෙස හැඳින්-
වූයේ ලාබන් කියූ මේ දේ නිසාය.
“අප දෙදෙනා එකිනෙකාගෙන් ඈත්
වී සිටින විට යෙහෝවා දෙවි අප
දෙස බලාවා![6] **50** ඔබ මගේ දූව-
රුන්ට හිරිහැර කර[7] ඔවුන්ට අමතරව
වෙනත් ස්ත්‍රීන්ව විවාහ කරගත්-
තොත්, එය වෙන කවුරු නොදැක්-
කත් අප ඉදිරියේ සාක්ෂිකරුවෙක්ව
සිටින දෙවි එය අනිවාර්යයෙන්ම දකි-
නවා.”[8] **51** ලාබන් යාකොබ්ට මෙ-
සේද කීවේය. “අපි දෙදෙනා අතරේ
මම තැබූ මේ ගල් ගොඩත් මේ කණු-
වත් දෙස බලන්න. **52** ඒවා අපි
දෙදෙනා ඉදිරියේ සාක්ෂියක් වෙයි.[9]
ඔබට විරුද්ධව යමක් කිරීමට මම මේ
ගල් ගොඩ පසු කරගෙන එන්නේ
නැති බවටත් මට විරුද්ධව යමක්
කිරීමට ඔබ මේ ගල් ගොඩ හා කණුව
පසු කරගෙන එන්නේ නැති බව-
ටත් එය ලකුණක්.[1] **53** ආබ්‍රහම්ගේ
දෙවිත්[2] නාහෝර්ගේ දෙවිත්[3] ඔවුන්-
ගේ පියාගේ දෙවිත්* අපව විනිශ්චය
කරත්වා!” නමුත් යාකොබ් දිවුරුවේ
තම පියා වන ඊසාක් ගරුබිය දැක්වූ
දෙවිගේ නමින්ය.[4]

**54** ඉන්පසු යාකොබ් ඒ කන්දේදී
පූජාවක් ඔප්පු කර කෑම කන ලෙස
තම ඥාතීන්ට ආරාධනා කළේය.[5]
ඔවුහුද කෑම කා ඒ කන්දේම රාත්‍රිය
ගත කළෝය. **55** ලාබන් පාන්ද-
රින්ම නැඟිට තම දූවරුන්වද දරුවන්-
වද සිපා[6] ඔවුන්ට ආශීර්වාද කර[7] තම
නිවස බලා පිටත් විය.[8]

**32** යාකොබ් දිගටම ගමන්
කළේය. ඒ අතරතුරේදී
ඔහුට දෙවිගේ දූතයන්ව හමු විය.[9]
**2** යාකොබ් ඔවුන්ව දුටු විට, “දෙවිගේ
කඳවුර මෙතැනයි”[10] කියා පවස-
මින් එතැනට මහනායිම්*[11] යන නම
තැබීය.

**3** ඉන්පසු යාකොබ් ඒදොම්හි[12]
පිහිටි සේයිර් නම් පළාතේ[13]
ජීවත් වූ තම සහෝදරයා වන ඒසව්
වෙතට පණිවිඩකරුවන්ව[14] යැවීය.
**4** යාකොබ් ඔවුන්ට මෙසේ අණ
කළේය. “මාගේ ස්වාමීන්[15] වන
ඒසව්ට ඔබ මෙහෙම කියන්න. ‘ඔබේ
සේවකයා වන යාකොබ් ඔබට
මෙහෙම කියනවා. “මම මේ වෙ-
නකම් දිගු කාලයක් පුරා ලාබන්
සමඟ විදේශිකයෙක් ලෙස ජීවත්
වුණා.[16] **5** මට දැන් සැහෙන ගො-
නුන්ද බූරුවන්ද බැටළුවන්ද සේවක
සේවිකාවන්ද සිටිනවා.[17] මාගේ ස්වා-
මීනි, මම එන බව ඔබට දන්වා එවන්-
නේ ඔබ මට කරුණාවෙන් සලකාවි
යන බලාපොරොත්තුවෙන්.” ’ ”[18]

උත් **31:47*** තේරුම, “සාක්ෂිකරුවන්ගේ ගොඩ (අරාමීය බසින්).” **47#** තේරුම, “සාක්ෂිකරුවන්ගේ ගොඩ (හෙබ්‍රෙව් බසින්).”

උත් **31:53*** හෝ, “දෙවිවරු.” හෙබ්‍රෙව් භාෂාවට අනුව එලෝහේ යන වචනය බහුවචනයෙන් යොදා ඇත. යෙහෝවා දෙවිට පමණක් යොමු දක්වන්නේ නැත. **32:2*** තේරුම, “කඳවුරු දෙකක්.”

**31 පරි.**
1 උත් 26:28, ගලා 3:15
2 උත් 21:30, යොශු 22:27, 3යොහ 12
3 උත් 28:18
4 යොශු 4:7, යොශු 4:20, යොශු 24:26
5 උත් 31:23
6 2ලේක 16:9, හිතෝ 5:21, හිතෝ 15:3
7 මලා 2:15, කොලො 3:19
8 විනි 11:10, 1සාමු 12:5, මලා 2:14
9 උත් 31:45

**2 තීරුව**
1 යොශු 4:6
2 උත් 17:7, ලූක් 20:37
3 යොශු 24:2
4 උත් 31:42
5 උත් 18:5, ගීතා 104:15
6 උත් 31:28
7 උත් 24:60
8 උත් 27:43, උත් 28:2

**32 පරි.**
9 ගීතා 34:7
10 ලූක් 2:13
11 2සාමු 17:24, සල 6:13
12 උත් 25:30, විනි 5:4
13 උත් 27:39, උත් 36:8, ද්වි 2:5, යොශු 24:4
14 ලූක් 9:52, ලූක් 14:32
15 උත් 23:6, රෝම 12:10
16 උත් 31:41
17 උත් 30:43, උත් 33:11
18 උත් 33:8, උත් 47:25

**6** පණිවිඩකරුවන් ආපසු යාකොබ්
වෙනට පැමිණි විට ඔවුහු මෙසේ
කීවෝය. "ඔබේ සහෝදරයා වන
ඒසව්ව අපිට හමු වුණා. ඔහු දැන් මිනි-
සුන් හාරසියයක් සමඟ ඔබව හමු
වීමට එනවා."[1] **7** එවිට යාකොබ්
අතිශයින් භය වී කලබල විය.[2] එබැ-
වින් ඔහු එළුවන්, බැටළුවන්, ගොනුන්
සහ ඔටුවන් ඇතුළු තමන් සමඟ
ගමන් ගත් මුළු පිරිස කඳවුරු දෙ-
කකට බෙදා,[3] **8** මෙසේ කීවේය.
"ඒසව් ඇවිත් එක කණ්ඩායමකට
පහර දුන්නොත් අනික් කණ්ඩායම
හරි ගැලවෙයි."[4]

**9** ඉන්පසු යාකොබ් මෙසේ
යාච්ඤා කළේය. "මගේ පියවරුන්
වූ ආබ්‍රහම්ගේ සහ ඊසාක්ගේ දෙවි[5]
වන යෙහෝවා, 'ඔබේ දේශයටත්
ඔබේ නෑදෑයන් වෙනටත් නැවත
යන්න. මම ඔබට ආශීර්වාද කරන්-
නෙමි' කියා ඔබ මට පැවසුවා.[6]
**10** ඔබේ සේවකයා වන මට ඔබ
පෙන්වූ ප්‍රේමය* හා විශ්වාසවන්ත-
කම මොන තරම්ද![7] නමුත් මම ඒ
කිසිම දෙයක් ලබන්න තරම් වටින
පුද්ගලයෙක් නෙවෙයි. මා යොර්-
දාන් ගඟෙන් එගොඩ වෙද්දී මා
ළඟ තිබුණේ මගේ සැරයටිය විත-
රයි. එහෙත් දැන් මට කඳවුරු දෙ-
කක්ම තිබෙනවා.[8] **11** අනේ, මගේ
සහෝදරයා වන ඒසව්ගේ අතින් මාව
ගලවාගන්න.[9] ඔහු ඇවිත් මටත්
මගේ දරුවන්ටත් ඔවුන්ගේ මව්ව-
රුන්ටත් පහර දෙයි කියා මට ලොකු
භයක් දැනෙනවා.[10] **12** 'මම ස්ථිර-
වම ඔබට ආශීර්වාද කර ඔබෙන් පැව-
තෙන්නන්ව මුහුදේ වැලි මෙන් ගණන්
කළ නොහැකි තරමට වැඩි කරන්-
නෙමි'[11] කියා ඔබ මට පොරොන්දු වූ
බව සිහි කරන මෙන් මම ඔබෙන් ඉල්-
ලනවා."

**13** ඔහු ඒ ස්ථානයේ රාත්‍රිය ගත
කළේය. පසුව, තම සහෝදරයා
වන ඒසව්ට තෑග්ගක් ලෙස ඔහු
තමාට අයිති දේවලින් කොටසක්
වෙන් කළේය.[1] **14** එළුදෙනුන් දෙ-
සියයක් සහ එළුවන් විස්සක්ද බැටළු-
දෙනුන් දෙසියයක් සහ බැටළුවන්
විස්සක්ද, **15** කිරි දෙන ඔටුදෙනුන්
තිහක් සහ උන්ගේ පැටවුන්ද එළදෙ-
නුන් හතළිහක් සහ ගොනුන් දහයක්ද
බූරුදෙනුන් විස්සක් සහ බූරුවන් දහ-
යක්ද ඔහු වෙන් කළේය.[2]

**16** ඉන්පසු ඔහු එක් එක් රැළ වෙන්
වෙන් වශයෙන් තම සේවකයන්ට
භාර දී ඔවුන් එක් එක් කෙනාට මෙසේ
කීවේය. "මේ ඔයෙන් එගොඩ වී මට
ඉදිරියෙන් යන්න. එක් කණ්ඩායමක්
අනික් කණ්ඩායමෙන් ඈත් වී ගමන්
කරන්න."[3] **17** ඔහු පළමුවෙනි සේ-
වකයාට මෙසේ අණ කළේය. "මගේ
සහෝදරයා වන ඒසව්ව හමු වූ
විට ඔහු, 'ඔබ කාගේ සේවකයාද?
ඔබ යන්නේ කොහෙද? ඔබ ඉදිරි-
යෙන් යන මේ සත්තු කාගෙද' කියා
ඔබෙන් ඇසුවොත්, **18** ඔබ පිළි-
තුරු දිය යුත්තේ මෙහෙමයි. 'මේ
සත්තු ඔබේ සේවකයා වන යාකොබ්-
ගේ. ඔහුත් අප පිටුපසින් ගමන් කර-
නවා. මේ සත්තු එවා තිබෙන්නේ
මාගේ ස්වාමීන්[4] වන ඒසව්ට තෑග්-
ගක්[5] හැටියටයි.'" **19** පසුව ඔහු
දෙවෙනි සේවකයාටද තුන්වෙනියා-
ටද රැළවල් පිටුපස ගිය සියල්ලන්-
ටද මෙසේ අණ කළේය. "ඔබට
ඒසව්ව මුණගැසුණොත් ඔබත් ඒ දේම
ඔහුට කියන්න.[6] **20** ඔබ මෙහෙ-
මත් කියන්න. 'ඔබේ සේවකයා වන
යාකොබ් අපට පිටුපසින් එනවා.'"[7]
යාකොබ් එසේ කළේ, "ඒසව් මුහුණට
මුහුණ හමු වෙන්න කලින් මට ඉදිරි-
යෙන් තෑග්ගක්[8] යැව්වොත් සම-
හරවිට ඔහුගේ කෝපය නිවී ඔහු
මාව සාදරයෙන් පිළිගනීවි"[9] කියා
සිතූ බැවිනි. **21** ඔහුගේ සේවකයෝ
තෑග්ග සමඟ ඔහුට ඉදිරියෙන් ගොස්
ඔයෙන් එගොඩ වූහ. නමුත් යාකොබ්
එදින රාත්‍රියේ කඳවුරේ සිටියේය.[10]

**22** ඔහු එම රාත්‍රියේදීම නැඟිට තම
භාර්යාවන් දෙදෙනාවද[11] තම සේවි-

**32 පරි.**
1 උත් 33:1
2 උත් 27:41; උත් 32:11
3 හිතෝ 2:11; දේශ 9:18
4 උත් 33:1
5 නික් 3:6; 1පේතෘ 5:7
6 උත් 31:3; උත් 31:13
7 උත් 28:15; ගීතා 100:5; මීකා 7:20
8 උත් 28:10; උත් 30:43; උත් 32:7; ගීතා 113:7
9 ගීතා 34:4; ගීතා 107:19; 2පේතෘ 2:9
10 උත් 27:41; ගීතා 112:8; හිතෝ 18:19
11 උත් 28:14; උත් 46:3; නික් 1:7; නික් 32:13; ක්‍රියා 7:17

**2 තීරුව**
1 උත් 33:10; හිතෝ 18:16; රෝම 12:20
2 උත් 30:43
3 උත් 33:8; මතෙ 10:16
4 උත් 33:8; ලූක් 14:32
5 උත් 32:13; 1සාමු 25:27
6 හිතෝ 13:17
7 හිතෝ 25:13
8 උත් 43:11; 1සාමු 25:18; හිතෝ 17:8
9 ගීතා 133:1; හිතෝ 6:3
10 උත් 32:13
11 උත් 29:30; රූත් 4:11

---

උත් **32:10*** හෝ, "ළැදි ප්‍රේමය."

කාවන් දෙදෙනාවද[1] තම කුඩා පුත්‍ර-
යන් එකොළොස්දෙනාවද[2] රැගෙන
යබ්බොක් ඔයෙන්[3] එගොඩ විය.
**23** ඔහු ඔවුන්වද තමාට අයිතිව තිබූ
සියල්ලද ඔයෙන් එගොඩ කළේය.[4]
**24** පසුව යාකොබ් තනිව සිටියදී
මිනිසෙක් අලුයම වන තුරු ඔහු සමඟ
පොරබැදීය.[5] **25** තමාට යාකොබ්-
ගෙන් ජය ගත නොහැකි බව ඒ
තැනැත්තා දුටු විට[6] ඔහු යාකොබ්ගේ
කළව සන්ධිය* ඇල්ලුවේය. මෙසේ,
ඔහු සමඟ පොරබදද්දී යාකොබ්-
ගේ කළව සන්ධියේ ඇටය පැන්-
නේය.[7] **26** ඉන්පසු ඒ තැනැත්තා
මෙසේ කීවේය. “දැන් පහන් වී ඇති
නිසා මට යන්න දෙන්න.” එවිට
යාකොබ් මෙසේ කීවේය. “ඔබ මට
ආශීර්වාද කරන තුරු මම ඔබට
යන්න දෙන්නේ නැහැ.”[8] **27** එබැ-
වින් ඔහු, “ඔබේ නම කුමක්ද” කියා
ඇසීය. “මම යාකොබ්” කියා ඔහු
උත්තර දුන්නේය. **28** එවිට ඔහු
මෙසේ කීවේය. “මින්මතු ඔබේ නම
යාකොබ් නොවෙයි. මන්ද ඔබ දෙවි
සමඟත් මිනිසුන් සමඟත් පොර-
බැද[9] ජය ගත් නිසා ඔබට ඊශ්‍රා-
යෙල්*[10] යන නම දෙනු ලැබේ.”
**29** යාකොබ් ඔහුගෙන් මෙසේ ඇසු-
වේය. “ඔබේ නම කුමක්ද?” එහෙත්
ඔහු, “ඔබ මගෙන් නම[11] අසන්-
නේ මන්ද” කියා ඇසුවේය. ඉන්පසු
ඔහු යාකොබ්ට ආශීර්වාද කළේය.
**30** එබැවින් යාකොබ් එතැනට පෙනී-
යෙල්*[12] යන නම තැබීය. මන්ද, “මම
දෙවිව මුහුණට මුහුණ ලා දුටුවත්
මගේ ජීවිතය බේරුණා” කියා ඔහු
පැවසීය.[13]
**31** ඔහු පෙනුයෙල් පසු කර
යද්දී ඉර උදා විය. ඔහුගේ කළ-
වයේ වේදනාව නිසා ඔහු කොර-
ගසමින් ගියේය.[14] **32** යාකොබ්ගේ
කළව සන්ධිය ළඟ තිබෙන නහරය
ඇල්ලූ නිසා අද වන තුරු ඊශ්‍රා-
යෙල්වරු සතුන්ගේ කළව සන්ධියේ
තිබෙන නහරය* නොකන්නෝය.[1]

# 33

යාකොබ් ගමන් කරමින් සිටි-
යදී මිනිසුන් හාරසියදෙනෙකු
සමඟ ඒසව් එනවා දුටුවේය.[2] එවිට
ඔහු ලෙයාටද රාකෙල්ටද සේවි-
කාවන් දෙදෙනාටද තම තමන්ගේ
දරුවන්ව භාර දුන්නේය.[3] **2** ඔහු
සේවිකාවන්ව සහ ඔවුන්ගේ දරුවන්ව
ඉදිරියෙන්ම තැබූ[4] අතර ඔවුන්ගේ
පිටුපසින් ලෙයාව සහ ඇගේ දරුවන්ව
තැබුවේය.[5] රාකෙල්ව සහ යෝසෙප්ව
පිටුපසින්ම තැබුවේය.[6] **3** යාකොබ්
ඔවුන් සියල්ලන්ටම ඉදිරියෙන් ගමන්
කළේය. ඔහු හත් වතාවක්ම හිස
නමා ආචාර කරමින් තම සහෝදරයා
වෙතට ගියේය.[7]
**4** ඒසව් යාකොබ් වෙතට දිව
ඇවිත්[8] ඔහුව බදාගෙන[9] සිපගත්-
තේය. ඉන්පසු දෙදෙනාම අඬන්න
පටන්ගත්තෝය. **5** ඒසව් ස්ත්‍රීන්වද
දරුවන්වද දැක යාකොබ්ගෙන් මෙසේ
ඇසුවේය. “ඔබ සමඟ සිටින මේ අය
කවුද?” යාකොබ්ද, “මේ මගේ දරු-
වන්. දෙවි ඔබේ සේවකයා වන මට
ආශීර්වාද කර දුන් දරුවන්” කියා
උත්තර දුන්නේය.[10] **6** එවිට සේවි-
කාවෝද ඔවුන්ගේ දරුවෝද ඉදිරි-
යට ඇවිත් හිස නමා ඔහුට ආචාර
කළෝය. **7** ලෙයාද ඇගේ දරුවෝද
ඉදිරියට ඇවිත් හිස නමා ඔහුට
ආචාර කළෝය. අන්තිමට යෝසෙප්ද
රාකෙල්ද ඉදිරියට ඇවිත් හිස නමා
ඔහුට ආචාර කළෝය.[11]
**8** එවිට ඒසව් යාකොබ්ගෙන්
මෙසේ ඇසුවේය. “ඔබ මා හමු වීමට
මෙතරම් විශාල කණ්ඩායමක් එක්ක
ආවේ මොකටද?”[12] එවිට යාකොබ්,
“මාගේ ස්වාමීනි, මම එහෙම කළේ
ඔබේ හිත සතුටු කරන්නයි” කියා
උත්තර දුන්නේය.[13] **9** එවිට ඒසව්
මෙසේ කීවේය. “මගේ සහෝදරය,

---

උත් **32:25*** මූ.අ., “කළව සන්ධි කුහරය.”
**28*** තේරුම, “දෙවි පොරබදයි, දෙවි සමඟ පොර-
බදන්නා.” **30*** තේරුම, “දෙවිගේ මුහුණ.”

උත් **32:32*** පෙනෙන විදිහට කළව සන්ධි කුහ-
රය මත තිබෙන සයටික ස්නායුවට සම්බන්ධ
නහරය.

---

**32 පරි.**
1 උත් 30:3
උත් 30:9
2 උත් 30:26
3 ද්වි 3:16
විනි 11:13
4 යොෂු 12:2
5 හොෂෙ 12:3
6 හොෂෙ 12:4
7 උත් 32:32
2කොරි 12:7
8 1ලේක 4:10
ගීතා 115:12
හොෂෙ 12:4
9 හොෂෙ 12:3
10 උත් 35:10
2රාජා 17:34
ගීතා 22:23
ගීතා 78:71
11 විනි 13:18
12 විනි 8:8
1රාජා 12:25
13 උත් 16:7
උත් 16:13
විනි 6:22
යොහ 1:18
14 උත් 32:25

**2 තීරුව**
1 යෝබ් 10:11

**33 පරි.**
2 උත් 14:14
උත් 32:6
3 උත් 32:22
4 උත් 30:7
උත් 30:12
5 උත් 30:19
6 උත් 30:22
7 හිතෝ 6:3
ලූක් 14:11
8 උත් 27:44
9 දේශ 3:5
10 උත් 32:22
ගීතා 127:3
11 උත් 33:2
12 උත් 32:16
13 උත් 32:5
උත් 33:15
හිතෝ 18:16

මටත් බොහෝ දේවල් තියෙනවා.[1]
ඒ නිසා ඔබට අයිති මේ දේවල්
ඔබ ළඟම තබාගන්න.” **10** නමුත්
යාකොබ් මෙසේ කීවේය. “නැහැ,
එහෙම කියන්න එපා. ඔබ මාව සතු-
ටින් පිළිගන්නවා නම් මේ තෑග්ග
ගන්න.[2] ඔබව දකින්න ලොකු ආශාව-
කින් සිටි නිසයි මම මේ තෑග්ග ඔබට
දුන්නේ. ඔබ මාව ආදරයෙන් පිළි-
ගත්තා. ඒ නිසා ඔබව දකිද්දී මට දැනු-
ණේ හරියට මම දෙවිගේ මුහුණ
දැක්කා වගෙයි.[3] **11** දෙවි මට කරු-
ණාවෙන් සැලකූ නිසා මට දැන් කිසි
දෙයකින් අඩුවක් නැහැ.[4] ඒ නිසා, මම
ඔබට ගෙනා තෑග්ග ගන්න කියා
මම ඔබෙන් බැගෑපත්ව ඉල්ලනවා.”[5]
මෙසේ, යාකොබ් ඒසව්ට පෙරැත්ත
කළ නිසා ඔහු ඒ තෑග්ග භාරගත්-
තේය.[6]

**12** පසුව ඒසව් මෙසේ කීවේය.
“දැන් අපි කූඩාරම් අකුළගෙන මෙතැ-
නින් යමු. මම ඔබට ඉදිරියෙන් යන්-
නම්.” **13** නමුත් යාකොබ් ඔහුට
මෙසේ කීවේය. “මාගේ ස්වාමීනි, දරු-
වන් තවම පොඩියි. අනික, මා ළඟ
කිරි දෙන බැටළුදෙනුන් හා එළදෙ-
නුන් සිටිනවා.[7] දවසක් ඇතුළත
ඒ තරම් දුරක් උන්ව දක්කගෙන
ගියොත් මුළු රැළම මැරෙයි.[8] **14** ඒ
නිසා මාගේ ස්වාමීනි, ඔබේ සේවක-
යාට ඉදිරියෙන් ගමන් කරන්න. ඔබව
හමු වෙන්න මම සේයිර්[9] වෙතට
හෙමිහිට එන්නම්. මේ සතුන්ටත්
දරුවන්ටත් ගමන් කළ හැකි වේග-
යෙන්[10] මට එන්න අවසර දෙන්න.”
**15** එවිට ඒසව් මෙසේ කීවේය. “මගේ
සේවකයන් කිහිපදෙනෙකුව ඔබත්
එක්ක මෙහෙ නතර කර යන්න මට
ඉඩ දෙන්න.” එවිට යාකොබ් මෙසේ
කීවේය. “නැහැ, කමක් නැහැ. මාගේ
ස්වාමීන් මාව සතුටින් පිළිගන්නවා
නම් ඒ ඇති.”[11] **16** ඒසව් එදිනම
සේයිර් වෙතට ගමන් කළේය.

**17** යාකොබ්ද කූඩාරම් අකුළගෙන
සුක්කොත්[12] බලා ගියේය. ඔහු තමා-
ටම ගෙයක්ද තමාගේ රැළ සඳහා
මඩුද ගොඩනැඟුවේය.[1] ඔහු එතැනට
සුක්කොත්* යන නම තැබුවේ ඒ
නිසාය.

**18** පසුව, යාකොබ් කානාන් දේශ-
යේ[2] පිහිටි ෂීකෙම් නුවර[3] ළඟට
පැමිණ ඒ නුවර ඉදිරිපිට කූඩාරම්
ගසාගත්තේය. මෙසේ, ඔහු අනතුරක්
නැතුව පදන්-ආරම්[4] සිට කානාන් දේ-
ශයට ආවේය. **19** ඔහු ෂීකෙම්ගේ
පියා වූ හාමෝර්ගේ පුත්‍රයන්ට කෙ-
සිටා* සියයක් ගෙවා[5] තමා කූඩාරම්
ගසාගත් ප්‍රදේශයේම ඉඩමක් ගත්-
තේය. **20** පසුව ඔහු එහිදී පූජාසන-
යක් ගොඩනඟා, ඊට ඊශ්‍රායෙල්ගේ
දෙවි යන නම තැබීය.[6]

**34** ලෙයා යාකොබ්ට ආව බිහි
කළ දියණිය වන දීනා[7] දේශ-
යේ තරුණියන්ව[8] බලන්න යෑමට
පුරුදු වී සිටියාය.[9] **2** ඇය මෙසේ
යද්දී දේශයේ අධිපතියෙකු වූ හිවීය
ජාතික[10] හාමෝර්ගේ පුත්‍රයා වන
ෂීකෙම් ඇය කෙරෙහි උනන්දුවක්
දක්වන්න පටන්ගත්තේය. දිනක් ඔහු
ඇයව ගෙන ගොස් දූෂණය කළේය.[11]
**3** යාකොබ්ගේ දියණිය වන දීනාට
ඔහුගේ සිත තදින්ම ඇදී ගිය නිසාත්
ඔහු ඇයට ආදරය කළ නිසාත් ඔහු
නිතරම කතාවෙන් ඇගේ සිත දිනා-
ගන්න උත්සාහ කළේය. **4** පසුව
ෂීකෙම් තම පියා වන හාමෝර්ට[12]
මෙසේ කීවේය. “මේ තරුණියව මට
භාර්යාවක් හැටියට ලබා දෙන්න.”[13]

**5** ෂීකෙම්, තම දුව වන දීනාව
දූෂණය කළ බව යාකොබ්ට ආරංචි
විය. ඒ අවස්ථාවේදී යාකොබ්ගේ
පුත්‍රයෝ ඔහුගේ රැළ සමඟ තණ-
බිමේ සිටියෝය.[14] එබැවින් ඔවුන්
නැවත එන තෙක් යාකොබ් නිශ්-
ශබ්දව සිටියේය.[15] **6** පසුව ෂීකෙම්-
ගේ පියා වන හාමෝර් යාකොබ්
සමඟ කතා කරන්න පැමිණියේය.[16]
**7** යාකොබ්ගේ පුත්‍රයන්ට ඒ ගැන

**33 පරි.**
**1** උත් 36:7
**2** උත් 47:29
**3** උත් 32:11 උත් 32:20 යෝබ් 33:26
**4** උත් 30:43 හෙබ්‍රෙ 13:5
**5** උත් 32:13 හිතෝ 18:16
**6** ක්‍රියා 16:15
**7** උත් 31:17 යෙසා 40:11
**8** හිතෝ 12:10
**9** උත් 27:39 උත් 32:3
**10** හිතෝ 12:10 යෙසා 40:11 රෝම 15:1
**11** උත් 34:11 රූත් 2:13
**12** යොෂු 13:27 1රාජා 7:46 ගීතා 60:6

**2 තීරුව**
**1** හෙබ්‍රෙ 11:9
**2** උත් 10:19 උත් 12:6
**3** උත් 37:14 යොෂු 24:1
**4** උත් 25:20 උත් 28:6
**5** යොෂු 24:32 ක්‍රියා 7:16
**6** උත් 35:1 උත් 35:7

**34 පරි.**
**7** උත් 30:21 උත් 46:15
**8** උත් 26:35 උත් 27:46
**9** 1රාජා 11:2 1කොරි 15:33 2කොරි 6:14
**10** ද්වි 7:1 1ලේක 1:15
**11** උත් 6:2 උත් 34:26 ද්වි 22:29 2සාමු 13:14 1කොරි 6:18
**12** උත් 33:19
**13** උත් 21:21 විනි 14:2
**14** උත් 37:13
**15** ගීතා 39:1 දේශ 3:7
**16** ද්වි 7:3 නෙහෙ 13:25

උත් **33:17*** තේරුම, “මඩු හෝ පැල්.” **19*** එව-
කට භාවිත කළ මුදල් ඒකකයකි. එහි වටිනාකම
නිශ්චිතව නොදනී.

ආරංචි වූ විගස ඔවුහු තණබිමේ සිට
ආවෝය. ඒ ගැන දැනගත් විට ඔවුහු
කම්පා වී අතිශයින් කෝප වූහ.[1]
මන්ද ෂීකෙම් කිසිවිටෙක නොකළ
යුතු දුෂ්ට මෙන්ම නින්දිත ක්‍රියාවක්[2]
කර තිබිණ. යාකොබ්ගේ දුවව දූෂ-
ණය කිරීමෙන් ඔහු ඊශ්‍රායෙල්ට කළේ
මහත් නින්දාවකි.[3]
**8** හාමෝර් ඔවුන්ට කතා කර-
මින් මෙසේ කීවේය. "මගේ පුත්
ෂීකෙම් ඔබේ දුවට ආදරය කරනවා.[4]
ඇයව ඔහුට භාර්යාවක් හැටියට
දෙන්න කියා මම ඔබෙන් කරුණා-
වෙන් ඉල්ලා සිටිනවා.[5] **9** ඔබ අප
සමඟ විවාහ ගිවිසුම් ඇති කර-
ගන්න.[6] ඔබේ දූවරුන්ව අපේ පුත්‍ර-
යන්ට විවාහ කර දෙන්න. අපේ
දූවරුන්ව අපි ඔබේ පුත්‍රයන්ට
විවාහ කර දෙන්නම්.[7] **10** ඔබ අප
සමඟ ජීවත් වෙන්න. දේශයේ ඕනෑම
තැනක නිදහසේ ජීවත් වෙන්න ඔබට
අවසර තියෙනවා. වෙළඳාම් කට-
යුතු කරමින් මේ දේශයේම පදිංචි
වෙන්න."[8] **11** එවිට ෂීකෙම් දීනා-
ගේ පියාටද ඇගේ සහෝදරයන්-
ටද මෙසේ කීවේය. "අනේ, මට
කරුණාවෙන් සලකන්න කියා මම
ඔබෙන් ඉල්ලනවා. ඔබ මගෙන් ඉල්-
ලන ඕනෑම දෙයක් මම දෙන්නම්.
**12** ඇය වෙනුවෙන් ඕනෑම මුදල්
ප්‍රමාණයක්, ඕනෑම තෑග්ගක් මම
දෙන්න සූදානම්.[9] මගේ බිරිඳ හැටියට
මේ තරුණියව විතරක් මට දෙන්න."
**13** ඔවුන්ගේ සහෝදරිය වන
දීනාව ෂීකෙම් දූෂණය කළ බැවින්
යාකොබ්ගේ පුත්‍රයෝ ඔහුටත් ඔහුගේ
පියාටත් කූට ලෙස උත්තර දෙ-
මින්,[10] **14** මෙසේ කීවෝය. "චර්-
මච්ඡේදනය නොකළ කෙනෙකුට
අපේ සහෝදරියව විවාහ කර දෙන්න
කොහෙත්ම බැහැ.[11] එය අපට නින්දා-
වක්. **15** ඔබේ ඉල්ලීමට අපි එකඟ
වෙන්නේ, ඔබ සමඟ ඉන්න සිය-
ලුම පුරුෂයන් අපි වගේම චර්මච්-
ඡේදනය කරගත්තොත් විතරයි.[12]
**16** එහෙම කළොත් අපේ දූවරුන්ව
ඔබට දෙන්නම්. අපිත් ඔබේ දූවරුන්ව
විවාහ කරගෙන මේ දේශයේ පදිංචි වී
ඔබත් එක්ක එක සෙනඟක් ලෙස
ජීවත් වෙන්නම්.[1] **17** එහෙත් අපි
කියන විදිහට ඔබ චර්මච්ඡේදනය
කරගන්න අකමැති නම් අපේ සහෝ-
දරියව රැගෙන අපි මෙහෙන් යනවා."
**18** ඔවුන් කී දේට හාමෝර්ද
හාමෝර්ගේ පුතා වන ෂීකෙම්ද එකඟ
වූහ.[2] **19** තරුණයා යාකොබ්ගේ
දුවට ඇත්තෙන්ම ප්‍රිය කළේය. ඒ
වගේම ඔහු තම පියාගේ නිවසේ
සියල්ලන්ට වඩා[3] ගෞරවාන්විත
කෙනෙකු විය.[4] ඒ නිසා ඔවුන් කී දේ
ඉටු කරන්න ඔහු ප්‍රමාද නොවීය.[5]
**20** හාමෝර් සහ ඔහුගේ පුත්‍රයා
වන ෂීකෙම් ඔවුන්ගේ නුවර දොරටුව
අසලට ගොස් නුවරේ පුරුෂයන්ට
මෙසේ කීවෝය.[6] **21** "මේ මිනිස්සු
අපි සමඟ සමාදානයෙන් ඉන්න කැම-
තියි.[7] ඔවුන්ට මේ දේශයේ ජීවත්
වෙන්නත් වෙළඳාම් කරන්නත් අපි
ඉඩ දෙමු. ඔවුන්ටත් දේශයේ ඇති
තරම් ඉඩකඩ තිබෙනවා.[8] ඔවුන්ගේ
දූවරුන්ව විවාහ කරගන්නත් අපේ
දූවරුන්ව ඔවුන්ට විවාහ කර දෙන්-
නත් අපිට පුළුවන්.[9] **22** නමුත් එක
සෙනඟක් ලෙස අපත් සමඟ මෙහි
ජීවත් වීමට එකඟ වෙන්නේ අපේ සිය-
ලුම පුරුෂයන් ඔවුන් මෙන් චර්-
මච්ඡේදනය කරගත්තොත් විතරයි.[10]
**23** අපි එහෙම කළොත් ඔවුන්ගේ
දේපළ, ධනය හා ඔවුන්ගේ සත්ව සම්-
පත් අපිට අයිති කරගන්න පුළුවන්.[11]
අපත් සමඟ ජීවත් වෙන්න ඔවුන්ව
කැමති කරවගන්න නම් අපි ඔවුන්
කියන දේට එකඟ විය යුතුයි."[12]
**24** එබැවින් නුවර දොරටුව ළඟින්
යන එන සියලුදෙනාම හාමෝර්ටද
ඔහුගේ පුත්‍රයා වන ෂීකෙම්ටද සවන්
දුන්නෝය. එතැනින් යන එන සියලු
පුරුෂයෝ චර්මච්ඡේදනය කරගත්හ.
**25** තුන්වෙනි දවසේදී නුවරේ පුරු-
ෂයෝ මහත් වේදනාවෙන් සිටි-
යෝය.[13] එවිට යාකොබ්ගේ
පුතුන් දෙදෙනෙකු වන දීනාගේ[14]

**34 පරි.**
1 ගීතා 37:8 යාකො 1:20
2 හෙබ්‍රෙ 13:4
3 ද්වි 22:21 2සාමු 13:22
4 ද්වි 21:11
5 නික් 22:16
6 නික් 34:12 යොෂු 23:12 එස්රා 9:14
7 උත් 24:3 ද්වි 7:3 1රාජා 11:2 1කොරි 7:39
8 උත් 42:34 ලූක් 19:15
9 උත් 24:53 1සාමු 18:25 හොෂෙ 3:2
10 හිතෝ 6:18 හිතෝ 16:29 හිතෝ 26:26 මාක් 7:22
11 උත් 17:12 රෝම 4:11
12 උත් 17:10 නික් 12:48

**2 තීරුව**
1 හිතෝ 4:24
2 උත් 33:19 උත් 34:2
3 1සාමු 22:14
4 මීකා 7:4
5 උත් 34:15
6 උත් 23:10 රූත් 4:1 සෙක 8:16
7 හිතෝ 14:15
8 උත් 13:9
9 උත් 34:9 ද්වි 7:3 එස්රා 9:1
10 උත් 17:11
11 හිතෝ 23:4 1තිමෝ 6:9
12 ගීතා 35:20
13 යොෂු 5:8
14 උත් 46:15

සහෝදරයන් වූ සිමියොන් සහ
ලෙවී[1] තම තමන්ගේ කඩු රැගෙන
නුවර වැසියන්ට නොදැනුවත්ව
නුවරට ඇතුල් වී එහි සියලු පුරු-
ෂයන්ට දරුණු ලෙස පහර දුන්-
නෝය.[2] **26** ඔවුහු හාමෝර්ව සහ
ඔහුගේ පුතා වන ෂීකෙම්වද කඩුවෙන්
මරා දැමූහ.[3] ඉන්පසු ඔවුහු දීනාව
ෂීකෙම්ගේ නිවසින් රැගෙන ගියෝය.[4]
**27** යාකොබ්ගේ අනික් පුත්‍රයෝද
නුවරට ඇතුල් වී දරුණු ලෙස තුවාල
ලැබූ පුරුෂයන්ට පහර දී නුවර
කොල්ල කෑවෝය. මන්ද ඔවුන්ගේ
සහෝදරියව ඒ නුවරේදී දූෂණය කර
තිබිණ.[5] **28** ඔවුන්ගේ එළු බැටළු
රැළවල්ද ගව රැළවල්ද බූරුවන්ද
නුවරේ තිබූ දේවල්ද කෙත්වතුවල
තිබූ දේවල්ද පැහැරගත්තෝය.[6]
**29** ඔවුන්ගේ කුඩා දරුවන්වද භාර්යා-
වන්වද වහලුන් මෙන් ගෙන යනු ලැබු-
වෝය. ඔවුන්ගේ නිවෙස්වල තිබූ
සියල්ලද කොල්ල කනු ලැබුවෝය.
ඔවුන්ට කිසිම දෙයක් ඉතුරු නොකර
ඔවුහු පිටත්ව ගියෝය.[7]
**30** පසුව සිමියොන්ව සහ ලෙවීව[8]
අමතමින් යාකොබ් මෙසේ කීවේය.
"ඔබ කළ මේ දේ නිසා දේශයේ ජීවත්
වන කානානිවරු සහ පෙරිස්සිවරු
මාව පිළිකුල් කරයි.[9] මා සමඟ ඉන්-
නේ සුළු පිරිසක්.[10] ඒ නිසා ඔවුන් දැන්
එකතු වී මට පහර දී මාව මේ දේශ-
යෙන් පන්නා දමයි. මාත් මගේ පවු-
ලේ සියලුදෙනාත් එකට විනාශ වී
යයි." **31** එවිට ඔවුහු තම පියාට
මෙසේ කීවෝය. "කාටවත් අයිතියක්
තියෙනවාද අපේ සහෝදරියව ගණි-
කාවක් ලෙස සලකන්න?"[11]

**35** පසුව දෙවි යාකොබ්ට මෙසේ
කීවේය. "ඔබ බෙතෙල් නම්
ස්ථානයට ගොස් එහි ජීවත් වෙන්න.[12]
ඔබේ සහෝදරයා වන ඒසව්ගෙන් ඔබ
පලා යන විට[13] ඔබට දර්ශනය වූ
සැබෑ දෙවි වන මට එහි පූජාසනයක්
සාදන්න."
**2** ඉන්පසු යාකොබ් තම ගෙයි
වැසියන්ටද ඔහු සමඟ සිටි අන්
සියල්ලන්ටද මෙසේ කීවේය. "ඔබ
ළඟ තියෙන දේවතා රූප ඉවත
දමන්න.[1] පවිත්‍ර වී පිරිසිදු වස්ත්‍ර
ඇඳගන්න.[2] **3** අපි බෙතෙල් වෙනට
යමු. මගේ දුකේදී මම කළ කන්නලව්-
වලට සවන් දී[3] මගේ සියලු ගමන්ව-
ලදී මා ළඟින්ම සිටි[4] සැබෑ දෙවිට
මම එහිදී පූජාසනයක් සාදනවා."
**4** එබැවින් ඔවුහු තමන් ළඟ තිබූ
සියලු දේවතා රූපද[5] තමන්ගේ කන්-
වල තිබූ කරාබුද යාකොබ්ට දුන්-
නෝය. ඔහු ෂීකෙම් අසල තිබූ විශාල
ගස යට ඒවා වළලා දැමුවේය.[6]
**5** ඉන්පසු ඔවුහු කූඩාරම් අකුළ-
ගෙන එතැනින් ගියෝය. දෙවි අවට
නුවරවල වැසියන් තුළ මහත් භීති-
යක්[7] ඇති වීමට සැලැස්වූ නිසා
ඔවුහු කිසිවෙක් යාකොබ්ගේ පුත්‍ර-
යන්ව ලුහුබැඳ ආවේ නැත. **6** පසුව
යාකොබ්ද ඔහු සමඟ සිටි සියල්ලෝද
කානාන් දේශයේ පිහිටි ලූෂ්[8] හෙ-
වත් බෙතෙල් නම් ස්ථානයට පැමි-
ණියෝය. **7** ඉන්පසු යාකොබ් එම
ස්ථානයේදී පූජාසනයක් ගොඩනඟා
ඊට එල්-බෙතෙල්* යන නම තැබීය.
මන්ද ඔහු තම සහෝදරයා වෙතින්
පලා යද්දී සැබෑ දෙවි එම ස්ථානයේදී
ඔහුට දර්ශනය වී තිබිණ.[9] **8** කලක්
ගිය පසු රෙබෙකාගේ කිරි මව වූ දෙ-
බොරා[10] මිය ගියාය. බෙතෙල් නම්
ස්ථානයට පහළින් තිබූ අතිවිශාල
ගසක් යට ඇයව භූමදානය කළ නිසා
ඔහු එම ගසට අල්ලොන් බාකුත්*
යන නම තැබීය.
**9** යාකොබ් පදන්-ආරම්[11] සිට එන
විට නැවත වරක් දෙවි ඔහුට දර්ශ-
නය වී ආශීර්වාද[12] කළේය. **10** දෙවි
ඔහුට මෙසේ කීවේය. "ඔබේ නම
යාකොබ්ය.[13] නමුත් මින් මතු ඔබේ
නම යාකොබ් නොව ඊශ්‍රායෙල්ය."
මෙසේ, දෙවි ඔහුට ඊශ්‍රායෙල් යන නම
තැබීය.[14] **11** දෙවි ඔහුට මෙසේද
කීවේය. "මා සියලු බලැති දෙවිය.[15]

උත් **35:7*** තේරුම, "බෙතෙල්හි දෙවි." **8*** තේරුම, "වැලපීමේ විශාල ගස."

**34 පරි.**
**1** උත් 49:5
**2** උත් 49:6 උත් 49:7 ගීතා 140:2 මීකා 2:1
**3** 2සාමු 2:26
**4** උත් 34:2
**5** උත් 34:2
**6** ගණන් 31:11
**7** ද්වි 2:35 ද්වි 20:14 යොෂු 8:2
**8** උත් 49:5
**9** නික් 5:21 හිතෝ 11:17
**10** ද්වි 7:1
**11** 2සාමු 13:32

**35 පරි.**
**12** උත් 28:19 උත් 31:13
**13** උත් 27:43

**2 තීරුව**
**1** උත් 31:19 ද්වි 5:7 යොෂු 23:7 1කොරි 10:14
**2** නික් 19:10
**3** උත් 28:13 ගීතා 46:1
**4** උත් 28:20 උත් 31:42 හිතෝ 3:6 යෙසා 43:2
**5** යොෂු 24:23 1යොහ 5:21
**6** ද්වි 7:25
**7** නික් 1:12 නික් 23:27 ද්වි 11:25 යොෂු 2:9 ගීතා 14:5
**8** උත් 28:19
**9** උත් 28:22
**10** උත් 24:59
**11** උත් 25:20
**12** හොෂෙ 12:4
**13** උත් 25:26 උත් 27:36
**14** උත් 32:28 1රාජා 18:31
**15** උත් 17:1 නික් 6:3 2කොරි 6:18 එළි 15:3

මම ඔබට ආශීර්වාද කර ඔබේ දරු-
වන්ගෙන් මහත් සෙනඟක් බිහි වීමට
සලස්වන්නෙමි. ඔවුන්ගෙන් ජාතීන්
සමූහයක්ද රජවරුන්ද බිහි කරන්-
නෙමි.[1] **12** මම ආබ්‍රහම්ටද ඊසාක්-
ටද දුන් දේශය ඔබටද දෙන්නෙමි.
ඔබෙන් පසුව පැමිණෙන ඔබේ දරු-
වන්ටද[2] මම ඒ දේශය දෙන්නෙමි."[3]
**13** දෙවි ඔහු සමඟ කතා කළ පසු
එතැනින් ඉවත්ව ගියේය.[4]
**14** යාකොබ්, තමා සමඟ දෙවි
කතා කළ එම ස්ථානයේ ගල් කණු-
වක් සිටෙව්වේය.[5] ඉන්පසු ඔහු ඒ මත
පාන පූජාවක් ඔප්පු කර තෙල් වත්
කළේය.[6] **15** යාකොබ්, තමා සමඟ
දෙවි කතා කළ එම ස්ථානය නැව-
තත් බෙතෙල්[7] කියා හැඳින්වූයේය.
**16** ඉන්පසු ඔවුහු බෙතෙල් සිට
එෆ්‍රාත් වෙතට ගමන් කළෝය.
එෆ්‍රාත්වලට සැහෙන දුරක් තිබියදී[8]
රාකෙල්ට ප්‍රසව වේදනාව ඇති විය.
වේදනාව ඇයට දරාගත නොහැකි
විය.[9] **17** රාකෙල් අධික වේදනා-
වකින් සිටි අවස්ථාවේදී වින්නඹුව
ඇයට මෙසේ කීවාය. "භය වෙන්න
එපා. ඔබට මේ පුත්‍රයාත් ලැබෙ-
නවාමයි."[10] **18** එහෙත් ඇය මිය
ගියාය.[11] ඇය අවසන් හුස්ම හෙ-
ළන්න[12] පෙර තම පුතුට බෙන්-ඕනි*
යන නම තැබුවාය. නමුත් දරුවා-
ගේ පියා ඔහුට බෙන්ජමින්#[13] යන
නම තැබීය. **19** රාකෙල් මිය ගිය
පසු එෆ්‍රාත් හෙවත් බෙත්ලෙහෙම[14]
වෙතට යන මාර්ගය අසල ඇයව
භූමදානය කරනු ලැබීය. **20** ඉන්-
පසු යාකොබ් ඇයව භූමදානය කළ
ස්ථානයේ කණුවක් සිටෙව්වේය. අද
දක්වා එය රාකෙල්ගේ සොහොන්
කණුව ලෙස හැඳින්වේ.[15]
**21** පසුව ඊශ්‍රායෙල් එතැනින්
කූඩාරම් අකුළගෙන ඒදෙර් ටැඹ[16] පසු
කරගෙන ටික දුරක් ගොස් කූඩාරම්
ගසාගත්තේය. **22** ඊශ්‍රායෙල් ඒ දේ-
ශයේ කූඩාරම් ගසාගෙන සිටියදී[1]
රූබෙන් තම පියාගේ උපභාර්යාව වන
බිල්හා සමඟ සයනය කළේය. ඊශ්‍රා-
යෙල්ට ඒ ගැන ආරංචි විය.[2]
යාකොබ්ට පුත්‍රයන් දොළොස්-
දෙනෙකු සිටියේය. **23** ලෙයාට
උපන් පුත්‍රයන් නම් යාකොබ්ගේ
කුලුඳුලා වන රූබෙන්,[3] සිමියොන්,
ලෙවී, යූදා, ඉසකාර් සහ සෙබුලූන්
යන අයයි. **24** රාකෙල්ගේ පුත්‍රයන්-
ගේ නම් යෝසෙප් සහ බෙන්ජමින්ය.
**25** රාකෙල්ගේ සේවිකාව වන බිල්-
හාට උපන් පුත්‍රයන් නම් දාන් සහ
නප්තලී යන අයයි. **26** ලෙයාගේ
සේවිකාව වන සිල්පා බිහි කළ පුත්‍ර-
යන් නම් ගාද් සහ ආෂේර්ය. ඔවුහු
සැවොම පදන්-ආරම්හිදී යාකොබ්ට
දාව උපන් පුත්‍රයෝය.
**27** කල් යත්ම යාකොබ් තම පියා
වන ඊසාක් සිටි කිර්යත්-අර්බා[4] හෙ-
වත් හෙබ්‍රොන්හි පිහිටි මම්රේ[5] නම්
ප්‍රදේශයට පැමිණියේය. ආබ්‍රහම්ද
ඊසාක්ද විදේශිකයන් ලෙස ජීවත්
වූයේ එහිදීය.[6] **28** ඊසාක් ජීවත් වූ
මුළු අවුරුදු ගණන එකසිය අසූවක්
විය.[7] **29** ඊසාක් තෘප්තිමත් ජීවිත-
යක්[8] ගත කළ පසු මහලු වියේදී අව-
සන් හුස්ම හෙළුවේය. ඉන්පසු ඔහුවද
තම ආදිපියවරුන් මෙන් තැන්පත්
කරන ලදි. ඔහුගේ පුත්‍රයෝ වන
ඒසව් සහ යාකොබ් ඔහුව තැන්පත්
කළෝය.[9]

**36** ඒදොම්[10] ලෙසත් හඳුන්වනු
ලැබූ ඒසව්ගේ ජීවිත කතාව
මෙයයි.
**2** ඒසව් කානාන් දේශයේ ස්ත්‍රීන්ව
විවාහ කරගත්තේය.[11] ඔහු විවාහ
කරගත් ඒ ස්ත්‍රීන් නම්, හිත්තී ජාතික
ඒලොන්ගේ[12] දියණිය වූ ආදා[13] සහ
හිවීය ජාතික සිබියොන්ගේ මිනිපිරි-
යද අනාගේ දියණියද වූ ඔහොලිබා-
මාය.[14] **3** ඉෂ්මායෙල්ගේ දියණිය
සහ නෙබායොත්ගේ[15] සහෝදරිය වූ
බසෙමත්වද[16] ඔහු විවාහ කරගත්-
තේය.

---

උත් **35:18*** තේරුම, "මැරෙන මොහොතේ බිහි කළ පුත්‍රයා." **18#** තේරුම, "දකුණතේ පුත්‍රයා."

**35 පරි.**
1 උත් 17:5 උත් 48:4 මාක් 15:32 යොහ 12:13
2 ගලා 3:16
3 උත් 15:18 ද්වි 34:4
4 විනි 13:20 ලූක් 24:31
5 උත් 31:52 විනි 9:6
6 උත් 28:18
7 උත් 28:19
8 උත් 48:7 මීකා 5:2 මතෙ 2:6
9 උත් 3:16
10 උත් 30:24 1සාමු 4:20
11 ගීතා 146:4 දේශ 9:5
12 උත් 2:7
13 උත් 46:21 උත් 49:27 ද්වි 33:12
14 උත් 48:7
15 1සාමු 10:2
16 මීකා 4:8

**2 තීරුව**
1 උත් 14:13 2සාමු 7:6
2 උත් 49:4 ලෙවී 18:8 1ලේක 5:1 1කොරි 5:1
3 උත් 49:3
4 උත් 23:2
5 උත් 31:18
6 උත් 15:13 නික් 6:4 නික් 23:9 ක්‍රියා 7:6 හෙබ්‍රෙ 11:9
7 උත් 25:20 උත් 25:26
8 උත් 25:8 1ලේක 29:28
9 උත් 49:31

**36 පරි.**
10 උත් 25:30 ද්වි 23:7 එස 25:12 රෝම 9:13
11 ද්වි 7:3 ද්වි 9:5 විනි 3:5
12 උත් 26:34
13 උත් 36:10
14 උත් 36:18
15 උත් 25:13 උත් 28:9
16 උත් 36:17

4 ආදා ඒසව්ට දාව එලිෆස් බිහි
කළාය. බසෙමත් රුවෙල් බිහි
කළාය.
5 ඔහොලිබාමා යෙවුෂ්, යාලාම්
සහ කෝරා බිහි කළාය.[1]
ඒ සියලුදෙනා කානාන් දේශ-
යේදී ඒසව්ට දාව උපන් පුත්‍රයෝය.
6 ඉන්පසු ඒසව් තම සහෝදරයා වන
යාකොබ්ගෙන් ඈත්ව වෙනත් ප්‍රදේශ-
යකට ගොස් ජීවත් විය.[2] ඔහු තම
භාර්යාවන්වද තම දූපුතුන්වද තම
නිවසේ ජීවත් වූ අන් සියලුදෙනාවද
තම රැළද තමන් ළඟ සිටි අන් සියලු
සතුන්වද කානාන් දේශයේ තමා
රැස් කරගත් සියලු වස්තුවද රැගෙන
ගියේය.[3] 7 මන්ද එකට ජීවත් වීමට
නොහැකි වන තරමටම ඔවුන්ගේ
සම්පත් බොහෝ සෙයින් වැඩි වී
තිබිණ. ඔවුන්ගේ සත්ව රැළවල් නිසා
ඔවුන් විදේශිකයන් ලෙස ජීවත් වූ ඒ
ප්‍රදේශයේ ඔවුන්ට ප්‍රමාණවත් ඉඩකඩ
තිබුණේ නැත.[4] 8 එබැවින් ඒසව්
සේයිර්[5] නමැති කඳුකර ප්‍රදේශයට
ගොස් ජීවත් විය. ඒසව්ව ඒදොම්[6]
ලෙසද හඳුන්වනු ලැබීය.
9 සේයිර් නමැති කඳුකර ප්‍රදේශ-
යේ ජීවත් වූ ඒදොම්වරුන්ගේ පියා වූ
ඒසව්ගේ පෙළපත් වාර්තාව මෙයයි.[7]
10 ඒසව්ගේ පුත්‍රයන්ගේ නම් මතු
දැක්වේ. ඒසව්ගේ භාර්යාව වූ ආදාගේ
පුත්‍රයාගේ නම එලිෆස්ය. ඒසව්ගේ
භාර්යාව වූ බසෙමත්ගේ පුත්‍රයාගේ
නම රුවෙල්ය.[8]
11 එලිෆස්ගේ පුත්‍රයන්ගේ නම්
තේමාන්,[9] ඕමාර්, ෂෙපෝ, ගාතම්
සහ කෙනෂ්[10] යන අයයි.
12 ඒසව්ගේ පුත්‍රයා වන එලිෆස්ගේ
උපභාර්යාව තිම්නාය.[11] ඇය එලි-
ෆස්ට දාව අමලෙක්[12] බිහි කළාය. ඒ
සියලුදෙනා ඒසව්ගේ භාර්යාව වූ
ආදාගේ පුත්‍රයෝය.*
13 රුවෙල්ගේ පුත්‍රයන්ගේ නම්
නාහත්, සේරා, ෂම්මාහ් සහ මිෂ්ෂා[13]
යන අයයි. ඒ සියලුදෙනා ඒසව්-

උත් 36:12* හෝ, "මුනුපුරන්."

**36 පරි.**
1 1ලේක 1:35
2 උත් 27:39 උත් 32:3
3 උත් 33:9 ඔබ 6
4 උත් 13:6 උත් 28:4
5 උත් 14:6 ද්වි 2:5
6 උත් 25:30
7 ද්වි 2:12 ඔබ 8
8 1ලේක 1:35
9 උත් 36:34 එස 25:13 ඔබ 9
10 උත් 36:42 1ලේක 1:36
11 1ලේක 1:39
12 නික් 17:8 ගණන් 13:29 ගණන් 24:20 ද්වි 25:19 1සාමු 15:8 1සාමු 30:1
13 1ලේක 1:37

**2 තීරුව**
1 උත් 26:34
2 1ලේක 1:35
3 නික් 15:15
4 1ලේක 1:53 යෝබ් 4:1 යෙරෙ 49:20
5 1ලේක 1:36
6 ගණන් 20:23 විනි 11:18 1රාජා 9:26
7 උත් 25:30 උත් 32:3 මලා 1:3
8 උත් 14:6 ද්වි 2:12 ද්වි 2:22
9 1ලේක 1:40
10 1ලේක 1:38
11 1ලේක 1:39

ගේ භාර්යාව වූ බසෙමත්ගේ[1] පුත්‍ර-
යෝය.*
14 ශිබියොන්ගේ මිනිපිරිය සහ
අනාගේ දියණිය වූ ඔහොලිබාමා
ඒසව්ට දාව බිහි කළ පුත්‍රයන්ගේ
නම් යෙවුෂ්, යාලාම් සහ කෝරාය.[2]
15 ඒසව්ගේ පුත්‍රයන් අතරින් බිහි
වූ අධිපතීන්ගේ[3] නම් මෙසේය. ඒසව්-
ගේ කුලුඳුලා වූ එලිෆස්ගේ පුත්‍ර-
යන්ගෙන් පැවත ආ අධිපතීන් නම්
තේමාන්,[4] ඕමාර්, ෂෙපෝ, කෙනෂ්,
16 කෝරා, ගාතම් සහ අමලෙක් යන
අයයි. එලිෆස්ගෙන් පැවත ආ ඒ සිය-
ලුදෙනා[5] ඒදොම් දේශයේ අධිපතියෝ
ලෙස කටයුතු කළෝය. ඒ සියලු-
දෙනා ආදාගෙන් පැවත ආ අයයි.
17 ඒසව්ගේ පුත් රුවෙල්ගේ පුත්‍ර-
යන්ගේ නම් නාහත්, සේරා, ෂම්මාහ්
සහ මිෂ්ෂාය. රුවෙල්ගෙන් පැවත ආ
ඒ සියලුදෙනා ඒදොම් දේශයේ[6] අධි-
පතියෝ ලෙස කටයුතු කළෝය.
ඒ සියලුදෙනා ඒසව්ගේ භාර්යාව වූ
බසෙමත්ගෙන් පැවත ආ අයයි.
18 ඒසව්ගේ භාර්යාව වූ ඔහොලි-
බාමාගේ පුත්‍රයන් නම් යෙවුෂ්, යාලාම්
සහ කෝරා යන අයයි. ඒ සියලුදෙනා
අනාගේ දියණියද ඒසව්ගේ භාර්යාවද
වූ ඔහොලිබාමාගෙන් පැවත ආ අධිප-
තීහුය.
19 ඒදොම්[7] ලෙසත් හැඳින්වෙන
ඒසව්ගේ පුත්‍රයන්ගේද ඔවුන්ගෙන්
පැවත ආ අධිපතීන්ගේද නම් ඒවාය.
20 ඒ දේශයේ ජීවත් වූ හෝරිව-
රුන්ගෙන් කෙනෙකු වන සේයිර්ගේ
පුත්‍රයන්[8] නම් ලොතන්, ශෝබාල්,
ශිබියොන්, අනා,[9] 21 දීෂොන්,
එෂෙර් සහ දීෂන් යන අයයි.[10] ඒදොම්
දේශයේ සිටි සේයිර්ගේ පුත්‍රයන්ගෙන්
පැවත ආ ඒ සියලුදෙනා හෝරිවරුන්
අතරේ අධිපතියෝ ලෙස කටයුතු
කළෝය.
22 ලොතන්ගේ පුත්‍රයන්ගේ නම්
හෝරී සහ හෙමම්ය. ලොතන්ගේ
සහෝදරියගේ නම තිම්නාය.[11]

උත් 36:13* හෝ, "මුනුපුරන්."

**23** ෂෝබාල්ගේ පුත්‍රයන් නම්
අල්වාන්, මනහාත්, ඒබාල්, ෂෙපො
සහ ඕනාම් යන අයයි.
**24** ශිබියොන්ගේ පුත්‍රයන්ගේ නම්
ආයා සහ අනාය. තම පියා වන ශිබි-
යොන්ට අයිති බූරුවන්ව කාන්තා-
රයේදී රැකබලා ගනිමින් සිටියදී
අනාට උණුදිය උල්පත් සම්බ විය.[1]
**25** අනාගේ පුත්‍රයාගේ නම
දීෂොන්ය. ඔහුගේ දියණියගේ නම
ඔහොලිබාමාය.
**26** දීෂොන්ගේ පුත්‍රයන්ගේ නම්
හෙම්දන්, එෂ්බන්, ඉත්රාන් සහ
කෙරන්ය.[2]
**27** එෂෙර්ගේ පුත්‍රයන්ගේ නම්
බිල්හාන්, සයවාන් සහ අකාන්ය.
**28** දීෂන්ගේ පුත්‍රයන්ගේ නම්
ඌෂ් සහ අරාන්ය.[3]
**29** හෝරිවරුන්ගේ අධිපතීන් නම්,
ලොතන්, ෂෝබාල්, ශිබියොන්, අනා,
**30** දීෂොන්, එෂෙර් සහ දීෂන් යන
අයයි.[4] ඒ සියලුදෙනා සේයිර් දේශයේ
සිටි හෝරිවරුන් අතරේ අධිපතියෝ
ලෙස කටයුතු කළෝය.
**31** ඒදොම් දේශයේ පාලනය කළ
රජවරුන්ගේ නම් මතු දැක්වේ.[5]
ඔවුන් දේශය පාලනය කළේ ඊශ්‍රා-
යෙල්වරුන් රජ කෙනෙකුව පත්
කරගැනීමට කලින්ය.[6] **32** ප්‍රථමයා
බෙයොර්ගේ පුත්‍රයා වූ බෙලාය.[7]
ඔහු පාලනය කළේ දින්හබා යන
නුවරේ සිටය. **33** බෙලා මිය ගිය
පසු ඔහු වෙනුවට බොෂ්රා නුව-
රෙන්[8] පැමිණි සේරාගේ පුත්‍ර යෝබාබ්
පාලනය කරන්න පටන්ගත්තේය.[9]
**34** යෝබාබ් මිය ගිය පසු ඔහු වෙ-
නුවට තේමාන්වරුන්ගේ[10] දේශයේ
හූෂාම් රජකම් කරන්න පටන්ගත්-
තේය.[11] **35** හූෂාම් මිය ගිය පසු ඔහු
වෙනුවට මෝවබ් තණබිමෙහි[12] මිදි-
යන්ව[13] පරාජය කළ බෙදද්ගේ පුත්‍ර
හදද් රජකම් කරන්න පටන්ගත්-
තේය. ඔහුගේ නුවරේ නම අවිත්ය.[14]
**36** හදද් මිය ගිය පසු ඔහු වෙනුවට
මස්රේකා නම් ස්ථානයෙන් පැමිණි
සම්ලා රජකම් කරන්න පටන්ගත්-
තේය.[1] **37** සම්ලා මිය ගිය පසු ඔහු
වෙනුවට මහ ගඟ* අසබඩ පිහිටි රෙ-
හොබොත් නම් ස්ථානයෙන් පැමිණි
ෂාවුල් රජකම් කරන්න පටන්ගත්-
තේය.[2] **38** ෂාවුල් මිය ගිය පසු ඔහු
වෙනුවට අක්බෝර්ගේ පුත්‍ර බාල්-
හානාන් රජකම් කරන්න පටන්-
ගත්තේය.[3] **39** අක්බෝර්ගේ පුත්‍රයා
වන බාල්-හානාන් මිය ගිය පසු ඔහු
වෙනුවට හදර් රජකම් කරන්න පටන්-
ගත්තේය. ඔහු ජීවත් වූ නුවරේ නම
පාව්ය. ඔහුගේ භාර්යාවගේ නම මෙ-
හේටබෙල්ය. ඇය මේෂාහාබ්ගේ දිය-
ණිය වූ මාත්රෙද්ගේ දියණියයි.[4]
**40** ඒසව්ගෙන් පැවත ආ අධිප-
තීන්ගේ නම් මතු දැක්වේ. ඔවුන්
එක් එක් කෙනාගේ පවුල්වලට
අනුවද ඔවුන් පාලනය කළ ප්‍රදේ-
ශවලට අනුවද ඔවුන්ගේ නම් මේ-
වාය. තිම්නා, අල්වා, යේතෙත්,[5]
**41** ඔහොලිබාමා, ඒලාහ්, පීනොන්,[6]
**42** කෙනෂ්, තේමාන්, මිබ්ෂාර්,[7]
**43** මග්දියෙල් සහ ඊරාම්ය. ඔවුන්ට
හිමි වූ දේශයේ[8] ඔවුන් පාලනය
කළ ස්ථානවලට අනුව ඒදොම්ගෙන්
පැවත ආ අධිපතීහු ඔවුන්ය.[9] ඒසව්
ඒදොම්වරුන්ගේ පියාය.[10]

# 37

යාකොබ් තම පියා විදේශික-
යෙකු ලෙස ජීවත් වූ[11] දේශය
වන කානාන්හි[12] දිගටම ජීවත් විය.
**2** යාකොබ්ගේ ජීවිත කතාව
මෙයයි.
වයස අවුරුදු දහහතක් වූ
යෝසෙප්[13] තම සහෝදරයන් සමඟ
බැටළුවන් රැකබලා ගනිමින් සිටි-
යේය.[14] ඔහු යෞවනයෙකුව සිටි නිසා
ඔහු තම පියාගේ භාර්යාවන් වන බිල්-
හාගේද[15] සිල්පාගේද පුත්‍රයන්[16] සමඟ
රැළ බලාගත්තේය. එක් දිනක් යෝ-
සෙප් තම පියා වෙතට ගොස් ඔහුගේ
සහෝදරයන්ගේ නපුරු ක්‍රියා ගැන
කීවේය.[17] **3** ඊශ්‍රායෙල් තම සියලුම
පුත්‍රයන්ට වඩා ආදරේ කළේ යෝ-
සෙප්ටය.[18] මන්ද යෝසෙප් ඉපදුණේ

**36 පරි.**
1 උත් 36:2
2 1ලේක 1:41
3 1ලේක 1:42
4 1ලේක 1:38
5 ගණන් 20:14
6 අචි 17:14 අචි 17:15 1සාමු 10:19
7 1ලේක 1:43
8 යෙසා 34:6 යෙරෙ 49:13
9 1ලේක 1:44
10 යෝබ් 2:11
11 1ලේක 1:45
12 රූත් 1:1
13 උත් 25:2 නික් 2:15 ගණන් 31:2
14 1ලේක 1:46

**2 තීරුව**
1 1ලේක 1:47
2 1ලේක 1:48
3 1ලේක 1:49
4 1ලේක 1:50
5 1ලේක 1:51
6 1ලේක 1:52
7 1ලේක 1:53
8 අචි 2:5
9 1ලේක 1:54
10 උත් 25:30 උත් 36:8

**37 පරි.**
11 උත් 23:4 උත් 28:4 හෙබ්‍රෙ 11:9
12 උත් 17:8
13 උත් 30:25 උත් 46:19
14 උත් 47:3
15 උත් 35:25
16 උත් 35:26
17 ලෙවී 5:1 1සාමු 2:24 යොහ 7:7
18 1ලේක 2:1

උත් **36:37*** එනම්, යුප්‍රටීස් ගඟ.

ඔහු මහලුව සිටියදීය. ඔහු යෝසෙප්ට
විශේෂ ඇඳුමක් මසා දුන්නේය. එය
ඉරි වැටුණු, අත් ඇති දිග වස්ත්‍ර-
යකි.[1] **4** ඊශ්‍රායෙල් ඔහුගේ සියලු
පුත්‍රයන්ට වඩා යෝසෙප්ට ප්‍රේම කළ
බව තේරුම්ගත් විට යෝසෙප්ගේ
සහෝදරයෝ ඔහුට වෛර කරන්න
පටන්ගත්තෝය.[2] ඒ නිසා ඔහු සමඟ
සමාදානයෙන් කතා කරන්න ඔවුන්ට
නොහැකි විය.[3]

**5** දිනක් යෝසෙප් සිහිනයක් දුටු-
වේය. ඔහු ඒ ගැන තම සහෝදර-
යන්ට කියූ විට[4] ඔවුහු තව
තවත් ඔහුට වෛර කරන්න පටන්-
ගත්තෝය. **6** ඔහු ඔවුන්ට මෙසේ
කීවේය. "මම දැක්ක හීනය ගැන
ඔබට කියන්න මට ඉඩ දෙන්න.[5]
**7** අපි සියලුදෙනා කෙතේ අස්වැන්න
මිටි බඳිද්දී, එකපාරටම මගේ මිටිය
නැඟිට කෙළින් හිටගත්තා. ඊට-
පස්සේ ඔබ හැමෝගේම මිටි මගේ
මිටිය වටේට හිටගෙන හිස නැමුවා."[6]
**8** එවිට ඔහුගේ සහෝදරයෝ ඔහුට
මෙසේ කීවෝය. "ඔබ අපේ රජ වෙන්-
නද හිතාගෙන ඉන්නේ?[7] ඔබ ඇත්ත-
ටම හිතුවාද ඔබට අපව පාලනය
කරන්න පුළුවන් වෙයි කියලා?"[8] ඔහු
දුටු සිහින නිසාද ඔහු කියූ දේවල්
නිසාද ඔවුහු ඔහුට තව තවත් වෛර
කරන්න පටන්ගත්තෝය.

**9** ඉන්පසු යෝසෙප් තවත් සිහින-
යක් දුටුවේය. ඒ ගැනත් ඔහු තම
සහෝදරයන්ට කීවේය. "මම තවත්
හීනයක් දැක්කා. ඒ හීනයේදී ඉර, හඳ
හා තාරකා එකොළහක් මට හිස නමා
ආචාර කළා."[9] **10** පසුව ඔහු ඒ
ගැන තම පියාටත් කීවේය. ඒ අවස්-
ථාවේදී ඔහුගේ සහෝදරයන්ද එතැන
සිටියේය. ඔහුගේ සිහිනය ගැන ඇසූ
විට පියා, "ඔබ දැක්ක හීනයේ තේරුම
කුමක්ද? මමත් ඔබේ මවත් ඔබේ
සහෝදරයනුත් ඔබ ළඟට ඇවිත්
හිස නමා ආචාර කරන්න යනවා
කියාද ඔබ කියන්නේ" යයි කියමින්
ඔහුට තරවටු[10] කළේය. **11** යෝ-
සෙප් පැවසූ දේවල් නිසා ඔහුගේ
සහෝදරයෝ ඔහුට ඊර්ෂ්‍යා[1] කරන්න
පටන්ගත්තෝය. නමුත් ඔහුගේ පියා
ඒ දේවල් සිතේ තබාගත්තේය.[2]

**12** එක් දිනක් ඔහුගේ සහෝදර-
යෝ ෂීකෙම්[3] අසල පිහිටි තණබිම-
කට පියාගේ රැළ රැගෙන ගියෝය.
**13** ඊශ්‍රායෙල් යෝසෙප්ට කතා
කර, "ඔබේ සහෝදරයෝ ෂීකෙම්
ළඟ රැළ බලාගෙන ඉන්නවා. ඔබත්
ඔවුන් ළඟට යන්න කැමතිද" කියා
ඇසීය. එවිට ඔහු, "මම යන්න කැම-
තියි"[4] කියා පැවසුවේය. **14** එවිට
ඊශ්‍රායෙල්, "ඔබ ගිහින් ඔබේ සහෝ-
දරයන් හා රැළේ සත්තු කිසි අන-
තුරක් නැතුව හොඳින් ඉන්නවාද
කියා බලා මට ඇවිත් කියන්න."[5]
එසේ කියා ඔහු යෝසෙප්ව හෙ-
බ්‍රොන් තැනිතලාවේ[6] සිට පිටත්
කර යැව්වේය. යෝසෙප් ෂීකෙම්
බලා ගියේය. **15** පසුව යෝසෙප්
තණබිමක ඇවිදිමින් සිටියේය. මිනි-
සෙක් ඔහුව දැක, "ඔබ කාවද හො-
යන්නේ" කියා ඔහුගෙන් ඇසුවේය.
**16** ඔහුද, "මම මගේ සහෝදරයන්ව
හොයනවා. ඔවුන් රැළ බලාගන්-
නේ කොහෙද කියා මට කියන්න
පුළුවන්ද?" **17** එවිට මිනිසා ඔහුට
මෙසේ කීවේය. "ඔවුන් කූඩාරම්
අකුළගෙන මෙතැනින් ගියා. 'අපි
දොතාන් වෙනට යමු' කියා ඔවුන්
කතා වෙනවා මට ඇහුණා." එබැවින්
යෝසෙප් දොතාන් දක්වා ඇවිදගෙන
ගියේය. එතැනට පැමිණි විට ඔහු තම
සහෝදරයන්ව දුටුවේය.

**18** යෝසෙප්ගේ සහෝදරයෝ දුර
තියාම ඔහුව දැක කූට ලෙස ඔහුව
මරා දැමීමට කුමන්ත්‍රණය කළෝය.[7]
**19** ඔවුහු එකිනෙකා අතරේ මෙසේ
කතා වූහ. "ඔය එන්නේ අර හීන
මවන්නා![8] **20** අපි ඔහුව මරා දමා
වතුර වළකට විසි කරමු.[9] ඊට-
පස්සේ, නපුරු වනමෘගයෙක් ඔහුව
මරා දැම්මා කියලා කියමු.[10] එන-
කොට බලමු ඔහුගේ හීනවලට මො-
නවද වෙන්නේ කියලා." **21** ඔවුන්
කුමන්ත්‍රණය කරමින් සිටි දෙය දැන-

**37 පරි.**
**1** උත් 37:32
**2** හිතෝ 14:30, හිතෝ 27:4
**3** ගලා 5:20, තීත 3:3
**4** උත් 37:19
**5** ගණන් 12:6
**6** උත් 42:6, උත් 42:9
**7** උත් 45:8
**8** උත් 49:26
**9** උත් 44:14, උත් 45:9
**10** හිතෝ 17:10, දේශ 7:5

**2 තීරුව**
**1** හිතෝ 14:30, ක්‍රියා 7:9, යාකො 3:14
**2** දානි 7:28, ලූක් 2:19
**3** උත් 33:18
**4** 1සාමු 3:4, යෙසා 6:8
**5** 1සාමු 17:17, හිතෝ 15:30
**6** උත් 23:19, උත් 35:27
**7** ගීතා 37:14, ගීතා 94:21, හිතෝ 6:17, මතෙ 15:19
**8** උත් 37:5
**9** ගීතා 64:5, හිතෝ 1:11, හිතෝ 27:4
**10** උත් 31:39, නික් 22:13

ගත් විට රූබෙන් යෝසෙප්ව බේ-
රාගන්න උත්සාහ කරමින්[1] මෙසේ
කීවේය. “අපි ඔහුගේ ජීවිතේට
හානියක් නොකරමු.”[2] **22** රූබෙන්
ඔවුන්ට මෙසේද කීවේය. “අනේ, ඔහුව
මරන්න නම් එපා.[3] අපි පාළුකරයේ
තියෙන මේ වතුර වළට ඔහුව තල්ලු
කරලා දාමු. නමුත් ඔහුට කිසි අනතු-
රක් කරන්න එපා.”[4] ඔහු මෙසේ කීවේ
යෝසෙප්ව ඔවුන්ගේ අතින් ගලවා
නැවත පියාට භාර දීමේ අදහසින්ය.

**23** යෝසෙප් තම සහෝදරයන්
ළඟට පැමිණි විට ඔවුහු යෝසෙප් ඇඳ
සිටි ඉරි වැටුණු දිග වස්ත්‍රය ගලවා,[5]
**24** ඔහුව ගෙන ගොස් වතුර වළට
තල්ලු කර දැමුවෝය.[6] ඒ කාලයේදී
එහි වතුර හිඳී ගොස් තිබිණ.

**25** ඉන්පසු ඔවුහු කෑම කන පිණිස
හිඳගත්තෝය.[7] ටික වේලාවකට පසු,
ගිලියද් සිට පැමිණෙන ඉෂ්මායෙල්ව-
රුන්ගේ[8] තවලමක් ඔවුහු දුටුවෝය.
ඊජිප්තුවේ වෙළඳාම් කිරීමට රැගෙන
ගිය ලැබ්ඩනම් මැලියම්ද බෝල්සම්
තෙල්ද රුක්ලාටුද[9] ඔවුන්ගේ ඔටු-
වන් පිට පටවා තිබිණ. **26** යූදා
ඔවුන්ව දැක තම සහෝදරයන්ට
මෙසේ කීවේය. “අපි අපේ සහෝදර-
යාව මරා දැමුවා කියා අපිට තියෙන
වාසිය මොකක්ද?[10] **27** අපි ඔහුට
කිසි හානියක් නොකර[11] ඉෂ්මායෙල්-
වරුන්ට විකුණමු.[12] අනික ඔහු අපේම
සහෝදරයානේ.” ඔවුහු යූදා කියූ
දේට සවන් දුන්නෝය.[13] **28** මිදියන්
ජාතික වෙළෙන්දෝ[14] එතැන පසු
කරමින් ගියෝය. එවිට ඔවුහු යෝ-
සෙප්ව වතුර වළෙන් ගොඩට ගෙන[15]
ඔහුව ඉෂ්මායෙල්වරුන්ට රිදී ෂෙ-
කෙල් විස්සකට වික්කෝය.[16] ඉෂ්-
මායෙල්වරු යෝසෙප්ව ඊජිප්තුවට
ගෙන ගියෝය.

**29** පසුව රූබෙන් නැවත වතුර
වළ ළඟට ගොස් බැලුවේය. යෝසෙප්
එහි නැති බව දුටු විට ඔහු බොහෝ
සෙයින් දුක් වී තම වස්ත්‍ර ඉරාගත්-
තේය.[17] **30** ඔහු තම සහෝදරයන්
වෙතට දුව ගොස් මෙසේ ඇසුවේය.
“දරුවා නැහැනේ! දැන් මම මොන-
වාද කරන්නේ?”[1]

**31** ඔවුහු එළුවෙකුව මරා යෝ-
සෙප්ගේ දිග වස්ත්‍රය උගේ ලේවල
පෙඟෙව්වෝය.[2] **32** ඉන්පසු ඔවුහු
මේ පණිවිඩය සමඟින් ඒ වස්ත්‍රය
තමන්ගේ පියා වෙතට යැව්වෝය.
“අපිට මේක හම්බ වුණා. මේ ඔබේ
පුතාගේ ඇඳුමද[3] කියා බලන්න.”[4]
**33** එවිට ඔහු ඒ දෙස බලා හඬ නඟා
මෙසේ කීවේය. “මේ මගේ පුතාගේ
දිග වස්ත්‍රයනේ! අනේ මගේ පුතාව
නපුරු සතෙක් මරලා දාන්න ඇති!”[5]
**34** ඉන්පසු යාකොබ් තම වස්ත්‍ර ඉරා-
ගෙන තම ඉණ වටේ ගෝණි රෙදි
ඇඳ දවස් ගණනාවක්ම තම පුත්‍රයා
නිසා වැලපුණේය.[6] **35** ඔහුගේ දූපු-
තුන් සියලුදෙනාම ඔහුව සනසන්න
උත්සාහ කළ[7] නමුත් ඔහු, “අනේ,
මගේ පුතා එක්කම මාත් මැරුණා
නම්” යයි කියමින් බොහෝ සෙයින්
ඇඬුවේය. යෝසෙප්ගේ පියා දවස්
ගණනාවක්ම මෙසේ හඬා වැලපු-
ණේය.[8]

**36** මිදියන්වරු යෝසෙප්ව ඊජිප්-
තුවට ගෙන ගොස් පාරාවෝගේ මාලි-
ගාවේ නිලධාරියෙකු සහ ආරක්ෂක
නිලධාරීන්ගේ ප්‍රධානියා[9] වන පොති-
ෆර්ට වික්කෝය.[10]

**38** ඒ කාලයේදී යූදා තම සහෝ-
දරයන්ගෙන් වෙන් වී හීරා
නම් වූ අදුල්ලාම් ජාතික[11] මිනිසෙකු
ජීවත් වූ ස්ථානය අසල තම කූඩාරම
ගසාගත්තේය. **2** එහිදී යූදාට ෂූවා
නම් වූ කානානි ජාතිකයෙකුගේ[12] දිය-
ණියක ගැන උනන්දුවක් ඇති විය.
ඔහු ඇයව තම බිරිඳ වශයෙන් භාර-
ගෙන තම කූඩාරමට ගෙන ගියේය.
**3** පසුව ඇය ගැබ්ගෙන පුත්‍රයෙකු බිහි
කළාය. යූදා ඔහුට ඒර්[13] යන නම
තැබීය. **4** ඇය නැවත ගැබ්ගෙන
පුත්‍රයෙකු බිහි කළාය. ඇය ඔහුට
ඕනාන් යන නම තැබුවාය. **5** ඇය
තුන්වන වරටත් පුත්‍රයෙකු බිහි කර
ඔහුට ෂේලා යන නම තැබුවාය. ඔහු

**37 පරි.**
1 ගීතා 97:10, ආදි 3:17
2 උත් 9:5, නික් 20:13, ලෙවී 24:17, 1යොහ 3:15
3 උත් 4:10, උත් 42:22, හිතෝ 6:17
4 උත් 42:21, ගීතා 37:8, යෙරෙ 22:3
5 උත් 37:3
6 ගීතා 69:8
7 ආමො 6:6
8 උත් 25:12
9 උත් 43:11, නික් 25:6
10 උත් 4:10, නික් 21:14
11 යෙරෙ 22:3
12 නික් 21:16, නෙහෙ 5:8, ක්‍රියා 7:9
13 හිතෝ 12:15
14 උත් 25:2
15 යෙරෙ 38:13
16 උත් 40:15, උත් 45:4, ද්වි 24:7, ගීතා 105:17
17 උත් 44:13, ක්‍රියා 14:14

**2 තීරුව**
1 උත් 49:3
2 හිතෝ 28:17
3 උත් 37:3, 1තිමෝ 5:24
4 උත් 38:25, ගණන් 35:24
5 උත් 44:28, නික් 22:13, 2රාජා 2:24
6 2සාමු 1:11, යෝබ් 1:20
7 1තෙස 5:14
8 ගීතා 77:2, මතෙ 2:18
9 උත් 40:3
10 උත් 39:1

**38 පරි.**
11 යොෂු 12:15, 1සාමු 22:1
12 උත් 24:3, උත් 28:1
13 ගණන් 26:19

ඉපදුණු අවස්ථාවේදී ඔවුන් සිටියේ
අක්සිබ් නුවරේය.[1]
**6** කලක් ගෙවුණු පසු යූදා තම
කුලුඳුල් පුත්‍රයා වන ඒර්ට භාර්යා-
වක් සොයා දුන්නේය. ඇගේ නම
තාමර්ය.[2] **7** නමුත් යෙහෝවා දෙවි
යූදාගේ කුලුඳුලා වන ඒර්ව සැලකුවේ
ඉතා දුෂ්ට කෙනෙකු ලෙසයි.[3] එබැ-
වින් යෙහෝවා දෙවි ඔහුව මරණ-
යට පත් කළේය.[4] **8** ඒ නිසා යූදා
ඕනාන්ට කතා කර මෙසේ කීවේය.
“ඔබේ සහෝදරයාගේ භාර්යාව සමඟ
විවාහ වී ඔබේ සහෝදරයාගේ නමින්
දරුවන් බිහි කරන්න. ඔබ එසේ කර
මස්සිනාගේ යුතුකම් ඉටු කරන්න.”[5]
**9** එහෙත් දරුවන් තමාට අයිති නො-
වන බව දැන සිටි නිසා[6] ඕනාන් තම
සහෝදරයාගේ භාර්යාව සමඟ සය-
නය කළ විට තම ශුක්‍රධාතු බිම
වැගිරෙන්න සැලැස්වූවේය. ඔහු එසේ
කළේ තම සහෝදරයාගේ නමින් දරු-
වන් බිහි නොවන පිණිසය.[7] **10** ඔහු
කළ මේ ක්‍රියාව යෙහෝවා දෙවි හෙ-
ළාදුටු[8] බැවින් දෙවි ඔහුවද මරණයට
පත් කළේය.[9] **11** එබැවින් යූදා තම
ලේලිය වන තාමර්ට මෙසේ කීවේය.
“මගේ පුත් ෂේලා වැඩිහිටියෙක් වන
තුරු ඔබේ පියාගේ නිවසේ වැන්දඹු-
වක් ලෙස ජීවත් වෙන්න.”[10] ඔහු එසේ
කීවේ ෂේලාත් තම අනික් පුතුන් මෙන්
මිය යයි කියා භයින් සිටි නිසාය.[11]
තාමර් ඔහු කිවූ ලෙස තම පියාගේ
නිවසට ගොස් එහි ජීවත් වූවාය.[12]
**12** කලක් ගෙවුණු පසු ෂුවාගේ
දියණිය වන යූදාගේ භාර්යාව[13] මිය
ගියාය. වැලපීමේ කාලය[14] නිම වූ පසු
යූදා තම බැටළුවන්ගේ ලොම් කපන්-
නන් සිටි ස්ථානය වන තිම්නාහ්[15]
බලා ගියේය. ඔහු සමඟ ඔහුගේ මිතුරා
වන අදුල්ලාම් ජාතික[16] හීරාද ගියේය.
**13** ඉන්පසු තාමර්ට මෙසේ දන්වන
ලදී. “ඔබේ මාමා ඔහුගේ බැටළුවන්-
ගේ ලොම් කපන්න තිම්නාහ් වෙතට
යනවා.”[17] **14** එවිට ඇය වැන්දඹු
ඇඳුම් ගලවා වෙනත් වස්ත්‍රයක් ඇඳ
මුහුණද සළුවකින් වසාගෙන තිම්-
නාහ් වෙතට යන මඟෙහි පිහිටි
එනායිම්ට ඇතුල් වන ස්ථානයෙහි
හිඳගත්තාය. ෂේලා වැඩිහිටියෙකුව
සිටියත් ඇයව ඔහුට විවාහ කර නො-
දෙන බව ඇය දැන සිටියාය.[1]
**15** ඇය මුහුණ වසාගෙන[2] සිටි
නිසා යූදා ඇයව දුටු විට ඇය ගණිකා-
වක්යයි[3] සිතුවේය. **16** එබැවින් ඔහු
ඇය ළඟට ගොස් මෙසේ කීවේය.
“එන්න, ඇවිත් මා සමඟ සයනය
කරන්න.”[4] ඇය ඔහුගේ ලේලිය[5] බව
ඔහු නොදැන සිටියේය. එවිට ඇය
මෙසේ ඇසුවාය. “ඔබ සමඟ සයනය
කළොත් ඔබ මට මොනවද දෙන්-
නේ?”[6] **17** එවිට ඔහු මෙසේ පිළි-
තුරු දුන්නේය. “මම රැළෙන් එළු
පැටියෙක් එවන්නම්.” නමුත් ඇය,
“ඌව එවනකම් ඔබ ඇප වශයෙන්
මට යමක් දෙනවාද”[7] කියා ඇසුවාය.
**18** එවිට ඔහු, “ඔබට ඇප වශ-
යෙන් මගෙන් මොනවාද ඕනේ” කියා
ඇගෙන් ඇසීය. එවිට ඇය මෙසේ පිළි-
තුරු දුන්නාය. “ඔබේ මුද්දත්*[8] මාල-
යත් ඔබේ අතේ තියෙන සැරයටියත්
මට දෙන්න.” එවිට ඔහු ඒවා ඇයට දී
ඇය සමඟ සයනය කළේය. ඇය ඔහු
නිසා ගැබ්ගත්තාය. **19** ඇය එතැ-
නින් නැඟිට ගොස් එම වස්ත්‍රය ගලවා
ඇය කලින් ඇඳ සිටි වැන්දඹු ඇඳුම්
ඇඳගත්තාය.[9]
**20** ඇප වශයෙන් දුන් දේවල් ඒ
ස්ත්‍රියගෙන් නැවත ලබාගන්නා
පිණිස යූදා තම අදුල්ලම් ජාතික
මිතුරා[10] අතෙහි එළු පැටියාව යැව්-
වේය. නමුත් ඇයව ඔහුට සම්බ වුණේ
නැත. **21** ඔහු ඇය සිටි ස්ථානයේ
පුරුෂයන්ට කතා කර, “එනායිම් මඟ
අසල සිටි දේවාලේ ගණිකාව කො-
හේද” කියා ඇසූ විට ඔවුහු, “දේවා-
ලේ ගණිකාවක්[11] කවදාවත් මෙතන
හිටියේ නැහැ” කියා පිළිතුරු දුන්-
නෝය. **22** පසුව ඔහු යූදා වෙතට
ගොස් මෙසේ කීවේය. “මට ඇයව
හම්බ වුණේ නැහැ. අනික, ‘දේවාලේ

**38 පරි.**
1 යොෂු 19:29 විනි 1:31
2 මතෙ 1:3
3 ද්වි 21:20 ගලා 5:19 1පේතෘ 3:12
4 2සාමු 6:7 ක්‍රියා 12:23
5 ද්වි 25:5 ද්වි 25:6 රූත් 1:11 මතෙ 22:24
6 රූත් 4:6
7 ද්වි 25:9
8 යෙසා 65:12
9 1ලේක 2:3 ගීතා 55:23
10 රූත් 1:13 මතෙ 22:24
11 ගණන් 26:19
12 ලෙවී 22:13
13 උත් 38:2
14 ගණන් 20:29 ද්වි 34:8
15 යොෂු 15:10 විනි 14:1
16 උත් 38:1
17 1සාමු 25:4

**2 තීරුව**
1 ද්වි 25:5 රූත් 1:11 මතෙ 22:24
2 හිතෝ 7:10
3 යෙරෙ 3:2
4 1කොරි 6:18 හෙබ්‍රෙ 13:4
5 උත් 38:11
6 ද්වි 23:18 එස 16:33 ලූක් 15:30
7 හිතෝ 20:16
8 උත් 41:42 1රාජා 21:8 එස්ත 8:8 දානි 6:17
9 2සාමු 14:2
10 උත් 38:1
11 ද්වි 23:17

උත් **38:18*** මූ.අ., “මුද්‍රා තබන මුද්ද.”

ගණිකාවක් කවදාවත් මෙතන හිටියෙත් නැහැ’ කියා ඒ පළාතේ ඉන්න පුරුෂයන් කිව්වා.” **23** එවිට යූදා මෙසේ කීවේය. “ඇයට ඒවා තියාගන්න දෙමු. ඇයව තවත් හොයන්න ගියොත් අපි ලැජ්ජාවට පත් වෙයි.[1] ඔබට ඇයව හම්බ වුණේ නැත්නම් කරන්න දෙයක් නැහැ. මම මගේ පොරොන්දුව ඉටු කරලා මේ එළු පැටියාව යැව්වානේ.”

**24** මාස තුනකට පසු, “ඔබේ ලේලිය වන තාමර් ගණිකාවක් වගේ හැසිර[2] දැන් ගැබ්ගෙන[3] සිටිනවා” කියා යූදාට ආරංචි විය. එවිට යූදා මෙසේ කීවේය. “ඇයව පිටතට ගෙනැවිත් මරා පුලුස්සා දමන්න.”[4] **25** ඇයව ගෙන යද්දී ඇය තම මාමාට පණිවිඩයක් යවමින් මෙසේ කීවාය. “මම ගැබ්ගත්තේ මේවා අයිති පුරුෂයා නිසයි.”[5] ඇය මෙසේද කියා යැව්වාය. “මේ මුද්දත් මාලයත් සැරයටියත්[6] අයිති කාටද කියා හොඳින් බලන[7] මෙන් මම ඔබෙන් ඉල්ලා සිටිනවා.” **26** එවිට යූදා ඒවා හොඳින් සෝදිසි කර බලා මෙසේ කීවේය.[8] “ඇය මට වඩා ධර්මිෂ්ඨයි.[9] ඇය මේ දේ කළේ ඇයව මගේ පුත් ෂේලාට නොදුන් නිසයි.”[10] එම සිද්ධියෙන් පසු ඔහු ඇය සමඟ නැවත කායික සම්බන්ධකම් පැවැත්වූයේ නැත.[11]

**27** ඇගේ කුසෙහි නිවුන් දරුවන් සිටින බව දරු ප්‍රසූතියේදී පෙනී ගියේය. **28** දරු ප්‍රසූතියේදී එක් දරුවෙක් තම අත පිටතට දැමුවේය. වින්නඹුව විගස තද රතු පැහැති නූලක් ගෙන ඔහුගේ අතේ බඳිමින් මෙසේ කීවාය. “මුලින්ම එළියට ආවේ මේ දරුවායි.” **29** නමුත් ඔහු තම අත ඇතුළට ගත් විට ඔහුගේ සහෝදරයා පිටතට ආවේය. එවිට වින්නඹුව පුදුමයෙන් මෙසේ කීවාය. “ඔබ අම්මාව තුවාල කරගෙන මේ විදිහට එළියට ආවේ ඇයි?” ඔහුට පේරෙස්*[12] යන නම තැබුවේ ඒ නිසාය.

උත් **38:29*** තේරුම, “ඉරී යෑම.”

**30** පසුව තද රතු පැහැති නූල අතෙහි බැඳ තිබූ ඔහුගේ සහෝදරයා පිටතට ආවේය. ඔහුට සේරා*[1] යන නම තබන ලදි.

**39** යෝසෙප්ව ඉෂ්මායෙල්වරුන් විසින් ඊජිප්තුවට ගෙන යන ලදි.[2] ඊජිප්තු ජාතිකයෙක් වූ පොතිෆර්[3] ඉෂ්මායෙල්වරුන්ගෙන්[4] ඔහුව මිල දී ගත්තේය. පොතිෆර්, පාරාවෝගේ මාලිගාවේ නිලධාරියෙක් සහ ආරක්ෂක නිලධාරීන්ගේ ප්‍රධානියාද විය. **2** යෝසෙප්ට යෙහෝවා දෙවිගේ ආශීර්වාදය තිබූ නිසා ඔහු කළ සියල්ල සාර්ථක විය.[5] කලක් ගෙවුණු පසු ඔහුගේ ඊජිප්තු ජාතික ස්වාමියාගේ නිවසේ යම් වගකීම්ද ඔහුට භාර දෙන ලදි. **3** යෙහෝවා දෙවිගේ ආශීර්වාදය ඔහුට තිබූ බවත් ඔහු කළ සියල්ල යෙහෝවා දෙවි සාර්ථක වීමට සැලැස්වූ බවත් ඔහුගේ ස්වාමියාට පෙනී ගියේය.

**4** යෝසෙප් දිනෙන් දින තම ස්වාමියාගේ සිත දිනාගත්තේය. ඔහු නිතරම තම ස්වාමියාගේ ඕනෑ එපාකම් ගැන සොයා බලමින් ඔහුට සේවය කළේය. කල් යත්ම ස්වාමියා තම නිවසේ වැඩකටයුතු බලා කියා ගැනීමට යෝසෙප්ව පත් කර[6] තමාට අයිති සියල්ලත් ඔහුගේ අතට භාර දුන්නේය. **5** ඊජිප්තු ජාතිකයා තම නිවසේ වැඩකටයුතු හා තමාට අයිති සියල්ල යෝසෙප්ගේ අතට භාර දුන් පසු යෙහෝවා දෙවි ඔහුගේ නිවසට ආශීර්වාද කරන්න පටන්ගත්තේය. යෝසෙප් නිසා ඔහුගේ නිවසේ තිබූ සියල්ලටත් කෙත්වතුවල තිබූ සියල්ලටත් යෙහෝවා දෙවි ආශීර්වාද කළේය.[7] **6** එබැවින් ඔහු තමා කන කෑම හැරෙන්න තමාට අයිති කිසිම දෙයක් ගැන කරදර නොවී ඒ සියල්ල යෝසෙප්ගේ අතට භාර දුන්නේය.[8] යෝසෙප් ඉතා කඩවසම් පෙනුමක් ඇති කෙනෙක් විය.

උත් **38:30*** තේරුම, “බැබළෙමින්.”

**38 පරි.**
1 හිතෝ 6:33 හිතෝ 12:14 හිතෝ 18:3 රෝම 6:21 2කොරි 4:2 එෆි 5:12
2 උත් 34:31 ගණන් 5:12
3 උත් 19:36 2සාමු 11:5
4 ලෙවී 21:9 ද්වි 24:16
5 උත් 38:16 හිතෝ 18:17 1කොරි 4:5
6 උත් 38:18
7 උත් 31:32 උත් 37:32 ලෙවී 19:15
8 රෝම 2:1
9 1සාමු 24:17 යෝබ 33:27 හිතෝ 11:6
10 උත් 38:11 ද්වි 25:5 රූත් 3:12
11 යෝබ 34:32
12 උත් 46:12 රූත් 4:12 1ලේක 2:4 ලූක් 3:33

**2 තීරුව**
1 1ලේක 9:6 මතෙ 1:3

**39 පරි.**
2 ගීතා 105:17 ක්‍රියා 7:9
3 උත් 37:36
4 උත් 17:20 උත් 37:25
5 ගීතා 1:3 රෝම 8:31 හෙබ්‍රෙ 13:6
6 හිතෝ 14:35 ලූක් 12:44 1කොරි 4:2
7 උත් 30:27 ද්වි 28:3 2සාමු 6:11
8 ලූක් 16:10 ලූක් 19:17

**7** යෝසෙප්ගේ ස්වාමියාගේ භාර්-
යාව යෝසෙප් දෙස රාගයෙන්
බලන්න පටන්ගත්තාය.[1] ඇය කිහිප
වතාවක්ම, “මාත් සමඟ සයනය
කරන්න”[2] කියා ඔහුට පෙරැත්ත
කළාය. **8** එහෙත් ඔහු ඒ හැම
අවස්ථාවකදීම ඇගේ ඉල්ලීම ප්‍රතික්-
ෂේප[3] කරමින් මෙසේ කීවේය. “මගේ
ස්වාමියා මාව විශ්වාස කරන නිසා
ඔහුගේ නිවසේ තියෙන හැම දෙයක්ම
ඔහු මගේ අතට භාර දුන්නා. ඔහු මම
කරන කිසිම දෙයක් ගැන හො-
යලා බලන්නේ නැහැ.[4] **9** මේ නිව-
සේ මට ඉහළින් ඉන්න කෙනෙක්
නැහැ. ඔබ ඔහුගේ භාර්යාව නිසා ඔබ
හැර[5] අනික් හැම දෙයක්ම ඔහු මට
භාර දී තිබෙනවා. එහෙමනම්, මේ
තරම් දුෂ්ට දෙයක් කර දෙවිට විරුද්-
ධව මම පව් කරන්නේ කොහොමද?”[6]
**10** ඇය සමඟ තනිවම කාලය
ගත කරන ලෙසත් ඇය සමඟ සය-
නය කරන ලෙසත් දවසක් දවසක්
පාසා ඇය යෝසෙප්ට ඇවිටිලි කළත්
ඔහු ඇයට සවන් දුන්නේ නැත.[7]
**11** එක් දිනක් ඔහු වෙනදා මෙන් තම
වගකීම් ඉටු කරන පිණිස නිවස
ඇතුළට ගියේය. ඒ අවස්ථාවේදී
කිසිම සේවකයෙක් නිවස තුළ සිටියේ
නැත.[8] **12** එවිට ඇය යෝසෙප්ගේ
ඇඳුමෙන් අල්ලා ඔහුව තමා ළඟට
ඇදගනිමින්,[9] “මා සමඟ සයනය
කරන්න”[10] යයි කීවාය. නමුත් ඔහු
තම ඇඳුම අත්හැර නිවසෙන් පිට-
තට පලා ගියේය.[11] **13** ඔහු තම
ඇඳුම අත්හැර ගිය බව දුටු විට,
**14** ඇය කෑගසමින් නිවසේ සේවක-
යන්ට මෙසේ කීවාය. “මේ බලන්න!
මගේ ස්වාමියා ගෙදරට ගෙනා අර
හෙබ්‍රෙව් ජාතික මනුස්සයා අපිට
නින්දා කළා. ඔහු මාව දූෂණය
කරන්න හැදුවා. නමුත් මම හයි-
යෙන් කෑගහන්න පටන්ගත්ත නිසා,[12]
**15** ඔහු ඇඳුමත් දාලා එළියට දිව්වා.”
**16** ඉන්පසු ඇය ඔහුගේ ඇඳුම තමා
ළඟ තබාගෙන තම ස්වාමියා එන
තෙක් බලා සිටියාය.[13]

**17** ඔහු පැමිණි විට ඇය ඔහුට
මෙසේ පැවසුවාය. “ඔබ අපේ ගෙදරට
ගෙනා හෙබ්‍රෙව් ජාතික සේවකයා
මගේ ළඟට ඇවිත් මාව නින්දා-
වට පත් කරන්න හැදුවා. **18** නමුත්
මම හයියෙන් කෑගැහුව නිසා ඔහු-
ගේ ඇඳුමත් දාලා එළියට දිව්වා.”[1]
**19** මෙසේ ඇය, “ඔබේ සේවකයා
මට මේ මේ දේවල් කළා” යයි කී
විට යෝසෙප්ගේ ස්වාමියා අතිශ-
යින් කෝප විය.[2] **20** එබැවින් යෝ-
සෙප්ගේ ස්වාමියා ඔහුව සිරගෙට
භාර දුන්නේය. රජුද සිරකරුවන්ව
භාර දුන්නේ එම සිරගෙදරටමය.
යෝසෙප් යම් කාලයක් සිරභාරයේ
සිටියේය.[3]

**21** එහෙත් යෙහෝවා දෙවි දිගටම
යෝසෙප්ට උපකාර කර ඔහුට කරු-
ණාව* දැක්වූයේය. එමනිසා කල්
යත්ම, යෝසෙප්ට සිරගෙයි ප්‍රධා-
නියාගේ සිත දිනාගැනීමට හැකි
විය.[4] **22** සිරගෙයි ප්‍රධානියා සියලු
සිරකරුවන්ව යෝසෙප්ගේ භාරයේ
තැබුවේය. සිරගෙයි සෑම කටයුත්-
තක්ම මෙහෙයවනු ලැබුවේත් යෝ-
සෙප් විසින්ය.[5] **23** යෙහෝවා දෙවි
යෝසෙප්ට ආශීර්වාද කළ නිසාත්
යෙහෝවා දෙවි යෝසෙප් කළ
සියල්ල සාර්ථක[6] වෙන්න සැලැස්වූ
නිසාත් සිරගෙයි ප්‍රධානියා තමා යට-
තේ තිබූ කිසිම දෙයක් ගැන සොයා
බැලුවේ නැත.

**40** කල් යත්ම ඊජිප්තුවේ රජු-
ගේ කුසලාන දරන්නා[7] හා
රොටි සාදන්නා තමන්ගේ ස්වා-
මීන් වන ඊජිප්තුවේ රජුට[8] විරුද්-
ධව වරදක් කළෝය. **2** පාරාවෝ
තම සේවකයන් දෙදෙනා වන කුස-
ලාන දරන්නන්ගේ ප්‍රධානියාද රොටි
සාදන්නන්ගේ ප්‍රධානියාද[9] සමඟ උද-
හස් විය.[10] **3** එබැවින් රජ ඔවුන්ව
ප්‍රධාන ආරක්ෂක නිලධාරියා[11] භාර-
යේ තිබූ සිරගෙදරට භාර දුන්නේය.[12]
යෝසෙප් සිටියේද එම සිරගෙදරමය.

**39 පරි.**
1 මතෙ 5:28 2පේතෘ 2:14
2 ලෙවී 20:10 හිතෝ 2:16 1කොරි 6:9
3 හිතෝ 1:10 හිතෝ 5:20 හිතෝ 22:6
4 ලූක් 16:12 1කොරි 4:2
5 හිතෝ 6:29 මාක් 10:8
6 උත් 2:24 උත් 20:6 ගීතා 51:4 ගලා 5:19 හෙබ්‍රෙ 13:4
7 හිතෝ 5:3 හිතෝ 22:14
8 යෝබ් 24:15 යෙරෙ 23:24
9 දේශ 7:26 යාකො 1:14
10 2සාමු 13:11
11 හිතෝ 6:32 1කොරි 6:18 2තිමෝ 2:22
12 ගීතා 35:20 හිතෝ 6:19 හිතෝ 12:17
13 ගීතා 37:12

**2 තීරුව**
1 නික් 20:16 හිතෝ 12:22 හිතෝ 19:5
2 ද්වි 19:15 හිතෝ 6:34 හිතෝ 29:12
3 ගීතා 105:18 1පේතෘ 2:20 1පේතෘ 3:14
4 උත් 40:3 ගීතා 105:19 හිතෝ 16:7 ආනි 1:9 ක්‍රියා 7:9
5 උත් 39:6
6 උත් 49:22 ගීතා 1:3 ක්‍රියා 7:10

**40 පරි.**
7 උත් 40:11 උත් 41:9
8 ක්‍රියා 7:10
9 උත් 40:20
10 උත් 41:10 හිතෝ 16:14 හිතෝ 19:12
11 උත් 37:36
12 උත් 39:20 ගීතා 105:18

උත් **39:21*** හෝ, “ඇදි ප්‍රේමය.”

**4** ප්‍රධාන ආරක්ෂක නිලධාරියා යෝ-
සෙප්ව ඒ දෙදෙනාගේ සේවකයා ලෙස
පත් කළේය.[1] ඔවුහු යම් කාලයක්
සිරභාරයේ සිටියෝය.

**5** මෙසේ, සිරකරුවන්ව සිටියදී
ඊජිප්තුවේ රජුගේ කුසලාන දරන්නා
හා රොටි සාදන්නා[2] එකම රාත්‍රියේ[3]
සිහින[4] දුටුවෝය. ඔවුන් දෙදෙනා දුටු-
වේ අර්ථ දෙකක් ඇති එකිනෙකට
වෙනස් සිහින දෙකකි.[5] **6** පසුවදා
උදෑසන යෝසෙප් ඔවුන් වෙතට
පැමිණි විට ඔවුන් දුක්මුසු ස්වභාව-
යකින් සිටින බව ඔහු දුටුවේය.[6]
**7** ඒ නිසා, ඔහු ඔවුන් දෙදෙනා-
ගෙන් මෙසේ ඇසුවේය. “අද ඔබ
දෙදෙනා දුකෙන් ඉන්නේ ඇයි?”[7]
**8** එවිට ඔවුහු මෙසේ කීවෝය. “අපි
දෙන්නම හීන දැක්කා. නමුත් ඒ හීන-
වල අර්ථය තෝරා දෙන්න කවුරුත්
නැහැ.” එය අසා යෝසෙප් මෙසේ
කීවේය. “යම් කාරණයක අර්ථය
තෝරා දෙන්න අයිතිය තියෙන්නේ
දෙවිටයි.[8] ඔබ දැක්ක හීන මට දැන්
කියන්න.”

**9** කුසලාන දරන්නන්ගේ ප්‍රධා-
නියා තමාගේ සිහිනය ගැන
විස්තර කරමින් යෝසෙප්ට මෙසේ
කීවේය. “මම හීනෙන් දැක්කේ මිදිවැ-
ලක්. **10** ඒ මිදිවැලේ රිකිලි තුනක්
තිබුණා. රිකිලිවල දලු දැම්මාට
පස්සේ,[9] මල් හා ඉදුණු මිදිපො-
කුරු හටගත්තා. **11** මම මිදි කඩා-
ගෙන මගේ අතේ තිබුණ පාරාවෝගේ
කුසලානයට ඒවා මිරිකා[10] පාරා-
වෝගේ අතට කුසලානය දුන්නා.”[11]
**12** එවිට යෝසෙප් ඔහුට මෙසේ
කීවේය. “ඒ හීනේ අර්ථය මෙකයි.[12]
රිකිලි තුන කියන්නේ දවස් තුනක්.
**13** තව දවස් තුනකින් පාරාවෝ
ඔබව නිදහස් කර කුසලාන දරන්නා
හැටියට ඔබ කලින් දැරූ තනතුර
නැවතත් ඔබට ලබා දෙනවා.[13] ඔබ
කලින් කළා වගේම නැවතත් පාරා-
වෝගේ අතට කුසලානය දෙනවා.[14]
**14** මම ඔබෙන් එක ඉල්ලීමක් කර-
නවා. ඔබව නිදහස් කළාට පස්සේ

**40 පරි.**
1 උත් 39:22
2 උත් 41:10
3 උත් 41:11
4 යෝබ් 33:15
5 උත් 41:12
6 හිතෝ 15:13 දානි 1:10
7 ලූක් 24:17
8 උත් 41:16 ගීතා 25:14 දානි 2:28 දානි 2:45
9 ගණන් 13:23
10 හිතෝ 3:10
11 උත් 40:21
12 උත් 41:12 දානි 2:30
13 උත් 40:21 උත් 41:13 යෙරෙ 52:31
14 නෙහෙ 2:1

**2 තීරුව**
1 1සාමු 25:31 ලූක් 23:42
2 2සාමු 9:1
3 උත් 14:13 උත් 37:28 උත් 41:12 නික් 21:16 ක්‍රියා 7:9
4 උත් 39:8 ගීතා 105:19 ගීතා 119:86 දානි 6:22 යොහ 15:25 හෙබ්‍රෙ 12:11 1පේතෘ 3:17
5 උත් 49:20 1ලේක 12:40
6 උත් 15:11
7 උත් 41:12
8 උත් 41:13 ද්වි 21:22 යොෂු 8:29 යොෂු 10:26
9 1සාමු 17:44 2සාමු 21:10 යෙරෙ 16:4 එස 39:4 එළි 19:17
10 දේශ 7:1 මාක් 6:21
11 හිතෝ 16:14
12 නෙහෙ 2:1
13 උත් 41:13 එස්ත 7:10

මාව අමතක කරන්න එපා.[1] මට
කරුණාව* පෙන්වා මා ගැන පාරා-
වෝට කියන්න.[2] මේ හිරගෙදරින්
මාව නිදහස් කරන්න. **15** මේ දේශ-
යට මාව එක්කගෙන ආවේ හෙබ්‍රෙව්-
වරුන්ගේ දේශයේදී මාව පැහැරගත්
පිරිසක්.[3] මේ වළේ මාව හිර කර
තබන්න තරම් වරදක් මම කළේ
නැහැ.”[4]

**16** ඒ සිහිනයට හොඳ අර්ථයක්
තිබෙන බව යෝසෙප් කියූ නිසා
රොටි සාදන්නන්ගේ ප්‍රධානියාද යෝ-
සෙප්ට මෙසේ කීවේය. “මාත් හීන-
යක් දැක්කා. මම හිස මත කූඩ
තුනක් තියාගෙන හිටියා. ඒ කූඩවල
සුදු රොටි තිබුණා. **17** උඩම කූඩ-
යේ පාරාවෝට කන්න විවිධ කෑම
වර්ග තිබුණා.[5] රොටි සාදන්නෙක්
සාදන සෑම කෑම වර්ගයක්ම ඒකේ
තිබුණා. කුරුල්ලෝ ඇවිත් ඒ කූඩ-
යෙන් කෑම කෑවා.”[6] **18** එවිට යෝ-
සෙප් මෙසේ කීවේය. “ඔබේ හීනයේ
අර්ථය මෙකයි.[7] කූඩ තුන කියන්නේ
දවස් තුනක්. **19** තව දවස් තුන-
කින් පාරාවෝ ඔබව නිදහස් කරනවා.
නමුත් ඔහු ඔබේ හිස ගසා දමා
ඔබව කණුවක එල්ලනවා.[8] කුරුල්-
ලෝ ඇවිත් ඔබේ මළ සිරුර කා දම-
නවා.”[9]

**20** තුන්වන දවසේ පාරාවෝගේ
උපන් දිනය විය.[10] ඔහු තම
සියලු සේවකයන්ට භෝජන සංග්‍රහ-
යක් පිළියෙල කළේය. ඔහු තම
සේවකයන් ඉදිරියේ කුසලාන දරන්-
නන්ගේ ප්‍රධානියාවද රොටි සාදන්-
නන්ගේ ප්‍රධානියාවද නිදහස්
කළේය.[11] **21** ඉන්පසු ඔහු කුසලාන
දරන්නන්ගේ ප්‍රධානියාව කුසලාන
දරන තනතුරට නැවත පත් කළ[12]
අතර ඔහු පාරාවෝගේ අතට දිග-
ටම කුසලාන දුන්නේය. **22** නමුත්
රොටි සාදන්නන්ගේ ප්‍රධානියාව ඔහු
එල්ලා දැමුවේය.[13] යෝසෙප් සිහින-
වල අර්ථ තෝරා දුන් ලෙසම සිදු

උත් **40:14*** හෝ, “ඇදි ප්‍රේමය.”

විය.[1] **23** නමුත් කුසලාන දරන්-
නන්ගේ ප්‍රධානියාට යෝසෙප්ව අම-
තක විය.[2]

**41** අවුරුදු දෙකක් ගත වූ පසු
පාරාවෝ තමා නයිල් ගඟ
අසල සිටගෙන සිටිනවා සිහිනෙන්[3]
දුටුවේය. **2** එවිට තර එළදෙන්නු
සත්දෙනෙක් නයිල් ගඟෙන් ගොඩට
ඇවිත් ඒ අවට තණකොළ කන්න
පටන්ගත්තෝය.[4] **3** ඉන්පසු තව
එළදෙන්නු සත්දෙනෙක් නයිල්
ගඟෙන් ගොඩට ආවෝය. කැහැටු,
අවලස්සන පෙනුමක්[5] තිබුණ ඒ එළ-
දෙන්නු නයිල් ගං ඉවුරට ගොස්
අනික් එළදෙනුන් ළඟ සිටගත්තෝය.
**4** ඉන්පසු කැහැටු එළදෙන්නු තර
එළදෙනුන් සත්දෙනාව කෑවෝය.[6] ඒ
මොහොතේදී පාරාවෝ අවදි විය.[7]
**5** ඔහු නැවත නිදාගත් විට දෙවන
වතාවටත් සිහිනයක් දුටුවේය. ඒ සිහි-
නයේදී ධාන්‍ය ගසක හොඳ මහත
රන්වන් ධාන්‍ය කරල් හතක් හටගත්-
තේය.[8] **6** ඉන්පසු නැඟෙනහිර දෙ-
සින් හැමූ සුළඟින් වියළී ගිය[9] සිහින්
නිසරු ධාන්‍ය කරල් හතක්ද හටගත්-
තේය.[10] **7** සිහින් ධාන්‍ය කරල් හත
හොඳ මහත ධාන්‍ය කරල් හත ගිල
දැමුවේය.[11] ඒ මොහොතේදී පාරාවෝ
අවදි විය. එවිට එය සිහිනයක් බව ඔහු
තේරුම්ගත්තේය.
**8** උදෑසන පාරාවෝගේ සිත
කැලඹුණේය.[12] එබැවින් ඔහු ඊජිප්තු-
වේ මන්තර ගුරුකම් කරන සියලු
පූජකයන්වද[13] සියලු බුද්ධිමතුන්වද[14]
කැඳවා ඔවුන්ට තමා දුටු සිහින ගැන
කීවේය.[15] නමුත් පාරාවෝ දුටු සිහින-
වල අර්ථය තෝරා දීමට පුළුවන්
කෙනෙක් එහි සිටියේ නැත.
**9** එවිට කුසලාන දරන්නන්ගේ
ප්‍රධානියා පාරාවෝට කතා කර
මෙසේ කීවේය.[16] “මගේ අතින් සිදු
වුණ වරද ගැන මට දැන් මතක්
වුණා.[17] **10** ඔබේ සේවකයන් සමඟ
ඔබ කෝපයෙන්[18] සිටි නිසා ඔබ
මාවත් රොටි සාදන්නන්ගේ ප්‍රධානි-
යාවත් ප්‍රධාන ආරක්ෂක නිලධාරියා-
ගේ[1] නිවස ළඟ තියෙන හිරගෙදරට
භාර දුන්නා. **11** අපි දෙන්නාම
එකම රාත්‍රියේ හීන දැක්කා. අපි දැක්-
කේ අර්ථ දෙකක් තියෙන එකිනෙකට
වෙනස් හීන දෙකක්.[2] **12** ඒ කාල-
යේදී අපිත් එක්ක හෙබ්‍රෙව් ජාතික
තරුණයෙකුත්[3] හිරගෙදර හිටියා. ඔහු
ප්‍රධාන ආරක්ෂක නිලධාරියාගේ සේ-
වකයෙක්.[4] අපි ඔහුට අපේ හීන
ගැන විස්තර කළ විට[5] ඔහු ඒවායේ
අර්ථය තෝරා දුන්නා. ඔහු අප
එක් එක් කෙනාගේ හීනයේ අර්-
ථය වෙන වෙනම තෝරා දුන්නා.
**13** ඔහු අපට කියූ විදිහටම සිදු වුණා.
මම කලින් දැරූ තනතුර මට නැව-
තත් ලැබුණා.[6] නමුත් රොටි සාදන්-
නාව එල්ලා දැමුවා.”[7]
**14** එවිට පාරාවෝ යෝසෙප්ව ඉක්-
මනින් සිර කුටියෙන්*[8] රැගෙන එන
ලෙස පණිවිඩයක් යැව්වේය.[9] යෝ-
සෙප් තම රැවුල කපා#[10] ඇඳුම් මාරු
කරගෙන[11] පාරාවෝ වෙතට ගියේය.
**15** එවිට පාරාවෝ යෝසෙප්ට මෙසේ
කීවේය. “මම හීනයක් දැක්කා. නමුත්
ඒකේ අර්ථය තෝරා දෙන්න පුළුවන්
කෙනෙක් මෙහෙ නැහැ. ඔබට හීන-
වල අර්ථය තෝරා දෙන්න පුළුවන්
කියා මට ආරංචි වුණා.”[12] **16** එවිට
යෝසෙප් පාරාවෝට උත්තර දෙමින්
මෙසේ කීවේය. “රජ්ජුරුවනි, ඔබේ
හීනයේ අර්ථය පැහැදිලි කර ඔබට
සතුටුදායක පිළිතුරක් දෙන්නේ මම
නොවෙයි දෙවියි.”[13]
**17** පාරාවෝ තම සිහිනය යෝ-
සෙප්ට මෙසේ විස්තර කළේය. “මම
නයිල් ගං ඉවුරේ සිටගෙන ඉන්-
නවා හීනෙන් දැක්කා. **18** එවිට
තර එළදෙනුන් හත්දෙනෙක් නයිල්
ගඟෙන් ගොඩට ඇවිත් ඒ අවට
තිබුණ තණකොළ කන්න පටන්-
ගත්තා.[14] **19** ඊටපස්සේ තවත් එළ-
දෙනුන් හත්දෙනෙක් ගොඩට ආවා.
උන් ඉතා දුර්වල, අවලස්සන, කැහැටු

**40 පරි.**
1 උත් 40:8; දානි 2:30
2 උත් 40:14; යෝබ 19:14

**41 පරි.**
3 උත් 20:3; උත් 40:5; යෝබ 33:15; දානි 2:1
4 උත් 1:30; උත් 41:18
5 උත් 41:19
6 උත් 41:20
7 උත් 41:21; 1රාජා 3:15
8 උත් 41:22
9 2රාජා 19:26; එස 17:10; හොෂෙ 13:15
10 උත් 41:23
11 උත් 41:24
12 දානි 2:1
13 නික් 7:11
14 යෙසා 19:11; දානි 2:2; 1කොරි 3:20
15 දානි 4:7
16 උත් 40:21
17 හිතෝ 28:13
18 උත් 40:2

**2 තීරුව**
1 උත් 37:36; උත් 40:3
2 උත් 40:5
3 උත් 39:17
4 උත් 39:1
5 උත් 40:8
6 උත් 40:21
7 උත් 40:22
8 උත් 40:15; දානි 2:25
9 1සාමු 2:8; ගීතා 105:20
10 යෙරෙ 9:26
11 යෙරෙ 52:33
12 ගීතා 25:14; දානි 5:12; ක්‍රියා 7:10
13 උත් 40:8; දානි 2:23; දානි 2:28
14 උත් 41:2

---

**උත් 41:14*** මූ.අ., “සිර වළෙන්.” **14#** මෙහි භාවිත කර තිබෙන හෙබ්‍රෙව් වචනයෙන් ඔහු තම හිස බූ ගෑ බවත් ඇඟවේ.

එළදෙනුන්.[1] උන් තරම් කැත එළ-
දෙන්නු ඊජිප්තු දේශයේ කොතැනක-
වත් මම දැකලා නැහැ. **20** නමුත්
ඒ කැහැටු එළදෙන්නු, තර එළදෙ-
නුන් හත්දෙනාව කෑවා.[2] **21** තර
උන්ව කෑවට පස්සෙවත් උන්ගේ පෙ-
නුමේ නම් කිසි වෙනසක් වුණේ
නැහැ. කලින් වගේම උන්ට කැහැටු,
අවලස්සන පෙනුමක් තිබුණා.[3] ඊක
දැක්කාට පස්සේ මම නින්දෙන්
ඇහැරුණා.

**22** “ධාන්‍ය ගහක හොඳ මහත
රන්වන් ධාන්‍ය කරල් හතක් හටගන්-
නවා මම තවත් හීනෙකින් දැක්කා.[4]
**23** ඊටපස්සේ නැඟෙනහිර දෙසින්
හැමූ සුළඟින් වියළී ගිය[5] සිහින් නිසරු
ධාන්‍ය කරල් හතකුත් හටගත්තා.
**24** ඒ සිහින් ධාන්‍ය කරල් හොඳ
ධාන්‍ය කරල් ටික ගිලගත්තා.[6] මන්-
තර ගුරුකම් කරන පූජකයන්ට මම
මේ හීන ගැන කිව්වත්[7] ඔවුන් එක්
කෙනෙකුටවත් මට අර්ථය තෝරා
දෙන්න බැරි වුණා.”[8]

**25** එවිට යෝසෙප් පාරාවෝට
මෙසේ කීවේය. “පාරාවෝගේ හීන
දෙකටම තියෙන්නේ එකම අර්ථ-
යක්. සැබෑ දෙවි ඒ හීන මාර්ග-
යෙන් තමා කරන්න යන දේ ඔබට
දන්වා තිබෙනවා.[9] **26** හොඳ එළ-
දෙන්නු හත්දෙනා අවුරුදු හතක්.
හොඳ ධාන්‍ය කරල් හතත් අවුරුදු
හතක්. හීන දෙකටම තියෙන්නේ
එකම අර්ථයයි. **27** ඔබ ඊටපස්සේ
දැක්ක කැත, කැහැටු එළදෙන්නු
හත්දෙනා අවුරුදු හතක්. නැඟෙනහි-
රෙන් ආව සුළඟින් වියළී ගිය[10] නිසරු
ධාන්‍ය කරල් හතත් අවුරුදු හතක්. ඒ
අවුරුදු හත පුරාම සාගතයක් පවති-
නවා.[11] **28** මම දැන් ඔබට කිව්වේ
සැබෑ දෙවි කරන්න බලාපොරොත්තු
වන දේ ගැනයි. දෙවි කල්තියාම පාරා-
වෝට ඒ ගැන දන්වා තිබෙනවා.[12]

**29** “මුළු ඊජිප්තු දේශයටම ඉතා
සාරවත් කාලයක් පැමිණෙනවා. ඒ
කාලය අවුරුදු හතක් පුරා පවතීවි.
**30** නමුත් ඊටපස්සේ අවුරුදු හතක්
පුරාම සාගතයක් පවතිනවා. සාග-
තය නිසා මුළු දේශයම නාස්ති වී යයි.
ඒ කාලයේදී, ඊජිප්තු දේශයේ සාරවත්
කාලයක් තිබුණාද කියාවත් මතක්
වෙන්නේ නැහැ.[1] **31** ඒ සාගතය
ඉතා දරුණු වන නිසා කලින් සරුවට
තිබුණ කෙත්වතුවල කිසිම දෙයක්
ඉතුරු වෙන්නේ නැහැ. **32** පාරා-
වෝ එකම සිහිනය දෙවරක් දැකී-
මෙන් අදහස් කරන්නේ සැබෑ දෙවි
මේ දේ අනිවාර්යයෙන්ම සිදු කරන
බවයි.[2] සැබෑ දෙවි ඒ දේ ඉක්මනටම
කරන්න තීරණය කර තිබෙනවා.[3]

**33** “දැන් ඔබ දැනුම් තේරුම් ඇති
ප්‍රඥාවන්ත මිනිසෙකුව තෝරා
ඊජිප්තු දේශය බලා කියා ගන්න ඔහුව
පත් කරන්න.[4] **34** දේශය බලාගැ-
නීමට නිලධාරීන්වත් පත් කරන්න.[5]
ඒ සාරවත් අවුරුදු හතේදී ඊජිප්තු දේ-
ශයේ පලදාවෙන් පහෙන් කොටසක්
ඔබ එකතු කරගත යුතුයි.[6] **35** ඔබ
පත් කරන නිලධාරීන්ට කියන්න
ඒ හොඳ කාලයේදී ලැබෙන සියලු
ආහාර ද්‍රව්‍ය එකතු කරගන්න කියා.
ඔවුන් පාරාවෝගේ අධීක්ෂණය යට-
තේ එක් එක් නුවරවල ආහාර ද්‍රව්‍ය
ගබඩා කර[7] ඒවා සුරක්ෂිතව තබා-
ගත යුතුයි. **36** එකතු කරගන්නා ඒ
ආහාර ද්‍රව්‍ය ඊජිප්තු දේශයට පැමි-
ණෙන සාගත අවුරුදු හත සඳහා
වෙන් කර තැබිය යුතුයි.[8] එහෙම
කළේ නැත්නම් සාගතය නිසා ඊජිප්තු
දේශයේ මිනිස්සු විතරක් නෙවෙයි,
සත්තු පවා විනාශ වී යයි.”[9]

**37** යෝසෙප්ගේ උපදෙස් හොඳ
බව පාරාවෝට සහ ඔහුගේ සියලු
සේවකයන්ට පෙනිණ.[10] **38** එබැ-
වින් පාරාවෝ තම සේවකයන්ට
මෙසේ කීවේය. “මේ මිනිසාට දෙවි-
ගේ බලය තියෙනවා. ඔහු වගේ
තවත් කෙනෙක් අපට හොයාගන්න
පුළුවන්ද?”[11] **39** ඉන්පසු පාරාවෝ
යෝසෙප්ට මෙසේ කීවේය. “දෙවි
ඔබට මේ සියල්ල දැන්වූ නිසා[12]
ඔබ තරම් දැනුම් තේරුම් ඇති
බුද්ධිමත් කෙනෙක් නම් නැහැ.[13]

**41 පරි.**
1 උත් 41:3
2 උත් 41:4
3 ලෙවී 26:26, යෙසා 9:20
4 උත් 41:5
5 උත් 41:6, ගීතා 129:6
6 උත් 41:7
7 උත් 41:8, නික් 7:11, දානි 2:2
8 දානි 2:27, දානි 4:7
9 ගීතා 98:2, යෙසා 41:22, දානි 2:28, ආමෝ 3:7
10 නික් 14:21
11 උත් 12:10, 2රාජ 8:1
12 දානි 2:28

**2 තීරුව**
1 යෙසා 24:4, මතෙ 24:7, ක්‍රියා 7:11, ක්‍රියා 11:28
2 ද්වි 19:15, යෝබ 33:14, මතෙ 18:16
3 2තෙස 3:1
4 ද්වි 1:13, 1කොරි 4:2
5 1රාජ 11:28
6 උත් 41:47, උත් 47:26
7 උත් 41:48, හිතෝ 8:21, ක්‍රියා 7:12
8 උත් 47:13
9 උත් 45:11, උත් 47:19
10 දානි 1:20
11 ගණන් 27:18, යෝබ 32:8, යෙසා 61:1, දානි 4:8
12 ගීතා 32:8, හිතෝ 14:35, 1කොරි 1:27
13 හිතෝ 2:6, 1කොරි 2:6

**40** මගේ මුළු නිවසම මම ඔබට භාර
දෙනවා.[1] මගේ මුළු සෙනඟ ඔබ
කියන හැම දේටම යටත් වෙයි.[2]
ඔබට වඩා ඉහළින් ඉන්නේ මම විත-
රයි."[3] **41** පාරාවෝ යෝසෙප්ට මෙ-
සේද කීවේය. "මුළු ඊජිප්තු දේශයම
බලා කියා ගැනීමට මම ඔබව පත්
කරනවා."[4] **42** පාරාවෝ එසේ කියා
ඔහුගේ මුද්ද*[5] ගලවා යෝසෙප්ගේ
ඇඟිල්ලේ දැමුවේය. අගනා ලිනන් රෙ-
දිවලින් මහන ලද ඇඳුමක් ඔහුට
අන්දවා රන් මාලයක්ද පැළඳුවේය.[6]
**43** පසුව පාරාවෝ දෙවෙනි රාජකීය
රථයේ ඔහුට ගමන් කරන්න සැලැස්-
වූවේය.[7] සෙනඟ ඔහුට ගෞරවය දෙන
පිණිස ඔහුට ඉදිරියෙන් ගමන් කර-
මින්, "අව්රේක්"* කියා හඬගැසුවේය.
මෙසේ, මුළු ඊජිප්තු දේශයම බලා
කියා ගැනීම සඳහා යෝසෙප්ව පත්
කරන ලදි.

**44** පාරාවෝ යෝසෙප්ට මෙසේද
කීවේය. "මම පාරාවෝ බව ඇත්තයි.
නමුත් ඊජිප්තු දේශයේ කිසි වැසියෙ-
කුට ඔබේ අවසරය නැතුව කිසි-
වක් කරන්න* තහනම් බව මම
නියෝග කරනවා."[8] **45** ඉන් අනතු-
රුව පාරාවෝ යෝසෙප්ට ෂාපෙනත්-
පනේයා* යන නම තබා ඕන්
නුවරෙහි පූජකයෙකු වූ[9] පොතිෆෙරා-
ගේ දුව වන අසෙනත්ව[10] ඔහුට භාර්-
යාවක වශයෙන් දුන්නේය. යෝසෙප්
ඊජිප්තු දේශයේ එක් එක් පළාත්ව-
ලට ගමන් කිරීමට පටන්ගත්තේය.[11]
**46** ඊජිප්තුවේ රජු වූ පාරාවෝ ඉදිරි-
යට පැමිණෙන විට යෝසෙප්ට වයස
අවුරුදු තිහක් විය.[12]

පාරාවෝ සමඟ කතා කළ පසු
යෝසෙප් ඊජිප්තු දේශය පුරාම
ගමන් කළේය. **47** සාරවත් වූ අවු-
රුදු හතේදී දේශය බොහෝ සෙ-
යින් පල දැරුවේය.[13] **48** ඊජිප්තු
දේශයට පැමිණි ඒ සාරවත් අවු-
රුදු හත තුළදී ඔහු සියලු ආහාර
ද්‍රව්‍ය රැස් කරමින් ඒවා නුවරවල
ගබඩා කර තැබුවේය.[1] එක් එක්
නුවර අවට තිබූ කෙත්වලින් ගත්
ආහාර ද්‍රව්‍ය ඔහු ඒ නුවරේම ගබඩා
කර තැබුවේය.[2] **49** යෝසෙප් මුහු-
දේ වැලි මෙන් වූ විශාල ධාන්‍ය
ප්‍රමාණයක් රැස් කළේය.[3] අන්තිමේදී
ගණන් කළ නොහැකි තරමට ධාන්‍ය
තිබූ බැවින් ඔවුහු එය ගණන් කිරීම
නතර කළෝය.[4]

**50** සාගතය පටන්ගැනීමට කලින්,
ඕන් නුවරෙහි පූජක වූ පොතිෆෙරාගේ
දුව වන අසෙනත් යෝසෙප්ට ආව
පුත්‍රයන් දෙදෙනෙකු[5] බිහි කළාය.
**51** යෝසෙප් තම කුලුඳුලාට මනස්-
සේ*[6] යන නම තැබීය. මන්ද ඔහු
මෙසේ පැවසුවේය. "දෙවි මගේ සියලු
දුක් කරදර හා මගේ පියාගේ නිවස
මට අමතක කරන්න සැලැස්සුවා."[7]
**52** ඔහු දෙවෙනි පුත්‍රයාට එෆ්‍රායිම්*[8]
යන නම තැබීය. මන්ද ඔහු මෙසේ
පැවසුවේය. "මා දුක් පීඩා වින්ද දේශ-
යේදී දෙවි මට දරුවන් ලබා දුන්නා."[9]
**53** ඊජිප්තු දේශයට පැමිණි සාර-
වත් අවුරුදු හත අවසන් විය.[10]
**54** යෝසෙප් කී ලෙසම සාගත අවු-
රුදු හත පටන්ගත්තේය.[11] සාග-
තය සියලු දේශයන්හි පැවතුණත්
ඊජිප්තු දේශය පුරාම ආහාර තිබිණ.[12]
**55** අන්තිමේදී ඊජිප්තු දේශයේ සියලු
වැසියන්ටද සාගතය බලපෑවේය.
ඔවුහු පාරාවෝගෙන් ආහාර ඉල්ලා
හැඬූ විට[13] පාරාවෝ, "යෝසෙප්
ළඟට යන්න. ඔහු ඔබට කියන විදි-
හට කරන්න"[14] යයි ඔවුන්ට කීවේය.
**56** සාගතය පොළොව පුරාම පැතිර
ගියේය.[15] ඊජිප්තු දේශයට සාග-
තය දරුණු ලෙස බලපෑ නිසා යෝ-
සෙප් නුවරවල ගබඩා කළ
ධාන්‍ය ඊජිප්තුවරුන්ට විකුණන්න
පටන්ගත්තේය.[16] **57** සාගතය මුළු

**41 පරි.**
1 උත් 39:6 ගීතා 105:21 ක්‍රියා 7:10
2 උත් 49:10
3 එස්ත 10:3 දානි 6:3
4 දානි 5:7
5 එස්ත 8:10 දානි 6:17
6 එස්ත 8:2 ගීතා 75:7 දානි 5:29
7 1රාජා 1:38 එස්ත 6:11
8 උත් 44:18 උත් 45:8 ක්‍රියා 7:10
9 යෙරෙ 43:13 එස 30:17
10 උත් 46:20
11 ගීතා 105:21
12 ගණන් 4:3 2සාමු 5:4 ලූක් 3:23
13 උත් 26:12 ගීතා 65:9

**2 තීරුව**
1 නික් 1:11
2 1රාජා 9:19 2ලේක 32:28
3 ගීතා 107:37
4 ද්වි 28:11 මලා 3:10
5 උත් 48:5
6 උත් 50:23 ගණන් 1:35 එළි 7:6
7 ගීතා 30:11 යෙසා 65:16 එළි 21:4
8 උත් 48:17 ගණන් 1:33 ද්වි 33:17 යොෂු 14:4
9 ගීතා 105:18 ගීතා 107:41 ආමො 6:6 ක්‍රියා 7:10
10 උත් 41:26
11 උත් 41:30 ක්‍රියා 7:11
12 උත් 45:11 උත් 47:17
13 උත් 47:13 විලා 5:10
14 ගීතා 105:21 ගීතා 146:7
15 උත් 43:1 ලූක් 4:25
16 උත් 41:48 උත් 47:16 හිතෝ 11:26

උත් **41:42*** මූ.අ., "මුද්‍රා තබන මුද්ද." **43*** මෙම ඊජිප්තු වචනයේ අර්ථය නිශ්චිතව දන්නේ නැත. **44*** මූ.අ., "කිසිවෙකුට තම අත පය ඔසවන්න තහනම්." **45*** තේරුම, "සැඟවූ දේවල් හෙළිකරන්නා."

උත් **41:51*** තේරුම, "අමතක කිරීමට සලස්වන්නා." **52*** තේරුම, "දෙවන වරටත් දරුවෙකු ලැබුණා."

පොළොවටම දරුණු ලෙස බලපෑ
නිසා සෑම ප්‍රදේශයකම ජීවත් වූ
මිනිස්සු ඊජිප්තුවට පැමිණ යෝසෙප්-
ගෙන් ධාන්‍ය මිල දී ගත්තෝය.[1]

## 42

ඊජිප්තුවේ ධාන්‍ය තිබෙන
බව යාකොබ්ට දැනගන්න
ලැබුණු විට[2] ඔහු තම පුත්‍රයන්ට
කතා කර මෙසේ කීවේය. “ඇයි ඔබ
නිකම් බලාගෙන ඉන්නේ? 2 ඊජිප්-
තුවේ ධාන්‍ය තියෙනවා කියලා මට
ආරංචි වුණා.[3] අපි සියලුදෙනාම බඩ-
ගින්නේ මැරෙන්න කලින්, ඊජිප්තුවට
ගිහින් ධාන්‍ය ටිකක් මිල දී ගන්න.”
3 යාකොබ් කියූ ලෙස, යෝසෙප්-
ගේ සහෝදරයන්[4] දහදෙනෙක් ඊජිප්-
තුවෙන් ධාන්‍ය මිල දී ගැනීමට
පිටත්ව ගියෝය. 4 නමුත් යාකොබ්
යෝසෙප්ගේ සහෝදරයා වන බෙන්ජ-
මින්ට[5] ඔවුන් සමඟ යෑමට ඉඩ දුන්නේ
නැත. මන්ද බෙන්ජමින්ට අනතුරක්
වෙන්න පුළුවන් කියා ඔහුට භයක්
තිබිණ.[6]

5 ඊශ්‍රායෙල්ගේ පුත්‍රයෝ කානාන්
දේශයේ සාගතයෙන් පෙළුණු අනික්
අය සමඟ ධාන්‍ය මිල දී ගැනී-
මට ඊජිප්තුවට ගියෝය.[7] 6 දේශය
පාලනය කරමින් සිටි යෝසෙප්[8] පො-
ළොවේ සෑම පළාතකින්ම පැමිණි
ජනයාට ධාන්‍ය වික්කේය.[9] යෝ-
සෙප්ගේ සහෝදරයෝද ඔහු වෙතට
ගොස් හිස නමා ඔහුට ආචාර
කළෝය.[10] 7 යෝසෙප් තම සහෝ-
දරයන්ව දුටු විගස ඔවුන්ව හඳුනා-
ගත්තේය. නමුත් තමා කවුද කියා
ඔහු ඔවුන්ට දැනෙන්න සැලැස්වූයේ
නැත.[11] ඔහු ඔවුන්ට සැරපරුෂ ලෙස
කතා කර, “නුඹලා කොහෙන්ද ආවේ”
කියා ඇසුවේය. ඔවුහුද, “අපි කෑම මිල
දී ගන්න කානාන් දේශයේ ඉඳන්
ආවේ”[12] කියා පිළිතුරු දුන්නෝය.

8 යෝසෙප්ගේ සහෝදරයෝ
ඔහුව හඳුනාගත්තේ නැත. 9 ඒ
මොහොතේදී, තම සහෝදරයන්
ගැන දුටු සිහින යෝසෙප්ට මතක්
විය.[13] ඔහු නැවතත් ඔවුන්ට කතා
කරමින් මෙසේ කීවේය. “නුඹලා
ඔත්තුකාරයෝ! මේ රටේ අනාරක්-
ෂිත තැන් ගැන තොරතුරු හොයලා
බලන්නයි නුඹලා ඇවිත් ඉන්නේ!”[1]
10 එවිට ඔවුහු මෙසේ කීවෝය.
“නැහැ, මාගේ ස්වාමීනි,[2] ඔබේ සේව-
කයන්[3] ආවේ කෑම මිල දී ගන්නයි.
11 අපි හැමෝම එක පවුලක සහෝ-
දරයෝ. එක පියෙකුගේ දරුවන්.
අපි අවංක මිනිස්සු, ඔත්තුකාරයන්
නොවෙයි.”[4] 12 නමුත් ඔහු මෙසේ
කීවේය. “නැහැ, නුඹලා ඇවිත් ඉන්-
නේ අපේ දේශයේ අනාරක්ෂිත තැන්
බලන්නයි!”[5] 13 එවිට ඔවුහු මෙසේ
පැවසුවෝය. “ඔබේ සේවකයන් වන
අපි එකම පවුලේ දරුවන්. අපේ
පියා[6] ජීවත් වෙන්නේ කානාන් දේශ-
යේ. අපේ පවුලේ සහෝදරයන්[7] දො-
ළොස්දෙනෙක්. බාලම සහෝදරයා
අපේ පියා එක්ක නැවතුණා.[8] අනික්
සහෝදරයා දැන් අප අතර නැහැ.”[9]

14 එහෙත් යෝසෙප් ඔවුන්ට
මෙසේ කීවේය. “නැහැ, නුඹලා
ඔත්තුකාරයෝ. 15 නුඹලා කියන
කතාව ඇත්ත නම් නුඹලාගේ
බාල සහෝදරයාව මෙතැනට ගෙන්-
වගන්න.[10] නමුත් මම පාරාවෝ-
ගේ නමින් දිවුරලාම කියන්නම්,
නුඹලා මට බොරුවක් කියලා තියෙ-
නවා නම් මේ දේශයෙන් පිට වෙලා
යන්න මම නුඹලාට ඉඩ තියන්නේ
නැහැ. 16 නුඹලාගෙන් එක් කෙ-
නෙක් ගිහින් බාල සහෝදරයාව මෙ-
තැනට එක්කගෙන එන්න. අනික්
හැමෝවම මම අත්අඩංගුවේ තියා-
ගන්නවා. එතකොට මට බලන්න
පුළුවන් නුඹලා කියන දේ ඇත්තද
කියලා.[11] මම පාරාවෝගේ නමින් දිවු-
රලා කියන්නේ, නුඹලාගේ සහෝදර-
යාව එක්කගෙන ආවේ නැත්නම් මම
නුඹලාව ඔත්තුකාරයන් හැටියටයි
ගණන් ගන්නේ.” 17 එසේ කියා ඔහු
ඔවුන් සියලුදෙනාවම දවස් තුනකට
අත්අඩංගුවේ තැබුවේය.

18 තුන්වන දවසේ යෝසෙප්
ඔවුන්ට මෙසේ කීවේය. “සැබෑ දෙවි

**41 පරි.**
1 උත් 47:4 ගීතා 33:19

**42 පරි.**
2 උත් 41:48
3 ක්‍රියා 7:12
4 1ලේක 2:1
5 උත් 35:18 උත් 42:38 උත් 44:20
6 උත් 43:14
7 උත් 41:57 ක්‍රියා 7:11
8 උත් 41:44 උත් 45:8 ගීතා 105:21 ක්‍රියා 7:10
9 උත් 47:14
10 උත් 37:7 උත් 37:9
11 උත් 42:23 ගීතා 81:5
12 උත් 37:1 ක්‍රියා 7:12
13 උත් 37:7 උත් 37:9 ගණන් 12:6

**2 තීරුව**
1 උත් 47:13
2 රෝම 13:7
3 උත් 37:8
4 උත් 42:31
5 උත් 41:30
6 නික් 1:1
7 1ලේක 2:1
8 උත් 35:18 උත් 42:38 උත් 43:7
9 උත් 37:27 උත් 37:35 උත් 44:20 උත් 45:26 ක්‍රියා 7:9
10 උත් 42:34 උත් 43:29
11 ගීතා 7:9

ගැන මට ගරුබියක්[1] තියෙනවා. ඒ
නිසා ජීවත් වෙන්න කැමති නම්
මම කියන විදිහට කරන්න. **19** ඔබ
සැවොම අවංක මිනිස්සු නම් මේ
දේ කරන්න. මම එක් කෙනෙ-
කුව විතරක් හිරගෙදර තියාගන්නම්.[2]
අනික් හැමෝම මෙහෙන් පිට වී බඩ-
ගින්නේ ඉන්න ඔබේ පවුලේ අයට
ධාන්‍ය අරගෙන යන්න.[3] **20** ඔබ
කියූ දේ ඇත්ත නම් බාල සහෝදර-
යාත් එක්ක ඔබ නැවත මේ දේශයට
එයි. ඔබේ ජීවිතත් බේරෙයි."[4] ඔවුහු
ඔහු කී දේ කරන්න එකඟ වූහ.

**21** ඔවුහු එකිනෙකා අතරේ මෙසේ
කතා වූහ. "අපේ සහෝදරයාට අපි
කළේ ලොකු අසාධාරණයක්.[5] අනු-
කම්පා කරන්න කියා ඔහු අඬඅඬා
අපෙන් ඉල්ලුවත් අපි ගණන් ගත්තෙ-
වත් නැහැ. අපි කළ වරදට ගණන්
දෙන්න ඕනේ. අපි මේ වගේ දුක් විඳින්-
නේ ඒ නිසයි."[6] **22** එවිට රූබෙන්
ඔවුන්ට මෙසේ කීවේය. "'දරුවාට
මොකුත් කරන්න එපා' කියා මම
ඒ වෙලාවේ කිව්වා නේද? නමුත්
එක් කෙනෙක්වත් මට සවන් දුන්නේ
නැහැ.[7] දැන් ඔහුගේ ජීවිතේට අපිට
වන්දි ගෙවන්න වෙයි."[8] **23** යෝ-
සෙප් ඔවුන් සමඟ පරිවර්තකයෙකු-
ගේ උපකාරයෙන් කතා කළ බැවින්
ඔවුන් කතා කරමින් සිටි දේවල්
ඔහුට තේරුණු බව ඔවුහු දැන සිටි-
යේ නැත. **24** ඔහු ඔවුන්ගෙන් මඳක්
ඈතට ගොස් ඇඬුවේය.[9] පසුව ඔහු
නැවත ඔවුන් ළඟට පැමිණ ඔවුන්
සමඟ කතා කළේය. ඔහු ඔවුන් ඉදිරි-
යේම සිමියොන්ව[10] බැඳ තැබුවේය.[11]
**25** ඉන්පසු ඔවුන්ගේ මලුවලට ධාන්‍ය
පුරවන ලෙසත් ඔවුන් එක් එක් කෙ-
නාගේ මුදල් නැවත මලුවලට දමන
ලෙසත්[12] ගමනට අවශ්‍ය දේ ඔවුන්ට
දෙන ලෙසත්[13] යෝසෙප් තම සේවක-
යන්ට අණ කළේය. අණ කළ ලෙසම
සිදු කෙරිණ.

**26** ඔවුහුද තමන්ගේ බූරුවන්
පිට ධාන්‍ය පටවාගෙන එතැනින්
පිටත්ව ගියෝය. **27** ගමන අතර-
තුරේ නවාතැන්පොළකදී එක් සහෝ-
දරයෙක් තම බූරුවාට ආහාර දෙන
පිණිස තම මල්ල ඇරියේය.[1] ඔහු
මල්ල ඇර බැලූ විට ආහාර ද්‍රව්‍යවලට
උඩින්ම තමා ගෙවූ මුදල තිබෙන බව
දුටුවේය.[2] **28** ඔහු තම සහෝදර-
යන්ට මෙසේ කීවේය. "මේ බලන්න,
මම ගෙවූ මුදල් ටික නැවතත් මගේ
මල්ලට ආලා!" එය ඇසූ විට ඔවුහු
බොහෝ සෙයින් භය වී වෙවුලමින්,[3]
"දෙවි අපට කුමක්ද මේ කළේ"[4] කියා
එකිනෙකාගෙන් ඇසූහ.

**29** කානාන් දේශයට පැමිණි පසු
ඔවුහු සිදු වූ සියල්ල ගැන විස්-
තර කරමින් තම පිය වූ යාකොබ්ට
මෙසේ කීවෝය. **30** "අපි රටේ
ඔත්තු බලන්න ආවා කියා හිතා-
ගෙන[5] ඒ රටේ ස්වාමියා අපට
සැරෙන් කතා කළා.[6] **31** නමුත් අපි
ඔහුට මෙහෙම කිව්වා. 'අපි අවංක
මිනිස්සු,[7] ඔත්තුකාරයන් නොවෙයි.
**32** අපි හැමෝම එක පියෙකුගේ දරු-
වෝ.[8] අපි සහෝදරයෝ දොළොස්-
දෙනෙක්.[9] එක සහෝදරයෙක් අප
අතර නැහැ.[10] බාලයා අපේ පියා
එක්ක කානාන් දේශයේ ඉන්නවා.'[11]
**33** නමුත් රටේ ස්වාමියා අපිට මෙ-
හෙම කිව්වා.[12] 'ඔබ ඇත්තටම අවංක
මිනිස්සු නම්,[13] ඔබෙන් එක් කෙනෙක්
මාත් එක්ක මෙහෙ නතර වෙන්න.[14]
අනික් හැමෝටම මෙහෙන් යන්න
පුළුවන්. බඩගින්නේ ඉන්න ඔබේ පවු-
ලේ අයට කෑම අරගෙන යන්න.[15]
**34** ඔබේ බාල සහෝදරයාව මෙහෙට
එක්කගෙන ආවොත් ඔබ ඔත්තුකාර-
යන් නොව අවංක මිනිස්සු කියා මම
පිළිගන්නම්. මම නැවතත් ඔබේ
සහෝදරයාව ඔබටම භාර දෙන්නම්.
ඔබට මේ දේශයෙන් ආහාර ද්‍රව්‍ය
රැගෙන යන්නත් පුළුවන්.' "[16]

**35** පසුව ඔවුහු තම තමන්ගේ මලු
ඇර බැලූ විට තමන් ගෙවූ මුදල්
නැවත මලුවලට දමා තිබූ බව දුටු-
වෝය. එය දැක ඔවුහුද ඔවුන්ගේ
පියාද භය වූහ. **36** එවිට ඔවුන්ගේ
පියා වන යාකොබ් මෙසේ කීවේය.

**42 පරි.**
1 උත් 20:11, ලෙවී 25:43, නෙහෙ 5:15, හිතෝ 8:13, 2කොරි 7:1
2 උත් 42:24
3 උත් 43:2, උත් 45:23
4 උත් 43:5, උත් 44:23
5 උත් 37:18, උත් 37:28, උත් 50:17, ක්‍රියා 7:9
6 ගණන් 32:23, හිතෝ 21:13, මතෙ 7:2, 1තිමෝ 5:24
7 උත් 37:21, රෝම 2:15
8 උත් 9:5, ගීතා 9:12, එළි 6:10
9 උත් 43:30
10 උත් 42:19, උත් 49:5
11 උත් 43:23, යෝබ් 36:8
12 උත් 44:1
13 උත් 45:21, 1පේත්‍රු 3:9

**2 තීරුව**
1 උත් 43:21, හිතෝ 12:10, යෙරෙ 9:2, යෙරෙ 41:17
2 උත් 43:21
3 ලෙවී 26:36, ලූක් 19:21
4 යෙසා 45:7, ආමො 3:6, හෙබ්‍රෙ 10:30
5 යොෂු 2:1, විනි 1:23, 2සාමු 10:3
6 උත් 42:7
7 උත් 42:11, හිතෝ 11:6, හිතෝ 14:2
8 ක්‍රියා 7:8
9 උත් 42:13
10 උත් 37:28, උත් 37:35
11 උත් 35:18, උත් 42:4
12 උත් 45:9
13 හිතෝ 14:9
14 උත් 42:19
15 උත් 42:2, විලා 4:9
16 උත් 34:10, උත් 42:20, යාකො 4:13

“ඔබ මේ විදිහට මට දුක් දෙන්-
නේ ඇයි?[1] මට යෝසෙප් නැති
වුණා. සිමියොනුත් නැති වුණා.[2] දැන්
ඔබ බෙන්ජමින්වත් අරගෙන යන්න
හදනවා. මේ හැම දුකක්ම විඳින්-
නේ මමයි.” **37** එවිට රූබෙන් තම
පියාට මෙසේ කීවේය. “බෙන්ජමින්ව
මට භාර දෙන්න. මම ඔහුව බලාගන්-
නම්. මම ඔහුව නැවත තාත්තා
ගාවට එක්කගෙන එන්න පොරොන්දු
වෙනවා.[3] ඔහුව ගෙදරට එක්කගෙන
ආවේ නැත්නම් මගේ පුතාලා දෙන්-
නාව මරා දමන්න.”[4] **38** එහෙත්
ඔහු මෙසේ කීවේය. “මගේ පුතාව
ගෙනි යන්න මම ඉඩ දෙන්නේ නැහැ.
ඔහුගේ සහෝදරයාත් මැරුණා. දැන්
ඉතුරු වෙලා ඉන්නේ ඔහු විත-
රයි.[5] ගමන අතරතුරේදී අනතුරක්
වෙලා ඔහු මැරුණොත් මහලු වයසේ
ඉන්න මාත් දුක දරාගන්න බැරිව
මැරිලා යයි.”[6]

**43** සාගතය ඉතා දරුණු
ලෙස දේශයට බලපෑවේය.[7]
**2** ඊජිප්තුවෙන්[8] ගෙන ආ ධාන්‍ය
සියල්ල ඉවර වූ පසු ඊශ්‍රායෙල් ඔහුගේ
පුත්‍රයන්ට මෙසේ කීවේය. “ආපහු
ගිහින් කෑම ටිකක් රැගෙන එන්න.”[9]
**3** එවිට යූදා[10] ඔහුට මෙසේ කීවේය.
“ඒ මිනිසා, ‘ඔබේ සහෝදරයා නැතුව
ආයෙත් මා ඉදිරියට එන්න එපා’
කියා අපට තදින්ම කිව්වා.[11] **4** ඔබ
අපේ සහෝදරයාව ගෙනි යන්න අපට
ඉඩ දෙනවා නම්[12] අපි ගිහින් කෑම
අරගෙන එන්නම්. **5** නමුත් ඔබ
ඔහුව යවන්නේ නැත්නම් අපි යන්-
නේ නැහැ. මන්ද ‘ඔබේ සහෝදරයා
නැතුව මා ඉදිරියට එන්න එපා’ කියා
ඒ මිනිසා අපට කිව්වා.”[13] **6** එවිට
ඊශ්‍රායෙල්[14] මෙසේ ඇසුවේය. “ඔබ මට
මේ විදිහට දුක් දෙන්නේ ඇයි? ඔබට
තව සහෝදරයෙක් ඉන්නවා කියා
ඔහුට නොකියා ඉන්න තිබුණා නේද?”
**7** එවිට ඔවුහු මෙසේ කීවෝය. “ඒ
මිනිසා අපේ පවුලේ විස්තර ඇහුවා.
‘ඔබේ පියා තවමත් ඉන්නවාද?[15]
ඔබට තව සහෝදරයෙක් ඉන්නවාද’
කියා ඔහු අපෙන් ඇහුවා. අපි ඒ විස්-
තර ඔහුට කිව්වේ ඒ නිසයි.[1] ‘ඔබේ
සහෝදරයාව එක්කගෙන එන්න’[2]
කියා ඔහු අපට කියන බව අපි දැන-
ගෙන හිටියේ නැහැ.”

**8** අන්තිමේදී යූදා තම පියා වන
ඊශ්‍රායෙල්ට මෙසේ කීවේය. “දරුවාට
මාත් එක්ක යන්න දෙන්න.[3] නැත්-
නම් අපේ දරුදැරියන් එක්කම අපි
සියලුදෙනාම[4] මැරිලා යයි.[5] **9** මම
දරුවාට කිසිම හානියක් වෙන්න ඉඩ
තියන්නේ නැහැ.[6] ඔහුට අනතුරක්
වුණොත් ඔබ මට දඬුවම් කරන්න.[7]
ඔහුව නැවත ඔබ ළඟට ගෙනාවේ
නැත්නම් මම මැරෙන තුරුම ඒ වර-
දට දඬුවම් විඳිනවා. **10** අපි මේ
තරම් කාලයක් බලාගෙන හිටියේ
නැත්නම් මේ වෙද්දී දෙවතාවක්ම
ඊජිප්තුවට ගිහින් එන්න තිබුණා.”[8]

**11** එබැවින් ඊශ්‍රායෙල් ඔහුගේ පුත්‍ර-
යන්ට මෙසේ කීවේය. “එහෙමනම්[9]
අපේ දේශයේ තියෙන හොඳම දේවල්
ඒ මිනිසාට තෑග්ගක්[10] හැටියට ගෙනි
යන්න. බෝල්සම් තෙල්,[11] මීපැණි,[12]
ලැබ්ඩනම් මැලියම්, රුක්ලාටු,[13] පිස්-
ටැෂියෝ ඇට හා ආමන්ඩ් ඇටත්[14]
ඔබේ මලුවල අරගෙන යන්න.
**12** ගිය වතාවේ ගෙන ගිය මුදල් ප්‍රමා-
ණය මෙන් දෙගුණයක් ගෙනි යන්න.
ඔබේ මලුවල තිබුණු මුදලුත් අරගෙන
යන්න.[15] සමහරවිට ඒ මුදල් ඔබේ
මලුවලට දාන්න ඇත්තේ වැරදීම-
කින් වෙන්න ඇති.[16] **13** දැන් ඔබේ
සහෝදරයා එක්ක ඒ මිනිසා ළඟට
යන්න. **14** ඒ මිනිසා ඔබට අනු-
කම්පා කර සිමියොන්ටත් බෙන්ජ-
මින්ටත් ඔබත් එක්කම එන්න දෙයි
කියා මම සියලු බලැති දෙවිගෙන්
ඉල්ලනවා.[17] නමුත් මගේ දරුවන්ව
මට නැවත දැකගන්න නොලැබු-
ණොත් ඒ දුකත් මම කොහොමහරි
දරාගන්නම්.”[18]

**15** ඔවුහු තෑග්ග සහ පෙරට වඩා
දෙගුණයක් මුදල් රැගෙන බෙන්ජමින්

**42 පරි.**
**1** උත් 43:14
**2** උත් 37:28 උත් 37:35 උත් 42:24
**3** උත් 43:9 උත් 44:32
**4** උත් 37:22 උත් 46:9
**5** උත් 37:33 උත් 44:20
**6** උත් 37:35 ගණන් 16:30 1රාජා 2:6 ගීතා 49:14 ගීතා 89:48 දේශ 9:10 හොෂෙ 13:14 ක්‍රියා 2:27 එළි 20:13

**43 පරි.**
**7** උත් 41:30 ක්‍රියා 7:11
**8** උත් 42:2 ක්‍රියා 7:12
**9** ද්වි 2:6
**10** උත් 29:35
**11** උත් 42:15
**12** උත් 42:20 උත් 42:36
**13** උත් 42:15 උත් 44:26
**14** උත් 32:28
**15** උත් 43:27

**2 තීරුව**
**1** උත් 42:13
**2** උත් 42:16
**3** උත් 37:26 උත් 42:38
**4** ක්‍රියා 7:14
**5** උත් 42:2 විලා 4:9
**6** උත් 44:32 යොහ 15:13
**7** නික් 21:23 1රාජා 20:39 රෝම 5:7
**8** 1ලේක 5:2
**9** 2රාජා 7:4 ක්‍රියා 21:14
**10** උත් 32:20 හිතෝ 18:16
**11** නික් 25:6 එස්ත 2:12 යෙරෙ 8:22 යෙරෙ 46:11 එස 27:17
**12** 1සාමු 14:25 හිතෝ 25:16 මතෙ 3:4
**13** උත් 37:25
**14** ගණන් 17:8
**15** උත් 42:25 උත් 42:35
**16** රෝම 13:8 2කොරි 8:21 හෙබ්‍රෙ 13:18

**17** නෙහෙ 1:11; ලූක් 1:50; 2කොරි 5:10; **18** උත් 27:45; උත් 42:36.

සමඟ පිටත්ව ගියෝය. ඔවුහු ඊජිප්තු-
වට ගොස් යෝසෙප් ඉදිරියට පැමිණි-
යෝය.[1] **16** ඔවුන් සමඟ බෙන්ජමින්
සිටින බව දුටු විට යෝසෙප් තම
නිවස භාරව සිටි සේවකයාට මෙසේ
කීවේය. "දැන් මේ මිනිසුන්ව නිවස
ඇතුළට ගෙනි යන්න. ඔවුන් අද
දවල් කෑම කන්නේ මාත් එක්-
කයි. සතුන්ව මරා කෑමට සූදානම්
කරන්න."[2] **17** ඒ මිනිසා යෝසෙප්
කී ලෙසම කළේය.[3] ඔහු ඒ මිනිසුන්ව
යෝසෙප්ගේ නිවසට ගෙන ගියේය.
**18** එහෙත් ඔහුගේ නිවසට ගෙන ගිය
බැවින් යෝසෙප්ගේ සහෝදරයෝ භය
වී[4] මෙසේ කීවෝය. "කලින් වතාවේදී
අපි ගෙවූ මුදල් ඔවුන්ට නොලැබුණු
නිසයි අපිව මෙතැනට ගෙනාවේ. දැන්
ඔවුන් අපිට පහර දී අපේ බූරුවන්ව
පැහැරගෙන අපිව වහලුන් හැටියට
තියාගනී."[5]

**19** ඔවුහු යෝසෙප්ගේ නිවස භාරව
සිටි සේවකයා වෙතට ගොස් දොර-
කඩ ළඟ සිට ඔහුට කතා කර
**20** මෙසේ කීවෝය. "මාගේ ස්වාමීනි,
අපට සමාවෙන්න. අපි කලින් වතාවේ
ඔබේ දේශයට ආවේ කෑම මිල දී ගන්-
නයි.[6] **21** අපි නවාතැනට[7] ගියාට
පස්සේ අපේ මලු ඇරලා බලද්දී අපි
ගෙවූ මුදල් ආහාර ද්‍රව්‍යවලට උඩින්ම
තිබුණා. අපි දුන්න සම්පූර්ණ මුදලම
තිබුණා. ඒ මුදල් ටික ආපහු අපේ
අතින් භාරගන්න කියා අපි ඉල්ලා
සිටිනවා.[8] **22** මෙවරත් කෑම මිල දී
ගන්න අපි මුදල් ගෙනාවා. අපේ
මුදල් ආපහු මලුවලට දැම්මේ කවුද
කියා අපි ඇත්තටම දන්නේ නැහැ."[9]
**23** එවිට ඔහු මෙසේ කීවේය. "කල-
බල වෙන්න එපා. භය වෙන්න කිසිම
හේතුවක් නැහැ.[10] ඔබේ මුදල් මගේ
අතටම ලැබුණා. ඔබේ මලුවල වස්තු
පිරෙව්වේ ඔබ අදහන ඔබේ පියා-
ගේ දෙවියන්."[11] ඉන්පසු ඔහු සිමි-
යොන්ව[12] ඔවුන් ළඟට ගෙනාවේය.

**24** යෝසෙප්ගේ සේවකයා ඔවුන්ව
නිවසට ගෙන ගොස් ඔවුන්ගේ පාද
සෝදන පිණිස වතුර ගෙනැවිත් දුන්-
නේය.[1] ඔවුන්ගේ බූරුවන් සඳහා
ආහාරද දුන්නේය.[2] **25** ඔවුහු යෝ-
සෙප්ට ගෙන ආ තෑග්ග සූදානම්
කළෝය.[3] මන්ද ඔවුන් යෝසෙප්ගේ
නිවසේ දවල් කෑම කන බව ඔවුන්ට
දැනගන්න ලැබිණ.[4] **26** යෝසෙප්
නිවසට පැමිණි විට ඔවුහු ඉදිරියට
ගොස් තමන් ගෙන ආ තෑග්ග දී
හිස නමා ඔහුට ආචාර කළෝය.[5]
**27** ඔහු ඔවුන්ගේ සැප දුක් විමසා[6]
මෙසේ ඇසීය. "මහලු වයසේ ඉන්න
ඔබේ පියා කොහොමද? ඔහු හොඳින්
ඉන්නවාද?"[7] **28** ඔවුහුද, "ඔබේ සේ-
වකයා වන අපේ පියා හොඳින් ඉන්-
නවා" යයි පිළිතුරු දුන් පසු ඔහු
ඉදිරියේ මුණින් වැටුණෝය.[8]

**29** එවිට යෝසෙප් එකම කුසේ
උපන් තම සහෝදරයා වන බෙන්ජ-
මින්ව දැක,[9] "මේ ඉන්නේ ඔබේ
බාල සහෝදරයාද"[10] කියා ඔවුන්-
ගෙන් ඇසුවේය. ඔහු බෙන්ජමින් දෙස
බලා, "පුතේ, ඔබට දෙවිගෙන් ආශීර්-
වාද ලැබේවා"[11] යයි කීය. **30** යෝ-
සෙප් තම සහෝදරයාව දුටු බැවින්
ඇඬෙන තරමට හැඟීම්බර විය.[12]
එබැවින් ඔහු විගස නිවස ඇතුළට
ගොස් හැඬුවේය.[13] **31** ඉන්පසු ඔහු
මුහුණ සෝදාගෙන පිටතට ඇවිත්
තමාගේ හැඟීම් පාලනය කරගෙන
සේවකයන්ට මෙසේ කීවේය.[14] "කෑම
ගේන්න."[15] **32** සේවකයෝ ඔහුටද
ඔහුගේ සහෝදරයන්ටද ඔහු සමඟ
සිටි ඊජිප්තුවරුන්ටද වෙන වෙනම
කෑම පිළිගැන්වූවෝය. මන්ද ඊජිප්තු-
වරුන් හෙබ්‍රෙව්වරුන් සමඟ එකට
කෑම වේලක් ගැනීම පිළිකුල් දෙයක්
ලෙස සැලකූ බැවිනි.[16]

**33** යෝසෙප්ගේ සහෝදරයෝ ඔහු
ඉදිරියේ හිඳගෙන සිටියෝය. වැඩිම-
ලාට හිමි ගෞරවය දෙමින්[17] ඔවුන්ව
වැඩිමලා සිට බාලයා දක්වා අනු-
පිළිවෙළට ඉන්දවා තිබිණ. ඔවුහු
පුදුමයෙන් එකිනෙකා දෙස බලා සිටි-
යෝය. **34** යෝසෙප් ඔහුගේ මේස-
යෙන් ඔවුන්ට කෑම යැව්වේය. නමුත්
ඔහු බෙන්ජමින්ට යැවූ ප්‍රමාණය අන්

**43 පරි.**
**1** උත් 37:7
**2** උත් 18:7
හිතෝ 9:2
**3** උත් 41:40
**4** උත් 20:11
උත් 42:21
**5** උත් 42:25
උත් 42:35
**6** උත් 42:3
**7** උත් 42:27
ලූක් 2:7
**8** ද්වි 22:2
ක්‍රියා 20:33
රෝම 13:8
හෙබ්‍රෙ 13:5
1පේතෘ 2:12
**9** උත් 43:12
**10** විනි 6:23
**11** දේශ 5:19
ක්‍රියා 17:25
**12** උත් 42:24

**2 තීරුව**
**1** උත් 18:4
උත් 19:2
1සාමු 25:41
යොහ 13:12
**2** උත් 24:32
විනි 19:21
**3** උත් 43:11
හිතෝ 18:16
**4** උත් 43:16
නික් 2:20
යෝබ් 42:11
**5** උත් 37:7
උත් 42:6
**6** නික් 18:7
1සාමු 17:22
**7** උත් 43:7
**8** උත් 37:9
2සාමු 1:2
2ලේක 24:17
**9** උත් 35:24
**10** උත් 42:13
**11** ගණන් 6:25
**12** 1රාජා 3:26
පිලි 1:8
කොලො 3:12
**13** උත් 42:24
**14** උත් 45:1
**15** උත් 43:25
**16** උත් 46:34
නික් 8:26
**17** උත් 49:3
ද්වි 21:17

සියලුදෙනාටම යැවූ ප්‍රමාණයට වඩා
පස් ගුණයකින් වැඩි කළේය.[1] මෙසේ,
ඔවුහු තෘප්තියට පත් වන තුරුම ඔහු
සමඟ කමින් බොමින් සිටියෝය.[2]

**44** පසුව යෝසෙප් තම නිවස
භාරව සිටි සේවකයාට[3]
මෙසේ අණ කළේය. "මේ මිනි-
සුන්ට රැගෙන යන්න පුළුවන් ප්‍රමා-
ණයට ඔවුන්ගේ මලුවලට ආහාර
පුරවන්න. ඔවුන් එක් එක් කෙනා දුන්
මුදල්ද ඔවුන්ගේ මලුවලට දමන්න.[4]
**2** නමුත් බාලයාගේ මල්ලට ඔහු
ධාන්‍යවලට ගෙවූ මුදල් එක්කම මගේ
රිදී කුසලානයත් දමන්න." සේවකයා
යෝසෙප් කී ලෙසම කළේය.[5]
**3** පසුවදා උදෑසන යෝසෙප්ගේ
සහෝදරයන්ව පිටත් කර යවන ලදි.[6]
ඔවුහු තම බූරුවන් සමඟ නුව-
රින් පිටත්ව ගියෝය. **4** ඔවුන් වැඩි
දුරක් යන්න කලින් යෝසෙප් තම
සේවකයාට මෙසේ කීවේය. "ඉක්-
මන් කරන්න. අර මිනිස්සු පිටුපස
එළවගෙන ගිහින් ඔවුන්ව අල්ල-
ගන්න. ඔවුන්ගෙන් මෙහෙම අහන්න.
'ඔබට හොඳින් සැලකුවාට පස්සේ
ඔබ මගේ ස්වාමියාට නපුරක් කළේ
ඇයි?[7] **5** ඔබ මගේ ස්වාමියා බොන
කුසලානය ගත්තා නේද? ඔහු අකුර-
ටම නිමිති බලන්නේ ඒ කුසලානය
යොදාගෙනයි.[8] ඔබ මේ කළේ මොන
තරම් දුෂ්ට දෙයක්ද!' "
**6** පසුව යෝසෙප්ගේ සේවකයා
ඔවුන් ළඟටම පැමිණ තමාට
කියා තිබූ ලෙසම ඔවුන්ට කීවේය.
**7** නමුත් ඔවුහු, "මාගේ ස්වාමීනි, ඔබ
අපිව මේ විදිහට සැක කරන්නේ ඇයි?
ඔබේ සේවකයන් වන අපි හීනෙකින්-
වත් ඒ වගේ දෙයක් කරන්න හිතු-
වේ නැහැ. **8** අපේ මලුවලට නැවත
දමා තිබූ මුදල් ටිකත් අපි කානාන්
දේශයේ ඉඳන් ඔබට ගෙනත් දුන්නා.[9]
එහෙනම් ඔබේ ස්වාමියාගේ නිවසින්
අපි රන් රිදී හොරකම් කළා කියා සැක
කරන්නේ ඇයි?[10] **9** ඔබේ සේවක-
යන්ගෙන් කෙනෙක් ළඟ ඒ කුසලා-
නය තිබුණොත් ඔහුව මරා දමන්න.
ඒක හම්බ වුණොත් අපි සියලුදෙනාම
ඔබේ ස්වාමියාට දාසයන් වෙනවා."[1]
**10** එවිට ඔහු මෙසේ කීවේය. "ඔබ
කියූ දේ හොඳයි.[2] කුසලානය කාගේ
හරි ගාව තිබිලා හම්බ වුණොත්
ඔහු මගේ ස්වාමියාගේ දාසයා විය
යුතුයි.[3] අනික් අයව මම නිදහස් කර-
නවා." **11** එවිට ඔවුහු එකිනෙකා
විගස තම තමාගේ මලු බිමට බා
ඒවා විවෘත කළෝය. **12** ඔහු වැඩි-
මලාගෙන් පටන්ගෙන බාලයා දක්වා
ඔවුන්ගේ මලු හොඳින් අවුස්සා බැලු-
වේය. අන්තිමේදී කුසලානය බෙන්ජ-
මින්ගේ මල්ලේ තිබී සම්බ විය.[4]
**13** එවිට ඔවුහු තම වස්ත්‍ර ඉරා-
ගෙන[5] තම තමන්ගේ බූරුවන් පිට
බඩු පටවාගෙන ආපසු නුවරට හැරී
ගියෝය. **14** යූදා[6] ඔහුගේ සහෝ-
දරයන් සමඟ යෝසෙප්ගේ නිව-
සට ඇතුල් වී ඔහු වෙතට ගොස්
ඔහු ඉදිරියේ මුණින් වැටුණේය.[7]
**15** එවිට යෝසෙප් ඔවුන්ට කතා
කර මෙසේ කීවේය. "ඔබ මොනවාද
මේ කළේ? මං වගේ කෙනෙකුට
අකුරටම නිමිති බලන්න පුළුවන්
කියා ඔබ දැනගෙන සිටියේ නැද්ද?"[8]
**16** එවිට යූදා ඔහුට මෙසේ කීවේය.
"මාගේ ස්වාමීනි, අපි ඔබට මො-
නවා කියන්නද? ඔබේ දාසයන්ගේ
වැරදි හෙළි කර දුන්නේ සැබෑ දෙ-
වියි.[9] ඉතින් අපි ධර්මිෂ්ඨයි කියා
ඔප්පු කරන්නේ කොහොමද?[10] මාගේ
ස්වාමීනි, කුසලානය ළඟ තිබුණු
කෙනා විතරක් නෙවෙයි අපිත් ඔබේ
දාසයන්!"[11] **17** එහෙත් ඔහු මෙසේ
කීවේය. "නැහැ, මට එහෙම වෙන්න
නම් ඉඩ දෙන්න බැහැ.[12] කුසලානය
ළඟ තිබුණු කෙනා විතරයි මගේ
දාසයා වෙන්නේ.[13] අනික් හැමෝම
සමාදානයෙන් තමන්ගේ පියා වෙතට
යන්න."[14]

**18** එවිට යූදා ඔහු ළඟට ගොස්
මෙසේ කීවේය. "මාගේ ස්වාමීනි,
ඔබත් පාරාවෝට සමානයි[15] කියා
මම දන්නවා. එහෙත් කෝප නොවී[16]
ඔබේ දාසයාට යමක් කියන්න අවසර

**43 පරි.**
1 උත් 45:22; මතෙ 20:15
2 විනි 14:10; යෝබ් 1:4

**44 පරි.**
3 උත් 43:16
4 උත් 42:25
5 උත් 41:40
6 උත් 19:2; විනි 19:5
7 ගීතා 109:5; හිතෝ 17:13
8 උත් 44:15; ලෙවී 19:26
9 උත් 43:12
10 ලෙවී 19:11; හිතෝ 29:24; 1පේතෘ 3:16

**2 තීරුව**
1 ක්‍රියා 25:11
2 හිතෝ 6:2
3 නික් 22:3; මතෙ 18:25
4 උත් 44:2
5 උත් 37:29; යොෂු 7:6; ක්‍රියා 14:14
6 උත් 43:8; උත් 44:32
7 උත් 37:7; උත් 50:18
8 උත් 44:5
9 උත් 37:28; උත් 42:21; හිතෝ 28:17; ක්‍රියා 2:37
10 මතෙ 7:20
11 උත් 50:18
12 උත් 42:18
13 උත් 44:9
14 උත් 26:29
15 උත් 41:44; උත් 45:8
16 හිතෝ 14:29; හිතෝ 19:11; හිතෝ 29:8

දෙන්න.[1] **19** ‘ඔබේ පියා තවමත්
ඉන්නවාද? ඔබට තව සහෝදර-
යෙක් ඉන්නවාද’ කියා මාගේ ස්වාමීන්
ඔබේ දාසයන් වන අපෙන් ඇහුවා.
**20** එනකොට අපි ඔබට මෙහෙම
කිව්වා. ‘අපේ පියා තාමත් ජීවත්
වෙනවා. ඔහු දැන් වයසයි. අපිට
තව සහෝදරයෙකුත් ඉන්නවා. ඔහු
බාලයා.[2] ඔහු ඉපදුණේ අපේ පියා වය-
සට ගියාට පස්සේ. ඔහුගේ මවට උපන්
තවත් පුතෙක් හිටියා. නමුත් ඔහු
මැරුණ නිසා දැන් බාලයා විත-
රයි ඉතුරු වෙලා ඉන්නේ.[3] ඔහු-
ගේ පියා ඔහුට ගොඩක් ආදරෙයි.’
**21** එහෙත් ඔබ, ‘මගේම ඇස්වලින්
ඔහුව දැකගන්නා පිණිස ඔහුව මෙහාට
රැගෙන එන්න’ කියා ඔබේ දාසයන්ට
කිව්වා.[4] **22** නමුත් අපේ ස්වාමීන්ට
අපි මෙහෙම කිව්වා. ‘දරුවා ඔහු-
ගේ පියාව ආලා ගියොත් අපේ පියා
මැරෙයි.’[5] **23** නමුත්, ‘ඔබේ බාල
සහෝදරයාව එක්කගෙන ආවේ නැත්-
නම් නැවත මා ඉදිරියට එන්න එපා’
කියා ඔබ අපට අණ කළා.[6]

**24** “ඊටපස්සේ අපි ඔබේ දාසයා
වන මගේ පියා ළඟට ගොස්
ඔබ කියූ දේවල් ඔහුට පැවසුවා.
**25** ටික කාලයකට පස්සේ අපේ පියා,
‘ආයෙත් ගිහින් කෑම ටිකක් මිල දී
ගෙන එන්න’ කියා අපෙන් ඉල්ලා
සිටියා.[7] **26** නමුත් අපි ඔහුට මෙ-
හෙම කිව්වා. ‘අපිට යන්න බැහැ.
අපේ බාල සහෝදරයා නැතුව අපිට
ආයෙත් ඒ මිනිසා ඉදිරියට යන්න අව-
සර නැහැ. ඔබ අපේ බාල සහෝදර-
යාව අපිත් එක්ක එවනවා නම්
අපි යන්නම්.’[8] **27** මගේ පියා අපිට
මෙහෙම කිව්වා. ‘මගේ බිරිඳ මට
පුතාලා දෙන්නෙක් බිහි කළා කියා
ඔබ හොඳින්ම දන්නවා.[9] **28** ඒ එක
පුතෙක් මගෙන් වෙන් වුණා. ඒ වෙලා-
වේ, “අනේ, සතෙක් ඔහුව මරලා
දාන්න ඇති” කියලා මම ඇඬුවා.[10] අද
වන තුරුත් මම ඔහුව දැක්කේ නැහැ.
**29** ඔබ මේ පුතාවත් එක්කගෙන
ගිහින් ඔහුට අනතුරක් වෙලා මැරු-
ණොත් මහලු වයසේ ඉන්න මාත් දුක
දරාගන්න බැරිව මැරිලා යයි.’[1]

**30** “අපේ පියා ඔහුගේ දරුවාට
පණටත් වඩා ආදරෙයි.[2] මම දරුවා
නැතුව ඔහු ළඟට ගියොත්, **31** ඔහු
මැරෙන එක නම් ස්ථිරයි. ඔබේ
දාසයා වන අපේ පියා මා නිසා මහලු
වයසේදී දුක දරාගන්න බැරිව මැරෙයි.
**32** දරුවාට කිසිම දෙයක් වෙන්න
ඉඩ දෙන්නේ නැහැ කියා මම පියාට
පොරොන්දු වුණා.[3] ‘ඔහුව නැවත
ඔබ ළඟට ගෙනාවේ නැත්නම් මම
මැරෙන තුරුම ඒ වරදට දඬුවම්
විඳින්න සූදානම්’[4] කියාත් මම ඒ වෙ-
ලාවේ පියාට කිව්වා. **33** ඒ නිසා
දැන් දරුවාටත් ඔහුගේ අනික් සහෝ-
දරයන්ටත් යන්න දී මාව තියාගන්න
කියා මම ඔබෙන් බැගෑපත්ව ඉල්ල-
නවා. මම ඔබේ දාසයා හැටියට සේ-
වය කරන්නම්.[5] **34** අනේ, දරුවා
නැතුව නම් අපේ පියා ළඟට යන්න
කියන්න එපා. මම කොහොමද මගේ
පියා මැරෙන එක මගේ ඇස් දෙකෙන්
බලාගෙන ඉන්නේ?”[6]

**45** යූදා කී දේවල් ඇසූ විට යෝ-
සෙප්ට තම හැඟීම් පාලනය
කරගත නොහැකි විය.[7] ඒ නිසා
ඔහු, “හැමෝම මෙතැනින් යන්න”
කියා තමා ඉදිරියේ සිටි සේවකයන්ට
කීවේය. යෝසෙප් තම සහෝදරයන්ට
තමා කවුද කියා හෙළි කළ විට වෙන
කිසිවෙක් එතැන සිටියේ නැත.[8]

**2** යෝසෙප් ඒ අවස්ථාවේදී හයි-
යෙන් අඬන්න පටන්ගත්තේය.[9] ඔහු
අඬන ශබ්දය ඒ අවට සිටි ඊජිප්තුව-
රුන්ටත් ඇසිණ. පාරාවෝගේ ගෙයි
වැසියන්ටත් ඒ ගැන ආරංචි විය.
**3** අවසානයේදී යෝසෙප් තම සහෝ-
දරයන්ට මෙසේ කීවේය. “මම යෝ-
සෙප්! මගේ පියා තවමත් ජීවත්
වෙනවාද?” එහෙත් ඔහුගේ සහෝදර-
යෝ ඔහු කී දේ නිසා කැලඹී ඔහුට
උත්තරයක් දීමට නොහැකිව සිටි-
යෝය.[10] **4** එබැවින් යෝසෙප්, “මා
ළඟට එන්න” කියා ඔවුන්ට කීවේය.
ඔවුහුද ඔහු ළඟට ගියෝය.

**44 පරි.**
**1** උත් 18:30
**2** උත් 42:13; උත් 43:7
**3** උත් 35:18; උත් 37:33
**4** උත් 42:15; උත් 43:29
**5** උත් 42:38
**6** උත් 42:20; උත් 43:3
**7** උත් 43:2
**8** උත් 43:5
**9** උත් 29:18; උත් 30:23; උත් 35:18; උත් 46:19
**10** උත් 37:33

**2 තීරුව**
**1** උත් 37:35; උත් 42:38; ගීතා 16:10; ගීතා 88:3; දේශ 9:10; හොෂෙ 13:14; මතෙ 11:23; ක්‍රියා 2:31; එළි 20:13
**2** 1සාමු 18:1; 2සාමු 18:33
**3** රෝම 16:4
**4** උත් 43:9; 1රාජා 20:39
**5** රෝම 9:3
**6** එස්ත 8:6

**45 පරි.**
**7** උත් 43:30
**8** ක්‍රියා 7:13
**9** රූත් 1:9
**10** මාක් 6:50

ඉන්පසු ඔහු මෙසේ කීවේය. “මම
යෝසෙප්. ඔබ ඊජිප්තුවට වික්ක
ඔබේ සහෝදරයා මමයි![1] **5** ඔබ
මාව විකුණූ නිසා දැන් දුක් වෙන්-
නවත්[2] ඔබටම දොස් කියාගන්න-
වත් එපා. ඔබේ ජීවිත ආරක්ෂා
කරන්නයි දෙවි මාව මේ දේශයට
ගෙනාවේ.[3] **6** දැන් අවුරුදු දෙකක්
තිස්සේ පොළොව පුරාම සාගතය පව-
තිනවා.[4] තව අවුරුදු පහක් යන
තුරු බීජ වපුරන්නවත් අස්වැන්න
නෙළාගන්නවත් ලැබෙන්නේ නැහැ.[5]
**7** ඔබ මේ දේශයට එන්න කලින්ම
දෙවි මාව මෙතැනට ගෙනාවා. දෙවි
එහෙම කළේ පුදුම ක්‍රියාවකින් ඔබේ
ජීවිත බේරා ඔබේ පරම්පරාව දිගටම
පොළොවේ පවතින්න සලස්වන්නයි.[6]
**8** මාව මෙතැනට එව්වේ ඔබ නො-
වෙයි,[7] සැබෑ දෙවියි. මම දැන් පියෙකු
වගේ පාරාවෝට මඟ පෙන්වනවා.[8]
ඔහුගේ සියලු ගෙයි වැසියන්ගේ ස්වා-
මියා ලෙස කටයුතු කරනවා. මුළු
ඊජිප්තු දේශයම පාලනය කරනවා.
ඒ සියල්ල සිදු වෙන්න සැලැස්සුවේ
දෙවියි.

**9** “දැන් ඉක්මනට මගේ පියා ළඟට
ගිහින් මෙහෙම කියන්න. ‘“දෙවි මා
ඊජිප්තු දේශයේ ස්වාමියා ලෙස පත්
කර තිබෙනවා.[9] දැන් ප්‍රමාද නොවී
මා ළඟට එන්න” කියා ඔබේ පුත්
යෝසෙප් ඔබට පණිවිඩයක් එව්වා.
**10** “ඔබේ පුත්‍රයනුත් පුත්‍රයන්ගේ දරු-
වනුත් ඔබේ එළු බැටළු රැළ හා
ගව රැළ ඇතුළු ඔබේ සියලු සතු-
නුත් රැගෙන ගෝෂෙන් දේශයට[10]
ඇවිත් මාත් එක්ක ජීවත් වෙන්න.
**11** නැත්නම් ඔබට තියෙන හැම දෙ-
යක්ම නැති වී ඔබත් ඔබේ ගෙයි වැසි-
යනුත් අන්ත දුගී තත්වයට පත් වෙයි.
සාගතය තව අවුරුදු පහක් පුරාම පව-
තිනවා. ඒ කාලයේදී මම ඔබට කන්න
දෙන්නම්”[11] කියා ඔබේ පුත් යෝ-
සෙප් ඔබට කිව්වා.’ **12** දැන් ඔබත්
එක්ක කතා කරන්නේ මමම කියා
මගේ සහෝදර බෙන්ජමින්ටත් ඔබ
සියලුදෙනාටත් තේරෙනවා ඇති.[12]
**13** ඊජිප්තුවේ මට ලැබුණු ගෞරවය
හා ඔබ මෙහෙ දුටු හැම දෙයක්ම මගේ
පියාට කියන්න. දැන් ඉක්මනට ගිහින්
මගේ පියාව මේ දේශයට එක්කගෙන
එන්න.”

**14** එසේ කී පසු ඔහු තම සහෝදර
බෙන්ජමින්ව බදාගෙන ඇඬුවේය.[1]
බෙන්ජමින්ද ඔහුව බදාගෙන ඇඬු-
වේය. **15** ඔහු අනික් සහෝදරයන්ව
සිපගෙන ඔවුන්වද බදාගෙන ඇඬු-
වේය.[2] ඉන්පසු ඔහුගේ සහෝදරයෝ
ඔහු සමඟ කතා කළෝය.

**16** “යෝසෙප්ගේ සහෝදරයන්
ඇවිත් ඉන්නවා” කියා පාරාවෝ-
ගේ නිවසේ අයට ආරංචි වූ
විට පාරාවෝද ඔහුගේ සේවකයෝද
ඒ ගැන සතුටු වූහ.[3] **17** පාරාවෝ
යෝසෙප්ට මෙසේ කීවේය. “ඔබේ
සහෝදරයන්ට මෙහෙම කියන්න.
‘ඔබේ සතුන් පිට බඩු පටවාගෙන
කානාන් දේශයට යන්න.[4] **18** ඔබේ
පියාවත් ඔබේ ගෙයි වැසියන්වත්
මගේ දේශයට එක්කගෙන එන්න.
මම ඔබට ඊජිප්තු දේශයේ තියෙන
හොඳම දේ දෙන්නම්. දේශයේ තියෙන
හොඳම කෑම ඔබට කන්න පුළුවන්.’[5]
**19** ඔබ ඔවුන්ට මෙහෙමත් කියන්න.[6]
‘ඊජිප්තු දේශයෙන් කරත්ත[7] රැගෙන
ඔබේ කුඩා දරුවන්වත් භාර්යාවන්වත්
ඔබේ පියාවත් කැඳවාගෙන එන්න.[8]
**20** ඔබට අයිති බඩු බාහිරාදිය එහෙ
දාලා එන එක ගැන කනගාටු වෙන්න
එපා.[9] ඔබට ඊජිප්තු දේශයේ සැප සම්-
පත් භුක්ති විඳින්න පුළුවන්.’ ”[10]

**21** ඊශ්‍රායෙල්ගේ පුත්‍රයෝ පාරාවෝ
කී දේට එකඟ වූහ. පාරාවෝ අණ
කළ පරිදි යෝසෙප් ඔවුන්ට කරත්-
තද ගමනට අවශ්‍ය දේවල්ද දුන්-
නේය.[11] **22** ඔවුන් එකිනෙකාට ඔහු
ඇඳුම් කට්ටලය බැගින් දුන්නේය.[12]
නමුත් ඔහු බෙන්ජමින්ට රිදී ෂෙ-
කෙල් තුන්සියයක්ද ඇඳුම් කට්ටල
පහක්ද දුන්නේය.[13] **23** ඔහු තම
පියාට බූරුවන් දහදෙනෙකු පිට ඊජිප්-
තුවේ හොඳ දේවල්ද ඊජිප්තුව බලා
එන ගමනට බූරුදෙනුන් දහදෙනෙකු

**45 පරි.**
1 උත් 37:28 ක්‍රියා 7:9
2 2කොරි 2:7
3 උත් 47:25 උත් 50:20 1සාමු 2:6 ගීතා 33:19 ගීතා 105:17
4 උත් 41:30 උත් 47:18
5 1කොරි 9:10
6 උත් 46:26
7 රෝම 8:28
8 විනි 17:10 යෝබ 29:16 ගීතා 105:21
9 උත් 45:26 ක්‍රියා 7:10 1යොහ 4:14
10 උත් 46:34 උත් 47:1 නික් 8:22 නික් 9:26
11 උත් 47:12 හිතෝ 3:27 ක්‍රියා 7:14
12 උත් 42:23

**2 තීරුව**
1 උත් 33:4 උත් 46:29
2 නික් 4:27 1සාමු 20:41 ලූක් 15:20
3 2සාමු 3:36 එස්ත 1:21
4 උත් 42:25 උත් 43:18
5 උත් 27:28 උත් 47:6
6 උත් 41:40
7 උත් 45:27 උත් 46:5 ගණන් 7:3 1සාමු 6:14
8 උත් 47:9
9 උත් 46:6
10 යෙසා 1:19
11 උත් 21:14 උත් 42:25
12 2රාජා 5:5
13 උත් 43:34

පිට අවශ්‍ය ධාන්‍ය සහ කෑමද යැව්-
වේය. **24** ඔහු තම සහෝදරයන්ව
පිටත් කර යැවූ අවස්ථාවේදී, “ගමන
යන අතරතුරේදී රණ්ඩු වෙන්න එපා”[1]
කියා උපදෙස් දුන්නේය.

**25** කල් යත්ම ඔවුහු කානාන් දේ-
ශයට පැමිණියෝය. ඔවුහු තමන්-
ගේ පියා වන යාකොබ් වෙතට
ගොස් **26** මෙසේ කීවෝය. “යෝ-
සෙප් තවමත් ජීවතුන් අතර ඉන්නවා!
ඔහුව මුළු ඊජිප්තු දේශයේම පාලකයා
ලෙස පත් කර තිබෙනවා.”[2] නමුත්
යාකොබ් ඔවුන් කී දේවල් විශ්වාස
නොකළ නිසා ඒ ගැන කිසිම හැඟීමක්
ඔහුට ඇති නොවීය.[3] **27** ඉන්පසු
ඔවුහු යෝසෙප් කී සියල්ල තම පියාට
කීවෝය. යාකොබ් තමාව රැගෙන
යෑමට යෝසෙප් එවා තිබූ කරත්ත
දුටු විට ඔහුගේ සිත සතුටින් ඉපිල
ගියේය.[4] **28** ඊශ්‍රායෙල් ඉතා හැඟීම්-
බරව මෙසේ කීවේය. “අනේ මගේ
පුතේ, යෝසෙප්, ඔබ ඇත්තටම තව-
මත් ජීවත් වෙනවාද? මගේ ඇස්
පියවෙන්න කලින් ඔබේ මුහුණ දැක-
ගන්න පුළුවන් නම් මට ඒ ඇති.”[5]

**46** ඊශ්‍රායෙල් සහ ඔහුගේ පවුලේ
සියලුදෙනාම කූඩාරම් අකු-
ළගෙන බෙයර්-ෂෙබා[6] දක්වා ගමන්
කළෝය. එහිදී ඊශ්‍රායෙල් තම පිය වූ
ඊසාක්ගේ[7] දෙවිට පූජා ඔප්පු කළේය.
**2** දෙවි රාත්‍රියේ ඊශ්‍රායෙල්ට දර්ශනය
වී,[8] “යාකොබ්, යාකොබ්” කියා ඔහුට
හඬගැසුවේය. ඔහුද, “දෙවියනි, මම
ඔබ කියන දේට සවන් දීගෙනයි
ඉන්නේ” කියා උත්තර දුන්නේය.[9]
**3** දෙවි ඔහුට මෙසේ කීවේය. “මා
ඔබේ පියාගේ දෙවිය.[10] සැබෑ දෙවි
මමයි.[11] ඊජිප්තුවට යන්න භය නො-
වන්න. එහිදී මම ඔබෙන් මහත්
ජාතියක් බිහි වීමට සලස්වන්නෙමි.[12]
**4** ඔබ ඊජිප්තුවට යන විට මමද ඔබ
සමඟ එන්නෙමි. නමුත් මම නැව-
තත් ඔබව ඒ දේශයෙන් පිටතට
ගෙන එන්නෙමි.[13] ඔබ මිය යන
මොහොතේදී යෝසෙප් ඔබේ ඇස්
පියවන්නේය.”[14]

**45 පරි.**
**1** උත් 42:21 ගීතා 133:1
**2** ගීතා 105:21
**3** උත් 42:38 උත් 44:28 ලූක් 24:11
**4** යෙසා 57:15 1කොරි 16:18 2කොරි 7:13
**5** උත් 46:30 ලූක් 2:29

**46 පරි.**
**6** උත් 21:31
**7** උත් 31:42 නික් 3:6 ලූක් 20:37
**8** ගණන් 12:6 යෝබ් 33:15
**9** 1සාමු 3:4
**10** උත් 28:13 මතෙ 22:32
**11** උත් 5:22 1රාජා 18:21 1කොරි 8:6
**12** උත් 12:2 නික් 1:7 ද්වි 26:5 ගීතා 105:12 ක්‍රියා 7:17
**13** උත් 15:16 උත් 28:15 උත් 47:29 උත් 50:13 නික් 3:8 ගීතා 105:37
**14** උත් 50:1

**2 තීරුව**
**1** උත් 45:19
**2** උත් 31:18 උත් 36:7
**3** ගණන් 20:15 ගීතා 105:23 යෙසා 52:4 ක්‍රියා 7:15
**4** නික් 1:1
**5** උත් 35:23 උත් 49:3 1ලේක 5:1
**6** නික් 6:14 ගණන් 26:5
**7** උත් 29:33
**8** ගණන් 26:12
**9** නික් 6:15 1ලේක 4:24
**10** උත් 29:34 1ලේක 6:16
**11** නික් 6:16 ගණන් 3:23
**12** නික් 6:18 ගණන් 3:27 1ලේක 9:32
**13** ගණන් 3:33 1ලේක 6:63
**14** උත් 29:35 උත් 49:10 එළි 5:5
**15** උත් 38:3
**16** උත් 38:4

**5** යාකොබ් බෙයර්-ෂෙබා වෙතින්
පිටත් විය. ඊශ්‍රායෙල්ගේ පුත්‍රයෝ
තම පියාවද තම කුඩා දරුවන්-
වද තම භාර්යාවන්වද පාරාවෝ එවූ
කරත්තවලට නංවාගෙන එතැනින්
ගියෝය.[1] **6** ඔවුහු කානාන් දේශ-
යේදී රැස් කරගත් සත්ව රැළවල්ද බඩු
බාහිරාදියද රැගෙන පිටත්ව ගියෝය.[2]
කල් යත්ම යාකොබ්ද ඔහුගේ සියලු
දරුදැරියෝද ඊජිප්තුවට පැමිණියහ.
**7** යාකොබ් තම සියලු දරුදැරියන්වද
මුනුපුරු මිනිපිරියන්වද ඊජිප්තුවට
ගෙනාවේය.[3]

**8** ඊජිප්තුවට පැමිණි ඊශ්‍රායෙල්ගේ
එනම්, යාකොබ්ගේ පුත්‍රයන්ගේ නම්
මේවාය.[4] යාකොබ්ගේ කුලුඳුලාගේ
නම රූබෙන්ය.[5]

**9** රූබෙන්ගේ පුත්‍රයන් නම්
හනොක්, පල්ලූ, හෙස්‍රොන් සහ කාමී
යන අයයි.[6]

**10** සිමියොන්ගේ[7] පුත්‍රයන් නම්
යෙමුවෙල්, යාමින්, ඕහද්, යාකින්,[8]
ෂෝහර් සහ කානාන් ජාතික
ස්ත්‍රියකගෙන් බිහි වූ ෂාවුල්[9] යන
අයයි.

**11** ලෙවීගේ[10] පුත්‍රයන් නම් ගේර්-
ෂොන්,[11] කෝහාත්[12] සහ මෙරා-
රිය.[13]

**12** යූදාගේ[14] පුත්‍රයන් නම් ඒර්,[15]
ඕනාන්,[16] ෂේලා,[17] පේරෙස්[18] සහ
සේරා[19] යන අයයි. ඒර් සහ ඕනාන්
කානාන් දේශයේදී මිය ගියෝය.[20]

පේරෙස්ගේ පුත්‍රයන්ගේ නම් හෙ-
ස්‍රොන්[21] සහ හාමුල්ය.[22]

**13** ඉසකාර්ගේ[23] පුත්‍රයන් නම්
තෝලා,[24] පූවා,[25] යොබ් සහ ෂිම්-
රොන්[26] යන අයයි.

**14** සෙබ්‍යූලන්ගේ[27] පුත්‍රයන් නම්
සෙරෙද්, ඒලොන් සහ යාලෙයෙල්[28]
යන අයයි.

**15** ඒ සියලුදෙනා පදන්-ආරම්හිදී
යාකොබ්ට දාව ලෙයා[29] බිහි කළ

---

**17** උත් 38:5; **18** රූත් 4:12; ලූක් 3:33; **19** උත් 38:30; **20** උත් 38:7; උත් 38:10; **21** ගණන් 26:21; **22** 1ලේක 2:5; **23** උත් 49:14; යොෂු 19:17; **24** ගණන් 26:23; **25** 1ලේක 7:1; **26** ගණන් 26:24; **27** උත් 30:20; උත් 49:13; **28** ගණන් 26:26; **29** උත් 35:23.

පුත්‍රයෝය. ඇය යාකොබ්ට දාව ඔහු-
ගේ දියණිය වූ දීනාවද[1] බිහි කළාය.
ඔහුගෙන් පැවත ආ ඒ සියලුදෙනා
තිස්තුන්දෙනෙකි.
**16** ගාද්ගේ[2] පුත්‍රයන් නම් ෂිපි-
යොන්, හග්ගී, ෂූනී, එෂ්බොන්, ඒරී,
අරොද් සහ අරේලී යන අයයි.[3]
**17** ආෂෙර්ගේ[4] පුත්‍රයන් නම් ඉම්-
නාහ්, ඉෂ්වා, ඉෂ්වී සහ බෙරීයාය.[5]
ඔවුන්ගේ සහෝදරියගේ නම සෙ-
රාය.
බෙරීයාගේ පුත්‍රයන් නම් හෙබෙර්
සහ මල්කියෙල්ය.[6]
**18** ඒ සියලුදෙනා ලාබන් තම දිය-
ණිය වන ලෙයාට දුන් සේවිකාව
වන ෂිල්පාගේ[7] පුත්‍රයෝය. යාකොබ්-
ගෙන් පැවත ආ ඒ සියලුදෙනා දහසය-
දෙනෙකි.
**19** යාකොබ්ගේ භාර්යාව වන
රාකෙල්ගේ[8] පුත්‍රයන්ගේ නම් යෝ-
සෙප්[9] සහ බෙන්ජමින්ය.[10]
**20** ඊජිප්තු දේශයේදී ඕන් නුව-
රෙහි පූජක වූ පොතිෆෙරාගේ දිය-
ණිය වන අසෙනත්[11] යෝසෙප්ට
දාව මනස්සේ[12] සහ එෆ්‍රායිම්*[13] බිහි
කළාය.
**21** බෙන්ජමින්ගේ පුත්‍රයන් නම්
බෙලා,[14] බෙකෙර්,[15] අෂ්බෙල්,
ගෙරා,[16] නාමන්,[17] ඒහී, රෝෂ්,
මප්පිම්,[18] හප්පිම්[19] සහ අර්ද් යන
අයයි.
**22** ඒ සියලුදෙනා රාකෙල් බිහි කළ
පුත්‍රයෝය. යාකොබ්ගෙන් පැවත ආ
ඒ සියලුදෙනා දහහතරදෙනෙකි.
**23** දාන්ගේ[20] පුත්‍රයන් නම්
හුෂිම්ය.*[21]
**24** නප්තලීගේ[22] පුත්‍රයන් නම්
යාෂෙයෙල්, ගූනී,[23] යේෂෙර් සහ
ෂිල්ලෙම්ය.[24]

**25** ඒ සියලුදෙනා ලාබන් තම දිය-
ණිය වන රාකෙල්ට දුන් සේවිකාව
වන බිල්හාගේ පුත්‍රයෝය.[1] යාකොබ්-
ගෙන් පැවත ආ ඔවුන් හත්දෙනෙකි.
**26** යාකොබ්ගේ ලේලියන් හැර ඔහු
සමඟ ඊජිප්තුවට ආ අනික් සියලුදෙ-
නාම ඔහුගෙන් පැවත ආ දරුවෝය.[2]
ඔවුන්ගේ මුළු ගණන හැටහයකි.
**27** ඊජිප්තුවේදී යෝසෙප්ට දාව පුත්‍ර-
යෝ දෙදෙනෙක් බිහි වූහ. ඊජිප්තු-
වට පැමිණි යාකොබ්ගේ සියලු ගෙයි
වැසියන්ගේ මුළු ගණන හැත්තෑවක්
විය.*[3]
**28** යාකොබ් තමා ගෝෂෙන්
වෙතට එන බව යෝසෙප්ට දන්-
වන පිණිස යූදාව[4] තමාට ඉදිරියෙන්
යැව්වේය. පසුව ඔවුහු සියලු-
දෙනම ගෝෂෙන් දේශයට[5] පැමිණි-
යහ. **29** යෝසෙප් තම අශ්ව රථය
සූදානම් කරගෙන ගෝෂෙන්[6] වෙතට
පැමිණ තම පියා වන ඊශ්‍රායෙල්ව
හමු වන පිණිස ගියේය. යෝසෙප්
තම පියාව දුටු විගස ඔහුව බදා-
ගෙන බොහෝ වේලාවක් ඇඬුවේය.[7]
**30** පසුව ඊශ්‍රායෙල් යෝසෙප්ට මෙසේ
කීවේය. “මගේ ඇස් දෙකෙන්ම ඔබව
දැක්කානේ. දැන් මම මැරුණත්
කමක් නැහැ.”[8]
**31** එවිට යෝසෙප් තම සහෝදර-
යන්ටද තම පියාගේ ගෙයි වැසියන්ටද
මෙසේ කීවේය. “මම පාරාවෝට කතා
කර මෙහෙම කියන්නම්.[9] ‘කානාන්
දේශයේ ජීවත් වූ මගේ සහෝදරයෝ
සහ මගේ පියාගේ පවුලේ අය මේ දේ-
ශයට ඇවිත් ඉන්නවා.[10] **32** ඔවුන්
එඬේරුන්.[11] ඒ නිසා එළු බැටළු රැළ-
වල්, ගව රැළවල් සහ අනිකුත් හැම
දෙයක්ම රැගෙනයි ඔවුන් මෙහාට
ආවේ.’[12] **33** පාරාවෝ ඔබට කතා
කර, ‘ඔබ කරන රැකියාව කුමක්ද’
කියා ඇහුවොත් **34** ‘තරුණ කාලේ
සිටම ඔබේ සේවකයන් වන අපත්
අපේ මුතුන්මිත්තනුත් සතුන් ඇති

උත් **46:20*** යෝසෙප්ගේ පවුලට අයත් තව පස්දෙනෙකුගේ නම් සෙප්ටුඅජින්ට් පරිවර්තනයේ අඩංගු ලැයිස්තුවට ඇතුළත් කර තිබේ. ක්‍රියා 7:14හි ස්තේපන් උපුටා දක්වන්න ඇත්තේ එම පරිවර්තනයෙනි. **23*** සමහරවිට ඔහුගේ අනික් පුත්‍රයන්ගේ නම් මෙම වාර්තාවෙන් ඉවත් කරන්න ඇති.

උත් **46:27*** හෝ, “සෙප්ටුඅජින්ට් පරිවර්තනයට අනුව ‘හැත්තෑපහක්.’” උත් 46:20හි පාදසටහන බලන්න.

**46 පරි.**
1 උත් 30:21
2 උත් 30:11
උත් 49:19
3 ගණන් 26:15
4 උත් 30:13
උත් 49:20
ද්වි 33:24
5 ගණන් 26:44
6 ගණන් 26:45
7 උත් 29:24
උත් 35:26
8 උත් 29:18
උත් 35:24
9 උත් 30:24
උත් 49:22
10 උත් 35:18
උත් 49:27
11 උත් 41:50
12 උත් 41:51
උත් 48:14
13 උත් 41:52
14 ගණන් 26:38
15 1ලේක 7:6
16 1ලේක 8:3
17 ගණන් 26:40
18 ගණන් 26:39
19 1ලේක 7:12
20 උත් 30:6
උත් 49:16
21 ගණන් 26:42
22 උත් 30:8
උත් 49:21
23 ගණන් 26:48
24 ගණන් 26:49

**2 තීරුව**
1 උත් 29:29
උත් 35:25
2 උත් 35:11
3 නික් 1:5
ද්වි 10:22
ක්‍රියා 7:14
4 උත් 43:8
උත් 44:18
5 උත් 45:10
උත් 47:1
6 උත් 41:43
7 උත් 33:4
උත් 45:14
8 උත් 45:28
ලූක් 2:29
9 උත් 41:40
10 උත් 45:19
උත් 47:1
ක්‍රියා 7:13
11 උත් 31:18
උත් 31:38
උත් 47:3
12 උත් 46:6

කරන අය’ කියා උත්තර දෙන්න.[1]
ඊජිප්තු ජාතිකයන් එඬේරුන්ව පිළි-
කුල්[2] කරන නිසා ඔහු ඔබට ගෝෂෙන්
දේශයේ[3] ජීවත් වෙන්න ඉඩ දෙයි.”

**47** යෝසෙප් පාරාවෝ වෙතට
ගොස් ඔහුට මෙසේ දැනුම්
දුන්නේය.[4] “මගේ පියාත් මගේ සහෝ-
දරයනුත් ඔවුන්ගේ එළු බැටළු රැළ-
වල්, ගව රැළවල් සහ ඔවුන්ට අයිති
සියල්ලත් රැගෙන කානාන් දේශයේ
සිට ආවා. ඔවුන් දැන් ඉන්නේ ගෝ-
ෂෙන් දේශයේ.”[5] **2** ඔහු තම සහෝ-
දරයන්ගෙන් පස්දෙනෙකුව තෝරා
පාරාවෝ ඉදිරියට ගෙන ගියේය.[6]
**3** පාරාවෝ ඔහුගේ සහෝදරයන්-
ගෙන්, “ඔබේ රැකියාව කුමක්ද”[7]
කියා ඇසුවේය. ඔවුහුද, “ඔබේ සේව-
කයන් වන අපි එඬේරුන්.[8] අපේ
මුතුන්මිත්තනුත් කළේ ඒ රැකියාව-
මයි”[9] කියා පාරාවෝට පිළිතුරු දුන්-
නෝය. **4** ඔවුහු පාරාවෝට මෙසේද
කීවෝය. “කානාන් දේශයේ සාග-
තය[10] දරුණු නිසා අපේ සතුන්ට එහි
තණබිම් නැහැ.[11] ඔබේ සේවකයන්
වන අප මේ දේශයේ විදේශිකයන්[12]
ලෙස ජීවත් වෙන්න ආවේ ඒ නිසයි.
ඔබේ සේවකයන්ට ගෝෂෙන් දේ-
ශයේ ජීවත් වීමට[13] ඉඩ දෙන්න
කියා අපි ඔබෙන් බැගෑපත්ව ඉල්ලා
සිටිනවා.” **5** එවිට පාරාවෝ යෝ-
සෙප්ට මෙසේ කීවේය. “ඔබේ පියාත්
ඔබේ සහෝදරයනුත් දැන් මෙහෙ
ඉන්නවා. **6** ඊජිප්තු දේශයේ ඕනෑම
පළාතක් තෝරාගන්න.[14] ඔබේ පියා-
වත් ඔබේ සහෝදරයන්වත් දේශයේ
හොඳම පළාතේ පදිංචි කරවන්න.[15]
ඔවුන්ට ගෝෂෙන් දේශයේ[16] ජීවත්
වෙන්න අවසර තිබෙනවා. ඔබේ පවු-
ලේ ශක්තිමත් පුරුෂයන්[17] ඉන්නවා
නම් මගේ ගව රැළවල් රැකබලා ගැනී-
මට ඔවුන්ව පත් කරන්න.”[18]
**7** ඉන්පසු යෝසෙප් තම පියා
වන යාකොබ්ව පාරාවෝට හඳුන්වා
දුන්නේය. ඒ අවස්ථාවේදී යාකොබ්
පාරාවෝට ආශීර්වාද කළේය.[19]
**8** පාරාවෝද, “ඔබට වයස කීයද”
කියා යාකොබ්ගෙන් ඇසුවේය.
**9** යාකොබ් පාරාවෝට මෙසේ
කීවේය. “මම අවුරුදු එකසිය තිහක්
විදේශිකයෙක් ලෙස ජීවත් වෙලා
තියෙනවා.[1] මගේ ජීවිතය හරිම
කෙටියි. එයත් දුක්බර ජීවිතයක්.[2]
විදේශිකයන් ලෙස ජීවත් වූ මගේ පිය-
වරුන් තරම් දිගු කාලයක් මම ජීවත්
වෙයි කියා මම සිතන්නේ නැහැ.”[3]
**10** යාකොබ් පාරාවෝට ආශීර්වාද
කර එතැනින් ඉවත්ව ගියේය.[4]
**11** යෝසෙප් පාරාවෝ අණ කළ
පරිදි තම පියාවද තම සහෝදරයන්-
වද දේශයේ හොඳම පළාත වන
රමෙසේස්හි[5] පදිංචි කරවා ඔවුන්ට
ඊජිප්තු දේශයේ බිම් කොටසක් ලබා
දුන්නේය. **12** යෝසෙප් තම පියා-
ටද තම සහෝදරයන්ටද තම පියාගේ
පවුලේ සියලුදෙනාටද කෑම දුන්-
නේය.[6] එක් එක් පවුල්වල සිටි දරුදැ-
රියන් සංඛ්‍යාව බලා ඔහු ඔවුන්ට
අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබා දුන්නේය.[7]
**13** සාගතය ඉතා දරුණු වූ නිසා
දේශයේ කිසිම තැනක ආහාර තිබුණේ
නැත.[8] සාගතය නිසා කානාන් දේශ-
යේ මෙන්ම ඊජිප්තු දේශයේ ජනයාද
මලානිකව සිටියෝය.[9] **14** ජනයා
ධාන්‍ය මිල දී ගැනීමට යෝසෙප් වෙ-
තට ආවෝය. ඒ නිසා ඊජිප්තු දේශයේ
හා කානාන් දේශයේ ජනයා සතු සියලු
මුදල් ඔහුගේ අතට ලැබිණ.[10] යෝ-
සෙප් තමා එකතු කරගත් මුදල්
පාරාවෝගේ නිවසට ගෙනාවේය.
**15** කලක් ගෙවුණු පසු ඊජිප්තු දේශ-
යේ සහ කානාන් දේශයේ ජනයාගේ
මුදල් සියල්ල වියදම් විය. ඊජිප්තු-
වේ සියලු වැසියෝ යෝසෙප් වෙතට
පැමිණ, “අපිට කෑම ගන්න දැන් මුදල්
නැහැ. අපිට කෑම දෙන්න![11] නැත්-
නම් අපි මෙතැනම මැරිලා යයි”[12]
කියා පැවසුවෝය. **16** එවිට යෝ-
සෙප් මෙසේ කීවේය. “ඔබට මුදල්
නැත්නම් ඔබේ සත්තු දෙන්න. මම
ඔබට කෑම දෙන්නම්.” **17** ඔවුහු
යෝසෙප් කී ලෙස තමන්ගේ සතුන්
ඔහුට ගෙනැවිත් දුන්නෝය. යෝසෙප්

**46 පරි.**
1 උත් 30:35
උත් 34:5
2 උත් 43:32
3 උත් 45:18
උත් 47:27

**47 පරි.**
4 උත් 46:31
5 උත් 45:10
නික් 8:22
6 ක්‍රියා 7:13
7 උත් 46:33
8 උත් 31:18
9 උත් 12:16
උත් 26:14
උත් 46:34
10 ක්‍රියා 7:11
11 යෝවෙ 1:18
12 උත් 15:13
ද්වි 26:5
ගීතා 105:23
යෙසා 52:4
ක්‍රියා 7:6
13 උත් 45:10
14 උත් 42:34
15 උත් 13:10
උත් 45:18
16 උත් 46:34
17 හිතෝ 22:29
18 1ලේක 27:31
19 නික් 12:32
1සාමු 13:10
2රාජා 10:15

**2 තීරුව**
1 1ලේක 29:15
ගීතා 39:12
හෙබ්‍රෙ 11:9
2 යෝබ් 14:1
යාකො 4:14
3 උත් 25:7
උත් 35:28
නික් 6:4
4 2සාමු 19:39
1රාජා 8:66
5 උත් 45:10
නික් 1:11
නික් 12:37
ගණන් 33:3
6 හිතෝ 11:25
1තිමෝ 5:8
7 උත් 50:8
8 උත් 41:31
9 උත් 41:30
10 උත් 41:56
උත් 44:25
11 නික් 16:3
12 දේශ 7:12
විලා 1:11

ඔවුන් ගෙන ආ අශ්වයන්, එළුවන්,
බැටළුවන්, ගවයන් හා බූරුවන්[1] වෙ-
නුවට ඔවුන්ට ආහාර දුන්නේය. ඒ
අවුරුද්දේදී ඔවුහු තමන්ගේ සියලු
සතුන්ව යෝසෙප්ට ගෙනැවිත් දුන්-
නෝය. ඔහුද දිගටම ඔවුන්ට ආහාර
දුන්නේය.

**18** ඒ අවුරුද්ද අවසානයේදී ඔවුහු
යෝසෙප් වෙතට පැමිණ මෙසේ
කීවෝය. "අපේ ස්වාමීනි, අපිට මේ
කාරණය ඔබෙන් සඟවන්න බැහැ.
අපේ මුදල් සියල්ලම ඉවරයි. අපිට
දෙන්න තව සත්තුත් නැහැ. ඒ
සියල්ල අපි ඔබට දුන්නා.[2] දැන්
අපේ ඉඩකඩම් හා අපි හැර වෙන
දෙන්න කිසිම දෙයක් ඉතුරු වී නැහැ.[3]
**19** අපද අපේ ඉඩම්ද ඔබ ඉදිරියේ
නැති නාස්ති වී යන්න ඉඩ දෙන්නේ
මොකටද?[4] ධාන්‍ය වෙනුවට අපිව
ගන්න. අපේ ඉඩම් පවා ගන්න.[5] අපි
පාරාවෝට දාසකම් කරන්නම්. අපේ
ඉඩම්ද ඔහුට අයිති කරගන්න පුළුවන්.
අපිට බීජ දෙන්න. නැත්නම් අපේ ඉඩ-
කඩම් පාළුවට ගොස් අපත් මිය
යයි."[6] **20** මෙසේ, යෝසෙප් පාරා-
වෝගේ නමට ඊජිප්තුවරුන්ගේ සියලු
ඉඩම් පවරාගත්තේය.[7] සාගතය ඊජිප්-
තුවරුන්ට දරුණු ලෙස බලපෑ නිසා
සියලුදෙනාම තම තමන්ගේ ඉඩම්
වික්කෝය. මුළු දේශයම පාරාවෝට
අයිති විය.

**21** ඔහු ජනයාව ඊජිප්තු දේශය
පුරාම පිහිටි නුවරවල පදිංචි කෙරෙව්-
වේය.[8] **22** ඔහු පූජකයන්ගේ ඉඩම්
පමණක් නොගත්තේය.[9] මන්ද පූජක-
යන්ට ආහාර ලැබුණේ පාරාවෝ-
ගෙනි.[10] පාරාවෝ ඔවුන්ට කන්න
ආහාර දුන් නිසා ඔවුහු තමන්ගේ
ඉඩම් පාරාවෝට වික්කේ නැත.[11]
**23** එවිට යෝසෙප් ජනයාට මෙසේ
කීවේය. "මම ඔබවද ඔබේ සියලු
ඉඩම්ද පාරාවෝගේ නමට පවරා-
ගත්තා. මම ඔබට බීජ දෙන්නම්.
දේශයේ වගා කරන්න.[12] **24** අස්-
වැන්න නෙළන කාලයේ[13] ඔබ පහෙන්
කොටසක් පාරාවෝට දිය යුතුයි.[14]
ඉතුරු කොටස් හතර ඔබ තියා-
ගන්න. කෙතේ වැපිරීමටත් ඔබටත්
ඔබේ ගෙයි වැසියන්ටත් ඔබේ දරු-
වන්ටත් කෑම සඳහා එය ගන්න."[1]
**25** එබැවින් ඔවුහු මෙසේ කීවෝය.
"ස්වාමීනි, ඔබ අපේ ජීවිත බේර-
ගත්තා.[2] අපි පාරාවෝගේ දාසයෝ
වෙන්න කැමතියි. අපිට කරුණා-
වෙන් සලකන්න කියා ඔබෙන් ඉල්ලා
සිටිනවා."[3] **26** ඊජිප්තුවේ කෙත්ව-
තුවල අස්වැන්නෙන් පහෙන් කො-
ටසක් පාරාවෝට දිය යුතු බවට
නියෝගයක් යෝසෙප් පැනෙව්වේය.
එම නියෝගය අද දක්වාම පවතී.
පූජකයන්ගේ ඉඩම් පමණක් පාරා-
වෝට අයිති නොවීය.[4]

**27** ඊශ්‍රායෙල්වරු ඊජිප්තු දේශයේ
ගෝෂෙන් නම් පළාතේ දිගටම ජීවත්
වූහ.[5] ඔවුහු එහි ජීවත් වී දරුවන් බිහි
කර බොහෝ සෙයින් ගණනින් වැඩි
වූහ.[6] **28** යාකොබ් ඊජිප්තු දේශයේ
අවුරුදු දහහතක් ජීවත් විය. යාකොබ්
ජීවත් වූ මුළු අවුරුදු ගණන එකසිය
හතළිස්හතක් විය.[7]

**29** ඊශ්‍රායෙල් මිය යන දවස ළං වූ
විට[8] ඔහු තම පුත් යෝසෙප්ට කතා
කර මෙසේ කීවේය. "ඔබ මට ආදරේ
නම් ඔබ මාත් එක්ක විශ්වාසවන්-
තව කටයුතු කර මට කරු-
ණාව* පෙන්වන බවට පොරොන්දු
වෙන්න.[9] මම මැරුණාට පස්සේ ඔබ
මාව ඊජිප්තුවේ තැන්පත් කරන්නේ
නැහැයි කියා[10] මගේ කළවයට යටින්
අත තබා පොරොන්දු වෙන්න.[11]
**30** මම මැරුණාට පස්සේ ඔබ
මාව ඊජිප්තුවෙන් පිටතට ගෙනි-
හින් මගේ පියවරුන්ගේ[12] සොහොනේ
මාව තැන්පත් කරන්න."[13] යෝ-
සෙප් ඔහුට මෙසේ පිළිතුරු දුන්නේය.
"මම ඔබ කියන විදිහටම කරන්නම්."
**31** එවිට යාකොබ්, "මට දිවුරා පො-
රොන්දු වෙන්න" කියා කීවේය. යෝ-
සෙප්ද ඔහුට දිවුරා පොරොන්දු විය.[14]
එවිට ඊශ්‍රායෙල් ඇඳේ සිට හිස නමා
යාච්ඤා කළේය.[15]

**47 පරි.**
**1** 1රාජා 10:28
**2** නෙහෙ 5:3
**3** නෙහෙ 5:2 මාක් 8:37
**4** යෝබ් 2:4
**5** විලා 4:9
**6** හෙබ්‍රෙ 2:15
**7** හිතෝ 11:26
**8** උත් 41:48 ගීතා 33:19 ගීතා 107:36
**9** උත් 41:45
**10** නෙහෙ 13:13 මතෙ 10:10 1කොරි 9:13
**11** එස්රා 7:24
**12** උත් 45:6 ගීතා 41:1 2කොරි 9:10
**13** ගීතා 85:12 ගීතා 107:37
**14** උත් 41:34 1සාමු 8:15 රෝම 13:7

**2 තීරුව**
**1** හිතෝ 12:11 1තිමෝ 5:18
**2** උත් 45:5 හිතෝ 11:26 ක්‍රියා 7:11
**3** උත් 47:19 හිතෝ 14:21
**4** උත් 47:22
**5** උත් 47:4
**6** නික් 1:7 ද්වි 10:22 ගීතා 105:24 ක්‍රියා 7:17
**7** උත් 47:9
**8** උත් 49:33 හෙබ්‍රෙ 11:21
**9** උත් 24:49
**10** උත් 46:4 උත් 50:13 ක්‍රියා 7:16
**11** උත් 24:9
**12** උත් 49:33
**13** උත් 25:9 උත් 49:29
**14** උත් 50:5
**15** 1රාජා 1:47 හෙබ්‍රෙ 11:21

උත් **47:29*** හෝ, "ඇදි ප්‍රේමය."

**48** පසුව යෝසෙප්ට මෙසේ දන්-
වන ලදි. “ඔබේ පියා දැන්
හුඟක් දුර්වලයි.” එය ඇසූ විට යෝ-
සෙප් ඔහුගේ පුත්‍රයන් දෙදෙනා වන
මනස්සේ සහ එෆ්‍රායිම් සමඟ තම පියා
වෙතට ගියේය.[1] **2** “ඔබේ පුත් යෝ-
සෙප් ඔබව බලන්න ඇවිත් ඉන්-
නවා” කියා ඊශ්‍රායෙල්ට කියූ විට, ඔහු
වෙර දරා නැඟිට ඇඳ මත හිඳ-
ගත්තේය. **3** යාකොබ් යෝසෙප්ට
මෙසේ කීවේය.

“කානාන් දේශයේ ලූෂ්වලදී[2] සියලු
බලැති දෙවි මට දර්ශනය වී ආශීර්වාද
කළා.[3] **4** දෙවි මට මෙහෙම කිව්වා.
‘මම ඔබ මාර්ගයෙන් බොහෝ දරු-
වන් බිහි වෙන්න සලස්වන්නෙමි.[4]
ඔබෙන් ජාතීන් සමූහයක් බිහි කර[5]
ඔබෙන් පැවතෙන අයට මේ දේශය
උරුමයක් ලෙස දෙන්නෙමි. ඔවුහු
බොහෝ කාලයකට එහි ජීවත් වන්-
නෝය.’[6] **5** මම ඊජිප්තුවට එන්න
කලින් මේ දේශයේ ඉපදුණ ඔබේ
පුතුන් දෙදෙනාව මගේම දරුවන්
ලෙස භාරගන්නවා.[7] මම එෆ්‍රායිම්ව හා
මනස්සේව සලකන්නේ මගේ දරුවන්
වන රූබෙන් හා සිමියොන්[8] වගේමයි.
**6** නමුත් ඔබට බිහි වෙන අනිකුත්
දරුවන් ඔබේ දරුවන් ලෙස සැලකිය
හැකියි. ඒ දරුවන්ට ඔවුන්ගේ සහෝ-
දරයන් වන එෆ්‍රායිම් හා මනස්සේ-
ගේ උරුමයෙන් කොටසක් ලැබෙයි.[9]
**7** මම පදන්[10] සිට එෆ්‍රාත්[11] දක්වා
ගමන් කරද්දී රාකෙල් කානාන් දේශ-
යේදී මැරුණා.[12] එෆ්‍රාත්වලට යන්න
සෑහෙන දුරක් තිබියදී ඇය මැරුණා.
ඒ නිසා මම බෙත්ලෙහෙම[13] කියා
හඳුන්වන එෆ්‍රාත් නුවරට යන මඟ
අසල ඇයව වැළලුවා.”

**8** ඊශ්‍රායෙල් යෝසෙප්ගේ පුත්‍රයන්ව
දැක, “මේ දරුවන් කවුද”[14] කියා
ඇසීය. **9** එවිට යෝසෙප් තම පියාට
උත්තර දෙමින් මෙසේ කීවේය. “මේ
ඊජිප්තු දේශයේදී දෙවි මට දුන් පුත්‍ර-
යන්.”[15] ඔහු එය අසා, “ඔවුන්ව මා
ළඟට ගේන්න. මම ඔවුන්ට ආශීර්වාද
කරන්නම්” කියා කීවේය.[1] **10** ඊශ්‍රා-
යෙල් මහලුව සිටි නිසා ඔහුගේ ඇස්
නොපෙනෙන තරමටම දුර්වල වී
තිබිණ.[2] යෝසෙප් දරුවන්ව යාකොබ්
ළඟට ගෙන ආ විට ඔහු දරුවන්ව
සිප වැලඳගත්තේය.[3] **11** ඊශ්‍රායෙල්
යෝසෙප්ට මෙසේද කීවේය. “මම
කවදාවත් හිතුවේ නැහැ මට ආයෙත්
ඔබේ මුහුණ දකින්න ලැබෙයි කියා.[4]
නමුත් දෙවි ඔබව විතරක් නොවෙයි
ඔබේ දරුවන්වත් දකින්න මට ඉඩ
දුන්නා.” **12** ඉන්පසු යෝසෙප් ඔහු-
ගේ දරුවන්ව පැත්තකට ගෙන තම
පියා ඉදිරියේ හිස නමා ඔහුට ආචාර
කළේය.[5]

**13** ඉන්පසු යෝසෙප් එෆ්‍රායිම්ව
දකුණතින් අල්ලාගෙන ඊශ්‍රායෙල්ගේ
වම් පැත්තට ගෙනාවේය.[6] මනස්-
සේව වමතින් අල්ලාගෙන ඊශ්‍රායෙල්-
ගේ දකුණු පැත්තට ගෙනාවේය.[7]
**14** එෆ්‍රායිම් බාලයා වුවත්[8] ඊශ්‍රා-
යෙල් තම දකුණත ඔහුගේ හිස
මත තැබුවේය.[9] ඔහු කුලුඳුලා[10] වන
මනස්සේගේ හිස මත තම වමත
තැබුවේය.[11] ඔහු හිතාමතාම එසේ
කළේය. **15** ඔහු යෝසෙප්ට ආශීර්-
වාද කරමින් මෙසේ කීවේය.[12]

“මගේ පියවරුන් වන ආබ්‍රහම් හා
ඊසාක් සිහි කළ සැබෑ දෙවි-
ගේ ආශීර්වාදය මේ පුතුන්
දෙදෙනාට ලැබේවා![13]
මගේ ජීවිත කාලය පුරාවට මේ
දක්වාම මාව රැකබලා ගත්
ඒ සැබෑ දෙවිගෙන්ද[14]
**16** මාව සියලු විපත්තිවලින් ගල-
වාගත්[15] දේවදූතයාගෙන්ද
ඔවුන්ට ආශීර්වාද ලැබේවා![16]
මගේ නමින්ද මගේ පියවරුන්
වන ආබ්‍රහම් හා ඊසාක්ගේ
නම්වලින්ද ඔවුහු හඳුන්වනු
ලබත්වා![17]
ඔවුහු බොහෝ දරුවන් බිහි
කර පොළොව පුරා වර්ධනය
වෙත්වා!”[18]

---

**18** නික් 1:7; ගණන් 26:34; ගණන් 26:37.

**48 පරි.**
**1** උත් 41:50 යොෂු 14:4
**2** උත් 28:19
**3** උත් 28:13 හොෂෙ 12:4
**4** උත් 28:14 උත් 32:12
**5** උත් 28:3 උත් 35:11 ක්‍රියා 7:17
**6** උත් 28:13 ද්වි 32:8 ආමො 9:15 ක්‍රියා 7:5
**7** යොෂු 14:4 1ලේක 5:1
**8** උත් 35:23
**9** යොෂු 13:29 යොෂු 16:5 ගීතා 77:15
**10** උත් 33:18 හොෂෙ 12:12
**11** රූත් 4:11 මීකා 5:2
**12** උත් 35:19
**13** 1සාමු 17:12 මතෙ 2:6
**14** උත් 27:18
**15** උත් 41:50

**2 තීරුව**
**1** උත් 27:4 උත් 28:1 ද්වි 33:1 හෙබ්‍රෙ 11:21
**2** උත් 27:1 දේශ 12:3
**3** උත් 27:26
**4** උත් 37:35 උත් 42:36 උත් 46:30
**5** උත් 18:2 උත් 33:3
**6** උත් 41:52
**7** උත් 41:51 ගීතා 89:13 ක්‍රියා 2:34 එෆී 1:20
**8** උත් 25:23
**9** නික් 15:6 ගීතා 110:1 1පේතෘ 3:22 එළි 1:17
**10** උත් 41:51 උත් 46:20
**11** මාක් 10:16
**12** 1ලේක 5:2
**13** උත් 17:1 උත් 24:40
**14** උත් 28:13 ගීතා 23:1 1පේතෘ 2:25
**15** උත් 28:15 උත් 31:11 නික් 15:13 යෝබ් 19:25 ගීතා 34:7
**16** උත් 32:26
**17** උත් 32:28 යෙසා 44:5

17 ඔහුගේ පියා තම දකුණත එෆ්‍රා-
යිම්ගේ හිස මත තැබූ බව යෝසෙප්
දුටු විට ඔහු ඒ ගැන අසතුටු විය.[1] ඒ
නිසා, යෝසෙප් තම පියාගේ දකුණත
එෆ්‍රායිම්ගේ හිසෙන් අහකට ගෙන
මනස්සේගේ හිස මත තබන්න උත්-
සාහ කරමින්[2] 18 මෙසේ කීවේය.
“තාත්තේ, ඔබේ දකුණත මේ දරුවා-
ගේ හිස මත තබන්න. කුලුඳුලා[3]
ඔහුයි.” 19 එහෙත් ඔහුගේ පියා
එයට එකඟ නොවී මෙසේ කීවේය.
“මම ඒක දන්නවා පුතේ, මම ඒක
දන්නවා. ඔහුගෙනුත් ජාතියක් බිහි
වෙනවා. ඔහුත් බලවත් කෙනෙක්
වෙයි.[4] නමුත් ඔහුගේ බාල සහෝද-
රයා ඔහුට වඩා බලවත් වෙයි.[5]
ඔහුගෙන් පැවත එන්නන් විශාල සෙ-
නඟක් බවට පත් වෙයි. ඔවුන් ජාතීන්
සමූහයක් මෙන් වෙයි.”[6] 20 ඒ දව-
සේදී ඔහු ඔවුන්ට තවත් ආශීර්වාද
කරමින්[7] මෙසේ කීවේය.

“‘දෙවි එෆ්‍රායිම්ටත් මනස්සේටත්
කළ ලෙසම ඔබටත් ආශීර්-
වාද කරත්වා’ යයි කියමින්
ඊශ්‍රායෙල් සෙනඟ ඔබගේ නාම-
යෙන් නිතරම එකිනෙකාට
ආශීර්වාද කරත්වා!”[8]

මෙසේ, ඔහු මනස්සේට ඉදිරියෙන්
එෆ්‍රායිම්ව තැබුවේය.[9]

21 ඉන්පසු ඊශ්‍රායෙල් යෝසෙප්ට
මෙසේ කීවේය. “මම මැරෙන මො-
හොත දැන් හුඟක් ළඟයි.[10] නමුත්
දෙවි හැමදාමත් ඔබේ උපකාරයට
ඉන්නවා. ඔහු නැවතත් ඔබේ මුතුන්-
මිත්තන්ගේ දේශයට ඔබව ගෙන
යයි.[11] 22 මම ඔබේ සහෝදරයන්ට
වඩා වැඩියෙන් ඔබට බිම් කොට-
සක් දෙනවා.[12] මගේ කඩුවෙන් හා
දුන්නෙන් අමෝරිවරුන්ට පහර දී
ලබාගත් බිම් කොටස මම ඔබට දෙ-
නවා.”

**49** පසුව යාකොබ් තම පුත්‍ර-
යන්ට කතා කර මෙසේ
කීවේය. “ඔබ සියලුදෙනාම මා ළඟට
එන්න. ඉදිරියේදී සිදු වෙන්න
යන දේවල් මම ඔබට කියන්නම්.

48 පරි.
1 රෝම 9:16
2 1සාමු 16:7
3 උත් 41:51 ද්වි 21:17
4 උත් 17:20
5 ගණන් 2:19 ගණන් 2:21
6 උත් 25:23 ගණන් 1:33 ගණන් 1:35 ද්වි 33:17 යෙරෙ 31:9
7 හෙබ්‍රෙ 11:21
8 ද්වි 10:22
9 ද්වි 33:17 ද්වි 34:2 යොෂු 17:17
10 උත් 50:24
11 උත් 15:14 උත් 26:3 ද්වි 31:8
12 ද්වි 21:17 යොෂු 17:14 එස 47:13

2 තීරුව

49 පරි.
1 උත් 49:28
2 උත් 29:32 නික් 6:14 1ලේක 5:1
3 ද්වි 21:17 ගීතා 78:51
4 උත් 35:22
5 ද්වි 33:6
6 ලෙවී 18:8 ද්වි 27:20 1කොරි 5:1
7 උත් 29:33 උත් 29:34 උත් 35:23
8 උත් 34:25
9 ගීතා 64:2
10 ගීතා 26:5
11 උත් 34:7 රෝම 12:19
12 හිතෝ 22:24 එෆී 4:31
13 හිතෝ 11:17
14 උත් 34:25
15 යොෂු 19:1 යොෂු 21:41
16 උත් 29:35
17 උත් 43:9 උත් 46:28 1ලේක 5:2
18 ගණන් 10:14 ද්වි 33:7 2සාමු 5:3
19 යොෂු 10:24 විනි 1:2 2සාමු 22:41
20 හොෂෙ 5:14 එළි 5:5
21 ගණන් 24:9

2 යාකොබ්ගේ පුත්‍රයෙනි, මා ළඟට
එන්න. ඔබේ පියා වන ඊශ්‍රායෙල්
කියන දේට ඇහුම්කන් දෙන්න.[1]
3 “රූබෙන්, ඔබ මගේ කුලුඳුලාය.[2]
ඔබ මගේ ශක්තියය. මගේ පුරුෂ
ශක්තියේ මුල්ම පලය ඔබයි.[3] උසස්ම
ගෞරවයද බලයද හිමිව තිබුණේ ඔබ-
ටයි. 4 නමුත් ඔබ වේගයෙන් ගසා-
ගෙන යන ජල ධාරාවක් මෙන් ක්‍රියා
කර ඔබේ පියාගේ යහන කිලිටි කළ
බැවින්[4] ඔබ උසස් නොවන්නෙහිය.[5]
රූබෙන් මගේ යහන කිලිටි කළේය.[6]
5 “සිමියොන් සහ ලෙවී සහෝදර-
යෝය.[7] ඔවුහු තම කඩු අතට ගෙන
දරුණු අපරාධ සිදු කරන්නෝය.[8]
6 මා කිසිදා ඔවුන්ගේ ඇසුරට නොවැ-
ටේවා![9] ඔවුන්ගේ මිතුරු කැලට එකතු
නොවේවා![10] මන්ද ඔවුහු කෝපයෙන්
මිනී මැරුවෝය.[11] දරුණු ලෙස
හරකුන්ගේ පාද තුවාල කළෝය.
7 ඔවුන්ගේ කෝපය[12] දරුණුය.[13] උද-
හස භයානකය.[14] එබැවින් ඔවුන්
පිටට ශාප පැමිණෙනු ඇත. ඔවුන්ව
යාකොබ්ගේ දේශයේ සෑම තැනකටම
යවා ඊශ්‍රායෙල් සෙනඟ අතරේ විසුරු-
වාහරින්නෙමි.[15]
8 “යූදා,[16] ඔබ නම් ඔබේ සහෝදර-
යන්ගෙන් ප්‍රශංසාව ලබන්නෙහිය.[17]
ඔවුහු ඔබ ඉදිරියේ දණ නමන්-
නෝය.[18] ඔබේ සතුරන්ව ඔබ බෙල්-
ලෙන්ම අල්ලාගන්නෙහිය.[19] 9 යූදා
සිංහ පැටවෙකි.[20] මාගේ පුත්‍රය, ඔබ
ගොදුර කා නැඟිට යන්නෙහිය. ඔබ
සිංහයෙකු මෙන් බිම දිගා වන්-
නෙහිය. සිංහයෙකුව අවදි කරන්න
තරම් ධෛර්යය ඇත්තේ කාටද?[21]
10 ශීලෝ* පැමිණෙන තෙක්[22] යූදා
වෙතින් රාජ යෂ්ටිය අහකට නොගනු
ඇත.[23] ඔහුගේ පාද ඉදිරියේ තිබෙන
පාලකයාගේ සැරයටියද ඔහුගෙන්
ඉවතට නොගනු ඇත. ජාතීහු ශීලෝට

---

**22** යෙසා 9:6; එස 21:27; ලූක් 1:32; හෙබ්‍රෙ 7:14; **23** ගණන් 24:17; 2සාමු 2:4; 2සාමු 7:16.

---

උත් **49:10*** ශීලෝ යන හෙබ්‍රෙව් වචනයෙහි තේරුම, “අයිතිය ඇති තැනැත්තා” යන්නයි.

කීකරු වන්නෝය.[1] **11** ඔහු තම
බූරුවාව මිදිවැලක ගැට ගසන්නේය.
ඔහු හොඳම මිදිවැල තෝරා උගේ
පැටවාව එහි ගැට ගසන්නේය. ඔහු
තම ඇඳුම් වයින්වලින්ද මිදියුෂව-
ලින්ද සෝදාගන්නේය.[2] **12** ඔහුගේ
දෙනෙත් වයින්වලින් දීප්තිමත්* වී
ඇත. ඔහුගේ දත් කිරිවලින් සුදු වී
ඇත.

**13** "සෙබ්‍යුලන් මුහුදු වෙරළ අසල
ජීවත් වන්නේය.[3] ඔහු මුහුදු වෙරළේ
නැව් නවත්වා තිබෙන තැන්වල කල්
ගෙවන්නේය.[4] ඔහුගේ දේශ සීමාව
සීදොන් දක්වා දිව යන්නේය.[5]

**14** "ඉසකාර්[6] ශක්තිමත් බූරුවෙකු
මෙනි. ඔහු ලැග සිටියදීත් බර මලු
දෙකක් දෙපස එල්ලා තබාගන්නේය.
**15** නවාතැන හොඳ බවත් දේශය
සරුසාර බවත් ඔහු තේරුම්ගන්නේය.
ඔහු කැමැත්තෙන්ම බර කරට ගන්-
නේය. වහලෙකු මෙන් ඔහුගෙන් වැඩ
ගන්නේය.

**16** "ඊශ්‍රායෙල්හි ගෝත්‍රයක් වන
දාන් මුළු සෙනඟ විනිශ්චය කරන්-
නේය.[7] **17** දාන් මඟ අසල රැක
සිටින සර්පයෙකු මෙන් වන්නේය.
අශ්වයන්ගේ පාදවලට දෂ්ට කර අස-
රුවන්ව බිම වැටෙන්න සලස්වන පො-
ළඟෙකු මෙන් ඔහු ක්‍රියා කරන්නේය.[8]
**18** යෙහෝවා දෙවියනි, ඔබ ගැලවීම
දෙන තෙක් මම බලා සිටින්නෙමි.[9]

**19** "ගාද්ට කොල්ලකරුවෝ පහර
දෙන්නෝය. නමුත් ඔහු කොල්ල-
කරුවන් පසුපස ලුහුබඳිමින් ඔවුන්ට
පහර දෙන්නේය.[10]

**20** "ආෂෙර්ට හොඳම ආහාර
ලැබෙනු ඇත.[11] ඔහු රජෙකුට දීමට
තරම් සුදුසු කෑම පිළිගන්වන්නේය.[12]

**21** "නප්තලී[13] වේගයෙන් දුව පැන
යන මුවදෙනක මෙනි. ඔහු ප්‍රිය වචන
පවසන්නේය.[14]

**22** "යෝසෙප් පල දරන ගසක
රිකිල්ලකි.[15] ඔහු දිය උල්පතක් ළඟ
සිටවූ,[16] පවුරක් දිගේ අතු විහිදු-
වන ගසක රිකිල්ලකි.[1] **23** දුනුවා-
යෝ ඔහු සමඟ වෛර බැඳගෙන
සිටියෝය. ඔහුට හිරිහැර කර ඊතල-
වලින් විද්දෝය.[2] **24** නමුත් ඔහුගේ
දුන්න ස්ථිරව පිහිටා තිබේ.[3] ඔහුගේ
දෑත් සවිමත්ය, ක්‍රියාශීලීය.[4] ඔහු ශක්-
තිය ලබන්නේ යාකොබ්ගේ බලවත්
දෙවිගෙන්ය.[5] ඊශ්‍රායෙල්ගේ එඬේරා
සහ පර්වතය වන ඔහු,[6] **25** ඔබේ
පියා නමස්කාර කරන දෙවිගෙන්
ලද ත්‍යාගයකි.[7] ඔහු සියලු බලැති
තැනැත්තාට ළංව සිටින්නේය.[8] මගේ
පුත් යෝසෙප්, දෙවි ඔබට උපකාර
කරන්නේය.[9] දෙවි අහසින්ද[10] ගැඹුරු
දිය උල්පත්වලින්ද ඔබට බොහෝ
ආශීර්වාද වගුරුවන්නේය.[11] ඔහු දරු
සම්පතින්ද ඔබට නොඅඩුව ආශීර්වාද
කරන්නේය.[12] **26** ඔබේ පියාගෙන්
ලැබෙන ආශීර්වාද සදහටම පවතින
කඳුවලින් ලැබෙන හොඳ දේවලට
වඩා වටින්නේය.[13] බොහෝ කල් පව-
තින හෙල්වල අලංකාරයට වඩා අග-
නේය.[14] ඔහුගේ සහෝදරයන් අතරින්
වෙන් කර තැබුවාවූ යෝසෙප්ට* ඒ
ආශීර්වාද සැමදා ලැබෙන්නේය.[15]

**27** "බෙන්ජමින් වෘකයෙකු මෙන්
ගොදුර ඉරා දමන්නේය.[16] ඔහු උදේ
ගොදුර කන්නේය. සවස කොල්ලය
බෙදාගන්නේය."[17]

**28** ඊශ්‍රායෙල්හි ගෝත්‍ර දොළහ
පැවත එන්නේ මොවුන්ගෙන්ය.
ඔවුන්ගේ පියා ඔවුන් එක් එක් කෙනාට
ගැළපෙන ආශීර්වාදයක් දුන්නේය.[18]

**29** ඉන්පසු ඔහු ඔවුන්ට මෙසේ
අණ කළේය. "මම මැරෙන මො-
හොත ඉතා ළඟයි.[19] මගේ පියව-
රුන් වගේම මාවත් හිත්තී ජාතික
එෆ්‍රොන්ගේ ඉඩමේ තිබෙන ගුහාවේ
තැන්පත් කරන්න.[20] **30** ඒ ගුහාව
තිබෙන්නේ කානාන් දේශයේ මම්-
රේට ඉදිරියෙන් පිහිටි මක්පේලා නම්
ඉඩමේ. සොහොන් ගෙයක් අවශ්‍ය

උත් **49:12*** මූ.අ., "දීප්තිමත් රතු පැහැයක්."

**19** උත් 35:29; උත් 49:33; **20** උත් 23:17.

උත් **49:26*** මූ.අ., "එම ආශීර්වාද යෝසෙප්ගේ හිස මත සැමදා පවතින්නේය."

**49 පරි.**
**1** ද්වි 18:18
ගීතා 2:8
යෙසා 11:10
මතෙ 2:6
යොහ 10:16
එළි 7:9
**2** යෙසා 63:2
**3** ද්වි 33:19
යෙසා 9:1
**4** මතෙ 4:13
**5** යොෂු 19:10
**6** ද්වි 33:18
යොෂු 19:17
1ලේක 7:5
**7** විනි 13:2
විනි 13:24
විනි 15:20
**8** ද්වි 33:22
විනි 14:19
විනි 15:15
**9** ගීතා 14:7
**10** ද්වි 33:20
යොෂු 13:8
**11** ද්වි 32:14
ගීතා 81:16
**12** ද්වි 33:24
යොෂු 19:24
1රාජා 4:7
1රාජා 4:16
**13** ද්වි 33:23
යොෂු 19:32
මතෙ 4:15
**14** මතෙ 4:13
යොහ 7:46
**15** නික් 1:5
**16** ද්වි 33:13
යොෂු 16:1

**2 තීරුව**
**1** ද්වි 33:17
**2** උත් 37:8
උත් 40:15
**3** උත් 50:20
**4** ගණන් 13:8
යොෂු 1:6
යොෂු 8:18
විනි 6:14
විනි 11:32
**5** ගීතා 80:1
**6** උත් 45:7
උත් 50:20
යෙසා 28:16
මතෙ 21:42
1පේතෘ 2:4
**7** යොහ 17:3
**8** හෙබ්‍රෙ 10:12
**9** පිලි 4:19
**10** මලා 3:10
**11** ද්වි 33:13
යෙසා 11:9
**12** යෙසා 59:21
**13** යොෂු 17:14
**14** යෙසා 54:10
**15** ද්වි 33:16
ක්‍රියා 7:9
**16** ද්වි 33:12
විනි 20:16
1සාමු 9:16
**17** එස්ත 2:5
එස්ත 8:7
**18** හෙබ්‍රෙ 11:21

වුණ නිසා ආබ්‍රහම් එෆ්‍රොන්ගෙන් ඒ
ඉඩම මිල දී ගත්තා.[1] **31** ආබ්‍රහම්-
වත් ඔහුගේ භාර්යාව වන සාරාවත්
ඒ ඉඩමේ තැන්පත් කළා.[2] ඊසාක්
සහ ඔහුගේ භාර්යාව වන රෙබෙකාව
තැන්පත් කළෙත් එතැනමයි.[3] මම
ලෙයාව තැන්පත් කළෙත් එතැනයි.
**32** ඉඩම හා ඒ එක්කම තිබෙන ගුහාව
මිල දී ගත්තේ හෙත්ගේ පුත්‍රයන්-
ගෙන්.”[4]

**33** යාකොබ් තම පුත්‍රයන්ට ඒ
සියල්ල කී පසු නැවතත් ඇඳේ හාන්සි
විය. ඔහු තම අවසන් හුස්ම හෙළා මිය
ගියේය.[5]

**50** යෝසෙප් තම පියා මිය ගිය
බව දැක[6] ඔහුව බදාගෙන
සිඹගනිමින් ඇඬුවේය.[7] **2** යෝසෙප්
තම පියාගේ දේහය නොදිරන පිණිස
එයට බෙහෙත් ගල්වන ලෙස[8] තමන්
යටතේ සේවය කළ වෛද්‍යවරුන්ට
අණ කළේය. වෛද්‍යවරුද ඔහු කී
ලෙස කළෝය. **3** ඊශ්‍රායෙල්ගේ දේ-
හයට බෙහෙත් ගැල්වීමට දවස් හතළි-
හක් ගත විය. සාමාන්‍යයෙන් මළ
සිරුරකට බෙහෙත් ගැල්වීම සඳහා
එපමණ කාලයක් ගත විය. ඊජිප්තු-
වරු යාකොබ් වෙනුවෙන් දවස් හැත්-
තෑවක් වැලපුණෝය.[9]

**4** වැලපෙන කාලය අවසන් වූ පසු
යෝසෙප් පාරාවෝගේ ගෙයි වැසි-
යන්ට කතා කර මෙසේ කීවේය.
“ඔබ මාත් එක්ක හිතවත් නම්[10] මා
වෙනුවෙන් පාරාවෝ සමඟ කතා
කරන්න. **5** ‘මගේ පියා මට මෙ-
හෙම කිව්වා. “මම වැඩි කල් ජීවත්
වෙන එකක් නැහැ.[11] මම මැරුණාට
පස්සේ, කානාන් දේශයේ[12] මම සූදා-
නම් කළ සොහොන් ගේ තුළ මාව
තැන්පත් කරන්න.”[13] මම එහෙම
කරනවා කියා ඔහුට දිවුරා පොරොන්දු
වුණා.[14] ඒ නිසා මට දැන් යන්න අව-
සර දෙන්න. මගේ පියාව තැන්පත්
කර මම ආපහු එන්නම්.’ ” **6** එවිට
පාරාවෝ ඔහුට මෙසේ කියා එව්වේය.
“ඔබේ පියාට ඔබ දිවුරූ ලෙසම ඔහුව
තැන්පත් කරන්න.”[15]

**7** යෝසෙප් තම පියාව තැන්පත්
කරන පිණිස පිටත්ව ගියේය. පාරා-
වෝගේ සියලු සේවකයෝ එනම්,
රජමාලිගාවේ නිලධාරීහුද[1] ඊජිප්තු
දේශයේ සියලු ප්‍රධානියෝද ඔහු සමඟ
ගියෝය. **8** යෝසෙප්ගේ සියලු
ගෙයි වැසියෝද ඔහුගේ සහෝදර-
යෝද ඔහුගේ පියාගේ ගෙයි වැසියෝද
ඔහු සමඟ ගියෝය.[2] ඔවුහු තමන්ගේ
කුඩා දරුවන් හා සත්ව රැළවල්
පමණක් ගෝෂෙන් දේශයේ තබා
ගියෝය. **9** අශ්ව රථද[3] අසරුවෝද
ඇතුළුව විශාල සෙනඟක් ඔහු සමඟ
පිටත්ව ගියෝය. **10** ඔවුහු යෝර්-
දාන් ගඟ අසල පිහිටි ආතද් නම්
ස්ථානයේ[4] තිබූ කමතට[5] පැමිණි-
යෝය. එතැනදී ඔවුහු ශබ්ද නඟා
බොහෝ සෙයින් ඇඬුවෝය. යෝසෙප්
දවස් හතක් පුරාම තම පියා නිසා
වැලපුණේය.[6] **11** ඒ දේශයේ පදිං-
චිව සිටි කානානිවරු ආතද්හි කමත
ළඟ සෙනඟ වැලපෙන හැටි දැක,
“ඊජිප්තුවරුන් බොහෝ සෙයින් හඬා
වැලපෙයි” යයි කීවෝය. යෝර්දාන්
ගඟ අසල පිහිටි එම ස්ථානයට[7]
ආබෙල්-මිෂ්‍රායිම්* යන නම තැබුවේ ඒ
නිසාය.

**12** යාකොබ් අණ කළ ලෙසම ඔහු-
ගේ පුත්‍රයෝ කළෝය.[8] **13** ඔවුහු
කානාන් දේශයට ඔහුගේ දේහය උසු-
ලාගෙන ගොස් මක්පේලා නම් ඉඩ-
මේ තිබූ ගුහාවේ ඔහුව තැන්පත්
කළෝය. සොහොන් ගෙයක් හිමි කර-
ගන්නා පිණිස ආබ්‍රහම් හිත්තී ජාතික
එෆ්‍රොන්ගෙන් මිල දී ගත් එම ඉඩම
මම්රේට ඉදිරියෙන් පිහිටා තිබිණ.[9]
**14** යෝසෙප් තම පියාව තැන්පත්
කළ පසු ඔහුද ඔහුගේ සහෝදරයෝද
ඔවුන් සමඟ ගිය සියල්ලෝද නැවත
ඊජිප්තුවට පැමිණියෝය.

**15** යෝසෙප්ගේ සහෝදරයෝ
තමන්ගේ පියා මිය ගිය පසු භය
වී එකිනෙකාට මෙසේ කියාගත්-
තෝය. “යෝසෙප්ගේ හිතේ තාමත්

**49 පරි.**
1 උත් 23:20
2 උත් 23:19; උත් 25:10
3 උත් 35:29
4 උත් 23:18
5 උත් 25:8; ගීතා 116:15; මතෙ 22:32; ක්‍රියා 7:15

**50 පරි.**
6 උත් 46:4
7 ද්‍රේශ 7:2; යොහ 11:35; ක්‍රියා 8:2
8 උත් 50:26
9 ගණන් 20:29
10 උත් 18:3
11 උත් 48:21; 1කොරි 15:22
12 උත් 23:17; උත් 49:30
13 උත් 46:4; උත් 47:29; යොහ 19:38
14 උත් 47:31; මතෙ 5:33; හෙබ්‍රෙ 6:16
15 උත් 47:31

**2 තීරුව**
1 ගීතා 105:22; ක්‍රියා 4:8
2 උත් 32:5; උත් 46:27
3 උත් 41:43; උත් 46:29; ක්‍රියා 8:28
4 ද්වි 1:1
5 මතෙ 3:12
6 1සාමු 31:13; මාක් 5:38
7 උත් 10:19
8 උත් 47:29; උත් 49:29; එෆී 6:1
9 උත් 23:17; උත් 25:9; උත් 35:27; උත් 49:30

උත් **50:11*** තේරුම, “ඊජිප්තුවරුන්ගේ වැලපීම.”

අපි ගැන අමනාපයක් තියෙනවාද
දන්නේ නැහැ.[1] එහෙමවුණොත් අපි
ඔහුට කළ හැම වරදකටම ඔහු අපෙන්
පළිගනී.”[2] **16** එබැවින් ඔවුහු යෝ-
සෙප්ට මෙසේ දැන්වූහ. “ඔබේ පියා
මැරෙන්න කලින් අපිට අණක් දුන්නා.
**17** ඔහු ඔබට මෙහෙම කියන මෙන්
අපෙන් ඉල්ලා සිටියා. ‘අනේ පුතේ,
මගේ මේ ඉල්ලීම ඉෂ්ට කරන්න. ඔබේ
සහෝදරයන් ඔබට නපුරක්[3] කළ බව
ඇත්තයි. නමුත් ඔබට විරුද්ධව කළ
වරදට ඔවුන්ට සමාව[4] දෙන්න.’ ඔබේ
පියාගේ දෙවිගේ සේවකයන් වන අපි
ඔබෙන් බැගෑපත්ව ඉල්ලන්නේ අපි
කළ වරදට සමාව දෙන්න කියායි.”[5]
එය ඇසූ විට යෝසෙප් අඬන්න
පටන්ගත්තේය. **18** ඔහුගේ සහෝ-
දරයෝ ඔහු ඉදිරියට පැමිණ බිම වැටී,
“අපි ඔබේ දාසයෝ” යයි කීවෝය.[6]
**19** නමුත් යෝසෙප් ඔවුන්ට මෙසේ
කීවේය. “භය වෙන්න එපා. දෙවිගේ
තැන ගන්න මට අයිතියක් නැහැ.[7]
**20** ඔබ මට නපුරක් කරන්න හැදුවා.
ඒත් දෙවි ඒ දේ සිදු වෙන්න ඉඩ-
හැරියේ හොඳ හේතුවක් ඇතුවයි.
බොහෝදෙනෙකුගේ ජීවිත බේරගන්-
නයි ඔහු එහෙම කළේ.[8] **21** භය
වෙන්න එපා. මම ඔබටත් ඔබේ දරු-
වන්ටත් දිගටම කෑම දෙන්නම්.”[9]
මෙසේ, ඔහු ඔවුන්ව සනසා ඔවුන්ගේ
බිය සැක දුරු කළේය.

**50 පරි.**
**1** උත් 27:41
ලෙවී 19:17
හිතෝ 19:11
හිතෝ 28:1
**2** උත් 37:28
උත් 42:21
ගීතා 105:17
හිතෝ 24:29
ලූක් 17:3
රෝම 12:17
1කොරි 13:5
**3** උත් 37:28
1සාමු 24:17
හිතෝ 28:13
රෝම 13:10
**4** මතෙ 6:12
මතෙ 18:35
ලූක් 17:3
එෆී 4:32
**5** 2කොරි 7:10
**6** උත් 37:7
එෆී 6:7
**7** ද්වි 32:35
රෝම 12:19
**8** උත් 37:18
උත් 45:5
ගීතා 105:17
ගීතා 119:71
රෝම 8:28
**9** උත් 47:12
1පේතෘ 3:9

**2 තීරුව**
**1** 1ලේක 7:20
**2** යොෂු 17:1
1ලේක 7:14
**3** උත් 30:3
**4** නික් 4:31
**5** උත් 12:7
උත් 17:8
උත් 26:3
උත් 28:13

**22** යෝසෙප්ද ඔහුගේ පියාගේ
ගෙයි වැසියෝද දිගටම ඊජිප්තුවේ
ජීවත් වූහ. යෝසෙප් අවුරුදු එකසිය
දහයක් ජීවත් විය. **23** ඔහු එෆ්‍රායිම්-
ගේ දරු පරම්පරා තුනක් දුටුවේය.[1]
මනස්සේගේ පුත්‍රයා වූ මාකීර්ගේ
පුත්‍රයන්වද[2] ඔහු දුටුවේය. ඒ දරු-
වෝ කුඩා වයසේ සිටම යෝසෙප්ගේ
උකුළේ සිටියෝය.*[3] **24** කල් යත්ම
යෝසෙප් තම සහෝදරයන්ට මෙසේ
කීවේය. “මම වැඩි කල් ජීවත් වෙන
එකක් නැහැ. දෙවි අනිවාර්යයෙන්ම
ඔබ දෙස බලා ඔබට කරුණාව දක්-
වයි.[4] ඔහු ඔබව මේ දේශයෙන් පිටතට
ගෙන ගොස් ආබ්‍රහම්ටත් ඊසාක්-
ටත් යාකොබ්ටත් දෙන්න පොරොන්දු
වූ දේශයට ඔබව රැගෙන යයි.”[5]
**25** යෝසෙප් ඊශ්‍රායෙල්ගේ පුත්‍රයන්-
ගෙන් මෙසේ දිවුරුම් ගත්තේය. “දෙවි
අනිවාර්යයෙන්ම ඔබ දෙස බලා ඔබට
කරුණාව දක්වයි. ඔබ මේ දේශයෙන්
පිට වී යද්දී මගේ ඇටකටු මෙතැ-
නින් ගෙන යන්න.”[6] **26** යෝසෙප්ට
වයස අවුරුදු එකසිය දහයක් වූ විට
ඔහු මිය ගියේය. ඔහුගේ දේහය නො-
දිරන පිණිස එයට බෙහෙත් ගල්වා[7]
ඊජිප්තුවේ මිනී පෙට්ටියක තබන ලදි.

**6** නික් 13:19; යොෂු 24:32; හෙබ්‍රෙ 11:22; **7** උත් 50:2.

උත් **50:23*** මූ.අ., “යෝසෙප්ගේ දණිස් මත ඔවුහු ඉපදුණෝය.”

# නික්මයාම

**1** ඊජිප්තුවට පැමිණි ඊශ්‍රායෙල්ගේ
පුත්‍රයන්ගේ නම් මතු දැක්වේ.
ඔවුහු එක් එක් කෙනා තම තමා-
ගේ ගෙයි වැසියන් සමඟ ඊජිප්තු-
වට පැමිණියෝය.[1] යාකොබ්ද ඔවුන්
සමඟ ආවේය. **2** ඔවුන්ගේ නම්
රූබෙන්,[2] සිමියොන්,[3] ලෙවී,[4] යූදා,[5]
**3** ඉසකාර්,[6] සෙබුලුන්,[7] බෙන්ජ-

**1 පරි.**
**1** උත් 46:8
**2** නික් 6:14
**3** නික් 6:15
**4** නික් 2:1
නික් 6:16
**5** 1ලේක 2:3
හෙබ්‍රෙ 7:14
**6** උත් 46:13
**7** උත් 46:14

මින්,[1] **4** දාන්,[2] නෆ්තලී,[3] ගාද්[4] සහ
ආෂේර්ය.[5] **5** යෝසෙප් ඒ වන විට
සිටියේ ඊජිප්තුවෙහිය.[6] යාකොබ්ගෙන්
පැවත ආ[7] සියලුදෙනාගේ ගණන
හැත්තෑවකි. **6** කාලයාගේ ඇවෑ-

**2 තීරුව** **1** උත් 46:21; **2** උත් 46:23; **3** 1ලේක 7:13; **4** උත් 46:16; **5** 1ලේක 7:30; **6** ද්වි 10:22; ක්‍රියා 7:14; **7** උත් 46:26.

මෙන් යෝසෙප්ද[1] ඔහුගේ සියලු
සහෝදරයන්ද ඇතුළු මුල් පරම්පරාව
මිය ගියෝය. **7** එහෙත් ඊශ්‍රායෙල්
පුත්‍රයෝ ගණනින් බොහෝ සෙයින්
වැඩි වූහ.[2] ඔවුන් මොන තරම් වැඩි
වූවාද කිවහොත් ඉතා කෙටි කාලයක්
ඇතුළත මුළු දේශයම පිරී යන තරම-
ටම ඔවුහු ගණනින් වැඩි වී බල-
වත් වූහ.

**8** කල් යත්ම යෝසෙප් ගැන නො-
දන්නා අලුත් රජෙක් ඊජිප්තුව
පාලනය කිරීමට පටන්ගත්තේය.[3]
**9** ඔහු තම සෙනඟ අමතා මෙසේ
කීවේය. "බලන්න! ඊශ්‍රායෙල් පුත්‍ර-
යන්ගේ ගණන අපිට වඩා බොහෝ
සෙයින් වැඩියි. ඔවුන් අපිට වඩා ගො-
ඩක් බලවත්.[4] **10** ඔවුන් තවදුරටත්
ගණනින් වැඩි නොවන පිණිස අපි
ඔවුන් සමඟ උපායශීලීව[5] වැඩ කරමු.
මන්ද අපිට විරුද්ධව යුද්ධයක් ඇති
වුණොත් ඔවුන් අපේ සතුරන් සමඟ
එකතු වී අපිට විරුද්ධව සටන් කරයි.
ඔවුන් අපේ රටෙනුත් පිට වී යයි."

**11** එහෙයින් ඊශ්‍රායෙල්වරුන්ගෙන්
බලෙන් වැඩ ගන්නා පිණිසත් ඔවුන්ට
හිංසා පීඩා කරන පිණිසත්[6] ඊජිප්-
තුවරු ඔවුන් කෙරෙහි ප්‍රධානීන්ව
පත් කළෝය. ඊශ්‍රායෙල්වරු පාරා-
වෝට පීතොම් සහ රාම්සේස්[7] යන
ගබඩා නුවරවල් ගොඩනැඟුවෝය.
**12** ඔවුන්ට කොතරම් හිංසා පීඩා
කළත් ඔවුහු තව තවත් ගණනින්
වැඩි වී දේශය පුරා පැතිර ගියෝය.
එහෙයින් ඊශ්‍රායෙල් පුත්‍රයන් ගැන
ඊජිප්තුවරුන්ට මහත් බියක්[8] මෙන්ම
වෛරයක්ද ඇති විය. **13** එහෙයින්
ඊජිප්තුවරු ඊශ්‍රායෙල්වරුන්ට කුරිරු-
කම් කරමින් ඔවුන්ව වහල්භාවයේ
තබාගත්හ.[9] **14** ඔවුහු මැටි බදාම[10]
සහ ගඩොල් සෑදීමටත් සියලු ආකාර-
යේ බර වැඩ[11] කිරීමටත් ඊශ්‍රායෙල්
පුත්‍රයන්ව යොදාගත්තෝය. මෙසේ
ඊජිප්තුවරු ඔවුන්ට තව තවත් කුරි-
රුකම් කරමින් අන්ත අසරණ තත්ව-
යකට ඔවුන්ව පත් කළහ.[12]

**15** ඉන්පසු ඊජිප්තුවේ රජ, ෂිප්රා

**1 පරි.**
1 උත් 50:26
2 උත් 46:3
ද්වි 26:5
ක්‍රියා 7:17
3 ක්‍රියා 7:18
4 ගණන් 22:3
ගීතා 105:24
5 ගීතා 105:25
හිතෝ 21:30
ක්‍රියා 7:19
1කොරි 3:19
6 උත් 15:13
නික් 3:7
ගණන් 20:15
ද්වි 26:6
ක්‍රියා 7:34
7 උත් 47:11
8 ගීතා 105:24
ගීතා 105:38
9 නික් 2:23
හිතෝ 14:31
ක්‍රියා 7:6
10 නාහූ 3:14
11 නික් 5:7
ගීතා 81:6
12 නික් 20:2
ලෙවී 25:43
ලෙවී 26:13
හිතෝ 29:2
යෙසා 14:6

**2 තීරුව**
1 උත් 35:17
උත් 38:28
එස 16:4
2 නෙහෙ 5:15
හිතෝ 8:13
3 ආනි 3:16
ආනි 6:13
මතෙ 10:28
ක්‍රියා 5:29
4 උත් 9:6
5 දේශ 8:4
6 ගීතා 41:2
හිතෝ 11:18
හිතෝ 19:17
දේශ 8:12
යෙසා 3:10
ලූක් 1:50
හෙබ්‍රෙ 6:10
7 ගීතා 107:41
ගීතා 127:3
8 ගීතා 105:25
මතෙ 2:16
ක්‍රියා 7:19

**2 පරි.**
9 නික් 6:20
ගණන් 26:59
10 ක්‍රියා 7:20
හෙබ්‍රෙ 11:23

සහ පුවා නම් වූ හෙබ්‍රෙව් ජාතික වින්-
නඹුවන්ව[1] කැඳවා මෙසේ කීවේය.
**16** "දරු ප්‍රසූතියට සූදානම්ව සිටින
හෙබ්‍රෙව් ජාතික ස්ත්‍රීන්ට ඔබ උප-
කාර කරද්දී ඔවුන් පුතෙකු බිහි
කළොත් ඒ දරුවාව මරා දැමිය
යුතුයි. නමුත් දරුවා දුවෙක් නම්
ඇයට ජීවත් වෙන්න ඉඩහරින්න."
**17** එහෙත් ඔවුහු සැබෑ දෙවිට ගරු-
බිය[2] දැක්වූ නිසා ඊජිප්තුවේ රජු
තමන්ට අණ කළ දේ නොකර[3] පිරිමි
දරුවන්ටත් ජීවත් වීමට ඉඩහැරි-
යෝය.[4] **18** කාලයක් ගත වූ පසු
ඊජිප්තුවේ රජ වින්නඹුවන්ව කැඳවා,
"ඔබ පිරිමි දරුවන්ට ජීවත් වෙන්න
ඉඩහැරියේ ඇයි" කියා ඔවුන්ගෙන්
ඇසුවේය.[5] **19** එවිට ඔවුහු, "හෙ-
බ්‍රෙව් ජාතික ස්ත්‍රීන් ඊජිප්තු ජාතික
ස්ත්‍රීන් වගේ නෙවෙයි. ඔවුන් හරිම
ශක්තිමත්. ඔවුන් කොතරම් ශක්ති-
මත්ද කියනවා නම් අපි ඔවුන් ළඟට
යන්නත් කලින් ඔවුන් දරුවන් බිහි
කර අවසන්" කියා පාරාවෝට පිළිතුරු
දුන්නෝය.

**20** දෙවි ඔවුන් දෙදෙනාට ආශීර්-
වාද කළේය.[6] ඊශ්‍රායෙල් සෙනඟ දිගින්
දිගටම ගණනින් වැඩි වෙමින් ඉතා
බලසම්පන්න වූහ. **21** ඒ වින්නඹු-
වන් සැබෑ දෙවිට ගරුබිය දැක්වූ නිසා
දරු සම්පත් ලබමින් සන්තෝෂවත්
පවුල් ජීවිත ගත කිරීමට ඔහු ඔවුන්ට
ආශීර්වාද කළේය.[7] **22** පසුව පාරා-
වෝ ඔහුගේ මුළු සෙනඟට අණ කර-
මින් මෙසේ කීවේය. "අලුත උපන්
සෑම හෙබ්‍රෙව් ජාතික පිරිමි ළමයෙක්-
වම නයිල් ගඟට විසි කරන්න.[8]
නමුත් සෑම ගැහැනු ළමයෙක්ටම
ජීවත් වෙන්න ඉඩහරින්න."

**2** ඒ කාලයේදී ලෙවී ගෝත්‍රයේ
එක්තරා මනුෂ්‍යයෙක් ඒ ගෝත්‍ර-
යේම ස්ත්‍රියක සමඟ විවාහ විය.[9]
**2** ඒ ස්ත්‍රිය ගැබ්ගෙන පුත්‍රයෙකු බිහි
කළාය. ඒ දරුවා ඉතා ලස්සන නිසා
ඇය මාස* තුනක්[10] පුරා ඔහුව සඟවා

**නික් 2:2*** මෙහි සඳහන් කරන මාසය ආරම්භ වන්නේ නව සඳ පෙනීමත් සමඟය.

තබාගත්තාය.[1] **3** දරුවාව තවදුර-
ටත් සඟවා තබාගත නොහැකි වූ
විට[2] ඇය පැපිරස් බටවලින් සෑදූ කූඩ-
යක් ගෙන එයට තාර*[3] තවරා දරු-
වාව එහි තබා නයිල් ගං ඉවුරේ
බට පඳුරු[4] අතරෙහි එය තැබුවාය.
**4** දරුවාට සිදු වන්නේ කුමක්ද කියා
දැනගැනීමට ඔහුගේ සහෝදරිය[5] ඒ
අසල රැඳී සිටියාය.

**5** ටික වේලාවකට පසු පාරා-
වෝගේ දියණිය නයිල් ගඟේ දිය
නෑමට පැමිණියාය. ඇගේ සේවිකා-
වෝ නයිල් ගං ඉවුරෙහි ඇවිදිමින්
සිටියෝය. බට පඳුරු අතරෙහි තිබුණු
කූඩය ඇගේ නෙත ගැටිණ. එය දුටු
විගස ඇය කූඩය රැගෙන ඒමට ඇගේ
දාසියව යැව්වාය.[6] **6** එය විවෘත
කළ විට පාරාවෝගේ දියණිය එහි
සිටි දරුවාව දුටුවාය. දරුවා හඬ-
මින් සිටියේය. “මේ හෙබ්‍රෙව්වරුන්ගේ
දරුවෙක්නේ” කියා ඇය පැවසුවාය.
එහෙත් ඇයට දරුවා ගැන අනුකම්-
පාවක්[7] ඇති විය. **7** එවිට දරුවා-
ගේ සහෝදරිය, “දරුවාට කිරි දෙන්න
හෙබ්‍රෙව්වරුන්ගෙන් කිරි මවක් සො-
යාගෙන එන්නද” කියා පාරාවෝගේ
දියණියගෙන් ඇසුවාය. **8** “හොඳයි,
කිරි මවක්ව සොයාගෙන එන්න” කියා
ඇය පැවසුවාය. එවෙලේම ඇරිය දුව
ගොස් දරුවාගේ මවව[8] කැඳවාගෙන
ආවාය. **9** එවිට පාරාවෝගේ දිය-
ණිය, “මේ දරුවාව ගෙන ගොස් කිරි දී
බලාගන්න. ඒ සඳහා ඔබට යන සියලු
වියදම් මම දෙන්නම්”[9] කියා ඇයට
කීවාය. එහෙයින් ඒ ස්ත්‍රිය දරුවාව
ගෙන ගොස් කිරි දී ඔහුව බලාගත්-
තාය. **10** දරුවා වැඩුණායින් පසු
ඇය පාරාවෝගේ දියණියට ඔහුව
භාර දුන්නාය. පාරාවෝගේ දියණිය
ඔහුව සැලකුවේ තමාගේම පුත්‍රයෙකු
ලෙසය.[10] ඇය, “මම ඔහුව වතුරෙන්
ගොඩට ගත්තා”[11] යයි කියමින් ඔහුට
මෝසෙස්* යන නම තැබුවාය.

**11** මෝසෙස් උස් මහත් වූ පසු
තම සහෝදරයන්ව බැලීමට ගියේය.
එවිට ඔවුන්ට කොතරම් බර වැඩ[1]
පවරා තිබුණාද කියා ඔහු දුටුවේය. ඒ
අවස්ථාවේදී ඔහුගේම ජාතියේ කෙ-
නෙකුට ඊජිප්තු ජාතිකයෙකු පහර
දෙනවාද[2] ඔහු දුටුවේය. **12** ඔහු
වටපිට බලා කිසිවෙකු නැති බව දුටු
හෙයින් ඊජිප්තු ජාතිකයාට පහර දී
ඔහුව මරා දැමුවේය.[3] ඉන්පසු ඔහුව
වැල්ලේ සැඟෙව්වේය.

**13** පසුවදා මෝසෙස් පිටතට ගිය
විට හෙබ්‍රෙව් ජාතිකයන් දෙදෙ-
නෙකු රණ්ඩු කරමින් සිටිනවා දුටු-
වේය. එවිට ඔහු, “ඇයි ඔබ ඔබේම
සහෝදරයාට[4] පහර දෙන්නේ” කියා
වරද කළ තැනැත්තාගෙන් ඇසුවේය.
**14** එවිට ඒ තැනැත්තා, “ඔබව අපේ
පාලකයා හා විනිශ්චයකාරයා හැටි-
යට පත් කළේ කවුද?[5] ඔබ ඊජිප්-
තුවරයාව මරා දැම්මා වගේ දැන්
මාවත් මරා දමන්නද හදන්නේ”[6]
කියා ඇසීය. එවිට මෝසෙස් භය වී,
“මා කළ දේ හැමෝම දැනගෙන
වගෙයි”[7] කියා සිතුවේය.

**15** මෝසෙස් කළ දේ ගැන ආරංචි
වූ විට පාරාවෝ ඔහුව මරන්න[8]
තැත් කළේය. එහෙත් ඔහු පාරාවෝ
වෙතින් පලා ගොස්[9] මිදියන් දේ-
ශයේ ජීවත් වන පිණිස ඒ දේ-
ශයට ගියේය. මෝසෙස් මිදියන්[10]
දේශයට පැමිණ එහි තිබූ ළිඳක්
අසල හිඳගත්තේය. **16** මිදියන්හි
පූජකයාට[11] දූවරු සත්දෙනෙක් සිටි-
යෝය. ඔහුගේ දූවරු සුපුරුදු පරිදි
ළිඳ ළඟට පැමිණ තමන්ගේ පියාගේ
සත්ව රැළ සඳහා වතුර ඇද, දිය-
ඔරු පුරවමින්[12] සිටියෝය. **17** වෙ-
නදා මෙන් එදත් එඬේරු පැමිණ
ඔවුන්ව එතැනින් එළවා දැමුවෝය.
මෙය දුටු මෝසෙස් ස්ත්‍රීන්ගේ උපකා-
රයට පැමිණ ඔවුන්ගේ සත්ව රැළට
වතුරද ඇද දුන්නේය.[13] **18** පසුව ඒ
ස්ත්‍රීන් තමන්ගේ පියා වන රුවෙල්[14]
ළඟට ගිය විට ඔහු, “ඔබ මෙතරම්

---

**නික් 2:3*** උත් 11:3හි පාදසටහන බලන්න.
**10*** තේරුම, “ඇදගත්තා, වතුරෙන් බේරගත්තා.”

---

**2 පරි.**
**1** 2රාජා 11:2
**2** ක්‍රියා 7:19
**3** උත් 6:14, උත් 14:10
**4** යෝබ් 8:11
**5** නික් 15:20, 1ලේක 6:3, මීකා 6:4
**6** ක්‍රියා 7:21
**7** 1රාජා 8:50, ගීතා 106:46, 1පේතෘ 3:8
**8** නික් 6:20
**9** 1තිමෝ 5:18
**10** හෙබ්‍රෙ 11:24
**11** ක්‍රියා 7:21

**2 තීරුව**
**1** නික් 1:11, නික් 3:7, ක්‍රියා 7:23
**2** නික් 5:14
**3** ක්‍රියා 7:24, හෙබ්‍රෙ 11:24
**4** උත් 13:8, ක්‍රියා 7:26
**5** ගණන් 16:13, ක්‍රියා 7:27
**6** ක්‍රියා 7:28
**7** හිතෝ 19:12
**8** නික් 4:19
**9** හිතෝ 22:3, හෙබ්‍රෙ 11:27
**10** උත් 25:2, නික් 3:1
**11** නික් 18:12
**12** උත් 24:20
**13** උත් 29:10
**14** නික් 4:18, නික් 18:1, ගණන් 10:29

ඉක්මනට ගෙදර ආවේ කොහොමද”
කියා පුදුමයෙන් ඇසුවේය. **19** එවිට
ඔවුහු මෙසේ පිළිතුරු දුන්නෝය.
“ඊජිප්තු ජාතිකයෙක්[1] අපව එඬේ-
රුන්ගෙන් බේරාගත්තා. ඒ විතරක්
නෙවෙයි, ඔහු අපේ සතුන්ට වතුරත්
ඇදලා දුන්නා.” **20** එවිට රුවෙල්,
“කෝ ඒ තැනැත්තා? ඔහුට ගෙද-
රට එන්න නොකිව්වේ ඇයි? අප
සමඟ කෑම කන්න ඔහුටත් එන්න
කියන්න”[2] කියා තම දූවරුන්ට පැවසු-
වේය. **21** පසුව මෝසෙස් ඔහු සමඟ
ජීවත් වීමට කැමති විය. රුවෙල් තම
දියණිය වන ශිප්පොරාව[3] මෝසෙස්ට
විවාහ කර දුන්නේය. **22** ඇය පුත්‍ර-
යෙකු බිහි කළාය. “මම මේ දේශයේ
ජීවත් වෙන්නේ විදේශිකයෙක් ලෙ-
සයි”[4] කියමින් මෝසෙස් ඔහුට ගේර්-
ෂෝම්*[5] යන නම තැබීය.

**23** බොහෝ කාලයක් ගත වූ පසු[6]
ඊජිප්තුවේ රජ මිය ගියේය. නමුත්
ඊශ්‍රායෙල් පුත්‍රයන් දිගටම වහලුන්
ලෙස වැඩ කළ නිසා ඔවුහු සුසුම්ල-
මින් තමන්ගේ දුක් ගැහැට ගැන සැබෑ
දෙවිට කන්නලව් කළෝය.[7] ඔවුන්
උපකාරය පතා කළ කන්නලව් සැබෑ
දෙවිට ඇසිණ.[8] **24** කලක් ගත වූ
පසු දෙවි ඔවුන්ගේ දුක් ගැනවිල්ල[9]
අසා[10] ආබ්‍රහම්, ඊසාක් සහ යාකොබ්
සමඟ කළ ගිවිසුම සිහි කළේය.[11]
**25** දෙවිට ඊශ්‍රායෙල් පුත්‍රයන් ගැන
අනුකම්පාවක් ඇති විය.

**3** මෝසෙස් මිදියන්හි පූජකයා වූ
යෙත්‍රෝගේ*[12] බෑනා[13] විය. ඔහු
යෙත්‍රෝගේ සත්ව රැළ බලාගත්තේය.
පාළුකරයේ බටහිර දෙසට සතුන්ව
ගෙන යද්දී ඔහු සැබෑ දෙවිගේ කන්ද[14]
වූ හොරෙබ්[15] අසලට ආවේය. **2** ඒ
අවස්ථාවේදී කටු පඳුරෙන් නැඟුණු
ගින්නක් තුළින් යෙහෝවා දෙවිගේ
දූතයා ඔහුට පෙනිණ.[16] පඳුර ඇවි-
ළෙමින් තිබුණත් එය නොදැවුණු
බව ඔහු දුටුවේය. **3** එවිට, “මේක
නම් මහා පුදුමයක්![1] කටු පඳුර
දැවී නොයන්නේ ඇයි කියලා ගිහින්
බලන්න ඕනේ” යයි මෝසෙස් සිතු-
වේය. **4** මෝසෙස් කටු පඳුර බැලී-
මට එන බව දුටු යෙහෝවා දෙවි පඳුර
තුළින්, “මෝසෙස්! මෝසෙස්!” කියා
ඔහුට කතා කළේය. මෝසෙස්ද, “මා
මෙතැනය”[2] කියා පිළිතුරු දුන්නේය.
**5** එවිට දෙවි මෙසේ පැවසීය. “මෙතැ-
නට ළං නොවන්න. ඔබ සිටගෙන
සිටින්නේ ශුද්ධ භූමියකය. ඒ නිසා
ඔබේ පාවහන් ගලවන්න.”[3]

**6** දෙවි ඔහුට මෙසේද කීවේය.
“ඔබේ පියාගේ දෙවි මමය. ආබ්‍රහම්-
ගේ, ඊසාක්ගේ සහ යාකොබ්ගේ දෙ-
විත් මමය.”[4] එවිට මෝසෙස් සැබෑ
දෙවි දෙස බැලීමට භය වී තම
මුහුණ වසාගත්තේය. **7** යෙහෝවා
දෙවි නවදුරටත් මෙසේ කීවේය.
“ඊජිප්තුවේ සිටින මාගේ සෙනඟ
විඳින දුක් ගැහැට මම දුටුවෙමි.
ඔවුන්ගෙන් බලෙන් වැඩ ගන්න අය
ඔවුන්ට කරන පීඩා නිසා ඔවුන් අඬ-
මින් කරන කන්නලව් මට ඇසිණ.
ඔවුන් විඳින වේදනාව මට තේ-
රුම්ගත හැකියි.[5] **8** ඒ නිසා මම
ඔවුන්ව ඊජිප්තුවරුන්ගේ අතින් ගල-
වාගන්නෙමි.[6] ඔවුන්ව ඊජිප්තුවෙන්
පිටතට ගෙනැවිත් කිරියෙන් හා
පැණියෙන් ඉතිරෙන සාරවත් දේශය-
කට ගෙන යන්නෙමි.[7] මම ඔවුන්ව
කානානිවරුන්ගේ, හිත්තීවරුන්ගේ,
අමෝරිවරුන්ගේ, පෙරිස්සිවරුන්ගේ,
හිවීයවරුන්ගේ හා යෙබූසිවරුන්ගේ
දේශයට රැගෙන යන්නෙමි.[8] ඒ දේශ-
යේ ඔවුන්ට ඇති තරම් ඉඩකඩ
තිබේ. **9** ඊශ්‍රායෙල් පුත්‍රයන්ගේ දුක්
ගැනවිලි මට ඇසිණ. ඊජිප්තුවරුන්
ඔවුන්ට කරන පීඩා මම දුටුවෙමි.[9]
**10** එහෙයින් මම ඔබව පාරාවෝ වෙ-
නට යවන්නෙමි. ඔබ ගොස් මාගේ
සෙනඟ වන ඊශ්‍රායෙල්වරුන්ව ඊජිප්-
තුවෙන් පිටතට ගෙනෙන්න.”[10]

---

නික් **2:22*** තේරුම, “විදේශිකයෙක්.” **3:1*** රු-
වෙල් යන නමින්ද හඳුන්වන්නේ මොහුවය. නික්
2:18 බලන්න.

**10** 1සාමු 12:6; ගීතා 105:26; යෙසා 63:11; ක්‍රියා 7:34.

**2 පරි.**
**1** ක්‍රියා 7:22
**2** උත් 19:3
උත් 24:31
යෝබ් 31:32
රෝම 12:13
හෙබ්‍රෙ 13:2
**3** නික් 18:2
ගණන් 12:1
**4** ක්‍රියා 7:29
**5** නික් 18:3
1ලේක 23:15
**6** නික් 4:19
නික් 7:7
ක්‍රියා 7:30
**7** නික් 6:5
ගණන් 20:16
ද්වි 26:7
ගීතා 12:5
**8** නික් 3:7
1රාජා 8:51
නෙහෙ 9:9
ගීතා 107:19
**9** ක්‍රියා 7:34
**10** විනි 2:18
නෙහෙ 9:27
1පේත්‍ර 5:7
**11** උත් 15:14
2රාජා 13:23
ගීතා 105:8

**3 පරි.**
**12** නික් 2:16
නික් 18:1
**13** විනි 1:16
විනි 4:11
**14** නික් 24:13
**15** නික් 17:6
1රාජා 19:8
මලා 4:4
**16** ද්වි 33:16
ක්‍රියා 7:30

**2 තීරුව**
**1** උත් 18:14
ආනි 3:27
ක්‍රියා 7:31
**2** 1සාමු 3:4
**3** යොෂු 5:15
ක්‍රියා 7:33
**4** උත් 26:24
උත් 32:9
මතෙ 22:32
ක්‍රියා 7:32
**5** නික් 1:11
නික් 6:5
ගීතා 106:44
යෙසා 63:9
ක්‍රියා 7:34
**6** නික් 12:51
**7** ගණන් 13:27
ද්වි 27:3
**8** උත් 10:16
නික් 33:2
ද්වි 7:1
යොෂු 3:10
නෙහෙ 9:8
**9** නික් 1:11

**11** එහෙත් මෝසෙස් සැබෑ දෙවි-
ගෙන් මෙසේ ඇසුවේය. “මා වැනි කෙ-
නෙකුට පාරාවෝ ළඟට යා හැකිද?
ඊශ්‍රායෙල්වරුන්ව ඊජිප්තුවෙන් පිට-
තට රැගෙන ඒමට මට පුළුවන්ද?”[1]
**12** එවිට දෙවි ඔහුට මෙසේ කීවේය.
“මම ඔබ සමඟ සිටිමි.[2] ඔබව යවන්-
නේ සැබෑ දෙවි වන මා බව ස්ථිර
ලෙස ඔබ දැනගන්නා පිණිස මා
ඔබට මේ පොරොන්දුව* දෙමි.[3] ඔබ
ඊශ්‍රායෙල් සෙනඟව ඊජිප්තුවෙන් පිට-
තට ගෙනා පසු ඔබ ඒ මුළු සෙනඟ
සමඟ මේ කන්දේදී[4] මට නමස්කාර
කරනු ඇත.”
**13** එහෙත් මෝසෙස් සැබෑ දෙවි-
ගෙන් මෙසේ ඇසුවේය. “මම ඊශ්‍රායෙල්
පුත්‍රයන් ළඟට ගොස්, ‘මාව ඔබ ළඟට
එව්වේ ඔබේ මුතුන්මිත්තන්ගේ දෙවි’
කියා ඔවුන්ට කියූ විට, ‘ඔහුගේ නම
කුමක්ද’[5] කියා ඔවුන් මගෙන් ඇසු-
වොත් මම ඔවුන්ට මොනවාද කියන්-
නේ?” **14** එවිට දෙවි මෝසෙස්ට
මෙසේ පැවසුවේය. “තමා කැමති දේ
ඉටු කළ හැකි එකම තැනැත්තා මා
බව මමම ඔප්පු කර පෙන්වමි.”[6] දෙවි
තවදුරටත් මෙසේ කීවේය. “ඔබ ඊශ්‍රා-
යෙල් පුත්‍රයන්ට මෙසේ කියන්න.
‘මාව ඔබ ළඟට එව්වේ තමා කැමති
දේ ඉටු කළ හැකි තැනැත්තා-
ණන්ය.’ ”[7] **15** දෙවි නැවතත් මෝ-
සෙස්ට මෙසේ කීවේය.
“ඔබ ඊශ්‍රායෙල් පුත්‍රයන්ට මෙසේ
කියන්න. ‘ඔබේ මුතුන්මිත්තන්ගේ
දෙවි වන යෙහෝවා, එසේය ආබ්‍රහම්-
ගේ,[8] ඊසාක්ගේ[9] සහ යාකොබ්ගේ[10]
දෙවි ඔබ වෙතට මාව එව්වේය.’ සඳ-
හටම මගේ නාමය එයයි.[11] පරම්පරා-
වෙන් පරම්පරාවට[12] මා සිහි කරනු
ලබන්නේ ඒ නාමයෙන්ය. **16** ඔබ
ගොස් ඊශ්‍රායෙල් වැඩිමහල්ලන්ව
කැඳවා ඔවුන්ට මෙසේ කියන්න.
‘ආබ්‍රහම්ගේද ඊසාක්ගේද යාකොබ්-
ගේද දෙවි වන ඔබේ මුතුන්මිත්තන්-
ගේ දෙවි[13] වූ යෙහෝවා මට කතා
කර මෙසේ කීවේය. “මට ඔබවත්
ඊජිප්තුවේදී ඔබට සිදු වන අසා-
ධාරණත් හොඳින් පෙනෙන්නේය.[1]
**17** ඒ නිසා ඔබට පීඩා කරන
ඊජිප්තුවරුන්ගේ අතින් මම ඔබව
ගලවාගන්නෙමි.[2] කානානිවරුන්ගේ,
හිත්තීවරුන්ගේ, අමෝරිවරුන්ගේ,[3]
පෙරිස්සිවරුන්ගේ, හිවීයවරුන්ගේ හා
යෙබූසිවරුන්ගේ දේශයට[4] මම ඔබව
ගෙන යන්නෙමි. ඒ දේශය කිරියෙන්
හා පැණියෙන් ඉතිරී යන දේශයකි.” ’[5]
**18** “ඊශ්‍රායෙල්හි වැඩිමහල්ලෝ
අනිවාර්යයෙන්ම ඔබ කියන දේට
සවන් දෙනු ඇත.[6] ඉන්පසු ඔබ ඔවුන්
සමඟ ඊජිප්තුවේ රජු ළඟට ගොස්
මෙසේ කියන්න. ‘හෙබ්‍රෙව්වරුන්ගේ[7]
දෙවි වන යෙහෝවා අප සමඟ කතා
කළා.[8] ඒ නිසා අපේ දෙවි වන යෙ-
හෝවාට පූජාවක් ඔප්පු කරන්න දවස්
තුනකට පාළුකරයට යන්න අපට
අවසර දෙන්න.’[9] **19** නමුත් ඊජිප්-
තුවේ රජුට විරුද්ධව මගේ මහත්
බලය* විදහාපෙන්නුවොත් මිසක,
ඔහු ඔබට යන්න දෙන්නේ නැහැ
කියා මම හොඳාකාරවම දනිමි.[10]
**20** එහෙයින් මම මගේ බලය* යොදා-
ගෙන[11] පුදුම දනවන සෑම ක්‍රියාව-
කින්ම ඊජිප්තුවට පහර දෙන්නෙමි.
එවිට ඊජිප්තුවේ රජ ඔබට යන්න අව-
සර දෙනු ඇත.[12] **21** මා කරන ඒ
දෙයින් ඊශ්‍රායෙල් සෙනඟට ඊජිප්තුව-
රුන්ගෙන් කරුණාව ලැබෙන්නේය. ඒ
නිසා ඔබ ඊජිප්තුවෙන් පිටත්ව යන
විට හිස් අතින් යන්නේ නැත.[13]
**22** ඒ දවසේදී සෑම ස්ත්‍රියක්ම තම
අසල්වාසියාගෙන්ද තමාගේ නිවසේ
නැවතී සිටින විදේශීය ස්ත්‍රීන්ගෙන්ද
රන් හා රිදී ආභරණ සහ වස්ත්‍ර ඉල්ලා-
ගත යුතුයි. ඒවා ඔබේ පුත්‍රයන්ට හා
දූවරුන්ට පළඳවන්න. ඊජිප්තුවරුන්ට
කිසි දෙයක් ඉතුරු නොකරන්න.”[14]

**3 පරි.**
**1** නික් 6:12, 2සාමු 7:18, යෙරෙ 1:6
**2** ද්වි 31:23, යොෂු 1:5, යෙසා 41:10, රෝම 8:31, පිලි 4:13
**3** විනි 6:17
**4** නික් 19:2, ද්වි 4:11
**5** නික් 15:3, 1සාමු 17:45, ගීතා 96:8, ගීතා 135:13, හොෂෙ 12:5, මතෙ 21:9, යොහ 17:26, රෝම 10:13
**6** ලෙවී 11:45, යෝබ් 23:13, යෙසා 14:27, ආනි 4:35, යොහ 12:28
**7** නික් 6:3, නික් 6:7, රෝම 9:17
**8** උත් 17:7, මතෙ 22:32
**9** උත් 26:24
**10** උත් 28:13
**11** ගීතා 135:13
**12** ගීතා 30:4, ගීතා 102:12, හොෂෙ 12:5
**13** උත් 17:1, උත් 48:15

**2 තීරුව**
**1** උත් 50:24, නික් 13:19, ගීතා 80:14, ලූක් 1:68
**2** උත් 15:13, ලෙවී 26:13, නෙහෙ 9:9, ක්‍රියා 7:34
**3** උත් 15:16
**4** නික් 23:23
**5** ගණන් 13:27, ද්වි 8:7
**6** නික් 4:31, නික් 20:19
**7** උත් 14:13, උත් 40:15, නික් 10:3
**8** නික් 5:3
**9** නික් 7:16, නික් 8:27, නික් 10:26
**10** නික් 5:2, නික් 7:4, නික් 14:8, රෝම 9:17
**11** ගීතා 118:15
**12** නික් 7:3, නික් 12:33, ද්වි 6:22, ගීතා 135:9, ක්‍රියා 7:36
**13** නික් 11:2; නික් 12:35; **14** උත් 15:14; නික් 12:36; ගීතා 105:37.

**නික් 3:12*** මූ.අ., “ලකුණ.”

**නික් 3:19*** මූ.අ., “මගේ බලවත් හස්තය.” **20*** නික් 3:19හි පාදසටහන බලන්න.

**4** එහෙත් මෝසෙස් මෙසේ ඇසු-
වේය. “සෙනඟ මම කියන දේ
විශ්වාස නොකර,[1] ‘යෙහෝවා දෙවි
ඔබට කතා කළේ නැහැ’ කියා පැව-
සුවොත් මා කළ යුත්තේ කුමක්ද?”
**2** එවිට යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. “ඔබ අතේ තිබෙන්-
නේ මොකද්ද?” මෝසෙස්, “සැර-
යටියක්”[2] කියා උත්තර දුන්නේය.
**3** ඉන්පසු දෙවි, “එය බිමට විසි
කරන්න” කියා කීවේය. මෝසෙස්
සැරයටිය බිමට විසි කළ විට එය සර්-
පයෙකු[3] බවට පත් විය. මෝසෙස්
ඌව දුටු විගස එතැනින් ඉවතට
දිව්වේය. **4** එවිට යෙහෝවා දෙවි
මෝසෙස්ට කතා කර, “සර්පයා-
ගේ වලිගයෙන් අල්ලාගන්න” කියා
කීවේය. මෝසෙස්ද සර්පයාව අල්ලා-
ගත්තේය. එවිට සර්පයා සැරයටියක්
බවට පත් විය. **5** දෙවි තවදුරටත්
මෙසේ පැවසීය. “ඔවුන්ගේ මුතුන්-
මිත්තන්ගේ දෙවි[4] එනම්, ආබ්‍රහම්-
ගේ,[5] ඊසාක්ගේ[6] සහ යාකොබ්ගේ
දෙවි[7] වන යෙහෝවා ඔබට කතා
කළ[8] බව ඔවුන් විශ්වාස කරන පිණිස
සෙනඟ ඉදිරියේ එලෙස කරන්න.”
**6** යෙහෝවා දෙවි ඔහුට මෙසේද
කීවේය. “දැන් ඔබේ අත සළුව ඇතු-
ළට දමන්න.” මෝසෙස්ද තම අත
සළුව ඇතුළට දැමුවේය. පසුව ඔහු
තම අත සළුවෙන් පිටතට ගත් විට
පුදුම දෙයක් සිදු වී තිබිණ. හිම
මෙන්[9] පෙනුණ කුෂ්ඨයක්* ඔහුගේ
අතේ හටගෙන තිබුණේය. **7** පසුව
දෙවි, “ඔබේ සළුව ඇතුළට නැවතත්
අත දමන්න” කියා ඔහුට කීවේය.
ඔහුද සළුව ඇතුළට නැවතත් අත
දැමුවේය. ඔහු තම අත සළුවෙන්
පිටතට ගත් විට එය නැවතත්
සාමාන්‍ය තත්වයට පත්ව තිබිණ.[10]
**8** දෙවි තවදුරටත් මෙසේ පැවසු-
වේය. “ඔවුන් ඔබව විශ්වාස නොකර
පළමුවෙනි ලකුණ පිළි නොගත්-
තොත් ඔබ ඊළඟට පෙන්වන ලකුණ

**නික් 4:6*** හෝ, “ලාදුරු රෝගය.”

4 පරි.
1 නික් 2:14
ක්‍රියා 7:25
2 නික් 8:5
නික් 17:5
ගණන් 20:11
3 නික් 7:9
4 1සාමු 2:27
ක්‍රියා 7:32
5 ක්‍රියා 7:2
රෝම 4:3
6 උත් 28:13
මාක් 12:26
7 උත් 28:21
ලූක් 20:37
8 නික් 3:16
නික් 4:31
යෙරෙ 31:3
9 ගණන් 12:10
2රාජා 5:27
10 2රාජා 5:14
මතෙ 8:3

2 තීරුව
1 යොහ 10:38
ක්‍රියා 7:36
2 2තෙස 3:2
3 නික් 4:30
4 නික් 6:12
ගණන් 12:3
යෙරෙ 1:6
ක්‍රියා 7:22
2කොරි 11:6
5 ගීතා 94:9
යෙසා 6:10
ලූක් 1:20
ක්‍රියා 13:11
6 ගීතා 51:15
ගීතා 143:10
යෙසා 50:4
මාක් 13:11
ලූක් 12:12
7 ගණන් 26:59
8 උත් 33:4
නික් 4:27
ක්‍රියා 7:30
9 නික් 4:28
නික් 7:1
10 යෙරෙ 1:9
11 යෙසා 54:13
1කොරි 1:5
2කොරි 3:5

ඔවුන් පිළිගනීවි.[1] **9** නමුත් ඔවුන් ඒ
ලකුණු දෙකම විශ්වාස නොකර ඔබ
කියන දේ පිළි නොගත්තොත්[2] නයිල්
ගඟෙන් වතුර ටිකක් රැගෙන එය
බිමට වත් කරන්න. ඔබ ඒ වතුර
බිමට වත් කරද්දී එය ලේ බවට
හැරෙයි.”[3]
**10** එවිට මෝසෙස් යෙහෝවා දෙ-
විට මෙසේ කීවේය. “අනේ යෙ-
හෝවා දෙවියනි, මම කවදාවත්
දක්ෂ කථිකයෙක් වෙලා හිටියේ
නැහැ. ඔබේ සේවකයා වන මා සමඟ
ඔබ කතා කළ පසුවත් මම කතා-
වට දක්ෂ කෙනෙක් වෙයි කියා
සිතන්න බැහැ.”[4] **11** එවිට යෙ-
හෝවා දෙවි ඔහුට මෙසේ කීවේය.
“මනුෂ්‍යයාට මුඛයක් දුන්නේ කවුද?
ඔහුව ගොළුවෙකු නැත්නම් බිහි-
රෙකු කරන්නේ කවුද?* ඔහුට පෙ-
නීම දෙන්නෙත් ඔහුව අන්ධයෙකු
කරන්නෙත් කවුද? යෙහෝවා දෙවි
වන මා නොවෙයිද?[5] **12** දැන් ඔබ
පිටත්ව යන්න. ඔබ කතා කරන විට
මම ඔබ සමඟ සිටිමි. ඔබ පැව-
සිය යුතු වචන මම ඔබට කියා
දෙන්නෙමි.”[6] **13** නමුත් මෝසෙස්,
“අනේ යෙහෝවා දෙවියනි, වෙන
කෙනෙකුව මේ සඳහා යවන්න” කියා
කීවේය. **14** මෝසෙස් කී දේ නිසා
යෙහෝවා දෙවි කෝප වී මෙසේ
කීවේය. “ලෙවී ගෝත්‍රයට අයත් ඔබේ
සහෝදරයා[7] වන ආරොන් කතාවට
දක්ෂයෙක් බව මම දනිමි. ඔහු දැන්
ඔබව හමු වීමට පැමිණෙයි. ඔහු
ඔබව දැක මහත් සේ සතුටට පත්
වෙයි.[8] **15** මා ඔබට පවසන දේවල්
ඔබ ආරොන්ට කියන්න.[9] ඔබ කතා
කරන විට මම ඔබ සමඟ සිටිමි.
ආරොන් කතා කරන විටත් මම ඔහු-
ගේ උපකාරයට සිටිමි.[10] ඔබ දෙ-
දෙනා කළ යුතු දේ මම ඔබට කියා
දෙන්නෙමි.[11] **16** ආරොන් ඔබ වෙ-
නුවෙන් සෙනඟට කතා කරනු ඇත.

**නික් 4:11*** හෝ, “එසේ වීමට ඉඩහරින්නේ කවුද?”

ඔහු ඔබේ මුඛය සේ ක්‍රියා කරයි.[1]
දෙවි වන මා පවසන දේ ඔහුට දන්-
වන්නේ ඔබයි.*[2] **17** මේ සැරයටිය
මාර්ගයෙන් ලකුණු[3] පෙන්වන පිණිස
ඔබ එය රැගෙන යන්න."

**18** පසුව මෝසෙස් තම මාමා
වන යෙත්‍රෝ[4] වෙතට ගොස්
මෙසේ කීවේය. "මගේ සහෝදරයන්
තවම ජීවතුන් අතර සිටිනවාද කියා
බලන්න මට ඊජිප්තුවට යන්න අව-
සර දෙන්න."[5] යෙත්‍රෝද, "සමාදාන-
යෙන් ගිහින් එන්න"[6] කියා ඔහුට
කීවේය. **19** යෙහෝවා දෙවි මිදි-
යන්හිදී මෝසෙස්ට මෙසේ කීවේය.
"ඔබව මරන්න[7] සෙවූ සියලුදෙනා
දැන් ජීවතුන් අතර නැත. එමනිසා
ඔබ දැන් ඊජිප්තුවට යන්න."

**20** එහෙයින් මෝසෙස් තම භාර්-
යාවද පුත්‍රයන්වද බූරුවෙකු පිට
නංවාගෙන ඊජිප්තුව බලා පිටත්
විය. ඔහු සැබෑ දෙවිගේ සැරයටි-
යද අතේ[8] රැගෙන ගියේය. **21** යෙ-
හෝවා දෙවි තවදුරටත් මෝසෙස්ට
මෙසේ කීවේය. "මා ඔබට කිරී-
මට බලය දුන් සෑම ආශ්චර්යයක්ම
ඔබ ඊජිප්තුවට ගිය පසු පාරාවෝ
ඉදිරියේ[9] කරන්න. නමුත් පාරාවෝ
තම සිත මුරණ්ඩු කරගෙන මගේ
සෙනඟට යන්න දෙන්නේ නැත.[10]
මමද ඔහුට එසේ කිරීමට ඉඩහරින්-
නෙමි.[11] **22** ඔබ පාරාවෝට මෙ-
ලෙසත් කියන්න. 'යෙහෝවා දෙවි
මෙසේ පවසන්නේය. "ඊශ්‍රායෙල් මගේ
පුත්‍රයාය. ඔහු මගේ කුලුඳුල් පුත්‍ර-
යාය.[12] **23** මට නමස්කාර කිරීම
සඳහා මගේ පුත්‍රයාට යන්න අවසර
දෙන්න. ඔබ ඔහුට යන්න අවසර
නොදෙන්නේ නම් මම ඔබේ පුත්‍රයාව
එනම්, ඔබේ කුලුඳුල් පුත්‍රයාව මරා
දමන්නෙමි." ' "[13]

**24** ගමන අතරතුරේදී ඔවුන් නවා-
තැන්[14] ගෙන සිටියදී යෙහෝවා දෙවි*

**4 පරි.**
1 නික් 7:2
2 නික් 7:1 ගීතා 82:6 යොහ 10:34
3 නික් 7:19
4 නික් 2:18 නික් 18:1 ගණන් 10:29
5 උත් 30:25 ක්‍රියා 7:30
6 1සාමු 1:17
7 නික් 2:15
8 නික් 17:9 ගණන් 20:8
9 නික් 7:9
10 නික් 7:22 නික් 8:15
11 නික් 7:3 නික් 10:1 නික් 11:10 ද්වි 2:30 1සාමු 6:6 ආනි 5:20 රෝම 9:18
12 ද්වි 7:6 ද්වි 14:2 යෙරෙ 31:9 හොෂෙ 11:1 රෝම 9:4
13 නික් 12:29 ගීතා 105:36 ගීතා 135:8
14 උත් 42:27 යෙරෙ 9:2

**2 තීරුව**
1 ගණන් 22:22 1ලේක 21:16
2 උත් 17:14
3 නික් 2:21 නික් 18:2
4 යොෂු 5:2
5 නික් 4:14
6 නික් 3:1 නික් 20:18 නික් 24:16 1රාජා 19:8
7 නික් 4:15 නික් 7:1
8 නික් 4:8
9 නික් 3:16 නික් 24:1
10 නික් 3:16
11 නික් 4:3 නික් 4:6 නික් 4:9
12 නික් 3:18 නික් 4:8
13 උත් 50:25 නික් 13:19
14 නික් 1:14 නික් 3:7 ද්වි 26:6
15 උත් 43:28 2ලේක 7:3 නෙහෙ 8:6

ඔහු වෙතට පැමිණ[1] ඔහුව මරා දැමී-
මට මඟක් සෙවීය.[2] **25** එවිට ශිප්-
පොරා[3] මුවහත් ගලක් ගෙන ඇගේ
පුත්‍රයාව චර්මච්ඡේදනය[4] කර ඒ චර්-
මාග්‍රය ඔහුගේ පාමුල තබා, "මා
මෙසේ කරන්නේ ඔබ මට රුධිරයේ
මනාලයෙක් වන නිසයි" කියා කීවාය.
**26** එහෙයින් දෙවි ඔහුට යන්න හැරි-
යේය. එවිට චර්මච්ඡේදනය නිසා,
"ඔබ මට රුධිරයේ මනාලයෙක්" කියා
ඇය කීවාය.

**27** ඒ අතරතුරේදී යෙහෝවා දෙවි
ආරොන්ට මෙසේ කීවේය. "මෝ-
සෙස්ව හමු වීමට පාළුකරයට[5]
යන්න." ආරොන්ද සැබෑ දෙවිගේ
කන්දට[6] ගොස් මෝසෙස්ව හමු වී
ඔහුව සිපගත්තේය. **28** පසුව මෝ-
සෙස් තමාව එවූ තැනැත්තා වන යෙ-
හෝවා දෙවි පැවසූ සියල්ල ආරොන්ට
කීවේය.[7] තමාට කිරීමට අණ කළ
සියලු ලකුණු ගැනද පැවසුවේය.[8]
**29** ඉන්පසු මෝසෙස් සහ ආරොන්
ඊශ්‍රායෙල්වරුන් වෙතට ගොස් ඔවුන්
අතරේ සිටි සියලු වැඩිමහල්ලන්ව[9]
රැස් කළහ. **30** යෙහෝවා දෙවි
මෝසෙස්ට පැවසූ සියල්ල ආරොන්
සෙනඟට පැවසූ[10] අතර මෝසෙස්
ඔවුන්ට ඒ සියලු ලකුණු[11] පෙන්වූ-
යේය. **31** එවිට සෙනඟ ඔහුව විශ්-
වාස කළෝය.[12] යෙහෝවා දෙවි
ඊශ්‍රායෙල් පුත්‍රයන් දෙස බලා සිටින[13]
බවත් ඔවුන් විඳින දුක් ගැහැට[14]
ඔහුට පෙනෙන බවත් සෙනඟ දැන-
ගත් විට ඔවුහු දෙවි ඉදිරියේ දණින්
වැටී[15] නමස්කාර කළෝය.

**5** පසුව මෝසෙස් සහ ආරොන්
පාරාවෝ ළඟට ගොස්[16] මෙසේ
කීවෝය. "ඊශ්‍රායෙල්වරුන්ගේ දෙවි
වන යෙහෝවා ඔබට මෙසේ පව-
සන්නේය. 'මගේ සෙනඟට යන්න
අවසර දෙන්න. මගේ නාමයෙන්
පාළුකරයේ උත්සවයක්[17] පැවැත්වීම
සඳහා ඔවුන්ට යන්න ඉඩ දෙන්න.' "

---

**නික් 4:16*** හෝ, "ඔබ ඔහුට දෙවි කෙනෙකු මෙන් ක්‍රියා කරනු ඇත." **24*** සමහර පිටපත්වල, 'යෙහෝවා දෙවිගේ දූතයා' ලෙස සඳහන් වේ.

**5 පරි.** **16** නික් 7:1; නික් 7:10; ගීතා 119:46; **17** නික් 10:9.

**2** නමුත් පාරාවෝ ඔවුන්ට මෙසේ
කීවේය. “මම ඊශ්‍රායෙල්වරුන්ට
යන්න ඉඩ දෙන්නේ නැහැ.[1] යෙහෝ-
වාට කීකරු වෙන්න ඔහු කවුද?[2] යෙ-
හෝවා කියන්නේ කවුද කියාවත් මම
දන්නේ නැහැ.[3] ඉතින් ඇයි මම
ඊශ්‍රායෙල්වරුන්ට යන්න දෙන්නේ?”[4]
**3** එහෙත් මෝසෙස් සහ ආරොන්
පාරාවෝට මෙසේ කීවෝය. “හෙ-
බ්‍රෙව්වරුන්ගේ දෙවි අප සමඟ කතා
කළා.[5] ඒ නිසා අපේ දෙවි වන යෙ-
හෝවාට පූජාවක් ඔප්පු කිරීම සඳහා
දවස් තුනකට පාළුකරයට යන්න
අපට අවසර දෙන්න.[6] අපි නොගි-
හින් සිටියොත් ඔහු අපට වසංගතය-
කින් පහර දෙන්න ඉඩ තිබෙනවා.
එසේ නැත්නම් ඔහු අපිට කඩු-
වෙන් පහර දෙයි.”[7] **4** එවිට ඊජිප්තු-
වේ රජ මෝසෙස්ට සහ ආරොන්ට
මෙසේ කීවේය. “නුඹලා මේ සෙ-
නඟගේ වැඩවලට බාධා කරන්-
නේ ඇයි?[8] නුඹලා වහාම ගිහින්
ඔවුන්ට වැඩ පටන්ගන්න කියන්න.”[9]
**5** පාරාවෝ ඔවුන්ට මෙසේද කීවේය.
“සෙනඟ ගණනින් වැඩි වී[10] මේ මුළු
දේශය පුරාම පැතිරී සිටිනවා මදිවට
නුඹලා දැන් ඔවුන්ගේ වැඩ නතර
කරන්නත් හදනවා.”[11]

**6** එදිනම පාරාවෝ සෙනඟ-
ගේ විධායකයන්ටද[12] නිලධාරීන්-
ටද මෙසේ අණ කළේය. **7** “ඔබ
කලින් ගඩොල්[13] සෑදීමට සෙ-
නඟට පිදුරු එකතු කර දුන්නත්
දැන් එසේ කරන්න එපා. ඔවුන්ටම
ඒවා එකතු කරගන්න ඉඩහරින්න.
**8** නමුත් කලින් සෑදූ ගඩොල් ප්‍රමා-
ණයම සෑදීමට ඔවුන්ට අණ
කරන්න. කිසි ලෙසකින්වත් ඔවුන්-
ගේ වැඩ අඩු කරන්න එපා. ඔවුන් හරි
කම්මැළි සෙනඟක්.[14] ‘අපිට යන්න
දෙන්න. අපේ දෙවිට පූජාවක්[15] ඔප්පු
කරන්න තිබෙනවා’ කියා ඔවුන්
කෑගසන්නේ ඒ නිසයි. **9** ඔවුන්ගේ
වැඩ තව තවත් අමාරු කරන්න.
දිගටම ඔවුන්ගෙන් වැඩ ගන්න.
එවිට බොරු කතාවලට[16] ඇහුම්කන්
දීමට ඔවුන්ට අවස්ථාවක් ලැබෙන්-
නේ නැති වෙයි.”

**10** එහෙයින් සෙනඟගේ විධායක-
යෝද[1] නිලධාරීහුද සෙනඟ ළඟට
ගොස් මෙසේ කීවෝය. “පාරාවෝ
ඔබට මෙසේ කියා තිබෙනවා. ‘මම
කලින් කළාක් මෙන් මින් ඉදිරියට
නම් නුඹලාට පිදුරු දෙන්නේ නැහැ.
**11** පිදුරු සොයාගත හැකි තැන්ව-
ලට ගොස් නුඹලාම ඒවා එකතු
කරගන්න. නමුත් මා කොයි ලෙස-
කින්වත් නුඹලාගේ වැඩ කොටස නම්
අඩු කරන්නේ නැහැ.’ ”[2] **12** එහෙ-
යින් සෙනඟ කෙත්වල ඉතුරු වී තිබූ
පිදුරු සොයාගැනීමට ඊජිප්තු දේ-
ශය පුරාම ඇවිද්දෝය. **13** ඔවුන්-
ගේ විධායකවරු, “නුඹලා දවසට
නියමිත වැඩ කොටස කෙසේ හෝ
අවසන් කළ යුතුයි. නුඹලාට පිදුරු
ගෙනැවිත් දුන් කාලයේ කළ වැඩ
කොටසම දැනුත් කළ යුතුයි”[3] කියා
ඔවුන්ට කීවෝය.[4] **14** පාරාවෝගේ
විධායකවරු සෙනඟගේ වැඩ බැලීම
සඳහා ඊශ්‍රායෙල්වරුන් අතරින්ද නිල-
ධාරීන්ව[5] පත් කර තිබිණ. දවස්
කිහිපයක් ගෙවුණු පසු විධායකවරු
එම නිලධාරීන්ට තළා[6] ඔවුන්ගෙන්
මෙසේ ඇසුවෝය. “ඊයෙත් අදත් නුඹ-
ලාට නියමිත වැඩ කොටස අව-
සන් නොකළේ ඇයි?[7] නුඹලා කලින්
කළාක් මෙන් නියමිත ගඩොල්[8]
ප්‍රමාණය දැන් සාදන්නේ නැත්තේ
ඇයි?”

**15** එහෙයින් සෙනඟගේ වැඩ
බැලීමට ඊශ්‍රායෙල්වරුන් අතරින් පත්
කර සිටි නිලධාරීහු[9] පාරාවෝ ඉදිරි-
යට ගොස් මෙසේ කීවෝය. “ඔබේ
දාසයන් වන අපට ඔබ මෙලෙස
සලකන්නේ ඇයි? **16** අපට අවශ්‍ය
පිදුරු නොදී, ‘ගඩොල් හදන්න’ කියා
ඔවුන් පවසනවා. ඉන්පසු ඔවුන් අපිට
තළනවා. නමුත් අපේ අතේ වර-
දක් නැහැ. වරද ඔබේ සේවකයන්-
ගේ අතේ.”[10] **17** එවිට පාරාවෝ
කතා කර, “නුඹලා කම්මැළි ජාති-
යක්. නුඹලා හරි අලසයි.[11] ‘අපට

**5 පරි.**
**1** නික් 3:19; නික් 7:3
**2** නික් 7:5; නික් 9:16; 1සාමු 25:10
**3** 1සාමු 2:12; යොහ 16:3; 2තෙස 1:8
**4** 2රාජා 18:35; යෝබ් 21:15; රෝම 1:21
**5** නික් 3:18; රෝම 3:29
**6** උත් 46:1; නික් 8:27
**7** ද්වි 28:21; 2රාජා 17:25
**8** යෙරෙ 38:4; ක්‍රියා 16:20
**9** නික් 1:11; නික් 2:11
**10** නික් 1:9
**11** නික් 6:6
**12** නික් 3:7
**13** උත් 11:3; නික් 1:14; නාහු 3:14
**14** නික් 5:17
**15** නික් 10:25
**16** 2රාජා 18:20; යෙරෙ 43:2

**2 තීරුව**
**1** නික් 1:11; නික් 3:7
**2** 1රාජා 12:10; දේශ 7:7
**3** ද්වි 26:7; දේශ 4:1
**4** නික් 3:9
**5** ද්වි 29:10
**6** නික් 2:11; ක්‍රියා 7:24
**7** උත් 15:13
**8** නාහු 3:14
**9** ගණන් 11:16; යොහ 18:12
**10** ගීතා 37:12
**11** නික් 5:8

යන්න දෙන්න. අපට යෙහෝවා දෙවි
වෙනුවෙන් පූජාවක් ඔප්පු කරන්න
තිබෙනවා'[1] කියා නුඹලා කියන්නේ
ඒ නිසයි. **18** වහාම ගොස් නුඹ-
ලාගේ වැඩ පටන්ගන්න. නුඹලාට
පිදුරු නම් ලැබෙන්නේ නැහැ. නමුත්
නුඹලා නියමිත ගඩොල් ප්‍රමාණය
සාදා නිම කළ යුතුයි."[2]
**19** "එක් එක් කෙනා දවසකට
සෑදිය යුතු ගඩොල් ප්‍රමාණය කොයි
ලෙසකින්වත් අඩු කරන්න එපා"[3]
කියා පාරාවෝ ඔවුන්ට කී බැවින් සෙ-
නඟගේ වැඩ බැලීමට ඊශ්‍රායෙල්වරුන්
අතරින් පත් කර සිටි නිලධාරීහු
අන්ත අසරණ තත්වයකට පත් වූහ.[4]
**20** ඒ නිසා ඔවුහු පාරාවෝ වෙ-
තින් පිටත්ව මෝසෙස් සහ ආරොන්ව
හමු වීමට ගියෝය.[5] මෝසෙස් හා
ආරොන්ද ඔවුන් එන තුරු බලා සිටි-
යෝය. **21** ඒ නිලධාරීහු ඔවුන් දෙ-
දෙනාට මෙසේ කීවෝය. "ඔබ කළ දේ
නිසා පාරාවෝයි ඔහුගේ සේවකයනුයි
අපිව පිළිකුල් කරනවා.[6] ඔබ කළේ
අපිව මරා දැමීමට ඔවුන්ගේ අතට
කඩුවක් දුන්නා වගේ වැඩක්.[7] ඔබ
කළ දේ නිසා යෙහෝවා දෙවි ඔබව
විනිශ්චය කළ යුතුයි."[8] **22** එවිට
මෝසෙස්, යෙහෝවා දෙවිට මෙසේ
කීවේය.[9] "අනේ යෙහෝවා දෙවියනි,
ඔබ මේ සෙනඟ පිටට මෙතරම් දුක්
පීඩා ගෙනෙන්නේ ඇයි?[10] ඔබ මාව
ඔවුන් ළඟට යැව්වේ ඇයි?[11] **23** මම
පාරාවෝ ළඟට ගොස් ඔබේ නාම-
යෙන් ඔහුට කතා කළ[12] දවසේ
සිට මේ දක්වාම ඔහු මේ සෙනඟට
ඉතා දුෂ්ට ආකාරයටයි සලකන්-
නේ.[13] නමුත් ඔබේ සෙනඟව බේරා-
ගැනීමට ඔබ තවම කිසිවක් කර
නැහැ."[14]

**6** එහෙයින් යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. "මා
පාරාවෝට කරන්න යන දේ[15] දැන්
බලාගන්න. මම ඔහුට විරුද්ධව මගේ
මහත් බලය* විදහාපෙන්වන්නෙමි.
එවිට ඔහු සෙනඟට යන්න දෙනු ඇත.
ඔහු මගේ මහත් බලය දැක සෙනඟව
ඔහුගේ දේශයෙන් එළවා දමයි."[1]
**2** දෙවි, මෝසෙස්ට මෙසේද
කීවේය. "මා යෙහෝවා දෙවිය.[2]
**3** මම ආබ්‍රහම්ටද[3] ඊසාක්ටද[4]
යාකොබ්ටද[5] සියලු බලැති දෙවි
ලෙස[6] ප්‍රකාශ වුණෙමි. නමුත් යෙ-
හෝවා යන නමින්[7] මම ඔවුන්ට මාව
හඳුන්වා නොදුන්නෙමි.*[8] **4** ඔවුන්
විදේශිකයන් ලෙස ජීවත් වූ කානාන්
දේශය ඔවුන්ට උරුම කර දෙන බවට
පොරොන්දු වෙමින් මම ඔවුන් සමඟ
ගිවිසුමක් ඇති කරගත්තෙමි.[9] **5** ඒ
ගිවිසුම මම සිහි කරන්නෙමි.[10] මන්ද
ඊජිප්තුවරුන් වහලුන් ලෙස තබා-
ගෙන සිටින ඊශ්‍රායෙල්වරුන්ගේ දුක්
ගැනවිල්ල මට ඇසුණා.[11]
**6** "ඒ නිසා ඔබ දැන් ඊශ්‍රායෙල්
පුත්‍රයන්ට මෙසේ කියන්න. 'මා යෙ-
හෝවා දෙවිය. ඔබව වහල්භාවයේ
තබාගෙන සිටින ඊජිප්තුවරුන්ගෙන්
මම ඔබව ගලවාගන්නෙමි.[12] මම
මගේ මහත් බලය විදහාපෙන්වමින්
ඔවුන්ට දඬුවම් කර ඔබව ගලවාගන්-
නෙමි.[13] **7** මම ඔබව මගේ සෙනඟ
ලෙස භාරගෙන[14] මා ඔබේ දෙවි[15] බව
ඔප්පු කර පෙන්වන්නෙමි. ඊජිප්තුව-
රුන් ඔබ පිට තබා තිබෙන වියග-
සින් ඔබව නිදහස් කරන මා, ඔබේ
දෙවි වන යෙහෝවා බව එවිට ඔබ
අනිවාර්යයෙන්ම දැනගනු ඇත.[16]
**8** ආබ්‍රහම්ටද ඊසාක්ටද යාකොබ්ටද
දෙන බවට මම අත ඔසවා දිවුරා[17]
පොරොන්දු වූ ඒ දේශයට නිසැකවම
ඔබව ගෙන යන්නෙමි. මම ඒ දේශය
ඔබට උරුමයක් ලෙස දෙන්නෙමි.[18]
මා යෙහෝවා දෙවිය.' "[19]
**9** පසුව මෝසෙස්, ඊශ්‍රායෙල්ව-
රුන්ට ඒ සියල්ල දැන්වූවේය.

**5 පරි.**
**1** නික් 3:18 නික් 5:3 නික් 10:25
**2** නික් 1:14
**3** නික් 5:8
**4** නික් 5:7
**5** නික් 7:1
**6** උත් 34:30 1සාමු 13:4 1ලේක 19:6
**7** නික් 6:9 නික් 17:3
**8** විනි 11:27 1සාමු 2:10 යෙසා 33:22
**9** නික් 17:4 යෙරෙ 12:1
**10** ගණන් 11:11 1සාමු 30:6
**11** නික් 3:12
**12** නික් 5:1
**13** නික් 5:9
**14** නික් 3:8

**6 පරි.**
**15** නික් 12:29 නික් 14:13 ගීතා 12:5

**2 තීරුව**
**1** නික් 9:3 නික් 11:1 නික් 12:31
**2** යෙසා 43:11
**3** උත් 18:1
**4** උත් 26:2
**5** උත් 28:13
**6** උත් 17:1 උත් 35:11
**7** නික් 10:2 ගීතා 83:18 ලූක් 11:2 යොහ 12:28 ක්‍රියා 15:14 එළි 15:3
**8** උත් 12:8 උත් 27:27 උත් 28:16 2සාමු 7:23 ගීතා 9:16 යෙසා 52:6 යෙරෙ 16:21 යෙරෙ 32:20
**9** උත් 15:18 උත් 28:4
**10** උත් 17:7
**11** නික් 2:24
**12** ද්වි 4:20
**13** නික් 7:5 ද්වි 26:8 1ලේක 17:21 ක්‍රියා 13:17
**14** ද්වි 7:6 2සාමු 7:24 ගීතා 33:12

**15** නික් 29:45; ද්වි 20:4; **16** නික් 1:14; නික් 7:5; නික් 9:16; රෝම 9:17; **17** හෙබ්‍රෙ 6:13; **18** උත් 15:18; උත් 26:3; උත් 35:12; නික් 32:13; **19** නික් 20:2; යෙසා 42:8.

නික් **6:1*** නික් 3:19හි පාදසටහන බලන්න.

නික් **6:3*** හෝ, "යෙහෝවා යන මගේ නමෙහි අර්ථය ඔවුහු මුළුමනින්ම වටහාගෙන තිබුණේ නැත."

නමුත් ඔවුන් වහලුන් ලෙස පීඩා
විඳිමින් අධෛර්යයට පත්ව සිටි
නිසා[1] ඔවුහු මෝසෙස් කී දේට සවන්
නොදුන්නෝය.
**10** එහෙයින් යෙහෝවා දෙවි මෝ-
සෙස්ට නැවත මෙසේ කීවේය.
**11** "ඊජිප්තුවරුන්ගේ රජු වන පාරා-
වෝ[2] ළඟට ගොස් ඊශ්‍රායෙල්ව-
රුන්ට මේ දේශයෙන් යන්න අවසර
දෙන්න කියා කියන්න."[3] **12** නමුත්
මෝසෙස් යෙහෝවා දෙවිට මෙසේ
කීවේය. "ඊශ්‍රායෙල් ජනයාවත් මට
ඇහුම්කන් දුන්නේ නැහැ.[4] එසේනම්
පාරාවෝ මට ඇහුම්කන් දෙයි කියා
සිතන්න පුළුවන්ද?[5] හොඳට කතා
කළ නොහැකි*[6] මා වැනි කෙනෙකුට
ඔහු ඇහුම්කන් දෙයිද?" **13** එසේවු-
වත් ඊශ්‍රායෙල්වරුන්ට හා ඊජිප්තුවේ
රජු වන පාරාවෝට දැන්විය යුතු දේ
ප්‍රකාශ කිරීමට යෙහෝවා දෙවි මෝ-
සෙස්ව හා ආරොන්ව යොදාගත්තේය.
එසේ කළේ ඊශ්‍රායෙල් ජනයාව ඊජිප්තු
දේශයෙන් පිටතට ගෙන ඒම සඳ-
හාය.[7]
**14** ඊශ්‍රායෙල්වරුන්ගේ පෙළපත්-
වල ප්‍රධානීන්ගේ නම් මේවාය. ඊශ්‍රා-
යෙල්ගේ කුලුඳුලා වන රූබෙන්ගේ[8]
පුත්‍රයෝ නම් හනොක්, පල්ලූ, හෙ-
ස්‍රොන් හා කාමීය.[9] ඒ සියලුදෙනා
රූබෙන්ගෙන් පැවතෙන්නන්ය.[10]
**15** සිමියොන්ගේ පුත්‍රයෝ නම්
යෙමුවෙල්, යාමින්, ඕහද්, යාකින්,
ෂෝහර් හා කානානිය ස්ත්‍රියගේ
පුත්‍රයා වූ ෂාවුල්ය.[11] ඒ සියලුදෙනා
සිමියොන්ගෙන් පැවතෙන්නන්ය.[12]
**16** ලෙවීගේ පුත්‍රයන්ගේ නම්[13]
මේවාය. ගේර්ෂොන්, කෝහාත් හා
මෙරාරීය.[14] ඒ එක් එක් පුත්‍රයාගේ
නමින් පෙළපත්[15] බිහි විය. ලෙවී අවු-
රුදු එකසිය තිස්හතක් ජීවත් විය.
**17** ගේර්ෂොන්ගේ පුත්‍රයන්ගේ
නම් මේවාය. ලිබ්නි හා ෂිමෙයිය.[16]
ඒ එක් එක් පුත්‍රයාගෙන් පවුල් බිහි
විය.[17]

**18** කෝහාත්ගේ පුත්‍රයෝ නම්
අම්රාම්, ඉෂ්හාර්, හෙබ්‍රොන් හා උස්-
සියෙල්ය.[1] කෝහාත් අවුරුදු එක-
සිය තිස්තුනක් ජීවත් විය.
**19** මෙරාරීගේ පුත්‍රයෝ නම් මාලී
හා මූෂීය.[2]
ලෙවී ගෝත්‍රයට අයත් පවුල්
ඒවාය.[3]
**20** අම්රාම් තම පියාගේ සහෝද-
රිය වූ යොකෙබෙද්ව විවාහ කරගත්-
තේය.[4] පසුව ඇය ආරොන්ව හා
මෝසෙස්ව බිහි කළාය.[5] අම්රාම් අවු-
රුදු එකසිය තිස්හතක් ජීවත් විය.
**21** ඉෂ්හාර්ගේ පුත්‍රයෝ නම්
කෝරා,[6] නෙෆෙග් හා ෂික්රිය.
**22** උස්සියෙල්ගේ පුත්‍රයෝ නම්
මිෂායෙල්, එල්ෂාෆාන් හා සිත්රිය.[7]
**23** ආරොන් අම්නාදාබ්ගේ දියණිය
වූ එලිෂෙබාව විවාහ කරගත්තේය.
එලිෂෙබා නාෂොන්ගේ[8] සහෝදරිය
වූවාය. ඇය නාදාබ්, අබිහු, එලියාසර්
හා ඉතාමාර්ව බිහි කළාය.[9]
**24** කෝරාගේ පුත්‍රයෝ නම් අස්-
සීර්, එල්කානා හා අබියාසාෆ්ය.[10] ඒ
එක් එක් පුත්‍රයාගෙන් පවුල් බිහි
විය.[11]
**25** ආරොන්ගේ පුත්‍රයා වූ එලියා-
සර්,[12] පුතියෙල්ගේ දියණියක සමඟ
විවාහ විය. පසුව ඇය පිනෙහාස්ව[13]
බිහි කළාය.
ලෙවීවරුන්ගේ පෙළපත්වල ප්‍රධා-
නියෝ ඔවුහුය.[14]
**26** "ඊශ්‍රායෙල්වරුන්ව කණ්ඩා-
යම්* වශයෙන් ඊජිප්තු දේශයෙන් පිට-
තට ගෙන එන්න"[15] කියා යෙහෝවා
දෙවි කීවේ ඉහත සඳහන් වූ ආරොන්ට
හා මෝසෙස්ටය.[16] **27** ඊශ්‍රායෙල්ව-
රුන්ව ඊජිප්තුවෙන් පිටතට ගෙන
එන පිණිස ඊජිප්තුවේ රජු වූ පාරාවෝ
සමඟ කතා කළේද ඔවුහුය.[17]
**28** ඊජිප්තු දේශයේදී යෙහෝවා
දෙවි මෝසෙස්ට කතා කළේය.[18]
**29** එදින යෙහෝවා දෙවි, මෝ-
සෙස්ට මෙසේ කීවේය. "මා යෙහෝවා

**6 පරි.**
1 නික් 5:21
2 නික් 1:8
3 නික් 3:10; නික් 5:1
4 නික් 5:21; නික් 6:9
5 නික් 5:2
6 නික් 4:10; යෙරෙ 1:6; ක්‍රියා 7:22
7 නික් 7:4; නික් 9:13
8 උත් 49:3
9 උත් 46:9
10 ගණන් 26:7; යොෂු 13:15
11 1ලේක 4:24
12 ගණන් 26:14; යොෂු 21:9
13 උත් 29:34; 1ලේක 6:1
14 උත් 46:11
15 ගණන් 26:57
16 1ලේක 23:7
17 ගණන් 3:18

**2 තීරුව**
1 ගණන් 3:19; 1ලේක 23:12
2 ගණන් 3:20; 1ලේක 23:21
3 යොෂු 21:40; 1ලේක 6:19
4 නික් 2:1; ගණන් 26:59
5 1ලේක 23:13
6 ගණන් 16:1; ගණන් 16:32; ගණන් 26:10
7 ලෙවී 10:4; ගණන් 3:30
8 රූත් 4:20; මතෙ 1:4
9 ගණන් 3:2
10 ගණන් 26:11; 1ලේක 6:37
11 ගණන් 26:58; 1ලේක 9:19
12 ගණන් 3:32
13 ගණන් 25:7; ගණන් 31:6; යොෂු 22:31; විනි 20:28
14 නික් 6:19
15 නික් 7:4; නික් 12:41; ක්‍රියා 7:35
16 යොෂු 24:5; 1සාමු 12:6
17 නික් 33:1; ගීතා 77:20; මීකා 6:4
18 නික් 6:1

නික් **6:12*** මූ.අ., "අචර්මච්ඡේදිත තොල් තිබෙන."

නික් **6:26*** මූ.අ., "සේනා."

දෙවිය.[1] මා ඔබට කියන සෑම දෙ-
යක්ම ඊජිප්තුවේ රජු වන පාරාවෝට
කියන්න.” **30** එවිට මෝසෙස් යෙ-
හෝවා දෙවිට මෙසේ කීවේය.
“හොඳට කතා කළ නොහැකි* මා
වැනි කෙනෙකුට පාරාවෝ ඇහුම්කන්
දෙයිද?”[2]

**7** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. “මම ඔබව
පාරාවෝ ඉදිරියේ දෙවි කෙ-
නෙකු මෙන්* වීමට සලස්වන්නෙමි.[3]
ඔබේම සහෝදරයා වන ආරොන්
අනාගතවක්තෘවරයෙකු ලෙස ඔබ
වෙනුවෙන් කතා කරන්නේය.[4]
**2** මා ඔබට අණ කරන සෑම දෙ-
යක්ම ඔබේ සහෝදරයා වන
ආරොන්ට කියන්න.[5] පාරාවෝ ඉදි-
රියේ කතා කළ යුත්තේ ඔහුයි.[6]
පාරාවෝ, ඊශ්‍රායෙල් සෙනඟව මේ දේ-
ශයෙන් පිටතට යවන බව මම ස්ථිර-
වම දනිමි.[7] **3** එහෙත් ඊට කලින්
ඔහු තම සිත මුරණ්ඩු කරගන්නේය.
ඔහුට එසේ කිරීමට මම ඉඩහරින්-
නෙමි.[8] ඉන්පසු මම ඊජිප්තු දේශයේදී
බොහෝ ලකුණු පෙන්වන්නෙමි. දේ-
ශය පුරා බොහෝ ආශ්චර්යයන්ද
සිදු කරන්නෙමි.[9] **4** එහෙත් පාරා-
වෝ ඔබ දෙදෙනාට සවන් නොදෙන්-
නේය.[10] ඒ නිසා මම ඊජිප්තුවේ
වැසියන්ට විරුද්ධව මාගේ මහත්
බලය* විදහාපෙන්වන්නෙමි. ඔවුන්ට
දැඩි ලෙස දඬුවම්[11] කර මහත් සේ-
නාවක්[12] බඳු මගේ සෙනඟ වන
ඊශ්‍රායෙල්වරුන්ව[13] ඊජිප්තු දේශයෙන්
පිටතට ගෙනෙන්නෙමි.[14] **5** ඊජිප්-
තුවේ වැසියන්ට විරුද්ධව මාගේ
මහත් බලය* විදහාපෙන්වන විට
මා යෙහෝවා දෙවි බව ඊජිප්තුවරු
අනිවාර්යයෙන්ම දැනගනු ඇත.[15]
මම ඊශ්‍රායෙල් පුත්‍රයන්ව ඊජිප්තු දේ-
ශයෙන් පිටතට ගෙනෙන්නෙමි.”[16]
**6** පසුව මෝසෙස් සහ ආරොන් යෙ-
හෝවා දෙවි කී ලෙස කළෝය.[1] ඔවුහු
දෙවි අණ කළ ලෙසම කළෝය.[2]
**7** පාරාවෝ සමඟ කතා කළ අවස්-
ථාව වන විට මෝසෙස්ට වයස අවු-
රුදු අසූවක්ද ආරොන්ට වයස අවුරුදු
අසූතුනක්ද විය.[3]

**8** යෙහෝවා දෙවි මෝසෙස්ට
සහ ආරොන්ට මෙසේ කීවේය.
**9** “‘ආශ්චර්යයක් කර පෙන්වන්න’[4]
කියා පාරාවෝ පැවසුවොත්, ‘පාරා-
වෝ ඉදිරියේ සැරයටිය[5] බිමට
විසි කරන්න’ කියා ඔබ ආරොන්ට
කියන්න. එවිට සැරයටිය විශාල සර්-
පයෙක් බවට පත් වෙයි.”[6] **10** පසුව
මෝසෙස් සහ ආරොන් පාරාවෝ ඉදි-
රියට ගොස් යෙහෝවා දෙවි ඔවුන්ට
අණ කළ ලෙසම කළෝය. පාරා-
වෝ හා ඔහුගේ සේවකයන් ඉදිරියේ
ආරොන් තම සැරයටිය බිමට විසි
කළ විට එය විශාල සර්පයෙකු බවට
පත් විය. **11** එවිට පාරාවෝ ඊජිප්තු
දේශයේ සිටි ප්‍රඥාවන්තයන්වද කට්-
ටඩියන්වද[7] එතැනට කැඳෙව්වේය.
කට්ටඩියෝ තම මන්තර බලය යො-
දාගෙන ආරොන් කළ දේම කළෝය.[8]
**12** ඔවුහු එක් එක් කෙනා තම තමා-
ගේ සැරයටිය බිමට විසි කළෝය.
එවිට ඒවා සියල්ලද විශාල සර්පයන්
බවට පත් විය. නමුත් ආරොන්ගේ
සැරයටිය ඔවුන්ගේ සැරයටි ගිල දැමු-
වේය. **13** එහෙත් යෙහෝවා දෙවි
කී ලෙසම පාරාවෝ තම සිත තව
තවත් මුරණ්ඩු කරගත් බැවින්[9] ඔහු
මෝසෙස් හා ආරොන් කී දේට සවන්
දුන්නේ නැත.

**14** එවිට යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. “පාරාවෝගේ
සිත දැඩි වී ඇත.[10] ඔහු සෙනඟට
යන්න නොදෙන්නේ ඒ නිසයි.[11]
**15** හෙට උදේට ඔබ නැවත පාරා-
වෝ හමු වීමට යන්න. ඔහු නයිල්
ගඟ ළඟට පැමිණෙයි.[12] ඔබ ගං-
ඉවුරට වී ඔහු එන තුරු බලා
සිටින්න.[13] මා කලින් වතාවේ සර්ප-
යෙකු බවට පත් කළ ඔබේ සැරයටි-
යත් රැගෙන යන්න.[14] **16** ඔබ ඔහුට

**6 පරි.**
**1** නික් 6:2
**2** නික් 4:10
නික් 6:12

**7 පරි.**
**3** නික් 4:16
ගීතා 82:6
**4** නික් 4:15
නික් 4:30
**5** නික් 4:12
**6** නික් 4:15
**7** නික් 6:11
**8** නික් 4:21
නික් 8:15
නික් 9:12
රෝම 9:18
**9** නික් 3:20
නික් 11:9
ගීතා 105:27
ක්‍රියා 7:36
**10** නික් 9:35
**11** නික් 6:6
නික් 12:12
**12** නික් 5:1
**13** නික් 6:11
**14** නික් 12:51
**15** නික් 3:19
නික් 8:19
නික් 8:22
නික් 14:4
ගීතා 83:18
**16** නික් 3:20

**2 තීරුව**
**1** නික් 4:28
**2** උත් 6:22
නික් 12:28
**3** ද්වි 34:7
ක්‍රියා 7:23
**4** යෙසා 7:11
මතෙ 12:39
යොහ 6:30
**5** නික් 4:2
නික් 9:23
**6** නික් 4:3
**7** උත් 41:8
යෙසා 19:11
යෙරෙ 27:9
දානි 2:2
2තිමෝ 3:8
එළි 21:8
**8** නික් 7:22
නික් 8:18
නික් 9:11
ක්‍රියා 8:9
2තෙස 2:9
**9** නික් 4:21
නික් 7:3
නික් 8:15
රෝම 9:18
**10** නික් 10:1
1සාමු 6:6
**11** නික් 10:20
**12** නික් 2:5
නික් 8:20
**13** නික් 9:13
**14** නික් 4:3

---

නික් **6:30*** නික් 6:12හි පාදසටහන බලන්න. **7:1*** නික් 4:16හි පාදසටහන බලන්න. **4*** නික් 3:19හි පාදසටහන බලන්න. **5*** නික් 3:19හි පාදසටහන බලන්න.

මෙසේ කියන්න. 'මාව ඔබ ළඟට එව්-
වේ හෙබ්‍රෙව්වරුන්ගේ දෙවි වන යෙ-
හෝවාය.[1] "මට නමස්කාර කරන
පිණිස මගේ සෙනඟට පාළුකරයට
යන්න දෙන්න"[2] කියා දෙවි ඔබට
කීවේය. නමුත් ඔබ ඔහු කියූ දේ ඇසු-
වේ නැත. **17** දැන් යෙහෝවා දෙවි
ඔබට මෙසේ කියන්නේය.[3] "මා යෙ-
හෝවා දෙවි බව මා කරන්න යන මේ
දෙයින් ඔබ දැනගන්නෙහිය.[4] සැර-
යටියෙන් මම නයිල් ගඟේ වතු-
රට පහර දෙමි.[5] එවිට එහි වතුර
ලේ බවට හැරෙන්නේය.[6] **18** නයිල්
ගඟේ සියලු මසුන් මැරී,[7] ගඟෙන්
දුගඳක් හමනු ඇත.[8] එවිට ඊජිප්තුවරු
ගඟේ වතුර බීමට පිළිකුල් කරනු
ඇත."' "[9]

**19** යෙහෝවා දෙවි මෝසෙස්ට
තවදුරටත් මෙසේ කීවේය. "ආ-
රොන්ට මෙසේ කියන්න. 'ඊජිප්තු දේ-
ශයේ සියලු ගංගා, ඇළදොළ* හා
පොකුණුවල[10] තිබෙන වතුර ලේ
බවට හැරෙන පිණිස ඔබේ සැරයටිය
ජලය තිබෙන සෑම තැනකටම දිගු
කරන්න.'[11] එවිට ඊජිප්තු දේශයේ
සෑම තැනකම ලේ දකින්න ලැබෙයි.
ලීවලින් හා ගල්වලින් සෑදූ සෑම
භාජනයකම ලේ තිබේවි." **20** මෝ-
සෙස් හා ආරොන් යෙහෝවා දෙවි
අණ කළ පරිදි[12] කළෝය.[13] පාරා-
වෝ හා ඔහුගේ සේවකයන් ඉදි-
රියේ ආරොන් තම සැරයටියෙන්
නයිල් ගඟේ වතුරට ගැසුවේය.[14]
එවිට නයිල් ගඟේ වතුර ලේ බවට
හැරුණේය.[15] **21** ගඟේ සිටි සියලු
මත්ස්‍යයෝද මිය ගියෝය.[16] ගඟෙන්
දුගඳක්ද හමන්න පටන්ගත්තේය.
ඊජිප්තුවරුන්ට ගඟේ වතුර බීමට
නොහැකි විය.[17] ඊජිප්තු දේශයේ සෑම
තැනකම ලේ දක්නට ලැබිණ.

**22** නමුත් ඊජිප්තුවේ මන්තර ගුරු-
කම් කරන පූජකයෝද ඔවුන්ගේ
මන්තර බලය යොදාගෙන එලෙසම
කළෝය.[1] එහෙයින් පාරාවෝ තම
සිත තව තවත් මුරණ්ඩු කරගත්-
තේය.[2] යෙහෝවා දෙවි කී ලෙ-
සම ඔහු මෝසෙස්ට හා ආරොන්ට
සවන් දුන්නේ නැත.[3] **23** ඒ ආශ්-
චර්යය පවා ගණනකට නොගත්[4] ඔහු
තම මාලිගාව වෙතට හැරී ගියේය.
**24** නයිල් ගඟේ වතුර බීමට නොහැකි
වූ නිසා සියලු ඊජිප්තුවරු වතුර සො-
යමින් නයිල් ගඟ වටේ වළවල් හෑරු-
වෝය.[5] **25** යෙහෝවා දෙවි නයිල්
ගඟට පහර දී දවස් හතක් ගත විය.

**8** පසුව යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. "පාරාවෝ ළඟට
ගොස් මෙසේ කියන්න. 'යෙහෝවා
දෙවි ඔබට මෙසේ පවසන්නේය.
"මට නමස්කාර කරන පිණිස මගේ
සෙනඟට යන්න දෙන්න.[6] **2** ඔබ
ඔවුන්ට යන්න නොදුන්නොත් මැඩි
වසංගතයකින් මම ඔබේ මුළු දේ-
ශයටම පහර දෙන්නෙමි.[7] **3** එවිට
නයිල් ගඟ මැඩියන්ගෙන් පිරී ඉතිරී
යනු ඇත. උන් ගඟෙන් එළියට ඇවිත්
ඔබේ මාලිගාවටද ඔබේ නිදන කාමර-
යටද ඔබේ යහනටද ඔබේ සේවක-
යන්ගේ ගෙවල්වලටද පනින්නෝය.
ඔබේ සෙනඟගේ ඇඟටද ඔබේ උඳුන්
හා පිටි භාජන තුළටද උන් පනින්-
නෝය.[8] **4** උන් ඔබේ ඇඟටත් ඔබේ
සෙනඟගේ හා ඔබේ සියලු සේවක-
යන්ගේ ඇඟටත් පනිනු ඇත."' "[9]

**5** යෙහෝවා දෙවි මෝසෙස්ට
තවදුරටත් මෙසේ කීවේය. "'ඊජිප්තු
දේශය මැඩියන්ගෙන් පිරී යන පිණිස
එහි ඇළදොළ,* ගංගා හා පො-
කුණු දෙසට ඔබේ සැරයටිය[10] දිගු
කරන්න' කියා ආරොන්ට කියන්න."
**6** ආරොන්ද ඊජිප්තු දේශයේ ජලාශ
දෙසට තම අත දිගු කළේය.
එවිට මැඩියෝ වතුරෙන් මතු වී
මුළු දේශය පුරාම පැතිර ගියෝය.
**7** එහෙත් මන්තර ගුරුකම් කරන
පූජකයෝද තම මන්තර බලයෙන්
ඊජිප්තු දේශයෙහි මැඩියන් ඇති වීමට

**7 පරි.**
**1** නික් 3:18, නික් 9:1, රෝම 3:29
**2** නික් 5:1
**3** 1රාජා 20:28
**4** නික් 7:5, නික් 8:22, එස 25:17
**5** නික් 4:9
**6** ගීතා 78:44
**7** ගීතා 105:29
**8** යෙසා 50:2
**9** නික් 7:24
**10** නික් 8:5
**11** නික් 9:22, නික් 10:12, නික් 14:21
**12** නික් 4:28
**13** නික් 7:6, නික් 12:28
**14** නික් 17:5
**15** ගීතා 78:44
**16** ගීතා 105:29
**17** නික් 7:18, නික් 7:24

**2 තීරුව**
**1** නික් 7:11, නික් 8:7, දානි 1:20, ක්‍රියා 8:9, 2කොරි 11:14, 2තිමෝ 3:8
**2** නික් 4:21, නික් 8:15, රෝම 9:18
**3** නික් 3:19
**4** නික් 9:21, හිතෝ 29:1, යෙරෙ 5:3
**5** නික් 7:18

**8 පරි.**
**6** නික් 3:12, නික් 5:1
**7** නික් 12:12, යොෂු 24:5, ගීතා 78:45
**8** නික් 12:34, ගීතා 105:30
**9** දානි 4:37
**10** නික් 4:20, නික් 17:9

**නික් 7:19*** මූ.අ., "නයිල් ගඟේ වතුර ලබාගැනීම සඳහා කපා ඇති ඇළ මාර්ග."

**නික් 8:5*** නික් 7:19හි පාදසටහන බලන්න.

සැලැස්වූවෝය.[1] **8** පසුව පාරාවෝ
මෝසෙස්ව හා ආරොන්ව කැඳවා
මෙසේ කීවේය. "ඔබ යෙහෝවා දෙ-
විට කන්නලව් කර[2] මා වටාත් මගේ
සෙනඟ වටාත් සිටින මේ මැඩියන්ව
නැති කර දමන්න කියා කියන්න.
ඔබේ දෙවි වන යෙහෝවාට පූජා
ඔප්පු කිරීමට මම ඔබේ සෙනඟට
යන්න දෙන්නම්."[3] **9** එවිට මෝ-
සෙස්, පාරාවෝට මෙසේ කීවේය.
"ඔබ වටාත් ඔබේ නිවෙස්වලත් සිටින
මැඩියන්ව නයිල් ගඟට පමණක්
සීමා කරන පිණිස ඔබ වෙනුවෙනුත්
ඔබේ සේවකයන් හා ඔබේ සෙ-
නඟ වෙනුවෙනුත් මම කන්නලව්
කළ යුත්තේ කවදාද කියා ඔබ
මට කියන්න." **10** පාරාවෝ පිළි-
තුරු දෙමින්, "හෙටම අපි වෙනුවෙන්
කන්නලව් කරන්න" කියා කීවේය.
මෝසෙස්ද, "ඔබ කියූ ලෙසම සිදු
වෙයි. එසේ සිදු වෙන්නේ අපේ දෙවි
වන යෙහෝවාට සමාන තවත් දෙවි
කෙනෙක් නැති බව ඔබ දැනගන්නා
පිණිසයි.[4] **11** මැඩියෝ ඔබෙන් හා
ඔබේ ගෙවල්වලින්ද ඔබේ සේවක-
යන්ගෙන්ද ඔබේ සෙනඟගෙන්ද ඉවත්
වී යයි. උන් ගඟට පමණක් සීමා
වෙයි."[5]

**12** මෝසෙස් හා ආරොන්, පාරා-
වෝ ඉදිරියෙන් පිටත්ව ගියෝය. ඉන්-
පසු මෝසෙස්, පාරාවෝ වෙතින්
මැඩියන් ඉවත් කරන ලෙස යෙ-
හෝවා දෙවිට කන්නලව් කළේය.[6]
**13** යෙහෝවා දෙවිද මෝසෙස්ගේ
කන්නලව්වට සවන් දුන්නේය.[7] එවිට
ගෙවල්වල, මිදුල්වල හා වතුපිටි-
වල සිටි මැඩියෝ මිය ගියෝය.
**14** ජනයා උන්ව එකතු කර සෑම
තැනකම ගොඩ ගැසූහ. මුළු දේ-
ශය පුරාම දුගඳක් පැතිර ගියේය.[8]
**15** මැඩි වසංගතයෙන් සහනයක්
ලැබූ බව දුටු පාරාවෝ, යෙහෝවා
දෙවි කී ලෙසම තම සිත මුරණ්ඩු
කරගත්තේය.[9] ඔහු මෝසෙස්ට හා
ආරොන්ට සවන් දුන්නේ නැත.[10]

**16** එහෙයින් යෙහෝවා දෙවි
නැවත මෝසෙස්ට මෙසේ කීවේය.
"ආරොන්ට මෙසේ කියන්න. 'ඔබේ
සැරයටියෙන්[1] පොළොවට ගසන්න.
එවිට ඊජිප්තු දේශය පුරාම ඇති දූවිලි,
වැලි මැක්කන් බවට පත් වෙයි.'"
**17** ඔවුහුද එලෙස කළෝය. ආරොන්
තම සැරයටියෙන් පොළොවට ගැසූ
විට දේශය පුරා තිබූ දූවිලි, වැලි
මැක්කන් බවට හැරුණේය.[2] උන්
මිනිසුන්ගේ හා සතුන්ගේ ඇඟට
නැග්ගෝය. **18** මන්තර ගුරුකම්
කරන පූජකයන්ද තම මන්තර බලය
යොදාගෙන[3] දූවිල්ල, වැලි මැක්කන්
බවට පත් කරන්න වෑයම් කළත්
ඔවුහු අසාර්ථක වූහ.[4] වැලි මැක්කෝ
මිනිසුන්ගේද සතුන්ගේද ඇඟවල්-
වල සිටියෝය. **19** මන්තර ගුරු-
කම් කරන පූජකයෝ එය දැක, "මෙය
දෙවිගේ[5] බලයෙන්*[6] කළ දෙයක්"
කියා පාරාවෝට කීවෝය. නමුත් යෙ-
හෝවා දෙවි කී ලෙසම පාරාවෝ තව
තවත් මුරණ්ඩු වී[7] ඔවුන් කී දේ ගණ-
නකටවත් නොගත්තේය.

**20** එවිට යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. "උදේ පාන්ද-
රින්ම නැඟිට පාරාවෝ ගඟ ළඟට
එන වේලාවේදී ඔහු හමු වීමට[8]
ගොස් ඔහුට මෙසේ කියන්න. 'යෙ-
හෝවා දෙවි ඔබට මෙසේ පැවසුවේය.
"මට නමස්කාර කරන පිණිස මගේ
සෙනඟට යන්න දෙන්න.[9] **21** ඔබ
ඔවුන්ට යන්න නොදෙන්නේ නම් මම
ඔබ පිටත් ඔබේ සේවකයන් හා ඔබේ
සෙනඟ පිටත් ඔබේ ගෙවල් ඇතුළ-
ටත් ගඩු මැස්සන්*[10] එවන්නෙමි.
එවිට ඊජිප්තුවරුන්ගේ ගෙවල්ද ඔවුන්
ජීවත් වන ප්‍රදේශයද ගඩු මැස්සන්-
ගෙන් පිරී යනු ඇත. **22** එහෙත්
මගේ සෙනඟ පදිංචි වී සිටින ප්‍රදේශය
වන ගෝෂෙන් මම ආරක්ෂා කරන්-
නෙමි. මා ඒ ප්‍රදේශයට ගඩු මැස්සන්ව
යවන්නේ නැත.[11] පොළොව පුරාම

**8 පරි.**
**1** නික් 7:11, නික් 7:22, නික් 8:18, 2තිමෝ 3:8
**2** උත් 20:7, නික් 10:17, ගණන් 21:7, 1රාජා 13:6, ක්‍රියා 8:24
**3** නික් 8:15, නික් 8:29, නික් 10:8, නික් 12:31
**4** නික් 9:14, නික් 15:11, 2සාමු 7:22, ගීතා 83:18, ගීතා 86:8, යෙසා 46:9, යෙරෙ 10:6, රෝම 9:17
**5** නික් 8:3
**6** නික් 8:30, නික් 9:33, යාකො 5:16
**7** ද්වි 34:10
**8** නික් 7:21
**9** නික් 4:21, නික් 7:3, හිතෝ 21:29, රෝම 9:18
**10** යෙසා 26:10, යෙරෙ 34:11

**2 තීරුව**
**1** නික් 17:9
**2** ගීතා 105:31
**3** නික් 7:11, නික් 9:11, ආනි 1:20, 2තිමෝ 3:8
**4** උත් 41:8, ආනි 2:10
**5** නික් 12:12
**6** නික් 31:18, මතෙ 12:28, ලූක් 11:20
**7** නික් 14:8, ද්වි 2:30, යොෂු 11:20, 1සාමු 6:6
**8** නික් 7:15
**9** නික් 8:1
**10** ගීතා 78:45, ගීතා 105:31
**11** නික් 9:4, නික් 10:23, නික් 11:7, නික් 12:13

**නික් 8:19*** මූ.අ., "දෙවිගේ ඇඟිල්ලෙන්."
**21*** අශ්වයන් ආදි සතුන්ගේ සිරුරෙහි වසන පරපෝෂිත කීටයෙකු ඇති මැසි වර්ගයකි.

බලය විදහාපෙන්වන මා, යෙහෝවා
දෙවි බව ඔබ දැනගන්නා පිණිස[1] මම
එසේ කරන්නෙමි. **23** මම මගේ
සෙනඟ ඔබේ සෙනඟගෙන් වෙන්
කරන්නෙමි.[2] හෙට දවසේදී ඔබට එය
දැකගන්න ලැබෙයි." ' "

**24** යෙහෝවා දෙවි තමා කී ලෙස
කළේය. පාරාවෝගේ මාලිගාවටත්
ඔහුගේ සේවකයන්ගේ ගෙවල්වල-
ටත් ඊජිප්තුවේ සියලු ප්‍රදේශවලටත්
ගඩු මැස්සෝ රංචු පිටින් ආවෝය.[3]
මැස්සන් නිසා දේශය නාස්ති
විය.[4] **25** අන්තිමේදී පාරාවෝ මෝ-
සෙස්ව සහ ආරොන්ව කැඳවා, "නුඹ-
ලාගේ දෙවිට මේ දේශයේ සිටම
නමස්කාර කරන්න"[5] කියා කීවේය.
**26** නමුත් මෝසෙස් ඔහුට මෙසේ
කීවේය. "අපට එසේ කරන්න බැහැ.
අපේ දෙවි වන යෙහෝවාට අපි ඔප්පු
කරන පූජා ඊජිප්තුවරුන්ට පිළිකුලක්
වෙයි.[6] අපි ඊජිප්තුවරුන්ගේ ඇස්
පනාපිටම එවැනි දෙයක් කළොත්
ඔවුන් අපට ගල් ගසයි. **27** ඒ නිසා
අපේ දෙවි වන යෙහෝවා කියූ ලෙස
අපි දවස් තුනකට පාළුකරයට ගොස්
ඔහුට පූජා ඔප්පු කරන්නම්."[7]

**28** එවිට පාරාවෝ ඔවුන්ට මෙසේ
කීවේය. "නුඹලාගේ දෙවි වන යෙ-
හෝවාට පූජා ඔප්පු කිරීමට මම
නුඹලාට පාළුකරයට[8] යන්න දෙන්-
නම්.[9] නමුත් ඊට වඩා දුර
යන්න එපා. දැන් මා වෙනුවෙන්
ඔබේ දෙවිට කන්නලව් කරන්න."[10]
**29** එය අසා මෝසෙස් ඔහුට මෙසේ
කීවේය. "මම දැන් මෙතැනින් පිටත්ව
ගොස් යෙහෝවා දෙවිට ඔබ වෙනු-
වෙන් කන්නලව් කරන්නම්. හෙට
දවස වන විට ඔබ වෙතිනුත් ඔබේ
සේවකයන් හා සෙනඟ වෙතිනුත්
ගඩු මැස්සෝ ඉවත් වී යන්නෝය.
නමුත් කලින් වතාවලදී මෙන් මේ
වතාවේදීත් ඔබ අපව රවටා, යෙ-
හෝවා දෙවිට නමස්කාර කිරීමට සෙ-
නඟට යන්න නොදී සිටින්න එපා."[11]
**30** එසේ කියා පාරාවෝ ඉදිරියෙන්
මෝසෙස් පිටත්ව ගොස් යෙහෝවා

**8 පරි.**
1 නික් 7:5, නික් 8:10, 1සාමු 17:46, 1රාජා 20:28, 2රාජා 19:19, එස 34:30
2 මලා 3:18
3 නික් 8:3
4 ගීතා 78:45, ගීතා 105:31
5 නික් 5:2, නික් 7:2
6 උත් 43:32, උත් 46:34, නික් 10:26
7 උත් 8:20, නික් 3:12, නික් 3:18, නික් 5:3
8 නික් 7:16
9 නික් 9:28
10 නික් 8:8, නික් 9:28, 1සාමු 12:19, ක්‍රියා 8:24
11 නික් 8:8, නික් 8:15, ගීතා 78:36, ගලා 6:7

**2 තීරුව**
1 නික් 9:33, යාකො 5:16
2 ගීතා 65:2
3 1රාජා 13:6
4 නික් 4:21, හිතෝ 28:14, ක්‍රියා 28:27, රෝම 2:5, රෝම 9:18

**9 පරි.**
5 නික් 5:1, නික් 8:1
6 නික් 4:23, නික් 8:2, ගීතා 68:21, හිතෝ 6:15
7 ගීතා 78:48
8 නික් 9:15, ගීතා 78:50, එස 14:21, ආමො 4:10
9 නික් 7:4, නික් 8:19, 1සාමු 5:7, ගීතා 39:10, ක්‍රියා 13:11
10 නික් 8:22, නික් 10:23, නික් 11:7, නික් 12:13, යෙසා 65:13, මලා 3:18
11 නික් 8:23, ගීතා 76:12
12 ගීතා 78:48

දෙවිට කන්නලව් කළේය.[1] **31** යෙ-
හෝවා දෙවිද මෝසෙස්ගේ ඉල්ලීම
ඉටු කළේය.[2] ගඩු මැස්සෝ පාරා-
වෝ වෙතින්ද ඔහුගේ සේවකයන් හා
ඔහුගේ සෙනඟ වෙතින්ද ඉවත්ව
ගියෝය.[3] එක මැස්සෙක්වත් ඉතුරු
නොවීය. **32** නමුත් පාරාවෝ මේ
වතාවේදීත් තම සිත මුරණ්ඩු කර-
ගත්තේය. ඔහු සෙනඟට යන්න නො-
දුන්නේය.[4]

**9** ඉන්පසු යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. "ඔබ
පාරාවෝ ළඟට ගොස් මෙසේ
කියන්න.[5] 'හෙබ්‍රෙව්වරුන්ගේ දෙවි
වන යෙහෝවා මෙසේ පැවසුවේය.
"මට නමස්කාර කරන පිණිස මගේ
සෙනඟට යන්න අවසර දෙන්න.
**2** නමුත් ඔබ දිගටම මට සවන්
නොදී ඔවුන්ට යන්න නොදුන්නොත්[6]
**3** යෙහෝවා දෙවි වන මම* ඔබේ
අශ්වයන්ටද බූරුවන්ටද ඔටුවන්-
ටද ගවයන්ටද බැටළුවන්ටද[7] දරුණු
වසංගතයකින්[8] පහර දෙන්නෙමි.[9]
**4** යෙහෝවා දෙවි වන මම, ඊජිප්තුව-
රුන්ගේ සත්ව රැළට පහර දුන්නත්
ඊශ්‍රායෙල්වරුන්ගේ සත්ව රැළට පහර
නොදෙන්නෙමි. ඊශ්‍රායෙල් ජනයාට
අයිති එක සතෙක්වත් විනාශ වන්නේ
නැත." ' "[10] **5** වසංගතය ගෙනෙන
දවස නියම කරමින් යෙහෝවා දෙවි
මෙසේ කීවේය. "යෙහෝවා දෙවි වන
මා ඒ දේ කරන්නේ හෙට දිනයේ-
දීය."[11]

**6** පසුවදා යෙහෝවා දෙවි තමා
කී ලෙසම සත්ව රැළට පහර දුන්-
නේය. ඊජිප්තුවරුන්ගේ සියලු සත්-
වයන් මැරුණු[12] නමුත් ඊශ්‍රායෙල්
පුත්‍රයන්ගේ එක සතෙක්වත් මැරුණේ
නැත. **7** ඊශ්‍රායෙල්වරුන්ගේ සත්ව
රැළට සිදු වූයේ කුමක්ද කියා විමසා
බලන පිණිස පාරාවෝ තම සේවක-
යන්ව යැව්වේය. ඔවුන්ගේ එක සතෙ-
කුවත් විනාශ වී නැති බව ඔහුට
දැනගන්න ලැබිණ. නමුත් පාරාවෝ

---
නික් **9:3*** නික් 3:19හි පාදසටහන බලන්න.

දිගටම මුරණ්ඩු ලෙස ක්‍රියා කළේය.[1]
ඔහු සෙනඟට යන්න නොදුන්නේය.
**8** යෙහෝවා දෙවි මෝසෙස්ට හා
ආරොන්ට මෙසේ කීවේය. “අත් දෙක
පිරෙන්න පෝරණුවකින්[2] අළු ගන්න.
ඉන්පසු මෝසෙස් ඒවා පාරාවෝ ඉදි-
රියේ අහසට විසි කළ යුතුයි. **9** ඒ
අළු, දූවිලි මෙන් මුළු ඊජිප්තු දේශය
පුරාම පැතිරෙන්නේය. එවිට ඊජිප්තු
දේශයේ ජීවත් වන සියලු මනුෂ්‍යයන්-
ගේ හා සතුන්ගේ ශරීරවල සැරව
ගෙඩි[3] හටගනු ඇත.”
**10** ඔවුහු පෝරණුවකින් අළු ගෙන
පාරාවෝ ඉදිරියට ගියෝය. මෝ-
සෙස් ඒ අළු අහසට විසි කළේය.
එවිට මනුෂ්‍යයන්ගේ හා සතුන්ගේ
ශරීර පුරා සැරව ගෙඩි[4] හටගත්තේය.
**11** මන්තර ගුරුකම් කරන පූජක-
යන්ට මෝසෙස් ඉදිරියට පැමිණී-
මට නොහැකි වන තරමට ඔවුන්ගේ
ශරීර පුරා සැරව ගෙඩි හටගෙන
තිබිණ. සියලුම ඊජිප්තුවරුන්ගේ ශරී-
රවල සැරව ගෙඩි හටගත්තේය.[5]
**12** එහෙත් යෙහෝවා දෙවි, මෝ-
සෙස්ට කී ලෙසම පාරාවෝ ඔවුන්ට
සවන් දුන්නේ නැත. පාරාවෝ මෙව-
රද තම සිත මුරණ්ඩු කරගත්තේය.[6]
යෙහෝවා දෙවිද එයට ඉඩහැරියේය.
**13** එවිට යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. “ඔබ උදේ
පාන්දරින්ම නැඟිට පාරාවෝ ඉදිරි-
යට ගොස්[7] මෙසේ කියන්න. ‘හෙ-
බ්‍රෙව්වරුන්ගේ දෙවි වන යෙහෝවා
මෙසේ පවසන්නේය. “මට නමස්-
කාර කරන පිණිස මගේ සෙනඟට
යන්න දෙන්න.[8] **14** ඔබ එසේ නො-
කළොත් මම ඔබටත් ඔබේ සේව-
කයන්ටත් ඔබේ සෙනඟටත් සෑම
පීඩාවකින්ම පහර දෙන්නෙමි. මා
එසේ ක්‍රියා කරන්නේ මට සමාන කිසි
දෙවි කෙනෙක් මේ පොළොවේ කො-
තැනකවත් නැති බව ඔබ දැන-
ගන්නා පිණිසයි.[9] **15** ඔබටත් ඔබේ
සෙනඟටත් වසංගතයකින් පහර දී
මේ පොළෝතලයෙන් ඔබව නැත්ත-
ටම නැති කර දමන්න මට හැකිකම
තිබිණ.[1] **16** නමුත් මා මේ වන
තුරු ඔබට ජීවත් වීමට ඉඩහැරියේ[2]
ඔබට මගේ බලය දැකගැනීමට හැකි
වන පිණිසත් මාගේ නාමය පො-
ළොවේ සිටින සියල්ලන් දැනගන්නා
පිණිසත්ය.[3] **17** ඔබ තවමත් මගේ
සෙනඟට යන්න නොදී අහංකාර ලෙස
ක්‍රියා කරන්නෙහිද?[4] **18** මම හෙට
මේ වේලාවේදී මහා හිම කැට වර්ෂා-
වක් දේශය මතට ඇද හැළෙන්න
සලස්වන්නෙමි. එවැනි වර්ෂාවක් මීට
පෙර කිසි දිනක ඊජිප්තු දේශයට ඇද
හැළුණේ නැත.[5] **19** දැන් සේවක-
යන් යවා එළිමහනේ සිටින ඔබේ
සතුන්ව හා ඔබට අයිති සෑම දෙ-
යක්ම ආරක්ෂිත ස්ථානයකට ගෙන්-
වාගන්න. මන්ද එළිමහනේ සිටින
ඕනෑම මනුෂ්‍යයෙක් හෝ සතෙක් හිම
කැට වර්ෂාවට[6] හසු වී මිය යනු
ඇත.”’”
**20** පාරාවෝගේ සේවකයන් අත-
රින් යෙහෝවා දෙවි කී දේට භය වූ
අය තම සේවකයන්ව හා සත්ව රැළ
ගෙට ගත්තෝය.[7] **21** නමුත් යෙ-
හෝවා දෙවි කී දේ නොතැකූ අය තම
සේවකයන්ට හා සත්ව රැළට එළිම-
හනේ සිටීමට ඉඩහැරියෝය.[8]
**22** පසුව යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. “ඊජිප්තු දේ-
ශය පිටට එනම්, එහි සියලු වැසියන්,
සත්වයන් හා වගාබිම් පිටට හිම
කැට[9] වැටෙන පිණිස ඔබේ අත අහස
දෙසට දිගු කරන්න.”[10] **23** මෝ-
සෙස්ද තම සැරයටිය අහස දෙසට
දිගු කළේය. එවිට යෙහෝවා දෙවි
ගර්ජනා හා අකුණු සැර මැද මහා
හිම කැට වර්ෂාවක්[11] ඇද හැළෙන්න
සැලැස්වූවේය. මෙසේ, යෙහෝවා
දෙවි ඊජිප්තු දේශය පිටට මහා හිම
කැට වර්ෂාවක් ගෙනාවේය. **24** එය
ඉතා දරුණු වර්ෂාවක් විය. අකුණු
සැර මැද පොළොවට හිම කැට
ඇද හැළුණේය. මින් පෙර කවදා-
වත් ඊජිප්තු දේශය මතට ඒ හා
සමාන වර්ෂාවක් ඇද හැලී තිබුණේ
නැත.[12] **25** හිම කැට වර්ෂාව මුළු

**9 පරි.**
**1** නික් 4:21, 1සාමු 6:6, යෝබ් 9:4, හිතෝ 29:1, ආනි 5:20, රෝම 9:18
**2** උත් 11:3, උත් 19:28
**3** ලෙවී 13:18, ද්වි 28:35, යෝබ් 2:7
**4** ද්වි 28:27
**5** නික් 7:11, නික් 8:18, 2තිමෝ 3:8
**6** නික් 4:21, නික් 8:32, නික් 14:17, යොෂු 11:20, 2ලේක 36:13, ගීතා 75:5
**7** නික් 7:15
**8** නික් 7:16
**9** නික් 8:10, ද්වි 33:26, 2සාමු 7:22, ගීතා 71:19, ගීතා 83:18, යෙසා 45:5, යෙසා 46:9, යෙරෙ 10:7

**2 තීරුව**
**1** නික් 3:20, නික් 9:3
**2** නික් 14:17, හිතෝ 16:4
**3** යොෂු 2:10, 1ලේක 16:24, යෙසා 63:12, මලා 1:11, රෝම 9:17
**4** යෝබ් 9:4, යෙසා 37:23
**5** ගීතා 78:47, ගීතා 105:32
**6** යොෂු 10:11
**7** හිතෝ 22:3, යෝනා 3:5
**8** නික් 7:23
**9** නික් 10:5, යෝබ් 38:22, ගීතා 78:47, ගීතා 105:32
**10** නික් 7:19, නික් 8:5
**11** ගීතා 148:8, යෙසා 30:30
**12** නික් 9:18

ඊජිප්තු දේශය පුරාම ඇති විය. ඒ
නිසා එළිමහනේ සිටි මනුෂ්‍යයෝද
සත්වයෝද සම්පූර්ණයෙන්ම විනාශ
වූහ. එමෙන්ම සියලු වගාබිම්ද සියලු
ගස් කොළන්ද විනාශ වී ගියේය.[1]
**26** ඊශ්‍රායෙල් ජනයා ජීවත් වූ ගෝ-
ෂෙන් දේශයට පමණක් ඒ වර්ෂාව ඇද
හැළුණේ නැත.[2]

**27** පසුව පාරාවෝ පණිවිඩයක්
යවා මෝසෙස්ව හා ආරොන්ව තමා
වෙතට කැඳවා මෙසේ කීවේය. “මා
පාපයක් කළ බව පිළිගන්නවා.[3] යෙ-
හෝවා දෙවියන් ධර්මිෂ්ඨයි.[4] වරද
මගේ හා මගේ සේවකයන්ගේ අතෙයි.
**28** යෙහෝවා දෙවියන්ට කන්නලව්
කර ගිගුරුම් හඬ දෙමින් ඇද හැළෙන
මේ හිම කැට වර්ෂාව නතර
කරන්න කියා කියන්න.[5] මම ඔහු-
ගේ සෙනඟට මේ දේශයෙන් පිටව
යන්න අවසර දෙන්නම්.” **29** මෝ-
සෙස්ද පාරාවෝට මෙසේ කීවේය.
“මම නුවරින් පිටත්ව ගිය විගසම
මගේ අත් ඔසවා යෙහෝවා දෙ-
විට කන්නලව් කරන්නම්.[6] එවිට
ගිගුරුම් දෙමින් ඇද හැළෙන මේ
වර්ෂාව නතර වෙයි. එසේ සිදු වෙන්-
නේ පොළොවේ අයිතිකරු යෙහෝවා
දෙවි බව ඔබ දැනගන්නා පිණිසයි.[7]
**30** නමුත් ඒ සියල්ල සිදු වූ පසුවද
ඔබත් ඔබේ සේවකයනුත් යෙහෝවා
දෙවිට ගරුබිය නොදක්වන බව මම
හොඳාකාරව දන්නවා.”[8]

**31** ඒ දවස්වල බාර්ලි කරල් හට-
ගෙන තිබූ අතර හණ පැළෑටිවල*
මල් පීදී තිබිණ.[9] ඒ සියල්ල හිම
කැට වර්ෂාවෙන් නාස්ති වී ගියේය.
**32** නමුත් ඒ වන විට තිරිඟු හා
තණ හාල්*[10] කරල් හටගෙන නොති-
බුණු නිසා ඒවා නාස්ති නොවීය.
**33** මෝසෙස්, පාරාවෝ ඉදිරියෙන්
පිටත්ව ගියේය. ඔහු නුවරින් පිටතට
ගොස් තම අත් ඔසවා යෙහෝවා
දෙවිට කන්නලව් කළේය. එවිට ගිගු-
රුම් දෙමින් ඇද හැළුණු හිම කැට වර්-
ෂාව සම්පූර්ණයෙන්ම නතර විය.[1]
**34** වර්ෂාව නතර වූ බව දුටු පාරාවෝ
නැවත වරක් තම සිත මුරණ්ඩු කරග-
නිමින් පව් කළේය.[2] ඔහුගේ සේ-
වකයෝද එලෙස ක්‍රියා කළෝය.
**35** යෙහෝවා දෙවි, මෝසෙස්ට කී
ලෙසම පාරාවෝ තම සිත මුරණ්ඩු
කරගෙන සෙනඟට යන්න නොදුන්-
නේය.[3]

**10** පසුව යෙහෝවා දෙවි, මෝ-
සෙස්ට මෙසේ කීවේය. “ඔබ
දැන් පාරාවෝ ළඟට යන්න. නමුත්
පාරාවෝගෙත් ඔහුගේ සේවකයන්-
ගෙත් මුරණ්ඩුකම අඩු වී නැත.[4] මම
ඔවුන්ට මුරණ්ඩු ලෙස ක්‍රියා කිරී-
මට ඉඩහැරියේ මේ සියලු ලකුණු
පාරාවෝට පෙන්වන පිණිසය.[5]
**2** එමෙන්ම ඊජිප්තුවරුන් ඉදිරියේ මේ
සියලු ලකුණු සිදු කරමින් ඔවුන් පිටට
කොතරම් දරුණු පීඩා ගෙනාවාද
කියා ඔබ ඔබේ පුත්‍රයන්ට හා ඔබේ
පුත්‍රයන්ගේ පුත්‍රයන්ට කියා දෙන
පිණිසය.[6] මේ සියලු දේ දකින ඔබ,
මා යෙහෝවා දෙවි බව අනිවාර්ය-
යෙන්ම දැනගනු ඇත.”[7]

**3** ඉන්පසු මෝසෙස් හා ආරොන්,
පාරාවෝ ඉදිරියට ගොස් මෙසේ
කීවෝය. “හෙබ්‍රෙව්වරුන්ගේ දෙවි
වන යෙහෝවා ඔබට මෙසේ පැවසු-
වේය. ‘ඔබ තව කොපමණ කල් මට
විරුද්ධව ක්‍රියා කරන්නෙහිද?[8] මට
නමස්කාර කරන පිණිස මාගේ සෙ-
නඟට යන්න දෙන්න. **4** ඔබ දිග-
ටම මා කියන දේට සවන්
නොදී මාගේ සෙනඟට යන්න නො-
දෙන්නේ නම් හෙට ඔබේ දේශයේ
සෑම තැනකටම මම පළඟැටියන්
එවන්නෙමි.[9] **5** පොළොව නොපෙ-
නෙන තරමට උන් මුළු දේශයම වසා-
ගනු ඇත. හිම කැට වර්ෂාවෙන්
විනාශ නොවූ සෑම දෙයක්ම උන් සම්-
පූර්ණයෙන්ම කා විනාශ කර දමනු
ඇත. ඔබේ කෙත්වල දලුලන සෑම
ගසක්ම උන් කා දමනු ඇත.[10]

**9 පරි.**
1 ගීතා 105:33
2 නික් 8:22, නික් 9:4
3 1සාමු 26:21, ගීතා 12:2, මතෙ 27:4
4 ගීතා 129:4, ගීතා 145:17, දානි 9:14, රෝම 2:5
5 නික් 8:8, නික් 10:17, ක්‍රියා 8:24
6 1රාජා 8:22, එස්රා 9:5, ගීතා 143:6
7 ද්වි 10:14, ගීතා 24:1, ගීතා 50:12, 1කොරි 10:26
8 හිතෝ 16:6, යෙසා 26:10, ලූක් 16:31
9 රූත් 1:22
10 යෙසා 28:25, එස 4:9

**2 තීරුව**
1 නික් 10:18, යාකො 5:17
2 නික් 4:21, නික් 8:15, ද්වි 2:30, යොෂු 11:20, රෝම 9:18
3 නික් 7:4, නික් 8:15

**10 පරි.**
4 නික් 4:21, නික් 9:34, ගීතා 7:11
5 නික් 7:4, නික් 9:16, 1සාමු 4:8, ගීතා 78:12, ගීතා 135:9, රෝම 9:17
6 නික් 13:8, ද්වි 4:9, ද්වි 6:21, ගීතා 44:1, ගීතා 78:5, යෝවෙ 1:3
7 නික් 6:3
8 නික් 9:17, නික් 16:28, හිතෝ 18:12, යෙසා 2:11, යෙරෙ 13:18
9 ගීතා 78:46, ගීතා 105:34, හිතෝ 30:27, යෝවෙ 1:4
10 නික් 9:32, ගීතා 105:35, යෝවෙ 2:3

නික් **9:31*** කෙඳි ලබාගැනීම සඳහා ඊජිප්තුවෙහි වගා කළ පැළෑටි වර්ගයකි. එම කෙඳි, රෙදි සෑදීම සඳහා භාවිත කෙරිණ. **32*** කුරක්කන් වැනි ධාන්‍ය වර්ගයකි.

6 ඔබේ මාලිගාවද ඔබේ සේවකයන්-
ගේ නිවෙස්ද ඊජිප්තුවරුන්ගේ සියලු
නිවෙස්ද පළඟැටියන්ගෙන් පිරී යනු
ඇත. ඔබේ පියවරුන්වත් ඔබේ පියව-
රුන්ගේ පියවරුන්වත් මේ දක්වා
එවැනි දෙයක් දැක නැත.’”[1] එසේ
පවසා මෝසෙස් හා ආරොන්, පාරා-
වෝ ඉදිරියෙන් පිටත්ව ගියෝය.[2]
7 පසුව පාරාවෝට ඔහුගේ සේ-
වකයෝ මෙසේ කීවෝය. “අපට
මෙලෙස පීඩා කිරීමට ඔබ තව කො-
පමණ කල් මේ මනුෂ්‍යයාට ඉඩ දෙ-
නවාද?[3] මුළු දේශයම නාස්ති වී ඇති
ආකාරය ඔබට පෙනෙන්නේ නැද්ද?[4]
ඔවුන්ගේ දෙවියන් වන යෙහෝවාට
නමස්කාර කරන පිණිස මේ මිනි-
සුන්ට යන්න දෙන්න.” 8 එහෙයින්
පාරාවෝ, මෝසෙස්ව හා ආරොන්ව
නැවත කැඳවා ඔවුන්ට මෙසේ
කීවේය. “නුඹලාගේ දෙවියන් වන
යෙහෝවාට නමස්කාර කරන්න නුඹ-
ලාට යන්න මම අවසර දෙනවා.[5]
නමුත් මේ ගමනට සහභාගි වෙන්නේ
කවුද කියා මට දන්වන්න.” 9 එවිට
මෝසෙස් ඔහුට මෙසේ කීවේය. “බාල
මහලු සියලුදෙනාම මේ ගමන යා
යුතුයි. අපේ දූවරුන්ද පුත්‍රයන්ද[6]
අපේ ගව හා බැටළු රැළවල්ද අපි
රැගෙන යනවා.[7] අප මේ ගමන
යන්නේ යෙහෝවා දෙවිට ගෞරවය
දෙන පිණිස උත්සවයක් පැවැත්වීම-
ටයි.”[8] 10 පාරාවෝ එය අසා මෙසේ
කීවේය. “මම නුඹලාගේ දරුදැරියන්
සමඟ නුඹලාට යන්න දුන්නොත් යෙ-
හෝවා දෙවි අනිවාර්යයෙන්ම නුඹ-
ලාට ආශීර්වාද කරයි. හැබැයි ඒ මම
නුඹලාට යන්න දුන්නොත් විතරයි![9]
නුඹලාට කූට සැලැස්මක් තිබෙනවා
කියා මම දන්නවා.[10] 11 මම කො-
හොමටවත් නුඹලා හැමෝටම යන්න
දෙන්නේ නැහැ. නුඹලාට අවශ්‍ය
නුඹලාගේ දෙවියන් වන යෙහෝවාට
නමස්කාර කරන්න නම් ඒ සඳහා
නුඹලා අතරේ සිටින පුරුෂයන්ට
පමණක් යන්න අවසර දෙන්නම්.”
පාරාවෝ එසේ කියා මෝසෙස්ව
හා ආරොන්ව තමා ඉදිරියෙන් එළවා
දැමුවේය.[1]
12 ඉන්පසු යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. “පළඟැටියන්
පැමිණ ඊජිප්තු දේශයේ වගාබිම්වල
තිබෙන සෑම දෙයක්ම කා දමන
පිණිස ඔබේ අත දේශය දෙසට දිගු
කරන්න.[2] එවිට උන් පැමිණ හිම
කැට වර්ෂාවෙන් විනාශ නොවූ සෑම
දෙයක්ම කා දමනු ඇත.”[3] 13 මෝ-
සෙස් ඒ අවස්ථාවේදීම ඊජිප්තු දේශය
දෙසට තම සැරයටිය දිගු කළේය.
එවිට යෙහෝවා දෙවි නැඟෙනහිර
දෙසින් සුළඟක් හමන්න සැලැස්-
වූවේය.[4] එම සුළඟ මුළු දහවල්
කාලය පුරාද රාත්‍රි කාලය පුරාද දේ-
ශය දෙසට හැමුවේය. පසුවදා උදෑ-
සන නැඟෙනහිර දෙසින් හැමූ ඒ
සුළඟ සමඟ පළඟැටියෝද දේශයට
ආවෝය. 14 පළඟැටියෝ ඊජිප්තු
දේශයේ සියලු පළාත්වලට පැතිර
ගියෝය.[5] උන් දේශය වැනසුවෝය.[6]
මින් පෙර කවදාවත් පළඟැටියෝ
එතරම් ප්‍රමාණයක් දේශයට පැමිණ
තිබුණේ නැත. මින් මතුද එසේ
සිදු නොවනු ඇත. 15 දේශය අඳුරු
වන තරමටම[7] උන් මුළු පොළොවම
වසාගත්තෝය.[8] හිම කැට වර්ෂා-
වෙන් විනාශ නොවූ වගාබිම් සියල්-
ලද ගස්වල සියලු පලදාවද උන්
කා දැමුවෝය.[9] උන් ඊජිප්තු දේශ-
යේ ගස් වැල්වල එක කොළයක්-
වත් ඉතුරු නොවන ලෙස වගාබිම්
සියල්ල විනාශ කර දැමුවෝය.[10]
16 පාරාවෝ වහාම මෝසෙස්ව
හා ආරොන්ව තමා වෙතට කැඳවා
මෙසේ කීවේය. “මම ඔබේ දෙවියන්
වන යෙහෝවාටත් ඔබටත් විරුද්-
ධව පව් කළා.[11] 17 මේ වතාවේදීත්
මට සමාව දෙන්න.[12] මේ දරුණු
වසංගතය මගෙන් ඉවත් කරන්න
කියා ඔබේ දෙවියන් වන යෙහෝවාට
මා වෙනුවෙන් කන්නලව් කරන්න.”[13]
18 පාරාවෝ ඉදිරියෙන් මෝසෙස්
පිටත්ව ගොස් යෙහෝවා දෙ-
විට කන්නලව් කළේය.[14] 19 එවිට

**10 පරි.**
1 නික් 9:24, යෝවෙ 2:9
2 නික් 11:8, හෙබ්‍රෙ 11:27
3 හිතෝ 29:6
4 ගීතා 107:34
5 නික් 12:31
6 ද්වි 31:12, ගීතා 148:12
7 උත් 46:6, උත් 50:8, නික් 10:26
8 නික් 3:18, නික් 5:1
9 නික් 12:31
10 2ලේක 32:15

**2 තීරුව**
1 නික් 10:28
2 නික් 7:19
3 ද්වි 28:38, යෝවෙ 2:3
4 උත් 41:6, නික් 14:21, ගීතා 78:26, යෝනා 4:8
5 ගීතා 78:46, ගීතා 105:34
6 නික් 10:5
7 යෝවෙ 2:10
8 යෝවෙ 1:6
9 ගීතා 105:35
10 යෝවෙ 1:7, යෝවෙ 2:3
11 නික් 9:27, 1සාමු 26:21
12 ගීතා 76:12
13 නික් 9:28, 1රාජා 13:6, ක්‍රියා 8:24
14 නික් 8:30

යෙහෝවා දෙවි බටහිර දෙසින් තද
සුළඟක් හමන්න සැලැස්වූවේය. එම
සුළඟින් සියලු පළඟැටියෝ රතු මුහු-
දට ගසාගෙන ගියෝය. එක
පළඟැටියෙක්වත් ඊජිප්තු දේශයේ
ඉතුරු නොවීය. **20** නමුත් පාරා-
වෝ නැවත වරක් තම සිත මුරණ්ඩු
කරගෙන ඊශ්‍රායෙල් සෙනඟට යන්න
නොදුන්නේය. යෙහෝවා දෙවිද එයට
ඉඩහැරියේය.[1]

**21** එවිට යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. “මුළු ඊජිප්තු
දේශයම ඝන අන්ධකාරයෙන් වැසී
යන පිණිස ඔබේ අත අහස දෙසට දිගු
කරන්න.”[2] **22** මෝසෙස් ඒ මො-
හොතේදීම අහස දෙසට අත දිගු
කළේය. එවිට මුළු දේශයම ඝන අන්-
ධකාරයෙන් වැසී ගියේය. අඳුර දවස්
තුනක් පුරා දේශය වෙළාගත්තේය.[3]
**23** ඊජිප්තුවරු දින තුනක් පුරා තම
නිවෙස්වලට වී සිටියෝය. මන්ද එකි-
නෙකාව නොපෙනෙන තරමට අන්ධ-
කාරය දේශය වෙළාගෙන තිබිණ.
නමුත් ඊශ්‍රායෙල්වරුන්ගේ නිවෙස්-
වල එළිය තිබිණ.[4] **24** පසුව පාරා-
වෝ මෝසෙස්ට කතා කර, “වහාම
ගොස් නුඹලාගේ යෙහෝවා දෙවි-
යන්ට නමස්කාර කරන්න.[5] නුඹලා-
ගේ දරුදැරියනුත් රැගෙන යන්න.
නුඹලාගේ ගව හා බැටළු රැළ-
වල් පමණක් මෙහි තබා යන්න”
කියා කීවේය.[6] **25** නමුත් මෝ-
සෙස් ඔහුට මෙසේ කීවේය. “එසේ
කරන්න බැහැ. අපේ සතුන්වත්
රැගෙන යෑමට අපට අවසර දෙන්න.
මන්ද අපේ දෙවි වන යෙහෝවාට
ඔප්පු කරන පූජාවලට අපට සතුන්
අවශ්‍යයි.[7] **26** අපි අපේ සෑම සතෙ-
කුවම රැගෙන යනවා.[8] එක සතෙකු-
වත් මෙහි තබා යන්නේ නැහැ. අපේ
දෙවි වන යෙහෝවාට පූජා කරන්නේ
අපේම සතුන්වයි.[9] අප එම ස්ථානයට
යන තුරු යෙහෝවා දෙවිට ඔප්පු කළ
යුත්තේ කුමන සතුන්වද කියා අපවත්
දන්නේ නැහැ.”[10] **27** නමුත් පාරා-
වෝ තම සිත මුරණ්ඩු කරගෙන
ඔවුන්ට යන්න නොදුන්නේය. යෙ-
හෝවා දෙවිද එයට ඉඩහැරියේය.[1]
**28** ඔහු මෝසෙස්ට මෙසේද කීවේය.
“තව මොහොතක්වත් මෙතැන රැඳී
සිටින්න නුඹට බැහැ. මගේ දෑහට
නොපෙනී මෙතැනින් යනවා යන්න.[2]
මා ළඟට ආපහු ආවොත් නුඹව මර-
නවා!”[3] **29** එවිට මෝසෙස්, “ඔබ
කියූ ලෙසම මම නැවත ඔබ ඉදිරියට
එන්නේ නැහැ” කියා කීවේය.[4]

**11** පසුව යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය.
“පාරාවෝට හා ඊජිප්තුවේ වැසියන්ට
මම තව එක පීඩාවකින් පහර දෙන්-
නෙමි. ඉන්පසු ඔබට අයිති සෑම
දෙයක්ම රැගෙන මෙම දේශයෙන්
පිටත්ව යෑමට ඔහු ඔබට අවසර
දෙන බව නිසැකයි.[5] ඇත්තෙන්ම ඔහු
ඔබව මෙහෙන් එළවා දමනු ඇත.[6]
**2** සෙනඟ අතරේ සිටින සෑම පුරුෂ-
යෙකුම තම මිතුරාගෙන්ද සෑම ස්ත්‍රී-
යක්ම තම මිතුරියගෙන්ද රන් හා
රිදී ආභරණ ඉල්ලාගත යුතුයි.[7] ඒ
බව ඔබ සෙනඟට දැනුම් දෙන්න.”
**3** ඊශ්‍රායෙල් ජනයාට කාරුණිකව
සැලකීමට යෙහෝවා දෙවි ඊජිප්තුව-
රුන්ගේ සිත් පෙලඹුවේය.[8] ඊජිප්තු
දේශයේ සියලු වැසියෝ හා පාරාවෝ-
ගේ සේවකයෝ මෝසෙස්ව ඉතා
ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකු ලෙස සැල-
කුවෝය.[9]

**4** මෝසෙස් පාරාවෝට මෙසේ
කීවේය. “යෙහෝවා දෙවි මෙසේ
පැවසුවේය. ‘මම අද මධ්‍යම රාත්‍රි-
යේදී පමණ ඊජිප්තුවරුන් අතරට
එන්නෙමි.[10] **5** එවිට ඊජිප්තු දේශ-
යේ සිටින සියලු කුලුඳුල්[11] දරුවෝ
මිය යනු ඇත. සිංහාසනයේ සිටින
පාරාවෝගේ කුලුඳුල් දරුවාද ඇඹ-
රුම් ගල ළඟ සිටින මෙහෙකාරියගේ
කුලුඳුල් දරුවාද මිය යන්නෝය.
සියලු කුලුඳුල් සත්තුද මිය යන්-
නෝය.[12] **6** මහත් අඳෝනාවක් මුළු
ඊජිප්තු දේශය පුරාම ඇසෙනු ඇත.
මින් පෙර කවදාවත් එවැනි අඳෝ-
නාවක් ඇසී නැත. මින් මතුවටද

**10 පරි.**
**1** නික් 7:3 නික් 11:10 යොහ 12:40 රෝම 9:18
**2** නික් 8:5
**3** ගීතා 105:28 ආමො 5:8
**4** නික් 8:22 නික් 9:6 නික් 9:26 මලා 3:18
**5** නික් 8:28 නික් 9:28
**6** උත් 34:23 නික් 10:10
**7** නික් 3:18 නික් 5:3 නික් 8:27
**8** නික් 12:32
**9** මලා 1:11
**10** හිතෝ 3:9

**2 තීරුව**
**1** නික් 4:21 නික් 14:4 රෝම 9:18
**2** නික් 10:11
**3** 2ලේක 16:10
**4** හෙබ්‍රෙ 11:27

**11 පරි.**
**5** නික් 12:31 ද්වි 4:34
**6** නික් 3:20 නික් 12:32
**7** නික් 3:22 නික් 12:35 ගීතා 105:37 හිතෝ 13:22
**8** නික් 3:21 නික් 12:36
**9** 2සාමු 7:9 එස්ත 9:4 ක්‍රියා 7:22
**10** නික් 12:29 ආමො 4:10
**11** නික් 4:23 නික් 13:15 ගීතා 78:51 ගීතා 105:36 ගීතා 136:10 හෙබ්‍රෙ 11:28
**12** නික් 12:12 ගීතා 135:8

එවැනි දෙයක් සිදු වන්නේ නැත.[1]
**7** නමුත් ඒ දේ සිදු වන විට කිසි
මනුෂ්‍යයෙක්වත් සතෙක්වත් ඊශ්‍රා-
යෙල් සෙනඟට හිරිහැර කරන්නේ
නැත. අඩුම තරමින් බල්ලෙක්වත්
ඔවුන්ට බුරන්නේ නැත.[2] එයින් යෙ-
හෝවා දෙවි වන මා ඊජිප්තු ජනයාට
සලකන ආකාරයට වඩා වෙනස්
ආකාරයකින් ඊශ්‍රායෙල් ජනයාට සල-
කන බව ඔබ නිසැකවම දැනගනු
ඇත.'[3] **8** එවිට ඔබේ සියලු සේව-
කයන් මා ළඟට ඇවිත් මා ඉදිරි-
යේ වැඳ වැටී,[4] 'ඔබ යටතේ සිටින
මේ මුළු සෙනඟ සමඟ මේ දේශ-
යෙන් පිටත්ව යන්න' කියා මගෙන්
ඉල්ලයි. මමද මෙතනින් පිටත්ව
යනවා." එසේ පවසා මහත් කෝප-
යෙන් යුතුව මෝසෙස්, පාරාවෝ
ඉදිරියෙන් පිටත්ව ගියේය.

**9** "මම ඊජිප්තු දේශයේ තව
බොහෝ පුදුම ක්‍රියා කරන පිණිස[5]
පාරාවෝ ඔබ කියන දේට සවන් නො-
දෙන්නේය"[6] කියා යෙහෝවා දෙවි
මෝසෙස්ට කීවේය. **10** මෝසෙස්
හා ආරොන්, පාරාවෝ ඉදිරියේ ඒ
සියලු පුදුම ක්‍රියා කර පෙන්වූ[7] නමුත්
ඔහු තම සිත මුරණ්ඩු කරගෙන ඊශ්‍රා-
යෙල් පුත්‍රයන්ට ඊජිප්තු දේශයෙන්
පිටත්ව යන්න ඉඩ නොදුන්නේය.
යෙහෝවා දෙවිද පාරාවෝට එසේ
ක්‍රියා කිරීමට ඉඩහැරියේය.[8]

**12** යෙහෝවා දෙවි ඊජිප්තු දේ-
ශයේදී මෝසෙස්ට හා
ආරොන්ට මෙසේ කීවේය. **2** "ඔබ
මේ මාසය, අවුරුද්දේ පළමු-
වෙනි මාසය*[9] ලෙස ගණන් ගන්න.
**3** මුළු ඊශ්‍රායෙල් සෙනඟට මෙසේ
කියන්න. 'මේ මාසයේ දහවන දින-
යේදී සියලුදෙනාම තම තමන්ගේ
පවුලේ සාමාජිකයන් සඳහා බැටළු-
වෙකුව[10] තෝරාගත යුතුයි. එක
පවුලක්* සඳහා එක බැටළු-
වෙකු බැගින් ගන්න. **4** යම් පවු-
ලක සම්පූර්ණ බැටළුවෙකු අනුභව
කිරීමට තරම් ප්‍රමාණවත් සාමාජි-
කයන් නැත්නම් ඒ පවුලේ අය අසල්-
වැසි පවුලක් සමඟ ඌව බෙදාගත
යුතුයි. ඔවුන්ගේ පවුල්වල සිටින එක්
එක් සාමාජිකයන්ට අවශ්‍ය ප්‍රමාණය
තීරණය කර ඒ අනුව බැටළුවාව
බෙදාගත යුතුයි. **5** බැටළු පැටවුන්
අතරින් හෝ එළුවන් අතරින් හෝ
අවුරුද්දක් වයසැති කැළැල් නැති[1]
පිරිමි සතෙකු තෝරාගන්න.[2] **6** මේ
මාසයේ දහහතරවන දිනය[3] වන
තුරු ඌව ඔබ ළඟ තබාගන්න.
එදින සවස*[4] මුළු ඊශ්‍රායෙල් සෙනඟ
එකතු වී තම තමන්ගේ සතාව
මැරිය යුතුයි. **7** ඉන්පසු උගේ ලෙ-
යින් ටිකක් රැගෙන උගේ මස් අනු-
භව කරන නිවෙස්වල උළුවහු කණු
දෙකේ හා එහි උඩු ලීයේ තැවරිය
යුතුයි.[5]

**8** "'එදින රාත්‍රියේදී උගේ මස්
ගින්නෙන් පුලුස්සා මුහුන් නො-
දැමූ රොටි[6] හා තිත්ත පලා[7] සමඟ
කන්න.[8] **9** උගේ මස් අමුවෙන් හෝ
වතුරෙන් තම්බා හෝ නොකෑ යුතුයි.
හිස, කකුල් හා බඩවැල් සමඟ මුළු
සතාවම ගින්නෙන් පුලුස්සාගන්න.
**10** උගේ මස් පසුවදා උදැසන වන
තුරු තබා නොගන්න. යමක් ඉතුරු
වුණොත් එය ගින්නෙන් පුලුස්සා
දැමිය යුතුයි.[9] **11** ඔබ ඉණපටිය
බැඳගෙන[10] පාවහන්[11] දමාගෙන සැර-
යටිය අතැතිව ලහි ලහියේ එය කෑ
යුතුයි. මන්ද එය යෙහෝවා දෙවි
වන මට ගෞරවය කිරීම සඳහා

**11 පරි.**
**1** නික් 12:30
**2** යොෂු 10:21
**3** නික් 8:22, නික් 9:4, නික් 10:23, නික් 12:13, ගීතා 91:7, මලා 3:18
**4** නික් 12:33
**5** නික් 7:3, යෙරෙ 32:20
**6** නික් 3:19, නික් 7:4, රෝම 9:18
**7** ගීතා 135:9
**8** නික් 4:21, නික් 9:16, නික් 10:20, 1සාමු 6:6, යෙසා 26:10

**12 පරි.**
**9** නික් 13:4, නික් 23:15, නික් 34:18, ගණන් 28:16, ද්වි 16:1, එස්ත 3:7
**10** උත් 22:8, යොහ 1:29, 1කොරි 5:7, එළි 5:6, එළි 7:10

**2 තීරුව**
**1** ලෙවී 22:19, ද්වි 17:1, මලා 1:14, හෙබ්‍රෙ 7:26, හෙබ්‍රෙ 9:14, 1පේත 1:19
**2** ලෙවී 1:3, ලෙවී 23:12
**3** ගණන් 28:16, එස 45:21
**4** නික් 12:18, නික් 16:12, ලෙවී 23:5, ගණන් 9:3, ද්වි 16:6
**5** 1කොරි 5:7, එෆී 1:7, හෙබ්‍රෙ 11:28, 1පේත 1:2
**6** නික් 13:3, නික් 34:25, ද්වි 16:3, 1කොරි 5:8
**7** නික් 1:14, ගණන් 9:11
**8** ද්වි 16:7, මතෙ 26:17
**9** ලෙවී 7:15, ලෙවී 22:30, ද්වි 16:4
**10** ලූක් 12:35, එෆී 6:14, 1පේත 1:13
**11** එෆී 6:15

**නික් 12:2*** මෙහි සඳහන් වන්නේ ආබීබ් මාසය ගැනය. එය යුදෙව් දිනදර්ශනයේ පළමුවෙනි මාසයයි. මාර්තු මාසයේ මැද සිට අප්‍රියෙල් මාසයේ මැද දක්වා කාලය ආබීබ් මාසයට ඇතුළත් විය.

**නික් 12:3*** මෙහි සඳහන් වන්නේ එකම ආදිපියෙකුගෙන් පැවතෙන පවුල් කිහිපයක් ගැනය. **6*** මූ.අ., "සවස් වරු දෙක අතරතුරදී." මෙයින් යොමු දක්වන්නේ හිරු බැස යන වේලාවේ සිට රාත්‍රිය උදා වන වේලාව දක්වා පවතින කාලය ගැන කියා සමහර අය විශ්වාස කරති. එහෙත් තවත් සමහර අය පවසන්නේ හිරු බැස යෑම ආරම්භ වන වේලාවේ සිට එය අවසන් වන වේලාව දක්වා පවතින කාලයට මෙය යොමු දක්වන බවය.

ඔබ පවත්වන පාස්කු උත්සවයයි.[1]
12 මම එදින රාත්‍රියේ ඊජිප්තු දේශය
මැදින් ගොස්[2] ඊජිප්තුවරුන්ගේ සෑම
කුලුඳුල් දරුවෙකුටම හා සෑම කුලුඳුල්
සතෙකුටම පහර දෙන්නෙමි.[3] ඊජිප්-
තුවරුන්ගේ සියලු දෙවිවරුන්ට විරුද්-
ධවද මම තීන්දුවක් දෙන්නෙමි.[4] මා
යෙහෝවා දෙවිය.[5] 13 ඔබ ජීවත්
වන නිවෙස්වල ලේ තැවරිය යුත්තේ
ලකුණක් ලෙසය. ඒ ලකුණ නිසා මා
ඊජිප්තු දේශයට පහර දෙන විට ඔබට
කිසි හානියක් සිදු නොවනු ඇත. මම
එම ලකුණ දුටු විට ඔබේ නිවෙස් පසු
කරගෙන යන්නෙමි.[6]

14 "'ඔබ මෙම දිනය සිහි කළ
යුතුයි. යෙහෝවා දෙවි වන මට ගෞ-
රවය දෙන පිණිස එම දවසේදී උත්ස-
වයක් පැවැත්විය යුතුයි. ඔබේ සියලු
පරම්පරාවලදී එය පවත්වන ලෙස
මම නියෝග කරමි. 15 ඔබ දවස්
හතක් මුහුන් නොදැමූ රොටි පමණක්
අනුභව කළ යුතුයි. ඔබේ නිවෙස්-
වල පිපුණු පිටි තබා නොගන්න.
පළමුවෙනි දවසේම මුහුන් සියල්ල
ඔබේ නිවෙස්වලින් ඉවත් කරන්න.
යමෙකු ඒ දවස් හත[7] ඇතුළතදී
මුහුන් දැමූ කිසිවක් කෑවොත් ඔහුව
මරා දැමිය යුතුයි.[8] 16 පළමුවෙනි
දවසේදී ඔබේ දෙවි වන මට නමස්-
කාර කිරීම සඳහා ඔබ සියලුදෙනා
එක් රැස් විය යුතුයි. හත්වන දවසේ-
දීත් ඔබ එසේ කරන්න.[9] ඒ දවස්වලදී
කිසි වැඩක් නොකරන්න.[10] නමුත්
තම තමාට අවශ්‍ය ආහාර පමණක්
සූදානම් කරගත හැකියි.[11]

17 "'ඔබ මුහුන් නොදැමූ රොටි
උත්සවය පැවැත්විය යුතුයි.[12] මන්ද
මා සේනාවක් බඳු ඔබව ඊජිප්තු දේශ-
යෙන් පිටතට ගෙන එන්නේ එම
දවසේදීය. ඔබේ සියලු පරම්පරාව-
ලදී එම දිනය සිහි කරන මෙන්
මම නියෝග කරමි. 18 පළමුවෙනි
මාසයේ දහහතරවන දින සවස් වරු-
වේදී ඔබ මුහුන් නොදැමූ රොටි කෑ
යුතුයි. එම මාසයේ විසිඑක්වන දින
සවස් වරුව දක්වාම ඔබ කෑ යුත්තේ
මුහුන් නොදැමූ රොටි පමණක්ය.[1]
19 දවස් හතක් පුරා ඔබේ නිවෙස්වල
පිපුණු පිටි තබා නොගන්න. විදේශි-
කයෙකු වුවත් ඊශ්‍රායෙල් ජාතිකයෙකු
වුවත්[2] මුහුන් දැමූ කිසිවක් අනුභව
කළොත් ඔහුව මරා දැමිය යුතුයි.[3]
20 මුහුන් දැමූ කිසිම දෙයක් ආහාර-
යට නොගන්න. ඔබේ නිවෙස්වල
ජීවත් වන සෑම කෙනෙකුම අනුභව
කළ යුත්තේ මුහුන් නොදැමූ රො-
ටිය.'"

21 මෝසෙස් ඒ මොහොතේදීම
ඊශ්‍රායෙල්හි සියලු වැඩිමහල්ලන්ව[4]
කැඳවා ඔවුන්ට මෙසේ කීවේය. "ඔබ
එක් එක් කෙනා තම තමන්ගේ
පවුල වෙනුවෙන් බැටළුවෙකු නැත්-
නම් එළුවෙකු තෝරාගන්න. පාස්-
කුව සඳහා ඔප්පු කරන ඒ
සතාව මරන්න.[5] 22 ඉන්පසු උගේ
ලේ භාජනයකට එකතු කරගන්න.
හිසොප්*[6] මිටියක් ඒ ලේවල පොඟවා
උළුවහු කණු දෙකේ හා එහි උඩු
ලීයේ තවරන්න. උදේ වන තුරු
කිසිම කෙනෙක් තමාගේ නිවසින්
පිටතට නොයන්න. 23 ඊජිප්තුව-
රුන්ට පීඩා කිරීමට යෙහෝවා දෙවි
දේශය මැදින් යන විට ඔබ උළුවහු
කණු දෙකේ හා එහි උඩු ලීයේ තැවරූ
ලේ ඔහු දකීවි. එවිට යෙහෝවා දෙවි
ඔබේ නිවස පසු කරගෙන යයි. එම
මාරාන්තික පීඩාවෙන් ඔහු ඔබේ නිව-
සේ වැසියන්ට පහර දෙන්නේ නැහැ.[7]

24 "ඔබේ සියලු පරම්පරාවලදී
ඔබත් ඔබේ දරුවනුත් මෙම දිනය
සිහි කළ යුතුයි.[8] එය ඔබට දෙන
නියෝගයකි.[9] 25 යෙහෝවා දෙවි
ඔබට දෙන බවට පොරොන්දු වූ දේශ-
යට ගිය පසුත් ඔබ මේ උත්ස-
වය පැවැත්විය යුතුයි.[10] 26 'මේ
උත්සවය පවත්වන්නේ ඇයි' කියා
ඔබේ දරුවන් ඔබෙන් ඇසුවොත්[11]
27 ඔවුන්ට මෙසේ කියන්න. 'දෙවි,
ඊජිප්තුවරුන්ට පීඩා කළ අවස්ථාවේදී

**12 පරි.**
1 ගණන් 28:16
ද්වි 16:6
2 නික් 11:4
ආමො 5:17
3 නික් 11:5
නික් 12:29
4 ගණන් 33:4
යෙසා 19:1
යෙරෙ 43:13
ශෙප 2:11
5 1කොරි 8:6
6 මතෙ 20:28
රෝම 5:9
හෙබ්‍රෙ 11:28
1යොහ 1:7
7 නික් 23:15
ලෙවී 23:6
8 ගණන් 9:13
9 ලෙවී 23:4
10 ලෙවී 23:8
11 මතෙ 12:1
12 ලෙවී 23:6
ලූක් 22:1
1කොරි 5:8

**2 තීරුව**
1 ලෙවී 23:5
ලෙවී 23:6
එස 45:21
2 නික් 12:49
ගණන් 9:14
ද්වි 16:3
1කොරි 5:7
3 ගණන් 9:13
4 නික් 3:16
නික් 19:7
ගණන් 11:16
5 ගණන් 9:2
යොෂු 5:10
2රාජා 23:21
2ලේක 35:6
එස්රා 6:20
ලූක් 22:7
6 ලෙවී 14:6
ගීතා 51:7
හෙබ්‍රෙ 9:19
7 යෙසා 37:36
එස 9:6
හෙබ්‍රෙ 11:28
8 ලෙවී 23:4
ද්වි 16:3
9 එෆී 2:15
කොලො 2:14
හෙබ්‍රෙ 8:13
10 යොෂු 5:10
ගීතා 105:45
11 නික් 13:8
ද්වි 6:7
යොෂු 4:6
ගීතා 78:6
ගීතා 145:4
එෆී 6:4

**නික් 12:22*** මෙය එක්තරා පැළෑටියක් හෝ පැළෑටි වර්ග කිහිපයක් විය හැකියි. නමුත් සැබවින්ම එයින් හඳුන්වන දේ අවිනිශ්චිතය.

ඊශ්‍රායෙල් ජනයා වන අපට පහර
නොදී අපේ ගෙවල් පසු කරගෙන
ගියා. ඔහු අපේ ගෙයි වැසියන්ව
ආරක්ෂා කළා. ඒ නිසයි අපි මෙලෙස
සතෙකුව මරා යෙහෝවා දෙවිට ගෞ-
රවය දෙන පිණිස පාස්කු උත්සවය
පවත්වන්නේ.’ ”[1]

එය ඇසූ විට සියලුදෙනා දණින්
වැටී දෙවිට නමස්කාර කළෝය.[2]
**28** යෙහෝවා දෙවි, මෝසෙස් හා
ආරොන් මාර්ගයෙන් අණ කළ
සියල්ල ඊශ්‍රයෙල් ජනයා එලෙසම
කළෝය.[3]

**29** මධ්‍යම රාත්‍රියේදී යෙහෝවා
දෙවි ඊජිප්තු දේශයේ සිටි සියලු
කුලුඳුලන්ට පහර දුන්නේය.[4] සිංහාස-
නයේ සිටි පාරාවෝගේ කුලුඳුල් දරු-
වාටද සිරගෙයි සිටි සිරකරුවන්ගේ
කුලුඳුල් දරුවන්ටද සියලු කුලුඳුල්
සතුන්ටද ඔහු පහර දුන්නේය.[5]
**30** පාරාවෝද ඔහුගේ සියලු සේවක-
යෝද ඊජිප්තුවේ සියලු වැසියෝද
රාත්‍රියේ අවදි වූහ. එදින රාත්‍රියේ
ඊජිප්තු දේශය පුරාම මහත් අඳෝනා-
වක් ඇසිණ.[6] මන්ද මළ අයෙකු නැති
ගෙයක් නොවීය. **31** පාරාවෝ ඒ
රාත්‍රියේම[7] මෝසෙස්ව හා ආරොන්ව
කැඳවා ඔවුන්ට මෙසේ කීවේය.
“නුඹලා තව මොහොතක්වත් මගේ
සෙනඟ අතරේ රැඳී සිටින්න එපා.
වහාම මෙතැනින් යන්න. නුඹලා කියූ
ලෙස මුළු ඊශ්‍රායෙල් සෙනඟ සමඟ
ගොස් යෙහෝවා දෙවිට නමස්කාර
කරන්න.[8] **32** නුඹලාගේ එළු බැටළු
හා ගව රැළවල්ද රැගෙන යන්න.[9]
නුඹලා එහි යැමට පෙර මටත් ආශීර්-
වාද කරන්න.”

**33** “ඊශ්‍රායෙල්වරුන්ව මේ දේශ-
යෙන් පිටත් කළේ නැත්නම් අපිටත්
මැරෙන්නයි වෙන්නේ” කියා ඊජිප්තු-
වරු එකිනෙකාට කියාගත්තෝය.[10]
එහෙයින් දේශයෙන් වහාම පිටත් වන
ලෙස ඔවුහු ඊශ්‍රායෙල් සෙනඟට පෙ-
රැත්ත කළෝය.[11] **34** එවිට සෙනඟ
මුහුන් නොදමා ඇනූ පිටිද භාජ-
නද තමන්ගේ වස්ත්‍රවල ඔතා ඒවා

**12 පරි.**
1 නික් 34:25
දේවි 16:2
1කොරි 5:7
2 නික් 4:31
නෙහෙ 8:6
3 හෙබ්‍රෙ 11:28
4 උත් 15:14
ගණන් 33:4
ගීතා 78:51
ගීතා 105:36
ගීතා 136:10
හෙබ්‍රෙ 11:28
5 නික් 11:5
ගණන් 3:13
ගීතා 135:8
6 නික් 11:6
7 නික් 10:29
8 නික් 3:20
නික් 6:1
නික් 10:9
ගීතා 105:38
9 නික් 10:26
10 උත් 20:3
නික් 10:7
ගණන් 17:12
11 නික් 12:11

**2 තීරුව**
1 උත් 15:14
නික් 3:21
නික් 11:2
ගීතා 105:37
2 නික් 11:3
හිතෝ 16:7
3 දේවි 15:15
4 නික් 3:22
5 උත් 47:11
නික් 1:11
6 ගණන් 33:5
7 උත් 12:2
උත් 15:5
උත් 46:3
නික් 1:7
නික් 38:26
ගණන් 2:32
ගණන් 11:21
8 ගණන් 11:4
සෙක 8:23
9 නික් 6:1
නික් 11:1
නික් 12:31
10 උත් 46:3
උත් 47:27
ක්‍රියා 13:17
11 උත් 12:4
උත් 21:5
උත් 25:26
උත් 47:9
12 උත් 15:13
ක්‍රියා 7:6
ගලා 3:17
13 නික් 7:4
14 නික් 12:14
දේවි 16:1

කරේ තබාගෙන පිටත්ව ගියෝය.
**35** එසේ පිටත්ව යැමට පෙර ඊශ්‍රා-
යෙල් සෙනඟ මෝසෙස්ගේ උප-
දෙස් පිළිපදිමින් ඊජිප්තුවරුන්ගෙන්
රන් හා රිදී ආභරණද වස්ත්‍රද ඉල්-
ලාගත්තෝය.[1] **36** ඊශ්‍රායෙල් සෙ-
නඟට කාරුණිකව සැලකීමට
යෙහෝවා දෙවි ඊජිප්තුවරුන්ගේ සිත්
පෙලඹුවේය.[2] එහෙයින් ඔවුහු ඊශ්‍රා-
යෙල්වරුන් ඉල්ලූ සෑම දෙයක්ම
දුන්නෝය.[3] ඊශ්‍රායෙල්වරු ඊජිප්තුව-
රුන්ට කිසි දෙයක් ඉතුරු නොකර
සියල්ල රැගෙන ගියෝය.[4]

**37** ඊශ්‍රායෙල් සෙනඟ රමෙසේස්[5]
සිට සුක්කොත්[6] බලා පිටත් වූහ.
කුඩා දරුවන්ට අමතරව පුරුෂයෝ
හයලක්ෂයක් පයින් ගමන් කළෝය.[7]
**38** ඊශ්‍රායෙල් ජාතීන්ට අමතරව වෙ-
නත් ජාතීන්ට අයත් මහත් සමූහ-
යක්ද[8] ඔවුන් සමඟ ගියෝය.
ඔවුහු එළුවන්, බැටළුවන් හා ගව-
යන් ඇතුළු විශාල සත්ව රැළක්ද
රැගෙන ගියෝය. **39** ඔවුහු ඊජිප්-
තුවෙන් පිටත්ව එන අවස්ථාවේදී
රැගෙන ආ මුහුන් නොදමා ඇනූ පිටි-
වලින් රොටි සාදාගෙන ඒවා පුලුස්-
සාගත්තෝය. ඊජිප්තුවරුන් ඔවුන්ව
දේශයෙන් පන්නා දැමූ බැවින් ගමනට
අවශ්‍ය ආහාර සූදානම් කරගන්නවත්
ඔවුන්ට කාලය තිබුණේ නැත.[9]

**40** මෙතෙක් ඊජිප්තුවේ[10] වාසය
කළ ඊශ්‍රායෙල් ජනයා,[11] අන් දේශවල
වාසය කළ කාලය අවුරුදු හාරසිය
තිහකි.[12] **41** අවුරුදු හාරසිය තිහ
අවසන් වූ දවසේදී යෙහෝවා දෙ-
විට අයිති සේනාවක් බඳු මුළු ඊශ්‍රා-
යෙල් ජාතියම ඊජිප්තු දේශයෙන්
පිටත්ව ගියෝය.[13] **42** යෙහෝවා
දෙවි ඔවුන්ව ඊජිප්තු දේශයෙන් පිට-
තට ගෙන ගිය එම රාත්‍රිය සිහි කළ
යුතු රාත්‍රියකි. එම රාත්‍රියේදී යෙ-
හෝවා දෙවි කළ දේ ඊශ්‍රායෙල් ජනයා
තමන්ගේ සියලු පරම්පරාවලදී සිහි
කළ යුතුය.[14]

**43** යෙහෝවා දෙවි, මෝසෙස්ට
හා ආරොන්ට තවදුරටත් මෙසේ

කීවේය. “පාස්කු උත්සවය සම්බන්ධ
පනත මෙයයි.[1] කිසි විජාතිකයෙකු
පාස්කු භෝජනයෙන් නොකෑ යුතුයි.[2]
**44** මිලට ගත් දාසයෙකු ඔබ ළඟ සිටී
නම් ඔහුව චර්මච්ඡේදනය[3] කළ පසු
ඔහුට ඒ භෝජනයෙන් අනුභව කළ
හැකිය. **45** එහෙත් විදේශිකයෙකු
හෝ කුලීකාරයෙකු හෝ එය අනුභව
නොකළ යුතුයි. **46** සතාගේ මස්
ගෙයින් පිටතට රැගෙන නොගොස්
නිවස තුළදීම එය අනුභව කරන්න.
උගේ ශරීරයේ එක ඇටයක්වත් නො-
කැඩිය යුතුය.[4] **47** මුළු ඊශ්‍රායෙල්
සෙනඟම පාස්කුව සැමරිය යුතුයි.[5]
**48** ඔබ සමඟ ජීවත් වන විදේශික-
යෙකු යෙහෝවා දෙවිට ගෞරවය දීම
සඳහා පවත්වන පාස්කු උත්සවය
සැමරීමට කැමති නම් ඔහුගේ පවු-
ලේ සියලු පුරුෂයන්ව චර්මච්ඡේදනය
කළ යුතුයි.[6] එවිට ඊශ්‍රායෙල් ජාතික-
යන් මෙන් ඔහුටද පාස්කු උත්සවය
සැමරිය හැකියි. නමුත් අචර්මච්ඡේ-
දිත කිසි කෙනෙකු පාස්කු භෝජන-
යෙන් නොකෑ යුතුයි. **49** ඊශ්‍රායෙල්
ජාතිකයන් වන ඔබටත් ඔබ සමඟ
ජීවත් වන විදේශිකයන්ටත් තිබෙන්-
නේ එකම නීතියයි.”[7]

**50** යෙහෝවා දෙවි, මෝසෙස් හා
ආරොන් මාර්ගයෙන් අණ කළ
සියල්ල ඊශ්‍රායෙල් සෙනඟ කළෝය.[8]
**51** යෙහෝවා දෙවි ඊශ්‍රායෙල් ජන-
යාව කණ්ඩායම්* වශයෙන්[9] ඊජිප්තු
දේශයෙන් පිටතට ගෙන ආවේ එම
දිනයේදීය.

**13** යෙහෝවා දෙවි මෝසෙස්ට
තවදුරටත් මෙසේ කීවේය.
**2** “ඊශ්‍රායෙල් සෙනඟ අතරේ සිටින
සෑම කුලුඳුල් පිරිමි දරුවෙක්වම හා
සතෙක්වම මට කැප කරන්න. මන්ද
සියලු කුලුඳුලන් මට අයිතිය.”[10]
**3** මෝසෙස් සෙනඟට මෙසේ
කීවේය. “යෙහෝවා දෙවි, ඔබව
ඊජිප්තු දේශයෙන් පිටතට ගෙන ආවේ
ඔහුගේ මහත් බලය යොදාගෙනයි.[11]

නික් **12:51*** නික් 6:26හි පාදසටහන බලන්න.

එහෙයින් ඔබ වහලුන්ව සිටි ඊජිප්තු
දේශයෙන් පිටතට ආ මේ දවස සිහි
කළ යුතුයි.[1] අද මුහුන් දැමූ කිසි-
වක් කන්න එපා.[2] **4** ඔබ පිටත්ව
ආ මේ දවස ආබීබ් මාසයේ දව-
සක්.[3] **5** කිරියෙන් හා පැණියෙන්
ඉතිරී යන[4] කානානිවරුන්ගේ, හිත්තී-
වරුන්ගේ, අමෝරිවරුන්ගේ, හිවීයව-
රුන්ගේ හා යෙබූසිවරුන්ගේ දේශය[5]
ඔබට දෙන බවට යෙහෝවා දෙවි
ඔබේ මුතුන්මිත්තන්ට දිවුරා පො-
රොන්දු වුණා.[6] ඔබව ඒ දේශයට
ගෙන ගිය පසුත් ඔබ මෙම මාස-
යේදී මේ උත්සවය පැවැත්විය යුතුයි.
**6** ඔබ දවස් හතක් මුහුන් නො-
දැමූ රොටි අනුභව කළ යුතුයි.[7]
හත්වන දවසේදී යෙහෝවා දෙවිට
ගෞරවය දෙන පිණිස උත්සවයක්
පවත්වන්න.[8] **7** ඔබ මුහුන් නොදැමූ
රොටි දවස් හතක් පුරා කන්න.[9] මුහුන්
දැමූ කිසිවක් ඔබ ළඟ තබා නො-
ගන්න.[10] ඔබ ජීවත් වන ප්‍රදේශ-
යේ කොතැනකවත් පිපුණු පිටි තබා
නොගන්න.[11] **8** ‘මම ඊජිප්තු දේශ-
යෙන් පිටත්ව එන විට යෙහෝවා දෙවි
මා වෙනුවෙන් කළ දේ නිසයි මම
මේ දවස සමරන්නේ’ කියා ඔබ
ඔබේ දරුවන්ට තේරුම් කර දිය
යුතුයි.[12] **9** ඔබේ අත්වල හා නළල්-
වල තිබෙන ලකුණක් මෙන් මෙම
සැමරීම ඔබට සිහිවටනයක් වෙයි.[13]
යෙහෝවා දෙවිගේ නීතිය ගැන නිත-
රම කතා කිරීමටද එය ඔබට උපකා-
රවත් වෙයි.[14] මන්ද යෙහෝවා දෙවි
ඔබව ඊජිප්තු දේශයෙන් පිටතට ගෙන
ආවේ ඔහුගේ මහත් බලය යොදා-
ගෙනයි.[15] **10** ඔබට නියෝග කර
තිබෙන මේ දේවල් සෑම අවුරුද්දකදීම
නියම කරන ලද කාලයේදී ඔබ
පැවැත්විය යුතුයි.[16]

**11** “යෙහෝවා දෙවි ඔබටත් ඔබේ
මුතුන්මිත්තන්ටත් දිවුරූ ලෙස[17]
කානානිවරුන්ගේ දේශයට[18] ඔහු
ඔබව ගෙන යයි. ඒ දේශය ඔහු ඔබට

**16** නික් 12:24; නික් 23:15; ලෙවී 23:6; ද්වි 16:3; **17** උත් 15:18; ගීතා 105:42; **18** නෙහෙ 9:24.

**12 පරි.**

**1** ලෙවී 23:5, ගණන් 9:14, ද්වි 16:2, යොෂු 5:10, මාක් 14:1, 1කොරි 5:7
**2** ලෙවී 22:10, එෆී 2:12
**3** උත් 17:12, උත් 17:23
**4** ගණන් 9:12, ගීතා 34:20, යොහ 19:33, යොහ 19:36
**5** ගණන් 9:14
**6** උත් 17:12
**7** ලෙවී 24:22, ගණන් 15:16, ගලා 3:28, කොලො 3:11
**8** නික් 7:6, නික් 39:32, ද්වි 12:32
**9** නික් 6:26, නික් 13:18

**13 පරි.**

**10** ලෙවී 27:26, ගණන් 3:13, ගණන් 18:15, ද්වි 15:19, ලූක් 2:23
**11** නික් 6:1, ද්වි 4:34, නෙහෙ 9:10

**2 තීරුව**

**1** නික් 12:42, ද්වි 16:3
**2** නික් 12:20, 1කොරි 5:7
**3** නික් 23:15, නික් 34:18, ද්වි 16:1
**4** නික් 3:17, ද්වි 6:3, ද්වි 8:8
**5** නික් 3:8, නික් 34:11, 1රාජා 9:20
**6** උත් 15:18, නික් 6:8, ක්‍රියා 7:5
**7** නික් 12:15, නික් 34:18, 1කොරි 5:8
**8** නික් 10:9, ලෙවී 23:8, ලූක් 22:1
**9** නික් 23:15
**10** ද්වි 16:3
**11** නික් 12:19
**12** නික් 12:27
**13** නික් 12:14, ද්වි 6:8, ද්වි 11:18
**14** හිතෝ 23:16
**15** නික් 6:1, නික් 7:4

ලබා දුන් පසු **12** සෑම කුලුඳුල්
දරුවෙකුම ඔබ යෙහෝවා දෙවිට
කැප කළ යුතුයි.[1] ඔබට අයිති
සෑම කුලුඳුල් සතෙකුවද කැප කළ
යුතුයි.[2] මන්ද සෑම කුලුඳුල් පිරිමි දරු-
වෙකු මෙන්ම සෑම කුලුඳුල් පිරිමි
සතෙකුම අයිති යෙහෝවා දෙවි-
ටයි.[3] **13** නමුත් බූරුවන් අතරින්
සෑම කුලුඳුල් පැටියෙකුවම මුදවා-
ගත යුතුයි. ඒ එක් එක් කුලුඳුල්
පැටියා වෙනුවට බැටළුවෙකු බැගින්
දිය යුතුයි. ඔබ එලෙස උන්ව මුදවා
නොගන්නේ නම් උන්ගේ බෙල්ල
කඩා දැමිය යුතුයි.[4] ඔබ ගෙවීමක්
කර ඔබේ සෑම කුලුඳුල් පුත්‍රයෙකුවද
මුදවාගත යුතුයි.[5]

**14** "පසු කාලයක ඔබේ දරුවන්,
'මේ දේවල් කරන්නේ ඇයි' කියා
ඔබෙන් අසන විට ඔබ ඔවුන්ට
මෙසේ කියන්න.[6] 'අපි වහලුන් ලෙස[7]
ජීවත් වූ ඊජිප්තු දේශයෙන් යෙ-
හෝවා දෙවි අපිව පිටතට ගෙන ආවේ
ඔහුගේ මහත් බලය යොදාගෙනයි.[8]
**15** පාරාවෝ සිත මුරණ්ඩු කරගෙන
අපිට දේශයෙන් පිටත්ව යන්න අව-
සර දුන්නේ නැහැ.[9] එවිට යෙහෝවා
දෙවි ඊජිප්තුවරුන්ගේ සියලු කුලුඳු-
ලන්ව මරා දැමුවා.[10] කුලුඳුල් දරු-
වන්ට වගේම කුලුඳුල් සතුන්ටත් ඔහු
පහර දුන්නා.[11] එමනිසා සෑම කුලුඳුල්
සතෙකුම යෙහෝවා දෙවිට අපි කැප
කරනවා.[12] නමුත් සෑම කුලුඳුල්
පුත්‍රයෙක්වම අපි මුදවාගන්නවා.'[13]
**16** ඔබේ අත්වල තිබෙන ලකුණක්ද
ඔබේ නළල්වල බැඳ තිබෙන පටි-
යක්ද මෙන් මෙම සැමරීම ඔබට සිහි-
වටනයක් වෙයි.[14] මන්ද යෙහෝවා
දෙවි තම මහත් බලය යොදාගෙන
අපිව ඊජිප්තු දේශයෙන් පිටතට ගෙන
ආවා."[15]

**17** පාරාවෝ සෙනඟට යන්න දුන්
විට දෙවි ඔවුන්ව පිලිස්තිවරුන්ගේ
දේශය මැදින් ගෙන ගියේ නැත. එය
කෙටි මාර්ගයක් වුවත් ඔහු ඔවුන්ව ඒ
මාර්ගයේ ගෙන ගියේ නැත. මන්ද,
"ඊශ්‍රායෙල් සෙනඟට යුද්ධ කරන්න
සිදු වුවහොත් ඔවුහු පසුබට වී ආපසු
ඊජිප්තුවට හැරී යන්නෝය" කියා
දෙවි කීවේය.[1] **18** එහෙයින් දෙවි
රතු මුහුද අසල තිබෙන පාළුකරය
හරහා සෙනඟව ගෙන ගියේය.[2] යුද්-
ධයට යන හමුදාවක් මෙන් ඊශ්‍රා-
යෙල් සෙනඟ ඊජිප්තු දේශයෙන්
පිටතට ගියෝය.[3] **19** ඒ අවස්ථා-
වේදී මෝසෙස්, යෝසෙප්ගේ ඇට-
කටු රැගෙන ගියේය. මන්ද යෝසෙප්
ජීවත්ව සිටියදී ඔහු ඊශ්‍රායෙල් පුත්‍ර-
යන්ගෙන් මෙසේ දිවුරුම් ගත්තේය.
"දෙවි අනිවාර්යයෙන්ම ඔබ දෙස බලා
ඔබට කරුණාව දක්වයි.[4] ඔබ මේ
දේශයෙන් පිටත්ව යන විට මගේ
ඇටකටු ඔබ සමඟ ගෙන යන්න."[5]
**20** ඊශ්‍රායෙල් සෙනඟ සුක්කොත් සිට
පාළුකරයේ කෙළවරේ තිබෙන ඒතාම්
දක්වා ගමන් කර එහි කඳවුරු බැඳ-
ගත්තෝය.[6]

**21** යෙහෝවා දෙවි ඔවුන්ට මඟ
පෙන්වන පිණිස ඔවුන්ට ඉදිරියෙන්
ගමන් කළේය. ඔහු දවාලේදී වලා
ටැඹක්[7] මාර්ගයෙන්ද රාත්‍රියේදී ගිනි
ජාලාවක්[8] මාර්ගයෙන්ද ඔවුන්ට මඟ
පෙන්වූවේය. මෙසේ සෙනඟ දවල්
කාලයේදීද රාත්‍රි කාලයේදීද ගමන්
කළෝය. **22** දවල් කාලයේදී වලා
ටැඹද රාත්‍රි කාලයේදී ගිනි ජාලාවද
සෙනඟ ඉදිරියේ තිබිණ. එය කිසිවිට-
කත් පහව නොගියේය.[9]

**14** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. **2** "නැවත
හැරී ගොස් මුහුද* හා මිග්දෝල්
අතර පිහිටි පීහහීරොත්හි කඳවුරු
බැඳගන්න කියා ඊශ්‍රායෙල් සෙනඟට
පවසන්න. ඔබ මුහුදට කිට්ටුවෙන්
බාල්-ෂෙපොන් ඉදිරිපිට පීහහීරොත්හි
කඳවුරු බැඳගත යුතුයි.[10] **3** ඒ
ගැන පාරාවෝ දැනගත් විට, 'ඊශ්‍රා-
යෙල්වරු අතරමං වෙලා. ඔවුන් පාළු-
කරයේ ඒ මේ අත සැරිසරන්නේ
ඒ නිසයි' කියා තම සේවකයන්ට

**13 පරි.**
1 ගණන් 3:13
2 ලෙවී 27:26
3 නික් 22:29
නික් 34:19
ගණන් 8:17
ද්වි 15:19
ලූක් 2:23
4 නික් 34:20
5 ගණන් 18:15
6 නික් 12:26
ද්වි 6:20
ගීතා 145:4
7 ද්වි 7:8
8 ද්වි 26:8
9 නික් 5:2
10 ගීතා 78:51
ගීතා 135:8
11 නික් 11:5
නික් 12:29
12 නික් 13:2
නික් 13:12
ද්වි 21:17
13 නික් 6:6
14 ද්වි 6:8
ද්වි 11:18
15 නික් 6:1
යූද් 5

**2 තීරුව**
1 නික් 14:11
නික් 16:3
ගණන් 14:3
නෙහෙ 9:17
ක්‍රියා 7:39
2 නික් 14:2
ගණන් 33:5
3 නික් 12:51
4 ගීතා 135:4
ලූක් 1:68
ලූක් 7:16
5 උත් 50:25
යොෂු 24:32
හෙබ්‍රෙ 11:22
6 ගණන් 33:6
7 නික් 14:19
ගණන් 9:15
ද්වි 1:33
නෙහෙ 9:12
ගීතා 99:7
8 නික් 14:24
ගණන් 14:14
ගීතා 78:14
9 ගීතා 105:39
1කොරි 10:1

**14 පරි.**
10 නික් 13:18
ගණන් 33:7

**නික් 14:2*** මෙහි කතා කරන්නේ රතු මුහුද ගැන විය හැකියි.

කියනු ඇත.[1] 4 පාරාවෝ තම සිත
මුරණ්ඩු කරගෙන ඊශ්‍රායෙල් සෙනඟ
පසුපස ලුහුබැඳ එයි. මමද ඔහුට
එලෙස ක්‍රියා කිරීමට ඉඩහරින්නෙමි.[2]
නමුත් ඔහුවත් ඔහුගේ මුළු හමුදාවත්
මම අන්ත පරාජයකට පත් කර මගේ
නාමය ගෞරවයට පත් කරන්නෙමි.[3]
එවිට ඊජිප්තුවරුන් මා යෙහෝවා
දෙවි බව අනිවාර්යයෙන්ම දැනගනී."[4]
ඉන්පසු ඊශ්‍රායෙල් සෙනඟ දෙවි කී
ලෙසම කළෝය.

5 සෙනඟ පලා ගිය බව ඊජිප්තුවේ
රජුට ආරංචි වූ විට ඔහුද ඔහුගේ
සේවකයෝද සෙනඟට යන්න දීම
ගැන පසුතැවී[5] එකිනෙකා අතරේ
මෙසේ කියාගත්තෝය. "අපි කළේ
මහ මෝඩ වැඩක්! අපිට වහල්කම්[6]
කළ ඊශ්‍රායෙල්වරුන්ට යන්න දුන්නේ
ඇයි?" 6 ඉන්පසු පාරාවෝ තම යුධ
රථ සූදානම් කරගෙන තම සෙනඟ
සමඟ ඊශ්‍රායෙල්වරුන් පසුපස ලුහු-
බැඳ ගියේය.[7] 7 ඔහු විශේෂ යුධ
රථ[8] හයසියයක්ද ඊජිප්තුවේ තිබූ
සියලු අශ්ව රථද එහි මුළු හමු-
දාවද කැටුව ගියේය. 8 ඊජිප්තුවේ
පාරාවෝ රජ මුරණ්ඩු ලෙස ක්‍රියා
කරමින්, ජයග්‍රාහී ලීලාවෙන්[9] ගමන්
ගත් ඊශ්‍රායෙල් සෙනඟ පසුපස හඹා
ගියේය. යෙහෝවා දෙවිද ඔහුට බාධා
නොකළේය.[10] 9 මෙසේ ඊශ්‍රායෙල්
සෙනඟ පසුපස ලුහුබැඳ ගිය පාරා-
වෝගේ අශ්ව රථද ඔහුගේ අස-
රුවෝද[11] ඔහුගේ මුළු හමුදාවද මුහුද
අසල බාල්-ෂෙපොන් ඉදිරිපිට පීහහී-
රොත්හි කඳවුරු බැඳගෙන සිටි ඊශ්‍රා-
යෙලිතයන් ළඟටම ආවෝය.[12]

10 පාරාවෝ සහ ඔහුගේ හමු-
දාව ඊශ්‍රායෙල් පුත්‍රයන් සිටි ස්ථාන-
යට ළඟා වූ විට ඊශ්‍රායෙල් ජනයා
මහත් සේ භය වී යෙහෝවා දෙවිට
මොරගැසුවෝය.[13] 11 ඔවුහු මෝ-
සෙස්ට මෙසේ කීවෝය. "ඔබ අපිව
ඊජිප්තු දේශයේ සිට මේ පාළුකරයට
ගෙනාවේ ඇයි? අපිව මරා දාන්-
නද?[14] ඊජිප්තු දේශයේ මිනී වළවල්
නැති නිසාද අපිව මේ පාළුකරයට
ගෙනාවේ? 12 'ඊජිප්තුවරුන්ට සේ-
වය කරන්න අපිට ඉඩ දෙන්න'
කියා ඊජිප්තු දේශයේදී අපි ඔබට
කිව්වේ මේ නිසයි. මේ පාළුකර-
යේ මැරිලා යනවාට වඩා ඊජිප්තු-
වරුන්ට බැළ මෙහෙවරකම් කළා
නම් ඊට වඩා හොඳයි."[1] 13 එවිට
මෝසෙස් සෙනඟට මෙසේ කීවේය.
"භය වෙන්න එපා.[2] නොසැලී ස්ථි-
රව ඉන්න. අද යෙහෝවා දෙවි
ඔබව ගලවාගන්නා ආකාරය ඔබේ
දෑසින්ම බලාගන්න.[3] ඔබ ඉදිරියේ
සිටින මේ ඊජිප්තුවරුන්ව ඔබ යළි
කිසිදාක දකින්නේ නැහැ.[4] 14 යෙ-
හෝවා දෙවි ඔබ වෙනුවෙන් අනි-
වාර්යයෙන්ම සටන් කරයි.[5] ඔබ
නිශ්චලව බලා සිටින්න."

15 ඉන්පසු යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. "සෙනඟ මෙ-
ලෙස මොරගසන්නේ මන්ද?[6]
මෙතැනින් පිටත්ව යන්න සූදා-
නම් වෙන්න කියා ඊශ්‍රායෙල් ජනයාට
පවසන්න. 16 මුහුද දෙබෑ වී[7] ඒ
මැදින් වියළි පාරක් ඇති වන පිණිස
ඔබේ සැරයටිය[8] මුහුද දෙසට දිගු
කරන්න. එවිට ඊශ්‍රායෙල් ජනයාට
මුහුද මැදින්[9] ඇවිද යෑමට හැකි වනු
ඇත. 17 ඊජිප්තුවරු තමන්ගේ සිත්
මුරණ්ඩු කරගෙන[10] ඊශ්‍රායෙල් සෙනඟ
පසුපස හඹා එනු ඇත. මා ඔවුන්ට
එසේ කිරීමට ඉඩහරින්නේ පාරාවෝද
ඔහුගේ යුධ රථද ඔහුගේ අසරු-
වන්ද ඔහුගේ මුළු හමුදාවද අන්ත
පරාජයකට පත් කර මාගේ නාමය
ගෞරවයට පත් කරන පිණිසය.[11]
18 මෙසේ ඊජිප්තුවරුන්ව පරාජයට
පත් කර මාගේ නාමය ගෞරවයට
පත් වන විට මා යෙහෝවා දෙවි
බව ඔවුහු අනිවාර්යයෙන්ම දැනගනු
ඇත."[12]

19 ඉන්පසු ඊශ්‍රායෙල් සෙනඟට
ඉදිරියෙන් ගමන් කරමින් සිටි සැබෑ
දෙවිගේ දූතයා[13] සෙනඟ පිටුපසට
ගියේය. ඔවුන්ට ඉදිරියෙන් තිබූ වලා

**14 පරි.**

1 ගීතා 71:11
2 නික් 4:21; නික් 7:13; රෝම 9:18
3 නික් 9:16; නික් 15:11; නික් 18:11; යොෂු 2:10; නෙහෙ 9:11; යෙසා 2:11; රෝම 9:17
4 නික් 7:5; නික් 8:22; ගීතා 83:18; එස 26:6
5 නික් 12:33; ගීතා 105:25
6 විනි 6:8; 1සාමු 2:27; 1සාමු 6:6
7 නික් 14:23
8 යොෂු 17:16; විනි 4:3
9 ගණන් 33:3
10 නික් 7:3; ද්වි 2:30; යොෂු 11:20; ගීතා 10:2; හිතෝ 16:18
11 නික් 15:19
12 නික් 15:9; යොෂු 24:6
13 යොෂු 24:7; නෙහෙ 9:9; ගීතා 34:17; ගීතා 107:6
14 නික් 16:3; නික් 17:3; ගණන් 14:2; ගීතා 106:7

**2 තීරුව**

1 නික් 5:21; නික් 6:9; හෙබ්‍රෙ 3:16; හෙබ්‍රෙ 10:38
2 ගණන් 14:9; ද්වි 20:3; 2ලේක 20:15; ගීතා 27:1; ගීතා 46:1; යෙසා 41:10
3 2ලේක 20:17; හිතෝ 29:25
4 නික් 14:30; නික් 15:5; නෙහෙ 9:11; ගීතා 136:15; හිතෝ 16:4
5 ද්වි 1:30; ද්වි 20:4; 2ලේක 20:29
6 යොෂු 7:10
7 ගීතා 78:13
8 නික් 4:20; නික් 17:9
9 නෙහෙ 9:11
10 නික් 4:21; නික් 7:13; රෝම 9:18

11 නික් 9:16; යොෂු 24:6; රෝම 9:17; 12 නික් 14:4; 13 උත් 48:16; නික් 32:34; ගණන් 20:16; යූද් 9.

ටැඹද ඔවුන් පිටුපසට ගොස් නැවතු-
ණේය.[1] **20** ඊජිප්තු සේනාව, වලා
ටැඹෙහි එක් පැත්තකද ඊශ්‍රායෙල්
සෙනඟ එහි අනික් පැත්තේද සිටි-
යෝය.[2] මුළු රාත්‍රිය පුරාම වලා
ටැඹෙහි එක් පැත්තක් අඳුරුව තිබූ
අතර එහි අනික් පැත්තෙන් ආලෝක-
යක් විහිදුණේය.[3] මෙසේ මුළු රාත්‍රිය
පුරාම වලා ටැඹ ඒ දෙපිරිසව වෙන්
කර තැබුවේය.

**21** මෝසෙස් තම අත මුහුද දෙ-
සට දිගු කළේය.[4] යෙහෝවා
දෙවි එවෙලේම නැඟෙනහිරෙන් තද
සුළඟක් හමන්න සැලැස්වූවේය. මුළු
රාත්‍රිය පුරාම හැමූ එම සුළඟ නිසා
මුහුද ක්‍රමක්‍රමයෙන් දෙබෑ විය.[5] මුහුදු
පතුල මතු විය.[6] **22** පසුව මුහුද
හරහා තිබූ වියළි මාර්ගය දිගේ
ඊශ්‍රායෙල් පුත්‍රයෝ ගමන් කළෝය.[7]
ඔවුන් ගමන් කළ මඟ දෙපස
මුහුදු ජලය පවුරක් මෙන් තිබිණ.[8]
**23** එය දැක පාරාවෝගේ සියලු අස-
රුවෝද යුධ රථද ඔවුන් පසුපස
හඹාගෙන[9] මුහුද මැදට ගියෝය.
**24** අන්තිම රැකවල් යාමයේදී* යෙ-
හෝවා දෙවි එක් පැත්තක ආලෝක-
යද අනික් පැත්තේ අන්ධකාරයද තිබූ
වලා ටැඹේ[10] සිට ඊජිප්තු සේනාව
දෙස බැලුවේය. දෙවි ඊජිප්තුවරුන්
අතරේ මහත් වියවුලක් ඇති වීමට
සැලැස්වූවේය.[11] **25** දෙවි ඔවුන්ගේ
අශ්ව රථවල රෝද ගලවා දැමූ
නිසා ඔවුහු ඉතා අමාරුවෙන් ඒවා
පදවාගෙන ගියෝය.[12] එවිට ඊජිප්-
තුවරු එකිනෙකාට මෙසේ කියාගත්-
තෝය. "ඊශ්‍රායෙල්වරුන්ව ලුහුබඳින
එක අත්හැර අපි දැන්මම මෙතැනින්
යමු. යෙහෝවා දෙවි සැබවින්ම ඔවුන්
වෙනුවෙන් සටන් කරනවා."[13]

**26** පසුව යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. "මුහුද නැවත
එකතු වී ඊජිප්තුවරුන්වද ඔවුන්-
ගේ යුධ රථද අසරුවන්ද සම්පූර්ණ-
යෙන්ම යට වී යන පිණිස දැන් ඔබේ
අත මුහුද දෙසට දිගු කරන්න."[1]
**27** මෝසෙස් විගස තම අත මුහුද
දෙසට දිගු කළේය. පාන්දර වන විට
මුහුද සාමාන්‍ය තත්වයට පත් වී
තිබිණ. ඊජිප්තුවරු ඒ වන තුරුම
තම ජීවිත බේරාගන්න උත්සාහ කළ
නමුත් යෙහෝවා දෙවි ඔවුන්ව රැල්-
ලට ගසාගෙන යෑමට සැලැස්වූවේය.[2]
**28** මුහුදේ වතුර නැවත ක්‍රමක්‍රම-
යෙන් එකතු විය.[3] අවසානයේදී ඊශ්‍රා-
යෙලිතයන් පසුපස හඹාගෙන මුහුද
මැදට ගිය පාරාවෝගේ සේනාවට
අයිති සියලු යුධ රථද අසරුවෝද
මුහුදට යට වූහ.[4] පාරාවෝගේ සේනා-
වේ කිසිවෙක් බේරුණේ නැත.[5]

**29** ඊශ්‍රායෙල් ජනයා මුහුද මැදින්
ගමන් කළෝය. ඔවුහු වියළි
බිමෙහි ගමන් කළ අතර[6] මුහුදු
ජලය ඔවුන් ගිය මඟ දෙපස පවු-
රක් මෙන් තිබිණ.[7] **30** මෙසේ යෙ-
හෝවා දෙවි එදින ඊශ්‍රායෙලිතයන්ව
ඊජිප්තුවරුන්ගෙන් ගලවාගත්තේය.[8]
ඊශ්‍රායෙල්වරු මුහුදු වෙරළේ විසිරී
තිබූ ඊජිප්තුවරුන්ගේ මළ කඳන් දුටු-
වෝය.[9] **31** එදින යෙහෝවා දෙවි
ඊජිප්තුවරුන්ට විරුද්ධව තම මහත්
බලය විදහාපෙන්වූ ආකාරය ඊශ්‍රා-
යෙල්වරුන්ට තම ඇසින්ම දැකගැනී-
මට හැකි විය. ඔවුන්ට යෙහෝවා
දෙවි ගැන ගරුබියක් ඇති විය. යෙ-
හෝවා දෙවි කෙරෙහිද ඔහුගේ සේව-
කයා වූ මෝසෙස් කෙරෙහිද ඔවුහු
විශ්වාසය තැබුවෝය.[10]

**15** ඒ අවස්ථාවේදී මෝසෙස් සහ
ඊශ්‍රායෙල් සෙනඟ යෙහෝවා
දෙවිට මේ ප්‍රශංසා ගීය ගායනා
කළෝය.[11]

"යෙහෝවා දෙවි අසරුවන්ව මුහු-
දට හෙළා[12] විශිෂ්ට ජයක්
අත් කරගත්තේය.
එහෙයින් මම ඔහුට ගී ගයන්-
නෙමි.[13]
**2** මගේ ශක්තියද බලයද යෙහෝවා

**14 පරි.**
1 නික් 13:21; ගීතා 34:7; යෙසා 52:12
2 යොෂු 24:7
3 ගීතා 105:39
4 නික් 14:16; ක්‍රියා 7:36
5 නෙහෙ 9:11; ගීතා 78:13; ගීතා 136:13; යෙසා 63:12
6 යොෂු 2:10; ගීතා 66:6; ගීතා 106:9; ගීතා 114:3; යෙසා 51:10
7 නික් 15:19; ගණන් 33:8; යෙසා 63:13; 1කොරි 10:1; හෙබ්‍රෙ 11:29
8 නික් 15:8
9 නික් 14:17; ගීතා 10:2
10 නික් 13:21
11 නික් 23:27; 1සාමු 5:11; ගීතා 18:14
12 ගීතා 76:6
13 නික් 14:4; ද්වි 3:22; 1සාමු 4:8

**2 තීරුව**
1 නික් 7:19; නික් 8:5
2 නික් 15:1
3 නික් 15:10; ද්වි 11:4; නෙහෙ 9:11; ගීතා 78:53; හෙබ්‍රෙ 11:29
4 උත් 15:14; නික් 14:23; යොෂු 24:7
5 නික් 14:13; ගීතා 106:11; ගීතා 136:15
6 ගීතා 66:6; ගීතා 77:19
7 නික් 14:22; නික් 15:8
8 ද්වි 4:20; ගීතා 106:8
9 ගීතා 58:10; ගීතා 59:10; ගීතා 91:8; හිතෝ 16:4
10 නික් 4:31; නික් 19:9; ගීතා 106:12

**15 පරි.**
11 විනි 5:1; 2සාමු 22:1; එළි 15:3
12 නික් 15:21; ගීතා 136:15

---

**නික් 14:24*** හෙබ්‍රෙව්වරුන්ට අනුව තුන්වෙනි රැකවල් යාමයේදී. පාන්දර දෙකේ සිට පාන්දර හය දක්වා කාලයයි.

13 නික් 9:16; නික් 18:11; ගීතා 106:12.

දෙවිය.[1] මගේ ගැලවුම්කරුත්
ඔහුය.[2]
මගේ පියාගේ දෙවිත්[3] මගේ
දෙවිත් ඔහුමය. මම ඔහුට
ප්‍රශංසා කරන්නෙමි.[4] ඔහු-
ගේ නාමය ගෞරවයට පත්
කරන්නෙමි.[5]
3 යෙහෝවා දෙවි යුධ දක්ෂයෙකි.[6]
ඔහුගේ නාමය යෙහෝවාය.[7]
4 දෙවි, පාරාවෝගේ අශ්ව රථද හමු-
දාවද මුහුදට හෙළුවේය.[8]
ඔහුගේ දක්ෂතම යුධ භටයෝද
රතු මුහුදේ ගිලුණෝය.[9]
5 මහා ජල කඳ ඔවුන්ව වසාගත්-
තේය.[10] ගලක් මෙන් ඔවුහු
මුහුදු පතුලටම කිඳා බැස්-
සෝය.[11]
6 යෙහෝවා දෙවියනි, ඔබේ දකු-
ණත බලවත්ය.[12]
යෙහෝවා දෙවියනි, ඔබ ඔබේ
දකුණතින් සතුරන්ව සුනුවි-
සුනු කර දමන්නෙහිය.[13]
7 ඔබ තේජසින් ඉතා උසස් නිසා
ඔබට විරුද්ධව නැඟී සිටින්-
නන්ව ඔබ පහතට හෙළන්-
නෙහිය.[14]
ඔබේ උදහස නිසා ඔවුහු පිදුරු
මෙන් දැවී යන්නෝය.[15]
8 ඔබේ එක හුස්මට[16] ජලය දෙපසට
තල්ලු වී ගියේය.
ජල ධාරාවෝ වේල්ලකින් හිර
කර තබන්නාක් මෙන් නො-
සෙල්වී සිටියෝය.
මහ මුහුදේ ජල කඳ මිදුණෝය.
9 ‘මම ඔවුන්ව ලුහුබැඳ[17] ඔවුන්ව
අල්ලාගන්නෙමි.[18]
තෘප්තියට පැමිණෙන තුරු
කොල්ල කා ගත් දේ බෙදන්-
නෙමි.[19]
මම කඩුව ඇද ඔවුන්ව පන්නා
දමන්නෙමි’[20] කියා සතුරා
කීවේය.
10 ඔවුන් ජලයෙන් යට වී[21] යන
පිණිස ඔබ ඔබේ හුස්ම මුහුද
දෙසට පිම්බෙහිය.[22]
ඔවුහු රුදුරු ජල කඳට හසු
වී ඊයම් මෙන් කිඳා බැස්-
සෝය.[1]
11 යෙහෝවා දෙවියනි, ඔබට සමාන
තව දෙවි කෙනෙක් සිටීද?[2]
ඔබ තරම් ශුද්ධ කෙනෙක්
තවත් සිටීද?[3]
පුදුම දනවන ක්‍රියා[4] කරන
තැනැත්තා ඔබය. ප්‍රශංසාව[5]
හා ගරුබිය[6] ලැබිය යුතු
තැනැත්තාද ඔබය.
12 ඔබ ඔබේ දකුණත[7] දිගු කළ
විට පොළොව ඇරී සතුරන්ව
ගිලගත්තේය.[8]
13 ඔබ මුදාගත්[9] ඔබේ සෙනඟට
මඟ පෙන්වමින් ඔබේ ඉමහත්
ප්‍රේමය* ඔබ ඔවුන්ට පෙන්වූ-
වෙහිය.
ඔබේ මහත් බලය විදහාපෙන්-
වමින් ඔබේ ශුද්ධ වාසස්-
ථානයට[10] ඔවුන්ව ගෙන
යන්නෙහිය.
14 මනුෂ්‍යයෝ මේ ගැන දැනගෙන[11]
භයෙන් වෙවුලන්නෝය.[12]
පිලිස්තියේ වැසියන්ට මහත්
වේදනා[13] ඇති වන්නේය.
15 ඒදොම්හි අධිපතියෝ කැලඹෙන්-
නෝය.
මෝවබ්හි බලවන්තයෝ තැති-
ගන්නෝය.[14]
කානාන්හි සියලු වැසියෝ බෙ-
ලහීන වන්නෝය.[15]
16 භීතිය ඔවුන්ව වෙළාගන්නේය.[16]
යෙහෝවා දෙවියනි, ඔබේ මහත්
බලයෙන් ඔබ බිහි කළ[17]
ඊශ්‍රායෙල් ජාතිය[18] දේශය
මැදින් යන තෙක්[19]
ඔවුහු ගල් ගැසී බලා සිටින්-
නෝය.
17 යෙහෝවා දෙවියනි, ඔබේ වාසය
සඳහා ස්ථිර ලෙස පිහිටෙවූ
ස්ථානයට[20] ඔබ ඔවුන්ව
ගෙන යන්නෙහිය.

**15 පරි.**
1 නික් 17:16; ගීතා 18:1; යෙසා 12:2; පිලි 4:13
2 එළි 7:10
3 නික් 3:15
4 2සාමු 22:47; ගීතා 99:5; යෙසා 25:1
5 ගීතා 83:18; ගීතා 148:13
6 නෙහෙ 4:20; ගීතා 24:8
7 නික් 6:3; යෙසා 42:8
8 නික් 14:27; යොෂු 24:6
9 නික් 14:7
10 යොෂු 24:7
11 නෙහෙ 9:11
12 ගීතා 17:7; ගීතා 60:5; ගීතා 89:13; ගීතා 118:15; 1පේතෘ 5:6
13 හෙබ්‍රෙ 10:31
14 ගීතා 148:13; යෙසා 5:16; යෙසා 37:23
15 ද්වි 4:24; ගීතා 59:13; හෙබ්‍රෙ 12:29
16 2සාමු 22:16; ගීතා 18:15
17 නික් 14:8
18 නික් 14:9
19 එස 38:12
20 නික් 14:5; යෙසා 36:20
21 නික් 14:28; ද්වි 11:4
22 උත් 8:1; නික් 14:21

**2 තීරුව**
1 නික් 15:5; නෙහෙ 9:11
2 ද්වි 3:24; 2සාමු 7:22; 1කොරි 8:5
3 ලෙවී 19:2; යෙසා 6:3; 1පේතෘ 1:16
4 නික් 11:9
5 හෙබ්‍රෙ 2:12
6 ලූක් 12:5; හෙබ්‍රෙ 12:28
7 නික් 15:6
8 ගීතා 78:53; හෙබ්‍රෙ 11:29
9 ගීතා 106:10
10 ගීතා 78:54
11 ගණන් 14:14; යොෂු 2:10
12 ගීතා 99:1
13 ගීතා 48:6
14 ගණන් 22:3
15 යොෂු 2:11; යොෂු 5:1

**16** ද්වි 11:25; යොෂු 2:9; **17** යෙසා 43:1; **18** නික් 19:5; ද්වි 32:9; 2සාමු 7:23; **19** ගණන් 20:17; ගණන් 21:22; ද්වි 2:27; **20** 1රාජා 8:27.

නික් **15:13*** හෝ, “ලැදි ප්‍රේමය.”

යෙහෝවා දෙවියනි, ඔබේම
අතින් ඔබ සෑදූ ශුද්ධස්-
ථානය[1] වන ඔබට අයිති
කන්දේ ඔබ ඔවුන්ව පිහිටු-
වන්නෙහිය.*[2]
**18** යෙහෝවා දෙවි සදාකාලයෙන්
සදාකාලයට රජකම් කරන්-
නේය.[3]
**19** පාරාවෝගේ අසරුවෝද[4] යුධ
රථද මුහුද මැදට ගිය විට[5]
යෙහෝවා දෙවි මහා ජල කඳ
ඔවුන් මතට හෙළුවේය.[6]
එනමුත් ඊශ්‍රායෙල් ජනයා මුහුද
හරහා වියළි මඟක ඇවිද
ගියෝය."[7]

**20** ආරොන්ගේ සහෝදරිය වූ
අනාගතවක්තෘවරියක වන මිරියම්[8]
රබානක් අතට ගත්තාය.[9] අනික්
ස්ත්‍රීහුද රබන් ගසමින් හා නටමින්
ඇය පසුපස ගියෝය.[10] **21** ඊශ්‍රා-
යෙල් පුරුෂයන් වදන් පෙළක් ගැයූ
පසු මිරියම්ද මේ වදන් පෙළ ගැයූ-
වාය.[11]

"යෙහෝවා දෙවි අසරුවන්ව මුහු-
දට හෙළා[12] විශිෂ්ට ජයක්
අත් කරගත්තේය.[13]
එහෙයින් ඔහුට ප්‍රශංසා ගී
ගයමු."[14]

**22** පසුව මෝසෙස් ඊශ්‍රායෙල් සෙ-
නඟව රතු මුහුදේ සිට ෂූර් පාළුකරය[15]
දක්වා ගෙන ගියේය. ඔවුන් දවස්
තුනක් පුරා පාළුකරයේ ගමන් කළත්
ඔවුන්ට බීමට වතුර සම්බ නොවීය.[16]
**23** අන්තිමේදී ඔවුහු මාරාහ්[17] නම්
ස්ථානයට පැමිණියෝය. නමුත් ඒ
ස්ථානයේ තිබූ වතුර තිත්ත වූ
බැවින් ඔවුන්ට එය බීමට නොහැකි
විය. ඔහු එම ස්ථානයට මාරාහ්*[18]
යන නම තැබුවේ ඒ නිසාය.
**24** ඒ අවස්ථාවේදී සෙනඟ මෝ-
සෙස්ට විරුද්ධව මැසිවිලි නඟමින්,[19]
"අපිට බොන්න වතුර කෝ" කියා
ඇසුවෝය. **25** එවිට මෝසෙස් යෙ-
හෝවා දෙවිට කන්නලව් කළේය.[1]
යෙහෝවා දෙවි ඔහුට කුඩා පැළෑටි-
යක් පෙන්වූවේය. පසුව ඔහු එම
පැළෑටිය රැගෙන වතුරට විසි කළේය.
එවිට වතුර බීමට ගත හැකි ලෙස
මිහිරි විය.[2]

එහිදී ඔවුන්ගේ සිත් සෝදිසි කර
බලන[3] පිණිස දෙවි ඔවුන්ට පනතක්ද
නියෝගයක්ද දුන්නේය. **26** දෙවි
ඔවුන්ට මෙසේ කීවේය. "මා ඔබේ
දෙවි වන යෙහෝවාය. ඔබ මගේ
හඬට ඉතා ඕනෑකමින් සවන් දී
මා හරියයි කියන දේ කරන්න.
මගේ ආඥාවලට කන් දී මගේ සියලු
පනත්වලට කීකරු වන්න.[4] ඔබ
එසේ කළොත් ඊජිප්තුවරුන් පිටට
ගෙනා එක වසංගතයක්වත් මම
ඔබ පිටට නොගෙනෙන්නෙමි.[5] ඔබට
සුවය ගෙන දෙන්නේ යෙහෝවා දෙවි
වන මමය."[6]

**27** පසුව ඔවුහු ඒලිම් වෙතට
ආවෝය. එහි දිය උල්පත් දොළහක්ද
තාල වර්ගයට අයත් ගස් හැත්තෑ-
වක්ද[7] තිබූ බැවින් ඔවුහු එහි කඳවුරු
බැඳගත්තෝය.

**16** ඊශ්‍රායෙල් සෙනඟ ඒලිම් වෙ-
තින් පිටත්ව ගියෝය.[8] පසුව
ඔවුහු ඒලිම් හා සීනයි අතරේ තිබෙන
සින් නම් පාළුකරයට[9] පැමිණියෝය.
ඊජිප්තු දේශයෙන් පිටත්ව යැමෙන්
අනතුරුව දෙවෙනි මාසයේ පහ-
ළොස්වන දිනයේදී ඊශ්‍රායෙල් සෙනඟ
එතැනට ආවෝය.

**2** මුළු ඊශ්‍රායෙල් සෙනඟ පාළු-
කරයේදී මෝසෙස්ට හා ආරොන්ට
විරුද්ධව මැසිවිලි නඟන්න පටන්-
ගත්තෝය.[10] **3** ඔවුහු මැසිවිලි
නඟමින් මෙසේ කීවෝය. "ඔබ අපිව
මේ පාළුකරයට ගෙනාවේ හාමතේ
මරලා දාන්නද?[11] අපි ඊජිප්තු දේශ-
යේදීම යෙහෝවා දෙවිගේ අතින්
මැරුම් කෑවා නම්[12] මීට වඩා
හොඳයි. එහෙදී අපි හිතේ හැටියට
මස් කෑවා.[13] තව කොච්චර කෑම
ජාතින් අපි කෑවද!"

**15 පරි.**
1 නික් 25:8
2 ද්වි 4:21; ගීතා 44:2; ගීතා 78:54; ගීතා 80:8
3 ගීතා 10:16; ගීතා 146:10; දානි 4:3
4 නික් 14:23; හිතෝ 21:31
5 යොෂු 24:6
6 නික් 14:28; හෙබ්‍රෙ 11:29
7 නික් 14:22
8 ගණන් 26:59
9 ගීතා 81:2
10 විනි 11:34; 1සාමු 18:6; 2සාමු 6:5; ගීතා 150:4; යෙරෙ 31:4
11 1සාමු 18:7
12 නික් 14:27
13 නික් 14:17; නික් 18:11
14 විනි 5:3
15 උත් 16:7; උත් 25:18
16 නික් 17:1
17 ගණන් 33:8
18 රූත් 1:20
19 නික් 16:2; නික් 17:3; ගණන් 11:1; 1කොරි 10:10; යූද් 16

**2 තීරුව**
1 නික් 17:4; ගීතා 50:15
2 2රාජා 2:21
3 නික් 16:4; ද්වි 8:2; 1පේතෘ 1:7
4 ලෙවී 26:3; ද්වි 28:1; 1යොහ 5:3
5 නික් 9:10; ද්වි 7:15
6 නික් 23:25; ගීතා 103:3
7 ගණන් 33:9

**16 පරි.**
8 ගණන් 33:10
9 ගණන් 33:11
10 නික් 15:24; ගීතා 106:25; 1කොරි 10:10
11 නික් 17:3; ගණන් 16:13; ද්වි 8:3; විලා 4:9
12 ගණන් 14:2; යෝනා 4:8
13 ගණන් 11:4

**නික් 15:17*** මූ.අ., "සිටුවන්නෙහිය." **23*** තේ-
රුම, "තිත්ත."

**4** එවිට යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. “මේ සෙනඟ
මගේ නීතියට එකඟව ක්‍රියා කරන-
වාද නැද්ද කියා මම දැන් සෝ-
දිසි කර බලන්නෙමි.[1] මම ඔබට
අහසෙන් කෑම වැටෙන්න සලස්-
වන්නෙමි.[2] සෙනඟ තම තමන්ට
අවශ්‍ය කෑම ප්‍රමාණය දවසින් දවස
අහුලාගත යුතුයි.[3] **5** නමුත් ඔවුන්
හයවෙනි දවසේදී[4] අනික් දවස්වලදී
එකතු කරන කෑම ප්‍රමාණයට වඩා
දෙගුණයක් එකතු කරගත යුතුයි.[5]
ඉන්පසු ඒවා කෑමට පිළියෙල කරගත
යුතුයි.”

**6** එහෙයින් මෝසෙස් සහ ආරොන්
සෙනඟට මෙසේ කීවෝය. “ඔබව
ඊජිප්තු දේශයෙන් පිටතට ගෙනාවේ
වෙන කිසිවෙකු නොව යෙහෝවා දෙ-
විම බව ඔබ අද හවස නිසැකවම
දැනගනීවි.[6] **7** ඇයි ඔබ අපට විරුද්-
ධව මැසිවිලි නඟන්නේ? අපි කවුද?
අපි නිකම්ම නිකම් මිනිස්සු විතරයි.
ඇත්තෙන්ම ඔබ මැසිවිලි නඟන්නේ
යෙහෝවා දෙවිට විරුද්ධවයි. එය
ඔහුට ඇහෙන බව අමතක කරන්න
එපා. හෙට උදෑසන වන විට ඔබ
ස්ථිර වශයෙන්ම යෙහෝවා දෙවි-
ගේ තේජස දකීවි?”[7] **8** මෝසෙස්
ඔවුන්ට තවදුරටත් මෙසේ කීවේය.
“ඔබ යෙහෝවා දෙවිට විරුද්ධව
නඟන මැසිවිලි ඔහුට ඇහෙනවා. ඒ
නිසා යෙහෝවා දෙවි අද හවසට
ඔබට කන්න මස්ද හෙට උදෑසන
ඇති තරම් කන්න තවත් ආහාරද
ලබා දී ඔහුගේ තේජස ඔබට දකින්න
සලස්වයි. අපිට විරුද්ධව මැසිවිලි
නඟන්න අපි කවුද? ඔබ මැසිවිලි
නඟන්නේ අපිට විරුද්ධව නොවෙයි.
යෙහෝවා දෙවිට විරුද්ධවයි.[8] ඒක
අමතක කරන්න එපා.”

**9** පසුව මෝසෙස් ආරොන්ට
මෙසේ කීවේය. “ඊශ්‍රායෙල් සෙනඟට
මෙසේ කියන්න. ‘ඔබ නැඟූ මැසිවිලි
දෙවිට ඇහුණා.[9] දැන් යෙහෝවා දෙවි
ඉදිරියේ රැස් වෙන්න.’ ” **10** ආරොන්
මුළු ඊශ්‍රායෙල් සෙනඟට කතා කළ
පසු ඔවුහු පාළුකරය දෙස හැරී බැලූ-
වෝය. එවිට යෙහෝවා දෙවිගේ තේ-
ජස වලාකුළක් තුළ දිස් විය.[1]

**11** යෙහෝවා දෙවි නැවත මෝ-
සෙස්ට මෙසේ කීවේය. **12** “ඊශ්‍රා-
යෙල් පුත්‍රයන්ගේ මැසිවිලි මට
ඇසිණ.[2] ඔවුන්ට මෙසේ පවසන්න.
‘අද හවස* ඔබට කෑමට මස් ලැබෙනු
ඇත. හෙට උදේට තවත් ආහාර ඇති
තරම් ඔබට ලැබෙනු ඇත.[3] එවිට මා
ඔබේ දෙවි වන යෙහෝවා බව ඔබ
අනිවාර්යයෙන්ම දැනගනීවි.’ ”[4]

**13** සවස් වූ විට මුළු කඳවුරම වැසී
යන තරමට ඒ දෙසට වටුවෝ[5]
ආවෝය. පසුවදා උදෑසන කඳවුර
අවට සෑම තැනකම පිනි තිබිණ.[6]
**14** පින්න නැති වී ගිය පසු හිමවලට
සමාන[7] වූ ඉතා කුඩා ඇට වර්ග-
යක්[8] පාළුකරයේ භූමිය පුරා තිබෙ-
නවා ඔවුහු දුටුවෝය. **15** ඊශ්‍රායෙල්
සෙනඟ එය දැක, “ඒ මොනවාද”
කියා එකිනෙකාගෙන් ඇසුවෝය.
මන්ද පොළොව පුරා වැටී තිබු-
ණේ කුමක්දැයි ඔවුහු දැන සිටියේ
නැත. එවිට මෝසෙස් ඔවුන්ට මෙසේ
කීවේය. “මේ තිබෙන්නේ යෙහෝවා
දෙවි ඔබට දුන් කෑම.[9] **16** ඔබ
කෑම එකතු කරගත යුත්තේ කෙ-
සේද කියා යෙහෝවා දෙවි ඔබට
දැන්නුවා. ‘ඔබ එක් එක් කෙනා
තම තමාට අවශ්‍ය ප්‍රමාණය එකතු
කරගන්න. ඔබේ කූඩාරම්වල ජීවත්
වන අයගේ සංඛ්‍යාව ගණන් කර ඒ
එක් එක් කෙනාට කෑම ඕමෙර-
යක්*[10] බැගින් එකතු කරගන්න.’ ”
**17** ඊශ්‍රායෙල් සෙනඟ ඔහු කී ලෙස
කළෝය. ඔවුන්ගෙන් සමහරෙක් වැඩි
ප්‍රමාණයක්ද තවත් සමහරෙක් සුළු
ප්‍රමාණයක්ද එකතු කරගත්තෝය.
**18** ඔවුහු තමන් එකතු කරගත් දේ
ඕමෙරයක මිම්මෙන් මැන බැලූ විට
සියලුදෙනාම තම තමන්ට ප්‍රමාණ-
වත් ලෙස කෑම එකතු කරගෙන තිබූ

**16 පරි.**
1 ද්වි 8:2; යාකො 1:3; 1පේතෘ 1:7
2 ගීතා 78:24; ගීතා 105:40; යොහ 6:31; 1කොරි 10:3
3 නෙහෙ 11:23; හිතෝ 30:8; මතෙ 6:11
4 නික් 35:2
5 නික් 16:22
6 නික් 6:7; ගණන් 16:28; ගීතා 77:20; යෙසා 63:11
7 නික් 24:10; ලෙවී 9:6; ගණන් 16:42; යොහ 11:40
8 ගණන් 21:7; 1සාමු 8:7; යෙසා 32:6; ලූක් 10:16
9 නික් 16:2; ගණන් 11:1

**2 තීරුව**
1 නික් 13:21; ගණන් 16:19; 1රාජා 8:11; මතෙ 17:5
2 ගණන් 14:27; යූද් 16
3 ගීතා 105:40
4 නික් 4:5; නික් 6:7; එස 34:31
5 ගණන් 11:31; ගීතා 78:27
6 ගණන් 11:9
7 ගීතා 147:16
8 ගණන් 11:7; ද්වි 8:3; නෙහෙ 9:15; ගීතා 78:24
9 ගණන් 21:5; ද්වි 8:16; යොෂු 5:12; යොහ 6:31; යොහ 6:58; 1කොරි 10:3; හෙබ්‍රෙ 9:4
10 නික් 16:36

**නික් 16:12*** නික් 12:6හි පාදසටහන බලන්න.
**16*** ලීටර් 2.2ක් පමණය.

බව පෙනී ගියේය. කිසිවෙකුට කෑම
අඩු වුණේවත් වැඩි වුණේවත් නැත.[1]
**19** ඉන්පසු මෝසෙස්, “හෙට උදේ
වෙනකම් කිසි දෙයක් ඉතුරු කර-
ගන්න එපා”[2] කියා ඔවුන්ට කීවේය.
**20** නමුත් ඔවුහු මෝසෙස් කී දේට
සවන් දුන්නේ නැත. යමෙකු උදේ
වන තුරු කෑම ඉතුරු කරගත් විට
එහි පණුවන් බෝ වී ගඳ ගසන්න
පටන්ගත්තේය.[3] එය දැක මෝසෙස්
ඔවුන් සමඟ කෝප විය.[4] **21** ඔවුහු
උදයක් පාසා උදයක්[5] තම තමන්ට
අවශ්‍ය කෑම ප්‍රමාණය එකතු කරගත්-
තෝය. අව් රශ්මිය තද වූ විට පො-
ළොව මත තිබූ ඒ කෑම දිය වී ගියේය.
**22** හයවෙනි දවසේදී ඔවුහු වෙ-
නදා එකතු කරගත් ප්‍රමාණය
මෙන් දෙගුණයක් එකතු කරගත්-
තෝය.[6] ඔවුහු තම තමාට ඕමෙර දෙ-
කක් බැගින් එකතු කරගත්තෝය.
පසුව සෙනඟ අතරේ සිටි අධිපති-
යෝ මෝසෙස්ට ඒ ගැන දැන්වූවෝය.
**23** එවිට මෝසෙස් ඔවුන්ට මෙසේ
කීවේය. “දැන් යෙහෝවා දෙවි කියූ
කාරණය අසන්න. හෙට දින සබත්
දවසක්. හෙට යෙහෝවා දෙවිට ගෞ-
රව කරන පිණිස ශුද්ධ සබතක්
පැවැත්විය යුතුයි.[7] ඒ නිසා ඔබට යම්
කෑමක් පුලුස්සගන්න හෝ තම්බ-
ගන්න අවශ්‍ය නම් එය අදම කරන්න.[8]
ඉතුරු වන කෑම හෙටට තබාගන්න.
ඒක විසි කරන්න එපා.” **24** ඔවුහු
මෝසෙස් කී ලෙස කෑම උදේ වන
තුරු තබාගත්තෝය. එයින් දුඟ-
දක් හැමුවේවත් එයට පණුවෝ බෝ
වුණේවත් නැත.[9] **25** ඉන්පසු මෝ-
සෙස්, “අද යෙහෝවා දෙවිට ගෞරව
කරන පිණිස සබතක්[10] පැවැත්විය
යුතුයි. ඉතුරු කරගත් කෑම අද
ඔබට කන්න පුළුවන්. අද භූමිය
මතුපිටට කෑම වැටෙන්නේ නැහැ.
**26** ඔබ දවස් හයක් කෑම එකතු කර-
ගත යුතුයි. නමුත් හත්වෙනි දවස
සබත් දවසක්.[11] එදින භූමිය මතුපිට
කෑම තිබෙන්නේ නැහැ.” **27** නමුත්
සමහර අය හත්වන දවසේදීද කෑම
එකතු කරගැනීමට ගියෝය. එහෙත්
ඔවුන්ට එකතු කරගැනීමට කිසිවක්
තිබුණේ නැත.
**28** එහෙයින් යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. “මේ සෙනඟ
තව කොපමණ කාලයක් මෙලෙස
මගේ ආඥා හා නීති කඩ කරයිද?[1]
**29** යෙහෝවා දෙවි වන මා ඔබට
සබත පැවැත්වීමට අණ කළ බව අම-
තක නොකරන්න.[2] හත්වෙනි දවසේදී
සියලුදෙනාම තම තමන්ගේ ස්ථාන-
වලම රැඳී සිටින්න.[3] කිසිම කෙනෙක්
පිටතට නොයා යුතුයි. මා හයවෙනි
දවසේදී ඔබට දවස් දෙකකට ප්‍රමා-
ණවත් කෑම දෙන්නේ ඒ නිසයි.”
**30** සෙනඟද හත්වෙනි දවසේදී සබත
පැවැත්වූවෝය.[4]
**31** ඊශ්‍රායෙල් ජනයා භූමිය මතුපි-
ටට වැටුණු එම ආහාරයට, “මන්නා”*
යන නම තැබූහ. එය සුදු පාටය.
එහි හැඩය කොත්තමල්ලි ඇටයකට
සමානය. එහි රස, පැණි දමා සෑදූ
කැවිලිවල රස මෙනි.[5] **32** පසුව
මෝසෙස් මෙසේ කීවේය. “යෙහෝවා
දෙවි මෙසේ පැවසුවේය. ‘මා ඔබව
ඊජිප්තු දේශයෙන් පිටතට ගෙනා පසු
ඔබට පාළුකරයේදී කන්න දුන්නේ[6]
කුමක්ද කියා ඔබේ මතු පරම්ප-
රාවල සියලුදෙනාම දකින පිණිස
එයින් ඕමෙරයක් එකතු කර තබා-
ගන්න.’ ”[7] **33** ඉන්පසු මෝසෙස්
ආරොන්ට මෙසේ කීවේය. “මන්නා
ඕමෙරයක් භාජනයක දමා ඔබේ
සියලු පරම්පරාවල අයට එය දැකගැ-
නීම සඳහා යෙහෝවා දෙවි ඉදිරි-
යේ තබන්න.”[8] **34** යෙහෝවා දෙවි
මෝසෙස්ට අණ කළ පරිදි ආරොන්,
මන්නා භාජනය විශේෂ පෙට්ටිය*[9]
ඉදිරියේ ආරක්ෂා සහිතව තැබුවේය.
**35** ඊශ්‍රායෙල් සෙනඟ ජනාවාස දේශ-
යක් වූ කානාන් දේශයේ[10] සීමාවට
පැමිණෙන තෙක්ම[11] එනම්, අවුරුදු
හතළිහක්[12] පුරාම මන්නා කෑවෝය.

**16 පරි.**
**1** 2කොරි 8:15
**2** නික් 12:10; මතෙ 6:34
**3** මතෙ 6:19
**4** නික් 32:19; ගණන් 16:15; එෆී 4:26
**5** මතෙ 6:11
**6** නික් 16:5
**7** නික් 20:8; නික් 31:15; නික් 35:2; ලෙවී 23:3; මාක් 2:27
**8** ගණන් 11:8
**9** නික් 16:33
**10** නෙහෙ 9:14
**11** නික් 20:9; නික් 31:13; ද්වි 5:15; යෙරෙ 17:22; මතෙ 12:12; ලූක් 13:15

**2 තීරුව**
**1** ගණන් 14:11; 2රාජා 17:14; ගීතා 78:10; ගීතා 81:13; ගීතා 106:13; ලූක් 16:31
**2** නික් 31:13; යෙසා 58:13; එස 20:12
**3** ලූක් 23:56
**4** ලෙවී 23:3; ද්වි 5:14
**5** නික් 16:15; ගණන් 11:7
**6** ගීතා 78:20
**7** ගීතා 105:5; ගීතා 111:4
**8** හෙබ්‍රෙ 9:4
**9** නික් 27:21; නික් 30:6; නික් 40:20; 1රාජා 8:9
**10** ගණන් 33:48; ද්වි 1:8; ද්වි 34:1
**11** යොෂු 5:12; නෙහෙ 9:15
**12** ද්වි 8:2; නෙහෙ 9:21; ගීතා 78:24; යොහ 6:49

**නික් 16:31*** තේරුම, “ඒ මොනවාද” විය හැකියි. 15වන පදය බලන්න. **34*** මූ.අ., “සාක්ෂිය.”

**36** ඕමෙරයක් යනු ඒපාවකින්* දහ-
යෙන් කොටසකි.

**17** ඊශ්‍රායෙල් ජනයා සින් පාළු-
කරයෙන් පිටත්ව ගියෝය.[1]
ඔවුහු යෙහෝවා දෙවි අණ කළ ලෙස[2]
තැනින් තැන නතර වෙමින් රෙෆිඩීම්[3]
වෙතට පැමිණ කඳවුරු බැඳගත්-
තෝය. නමුත් ඔවුන්ට බොන්න එහි
ජලය තිබුණේ නැත.
**2** එහෙයින් සෙනඟ, "අපිට
බොන්න වතුර දෙන්න" කිය-
මින් මෝසෙස් සමඟ වාද කළෝය.[4]
එවිට මෝසෙස් ඔවුන්ගෙන් මෙසේ
ඇසුවේය. "ඇයි ඔබ මා සමඟ මේ විදි-
හට වාද කරන්නේ? නිතරම යෙ-
හෝවා දෙවිව සැක කරමින් ඔහු ඔබ
වෙනුවෙන් මැදිහත් වෙයිද නැද්ද
කියා පරීක්ෂා කර බලන්නේ ඇයි?"[5]
**3** පිපාසයෙන් පෙළුණු සෙනඟ මෝ-
සෙස්ට විරුද්ධව මෙසේ මැසිවිලි
නැඟුවෝය. "ඔබ අපව ඊජිප්තු දේ-
ශයේ සිට කාන්තාරයකට ගෙනා-
වේ ඇයි? අපිවත් අපේ දරුවන්වත්
අපේ සතුන්වත් මරා දාන්නද?"[6]
**4** එවිට මෝසෙස් යෙහෝවා දෙවිට
කන්නලව් කරමින්, "මම දැන් මොන-
වාද කරන්නේ? තව සුළු මොහොත-
කින් මේ සෙනඟ මට ගල් ගසයි"[7]
කියා කීවේය.
**5** එවිට යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. "නයිල් ගඟේ
වතුරට පහර දුන් සැරයටිය[8] රැගෙන
ඊශ්‍රායෙල්හි වැඩිමහල්ලන් කිහි-
පදෙනෙකු සමඟ සෙනඟට පෙර-
ටුවෙන් ගමන් කරන්න.[9] **6** එසේ
ගමන් කරමින් හොරෙබ්හි* තිබෙන
කන්ද ළඟට යන්න. මම ඒ කන්ද මත
සිටින්නෙමි. ඉන්පසු ඔබ සැරයටි-
යෙන් කන්දට ගසන්න. එවිට එයින්
වතුර ගලා එනු ඇත. සෙනඟට ඒ
වතුර බොන්න දෙන්න."[10] මෝසෙස්ද
ඊශ්‍රායෙල්හි වැඩිමහල්ලන් බලා සිටි-
යදී දෙවි කී ලෙස කළේය. **7** ඊශ්‍රා-
යෙල් සෙනඟ තමා සමඟ වාද කළ
නිසාත්, "යෙහෝවා දෙවි ඇත්තටම
අප අතරේ සිටිනවාද"[1] කියමින් යෙ-
හෝවා දෙවි ඔවුන් වෙනුවෙන් මැදි-
හත් වෙයිද නැද්ද කියා පරීක්ෂා කළ
නිසාත්[2] මෝසෙස් එම ස්ථානයට
මස්සාහ්*[3] හා මෙරිබා#[4] යන නම්
තැබුවේය.
**8** අමලෙක්වරු[5] රෙෆිඩීම්හිදී ඊශ්‍රා-
යෙල් සෙනඟට විරුද්ධව සටනට
ආවෝය.[6] **9** එවිට මෝසෙස් යොෂු-
වාට*[7] මෙසේ කීවේය. "අමලෙක්-
වරුන්ට විරුද්ධව සටනට යෑමට
මිනිසුන්ව තෝරාගන්න.[8] ඔවුන් ඊශ්‍රා-
යෙල් ජාතිය වෙනුවෙන් සටන් කළ
යුතුයි. මමත් සැබෑ දෙවිගේ සැරය-
ටිය[9] අතැතිව හෙට කඳු මුදුනේ සිටි-
නවා." **10** මෝසෙස් කියූ ලෙසම
යොෂුවා අමලෙක්වරුන්ට විරුද්ධව
සටන් කරන පිණිස මිනිසුන්ව තෝ-
රාගත්තේය.[10] මෝසෙස්, ආරොන්
සහ හූර්[11] යන තිදෙනාම කන්ද මුදු-
නට ගියෝය.
**11** මෝසෙස් තම අත ඔසවා-
ගෙන සිටි විට ඊශ්‍රායෙල්වරු අමලෙක්-
වරුන්ට වඩා දක්ෂ ලෙස සටන්
කළෝය.[12] නමුත් මෝසෙස් තම අත
පහත දැමූ විට අමලෙක්වරු ඊශ්‍රා-
යෙල්වරුන්ට වඩා දක්ෂ ලෙස සටන්
කළෝය. **12** මෝසෙස්ට තවදුර-
ටත් තම අත් ඔසවාගෙන සිටින්න
බැරි වූ විට ආරොන් සහ හූර් ඔහුට
ඉඳගන්න ගලක් දී ඔහුගේ දෙපැත්තේ
සිට ඔහුට අත් ඔසවාගෙන සිටින්න
උපකාර කළෝය. මෙසේ හිරු බැස
යන තෙක් ඔහු තම අත් පහතට දැමු-
වේ නැත. **13** යොෂුවා, අමලෙක්ව-
රුන්ටද ඔවුන් සමඟ සිටි සෙනඟටද
කඩුවෙන් පහර දී[13] ඔවුන්ව පරාජය
කළේය.

**17 පරි.**
1 ගණන් 33:12
2 ගණන් 33:2
3 ගණන් 33:14
4 නික් 5:21; ගණන් 14:2; ගණන් 20:3
5 ගණන් 14:22; ගීතා 78:18; ගීතා 95:9; ගීතා 106:14; ලූක් 4:12; 1කොරි 10:9; හෙබ්‍රෙ 3:9
6 නික් 16:2
7 1සාමු 30:6; යොහ 10:31
8 නික් 7:20
9 එස 2:6
10 ගණන් 20:8; ද්වි 8:15; නෙහෙ 9:15; ගීතා 78:15; ගීතා 105:41; ගීතා 114:8; යෙසා 48:21; 1කොරි 10:4

**2 තීරුව**
1 නික් 34:9; ද්වි 31:17; ක්‍රියා 7:39
2 ද්වි 6:16; ගීතා 95:8; හෙබ්‍රෙ 3:8
3 ද්වි 9:22; ද්වි 33:8
4 ගීතා 81:7
5 උත් 36:12
6 ද්වි 25:17; 1සාමු 15:2
7 ගණන් 11:28; ද්වි 32:44; ක්‍රියා 7:45
8 ගණන් 31:3
9 නික් 4:2
10 යොෂු 11:15
11 නික් 24:14
12 ගීතා 56:9
13 යොෂු 11:12

**නික් 16:36*** ඒපාවක් යනු ලීටර් 22ක් දැමිය හැකි මිනුම් භාජනයකි. **17:6*** මෙහි සඳහන් වන්නේ සීනයි කන්ද අවට තිබෙන කඳුකර ප්‍රදේශය ගැනයි. දසපනත ලබා දුන් හොරෙබ් කන්ද ගැන නොවෙයි. එම ප්‍රදේශය සීනයි පාළුකරය ලෙසද හැඳින්වේ.

**නික් 17:7*** තේරුම, "පරීක්ෂා කිරීම." **7#** තේරුම, "රණ්ඩු කිරීම." **9*** තේරුම, "යෙහෝවා දෙවි දෙන ගැලවීම." ග්‍රීක උච්චාරණයට අනුව මෙය ඉජේසුස් හෙවත් 'යේසුස්.'

14 පසුව යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. “කාලයත්
සමඟම මම අමලෙක්වරුන්ව සහමු-
ලින්ම විනාශ වී යෑමට සලස්වන්-
නෙමි. නැවත කිසිදාක ඔවුන්ව සිහි
වන්නේ නැත.[1] මා දැන් පැවසූ ඒ දේ
ලියවිල්ලේ සටහන් කර[2] යොෂුවා
ඉදිරියේ ශබ්ද නඟා කියවන්න. එය
සෙනඟට සිහිගැන්වීමක් වනු ඇත.”
15 ඉන්පසු මෝසෙස් පූජාසනයක්
ගොඩනඟා එයට යෙහෝවා-නිස්සයි*
යන නාමය තැබීය. 16 “අමලෙක්-
වරුන් යෙහෝවා දෙවිගේ[3] සිංහාසන-
යට[4] විරුද්ධව නැඟී සිටිය නිසා
යෙහෝවා දෙවි ඔවුන්ගේ සියලු පරම්-
පරාවලදී ඔවුන්ට විරුද්ධව යුද්ධ
කරන්නේය”[5] කියමින් මෝසෙස් එම
පූජාසනයට ඒ නාමය තැබීය.

**18** දෙවි, මෝසෙස් වෙනුවෙන්ද
තම සෙනඟ වන ඊශ්‍රායෙල්
ජාතිය වෙනුවෙන්ද කළ සියලු දේ
මෝසෙස්ගේ මාමා වූ මිදියන්හි පූජක
යෙත්‍රෝට[6] ආරංචි විය. යෙහෝවා
දෙවි ඊශ්‍රායෙල්වරුන්ව ඊජිප්තු දේ-
ශයෙන් පිටතට ගෙනා ආකාරයද
ඔහුට දැනගන්න ලැබිණ.[7] 2 (මේ
වන විට මෝසෙස් තම මාමා
වන යෙත්‍රෝ වෙතට තම භාර්යා-
වව යවා තිබිණ.) යෙත්‍රෝ මෝ-
සෙස්ගේ භාර්යාව වන ශිප්පෝරාවද
3 ඇගේ පුත්‍රයන් දෙදෙනාවද[8] කැඳ-
වාගෙන ආවේය. ඇගේ වැඩිමල්
පුත්‍රයාගේ නම ගේර්ෂෝම්ය.[9] ඔහුට
එම නම දෙනු ලැබුවේ, “මම මේ
දේශයේ ජීවත් වෙන්නේ විදේශික-
යෙක් ලෙසයි” කියා මෝසෙස් පැවසූ
නිසාය. 4 ඇගේ දෙවෙනි පුත්‍රයාගේ
නම එලියේසර්ය.[10] ඔහුට එම නම
දුන් අවස්ථාවේදී මෝසෙස් මෙසේ
කියා තිබිණ. “මගේ උපකාරකයා
වන්නේ මගේ පියාගේ දෙවියය. මාව
පාරාවෝගේ අතින් ගලවාගත්තේ
ඔහුය.”[11]

5 පසුව මෝසෙස්ගේ මාමා වන
යෙත්‍රෝද මෝසෙස්ගේ පුතුන් දෙ-
දෙනා හා ඔහුගේ භාර්යාවද පාළුකර-
යේ ඔහු කඳවුරු බැඳගෙන සිටි
ස්ථානය අසලට පැමිණියෝය. මෝ-
සෙස් කඳවුරු බැඳගෙන සිටියේ සැබෑ
දෙවිගේ කන්ද[1] අසලය. 6 යෙත්‍රෝ[2]
මෝසෙස්ට පණිවිඩයක් යවා මෙසේ
දැන්වීය. “ඔබේ භාර්යාව හා පුතුන්
දෙදෙනා සමඟ මම ඔබව බලන්න
ඇවිත් සිටිනවා.” 7 එය ඇසූ විගස
මෝසෙස් තම මාමාව හමු වීමට
ගියේය. ඔහු හිස නමා යෙත්‍රෝට
ආචාර කර ඔහුව සිපගත්තේය.[3] ඉන්-
පසු ඔවුහු එකිනෙකාගෙන් සැප දුක්
විමසා කූඩාරම ඇතුළට ගියෝය.
8 යෙහෝවා දෙවි ඊශ්‍රායෙල් සෙ-
නඟව ගලවාගැනීමට පාරාවෝට හා
ඊජිප්තු සෙනඟට කළ සියල්ල මෝ-
සෙස් තම මාමා වන යෙත්‍රෝට
විස්තර කළේය.[4] ගමන අතරතු-
රේදී ඔවුන්ට මුහුණ දීමට සිදු වූ
සියලු දුෂ්කරතා[5] ගැනද යෙහෝවා
දෙවි ඔවුන්ව ගලවාගත් ආකා-
රය[6] ගැනද මෝසෙස් ඔහුට කීවේය.
9 යෙහෝවා දෙවි ඊශ්‍රායෙල් සෙනඟව
ඊජිප්තුවරුන්ගේ අතින් බේරාගෙන
ඔවුන් වෙනුවෙන් කළ සියලු යහපත්-
කම් ගැන ඇසූ විට යෙත්‍රෝ ඉතා
සතුටු විය.[7] 10 ඔහු මෙසේ කීවේය.
“ඊජිප්තුවරුන්ගේ හා පාරාවෝගේ
අතින් ඔබව ගලවාගත් යෙහෝවා
දෙවිට ප්‍රශංසා වේවා![8] 11 සියලු
දෙවිවරුන්ට වඩා යෙහෝවා දෙවි
උසස්[9] බව දැන් මම දන්නවා. ඊශ්‍රා-
යෙල්වරුන්ට විරුද්ධව උද්ධච්ච ලෙස
ක්‍රියා කළ ඊජිප්තුවරුන්ට දෙවි කළ
දෙයින් ඒ බව හොඳින් ඔප්පු වුණා.”
12 දෙවිට ඔප්පු කරන පිණිස යාග හා
දවන පූජාවක්[10] යෙත්‍රෝ ගෙනාවේය.
පසුව ආරොන්ද ඊශ්‍රායෙල්හි සියලු
වැඩිමහල්ලෝද මෝසෙස්ගේ මාමා
සමඟ එකට ඉඳගෙන සැබෑ දෙවි ඉදි-
රියේ කෑම කෑවෝය.[11]
13 පසුවදා මෝසෙස් සුපුරුදු පරිදි
සෙනඟගේ නඩු විභාග කිරීම සඳහා

**17 පරි.**
1 ගණන් 24:20 ද්වි 25:19 1ලේක 4:43
2 නික් 34:27
3 ගීතා 94:12 යෙසා 12:2 යෙසා 26:4 එළි 19:1
4 යෙසා 66:1 ක්‍රියා 7:49
5 1සාමු 15:20 එස්ත 3:1 එස්ත 7:10 එස්ත 9:24

**18 පරි.**
6 නික් 2:21 නික් 3:1
7 යොෂු 2:10 යොෂු 9:9
8 ක්‍රියා 7:29
9 නික් 2:22
10 1ලේක 23:15
11 නික් 2:15 2කොරි 1:10

**2 තීරුව**
1 නික් 19:2 1රාජා 19:8
2 නික් 4:18 ගණන් 10:29
3 උත් 33:3 2සාමු 14:33 රෝම 12:10
4 නික් 7:3 නික් 14:28 ද්වි 4:34 නෙහෙ 9:10
5 නික් 15:22 නික් 16:3 ගණන් 20:14
6 ගීතා 81:7 ගීතා 102:2 දානි 3:29
7 ද්වි 33:29 රෝම 15:10
8 උත් 14:20 ලූක් 1:68
9 නික් 15:11 2ලේක 2:5 ගීතා 95:3 ගීතා 97:9 දානි 2:47
10 මලා 1:11
11 උත් 31:54

**නික් 17:15*** තේරුම, “මට මහ පෙන්වන්නේ යෙහෝවා දෙවිය” යන්න විය හැකියි.

හිඳගත්තේය.[1] උදෑසන සිට සවස
දක්වාම සෙනඟ ඔහු ළඟට ආවෝය.
**14** මෝසෙස් සෙනඟ වෙනුවෙන් කළ
සියල්ල දැක ඔහුගේ මාමා ඔහුට
මෙසේ කීවේය. “ඔබ ඇයි මේ විදි-
හට නඩු විසඳන්නේ? උදේ සිට
හවස් වන තුරු සෙනඟ ඔබ ළඟට
එනවා. ඔබ තනියෙන්ම ඔවුන්ගේ
නඩු විසඳනවා.” **15** එවිට මෝ-
සෙස් තම මාමාට මෙසේ උත්-
තර දුන්නේය. “සෙනඟ මා ළඟට
එන්නේ යම් යම් කාරණා සම්-
බන්ධයෙන් දෙවිගේ උපදෙස් ලබා-
ගන්නයි.[2] **16** ඔවුන්ට විසඳගන්න
නඩුවක්[3] තිබුණාම ඔවුන් මා ළඟට
එනවා. නඩුවට සම්බන්ධ දෙපිරිස-
ගේම කාරණා ඇසූ පසු මම සැබෑ දෙ-
විගේ අණපනත් හා ඔහුගේ තීන්දුව
ඔවුන්ට දන්වනවා.”[4]

**17** එය අසා මෝසෙස්ගේ මාමා
ඔහුට මෙසේ කීවේය. “ඔබ කට-
යුතු කරන ආකාරය එතරම්
සාර්ථක නැහැ. **18** ඔබ මෙලෙස
දිගටම කළොත් ඔබත් ඔබ ළඟ
සිටින සෙනඟත් හොඳටම හෙම්බත්
වෙයි.[5] කාගෙන් හෝ උදව්වක් නො-
මැතිව මේ කටයුතු සියල්ල ඔබට
තනියෙන් කරන්න බැහැ.[6] **19** දැන්
මා කියන දේ අසන්න.[7] මේ කාර්-
යය කරන්න ඕන විදිහ මම ඔබට
කියා දෙන්නම්. දෙවි ඔබේ උපකාර-
යට ඉන්නවා[8] කියා මට විශ්වා-
සයි. ඔබ සෙනඟ ඉදිරියේ සැබෑ
දෙවිගේ නියෝජිතයා ලෙස කට-
යුතු කරන්න.[9] ඔබ ළඟට නඩුවක්
ගෙනා විට ඔබ ඒ ගැන සැබෑ දෙවිට
දන්වන්න.[10] **20** සෙනඟ පිළිපැදිය
යුතු නීති හා පනත් ඔබ ඔවුන්ට
දන්වන්න.[11] ඔවුන් ජීවත් විය යුතු
ආකාරය ගැනත් ඔවුන් ක්‍රියා කළ
යුත්තේ කෙසේද කියාත් ඔවුන්ට
කියා දෙන්න.[12] **21** ඔබ මුළු සෙනඟ
අතරින් වගකීම් දැරිය හැකි පුරුෂ-
යන් කිහිපදෙනෙකුව තෝරාගන්න.[13]
ඔබ තෝරාගත් පුරුෂයන් අයුතු
ලෙස ලාභ ප්‍රයෝජන ගැනීම පිළිකුල්
කරන,[1] දෙවිට ගරුබිය දක්වන,[2] විශ්-
වාසවන්ත අය[3] විය යුතුයි. සෙනඟව
දහසක්, සියයක්, පනහක් හා දහයක්
බැගින් වූ කණ්ඩායම්වලට[4] වෙන් කර
ඔවුන්ව බලාගැනීම සඳහා ඒ පුරුෂ-
යන්ව[5] පත් කරන්න. **22** එවිට සෙ-
නඟගේ එදිනෙදා කාරණා ඔවුන්ට
විභාග කළ හැකියි. නමුත් විනිශ්චය
කිරීමට අමාරු නඩු ඔවුන් ඔබ වෙ-
තට ගෙනා යුතුයි.[6] සුළු සුළු නඩු
ඔවුන්ට තනියෙන් විසඳිය හැකියි.
ඔබේ වැඩේ වඩාත් පහසු කරගැනීමට
ඔබේ වගකීම ඔවුන් සමඟ බෙ-
දාගන්න.[7] **23** මම කියන විදිහට
කළොත් මේ කාර්යය සාර්ථකව කර-
ගැනීමට ඔබට හැකි වෙයි. සෙ-
නඟද සමාදානයෙන් තම තමන්ගේ
නිවෙස්වලට යයි.[8] දෙවිත් මා කියන
දේට එකඟ වෙයි.”

**24** මෝසෙස් ඒ මොහොතේදීම
තම මාමාගේ උපදෙස් පිළිගෙන ඒ
අනුව ක්‍රියා කළේය.[9] **25** ඔහු ඊශ්‍රා-
යෙල් සෙනඟ අතරින් වගකීම් දැරිය
හැකි පුරුෂයන්ව තෝරාගත්තේය.
පසුව ඔහු දහසක්, සියයක්, පනහක්
හා දහයක් බැගින් වූ කණ්ඩායම්වලට
සෙනඟව වෙන් කර ඔවුන්ව බලාගැ-
නීමට තෝරාගත් පුරුෂයන්ව පත්
කළේය.[10] **26** සෙනඟගේ එදිනෙදා
කාරණා හා සුළු සුළු නඩු ඔවුහු
තනිව විභාග කර විසඳුවෝය. නමුත්
විනිශ්චය කිරීමට අමාරු නඩු ඔවුහු
මෝසෙස් වෙත ගෙන ආවෝය.[11]
**27** මෝසෙස්ගේ මාමා තමාගේ දේශ-
යට පිටත්ව ගියේය.[12]

**19** ඊශ්‍රායෙල් ජනයා ඊජිප්තු දේ-
ශයෙන් පිටත් වීමෙන් අනතු-
රුව තුන්වන මාසයේදී*[13] සීනයි නම්
පාළුකරයට[14] ආවෝය. **2** ඊශ්‍රායෙල්
සෙනඟ රෙෆිඩිම්හි[15] සිට සීනයි පාළු-
කරය[16] දක්වා ගමන් කර එහි තිබූ
කන්ද ඉදිරියේ කඳවුරු බැඳගත්-
තෝය.[17]

**නික් 19:1*** හෙබ්‍රෙව් භාෂාවේ එම දවසේදීම යන අදහසත් ගැබ්ව තිබේ.

**18 පරි.**
1 මතෙ 23:2
2 නික් 20:19; ගණන් 12:8; ගණන් 27:5
3 නික් 24:14; ද්වි 17:8; 1කොරි 6:1
4 ද්වි 4:5; ද්වි 5:1; ද්වි 6:1
5 ගණන් 11:11
6 ගණන් 11:14; ද්වි 1:9; ක්‍රියා 6:2
7 නික් 18:24; හිතෝ 9:9
8 යොෂු 1:17
9 නික් 20:19; ද්වි 5:5
10 ගණන් 27:5
11 ද්වි 7:11; නෙහෙ 9:14; මාක් 10:3
12 1සාමු 12:23; ගීතා 32:8; යෙසා 30:21; යෙරෙ 42:3; මීකා 4:2
13 ගණන් 11:17; ද්වි 1:13; ක්‍රියා 6:3; 1තිමෝ 3:2; තීත 1:9

**2 තීරුව**
1 නික් 23:8; ක්‍රියා 20:33; 1තිමෝ 3:3; 1පේතෘ 5:2
2 2ලේක 6:31; 2ලේක 19:7; යෝබ් 2:3; හිතෝ 8:13
3 එස 18:8; ආනි 6:5; 1තෙස 2:10; 1තිමෝ 3:7; තීත 1:7
4 ද්වි 1:15; ක්‍රියා 14:23; තීත 1:5
5 ගණන් 10:4
6 ලෙවී 24:11; ගණන් 15:33; ද්වි 1:17
7 ගණන් 11:17
8 හිතෝ 11:14
9 හිතෝ 12:15
10 ක්‍රියා 6:5
11 ක්‍රියා 15:2
12 ගණන් 10:29

**19 පරි.**
13 එස්ත 8:9
14 ලෙවී 7:38
15 නික් 17:1
16 ගණන් 33:15
17 නික් 3:12

**3** මෝසෙස් සැබෑ දෙවි ඉදිරියට
යන පිණිස කන්දට නැග්ගේය. යෙ-
හෝවා දෙවි එම ස්ථානයේ[1]
සිට මෝසෙස්ට මෙසේ කීවේය. “ඔබ
යාකොබ්ගේ ගෙයි වැසියන් වන ඊශ්‍රා-
යෙල් පුත්‍රයන්ට මෙසේ කියන්න.
**4** ‘මා ඊජිප්තුවරුන්ට විරුද්ධව කළ
සියල්ල ඔබ දුටුවහුය.[2] රාජාලීන් තම
පැටවුන්ව පියාපත් පිට ගෙන යන්-
නාක් මෙන් මම ඔබව උසුලාගෙන
මා වෙතට ගෙනාවෙමි.[3] **5** එහෙ-
යින් ඔබ මාගේ සෑම වචනයකටම
කීකරු වී[4] මා ඔබ සමඟ ඇති කර-
ගන්නා ගිවිසුම රක්ෂා කරනවා නම්[5]
සියලු ජාතීන් අතරින් මම ඔබව
මාගේ විශේෂ සෙනඟ ලෙස තෝරා-
ගන්නෙමි.[6] මන්ද මේ පොළොවේ
අයිතිකරු මමය.[7] **6** ඔබ මට පූජ-
කයන්ගෙන් යුත් රාජ්‍යයක් හා ශුද්ධ
ජාතියක් වන්නේය.’[8] ඔබ මේ සියල්ල
ඊශ්‍රායෙල් සෙනඟට කියන්න.”

**7** පසුව මෝසෙස් ඊශ්‍රායෙල්හි
වැඩිමහල්ලන්ව[9] තමා වෙතට
කැඳවා යෙහෝවා දෙවි පැවසූ
සියල්ල ඔවුන්ට දැන්වූවේය.[10]
**8** එය අසා මුළු සෙනඟ එක
හඬින් මෙසේ කීවෝය. “යෙහෝවා
දෙවි පැවසූ සියල්ල කිරීමට අප
සතුටුයි.”[11] මෝසෙස්ද විගස යෙ-
හෝවා දෙවි වෙතට ගොස් සෙනඟ-
ගේ කැමැත්ත ඔහුට දැන්වූවේය.[12]
**9** එවිට යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. “මා ඔබ සමඟ කතා
කරන විට එය සෙනඟට ඇසෙන
පිණිසත්[13] සෙනඟ සැමදාටම ඔබව
විශ්වාස කරන පිණිසත්[14] මම ඝන
වලාකුළකින්[15] ඔබ වෙතට පැමි-
ණෙන්නෙමි.” ඉන්පසු මෝසෙස් සෙ-
නඟ පැවසූ දේ යෙහෝවා දෙවිට
දැන්වූවේය.

**10** යෙහෝවා දෙවි තවදුරටත්
මෝසෙස්ට මෙසේ කීවේය. “දැන් සෙ-
නඟ ළඟට යන්න. සෙනඟව
ශුද්ධ තත්වයකට ගෙන එන
පිණිස ඔවුන්ව අදත් හෙටත් ඒ සඳහා
සූදානම් කරන්න. ඔවුන් තම තමන්-
ගේ වස්ත්‍ර සෝදාගෙන[1] **11** තුන්-
වන දවස සඳහා සූදානම්ව සිටිය
යුතුයි. මන්ද තුන්වන දවසේදී යෙ-
හෝවා දෙවි වන මම මුළු සෙනඟ
ඉදිරියේ සීනයි කන්ද මතට බැස එන්-
නෙමි.[2] **12** ඔබ කන්ද වටේට සීමා
තබමින් සෙනඟට මෙසේ කියන්න.
‘ඔබ කන්දට නොනඟින ලෙස වග-
බලා ගන්න. එහි පාමුල නොඇල්-
ලීමටත් වගබලා ගන්න. යමෙකු
කන්දට පය තැබුවොත් ඔහුව අනි-
වාර්යයෙන්ම මරා දැමිය යුතුයි.[3]
**13** මනුෂ්‍යයෙකු හෝ සතෙකු හෝ
කන්දට පය තැබුවොත් ඒ මනුෂ්‍ය-
යාව හෝ සතාව ගල් ගසා මරා
දැමිය යුතුයි.[4] එසේ නැතහොත් ආයු-
ධයකින් ඇන මරා දැමිය යුතුයි.
ඒ මනුෂ්‍යයාව හෝ සතාව කිසි-
වෙකු නොඇල්ලිය යුතුයි.’ හොරණෑ-
වේ හඬ[5] ඇසෙන විට කන්ද පාමුලට
පැමිණීමට සෙනඟට හැකිය.”

**14** ඉන්පසු මෝසෙස් කන්දෙන්
බැස සෙනඟ ළඟට ගියේය. ඔහු
සෙනඟව ශුද්ධ තත්වයකට ගෙන
එන පිණිස ඔවුන්ව සූදානම්
කළේය. සෙනඟද තම තමන්ගේ
වස්ත්‍ර සෝදාගත්තෝය.[6] **15** “සූදා-
නමින් සිටින්න.[7] මේ දවස් තුන ඇතු-
ළත කිසි පුරුෂයෙකු තම භාර්යාව
සමඟ සම්බන්ධකම්* නොපැවැත්විය
යුතුයි”[8] කියා මෝසෙස් සෙනඟට
කීවේය.

**16** තුන්වෙනි දවසේ උදෑසන ඝන
වලාකුළක්[9] කන්ද මුදුනේ පෙනෙන්-
නට තිබිණ. ඒ අවස්ථාවේදී ගිගුරුම්
හඬ මැද විදුලි කෙටුවේය.[10] මහා
හයියෙන් හොරණෑවක් පිඹින ශබ්ද-
යද[11] ඇසුණේය. එවිට කඳවුරේ සිටි
සියලුදෙනා භයෙන් වෙවුලුවෝය.[12]
**17** මෝසෙස් කඳවුරේ සිටි සියලුදෙ-
නාවම සැබෑ දෙවි ඉදිරියට ගෙන
ගියේය. ඔවුහු කන්ද පාමුල සිට-
ගත්තෝය.[13] **18** යෙහෝවා දෙවි

---

නික් **19:15*** එනම්, ලිංගික සම්බන්ධකම්.

**19 පරි.**
1 නෙහෙ 9:13, ක්‍රියා 7:38
2 ද්වි 4:34
3 ද්වි 32:11, යෙසා 63:9
4 ගීතා 119:4, හිතෝ 19:16, 1යොහ 5:3
5 1රාජා 8:21, ගීතා 25:10, ගලා 4:24
6 1රාජා 8:53, ගීතා 135:4
7 ද්වි 10:14, 1කොරි 10:26
8 ලෙවී 11:44, ද්වි 7:6, යෙසා 61:6, 1පේත්‍ 2:9, එළි 5:10
9 නික් 3:16
10 නික් 24:3
11 නික් 24:7, ද්වි 26:17, යොෂු 24:24
12 ගණන් 12:8
13 ද්වි 4:12, ද්වි 4:36, ක්‍රියා 7:38
14 ලූක් 10:16
15 ද්වි 4:11, 1රාජා 8:12, ගීතා 97:2, හෙබ්‍රෙ 12:18

**2 තීරුව**
1 ගණන් 8:21
2 නික් 34:5, ද්වි 33:2, ගීතා 18:9
3 ලෙවී 10:2, 2සාමු 6:7
4 හෙබ්‍රෙ 12:20
5 නික් 20:18, යොෂු 6:4
6 නික් 19:10, යොෂු 7:13, 1සාමු 16:5
7 ආමො 4:12
8 1සාමු 21:4, 1කොරි 7:5
9 ද්වි 4:11, 1රාජා 8:12, ගීතා 97:2
10 ගීතා 77:18
11 හෙබ්‍රෙ 12:19
12 හෙබ්‍රෙ 12:21
13 ද්වි 4:10, ද්වි 5:5

ගින්න මැදින්[1] සීනයි කන්ද මතට
බැස ඇවිත් සිටි නිසා පෝරණුව-
කින් දුම් නඟින්නාක් මෙන්[2] කන්-
දෙන් දුම් නඟින්න පටන්ගත්තේය.
මුළු කන්දම දුමෙන් වැසී ගියේය.[3]
කන්ද දෙදරන්න පටන්ගත්තේය.[4]
19 හොරණෑ ශබ්දය ක්‍රමක්‍රමයෙන්
වැඩි වූ විට මෝසෙස් සැබෑ දෙවිට
කතා කළේය. දෙවිද සියල්ලන්ට
ඇසෙන සේ ඔහුට පිළිතුරු දුන්-
නේය.[5]

20 යෙහෝවා දෙවි සීනයි කන්ද
මුදුනට බැස ආවේය. ඉන්පසු යෙ-
හෝවා දෙවි කන්ද මුදුනට එන
ලෙස මෝසෙස්ට කීවේය. මෝසෙස්
කන්ද මුදුනට ගිය විට[6] 21 යෙ-
හෝවා දෙවි ඔහුට මෙසේ කීවේය.
"දැන් කන්දෙන් බැස යන්න. යෙ-
හෝවා දෙවිව බැලීමට කන්ද වටේ
තිබෙන සීමා බිඳගෙන නොඑන ලෙස
සෙනඟට අනතුරු අඟවන්න. ඔවුන්
එසේ කළොත් බොහෝදෙනෙකුට
මැරෙන්න සිදු වෙයි.[7] 22 නිතරම
යෙහෝවා දෙවි ඉදිරියට එන පූජක-
යන්ටත් ශුද්ධ තත්වයක සිටින්න
කියා පවසන්න.[8] නැත්නම් යෙ-
හෝවා දෙවි වන මම ඔවුන්ට
පහර දෙන්නෙමි."[9] 23 එවිට මෝ-
සෙස් යෙහෝවා දෙවිට මෙසේ
කීවේය. " 'කන්ද වටේට සීමා දමා එය
පරිශුද්ධ භූමියක් ලෙස වෙන් කර
තබන්න' කියා ඔබ අපට පැවසූ
නිසා සෙනඟට කිසිසේත් කඳු මුදුනට
ඒමට නොහැකියි."[10] 24 එහෙත්
යෙහෝවා දෙවි මෝසෙස්ට මෙසේ
කීවේය. "දැන් කන්දෙන් බැස ගොස්
ආරොන් සමඟ නැවත මෙම ස්ථාන-
යට එන්න. නමුත් පූජකයන්ටවත්
සෙනඟටවත් සීමා මායිම් බිඳගෙන
යෙහෝවා දෙවි වන මා ඉදිරියට
ඒමට ඉඩ නොදෙන්න. ඔවුන් එසේ
කළොත් මම ඔවුන්ට පහර දෙන්-
නෙමි."[11] 25 දෙවි කී සියල්ල මෝ-
සෙස් කන්දෙන් බැස ඇවිත් සෙනඟට
කීවේය.[12]

**19 පරි.**
1 නික් 24:17 2ලේක 7:3
2 උත් 19:28 ගීතා 144:5
3 ද්වි 4:11 ද්වි 5:22 ගීතා 68:8 ගීතා 104:32
4 1රාජා 19:11 ගීතා 68:8
5 නෙහෙ 9:13 ගීතා 81:7
6 නික් 24:12
7 1සාමු 6:19
8 නික් 28:41
9 ලෙවී 10:2 1ලේක 13:10 ක්‍රියා 5:5
10 නික් 19:12
11 ගණන් 16:35
12 ක්‍රියා 20:27

**2 තීරුව**

**20 පරි.**
1 ද්වි 5:22 ක්‍රියා 7:38
2 නික් 13:3
3 ගීතා 81:10 හොෂෙ 13:4 රෝම 3:29
4 ද්වි 5:7 2රාජා 17:35 යෙරෙ 25:6
5 ලෙවී 26:1 ද්වි 4:16 ද්වි 5:8 යෙසා 40:25 ක්‍රියා 17:29 1කොරි 8:4 එළි 9:20
6 උත් 35:2 නික් 23:24 1කොරි 10:20 1යොහ 5:21
7 නික් 34:14 ගණන් 25:11 මතෙ 4:10 ලූක් 10:27
8 ද්වි 5:9 2සාමු 21:6 1රාජා 21:29 මතෙ 23:35
9 ද්වි 4:37 ද්වි 5:10 දේශ 12:13 රෝම 11:28
10 ලෙවී 19:12 හිතෝ 30:9 එස 36:21
11 ලෙවී 24:16 ද්වි 5:11 යොෂු 9:20
12 නික් 16:23 නික් 31:13 ද්වි 5:12
13 නික් 23:12 ද්වි 5:13 ලූක් 13:14
14 නික් 34:21

**20** දෙවි මේ සියලු ආඥා දුන්-
නේය.[1]
2 "ඔබ බැළ මෙහෙවරකම් කළ
ඊජිප්තු දේශයෙන් ඔබව පිටතට
ගෙනා[2] ඔබේ දෙවි වන යෙහෝවා
මමය.[3] 3 මා හැර වෙන කිසි දෙවි
කෙනෙකුට ඔබ නමස්කාර නොකළ
යුතුය.[4]

4 "රූප සාදා නොගන්න. අහ-
සේ හෝ පොළොවේ හෝ ජල-
යේ හෝ තිබෙන කිසිම දෙයක
හැඩයකට සමාන රූප සාදා නො-
ගන්න.[5] 5 ඔබ ඒවා ඉදිරියේ වැඳ
නොවැටෙන්න. නමස්කාර නොක-
රන්න.[6] මන්ද යෙහෝවා නම් වූ ඔබේ
දෙවි වන මම වෙනත් දෙවිවරුන්ට
කරන නමස්කාරය ඇඩි ලෙස හෙ-
ළාදකින්නෙමි.[7] මට වෛර කරන
අයගේ වැරදිවලට ඔවුන්ගේ තුන්-
වෙනි හා හතරවෙනි පරම්පරා දක්වා
මම ඔවුන්ට දඬුවම් කරන්නෙමි.[8]
6 නමුත් මට ප්‍රේම කරන, මගේ ආඥා
පවත්වන අයගේ පරම්පරා දහස් ගණ-
නකට මම මහත් ප්‍රේමයක්* පෙන්-
වන්නෙමි.[9]

7 "යෙහෝවා යන ඔබේ දෙවි-
ගේ නාමයට අගෞරවයක් ගෙන
දෙන ආකාරයෙන් එම නාමය
සඳහන් නොකරන්න.[10] යෙහෝවා
දෙවි වන මම මාගේ නාමයට අප-
හාස කරන සියලුදෙනාටම අනිවාර්-
යයෙන්ම දඬුවම් කරන්නෙමි.[11]

8 "සබත් දවස ශුද්ධ දවසක් බව
මතක තබාගන්න.[12] 9 ඔබ දවස්
හයක් පුරා වෙහෙස මහන්සි වී වැඩ
කරන්න.[13] 10 නමුත් හත්වෙනි දව-
සේදී ඔබේ දෙවි වන යෙහෝවා වෙනු-
වෙන් සබතක් පවත්වන්න.[14] ඔබත්
ඔබේ දූපුතුන්වත් ඔබේ දාසදාසීන්-
වත් ඔබේ සතුන්වත් ඔබේ නුවරේ
ජීවත් වන විදේශිකයන්වත් එදින කිසි
වැඩක් නොකළ යුතුයි.[15] 11 මන්ද

15 නික් 16:29; ද්වි 5:14; නෙහෙ 13:16; යොහ 7:23.

නික් **20:6*** හෝ, "ලැදි ප්‍රේමයක්."

යෙහෝවා දෙවි වන මම අහසද පො-
ළොවද මුහුදද ඒවායේ තිබෙන සියල්-
ලද දවස් හයකින් සාදා[1] හත්වෙනි
දවසේදී විවේක ගත්තෙමි.[2] යෙහෝවා
දෙවි සබත් දවසට ආශීර්වාද කර එය
ශුද්ධ දවසක් ලෙස වෙන් කර තැබුවේ
ඒ නිසාය.[3]

12 “ඔබේ දෙවි වන යෙහෝවා
ඔබට දෙන දේශයේ ඔබ බොහෝ
කාලයක් ජීවත් වන පිණිස[4] ඔබේ
පියාටත් මවටත් ගෞරව කරන්න.[5]

13 “මිනී නොමරන්න.[6]

14 “අනාචාරයේ නොහැසිරෙන්න.*[7]

15 “සොරකම් නොකරන්න.[8]

16 “වෙනත් කෙනෙකුට විරුද්ධව
බොරු සාක්ෂි නොදෙන්න.[9]

17 “වෙනත් කෙනෙකුගේ නිවසට
ආශා නොකරන්න. වෙනත් කෙනෙ-
කුගේ භාර්යාවට[10] හෝ ඔහුගේ දාස-
යාට හෝ දාසියට හෝ ගවයාට හෝ
බූරුවාට හෝ ඔහුට අයිති වෙන
ඕනෑම දෙයකට හෝ ආශා නොක-
රන්න.”[11]

18 කන්දෙන් දුම් නඟිනවාත්
සමඟම විදුලි කෙටීම් හා ගිගුරුම් හඬ
මැද මහා හොරණෑ ශබ්දයක් ඇසුණු
විට සෙනඟ භයෙන් වෙවුලුවෝය.
එහෙයින් ඔවුහු කන්ද ළඟට නො-
ගියෝය.[12] 19 ඔවුහු මෝසෙස්ට
මෙසේ කීවෝය. “දෙවි අප සමඟ කෙ-
ළින්ම කතා කළොත් අපි මැරෙයි. ඒ
නිසා දෙවි කියන දේ ඔබ ඇවිත් අපට
කියන්න. අප ඒ අනුව ක්‍රියා කරන්-
නම්.”[13] 20 එවිට මෝසෙස්, “භය
වෙන්න එපා. සැබෑ දෙවි ඔබ ඉදිරියට
ඇවිත් සිටින්නේ ඔබේ සිත් විමසා
බලන්නයි.[14] ඒ වගේම ඔහුට විරුද්ධව
පව් නොකරන පිණිස ඔබ තුළ දෙවි
කෙරෙහි ගරුබියක් ඇති කරන්නයි”[15]
කියා සෙනඟට කීවේය. 21 එහෙත්
ඔවුහු කන්ද ළඟට ආවේ නැත. මෝ-
සෙස් ඝන වලාකුළ තිබෙන තැනට
ගියේය. සැබෑ දෙවි එහි සිටියේය.[16]

**නික් 20:14*** මූ.අ., “පරදාර සේවනයේ නොයෙදෙන්න.”

**20 පරි.**
1 ක්‍රියා 4:24, ක්‍රියා 14:15, එළි 10:6, එළි 14:7
2 උත් 2:2, හෙබ්‍රෙ 4:4
3 ද්වි 5:12
4 ලෙවී 19:3, ද්වි 5:16, මතෙ 15:4, එෆී 6:2
5 නික් 21:15, හිතෝ 1:8, යෙරෙ 35:18
6 උත් 9:6, ද්වි 5:17, යාකො 2:11, 1යොහ 3:15, එළි 21:8
7 උත් 39:9, ද්වි 5:18, හිතෝ 6:32, මතෙ 5:27, මතෙ 5:28, රෝම 13:9, 1කොරි 6:18, හෙබ්‍රෙ 13:4
8 ලෙවී 19:11, ද්වි 5:19, මාක් 10:19, 1කොරි 6:10, එෆී 4:28
9 ලෙවී 19:16, ද්වි 5:20, ද්වි 19:16, ගීතා 15:3
10 මතෙ 5:28
11 යොෂු 7:21, මීකා 2:2, ලූක් 12:15, රෝම 7:7
12 නික් 19:16, හෙබ්‍රෙ 12:18
13 ද්වි 18:16, ක්‍රියා 7:38, ගලා 3:19
14 උත් 22:1, ද්වි 8:2
15 යොෂු 24:14, යෝබ් 28:28, හිතෝ 1:7, යෙසා 8:13
16 ද්වි 5:5, ගීතා 97:2

**2 තීරුව**
1 නික් 33:1, ගණන් 12:8
2 ද්වි 4:36, නෙහෙ 9:13
3 නික් 32:4, ආනි 5:4, ක්‍රියා 17:29
4 2රාජා 5:17
5 ලෙවී 6:9, යෝබ් 1:5
6 ද්වි 12:5, 2ලේක 6:6
7 ද්වි 27:5, යොෂු 8:31

22 යෙහෝවා දෙවි තවදුරටත්
මෝසෙස්ට මෙසේ කීවේය.[1] “ඊශ්‍රා-
යෙල් සෙනඟට මෙසේ කියන්න. ‘මා
ඔබ සියලුදෙනාට ස්වර්ගයේ සිට
කතා කළ බව ඔබ දැන් දුටුවහුය.[2]
23 මා හැර වෙන කිසි දෙවි කෙනෙ-
කුට නමස්කාර නොකරන්න. නමස්-
කාර කරන පිණිස රන්වලින්වත්
රිදීවලින්වත් දේවතා රූප සාදා නො-
ගන්න.[3] 24 පස්වලින් මට පූජාස-
නයක්[4] ගොඩනඟා ඒ මත දවන
පූජා හා හවුල් පූජා* ඔප්පු කරන්න.
ඔබේ එළුවන්, බැටළුවන් හා ගව-
යන් ඒ මත ඔප්පු කරන්න.[5] මාගේ
නාමය ප්‍රකාශ කරන පිණිස මා
තෝරාගන්නා ඕනෑම ස්ථානයකදී
මම ඔබ ළඟ සිට ඔබට ආශීර්-
වාද කරන්නෙමි.[6] 25 ඔබ මට ගල්-
වලින් පූජාසනයක් ගොඩනඟන්නේ
නම් කැපූ ගල්වලින් එය නොසා-
දන්න. මන්ද ඔබ ආයුධයකින් එය
කැපුවොත් පූජාසනය අපවිත්‍ර වන්-
නේය.[7] 26 මාගේ පූජාසනය වෙ-
නට ඔබ නැඟ යන විට ඔබේ
නග්නභාවය නොපෙනෙන පිණිස
පූජාසනයට යෑම සඳහා පඩි සාදා
නොගන්න.’

**21** “සෙනඟ විසින් පිළිපැදිය යුතු
නීති මේවාය.[8]

2 “ඔබ හෙබ්‍රෙව් ජාතිකයෙකුව
දාසයෙකු ලෙස මිල දී ගන්නේ නම්[9]
ඔහු අවුරුදු හයක් ඔබට සේවය කළ
යුතුයි. හත්වෙනි අවුරුද්දේදී කිසි මුද-
ලක් නොගෙවා ඔහුට නිදහස්ව යා
හැකියි.[10] 3 ඔහු දාසකමට පැමිණි-
යේ තනියෙන් නම් ඔහු නිදහස් වන
අවස්ථාවේදී තනියෙන්ම යා යුතුයි.
ඔහු දාසකමට පැමිණියේ තම භාර්-
යාව සමඟ නම් ඇයටද ඔහු සමඟ යා
හැකියි. 4 ඔහුගේ ස්වාමියා ඔහුට

**21 පරි.** 8 නික් 24:3; ද්වි 4:14; එළි 15:4; 9 ලෙවී 25:39; 2රාජා 4:1; මතෙ 18:25; 10 ද්වි 15:12; යෙරෙ 34:14.

**නික් 20:24*** හෝ, “සාම පූජා.” එය ඔප්පු කළ තැනැත්තාත් දෙවිත් අතර සමාදානය තිබූ බව එයින් පෙන්වයි.

භාර්යාවක් විවාහ කර දුන්නේ නම්
එමෙන්ම ඇය ඔහුට දාව පුත්‍රයන්
හෝ දූවරුන් බිහි කළේ නම් ඔහුගේ
භාර්යාව හා දරුවන් අයිති වන්නේ
ඔහුගේ ස්වාමියාටයි.[1] එහෙයින් ඔහු
නිදහස් වන අවස්ථාවේදී තනියෙන්ම
යා යුතුයි.[2] **5** නමුත් නිදහස් කරන
අවස්ථාවේදී, 'මම මගේ ස්වාමියා-
ටත් මගේ භාර්යාවටත් දරුවන්ටත්
බොහෝ සෙයින් ආදරය කරමි. ඒ
නිසා මට නිදහස් වී යා නොහැකියි'
කියා දාසයා පැවසුවොත්[3] **6** ඔහු-
ගේ ස්වාමියා ඔහුව සැබෑ දෙවි ඉදිරි-
යට කැඳවිය යුතුයි. ඔහුව දොර ළඟට
හෝ උළුවහු කණුව ළඟට ගෙන
ගොස් විදින කටුවකින් ඔහුගේ කන
විදිය යුතුයි. එසේ කළ පසු ඔහු හැම-
දාටම තම ස්වාමියාට අයිතිය.[4]

**7** "මනුෂ්‍යයෙකු තම දියණියව
දාසකමට විකුණුවොත්[5] දාසයන්ව
පිටත් කර යවන ආකාරයට ඇයව
පිටත් කර යැවිය නොහැකි බව ඇගේ
ස්වාමියා මතක තබාගත යුතුයි.
**8** ඇයව උපභාර්යාවක් ලෙස භාර-
ගැනීමට ඇගේ ස්වාමියා අකමැති
වුණොත්[6] වෙනත් කෙනෙකුට ඇයව
මුදවාගැනීමට අවසර තිබේ. නමුත්
ඇගේ ස්වාමියා ඇයට අසාධාරණයක්
කළ නිසා ඇයව විදේශිකයෙකුට
විකිණීමට ඔහුට අයිතියක් නැත.
**9** නමුත් මනුෂ්‍යයෙක් දාසියෙකුව
මිල දී ගෙන තම පුත්‍රයාට භාර්යාවක්
ලෙස ඇයව දුන්නොත් ඇයට දිය-
ණියකට මෙන් සැලකිය යුතුයි.[7]
**10** ඔහු ඇයට අමතරව වෙනත් ස්ත්‍රි-
යක විවාහ කරගත්තත් ඇයට කෑම
බීම හා ඇඳුම් පැළඳුම් නොඅඩුව
සැපයිය යුතුයි.[8] ඔහු ස්වාමිපුරුෂයෙ-
කුගේ යුතුකම්ද ඇය වෙනුවෙන් ඉටු
කළ යුතුයි.[9] **11** ඔහු ඉහත සඳහන්
වගකීම් තුන පැහැරහැරියොත් ඇයට
නිදහස්ව යෑමට හැකියි. ඒ සඳහා
ඇය කිසි මුදලක් ගෙවීමට අවශ්‍ය
නැත.

**12** "යමෙකු තව කෙනෙකුට පහර
දී ඔහුව මරා දැමුවොත් පහර දුන්
තැනැත්තාවද අනිවාර්යයෙන්ම මරා
දැමිය යුතුයි.[1] **13** නමුත් අත්වැරදී-
මක් නිසා යමෙකු මිය ගියොත්
වරද කළ තැනැත්තාට පලා
යෑමට ස්ථානයක් මම නියම කරන්-
නෙමි.[2] මන්ද ඔහු එම තැනැත්-
තාව හිතාමතා මැරුවේ නැත. එවැනි
දෙයක් සිදු වීමට සැබෑ දෙවි ඉඩ-
හැරියේය.[3] **14** මනුෂ්‍යයෙකු තවත්
කෙනෙකු සමඟ තිබෙන කෝපය
නිසා සැලසුම්සහගතව එම තැනැත්-
තාව මරා දැමුවොත්[4] ඔහු ආරක්ෂාව
පතා මාගේ පූජාසනය වෙතට දිව
ගියත් ඔහුව මරා දැමිය යුතුයි.[5]
**15** යමෙකු තම මවට හෝ පියාට
හෝ පහර දුන්නොත් ඔහුව අනිවාර්-
යයෙන්ම මරා දැමිය යුතුයි.[6]

**16** "යමෙකු මිනිසෙකුව පැහැර-
ගෙන[7] ඔහුව වෙනත් කෙනෙ-
කුට විකුණුවොත්[8] එසේත් නැත්නම්
පැහැරගත් මිනිසා තමා ළඟ සිටිය-
දීම හසු වුණොත් ඔහුව මරා දැමිය
යුතුයි.[9]

**17** "යමෙකු තම මවට හෝ පියාට
හෝ ශාප කළොත් ඔහුව අනිවාර්ය-
යෙන්ම මරා දැමිය යුතුයි.[10]

**18** "මනුෂ්‍යයන් දෙදෙනෙකු රණ්ඩු
කරන අතරතුර එක් කෙනෙකු අනික්
තැනැත්තාට ගලකින් හෝ උදැල්ල-
කින් හෝ පහර දුන්නොත් පහර ලැබූ
තැනැත්තා නොමැරී ඔත්පළව සිටි-
නවා නම් ඔබ කළ යුත්තේ මෙයයි.
**19** ඔහු ඔත්පළව සිටියත් යම් දෙයක
උපකාරය ඇතුව ඔහුට ඇවිදීමට
හැකි නම් පහර දුන් තැනැත්තා දඬු-
වමින් නිදහස්ය. නමුත් සම්පූර්ණ
සුවයක් ලබන තෙක් ඔහුට කිසිම
වැඩක් කිරීමට නොහැකි නිසා ඔහු
විඳින පාඩුව වෙනුවෙන් ඔහුට වන්දි-
යක් ගෙවිය යුතුයි.

**20** "මනුෂ්‍යයෙකු තමාගේ දාස-
යාට හෝ දාසියට හෝ පොල්ලකින්
පහර දුන්[11] නිසා ඔහු හෝ ඇය මැරු-
ණොත් ඔහු අනිවාර්යයෙන්ම ඒ සඳහා
වන්දි ගෙවිය යුතුයි.[12] **21** නමුත් ඒ
දාසයා හෝ දාසිය දවස් දෙක තුනක්

**21 පරි.**
1 ලෙවී 25:44, ලෙවී 25:46
2 ද්වි 15:12
3 ද්වි 15:16
4 ද්වි 15:17
5 නෙහෙ 5:5
6 උත් 16:5, ගලා 4:22
7 ගණන් 30:16
8 එෆි 5:29, 1තිමෝ 5:8
9 ද්වි 25:5, 1කොරි 7:3

**2 තීරුව**
1 උත් 9:6, ගණන් 35:30, මතෙ 5:21
2 ගණන් 35:11, ද්වි 4:42, ද්වි 19:3, යොෂු 20:7
3 ගණන් 35:22, ද්වි 19:4, දේශ 9:11
4 ගණන් 15:30, ද්වි 19:11, 2සාමු 3:27, 1යොහ 3:15
5 1රාජා 1:50, 1රාජා 2:29, 2රාජා 11:15
6 නික් 20:12, 1තිමෝ 1:9
7 උත් 40:15, 1තිමෝ 1:10
8 උත් 37:28
9 ද්වි 24:7
10 ලෙවී 20:9, හිතෝ 20:20, හිතෝ 30:11, හිතෝ 30:17, මතෙ 15:4
11 හිතෝ 10:13
12 උත් 9:5, ලෙවී 24:17

ජීවත් වුණොත් ඔහුට දඬුවම් නොකළ
යුතුයි. මන්ද ඒ දාසයාව හෝ දාසියව
මිල දී ගත්තේ ඔහුයි.
**22** "මනුෂ්‍යයන් දෙදෙනෙකු පොර-
බදින විට ගැබිනි මවකට පහරක්
වැදී දරුවා[1] ඒ මොහොතේදීම බිහි
වුණොත් ඔබ මෙසේ කළ යුතුයි. දරු-
වාට හෝ මවට ඒ පහරින් දරුණු
අනතුරක් සිදු වී නැතත් ඒ ස්ත්‍රිය-
ගේ පුරුෂයා නියම කරන වන්දිය
වරදකරු අනිවාර්යයෙන්ම ගෙවිය
යුතුයි. විනිශ්චයකරුවන්ගේ අධීක්ෂ-
ණය යටතේ ඔහු එම වන්දිය ගෙවිය
යුතුයි.[2] **23** නමුත් මවට හෝ දරු-
වාට හෝ දරුණු අනතුරක් සිදු
වුණොත් ජීවිතයකට ජීවිතයක්ද[3]
**24** ඇසකට ඇසක්ද දතකට දතක්ද
අතකට අතක්ද පයකට පයක්ද[4]
**25** පිලිස්සීමකට පිලිස්සීමක්ද තුවා-
ලයකට තුවාලයක්ද පහරකට පහ-
රක්ද වන්දියක් ලෙස දිය යුතුයි.[5]
**26** "මනුෂ්‍යයෙකු තමාගේ දාස-
යාගේ හෝ දාසියගේ ඇස දරුණු
ලෙස තුවාල වන තරමට පහර දුන්-
නොත් ඇසට වන්දියක් ලෙස ඒ
දාසයාව හෝ දාසියව නිදහස් කර
යැවිය යුතුයි.[6] **27** ඔහු තම දාසයා-
ගේ හෝ දාසියගේ දතක් ගැලවෙන
තරමටම පහර දුන්නොත් දතට වන්-
දියක් ලෙස ඒ දාසයාව හෝ දාසියව
නිදහස් කර යැවිය යුතුයි.
**28** "ගවයෙක් පුරුෂයෙකුට හෝ
ස්ත්‍රියකට ඇන මැරුවොත් එම ගව-
යාට අනිවාර්යයෙන්ම ගල් ගසා
මැරිය යුතුයි.[7] උගේ මස් නොකෑ
යුතුයි. උගේ අයිතිකරු දඬුවමෙන්
නිදහස්ය. **29** නමුත් ගවයා ඊට
කලිනුත් අනින්න පුරුදුව සිටියා නම්
හා ඒ ගැන අයිතිකරුට දන්වා තිබු-
ණත් ඔහු ඒ ගැන කිසිවක් නොකළා
නම් අයිතිකරුව මරා දැමිය යුතුයි.
ගවයාටත් ගල් ගසා මැරිය යුතුයි.
**30** නමුත් අයිතිකරුට වන්දි මුදලක්
ගෙවීමට නියම කරන්නේ නම් ඔහුගේ
ජීවිතය මුදවාගැනීම සඳහා ඔහු ඒ
මුළු මුදලම ගෙවිය යුතුයි.[8] **31** උෟ
දරුවෙකුට ඇන්නත් දැරියකට ඇන්-
නත් ඒ නීතියම අදාළයි.[1] **32** උෟ
ඇන්නේ යමෙකුගේ දාසයෙකුට හෝ
දාසියකට නම් අයිතිකරු ඔහුගේ
හෝ ඇයගේ ස්වාමියාට ෂෙකෙල්*
තිහක්[2] ගෙවිය යුතුයි. ගවයාට ගල්
ගසා මැරිය යුතුයි.
**33** "වළක වැස්ම ඇර තැබීම නිසා
හෝ වළක් හාරා එය වසා නොදැමීම
නිසා හෝ ගවයෙකු නැත්නම් බූරු-
වෙකු එයට වැටුණොත්[3] **34** එයට
වග කිව යුතු තැනැත්තා එම සතාගේ
වටිනාකමට අනුව අයිතිකරුට වන්දි-
යක් ගෙවිය යුතුයි.[4] මළ සතාගේ මස්
ඔහුට ගත හැකියි. **35** එක් මනුෂ්‍යා-
යෙකුගේ ගවයෙකු තව කෙනෙකුගේ
ගවයෙකුට ඇන උෟ මැරුණොත්
ඔවුන් දෙදෙනා පණපිටින් සිටින ගව-
යාව විකුණා මුදල සම සේ බෙදාගත
යුතුයි. මළ සතාවද ඔවුන් බෙදාගත
යුතුයි.[5] **36** නමුත් ගවයා ඊට කලි-
නුත් අනින්න පුරුදුව සිටියා නම් හා
අයිතිකරු ඒ ගැන කිසිවක් නොකළා
නම්[6] ඔහු අනිවාර්යයෙන්ම මිය ගිය
සතා වෙනුවෙන් වන්දියක් ගෙවිය
යුතුයි.[7] ඔහු ගවයෙකු වෙනුවට ගව-
යෙකු දිය යුතුයි. මළ සතාගේ මස්
ඔහුට ගත හැකියි.

**22** "යමෙකු ගවයෙකුව හෝ
බැටළුවෙකුව හෝ සොරකම්
කර උෟව මැරුවොත් නැතහොත්
උෟව විකුණුවොත් ඔහු අයිතික-
රුට වන්දියක් ගෙවිය යුතුයි. ඔහු
ගවයෙකු වෙනුවෙන් ගවයන් පස්-
දෙනෙකුවද බැටළුවෙකු වෙනුවෙන්
බැටළුවන් හතරදෙනෙකුවද වන්දිය
වශයෙන් දිය යුතුයි.[8]
**2** ("සොරෙකු[9] ගෙයක් බිඳින අත-
රතුරදී[10] ඔහුට පහර දී ඔහු මිය
ගියොත් පහර දුන් තැනැත්තා ඔහුගේ
ලේවලට වග කිව යුතු නැත.[11]
**3** නමුත් සොරාට පහර දුන්නේ එළිය
තිබියදී නම් පහර දුන් තැනැත්තා
ඔහුගේ ලේවලට වග කිව යුතුයි.)

---

නික් **21:32*** ෂෙකෙලයක් යනු ග්‍රෑම් 11.4කි.

**21 පරි.**
**1** ගීතා 139:16, යෙරෙ 1:5
**2** නික් 18:26, ද්වි 16:18, ද්වි 17:8, ද්වි 22:18, 2ලේක 19:10
**3** උත් 9:6, ලෙවී 24:17, ගණන් 35:31, එළි 21:8
**4** ලෙවී 24:20, විනි 1:7, මතෙ 5:38
**5** 1සාමු 15:33, මතෙ 7:2
**6** එෆී 6:9, කොලො 4:1
**7** උත් 9:5, ගණන් 35:33
**8** ද්වි 17:8

**2 තීරුව**
**1** ද්වි 1:17
**2** සෙක 11:12, මතෙ 27:9
**3** මතෙ 12:11, 1කොරි 10:24
**4** නික් 22:6, නික් 22:14, ද්වි 22:8
**5** ලෙවී 25:17, මතෙ 7:12
**6** හිතෝ 22:3
**7** ලෙවී 24:21

**22 පරි.**
**8** 2සාමු 12:6, ලූක් 19:8
**9** නික් 20:15, රෝම 13:9, 1කොරි 6:10, එෆී 4:28, 1පේතෘ 4:15
**10** යෙරෙ 2:26, මතෙ 6:20, මතෙ 24:43
**11** ගණන් 35:27

“සොරෙකු තමා සොරකම් කළ දේ
වෙනුවෙන් අනිවාර්යයෙන්ම වන්දි
ගෙවිය යුතුයි. ඔහුට වන්දිය ගෙ-
වන්න බැරි නම් තමන් සොරකම් කළ
දේ වෙනුවෙන් ඔහු තමාවම දාසක-
මට විකිණිය යුතුයි.[1] **4** සොරකම්
කළ ගවයෙකුව හෝ බූරුවෙකුව හෝ
බැටළුවෙකුව හෝ සොරා ළඟ සිට
හසු වුණොත් ඔහු ඒ සතාගේ වටිනා-
කම මෙන් දෙගුණයක් අයිතිකරුට
ගෙවිය යුතුයි.

**5** “මිනිසෙකු වෙනත් කෙනෙකුගේ
කෙතක හෝ මිදිවත්තක හෝ තමා-
ගේ සතාට නිදැල්ලේ යන්න හැර එම
සතා එහි අස්වැන්න කා දැමුවොත්
ඔහු වන්දියක් ගෙවිය යුතුයි.[2] ඔහු
තම කෙතේ හෝ මිදිවත්තේ පලදා-
වෙන් හොඳම කොටස වන්දිය ලෙස
දිය යුතුයි.

**6** “ගින්නක් කටු ගස්වලට පැතිර,
ඒ ළඟ තිබෙන ධාන්‍ය ගොඩවල් හෝ
නොකැපූ අස්වැන්න හෝ මුළු කෙතම
හෝ ගිනි ගත්තොත්[3] ඒ ගින්න ඇවිළු-
නැනැත්තා විනාශ වූ දේ වෙනුවෙන්
වන්දියක් ගෙවිය යුතුයි.

**7** “යමෙකු සුරක්ෂිතව තබාගැනී-
මට තම අසල්වැසියාට මුදල් හෝ
වෙන යම් දෙයක් හෝ භාර දුන්
පසු[4] එය ඔහුගේ නිවසෙන් සොරකම්
කරනු ලැබුවොත් ඔබ කළ යුත්තේ
මෙයයි. සොරාව හසු වුණොත් ඔහු
සොරකම් කළ දේ මෙන් දෙගුණ-
යක් වන්දි වශයෙන් ගෙවිය යුතුයි.[5]
**8** සොරාව හසු නොවුණොත් බඩු
සුරක්ෂිතව තබා තිබූ නිවසේ අයි-
තිකරුම ඒ බඩු සොරකම් කළාද
නැද්ද කියා තීරණය කිරීම සඳහා
ඔහුව සැබෑ දෙවි ඉදිරියට* ගෙන
යා යුතුයි.[6] **9** යමෙකු වෙනත් කෙ-
නෙකු ළඟ සිටින ගවයෙකුව හෝ
බූරුවෙකුව හෝ බැටළුවෙකුව හෝ
දැක එසේ නැතහොත් ඒ තැනැත්තා
ළඟ තිබෙන වස්ත්‍රයක් දැක, ‘මේක
අයිති මටයි’ කියා කීවොත් ඒ දෙ-
දෙනා තම නඩුව[1] සැබෑ දෙවි ඉදිරියට
ගෙන යා යුතුයි.[2] දෙවි ඔවුන්ගෙන්
දුෂ්ටයයි ප්‍රකාශ කරන තැනැත්තා
අනික් තැනැත්තාට වන්දියක් ගෙවිය
යුතුයි. ඔහු තම අසල්වැසියාගෙන්
ගැනීමට උත්සාහ කළ දේ මෙන් දෙ-
ගුණයක් ගෙවිය යුතුයි.[3]

**10** “යමෙකු තම බූරුවෙකුව හෝ
ගවයෙකුව හෝ බැටළුවෙකුව හෝ
වෙන ඕනෑම සතෙකුව හෝ බලාගැ-
නීමට තම අසල්වැසියාට දුන් පසු ඌ
මැරුණොත් නැත්නම් දරුණු ලෙස
තුවාල වුණොත් එසේත් නැත්නම්
කිසිවෙකු බලා නොසිටි අවස්ථා-
වක යමෙකු විසින් ඌව පැහැරගෙන
ගියොත් **11** සතාව බලාගැනීමට
භාරගත් තැනැත්තා තමා සතාව
සොරකම් නොකළ බවට[4] යෙහෝවා
දෙවිගේ නමින් අයිතිකරුට දිවුරා[5]
ප්‍රකාශ කළ යුතුයි. සතාගේ අයිතික-
රුද ඔහු පැවසූ දේ පිළිගත යුතුයි.
නැති වූ සතා වෙනුවෙන් වන්දියක්
ගෙවිය යුතු නැත. **12** නමුත් සතා
ඔහුගේ රැකවරණයේ සිටියදී* වෙනත්
කෙනෙකු ඌව සොරකම් කළොත්
ඔහු අයිතිකරුට වන්දියක් ගෙවිය
යුතුයි.[6] **13** වෙනත් සතෙකු[7] ඌව
මරා දැමුවොත් ඔහු සාක්ෂියක්[8] හැටි-
යට මළ සතාව ගෙනැවිත් අයිතික-
රුට පෙන්විය යුතුයි. මරා දැමූ සතා
වෙනුවෙන් ඔහු වන්දියක් ගෙවිය යුතු
නැත.

**14** “යමෙකු තම අසල්වැසියා-
ගෙන් සතෙකු ඉල්ලාගත් පසු[9] සතා-
ගේ අයිතිකරු නැති වේලාවක ඌ
දරුණු ලෙස තුවාල ලැබුවොත් නැත-
හොත් මැරුණොත් ඌ වෙනුවෙන්
අනිවාර්යයෙන්ම වන්දියක් ගෙවිය
යුතුයි.[10] **15** ඌට අනතුරක් සිදු
වුණේ උගේ අයිතිකරු ළඟ සිටියදීම
නම් ඌ වෙනුවෙන් වන්දියක් ගෙවිය

**22 පරි.**
**1** මතෙ 18:25
**2** හෙබ්‍රෙ 2:2
**3** 2සාමු 14:30
**4** මතෙ 25:14
**5** නික් 22:4
**6** ද්වි 16:18, ද්වි 19:17, ගීතා 82:1

**2 තීරුව**
**1** නික් 23:21
**2** නික් 18:22, ද්වි 16:18, ද්වි 25:1, 1සාමු 2:25, 2ලේක 19:10
**3** නික් 22:4
**4** ලෙවී 6:3, හිතෝ 30:9
**5** හෙබ්‍රෙ 6:16
**6** උත් 31:39
**7** එස 4:14
**8** උත් 37:33, ආමො 3:12
**9** ගීතා 37:21, හිතෝ 22:7
**10** නික් 21:34, ලෙවී 24:18

**නික් 22:8*** එනම්, යෙහෝවා දෙවිව නියෝජනය කළ විනිශ්චයකරුවන් ඉදිරියට.

**නික් 22:12*** මෙහි විස්තර කරන්නේ සතාව බලාගැනීමට භාරගත් තැනැත්තාගේ නොසැලකිලිමත්කම නිසා සතාව යමෙකු සොරකම් කළොත් පිළිපැදිය යුතු නීතිය ගැනයි.

යුතු නැත. කුලියට ගත් සතෙකුට
අනතුරක් සිදු වුණොත් අයිතිකරුට
කුලිය පමණක් ගෙවිය යුතුයි.
**16** “මිනිසෙකු විවාහ ගිවිසගෙන
නැති කන්‍යාවක රවටා ඇය සමඟ
සයනය කළොත්[1] ඔහු අනිවාර්ය-
යෙන්ම නියමිත මුදල ගෙවා ඇයව
තම භාර්යාව ලෙස භාරගත යුතුයි.[2]
**17** ඇගේ පියා ඔහුට ඇයව විවාහ
කර දීමට කොහෙත්ම කැමති නැත්-
නම් සාමාන්‍යයෙන් කන්‍යාවක විවාහ
කරගනිද්දී ගෙවන මුදල ඔහු ගෙවිය
යුතුයි.[3]
**18** “ඔබ අතරේ මන්තරකාරියක
සිටිනවා නම් ඇයව මරා දැමිය
යුතුයි.[4]
**19** “යමෙකු සතෙකු සමඟ ලිංගික
සම්බන්ධකම් පැවැත්වුවහොත් ඔහුව
අනිවාර්යයෙන්ම මරා දැමිය යුතුයි.[5]
**20** “යෙහෝවා දෙවිට හැර වෙනත්
දෙවිවරුන්ට පුදපූජා ඔප්පු කරන
ඕනෑම කෙනෙකුව අනිවාර්යයෙන්ම
මරා* දැමිය යුතුයි.[6]
**21** “ඔබ අතරේ ජීවත් වන විදේශි-
කයන්ට ඔබ හිංසා පීඩා නොකළ
යුතුයි. ඔවුන්ගෙන් අයුතු ප්‍රයෝජන
නොගත යුතුයි.[7] මන්ද ඔබත් ඊජිප්තු
දේශයේදී විදේශිකයන් ලෙස ජීවත්
වූහ.[8]
**22** “ඔබ වැන්දඹුවන්ට හෝ පියා
නැති දරුවන්ට හෝ හිරිහැර නො-
කළ යුතුයි.[9] **23** ඔබ ඔවුන්ට හිරි-
හැර කළොත් ඔවුන් හැඬූ කඳුළින්
මට කරන කන්නලව්වලට මම අනි-
වාර්යයෙන්ම සවන් දෙන්නෙමි.[10]
**24** එවිට මම ඔබට විරුද්ධව මහත්
සේ උදහස් වී[11] ඔබව කඩුවෙන් මරා
දමන්නෙමි. ඔබේ භාර්යාවෝ වැන්-
දඹුවන්ද ඔබේ පුත්‍රයෝ පියා නැති
දරුවන්ද වනු ඇත.[12]
**25** “මාගේ සෙනඟ අතරේ සිටින
දුප්පත් කෙනෙකුට ඔබ ණයට මුදල්
දුන්නොත්[1] පොලියට මුදල් දෙන කෙ-
නෙකු මෙන් ක්‍රියා නොකරන්න. ඔහු-
ගෙන් පොලී අය නොකරන්න.[2]
**26** “ඔබ ඇපයක් වශයෙන් ඔබේ
අසල්වැසියාගෙන් ඔහුගේ පිට වස්ත්‍රය
ගත්තොත්[3] ඉර බැස යෑමට පෙර එය
නැවත ඔහුට දිය යුතුයි. **27** මන්ද
ඔහුට පොරවාගැනීමට තිබෙන්නේ
එය පමණයි.[4] ඔබ ඒ වස්ත්‍රය ඔබ
ළඟ තබාගත්තොත් ඔහු නිදාගන්නා
විට පොරවාගන්නේ කුමකින්ද? ඔහු
හඬමින් මට කන්නලව් කළොත්
මම අනිවාර්යයෙන්ම ඔහුට සවන්
දෙන්නෙමි. මන්ද මා අනුකම්පාවෙන්
පිරුණු දෙවි කෙනෙකි.[5]
**28** “ඔබ දෙවිට ශාප නොකළ
යුතුයි.[6] ඔබ අතරේ සිටින අධිපති-
යෙකු ගැන වුවද ඔබ අවමන්සහගත
ලෙස කතා නොකළ යුතුයි.[7]
**29** “ඔබේ සාරවත් අස්වැන්නෙන්
හා මඩින ලද යුෂවලින් මට යමක්
දීමට පසුබට නොවන්න.[8] ඔබේ
කුලුඳුලන්වද ඔබ මට දිය යුතුයි.[9]
**30** කුලුඳුල් වසු පැටවෙකු හා බැටළු
පැටවෙකු සම්බන්ධයෙන් ඔබ කළ
යුත්තේ මෙයයි.[10] ඌව දවස් හතක්
උගේ මව සමඟ තබන්න.[11] අටවෙනි
දවසේදී ඌව මට දෙන්න.
**31** “ඔබ මාගේ ශුද්ධ සෙනඟ බව
පෙන්විය යුතුයි.[12] ඔබ වෙනත්
සතෙකු විසින් මරා දමනු ලැබූ සතෙ-
කුගේ මස් නොකෑ යුතුයි.[13] උගේ මස්
බල්ලන්ට දැමිය යුතුයි.[14]

**23** “යමෙකු ගැන බොරු ප්‍රචාරය
නොකරන්න.[15] දුෂ්ට කෙ-
නෙකු සමඟ කුමන්ත්‍රණය කර නිර්-
දෝෂ පුද්ගලයෙකුට විරුද්ධව බොරු
සාක්ෂි නොදෙන්න.[16] **2** වැඩිදෙ-
නෙකුගේ කීම අසා වැරදි දේ නො-
කරන්න.[17] ආරවුලක් විසඳන විට
වැඩිදෙනාගේ පැත්ත ගෙන යුක්-
තිය පෙරළන පිණිස බොරු සාක්ෂි

**නික් 22:20*** හෙබ්‍රෙව් බසින්, හේරේම්. විනාශය සඳහා යමක් යෙහෝවා දෙවිට කැප කිරීම ඉන් අදහස් වේ.

**23 පරි.** **15** ලෙවී 19:16; හිතෝ 6:19; හිතෝ 10:18; යොහ 8:44; **16** ද්වි 19:18; හිතෝ 19:5; මතෙ 26:59; ක්‍රියා 6:11; එළි 12:10; **17** හිතෝ 1:10; හිතෝ 1:11; 1කොරි 15:33; 1පේතෘ 4:4.

**22 පරි.**
**1** උත් 34:2; ද්වි 22:28
**2** උත් 34:12
**3** ද්වි 22:29
**4** ලෙවී 19:26; ලෙවී 20:6; ද්වි 18:10; 1සාමු 28:3; ගලා 5:20; එළි 22:15
**5** ලෙවී 18:23; ලෙවී 20:15; ද්වි 27:21
**6** ගණන් 25:3; 1රාජා 18:40; 2රාජා 10:25; 1කොරි 10:20
**7** ලෙවී 19:33; ලෙවී 25:35; සෙක 7:10
**8** ද්වි 10:19; ක්‍රියා 7:6
**9** ද්වි 27:19; ගීතා 94:6; යෙසා 1:17; එස 22:7; යාකො 1:27
**10** යෝබ් 34:28; ගීතා 10:18; ලූක් 18:7; යාකො 5:4
**11** ගීතා 69:24; හෙබ්‍රෙ 10:31
**12** ද්වි 32:35; ගීතා 109:9

**2 තීරුව**
**1** ලෙවී 25:35
**2** ලෙවී 25:36; ද්වි 23:19; නෙහෙ 5:7; ලූක් 6:35
**3** ද්වි 24:6; යෝබ් 24:9; ආමො 2:8
**4** ද්වි 10:18; ද්වි 24:13; යෝබ් 24:10
**5** ගීතා 34:6; එෆී 2:7
**6** ලෙවී 24:14; යොහ 10:36; යූද් 15
**7** දේශ 10:20; ක්‍රියා 23:5; 2පේතෘ 2:10; යූද් 8
**8** හිතෝ 3:9; 2කොරි 9:7
**9** නික් 13:2
**10** ද්වි 15:19
**11** ලෙවී 22:27
**12** ලෙවී 19:2; ගණන් 15:40; 1පේතෘ 1:15
**13** ලෙවී 22:8; එස 4:14; ක්‍රියා 10:14
**14** 1රාජා 14:11; යෙරෙ 15:3

නොදෙන්න.[1] 3 දුප්පත් කෙනෙකු
තවත් කෙනෙකුට විරුද්ධව පැමි-
ණිල්ලක් කරන විට ඔහු දුප්පත්
නිසාම ඔහුගේ පැත්ත නොගන්න.[2]
4 “ඔබේ සතුරාගේ ගවයා හෝ
බූරුවා හෝ ඉබාගාතේ යනවා ඔබ
දුටුවොත් ඔබ අනිවාර්යයෙන්ම උෟව
ගෙන ගොස් ඔහුට භාර දිය යුතුයි.[3]
5 ඔබට වෛර කරන කෙනෙකුගේ
බූරුවා ලොකු බරක් පිටේ තබාගෙන
වැටී සිටිනවා දුටුවොත් උෟට උප-
කාර නොකර එතැනින් නොයන්න.
උගේ අයිතිකරු සමඟ එකතු වී උෟට
නැඟිටින්න උදව් කරන්න.[4]
6 “දුප්පත් කෙනෙකුගේ නඩුවක්
විසඳන විට ඔහුට අසාධාරණයක්
වන ලෙස විනිශ්චය නොකරන්න.[5]
7 “බොරු කීමෙන් සම්පූර්ණ-
යෙන්ම වළකින්න.[6] නිර්දෝෂ, ධර්-
මිෂ්ඨ කෙනෙකුව නොමරන්න. මන්ද
දුෂ්ට කෙනෙකු ධර්මිෂ්ඨයි කියා මම
කවදාවත් ප්‍රකාශ නොකරන්නෙමි.[7]
8 “අල්ලස් නොගන්න. බුද්ධිමත්ව
විනිශ්චය කරන කෙනෙකුව පවා අල්-
ලසකින් නොමඟ යැවිය හැකියි. එම-
ගින් ධර්මිෂ්ඨ කෙනෙකුගේ තීන්දු
පවා පෙරළිය හැකියි.[8]
9 “ඔබ සමඟ ජීවත් වන විදේශි-
කයන්ට හිංසා පීඩා නොකරන්න.[9]
ඔබත් ඊජිප්තු දේශයේ විදේශිකයන්
ලෙස ජීවත් වූ නිසා[10] විදේශිකයන්ට
හැඟෙන ආකාරය ඔබ හොඳින් දන්-
නහුය.
10 “අවුරුදු හයක් ඔබේ කෙ-
තේ බීජ වපුරා එහි පලදාව රැස්
කරගන්න.[11] 11 සත්වන අවුරුද්-
දේදී ඔබේ කෙතේ නොවපුරා එය
නිකම්ම තිබෙන්න හරින්න.[12] ඒ
කාලයේදී ඔබ අතරේ සිටින දුප්-
පත් අයට එහි පල එකතු කර-
ගැනීමට ඉඩහරින්න. ඉතුරු වන
දේ සතුන්ට කන්න හරින්න.[13] ඔබේ
මිදි හා ඔලීවවතුවලටත් එලෙසම
කරන්න.
12 “දවස් හයක් ඔබ වැඩ කළ
යුතුයි.[14] ඔබේ ගවයාට හා බූරුවාට
විවේකයක් ලබා දෙන පිණිසත් ඔබේ
දාසියගේ පුත්‍රයාට හා විදේශිකයන්ට
නිවාඩුවක් දෙන පිණිසත් හත්වන
දවසේදී වැඩ නොකරන්න.[1]
13 “මම ඔබට පැවසූ සෑම කාරණ-
යක්ම හිතට ගන්න.[2] වෙනත් දෙවිව-
රුන්ගේ නම් සඳහන් නොකරන්න.
ඔවුන්ට කිසිවිටකත් හඬ නොග-
සන්න.[3]
14 “ඔබ මට ගෞරව කරන පිණිස
අවුරුද්දට තුන් වරක් උත්සවයන්
පවත්වන්න.[4] 15 ඔබ මුහුන් නො-
දැමූ රොටි උත්සවය පැවැත්විය
යුතුයි.[5] මම ඔබට අණ කළ ලෙස ඔබ
දවස් හතක් පුරා මුහුන් නොදැමූ
රොටි[6] කන්න. ආබීබ් මාසයේ[7] මා
නියම කළ දිනවලදී ඔබ එසේ කළ
යුතුයි. මන්ද ඔබ ඊජිප්තු දේශයෙන්
පිටතට ආවේ එම මාසයේදීය. ඒ
උත්සවය පවත්වන කාලයේදී සෙ-
නඟ මා ඉදිරියට හිස් අතින් නො-
පැමිණිය යුතුයි.[8] 16 ඔබ වෙහෙස
මහන්සි වී කෙතෙහි වගා කළ[9] දෙ-
යින් ප්‍රථම ඵල[10] නෙළන කාලයේදීද
උත්සවයක් පැවැත්විය යුතුයි. එය
නාඹුල් පල උත්සවයයි. අවුරුද්ද අව-
සානයේදී ඔබ කෙතේ පලදාව රැස්
කරගන්නා විට උත්සවයක් පැවැත්-
විය යුතුයි. එය අස්වැන්න නෙළීමේ
උත්සවයයි.[11] 17 මේ උත්සවයන්
තුන පවත්වන කාලයේදී සෑම පුරුෂ-
යෙකුම ස්වාමීන් වන යෙහෝවා දෙවි
ඉදිරියට පැමිණිය යුතුයි.[12]
18 “ඔබ මට ඔප්පු කරන සතුන්-
ගේ ලේ සමඟ මුහුන් දැමූ කිසිවක්
ඔප්පු නොකළ යුතුයි. මට ගෞරව
කරන පිණිස පවත්වන උත්සවයන්ව-
ලදී ඔබ මට ඔප්පු කරන තෙල් කො-
ටස් රාත්‍රිය පුරාම පූජාසනය මත
නොතැබිය යුතුයි.[13]
19 “ඔබේ අස්වැන්නේ ප්‍රථම ඵලව-
ලින් හොඳම කොටස ඔබේ දෙවි
වන යෙහෝවාගේ ගෘහයට ගෙනා
යුතුයි.[14]
“එළු පැටියෙකු උගේ මවගේ කිරිව-
ලින් පිසීමෙන් වළකින්න.[15]

**23 පරි.**

1 යෝබ් 31:34; ලූක් 23:23; ක්‍රියා 25:9; රෝම 1:32
2 ලෙවී 19:15; යාකො 3:17
3 හිතෝ 25:21; 1තෙස 5:15
4 ද්වි 22:4; ලූක් 6:27; රෝම 12:21
5 ද්වි 16:19; 2ලේක 19:7; ආමො 5:12
6 ලෙවී 19:11; ලූක් 3:14; එෆී 4:25
7 හිතෝ 17:15; නාහු 1:3; රෝම 1:18; රෝම 2:6
8 1සාමු 8:3; 1සාමු 12:3; හිතෝ 17:23; දේශ 7:7
9 එස 22:7
10 ලෙවී 19:34; ද්වි 10:19
11 ලෙවී 25:3
12 ලෙවී 25:4
13 ගීතා 147:9
14 නික් 20:9; ලූක් 13:14

**2 තීරුව**

1 ද්වි 5:14
2 ද්වි 4:9; 1තිමෝ 4:16; හෙබ්‍රෙ 12:15
3 ද්වි 12:3; යොෂු 23:7; හොෂෙ 2:17
4 ද්වි 16:16
5 ලෙවී 23:6; ලූක් 22:7
6 1කොරි 5:8
7 නික් 12:18
8 ද්වි 16:17
9 ලෙවී 23:10; ගණන් 28:26; ද්වි 16:9; ක්‍රියා 2:1
10 යාකො 1:18; එළි 14:4
11 ද්වි 16:13; නෙහෙ 8:14; යොහ 7:2; යොහ 7:37
12 ද්වි 12:5
13 නික් 12:10; ලෙවී 7:15
14 නික් 34:26; ගණන් 18:12; නෙහෙ 10:35; 1කොරි 15:20
15 ද්වි 14:21; හිතෝ 12:10

**20** “ගමන අතරතුරේදී ඔබව රැක-
බලා ගන්නා පිණිසත් මා ඔබට සූදා-
නම් කළ ස්ථානයට[1] ඔබව ගෙන යන
පිණිසත් මම ඔබට ඉදිරියෙන් දේව-
දූතයෙකු[2] යවන්නෙමි. **21** ඔහුගේ
හඬට කීකරු වීමට වගබලා ගන්න.
ඔහුට විරුද්ධව කැරලි නොගසන්න.
ඔබ කැරලිගැසුවොත් ඔහු ඔබට
සමාව දෙන්නේ නැත.[3] මන්ද ඔහු
පෙනී සිටින්නේ මාගේ නාමයෙන්ය.
**22** ඔබ ඔහුගේ හඬට සම්පූර්ණ-
යෙන්ම කීකරු වී මා ඔබට පවසන
සෑම දෙයක්ම පිළිපදින්නේ නම්[4] මම
ඔබේ සතුරන්ට විරුද්ධව ක්‍රියා කරන්-
නෙමි. ඔබට හිරිහැර කරන අයට
මම දඬුවම් කරන්නෙමි.[5] **23** මාගේ
දූතයා ඔබට ඉදිරියෙන් ගොස් අමෝ-
රිවරුන්ගේද හිත්තීවරුන්ගේද පෙ-
රිස්සිවරුන්ගේද කානානිවරුන්ගේද
හිවීයවරුන්ගේද යෙබූසිවරුන්ගේද
දේශයට ඔබව ගෙන යන්නේය. මම
ඒ ජාතීන්ව සහමුලින්ම විනාශ කරන්-
නෙමි.[6] **24** ඔබ ඔවුන්ගේ දෙවිව-
රුන් ඉදිරියේ වැඳ වැටී නමස්කාර
නොකළ යුතුයි. ඔවුන්ගේ දේවතා
රූපවලට සමාන කිසිවක් සාදා නො-
ගන්න.[7] ඔබ ඒවා බිම හෙළා කඩා
දැමිය යුතුයි. නමස්කාර කරන පිණිස
ඔවුන් ඉදි කළ කණුද ඔබ බිඳ
දැමිය යුතුයි.[8] **25** ඔබ ඔබේ දෙවි
වන යෙහෝවාට නමස්කාර කළ
යුතුයි.[9] එවිට මම අනිවාර්යයෙන්ම
ඔබට කෑම බීම දී ආශීර්වාද කරන්-
නෙමි.[10] කිසි වසංගතයක් ඔබ පිටට
පැමිණෙන්න ඉඩ නොදෙන්නෙමි.[11]
**26** ඔබේ දේශයේ කිසි ස්ත්‍රියකට
ගබ්සාවක් සිදු නොවන්නේය. එහි
වඳ ස්ත්‍රියක්ද නොසිටින්නේය.[12] ඔබ
බොහෝ කල් ජීවත් වන්නහුය.[13]

**27** “ඔබ යන සෑම තැනකම ජීවත්
වන මිනිස්සු මා ගැන අසා, ඔබව
දකින්නත් පෙර භයෙන් වෙවුලන්-
නෝය.[14] ඔබ ඔවුන් අතරට ගිය පසු
මම ඔවුන්ව වියවුලට පත් කරන්-
නෙමි. ඔබේ සියලු සතුරන්ට ඔබ
ඉදිරියෙන් පලා දුවන්න සලස්වන්-

**23 පරි.**
**1** ගණන් 20:16
**2** නික් 14:19
**3** ගණන් 14:35
යොෂු 24:19
හෙබ්‍රෙ 12:25
**4** නික් 19:5
ද්වි 30:8
**5** උත් 12:3
ද්වි 30:7
**6** නික් 34:11
යොෂු 5:13
යොෂු 24:8
**7** නික් 20:5
ලෙවී 18:3
ද්වි 12:30
2ලේක 33:2
**8** නික් 20:3
ගණන් 33:52
2ලේක 34:3
**9** ද්වි 6:13
ද්වි 10:12
යොෂු 22:5
මතෙ 4:10
**10** ද්වි 7:13
මලා 3:10
**11** ද්වි 7:15
ගීතා 103:3
**12** ද්වි 7:14
ද්වි 28:4
**13** නික් 20:12
ගීතා 92:14
**14** ද්වි 2:25
යොෂු 2:9

**2 තීරුව**
**1** ද්වි 7:23
**2** ද්වි 7:20
යොෂු 2:11
**3** යොෂු 24:11
**4** ද්වි 7:22
**5** ද්වි 9:4
ගීතා 80:8
**6** උත් 15:18
ද්වි 1:7
යොෂු 1:4
1රාජ 4:21
**7** විනි 1:4
විනි 11:21
**8** නික් 34:12
ගණන් 25:2
ද්වි 7:2
2කොරි 6:14
**9** යොෂු 23:13
විනි 1:28
විනි 2:3
ගීතා 106:36

**24 පරි.**
**10** ලෙවී 10:1
1ලේක 6:3
**11** ගණන් 11:16
**12** නික් 20:21
ගණන් 12:8

නෙමි.[1] **28** හිවීයවරුන්ද කානානි-
වරුන්ද හිත්තීවරුන්ද ඔබ එන බව
අසා කලබල වී[2] ඔබ ඉදිරියෙන්
පලා දුවන්නෝය.[3] **29** මම ඔවුන්ව
ඔබ ඉදිරියෙන් එකවරම* පන්නා
දැමුවොත් දේශය පාළුවට යන්-
නේය. වනසතුන්ගේ ගණනද වැඩි වී
උන් ඔබට හිංසා කරනු ඇත. ඒ
නිසා මම ඔවුන්ව ඔබ ඉදිරියෙන්
එකවරම පන්නා නොදමන්නෙමි.[4]
**30** ඔබ ගණනින් බොහෝ සේ වැඩි වී
දේශය අයිති කරගන්නා තෙක් මම
ඔවුන්ව ටිකෙන් ටික පන්නා දමන්-
නෙමි.[5]

**31** “මම ඔබේ දේශ සීමා රතු මුහු-
දේ සිට පිලිස්තිවරුන්ගේ මුහුද දක්වාද
පාළුකරයේ සිට මහා ගංගාව*[6] දක්වාද
විශාල කරන්නෙමි. දේශයේ ජීවත් වන
වැසියන්ව මම ඔබේ අතට හසු කර
දෙන්නෙමි. ඔබ ඔවුන්ව දේශයෙන්
පන්නා දමන්නහුය.[7] **32** ඔබ ඔවුන්
සමඟවත් ඔවුන්ගේ දෙවිවරුන් සමඟ-
වත් කිසි ගිවිසුමක් ඇති කර නොගත
යුතුයි.[8] **33** ඔබේ දේශයේ ඔබ සමඟ
ජීවත් වීමට ඔවුන්ට ඉඩ නොදිය
යුතුයි. මන්ද එසේ කළොත් මට විරුද්-
ධව පව් කිරීමට ඔවුහු ඔබව පොලඹ-
වනු ඇත. ඔබ ඔවුන්ගේ දෙවිවරුන්ට
නමස්කාර කළොත් එය ඔබේ විනාශ-
යට මඟ පාදනු ඇත.”[9]

**24** දෙවි මෝසෙස්ට මෙසේ
කීවේය. “කන්දට නැඟ යෙ-
හෝවා දෙවි වන මා වෙතට එන්න.
ආරොන්වද නාදාබ්වද අබිහුවද[10] ඊශ්‍රා-
යෙල්හි වැඩිමහල්ලන් හැත්තෑදෙනෙ-
කුවද[11] ඔබ සමඟ රැගෙන එන්න.
සියලුදෙනාම දුරින් සිට මට නමස්කාර
කළ යුතුයි. **2** යෙහෝවා දෙවි වන
මා වෙතට පැමිණිය හැක්කේ මෝ-
සෙස්ට පමණයි. අනික් අය මා වෙතට
නොපැමිණිය යුතුයි. ඔබ සමඟ කන්-
දට නැඟ ඒමට සෙනඟට ඉඩ නො-
දෙන්න.”[12]

**නික් 23:29*** මූ.අ., “අවුරුද්දකින්.” **31*** එනම්, යුප්‍රටීස් ගඟ.

**3** පසුව මෝසෙස් සෙනඟ ළඟට
පැමිණ, යෙහෝවා දෙවි පැවසූ සියලු
දේද ඔහු දුන් සෑම නියෝගයන්ද
ඔවුන්ට දැන්වීය.[1] එය අසා සෙනඟ
එක හඬින් මෙසේ කීවෝය. “යෙ-
හෝවා දෙවි පැවසූ සියල්ල කිරීමට
අප සතුටුයි.”[2] **4** එහෙයින් මෝ-
සෙස් යෙහෝවා දෙවි පැවසූ සෑම
වචනයක්ම ලියා තැබුවේය.[3] ඔහු
පසුවදා හිමිදිරියේ නැඟිට කන්ද
පාමුලට ගොස් එහි පූජාසන-
යක් ගොඩනැඟුවේය. ඊශ්‍රායෙල්හි
ගෝත්‍ර දොළහ නියෝජනය කිරීමට
එහි කණු දොළහක්ද ඉදි කළේය.[4]
**5** ඉන්පසු ඔහු ඊශ්‍රායෙල් සෙනඟ
අතරින් තරුණයන් කිහිපදෙනෙ-
කුව තෝරාගත්තේය. ඔවුහු දවන
පූජාද හවුල් පූජා[5] ලෙස ගවයන්ද
යෙහෝවා දෙවිට ඔප්පු කළෝය.
**6** මෝසෙස් පූජාවලට ඔප්පු කළ
සතුන්ගේ ලෙයින් භාගයක් භාජන-
වලට වත් කළේය.[6] ඉතුරු ලේ
ටික ඔහු පූජාසනය මත ඉස්සේය.[7]
**7** පසුව ඔහු ගිවිසුම සඳහන් වී
තිබෙන ලියවිල්ල[8] අතට ගෙන එහි
සඳහන් දේවල් සෙනඟ ඉදිරියේ ශබ්ද
නඟා කියෙව්වේය.[9] ඉන්පසු සෙනඟ,
“යෙහෝවා දෙවි පැවසූ සෑම දෙ-
යක්ම ඉටු කරන්න අපි එකඟයි. අපි
ඔහුට කීකරු වෙනවා” කියා පො-
රොන්දු වූහ.[10] **8** එහෙයින් මෝ-
සෙස් සෙනඟ මත ලේ ඉසිමින්[11]
මෙසේ කීවේය. “ඔබ දැන් සවන් දුන්
සෑම වචනයක්ම පැවැත්වීමට ඔබ
පොරොන්දු වුණා. එම පොරොන්දුවට
එකඟව යෙහෝවා දෙවි ඔබ සමඟ
ඇති කරගත් ගිවිසුම මේ ලේ මාර්ග-
යෙන් ස්ථිර වෙයි.”[12]

**9** පසුව ඊශ්‍රායෙල් සෙනඟ අතරේ
සිටි වැඩිමහල්ලන් සැත්තෑදෙනෙකු
සමඟ මෝසෙස්, ආරොන්, නාදාබ් හා
අබිහු කන්දට නඟින්න පටන්ගත්-
තෝය. **10** ඔවුහු ඊශ්‍රායෙල්හි දෙ-
විව දර්ශනයකින් දුටුවෝය.[13] දෙවිගේ
පාද යට නීල මාණික්‍යවලින් සෑදූ වේ-
දිකාවක් වැනි යමක් දක්නට තිබිණ.
එය පැහැදිලි නිල් අහස්තලය මෙන්
විය.[1] **11** දෙවි ඊශ්‍රායෙල් ජනයාගේ
ප්‍රධානීන්ට විරුද්ධව කිසිවක් කළේ
නැත.[2] ඔවුන් සැබෑ දෙවිව දුටුවේ[3]
කමින් බොමින් සිටියදීය.[4]

**12** යෙහෝවා දෙවි නැවත මෝ-
සෙස්ට මෙසේ කීවේය. “කන්ද මුදුනට
නැඟ මා ළඟට එන්න. මගේ නීති හා
ආඥා සෙනඟට උගන්වන පිණිස මම
ඒවා ගල් පුවරු මත ලියා ඔබට දෙන්-
නෙමි.”[5] **13** ඉන්පසු මෝසෙස් හා
ඔහුගේ සේවකයා වන යොෂුවා, සැබෑ
දෙවි සිටි කඳු මුදුනට නඟින්න පටන්-
ගත්තෝය.[6] **14** මෝසෙස් පිටත්ව
යෑමට පෙර වැඩිමහල්ලන්ට මෙසේ
කීවේය. “ඔබ අපි එන තුරු මෙතැනට
වී බලා සිටින්න.[7] ආරොන් හා හූර්[8]
ඔබ සමඟ සිටීවි. යම් නඩුවක් විසඳා-
ගැනීමට තිබේ නම් ඔවුන් දෙදෙනා
ළඟට යන්න.”[9] **15** මෝසෙස් කඳු
මුදුනට යෑමට පිටත් වූ අවස්ථාවේදී
වලාකුළෙන් කන්ද වැසී තිබිණ.[10]

**16** යෙහෝවා දෙවිගේ තේජස[11]
සීනයි කන්ද[12] මත දිස් වෙ-
මින් තිබූ අතර දවස් හයක්
පුරාම එය වලාකුළෙන් වැසී තිබිණ.
හත්වෙනි දවසේදී දෙවි වලාකුළේ
සිට[13] මෝසෙස්ට කතා කළේය.
**17** කඳු මුදුනේ බුරබුරා නඟින ගින්-
නක් මෙන්[14] යෙහෝවා දෙවිගේ තේ-
ජස ඊශ්‍රායෙල් සෙනඟ දුටුවෝය.
**18** ඒ අවස්ථාවේදී මෝසෙස් වලාකුළ
තුළට ගියේය.[15] ඔහු දහවල් හතළි-
හක්ද රාත්‍රි හතළිහක්ද කන්දෙහි සිටි-
යේය.[16]

**25** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය.[17] **2** “මා
වෙනුවෙන් සම්මාදමක් එකතු
කරන්න කියා ඊශ්‍රායෙල් සෙනඟට
කියන්න. කැමැත්තෙන් දෙන සෑම
කෙනෙකුගෙන්ම ඔබ එය එකතු
කරගත යුතුයි.[18] **3** ඔබ සම්මාදම්
ලෙස මෙවැනි දේවල් එකතු කර-
ගන්න. රන්ද[19] රිදීද[20] තඹද[21] **4** නිල්
පැහැති නූල්ද රත්නිල් පැහැගැන්වූ

**24 පරි.**
1 නික් 21:1; ද්වි 4:1; හෙබ්‍රෙ 8:6
2 ද්වි 5:27; යොෂු 24:22
3 නික් 34:27; ද්වි 31:9
4 යොෂු 4:8
5 ලෙවී 3:1; ලෙවී 7:11
6 හෙබ්‍රෙ 9:18
7 ලෙවී 17:11
8 නික් 34:27
9 ද්වි 31:11; ක්‍රියා 13:15
10 නික් 19:8
11 හෙබ්‍රෙ 9:19; හෙබ්‍රෙ 12:24
12 ගලා 3:19; ගලා 3:24; කොලො 2:17; හෙබ්‍රෙ 9:20; හෙබ්‍රෙ 10:1
13 නික් 24:11; යෙසා 6:1; යොහ 1:18

**2 තීරුව**
1 එස 1:26; එළි 4:3
2 නික් 24:1
3 ගණන් 12:6
4 උත් 31:54; නික් 18:12; 1කොරි 10:18
5 ද්වි 5:22; මතෙ 5:19
6 නික් 24:2; ගණන් 11:28
7 නික් 32:1
8 නික් 17:10
9 නික් 18:26
10 නික් 19:9
11 නික් 16:10; ලෙවී 9:23; ගණන් 16:42; එස 1:28
12 නික් 19:11
13 මතෙ 17:5
14 නික් 3:2; ද්වි 4:24; එස 1:27; හෙබ්‍රෙ 12:29
15 නික් 19:20
16 නික් 34:28; ද්වි 9:9; 1රාජා 19:8; මතෙ 4:2

**25 පරි.**
17 ක්‍රියා 7:53; ගලා 3:19
18 නික් 35:5; 1ලේක 29:9; 2කොරි 9:7
19 නික් 38:24
20 නික් 38:25
21 නික් 38:3; නික් 38:29

ලොම්ද තද රතු* පැහැති රෙදිද
අගනා ලිනන් රෙදිද එළු රෝමද[1]
5 රතු සායම් දැමූ බැටළු
හම්ද සීල් මත්ස්‍යයාගේ හම්ද ෂිටිම්
ලීද[2] 6 පහන් සඳහා තෙල්ද[3] ශුද්ධ
තෛලය*[4] හා සුවඳ ද්‍රව්‍ය[5] සඳහා
බෝල්සම්[6] තෙල්ද 7 ඒෆොද් හැට්-
ටය[7] හා ළයවැස්ම*[8] සඳහා ඔනික්ස්
ගල්ද වෙනත් අනර්ඝ ගල්ද එකතු
කරගන්න. 8 මම ඊශ්‍රායෙල් සෙනඟ
සමඟ වාසය කරන බැවින් ඔවුන්
මා වෙනුවෙන් ශුද්ධස්ථානයක් සෑදිය
යුතුයි.[9] 9 ඔබ මාගේ ශුද්ධ කූඩා-
රම* හා එහි සියලු බඩු බාහිරාදිය
සෑදිය යුත්තේ මා ඔබට ලබා දෙන
සැලැස්මට අනුවය.[10]

10 “ඔවුන් ෂිටිම් ලීවලින් පෙට්ටි-
යක් සෑදිය යුතුයි.[11] එහි දිග රියන්*
දෙකහමාරක්ද පළල රියන් එකහමා-
රක්ද උස රියන් එකහමාරක්ද විය
යුතුයි. 11 පෙට්ටියේ ඇතුළත හා
පිටත පවිත්‍ර රනින් ආලේප කර[12]
එහි උඩ දාරයට යටින් පෙට්ටිය
වටාම රන් ලියවැලක් සෑදිය යුතුයි.[13]
12 එම පෙට්ටියට කකුල් හතරක්
සවි කර ඒවාට මදක් ඉහළින් රනින්
සෑදූ වළලු හතරක් සවි කරන්න.
වළලු දෙකක් පෙට්ටියේ එක් පැත්ත-
කද අනික් දෙක පෙට්ටියේ අනික්
පැත්තේද තිබෙන සේ සවි කරන්න.[14]
13 ෂිටිම් ලීවලින් පොලු දෙකක්
සාදා ඒවා රනින් ආලේප කරන්න.[15]
14 පෙට්ටිය උසුලාගෙන යන පිණිස
එහි දෙපැත්තේ තිබෙන වළලුවලට
එම පොලු දෙක දමන්න. 15 එම
පොලු වළලුවලින් කිසිවිටක ඉවත්
නොකළ යුතුයි.[16] 16 මා සාක්ෂි-
යක් ලෙස ඔබට දෙන පුවරු* එම
පෙට්ටිය ඇතුළේ තබන්න.[1]

17 “පවිත්‍ර රනින් එම පෙට්ටියට
පියනක්* සාදන්න. එහි දිග රියන්
දෙකහමාරක්ද පළල රියන් එකහ-
මාරක්ද විය යුතුයි.[2] 18 පෙට්ටියේ
පියන මත තබන පිණිස රත්ත-
රන් තළා කෙරුබ්වරුන් දෙදෙනෙ-
කුව සාදාගන්න. එහි දෙකෙළවරෙහි
ඔවුන්ව තබන්න.[3] 19 පියනේ එක්
කෙළවරක එක් කෙරුබ්වරයෙකුද
අනික් කෙළවරේ අනික් කෙ-
රුබ්වරයාවද සවි කර තබන්න.[4]
20 ඔවුන්ව මුහුණට මුහුණ ලා සිටින
සේ තබන්න. ඔවුන් තම පියා-
පත් ඉහළට ඔසවා පියන දෙසට
තම හිස නමාගෙන සිටිය යුතුයි.
ඔවුන්ගේ පියාපත් වියනක් සේ විහිදී
යා යුතුයි.[5] 21 මා සාක්ෂියක් ලෙස
ඔබට දෙන පුවරු එම පෙට්ටිය ඇතු-
ළේ තබන්න. ඉන්පසු පියනෙන්[6]
පෙට්ටිය වසා තබන්න. 22 ගිවි-
සුම් පෙට්ටියේ* පියනට ඉහළින් මම
ඔබට පෙනී සිටින්නෙමි.[7] කෙරුබ්ව-
රුන් දෙදෙනා මැද සිට මම ඔබ සමඟ
කතා කර ඊශ්‍රායෙල් සෙනඟට මා
නියම කරන සියලු පනත් ඔබට
දෙන්නෙමි.[8]

23 “ඔබ ෂිටිම් ලීවලින් මේසයක්
සෑදිය යුතුයි.[9] එහි දිග රියන් දෙකක්ද
පළල රියනක්ද උස රියන් එකහමා-
රක්ද විය යුතුයි. 24 මේසය පවිත්‍ර
රනින් ආලේප කර එහි ලෑල්ලේ දාරය
වටා රන් ලියවැලක් සෑදිය යුතුයි.[10]
25 ඉන්පසු මේසය වටා තිබෙන
එම දාරයට අල්ලක* පමණ පළලින්
යුත් පටියක් සවි කළ යුතුයි. එම
පටිය වටාද තවත් රන් ලියවැලක්
සාදන්න.[11] 26 රනින් වළලු හත-
රක් සාදා ඒවා මේසයේ කකුල් හත-
රේ සවි කරන්න.[12] 27 එම වළලු
සවි කළ යුත්තේ මේසයේ ලියවැල
සාදා ඇති පටියට යටිනි. මේසය

---

**නික් 25:4*** කොචිනීල් කෘමියා වැනි කුඩා ජීවියෙකුගෙන් සාදාගත් සායම්. **6*** යමෙකුව යම් නිලයකට පත් කරන විට භාවිත කළ තෛලයකි. **7*** උත්තම පූජකයා පැළඳ සිටි වස්ත්‍රයේ ළය පෙදෙසේ තිබූ සාක්කුවක්. **9*** එනම්, ඊශ්‍රායෙල් සෙනඟ නමස්කාරය සඳහා භාවිත කළ කූඩාරම. මෙය තැනින් තැනට ගෙන යෑමට හැකි ආකාරයෙන් සාදා තිබිණ. සමහර අවස්ථාවලදී, ‘සම්මුඛ වීමේ කූඩාරම’ ලෙසද මෙය හැඳින්විය. **10*** රියනක් යනු සෙන්ටිමීටර් 44.5කි.

**නික් 25:16*** එනම්, දසපනත ඇතුළත් පුවරු. **17*** එනම්, ආවරණයක්. **22*** මූ.අ., “සාක්ෂි පෙට්ටියේ.” **25*** සෙන්ටිමීටර් 7.4ක් පමණ.

---

**25 පරි.**
1 නික් 35:6
2 නික් 36:20
3 නික් 27:20
4 නික් 30:23
5 නික් 30:34
6 නික් 35:8
7 නික් 28:6
8 නික් 28:15
9 නික් 29:45, 1රාජා 6:13, හෙබ්‍රෙ 9:11
10 1ලේක 28:12, ක්‍රියා 7:44, හෙබ්‍රෙ 8:5, හෙබ්‍රෙ 9:9
11 නික් 37:1
12 නික් 37:2, හෙබ්‍රෙ 9:4
13 නික් 30:3
14 නික් 37:5
15 නික් 30:5, 1ලේක 15:15
16 1රාජා 8:8

**2 තීරුව**
1 නික් 16:34, නික් 31:18, නික් 40:20, ගණන් 17:10, ද්වි 31:26, 1රාජා 8:9, හෙබ්‍රෙ 9:4
2 නික් 37:6
3 1සාමු 4:4, හෙබ්‍රෙ 9:5
4 උත් 3:24
5 1රාජා 8:7, 1ලේක 28:18
6 නික් 40:20, 1ලේක 28:11, හෙබ්‍රෙ 9:5
7 නික් 30:6, ලෙවී 16:2, ගණන් 7:89, විනි 20:27, ගීතා 80:1
8 2සාමු 6:2, 2රාජා 19:15, යෙසා 37:16
9 නික් 40:22, ලෙවී 24:6, ගණන් 3:31, හෙබ්‍රෙ 9:2
10 නික් 37:11
11 නික් 37:12
12 නික් 37:13

පොලුවලින් උසුලාගෙන යැමට මෙය
උපකාරවත් වේ.[1] **28** මේසය එහා
මෙහා ගෙන යැම සඳහා ඔබ ෂිටිම්
ලීවලින් පොලු දෙකක් සාදා ඒවා
රනින් ආලේප කරන්න.[2]

**29** "ඔබ මේසය මත තැබීමට
පවිත්‍ර රනින් දීසිද කුසලානද පාන
පූජා වත් කිරීම සඳහා බඳුන්ද පාත්‍රද
සෑදිය යුතුයි.[3] **30** ඔබ මට පුදන
රොටි හැමවිටම මා ඉදිරියේ එම මේ-
සය මත තැබිය යුතුයි.[4]

**31** "ඔබ පවිත්‍ර රත්තරන් තළා
පහන් රුකක් සාදන්න.[5] එයට
කඳක්ද අතුද මල්ද පොහොට්ටුද
මල් පෙතිද තිබිය යුතුයි. ඒවා
එකිනෙකට සම්බන්ධ විය යුතුයි.
**32** පහන් රුකෙහි අතු හයක්
තිබිය යුතුයි. කඳෙහි එක් පැත්ත-
කින් අතු තුනක්ද අනික් පැත්තෙන්
තව අතු තුනක්ද විහිදී යා යුතුයි.[6]
**33** ඒ එක් අත්තක් ආමන්ඩ් මල්
තුනකින් යුක්තය. ඒ සෑම ආමන්ඩ්
මලකටම උඩින් පොහොට්ටුවක්ද
ඒ සෑම පොහොට්ටුවකටම උඩින්
මල් පෙතිද පිහිටා තිබේ.[7] පහන්
රුකෙන් විහිදී යන සෑම අත්තක්ම
එලෙස සකස් කළ යුතුයි. **34** පහන්
රුකෙහි කඳ කොටස ආමන්ඩ් මල්
හතරකින් යුක්තය. ඒ සෑම මලක-
ටම උඩින් පොහොට්ටුවක්ද ඒ සෑම
පොහොට්ටුවකටම උඩින් මල් පෙ-
තිද තිබෙන සේ කඳ සකස් කළ
යුතුයි.[8] **35** පහන් රුකෙහි දෙපැත්-
තට විහිදී යන අතු හය යුගළ වශ-
යෙන් තිබිය යුතුයි. අතු යුගළය
කඳට සම්බන්ධ වන සෑම තැනටම
යටින් පොහොට්ටුවක් තිබිය යුතුයි.[9]
**36** පහන් රුකෙහි අතු සහ පො-
හොට්ටු කඳට සම්බන්ධ විය යුතුයි.
ඒ සියල්ල සෑදිය යුත්තේ පවිත්‍ර රත්-
තරන් කුට්ටියක් තළාගැනීමෙන්ය.[10]
**37** ඉන්පසු පහන් රුක මත තැබීමට
පහන් හතක් සාදන්න. පහන් රුක
ඉදිරිපිට තිබෙන ස්ථානය ආලෝක-
වත් කරන පිණිස ඒ පහන් හත දල්වා
තබන්න.[11] **38** පහන් තිර ඇල්ලී-
මට අඬුද ඇවී ගිය පහන් තිර දැමීමට
භාජනද පවිත්‍ර රනින් සෑදිය යුතුයි.[1]
**39** පහන් රුකද පහන්ද එහි සියලු
භාජනද පවිත්‍ර රන් තලෙන්තය-
කින්* සෑදිය යුතුයි. **40** ඔබට කන්-
දේදී පෙන්වන ලද සැලැස්මට අනුව
සියල්ල සෑදීමට වගබලා ගන්න.[2]

**26** "ශුද්ධ කූඩාරම ආවරණය
කිරීමට ඔබ විශාල රෙදි තිර
දහයක් භාවිත කළ යුතුයි.[3] එම රෙදි
තිර විවීම සඳහා සිහින්ව කටින ලද
ලිනන් නූල්ද නිල් පැහැති නූල්ද රත්-
නිල් පැහැගැන්වූ ලොම්ද තද රතු
පැහැති නූල්ද භාවිත කරන්න.[4]
එම රෙදිවල කෙරුබ්වරුන්ගේ[5] රූප
මසන්න. **2** සෑම රෙදි තිරයක්ම
එකම ප්‍රමාණයට සාදන්න. එක්
රෙදි තිරයක දිග රියන් විසිඅටක්ද
පළල රියන් හතරක්ද විය යුතුයි.[6]
**3** එම රෙදි තිර පහක් ගෙන එකිනෙ-
කට මූට්ටු කර එක් විශාල රෙද්දක්
සාදන්න. අනික් රෙදි තිර පහද ගෙන
එකිනෙකට මූට්ටු කර තවත් විශාල
රෙද්දක් සාදන්න.[7] **4** මෙසේ මූට්ටු
කළ පළමු රෙද්දේ අවසාන තිරයේ
වාටිය දිගේ නිල් පැහැති නූල්වලින්
මුදු මසන්න. මූට්ටු කළ දෙවන රෙද්-
දේ අවසාන තිරයේද එලෙසම මුදු
මසන්න. එවිට මූට්ටු කළ රෙදි දෙක
එකිනෙකට සම්බන්ධ කිරීමට හැකි
වේ.[8] **5** රෙදි දෙකේම ඇති වාටි
දිගේ එකිනෙකට සමාන්තරව මුදු
පනහ බැගින් මැසිය යුතුයි. වාටිවල
මසා තිබෙන එම මුදු යොදාගෙන
රෙදි දෙක එකිනෙකට සම්බන්ධ කළ
හැක.[9] **6** රත්තරන් කොකු පන-
හක් සාදා එම කොකු මුදුවලට දමා
රෙදි දෙක එකිනෙකට සම්බන්ධ
කරන්න. මෙසේ ශුද්ධ කූඩාරම ආව-
රණය කිරීම සඳහා තනි රෙද්දක්
ලෙස එය සාදන්න.[10]

**7** "කූඩාරමට දැමූ එම පළමු රෙද්-
දට උඩින් දැමීමට එළු රෝමවලින්[11]

**25 පරි.**
1 නික් 37:14
2 නික් 37:15
3 නික් 37:16 ගණන් 4:7 1රාජා 7:50
4 ලෙවී 24:5 1සාමු 21:6 1ලේක 9:32 2ලේක 13:11 මතෙ 12:4
5 නික් 37:17 නික් 40:24 1රාජා 7:49 හෙබ්‍රෙ 9:2
6 නික් 37:18
7 නික් 37:19
8 නික් 37:20
9 නික් 37:21
10 ගණන් 8:4
11 නික් 30:8 ලෙවී 24:3 ගණන් 8:2 2ලේක 13:11

**2 තීරුව**
1 නික් 37:23 ගණන් 4:9
2 නික් 39:42 ගණන් 8:4 ක්‍රියා 7:44 හෙබ්‍රෙ 8:5

**26 පරි.**
3 හෙබ්‍රෙ 8:5 හෙබ්‍රෙ 9:11
4 නික් 36:8
5 උත් 3:24 ගීතා 99:1
6 ගණන් 4:25 1ලේක 17:1
7 නික් 36:10
8 නික් 36:11
9 නික් 36:12
10 නික් 36:13 නික් 39:33 හෙබ්‍රෙ 9:9
11 නික් 35:26

**නික් 25:39*** තලෙන්තයක් යනු කිලෝග්‍රෑම් 34.2ක් පමණය.

තවත් ආවරණයක් සෑදිය යුතුයි.
ඒ සඳහා එළු රෝමවලින් තැනූ
තිර එකොළහක් යොදාගන්න.
**8** එම තිර එකොළහම එකම ප්‍රමා-
ණයට සාදන්න. එක් තිරයක දිග
රියන්[1] තිහක්ද පළල රියන් හතරක්ද
විය යුතුයි. **9** එයින් තිර පහක්
ගෙන එකිනෙකට මූට්ටු කර එක්
විශාල ආවරණයක් සාදන්න. අනික්
හයද එකිනෙකට මූට්ටු කර තවත්
ආවරණයක් සාදන්න.[2] තිර හය-
කින් සමන්විත ආවරණයේ හයවෙනි
තිරය කූඩාරමට ඇතුල් වන පැත්-
තට එල්ලා වැටෙන සේ තබන්න.
එම හයවෙනි තිරය දෙකට නමා
තැබිය යුතුයි. **10** එම ආවරණයේ
අනික් කෙළවරේ වාටිය දිගේ මුදු
පනහක් මසන්න. අනික් ආවරණයේ
අවසන් තිරයේ වාටිය දිගේද මුදු
පනහක් මසන්න. **11** පසුව තඹ[3]
කොකු පනහක් සාදා ආවරණ දෙ-
කේම තිබෙන මුදුවලට ඒවා දමන්න.
මෙසේ ආවරණ දෙක එකිනෙකට
සම්බන්ධ කර ශුද්ධ කූඩාරම සඳහා
එක ආවරණයක් සාදන්න.[4] **12** එම
ආවරණය ශුද්ධ කූඩාරම මත දැමූ
පසු එය එල්ලා වැටෙන සේ සකස්
කළ යුතුයි. තිර පහකින් සමන්-
විත ආවරණයෙන් භාගයක් කූඩාරමේ
පිටුපස පැත්තෙන් එල්ලා වැටෙන සේ
සකස් කළ යුතුයි. **13** කූඩාරමේ
දෙපැත්තෙන් එල්ලී වැටෙන මෙම
ආවරණයේ කොටස මුලින් සෑදූ රෙද්-
දට වඩා රියනක් වැඩි විය යුතුයි.
කූඩාරමේ දෙපැත්තම එයින් වැසී යා
යුතුයි.

**14** "ශුද්ධ කූඩාරම වැසීම සඳහා
රතු සායම් දැමූ බැටළු හම්වලින්
තවත් ආවරණයක් සාදන්න. ඊට
උඩින් දැමීම සඳහා මුහුදු සිංහයන්-
ගේ හම්වලින් තවත් ආවරණයක්
සාදන්න.

**15** "ශුද්ධ කූඩාරම සෑදීම සඳහා
ෂිටිම් ලීවලින් රාමු[5] සාදා ඒවා කෙ-
ළින් සිටුවන්න. **16** එක් රාමුවක
දිග රියන් දහයක්ද පළල රියන්
එකහමාරක්ද විය යුතුයි. **17** එම
රාමු පොළොවේ ශක්තිමත්ව රඳවන
පිණිස ඒවායේ ලී ඇණ* දෙක බැගින්
සවි කරන්න. එම ලී ඇණවල පිහිටීම
සමාන්තර විය යුතුයි. කූඩාරම සඳහා
සාදන සෑම රාමුවක්ම එසේ සෑදිය
යුතුයි. **18** නෙගෙබ් වෙතට මුහුණ
ලා තිබෙන කූඩාරමේ දකුණු පැත්ත
සෑදීම සඳහා රාමු විස්සක් යොදා-
ගන්න.

**19** "එක් රාමුවක් අනික් රාමුව ළඟ
කෙළින් සිටුවා පොළොවේ රඳවන්න.
රාමුවල තිබෙන ලී ඇණ පොළො-
වට සවි කරන පිණිස රිදී අඩි*
හතළිහක් සාදන්න.[1] සෑම රාමුව-
කට අඩි දෙක බැගින් තිබිය යුතුයි.
**20** කූඩාරමේ උතුරු පැත්ත සඳහා
තවත් රාමු විස්සක් සාදන්න.[2] **21** ඒ
එක් එක් රාමුවද එක ළඟ සිටුවන්න.
එම රාමුද පොළොවේ රඳවන පිණිස
තවත් රිදී අඩි හතළිහක් සාදන්න.
සෑම රාමුවකටම අඩි දෙක බැගින්
තිබිය යුතුයි.[3] **22** කූඩාරමේ බස්-
නාහිර පැත්ත එනම්, එහි පිටුපස
කොටස සඳහාද රාමු හයක් සාදන්න.[4]
**23** මීට අමතරව කූඩාරමේ පිටුපස
පැත්තේ දෙකෙළවරේ ආධාරක කණු
ලෙස තැබීම සඳහා තවත් රාමු දෙ-
කක් සෑදිය යුතුයි.[5] **24** එක් රාමුවක්
එකිනෙකට සමානව තිබෙන ලෑලි
දෙකකින් සමන්විත වන අතර එහි
මුදුන එකිනෙකට සම්බන්ධව පවතී.
එය එසේ සම්බන්ධ විය යුත්තේ කූඩා-
රමේ පළමු වළල්ල තිබෙන ස්ථා-
නයේදීය. රාමු දෙකම එයාකාරයට
සෑදිය යුතු අතර ඒවා කෙළවරේ
ආධාරක කණු ලෙස සවි කළ යුතුයි.
**25** මෙසේ, කූඩාරමේ පිටුපස කොටස
සඳහා රාමු අටක් සාදන්න. ඒ එක් එක්
රාමු එක ළඟ සිටුවන්න. රාමු පො-
ළොවේ රඳවන පිණිස රිදී අඩි දහස-
යක් සාදන්න. සෑම රාමුවකටම අඩි
දෙක බැගින් තිබිය යුතුයි.

**26 පරි.**
1 එළි 3:11
2 නික් 36:16
3 එළි 8:9; යෝබ් 28:2
4 නික් 36:13
5 ගණන් 4:31

**2 තීරුව**
1 ගණන් 3:36
2 නික් 36:25
3 නික් 36:26
4 නික් 36:20; නික් 36:27
5 නික් 36:28

---

**නික් 26:17*** මෙහි සඳහන් වන්නේ කප්පිලි ගැනයි. **19*** මෙහි සඳහන් වන්නේ සිදුරු සහිත අඩි ගැනයි.

**26** “රාමු එකිනෙකට සම්බන්ධ
කරන පිණිස ෂිටිම් ලීවලින් පොලු
සාදන්න.[1] කූඩාරමේ එක් පැත්-
තක තිබෙන රාමු සවි කිරීම සඳහා
පොලු පහක් සාදන්න. **27** කූඩාර-
මේ අනික් පැත්තේ තිබෙන රාමු සවි
කිරීම සඳහාද පොලු පහක් සාදන්න.
කූඩාරමේ බස්නාහිර පැත්ත එනම්,
එහි පිටුපස කොටස සඳහා තවත්
පොලු පහක් සාදන්න.[2] **28** රාමුවේ
හරි මැදින් යවන පොල්ල එක් කෙළ-
වරක සිට අනික් කෙළවර දක්වාම
තිබෙන ආකාරයෙන් සෑදිය යුතුයි.

**29** “සෑම රාමුවක්ම රනින් ආලේප
කරන්න.[3] රාමු එකිනෙකට සම්-
බන්ධ කරන පොලුද රනින් ආලේප
කරන්න. ඒ පොලු දැමීම සඳහා
රනින් වළලු සාදා රාමු මත සවි
කරන්න. **30** ඔබට කන්දේදී පෙන්-
වන ලද සැලැස්මට අනුව ශුද්ධ කූඩා-
රම සාදන්න.[4]

**31** “නිල් පැහැති නූල්, රත්නිල්
පැහැගැන්වූ ලොම්, තද රතු
පැහැති නූල් හා සිහින්ව කටින ලද
ලිනන් නූල් යොදාගෙන තිර රෙද්-
දක්[5] සාදන්න. එහි කෙරුබ්වරුන්ගේ[6]
රූප මැසිය යුතුයි. **32** ෂිටිම් ලීව-
ලින් කණු හතරක් සාදා ඒවා රනින්
ආලේප කරන්න. ඒවා රිදී අඩි හතරක්
යොදාගෙන පොළොවේ රඳවන්න.
තිර රෙද්ද එල්ලීම සඳහා කණු මත
රන් ඇණ සවි කරන්න. **33** කො-
කුවලින් එම තිර රෙද්ද එල්ලිය
යුතුයි. තිර රෙද්දෙන් වෙන්ව තිබෙන
කොටස තුළට ගිවිසුම් පෙට්ටිය[7]
ගෙනෙන්න. අතිශුද්ධස්ථානය[8] හා
ශුද්ධස්ථානය[9] වෙන් කෙරෙන්නේ එම
තිර රෙද්ද මගිනි. **34** අතිශුද්ධස්-
ථානයේ තිබෙන ගිවිසුම් පෙට්ටිය එහි
පියනෙන් වසා තබන්න.

**35** “තිර රෙද්දෙන් වෙන් කර
තිබෙන ස්ථානයට පිටින් මේසය
තබන්න. මේසය ඉදිරිපිටින් පහන්
රුක[10] තබන්න. මේසය කූඩාරමේ
උතුරු පැත්තේද පහන් රුක කූඩාර-
මේ දකුණු පැත්තේද තිබිය යුතුයි.

**26 පරි.**
**1** නික් 36:31
**2** නික් 36:32
**3** නික් 12:35
නික් 36:34
**4** නික් 19:3
නික් 25:9
නික් 27:8
ක්‍රියා 7:44
හෙබ්‍රෙ 8:5
**5** නික් 36:35
නික් 40:21
ලෙවී 16:2
ලූක් 23:45
හෙබ්‍රෙ 6:19
හෙබ්‍රෙ 9:3
හෙබ්‍රෙ 10:20
**6** උත් 3:24
**7** 1රාජා 8:6
හෙබ්‍රෙ 9:4
**8** නික් 40:21
ලෙවී 16:2
1රාජා 8:6
හෙබ්‍රෙ 9:3
හෙබ්‍රෙ 9:12
හෙබ්‍රෙ 9:24
**9** නික් 40:22
නික් 40:26
හෙබ්‍රෙ 9:2
**10** ලෙවී 24:3
1රාජා 7:49

**2 තීරුව**
**1** නික් 36:37

**27 පරි.**
**2** නික් 38:1
නික් 40:29
2ලේක 4:1
හෙබ්‍රෙ 13:10
**3** ලෙවී 4:25
1රාජා 2:28
ගීතා 118:27
**4** නික් 38:2
ගණන් 16:38
1රාජා 8:64
**5** නික් 38:3
ලෙවී 16:12
1රාජා 7:45
**6** නික් 35:16
**7** නික් 38:4
**8** නික් 38:6
ගණන් 4:14
**9** නික් 38:7
ගණන් 4:15
**10** නික් 25:40
1ලේක 28:12
ක්‍රියා 7:44
හෙබ්‍රෙ 8:5
**11** නික් 40:8
1රාජා 6:36
1රාජා 8:64
ගීතා 84:10
ගීතා 92:13
ගීතා 100:4

**36** නිල් පැහැති නූල්, රත්නිල් පැහැ-
ගැන්වූ ලොම්, තද රතු පැහැති
නූල් සහ සිහින්ව කටින ලද ලිනන්
නූල් යොදාගෙන තවත් රෙදි තිරයක්
වියන්න.[1] එය එල්ලිය යුත්තේ ශුද්ධ
කූඩාරමට ඇතුල් වන ස්ථානයේය.
**37** එම තිරය එල්ලීම සඳහා ෂිටිම්
ලීවලින් කණු පහක් සාදා ඒවා රනින්
ආලේප කරන්න. ඒවා තඹ අඩි පහක්
යොදාගෙන පොළොවේ රඳවන්න.
කණු මත රන් ඇණ සවි කර ඒවායේ
තිරය එල්ලන්න.

**27** “ෂිටිම් ලීවලින් පෙට්ටියක
හැඩයෙන් යුත් පූජාසනයක්[2]
සාදන්න. එහි දිග රියන් පහක්ද පළල
රියන් පහක්ද උස රියන් තුනක්ද
විය යුතුයි. **2** පූජාසනයට සම්බන්ධ
වන ආකාරයෙන් එහි කොන් හතර
මත අං[3] හතරක් සාදන්න. ඉන්පසු
මුළු පූජාසනයම තඹවලින් ආලේප
කරන්න.[4] **3** පූජාසනයෙන් තෙල්
මිශ්‍ර අළු ඉවත් කිරීම සඳහා හැළි,
සවල්, බේසම් කොකු හා අඟුරු දැමීම
සඳහා භාජනද සාදන්න. මේ සියලු
භාණ්ඩ තඹවලින් සෑදිය යුතුයි.[5]
**4** පූජාසනය සඳහා දැලක ආකාරයේ
මැස්සක් තඹවලින් සාදන්න.[6] එහි
කොන් හතරට තඹ වළලු හතරක්
සවි කරන්න. **5** එම මැස්ස පූජාස-
නය ඇතුළට යවා එහි වටා ඇති පටි-
යට යටින් එය රඳවා තබන්න.[7]
**6** පූජාසනය උසුලාගෙන යෑම සඳහා
ෂිටිම් ලීවලින් පොලු සෑදිය යුතුයි. එම
පොලු තඹවලින් ආලේප කරන්න.[8]
**7** පූජාසනය දෙපැත්තේ සවි කර ඇති
වළලුවලට එම පොලු දමන්න. එසේ
කළ යුත්තේ පූජාසනය එහා මෙහා
ගෙන යෑමට හැකි වීම සඳහාය.[9]
**8** පූජාසනය හිස් පෙට්ටියක හැඩ-
යට ලෑලිවලින් සාදන්න. කන්දේදී
ඔබට පෙන්වූ ආකාරයටම එය සෑදිය
යුතුයි.[10]

**9** “ශුද්ධ කූඩාරමට මළුවක්[11]
තිබිය යුතුයි. නෙගෙබ් වෙතට මුහුණ
ලා තිබෙන මළුවේ දකුණු පැත්ත
ආවරණය කිරීම සඳහා සිනිඳු ලිනන්

රෙදිවලින් තිර සාදන්න.[1] එහි දිග
රියන් සියයක් විය යුතුයි. **10** තිර
රඳවා තැබීම සඳහා තඹවලින් කණු
විස්සක් සාදන්න. ඒ කණු පොළොවේ
රඳවන පිණිස තඹ අඩි විස්සක්
සාදන්න. එම කණුවල තිර එල්-
ලන පිණිස කණු මත රිදී ඇණ
සවි කරන්න. රිදී වළලුද කණුවලට
සවි කරන්න.[2] **11** මළුවේ උතුරු
පැත්තෙහිද එලෙසම කරන්න. ඒ
පැත්ත සඳහාද රියන් සියයක් දිග තිර
සාදන්න. තඹ කණු විස්සක්ද ඒවා
පොළොවේ රඳවා තබන පිණිස තඹ
අඩි විස්සක්ද සාදන්න. එම කණුවල
තිර එල්ලන පිණිස රිදී ඇණ කණු
මත සවි කරන්න. රිදී වළලුද එම
කණුවල සවි කරන්න.[3] **12** මළුවේ
බස්නාහිර පැත්ත සඳහා රියන් පන-
හක් දිග තිර සාදන්න. ඒවා රඳවා
තැබීම සඳහා කණු දහයක්ද එම
කණු පොළොවේ රඳවා තබන පිණිස
අඩි දහයක්ද සාදන්න.[4] **13** මළුවේ
නැඟෙනහිර පැත්තේ දිග රියන් පන-
හක් විය යුතුයි.[5] **14** එම පැත්තේ
එක් කෙළවරක කණු තුනක් හා
ඒවා පොළොවේ රඳවා තබන පිණිස
අඩි තුනක් සාදන්න. එම කණුවල
එල්ලීමට රියන් පහළවක් දිග තිර
සාදන්න.[6] **15** නැඟෙනහිර පැත්තේ
අනික් කෙළවර සඳහාද කණු තුනක්
හා ඒවා පොළොවේ රඳවා තබන
පිණිස අඩි තුනක් සාදන්න. එම කණු-
වල එල්ලීම සඳහාද රියන් පහළවක්
දිග තිර සාදන්න.[7]

**16** "එහි මැද තිබෙන කොටස මළු-
වේ දොරටුව සඳහා යොදාගන්න. එම
දොරටුවට රියන් විස්සක් දිග තිරයක්
සාදන්න. නිල් පැහැති නූල්වලින්ද
රත්නිල් පැහැගැන්වූ ලොම්වලින්ද
තද රතු පැහැති නූල්වලින්ද සිහින්ව
කටින ලද ලිනන් නූල්වලින්ද එම
තිර රෙද්ද වියන්න.[8] එය එල්ලීම
සඳහා කණු හතරක්ද ඒවා පොළො-
වේ රඳවා තබන පිණිස අඩි හතරක්ද
සාදන්න.[9] **17** මළුව වටේ තිබෙන
සෑම කණුවකම රිදී ඇණ හා රිදී
වළලු තිබිය යුතුයි. කණු පොළො-
වේ රැඳවිය යුත්තේ තඹ අඩිවලිනි.[1]
**18** මළුවේ දිග රියන් සියයක්ද[2] පළල
රියන් පනහක්ද විය යුතුයි. එය වටා
සිහින් ලිනන් නූල්වලින් වියන ලද
රියන් පහක් උස තිර එල්ලිය යුතුයි.
ඒවා එල්ලන කණු පොළොවේ රඳවා
තබන පිණිස තඹ අඩි සෑදිය යුතුයි.
**19** ශුද්ධ කූඩාරමේ සියලු වැඩකට-
යුතු සඳහා ගන්නා භාණ්ඩද එහි
කූඤ්ඤද මළුවේ කණු රඳවන කූඤ්-
ඤද තඹවලින් සෑදිය යුතුයි.[3]

**20** "පහන් නිතරම දල්වා තබා-
ගැනීම සඳහා ඔලීව ගෙඩි කොටා
සාදාගත් ඉස්තරම්ම වර්ගයේ තෙල්
ඔබට ගෙනැවිත් දෙන ලෙස ඊශ්‍රායෙල්
සෙනඟට අණ කරන්න.[4] **21** සම්-
මුඛ වීමේ කූඩාරමේ ගිවිසුම් පෙට්-
ටිය තිබෙන ස්ථානය වෙන් කරන
තිරය[5] අසල තිබෙන පහන් සවස
සිට උදෑසන දක්වා නොකඩවා යෙ-
හෝවා දෙවි ඉදිරියේ දැල්වෙමින්
තිබිය යුතුයි. එම පහන් නොකඩවා
දැල්වෙන බවට ආරොන් සහ ඔහුගේ
පුත්‍රයන් වගබලා ගත යුතුයි.[6] එය
ඊශ්‍රායෙල් සෙනඟගේ සියලු පරම්පරා-
වලදී[7] ඔවුන් විසින් බොහෝ කාලයක්
පුරා පැවැත්විය යුතු නියෝගයක්
වන්නේය.[8]

**28** "පූජකයෙකු ලෙස මට සේ-
වය කරන පිණිස මම ඔබේ
සහෝදරයා වන ආරොන්ව තෝරා-
ගත්තෙමි.[9] එහෙයින් ආරොන්වද[10]
ඔහුගේ පුත්‍රයන් වන නාදාබ්වද අබිහු-
වද[11] එලියාසර්වද ඉතාමාර්වද[12] ඔබ
වෙතට කැඳවන්න. **2** ඔබේ සහෝ-
දරයා වන ආරොන්ට ගෞරවය හා
අලංකාරය ගෙන දෙන ශුද්ධ වස්ත්‍ර
සාදා දිය යුතුයි.[13] **3** පූජකයෙකු
ලෙස මට සේවය කරන පිණිසත්
එම පරිශුද්ධ සේවය සඳහා ඔහුව
වෙන් කර තබන පිණිසත් ඔහු එම
වස්ත්‍ර ඇඳිය යුතුයි. වැඩවලට දක්ෂ
සියල්ලන්ව ඔබ වෙතට කැඳවන්න.
ආරොන්ගේ වස්ත්‍ර සෑදිය යුත්තේ ඔවු-

**27 පරි.**
**1** නික් 38:9
**2** නික් 38:10
**3** නික් 38:11
**4** නික් 38:12
**5** නික් 38:13
**6** නික් 38:14 නික් 39:40
**7** නික් 38:15
**8** නික් 35:25 නික් 38:18
**9** නික් 38:19

**2 තීරුව**
**1** නික් 38:17
**2** නික් 27:9
**3** නික් 38:20 ගණන් 3:36
**4** නික් 39:37 ලෙවී 24:2
**5** නික් 26:33 නික් 40:3 හෙබ්‍රෙ 6:19 හෙබ්‍රෙ 9:2 හෙබ්‍රෙ 9:3 හෙබ්‍රෙ 10:20
**6** නික් 30:8 ලෙවී 24:3 2ලේක 13:11
**7** නික් 28:43 නික් 40:15
**8** ලෙවී 21:21 ගණන් 16:40 ගණන් 18:23 2ලේක 26:18

**28 පරි.**
**9** ලෙවී 8:2 හෙබ්‍රෙ 5:1
**10** නික් 4:14 ගීතා 99:6 හෙබ්‍රෙ 5:4
**11** නික් 6:23 ලෙවී 10:1 ගණන් 26:61
**12** නික් 38:21 ලෙවී 10:16 1ලේක 6:3 1ලේක 24:2
**13** නික් 29:5 ලෙවී 8:7

හුය.[1] මමද ඔවුන්ට අවශ්‍ය ප්‍රඥාව
ලබා දෙන්නෙමි.[2]
**4** “ඔවුන් ළයවැස්මක්ද[3] ඒෆොද්
හැට්ටයක්ද[4] අත් නැති වස්ත්‍ර-
යක්ද[5] කොටු මෝස්තර සහිත වස්ත්‍ර-
යක්ද විශේෂ හිස්වැස්මක්ද[6] ඉණ
පටියක්ද[7] සෑදිය යුතුයි. පූජකයෙකු
ලෙස මට සේවය කරන පිණිස ඔබේ
සහෝදරයා වන ආරොන්ට ඔවුන් එම
වස්ත්‍ර සෑදිය යුතුයි. ඔවුන් ආරොන්-
ගේ පුත්‍රයන්ටද ශුද්ධ වස්ත්‍ර සෑදිය
යුතුයි. **5** ඔවුන් ඒ සඳහා රන් නූල්,
නිල් පැහැති නූල්, රත්නිල් පැහැ-
ගැන්වූ ලොම්, තද රතු පැහැති රෙදි
හා අගනා ලිනන් රෙදි භාවිත කළ
යුතුයි.
**6** “රත්නිල් පැහැගැන්වූ ලොම්,
රන් නූල්, නිල් පැහැති නූල්, තද රතු
පැහැති නූල් හා සිහින්ව කටින
ලද ලිනන් නූල් යනාදියෙන් වැඩ
දමා ඒෆොද් හැට්ටය සෑදිය යුතුයි.[8]
**7** ඒෆොද් හැට්ටය සඳහා උරහිස්පටි
දෙකක් සාදන්න. ඒ එක් එක් පටියේ
එක් කොනක් උරහිසට සම්බන්ධ
කළ යුතුයි.[9] **8** ඒෆොද් හැට්ටය
තදින් බඳින පිණිස ඉණපටියක්ද[10]
එයට තිබිය යුතුයි. එම පටිය ඒෆොද්
හැට්ටය මෙන් රන් නූල්, නිල් පැහැති
නූල්, රත්නිල් පැහැගැන්වූ ලොම්, තද
රතු පැහැති නූල් හා සිහින්ව කටින
ලද ලිනන් නූල් භාවිත කර සෑදිය
යුතුයි.
**9** “ඔනික්ස්[11] ගල් දෙකක් ගෙන
ඊශ්‍රායෙල් ගෝත්‍රවල නම්[12] ඒවා
මත කොටන්න.[13] **10** එක් ගලක
නම් හයක්ද අනික් ගලේ ඉතුරු
නම් හයද කොටන්න. ඊශ්‍රායෙල්-
ගේ පුත්‍රයන් ඉපදුණු අනුපිළිවෙළට
අනුව ඒවා කොටන්න.[14] **11** එම
ගල් දෙක මත ඊශ්‍රායෙල් ගෝත්‍රවල
නම් කෙටිය යුත්තේ ගල් කැටයම්
කරන්නෙකු විසින්ය. මුද්‍රා තබන
අච්චුවක කෙටූ අකුරු මෙන් එම
නම් තිබිය යුතුයි.[15] එම ගල් දෙක
රත්තරන්වල ඔබ්බවා[16] **12** ඒෆොද්
හැට්ටයේ උරහිස් මත තිබෙන පටි
දෙකෙහි සවි කරන්න. ඒවා ඊශ්‍රායෙල්
සෙනඟට සිහිවටනයක් වන්නේය.[1]
ආරොන් එම නම් සිහිවටනයක් ලෙස
යෙහෝවා දෙවි ඉදිරියට ගෙන යනු
ඇත. **13** ඔබ එම ගල් දෙක රත්ත-
රන්වල එබ්බවිය යුතුයි. **14** පිරිසිදු
රන් කෙඳි ලණු මෙන් අඹරාගන්න.[2]
එලෙස ලණු දෙකක් සාදා එම ගල්
දෙකට සම්බන්ධ කරන්න.[3]
**15** “ළයවැස්මද ඒෆොද් හැට්ටය
මෙන් සාදන්න. එය රත්නිල් පැහැ-
ගැන්වූ ලොම්, රන් නූල්, නිල් පැහැති
නූල්, තද රතු පැහැති නූල් හා සිහින්ව
කටින ලද ලිනන් නූල් යනාදියෙන්
වැඩ දමා සෑදිය යුතුයි.[4] එය දෙවි-
ගේ තීන්දු ප්‍රකාශ කෙරෙන ළයවැස්-
මය.[5] **16** ළයවැස්ම හරි හතරැස්ව
තිබෙන පිණිස දෙකට නමන්න. එහි
දිග වියතක්ද පළල වියතක්ද විය
යුතුයි.[6] **17** ඒ මත මැණික් ගල්
පේළි හතරක් අල්ලන්න.[7] පළමුවෙනි
පේළියේ රතු කැට,[8] පඩියන්[9] හා මර-
කත ගල්[10] තිබිය යුතුයි. **18** දෙ-
වෙනි පේළියේ පච්ච ගලක්ද[11] නීල
මාණික්‍යයක්ද[12] ජැස්පර් ගලක්ද[13]
තිබිය යුතුයි. **19** තුන්වෙනි පේළි-
යේ ලෙෂම්,* අගස්ති[14] හා අම-
තේස්ත[15] ගල් තිබිය යුතුයි.
**20** හතරවෙනි පේළියේ ක්‍රිසොලයිට්
ගලක්ද[16] ඔනික්ස් ගලක්ද[17] ජේඩ්
ගලක්ද තිබිය යුතුයි. එම ගල් රත්ත-
රන්වල ඔබ්බවා ළයවැස්මට අල්-
ලන්න.[18] **21** ඒ ගල් දොළහ මත
ඊශ්‍රායෙල්ගේ පුත්‍රයන්ගේ නම් දොළහ
කොටන්න. එක ගලක් මත එක
නමක් කොටන්න.[19] මුද්‍රා තබන අච්-
චුවක කෙටූ අකුරු මෙන් ඊශ්‍රායෙල්
ගෝත්‍ර දොළහේ නම් තිබිය යුතුයි.[20]
**22** “ළයවැස්ම සඳහා පිරිසිදු රන්
කෙඳි ලණු මෙන් අඹරා සාදාගන්න.[21]
**23** රන් මුදු දෙකක් සාදා[22] ඒවා ළය-
වැස්මේ ඉහළ දෙකෙළවරේ අල්-
ලන්න. **24** මුලින්ම සෑදූ රන් ලණු

**28 පරි.**
**1** නික් 31:6
නික් 36:1
හිතෝ 2:6
**2** එෆි 1:17
**3** නික් 39:8
නික් 39:15
ලෙවී 8:8
**4** නික් 39:2
**5** නික් 39:22
**6** නික් 39:28
නික් 39:30
ලෙවී 8:9
**7** නික් 39:29
ලෙවී 8:7
යෙසා 11:5
**8** නික් 39:3
**9** නික් 39:4
**10** නික් 29:5
**11** උත් 2:12
නික් 35:9
**12** නික් 39:14
**13** නික් 39:6
2ලේක 2:7
**14** උත් 43:33
නික් 1:1
**15** නික් 35:27
**16** නික් 39:13

**2 තීරුව**
**1** නික් 39:7
**2** නික් 39:15
**3** නික් 39:18
**4** නික් 39:8
**5** නික් 28:30
ලෙවී 8:8
ගණන් 27:21
**6** නික් 39:9
**7** නික් 39:10
**8** එස 27:16
**9** එළි 21:20
**10** නික් 39:10
එළි 21:19
**11** නික් 39:11
**12** නික් 24:10
එස 1:26
**13** එළි 4:3
එළි 21:11
**14** නික් 39:12
**15** එළි 21:20
**16** සල 5:14
**17** 1ලේක 29:2
**18** නික් 39:13
**19** 1රාජ 18:31
**20** නික් 1:1
**21** නික් 39:15
**22** නික් 39:16

---

**නික් 28:19*** හඳුනා නොගත් අගනා මැණික් වර්ගයකි.

දෙක ළයවැස්මේ තිබෙන මුදු දෙ-
කට සම්බන්ධ කරන්න.[1] **25** ඉන්-
පසු එම ලණුවල අනික් දෙකෙළවර
රත්තරන්වල ඔබ්බවා තිබෙන ගල්
දෙකට සම්බන්ධ කරන්න. ළයවැස්ම
ඒෆොද් හැට්ටයට උඩින් තිබෙන
පිණිස එම ගල් දෙක ඒෆොද් හැට්-
ටයේ උරහිස් මත තිබෙන පටි
දෙකෙහි සවි කරන්න.[2] **26** රනින්
තවත් මුදු දෙකක් සාදා ළයවැස්-
මේ පහළ දෙකෙළවරේ අල්ලන්න.
ඒවා ඇල්ලිය යුත්තේ ළයවැස්මේ
ඇතුල් පැත්තෙන්ය.[3] **27** ඒෆොද්
හැට්ටයේ උරහිසට සම්බන්ධ කළ
පටි දෙක පිටුපසින්ද ඒෆොද් හැට්ට-
යට සම්බන්ධ කරන්න. එසේ සම්-
බන්ධ කළ යුත්තේ ඉණ පටියට
ඉහළින්ය. පිටුපසින් සම්බන්ධ කරන
ඒ තැන් දෙකෙහි සවි කිරීම සඳහා
තවත් රන් මුදු දෙකක් සාදන්න.[4]
**28** එම පටි දෙකෙළවරේ තිබෙන මුදු
දෙක තුළින් නිල් පැහැති ලණුවක්
යවා එය ළයවැස්මේ පහළ කෙළව-
රේ තිබෙන මුදු දෙකට සම්බන්ධ
කරන්න. ළයවැස්ම නොසෙල්වෙන
පිණිසත් ඒෆොද් හැට්ටයේ ඉණ පටි-
යට ඉහළින් ස්ථිරව තිබෙන පිණිසත්
එය බඳින්න.[5]

**29** "ශුද්ධස්ථානයට යන සෑම
අවස්ථාවකදීම ඊශ්‍රායෙල් පුත්‍රයන්ගේ
නම් දරන දෙවිගේ තීන්දු ප්‍රකාශ
කෙරෙන ළයවැස්ම ආරොන් තම
ළයෙහි* බැඳගෙන සිටිය යුතුයි.
ළයවැස්ම නිරතුරුවම යෙහෝවා
දෙවි වන මා ඉදිරියේ සිහිවටනයක්
වනු ඇත. **30** දෙවිගේ තීන්දු ප්‍රකාශ
කෙරෙන ළයවැස්ම තුළට* ඌරීම්[6]
සහ තුම්මීම්# දමන්න. ආරොන්, යෙ-
හෝවා දෙවි ඉදිරියට යන සෑමවිට-
කම ඒවා ඔහුගේ ළයට ස්පර්ශ වන
සේ තිබිය යුතුයි. ආරොන්, යෙහෝවා
දෙවි ඉදිරියේ ඊශ්‍රායෙල් පුත්‍රයන්ට
තීන්දු[1] ප්‍රකාශ කිරීමට භාවිත කරන
ඌරීම් සහ තුම්මීම් නිරතුරුවම තම
ළයවැස්ම තුළ දැරිය යුතුයි.

**31** "ඒෆොද් හැට්ටයට යටින්
ඇඳීම සඳහා අත් නැති වස්ත්‍රයක්
නිල් පැහැති නූල්වලින් වියන්න.[2]
**32** වස්ත්‍රයේ කර කපා වියන ලද පටි-
යක් එය වටේට අල්ලන්න. එය
අඳින විට නොඉරෙන පිණිස යුද
ඇඳුමක කර මෙන් එය මසන්න.[3]
**33** වස්ත්‍රයේ වාටිය දිගේ අල්ලන
පිණිස නිල් පැහැති නූල්වලින්, රත්-
නිල් පැහැගැන්වූ ලොම්වලින් හා
තද රතු පැහැති නූල්වලින් දෙළුම්
ගෙඩි සාදන්න. එහි වාටිය දිගේ
රන් සීනුද[4] අල්ලන්න. ඒවා දෙළුම්
ගෙඩි දෙකක් අතරේ සිටින සේ
අල්ලන්න. **34** අත් නැති වස්ත්‍රයේ
වාටිය දිගේ රන් සීනුවක් හා දෙළුම්
ගෙඩියක් මාරුවෙන් මාරුවට අල්-
ලන්න.[5] **35** දෙවිට සේවය කරන
පිණිස ශුද්ධස්ථානයට ඇතුල් වන
විට ආරොන් අත් නැති වස්ත්‍රය ඇඳ
සිටිය යුතුයි. ඔහු එසේ නොකළොත්
ඔහුගේ ජීවිතය ඔහුට අහිමි වනු
ඇත.[6] ඔහු යෙහෝවා දෙවි ඉදිරියට
යන විටත් ශුද්ධස්ථානයෙන් පිටතට
එන විටත් වස්ත්‍රයේ තිබෙන සීනුව-
ලින් හඬක් නික්මෙනු ඇත.

**36** "පවිත්‍ර රනින් දිලිසෙන තහඩු-
වක් සාදා, 'ශුද්ධකමේ උල්පත යෙ-
හෝවා දෙවිය'[7] යන වචන පෙළ
එහි කොටන්න. එම වචන පෙළ
මුද්‍රා තබන අච්චුවක කෙටූ අකුරු
මෙන් විය යුතුයි. **37** විශේෂ හිස්-
වැස්ම මත නිල් පැහැති ලණුවකින්
එම තහඩුව බඳින්න. එම තහඩුව
හිස්වැස්මේ ඉදිරිපස තිබිය යුතුයි.[8]
**38** එනම්, එම තහඩුව ආරොන්ගේ
නළල මත තිබිය යුතුයි. ඊශ්‍රායෙල්
සෙනඟ දෙවිට කැප කරන ශුද්ධ
වස්තු එනම්, ඔහුට පිළිගන්වන ශුද්ධ
තෑගි දූෂ්‍ය කළොත්[9] ආරොන් ඔවුන්-
ගේ පාපය තමා පිටට ගෙන ඔවුන්

---

**නික් 28:29*** මූ.අ., "සිතෙහි." **30*** දෙකට නැමූ ළයවැස්ම තුළට ඌරීම් හා තුම්මීම් දැමූ බව මින් අදහස් කරනවා විය හැකියි. 16වන පදය බලන්න. **30#** දිව්‍ය විනිශ්චයන් ප්‍රකාශ කිරීම සඳහා ඌරීම් සහ තුම්මීම් භාවිත කෙරිණ. මේවා සමහරවිට දාදු දැමීමට භාවිත කළ ගල් වර්ගයන් විය හැකියි.

**28 පරි.**
**1** නික් 39:17, ලෙවී 8:8
**2** නික් 39:18
**3** නික් 39:19
**4** නික් 28:8, නික් 39:20, ලෙවී 8:7
**5** නික් 39:21
**6** ලෙවී 8:8, ගණන් 27:21, ද්වි 33:8, 1සාමු 28:6, එස්රා 2:63

**2 තීරුව**
**1** යෙසා 58:2, යොහ 8:16, හෙබ්‍රෙ 4:15, හෙබ්‍රෙ 5:1
**2** නික් 39:22, ලෙවී 8:7
**3** නික් 39:23
**4** නික් 39:25
**5** නික් 39:26
**6** ලෙවී 16:2, ගණන් 18:7
**7** නික් 39:30, ලෙවී 8:9, 1ලේක 16:29, ගීතා 93:5, සෙක 14:20, හෙබ්‍රෙ 7:26, 1පේතෘ 1:16
**8** නික් 29:6, නික් 39:31
**9** ලෙවී 10:17, ලෙවී 22:9, ගණන් 18:1, යෙසා 53:11, 2කොරි 5:21, හෙබ්‍රෙ 9:28, 1පේතෘ 2:24

වෙනුවෙන් යෙහෝවා දෙවි ඉදිරියේ කන්නලව් කළ යුතුයි. දෙවි එම කන්නලව් පිළිගන්නා පිණිස[1] තහඩුව නිරතුරුවම ආරෝන්ගේ නළල මත තිබිය යුතුයි.

**39** “අගනා ලිනන් නූල්වලින් කොටු මෝස්තර සහිත වස්ත්‍රයක් වියන්න. අගනා ලිනන් රෙදිවලින්[2] ඉණ පටියක්ද[3] විශේෂ හිස්වැස්මක්ද සාදන්න.

**40** “ආරෝන්ගේ පුත්‍රයන්ටත් වස්ත්‍රද[4] ඉණපටිද හිස්වැසුම්ද සාදන්න.[5] ඔවුන්ට ගෞරවය හා අලංකාරය[6] ලැබෙන පිණිස එසේ කරන්න. **41** මේ ඇඳුම් ඔබේ සහෝදරයා වන ආරෝන්ටද ඔහුගේ පුත්‍රයන්ටද අන්දවා ඔවුන්ව අභිෂේක කරන්න.[7] පූජකයන් ලෙස මට සේවය කරන පිණිස ඔවුන්ට බලය දී*[8] ඔවුන්ව කැප කරන්න. **42** ඔවුන්ගේ නග්නභාවය වසන පිණිස ලිනන් රෙදිවලින් යට ඇඳුම් මසන්න.[9] එම යට ඇඳුම් උකුළ සිට කලවය දක්වා දික් විය යුතුයි. **43** ආරෝන් සහ ඔහුගේ පුත්‍රයන් සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල් වන විටත් ශුද්ධස්ථානයේ තිබෙන පූජාසනය ළඟට යන විටත් එම යට ඇඳුම් ඇඳ සිටිය යුතුයි. ඔවුන් එසේ නොකළොත් එය පාපයකි. ඔවුන්ගේ ජීවිත ඔවුන්ට අහිමි නොවන පිණිස ආරෝන්ද ඔහුගේ දරුවන්ද බොහෝ කාලයක් පුරා එම පනත පැවැත්විය යුතුයි.[10]

**29** “ආරෝන්ව හා ඔහුගේ පුත්‍රයන්ව පූජකයන් ලෙස මට කැප කිරීමේදී මේ ක්‍රියාපිළිවෙත අනුගමනය කරන්න. වස්සෙකුව හා කැළැල් නැති[11] බැටළුවන් දෙදෙනෙකුව ගෙනෙන්න.[12] **2** මුහුන් නොදැමූ රොටි, තෙල් මිශ්‍ර කර සාදාගත් මුද්දක හැඩැති මුහුන් නොදැමූ රොටි හා තෙල් තැවරූ මුහුන් නොදැමූ සිහින් රොටි සාදාගන්න.[13] ඒවා සැදිය යුත්තේ සිහින් තිරිඟු පිටිවලිනි. **3** එම රොටි කූඩයක[1] දමා වස්සා හා බැටළුවන් දෙදෙනා සමඟ ඔප්පු කළ යුතුයි.

**4** “ආරෝන්ව හා ඔහුගේ පුත්‍රයන්ව සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල් වන ස්ථානයට[2] කැඳවා ස්නානය[3] කරන ලෙස ඔවුන්ට අණ කරන්න. **5** ඉන්පසු ආරෝන්ට මැසූ කොටු මෝස්තර සහිත වස්ත්‍රයද ඒෆොද් හැට්ටයට යටින් අඳින අත් නැති වස්ත්‍රයද ඒෆොද් හැට්ටයද ඔහුට අන්දවන්න.[4] ඊට උඩින් ළයවැස්ම පළඳවන්න. ඉන්පසු ඒෆොද් හැට්ටයේ ඉණපටිය තදින් බඳින්න.[5] **6** විශේෂ හිස්වැස්මද ඔහුට පළඳවා, එය මත ශුද්ධ රන් තහඩුව* බඳින්න.[6] **7** ඉන්පසු ඔබ ශුද්ධ තෛලය*[7] ගෙන ආරෝන්ගේ හිස මත වත් කර ඔහුව අභිෂේක කරන්න.[8]

**8** “පසුව ආරෝන්ගේ පුත්‍රයන්ව කැඳවා ඔවුන්ට මැසූ වස්ත්‍ර අන්දවන්න.[9] **9** ආරෝන්ට මෙන් ඔහුගේ පුත්‍රයන්ටද ඉණ පටි බැඳ හිස්වැසුම් හිස වටා ඔතන්න. පූජකයන් ලෙස සේවය කිරීම සඳහා ඔබ ඔවුන්ට බලය දිය යුතුයි.*[10] මන්ද පූජකයන් වීමේ අයිතිය හිමි වන්නේ ආරෝන්ට හා ඔහුගේ පුත්‍රයන්ටය. එය බොහෝ කාලයකට වලංගු වන නීතියකි.[11]

**10** “පසුව වස්සාව සම්මුඛ වීමේ කූඩාරම ඉදිරියට ගෙනෙන්න. ආරෝන්ද ඔහුගේ පුත්‍රයන්ද වස්සාගේ හිස මත අත් තැබිය යුතුයි.[12] **11** ඔබ සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල් වන ස්ථානයේදී යෙහෝවා දෙවි වන මා ඉදිරියේ වස්සාව මැරිය යුතුයි.[13] **12** උගේ ලේ[14] ටිකක් ගෙන එය පූජාසනය වටේ තිබෙන අං මත ඔබේ ඇඟිල්ලෙන් තවරන්න.[15] වස්සාගේ ඉතුරු ලේ ටික පූජාසනයේ පාමුල වත්

---

**නික් 28:41*** හෝ, “ඔවුන්ගේ අත්වලට බලය ලබා දී.”

**නික් 29:6*** මූ.අ., “දෙවිට වූ කැප වීම පෙන්වන ශුද්ධ සංකේතය.” **7*** නික් 25:6හි පාදසටහන බලන්න. **9*** හෝ, “ඔවුන්ගේ අත්වලට බලය ලබා දෙන්න.”

---

**28 පරි.**
**1** ලෙවී 23:11, රෝම 8:34, හෙබ්‍රෙ 7:25
**2** නික් 28:4, එළි 19:8
**3** නික් 39:29
**4** නික් 39:27, ලෙවී 8:13, 1සාමු 2:18
**5** නික් 39:28, ලෙවී 8:13
**6** නික් 28:2
**7** නික් 29:7, නික් 30:30, ලෙවී 10:7, ක්‍රියා 10:38, 2කොරි 1:21, 1යොහ 2:27
**8** නික් 29:9, ලෙවී 8:33, ගණන් 3:3
**9** ලෙවී 6:10
**10** නික් 27:21

**29 පරි.**
**11** ද්වි 15:21, ද්වි 17:1
**12** ලෙවී 8:2, ලෙවී 9:2, 2ලේක 13:9
**13** ලෙවී 6:20, ලෙවී 7:12

**2 තීරුව**
**1** ලෙවී 8:26
**2** නික් 26:36, නික් 40:28, ලෙවී 8:3
**3** ලෙවී 8:6, හෙබ්‍රෙ 7:26, හෙබ්‍රෙ 10:22
**4** නික් 28:4, ලෙවී 8:7, ලෙවී 16:4
**5** නික් 28:8
**6** නික් 28:36, නික් 39:30, ලෙවී 8:9
**7** නික් 30:25
**8** ලෙවී 8:12, ගීතා 133:2, යෙසා 61:1, ක්‍රියා 10:38
**9** නික් 28:40, ලෙවී 8:13
**10** නික් 28:41, නික් 32:29, පිලි 4:13
**11** නික් 28:1, නික් 28:43, නික් 40:15
**12** ලෙවී 8:14
**13** ලෙවී 1:3, ලෙවී 1:5
**14** ලෙවී 8:15
**15** නික් 27:2

කරන්න.[1] **13** උගේ බඩවැල්[2] වටා
ඇති සම්පූර්ණ තෙල් තට්ටුවද[3] අක්-
මාව[4] වටා තිබෙන තෙල්ද වකු-
ගඩු දෙක සහ ඊට පිටින් තිබෙන
තෙල් තට්ටුවද ගෙන පූජාසනය මත
දවන්න.[5] **14** නමුත් වස්සාගේ හම,
මාංසය සහ ගොම කඳවුරෙන් පිටතට
ගෙන ගොස් ගින්නෙන් පුලුස්සා දැමිය
යුතුයි.[6] එය පාප පූජාවකි.

**15** "පසුව බැටළුවන්ගෙන් එකෙ-
කුව එතැනට ගෙනෙන්න.[7] ආරොන්ද
ඔහුගේ පුත්‍රයන්ද බැටළුවාගේ හිස
මත අත් තැබිය යුතුයි.[8] **16** බැටළු-
වාව මරා උගේ ලේ පූජාසනයේ සෑම
පැත්තටම ඉසින්න.[9] **17** බැටළුවාව
කැබලිවලට කපා උගේ බඩවැල්ද
පාදද වතුරෙන් සෝදන්න.[10] හිසේ සිට
පාද දක්වා තිබෙන උගේ එක් එක්
කොටස් එකිනෙකට ගැළපෙන සේ
එක ළඟ තබන්න. **18** ඉන්පසු මුළු
බැටළුවාවම පූජාසනය මත දවන්න.
එය යෙහෝවා දෙවි වන මට ප්‍රසන්න
සුවඳක්[11] ගෙනෙන දවන පූජාවකි.[12]
දවන පූජාවක් ලෙස එය යෙහෝවා
දෙවි වන මට ඔප්පු කරන්න.

**19** "ඉන්පසු ඔබ අනික් බැටළුවාත්
එතැනට ගෙනෙන්න. ඒ බැටළුවාගේ
හිස මතත් ආරොන් හා ඔහුගේ පුත්‍ර-
යන් අත් තැබිය යුතුයි.[13] **20** ඉන්-
පසු ඌව මරා උගේ ලේ ටිකක්
ගෙන ආරොන්ගේ දකුණු කන් පෙත්ත
මතද ඔහුගේ දකුණතේ මාපටැඟිල්ල
මතද දකුණු පයේ මාපටැඟිල්ල මතද
ගාන්න.[14] ඔහුගේ පුත්‍රයන්ටද එසේම
කරන්න. ඉතුරු ලේ ටික පූජා-
සනයේ සෑම පැත්තටම ඉසින්න.
**21** ශුද්ධ තෛලයෙන්[15] හා පූජාසනය
මත තිබෙන ලේවලින් ටිකක් ගෙන
ආරොන්ට සහ ඔහුගේ වස්ත්‍රවලටද
ඔහුගේ පුත්‍රයන්ට සහ ඔවුන්ගේ වස්-
ත්‍රවලටද ඉසින්න. ඔබ එසේ කළ
යුත්තේ ආරොන්ව හා ඔහුගේ පුත්‍ර-
යන්ව පරිශුද්ධ සේවය සඳහා කැප
කරන පිණිසත් ඔවුන් සියලුදෙනාගේ
වස්ත්‍ර ශුද්ධ දේවල් ලෙස වෙන් කර
තබන පිණිසත්ය.[16]

**22** "ඉන්පසු අභිෂේක කිරීමේ
පූජාව[1] සඳහා ඔප්පු කරන බැටළුවා-
ගේ තෙල් කොටස්ද තෙලින් පිරුණු
වල්ගයද[2] බඩවැල් වටා තිබෙන
තෙල් කොටස්ද අක්මාව වටා
තිබෙන තෙල්ද වකුගඩු දෙක සහ
ඒවායේ තෙල්ද බැටළුවාගේ දකුණු
ගාතයද[3] අරගන්න. **23** යෙහෝවා
දෙවි ඉදිරියේ තිබෙන රොටි කූඩයෙන්
මුහුන් නොදැමූ රොටියක්ද තෙල් මිශ්‍ර
කර සාදාගත් මුද්දක හැඩැති රොටි-
යක්ද සිහින් රොටියක්ද අරගන්න.[4]
**24** ඒවා ආරොන්ගේ සහ ඔහුගේ පුත්‍ර-
යන්ගේ අල්ල මත තබා[5] යෙහෝවා
දෙවි ඉදිරියේ ඒ මේ අත සොලවන්න.
දෙවිට පිළිගන්වන පිණිස සෙලවීමේ
පූජාවක් වශයෙන් එසේ කරන්න.[6]
**25** ඉන්පසු ඒවා ඔවුන්ගේ අල්ලෙන්
ඉවතට ගෙන පූජාසනයේ තිබෙන
දවන පූජාව මත තබා යෙහෝවා
දෙවි වන මට ප්‍රසන්න සුවඳක් ගෙ-
නෙන පිණිස දවන්න.[7] එය යෙහෝවා
දෙවි වන මට ඔප්පු කරන සෙලවීමේ
පූජාවකි.[8]

**26** "අභිෂේක කිරීමේ පූජාවට[9]
ගෙනා බැටළුවා අයිති වන්නේ
ආරොන්ටය. එම බැටළුවාගේ පපු
කොටස ඔබේ අතට ගෙන එය යෙ-
හෝවා දෙවි වන මට පිළිගන්වන
පිණිස සෙලවීමේ පූජාවක් ලෙස මා
ඉදිරියේ ඒ මේ අත සොලවන්න.
එම කොටස අයිති ඔබටය. **27** අභි-
ෂේක කිරීමේ පූජාවට[10] ගෙනා බැට-
ළුවා ආරොන්ට සහ ඔහුගේ පුත්‍රයන්ට
අයිතිය. සෙලවීමේ පූජාව සඳහා
උගෙන් ගත් පපු කොටස[11] සහ ශුද්ධ
කොටස ලෙස වෙන් කළ ගාත් කො-
ටස ඔබ ශුද්ධ දෙයක් ලෙස වෙන්
කළ යුතුයි. **28** ආරොන්ටත් ඔහු-
ගේ පුත්‍රයන්ටත් එම කොටස් අයිතිය.
මන්ද ඒවා ශුද්ධ කොටස්ය.[12] ඊශ්‍රා-
යෙල් සෙනඟ ඔප්පු කරන සියලුම
හවුල් පූජාවලින්ද[13] එම කොටස් දෙක
රැගෙන යෙහෝවා දෙවි වන මට
ශුද්ධ දෙයක් ලෙස කැප කළ යුතුයි.
එය බොහෝ කාලයකට ඊශ්‍රායෙල්

**29 පරි.**
**1** ලෙවී 4:7
**2** ලෙවී 1:9; ලෙවී 9:14
**3** ලෙවී 3:17; ලෙවී 4:8; ගීතා 69:9
**4** ලෙවී 8:16; ලෙවී 9:19
**5** ලෙවී 17:6
**6** ලෙවී 16:27
**7** ලෙවී 8:18
**8** ලෙවී 1:4
**9** ලෙවී 8:19; හෙබ්‍රෙ 9:22
**10** ලෙවී 1:13; ලෙවී 8:21
**11** උත් 8:21; එෆී 5:2; පිලි 4:18
**12** උත් 22:2; ලෙවී 9:24
**13** ලෙවී 8:22
**14** ලෙවී 8:24
**15** නික් 30:25; ගීතා 133:2; යෙසා 61:1
**16** ලෙවී 8:30

**2 තීරුව**
**1** ලෙවී 8:22
**2** ලෙවී 3:9; ලෙවී 7:3; ලෙවී 9:19
**3** ලෙවී 7:32; ලෙවී 9:21; ගණන් 18:18
**4** ලෙවී 8:26; 1කොරි 5:8
**5** ලෙවී 8:27
**6** ලෙවී 7:30
**7** ලෙවී 8:28; එෆී 5:2
**8** ලෙවී 10:13; 1සාමු 2:28
**9** ලෙවී 8:29; ගීතා 99:6
**10** නික් 29:22; ලෙවී 7:37
**11** ලෙවී 10:15
**12** ලෙවී 7:34; ලෙවී 10:14; ගණන් 15:19; ගණන් 18:24; ද්වි 18:3
**13** ලෙවී 7:11

සෙනඟ විසින් පිළිපැදිය යුතු නියෝ-
ගයකි.
29 “ආරොන්ට මැසූ ශුද්ධ වස්ත්‍ර[1]
ඔහුගෙන් පසු පූජකයන් ලෙස සේ-
වය කරන ඔහුගේ පුත්‍රයන්ට
අයිති වන්නේය.[2] ඔවුන්ව අභිෂේක
කර[3] පූජකයන් ලෙස සේවය කිරීමට
ඔවුන්ට බලය ලබා දෙන[4] අවස්ථා-
වේදී ඔවුන් එම වස්ත්‍ර ඇඳිය යුතුයි.
30 ආරොන්ගෙන් පසු පූජකයා ලෙස
පත් වන ඔහුගේ පුත්‍රයා ශුද්ධස්ථාන-
යේ සේවය කරන පිණිස සම්මුඛ වීමේ
කූඩාරමට ඇතුල් විය යුත්තේ එම
වස්ත්‍ර ඇඳගෙනය. ඔහු දවස් හතක්[5]
පුරා එම වස්ත්‍ර ඇඳ සිටිය යුතුයි.
31 “අභිෂේක කිරීමේ පූජාව සඳහා
ගෙනා බැටළුවාගේ මස් ශුද්ධ තැන-
කදී තම්බාගන්න.[6] 32 ආරොන්
සහ ඔහුගේ පුත්‍රයන් තම්බාගත් මස්ද
කූඩයේ තිබෙන රොටිද සම්මුඛ වීමේ
කූඩාරමට ඇතුල් වන ස්ථානයේ
සිට කෑ යුතුයි.[7] 33 ඔවුන්ව පරි-
ශුද්ධ සේවය සඳහා කැප කරන පිණි-
සත් පූජකයන් ලෙස සේවය කිරීමට
ඔවුන්ට බලය දෙන පිණිසත් ඔප්පු
කළ ඒ පූජාවෙන් ඔවුන් කෑ යුතුයි.[8]
පූජක පවුලට අයිති නැති කිසිවෙකු
එයින් නොකෑ යුතුයි. මන්ද ඒවා ශුද්-
ධය.[9] 34 අභිෂේක කිරීමේ පූජාව
සඳහා ගෙනා සතාගේ මස් හෝ රොටි
හෝ පසුවදා උදෑසන වන තෙක්
ඉතුරු වුවහොත් ඔබ ඒවා ගින්නෙන්
පිළිස්සිය යුතුයි.[10] එය ශුද්ධ දෙයක්
නිසා එයින් නොකෑ යුතුයි.
35 “ආරොන් හා ඔහුගේ පුත්‍රයන්
සම්බන්ධයෙන් මා ඔබට අණ කළ
සියල්ල කරන්න.[11] පූජකයන් ලෙස
සේවය කිරීම සඳහා ඔවුන්ට බලය
ලබා දීමට දවස් හතක් ගත වන්-
නේය.[12] 36 ආරොන් සහ ඔහුගේ
පුත්‍රයන්ගේ පව්වලට සමාව ලබා-
ගන්නා පිණිස ඒ සෑම දවසකම
පාප පූජාවක් ලෙස ගොනෙකුව ඔප්පු
කරන්න.[13] එලෙස පූජා ඔප්පු කර
පූජාසනයද පවිත්‍ර කරන්න. එය ශුද්ධ
දෙයක් ලෙස වෙන් කර තබන පිණිස
කැප කළ යුතුයි.[1] 37 පූජාසනය
පවිත්‍ර කරන පිණිස දවස් හතක් පුරා
එලෙස පූජා ඔප්පු කරන්න. එය අති-
ශුද්ධ පූජාසනයක්[2] ලෙස වෙන් කර
තබන්න.[3] පූජාසනයට අත තබන
සියලුදෙනා ශුද්ධව සිටිය යුතුයි.[4]
38 “ඔබ මේ දේවල් පූජාසනය මත
ඔප්පු කළ යුතුයි. අවුරුද්දක් වයසැති
බැටළු පැටවුන් දෙදෙනෙකුව දින-
පතා ඔප්පු කරන්න.[5] 39 එකෙකු
උදෑසනත්[6] අනිකා සවසත්*[7] ඔප්පු
කරන්න. 40 ඔලීව ගෙඩි කොටා
සාදාගත් තෙල්, හින මිනුමෙන්* හත-
රෙන් කොටසක් සමඟ මිශ්‍ර කළ
සිහින් පිටි, ඒපාවකින් දහයෙන් කො-
ටසක්[8] ගෙනෙන්න. පාන පූජාවක්[9]
ලෙස වයින්, හින මිනුමෙන් හතරෙන්
කොටසක්ද ගෙනෙන්න. පළමුවෙනි
බැටළු පැටවා සමඟ ඒවා ඔප්පු
කරන්න. 41 අනික් බැටළු පැටවා
සවස් වරුවේ ඔප්පු කළ යුතුයි. ඒ
සමඟ උදෑසන ඔප්පු කළ ලෙසම
ධාන්‍ය පූජාවක්[10] හා පාන පූජාවක්
ඔප්පු කළ යුතුයි. යෙහෝවා දෙවි වන
මට ප්‍රසන්න සුවඳක් ගෙනෙන දවන
පූජාවක් ලෙස එය ඔප්පු කරන්න.
42 ඔබ සමඟ කතා කරන පිණිස මා
පෙනී සිටින ස්ථානය[11] වන සම්මුඛ
වීමේ කූඩාරම ළඟ නිතිපතා දවන
පූජාවක් දැවෙමින් තිබිය යුතුයි.[12]
ඔබගේ සියලු පරම්පරාවලදී යෙ-
හෝවා දෙවි වන මා ඉදිරියේ එය
දැවෙමින් තිබිය යුතුයි.
43 “මම ඒ ස්ථානයේදී ඊශ්‍රායෙල්
සෙනඟ ඉදිරියේ පෙනී සිටින්නෙමි.
මගේ තේජස නිසා එම ස්ථානය
පවිත්‍ර වනු ඇත.[13] 44 සම්මුඛ වීමේ
කූඩාරමද පූජාසනයද මම පවිත්‍ර
කරන්නෙමි. ආරොන් හා ඔහුගේ
පුත්‍රයන් පූජකයන් ලෙස මට සේ-
වය කරන පිණිස මම ඔවුන්ව පරි-
ශුද්ධ තත්වයකට ගෙනෙන්නෙමි.[14]
45 මම මගේ ශුද්ධ කූඩාරම ඊශ්‍රායෙල්

**නික් 29:39*** නික් 12:6හි පාදසටහන බලන්න.
**40*** හින මිනුමක් යනු ලීටර් 3.67කි.

**29 පරි.**
1 නික් 28:4
2 ගණන් 20:26
3 නික් 30:30, නික් 40:15, ලෙවී 8:12, 2කොරි 1:21
4 නික් 28:41, ලෙවී 8:33, 2කොරි 3:5
5 ලෙවී 8:35, ලෙවී 9:1
6 ලෙවී 8:31
7 1කොරි 9:13, 1කොරි 9:14
8 ලෙවී 10:13
9 ලෙවී 22:10, ගණන් 3:10, මතෙ 12:4
10 නික් 12:10, ලෙවී 8:32
11 ලෙවී 8:4
12 ලෙවී 8:33
13 ලෙවී 4:20

**2 තීරුව**
1 නික් 30:28, ලෙවී 8:11, ගණන් 7:1
2 නික් 30:29, මතෙ 23:19
3 නික් 40:10
4 නික් 30:29
5 1ලේක 16:40, 2ලේක 2:4, 2ලේක 13:11, දානි 9:27, හෙබ්‍රෙ 7:27, හෙබ්‍රෙ 10:11
6 2රාජා 16:15, ක්‍රියා 26:7
7 දානි 9:21
8 නික් 16:36, ගණන් 28:5
9 උත් 35:14, ලෙවී 23:13, පිලි 2:17
10 1රාජා 18:29, ගීතා 141:2
11 නික් 25:22, ලෙවී 1:1, ගණන් 17:4
12 ගණන් 28:6
13 නික් 40:34, ගණන් 12:5, 1රාජා 8:11
14 ලෙවී 21:15, ලෙවී 22:9, යොහ 10:36

ජනයාගේ කඳවුර මැද පිහිටුවන්-
නෙමි. මම ඔවුන්ගේ දෙවි වන්නෙමි.[1]
**46** ඊජිප්තු දේශයෙන් ඔවුන්ව පිටතට
ගෙනා ඔවුන්ගේ දෙවි වන යෙහෝවා
මා බව ඔවුහු සැබවින්ම දැනගන්-
නෝය. මා එසේ කළේ ඔවුන් අතරේ
මගේ ශුද්ධ කූඩාරම පිහිටුවන පිණි-
සය.[2] මා ඔවුන්ගේ දෙවි වන යෙහෝ-
වාය.[3]

**30** "සුවඳ ද්‍රව්‍ය[4] ඔප්පු කරන
පිණිස ඔබ ෂිටිම් ලීවලින්
පූජාසනයක් සාදන්න. **2** පූජාසනය
පෙට්ටියක හැඩයට සාදන්න. එහි දිග
රියනක්ද පළල රියනක්ද උස රියන්
දෙකක්ද විය යුතුයි. එහි කොන්-
වල අං තිබිය යුතුයි.[5] **3** පූජාස-
නය පවිත්‍ර රනින් ආලේප කරන්න.
එහි උඩ පැත්තටද හතර පැත්-
තටද එහි අංවලටද රන් ආලේප
කරන්න. පූජාසනය වටේට රන් පටි-
යක් අල්ලන්න.[6] **4** පූජාසනය පො-
ලුවලින් උසුලාගෙන යෑමට හැකි වන
පිණිස එහි දෙපැත්තෙන් රන් වළලු
දෙක බැගින් සවි කරන්න. එම වළලු
පූජාසනය වටේට තිබෙන පටියට
යටින් සවි කරන්න.[7] **5** එම වළලු
තුළට යවන පොලු දෙක ඔබ සෑදිය
යුත්තේ ෂිටිම් ලීවලිනි. එම පොලු දෙ-
කද රනින් ආලේප කරන්න.[8] **6** මා
පෙනී සිටින ස්ථානය වන ගිවි-
සුම් පෙට්ටිය*[9] ළඟ තිබෙන තිරයට
එහා පැත්තෙන් ඔබ එම පූජාසනය
තැබිය යුතුයි.[10] එය ගිවිසුම් පෙට්ටි-
යට සමාන්තරව තැබිය යුතුයි.

**7** "ආරොන් එම පූජාසනය මත
සුවඳ ද්‍රව්‍ය[11] ඔප්පු කළ යුතුයි.[12] ඔහු
සෑම උදෑසනකම පහන් සූදානම්
කිරීමට යන විට[13] එම පූජාසනය
මත සුවඳ ද්‍රව්‍ය ඔප්පු කළ යුතුයි.
**8** ආරොන් සවස් වරුවේ* පහන්
දැල්වීමට යන විටද ඒ මත සුවඳ ද්‍රව්‍ය
ඔප්පු කළ යුතුයි. ඔබේ සියලු පරම්ප-
රාවලදී නිරතුරුවම යෙහෝවා දෙවි
වන මා ඉදිරියේ සුවඳ ද්‍රව්‍ය ඔප්පු
කළ යුතුයි. **9** ඔබ නීතියේ සඳ-
හන්ව නැති ආකාරයට ඒ මත සුවඳ
ද්‍රව්‍ය ඔප්පු නොකළ යුතුයි.[1] ඒ මත
දවන පූජාවක්වත් ධාන්‍ය පූජාවක්වත්
පාන පූජාවක්වත් ඔප්පු නොකළ
යුතුයි. **10** ආරොන් එම පූජාසනය
පවිත්‍ර තත්වයකට ගෙනෙන පිණිස
අවුරුද්දකට වරක් එහි අං මත[2] පාප
පූජාවට ඔප්පු කළ සතාගේ ලේ[3]
ස්වල්පයක් තැවරිය යුතුයි. ඔහු අවු-
රුද්දකට වරක් දෙවිට අයැද පූජාස-
නය පවිත්‍ර තත්වයකට ගෙනා යුතුයි.
ඔබේ සියලු පරම්පරාවලදී එසේ කළ
යුතුයි. මන්ද පූජාසනය යෙහෝවා
දෙවි වන මා ඉදිරියේ ඉතා ශුද්ධය."

**11** යෙහෝවා දෙවි තවදුර-
ටත් මෝසෙස්ට මෙසේ කීවේය.
**12** "ඊශ්‍රායෙල් ජනයාගේ ජන ලේ-
ඛනයක් සෑදීම සඳහා සංගණන-
යක්[4] කරන සෑම අවස්ථාවකදීම
සියලුදෙනාම තම තමාගේ ජීවි-
තය මුදවාගැනීමට මුදලක්* යෙ-
හෝවා දෙවි වන මට ගෙවිය යුතුයි.[5]
තමන් පිටට වසංගතයක් නොපැ-
මිණෙන පිණිස ඔවුන් එසේ කළ
යුතුයි.[6] **13** සංගණනයට ඇතුළත්
වන සියලුදෙනා ෂෙකෙල් භාගයක්
ගෙවිය යුතුයි. එය යෙහෝවා දෙ-
විට දෙන සම්මාදමකි.[7] ඔවුන් එම
මුදල ගෙවිය යුත්තේ ශුද්ධස්ථානයේ
තිබෙන ෂෙකෙලයේ බරට සමාන
ෂෙකෙල්වලින්ය.[8] ෂෙකෙලයක බර
ගේරා මිමි* විස්සකි. **14** සංගණන-
යට ඇතුළත් වන අවුරුදු විස්සක්
හෝ ඊට වැඩි සියලුදෙනාම යෙ-
හෝවා දෙවිට එම සම්මාදම දිය
යුතුයි.[9] **15** ධනවත් අය ෂෙකෙල්
භාගයකට වඩා වැඩියෙන්වත් දුප්පත්
අය ඊට වඩා අඩුවෙන්වත් නොදිය
යුතුයි.[10] සෙනඟගේ ජීවිත මුදවා-
ගන්නා පිණිස එම සම්මාදම එකතු
කර යෙහෝවා දෙවිට දිය යුතුයි.[11]

**29 පරි.**
**1** නික් 25:8, ලෙවී 26:12, සෙක 2:11, 2කොරි 6:16, එෆී 2:22
**2** නික් 20:2
**3** ලෙවී 11:44, ලෙවී 18:30, ලෙවී 19:2, එස 20:5

**30 පරි.**
**4** නික් 40:5, ගීතා 141:2
**5** නික් 27:2, නික් 37:25, ලෙවී 4:7
**6** නික් 37:26
**7** නික් 37:27
**8** නික් 37:28
**9** නික් 25:22
**10** නික් 26:33, හෙබ්‍රෙ 9:3
**11** නික් 30:34, 2ලේක 13:11, එළි 8:4
**12** ලෙවී 16:13, ගණන් 16:40, 1සාමු 2:28, 1ලේක 23:13, ලූක් 1:9
**13** නික් 27:20, 1සාමු 3:3

**2 තීරුව**
**1** ලෙවී 10:1, 2ලේක 26:18, එස 8:11
**2** ලෙවී 16:18, ලෙවී 23:27, හෙබ්‍රෙ 9:7
**3** ලෙවී 16:5, ලෙවී 16:6, ලෙවී 16:19
**4** නික් 38:25, ගණන් 1:2
**5** ගණන් 31:50
**6** 2සාමු 24:10, 2සාමු 24:15, 1ලේක 21:12
**7** 2ලේක 24:9, නෙහෙ 10:32, මතෙ 17:24
**8** ලෙවී 27:25
**9** නික් 38:26, ගණන් 1:3, ගණන් 26:2
**10** යෝබ් 34:19, හිතෝ 22:2, එෆී 6:9
**11** ගණන් 31:50

---

**නික් 30:6*** මූ.අ., "ගිවිසුම් පෙට්ටියේ පියන."
**8*** නික් 12:6හි පාදසටහන බලන්න.

**නික් 30:12*** හෙබ්‍රෙව් බසින්, කොෆ. **13*** ගේරා එකක් යනු ග්‍රෑම් 0.57කි.

**16** ඊශ්‍රායෙල් සෙනඟගේ ජීවිත මුද-
වාගැනීම සඳහා ඔවුන්ගෙන් එකතු
කරගත් රිදී කාසි සම්මුඛ වීමේ කූඩා-
රමේ වැඩකටයුතු සඳහා දිය යුතුයි.[1]
යෙහෝවා දෙවි වන මට ඊශ්‍රායෙල්
සෙනඟව සිහි වන පිණිසත් ඔවුන්ගේ
ජීවිත මුදවාගන්නා පිණිසත් එසේ
කරන්න.”

**17** යෙහෝවා දෙවි මෝසෙස්ට
තවදුරටත් මෙසේ කීවේය.
**18** “පවිත්‍ර වීම සඳහා වතුර භාජන-
යක්ද එම භාජනය තැබීමට ආධාර-
කයක්ද තඹවලින් සාදන්න.[2] එය
සම්මුඛ වීමේ කූඩාරම හා පූජාස-
නය අතරේ තබා එයට වතුර පුර-
වන්න.[3] **19** ආරොන් සහ ඔහුගේ
පුත්‍රයන් ඔවුන්ගේ අත් පා එයින් සෝ-
දාගත යුතුයි.[4] **20** ඔවුන් සම්මුඛ
වීමේ කූඩාරමට ඇතුල් වීමට පෙර
එයින් සෝදාගත යුතුයි. එසේ නො-
කළොත් ඔවුන්ගේ ජීවිත ඔවුන්ට
අහිමි වනු ඇත. යෙහෝවා දෙවිට
ගින්නෙන් දවා පූජා ඔප්පු කිරීම
සඳහා පූජාසනය ළඟට යෑමට පෙරත්
එයින් සෝදාගත යුතුයි.[5] **21** එසේ
කිරීමෙන් ඔවුන්ට ඔවුන්ගේ ජීවි-
තය රැකගැනීමට හැකි වන්නේය.[6]
ආරොන් සහ ඔහුගේ පුත්‍රයන්ද ඔවුන්-
ගෙන් පැවතෙන්නන්ද එය බොහෝ
කාලයක් පුරා පැවැත්විය යුතු නියෝ-
ගයකි.”[7]

**22** යෙහෝවා දෙවි මෝසෙස්
සමඟ තවදුරටත් කතා කරමින්
මෙසේ කීවේය. **23** “ඔබ ඉස්තරම්ම
වර්ගයේ සුවඳ ද්‍රව්‍ය[8] එකතු කරගත
යුතුයි. සුවඳ ලාටු[9] ෂෙකෙල් පන්සිය-
යක්ද සුවඳවත් කුරුඳු[10] ෂෙකෙල් දෙ-
සිය පනහක්ද සුවඳ දඬු[11] ෂෙකෙල්
දෙසිය පනහක්ද **24** පැඟිරි කුරුඳු[12]
ෂෙකෙල් පන්සියයක්ද එකතු කර-
ගන්න. ශුද්ධස්ථානයේ තිබෙන ෂෙ-
කෙලයේ බරට අනුව[13] ඒවායේ බර
මැනිය යුතුයි. ඔලීව තෙල් හින
මිනුමක්ද[14] එකතු කරගන්න. **25** ඒ
සියලු ද්‍රව්‍යයන් යොදා අභිෂේක කිරීම
සඳහා ශුද්ධ තෙලයක් සාදාගන්න.

**30 පරි.**
1 නික් 38:25
2 නික් 38:8, ලෙවී 8:11, 1රාජා 7:38
3 නික් 40:7
4 නික් 40:31, එෆී 5:26, හෙබ්‍රෙ 10:22
5 2ලේක 13:11
6 නික් 40:31
7 නික් 28:43, 2ලේක 4:6
8 සල 4:14, යෙරෙ 6:20
9 ගීතා 45:8, සල 1:13, සල 3:6
10 හිතෝ 7:17, එළි 18:13
11 එස 27:19
12 ගීතා 45:8
13 ගණන් 3:47
14 නික් 29:40, ලෙවී 19:36, ගණන් 15:5

**2 තීරුව**
1 නික් 37:29
2 ගණන් 35:25, ගීතා 89:20, ගීතා 133:2, හෙබ්‍රෙ 1:9
3 නික් 40:9, ගණන් 7:1
4 ලෙවී 8:10
5 නික් 29:37, ලෙවී 6:18
6 ගණන් 3:3, 2කොරි 1:21
7 ලෙවී 8:12, ක්‍රියා 10:38
8 නික් 40:15, එළි 5:10
9 නික් 37:29, 1රාජා 1:39, ගීතා 89:20
10 නික් 30:38
11 නික් 25:6, නික් 37:29
12 ලෙවී 5:11, නෙහෙ 13:5, සල 3:6, මතෙ 2:11

එය දක්ෂ තෙල් සාදන්නෙකු විසින්
සෑදිය යුතු අනර්ඝ තෙලයකි.[1] එම
ශුද්ධ තෙලය අභිෂේක කිරීම සඳහා
භාවිත කරන්න.[2]

**26** “ඔබ සම්මුඛ වීමේ කූඩාරම[3]
සහ ගිවිසුම් පෙට්ටිය එම තෙල-
යෙන් කැප කළ යුතුයි. **27** සම්මුඛ
වීමේ කූඩාරමේ තිබෙන මේසය සහ
එහි සියලු භාණ්ඩද පහන් රුක සහ
එහි සියලු මෙවලම්ද සුවඳ ද්‍රව්‍ය ඔප්පු
කරන පූජාසනයද **28** දවන පූජා
ඔප්පු කරන පූජාසනය සහ එහි සියලු
භාණ්ඩද වතුර භාජනය සහ එහි
ආධාරකයද එම තෙලයෙන් කැප
කරන්න. **29** ඔබ ඒ සියල්ල පරි-
ශුද්ධ දේවල් ලෙස වෙන් කර තැබිය
යුතුයි.[4] ඒවාට අත තබන සියලු-
දෙනා ශුද්ධව සිටිය යුතුයි.[5] **30** ඔබ
ආරොන්ව සහ ඔහුගේ පුත්‍රයන්ව[6] අභි-
ෂේක කර,[7] මා ඉදිරියේ පූජකයන්
ලෙස සේවය කරන පිණිස ඔවුන්ව
කැප කරන්න.[8]

**31** “ඔබ ඊශ්‍රායෙල් සෙනඟට
මෙසේ පවසන්න. ‘අභිෂේක කිරීම
සඳහා ඔබේ සියලු පරම්පරාවලදී එම
ශුද්ධ තෙලය පමණක් භාවිත කළ
යුතුයි.[9] **32** එය කිසි මිනිසෙකුගේ
ශරීරයේ ආලේප නොකළ යුතුයි. මේ
තෙලයට සමානව වෙන කිසි තෙ-
ලයක් සාදා නොගන්න. මන්ද එය
ශුද්ධ තෙලයකි. ඔබ එය ශුද්ධ දෙ-
යක් ලෙස සැමදා සැලකිය යුතුයි.
**33** යමෙකු ඊට සමාන තෙලයක්
සාදා පූජක පවුලට අයිති නොවන
කෙනෙකු මත එය ආලේප කළොත්
ඔහුව මරා දැමිය යුතුයි.’ ”[10]

**34** යෙහෝවා දෙවි මෝසෙස්ට
තවදුරටත් මෙසේ කීවේය. “ඔබ
නාතාප්ද සුවඳැති[11] ඔනිකා* හා
කෙල්බෙනාද පිරිසිදු කට්ටකුමං-
ජල්ද[12] එකම ප්‍රමාණවලින් එකතු
කරගන්න. **35** සුවඳ ද්‍රව්‍ය ඔප්පු
කරන පිණිස මේ සියල්ල යොදා

---

**නික් 30:34*** මේ නමින් හඳුන්වන ද්‍රව්‍යය කුමක්ද කියා ස්ථිර වශයෙන් කිව නොහැක.

සුගන්ධවත් ද්‍රව්‍යයක්[1] සාදාගන්න.
එයට ලුණුද[2] එකතු කරන්න. එය
ශුද්ධ ද්‍රව්‍යයකි. එය දක්ෂ ලෙස තෙල්
සාදන්නෙකු විසින් සෑදිය යුතුයි.
**36** එම සුගන්ධවත් ද්‍රව්‍ය කොටා
සිහින් කුඩක් සාදා, එයින් ටිකක් සම්-
මුඛ වීමේ කූඩාරමෙහි මා ඔබට පෙනී
සිටින ස්ථානය[3] වන ගිවිසුම් පෙට්-
ටිය[4] ඉදිරියේ තබන්න. ඔබ සිය-
ලුදෙනා එය ඉතා ශුද්ධ ද්‍රව්‍යයක්
ලෙස සැලකිය යුතුයි. **37** පෞද්ග-
ලික භාවිතය සඳහා ඔබ එම ද්‍රව්‍ය
සාදා නොගත යුතුයි.[5] එය යෙහෝවා
දෙවි වන මා ඉදිරියේ ශුද්ධ දෙයක්[6]
බව ඔබ සැමදා මතකයේ තබාගත
යුතුයි. **38** යමෙකු එම සුගන්ධවත්
ද්‍රව්‍යයේ සුවඳ භුක්ති විඳීමට එය
සාදාගත්තොත් ඔහුව මරා දැමිය
යුතුයි.”[7]

**31** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. **2** “යූදා
ගෝත්‍රයට අයත් හූර්ගේ පුත්‍රයා
වන උරීගේ පුත්[8] බෙසලෙල්ව[9]
මම කැඳවන්නෙමි. **3** ඔහුට ප්‍රඥාව,
දැනුම හා තේරුම්ගැනීමේ හැකි-
යාව ලැබෙන පිණිසත් සියලු ශිල්ප
ක්‍රමවල ඉතා දක්ෂ ලෙස යෙදී-
මට හැකි වන පිණිසත් මම මගේ
බලය ඔහුට නොඅඩුව දෙන්නෙමි.[10]
**4** එවිට වැඩ සැලසුම් කිරීමට, රන්,
රිදී හා තඹ කැටයම් කිරීමට,[11]
**5** මැණික් ගල් කැපීමට, ඒවා එබ්බවී-
මට[12] සහ වඩු වැඩ කිරීමට ඔහුට
හැකියාව ලැබෙයි. සියලු කර්මාන්ත
කිරීමට අවශ්‍ය දක්ෂතාව මම ඔහුට
ලබා දෙන්නෙමි.[13] **6** බෙසලෙල්ට
උදව් කරන පිණිස මම දාන් ගෝ-
ත්‍රයට අයත් අහිසාමක්ගේ පුත්‍රයා
වන ඔහොලියාබ්ව[14] පත් කරන්නෙමි.
විවිධ කර්මාන්තවලට දක්ෂ වූ*
සියල්ලන්ට මම ප්‍රඥාව ලබා දෙන්-
නෙමි. මා ඔබට අණ කළ ලෙස ඔවුන්
මේ සියලු දේවල් සෑදිය යුතුයි.[15]
**7** සම්මුඛ වීමේ කූඩාරමද[16] ගිවිසුම්
පෙට්ටිය[1] සහ එහි පියනද[2] කූඩාරමේ
සියලු වැඩකටයුතු සඳහා ගන්නා
භාණ්ඩද **8** මේසය[3] සහ ඒ මත
තබන භාණ්ඩද පවිත්‍ර රනින් සෑදූ
පහන් රුක සහ එහි සියලු මෙව-
ලම්ද[4] සුවඳ ද්‍රව්‍ය ඔප්පු කරන පූජාස-
නයද[5] **9** දවන පූජා ඔප්පු කරන
පූජාසනය[6] සහ එහි සියලු භාජනද
වතුර භාජනය සහ එහි ආධාරකයද[7]
**10** මනා ලෙස වියන ලද නිල වස්ත්‍රද
පූජක ආරොන්ගේ ශුද්ධ වස්ත්‍රද පූජ-
කයන් ලෙස සේවය කරන ඔහුගේ
පුත්‍රයන්ගේ වස්ත්‍රද[8] **11** ශුද්ධ තෛ-
ලයද ශුද්ධස්ථානයේ භාවිත කිරීම
සඳහා සුගන්ධවත් ද්‍රව්‍යද ඔවුන් සෑදිය
යුතුයි.[9] මම ඔබට අණ කළ ලෙසම
ඔවුන් ඒවා සෑදිය යුතුයි.”

**12** යෙහෝවා දෙවි තවදුර-
ටත් මෝසෙස්ට මෙසේ කීවේය.
**13** “ඔබ ඊශ්‍රායෙල් සෙනඟට මෙසේ
කියන්න. ‘මා නියම කළ සබත්
දිනයන් ඔබ නොවරදවාම පැවැත්-
විය යුතුයි.[10] මන්ද ඔබ සමඟ මා
පිහිටුවා ඇති ගිවිසුමට එය ලකු-
ණකි. ශුද්ධ සෙනඟක් ලෙස ඔබව
වෙන් කර තබන්නේ යෙහෝවා දෙවි
වන මා බව එම ලකුණ ඔබේ
සියලු පරම්පරාවලදී ඔබට සිහි කරනු
ඇත.[11] **14** ඔබ සබත් දවස පැවැත්-
විය යුතුයි. මන්ද එය ශුද්ධ දව-
සකි.[12] යමෙක් සබත කඩ කළොත්
ඔහුව අනිවාර්යයෙන්ම මරා දැමිය
යුතුයි.[13] එදින වැඩ කරන කවරෙකු
වුවත් මරා දැමිය යුතුයි.[14] **15** දින
හයක් ඔබට වැඩ කිරීමට පුළුවන.
නමුත් හත්වන දවස සබත් දින-
යකි. එදින ඔබ මුළු දවසම කිසි
වැඩක් නොකර විවේකයෙන් ගත
කළ යුතුයි.[15] මන්ද යෙහෝවා දෙවි
වන මම එය ශුද්ධ දවසක් ලෙස සල-
කමි. එදින වැඩ කරන කවරෙ-
කුව නමුත් අනිවාර්යයෙන්ම මරා
දැමිය යුතුයි. **16** ඊශ්‍රායෙල් සෙනඟ
ඔවුන්ගේ සියලු පරම්පරාවලදී සබත
පැවැත්විය යුතුයි. එය මා ඔවුන්

**30 පරි.**
1 ගීතා 141:2
එළි 5:8
2 ලෙවී 2:13
3 නික් 29:42
ලෙවී 16:2
4 නික් 16:34
5 නික් 30:32
6 නික් 29:37
7 ලෙවී 24:16
ගණන් 15:35

**31 පරි.**
8 නික් 35:30
1ලේක 2:20
9 නික් 37:1
10 නික් 35:31
1රාජා 7:14
11 2ලේක 2:7
12 නික් 28:9
13 නික් 35:33
14 නික් 35:34
නික් 38:23
15 නික් 36:1
16 නික් 36:8

**2 තීරුව**
1 නික් 37:1
2 නික් 37:6
3 නික් 37:10
4 නික් 35:14
නික් 37:17
5 නික් 37:25
6 නික් 38:1
නික් 40:6
7 නික් 30:18
නික් 38:8
8 නික් 28:2
නික් 28:15
නික් 39:1
නික් 39:27
ලෙවී 8:7
9 නික් 30:25
නික් 30:35
නික් 37:29
10 නික් 20:8
ලෙවී 19:30
කොලො 2:17
11 එස 20:12
යොහ 17:17
1තෙස 5:23
12 ද්වි 5:12
යෙසා 56:2
13 එස 20:13
14 නික් 35:2
ගණන් 15:32
ගණන් 15:35
15 නික් 16:23
නික් 20:10
ලූක් 23:56

**නික් 31:6*** මූ.අ., “ප්‍රඥාවන්ත සිතක් ඇති.”

සමඟ දිගු කාලයකට ඇති කරගන්නා
ගිවිසුමකි.[1] **17** එය දිගු කාලයකට
මා හා ඊශ්‍රායෙල් සෙනඟ අතරේ ලකු-
ණක් වශයෙන් තිබෙනු ඇත.[2] මන්ද
යෙහෝවා දෙවි වන මම අහසද
පොළොවද මුහුදද දවස් හයකින්
සාදා, හත්වෙනි දවසේදී විවේක ගත්-
තෙමි.’ ”[3]

**18** සීනයි කන්දේදී මෝසෙස්
සමඟ කතා කර අවසන් වූ විට දෙවි
සාක්ෂියක් ලෙස ගල් පුවරු දෙකක්
ඔහුට දුන්නේය.[4] එම ගල් පුවරු දෙක
ලියනු ලැබුවේ දෙවිගේ බලයෙන්ය.*[5]

**32** මෝසෙස් කන්දෙන් බැස
ඒමට ප්‍රමාද වූ බැවින්[6]
මුළු සෙනඟම ආරොන් ළඟට ගොස්
මෙසේ කීවෝය. “ඊජිප්තු දේශයෙන්
අපිව පිටතට ගෙනා මෝසෙස්ට[7]
මොනවා වුණාද කියලා අපි දන්නේ
නැහැ. දැන් අපිට මඟ පෙන්වන්න
දෙවි කෙනෙක්ව සාදා දෙන්න.”[8]
**2** එහෙයින් ආරොන් ඔවුන්ට මෙසේ
කීවේය. “ඔබේ භාර්යාවන්ගේ හා දරු-
දැරියන්ගේ කන්වල තිබෙන රත්ත-
රන් කරාබු[9] ගලවා මට ගෙනැවිත්
දෙන්න.” **3** එවිට ඔවුහු තම කන්-
වල දමාගෙන සිටි රන් ආභරණ
ගලවා ආරොන්ට ගෙනැවිත් දුන්-
නෝය. **4** ආරොන්ද ඔවුන් ගෙනා
රන් ආභරණ උණු කර ඒවායින්
වස්සෙකුගේ[10] රූපයක් සෑදුවේය.[11]
ඉන්පසු ඔවුන් අතරින් සමහරෙක්
රූපය පෙන්වමින්, “ඊශ්‍රායෙල් ජන-
යෙනි, මේ තමයි ඔබව ඊජිප්තු දේශ-
යෙන් පිටතට ගෙනා ඔබේ දෙවි” කියා
කීවෝය.[12]

**5** ආරොන් රූපය ඉදිරියේ පූජා-
සනයක්ද ගොඩනැඟුවේය. ඉන්පසු
ඔහු, “හෙට යෙහෝවා දෙවි වෙනු-
වෙන් අපි උත්සවයක් පවත්වමු” කියා
සෙනඟට කීවේය. **6** සෙනඟ පසු-
වදා පාන්දරින්ම නැඟිට රූපය ඉදිරි-
යේ දවන පූජාද හවුල් පූජාද ඔප්පු
කළෝය. ඉන්පසු ඔවුහු ඒ අවට
ඉඳගෙන කා බී විනෝද වීමට පටන්-
ගත්තෝය.[1]

**7** ඒ අවස්ථාවේදී යෙහෝවා දෙවි
මෝසෙස්ට මෙසේ කීවේය. “ඔබ දැන්
කන්දෙන් බැස යන්න. ඔබ ඊජිප්තු
දේශයෙන් පිටතට ගෙනා සෙනඟ
හැසිරෙන්නේ ඉතාමත් දුෂ්ට ලෙ-
සයි![2] **8** ඔවුන් යා යුතු මාර්ගය
මම ඔවුන්ට කියා දුනිමි. නමුත්
ඔවුහු ඉක්මනින්ම ඒ මාර්ගයෙන්
ඉවත්ව ගියෝය.[3] ඔවුහු වස්සෙකු-
ගේ රූපයක් සාදාගෙන එය ඉදිරියේ
වැඳ වැටී නමස්කාර කරති. ඔවුහු
එයට පුදපූජා ඔප්පු කරමින්, ‘ඊශ්‍රා-
යෙල් ජනයෙනි, මේ තමයි ඔබව
ඊජිප්තු දේශයෙන් පිටතට ගෙනා
ඔබේ දෙවි’ කියා කියති.”[4] **9** යෙ-
හෝවා දෙවි තවදුරටත් මෝසෙස්ට
මෙසේ කීවේය. “මේ සෙනඟ මුරණ්-
ඩුය![5] **10** ඒ නිසා ඔවුන්ට විරුද්ධව
ඇවිළී තිබෙන මාගේ උදහස මම
ඔවුන් පිට වගුරුවන්නෙමි. ඔවුන්ව
සහමුලින්ම විනාශ කර දමන්නෙමි.[6]
ඔවුන් වෙනුවට ඔබෙන් මහත් ජාති-
යක් බිහි කරන්න මට ඉඩ දෙන්න.”[7]

**11** මෝසෙස්, යෙහෝවා දෙවිගේ
උදහස නිවා දමන පිණිස[8] ඔහුට
කන්නලව් කරමින් මෙසේ කීවේය.
“අනේ යෙහෝවා දෙවියනි, මේ
සෙනඟ සමඟ උදහස් වී[9] ඔවුන්ට
විරුද්ධව ක්‍රියා නොකරන්න. ඔබේ
මහත් බලය යොදාගෙන ඊජිප්තුව-
රුන්ට පහර දී ඔවුන්ව ඒ දේශයෙන්
පිටතට ගෙනාවේ ඔබයි. **12** ඔබ
ඔවුන්ව විනාශ කළොත් ඊජිප්තුව-
රුන්[10] මෙසේ කියයි. ‘දෙවි ඊශ්‍රායෙල්-
වරුන්ව අපේ අතින් ගලවාගත්තේ
හොඳ චේතනාවකින් නොවෙයි. ඔහු
ඔවුන්ව ගලවාගත්තේ කඳුකරයට
ගෙන ගොස් ඔවුන්ව සහමුලින්ම
විනාශ කර දමන්නයි!’[11] ඒ නිසා
ඔබේ උදහස පහ කර[12] ඔබේ සෙ-
නඟට දඬුවම් කිරීමට ඔබ ගත් තීර-
ණය වෙනස් කරන්න.[13] **13** ඔබේ
සේවකයන් වන ආබ්‍රහම්ට, ඊසාක්ට
හා ඊශ්‍රායෙල්ට ඔබේම නාමයෙන්

**31 පරි.**
**1** ලෙවී 24:8
**2** නික් 31:13
**3** උත් 2:2; යෙසා 40:28; හෙබ්‍රෙ 4:4
**4** නික් 24:12; නික් 32:15; ද්වි 4:13; ද්වි 9:15
**5** නික් 8:19; මතෙ 12:28; ලූක් 11:20; 2කොරි 3:3

**32 පරි.**
**6** නික් 24:18; ද්වි 9:9
**7** හොෂෙ 12:13; මීකා 6:4
**8** ද්වි 4:15; යොහ 4:24; ක්‍රියා 7:40; ක්‍රියා 17:29
**9** නික් 12:35
**10** 1රාජා 12:28; 2රාජා 10:29; ගීතා 106:19; හොෂෙ 13:2
**11** ද්වි 9:16; යෙසා 44:9; යෙසා 46:6; ක්‍රියා 7:41
**12** නික් 20:4; නෙහෙ 9:18; ගීතා 106:20; රෝම 1:23

**2 තීරුව**
**1** ක්‍රියා 7:41; 1කොරි 10:7
**2** ද්වි 4:16; ද්වි 9:12; ද්වි 32:5; විනි 2:19
**3** නික් 18:20; නික් 20:3; ද්වි 9:16; විනි 2:17
**4** 1රාජා 12:28
**5** නික් 34:9; ද්වි 9:6; නෙහෙ 9:16; ක්‍රියා 7:51; හෙබ්‍රෙ 3:15
**6** ද්වි 9:14
**7** ගණන් 14:12
**8** ද්වි 9:18; ගීතා 106:23
**9** ද්වි 9:19
**10** ගණන් 14:13
**11** ද්වි 9:28
**12** යොෂු 7:26
**13** ද්වි 32:36; 2සාමු 24:16

නික් **31:18*** නික් 8:19හි පාදසටහන බලන්න.

දිවුරා[1] ඔබ දුන් මේ පොරොන්දුව
සිහි කරන්න. ‘මම ඔබෙන් පැව-
තෙන්නන්ව අහසේ තාරකා මෙන්
බොහෝ සෙයින් වැඩි කරන්නෙමි.[2]
මා තෝරාගත් මේ මුළු දේශයම
ඔබෙන් පැවතෙන්නන්ට[3] මම දෙන්-
නෙමි. බොහෝ කාලයකට ඔබෙන්
පැවතෙන්නන්ට එම දේශය උරුම
වන්නේය.’[4] අනේ දෙවියනි, ඒ පො-
රොන්දුව අමතක කරන්න එපා.”
**14** එහෙයින් යෙහෝවා දෙවි තම
සෙනඟට දඬුවම් කිරීමට ගත් තීර-
ණය වෙනස් කළේය.[5]
**15** ඉන්පසු මෝසෙස්, දෙවි සාක්-
ෂියක් පිණිස තමාට දුන් ගල් පුවරු
දෙකත්[6] රැගෙන කන්දෙන් පහළට
බැස ගියේය.[7] එම ගල් පුවරු දෙකේ
දෙපැත්තේම ලියා තිබිණ. **16** එම
පුවරු දෙක සාදා තිබුණේ දෙවි
විසින්මය. ඒවායේ ලියා තිබුණු දේද
දෙවිගේම අතින් කොටා තිබිණ.[8]
**17** ඔවුන් කන්දෙන් බැස එද්දී මහත්
හඬින් කෑගසමින් සිටි සෙනඟගේ
ඝෝෂාව යෝෂුවාට ඇසී ඔහු මෝ-
සෙස්ට මෙසේ කීවේය. “කඳවුර පැත්-
තෙන් යුධ ඝෝෂාවක්[9] ඇසෙනවා.”
**18** නමුත් මෝසෙස් ඔහුට මෙසේ
කීවේය.

“මට ඇසෙන්නේ ජය නාදයක්-
වත්[10]
පරාජය නිසා නඟන ඝෝෂා-
වක්වත් නොවෙයි.
මට ඇසෙන්නේ ගී නාදයක්.”

**19** කඳවුරට ළං වූ විට මෝ-
සෙස් වස්සාවද[11] නටමින් සිටි සෙ-
නඟවද දුටුවේය. එය දුටු විගස
ඔහු මහත් කෝපයකින් තම
අතේ තිබූ ගල් පුවරු දෙක වීසි
කළේය. ඒවා කන්ද පාමුල වැටී කැලි
කැලිවලට කැඩී ගියේය.[12] **20** ඉන්-
පසු මෝසෙස් සෙනඟ සෑදූ වස්-
සාව ගෙන ගින්නෙන් දවා ඇමුවේය.
ඉතුරු වූ කොටස් කුඩු කර දමා[13]
එම කුඩු වතුර මත ඉස[14] ඊශ්‍රා-
යෙල් සෙනඟට බොන්න දුන්නේය.[15]
**21** පසුව මෝසෙස් ආරොන්ගෙන්
මෙසේ ඇසුවේය. “මේ තරම් බරප-
තළ පාපයක් කරන්න මේ සෙ-
නඟ ඔබව පෙලඹුවේ කොහොමද?”
**22** එවිට ආරොන් ඔහුට මෙසේ
කීවේය. “මාගේ ස්වාමීනි, කේන්ති
ගන්න එපා. මේ සෙනඟ හැම වෙ-
ලේම කරන්නේ දුෂ්ට ක්‍රියා බව ඔබ
හොඳ හැටි දන්නවා.[1] **23** ඔවුන්
මට මෙසේ පැවසුවා. ‘ඊජිප්තු දේශ-
යෙන් අපිව පිටතට ගෙනා මෝ-
සෙස්ට මොනවා වුණාද කියා අපි
දන්නේ නැහැ. අපිට මඟ පෙන්වන්න
දෙවි කෙනෙක්ව සාදා දෙන්න.’[2]
**24** ඒ නිසා ඔවුන්ගේ, ‘රන් ආභරණ
ගලවා මට දෙන්න’ කියා මම ඔවුන්ට
පැවසුවා. මම ඒ ආභරණ රැගෙන
ගින්නට වීසි කළා. එවිට මේ වස්සා-
ගේ රූපය ගින්නෙන් මතු වුණා.”
**25** සෙනඟ නොහික්මුණු ආකාර-
යෙන් හැසිරුණේ ආරොන් ඔවුන්ට
එසේ කරන්න ඉඩහැරිය නිසා බව
මෝසෙස්ට පෙනී ගියේය.[3] සෙනඟ
එලෙස හැසිරුණ නිසා ඔවුහු තම
සතුරන් ඉදිරියේ නින්දාවට පත්
වූහ.[4] **26** මෝසෙස් කඳවුරේ දො-
රටුව අසල සිටගෙන, “යෙහෝවා
දෙවිගේ පැත්ත ගන්න සියලුදෙ-
නාම දැන් මා ළඟට එන්න”[5] කියා
කීවේය. එවිට ලෙවී ගෝත්‍රයේ පුරුෂ-
යෝ මෝසෙස්ගේ පැත්තට ගියෝය.
**27** මෝසෙස් ඔවුන්ට මෙසේ කීවේය.
“ඊශ්‍රායෙල්වරුන්ගේ දෙවි වන යෙ-
හෝවා මෙසේ පැවසුවා. ‘ඔබ සියලු-
දෙනාම තම තමාගේ කඩුව ඉණේ
බැඳගන්න. කඳවුරේ එක් කෙළව-
රක සිට අනික් කෙළවර දක්වා*
ගොස් තම තමන්ගේ සහෝදරයන්-
වත් අසල්වැසියන්වත් මිත්‍රයන්වත්
මරා දමන්න.’”[6] **28** ලෙවී ගෝ-
ත්‍රයේ පුරුෂයෝ[7] මෝසෙස් පැවසූ
ලෙසම කළෝය. එදින සෙනඟ
අතරේ සිටි පුරුෂයෝ තුන්දාහක්
පමණ මැරුම් කෑවෝය. **29** ලෙවී

**නික් 32:27*** මූ.අ., “දොරටුවක් දොරටුවක් පාසා.”

**32 පරි.**
1 උත් 22:16; හෙබ්‍රෙ 6:13
2 උත් 22:17; උත් 26:4; උත් 35:11
3 රෝම 9:7
4 උත් 13:15
5 ගීතා 106:45; හොෂෙ 11:9; යෝවෙ 2:13
6 නික් 40:20; ද්වි 5:22
7 ද්වි 9:15
8 නික් 31:18; නික් 34:1; ද්වි 9:10; ද්වි 10:2; 2කොරි 3:7
9 යොෂු 6:5; ආමො 1:14
10 නික් 15:1
11 ද්වි 9:16; නෙහෙ 9:18; ගීතා 106:19; ක්‍රියා 7:41
12 ද්වි 9:17
13 ද්වි 7:25; ද්වි 9:21; 2රාජා 23:6
14 නික් 17:6
15 හිතෝ 1:31

**2 තීරුව**
1 නික් 15:24; නික් 16:2; නික් 17:2; ද්වි 9:7; ද්වි 31:27
2 නික් 32:1; ද්වි 4:15; ක්‍රියා 7:40; ක්‍රියා 17:29
3 2ලේක 28:19
4 නික් 32:12; ද්වි 28:37
5 යොෂු 24:15; 2රාජා 9:32; 2රාජා 10:15
6 ගණන් 25:5; ද්වි 13:8; සෙක 13:3
7 ද්වි 33:9; මලා 2:4

ගෝත්‍රයේ පුරුෂයන්ට මෝසෙස්
මෙසේ කීවේය. “අද ඔබෙන් කිසිවෙකු
තම තමාගේ පුත්‍රයාගේ හෝ සහෝද-
රයාගේ හෝ පැත්ත ගත්තේ නැහැ.[1]
ඔබ ඔබේ අත් සවිමත් කරගෙන[2] යෙ-
හෝවා දෙවි වෙනුවෙන් සටන් කළ
නිසා දෙවි ඔබට ආශීර්වාද කරයි.”[3]
**30** පසුවදා මෝසෙස් සෙනඟට
මෙසේ කීවේය. “ඔබ සියලුදෙනා
කළේ බරපතළ පාපයක්.[4] දැන් මම
යෙහෝවා දෙවි වෙතට ගොස් ඔබේ
පව් වෙනුවෙන් සමාව අයැදින්නම්.
සමහරවිට දෙවි ඔබට සමාව දෙයි.”[5]
**31** ඉන්පසු මෝසෙස් නැවත යෙ-
හෝවා දෙවි වෙතට ගොස් මෙසේ
කීවේය. “දෙවියනි, මේ සෙනඟ ඔබට
විරුද්ධව කර තිබෙන්නේ බරපතළ
පාපයක්. ඔවුන් රන් රූපයක් සාදා
එයට නමස්කාර කළා.[6] **32** අනේ
දෙවියනි, ඔවුන් කළ පාපයට සමාව
දෙන්න.[7] නැත්නම් ඔබේ ලියවිල්-
ලෙන්[8] මගේ නම මකා දමන්න.”[9]
**33** නමුත් යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. “මාගේ ලිය-
විල්ලෙන් මකා දමන්නේ මට
විරුද්ධව පව් කර තිබෙන අය-
ගේ නම් පමණයි.[10] **34** දැන් මා
ඔබට පෙන්වන තැනට මේ සෙනඟව
ගෙන යන්න. මාගේ දූතයා ඔබට
ඉදිරියෙන් ගමන් කරයි.[11] සෙනඟ
කළ පාපයට දඬුවම මම නියම
කළ දවසේදී ඔවුන්ට දෙන්නෙමි.”[12]
**35** සෙනඟ ආරොන් ලවා වස්සාගේ
රූපය සෑදූ බැවින් යෙහෝවා දෙවි
ඔවුන්ට පහර දුන්නේය.[13]

**33** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. “ඔබ ඊජිප්තු
දේශයෙන් පිටතට ගෙනා මේ සෙනඟ
සමඟ මෙතැනින් පිටත්ව යන්න.[14]
මා ආබ්‍රහම්ට, ඊසාක්ට හා යාකොබ්ට
දිවුරා ඔවුන්ගෙන් පැවතෙන්නන්ට
දෙන බවට පොරොන්දු වූ දේශයට
දැන් යන්න.[15] **2** මම මගේ දූතයෙ-
කුව ඔබට ඉදිරියෙන් යවන්නෙමි.[16]
මම කානානිවරුන්වද අමෝරිවරුන්-
වද හිත්තීවරුන්වද පෙරිස්සිවරුන්වද

**32 පරි.**
1 ගණන් 25:11
ද්වි 13:6
සෙක 13:3
2 2ලේක 29:31
3 ද්වි 33:11
4 1සාමු 2:17
1සාමු 12:20
5 ගණන් 14:20
ගණන් 16:47
ගණන් 21:7
ද්වි 9:18
6 නික් 20:23
7 ගණන් 14:19
යෙසා 1:18
8 ගීතා 69:28
දානි 12:1
පිලි 4:3
එළි 3:5
එළි 17:8
9 ද්වි 9:14
රෝම 9:3
10 යෙරෙ 15:1
එස 18:4
11 නික් 23:20
නික් 33:2
12 ආමෝ 3:14
රෝම 2:5
13 ක්‍රියා 7:41

**33 පරි.**
14 ක්‍රියා 7:36
15 උත් 12:7
උත් 15:6
උත් 26:3
හෙබ්‍රෙ 11:9
16 නික් 23:20
නික් 32:34

**2 තීරුව**
1 ද්වි 7:1
ද්වි 7:22
යොෂු 24:11
2 නික් 3:8
ද්වි 8:7
යොෂු 5:6
යෙරෙ 11:5
3 නික් 32:9
ද්වි 9:6
ක්‍රියා 7:51
4 නික් 32:10
ගණන් 16:21
5 ගණන් 14:39
හොෂෙ 7:14
6 නික් 34:9
ගීතා 78:8
ගීතා 106:25
7 ගණන් 16:45
ගීතා 73:19
8 උත් 18:21
ද්වි 8:2
ගීතා 139:23
9 ද්වි 9:8
10 නික් 18:26
ගණන් 27:5
11 ලෙවී 19:32
12 නික් 13:21
ගීතා 99:7
13 ගණන් 11:17
ගණන් 12:5

හිවීයවරුන්වද යෙබූසිවරුන්වද දේශ-
යෙන් පන්නා දමන්නෙමි.[1] **3** කිරි-
යෙන් හා පැණියෙන් ඉතිරෙන ඒ
දේශයට[2] යන්න සූදානම් වන්න.
නමුත් මම ඔබ සමඟ නොයන්නෙමි.
මන්ද මේ සෙනඟ මුරණ්ඩු[3] නිසා
ගමන යන අතරතුරේදී මා ඔවුන්ව
විනාශ කර දැමීමට ඉඩ තිබේ.”[4]
**4** සෙනඟ මේ නරක ආරංචිය ඇසූ
විට වැලපෙන්න පටන්ගත්තෝය.[5]
ඔවුන්ගෙන් කිසිවෙක් තම ආභරණ
පැළඳගත්තේ නැත. **5** යෙහෝවා
දෙවි මෝසෙස්ට මෙසේ කීවේය.
“ඊශ්‍රායෙල් සෙනඟට මෙසේ කියන්න.
‘ඔබ කටයුතු කරන්නේ ඉතා මුරණ්ඩු
ලෙසයි.[6] ඔබ අතරට පැමිණ ඔබ
සියලුදෙනාවම එක මොහොතකින්[7]
විනාශ කර දැමීමට මට පුළුවන.
දැන් ඔබේ ආභරණ ගලවා දමන්න.
ඔබට දඬුවම් කළ යුත්තේ කෙසේද
කියා මම පසුව තීරණය කරන්-
නෙමි.’ ”[8] **6** හොරෙබ් කන්ද[9] අසලදී
ඊශ්‍රායෙල් පුත්‍රයෝ ආභරණ සියල්ල
ගලවා දැමුවෝය. එතැන් සිට ආභ-
රණ නැතුව ඔවුහු ගමන් කළෝය.
**7** මෝසෙස් කූඩාරම අකුළාගෙන
ගොස් සෙනඟ කඳවුරු බැඳගෙන
සිටි ස්ථානයෙන් ඈතට වෙන්න
කූඩාරම නැවත ගසාගත්තේය. ඔහු
එය සම්මුඛ වීමේ කූඩාරම ලෙස
හැඳින්විය. යෙහෝවා දෙවිගෙන් යම්
කාරණා විමසීමට[10] ඕනෑ වූ සෑම
කෙනෙක්ම කඳවුරෙන් පිටත තිබූ
සම්මුඛ වීමේ කූඩාරමට ගියෝය.
**8** මෝසෙස් සම්මුඛ වීමේ කූඩාරමට
ඇතුල් වන පිණිස පිටත්ව ගිය විට
මුළු සෙනඟ නැඟිට[11] තම තමන්-
ගේ කූඩාරම්වල දොරටුව අසල සිට-
ගෙන ඔහු සම්මුඛ වීමේ කූඩාරමට
ඇතුල් වන තුරු බලා සිටියෝය.
**9** මෝසෙස් සම්මුඛ වීමේ කූඩාරමට
ඇතුල් වූ විගස වලා ටැඹ[12] පහ-
තට ඇවිත් කූඩාරමට ඇතුල් වන
ස්ථානය ළඟ නැවතුණේය. එවිට
දෙවි මෝසෙස් සමඟ කතා කළේය.[13]
**10** සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල්

වන ස්ථානයේ වලා ටැඹ[1] නැවතී
තිබෙන බව මුළු සෙනඟ දැක තම
තමන්ගේ කූඩාරම්වල සිට හිස නමා
වැන්දෝය.[2] **11** මිනිසෙකු තමාගේ
මිත්‍රයෙකු සමඟ මුහුණට මුහුණ ලා
කතා කරන්නාක් මෙන් යෙහෝවා
දෙවි මෝසෙස් සමඟ කතා කළේය.[3]
මෝසෙස් කඳවුරට පැමිණි අවස්ථාව-
ලදී ඔහුගේ සේවකයා[4] වන නූන්ගේ
පුත්‍රයා වූ යොෂුවා[5] සම්මුඛ වීමේ
කූඩාරම අසල රැඳී සිටියේය.

**12** මෝසෙස් යෙහෝවා දෙවි
අමතා මෙසේ කීවේය. “ ‘මේ සෙනඟව
රැගෙන යන්න’ කියා ඔබ මට පවසා-
නවා. නමුත් ඒ ගමන යෑමට මා
සමඟ එවන්නේ කාවද කියා ඔබ
මට පැවසුවේ නැහැ. ‘මම ඔබව
හොඳින් හඳුනමි.[6] ඔබ මට ප්‍රසන්නය’
කියාත් ඔබ මට පැවසුවා. **13** මම
ඔබට ප්‍රසන්න කෙනෙක් නම්[7] ඔබේ
මාර්ග මට කියා දෙන්න.[8] එවිට
ඔබව හොඳින් දැන හඳුනා ගෙන
හැමදාමත් ඔබට ප්‍රසන්න කෙනෙක්
ලෙස ජීවත් වීමට මට හැකි වෙයි.
මේ ජාතිය ඔබේ සෙනඟ බව අම-
තක නොකරන්න.”[9] **14** එවිට දෙවි,
“මම ඔබ සමඟ එන්නෙමි.[10] ඔබේ
සිතට සැනසීමක් ලබා දෙන්නෙමි”
කියා කීවේය.[11] **15** මෝසෙස් දෙ-
විට මෙසේ කීවේය. “ඔබ අප සමඟ
නොඑන්නේ නම් අපව මෙතැනින්
පිටත් කර යවන්න එපා. **16** ඔබ
එසේ කළොත් අපට ඔබේ අනුමැතිය
තිබෙනවා කියා අප දැනගන්නේ
කොහොමද? ඒ වගේම පොළොවේ
ජීවත් වෙන අන් සියලු ජාතීන්ට වඩා
අපි සුවිශේෂී ජාතියක්[12] වුණේ ඔබ අප
සමඟ සිටි නිසා නොවේද?”[13]

**17** එවිට යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. “මම ඔබව
හොඳින් හඳුනමි. ඔබ මට ප්‍රසන්-
නය. ඒ නිසා ඔබ මගෙන් ඉල්ලන
මේ දේත් මම ඉටු කරන්නෙමි.”[14]
**18** එවිට මෝසෙස්, “ඔබේ තේ-
ජස මට දකින්න සලස්වන්න” කියා
දෙවිගෙන් බැගෑපත්ව ඉල්ලුවේය.[15]
**19** නමුත් දෙවි ඔහුට මෙසේ කීවේය.
“මාගේ යහපත්කම මම ඔබට සම්පූර්-
ණයෙන්ම දකින්න සලස්වන්නෙමි.[1]
යෙහෝවා වන මාගේ නාමයද මම
ඔබට ප්‍රකාශ කරන්නෙමි.[2] මම යමෙ-
කුට කරුණාව පෙන්වන්න කැමති
නම් මම ඔහුට කරුණාව පෙන්වන්-
නෙමි. මම යමෙකුට දයාව පෙන්-
වන්න කැමති නම් මම ඔහුට දයාව
පෙන්වන්නෙමි.”[3] **20** දෙවි තවදුර-
ටත් ඔහුට මෙසේ කීවේය. “නමුත්
මාගේ මුහුණ දකින්න ඔබට නුපුළු-
වන. මන්ද මනුෂ්‍යයෙකුට මා දැක
ජීවත් විය නොහැක.”[4]

**21** යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ කීවේය. “මා ඔබට පෙන්වන
මේ පර්වතය උඩට වී සිටින්න.
**22** මාගේ තේජස මේ පර්වතය පසු
කරගෙන යන තෙක් මෙහි ඔබව
සඟවා ඔබව ආරක්ෂා කරන පිණිස
මාගේ අතින් ඔබව වසාගන්නෙමි.
**23** ඉන්පසු මාගේ අත මම ඉවතට
ගන්නෙමි. එවිට ඔබ මාගේ පිටුපස
දකින්නෙහිය. ඔබට මාගේ මුහුණ
දකින්න ලැබෙන්නේ නැත.”[5]

**34** පසුව යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය.
“ඔබට කලින් දුන් ගල් පුවරු දෙක
හා සමාන තවත් ගල් පුවරු දෙ-
කක් කපාගන්න.[6] ඔබ බිඳ දැමූ[7]
ගල් පුවරුවල ලියා තිබූ වචනම
මම ඒ පුවරු දෙකෙහිද ලියන්නෙමි.[8]
**2** ඔබ හෙට උදෑසන සීනයි කඳු මුදු-
නට නැඟ මා ඉදිරියට පැමිණෙන්න.[9]
**3** ඔබ සමඟ වෙන කිසිවෙකුට ඒමට
ඉඩ නොදෙන්න. කිසිවෙකු කන්දේ
කිසිම තැනක රැඳී නොසිටිය යුතුයි.[10]
එළුවන්ටවත් බැටළුවන්ටවත් ගව-
යන්ටවත් කන්ද ඉදිරියේ තණ කෑමට
ඉඩ නොදෙන්න.”[11]

**4** ඉන් අනතුරුව කලින් තිබූ
ගල් පුවරු දෙක හා සමාන තවත්
ගල් පුවරු දෙකක් මෝසෙස් කපා-
ගත්තේය. යෙහෝවා දෙවි තමාට
අණ කළ ලෙසම ඔහු උදෑසනින්ම
නැඟිට ඒ ගල් පුවරු දෙකත් රැගෙන

**33 පරි.**
1 නික් 40:35
2 නික් 4:31
3 උත් 32:30; නික් 33:23; ගණන් 12:8; ද්වි 34:10; යොහ 1:18; යොහ 6:46; ක්‍රියා 7:38
4 නික් 17:9; නික් 24:13
5 ගණන් 11:28; ද්වි 1:38; යොෂු 1:1
6 උත් 18:19; ගීතා 1:6; 2තිමෝ 2:19
7 නික් 34:9
8 ගීතා 25:4; ගීතා 27:11; ගීතා 86:11; ගීතා 119:33; යෙසා 30:21
9 ද්වි 9:26; ගීතා 33:12
10 නික් 13:21; නික් 40:34; යොෂු 1:5; යෙසා 63:9
11 යොෂු 21:44; යොෂු 23:1; යෙරෙ 6:16
12 ද්වි 4:34; 2සාමු 7:23; ගීතා 147:20
13 ගණන් 14:14
14 යාකො 5:16; 1යොහ 5:14
15 නික් 16:10; නික් 24:17

**2 තීරුව**
1 ලූක් 2:9; ක්‍රියා 7:38; ක්‍රියා 7:53
2 නික් 3:13; නික් 6:3; නික් 34:6
3 රෝම 9:15; රෝම 9:18
4 ද්වි 5:24; යොහ 4:24
5 නික් 33:20; යොහ 1:18

**34 පරි.**
6 ද්වි 10:1
7 නික් 32:19; ද්වි 9:17
8 ද්වි 9:10; 2කොරි 3:3
9 නික් 19:20; නික් 24:12
10 නික් 19:12
11 නික් 19:13; හෙබ්‍රෙ 12:20

සීනයි කන්දට නැග්ගේය. **5** යෙ-
හෝවා දෙවිද කන්ද මත සිටි මෝ-
සෙස් වෙතට වලාකුළකින් බැස
ආවේය.[1] දෙවි, යෙහෝවා යන තම
නාමය මෝසෙස්ට ප්‍රකාශ කළේය.[2]
**6** ඒ අවස්ථාවේදී යෙහෝවා දෙවි
මෝසෙස්ව පසු කර යමින් මෙසේ
ප්‍රකාශ කළේය. "යෙහෝවා දෙවි වන
මා දයාන්විතය.[3] කරුණාවන්තය.[4]
කෝප වීමට ඉක්මන් නොවන්නෙමි.[5]
යෙහෝවා දෙවි වන මම ඉමහත් ප්‍රේ-
මයක්*[6] පෙන්වන්නෙමි. සැමවිටම
විශ්වාසවන්තව[7] ක්‍රියා කරන්නෙමි.
**7** මම පරම්පරා දහස් ගණනකට
මහත් ප්‍රේමයක්*[8] පෙන්වමින් අයුතු-
කම්වලටද වැරදිවලටද පාපවලටද
සමාව දෙන්නෙමි.[9] එහෙත් වරද-
කරුවන්ට දිය යුතු දඬුවමින් මම
කිසිවිටෙක ඔවුන්ව නිදහස් නොක-
රන්නෙමි.[10] පියවරුන්ගේ වැරදි නිසා
තුන්වෙනි හා හතරවෙනි පරම්පරා
දක්වා ඔවුන්ගේ පුත්‍රයන්ටද පුත්‍රයන්-
ගේ පුත්‍රයන්ටද අනිවාර්යයෙන්ම දඬු-
වම් කරන්නෙමි."[11]

**8** මෝසෙස් එය ඇසූ විගස බිම
වැටී දෙවිට නමස්කාර කළේය.[12]
**9** ඔහු දෙවිට මෙසේ කීවේය. "අනේ
යෙහෝවා දෙවියනි, මා ඔබේ කරු-
ණාව ලැබූ කෙනෙක් නම් මාගේ මේ
ඉල්ලීම ඉටු කරන්න. යෙහෝවා දෙ-
වියනි, මේ ගමන යෑමට අප සමඟ
පැමිණෙන්න[13] කියා මම ඔබෙන්
බැගෑපත්ව ඉල්ලා සිටිනවා. මේ සෙ-
නඟ මුරණ්ඩු[14] බව ඇත්තයි. එහෙත්
අපේ අයුතුකම්වලට හා පව්වලට
සමාව දී[15] ඔබේ උරුමය හැටියට
අපව පිළිගන්න."[16] **10** එවිට දෙවි
ඔහුට මෙසේ පිළිතුරු දුන්නේය. "මම
දැන් ඔබ සමඟ මේ ගිවිසුම ඇති කර-
ගන්නෙමි. මින් පෙර කිසි දිනක මේ
පොළොවේ කොතැනකවත් සිදු නො-
කළ පුදුම ක්‍රියා මම මේ සෙනඟ ඉදි-
රියේ කරන්නෙමි. වෙන කිසි ජාතියක්
ඉදිරියේ මා එවැනි දේවල් කර නැත.[1]
යෙහෝවා දෙවි වන මා ඔබ වෙනු-
වෙන් කරන පුදුම දනවන ක්‍රියා දැක
ඔබ අවට සිටින සියලු ජාතීහු බියෙන්
වෙවුලනු ඇත.[2]

**11** "අද මා ඔබට අණ කරන
මේ සියල්ල පැවැත්වීමට ඔබ වග-
බලා ගත යුතුයි.[3] මම අමෝරිවරුන්-
වද කානානිවරුන්වද හිත්තීවරුන්වද
පෙරිස්සිවරුන්වද හිවීයවරුන්වද යෙ-
බූසිවරුන්වද ඔබ ඉදිරියෙන් පන්නා
දමන්නෙමි.[4] **12** ඔබ යන දේශ-
යේ වැසියන් සමඟ කිසි ගිවිසු-
මක් ඇති කර නොගන්න.[5] එසේ
කළොත් එය ඔබේ විනාශයට හේතු
වනු ඇත.[6] **13** ඔබ ඔවුන්ගේ පූජා-
සන කඩා දැමිය යුතුයි. නමස්කා-
රය සඳහා ඔවුන් ඉදි කළ කුලුනුද
කණුද කුඩු කර දමන්න.[7] **14** ඔබ
වෙන කිසි දෙවි කෙනෙක් ඉදිරි-
යේ වැඳ වැටී නමස්කාර නො-
කළ යුතුයි.[8] මන්ද යෙහෝවා දෙවි
වන මම වෙනත් දෙවිවරුන්ට කරන
නමස්කාරය දැඩි ලෙස හෙළාද-
කින්නෙමි.[9] **15** ඔබ දේශයේ වැසි-
යන්ගේ පූජනීය වස්තු විනාශ කර
නොදැම්මොත් ඔවුහු තම දෙවිව-
රුන් ඉදිරියේ පිළිකුල්සහගත ක්‍රියා-
වල නියැලෙමින්*[10] ඔවුන්ට පුදපූජා
ඔප්පු කරනු ඇත.[11] එවිට ඔවුන්ගේ
පූජාවලට හවුල් වෙන්න කියා ඔබට
පවසන විට ඔබත් ඔවුන් සමඟ
හවුල් වී දෙවිවරුන්ට ඔප්පු කළ දේ-
වලින් අනුභව කිරීමට පෙලඹෙනු
ඇත.[12] ඔබ ඔවුන් සමඟ ගිවිසුමක්
ඇති කරගෙන **16** ඔවුන්ගේ දූව-
රුන්ව ඔබේ පුත්‍රයන්ට විවාහ කර
දෙනු ඇත.[13] ඔවුන්ගේ දූවරු ඔවුන්ගේ
දෙවිවරුන් ඉදිරියේ පිළිකුල්සහගත

**34 පරි.**
**1** ක්‍රියා 7:38; ක්‍රියා 7:53
**2** නික් 6:3; නික් 33:19
**3** 2ලේක 30:9; නෙහෙ 9:17; යෝවෙ 2:13; ලූක් 6:36; හෙබ්‍රෙ 8:12
**4** නික් 22:27; නෙහෙ 9:31; ගීතා 86:15; යෝනා 4:2
**5** ගණන් 14:18; නාහු 1:3; රෝම 9:22; 2පේතෘ 3:9
**6** යෙරෙ 31:3; විලා 3:22; මීකා 7:18
**7** ගීතා 31:5; රෝම 2:2
**8** යෙරෙ 32:18; දානි 9:4
**9** ගීතා 103:12; යෙසා 55:7; එෆී 4:32; 1යොහ 1:9
**10** ද්වි 32:35; යොෂු 24:19; රෝම 2:5; 2පේතෘ 2:4; යූද් 15
**11** නික් 20:5; ගණන් 14:18; ද්වි 30:19; 1සාමු 15:2
**12** ද්වි 9:18
**13** නික් 33:14
**14** නික් 32:9; නික් 33:3
**15** ගණන් 14:19
**16** ගීතා 33:12; ගීතා 94:14

**2 තීරුව**
**1** 1සාමු 12:16; 2සාමු 7:23; 1ලේක 17:21; ගීතා 147:20
**2** නික් 33:16; ද්වි 10:21; යෙසා 64:3
**3** නික් 19:5; ද්වි 12:28
**4** උත් 15:18; නික් 3:8; නික් 33:2; ද්වි 7:1
**5** නික් 23:32; ද්වි 7:2; විනි 2:2
**6** නික් 23:33; යොෂු 23:13
**7** නික් 23:24; ද්වි 12:3; විනි 6:25; 2රාජා 18:4
**8** නික් 20:3; 1කොරි 10:14; 1යොහ 5:21

**9** යොෂු 24:19; එස 39:25; 1කොරි 10:22; **10** ලෙවී 17:7; ද්වි 31:16; විනි 2:17; විනි 8:33; යෙරෙ 3:9; එස 6:9; **11** ගණන් 25:2; 1කොරි 10:20; **12** ගීතා 106:28; එස 18:6; 2කොරි 6:14; එළි 2:20; **13** එස්රා 9:2.

**නික් 34:6*** හෝ, "ලැදි ප්‍රේමයක්." **7*** හෝ, "ලැදි ප්‍රේමයක්."

**නික් 34:15*** මූ.අ., "දෙවිවරුන් සමඟ දුරාචාරයේ යෙදෙමින්."

ක්‍රියාවල නියැලෙමින්* ඔබේ පුත්‍ර-
යන්වත් එසේ කිරීමට පොලඹවනු
ඇත.[1]
**17** "දේවතා රූප සාදා නො-
ගන්න.[2]
**18** "ඔබ මුහුන් නොදැමූ රොටි
උත්සවය පැවැත්විය යුතුයි.[3] මා
ඔබට අණ කළ ලෙස දවස් හතක්
පුරා මුහුන් නොදැමූ රොටි අනුභව
කරන්න. ආබීබ් මාසයේ මා නියම
කළ දිනවලදී ඔබ එය කළ යුතුයි.[4]
මන්ද ඔබ ඊජිප්තු දේශයෙන් පිටතට
ආවේ එම මාසයේදීය.
**19** "සෑම කුලුඳුලෙක්ම මට අයි-
තිය.[5] ඔබේ ගව රැළේ හෝ බැටළු
රැළේ හෝ සිටින සියලු කුලුඳුල් පිරිමි
සතුන්ද මට අයිතිය.[6] **20** බූරුවන්
අතරින් සෑම කුලුඳුල් පැටියෙකු-
වම මුදවාගැනීම සඳහා බැටළුවෙකු
බැගින් දිය යුතුයි.[7] ඔබ උන්ව මුදවා-
ගන්නේ නැත්නම් උන්ගේ බෙල්ල
කඩා දැමිය යුතුයි. ඔබේ සෑම
කුලුඳුල් පුත්‍රයෙකුවද ඔබ මුදවාගත
යුතුයි.[8] කිසිවෙකු මා ඉදිරියට හිස්
අතින් නොපැමිණිය යුතුයි.[9]
**21** "ඔබ දවස් හයක් පුරා වෙහෙස
මහන්සි වී වැඩ කරන්න. නමුත් හත්-
වන දවසේදී සබතක් පවත්වන්න.[10]
ඔබ වපුරන කාලයේදීත් අස්වැන්න
නෙළන කාලයේදීත් සබත පැවැත්-
විය යුතුයි.[11]
**22** "ඔබ සති උත්සවය පැවැත්විය
යුතුයි. ඒ සඳහා ඔබේ තිරිඟු අස්වැන්-
නෙන් ප්‍රථම ඵල භාවිත කරන්න.[12]
අවුරුද්ද අවසානයේදී අස්වැන්න නෙ-
ළීමේ උත්සවය පවත්වන්න.[13]
**23** "අවුරුද්දට තුන් වතාවක්
සෑම පුරුෂයෙකුම ඊශ්‍රායෙල්වරුන්ගේ
ස්වාමීන් වන යෙහෝවා දෙවි ඉදිරියට
පැමිණිය යුතුයි.[14] **24** ඔබ යන දේ-
ශයේ ජීවත් වන සියලු ජාතීන්ව මම
පන්නා දමන්නෙමි.[15] ඔබට බොහෝ
ඉඩකඩ ඇති දේශයක් දෙන්නෙමි.[16]
ඔබ අවුරුද්දට තුන් වතාවක් ඔබේ
දෙවි වන යෙහෝවාට නමස්කාර
කිරීමට ඔබේ දේශයෙන් පිටත්ව යන
විට කිසි මිනිසෙකු ඔබේ දේශය
අයිති කරගැනීමට උත්සාහ නොක-
රන්නේය.[1]
**25** "ඔබ මට ඔප්පු කරන සතුන්-
ගේ ලේ සමඟ මුහුන් දැමූ කිසිවක්
ඔප්පු නොකළ යුතුයි.[2] පාස්කු උත්ස-
වය සඳහා ඔප්පු කරන සතාගේ මස්
පසුවදා උදෑසන වන තුරු තබා නො-
ගන්න.[3]
**26** "ප්‍රථම ඵල[4] අතරින් ඉදුණු
හොඳම පල ඔබේ දෙවි වන යෙහෝ-
වාගේ ගෘහයට ගෙනා යුතුයි.[5]
"එළු පැටියෙකුව උගේ මවගේ කිරි-
වලින් පිසීමෙන් වළකින්න."[6]
**27** යෙහෝවා දෙවි තවදුරටත්
මෝසෙස්ට මෙසේ කීවේය. "මා ඔබට
පැවසූ දේවල් ලියාගන්න.[7] මම ඊශ්‍රා-
යෙල් සෙනඟ හා ඔබ සමඟ ගිවිසු-
මක් ඇති කරගන්නේ ඒ වචනවලට
එකඟවයි."[8] **28** මෝසෙස් දහවල්
හතළිහක්ද රාත්‍රී හතළිහක්ද යෙ-
හෝවා දෙවි ඉදිරියේ සිටියේය. ඔහු ඒ
කාලය අතරතුරේදී කෑම කෑවේවත්
වතුර බීවේවත් නැත.[9] ඔහු* ගල්
පුවරු දෙක මත ගිවිසුමට ඇතුළත්
ආඥා දහය# ලියා දුන්නේය.[10]
**29** මෝසෙස් ගල් පුවරු දෙකත්
රැගෙන සීනයි කන්දෙන් බැස
ආවේය.[11] ඔහු දෙවි සමඟ කතා
කළ නිසා ඔහුගේ මුහුණ දීප්තියෙන්
බැබළෙමින් තිබුණේය. නමුත් මෝ-
සෙස් ඒ බව දැන සිටියේ නැත.[12]
**30** මෝසෙස් ආරොන් හා ඊශ්‍රායෙල්
පුත්‍රයන් ඉදිරියට පැමිණි විට ඔහුගේ
මුහුණ දීප්තියෙන් බැබළෙමින් තිබූ
බව ඔවුහු දැක ඔහු ළඟට යෑමට භය
වූහ.[13]
**31** එවිට මෝසෙස් ඔවුන්ව තමා
ළඟට කැඳෙව්වේය. ආරොන් සහ
සෙනඟ අතරේ සිටි අධිපතීන් සියලු-

**34 පරි.**
**1** ගණන් 25:2 ද්වි 7:4 1රාජා 11:2 නෙහෙ 13:26
**2** නික් 32:8 ලෙවී 19:4
**3** ලෙවී 23:6 1කොරි 5:8
**4** නික් 23:15
**5** නික් 13:2 ලූක් 2:23
**6** නික් 22:30
**7** නික් 13:13
**8** නික් 13:15 ගණන් 18:15 ගණන් 18:16
**9** ද්වි 16:16
**10** ද්වි 5:12 මතෙ 12:8 ලූක් 13:14
**11** යෙරෙ 17:22
**12** නික් 23:16
**13** ලෙවී 23:34
**14** ද්වි 16:16
**15** නික් 34:11 යොෂු 24:8
**16** ද්වි 12:20 ගීතා 78:55

**2 තීරුව**
**1** උත් 35:5 හිතෝ 16:7
**2** නික් 23:18
**3** නික් 12:10 ගණන් 9:12
**4** ගණන් 18:12 රෝම 8:23 1කොරි 15:23 යාකො 1:18 එළි 14:4
**5** ද්වි 26:2 නෙහෙ 10:35 හිතෝ 3:9 එස 44:30
**6** නික් 23:19 ද්වි 14:21
**7** නික් 24:4 ද්වි 31:9 ද්වි 31:11
**8** නික් 24:8 ද්වි 4:13
**9** ද්වි 9:18 මතෙ 4:2
**10** නික් 31:18 ද්වි 10:2 2කොරි 3:6
**11** නික් 32:15 2කොරි 3:3 හෙබ්‍රෙ 9:4
**12** මතෙ 17:2
**13** 2කොරි 3:7

---
**නික් 34:16*** නික් 34:15හි පාදසටහන බලන්න.

**නික් 34:28*** මෙය යෙහෝවා දෙවිට යොමු දැක්වෙන බව පැහැදිලියි. 1වන පදය බලන්න. **28#** මූ.අ., "වචන දහය."

දෙනාම මෝසෙස් ළඟට පැමිණි විට
ඔහු ඔවුන් සමඟ කතා කළේය.
**32** ඉන්පසු මුළු ඊශ්‍රායෙල් සෙනඟද
මෝසෙස් ළඟට ආවෝය. යෙහෝවා
දෙවි සීනයි කන්දේදී තමාට දුන්
සෑම ආඥාවක් ගැනම මෝසෙස් සෙ-
නඟට පැවසුවේය.[1] **33** එදා පටන්
මෝසෙස් සෙනඟ සමඟ කතා කළ
පසු වැස්මකින් තම මුහුණ වසාගත්-
තේය.[2] **34** නමුත් ඔහු යෙහෝවා
දෙවි සමඟ කතා කිරීමට යන විට
මුහුණෙන් එම වැස්ම අහක් කළේය.[3]
දෙවි ඉදිරියෙන් හැරී එන විට ඔහු එම
වැස්මෙන් නැවත මුහුණ වසාගත්-
තේය. ඉන්පසු දෙවි තමාට අණ
කළ දේවල් ඔහු ඊශ්‍රායෙල් සෙ-
නඟට දැන්වූවේය.[4] **35** ඒ අවස්ථා-
වලදී මෝසෙස්ගේ මුහුණ දීප්තියෙන්
බැබළෙමින් තිබූ බව ඊශ්‍රායෙල් සෙ-
නඟ දුටුවෝය.[5] එහෙයින් මෝසෙස්
නැවත දෙවි ඉදිරියට යන තුරු
එම වැස්මෙන් තම මුහුණ වසාගත්-
තේය.[6]

**35** පසුව මෝසෙස් මුළු ඊශ්‍රා-
යෙල් සෙනඟ එකට රැස් කර
මෙසේ කීවේය. "ඔබ විසින් පිළිපැදිය
යුතු යෙහෝවා දෙවි නියම කළ
කාරණා මේවාය.[7] **2** දින හයක්
ඔබට වැඩ කිරීමට පුළුවන.[8] නමුත්
හත්වන දවස ශුද්ධ දවසක් වන නිසා
ඔබ එදින යෙහෝවා දෙවිට ගෞ-
රව කරන පිණිස සබතක් පැවැත්-
විය යුතුයි. කිසි වැඩක් නොකර
එදින ඔබ විවේක ගන්න. එදින
වැඩ කරන කවරෙකු නමුත් අනි-
වාර්යයෙන්ම මරා දැමිය යුතුයි.[9]
**3** සබත් දිනයේදී ඔබේ නිවසේ ගින්-
නක් නොදල්වන්න."

**4** මෝසෙස් තවදුරටත් ඊශ්‍රායෙල්
සෙනඟ අමතමින් මෙසේ කීවේය.
"යෙහෝවා දෙවි මෙසේ කිරීමටද
අණ කළා. **5** 'ඔබ යෙහෝවා දෙ-
විට සම්මාදමක් දිය යුතුයි.[10] සතුටු
සිතින්[11] යෙහෝවා දෙවිට යමක් දීමට
පෙලඹෙන සියලුදෙනා සම්මාදමක්
හැටියට මෙවැනි දේවල් ගෙනෙන්න.
රන්ද රිදීද තඹද[1] **6** නිල් පැහැති
නූල්ද රත්නිල් පැහැගැන්වූ ලොම්ද
තද රතු පැහැති රෙදිද අගනා ලිනන්
රෙදිද එළු රෝමද[2] **7** රතු සායම්
දැමූ බැටළු හම්ද සීල් මත්ස්‍යයන්-
ගේ හම්ද ෂිට්ටිම් ලීද **8** පහන් සඳහා
තෙල්ද ශුද්ධ තෛලය හා සුවඳ ද්‍රව්‍ය
සඳහා බෝල්සම් තෙල්ද[3] **9** ඒෆෝද්
හැට්ටය හා ළයවැස්ම[4] සඳහා ඔනික්ස්
ගල්ද අනර්ඝ ගල්ද ගෙනෙන්න.[5]

**10** "'විවිධ කර්මාන්තවලට දක්ෂ
වූ[6] සෑම කෙනෙකුම ඇවිත් යෙහෝවා
දෙවි අණ කළ මේ සියලු දේවල් සෑදිය
යුතුයි. **11** සම්මුඛ වීමේ කූඩාරම
හා එහි සියලු උපකරණද රෙදි
තිරද කොකුද එහි රාමුද පොලුද
කණුද අඩිද සාදන්න. **12** ගිවිසුම්
පෙට්ටිය[7] සහ එහි පියනද[8] පොලුද[9]
ගිවිසුම් පෙට්ටිය වෙන් කර තබන
තිර රෙද්දද[10] සාදන්න. **13** මේ-
සය[11] සහ ඒ මත තැබීමට භාණ්-
ඩද පොලුද දෙවිට පුදන රොටිද[12]
**14** පහන් රුක[13] සහ එහි පහන්ද
එහි සියලු මෙවලම්ද පහන් දැල්වී-
මට තෙල්ද[14] සාදන්න. **15** සුවඳ
ද්‍රව්‍ය ඔප්පු කරන පූජාසනයද[15] එහි
පොලුද ශුද්ධ තෛලයද සුගන්ධ-
වත් ද්‍රව්‍යද[16] සම්මුඛ වීමේ කූඩාරමට
ඇතුල් වන ස්ථානය සඳහා තිර රෙද්-
දද සාදන්න. **16** දවන පූජා ඔප්පු
කරන පූජාසනය[17] සහ එහි උපකර-
ණද එහි පොලුද වතුර භාජනය[18] සහ
එහි ආධාරකයද පූජාසනය ඇතුළට
දැමීම සඳහා දැලක ආකාරයට තඹ
මැස්සක්ද සාදන්න. **17** මළුව වටා
එල්ලීමට තිරද[19] මළුව සඳහා කණුද
අඩිද එහි දොරටුව සඳහා තිරද
**18** කූඩාරම හා මළුව සඳහා කූඤ්-
ඤද ඒවා සඳහා ලණුද සාදන්න.[20]
**19** ශුද්ධස්ථානයේ සේවය කරන අය
සඳහා මනා ලෙස වියන ලද නිල
වස්ත්‍රද[21] පූජක ආරොන්ගේ ශුද්ධ
වස්ත්‍රද[22] පූජකයන් ලෙස සේවය
කරන ඔහුගේ පුත්‍රයන්ගේ වස්ත්‍රද
සාදන්න.'"

**34 පරි.**
1 නික් 24:3; ද්වි 1:3
2 2කොරි 3:13
3 2කොරි 3:16
4 ද්වි 27:10
5 2කොරි 3:7
6 2කොරි 3:13

**35 පරි.**
7 නික් 34:32; රෝම 2:13; යාකො 1:22
8 නික් 20:9; නික් 31:15; ලෙවී 23:3; ද්වි 5:13; ලූක් 13:14
9 නික් 31:14; ගණන් 15:32; ගණන් 15:35
10 නික් 35:29
11 2කොරි 8:12; 2කොරි 9:7

**2 තීරුව**
1 නික් 25:3
2 නික් 25:4; නික් 26:7; නික් 36:8
3 නික් 25:6; ගීතා 141:2; එළි 5:8
4 නික් 28:15
5 නික් 28:9; නික් 39:14
6 නික් 31:6; නික් 36:1
7 නික් 25:10
8 නික් 25:17
9 නික් 25:13
10 නික් 26:31
11 නික් 25:23
12 නික් 25:30; ලෙවී 24:5
13 නික් 25:31
14 නික් 27:20
15 නික් 30:1; නික් 37:25; නික් 40:5; ගීතා 141:2; එළි 5:8
16 නික් 30:34
17 නික් 27:1
18 නික් 30:18; නික් 38:8
19 නික් 27:9
20 නික් 27:19
21 නික් 31:10; නික් 39:41
22 නික් 39:1

**20** පසුව ඊශ්‍රායෙල් සෙනඟ මෝ-
සෙස් වෙතින් පිටත්ව ගියෝය.
**21** යෙහෝවා දෙවිට සතුටු සිතින්
යමක් දීමට පෙලඹුණු අය[1] සම්මුඛ
වීමේ කූඩාරම සෑදීමට අවශ්‍ය දේවල්ද
එහි සේවාවන් සඳහා අවශ්‍ය දේ-
වල්ද ශුද්ධ වස්ත්‍ර සෑදීමට අවශ්‍ය
දේවල්ද ගෙනාවෝය. **22** ස්ත්‍රීහුද
පුරුෂයෝද වැල නොකැඩී ආවෝය.
ඔවුහු හාරිච්චිද කරාබුද මුදුද විවිධ
වර්ගයේ රන් ආභරණද නොයෙකුත්
වර්ගයේ රන් භාණ්ඩද සිය කැමැත්-
තෙන්ම ගෙනාවෝය. ඔවුහු එම රන්
ආභරණ යෙහෝවා දෙවිට සෙලවී-
මේ පූජාවක් ලෙස ඔප්පු කළෝය.[2]
**23** තමන් සතුව නිල් පැහැති නූල්ද
රත්නිල් පැහැගැන්වූ ලොම්ද තද රතු
පැහැති රෙදිද අගනා ලිනන් රෙ-
දිද එළු රෝමද රතු සායම් ඇමූ
බැටළු හම්ද සීල් මත්ස්‍යයන්ගේ හම්ද
තිබූ අය ඒවා ගෙනැවිත් දුන්නෝය.[3]
**24** රිදී හා තඹ ඇති සියලුදෙනා ඒවා
යෙහෝවා දෙවිට සම්මාදමක් හැටි-
යට දුන්නෝය. ෂිටිම් ලී තිබූ සියලු-
දෙනාද වැඩකටයුතු සඳහා අවශ්‍ය ලී
ගෙනාවෝය.

**25** වැඩවලට දක්ෂ[4] සියලු ස්ත්‍රීහු
නූල් කටින්න පටන්ගත්තෝය. ඔවුහු
කටින ලද නිල් පැහැති නූල්ද රත්නිල්
පැහැගැන්වූ ලොම්ද තද රතු පැහැති
නූල්ද අගනා ලිනන් නූල්ද දිගින් දිග-
ටම ගෙනැවිත් දුන්නෝය. **26** එම
ස්ත්‍රීහු එළු රෝමවලින්ද නූල් කටින්න
කැමැත්තෙන්ම ඉදිරිපත් වූහ.

**27** අධිපතීහු ඒෆොද් හැට්ටය
හා ළයවැස්ම සඳහා ඔනික්ස්
ගල්ද අනර්ඝ ගල්ද ගෙනාවෝය.[5]
**28** බෝල්සම් තෙල්ද පහන් සඳහා
තෙල්ද ශුද්ධ තෛලය හා සුවඳ
ද්‍රව්‍ය සඳහා තෙල්ද ඔවුහු ගෙනා-
වෝය.[6] **29** දෙවිට සතුටු සිතින්
යමක් දීමට පෙලඹුණු ස්ත්‍රීහු හා
පුරුෂයෝ, යෙහෝවා දෙවි මෝ-
සෙස්ට සාදන්න කියා පැවසූ දේවල්
සඳහා අවශ්‍ය සියලු ද්‍රව්‍ය ගෙනැවිත්
දුන්නෝය. ඊශ්‍රායෙල් සෙනඟ සිය
කැමැත්තෙන්ම යෙහෝවා දෙවිට ඒ
සියලු දේ ගෙනැවිත් දුන්නෝය.[1]

**30** පසුව මෝසෙස් ඊශ්‍රායෙල් සෙ-
නඟට මෙසේ කීවේය. “යෙහෝවා
දෙවි යූදා ගෝත්‍රයේ හූර්ගේ පුත්‍රයා
වන උරීගේ පුත් බෙසලෙල්ව[2] කැඳවා
තිබෙනවා. **31** ඔහුට ප්‍රඥාව,
දැනුම හා තේරුම්ගැනීමේ හැකි-
යාව ලැබෙන පිණිසත් සියලු ශිල්ප
ක්‍රමවල ඉතා දක්ෂ ලෙස යෙදීමට
හැකි වන පිණිසත් දෙවි තමාගේ
බලය නොඅඩුව ඔහුට දී තිබෙ-
නවා. **32** වැඩ සැලසුම් කිරීමට,
රන්, රිදී හා තඹවලින් කැටයම්
කිරීමට,[3] **33** මැණික් ගල් කැපීමට,
ඒවා එබ්බවීමට සහ වඩු වැඩ කිරීම
ඇතුළු සියලු කර්මාන්ත කිරීමට
අවශ්‍ය දක්ෂතාව දෙවි ඔහුට ලබා දී
තිබෙනවා.[4] **34** අන් අයට මේ දක්-
ෂතාවන් ඉගැන්වීම සඳහා අවශ්‍ය
හැකියාව දෙවි බෙසලෙල්ට හා දාන්
ගෝත්‍රයට අයත් අහිසාමක්ගේ පුත්‍රයා
වන ඔහොලියාබ්ට[5] ලබා දී තිබෙ-
නවා. **35** සියලු ශිල්ප ක්‍රමවල යෙ-
දීමටද නූල්වලින් මෝස්තර මැසීමටද
නිල් පැහැති නූල්වලින්, රත්නිල්
පැහැගැන්වූ ලොම්වලින්, තද රතු
පැහැති නූල්වලින් හා අගනා ලිනන්
නූල්වලින් රෙදි විවීමටද[6] සියලු කර්-
මාන්ත කිරීමටද සියලු වැඩ සැල-
සුම් කිරීමටද අවශ්‍ය ප්‍රඥාවෙන් දෙවි
ඔවුන්ට නොඅඩුව ලබා දී තිබෙනවා.[7]

**36** “යෙහෝවා දෙවි සෑදීමට අණ
කළ මේ සියලු දේවල් දෙවි
දුන් සැලැස්මට අනුව සෑදිය යුතුයි.[8]
මන්ද යෙහෝවා දෙවි බෙසලෙල්ටද
ඔහොලියාබ්ටද[9] අන් සියලු දක්ෂ
මිනිසුන්ටද ශුද්ධ කූඩාරම සෑදීම
සඳහා අවශ්‍ය ප්‍රඥාව[10] හා තේරුම්ගැ-
නීමේ හැකියාව[11] ලබා දී තිබෙනවා.”

**2** මෝසෙස්, බෙසලෙල්වද ඔහො-
ලියාබ්වද යෙහෝවා දෙවි ප්‍රඥාව
දුන් අනික් සියලුම දක්ෂ පුරුෂ-
යන්වද තමා වෙතට කැඳෙව්වේය.[12]
ඒ සියලුදෙනා කැමැත්තෙන්ම වැඩ
කිරීමට ඉදිරිපත් වූහ.[13] **3** ඔවුහු

**35 පරි.**
1 නික් 25:2, නික් 36:2, 2කොරි 8:12, 2කොරි 9:7
2 නික් 38:24
3 නික් 25:4
4 නික් 28:3, නික් 31:6, නික් 36:8
5 නික් 28:15, නික් 28:29, නික් 28:30, නික් 39:15, නික් 39:21
6 නික් 30:23, නික් 30:34

**2 තීරුව**
1 නික් 36:5, එස්රා 2:68, 2කොරි 9:7
2 නික් 31:2
3 නික් 31:4
4 නික් 31:5
5 නික් 31:6, නික් 36:1
6 නික් 26:1
7 නික් 31:3

**36 පරි.**
8 නික් 25:9, නික් 39:1
9 නික් 31:6
10 1රාජා 4:29, හිතෝ 2:6, 2පේතෘ 3:15
11 යෝබ් 32:8
12 නික් 28:3, නික් 31:6, නික් 35:10
13 නික් 35:21, නික් 35:26

ඊශ්‍රායෙල් සෙනඟ ශුද්ධ කූඩාරමේ
වැඩ සඳහා ගෙනා සම්මාදම්[1] මෝ-
සෙස්ගෙන් ඉල්ලාගෙන වැඩකටයුතු
ආරම්භ කළෝය. ඉන්පසුවත් ඊශ්‍රා-
යෙල් සෙනඟ දිගින් දිගටම සම්මාදම්
ගෙනාවෝය. සෙනඟ සෑම උදෑසන-
කම කැමැත්තෙන්ම මෝසෙස්ට සම්-
මාදම් ගෙනැවිත් දුන්නෝය.

**4** පරිශුද්ධ සේවය සඳහා අවශ්‍ය
කරන දේවල් සාදමින් සිටි දක්ෂ
මනුෂ්‍යයෝ තමන්ගේ වැඩ නතර කර
**5** මෝසෙස් ළඟට පැමිණ මෙසේ
කීවෝය. “යෙහෝවා දෙවි සාදන්න
කියා පැවසූ දේවල් සඳහා සෙ-
නඟ අවශ්‍ය ප්‍රමාණයටත් වඩා වැඩි-
යෙන් ද්‍රව්‍ය ගෙනැවිත් තිබෙනවා.”
**6** එහෙයින් මෝසෙස් කඳවුරේ
සිටි සියලුදෙනාටම මෙසේ දන්වන්න
කියා කීවේය. “සෙනඟෙනි, ශුද්ධ
කූඩාරමේ වැඩ සඳහා තවත් සම්-
මාදම් ගෙනෙන්න එපා.” මෙලෙස
සම්මාදම් ගෙන ඒමෙන් සෙනඟව
වළක්වනු ලැබීය. **7** මන්ද ඔවුහු
අවශ්‍ය ප්‍රමාණයටත් වඩා වැඩියෙන්
සම්මාදම් ගෙනාවෝය.

**8** වැඩවලට දක්ෂ[2] සියල්ලෝ
සම්මුඛ වීමේ කූඩාරම[3] සහ එහි රෙදි
තිර දහය සෑදුවෝය. රෙදි තිර දහය
සාදන පිණිස ඔවුහු සිහින්ව කටින
ලද ලිනන් නූල්ද නිල් පැහැති නූල්ද
රත්නිල් පැහැගැන්වූ ලොම්ද තද
රතු පැහැති නූල්ද භාවිත කළෝය.
කෙරුබ්වරුන්ගේ රූපද එම රෙදි
තිරවල මැසුවෝය. බෙසලෙල් ඒ
වැඩ සියල්ල අධීක්ෂණය කළේය.
**9** සෑම රෙදි තිරයක්ම සාදන ලද්-
දේ එකම ප්‍රමාණයටය. ඒවායේ දිග
රියන් විසිඅටක් හා පළල රියන් හත-
රක් විය. **10** ඔහු රෙදි තිර පහක්
එකිනෙකට මූට්ටු කර එක් විශාල
රෙද්දක් සෑදුවේය.[4] අනික් රෙදි තිර
පහද එකිනෙකට මූට්ටු කර තවත්
විශාල රෙද්දක් සෑදුවේය. **11** ඉන්-
පසු ඔහු මූට්ටු කළ ඒ එක් විශාල
රෙද්දක අවසාන රෙදි තිරයේ වාටිය
දිගේ නිල් පැහැති නූල්වලින් මුදු
මැසුවේය. අනික් විශාල රෙද්දේ අව-
සාන රෙදි තිරයේද ඔහු එලෙසම මුදු
මැසුවේය.[1] **12** විශාල රෙදි දෙකේම
ඇති වාටිය දිගේ එකිනෙකට සමාන්-
තරව මුදු පනහ බැගින් ඔහු මැසු-
වේය.[2] **13** අවසානයේදී ඔහු රන්
කොකු පනහක් සාදා කොකුවලින්
රෙදි දෙක එකිනෙකට සම්බන්ධ
කළේය. මෙසේ රෙදි දෙක එකිනෙ-
කට සම්බන්ධ කර ශුද්ධ කූඩාරම
වැසීම සඳහා තනි රෙද්දක් ලෙස එය
සෑදුවේය.[3]

**14** ඉන්පසු කූඩාරමට දමන එම
පළමු රෙද්දට උඩින් දැමීමට ඔහු
තවත් ආවරණයක් සෑදුවේය. ඒ
සඳහා ඔහු එළු රෝමවලින් සෑදූ
තිර එකොළහක් යොදාගත්තේය.[4]
**15** එම තිර එකොළහම එකම
ප්‍රමාණයට සෑදුවේය. එක් තිරයක
දිග රියන් තිහක් හා පළල රියන්
හතරක් විය.[5] **16** ඔහු තිර පහක්
එකිනෙකට මූට්ටු කර එක් විශාල
ආවරණයක් සෑදුවේය. අනික් හයද
එකිනෙකට මූට්ටු කර තවත් විශාල
ආවරණයක් සෑදුවේය.[6] **17** ඉන්පසු
ඔහු එම විශාල ආවරණයේ කෙළව-
රේ වාටිය දිගේ මුදු පනහක් මැසු-
වේය. අනික් ආවරණයේ වාටිය දිගේද
එලෙසම මුදු මැසුවේය.[7] **18** ආව-
රණ දෙක එකිනෙකට සම්බන්ධ කර
එක් රෙද්දක් සාදන පිණිස ඔහු තඹ
කොකු පනහක් සෑදුවේය.[8]

**19** කූඩාරම වැසීම සඳහා රතු
සායම් දැමූ බැටළු හම්වලින් තවත්
ආවරණයක්ද ඊට උඩින්[9] දැමීම
සඳහා සීල් මත්ස්‍යයන්ගේ හම්වලින්[10]
තවත් ආවරණයක්ද ඔහු සෑදුවේය.

**20** පසුව ෂිටිම් ලීවලින්[11] ඔහු
කූඩාරම සඳහා රාමු සාදා ඒවා කෙ-
ළින් සිටෙව්වේය. **21** එක් රාමුවක
දිග රියන් දහයක්ද පළල රියන්
එකහමාරක්ද විය.[12] **22** ඔහු ඒවා
සඳහා ලී ඇණ දෙක බැගින් සෑදුවේය.
එම ලී ඇණවල පිහිටීම එකිනෙකට
සමාන්තරව තිබිණ. කූඩාරමේ සෑම
රාමුවක්ම ඔහු එලෙස සෑදුවේය.[13]

**36 පරි.**
1 නික් 35:5, හිතෝ 3:9, 2කොරි 9:7
2 නික් 31:6
3 නික් 25:9, නික් 39:32, හෙබ්‍රෙ 9:9
4 නික් 26:3

**2 තීරුව**
1 නික් 26:4
2 නික් 26:5
3 නික් 26:6, හෙබ්‍රෙ 8:5, හෙබ්‍රෙ 9:9
4 නික් 25:4, නික් 26:7
5 නික් 26:8
6 නික් 26:9
7 නික් 26:10
8 නික් 26:11
9 නික් 26:14
10 නික් 25:5
11 නික් 25:10, නික් 25:23, නික් 26:15, නික් 27:1, නික් 30:5, නික් 36:36
12 නික් 26:16
13 නික් 26:17

**23** නෙගෙබ් වෙතට මුහුණ ලා
තිබෙන කූඩාරමේ දකුණු පැත්ත
සඳහා ඔහු රාමු විස්සක් සෑදුවේය.[1]
**24** ඔහු එක් රාමුවක් අනික් රාමුව
ළඟ කෙළින් සිටුවා ඒවා පොළොවේ
රැඳෙව්වේය. රාමුවල තිබෙන ලී ඇණ
පොළොවට සවි කරන පිණිස ඔහු රිදී
අඩි හතළිහක්ද සෑදුවේය. ඒ සෑම
රාමුවකටම අඩි දෙක බැගින් තිබිණ.[2]
**25** කූඩාරමේ උතුරු පැත්ත සඳහා
ඔහු තවත් රාමු විස්සක් සෑදුවේය.[3]
**26** ඒ එක් එක් රාමුව එක ළඟ
සිටෙව්වේය. රාමු පොළොවේ රඳවන
පිණිස ඔහු රිදී අඩි හතළිහක්ද සෑදු-
වේය. ඒ සෑම රාමුවකටම අඩි දෙක
බැගින් තිබිණ.[4]

**27** කූඩාරමේ බස්නාහිර පැත්ත
එනම්, එහි පිටුපස කොටස සඳ-
හාද ඔහු රාමු හයක් සෑදුවේය.[5]
**28** කූඩාරමේ පිටුපස පැත්තේ දෙ-
කෙළවරේ ආධාරක කණු ලෙස
තැබීම සඳහා ඔහු තවත් රාමු දෙකක්
සෑදුවේය.[6] **29** එක් රාමුවක් එකි-
නෙකට සමාන වූ ලෑලි දෙකකින්
සාදා තිබුණු අතර එහි මුදුන එකිනෙ-
කට සම්බන්ධ කර තිබිණ. එය එසේ
සම්බන්ධ කර තිබුණේ කූඩාරමේ
පළමු වළල්ල තිබෙන ස්ථානයේදීය.
රාමු දෙකම එයාකාරයට සාදා තිබුණු
අතර එම රාමු දෙක කූඩාරමේ ආධා-
රක කණු ලෙස සවි කර තිබිණ.[7]
**30** මෙසේ, කූඩාරමේ පිටුපස කො-
ටස සඳහා රාමු අටක් තිබිණ. ඒ එක්
එක් රාමුව එක ළඟ සිටුවා තිබිණ.
රාමු පොළොවේ රඳවන පිණිස ඔහු
රිදී අඩි දහසයක් සෑදුවේය. සෑම රාමු-
වකටම අඩි දෙක බැගින් තිබිණ.[8]

**31** රාමු එකිනෙකට සම්බන්ධ
කරන පිණිස ඔහු ෂිටිම් ලීවලින්
පොලු සෑදුවේය. කූඩාරමේ එක් පැත්-
තක තිබෙන රාමු සවි කිරීම සඳහා
පොලු පහක් සෑදුවේය.[9] **32** කූඩාර-
මේ අනික් පැත්තේ තිබෙන රාමු
සවි කිරීම සඳහාද ඔහු පොලු
පහක් සෑදුවේය. කූඩාරමේ බස්නාහිර
පැත්ත එනම්, එහි පිටුපස කොටස
සඳහා තවත් පොලු පහක් සෑදුවේය.[1]
**33** ඉන්පසු ඔහු රාමුවේ හරි මැද්-
දෙන් යවන පොල්ලද සෑදුවේය. එය
එක් කෙළවරක සිට අනික් කෙළ-
වර දක්වාම තිබෙන ආකාරයෙන්
සාදා තිබිණ.[2] **34** සෑම රාමුවක්ම
හා ඒවා එකිනෙකට සම්බන්ධ කරන
පොලුද ඔහු රනින් ආලේප කළේය.
ඔහු ඒ පොලු දැමීම සඳහා රනින්
වළලු සාදා රාමු මත සවි කළේය.[3]

**35** නිල් පැහැති නූල්වලින්, රත්-
නිල් පැහැගැන්වූ ලොම්වලින්, තද
රතු පැහැති රෙදිවලින් හා සිහින්ව
කටින ලද ලිනන් නූල් යොදාගෙන
ඔහු තවත් තිර රෙද්දක්[4] සාදා එහි
කෙරුබ්වරුන්ගේ[5] රූප මැසුවේය.
**36** පසුව ෂිටිම් ලීවලින් කණු හත-
රක් සාදා ඒවා රනින් ආලේප කර
රිදී අඩි හතරකින් ඒවා පොළොවේ
රඳවා තැබුවේය. තිර රෙද්ද එල්ලීම
සඳහා ඔහු කණු මත රන් ඇණ සවි
කළේය.[6] **37** කූඩාරමට ඇතුල් වන
ස්ථානය සඳහා නිල් පැහැති නූල්ව-
ලින්ද රත්නිල් පැහැගැන්වූ ලොම්ව-
ලින්ද තද රතු පැහැති නූල්වලින්ද
සිහින්ව කටින ලද ලිනන් නූල්වලින්ද
තිරයක් වියන ලදි.[7] **38** තිරය එල්-
ලීම සඳහා ඔහු කණු පහක්ද ඇණද
සාදා ඒවා රනින් ආලේප කළේය.
ඒවා පොළොවේ රඳවන පිණිස තඹ
අඩි පහක්ද සෑදුවේය.[8]

**37** බෙසලෙල්[9] ෂිටිම් ලීවලින්
ගිවිසුම් පෙට්ටිය[10] සෑදු-
වේය. එහි දිග රියන් දෙකහමා-
රක්ද පළල රියන් එකහමාරක්ද උස
රියන් එකහමාරක්ද විය.[11] **2** ඔහු
පෙට්ටියේ ඇතුළත හා පිටත පවිත්‍ර
රනින් ආලේප කර එහි උඩ දාරයට
යටින් පෙට්ටිය වටාම රන් ලියවැලක්
සෑදුවේය.[12] **3** ඔහු එම පෙට්ටියට
කකුල් හතරක් සවි කර ඒවාට මදක්
ඉහළින් රනින් සෑදූ වළලු හතරක් සවි
කළේය. ඔහු වළලු දෙකක් පෙට්ටියේ
එක පැත්තකද අනික් දෙක පෙට්ටියේ
අනික් පැත්තේ තිබෙන සේ දෙපැත්-
තේ සවි කළේය.[13] **4** ඉන්පසු ෂිටිම්

**36 පරි.**
1 නික් 26:18
2 නික් 26:19
3 නික් 26:20
4 නික් 26:21
5 නික් 26:22
6 නික් 26:23
7 නික් 26:24
8 නික් 26:25
9 නික් 26:26

**2 තීරුව**
1 නික් 26:27
2 නික් 26:28
3 නික් 26:29
4 නික් 26:31, නික් 40:21, හෙබ්‍රෙ 10:20
5 උත් 3:24
6 නික් 26:32
7 නික් 26:36
8 නික් 26:37

**37 පරි.**
9 නික් 31:2, නික් 38:22
10 නික් 40:3, ගණන් 10:33
11 නික් 25:10
12 නික් 25:11, හෙබ්‍රෙ 9:4
13 නික් 25:12

ලීවලින් පොලු දෙකක් සාදා ඒවා
රනින් ආලේප කළේය.[1] **5** පෙට්ටිය
උසුලාගෙන යන පිණිස එහි දෙපැත්-
තේ තිබෙන වළලුවලට ඔහු එම
පොලු දෙක දැමුවේය.[2]
**6** ඔහු එම පෙට්ටියට පවිත්‍ර රනින්
පියනක්[3] සෑදුවේය. එහි දිග රියන්
දෙකහමාරක්ද පළල රියන් එක-
හමාරක්ද විය.[4] **7** ඔහු රත්තරන්
තළා කෙරුබ්වරුන් දෙදෙනෙකුව
සාදා පියනේ දෙකෙළවරෙහි තැබු-
වේය.[5] **8** පියනේ එක් කෙළවරක
එක කෙරුබ්වරයෙකුද අනික් කෙළව-
රේ අනික් කෙරුබ්වරයාවද තබන
ලදි.[6] **9** ඔවුන් දෙදෙනාව එකිනෙ-
කාට මුහුණ ලා සිටින සේ තැබුවේය.
ඔවුහු තම පියාපත් ඉහළට ඔසවා-
ගෙන පියන දෙසට තම හිස නමා-
ගෙන සිටියෝය.[7] ඔවුන්ගේ පියාපත්
වියනක් සේ විහිදී තිබිණ.[8]
**10** ඔහු ෂිටිම් ලීවලින් මේසයක්[9]
සෑදුවේය. එහි දිග රියන් දෙකක්ද
පළල රියනක්ද උස රියන් එකහමා-
රක්ද විය.[10] **11** මේසය පවිත්‍ර රනින්
ආලේප කර එහි ලෑල්ලේ දාරය
වටා රන් ලියවැලක් සෑදුවේය.[11]
**12** ඉන්පසු මේසය වටා තිබෙන
එම දාරයට අල්ලක පමණ පළලින්
යුත් පටියක් ඇල්ලුවේය. එම පටිය
වටාද නවත් රන් ලියවැලක් සෑදු-
වේය.[12] **13** ඔහු රනින් වළලු හත-
රක් සාදා මේසයේ කකුල් හතරට
සවි කළේය.[13] **14** මේසය පොලුව-
ලින් උසුලාගෙන යෑමට හැකි වන
පිණිස එම වළලු සවි කළේ මේස-
යේ ලියවැල සාදා ඇති පටියට
යටින්ය.[14] **15** මේසය එහා මෙහා
ගෙන යෑම සඳහා ඔහු ෂිටිම් ලීවලින්
පොලු දෙකක් සාදා ඒවා රනින්
ආලේප කළේය.[15] **16** ඔහු මේසය
මත තැබීමට පවිත්‍ර රනින් දීසිද කුස-
ලානද පාත්‍රද පාන පූජා වත් කරන
පිණිස බඳුන්ද සෑදුවේය.[16]
**17** ඉන්පසු ඔහු පවිත්‍ර රත්තරන්
තළා පහන් රුකක්[17] සෑදුවේය. එයට
කඳක්ද අතුද මල්ද පොහොට්ටුද මල්
පෙතිද තිබිණ. ඒ කොටස් සියල්ල
එකිනෙකට සම්බන්ධ වී තිබිණ.[1]
**18** පහන් රුකෙහි අතු හයක්
තිබිණ. එහි කඳෙහි එක් පැත්-
තක අතු තුනක්ද අනික් පැත්-
තේ තවත් අතු තුනක්ද තිබිණ.[2]
**19** ඒ එක් එක් අතුවල ආමන්ඩ්
මල් තුනක්ද ඒ සෑම මලකටම
උඩින් පොහොට්ටුවක්ද සෑම පො-
හොට්ටුවකටම උඩින් මල් පෙතිද
තිබිණ. පහන් රුකෙන් විහිදී ගිය අතු
හයම එලෙස සකස් කර තිබිණ.[3]
**20** පහන් රුකෙහි කඳ කොටසේ
ආමන්ඩ් මල් හතරක්ද තිබිණ. ඒ
සෑම මලකටම උඩින් පොහොට්ටු-
වක්ද සෑම පොහොට්ටුවකටම උඩින්
මල් පෙතිද තිබෙන සේ කඳ සකස්
කර තිබිණ.[4] **21** පහන් රුකෙහි දෙ-
පැත්තට විහිදී යන අතු හය යුගළ
වශයෙන් තිබිණ. අතු යුගළය කඳට
සම්බන්ධ වන සෑම තැනටම යටින්
පොහොට්ටුවක් තිබිණ.[5] **22** මෙ-
ලෙස පහන් රුකෙහි අතු සහ පො-
හොට්ටු කඳට සම්බන්ධ වී තිබිණ.
ඒ සියල්ල පවිත්‍ර රන් කුට්ටියක්
තළා සාදා තිබිණ.[6] **23** ඉන්පසු ඔහු
පහන් රුක මත තැබීමට පහන්
හතක් සෑදුවේය. පහන් තිර අල්ලන
අඬුද දැවී ගිය පහන් තිර දැමී-
මට භාජනද පවිත්‍ර රනින් සෑදුවේය.[7]
**24** පහන් රුකද පහන්ද එහි සියලු
භාජනද සාදනු ලැබුවේ පවිත්‍ර රන්
තලෙන්තයකින්ය.
**25** ඉන්පසු ඔහු සුවඳ ද්‍රව්‍ය[8] ඔප්පු
කරන පිණිස ෂිටිම් ලීවලින් පෙට්ටි-
යක හැඩැති පූජාසනයක්[9] සෑදුවේය.
එහි දිග රියනක්ද පළල රියනක්ද උස
රියන් දෙකක්ද විය. එහි කොන්වල
අං තිබිණ.[10] **26** පූජාසනය පවිත්‍ර
රනින් ආලේප කළේය. එහි උඩ පැත්-
තටද හතර වටේටද එහි අංවලටද
ඔහු රන් ආලේප කළේය. ඉන්පසු
පූජාසනය වටේට රන් පටියක් ඇල්ලු-
වේය.[11] **27** පූජාසනය පොලුවලින්
උසුලාගෙන යෑමට හැකි වන පිණිස
එහි දෙපැත්තෙන් රන් වළලු දෙක

**37 පරි.**
1 නික් 25:13; 2ලේක 5:9
2 නික් 25:14; යොෂු 3:8
3 ලෙවී 16:2; ලෙවී 16:14; 1ලේක 28:11
4 නික් 25:17
5 නික් 25:18; නික් 40:20
6 නික් 25:19
7 1සාමු 4:4; ගීතා 80:1
8 උත් 3:24; නික් 25:20; හෙබ්‍රෙ 9:5
9 නික් 35:13; නික් 40:4
10 නික් 25:23
11 නික් 25:24
12 නික් 25:25
13 නික් 25:26
14 නික් 25:27
15 නික් 25:28
16 නික් 25:29; යෙරෙ 52:19
17 නික් 40:24; ලෙවී 24:4; 2ලේක 13:11

**2 තීරුව**
1 නික් 25:31
2 නික් 25:32
3 නික් 25:33
4 නික් 25:34
5 නික් 25:35
6 නික් 25:36
7 නික් 25:37; නික් 25:38; ගණන් 8:2
8 නික් 30:7; නික් 39:38; ගීතා 141:2; ලූක් 1:10; එළි 8:3
9 නික් 30:1; නික් 40:5
10 නික් 30:2
11 නික් 30:3

බැගින් සවි කළේය. එම වළලු පූජාස-
නය වටේට තිබෙන පටියට යටින්
සවි කළේය.[1] **28** එම වළලු තුළට
යවන පොලු දෙක ඔහු ෂිටිම් ලීවලින්
සෑදුවේය. ඉන්පසු එම පොලු දෙකද
රනින් ආලේප කළේය.[2] **29** ඉන්පසු
ඔහු ශුද්ධ සුගන්ධවත් ද්‍රව්‍යද[3] අභි-
ෂේක කිරීම සඳහා ශුද්ධ තෛලයද[4]
සෑදුවේය. ඒවා දක්ෂ ලෙස තෙල්
සාදන්නෙකු විසින් සාදන ලදි.

**38** දවන පූජා ඔප්පු කිරීම සඳහා
ඔහු ෂිටිම් ලීවලින් පෙට්ටි-
යක හැඩයට පූජාසනයක් සෑදුවේය.
එහි දිග රියන් පහක්ද පළල රියන්
පහක්ද උස රියන් තුනක්ද විය.[5]
**2** පූජාසනයේ කොන් හතර මත අං[6]
හතරක් සෑදුවේය. ඒවා සවි කර
තිබුණේ පූජාසනයට සම්බන්ධ වන
ආකාරයටය. ඉන්පසු මුළු පූජාසන-
යම ඔහු තඹවලින් ආලේප කළේය.[7]
**3** පූජාසනයේ වැඩකටයුතු සඳහා
අවශ්‍ය කරන අළු දැමීමේ භාජනද
සවල්ද බේසම්ද කොකුද අඟුරු දැමී-
මේ භාජනද ඔහු සෑදුවේය. මේ සියලු
භාණ්ඩ ඔහු තඹවලින් සෑදුවේය.[8]
**4** පූජාසනයට සවි කිරීම සඳහා ඔහු
දැලක ආකාරයේ තඹ මැස්සක් සාදා
එය පූජාසනය වටා ඇති පටියට
යටින් රඳවා තැබුවේය.[9] **5** පූජාස-
නය පොලුවලින් උසුලාගෙන යෑමට
හැකි වන පිණිස ඔහු එහි කොන් හත-
රේ තඹ වළලු හතරක් සවි කළේය.
**6** පූජාසනය ඉසිලීම සඳහා ෂිටිම්
ලීවලින් පොලු සාදා ඒවා තඹවලින්
ආලේප කළේය.[10] **7** ඉන්පසු පූජා-
සනය එහා මෙහා ගෙන යන පිණිස
එහි දෙපැත්තේ තිබෙන වළලුවලට
පොලු දැමුවේය.[11] ඔහු පූජාසනය හිස්
පෙට්ටියක හැඩයට ලෑලිවලින් සෑදු-
වේය.[12]

**8** ඔහු තඹවලින් වතුර භාජන-
යක්ද[13] එම භාජනය තැබීමට ආධා-
රකයක්ද සෑදුවේය. සම්මුඛ වීමේ
කූඩාරමට ඇතුල් වන ස්ථානය ළඟ
සේවය කරමින් සිටි ස්ත්‍රීන්[14] දුන්
කැඩපත්වලින්* ඔහු එම භාජනය හා
ආධාරකය සෑදුවේය.

**9** ඉන්පසු ඔහු කූඩාරම සඳහා
මළුවක් සෑදුවේය.[1] නෙගෙබ් වෙ-
තට මුහුණ ලා තිබෙන එම මළුවේ
දකුණු පැත්තෙහි දිග රියන් සිය-
යක් විය. මළුවේ දකුණු පැත්ත
සඳහා ඔහු සිනිඳු ලිනන් රෙදිව-
ලින් තිර සෑදුවේය.[2] **10** එම පැත්ත
සඳහා තඹවලින් කණු විස්සක්ද ඒ
කණු පොළොවේ රඳවන පිණිස තඹ
අඩි විස්සක්ද සෑදුවේය. තිර එල්ලන
පිණිස රිදී ඇණ කණුවල සවි කළේය.
රිදී වළලුද කණුවලට සවි කළේය.[3]
**11** මළුවේ උතුරු පැත්ත සඳහාද ඔහු
එලෙසම කළේය. එම පැත්තේ දිගද
රියන් සියයක් විය. එම පැත්ත සඳහා
ඔහු තඹ කණු විස්සක්ද ඒවා පො-
ළොවේ රඳවා තබන පිණිස තඹ
අඩි විස්සක්ද සෑදුවේය. තිර එල්ලන
පිණිස රිදී ඇණ කණුවල සවි කළේය.
රිදී වළලුද කණුවලට සවි කළේය.[4]
**12** මළුවේ බස්නාහිර පැත්ත සඳහා
ඔහු රියන් පනහක් දිග තිර සෑදුවේය.
ඒවා රඳවා තැබීම සඳහා කණු දහ-
යක්ද එම කණු පොළොවේ රඳවා
තබන පිණිස අඩි දහයක්ද සෑදුවේය.[5]
තිර එල්ලන පිණිස රිදී ඇණ කණුවල
සවි කළේය. රිදී වළලුද කණුවලට
සවි කළේය. **13** මළුවේ නැඟෙන-
හිර පැත්තේ දිග රියන් පනහක් විය.[6]
**14** එම පැත්තේ එක් කෙළවරක කණු
තුනක් හා ඒවා පොළොවේ රඳවා
තබන පිණිස අඩි තුනක් සෑදුවේය.
ඔහු එම කණුවල එල්ලීමට රියන් පහ-
ළවක් දිග තිර සෑදුවේය.[7] **15** එම
පැත්තේ අනික් කෙළවර සඳහාද කණු
තුනක් සෑදූ අතර ඒවා පොළොවේ
රඳවා තබන පිණිස අඩි තුනක්ද සෑදු-
වේය. එම කණුවලද එල්ලීම සඳහා
රියන් පහළවක් දිග තිර සෑදුවේය.[8]
**16** මළුව වටේට තිබෙන කණුවල
එල්ලූ සියලු තිර සිනිඳු ලිනන් රෙදිව-

**37 පරි.**
1 නික් 30:4
2 නික් 30:5
3 නික් 30:35 ගීතා 141:2 එළි 5:8
4 නික් 30:25 නික් 30:33 නික් 40:9 1ලේක 9:30 ගීතා 45:7 හෙබ්‍රෙ 1:9

**38 පරි.**
5 නික් 27:1 නික් 40:10 හෙබ්‍රෙ 13:10
6 නික් 27:2
7 2ලේක 1:5
8 නික් 27:3
9 නික් 27:4
10 නික් 27:6
11 නික් 27:7
12 නික් 27:8
13 නික් 30:18 නික් 31:9 නික් 40:7 ලෙවී 8:11 1රාජා 7:23
14 1සාමු 2:22

**2 තීරුව**
1 නික් 40:8 ගීතා 84:2 ගීතා 92:13
2 නික් 27:9
3 නික් 27:10 ගණන් 3:37
4 නික් 27:11
5 නික් 27:12
6 නික් 27:13
7 නික් 27:14
8 නික් 27:15

**නික් 38:8*** මෙහි සඳහන් කරන්නේ ඔප මට්ටම් කළ ලෝහවලින් සෑදූ කැඩපත් ගැනය.

ලින් සාදන ලදි. **17** මළුව වටේ
තිබෙන කණු පොළොවේ රඳවන
පිණිස තඹ අඩි සාදා තිබිණ. කණුවල
සවි කළ ඇණ හා වළලු සාදා තිබුණේ
රිදීවලිනි. කණුවල මුදුන් රිදීවලින්
ආලේප කර තිබිණ. මළුවේ සෑම
කණුවකම රිදී වළලු තිබිණ.[1]
**18** මළුවේ දොරටුව සඳහා නිල්
පැහැති නූල්වලින්ද රත්නිල් පැහැ-
ගැන්වූ ලොම්වලින්ද තද රතු
පැහැති නූල්වලින්ද සිහින්ව කටින
ලද ලිනන් නූල්වලින්ද තිරයක් වියන
ලදි.[2] තිරයේ දිග රියන් විස්සක් විය.
මළුවේ කණුවල එල්ලා තිබෙන අනි-
කුත් තිර මෙන් මෙම තිරයේ උසද
රියන් පහක් විය.[3] **19** ඒ තිර එල්-
ලීම සඳහා කණු හතරක්ද ඒවා පො-
ළොවේ රඳවා තබන පිණිස අඩි හත-
රක්ද තඹවලින් සාදන ලදි. කණුවල
සවි කළ ඇණ හා වළලු රිදීවලින්
සාදන ලදි. කණුවල මුදුන්ද රිදීවලින්
ආලේප කර තිබිණ. **20** කූඩාරමේ
හා මළුවේ කණු රඳවන කූඤ්ඤ
තඹවලින් සාදන ලදි.[4]
**21** ගිවිසුම් පෙට්ටිය[5] තබා තිබූ
සම්මුඛ වීමේ කූඩාරම තුළ තිබෙන
සියලුම භාණ්ඩ හා භාජන ප්‍රමා-
ණය ගණන් කරන ලෙස මෝසෙස්
අණ කළේය. එය පූජක ආරොන්ගේ
පුත්‍රයා වන ඉතමාර්ගේ[6] අධීක්ෂණය
යටතේ සිදු කෙරිණ. එය ලෙවීවරුන්-
ගේ වගකීමක් විය.[7] **22** මෝසෙස්
ලවා යෙහෝවා දෙවි සෑදීමට අණ
කළ සෑම දෙයක්ම යූදා ගෝත්‍රයට
අයත් හූර්ගේ පුත්‍රයා වන උරීගේ
පුත් බෙසලෙල්[8] සෑදුවේය. **23** දාන්
ගෝත්‍රයට අයත් අහිසාමක්ගේ පුත්‍රයා
වන ඔහොලියාබ්[9] බෙසලෙල්ට උප-
කාර කළේය. ඔහොලියාබ් සෑම
අතින්ම දක්ෂ කර්මාන්තකරුවෙකු
විය. ඔහු නූල්වලින් මෝස්තර මැසු-
වේය. නිල් පැහැති නූල්වලින්, රත්-
නිල් පැහැගැන්වූ ලොම්වලින්, තද
රතු පැහැති නූල්වලින් හා අගනා
ලිනන් නූල්වලින් රෙදි විවීමටද ඔහු
දක්ෂයෙකු විය.

**24** සෙලවීමේ පූජාවක් ලෙස
ගෙනා රන් සියල්ල ශුද්ධස්ථානයේ
සියලු වැඩකටයුතු සඳහා භාවිත කෙ-
රිණ.[1] ඒවායේ බර තලෙන්ත විසිනව-
යක්ද ෂෙකෙල් හත්සිය තිහක්ද විය.
එම ෂෙකෙලයක බර ශුද්ධස්ථානයේ[2]
තිබෙන ෂෙකෙලයේ බරට සමාන
විය.[3] **25** සංගණනයට ඇතුළත් වූ
අය ගෙනා රිදීවල බර තලෙන්ත සිය-
යක් හා ෂෙකෙල් එක්දහස් හත්සිය
හැත්තෑපහක් විය. එම ෂෙකෙලයක
බර ශුද්ධස්ථානයේ තිබෙන ෂෙකෙල-
යේ බරට සමාන විය. **26** සංගණ-
නයට ඇතුළත් වූ අවුරුදු විස්සක්
හෝ ඊට වැඩි සියලුදෙනාගේ ගණන
හයලක්ෂ තුන්දාස් පන්සිය පනහක්
විය.[4] ඔවුහු සියලුදෙනාම ෂෙකෙල්
භාගයක් බැගින් ගෙව්වෝය.[5] ඔවුන්
එම මුදල ගෙව්වේ ශුද්ධස්ථානයේ
තිබෙන ෂෙකෙලයේ බරට සමාන
ෂෙකෙල්වලින්ය.
**27** ශුද්ධස්ථානයේ රාමු සඳහා
සෑදූ අඩිවලට හා එහි තිරය එල්ලා
තැබූ කණු සඳහා සෑදූ අඩිවලට රිදී
තලෙන්ත සියයක් භාවිත කෙරිණ.
එක් අඩියක බර තලෙන්තයක් විය.
අඩි සියයක් තලෙන්ත සියයක් විය.[6]
**28** ෂෙකෙල් එක්දහස් හත්සිය හැත්-
තෑපහකින් ඔහු කණුවල සවි කිරීමට
ඇණ සෑදුවේය. ඔහු කණුවල මුදුන්
ලෝහවලින් ආලේප කර ඒවා වළලු-
වලින් එකිනෙකට සම්බන්ධ කළේය.
**29** සෙලවීමේ පූජාවක් ලෙස
ගෙනා තඹවල බර තලෙන්ත
හැත්තෑවක් හා ෂෙකෙල් දෙදහස්
හාරසියයක් විය. **30** සම්මුඛ වීමේ
කූඩාරමට ඇතුල් වන ස්ථානයේ
කණු සඳහා ඔහු එම තඹවලින් අඩි
සෑදුවේය. පූජාසනයද එහි මැස්සද
එහි සියලු භාණ්ඩද **31** කූඩාරමේ
මළුව වටේ තිබෙන කණු රඳවන අඩිද
මළුවේ දොරටුවේ තිබෙන කණු රඳ-
වන අඩිද කූඩාරමේ කූඤ්ඤද මළුව
වටේට තිබෙන කූඤ්ඤද එම තඹව-
ලින් සෑදුවේය.[7]

**38 පරි.**
1 නික් 27:17
2 නික් 35:6
3 නික් 27:16
4 නික් 27:19
5 නික් 25:16, නික් 31:18, නික් 34:29, ගණන් 17:7
6 නික් 6:23, ගණන් 4:28, 1ලේක 6:3
7 ගණන් 3:6, ගණන් 4:47
8 නික් 31:2, නික් 35:30, නික් 36:1, නික් 37:1, 2ලේක 1:5
9 නික් 31:6, නික් 35:34, නික් 36:2

**2 තීරුව**
1 නික් 35:22
2 ලෙවී 5:15, ලෙවී 27:3
3 නික් 30:13, ගණන් 3:47, ගණන් 18:16
4 නික් 12:37, ගණන් 1:46
5 නික් 30:15
6 නික් 26:19, නික් 26:25, නික් 26:32
7 නික් 27:19

**39** ඔවුහු ශුද්ධස්ථානයේ[1] සේ-
වය කරන අය සඳහා නිල්
පැහැති නූල්වලින්, රත්නිල් පැහැ-
ගැන්වූ ලොම්වලින් හා තද රතු
පැහැති රෙදිවලින්[2] මනා ලෙස වියන
ලද වස්ත්‍ර සැදුවෝය.[3] ඔවුහු ආරොන්
සඳහා ශුද්ධ වස්ත්‍ර[4] සැදුවෝය. යෙ-
හෝවා දෙවි මෝසෙස්ට අණ කළ
ලෙසම ඔවුහු කළෝය.
**2** ඔහු ඒෆොද් හැට්ටය[5] සාදන්න
රත්නිල් පැහැගැන්වූ ලොම්, රන් නූල්,
නිල් පැහැති නූල්, තද රතු පැහැති
නූල් හා සිහින්ව කටින ලද ලිනන්
නූල් භාවිත කළේය. **3** ඔවුහු රත්-
තරන් තුනී තහඩුවක් වන සේ තළා
ඒවායින් කෙඳි කපා, රත්නිල් පැහැ-
ගැන්වූ ලොම්, නිල් පැහැති නූල්,
තද රතු පැහැති නූල් හා ලිනන්
නූල් සමඟ වියා මෝස්තර සහි-
තව ඒෆොද් හැට්ටය මැසුවෝය.[6]
**4** එම හැට්ටය සඳහා උරහිස්පටි දෙ-
කක් සැදුවෝය. ඒ එක් එක් පටියේ
එක් කොනක් උරහිසට සම්බන්ධ
කළෝය. **5** ඒෆොද් හැට්ටය තදින්
බඳින පිණිස ඔවුහු ඉණපටියක්ද සැදු-
වෝය. එම පටිය සෑදීම සඳහාද රන්
නූල්, නිල් පැහැති නූල්, රත්නිල්
පැහැගැන්වූ ලොම්, තද රතු පැහැති
නූල් හා සිහින්ව කටින ලද ලිනන්
නූල් භාවිත කෙරිණ.[7] යෙහෝවා දෙවි
මෝසෙස්ට අණ කළ ලෙසම ඔවුහු
කළෝය.
**6** ඔවුහු ඕනික්ස්[8] ගල් දෙක රත්-
තරන්වල ඔබ්බවා ඊශ්‍රායෙල් ගෝත්‍ර-
වල නම් ඒවා මත කෙටුවෝය.[9] මුද්‍රා
තබන අච්චුවක කෙටූ අකුරු මෙන්
එම නම් කොටන ලදි. **7** ඉන්පසු
ඔහු ඒෆොද් හැට්ටයේ උරහිස් මත
තිබෙන පටි දෙකෙහි එම ගල් දෙක
සවි කළේය. එම ගල් ඊශ්‍රායෙල් සෙ-
නඟට සිහිවටනයක්[10] වන්නේය. යෙ-
හෝවා දෙවි මෝසෙස්ට අණ කළ
ලෙසම ඔහු කළේය. **8** ඔහු ළය-
වැස්මද[11] ඒෆොද් හැට්ටය මෙන් වැඩ
දමා සැදුවේය. ඒ සඳහා ඔහු රන් නූල්,
නිල් පැහැති නූල්, රත්නිල් පැහැ-
ගැන්වූ ලොම්, තද රතු පැහැති
නූල් හා සිහින්ව කටින ලද ලිනන්
නූල් භාවිත කළේය.[1] **9** ළයවැස්ම
හරි හතරැස්ව තිබෙන පිණිස දෙකට
නමන ලදි. එසේ නැමූ විට එහි
දිග වියතක්ද පළල වියතක්ද විය.[2]
**10** ඔවුහු ඒ මත මැණික් ගල් පේළි
හතරක් ඇල්ලුවෝය. පළමුවෙනි පේ-
ළියේ රතු කැට, පඩියන් හා මරකත
ගල් තිබිණ.[3] **11** දෙවෙනි පේළි-
යේ[4] පච්ච ගලක්ද නීල මාණික්‍ය-
යක්ද[5] ජැස්පර්[6] ගලක්ද තිබිණ.
**12** තුන්වෙනි පේළියේ[7] ලෙෂම්*,
අගස්ති හා අමතේස්ත ගල් තිබිණ.
**13** හතරවෙනි පේළියේ[8] ක්‍රිසොල-
යිට් ගලක්ද ඕනික්ස්[9] ගලක්ද ජේඩ්
ගලක්ද තිබිණ. එම ගල් රත්ත-
රන්වල ඔබ්බවා ළයවැස්මට අල්ලා
තිබිණ. **14** ඒ ගල් දොළහ මත
ඊශ්‍රායෙල්ගේ පුත්‍රයන්ගේ නම් දොළහ
කොටන ලදි. එක ගලක් මත එක
නමක් කොටන ලදි. එම නම් කොටා
තිබුණේ ඊශ්‍රායෙල් ගෝත්‍ර දොළහේ
අනුපිළිවෙළටය. මුද්‍රා තබන අච්චුවක
කෙටූ අකුරු මෙන් එම නම්ද කොටා
තිබිණ.[10]
**15** ඉන්පසු ඔවුහු පවිත්‍ර රන් කෙඳි
ලණු මෙන් අඹරා ළයවැස්ම
වටා ඒවා ඇල්ලුවෝය.[11] **16** ඔවුහු
රත්තරන්වල ගල් දෙක ඔබ්බවා,
රන් මුදු දෙකක් සාදා එම රන්
මුදු දෙක ළයවැස්මේ ඉහළ දෙකෙ-
ළවරේ ඇල්ලුවෝය.[12] **17** ඉන්පසු
ඔවුහු රන් ලණු දෙකක් ගෙන ළය-
වැස්මේ තිබෙන මුදු දෙකට ඒවා සම්-
බන්ධ කළෝය.[13] **18** ඉන්පසු එම
රන් ලණුවල අනික් දෙකෙළවර රත්-
තරන්වල ඔබ්බවා තිබෙන ගල් දෙ-
කට සම්බන්ධ කළෝය. ළයවැස්ම
ඒෆොද් හැට්ටයට උඩින් තිබෙන
පිණිස එම ගල් දෙක ඒෆොද් හැට්-
ටයේ උරහිස් මත තිබෙන පටි
දෙකෙහි සවි කළෝය.[14] **19** ඔවුහු
රනින් තවත් මුදු දෙකක්

**39 පරි.**
1 නික් 25:8 ලෙවී 16:2
2 නික් 25:4 නික් 35:23
3 නික් 29:5 නික් 31:10 නික් 35:19
4 නික් 28:4
5 නික් 25:7 නික් 28:6 ලෙවී 8:7
6 නික් 26:1 නික් 36:8
7 නික් 28:8 නික් 29:5 යෙසා 11:5
8 නික් 25:7 නික් 35:9
9 නික් 1:1 නික් 28:9 නික් 28:10
10 නික් 28:12
11 නික් 25:7 ලෙවී 8:8

**2 තීරුව**
1 නික් 28:15
2 නික් 28:16
3 නික් 28:17
4 නික් 28:18
5 යෝබ් 28:6
6 එළි 4:3
7 නික් 28:19
8 නික් 28:20
9 උත් 2:12 1ලේක 29:2
10 නික් 28:21
11 නික් 28:22
12 නික් 28:23
13 නික් 28:24
14 නික් 28:25

නික් **39:12*** නික් 28:19හි පාදසටහන බලන්න.

සාදා ළයවැස්මේ පහළ දෙකෙළව-
රේ ඒවා ඇල්ලුවෝය. ඒවා ළය-
වැස්මේ ඇතුල් පැත්තෙන් අල්ලා
තිබිණ.[1] **20** ඒෆොද් හැට්ටයේ උර-
හිසට සම්බන්ධ කළ පටි දෙක
පිටුපසින්ද ඒෆොද් හැට්ටයට සම්-
බන්ධ කළෝය. එසේ සම්බන්ධ
කළේ ඉණ පටියට ඉහළින්ය. පිටුප-
සින් සම්බන්ධ කළ ඒ තැන් දෙකෙහි
සවි කරන පිණිස ඔවුහු තවත් රන්
මුදු දෙකක් සෑදුවෝය.[2] **21** එම මුදු
දෙක තුළින් නිල් පැහැති ලණුවක්
යවා එය ළයවැස්මේ පහළ කෙළව-
රේ තිබෙන මුදු දෙකට සම්බන්ධ
කළෝය. ළයවැස්ම නොසෙල්වෙන
පිණිසත් ඒෆොද් හැට්ටයේ ඉණ පටි-
යට ඉහළින් ස්ථිරව තිබෙන පිණිසත්
එය බඳින ලදි.[3] යෙහෝවා දෙවි
මෝසෙස්ට අණ කළ ලෙසම ඔවුහු
කළෝය.

**22** ඔහු ඒෆොද් හැට්ටයට යටින්
අඳින අත් නැති වස්ත්‍රය[4] නිල් පැහැති
නූල්වලින් සෑදුවේය. **23** වස්ත්‍රයේ
කර කපා එය වටේට පටියක් ඇල්ලු-
වේය. එය අඳින විට නොඉරෙන
පිණිස යුධ ඇඳුමක කර මෙන් එය
මසන ලදි.[5] **24** ඉන්පසු ඔවුහු නිල්
පැහැති නූල්වලින්, රත්නිල් පැහැ-
ගැන්වූ ලොම්වලින් හා තද රතු
පැහැති නූල්වලින් දෙළුම් ගෙඩි සාදා
වස්ත්‍රයේ වාටිය දිගේ ඒවා ඇල්-
ලුවෝය.[6] **25** පිරිසිදු රනින් සීනුද
සාදා අත් නැති වස්ත්‍රයේ වාටිය දිගේ
ඇල්ලුවෝය. ඒවා දෙළුම් ගෙඩි දෙ-
කක් අතරේ[7] සිටින සේ ඇල්ලුවෝය.
**26** දෙවිට සේවය කරන විට අඳින
අත් නැති වස්ත්‍රයේ වාටිය දිගේ රන්
සීනුවක් හා දෙළුම් ගෙඩියක් මාරු-
වෙන් මාරුවට ඇල්ලුවෝය.[8] යෙ-
හෝවා දෙවි මෝසෙස්ට අණ කළ
ලෙසම ඔවුහු කළෝය.

**27** ඉන්පසු ආරොන් සහ ඔහුගේ
පුත්‍රයන් සඳහා අගනා ලිනන් නූල්ව-
ලින් වස්ත්‍ර වියන ලදි.[9] **28** අගනා
ලිනන් රෙදිවලින් විශේෂ හිස්-
වැස්මක්ද[10] අලංකාර හිස්වැසුම්ද[11]
යට ඇඳුම්ද[1] මහන ලදි. **29** සිහින්ව
කටින ලද ලිනන් නූල්වලින්, නිල්
පැහැති නූල්වලින්, රත්නිල් පැහැ-
ගැන්වූ ලොම්වලින් හා තද රතු
පැහැති නූල්වලින් ඉණ පටියක්ද[2]
වියන ලදි. යෙහෝවා දෙවි මෝ-
සෙස්ට අණ කළ ලෙසම ඔවුහු
කළෝය.

**30** අවසානයේදී ඔවුහු පිරිසිදු
රනින් දිලිසෙන තහඩුව සෑදුවෝය.
එම රන් තහඩුව දෙවිට කැප වූ බවට
ශුද්ධ සංකේතයක් විය. ඉන්පසු, “ශුද්-
ධකමේ උල්පත යෙහෝවා දෙවිය”
යන වචන පෙළ එහි කොටන ලදි.[3]
එම වචන පෙළ මුද්‍රා තබන අච්චුවක
කෙටූ අකුරු මෙන් විය. **31** ඔවුහු
නිල් පැහැති ලණුවකින් එම තහඩුව
විශේෂ හිස්වැස්ම මත බැන්දෝය.[4]
යෙහෝවා දෙවි මෝසෙස්ට අණ කළ
ලෙසම ඔවුහු කළෝය.

**32** මෙසේ ශුද්ධ කූඩාරමේ එනම්,
සම්මුඛ වීමේ කූඩාරමේ සියලු වැඩක-
ටයුතු සම්පූර්ණ කරන ලදි. යෙ-
හෝවා දෙවි මෝසෙස්ට අණ කළ
සියල්ල ඊශ්‍රායෙල් සෙනඟ එලෙසම
කළෝය.[5]

**33** ඔවුහු සම්මුඛ වීමේ කූඩා-
රම[6] එනම්, එහි රෙදි තිරද සියලු
භාණ්ඩ[7] හා මෙවලම්ද මෝසෙස්
ළඟට ගෙනාවෝය. කූඩාරමේ[8] කො-
කුද[9] රාමුද[10] පොලුද[11] කණුද අඩිද[12]
**34** රතු සායම් ඈමූ බැටළු හම්වලින්[13]
සෑදූ ආවරණයද සීල් මත්ස්‍යයන්ගේ
හම්වලින් සෑදූ ආවරණයද[14] ගිවිසුම්
පෙට්ටිය වෙන් කර තබන තිරයද[15]
**35** ගිවිසුම් පෙට්ටියද[16] එහි පියනද[17]
පොලුද[18] **36** මේසය[19] සහ ඒ මත
තබන භාණ්ඩද[20] දෙවිට පුදන රො-
ටිද **37** පවිත්‍ර රනින් සෑදූ පහන්
රුක[21] සහ එහි සියලු මෙවලම්ද[22]
එහි පහන්ද[23] එම පහන් ඇල්වීම
සඳහා තෙල්ද[24] **38** රන් පූජාසන-
යද[25] ශුද්ධ තෛලයද[26] සුගන්ධ-
වත් ද්‍රව්‍යද[27] සම්මුඛ වීමේ කූඩාරමට
ඇතුල් වන ස්ථානය සඳහා තිර-
යද[28] **39** තඹ පූජාසනයද[29] ඇලක

**39 පරි.**
1 නික් 28:26
2 නික් 28:27
3 නික් 28:28
4 නික් 28:31; ලෙවී 8:7; යෙසා 61:10
5 නික් 28:32
6 නික් 28:33
7 2රාජා 25:17
8 නික් 28:34
9 නික් 28:39; ලෙවී 8:7; ලෙවී 8:13; එළි 19:8
10 නික් 28:4; නික් 28:39
11 නික් 28:40; නික් 29:9; ලෙවී 8:13

**2 තීරුව**
1 නික් 28:42; එස 44:18
2 නික් 28:4; නික් 28:39; යෙසා 11:5
3 නික් 28:36; ලෙවී 8:9; සෙක 14:20
4 නික් 28:37
5 නික් 25:40; හෙබ්‍රෙ 8:5
6 නික් 36:8
7 නික් 31:7
8 නික් 36:14
9 නික් 36:18
10 නික් 36:20
11 නික් 36:31
12 නික් 36:24
13 නික් 36:19
14 නික් 26:14
15 නික් 36:35
16 නික් 37:1
17 නික් 37:6
18 නික් 37:4
19 නික් 37:10
20 නික් 37:16
21 නික් 37:17
22 නික් 25:38
23 නික් 37:23
24 නික් 35:28
25 නික් 37:25
26 නික් 37:29
27 නික් 30:35
28 නික් 36:37
29 නික් 38:1

ආකාරයේ තඹ මැස්සද[1] සියලු
භාණ්ඩද[2] පොලුද[3] වතුර භාජන-
යද[4] එම භාජනය තැබීමට ආධාරක-
යද[5] **40** මළුව සඳහා තිරද[6] කණුද[7]
ඒවා රඳවන අඩිද[8] මළුවේ දොරටුව
සඳහා තිරයද[9] මළුව සඳහා ලණුද[10]
කූඤ්ඤද[11] ඔවුහු ගෙනාවෝය. ඔවුහු
ශුද්ධ කූඩාරමේ එනම්, සම්මුඛ වීමේ
කූඩාරමේ සියලු වැඩකටයුතු සඳහා
භාවිත කරන භාණ්ඩද[12] ගෙනාවෝය.
**41** ශුද්ධස්ථානයේ සේවය කරන අය
සඳහා මනා ලෙස වියන ලද නිල වස්-
ත්‍රද[13] පූජක ආරොන්ගේ ශුද්ධ[14] වස්-
ත්‍රද පූජකයන් ලෙස සේවය කරන
ඔහුගේ පුත්‍රයන්ගේ වස්ත්‍රද[15] ඔවුහු
ගෙනාවෝය.

**42** යෙහෝවා දෙවි මෝසෙස්ට
අණ කළ ලෙසම ඊශ්‍රායෙල් සෙ-
නඟ ඒ සියලු දේවල් සෑදූවෝය.[16]
**43** ඔවුන් සාදා තිබූ දේවල් පරීක්ෂා
කර බැලූ විට ඒ සියල්ල යෙහෝවා
දෙවි අණ කළ ලෙසම සාදා තිබෙන
බව මෝසෙස්ට පෙනුණේය. එහෙ-
යින් මෝසෙස් ඔවුන්ට ආශීර්වාද
කළේය.[17]

**40** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. **2** “ඔබ
පළමුවෙනි මාසයේ[18] පළමුවෙනි දින-
යේදී සම්මුඛ වීමේ කූඩාරම
සාදන්න.[19] **3** සම්මුඛ වීමේ කූඩා-
රමේ ගිවිසුම් පෙට්ටිය[20] තැබීමට
නියමිත ස්ථානයේ එය තබා, එම
ස්ථානය නොපෙනෙන පිණිස තිර
රෙද්ද එල්ලන්න.[21] **4** මේසයද[22]
කූඩාරම ඇතුළට ගෙන එහි භාණ්ඩ
පිළිවෙළට සකස් කරන්න. පහන්
රුකද[23] ගෙනැවිත් එහි පහන් දල්වා
තබන්න.[24] **5** සුවඳ ද්‍රව්‍ය[25] ඔප්පු
කරන රන් පූජාසනය ගිවිසුම් පෙට්ටි-
යට සමාන්තරව තබන්න. කූඩාරමට
ඇතුල් වන ස්ථානය සඳහා සෑදූ තිර
රෙද්ද එල්ලන්න.[26]

**6** “දවන පූජා ඔප්පු කරන පූජා-
සනය[27] සම්මුඛ වීමේ කූඩාරමට
ඇතුල් වන ස්ථානය ළඟ තබන්න.
**7** වතුර භාජනය සම්මුඛ වීමේ
කූඩාරම හා පූජාසනය අතරේ තබා
එයට වතුර පුරවන්න.[1] **8** සම්මුඛ
වීමේ කූඩාරම වටේට තිර රෙදි එල්ලා
මළුව සකස් කරගන්න.[2] මළුවේ දො-
රටුව සඳහා සෑදූ තිරයද[3] එල්ලන්න.
**9** ශුද්ධ තෛලයෙන්[4] සම්මුඛ වීමේ
කූඩාරමද එහි සියලු භාණ්ඩ හා මෙව-
ලම්ද[5] කැප කරන්න. මෙසේ ඒ
සියල්ල පරිශුද්ධ දේවල් ලෙස වෙන්
කර තබන්න. මන්ද ඒවා ශුද්ධය.
**10** දවන පූජා ඔප්පු කරන පූජාසන-
යද එහි සියලු භාණ්ඩද තෛලයෙන්
කැප කර පූජාසනය පරිශුද්ධ දෙයක්
ලෙස වෙන් කර තබන්න.[6] මන්ද
පූජාසනය ඉතා ශුද්ධය.[7] **11** වතුර
භාජනයද එම භාජනය තබන ආධා-
රකයද තෛලයෙන් කැප කර ඒවාද
පරිශුද්ධ දේවල් ලෙස වෙන් කර
තබන්න.

**12** “ආරොන්ව සහ ඔහුගේ පුත්‍ර-
යන්ව සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල්
වන ස්ථානය ළඟට කැඳවා ඔවුන්ට
ස්නානය කිරීමට සැලැස්විය යුතුයි.[8]
**13** ඉන්පසු පූජකයෙකු ලෙස මට
පරිශුද්ධ සේවය පිරිනමන පිණිස
ආරොන්ට ශුද්ධ වස්ත්‍ර අන්දවා[9] ඔහුව
අභිෂේක කරන්න.[10] **14** ආරොන්-
ගේ පුත්‍රයන්වද කැඳවා ඔවුන්ට වස්ත්‍ර
අන්දවා,[11] **15** ඔවුන්ගේ පියා මෙන්
ඔවුන්වද අභිෂේක කරන්න.[12] ඉන්පසු
ඔවුන් පූජකයන් ලෙස මට සේවය
කළ යුතුයි. ඔවුන්ව අභිෂේක කිරී-
මෙන් අනතුරුව පරම්පරා ගණනාව-
කට පූජකයන් ලෙස සේවය කිරීමේ
වරප්‍රසාදය ඔවුන්ට හිමි වනු ඇත.
ඔවුන්ගේ සියලු පරම්පරාවලදී එම
වරප්‍රසාදය ඔවුන් සතු වනු ඇත.”[13]

**16** මෝසෙස් යෙහෝවා දෙවි අණ
කළ සියල්ල එලෙසම කළේය.[14]

**17** දෙවෙනි අවුරුද්දේ පළමුවෙනි
මාසයේ පළමුවෙනි දිනයේදී ශුද්ධ
කූඩාරම සාදන ලදි.[15] **18** මෝ-
සෙස් පළමුවෙන් කූඩාරමේ අඩි[16]

**39 පරි.**

**1** නික් 38:4
**2** නික් 38:30
**3** නික් 38:6
**4** නික් 38:8
**5** නික් 30:18
**6** නික් 38:9
**7** නික් 38:10
**8** නික් 38:11
**9** නික් 38:18
**10** නික් 35:18
**11** නික් 38:20
**12** නික් 27:19
**13** නික් 31:10
**14** නික් 28:3
**15** නික් 35:19
**16** නික් 35:10
නික් 36:1
**17** ලෙවී 9:23
ගණන් 6:23
යොෂු 22:6
1රාජා 8:14
2ලේක 30:27

**40 පරි.**

**18** නික් 12:2
නික් 34:18
එස්ත 3:7
**19** ගණන් 7:1
**20** නික් 25:21
**21** ගණන් 4:5
හෙබ්‍රෙ 9:3
හෙබ්‍රෙ 10:20
**22** නික් 26:35
**23** නික් 25:31
හෙබ්‍රෙ 9:2
**24** නික් 25:37
**25** නික් 30:1
ගීතා 141:2
ලූක් 1:10
එළි 5:8
**26** නික් 26:36
නික් 39:38
**27** නික් 38:1
1කොරි 10:18
හෙබ්‍රෙ 13:10

**2 තීරුව**

**1** නික් 30:18
**2** නික් 27:9
**3** නික් 27:16
නික් 38:18
**4** නික් 30:25
හෙබ්‍රෙ 1:9
**5** ලෙවී 8:10
ගණන් 7:1
**6** නික් 29:36
ලෙවී 8:11
**7** නික් 29:37
**8** ලෙවී 8:6
එෆී 5:26
හෙබ්‍රෙ 7:28
**9** නික් 29:5
ලෙවී 8:7
**10** ලෙවී 8:12
ගීතා 133:2
ක්‍රියා 10:38
**11** ලෙවී 8:13
**12** ලෙවී 8:30
2කොරි 1:21

**13** ගණන් 25:13; හෙබ්‍රෙ 7:11; හෙබ්‍රෙ 7:23; **14** නික් 39:43; ද්වි 4:2; **15** ගණන් 7:1; ගණන් 9:15; **16** නික් 36:24.

පොළොවට සවි කර රාමු[1] අඩි මත තබා නියමිත ස්ථානවලට පොලු[2] දැමුවේය. කණුද[3] සිටෙව්වේය. **19** ඉන්පසු ඔහු කූඩාරමට උඩින් දමන රෙද්ද අතුරා[4] ඊට උඩින් කූඩාරමේ අනික් ආවරණය[5] දැමුවේය. යෙහෝවා දෙවි මෝසෙස්ට අණ කළ ලෙසම ඔහු කළේය.

**20** ඉන්පසු මෝසෙස්, දෙවි සාක්ෂියක් පිණිස දුන් ගල් පුවරු දෙක[6] ගිවිසුම් පෙට්ටිය[7] ඇතුළේ තබා පියනෙන්[8] පෙට්ටිය වැසුවේය.[9] ගිවිසුම් පෙට්ටියේ පොලු දෙකද[10] ඔහු වළලු තුළට දැමුවේය. **21** ඉන්පසු ශුද්ධ කූඩාරම තුළට ගිවිසුම් පෙට්ටිය ගෙන ගොස් එම ස්ථානය නොපෙනෙන පිණිස[11] තිර රෙද්ද[12] එල්ලුවේය. යෙහෝවා දෙවි අණ කළ ලෙසම මෝසෙස් කළේය.

**22** ඉන්පසු තිර රෙද්දට අනික් පැත්තෙන් ඔහු මේසය[13] තැබුවේය. මේසය ශුද්ධ කූඩාරමේ උතුරු පැත්තේ තබන ලදි. **23** මෝසෙස් පිදීමේ රොටි[14] යෙහෝවා දෙවි ඉදිරියේ තැබුවේය. යෙහෝවා දෙවි අණ කළ ලෙසම එම රොටි මේසය මත පේළියට තබන ලදි.

**24** ඉන්පසු ඔහු මේසය ඉදිරිපිටින් පහන් රුක[15] තැබුවේය. පහන් රුක කූඩාරමේ දකුණු පැත්තේ තබන ලදි. **25** මෝසෙස් එහි පහන් යෙහෝවා දෙවි ඉදිරියේ දල්වා[16] තැබුවේය. ඔහු යෙහෝවා දෙවි අණ කළ ලෙසම කළේය.

**26** ඊළඟට ඔහු සම්මුඛ වීමේ කූඩාරම ඇතුළේ තිබෙන තිරය ළඟ රන් පූජාසනය[17] තැබුවේය. **27** යෙහෝවා දෙවි අණ කළ ලෙස පූජාසනය මත සුවඳ ද්‍රව්‍ය ඔප්පු කරන පිණිස[18] මෝසෙස් එසේ කළේය.

**28** අවසානයේදී ඔහු සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල් වන ස්ථානය සඳහා සෑදූ තිර රෙද්ද එල්ලුවේය.[19]

**29** ඔහු සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල් වන ස්ථානය ළඟ දවන පූජා ඔප්පු කරන පූජාසනය[20] තැබුවේය. යෙහෝවා දෙවි අණ කළ ලෙස ඒ මත දවන පූජා[1] හා ධාන්‍ය පූජා ඔප්පු කරන පිණිස මෝසෙස් එසේ කළේය.

**30** සම්මුඛ වීමේ කූඩාරම හා පූජාසනය අතරේ ඔහු වතුර භාජනය තබා එයට වතුර පිරෙව්වේය.[2] **31** මෝසෙස්ද ආරොන්ද ආරොන්ගේ පුත්‍රයෝද එයින් තම අත් පා සෝදාගත්තෝය. **32** සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල් වන විටත් පූජාසනය ළඟට යන විටත් යෙහෝවා දෙවි මෝසෙස්ට අණ කළ ලෙස ඔවුහු තම අත් පා සෝදාගත්තෝය.[3]

**33** ඔහු සම්මුඛ වීමේ කූඩාරම හා පූජාසනය වටේට තිර රෙදි එල්ලා මළුව[4] සකස් කළේය. මළුවේ දොරටුව සඳහා සෑදූ තිරයද එල්ලුවේය.[5]

මෙසේ මෝසෙස් ශුද්ධ කූඩාරමේ සියලු වැඩකටයුතු අවසන් කළේය. **34** පසුව සම්මුඛ වීමේ කූඩාරම වලා ටැඹෙන්[6] වැසී ගියේය. යෙහෝවා දෙවිගේ තේජස ශුද්ධ කූඩාරම පුරාම දක්නට ලැබිණ. **35** සම්මුඛ වීමේ කූඩාරමට ඉහළින් වලා ටැඹ[7] තිබූ නිසාත් එය යෙහෝවා දෙවිගේ තේජසින් පිරී[8] තිබූ නිසාත් කූඩාරම ඇතුළට යෑමට මෝසෙස්ට නොහැකි විය.

**36** සම්මුඛ වීමේ කූඩාරමට ඉහළින් තිබූ වලා ටැඹ එතැනින් නැඟී ගිය විට ඊශ්‍රායෙල් සෙනඟ තම කූඩාරම් අකුළාගෙන තමන් සිටි ස්ථානයෙන් පිටත්ව ගියෝය. ඔවුහු තැනින් තැන ගමන් කළ කාලය පුරාමෙ එලෙස කළෝය.[9] **37** නමුත් වලා ටැඹ කූඩාරමට ඉහළින් තිබුණු විට තමන් සිටි ස්ථානයෙන් ඔවුහු පිටත්ව ගියේ නැත. වලා ටැඹ එතැනින් ඉහළට නැඟී යන තෙක් ඔවුහු එතැනම රැඳී සිටියෝය.[10] **38** යෙහෝවා දෙවිගේ වලා ටැඹ දවාලේදී සම්මුඛ වීමේ කූඩාරමට ඉහළින් තිබිණ. රාත්‍රියේදී කූඩාරමට ඉහළින් ගිනි ජාලාවක් තිබිණ. ඊශ්‍රායෙල් සෙනඟ තැනින් තැන ගමන් කළ කාලය පුරාම වලා ටැඹද ගිනි ජාලාවද ඔවුන්ට දක්නට ලැබිණ.[11]

**40 පරි.**
1 නික් 26:15
2 නික් 36:31
3 නික් 35:11
4 නික් 26:7; නික් 36:14
5 නික් 26:14
6 නික් 16:34; නික් 31:18
7 නික් 25:22; නික් 37:1
8 නික් 37:6; 1ලේක 28:11
9 ලෙවී 16:2
10 නික් 37:4; 1රාජා 8:8
11 හෙබ්‍රෙ 9:3; හෙබ්‍රෙ 10:19
12 නික් 36:35; හෙබ්‍රෙ 10:20
13 නික් 37:10; හෙබ්‍රෙ 9:2
14 නික් 25:30; මතෙ 12:4
15 නික් 37:17
16 නික් 25:37; නික් 37:23; ගීතා 119:105
17 නික් 30:1; නික් 37:25
18 නික් 30:7; නික් 30:35
19 නික් 26:36; නික් 36:37
20 නික් 38:1; හෙබ්‍රෙ 13:10

**2 තීරුව**
1 නික් 29:38
2 නික් 30:18; හෙබ්‍රෙ 10:22
3 නික් 30:19
4 නික් 27:9; නික් 38:9
5 නික් 38:18
6 ලෙවී 16:2; ගණන් 9:15; ගණන් 16:42; 1රාජා 8:10; එළි 15:8
7 ගීතා 78:14
8 නික් 29:43; 2ලේක 5:14
9 ගණන් 10:11; නෙහෙ 9:19
10 ගණන් 9:17; ගණන් 9:22
11 නික් 13:21; ගණන් 9:16; ගීතා 78:14

# ලෙවී කතාව

1 යෙහෝවා දෙවි සම්මුඛ වීමේ
කූඩාරමේ[1] සිට මෝසෙස්ව
අමතා මෙසේ කීවේය. 2 "ඊශ්‍රායෙල්
සෙනඟට මෙසේ කියන්න.[2] 'ඔබ
අතරේ සිටින යම් කෙනෙකු යෙහෝවා
දෙවි වන මට පූජාවක් ඔප්පු කරන
පිණිස සතෙකුව ගෙනෙනවා නම් ඔහු
එම සතාව එළු බැටළු රැළෙන් හෝ
ගව රැළෙන් හෝ තෝරාගත යුතුයි.

3 "'ඔහු ගව රැළෙන් දවන පූජා-
වක්[3] ඔප්පු කරනවා නම් ඔහු ගෙනා
යුත්තේ නිකැළැල් පිරිමි සතෙකුවයි.[4]
ඔහු සිය කැමැත්තෙන්ම සම්මුඛ වීමේ
කූඩාරමට ඇතුල් වන ස්ථානයේදී
යෙහෝවා දෙවි වන මා ඉදිරියේ ඌව
ඔප්පු කළ යුතුයි.[5] 4 දවන පූජාව
ලෙස ඔප්පු කරන එම සතාගේ හිස
මත ඔහු අත තැබිය යුතුයි. එවිට ඔහු
ඔප්පු කළ එම පූජාව සතුටින් පිළිගනු
ලබයි.[6] එමගින් ඔහුගේ පාපවලට
සමාව* ලැබෙයි.[7]

5 "'ඉන්පසු යෙහෝවා දෙවි වන
මා ඉදිරියේ වස්සාව මැරිය යුතුයි.
පූජකයන්[8] ලෙස කටයුතු කරන
ආරොන්ගේ පුත්‍රයන් එම ලේ රැගෙන
සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල් වන
ස්ථානයේ තිබෙන පූජාසනයේ සෑම
පැත්තටම ඉසිය යුතුයි.[9] 6 ඉන්පසු
දවන පූජාවට ඔප්පු කළ සතාගේ
හම ඉවත් කර ඌව කැබලිවලට
කැපිය යුතුයි.[10] 7 පූජකයන් වන
ආරොන්ගේ පුත්‍රයන් පූජාසනය මත
ගිනි දල්වා[11] ඊට උඩින් දර ඇති-
රිය යුතුයි.[12] 8 පූජාසනයේ ඇවි-
ළෙන ගින්නට උඩින් ඇතිරූ දර මත
සතාගේ හිස සහ තෙල් කොටස්
ඇතුළුව ඉතුරු කැබලි[13] පිළිවෙළින්
තැබිය යුතුයි. 9 උගේ බඩවැල්[14]
හා පාද* වතුරෙන් සේදිය යුතුයි. පූජ-
කයා ඒ සියල්ල යෙහෝවා දෙවි වන
මට ප්‍රසන්න සුවඳක් ගෙනෙන පිණිස
පූජාසනය මත දැවිය යුතුයි. එය
දවන පූජාවකි.[1]

10 "'යමෙකු බැටළු පැටවෙකු
හෝ එළුවෙකු හෝ දවන පූජාවක්
ලෙස ඔප්පු කරනවා නම්[2] ඔහු ගෙනා
යුත්තේ නිකැළැල්[3] පිරිමි සතෙකු-
වයි.[4] 11 එම සතාව පූජාසනයේ
උතුරු පැත්තට ගෙන ගොස් යෙ-
හෝවා දෙවි වන මා ඉදිරියේ මැරිය
යුතුයි. පූජකයන් වන ආරොන්ගේ
පුත්‍රයන් උගේ ලේ පූජාසනයේ සෑම
පැත්තටම ඉසිය යුතුයි.[5] 12 ඌව
කැබලිවලට කපා පූජකයා උගේ හිස
සහ තෙල් කොටස් ඇතුළුව ඉතුරු
කැබලි පූජාසනයේ ඇවිළෙන ගින්-
නට උඩින් ඇතිරූ දර මත පිළි-
වෙළින් තැබිය යුතුයි.[6] 13 උගේ
බඩවැල් හා පාද වතුරෙන් සේදිය
යුතුයි.[7] පූජකයා ඒ සියල්ල යෙහෝවා
දෙවි වන මට ප්‍රසන්න සුවඳක් ගෙ-
නෙන පිණිස පූජාසනය මත දැවිය
යුතුයි. එය දවන පූජාවකි.[8]

14 "'යමෙකු යෙහෝවා දෙවි වන
මට දවන පූජාවක් ලෙස පක්ෂියෙකු
ඔප්පු කරනවා නම් ඔහු කොබෙයි-
යෙකු[9] හෝ පරෙවි පැටවෙකු[10] හෝ
ගෙනා යුතුයි. 15 පූජකයා ඌව
පූජාසනයට ගෙනැවිත් උගේ බෙල්ල
කඩා[11] පූජාසනය මත දැවිය යුතුයි.
නමුත් උගේ ලේ පූජාසනයේ පැත්ත-
කින් සම්පූර්ණයෙන්ම ගලා යන්න
සැලැස්විය යුතුයි. 16 ඔහු උගේ
පිහාටුද ගොදුරු බොක්කද ඉවත්
කර ඒවා පූජාසනයේ නැඟෙනහිර
පැත්තේ තිබෙන තෙල් මිශ්‍ර අළු
දමන ස්ථානයට විසි කළ යුතුයි.[12]
17 ඉන්පසු ඌව උගේ තටු ළඟින්
පැළිය යුතුයි. නමුත් උගේ තටු
ඇඟෙන් සම්පූර්ණයෙන් වෙන් නො-
කළ යුතුයි.[13] පූජකයා ඌව පූජාසන-
යේ ඇවිළෙන ගින්නට උඩින් ඇතිරූ
දර මත තබා දැවිය යුතුයි. එය

**1 පරි.**
1 නික් 40:34; ගණන් 12:5
2 ලෙවී 22:18
3 ලෙවී 12:6; ගණන් 15:3
4 නික් 12:5; ලෙවී 22:20; ද්වි 15:21; මලා 1:14; හෙබ්‍රෙ 9:14; 1පේත 1:19
5 2කොරි 9:7
6 යෙසා 56:7
7 ගණන් 15:25; රෝම 3:25; 1යොහ 2:2
8 හෙබ්‍රෙ 10:11
9 හෙබ්‍රෙ 9:13; 1පේත 1:2
10 ලෙවී 7:8
11 ලෙවී 6:12
12 උත් 22:9; නෙහෙ 13:31
13 නික් 29:17; ලෙවී 9:13; 1රාජා 18:23
14 ලෙවී 8:21; ලෙවී 9:14

**2 තීරුව**
1 උත් 8:21; නික් 29:18; ගණන් 15:3; එෆී 5:2; පිලි 4:18
2 උත් 4:4
3 ලෙවී 22:20; මලා 1:14; 1පේත 1:19
4 ලෙවී 22:19
5 ලෙවී 9:12; 2ලේක 29:22
6 ලෙවී 9:13; 1රාජා 18:23
7 නික් 29:17; ලෙවී 9:14
8 නික් 29:18; නික් 29:41; ලෙවී 1:9
9 ලූක් 2:24
10 ලෙවී 5:7; ලෙවී 12:8
11 ලෙවී 5:8
12 නික් 27:3; ලෙවී 4:12; ලෙවී 6:10
13 උත් 15:10

---

ලෙවී **1:4*** මූ.අ., "පාපවලට වැස්මක්." **9*** මෙය විශේෂයෙන්ම යොමු දක්වන්නේ පාදයේ පහත කොටසටය.

යෙහෝවා දෙවි වන මට ප්‍රසන්න
සුවඳක්[1] ගෙනෙන පිණිස ඔප්පු කරන
දවන පූජාවකි.[2]

2 “‘යමෙකු යෙහෝවා දෙවි වන
මට ධාන්‍ය පූජාවක්[3] ඔප්පු කර-
නවා නම් ඔහු පූජාව සඳහා සිහින්
පිටි[4] ගෙනා යුතුයි. ඔහු පිටි මත
තෙල් වත් කර ඊට උඩින් කට්-
ටකුමංජල්ද දැමිය යුතුයි. 2 ඔහු
එය පූජකයන් වන ආරොන්ගේ පුත්‍ර-
යන් වෙතට ගෙනා යුතුයි. පූජකයාද
ගෙනා පූජාවෙන් අහුරක් ගත යුතුයි.
සිහින් පිටිද තෙල් ස්වල්පයක්ද කට්-
ටකුමංජල් සියල්ලද ඇතුළත් එම
අහුර දෙවිට සිහිගැන්වීමක්[5] වශ-
යෙන් ඔහු පූජාසනය මත දැවිය
යුතුයි. එය යෙහෝවා දෙවි වන මට
ප්‍රසන්න සුවඳක් ගෙනෙන පිණිස
ගින්නෙන් ඔප්පු කරන ලද පූජාවකි.
3 ධාන්‍ය පූජාවෙන් ඉතුරු වන කො-
ටස ආරොන්ටත් ඔහුගේ පුත්‍රයන්ටත්
අයිතිය.[6] යෙහෝවා දෙවි වන මට
ඔප්පු කරන පූජාවලින් ඉතුරු වන එම
කොටස ඉතා ශුද්ධය.[7]

4 “‘ඔබ උඳුනේ පුලුස්සන ලද
යමක් ධාන්‍ය පූජාවක් වශයෙන් ඔප්පු
කරනවා නම් සිහින් පිටි හා තෙල් මිශ්‍ර
කර සාදාගත් මුද්දක හැඩැති[8] මුහුන්
නොදැමූ රොටි හෝ තෙල් තැවරූ
මුහුන් නොදැමූ[9] සිහින් රොටි හෝ
ගෙනා යුතුයි.[10]

5 “‘ඔබ කබලේ පුලුස්සන[11] ලද
යමක් ධාන්‍ය පූජාවක් වශයෙන් ඔප්පු
කරනවා නම් සිහින් පිටි හා තෙල් මිශ්‍ර
කර සාදාගත් මුහුන් නොදැමූ රොටි
ගෙනා යුතුයි. 6 ඔබ එය කැබලිව-
ලට කඩා ඒ මත තෙල් වත් කළ
යුතුයි.[12] එය ධාන්‍ය පූජාවක් වන්-
නේය.

7 “‘ඔබ තාච්චියේ බදින ලද යමක්
ධාන්‍ය පූජාවක් වශයෙන් ඔප්පු කර-
නවා නම් එය සිහින් පිටිවලින්
හා තෙල්වලින් සාදාගන්න. 8 ඔබ
එලෙස පිළියෙල කරගත් ධාන්‍ය
පූජාව යෙහෝවා දෙවි වන මා වෙ-
තට ගෙනෙන්න. එය පූජකයාට භාර
දෙන්න. පූජකයාද එය පූජාසනය
වෙතට ගෙන යා යුතුයි. 9 පූජ-
කයා ධාන්‍ය පූජාවෙන් කොටසක්
ගෙන දෙවිට සිහිගැන්වීමක්[1] වශ-
යෙන් එය පූජාසනය මත දැවිය
යුතුයි. එය යෙහෝවා දෙවි වන
මට ප්‍රසන්න සුවඳක් ගෙනෙන ගින්-
නෙන් ඔප්පු කරන ලද පූජාවකි.[2]
10 ධාන්‍ය පූජාවෙන් ඉතුරු වන කො-
ටස ආරොන්ටත් ඔහුගේ පුත්‍රයන්ටත්
අයිතිය. යෙහෝවා දෙවි වන මට
ඔප්පු කළ ඒ පූජාවෙන් ඉතුරු වන
කොටස ඉතා ශුද්ධය.[3]

11 “‘ඔබ යෙහෝවා දෙවි වන
මට ගෙනෙන කිසිම ධාන්‍ය පූජාවක්
මුහුන් දමා නොසෑදිය යුතුයි.[4] ඔබ
යෙහෝවා දෙවි වන මට පූජාසනය
මත දැවීම සඳහා මුහුන් හෝ පැණි*
හෝ නොගෙනා යුතුයි.

12 “‘ඔබ යෙහෝවා දෙවි වන
මා වෙතට එවැනි දෙයක් ගෙනා-
වොත් එය ප්‍රථම ඵල[5] පූජාවක් වශ-
යෙන් ඔප්පු කරන්න. නමුත් ප්‍රසන්න
සුවඳක් ගෙනෙන පූජාවක් වශයෙන්
ඒවා පූජාසනය මත නොදැවිය යුතුයි.

13 “‘ඔබ ඔප්පු කරන සෑම ධාන්‍ය
පූජාවකටම ලුණු මිශ්‍ර කළ යුතුයි.[6]
ඔබේ දෙවි වන මා ඔබ සමඟ ඇති
කරගත් ගිවිසුම ඔබට සිහි කරවන
ලුණු,[7] ඔබේ ධාන්‍ය පූජාවලට දැමී-
මට අමතක නොකරන්න. ඔබ ඔප්පු
කරන සෑම පූජාවක් සමඟම ලුණුද
ඔප්පු කරන්න.

14 “‘ඔබ යෙහෝවා දෙවි වන
මට ප්‍රථම පලවලින් ධාන්‍ය පූජාවක්
ඔප්පු කරනවා නම් නැවුම් කරල්ව-
ලින් ධාන්‍ය ගෙන ඒවා බැද පොඩි
කර ගෙනා යුතුයි.[8] 15 ඔබ ඒ මත
තෙල් වත් කර ඊට උඩින් කට්ටකුමං-
ජල්ද දමන්න. එය ධාන්‍ය පූජා-
වක් වන්නේය.[9] 16 පූජකයා පොඩි
කරන ලද ධාන්‍යවලින් හා තෙල්ව-
ලින් ටිකක්ද කට්ටකුමංජල් සියල්ලද

**1 පරි.**
1 ලෙවී 6:21, ගණන් 28:8
2 උත් 8:20, නික් 29:18

**2 පරි.**
3 ලෙවී 6:14, ලෙවී 9:17, ගණන් 15:4
4 නික් 29:2, ගණන් 7:13
5 ලෙවී 6:15, ගණන් 5:26
6 ලෙවී 7:9
7 ලෙවී 10:12, ගණන් 18:9
8 නික් 29:23, ලෙවී 8:26
9 ගණන් 6:19, 1කොරි 5:7
10 නික් 29:2, ලෙවී 7:10, ගණන් 6:15
11 ලෙවී 6:21, ලෙවී 7:9, 1ලේක 23:29
12 ගණන් 28:9

**2 තීරුව**
1 ලෙවී 2:2, ලෙවී 5:12
2 නික් 29:41, ගණන් 28:8
3 ගණන් 18:9, හෙබ්‍රෙ 13:10
4 නික් 12:19, ලෙවී 6:17, මතෙ 16:12, 1කොරි 5:7, ගලා 5:9
5 නික් 23:19, ගණන් 15:20, 2ලේක 31:5, හිතෝ 3:9, 1කොරි 15:20, එළි 14:4
6 එස 43:24
7 ගණන් 18:19, 2ලේක 13:5
8 නික් 23:16, නික් 34:22, ගණන් 28:26
9 යෙරෙ 17:26, යෙරෙ 41:5

ලෙවී **2:11*** මෙහි කතා කරන්නේ පලතුරුවලින් ලබාගත් යුෂ ගැන මිසක මීපැණි ගැන නොවේ.

ගෙන දෙවිට සිහිගැන්වීමක්[1] වශයෙන්
පූජාසනය මත දැවිය යුතුයි. එය යෙ-
හෝවා දෙවි වන මට ගින්නෙන් ඔප්පු
කරන ලද පූජාවකි.

**3** “ ‘යමෙකු හවුල් පූජාවක්[2] ඔප්පු
කරන පිණිස ගව රැළෙන් පිරිමි
සතෙකුව හෝ ගැහැනු සතෙකුව
හෝ ගෙනෙනවා නම් ඔහු යෙහෝවා
දෙවි වන මා ඉදිරියට ගෙනා යුත්-
තේ නිකැළැල්[3] සතෙකුවයි. **2** ඔප්පු
කරන සතාගේ හිස මත ඔහු අත
තැබිය යුතුයි.[4] සම්මුඛ වීමේ කූඩාර-
මට ඇතුල් වන ස්ථානයේදී ඌව
මැරූ පසු පූජකයන් වන ආරොන්-
ගේ පුත්‍රයන් උගේ ලේ පූජාසනයේ
සෑම පැත්තටම ඉසිය යුතුයි. **3** එම
පූජාව ගෙනා තැනැත්තා හවුල් පූජා-
වෙන් කොටසක් යෙහෝවා දෙවි වන
මා ඉදිරියේ ගින්නෙන් ඔප්පු කළ
යුතුයි. සතාගේ තෙල්[5] කොටස් එනම්,
උගේ බඩවැල්[6] වටා ඇති සම්පූර්ණ
තෙල් තට්ටුවද **4** වකුගඩු[7] දෙකද
ඒවා මත තිබෙන තෙල්ද තුනටිය පෙ-
දෙසේ තිබෙන තෙල් තට්ටුවද ඉවතට
ගත යුතුයි. අක්මාව වටා තිබෙන
තෙල්ද වකුගඩු සමඟම ඉවතට ගත
යුතුයි. **5** ආරොන්ගේ පුත්‍රයන්[8] එම
කොටස් පූජාසනය මත දැවිය යුතුයි.[9]
ඒවා පූජාසනයේ ඇවිළෙන ගින්නට
උඩින් ඇතිරූ දර මත[10] තිබෙන
දවන පූජාව සමඟ දැවිය යුතුයි. එය
යෙහෝවා දෙවි වන මට ප්‍රසන්න
සුවඳක්[11] ගෙනෙන පූජාවකි.
**6** “ ‘යමෙකු හවුල් පූජාවක් ඔප්පු
කරන පිණිස එළු බැටළු රැළෙන්
පිරිමි සතෙකුව හෝ ගැහැනු සතෙ-
කුව හෝ ගෙනෙනවා නම් ඔහු
යෙහෝවා දෙවි වන මා ඉදිරියට
ගෙනා යුත්තේ නිකැළැල්[12] සතෙකු-
වයි. **7** පූජාව සඳහා බැටළු පැටවෙ-
කුව ගෙනෙනවා නම් ඔහු යෙහෝවා
දෙවි ඉදිරියේ ඌව ඔප්පු කළ යුතුයි.[13]
**8** ඔප්පු කරන සතාගේ හිස මත ඔහු
අත තැබිය යුතුයි.[14] සම්මුඛ වීමේ
කූඩාරමට ඇතුල් වන ස්ථානයේදී
ඌව මැරූ[15] පසු පූජකයන් වන
ආරොන්ගේ පුත්‍රයන් උගේ ලේ පූජාස-
නයේ සෑම පැත්තටම ඉසිය යුතුයි.
**9** ඔහු හවුල් පූජාවේ තෙල් කොටස්
පූජාසනය මත දවා යෙහෝවා දෙවි
වන මට ඔප්පු කළ යුතුයි.[1] තෙ-
ලින් පිරුණු උගේ මුළු වලිගයම[2]
කොඳු ඇට පෙළ ළඟින් ඉවත් කළ
යුතුයි. සතාගේ අනිකුත් තෙල් කො-
ටස් එනම්, උගේ බඩවැල් වටා ඇති
සම්පූර්ණ තෙල් තට්ටුවද[3] **10** වකු-
ගඩු දෙකද ඒවා මත තිබෙන තෙල්ද
තුනටිය පෙදෙසේ තිබෙන තෙල්
තට්ටුවද ඉවතට ගත යුතුයි. අක්මාව
වටා තිබෙන තෙල්ද[4] වකුගඩු සමඟම
ඔහු ඉවතට ගත යුතුයි. **11** පූජ-
කයා ඒ සියල්ල ආහාරයක්[5] ලෙස
පූජාසනය මත දැවිය යුතුයි.[6] එය
යෙහෝවා දෙවි වන මට ගින්නෙන්
ඔප්පු කරන ලද පූජාවකි.
**12** “ ‘යමෙකු පූජාව සඳහා එළුවෙ-
කුව[7] ගෙනෙනවා නම් ඔහු යෙහෝවා
දෙවි වන මා ඉදිරියේ ඌව ඔප්පු
කළ යුතුයි. **13** ඔප්පු කරන සතා-
ගේ හිස මත ඔහු අත තැබිය යුතුයි.[8]
සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල් වන
ස්ථානයේදී ඌව මැරූ[9] පසු පූජකයන්
වන ආරොන්ගේ පුත්‍රයන් උගේ ලේ
පූජාසනයේ සෑම පැත්තටම ඉසිය
යුතුයි. **14** ඔහු එම පූජාවෙන් කො-
ටසක් යෙහෝවා දෙවි වන මා ඉදිරි-
යේ ගින්නෙන් ඔප්පු කළ යුතුයි.
සතාගේ තෙල් කොටස් එනම්, උගේ
බඩවැල් වටා ඇති සම්පූර්ණ තෙල්
තට්ටුවද[10] **15** වකුගඩු දෙකද ඒවා
මත තිබෙන තෙල්ද තුනටිය පෙදෙ-
සේ තිබෙන තෙල් තට්ටුවද ඉවතට
ගත යුතුයි. අක්මාව වටා තිබෙන
තෙල්ද වකුගඩු සමඟම ඔහු ඉව-
තට ගත යුතුයි. **16** පූජකයා ඒ
සියල්ල ආහාරයක් ලෙස පූජාසනය
මත දැවිය යුතුයි. එය මට ප්‍රසන්න
සුවඳක් ගෙනෙන පූජාවකි. සියලුම
තෙල් කොටස් අයිති යෙහෝවා දෙවි
වන මටය.[11]
**17** “ ‘ඔබ තෙලවත් ලෙයවත්[12]
කිසිසේත් නොකෑ යුතුයි. ඔබ කො-

**2 පරි.**
1 නික් 29:25
ලෙවී 5:12

**3 පරි.**
2 ලෙවී 22:21
3 ගණන් 6:14
4 නික් 29:10
ලෙවී 8:18
5 නික් 29:13
ලෙවී 7:23
ලෙවී 7:30
1රාජා 8:64
එස 44:15
6 ලෙවී 1:13
7 ලෙවී 3:15
ලෙවී 7:4
ලෙවී 8:16
8 ගණන් 3:2
මලා 2:4
9 ලෙවී 1:9
ලෙවී 7:31
ලෙවී 9:10
10 ලෙවී 6:12
11 ලෙවී 1:17
ලෙවී 4:31
එෆී 5:2
12 නික් 12:5
ගණන් 6:14
2කොරි 5:21
හෙබ්‍රෙ 7:26
1පේත 1:19
13 හෙබ්‍රෙ 9:14
14 ලෙවී 4:4
15 ලෙවී 4:15

**2 තීරුව**
1 2ලේක 7:7
2 නික් 29:22
ලෙවී 9:19
3 ලෙවී 3:3
4 ලෙවී 4:9
ලෙවී 9:10
5 ලෙවී 21:6
6 ලෙවී 3:5
ලෙවී 4:31
7 ලෙවී 9:3
ලෙවී 22:19
8 නික් 29:10
ලෙවී 3:2
9 නික් 29:11
ලෙවී 3:8
ලෙවී 14:13
10 ලෙවී 3:3
ලෙවී 3:9
ලෙවී 4:26
ගීතා 20:3
11 ලෙවී 7:23
1සාමු 2:16
12 උත් 9:4
ලෙවී 17:10
ලෙවී 17:13
ද්වි 12:23
එස 44:7
ක්‍රියා 15:20

තැනක ජීවත් වුවත් එම පනත
ඔබටත් ඔබෙන් පැවත එන සියල්-
ලන්ටත් බොහෝ කාලයක් පුරා
වලංගු වනු ඇත.’ ”

4 යෙහෝවා දෙවි තවදුරටත් මෝ-
සෙස්ට මෙසේ කීවේය. 2 “ඊශ්‍රා-
යෙල් සෙනඟට මෙසේ කියන්න.
‘යමෙකු නොදැනුවත්වම[1] යෙහෝවා
දෙවි වන මාගේ ආඥාවක් කඩ කර පව්
කළොත් ඔහු කළ යුතු දේ මෙයයි.
3 “‘අභිෂේක[2] ලත් පූජකයා පව්[3]
කළොත් ඔහු කළ වරද මුළු සෙනඟ
පිටට පැමිණෙයි. ඔහු තමා කළ
පාපය[4] වෙනුවෙන් නිකැළැල් වස්සෙ-
කුව යෙහෝවා දෙවි වන මා වෙතට
ගෙනා යුතුයි. එය පාප පූජාවක් වන්-
නේය. 4 ඔහු යෙහෝවා දෙවි වන
මා ඉදිරියට එනම්, සම්මුඛ වීමේ
කූඩාරමට ඇතුල් වන ස්ථානයට
වස්සාව ගෙනා යුතුයි.[5] ඉන්පසු ඔහු
උගේ හිස මත අත තබා[6] යෙහෝවා
දෙවි වන මා ඉදිරියේ ඌව මැරිය
යුතුයි. 5 අභිෂේක ලත් පූජකයා[7]
වස්සාගේ ලෙයින් ටිකක් ගෙන එය
සම්මුඛ වීමේ කූඩාරම ඇතුළට ගෙන
යා යුතුයි. 6 පූජකයා තම ඇඟිල්ල[8]
ලේවල ගිල්වා ශුද්ධස්ථානයේ තිරය
ඉදිරියට ගොස් යෙහෝවා දෙවි වන
මා ඉදිරියේ එය ඉසිය යුතුයි. ඔහු හත්
වරක්[9] එලෙස කළ යුතුයි. 7 පූජ-
කයා සම්මුඛ වීමේ කූඩාරම ඇතුළේ,
යෙහෝවා දෙවි වන මා ඉදිරියේ
තිබෙන සුවඳ දුම් ඔප්පු කරන පූජාස-
නයේ අං[10] මතද ලේ ස්වල්පයක්
තැවරිය යුතුයි. වස්සාගේ ඉතුරු ලේ
ටික සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල්
වන ස්ථානයේ තිබෙන දවන පූජා
ඔප්පු කරන පූජාසනයේ පාමුල[11] වත්
කළ යුතුයි.
8 “‘පාප පූජාව සඳහා ඔප්පු කරන
වස්සාගේ සියලු තෙල් කොටස් ඔහු
ඉවතට ගත යුතුයි. උගේ බඩවැල්
වටා ඇති සම්පූර්ණ තෙල් තට්ටුවද[12]
9 වකුගඩු දෙකද ඒවා මත තිබෙන
තෙල්ද තුනටිය පෙදෙසේ තිබෙන
තෙල් තට්ටුවද ඉවතට ගත යුතුයි.

4 පරි.
1 ලෙවී 5:17
ගණන් 15:28
ගීතා 119:67
ගලා 6:1
යාකො 2:10
2 ලෙවී 8:12
ලෙවී 21:10
ලූක් 4:18
හෙබ්‍රෙ 1:9
3 ගණන් 12:1
හෙබ්‍රෙ 4:15
හෙබ්‍රෙ 7:26
4 හෙබ්‍රෙ 5:3
හෙබ්‍රෙ 7:27
5 ලෙවී 1:3
ලෙවී 6:25
6 නික් 29:10
ලෙවී 1:4
7 නික් 29:29
නික් 30:30
8 ලෙවී 8:15
ලෙවී 16:19
9 ලෙවී 16:14
10 නික් 30:10
11 ලෙවී 5:9
12 ලෙවී 4:19
ලෙවී 4:26

2 තීරුව
1 ලෙවී 3:4
ලෙවී 9:10
2 ලෙවී 3:3
3 ලෙවී 4:26
ගීතා 20:3
හෙබ්‍රෙ 10:8
4 නික් 29:14
ගණන් 19:5
5 ගණන් 5:3
හෙබ්‍රෙ 13:11
6 ලෙවී 6:11
7 ලෙවී 8:17
8 යොෂු 7:11
හිතෝ 14:34
9 නික් 32:30
ගණන් 15:24
10 දේශ 12:14
1තිමෝ 5:24
11 නික් 29:10
ලෙවී 1:4
ලෙවී 3:2
ලෙවී 16:21
මතෙ 8:17
හෙබ්‍රෙ 9:28
1පේතෘ 2:24
12 නික් 40:15
13 ලෙවී 4:5
14 නික් 26:31
නික් 40:21
හෙබ්‍රෙ 10:20
15 නික් 30:1
නික් 30:6

අක්මාව වටා තිබෙන තෙල්ද වකු-
ගඩු සමඟම ඉවතට ගත යුතුයි.[1]
10 හවුල් පූජාව[2] සඳහා ඔප්පු කරන
ගවයාගේ තෙල් කොටස් ඉවතට ගත්
ආකාරයටම මෙම සතාගේ තෙල්
කොටස්ද ඉවතට ගත යුතුයි. ඉන්පසු
පූජකයා එම කොටස් දවන පූජා ඔප්පු
කරන පූජාසනය මත දැවිය යුතුයි.[3]
11 “‘වස්සාගේ හම, මාංසය, උගේ
හිස, පාද, බඩවැල් සහ ගොම[4]
12 යන ඒ සෑම කොටසක්ම ඔහු කඳ-
වුරෙන් පිටත[5] පවිත්‍ර තැනකට ගෙන
යා යුතුයි. තෙල් මිශ්‍ර අළු[6] දමන ස්ථා-
නයට ඒ කොටස් ගෙන ගොස් දර මත
දැවිය යුතුයි.[7] එම සතාගේ කොටස්
දැවිය යුත්තේ තෙල් මිශ්‍ර අළු දමන
ස්ථානයේදීය.
13 “‘මුළු ඊශ්‍රායෙල් සෙනඟ යෙ-
හෝවා දෙවි වන මාගේ ආඥාවක්
කඩ කළොත් එය නොදැනුවත්ක-
මින්[8] කළත් මා ඉදිරියේ ඔවුහු වරද-
කරුවෝ වෙති.[9] 14 තමන් වරදක්
කළ බව දැනගන්න ලැබුණු පසු[10] මුළු
සෙනඟම සම්මුඛ වීමේ කූඩාරම ඉදි-
රියට පාප පූජාවක් ලෙස වස්සෙකුව
ගෙනා යුතුයි. 15 සෙනඟ අතරේ
සිටින වැඩිමහල්ලන් යෙහෝවා දෙවි
වන මා ඉදිරියේ වස්සාගේ හිස මත
තම අත් තැබිය යුතුයි.[11] ඉන්පසු යෙ-
හෝවා දෙවි වන මා ඉදිරියේ ඌව
මැරිය යුතුයි.
16 “‘අභිෂේක ලත් පූජකයා[12] වස්-
සාගේ ලෙයින් ස්වල්පයක් සම්මුඛ
වීමේ කූඩාරම ඇතුළට ගෙන යා
යුතුයි.[13] 17 පූජකයා තම ඇඟිල්ල
ලේවල ගිල්වා ශුද්ධස්ථානයේ තිරය[14]
ඉදිරියට ගොස් යෙහෝවා දෙවි වන
මා ඉදිරියේ එය ඉසිය යුතුයි. ඔහු හත්
වරක් එලෙස කළ යුතුයි. 18 පූජ-
කයා සම්මුඛ වීමේ කූඩාරම ඇතුළේ,
යෙහෝවා දෙවි වන මා ඉදිරියේ
තිබෙන පූජාසනයේ[15] අං මතද ලේ
ස්වල්පයක් තැවරිය යුතුයි. වස්සාගේ
ඉතුරු ලේ ටික සම්මුඛ වීමේ කූඩා-
රමට ඇතුල් වන තැන තිබෙන
දවන පූජා ඔප්පු කරන පූජාසනයේ

පාමුලට වත් කළ යුතුයි.[1] **19** උගේ
සියලු තෙල් කොටස් ඉවතට ගෙන
පූජාසනය මත ඒවා දැවිය යුතුයි.[2]
**20** පාප පූජාව සඳහා ඔප්පු කළ ගව-
යාට සිදු කළ ලෙසම මෙම සතාටද
සිදු කළ යුතුයි. සෙනඟ කළ පාපයට
සමාව[3] ලබාගන්නා පිණිස පූජකයා
එසේ කළ යුතුයි. එවිට ඔවුන්ට
සමාව ලැබෙයි. **21** ඔහු වස්සාගේ
ඉතුරු කොටස් කඳවුරෙන් පිටතට
ගෙන ගොස් කලින් සතාව[4] පිලිස්සූ
ලෙසම ඌවද පිලිස්සිය යුතුයි. එය
සෙනඟ වෙනුවෙන් කරන පාප පූජා-
වකි.[5]

**22** "'අධිපතියෙකු[6] යෙහෝවා
දෙවි වන මාගේ ආඥාවක් කඩ කර
පව් කළොත් එය නොදැනුවත්කමින්
කළත්[7] ඔහු මා ඉදිරියේ වරදකරු-
වෙක් වෙයි. **23** ඔහු කළ පාපය
ඔහුට කියා දුන් විට[8] ඔහු නිකැළැල්
එළු පැටවෙකුව[9] පූජාවක් ලෙස ගෙනා
යුතුයි. **24** ඔහු එළු පැටවාගේ හිස
මත අත තැබිය යුතුයි.[10] ඉන්පසු
දවන පූජා සඳහා සතුන්ව මරන ස්ථා-
නයේ යෙහෝවා දෙවි වන මා ඉදිරියේ
ඌව මැරිය යුතුයි.[11] එය පාප පූජා-
වකි.[12] **25** පූජකයා පාප පූජාවේ ලේ
ස්වල්පයක් ඇඟිල්ලට ගෙන දවන
පූජා ඔප්පු කරන පූජාසනයේ අං[13]
මත තැවරිය යුතුයි. එළු පැටවා-
ගේ ඉතුරු ලේ ටික දවන පූජා
ඔප්පු කරන පූජාසනයේ පාමුලට වත්
කළ යුතුයි. **26** හවුල් පූජාවේ තෙල්
කොටස් පිලිස්සූ ලෙසම මෙම සතා-
ගේ තෙල් කොටස් සියල්ලද පූජාස-
නය මත දැවිය යුතුයි.[14] ඔහු කළ
පාපයට සමාව ලබාගන්නා පිණිස
පූජකයා එසේ කළ යුතුයි.[15] එවිට
ඔහුට සමාව ලැබෙයි.

**27** "'සාමාන්‍ය මනුෂ්‍යයෙකු යෙ-
හෝවා දෙවි වන මාගේ ආඥාවක් කඩ
කර පව් කළොත් එය නොදැනුවත්ක-
මින් කළත් දෙවි ඉදිරියේ ඔහු වරදක-
රුවෙක් වෙයි.[16] **28** ඔහු කළ පාපය
ඔහුට කියා දුන් විට ඔහු තමා කළ
පාපය වෙනුවෙන් නිකැළැල් එළු-

**4 පරි.**
**1** නික් 27:1; නික් 40:6; ලෙවී 4:7
**2** ලෙවී 3:16
**3** නික් 32:30; ලෙවී 12:8; ලෙවී 16:17; ගණන් 15:25; එෆී 1:7; 1තිමෝ 2:5; හෙබ්‍රෙ 2:17
**4** ලෙවී 4:12
**5** ලෙවී 16:15; මතෙ 20:28; යොහ 1:29; 1යොහ 2:2
**6** නික් 18:21; ගණන් 16:2; ගණන් 34:18; යොෂු 22:14; 2සාමු 24:10
**7** ලෙවී 5:4; ලෙවී 5:17; ලෙවී 6:2
**8** 2සාමු 12:13
**9** ලෙවී 23:19; ගණන් 15:24; ගණන් 28:15; ගණන් 29:5
**10** ලෙවී 1:4; ලෙවී 4:4; හිතෝ 28:13; යෙසා 53:6
**11** ලෙවී 1:11; ලෙවී 3:2; ලෙවී 6:25; ලෙවී 7:2
**12** ලෙවී 4:3
**13** ලෙවී 8:15; ලෙවී 9:9; ලෙවී 16:18; හෙබ්‍රෙ 9:22
**14** ලෙවී 3:5
**15** නික් 32:30; ගණන් 15:28
**16** නික් 12:49; ගණන් 5:6; ගණන් 15:29

**2 තීරුව**
**1** ලෙවී 5:6
**2** ලෙවී 1:4; ලෙවී 3:2; ලෙවී 4:4; ලෙවී 16:21; හිතෝ 28:13; යෙසා 53:6; මතෙ 8:17; 1පේත 2:24
**3** ලෙවී 1:11; ලෙවී 6:25
**4** ලෙවී 4:25
**5** ලෙවී 8:15; ලෙවී 9:9; හෙබ්‍රෙ 9:22
**6** ලෙවී 3:16; ලෙවී 4:8
**7** ලෙවී 3:3

දෙනක[1] ගෙනා යුතුයි. එය පාප
පූජාවක් වන්නේය. **29** පාප පූජාව
සඳහා ඔප්පු කරන සතාගේ හිස මත
ඔහු අත තැබිය යුතුයි.[2] ඉන්පසු දවන
පූජා සඳහා සතුන්ව මරන ස්ථාන-
යේදී ඌව මැරිය යුතුයි.[3] **30** පූජ-
කයා උගේ ලේ ස්වල්පයක් ඇඟිල්ලට
ගෙන දවන පූජා ඔප්පු කරන පූජාස-
නයේ අං[4] මත තැවරිය යුතුයි. එළුදෙ-
නගේ ඉතුරු ලේ ටික දවන පූජා
ඔප්පු කරන පූජාසනයේ පාමුලට වත්
කළ යුතුයි.[5] **31** හවුල් පූජාව සඳහා
ඔප්පු කළ සතාගේ තෙල්[6] කොටස්
සියල්ල ඉවතට ගත් ආකාරයටම
මෙම සතාගේ තෙල් කොටස් සියල්-
ලද ඉවතට ගත යුතුයි.[7] යෙහෝවා
දෙවි වන මට ප්‍රසන්න සුවඳක් ගෙ-
නෙන පිණිස පූජකයා ඒවා පූජාසනය
මත දැවිය යුතුයි.[8] ඔහු කළ පාපයට
සමාව ලබාගන්නා පිණිස පූජකයා
එසේ කළ යුතුයි. එවිට ඔහුට සමාව
ලැබෙයි.[9]

**32** "'ඔහු තම පාප පූජාව සඳහා
බැටළු පැටවෙකු[10] ගෙනෙනවා නම්
නිකැළැල්[11] ගැහැනු සතෙකුව ගෙනා
යුතුයි. **33** ඔහු පාප පූජාව සඳහා
ගෙනා සතාගේ හිස මත තම අත
තැබිය යුතුයි. ඉන්පසු දවන පූජා
සඳහා සතුන්ව මරන ස්ථානයේදී
ඌව මැරිය යුතුයි.[12] එය පාප පූජා-
වකි. **34** පූජකයා පාප පූජාව සඳහා
ඔප්පු කළ සතාගේ ලේ ස්වල්පයක්
ඇඟිල්ලට ගෙන දවන පූජා ඔප්පු
කරන පූජාසනයේ අං මත තැවරිය
යුතුයි.[13] බැටළු පැටවාගේ ඉතුරු ලේ
ටික දවන පූජා ඔප්පු කරන පූජාස-
නයේ පාමුලට වත් කළ යුතුයි.
**35** පූජකයා හවුල් පූජාව සඳහා ඔප්පු
කළ බැටළු පැටවාගේ තෙල් කොටස්
ඉවතට ගත් ආකාරයටම මෙම සතා-
ගේ සියලු තෙල් කොටස්ද ඉව-
තට ගෙන යෙහෝවා දෙවි වන මට

**8** නික් 29:18; ලෙවී 1:9; ලෙවී 3:5; ලෙවී 8:21; එස්රා 6:10; **9** ලෙවී 4:26; හොෂෙ 14:2; **10** යෙසා 53:7; යොහ 1:29; හෙබ්‍රෙ 9:14; 1පේත 1:19; **11** ලෙවී 3:6; හෙබ්‍රෙ 7:26; හෙබ්‍රෙ 9:14; 1පේත 2:22; **12** ලෙවී 1:11; ලෙවී 4:4; **13** ලෙවී 4:25; ලෙවී 16:18.

ඔප්පු කළ අනික් පූජා සමඟ ඒවාද
දැවිය යුතුයි.[1] ඔහු කළ පාපයට
සමාව[2] ලබාගන්නා පිණිස පූජකයා
එසේ කළ යුතුයි. එවිට ඔහුට සමාව
ලැබෙයි.[3]

5 "'යමෙකු යම් වරදකට[4] අදාළ
වන දෙයක් දැක ඇත්නම් හෝ
දැන සිටිනවා නම් හෝ ඔහු එම වර-
දට සාක්ෂිකරුවෙකි. ඒ ගැන සාක්ෂි
දරන්න කියා ප්‍රසිද්ධ නිවේදනයක්*
දුන් පසුවත් ඔහු ඒ ගැන සාක්ෂි නොදී
සිටියොත්[5] එය පාපයකි. ඔහු තම
වරදට වග කිව යුතුයි.
2 "'යමෙකු අපවිත්‍රයයි සැලකෙන
වනමෘගයෙකුගේ හෝ හීලෑ සතෙකු-
ගේ හෝ කුඩා සතෙකුගේ හෝ මළ
කඳක් ස්පර්ශ කළොත්[6] ඔහු අපවි-
ත්‍රය. ඒ නිසා ඔහු වරදකරුවෙක්
වන්නේය.[7] 3 යමෙකු මිනිසෙකුව
අපවිත්‍ර කළ හැකි ඕනෑම දෙයක්[8]
එනම්, අපවිත්‍ර මිනිසෙකු හෝ අපවිත්‍ර
යමක් ස්පර්ශ කළොත් ඔහු එය
නොදැනුවත්කමින් කළත් ඒ ගැන
දැනගත් පසු ඔහු වරදකරුවෙක් වන්-
නේය.
4 "'යමෙකු දුර දිග නොබලා නපු-
රක්[9] හෝ යහපතක් හෝ කරන බවට
දිවුරුමක්[10] දුන් විට ඔහු වරදකරු-
වෙක් වන්නේය. එම දිවුරුම දෙන
අවස්ථාවේදී එහි බැරෑරුම්කම ගැන
ඔහු නොදැන සිටියත් ඔහු වරදකරු-
වෙක් වන්නේය.[11]
5 "'යමෙකු ඉහත කී එක් කාරණා-
යක් සම්බන්ධයෙන් හෝ වරදකරු-
වෙකු වේ නම් ඔහු තමා කළ පාපය
හෙළි[12] කළ යුතුයි. 6 ඔහු තමා
කළ පාපයට වන්දියක් වශයෙන් යෙ-
හෝවා දෙවි වන මට පූජාවක් ඔප්පු
කළ යුතුයි. එය වන්දි පූජාවකි.[13] ඔහු
පූජාව සඳහා රැළෙන් බැටළු පැටවෙ-
කුව හෝ එළු පැටවෙකුව හෝ ගෙනා

ලෙවී **5:1*** මූ.අ., "ප්‍රසිද්ධ ශාපයක්." මෙහි සඳහන් ප්‍රසිද්ධ නිවේදනයට ශාපයක්ද ඇතුළත් විය. එම ශාපය ප්‍රකාශ කළේ වරදකරුට හෝ එම වරද ගැන සාක්ෂි තිබියදීත් ඒ ගැන කිසිවක් නොකියූ තැනැත්තාට විරුද්ධව විය හැකියි.

**4 පරි.**
**1** නික් 29:13
ලෙවී 3:3
ලෙවී 6:12
ලෙවී 9:10
**2** ලෙවී 1:4
ලෙවී 4:26
ලෙවී 4:31
ලෙවී 6:7
ලෙවී 16:30
ගණන් 15:28
කොලො 1:14
1යොහ 2:2
**3** 1යොහ 1:7

**5 පරි.**
**4** හිතෝ 29:24
**5** උත් 37:2
1සාමු 2:24
එස්ත 6:2
හිතෝ 29:24
1කොරි 1:11
1කොරි 5:1
**6** ලෙවී 11:24
ලෙවී 17:15
ලෙවී 21:1
ගණන් 19:11
ද්වි 14:8
ගීතා 19:12
**7** ලෙවී 4:13
**8** ලෙවී 12:2
ලෙවී 13:3
ලෙවී 15:3
ගණන් 19:11
**9** මලා 3:5
**10** විනි 21:7
1සාමු 14:24
මතෙ 5:33
මාක් 6:23
**11** යාකො 3:8
1පේත්‍ර 3:10
**12** ලෙවී 26:40
ගණන් 5:7
යොෂු 7:19
එස්රා 10:11
ගීතා 32:5
හිතෝ 28:13
1යොහ 1:9
**13** ලෙවී 7:1
ලෙවී 14:12
ලෙවී 19:21
ගණන් 6:12

**2 තීරුව**
**1** ලෙවී 4:28
**2** ලෙවී 4:20
යොහ 1:29
1තිමෝ 2:5
හෙබ්‍රෙ 9:14
1යොහ 4:10
**3** ලෙවී 12:8
ලෙවී 14:21
2කොරි 8:12
යාකො 2:5
**4** ලෙවී 1:14
ලෙවී 15:14
**5** ලෙවී 14:22
ලූක් 2:24
**6** ලෙවී 1:15

යුතුයි. ඔහු එම පාප පූජාව සඳහා
ගෙනා යුත්තේ ගැහැනු සතෙකි.[1]
ඔහු කළ පාපයට සමාව ලබාගන්නා
පිණිස පූජකයා ඔහු ගෙනා පූජාව
ඔප්පු කළ යුතුයි.[2]
7 "'ඔහුට බැටළුවෙකු ගෙන ඒමට
තරම් වත්කමක් නැත්නම්[3] තමා කළ
පාපය වෙනුවෙන් වන්දි පූජාවක් ලෙස
යෙහෝවා දෙවි වන මට කොබෙයි-
යන් දෙදෙනෙකුව[4] හෝ පරෙවි පැට-
වුන් දෙදෙනෙකුව හෝ ගෙනා යුතුයි.
ඉන් එක් කුරුල්ලෙකු පාප පූජාව සඳ-
හාය.[5] අනික් කුරුල්ලා දවන පූජාව
සඳහාය. 8 ඔහු කුරුල්ලන් දෙදෙ-
නාව පූජකයා වෙත ගෙනා යුතුයි.
පූජකයා මුලින්ම ඔප්පු කළ යුත්තේ
පාප පූජාව සඳහා ගෙනා කුරුල්ලා-
වය. ඔහු උගේ බෙල්ල කැඩිය[6]
යුතුයි. නමුත් එසේ කළ යුත්තේ
බෙල්ල කඳෙන් වෙන් නොවන ආකා-
රයටය. 9 ඔහු පාප පූජාව සඳහා
ඔප්පු කරන කුරුල්ලාගේ ලේ ස්වල්ප-
යක් පූජාසනයේ පැත්තකින් ගලා
යන්න සැලැස්විය යුතුයි. ඉතුරු ලේ
ටික පූජාසනයේ පාමුලට වත් කළ
යුතුයි.[7] එය පාප පූජාවකි. 10 ඔහු
අනික් කුරුල්ලාව දවන පූජාවක්
ලෙස ඔප්පු කළ යුතුයි. සාමාන්‍ය-
යෙන් දවන පූජා ඔප්පු කරන ආකාර-
යටම එයද ඔප්පු කළ යුතුයි.[8] ඔහු
කළ පාපයට සමාව[9] ලබාගන්නා
පිණිස පූජකයා එම පූජා ඔප්පු කළ
යුතුයි. එවිට ඔහුට සමාව ලැබෙයි.[10]
11 "'ඔහුට කොබෙයියන් දෙදෙ-
නෙකුව හෝ පරෙවි පැටවුන් දෙ-
දෙනෙකුව ගෙන ඒමට තරම්වත්
වත්කමක් නැත්නම්[11] ඔහු තමා කළ
පාපය වෙනුවෙන් සිහින් පිටි ඒෆාව-
කින්*[12] දහයෙන් කොටසක් ගෙනා
යුතුයි. එය පාප පූජාවකි.[13] එය
පාප පූජාවක් වන නිසා ඔහු ඒ

**7** ලෙවී 1:5; ලෙවී 7:2; හෙබ්‍රෙ 9:22; **8** ලෙවී 1:17; **9** ලෙවී 6:7; හෙබ්‍රෙ 2:17; 1යොහ 2:2; **10** නික් 34:9; **11** 2කොරි 8:12; **12** නික් 16:36; **13** ලෙවී 5:6; හිතෝ 28:13; 2කොරි 5:21.

ලෙවී **5:11*** නික් 16:36හි පාදසටහන බලන්න.

මත තෙල්වත්[1] කට්ටකුමංජල්වත්
නොදැමිය යුතුයි. **12** ඔහු එය පූජ-
කයා වෙතට ගෙනා යුතුයි. පූජකයාද
සිහිගැන්වීමක්[2] වශයෙන් එයින් අහු-
රක් ගෙන, යෙහෝවා දෙවි වන මට
පූජාසනය මත ඔප්පු කළ අනික් පූජා-
වන් සමඟ එයද දැවිය යුතුයි.[3] එය
පාප පූජාවකි.[4] **13** යමෙකු ඉහත කී
එක් කාරණයක් සම්බන්ධයෙන් හෝ
වරදකරුවෙකු වේ නම් ඔහුගේ පාප-
යට සමාව ලබාගන්නා පිණිස[5] පූජ-
කයා ඔහු ගෙනා පූජාව ඔප්පු කළ
යුතුයි. එවිට ඔහුට සමාව ලැබෙයි.
ධාන්‍ය පූජාවෙන් ඉතුරු වන කොටස
මෙන් එම පූජාවෙන් ඉතුරු වන කො-
ටසද පූජකයන්ට අයිති වන්නේය.' "[6]

**14** යෙහෝවා දෙවි මෝසෙස්ට
තවදුරටත් මෙසේ කීවේය.
**15** "යමෙකු යෙහෝවා දෙවි වන
මාගේ ශුද්ධ දේවල් කෙලෙසන අයු-
රින් ක්‍රියා කර නොදැනුවත්වම පව්
කළොත්[7] ඔහු අවිශ්වාසවන්ත ලෙස
කටයුතු කළ නිසා යෙහෝවා දෙවි
වන මට වන්දි පූජාවක් ඔප්පු කළ
යුතුයි.[8] ඔහු වන්දි පූජාව සඳහා නිකැ-
ළැල් බැටළුවෙකුව ගෙනා යුතුයි. උං
නියම කරන ලද රිදී ෂෙකෙල්*[9] ප්‍රමා-
ණයේ වටිනාකමට සරිලන බැට-
ළුවෙකු විය යුතුයි. නියම කරන
ලද ෂෙකෙලයේ බර ශුද්ධස්ථානයේ
තිබෙන ෂෙකෙලයේ බරට සමාන
විය යුතුයි. **16** ඔහු ශුද්ධස්ථානයට
විරුද්ධව කළ පාපය වෙනුවෙන් වන්-
දියක් ගෙවිය යුතුයි. නියම කළ වන්-
දියද එයින් පහෙන් කොටසක්ද[10]
ඔහු ගෙනැවිත් පූජකයාට දිය යුතුයි.
ඔහු කළ පාපයට සමාව ලබාගන්නා
පිණිස[11] වන්දි පූජාව සඳහා ගෙනා
බැටළුවාව පූජකයා ඔප්පු කළ යුතුයි.
එවිට ඔහුට සමාව ලැබෙයි.[12]

**17** "යමෙකු යෙහෝවා දෙවි වන
මාගේ ආඥාවක් කඩ කර පව්
කළොත්, ඔහු එය නොදැනුවත්ක-
මින් කළත්[13] වරදකරුවෙක් වන්-
නේය. ඔහු තම වරදට වග කිව
යුතුයි.[1] **18** ඔහු වන්දි පූජාවක් වශ-
යෙන් නිකැළැල් බැටළුවෙකුව ගෙ-
නැවිත් පූජකයාට දිය යුතුයි.[2] උං,
නියම කරන ලද වටිනාකමට සරිලන
බැටළුවෙකු විය යුතුයි. නොදැනුවත්-
කමින් හෝ ඔහුගේ අතින් සිදු වූ
වරදට සමාව ලබාගන්නා පිණිස[3]
පූජකයා එම බැටළුවාව ඔප්පු කළ
යුතුයි. එවිට ඔහුට සමාව ලැබෙයි.[4]
**19** එය වන්දි පූජාවකි. මන්ද ඔහු යෙ-
හෝවා දෙවි වන මා ඉදිරියේ වරදක-
රුවෙකි."[5]

**6** යෙහෝවා දෙවි තවදුරටත් මෝ-
සෙස්ට මෙසේ කීවේය.
**2** "යමෙකු යෙහෝවා දෙවි වන මට
අවිශ්වාසවන්ත[6] වෙමින් කරන පාප
මේවාය. යම් ගනු දෙනුවක් සම්-
බන්ධයෙන් හෝ තමාට සුරක්ෂිතව
තබාගැනීමට භාර දුන් දෙයක්[7] සම්-
බන්ධයෙන් හෝ යමෙකු තම ආශ්‍රිත-
යාව රැවටුවොත්[8] එය පාපයකි. ඔහු
තම ආශ්‍රිතයාගෙන් යමක් සොරකම්
කර ඒ ගැන බොරු කීවොත් හෝ තම
ආශ්‍රිතයාට වංචාවක් කළොත් හෝ
එයද පාපයකි.[9] **3** නැති වූ දෙයක්
යමෙකුට සම්බ වූ විට[10] ඔහු එය භාර
නොදී තමන් ළඟම තබාගනිමින් ඒ
ගැන බොරු කීවොත්[11] එයද පාප-
යකි. එවැනි වරදක් කළ පසු ඔහු
එසේ නොකළ බවට බොරුවට දිවු-
රුවොත් එයද පාපයකි. **4** එවැනි
පාපයක්[12] කළ පුද්ගලයෙකු තමා
සොරකම් කළ දේ හෝ වංචාවෙන්
ලබාගත් දේ හෝ සුරක්ෂිතව තබා-
ගැනීමට භාර දුන් දේ හෝ නැති වී
සම්බ වූ දේ හෝ නැවත භාර දිය
යුතුයි. **5** බොරුවට දිවුරූ දෙයක්
සම්බන්ධයෙන්ද ඔහු කළ යුත්තේ
එයමය. ඔහු වරද කළ බව ඔප්පු
වීමෙන් අනතුරුව ඔහු වන්දියක්[13]
ගෙවිය යුතුයි. ඔහු ගත් දෙය සම්පූර්-
ණයෙන්ම නැවත අයිතිකරුට දිය
යුතු අතර එයින් පහෙන් කොටසක්ද
ඒ සමඟ දිය යුතුයි. **6** ඔහු යෙ-
හෝවා දෙවි වන මට වන්දි පූජාවක්[14]

**5 පරි.**
**1** ගණන් 5:15
**2** ලෙවී 6:15
ගණන් 5:26
**3** ලෙවී 4:35
**4** ලෙවී 4:3
**5** ලෙවී 4:26
**6** ලෙවී 2:10
ලෙවී 7:6
1සාමු 2:28
1කොරි 9:13
**7** ලෙවී 10:18
ලෙවී 22:14
ගණන් 18:9
**8** ලෙවී 6:6
**9** නික් 30:13
ලෙවී 27:25
**10** ලෙවී 6:5
ලෙවී 22:14
ලෙවී 27:13
ගණන් 5:7
**11** නික් 32:30
ලෙවී 12:8
ගණන් 15:25
හෙබ්‍රෙ 2:17
1යොහ 2:2
**12** නික් 34:9
ලෙවී 4:20
ලෙවී 6:7
ලෙවී 19:22
**13** ගීතා 19:12
ලූක් 12:48
හෙබ්‍රෙ 5:2

**2 තීරුව**
**1** ලෙවී 5:2
1තිමෝ 5:24
**2** ලෙවී 5:7
ලෙවී 6:6
**3** ලෙවී 1:4
**4** යෙසා 53:12
**5** එස්රා 10:2
ගීතා 51:3

**6 පරි.**
**6** ලෙවී 5:15
ගණන් 5:6
ගීතා 51:4
**7** නික් 22:7
**8** ලෙවී 19:11
**9** යෝබ් 24:2
මීකා 2:2
ක්‍රියා 13:10
**10** ද්වි 22:1
**11** නික් 22:11
ලෙවී 19:12
යෙරෙ 7:9
මලා 3:5
එෆි 4:25
කොලො 3:9
1තිමෝ 1:10
**12** ලෙවී 4:13
**13** ලෙවී 5:16
ගණන් 5:7
1සාමු 12:3
**14** ලෙවී 7:1

ලෙවී **5:15*** ෂෙකෙලයක් යනු ග්‍රෑම් 11.4කි.

ගෙනා යුතුයි. ඒ සඳහා නියම කරන
ලද වටිනාකමට සරිලන නිකැළැල්
බැටළුවෙකු[1] පූජකයා වෙතට ගෙනා
යුතුයි. **7** ඔහු කළ වරදට සමාව
ලබාගන්නා පිණිස[2] පූජකයා එම
පූජාව යෙහෝවා දෙවි වන මට ඔප්පු
කළ යුතුයි. එවිට ඉහත සඳහන්
කුමන වරදක් හෝ කර තිබුණද ඒ
සඳහා ඔහුට සමාව ලැබෙයි.”
**8** යෙහෝවා දෙවි මෝසෙස්ට
තවදුරටත් මෙසේ කීවේය.
**9** “ආරොන්ට සහ ඔහුගේ පුත්‍රයන්ට
මෙසේ අණ කරන්න. ‘දවන පූජාව[3]
සඳහා නීතිය මෙයයි. දවන පූජාව
රාත්‍රියේ සිට උදෑසන දක්වා පූජාස-
නය මත තිබිය යුතුයි. ගින්දරද එහි
දැල්වෙමින් තිබිය යුතුයි. **10** පූජ-
කයා ලිනන් රෙදිවලින් මැසූ ඔහුගේ
යට ඇඳුම[4] ඇඳ ඊට උඩින් තම ලිනන්
නිල වස්ත්‍රය ඇඳිය යුතුයි.[5] ඉන්-
පසු පූජකයා පූජාසනය මත දැවූ
දවන පූජාවේ අළු*[6] ගෙන පූජා-
සනයේ පැත්තකින් තැබිය යුතුයි.
**11** ඔහු ඇඳ සිටින වස්ත්‍ර ගලවා[7] වෙ-
නත් වස්ත්‍රයකින් සැරසී කඳවුරෙන්
පිටත පවිත්‍ර තැනකට තෙල් මිශ්‍ර
අළු ගෙන යා යුතුයි.[8] **12** පූජාසනය
මත නොකඩවා ගින්දර ඇවිළෙන්න
සැලැස්විය යුතුයි. එය නිවී යෑමට
ඉඩ නොදිය යුතුයි. පූජකයා සෑම
උදෑසනකම ගින්නට දර[9] දමා ඒ
මත දවන පූජාව පිළිවෙළින් තැබිය
යුතුයි. හවුල් පූජා සඳහා ගෙනෙන
සතාගේ තෙල් කොටස්ද ඒ මත දැවිය
යුතුයි.[10] **13** පූජාසනය මත ගින්-
දර[11] නොකඩවා ඇවිළෙමින් තිබිය
යුතු අතර එය නිවී යෑමට ඉඩ නො-
දිය යුතුයි.
**14** “ ‘ධාන්‍ය[12] පූජාව සඳහා නීතිය
මෙයයි. ආරොන්ගේ පුත්‍රයන් යෙ-
හෝවා දෙවි වන මා වෙතට
එනම්, පූජාසනය ඉදිරියට ධාන්‍ය
පූජාව ගෙනා යුතුයි. **15** ඔවුන්ගෙන්
කෙනෙකු ධාන්‍ය පූජාවෙන් අහුරක්
ගත යුතුයි. සිහින් පිටි හා තෙල්
ස්වල්පයක්ද කට්ටකුමංජල් සියල්-
ලද ඇතුළත් එම අහුර දෙවිට සිහි-
ගැන්වීමක්[1] වශයෙන් පූජාසනය මත
දැවිය යුතුයි. එය යෙහෝවා දෙවි
වන මට ප්‍රසන්න සුවඳක් ගෙනෙන
පූජාවක් වන්නේය. **16** ධාන්‍ය පූජා-
වෙන් ඉතුරු වන කොටසින්
මුහුන් නොදැමූ රොටි[2] සාදා ආරොන්
සහ ඔහුගේ පුත්‍රයන්[3] ශුද්ධ තැනකදී
ඒවා අනුභව කළ යුතුයි. ඔවුන්
ඒවා අනුභව කළ යුත්තේ සම්මුඛ
වීමේ කූඩාරමේ මළුව ඇතුළේය.
**17** එම රොටි මුහුන් නොදමා සෑදිය
යුතුයි.[4] මට ගින්නෙන්[5] ඔප්පු කරන
පූජාවලින් මා ඔවුන්ට දෙන කො-
ටස එයයි. පාප පූජාව හා වන්දි
පූජාව මෙන් එයද ඉතා ශුද්ධය.[6]
**18** ආරොන්ගෙන් පැවත එන සිය-
ලුම පුරුෂයන්ට[7] එයින් අනුභව කළ
හැකියි. යෙහෝවා දෙවි වන මට ගින්-
නෙන් ඔප්පු කරන පූජාවලින් ඔවුන්ට
ලැබෙන එම කොටස බොහෝ කාල-
යක්[8] පුරා ඔවුන්ගෙන් පැවත එන්-
නන්ට උරුම වෙයි. පූජා කළ දේ යම්
දෙයක ස්පර්ශ වුවහොත් ඒ දේ ශුද්ධ
දෙයක් ලෙස සැලකිය යුතුයි.’ ”
**19** යෙහෝවා දෙවි මෝසෙස්ට
තවදුරටත් මෙසේ කීවේය.
**20** “උත්තම පූජකයා ලෙස
ආරොන්ව අභිෂේක[9] කරනු ලබන
දවසේදී ආරොන් සහ ඔහුගේ
පුත්‍රයන් යෙහෝවා දෙවි වන මට
ධාන්‍ය පූජාවක්[10] ඔප්පු කළ යුතුයි.
උත්තම පූජකයෙකු ලෙස යමෙකුව
අභිෂේක කරන සෑම අවස්ථාවක-
දීම ඔවුන් සිහින් පිටි ඒපාවකින්[11]
දහයෙන් කොටසක් ධාන්‍ය පූජා-
වක්[12] ලෙස ගෙනා යුතුයි. එයින්
භාගයක් උදෑසනද අනික් භාගය සව-
සද ඔප්පු කළ යුතුයි. **21** පිටිව-
ලට හොඳට තෙල් දමා මිශ්‍ර කළ
පසු එය කබලේ පිලිස්සිය යුතුයි.[13]
එලෙස පිලිස්සූ ධාන්‍ය පූජාව කැබලි-
වලට කඩා යෙහෝවා දෙවි වන මට
ප්‍රසන්න සුවඳක් ගෙනෙන පිණිස

**6 පරි.**
1 ලෙවී 5:15, යෙසා 53:10, හෙබ්‍රෙ 9:14
2 ලෙවී 4:20, ලෙවී 5:10, ලෙවී 5:18, 1යොහ 1:7, 1යොහ 2:2
3 නික් 29:42, ගණන් 28:3, හෙබ්‍රෙ 10:11
4 නික් 28:42, නික් 39:28
5 නික් 28:39, ලෙවී 16:32, එස්රා 3:10, එස 44:17
6 නික් 27:3, ලෙවී 1:16, ලෙවී 4:12
7 ලෙවී 16:23, එස 44:19
8 ලෙවී 4:12, ලෙවී 16:27, ගණන් 19:9, හෙබ්‍රෙ 13:12
9 ලෙවී 1:7, ලෙවී 3:5, නෙහෙ 13:31
10 ලෙවී 3:5, ලෙවී 3:16, ගණන් 18:17
11 ගණන් 16:46
12 ලෙවී 2:1, ගණන් 15:4

**2 තීරුව**
1 ලෙවී 2:2, ලෙවී 2:9, ලෙවී 5:12
2 ලෙවී 10:12
3 ලෙවී 2:3, ලෙවී 5:13, එස 44:29, 1කොරි 9:13
4 ලෙවී 2:11, මතෙ 16:12, 1පේතෘ 2:22
5 ගණන් 18:9
6 ලෙවී 2:3, ලෙවී 2:10
7 ගණන් 18:10
8 ලෙවී 24:9
9 නික් 30:30, ගීතා 133:2, ලූක් 4:18, ක්‍රියා 10:38, හෙබ්‍රෙ 1:9, හෙබ්‍රෙ 5:1, හෙබ්‍රෙ 7:28, හෙබ්‍රෙ 8:3
10 නික් 29:2
11 නික් 16:36, ලෙවී 5:11
12 නික් 29:40, ලෙවී 2:1, ලෙවී 9:17, ගණන් 28:5
13 ලෙවී 2:5, ලෙවී 7:9, 1ලේක 23:29

ලෙවී **6:10*** මූ.අ., “තෙල් මිශ්‍ර අළු.”

ඔප්පු කරන්න. **22** එය ඔප්පු කළ
යුත්තේ ආරොන්ගෙන් පසුව උත්තම
පූජකයා ලෙස අභිෂේක කරනු ලැබී-
මට නියමිත ඔහුගේ පුත්‍රයාය.[1] මුළු
පූජාවම[2] යෙහෝවා දෙවි වන මා ඉදි-
රියේ දැවිය යුතුයි. එය බොහෝ
කාලයක් පුරා පිළිපැදිය යුතු නියෝ-
ගයකි. **23** පූජකයන්[3] ඔප්පු කරන
සියලු ධාන්‍ය පූජා මුළුමනින්ම ඔප්පු
කළ යුතුයි. එයින් කිසිවක් නොකෑ
යුතුයි.”

**24** යෙහෝවා දෙවි මෝසෙස්ට
තවදුරටත් මෙසේ කීවේය.
**25** “ආරොන්ට සහ ඔහුගේ පුත්‍රයන්ට
මෙසේ කියන්න. ‘පාප පූජාව සඳහා
නීතිය මෙයයි.[4] දවන පූජාව සඳහා
සතුන්ව මරන ස්ථානයේදීම[5] පාප
පූජාව සඳහා ඔප්පු කරන සතාවද
මැරිය යුතුයි. යෙහෝවා දෙවි වන මා
ඉදිරියේ එම සතාව මැරිය යුතුයි. එය
ඉතා ශුද්ධය.[6] **26** පාප පූජාව ඔප්පු
කරන පූජකයා එයින් අනුභව කරන්-
නේය.[7] එය අනුභව කළ යුත්තේ
ශුද්ධ තැනකදීය.[8] එනම්, සම්මුඛ
වීමේ කූඩාරමේ මළුව[9] ඇතුළේය.

**27** “ ‘එම සතාගේ මාංසය යම් කිසි
දෙයක ස්පර්ශ වුණොත් ස්පර්ශ වූ
දෙය ශුද්ධ දෙයක් ලෙස සැලකිය
යුතුයි.[10] උගේ ලේ යමෙකුගේ වස්ත්‍ර-
යට විසි වුණොත්[11] ඔබ එම වස්-
ත්‍රය ශුද්ධ තැනකදී සේදිය යුතුයි.[12]
**28** එම සතාගේ මස් මැටි භාජන-
යක[13] තැම්බුවොත් එම භාජනය
බිඳිය යුතුයි. එය තඹ භාජනයක
තැම්බුවොත් එම භාජනය හොඳට
මැද වතුරෙන් සේදිය යුතුයි.

**29** “ ‘සෑම පූජකයෙකුම එම පූජා-
වෙන් අනුභව කළ යුතුයි.[14] මන්ද එය
ඉතා ශුද්ධය.[15] **30** ශුද්ධස්ථානයේදී
පව්වලට සමාව ලබාගන්නා පිණිස
පාප පූජාවක් ඔප්පු කරන අවස්ථාව-
ලදී එම සතාගේ ලේ[16] සම්මුඛ වීමේ
කූඩාරමට ගෙන යනු ලබන්නේය.
එවැනි අවස්ථාවලදී එම සතාගේ මස්
නොකෑ යුතුයි. උගේ මස් සම්පූර්ණ-
යෙන්ම ගින්නෙන් දවන්න.

**6 පරි.**
1 ද්වි 10:6 හෙබ්‍රෙ 7:23
2 නික් 29:41
3 හෙබ්‍රෙ 7:28
4 ලෙවී 4:3
5 ලෙවී 1:3 ලෙවී 1:11
6 ලෙවී 21:22 ලෙවී 22:7
7 ලෙවී 10:17 ගණන් 18:9 එස 44:29
8 ලෙවී 6:16
9 නික් 27:9 නික් 38:9 නික් 40:33 එස 42:13
10 මතෙ 9:21 මතෙ 14:36
11 1පේතෘ 1:2
12 හෙබ්‍රෙ 9:10
13 ලෙවී 11:33 ලෙවී 15:12
14 ලෙවී 6:18 ගණන් 18:10
15 ලෙවී 6:25 ලෙවී 21:22
16 ලෙවී 4:5 ලෙවී 10:18 ලෙවී 16:27 හෙබ්‍රෙ 13:11

**2 තීරුව**

**7 පරි.**
1 ලෙවී 5:6 ලෙවී 6:6 ලෙවී 14:12 ලෙවී 19:21 ගණන් 6:12
2 ලෙවී 6:17 ලෙවී 21:22
3 ලෙවී 1:3 ලෙවී 6:25
4 ලෙවී 5:9 හෙබ්‍රෙ 9:22
5 ලෙවී 1:5 ලෙවී 3:2 ලෙවී 5:9 1පේතෘ 1:2
6 නික් 29:13 ලෙවී 3:9 ලෙවී 3:17 ලෙවී 4:8 ලෙවී 8:20
7 ලෙවී 3:4 ලෙවී 4:9
8 ලෙවී 1:9 ලෙවී 3:16 ලෙවී 5:12
9 ලෙවී 5:13 ලෙවී 6:16 ගණන් 18:9
10 ලෙවී 2:3
11 ලෙවී 6:25 ලෙවී 14:13
12 නික් 29:14 ලෙවී 1:6 ගණන් 19:5

**7** “ ‘වන්දි පූජාව සම්බන්ධ නීතිය
මෙයයි.[1] වන්දි පූජාව ඉතා
ශුද්ධ දෙයකි.[2] **2** දවන පූජා සඳහා
සතුන්ව මරන ස්ථානයේදීම[3] වන්දි
පූජාව සඳහා ගෙනෙන සතාවද මැරිය
යුතුයි. උගේ ලේ[4] පූජාසනයේ සෑම
පැත්තටම ඉසිය[5] යුතුයි. **3** උගේ
සියලු තෙල්[6] කොටස් එනම්, තෙ-
ලින් පිරුණු උගේ වලිගයද බඩ-
වැල් වටා ඇති සම්පූර්ණ තෙල්
තට්ටුවද **4** වකුගඩු දෙකද ඒවා
මත තිබෙන තෙල්ද තුනටිය පෙදෙ-
සේ තිබෙන තෙල් තට්ටුවද ඉවතට
ගත යුතුයි. අක්මාව වටා තිබෙන
තෙල්ද වකුගඩු සමඟම ඉවතට ගත
යුතුයි.[7] **5** පූජකයා, ඒවා පූජාසනය
මත දවා යෙහෝවා දෙවි වන මට
ඔප්පු කළ යුතුයි.[8] එය වන්දි පූජාවකි.
**6** සෑම පූජකයෙකුම එයින් අනුභව
කළ යුතුයි.[9] එය අනුභව කළ යුත්-
තේ ශුද්ධ තැනකදීය. මන්ද එය
ඉතා ශුද්ධය.[10] **7** වන්දි පූජාව පාප
පූජාව මෙන් වන්නේය. ඒ දෙකටම
තිබෙන්නේ එකම නීතියයි.[11] පාපව-
ලට සමාව ලබාගන්නා පිණිස වන්දි
පූජාව ඔප්පු කරන පූජකයාට එම
පූජාව අයිති වන්නේය.

**8** “ ‘පූජකයෙකු යමෙකු වෙනුවෙන්
දවන පූජාවක් ඔප්පු කරනවා නම්
ඔප්පු කරන එම සතාගේ හම[12] අයිති
වන්නේ පූජකයාටය.

**9** “ ‘යමෙකු ධාන්‍ය පූජාවක් ලෙස
උදුනේ[13] පුලුස්සන ලද යමක් හෝ
තාච්චියේ[14] බදින ලද යමක් හෝ කබ-
ලේ[15] පුලුස්සන ලද යමක් හෝ ඔප්පු
කරනවා නම් එය අයිති වන්නේ
පූජාව ඔප්පු කරන පූජකයාටය.[16]
**10** නමුත් තෙල්[17] මිශ්‍ර කළ ධාන්‍ය
පූජා සහ වියළි[18] ධාන්‍ය පූජා සියල්ල
ආරොන්ගේ පුත්‍රයන්ට අයිති වන්-
නේය. එම පූජා ඔවුන් සියලුදෙනා
අතරේ සම සේ බෙදාගත යුතුයි.

**11** “ ‘යෙහෝවා දෙවි වන මට

---

13 ලෙවී 2:4; 14 ලෙවී 2:7; 15 ලෙවී 2:5; ලෙවී 6:21; 1ලේක 23:29; 16 ලෙවී 2:3; ගණන් 18:9; 1කොරි 9:13; 17 ලෙවී 2:4; ලෙවී 14:21; 18 ලෙවී 5:11; ගණන් 5:15.

ඔප්පු කරන හවුල් පූජාව[1] සඳහා
නීතිය මෙයයි. **12** යමෙකු තම
ස්තුතිය[2] ප්‍රකාශ කරන පිණිස හවුල්
පූජාවක් ඔප්පු කරනවා නම් ඔහු එම
ස්තුති පූජාව සමඟ තෙල් මිශ්‍ර කර
සාදාගත් මුද්දක හැඩැති මුහුන් නො-
දැමූ රොටි සහ තෙල් තැවරූ මුහුන්
නොදැමූ සිහින් රොටි ගෙනා යුතුයි.[3]
එමෙන්ම සිහින් පිටි හා තෙල් හොඳට
මිශ්‍ර කර සාදාගත් මුද්දක හැඩැති
රොටිද ගෙනා යුතුයි. **13** ඔහු එම
රොටි සමඟ මුහුන් දැමූ[4] මුද්දක
හැඩැති රොටිද ගෙනා යුතුයි. ඔහු
ස්තුති පූජාවක් ලෙස ඔප්පු කරන
හවුල් පූජා සමඟ ඒවා ඔප්පු කළ
යුතුයි. **14** ඔහු ගෙනා සෑම රොටි
වර්ගයකින්ම එක රොටිය බැගින්
වෙන් කළ යුතුයි. ඒවා යෙහෝවා
දෙවි වන මට දෙනු ලබන ශුද්ධ කො-
ටසය.[5] එම කොටස අයිති වන්-
නේ හවුල් පූජාවේ ලේ පූජාසනය
මත ඉසින පූජකයාටය.[6] **15** ස්තුති
පූජාවක් ලෙස ඔප්පු කරන හවුල්
පූජාවක මස් ඔප්පු කළ දවසේම අනු-
භව කළ යුතුයි. එය පසුවදා උදෑසන
වන තෙක් ඉතුරු නොකළ යුතුයි.[7]

**16** " 'යමෙකු භාරයක්[8] ලෙස හෝ
සිය කැමැත්තෙන්ම[9] හෝ පූජාවක්
ඔප්පු කරනවා නම් පූජාව ඔප්පු කරන
දවසේම එය කෑ යුතුයි. එයින් යමක්
ඉතුරු වුණොත් එය පසුවදා කෑමටද
ගත හැකියි. **17** එහෙත් තුන්වන
දවස දක්වා මස් ඉතුරු වුණොත්
එය ගින්නෙන් දැවිය යුතුයි.[10]
**18** නමුත් හවුල් පූජාවේ මස් තුන්වන
දවසේ අනුභව කළොත් මම එම
පූජාව පිළි නොගන්නෙමි.[11] පූජාව
ඔප්පු කළ තැනැත්තාට එයින් ප්‍රයෝ-
ජනයක් අත් වන්නේ නැත.[12] එය
ඉතා පිළිකුල් දෙයක් ලෙස සැලකේ.
එය කෑමට ගත් තැනැත්තා එම වර-
දට ගණන් දිය යුතුයි.[13] **19** පවිත්‍රව
සිටින සියලුදෙනාටම පූජාව සඳහා
ඔප්පු කළ සතාගේ මාංසය අනුභව
කළ හැකියි. නමුත් එම මාංසය යම්
අපවිත්‍ර දෙයක ස්පර්ශ වුණොත්[14]
එය නොකෑ යුතුයි. එය ගින්නෙන්
දැවිය යුතුයි.

**20** " 'යමෙකු අපවිත්‍රව සිටියදී යෙ-
හෝවා දෙවි වන මට ඔප්පු කරන
ලද හවුල් පූජාවේ මාංසය අනුභව
කළොත් ඔහුව මරා දැමිය යුතුයි.[1]
**21** යමෙකු තමාව අපවිත්‍ර කළ හැකි
ඕනෑම දෙයක් එනම්, අපවිත්‍ර මිනිසෙ-
කුව[2] හෝ අපවිත්‍ර යමක් හෝ අප-
විත්‍රයයි සලකන සතෙකුව[3] හෝ
ඉතා පිළිකුල්සහගත වූ දෙයක්[4] හෝ
ස්පර්ශ කළ පසු යෙහෝවා දෙවි වන
මට ඔප්පු කළ හවුල් පූජාවේ මාංසය
අනුභව කළොත් එම තැනැත්තාව
මරා දැමිය යුතුයි.' "

**22** යෙහෝවා දෙවි තවදුර-
ටත් මෝසෙස්ට මෙසේ කීවේය.
**23** "ඔබ ඊශ්‍රායෙල් සෙනඟට මෙසේ
කියන්න. 'ඔබ ගවයෙකුගේ හෝ
බැටළුවෙකුගේ හෝ එළුවෙකුගේ හෝ
තෙල් කොටස් කිසිසේත් නොකෑ
යුතුයි.[5] **24** නමුත් මිය ගිය සතෙ-
කුගේ හෝ වෙනත් සතෙකු විසින්
මරා දැමූ[6] සතෙකුගේ හෝ තෙල්
කොටස් වෙන ඕනෑම දෙයක්
සඳහා ප්‍රයෝජනයට ගත හැකියි.
එහෙත් ඒවා අනුභව නොකළ යුතුයි.
**25** යමෙකු යෙහෝවා දෙවි වන මට
ගින්නෙන් ඔප්පු කරන ලද පූජාවක
තෙල් කොටස් අනුභව කළොත් ඔහුව
මරා දැමිය යුතුයි.[7]

**26** " 'ඔබ ජීවත් වන කවර තැන-
කදී හෝ වේවා ලේ[8] කොහෙත්ම
නොකෑ යුතුයි. කුරුල්ලෙකුගේ
ලේ හෝ වේවා මෘගයෙකුගේ ලේ
හෝ වේවා ඔබ නොකෑ යුතුයි.
**27** යමෙකු ලේ අනුභව කළොත්
ඔහුව මරා දැමිය යුතුයි.' "[9]

**28** යෙහෝවා දෙවි තවදුරටත්
මෝසෙස්ට මෙසේ කීවේය. **29** "ඊශ්‍රා-
යෙල් සෙනඟට මෙසේ කියන්න.
'යමෙකු යෙහෝවා දෙවි වන මට
හවුල් පූජාවක් ඔප්පු කරනවා නම් ඔහු
එම පූජාවෙන් කොටසක් යෙහෝවා
දෙවි වන මා වෙතට ගෙනා යුතුයි.[10]
**30** ඔහු සතාගේ තෙල්[11] කොටස් හා

**7 පරි.**

**1** ලෙවී 3:1
ලෙවී 7:20
ලෙවී 22:21
1කොරි 10:16
**2** ලෙවී 22:29
2ලේක 29:31
නෙහෙ 12:43
ගීතා 50:14
2කොරි 9:11
**3** ලෙවී 2:4
ලෙවී 6:16
ගණන් 6:15
**4** ලෙවී 2:11
ලෙවී 23:17
**5** ලෙවී 10:14
**6** ලෙවී 6:26
ලෙවී 7:35
ගණන් 18:8
**7** ලෙවී 22:30
**8** ලෙවී 22:21
ගණන් 30:2
විනි 11:30
1සාමු 1:11
ගීතා 66:13
හිතෝ 20:25
දේශ 5:4
ක්‍රියා 21:23
**9** ලෙවී 22:23
ද්වි 12:6
**10** ලෙවී 19:6
**11** ලෙවී 19:7
**12** උත් 4:5
**13** ලෙවී 5:17
ලෙවී 19:8
ගණන් 9:13
එස 4:14
**14** ලෙවී 11:24
ගණන් 19:15

---

**2 තීරුව**

**1** ලෙවී 15:3
ගණන් 19:20
**2** ලෙවී 12:4
ලෙවී 15:2
**3** ලෙවී 11:24
ද්වි 14:7
**4** ලෙවී 11:10
ද්වි 14:10
එස 4:14
**5** ලෙවී 3:16
ලෙවී 3:17
ලෙවී 4:8
1සාමු 2:16
**6** නික් 22:31
ලෙවී 17:15
**7** ගණන් 15:31
**8** උත් 9:4
ලෙවී 3:17
ලෙවී 17:10
ද්වි 12:16
1සාමු 14:33
එස 33:25
ක්‍රියා 15:20
ක්‍රියා 15:29
**9** ලෙවී 17:14
**10** ලෙවී 3:1
1කොරි 10:18
**11** ලෙවී 3:3

උගේ පපු පෙදෙස ගෙන යෙහෝවා
දෙවි වන මට ගින්නෙන් ඔප්පු කළ
යුතුයි. ඔහු සතාගේ තෙල් කොටස්
සමඟ පපු පෙදෙස යෙහෝවා දෙවි වන
මා ඉදිරියේ ඒ මේ අත සෙලවිය
යුතුයි. එය දෙවිට පිළිගන්වන පිණිස
කරන සෙලවීමේ පූජාවකි.[1] **31** පූජ-
කයා සතාගේ තෙල් කොටස් පූජාස-
නය මත දැවිය යුතුයි.[2] එහෙත් උගේ
පපු පෙදෙස ආරොන්ටත් ඔහුගේ පුත්‍ර-
යන්ටත් අයිති වන්නේය.'[3]

**32** "'හවුල් පූජාව වශයෙන් ගෙ-
නෙන සතාගේ දකුණු ගාතය ශුද්ධ
කොටසක්[4] ලෙස පූජකයාට දෙන්න.
**33** දකුණු ගාතය අයිති වන්නේ
ආරොන්ගේ පුත්‍රයන් අතරින් හවුල්
පූජාවේ ලේ සහ තෙල් කොටස් ඔප්පු
කරන තැනැත්තාටය.[5] **34** ඊශ්‍රා-
යෙල් සෙනඟ මට ගෙනෙන හවුල්
පූජාවලින් සෙලවීමේ පූජාව[6] සඳහා
වෙන් කරන සතාගේ පපු පෙදෙස සහ
ශුද්ධ කොටසක් ලෙස වෙන් කරන
සතාගේ ගාතය මම ගන්නෙමි. මම
එය ඊශ්‍රායෙල් සෙනඟගෙන් රැගෙන
පූජකයා වන ආරොන්ටත් ඔහුගේ
පුත්‍රයන්ටත් දෙන්නෙමි. එය බොහෝ
කාලයකට වලංගු වන නියෝගයකි.

**35** "'යෙහෝවා දෙවි වන මට
ගින්නෙන් ඔප්පු කරන පූජාවලින්
ආරොන්ට සහ ඔහුගේ පුත්‍රයන්ට හිමි
වන කොටස එයයි. යෙහෝවා දෙවි
වන මාගේ පූජකයන් ලෙස ඔවුන්ව
පත් කළ[7] දවසේ සිට ඔවුන්ට එම
කොටස හිමි වන්නේය. **36** යෙ-
හෝවා දෙවි වන මා ඊශ්‍රායෙල්
සෙනඟ අතරින් ඔවුන්ව තෝරා පූජ-
කයන් ලෙස සේවය කිරීමට ඔවුන්ව
අභිෂේක[8] කළ දවසේ නියම කළ ලෙ-
සම ඔවුන්ට එම කොටස දිය යුතුයි.
එය ඔවුන්ගේ සියලු පරම්පරාවලදී
බොහෝ කාලයක් පුරා පිළිපැදිය යුතු
නියෝගයකි.'"[9]

**37** දවන පූජාව,[10] ධාන්‍ය පූජාව,[11]
පාප පූජාව,[12] වන්දි පූජාව,[13] අභිෂේක
කිරීමේ පූජාව[14] සහ හවුල් පූජාව[15]
සඳහා නීති ඒවාය. **38** යෙහෝවා
දෙවි සීනයි පාළුකරයේදී තමාට පූජා
ඔප්පු කරන ලෙස ඊශ්‍රායෙල් සෙනඟට
අණ කළ අවස්ථාවේදී එම නියමයන්
දුන්නේය.[1] යෙහෝවා දෙවි සීනයි
කන්දේදී[2] මෝසෙස්ට පැවසූ ආකාර-
යටම එය වාර්තා වී ඇත.

**8** යෙහෝවා දෙවි මෝසෙස්ට
තවදුරටත් මෙසේ කීවේය.
**2** "ආරොන්වද ඔහුගේ පුත්‍රයන්වද[3]
ඔවුන්ගේ වස්ත්‍රද[4] ශුද්ධ තෛල-
යද[5] පාප පූජාවට ඔප්පු කරන ගව-
යාව[6] සහ බැටළුවන් දෙදෙනාවද
මුහුන් නොදැමූ රොටි[7] සහිත කූඩ-
යද රැගෙන **3** සම්මුඛ වීමේ කූඩාර-
මට ඇතුල් වන ස්ථානයට යන්න.[8]
ඉන්පසු මුළු සෙනඟ එතැනට රැස්
කරන්න."[9]

**4** යෙහෝවා දෙවි අණ කළ ලෙ-
සම මෝසෙස් කළේය. සම්මුඛ වීමේ
කූඩාරමට ඇතුල් වන ස්ථානය[10]
අසල මුළු සෙනඟ රැස් වූහ. **5** මෝ-
සෙස් සෙනඟ අමතා, "යෙහෝවා දෙවි
මෙලෙස කිරීමට අණ කළා" කියා
කීවේය.[11] **6** ඉන් අනතුරුව මෝ-
සෙස් ආරොන්වද ඔහුගේ පුත්‍රයන්වද
කැඳවා ඔවුන්ව වතුරෙන්[12] නෑව්-
වේය.[13] **7** ඔහු ආරොන්ට ලිනන්
වස්ත්‍රය[14] අන්දවා ඉණපටියද[15]
බැන්දේය. පසුව අත් නැති වස්ත්‍ර-
යද[16] ඇන්දුවේය. ඔහු ඊට උඩින්
ඒෆොද් හැට්ටය[17] අන්දවා එහි පටිය[18]
ආරොන්ගේ ඉණ වටා තදින් බැන්-
දේය. **8** ඔහු ආරොන්ට ළයවැස්ම[19]
පළඳවා එය තුළ ඌරීම් සහ තුම්-
මීම්*[20] දැමුවේය. **9** ඉන්පසු යෙ-
හෝවා දෙවි අණ කළ ලෙස මෝසෙස්
ආරොන්ට විශේෂ හිස්වැස්ම[21] පැළඳු-
වේය. ඔහු එම හිස්වැස්මෙන් නළල
ආවරණය වන කොටස මත ශුද්ධ
රන් තහඩුව*[22] බැන්දේය.

**7 පරි.**
**1** නික් 29:24; ලෙවී 8:27; ලෙවී 9:21; ගණන් 6:20
**2** ලෙවී 3:5
**3** ලෙවී 5:13; ලෙවී 6:16; ලෙවී 8:29; ගණන් 18:18
**4** නික් 29:27; ලෙවී 10:14; ගණන් 6:20
**5** ලෙවී 6:26; ද්වි 18:3
**6** නික් 29:28; ලෙවී 10:14; ගණන් 18:18
**7** නික් 28:1; නික් 29:7; නික් 40:13; ගණන් 18:7
**8** නික් 40:15; ලෙවී 8:12
**9** හෙබ්‍රෙ 7:12
**10** ලෙවී 6:9; ආමො 5:22; මාක් 12:33; හෙබ්‍රෙ 10:5; හෙබ්‍රෙ 10:6
**11** ලෙවී 2:1; ලෙවී 6:14
**12** ලෙවී 6:25
**13** ලෙවී 5:6; ලෙවී 7:1
**14** නික් 29:1; ලෙවී 6:20
**15** ලෙවී 3:1

**2 තීරුව**
**1** නික් 24:5; ලෙවී 1:2
**2** නික් 34:27; ලෙවී 25:1

**8 පරි.**
**3** නික් 28:1
**4** නික් 28:4; නික් 39:41
**5** නික් 30:23; නික් 40:15
**6** නික් 29:1
**7** නික් 29:2
**8** ගණන් 27:2
**9** ක්‍රියා 7:38
**10** නික් 36:37
**11** යොහ 8:28
**12** නික් 29:4
**13** නික් 40:12; 1කොරි 6:11; එෆී 5:26; හෙබ්‍රෙ 9:10
**14** නික් 28:39; එළි 19:8
**15** නික් 39:29; යෙසා 11:5
**16** නික් 28:31; නික් 39:22; ගණන් 15:39; ගීතා 119:129

**17** නික් 28:6; නික් 39:2; **18** නික් 28:8; නික් 29:5; නික් 39:20; **19** නික් 28:15; නික් 39:9; **20** නික් 28:30; එස්රා 2:63; යොහ 5:30; **21** නික් 29:6; නික් 39:28; 1කොරි 11:3; **22** නික් 28:36; නික් 39:30.

ලෙවී **8:8*** නික් 28:30හි දෙවන පාදසටහන බලන්න. **9*** නික් 29:6හි පාදසටහන බලන්න.

**10** ඉන්පසු මෝසෙස් ශුද්ධ තෛ-
ලය ගෙන කූඩාරම සහ ඒ තුළ
ඇති සියල්ල නමස්කාරය සඳහා
කැප කළේය.[1] ඔහු ඒ සියල්ල පරි-
ශුද්ධ දේවල් ලෙස වෙන් කළේය.
**11** ඉන්පසු පූජාසනය[2] සහ එහි සියලු
භාණ්ඩ මතද වතුර භාජනය සහ එම
භාජනය තබන ආධාරකය මතද
හත් වරක් ශුද්ධ තෛලය ඉස ඒවා
කැප කළේය. ඔහු එසේ කළේ ඒවා
පරිශුද්ධ දේවල් ලෙස වෙන් කර
තබන පිණිසය. **12** අන්තිමට ඔහු
ආරොන්ගේ හිස මත තෙල් වත් කර
ඔහුව අභිෂේක කළේය. ඔහු එසේ
කළේ ආරොන්ව පරිශුද්ධ සේවය
සඳහා කැප කරන පිණිසය.[3]

**13** යෙහෝවා දෙවි මෝසෙස්ට
අණ කළ ලෙස ඔහු ආරොන්ගේ පුත්‍ර-
යන්ව කැඳවා[4] ඔවුන්ට වස්ත්‍ර අන්දවා
ඉණපටි[5] බැන්දේය. ඔවුන්ට හිස්වැ-
සුම්ද[6] පැළඳුවේය.

**14** ඊළඟට ඔහු පාප පූජාව සඳහා
ඔප්පු කරන ගවයාව[7] ගෙනාවේය.
එවිට ආරොන්ද ඔහුගේ පුත්‍රයන්ද ගව-
යාගේ හිස මත තම අත් තැබූහ.[8]
**15** ඉන්පසු මෝසෙස් ඌව මරා[9] තම
ඇඟිල්ලෙන් උගේ ලේ[10] ටිකක් ගෙන
පූජාසනය වටා තිබෙන අං මත තැව-
රුවේය. මෙසේ, ඔහු පූජාසනය පවිත්‍ර
කළේය. ඉතුරු ලේ ටික ඔහු පූජාසන-
යේ පාමුලට වත් කළේය. පූජාසනය
පරිශුද්ධ දෙයක්[11] ලෙස වෙන් කර
තබන පිණිස ඔහු ඒ සියල්ල කළේය.
**16** ඉන්පසු මෝසෙස් සතාගේ බඩ-
වැල් වටාද අක්මාව වටාද තිබූ සම්-
පූර්ණ තෙල් තට්ටුවද වකුගඩු දෙකද
ඒවායේ තෙල්ද රැගෙන පූජාසනය
මත දැවීය.[12] **17** යෙහෝවා දෙවි
මෝසෙස්ට අණ කළ ලෙසම ඔහු ගව-
යාවද උගේ හමද මාංසයද ගො-
මද කඳවුරෙන් පිටතට ගෙන ගොස්
පිලිස්සුවේය.[13]

**18** ඉන්පසු ඔහු දවන පූජාව සඳහා
ඔප්පු කරන බැටළුවාව ළඟට ගෙ-
නාවේය. එවිට ආරොන් සහ ඔහු-
ගේ පුත්‍රයෝ උගේ හිස මත තම
අත් තැබූහ.[1] **19** ඉන්පසු මෝසෙස්
බැටළුවාව මරා උගේ ලේ පූජාසන-
යේ සෑම පැත්තටම ඉසීය.[2] **20** ඔහු
බැටළුවාව කැබලිවලට කපා[3] උගේ
හිසද කපාගත් කැබලිද තෙල් කො-
ටස්ද පූජාසනය මත දැවීය.
**21** උගේ බඩවැල් සහ පාද වතුරෙන්
සේදූ පසු මෝසෙස් මුළු බැටළුවාම
පූජාසනය මත දැවීය.[4] එය ප්‍රසන්න
සුවඳක් ගෙනෙන දවන පූජාවක් විය.[5]
යෙහෝවා දෙවි මෝසෙස්ට අණ කළ
ලෙසම එය දවන පූජාවක් ලෙස යෙ-
හෝවා දෙවිට ඔප්පු කළේය.

**22** ඉන්පසු ඔහු අභිෂේක කිරීමේ
පූජාව සඳහා ඔප්පු කරන බැටළුවාව
ගෙනාවේය.[6] ආරොන්ද ඔහුගේ පුත්‍ර-
යෝද උගේ හිස මත තම අත් තැබූහ.
**23** ඉන්පසු මෝසෙස් ඌව මරා උගේ
ලේ ස්වල්පයක් ගෙන ආරොන්ගේ
දකුණු කන් පෙත්ත මතද ඔහුගේ
දකුණතේ සහ දකුණු පයේ මාප-
ටැඟිල්ල මතද ගෑවේය.[7] **24** ඉන්-
පසු මෝසෙස් ආරොන්ගේ පුත්‍රයන්ව
ළඟට කැඳවා ඔවුන් එකිනෙකාගේ
දකුණු කන් පෙත්ත මතද දකුණතේ
සහ දකුණු පයේ මාපටැඟිල්ල මතද
ලේ ස්වල්පයක් ගෑවේය. ඉතුරු ලේ
ටික ඔහු පූජාසනයේ සෑම පැත්තටම
ඉසීය.[8]

**25** ඉන්පසු මෝසෙස් තෙල් කො-
ටස්ද තෙලින් පිරුණු වලිගයද
බඩවැල් වටා තිබූ තෙල් කො-
ටස් සියල්ලද[9] අක්මාව වටා තිබෙන
තෙල්ද වකුගඩු දෙක සහ ඒවායේ
තෙල්ද බැටළුවාගේ දකුණු ගාත-
යද ගත්තේය.[10] **26** යෙහෝවා දෙවි
ඉදිරියේ තිබූ මුහුන් නොදැමූ රොටි
සහිත කූඩයෙන් ඔහු මුද්දක හැඩැති
රොටියක්ද[11] තෙල් මිශ්‍ර කර සාදා-
ගත් මුද්දක හැඩැති රොටියක්ද[12]
සිහින් රොටියක්ද[13] ගෙන බැටළු-
වාගේ තෙල් කොටස් හා දකුණු
ගාතය මත තැබුවේය. **27** ඊළඟට
ඔහු ඒ සියල්ල ආරොන්ගේ සහ ඔහු-
ගේ පුත්‍රයන්ගේ අල්ල මත තබා
ඒවා යෙහෝවා දෙවි ඉදිරියේ ඒ මේ

**8 පරි.**
**1** නික් 30:26
**2** නික් 30:28
**3** නික් 29:7, නික් 30:30, නික් 40:13, ලෙවී 21:10, ගීතා 133:2, ක්‍රියා 10:38
**4** නික් 29:8, නික් 40:14
**5** නික් 29:9
**6** නික් 28:40
**7** නික් 29:10, ලෙවී 4:3, ලෙවී 16:6, එස 43:19
**8** ලෙවී 1:4, ලෙවී 4:4
**9** නික් 29:11
**10** නික් 29:12, හෙබ්‍රෙ 9:22
**11** ලෙවී 6:7, ලෙවී 6:30
**12** නික් 29:13, ලෙවී 4:8, ගීතා 69:9
**13** නික් 29:14, ලෙවී 4:11, ලෙවී 16:27, හෙබ්‍රෙ 13:12

**2 තීරුව**
**1** නික් 29:15, ලෙවී 1:4
**2** නික් 29:16
**3** නික් 29:17
**4** නික් 29:18
**5** උත් 8:21, එෆී 5:2
**6** නික් 29:19, ලෙවී 8:33
**7** නික් 29:20, ලෙවී 14:14, ලූක් 24:44
**8** නික් 24:6
**9** ලෙවී 3:16, ලෙවී 4:9, ලෙවී 9:10, එස 44:7
**10** නික් 29:22
**11** ලෙවී 2:4, ලෙවී 7:12, 1කොරි 5:8
**12** නික් 29:2, ගණන් 6:15
**13** නික් 29:23

අත සෙලෙව්වේය. දෙවිට පිළිගන්වන
පිණිස කරන සෙලවීමේ පූජාවක් වශ-
යෙන් එසේ කළේය.[1] **28** ඉන්පසු
මෝසෙස් ඒවා ඔවුන්ගේ අල්ලෙන්
ඉවතට ගෙන පූජාසනයේ තිබූ දවන
පූජාව මත දැවීය.[2] එය යෙහෝවා
දෙවිට ප්‍රසන්න සුවඳක්[3] ගෙනෙන
පිණිස පූජාසනය මත දවනු ලැබූ අභි-
ෂේක[4] කිරීමේ පූජාවකි.[5]
**29** මෝසෙස් බැටළුවාගේ පපු[6]
කොටස අතට ගෙන දෙවිට පිළිගන්-
වන පිණිස සෙලවීමේ පූජාවක් ලෙස
එය යෙහෝවා දෙවි ඉදිරියේ ඒ මේ
අත සෙලෙව්වේය.[7] අභිෂේක කිරීමේ
පූජාවට ඔප්පු කරන බැටළුවාගෙන්
ගත් එම කොටස[8] මෝසෙස්ට අයිති
විය. යෙහෝවා දෙවි මෝසෙස්ට අණ
කළ ලෙසම ඔහු සිදු කළේය.
**30** ඉන්පසු මෝසෙස් ශුද්ධ තෛ-
ලයෙන්[9] ස්වල්පයක්ද පූජාසනය මත
තිබූ ලේ ස්වල්පයක්ද ගෙන ආරොන්
සහ ඔහුගේ පුත්‍රයන් මතටද ඔවුන්
සියලුදෙනාගේ වස්ත්‍රවලටද ඉසීය.
මෙසේ, ඔහු ආරොන්වද ඔහුගේ පුත්‍ර-
යන්වද[10] පරිශුද්ධ සේවය සඳහා
කැප[11] කළේය. ඔවුන් සියලුදෙනාගේ
වස්ත්‍රද ශුද්ධ දේවල් ලෙස වෙන් කර
තැබුවේය.
**31** ඉන්පසු මෝසෙස් ආරොන්ටද
ඔහුගේ පුත්‍රයන්ටද මෙසේ කීවේය.
"සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල් වන
ස්ථානයේ මස් තම්බන්න.[12] තම්-
බාගත් මස්ද අභිෂේක කිරීමේ පූජාව
සඳහා ගෙනා කූඩයේ තිබෙන රොටිද
ඔබ එතැන සිට අනුභව කළ යුතුයි.[13]
මන්ද 'ආරොන් සහ ඔහුගේ පුත්‍රයන්
එයින් අනුභව කළ යුතුයි' කියා දෙවි
මට පැවසුවා. **32** ඉතුරු වන මස්
හා රොටි ඔබ ගින්නෙන් පිළිස්-
සිය යුතුයි.[14] **33** අභිෂේක කිරීමේ
දවස් සම්පූර්ණ වන තෙක් ඔබ දවස්
හතක්ම[15] සම්මුඛ වීමේ කූඩාරමට
ඇතුල් වන ස්ථානයේම රැඳී සිටින්න.
මන්ද පූජකයන් ලෙස සේවය කිරීමට
ඔබට බලය ලැබීමට දවස් හතක් ගත
වෙයි.[16] **34** අද මේ සියල්ල සිදු
කළේ යෙහෝවා දෙවි අණ කළ
ආකාරයටයි. එසේ කිරීමට දෙවි අණ
කළේ ඔබේ පාපවලට සමාව ලබාගැ-
නීම සඳහායි.[1] **35** ඔබ දවස් හතක්[2]
පුරා සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල්
වන තැන රැඳී සිටිය යුතුයි. ඔබේ ජීවි-
තය රැකගැනීම සඳහා ඔබ අනිවාර්ය-
යෙන්ම යෙහෝවා දෙවි වෙනුවෙන්
මුර සේවයේ යෙදිය යුතුයි.[3] මන්ද
එලෙස කරන මෙන් දෙවි මට අණ
කළා."
**36** මෝසෙස් මාර්ගයෙන් යෙ-
හෝවා දෙවි අණ කළ සියල්ල ආරොන්
සහ ඔහුගේ පුත්‍රයෝ කළෝය.

**9** අටවන[4] දවසේදී මෝසෙස්
ආරොන්වත් ඔහුගේ පුත්‍රයන්-
වත් ඊශ්‍රායෙල්හි වැඩිමහල්ලන්-
වත් කැඳෙව්වේය. **2** ඔහු ආරොන්ට
මෙසේ කීවේය. "පාප පූජාවක්[5] සඳහා
නිකැළැල් වස්සෙකුව හා දවන පූජා-
වක්[6] සඳහා නිකැළැල් බැටළුවෙකුව
ගෙන උන්ව යෙහෝවා දෙවි ඉදිරියේ
ඔප්පු කරන්න.[7] **3** ඔබ ඊශ්‍රායෙල්
සෙනඟට මෙසේ කියන්න. 'පාප පූජා-
වක් සඳහා එළුවෙකුව[8] ගෙනෙන්න.
දවන පූජාවක් සඳහා අවුරුද්දක් වය-
සැති වස්සෙකුව හා බැටළු පැටවෙ-
කුවද[9] ගෙනෙන්න. උන් නිකැළැල්
සතුන් විය යුතුයි. **4** හවුල් පූජා-
වක්[10] ලෙස යෙහෝවා දෙවි ඉදිරියේ
ඔප්පු කරන පිණිස ගවයෙකුව හා
බැටළුවෙකුවද තෙල් සහිත ධාන්‍ය
පූජාවක්ද[11] ගෙනෙන්න. මන්ද යෙ-
හෝවා දෙවි අද ඔබ ඉදිරියේ පෙනී
සිටිනවා.' "[12]
**5** එබැවින් මෝසෙස් ගෙනෙන්න
කියා අණ කළ සියල්ල රැගෙන
ඔවුහු සම්මුඛ වීමේ කූඩාරම ඉදිරි-
යට ගියෝය. මුළු සෙනඟම එතැ-
නට ඇවිත් යෙහෝවා දෙවි ඉදිරියේ
සිටගත්තෝය.[13] **6** එවිට මෝසෙස්
මෙසේ කීවේය. "ඔබ යෙහෝවා දෙ-
විගේ තේජස දකින පිණිස මේ
දේවල් කරන්න කියා යෙහෝවා දෙවි
අණ කළා."[14] **7** ඉන්පසු මෝසෙස්
ආරොන්ට මෙසේ කීවේය. "යෙහෝවා

**8 පරි.**
**1** නික් 29:24 ගණන් 8:13
**2** නික් 29:25
**3** උත් 8:21 නික් 29:41 එෆී 5:2
**4** නික් 29:19 ලෙවී 7:37
**5** ලෙවී 1:13 ලෙවී 3:5
**6** හිතෝ 23:26
**7** නික් 29:26 ලෙවී 7:30
**8** නික් 29:27 ලෙවී 7:35
**9** නික් 29:21 නික් 30:30 ගීතා 99:6
**10** ගණන් 3:3
**11** නික් 29:37
**12** නික් 29:31 ලෙවී 6:28 1සාමු 2:13
**13** නික් 29:32 ලෙවී 10:17 1කොරි 9:13 ගලා 6:6
**14** නික් 29:34
**15** නික් 29:30
**16** නික් 29:35 ගණන් 3:3

**2 තීරුව**
**1** නික් 29:36 ලෙවී 17:11 හෙබ්‍රෙ 2:17
**2** නික් 29:37
**3** ගණන් 1:53 ගණන් 3:7 ද්වි 11:1 එස 48:11

**9 පරි.**
**4** ලෙවී 8:35 එස 43:27
**5** ලෙවී 4:3
**6** ලෙවී 8:18
**7** ලෙවී 8:14
**8** ලෙවී 4:23 ලෙවී 16:15 එස්රා 6:17
**9** ලෙවී 16:5 එස්රා 10:19
**10** ලෙවී 3:1
**11** ලෙවී 2:4 ලෙවී 6:14
**12** නික් 29:43
**13** නික් 19:17 ද්වි 31:12
**14** නික් 16:10 නික් 24:16 නික් 40:34 2ලේක 5:14

දෙවි අණ කළ ලෙස පූජාසනය ළඟට
ගොස් ඔබ ගෙනා පාප පූජාව[1] සහ
දවන පූජාව ඔප්පු කර ඔබේ සහ ඔබේ
ගෙයි වැසියන්ගේ පව්වලට සමාව
ලබාගන්න.[2] සෙනඟ[3] ගෙනා පූජාව
ඔවුන් වෙනුවෙන් ඔප්පු කර ඔවුන්ගේ
පව්වලට සමාව ලබාගන්න.”[4]

**8** ආරොන් එවෙලේම පූජාසනය
ළඟට ගොස් පාප පූජාව සඳහා තමා
ගෙනා වස්සාව මැරුවේය.[5] **9** ඉන්-
පසු ආරොන්ගේ පුත්‍රයෝ සතාගේ
ලේ[6] ඔහු වෙතට ගෙනාවෝය. ඔහු
තම ඇඟිල්ල ලේවල[7] ගිල්වා පූජාස-
නයේ අං මත එය තැවරීය.[8] ඔහු
ඉතුරු ලේ ටික පූජාසනයේ පාමු-
ලට වත් කළේය. **10** යෙහෝවා
දෙවි මෝසෙස්ට අණ කළ ලෙසම,
ආරොන් පාප පූජාවට ගෙනා සතාගේ
තෙල්[9] කොටස්ද වකුගඩු දෙකද අක්-
මාව වටා තිබෙන තෙල්ද පූජාසනය
මත දැවීය.[10] **11** ඉන්පසු සතාගේ
මාංසය සහ හම කඳවුරෙන් පිට-
තට ගෙන ගොස් ගින්නෙන් පිලිස්සු-
වේය.[11]

**12** ඉන්පසු ඔහු දවන පූජාව සඳහා
ගෙනා සතාව මැරීය. ආරොන්ගේ
පුත්‍රයෝ සතාගේ ලේ ඔහු වෙත ගෙ-
නාවෝය. එවිට ඔහු ඒ ලේ පූජා-
සනයේ සෑම පැත්තටම ඉසීය.[12]
**13** දවන පූජාවට මැරූ සතාගේ මස්
කැබලිද උගේ හිසද ඔවුහු ආරොන්ට
දුන්නෝය. ඔහු ඒවා පූජාසනය මත
දැවීය.[13] **14** උගේ බඩවැල් හා පාද
සෝදා පූජාසනයේ තිබූ දවන පූජාව
මත ඒවා දැවීය.[14]

**15** ඉන්පසු ඔහු සෙනඟ ගෙනා
පූජා ඔප්පු කළේය.[15] කලින්
කළාක් මෙන් පාප පූජාව සඳහා සෙ-
නඟ ගෙනා එළුවාව මරා ඔවුන්ගේ
පාප වෙනුවෙන් ඌව ඔප්පු කළේය.
**16** ඉන්පසු ඔහු දවන පූජාවද ඔප්පු
කළේය. සාමාන්‍යයෙන් දවන පූජා
ඔප්පු කරන ආකාරයටම එය ඔප්පු
කළේය.[16]

**17** ඉන්පසු ඔහු ධාන්‍ය පූජාව[17]
ගෙනැවිත් එයින් අහුරක් ගෙන එය
පූජාසනය මත දැවීය. උදෑසන ඔප්පු
කළ දවන පූජාවට අමතරව මෙම
ධාන්‍ය පූජාවද ඔප්පු කළේය.[1]

**18** පසුව සෙනඟ හවුල් පූජාව[2]
සඳහා ගෙනා ගවයාව සහ බැටළුවාව
ඔහු මැරුවේය. ඉන්පසු ආරොන්ගේ
පුත්‍රයෝ එම සතුන්ගේ ලේ ඔහු වෙ-
තට ගෙනාවෝය. ඔහු ලේ ගෙන
පූජාසනයේ සෑම පැත්තටම ඉසීය.[3]
**19** ඔවුහු ගවයාගේ තෙල් කොටස්ද[4]
බැටළුවාගේ තෙලින් පිරුණු වලිග-
යද[5] බඩවැල් වටා ඇති තෙල් තට්ටු-
වද වකුගඩු දෙකද අක්මාව වටා
තිබෙන තෙල්ද ගෙන, **20** සතාගේ
පපු[6] කොටස මත ඒවා තැබූහ. ඉන්-
පසු ආරොන් තෙල් කොටස් පූජාස-
නය මත දැවීය. **21** නමුත් ඔහු
සතාගේ පපු කොටස සහ දකුණු
ගාතය අතට ගෙන, දෙවිට පිළිගන්-
වන පිණිස කරන සෙලවීමේ පූජාවක්[7]
වශයෙන් ඒවා යෙහෝවා දෙවි ඉදිරි-
යේ ඒ මේ අත සෙලෙව්වේය. මෝ-
සෙස් අණ කළ ලෙස ඔහු කළේය.

**22** ඉන්පසු ආරොන් සෙනඟ දෙ-
සට අත් දිගු කර ඔවුන්ට ආශීර්වාද
කළේය.[8] පාප පූජාව, දවන පූජාව
සහ හවුල් පූජාව ඔප්පු කළ පසු ඔහු
පූජාසනය වෙතින් බැස ආවේය.[9]
**23** පසුව මෝසෙස් සහ ආරොන් සම්-
මුඛ වීමේ කූඩාරමට ඇතුල් වුණෝය.
ඉන්පසු ඔවුහු පිටතට පැමිණ සෙ-
නඟට ආශීර්වාද කළෝය.[10]

එවිට මුළු සෙනඟට යෙහෝවා
දෙවිගේ තේජස[11] දකින්න ලැබිණ.
**24** යෙහෝවා දෙවි වෙතින් ගින්නක්
නික්ම ඇවිත්[12] පූජාසනය මත තිබූ
දවන පූජාව සහ තෙල් කොටස්
සියල්ල දවා දැමුවේය. එය දැක
මුළු සෙනඟ මහත් හඬක්[13] නඟමින්
දණින් වැටී නමස්කාර කළෝය.

**10** දිනක්, ආරොන්ගේ පුත්‍රයන්
වන නාදාබ් සහ අබිහු[14] තම
තමන්ගේ සුවඳ දුම් ඔප්පු කරන

**9 පරි.**
**1** ලෙවී 4:3
**2** ලෙවී 8:34; හෙබ්‍රෙ 5:3; හෙබ්‍රෙ 7:27
**3** හෙබ්‍රෙ 5:1
**4** ලෙවී 16:33; හෙබ්‍රෙ 9:7
**5** ලෙවී 4:4
**6** හෙබ්‍රෙ 9:22
**7** ලෙවී 8:15
**8** ලෙවී 4:7; ලෙවී 16:18
**9** ලෙවී 3:3; ලෙවී 4:8
**10** ලෙවී 8:16
**11** ලෙවී 4:12; ලෙවී 8:17; හෙබ්‍රෙ 13:11
**12** ලෙවී 1:5; ලෙවී 8:19
**13** ලෙවී 8:20
**14** ලෙවී 8:21
**15** ලෙවී 4:27; යෙසා 53:10; යොහ 1:29; 1කොරි 15:3; 2කොරි 5:21; ගලා 1:4; එෆී 5:2; තීත 2:14; හෙබ්‍රෙ 2:17; 1පේතෘ 2:24; 1යොහ 2:2
**16** ලෙවී 1:3; ලෙවී 5:10; ලෙවී 6:9; ලෙවී 8:18
**17** ලෙවී 2:1; ලෙවී 2:4; ලෙවී 2:11; ලෙවී 2:13

**2 තීරුව**
**1** නික් 29:39
**2** ලෙවී 3:1; ලෙවී 7:11
**3** ලෙවී 3:2
**4** ලෙවී 3:3
**5** නික් 29:22; ලෙවී 3:9; ලෙවී 8:25
**6** ලෙවී 7:30
**7** නික් 29:27; ලෙවී 8:27
**8** ගණන් 6:23; ද්වි 10:8; ද්වි 21:5; 1ලේක 23:13; ලූක් 24:50; ක්‍රියා 3:26; හෙබ්‍රෙ 7:7
**9** නික් 20:26
**10** 2සාමු 6:18; 2ලේක 6:3
**11** ලෙවී 9:6; ගණන් 14:10; ගණන් 16:42
**12** විනි 6:21; 1රාජා 18:38; 1ලේක 21:26; 2ලේක 7:1

**13** 1රාජා 18:39; 2ලේක 7:3; **10 පරි.** 14 නික් 6:23; 1ලේක 24:2.

භාජන[1] ගෙන ඒවායෙහි සුවඳ ද්‍රව්‍ය
දවා,[2] යෙහෝවා දෙවි ඔවුන්ට නියම
නොකළ ආකාරයකට දෙවි ඉදිරි-
යේ ගින්නක් ඔප්පු කළෝය. ඔවුන්
එම ගින්න ඔප්පු කළේ දෙවිගේ
නීතියට පටහැනිවයි.[3] **2** ඒ අවස්-
ථාවේදී යෙහෝවා දෙවිගෙන් ගින්-
නක් නික්ම ඇවිත් ඔවුන් දෙදෙනාව
පුලුස්සා දැමුවේය.[4] ඔවුහු යෙහෝවා
දෙවි ඉදිරියේ මිය ගියෝය.[5] **3** එවිට
මෝසෙස් ආරොන්ට මෙසේ කීවේය.
"දෙවි මෙසේ පැවසුවා. 'යෙහෝවා
දෙවි වන මා ඉදිරියට පැමිණෙන සිය-
ලුදෙනා[6] මාව සැලකිය යුත්තේ ඉතා
ශුද්ධ කෙනෙකු ලෙසයි.[7] එමෙන්ම
මුළු සෙනඟ මාව ගෞරවයට[8] පත්
කළ යුතුයි.'" ඒ අවස්ථාවේදී ආරොන්
නිහඬව සිටියේය.

**4** ඉන් අනතුරුව, මෝසෙස්
ආරොන්ගේ මාමා වූ උස්සියෙල්ගේ[9]
පුත්‍රයන් වන මිෂායෙල් සහ එල්ෂා-
ෆාන්ට මෙසේ කීවේය. "ඇවිත් ශුද්-
ධස්ථානය ඉදිරිපිට තිබෙන ඔබේ
සහෝදරයන්ගේ මළ කඳන් ඉවතට
ගෙන යන්න. ඔවුන්ව කඳවුරෙන්
පිටතට රැගෙන යන්න."[10] **5** එවිට
ඔවුහු මෝසෙස් අණ කළ ලෙස
නාදාබ්ව සහ අබිහුව ඇඳුම් පිටින්ම
කඳවුරෙන් පිටතට රැගෙන ගියෝය.

**6** ඉන්පසු මෝසෙස් ආරොන්ටද
ඔහුගේ ඉතුරු පුත්‍රයන් වන එලියා-
සර් සහ ඉතාමාර්ටද මෙසේ කීවේය.
"ඔබේ හිසකෙස් අවුල්[11] කරගන්න-
වත් ඔබේ ඇඳුම් ඉරාගන්නවත් එපා.
ඔබ එසේ කළොත් ඔබේ ජීවිතය
ඔබට අහිමි වෙයි. දෙවි මුළු සෙනඟ
සමඟද කෝප වෙයි.[12] යෙහෝවා දෙ-
විගෙන් නික්ම ආ ගින්න නිසා සිදු වූ
විනාශය ගැන ඔබ වෙනුවට ඔබේ
සහෝදරයන් වන මුළු ඊශ්‍රායෙල් සෙ-
නඟ වැලපෙයි. **7** යෙහෝවා දෙවි-
ගේ ශුද්ධ තෛලයෙන් ඔබව අභිෂේක
කර තිබෙන නිසා[13] සම්මුඛ වීමේ
කූඩාරමට ඇතුල් වන ස්ථානයෙන්
පිටතට නොයන්න. එතැනින් පිට-
තට ගියොත් නිසැකවම ඔබ මිය
යයි."[1] ඔවුහු මෝසෙස් කී දේට සවන්
දුන්නෝය.

**8** යෙහෝවා දෙවි ආරොන්ට
මෙසේ කීවේය. **9** "ඔබත් ඔබේ
පුත්‍රයනුත් සම්මුඛ වීමේ කූඩාරමට
ඇතුල් වන විට වයින්වත් වෙන
ඕනෑම මත්පැන්[2] වර්ගයක්වත් පානය
නොකළ යුතුයි. ඒවා පානය කළොත්
නිසැකවම ඔබ මිය යනු ඇත. එය
ඔබත් ඔබෙන් පැවත එන අයත් හැම-
දාටම පිළිපැදිය යුතු නියෝගයකි.
**10** එම නියෝගය දී තිබෙන්නේ ශුද්ධ
දේ සහ පිළිකුල් දේ අතරද පවිත්‍ර
දේ හා අපවිත්‍ර දේ අතරද තිබෙන
වෙනස පැහැදිලිව දකින පිණිසය.[3]
**11** එමෙන්ම යෙහෝවා දෙවි වන මා
මෝසෙස් මාර්ගයෙන් ඊශ්‍රායෙල් සෙ-
නඟට දුන් සියලු අණපනත් ඔවුන්ට
උගන්වන පිණිසය."[4]

**12** ඉන්පසු මෝසෙස්, ආරොන්ටද
ජීවතුන් අතරේ සිටි ඔහුගේ පුත්‍රයන්
වන එලියාසර් සහ ඉතාමාර්ටද මෙසේ
කීවේය. "යෙහෝවා දෙවිට ගින්නෙන්
දවා ඔප්පු කළ පූජාවෙන් ඉතුරු වී
තිබෙන ධාන්‍ය පූජාව[5] රැගෙන පූජාස-
නය අසලදී කන්න. එයට මුහුන්
එකතු කරන්න එපා. මන්ද එය ඉතා
ශුද්ධයි.[6] **13** ඔබ එය ශුද්ධ තැනකදී
කෑ යුතුයි.[7] යෙහෝවා දෙවිට ගින්-
නෙන් ඔප්පු කරන ලද පූජාවලින්
ඔබටත් ඔබේ පුත්‍රයන්ටත් ලැබෙන
කොටස එයයි. මේ දේවල් ඔබට පව-
සන්න කියා දෙවි මට අණ කළා.
**14** සෙලවීමේ පූජාවේ පපු කොටස[8]
සහ ශුද්ධ කොටස ලෙස වෙන් කර-
ගත් ගාත් කොටස[9] ගෙන පවිත්‍ර
තැනකදී කෑ යුතුයි. ඔබේ පුත්‍රයන්
හා දූවරුන් සමඟ ඔබ එය කෑ
යුතුයි.[10] මන්ද ඊශ්‍රායෙල් සෙනඟ
ඔප්පු කරන හවුල් පූජාවලින් ඔබටත්
ඔබේ පුත්‍රයන්ටත් ලැබෙන කොටස
එයයි. **15** ඊශ්‍රායෙල් සෙනඟ ගින්-
නෙන් ඔප්පු කරන ලද පූජාවල
තෙල් කොටස් සමඟ ශුද්ධ කොටස
ලෙස වෙන් කරගත් ගාත් කොටස
සහ සෙලවීමේ පූජාව[11] සඳහා ගත් පපු

**10 පරි.**

**1** නික් 27:3; ලෙවී 16:12
**2** නික් 30:35; ලෙවී 16:12
**3** නික් 30:9; ලෙවී 10:9; ලෙවී 16:2; යෙසා 28:7
**4** ගණන් 16:35
**5** ලෙවී 22:9; ගණන් 26:61
**6** නික් 19:22; යෙසා 52:11
**7** යෙසා 29:23; එස 20:41; මතෙ 6:9
**8** යෙසා 49:3; යොහ 13:31; 2තෙස 1:10
**9** නික් 6:18
**10** ක්‍රියා 5:6
**11** ලෙවී 21:10; ගණන් 6:7
**12** ගණන් 16:22; යොෂු 7:1
**13** නික් 28:41; ලෙවී 8:12

**2 තීරුව**

**1** ලෙවී 21:12
**2** හිතෝ 31:5; යෙසා 28:7; එස 44:21; හොෂෙ 4:11; එෆි 5:18; 1තිමෝ 3:3; 1තිමෝ 3:8; තීත 1:7
**3** එස 22:26; එස 44:23
**4** ද්වි 24:8; ද්වි 33:10; 2ලේක 17:9; නෙහෙ 8:8; යෙරෙ 18:18; මලා 2:7
**5** නික් 29:2; ලෙවී 6:16
**6** ලෙවී 21:22
**7** ලෙවී 6:26; ගණන් 18:10
**8** නික් 29:26; ලෙවී 7:31; ලෙවී 9:21; ගණන් 18:11
**9** ලෙවී 7:34
**10** ලෙවී 22:13
**11** ලෙවී 8:29; ගණන් 18:18

කොටස රැගෙන ආ යුතුයි. යෙහෝවා
දෙවි ඉදිරියේ සෙලවීමේ පූජාවක් වශ-
යෙන් ඒ මේ අත සොලවන පිණිස
ඔවුන් ඒවා රැගෙන ආ යුතුයි. යෙ-
හෝවා දෙවි අණ කළ ලෙස එම
කොටස ඔබටත් ඔබේ පුත්‍රයන්ටත්
ලැබෙනවා.[1] එය බොහෝ කාලයකට
වලංගු නියෝගයක්.”
**16** මෝසෙස් පාප පූජාව සඳහා
ඔප්පු කළ එළුවා[2] ගැන විමසා බැලූ
විට ඌව සම්පූර්ණයෙන් දවා ඇති
බව ඔහුට දැනගන්න ලැබිණ. එවිට
ඔහු ආරොන්ගේ පුත්‍රයන් වන එලියා-
සර් සහ ඉතමාර් සමඟ අතිශයින්
කෝප වී ඔවුන්ට මෙසේ කීවේය.
**17** “ඔබ පාප පූජාවේ මස් ශුද්ධ තැන-
කදී[3] නොකෑවේ ඇයි? සෙනඟගේ පව්
දරමින් දෙවිගෙන් ඔවුන්ගේ පව්වලට
සමාව ලබාගන්න පිණිසයි යෙහෝවා
දෙවි ඔබට එය දුන්නේ.[4] එය ඉතා
ශුද්ධ දෙයක්. **18** ඔබ දෙවි අණ
කළ ලෙස[5] පූජාවේ මස් ශුද්ධ තැන-
කට ගෙන ගොස් කෑවේ නැහැ. ඔබ
සතාගේ ලේ ශුද්ධස්ථානයට ගෙනා-
වෙත් නැහැ.”[6] **19** එවිට ආරොන්
මෝසෙස්ට මෙසේ කීවේය. “මම යෙ-
හෝවා දෙවි ඉදිරියේ පාප පූජාව සහ
දවන පූජාව ඔප්පු කළේ[7] මහත් විප-
තකට මුහුණ දුන් වෙලාවකදී. මේ
වගේ වේදනාකාරී අවස්ථාවකදී මම
පාප පූජාවේ මස් අනුභව කළා නම්
යෙහෝවා දෙවි ඒ ගැන සතුටු වෙ-
යිද?”[8] **20** එවිට මෝසෙස්ගේ කෝ-
පය පහව ගියේය.

**11** නැවතත් යෙහෝවා දෙවි
මෝසෙස් සහ ආරොන්ව
අමතා මෙසේ කීවේය. **2** “ඊශ්‍රායෙල්
සෙනඟට මෙසේ කියන්න. ‘පොළො-
වේ සිටින සියලු සතුන් අතරින් ඔබ
අනුභව කළ යුත්තේ මේ සතුන්ව
පමණයි.[9] **3** කුර දෙකට බෙදුණු,
වමාරා කන සෑම සතෙකුම ඔබට
කෑමට ගත හැකියි.[10]
**4** “‘නමුත් එම සතුන් අතරින් ඔබ
කෑමට නොගත යුතු සත්තුද සිටිති.
ඔටුවා වමාරා කන නමුත් උගේ
කුර බෙදී නැත. ඔබ ඌව අප-
විත්‍ර සතෙකු ලෙස සැලකිය යුතුයි.[1]
එබැවින් උගේ මස් නොකෑ යුතුයි.
**5** බෙන්හාවා[2] වමාරා කන නමුත්
උගේ කුර බෙදී නැත. ඌව අපවිත්‍ර
සතෙකු ලෙස සැලකිය යුතුයි. එබැ-
වින් උගේ මස්ද නොකෑ යුතුයි.
**6** හාවා[3] වමාරා කන නමුත් උගේ
කුර බෙදී නැත. ඌ ඔබට අපවිත්‍රය.
එබැවින් උගේ මස්ද නොකෑ යුතුයි.
**7** ඌරාගේ[4] කුර දෙකට බෙදී තිබු-
ණත් ඌ වමාරා නොකන බැවින් ඌ
ඔබට අපවිත්‍රය. උගේ මස්ද නොකෑ
යුතුයි. **8** එම සතුන්ගේ මස් ඔබ
කිසිසේත් නොකෑ යුතුයි. උන්ගේ මළ
සිරුරුද ස්පර්ශ නොකරන්න.[5] ඒවා
ඔබට අපවිත්‍රය.[6]
**9** “‘ජලයේ සිටින සතුන්ගෙන්
ඔබ මේ සතුන්ව පමණක් කෑමට
ගන්න.[7] සාගරයේ හෝ ගංගාවේ
හෝ සිටින සියලු සතුන් අත-
රින් වරල් හා කොරපොතු[8] ඇති
සතුන්ව කෑමට ගන්න ඔබට හැකියි.
**10** සාගරයේ හෝ ගංගාවේ හෝ රංචු
පිටින් සිටින සතුන් ඇතුළුව අන්
සියලු සතුන් අතරින් වරල් හා කො-
රපොතු නැති සතුන්ව ඔබ ඉතා පිළි-
කුල් සතුන් ලෙස සැලකිය යුතුයි.
**11** ඔබ උන්ව පිළිකුල් සතුන් ලෙස
සැලකිය යුතු අතර උන්ව කිසිසේත්
නොකෑ යුතුයි.[9] උන්ගේ මළ කුණුද
පිළිකුල් දෙයක් ලෙස සලකන්න.
**12** වරල් හා කොරපොතු නැති ජල-
යේ සිටින සෑම සතෙකුවම ඔබ පිළි-
කුල් කළ යුතුයි.
**13** “‘ඔබ පියාසර කරන ජීවීන් අත-
රින් මේ පක්ෂීන්ව[10] නොකෑ යුතුයි.
උන්ව ඉතා පිළිකුල් කොට සැලකිය
යුතුයි. ඒ පක්ෂීන් නම්, රාජාලියා,[11]
මාළු උකුස්සා, කලු ගිජුලිහිණියා,
**14** නානාවිධ රතු හා කලු උකුස්-
සන්,[12] **15** නානාවිධ කපුටන්,[13]
**16** නානාවිධ පැස්බරුන්,[14] බස්සන්,
මුහුදු කපුටන්* සහ කුරුලුගොයන්ය.

**10 පරි.**
1 1කොරි 9:13
2 ලෙවී 9:3, ලෙවී 9:15
3 ලෙවී 6:26, ලෙවී 7:6, එස 44:29
4 නික් 28:38, ගණන් 18:1, යෙසා 53:11, යොහ 1:29, 2කොරි 5:21, හෙබ්‍රෙ 9:28, 1පේතෘ 2:24
5 ලෙවී 6:26
6 ලෙවී 6:30
7 ලෙවී 9:8, ලෙවී 9:12
8 ලෙවී 6:29

**11 පරි.**
9 ද්වි 14:4, එස 4:14
10 ද්වි 14:6

**2 තීරුව**
1 ද්වි 14:7
2 ගීතා 104:18, හිතෝ 30:26
3 ද්වි 14:7
4 ද්වි 14:8, යෙසා 65:4, යෙසා 66:3, යෙසා 66:17
5 ලෙවී 11:24
6 ක්‍රියා 10:14
7 ද්වි 14:9
8 මතෙ 4:18, ලූක් 24:42
9 ද්වි 14:3, ද්වි 14:10
10 ද්වි 14:12
11 යෝබ් 39:30, මතෙ 24:28
12 ද්වි 14:13
13 ද්වි 14:14
14 ද්වි 14:15

ලෙවී **11:16*** ගලුවියන්.

**17** සිහිති බස්සා, දියකාවා, කන් දිග බස්සා,[1] **18** හංසයා, පැස්තුඩුවා, ගිජුලිහිණියා,[2] **19** මානකොකා, නානාවිධ කොක්කු, පොරෝ කුරුල්ලා* හා වවුලා[3] යන පක්ෂීන්ව ඔබ නොකෑ යුතුයි. **20** එමෙන්ම පියාපත් ඇති, ඇවිදීමට හැකි රංචු ගැසෙන සියලු කෘමීන්වද ඔබ පිළිකුල් සතුන් ලෙස සැලකිය යුතුයි.[4]

**21** “‘එහෙත් එම කෘමීන් අතරින් දික් වූ පා යුගළක් ඇති බිම පැනපැන යන සතුන්ව ඔබට කෑමට ගත හැකියි. **22** එනම්, නානාවිධ පළහැටියන්,[5] රෑහැයියන්[6] සහ තණකොළ පෙත්තන්[7] කෑමට සුදුසුය. **23** පියාපත් ඇති, ඇවිදීමට හැකි රංචු ගැසෙන අනිකුත් සියලුම කෘමීන් ඔබ සැලකිය යුත්තේ පිළිකුල්[8] සතුන් ලෙසය. **24** එම කෘමීන් කැවොත් ඔබ අපවිත්‍ර වන්නේය. උන්ගේ මළ කුණු ස්පර්ශ කරන කවුරු නමුත් සවස් වන තුරු අපවිත්‍ර වන්නේය.[9] **25** මිය ගිය එවැනි සතෙකුව අල්ලන කවුරු නමුත් තම වස්ත්‍ර සෝදා[10] සවස් වන තුරු අපවිත්‍ර කෙනෙකු ලෙස වෙන් වී සිටිය යුතුයි.

**26** “‘කුර වෙන් වී තිබුණත් එය දෙකට බෙදී නැති වමාරා නොකන සියලු මෘගයන් අපවිත්‍ර සතුන් ලෙස සැලකිය යුතුයි. උන්ව ස්පර්ශ කරන කවුරු නමුත් අපවිත්‍ර වන්නේය.[11] **27** පාද සතරින් ඇවිදින සතුන් අතරින් පතුල පොළොවේ වදින සේ ඇවිදින සියලු සතුන් අපවිත්‍ර සතුන් ලෙස සැලකිය යුතුයි. උන්ගේ මළ කුණු ස්පර්ශ කරන කවරෙකු හෝ සවස් වන තුරු අපවිත්‍ර කෙනෙකු ලෙස වෙන් වී සිටිය යුතුයි. **28** මිය ගිය එවැනි සතෙකුව[12] උසුලාගෙන යන කවුරු නමුත් තම වස්ත්‍ර සෝදා[13] සවස් වන තුරු අපවිත්‍ර කෙනෙකු ලෙස වෙන් වී සිටිය යුතුයි. ඔබ එම සතුන්ව අපවිත්‍ර සතුන් ලෙස සැලකිය යුතුයි.

ලෙවී **11:19*** පොරෝඑවා.

**11 පරි.**
1 ද්වි 14:16
2 ද්වි 14:17
3 ද්වි 14:18
4 ද්වි 14:19
5 නික් 10:12 හිතෝ 30:27 යෙසා 33:4
6 මතෙ 3:4 මාක් 1:6
7 2ලේක 7:13
8 ද්වි 14:3
9 ලෙවී 17:15
10 නික් 19:10 ලෙවී 14:8 ලෙවී 15:5 ගණන් 19:10
11 ද්වි 14:8
12 ලෙවී 5:2
13 ලෙවී 17:16

**2 තීරුව**
1 හෙබ්‍රෙ 9:10
2 යෙසා 66:17
3 ලෙවී 22:5 ද්වි 14:19
4 ලෙවී 11:24
5 නික් 7:19
6 උත් 21:14
7 උත් 37:34
8 ලෙවී 6:28 මාක් 14:13
9 ලෙවී 15:12 යෙසා 30:14

**29** “‘පොළොවේ බහුලව සිටින කුඩා සතුන් අතරින් ඔබ අපවිත්‍ර ලෙස සැලකිය යුතු සතුන් නම්,[1] නානාවිධ මීයන්*[2] හා උරගයන්ය. **30** එමෙන්ම හූණා, තලගොයා, හිකනලා, වැලි හූණා සහ කටුස්සා යන සතුන්ද අපවිත්‍රය. **31** එම සතුන්ව ඔබ අපවිත්‍ර සතුන් ලෙස සැලකිය යුතුයි.[3] උන්ගේ මළ කුණු ස්පර්ශ කරන කවුරු නමුත් සවස් වන තුරු අපවිත්‍ර අය ලෙස වෙන් වී සිටිය යුතුයි.[4]

**32** “‘උන්ගේ මළ කුණු ලී භාජනයක්[5] හෝ වස්ත්‍රයක් හෝ සම් භාජනයක්[6] හෝ ගෝනියක්[7] හෝ වෙන ඕනෑම දෙයක් මතට වැටුණොත් එය අපවිත්‍ර වන්නේය. භාවිතයට ගන්නා භාජනයක් එලෙස අපවිත්‍ර වුණොත් එය වතුරේ ගිල්වා තැබිය යුතුයි. එය සවස් වන තුරු අපවිත්‍ර දෙයක් ලෙස සැලකිය යුතුයි. ඉන්පසු එය භාවිතයට ගත හැක. **33** උන්ගේ මළ කුණු මැටි භාජනයක්[8] තුළට වැටුණොත් භාජනය තුළ ඇති ඕනෑම දෙයක් අපවිත්‍ර වන්නේය. ඔබ එම භාජනය බිඳ දැමිය යුතුයි.[9] **34** එවැනි භාජනයක තිබූ වතුර කෑම මතට වැටුණොත් එයද අපවිත්‍ර වන්නේය. එවැනි භාජනයක තිබෙන ඕනෑම බීම වර්ගයක්ද අපවිත්‍රය. **35** උන්ගේ මළ කුණු යම් දෙයක් මතට වැටුණොත් එය අපවිත්‍ර වන්නේය. එම මළ කුණු උඳුනු හෝ දරණු මතට වැටුණොත් ඒවා කඩා දැමිය යුතුයි. මන්ද ඒවා අපවිත්‍රය. ඔබ ඒවා අපවිත්‍රයයි සැලකිය යුතුයි. **36** උන්ගේ මළ කුණු නිසා අපවිත්‍ර නොවන්නේ දිය උල්පතක් හෝ පොකුණක් පමණි. නමුත් උන්ගේ මළ කුණු ස්පර්ශ කරන කවුරු නමුත් අපවිත්‍ර වන්නේය. **37** වැපිරීමට තිබෙන බීජ මතට උන්ගේ මළ කුණු වැටුණොත් ඒවා අපවිත්‍ර

ලෙවී **11:29*** හෙබ්‍රෙව් භාෂාවට අනුව කෝලෙඩ් සහ අක්බා යනුවෙන් හැඳින්වෙන මීයන්.

වන්නේ නැත. 38 නමුත් තෙත් වූ
බීජ මතට සතෙකුගේ මළ කුණක්
වැටුණොත් එම බීජ ඔබ අපවිත්‍ර ලෙස
සැලකිය යුතුයි.

39 “ ‘ඔබට කෑමට අවසර තිබෙන
ඕනෑම සතෙකු මිය ගියොත්, එම මළ
සතාව ස්පර්ශ කරන කවුරු නමුත්
සවස් වන තුරු අපවිත්‍රව සිටින්-
නේය.[1] 40 උගේ මස් කන ඕනෑම
කෙනෙකු[2] තම වස්ත්‍ර සෝදා සවස්
වන තුරු අපවිත්‍ර කෙනෙකු ලෙස
වෙන් වී සිටිය යුතුයි. කවරෙකු හෝ
මළ සතාව උසුලාගෙන ගියොත්
ඔහුද තම වස්ත්‍ර සෝදා සවස් වන
තුරු අපවිත්‍ර කෙනෙකු ලෙස වෙන් වී
සිටිය යුතුයි. 41 පොළොවේ බහු-
ලව සිටින සියලුම කුඩා සතුන්
ඉතා පිළිකුල්ය.[3] උන්ව කිසිසේත්
නොකෑ යුතුයි. 42 පොළොවේ බහු-
ලව සිටින සියලුම කුඩා සතුන්
අතරින් බඩ ගා යන[4] හෝ පාද
සතරක් ඇති හෝ පාද බොහො-
මයක් ඇති කිසිම සතෙකුව ඔබ
නොකෑ යුතුයි. මන්ද උන් ඉතා
පිළිකුල්ය.[5] 43 බහුලව සිටින කුඩා
සතුන් පිළිකුල් සතුන් වන බැවින්
උන්ව කෑමෙන් හෝ ස්පර්ශ කිරීමෙන්
හෝ අපවිත්‍ර තත්වයකට පත් නො-
වන්න.[6] 44 මා ඔබේ දෙවි වන යෙ-
හෝවාය.[7] ඔබ පවිත්‍ර සෙනඟක් ලෙස
වෙන් වී සිටිය යුතුයි. මා ශුද්-
ධව[8] සිටින නිසා ඔබද ශුද්ධව සිටිය
යුතුයි.[9] එබැවින් ඔබ පොළොවේ
බහුලව සිටින කුඩා සතුන් නිසා
අපවිත්‍ර නොවන්න. 45 මා ඔබව
ඊජිප්තු දේශයෙන් පිටතට ගෙනා යෙ-
හෝවා දෙවිය. මා ඔබේ දෙවි බව
ඔබට ඔප්පු කර පෙන්වන පිණිස එසේ
කළෙමි.[10] මා ශුද්ධව[11] සිටින නිසා
ඔබද ශුද්ධව සිටිය යුතුයි.[12]

46 “ ‘මෘගයන්, පියාසර කරන
ජීවීන්, ජලයේ සිටින සියලු ජීවීන්[13]
සහ පොළොවේ බහුලව සිටින
කුඩා සතුන් සම්බන්ධ නීතිය එයයි.
47 පවිත්‍ර දේ හා අපවිත්‍ර දේ අත-
රද කෑමට සුදුසු සතුන් හා නුසු-
දුසු සතුන් අතරද තිබෙන වෙනස[1]
හඳුනාගන්නා පිණිස මම එම නීතිය
දුනිමි.’ ”

**12** යෙහෝවා දෙවි නැවතත්
මෝසෙස්ව අමතා මෙසේ
කීවේය. 2 “ඊශ්‍රායෙල් සෙනඟට
මෙසේ කියන්න. ‘ස්ත්‍රියක පිළිසිඳ-
ගෙන[2] පුත්‍රයෙකු බිහි කළොත් ඇගේ
ඔසප් දිනවලදී මෙන් ඇය දවස් හතක්
අපවිත්‍ර කෙනෙකු ලෙස වෙන්ව සිටිය
යුතුයි.[3] 3 අටවන දවසේදී දරු-
වාව චර්මච්ඡේදනය* කළ යුතුයි.[4]
4 ලේ ගැලීම හේතුවෙන් ඇය අපවිත්‍ර
තත්වයක සිටින නිසා එයින් පවිත්‍ර
වීමට තව අමතර දවස් තිස්තුනක්
ඇය නිවසේ රැඳී සිටිය යුතුයි. ඒ
සියලු දවස් සම්පූර්ණ වන තෙක් ශුද්-
ධස්ථානයට යෑමටවත් කිසිම ශුද්ධ
දෙයක් ස්පර්ශ කිරීමටවත් ඇයට අයි-
තියක් නැත.[5]

5 “ ‘ඇය දුවක බිහි කළොත් ඔසප්
දිනවලදී මෙන් දවස් දහහතරක් ඇය
අපවිත්‍ර කෙනෙකු ලෙස වෙන්ව සිටිය
යුතුයි. ලේ ගැලීම හේතුවෙන් ඇය
අපවිත්‍ර තත්වයක සිටින නිසා එයින්
පවිත්‍ර වීමට තව අමතර දවස් හැටහ-
යක් ඇය නිවසේ රැඳී සිටිය යුතුයි.
6 ඇය පුත්‍රයෙකු හෝ දුවක හෝ
බිහි කිරීමෙන් අනතුරුව පවිත්‍ර වීම
උදෙසා වෙන් කළ දවස් සම්පූර්ණ වූ
පසු දවන පූජාවක්[6] සඳහා අවුරුද්දක්
පමණ වයසැති බැටළු පැටවෙකුව
සහ පාප පූජාවක් සඳහා පරෙවි පැට-
වෙකුව හෝ කොබෙයියෙකුව[7] හෝ
සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල් වන
ස්ථානයට ගෙනැවිත් පූජකයාට දිය
යුතුයි. 7 ඇගේ පව්කාර තත්වයට
සමාව ලබාගන්නා පිණිස පූජකයා
එම පූජා යෙහෝවා දෙවි ඉදිරියේ
ඔප්පු කළ යුතුයි. එවිට ලේ ගැලීම
නිසා අපවිත්‍රව සිටි ඇය පවිත්‍ර වනු
ඇත.[8] දරුවෙකු බිහි කළ තැනැත්ති-
යක විසින් පිළිපැදිය යුතු නීතිය
එයයි. 8 ඇයට බැටළුවෙකු ගෙන

**11 පරි.**
1 ලෙවී 11:24; ගණන් 19:11; ගණන් 19:16
2 ලෙවී 17:15; ලෙවී 22:8; ද්වි 14:21; එස 4:14; එස 44:31; ක්‍රියා 10:13
3 ලෙවී 11:21
4 උත් 3:14; මීකා 7:17
5 ද්වි 14:3
6 ලෙවී 20:25
7 නික් 20:2; ද්වි 5:6
8 1පේත්‍රු 1:16; එළි 4:8
9 නික් 19:6; ලෙවී 19:2; ද්වි 14:2; 1තෙස 4:7; 1පේත්‍රු 1:15
10 උත් 46:4; නික් 6:7; නික් 29:46; ගීතා 81:10; හොෂෙ 11:1
11 යොෂු 24:19; 1සාමු 2:2; 1සාමු 6:20
12 නික් 22:31; ලෙවී 20:7; ලෙවී 20:26; ගණන් 15:40; ද්වි 7:6
13 උත් 1:21

**2 තීරුව**
1 ලෙවී 10:10; ලෙවී 20:25; එස 22:26; එස 44:23

**12 පරි.**
2 උත් 4:1
3 ලෙවී 15:19
4 උත් 17:12; උත් 21:4; ලූක් 1:59; ලූක් 2:21; යොහ 7:22
5 ලූක් 2:22
6 ලෙවී 1:4; ලෙවී 1:10
7 ලෙවී 15:14
8 ලෙවී 15:28

ලෙවී **12:3*** උත් 17:11හි පාදසටහන බලන්න.

ඒමට තරම් වත්කමක් නැත්නම් ඇය කොබෙයියන් දෙදෙනෙකුව හෝ පරෙවි පැටවුන්[1] දෙදෙනෙකුව හෝ ගෙනා යුතුයි. එකෙකු දවන පූජාව සඳහාය. අනිකා පාප පූජාව සඳහාය. ඇගේ පව්කාර තත්වයට සමාව[2] ලබාගන්නා පිණිස පූජකයා එම පූජා දෙවි ඉදිරියේ ඔප්පු කළ යුතුයි. එවිට ඇය පවිත්‍ර වනු ඇත.' "

**13** යෙහෝවා දෙවි මෝසෙස්ට සහ ආරොන්ට මෙසේ කීවේය. **2** "මිනිසෙකුගේ සමේ දදයක් හෝ තුවාලයක්[3] හෝ ලපයක් හෝ හටගත් විට එය ලාදුරු රෝගය[4] කියා සැකයක් ඇති වේ නම් එම නැනැත්තාව පූජක ආරොන් වෙතට හෝ ඔහුගේ පුත්‍රයෙකු වෙතට හෝ ගෙන යා යුතුයි.[5] **3** එවිට පූජකයා ඔහුගේ සමේ තිබෙන රෝගය පරීක්ෂා කර බැලිය යුතුයි.[6] රෝගය පැතිරුණු ස්ථානයේ රෝම දුර්වර්ණ වී, රෝගය සමට යටිනුත් පැතිර ඇති බව පෙනෙන්න තිබේ නම් එය ලාදුරු රෝගය වේ. පූජකයා ඔහුව සෝදිසි කර බැලූ පසු ඔහු අපවිත්‍ර කෙනෙකු ලෙස ප්‍රකාශ කළ යුතුයි. **4** එහෙත් සුදු පාට ලපයක් හටගෙන තිබෙන නමුත් එය සමට යටින් පැතිර නැති බවත් ඒ ස්ථානයේ තිබෙන රෝම දුර්වර්ණ වී නැති බවත් පෙනෙන්න තිබේ නම් පූජකයා ඔහුව දවස් හතක් වෙන් කර[7] තැබිය යුතුයි. **5** හත්වන දවසේදී පූජකයා ඔහුගේ රෝගය පරීක්ෂා කර බැලිය යුතුයි. ලපයේ ස්වභාවය වෙනස් වී නැත්නම් සහ රෝගය තවදුරටත් සමෙහි පැතිර නැත්නම් පූජකයා ඔහුව තව දවස් හතක් වෙන් කර[8] තැබිය යුතුයි.

**6** "හත්වන දවසේදී පූජකයා ඔහුව නැවත වරක් පරීක්ෂා කර බැලිය යුතුයි. ඔහුගේ සම සාමාන්‍ය පැහැයට හැරෙන බවත් රෝගය සම පුරා පැතිර නැති බවත් පෙනෙන්න තිබේ නම් පූජකයා එම නැනැත්තාව පවිත්‍රයයි ප්‍රකාශ කළ යුතුයි. මන්ද එය සාමාන්‍ය තුවාලයක් පමණයි.

**12 පරි.**
1 ලෙවී 1:14 ලෙවී 5:7 ලෙවී 14:22 ලූක් 2:24
2 ලෙවී 4:26 ලෙවී 6:7 ගණන් 15:25

**13 පරි.**
3 ලෙවී 14:56
4 ගණන් 12:10 2ලේක 26:19 මතෙ 8:3
5 ද්වි 24:8 මලා 2:7 ලූක් 17:14
6 ලෙවී 10:10 එස 44:23
7 ලෙවී 14:38 ගණන් 12:15
8 ලෙවී 14:46

**2 තීරුව**
1 ලෙවී 13:27
2 ගණන් 12:12
3 ලෙවී 13:3 2ලේක 26:20
4 ලෙවී 13:24
5 2ලේක 26:21
6 ලෙවී 13:4
7 ද්වි 24:8
8 ලෙවී 13:8
9 ලූක් 5:14 ලූක් 17:14

ඔහු තම වස්ත්‍ර සෝදා පවිත්‍ර විය යුතුයි. **7** නමුත් පූජකයා ඔහු පවිත්‍රයයි ප්‍රකාශ කළ පසුවද තුවාලය සම පුරා පැතිර යන බව පෙනෙන්න තිබේ නම් ඔහු නැවත වරක් පූජකයා ඉදිරියට යා යුතුයි.[1] **8** පූජකයා ඔහුව පරීක්ෂා කර බැලිය යුතුයි. තුවාලය සම පුරා පැතිර ඇත්නම් එය ලාදුරු රෝගය වේ.[2] පූජකයා ඔහු අපවිත්‍ර කෙනෙකුයයි ප්‍රකාශ කළ යුතුයි.

**9** "යමෙකුට ලාදුරු රෝගය වැළඳී ඇති බවට සැකයක් තිබේ නම් ඔහුව පූජකයා වෙතට ගෙන යා යුතුයි. **10** පූජකයා ඔහුව සෝදිසි කර බැලිය යුතුයි.[3] සමේ සුදු පාට දදයක් හටගෙන ඒ අවට තිබෙන රෝම දුර්වර්ණ වී ඇත්නම් එමෙන්ම ඒ දදය සුව වී නැත්නම්[4] **11** එය ලාදුරු රෝගය වේ. එය කාලයක් තිස්සේ ඔහුගේ සමේ තිබී ඇත.[5] එවිට පූජකයා ඔහු අපවිත්‍ර කෙනෙකු ලෙස ප්‍රකාශ කළ යුතුයි. ඔහුව තවදුරටත් පරීක්ෂා කර බලන පිණිස වෙන් කර[6] තැබීම අවශ්‍ය නැත. මන්ද ඔහු දැනටමත් අපවිත්‍රය. **12** රෝගය හටගෙන එය රෝගියාගේ හිස සිට පතුල දක්වාම පැතිර ඇති බව පූජකයාට පැහැදිලිව පෙනෙන්න තිබේ නම් **13** පූජකයා ඔහු පවිත්‍රයයි ප්‍රකාශ කළ යුතුයි. මන්ද ඔහුගේ මුළු ශරීරයම සුදු පාටට හැරී ඇත. එබැවින් ඔහු පවිත්‍රය.* **14** නමුත් ඔහුගේ සමේ අලුතින් දදයක් හටගන්නවා නම් ඔහු අපවිත්‍ර වන්නේය. **15** පූජකයා[7] අලුතින් හටගත් දදය පරීක්ෂා කර බලා ඔහු අපවිත්‍රයයි ප්‍රකාශ කළ යුතුයි. අලුතින් හටගත් දදය අපවිත්‍රය. එය ලාදුරු රෝගය වේ.[8] **16** අලුතින් හටගත් දදය සුව වී එය සුදු පාටට හැරේ නම් ඔහු ආපසු පූජකයා වෙතට යා යුතුයි. **17** පූජකයාද ඔහුව සෝදිසි කර බැලිය යුතුයි.[9]

ලෙවී **13:13*** නැත්නම්, රෝගය බෝ නොවන්නේය.

දදය හටගත් තැන සුදු පාටට හැරී
ඇත්නම් එය සුව වී ඇත. පූජකයා
ඔහු පවිත්‍රයයි ප්‍රකාශ කළ යුතුයි.
**18** "සමේ සැරව ගෙඩියක්[1] හට-
ගෙන එය සුව වූ පසු, **19** එතැන සුදු
දදයක් හෝ ළා රතු පැහැති ලපයක්
හෝ හටගත්තොත් එම තැනැත්තා
පූජකයා වෙතට යා යුතුයි. **20** පූජ-
කයා ඔහුව සෝදිසි කර බැලූ විට[2]
එය සමට යටින් පැතිර ඇති බවත් ඒ
අවට රෝම දුර්වර්ණ වී ඇති බවත්
පෙනෙන්න තිබේ නම් ඔහු අපවිත්‍රයයි
ප්‍රකාශ කළ යුතුයි. එය සැරව ගෙඩිය
තුළින් හටගත් ලාදුරු රෝගය වේ.
**21** නමුත් පූජකයා එය පරීක්ෂා කර
බැලූ විට රෝම දුර්වර්ණ වී නැති
බවත් එය සමට යටින් පැතිර නැති
බවත් ඔහුගේ සම සාමාන්‍ය පැහැයට
හැරී ඇති බවත් පෙනෙන්න තිබේ නම්
රෝගය තවදුරටත් සෝදිසි කර බලන
පිණිස ඔහුව දවස් හතක් වෙන් කර[3]
තැබිය යුතුයි. **22** ලපය සම පුරා
පැතිර ඇති බව පැහැදිලිව පෙනෙන්න
තිබේ නම් එය බෝ වන රෝගයකි.
පූජකයා ඔහු අපවිත්‍රයයි ප්‍රකාශ කළ
යුතුයි. **23** ලපය පැතිරී නැත්නම්
එය සැරව ගෙඩිය නිසා ඇති වූ ඉදිමී-
මක්[4] පමණි. පූජකයා ඔහුව පවිත්‍ර කෙ-
නෙකු ලෙස ප්‍රකාශ කළ යුතුයි.[5]
**24** "ගින්නෙන් පිලිස්සීම නිසා
යමෙකුගේ ශරීරයේ ඇති වූ තුවාල-
යක් රතු පැහැයට හෝ සුදු පැහැයට
හෝ හැරුණොත් **25** පූජකයා එය
පරීක්ෂා කර බැලිය යුතුයි. තුවා-
ලය ගැඹුරු එකක් බවත් එහි අවට
තිබෙන රෝම දුර්වර්ණ වී ඇති බවත්
පෙනෙන්න තිබේ නම් එය ලාදුරු
රෝගය වේ. පිලිස්සීම නිසා ඇති වූ
තුවාලය තුළින් එම රෝගය මතු වී
ඇත. එබැවින් පූජකයා ඔහු අපවිත්‍ර-
යයි ප්‍රකාශ කළ යුතුයි. **26** නමුත්
පූජකයා තුවාලය සෝදිසි කර බැලූ
විට එය ගැඹුරු එකක් නොවන
බවත් ඒ අවට තිබෙන රෝම දුර්-
වර්ණ වී නැති බවත් සම එහි
සාමාන්‍ය පැහැයට හැරී යන බවත්
පෙනෙන්න තිබේ නම් ඔහුව දවස්
හතක් වෙන් කර තැබිය යුතුයි.
**27** හත්වන දවසේදී පූජකයා ඔහුව
නැවත පරීක්ෂා කර බැලිය යුතුයි.
තුවාලය සම පුරා පැතිර ඇති බව
පැහැදිලිව පෙනෙන්න තිබේ නම් පූජ-
කයා ඔහු අපවිත්‍රයයි ප්‍රකාශ කළ
යුතුයි. මන්ද ඔහුට ලාදුරු රෝ-
ගය වැලඳී ඇත. **28** නමුත් තුවා-
ලය පැතිරී නැති බවත් සම සාමාන්‍ය
පැහැයට හැරී ඇති බවත් පෙනෙන්න
තිබේ නම් එය පිලිස්සීම නිසා හට-
ගත් තුවාලයක් පමණි. ඒ නිසා පූජ-
කයා ඔහු පවිත්‍රයයි ප්‍රකාශ කළ
යුතුයි.
**29** "යමෙකුගේ හිසේ නැත්-
නම් නිකට ප්‍රදේශයේ සමේ රෝ-
ගයක් හටගත්තොත් **30** පූජකයා[1]
එය පරීක්ෂා කර බැලිය යුතුයි.
එය සමට යටින් පැතිරී ඇති බවත්
හිසෙහි කෙස් හෝ නිකටෙහි රෝම
හෝ අඩු වී ඇති බවත් ඒවා දුර්වර්ණ
වී* ඇති බවත් පෙනෙන්න තිබේ
නම් පූජකයා ඔහු අපවිත්‍රයයි ප්‍රකාශ
කළ යුතුයි. මෙය සාමාන්‍ය ලෙස
හිසකේ අඩුවීමක් හෝ රෝම අඩු-
වීමක් හෝ නොවේ.[2] එය ලාදුරු
රෝගය වේ. **31** නමුත් පූජකයා,
එවැනි සමේ රෝගයක් තිබෙන පුද්ග-
ලයෙකුව පරීක්ෂා කර බැලූ විට රෝ-
ගය සමට යටින් පැතිර ගොස් නැති
වුවත් එතැන කලු කෙස් හෝ කලු
රෝම හෝ නැති බව පෙනෙන්න
තිබේ නම් ඔහු රෝගියාව දවස්
හතක්[3] වෙන් කර[4] තැබිය යුතුයි.
**32** හත්වන දවසේදී පූජකයා රෝගි-
යාව නැවත පරීක්ෂා කර බැලිය
යුතුයි. හිසකේ හෝ රෝම හෝ දුර්-
වර්ණ වී නැත්නම් ඒවා තවදුරටත්
හැළෙන්නේ නැත්නම්[5] සහ රෝගය
මතුපිටින් පමණක් හටගෙන තිබේ
නම් **33** ඔහු තම හිස බූ ගෑ යුතුයි.
නැත්නම් තම රැවුල කැපිය යුතුයි.

**13 පරි.**
1 ද්වි 28:27; 2රාජා 20:7; යෝබ 2:7
2 ලෙවී 10:10; එස 44:23
3 ලෙවී 13:4; ලෙවී 14:38; ගණන් 12:15
4 ද්වි 28:22
5 ලූක් 5:14; ලූක් 17:14

**2 තීරුව**
1 ද්වි 24:8; මලා 2:7
2 ලෙවී 14:54
3 ලෙවී 13:4
4 ලෙවී 14:38; ගණන් 12:15
5 ලෙවී 14:54

ලෙවී **13:30*** මූ.අ., "කහ පාට."

නමුත් රෝගය තිබෙන ස්ථානයේ කෙස් හෝ රෝම හෝ නොකැපිය යුතුයි.[1] රෝගය තවදුරටත් පරීක්ෂා කර බලන පිණිස පූජකයා ඔහුව තව දවස් හතක් වෙන් කර තැබිය යුතුයි.

**34** “හත්වන දවසේදී පූජකයා, කෙස් හෝ රෝම හෝ අසාමාන්‍ය ලෙස අඩු වූ තැනැත්තාව නැවත පරීක්ෂා කර බැලිය යුතුයි. හිසකේ හෝ රෝම හෝ තවදුරටත් නොහැළෙන බවත් රෝගය මතුපිටින් පමණක් හටගෙන තිබෙන බවත් පෙනෙන්න තිබේ නම් ඔහු පවිත්‍රයයි පූජකයා ප්‍රකාශ කළ යුතුයි.[2] ඔහුද තම වස්ත්‍ර සෝදාගෙන පවිත්‍ර විය යුතුයි. **35** නමුත් ඔහු පවිත්‍රයයි ප්‍රකාශ කළ පසුවද හිසකේ හෝ රෝම හෝ අසාමාන්‍ය ලෙස හැළෙන බව පෙනෙන්න තිබේ නම් **36** පූජකයා[3] ඔහුව නැවත පරීක්ෂා කර බැලිය යුතුයි. රෝගය දිගටම පැතිර යනවා නම් දුර්වර්ණ වූ කෙස් හෝ රෝම හෝ තිබෙනවාද කියා සෝදිසි කර බැලීම අවශ්‍ය නැත. මන්ද ඔහු අපවිත්‍රය. **37** නමුත් කෙස් හෝ රෝම හෝ අසාමාන්‍ය ලෙස හැළීම නතර වී ඇත්නම් සහ එතැන කලු පාට කෙස් හෝ කලු පාට රෝම හෝ හටගෙන ඇත්නම් රෝගය සුව වී ඇත. ඔහු පවිත්‍රය. එබැවින් පූජකයා ඔහු පවිත්‍ර කෙනෙකුයයි ප්‍රකාශ කළ යුතුයි.[4]

**38** “මිනිසෙකුගේ හෝ ස්ත්‍රියකගේ හෝ සමේ සුදු ලප[5] හටගත්තොත් **39** පූජකයා[6] එම තැනැත්තාව පරීක්ෂා කර බැලිය යුතුයි. සමෙහි ලා පැහැති ලප හටගෙන ඇත්නම් එය බෝ නොවන සමේ රෝගයකි. එබැවින් ඔහු පවිත්‍රය.

**40** “මිනිසෙකුගේ හිස මුදුනේ හෝ හිස පිටුපස හෝ කෙස් අඩු වී ඇත්නම්[7] ඔහු අපවිත්‍ර නැත. **41** එමෙන්ම යමෙකුගේ නළලට ඉහළින් කෙස් අඩු වී ඇත්නම් ඔහුද අපවිත්‍ර නැත. **42** නමුත් නළලට ඉහළින් කෙස් අඩු වී ඇති තැන්වල රතු පැහැති දදයක් හටගත්තොත් එය ලාදුරු රෝගය වේ. **43** පූජකයා[1] ඔහුව පරීක්ෂා කර බලන විට ඔහුගේ නළලට ඉහළින් ලාදුරු රෝගයේ පෙනුම ඇති දදයක් හටගෙන ඇත්නම් **44** ඔහුව අපවිත්‍ර කෙනෙකු ලෙස ප්‍රකාශ කළ යුතුයි. මන්ද ඔහු ලාදුරු රෝගියෙකි. **45** ලාදුරු රෝගියාගේ වස්ත්‍ර ඉරා දැමිය යුතුයි.[2] ඔහු තම හිසකෙස් අවුල්[3] කර උඩු රැවුල වසාගත යුතුයි.[4] ඔහු තමා, ‘අපවිත්‍රය, අපවිත්‍රය’ කියා හඬ නඟා කිව යුතුයි.[5] **46** රෝගයෙන් පෙළෙන සියලු දවස්වලදී ඔහු අපවිත්‍ර කෙනෙකු වේ. ඔහු අපවිත්‍ර කෙනෙකු වන නිසා අන් අයගෙන් වෙන්ව ජීවත් විය යුතුයි. ඔහු ජීවත් විය යුත්තේ කඳවුරෙන් පිටතය.[6]

**47** “වස්ත්‍රයක යම් විෂබීජයක්* තිබෙන විට කළ යුතු දේ පහත දැක්වේ. විෂබීජය ලොම් වස්ත්‍රයක හෝ ලිනන් වස්ත්‍රයක හෝ **48** එවැනි වස්ත්‍රයක නූල්වල*[7] හෝ සම් භාජනයක හෝ සමෙන් සෑදූ[8] වෙන ඕනෑම දෙයක හෝ තිබිය හැකියි. **49** වස්ත්‍රයක හෝ සම් භාජනයක හෝ සමෙන් සෑදූ වෙන ඕනෑම දෙයක හෝ කොළ පාටට හුරු නැත්නම් රතු පාටට හුරු පැල්ලමක් තිබෙනවා නම් එය විෂබීජයක් විය හැකියි. එය පූජකයාට පෙන්විය යුතුයි. **50** පූජකයා[9] පැල්ලම සෝදිසි කර බැලූ පසු එය තවදුරටත් පරීක්ෂා කර බලන පිණිස දවස් හතක් වෙන් කර[10] තැබිය යුතුයි. **51** හත්වන දවසේදී ඔහු වස්ත්‍රයක හෝ සම් භාජනයක හෝ සමෙන් සෑදූ වෙන ඕනෑම දෙයක හෝ තිබෙන පැල්ලම[11] දෙස බැලූ විට එය පැතිර ඇති බව පෙනෙන්න තිබේ නම් එය දරුණු ලෙස පැතිර යන විෂබීජයකි.[12] එය අපවිත්‍රය. **52** එබැවින් විෂබීජය[13] තිබෙන වස්ත්‍රය[14]

**13 පරි.**
**1** ලෙවී 14:8
**2** ලෙවී 13:23 මාක් 1:42 ලූක් 5:13
**3** එස 22:26 ලූක් 17:14
**4** මතෙ 8:4 මාක් 1:44
**5** ලෙවී 13:2
**6** ලෙවී 10:10
**7** 2රාජා 2:23

**2 තීරුව**
**1** එස 44:23
**2** 2සාමු 13:19 එස්රා 9:5
**3** ලෙවී 10:6 ලෙවී 21:10
**4** එස 24:17 මීකා 3:7
**5** විලා 4:15
**6** ගණන් 5:2 ගණන් 12:14 2රාජා 7:3 2ලේක 26:21
**7** ලෙවී 13:53 ලෙවී 13:59
**8** උත් 21:15 ලෙවී 13:53 මාක් 2:22
**9** ලෙවී 10:10 එස 44:23
**10** ලෙවී 13:4
**11** ලෙවී 13:58
**12** ලෙවී 14:44
**13** ලෙවී 14:44
**14** නික් 28:39 නික් 39:28

ලෙවී **13:47*** මූ.අ., “ලාදුරු.” මෙය පුස් වර්ගයක් විය හැක. නමුත් එය හරියටම කුමක්ද කියා කිව නොහැක. **48*** මූ.අ., “දික් අතට හෝ හරස් අතට තිබෙන නූල්වල.”

හෝ භාජනය හෝ ගින්නෙන් පුලුස්සා
දැමිය යුතුයි.
**53** "වස්ත්‍රයක තිබෙන නූල්වල
හෝ සම් භාජනයක[1] හෝ තිබෙන
පැල්ලම පරීක්ෂා කර බැලූ පසු එය
පැතිර නැති බව පූජකයාට පෙ-
නෙන්න තිබේ නම් **54** එම වස්ත්‍රය
හෝ භාජනය හෝ සෝදා දවස්
හතක් වෙන් කර තබන මෙන් ඔහු
අණ කළ යුතුයි. ඉන්පසු එය දෙවන
වරටත් පරීක්ෂා කර බැලිය යුතුයි.
**55** එය සේදූ පසු පූජකයා නැවත
වරක් පැල්ලම පරීක්ෂා කර බැලූ විට
එහි කිසි වෙනසක් සිදු වී නැත්නම්
එය අපවිත්‍රය. පැල්ලම පැතිර ගොස්
නැතත් එය අපවිත්‍රය. එම වස්ත්‍රය
නැත්නම් භාජනය ඇතුල් පැත්තෙන්
හෝ පිට පැත්තෙන් හෝ දිරන්න
පටන්ගෙන තිබේ. එබැවින් එය ගින්-
නෙන් පිලිස්සිය යුතුයි.
**56** "වස්ත්‍රය හෝ භාජනය හෝ
සේදූ පසු පූජකයා එය නැවත පරීක්ෂා
කර බැලූ විට එහි තිබෙන පැල්ලමේ
පාට වෙනස් වී ඇත්නම් ඔහු පැල්ලම
තිබෙන කොටස ඉරා අයින් කළ
යුතුයි. **57** නමුත් පැල්ලම තවදුර-
ටත් එලෙසම පවතී නම් විෂබීජය
පැතිර යන්නේය. එබැවින් ඔබ එම
වස්ත්‍රය[2] හෝ සම් භාජනය හෝ ගින්-
නෙන් පිලිස්සිය යුතුයි.[3] **58** වස්-
ත්‍රයක් හෝ සම් භාජනයක් හෝ
සමෙන් සෑදූ වෙන ඕනෑම දෙයක් හෝ
සේදූ පසු එහි තිබුණු පැල්ලම මැකී
ගියොත් එය දෙවන වරටත් සේදිය
යුතුයි. එවිට එය පවිත්‍ර වන්නේය.
**59** "ලොම් වස්ත්‍රයක හෝ ලිනන්
වස්ත්‍රයක[4] හෝ සම්වලින් සෑදූ ඕනෑම
දෙයක හෝ යම් විෂබීජයක් ඇත්නම්
ඒවා පවිත්‍රද අපවිත්‍රද කියා පරීක්ෂා
කර බලන පිණිස පිළිපැදිය යුතු
ක්‍රියාමාර්ගය එයයි."

**14** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. **2** "ලාදුරු[5]
රෝගය නිසා අපවිත්‍රව සිටි කෙනෙකු
පවිත්‍ර වන දවසේදී පිළිපැදිය යුතු
නීතිය මෙයයි. ඔහුව පූජකයා වෙත
ගෙන යා යුතුයි.[1] **3** පූජකයා ලාදුරු
රෝගය වැලඳී සිටි තැනැත්තාව කඳ-
වුරෙන් පිටතට ගෙන ගොස් පරීක්ෂා
කර බැලිය යුතුයි. ඔහුගේ රෝගය
සුව[2] වී ඇත්නම් **4** පවිත්‍ර වීමේ පිළි-
වෙත සඳහා පවිත්‍ර කුරුල්ලන්[3] දෙදෙ-
නෙකුද දේවදාර අතුද[4] තද රතු*
නූල්ද[5] හිසොප් මිටියක්ද#[6] ගෙනෙන
මෙන් පූජකයා ඔහුට අණ කළ යුතුයි.
**5** ඊළඟට දිය පහරකින් නැවුම් ජලය
ටිකක් ගෙන මැටි බඳුනකට පිරවිය
යුතුයි. ඉන්පසු එක් කුරුල්ලෙකුව එම
බඳුනට ඉහළින් අල්ලා මරන ලෙස
පූජකයා අණ කළ යුතුයි.[7] **6** අනික්
කුරුල්ලාවද දේවදාර අතුද තද රතු
නූල්ද හිසොප් මිටියද ගෙන නැවුම්
ජල බඳුනට ඉහළින් මැරූ කුරුල්ලා-
ගේ ලේවල ගිල්විය යුතුයි. **7** ඉන්-
පසු පූජකයා ලාදුරු රෝගය වැලඳී
සිටි තැනැත්තා මත ලේ හත් වරක්[8]
ඉස[9] ඔහු පවිත්‍රයයි ප්‍රකාශ කළ
යුතුයි.[10] ඉන්පසු පණ ඇති කුරුල්-
ලාට නිදැල්ලේ යන්න හැරිය යුතුයි.[11]
**8** "පවිත්‍ර වන තැනැත්තා තම හිස
බූ ගා ශරීරයේ රෝම සියල්ලද කපා
තමාගේ වස්ත්‍ර සෝදාගෙන[12] ස්නා-
නය[13] කර පවිත්‍ර විය යුතුයි. ඉන්පසු
ඔහුට කඳවුරට ඇතුල් විය හැක.
දවස් හතක් ඔහු තම කූඩාරමෙන්
පිටත ජීවත් විය යුතුයි.[14] **9** හත්-
වන දවසේදී ඔහු නැවත තම හිස බූ
ගෑ යුතුයි.[15] තම රැවුලද ඇහිබැමිද
සම්පූර්ණයෙන් කැපිය යුතුයි. ඔහු
තම වස්ත්‍ර සෝදාගත් පසු ස්නානය
කර පවිත්‍ර විය යුතුයි.
**10** "ඔහු අටවන[16] දවසේදී නිකැ-
ළැල් බැටළු පැටවුන් දෙදෙනෙකුද
අවුරුද්දක් පමණ වයසැති නිකැ-
ළැල් බැටළුදෙනකද[17] ධාන්‍ය පූජා-
වක්[18] සඳහා තෙල් මිශ්‍ර සිහින් පිටි
ඒපාවකින් දසයෙන් තුන් කොටසක්ද
තෙල් තුන්කාලක්ද* ගෙනා යුතුයි.[19]

**13 පරි.**
1 උත් 3:21, උත් 21:14, එස 16:10, මතෙ 3:4
2 ලෙවී 13:48
3 ලෙවී 13:52
4 ලෙවී 13:47

**14 පරි.**
5 ලෙවී 13:2

**2 තීරුව**
1 මාක් 1:44, ලූක් 5:14
2 ලූක් 7:22, ලූක් 17:15
3 ලෙවී 1:14, ලෙවී 14:30, ලෙවී 14:49
4 ගණන් 19:6
5 හෙබ්‍රෙ 9:19
6 නික් 12:22, ලෙවී 14:51, ගණන් 19:18, 1රාජා 4:33, ගීතා 51:7
7 ලෙවී 14:50, ලෙවී 15:13
8 2රාජා 5:10
9 හෙබ්‍රෙ 9:13
10 ලෙවී 13:23
11 ලෙවී 16:22, ගීතා 103:12
12 ලෙවී 13:6
13 ලෙවී 15:6
14 ලෙවී 13:5, ගණන් 5:2, ගණන් 12:15
15 ලෙවී 13:33
16 ලෙවී 15:14
17 ලෙවී 4:32
18 ලෙවී 2:1
19 මාක් 1:44

ලෙවී **14:4*** නික් 25:4හි පාදසටහන බලන්න. **4#** නික් 12:22හි පාදසටහන බලන්න. **10*** මූ.අ., "ලොග් එකක්." ලොග් එකක් යනු ලීටරයකින් තුනෙන් පංගුවකි.

**11** පවිත්‍ර වීමේ පිළිවෙත ඉටු කරන
පූජකයා ඔහුවත් ඔහු ගෙනා දේව-
ලුත් සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල්
වන ස්ථානයට ගෙනැවිත් යෙහෝවා
දෙවි වන මා ඉදිරියේ ඒවා පිළි-
ගැන්විය යුතුයි. **12** පූජකයා බැටළු
පැටවෙකු සහ තෙල් තුන්කාල[1] වන්දි
පූජාවක්[2] ලෙස ඔප්පු කළ යුතුයි. දෙ-
විට පිළිගන්වන පිණිස කරන සෙලවී-
මේ පූජාවක්[3] ලෙස එය යෙහෝවා
දෙවි වන මා ඉදිරියේ ඒ මේ අත සෙ-
ලවිය යුතුයි. **13** ඔහු ශුද්ධ තැන-
කදී[4] බැටළු පැටවාව මැරිය යුතුයි.
ඌව මැරිය යුත්තේ පාප පූජා සහ
දවන පූජා සඳහා සතුන්ව මරන ස්ථා-
නයේදීමය.[5] මන්ද පාප පූජාව මෙන්
වන්දි පූජාවද පූජකයාට අයිතිය.[6]
එය ඉතා ශුද්ධය.

**14** "පූජකයා වන්දි පූජාවට ගෙනා
සතාගේ ලේ ස්වල්පයක් ගෙන පවිත්‍ර
වීම සඳහා පැමිණි තැනැත්තාගේ
දකුණු කන් පෙත්ත මතද ඔහු-
ගේ දකුණු අතේ සහ දකුණු පයේ
මාපටැඟිලි මතද තැවරිය යුතුයි.[7]
**15** ඉන්පසු පූජකයා තෙල් තුන්කා-
ලෙන්[8] ටිකක් තම වම් අතේ අල්ලට
වත් කරගත යුතුයි. **16** ඔහු තම
දකුණතේ ඇඟිල්ලකින් තම අල්ලෙහි
තිබෙන තෙල් ටිකක් ගෙන යෙ-
හෝවා දෙවි වන මා ඉදිරියේ හත්
වරක්[9] ඉසිය යුතුයි. **17** ඉන්පසු
පූජකයා තම අල්ලේ ඉතුරු වී තිබෙන
තෙල්වලින් ටිකක් එම තැනැත්තා-
ගේ දකුණු කන් පෙත්ත මතද ඔහුගේ
දකුණු අතේ සහ දකුණු පයේ මාප-
ටැඟිලි මතද තැවරිය යුතුයි. තෙල්
තැවරිය යුත්තේ වන්දි පූජාවට ගෙනා
සතාගේ ලේ තැවරූ තැන්වලමය.[10]
**18** පූජකයා තම අල්ලේ ඉතුරු වූ
තෙල් ටික එම තැනැත්තාගේ හිසේ
ගැල්විය යුතුයි. ඉන්පසු පූජකයා යෙ-
හෝවා දෙවි වන මා ඉදිරියේ එම
තැනැත්තාගේ පව්කාර තත්වය වෙ-
නුවෙන් සමාව[11] ලබාගත යුතුයි.

**19** "පූජකයා පාප පූජාව[12] ඔප්පු
කර අපවිත්‍රව සිටින තැනැත්තාගේ
පව්කාර තත්වය වෙනුවෙන් සමාව
ලබාගත යුතුයි. එමගින් ඔහු පවිත්‍ර
තත්වයකට පැමිණෙනු ඇත. ඉන්පසු
පූජකයා දවන පූජාවට ගෙනා සතාව
මැරිය යුතුයි. **20** එම තැනැත්තා-
ගේ පව්කාර තත්වය වෙනුවෙන්
සමාව ලබාගන්නා පිණිස[1] පූජකයා[2]
දවන පූජාව සහ ධාන්‍ය පූජාව[3] පූජා-
සනය මත ඔප්පු කළ යුතුයි. එවිට
ඔහු පවිත්‍ර වන්නේය.[4]

**21** "එම දේවල් ගෙන ඒමට තරම්
වත්කමක් ඔහුට නැත්නම්[5] ඔහු වන්දි
පූජාව සඳහා බැටළු පැටවෙකු ගෙනා
යුතුයි. ඔහු එය සෙලවීමේ පූජාවක්
ලෙස ඔප්පු කරනු ඇත. එම පූජාව
ඔප්පු කරන්නේ ඔහුගේ පව්කාර තත්-
වය වෙනුවෙන් සමාව ලබාගන්නා
පිණිසය. ඔහු ධාන්‍ය පූජාව සඳහා
තෙල් මිශ්‍ර සිහින් පිටි ඒපාවකින් දහ-
යෙන් කොටසක්ද තෙල් තුන්කාලක්ද
ගෙනා යුතුයි. **22** ඔහුගේ වත්කමේ
හැටියට පරෙවි පැටවුන් දෙදෙනෙකුව
හෝ කොබෙයි පැටවුන්[6] දෙදෙනෙ-
කුව හෝ ගෙනා යුතුයි. එක් කුරුල්-
ලෙකු පාප පූජාවක් ලෙසද අනික්
කුරුල්ලා දවන පූජාවක් ලෙසද ඔප්පු
කළ යුතුයි. **23** අටවන දවසේදී[7]
ඔහු සම්මුඛ වීමේ කූඩාරමට[8] ඇතුල්
වන ස්ථානයේ යෙහෝවා දෙවි වන
මා ඉදිරියට ගොස් පවිත්‍ර[9] වීමේ පිළි-
වෙත සඳහා ඒවා පූජකයාට භාර දිය
යුතුයි.

**24** "පූජකයා වන්දි පූජාව[10] සඳහා
ගෙනා බැටළු පැටවාව සහ තෙල්
තුන්කාල ගෙන යෙහෝවා දෙවි වන
මා ඉදිරියේ ඒවා ඒ මේ අත සෙල-
විය යුතුයි. එය දෙවිට පිළිගන්වන
පිණිස කරන සෙලවීමේ පූජාවකි.[11]
**25** පූජකයා වන්දි පූජාව සඳහා
ගෙනා බැටළු පැටවාව මරා උගේ ලේ
ස්වල්පයක් එම තැනැත්තාගේ දකුණු
කන් පෙත්ත මතද ඔහුගේ දකුණු
අතේ සහ දකුණු පයේ මාපටැඟිලි
මතද තැවරිය යුතුයි.[12] **26** ඉන්පසු
පූජකයා තම වම් අතේ අල්ලට තෙල්
ස්වල්පයක් වත් කරගත යුතුයි.[13]

**14 පරි.**
**1** ලෙවී 14:24
**2** ලෙවී 5:2, ලෙවී 6:6
**3** නික් 29:24, ලෙවී 7:30, ගණන් 8:11
**4** ලෙවී 7:6
**5** ලෙවී 1:11, ලෙවී 4:4, ලෙවී 6:25
**6** ලෙවී 2:3, ලෙවී 7:7, 1කොරි 9:13, 1කොරි 10:18
**7** නික් 29:20
**8** ලෙවී 14:10, ලෙවී 14:24
**9** ලෙවී 4:6, ලෙවී 4:17
**10** ලෙවී 8:24
**11** ලෙවී 6:7, 1යොහ 1:7, 1යොහ 2:2
**12** ලෙවී 5:6

**2 තීරුව**
**1** මතෙ 8:4, ලූක් 5:14
**2** ලෙවී 4:26, ලෙවී 10:10, හෙබ්‍රෙ 2:17
**3** ලෙවී 2:1, ලෙවී 14:10, ගණන් 15:4
**4** ලෙවී 14:9
**5** ලෙවී 5:7, ලෙවී 12:8, ගීතා 72:13, හිතෝ 17:5, හිතෝ 22:2, ලූක් 6:20
**6** ලෙවී 1:14
**7** ලෙවී 15:13, ලෙවී 15:14, ගණන් 12:14
**8** ලෙවී 14:11
**9** ලෙවී 14:2, ලෙවී 14:7
**10** ලෙවී 5:2, ලෙවී 6:6
**11** ලෙවී 14:12
**12** ලෙවී 8:23, ලෙවී 14:14
**13** ලෙවී 14:15

**27** ඔහු තම දකුණු අතේ ඇඟිල්ල-
කින් තම අල්ලේ තිබෙන තෙල්
ටිකක් ගෙන යෙහෝවා දෙවි වන මා
ඉදිරියේ හත් වරක් ඉසිය[1] යුතුයි.
**28** ඉන්පසු පූජකයා තම අල්ලේ
තිබෙන තෙල්වලින් ටිකක් පවිත්‍ර වීම
සඳහා පැමිණි තැනැත්තාගේ දකුණු
කන් පෙත්ත මතද ඔහුගේ දකුණු
අතේ සහ දකුණු පයේ මාපටැඟිලි
මතද තැවරිය යුතුයි. තෙල් තැවරිය
යුත්තේ වන්දි පූජාවට ගෙනා සතාගේ
ලේ තැවරූ තැන්වලමය.[2] **29** පූජ-
කයා තම අල්ලේ ඉතුරු වූ තෙල් ටික
එම තැනැත්තාගේ හිසේ ගැල්විය
යුතුයි.[3] ඉන්පසු පූජකයා යෙහෝවා
දෙවි වන මා ඉදිරියේ එම තැනැත්-
තාගේ පව්කාර තත්වය වෙනුවෙන්
සමාව ලබාගත යුතුයි.

**30** "එම තැනැත්තාගේ වත්කමේ
හැටියට ගෙනා පරෙවි පැටවුන්ව
හෝ කොබෙයි පැටවුන්ව හෝ පූජ-
කයා ඔප්පු කළ යුතුයි.[4] **31** උන්-
ගෙන් එකෙකුව පාප පූජාවක්[5] ලෙසද
අනිකාව ධාන්‍ය පූජාව සමඟ දවන
පූජාවක්[6] ලෙසද ඔප්පු කළ යුතුයි.
පූජකයා එසේ කර පවිත්‍ර වන පිණිස
යෙහෝවා දෙවි වන මා ඉදිරියට
පැමිණි එම තැනැත්තාගේ පව්කාර
තත්වය වෙනුවෙන් සමාව[7] ලබාගත
යුතුයි.

**32** "පවිත්‍ර වීමේ පිළිවෙතට අවශ්‍ය
දේවල් ගෙන ඒමට තරම් වත්කමක්
නැති ලාදුරු රෝගයෙන් පෙළුණු කෙ-
නෙකු පිළිපැදිය යුතු නීතිය එයයි."

**33** යෙහෝවා දෙවි මෝසෙස්ට
සහ ආරොන්ට මෙසේ කීවේය.
**34** "මා උරුමයක්[8] ලෙස ඔබට දෙන
කානාන්[9] දේශයට ඔබ පැමිණි පසු
ඔබට හිමි නිවසක යම් විෂබීජ-
යක්* ඇති වීමට මා ඉඩහැරියොත්[10]
**35** ඒ නිවසේ අයිතිකරු පූජකයා වෙ-
තට පැමිණ මෙසේ කිව යුතුයි. 'මගේ
ගෙදර බිත්තියේ පැල්ලමක් තිබෙ-
නවා. එය විෂබීජ සහිත පැල්ලමක්
වෙන්න පුළුවන්.' **36** පූජකයා එම
නිවස සෝදිසි කර බැලීමට පෙර නිව-
සේ තිබෙන සියලු බඩු බාහිරාදිය
ඉවත් කරන ලෙස ගෙහිමියාට අණ
කළ යුතුයි. එසේ කළ යුත්තේ ගෙදර
තිබෙන සියලු බඩු අපවිත්‍රයයි ඔහු
විසින් ප්‍රකාශ නොකරන පිණිසය. බඩු
බාහිරාදිය ඉවත් කළ පසු පූජකයා
නිවස පරීක්ෂා කර බැලීමට පැමි-
ණිය යුතුය. **37** කොළ හෝ රතු
පැහැයට හුරු පැල්ලමක් නිවසේ
බිත්තියේ තිබේ නම් එය බිත්තිය
ඇතුළටම කාවැදී ඇති බව පෙනේ
නම් **38** පූජකයා නිවසෙන් පිටතට
ගොස් දවස් හතක් නිවස වසා තැබිය
යුතුයි.[1]

**39** "හත්වන දවසේදී පූජකයා
පැල්ලම පරීක්ෂා කර බැලිය යුතුයි.[2]
පැල්ලම නිවසේ බිත්තිවල පැතිර
තිබෙනවා නම් **40** පැල්ලම පැතිරී
ගොස් තිබෙන ගඩොල් ගලවා[3] නග-
රයෙන් පිටත අපවිත්‍ර තැනකට විසි
කරන ලෙස පූජකයා අණ කළ යුතුයි.
**41** නිවසේ ඇතුල් බිත්ති සියල්ලම
සූරා එම බදාම නගරයෙන් පිටත
තිබෙන අපවිත්‍ර තැනකට විසි කරන
ලෙසටත් ඔහු අණ කළ යුතුයි.
**42** අලුත් බදාම හා අලුත් ගඩොල්
භාවිත කර බිත්තියේ කැඩූ තැන්
නැවත බැඳ එය කපරාරු කළ යුතුයි.

**43** "පැල්ලම පැතිර තිබූ ගඩොල්
ගලවා ඇතුල් බිත්ති සූරා අලු-
තින් කපරාරු කළ පසුවද පැල්ල-
මක් මතු වුවහොත් **44** පූජකයා[4]
නැවත පැමිණ නිවස පරීක්ෂා කර
බැලිය යුතුයි. පැල්ලම බිත්තියේ
පැතිර ඇත්නම් එය දරුණු ලෙස
පැතිරෙන විෂබීජයකි.[5] එබැවින් එම
නිවස අපවිත්‍රය. **45** ඔහු මුළු නිව-
සම සම්පූර්ණයෙන්ම කඩා දමා
එහි ගඩොල්ද ලීද සියලු බදාමද
නගරයෙන් පිටත අපවිත්‍ර තැනකට
රැගෙන යා යුතුයි.[6] **46** නිවස වසා
තැබූ කාලයේදී[7] යමෙකු එය ඇතුළට
ගියොත් ඔහු එදින සවස දක්වා
අපවිත්‍ර වන්නේය.[8] **47** යමෙකු එම

ලෙවී **14:34*** ලෙවී 13:47හි පාදසටහන බලන්න.

**14 පරි.**
1 ලෙවී 14:7
2 ලෙවී 14:17
3 ලෙවී 14:10, ලෙවී 14:18
4 ලෙවී 12:8, ලෙවී 14:22, 2කොරි 8:12
5 ලෙවී 5:7
6 ලෙවී 1:14
7 ලෙවී 14:20
8 උත් 17:8, ගණන් 32:22, ද්වි 6:10
9 ලෙවී 23:10, ගණන් 35:10, ද්වි 26:1
10 ද්වි 7:12, ද්වි 7:15, හිතෝ 3:33

**2 තීරුව**
1 ගණන් 12:15
2 ලෙවී 10:10, ලෙවී 13:6
3 ලෙවී 13:56
4 ලෙවී 14:3, එස 44:23
5 ලෙවී 13:51
6 ලෙවී 14:41
7 ලෙවී 14:38
8 ලෙවී 11:24, ලෙවී 15:8, ලෙවී 17:15, ලෙවී 22:6, ගණන් 19:7

නිවසේ නිදාගත්තොත් හෝ කෑම
කෑවොත් හෝ ඔහු තම වස්ත්‍ර සෝදා-
ගත යුතුයි.[1]
**48** “නිවස අලුතින් කපරාරු කළ
පසු පූජකයා පැමිණ එය පරීක්ෂා කර
බැලූ විට පැල්ලම බිත්තියේ පැතිර
නැති බව පෙනේ නම් නිවස පවිත්‍රයයි
ප්‍රකාශ කළ යුතුයි. මන්ද විෂබී-
ජය නිවසෙන් පහව ගොස් ඇත.[2]
**49** නිවස පවිත්‍ර කරන පිණිස කුරුල්-
ලන්[3] දෙදෙනෙකුවද දේවදාර අතුද[4]
තද රතු නූල්ද[5] හිසොප් මිටියක්ද
නිවසේ අයිතිකරු ගෙනා යුතුයි.
**50** ඊළඟට දිය පහරකින් නැවුම්
ජලය ටිකක් ගෙන මැටි බඳුන-
කට පිරවිය යුතුයි. ඉන්පසු එක්
කුරුල්ලෙකුව එම බඳුනට ඉහළින්
අල්ලා මරන ලෙස පූජකයා අණ කළ
යුතුයි.[6] **51** ඔහු පණ ඇති කුරුල්-
ලාවද දේවදාර අතුද තද රතු නූල්ද
හිසොප් මිටියද[7] ගෙන නැවුම් ජලයට
ඉහළින් මැරූ කුරුල්ලාගේ ලේවල
ගිල්විය යුතුයි. ඉන්පසු ඒ ලේ නිවස
දෙසට හත් වරක්[8] ඉසිය යුතුයි.[9]
**52** ඔහු කුරුල්ලාගේ ලේද නැවුම්
ජලයද පණ ඇති කුරුල්ලාවද දේව-
දාර අතුද තද රතු නූල්ද හිසොප් මිටි-
යද ගෙන නිවස පවිත්‍ර කළ යුතුයි.
**53** ඉන්පසු ඔහු පණ ඇති කුරුල්ලාට
නගරයෙන් පිටත නිදැල්ලේ යන්න
හැරිය යුතුයි. එම ක්‍රියා පිළිවෙත අනු-
ගමනය කර අපවිත්‍රව තිබූ නිවස
පවිත්‍ර කළ[10] යුතුයි.
**54** “ලාදුරු රෝගය[11] වැලඳුණොත්
හෝ හිසකේ හෝ රෝම අසාමාන්‍ය
ලෙස හැළුණොත්[12] හෝ අනුගම-
නය කළ යුතු ක්‍රියාමාර්ගය එයයි.
**55** වස්ත්‍රයක[13] හෝ නිවසක හෝ
යම් විෂබීජයක් මතු වූ විටද **56** දද-
යක් හෝ තුවාලයක් හෝ ලපයක්
හෝ මතු වූ විටද[14] **57** යමක් පවි-
ත්‍රද අපවිත්‍රද කියා තීරණය කිරීම
සඳහා එම ක්‍රියාමාර්ගය[15] අනුගමනය
කළ යුතුයි. ලාදුරු රෝගය හා විෂබීජ
සම්බන්ධයෙන් නීතිය එයයි.”[16]

**14 පරි.**
1 ලෙවී 11:25 ලෙවී 13:6 ලෙවී 15:5 ගණන් 8:7
2 ලෙවී 14:3 ද්වි 32:39
3 ලෙවී 1:14
4 ලෙවී 14:4 ගණන් 19:6
5 හෙබ්‍රෙ 9:19
6 ලෙවී 14:6
7 නික් 12:22 ගණන් 19:18 1රාජා 4:33 ගීතා 51:7
8 ලෙවී 14:7
9 හෙබ්‍රෙ 9:13 1පේතෘ 1:2
10 ලෙවී 12:8 ලෙවී 14:20 හෙබ්‍රෙ 2:17
11 ලෙවී 13:59
12 ලෙවී 13:30
13 ලෙවී 13:47
14 ලෙවී 13:2
15 ලෙවී 10:10 එස 44:23
16 ද්වි 24:8

**2 තීරුව**

**15 පරි.**
1 ලෙවී 22:4 ගණන් 5:2 2සාමු 3:29
2 ලෙවී 11:25 ලෙවී 17:15
3 යෙසා 1:16
4 ලෙවී 22:4 ගණන් 5:2 2සාමු 3:29
5 ලෙවී 11:24 ලෙවී 17:15
6 උත් 31:34
7 ලෙවී 15:2

# 15
යෙහෝවා දෙවි මෝසෙස්-
ටත් ආරොන්ටත් මෙසේ
කීවේය. **2** “ඊශ්‍රායෙල් සෙනඟට
මෙසේ කියන්න. ‘යමෙකුගේ ලිං-
ගේන්ද්‍රියෙන් ශ්‍රාවයක් ගලනවා නම්[1]
එම තැනැත්තා සිටින්නේ අපවිත්‍ර
තත්වයකයි. **3** එම ශ්‍රාවය ඔහුගේ
ලිංගේන්ද්‍රියෙන් පිටතට ගලා ගියත්
නැතත් ඔහු අපවිත්‍රය.
**4** “ ‘එවැනි තැනැත්තෙකු යහනක
හාන්සි වේ නම් එම යහන අපවිත්‍ර
වන්නේය. ඔහු යම් තැනක හිඳගන්-
නේද එතැනද අපවිත්‍ර වන්නේය.
**5** යමෙකු ඔහුගේ යහන ස්පර්ශ
කළොත් එම තැනැත්තා තම වස්ත්‍ර
සෝදාගෙන නාගත යුතුයි. ඔහු සවස්
වන තුරු අපවිත්‍ර කෙනෙකු ලෙස
වෙන්ව සිටිය යුතුයි.[2] **6** ලිංගේන්ද්‍රි-
යෙන් ශ්‍රාවයක් ගලන කෙනෙකු හිඳ-
ගත් තැනක යමෙකු හිඳගත්තොත්
ඔහු තම වස්ත්‍ර සෝදාගෙන[3] නාගත
යුතුයි. ඔහු සවස් වන තුරු අප-
විත්‍ර කෙනෙකු ලෙස වෙන්ව සිටිය
යුතුයි. **7** ශ්‍රාවයක් ගලන කෙනෙ-
කුව ස්පර්ශ කරන[4] කවුරු නමුත් තම
වස්ත්‍ර සෝදාගෙන නාගත යුතුයි. ඔහු
සවස් වන තුරු අපවිත්‍ර කෙනෙකු
ලෙස වෙන්ව සිටිය යුතුයි.[5] **8** ශ්‍රාව-
යක් ගලන තැනැත්තාගේ කෙළ
පවිත්‍ර කෙනෙකුගේ ඇඟේ වැදුණොත්
ඔහු තම වස්ත්‍ර සෝදාගෙන නාගත
යුතුයි. ඔහු සවස් වන තුරු අපවිත්‍ර
කෙනෙකු ලෙස වෙන්ව සිටිය යුතුයි.
**9** ශ්‍රාවයක් ගලන කෙනා සෑදලයක්[6]
පිට හිඳගත්තොත් එයද අපවිත්‍ර වන්-
නේය. **10** ඔහු යම් දෙයක් මත
හිඳගත් පසු ඒ දේ ස්පර්ශ කරන
තැනැත්තා සවස් වන තුරු අපවිත්‍ර
වන්නේය. යමෙකු ඔහු හිඳගත් දේ
රැගෙන ගියොත් එම තැනැත්තා තම
වස්ත්‍ර සෝදාගෙන නාගත යුතුයි.
ඔහු සවස් වන තුරු අපවිත්‍ර කෙ-
නෙකු ලෙස වෙන්ව සිටිය යුතුයි.
**11** ශ්‍රාවයක් ගලන[7] කෙනා තම අත්
සෝදන්නේ නැතුව යමෙකුව ස්පර්ශ
කළොත් එම තැනැත්තා තම වස්ත්‍ර

සෝදාගෙන නාගත යුතුයි. ඔහු සවස්
වන තුරු අපවිත්‍ර කෙනෙකු ලෙස
වෙන්ව සිටිය යුතුයි. **12** ශ්‍රාවයක්
ගලන කෙනා මැටි භාජනයක් ස්පර්ශ
කළොත් එය බිඳ දැමිය යුතුයි.[1] ඔහු
ලී භාණ්ඩයක්[2] ස්පර්ශ කළොත් එය
වතුරෙන් සේදිය යුතුයි.

**13** "'එම තැනැත්තාගේ ශරී-
රයෙන් ශ්‍රාවය ගලා යෑම නතර
වුණොත් එය නතර වී දවස් හතක්[3]
ගෙවුණු පසු ඔහු තම වස්ත්‍ර සෝ-
දාගෙන පිරිසිදු වතුරෙන් නාගත
යුතුයි.[4] එවිට ඔහු පවිත්‍ර වන්නේය.
**14** අටවන දවසේදී ඔහු පරෙවියන්
දෙදෙනෙකු හෝ කොබෙයි පැටවුන්[5]
දෙදෙනෙකු හෝ රැගෙන සම්මුඛ
වීමේ කූඩාරමට ඇතුල් වන ස්ථාන-
යේ යෙහෝවා දෙවි වන මා ඉදිරියට
පැමිණ පූජකයාට උන්ව දිය යුතුයි.
**15** පූජකයා උන්ගෙන් එකෙකුව පාප
පූජාවක් ලෙසද අනිකාව දවන පූජා-
වක්[6] ලෙසද ඔප්පු කළ යුතුයි. ඉන්-
පසු පූජකයා යෙහෝවා දෙවි වන මා
ඉදිරියේ එම තැනැත්තාගේ පව්කාර
තත්වය වෙනුවෙන් සමාව ලබාගත
යුතුයි.

**16** "'පුරුෂයෙකුගෙන් ශුක්‍රාණු[7]
පිට වුණොත් ඔහු නාගත යුතුයි. ඉන්-
පසු ඔහු සවස් වන තුරු අපවිත්‍ර කෙ-
නෙකු ලෙස වෙන්ව සිටිය යුතුයි.
**17** යම් වස්ත්‍රයක හෝ සමෙන් සෑදූ
ඕනෑම දෙයක හෝ ශුක්‍රාණු වැදු-
ණොත් එය වතුරෙන් සේදිය යුතුයි.
එය සවස් වන තුරු අපවිත්‍ර දෙයක්
ලෙස වෙන් කර තැබිය යුතුයි.[8]

**18** "'පුරුෂයෙකු ස්ත්‍රියක සමඟ
සයනය කළ විට ශුක්‍රාණු පිට වීමක්
සිදු වන බැවින් ඔවුහු දෙදෙනා අපවිත්‍ර
තත්වයකට පත් වනු ඇත.[9] ඒ නිසා
ඔවුන් දෙදෙනාම නාගෙන සවස් වන
තුරු වෙන්ව සිටිය යුතුයි.

**19** "'ස්ත්‍රියකගේ ශරීරයෙන් ලේ[10]
ගලනවා නම් එය ඇගේ ඔසප් දවස්
වේ. ඔසප් වීම නිසා ඇය අපවිත්‍ර[11]
තත්වයක සිටින්නීය. එබැවින් ඇය
දවස් හතක්[12] වෙන්ව සිටිය යුතුයි.
ඇයව ස්පර්ශ කරන කවුරු නමුත්
සවස් වන තුරු අපවිත්‍ර වන්නේය.
**20** ඇය අපවිත්‍රව සිටින ඔසප් කාල-
යේදී යමක් මත හාන්සි වුණොත්
හෝ හිඳගත්තොත් හෝ ඒ දේ අප-
විත්‍ර වන්නේය.[1] **21** ඇගේ යහන
ස්පර්ශ කරන කවුරු නමුත් තම
වස්ත්‍ර සෝදාගෙන නාගත යුතුයි.
ඒ තැනැත්තා අපවිත්‍ර තත්වයක
සිටින බැවින් සවස් වන තුරු වෙන්ව
සිටිය යුතුයි.[2] **22** කවරෙකු හෝ
ඇය හිඳගත් තැන ස්පර්ශ කළොත්
ඔහුද තම වස්ත්‍ර සෝදාගෙන නාගත
යුතුයි. ඔහු සවස් වන තුරු අප-
විත්‍ර කෙනෙකු ලෙස වෙන්ව සිටිය
යුතුයි.[3] **23** ඇය හිඳගත් යහන
හෝ වෙන ඕනෑම දෙයක් හෝ
ස්පර්ශ[4] කරන යමෙකු සවස් වන
තුරු අපවිත්‍ර වන්නේය. **24** ඇගේ
ඔසප් දවස්වලදී පුරුෂයෙකු ඇය
සමඟ සයනය කළොත්[5] ඔහු දවස්
හතක් යන තුරු අපවිත්‍ර තත්වයක
සිටින්නේය. ඔහු ඒ කාලයේදී යහ-
නක හාන්සි වුණොත් එයද අපවිත්‍ර
වන්නේය.

**25** "'ස්ත්‍රියකගේ ඔසප් දවස් හැර
වෙනත් දවස්වලදීත්[6] දවස් ගණනා-
වක්[7] පුරා ඇගේ ශරීරයෙන් ලේ ගල-
නවා නම් හෝ ඔසප් වීම සාමාන්‍ය
දින ගණනට වඩා දිගු කාලයක්
පුරා පවතිනවා නම් හෝ එම අප-
විත්‍ර ශ්‍රාවය ගලන සියලු දවස්ව-
ලදී ඇගේ ඔසප් දිනවලදී මෙන්
ඇය අපවිත්‍ර තත්වයක සිටින්නීය.
**26** ඇගේ ඔසප් වීම සිදු වන දවස්ව-
ලදී මෙන් මෙම කාලයේදීද ඇය යහ-
නක හාන්සි වුණොත් හෝ යමක
හිඳගත්තොත් හෝ එය අපවිත්‍ර[8]
වන්නේය. **27** එම දේවල් ස්පර්ශ[9]
කරන කවුරු නමුත් තම වස්ත්‍ර
සෝදාගෙන නාගත යුතුයි. ඔහු සවස්
වන තුරු අපවිත්‍ර කෙනෙකු ලෙස
වෙන්ව සිටිය යුතුයි.

**28** "'එහෙත් ඇගේ ශරීරයෙන්
ගලා ගිය ශ්‍රාවය නැවතුණොත්
ශ්‍රාවය නතර වී දවස් හතක්

**15 පරි.**
1 ලෙවී 6:28, ලෙවී 11:33
2 නික් 7:19, ලෙවී 11:32
3 ලෙවී 14:8, ලෙවී 14:23
4 ලෙවී 15:5
5 ලෙවී 1:14, ලෙවී 14:22, ගණන් 6:10
6 ලෙවී 5:7, ලෙවී 14:19, ලෙවී 14:31
7 ලෙවී 22:4, ද්වි 23:10
8 ලෙවී 11:25
9 නික් 19:15, 1සාමු 21:5
10 ලෙවී 20:18
11 එස 22:10, එස 36:17
12 ලෙවී 12:2, ලෙවී 12:5, ලෙවී 15:26

**2 තීරුව**
1 ලෙවී 15:4
2 ලෙවී 15:5
3 ලෙවී 15:6
4 ලෙවී 15:10
5 ලෙවී 18:19, ලෙවී 20:18
6 ලෙවී 12:2, ලෙවී 15:19
7 මතෙ 9:20, මාක් 5:25, ලූක් 8:43
8 ලෙවී 15:21
9 ලෙවී 15:10, ලෙවී 15:22

ගෙවුණු පසු ඇය පවිත්‍ර වන්නීය.[1]
29 අටවන දවසේදී ඇය පරෙවියන්
දෙදෙනෙකු හෝ කොබෙයි පැට-
වුන්[2] දෙදෙනෙකු හෝ සම්මුඛ වීමේ
කූඩාරමට ඇතුල් වන ස්ථානයට
ගෙනැවිත් පූජකයාට දිය යුතුයි.[3]
30 පූජකයා උන්ගෙන් එකෙකුව පාප
පූජාවක් ලෙසද අනිකාව දවන පූජා-
වක් ලෙසද[4] ඔප්පු කළ යුතුයි. ඉන්-
පසු පූජකයා යෙහෝවා දෙවි වන මා
ඉදිරියේ එම තැනැත්තියගේ පව්කාර
තත්වය වෙනුවෙන් සමාව[5] ලබාගත
යුතුයි.
31 "'ඔබ ඊශ්‍රායෙල් සෙනඟව අප-
විත්‍ර දේවලින් වෙන් කර තැබිය
යුතුයි. මන්ද ඔවුන් අපවිත්‍ර තත්වය-
කට පත් වුණොත් ඔවුන් අතරේ
තිබෙන මගේ ශුද්ධ කූඩාරමද[6] දූෂ්‍ය
වන්නේය. එසේවුවහොත් ඔවුන්ට
ඔවුන්ගේ ජීවිතයෙන් වන්දි ගෙවන්න
සිදු වෙයි.
32 "'ලිංගේන්ද්‍රියෙන් ශ්‍රාවයක්[7]
ගැලීම නිසා හෝ ශුක්‍රාණු[8] පිට වීම
නිසා හෝ අපවිත්‍ර වන පුරුෂයෙකු
විසින් පිළිපැදිය යුතු නීතිය එයයි.
33 ඔසප්[9] දවස්වලදී අපවිත්‍ර වන
ස්ත්‍රියක විසින්ද ශ්‍රාවයක්[10] ගලන
පුරුෂයෙකු හෝ ස්ත්‍රියක හෝ විසින්ද
අපවිත්‍රව සිටින ස්ත්‍රියක සමඟ සය-
නය කරන පුරුෂයෙකු විසින්ද පිළිපැ-
දිය යුතු නීතිය එයයි.'"

16 ආරොන්ගේ පුත්‍රයන් යෙ-
හෝවා දෙවි අනුමත නො-
කළ ආකාරයකට දෙවි ඉදිරියට
පැමිණ මරණයට පත් වූ පසු,[11]
යෙහෝවා දෙවි මෝසෙස්ට කතා
කළේය. 2 යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. "තිරය[12] පිටු-
පසින් තිබෙන ශුද්ධස්ථානයේ තබා
ඇති ගිවිසුම් පෙට්ටියේ ආවරණයට
ඉහළින්[13] වලාකුළක් තුළ[14] මම පෙනී
සිටින්නෙමි. එබැවින් ඔබේ සහෝද-
රයා වන ආරොන්ට තම හිතුමනා-
පෙට එතැනට නොයන ලෙස[15] අණ
කරන්න. ඔහු එසේ කළොත් ඔහු මිය
යන්නේය.[16]

15 පරි.
1 ලෙවී 15:13
2 ලෙවී 1:14
ලෙවී 15:14
3 ගණන් 6:10
4 ලෙවී 5:7
ලෙවී 14:31
ලෙවී 15:15
5 ලෙවී 4:31
ලෙවී 12:7
1යොහ 2:2
6 ලෙවී 19:30
ගණන් 5:3
ගණන් 19:20
7 ලෙවී 15:2
8 ලෙවී 15:16
9 ලෙවී 15:19
10 ලෙවී 15:25

16 පරි.
11 ලෙවී 10:2
12 නික් 40:21
හෙබ්‍රෙ 6:19
හෙබ්‍රෙ 9:3
හෙබ්‍රෙ 10:20
13 නික් 25:22
14 නික් 40:34
15 නික් 30:10
ලෙවී 23:27
හෙබ්‍රෙ 9:7
16 ගණන් 4:19

2 තීරුව
1 ලෙවී 4:3
2 ලෙවී 1:3
ලෙවී 8:18
3 නික් 26:33
හෙබ්‍රෙ 9:7
4 නික් 30:20
හෙබ්‍රෙ 10:22
5 නික් 28:42
6 නික් 28:39
එළි 19:8
7 නික් 39:29
8 නික් 28:4
1කොරි 11:3
9 නික් 28:2
10 ලෙවී 4:14
හෙබ්‍රෙ 7:27
11 ගණන් 29:11
2ලේක 29:21
එස්රා 6:17
12 ලෙවී 1:3
13 ලෙවී 8:14
හෙබ්‍රෙ 9:7
14 ලෙවී 9:7
හෙබ්‍රෙ 5:3
15 නික් 30:30
ගීතා 135:19
16 හෙබ්‍රෙ 10:1
17 ගණන් 26:55
යොෂු 18:10
18 ලෙවී 14:7
ලෙවී 14:53
19 හිතෝ 16:33
20 ක්‍රියා 2:23
21 ලෙවී 16:22
යෙසා 53:4
රෝම 15:3

3 "ආරොන් පාප පූජාවක්[1] සඳහා
නහඹර වස්සෙකුවද දවන පූජාවක්[2]
සඳහා බැටළුවෙකුවද රැගෙන ශුද්ධස්-
ථානයට[3] පැමිණිය යුතුයි. 4 ඔහු
ස්නානය කළ පසු[4] ලිනන් රෙදිවලින්
මැසූ යට ඇඳුම[5] හා ශුද්ධ වස්-
ත්‍රය[6] ඇඳගෙන ලිනන් පටිය[7] ඉණ
වටා බැඳ විශේෂ හිස්වැස්ම[8] පැළඳිය
යුතුයි. ඒවා ශුද්ධ වස්ත්‍ර වේ.[9]
5 "ඊශ්‍රායෙල් සෙනඟ[10] පාප පූජා-
වක්[11] සඳහා එළු පැටවුන් දෙදෙ-
නෙකුවද දවන පූජාවක්[12] සඳහා
බැටළුවෙකුවද දිය යුතුයි.
6 "ආරොන් පාප පූජාවට ගෙනා
වස්සාව ඔප්පු කළ යුතුයි. එම පාප
පූජාව ඔහු උදෙසාය.[13] ඔහු එය
ඔප්පු කර තමන්ගේ[14] පාපවලට හා
තම ගෙයි වැසියන්ගේ[15] පාපවලට
සමාව[16] ලබාගත යුතුයි.
7 "ඔහු එළු පැටවුන් දෙදෙනාව
සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල් වන
ස්ථානයේ යෙහෝවා දෙවි වන මා ඉදි-
රියට රැගෙන ආ යුතුයි. 8 ආරොන්
එළු පැටවුන් දෙදෙනා වෙනුවෙන් ආදු[17]
දැමිය යුතුයි. එකක් යෙහෝවා දෙවි
වන මා වෙනුවෙන්ද අනික අෂා-
ෂෙල්* වෙනුවෙන්ද දැමිය යුතුයි.[18]
9 ආරොන් යෙහෝවා දෙවි වන මට
ඔප්පු කිරීමට නියම වූ[19] එළුවාව පාප
පූජාවක් ලෙස ඔප්පු කළ යුතුයි.[20]
10 අෂාෂෙල්ට නියම වූ එළුවාව නො-
මැරිය යුතුයි. පාපවලට සමාව ලබා-
ගන්නා පිණිස ඌව යෙහෝවා දෙවි
වන මා ඉදිරියට ගෙනා යුතුයි. පසුව
අෂාෂෙල් උදෙසා ඌව පාළුකරයට[21]
යැවිය යුතුයි.[22]
11 "ආරොන් තමා උදෙසා පාප
පූජාවක් ලෙස ගෙනා වස්සාව මරා
ඔප්පු කර තම පාපවලට හා තම ගෙයි
වැසියන්ගේ පාපවලට සමාව ලබාගත
යුතුයි.[23]

22 ලෙවී 14:7; 23 ලෙවී 16:6.

ලෙවී 16:8* 'අෂාෂෙල් වෙනුවෙන්' යන යෙදුමේ නියම අර්ථය ස්ථිර ලෙස නොදන්නේය. පාළුකරයට යවන එළුවා ගැන සඳහන් කරද්දී මෙම යෙදුම භාවිත කෙරේ. ලෙවී 16:10 සහ 26 සසඳා බලන්න.

**12** “ඔහු යෙහෝවා දෙවි වන මා
ඉදිරියේ පූජාසනයේ[1] ඇවිළෙමින්
තිබෙන ගිනි අඟුරු ගෙන සුවඳ
දුම් ඔප්පු කරන භාජනය[2] පුරවාගත
යුතුයි. ඉන්පසු සුවඳ ද්‍රව්‍ය අඟුරු දෙ-
කක්[3] ගෙන සුවඳ දුම්[4] ඔප්පු කරන
භාජනයද රැගෙන තිරය[5] පිටුපසට යා
යුතුයි. **13** ඔහු සුවඳ ද්‍රව්‍ය ගිනි
අඟුරු මත දමා යෙහෝවා දෙවි වන
මා ඉදිරියේ දැවිය යුතුයි.[6] එවිට එයින්
නැඟෙන දුමෙන් ගිවිසුම් පෙට්ටියේ[7]
ආවරණය[8] වැසී යන්නේය. ඔහු මිය
නොයන පිණිස එසේ කළ යුතුයි.

**14** “ඔහු තම ඇඟිල්ලට වස්සාගේ
ලේවලින්[9] ස්වල්පයක් ගෙන ආවර-
ණය ඉදිරියේ නැඟෙනහිර පැත්තට
එය ඉසිය[10] යුතුයි. මෙසේ, ඔහු ආව-
රණය ඉදිරියේ හත් වරක්ම ලේ ඉසිය
යුතුයි.[11]

**15** “ඔහු පාප පූජාවට ගෙනා එළු-
වාව මැරිය යුතුයි. එම පූජාව සෙනඟ
උදෙසාය.[12] ඉන්පසු ඔහු එළුවාගේ ලේ
රැගෙන තිරය පිටුපසට ගොස්[13] වස්සා-
ගේ ලේ[14] ඉසූ ලෙසම උගේ ලේත් ආව-
රණය ඉදිරියේ ඉසිය යුතුයි.

**16** “ආරොන් ශුද්ධස්ථානය ගැන
කන්නලව් කළ යුතුයි. ඔහු එසේ කළ
යුත්තේ ඊශ්‍රායෙල් සෙනඟගේ අප-
විත්‍රකම්වලින්ද[15] කැරලිගැසීම්වලින්ද
සියලු පාපවලින්ද[16] එය දූෂ්‍ය නොවන
පිණිසය. අපවිත්‍රව සිටින ඊශ්‍රායෙල්
සෙනඟ අතරේ පිහිටුවා තිබෙන සම්-
මුඛ වීමේ කූඩාරම සම්බන්ධයෙන්ද
ඔහු එලෙසම කළ යුතුයි.

**17** “පාපවලට සමාව ලබාගන්නා
පිණිස ශුද්ධස්ථානයට ඔහු ඇතුල්
වන විට සම්මුඛ වීමේ කූඩාරමේ කිසි-
වෙකු නොසිටිය යුතුයි. ඔහු එයින්
පිටතට එන තෙක් කිසිවෙකු කූඩාර-
මට ඇතුල් නොවිය යුතුයි. ඔහු
තමාගේ[17] පාපවලටද තම ගෙයි වැසි-
යන්ගේ පාපවලටද මුළු ඊශ්‍රායෙල්
සෙනඟගේ[18] පාපවලටද සමාව ලබා-
ගත යුතුයි.

**18** “ඔහු ශුද්ධස්ථානයෙන් පිට-
තට ඇවිත් යෙහෝවා දෙවි වන මා

**16 පරි.**
**1** නික් 40:29
ලෙවී 6:13
ගණන් 16:46
**2** හෙබ්‍රෙ 9:4
**3** එළි 8:4
**4** නික් 30:34
නික් 30:36
ක්‍රියා 10:4
එළි 5:8
එළි 8:3
**5** ලෙවී 16:2
හෙබ්‍රෙ 6:19
හෙබ්‍රෙ 10:20
**6** නික් 25:22
ගණන් 16:7
2රාජා 19:15
**7** නික් 25:21
නික් 34:29
**8** නික් 25:18
නික් 25:21
1ලේක 28:11
**9** හෙබ්‍රෙ 9:22
**10** හෙබ්‍රෙ 9:12
1පේත්‍රු 1:2
**11** රෝම 3:25
හෙබ්‍රෙ 9:24
හෙබ්‍රෙ 9:25
හෙබ්‍රෙ 10:4
හෙබ්‍රෙ 10:12
**12** ලෙවී 16:5
හෙබ්‍රෙ 2:17
හෙබ්‍රෙ 5:3
හෙබ්‍රෙ 9:26
1යොහ 2:1
1යොහ 2:2
**13** හෙබ්‍රෙ 6:19
හෙබ්‍රෙ 9:3
හෙබ්‍රෙ 9:7
හෙබ්‍රෙ 10:20
**14** ලෙවී 17:11
හෙබ්‍රෙ 9:22
**15** ගීතා 51:5
දේශ 7:20
රෝම 3:23
**16** ද්වි 32:5
1රාජා 8:46
**17** ලෙවී 9:7
ලෙවී 16:6
හෙබ්‍රෙ 7:27
**18** යෙසා 53:6
මාක් 10:45
හෙබ්‍රෙ 2:9
හෙබ්‍රෙ 9:7
හෙබ්‍රෙ 9:12
1යොහ 2:2
එළි 1:5

**2 තීරුව**
**1** නික් 38:1
ලෙවී 16:12
**2** ලෙවී 9:9
හෙබ්‍රෙ 9:22
**3** ලෙවී 9:12
**4** නික් 29:36
ලෙවී 8:15
ලෙවී 16:16
හෙබ්‍රෙ 9:23
**5** ලෙවී 16:8
ලෙවී 16:10
එළි 5:9
**6** ලෙවී 1:4

ඉදිරියේ තිබෙන පූජාසනය[1] ළඟට
ගොස් සියලු අපවිත්‍රකම්වලින් එය
ආරක්ෂා කරන ලෙස කන්නලව් කළ
යුතුයි. වස්සාගේ ලෙයින් ස්වල්ප-
යක්ද එළුවාගේ ලෙයින් ස්වල්පයක්ද
ගෙන පූජාසනය වටේට තිබෙන අං
මත තැවරිය යුතුයි.[2] **19** ඔහු තම
ඇඟිල්ල ලේවල ගිල්වා පූජාසනය
මත හත් වරක් එය ඉසිය[3] යුතුයි.
මෙසේ, ඊශ්‍රායෙල් සෙනඟගේ අපවිත්‍ර-
කම්වලින් පූජාසනය දූෂ්‍ය නොවන
පිණිස ඔහු එය පවිත්‍ර කර පරිශුද්ධ
දෙයක් ලෙස වෙන් කර තැබිය යුතුයි.

**20** “ශුද්ධස්ථානයද සම්මුඛ වීමේ
කූඩාරමද පූජාසනයද අපවිත්‍රකම්-
වලින් ආරක්ෂා කරන මෙන් ඔහු
කන්නලව්[4] කළ පසු පණ ඇති එළු-
වාව ඔහු ඉදිරියට ගෙනා යුතුයි.[5]
**21** ඉන්පසු ආරොන් තම අත් දෙ-
කම[6] එළුවාගේ හිස මත තබා ඊශ්‍රා-
යෙල් සෙනඟ කළ සියලු අයුතුකම්ද[7]
ඔවුන්ගේ සියලු පාපද හෙළි[8] කළ
යුතුයි. මෙසේ, ඔවුන්ගේ පව්[9] සියල්ල
එළුවා මත පටවා[10] ඌව රැගෙන
යෑමට සූදානමින් සිටින මිනිසෙකු[11]
සමඟ ඌව පාළුකරයට යැවිය
යුතුයි.[12] **22** ඔහු එළුවාව පාළුකර-
යට[13] ගෙන යා යුතුයි. ඌද සෙනඟ-
ගේ සියලු පාප දරමින්[14] පිටත්ව
යන්නේය.

**23** “ඉන්පසු ආරොන් සම්මුඛ වීමේ
කූඩාරමට පැමිණ, ඔහු ශුද්ධස්ථා-
නයට යන විට ඇඳ සිටි ලිනන්
වස්ත්‍ර ගලවා එහි පැත්තකින් තැබිය
යුතුයි.[15] **24** ඉන්පසු ඔහු ශුද්ධ
තැනකදී[16] නාගෙන[17] ඔහුගේ වස්ත්‍ර
ඇඳගත යුතුයි.[18] ඊළඟට ඔහු පිටතට
ඇවිත් තමා වෙනුවෙන් ඔප්පු කිරීමට
ගෙනා දවන පූජාවද[19] සෙනඟ ගෙනා

---

**7** ගීතා 69:9; යෙසා 53:5; එෆී 2:3; **8** නෙහෙ 1:6; **9** 1කොරි 15:3; 1පේත්‍රු 2:24; **10** යෙසා 53:6; 2කොරි 5:21; **11** මතෙ 4:1; ලූක් 4:1; **12** ලෙවී 14:7; **13** ලෙවී 16:10; **14** ගීතා 103:12; යෙසා 53:12; එස 18:22; මීකා 7:19; යොහ 1:29; රෝම 15:3; එෆී 1:7; හෙබ්‍රෙ 9:28; හෙබ්‍රෙ 13:12; 1පේත්‍රු 2:24; 1යොහ 3:5; **15** එස 42:14; එස 44:19; **16** ලෙවී 6:16; ලෙවී 6:26; **17** නික් 30:20; හෙබ්‍රෙ 9:9; හෙබ්‍රෙ 10:22; **18** නික් 28:4; ලෙවී 8:7; **19** ලෙවී 16:3.

දවන පූජාවද[1] ඔප්පු කර තමාගේ
පාපවලට හා සෙනඟගේ පාපවලට
සමාව ලබාගත යුතුයි.[2] **25** පාප
පූජාවට ගෙනා සතුන්ගේ තෙල් කො-
ටස් ඔහු පූජාසනය මත දැවිය යුතුයි.[3]
**26** “අෂාෂෙල්[4] වෙනුවෙන් යැවූ
එළුවා සමඟ ගිය මිනිසා[5] තම වස්ත්‍ර
සෝදා නාගත යුතුයි.[6] ඉන්පසු ඔහුට
කඳවුර ඇතුළට පැමිණිය හැකියි.
**27** “පාප පූජා සඳහා මැරූ වස්සා-
ගේද එළුවාගේද ලේ ශුද්ධස්ථානයට
ගෙන ගොස් පාපවලට සමාව ලබා-
ගත් පසු උන්ගේ මළ සිරුරු කඳවු-
රෙන් පිටතට ගෙන යැමට අණ කළ
යුතුයි. උන්ගේ හමද මාංසද උන්-
ගේ අසූචිද යන සියල්ල ගින්නෙන්
පිලිස්සිය යුතුයි.[7] **28** ඒවා පිලිස්සූ
තැනැත්තා තම වස්ත්‍ර සෝදාගත් පසු
නාගත යුතුයි. ඉන්පසු ඔහුට කඳවුර
ඇතුළට පැමිණිය හැකියි.
**29** “මෙය ඔබේ පරම්පරාවල
බොහෝ කාලයක් පුරා පිළිපැදිය යුතු
පනතකි.[8] එනම්, හත්වන මාසයේ
දහවනදා[9] ඔබ යටහත්ව ඔබේ පව්
ගැන දුක් වෙමින්*[10] කිසි වැඩක් නො-
කර සිටිය යුතුයි.[11] දේශයේ වැසි-
යෙකු හෝ වේවා ඔබ අතරේ වාසය
කරන විදේශිකයෙකු හෝ වේවා එසේ
කළ යුතුයි. **30** මන්ද ඔබ පවිත්‍රයයි
ප්‍රකාශ කරන පිණිස එදින ඔබේ පව්-
වලට සමාව[12] ලබාගත යුතුයි. එවිට
ඔබ ඔබේ සියලු පව්වලට සමාව ලැබ
යෙහෝවා දෙවි වන මා ඉදිරියේ පවිත්‍ර
තත්වයක සිටිනු ඇත.[13] **31** එදින
ඔබ යටහත්ව ඔබේ පව් ගැන දුක්
වෙමින් වෙනත් වැඩවල නොයෙදී
මුළු දවසම විවේකයෙන් ගත කළ
යුතුයි. එය සබත්[14] දිනයකි. එය
බොහෝ කාලයක් පුරා පැවැත්විය
යුතු පනතකි.
**32** “තම පියාගෙන් පසුව[15] බලය
ලබා දී පූජකයා[16] ලෙස සේවය
කිරීමට අභිෂේක[17] කරනු ලබන
තැනැත්තා, පාපවලට සමාව ලබා-
ගන්නා පිණිස පූජා ඔප්පු කළ යුතුයි.
ඔහු ශුද්ධ[1] ලිනන් වස්ත්‍ර ඇඳ සිටිය
යුතුයි.[2] **33** ඔහු අතිශුද්ධස්ථානය,[3]
සම්මුඛ වීමේ කූඩාරම,[4] පූජාසනය,[5]
පූජකයන් සහ ඊශ්‍රායෙල් සෙනඟ වෙ-
නුවෙන් පූජා ඔප්පු කළ යුතුයි.[6]
**34** ඊශ්‍රායෙල් සෙනඟගේ සියලු පාප-
වලට සමාව ලබාගන්නා පිණිස
අවුරුද්දකට වතාවක් එලෙස කළ
යුතුයි.[7] එය බොහෝ කාලයක් පුරා
ඔබ පිළිපැදිය යුතු පනතකි.”[8]
යෙහෝවා දෙවි මෝසෙස්ට අණ
කළ ලෙස ඔහු කළේය.

**17** නැවත යෙහෝවා දෙවි මෝ-
සෙස්ව අමතමින් මෙසේ
කීවේය. **2** “ඔබ ආරොන්ටත් ඔහු-
ගේ පුත්‍රයන්ටත් මුළු ඊශ්‍රායෙල්
සෙනඟටත් මෙසේ කිව යුතුයි. ‘යෙ-
හෝවා දෙවි දුන් ආඥාව මෙයයි.
**3** “‘“ඊශ්‍රායෙල් සෙනඟ අතරින්
යමෙකු කඳවුර ඇතුළේ නැත්නම්
කඳවුරෙන් පිටතදී වස්සෙකුව හෝ
බැටළු පැටවෙකුව හෝ එළුවෙකුව
හෝ මැරූ පසු, **4** යෙහෝවා දෙවි
වන මාගේ ශුද්ධ කූඩාරම ඉදිරි-
යට එනම්, සම්මුඛ වීමේ කූඩාරමට[9]
ඇතුල් වන ස්ථානය වෙත ඌව ගෙ-
නැවිත් යෙහෝවා දෙවි වන මට
පූජාවක් ලෙස ඔප්පු කළ යුතුයි.
එසේ නොකළොත් ඔහු වැගිරූ ලේ-
වලට ඔහු වන්දි ගෙවිය යුතුයි.
ඔහු ලේ වැගිරෙවූ නිසා ඔහුව මරා
දැමිය යුතුයි.[10] **5** මන්ද මින් ඉදිරි-
යට ඊශ්‍රායෙල් සෙනඟ එළිමහනේ
තම සතුන්ව නොමැරිය යුතුයි.[11] ඒ
වෙනුවට සතුන්ව යෙහෝවා දෙවි
වන මා ඉදිරියට එනම්, සම්මුඛ
වීමේ කූඩාරමට ඇතුල් වන ස්ථානය
වෙත ගෙනැවිත් පූජකයාට භාර දිය
යුතුයි.[12] යෙහෝවා දෙවි වන මට
හවුල් පූජාවන් ලෙස උන්ව ඔප්පු කළ
යුතුයි.[13] **6** සම්මුඛ වීමේ කූඩාරමට
ඇතුල් වන ස්ථානයේ තිබෙන යෙ-

**16 පරි.**
**1** ලෙවී 16:5
**2** එෆී 1:7
**3** නික් 29:13
ලෙවී 3:16
**4** ලෙවී 16:8
**5** ලෙවී 16:21
**6** ගණන් 19:7
හෙබ්‍රෙ 9:10
**7** ලෙවී 4:12
ලෙවී 8:17
හෙබ්‍රෙ 13:11
හෙබ්‍රෙ 13:12
**8** නික් 30:10
**9** ලෙවී 23:27
ගණන් 29:7
**10** ගීතා 35:13
යෙසා 58:5
2කොරි 7:10
**11** ලෙවී 23:28
**12** යොහ 3:16
රෝම 8:32
තීත 2:14
1යොහ 1:7
1යොහ 3:16
**13** ගීතා 51:2
යෙරෙ 33:8
එස 36:25
එෆී 5:26
හෙබ්‍රෙ 9:14
හෙබ්‍රෙ 10:2
**14** ලෙවී 23:32
**15** ගණන් 20:26
**16** නික් 29:29
ලෙවී 8:33
හෙබ්‍රෙ 5:5
හෙබ්‍රෙ 5:10
හෙබ්‍රෙ 7:11
හෙබ්‍රෙ 7:16
**17** නික් 29:7
ලෙවී 8:12
ක්‍රියා 10:38
හෙබ්‍රෙ 1:9

**2 තීරුව**
**1** නික් 28:2
එළි 19:8
**2** නික් 28:39
නික් 39:28
ලෙවී 16:4
**3** ලෙවී 16:16
**4** ලෙවී 16:20
**5** නික් 29:36
ලෙවී 8:15
ලෙවී 16:18
**6** ලෙවී 16:24
1යොහ 2:2
**7** නික් 30:10
හෙබ්‍රෙ 9:7
**8** ලෙවී 23:31
ගණන් 29:7

**17 පරි.**
**9** ලෙවී 1:3
ද්වි 6:1
ද්වි 12:21
**10** ලෙවී 18:29
ලෙවී 20:2
**11** 2රාජා 16:4
එස 20:28

---

ලෙවී **16:29*** නිරාහාරව සිටීම හා තමන්ටම පනවාගත් වෙනත් තහංචි මෙයින් අදහස් කළා විය හැක.

**12** ද්වි 12:5; ද්වි 12:18; **13** ලෙවී 3:2; ලෙවී 7:11.

හෝවා දෙවි වන මාගේ පූජාස-
නය මත පූජකයා එම සතුන්ගේ
ලේ ඉසිය යුතුයි.[1] යෙහෝවා දෙවි
වන මට ප්‍රසන්න සුවඳක් ගෙනෙන
පිණිස උන්ගේ තෙල්[2] කොටස් පූජා-
සනය මත දැවිය යුතුයි.[3] **7** ඔබ
මට අවිශ්වාසවන්ත වෙමින්[4] භූත-
යන්ට*[5] පුදපූජා ඔප්පු කිරීම මින් ඉදි-
රියට අත්හැරිය යුතුයි. එය ඔබේ
පරම්පරාවලදී බොහෝ කාලයක් පුරා
පැවැත්විය යුතු පනතකි.” ’

**8** “ඔබ ඔවුන්ට මෙසේ කියන්න.
‘දවන පූජාවක්[6] හෝ වෙන ඕනෑම
පූජාවක් හෝ ඔප්පු කරන ඊශ්‍රායෙල්
ජාතිකයෙකු නැත්නම් ඔබ සමඟ
ජීවත් වන විදේශිකයෙකු **9** පූජා-
වක් ලෙස ඔප්පු කරන එම සතාව
යෙහෝවා දෙවි වන මට පිළිගන්-
වන පිණිස සම්මුඛ වීමේ කූඩාරමට
ඇතුල් වන ස්ථානයට නොගෙනා-
වොත්[7] ඔහුව මරා දැමිය යුතුයි.[8]

**10** “ ‘ඊශ්‍රායෙල් ජාතිකයෙකුවත්
ඔබ සමඟ ජීවත් වන විදේශිකයෙකු-
වත් මොනම ආකාරයකින් හෝ ලේ[9]
අනුභව කළොත් මම ඔහුව ප්‍රතික්-
ෂේප* කරන්නෙමි. මම ඔහු සමඟ
මහත් සේ උදහස් වී[10] ඔහුව මරා
දමන්නෙමි. **11** මන්ද පණ ඇති
සියල්ලන්ගේ ජීවය රැඳී තිබෙන්නේ
ලේවලය.[11] නමුත් මා සමඟ සාම-
කාමී සබඳතාවක්[12] ඇති කරගැනීමට
හැකි වන පිණිස පූජාසනය මත ලේ[13]
ඔප්පු කරන මෙන් මම ඔබට නියම
කරන්නෙමි. මන්ද ලේවල ජීවය රැඳී
තිබෙන බැවින් පව්වලට සමාව[14]
ලබාගත හැක්කේ ලේ මාර්ගයෙන්
පමණි. **12** “ඔබෙන් කිසිවෙකු ලේ
අනුභව නොකළ යුතුයි. ඔබ සමඟ
ජීවත් වන විදේශිකයන්ද[15] ලේ[16] අනු-
භව නොකළ යුතුයි” කියා මා ඊශ්‍රා-
යෙල් පුත්‍රයන්ට කීවේ ඒ නිසාය.

**13** “ ‘ඊශ්‍රායෙල් සෙනඟගෙන් කෙ-
නෙකු හෝ වේවා ඔබ සමඟ ජීවත්
වන විදේශිකයෙකු හෝ වේවා කෑමට
ගත හැකි සතෙකුව හෝ කුරුල්ලෙ-
කුව හෝ දඩයම් කරගත්තොත් ඔහු
උගේ ලේ බිමට වත් කර[1] පස්වලින්
වසා දැමිය යුතුයි.[2] **14** මන්ද පණ
ඇති සියල්ලන්ගේ ජීවය රැඳී තිබෙන්-
නේ ලේවලය. “මොනම සතෙකුගේ-
වත් ලේ නොකන්න. මන්ද පණ
ඇති සියල්ලන්ගේ ජීවය රැඳී තිබෙන්-
නේ ලේවලය.[3] එබැවින් ලේ අනුභව
කරන කවරෙකු නමුත් මරා දමනු
ලබන්නේය”[4] කියා මා ඊශ්‍රායෙල්
සෙනඟට කීවේ ඒ නිසාය. **15** ඊශ්‍රා-
යෙල් ජාතිකයෙකු හෝ වේවා විදේශි-
කයෙකු හෝ වේවා මළ සතෙකු
නැත්නම් වෙනත් සතෙකු විසින් මරා
දමනු ලැබූ සතෙකුව කෑවොත්[5] ඔහු
තම වස්ත්‍ර සෝදා නාගෙන සවස් වන
තුරු අපවිත්‍ර කෙනෙකු ලෙස වෙන්ව
සිටිය යුතුයි.[6] ඉන්පසු ඔහු පවිත්‍ර වන්-
නේය. **16** නමුත් ඔහු තම වස්ත්‍ර
සෝදාගෙන නාගත්තේ නැත්නම් ඔහු
තම වරදට ගණන් දිය යුතුයි.’ ”[7]

**18** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. **2** “ඊශ්‍රා-
යෙල් සෙනඟට මෙසේ කියන්න.
‘මා ඔබේ දෙවි වන යෙහෝවාය.[8]
**3** ඔබ ජීවත් වූ ඊජිප්තු දේශයේ
වැසියන් මෙන්ද[9] මා ඔබව ගෙන
යන කානාන් දේශයෙහි වැසියන්
මෙන්ද[10] ක්‍රියා නොකරන්න. ඔවුන්-
ගේ චාරිත්‍ර අනුගමනය නොකරන්න.
**4** ඔබ මාගේ තීන්දුවලට යටත් විය
යුතුයි.[11] මාගේ පනත්වලට කීකරු
වෙමින්[12] ඒවා අනුව ජීවත් විය
යුතුයි.[13] මන්ද මා ඔබේ දෙවි වන යෙ-
හෝවාය. **5** ඔබ මාගේ තීන්දුවලට
සහ මාගේ පනත්වලට කීකරු විය
යුතුයි. යමෙකු ඒවා පිළිපදින්නේ නම්
ඔහුගේ ජීවිතය රැකෙනු ඇත.[14] මා
යෙහෝවා දෙවිය.[15]

**17 පරි.**
**1** ලෙවී 3:8
**2** ලෙවී 3:16; ලෙවී 7:31
**3** ලෙවී 3:5; ලෙවී 4:31
**4** නික් 34:15; ලෙවී 20:5; ද්වි 31:16; යෙරෙ 3:1; එස 23:8; යාකො 4:4
**5** ද්වි 32:17; යොෂු 24:14; 2ලේක 11:15; 1කොරි 10:20
**6** ලෙවී 1:3
**7** ද්වි 12:6; ද්වි 12:14
**8** ලෙවී 17:4
**9** උත් 9:4; ලෙවී 3:17; ලෙවී 7:26; ලෙවී 19:26; ද්වි 12:16; 1සාමු 14:33; ක්‍රියා 15:29
**10** ලෙවී 20:3; ගීතා 34:16; යෙරෙ 44:11; 1පේතෘ 3:12
**11** උත් 9:4; ලෙවී 17:14; ද්වි 12:23; 1ලේක 11:19
**12** ලෙවී 8:15; ලෙවී 16:18
**13** මතෙ 26:28; මාක් 14:24; රෝම 3:25; රෝම 5:9; එෆී 1:7; කොලො 1:20
**14** හෙබ්‍රෙ 9:22; හෙබ්‍රෙ 13:12; 1පේතෘ 1:2; 1යොහ 1:7; එළි 1:5
**15** නික් 12:49
**16** උත් 9:4; ද්වි 12:23; 1ලේක 11:19; ක්‍රියා 15:20; ක්‍රියා 15:29

**2 තීරුව**
**1** ද්වි 12:16; ද්වි 15:23
**2** එස 24:7
**3** ලෙවී 17:11; ද්වි 12:23
**4** ලෙවී 17:10
**5** නික් 22:31; ද්වි 14:21
**6** ලෙවී 11:40
**7** ලෙවී 7:18; ගණන් 19:20

**18 පරි.** **8** උත් 17:7; නික් 6:7; ලෙවී 11:44; මාක් 12:29; **9** ගීතා 106:35; එස 20:7; යාකො 4:4; **10** නික් 23:24; ලෙවී 20:23; ද්වි 12:30; යෙරෙ 10:2; **11** ලෙවී 19:37; ලෙවී 20:22; ද්වි 4:1; **12** ද්වි 6:2; ගීතා 119:16; එස 20:19; 1යොහ 5:3; **13** ලූක් 1:6; **14** එස 20:11; ලූක් 10:28; රෝම 10:5; ගලා 3:12; **15** නික් 6:2; මලා 3:6.

ලෙවී **17:7*** හෝ, “එළු භූතයන්.” එළුවෙකුගේ ස්වරූපය ගත් භූතයන්. **10*** මූ.අ., “මම මගේ මුහුණ ඉවතට හරවාගන්නෙමි.”

6 “‘ඔබ අතරේ සිටින කිසි පුරුෂ-
යෙකු තම කිට්ටු නෑයෙකු සමඟ
සයනය නොකළ යුතුයි.[1] මා යෙ-
හෝවා දෙවිය. 7 ඔබේ මව සමඟ
සයනය නොකරන්න. මන්ද ඔබව
මෙලොවට බිහි කළේ ඇයයි. එසේම
ඔබ ඔබේ පියා සමඟද සයනය නො-
කළ යුතුයි.[2]
8 “‘ඔබේ පියාගේ භාර්යාව සමඟ
සයනය නොකළ යුතුයි.[3] මන්ද එසේ
කිරීම ඔබේ පියාට කරන නින්දාවකි.
9 “‘ඔබේම සහෝදරිය හෝ ඔබේ
නිවසේ හෝ වෙනත් නිවසක හෝ
උපන් ඔබේ පියාගේ හෝ මවගේ හෝ
දුව සමඟ ඔබ සයනය නොකළ
යුතුයි.[4]
10 “‘ඔබේ මිනිපිරිය සමඟ එනම්,
ඔබේ පුත්‍රයාගේ දුව සමඟවත් දුව-
ගේ දුව සමඟවත් සයනය නොකළ
යුතුයි. මන්ද ඔබ එසේ කළොත් එය
ඔබටම කරගන්නා වූ නින්දාවකි.
11 “‘ඔබේ පියාට වෙන භාර්යාව-
කගෙන් දුවක ඉපදුණොත් ඇය ඔබේ
සහෝදරිය වන නිසා ඇය සමඟ සය-
නය නොකළ යුතුයි.
12 “‘ඔබේ පියාගේ සහෝදරිය
සමඟ සයනය නොකළ යුතුයි. මන්ද
ඇය ඔබේ පියාගේ ලේ නෑයෙකි.[5]
13 “‘ඔබේ මවගේ සහෝදරිය
සමඟ සයනය නොකළ යුතුයි. මන්ද
ඇය ඔබේ මවගේ ලේ නෑයෙකි.
14 “‘ඔබේ පියාගේ සහෝදරයාගේ
භාර්යාව සමඟ සයනය නොකළ
යුතුයි. එසේ කළොත් ඔබ ඔහුට
කරන්නේ නින්දාවකි. මන්ද ඇය
ඔබේ නැන්දාය.[6]
15 “‘ඔබේ ලේලි සමඟ සයනය
නොකළ යුතුයි.[7] ඇය ඔබේ පුතාගේ
භාර්යාවය. ඔබ එසේ කළොත් එය
ඔබේ පුත්‍රයාට කරන නින්දාවකි.
16 “‘ඔබේ සහෝදරයාගේ භාර්-
යාව සමඟ සයනය නොකළ යුතුයි.[8]
ඔබ එසේ කළොත් එය ඔබේ සහෝද-
රයාට කරන නින්දාවකි.
17 “‘ඔබ ස්ත්‍රියක සමඟ විවාහ
වුණොත් ඇගේ දුව සමඟ[9] හෝ
ඇගේ මිනිපිරිය සමඟ හෝ සයනය
නොකළ යුතුයි. ඔවුන් ඇගේ ලේ
නෑදෑයන් වන බැවින් එය නින්දිත[1]
ක්‍රියාවකි.
18 “‘ඔබේ භාර්යාව ජීවතුන් අතර
සිටියදී ඇගේ සහෝදරිය සමඟ විවාහ
නොවන්න.[2] ඇය සමඟ සයනය නො-
කරන්න.
19 “‘ස්ත්‍රියක අපවිත්‍රව සිටින විට
එනම්, ඇගේ ඔසප් දවස්වලදී[3] ඇය
සමඟ සයනය නොකළ යුතුයි.[4]
20 “‘ඔබ අපවිත්‍ර නොවන පිණිස
ඔබේ මිත්‍රයාගේ භාර්යාව සමඟ සය-
නය නොකළ යුතුයි.[5]
21 “‘ඔබේ දරුවන්ව මෝලෙක්ට[6]
පූජා[7] නොකළ යුතුයි. මන්ද එය ඔබේ
දෙවිගේ නාමයට ඔබ කරන නින්දා-
වකි.[8] මා යෙහෝවා දෙවිය.[9]
22 “‘ඔබ ස්ත්‍රියක සමඟ සයනය
කරන්නාක් මෙන්[10] පුරුෂයෙකු සමඟ
නොහැසිරිය යුතුයි.[11] එය ඉතා පිළි-
කුල් දෙයකි.
23 “‘ඔබ අපවිත්‍ර නොවන පිණිස
සතෙකු සමඟ සංසර්ගයේ නොයෙදිය
යුතුයි.[12] ස්ත්‍රියකද සතෙකු වෙනට
ගොස් ඌ සමඟ සංසර්ගයේ නොයෙ-
දිය යුතුයි.[13] එය මුළුමනින්ම අස්වා-
භාවික ක්‍රියාවකි.
24 “‘ඔබ මේ එක ක්‍රියාවක් හෝ
කර දූෂ්‍ය තත්වයකට පත් නො-
වන්න. මන්ද ඔබ ඉදිරියෙන් මා
පන්නා දමන සියලු ජාතීහුද මෙවැනි
ක්‍රියා කර දූෂ්‍ය වී සිටින්නෝය.[14]
25 එබැවින් ඔවුන්ගේ දේශයද අප-
විත්‍ර වී ඇත. ඔවුන්ගේ අයුතුකම්
නිසා මා දේශය පිටට විනාශය
පමුණුවන්නෙමි. ඔවුන්ව දේශ-
යෙන් පන්නා දමනු ඇත.[15] 26 ඔබ
මාගේ නීතිවලට සහ මාගේ පනත්-
වලට කීකරු විය යුතුයි.[16] ඊශ්‍රායෙල්
ජාතිකයෙකු හෝ වේවා ඔබ සමඟ
ජීවත් වන විදේශිකයෙකු හෝ වේවා
මේ පිළිකුල් ක්‍රියා කිසිවක් නො-
කළ යුතුයි.[17] 27 ඔබට පෙර දේශ-
යේ ජීවත් වූ වැසියන් මේ සියලු

**18 පරි.**
1 ලෙවී 20:17, ගලා 5:19
2 උත් 9:22, එස 22:10
3 උත් 35:22, ලෙවී 20:11, ද්වි 22:30, ද්වි 27:20, 2සාමු 16:21, 1කොරි 5:1
4 ලෙවී 20:17, ද්වි 27:22, 2සාමු 13:12, එස 22:11
5 ලෙවී 20:19
6 ලෙවී 20:20
7 උත් 38:26, ලෙවී 20:12, එස 22:11
8 ලෙවී 20:21, ද්වි 25:5, මාක් 6:17, මාක් 12:19
9 ලෙවී 20:14, ද්වි 27:23

**2 තීරුව**
1 ගලා 5:19
2 උත් 30:15, 1සාමු 1:6
3 ලෙවී 20:18
4 ලෙවී 15:19, ලෙවී 15:24, ලෙවී 20:18, එස 22:10
5 නික් 20:14, ලෙවී 20:10, ද්වි 22:22, 2සාමු 11:4, හිතෝ 6:29, මතෙ 5:27, 1කොරි 6:9, හෙබ්‍රෙ 13:4
6 ලෙවී 20:2, 1රාජා 11:7, 2රාජා 23:10, ක්‍රියා 7:43
7 ද්වි 18:10
8 නික් 20:7, ලෙවී 19:12, ලෙවී 20:3, එස 36:20
9 යෙසා 42:8
10 උත් 19:5, ලෙවී 20:13, විනි 19:22, රෝම 1:27
11 1කොරි 6:9, 1තිමෝ 1:10, යූද් 7
12 නික් 22:19, ලෙවී 20:15
13 ලෙවී 20:16
14 ලෙවී 20:23, ද්වි 18:12
15 උත් 15:16
16 ලෙවී 20:22, ද්වි 4:1, ද්වි 4:40, රෝම 2:12
17 නික් 12:49

පිළිකුල් ක්‍රියා කළ නිසා[1] දේශය
අපවිත්‍ර වී ඇත. **28** ඔබට පෙර
මෙහි ජීවත් වූ වැසියන් මෙන් ඔබද
මේ ක්‍රියාවල යෙදී දේශය අපවිත්‍ර
කළොත් ඔබවද දේශයෙන් පන්නා
දමනු ඇත.[2] **29** කවරෙකු නමුත්
මේ පිළිකුල් ක්‍රියාවලින් එකක්වත්
කළොත් ඔහුව මරා දැමිය යුතුයි.[3]
**30** ඔබ මාගේ ආඥාවලට කීකරු
වන්න. එවිට මේ දේශයේ ඔබට
කලින් විසූ වැසියන්ගේ පිළිකුල්සහ-
ගත චාරිත්‍රවලින්[4] ඔබ අපවිත්‍ර නො-
වනු ඇත. මා ඔබේ දෙවි වන
යෙහෝවාය.’ ”

**19** යෙහෝවා දෙවි මෝසෙස්ට
තවදුරටත් මෙසේ කීවේය.
**2** “මුළු ඊශ්‍රායෙල් සෙනඟට මෙසේ
කියන්න. ‘මා ඔබේ දෙවි වන යෙ-
හෝවාය. මා ශුද්ධව සිටින නිසා[5]
ඔබද ශුද්ධව සිටිය යුතුයි.[6]

**3** “ ‘ඔබ සියලුදෙනාම තම තමා-
ගේ පියාටද මවටද ගෞරව-
යෙන් සලකන්න.[7] මා නියම කළ
සබත් දිනයන් පවත්වන්න.[8] මා ඔබේ
දෙවි වන යෙහෝවාය. **4** වැඳගැම්-
මකට නැති දෙවිවරුන්ට නමස්කාර
නොකරන්න.[9] දේවතා රූප සාදා
නොගන්න.[10] මා ඔබේ දෙවි වන යෙ-
හෝවාය.

**5** “ ‘ඔබ යෙහෝවා දෙවි වන මට
හවුල් පූජාවක්[11] ඔප්පු කරනවා නම්
මගේ අනුමැතිය ලබාගැනීමට හැකි
වන අයුරින් එය ඔප්පු කරන්න.[12]
**6** පූජාව ඔප්පු කරන දවසේදී හා ඊට
පසුවදා එයින් අනුභව කළ යුතුයි.
නමුත් තුන්වන දවස දක්වා පූජාවෙන්
යමක් ඉතුරු වුණොත් එය ගින්නෙන්
පුළුස්සා දමන්න.[13] **7** තුන්වන දව-
සේදී එම පූජාවෙන් ඉතුරු වන දේ
අනුභව කළොත් එය ඉතා පිළිකුල්
දෙයකි.[14] දෙවි එම පූජාව සතුටින්
පිළිගන්නේ නැත.[15] **8** එයින් අනු-
භව කරන තැනැත්තා යෙහෝවා දෙ-
විගේ ශුද්ධ දේ කෙලෙසූ නිසා ඔහු තම
වරදට ගණන් දිය යුතුයි.[16] එම
තැනැත්තාව මරා දැමිය යුතුයි.

**9** “ ‘ඔබ දේශයේ අස්වැන්න නෙ-
ළන විට කෙත්වල මායිම් දක්වාම
අස්වැන්න නෙළීමෙන් වළකින්න.
අස්වැන්න නෙළූ පසු කෙතේ අතහැ-
රුණු කරල් එකතු නොකරන්න.[1]
**10** එමෙන්ම ඔබ මිදිපල නෙළන විට
අතහැරුණු පල නැවත නෙළා නො-
ගන්න.[2] තැනින් තැන වැටුණු පලද
එකතු නොකරන්න. පීඩාවට පත්ව
සිටින තැනැත්තාටද විදේශිකයාටද
ඒවා ඉතුරු කළ යුතුයි.[3] මා ඔබේ
දෙවි වන යෙහෝවාය.

**11** “ ‘ඔබ සොරකම් නොකළ
යුතුයි.[4] එකිනෙකාව රැවටීමෙන්ද[5]
එකිනෙකාට වංචා කිරීමෙන්ද වැළකී
සිටිය යුතුයි.[6] **12** ඔබ මගේ නාම-
යෙන් දිවුරා බොරු නොකිව යුතුයි.[7]
එසේ කළොත් ඔබේ දෙවිගේ නාමයට
ඔබ අපහාස කරන්නහුය. මා යෙ-
හෝවා දෙවිය. **13** ඔබේ ආශ්‍රිතයාට
වංචාවක් නොකරන්න.[8] ඔහුගේ දේ
කොල්ල කෑමෙන් වළකින්න.[9] කුලී-
කරුවෙකුගේ දවසේ වැටුප පසුවදා
උදෑසන වන තෙක් ඔබ ළඟ තබා
නොගන්න.[10]

**14** “ ‘ඔබ බිහිරි කෙනෙකුට ශාප
නොකළ යුතුයි. අන්ධ මිනිසෙකු ඉදි-
රියේ බාධකයක් නොතැබිය යුතුයි.[11]
මා යෙහෝවා දෙවිය. ඔබ ඔබේ දෙ-
විට ගරුබිය[12] දැක්විය යුතුයි.

**15** “ ‘නඩු විභාගයකදී ඔබ අසා-
ධාරණ ලෙස විනිශ්චය නොකළ
යුතුයි. දුප්පතාට අනවශ්‍ය සැලකිල්-
ලක් දැක්වීමෙන්[13] හෝ ධනවතාට
අනිසි අනුග්‍රහයක්[14] දැක්වීමෙන් හෝ
වළකින්න. ඔබ විනිශ්චය කරද්දී එකි-
නෙකාට යුක්තිය ඉටු කළ යුතුයි.

**16** “ ‘ඔබ තැනින් තැන ගොස්
ඔබේ ආශ්‍රිතයා ගැන අපහාසාත්-
මක ලෙස කතා නොකරන්න.[15]
ඔබේ ආශ්‍රිතයාගේ ජීවිතය නැති කර

**18 පරි.**
**1** ද්වි 20:18; 2රාජා 16:3; 2රාජා 21:2
**2** ලෙවී 20:22
**3** ලෙවී 20:15
**4** ලෙවී 18:3; ලෙවී 20:23; ද්වි 18:9

**19 පරි.**
**5** ලෙවී 21:8; යෙසා 6:3; එළි 4:8
**6** ලෙවී 11:44; එෆී 1:4; 1පේතෘ 1:16
**7** නික් 20:12; එෆී 6:2; හෙබ්‍රෙ 12:9
**8** නික් 20:8; නික් 20:11; නික් 31:13; ලූක් 6:5
**9** නික් 20:4; ලෙවී 26:1; ගීතා 96:5; හබ 2:18; 1කොරි 10:14
**10** නික් 20:23; නික් 32:4; ද්වි 27:15
**11** ලෙවී 3:1
**12** ලෙවී 7:12
**13** ලෙවී 7:17
**14** එස 4:14
**15** ලෙවී 7:18
**16** ලෙවී 5:17

**2 තීරුව**
**1** නික් 23:11; ලෙවී 23:22; ද්වි 24:19
**2** යෙසා 17:6; යෙරෙ 49:9
**3** ලෙවී 25:6; ද්වි 15:7; රූත් 2:15; ගීතා 140:12
**4** නික් 20:15; එෆී 4:28
**5** ලෙවී 6:2; හිතෝ 12:22; එෆී 4:25
**6** 1රාජා 13:18; යෙරෙ 9:5
**7** නික් 20:7; ද්වි 5:11; මතෙ 5:37; යාකො 5:12
**8** හිතෝ 22:16; මාක් 10:19
**9** හිතෝ 22:22
**10** ද්වි 24:15; යෙරෙ 22:13; යාකො 5:4
**11** ද්වි 27:18

**12** උත් 42:18; ලෙවී 25:17; නෙහෙ 5:15; හිතෝ 1:7; හිතෝ 8:13; 1පේතෘ 2:17; **13** නික් 23:3; ද්වි 16:19; 2ලේක 19:6; හිතෝ 24:23; රෝම 2:11; **14** ද්වි 1:17; යාකො 2:9; **15** ගීතා 15:3; හිතෝ 11:13; 1තිමෝ 3:11; 2තිමෝ 3:3; තීත 2:3.

දැමීමට කුමන්ත්‍රණය නොකරන්න.[1]
මා යෙහෝවා දෙවිය.
**17** "'ඔබේ සිතින් ඔබේ සහෝද-
රයාට වෛර නොකරන්න.[2] ඔබේ
ආශ්‍රිතයා වරදක් කළොත් ඔහුගේ
පාපයට ඔබද හවුල් නොවන පිණිස
ඔහුට අවවාද කළ යුතුයි.[3]
**18** "'පළි නොගන්න.[4] ඔබේ
සහෝදරයා සමඟ අමනාප වී නොසි-
ටින්න.[5] ඔබට මෙන් ඔබේ අසල්වැසි-
යාටද ප්‍රේම කරන්න.[6] මා යෙහෝවා
දෙවිය.
**19** "'ඔබ මගේ පනත්වලට කීකරු
විය යුතුයි. වර්ග දෙකකට අයත්
සතුන් දෙදෙනෙකුට සංසර්ගයේ යෙ-
දීමට ඉඩ නොදෙන්න. ඔබේ
කෙත්වල බීජ වර්ග දෙකක් එකට
නොවපුරන්න.[7] ඔබේ ඇඳුම් මැසීමට
නූල් වර්ග දෙකකින් වියන ලද රෙද්-
දක් භාවිත නොකරන්න.[8]
**20** "'වෙනත් පුරුෂයෙකුට දීමට
පොරොන්දු වූ දාසියක මුදවාගැනීමට
පෙර හෝ නිදහස් කිරීමට පෙර හෝ
ඇගේ අයිතිකරු ඇය සමඟ සයනය
කළොත් ඔහු එම වරදට දඬුවම්
ලැබිය යුතුයි. නමුත් ඔවුන් දෙදෙ-
නාව නොමැරිය යුතුයි. මන්ද ඒ අවස්-
ථාවේදී ඇය නිදහස් වී සිටියේ නැත.
**21** ඇගේ අයිතිකරු යෙහෝවා දෙවි
වන මට වන්දි පූජාවක් ඔප්පු කළ
යුතුයි. පූජාව සඳහා බැටළුවෙකුව
සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල් වන
ස්ථානයට ගෙනා යුතුයි.[9] **22** එම
තැනැත්තා කළ පාපයට යෙහෝවා
දෙවි වන මගෙන් සමාව ලබාගන්නා
පිණිස වන්දි පූජාව සඳහා ගෙනා
බැටළුවාව පූජකයා ඔප්පු කළ යුතුයි.
එවිට එම තැනැත්තා කළ පාපයට
ඔහුට සමාව ලැබෙයි.[10]
**23** "'ඔබ දේශයට පැමිණි පසු
කෑමට ගත හැකි පල දරන
ගසක් සිටෙව්වොත් පළමුවෙනි අවු-
රුදු තුනේදී එහි පල අපවිත්‍ර ලෙස
සැලකිය යුතුයි. අචර්මච්ඡේදිත පුද්-
ගලයෙකු අපවිත්‍රයයි සලකන්නාක්
මෙන් ඔබ එම පලද අපවිත්‍රයයි සැල-
කිය යුතුයි. එබැවින් ඒවා නොකෑ
යුතුයි. **24** නමුත් හතරවන අවුරුද්-
දේදී එහි පල[1] ශුද්ධයයි සලකමින්
යෙහෝවා දෙවි වන මට කැප කළ
යුතුයි. උත්සවයක් පවත්වා මහත්
සේ ප්‍රීති වෙමින් එම පල දෙවිට ඔප්පු
කළ යුතුයි.[2] **25** පස්වෙනි අවුරුද්-
දේදී ඔබට එහි පල කන්න පුළුවන.
ඉන්පසු එම ගස බොහෝ පල දරනු
ඇත.[3] මා ඔබේ දෙවි වන යෙහෝ-
වාය.
**26** "'කිසි ලෙසකින්වත් ඔබ කන
කෑමට ලේ මිශ්‍ර නොවිය යුතුයි.[4]
"'ඔබ නැකත් බැලීමෙන්ද[5] මන්-
තර ගුරුකම් කිරීමෙන්ද[6] වැළකී
සිටිය යුතුයි.
**27** "'ඔබ කම්මුල් දෙපස තිබෙන
රැවුල කොටට නොකැපිය යුතුයි.
ඔබේ රැවුල* විකෘති ලෙස කපා නො-
ගන්න.[7]
**28** "'මළ අය වෙනුවෙන් ඔබේ
ශරීරය කපා නොගන්න.[8] ඔබේ ශරී-
රයේ පච්ච කොටා නොගන්න. මා
යෙහෝවා දෙවිය.
**29** "'ඔබේ දූවව ගණිකාවක ලෙස
නොදෙන්න.[9] ඔබ එසේ කළොත් ඇය
නින්දාවට පත් වන්නීය. එමෙන්ම
දේශය පුරාම වේශ්‍යාකම් කිරීම ප්‍රච-
ලිත වී දේශය දූෂිත තත්වයකට පත්
වනු ඇත.[10]
**30** "'ඔබ මා නියම කළ සබත්
දිනයන් පැවැත්විය යුතුයි.[11] මගේ
ශුද්ධස්ථානයට ඔබ ගරුබිය දැක්විය
යුතුයි.[12] මා යෙහෝවා දෙවිය.
**31** "'මායාකාරයන්ගෙන්[13] හෝ
ශාස්ත්‍ර කියන්නන්ගෙන්[14] හෝ උප-
කාර නොපතන්න. එසේ කළොත්
ඔබ අපවිත්‍ර වනු ඇත. මා ඔබේ දෙවි
වන යෙහෝවාය.
**32** "'පැසුණු හිසකෙස් ඇති කෙ-
නෙකු ඉදිරියේ නැඟිට සිටින්න.[15]
මහලු තැනැත්තෙකුට ඔබ ගෞරව-

---

**15** හිතෝ 16:31; හිතෝ 20:29.

---

ලෙවී **19:27*** මූ.අ., "රැවුලේ අගිස්." මෙය බොරු නමස්කාරයේ යෙදුණු අය කළ චාරිත්‍රයකි.

**19 පරි.**
**1** නික් 20:16; 1රාජා 21:13; හිතෝ 6:17; මතෙ 26:60; ක්‍රියා 6:11
**2** උත් 27:41; හිතෝ 10:18; 1යොහ 2:9; 1යොහ 3:15
**3** ගීතා 141:5; හිතෝ 9:8; මතෙ 18:15; ගලා 2:11; 1තිමෝ 5:20; තීත 1:13
**4** හිතෝ 20:22; රෝම 12:19
**5** 1සාමු 18:29; ගීතා 55:3
**6** මතෙ 5:43; මතෙ 22:39; රෝම 13:9; ගලා 5:14; යාකො 2:8
**7** ද්වි 22:9
**8** ද්වි 22:11
**9** ලෙවී 6:6
**10** ලෙවී 4:31; ලෙවී 6:7

**2 තීරුව**
**1** ගණන් 18:12; ද්වි 18:4
**2** ද්වි 26:2; හිතෝ 3:9
**3** ලෙවී 26:4
**4** ලෙවී 3:17; ලෙවී 17:13; ද්වි 12:23; ක්‍රියා 15:20; ක්‍රියා 21:25
**5** 2රාජා 17:17
**6** නික් 8:7; ද්වි 18:10; 2රාජා 21:6; ගලා 5:20; එළි 21:8
**7** ලෙවී 21:5; යෙරෙ 9:26
**8** ද්වි 14:1; යෙරෙ 16:6
**9** ලෙවී 21:7; ද්වි 23:17; හෙබ්‍රෙ 13:4
**10** හිතෝ 21:27; 1පේතෘ 4:3
**11** නික් 20:10; නික් 31:13
**12** ලෙවී 26:2
**13** ලෙවී 20:6; ද්වි 18:11; 1සාමු 28:7; 1ලේක 10:13; 2ලේක 33:6; යෙසා 8:19; ගලා 5:20; එළි 21:8
**14** ලෙවී 20:27; ක්‍රියා 16:16

යෙන් සැලකිය යුතුයි.[1] ඔබ ඔබේ දෙ-
විට ගරුබිය දැක්විය යුතුයි.[2] මා යෙ-
හෝවා දෙවිය.
**33** “‘ඔබ සමඟ විදේශිකයෙකු
ජීවත් වන්නේ නම් ඔහුට අයුතු ලෙස
නොසලකන්න.[3] **34** ඔබ සමඟ
ජීවත් වන විදේශිකයාට ඔබ සැලකිය
යුත්තේ ඔබේම ජාතියේ කෙනෙකුට
මෙනි. ඔබ ඔබට මෙන් ඔහුටත් ප්‍රේම
කළ යුතුයි.[4] මන්ද ඔබද ඊජිප්තු දේ-
ශයේ විදේශිකයන් ලෙස ජීවත් වූහ.[5]
මා ඔබේ දෙවි වන යෙහෝවාය.
**35** “‘ඔබ විනිශ්චය කරන විට[6]
හෝ දිග පළල මනින විට හෝ
බර කිරන විට[7] හෝ දියර මනින
විට හෝ වංක ලෙස ක්‍රියා නොකළ
යුතුයි. **36** ඔබ හොර තරාදි[8] හෝ
හොර පඩි හෝ භාවිත නොකළ
යුතුයි. වියළි ද්‍රව්‍ය සහ දියර මැනීම
සඳහා නිවැරදි මිමි* භාවිත කරන්න.
මා ඔබව ඊජිප්තු දේශයෙන් පිටතට
ගෙනා ඔබේ දෙවි වන යෙහෝවාය.
**37** එබැවින් ඔබ මගේ සියලු පනත්ව-
ලටද තීන්දුවලටද කීකරු වී ඒවා
අනුව ජීවත් විය යුතුයි.[9] මා යෙ-
හෝවා දෙවිය.’”

**20** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. **2** “ඔබ
ඊශ්‍රායෙල් සෙනඟට මෙසේ කියන්න.
‘ඊශ්‍රායෙල් සෙනඟගෙන් කෙනෙකු
හෝ ඊශ්‍රායෙල් දේශයෙහි ජීවත් වන
විදේශිකයෙකු හෝ තම දරුවන්ව
මෝලෙක්ට[10] පූජා කළොත් ඔහුව
අනිවාර්යයෙන්ම මරා දැමිය යුතුයි.
දේශයේ වැසියන් ඔහුට ගල් ගසා
ඔහුව මරා දැමිය යුතුයි. **3** ඔහු තම
දරුවන්ව මෝලෙක්ට පූජා කර මගේ
ශුද්ධස්ථානය දූෂ්‍ය කළ නිසාත්[11]
මගේ ශුද්ධ නාමය කෙලෙසූ නිසාත්[12]
මම ඔහුව ප්‍රතික්ෂේප කරන්නෙමි.
මම ඔහු සමඟ මහත් සේ උදහස් වී
ඔහුව මරා දමන්නෙමි.[13] **4** ඔහු තම
දරුවාව මෝලෙක්ට පූජා කළ පසු
දේශයේ වැසියන් ඔහුව මරා දම-
නවා වෙනුවට තම ඇස් කන් පියා-
ගෙන සිටියොත්[1] **5** මම සැබවින්ම
ඒ මිනිසාව සහ ඔහුගේ පවුලේ අයව
ප්‍රතික්ෂේප කරන්නෙමි.[2] මම ඔහුද
ඔහු හා එක්ව මෝලෙක්ට නමස්කාර
කරමින් මට ද්‍රෝහි වූ[3] අන් සියලුදෙ-
නාද සමඟ මහත් සේ උදහස් වී
ඔවුන්ව මරා දමන්නෙමි.
**6** “‘මට ද්‍රෝහි වෙමින් මායාකාර-
යන්ගෙන්[4] හා ශාස්ත්‍ර කියන්නන්-
ගෙන්[5] උපකාර පතන සියලුදෙනාවම
මම ප්‍රතික්ෂේප කරන්නෙමි. මම
ඔවුන් සමඟ මහත් සේ උදහස් වී
ඔවුන්ව මරා දමන්නෙමි.[6]
**7** “‘ඔබ පවිත්‍ර සෙනඟක් ලෙස
වෙන් වී සිටිය යුතුයි. ඔබ ශුද්-
ධව සිටිය යුතුයි.[7] මන්ද මා ඔබේ
දෙවි වන යෙහෝවාය. **8** ඔබ මගේ
පනත්වලට කීකරු වී ඒවා අනුව
ජීවත් වන්න.[8] ශුද්ධ සෙනඟක් ලෙස
ඔබව වෙන් කර තබන්නේ යෙහෝවා
දෙවි වන මමය.[9]
**9** “‘යමෙකු තම පියාට හා මවට
ශාප කළොත්[10] ඔහුව අනිවාර්ය-
යෙන්ම මරා දැමිය යුතුයි.[11] ඔහුගේ
මරණයට වග කිව යුත්තේ ඔහුමය.[12]
මන්ද ඔහු තම පියාට හා මවට ශාප
කළේය.
**10** “‘යමෙකු වෙනත් කෙනෙකුගේ
භාර්යාව සමඟ සයනය කළොත්
ඔහුව අනිවාර්යයෙන්ම මරා දැමිය
යුතුයි. ඔහු තම මිත්‍රයාගේ භාර්යාව
සමඟ අනාචාරයේ* යෙදුණු බැවින්[13]
ඔහුව පමණක් නොව ඒ ස්ත්‍රිය-
වද මරා දැමිය යුතුයි.[14] **11** යමෙකු
තම පියාගේ වෙනත් භාර්යාවක
සමඟ සයනය කළොත් ඔහු තම
පියාට නින්දා කරන්නේය.[15] එබැ-
වින් ඔහුවද ඒ ස්ත්‍රියවද අනිවාර්ය-
යෙන්ම මරා දැමිය යුතුයි. ඔවුන්ගේ

**19 පරි.**
1 යෝබ් 32:6 හිතෝ 23:22 විලා 5:12 1තිමෝ 5:1
2 නෙහෙ 5:9 යෝබ් 28:28 හිතෝ 1:7 හිතෝ 8:13 1පේතෘ 2:17
3 නික් 23:9 මලා 3:5
4 නික් 12:49 ද්වි 10:19
5 නික් 22:21
6 සෙක 7:9
7 ද්වි 25:13 ද්වි 25:15 හිතෝ 20:10
8 හිතෝ 11:1 හිතෝ 16:11
9 ලෙවී 18:5 ද්වි 4:6

**20 පරි.**
10 ලෙවී 18:21 ද්වි 18:10
11 නික් 15:17 ගණන් 19:20 ද්වි 23:14 එස 5:11
12 ලෙවී 18:21
13 1පේතෘ 3:12

**2 තීරුව**
1 ද්වි 13:8
2 නික් 20:5 1රාජා 20:42
3 ගීතා 106:39 හොෂෙ 2:13
4 ලෙවී 19:31 ද්වි 18:11 ගලා 5:20 එළි 21:8
5 ලෙවී 20:27 ක්‍රියා 16:16
6 1ලේක 10:13 එස 6:9
7 ලෙවී 11:44 එෆී 1:4 1පේතෘ 1:16
8 ලෙවී 18:4 දේශ 12:13 ලූක් 1:6
9 නික් 31:13 ලෙවී 21:8 එස 37:28 1තෙස 5:23 2තෙස 2:13
10 ද්වි 27:16 හිතෝ 20:20 මතෙ 15:4
11 නික් 21:17
12 2සාමු 1:16 1රාජා 2:32
13 ලෙවී 18:20 ද්වි 5:18 යෙරෙ 29:23 රෝම 7:3
14 ද්වි 22:22 1කොරි 6:9

15 ලෙවී 18:8; ද්වි 27:20.

ලෙවී **19:36*** වියළි ද්‍රව්‍ය මැනීමට ඒපා මිනුම භාවිත කෙරිණ. දියර මැනීමට හින මිනුම භාවිත කෙරිණ. හින මිනුමක් ලීටර් 3.67කි.

ලෙවී **20:10*** මූ.අ., “පරදාර සේවනයේ.”

මරණයට වග කිව යුත්තේ ඔවුන්මය.
**12** යමෙකු තම ලේලි සමඟ සයනය
කළොත් එය මුළුමනින්ම අස්වාභා-
වික ක්‍රියාවකි. එබැවින් ඔවුන් දෙදෙ-
නාවම අනිවාර්යයෙන්ම මරා දැමිය
යුතුයි.[1] ඔවුන්ගේ මරණයට වග කිව
යුත්තේ ඔවුන්මය.[2]
**13** "'පුරුෂයෙකු ස්ත්‍රියක සමඟ
සයනය කරන්නාක් මෙන් පුරුෂයෙකු
සමඟ හැසිරුණොත් ඔවුන් දෙදෙනා
ඉතා පිළිකුල් දෙයක් කර ඇත.[3] එබැ-
වින් ඔවුන් දෙදෙනාවම අනිවාර්ය-
යෙන්ම මරා දැමිය යුතුයි. ඔවුන්ගේ
මරණයට වග කිව යුත්තේ ඔවුන්මය.
**14** "'යමෙකු ස්ත්‍රියක සමඟ විවාහ
වූ පසු ඇගේ මව සමඟත් සයනය
කළොත් එය නින්දිත ක්‍රියාවකි.[4]
එබැවින් ඔහුවද ඒ ස්ත්‍රීන් දෙදෙනාවද
මරා ගින්නෙන් පිලිස්සිය යුතුයි.[5]
මෙවැනි නින්දිත ක්‍රියා[6] ඔබ අතරේ
නොපවතින පිණිස එසේ කරන්න.
**15** "'පුරුෂයෙකු සතෙකු සමඟ
සංසර්ගයේ යෙදුණොත්[7] ඔහුව අනි-
වාර්යයෙන්ම මරා දැමිය යුතුයි. එම
සතාවද මරා දැමිය යුතුයි. **16** ස්ත්‍රි-
යක සතෙකු වෙතට ගොස් ඌ සමඟ
සංසර්ගයේ යෙදුණොත්[8] එම ස්ත්‍රිය-
වද සතාවද අනිවාර්යයෙන්ම මරා
දැමිය යුතුයි. පුරුෂයෙකු හෝ ස්ත්‍රි-
යක හෝ එලෙස ක්‍රියා කළොත්
ඔවුන්ගේ මරණයට වග කිව යුත්තේ
ඔවුන්මය.
**17** "'යමෙකු තම පියාගේ හෝ මව-
ගේ හෝ වෙනත් විවාහයකින් උපන්
දුව සමඟ විවාහ වී ඇය සමඟ සයනය
කළොත් එය නීච ක්‍රියාවකි.[9] ඔවුන්ව
මරා දැමිය යුතුයි. මන්ද ඔහු සයනය
කළේ තම සහෝදරිය සමඟය. ඔහු
තම වරදට ගණන් දිය යුතුයි.
**18** "'යමෙකු ස්ත්‍රියකගේ ඔසප්
දවස්වලදී ඇය සමඟ සයනය
කළොත් ඔවුන් දෙදෙනාවම මරා
දැමිය යුතුයි. මන්ද ඔවුන් දෙදෙනාම
ලේ ශුද්ධ දෙයක් ලෙස නොසලකන
බව[10] ඔවුන් කළ දෙයින් පැහැදිලි
වන්නේය.

**19** "'ඔබේ මවගේ හෝ පියාගේ
හෝ සහෝදරිය සමඟ සයනය නො-
කළ යුතුයි.[1] මන්ද ඇය ඔබේ ලේ
නෑයෙකි.[2] පුරුෂයෙකු හා ස්ත්‍රියක
එලෙස ක්‍රියා කළොත් ඔවුන් දෙදෙ-
නාම තම තමන්ගේ වරදට ගණන් දිය
යුතුයි. **20** පුරුෂයෙකු තම පියාගේ
සහෝදරයාගේ භාර්යාව සමඟ සය-
නය කළොත් එම පුරුෂයා සහ
ස්ත්‍රිය තමන්ගේ වරදට ගණන් දිය
යුතුයි. ඔවුන්ට දරුවන් නොලැබෙනු
ඇත.[3] ඔවුන්ව මරා දැමිය යුතුයි.
මන්ද ඔහු තම පියාගේ සහෝදරයාට
නින්දා කර ඇත.[4] **21** පුරුෂයෙකු
තම සහෝදරයාගේ භාර්යාව සමඟ
සයනය කළොත් එය පිළිකුල්සහගත
ක්‍රියාවකි.[5] ඔවුන්ට දරුවන් නොලැ-
බෙනු ඇත. මන්ද ඔහු නින්දා කළේ
තම සහෝදරයාටය.
**22** "'ඔබ මගේ සියලු පනත්වල-
ටද[6] සියලු නීන්දුවලටද[7] කීකරු වෙ-
මින් ඒවා අනුව ජීවත් වන්න. පදිංචි
වීම සඳහා මා ඔබට දෙන දේශ-
යෙන් ඔබව පන්නා නොදමන පිණිස
එසේ කරන්න.[8] **23** මා ඔබ වෙතින්
පන්නා දමන ජාතීන්ගේ චාරිත්‍ර අනු-
ගමනය නොකරන්න.[9] ඔවුන් මේ
සියලු ක්‍රියා කළ නිසා මම ඔවුන්ට
ද්වේෂ කරන්නෙමි.[10] **24** ඒ නිසා
මම ඔබට මෙසේ කීවෙමි.[11] "ඔබ
ඔවුන්ගේ දේශය උරුම කරගන්න-
හුය. මම කිරියෙන් හා පැණියෙන්
ඉතිරෙන එම දේශය ඔබට උරුම-
යක් ලෙස දෙන්නෙමි.[12] ඔබව සියලු
ජාතීන්ගෙන් වෙන් කළ මා ඔබේ
දෙවි වන යෙහෝවාය.[13] **25** පවිත්‍ර
සතුන් හා අපවිත්‍ර සතුන් අතරද
පවිත්‍ර කුරුල්ලන් හා අපවිත්‍ර කුරුල්-
ලන් අතරද වෙනස ඔබ හඳුනාගත
යුතුයි.[14] අපවිත්‍ර සතුන් ලෙස මා
වෙන් කර හඳුන්වා දුන් මෘගයන්,
කුරුල්ලන් හා කුඩා සතුන් නිසා
ඔබ පිළිකුල් තත්වයකට පත් නො-
වන්න.[15] **26** යෙහෝවා දෙවි වන
මා ශුද්ධව සිටින නිසා[16] ඔබද මා ඉදි-
රියේ ශුද්ධව[17] සිටිය යුතුයි. මම ඔබව

**20 පරි.**
**1** ලෙවී 18:15
**2** ලෙවී 18:29
**3** උත් 19:5 ලෙවී 18:22 විනි 19:22 රෝම 1:27 1කොරි 6:9 යූද් 7
**4** ලෙවී 18:17 ද්වි 27:23
**5** ලෙවී 21:9
**6** ගලා 5:19
**7** නික් 22:19 ද්වි 27:21
**8** ලෙවී 18:23
**9** ලෙවී 18:9 ද්වි 27:22 2සාමු 13:12 එස 22:11
**10** ලෙවී 15:24 ලෙවී 18:19 එස 22:10

**2 තීරුව**
**1** ලෙවී 18:12 ලෙවී 18:13
**2** ලෙවී 18:6
**3** ගීතා 109:13
**4** ලෙවී 18:14
**5** ලෙවී 18:16 ද්වි 25:5 මාක් 6:18 මාක් 12:19
**6** ලෙවී 18:26 ගීතා 105:45 ගීතා 119:80 දේශ 12:13
**7** නික් 21:1 ද්වි 5:1 ගීතා 119:20 යෙසා 26:9
**8** ලෙවී 18:28
**9** ලෙවී 18:3 ලෙවී 18:24 ද්වි 12:30 යෙරෙ 10:2
**10** ලෙවී 18:27 ද්වි 9:5
**11** නික් 3:17 නික් 6:8
**12** ද්වි 8:8 එස 20:6
**13** නික් 19:5 නික් 33:16 1රාජා 8:53 2කොරි 6:16 1පේත 2:9
**14** ලෙවී 11:47 ද්වි 14:4 ක්‍රියා 10:14
**15** ලෙවී 11:43
**16** ගීතා 99:5 1පේත 1:16 එළි 4:8
**17** ලෙවී 19:2

සියලු ජාතීන්ගෙන් වෙන් කර මගේ
සෙනඟ ලෙස තෝරාගන්නෙමි.[1]
**27** “‘මන්තර ගුරුකම් කරන
නැත්නම් ශාස්ත්‍ර කියන පුරුෂයෙකු
හෝ ස්ත්‍රියක හෝ ඔබ අතරේ සිටි-
යොත්[2] ඔවුන්ව අනිවාර්යයෙන්ම මරා
දැමිය යුතුයි.[3] ඔවුන්ට ගල් ගසා
මැරිය යුතුයි. ඔවුන්ගේ මරණයට වග
කිව යුත්තේ ඔවුන්මය.’ ”[4]

**21** යෙහෝවා දෙවි මෝසෙස්ට
තවදුරටත් මෙසේ කීවේය.
“පූජකයන් වන ආරොන්ගේ පුත්‍රයන්ට
මෙසේ කියන්න. ‘සෙනඟ අතරින්
යමෙකු මිය ගිය විට එම තැනැත්තා
වෙනුවෙන් සිදු කරන වත්පිළිවෙත්-
වලට පූජකයෙකු සහභාගි නො-
විය යුතුයි. මන්ද එසේ කළොත්
ඔහු අපවිත්‍ර වන්නේය.[5] **2** නමුත්
ඔහුගේ ලේ නෑයෙකු මිය ගියොත්
එනම්, ඔහුගේ මව හෝ පියා හෝ
පුතා හෝ දුව හෝ සහෝදරයා හෝ
**3** කන්‍යාවක වන ඔහුගේ සහෝදරිය
හෝ මිය ගියොත් එම තැනැත්තා
වෙනුවෙන් සිදු කරන වත්පිළිවෙත්ව-
ලට ඔහුට සහභාගි වීමට* පුළුවන.
**4** නමුත් ඔහුට නෑ වන විවාහක ස්ත්‍රි-
යක මිය ගියොත් ඇය වෙනුවෙන්
සිදු කරන වත්පිළිවෙත්වලට සහභාගි
නොවිය යුතුයි. එසේ කළොත් පූජක-
යෙකු වන ඔහු අපවිත්‍ර වන්නේය.
**5** පූජකයෙකු තම හිස බූ ගෑමෙන්[6]
හෝ තම රැවුල* විකෘති ලෙස කැපී-
මෙන්[7] හෝ වැළකී සිටිය යුතුයි. ඔහු-
ගේ ශරීරය කපා නොගත යුතුයි.[8]
**6** පූජකයන් දෙවි වන මා ඉදිරියේ
ශුද්ධව සිටිය යුතුයි.[9] මාගේ නාමය
කෙලෙසීමෙන් වැළකී සිටිය යුතුයි.[10]
මන්ද ඔවුන්ගේ දෙවි වූ යෙහෝවා වන
මට අයිති ආහාර[11] එනම්, ගින්-
නෙන් දවන ලද පූජා ඔප්පු කරන්-
නේ ඔවුන්ය. එබැවින් ඔවුන් ශුද්ධව
සිටිය යුතුයි.[12] **7** පූජකයෙකු ගණි-
කාවක[13] හෝ අගෞරවයට පත් වූ
ස්ත්‍රියක හෝ දික්කසාද වූ ස්ත්‍රියක[1]
හෝ සමඟ විවාහ නොවිය යුතුයි.[2]
මන්ද ඔහුගේ දෙවි වන මා ඔහුව සල-
කන්නේ ශුද්ධ කෙනෙකු ලෙසයි.
**8** ඔහු දෙවි වන මට අයිති ආහාර
ඔප්පු කරන නිසා එම පරිශුද්ධ සේවය
සඳහා ඔහුව කැප කළ යුතුයි.[3] ඔහු
ශුද්ධව සිටිය යුතුයි.[4] මන්ද ශුද්ධ සෙ-
නඟක් ලෙස ඔබව වෙන් කර තබන
යෙහෝවා දෙවි වන මා ශුද්ධය.[5]
**9** “‘පූජකයෙකුගේ දුව ගණිකාවක
ලෙස හැසිරෙමින් අගෞරවයට පත්
වුණොත් ඇය නින්දාවට පත් කරන්-
නේ ඇගේ පියාවය. ඇයව මරා ගින්-
නෙන් පිලිස්සිය යුතුයි.[6]
**10** “‘පූජකයන් අතරින් උත්තම
පූජකයා ලෙස තෝරා හිස මත
ශුද්ධ තෛලය වත් කරනු ලැබූ[7]
තැනැත්තා පූජක වස්ත්‍ර ඇඳිය
යුතුයි.[8] මන්ද පූජකයෙකු ලෙස සේ-
වය කිරීමට ඔහුට බලය දී තිබේ. ඔහු
තම හිසකෙස් අවුල් කරගැනීමෙන්[9]
හෝ ඇඳුම් ඉරාගැනීමෙන්[10] හෝ
වැළකී සිටිය යුතුයි. **11** ඔහු මළ
සිරුරක් වෙතට ළං නොවිය යුතුයි.[11]
මිය ගිය තැනැත්තා ඔහුගේ පියා
හෝ මව හෝ වේවා ඔවුන් වෙනු-
වෙන් සිදු කරන වත්පිළිවෙත්වලට-
වත් ඔහු සහභාගි නොවිය යුතුයි.
**12** එම වත්පිළිවෙත්වලට සහභාගි
වන පිණිස ඔහු ශුද්ධස්ථානයෙන්
පිටතට නොයා යුතුයි. එසේ කළොත්
ඔහු තම දෙවිගේ ශුද්ධස්ථානය කෙ-
ලෙසන්නේය.[12] මන්ද තම දෙවිගේ
ශුද්ධ තෛලයද[13] ශුද්ධ සංකේතයද*
ඔහු පිටය. මා යෙහෝවා දෙවිය.
**13** “‘පූජකයෙකු විවාහ විය යුත්-
තේ කන්‍යාවක[14] සමඟය. **14** ඔහු
වැන්දඹුවක හෝ දික්කසාද වූ ස්ත්‍රි-
යක හෝ අගෞරවයට පත් වූ ස්ත්‍රි-
යක හෝ ගණිකාවක ලෙස හැසිරෙන
ස්ත්‍රියක හෝ සමඟ විවාහ නොවිය
යුතුයි. ඔහු තම සෙනඟ අතරින් තම
භාර්යාව ලෙස තෝරාගත යුත්තේ

ලෙවී **21:3*** මූ.අ., “අපවිත්‍ර වීමට.” **5*** ලෙවී 19:27හි පාදසටහන බලන්න.

ලෙවී **21:12*** නික් 29:6හි පාදසටහන බලන්න.

**20 පරි.**
**1** ද්වි 7:6
ද්වි 14:2
තීත 2:14
**2** නික් 22:18
ලෙවී 19:31
ද්වි 18:10
1සාමු 28:7
එළි 21:8
**3** නික් 22:18
ලෙවී 20:6
මීකා 5:12
**4** 2සාමු 1:16

**21 පරි.**
**5** ගණන් 19:14
**6** ද්වි 14:1
යෙසා 15:2
එස 44:20
**7** ලෙවී 19:27
යෙරෙ 48:37
**8** ලෙවී 19:28
1රාජ 18:28
යෙරෙ 16:6
**9** නික් 29:44
ලෙවී 10:3
එස්රා 8:28
**10** ලෙවී 18:21
ලෙවී 19:12
ලෙවී 22:32
**11** ලෙවී 3:11
මලා 1:7
**12** යෙසා 52:11
1පේතෘ 1:16
**13** ලෙවී 19:29

**2 තීරුව**
**1** ද්වි 24:1
මතෙ 19:8
**2** එස 44:22
**3** නික් 28:41
ලෙවී 20:8
1කොරි 6:11
හෙබ්‍රෙ 9:13
**4** ලෙවී 11:44
**5** නික් 28:36
ලෙවී 11:45
ලෙවී 20:7
යෙසා 43:15
**6** උත් 38:24
ලෙවී 20:14
**7** ලෙවී 8:12
ගණන් 35:25
ගීතා 133:2
**8** නික් 28:2
නික් 29:29
ලෙවී 16:32
**9** ලෙවී 10:6
**10** උත් 37:34
**11** ගණන් 6:7
ගණන් 19:11
ගණන් 19:14
**12** ලෙවී 10:7
ලෙවී 21:23
**13** ලෙවී 8:12
ලූක් 4:18
ක්‍රියා 10:38
**14** එස 44:22
2කොරි 11:2
එළි 14:4

කන්‍යා ස්ත්‍රියකවයි. **15** තමන්-
ගෙන් පැවත එන දරුවන් අපවිත්‍ර
නොවන පිණිස[1] ඔහු එසේ කළ
යුතුයි. මන්ද යෙහෝවා දෙවි වන මම
පරිශුද්ධ සේවය සඳහා ඔහුව වෙන්
කර තබන්නෙමි.’ ”[2]

**16** යෙහෝවා දෙවි තවදුරටත්
මෝසෙස්ට කතා කරමින් මෙසේ
කීවේය. **17** “ආරොන්ට මෙසේ
කියන්න. ‘ඔබේ පරම්පරාවේ ශරීරයේ
යම් දෝෂයක් ඇතුව ඉපදෙන කිසිම
කෙනෙකු[3] දෙවිට අයිති ආහාර ඔප්පු
කරන පිණිස පූජාසනය ළඟට නො-
පැමිණිය යුතුයි.[4] **18** ශරීරයේ යම්
දෝෂයක් ඇති කිසිවෙකු පූජාසන-
යට ළං නොවිය යුතුයි. අන්ධ කෙ-
නෙකු හෝ කොර කෙනෙකු හෝ
නහයේ යම් දෝෂයක් ඇති කෙ-
නෙකු හෝ අංගවිකල කෙනෙකු[5] හෝ
**19** අත පය කැඩුණු කෙනෙකු හෝ
**20** කුදු කෙනෙකු හෝ කෙසඟ කෙ-
නෙකු* හෝ ඇස්වල රෝගයක් ඇති
කෙනෙකු හෝ දදයක් ඇති කෙ-
නෙකු හෝ සමේ දිලීර රෝගයක්
ඇති කෙනෙකු හෝ වෘෂණ කෝෂ
තැළුණු කෙනෙකු[6] හෝ පූජාසන-
යට ළඟා නොවිය යුතුයි. **21** පූජක
ආරොන්ගෙන් පැවත එන දරුවෙකුට
ශරීරයේ එවැනි දෝෂයක් ඇත්නම්,
ගින්නෙන් පූජා ඔප්පු කරන පිණිස
ඔහු යෙහෝවා දෙවි වන මා ඉදි-
රියට නොපැමිණිය යුතුයි.[7] ඔහු-
ගේ ශරීරයේ දෝෂයක් ඇති නිසා
ඔහු තම දෙවිට අයිති ආහාර ඔප්පු
කරන පිණිස පූජාසනයට ළං නො-
විය යුතුයි.[8] **22** එහෙත් තම දෙවිට
අයිති ආහාරවලින් කොටසක් ඔහුට
අනුභව කළ හැක. ශුද්ධ දෙයින්ද[9]
ඉතා ශුද්ධ දෙයින්ද[10] ඔහුට කොට-
සක් ගත හැකියි. **23** නමුත් ඔහු
තිරය ළඟට නොපැමිණිය යුතුයි.[11]
පූජාසනය ළඟටද ඔහු නොපැමිණිය
යුතුයි.[1] මන්ද ඔහුගේ ශරීරයේ දෝෂ-
යක්[2] ඇත. ඔහු මගේ ශුද්ධස්ථානය
නොකෙලෙසිය[3] යුතුයි. මන්ද යෙ-
හෝවා දෙවි වන මම පූජකයන්ව
ශුද්ධ අය ලෙස වෙන් කර තබන්-
නෙමි.’ ”[4]

**24** මෝසෙස් දෙවි කී සියල්ල
ආරොන්ටද ඔහුගේ පුත්‍රයන්ටද මුළු
ඊශ්‍රායෙල් සෙනඟටද කීවේය.

**22** යෙහෝවා දෙවි මෝසෙස්ට
නැවත මෙසේ කීවේය.
**2** “මා යෙහෝවා දෙවිය. ඊශ්‍රායෙල්
සෙනඟ පරිශුද්ධ දේවල් ලෙස මට
කැප කරන කිසිම දෙයකට[5] අගෞ-
රවනීය ලෙස නොසලකන්න. එය
මගේ ශුද්ධ නාමයට කරන නින්දා-
වකි.[6] ඒ බව ආරොන්ට සහ ඔහුගේ
පුත්‍රයන්ට කියන්න. **3** ඔබ ඔවුන්ට
මෙසේ කියන්න. ‘ඔබේ සියලු පරම්ප-
රාවලදී ඔබෙන් පැවත එන ඕනෑම
කෙනෙකු අපවිත්‍රව සිටියදී,[7] ඊශ්‍රා-
යෙල් සෙනඟ යෙහෝවා දෙවි වන
මට පරිශුද්ධ දේවල් ලෙස කැප
කළ දෙයක් අසලට ආවොත් එම
තැනැත්තාව මරා දැමිය යුතුයි.
මා යෙහෝවා දෙවිය. **4** ආරොන්-
ගෙන් පැවත එන පුරුෂයෙකුට
ලාදුරු රෝගය වැලඳී ඇත්නම්[8]
හෝ ඔහුගේ ලිංගේන්ද්‍රියෙන් ශ්‍රාව-
යක් ගලනවා නම්[9] හෝ ඔහු පවිත්‍ර
තත්වයකට පත් වන තෙක් ශුද්ධ දේ-
වලින් නොකෑ යුතුයි.[10] මළ සිරු-
රක් අල්ලා අපවිත්‍ර තත්වයක සිටින
යමෙකුව ස්පර්ශ කළ කෙනෙකුටද[11]
ශුක්‍රාණු පිට වූ කෙනෙකුටද[12] එයින්
කෑමට අවසර නැත. **5** අපවිත්‍රයයි
ප්‍රකාශ කළ කුඩා සතෙකුව ස්පර්ශ
කළ කෙනෙකු[13] හෝ අපවිත්‍රව සිටින
මිනිසෙකුව ස්පර්ශ කළ කෙනෙකු[14]
හෝ ශුද්ධ දෙයින් නොකෑ යුතුයි.
**6** එවැනි අපවිත්‍ර දේවල් ස්පර්ශ කරන
කවුරු නමුත් ශුද්ධ දේවලින් කිසිවක්
නොකෑ යුතුයි. ඔහු නාගෙන සවස්
වන තුරු අපවිත්‍ර කෙනෙකු ලෙස
වෙන්ව සිටිය යුතුයි.[15] **7** ඉර බැස
ගිය පසු ඔහු පවිත්‍ර වන්නේය. ඉන්-

**21 පරි.**

1 එස්රා 9:2
2 1තෙස 5:23; 2තෙස 2:13
3 ලෙවී 22:21; රෝම 12:1; එෆී 5:27; හෙබ්‍රෙ 7:26; එළි 14:5
4 ලෙවී 3:11; ගණන් 16:5
5 ලෙවී 22:23
6 ලෙවී 22:24; ද්වි 23:1
7 ලෙවී 2:2
8 ලෙවී 22:25
9 ලෙවී 22:10; ගණන් 18:19
10 ලෙවී 2:10; ලෙවී 6:16; ලෙවී 24:9; ගණන් 18:9
11 නික් 30:6; හෙබ්‍රෙ 10:20

**2 තීරුව**

1 නික් 38:1
2 ලෙවී 21:17
3 නික් 25:8; ලෙවී 21:12
4 නික් 28:41

**22 පරි.**

5 නික් 28:38; ගණන් 18:32; ද්වි 15:19
6 ලෙවී 21:6; ගීතා 83:18; ගීතා 135:13
7 ලෙවී 7:20
8 ලෙවී 13:2
9 ලෙවී 15:2
10 ලෙවී 14:2; ලෙවී 15:13
11 ලෙවී 21:1; ගණන් 19:11; ගණන් 19:22
12 ලෙවී 15:16
13 ලෙවී 11:24; ලෙවී 11:43
14 ලෙවී 15:7; ලෙවී 15:19
15 ගණන් 19:7; 1කොරි 6:11; හෙබ්‍රෙ 10:22

---

ලෙවී **21:20*** මෙයින් යොමු දක්වන්නේ අසාමාන්‍ය ලෙස කුඩා පුද්ගලයෙකුට හෝ යම් අසනීපයක් නිසා කෙසඟ සිරුරක් ඇති පුද්ගලයෙකුට විය හැකියි.

පසු ඔහුට ශුද්ධ දේවලින් කන්න
පුළුවන. මන්ද එය ඔහුට අයිති කො-
ටසය.[1] **8** වෙනත් සතෙකු විසින්
මරා දමනු ලැබූ සතෙකුගේ මස්
හෝ වෙනයම් ආකාරයකින් මිය ගිය
සතෙකුගේ මස් හෝ ඔහු නොකෑ
යුතුයි. ඔහු එසේ කළොත් අපවිත්‍ර
වන්නේය.[2] මා යෙහෝවා දෙවිය.

**9** "'මා පූජකයන්ට දුන් වගකීම්
ඔවුන් නිසි ආකාරයට ඉටු කළ යුතුයි.
පූජකයන් තම වගකීම් පැහැරහැර
ශුද්ධ දේ කෙලෙසා පව් කළොත්
ඔවුහු අනිවාර්යයෙන්ම මිය යන්-
නෝය.[3] මන්ද යෙහෝවා දෙවි වන
මම පරිශුද්ධ සේවය සඳහා ඔවුන්ව
වෙන් කර තබන්නෙමි.

**10** "'පූජක පවුලට අයිති නොවන
කිසිවෙකු ශුද්ධ දේවලින් නොකෑ
යුතුයි.[4] පූජකයෙකු සමඟ ජීවත්
වන විදේශිකයෙකුවත් කුලීකරුවෙ-
කුවත් ශුද්ධ දේවලින් නොකෑ යුතුයි.
**11** නමුත් පූජකයෙකු මිල දී ගත්
දාසයෙකුට හෝ ඔහුගේ නිවසේ
උපන් දාසයෙකුට හෝ පූජකයන්ට
අයිති කොටසෙන් කන්න පුළු-
වන.[5] **12** පූජකයෙකුගේ දුව පූජක
පවුලට අයිති නොවන කෙනෙකු
සමඟ විවාහ වුණොත් පරිත්‍යාග කළ
ශුද්ධ දේවලින් ඇය නොකෑ යුතුයි.
**13** නමුත් පූජකයෙකුගේ දුව දරුවන්
නොලැබ වැන්දඹුවක වුණොත් හෝ
ඇගේ ස්වාමිපුරුෂයා ඇයව දික්කසාද
කළොත් හෝ ඇයට නැවත ඇගේ
පියාගේ නිවසට යා හැකියි.[6] යෞවන
කාලයේදී මෙන් තම පියාට අයිති
කොටසෙන් ඇයට කන්න පුළුවන.[7]
නමුත් පූජක පවුලට අයිති නොවන
කිසිවෙකු එයින් නොකෑ යුතුයි.

**14** "'පූජක පවුලට අයිති නො-
වන කෙනෙකු වැරදීමකින් ශුද්ධ දෙ-
යක් කෑවොත් ඔහු වන්දියක් ගෙවිය
යුතුයි.[8] ඔහු කෑ දේට අමතරව ශුද්ධ
දෙයෙහි මුළු වටිනාකමෙන් පහෙන්
කොටසක්ද[9] පූජකයාට දිය යුතුයි.
**15** ඊශ්‍රායෙල් සෙනඟ යෙහෝවා දෙවි
වන මට පරිත්‍යාග කරන ශුද්ධ දේව-
ලට පූජකයන් අගෞරව නොකළ
යුතුයි.[1] **16** සෙනඟට ශුද්ධ දේවල්
කෑමට පූජකයන් ඉඩ නොදිය යුතුයි.
මන්ද එසේ කළොත් ඔවුන් නිසා සෙ-
නඟ පිට දඬුවම් පැමිණෙනු ඇත. යෙ-
හෝවා දෙවි වන මම පූජකයන්ව
ශුද්ධ සෙනඟක් ලෙස වෙන් කර
තබන්නෙමි.'"

**17** යෙහෝවා දෙවි නැවතුර-
ටත් මෝසෙස්ට මෙසේ කීවේය.
**18** "ආරොන්ටද ඔහුගේ පුත්‍රයන්-
ටද ඊශ්‍රායෙල් පුත්‍රයන්ටද මෙසේ
කියන්න. 'ඊශ්‍රායෙල් ජාතිකයෙකු
හෝ ඊශ්‍රායෙල්හි ජීවත් වන විදේශි-
කයෙකු භාරයක් ලෙස[2] හෝ සිය
කැමැත්තෙන්ම කරන පූජාවක් ලෙස[3]
හෝ යෙහෝවා දෙවි වන මට දවන
පූජාවක් ඔප්පු කරන විට[4] **19** ගව
රැළෙන් හෝ එළු බැටළු රැළෙන් හෝ
නිකැළැල්[5] පිරිමි සතෙකුව ගෙනා
යුතුයි. දෙවිගේ අනුමැතිය ලබාගැනී-
මට නම්[6] උන් නිකැළැල් සතුන් විය
යුතුයි. **20** කැළැලක් ඇති කිසිම
සතෙකුව ඔප්පු නොකරන්න.[7] මන්ද
ඔබේ අතින් පිළිගන්වන එවැනි පූජා-
වලට දෙවිගේ අනුමැතිය නොලැබේ.

**21** "'යමෙකු භාරයක්[8] ලෙස හෝ
සිය කැමැත්තෙන්ම කරන පූජා-
වක් ලෙස හෝ යෙහෝවා දෙවි
වන මට හවුල් පූජාවක්[9] ඔප්පු
කරනවා නම් දෙවිගේ අනුමැ-
තිය ලබාගැනීම සඳහා ඔහු ගව
රැළෙන් හෝ එළු බැටළු රැළෙන්
හෝ නිකැළැල් සතෙකුව ගෙනා
යුතුයි. එම සතා තුළ කිසි දෝෂ-
යක් නොතිබිය යුතුයි. **22** අන්ධ
වූ හෝ කකුල් කැඩුණු හෝ තුවාල වූ
හෝ සමේ ගඩු හෝ දද හෝ දිලීර
රෝගයක් හෝ[10] ඇති කිසි සතෙ-
කුව යෙහෝවා දෙවි වන මට ඔප්පු
නොකරන්න. එවැනි සතෙකුව
කිසිවිටෙකත් පූජාසනය මත යෙ-
හෝවා දෙවි වන මට ඔප්පු නො-
කළ යුතුයි.[11] **23** අංගවිකල වූ[12]
ගොනෙකුව හෝ බැටළුවෙකුව හෝ
සිය කැමැත්තෙන් දෙන පූජාවක්

**22 පරි.**
1 ලෙවී 21:22, ගණන් 18:11
2 නික් 22:31, ලෙවී 17:15, ද්වි 14:21
3 නික් 28:43, ලෙවී 10:2
4 නික් 29:33, මතෙ 12:4
5 ගණන් 18:11
6 උත් 38:11
7 ලෙවී 10:14, ගණන් 18:19
8 ලෙවී 5:15
9 ලෙවී 5:16, ලෙවී 27:13

**2 තීරුව**
1 ගණන් 18:32, එස 22:26
2 ලෙවී 7:16, ලෙවී 23:38, ගණන් 15:3, ගීතා 22:25, ගීතා 56:12
3 ද්වි 12:6
4 ගණන් 15:14, ගණන් 15:16
5 ලෙවී 1:3, ලෙවී 22:22
6 ලෙවී 7:18, ලෙවී 23:11
7 ද්වි 15:21, ද්වි 17:1, මලා 1:8, හෙබ්‍රෙ 9:14, 1පේතෘ 1:19
8 ගණන් 15:8, ද්වි 23:21, ගීතා 50:14, ගීතා 61:8, දේශ 5:4
9 ලෙවී 3:1
10 ද්වි 15:21, මලා 1:8
11 ලෙවී 3:3, ලෙවී 3:14
12 ලෙවී 21:18

ලෙස ඔප්පු කළ හැක. නමුත් භාර-
යක් ලෙස එවැනි සතෙකුව
ඔප්පු කළොත් එය පිළිගනු නො-
ලැබේ. **24** එහෙත් වෘෂණ කෝෂ[1]
තුවාල වුණු හෝ තැළුණු හෝ
අයින් කර දැමූ හෝ කපා දැමූ
හෝ සතෙකුව යෙහෝවා දෙවි වන
මට ඔප්පු නොකළ යුතුයි. ඔබේ
දේශයේ එවැනි සතෙකුව පූජාවක්
ලෙස ඔප්පු නොකරන්න. **25** විදේ-
ශිකයෙකු එවැනි සතෙකුව පූජාවක්
ලෙස ගෙන ආවොත් දෙවිට පිළිගන්-
වන ආහාර ලෙස ඔබ ඌව ඔප්පු
නොකළ යුතුයි. මන්ද උන් දෝෂ
සහිත[2] සතුන්ය. උන් තුළ යම්
කැළැලක් ඇති බැවින් උන් අපවි-
ත්‍රය. ඔබේ අතින් පිළිගන්වන එවැනි
පූජාවකට දෙවිගේ අනුමැතිය[3] නො-
ලැබේ.’ ”

**26** යෙහෝවා දෙවි මෝසෙස්ට
තවදුරටත් මෙසේ කීවේය.
**27** “වස්සෙකු හෝ බැටළු පැටවෙකු
හෝ එළු පැටවෙකු හෝ ඉපදුණොත්
ඌ දවස් හතක් යන තෙක් උගේ මව
සමඟ සිටිය යුතුයි.[4] නමුත් අටවන
දවසෙන් පසු ඌව යෙහෝවා දෙවි
වන මට ඔප්පු කළ හැක. ගින්නෙන්
ඔප්පු කරන ලද එම පූජාව සතු-
ටින් පිළිගනු ලැබේ. **28** ගොනෙකු
සමඟ උගේ පැටියාව හෝ බැටළු-
වෙකු සමඟ උගේ පැටියාව හෝ
එකම දිනයේදී නොමැරිය යුතුයි.[5]

**29** “ඔබ යෙහෝවා දෙවි වන මට
ස්තුති පූජාවක් ඔප්පු කරනවා[6] නම්
ඔබට අනුමැතිය ලබාගැනීමට හැකි
වන අයුරින් එම පූජාව ඔප්පු කරන්න.
**30** ඔබ පූජාව ඔප්පු කරන දවසේදීම
එයින් අනුභව කළ යුතුයි.[7] පසුවදා
උදෑසන වන තෙක් එයින් කිසිවක්
ඉතුරු නොකළ යුතුයි.[8] මා යෙ-
හෝවා දෙවිය.

**31** “ඔබ මගේ ආඥාවලට කීකරු
වෙමින් ඒවා අනුව ජීවත් විය යුතුයි.[9]
මා යෙහෝවා දෙවිය. **32** ඔබ මගේ
ශුද්ධ නාමය නොකෙලෙසිය යුතුයි.[10]
ඊශ්‍රායෙල් සෙනඟ මා ඉතා ශුද්ධ

**22 පරි.**
1 ලෙවී 21:20 ද්වි 23:1
2 ලෙවී 21:21
3 ලෙවී 7:18 ලෙවී 19:7
4 නික් 22:30
5 නික් 23:19 ද්වි 22:6 හිතෝ 12:10
6 ලෙවී 7:12 ගීතා 107:22 ගීතා 116:17 ආමො 4:5
7 ලෙවී 7:15
8 නික් 12:10
9 ලෙවී 19:37 ගණන් 15:40 ද්වි 4:40
10 ලෙවී 18:21 ලෙවී 19:12 ආමො 2:7

**2 තීරුව**
1 ලෙවී 10:3 යෙසා 29:23 ලූක් 11:2
2 නික් 19:5 ලෙවී 20:8 ලෙවී 21:8 යොහ 17:17
3 නික් 6:7 ලෙවී 11:45 ගණන් 15:41

**23 පරි.**
4 නික් 23:14 ලෙවී 23:37
5 ගණන් 10:10
6 නික් 16:30 නික් 20:10 ලෙවී 19:3 ක්‍රියා 15:21
7 නෙහෙ 13:22 යෙසා 56:2 යෙසා 58:13
8 නික් 23:14
9 නික් 12:16 ගණන් 29:12
10 ගණන් 9:2
11 ගණන් 9:3 ගණන් 28:16
12 නික් 12:6 ද්වි 16:1 යොෂු 5:10 1කොරි 5:7
13 ගණන් 28:17 ක්‍රියා 12:3 1කොරි 5:8
14 නික් 12:15 නික් 13:6 නික් 34:18

කෙනෙකු ලෙස සැලකිය යුතුයි.[1]
ඔබව ශුද්ධ සෙනඟක් ලෙස වෙන්
කර තබන මා යෙහෝවා දෙවිය.[2]
**33** ඔබව ඊජිප්තු දේශයෙන් පිටතට
ගෙනාවේ මමය. මම ඔබේ දෙවි බව
ඔබට ඔප්පු කර පෙන්වන පිණිස එසේ
කළෙමි.[3] මා යෙහෝවා දෙවිය.”

**23** යෙහෝවා දෙවි තවදුරටත්
මෝසෙස්ට මෙසේ කීවේය.
**2** “ඔබ ඊශ්‍රායෙල් සෙනඟට මෙසේ
කියන්න. ‘යෙහෝවා දෙවි වන මා
ඔබට නියම කරන උත්සව දිනයන්[4]
සඳහා සියලුදෙනාම එක් රැස් විය
යුතුයි. ඒවා ශුද්ධ දිනයන් වේ. ඔබ ඒ
උත්සවයන් ගැන නිවේදනය කළ
යුතුයි.[5] මා නියම කරන උත්සවයන්
මේවාය.

**3** “ ‘ඔබට දින හයක් වැඩ කිරීමට
පුළුවන. නමුත් හත්වන දවස ශුද්ධ
එක්රැස්වීමක් පවත්වන සබත් දින-
යකි. එදින ඔබ වෙනත් වැඩවල නො-
යෙදී මුළු දවසම විවේකයෙන් ගත
කළ යුතුයි.[6] ඔබ කොතැනක ජීවත්
වුණත් යෙහෝවා දෙවි වන මා වෙ-
නුවෙන් එම දවස සබතක් ලෙස
පැවැත්විය යුතුයි.[7]

**4** “ ‘යෙහෝවා දෙවි වන මා ඔබට
නියම කරන උත්සව දිනවලදී[8] ඔබ
ශුද්ධ එක්රැස්වීම්[9] පැවැත්විය යුතුයි.
ඔබ ඒ උත්සවයන් පවත්වන නිය-
මිත කාලවලදී[10] ඒ ගැන නිවේදනය
කළ යුතුයි. **5** යෙහෝවා දෙවි වන
මට ගෞරවය ගෙනෙන පිණිස පළ-
මුවෙනි මාසයේ* දහහතරවනදා[11]
සවස# පාස්කු උත්සවය[12] පැවැත්විය
යුතුයි.

**6** “ ‘එම මාසයේම පහළොස්වන
දින යෙහෝවා දෙවි වන මා
වෙනුවෙන් මුහුන් නොදැමූ රොටි
උත්සවය[13] පැවැත්විය යුතුයි. ඔබ
හත් දවසක් මුහුන් නොදැමූ රොටි
කන්න.[14] **7** ඔබ පළමුවෙනි දව-
සේ ශුද්ධ එක්රැස්වීමක් පැවැත්විය

ලෙවී **23:5*** නික් 12:2හි පාදසටහන බලන්න. **5#** නික් 12:6හි පාදසටහන බලන්න.

යුතුයි.[1] ඔබ එදින වෙහෙස මහන්සි
වී කිසි වැඩක් නොකරන්න. **8** එම
දවස් හතේදීම ඔබ යෙහෝවා දෙවි
වන මට ගින්නෙන් දවන ලද පූජා
ඔප්පු කළ යුතුයි. හත්වන දවසේද
ඔබ ශුද්ධ එක්රැස්වීමක් පැවැත්විය
යුතුයි. ඔබ එදිනත් වෙහෙස මහන්සි
වී කිසි වැඩක් නොකළ යුතුයි.’ ”

**9** යෙහෝවා දෙවි තවදුරටත්
මෝසෙස්ට මෙසේ කීවේය.
**10** “ඊශ්‍රායෙල් සෙනඟට මෙසේ
කියන්න. ‘මා ඔබට දෙන දේශ-
යට ඔබ පැමිණ එහි අස්වැන්න
නෙළාගත් පසු ඔබේ අස්වැන්නේ
ප්‍රථම ඵලවලින් මිටියක්[2] පූජකයා
වෙතට ගෙනෙන්න. **11** පූජකයා
සබත් දිනයට පසුවදා ඔබ ගෙනා
ධාන්‍ය මිටිය යෙහෝවා දෙවි වන මා
ඉදිරියේ ඒ මේ අත සෙලවිය යුතුයි.[3]
ඔබ දෙවිගේ අනුමැතිය ලබාගන්නා
පිණිස පූජකයා එසේ කළ යුතුයි.
**12** ඔබ එම මිටිය පූජකයා වෙතට
ගෙන යන දවසේ දවන පූජාවක් ලෙස
අවුරුද්දක් පමණ වයසැති නිකැළැල්
බැටළු පැටවෙකුවද යෙහෝවා දෙවි
වන මට ඔප්පු කළ යුතුයි. **13** ඒ
සමඟ ඔබ ධාන්‍ය පූජාවක්ද ඔප්පු කළ
යුතුයි. ඒ සඳහා තෙල් මිශ්‍ර සිහින් පිටි
ඒඵාවකින් දහයෙන් කොටස් දෙකක්
ගෙනැවිත් යෙහෝවා දෙවි වන මට
ප්‍රසන්න සුවඳක් ගෙනෙන පිණිස
ගින්නෙන් දවා ඔප්පු කරන්න. ඒ
පූජාව සමඟ පාන පූජාවක්ද ඔප්පු
කළ යුතුයි. ඒ සඳහා වයින් හින මිනු-
මෙන් හතරෙන් එකක් ගෙනෙන්න.
**14** ඔබේ දෙවිට ඔප්පු කිරීම සඳහා
එම පූජාවන් ගෙනෙන දවස වන
තෙක් ඔබ රොටිවත් බැදපු ධාන්‍යවත්
අලුත් ධාන්‍යවත් නොකෑ යුතුයි.[4]
ඔබ කොතැනක ජීවත් වුවත් ඔබත්
ඔබෙන් පැවත එන අයත් බොහෝ
කාලයකට එම පනත පැවැත්විය
යුතුයි.

**15** “ ‘සබත් දවසට පසුවදා එනම්,
සෙලවීමේ පූජාව සඳහා ධාන්‍ය මිටිය
ගෙනා දවසේ සිට සම්පූර්ණ සති
හතක්* ගණන් කරන්න.[1] **16** සති
හත අවසන් වන දවසට පසුවදා
එනම්, පනස්වන දවසේදී[2] ඔබ අලුත්
ධාන්‍ය ගෙන යෙහෝවා දෙවි වන
මට පූජාවක් ලෙස ඔප්පු කරන්න.[3]
**17** සෙලවීමේ පූජාවක් ලෙස ඔප්පු
කරන පිණිස ඔබේ නිවසේදී සාදාගත්
රොටි දෙකක්[4] ගෙනෙන්න. සිහින් පිටි
ඒඵාවකින් දහයෙන් කොටස් දෙක-
කට මුහුන් මිශ්‍ර කර ඒවා සාදාගන්න.[5]
අස්වැන්නේ ප්‍රථම ඵල ලෙස යෙ-
හෝවා දෙවි වන මා වෙත එම රොටි
ගෙනා යුතුයි.[6] **18** ඔබ රොටි සමඟ
අවුරුද්දක් වයසැති නිකැළැල් බැටළු
පැටවුන් හත්දෙනෙකුවද[7] වස්සෙකු-
වද බැටළුවන් දෙදෙනෙකුවද ගෙනා
යුතුයි. උන්ව දවන පූජාවක් ලෙස
යෙහෝවා දෙවි වන මට ඔප්පු කළ
යුතුයි. ඒ සමඟ ධාන්‍ය පූජාවක් හා
පාන පූජාද ගින්නෙන් දවා ඔප්පු
කරන්න. යෙහෝවා දෙවි වන මට
ප්‍රසන්න සුවඳක් ගෙනෙන පිණිස ඔබ
එම පූජා ඔප්පු කරන්න. **19** පාප
පූජාවක් ලෙස එළු පැටවෙකුද[8] හවුල්
පූජාවක් ලෙස[9] අවුරුද්දක් වයසැති
බැටළු පැටවුන් දෙදෙනෙකුද ඔප්පු
කරන්න. **20** පූජකයා ප්‍රථම ඵලව-
ලින් සාදාගත් රොටි සමඟ බැටළු
පැටවුන් දෙදෙනාව යෙහෝවා දෙවි
වන මා ඉදිරියේ ඒ මේ අත සෙල-
විය යුතුයි.[10] එය දෙවිට පිළිගන්වන
පිණිස කරන සෙලවීමේ පූජාවකි. යෙ-
හෝවා දෙවි වන මට ශුද්ධ දෙ-
යක් වන එම පූජාව අයිති වන්නේ
පූජකයාටයි.[11] **21** එම පූජාව ඔප්පු
කරන දවසේ ඔබ ශුද්ධ එක්රැස්වීමක්
පැවැත්විය යුතුයි. සෙනඟ එක් රැස්
කරගැනීම සඳහා ඔබ එදින ප්‍රසිද්ධ
නිවේදනයක්[12] කළ යුතුයි. එදින වෙ-
හෙස මහන්සි වී කිසි වැඩක් නොක-
රන්න. ඔබ කොතැනක ජීවත් වුවත්
ඔබටත් ඔබෙන් පැවත එන්නන්ටත්
එම පනත බොහෝ කාලයක් පුරා
වලංගු වනු ඇත.

**23 පරි.**
**1** නික් 12:16
**2** ගණන් 18:12; හිතෝ 3:9; එස 44:30; 1කොරි 15:20; යාකො 1:18
**3** ලෙවී 23:15; 1කොරි 15:20; 1කොරි 15:23
**4** යොෂු 5:11

**2 තීරුව**
**1** නික් 34:22; ද්වි 16:9
**2** ක්‍රියා 2:1
**3** ගණන් 28:26; ද්වි 16:16
**4** එෆී 2:16; එෆී 2:18
**5** ලෙවී 7:13; රෝම 5:12
**6** නික් 23:16; නික් 34:22; යාකො 1:18; එළි 14:4
**7** ගණන් 28:27
**8** ලෙවී 4:23; ගණන් 28:30
**9** ලෙවී 3:1
**10** ලෙවී 7:30
**11** ලෙවී 7:34; ලෙවී 10:14; ගණන් 18:9; ද්වි 18:4; 1කොරි 9:13
**12** ගණන් 10:10

ලෙවී **23:15*** මූ.අ., “සබත් හතක්.”

**22** "'ඔබ දේශයේ අස්වැන්න නෙ-
ළන විට කෙත්වල මායිම් දක්වාම
අස්වැන්න නෙළීමෙන් වළකින්න.
අස්වැන්න නෙළාගත් පසු කෙතේ
අතහැරුණු කරල් එකතු කර නො-
ගන්න.[1] පීඩාවට පත් වූ තැනැත්තා-
ටද[2] විදේශිකයාටද[3] ඔබ ඒවා ඉතුරු
කළ යුතුයි. මා ඔබේ දෙවි වන යෙ-
හෝවාය.'"

**23** යෙහෝවා දෙවි මෝසෙස්ට
තවදුරටත් මෙසේ කීවේය.
**24** "ඊශ්‍රායෙල් සෙනඟට මෙසේ
කියන්න. 'හත්වන මාසයේ[4] පළමු-
වෙනිදා වෙනත් වැඩවල නොයෙදී
ඔබ මුළු දවසම විවේකයෙන් ගත
කළ යුතුයි. එදින ශුද්ධ එක්රැස්වීමක්
පැවැත්විය යුතුයි.[5] එය හොරණෑ නාද
කරමින් සිහි කළ යුතු දිනයකි.[6]
**25** එදින ඔබ වෙහෙස මහන්සි වී කිසි
වැඩක් නොකළ යුතුයි. ඔබ යෙ-
හෝවා දෙවි වන මට ගින්නෙන් දවන
ලද පූජාවක් ඔප්පු කළ යුතුයි.'"

**26** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. **27** "හත්වන මාස-
යේ දහවනදා සමඟි වීමේ දවසය.*[7]
එදින ඔබ යටහත්ව ඔබේ පව් ගැන
දුක් වෙමින්#[8] යෙහෝවා දෙවි වන මට
ගින්නෙන් දවන ලද පූජාවක් ඔප්පු
කරන්න.[9] ඔබ ශුද්ධ එක්රැස්වීමක්ද
එදින පැවැත්විය යුතුයි. **28** එදින
ඔබ වෙන කිසි වැඩක් නොකළ යුතුයි.
මන්ද එය ඔබේ දෙවි වන යෙ-
හෝවා ඉදිරියේ ඔබේ පව්වලට සමාව
ලබාගන්නා සමඟි වීමේ දවසයි.[10]
**29** මේ දවසේදී යටහත්ව තමන්ගේ
පව් ගැන දුක් නොවන සියලුදෙනා-
වම මරා දැමිය යුතුයි.[11] **30** එදින
යමෙකු මොනයම් ආකාරයක හෝ
වැඩක් කළොත් මම අනිවාර්යයෙන්ම
ඔහුව විනාශ කරන්නෙමි.[12] **31** ඔබ
මොනයම් ආකාරයක හෝ වැඩක්
එදින නොකළ යුතුයි.[13] ඔබ කොතැ-
නක ජීවත් වුවත් ඔබත් ඔබෙන් පැවත
එන අයත් බොහෝ කාලයක් පුරා එම
පනත පිළිපැදිය යුතුයි. **32** එය ඔබ
වෙන කිසි වැඩක් නොකර මුළු දවසම
විවේකයෙන් ගත කළ යුතු සබත් දව-
සකි.[1] ඔබ හත්වන මාසයේ නවවනදා
සවස සිට පසුවදා සවස දක්වා යට-
හත්ව ඔබේ පව් ගැන දුක් වෙමින්[2] එම
සබත පැවැත්විය යුතුයි."

**33** යෙහෝවා දෙවි නැවතත් මෝ-
සෙස්ට මෙසේ කීවේය. **34** "ඊශ්‍රා-
යෙල් සෙනඟට මෙසේ කියන්න.
'හත්වන මාසයේ පහළොස්වන
දින යෙහෝවා දෙවි වන මා වෙනු-
වෙන් පැල් උත්සවය පවත්වන්න. එය
දවස් හතක් පුරා පැවැත්විය යුතුයි.[3]
**35** පළමුවෙනි දවසේ ශුද්ධ එක්රැස්වී-
මක් පැවැත්විය යුතුයි. ඔබ එදින වෙ-
හෙස මහන්සි වී කිසි වැඩක් නොකළ
යුතුයි. **36** ඒ දවස් හත පුරාම ඔබ
යෙහෝවා දෙවි වන මට ගින්නෙන්
දවන ලද පූජා ඔප්පු කරන්න. අටවන
දවසෙත් ශුද්ධ එක්රැස්වීමක් පැවැත්-
විය යුතුයි.[4] ඔබ එදිනත් යෙහෝවා
දෙවි වන මට ගින්නෙන් දවන ලද
පූජාවක් ඔප්පු කරන්න. එය දෙවිව සිහි
කරන පිණිස පවත්වන විශේෂ රැස්වී-
මකි.* එබැවින් ඔබ එදින වෙහෙස
මහන්සි වී කිසි වැඩක් නොකළ යුතුයි.

**37** "'යෙහෝවා දෙවි වන මා
ඔබට නියම කරන එම උත්සව දින-
වලදී[5] ශුද්ධ එක්රැස්වීම්[6] පැවැත්වෙන
බව නිවේදනය කරන්න. ඒ දිනවලදී
යෙහෝවා දෙවි වන මට ගින්නෙන්
දවන ලද පූජා[7] ඔප්පු කළ යුතුයි. ඒ ඒ
දවසට නියම වූ දවන පූජාවද[8] ඒ
සමඟම ධාන්‍ය පූජාවද[9] පාන පූජාද[10]
ඔප්පු කළ යුතුයි. **38** ඒවාට අමත-
රව ඔබ පිළිගන්වන තෑගි,[11] ඔප්පු
කරන භාර[12] හා ඔබේ කැමැත්තෙන්ම
පූජා කරන සියලු දේ[13] සුපුරුදු පරිදි
යෙහෝවා දෙවි වන මට දිය යුතු
බව මතක තබාගන්න. එමෙන්ම
ඒ උත්සවයන්ට අමතරව යෙහෝවා

**23 පරි.**
1 ලෙවී 19:9, ද්වි 24:19, රූත් 2:3
2 යෙසා 58:7
3 ලෙවී 19:33, ගණන් 15:15
4 1රාජා 8:2
5 ගණන් 29:12
6 ගණන් 10:10, ගණන් 29:1
7 නික් 30:10, ලෙවී 16:30, ලෙවී 25:9, 1යොහ 1:7
8 ලෙවී 16:29, ගණන් 29:7, ගීතා 35:13, යෙසා 58:5
9 ද්වි 16:16, එස 45:17
10 ලෙවී 16:34, හෙබ්‍රෙ 9:12, හෙබ්‍රෙ 9:24, හෙබ්‍රෙ 9:26, හෙබ්‍රෙ 10:10, 1යොහ 2:2
11 ගණන් 9:13, ගණන් 15:30
12 ක්‍රියා 3:23
13 ලෙවී 23:28, මතෙ 12:12, මාක් 3:4

**2 තීරුව**
1 ලෙවී 16:31
2 ලෙවී 16:29, ලෙවී 23:27, ගණන් 29:7, ගීතා 35:13
3 නික් 23:16, ගණන් 29:12, ද්වි 16:13, එස්රා 3:4, නෙහෙ 8:14, සෙක 14:16, යොහ 7:2
4 නෙහෙ 8:18, යොහ 7:37
5 නික් 23:14, ද්වි 16:16
6 ලෙවී 23:4, ගණන් 28:26, ගණන් 29:7
7 ලෙවී 1:9, ලෙවී 2:2
8 ලෙවී 1:3
9 ලෙවී 2:1, ලෙවී 2:11
10 නික් 29:40, ගණන් 15:5, ගණන් 28:7, පිලි 2:17
11 නික් 28:38, ගණන් 18:29
12 ගණන් 29:39, ද්වි 12:11
13 ද්වි 12:6, 1ලේක 29:9, 2ලේක 35:8, එස්රා 2:68

ලෙවී **23:27*** හෝ, "දෙවි සමඟ සමඟි වන දවසය." **27#** ලෙවී 16:29හි පාදසටහන බලන්න.

ලෙවී **23:36*** එනම්, ඊජිප්තුවෙන් නික්ම යෑම සිහි කරන උත්සව දිනයකි.

දෙවි වන මා ඔබට නියම කරන
සබත් දවස්ද[1] ඔබ පැවැත්විය යුතුයි.
**39** ඔබේ දේශයේ පලදාව රැස් කර-
ගත් පසු හත්වන මාසයේ පහළොස්-
වන දින ඔබ යෙහෝවා දෙවි වන
මා වෙනුවෙන් උත්සවයක්[2] පැවැත්-
විය යුතුයි. ඔබ දවස් හතක් පුරා[3]
එම උත්සවය පවත්වන්න. වෙන
කිසි වැඩක් නොකර පළමුවෙනි දවස
පුරාම ඔබ විවේකයෙන් ගත කරන්න.
අටවෙනි දවස පුරාද විවේකයෙන්
සිටින්න.[4] **40** ඔබ පළමුවෙනි දව-
සේදී හොඳම පලතුරු එකතු කර-
ගන්න. තාල ගස්වල අතුද[5] කොළ
පිරුණු අතුද නිම්න අසල වැඩෙන
විලෝ ගස්වල අතුද කපාගන්න. ඉන්-
පසු ඔබේ දෙවි වන යෙහෝවා ඉදිරි-
යට ගොස් හත් දවසක් ප්‍රීති වෙන්න.[6]
**41** මෙසේ, යෙහෝවා දෙවි වන මා
වෙනුවෙන් පවත්වන එම උත්සවය
ඔබ සෑම අවුරුද්දකම දවස් හතක්
පුරා[7] පැවැත්විය යුතුයි. එය පැවැත්-
විය යුත්තේ හත්වන මාසයේදීය. එය
ඔබත් ඔබෙන් පැවත එන අයත්
බොහෝ කාලයක් පුරා පිළිපැදිය යුතු
නියෝගයකි. **42** එම දවස් හතේදී
ඔබ කුඩා පැල්පත්වල* ජීවත් විය
යුතුයි.[8] සෑම ඊශ්‍රායෙල් ජාතිකයෙකුම
කුඩා පැල්පත්වල ජීවත් විය යුතුයි.[9]
**43** ඔබ එසේ කළ යුත්තේ, මා ඊශ්‍රා-
යෙල් සෙනඟව ඊජිප්තු දේශයෙන්
පිටතට රැගෙන ආ පසු ඔවුන්ට පැල්-
පත්වල* ජීවත් වීමට සැලැස්වූ බව[10]
ඔබේ අනාගත පරපුර දැනගන්නා
පිණිසය.[11] මා ඔබේ දෙවි වන යෙ-
හෝවාය.’ ”

**44** යෙහෝවා දෙවි නියම කළ
උත්සවයන්[12] ගැන මෝසෙස් ඊශ්‍රා-
යෙල් සෙනඟට කීවේය.

# 24

යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. **2** “පහන්
නිතරම දල්වා තබාගැනීම සඳහා[13]
ඔලීව ගෙඩි කොටා සාදාගත් හොඳම
තෙල් ඔබට ගෙනැවිත් දෙන ලෙස
ඊශ්‍රායෙල් සෙනඟට අණ කරන්න.[1]
**3** සම්මුඛ වීමේ කූඩාරමේ ගිවිසුම්
පෙට්ටිය තිබෙන ස්ථානයට පිටතින්
එනම්, තිරයට අනික් පැත්තෙන්
තිබෙන පහන් සවස සිට උදෑසන
දක්වා නොකඩවා යෙහෝවා දෙවි
වන මා ඉදිරියේ දැල්වෙමින් තිබිය
යුතුයි. එය නොකඩවා දැල්වෙන
බවට ආරොන් වගබලා ගත යුතුයි.
එය ඔබත් ඔබෙන් පැවත එන අයත්
බොහෝ කාලයක් පුරා පිළිපැදිය යුතු
නියෝගයකි. **4** පවිත්‍ර රනින් සාදා
තිබෙන පහන් රුක[2] මත ඔහු පහන්
තබා[3] යෙහෝවා දෙවි වන මා ඉදි-
රියේ ඒවා නොකඩවා දැල්වෙන්න
සැලැස්විය යුතුයි.[4]

**5** “ඔබ සිහින් පිටිවලින් මුද්දක
හැඩැති රොටි දොළහක් සාදාගන්න.
ඒ එක් එක් රොටිය සඳහා සිහින් පිටි
ඒපාවකින් දහයෙන් කොටස් දෙ-
කක් භාවිත කරන්න. **6** එක ගොඩ-
කට රොටි හය බැගින් සිටින සේ
රොටි ගොඩවල් දෙකක් සාදා[5] ඒවා
යෙහෝවා දෙවි වන මා ඉදිරියේ
පවිත්‍ර රනින් නිමවා තිබෙන මේසය
උඩ තබන්න.[6] **7** අමිශ්‍ර කට්ටකුමං-
ජල් ටිකක් රොටි ගොඩවල් දෙක මත
තබන්න. පසුව එම කට්ටකුමංජල්
ටික යෙහෝවා දෙවි වන මා ඉදිරියේ
ගින්නෙන් දවා ඔප්පු කළ යුතුයි. සිහි-
ගැන්වීමක් වශයෙන් ඔප්පු කරන එම
කට්ටකුමංජල් මගින් රොටි නියෝජ-
නය වේ.[7] **8** යෙහෝවා දෙවි වන
මා ඉදිරියේ එම රොටි නිරතුරුවම
තිබෙන පිණිස සෑම සබත් දවසකදීම
ඒවා මාරු කළ යුතුයි.[8] එය මා ඊශ්‍රා-
යෙල් සෙනඟ සමඟ ඇති කරගන්නා
ගිවිසුමකි. එය බොහෝ කාලයකට
පවතින්නේය. **9** ඉවත් කරන රොටි
ආරොන්ට සහ ඔහුගේ පුත්‍රයන්ට[9]
අයිතිය. ඔවුන් ඒවා ශුද්ධ තැනකදී
අනුභව කළ යුතුයි.[10] මන්ද යෙ-
හෝවා දෙවි වන මට ගින්නෙන්
ඔප්පු කරන ලද පූජාවලින් පූජකයාට
ලැබෙන එම කොටස ඉතා ශුද්ධය.

ලෙවී **23:42*** කොළ අතුවලින් සාදාගත් තාවකා-
ලික වාසස්ථාන. **43*** හෝ, “පැල්වල.”

**23 පරි.**
**1** නික් 16:23
නික් 20:8
නික් 31:13
යෙසා 56:2
**2** සෙක 14:16
මතෙ 13:39
මතෙ 24:31
මතෙ 25:31
**3** ද්වි 16:13
**4** ලෙවී 23:7
ලෙවී 23:24
ගණන් 29:12
**5** නෙහෙ 8:15
යොහ 12:13
එළි 7:9
**6** ද්වි 16:15
නෙහෙ 8:10
**7** ගණන් 29:12
නෙහෙ 8:18
**8** ද්වි 31:10
**9** නෙහෙ 8:14
නෙහෙ 8:16
නෙහෙ 8:17
**10** නික් 12:38
ගණන් 24:5
සෙක 14:16
**11** නික් 13:14
ද්වි 31:13
ගීතා 78:6
**12** ලෙවී 23:2

**24 පරි.**
**13** ගණන් 8:2
2ලේක 13:11

**2 තීරුව**
**1** නික් 27:20
**2** නික් 25:31
යෙරෙ 52:19
හෙබ්‍රෙ 9:2
**3** නික් 39:37
**4** නික් 27:20
**5** නික් 40:23
1සාමු 21:4
මාක් 2:26
**6** නික් 25:24
1රාජා 7:48
හෙබ්‍රෙ 9:2
**7** ලෙවී 2:2
ලෙවී 6:15
**8** ගණන් 4:7
1ලේක 9:32
2ලේක 2:4
නෙහෙ 10:33
**9** ලෙවී 21:22
ලෙවී 22:10
1සාමු 21:6
මතෙ 12:4
ලූක් 6:4
**10** ලෙවී 6:16

එය බොහෝ කාලයක් පුරා පිළිපැදිය
යුතු නියෝගයකි.”
**10** ඊශ්‍රායෙල් ජාතික ස්ත්‍රියකට
හා ඊජිප්තු ජාතික පුරුෂයෙකුට
උපන් එක්තරා මිනිසෙක්[1] ඊශ්‍රා-
යෙල් සෙනඟ අතරට ගොස් ඔවුන්-
ගෙන් කෙනෙකු සමඟ කඳවුරේදී
ගහගත්තේය.[2] **11** ඒ අවස්ථාවේදී
ඊශ්‍රායෙල් ජාතික ස්ත්‍රියගේ පුත්‍රයා
දෙවිට ශාප කර[3] ඔහුගේ නාම-
යට අපහාස කළේය.[4] එබැවින් ඔහුව
මෝසෙස් ඉදිරියට ගෙන යනු ලැබු-
වේය.[5] ඔහුගේ මව දාන් ගෝත්‍ර-
යේ දිබ්රීගේ දුව වන ෂෙලොමිත්ය.
**12** ඔවුහු යෙහෝවා දෙවිගෙන් නිශ්-
චිත තීන්දුවක්[6] ලැබෙන තෙක් ඔහුව
එහි රඳවා තබාගත්හ.[7]
**13** පසුව යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. **14** “දෙවිට
අපහාස කළ එම තැනැත්තාව කඳවු-
රෙන් පිටතට ගෙන යන්න.[8] ඔහු කළ
අපහාසය අසා සිටි සියලුදෙනා ඔහු-
ගේ හිස මත අත් තැබිය යුතුයි.[9]
මුළු ඊශ්‍රායෙල් සෙනඟ ඔහුට ගල්
ගසා මැරිය යුතුයි.[10] **15** ඔබ ඊශ්‍රා-
යෙල් සෙනඟට මෙසේ කියන්න.
‘යමෙකු දෙවිට ශාප කළොත් ඔහු
තම පාපය වෙනුවෙන් ගණන් දිය
යුතුයි. **16** යෙහෝවා යන මාගේ
නාමයට අපහාස කරන තැනැත්තාට
මුළු සෙනඟ ගල් ගසා මරා දැමිය
යුතුයි.[11] ඊශ්‍රායෙල් ජාතිකයෙකු හෝ
වේවා විදේශිකයෙකු හෝ වේවා දෙවි-
ගේ නාමයට අපහාස කළොත් ඔහුව
අනිවාර්යයෙන්ම මරා දැමිය යුතුයි.[12]
**17** “‘යමෙකු මිනිසෙකුට පහර දී
ඔහු මිය ගියොත් එම තැනැත්-
තාවද අනිවාර්යයෙන්ම මරා දැමිය
යුතුයි.[13] **18** යමෙකු වෙනත් කෙ-
නෙකුට අයිති සතෙකුව මැරුවොත්
ඔහු එම සතා වෙනුවෙන් වන්දියක්
ගෙවිය යුතුයි. එම සතාගේ ජීවි-
තය වෙනුවට ඔහු තව සතෙකුව
දිය යුතුයි.[14] **19** යමෙකු මිනිසෙකුව
තුවාල කළොත් ඔහුටත් එලෙසම
තුවාල කළ යුතුයි.[15] **20** බිඳුමකට
බිඳුමක්, ඇසකට ඇසක් සහ දතකට
දතක් යන ප්‍රතිපත්තියට අනුව ඔහු
තුවාල කළ ලෙසම ඔහුටත් තුවාල
කළ යුතුයි.[1] **21** යමෙකු මෘගයෙ-
කුව මැරුවොත්[2] ඔහු එම සතා වෙනු-
වෙන් වන්දියක්[3] ගෙවිය යුතුයි. නමුත්
යමෙකු මිනිසෙකුව මැරුවොත් ඔහුව
මරා දැමිය යුතුයි.[4]
**22** “‘සියලුදෙනාවම එක හා සමා-
නව විනිශ්චය කළ යුතුයි. ඊශ්‍රා-
යෙල් ජාතිකයන්ව විනිශ්චය කරන
ආකාරයටම විදේශිකයන්වද විනිශ්-
චය කරන්න.[5] මන්ද මා ඔබේ දෙවි
වන යෙහෝවාය.’”[6]
**23** ඉන්පසු මෝසෙස් ඊශ්‍රායෙල්
සෙනඟට ඒ සියල්ල කීවේය. ඔවුහු
දෙවිට ශාප කළ තැනැත්තාව කඳවු-
රෙන් පිටතට ගෙන ගොස් ගල් ගසා
මරා දැමුවෝය.[7] යෙහෝවා දෙවි
මෝසෙස්ට අණ කළ ලෙසම ඊශ්‍රා-
යෙල් සෙනඟ කළෝය.

**25** යෙහෝවා දෙවි සීනයි කන්-
දේදී මෝසෙස්ට මෙසේ
කීවේය. **2** “ඊශ්‍රායෙල් සෙනඟට
මෙසේ කියන්න. ‘මා ඔබට දෙන
දේශයට පැමිණි පසු[8] ඔබ භූමි-
යට විවේකයක් දෙමින් යෙහෝවා
දෙවි වන මා වෙනුවෙන් සබතක්
පැවැත්විය යුතුයි.[9] **3** ඔබ අවුරුදු
හයක් ඔබේ කෙත්වල බීජ වපුරන්න.
ඔබේ මිදිවතුවලට සාත්තු කරමින්
එහි වැල් කප්පාදු කරන්න. මෙසේ,
ඔබ අවුරුදු හයක් දේශයේ පල-
දාව රැස් කරගත යුතුයි.[10] **4** නමුත්
හත්වන අවුරුද්දේදී භූමියට විවේක-
යක් දෙමින් ඔබ යෙහෝවා දෙවි වන
මා වෙනුවෙන් සබතක් පැවැත්විය
යුතුයි.[11] ඔබ එම අවුරුද්ද මුළුල්-
ලේම ඔබේ කෙත්වල බීජ නොවැපිරිය
යුතුයි. ඔබේ මිදිවැල්ද කප්පාදු නො-
කළ යුතුයි. **5** පෙර අවුරුද්දේදී අස්-
වැන්න නෙළන විට ඔබේ කෙත්වල
වැටෙන බීජවලින් හටගන්නා ධාන්‍ය
කපා රැස් කර නොගන්න. කප්-
පාදු නොකළ ඔබේ මිදිවැල්වල පලද
රැස් කර නොගන්න. ඒ මුළු අවු-

**24 පරි.**
1 නික් 12:38
ගණන් 11:4
2 නික් 2:13
3 නික් 20:7
නික් 21:17
නික් 22:28
ලෙවී 19:12
යෙසා 8:21
එළි 16:9
4 ගීතා 8:1
ගීතා 83:18
හොෂෙ 12:5
5 නික් 18:22
6 නික් 18:15
7 ගණන් 15:34
8 ලෙවී 13:46
ගණන් 5:3
9 ද්වි 13:9
ද්වි 17:7
10 ලෙවී 5:1
ගණන් 15:35
ද්වි 13:10
11 ද්වි 5:11
12 1රාජා 21:10
ගීතා 74:10
13 උත් 9:6
නික් 21:12
ගණන් 35:31
ද්වි 19:13
14 නික් 21:35
15 නික් 21:23

**2 තීරුව**
1 නික් 21:24
ද්වි 19:21
මතෙ 5:38
2 නික් 21:33
3 නික් 21:34
නික් 22:1
4 උත් 9:6
නික් 21:12
5 නික් 12:49
ලෙවී 17:10
ලෙවී 19:34
ගණන් 9:14
ගණන් 15:16
6 රෝම 3:29
7 ගණන් 15:36
ද්වි 17:7

**25 පරි.**
8 උත් 15:16
ද්වි 32:8
ගීතා 24:1
9 ලෙවී 26:34
2ලේක 36:21
10 නික් 23:10
11 නික් 23:11
ලෙවී 26:34

රුද්දේදීම භූමියට විවේකයක් දිය
යුතුයි. **6** එහෙත් සබත් අවුරුද්දේ
ඉබේ වැඩෙන පලදාව ඔබට කෑමට
ගත හැකියි. ඔබටත් ඔබේ දාසදා-
සීන්ටත් කුලීකාරයාටත් ඔබ සමඟ
ජීවත් වන විදේශිකයාටත් **7** ඔබ
ඇති කරන සතුන්ටත් වනමෘගයන්-
ටත් එයින් කන්න පුළුවන. දේශයේ
ඉබේ වැඩෙන පලදාව කෑම සඳහා
ගත හැකියි.

**8** “‘ඔබ අවුරුදු හතළිස්නවයක්
ගණන් කරන්න. එනම්, සබත් අවු-
රුදු හතක් ගණන් කළ යුතුයි.
**9** හතළිස්නවවන අවුරුද්දේ හත්-
වන මාසයේ දහවනදා[1] එනම්, සමඟි
වීමේ දවසේදී[2] ඔබ මුළු දේශය-
ටම ඇසෙන සේ හොරණෑව පිඹිය
යුතුයි.[3] **10** ඉන්පසුව පැමිණෙන
පනස්වන අවුරුද්ද ශුද්ධ අවුරුද්-
දක් ලෙස සැලකිය යුතුයි. දේශ-
යේ සියලු වැසියන්ට එම අවුරුද්දේ
නිදහස* ලැබෙන බව නිවේදනය
කරන්න.[4] එය විශේෂ# අවුරුද්දක්[5]
වන නිසා ඔබ එකිනෙකා තම තමා-
ගේ පවුල්වලටද තම තමාට උරුම
වූ ස්ථානවලටද හැරී යා යුතුයි.[6]
**11** පනස්වන අවුරුද්ද ඔබට විශේෂ
අවුරුද්දක් වන්නේය.[7] එම අවුරුද්-
දේදී ඔබේ කෙත්වල බීජ නොවපු-
රන්න. කෙත්වල ඉතුරු වූ බීජවලින්
හටගත් ධාන්‍ය කපා රැස් කර නො-
ගන්න. කප්පාදු නොකළ මිදිවැල්වල
පලද රැස් කර නොගන්න.[8] **12** එම
අවුරුද්ද විශේෂ අවුරුද්දක් වන නිසා
එය ඔබ ශුද්ධ අවුරුද්දක් ලෙස සැල-
කිය යුතුයි. දේශයේ ඉබේ වැඩෙන
පලදාව ඔබට කෑම සඳහා ගත
හැකියි.[9]

**13** “‘එම විශේෂ අවුරුද්දේදී ඔබ
එකිනෙකා තම තමාට උරුම
වූ ස්ථානවලට හැරී යා යුතුයි.[10]
**14** ඔබ ඔබේ අසල්වැසියාට ඉඩමක්
විකුණන විට හෝ ඔහුගෙන් ඉඩමක්
මිල දී ගන්නා විට හෝ අසාධා-
රණ ලෙස ක්‍රියා නොකළ යුතුයි.[1]
**15** ඔබ ඔබේ අසල්වැසියාගෙන් ඉඩ-
මක් මිල දී ගන්නා විට එහි වටිනා-
කම ගණන් බැලිය යුත්තේ විශේෂ
අවුරුද්දේ සිට ගත වී තිබෙන කාල-
යට අනුවය. ඊළඟ විශේෂ අවුරුද්-
දට තිබෙන අවුරුදු ගණනට අනුව
එනම්, අස්වැන්න ලැබීමට ඉතුරුව
තිබෙන අවුරුදු ගණනට අනුව ඔහු
එහි වටිනාකම නියම කළ යුතුයි.[2]
**16** ඉතුරුව තිබෙන අවුරුදු ගණන
වැඩි වන තරමට එහි වටිනාක-
මත් වැඩි වන්නේය.[3] නමුත් ඉතුරුව
තිබෙන අවුරුදු ගණන අඩු වන තර-
මට එහි වටිනාකමද අඩු වන්නේය.
මන්ද ඔහු විකුණන ඉඩමේ වටිනා-
කම තීරණය වන්නේ එයින් ලබා-
ගත හැකි අස්වැන්නේ ප්‍රමාණයට
අනුවය. **17** එකිනෙකාගෙන් අයුතු
ප්‍රයෝජන නොගන්න.[4] ඔබ ඔබේ
දෙවිට ගරුබිය දක්වන්න.[5] මන්ද
මා ඔබේ දෙවි වන යෙහෝවාය.[6]
**18** ඔබ මාගේ පනත්වලට කීකරු
විය යුතුයි. මාගේ තීන්දුවලට යටත්
වෙමින් ඒවා අනුව ජීවත් විය යුතුයි.
එසේ කළොත් ඔබට දේශයේ සුරක්-
ෂිතව ජීවත් විය හැකියි.[7] **19** දේශ-
යෙන් ලැබෙන පලදාවද බොහෝ
සෙයින් වැඩි වනු ඇත.[8] එවිට ඔබ
කා බී තෘප්තිමත් ජීවිතයක් භුක්ති
විඳිනු ඇත.[9]

**20** “‘“හත්වෙනි අවුරුද්දේදී අපිට
බීජ වපුරන්නවත් අස්වැන්න රැස්
කරන්නවත් බැරි නම් අපි කන්-
නේ මොනවාද”[10] කියා ඔබ කල්පනා
කරන්න පුළුවන. **21** නමුත් හය-
වන අවුරුද්දේදී මා ඔබට බහුලව
ආශීර්වාද කරන නිසා අවුරුදු තුන-
කට ඇති වන තරමට ඒ අවුරුද්-
දේදී භූමිය පලදාව උපදවන්නේය.[11]
**22** ඔබ නවවන අවුරුද්ද දක්වාම
එම අස්වැන්නෙන් කන්නහුය. අටවන
අවුරුද්දේදී ඔබ බීජ වපුරන්නහුය.
ඔබ අටවන අවුරුද්දේ අස්වැන්න

**25 පරි.**
**1** ලෙවී 23:27
**2** ලෙවී 16:30, ලෙවී 23:28
**3** ගණන් 10:2, ගණන් 10:10
**4** ගීතා 146:7, යෙසා 61:1, යෙසා 63:4, යෙරෙ 34:8, ලූක් 4:18, රෝම 8:21
**5** ලෙවී 27:17, ලෙවී 27:24
**6** ලෙවී 25:13, ගණන් 36:4, ද්වි 15:1
**7** මතෙ 12:8, මතෙ 12:12, රෝම 8:21
**8** ලෙවී 25:5
**9** නික් 23:11, ලෙවී 25:6
**10** ලෙවී 25:30, ලෙවී 27:24

**2 තීරුව**
**1** 1සාමු 12:3, හිතෝ 14:31, ආමො 5:11, මීකා 2:2, 1කොරි 6:8
**2** ලෙවී 27:18
**3** ලෙවී 27:23
**4** ලෙවී 19:13, හිතෝ 22:22, යෙරෙ 7:6
**5** උත් 20:11, උත් 22:12, ලෙවී 25:43, 1සාමු 12:24, නෙහෙ 5:9, හිතෝ 1:7, හිතෝ 8:13, ක්‍රියා 9:31
**6** යෙසා 33:22
**7** ද්වි 12:10, ගීතා 4:8, හිතෝ 1:33
**8** ලෙවී 26:5, ගීතා 67:6, එස 34:27, යෝවෙ 2:24
**9** එස 34:25
**10** ලෙවී 25:5, මතෙ 6:25
**11** උත් 26:12, ද්වි 28:8, මලා 3:10

---

ලෙවී **25:10*** දාසයන්ව නිදහස් කිරීම. **10#** සැමරිය යුතු ජුබිලි අවුරුද්දක්.

නෙළන තෙක් පරණ අස්වැන්නෙන්
කන්නහුය.
**23** "'ඔබ යමෙකුට ඉඩමක් විකු-
ණන විට ඔහුට එය අයිති වන්නේ
තාවකාලිකව[1] බව මතක තබා-
ගන්න. මන්ද දේශයේ අයිතිකරු
මමය.[2] මා ඔබව සලකන්නේ විදේශි-
කයන් ලෙසය.[3] **24** ඔබට උරුම
වන දේශයේදී යමෙකු ඉඩමක් විකුණු-
වොත් එම ඉඩම ආපසු මිල දී ගැනී-
මේ අයිතිය එම ඉඩම විකුණන
තැනැත්තා සතුයි.[4]
**25** "'දුප්පත්කම නිසා ඊශ්‍රායෙල්
ජාතිකයෙකුට තම උරුමය විකු-
ණන්න සිදු වුණොත් ඔහුගේ ළඟ
නෑයෙකු එය ඔහු වෙනුවෙන් නැවත
මිල දී ගත යුතුයි.[5] **26** යමෙකුගේ
උරුමය එලෙස නැවත මිල දී ගැනීමට
ළඟ නෑයෙකු නොසිටින්න පුළුවන.
නමුත් කල් යද්දී උරුමය නැවත මිල
දී ගැනීමට හැකි තරම් මුදලක් අයිති-
කරුම උපයාගත හැකියි. **27** එවිට
ඔහු තම ඉඩම විකුණූ දවසේ සිට ගත
වී ඇති අවුරුදු ගණන ඇතුළතදී
එයින් ලබාගත් අස්වැන්නේ වටිනා-
කම ගණන් බලා, ඉඩම විකුණූ ගණ-
නින් එම ගණන අඩු කර ඉතුරු මුදල
ඉඩම මිල දී ගත් තැනැත්තාට දිය
යුතුයි. ඉන්පසු අයිතිකරුට තම උරු-
මය නැවත ලබාගත හැකියි.[6]
**28** "'උරුමය නැවත මිල දී ගන්න
අවශ්‍ය තරම් මුදලක් ඔහුට උප-
යාගැනීමට නොහැකි වුණොත් එය
විශේෂ අවුරුද්ද දක්වාම මිල දී ගත්
තැනැත්තා සතුයි.[7] නමුත් විශේෂ
අවුරුද්දේදී එය නැවත අයිතිකරුට
ලැබෙන්නේය. ඔහුද තමාට උරුම වූ
ඉඩමට නැවත යා යුතුයි.[8]
**29** "'යමෙකු පවුරකින් වට වූ නුව-
රක පිහිටි ගෙයක් විකුණුවොත් ගෙය
විකුණූ දවසේ සිට අවුරුද්දක් යන
තෙක් ඔහුට එය නැවත මිල දී ගැනී-
මේ අයිතිය ඇත.[9] **30** නමුත් අවු-
රුද්ද ඇතුළත ඔහු එය නැවත මිල
දී නොගත්තොත් එම ගෙය මිල
දී ගත් තැනැත්තාට සහ ඔහුගෙන්
පැවතෙන්නන්ට හැමදාටම අයිති
වන්නේය. විශේෂ අවුරුද්දේදී එය මුද-
වාගත නොහැකියි. **31** නමුත් පවු-
රකින් වට නොවූ ඉඩම්වල පිහිටි
ගෙවල් කෙතේම කොටසක් ලෙස
සැලකිය යුතුයි. එවැනි ගෙයක් විකු-
ණුවොත් එය ආපසු මිල දී ගැනීමට
අයිතියක් තිබේ.[1] විශේෂ අවුරුද්දේදී[2]
එය නැවත මිල දී ගත හැකියි.
**32** "'ලෙවීවරුන් තමන්ට අයිති
නුවරවල පිහිටි ගෙවල් විකුණුවොත්[3]
ඒවා නැවත මිල දී ගැනීමේ අයිතිය
හැමදාටම ඔවුන් සතුයි.[4] **33** ලෙවී-
වරුන්ට අයිති නුවරක පිහිටි ගෙයක්
නැවත මිල දී නොගත්තොත් විශේෂ
අවුරුද්දේදී එය නැවත අයිතිකරුට
ලැබෙන්නේය.[5] මන්ද ලෙවීවරුන්ට
අයිති නුවරවල පිහිටි නිවෙස් ඊශ්‍රා-
යෙල් සෙනඟ අතරේ ඔවුන්ට ලැබෙන
උරුමයකි.[6] **34** ඔවුන්ගේ නුවරවල
තිබෙන තණබිම්[7] කිසිවිටෙකත් විකි-
ණිය නොහැක. මන්ද ඒවා හැමදාටම
ඔවුන්ට උරුම වන්නේය.
**35** "'යම් ඊශ්‍රායෙල් ජාතිකයෙකු
වියහියදම් දරාගන්න බැරි තරමටම
දුප්පත් වුණොත්[8] ඔබ ඔහුව රැකබලා
ගත යුතුයි.[9] ඔබ විදේශිකයෙකුට
උපකාර කරන්නාක් මෙන්[10] ඔහුටද
උපකාර කළ යුතුයි. ඔහුට දිගටම
ඔබ අතරේ වාසය කිරීමට හැකි වන
පිණිස එසේ කරන්න. **36** ඔහුගෙන්
ලාභයක් උපයා නොගන්න. ඔහුගෙන්
පොලීද අය නොකරන්න.[11] ඔහුට
ඔබ අතරේ ජීවත් වීමට ඉඩහරින්න.
ඔබ ඔබේ දෙවිට ගරුබිය දැක්-
විය යුතුයි.[12] **37** ඔබේ මුදල් ඔහුට
පොලියට නොදෙන්න.[13] ලාභයක්
උපයාගන්නා අදහසින් ඔහුට කෑම
නොවිකුණන්න. **38** ඔබට කානාන්
දේශය දෙන පිණිස ඔබව ඊජිප්තු දේ-
ශයෙන් පිටතට ගෙනා මා, ඔබේ දෙවි
වන යෙහෝවාය.[14] මම ඔබේ දෙවි
බව ඔබට ඔප්පු කර පෙන්වන පිණිස
එසේ කළෙමි.[15]
**39** "'යම් ඊශ්‍රායෙල් ජාතිකයෙකු
දුගී තත්වයට වැටී ඔබ ළඟට ඇවිත්

**25 පරි.**
1 1රාජා 21:3
එස 48:14
2 2ලේක 7:20
ගීතා 24:1
ගීතා 85:1
යෝවෙ 2:18
3 1ලේක 29:15
ගීතා 39:12
1පේතෘ 2:11
4 ලෙවී 25:51
5 රූත් 2:20
රූත් 4:4
රූත් 4:6
යෙරෙ 32:7
6 ලෙවී 25:50
7 ලෙවී 25:10
ලෙවී 25:13
ලෙවී 27:24
8 ලෙවී 25:10
9 ලෙවී 25:25
ලෙවී 25:51

**2 තීරුව**
1 ලෙවී 25:48
2 ලෙවී 25:10
3 ගණන් 35:2
ගණන් 35:8
යොෂු 21:2
4 යෙරෙ 32:8
5 ලෙවී 25:28
6 ගණන් 18:20
ගණන් 35:4
ද්වි 18:1
7 ගණන් 35:7
යොෂු 14:4
යොෂු 21:2
8 ලෙවී 25:25
ද්වි 15:7
ගීතා 41:1
හිතෝ 14:20
හිතෝ 17:5
හිතෝ 19:17
මාක් 14:7
9 ගීතා 37:26
ගීතා 112:5
හිතෝ 3:27
හිතෝ 14:31
ලූක් 6:35
ක්‍රියා 11:29
1තිමෝ 6:18
1යොහ 3:17
10 නික් 22:21
නික් 23:9
ලෙවී 19:34
ද්වි 10:18
11 නික් 22:25
ද්වි 23:19
නෙහෙ 5:7
ගීතා 15:5
හිතෝ 28:8
එස 18:13
12 ගීතා 89:7
හිතෝ 8:13
හෙබ්‍රෙ 12:28
13 ද්වි 23:20
නෙහෙ 5:10
ලූක් 6:35
14 නික් 20:2
1රාජා 8:51
15 නික් 6:7
ගණන් 15:41

තමාවම දාසකමට විකුණුවොත්[1]
ඔබ ඔහුට කුරිරු ලෙස නොසැල-
කිය යුතුයි.[2] 40 ඔබ සමඟ සිටින
කුලීකාරයෙකුට[3] හෝ විදේශිකයෙ-
කුට හෝ සලකන ආකාරයට ඔබ
ඔහුට සැලකිය යුතුයි. විශේෂ අවු-
රුද්ද දක්වා ඔහු ඔබට සේවය කළ
යුතුයි. 41 ඉන්පසු ඔහුවත් ඔහු-
ගේ පුත්‍රයන්වත් ඔබ නිදහස් කළ
යුතුයි. එවිට තම පවුල වෙත-
ටත් තමාට පරම්පරාවෙන් උරුම
වූ ස්ථානය වෙතටත් ඔහුට
නැවත යා හැකියි.[4] 42 ඊශ්‍රායෙල්
ජාතිකයන් වහලුන් ලෙස තමන්-
වම විකුණා නොගත යුතුයි. මන්ද
ඔවුන් මා ඊජිප්තු දේශයෙන් පිටතට
ගෙනා මාගේ දාසයන්ය.[5] 43 තමා-
වම විකුණූ සහෝදරයෙකුගෙන් ඔබ
කුරිරු ලෙස වැඩ නොගත යුතුයි.[6]
ඔබ ඔබේ දෙවිට ගරුබිය දක්වන්න.[7]
44 ඔබට දාසදාසීන්ව අවශ්‍ය නම්
අවට ජාතීන්ගෙන් ඔවුන්ව මිල දී ගත
යුතුයි. 45 ඔබ සමඟ ජීවත් වන
විදේශිකයන්ගේ පුත්‍රයන්ව[8] දාසයන්
ලෙස ඔබට මිල දී ගත හැකියි. ඔබේ
දේශයේදී ඔවුන්ට උපන් දරුවන්වද
ඔබට මිල දී ගත හැකියි. ඔවුහු ඔබට
අයිති වන්නෝය. 46 ඔවුන්ව ඔබේ
දාසයන් කරගත හැකියි. ඔබෙන්
පසුව ඔබේ දරුවන්ටද උරුමයක්
ලෙස ඔවුන්ව දිය යුතුයි. ඔවුහු ජීවත්
වන තාක් කල් ඔබේ දරුවන්ට අයිති
වන්නෝය.[9] නමුත් ඔබේ සහෝදර-
යන් වන ඊශ්‍රායෙල් සෙනඟගෙන් කිසි-
වෙකුව එලෙස යටත් කර නොගන්න.
ඔවුන්ගෙන් කුරිරු ලෙස වැඩ නො-
ගන්න.[10]

47 “ ‘ඔබ සමඟ ජීවත් වන විදේශි-
කයෙකු හෝ ඔහුගේ පවුලේ කෙ-
නෙකු හෝ කල් යත්ම ධනවත් විය
හැක. දුගී තත්වයට පත් වූ ඊශ්‍රා-
යෙල් ජාතිකයෙකු එලෙස ධනවත් වූ
විදේශිකයෙකු වෙතට ගොස් තමාවම
දාසකමට විකුණුවොත් 48 ඔබට
මුදල් ගෙවා ඔහුව මුදවාගැනීමට පුළු-
වන.[11] ඔහුව මුදවාගැනීමට ඔහුගේ
සහෝදරයෙකුට හැකියි.[1] 49 ඔහු-
ගේ මවගේ හෝ පියාගේ හෝ සහෝද-
රයෙකුට හෝ ඥාති සහෝදරයෙකුට
හෝ වෙන ඕනෑම ලේ නෑයෙකුට[2]
හෝ ඔහුව මුදවාගත හැකියි.

“ ‘ඒ තැනැත්තාම තමාට අවශ්‍ය
මුදල් ප්‍රමාණය උපයාගත්තොත් ඒ
මුදල ගෙවා ඔහුට නිදහස් වී යා
හැකියි.[3] 50 ඔහුද ඔහුව මිල දී ගත්
තැනැත්තාද ඔහුව විකුණූ අවුරුද්දේ
සිට විශේෂ අවුරුද්ද[4] දක්වා තිබෙන
අවුරුදු ගණන ගණන් කර බැලිය
යුතුයි. ඔහු ගෙවිය යුතු මුදල තීරණය
වන්නේ එම අවුරුදු ගණනට අනු-
වය.[5] සේවය සඳහා ගනු ලබන කුලී-
කාරයෙකුට මෙන් ඔහුටද සැලකිය
යුතුයි.[6] 51 විශේෂ අවුරුද්ද දක්වා
බොහෝ අවුරුදු ගණනක් ඉතුරුව
තිබෙනවා නම් ඔහුව මුදවාගැනීමට
ගෙවිය යුතු මුදල් ප්‍රමාණය ඒ අවුරුදු
ගණන අනුව තීරණය කළ යුතුයි.
ඉතුරුව තිබෙන අවුරුදු ගණන සඳහා
ඔහුව මිල දී ගත් තැනැත්තාට මුදල්
ගෙවා ඔහුට නිදහස් විය හැකියි.
52 විශේෂ අවුරුද්ද[7] දක්වා කෙටි
කාලයක් ඉතුරුව තිබෙනවා නම්
ඔහුව මුදවාගැනීමට ගෙවිය යුතු
මුදල් ප්‍රමාණය ඒ කෙටි කාලයට
අනුව තීරණය කළ යුතුයි. ඉතු-
රුව තිබෙන අවුරුදු ගණන සඳහා
ඔහුව මිල දී ගත් තැනැත්තාට මුදල්
ගෙවා ඔහුට නිදහස් විය හැකියි.
53 තමාවම විකුණූ ඊශ්‍රායෙල් ජාති-
කයෙකුගෙන් කුරිරු[8] ලෙස වැඩ නො-
ගත යුතුයි. අවුරුද්දක් අවුරුද්දක්
පාසා සේවය සඳහා ගනු ලබන කුලී-
කාරයෙකුට[9] මෙන් ඔහුටද සැල-
කිය යුතුයි. 54 ඉහත සඳහන් කළ
කොන්දේසිවලට අනුව ඔහුට තමා-
වම මුදවාගත නොහැකි වුණොත්
විශේෂ අවුරුද්දේදී[10] ඔහුත් ඔහුගේ
පුත්‍රයනුත් නිදහස් වනු ඇත.

55 “ ‘ඊජිප්තු දේශයෙන් මා පිට-
තට ගෙනා[11] ඊශ්‍රායෙල් සෙනඟ මගේ
දාසයෝය.[12] මා ඔබේ දෙවි වන යෙ-
හෝවාය.[13]

**25 පරි.**
1 නික් 21:2, ද්වි 15:12, 2රාජා 4:1, නෙහෙ 5:5
2 නික් 1:14
3 ලෙවී 25:53, 1රාජා 9:22
4 නික් 21:3, ලෙවී 25:10
5 නික් 19:5, ලෙවී 25:55
6 නික් 1:13, නික් 3:7, යෙසා 47:6, එෆී 6:9, කොලො 4:1
7 නික් 1:17, ලෙවී 25:17, දේශ 12:13
8 නික් 12:38, යොෂු 9:21
9 යෙසා 14:2
10 ලෙවී 25:39, ලෙවී 25:43
11 ලෙවී 25:25, නෙහෙ 5:5

**2 තීරුව**
1 නෙහෙ 5:8
2 රූත් 2:20
3 ලෙවී 25:26, 1කොරි 7:21
4 ලෙවී 25:10, ලෙවී 25:16
5 ලෙවී 25:27
6 ද්වි 15:18, යෙසා 16:14, යෙසා 21:16
7 ලෙවී 25:16, ලෙවී 27:18
8 ලෙවී 25:43, කොලො 4:1
9 ලෙවී 25:40
10 නික් 21:3, ලෙවී 25:40
11 නික් 13:3, නික් 20:2, ලූක් 1:74
12 ලෙවී 25:42
13 ද්වි 1:21, යොෂු 1:9

26 “ ‘වැදගැම්මකට නැති දෙවි-
වරුන්ව සාදා නොගන්න.[1]
නමස්කාර කරන පිළිමස රූප[2] හෝ
කුලුනු හෝ සාදා නොගන්න. කැට-
යම් කළ ගල් රූප ඔබේ දේශ-
යේ ඉදි නොකරන්න.[3] ඒවා ඉදිරියේ
වැඳ නොවැටෙන්න.[4] මන්ද මා ඔබේ
දෙවි වන යෙහෝවාය. 2 මා නියම
කළ සබත් දිනයන් ඔබ පැවැත්විය
යුතුයි.[5] මගේ ශුද්ධස්ථානයට ගරු-
බිය දැක්විය යුතුයි. මා යෙහෝවා
දෙවිය.

3 “ ‘ඔබ මගේ ආඥාවලට කීකරු
වෙමින් මගේ පනත්වලට අනුව ජීවත්
වුණොත්[6] 4 මම නියම කලට ඔබේ
දේශය පිට වැසි වස්සවන්නෙමි.[7]
ඉතා සාරවත් අස්වැන්නක් භූමියෙන්
ඔබට ලැබෙන්නේය.[8] කෙත්වල ගස්ද
බොහෝ පල දරන්නේය.[9] 5 මිදි
අස්වැන්න එකතු කරන කාලය දක්-
වාම ඔබ ධාන්‍ය පාහිනවා ඇත.
බීජ වපුරන කාලය දක්වාම ඔබ
මිදි අස්වැන්න එකතු කරනවා ඇත.
ඔබට කෑමෙන් කිසි හිඟයක් නොවන්-
නේය.[10] ඔබ ඔබේ දේශයේ සුරක්ෂි-
තව ජීවත් වන්නහුය.[11] 6 මම ඔබේ
දේශය පුරා සමාදානය ඇති කරන්-
නෙමි.[12] ඔබ කිසිවෙකුට බිය නොවී
සැනසීමෙන් නිදාගන්නහුය.[13] මම
නපුරු වනමෘගයන්ව ඔබේ දේශයෙන්
පන්නා දමන්නෙමි.[14] ඔබේ දේශයේ
යුද්ධ ඇති නොවන්නේය.[15] 7 ඔබ
ඔබේ සතුරන්ව පන්නා දමන්නහුය.[16]
ඔබ සැබවින්ම ඔවුන්ව කඩුවෙන් මරා
දමන්නහුය. 8 ඔබෙන් පස්දෙනෙක්
සතුරන් සියදෙනෙකුවද ඔබෙන් සිය-
දෙනෙක් සතුරන් දසදහස්දෙනෙකුවද
පන්නා දමන්නහුය. සැබවින්ම ඔබ
ඔවුන්ව කඩුවෙන් මරා දමන්නහුය.[17]

9 “ ‘මම ඔබට ආශීර්වාද කරන්-
නෙමි.[18] ඔබට බොහෝ දරු
සම්පත් ලබා දී ඔබේ ජාතිය ගුණ-
නින් වැඩි කරන්නෙමි.[19] මෙසේ, මම
ඔබ සමඟ ඇති කරගත් ගිවිසුම
ඉටු කරන්නෙමි.[20] 10 ඔබේ අස්-
වැන්න කොතරම්ද කියා කීවොත්

**26 පරි.**

**1** නික් 20:4
ලෙවී 19:4
ගීතා 96:5
ක්‍රියා 17:29
1කොරි 8:4
**2** ද්වි 5:8
**3** ගණන් 33:52
**4** දානි 3:18
1කොරි 10:14
**5** ලෙවී 19:30
**6** ද්වි 11:13
දේශ 12:13
යෙසා 48:18
**7** ද්වි 28:12
යෙසා 30:23
එස 34:26
යෝවෙ 2:23
ආමො 4:7
**8** ගීතා 67:6
ගීතා 85:12
සෙක 8:12
**9** එස 34:27
එස 36:30
**10** ද්වි 11:15
යෝවෙ 2:19
**11** ලෙවී 25:18
හිතෝ 1:33
යෙරෙ 23:6
**12** 1ලේක 22:9
ගීතා 29:11
හග් 2:9
පිලි 4:9
**13** යෝබ් 11:19
ගීතා 4:8
යෙරෙ 30:10
මීකා 4:4
**14** 2රාජා 17:26
**15** එස 14:17
**16** ගීතා 18:37
**17** ද්වි 28:7
ද්වි 32:30
යොෂු 23:10
විනි 7:16
විනි 15:15
1ලේක 11:20
**18** නික් 2:25
2රාජා 13:23
**19** ද්වි 28:4
නෙහෙ 9:23
ගීතා 107:38
**20** නික් 6:4

**2 තීරුව**

**1** ලෙවී 25:22
**2** නික් 25:8
යොෂු 22:19
එස 37:26
එළි 21:3
**3** ලෙවී 20:23
යෙරෙ 14:21
**4** නික් 6:7
ද්වි 23:14
2කොරි 6:16
**5** යෙරෙ 7:23
එස 11:20
**6** නික් 20:2
ලෙවී 25:38
යෙරෙ 11:4
**7** යෙරෙ 2:20
**8** ද්වි 28:15
මලා 2:2

එක අවුරුද්දක අස්වැන්න නෙළන
විට කලින් අවුරුද්දේ අස්වැන්න[1] ඒ
වන විටත් ඉතුරුව තිබෙනු ඇත.
11 මම සැබවින්ම මාගේ ශුද්ධ කූඩා-
රම ඔබ අතරේ පිහිටුවන්නෙමි.[2]
මම ඔබට ද්වේෂ නොකරන්නෙමි.[3]
12 මම ඔබ සමඟ සිට ඔබේ දෙවි
වන්නෙමි.[4] ඔබද මගේ සෙනඟ වන්-
නහුය.[5] 13 ඔබ වහල්ව සිටි ඊජිප්තු
දේශයෙන් ඔබව පිටතට ගෙනා මා,
ඔබේ දෙවි වන යෙහෝවාය.[6] ඔබ
පිට තිබූ වියගහ අහක් කර ඔබට කෙ-
ළින් සිටගන්න සැලැස්වූවේ මමය.[7]

14 “ ‘ඔබ මට සවන් නොදී මගේ
සියලු ආඥාවලට කීකරු නොවු-
ණොත්[8] 15 එනම්, මගේ ගිවිසුම
කඩ කරන තරමටම මගේ තීන්දු
හෙළාදකිමින්[9] මගේ සියලු අණප-
නත් ප්‍රතික්ෂේප කළොත්[10] 16 මම
ඔබට මෙසේ කරන්නෙමි. මම ඔබට
දඬුවම් කරන්නෙමි. ඔබේ පෙනීම දුර්-
වල වන තරමටද[11] ශරීර ශක්තිය
හීන වන තරමටද[12] ක්ෂය රෝගය[13]
සහ තද උණ ඔබ පිට ගෙනෙන්නෙමි.
ඔබ එයින් බොහෝ සේ කැලඹෙන්න-
හුය. ඔබ කිසි පලක් නැතුව බීජ
වපුරන්නහුය. මන්ද ඔබේ සතුරෝ
ඔබ වැපුරූ සියල්ල කන්නෝය.[14]
17 මම ඔබට විරුද්ධව ක්‍රියා කරන්-
නෙමි. ඔබ ඔබේ සතුරන්ගේ අතින්
පරාජයට පත් වන්නහුය.[15] ඔබට
වෛර කරන්නෝ ඔබව පාගා දමන්-
නෝය.[16] කිසිවෙකු ඔබ පසුපස ලුහු-
බැඳ ආවේ නැතත් ඔබ බයෙන් පලා
යන්නහුය.[17]

18 “ ‘ඉන්පසුත් ඔබ මට සවන්
නොදෙන්නේ නම් ඔබ කළ පාප නිසා
පෙරට වඩා හත් ගුණයක් වැඩි-
යෙන් මම ඔබට දඬුවම් කරන්නෙමි.[18]
19 මම ඔබේ උද්ධච්චකම පහත්
කරන්නෙමි. අහස යකඩ[19] මෙන්ද

**9** නික් 24:7; ද්වි 31:16; යෙරෙ 11:10; හෙබ්‍රෙ 8:9; **10** 2රාජා 17:15; යෙරෙ 13:10; **11** 1සාමු 2:33; **12** එස 33:10; **13** ද්වි 28:22; **14** ද්වි 28:33; විනි 6:3; **15** ද්වි 28:25; විනි 2:14; 1සාමු 4:10; විලා 2:17; **16** ගීතා 106:41; විලා 1:5; **17** ලෙවී 26:36; හිතෝ 28:1; **18** ලෙවී 26:21; ගීතා 76:7; ගීතා 79:12; **19** ද්වි 11:17; 1රාජා 17:1.

භූමිය පිත්තල මෙන්ද වියළෙන්න
සලස්වන්නෙමි. **20** ඔබ නිකරු-
ණේ ඔබේ ශක්තිය වැය කරන්-
නහුය. මන්ද භූමියෙන් අස්වැන්න
ඔබට නොලැබෙන්නේය.[1] කෙත්වතු-
වල ගස්ද පල නොදරන්නේය.[2]

**21** "'එසේ සිදු වූ පසුත් ඔබ මට
විරුද්ධ වෙමින් මට සවන් නොදුන්-
නොත් මම ඔබේ පව්වලට සුදුසු ලෙස
දඬුවම් දෙමින් ඔබ පිට ගෙන එන
පීඩා තව හත් ගුණයකින් වැඩි කරන්-
නෙමි.[3] **22** මම වනමෘගයන්ව ඔබ
අතරට එවන්නෙමි.[4] උන් ඔබේ දරු-
වන්ව මරා[5] ඔබ ඇති කරන සතුන්ව
විනාශ කර දමන්නෝය. ඔබේ දේශ-
යේ මාවත් පාළු වන තරමටම ජනග-
හනය අඩු වන්නේය.[6]

**23** "'ඔබ මෙලෙස දඬුවම් විඳී-
මෙන් පසුත් මගේ හික්මවීම් පිළි
නොගෙන[7] දිගටම මුරණ්ඩු ලෙස මට
විරුද්ධව ක්‍රියා කළොත් **24** මමද
ඔබට විරුද්ධව ක්‍රියා කරන්නෙමි.[8]
ඔබ කළ පාපවලට මම ඔබට හත්
වරක් දඬුවම් කරන්නෙමි.[9] **25** ඔබ
මගේ ගිවිසුම[10] කඩ කළ බැවින් මම
ඔබට නිසි ලෙස දඬුවම් කර ඔබට
කඩුවෙන් පහර දෙන්නෙමි.[11] ඔබ
ඔබේ නුවරවල සැඟවී සිටියත් මම
ඔබට වසංගතවලින්[12] පහර දී ඔබේ
සතුරන් අතට ඔබව හසු කර දෙන්-
නෙමි.[13] **26** මම ඔබේ ආහාර ගබ-
ඩාවන්* විනාශ කර දමන්නෙමි.[14]
එවිට ස්ත්‍රීහු දසදෙනෙක් එක උදු-
නක රොටි පුලුස්සන්නෝය. ඔවුහු
ඔබ එක් එක් කෙනාට ඔබේ කෑම
පංගුව කිරා දෙන්නෝය.[15] ඔබ ඒවා
කෑවත් තෘප්තියට පත් වන්නේ
නැත.[16]

**27** "'එහෙත් මේ සියල්ලෙන්
පසුත් ඔබ මට සවන් නොදී මුරණ්ඩු
ලෙස දිගටම මට විරුද්ධව ගමන්
කළොත්[17] **28** මමද මහත් කෝප-
යෙන් යුක්තව ඔබට විරුද්ධව පියවර
ගන්නෙමි.[1] ඔබ කළ පාපවලට මම
ඔබට සත් වරක් දඬුවම් කරන්නෙමි.[2]
**29** එවිට ඔබ ඔබේම පුත්‍රයන්-
ගේද දූවරුන්ගේද මාංස කන්නහුය.[3]
**30** මම ඔබේ පූජනීය ස්ථාන* සහමු-
លින්ම විනාශ කර[4] සුවඳ දුම් ඔප්පු
කරන පූජාසන කඩා දමන්නෙමි.
ඔබ සෑදූ පිළිකුල් රූප# සුනුවි-
සුනු කර ඔබේ මළ කඳන්ද ඒවා
මතට විසි කරන්නෙමි.[5] මම ඔබව
මුළුමනින්ම ප්‍රතික්ෂේප කරන්නෙමි.[6]
**31** මම ඔබේ නුවරවල් කඩුවෙන්
විනාශ වන්න ඉඩහැර[7] ඔබේ ශුද්ධ-
ස්ථාන පාළු කරන්නෙමි.[8] ප්‍රසන්න
සුවඳක් ගෙනෙන පිණිස ඔබ මට
ඔප්පු කරන පූජා මම පිළි නොගන්-
නෙමි.[9] **32** මම ඔබේ මුළු දේශ-
යම පාළු කරන්නෙමි.[10] ඔබේ දේශය
අයිති කරගන්නාවූ ඔබේ සතුරෝ
ඔබේ දේශයට සිදු වන දෙය දැක
පුදුම වන්නෝය.[11] **33** මම ඔබව
ජාතීන් අතරේ විසුරුවාහරින්නෙමි.[12]
මම කඩුවක් පිටතට ගෙන එය
ඔබ පසුපස ලුහුබැඳ යෑමට සලස්-
වන්නෙමි.[13] ඔබේ නුවරවල් නටබුන්
ගොඩක් කර ඔබේ මුළු දේශයම පාළු
කරන්නෙමි.[14]

**34** "'එසේ දේශය පාළුව තිබෙන
සියලු දවස්වලදී එයට විවේකයක්
ලැබෙනු ඇත. ඔබ සතුරන්ගේ දේශ-
යේ සිටින ඒ කාලයේදී, ඔබ කලින්
නොපැවැත්වූ සෑම සබතක් වෙනු-
වෙන්ම දේශය විවේක ගනු ඇත.[15]
**35** ඔබ දේශයේ ජීවත් වූ කාලයේදී
ඔබට නියම කළ සබත් දිනයන්
නොපැවැත්වූ බැවින් දේශය පාළුව
තිබෙන සියලු දවස්වලදී එය විවේක
ගනු ඇත.

**36** "'ඔබ අතරින් දිවි ගලවා-
ගන්නා අය[16] සතුරන්ගේ දේශයේ

---

ලෙවී **26:26*** මූ.අ., "ඔබ රොටි එල්ලා තබන ලීය."

**11** ද්වි 28:37; යෙරෙ 18:16; විලා 2:15; එස 5:15; **12** ගීතා 44:11; යෙරෙ 9:16; **13** එස 12:14; **14** යෙරෙ 9:11; සෙක 7:14; **15** 2ලේක 36:21; **16** යෙසා 24:6.

ලෙවී **26:30*** බොරු දෙවිවරුන්ට නමස්කාර කිරීම සඳහා ඉදි කළ ස්ථාන. **30#** මුල් භාෂාවේ භාවිත කර ඇත්තේ ගොම රූප කියාය.

**26 පරි.**
**1** යෙරෙ 12:13 හග් 1:6
**2** ද්වි 11:17 ද්වි 28:18 හග් 1:10
**3** ලෙවී 26:18
**4** ද්වි 32:24 2රාජා 17:25 යෙරෙ 15:3
**5** 2රාජා 2:24 එස 5:17
**6** විනි 5:6 යෙසා 33:8 එස 14:15 සෙක 7:14
**7** යෙසා 1:16 යෙරෙ 2:30 යෙරෙ 5:3 හෙබ්‍රෙ 12:6
**8** යෝබ් 9:4 ගීතා 18:26
**9** ලෙවී 26:18
**10** නික් 24:7
**11** එස 6:9 හෙබ්‍රෙ 10:30
**12** ද්වි 28:21 2සාමු 24:15 යෙරෙ 24:10 ආමො 4:10
**13** විනි 2:14 1සාමු 4:10
**14** ගීතා 105:16 එස 5:16
**15** එස 4:16
**16** යෙසා 9:20 මීකා 6:14 හග් 1:6
**17** ලෙවී 26:21

**2 තීරුව**
**1** යෙසා 59:18 යෙරෙ 21:5
**2** ලෙවී 26:18 ලෙවී 26:21
**3** ද්වි 28:53 2රාජා 6:29 යෙරෙ 19:9 විලා 2:20 විලා 4:10 එස 5:10
**4** 1රාජා 13:2 2රාජා 23:8 2ලේක 34:3 යෙසා 27:9
**5** 2රාජා 23:20 යෙරෙ 16:18 එස 6:5
**6** ගීතා 78:59
**7** 2රාජා 25:9 2ලේක 36:17 නෙහෙ 2:3 යෙසා 1:7 යෙරෙ 4:7
**8** ගීතා 74:7 යෙරෙ 52:13 විලා 1:10 මාක් 13:2
**9** උත් 8:21
**10** ද්වි 29:23 යෙරෙ 9:11 ලූක් 21:20

බියෙන් ජීවත් වන්නෝය. සුළඟේ
පාවී යන කොළයක ශබ්දයකට
පවා ඔවුහු තිගැස්සී පලා දුවන්-
නෝය. කිසිවෙකු ඔවුන් පසුපස ලුහු-
බැඳ නොගියත් කඩු අතැති අය
ඔවුන් පසුපස එන්නාක් මෙන් ඔවුහු
පලා යන්නෝය.[1] **37** සතුරන් කඩු
අතැතිව ඔවුන් පසුපස එළවාගෙන
එන්නාක් මෙන් ඔවුහු පලා දුවන්-
නෝය. කිසිවෙකු ඔවුන්ව ලුහුබැඳ
නාවත් ඔවුහු කලබල වී ඒ මේ
අත දුව ගොස් වැටෙන්නෝය. ඔබේ
සතුරන්ට විරුද්ධව සටන් කිරීමට
ඔබට කිසි ශක්තියක් නොතිබෙනු
ඇත.[2] **38** වෙනත් ජාතීන්ගේ දේ-
ශයකදී ඔබ මිය යන්නහුය.[3] ඔබේ
සතුරන්ගේ දේශයේදී ඔබ විනාශ
වී යනු ඇත. **39** ඔබ අතරෙන්
බේරී ජීවත් වන අය ඔවුන්ගේ පාප
නිසාද ඔවුන්ගේ පියවරුන්ගේ පාප
නිසාද[4] සතුරන්ගේ දේශයේදී කුණු
වී යන්නෝය.[5] ඔවුන්ගේ පියවරුන්
මෙන් ඔවුහුද කුණු වී යන්නෝය.
**40** එවිට ඔවුන්ද ඔවුන්ගේ පියව-
රුන්ද මට ද්‍රෝහි වෙමින් මට විරුද්-
ධව පව් කළ බව ඔවුහු පිළිගනිති.[6]
**41** මා ඔවුන්ට විරුද්ධව ක්‍රියා කර[7]
සතුරන්ගේ දේශයට[8] ඔවුන්ව ගෙන
ගියේ ඔවුන් මට විරුද්ධව ක්‍රියා කළ
නිසයි.

“ ‘මා ඔවුන්ට එලෙස දඬුවම් කළේ
එවිටවත් ඔවුන් තම දැඩි සිත්*[9] වෙ-
නස් කරගෙන යටහත්පහත්[10] ලෙස
තම වරද පිළිගනියි කියා සිතූ නිසයි.
**42** මම යාකොබ් සමඟ කළ ගිවි-
සුම සිහි කරන්නෙමි.[11] ඊසාක් සමඟ
කළ මගේ ගිවිසුමද[12] ආබ්‍රහම් සමඟ
කළ මගේ ගිවිසුමද[13] සිහි කරන්-
නෙමි. දේශයද මම සිහි කරන්නෙමි.
**43** ඔවුන් දේශය අත්හැර දමා යන ඒ
මුළු කාලය පුරාම ඔවුන් නොපැ-
වැත්වූ සබත්[14] දිනයන් වෙනුවෙන්
දේශය විවේක ගනු ඇත. ඔවුන් මගේ
තීන්දු ප්‍රතික්ෂේප කරමින්[15] මගේ
අණපනත් හෙළාදුටු නිසා[1] දේශය
පාළුවට ගොස් තිබෙන ඒ කාලයේදී
ඔවුහුද තම වරදට වන්දි ගෙවනු
ඇත.[2] **44** නමුත් සතුරන්ගේ දේශ-
යේ ඔවුන් ජීවත් වන කාලයේදී මා
ඔවුන් සමඟ ඇති කරගත් ගිවිසුම
කඩ කරන තරමට[3] මම ඔවුන්ට
ද්වේෂ කරන්නේවත්[4] ඔවුන්ව අත්-
හරින්නේවත්[5] නැත. මම ඔවුන්ව
සහමුලින්ම විනාශ නොකරන්නෙමි.
මන්ද මා ඔවුන්ගේ දෙවි වන යෙහෝ-
වාය. **45** මා ඔවුන්ගේ දෙවි බව
ඔප්පු කර පෙන්වන පිණිස මම ඔවුන්-
ගේ මුතුන්මිත්තන්ව ජාතීන් ඉදිරි-
යේ ඊජිප්තු දේශයෙන් පිටතට ගෙන
ආවෙමි.[6] මම ඔවුන්ගේ මුතුන්මිත්-
තන් සමඟ කළ ගිවිසුම[7] සිහි කරන්-
නෙමි. මා යෙහෝවා දෙවිය.’ ”

**46** යෙහෝවා දෙවි මෝසෙස් මාර්-
ගයෙන් සීනයි කන්දේදී ඊශ්‍රායෙල් සෙ-
නඟට දුන් නීතිද නියෝගද[8] තීන්දුද[9]
ඒවාය.

**27** යෙහෝවා දෙවි මෝසෙස්ට
තවදුරටත් මෙසේ කීවේය.
**2** “ඊශ්‍රායෙල් සෙනඟට මෙසේ
කියන්න. ‘මිනිසෙකු තමාවම හෝ
වෙන යම් කෙනෙකුව හෝ යෙහෝවා
දෙවි වන මට විශේෂ භාරයක්[10]
ලෙස දුන්නොත් එම භාරයේ වටි-
නාකම නියම කළ යුත්තේ මෙ-
ලෙසය. **3** වයස අවුරුදු විස්සත්
හැටත් අතර සිටින පුරුෂයෙකු-
ගේ වටිනාකම රිදී ෂෙකෙල් පන-
හක් ලෙස නියම කරන්න. ඒ එක්
එක් ෂෙකෙලයේ බර ශුද්ධස්ථානයේ
තිබෙන ෂෙකෙලයේ බරට සමාන
විය යුතුයි. **4** භාරය පිණිස දෙන
එම වයසේම ස්ත්‍රියකගේ වටිනා-
කම ෂෙකෙල් තිහක් ලෙස නියම
කරන්න. **5** අවුරුදු පහත් විස්සත්
අතර වයසැති පිරිමි කෙනෙකුගේ
වටිනාකම ෂෙකෙල් විස්සක් ලෙසත්
ගැහැනු කෙනෙකුගේ වටිනාකම ෂෙ-
කෙල් දහයක් ලෙසත් නියම කරන්න.
**6** මාසයත් අවුරුදු පහත් අතර වය-

ලෙවී **26:41*** මූ.අ., “අචර්මච්ඡේදිත සිත්.”

**26 පරි.**

**1** ලෙවී 26:17 හිතෝ 28:1 යෙසා 30:17 එස 21:7
**2** යොෂු 7:12 විනි 2:14 යෙසා 10:4 යෙරෙ 37:10
**3** ද්වි 4:27 ද්වි 28:48 යෙරෙ 42:17
**4** නික් 20:5 ගණන් 14:18 ද්වි 5:9
**5** ද්වි 4:27 ද්වි 28:65 එස 6:9
**6** 1රාජා 8:33 නෙහෙ 9:2 යෙරෙ 31:19 එස 36:31 දානි 9:5
**7** ලෙවී 26:24
**8** 1රාජා 8:47 2ලේක 36:20
**9** ද්වි 30:6 යෙරෙ 4:4 යෙරෙ 9:26 එස 44:7 ක්‍රියා 7:51 රෝම 2:29
**10** 2ලේක 12:7
**11** උත් 28:13 ගණන් 32:11
**12** උත් 26:3
**13** උත් 12:7 නික් 2:24 ද්වි 4:31 ගීතා 106:45 ලූක් 1:72
**14** ලෙවී 26:34 2ලේක 36:21
**15** 2රාජා 17:15

**2 තීරුව**

**1** ලෙවී 26:15
**2** ලෙවී 26:41 ගණන් 14:34
**3** ද්වි 4:13 යෙරෙ 14:21
**4** ලෙවී 26:11
**5** ද්වි 4:31 2රාජා 13:23 නෙහෙ 9:31 රෝම 11:2
**6** ගීතා 98:2 එස 20:9
**7** නික් 24:3 නික් 24:8 ද්වි 9:9
**8** ලෙවී 27:34 යොහ 1:17
**9** ද්වි 6:1

**27 පරි.**

**10** ගණන් 6:2 ද්වි 23:21 විනි 11:30 1සාමු 1:11 දේශ 5:4

සැති පුත්‍රයකුගේ වටිනාකම රිදී ෂෙ-
කෙල් පහක්[1] ලෙසත් දියණියකගේ
වටිනාකම රිදී ෂෙකෙල් තුනක් ලෙ-
සත් නියම කරන්න.
**7** "'වයස අවුරුදු හැටක් හෝ
ඊට වැඩි පුරුෂයෙකුගේ වටිනාකම
ෂෙකෙල් පහළවක් ලෙසත් ස්ත්‍රිය-
කගේ වටිනාකම ෂෙකෙල් දහයක්
ලෙසත් නියම කරන්න. **8** නමුත්
නියම කරන ලද වටිනාකම දෙන්න
තරම් වත්කමක් ඔහුට නැත්නම්[2]
භාරය පිණිස දෙන තැනැත්තාව ඔහු
පූජකයා ඉදිරියට ගෙන යා යුතුයි.
එවිට පූජකයා භාරය වෙනුවෙන් දිය
යුතු මුදල නියම කරනු ඇත.[3] පූජ-
කයා භාරය ඔප්පු කරන තැනැත්තා-
ගේ වත්කමට අනුව[4] එය නියම කරනු
ඇත.
**9** "'යමෙකු යෙහෝවා දෙවි වන
මට පූජාවක් ලෙස ඔප්පු කළ හැකි
සතෙකුව භාරයක් ලෙස දුන්නොත්
ඔහු යෙහෝවා දෙවි වන මට දෙන
එම සතා ශුද්ධය.[5] ඌ අයිති මටය.
**10** එම සතාව ආපසු ඉල්ලා ඌ
වෙනුවට තව සතෙකුව දෙන්න
ඔහුට නොහැක. හොඳ සතෙකු
වෙනුවට නරක සතෙකු හුවමාරු
කරන්නවත් නරක සතෙකු වෙනුවට
හොඳ සතෙකු හුවමාරු කරන්නවත්
ඔහුට නොහැක. ඔහු එවැනි දෙ-
යක් කරන්න උත්සාහ කළොත් ඒ
සතුන් දෙදෙනාම එනම්, මුලින් දුන්
සතාද මාරු කිරීමට ගෙනා සතාද
මට අයිති වන්නේය. උන් ශුද්ධය.
**11** යෙහෝවා දෙවි වන මට පූජාවක්
ලෙස ඔප්පු කළ නොහැකි[6] අප-
විත්‍ර[7] සතෙකුව භාරයක් ලෙස ගෙන
ආවොත් ඔහු පූජකයා ඉදිරියට ඌව
රැගෙන යා යුතුයි.[8] **12** පූජකයා
ඌ නරක සතෙකුද හොඳ සතෙකුද
කියා පරීක්ෂා කර බලා ඒ අනුව
උගේ වටිනාකම නියම කළ යුතුයි.[9]
පූජකයා නියම කරන එම මුදල
උගේ වටිනාකම වේ. **13** භාරය වූ
තැනැත්තාට එම සතාව මුදවා-
ගන්න අවශ්‍ය නම්, සතාට නියම

**27 පරි.**
1 ගණන් 18:16
2 ලෙවී 5:7, ලෙවී 5:11, ලෙවී 12:8, ලෙවී 14:21
3 ගණන් 3:6, 2රාජා 12:4
4 ලූක් 21:2, 2කොරි 8:12
5 ලෙවී 2:3, ගණන් 18:9
6 මලා 1:11
7 ලෙවී 20:25, ද්වි 14:7
8 ලෙවී 10:10, ගණන් 3:6, එස 44:23
9 ලෙවී 5:15, ලෙවී 6:6

**2 තීරුව**
1 ලෙවී 5:16, ලෙවී 6:5, ලෙවී 22:14, ලෙවී 27:19
2 ලෙවී 27:12
3 ලෙවී 27:13
4 ක්‍රියා 4:34
5 එස 45:11, හොෂෙ 3:2
6 ලෙවී 25:10, ලෙවී 25:50
7 ලෙවී 25:15, ලෙවී 25:16, ලෙවී 25:27
8 ලෙවී 27:13

කළ මුදල සමඟ එම මුදලෙන්
පහෙන් එකකුත්[1] ගෙවිය යුතුයි.
**14** "'යමෙකු තම නිවස ශුද්ධ දෙ-
යක් ලෙස යෙහෝවා දෙවි වන මට
කැප කළොත් පූජකයා එම නිවස
තිබෙන්නේ හොඳ තත්වයකද නරක
තත්වයකද කියා බලා ඒ අනුව
එහි වටිනාකම නියම කළ යුතුයි.[2]
පූජකයා නියම කරන එම මුදල
නිවසෙහි වටිනාකම වේ. **15** නිවස
කැප කළ තැනැත්තාට නිවස මුදවා-
ගන්න අවශ්‍ය නම්, නිවස සඳහා
නියම වූ මුදල සමඟ එම මුදලෙන්
පහෙන් එකකුත් ගෙවිය යුතුයි.[3] එවිට
ඔහුට එය නැවත අයිති වන්නේය.
**16** "'යමෙකු තමාට උරුමයෙන්
ලැබුණු කෙතෙන් කොටසක්[4] යෙ-
හෝවා දෙවි වන මට කැප
කළොත් එහි වටිනාකම නියම කළ
යුත්තේ එම බිම් කොටස වැපි-
රීම සඳහා අවශ්‍ය බීජ ප්‍රමාණයට
අනුවය. බාර්ලි හෝමරයක්*[5] ඒ
සඳහා අවශ්‍ය වුණොත් එහි වටිනා-
කම රිදී ෂෙකෙල් පනහකි. **17** ඔහු
තම බිම් කොටස විශේෂ අවුරුද්දේදී[6]
කැප කළොත් ඔහු ඒ සඳහා නියම
කරන මුළු මුදල ගෙවිය යුතුයි.
**18** නමුත් ඔහු එය විශේෂ අවුරුද්-
දෙන් පසුව යම් දිනක කැප කළොත්,
කැප කළ බිම් කොටස වෙනුවෙන්
ගෙවිය යුතු මුදල් ප්‍රමාණය අඩු වන්-
නේය. පූජකයා ඊළඟ විශේෂ අවු-
රුද්ද දක්වා තිබෙන අවුරුදු ගණන
ගණන් කර, ඒ අනුව එහි වටිනාකම
නියම කරනු ඇත.[7] **19** බිම් කො-
ටස කැප කළ තැනැත්තාට එය මුද-
වාගන්න අවශ්‍ය නම්, ඔහු ඒ සඳහා
නියම වූ මුදල සමඟ එම මුදලෙන්
පහෙන් එකකුත් ගෙවිය යුතුයි.[8]
එවිට ඔහුට එම බිම් කොටස නැවත
අයිති වන්නේය. **20** නමුත් ඔහු
එම බිම් කොටස මුදවා නොගෙන
එය වෙනත් කෙනෙකුට විකුණු-
වොත් කවදාවත් එය ආපසු මිල දී

ලෙවී **27:16*** එනම්, ලීටර් 220කි.

ගත නොහැක. **21** විශේෂ අවුරුද්-
දේදීද එය මුදවාගත නොහැක. එය
සදහටම යෙහෝවා දෙවි වන මට
කැප කළ ශුද්ධ දෙයක් ලෙස සැල-
කිය යුතුයි.[1] එය පූජකයාට අයිති
වන්නේය.[2]

**22** “‘යමෙකු තමාට උරුමයෙන්
නොලැබුණු කෙතක් මිල දී ගෙන
එය යෙහෝවා දෙවි වන මට කැප
කළොත්,[3] **23** පූජකයා විශේෂ අවු-
රුද්ද දක්වා ඉතුරුව තිබෙන කාලය
ගණන් කර, ඒ අනුව එහි වටිනාකම
නියම කළ යුතුයි. එම තැනැත්තා
නියම කළ මුදල ඒ දවසේදීම ගෙවිය
යුතුයි.[4] එම මුදල යෙහෝවා දෙවි
වන මා සලකන්නේ ශුද්ධ දෙයක් ලෙ-
සයි.[5] **24** විශේෂ අවුරුද්දේදී කෙත
එය විකුණූ තැනැත්තාට එනම්, එහි
මුල් හිමිකරුට නැවත අයිති වන්-
නේය.[6]

**25** “‘ඕනෑම දෙයක වටිනාකම
නියම කළ යුත්තේ ශුද්ධස්ථානයේ
තිබෙන ෂෙකෙලයේ බරට අනුවය.
ෂෙකෙලයක බර ගේරා* මිමි විස්සක්
විය යුතුයි.[7]

**26** “‘කුලුඳුල් සතුන් යෙහෝවා
දෙවි වන මට අයිති නිසා[8] කිසිවෙකු
උන්ව කැප නොකළ යුතුයි. ඒ සතා
ගවයෙකු හෝ බැටළුවෙකු හෝ වේවා
ඌව අයිති යෙහෝවා දෙවි වන
මටය.[9] **27** නමුත් අපවිත්‍ර කුලුඳුල්
සතෙකුව[10] මුදවාගත හැක. යමෙකු
එසේ කරනවා නම්, ඌට නියම
කරන ලද මුදල සමඟ එම මුදලෙන්
පහෙන් එකක් ගෙවිය යුතුයි.[11] නමුත්
ඔහු එම සතාව මුදවාගන්නේ නැත්-
නම් නියම කරන ලද මුදලට පූජකයා
ඌව විකිණිය යුතුයි.

**28** “‘යමෙකු තමාගේ ගෙයි වැසි-
යෙකුව හෝ තමාට අයිති සතෙකුව
හෝ උරුමයෙන් තමාට හිමි වූ
කෙතක් හෝ යෙහෝවා දෙවි වන
මට සදහටම* කැප කරන්නේ නම්[12]
එම පුද්ගලයා හෝ එම සතා හෝ
එම කෙත හෝ කිසිවිටෙක විකු-
ණන්නවත් ආපසු මිල දී ගන්න-
වත් ඔහුට නොහැක.[1] කැප කළ ඒ
පුද්ගලයා හෝ ඒ සතා හෝ ඒ
කෙත හෝ යෙහෝවා දෙවි වන මට
අයිති වන බැවින් ඒවා ඉතා ශුද්ධය.
**29** විනාශය පිණිස කැප කළ පුද්ගල-
යෙකුව කිසිවිටෙක මුදවාගත නො-
හැක.[2] ඔහුව අනිවාර්යයෙන්ම මරා
දැමිය යුතුයි.[3]

**30** “‘භූමියේ පලදාවෙන් දහයෙන්
කොටසක්[4] යෙහෝවා දෙවි වන
මට අයිතිය. ධාන්‍ය අස්වැන්නෙන්
හෝ ගස්වල පලදාවෙන් හෝ දහ-
යෙන් කොටසක් මට දිය යුතුයි.
ඒවා යෙහෝවා දෙවි වන මට අයිති
ශුද්ධ කොටස්ය. **31** මට දෙන එම
දහයෙන් කොටස යමෙකුට ආපසු
මිල දී ගන්න අවශ්‍ය නම්, ඔහු
එහි වටිනාකම සමඟ එයින් පහෙන්
කොටසක්ද ගෙවිය යුතුයි.[5] **32** එළු
බැටළු සහ ගව රැළේ සතුන් දහදෙ-
නෙකුගෙන් එකෙකු යෙහෝවා දෙවි
වන මට දිය යුතුයි. එඬේරා තමන්ට
අයිති සතුන්ව ගණන් කරන විට[6] දහ-
වෙනියාට පැමිණෙන සතාව මට
දිය යුතුයි.* දහවෙනියාට පැමිණෙන
සෑම සතෙකුම ශුද්ධය. **33** එම දහ-
වන සතා හොඳ එකෙකුද නරක
එකෙකුද කියා ඔහු පරීක්ෂා කර නො-
බැලිය යුතුයි. එම සතාව ආපසු
රැගෙන ඌ වෙනුවට තව සතෙකුව
නොදිය යුතුයි. ඔහු එසේ කිරීමට
උත්සාහ කළොත් ඒ සතුන් දෙදෙ-
නාම එනම්, දහවන සතාද මාරු
කිරීමට ගෙනා සතාද මට අයිති වන්-
නේය. උන් ශුද්ධය.[7] උන්ව මුදවාගැ-
නීමට ඔහුට නොහැක.’”

**34** යෙහෝවා දෙවි සීනයි කන්-
දේදී[8] මෝසෙස් මාර්ගයෙන් ඊශ්‍රායෙල්
සෙනඟට දුන් ආඥා[9] ඒවාය.

**27 පරි.**
1 ද්වි 22:9, එස 44:29
2 ගණන් 18:14
3 ලෙවී 25:10, ලෙවී 25:25
4 ලෙවී 27:12, ලෙවී 27:18
5 ලෙවී 27:9
6 ලෙවී 25:28
7 නික් 30:13, ගණන් 3:47, ගණන් 18:16, එස 45:12
8 නික් 13:2, ගණන් 18:17
9 නික් 22:30, ද්වි 15:19
10 ද්වි 15:21
11 ලෙවී 27:13
12 නික් 22:20, ද්වි 7:25, ද්වි 7:26, යොෂු 6:17, යොෂු 7:1, 1සාමු 15:3

**2 තීරුව**
1 ගණන් 18:14
2 ගණන් 21:2, 1සාමු 15:18
3 1සාමු 15:33
4 උත් 14:20, උත් 28:22, ගණන් 18:21, ගණන් 18:26, ද්වි 12:6, ද්වි 14:22, 2ලේක 31:5, නෙහෙ 13:12, මලා 3:10, ලූක් 11:42, හෙබ්‍රෙ 7:5
5 ලෙවී 27:13
6 යෙරෙ 33:13
7 ලෙවී 27:10
8 නික් 3:1, ගණන් 1:1, යොහ 1:17
9 ලෙවී 26:46, ද්වි 4:45

ලෙවී **27:25*** ගේරා එකක් යනු ග්‍රෑම් 0.57කි. **28*** එනම්, විනාශයට කැප කරන්නේ නම්.

ලෙවී **27:32*** එඬේරා තම සැරයටිය ඔසවා ඊට යටින් ගමන් කරන ලෙස තම සතුන්ට නියම කළේය. එලෙස උන් ගමන් කරන විට එඬේරා උන්ව ගණන් කළේය.

# ගණන් කතාව

**1** ඊශ්‍රායෙල්වරු ඊජිප්තු දේශයෙන්
පිටත්ව යෑමෙන් අනතුරුව දෙ-
වෙනි අවුරුද්දේ[1] දෙවෙනි මාසයේ
පළමුවෙනි දින සීනයි පාළුකරයේදී[2]
යෙහෝවා දෙවි මෝසෙස් සමඟ කතා
කළේය. දෙවි එදින සම්මුඛ වීමේ
කූඩාරමේ සිට[3] ඔහු සමඟ කතා කර-
මින් මෙසේ කීවේය. **2** “සියලු ඊශ්‍රා-
යෙල් වැසියන්ව ගණන් කරන්න.[4]
ඔවුන් එක් එක් කෙනාගේ පවුල් අනු-
වද එක් එක් කෙනාගේ පෙළපත
අනුවද සියලු පුරුෂයන්ව ගණන්
කරන්න. එක් එක් කෙනාව නම්
වශයෙන් ගණන් කරන්න. **3** ඔබත්
ආරොන්නුත් ඊශ්‍රායෙල්හි හමුදාවට[5]
බඳවාගත හැකි වයස අවුරුදු විස්සක්
හෝ ඊට වඩා වැඩි සියලුදෙනාවම[6]
ගණන් කර කණ්ඩායම් අනුව ඔවුන්ව
ලියාපදිංචි කරන්න.

**4** “ඔබට උපකාර කිරීම සඳහා
එක් එක් ගෝත්‍රයෙන් පුරුෂයෙකු
බැගින් තෝරාගන්න. ඒ පුරුෂයෝ
ඔවුන්ගේ පෙළපතේ ප්‍රධානියෝය.[7]
**5** ඔබට උපකාර කරන පුරුෂයන්ගේ
නම් මේවාය. රූබෙන්[8] ගෝත්‍රයෙන්
ෂෙදෙවුර්ගේ පුත්‍රයා වන එලිෂූර්ය.[9]
**6** සිමියොන්[10] ගෝත්‍රයෙන් ෂූරිෂද්ද-
යිගේ පුත්‍රයා වන ෂෙලුමියෙල්ය.[11]
**7** යූදා[12] ගෝත්‍රයෙන් අමිනදාබ්ගේ
පුත්‍රයා වන නාෂොන්ය.[13] **8** ඉස-
කාර්[14] ගෝත්‍රයෙන් ෂූවර්ගේ පුත්‍රයා
වන නෙතනෙල්ය.[15] **9** සෙබුලුන්[16]
ගෝත්‍රයෙන් හේලොන්ගේ පුත්‍රයා
වන එලියාබ්ය.[17] **10** යෝසෙප්ගේ[18]
පුත්‍රයන්ගෙන් එනම්, එෆ්‍රායිම්[19] ගෝ-
ත්‍රයෙන් අමිහුද්ගේ පුත්‍රයා වන එලි-
ෂාමා හා මනස්සේ[20] ගෝත්‍රයෙන්
පෙදාෂූර්ගේ පුත්‍රයා වන ගමාලි-
යෙල්ය. **11** බෙන්ජමින්[21] ගෝත්‍ර-
යෙන් ගිඩියොනිගේ පුත්‍රයා වන
අබිදාන්ය.[22] **12** දාන්[23] ගෝත්‍රයෙන්
අමිෂද්දයිගේ පුත්‍රයා වන අහියේ-
සෙර්ය.[24] **13** ආෂේර්[25] ගෝත්‍රයෙන්
ඔක්‍රාන්ගේ පුත්‍රයා වන පගියෙල්ය.[1]
**14** ගාද්[2] ගෝත්‍රයෙන් දූවෙල්ගේ[3]
පුත්‍රයා වන එලියාසාෆ්ය.[4] **15** නෆ්-
තලී[5] ගෝත්‍රයෙන් ඒනාන්ගේ පුත්‍රයා
වන අහිරාය.[6] **16** ඊශ්‍රායෙල් සෙ-
නඟ අතරින් ඔබ වෙතට කැඳවාගත
යුත්තේ ඔවුහුය. ඔවුහු තම තමන්-
ගේ ගෝත්‍රවල අධිපතීහුය.[7] ඔවුහු
ඊශ්‍රායෙල්හි දහස් ගණන් කෙරෙහි[8]
ප්‍රධානීන් වශයෙන් කටයුතු කරන්-
නෝය.”

**17** මෝසෙස් සහ ආරොන් නම්
වශයෙන් සඳහන් කළ ඒ පුරුෂ-
යන්ව තමන් වෙතට කැඳවාගත්-
තෝය. **18** ඔවුහු දෙවෙනි මාසයේ
පළමුවෙනි දින මුළු ඊශ්‍රායෙල් සෙනඟ
රැස් කළෝය. එසේ කළේ වයස අවු-
රුදු විස්සක් හෝ ඊට වඩා වැඩි සිය-
ලුදෙනාවම[9] තම තමන්ගේ පවුල්
අනුවද පෙළපත[10] අනුවද නම් වශ-
යෙන් ලියාපදිංචි කරන පිණිසය.
ඔවුහු ඒ එක් එක් කෙනාව ගණන්
කර **19** යෙහෝවා දෙවි මෝසෙස්ට
අණ කළ ලෙසම සීනයි පාළුකරයේදී
ඔවුන්ව ලියාපදිංචි[11] කළෝය.

**20** ඊශ්‍රායෙල්ගේ කුලුඳුල් පුත්‍රයා
වන රූබෙන්ගෙන්[12] පැවත ආ අය
අතරින් හමුදාවට බඳවාගත හැකි
වයස අවුරුදු විස්සක් හෝ ඊට වඩා
වැඩි සෑම පුරුෂයෙකුවම තම තමන්-
ගේ පවුල් අනුවද පෙළපත අනුවද
ගණන් කරනු ලැබීය. **21** රූබෙන්
ගෝත්‍රයෙන් ලියාපදිංචි කළ අයගේ
මුළු ගණන හතළිස්හයදහස් පන්සිය-
යක් විය.[13]

**22** සිමියොන්ගෙන්[14] පැවත ආ අය
අතරින් හමුදාවට බඳවාගත හැකි
වයස අවුරුදු විස්සක් හෝ ඊට වඩා
වැඩි සෑම පුරුෂයෙකුවම තම තමන්-
ගේ පවුල් අනුවද පෙළපත අනුවද
ගණන් කරනු ලැබීය. **23** සිමියොන්

**1 පරි.**
**1** නික් 40:17
**2** නික් 19:1
ද්වි 33:2
ක්‍රියා 7:38
**3** නික් 25:22
**4** නික් 30:12
**5** ද්වි 3:18
**6** නික් 30:14
**7** නික් 18:25
ගණන් 1:16
යොෂු 22:14
යොෂු 23:2
1ලේක 27:1
**8** උත් 49:3
**9** ගණන් 2:10
**10** උත් 29:33
උත් 49:5
**11** ගණන් 7:36
**12** උත් 29:35
උත් 49:10
**13** රූත් 4:20
ලූක් 3:32
**14** උත් 30:18
උත් 49:14
**15** ගණන් 10:15
**16** උත් 30:20
උත් 49:13
**17** ගණන් 7:24
**18** උත් 30:24
උත් 49:22
1ලේක 5:1
**19** උත් 41:52
උත් 48:20
**20** උත් 41:51
**21** උත් 35:18
උත් 49:27
**22** ගණන් 2:22
**23** උත් 30:6
උත් 49:17
**24** ගණන් 7:66
**25** උත් 30:13
උත් 49:20

**2 තීරුව**
**1** ගණන් 7:72
**2** උත් 30:11
උත් 49:19
**3** ගණන් 2:14
**4** ගණන් 7:42
ගණන් 10:20
**5** උත් 30:8
උත් 49:21
**6** ගණන් 2:29
ගණන් 10:27
**7** නික් 18:21
ගණන් 7:2
**8** ද්වි 1:15
**9** නික් 30:14
ගණන් 14:29
**10** එස්රා 2:62
නෙහෙ 7:61
**11** ගණන් 26:2
**12** උත් 29:32
උත් 49:3
ගණන් 2:10
1ලේක 5:1

---

**13** ගණන් 2:11; **14** උත් 29:33; උත් 46:10; ගණන් 2:12; ගණන් 26:12.

ගෝත්‍රයෙන් ලියාපදිංචි කළ අයගේ මුළු ගණන පනස්නවදහස් තුන්සියයක් විය.[1]

**24** ගාද්ගෙන්[2] පැවත ආ අය අතරින් හමුදාවට බඳවාගත හැකි වයස අවුරුදු විස්සක් හෝ ඊට වඩා වැඩි පුරුෂයන්ව තම තමන්ගේ පවුල් අනුවද පෙළපත අනුවද ගණන් කරනු ලැබීය. **25** ගාද් ගෝත්‍රයෙන්[3] ලියාපදිංචි කළ අයගේ මුළු ගණන හතළිස්පන්දහස් හයසිය පනහක් විය.[4]

**26** යූදාගෙන්[5] පැවත ආ අය අතරින් හමුදාවට බඳවාගත හැකි වයස අවුරුදු විස්සක් හෝ ඊට වඩා වැඩි පුරුෂයන්ව තම තමන්ගේ පවුල් අනුවද පෙළපත අනුවද ගණන් කරනු ලැබීය. **27** යූදා ගෝත්‍රයෙන් ලියාපදිංචි කළ අයගේ මුළු ගණන හැත්තෑහතරදහස් හයසියයක් විය.[6]

**28** ඉසකාර්ගෙන්[7] පැවත ආ අය අතරින් හමුදාවට බඳවාගත හැකි වයස අවුරුදු විස්සක් හෝ ඊට වඩා වැඩි පුරුෂයන්ව තම තමන්ගේ පවුල් අනුවද පෙළපත අනුවද ගණන් කරනු ලැබීය. **29** ඉසකාර් ගෝත්‍රයෙන් ලියාපදිංචි කළ අයගේ මුළු ගණන පනස්හතරදහස් හාරසියයක් විය.[8]

**30** සෙබ්‍යූලන්ගෙන්[9] පැවත ආ අය අතරින් හමුදාවට බඳවාගත හැකි වයස අවුරුදු විස්සක් හෝ ඊට වඩා වැඩි පුරුෂයන්ව තම තමන්ගේ පවුල් අනුවද පෙළපත අනුවද ගණන් කරනු ලැබීය. **31** සෙබ්‍යූලන් ගෝත්‍රයෙන් ලියාපදිංචි කළ අයගේ මුළු ගණන පනස්හත්දහස් හාරසියයක් විය.[10]

**32** යෝසෙප්ගේ පුත්‍රයා වන එෆ්‍රායිම්ගෙන්[11] පැවත ආ අය අතරින් හමුදාවට බඳවාගත හැකි වයස අවුරුදු විස්සක් හෝ ඊට වඩා වැඩි පුරුෂයන්ව තම තමන්ගේ පවුල් අනුවද පෙළපත අනුවද ගණන් කරනු ලැබීය. **33** එෆ්‍රායිම් ගෝත්‍රයෙන්[12] ලියාපදිංචි කළ අයගේ මුළු ගණන හතළිස්දහස් පන්සියයක් විය.[13]

**34** යෝසෙප්ගේ පුත්‍රයා වන මනස්සේගෙන්[1] පැවත ආ අය අතරින් හමුදාවට බඳවාගත හැකි වයස අවුරුදු විස්සක් හෝ ඊට වඩා වැඩි පුරුෂයන්ව තම තමන්ගේ පවුල් අනුවද පෙළපත අනුවද ගණන් කරනු ලැබීය. **35** මනස්සේ ගෝත්‍රයෙන් ලියාපදිංචි කළ අයගේ මුළු ගණන තිස්දෙදහස් දෙසියයක් විය.[2]

**36** බෙන්ජමින්ගෙන්[3] පැවත ආ අය අතරින් හමුදාවට බඳවාගත හැකි වයස අවුරුදු විස්සක් හෝ ඊට වඩා වැඩි පුරුෂයන්ව තම තමන්ගේ පවුල් අනුවද පෙළපත අනුවද ගණන් කරනු ලැබීය. **37** බෙන්ජමින් ගෝත්‍රයෙන් ලියාපදිංචි කළ අයගේ මුළු ගණන තිස්පන්දහස් හාරසියයක් විය.[4]

**38** දාන්ගෙන්[5] පැවත ආ අය අතරින් හමුදාවට බඳවාගත හැකි වයස අවුරුදු විස්සක් හෝ ඊට වඩා වැඩි පුරුෂයන්ව තම තමන්ගේ පවුල් අනුවද පෙළපත අනුවද ගණන් කරනු ලැබීය. **39** දාන් ගෝත්‍රයෙන් ලියාපදිංචි කළ අයගේ මුළු ගණන හැටදෙදහස් හත්සියයක් විය.[6]

**40** ආෂේර්ගෙන්[7] පැවත ආ අය අතරින් හමුදාවට බඳවාගත හැකි වයස අවුරුදු විස්සක් හෝ ඊට වඩා වැඩි පුරුෂයන්ව තම තමන්ගේ පවුල් අනුවද පෙළපත අනුවද ගණන් කරනු ලැබීය. **41** ආෂේර් ගෝත්‍රයෙන් ලියාපදිංචි කළ අයගේ මුළු ගණන හතළිස්එක්දහස් පන්සියයක් විය.[8]

**42** නප්තලීගෙන්[9] පැවත ආ අය අතරින් හමුදාවට බඳවාගත හැකි වයස අවුරුදු විස්සක් හෝ ඊට වඩා වැඩි පුරුෂයන්ව තම තමන්ගේ පවුල් අනුවද පෙළපත අනුවද ගණන් කරනු ලැබීය. **43** නප්තලී ගෝත්‍රයෙන් ලියාපදිංචි කළ අයගේ මුළු ගණන පනස්තුන්දහස් හාරසියයක් විය.[10]

**44** ඊශ්‍රායෙල්හි පෙළපත් නියෝජනය කළ අධිපතීන් දොළොස්දෙනාගේ හා ආරොන්ගේ උපකාරය ඇතුව

**1 පරි.**
1 ගණන් 2:13
2 උත් 30:11; උත් 46:16; ගණන් 26:15
3 ගණන් 26:18
4 ගණන් 2:15
5 උත් 29:35; උත් 46:12; උත් 49:10; ගණන් 2:3; 1ලේක 5:2; මතෙ 1:2; හෙබ්‍රෙ 7:14; එළි 5:5
6 ගණන් 2:4; ගණන් 26:22
7 උත් 30:18; උත් 46:13; ගණන් 2:5; ගණන් 26:23
8 ගණන් 2:6
9 උත් 30:20
10 ගණන් 2:8
11 උත් 41:52; උත් 46:20; උත් 48:19; ගණන් 2:18; ගණන් 26:35; ද්වි 33:17; විනි 12:6; යෙරෙ 7:15
12 උත් 48:5
13 ගණන් 2:19

**2 තීරුව**
1 ගණන් 2:20; ගණන් 26:29
2 ගණන් 2:21
3 උත් 43:29; උත් 46:21; ගණන් 26:38
4 ගණන් 2:23
5 උත් 30:6; උත් 46:23; ගණන් 2:25; ගණන් 10:25; ගණන් 26:42
6 ගණන් 2:26
7 උත් 35:26; ගණන් 2:27
8 ගණන් 2:28
9 උත් 30:8; උත් 46:24; ගණන් 26:48
10 ගණන් 2:30

මෝසෙස් ලියාපදිංචි කළ අය ඔවුහුය.
**45** තම තමන්ගේ පෙළපත් අනුව
ලියාපදිංචි කළ අයගේ එනම්, ඊශ්‍රා-
යෙල්හි හමුදාවට බඳවාගත හැකි
වයස අවුරුදු විස්සක් හෝ ඊට වඩා
වැඩි අයගේ **46** මුළු ගණන හය-
ලක්ෂ තුන්දහස් පන්සිය පනහක්
විය.[1]

**47** නමුත් අනික් ගෝත්‍ර මෙන්
ලෙවීවරුන්ව[2] තම තමන්ගේ පෙළ-
පත් අනුව ලියාපදිංචි කළේ නැත.[3]
**48** මන්ද යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කියා තිබුණේය. **49** "ඊශ්‍රා-
යෙල් සෙනඟ ලියාපදිංචි කරන
විට ලෙවී ගෝත්‍රයේ අයව ලියාප-
දිංචි නොකරන්න. ඊශ්‍රායෙල් සෙනඟ
සමඟ ඔවුන්ව ගණන් නොකරන්න.[4]
**50** ගිවිසුම් පෙට්ටිය තබා තිබෙන
සම්මුඛ වීමේ කූඩාරම[5] හා එහි
සියලු භාණ්ඩද මෙවලම්ද බලා-
ගන්නා පිණිස ලෙවීවරුන්ව පත්
කරන්න.[6] සම්මුඛ වීමේ කූඩාරම
හා එහි භාණ්ඩ එහා මෙහා ගෙන
යා යුත්තේ ඔවුන් විසිනුයි.[7] සම්මුඛ
වීමේ කූඩාරමේ සේවාවන් කිරීම සඳ-
හාද ඔවුන්ව පත් කරන්න.[8] ඔවුන්
කඳවුරු බැඳගත යුත්තේද සම්-
මුඛ වීමේ කූඩාරම වටාය.[9] **51** සම්-
මුඛ වීමේ කූඩාරම වෙනත් තැනකට
රැගෙන යන විට ලෙවීවරුන් එහි
කොටස් ගැලවිය යුතුයි.[10] කූඩාරම
යම් තැනක ඉදි කරන විට එය ආපසු
සකස් කළ යුත්තේද ලෙවීවරුන් විසි-
නුයි. ලෙවී ගෝත්‍රයට අයත් නොවන
කෙනෙකු කූඩාරම ළඟට පැමිණි-
යොත් ඔහුව මරා දැමිය යුතුයි.[11]

**52** "ඊශ්‍රායෙල් සෙනඟ තම තමන්-
ගේ කණ්ඩායම් අනුව තම තමන්ට
නියමිත කඳවුරේ කූඩාරම් ගසා-
ගත යුතුයි. එක් කඳවුරක ගෝත්‍ර
තුන බැගින් කූඩාරම් ගසාගන්න.[12]
**53** ගිවිසුම් පෙට්ටිය තබා තිබෙන
සම්මුඛ වීමේ කූඩාරම වටා ලෙවීව-
රුන් කඳවුරු බැඳගත යුතුයි. දෙවිගේ
උදහස[13] ඊශ්‍රායෙල් සෙනඟ පිටට
නොපැමිණෙන පිණිස එසේ කරන්න.
ගිවිසුම් පෙට්ටිය තබා තිබෙන සම්-
මුඛ වීමේ කූඩාරමේ සේවාවන් ලෙවී-
වරුන් නොවරදවාම කළ යුතුයි."[1]

**54** යෙහෝවා දෙවි මෝසෙස්ට
අණ කළ සියල්ල ඊශ්‍රායෙල් සෙනඟ
එලෙසම කළෝය.[2]

**2** යෙහෝවා දෙවි මෝසෙස්ට හා
ආරොන්ට මෙසේ කීවේය.
**2** "ඊශ්‍රායෙල් සෙනඟ තමන්ට නිය-
මිත කඳවුරෙහි තම තමන්ගේ පෙළ-
පත නියෝජනය කරන ලකුණ අසල
කූඩාරම් ගසාගත යුතුයි. ඔවුන් සම්-
මුඛ වීමේ කූඩාරම දෙසට මුහුණ ලා
එය වටා කඳවුරු බැඳගෙන සිටිය
යුතුයි. එක් කඳවුරක ගෝත්‍ර තුනක්
කූඩාරම් ගසාගත යුතුයි.[3]

**3** "තම තමන්ගේ කණ්ඩායම්ව-
ලට අනුව නැඟෙනහිර පැත්තේ
කූඩාරම් ගසාගෙන සිටින ගෝත්‍ර
තුනෙන් ප්‍රධාන එක වන්නේ යූදා
ගෝත්‍රයයි. යූදා ගෝත්‍රයේ අධිප-
තියා වන්නේ අමිනදාබ්ගේ පුත්‍රයා
වන නාෂොන්ය.[4] **4** ඔහුගේ කණ්-
ඩායමට අයත් ලියාපදිංචි කළ
පුරුෂයන්ගේ මුළු ගණන හැත්තෑහ-
තරදහස් හයසියයයි.[5] **5** යූදා ගෝ-
ත්‍රය ළඟ ඉසකාර් ගෝත්‍රයේ[6] අයද
කඳවුරු බැඳගෙන සිටිය යුතුයි. ඉස-
කාර් ගෝත්‍රයේ අධිපතියා වන්නේ
ෂුවර්ගේ පුත්‍රයා වන නෙතනෙල්ය.[7]
**6** නෙතනෙල්ගේ කණ්ඩායමට අයත්
ලියාපදිංචි කළ පුරුෂයන්ගේ මුළු
ගණන පනස්හතරදහස් හාරසිය-
යයි.[8] **7** සෙබ්‍යූලන් ගෝත්‍රයේ අයද
යූදා ගෝත්‍රය ළඟ කඳවුරු බැඳ-
ගත යුතුයි. සෙබ්‍යූලන් ගෝත්‍ර-
යේ අධිපතියා වන්නේ හේලොන්ගේ
පුත්‍රයා වන එලියාබ්ය.[9] **8** එලියාබ්-
ගේ කණ්ඩායමට අයත් ලියාපදිංචි
කළ පුරුෂයන්ගේ මුළු ගණන පනස්-
හත්දහස් හාරසියයයි.[10]

**9** "යූදා කඳවුරෙහි ලියාපදිංචි කළ
අයගේ මුළු ගණන එක්ලක්ෂ අසූහය-
දහස් හාරසියයයි. ඔවුන් මුලින්ම
පිටත්ව යා යුතුයි.[11]

**1 පරි.**

1 උත් 13:16, උත් 22:17, උත් 46:3, නික් 12:37, නික් 38:26, ගණන් 2:32
2 උත් 29:34, උත් 46:11, ගණන් 3:12, 1ලේක 6:1
3 ගණන් 2:33, ගණන් 26:64
4 ගණන් 26:62
5 නික් 31:18
6 නික් 38:21, ගණන් 3:8
7 ගණන් 4:15, ගණන් 4:25, ගණන් 4:33
8 ගණන් 3:31, ගණන් 4:12
9 ගණන් 2:17, ගණන් 3:23, ගණන් 3:29, ගණන් 3:35, ගණන් 3:38
10 ගණන් 10:17, ගණන් 10:21
11 ගණන් 3:10, ගණන් 18:22, 1සාමු 6:19
12 ගණන් 2:2, ගණන් 2:34
13 ලෙවී 10:6, ගණන් 8:19, ගණන් 16:46, ගණන් 18:5

**2 තීරුව**

1 ගණන් 8:24, ගණන් 18:3, ගණන් 31:30, 1ලේක 23:32, 2ලේක 13:10
2 නික් 39:32

**2 පරි.**

3 ගණන් 1:52, ගණන් 24:2
4 ගණන් 7:12, ගණන් 10:14, රූත් 4:20, 1ලේක 2:10, මතෙ 1:4
5 ගණන් 1:27
6 උත් 35:23
7 ගණන් 1:8, ගණන් 7:18, ගණන් 10:15
8 ගණන් 1:29
9 ගණන් 1:9, ගණන් 7:24, ගණන් 10:16
10 ගණන් 1:31
11 ගණන් 10:14, 1ලේක 5:2

10 “තම තමන්ගේ කණ්ඩායම්ව-
ලට අනුව දකුණු පැත්තේ කූඩාරම්
ගසාගෙන සිටින ගෝත්‍ර තුනෙන්
ප්‍රධාන එක වන්නේ රූබෙන් ගෝ-
ත්‍රයයි.[1] රූබෙන් ගෝත්‍රයේ අධිප-
තියා ෂෙදෙවූර්ගේ පුත්‍රයා වන
එලිෂූර්ය.[2] 11 ඔහුගේ කණ්ඩායමට
අයත් ලියාපදිංචි කළ පුරුෂයන්-
ගේ මුළු ගණන හතළිස්හයදහස්
පන්සියයයි.[3] 12 රූබෙන් ගෝත්‍රය
ළඟ සිමියොන් ගෝත්‍රයේ අයද
කඳවුරු බැඳගෙන සිටිය යුතුයි. සිමි-
යොන් ගෝත්‍රයේ අධිපතියා වන්-
නේ ෂූරිෂද්දයිගේ පුත්‍රයා වන
ෂෙලුමියෙල්ය.[4] 13 ෂෙලුමියෙල්ගේ
කණ්ඩායමට අයත් ලියාපදිංචි කළ
පුරුෂයන්ගේ මුළු ගණන පනස්නවද-
හස් තුන්සියයයි.[5] 14 ගාද් ගෝත්‍ර-
යේ අයද රූබෙන් ගෝත්‍රය ළඟ
කඳවුරු බැඳගත යුතුයි. ගාද් ගෝත්‍ර-
යේ අධිපතියා වන්නේ රූවෙල්ගේ
පුත්‍රයා වන එලියාසාෆ්ය.[6] 15 එලි-
යාසාෆ්ගේ කණ්ඩායමට අයත් ලියා-
පදිංචි කළ පුරුෂයන්ගේ මුළු ගණන
හතළිස්පන්දහස් හයසිය පනහයි.[7]

16 “රූබෙන් කඳවුරෙහි ලියාපදිංචි
කළ අයගේ මුළු ගණන එක්ලක්ෂ
පනස්එක්දහස් හාරසිය පනහක් විය.
ඔවුන් දෙවනුවට පිටත්ව යා යුතුයි.[8]

17 “සම්මුඛ වීමේ කූඩාරම[9] වෙ-
නත් ස්ථානයකට ගෙන යන විට ලෙ-
වීවරුන්[10] කඳවුරු මැදින් ගමන් කළ
යුතුයි.

“ඔවුන් ගමන් කළ යුත්තේ ඔවුන්
කඳවුරු බැඳගෙන සිටින පිළිවෙළට
අනුවය.[11] සෑම ගෝත්‍රයක්ම තමන්ට
නියමිත කඳවුර සමඟ ගමන් කළ
යුතුයි. එක් කඳවුරක ගෝත්‍ර තුනක්
සිටිය යුතුයි.

18 “තම තමන්ගේ කණ්ඩායම්ව-
ලට අනුව බස්නාහිර පැත්තේ
කූඩාරම් ගසාගෙන සිටින ගෝත්‍ර
තුනෙන් ප්‍රධාන එක වන්නේ එෆ්‍රා-
යිම් ගෝත්‍රයයි.[12] එෆ්‍රායිම් ගෝත්‍ර-
යේ අධිපතියා වන්නේ අම්හුද්ගේ
පුත්‍රයා වන එලිෂාමාය.[13] 19 ඔහු-
ගේ කණ්ඩායමට අයත් ලියාපදිංචි
කළ පුරුෂයන්ගේ මුළු ගණන හත-
ළිස්දහස් පන්සියයයි.[1] 20 එෆ්‍රායිම්
ගෝත්‍රය ළඟ මනස්සේ ගෝත්‍ර-
යේ[2] අයද කඳවුරු බැඳගෙන සිටිය
යුතුයි. මනස්සේ ගෝත්‍රයේ අධිප-
තියා වන්නේ පෙදාෂූර්ගේ පුත්‍රයා වන
ගමාලියෙල්ය.[3] 21 ගමාලියෙල්ගේ
කණ්ඩායමට අයත් ලියාපදිංචි කළ
පුරුෂයන්ගේ මුළු ගණන තිස්දෙදහස්
දෙසියයයි.[4] 22 බෙන්ජමින් ගෝත්‍ර-
යේ[5] අයද එෆ්‍රායිම් ගෝත්‍රය ළඟ
කඳවුරු බැඳගත යුතුයි. බෙන්ජමින්
ගෝත්‍රයේ අධිපතියා වන්නේ ගිඩි-
යොනිගේ පුත්‍රයා වන අබිදාන්ය.[6]
23 අබිදාන්ගේ කණ්ඩායමේ ලියාප-
දිංචි කළ පුරුෂයන්ගේ මුළු ගණන
තිස්පන්දහස් හාරසියයයි.[7]

24 “එෆ්‍රායිම් කඳවුරෙහි ලියාපදිංචි
කළ අයගේ මුළු ගණන එක්ලක්ෂ
අටදහස් එකසියයයි. ඔවුන් තුන්වෙ-
නුවට පිටත්ව යා යුතුයි.[8]

25 “තම තමන්ගේ කණ්ඩායමට
අනුව උතුරු පැත්තේ කූඩාරම්
ගසාගෙන සිටින ගෝත්‍ර තුනෙන්
ප්‍රධාන එක වන්නේ දාන් ගෝත්‍රයයි.
දාන් ගෝත්‍රයේ අධිපතියා වන්නේ
අමිෂද්දයිගේ පුත්‍රයා වන අහියේ-
සෙර්ය.[9] 26 ඔහුගේ කණ්ඩායමට
අයත් ලියාපදිංචි කළ පුරුෂයන්-
ගේ මුළු ගණන හැටදෙදහස් හත්-
සියයයි.[10] 27 දාන් ගෝත්‍රය ළඟ
ආෂේර් ගෝත්‍රයේ අයද කඳවුරු බැඳ-
ගෙන සිටිය යුතුයි. ආෂේර් ගෝත්‍රයේ
අධිපතියා වන්නේ ඔක්‍රාන්ගේ පුත්‍රයා
වන පගියෙල්ය.[11] 28 පගියෙල්ගේ
කණ්ඩායමේ ලියාපදිංචි කළ පුරුෂ-
යන්ගේ මුළු ගණන හතළිස්එක්දහස්
පන්සියයයි.[12] 29 නෆ්තලී ගෝත්‍ර-
යේ[13] අයද දාන් ගෝත්‍රය ළඟ කඳවුරු
බැඳගත යුතුයි. නෆ්තලී ගෝත්‍රයේ
අධිපතියා වන්නේ ඒනාන්ගේ පුත්‍රයා
වන අහිරාය.[14] 30 අහිරාගේ කණ්-
ඩායමේ ලියාපදිංචි කළ පුරුෂයන්ගේ
මුළු ගණන පනස්තුන්දහස් හාරසිය-
යයි.[15]

**2 පරි.**
1 ගණන් 1:20
2 ගණන් 1:5; ගණන් 7:30; ගණන් 10:18
3 ගණන් 1:21
4 ගණන් 1:6; ගණන් 7:36; ගණන් 10:19
5 ගණන් 1:23
6 ගණන් 1:14; ගණන් 7:42; ගණන් 10:20
7 ගණන් 1:25
8 ගණන් 10:18; 1ලේක 5:1
9 ගණන් 1:51; ක්‍රියා 7:44; හෙබ්‍රෙ 8:5; හෙබ්‍රෙ 9:11
10 ගණන් 3:6; ගණන් 3:12
11 1කොරි 14:33; 1කොරි 14:40
12 ගණන් 1:33
13 ගණන් 1:10; ගණන් 7:48; ගණන් 10:22

**2 තීරුව**
1 ගණන් 1:33
2 උත් 48:20
3 ගණන් 1:10; ගණන් 7:54; ගණන් 10:23
4 ගණන් 1:35
5 උත් 35:18; ගීතා 68:27
6 ගණන් 1:11; ගණන් 7:60; ගණන් 10:24
7 ගණන් 1:37
8 ගණන් 10:22
9 ගණන් 1:12; ගණන් 7:66; ගණන් 10:25
10 ගණන් 1:39
11 ගණන් 1:13; ගණන් 7:72; ගණන් 10:26
12 ගණන් 1:41
13 උත් 46:24
14 ගණන් 1:15; ගණන් 7:78; ගණන් 10:27
15 ගණන් 1:43

**31** "දාන් කඳවුරෙහි ලියාපදිංචි
කළ අයගේ මුළු ගණන එක්ලක්ෂ
පනස්හත්දහස් හයසියයයි. ඔවුන්
අන්තිමටම පිටත්ව යා යුතුයි.[1] ඔවුන්
තමන්ට නියමිත කඳවුර සමඟ ගමන්
කළ යුතුයි. එක් කඳවුරක ගෝත්‍ර
තුනක් සිටිය යුතුයි."
**32** තම තමන්ගේ පෙළපත් අනුව
ඊශ්‍රායෙල් සෙනඟ අතරින් ලියාප-
දිංචි කළ අය ඔවුහුය. තම තමන්-
ගේ කණ්ඩායමට අනුව ලියාපදිංචි
කළ පුරුෂයන්ගේ මුළු ගණන හය-
ලක්ෂ තුන්දහස් පන්සිය පනහකි.[2]
**33** යෙහෝවා දෙවි මෝසෙස්ට
අණ කළ පරිදි ඊශ්‍රායෙල් සෙනඟ
සමඟ ලෙවීවරුන්ව ලියාපදිංචි කළේ
නැත.[3] **34** යෙහෝවා දෙවි මෝ-
සෙස්ට අණ කළ සියල්ල ඊශ්‍රායෙල්
සෙනඟ කළෝය.[4] තම තමන්ගේ
පවුල්වලට අනුවද තම තමන්ගේ
පෙළපත්වලට අනුවද ඔවුහු කඳ-
වුරු බැඳගත්තෝය. එක් කඳවුරක
ගෝත්‍ර තුනක් කූඩාරම් බැඳගෙන
සිටියෝය.[5] ඔවුහු එම අනුපිළිවෙළ-
ටම පිටත්ව ගියෝය.[6]

**3** යෙහෝවා දෙවි සීනයි කන්ද[7]
මත මෝසෙස් සමඟ කතා
කළ අවස්ථාවේදී ආරොන්ගේ හා
මෝසෙස්ගේ පවුල්වල සිටි සාමා-
ජිකයන් මොවුන්ය. **2** ආරොන්ගේ
කුලුඳුල් පුත්‍රයාගේ නම නාදාබ්ය.
අනික් පුත්‍රයන්ගේ නම් අබිහු,[8] එලි-
යාසර්[9] හා ඉතමාර්ය.[10] **3** පූජක-
යන් ලෙස සේවය කරන පිණිස
බලය ලබා දී අභිෂේක කරනු
ලැබූ ආරොන්ගේ පුත්‍රයන් ඔවුන්ය.[11]
**4** නමුත් සීනයි පාළුකරයේදී නාදාබ්
හා අබිහු යෙහෝවා දෙවිගේ නීති-
යට පටහැනි ලෙස ගින්නක් ඔප්පු
කළ නිසා[12] යෙහෝවා දෙවි ඉදිරි-
යේ ඔවුහු මිය ගියෝය. ඔවුන් මිය
යන විට ඔවුන්ට පුත්‍රයෝ සිටියේ
නැත. එබැවින් ඔවුන් වෙනුවට එලි-
යාසර්[13] හා ඉතමාර්[14] තම පියා වූ
ආරොන් සමඟ පූජකයෝ ලෙස සේ-
වය කළෝය.

**2 පරි.**
1 ගණන් 10:25
2 උත් 15:5; නික් 12:37; නික් 38:26; ගණන් 1:46; ගණන් 11:21; ගණන් 14:29; ගණන් 26:51
3 ගණන් 1:47; ගණන් 3:15; ගණන් 26:62
4 ගණන් 1:54
5 ගණන් 1:52; ගණන් 2:2; ගණන් 24:2
6 ගණන් 10:28

**3 පරි.**
7 නික් 19:2; ලෙවී 25:1
8 නික් 6:23; ලෙවී 10:1; 1ලේක 24:2
9 නික් 6:25; ද්වි 10:6
10 නික් 38:21; 1ලේක 6:3
11 නික් 28:1; ලෙවී 8:2
12 ලෙවී 10:1; ගණන් 26:61
13 ගණන් 3:32; ගණන් 20:26
14 ගණන් 4:28; ගණන් 7:8

**2 තීරුව**
1 නික් 32:26; ගණන් 8:6; ගණන් 18:2; මලා 2:4
2 ගණන් 1:50; ගණන් 8:11; ගණන් 16:9
3 ගණන් 4:12
4 ගණන් 1:51; යෙසා 52:11
5 ගණන් 8:16; ගණන් 18:6
6 නික් 40:15; ගණන් 18:7; හෙබ්‍රෙ 7:11
7 ගණන් 16:40; 1සාමු 6:19; 2ලේක 26:16
8 ගණන් 3:41; ගණන් 3:45; ගණන් 8:18
9 නික් 13:2; නික් 34:19; ගණන් 8:17; ගණන් 18:15; ලූක් 2:23
10 නික් 13:15
11 ලෙවී 27:26; නෙහෙ 10:36
12 නික් 19:1

**5** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. **6** "ලෙවී ගෝත්‍ර-
යේ[1] අයව ඔබ වෙතට කැඳවන්න.
පූජක ආරොන්ට සේවය කරන
පිණිස[2] ඔවුන්ව ඔහුට භාර දෙන්න.
**7** ඔවුන් සම්මුඛ වීමේ කූඩාරම හා
සම්බන්ධ සියලු සේවාවන් ඉටු කළ
යුතුයි. මෙසේ ආරොන් වෙනුවෙන්ද
මුළු සෙනඟ වෙනුවෙන්ද ඔවුන් ඒ
සියලු වගකීම් ඉටු කළ යුතුයි.
**8** සම්මුඛ වීමේ කූඩාරමේ වැඩකට-
යුතු සඳහා ගන්නා සියලු භාණ්ඩ[3]
බලා කියා ගනිමින් ශුද්ධ කූඩාරම හා
සම්බන්ධ සේවාවන් ඔවුන් ඊශ්‍රායෙල්
සෙනඟ වෙනුවෙන් ඉටු කළ යුතුයි.[4]
**9** ලෙවීවරුන්ව ආරොන්ට හා ඔහු-
ගේ පුත්‍රයන්ට භාර දෙන්න. මන්ද
ආරොන්ට සේවය කිරීම සඳහා ඊශ්‍රා-
යෙල් පුත්‍රයන් අතරින් දෙනු ලැබූ
අය ඔවුහුය.*[5] **10** ඔබ ආරොන්ව
හා ඔහුගේ පුත්‍රයන්ව පූජකයන් ලෙස
පත් කරන්න.[6] පූජකයන්ට හිමි වග-
කීම් ඔවුන් ඉටු කළ යුතුයි. වෙ-
නත් කිසිවෙකු ශුද්ධස්ථානය ළඟට
ආවොත් ඔහුව මරා දැමිය යුතුයි."[7]
**11** යෙහෝවා දෙවි තවදුර-
ටත් මෝසෙස්ට මෙසේ කීවේය.
**12** "ඊශ්‍රායෙල් සෙනඟගේ කුලුඳුලන්
වෙනුවට මම ඔවුන් අතරේ සිටින
ලෙවීවරුන්ව ගන්නෙමි.[8] ලෙවීව-
රුන් මට අයිතිය. **13** සියලු කුලුඳු-
ලන් මට අයිතිය.[9] ඊජිප්තුවරුන්ගේ
සියලු කුලුඳුලන්ට මා පහර දුන්
දවසේදී[10] ඊශ්‍රායෙල්වරුන්ගේ සෑම
කුලුඳුල් දරුවෙකුව හා සතෙකුව
මට කැප කරන ලෙස මම නියම
කළෙමි.[11] මන්ද ඔවුන්ව මා සලකන්-
නේ ශුද්ධ අය ලෙසයි. ඒ නිසා ඔවුන්
මට අයිතිය. මා යෙහෝවා දෙවිය."
**14** සීනයි පාළුකරයේදී[12] යෙ-
හෝවා දෙවි තවදුරටත් මෝසෙස්ට
මෙසේ කීවේය. **15** "ලෙවීගේ පුත්‍ර-
යන්ව තම පෙළපත් අනුවද පවුල්

ගණන් **3:9*** හෙබ්‍රෙව් බසින්, නෙතුනිම්. එම වචනය, 'නෙතිනිම්වරු' නම් පදවියට සම්බන්ධකම් කියයි. එස්රා 2:43 බලන්න.

අනුවද ලියාපදිංචි කරන්න. මාසයක්
හෝ ඊට වඩා වැඩි වයසැති සියලුම
පිරිමින්ව ඔබ ලියාපදිංචි කළ යුතුයි.”[1]
**16** යෙහෝවා දෙවි අණ කළ ලෙස
මෝසෙස් ලෙවීවරුන්ව ලියාපදිංචි
කළේය. **17** ලෙවීගේ පුත්‍රයන්ගේ[2]
නම් මේවාය. ගේර්ෂොන්, කෝහාත්
හා මෙරාරීය.[3]

**18** ගේර්ෂොන්ගේ පුත්‍රයන්ගේ නම්
මේවාය. ලිබ්නි හා ෂිමෙයිය.[4] ඒ
එක් එක් පුත්‍රයාගේ නමින් පවුලක්
බිහි විය.

**19** කෝහාත්ගේ පුත්‍රයන්ගේ[5] නම්
මේවාය. අම්රාම්, ඉෂ්හාර්,[6] හෙබ්‍රොන්
හා උස්සියෙල්ය. ඒ එක් එක් පුත්‍රයා-
ගේ නමින් පවුලක් බිහි විය.

**20** මෙරාරීගේ පුත්‍රයන්ගේ[7] නම්
මේවාය. මාලී[8] හා මූෂීය.[9] ඒ එක් එක්
පුත්‍රයාගේ නමින් පවුලක් බිහි විය.

තම පෙළපත්වලට අනුව ලෙවී
ගෝත්‍රයේ පවුල් ඒවාය.

**21** ගේර්ෂොන්ගෙන් ලිබ්නිවරු[10]
හා ෂිමෙයිවරු[11] පැවතෙන්නෝය.
ගේර්ෂොන්වරු ලෙස හැඳින්වෙන්නේ
ඔවුහුය. **22** ගේර්ෂොන්වරුන් අත-
රේ සිටි මාසයක් හෝ ඊට
වඩා වැඩි වයසැති සියලු පිරිමින්ව
ලියාපදිංචි කරන ලදි.[12] ඔවුන්ගේ
මුළු ගණන හත්දහස් පන්සියයක්
විය.[13] **23** ගේර්ෂොන්වරු සම්මුඛ
වීමේ කූඩාරමට පිටුපසින්[14] එනම්,
බස්නාහිර පැත්තේ කඳවුරු බැඳ-
ගෙන සිටියෝය. **24** ගේර්ෂොන්ව-
රුන්ගේ පෙළපතේ* අධිපතියා වූයේ
ලායෙල්ගේ පුත්‍රයා වන එලියා-
සාෆ්ය. **25** ගේර්ෂොන්වරුන්ට[15]
සම්මුඛ වීමේ කූඩාරම හා සම්බන්ධව
තිබෙන වගකීම නම් කූඩාරම, එහි
පළමුවෙනි තිර රෙද්ද,[16] ඊට උඩින්
දමා තිබෙන ආවරණ,[17] සම්මුඛ වීමේ
කූඩාරමට ඇතුල් වන ස්ථානයේ
තිබෙන තිර රෙද්ද,[18] **26** කූඩාරම
හා පූජාසනය වටා තිබෙන මළුවේ
තිර,[19] එම මළුවේ දොරටුව සඳහා
තිබෙන තිරය,[1] ඒවායේ ලණු[2] සහ ඒ
හා සම්බන්ධ සියලු සේවාවන් බලා
කියා ගැනීමය.

**27** කෝහාත්ගෙන් අම්රාම්වරු,
ඉෂ්හාරිවරු, හෙබ්‍රොන්වරු හා උස්-
සියෙල්වරු පැවතෙන්නෝය. කෝ-
හාත්වරු[3] ලෙස හැඳින්වෙන්නේ
ඔවුහුය. **28** කෝහාත්වරුන් අත-
රේ සිටි මාසයක් හෝ ඊට වඩා
වැඩි වයසැති පිරිමින්ගේ මුළු ගණන
අටදහස් හයසියයක්* විය. ශුද්ධස්-
ථානයේ සේවාවන් ඔවුන්ට භාරව
තිබිණ.[4] **29** කෝහාත්ගේ පුත්‍රයෝ
සම්මුඛ වීමේ කූඩාරමේ දකුණු පැත්-
තේ කඳවුරු බැඳගෙන සිටියෝය.[5]
**30** කෝහාත්වරුන්ගේ පෙළපතේ
අධිපතියා වූයේ උස්සියෙල්ගේ[6]
පුත්‍රයා වන එලිෂාෆාන්ය. **31** කෝ-
හාත්වරුන්ගේ වගකීම[7] නම් ගිවිසුම්
පෙට්ටිය,[8] මේසය,[9] පහන් රුක,[10]
පූජාසන,[11] ශුද්ධස්ථානයේ වැඩකට-
යුතු සඳහා ගන්නා භාණ්ඩ,[12] කූඩාරම
ඇතුළේ තිබෙන තිරය[13] සහ ඒ හා
සම්බන්ධ සියලු සේවාවන් බලා කියා
ගැනීමය.

**32** ලෙවීවරුන් අතරේ සිටින අධි-
පතීන්ගේ අධිපතියා ලෙස පූජක
ආරොන්ගේ පුත්‍රයා වන එලියාසර්ව[14]
පත් කළේය. ශුද්ධස්ථානයේ සේවා-
වන් ඉටු කළ අයව අධීක්ෂණය කළේ
ඔහුය.

**33** මෙරාරීගෙන් මාලීවරු[15] හා
මූෂීවරු[16] පැවතෙන්නෝය. මෙරාරී-
වරු[17] ලෙස හැඳින්වෙන්නේ ඔවුහුය.
**34** මෙරාරීවරුන් අතරේ සිටින මාස-
යක් හෝ ඊට වඩා වැඩි වයසැති
සියලු පිරිමින්ව ලියාපදිංචි කරන ලදි.
ඔවුන්ගේ මුළු ගණන හයදහස් දෙ-
සියයක් විය.[18] **35** මෙරාරීවරුන්ගේ
පෙළපතේ අධිපතියා වූයේ අබිහයිල්-

**3 පරි.**
1 ගණන් 3:39
2 නික් 6:16; 1ලේක 6:1
3 ගණන් 26:57; 1ලේක 23:6
4 නික් 6:17; 1ලේක 6:17; 1ලේක 23:9
5 නික් 6:18; 1ලේක 6:18
6 1ලේක 6:38
7 නික් 6:19
8 1ලේක 6:29
9 1ලේක 24:30
10 1ලේක 6:20
11 1ලේක 23:9
12 ගණන් 3:15
13 ගණන් 4:39; ගණන් 4:40
14 ගණන් 1:53
15 ගණන් 4:24
16 නික් 26:7; නික් 35:11; ගණන් 4:25
17 නික් 26:14
18 නික් 26:36
19 නික් 27:9

**2 තීරුව**
1 නික් 27:16
2 නික් 35:18
3 ගණන් 3:19
4 ගණන් 4:35; ගණන් 4:36
5 ගණන් 1:53
6 නික් 6:22; 1ලේක 6:18
7 ගණන් 4:15
8 නික් 25:10; හෙබ්‍රෙ 9:4
9 නික් 25:23; හෙබ්‍රෙ 9:2
10 නික් 25:31
11 නික් 27:1; නික් 30:1
12 නික් 38:3
13 නික් 26:31; නික් 36:35
14 ගණන් 4:16; ගණන් 20:28
15 ගණන් 26:58
16 1ලේක 24:30
17 ගණන් 3:20
18 ගණන් 4:43; ගණන් 4:44

**ගණන් 3:24*** මූ.අ., “පිය වංශයේ.”

**ගණන් 3:28*** *MsamSyVg* යන අනුවාදවල සඳහන් වන්නේ, “හයසියය” කියාය. නමුත් ග්‍රීක සෙප්ටුඅජින්ට් පරිවර්තනයේ සමහර පිටපත්වල සඳහන් වන්නේ, “තුන්සියය” කියාය. එම ගණන හා 22, 34 ඡේදවල සඳහන් ගණන්වල මුළු එකතුව 22,000කි. එය 39වන ඡේදයේ සඳහන් දෙයට එකඟය.

ගේ පුත්‍රයා වන ෂූරියෙල්ය. ඔවුන්
කඳවුරු බැඳගෙන සිටියේ සම්මුඛ
වීමේ කූඩාරමේ උතුරු පැත්තේය.[1]
**36** මෙරාරීවරුන්ගේ වගකීම නම්
කූඩාරමේ රාමු,[2] එහි පොලු,[3] කණු,[4]
අඩි, එහි සියලු භාණ්ඩ[5] සහ ඒ හා
සම්බන්ධ සියලු සේවාවන්[6] බලා
කියා ගැනීමය. **37** මළුවේ කණු,[7]
ඒවායේ අඩි,[8] කූඤ්ඤ හා ලණු බලා
කියා ගත්තේද ඔවුන්ය.

**38** සම්මුඛ වීමේ කූඩාරම ඉදි-
රියෙන් එනම්, නැඟෙනහිර පැත්-
තේ මෝසෙස්ද ආරොන්ද ඔහුගේ
පුත්‍රයෝද කඳවුරු බැඳගෙන සිටි-
යෝය. ඊශ්‍රායෙල් සෙනඟ වෙනුවෙන්
ඔවුහු ශුද්ධස්ථානයේ සේවාවන් බලා
කියා ගත්තෝය.[9] වෙනත් කිසිවෙකු
ශුද්ධස්ථානය ළඟට ආවොත් එම
තැනැත්තාව මරනු ලැබුවේය.[10]

**39** මෝසෙස් හා ආරොන් යෙ-
හෝවා දෙවි අණ කළ ලෙස ලෙවීව-
රුන්ව තම තමන්ගේ පවුල්වලට
අනුව ලියාපදිංචි කළෝය. ඔවුන් අත-
රේ සිටි මාසයක් හෝ ඊට වඩා වැඩි
වයසැති පිරිමින්ගේ මුළු ගණන විසි-
දෙදහසක් විය.

**40** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. "ඊශ්‍රායෙල් සෙනඟ
අතරේ සිටින මාසයක් හෝ ඊට
වඩා වැඩි වයසැති සියලු කුලුඳුලන්ව
ලියාපදිංචි කරන්න.[11] ඔවුන් එක් එක්
කෙනාව ගණන් කරන්න. **41** ඊශ්‍රා-
යෙල් සෙනඟ අතරේ සිටින සියලු
කුලුඳුලන් වෙනුවට ලෙවීවරුන්ව මට
කැප කරන්න.[12] ඊශ්‍රායෙල් සෙනඟ-
ගේ සියලු කුලුඳුල් සතුන් වෙනුවට
ලෙවීවරුන්ගේ සතුන්ව මට කැප
කරන්න.[13] මා යෙහෝවා දෙවිය."
**42** මෝසෙස්, යෙහෝවා දෙවි අණ
කළ ලෙස ඊශ්‍රායෙල් සෙනඟ අතරේ
සිටි සියලු කුලුඳුලන්ව ලියාපදිංචි
කළේය. **43** මාසයක් හෝ ඊට වඩා
වැඩි වයසැති ලියාපදිංචි කළ කුලුඳුල්
පිරිමින්ගේ මුළු ගණන විසිදෙදහස්
දෙසිය හැත්තෑතුනක් විය.

**44** යෙහෝවා දෙවි මෝසෙස්ට
තවදුරටත් මෙසේ කීවේය.
**45** "ඊශ්‍රායෙල් සෙනඟ අතරේ සිටින
සියලු කුලුඳුලන් වෙනුවට ලෙවීව-
රුන්වද ඊශ්‍රායෙල් සෙනඟගේ සියලු
කුලුඳුල් සතුන් වෙනුවට ලෙවීව-
රුන්ගේ සතුන්වද ගන්න. ලෙවීව-
රුන් මට අයිතිය.[1] මා යෙහෝවා
දෙවිය. **46** ලෙවීවරුන්ගේ ගණනට
වඩා ඊශ්‍රායෙල් සෙනඟ අතරේ සිටින
කුලුඳුලන්ගේ ගණන වැඩිය.[2] වැඩි-
පුර සිටින දෙසිය හැත්තෑතුන්දෙ-
නාව මුදවාගන්නා[3] පිණිස **47** ඔබ
ඔවුන් එක් එක් කෙනා වෙනුවට ෂෙ-
කෙල්* පහ බැගින් ගත යුතුයි.[4] එම
මුදල ගෙවිය යුත්තේ ශුද්ධස්ථානයේ
තිබෙන ෂෙකෙලයේ බරට සමාන
ෂෙකෙල්වලිනුයි. ෂෙකෙලයක බර
ගේරා මිම්# විස්සකි.[5] **48** ලෙවීව-
රුන්ගේ ගණනට වඩා වැඩිපුර සිටින
කුලුඳුලන්ව මුදවාගන්නා පිණිස ගනු
ලබන එම මුදල් ආරොන්ට හා ඔහුගේ
පුත්‍රයන්ට දෙන්න." **49** ලෙවීවරුන්-
ගේ ගණනට වඩා වැඩිපුර සිටි අයව
මුදවාගන්නා පිණිස මෝසෙස් එම
මුදල් භාරගත්තේය. **50** ඊශ්‍රායෙල්
සෙනඟ අතරේ සිටි කුලුඳුලන්ගෙන්
ඔහු ෂෙකෙල් එක්දහස් තුන්සිය හැට-
පහක් එකතු කරගත්තේය. එලෙස
එකතු කරගත් එක ෂෙකෙලයක බර
ශුද්ධස්ථානයේ තිබෙන ෂෙකෙලයේ
බරට සමාන විය. **51** ඉන්පසු යෙ-
හෝවා දෙවි අණ කළ ලෙස මෝසෙස්
කුලුඳුලන්ව මුදවාගැනීමට ගත් එම
මුදල් ආරොන්ට හා ඔහුගේ පුත්‍රයන්ට
භාර දුන්නේය. යෙහෝවා දෙවි අණ
කළ ලෙසම මෝසෙස් කළේය.

**4** යෙහෝවා දෙවි මෝසෙස්ට හා
ආරොන්ට මෙසේ කීවේය.
**2** "ලෙවී ගෝත්‍රයට අයත් කෝහාත්-
ගේ පුත්‍රයන්ව[6] තමන්ගේ පෙළපත්ව-
ලට අනුවද පවුල්වලට අනුවද ගණන්
කරන්න. **3** සම්මුඛ වීමේ කූඩාරමේ

---

**ගණන් 3:47*** ෂෙකෙලයක් යනු ග්‍රෑම් 11.4කි.
**47#** ගේරා එකක් යනු ග්‍රෑම් 0.57කි.

---

**3 පරි.**
1 ගණන් 1:53
2 නික් 36:20
3 නික් 36:31
4 නික් 26:32; නික් 26:37; නික් 36:38
5 නික් 27:19
6 ගණන් 4:31
7 නික් 27:10
8 නික් 27:11
9 ගණන් 18:5
10 ගණන් 3:10
11 ගණන් 3:15
12 ගණන් 3:12; ගණන් 8:16
13 නික් 13:2; ගණන් 18:15

**2 තීරුව**
1 ගණන් 3:41
2 ගණන් 3:39
3 ගණන් 18:15
4 ලෙවී 27:6; ගණන් 18:16
5 නික් 30:13; ලෙවී 27:25

**4 පරි.**
6 ගණන් 3:19; ගණන් 3:27

සේවාවන් කිරීම සඳහා පැමිණෙන[1]
අවුරුදු තිහත්[2] පනහත්[3] අතර වූ සිය-
ලුදෙනාවම ගණන් කරන්න.
4 "කෝහාත්ගේ පුත්‍රයන්ට සම්මුඛ
වීමේ කූඩාරමේ කිරීමට නියමිත සේ-
වය[4] ඉතා ශුද්ධය. ඔවුන්ගේ වගකීම්
මේවාය. 5 ඊශ්‍රායෙල් සෙනඟ වෙ-
නත් තැනකට ගමන් කිරීමට සූදානම්
වන අවස්ථාවලදී ආරොන් සහ ඔහු-
ගේ පුත්‍රයන් සම්මුඛ වීමේ කූඩාරම
ඇතුළට ගොස් ගිවිසුම් පෙට්ටිය[5]
වෙන් කර තබන තිර රෙද්ද[6] ගලවා
එයින් ගිවිසුම් පෙට්ටිය වැසිය යුතුයි.
6 ඊට උඩින් ඔවුන් සීල් මත්ස්‍යයාගේ
සම්වලින්[7] සෑදූ වැස්මක් හා නිල්
පැහැති රෙද්දක් දැමිය යුතුයි. ඉන්පසු
පෙට්ටියේ වළලු තුළට එහි පොලු[8]
දැමිය යුතුයි.
7 "ඔවුන් දෙවිට පුදන රොටි තබා
තිබෙන මේසය[9] මත නිල් පැහැති
රෙද්දක් එළා ඊට උඩින් දීසිද[10] කුස-
ලානද පාත්‍රද පාන පූජා වත් කිරීමට
භාවිත කරන බඳුන්ද[11] තැබිය යුතුයි.
නොකඩවා මේසය මත තබන රො-
ටිත්[12] ඒ මත තැබිය යුතුයි. 8 ඉන්-
පසු ඒ සියල්ල තද රතු පැහැති
රෙද්දකින්[13] වසා ඊට උඩින් සීල්
මත්ස්‍යයාගේ සම්වලින්[14] සෑදූ වැස්-
මක් දැමිය යුතුයි. ඉන්පසු මේසයේ
වළලුවලට එහි පොලු[15] දැමිය යුතුයි.
9 පහන් රුකද[16] එහි පහන්ද[17] පහන්
තිර අල්ලන අඬුද[18] දැවී ගිය පහන්
තිර දමන භාජනද[19] පහන් දැල්-
වීම සඳහා භාවිත කරන තෙල්
දමා තිබෙන භාජනද[20] නිල් පැහැති
රෙද්දකින් එතිය යුතුයි. 10 ඉන්-
පසු ඔවුන් පහන් රුකද එහි සියලු
භාණ්ඩ හා මෙවලම්ද සීල් මත්ස්‍ය-
යාගේ සම්වලින්[21] සෑදූ වැස්මකින්
ඔතා කද බැඳගත යුතුයි. 11 රන්
පූජාසනය[22] නිල් පැහැති රෙද්දකින්
වසා ඊට උඩින් සීල් මත්ස්‍යයා-
ගේ සම්වලින්[23] සෑදූ වැස්මක් දැමිය
යුතුයි. පූජාසනයේ පොලු[24] එහි වළලු
තුළට දැමිය යුතුයි. 12 ශුද්ධස්ථා-
නයේ නිතරම සේවය කරන විට
භාවිත කරන භාණ්ඩ[1] සියල්ල නිල්
පැහැති රෙද්දකින් එතිය යුතුයි. ඉන්-
පසු එයද සීල් මත්ස්‍යයාගේ සම්ව-
ලින්[2] සෑදූ වැස්මකින් ඔතා කද
බැඳගත යුතුයි.
13 "ඔවුන් අනික් පූජාසනයෙන්
තෙල් මිශ්‍ර අළු ඉවත් කළ පසු[3]
රත්නිල් පැහැගැන්වූ ලොම්වලින්
සෑදූ රෙද්දකින් එය වැසිය යුතුයි.
14 ඉන්පසු පූජාසනයේ සේවාවන්
සඳහා භාවිත කරන අඟුරු දමන
භාජන, කොකු, සවල, බේසම් හා
අනික් සියලු භාණ්ඩ[4] එම රෙද්ද මත
තබා සීල් මත්ස්‍යයාගේ සම්වලින්
සෑදූ වැස්මකින් ඒවා වැසිය යුතුයි.
පූජාසනයේ පොලු[5] එහි වළලුවලට
දැමිය යුතුයි.
15 "ඊශ්‍රායෙල් සෙනඟ වෙනත්
තැනකට ගමන් කිරීමට සූදානම් වන
අවස්ථාවලදී ආරොන් හා ඔහුගේ පුත්‍ර-
යන් ශුද්ධස්ථානයේ තිබෙන සියලු
භාණ්ඩ[6] හා මෙවලම් එලෙස වැසිය
යුතුයි.[7] ඉන්පසු කෝහාත්ගේ පුත්‍ර-
යන් ඇවිත් ඒ සියල්ල රැගෙන යා
යුතුයි.[8] මන්ද සම්මුඛ වීමේ කූඩාර-
මට අයත් භාණ්ඩ රැගෙන යෑමේ
වගකීම පැවරී තිබෙන්නේ කෝහාත්-
ගේ පුත්‍රයන්ටය.[9] නමුත් ඔවුන් කිසි-
විටෙකවත් ශුද්ධස්ථානයේ තිබෙන
කිසිවක් නොඇල්ලිය යුතුයි.[10] එසේ
කළොත් ඔවුහු මිය යනු ඇත.
16 "පහන් දැල්වීමට භාවිත කරන
තෙල්,[11] සුගන්ධ ද්‍රව්‍ය,[12] නිතිපතා
ඔප්පු කරන ධාන්‍ය පූජාව[13] හා
ශුද්ධ තෛලය[14] බලා කියා ගැනී-
මේ[15] වගකීම පැවරී තිබෙන්නේ පූජක
ආරොන්ගේ පුත්‍රයා වන එලියාසර්-
ටය. සම්මුඛ වීමේ කූඩාරම මුළුම-
නින්ම එනම්, ශුද්ධස්ථානය හා එහි
භාණ්ඩ සියල්ල බලාගැනීමේ වගකී-
මද පැවරී තිබෙන්නේ ඔහුටය."
17 යෙහෝවා දෙවි මෝසෙස්ට
හා ආරොන්ට තවදුරටත් මෙසේ
කීවේය. 18 "කෝහාත්ගෙන්[16] පැව-

**4 පරි.**
1 ගණන් 4:30
1ලේක 6:48
1ලේක 23:24
1ලේක 28:13
2 1ලේක 23:3
ලූක් 3:23
3 ගණන් 8:25
4 ගණන් 3:31
ගණන් 4:15
ගණන් 4:19
5 නික් 25:10
නික් 37:1
6 නික් 26:31
නික් 36:35
නික් 40:3
ලෙවී 16:2
ගණන් 3:31
හෙබ්‍රෙ 9:3
7 නික් 25:5
8 නික් 25:13
9 නික් 25:23
ලෙවී 24:6
10 නික් 25:29
11 නික් 37:16
12 ලෙවී 24:5
13 නික් 25:4
14 නික් 25:5
15 නික් 25:28
16 නික් 25:31
17 නික් 25:37
18 නික් 25:38
19 නික් 37:23
20 නික් 37:24
21 ගණන් 4:6
22 නික් 30:1
නික් 37:25
23 නික් 25:5
24 නික් 30:5

**2 තීරුව**
1 ගණන් 3:31
2 නික් 35:23
3 ලෙවී 6:12
4 නික් 27:3
5 නික් 27:6
6 ගණන් 3:8
7 ගණන් 4:5
8 ගණන් 7:9
ගණන් 10:21
ද්වි 31:9
1ලේක 15:2
9 ගණන් 3:31
10 2සාමු 6:6
11 නික් 27:20
ලෙවී 24:2
12 නික් 30:34
ගීතා 141:2
එළි 5:8
13 නික් 29:40
14 නික් 29:7
නික් 30:23
ලෙවී 8:12
ගීතා 133:2
15 ගණන් 3:32
16 ගණන් 3:27

තෙන්නන්ට ලෙවීවරුන් අතරින් පහව
යැමට ඉඩ නොදෙන්න. **19** මා
ඔබට පැවසූ දේවල් ඒ විදිහටම
කරන්න. අතිශුද්ධ දේවල් ළඟට යන
විට කෝහාත්වරුන්ගේ ජීවිත රැකෙන
පිණිස ඔබ එසේ කළ යුතුයි.[1] ආරොන්
සහ ඔහුගේ පුත්‍රයන් සම්මුඛ වීමේ
කූඩාරමට ගොස් කෝහාත්වරුන් එක්
එක් කෙනා රැගෙන යා යුතු දේවල්
මොනවාද කියා තීරණය කර ඔවුන්ට
නියමිත වැඩ කොටස පැවරිය යුතුයි.
**20** ශුද්ධ දේවල් දෙස බැලීමට මො-
හොතකටවත් ඔවුන් ශුද්ධ කූඩාරම
ඇතුළට නොපැමිණිය යුතුයි. එසේ
කළොත් ඔවුහු මිය යනු ඇත.”[2]

**21** පසුව යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. **22** “ගේර්-
ෂොන්ගේ පුත්‍රයන්ව[3] ඔවුන්ගේ
පෙළපත් අනුවද පවුල් අනුවද ගණන්
කරන්න. **23** සම්මුඛ වීමේ කූඩාර-
මේ සේවාවන් කිරීම සඳහා පැමි-
ණෙන අවුරුදු තිහත් පනහත් අතර වූ
සියලුදෙනාවම ලියාපදිංචි කරන්න.[4]
**24** ගේර්ෂොන්වරුන් බලා කියා ගත
යුතු දේවල් හා රැගෙන යා යුතු දේවල්
නම්[5] **25** ශුද්ධ කූඩාරමේ එනම්,
සම්මුඛ වීමේ කූඩාරමේ[6] තිර රෙද්ද,[7]
එම තිර රෙද්දට උඩින් දමන ආව-
රණය,[8] සීල් මත්ස්‍යයාගේ සම්ව-
ලින් සෑදූ ආවරණය,[9] සම්මුඛ වීමේ
කූඩාරමට ඇතුල් වන ස්ථානයේ
තිබෙන තිරය,[10] **26** ශුද්ධ කූඩාරම
හා පූජාසනය වටා තිබෙන මළු-
වේ තිර රෙදි,[11] මළුවේ දොරටුව
සඳහා තිබෙන තිරය,[12] ඒවායේ ලණු,
ඔවුන්ගේ සේවාවන් සඳහා යොදා-
ගන්නා සියලු ආයුධ සහ එහි වැඩක-
ටයුතු සඳහා භාවිත කරන උපකරණ
යනාදියයි. එය ගේර්ෂොන්වරුන්ට
පැවරී තිබෙන වගකීමය. **27** ගේර්-
ෂොන්ගේ පුත්‍රයන්[13] බලා කියා ගත
යුතු දේවල් හා රැගෙන යා යුතු දේවල්
මොනවාද කියා ආරොන් හා ඔහුගේ
පුත්‍රයන්[14] නියම කළ පසු ඔවුන්
තමන්ට නියමිත සේවාවන් ඉටු කළ
යුතුයි. ඔවුන් එක් එක් කෙනා ඉටු
කළ යුතු වගකීම ඔබ ඔවුන්ට පැවරිය
යුතුයි. **28** සම්මුඛ වීමේ කූඩාරම
හා සම්බන්ධව ගේර්ෂොන්වරුන්ට[1]
නියම කළ සේවාවන් ඒවාය. ඔවුන් ඒ
සියලු වගකීම් ඉටු කළ යුත්තේ පූජක
ආරොන්ගේ පුත්‍රයා වන ඉතමාර්ගේ[2]
අධීක්ෂණය යටතේය.

**29** “මෙරාරීගේ පුත්‍රයන්ව[3] ඔවුන්-
ගේ පෙළපත්වලට අනුව හා පවුල්-
වලට අනුව ලියාපදිංචි කරන්න.
**30** සම්මුඛ වීමේ කූඩාරමේ සේවා-
වන් කිරීම සඳහා පැමිණෙන අවුරුදු
තිහත් පනහත් අතර වූ සියලුදෙ-
නාව ලියාපදිංචි කරන්න.[4] **31** සම්-
මුඛ වීමේ කූඩාරම හා සම්බන්ධව
ඔවුන්ට තිබෙන වගකීම්[5] නම් සම්මුඛ
වීමේ කූඩාරමේ රාමු,[6] එහි පොලු,[7]
කණු,[8] අඩි,[9] **32** මළුව වටා තිබෙන
කණු,[10] ඒවායේ අඩි,[11] කූඤ්ඤ,[12]
ලණු, ඔවුන්ගේ සියලු ආයුධ සහ වැඩ
කිරීම සඳහා භාවිත කරන උපකරණ
රැගෙන යෑමයි. ඔවුන් එක් එක් කෙනා
රැගෙන යා යුතු දේ නිශ්චිතව සඳහන්
කර ඒ වැඩ කොටස ඔවුන්ට පව-
රන්න.[13] **33** සම්මුඛ වීමේ කූඩාරම
හා සම්බන්ධව මෙරාරීගේ පුත්‍රයන්ට[14]
නියම කළ සේවාවන් ඒවාය. ඔවුන් ඒ
සියලු වගකීම් ඉටු කළ යුත්තේ පූජක
ආරොන්ගේ පුත්‍රයා වන ඉතමාර්ගේ
අධීක්ෂණය යටතේය.”[15]

**34** මෝසෙස්ද ආරොන්ද සෙනඟ
අතරේ සිටි අධිපතීහුද[16] කෝහාත්ගේ
පුත්‍රයන්ව[17] ඔවුන්ගේ පෙළපත්වලට
අනුව හා පවුල්වලට අනුව ලියා-
පදිංචි කළෝය. **35** සම්මුඛ වීමේ
කූඩාරමේ[18] සේවාවන් කිරීම සඳහා
පැමිණි අවුරුදු තිහත්[19] පනහත්[20]
අතර වූ සියලුදෙනාව ඔවුහු ලියාප-
දිංචි කළෝය. **36** තම තමන්ගේ
පවුල්වලට අනුව ලියාපදිංචි කළ අය-
ගේ මුළු ගණන දෙදහස් හත්සිය
පනහක් විය.[21] **37** සම්මුඛ වීමේ
කූඩාරමේ සේවය කරන කෝහාත්ව-
රුන්ගේ මුළු ගණන එයයි. යෙහෝවා

**4 පරි.**
**1** ගණන් 4:4
**2** නික් 19:21; 1සාමු 6:19
**3** ගණන් 3:21
**4** ගණන් 4:3
**5** ගණන් 3:25
**6** නික් 26:7; නික් 36:14
**7** නික් 26:1; නික් 36:8
**8** නික් 26:14
**9** නික් 36:19
**10** නික් 26:36; නික් 36:37
**11** නික් 27:9; නික් 38:9
**12** නික් 27:16; නික් 38:18
**13** ගණන් 3:21; ගණන් 3:23
**14** ගණන් 3:3; ගණන් 3:10

**2 තීරුව**
**1** ගණන් 3:25
**2** නික් 6:23; ගණන් 3:4; ගණන් 4:33; ගණන් 7:8
**3** නික් 6:19; ගණන් 3:33
**4** ගණන් 4:3; ගණන් 4:23
**5** ගණන් 3:36
**6** නික් 26:15; නික් 36:20
**7** නික් 26:26; නික් 36:31
**8** නික් 26:37; නික් 36:38
**9** නික් 26:19; නික් 38:27
**10** නික් 27:10
**11** නික් 27:11
**12** නික් 27:19
**13** ගණන් 3:8
**14** ගණන් 3:33
**15** ගණන් 4:28
**16** ගණන් 1:16; යොෂු 22:14
**17** ගණන් 3:19; ගණන් 3:27; ගණන් 3:29
**18** ගණන් 4:3; ගණන් 8:26
**19** ගණන් 4:47
**20** ගණන් 8:25
**21** ගණන් 3:28

දෙවි මෝසෙස්ට අණ කළ පරිදි මෝසෙස් හා ආරොන් ඔවුන්ව ලියාපදිංචි[1] කළෝය.

**38** ඔවුන්ගේ පෙළපත්වලට අනුව හා පවුල්වලට අනුව ගේර්ෂොන්ගේ පුත්‍රයන්වද[2] ලියාපදිංචි කළෝය. **39** සම්මුඛ වීමේ කූඩාරමේ සේවාවන් කිරීම සඳහා පැමිණි අවුරුදු තිහත් පනහත් අතර වූ සියලුදෙනාව[3] **40** තම තමන්ගේ පවුල් අනුවද පෙළපත් අනුවද ලියාපදිංචි කළෝය. ඔවුන්ගේ මුළු ගණන දෙදහස් හයසිය තිහක් විය.[4] **41** සම්මුඛ වීමේ කූඩාරමේ සේවය කරන ගේර්ෂොන්ගේ පුත්‍රයන්ගේ මුළු ගණන එයයි. යෙහෝවා දෙවි අණ කළ පරිදි මෝසෙස් හා ආරොන් ඔවුන්ව ලියාපදිංචි කළෝය.[5]

**42** ඔවුන්ගේ පෙළපත්වලට හා පවුල්වලට අනුව මෙරාරීගේ පුත්‍රයන්වද ලියාපදිංචි කළෝය. **43** සම්මුඛ වීමේ කූඩාරමේ සේවාවන් කිරීම සඳහා පැමිණි අවුරුදු තිහත් පනහත් අතර වූ සියලුදෙනාව[6] **44** තම තමන්ගේ පවුල් අනුවද පෙළපත් අනුවද ලියාපදිංචි කරන ලදි. ඔවුන්ගේ මුළු ගණන තුන්දහස් දෙසියයක් විය.[7] **45** සම්මුඛ වීමේ කූඩාරමේ සේවය කරන මෙරාරීගේ පුත්‍රයන්ගේ මුළු ගණන එයයි. යෙහෝවා දෙවි මෝසෙස්ට අණ කළ පරිදි මෝසෙස් හා ආරොන් ඔවුන්ව ලියාපදිංචි කළෝය.[8]

**46** මෝසෙස්, ආරොන් හා ඊශ්‍රායෙල් සෙනඟ අතරේ සිටි අධිපතීහු ලෙවීවරුන්ව ඔවුන්ගේ පවුල් අනුවද පෙළපත් අනුවද ලියාපදිංචි කළෝය. **47** බර වැඩ කිරීම සඳහාද සම්මුඛ වීමේ කූඩාරමේ බඩු බාහිරාදිය රැගෙන යෑම[9] සඳහාද පැමිණි අවුරුදු තිහත් පනහත් අතර වූ සියලුදෙනාගේ[10] **48** මුළු ගණන අටදහස් පන්සිය අසූවක් විය.[11] **49** යෙහෝවා දෙවි අණ කළ පරිදි මෝසෙස් ඔවුන්ව ලියාපදිංචි කළේය. එක් එක් කෙනාට නියම කළ වැඩ කොටසට අනුවද රැගෙන යා යුතු දේවලට අනුවද ඔහු ඔවුන්ව ලියාපදිංචි කළේය. යෙහෝවා දෙවි අණ කළ ලෙසම මෝසෙස් කළේය.[1]

**5** යෙහෝවා දෙවි මෝසෙස්ට මෙසේ කීවේය. **2** “ලාදුරු රෝගීන් සියලුදෙනාවද[2] ශරීරයෙන් ශ්‍රාවයක් ගලන සියලුදෙනාවද[3] මළ සිරුරක් ස්පර්ශ කිරීම නිසා අපවිත්‍ර වූ සියලුදෙනාවද[4] කඳවුරෙන් පිටතට යවන්න කියා ඊශ්‍රායෙල් සෙනඟට අණ කරන්න. **3** පුරුෂයෙකු වුවත් ස්ත්‍රියක වුවත් එලෙස අපවිත්‍රව සිටින සෑම කෙනෙකුවම කඳවුරෙන් පිටතට යවන්න.[5] මාගේ ශුද්ධ කූඩාරම[6] පිහිටුවා තිබෙන කඳවුර ඔවුන් නිසා අපවිත්‍ර නොවන පිණිස[7] එසේ කරන්න.” **4** යෙහෝවා දෙවි මෝසෙස්ට අණ කළ ලෙසම ඊශ්‍රායෙල් සෙනඟ අපවිත්‍ර වූ සියලුදෙනාව කඳවුරෙන් පිටතට යැව්වෝය.

**5** යෙහෝවා දෙවි තවදුරටත් මෝසෙස්ට මෙසේ කීවේය. **6** “ඊශ්‍රායෙල් සෙනඟට මෙසේ කියන්න. ‘පුරුෂයෙකු හෝ ස්ත්‍රියක හෝ යෙහෝවා දෙවි වන මට ද්‍රෝහී වෙමින් මොනයම් ආකාරයක හෝ පාපයක් කළොත් ඒ තැනැත්තා වරදකරුවෙක් වන්නේය.[8] **7** ඒ තැනැත්තා තමා කළ පාපය හෙළි කළ යුතුයි.[9] තමා අතින් වරද සිදු වූ තැනැත්තාට සම්පූර්ණ අලාභය ඔහු වන්දියක් ලෙස ගෙවිය යුතුයි. ඊට අමතරව අලාභයෙන් පහෙන් කොටසක්ද[10] ඔහු එම තැනැත්තාට ගෙවිය යුතුයි. **8** පාඩුව වින්ද තැනැත්තා මිය ගොස් ඇත්නම් ඔහුගේ කිට්ටු නෑදෑයෙකුට වන්දිය දිය යුතුයි. නමුත් වන්දිය භාරගැනීමට කිට්ටු නෑදෑයෙකු නැත්නම් එම වන්දිය යෙහෝවා දෙවිට දිය යුතුයි. එය පූජකයාට අයිති වනු ඇත. වරදකරුගේ පාපයට සමාව ලබාගැනීම සඳහා ඔප්පු කිරීමට ගෙනෙන බැටළුවා සමඟ එම වන්දිය පූජකයාට දිය යුතුයි.[11]

**9** “ ‘ඊශ්‍රායෙල් සෙනඟ පරිත්‍යාගයක්[12] ලෙස පූජකයාට දෙන සෑම

4 පරි.
1 ගණන් 3:15
2 ගණන් 3:21
3 ගණන් 4:3, ගණන් 4:23
4 ගණන් 3:22
5 ගණන් 3:15, ගණන් 4:22
6 ගණන් 4:3, ගණන් 4:23, ගණන් 4:30, ගණන් 4:35, ගණන් 4:39, ගණන් 8:26
7 ගණන් 3:34
8 ගණන් 3:15, ගණන් 4:29
9 ගණන් 4:15, ගණන් 4:24, ගණන් 4:31
10 ගණන් 4:3, ගණන් 4:23, ගණන් 4:30
11 ගණන් 3:39

2 තීරුව
1 ගණන් 4:37, ගණන් 4:41, ගණන් 4:45

5 පරි.
2 ලෙවී 13:46, ගණන් 12:14, 2ලේක 26:21
3 ලෙවී 15:2
4 ලෙවී 22:4, ගණන් 19:11, ගණන් 31:19
5 2රාජා 7:3
6 නික් 25:8, ලෙවී 26:11, යොෂු 22:19, 2කොරි 6:16
7 ගණන් 19:22
8 ලෙවී 5:1, ලෙවී 5:17, ලෙවී 6:2
9 ලෙවී 5:5, යොෂු 7:19, ගීතා 32:5, යාකො 5:16
10 ලෙවී 6:5
11 ලෙවී 5:16, ලෙවී 6:7, ලෙවී 7:7
12 නික් 29:28, ගණන් 18:8

ශුද්ධ දෙයක්ම[1] පූජකයාට අයිති වන්-
නේය.[2] **10** එක් එක් කෙනා ගෙ-
නෙන ශුද්ධ පරිත්‍යාගයන් පූජකයාට
අයිතිය. පූජකයාට දෙන ඕනෑම දෙ-
යක්ද ඔහුට අයිතිය.' "

**11** යෙහෝවා දෙවි තවදුර-
ටත් මෝසෙස්ට මෙසේ කීවේය.
**12** "ඊශ්‍රායෙල් සෙනඟට මෙසේ
කියන්න. 'ස්ත්‍රියක් තම පුරුෂයාට
ද්‍රෝහි වෙමින්[3] **13** වෙනත් පුරුෂ-
යෙකු සමඟ සයනය කර[4] එය ඇගේ
පුරුෂයාගෙන් සඟවනු ලැබුවොත්[5]
ඇගේ වරද හෙළි නොවීමට ඉඩ
තිබේ. එමෙන්ම ඇය එම දූෂ්‍ය ක්‍රියාව
කළ බවට ඇයට විරුද්ධව සාක්ෂි
දීමට කිසිවෙකු නොසිටින්නට පුළු-
වන. **14** නමුත් පසු කලෙක, ඇය
ද්‍රෝහි වී ඇතැයි කියා පුරුෂයාට
සැකයක් ඇති වී ඔහු ඇයට වෛර
කිරීමට ඉඩ තිබේ.[6] එසේත් නැත්නම්
භාර්යාව එවැනි දූෂ්‍ය ක්‍රියාවක් නො-
කළත් ඇය ද්‍රෝහි වී ඇතැයි කියා
පුරුෂයාට සැකයක් ඇති වී ඇයට
වෛර කිරීමට ඉඩ තිබේ. එවැනි
අවස්ථාවකදී ඔහු කළ යුත්තේ මෙ-
යයි. **15** එම පුරුෂයා තම භාර්යා-
වව පූජකයා වෙතට ගෙනා යුතුයි.[7]
පූජාවක් ඔප්පු කිරීම සඳහා බාර්ලි
පිටි ඒපාවකින්* දහයෙන් කොටසක්ද
ගෙනා යුතුයි. එය සැකයක් ඇති වූ
නිසා ඔප්පු කරන ධාන්‍ය පූජාවක් වන
බැවින් පිටි මත තෙල් හෝ කට්ටකු-
මංජල්[8] හෝ නොදමන්න. ඔහු එය
ඔප්පු කරන්නේ එම වරද සිහි කරන
පිණිසය. එම පූජාව සිහිවීමේ ධාන්‍ය
පූජාවකි.

**16** " 'පූජකයා ඇයව යෙහෝවා
දෙවි වන මා ඉදිරියට කැඳවිය
යුතුයි.[9] **17** ඉන්පසු පූජකයා මැටි
භාජනයකට පිරිසිදු වතුර* ටිකක්
ගෙන ශුද්ධ කූඩාරමේ භූමියෙන් ගත්
පස් ටිකක් එම වතුරට මිශ්‍ර කළ
යුතුයි. **18** පූජකයා යෙහෝවා දෙවි
වන මා ඉදිරියට කැඳවූ එම ස්ත්‍රියගේ
කොණ්ඩේ ලිහා සිහි වීමේ ධාන්‍ය
පූජාව එනම්, සැකයක් ඇති වූ නිසා
ඔප්පු කරන පූජාව[1] ඇගේ අල්ල මත
තැබිය යුතුයි. ශාපයක් ගෙනෙන
තිත්ත වතුර සහිත භාජනය පූජකයා
තම අතේ තබාගත යුතුයි.[2]

**19** " 'ඉන්පසු පූජකයා ඇගෙන් දිවු-
රුම් ගනිමින් මෙසේ කිව යුතුයි. "ඔබ
ඔබේ පුරුෂයා යටතේ සිටින කාල-
යේදී වෙන පුරුෂයෙකු සමඟ කිසිවි-
ටෙකවත් සයනය කළේ නැත්නම්[3]
ඔහුට විරුද්ධව කිසි දූෂ්‍ය ක්‍රියාවක්
කළේ නැත්නම් ශාපයක් ගෙනෙන
මේ තිත්ත වතුරෙන් ඔබට කිසි
හානියක් සිදු නොවේවා! **20** නමුත්
ඔබ ඔබේ පුරුෂයා යටතේ සිටියදී[4]
වෙනත් පුරුෂයෙකු සමඟ සයනය
කර[5] ඔබේ පුරුෂයාට විරුද්ධව දූෂ්‍ය
ක්‍රියාවක් කළේ නම් . . ." **21** ශාප-
යක් ඇතුළත් මෙම දිවුරුම පූජකයා
ඇයට ප්‍රකාශ කළ යුතුයි.[6] "ඔබ
බොරු දිවුරුමක් දුන් නිසා යෙහෝවා
දෙවි මේ ශාපය ඔබ පිටට ගෙනෙනු
ඇත. ඔබේ සෙනඟට එය පාඩමක්
වන්නේය. යෙහෝවා දෙවි ඔබේ බඩ
ඉදිමීමට සලස්වනු ඇත. ඔබ ඔබේ
ජීවිත කාලයේදී වඳ ස්ත්‍රියකව* සිටිනු
ඇත.[7] **22** ශාපයක් ගෙනෙන මේ
වතුර ඔබ බිවූ විට ඔබේ බඩ ඉදිමෙන්-
නේය. ඔබ වඳ ස්ත්‍රියක වනු ඇත."
එවිට ස්ත්‍රිය, "එසේම වේවා! එසේම
වේවා"* කියා පැවසිය යුතුයි.

**23** " 'පූජකයා එම ශාපය ලිය-
විල්ලක සටහන් කර[8] එය තිත්ත
වතුරෙන් මකා දැමිය යුතුයි.[9]
**24** ඉන්පසු පූජකයා ශාපයක් ගෙ-
නෙන එම තිත්ත වතුර ස්ත්‍රියට
බොන්න දිය යුතුයි.[10] එම වතුර
පානය කළ විට ඇයට වේදනාවක්
ඇති වන්නේය. **25** සැකයක් ඇති

**5 පරි.**
1 ලෙවී 6:17, ලෙවී 7:6, ලෙවී 10:13
2 ද්වි 18:3, එස 44:29, 1කොරි 9:13
3 ගණන් 5:20, හොෂෙ 4:13
4 ලෙවී 18:20, ද්වි 5:18
5 ගීතා 26:4, හිතෝ 30:20
6 හිතෝ 6:34, සල 8:6
7 ගණන් 5:30
8 ලෙවී 5:11
9 යෙරෙ 17:10, මලා 3:5, හෙබ්‍රෙ 13:4

**2 තීරුව**
1 ගණන් 5:15, ගණන් 5:25
2 ගණන් 5:22, ගණන් 5:24
3 රෝම 7:2, හෙබ්‍රෙ 13:4
4 ගණන් 5:12, 1කොරි 6:9
5 ලෙවී 18:20, ගණන් 5:13
6 යොෂු 6:26, 1සාමු 14:24, 1රාජා 8:31
7 උත් 46:26
8 2ලේක 34:24, යෙරෙ 51:60
9 ක්‍රියා 3:19
10 ගණන් 5:18

---

**ගණන් 5:15*** ඒපාවක් යනු ලීටර් 22ක් දැමිය හැකි මිනුම් භාජනයකි. **17*** මූ.අ., "ශුද්ධ වතුර." සෙප්ටුඅජින්ට් පරිවර්තනයට අනුව, "දිය පහරකින් ලබාගත් නැවුම් වතුර."

**ගණන් 5:21*** මුල් භාෂාවේ කළව ක්ෂය වෙයි යන අදහස තිබේ. කළව යන්නෙන් ප්‍රජනනේන්ද්‍රිය අදහස් විය හැකියි. **22*** හෙබ්‍රෙව් භාෂාවට අනුව, *ආමෙන්! ආමෙන්!*

වූ නිසා ඔප්පු කිරීමට ගෙනා ධාන්‍ය
පූජාව[1] ඇගේ අතින් ගෙන පූජකයා
එය සෙලවීමේ පූජාවක් ලෙස යෙ-
හෝවා දෙවි වන මා ඉදිරියේ ඒ
මේ අත සෙලවිය යුතුයි. ඉන්පසු
එය පූජාසනය ළඟට ගෙනා යුතුයි.
**26** පූජකයා එම ධාන්‍ය පූජාවෙන්
ටිකක් ගෙන සිහිගැන්වීමක් ලෙස[2]
පූජාසනය මත දැවිය යුතුයි. ඉන්-
පසු ස්ත්‍රියට තිත්ත වතුර බොන්න
දිය යුතුයි. **27** ඇය තම පුරුෂයාට
ද්‍රෝහී වී දූෂ්‍ය ක්‍රියාවක් කර ඇත්නම්[3]
ශාපයක් ගෙනෙන එම වතුර බිව් පසු
ඇයට වේදනාවක් දැනෙනු ඇත.
එවිට ඇගේ බඩ ඉදිමෙන්නේය. ඇය
වඳ ස්ත්‍රියක වන්නේය. එම ස්ත්‍රිය
සෙනඟ ඉදිරියේ ශාප ලත් තැනැත්-
තියක වන්නීය.[4] **28** නමුත් ස්ත්‍රිය
තම පුරුෂයාට විරුද්ධව දූෂ්‍ය ක්‍රියා-
වක් කර නැත්නම් එම දඬුවම ඇය
පිටට පැමිණෙන්නේ නැත.[5] ඇය දරු-
වන් පිළිසිඳගන්නීය.

**29** "'සැකයක්[6] ඇති වූ විට අනුග-
මනය කළ යුතු නීතිය එයයි. ස්ත්‍රියක
තම පුරුෂයා යටතේ සිටින කාල-
යේදී[7] ඔහුට විරුද්ධව[8] දූෂ්‍ය ක්‍රියාවක්
කළොත් හෝ **30** ඇය ද්‍රෝහී වී
ඇතැයි කියා පුරුෂයාට සැකයක් ඇති
වී ඔහු ඇයට වෛර කරන්න පටන්-
ගත්තොත් හෝ ඔහු තම භාර්යාවව
යෙහෝවා දෙවි වන මා ඉදිරියට
ගෙනා යුතුයි. පූජකයාද ඉහත සඳ-
හන් නීතිය එලෙසම ක්‍රියාත්මක කළ
යුතුයි. **31** ස්ත්‍රිය තමා කළ වරදට
ප්‍රතිඵල විඳින්නීය. නමුත් පුරුෂයා
එයින් නිදොස් වන්නේය.'"

**6** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. **2** "ඊශ්‍රායෙල්
සෙනඟට මෙසේ කියන්න. 'යම්
මිනිසෙකු හෝ ස්ත්‍රියක හෝ යෙ-
හෝවා දෙවි වන මට විශේෂ භාරයක්
වෙමින් තමන් නසරීතවරයෙකු*[9]
ලෙස ජීවත් වන බවට පොරොන්දු

**5 පරි.**
1 ගණන් 5:15
2 ලෙවී 2:9, ලෙවී 5:12
3 ගණන් 5:13, ගණන් 5:20
4 ද්වි 27:26, ගලා 3:10
5 ගණන් 5:19
6 ගණන් 5:14, ගණන් 5:15
7 රෝම 7:2
8 ගණන් 5:12, ගණන් 5:19

**6 පරි.**
9 විනි 13:5

**2 තීරුව**
1 ලෙවී 10:9, විනි 13:14, ආමො 2:12, ලූක් 1:15, ලූක් 7:33
2 විනි 13:5, විනි 16:17, 1සාමු 1:11
3 විනි 16:19
4 ලෙවී 21:1
5 ලෙවී 21:11
6 ගණන් 19:14
7 ගණන් 6:18

වුණොත් **3** ඒ තැනැත්තා වයින්
හෝ වෙනත් ඕනෑම මත්පැන් වර්ග-
යක් හෝ බීමෙන් වැළකිය යුතුයි.
වයින්වලින් හෝ වෙනත් මත්පැන්
වර්ගයකින්[1] හෝ සෑදූ ඇඹුල් රසැති
පානයක්වත් මිදිවලින් සෑදූ කිසිම
පානයක්වත් ඔහු පානය නොකළ
යුතුයි. ඉදුණු මිදිවත් වියළි මිදිවත්
ඔහු නොකෑ යුතුයි. **4** නසරීතවර-
යෙකු ලෙස ජීවත් වන මුළු කාලයේදී
ඔහු මිදිවැලේ පලදාවෙන් සෑදූ කිසිම
දෙයක් නොකෑ යුතුයි. අමු මිදිවත්
මිදිලෙලිවත් ඔහු නොකෑ යුතුයි.

**5** "'නසරීතවරයෙකු ලෙස ජීවත්
වන මුළු කාලයේදී ඔහු තම හිසකෙස්
නොකැපිය යුතුයි.[2] යෙහෝවා දෙවි
වන මට කැප වී සිටින්න තමා පො-
රොන්දු වූ කාලය අවසන් වන තෙක්
ඔහු තම හිසකෙස් දිගට වැවෙන්න
ඉඩහැරිය යුතුය.[3] ඔහු ශුද්ධව සිටිය
යුතුයි. **6** යෙහෝවා දෙවි වන මට
කැප වී සිටින මුළු කාලයේදී ඔහු
මළ සිරුරක් ළඟට නොයා යුතුයි.[4]
**7** නසරීතවරයෙකු ලෙස දෙවිට කැප
වී සිටින බව පෙන්වන පිණිස තම
හිසකෙස් වවා තිබෙන ඒ කාලයේදී
ඔහුගේ පියා හෝ මව හෝ සහෝ-
දරයා හෝ සහෝදරිය හෝ මිය
ගියොත් එම තැනැත්තා වෙනුවෙන්
සිදු කරන වත්පිළිවෙත්වලට ඔහු
සහභාගි නොවිය යුතුයි.[5] මන්ද එසේ
කළොත් ඔහු අපවිත්‍ර වන්නේය.

**8** "'නසරීතවරයෙකු ලෙස ජීවත්
වන මුළු කාලයේදීම යෙහෝවා දෙවි
වන මා ඔහුව සලකන්නේ ශුද්ධ
කෙනෙකු ලෙසයි. **9** නමුත් යමෙකු
ඔහු ළඟ සිටියදී හදිස්සියේම මිය
ගියොත්[6] එම තැනැත්තා නිසා ඔහු
දූෂ්‍ය වෙයි. එබැවින් තමන් කැප වී
සිටින බව පෙන්වීමට වැවූ හිසකෙස්
ඔහු සම්පූර්ණයෙන්ම කැපිය[7] යුතුයි.
ඔහු තම හිසකෙස් කැපිය යුත්තේ
තමන් පවිත්‍ර වන දවසේදී එනම්,
හත්වෙනි දවසේදීය. **10** අටවෙනි
දවසේදී ඔහු සම්මුඛ වීමේ කූඩාර-
මට ඇතුල් වන ස්ථානයේ සිටින

---

**ගණන් 6:2*** තේරුම, "කැප වූ හෝ වෙන් කර තබන ලද තැනැත්තෙක්."

පූජකයාට කොබෙයියන් දෙදෙනෙකු
හෝ පරෙවි පැටවුන් දෙදෙනෙකු හෝ
ගෙනැවිත් දිය යුතුයි.[1] **11** පූජකයා
උන්ගෙන් එකෙකුව පාප පූජාවක්[2]
ලෙසද අනිකාව දවන පූජාවක්[3] ලෙ-
සද ඔප්පු කළ යුතුයි. මිය ගිය
තැනැත්තාව ස්පර්ශ කිරීම නිසා ඔහු
අතින් සිදු වූ වරදට සමාව ලබා-
ගන්නා පිණිස පූජකයා එම පූජා ඔප්පු
කළ යුතුයි. එදින ඔහු තමාවම*
පවිත්‍ර කරගත යුතුයි. **12** ඔහු දූෂ්‍ය
වූ නිසා නසරීතවරයෙකු ලෙස ජීවත්
වීමට[4] වූ භාරය අහෝසි වන්නේය. ඒ
නිසා ඔහු යෙහෝවා දෙවි වන මට වූ
එම භාරය නැවත මුල සිටම ඇරඹිය
යුතුයි. ඔහු වන්දි පූජාවක්[5] ලෙස අවු-
රුද්දක් පමණ වයසැති බැටළු පැට-
වෙකු දෙවිට ඔප්පු කළ යුතුයි.

**13** “‘නසරීතවරයෙකු විසින් අනු-
ගමනය කළ යුතු නීතිය මෙයයි. ඔහු
නසරීතවරයෙකු ලෙස ජීවත් වීමට
පොරොන්දු වූ කාලය අවසන් වූ විට[6]
සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල් වන
ස්ථානය ළඟට ඔහුව ගෙනා යුතුයි.
**14** ඔහු, යෙහෝවා දෙවි වන මට
ඔප්පු කරන පිණිස දවන පූජා-
වක්[7] ලෙස අවුරුද්දක් පමණ වයසැති
නිකැළැල් බැටළු පැටවෙකුවද පාප
පූජාවක්[8] ලෙස අවුරුද්දක් පමණ
වයසැති නිකැළැල් බැටළුදෙනෙකු-
වද හවුල් පූජාවක්[9] ලෙස නිකැ-
ළැල් බැටළුවෙකුවද ගෙනා යුතුයි.
**15** සිහින් පිටි[10] හා තෙල්[11] මිශ්‍ර
කර සාදාගත් මුද්දක හැඩැති මුහුන්
නොදැමූ රොටි හා මුහුන් නොදැමූ
සිහින් රොටි[12] සහිත කූඩයක්ද ඒ
සමඟ ඔප්පු කිරීමට ධාන්‍ය පූජාවක්[13]
හා පාන පූජාවක්ද[14] ගෙනා යුතුයි.
**16** පූජකයා ඔහු ගෙනා දේවල් යෙ-
හෝවා දෙවි වන මා ඉදිරියට රැගෙන
ආ යුතුයි. ඉන්පසු පූජකයා, ඔහු
ගෙනා පාප පූජාව හා දවන පූජාව[15]
ඔප්පු කළ යුතුයි. **17** ඔහු කූඩයේ
තිබෙන මුහුන් නොදැමූ රොටි සමඟ
හවුල් පූජාව[1] සඳහා ගෙනා බැටළුවාව
යෙහෝවා දෙවිට ඔප්පු කළ යුතුයි. ඒ
සමඟ ධාන්‍ය පූජාවද[2] පාන පූජාවද
ඔප්පු කළ යුතුයි.

**18** “‘ඉන් අනතුරුව සම්මුඛ වීමේ
කූඩාරමට ඇතුල් වන ස්ථානයේදී
නසරීතවරයා තම හිසකෙස් සම්පූර්-
ණයෙන්ම කැපිය[3] යුතුයි. නසරීතව-
රයෙකු ලෙස කැප වී සිටි කාලයේදී
වැවුණු තම හිසකෙස් ඔහු හවුල්
පූජාව දවාලන ගින්නට දැමිය යුතුයි.
**19** නසරීතවරයා එසේ කළ පසු බැට-
ළුවාගේ තම්බාගත්[4] ගාතයක් පූජ-
කයා ගත යුතුයි. ඔහු මුද්දක හැඩැති
මුහුන් නොදැමූ රොටියක් හා මුහුන්
නොදැමූ සිහින් රොටියක්[5] කූඩයෙන්
ගත යුතුයි. ඒ සියල්ල ඔහු නසරීතව-
රයාගේ අත් දෙක මත තැබිය යුතුයි.
**20** පූජකයා ඒවා යෙහෝවා දෙවි වන
මා ඉදිරියේ ඒ මේ අත සෙලවිය
යුතුයි.[6] එය දෙවිට පිළිගන්වන පිණිස
කරන සෙලවීමේ පූජාවකි. සෙලවීමේ
පූජාව ඉතා ශුද්ධය. එය පූජක-
යාට අයිතිය. සෙලවීමේ පූජාව සඳහා
වෙන් කළ සතාගේ පපු කොටසද[7]
ත්‍යාගයක් ලෙස දුන් උගේ ගාතයද[8]
පූජකයාට අයිතිය. එලෙස නසරීතව-
රයෙකු ලෙස ජීවත් වීමට වූ භාරය
සම්පූර්ණ කළ පසු එම තැනැත්තාට
නැවත වයින්[9] පානය කිරීමට අවසර
තිබේ.

**21** “‘නසරීතවරයෙකු තමන්ට
ඔප්පු කිරීමට නියම කළ පූජාවලට
අමතරව තමාගේ වත්කමේ හැටියට
යෙහෝවා දෙවි වන මට තවත් පූජා-
වන් ඔප්පු කරන බවට පොරොන්දු
වුණොත් ඔහු එම පොරොන්දුවට
එකඟවද ක්‍රියා කළ යුතුයි. නසරීතව-
රයෙකු විසින් අනුගමනය කළ යුතු
නීතිය එයයි.’ ”[10]

**22** යෙහෝවා දෙවි මෝසෙස්ට
තවදුරටත් මෙසේ කීවේය. **23** “ආ-
රොන්ට සහ ඔහුගේ පුත්‍රයන්ට මෙසේ
කියන්න. ‘ඔබ ඊශ්‍රායෙල් සෙනඟට
ආශීර්වාද[11] කළ යුත්තේ මේ ආකාර-
යටය.

**6 පරි.**
1 ලෙවී 14:22
2 ලෙවී 5:8
3 ලෙවී 5:10, ලෙවී 14:31
4 ගණන් 6:2, විනි 13:5, විනි 16:17
5 ලෙවී 14:24
6 ගණන් 30:2, දේශ 5:4, ක්‍රියා 21:26
7 ලෙවී 1:10
8 ලෙවී 4:32, ලෙවී 5:6
9 ලෙවී 3:1
10 ලෙවී 2:4
11 ලෙවී 2:5
12 නික් 29:2
13 ලෙවී 2:1, ලෙවී 6:14
14 ගණන් 15:10
15 ලෙවී 1:3

**2 තීරුව**
1 ලෙවී 3:1
2 ලෙවී 2:9
3 ගණන් 6:5, ක්‍රියා 18:18, ක්‍රියා 21:24
4 ලෙවී 8:31, 1සාමු 2:15
5 නික් 29:23
6 නික් 29:24, ලෙවී 10:15
7 ගණන් 18:18
8 ලෙවී 7:34
9 දේශ 9:7, දේශ 10:19
10 ගණන් 6:2, විනි 13:5, විනි 16:17
11 ලෙවී 9:22, ද්වි 10:8, ද්වි 21:5, ලූක් 24:50

ගණන් **6:11*** මූ.අ., “තම හිස.”

**24** “යෙහෝවා දෙවි ඔබව ආරක්ෂා
කර[1] ඔබට ආශීර්වාද කරනු[2]
ලැබේවා!
**25** යෙහෝවා දෙවි දයාවෙන් ඔබ
දෙස බලා[3] ඔබට කරුණාව
පෙන්වනු ලැබේවා![4]
**26** යෙහෝවා දෙවි තම නෙත් ඔබ
වෙත යොමා[5] ඔබට සමාදා-
නය දෙනු ලැබේවා!” ’[6]

**27** එලෙස ඔවුන් මාගේ නාමය
භාවිත කර[7] ඊශ්‍රායෙල් සෙනඟට
ආශීර්වාද කළ යුතුයි. එවිට මමද
ඔවුන්ට ආශීර්වාද කරන්නෙමි.”[8]

**7** සම්මුඛ වීමේ කූඩාරම සාදා නිම
කළ පසු[9] මෝසෙස් එම කූඩාරම
හා එහි සියලු භාණ්ඩද මෙවලම්ද කැප
කර[10] ඒවා පරිශුද්ධ දේවල් ලෙස වෙන්
කළේය. ඔහු පූජාසනයද එහි සියලු
භාණ්ඩද කැප කර පරිශුද්ධ දේවල්
ලෙස වෙන් කළේය.[11] **2** පසුව ඊශ්‍රා-
යෙල් සෙනඟ අතරේ සිටි අධිපතීහු[12]
එනම්, ලියාපදිංචි කරනු ලැබූ අය
භාරව සිටි ඊශ්‍රායෙල්වරුන්ගේ ගෝ-
ත්‍රවල හා පෙළපත්වල ප්‍රධානියෝ
දෙවිට පිරිනමන පිණිස නොයෙක්
දේවල් ගෙනාවෝය.[13] **3** එක් අධිප-
තියෙකු සඳහා ගවයෙකු බැගින්ද
අධිපතීන් දෙදෙනෙකු සඳහා කරත්ත-
යක් බැගින්ද ඔවුහු යෙහෝවා දෙවි
වෙත ගෙනාවෝය. මෙසේ ඔවුහු
වහල සහිත කරත්ත හයක්ද
ගවයන් දොළොස්දෙනෙකුද සම්-
මුඛ වීමේ කූඩාරම ඉදිරියට ගෙනැ-
විත් දුන්නෝය. **4** එවිට යෙහෝවා
දෙවි මෝසෙස්ට මෙසේ කීවේය.
**5** “ඔවුන් ගෙනා දේවල් භාරගෙන ඒවා
සම්මුඛ වීමේ කූඩාරමේ වැඩකටයුතු
සඳහා ලෙවීවරුන්ට දෙන්න. ලෙවීව-
රුන්ට පැවරූ වැඩ කොටස සඳහා
අවශ්‍ය වන ප්‍රමාණය ඔවුන් එක් එක්
කෙනාට දෙන්න.”

**6** මෝසෙස් අධිපතීන් ගෙනා
කරත්ත හා ගවයන් භාරගෙන ලෙ-
වීවරුන්ට දුන්නේය. **7** ඔහු ගේර්-
ෂොන්ගේ පුත්‍රයන්ට ඔවුන්ගේ වැඩ[14]
සඳහා කරත්ත දෙකක්ද ගවයන් හත-
රදෙනෙකුද දුන්නේය. **8** ඔහු මෙ-
රාරීගේ පුත්‍රයන්ට ඔවුන්ගේ වැඩ[1]
සඳහා කරත්ත හතරක්ද ගවයන්
අටදෙනෙකුද දුන්නේය. ඒ සියල්ල
සිදු කෙරුණේ පූජක ආරොන්ගේ
පුත්‍රයා වන ඉතමාර්ගේ අධීක්ෂණය
යටතේය.[2] **9** එහෙත් කෝහාත්ගේ
පුත්‍රයන්ට ඔහු කිසිවක් දුන්නේ නැත.
මන්ද ශුද්ධස්ථානයේ[3] භාවිත කළ
බඩු බාහිරාදිය ඔවුන් උසුලාගෙන
ගියේ තම කර පිටය.[4]

**10** පූජාසනය කැප කළ අවස්-
ථාවේදී[5] අධිපතීහු තම පරිත්‍යාගය-
යන් පූජාසනය වෙත ගෙනාවෝය.
**11** එවිට යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. “පූජාසනයේ
කැප කිරීම නිමිත්තෙන් අධිප-
තීන් පරිත්‍යාග කරන දේවල් එක්
එක් කෙනා තමාට නියමිත දවසේදී
ගෙනා යුතුයි.”[6]

**12** පළමුවෙනි දවසේදී යූදා ගෝ-
ත්‍රයට අයත් අම්මිනදාබ්ගේ පුත්‍රයා
වන නාෂොන්[7] තම පරිත්‍යාගය ගෙ-
නාවේය. **13** ඔහු ෂෙකෙල් එකසිය
තිහක් බරැති රිදී දීසියක්ද ෂෙකෙල්
හැත්තෑවක් බරැති රිදී පාත්‍රයක්ද ගෙ-
නාවේය. ඒවායේ වටිනාකම ශුද්ධස්-
ථානයේ තිබෙන ෂෙකෙලයේ බරට
අනුව නියම කර තිබිණ.[8] තෙල් මිශ්‍ර
කළ සිහින් පිටිවලින් එම භාජන දෙ-
කම පුරවා තිබිණ. ඔහු එම පිටි
ධාන්‍ය පූජාවක් සඳහා ගෙනාවේය.[9]
**14** ඔහු සුගන්ධ ද්‍රව්‍ය[10] පිරවූ කූඩා
රන් කුසලානයක්ද ගෙනාවේය. එහි
බර ෂෙකෙල් දහයක් විය. **15** ඔහු
දවන පූජාවක්[11] සඳහා වස්සෙකු,
බැටළුවෙකු හා අවුරුද්දක් පමණ වය-
සැති බැටළු පැටියෙකු ගෙනාවේය.
**16** ඔහු පාප පූජාවක් සඳහා එළු පැටි-
යෙකුද[12] **17** හවුල් පූජාවක්[13] සඳහා

**6 පරි.**
**1** ගීතා 91:11
ගීතා 121:7
යොහ 17:11
1පේතෘ 1:5
**2** රූත් 2:4
ගීතා 134:3
**3** ගීතා 31:16
ගීතා 67:1
ගීතා 80:3
**4** උත් 43:29
**5** ගීතා 4:6
**6** ගීතා 29:11
ලූක් 2:14
යොහ 14:27
**7** ද්වි 28:10
2ලේක 7:14
යෙසා 43:7
යෙසා 43:10
දානි 9:19
**8** ගණන් 23:20
ගීතා 5:12
ගීතා 67:7
ගීතා 115:12
එෆී 1:3

**7 පරි.**
**9** නික් 40:17
**10** නික් 30:26
ලෙවී 8:10
**11** නික් 40:10
**12** නික් 18:21
ගණන් 1:4
ගණන් 1:16
**13** නික් 25:2
නික් 35:27
නෙහෙ 7:70
**14** ගණන් 3:25
ගණන් 4:25

**2 තීරුව**
**1** ගණන් 3:36
ගණන් 4:31
**2** ගණන් 4:33
**3** ගණන් 3:31
ගණන් 4:15
**4** 2සාමු 6:13
1ලේක 15:15
**5** 1රාජා 8:63
2ලේක 7:5
**6** 1කොරි 14:33
1කොරි 14:40
**7** ගණන් 1:7
ගණන් 2:3
ගණන් 10:14
රූත් 4:20
මතෙ 1:4
**8** නික් 30:13
ලෙවී 27:25

**9** ලෙවී 2:1; ගණන් 7:19; ගණන් 7:25; ගණන් 7:31; ගණන් 7:37; ගණන් 7:43; ගණන් 7:49; ගණන් 7:55; ගණන් 7:61; ගණන් 7:67; ගණන් 7:73; ගණන් 7:79; ගණන් 7:87; **10** නික් 30:34; ද්වි 33:10; **11** ලෙවී 1:3; ගීතා 20:3; **12** ලෙවී 4:23; **13** ලෙවී 3:1; ලෙවී 7:11; මලා 3:4.

ගවයන් දෙදෙනෙකු, බැටළුවන් පස්-
දෙනෙකු, එළුවන් පස්දෙනෙකු හා
අවුරුද්දක් වයසැති බැටළු පැටවුන්
පස්දෙනෙකුද ගෙනාවේය. අම්නදාබ්-
ගේ[1] පුත්‍රයා වන නාෂොන් පරිත්‍යාග
කළ දේවල් ඒවාය.

**18** දෙවෙනි දවසේදී ඉසකාර් ගෝ-
ත්‍රයේ අධිපතියා වන ෂුවර්ගේ පුත්‍රයා
වූ නෙතනෙල්[2] තම පරිත්‍යාගය ගෙ-
නාවේය. **19** ඔහු ෂෙකෙල් එකසිය
තිහක් බරැති රිදී දීසියක්ද ෂෙකෙල්
හැත්තෑවක් බරැති රිදී පාත්‍රයක්ද ගෙ-
නාවේය. ඒවායේ වටිනාකම ශුද්ධස්-
ථානයේ තිබෙන ෂෙකෙලයේ බරට
අනුව නියම කර තිබිණ. තෙල් මිශ්‍ර
කළ සිහින් පිටිවලින් එම භාජන දෙ-
කම පුරවා තිබිණ. ඔහු එම පිටි
ධාන්‍ය පූජාවක් සඳහා ගෙනාවේය.[3]
**20** ඔහු සුගන්ධ ද්‍රව්‍ය පිරවූ කුඩා රන්
කුසලානයක්ද ගෙනාවේය. එහි බර
ෂෙකෙල් දහයක් විය. **21** ඔහු දවන
පූජාවක්[4] සඳහා වස්සෙකු, බැටළු-
වෙකු හා අවුරුද්දක් පමණ වය-
සැති බැටළු පැටියෙකු ගෙනාවේය.
**22** පාප පූජාවක් සඳහා එළු පැටි-
යෙකුද[5] **23** හවුල් පූජාවක්[6] සඳහා
ගවයන් දෙදෙනෙකු, බැටළුවන් පස්-
දෙනෙකු, එළුවන් පස්දෙනෙකු හා
අවුරුද්දක් වයසැති බැටළු පැටවුන්
පස්දෙනෙකුද ඔහු ගෙනාවේය. ෂුවර්-
ගේ පුත්‍රයා වන නෙතනෙල් පරිත්‍යාග
කළ දේවල් ඒවාය.

**24** තුන්වෙනි දවසේදී සෙබුලුන්-
ගේ පුත්‍රයන්ගේ අධිපති වන හේ-
ලොන්ගේ පුත්‍රයා වූ එලියාබ්[7] තම
පරිත්‍යාගය ගෙනාවේය. **25** ඔහු
ෂෙකෙල් එකසිය තිහක් බරැති රිදී
දීසියක්ද ෂෙකෙල් හැත්තෑවක් බරැති
රිදී පාත්‍රයක්ද ගෙනාවේය. ඒවායේ
වටිනාකම ශුද්ධස්ථානයේ තිබෙන
ෂෙකෙලයේ බරට අනුව නියම කර
තිබිණ. තෙල් මිශ්‍ර කළ සිහින් පිටිව-
ලින් එම භාජන දෙකම පුරවා තිබිණ.
ඔහු එම පිටි ධාන්‍ය පූජාවක් සඳහා
ගෙනාවේය. **26** ඔහු සුගන්ධ ද්‍රව්‍ය
පිරවූ කුඩා රන් කුසලානයක්ද ගෙනා-
වේය. එහි බර ෂෙකෙල් දහයක් විය.
**27** ඔහු දවන පූජාවක්[1] සඳහා වස්-
සෙකු, බැටළුවෙකු හා අවුරුද්දක්
පමණ වයසැති බැටළු පැටියෙකු ගෙ-
නාවේය. **28** පාප පූජාවක් සඳහා
එළු පැටියෙකුද[2] **29** හවුල් පූජාවක්[3]
සඳහා ගවයන් දෙදෙනෙකු, බැටළු-
වන් පස්දෙනෙකු, එළුවන් පස්දෙ-
නෙකු හා අවුරුද්දක් වයසැති බැටළු
පැටවුන් පස්දෙනෙකුද ඔහු ගෙනා-
වේය. හේලොන්ගේ[4] පුත්‍රයා වන එලි-
යාබ් පරිත්‍යාග කළ දේවල් ඒවාය.

**30** හතරවෙනි දවසේදී රූබෙන්ගේ
පුත්‍රයන්ගේ අධිපති වන ෂෙදෙවුර්ගේ
පුත්‍රයා වූ එලිෂූර්[5] තම පරිත්‍යා-
ගය ගෙනාවේය. **31** ඔහු ෂෙකෙල්
එකසිය තිහක් බරැති රිදී දීසියක්ද
ෂෙකෙල් හැත්තෑවක් බරැති රිදී පාත්‍ර-
යක්ද ගෙනාවේය. ඒවායේ වටිනාකම
ශුද්ධස්ථානයේ තිබෙන ෂෙකෙලයේ
බරට අනුව නියම කර තිබිණ. තෙල්
මිශ්‍ර කළ සිහින් පිටිවලින් එම භාජන
දෙකම පුරවා තිබිණ. ඔහු එම පිටි
ධාන්‍ය පූජාවක් සඳහා ගෙනාවේය.[6]
**32** ඔහු සුගන්ධ ද්‍රව්‍ය පිරවූ කුඩා රන්
කුසලානයක්ද ගෙනාවේය. එහි බර
ෂෙකෙල් දහයක් විය. **33** ඔහු දවන
පූජාවක්[7] සඳහා වස්සෙකු, බැටළු-
වෙකු හා අවුරුද්දක් පමණ වය-
සැති බැටළු පැටියෙකු ගෙනාවේය.
**34** පාප පූජාවක් සඳහා එළු පැටි-
යෙකුද[8] **35** හවුල් පූජාවක්[9] සඳහා
ගවයන් දෙදෙනෙකු, බැටළුවන් පස්-
දෙනෙකු, එළුවන් පස්දෙනෙකු හා
අවුරුද්දක් වයසැති බැටළු පැටවුන්
පස්දෙනෙකුද ඔහු ගෙනාවේය. ෂෙදෙ-
වුර්ගේ[10] පුත්‍රයා වන එලිෂූර් පරිත්‍යාග
කළ දේවල් ඒවාය.

**36** පස්වෙනි දවසේදී සිමියොන්ගේ
පුත්‍රයන්ගේ අධිපති වන ෂුරිෂද්දයිගේ
පුත්‍රයා වූ ෂෙලුමියෙල්[11] තම පරිත්‍යා-
ගය ගෙනාවේය. **37** ඔහු ෂෙකෙල්
එකසිය තිහක් බරැති රිදී දීසියක්ද
ෂෙකෙල් හැත්තෑවක් බරැති රිදී පාත්‍ර-
යක්ද ගෙනාවේය. ඒවායේ වටිනාකම
ශුද්ධස්ථානයේ තිබෙන ෂෙකෙලයේ

**7 පරි.**
1 නික් 6:23 ලූක් 3:33
2 ගණන් 1:8 ගණන් 2:5 ගණන් 10:15
3 ගණන් 7:13
4 ලෙවී 1:3
5 ලෙවී 4:23
6 ලෙවී 3:1
7 ගණන් 2:7 ගණන් 10:16

**2 තීරුව**
1 ලෙවී 1:3
2 ලෙවී 4:23
3 ලෙවී 3:1
4 ගණන් 1:9
5 ගණන් 2:10 ගණන් 10:18
6 ගණන් 7:13
7 ලෙවී 1:3 ගීතා 20:3
8 ලෙවී 4:23
9 ලෙවී 3:1
10 ගණන් 1:5
11 ගණන් 2:12

බරට අනුව නියම කර තිබිණ. තෙල්
මිශ්‍ර කළ සිහින් පිටිවලින් එම භාජන
දෙකම පුරවා තිබිණ. ඔහු එම පිටි
ධාන්‍ය පූජාවක් සඳහා ගෙනාවේය.[1]
**38** ඔහු සුගන්ධ ද්‍රව්‍ය පිරවූ කුඩා
රන් කුසලානයක්ද ගෙනාවේය. එහි
බර ෂෙකෙල් දහයක් විය. **39** ඔහු
දවන පූජාවක්[2] සඳහා වස්සෙකු,
බැටළුවෙකු හා අවුරුද්දක් පමණ
වයසැති බැටළු පැටියෙකු ගෙනා-
වේය. **40** ඔහු පාප පූජාවක් සඳහා
එළු පැටියෙකුද[3] **41** හවුල් පූජාවක්[4]
සඳහා ගවයන් දෙදෙනෙකු, බැටළු-
වන් පස්දෙනෙකු, එළුවන් පස්දෙ-
නෙකු හා අවුරුද්දක් වයසැති බැටළු
පැටවුන් පස්දෙනෙකුද ගෙනාවේය.
ෂුරිෂද්දයිගේ[5] පුත්‍රයා වන ෂෙලුමි-
යෙල් පරිත්‍යාග කළ දේවල් ඒවාය.

**42** හයවෙනි දවසේදී ගාද්ගේ පුත්‍ර-
යන්ගේ අධිපති වන දුවෙල්ගේ පුත්‍රයා
වූ එලියාසාෆ්[6] තම පරිත්‍යාගය ගෙ-
නාවේය. **43** ඔහු ෂෙකෙල් එකසිය
තිහක් බරැති රිදී දීසියක්ද ෂෙකෙල්
හැත්තෑවක් බරැති රිදී පාත්‍රයක්ද ගෙ-
නාවේය. ඒවායේ වටිනාකම ශුද්ධස්-
ථානයේ තිබෙන ෂෙකෙලයේ බරට
අනුව නියම කර තිබිණ. තෙල් මිශ්‍ර
කළ සිහින් පිටිවලින් එම භාජන දෙ-
කම පුරවා තිබිණ. ඔහු එම පිටි
ධාන්‍ය පූජාවක් සඳහා ගෙනාවේය.[7]
**44** ඔහු සුගන්ධ ද්‍රව්‍ය[8] පිරවූ කුඩා රන්
කුසලානයක්ද ගෙනාවේය. එහි බර
ෂෙකෙල් දහයක් විය. **45** ඔහු දවන
පූජාවක්[9] සඳහා වස්සෙකු, බැටළු-
වෙකු හා අවුරුද්දක් පමණ වය-
සැති බැටළු පැටියෙකු ගෙනාවේය.
**46** පාප පූජාවක් සඳහා එළු පැටියෙ-
කුද[10] **47** හවුල් පූජාවක්[11] සඳහා
ගවයන් දෙදෙනෙකු, බැටළුවන් පස්-
දෙනෙකු, එළුවන් පස්දෙනෙකු හා
අවුරුද්දක් වයසැති බැටළු පැට-
වුන් පස්දෙනෙකුද ඔහු ගෙනාවේය.
දුවෙල්ගේ[12] පුත්‍රයා වන එලියාසාෆ්
පරිත්‍යාග කළ දේවල් ඒවාය.

**48** හත්වෙනි දවසේදී එෆ්‍රායිම්ගේ
පුත්‍රයන්ගේ අධිපති වන අම්හුද්ගේ
පුත්‍රයා වූ එලිෂාමා[1] තම පරිත්‍යා-
ගය ගෙනාවේය. **49** ඔහු ෂෙකෙල්
එකසිය තිහක් බරැති රිදී දීසියක්ද
ෂෙකෙල් හැත්තෑවක් බරැති රිදී පාත්‍ර-
යක්ද ගෙනාවේය. ඒවායේ වටිනාකම
ශුද්ධස්ථානයේ තිබෙන ෂෙකෙල-
යේ බරට අනුව නියම කර තිබිණ.
තෙල් මිශ්‍ර කළ සිහින් පිටිවලින් එම
භාජන දෙකම පුරවා තිබිණ. ඔහු එම
පිටි ධාන්‍ය පූජාවක් සඳහා ගෙනා-
වේය.[2] **50** ඔහු සුගන්ධ ද්‍රව්‍ය පිරවූ
කුඩා රන් කුසලානයක්ද ගෙනා-
වේය. එහි බර ෂෙකෙල් දහයක් විය.
**51** ඔහු දවන පූජාවක්[3] සඳහා වස්-
සෙකු, බැටළුවෙකු හා අවුරුද්දක්
පමණ වයසැති බැටළු පැටියෙකු ගෙ-
නාවේය. **52** පාප පූජාවක් සඳහා
එළු පැටියෙකුද[4] **53** හවුල් පූජාවක්[5]
සඳහා ගවයන් දෙදෙනෙකු, බැටළු-
වන් පස්දෙනෙකු, එළුවන් පස්දෙ-
නෙකු හා අවුරුද්දක් වයසැති බැටළු
පැටවුන් පස්දෙනෙකුද ඔහු ගෙනා-
වේය. අම්හුද්ගේ[6] පුත්‍රයා වන එලි-
ෂාමා පරිත්‍යාග කළ දේවල් ඒවාය.

**54** අටවෙනි දවසේදී මනස්සේගේ
පුත්‍රයන්ගේ අධිපති වන පෙදාෂුර්ගේ
පුත්‍රයා වූ ගමාලියෙල්[7] තම පරිත්‍යා-
ගය ගෙනාවේය. **55** ඔහු ෂෙකෙල්
එකසිය තිහක් බරැති රිදී දීසියක්ද
ෂෙකෙල් හැත්තෑවක් බරැති රිදී පාත්‍ර-
යක්ද ගෙනාවේය. ඒවායේ වටිනාකම
ශුද්ධස්ථානයේ තිබෙන ෂෙකෙලයේ
බරට අනුව නියම කර තිබිණ. තෙල්
මිශ්‍ර කළ සිහින් පිටිවලින් එම භාජන
දෙකම පුරවා තිබිණ. ඔහු එම පිටි
ධාන්‍ය පූජාවක් සඳහා ගෙනාවේය.[8]
**56** ඔහු සුගන්ධ ද්‍රව්‍ය[9] පිරවූ කුඩා රන්
කුසලානයක්ද ගෙනාවේය. එහි බර
ෂෙකෙල් දහයක් විය. **57** ඔහු දවන
පූජාවක්[10] සඳහා වස්සෙකු, බැටළු-
වෙකු හා අවුරුද්දක් පමණ වය-
සැති බැටළු පැටියෙකු ගෙනාවේය.
**58** පාප පූජාවක් සඳහා එළු පැටියෙ-
කුද[11] **59** හවුල් පූජාවක්[12] සඳහා
ගවයන් දෙදෙනෙකු, බැටළුවන් පස්-
දෙනෙකු, එළුවන් පස්දෙනෙකු හා

**7 පරි.**
1 ගණන් 7:13
2 ලෙවී 1:3
3 ලෙවී 4:23
4 ලෙවී 3:1 ලෙවී 7:11
5 ගණන් 1:6
6 ගණන් 2:14 ගණන් 10:20
7 ගණන් 7:13
8 ද්වි 33:10
9 ලෙවී 1:3
10 ලෙවී 4:23
11 ලෙවී 3:1
12 ගණන් 1:14

**2 තීරුව**
1 ගණන් 2:18 ගණන් 10:22 1ලේක 7:26
2 ගණන් 7:13
3 ලෙවී 1:3
4 ලෙවී 4:23
5 ලෙවී 3:1
6 ගණන් 1:10
7 ගණන් 2:20 ගණන් 10:23
8 ගණන් 7:13
9 ද්වි 33:10
10 ලෙවී 1:3
11 ලෙවී 4:23
12 ලෙවී 3:1

අවුරුද්දක් වයසැති බැටළු පැටවුන්
පස්දෙනෙකුද ඔහු ගෙනාවේය. පෙ-
දාෂුර්ගේ[1] පුත්‍රයා වන ගමාලියෙල්
පරිත්‍යාග කළ දේවල් ඒවාය.
**60** නවවෙනි දවසේදී බෙන්ජමින්-
ගේ පුත්‍රයන්ගේ අධිපති[2] වන ගිඩ්-
යොනිගේ පුත්‍රයා වූ අබිදාන්[3] තම
පරිත්‍යාගය ගෙනාවේය. **61** ඔහු
ෂෙකෙල් එකසිය තිහක් බරැති රිදී
දීසියක්ද ෂෙකෙල් හැත්තෑවක් බරැති
රිදී පාත්‍රයක්ද ගෙනාවේය. ඒවායේ
වටිනාකම ශුද්ධස්ථානයේ තිබෙන
ෂෙකෙලයේ බරට අනුව නියම කර
තිබිණ. තෙල් මිශ්‍ර කළ සිහින් පිටිව-
ලින් එම භාජන දෙකම පුරවා තිබිණ.
ඔහු එම පිටි ධාන්‍ය පූජාවක් සඳහා
ගෙනාවේය.[4] **62** ඔහු සුගන්ධ ද්‍රව්‍ය
පිරවූ කුඩා රන් කුසලානයක්ද ගෙනා-
වේය. එහි බර ෂෙකෙල් දහයක් විය.
**63** ඔහු දවන පූජාවක්[5] සඳහා වස්-
සෙකු, බැටළුවෙකු හා අවුරුද්දක්
පමණ වයසැති බැටළු පැටියෙකු ගෙ-
නාවේය. **64** පාප පූජාවක් සඳහා
එළු පැටියෙකුද[6] **65** හවුල් පූජාවක්[7]
සඳහා ගවයන් දෙදෙනෙකු, බැටළු-
වන් පස්දෙනෙකු, එළුවන් පස්දෙ-
නෙකු හා අවුරුද්දක් වයසැති බැටළු
පැටවුන් පස්දෙනෙකුද ඔහු ගෙනා-
වේය. ගිඩ්යොනිගේ[8] පුත්‍රයා වන අබි-
දාන් පරිත්‍යාග කළ දේවල් ඒවාය.
**66** දහවෙනි දවසේදී දාන්ගේ පුත්‍ර-
යන්ගේ අධිපති වන අමිෂද්දයිගේ
පුත්‍රයා වූ අහියේසෙර්[9] තම පරිත්‍යා-
ගය ගෙනාවේය. **67** ඔහු ෂෙකෙල්
එකසිය තිහක් බරැති රිදී දීසියක්ද
ෂෙකෙල් හැත්තෑවක් බරැති රිදී පාත්‍ර-
යක්ද ගෙනාවේය. ඒවායේ වටිනාකම
ශුද්ධස්ථානයේ තිබෙන ෂෙකෙලයේ
බරට අනුව නියම කර තිබිණ. තෙල්
මිශ්‍ර කළ සිහින් පිටිවලින් එම භාජන
දෙකම පුරවා තිබිණ. ඔහු එම පිටි
ධාන්‍ය පූජාවක් සඳහා ගෙනාවේය.[10]
**68** ඔහු සුගන්ධ ද්‍රව්‍ය පිරවූ කුඩා රන්
කුසලානයක්ද ගෙනාවේය. එහි බර
ෂෙකෙල් දහයක් විය. **69** ඔහු දවන
පූජාවක්[11] සඳහා වස්සෙකු, බැටළු-
වෙකු හා අවුරුද්දක් පමණ වය-
සැති බැටළු පැටියෙකු ගෙනාවේය.
**70** පාප පූජාවක් සඳහා එළු පැටි-
යෙකුද[1] **71** හවුල් පූජාවක්[2] සඳහා
ගවයන් දෙදෙනෙකු, බැටළුවන් පස්-
දෙනෙකු, එළුවන් පස්දෙනෙකු හා
අවුරුද්දක් වයසැති බැටළු පැටවුන්
පස්දෙනෙකුද ඔහු ගෙනාවේය. අමි-
ෂද්දයිගේ[3] පුත්‍රයා වන අහියේසෙර්
පරිත්‍යාග කළ දේවල් ඒවාය.
**72** එකළොස්වෙනි දවසේදී
ආෂේර්ගේ පුත්‍රයන්ගේ අධිපති වන
ඔක්‍රාන්ගේ පුත්‍රයා වූ පගියෙල්[4] තම
පරිත්‍යාගය ගෙනාවේය. **73** ඔහු
ෂෙකෙල් එකසිය තිහක් බරැති රිදී
දීසියක්ද ෂෙකෙල් හැත්තෑවක් බරැති
රිදී පාත්‍රයක්ද ගෙනාවේය. ඒවායේ
වටිනාකම ශුද්ධස්ථානයේ තිබෙන
ෂෙකෙලයේ බරට අනුව නියම කර
තිබිණ. තෙල් මිශ්‍ර කළ සිහින් පිටිව-
ලින් එම භාජන දෙකම පුරවා තිබිණ.
ඔහු එම පිටි ධාන්‍ය පූජාවක් සඳහා
ගෙනාවේය.[5] **74** ඔහු සුගන්ධ ද්‍රව්‍ය
පිරවූ කුඩා රන් කුසලානයක්ද ගෙනා-
වේය. එහි බර ෂෙකෙල් දහයක් විය.[6]
**75** ඔහු දවන පූජාවක්[7] සඳහා වස්-
සෙකු, බැටළුවෙකු හා අවුරුද්දක්
පමණ වයසැති බැටළු පැටියෙකු ගෙ-
නාවේය. **76** පාප පූජාවක් සඳහා
එළු පැටියෙකුද[8] **77** හවුල් පූජාවක්[9]
සඳහා ගවයන් දෙදෙනෙකු, බැටළු-
වන් පස්දෙනෙකු, එළුවන් පස්දෙ-
නෙකු හා අවුරුද්දක් වයසැති බැටළු
පැටවුන් පස්දෙනෙකුද ඔහු ගෙනා-
වේය. ඔක්‍රාන්ගේ[10] පුත්‍රයා වන පගි-
යෙල් පරිත්‍යාග කළ දේවල් ඒවාය.
**78** දොළොස්වෙනි දවසේදී නෆ්-
තලීගේ පුත්‍රයන්ගේ අධිපති වන
ඒනාන්ගේ පුත්‍රයා වූ අහිරා[11] තම
පරිත්‍යාගය ගෙනාවේය. **79** ඔහු
ෂෙකෙල් එකසිය තිහක් බරැති
රිදී දීසියක්ද ෂෙකෙල් හැත්තෑවක්
බරැති රිදී පාත්‍රයක්ද ගෙනාවේය.
ඒවායේ වටිනාකම ශුද්ධස්ථානයේ
තිබෙන ෂෙකෙලයේ බරට අනුව
නියම කර තිබිණ. තෙල් මිශ්‍ර කළ

**7 පරි.**
1 ගණන් 1:10
2 ගණන් 1:16
3 ගණන් 2:22; ගණන් 10:24
4 ගණන් 7:13
5 ලෙවී 1:3
6 ලෙවී 4:23
7 ලෙවී 3:1; ලෙවී 7:11
8 ගණන් 1:11
9 ගණන් 2:25; ගණන් 10:25
10 ගණන් 7:13
11 ලෙවී 1:3

**2 තීරුව**
1 ලෙවී 4:23
2 ලෙවී 3:1
3 ගණන් 1:12
4 ගණන් 2:27; ගණන් 10:26
5 ගණන් 7:13
6 ගණන් 7:44
7 ලෙවී 1:3
8 ලෙවී 4:23
9 ලෙවී 3:1; ලෙවී 7:11
10 ගණන් 1:13
11 ගණන් 2:29; ගණන් 10:27

සිහින් පිටිවලින් එම භාජන දෙ-
කම පුරවා තිබිණ. ඔහු එම
පිටි ධාන්‍ය පූජාවක් සඳහා ගෙනා-
වේය.[1] **80** ඔහු සුගන්ධ ද්‍රව්‍ය පිරවූ
කුඩා රන් කුසලානයක්ද ගෙනාවේය.
එහි බර ෂෙකෙල් දහයක් විය.[2]
**81** ඔහු දවන පූජාවක්[3] සඳහා වස්-
සෙකු, බැටළුවෙකු හා අවුරුද්දක්
පමණ වයසැති බැටළු පැටියෙකු ගෙ-
නාවේය. **82** පාප පූජාවක් සඳහා
එළු පැටියෙකුද[4] **83** හවුල් පූජාවක්[5]
සඳහා ගවයන් දෙදෙනෙකු, බැටළු-
වන් පස්දෙනෙකු, එළුවන් පස්දෙ-
නෙකු හා අවුරුද්දක් වයසැති බැටළු
පැටවුන් පස්දෙනෙකුද ඔහු ගෙනා-
වේය. ඒනාන්ගේ[6] පුත්‍රයා වන අහිරා
පරිත්‍යාග කළ දේවල් ඒවාය.

**84** පූජාසනය කැප කළ අවස්-
ථාවේදී ඊශ්‍රායෙල් සෙනඟ අතරේ
සිටි අධිපතීන්[7] ගෙනා පරිත්‍යාග-
යන්[8] මේවාය. ඔවුහු රිදී දීසි දො-
ළහක්, රිදී පාත්‍ර[9] දොළහක් හා
කුඩා රන් කුසලාන දොළහක් ගෙනා-
වෝය. **85** ඒ සෑම රිදී දීසියක බර
ෂෙකෙල් එකසිය තිහක්ද ඒ සෑම
රිදී පාත්‍රයක බර ෂෙකෙල් හැත්තෑ-
වක්ද විය. රිදී භාජන සියල්ලෙහි
බර ෂෙකෙල් දෙදහස් හාරසියයක්
විය. ඒවායේ වටිනාකම ශුද්ධස්ථාන-
යේ තිබෙන ෂෙකෙලයේ බරට අනුව
නියම කර තිබිණ.[10] **86** සුගන්ධ
ද්‍රව්‍ය පිරවූ කුඩා රන් කුසලාන[11] දො-
ළහක්ද ඔවුහු ගෙනාවෝය. එක් රන්
කුසලානයක බර ෂෙකෙල් දහයක් වූ
අතර ඒ සියල්ලෙහි බර ෂෙකෙල් එක-
සිය විස්සක් විය. ඒවායේ වටිනාකම
ශුද්ධස්ථානයේ තිබෙන ෂෙකෙල-
යේ බරට අනුව නියම කර තිබිණ.
**87** වස්සන් දොළොස්දෙනෙකුද බැට-
ළුවන් දොළොස්දෙනෙකුද අවුරුද්දක්
පමණ වයසැති බැටළු පැටවුන් දො-
ළොස්දෙනෙකුද ඔවුන් දවන පූජාව[12]
සඳහා ගෙනැවිත් තිබිණ. ඒ සමඟ
ඔප්පු කිරීමට ඔවුහු ධාන්‍ය පූජාද[13]
ගෙනාවෝය. පාප පූජාව[14] සඳහා
එළු පැටවුන් දොළොස්දෙනෙකුද ගෙ-
නැවිත් තිබිණ. **88** හවුල් පූජාව[1]
සඳහා ගවයන් විසිහතරදෙනෙකුද
බැටළුවන් හැටදෙනෙකුද එළුවන්
හැටදෙනෙකුද අවුරුද්දක් පමණ වය-
සැති බැටළු පැටවුන් හැටදෙනෙකුද
ඔවුන් ගෙනැවිත් තිබිණ. පූජාසනය
කැප කළ අවස්ථාවේදී[2] පරිත්‍යාග[3]
කළ දේවල් ඒවාය.

**89** මෝසෙස් දෙවි සමඟ කතා
කරන පිණිස සම්මුඛ වීමේ කූඩා-
රම ඇතුළට ගිය සෑම අවස්ථාව-
කදීම[4] ගිවිසුම් පෙට්ටියේ පියනට[5]
ඉහළින් කෙරුබ්වරුන්[6] දෙදෙනා අත-
රින් හඬක්* ඔහුට ඇසිණ. මෝසෙස්ද
දෙවි සමඟ කතා කළේය.

**8** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. **2** “ආරොන්ට
මෙසේ කියන්න. ‘පහන් රුක ඉදිරි-
පිට තිබෙන ස්ථානය ආලෝකවත්
කරන පිණිස ඔබ ඒ මත තිබෙන
පහන් හත දල්වා තැබිය යුතුයි.’ ”[7]
**3** ආරොන්ද යෙහෝවා දෙවි මෝ-
සෙස්ට අණ කළ ලෙසම කළේය.
පහන් රුක[8] ඉදිරිපිට තිබෙන ස්ථා-
නය ආලෝකවත් කරන පිණිස ඔහු
පහන් දල්වා තැබුවේය. **4** රත්ත-
රන් තළා පහන් රුක සාදා තිබිණ.
එහි කඳේ සිට මල් පෙති දක්වා සාදා
තිබුණේ තැළූ රනින්ය.[9] යෙහෝවා
දෙවි මෝසෙස්ට දර්ශනයක් මාර්ග-
යෙන් පෙන්වූ සැලැස්මට[10] අනුව ඔහු
පහන් රුක සාදා තිබිණ.

**5** යෙහෝවා දෙවි මෝසෙස්ට
තවදුරටත් මෙසේ කීවේය. **6** “ඊශ්‍රා-
යෙල් සෙනඟ අතරේ සිටින ලෙ-
වීවරුන්ව ඔබ වෙතට කැඳවන්න.
ඔවුන්ව පවිත්‍ර තත්වයකට ගෙන එන
පිණිස[11] **7** පව් සෝදාහරින වතුර
ඔබ ඔවුන් මත ඉසින්න.[12] ඉන්පසු
ඔවුන් තම ශරීරය පුරා තිබෙන
රෝම කපා[13] තම වස්ත්‍ර සෝදා-
ගෙන[14] පවිත්‍ර විය යුතුයි.[15] **8** ඔවුන්
වස්සෙකුවද[16] ඒ සමඟ ඔප්පු කරන

---

**ගණන් 7:89*** සෙප්ටුඅජින්ට් පරිවර්තනයට අනුව, “යෙහෝවා දෙවිගේ කටහඬ.”

---

**7 පරි.**
**1** ගණන් 7:13
**2** ගණන් 7:14
**3** ලෙවී 1:3
**4** ලෙවී 4:23
**5** ලෙවී 3:1
**6** ගණන් 1:15
**7** යොෂු 22:14
**8** ගණන් 7:10 එස්රා 2:68
**9** ගණන් 7:13
**10** නික් 30:13 ලෙවී 27:25
**11** ගණන් 7:14
**12** ගණන් 7:15
**13** ගණන් 7:13
**14** ගණන් 7:16

**2 තීරුව**
**1** ගණන් 7:17
**2** ගණන් 7:1
**3** ගණන් 7:10 ගණන් 7:84
**4** නික් 33:9 ගණන් 11:17 ගණන් 12:8
**5** නික් 25:22 නික් 37:6
**6** නික් 25:18 1සාමු 4:4 ගීතා 80:1

**8 පරි.**
**7** නික් 25:37 නික් 40:25 ලෙවී 24:2
**8** හෙබ්‍රෙ 9:2
**9** නික් 37:17
**10** නික් 25:9 නික් 25:40 1ලේක 28:12 1ලේක 28:19 හෙබ්‍රෙ 8:5
**11** නික් 29:4 ගීතා 26:6 යෙසා 52:11 2කොරි 7:1
**12** නික් 30:18 එස 36:25
**13** ලෙවී 14:8
**14** නික් 19:10 ලෙවී 16:28 ගණන් 19:7
**15** ගීතා 51:2
**16** ලෙවී 1:3

පිණිස ධාන්‍ය පූජාවක්[1] ලෙස තෙල්
මිශ්‍ර කළ සිහින් පිටිද ගෙනා යුතුයි.
ඔබ පාප පූජාවක්[2] සඳහා තව වස්සෙ-
කුව ගෙනා යුතුයි. **9** ලෙවීවරුන්ව
සම්මුඛ වීමේ කූඩාරම ඉදිරියට ගෙන
යන්න. ඉන්පසු මුළු ඊශ්‍රායෙල් සෙනඟ
එතැනට රැස් කරවන්න.[3] **10** ඔබ
ලෙවීවරුන්ව[4] යෙහෝවා දෙවි වන මා
ඉදිරියට ගෙනා පසු ඊශ්‍රායෙල් සෙ-
නඟ තම අත් ඔවුන් පිට තැබිය
යුතුයි.[5] **11** ඉන්පසු ආරොන් ලෙවී-
වරුන්ව යෙහෝවා දෙවි වන මා
ඉදිරියේ සෙලවීමේ පූජාවක්[6] ලෙස
ඉදිරිපත් කළ යුතුයි. ඒ අවස්ථාවේදී
ඔවුන්ට ඒ මේ අත පැද්දෙන්න කියා
ඔහු පැවසිය යුතුයි. එය ඊශ්‍රායෙල්
සෙනඟ දෙවිට පිළිගන්වන සෙලවීමේ
පූජාවකි. මෙසේ යෙහෝවා දෙවි වන
මට සේවය කරන පිණිස ඔවුන්ව කැප
කරන්න.[7]

**12** “පසුව ලෙවීවරුන් වස්සන්ගේ
හිස මත තම අත් තැබිය යුතුයි.[8] ලෙ-
වීවරුන්ගේ පව්වලට සමාව ලබා-
ගන්නා පිණිස[9] උන්ගෙන් එකෙකුව
පාප පූජාවක් ලෙසද අනිකාව දවන
පූජාවක් ලෙසද යෙහෝවා දෙවි වන
මා ඉදිරියේ ඔප්පු කරන්න. **13** ලෙ-
වීවරුන්ව ආරොන් හා ඔහුගේ පුත්‍ර-
යන් ඉදිරියට කැඳවා යෙහෝවා දෙවි
වන මා ඉදිරියේ සෙලවීමේ පූජාවක්
ලෙස ඉදිරිපත් කරන්න. ඒ අවස්ථා-
වේදී ලෙවීවරුන්ට ඒ මේ අත පැද්-
දෙන්න කියා ඔවුන් පැවසිය යුතුයි.
**14** මෙසේ ඔබ ඊශ්‍රායෙල් සෙනඟ
අතරින් ලෙවීවරුන්ව වෙන් කරන්න.
මන්ද ලෙවීවරුන් මට අයිතිය.[10]
**15** ඔබ ලෙවීවරුන්ව පවිත්‍ර තත්ව-
යකට ගෙනැවිත් සෙලවීමේ පූජා-
වක්[11] ලෙස පිළිගැන්වූ පසු සම්මුඛ
වීමේ කූඩාරමේ සේවය කරන පිණිස
ඔවුන් පැමිණිය යුතුයි.[12] **16** ඊශ්‍රා-
යෙල් සෙනඟ අතරේ සිටින සියලු
කුලුඳුලන් වෙනුවට මම ලෙවීවරුන්ව
ගන්නෙමි.[13] ඔවුන් ඊශ්‍රායෙල් සෙ-
නඟ අතරින් මා තෝරාගනු ලැබූ
අයයි.[14] **17** ඊශ්‍රායෙල් සෙනඟ අත-
රේ සිටින සියලු කුලුඳුල් දරුවන් හා
සතුන් මට අයිතිය.[1] ඊජිප්තුවරුන්-
ගේ සෑම කුලුඳුලෙකුටම මම පහර
දුන් දවසේදී[2] ඊශ්‍රායෙල්වරුන්ගේ සෑම
කුලුඳුලෙක්ම මට කැප කරන ලෙස
මම නියම කළෙමි. මන්ද ඔවුන්ව
මා සලකන්නේ ශුද්ධ අය ලෙසයි.[3]
**18** එබැවින් ඊශ්‍රායෙල් සෙනඟ අත-
රේ සිටින සියලු කුලුඳුලන් වෙනු-
වට මම ලෙවීවරුන්ව ගන්නෙමි.[4]
**19** මම ඊශ්‍රායෙල් සෙනඟ අතරින්
තෝරාගත් ලෙවීවරුන්ව ආරොන්ට
හා ඔහුගේ පුත්‍රයන්ට භාර දෙන්-
නෙමි.[5] ඊශ්‍රායෙල් සෙනඟ ශුද්ධස්ථා-
නය අසලට ගොස් දඬුවම් නොලබන
පිණිස ලෙවීවරුන් ඔවුන් වෙනුවට
සම්මුඛ වීමේ කූඩාරමේ සේවය කළ
යුතුයි.[6] එමෙන්ම සෙනඟ අතින් සිදු
වන පව්වලට සමාව ලබාගන්නා
පිණිස කරන පිළිවෙත්වලටද ඔවුන්
උපකාර කළ යුතුයි.”[7]

**20** යෙහෝවා දෙවි ලෙවීවරුන්
සම්බන්ධයෙන් අණ කළ සියල්ල
මෝසෙස්, ආරොන් හා ඊශ්‍රා-
යෙල් සෙනඟ එලෙසම කළෝය.
**21** ලෙවීවරුන් තම වස්ත්‍ර සෝ-
දාගෙන තමන්වම පවිත්‍ර කරගත්-
තෝය.[8] ඉන්පසු ආරොන් ඔවුන්ව
සෙලවීමේ පූජාවක් ලෙස යෙහෝවා
දෙවිට පිළිගැන්වුවේය.[9] පව්වලට
සමාව ලබාගෙන ඔවුන්ව පවිත්‍ර තත්-
වයකට ගෙනෙන පිණිස ආරොන්
ඔවුන් වෙනුවෙන් පූජා ඔප්පු
කළේය.[10] **22** ඉන්පසු ලෙවීවරු
සම්මුඛ වීමේ කූඩාරම ළඟට පැමිණ
ආරොන් හා ඔහුගේ පුත්‍රයන් යට-
තේ තම තමන්ට නියමිත සේවාවන්
ඉටු කරන්න පටන්ගත්තෝය.[11] යෙ-
හෝවා දෙවි ලෙවීවරුන් සම්බන්ධ-
යෙන් මෝසෙස්ට අණ කළ ලෙසම
ඔවුහු කළෝය.

**23** යෙහෝවා දෙවි මෝසෙස්ට
නැවත මෙසේ කීවේය. **24** “ලෙවී-
වරුන් අනුගමනය කළ යුතු
නීතිය මෙයයි. වයස අවුරුදු විසිප-
හක් හෝ ඊට වඩා වැඩි ලෙවීවරුන්

**8 පරි.**
1 ලෙවී 2:1; ගණන් 15:9
2 ලෙවී 4:3; රෝම 8:3; 2කොරි 5:21
3 ලෙවී 8:3
4 ගණන් 3:41; ගණන් 3:45
5 ලෙවී 1:4; ගණන් 3:9
6 ලෙවී 7:30; ලෙවී 8:27; ගණන් 8:21
7 ගණන් 1:50; ගණන් 3:6
8 නික් 29:10
9 ලෙවී 1:4
10 ගණන් 3:45; ගණන් 16:9
11 නික් 29:24
12 ගණන් 4:3; ගණන් 8:11
13 ගණන් 3:12
14 ගණන් 3:45

**2 තීරුව**
1 නික් 13:2; නික් 13:12; ගණන් 3:13; ලූක් 2:23
2 නික් 12:29; ගීතා 78:51; ගීතා 105:36; ගීතා 135:8; හෙබ්‍රෙ 11:28
3 නික් 13:15; ලෙවී 27:26
4 ගණන් 3:12
5 ගණන් 3:9; ගණන් 18:6
6 1ලේක 23:32; එස 44:11
7 ගණන් 1:53; ගණන් 18:5; 1සාමු 6:19; 2ලේක 26:16
8 ගණන් 8:7
9 ගණන් 8:11
10 ගණන් 8:12
11 ගණන් 8:15; 2ලේක 31:2

සම්මුඛ වීමේ කූඩාරමේ සේවය කරන
පිණිස පැමිණිය යුතුයි. **25** නමුත්
වයස අවුරුදු පනහක් වූ පසු ඔවුන්
තම පැවරුමෙන් විශ්‍රාම ගත යුතුයි.
**26** එහෙත් සම්මුඛ වීමේ කූඩාරමේ
සේවය කරන තම සහෝදරයන්ට
උපකාර කිරීමට ඔවුන්ට හැකියි.
නමුත් ඔවුහු කලින් කරමින් සිටි සේ-
වාවන්ගෙන් නිදහස් වන්නෝය. ලෙ-
වීවරුන්ට නියමිත සේවාවන් ඔබ
ඔවුන්ට එලෙස පැවරිය යුතුයි.”[1]

**9** ඊශ්‍රායෙල්වරුන් ඊජිප්තු දේශ-
යෙන් පිටත්ව යැමෙන් අනතුරුව
දෙවෙනි අවුරුද්දේ පළමුවෙනි මාස-
යේ,*[2] යෙහෝවා දෙවි සීනයි පාළුක-
රයේදී මෝසෙස්ට මෙසේ කීවේය.
**2** “නියම කරන ලද කාලයේදී ඊශ්‍රා-
යෙල් සෙනඟ පාස්කු පූජාව[3] පිළියෙල
කළ යුතුයි.[4] **3** ඔබට නියම කළ
ලෙස මේ මාසයේ දහහතරවෙනි දින
සවස් වරුවේ*[5] ඔබ එම පූජාව පිළි-
යෙල කළ යුතුයි. ඔබ එම පූජාව පිළි-
යෙල කළ යුත්තේ ඊට සම්බන්ධව
ඔබට දුන් සියලු අණපනත්වලට
එකඟවයි.”[6]

**4** පාස්කු පූජාව පිළියෙල කරන්න
කියා මෝසෙස් ඊශ්‍රායෙල් සෙ-
නඟට කීවේය. **5** එබැවින් පළමු-
වෙනි මාසයේ දහහතරවෙනි දිනයේ
සවස ඔවුහු පාස්කු පූජාව සූදානම්
කළෝය. ඒ අවස්ථාවේ ඔවුන් සිටියේ
සීනයි පාළුකරයේය. යෙහෝවා දෙවි
මෝසෙස්ට අණ කළ සියල්ල ඊශ්‍රා-
යෙල් සෙනඟ කළෝය.[7]

**6** මළ සිරුරක් ස්පර්ශ කිරීම නිසා
අපවිත්‍ර වූ පුරුෂයෝ කිහිපදෙනෙක්
සිටියෝය.[8] එබැවින් ඔවුන්ට එදින
පාස්කු පූජාව සූදානම් කිරීමට නො-
හැකි විය. ඔවුහු මෝසෙස් හා ආරොන්
වෙතට ගොස්[9] **7** මෙසේ කීවෝය.
“මළ සිරුරක් ස්පර්ශ කළ නිසා අපි අද
අපවිත්‍ර බව ඇත්තයි. නමුත් ඊශ්‍රායෙල්
සෙනඟ අතරින් අපි විතරක් නිය-
මිත දවසේදී යෙහෝවා දෙවිට පාස්කු
පූජාව ඔප්පු නොකර[1] ඉන්න එක
හරි දෙයක් කියා ඔබ සිතනවාද?”
**8** එවිට මෝසෙස්, “ඔබ මෙතැනට
වී සිටින්න. යෙහෝවා දෙවි මේ
ගැන මොනවාද කියන්නේ කියලා අපි
බලමු” කියා ඔවුන්ට කීවේය.[2]

**9** ඉන්පසු යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. **10** “ඊශ්‍රා-
යෙල් සෙනඟට මෙසේ කියන්න. ‘මළ
සිරුරක් ස්පර්ශ කිරීම නිසා කෙනෙකු
අපවිත්‍රව සිටියත්[3] දුර ඈත ගමනක්
ගොස් සිටියත් යෙහෝවා දෙවි වෙනු-
වෙන් පාස්කු පූජාව ඔහු සූදානම් කළ
යුතුයි. ඔබේ සියලු පරම්පරාවලදී
ඔබ එසේ කළ යුතුයි. **11** දෙවෙනි
මාසයේ[4] දහහතරවෙනි දිනයේ සවස
ඔවුන් ඒ පූජාව පිළියෙල කළ යුතුයි.
මුහුන් නොදැමූ රොටි හා තිත්ත පලා
සමඟ ඔවුන් එය අනුභව කළ යුතුයි.[5]
**12** ඔවුන් පසුවදා උදෑසන වන තුරු
ඒ පූජාවේ මස් තබා නොගත යුතුයි.[6]
පූජාවට ගත් සතාගේ එක ඇටයක්-
වත් නොකැඩිය යුතුයි.[7] පාස්කුව හා
සම්බන්ධව මම දුන් සියලු අණපනත්-
වලට එකඟව ඔවුන් එය පැවැත්විය
යුතුයි.[8] **13** නමුත් පවිත්‍රව සිටින
කෙනෙකු හෝ දුර ඈත ගමනක් නො-
ගිය කෙනෙකු හෝ පාස්කු පූජාව
නොපැවැත්තුවොත් ඔහුව මරා දැමිය
යුතුයි.[9] ඒ තැනැත්තා තම පාපය වෙ-
නුවෙන් ගණන් දිය යුතුයි.[10] මන්ද
නියම කරන ලද කාලයේදී ඔහු යෙ-
හෝවා දෙවි වන මට එම පූජාව ඔප්පු
කළේ නැත.

**14** “‘ඔබ සමඟ විදේශිකයෙකු
ජීවත් වෙනවා නම් යෙහෝවා දෙවි
වන මා වෙනුවෙන් පවත්වන පාස්කු
පූජාව ඔහුත් පිළියෙල කළ යුතුයි.[11]
පාස්කුව හා සම්බන්ධව දුන් අණප-
නත්වලට එකඟව ඔහු එය සූදානම්
කළ යුතුයි.[12] ඊශ්‍රායෙල් ජාතිකයෙකු
වුවත් විදේශිකයෙකු වුවත් පිළිපැදිය
යුත්තේ එකම පනතය.’”[13]

**15** ගිවිසුම් පෙට්ටිය තබා තිබෙන
සම්මුඛ වීමේ කූඩාරම සෑදූ දව-

**8 පරි.**
1 ගණන් 1:53, ගණන් 3:32, ගණන් 18:4, 1ලේක 23:32, එස 44:11

**9 පරි.**
2 නික් 40:2, ගණන් 1:1
3 නික් 12:27
4 නික් 12:6, ලෙවී 23:5, ගණන් 28:16, ද්වි 16:1, යොෂු 5:10, මාක් 14:12, 1කොරි 5:7
5 නික් 12:6
6 නික් 12:8
7 ද්වි 30:8, දේශ 12:13
8 ලෙවී 21:11, ගණන් 5:2, ගණන් 6:6, ගණන් 19:14, ගණන් 19:16
9 නික් 18:15, ගණන් 15:33, ගණන් 27:2

**2 තීරුව**
1 ලෙවී 7:21, ද්වි 16:2
2 නික් 25:22, ලෙවී 16:2, ගීතා 99:6
3 ගණන් 5:2
4 2ලේක 30:2, 2ලේක 30:15
5 නික් 12:8
6 නික් 12:10
7 නික් 12:46, ගීතා 34:20, යොහ 19:36
8 නික් 12:43
9 නික් 12:15
10 යාකො 4:17
11 නික් 12:19, නික් 12:48
12 නික් 12:8
13 නික් 12:49, ලෙවී 24:22, ද්වි 29:11, ද්වි 31:12, රෝම 2:11

ගණන් **9:1*** නික් 12:2හි පාදසටහන බලන්න.
**3*** නික් 12:6හි පාදසටහන බලන්න.

සේදී[1] වලා ටැඹ ඊට ඉහළින් නැවතී
තිබිණ.[2] නමුත් රාත්‍රියේ සිට උදෑසන
දක්වා කූඩාරමට ඉහළින් ගින්නක්
පෙනෙන්න තිබිණ.[3] **16** දවාලේදී
වලා ටැඹ කූඩාරමට ඉහළින් තිබු-
ණේය. රාත්‍රියේදී ඊට ඉහළින් ගින්-
නක් පෙනෙන්න තිබිණ. දිගටම එසේ
සිදු විය.[4] **17** සම්මුඛ වීමේ කූඩාර-
මට ඉහළින් තිබූ වලා ටැඹ එතැනින්
නැඟී ගිය සෑම අවස්ථාවකදීම ඊශ්‍රා-
යෙල් සෙනඟ තම කූඩාරම් අකු-
ළාගෙන ඒ මොහොතේදීම පිටත්ව
ගියෝය.[5] වලා ටැඹ යම් ස්ථාන-
යක නතර වූ විට ඊශ්‍රායෙල් සෙ-
නඟ එතැන කඳවුරු බැඳගත්තෝය.[6]
**18** ඊශ්‍රායෙල් සෙනඟට වෙනත් ස්ථා-
නයකට ගමන් කරන ලෙස යෙ-
හෝවා දෙවි අණ කළ විට ඔවුහු එසේ
කළෝය. ඔවුන්ට යම් තැනක කඳ-
වුරු බැඳගන්න කියා යෙහෝවා දෙවි
අණ කළ විටද ඔවුහු එසේ කළෝය.[7]
සම්මුඛ වීමේ කූඩාරමට ඉහළින් වලා
ටැඹ තිබෙන තාක් කල් කඳවුරු බැඳ-
ගත් ස්ථානයෙන් ඔවුහු පිටත්ව ගියේ
නැත. **19** සම්මුඛ වීමේ කූඩාරමට
ඉහළින් වලා ටැඹ දවස් ගණනාවක්
නැවතී තිබූ විටද ඊශ්‍රායෙල් සෙනඟ
යෙහෝවා දෙවිට කීකරු වී එතැනම
රැඳී සිටියෝය.[8] **20** සමහර අවස්-
ථාවලදී වලා ටැඹ ටික දවසකට
පමණක් එහි රැඳී තිබිණ. මෙලෙස
කඳවුරු බැඳගෙන සිටින ස්ථානයේ
රැඳී සිටින්න කියා යෙහෝවා දෙවි
අණ කළ විට[9] ඔවුහු එසේ කළෝය.
එතැනින් පිටත්ව යන්න කියා යෙ-
හෝවා දෙවි පැවසූ විටද ඔවුහු එසේ
කළෝය. **21** සමහර අවස්ථාවලදී
වලා ටැඹ[10] රාත්‍රිය පුරා එහි රැඳී
තිබී උදෑසන එතැනින් නැඟී ගියේය.
ඒ අවස්ථාවලදීත් ඔවුහු එතැනින්
පිටත්ව ගියෝය. වලා ටැඹ දවාලේ
නැඟී ගියත් රාත්‍රියේ නැඟී ගියත් ඊශ්‍රා-
යෙල් සෙනඟ තමන් සිටි ස්ථානව-
ලින් පිටත්ව ගියෝය.[11] **22** වලා
ටැඹ කූඩාරමට ඉහළින් දවස් දෙ-
කක්, මාසයක් හෝ ඊට වැඩි කාල-

**9 පරි.**
1 නික් 40:2
නික් 40:17
2 නික් 14:24
නික් 40:34
නෙහෙ 9:12
3 නික් 13:21
නික් 40:38
ගණන් 14:14
4 නික් 13:22
ද්වි 1:33
නෙහෙ 9:19
5 නික් 40:36
ගණන් 10:11
ගණන් 10:34
6 නික් 33:14
නික් 40:37
7 නික් 17:1
ගණන් 10:13
8 නික් 40:37
ගණන් 1:52
9 ගීතා 48:14
10 ගීතා 78:14
11 නික් 40:36
ගණන් 9:17

**2 තීරුව**
1 ද්වි 1:7
ද්වි 2:3
2 නික් 24:3
ගණන් 9:19
ද්වි 11:1
යොෂු 22:3
3 නික් 39:42

**10 පරි.**
4 ලෙවී 23:24
ලෙවී 25:9
5 ගීතා 81:3
යෝවෙ 1:14
6 ගණන් 1:18
ද්වි 29:10
යෙරෙ 4:5
7 නික් 18:21
ගණන් 1:16
ගණන් 7:2
ද්වි 1:15
ද්වි 5:23
ද්වි 31:9
8 ගණන් 2:3
9 ගණන් 2:10
10 ගණන් 10:3
යෝවෙ 2:15
11 ගණන් 31:6
1ලේක 15:24
1ලේක 16:6
2ලේක 29:26
නෙහෙ 12:35
නෙහෙ 12:41

යක් හෝ රැඳී තිබුණු විට ඊශ්‍රායෙල්
සෙනඟ කඳවුරු බැඳගත් ස්ථාන-
යෙන් පිටත්ව නොගොස් එහිම රැඳී
සිටියෝය. නමුත් වලා ටැඹ නැඟී
ගිය විගස ඔවුහුද එතැනින් පිටත්ව
ගියෝය.[1] **23** යම් ස්ථානයක කඳ-
වුරු බැඳගන්න කියා යෙහෝවා දෙවි
අණ කළ විටද එතැනින් පිටත්ව
යන්න කියා යෙහෝවා දෙවි අණ කළ
විටද ඔවුහු යෙහෝවා දෙවිට කීකරු
වූහ.[2] යෙහෝවා දෙවි මෝසෙස්ට අණ
කළ ලෙස ඔවුහු කළෝය.[3]

**10** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. **2** "රිදී
තළා හොරණෑ[4] දෙකක් සාදන්න.
සෙනඟ එකට එක් රැස් කිරීම සඳ-
හාද[5] කඳවුර වෙනත් තැනකට ගෙන
යෑමට සූදානම් කිරීම සඳහාද එම
හොරණෑ පිඹින්න. **3** ඔවුන් හො-
රණෑ දෙකම පිඹින විට කලින් දැනුම්
දී තිබෙන ආකාරයට මුළු සෙනඟ
සම්මුඛ වීමේ කූඩාරමට ඇතුළ් වන
ස්ථානයේ ඔබ ඉදිරියට පැමිණිය
යුතුයි.[6] **4** ඔවුන් එක හොරණෑවක්
පිඹින විට ඊශ්‍රායෙල්හි දහස් ගණන්
කෙරෙහි පත් කර ඇති අධිපතීන්
කලින් දැනුම් දී තිබෙන ආකාරයට
ඔබ වෙතට පැමිණිය යුතුයි.[7]

**5** "උස් හඬක්ද පහත් හඬක්ද
නික්මෙන ආකාරයෙන් හොරණෑ
පිඹින විට නැඟෙනහිර පැත්තේ[8] කඳ-
වුරු බැඳගෙන සිටින අය පිටත්ව යා
යුතුයි. **6** උස් හඬක්ද පහත් හඬක්ද
නික්මෙන ආකාරයෙන් දෙවෙනි වරට
හොරණෑ පිඹින විට දකුණු පැත්තේ[9]
කඳවුරු බැඳගෙන සිටින අය පිටත්ව
යා යුතුයි. එක් එක් දිශාවල කඳවුරු
බැඳගෙන සිටින කණ්ඩායම් පිටත්
කර යැවීම සඳහා එලෙස හොරණෑ
පිඹිය යුතුයි.

**7** "එහෙත් මුළු සෙනඟ එකට
එක් රැස් කරන විට පැහැදිලි එක
හඬකින් හොරණෑ පිඹිය යුතුයි.[10]
**8** හොරණෑ පිඹිය යුත්තේ පූජක-
යන් වන ආරොන්ගේ පුත්‍රයන්ය.[11]
ඔබ බොහෝ කාලයක් පුරා ඔබේ

පරම්පරාවලදී හොරණෑ එලෙස
භාවිත කළ යුතුයි.
**9** “ඔබට හිංසා කරන ඔබේ සතු-
රන්ට[1] විරුද්ධව යුද්ධයකට යන
අවස්ථාවලදී හමුදාව කැඳවන පිණි-
සත් හොරණෑ පිඹින්න.[2] එවිට ඔබේ
දෙවි වන යෙහෝවා ඔබව සිහි කර
සතුරන්ගේ අතින් ඔබව ගලවාගනු
ඇත.[3]
**10** “ඔබ ප්‍රීතියෙන් සිටින අවස්-
ථාවලදීද[4] උත්සවයන් පවත්වන
කාලයේදීද[5] සෑම මාසයකම ආරම්භ-
යේදීද[6] හොරණෑ පිඹින්න. ඔබ හො-
රණෑ පිඹිය යුත්තේ දවන පූජා[7] හා
හවුල් පූජා[8] ඔප්පු කරන ස්ථානය
අසල සිටයි. ඔබේ දෙවි ඔබව සිහි
කරන පිණිස ඔබ එලෙස හොරණෑ
පිඹින්න. මම ඔබේ දෙවි වන යෙහෝ-
වාය.”[9]
**11** දෙවෙනි අවුරුද්දේ දෙවෙනි
මාසයේ විසිවන දින[10] ගිවිසුම් පෙට්-
ටිය තබා තිබූ කූඩාරමට ඉහළින්
වලා ටැඹ නැඟී ගියේය.[11] **12** එවිට
සීනයි පාළුකරයේ කඳවුරු බැඳගෙන
සිටි ඊශ්‍රායෙල් සෙනඟද තමන්ට
නියම කර තිබූ ආකාරයට එතැනින්
පිටත්ව ගියෝය.[12] වලා ටැඹ පාරාන්
පාළුකරය[13] දක්වා ගොස් නතර විය.
**13** යෙහෝවා දෙවි මෝසෙස් මාර්ග-
යෙන් දුන් මඟ පෙන්වීමට අනුව[14]
ඊශ්‍රායෙල් සෙනඟ පිටත්ව ගිය පළමු
අවස්ථාව එයයි.
**14** යූදා ගෝත්‍රය හා ඔවුන් සමඟ
කඳවුරු බැඳගෙන සිටි අනික් ගෝත්‍ර
දෙක තම තමන්ගේ කණ්ඩායම්වලට
අනුව මුලින්ම පිටත්ව ගියෝය.[15] අම්-
නදාබ්ගේ පුත්‍රයා වන නාෂොන්,[16]
යූදා ගෝත්‍රයට අයත් කණ්ඩායමේ
අධිපතියා විය. **15** ෂුවර්ගේ පුත්‍රයා
වන නෙතනෙල්,[17] ඉසකාර් ගෝත්‍ර-
යට අයත් කණ්ඩායමේ අධිපතියා
විය. **16** හේලොන්ගේ පුත්‍රයා වන
එලියාබ්, සෙබුලූන් ගෝත්‍රයට අයත්
කණ්ඩායමේ අධිපතියා විය.[18]
**17** පසුව සම්මුඛ වීමේ කූඩාරමේ
කොටස් වෙන් වෙන් වශයෙන් ගල-
වන ලදි.[1] ඉන් අනතුරුව ගේර්ෂොන්-
ගේ[2] පුත්‍රයෝ හා මෙරාරීගේ[3] පුත්‍රයෝ
කූඩාරමේ එම කොටස් උසුලාගෙන
පිටත්ව ගියෝය.
**18** ඉන්පසු රූබෙන් ගෝත්‍රය හා
ඔවුන් සමඟ කඳවුරු බැඳගෙන සිටි
අනික් ගෝත්‍ර දෙක තම තමන්-
ගේ කණ්ඩායම්වලට අනුව පිටත්ව
ගියෝය. ෂෙදෙවූර්ගේ පුත්‍රයා
වන එලිසූර්,[4] රූබෙන්[5] ගෝත්‍ර-
යට අයත් කණ්ඩායමේ අධිපතියා
විය. **19** ෂුරිෂද්දයිගේ පුත්‍රයා වන
ෂෙලුමියෙල්,[6] සිමියොන්[7] ගෝත්‍රයට
අයත් කණ්ඩායමේ අධිපතියා විය.
**20** දූවෙල්ගේ පුත්‍රයා වන එලියා-
සාෆ්,[8] ගාද් ගෝත්‍රයට අයත් කණ්ඩා-
යමේ අධිපතියා විය.
**21** ඉන්පසු කෝහාත්වරු ශුද්ධස්-
ථානයට අයත් දේවල් රැගෙන
පිටත්ව ගියෝය.[9] කෝහාත්වරුන්
කඳවුරු බැඳගන්නා ස්ථානයට පැමි-
ණීමට පෙර සම්මුඛ වීමේ කූඩාරම
එම ස්ථානයේ සකස් කරන ලදි.
**22** ඉන්පසු එප්‍රායිම්[10] ගෝත්‍රය
හා ඔවුන් සමඟ කඳවුරු බැඳ-
ගෙන සිටි අනික් ගෝත්‍ර දෙක
තම තමන්ගේ කණ්ඩායම්වලට අනුව
පිටත්ව ගියෝය. අම්හුද්ගේ පුත්‍රයා
වන එලිෂාමා,[11] එප්‍රායිම් ගෝත්‍ර-
යට අයත් කණ්ඩායමේ අධිපතියා
විය. **23** පෙදාෂූර්ගේ පුත්‍රයා වන
ගමාලියෙල්,[12] මනස්සේ[13] ගෝත්‍රයට
අයත් කණ්ඩායමේ අධිපතියා විය.
**24** ගිඩියොනිගේ පුත්‍රයා වන අබි-
දාන්,[14] බෙන්ජමින්[15] ගෝත්‍රයට අයත්
කණ්ඩායමේ අධිපතියා විය.
**25** ඉන්පසු දාන්[16] ගෝත්‍රය හා
ඔවුන් සමඟ කඳවුරු බැඳගෙන සිටි
අනික් ගෝත්‍ර දෙක තම තමන්-
ගේ කණ්ඩායම්වලට අනුව පිටත්ව
ගියෝය. ඔවුහු අනික් සියලු කණ්ඩා-
යම් පිටුපසින් ආරක්ෂක සේනාවක්
සේ ගියෝය.[17] අම්මිෂද්දයිගේ පුත්‍රයා
වන අහියේසෙර්,[18] දාන් ගෝත්‍රයට
අයත් කණ්ඩායමේ අධිපතියා විය.

**10 පරි.**
**1** විනි 2:18
විනි 6:9
**2** විනි 3:27
විනි 7:20
2ලේක 13:12
1කොරි 14:8
**3** ගීතා 106:4
**4** 1ලේක 15:28
2ලේක 5:12
2ලේක 7:6
එස්රා 3:10
**5** ලෙවී 23:24
ගණන් 29:1
**6** ගීතා 81:3
**7** ගණන් 28:11
**8** ලෙවී 3:1
ගණන් 29:39
**9** නික් 6:7
ලෙවී 11:45
**10** ගණන් 1:1
**11** ගණන් 9:17
ගීතා 78:14
**12** නික් 40:36
ගණන් 2:9
ගණන් 2:16
ගණන් 2:17
ගණන් 2:24
ගණන් 2:31
**13** උත් 21:21
ගණන් 12:16
ගණන් 13:26
ද්වි 1:2
**14** ගණන් 2:34
ගණන් 9:23
**15** ගණන් 2:3
**16** ගණන් 1:7
**17** ගණන් 1:8
ගණන් 2:5
**18** ගණන් 2:7

**2 තීරුව**
**1** ගණන් 1:51
**2** ගණන් 3:25
**3** ගණන් 3:36
**4** ගණන් 1:5
**5** ගණන් 2:10
**6** ගණන් 1:6
**7** ගණන් 2:12
**8** ගණන් 1:14
ගණන් 2:14
**9** ගණන් 3:31
ගණන් 4:4
ගණන් 4:15
ගණන් 7:9
**10** ගණන් 2:24
**11** ගණන් 1:10
ගණන් 2:18
**12** ගණන් 1:10
**13** ගණන් 2:20
**14** ගණන් 1:11
**15** ගණන් 2:22
**16** ගණන් 2:25
ගණන් 2:31
**17** යොෂු 6:9
**18** ගණන් 1:12

**26** ඔක්‍රාන්ගේ පුත්‍රයා වන පගියෙල්,[1]
ආෂේර්[2] ගෝත්‍රයට අයත් කණ්ඩාය-
මේ අධිපතියා විය. **27** ඒනාන්ගේ
පුත්‍රයා වන අහිරා,[3] නප්තලී[4] ගෝත්‍ර-
යට අයත් කණ්ඩායමේ අධිපතියා
විය. **28** ඊශ්‍රායෙල් සෙනඟ පිටත්ව
ගිය සෑම අවස්ථාවකදීම ඔවුන් ගමන්
කළේ ඒ පිළිවෙළට අනුවය.[5]

**29** පසුව මෝසෙස් තම මාමා වන
රුවෙල්ගේ[6] පුත්‍රයා වූ මිදියන් ජාතික
හොබාබ්ට මෙසේ කීවේය. “යෙ-
හෝවා දෙවි අපට දෙන්න පොරොන්දු
වුණු දේශයට[7] අපි යනවා. යෙහෝවා
දෙවි ඊශ්‍රායෙල් සෙනඟට බොහෝ
සෙයින් ආශීර්වාද කරන්න පො-
රොන්දු වී තිබෙනවා.[8] ඒ නිසා
ඔබත් අප සමඟ එන්න. අපි ඔබට
හොඳින් සලකන්නම්.”[9] **30** නමුත්
හොබාබ්, “මට මගේ රටට යන්න
ඕනේ.[10] මම කැමති මගේ නෑයොත්
එක්ක ජීවත් වෙන්න. ඒ නිසා ඔබ
සමඟ මේ ගමන යන්න මට බැහැ”
කියා මෝසෙස්ට කීවේය. **31** එවිට
මෝසෙස් ඔහුට මෙසේ කීවේය. “අපිව
අත්හැර යන්න එපා. පාළුකරයේ කඳ-
වුරු බැඳගන්න සුදුසු තැන් ගැන
ඔබට හොඳ අවබෝධයක් තිබෙනවා.
ඒ නිසා මේ ගමනේදී අපට මඟ
පෙන්වන්න ඔබ අපත් සමඟ එන්න.
**32** ඔබ අප සමඟ ආවොත්[11] යෙ-
හෝවා දෙවි අපට දෙන හැම හොඳ
දෙයක්ම ඔබ සමඟ බෙදාගන්න පො-
රොන්දු වෙනවා.”

**33** කඳවුරු බැඳගැනීමට සුදුසු
තැනක් සොයමින් ඔවුහු යෙ-
හෝවා දෙවිගේ කන්දේ[12] සිට පිටත්ව
ගියෝය. ඔවුහු යෙහෝවා දෙ-
විගේ ගිවිසුම් පෙට්ටියද[13] ඔවුන්ට
ඉදිරියෙන් රැගෙන ගියෝය. මෙසේ
ඔවුහු දවස් තුනක් ගමන් කළෝය.[14]
**34** ඒ දවස් තුනේම දවල් කාලයේදී
යෙහෝවා දෙවි වලා ටැඹ[15] මාර්ග-
යෙන් ඔවුන්ට මඟ පෙන්වූවේය.

**35** ගිවිසුම් පෙට්ටිය රැගෙන ගිය
සෑම අවස්ථාවකදීම මෝසෙස් මෙසේ
කීවේය. “යෙහෝවා දෙවියනි, නැඟී
සිටින්න. ඔබේ සතුරන්ව පන්නා
දමන්න.[1] ඔබට වෛර කරන
අය ඔබ ඉදිරියෙන් පලා දුවත්වා!”[2]
**36** ඔවුන් යම් තැනක නතර වී ගිවි-
සුම් පෙට්ටිය එහි තැබූ විට මෝසෙස්
මෙසේ කීවේය. “යෙහෝවා දෙවියනි,
මේ අතිවිශාල සෙනඟ[3] අතරට පැමි-
ණෙන්න.”

# 11

පසුව සෙනඟ තම දුක් කරදර
ගැන යෙහෝවා දෙවි ඉදිරියේ
කොඳුරන්න පටන්ගත්තෝය.[4] එය
අසා යෙහෝවා දෙවි මහත් සේ උද-
හස් විය. එබැවින් ඔවුන්ව විනාශ
කරන පිණිස යෙහෝවා දෙවි ගින්නක්
එව්වේය. ඒ ගින්නට හසු වී සමහරදෙ-
නෙක් මිය ගියෝය.[5] **2** ඒ අවස්-
ථාවේදී තමන්ව බේරාගන්න කියා
සෙනඟ මෝසෙස්ට මොරගැසුවෝය.
මෝසෙස්ද ඔවුන් වෙනුවෙන් යෙ-
හෝවා දෙවිට කන්නලව් කළේය.[6]
එවිට ගින්න නිවී ගියේය. **3** පසුව
එම ස්ථානය තබේරා*[7] ලෙස හඳුන්-
වන ලදි. මන්ද එම ස්ථානයේදී
ඔවුන්ව විනාශ කරන පිණිස යෙ-
හෝවා දෙවි ගින්නක් එව්වේය.

**4** ඊශ්‍රායෙල් සෙනඟ සමඟ සිටි
වෙනත් ජාතීන්ට අයත් අය[8] මහත්
කෑදරකමෙන් ආහාර ගැන සිත-
මින් ඒ ගැන කොඳුරන්න පටන්-
ගත්තෝය.[9] ඊශ්‍රායෙල් සෙනඟද මහ
හයියෙන් හඬමින් මෙසේ කීවෝය.
“අපිට කන්න මස් කෝ?[10] **5** ඊජිප්-
තුවේ ඉන්න කාලේ අපිට කොච්චර
දේවල් කන්න තිබුණාද? අපි හිතේ
හැටියට මාළු කෑවා![11] පිපිඤ්ඤා,
කොමඩු, ලීක්ස්, ලූනු, සුදුළූනු කොයි
තරම් කෑවාද? **6** ඒත් දැන් අපිට
කන්න තියෙන්නේ මන්නා විතරයි.
ඒවා කාලා කාලා දැන් අපිට එපා
වෙලා.”[12]

**7** මන්නාවල[13] හැඩය කොත්ත-
මල්ලි ඇට[14] මෙන්ද එහි පෙ-
නුම ඩෙලියම්* ලාටු[15] මෙන්ද විය.

**10 පරි.**
1 ගණන් 1:13
2 ගණන් 2:27
3 ගණන් 1:15
4 ගණන් 2:29
5 ගණන් 2:34
6 නික් 2:18
නික් 3:1
නික් 18:1
නික් 18:27
7 උත් 12:7
උත් 13:15
උත් 15:18
ක්‍රියා 7:5
8 උත් 32:12
නික් 3:8
නික් 6:7
ගණන් 23:19
9 විනි 1:16
විනි 4:11
1සාමු 15:6
10 නික් 3:1
11 විනි 1:16
විනි 4:11
12 නික් 3:1
නික් 19:3
නික් 24:16
ද්වි 5:2
1රාජා 19:8
මලා 4:4
13 නික් 25:10
නික් 25:17
14 ද්වි 1:33
යොෂු 3:3
යොෂු 3:4
15 නික් 13:21
නෙහෙ 9:12
ගීතා 78:14
ගීතා 105:39

**2 තීරුව**
1 ගීතා 17:13
ගීතා 132:8
2 ගීතා 68:1
3 ද්වි 1:10

**11 පරි.**
4 ද්වි 9:22
5 ගීතා 78:21
ගීතා 106:18
6 නික් 32:11
ද්වි 9:19
ගීතා 106:23
යාකො 5:16
7 ද්වි 9:22
8 නික් 12:38
ලෙවී 24:10
9 1කොරි 10:10
10 ගීතා 78:18
ගීතා 78:22
ගීතා 106:14
11 නික් 16:3
12 නික් 16:35
ගණන් 21:5
13 නික් 16:14
නෙහෙ 9:20
යොහ 6:31
යොහ 6:33
යොහ 6:51
14 නික් 16:31
15 උත් 2:12

---

**ගණන් 11:3*** තේරුම, “ගින්න.” **7*** උත් 2:12හි
පාදසටහන බලන්න.

**8** සෙනඟ සාමාන්‍යයෙන් බිම වැටී
තිබුණු මන්නා එකතු කරගත්[1] පසු
ඇඹරුම් ගලකින් එය අඹරාගත්-
තෝය. එසේත් නැත්නම් වංගෙඩි-
යක දමා කොටාගත්තෝය. ඉන්පසු
ඔවුහු එය භාජනවල දමා තම්බාගත්-
තෝය.[2] එයින් රවුම් කැවිලිද සාදා-
ගත්තෝය. එහි රස, තෙල් මිශ්‍ර
කර සාදාගත් කැවිලි මෙන් විය.[3]
**9** රාත්‍රියේදී කඳවුර අවට පිනි බිඳු
වැටුණු විට මන්නාද බිම මතුපිට
වැටිණ.[4]

**10** සෑම මනුෂ්‍යයෙකුම තම පවු-
ලේ අය සමඟ කූඩාරම්වලින් එළියට
ඇවිත් හඬමින් සිටින බව මෝසෙස්
දුටුවේය. යෙහෝවා දෙවිගේ උදහස
තව තවත් වැඩි විය.[5] මෝසෙස්ද
සෙනඟගේ හැසිරීම ගැන කලකිරී[6]
**11** යෙහෝවා දෙවිට මෙසේ කීවේය.
“ඔබේ සේවකයා වන මට මේ තරම්
අමාරු වගකීමක් දුන්නේ ඇයි? මම
ඔබට විරුද්ධව මොන වරදක් කළා-
ටද මේ විශාල සෙනඟ බලාගැනීමේ
වගකීම මට භාර දුන්නේ?[7] **12** ඔබ
මට කියන්නේ මේ සෙනඟව දරුවෙ-
කුව උසුලාගෙන යන්නාක් මෙන්[8]
උකුළේ තබාගෙන[9] ඔවුන්ගේ මුතුන්-
මිත්තන්ට ඔබ දෙන්න පොරොන්දු
වුණු දේශයට[10] ඔවුන්ව ගෙන යන්න
කියාද? ඔවුන්ව මෙලොවට බිහි කළේ
මමද? **13** සෙනඟ මස් ඉල්ලමින්
අඬනවා. මම ඔවුන්ට කොහෙන් මස්
සොයා දෙන්නද? **14** මේ සෙනඟව
මට තනියෙන් බලාගන්න බැහැ.[11]
**15** ඔබ මගෙන් ඒ දේ බලාපො-
රොත්තු වෙනවා නම් මාව මරා දමන
එක ඊට වඩා හොඳයි.[12] අනේ, මම
ඔබේ කරුණාව ලැබූ කෙනෙක් නම්
මේ දුකෙන් මාව ගලවාගන්න.”

**16** යෙහෝවා දෙවි එය අසා මෝ-
සෙස්ට මෙසේ කීවේය. “ඊශ්‍රායෙල්
සෙනඟ අතරේ සිටින වැඩිමහල්-
ලන්ගෙන් හැත්තෑදෙනෙකුව තෝර-
ගන්න.[13] ඔවුන්, ඔබ දැන හඳුනන
වැඩිමහල්ලන් හා අධිපතීන් විය
යුතුයි.[14] ඔබ ඒ පුරුෂයන් සමඟ සම්-
මුඛ වීමේ කූඩාරම ළඟට ගොස්
එතැනට වී බලා සිටින්න. **17** මම
එතැනට ඇවිත්[1] ඔබ සමඟ කතා
කරන්නෙමි.[2] මම මේ දක්වා ඔබට
දුන් මගේ බලයෙන් කොටසක් ගෙන
ඔවුන්ට දෙන්නෙමි.[3] ඉන්පසු මේ සෙ-
නඟ බලාගැනීමේ වගකීම ඉසිලීමට
ඔවුහු ඔබට උදව් කරනු ඇත.[4]
**18** ඔබ සෙනඟට මෙසේ කියන්න.
‘“ඊජිප්තුවේ ඉන්න කාලේ අපිට
හොඳට කන්න තිබුණා. දැන් අපිට
කන්න මස් නැහැ”[5] කියමින් ඔබ යෙ-
හෝවා දෙවි ඉදිරියේ හැඬූ නිසා[6] යෙ-
හෝවා දෙවි අනිවාර්යයෙන්ම ඔබට
කන්න මස් දෙනු ඇත. හෙට වන විට
පවිත්‍ර වී සිටින්න.[7] දෙවි අනිවාර්ය-
යෙන්ම ඔබට කන්න මස් දෙනු ඇත.[8]
**19** දවසක්, දෙකක්, දවස් පහක්, දහ-
යක්, විස්සක් නොව, **20** මාසයක්
පුරාම ඔබට කෑමට මස් තිබෙනු
ඇත. මස් අප්‍රිය වී වමාරන තෙක්ම
ඔබට එය කන්න සිදු වෙයි.[9] මන්ද
ඔබ, “ඊජිප්තු දේශයෙන් අපව පිටතට
ගෙනාවේ ඇයි” කියමින් ඔබ අතරේ
සිටින ඔබේ දෙවි වන යෙහෝවාට
විරුද්ධව කොඳුරමින් ඔහුව ප්‍රතික්-
ෂේප කළහුය.’ ”[10]

**21** එවිට මෝසෙස්, දෙවිට මෙසේ
කීවේය. “මා සමඟ සිටින සෙනඟ
අතරේ පුරුෂයන් පමණක් හයලක්-
ෂයක්[11] සිටියි. එතරම් සෙනඟක්
සිටිද්දී, ‘මාසයක් පුරාම ඔවුන්ට
කෑමට මස් දෙන්නෙමි’ කියා
ඔබ පොරොන්දු වන්නේ කොහොමද?
**22** රංචු පිටින්ම සතුන්ව මරා ඔවුන්ට
කන්න දුන්නත් මුහුදේ සිටින සියලු
මසුන් අල්ලා දුන්නත් ඒවා ඔවුන්ට
ප්‍රමාණවත් වෙයි කියා ඔබ හිතන-
වාද?”[12]

**23** එවිට යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. “යෙ-
හෝවා දෙවි වන මට පොරොන්දු ඉටු
කරන්න බලය නැහැ කියා ඔබ සිත-
නවාද?[13] මම පැවසූ දේ ඉටු වෙනවාද
නැද්ද කියා ඔබ දැන් දකිනු ඇත.”[14]
**24** පසුව මෝසෙස් එතැනින්

**11 පරි.**
1 නික් 16:16
2 නික් 16:23
3 නික් 16:31
4 ගීතා 78:24
5 ගණන් 11:1; ද්වි 32:22; ගීතා 78:21
6 හිතෝ 29:27
7 නික් 17:4; ද්වි 1:12
8 1තෙස 2:7
9 යෙසා 40:11
10 උත් 13:15; උත් 26:3; උත් 50:24; නික් 13:5
11 නික් 18:18; ද්වි 1:9
12 1රාජා 19:4; යෝබ 6:9
13 නික් 24:1; නික් 24:9
14 ද්වි 16:18

**2 තීරුව**
1 උත් 17:22; නික් 19:11; නික් 25:22; නික් 34:5; ගණන් 12:5
2 ගණන් 11:25; ගණන් 12:8
3 ගණන් 27:18; 1සාමු 10:6; 2රාජා 2:15; නෙහෙ 9:20; ක්‍රියා 2:17
4 නික් 18:22
5 ගණන් 11:4; ගණන් 11:5
6 නික් 16:7
7 නික් 19:10
8 නික් 16:8
9 ගීතා 78:29; ගීතා 106:15
10 ගණන් 21:5
11 උත් 12:2; නික් 12:37; නික් 38:26; ගණන් 1:46
12 මතෙ 15:33
13 උත් 18:14; යෙසා 50:2; යෙසා 59:1; මාක් 10:27; ලූක් 1:37
14 යෙසා 55:11; යෙරෙ 44:28; තීත 1:2; හෙබ්‍රෙ 6:18

පිටත්ව ගොස් සෙනඟට යෙහෝවා
දෙවි පැවසූ දේවල් දැන්වූවේය. සෙ-
නඟ අතරේ සිටි වැඩිමහල්ලන්ගෙන්
ඔහු පුරුෂයන් හැත්තෑදෙනෙකුව
තෝරාගෙන සම්මුඛ වීමේ කූඩා-
රම ළඟට ඔවුන්ව කැඳෙව්වේය.[1]
**25** ඉන්පසු යෙහෝවා දෙවි වලාකු-
ළක්[2] තුළින් මෝසෙස් වෙතට පැමිණ
ඔහු සමඟ කතා කළේය.[3] දෙවි මෝ-
සෙස්ට දී තිබුණු තම බලයෙන්
කොටසක්[4] වැඩිමහල්ලන් හැත්තෑ-
දෙනාට දුන්නේය. ඔවුන්ට එම බලය
ලැබුණු විගස ඔවුහු අනාගතවක්තෘ-
වරුන් මෙන් ක්‍රියා කිරීමට පටන්ගත්-
තෝය. නමුත් පසුව ඔවුහු එලෙස
ක්‍රියා කළේ නැත.[5]
**26** මෝසෙස් තෝරාගත් හැත්තෑ-
දෙනාගෙන් දෙදෙනෙක් සම්මුඛ වීමේ
කූඩාරම ළඟට නොගොස් කඳවුරේම
සිටියෝය. එක් කෙනෙකුගේ නම
එල්දාද්ය. අනික් තැනැත්තාගේ නම
මේදාද්ය. ඔවුන් දෙදෙනාටද දෙවි-
ගේ බලය ලැබිණ. එවිට කඳවුරේ
සිටියදීම ඔවුහු අනාගතවක්තෘවරුන්
මෙන් ක්‍රියා කිරීමට පටන්ගත්තෝය.
**27** තරුණයෙක් එය දැක මෝසෙස්
වෙතට දුව ගොස්, “එල්දාද් හා මේ-
දාද් කඳවුරේ සිට අනාගතවක්තෘව-
රුන් මෙන් හැසිරෙනවා” කියා ඔහුට
කීවේය. **28** එවිට තරුණ වයසේ
පටන් මෝසෙස්ට සේවය කරමින්
සිටි[6] නූන්ගේ පුත්‍රයා වන යො-
ෂුවා, “මෝසෙස්, මගේ ස්වාමීනි,
ඔවුන්ට එසේ හැසිරෙන්න ඉඩ දෙන්න
එපා” යයි කීවේය.[7] **29** නමුත් මෝ-
සෙස් ඔහුට මෙසේ කීවේය. “මට
ඒකෙන් අවාසියක් වෙයි කියා ඔබට
භයද? භය වෙන්න එපා. ඇත්ත-
ටම යෙහෝවා දෙවිට සේවය කරන
සෑම කෙනෙක්ම අනාගතවක්තෘව-
රුන් නම් කොයි තරම් හොඳද!
එහෙම වුණොත් යෙහෝවා දෙවි ඔහු-
ගේ බලය ඔවුන් සෑම කෙනෙකුටම
ලබා දෙයි.”[8] **30** පසුව මෝසෙස්ද
ඊශ්‍රායෙල් සෙනඟ අතරේ සිටි වැඩිම-
හල්ලෝද කඳවුරට ගියෝය.

**31** යෙහෝවා දෙවි තද සුළඟක්[1]
හමන්න සැලැස්වූවේය. ඒ සුළඟ
සමඟ මුහුද දෙසින් කඳවුර දෙසට
වටුවෝ ගසාගෙන ආවෝය.[2] පො-
ළොවේ සිට රියන්* දෙකකට පමණ
ඉහළින් පියාසර කරමින් ආ උන් මුළු
කඳවුරම වසාගත්තෝය. කඳවුරේ
සිට දවසක් ඇතුළත ගමන් කළ
හැකි දුර ප්‍රමාණයක් දක්වා උන්
පෙනෙන්න සිටියෝය. උන් කඳවුර
වටේම එලෙස පෙනෙන්න සිටියෝය.
**32** සෙනඟ ඒ මුළු දවස පුරාද මුළු
රාත්‍රිය පුරාද වටුවන් එකතු කරගත්-
තෝය. ඔවුහු පසුවදා දවස පුරාද
උන්ව එකතු කරගත්තෝය. අඩු-
වෙන්ම එකතු කරගත් තැනැත්තා
වටුවන් හෝමර*[3] දහයක් එකතු කර-
ගෙන තිබිණ. සෙනඟ කඳවුර වටා
උන්ව ඇතිරුවෝය. **33** ඒ අවස්ථා-
වේදී යෙහෝවා දෙවි සෙනඟ සමඟ
මහත් සේ උදහස් විය. ඔවුන් මස්
කා අවසන් වීමටත් පෙර ඔවුන්ගේ
කටේ මස් තිබියදීම[4] යෙහෝවා දෙවි
ඔවුන්ට පහර දුන්නේය.[5] එදින සෙ-
නඟගෙන් විශාල පිරිසක් විනාශ වූහ.[6]
**34** කෑදරකමින් හැසිරුණු අයගේ
මළ සිරුරු එම ස්ථානයේ තැන්පත්
කරන ලදි.[7] එමනිසා එම ස්ථානයට
කිබ්‍රොත්-හත්තාවා*[8] යන නම තබන
ලදි. **35** පසුව සෙනඟ කිබ්‍රොත්-
හත්තාවා සිට හෂේරොත් දක්වා
ගමන් කර එහි කඳවුරු බැඳගත්-
තෝය.[9]

# 12

මෝසෙස් කූෂ් ජාතික ස්ත්‍රි-
යක සමඟ විවාහ වී සිටි නිසා
මිරියම් සහ ආරොන් ඔහු ගැන විවේ-
චනාත්මක ලෙස කතා කළෝය.[10]
**2** “යෙහෝවා දෙවි කතා කරන්නේ
මෝසෙස් මාර්ගයෙන් විතරද? අපි
මාර්ගයෙනුත් දෙවි කතා කරන්නේ
නැද්ද”[11] කියමින් ඔවුහු කොඳුරන්න
පටන්ගත්තෝය. ඔවුන් පැවසූ දේට

**11 පරි.**
1 ගණන් 11:16
2 නික් 33:9, ගණන් 12:5, ද්වි 31:15
3 ගීතා 99:7
4 ගණන් 11:17, 2රාජා 2:9, 2රාජා 2:15
5 1සාමු 10:6, 1සාමු 19:20
6 නික් 17:9, නික් 24:13, නික් 33:11, ගණන් 27:18, ද්වි 31:3
7 මාක් 9:38
8 යෝවෙ 2:28, ක්‍රියා 26:29

**2 තීරුව**
1 ගීතා 78:26, ගීතා 135:7
2 නික් 16:13, ගීතා 78:27, ගීතා 105:40
3 නික් 16:36, එස 45:11
4 ගීතා 78:30, ගීතා 106:15
5 ගීතා 78:31
6 1කොරි 10:10
7 1කොරි 10:6
8 ගණන් 33:16, ද්වි 9:22
9 ගණන් 33:17, ද්වි 1:1

**12 පරි.**
10 නික් 2:16, නික් 2:21
11 නික් 4:15, නික් 4:30, නික් 15:20, නික් 28:30, මීකා 6:4

---

ගණන් **11:31*** රියනක් යනු සෙන්ටිමීටර් 44.5කි. **32*** හෝමර එකක් යනු ලීටර් 220කි. **34*** තේ-
රුම, “කෑදරයන්ගේ සොහොන්.”

යෙහෝවා දෙවි සවන් දීගෙන සිටි-
යේය.[1] **3** පොළොවේ ජීවත් වූ අන්
සියලු මනුෂ්‍යයන්ට වඩා මෝසෙස්
මෘදු ගුණැති[2] කෙනෙක් විය.
**4** යෙහෝවා දෙවි මෝසෙස්ට,
ආරොන්ට හා මිරියම්ට ඒ මො-
හොතේම කතා කර “ඔබ තිදෙ-
නාම සම්මුඛ වීමේ කූඩාරම ළඟට
දැන්මම යන්න” කියා කීවේය. ඔවු-
හුද එතැනට ගියෝය. **5** වලා ටැඹ[3]
තුළින් යෙහෝවා දෙවි සම්මුඛ වීමේ
කූඩාරමට ඇතුල් වන ස්ථානයට
පැමිණ ආරොන්ට හා මිරියම්ට ඉදිරි-
යට එන්න කියා කීවේය. ඔවුහුද
ගියෝය. **6** ඉන්පසු දෙවි ඔවුන්ට
මෙසේ කීවේය. “දැන් මම කියන දේට
හොඳින් සවන් දෙන්න. මීට පෙරත්
යෙහෝවා දෙවි වන මාව නියෝජ-
නය කළ අනාගතවක්තෘවරු ඔබ
අතරේ සිටි නමුත් ඔවුන්ට මා ගැන
තොරතුරු දැන්නුවේ දර්ශන[4] මාර්ග-
යෙනි. මම ඔවුන්ට කතා කළේ
සිහින[5] මාර්ගයෙනි. **7** මගේ සේව-
කයා වන මෝසෙස්[6] සමඟ මම කට-
යුතු කරන්නේ එලෙස නොවෙයි.
විශ්වාසයෙන් යුතුව මම මාගේ මුළු
සෙනඟව*[7] ඔහුට භාර දුන්නෙමි.
**8** වෙනත් මාර්ගවලින් නොව මම
ඔහු සමඟ කෙළින්ම කතා කරමි.[8]
කිව යුතු දේ පැහැදිලිව ඔහුට ප්‍රකාශ
කරමි.[9] ඒ විතරක් නොවෙයි, යෙ-
හෝවා දෙවි වන මම ඔහු ඉදිරියේ
පෙනී සිටිමි.[10] එසේනම් මාගේ සේව-
කයා වන මෝසෙස් ගැන විවේච-
නාත්මකව කතා කරන්න තරම් ඔබ
එඩිතර වුණේ කොහොමද?”[11]
**9** යෙහෝවා දෙවි ඔවුන් සමඟ
මහත් සේ උදහස් වී එතැනින්
පිටත්ව ගියේය. **10** කූඩාරමට ඉහ-
ළින් තිබූ වලා ටැඹද එතැනින්
අහක්ව ගියේය. ආරොන් හැරී බලන
විට මිරියම්ගේ ඇඟ පුරා කුෂ්ඨ-
යක්*[12] හටගෙන තිබිණ. එය හිම
මෙන් සුදට පෙනෙන්න තිබිණ.[1]
**11** එවිට ආරොන් මෝසෙස්ට
මෙසේ කීවේය. “අනේ මගේ ස්වා-
මීනි, අප මෝඩකමට කළ මේ
දේ පාපයක් ලෙස සලකන්න
එපා.[2] **12** මව්කුසෙන් පිටතට ආ
මළ දරුවෙක් මෙන් මේ රෝගය නිසා
මිරියම්ගේ ශරීරය කුණු වී යන්න ඉඩ
දෙන්න එපා.”[3] **13** එවිට මෝසෙස්
යෙහෝවා දෙවිට මෙසේ කන්නලව්
කළේය. “අනේ දෙවියනි, ඇයට සුවය
ලබා දෙන්න.”[4]
**14** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. “ඇගේ පියා ඇගේ
මූණට කෙළ ගැසුවා නම්[5] දවස්
හතක් යන තුරු ඇය ලැජ්ජාවෙන්
සිටිය යුතුයි. එමනිසා දවස් හතක්
යන තෙක් ඇයට කඳවුරෙන්[6] පිටතට
වී[7] සිටින්න කියා කියන්න. දවස්
හතක් ගත වූ පසු ඇයට කඳවුරට
එන්න පුළුවන.”[8] **15** එබැවින් මිරි-
යම්ව දවස් හතකට කඳවුරෙන් පිට-
තට යවන ලදි.[9] එම දවස් හත
අවසන් වන තෙක් සෙනඟ එම
ස්ථානයෙන් පිටත්ව ගියේ නැත.
**16** ඉන්පසු සෙනඟ හශේරොත්[10] සිට
පාරාන් පාළුකරය[11] දක්වා ගමන් කර
එහි කඳවුරු බැඳගත්තෝය.

**13** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. **2** “මම
ඊශ්‍රායෙල් සෙනඟට දෙන්න පො-
රොන්දු වූ කානාන් දේශය ගැන තො-
රතුරු සොයා බලන්න පුරුෂයන්
කිහිපදෙනෙකුව යවන්න.[12] ඒ සඳහා
සෑම ගෝත්‍රයකින්ම එක මනුෂ්‍යයෙකු
බැගින් තෝරාගන්න. ඔවුන් සෙනඟ
අතරේ සිටින ප්‍රධානීන්[13] විය යුතුයි.”
**3** මෝසෙස්ද යෙහෝවා දෙවි
අණ කළ ලෙස ඔවුන්ව තෝරා-
ගෙන පාරාන් පාළුකරයෙන්[14] පිටත්
කර යැව්වේය. ඒ සියලුදෙනා ඊශ්‍රා-
යෙල් සෙනඟ අතරේ සිටි ප්‍රධානි-
යෝය. **4** ඔවුන්ගේ නම් මෙසේය.
රූබෙන් ගෝත්‍රයෙන් සක්කූර්ගේ
පුත්‍රයා වන ෂම්මුවාය. **5** සිමියොන්
ගෝත්‍රයෙන් හෝරීගේ පුත්‍රයා වන

**12 පරි.**
1 ගණන් 11:1, 2රාජා 19:4
2 ගීතා 147:6, ගීතා 149:4, මතෙ 11:29, මතෙ 21:5, 1පේතෘ 3:4
3 නික් 34:5, ගණන් 11:25, ගීතා 99:7
4 උත් 15:1, උත් 46:2, නික් 24:11, යෝබ් 33:15
5 උත් 31:10, යෙරෙ 23:28
6 ගීතා 105:26
7 හෙබ්‍රෙ 3:2
8 නික් 33:11, ද්වි 34:10
9 ගීතා 49:4, 1කොරි 13:12
10 නික් 24:10
11 නික් 34:30, 2පේතෘ 2:10, යූද් 8
12 2ලේක 26:19

**2 තීරුව**
1 ද්වි 24:9
2 2සාමු 24:10, හිතෝ 30:32, මාක් 7:20
3 ලෙවී 13:45
4 නික් 32:11, යාකො 5:16
5 යෝබ් 30:10, යෙසා 50:6
6 ලෙවී 13:46, ගණන් 5:2
7 ලෙවී 13:4
8 ලෙවී 14:9
9 ද්වි 24:9
10 ගණන් 11:35, ගණන් 33:18, ද්වි 1:1
11 ගණන් 10:12, ගණන් 13:26

**13 පරි.**
12 ගණන් 32:8, ද්වි 1:22
13 නික් 18:25, ද්වි 1:15
14 ගණන් 12:16, ද්වි 1:19

**ගණන් 12:7*** මූ.අ., “මුළු ගෘහයම.” **10*** හෝ, “ලාදුරු රෝගය.”

ෂාපාත්ය. **6** යූදා ගෝත්‍රයෙන් යෙ-
ෆුන්නෙගේ පුත්‍රයා වන කාලෙබ්ය.[1]
**7** ඉසකාර් ගෝත්‍රයෙන් යෝසෙප්-
ගේ පුත්‍රයා වන ඉගාල්ය. **8** එෆ්‍රා-
යිම් ගෝත්‍රයෙන් නූන්ගේ පුත්‍රයා වන
හෝෂෙයාය.*[2] **9** බෙන්ජමින් ගෝ-
ත්‍රයෙන් රාෆුගේ පුත්‍රයා වන පල්-
තීය. **10** සෙබ්‍යූලන් ගෝත්‍රයෙන්
සෝදීගේ පුත්‍රයා වන ගද්දීයෙල්ය.
**11** යෝසෙප්ගෙන්[3] පැවතෙන මනස්-
සේ[4] ගෝත්‍රයෙන් සූසිගේ පුත්‍රයා වන
ගද්දීය. **12** දාන් ගෝත්‍රයෙන් ගෙ-
මල්ලිගේ පුත්‍රයා වන අම්යෙල්ය.
**13** ආෂෙර් ගෝත්‍රයෙන් මිකායෙල්-
ගේ පුත්‍රයා වන සෙතූර්ය. **14** නෆ්-
තලී ගෝත්‍රයෙන් වොප්සීගේ පුත්‍රයා
වන නාබීය. **15** ගාද් ගෝත්‍රයෙන්
මාකීගේ පුත්‍රයා වන ගෙවුයෙල්ය.
**16** දේශයේ තොරතුරු සොයා බලන
පිණිස මෝසෙස් පිටත් කර යැවූ
මනුෂ්‍යයන්ගේ නම් ඒවාය. මෝසෙස්
නූන්ගේ පුත්‍රයා වන හෝෂෙයාට යෙ-
හොෂුවා*[5] යන නම දුන්නේය.

**17** කානාන් දේශයේ තොරතුරු
සොයා බලන පිණිස ඒ පුරුෂ-
යන්ව පිටත් කර යැවූ අවස්ථාවේදී
මෝසෙස් ඔවුන්ට මෙසේ කීවේය.
"මේ පාරෙන් නෙගෙබ්[6] දෙසට ගොස්
පසුව කඳුකරයට[7] යන්න. **18** දේ-
ශය මොන වගේද කියා සොයා
බලන්න.[8] එහෙ ජීවත් වෙන මිනිස්සු
බලවත් අයද කියා බලන්න. කොත-
රම් ජන සංඛ්‍යාවක් එහි පදිංචිව
සිටිනවාද කියාත් සොයා බලන්න.
**19** ඔවුන්ගේ දේශය කොයි ආකාර-
යේද කියාත් ඔවුන් ජීවත් වෙන්නේ
කූඩාරම්වලද නැත්නම් බලකොටු
තියෙන නුවරවලද කියාත් විස්තර
දැනගෙන එන්න. **20** දේශය ගස්
වැල්වලින් පිරුණු සරුසාර දේශ-
යක්ද කියා බැලීමට[9] ඔබ නිර්භීතව[10]
ඒ දේශයට ගොස් එහි පලදාවෙන්
ස්වල්පයක් රැගෙන එන්න." දේශයේ
තොරතුරු බැලීමට ඔවුන් පිටත්ව
ගියේ මිදිවතුවල ප්‍රථම ඵල නෙළන
කාලයේදීය.[1]

**21** ඔවුහු ෂින් පාළුකරයේ[2] සිට
හමාත්හි[3] දේශ සීමාව කිට්ටුවෙන්
තිබෙන රෙහොබ්[4] දක්වා ගමන් කර-
මින් දේශයේ තොරතුරු සොයා බැලූ-
වෝය. **22** ඔවුහු නෙගෙබ්[5] වෙත
ගමන් කර හෙබ්‍රොන්[6] නම් නගරයට
ආවෝය. අනාක්ගේ[7] පුත්‍රයෝ වූ අහි-
මාන්, ෂේෂයි හා තල්මයි[8] ඒ ප්‍රදේශ-
යේ ජීවත් වූහ. ඊජිප්තුවේ ෂෝවන්[9]
නම් නගරය ගොඩනඟන්න අවුරුදු
හතකට පෙර හෙබ්‍රොන්[10] නගරය
ගොඩනඟා තිබිණ. **23** ඔවුහු එෂ්-
කොල් නිම්නයට[11] පැමිණ එතැන
තිබූ මිදිවැලකින් මිදිපොකුරක් සහිත
අත්තක් කපාගත්තෝය.[12] එම අත්ත
පොල්ලක ගැටගසා මනුෂ්‍යයන් දෙ-
දෙනෙක් එය උසුලාගෙන ගියෝය. ඒ
ස්ථානයෙන් දෙළුම් ගෙඩි[13] කිහිප-
යක්ද අත්තික්කා ගෙඩි කිහිපයක්ද
කඩාගෙන ගියෝය. **24** ඊශ්‍රායෙල්
සෙනඟ එම ස්ථානයෙන් මිදිපොකු-
රක් කපාගත් බැවින් එයට එෂ්-
කොල්*[14] නිම්නය යන නම තබන
ලදී.

**25** දේශයේ තොරතුරු සොයා
බලා දවස් හතළිහකට[15] පසුව
ඔවුහු හැරී **26** පාරාන් පාළුකරයේ
කාදෙෂ්[16] නම් ස්ථානය වෙත ඇවි-
දගෙන ගියෝය. ඔවුහු මෝසෙස්,
ආරොන් හා මුළු සෙනඟ වෙත පැමිණ
දේශයේ තොරතුරු ඔවුන්ට කීවෝය.
දේශයෙන් ගෙනා පලතුරුද ඔවුන්ට
පෙන්වූවෝය. **27** මෝසෙස්ට තො-
රතුරු දන්වමින් ඔවුහු මෙසේ
කීවෝය. "ඔබ අපිට යන්න කියූ දේශ-
යට අපි ගියා. ඇත්තටම ඒ දේශය
කිරියෙන් හා පැණියෙන් ඉතිරෙන දේ-
ශයක්.[17] අපි මේ පලතුරු ගෙනාවේ ඒ
දේශයෙන්.[18] **28** නමුත් එහෙ ජීවත්
වන මිනිස්සු නම් හරිම ශක්ති-
මත්. පවුරුවලින් වට කර තිබෙන

---

**ගණන් 13:8*** තේරුම, "ගැලවීම." **16*** තේ-
රුම, "යෙහෝවා දෙවි දෙන ගැලවීම."

**ගණන් 13:24*** තේරුම, "මිදිපොකුර."

**13 පරි.**
**1** ගණන් 13:30, ගණන් 14:30, ගණන් 14:38, ගණන් 34:19, 1ලේක 4:15
**2** ගණන් 11:28, ගණන් 13:16, ගණන් 14:30, ගණන් 34:17
**3** උත් 48:5
**4** උත් 48:19
**5** නික් 17:9
**6** උත් 20:1
**7** ද්වි 1:7, විනි 1:9
**8** නික් 3:8, ද්වි 8:7
**9** නෙහෙ 9:25, නෙහෙ 9:35, එස 20:6
**10** ද්වි 31:6, යොෂු 1:6

**2 තීරුව**
**1** ගණන් 13:23
**2** ගණන් 34:3, යොෂු 15:1
**3** ගණන් 34:8, යොෂු 13:5, ආමො 6:2
**4** 2සාමු 10:6, 2සාමු 10:8
**5** ගණන් 13:17
**6** උත් 13:18
**7** ද්වි 9:2, යොෂු 11:21, යොෂු 15:13
**8** විනි 1:10
**9** ගීතා 78:12, යෙසා 19:11
**10** යොෂු 21:11
**11** ගණන් 32:9
**12** ද්වි 1:25
**13** ද්වි 8:8
**14** ද්වි 1:24
**15** ගණන් 14:34
**16** ද්වි 1:19, යොෂු 14:6, ගීතා 29:8
**17** නික් 3:8, ලෙවී 20:24
**18** ද්වි 1:25

ඔවුන්ගේ නුවරවල් හරිම විශාලයි.[1]
ඒ වගේම අනාක්ගෙන් පැවතෙන
අයත් ඒ දේශයේ ජීවත් වෙනවා.[2]
**29** අමලෙක්වරුන්[3] නෙගෙබ්[4] ප්‍රදේ-
ශයේ ජීවත් වෙනවා. හිත්තීවරුන්,
යෙබූසිවරුන්[5] හා අමෝරිවරුන්[6] කඳු-
කර පළාතේ ජීවත් වෙනවා. කානා-
නිවරුන්[7] ජීවත් වෙන්නේ මුහුදුබඩ හා
යොර්දාන් ගඟ අසලයි.”
**30** ඒ අවස්ථාවේදී මෝසෙස් ඉදි-
රියේ කැලඹී සිටි සෙනඟව සන්-
සුන් කරන පිණිස කාලෙබ්[8] මෙසේ
කීවේය. “අපි දැන්මම ගිහින්
ඒ දේශය යටත් කරගමු. කිසිම
සැකයක් නැහැ, අපිට ඒ දේශය පහ-
සුවෙන්ම යටත් කරගන්න පුළුවන්.”[9]
**31** නමුත් ඔහු සමඟ ගිය අනික්
පුරුෂයෝ මෙසේ කීවෝය. “ඒ දේ-
ශයේ මිනිස්සු අපිට වඩා හුඟක්
බලවත්. ඔවුන්ට විරුද්ධව සටන්
කරන්න අපට ශක්තියක් නැහැ.”[10]
**32** ඔවුහු තමන් බැලීමට ගිය දේ-
ශය ගැන ඊශ්‍රායෙල් සෙනඟට මෙම
නරක තොරතුරු පැවසුවෝය.[11] “අපි
බලන්න ගිය දේශය, වැසියන්ව බිලි-
ගන්නා භයානක දේශයක්. ඒ දේශයේ
අපි දුටු සෑම කෙනෙක්ම යෝධයෝ
වගේ.[12] **33** ඒ දේශයේ නෙෆිලිම්ව-
රුන්ගෙන්* පැවතෙන අනාක්ගේ[13]
පුත්‍රයනුත් ජීවත් වෙනවා. ඔවුන් ඉදි-
රියේ අපි නිකම්ම නිකම් තණකොළ
පෙත්තන් වගෙයි.”[14]

**14** එය අසා මුළු සෙනඟ මහා
හයියෙන් හඬන්න පටන්-
ගත්තෝය.[15] ඔවුහු මුළු රාත්‍රිය
පුරාම හැඬුවෝය. **2** මුළු සෙනඟ
මෝසෙස්ට හා ආරොන්ට විරුද්ධව
මැසිවිලි නඟමින්[16] මෙසේ කීවෝය.
“අනේ, අපි ඊජිප්තු දේශයේදීම
මැරිලා ගියා නම් මීට වඩා හොඳයි.
එහෙම නැත්නම් අපි මේ පාළුක-
රයේදී මැරිලා ගියා නම් කොත-
රම් හොඳද! **3** යෙහෝවා දෙවි අපිව
ඒ දේශයට ගෙන යන්නේ ඇයි?
ඒ දේශයේ මිනිස්සු අපිව කඩුවෙන්
මරලා දායි.[1] අපේ භාර්යාවන්ව හා
දරුවන්ව පැහැරගනියි.[2] අපි ඊජිප්තු-
වට හැරිලා ගියා නම් මීට වඩා
හොඳයි.”[3] **4** ඔවුහු එකිනෙකා අත-
රේ මෙසේද කියාගත්තෝය. “අපි
නායකයෙක්ව පත් කරගෙන ඊජිප්තු-
වට හැරිලා යමු.”[4]
**5** එය අසා මෝසෙස් හා ආරොන්
දණින් වැටී[5] මුළු සෙනඟ ඉදිරියේ දෙ-
විට කන්නලව් කළෝය. **6** දේශ-
යේ තොරතුරු සොයා බලන්න ගිය
අය අතරේ සිටි නූන්ගේ[6] පුත්‍රයා වූ
යොෂුවා හා යෙෆුන්නෙගේ[7] පුත්‍රයා
වූ කාලෙබ් තම වස්ත්‍ර ඉරාගෙන[8]
**7** සෙනඟට මෙසේ කීවෝය. “අපි
බලන්න ගිය දේශය ඉතා සාරවත්
දේශයක්.[9] **8** අපට යෙහෝවා දෙවි-
ගේ ආශීර්වාදය තිබෙනවා නම්[10] ඔහු
අනිවාර්යයෙන්ම අපිව ඒ දේශයට
ගෙන යයි. ඔහු කිරියෙන් හා පැණි-
යෙන් ඉතිරෙන ඒ දේශය අපට ලබා
දෙයි.[11] **9** යෙහෝවා දෙවිට විරුද්-
ධව නම් කැරලිගසන්න එපා.[12] ඒ දේ-
ශයේ ජීවත් වෙන මිනිසුන්ට බය
වෙන්නත් එපා.[13] මන්ද යෙහෝවා
දෙවි සිටින්නේ අප සමඟයි.[14] නමුත්
ඒ මිනිසුන්ගේ ආරක්ෂාවට කවුරුත්
නැහැ. අපිට බය වෙන්න කිසිම හේ-
තුවක් නැහැ.[15] අපිට පහසුවෙන්ම
ඔවුන්ව යටත් කරගන්න පුළුවන්.”[16]
**10** එහෙත් මුළු සෙනඟ ඔවුන්ට
ගල් ගැසීමට සූදානම් වූහ.[17] එවිට
යෙහෝවා දෙවිගේ තේජස ඔවුන් සිය-
ලුදෙනාටම පෙනෙන සේ සම්මුඛ
වීමේ කූඩාරමට ඉහළින් දිස් විය.[18]
**11** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. “මේ සෙනඟ තව
කොතරම් කාලයක්[19] මේ විදිහට
මට අගෞරව කරයිද?[20] මම ඔවුන්ට
මෙතරම් ලකුණු පෙන්වා තිබියදීත්
ඔවුහු මාව විශ්වාස කරන්නේ නැත.[21]
**12** මම ඔවුන්ව වසංගතයකින් සම්-
පූර්ණයෙන්ම විනාශ කර ඔවුන්ට

**13 පරි.**
**1** ද්වි 1:28
**2** ගණන් 13:22
ගණන් 13:33
**3** උත් 36:12
නික් 17:8
1සාමු 15:3
**4** ගණන් 13:17
**5** උත් 10:16
නික් 23:23
ද්වි 7:1
විනි 1:21
2සාමු 5:8
**6** යොෂු 3:10
**7** උත් 10:19
ද්වි 20:17
**8** ගණන් 14:6
**9** යොෂු 14:7
ගීතා 60:12
**10** ගණන් 32:9
ද්වි 1:28
යොෂු 14:8
**11** ගණන් 14:36
ගණන් 32:9
**12** ආමො 2:9
**13** ද්වි 1:28
ද්වි 9:2
**14** ද්වි 2:10

**14 පරි.**
**15** ද්වි 1:32
**16** ද්වි 1:27
ගීතා 106:25

**2 තීරුව**
**1** ගණන් 14:29
ගීතා 78:40
**2** ගණන් 14:31
ද්වි 1:39
**3** ගණන් 11:5
**4** ද්වි 1:34
නෙහෙ 9:17
හෙබ්‍රෙ 10:38
**5** ද්වි 9:26
**6** ගණන් 13:8
ගණන් 13:16
**7** ගණන් 13:6
ගණන් 14:30
**8** යොෂු 7:6
**9** ගණන් 13:27
ද්වි 1:25
ද්වි 8:7
ද්වි 11:14
**10** ද්වි 9:5
ද්වි 10:15
**11** නික් 3:8
**12** ද්වි 9:7
**13** ද්වි 7:18
ද්වි 20:3
**14** උත් 48:21
නික් 33:16
ද්වි 20:1
යෙසා 41:10
රෝම 8:31
**15** ගීතා 27:14
**16** ගණන් 24:8
**17** නික් 17:4
**18** නික් 16:10
නික් 24:17
**19** නික් 16:28

**20** ගණන් 14:23; **21** ද්වි 9:23; ගීතා 78:42; ගීතා 106:24; යොහ 12:37; හෙබ්‍රෙ 3:19.

ගණන් **13:33*** උත් 6:4හි පාදසටහන බලන්න.

වඩා බලවත් ජාතියක් ඔබෙන් බිහි
කරන්නෙමි.”[1]
**13** නමුත් මෝසෙස් යෙහෝවා
දෙවිට මෙසේ කීවේය. “ඔබේ මහත්
බලය පෙන්වා ඊජිප්තුවරුන්ගේ අතින්
ගලවාගත් මේ සෙනඟට ඔබ එහෙම
කළොත් ඊජිප්තුවරුන්ට ඒ ගැන
ආරංචි වෙයි.[2] **14** ඔවුන් ඒ දේශයේ
වැසියන්ටත් ඒ ගැන කියයි. යෙ-
හෝවා දෙවි වන ඔබ මේ සෙනඟ
සමඟ සිටින බවත් ඔවුන් ඉදිරියේ ඔබ
පෙනී සිටි බවත්[3] මේ දේශයේ වැසියන්
අසා තිබෙනවා.[4] එමෙන්ම යෙහෝවා
දෙවි වන ඔබ මේ සෙනඟගේ කඳවුරට
ඉහළින් වලා ටැඹක් තබා තිබෙන
බවත් ඔවුන් දන්නවා. දවාලේදී වලා
ටැඹ මගින්ද රාත්‍රියේදී ගිනි ජාලාව
මගින්ද ඔබ සෙනඟට මඟ පෙන්-
වන බව ඔවුන් දන්නවා.[5] **15** ඔබ
මේ සෙනඟ සහමුලින්ම මරා දැම්-
මොත්[6] ඔබේ මහත් බලය ගැන
අසා තිබෙන ජාතීන් මෙසේ කියයි.
**16** ‘යෙහෝවා දෙවි මේ සෙනඟව
පාළුකරයේදී මරා දැම්මේ පොරොන්දු
වූ දේශයට ඔවුන්ව ගෙන යන්න
නොහැකි වූ නිසයි.’[7] **17** යෙහෝවා
දෙවියනි, ඔබේ මහත් බලය[8] හැමෝ-
ටම දකින්න සලස්වන්න. ඔබ කියූ
මේ දේට එකඟව ක්‍රියා කරන්න.
**18** ‘යෙහෝවා දෙවි වන මම කෝප
වීමට ඉක්මන් නොවන,[9] ඉමහත් ප්‍රේ-
මයක්*[10] පෙන්වන දෙවි කෙනෙක්ය.
මම අයුතුකම්වලටද වැරදිවලටද
සමාව දෙන[11] නමුත් කිසිවිටෙක වර-
දකරුවන්ට දිය යුතු දඬුවමින් ඔවුන්ව
නිදහස් නොකරමි.[12] පියවරුන්ගේ
වැරදි නිසා තුන්වෙනි හා හතර-
වෙනි පරම්පරා දක්වා ඔවුන්ගේ පුත්‍ර-
යන්ට අනිවාර්යයෙන්ම දඬුවම්
කරන්නෙමි.’[13] **19** දෙවියනි, ඔබ
මහත් ප්‍රේමයකින්* පිරුණු දෙවි කෙ-
නෙක්. ඊජිප්තුවෙන් පිටත්ව ආ දවසේ
සිට මේ දක්වා ඔබ මේ සෙනඟට
සමාව දුන් ලෙසම දැනුත් ඔවුන්ට ප්‍රේ-
මය පෙන්වා ඔවුන්ගේ වරදට සමාව
දෙන ලෙස ඔබෙන් අයැදිනවා.”[1]
**20** එවිට යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. “ඔබ මගෙන්
ඉල්ලූ ලෙස මම ඔවුන්ට සමාව දෙන්-
නෙමි.[2] **21** ජීවමාන දෙවි මමයි. ඒ
නිසා යෙහෝවා දෙවි වන මාගේ තේ-
ජසින් මේ පොළොව පිරී යන බව ස්ථි-
රයි.[3] **22** එහෙත් ඊජිප්තු දේශයේදී
හා පාළුකරයේදී මා පෙන්වූ ලකුණු[4]
හා මාගේ තේජස[5] දැක තිබියදීත් මා
ඔවුන් වෙනුවෙන් මැදිහත් වී ක්‍රියා
කරයිද නැද්ද කියා අනන්ත වාරයක්*
මාව සෝදිසි කර බලමින්[6] මට අකී-
කරු වූ මේ සෙනඟට,[7] **23** ඔවුන්ගේ
පියවරුන්ට මා දෙන බවට පො-
රොන්දු වූ දේශය කවදාවත් දකින්න
ලැබෙන්නේ නැත. මට අගෞරවනීය
ලෙස සලකන කිසි කෙනෙක් ඒ දේ-
ශය නොදකිනු ඇත.[8] **24** එහෙත්
මාගේ සේවකයා වන කාලෙබ්ට[9]
අනික් අයට වඩා වෙනස් ආකල්පයක්
තිබෙන නිසාත් ඔහු සම්පූර්ණ සිත-
කින් මට සේවය කරන නිසාත්[10]
එම දේශයට මම අනිවාර්යයෙන්ම
ඔහුව ගෙන යන්නෙමි. මම එම දේ-
ශය ඔහුගේ දරුවන්ටත් උරුමයක්
ලෙස දෙන්නෙමි.[11] **25** දැන් මේ දේ
අසන්න. අමලෙක්වරුන් හා කානානි-
වරුන්[12] තැනිතලාවේ වාසය කරන
නිසා හෙට මෙතැනින් පිටත් වී රතු
මුහුදට යන මාර්ගය ඔස්සේ පාළුක-
රය දෙසට යන්න.”[13]
**26** යෙහෝවා දෙවි තවදුරටත්
මෝසෙස්ට හා ආරොන්ට මෙසේ
කීවේය. **27** “ඊශ්‍රායෙල් සෙනඟ මට
විරුද්ධව නඟන මැසිවිලි මට
ඇසිණ.[14] මේ දුෂ්ට සෙනඟ මට විරුද්-
ධව තව කොපමණ කල් මැසි-
විලි නඟයිද?[15] **28** ඔවුන්ට මෙසේ
කියන්න. ‘යෙහෝවා දෙවි පැවසූ මේ
වචන අසන්න. “ඔබ පැවසූ සෑම විප-
තක්ම ඒ විදිහටම සිදු වීමට මම

**14 පරි.**
1 නික් 32:10
2 නික් 32:12; එස 20:9
3 ද්වි 4:12; ද්වි 5:4
4 නික් 15:14; යොෂු 2:10; යොෂු 5:1
5 නික් 13:21; නෙහෙ 9:12; ගීතා 78:14; ගීතා 105:39
6 විනි 6:16
7 ද්වි 9:28; ද්වි 32:27; යොෂු 7:9
8 ගීතා 62:11; ගීතා 147:5
9 නික් 34:6; රෝම 9:22
10 ගීතා 103:8; යෝනා 4:2; මීකා 7:18
11 නික් 34:7; 1යොහ 1:9
12 නාහූ 1:3; රෝම 2:5
13 නික් 34:7

**2 තීරුව**
1 නික් 34:9; ගීතා 78:38
2 යාකො 5:16
3 ගීතා 72:19; හබ 2:14
4 නෙහෙ 9:17
5 ද්වි 1:31
6 නික් 17:2; ගීතා 95:9; ගීතා 106:14; හෙබ්‍රෙ 3:16
7 ගීතා 81:11
8 ගණන් 26:64; ගණන් 32:11; ද්වි 1:35; ගීතා 95:11; ගීතා 106:26; හෙබ්‍රෙ 3:18; හෙබ්‍රෙ 4:3
9 ගණන් 13:30; ගණන් 26:65
10 යොෂු 14:9
11 යොෂු 14:14
12 ගණන් 13:29
13 ද්වි 1:40
14 1කොරි 10:10
15 නික් 16:28; ගණන් 14:11

**ගණන් 14:18*** හෝ, “ලැදි ප්‍රේමයක්.” **19*** හෝ, “ලැදි ප්‍රේමයකින්.”

**ගණන් 14:22*** මූ.අ., “දහ වතාවක්.”

ඉඩහරින්නෙමි. මා ජීවමාන දෙවිය.
එබැවින් ඒ විපත්ති ඔබ පිට පැමි-
ණෙන බව ස්ථිරයි.[1] **29** මට විරුද්-
ධව මැසිවිලි නැඟූ අවුරුදු විස්සක්
හෝ ඊට වඩා වැඩි වයසේ පසු වන
ලියාපදිංචි කළ සියලුදෙනාම[2] අනි-
වාර්යයෙන්ම පාළුකරයේදී මිය යනු
ඇත.[3] **30** මා අත ඔසවා, දිවුරා
ඔබට දෙන බවට පොරොන්දු වූ ඒ දේ-
ශයට[4] යෙෆුන්නෙගේ පුත්‍රයා වන
කාලෙබ් හා නූන්ගේ පුත්‍රයා වන යො-
ෂුවා හැර වෙන කිසිවෙක් නොයනු
ඇත.[5]

**31** "'"සතුරන් පැහැරගනියි කියා
ඔබ පැවසූ ඔබේ දරුවන්ව[6] මම ඒ දේ-
ශයට ගෙන යන්නෙමි. ඔබ හෙළා-
දුටු[7] ඒ දේශය ඔවුහු භුක්ති විඳිනු
ඇත. **32** නමුත් ඔබ සියලුදෙනා
මේ පාළුකරයේදී මිය යනු ඇත.[8]
**33** ඔබේ පුත්‍රයෝ අවුරුදු හතළිහක්
පුරා එඬේරුන් ලෙස මේ පාළුකරයේ[9]
ජීවත් වෙමින් ඔබේ ද්‍රෝහිකම්වලට*[10]
වන්දි ගෙවන්නෝය. මේ පරම්පරා-
වේ සියලුදෙනාම මිය යන තෙක්
ඔවුන්ට පාළුකරයේ ජීවත් වීමට සිදු
වනු ඇත.[11] **34** දේශයේ තොරතුරු
සොයා බැලීමට ඔබට දවස් හතළි-
හක්[12] ගත වුණේය. ඔබ කළ වරද
නිසා ඒ සෑම දවසකටම අවුරුද්දක්
බැගින්[13] වන්දි ගෙවිය යුතුයි. මෙසේ
ඒ දවස් හතළිහ වෙනුවෙන් ඔබ අවු-
රුදු හතළිහක් වන්දි ගෙවනු ඇත.[14]
මාව ප්‍රතික්ෂේප කිරීම කොතරම් බර-
පතළ ක්‍රියාවක්ද කියා එවිට ඔබ තේ-
රුම්ගනු ඇත.[15]

**35** "'"යෙහෝවා දෙවි වන මා
ප්‍රකාශ කළ ඒ දේ එලෙසම සිදු වනු
ඇත.[16] මට විරුද්ධව කැරලිගැසූ මේ
දුෂ්ට සෙනඟ අනිවාර්යයෙන්ම පාළු-
කරයේදී මිය යනු ඇත.[17] **36** දේශ-
යේ තොරතුරු සොයා බැලීමට යැවූ
මිනිසුන් දේශය ගැන නරක තො-
රතුරු කියමින්[18] මුළු සෙනඟවම
මෝසෙස්ට විරුද්ධව නැඟී සිටීමට
පෙලඹවූ නිසා **37** යෙහෝවා දෙවි
වන මම අනිවාර්යයෙන්ම ඔවුන්ට
පහර දී ඔවුන්ව මරා දමන්නෙමි.[1]
**38** නමුත් දේශයේ තොරතුරු සොයා
බැලීමට ගිය අය අතරින් නූන්ගේ
පුත්‍රයා වන යොෂුවා හා යෙෆුන්නෙ-
ගේ පුත්‍රයා වන කාලෙබ්ගේ ජීවිත
ගැලවෙනු ඇත."'"[2]

**39** මෝසෙස් ඒ සියල්ල ඊශ්‍රා-
යෙල් සෙනඟට පැවසුවේය. එවිට මුළු
සෙනඟ හඬා වැලපෙන්න පටන්-
ගත්තෝය.[3] **40** ඔවුහු පසුවදා උදෑ-
සනින්ම නැඟිට මෙසේ කියමින්
කන්ද මුදුනට යන්න සූදානම් වූහ.
"අපි යෙහෝවා දෙවිට විරුද්ධව පාප-
යක් කළ බව අපි පිළිගන්නවා. දැන්
අපි ඔහු කියූ තැනට යන්න සූදා-
නම්."[4] **41** නමුත් මෝසෙස් ඔවුන්ට
මෙසේ කීවේය. "ඔබ යෙහෝවා දෙ-
විට අකීකරු වෙන්නේ ඇයි?[5] ඔබ
කරන්න යන දේ සාර්ථක වෙන්නේ
නැහැ. **42** මන්ද යෙහෝවා දෙවිගේ
ආශීර්වාදය ඔබට ලැබෙන්නේ නැහැ.
ඒ නිසා ඔබ කඳුකරයට ගියොත්
අනිවාර්යයෙන්ම සතුරන්ගේ අතින්
පරාජයට පත් වෙනවා.[6] **43** අම-
ලෙක්වරුන් හා කානානිවරුන් ඔබට
විරුද්ධව සටන් කර[7] ඔබව කඩු-
වෙන් මරා දමයි. ඔබ යෙහෝවා දෙ-
විව ප්‍රතික්ෂේප කළ නිසා යෙහෝවා
දෙවිත් ඔබව ප්‍රතික්ෂේප කරලයි
තිබෙන්නේ."[8]

**44** නමුත් ඔවුහු හිතුවක්කාර
ලෙස කඳුකරයට ගියෝය.[9] යෙ-
හෝවා දෙවිගේ ගිවිසුම් පෙට්ටිය
කඳවුරෙන් පිටතට ගෙන ගියේවත්
මෝසෙස් කඳවුරෙන් පිටතට ගියේ-
වත් නැත.[10] **45** කඳුකරයේ ජීවත්
වූ අමලෙක්වරු[11] හා කානානිවරු
ඊශ්‍රායෙල් සෙනඟ වෙතට පැමිණ
ඔවුන්ට පහර දී හෝර්මා[12] දක්වා
ඔවුන්ව පන්නාගෙන ගියෝය.

**15** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. **2** "ඊශ්‍රා-
යෙල් සෙනඟට මෙසේ කියන්න. 'මම
ඔබට දෙන දේශයේ පදිංචි වූ පසු[13]

ගණන් **14:33*** මූ.අ., "ඔබේ දුරාචාරකම්වලට."

**14 පරි.**
1 ගණන් 14:2, ගණන් 26:64, ගණන් 32:11, ද්වි 1:35
2 ගණන් 1:45, යුද් 5
3 1කොරි 10:5, හෙබ්‍රෙ 3:17
4 නික් 6:8
5 ගණන් 26:65, ගණන් 32:12, ද්වි 1:36, ද්වි 1:38
6 ගණන් 14:3, ද්වි 1:39
7 ගීතා 106:24
8 ගීතා 106:26, 1කොරි 10:5, හෙබ්‍රෙ 3:17, යුද් 5
9 ගණන් 32:13, යොෂු 14:10
10 එස 16:26, යාකො 4:4
11 ද්වි 1:3, ද්වි 2:14
12 ගණන් 13:25
13 එස 4:6
14 ගීතා 95:10, ක්‍රියා 7:36, ක්‍රියා 13:18
15 ගීතා 60:1, ගීතා 108:11
16 ගණන් 23:19
17 ගණන් 14:29, හෙබ්‍රෙ 3:17
18 ගණන් 13:32

**2 තීරුව**
1 1කොරි 10:10, යුද් 5
2 ගණන් 14:30, ගණන් 26:65, ගණන් 32:12, ද්වි 1:36, යොෂු 14:6
3 නික් 33:4
4 ද්වි 1:41
5 ලෙවී 26:14, 2රාජා 21:15, 2ලේක 24:20
6 ලෙවී 26:17, ද්වි 1:42, ද්වි 28:25
7 ගණන් 13:29
8 යොෂු 6:13, 2ලේක 15:2
9 ද්වි 1:43, හිතෝ 21:24
10 ගණන් 10:33
11 ද්වි 1:44
12 ගණන් 21:3

**15 පරි.**
13 උත් 15:18, ද්වි 7:1

**3** ඔබ යෙහෝවා දෙවි වන මට
ප්‍රසන්න සුවඳක්[1] ගෙනෙන පිණිස
ගින්නෙන් දවා පූජා ඔප්පු කළ
යුතුයි.[2] ඔබ එලෙස යෙහෝවා දෙවි
වන මට එළු බැටළු රැළෙන් හෝ ගව
රැළෙන් හෝ සතෙකු ගෙන, දවන
පූජාවක්[3] ලෙස හෝ විශේෂ භාර-
යක් ලෙස හෝ ඔබේ කැමැත්තෙන්ම
කරන පූජාවක්[4] ලෙස හෝ නියම
කරන ලද උත්සව දිනවලදී[5] කරන
පූජා ලෙස හෝ ඔප්පු කරන විට
මේ පිළිවෙත අනුගමනය කරන්න.
**4** පූජාව ඔප්පු කරන තැනැත්තා යෙ-
හෝවා දෙවි වන මට ඒ සමඟ ධාන්‍ය
පූජාවක්ද ඔප්පු කළ යුතුයි. ඔහු ඒ
සඳහා සිහින් පිටි[6] ඒපාවකින් දහයෙන්
කොටසක් තෙල් හින මිනුමකින්*
හතරෙන් කොටසක් සමඟ මිශ්‍ර කර
ගෙනා යුතුයි. **5** දවන පූජාව සමඟ
පාන පූජාවක්[7] ලෙස වයින් හින මිනු-
මකින් හතරෙන් කොටසක්ද ඔප්පු
කරන්න. වෙනත් පූජාවක් සඳහා
බැටළු පැටියෙකුව ඔප්පු කරන විටද
එසේ කරන්න. **6** බැටළුවෙකු ඔප්පු
කරන අවස්ථාවේදී ධාන්‍ය පූජාවක්ද
ඔප්පු කළ යුතුයි. ඒ සඳහා සිහින් පිටි
ඒපාවකින් දහයෙන් කොටස් දෙ-
කක් ගෙනෙන්න. ඒ පිටිවලට තෙල්
හින මිනුමකින් තුනෙන් කොටසක්ද
මිශ්‍ර කර ගෙනා යුතුයි. **7** යෙහෝවා
දෙවි වන මට ප්‍රසන්න සුවඳක් ගෙ-
නෙන පිණිස පාන පූජාවක්ද ඒ සමඟ
ඔප්පු කරන්න. ඒ සඳහා වයින් හින
මිනුමකින් තුනෙන් කොටසක් ගෙ-
නෙන්න.

**8** “‘විශේෂ භාරයක්[8] ලෙස හෝ
දවන පූජාවක්[9] ලෙස හෝ හවුල්
පූජාවක් ලෙස හෝ යෙහෝවා දෙවි
වන මට ඔප්පු කරන පිණිස[10] ඔබ
ගව රැළෙන් පිරිමි සතෙකුව ගෙනෙ-
නවා නම් **9** ඒ සතා සමඟ ධාන්‍ය
පූජාවක්ද[11] ඔප්පු කළ යුතුයි. ඒ
සඳහා සිහින් පිටි ඒපාවකින් දහ-
යෙන් කොටස් තුනක් ගෙනෙන්න.
එම පිටිවලට තෙල් හින මිනුමකින්
භාගයක් මිශ්‍ර කර ගෙනා යුතුයි.
**10** යෙහෝවා දෙවි වන මට ප්‍රසන්න
සුවඳක් ගෙනෙන පිණිස ගින්නෙන්
දවා පාන පූජාවක්ද[1] ඒ සමඟ ඔප්පු
කරන්න. ඒ සඳහා වයින් හින මිනුම-
කින් භාගයක් ගෙනෙන්න. **11** ගව-
යෙකු හෝ බැටළුවෙකු හෝ එළුවෙකු
හෝ බැටළු පැටියෙකු හෝ ඔප්පු
කරන විට එම පිළිවෙත අනුගමනය
කරන්න. **12** ඔබ ඔප්පු කරන සෑම
සතෙකු සමඟ පාන පූජාවක් හා
ධාන්‍ය පූජාවක් එලෙස ඔප්පු කරන්න.
**13** ඊශ්‍රායෙල් ජාතිකයෙකු යෙහෝවා
දෙවි වන මට ප්‍රසන්න සුවඳක් ගෙ-
නෙන පිණිස ගින්නෙන් දවා පූජා-
වක් ඔප්පු කරන සෑම අවස්ථාවකදීම
එලෙස කළ යුතුයි.[2]

**14** “‘ඔබ සමඟ ජීවත් වන විදේ-
ශිකයෙකු හෝ පරම්පරා ගණනා-
වක් ඔබ සමඟ ජීවත් වන වෙන
ඕනෑම කෙනෙකු හෝ යෙහෝවා
දෙවි වන මට ප්‍රසන්න සුවඳක් ගෙ-
නෙන පිණිස ගින්නෙන් දවා පූජා-
වක් ඔප්පු කරන විට ඔහුද එම
පිළිවෙත අනුගමනය කළ යුතුයි.[3]
**15** යෙහෝවා දෙවි වන මා විදේශික-
යාට සලකන්නේ ඔබේම ජාතියේ
කෙනෙකුට සලකන ආකාරයටමයි.[4]
ඒ නිසා ඊශ්‍රායෙල් ජාතිකයෙකු වුවත්
විදේශිකයෙකු වුවත් පිළිපැදිය යුත්-
තේ එකම නීතියයි.[5] එය ඔබටත්
ඔබෙන් පැවතෙන්නන්ටත් බොහෝ
කාලයකට වලංගු වන නීතියකි.
**16** ඔබටත් ඔබ සමඟ ජීවත් වන
විදේශිකයන්ටත් ලැබෙන්නේ එකම
නියෝගයයි. ඔබ සියලුදෙනා එකම
නීතිය පිළිපැදිය යුතුයි.’ ”[6]

**17** යෙහෝවා දෙවි තවදුර-
ටත් මෝසෙස්ට මෙසේ කීවේය.
**18** “ඊශ්‍රායෙල් සෙනඟට මෙලෙසද
කියන්න. ‘මම ඔබට දෙන්න පො-
රොන්දු වූ දේශයට ඔබ පැමිණි පසු[7]
**19** එහි පලදාව රැස් කරන විට[8] ඔබ
යෙහෝවා දෙවි වන මට පූජාවක්
දිය යුතුයි. **20** ඔබේ පළමු ධාන්‍ය

**15 පරි.**
1 උත් 8:21; ලෙවී 1:9; එෆී 5:2
2 ලෙවී 1:2
3 ලෙවී 1:3
4 ලෙවී 7:16; ලෙවී 22:18; ලෙවී 22:21
5 ලෙවී 23:4; ගණන් 28:16; ගණන් 29:1; ද්වි 16:13; ද්වි 16:16
6 නික් 29:40; ලෙවී 2:1; ලෙවී 2:11
7 ගණන් 28:7; ගණන් 28:14; 2තිමෝ 4:6
8 ලෙවී 7:16
9 ලෙවී 1:3
10 ලෙවී 3:1; ලෙවී 3:3; ලෙවී 7:11
11 ලෙවී 6:14; ලෙවී 7:37; ගණන් 28:12; ගණන් 29:6; 1ලේක 21:23

**2 තීරුව**
1 ගණන් 28:14
2 උත් 8:21; ලෙවී 1:9; ලෙවී 3:16; එස 20:41
3 නික් 12:49; ලෙවී 22:18; ලෙවී 24:22; ගණන් 9:14
4 ලෙවී 19:34; ලෙවී 20:2; ලෙවී 24:16; රෝම 3:29
5 ගණන් 15:29
6 ලෙවී 16:29; ලෙවී 17:15; ගණන් 15:14
7 ලෙවී 23:10; ද්වි 7:1; ද්වි 26:1
8 යොෂු 5:11; යොෂු 5:12

ගණන් **15:4*** හින මිනුමක් යනු ලීටර් 3.67කි.

අස්වැන්නෙන්[1] ලබාගත් පිටිවලින්
මුද්දක හැඩැති රොටි සාදා පූජාවක්
ලෙස ඒවා මට ඔප්පු කරන්න. කම-
තේදී ලබාගත් දේ ඔප්පු කරන්නාක්
මෙන් ඔබ එම පූජාවද ඔප්පු කළ
යුතුයි. **21** ඔබත් ඔබෙන් පැවතෙන
අයත් පළමු ධාන්‍ය අස්වැන්නෙන්
ලබාගන්නා පිටිවලින් එලෙස යෙ-
හෝවා දෙවි වන මට පූජාවක් ඔප්පු
කළ යුතුයි.

**22** "'යෙහෝවා දෙවි මෝසෙස්
මාර්ගයෙන් දුන් ආඥා නොදැනුවත්-
කමින් කඩ කරන අවස්ථා පැන-
නැඟිය හැක.[2] **23** යෙහෝවා දෙවි
මෝසෙස් මාර්ගයෙන් ආඥා දුන් දව-
සේ සිට මේ දක්වාද ඔබේ මතු පරම්-
පරාවලදීද යෙහෝවා දෙවිගේ එම
ආඥා ඔබ ක්‍රියාත්මක කළ යුතුයි.
**24** නමුත් නොදැනුවත්කමින් ඔබ
එවැනි ආඥාවක් කඩ කළොත් මුළු
සෙනඟ යෙහෝවා දෙවි වන මට
ප්‍රසන්න සුවඳක් ගෙනෙන පිණිස
දවන පූජාවක් ලෙස වස්සෙකුව ඔප්පු
කළ යුතුයි. සාමාන්‍ය පිළිවෙතට
අනුව ඒ සමඟ ධාන්‍ය පූජාවක්ද පාන
පූජාවක්ද ඔප්පු කළ යුතුයි.[3] පාප
පූජාවක් ලෙස එළු පැටියෙකුවද ඔප්පු
කළ යුතුයි.[4] **25** පූජකයා එම පූජා
ඔප්පු කර[5] සෙනඟගේ පාපයට සමාව
ලබාගත යුතුයි. එය හිතාමතා නො-
කළ පාපයක් නිසා ඔවුන්ට සමාව
ලැබෙයි.[6] ඔවුන් යෙහෝවා දෙවි වන
මට දවන පූජාවක් ඔප්පු කළ නිසාත්
ඔවුන් කළ වරද වෙනුවෙන් යෙහෝවා
දෙවි වන මට පාප පූජාවක් ඔප්පු කළ
නිසාත් ඔවුන්ට නිසැකවම සමාව
ලැබෙයි. **26** මුළු ඊශ්‍රායෙල් සෙනඟ-
ටද ඔවුන් සමඟ ජීවත් වන විදේශික-
යන්ටද එම වරදට සමාව ලැබෙයි.[7]
මන්ද සෙනඟ එම ආඥාව නොපැ-
වැත්වූයේ නොදැනුවත්කමින්ය.

**27** "'කෙනෙකු නොදැනුවත්ක-
මින් දෙවිගේ ආඥාවක් කැඩුවොත්[8]
ඔහු පාප පූජාවක් ලෙස අවුරුද්-
දක් පමණ වයසැති එළුදෙනක් ඔප්පු
කළ යුතුයි.[9] **28** නොදැනුවත්කමින්
යෙහෝවා දෙවි වන මට විරුද්ධව
පව් කළ එම තැනැත්තාගේ වරදට
සමාව ලබාගන්නා පිණිස පූජකයා
එම පූජාව ඔප්පු කළ යුතුයි. එවිට
ඔහුට සමාව ලැබෙයි.[1] **29** නොදැ-
නුවත්කමින් දෙවිගේ ආඥාවක් කඩ
කළ අවස්ථාවකදී ඊශ්‍රායෙල් ජාතික-
යෙකු වුණත් ඔවුන් සමඟ ජීවත් වන
විදේශිකයෙකු වුණත් පිළිපැදිය යුත්-
තේ එකම නීතියයි.[2]

**30** "'එහෙත් ඊශ්‍රායෙල් ජාතික-
යෙකු හෝ විදේශිකයෙකු හෝ හිතා-
මතාම[3] ආඥාවක් කඩ කළොත් එය
යෙහෝවා දෙවි වන මට කරන
අපහාසයකි.[4] එබැවින් ඒ තැනැත්-
තාව මරා දැමිය යුතුයි.[5] **31** ඒ තැ-
නැත්තා යෙහෝවා දෙවි වන මාගේ
වචනය සුළු කර[6] මාගේ ආඥා කඩ
කළ නිසා[7] අනිවාර්යයෙන්ම ඔහුව
මරා දැමිය යුතුයි.[8] ඔහු කළ වරදට
ඔහුම වග කිව යුතුයි.'"[9]

**32** ඊශ්‍රායෙල් සෙනඟ පාළුකරයේ
සිටි කාලයේ එක්තරා මනුෂ්‍යයෙකු
සබත් දවසකදී[10] දර එකතු කර-
මින් සිටිනවා ඔවුන්ට සම්බ
විය. **33** ඔවුහු, ඔහුව මෝසෙස්,
ආරොන් හා මුළු සෙනඟ ඉදිරියට
ගෙන ගියෝය. **34** ඔහු සම්බන්ධ-
යෙන් කළ යුත්තේ කුමක්ද කියා
දැනගන්නා තෙක් ඔවුහු ඔහුව රඳවා
තබාගත්තෝය.[11] මන්ද එවැනි පුද්ග-
ලයෙකු සම්බන්ධයෙන් කුමක් කළ
යුතුද කියා මීට පෙර සඳහන් කර
තිබුණේ නැත.

**35** පසුව යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. "ඔබ
අනිවාර්යයෙන්ම ඔහුව මරා දැමිය
යුතුයි.[12] ඔහුව කඳවුරෙන් එළියට
ගෙන ගොස් මුළු සෙනඟ ඔහුට ගල්
ගැසිය යුතුයි."[13] **36** එබැවින් මුළු
සෙනඟ යෙහෝවා දෙවි මෝසෙස්ට
අණ කළ පරිදි ඒ මිනිසාව කඳවුරෙන්
පිටතට ගෙන ගොස් ඔහුට ගල් ගසා
මරා දැමුවෝය.

**37** යෙහෝවා දෙවි මෝසෙස්ට
තවදුරටත් මෙසේ කීවේය. **38** "නූල්

**15 පරි.**
1 නික් 23:19; ලෙවී 2:14; ගණන් 18:12; ද්වි 26:2; ද්වි 26:10; නෙහෙ 10:37; හිතෝ 3:9
2 ගීතා 19:12; යාකෝ 4:17
3 ගණන් 15:8; ගණන් 15:10
4 ලෙවී 4:23; ගණන් 28:15; 2ලේක 29:21; එස්රා 6:17; එස්රා 8:35
5 ලෙවී 4:20; හෙබ්‍රෙ 2:17; 1යොහ 2:2
6 හෙබ්‍රෙ 10:17; යාකෝ 4:17
7 නික් 34:9; ලෙවී 16:30
8 ගීතා 19:12; ක්‍රියා 17:30
9 ලෙවී 4:28

**2 තීරුව**
1 ලෙවී 4:35
2 නික් 12:49; ලෙවී 24:22; ගණන් 9:14; ගණන් 15:15
3 නික් 21:14; ද්වි 1:43; ද්වි 17:12; හෙබ්‍රෙ 10:26
4 ලෙවී 24:11; යෙසා 37:23
5 ලෙවී 24:14
6 යෙසා 30:12; 1තෙස 4:8
7 ලෙවී 26:15
8 ගණන් 14:18; හෙබ්‍රෙ 10:28
9 ලෙවී 5:1; ගණන් 27:3; එස 18:20
10 නික් 20:10; නික් 35:2; ද්වි 5:14
11 ලෙවී 24:12
12 නික් 31:14
13 ලෙවී 24:14

රටාවකට ගැටගසා තමන්ගේ වස්ත්‍ර-
වල වාටිය[1] සකස් කළ යුතු බව ඊශ්‍රා-
යෙල් සෙනඟට කියන්න. එලෙස
සකස් කළ වාටියට ඉහළින් නිල් පාට
පටියක්ද ඇල්ලිය යුතුයි. ඔබෙන්
පැවතෙන සියලුදෙනාද තම වස්ත්‍ර
එලෙස සකස් කළ යුතුයි. **39** මෙ-
යත් ඔවුන්ට කියන්න. ‘එලෙස සකස්
කරගත් ඔබේ වස්ත්‍රවල වාටිය ඔබට
සිහිගැන්වීමක් වනු ඇත. ඔබ එය
දකින විට යෙහෝවා දෙවි ඔබට දුන්
සියලු ආඥා සිහි කර[2] ඒවා පැවැත්වී-
මට සිතට ගන්න. සිතේ ආශාවන්ට
වහල් වෙමින් දකින දකින දේට ආශා
කරමින්[3] ඔබ දැන් ගත කරන දුරාචා-
රමය ජීවිතයෙන්[4] ඈත් විය යුතුයි.
**40** ඔබේ වස්ත්‍රවල වාටිය එලෙස
සකස් කරගන්න කියා මම පැවසුවේ,
ඔබ ඒ දෙස බලා මාගේ සියලු ආඥා
සිහි කර ඒවා පවත්වන පිණිසයි. එසේ
කිරීමෙන් ඔබේ දෙවි වන මා ඉදිරියේ
ඔබට ශුද්ධ තත්වයක සිටිය හැකියි.[5]
**41** ඔබව ඊජිප්තු දේශයෙන් පිටතට
ගෙනා මා, ඔබේ දෙවි වන යෙහෝ-
වාය. එසේ කළේ මා ඔබේ දෙවි බව
ඔබට ඔප්පු කර පෙන්වන පිණිසයි.[6]
මා ඔබේ දෙවි වන යෙහෝවාය.’ ”[7]

**16** ලෙවී ගෝත්‍රයට අයත් ඉෂ්-
හාර්ගේ පුත්‍රයා වන කෝරා[8]
නම් වූ මිනිසෙක් සිටියේය. ඉෂ්හාර්[9]
ලෙවීගේ[10] පුත්‍රයා වූ කෝහාත්ගේ[11]
පුත්‍රයා විය. කෝරාද රූබෙන්[12] ගෝ-
ත්‍රයට අයත් එලියාබ්ගේ[13] පුත්‍රයන්
වන දාතාන්[14] හා අබිරාම්ද[15] පෙ-
ලෙත්ගේ පුත්‍රයා වන ඕන්ද **2** ඊශ්‍රා-
යෙල් සෙනඟ අතරේ සිටි අධිපතියෝ
දෙසිය පනස්දෙනෙක්ද එකට එක්
රැස් වී මෝසෙස්ට විරුද්ධව කතා
කරන්න පටන්ගත්තෝය. සෙනඟව
නියෝජනය කළ ඒ දෙසිය පනස්-
දෙනා යම් කාරණා සාකච්ඡා කිරීම
සඳහා නිතරම කැඳවනු ලැබූ කීර්-
තිමත් මනුෂ්‍යයෝ වූහ. **3** ඔවුහු
මෝසෙස් හා ආරොන් වෙතට
ගොස් තම විරෝධය පළ කරමින්[16]
මෙසේ කීවෝය. “මේ මුළු සෙනඟම
සිටින්නේ ශුද්ධ තත්වයකයි.[1] යෙ-
හෝවා දෙවිත් ඔවුන් අතරේ සිටි-
නවා.[2] ඉතින් ඔබ දෙදෙනා විතරක්
ඇයි යෙහෝවා දෙවිගේ සෙනඟට
වඩා ඉහළින් යන්න හදන්නේ?[3] අපිට
දැන් නුඹලාව හොඳටම ඇති වෙලයි
තියෙන්නේ.”

**4** එය අසා මෝසෙස් දණින් වැටී
පොළොව දෙසට තම හිස පහත්
කරගත්තේය. **5** කෝරාට හා ඔහු
සමඟ සිටි සෙනඟට මෝසෙස් මෙසේ
කීවේය. “දෙවිගේ අනුමැතිය තිබෙන්-
නේ කාටද,[4] ශුද්ධව සිටින්නේ කවුද,[5]
දෙවි ඉදිරියට පැමිණිය යුත්තේ කවුද[6]
කියා යෙහෝවා දෙවිම හෙට උදේට
දන්වයි. දෙවි ඉදිරියට යා යුත්තේ
ඔහු තෝරාගන්නා තැනැත්තායි.[7]
**6** කෝරා, ඔබ සහ ඔබ සමඟ ඉන්න
අනික් හැමෝම[8] සුවඳ ද්‍රව්‍ය ඔප්පු
කරන භාජන රැගෙන[9] **7** යෙහෝවා
දෙවි ඉදිරියේ හෙට සුවඳ ද්‍රව්‍ය ඔප්පු
කරන්න. යෙහෝවා දෙවි තෝරාගන්-
නේ කාවද කියා අපිට දැනගන්න පුළු-
වන් වෙයි.[10] ශුද්ධ තත්වයක ඉන්නේ
කවුද කියා දෙවිම අපිට පෙන්වයි.
ලෙවීගේ පුත්‍රයෙනි,[11] ඔබ මැසිවිලි
නැඟුවා දැන් හොඳටම ඇති.”

**8** මෝසෙස් ඔවුන්ට තවදුරටත්
මෙසේ කීවේය. “ලෙවීගේ පුත්‍රයෙනි,
මම කියන දේට හොඳින් ඇහුම්කන්
දෙන්න. **9** මුළු ඊශ්‍රායෙල් සෙනඟ
අතරින් ඊශ්‍රායෙල්ගේ දෙවි තමා ඉදිරි-
යට කැඳවාගත්තේ ඔබව නොවේද?[12]
සෙනඟ වෙනුවෙන් සම්මුඛ වීමේ
කූඩාරමේ සේවය කිරීම සඳහාත් යෙ-
හෝවා දෙවි තෝරාගත්තේ ඔබව
නොවේද? ඔබට භාර දුන් ඒ වග-
කීම සුළු එකක් කියාද ඔබ සිතන්-
නේ?[13] **10** දෙවි, ලෙවී පුත්‍රයන් වන
ඔබවයි ඔබේ සහෝදරයන්වයි තමා
ළඟට කැඳවාගත්තා මදිවට දැන්
ඔබ පූජකයන් වෙන්නත් හදනවාද?[14]
**11** ඔබ ආරොන්ට විරුද්ධව මැසිවිලි
නඟන්නේ ඔහු කවුරු කියා හිතාගෙ-
නද?[15] ඇත්තටම ඔබත් ඔබ සමඟ
සිටින මේ සියලුදෙනාත් මැසිවිලි

**15 පරි.**
1 ද්වි 22:12; මතෙ 23:5; ලූක් 8:44
2 ද්වි 11:18
3 ද්වි 29:19; විනි 17:6; යෝබ් 31:7; යෙරෙ 9:14
4 නික් 34:15; ගීතා 106:39; යාකො 4:4
5 ලෙවී 11:44; රෝම 12:1; 1පේතෘ 1:15
6 උත් 17:8; නික් 29:45; ලෙවී 25:38
7 නික් 3:15; නික් 6:2; ලෙවී 22:33

**16 පරි.**
8 ගණන් 26:9; ගණන් 27:3; යූද් 11
9 නික් 6:21; ගණන් 3:19
10 නික් 6:16; ගණන් 3:17
11 නික් 6:18
12 උත් 46:8; 1ලේක 5:1
13 ගණන් 26:8
14 ගණන් 26:9
15 ද්වි 11:6
16 ගණන් 12:1; ගණන් 14:2; 1සාමු 15:23; ගීතා 106:16

**2 තීරුව**
1 නික් 19:6
2 නික් 29:45; ගණන් 14:14
3 ගණන් 12:2
4 2තිමෝ 2:19
5 ලෙවී 21:6
6 නික් 28:43; ලෙවී 10:3
7 නික් 28:1; ගණන් 17:5; 1සාමු 2:28; ගීතා 105:26
8 ගණන් 16:2
9 ලෙවී 10:1; ගණන් 16:38
10 ගණන් 3:10
11 ගණන් 16:1
12 ගණන් 3:9; ගණන් 3:41
13 ගණන් 1:53; ගණන් 3:6; ගණන් 4:4; ද්වි 10:8
14 හිතෝ 13:10; පිලි 2:3
15 නික් 16:8; ගීතා 106:16

නඟන්නේ යෙහෝවා දෙවිට විරුද්-
ධවයි.”[1]
12 පසුව මෝසෙස් එලියාබ්ගේ
පුත්‍රයන් වන දාතාන්ට හා අබිරාම්ට[2]
තමා ළඟට එන මෙන් පණිවිඩ-
යක් යැව්වේය. නමුත් ඔවුහු
මෙසේ දන්වා එව්වෝය. “අපි එන්නේ
නැහැ.[3] 13 මේ පාළුකරයේ අපිව
මරලා දාන්න[4] කිරියෙන් හා පැණි-
යෙන් ඉතිරී ගිය ඒ දේශයෙන් අපිව
ගෙනාවා මදිවට ඔබ දැන් අපිව පාල-
නය කරන්නත් හදනවාද?[5] 14 ඔබ
අපිව කිරියෙන් හා පැණියෙන් ඉති-
රෙන දේශයකට[6] ගෙන යනවා කියා
පැවසුවා නේද? කෙත්වතු හා මිදිවතු
දෙනවා කියාත් පොරොන්දු වුණා
නේද? කෝ දැන් ඒවා? ඔබ මේ
මිනිසුන්ගේ ඇස් උගුල්ලලා දාන්නද
හදන්නේ? දැන් නම් අපි කොහොමට-
වත් ඔබ ළඟට එන්නේ නැහැ.”
15 එය අසා මෝසෙස් මහත් සේ
කෝප වී යෙහෝවා දෙවිට මෙසේ
යාච්ඤා කළේය. “දෙවියනි, මේ සෙ-
නඟ ඔප්පු කරන එක ධාන්‍ය පූජාවක්-
වත් පිළිගන්න එපා.[7] මම ඔවුන්ගෙන්
එක් කෙනෙකුටවත් කිසි හිරිහැරයක්
කළේ නැහැ. ඔවුන්ට අයිති එක
සතෙකුවත් මම ගත්තේ නැහැ.”[8]
16 ඉන්පසු මෝසෙස් කෝරාට[9]
මෙසේ කීවේය. “හෙට ඔබත් ඔබ
සමඟ සිටින අනික් සියලුදෙනාත්
යෙහෝවා දෙවි ඉදිරියට පැමිණිය
යුතුයි.[10] ආරොන්ද එතැනට එයි.
17 ඔබ එක් එක් කෙනා සුවඳ ද්‍රව්‍ය
ඔප්පු කරන භාජනවලට සුගන්ධවත්
ද්‍රව්‍ය දමා යෙහෝවා දෙවි ඉදිරියට
ගොස් සුවඳ ද්‍රව්‍ය ඔප්පු කරන්න. ඔබ
සහ ඔබ සමඟ සිටින දෙසිය පනස්දෙ-
නාද ආරොන්ද එසේ කළ යුතුයි.”
18 එබැවින් ඔවුහු එක් එක් කෙනා
සුවඳ ද්‍රව්‍ය ඔප්පු කරන භාජනවලට
සුගන්ධවත් ද්‍රව්‍ය දමා සම්මුඛ වීමේ
කූඩාරමට ඇතුල් වන ස්ථානයට
ගියෝය. මෝසෙස් හා ආරොන්ද
එතැන සිටියෝය. 19 කෝරා මුළු
සෙනඟ[11] මෝසෙස්ට හා ආරොන්ට
විරුද්ධව උසිගන්වා සම්මුඛ වීමේ
කූඩාරමට ඇතුල් වන ස්ථානයට
ඔවුන්ව රැස් කළේය. එවිට යෙහෝවා
දෙවිගේ තේජස මුළු ඊශ්‍රායෙල් සෙනඟ
ඉදිරියේ දිස් විය.[1]
20 යෙහෝවා දෙවි මෝසෙස්ට හා
ආරොන්ට මෙසේ කීවේය. 21 “මම
දැන්ම මේ සෙනඟව විනාශ කර
දමන්නෙමි.[2] ඔබ දෙදෙනා ඉක්ම-
නට ඔවුන් අතරෙන් ඉවත් වන්න.”[3]
22 එය අසා ඔවුහු දණින් වැටී හිස
නමා මෙසේ කන්නලව් කළෝය.
“සියල්ලන්ට ජීවනය දෙන දෙවියනි,[4]
එක මනුෂ්‍යයෙකුගේ පාපය නිසා ඔබ
මේ මුළු මහත් ජාතිය සමඟ උදහස්
වන්නේ මන්ද?”[5]
23 එවිට යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. 24 “‘කෝ-
රාගේ, දාතාන්ගේ හා අබිරාම්ගේ[6]
කූඩාරම් ළඟින් දැන්ම ඉවත් වන්න’
කියා සෙනඟට කියන්න.”
25 මෝසෙස් එතැනින් නැඟිට
ඊශ්‍රායෙල්හි වැඩිමහල්ලන්[7] සමඟ
දාතාන් හා අබිරාම් සිටි ස්ථා-
නයට ගියේය. 26 මෝසෙස් සෙ-
නඟට මෙසේ කීවේය. “මේ දුෂ්ට
මිනිසුන්ගේ කූඩාරම් ළඟින් අහක්
වෙන්න. ඔවුන්ට අයිති කිසිම දෙය-
කට අත තබන්න එපා.[8] නැත්නම්
ඔවුන්ගේ පාපය නිසා ඔබත් විනාශ
වෙයි.” 27 එය ඇසූ විගස සෙනඟ
කෝරාගේ, දාතාන්ගේ හා අබිරාම්ගේ
කූඩාරම් ළඟින් ඉවත්ව ගියෝය. ඉන්-
පසු දාතාන් හා අබිරාම් තමන්ගේ
භාර්යාවන්, දරුවන් හා ළදරුවන්
සමඟ පිටතට ඇවිත් තම කූඩාරම්
ළඟ සිටගත්තෝය.[9]
28 එවිට මෝසෙස් මෙසේ කීවේය.
“මම කිසි දෙයක් මගේ හිතුමතේට
කළේ නැහැ.[10] මාව ඔබ ඉදිරියට එව්-
වේ යෙහෝවා දෙවියි.[11] දැන් මේ
වෙන්න යන දෙයින් ඔබට එය පැහැ-
දිලි වෙයි. 29 මේ මනුෂ්‍යයන් දෙ-
විගෙන් දඬුවමක් නොවිඳ මිනිසුන්
පොදුවේ මැරෙන ආකාරයට මැරු-
ණොත්[12] මාව එවා තිබෙන්නේ යෙ-

**16 පරි.**
1 ලූක් 10:16
2 ගණන් 16:1
3 1සාමු 15:23; යූද් 8
4 නික් 22:28; ක්‍රියා 7:35
5 නික් 16:3; ගණන් 14:29
6 නික් 3:8; ලෙවී 20:24
7 උත් 4:5
8 1සාමු 12:3; ක්‍රියා 20:33; 2කොරි 7:2; 1පේතෘ 3:16
9 ගණන් 16:6
10 1සාමු 12:7
11 ගණන් 16:2; ගණන් 16:40

**2 තීරුව**
1 ගණන් 12:5; ගණන් 14:10
2 ගණන් 3:10; ගණන් 3:38; ගණන් 16:45; ගීතා 73:19
3 උත් 19:15; එළි 18:4
4 ගණන් 27:16; යෝබ් 12:10; දේශ 3:19; දේශ 12:7; සෙක 12:1
5 උත් 18:23; 2සාමු 24:17
6 ගණන් 16:1
7 ගණන් 11:16
8 නික් 23:2
9 යෝබ් 9:4; හිතෝ 16:18; හිතෝ 18:12
10 නික් 7:2; නික් 25:22; එළි 18:18; යොහ 5:30
11 නික් 3:12; එළි 18:22; යොහ 5:36
12 දේශ 3:19; දේශ 9:5; එස 18:4; රෝම 5:12

හෝවා දෙවි නොවෙයි.[1] **30** නමුත්
යෙහෝවා දෙවි අසාමාන්‍ය දෙයක්
කළොත්[2] එනම්, ඔහු පොළොව විවර
කර ඔවුන් සතු සෑම දෙයක් සමඟම
ඔවුන්ව පණපිටින් පොළොවට*[3] ඇද-
ගත්තොත්[4] ඔවුන් අගෞරව කළේ
යෙහෝවා දෙවිට කියා ඔබට එයින්
දැනගන්න ලැබෙයි.”[5]
**31** මෝසෙස් එසේ කියා අව-
සන් වනවාත් සමඟම පොළොව
විවර වෙන්න පටන්ගත්තේය.[6]
**32** මෙසේ පොළොව එහි කට ඇර
ඔවුන්වද ඔවුන් සමඟ සිටි ඔවුන්ගේ
ගෙයි වැසියන්වද කෝරාගේ ගෙයි
වැසියන්වද ඔවුන්ගේ බඩු බාහිරාදියද
ගිලගත්තේය.[7] **33** ඔවුහුද ඔවුන්-
ගේ ගෙයි වැසියෝද පණපිටින්ම මිනී
වළට ගියෝය. ඉන්පසු පොළොව
ඔවුන්ව වසාගත්තේය.[8] මෙසේ ඔවුහු
ඊශ්‍රායෙල් සෙනඟ අතරින් විනාශ
වී ගියෝය.[9] **34** ඔවුන් කෑ මොර
ගසන ශබ්දය ඇසී ඔවුන් අවට සිටි
සෙනඟද, “මෙතැනින් දුවමු. නැත්-
නම් පොළොව අපවත් ගිලගනී”[10]
කියමින් එතැනින් පලා ගියෝය.
**35** පසුව යෙහෝවා දෙවි ගින්නක්
එවා[11] සුවඳ ද්‍රව්‍ය ඔප්පු කරමින්
සිටි මනුෂ්‍යයන් දෙසිය පනස්දෙනා-
වම දවා දැමීය.[12]
**36** ඉන්පසු යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. **37** “ගිනි
අඟුරු අතරේ තිබෙන සුවඳ ද්‍රව්‍ය
ඔප්පු කරන භාජන ටික එකතු කර-
ගෙන[13] අඟුරු ඒ මේ අත විසුරු-
වන්න කියා පූජක ආරොන්ගේ පුත්‍රයා
වන එලියාසර්ට කියන්න. මන්ද එම
භාජන ශුද්ධය. **38** එම භාජන යෙ-
හෝවා දෙවි වන මා ඉදිරියට රැගෙන
ආ නිසා ඒවා ශුද්ධය. පව් කර
තමන් පිටට විනාශය පමුණුවාගත්[14]
ඒ මනුෂ්‍යයන් ගෙනා සුවඳ ද්‍රව්‍ය
ඔප්පු කරන භාජන අඟුලාගෙන ඒවා
තළා තුනී තහඩු සාදන්න. සිදු වූ
දේ ඊශ්‍රායෙල් සෙනඟට සිහි වන
පිණිස[1] ඒ තහඩු පූජාසනය[2] වටා
සවි කරන්න.” **39** පූජක එලියාසර්,
ගින්නෙන් විනාශ වූ ඒ මනුෂ්‍යයන්
සුවඳ ද්‍රව්‍ය ඔප්පු කරන පිණිස ගෙනා
තඹ භාජන එකතු කරගෙන[3] ඒවා
තළා තුනී තහඩු සෑදුවේය. ඉන්පසු ඒ
තහඩු පූජාසනය වටා සවි කරන ලදි.
**40** එසේ කළේ ආරොන්ගේ පවුලට
අයිති නොවන කිසිවෙකු[4] සුවඳ ද්‍රව්‍ය
ඔප්පු කිරීම සඳහා යෙහෝවා දෙවි
ඉදිරියට නොපැමිණිය යුතු බවත්[5]
කෝරා සහ ඔහු සමඟ සිටි සෙනඟ
මෙන් කිසිවෙකු ක්‍රියා නොකළ යුතු
බවත්[6] ඊශ්‍රායෙල් සෙනඟට සිහිගැන්-
වීමටය. යෙහෝවා දෙවි මෝසෙස්
මාර්ගයෙන් අණ කළ සියල්ල එලි-
යාසර් කළේය.
**41** පසුවදා ඊශ්‍රායෙල් සෙනඟ
නැවත මෝසෙස්ට හා ආරොන්ට
විරුද්ධව මැසිවිලි නඟමින් මෙසේ
චෝදනා කළෝය.[7] “ඔබ දෙදෙනා
යෙහෝවා දෙවිගේ සෙනඟව මරා
දැමුවා.” **42** සෙනඟ මෝසෙස්ට හා
ආරොන්ට විරුද්ධව එක් රොක් වූහ.
එවිට ඔවුන් සම්මුඛ වීමේ කූඩාරම
දෙස බලා සිටියදී වලා ටැඹ මුළු
කූඩාරමම වසාගත්තේය. යෙහෝවා
දෙවිගේ තේජසද ඔවුන් ඉදිරියේ දිස්
විය.[8]
**43** මෝසෙස් හා ආරොන් සම්මුඛ
වීමේ කූඩාරම ළඟට පැමිණියෝය.[9]
**44** එවිට යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. **45** “මම
දැන්ම මේ සෙනඟව විනාශ කරන්-
නෙමි. ඔබ ඉක්මනට ඔවුන් අතරෙන්
ඉවත් වන්න.”[10] එය අසා මෝ-
සෙස් හා ආරොන් දණින් වැටී තම
මුහුණු පොළොව දෙසට පහත් කර-
ගත්තෝය.[11] **46** ඉන්පසු මෝසෙස්
ආරොන්ට මෙසේ කීවේය. “සුවඳ ද්‍රව්‍ය
ඔප්පු කරන භාජනයකට පූජාසන-
යේ ඇවෙන අඟුරු ටිකක් දමන්න.[12]
එයට සුගන්ධවත් ද්‍රව්‍යද දමා ඉක්ම-
නට සෙනඟ අතරට ගොස් එය
ඔප්පු කරමින් ඔවුන්ගේ පාප වෙ-
නුවෙන් සමාව අයැදින්න.[13] මන්ද

**16 පරි.**
**1** ද්වි 18:21
**2** යෙසා 45:7
**3** ගීතා 55:15; හිතෝ 1:12
**4** යෝබ් 31:3
**5** ගීතා 74:18; ගීතා 107:11
**6** ගණන් 26:10; ද්වි 11:6; ගීතා 106:17
**7** ගණන් 26:11; 1ලේක 6:31; 1ලේක 6:37
**8** ගීතා 55:23
**9** යූද් 11
**10** ගණන් 17:13
**11** ලෙවී 10:2; ගණන් 11:1
**12** ගණන් 16:17; ගණන් 26:10; ගීතා 106:18
**13** ගණන් 16:6
**14** 1රාජා 2:23; හිතෝ 8:36

**2 තීරුව**
**1** ගණන් 16:5; ගණන් 17:10; ගණන් 26:10; 1තිමෝ 5:20
**2** නික් 38:1
**3** ගණන් 16:6
**4** ගණන් 3:10; ගණන් 18:7; 2ලේක 26:18
**5** 2ලේක 26:16
**6** ගීතා 106:17; යූද් 11
**7** ගණන් 14:2; ගීතා 106:13; 2පේතෘ 2:10
**8** නික් 16:7; ගණන් 14:10; ගණන් 16:19
**9** ගණන් 20:6
**10** නික් 23:21; ගණන් 16:21; 1කොරි 10:10
**11** ගණන් 16:22
**12** ලෙවී 6:12
**13** නික් 34:9; ගණන් 8:19

ගණන් **16:30*** මූ.අ., “මිනී වළට.”

යෙහෝවා දෙවි සිටින්නේ මහත්
උදහසින්.[1] දෙවි ඔවුන්ට වසංග-
තයකින් පහර දෙන්න දැනට-
මත් පටන් අරගෙන.” **47** මෝසෙස්
පැවසූ ලෙස ආරොන් විගස සෙනඟ
අතරට දුව ගොස් ඔවුන්ගේ පාපයට
සමාව ලබාගන්නා පිණිස සුවඳ ද්‍රව්‍ය
ඔප්පු කළේය. ඒ වන විටත් සෙ-
නඟ පිටට වසංගතය පැමිණ තිබිණ.
**48** ඔහු මළ අය හා ජීවත්ව සිටි අය
අතරේ සිටගත්තේය.[2] එවිට වසං-
ගතය ක්‍රමක්‍රමයෙන් නතර විය.[3]
**49** කෝරාගේ කැරැල්ල නිසා මිය ගිය
අයට අමතරව වසංගතයෙන් දාහත-
රදහස් හත්සියදෙනෙක් මිය ගියෝය.
**50** වසංගතය නතර වූ පසු ආරොන්
සම්මුඛ වීමේ කූඩාරම ළඟට පැමිණි-
යේය. මෝසෙස් එතැන සිටියේය.

**17** පසුව යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය.
**2** “ඊශ්‍රායෙල් සෙනඟගේ පෙළපත්වල
අධිපතීන්ගෙන්[4] සැරයටිය[5] බැගින්
ඉල්ලාගෙන ඔවුන් එක් එක් කෙනා-
ගේ නම් ඒවා මත ලියන්න. පෙළ-
පත් දොළහ නියෝජනය කිරීමට
සැරයටි දොළහක් ගන්න. **3** ලෙවී
ගෝත්‍රයෙන්ද සැරයටියක් ගෙන එහි
ආරොන්ගේ නම ලියන්න. සැරය-
ටිය මගින් නියෝජනය කරන්නේ
ඔවුන්ගේ පෙළපතේ ප්‍රධානියාවයි.
**4** සම්මුඛ වීමේ කූඩාරමේ මා නිත-
රම ඔබට පෙනී සිටින ස්ථානය[6]
වන ගිවිසුම් පෙට්ටිය[7] ඉදිරියේ එම
සැරයටි තබන්න. **5** මා තෝරා-
ගන්නා[8] තැනැත්තාගේ සැරයටියෙන්
පොහොට්ටු හටගනී. ඊශ්‍රායෙල් සෙ-
නඟට තවදුරටත් ඔබට විරුද්ධව[9]
මැසිවිලි නඟන්න මම ඉඩ නොදෙන්-
නෙමි. මෙසේ ඔවුන් මට විරුද්ධව
නඟන මැසිවිලි[10] මම නතර කර
දමන්නෙමි.”

**6** මෝසෙස්, දෙවි පැවසූ දේවල්
ඊශ්‍රායෙල් සෙනඟට දැන්වූ පසු ඔවුන්
අතරේ සිටි අධිපතීහු සැරයටි ගෙනැ-
විත් ඔහුට දුන්නෝය. එක් එක් අධි-
පතියා තම පෙළපත නියෝජනය
කිරීමට සැරයටිය බැගින් දුන්නේය.
සැරයටි දොළහ[1] අතරේ ආරොන්ගේ
සැරයටියද තබා තිබිණ.[2] **7** මෝ-
සෙස් ඒ සැරයටි ගෙන ගිවිසුම් පෙට්-
ටිය තබා තිබෙන සම්මුඛ වීමේ
කූඩාරමේ යෙහෝවා දෙවි ඉදිරියේ
තැබුවේය.[3]

**8** ඊට පසුවදා මෝසෙස් සම්-
මුඛ වීමේ කූඩාරමට ගොස් බැලූ
විට ලෙවී ගෝත්‍රය නියෝජනය කළ
ආරොන්ගේ සැරයටියෙන් මල් සහ
පොහොට්ටුද ඉදුණු ආමන්ඩ් ගෙඩිද
හටගෙන තිබිණ. **9** මෝසෙස් යෙ-
හෝවා දෙවි ඉදිරියේ තිබූ ඒ සැරයටි
සියල්ල ඊශ්‍රායෙල් සෙනඟ ඉදිරියට
ගෙනාවේය. ඔවුහුද ඒවා පරීක්ෂා කර
බැලුවෝය. අධිපතීහු තම තමාගේ
සැරයටිය අතට ගත්තෝය.

**10** පසුව යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. “මේ කැරලි-
කාර[4] සෙනඟ මට විරුද්ධව තවත්
මැසිවිලි නොනඟන පිණිස සිහිගැන්-
වීමක්[5] ලෙස ආරොන්ගේ සැරයටිය[6]
නැවත ගිවිසුම් පෙට්ටිය ඉදිරියේ
තබන්න. ඔවුන් විනාශ නොවන
පිණිස එසේ කරන්න.” **11** මෝ-
සෙස් ඒ මොහොතේම යෙහෝවා දෙවි
අණ කළ ලෙස කළේය.

**12** පසුව ඊශ්‍රායෙල් සෙනඟ මෝ-
සෙස්ට මෙසේ කීවෝය. “අපි දැන්
මැරෙයි. අපි හැමෝම විනාශ වෙලා
යයි.[7] **13** යෙහෝවා දෙවිගේ ශුද්ධ
කූඩාරම ළඟට යන[8] ඕනෑම කෙ-
නෙක් මැරෙයි.[9] අපි හැමෝගේම අව-
සානය මේකද?”[10]

**18** යෙහෝවා දෙවි ආරොන්ට
මෙසේ කීවේය. “යමෙකු ශුද්-
ධස්ථානය[11] හා සම්බන්ධ නීතිරීති
කඩ කළොත් ඔබද ඔබේ පියාගේ
ගෙයි වැසියන්ද ඔබේ පුත්‍රයන්ද ඒ වෙ-
නුවෙන් ගණන් දිය යුතුයි. පූජ-
කයන් හා සම්බන්ධව දී තිබෙන
ආඥා යමෙකු කඩ කළොත් ඔබ
සහ ඔබේ පුත්‍රයන් ඒ වෙනුවෙන්
ගණන් දිය යුතුයි.[12] **2** ඔබේ පෙළ-

**16 පරි.**
1 ලෙවී 10:6; ගණන් 1:53; ගණන් 18:5; 1ලේක 27:24
2 2සාමු 24:16
3 නික් 23:21; ගණන් 25:8

**17 පරි.**
4 ගණන් 1:4; ගණන් 1:16
5 නික් 4:2
6 නික් 25:22; නික් 29:42; නික් 30:36; ලෙවී 16:2
7 නික් 34:29
8 ගණන් 16:5; ලූක් 9:35
9 ගණන් 14:2; ගණන් 16:13
10 ගණන් 11:1; ගණන් 14:27; ගණන් 16:11; ගණන් 16:41; 1කොරි 10:10

**2 තීරුව**
1 ගණන් 17:2
2 ගණන් 17:3
3 නික් 38:21; ගණන් 17:4; ගණන් 18:2
4 ගණන් 20:10; ද්වි 9:7; ද්වි 31:27; යෙසා 1:2
5 ගණන් 16:38
6 හෙබ්‍රෙ 9:4
7 ගීතා 90:7
8 ගණන් 1:51; ගණන් 18:4
9 ගණන් 18:7
10 ගණන් 16:26; ගණන් 16:41; ගණන් 16:49

**18 පරි.**
11 නික් 25:8; ලෙවී 21:12
12 නික් 28:38; ලෙවී 22:9; ගණන් 18:23; හෙබ්‍රෙ 5:2

පත වන ලෙවී ගෝත්‍රයට අයත්
ඔබේ සහෝදරයන්ව ඔබ වෙත කැඳ-
වාගන්න. ගිවිසුම් පෙට්ටිය තබා
තිබෙන සම්මුඛ වීමේ කූඩාරම ඉදි-
රියේ[1] ඔබටත් ඔබේ පුත්‍රයන්ටත්
සේවය කරන පිණිස[2] ඔවුන්ව ඔබ
වෙත කැඳවාගන්න. **3** ඔබ වෙනු-
වෙන් ඉටු කළ යුතු වගකීම්ද සම්මුඛ
වීමේ කූඩාරම හා සම්බන්ධව තිබෙන
වගකීම්ද ඔවුන් ඉටු කළ යුතුයි.[3]
පූජාසනය ළඟටවත් ශුද්ධස්ථානයේ
තිබෙන සියලු භාණ්ඩ හා මෙවලම්
ළඟටවත් ඔවුන් නොපැමිණිය යුතුයි.
ඔවුන් එසේ කළොත් ඔවුන් පම-
ණක් නොව ඔබත් මිය යනු ඇත.[4]
**4** ඔවුන් ඔබ සමඟ එක්ව සම්මුඛ
වීමේ කූඩාරම හා සම්බන්ධව ඔවුන්ට
පවරා තිබෙන සියලු වගකීම් ඉටු කළ
යුතුයි. ඔවුන් හැර ඔබට උදව් කරන
පිණිස වෙන කිසිවෙකු නොපැමි-
ණිය යුතුයි.[5] **5** දෙවිගේ උදහස[6]
නැවතත් ඊශ්‍රායෙල් සෙනඟ පිටට
නොපැමිණෙන පිණිස ශුද්ධස්ථානය[7]
හා පූජාසනය[8] සම්බන්ධව ඔබට
පවරා තිබෙන සියලු වගකීම් ඔබ
ඉටු කළ යුතුයි. **6** ඊශ්‍රායෙල් සෙ-
නඟ අතරෙන් මම ඔබේ සහෝදරයන්
වන ලෙවීවරුන්ව[9] තෝරාගෙන තෑග්-
ගක් ලෙස ඔබට දුන්නෙමි.[10] ඔවුන්ව
යෙහෝවා දෙවි වන මට භාර දී
තිබෙන්නේ සම්මුඛ වීමේ කූඩාර-
මේ සේවාවන් ඉටු කරන පිණිසය.[11]
**7** ඔබත් ඔබේ පුත්‍රයනුත් පූජකයන්
ලෙස සේවය කළ යුතුයි.[12] මන්ද
එම විශේෂ වරප්‍රසාදය මම ඔබට
තෑග්ගක් ලෙස දුන්නෙමි. එබැවින්
පූජකයන් වශයෙන් ඔබේ වගකීම්
නොපිරිහෙළා ඉටු කළ යුතුයි. තිරය
පිටුපස තිබෙන සියලු දේවල් හා සම්-
බන්ධ වගකීම්ද පූජාසනය හා සම්-
බන්ධ සියලු වගකීම්ද ඔබත් ඔබේ
පුත්‍රයනුත් ඉටු කළ යුතුයි.[13] වෙන
කිසිවෙකු එතැනට ආවොත් ඔහුව
මරා දැමිය යුතුයි."[14]

**8** යෙහෝවා දෙවි ආරොන්ට තව-
දුරටත් මෙසේ කීවේය. "ඊශ්‍රායෙල්
සෙනඟ මට දෙන සෑම පරිත්‍යාග-
යක්ම මම ඔබට භාර දෙන්නෙමි.[1]
ඔවුන් දෙන සෑම ශුද්ධ දෙ-
යක්ම මම ඔබටත් ඔබේ පුත්‍රයන්ටත්
දෙන්නෙමි. එය බොහෝ කාලයකට
ඔබට හිමි වන කොටසයි.[2] **9** සෙ-
නඟ ගෙනෙන සෑම ශුද්ධ දෙයක්ම
එනම්, ගින්නෙන් දවා ඔප්පු කරන
සෑම පූජාවක්ම ඔබටත් ඔබේ පුත්‍ර-
යන්ටත් අයිතිය. සෑම ධාන්‍ය පූජා-
වක්ම,[3] සෑම පාප පූජාවක්ම,[4] සෑම
වන්දි පූජාවක්ම[5] ඔබටත් ඔබේ පුත්‍ර-
යන්ටත් අයිතිය. එම පූජා ඉතා
ශුද්ධය. **10** ඔබ එය ඉතා ශුද්ධ
තැනකදී අනුභව කළ යුතුයි.[6] සෑම
පුරුෂයෙකුම එයින් කෑ යුතුයි.[7] එය
ශුද්ධ දෙයක් ලෙස ඔබ සැලකිය
යුතුයි.[8] **11** ඔබට අයිති කොටස්
මේවාය. ඊශ්‍රායෙල් සෙනඟ ගෙනෙන
පූජාවලින් පරිත්‍යාගයක් ලෙස වෙන්
කරන කොටස[9] හා ඔවුන් ගෙනෙන
සෑම සෙලවීමේ පූජාවක්ම[10] මම ඔබ-
ටත් ඔබේ පුත්‍රයන්ටත් ඔබේ දූව-
රුන්ටත් දෙන්නෙමි.[11] එය බොහෝ
කාලයකට ඔබට ලැබෙන්නේය. පවි-
ත්‍රව සිටින ඔබේ පවුලේ සෑම සාමාජි-
කයෙකුටම එයින් අනුභව කිරීමට
පුළුවන.[12]

**12** "සෙනඟ තම ප්‍රථම ඵලවලින්[13]
යෙහෝවා දෙවි වන මට ගෙනැ-
විත් දෙන හොඳම තෙල්ද හොඳම
ධාන්‍යද අලුත් වයින්ද මම ඔබට
දෙන්නෙමි.[14] **13** ඔවුන්ගේ කෙත්ව-
තුවල ප්‍රථම ඵලදාවෙන් ඔවුන් යෙ-
හෝවා දෙවිට ගෙනැවිත් දෙන සියලු
දේද ඔබට අයිතිය.[15] පවිත්‍රව සිටින
ඔබේ පවුලේ සෑම සාමාජිකයෙකුටම
ඒවායින් අනුභව කිරීමට පුළුවන.

**14** "ඊශ්‍රායෙල් දේශයේ මා වෙනු-
වෙන් සදහටම කැප කරන ඕනෑම
දෙයක් ඔබට අයිතිය.[16]

**15** "යෙහෝවා දෙවි වන මා ඉදිරි-
යට ගෙනෙන සෑම කුලුඳුල්[17] දරුවෙ-
කුම හා සතෙකුම ඔබට අයිතිය.

---

**16** ලෙවී 27:21; ලෙවී 27:28; **17** නික් 13:2; ලෙවී 27:26; ගණන් 3:13; ලූක් 2:23.

**18 පරි.**

**1** ගණන් 1:53
**2** ගණන් 3:6, ගණන් 8:22, ගණන් 16:9
**3** ගණන් 3:25, ගණන් 3:31, ගණන් 3:36
**4** ගණන් 4:15, ගණන් 4:20, ගණන් 16:40
**5** ගණන් 1:51, ගණන් 3:10
**6** ගණන් 16:46
**7** නික් 27:21, නික් 30:7, ලෙවී 24:3, ගණන් 3:32
**8** ලෙවී 1:17, ලෙවී 21:17
**9** ගණන් 3:12, ගණන් 3:45
**10** ගණන් 3:9, ගණන් 8:16
**11** ගණන් 8:19
**12** 1සාමු 2:28, හෙබ්‍රෙ 5:4
**13** ලෙවී 16:2, ලෙවී 16:12, හෙබ්‍රෙ 9:3, හෙබ්‍රෙ 9:7
**14** ගණන් 3:10, ගණන් 16:40

**2 තීරුව**

**1** නික් 23:19, ලෙවී 27:28, ලෙවී 27:30, ගණන් 18:11, ගණන් 18:26
**2** ලෙවී 7:34, ගණන් 5:9
**3** ලෙවී 2:3, ලෙවී 6:16, ලෙවී 10:12
**4** ලෙවී 5:12, ලෙවී 6:26, ලෙවී 6:29
**5** ලෙවී 5:6, ලෙවී 7:1, ලෙවී 7:7
**6** නික් 29:32, ලෙවී 6:16, ලෙවී 10:13
**7** ලෙවී 6:18, ලෙවී 7:6
**8** ලෙවී 14:13, ලෙවී 21:22
**9** නික් 29:27, ගණන් 15:20, එස 44:30
**10** නික් 29:27, ලෙවී 7:34
**11** ලෙවී 10:14, ද්වි 18:3
**12** ලෙවී 22:6
**13** හිතෝ 3:9
**14** ලෙවී 2:14, ද්වි 18:4, නෙහෙ 10:35
**15** නික් 23:19

නමුත් කුලුඳුල් දරුවන්ව[1] හා අප-
විත්‍ර කුලුඳුල් සතුන්ව ඔබ මුදවාගත
යුතුයි.[2] **16** මාසයක් හෝ ඊට වඩා
වැඩි වයසැති සියලු කුලුඳුලන් වෙනු-
වෙන් නියමිත මුදල ගෙවා ඔවුන්ව
මුදවාගත යුතුයි. ඔවුන් එක් එක්
කෙනා වෙනුවෙන් රිදී ෂෙකෙල් පහ
බැගින් ගත යුතුයි. එම මුදල ගෙවිය
යුත්තේ ශුද්ධස්ථානයේ තිබෙන ෂෙ-
කෙලයක බරට සමාන ෂෙකෙල්-
වලින්ය.[3] ෂෙකෙලයක බර ගේරා
මිම් විස්සකි.[4] **17** ඔබ කුලුඳුල් ගව-
යන්ව හෝ බැටළුවන්ව හෝ එළු-
වන්ව හෝ මුදවා නොගත යුතුයි.[5]
උන් ශුද්ධය. උන්ගේ ලේ[6] පූජාසනය
මත ඉසිය යුතුයි. යෙහෝවා දෙවි
වන මට ප්‍රසන්න සුවඳක් ගෙනෙන
පිණිස උන්ගේ තෙල් කොටස් පූජාස-
නය මත දැවිය යුතුයි.[7] **18** උන්-
ගේ මාංස ඔබට අයිතිය. සෙලවීමේ
පූජාවට ඔප්පු කරන සතාගේ පපු
කොටස හා දකුණු ගාතය ඔබට
අයිති වන්නාක් සේම එම සතුන්ගේ
මාංසත් ඔබට අයිතිය.[8] **19** ඊශ්‍රා-
යෙල් සෙනඟ යෙහෝවා දෙවිට ගෙ-
නෙන සෑම ශුද්ධ පරිත්‍යාගයක්ම[9]
මම ඔබටත් ඔබේ පුත්‍රයන්ටත් ඔබ
සමඟ සිටින ඔබේ දූවරුන්ටත් දෙන්-
නෙමි. බොහෝ කාලයකට එය ඔබට
හිමි වනු ඇත.[10] එය ඔබත් ඔබේ දරු-
වනුත් සමඟ යෙහෝවා දෙවි වන මා
ඇති කරගත් ස්ථිර ගිවිසුමකි.* එම
ගිවිසුම බොහෝ කාලයකට වලංගු
වනු ඇත.”[11]

**20** යෙහෝවා දෙවි ආරොන්ට
තවදුරටත් මෙසේ කීවේය. “ඊශ්‍රා-
යෙල් සෙනඟට හිමි වන දේශයේ
ඔබට උරුමයක්වත් කොටසක්වත්
ලැබෙන්නේ නැත.[12] ඔවුන් අතරේ
ඔබේ උරුමය හා ඔබේ කොටස මම
වෙමි.[13]

**21** “ඊශ්‍රායෙල් සෙනඟ තමන් සතු
දෙයින් ගෙනෙන දහයෙන් කොටස[14]
මම ලෙවී පුත්‍රයන්ට දෙන්නෙමි. මම
ලෙවීවරුන්ට එය දෙන්නේ ඔවුන්
සම්මුඛ වීමේ කූඩාරමේ කරන සේවය
වෙනුවෙන්ය. එය ඔවුන්ගේ උරුමය
වෙයි. **22** ඊශ්‍රායෙල් සෙනඟ මින්
ඉදිරියට සම්මුඛ වීමේ කූඩාරම ළඟට
නොපැමිණිය යුතුයි. එසේ කළොත්
දෙවි වන මා ඉදිරියේ ඔවුන් වර-
දකරුවන් වන බැවින් ඔවුහු මිය
යන්නෝය.[1] **23** ලෙවීවරුන් සම්-
මුඛ වීමේ කූඩාරමේ සේවාවන් ඉටු
කරමින් ශුද්ධස්ථානයට විරුද්ධව
සෙනඟ කරන පාප වෙනුවෙන් ගණන්
දිය යුතුයි.[2] ඊශ්‍රායෙල් සෙනඟට මෙන්
ඔවුන්ට දේශයේ උරුමයක් ලැබෙන්-
නේ නැත. එය ඔබටත් ඔබෙන් පැව-
තෙන්නන්ටත් බොහෝ කාලයකට
වලංගු වන පනතකි.[3] **24** ඊශ්‍රායෙල්
සෙනඟ තමන් සතු දෙයින් යෙහෝවා
දෙවි වන මට පරිත්‍යාග කරන දස-
යෙන් කොටස මම ලෙවීවරුන්ට
උරුමයක් ලෙස දෙන්නෙමි. ‘ඊශ්‍රා-
යෙල් පුත්‍රයන්ට මෙන් ඔවුන්ට දේශ-
යේ උරුමයක් ලැබෙන්නේ නැත’
කියා මම පැවසුවේ ඒ නිසයි.”[4]

**25** ඉන්පසු යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. **26** “ඔබ
ලෙවීවරුන්ට මෙසේ කියන්න. ‘මම
ඔබට උරුමයක් ලෙස දුන් දසයෙන්
කොටස ඊශ්‍රායෙල් සෙනඟගෙන්
ලැබුණු පසු[5] ඔබ එයින් දස-
යෙන් කොටසක් යෙහෝවා දෙවිට
පරිත්‍යාග කරන්න.[6] **27** කමතෙන්
ගෙනෙන පරිත්‍යාගයක් ලෙසද[7]
බහුලව තිබෙන වයින්වලින් හෝ
තෙල්වලින් කරන පරිත්‍යාගයක් ලෙ-
සද මම එය ඔබෙන් පිළිගන්නෙමි.
**28** මෙසේ ඊශ්‍රායෙල් සෙනඟගෙන්
ඔබට ලැබෙන දසයෙන් කොටසෙන්
ඔබත් යෙහෝවා දෙවි වන මට
පරිත්‍යාගයක් කරන්න. ඔවුන්ගෙන්
ලැබෙන කොටසින් ඔබ යෙහෝවා
දෙවි වන මට දෙන පරිත්‍යාගය
පූජක ආරොන්ට දෙන්න. **29** ඔබට
ලැබෙන සෑම පරිත්‍යාගයකින්ම
හොඳම කොටස[8] ශුද්ධ දෙයක් ලෙස
යෙහෝවා දෙවිට දෙන්න.’

**18 පරි.**
1 නික් 13:13
2 නික් 34:20; ලෙවී 27:27
3 ලෙවී 27:2; ලෙවී 27:6
4 නික් 30:13; ලෙවී 27:25
5 නික් 22:30; ද්වි 15:19
6 ලෙවී 17:11
7 ලෙවී 3:16
8 නික් 29:26; ලෙවී 7:31; ලෙවී 7:34
9 නික් 23:19; ගණන් 15:19; ගණන් 18:11; ගණන් 18:26; ගණන් 31:29
10 ගණන් 18:8; 2ලේක 31:4
11 ලෙවී 2:13; 2ලේක 13:5
12 ගණන් 26:62; ද්වි 10:9; ද්වි 12:12; ද්වි 14:27; යොෂු 14:3
13 ද්වි 18:2; යොෂු 13:14; යොෂු 18:7; එස 44:28
14 ලෙවී 27:30; 2ලේක 31:5; නෙහෙ 10:37; නෙහෙ 12:44; නෙහෙ 13:12; ගලා 6:6; හෙබ්‍රෙ 7:5

**2 තීරුව**
1 ගණන් 16:40; ගණන් 17:13
2 ගණන් 3:7; ගණන් 18:1
3 යොෂු 13:33
4 ද්වි 10:9
5 ගණන් 18:21; ද්වි 12:19
6 නෙහෙ 10:38; හෙබ්‍රෙ 7:9
7 ගණන් 15:20
8 ගණන් 18:12

ගණන් **18:19*** මූ.අ., “ලුණු ගිවිසුමකි.”

**30** "මේ දේත් ඔබ ලෙවීව-
රුන්ට කියන්න. 'ඔබට ලැබෙන
සෑම පරිත්‍යාගයකින්ම හොඳම
කොටස[1] දුන් පසු ඉතුරු වන දේ
එනම්, කමතෙන් ලැබූ පලදාවද
වයින් හෝ තෙල්ද ඔබට හිමි වන්-
නේය. **31** දෙවිට පරිත්‍යාග කළ
පසු ඉතුරු වන දේ ඔබටත් ඔබේ
ගෙයි වැසියන්ටත් ඕනෑම තැනක
සිට අනුභව කළ හැක. එය සම්මුඛ
වීමේ කූඩාරමේ ඔබ කරන සේවය
සඳහා ඔබට ලැබෙන ත්‍යාගයයි.[2]
**32** ඔබට ලැබෙන සෑම පරිත්‍යා-
ගයකින්ම හොඳම කොටස දෙවිට
දෙන්න. එසේ නොකළොත් ඔබ දෙවි
ඉදිරියේ වරදකරුවන් වනු ඇත. ඊශ්‍රා-
යෙල් සෙනඟ පරිත්‍යාග කරන ශුද්ධ
දේවලට අගෞරව නොකරන්න. එසේ
කළොත් ඔබට ඔබේ ජීවිතයෙන්
වන්දි ගෙවීමට සිදු වෙයි.' "[3]

**19** යෙහෝවා දෙවි මෝසෙස්ට
හා ආරොන්ට මෙසේ කීවේය.
**2** "යෙහෝවා දෙවි දුන් නීතියට
ඇතුළත් මේ පනත සෙනඟට දන්-
වන්න. 'කිසි දවසක වියගහක් නො-
දැරූ,[4] නිකැළැල්,[5] රත් පැහැයට හුරු
එළදෙනකව රැළෙන් තෝරාගෙන
ඔබට ගෙනැවිත් දෙන්න කියා ඊශ්‍රා-
යෙල් සෙනඟට කියන්න. **3** ඔබ
එම එළදෙනව පූජක එලියාසර්ට දුන්
පසු ඔහු ඌව කඳවුරෙන් පිටතට
ගෙන යා යුතුයි. ඉන්පසු ඔහු ඉදිරියේ
ඌව මැරිය යුතුයි. **4** පූජක එලි-
යාසර් ඔහුගේ ඇඟිල්ලෙන් උගේ ලේ
ස්වල්පයක් ගෙන සම්මුඛ වීමේ කූඩා-
රම දෙසට හත් වරක් ඉසිය යුතුයි.[6]
**5** එළදෙනව පූජක එලියාසර් ඉදිරිපි-
ටම පිළිස්සිය යුතුයි. උගේ හමද
මාංසයද ලෙයද ගොමද පුළුස්සා
දැමිය යුතුයි.[7] **6** පූජකයා දේවදාර
අතුද[8] හිසොප්ද*[9] තද රතු පාට රෙ-
දිද[10] ගෙන දැවෙමින් තිබෙන සතා
මතට වීසි කළ යුතුයි. **7** පසුව ඔහු
තම වස්ත්‍ර සෝදා, නාගෙන කඳවුරට
පැමිණිය යුතුයි. නමුත් ඔහු හවස්
වන තුරු අපවිත්‍ර කෙනෙකු ලෙස
වෙන්ව සිටිය යුතුයි.
**8** " 'සතාව පිලිස්සූ තැනැත්තාද
තම වස්ත්‍ර සෝදාගත් පසු නාගෙන[1]
හවස් වන තුරු අපවිත්‍ර කෙනෙකු
ලෙස වෙන්ව සිටිය යුතුයි.
**9** " 'පවිත්‍රව සිටින කෙනෙකු එළ-
දෙනගේ අළු[2] එකතු කර කඳවු-
රෙන් පිටත පවිත්‍ර ස්ථානයක තැබිය
යුතුයි. ඊශ්‍රායෙල් පුත්‍රයන් එම අළු
තබාගත යුත්තේ පවිත්‍ර කිරීමට
භාවිත කරන වතුර[3] සමඟ මිශ්‍ර කරන
පිණිසය. එය පාප පූජාවකි. **10** අළු
එකතු කරන තැනැත්තාද තම වස්ත්‍ර
සෝදාගෙන හවස් වන තුරු අපවිත්‍ර
කෙනෙකු ලෙස වෙන්ව සිටිය යුතුයි.[4]
" 'ඊශ්‍රායෙල් සෙනඟ හා ඔවුන්
සමඟ ජීවත් වන විදේශිකයන්
බොහෝ කාලයක් පුරා එම පනත
පැවැත්විය යුතුයි.[5] **11** මළ සිරු-
රක් ස්පර්ශ කරන කවරෙකු වුණත්[6]
දවස් හතක් ගත වන තුරු අප-
විත්‍ර කෙනෙකු ලෙස වෙන්ව සිටිය
යුතුයි.[7] **12** එලෙස අපවිත්‍ර වූ කෙ-
නෙකු තුන්වෙනි දවසේදී අළු මිශ්‍ර
වතුරෙන් තමන්ව පවිත්‍ර කරගත
යුතුයි.[8] එවිට හත්වෙනි දවසේදී
ඔහුව පවිත්‍ර කෙනෙකු ලෙස සලකනු
ලබන්නේය. නමුත් තුන්වෙනි දව-
සේදී ඔහු තමන්ව පවිත්‍ර කර නො-
ගත්තොත් හත්වෙනි දවසේදී ඔහුව
පවිත්‍ර කෙනෙකු ලෙස සලකනු නො-
ලබන්නේය. **13** යමෙකු මළ සිරු-
රක් ස්පර්ශ කළොත් පවිත්‍ර කිරීමට
භාවිත කරන වතුර[9] ඔහු මත ඉසිය
යුතුයි. ඔහු එලෙස තමන්ව පවිත්‍ර කර
නොගත්තොත් ඔහු දිගටම අපවිත්‍ර
තත්වයක සිටින බැවින්[10] ඔහු යෙ-
හෝවා දෙවි වන මාගේ ශුද්ධ කූඩාරම
දූෂ්‍ය කරන්නේය.[11] ඒ නිසා ඔහුව මරා
දැමිය යුතුයි.[12]
**14** " 'යමෙකු කූඩාරමක් තුළ මිය
ගියොත් මෙසේ කළ යුතුයි. ඔහු මිය
ගිය අවස්ථාවේදී කූඩාරම ඇතුළේ
සිටි අයද ඉන්පසු කූඩාරම ඇතුළට

ගණන් **19:6*** නික් 12:22හි පාදසටහන බලන්න.

**18 පරි.**
1 හිතෝ 3:9
2 මතෙ 10:10; ලූක් 10:7; 1කොරි 9:9; 1කොරි 9:13; ගලා 6:6; 1තිමෝ 5:18
3 ලෙවී 22:2; ලෙවී 22:15

**19 පරි.**
4 ද්වි 21:3
5 ලෙවී 22:20; මලා 1:14; 1පේත්‍ර 2:22
6 හෙබ්‍රෙ 9:13; 1පේත්‍ර 1:2
7 නික් 29:14; ලෙවී 4:11
8 ලෙවී 14:4; ලෙවී 14:49
9 ගීතා 51:7
10 යෙසා 1:18

**2 තීරුව**
1 ලෙවී 16:28
2 හෙබ්‍රෙ 9:13
3 ගණන් 19:13; ගණන් 19:21; ගණන් 31:23
4 ගණන් 19:8
5 නික් 12:49; ලෙවී 24:22; ගණන් 15:15
6 ලෙවී 21:1; ලෙවී 21:11; ගණන් 5:2; ගණන් 6:9; ගණන් 9:6
7 ගණන් 31:19; හග් 2:13
8 ගණන් 31:19
9 ගණන් 19:9; ගණන් 31:23
10 ලෙවී 22:3
11 ලෙවී 15:31
12 හෙබ්‍රෙ 2:2; හෙබ්‍රෙ 10:28

යන අයද දවස් හතක් යන තෙක් අපවිත්‍ර අය ලෙස වෙන්ව සිටිය යුතුයි. **15** පියන තදින් වසා නොතැබූ* භාජන[1] කූඩාරම තුළ තිබුණේ නම් ඒවාද අපවිත්‍රය. **16** එමෙන්ම යමෙකු එළිමහනේ සිටියදී කඩුවෙන් මැරුම් කෑ කෙනෙකුව හෝ වෙන යම් ආකාරයකින් මිය ගිය කෙනෙකුගේ ශරීරය හෝ ඇටකටු[2] හෝ මිනී වළක් හෝ ස්පර්ශ කළොත්[3] ඔහු දවස් හතක් යන තෙක් අපවිත්‍ර කෙනෙකු ලෙස වෙන්ව සිටිය යුතුයි. **17** එලෙස අපවිත්‍ර වූ තැනැත්තා සඳහා පාප පූජාවට ඔප්පු කළ සතාගේ අළු ටිකක් භාජනයකට ගෙන එයට නැවුම් වතුර එක් කරන්න. **18** ඉන්පසු පවිත්‍රව සිටින කෙනෙකු[4] හිසොප්[5] මිටියක් ගෙන එම වතුරේ පොඟවා කූඩාරම හා එහි ඇති සියලු භාජන මතද එහි සිටි සියලුදෙනා මතද ඉසිය යුතුයි. මැරුම් කෑ කෙනෙකුව හෝ වෙන යම් ආකාරයකින් මිය ගිය කෙනෙකුගේ ශරීරය හෝ ඇටකටු හෝ මිනී වළක් හෝ ස්පර්ශ කර අපවිත්‍රව සිටින තැනැත්තෙකු සඳහාද එලෙසම කළ යුතුයි. **19** පවිත්‍රව සිටින තැනැත්තා තුන්වෙනි දවසේදී හා හත්වෙනි දවසේදී අපවිත්‍රව සිටින තැනැත්තා මත එම වතුර ඉසිය යුතුයි. හත්වෙනි දවසේදී ඔහුගේ අපවිත්‍රකමින් ඔහුව පවිත්‍ර කළ පසු[6] ඔහු තම වස්ත්‍ර සෝදාගෙන නාගත යුතුයි. එදින සවස සිට ඔහුව පවිත්‍ර කෙනෙකු ලෙස සැලකිය යුතුයි.

**20** “‘නමුත් අපවිත්‍ර තත්වයක සිටින කෙනෙකු මත පවිත්‍ර කිරීමට භාවිත කරන වතුර ඉස්සේ නැත්නම් ඔහු දිගටම අපවිත්‍ර තත්වයක සිටියි. ඔහු යෙහෝවා දෙවිගේ ශුද්ධ කූඩාරම දූෂ්‍ය කරන බැවින් ඔහුව මරා දැමිය යුතුයි.[7]

**21** “‘අපවිත්‍රව සිටින තැනැත්තාව පවිත්‍ර කරන පිණිස ඔහු මතට වතුර ඉසින තැනැත්තා හා එම වතුර අල්ලන වෙන ඕනෑම කෙනෙකු තම වස්ත්‍ර සෝදාගෙන[1] හවස් වන තුරු අපවිත්‍ර කෙනෙකු ලෙස වෙන්ව සිටිය යුතුයි. එය බොහෝ කාලයකට වලංගු වන පනතකි. **22** අපවිත්‍ර තැනැත්තා අල්ලන ඕනෑම දෙයක්ද අපවිත්‍ර වෙයි.[2] එලෙසම අපවිත්‍ර වූ යමක් අල්ලන කෙනෙකුද හවස් වන තුරු අපවිත්‍ර කෙනෙකු ලෙස වෙන්ව සිටිය යුතුයි.’ ”[3]

**20** පළමුවෙනි මාසයේදී මුළු ඊශ්‍රායෙල් සෙනඟ ශින් පාළුකරයට[4] පැමිණ කාදෙෂ්හි[5] කඳවුරු බැඳගත්තෝය. මිරියම්[6] එහිදී මිය ගියාය. එම ස්ථානයේදී ඇයව තැන්පත් කරනු ලැබීය.

**2** සෙනඟට බොන්න වතුර එතැන නොතිබුණු බැවින්[7] ඔවුහු එක් රොක් වී මෝසෙස්ට හා ආරොන්ට විරුද්ධව මැසිවිලි නැඟුවෝය.[8] **3** සෙනඟ මෝසෙස්ට බැණවදිමින්[9] මෙසේ කීවෝය. “අපේ සහෝදරයන් යෙහෝවා දෙවි ඉදිරියේ මැරුණු වෙලාවේ අපිත් මැරුණා නම් මීට වඩා හොඳයි.[10] **4** ඔබ දෙදෙනා යෙහෝවා දෙවිගේ සෙනඟව මේ පාළුකරයට ගෙනාවේ ඇයි? අපිවයි අපේ සතුන්වයි මරලා දාන්නද?[11] **5** ඊජිප්තුවේ ඉඳන් අපිව මේ කිසි කමකට නැති තැනට ගෙනාවේ ඇයි?[12] මෙහේ අත්තික්කා, දෙළුම්, මිදිවතු නැහැ. ධාන්‍ය වපුරන්නත් බැහැ.[13] අඩුම තරමේ අපිට බොන්න වතුරවත් නැහැ.” **6** එය ඇසූ පසු මෝසෙස් හා ආරොන් සෙනඟගෙන් ඉවත්ව සම්මුඛ වීමේ කූඩාරමේ දොරටුව ළඟට ගොස් දෙවි ඉදිරියේ දණින් වැටී පොළොව දෙසට තම මුහුණු පහත් කරගත්තෝය.[14] එවිට යෙහෝවා දෙවිගේ තේජස ඔවුන් ඉදිරියේ දිස් විය.[15]

**7** ඉන්පසු යෙහෝවා දෙවි මෝසෙස්ට මෙසේ කීවේය. **8** “මේ සැරයටිය[16] අතට ගෙන ඔබයි ඔබේ සහෝදරයා වන ආරොනුයි සෙනඟව

---

**ගණන් 19:15*** හෝ, “පියන තදින් ලණුවකින් බැඳ නැති.”

**19 පරි.**
1 ලෙවී 11:32
2 ගණන් 19:11
3 ගණන් 31:19
4 ගණන් 19:9
5 ගීතා 51:7
6 ලෙවී 14:9; ගණන් 19:12; ගණන් 31:19
7 උත් 17:14; ගණන් 19:13

**2 තීරුව**
1 ගණන් 19:18; හෙබ්‍රෙ 9:10; හෙබ්‍රෙ 9:13
2 හග් 2:13
3 ලෙවී 15:5

**20 පරි.**
4 ගණන් 13:21; ගණන් 33:36
5 ගණන් 13:26; ගණන් 20:22; ද්වි 1:46; ද්වි 2:14; විනි 11:16
6 නික් 15:20; ගණන් 26:59; මීකා 6:4
7 නික් 17:1
8 ගණන් 16:42
9 නික් 17:2
10 ගණන් 16:35; ගණන් 16:41; ගණන් 16:49
11 නික් 14:11; නික් 17:3; ගණන් 16:13; ගණන් 21:5
12 ගණන් 16:14; ද්වි 8:15; නෙහෙ 9:21
13 නික් 3:17; නික් 13:5; ද්වි 8:8; යොරෙ 2:2
14 ගණන් 14:5
15 නික් 16:10; ගණන් 14:10
16 නික් 17:5

රැස් කරන්න. ඔවුන්ව රැස් කළ පසු
ඔවුන්ට පෙනෙන සේ ඔබ පර්වත-
යට කතා කරන්න. එවිට පර්වත-
යෙන් වතුර ගලා එයි. ඔබ එසේ
කර සෙනඟටත් ඔවුන්ගේ සතුන්ටත්
බොන්න වතුර ලබා දෙන්න.”[1]
**9** මෝසෙස් යෙහෝවා දෙවි අණ
කළ ලෙස දෙවි ඉදිරියේ තිබූ
සැරයටිය තම අතට ගත්තේය.[2]
**10** ඉන්පසු මෝසෙස් හා ආරොන්
පර්වතය ළඟට සෙනඟ රැස්
කළෝය. මෝසෙස් සෙනඟ අමත-
මින් මෙසේ කීවේය. “කැරලිකාර-
යෙනි,[3] දැන් ඇහුම්කන් දෙන්න. ඔබ
අපට කියන්නේ මේ පර්වතයෙන්
වතුර දෙන්න කියාද?”[4] **11** එසේ
අසමින් ඔහු දෙවරක් තම සැරයටි-
යෙන් පර්වතයට ගැසුවේය. එවිට
පර්වතයෙන් වතුර ගලා ආවේය.
සෙනඟද ඔවුන්ගේ සතුන්ද එයින්
බීවෝය.[5]
**12** පසුව යෙහෝවා දෙවි මෝ-
සෙස්ට හා ආරොන්ට මෙසේ කීවේය.
“ඔබ දෙදෙනා මාව විශ්වාස කළේ
නැත. ශුද්ධ තැනැත්තා මා බව
පෙන්වමින් ඔබ සෙනඟ ඉදිරියේ මාව
ගෞරවයට පත් කළේ නැත.[6] ඒ
නිසා මා දෙන දේශයට මේ සෙනඟ
රැගෙන යන්නේ ඔබ දෙදෙනා නො-
වේ.”[7] **13** ඊශ්‍රායෙල් සෙනඟ යෙ-
හෝවා දෙවිට බැණවැදුණු නිසා එම
වතුරට මෙරිබා*[8] යන නම දෙන ලදි.
ඒ අවස්ථාවේදී දෙවි සෙනඟ ඉදිරියේ
තම නාමය තේජසට පත් කළේය.
**14** මෝසෙස් කාදෙෂ්හි සිට
ඒදොම්හි රජු[9] වෙත පණිවිඩකරු-
වන් යවා මෙසේ දැන්වූවේය. “ඔබේ
සහෝදරයන් වන ඊශ්‍රායෙල්වරුන්[10]
ඔබට කියා සිටින්නේ මෙයයි. ‘අපි
කොතරම් කරදරවලට මුහුණ දුන්-
නද කියා ඔබ හොඳින් දන්නා බව
අපට නිසැකයි.[11] **15** අපේ පියව-
රුන් ඊජිප්තු දේශයට ගිය නිසා[12] දීර්ඝ
කාලයක් අපි ජීවත් වුණේ ඒ දේ-
ශයේයි.[1] අපේ පියවරුන්ටයි අප-
ටයි ඊජිප්තුවරු බොහෝ සෙයින්
හිංසා පීඩා කළෝය.[2] **16** එවිට අපි
අපේ දුක කියමින් යෙහෝවා දෙවිට
කන්නලව් කළෙමු.[3] ඔහු අපේ කන්න-
ලව්වට කන් දී අපිට මඟ පෙන්වන්න
දේවදූතයෙකුව[4] එවා අපිව ඊජිප්තු
දේශයෙන් ගලවාගත්තේය. අප දැන්
සිටින්නේ ඔබේ දේශ සීමාවේ තිබෙන
කාදෙෂ් නම් නුවරෙහිය. **17** අපිට
ඔබේ දේශය හරහා යෑමට අවසර
දෙන ලෙස අපි ඔබෙන් ඉල්ලා සිටින්-
නෙමු. අපි ඔබේ කෙත්වතු මැදින්වත්
මිදිවතු මැදින්වත් නොයන්නෙමු.
ඔබේ ළිංවලින් වතුර නොබොන්-
නෙමු. රජුගේ මාර්ගය දිගේ පමණක්
අපි ගමන් කරන්නෙමු.[5] ඔබේ දේශය
පසු කරන තුරු අපි ඒ මාර්ගයෙන්
දකුණටවත් වමටවත් නොහැරෙන්-
නෙමු.’ ”[6]
**18** එහෙත් ඒදොම්හි රජ මෙසේ
කීවේය. “මගේ දේශය හරහා නො-
යන්න. ඔබ මෙහි පැමිණියොත් අපි
ඔබට කඩුවෙන් පහර දෙන්නෙමු.”
**19** එවිට ඊශ්‍රායෙල් සෙනඟ ඔහුට
මෙසේ දැන්වූවෝය. “ප්‍රධාන මාර්ගය
දිගේ පමණක් යන්න අපට අවසර
දෙන්න. අපි හෝ අපේ සතුන් හෝ
ඔබේ දේශයෙන් වතුර බිව්වොත්
අපි ඒ වෙනුවෙන් මුදල් ගෙවන්-
නෙමු.[7] ඔබේ දේශය හරහා පයින්
යෑමට පමණක් අපට ඉඩ දෙන්න.
අපට වෙන කිසිවක් අවශ්‍ය නැත.”[8]
**20** නමුත් ඔහු, “ඔබට අපේ දේශය
හරහා යන්න අවසර නොදෙන්නෙමි”[9]
කියා කීවේය. ඉන්පසු ඒදොම්හි[10]
රජ බලවත් සේනාවක්ද විශාල සෙ-
නඟක්ද සමඟ ඔවුන්ව හමු වීමට
ආවේය. **21** මෙසේ ඒදොම්හි රජ
ඊශ්‍රායෙල් සෙනඟට තම දේශය හරහා
යෑමට අවසර නොදුන්නේය.[11] ඊශ්‍රා-
යෙල්වරුද එතැනින් පිටත්ව වෙනත-
කට හැරී ගියෝය.[12]
**22** මුළු ඊශ්‍රායෙල් සෙනඟ
කාදෙෂ්හි[13] සිට හෝර් කන්ද[14] දක්වා

**ගණන් 20:13*** තේරුම, “රණ්ඩුව නැත්නම් දබ-
රය.”

**20 පරි.**
1 නෙහෙ 9:15; ගීතා 78:15; ගීතා 105:41; ගීතා 114:8; යෙසා 43:20; යෙසා 48:21
2 නික් 7:12; නික් 7:19; ගණන් 17:10; හෙබ්‍රෙ 9:4
3 ද්වි 9:24; ගීතා 106:32
4 ගීතා 106:33
5 නික් 17:6; ද්වි 8:15; 1කොරි 10:4
6 ලෙවී 10:3; ගණන් 27:14; ද්වි 32:51; යෙසා 8:13; එළි 4:11
7 ද්වි 1:37; ද්වි 3:26; ද්වි 34:4; යොෂු 1:2
8 ද්වි 33:8; ගීතා 95:8; ගීතා 106:32; හෙබ්‍රෙ 3:8
9 විනි 11:17
10 උත් 36:8; ද්වි 2:4; ද්වි 23:7
11 නික් 18:8
12 උත් 46:6; ක්‍රියා 7:15

**2 තීරුව**
1 උත් 15:13; නික් 12:40
2 නික් 1:11; නික් 1:14; ද්වි 26:6; ක්‍රියා 7:19
3 නික් 2:23; නික් 3:7
4 නික් 14:19; නික් 23:20; නික් 33:2; ක්‍රියා 7:35
5 ගණන් 21:22
6 ද්වි 2:27
7 ද්වි 2:6
8 ද්වි 2:28
9 විනි 11:17
10 උත් 36:1
11 ද්වි 2:29
12 ද්වි 2:8; විනි 11:18
13 ගණන් 13:26; ගණන් 33:37
14 ගණන් 21:4; ගණන් 34:7

ගමන් කළෝය. **23** ඒදොම්හි දේශ
සීමාවේ පිහිටි හෝර් කන්දේදී යෙ-
හෝවා දෙවි මෝසෙස්ට හා
ආරොන්ට මෙසේ කීවේය. **24** “මෙ-
රිබාහි වතුර ළඟදී ඔබ දෙ-
දෙනා මා දුන් ආඥාවට විරුද්ධව
ක්‍රියා කළ බැවින්[1] ඊශ්‍රායෙල්
සෙනඟට දෙන දේශයට ආරොන්
ඇතුල් නොවන්නේය. ඔහුගේ ආදි-
පියවරුන් මෙන් ඔහුද මිය යනු
ඇත.[2] **25** ඔබ ආරොන් හා ඔහුගේ
පුත්‍රයා වන එලියාසර් සමඟ හෝර්
කන්දට නැඟ යන්න. **26** ආරොන්
ඇඳගෙන සිටින නිලවස්ත්‍ර[3] ගලවා
ඔහුගේ පුත්‍රයා වන එලියාසර්ට අන්ද-
වන්න.[4] ආරොන් එම ස්ථානයේදී මිය
යනු ඇත.”[5]

**27** මෝසෙස්, යෙහෝවා දෙවි අණ
කළ ලෙස කළේය. මුළු සෙනඟ
බලා සිටියදී ඔවුහු හෝර් කන්-
දට නැඟ ගියෝය. **28** මෝසෙස්,
ආරොන් ඇඳ සිටි නිලවස්ත්‍ර ගලවා
ඔහුගේ පුත්‍රයා වන එලියාසර්ට ඇන්-
දුවේය. ආරොන්ද කන්ද මුදුනේදී
මිය ගියේය.[6] පසුව මෝසෙස් හා
එලියාසර් කන්දෙන් බැස ආවෝය.
**29** ආරොන් මිය ගිය බව දැනගත්
විට මුළු ඊශ්‍රායෙල් සෙනඟ ඔහු නිසා
හඬන්න පටන්ගත්තෝය. ඔවුහු දවස්
තිහක් පුරා ඔහු වෙනුවෙන් හඬා වැල-
පුණෝය.[7]

**21** ඊශ්‍රායෙල්වරුන් අතාරීම්
හරහා ගමන් කරමින් සිටින
බව නෙගෙබ්හි[8] ජීවත් වූ කානානිවර-
යෙක් වන ආරද්හි රජුට[9] ආරංචි විය.
එවිට ඔහු ඊශ්‍රායෙල්වරුන්ට විරුද්-
ධව සටන් කර ඔවුන්ගෙන් සමහරෙ-
කුව වහලුන් ලෙස ගෙන ගියේය.
**2** එබැවින් ඊශ්‍රායෙල්වරු යෙහෝවා
දෙවිට භාරයක් වෙමින් මෙසේ
කීවෝය.[10] “ඔබ අපට මේ සෙනඟව
යටත් කරගන්න උදව් කළොත්
අපි ඔවුන්ගේ නුවරවල් සම්පූර්ණ-
යෙන්ම විනාශ කර* දමන්නෙමු.”[11]

**3** යෙහෝවා දෙවි ඊශ්‍රායෙල්වරුන්ගේ
ඉල්ලීමට සවන් දී කානානිවරුන්ව
පරාජය කිරීමට ඔවුන්ට උපකාර
කළේය. ඊශ්‍රායෙල්වරු කානානිව-
රුන්වද ඔවුන්ගේ නුවරවල්ද සම්පූර්-
ණයෙන්ම විනාශ කළෝය. එබැවින්
ඔවුහු එම ස්ථානයට හොර්මා* යන
නම තැබූහ.[1]

**4** පසුව ඊශ්‍රායෙල්වරු ඒදොම්ව-
රුන්ගේ දේශය මඟහරිමින්[2] හෝර්
කන්දේ[3] සිට රතු මුහුදට යන මාර්-
ගය හරහා ගමන් කළෝය. ගමන
දුෂ්කර වූ නිසා සෙනඟ විඩාවට
පත් වූහ. **5** ඔවුහු දෙවිටත්[4] මෝ-
සෙස්ටත්[5] විරුද්ධව මැසිවිලි නඟමින්
මෙසේ කීවෝය. “ඔබ ඊජිප්තු දේශ-
යේ ඉඳන් අපිව මෙතැනට ගෙ-
නාවේ මේ පාළුකරයේ අපිව මරලා
දාන්නද?[6] අපිට මෙහෙ කන්න කෑම
නැහැ. බොන්න වතුර නැහැ.[7] මේ
කිසි කමකට නැති කෑම අපිට දැන්
එපා වෙලා.”[8] **6** ඔවුන් එසේ මැසි-
විලි නැඟූ නිසා යෙහෝවා දෙවි
ඊශ්‍රායෙල් සෙනඟ අතරට විෂ සර්ප-
යන්ව එව්වේය.[9] සර්පයන් සෙනඟ-
ගෙන් බොහෝදෙනෙකුට දෂ්ට කළ
නිසා ඔවුහු මිය ගියෝය.[10]

**7** පසුව සෙනඟ මෝසෙස් වෙතට
පැමිණ මෙසේ ඉල්ලා සිටියෝය.
“අපි යෙහෝවා දෙවිටත් ඔබටත්
විරුද්ධව මැසිවිලි නඟලා කළේ
ලොකු පාපයක්.[11] මේ සර්පයන්ව මෙ-
හෙන් ඉවත් කරන්න කියා යෙ-
හෝවා දෙවිට කන්නලව් කරන්න.”[12]
එවිට මෝසෙස් සෙනඟ වෙනුවෙන්
දෙවිට කන්නලව් කළේය.[13] **8** ඒ
අවස්ථාවේදී යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. “විෂ සර්-
පයෙකුගේ හැඩයට රූපයක් සාදා
එය කණුවක සවි කරන්න. සර්ප-
යෙක් කාට හරි දෂ්ට කළොත් ඔහුට
එම රූපය දෙස බලන්න කියන්න.
එවිට ඔහු නොමැරී ජීවත් වෙයි.”[14]
**9** මෝසෙස් විගස සර්පයෙකුගේ රූප-

**20 පරි.**
1 ගණන් 20:12, ද්වි 32:51
2 උත් 25:8, ගණන් 33:38, ද්වි 32:50
3 නික් 28:2, නික් 29:29, හෙබ්‍රෙ 7:23
4 නික් 6:23, ගණන් 4:16
5 ගණන් 33:38
6 ගණන් 33:39, ද්වි 10:6, ද්වි 32:50
7 ද්වි 34:8

**21 පරි.**
8 ගණන් 13:22
9 ගණන් 33:40, යොෂු 12:14
10 ද්වි 23:21
11 ලෙවී 27:28, ද්වි 20:17, යොෂු 6:18

**2 තීරුව**
1 ගණන් 14:45, විනි 1:17
2 ගණන් 20:21, ද්වි 2:8, විනි 11:18
3 ගණන් 33:41
4 ගීතා 78:19
5 නික් 14:11, නික් 15:24, ගණන් 16:13
6 ගණන් 14:28, ගණන් 14:34
7 ගණන් 20:5
8 නික් 16:15, ගණන් 11:6, ගීතා 78:24
9 ද්වි 8:15
10 ගීතා 106:43, 1කොරි 10:9
11 ගීතා 78:34
12 ලෙවී 26:40
13 නික් 32:11
14 ගීතා 106:44

**ගණන් 21:2*** නික් 22:20හි පාදසටහන බලන්න.

**ගණන් 21:3*** තේරුම, “විනාශයට කැප කළ.”

යක් තඹවලින් සාදා[1] එය කණුවක
සවි කළේය.[2] සර්පයෙක් දෂ්ට කළ
යමෙකු එම තඹ රූපය දෙස බලා-
ගෙන සිටි විට[3] ඔහු මිය ගියේ නැත.[4]
**10** ඒ සිද්ධියෙන් පසු ඊශ්‍රායෙල්
පුත්‍රයෝ ඕබොත්[5] නම් ස්ථානය
දක්වා ගමන් කර එහි කඳවුරු බැඳ-
ගත්තෝය. **11** පසුව ඔවුහු නැඟෙ-
නහිර දෙසින් පිහිටි මෝවබ්
දේශයට මුහුණ ලා තිබෙන පාළුකර-
යට පැමිණ එහි ඉයෙ-අබරිම්[6] නම්
ස්ථානයේ කඳවුරු බැඳගත්තෝය.
**12** ඒ ස්ථානයේ සිට ඔවුහු ෂේ-
රෙද් නිම්නය[7] දක්වා ගොස් එහි
කඳවුරු බැඳගත්තෝය. **13** පසුව
ඔවුහු අමෝරිවරුන්ගේ දේශ සීමාවට
එහායින් පිහිටි පාළුකරයට පැමිණ
එහි ආනොන්[8] නම් පළාතේ කඳවුරු
බැඳගත්තෝය. ආනොන් තිබෙන්නේ
මෝවබ්වරුන්ගේ දේශ සීමාවේය.
මෝවබ් දේශය අමෝරිවරුන්ගේ දේ-
ශයෙන් වෙන් කරන සීමාව එයයි.
**14** යෙහෝවා දෙවිගේ යුද්ධ ගැන
සටහන් කර තිබෙන ලියවිල්ලෙහි,

“සූෆා ප්‍රදේශයෙහි වහෙබ්, ආනොන්
නිම්නය සහ **15** ආර්[9] දක්වාද
මෝවබ් දේශ සීමාව හරහාද දිව යන
ආනොන්හි අතු ගංගා” ගැන සඳහන්
වන්නේ ඒ නිසාය.

**16** ඔවුන් ඊළඟට ගමන් කළේ
බෙයර්*[10] දක්වාය. එම ස්ථානය
ගැන සඳහන් කරමින් යෙහෝවා දෙවි
මෝසෙස්ට මෙසේ කීවේය. “සෙ-
නඟ මෙතැනට එක් රැස් කරන්න.
මම ඔවුන්ට බොන්න වතුර දෙන්-
නෙමි.”[11]
**17** ඒ අවස්ථාවේදී ඊශ්‍රායෙල්වරු ඒ
ළිඳ ගැන මේ ගීය ගැයූහ.[12]

“අපේ පිපාසය සන්සිඳවීමට අපට
වතුර දෙන්න. සෙනඟෙනි,
එහි වතුර උනන ශබ්දය අසා
ගී ගයන්න.
**18** අධිපතීන් හෑරූ ළිඳ මෙය නො-
වේද!
වංශාධිපතීන් ඔවුන්ගේම සැර-
යටිවලින්[1] හෑරූ ළිඳ මෙය
නොවේද!”

පසුව සෙනඟ පාළුකරයෙන්
පිටත්ව මත්තනා වෙතටද **19** එතැ-
නින් නහලියෙල් වෙතටද නහලියෙල්
සිට බාමොත්[2] වෙතටද ගියෝය.
**20** බාමොත්හි සිට ඔවුහු මෝවබ්[3]
ප්‍රදේශයෙහි තිබූ නිම්නයට පැමිණ
පිස්ගාහි[4] මුදුන දක්වා ගමන්
කළෝය. පිස්ගාහි මුදුනේ සිට බැලූ
විට යෙෂිමොන්*[5] පෙනේ.
**21** ඊශ්‍රායෙල්වරු අමෝරිවරුන්ගේ
රජු වන සීහොන්[6] වෙතට පණිවිඩ-
කරුවන් යවා මෙසේ දැන්වූවෝය.
**22** “ඔබේ දේශය හරහා යන්න
අපිට පුළුවන්ද? අපි ඔබේ කෙත්-
වතු මැදින්වත් මිදිවතු මැදින්වත්
නොයන්නෙමු. ඔබේ ළිංවලින් වතුර
නොබොන්නෙමු. ඔබේ දේශය පසු
කරගෙන යන තුරු අපි රජුගේ මාව-
තේ පමණක් ගමන් කරන්නෙමු.”[7]
**23** නමුත් සීහොන් රජ ඊශ්‍රා-
යෙල්වරුන්ට ඔහුගේ දේශය හරහා
ගමන් කිරීමට ඉඩ නොදුන්නේය.[8]
ඔහු තමන්ගේ මුළු සෙනඟ එක්
රැස් කරගෙන පාළුකරයේ සිටි ඊශ්‍රා-
යෙල්වරුන් වෙත ගියේය. ඔවුහු
යහශ්හිදී[9] ඊශ්‍රායෙල්වරුන් සමඟ
සටන් කළෝය. **24** ඊශ්‍රායෙල්වරු
සීහොන්ට කඩුවෙන් පහර දී[10] ඔහුගේ
දේශය යටත් කරගත්තෝය.[11] ඔවුහු
ආනොන්[12] හා යබ්බොක්[13] අතරේ
තිබූ මුළු ප්‍රදේශයම යටත් කරගත්-
තෝය. එහෙත් ඔවුහු අම්මොන් පුත්‍ර-
යන්ගේ[14] දේශ සීමාව වන යාසෙර්[15]
පසු කරගෙන ගියේ නැත.
**25** ඊශ්‍රායෙල්වරු ඒ සියලු නුව-
රවල් යටත් කරගත් පසු හෙෂ්-
බොන්හි[16] තිබූ අමෝරිවරුන්ගේ[17]
නුවරවලද ඒ අවට තිබූ කුඩා නග-
රවලද පදිංචි වූහ. **26** හෙෂ්බොන්
නගරය අමෝරිවරුන්ගේ රජු වූ[18]
සීහොන්ගේ[19] අගනුවර වී තිබිණ.

**21 පරි.**
1 2රාජා 18:4
2 යොහ 3:14
යොහ 8:28
යොහ 12:32
ගලා 3:13
1පේතෘ 2:24
3 යොහ 1:29
හෙබ්‍රෙ 12:2
4 යොහ 3:14
යොහ 3:15
යොහ 6:40
රෝම 1:17
5 ගණන් 33:43
6 ගණන් 33:44
7 ද්වි 2:13
8 ගණන් 22:36
ද්වි 2:24
විනි 11:18
9 ගණන් 21:28
ද්වි 2:18
ද්වි 2:29
යොෂු 15:1
10 යොෂු 15:8
11 ගීතා 78:52
12 ගීතා 105:2

**2 තීරුව**
1 උත් 49:10
2 යොෂු 13:17
3 ගණන් 26:63
ගණන් 33:49
4 ද්වි 3:27
ද්වි 34:1
5 ගණන් 23:28
යොෂු 12:3
6 ද්වි 2:26
විනි 11:19
7 ගණන් 20:17
8 ද්වි 2:30
ද්වි 29:7
විනි 11:20
9 ද්වි 2:32
යොෂු 13:18
10 යොෂු 12:2
විනි 11:21
ගීතා 135:10
ගීතා 136:19
ආමො 2:9
11 ගණන් 32:33
නෙහෙ 9:22
12 ගණන් 21:13
ද්වි 3:16
13 විනි 11:22
14 යොෂු 12:2
15 ගණන් 32:1
1ලේක 6:81
16 ද්වි 2:26
විනි 11:19
සල 7:4
17 උත් 10:16
උත් 15:16
නික් 3:8
ද්වි 7:1
18 විනි 11:19
19 ගීතා 135:11

**ගණන් 21:16*** මූ.අ., “ළිඳ.”

**ගණන් 21:20*** හෝ, “කාන්තාරය.”

සීහොන් රජ මෝවබ්වරුන්ගේ රජුට
විරුද්ධව සටන් කර ඔහුට අයිති මුළු
දේශයම යටත් කරගත්තේය. ඔහු
ආනොන්[1] දක්වා වූ ඒ මුළු ප්‍රදේශ-
යම අල්ලාගත්තේය. **27** ඒ සිද්ධිය
සම්බන්ධයෙන් ඇතමෙක් මෙලෙස
ඇනුම් පද කියති.

“හෙෂ්බොන් නුවරට එන්න.
සීහොන්ගේ නුවර ශක්තිමත්ව
ගොඩනඟා ස්ථිරව පිහිටවනු
ලැබේවා!
**28** හෙෂ්බොන්[2] වෙතින් එනම්,
සීහොන්ගේ නුවර වෙතින්
ගින්නක් නික්ම ඇවිත්
මෝවබ්හි ආර්[3] නුවර දවා දැමු-
වේය. එය ආනොන්හි උස්
තැන්වල උත්තමයන්ව දවා
දැමුවේය.
**29** මෝවබ්වරුනි, ඔබට මුහුණ දීමට
සිදු වන විපතක මහත!
කෙමොෂ්ගේ[4] ජනයෙනි, ඔබ
සම්පූර්ණයෙන්ම විනාශ වී
යනු ඇත!
ඔහු පලා යන තම දූපුතුන්ව
අමෝරිවරුන්ගේ රජු වන
සීහොන්ට පාවා දෙන්නේය.
**30** අපි ඔවුන්ට පහර දී
හෙෂ්බොන් නැති නාස්ති
කරමු. දීබොන්[5] දක්වාම එය
නාස්ති කරමු.
නෝෆා දක්වාද මේදෙබා[6] දක්-
වාද එහි සියලු වැසියන්ව අපි
විනාශ කරමු.”

**31** ඊශ්‍රායෙල්වරු අමෝරිවරුන්-
ගේ දේශයේ පදිංචි වූහ.[7] **32** දේශ-
යේ තොරතුරු සොයා බලන පිණිස
මෝසෙස්, යාසෙර්[8] වෙතට මිනි-
සුන් යැව්වේය. ඔවුහු යාසෙර් අවට
තිබූ කුඩා නගර යටත් කරගෙන
එහි ජීවත් වෙමින් සිටි අමෝරිව-
රුන්ව පන්නා දැමුවෝය.[9] **33** ඉන්-
පසු ඔවුහු බාෂාන් දේශය වෙතට
යන මාර්ගයේ උතුරු දෙසට
ගමන් කළෝය.[10] ඒ ගැන ආරංචි වූ
බාෂාන්හි රජ වන ඕග්[11] ඊශ්‍රායෙල්ව-
රුන්ට විරුද්ධව සටන් කරන පිණිස
තම මුළු සෙනඟ සමඟ එද්රෙයි
නුවර වෙතට ගියේය.[1] **34** ඒ අවස්-
ථාවේදී යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. “ඕග් රජුට භය නො-
වන්න.[2] මම ඔහුවත් ඔහුගේ සෙනඟ-
වත් ඔහුගේ දේශයත් ඔබේ අතට
දෙන්නෙමි.[3] හෙෂ්බොන්හි ජීවත් වූ
අමෝරිවරුන්ගේ රජු වන සීහොන්ව
ඔබ විනාශ කළ ලෙසම ඔහුවත්
විනාශ කරන්න.”[4] **35** ඊශ්‍රායෙල්වරු
ඕග් රජුවත් ඔහුගේ පුත්‍රයන්වත් ඔහු-
ගේ මුළු සෙනඟවත් විනාශ කළෝය.
ඔවුන්ගෙන් කිසිවෙක් ඉතුරු නොක-
ළෝය.[5] මෙසේ ඊශ්‍රායෙල්වරු ඕග්
රජුගේ දේශයද අයිති කරගත්තෝය.[6]

**22** ඊශ්‍රායෙල් සෙනඟ එතැනින්
පිටත්ව ගොස් මෝවබ් පාළු-
කරයේ[7] එනම්, යොර්දාන් ගඟෙන්
මෙතෙර යෙරිකෝවට මුහුණ ලා කඳ-
වුරු බැඳගත්තෝය. **2** ඊශ්‍රායෙල්
සෙනඟ අමෝරිවරුන්ට කළ දේ ගැන
සිප්පෝර්ගේ පුත්‍රයා වන බාලාක්ට[8]
ආරංචි විය. **3** ඊශ්‍රායෙල්වරුන්
විශාල ජාතියක් වූ බැවින් මෝවබ්වරු
මහත් සේ භය වූහ. ඊශ්‍රායෙල් සෙනඟ
ගැන ඔවුන්ට වෛරයක්ද ඇති විය.[9]
**4** මෝවබ්වරු මිදියන්හි ප්‍රධානීන්ට[10]
මෙසේ කීවෝය. “ගවයෙක් වත්තක
තණකොළ කා දමනවා හා සමානව
මේ සෙනඟත් අපේ මුළු දේශයම කා
දමාවි.”

ඒ වන විට මෝවබ් දේශයේ
රජුව සිටියේ සිප්පෝර්ගේ පුත්‍රයා
වන බාලාක්ය.[11] **5** ඒ කාලයේ බෙ-
යෝර්ගේ පුත්‍රයා වන බාලාම්[12] තමන්
උපන් රටේ පෙතෝර්[13] නම් ප්‍රදේශයේ
ගඟ*[14] අසල ජීවත් විය. බාලාක්
රජ බාලාම්ට පණිවිඩයක් යවමින්
මෙසේ දැන්වූවේය. “ඊජිප්තුවෙන් සෙ-
නඟක් අපේ දේශය අසලටම පැමිණ
සිටිනවා. ඔවුන් දේශය අවට සෑම
තැනම විසිර සිටිනවා.[15] **6** ඔවුන්
අපට වඩා බලවත් ජාතියක්. නමුත්
ඔබ කෙනෙකුට ආශීර්වාද කළොත්

**21 පරි.**
1 ගණන් 21:13
2 යෙරෙ 48:45
3 ගණන් 21:15
ද්වි 2:9
4 විනි 11:24
1රාජා 11:7
2රාජා 23:13
යෙරෙ 48:7
5 ගණන් 32:34
යොෂු 13:17
යෙරෙ 48:18
6 යොෂු 13:9
7 ද්වි 3:8
8 ගණන් 32:1
9 ගණන් 21:25
10 ද්වි 3:1
11 ද්වි 1:4
ද්වි 3:11
ද්වි 4:47
යොෂු 9:10

**2 තීරුව**
1 ද්වි 3:10
යොෂු 13:12
2 ද්වි 3:2
ද්වි 3:22
ද්වි 20:3
3 නික් 23:27
ද්වි 7:24
4 ගීතා 135:11
5 ද්වි 3:3
යොෂු 13:12
6 යොෂු 12:4
යොෂු 12:6

**22 පරි.**
7 ගණන් 33:48
8 යොෂු 24:9
විනි 11:25
9 නික් 15:15
ද්වි 2:25
10 ගණන් 31:8
යොෂු 13:21
11 මීකා 6:5
එළි 2:14
12 යොෂු 13:22
යොෂු 24:9
2පේතෘ 2:15
යූද් 11
13 ද්වි 23:4
14 උත් 15:18
15 උත් 13:16

**ගණන් 22:5*** එනම්, යුප්‍රටීස් ගඟ.

එය එලෙසම සිදු වන බව මම
හොඳින් දන්නවා. ඒ වගේම ඔබ කෙ-
නෙකුට ශාප කළොත් එයත් එලෙසම
සිදු වන බව මම දන්නවා.[1] ඒ නිසා
ඔබ අපේ දේශයට ඇවිත් මේ සෙ-
නඟට ශාප කරන්න.[2] එවිට ඔවුන්ට
පහර දී මේ දේශයෙන් ඔවුන්ව පන්නා
දමන්න මට හැකි වෙයි.”

**7** පසුව මෝවබ්හි ප්‍රධානියෝද
මිදියන්හි ප්‍රධානියෝද බාලාම් සිටි
ස්ථානය බලා පිටත් විය. ඔහු
ලවා කරගැනීමට බලාපොරොත්තු
වූ මන්තර ගුරුකම් සඳහා ඔහුට
තෑගිද ඔවුහු රැගෙන ගියෝය.[3] ඔවුහු
බාලාම්[4] වෙත පැමිණ බාලාක් පැවසූ
දේ ඔහුට දැන්වූවෝය. **8** එවිට
බාලාම් ඔවුන්ට මෙසේ කීවේය. “අද
රෑ මෙහි නවාතැන් ගන්න. යෙහෝවා
දෙවි මේ ගැන පවසන්නේ කුමක්ද
කියා මා ඔබට කියන්නම්.”[5] එබැවින්
මෝවබ්හි ප්‍රධානියෝ එදින බාලාම්
සමඟ නතර වූහ.

**9** දෙවි බාලාම්ට කතා කර,[6] “ඔබ
සමඟ සිටින මේ මිනිස්සු කවුද” කියා
ඇසුවේය. **10** එවිට බාලාම් සැබෑ
දෙවිට මෙසේ කීවේය. “සිප්පෝර්ගේ
පුත් මෝවබ්හි රජු වන බාලාක්[7] මේ
මිනිසුන් අත මට මෙසේ පණිවිඩ-
යක් එවා තිබෙනවා. **11** ‘ඊජිප්තු-
වෙන් ඇවිත් සිටින මේ සෙනඟ
දේශය අවට සෑම තැනම විසිරී සිටි-
නවා.[8] දැන් ඔබ අපේ දේශයට ඇවිත්
මේ සෙනඟට ශාප කරන්න.[9] එවිට
මට පුළුවන් වෙයි ඔවුන්ට පහර
දී මේ දේශයෙන් ඔවුන්ව පන්නා
දමන්න.’” **12** එහෙත් දෙවි ඔහුට
මෙසේ කීවේය. “ඔබ මේ මිනිස්සු
සමඟ නොයන්න. ඒ සෙනඟ ආශීර්-
වාද ලත් සෙනඟක් නිසා[10] ඔබ
ඔවුන්ට ශාප නොකරන්න.”[11]

**13** බාලාම් පසුවදා උදෑසන අවදි
වී බාලාක් එවූ ප්‍රධානීන්ට මෙසේ
කීවේය. “ඔබ දැන් ඔබේ රටට
යන්න. මන්ද ඔබ සමඟ යෑමට යෙ-
හෝවා දෙවි මට අවසර දුන්නේ
නැහැ.” **14** පසුව මෝවබ්හි ප්‍රධානි-
යෝ බාලාක් රජු වෙත ගොස් මෙසේ
කීවෝය. “බාලාම් අප සමඟ එන්න
කැමති වුණේ නැහැ.”[1]

**15** පසුව බාලාක් කලින් වතා-
වේ යැවූ ප්‍රධානීන්ට වඩා ශ්‍රේෂ්ඨ
ප්‍රධානීන්ව බාලාම් වෙතට යැව්-
වේය. ඔවුන්ගේ ගණනද කලින් වතා-
වේ යැවූ ප්‍රධානීන්ගේ ගණනට
වඩා වැඩිය. **16** ඔවුහු බාලාම් වෙත
පැමිණ මෙසේ කීවෝය. “සිප්පෝර්-
ගේ පුත්‍රයා වන බාලාක් රජ ඔබට
මෙසේ දැන්නුවා. ‘මගේ දේශයට
එන්න බැහැ කියා නම් කියන්න එපා.
**17** ඔබ පැමිණියොත් මම ඔබට ගෞ-
රවයෙන් සලකනවා.[2] ඔබ ඉල්ලන
ඕනෑම දෙයක් මම ඔබට දෙන්-
නම්.[3] මා වෙනුවෙන් මෙහි පැමිණ
මේ සෙනඟට ශාප කරන්න කියා
මම ඔබෙන් බැගෑපත්ව ඉල්ලා සිටි-
නවා.’” **18** එවිට බාලාම්, බාලාක්
රජුගේ සේවකයන්ට මෙසේ කීවේය.
“බාලාක් රජ ඔහුගේ මාලිගාව රන් හා
රිදීවලින් පුරවා මට දුන්නත් මගේ
දෙවි වන යෙහෝවාගේ අණට විරුද්-
ධව මට ක්‍රියා කරන්න බැහැ. කාර-
ණය බරපතළ එකක් වුණත් සුළු
එකක් වුණත් මට නම් දෙවිට විරුද්-
ධව ක්‍රියා කරන්න බැහැ.[4] **19** ඔබ
අද රෑ මෙහි නවතින්න. යෙහෝවා
දෙවිට මේ ගැන තව දේවල් කීමට
තිබේ නම් මම ඒ ගැන දැනගෙන
ඔබට දන්වන්නම්.”[5]

**20** එදින රාත්‍රියේ දෙවි බාලාම්ට
මෙසේ කීවේය. “ඒ මිනිස්සු පැමිණ
සිටින්නේ ඔබව රැගෙන යන්න නම්
ඔබ ඔවුන් සමඟ යන්න. නමුත්
මා ඔබට දන්වන දේ පමණක් ඔබ
ඔවුන්ට කිව යුතුයි.”[6] **21** බාලාම්
පසුවදා උදෑසන නැඟිට තමාගේ
බූරුදෙනව ගමනට සූදානම් කරගෙන
මෝවබ්හි ප්‍රධානීන් සමඟ පිටත්ව
ගියේය.[7]

**22** නමුත් බාලාම් ඔවුන් සමඟ
පිටත්ව ගිය නිසා දෙවි මහත් සේ උද-
හස් විය. බාලාම් තමාගේ බූරුදෙන
පිට ගමන් කරමින් සිටියේය. ඔහුගේ

**22 පරි.**
1 ගීතා 109:28
2 උත් 12:3, ගණන් 23:7, යොෂු 24:9, නෙහෙ 13:2
3 මීකා 3:11, ක්‍රියා 16:16, 1තිමෝ 6:10
4 2පේතෘ 2:15, යූද් 11
5 ගණන් 12:6, ගණන් 23:12
6 ගණන් 22:20
7 ගණන් 22:4
8 ගණන් 22:5
9 ගණන් 22:6, ගණන් 23:7, ගණන් 23:11, ගණන් 24:10
10 උත් 12:2, උත් 22:17, ගණන් 23:20, ද්වි 23:5, ද්වි 33:29
11 මීකා 6:5

**2 තීරුව**
1 ගණන් 22:37
2 ගණන් 24:11, හිතෝ 17:23
3 හිතෝ 15:27
4 ගණන් 24:13
5 ගණන් 22:8
6 ගණන් 22:35, ගණන් 23:12, ගණන් 24:13
7 යාකො 1:14, 2පේතෘ 2:15, යූද් 11

සේවකයෝ දෙදෙනෙක්ද ඔහු සමඟ
ගමන් කරමින් සිටියෝය. ඔහුට
බාධා කරන පිණිස යෙහෝවා දෙවි-
ගේ දූතයෙකු ඔහු ගමන් කරමින්
සිටි මාර්ගය මැද සිටගත්තේය.[1]
**23** කඩුවක් අතැතිව පාර මැද සිට-
ගෙන සිටි යෙහෝවා දෙවිගේ දූත-
යාව දැක[2] බූරුදෙන ඔහුව මඟහැර
ළඟ තිබූ කෙතකට යන්න උත්-
සාහ කළාය. නමුත් බාලාම් ඌව
නැවත පාර දෙසට ගෙන යන පිණිස
ඌට පහර දුන්නේය. **24** ඉන්පසු
යෙහෝවා දෙවිගේ දූතයා මිදිවතු
අතරේ තිබූ පටු මාර්ගයේ සිට-
ගත්තේය. ඒ මාර්ගය දෙපැත්තේ
තාප්ප තිබිණ. **25** ඒ අවස්ථාවේදී
බූරුදෙන, යෙහෝවා දෙවිගේ දූතයාව
දැක පාර අයිනටම ගොස් තාප්පයේ
හැප්පුණාය. එවිට බාලාම්ගේ කකුල
තාප්පයට තද වූ නිසා ඔහු ඌට හයි-
යෙන් පහර දුන්නේය.
**26** ඉන්පසු යෙහෝවා දෙවිගේ
දූතයා එතැනින් පිටත්ව වමටවත්
දකුණටවත් හැරෙන්න බැරි තරම්
පටු ස්ථානයකට ගොස් සිටගත්-
තේය. **27** බූරුදෙන, යෙහෝවා දෙ-
විගේ දූතයාව දුටු විගස බාලාම්
තම පිටේ සිටියදීම බිම දිගා විය.
එවිට බාලාම් මහත් සේ උදහස් වී[3]
තම සැරයටියෙන් දිගටම ඌට පහර
දුන්නේය. **28** ඒ අවස්ථාවේදී යෙ-
හෝවා දෙවි බූරුදෙනට කතා කිරීමේ
හැකියාව දුන්නේය.[4] එවිට බූරුදෙන
බාලාම්ට මෙසේ කීවාය. "ඔබ මේ
විදිහට මට තුන් වතාවක්ම පහර දුන්-
නේ මම ඔබට මොන වරදක් කළා-
ටද?"[5] **29** එවිට බාලාම් බූරුදෙනට
මෙසේ කීවේය. "නුඹ මාව විහිළුවකට
ගත්ත නිසයි මම නුඹට ගැහුවේ.
මගේ අතේ කඩුවක් තිබුණා නම් මම
නුඹව මරලා දානවා."[6] **30** එවිට
බූරුදෙන බාලාම්ගෙන් මෙසේ ඇසු-
වාය. "මුළු ජීවිත කාලය පුරා ඔබ
ගමන්බිමන් ගියේ මා සමඟයි. මීට
පෙර කවදාවත් මම ඔබට මේ විදිහට
සලකලා තියෙනවාද?"[7] බාලාම්ද,
"නැහැ" කියා පිළිතුරු දුන්නේය.
**31** එවිට යෙහෝවා දෙවි බාලාම්ට
තම දූතයාව පැහැදිලිව දකින්න
සැලැස්වූවේය.[1] කඩුවක් අතැතිව
පාර මැද සිටගෙන සිටින යෙහෝවා
දෙවිගේ දූතයාව දුටු විගස බාලාම්
දණින් වැටී පොළොව දෙසට හිස
නමා ඔහුට ආචාර කළේය.
**32** යෙහෝවා දෙවිගේ දූතයා
ඔහුට මෙසේ කීවේය. "තුන් වතා-
වක්ම ඔබ ඔබේ බූරුදෙනට පහර
දුන්නේ ඇයි? මා පැමිණියේ ඔබ
මාගේ කැමැත්තට සම්පූර්ණයෙන්ම
විරුද්ධ වී ඔබේ හිතුමතේට[2] යන
මේ ගමන වැළැක්වීමටයි. **33** ඔබේ
බූරුදෙන තුන් වතාවක් මාව දැක
ආපසු හැරී යෑමට තැත් කළා.[3] ඌ
එසේ නොකළා නම් මේ වන විටත්
මම ඔබව මරා දමලා.[4] නමුත් සතාට
නම් මම කිසි හානියක් කරන්නේ
නැහැ." **34** එවිට බාලාම්, "මගේ
අතින් සිදු වුණේ පාපයක්.[5] මාව
හමු වෙන්න ඔබ පාරේ සිටගෙන
සිටි බව මම දැන සිටියේ නැහැ.
මම යන ගමන ගැන ඔබ සතුටු
නැත්නම් මම ආපහු හැරී යන්නම්"
කියා යෙහෝවා දෙවිගේ දූතයාට
කීවේය. **35** එහෙත් යෙහෝවා දෙ-
විගේ දූතයා බාලාම්ට මෙසේ කීවේය.
"ඔවුන් සමඟ යන්න.[6] ඒත් මා ඔබට
කියන දේ හැර වෙන කිසිවක් ඔවුන්ට
නොකියන්න."[7] බාලාම්ද බාලාක් රජු
එවූ ප්‍රධානීන් සමඟ යන්න ගියේය.
**36** බාලාම් පැමිණ සිටින බව
දැනගත් විගස බාලාක් රජ ඔහුව හමු
වන පිණිස මෝවබ් දේශ සීමාවේ
ආනොන්[8] ඔය අසල තිබෙන නුවර
වෙතට ගියේය. **37** රජ බාලාම්-
ගෙන් මෙසේ ඇසුවේය. "මම ඔබට
එන්න කියා පණිවිඩයක් එවූ විට ඔබ
ආවේ නැත්තේ ඇයි? ඔබව ගෞර-
වයට පත් කරන්න මට නොහැ-
කියි කියා ඔබ සිතුවද?"[9] **38** එවිට
බාලාම්, "ඔබේ ඉල්ලීමට අනුව මම
දැන් මෙහෙට ආවා. නමුත් මා කැමති
දේ කීමට මට කිසි බලයක් නැහැ.[10]

**22 පරි.**
1 නික් 23:21
2 2රාජා 6:17; 1ලේක 21:16
3 හිතෝ 14:16; හිතෝ 27:4
4 මතෙ 19:26; 2පේතෘ 2:16
5 ගණන් 22:32
6 හිතෝ 12:10
7 2පේතෘ 2:16

**2 තීරුව**
1 2රාජා 6:17
2 ගණන් 22:12; ද්වි 23:4; දේශ 9:3; 2පේතෘ 2:15
3 ගණන් 22:23; ගණන් 22:25; ගණන් 22:27
4 හිතෝ 16:25
5 1සාමු 15:24
6 ගීතා 81:12
7 ගණන් 22:20
8 ගණන් 21:26
9 ගණන් 22:17; ගණන් 24:11
10 හිතෝ 19:21

දෙවි කියන දේ මිස වෙන කිසිවක්
කීමට මට නොහැකියි”[1] කියා රජුට
කීවේය.
**39** ඉන්පසු බාලාම්, බාලාක් රජු
සමඟ කිර්යත්-හූෂොත් වෙතට
ගියේය. **40** බාලාක් ගවයන්ව හා
බැටළුවන්ව පූජා කළ පසු[2] එයින්
කොටසක් බාලාම්ටද ඔහු සමඟ සිටි
ප්‍රධානීන්ටද දුන්නේය. **41** පසුවදා
උදෑසන බාලාක් රජ බාලාම් සමඟ
බාමොත්-බාල්*[3] නම් නගරය වෙත
ගියේය. ඔහු බාලාම්ව බාමොත්-බාල්
වෙත ගෙන ගියේ එතැන සිට මුළු
ඊශ්‍රායෙල් සෙනඟ ඔහුට පෙන්වන
පිණිසය.[4]

**23** ඉන්පසු බාලාම් බාලාක්
රජුට කතා කොට, “මේ
ස්ථානයේ පූජාසන හතක් ගොඩ-
නඟන්න.[5] ගවයන් හත්දෙනෙකු
හා බැටළුවන් හත්දෙනෙකු පූජා-
වට සූදානම් කරන්න” කියා කීවේය.
**2** බාලාක් රජ ප්‍රමාද නොවී ඔහු කී
ලෙසම කළේය. ඉන් අනතුරුව ඔවුහු
ඒ එක් එක් පූජාසනය මත ගව-
යෙකු හා බැටළුවෙකු බැගින් ඔප්පු
කළෝය.[6] **3** ඉන්පසු බාලාම්, රජුට
මෙසේ කීවේය. “ඔබ ඔප්පු කළ මේ
දවන පූජා ළඟට වී සිටින්න.[7] මම
ටිකක් එහාට ගොස් එන්නම්. සමහර-
විට යෙහෝවා දෙවි මා ඉදිරියට
ඇවිත් මා සමඟ කතා කරාවි.[8] ඔහු
මට යමක් පැවසුවොත් මම ඇවිත් ඒ
දේ ඔබට කියන්නම්.” එසේ කියා
බාලාම් පාළු කන්දකට ගියේය.
**4** දෙවි බාලාම් සමඟ කතා
කළ විට[9] බාලාම් දෙවිට මෙසේ
කීවේය. “මම එක ළඟ පූජාසන
හතක් සාදා ඒ එක් එක් පූජාස-
නය මත ගවයෙක් හා බැටළුවෙක්
බැගින් පූජා කළා.”[10] **5** යෙහෝවා
දෙවි බාලාම්ට කිව යුතු දේ දැන්වූ පසු
මෙසේ කීවේය.[11] “ඔබ දැන් බාලාක්
ළඟට ගොස් මම පැවසූ දේ ඔහුට
කියන්න.”[12] **6** බාලාම් හැරී ගිය විට
බාලාක් රජු හා මෝවබ්හි ප්‍රධානීන්
දවන පූජා අසල සිටිනවා ඔහු දුටු-
වේය. **7** එවිට බාලාම් මේ පණිවි-
ඩය[1] ඔවුන්ට දැන්වූවේය.

“මෝවබ්හි රජු වන බාලාක්
ආරම්[2] සිට මා කැඳෙව්වේය.
නැඟෙනහිර දිශාවේ තිබෙන
කඳුකරයේ සිට මා කැඳෙව්-
වේය.
‘ඇවිත් මා වෙනුවෙන් යාකොබ්ට
ශාප කරන්න.
ඊශ්‍රායෙල්ව හෙළාදකින්න’
කියා ඔහු මට කීවේය.[3]
**8** දෙවි ශාප නොකළ සෙනඟකට මා
ශාප කරන්නේ කොහොමද?[4]
යෙහෝවා දෙවි හෙළා නොද-
කින සෙනඟක් මා හෙළාද-
කින්නේ කොහොමද?[5]
**9** උස් පර්වත මුදුනේ සිට මට
ඔවුන්ව පෙනේ.
කඳු මුදුනේ සිට මට ඔවුන්ව
පෙනේ.
ඔවුහු තනිව කඳවුරු බැඳගෙන
සිටින්නෝය.[6]
ඔවුහු අනික් ජාතීන්ගෙන්
වෙන්ව සිටින්නෝය.[7]
**10** දූවිලි අංශු මෙන් බහුලව සිටින
යාකොබ්ගේ සෙනඟ ගණන්
කළ හැක්කේ කාටද?[8]
ඊශ්‍රායෙල් සෙනඟගෙන් හත-
රෙන් කොටසක්වත් ගණන්
කළ නොහැකිය.
මගේ මරණයත් ධර්මිෂ්ඨයන්ගේ
මරණය මෙන් වේවා![9]
මගේ අවසානය ඔවුන්ගේ අව-
සානය මෙන් වේවා!”[10]

**11** එවිට බාලාක් රජ, “ඔබ මො-
නවාද මේ කළේ? මම ඔබව කැඳෙව්-
වේ මගේ සතුරන්ට ශාප කරන්න.
නමුත් ඔබ ඔවුන්ට බොහෝ සෙ-
යින් ආශීර්වාද කළා” කියා බාලාම්ට
කීවේය.[11] **12** බාලාම්ද, “යෙහෝවා
දෙවි කී දේ මිස වෙන කිසිවක්
කියන්න මට පුළුවන්කමක් නැහැ”
කියා ඔහුට කීවේය.[12]

---

ගණන් **22:41*** තේරුම, “බාල්ගේ පූජාසන.”

**22 පරි.**
1 ගණන් 23:26, ගණන් 24:13
2 ගණන් 23:14
3 යොෂු 13:15, යොෂු 13:17
4 ගණන් 23:13

**23 පරි.**
5 ගණන් 22:41
6 ගණන් 23:14, ගණන් 23:30
7 ගණන් 23:15
8 ගණන් 23:16, ගණන් 24:1
9 ගණන් 22:20
10 ගණන් 23:2
11 ගණන් 22:35
12 ගණන් 23:3

**2 තීරුව**
1 ගණන් 23:18, ගණන් 24:3
2 උත් 10:22, ගණන් 22:5, ද්වි 23:4
3 ගණන් 22:6
4 ගණන් 22:12, ගණන් 24:10
5 හිතෝ 21:30
6 ලෙවී 20:24, ද්වි 33:28, 1රාජා 8:53, එස්ත 3:8
7 නික් 33:16, ද්වි 32:8
8 උත් 13:16, උත් 22:17, නික් 1:7
9 ගීතා 37:37, ගීතා 116:15, හිතෝ 10:7
10 යොෂු 14:14, යෙසා 26:19, 1කොරි 15:55, හෙබ්‍රෙ 11:35
11 ගණන් 22:11, ගණන් 24:10, යොෂු 24:10, නෙහෙ 13:2, ගීතා 109:28, මීකා 6:5
12 ගණන් 22:38, ගණන් 24:13

13 එවිට බාලාක් රජ ඔහුට මෙසේ
කීවේය. “අපි වෙනත් තැනකට ගිහින්
ඊශ්‍රායෙල්වරුන් දිහා බලමු. එතැ-
නට මුළු සෙනඟවම පෙනෙන්නේ
නැහැ. ඔවුන්ගෙන් කොටසක් පම-
ණයි පෙනෙන්නේ.[1] එතැනට ගොස්
ඔවුන්ට ශාප කරන්න.”[2] 14 එසේ
කියා ඔහු බාලාම්ව පිස්ගා[3] මුදුනේ
තිබෙන ෂොපිම් නම් තණබිමට ගෙන
ගියේය. එම ස්ථානයේදීද ඔහු පූජාසන
හතක් ගොඩනඟා ඒවා මත ගව-
යෙකු හා බැටළුවෙකු බැගින් ඔප්පු
කළේය.[4] 15 එවිට බාලාම්, “මම
ටිකක් එහාට ගොස් දෙවි සමඟ
කතා කරන තුරු ඔබ මේ දවන
පූජා ළඟට වී සිටින්න” කියා රජුට
කීවේය. 16 පසුව යෙහෝවා දෙවි
බාලාම් ඉදිරියට පැමිණ කිව යුතු දේ
දැන්වීමෙන් අනතුරුව ඔහුට මෙසේ
කීවේය.[5] “ඔබ දැන් බාලාක්[6] ළඟට
ගොස් මම පැවසූ දේ ඔහුට කියන්න.”
17 බාලාම් හැරී ගිය විට බාලාක්
රජු හා මෝවබ්හි ප්‍රධානීන් දවන
පූජා අසල සිටිනවා ඔහු දුටුවේය.
බාලාක් රජ බාලාම්ගෙන් මෙසේ ඇසු-
වේය. “යෙහෝවා දෙවි ඔබට පැවසු-
වේ කුමක්ද?” 18 එවිට බාලාම් මේ
පණිවිඩය ඔවුන්ට දැන්වූවේය.[7]

“බාලාක්, දැන් මට සවන් දෙන්න.
ශිප්පෝර්ගේ[8] පුත්‍රය, දැන්
මා කියන දේ අසාගෙන
සිටින්න.
19 මනුෂ්‍යයන් බොරු කීවත් දෙවි
කිසිදාක බොරු කියන්නේ
නැත.[9]
මනුෂ්‍යයන් තමන් ගත් තීරණ
ගැන පසුතැවෙන නමුත්
දෙවි තම තීරණ ගැන පසු-
තැවෙන්නේ නැත.[10]
දෙවි යමක් කීවොත් එය ඉටු
කරන්නේය.
ඔහු යමක් තීන්දු කළොත් එය
එලෙසම කරන්නේය.[11]
20 මාව කැඳවනු ලැබුවේ ආශීර්වාද
කිරීමටය.
දෙවි ඔවුන්ට ආශීර්වාද[12] කළ
පසු මා කෙසේ එය වෙනස්
කරන්නද?[1]
21 කිසි මන්තර බලයකින්[2] යා-
කොබ්ට හානියක් වෙන්නවත්
ඔහු පිටට කිසි විපතක්
ගෙනෙන්නවත් දෙවි ඉඩ
දෙන්නේ නැත.
ඔහුගේ දෙවි වන යෙහෝවා ඔහු
සමඟය.[3]
දෙවි ඔහුගේ රජු බව ප්‍රකාශ
කරනු ලබන්නේය.
22 දෙවි ඊජිප්තු දේශයෙන් ඔවුන්ව
පිටතට ගෙනාවේය.[4]
ඔවුන්ගේ ගමන කුළු හරකෙකු
මෙන් වේගවත්ය.[5]
23 කිසිම මායා බලයකින් යාකොබ්ට
හානි කළ නොහැකිය.[6]
කිසිවිටෙක ඊශ්‍රායෙල්ට විරුද්-
ධව මන්තර ගුරුකම් කිරීමට
නොහැකිය.[7]
සෙනඟ යාකොබ් හා ඊශ්‍රායෙල්
දෙස බලා මෙසේ පවසනු
ඇත.
‘බලන්න, දෙවි කර තිබෙන දේ
මොන තරම් ශ්‍රේෂ්ඨද!’[8]
24 මේ සෙනඟ සිංහයෙකු* මෙන්
පිබිදෙන හැටි බලන්න.
ඔවුහු සිංහයෙකු# මෙන් නැඟි-
ටින්නෝය.[9]
ඔවුහු ගොදුර කා අවසන් වන
තුරු නොනිදන්නෝය.
මැරුම් කෑ අයගේ ලේ බී අවසන්
වන තුරු ඔවුහු ලගින්නේ
නැත.”[10]

25 එය අසා බාලාක් රජ, “ඔවුන්ට
ශාප කරන්න බැරි නම් ඔවුන්ට ආශීර්-
වාද නොකර ඉන්න” කියා බාලාම්ට
කීවේය. 26 බාලාම්, රජුට මෙසේ
කීවේය. “ ‘යෙහෝවා දෙවි කී දේ මිස
වෙන කිසි දෙයක් මට කිව නොහැ-
කියි’ කියා මම ඔබට කලින්ම පැව-
සුවා නේද?”[11]
27 එවිට බාලාක් රජ බාලාම්ට

23 පරි.
1 ගණන් 22:11
2 යොෂු 24:9
3 ද්වි 34:1
4 ගණන් 23:1 ගණන් 23:29
5 ගණන් 22:35 ගණන් 23:5 ගණන් 24:1
6 ගණන් 22:10
7 ගණන් 23:7 ගණන් 24:3
8 ගණන් 22:2 යොෂු 24:9
9 ගීතා 89:35 තීත 1:2
10 1සාමු 15:29 රෝම 11:29
11 යෙසා 14:24 යෙසා 46:10 මීකා 7:20
12 උත් 12:2 උත් 22:17 ගණන් 22:12

2 තීරුව
1 ගණන් 22:18 මලා 3:6
2 1සාමු 15:23
3 නික් 13:21 නික් 23:20 නික් 29:45 නික් 34:9 යෙසා 8:10
4 නික් 20:2
5 ගණන් 24:8
6 උත් 12:3 ගණන් 22:6
7 ගණන් 22:7 ද්වි 18:10 ද්වි 18:12
8 ගීතා 31:19 ගීතා 44:1 ගීතා 126:3 රෝම 11:33
9 උත් 49:9 ගණන් 24:9 හිතෝ 30:30
10 යෙසා 31:4 මීකා 5:8
11 ගණන් 22:38 ගණන් 23:12 ගණන් 24:13

ගණන් 23:24* එනම්, ආසියාතික සිංහයෙකු.
24# එනම්, අප්‍රිකානු සිංහයෙකු.

මෙසේ කීවේය. “මා සමඟ එන්න. මම
දැන් ඔබව වෙන තැනකට ගෙන
යන්නම්. සමහරවිට ඔබට ඒ ස්ථා-
නයේ සිට ඔවුන්ට ශාප කරන්න
සැබෑ දෙවි ඉඩ දෙයි.”[1] **28** ඉන්පසු
බාලාක් රජ බාලාම්ව පෙයෝර් මුදු-
නට ගෙන ගියේය. පෙයෝර් මුදුනේ
සිට බැලූ විට යෙෂිමෝන්[2] පෙ-
නේ. **29** එතැනට ගිය පසු බාලාම්[3]
බාලාක් රජුට මෙසේ කීවේය. “මේ
ස්ථානයෙන් මට පූජාසන හතක් සාදා
දෙන්න. පූජාවට ගවයන් හත්දෙ-
නෙකු හා බැටළුවන් හත්දෙනෙකු
සූදානම් කරන්න.”[4] **30** බාලාක්
රජ, බාලාම් කියූ ලෙසම කළේය. ඒ
එක් එක් පූජාසනය මත ඔහු ගවයෙකු
හා බැටළුවෙකු ඔප්පු කළේය.[5]

**24** ඊශ්‍රායෙල් සෙනඟට ආශීර්-
වාද කිරීමට යෙහෝවා දෙවි
කැමති බව බාලාම් තේරුම්ගත් විට
ඔහු කලින් වතාවලදී කළාක් මෙන්
ඔවුන්ට විරුද්ධව තම මන්තර බලය[6]
යොදාගත හැකිද කියා පරීක්ෂා කර
බැලීමට ගියේ නැත.[7] ඔහු පාළුකරය
දෙස බැලූ විට **2** ඊශ්‍රායෙල් සෙනඟ
තම තමන්ගේ ගෝත්‍රවලට අනුව
කූඩාරම් ගසාගෙන සිටින ආකාරය
දුටුවේය.[8] ඒ අවස්ථාවේදී දෙවිගේ
බලය ඔහු තුළ ක්‍රියාත්මක විය.[9]
**3** එවිට ඔහු මෙම පණිවිඩය[10] දැන්වූ-
වේය.

“ඇස් පැහැදුණා වූ[11] තැනැත්තා
වන බෙයෝර්ගේ පුත්
බාලාම්ගේ වචන අසන්න.
**4** දෙවිගේ වචනය ප්‍රකාශ වූ
තැනැත්තාට ඇහුම්කන්
දෙන්න.[12]
ඇස් ඇරී තිබියදීම බිම වැටී[13]
සියලු බලැති දෙවිගේ දර්ශ-
නයක්[14] දුටු ඒ තැනැත්තා-
ගේ වචන මේවාය.
**5** යාකොබ්, ඔබේ කූඩාරම් කොප-
මණ අලංකාරද! ඊශ්‍රායෙල්,
ඔබේ කඳවුර මොන තරම්
ඇකුම්කලුද![15]
**6** ඒවා ඈතට විහිදී යන විශාල
නිම්න මෙන්ද[1]
ගඟ අසල තිබෙන අලංකාර
උයනක් මෙන්ද[2]
යෙහෝවා දෙවි සිටෙවූ අගිල්
ගස්* මෙන්ද
ජලාශ අසල තිබෙන දේවදාර
ගස් මෙන්ද පෙනේ.[3]
**7** ඔහුගේ භාජනවලින් වතුර ඉතිරී
යන්නේය.
ඔහුගේ බීජ ජලාශ අසල වපු-
රන්නේය.[4]
ඔහුගේ රජ[5] ආගග්ට වඩා උසස්
වන්නේය.[6]
ඔහුගේ රාජ්‍යය විශිෂ්ටාකාර-
යෙන් පිහිටුවනු ලබන්-
නේය.[7]
**8** දෙවි ඊජිප්තු දේශයෙන් ඔහුව පිට-
තට ගෙනාවේය.
ඊශ්‍රායෙල්ගේ ගමන කුළු හර-
කෙකු මෙන් වේගවත්ය.[8]
ඔහුට පීඩා කරන ජාතීන්ව ඔහු
ගිල දමන්නේය.[9]
ඊතල විද ඔවුන්ව සුනුවි-
සුනු කරන්නේය.[10] ඔවුන්ගේ
ඇටකටු කා දමන්නේය.[11]
**9** ඔහු සිංහයෙකු මෙන් බිම දිගා විය.
සිංහයෙකුව අවදි කරන්න තරම්
ධෛර්යය ඇත්තේ කාටද?[12]
ඔබට ආශීර්වාද කරන අයට
ආශීර්වාද ලැබෙනු ඇත.[13]
ඔබට ශාප කරන අය පිටට ශාප
පැමිණෙනු ඇත.”[14]

**10** එවිට බාලාක් රජ මහත් සේ
උදහස් වී තම අත්ලට ගසාගෙන[15]
බාලාම්ට මෙසේ කීවේය. “මා ඔබව
කැඳෙව්වේ සතුරන්ට ශාප කරන්-
නයි.[16] නමුත් ඔබ තුන් වතාවක්ම
ඔවුන්ට බොහෝ සෙයින් ආශීර්වාද
කළා. **11** දැන් ඔබ යන තැන-
කට යන්න. මම හිතාගෙන හිටියේ
ඔබව ගෞරවයට පත් කරන්නයි.[17]
ඒත් යෙහෝවා දෙවි ඊට ඉඩ දුන්නේ
නැහැ.”

**ගණන් 24:6*** සුවඳ පතුරුවන ගස් වර්ගයක්.

**23 පරි.**
1 ගණන් 23:13
2 ගණන් 21:20
3 ගණන් 22:5
4 ගණන් 23:1
5 ගණන් 23:2
ගණන් 23:14

**24 පරි.**
6 උත් 30:27
ලෙවී 19:26
ගණන් 23:23
7 ගණන් 23:3
ගණන් 23:15
8 ගණන් 2:2
ගණන් 23:9
9 ගණන් 11:25
1සාමු 19:20
2ලේක 15:1
1කොරි 12:10
10 ගණන් 23:7
11 ආමෝ 3:7
12 ගණන් 24:16
13 එස 1:28
14 ගණන් 12:6
15 ගණන් 1:52
ගණන් 2:2

**2 තීරුව**
1 ගණන් 2:32
ගණන් 22:11
2 යෙසා 58:11
යෙරෙ 31:12
3 ගීතා 1:3
ගීතා 92:12
යෙරෙ 17:8
4 ද්වි 8:7
5 උත් 49:10
ගීතා 2:6
යොහ 1:49
පිළි 2:10
එළි 19:16
6 ගණන් 24:20
7 1ලේක 14:2
දානි 2:44
ක්‍රියා 5:31
එළි 11:15
8 ගණන් 23:22
9 නික් 23:27
ද්වි 9:5
එළි 19:15
10 ද්වි 32:42
ගීතා 2:9
11 යෙසා 38:13
12 උත් 49:9
13 උත් 12:3
14 උත් 27:29
15 යෝබ් 27:23
නාහූ 3:19
16 ගණන් 22:11
ගණන් 23:11
ද්වි 23:4
යොෂු 24:9
නෙහෙ 13:2
17 ගණන් 22:17
යූද් 11

**12** එවිට බාලාම්, රජුට මෙසේ
කීවේය. “ඔබ මා ළඟට එවූ පණිවිඩ-
කරුවන්ට මම මෙහෙම කිව්වා නේද?
**13** ‘බාලාක් රජ ඔහුගේ මාලිගාව
රන් හා රිදීවලින් පුරවා දුන්නත්
මට යෙහෝවා දෙවිගේ අණට විරුද්-
ධව නම් ක්‍රියා කරන්න බැහැ. මම
හොඳක් හෝ නරකක් හෝ කරන්න
සිතුවත් එය දෙවිගේ කැමැත්තට
විරුද්ධ නම් මට ඒ දේ කරන්න බැහැ.
යෙහෝවා දෙවි පවසන දේ මිස
වෙන කිසිවක් මට කියන්න බැහැ.’[1]
**14** මම මගේ සෙනඟ වෙතට හැරී
යනවා. නමුත් ඊශ්‍රායෙල්වරු මතු
දවස්වලදී ඔබේ සෙනඟට කරන දේ[2]
මම ඔබට කියන්නම්.”[3] **15** ඉන්පසු
ඔහු මෙම අනාවැකිය කීවේය.[4]

“ඇස් පැහැදුණා වූ තැනැත්තා
වන බෙයෝර්ගේ පුත්
බාලාම්ගේ වචන අසන්න.[5]
**16** දෙවිගේ වචනය ප්‍රකාශ වූද[6]
මහෝත්තම දෙවි දෙන දැනුම
ලැබුවා වූද තැනැත්තාගේ
වචන අසන්න.
ඇස් ඇරී තිබියදීම බිම වැටී[7]
සියලු බලැති දෙවිගේ දර්ශ-
නයක් දුටු[8] ඒ තැනැත්තාගේ
වචන මේවාය.
**17** මම ඔහුව දකින්නෙමි.[9] එහෙත්
දැන් නොවේ.
මට ඔහුව පෙනේ. එහෙත් ළඟට
නොපෙනේ.
යාකොබ්ගෙන් පැවතෙන්නන්-
ගෙන් තරුවක්[10] පායනු
ඇත.
ඊශ්‍රායෙල්ගෙන් පැවතෙන්නන්-
ගෙන් රාජ යෂ්ටියක් ඔසවනු
ලබන්නේය.[11]
ඔහු මෝවබ්ගේ හිස කැබලි
කරන්නේය.[12]
කලහකාරී පුත්‍රයන්ගේ හිස්-
කබල කුඩු කර දමන්නේය.
**18** ඊශ්‍රායෙල් එඩිතරව තම බලය
පෙන්වන්නේය.
ඒදොම් තම සතුරන්ගේ උරු-
මය වන්නේය.[13]
සේයිර්[1] තම සතුරන්ට අයිති
වන්නේය.[2]
**19** යාකොබ්ගෙන් පැවතෙන්නෙක්
ඔවුන්ව යටත් කරගන්-
නේය.[3]
ඔහු නුවරේ සිටින කිසිවෙකුව
ඉතුරු නොකරන්නේය.”[4]

**20** බාලාම් අමලෙක්වරුන්ව දැක
මෙම අනාවැකිය කීවේය.[5]

“අමලෙක්වරු ජාතීන් අතරේ ප්‍රථ-
මයෝය.[6]
නමුත් අවසානයේදී ඔවුහු නැන්-
නටම නැති වී යන්නෝය.”[7]

**21** බාලාම්, කේනිවරුන්ව[8] දැක
මෙම අනාවැකිය කීවේය.

“ඔබේ වාසස්ථානය ශක්තිමත්ය.
ඔබේ කැදැල්ල පර්වතයක
පිහිටා තිබේ.
**22** කායින්*[9] ගිනිබත් කිරීමට කෙ-
නෙකු පැමිණෙන්නේය.
ඇසිරියාව තව ස්වල්ප කාලය-
කින් ඔබව වහලුන් ලෙස
ගෙන යන්නේය.”[10]

**23** බාලාම් තවදුරටත් මෙම අනා-
වැකිය ප්‍රකාශ කළේය.

“දෙවි ගෙනෙන විනාශයෙන් ගැල-
විය හැක්කේ කාටද?[11]
**24** කිත්තිම්හි[12] සිට නැව් පැමිණ
ඇසිරියාවට හිරිහැර කරන්-
නෝය.[13]
ඔවුහු ඒබර්ටද හිරිහැර කරන්-
නෝය.
නමුත් අවසානයේදී ඔවුහුද*
විනාශ වී යන්නෝය.”

**25** ඉන්පසු බාලාම් එතැනින්
පිටත්ව ගියේය.[14] බාලාක් රජද එතැ-
නින් යන්න ගියේය.

# 25

ඊශ්‍රායෙල්වරුන් ෂිට්ටිම්හි[15]
ජීවත් වෙමින් සිටි කාල-
යේදී ඊශ්‍රායෙල් පුරුෂයෝ මෝවබ්
ජාතික ස්ත්‍රීන් සමඟ දුරාචාරයේ

**24 පරි.**
1 ගණන් 22:18
ගණන් 22:38
2 යෙරෙ 48:46
3 මීකා 6:5
4 ගණන් 23:7
ගණන් 24:3
5 ගණන් 24:3
6 ගණන් 24:4
7 එස 1:28
8 ගණන් 12:6
9 නික් 33:20
යොහ 1:18
10 2සාමු 7:16
යෙසා 9:7
යෙසා 14:13
යෙරෙ 23:5
එස 21:27
2පේතෘ 1:19
එළි 22:16
11 උත් 49:10
ගීතා 45:6
ගීතා 108:8
ගීතා 110:2
හෙබ්‍රෙ 1:8
12 2සාමු 8:2
1ලේක 18:2
ගීතා 108:9
ගීතා 110:6
යෙරෙ 48:45
13 උත් 27:37
2සාමු 8:14
1ලේක 18:13
ගීතා 60:8
යෙසා 34:5
ආමෝ 9:12

**2 තීරුව**
1 උත් 36:8
යොෂු 24:4
2 1ලේක 4:42
එස 25:14
3 උත් 49:10
ගීතා 2:9
ගීතා 72:11
එළි 6:2
එළි 19:15
4 එළි 19:21
5 ගණන් 23:7
6 නික් 17:8
නික් 17:14
7 ද්වි 25:19
1සාමු 15:3
1ලේක 4:43
8 උත් 15:19
විනි 1:16
9 විනි 4:11
10 2රාජා 15:29
එස්රා 4:2
11 ද්වි 32:39
12 උත් 10:4
යෙසා 23:1
එස 27:6
දානි 11:30
13 නාහු 1:1
නාහු 3:18
14 ගණන් 31:8

**25 පරි.** 15 යොෂු 2:1; මීකා 6:5.

ගණන් **24:22*** එනම්, කේනි ගෝත්‍රය. **24*** මූ.අ., “ඔහුද.”

යෙදෙන්න පටන්ගත්තෝය.[1] 2 ඒ
ස්ත්‍රීහු තමන්ගේ දෙවිවරුන්ට පුදපූජා
ඔප්පු කිරීම සඳහා තමන් සමඟ හවුල්
වීමට ඊශ්‍රායෙල්වරුන්ට ආරාධනා
කළෝය.[2] ඊශ්‍රායෙල්වරුද ඒ දෙවිව-
රුන්ට ඔප්පු කළ පූජා අනුභව කරමින්
දෙවිවරුන් ඉදිරියේ වැඳ වැටුණෝය.[3]
3 මෙසේ ඊශ්‍රායෙල්වරු මෝවබ්වරුන්
සමඟ පෙයෝර්හි බාල්[4] දෙවියාට
නමස්කාර කළෝය. එබැවින් යෙ-
හෝවා දෙවි ඊශ්‍රායෙල් සෙනඟ සමඟ
මහත් සේ උදහස් විය.[5] 4 පසුව
යෙහෝවා දෙවි මෝසෙස්ට මෙසේ
කීවේය. “ඊශ්‍රායෙල් සෙනඟගේ ප්‍රධා-
නීන්ව කැඳවන්න. ඊශ්‍රායෙල්වරුන්ට
විරුද්ධව ඇවිළී තිබෙන යෙහෝවා
දෙවි වන මාගේ උදහස පහව යන
පිණිස ඔවුන්ව මරා දමන්න. ඉන්පසු
යෙහෝවා දෙවි වන මා ඉදිරියෙත් අන්
සියල්ලන්ට පෙනෙන ලෙසත් ඔවුන්-
ගේ මළ සිරුරු එල්ලා තබන්න.”[6]
5 මෝසෙස් ඊශ්‍රායෙල්හි විනිශ්චය-
කරුවන්ව කැඳවා ඔවුන්ට මෙසේ
අණ කළේය.[7] “ඔබ ගොස් පෙයෝර්හි
බාල් දෙවියාට නමස්කාර කළ සෑම
මනුෂ්‍යයෙක්වම මරා දමන්න.”[8]

6 සිදු වූ දේ නිසා මුළු සෙ-
නඟම සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල්
වන ස්ථානයේ හඬා වැලපෙමින්
සිටියෝය. නමුත් එක්තරා ඊශ්‍රා-
යෙල් ජාතිකයෙක්[9] මෝසෙස් හා
මුළු සෙනඟ බලා සිටියදීම මිදියන්
ජාතික ස්ත්‍රියකව[10] කඳවුරට කැඳවා-
ගෙන ආවේය. 7 පූජක ආරොන්ගේ
පුත්‍රයා වූ එලියාසර්ගේ පුත් පිනෙ-
හාස්,[11] ඔවුන්ව දුටු විගස හෙල්ලයක්
අතට ගෙන 8 ඊශ්‍රායෙල් ජාතිකයා-
ගේ කූඩාරම ඇතුළට දුව ගොස්
දෙදෙනාටම එයින් ඇන මරා දැමු-
වේය. පිනෙහාස් මිදියන් ජාතික
ස්ත්‍රියගේ බඩ පසාරු කරගෙන යන
ලෙස ඇයට ඇන්නේය. ඉන්පසු දෙවි
ඊශ්‍රායෙල් සෙනඟ පිටට ගෙනා වසං-
ගතය නතර විය.[12] 9 ඒ වසංගත-
යෙන් මිනිස්සු විසිහතරදහසක් මිය
ගියෝය.[13]

10 පසුව යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. 11 “පූජක
ආරොන්ගේ පුත්‍රයා වූ එලියාසර්ගේ
පුත් පිනෙහාස්[1] නිසා මාගේ උදහස
පහව ගියේය.[2] ඊශ්‍රායෙල් සෙනඟ මට
විරුද්ධව කළ ද්‍රෝහිකම් ඔහු කො-
හෙත්ම ඉවසුවේ නැත. ඔවුන්ගේ
ද්‍රෝහිකම් නතර කර දැමීමට ඔහු
පියවර ගත්තේය.[3] ඔහු එලෙස ක්‍රියා
නොකළා නම් මම ඊශ්‍රායෙල් සෙ-
නඟව විනාශ කර දමන්නෙමි. මන්ද
වෙනත් දෙවිවරුන්ට කරන නමස්කා-
රය මම දැඩි ලෙස හෙළාදකිමි.[4]
12 ඔබ මේ දේ ඔහුට කියන්න. ‘මම
ඔහු සමඟ සාම ගිවිසුමක් ඇති කර-
ගන්නෙමි. 13 ඔහු සහ ඔහුගෙන්
පැවතෙන අය හැමදාටම පූජකයන්
ලෙස මා ඉදිරියේ සේවය කරනු ඇත.[5]
තම දෙවිට විරුද්ධව[6] කළ ද්‍රෝහිකම්
ඔහු කිසිසේත් නොඉවසා ඊශ්‍රායෙල්
සෙනඟ කළ පාපයට සමාව ලබා-
ගන්නා පිණිස ක්‍රියා කළ බැවින්[7] මම
ඔහු සමඟ එම ගිවිසුම පිහිටුවාගන්-
නෙමි.’ ”

14 මිදියන් ජාතික ස්ත්‍රිය සමඟ
මරා දැමූ ඊශ්‍රායෙල් ජාතික පුරුෂ-
යාගේ නම සිම්රීය. ඔහුගේ පියා
සිමියොන් ගෝත්‍රයේ ප්‍රධානියෙකු[8]
වූ සාලුය. 15 මරා දැමූ මිදියන්[9]
ජාතික ස්ත්‍රියගේ නම කොස්බීය.
ඇගේ පියා මිදියන්හි පෙළපතකට
අයිති ගෝත්‍රයක නායකයෙකු වූ
ෂූර්ය.[10]

16 යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. 17 “මිදියන්වරුන්ට
පීඩා කර ඔවුන්ට පහර දෙන්න.[11]
18 මන්ද ඔවුහු කපටි[12] ලෙස ක්‍රියා
කර පෙයෝර් හා සම්බන්ධ කාරණ-
යේදී[13] ඔබව පාපයට පොළඹවා ඔබ
පිටට විපත්ති ගෙනාවෝය. පෙයෝර්
නිසා ඔබ පිටට වසංගතයක්[14] ගෙනා
දවසේදී මරණයට පත් වූ[15] මිදියන්හි
නායකයෙකුගේ දියණිය වූ කොස්බී[16]
මාර්ගයෙනුත් ඔවුහු ඔබව පාපයට
පෙලඹුවෝය.”

**25 පරි.**

1 ගණන් 31:16
1කොරි 10:8
එළි 2:14
2 නික් 34:15
1රාජා 11:2
ක්‍රියා 15:29
1කොරි 10:20
3 නික් 20:5
යොෂු 23:7
1කොරි 10:7
4 ද්වි 4:3
යොෂු 22:17
ගීතා 106:28
හොෂෙ 9:10
5 ගීතා 106:29
6 2සාමු 21:6
7 නික් 18:21
8 නික් 22:20
නික් 32:27
ද්වි 13:8
ද්වි 13:9
1රාජා 18:40
9 ගණන් 25:14
10 ගණන් 25:15
11 නික් 6:25
යොෂු 22:30
1ලේක 6:4
12 නික් 23:21
ගීතා 106:30
13 ගණන් 25:4
ද්වි 4:3
1කොරි 10:8

**2 තීරුව**

1 ගණන් 25:7
2 ගීතා 106:30
3 ගීතා 106:31
2කොරි 11:2
4 නික් 20:5
නික් 34:14
ද්වි 4:24
යොෂු 24:19
5 1ලේක 6:4
1ලේක 6:50
එස්රා 7:5
එස්රා 8:2
6 1රාජා 19:10
7 නික් 32:30
8 ගණන් 1:16
9 උත් 25:2
1ලේක 1:32
10 ගණන් 31:8
යොෂු 13:21
11 ගණන් 31:2
12 ගණන් 31:16
2පේත්‍රු 2:14
එළි 2:14
13 ගණන් 25:3
නෙහෙ 13:2
2පේත්‍රු 2:15
යූද් 11
14 ගණන් 25:9
15 ගණන් 25:8
16 ගණන් 25:15

**26** වසංගතය අවසන් වූ පසු[1]
යෙහෝවා දෙවි මෝසෙස්ට
හා පූජක ආරොන්ගේ පුත්‍රයා වන එලි-
යාසර්ට මෙසේ කීවේය. 2 “ඊශ්‍රා-
යෙල්හි හමුදාවට බඳවාගත හැකි
වයස අවුරුදු විස්සක් හෝ ඊට වැඩි
සියලුදෙනාවම තම තමන්ගේ පෙ-
ළපතට අනුව ගණන් කරන්න.”[2]
3 යොර්දාන් ගඟ හා යෙරිකෝව[3]
අසල තිබෙන මෝවබ් පාළුකර-
යේදී[4] මෝසෙස් හා පූජක එලියාසර්[5]
ඔවුන්ට මෙසේ කීවෝය. 4 “සෙ-
නඟ අතරේ සිටින වයස අවුරුදු
විස්සක් හෝ ඊට වැඩි සියලුදෙ-
නාවම ගණන් කරන්න. යෙහෝවා
දෙවි මෝසෙස්ට අණ කළ ලෙස
කරන්න.”[6]

ඊජිප්තු දේශයෙන් පිටතට ආ
ඊශ්‍රායෙල් සෙනඟගේ නම් මේවාය.
5 රූබෙන් ඊශ්‍රායෙල්ගේ කුලුඳුල් පුත්‍ර-
යාය.[7] රූබෙන්ගේ පුත්‍රයෝ මොවු-
හුය. හනොක්ගෙන්[8] හනොක් නම්
පවුල බිහි විය. පල්ලූගෙන්[9] පල්ලූ
නම් පවුල බිහි විය. 6 හෙස්‍රොන්-
ගෙන්[10] හෙස්‍රොන් නම් පවුල බිහි
විය. කාමීගෙන්[11] කාමී නම් පවුල
බිහි විය. 7 රූබෙන්ගේ පුත්‍රයන්ගේ
නම්වලින් බිහි වූ පවුල් ඒවාය. ඔවුන්-
ගේ පවුල්වල ලියාපදිංචි කළ අයගේ
මුළු ගණන හතළිස්තුන්දහස් හත්සිය
තිහක් විය.[12]

8 පල්ලූගේ පුත්‍රයා එලියාබ්ය.
9 එලියාබ්ගේ පුත්‍රයෝ නම් නෙමු-
වෙල්, දාතාන් සහ අබිරාම්ය.
දාතාන්[13] හා අබිරාම්[14] කාරණා
සාකච්ඡා කිරීම සඳහා නිතරම කැඳ-
වනු ලැබූ කීර්තිමත් මනුෂ්‍යයෝ
වූහ. නමුත් කෝරාගේ[15] සෙනඟ යෙ-
හෝවා දෙවිට විරුද්ධව කැරලිගැසූ
අවස්ථාවේදී ඔවුහුද ඔවුන්ට එකතු වී
මෝසෙස්ට හා ආරොන්ට විරුද්ධව
මැසිවිලි නැඟුවෝය.

10 ඒ අවස්ථාවේදී පොළොව එහි
කට ඇර ඔවුන්ව ගිලගත්තේය.[16]
දෙවි ගින්නක් එවා කෝරාවද ඔහු
සමඟ සිටි මනුෂ්‍යයන් දෙසිය පනස්-
දෙනාවද විනාශ කළේය.[1] එම සිද්ධිය
ඊශ්‍රායෙල් සෙනඟට අනතුරු ඇඟ-
වීමක් විය.[2] 11 නමුත් කෝරාගේ
පුත්‍රයෝ ඔවුන් සමඟ මිය ගියේ
නැත.[3]

12 සිමියොන්ගේ[4] පුත්‍රයෝ මොවු-
හුය. නෙමුවෙල්ගෙන්[5] නෙමුවෙල්*
නම් පවුල බිහි විය. යාමින්ගෙන්[6]
යාමින් නම් පවුල බිහි විය. යාකින්-
ගෙන්[7] යාකින් නම් පවුල බිහි විය.
13 සේරාගෙන් සේරා* නම් පවුල බිහි
විය. ෂාවුල්ගෙන්[8] ෂාවුල් නම් පවුල
බිහි විය. 14 සිමියොන්ගේ පුත්‍රයන්-
ගේ නම්වලින් බිහි වූ පවුල් ඒවාය.
ඔවුන්ගේ පවුල්වල ලියාපදිංචි කළ
අයගේ මුළු ගණන විසිදෙදහස් දෙසි-
යයක් විය.[9]

15 ගාද්ගේ[10] පුත්‍රයෝ මොවුහුය.
ෂෙපොන්ගෙන්* ෂෙපොන් නම් පවුල
බිහි විය. හග්ගීගෙන් හග්ගී නම් පවුල
බිහි විය. ෂූනීගෙන් ෂූනී නම් පවුල
බිහි විය. 16 ඔෂ්නීගෙන්* ඔෂ්නී
නම් පවුල බිහි විය. ඒරීගෙන් ඒරී
නම් පවුල බිහි විය. 17 අරොද්ගෙන්
අරොද් නම් පවුල බිහි විය. අරේලී-
ගෙන්[11] අරේලී නම් පවුල බිහි විය.
18 ගාද්ගේ පුත්‍රයන්ගේ නම්වලින් බිහි
වූ පවුල් ඒවාය. ඔවුන්ගේ පවුල්වල
ලියාපදිංචි කළ අයගේ මුළු ගණන
හතළිස්දහස් පන්සියයක් විය.[12]

19 ඒර්[13] හා ඕනාන්[14] යූදාගේ[15]
පුත්‍රයෝය. නමුත් ඒර් හා ඕනාන්
කානාන් දේශයේදී මිය ගියෝය.[16]
20 යූදාගේ පුත්‍රයෝ මොවුහුය. ෂේ-
ලාගෙන්[17] ෂේලා නම් පවුල බිහි
විය. පේරෙස්ගෙන්[18] පේරෙස් නම්
පවුල බිහි විය. සේරාගෙන්[19] සේරා
නම් පවුල බිහි විය. 21 පේරෙස්ගේ
පුත්‍රයෝ මොවුහුය. හෙස්‍රොන්ගෙන්[20]

**26 පරි.**
1 ගණන් 25:5
ගණන් 25:8
2 නික් 30:12
නික් 38:26
ගණන් 1:2
3 ද්වි 34:3
යොෂු 6:1
4 ගණන් 22:1
ගණන් 31:12
ගණන් 33:48
5 ගණන් 20:26
6 ගණන් 1:3
7 උත් 29:32
උත් 46:8
1ලේක 5:1
8 නික් 6:14
9 උත් 46:9
10 1ලේක 5:3
11 නික් 6:14
12 ගණන් 1:21
13 ගණන් 16:24
ද්වි 11:6
14 ගණන් 16:1
ගණන් 16:12
ගණන් 16:27
ගීතා 106:17
15 ගණන් 16:5
ගණන් 16:19
යූද් 11
16 ගණන් 16:32

**2 තීරුව**
1 ගණන් 16:35
ගීතා 106:18
2 ගණන් 16:38
එස 14:8
1කොරි 10:11
2පේතෘ 2:6
3 නික් 6:24
ගණන් 26:58
ගීතා 42:පෙර
ගීතා 45:පෙර
4 උත් 35:23
උත් 46:10
5 උත් 46:10
6 1ලේක 4:24
7 නික් 6:15
8 1ලේක 4:24
9 ගණන් 1:23
10 උත් 35:26
11 උත් 46:16
12 ගණන් 1:25
13 උත් 38:3
14 උත් 38:4
1ලේක 2:3
15 උත් 29:35
උත් 49:10
1ලේක 5:2
හෙබ්‍රෙ 7:14
16 උත් 38:7
උත් 38:9
උත් 38:10
17 උත් 38:5
උත් 38:26
1ලේක 4:21
18 උත් 38:29
උත් 46:12
රූත් 4:18
මතෙ 1:3

**19** උත් 38:30; 1ලේක 2:4; **20** රූත් 4:19.

**ගණන් 26:12*** උත් 46:10හි සඳහන් වන්නේ, “යෙමුවෙල්” ලෙසයි. **13*** උත් 46:10හි සඳහන් වන්නේ, “ෂෝහර්” ලෙසයි. **15*** උත් 46:16හි සඳහන් වන්නේ, “ෂිපියොන්” ලෙසයි. **16*** උත් 46:16හි සඳහන් වන්නේ, “එෂ්බොන්” ලෙසයි.

හෙස්‍රොන් නම් පවුල බිහි විය. හාමුල්-
ගෙන්[1] හාමුල් නම් පවුල බිහි විය.
**22** යූදාගේ[2] පුත්‍රයන්ගේ නම්වලින්
බිහි වූ පවුල් ඒවාය. ඔවුන්ගේ පවුල්-
වල ලියාපදිංචි කළ අයගේ මුළු
ගණන හැත්තෑහයදහස් පන්සියයක්
විය.[3]

**23** ඉසකාර්ගේ[4] පුත්‍රයෝ මොවු-
හුය. තෝලාගෙන්[5] තෝලා නම් පවුල
බිහි විය. පූවාගෙන් පූනි නම් පවුල බිහි
විය. **24** යාෂුබ්ගෙන්* යාෂුබ් නම්
පවුල බිහි විය. ෂිම්රොන්ගෙන්[6] ෂිම්-
රොන් නම් පවුල බිහි විය. **25** ඉස-
කාර්ගේ පුත්‍රයන්ගේ නම්වලින් බිහි වූ
පවුල් ඒවාය. ඔවුන්ගේ පවුල්වල ලියා-
පදිංචි කළ අයගේ මුළු ගණන හැටහ-
තරදහස් තුන්සියයක් විය.[7]

**26** සෙබ්‍යූලන්ගේ[8] පුත්‍රයෝ මොවු-
හුය. සෙරෙද්ගෙන් සෙරෙද් නම් පවුල
බිහි විය. ඒලොන්ගෙන් ඒලොන් නම්
පවුල බිහි විය. යාලෙයෙල්ගෙන්[9]
යාලෙයෙල් නම් පවුල බිහි විය.
**27** සෙබ්‍යූලන්ගේ පුත්‍රයන්ගේ නම්ව-
ලින් බිහි වූ පවුල් ඒවාය. ඔවුන්ගේ
පවුල්වල ලියාපදිංචි කළ අයගේ මුළු
ගණන හැටදහස් පන්සියයක් විය.[10]

**28** යෝසෙප්ගේ[11] පුත්‍රයෝ නම්
මනස්සේ හා එප්‍රායිම්ය.[12] **29** මනස්-
සේගේ[13] පුත්‍රයෝ මොවුහුය. මාකීර්-
ගෙන්[14] මාකීර් නම් පවුල බිහි විය.
මාකීර්ගේ පුත්‍රයා ගිලියද්ය.[15] ගිලි-
යද්ගෙන් ගිලියද් නම් පවුල බිහි
විය. **30** ගිලියද්ගේ පුත්‍රයෝ මොවු-
හුය. ඊයෙසෙර්ගෙන්[16] ඊයෙසෙර් නම්
පවුල බිහි විය. හේලෙක්ගෙන් හේ-
ලෙක් නම් පවුල බිහි විය. **31** අස්‍රි-
යෙල්ගෙන් අස්‍රියෙල් නම් පවුල බිහි
විය. ෂෙකෙම්ගෙන් ෂෙකෙම් නම්
පවුල බිහි විය. **32** ෂෙමිදාගෙන්[17]
ෂෙමිදා නම් පවුල බිහි විය. හේෆෙර්-
ගෙන්[18] හේෆෙර් නම් පවුල බිහි විය.
**33** හේෆෙර්ගේ පුත්‍රයා වූ ෂෙලොපෙ-
හාද්ට පුත්‍රයෝ සිටියේ නැත. නමුත්
ඔහුට දූවරු සිටියෝය.[1] ඔවුන්ගේ නම්
මේවාය. මාලාහ්, නෝවා, හොග්ලා,
මිල්කා හා තිර්ෂාය.[2] **34** මනස්සේ-
ගේ පුත්‍රයන්ගේ නම්වලින් බිහි වූ පවුල්
ඒවාය. ඔවුන්ගේ පවුල්වල ලියාපදිංචි
කළ අයගේ මුළු ගණන පනස්දෙදහස්
හත්සියයක් විය.[3]

**35** එප්‍රායිම්ගේ[4] පුත්‍රයෝ මොවු-
හුය. ෂුතෙලාගෙන්[5] ෂුතෙලා නම්
පවුල බිහි විය. බෙකෙර්ගෙන් බෙ-
කෙර් නම් පවුල බිහි විය.
තහන්ගෙන්[6] තහන් නම් පවුල බිහි
විය. **36** ෂුතෙලාගේ පුත්‍රයෝ මො-
වුහුය. ඒරාන්ගෙන් ඒරාන් නම් පවුල
බිහි විය. **37** එප්‍රායිම්ගේ[7] පුත්‍රයන්-
ගේ නම්වලින් බිහි වූ පවුල් ඒවාය.
ඔවුන්ගේ පවුල්වල ලියාපදිංචි කළ
අයගේ මුළු ගණන තිස්දෙදහස් පන්සි-
යයක් විය. යෝසෙප්ගේ පුත්‍රයන්-
ගෙන් පැවත ආ පවුල් ඒවාය.[8]

**38** බෙන්ජමින්ගේ[9] පුත්‍රයෝ මො-
වුහුය. බෙලාගෙන්[10] බෙලා නම් පවුල
බිහි විය. අෂ්බෙල්ගෙන්[11] අෂ්බෙල්
නම් පවුල බිහි විය. අහිරාම්ගෙන්*
අහිරාම් නම් පවුල බිහි විය. **39** ෂෙ-
පූපාම්ගෙන්* ෂප්පිම් නම් පවුල බිහි
විය. හූෆාම්ගෙන්#[12] හූෆාම් නම් පවුල
බිහි විය. **40** බෙලාගේ පුත්‍රයන්ගේ
නම් මේවාය. අර්ද් හා නාමන්ය.[13] ඒ
දෙදෙනාගේ නම්වලින්ද පවුල් බිහි
විය. **41** බෙන්ජමින්ගේ[14] පුත්‍රයන්-
ගේ නම්වලින් බිහි වූ පවුල් ඒවාය.
ඔවුන්ගේ පවුල්වල ලියාපදිංචි කළ
අයගේ මුළු ගණන හතළිස්පන්දහස්
හයසියයක් විය.[15]

**42** දාන්ගෙන්[16] පැවතෙන්නෝ
මොවුහුය. ෂුහාම්ගෙන්* ෂුහාම් නම්
පවුල බිහි විය. දාන්ගේ[17] පුත්‍රයා-
ගේ නමින් බිහි වූ පවුල එයයි.
**43** ෂුහාම්ගේ පුත්‍රයාගේ නමින් බිහි වූ

---

**ගණන් 26:24*** උත් 46:13හි සඳහන් වන්නේ, "යොබ්" ලෙසයි.

**ගණන් 26:38*** උත් 46:21හි සඳහන් වන්නේ, "ඒහී" ලෙසයි. **39*** උත් 46:21හි සඳහන් වන්නේ, "මප්පිම්" ලෙසයි. 1ලේක 7:12හි සඳහන් වන්නේ, "ෂප්පිම්" ලෙසයි. **39#** උත් 46:21හි සඳහන් වන්නේ, "හප්පිම්" ලෙසයි. **42*** උත් 46:23හි සඳහන් වන්නේ, "හුෂිම්" ලෙසයි.

---

**26 පරි.**
**1** උත් 46:12; 1ලේක 2:5
**2** උත් 49:8
**3** ගණන් 1:27
**4** උත් 30:18; උත් 35:23; උත් 46:13
**5** 1ලේක 7:2
**6** 1ලේක 7:1
**7** ගණන් 1:29
**8** උත් 30:20
**9** උත් 46:14
**10** ගණන් 1:31
**11** උත් 30:24; උත් 35:24
**12** උත් 41:52; උත් 46:20; ද්වි 33:17
**13** උත් 41:51; උත් 48:5
**14** උත් 50:23; ගණන් 36:1; ද්වි 3:15; 1ලේක 7:14
**15** යොෂු 17:1
**16** යොෂු 17:2
**17** යොෂු 17:2
**18** ගණන් 27:1

**2 තීරුව**
**1** ගණන් 27:7; ගණන් 36:2; යොෂු 17:3; 1ලේක 7:15
**2** ගණන් 27:1; ගණන් 36:11
**3** ගණන් 1:35
**4** උත් 41:52
**5** 1ලේක 7:20
**6** 1ලේක 7:25
**7** උත් 48:20; යොෂු 17:17
**8** ගණන් 1:33
**9** උත් 35:24
**10** 1ලේක 7:6
**11** 1ලේක 8:1
**12** උත් 46:21
**13** උත් 46:21; 1ලේක 8:7
**14** උත් 49:27; විනි 1:21
**15** ගණන් 1:37
**16** උත් 49:16
**17** උත් 30:6

පවුලේ ලියාපදිංචි කළ අයගේ මුළු
ගණන හැටහතරදහස් හාරසියයක්
විය.[1]
**44** ආෂේර්ගේ[2] පුත්‍රයෝ මොවුහුය.
ඉම්නාහ්ගෙන්[3] ඉම්නාහ් නම් පවුල
බිහි විය. ඉෂ්වීගෙන්[4] ඉෂ්වී නම්
පවුල බිහි විය. බෙරීයාගෙන් බෙරීයා
නම් පවුල බිහි විය. **45** බෙරීයා-
ගේ පුත්‍රයෝ මොවුහුය. හෙබෙර්ගෙන්
හෙබෙර් නම් පවුල බිහි විය. මල්කි-
යෙල්ගෙන්[5] මල්කියෙල් නම් පවුල
බිහි විය. **46** ආෂේර්ගේ දියණිය-
ගේ නම සෙරාය.[6] **47** ආෂේර්ගේ[7]
පුත්‍රයන්ගේ නම්වලින් බිහි වූ පවුල්
ඒවාය. ඔවුන්ගේ පවුල්වල ලියාපදිංචි
කළ අයගේ මුළු ගණන පනස්තුන්ද-
හස් හාරසියයක් විය.[8]
**48** නප්තලීගේ[9] පුත්‍රයෝ මොවු-
හුය. යාෂෙයෙල්ගෙන්[10] යාෂෙයෙල්
නම් පවුල බිහි විය. ගුනීගෙන්[11] ගුනී
නම් පවුල බිහි විය. **49** යේෂෙර්-
ගෙන්[12] යේෂෙර් නම් පවුල බිහි විය.
ෂිල්ලෙම්ගෙන්[13] ෂිල්ලෙම් නම් පවුල
බිහි විය. **50** නප්තලීගේ[14] පුත්‍රයන්-
ගේ නම්වලින් බිහි වූ පවුල් ඒවාය.
ඔවුන්ගේ පවුල්වල ලියාපදිංචි කළ
අයගේ මුළු ගණන හතළිස්පන්දහස්
හාරසියයක් විය.[15]
**51** ඊශ්‍රායෙල් සෙනඟ අතරින්
ලියාපදිංචි කළ අයගේ මුළු ගණන
හයලක්ෂ එක්දහස් හත්සිය තිහක්
විය.[16]
**52** පසුව යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. **53** “නම්
වශයෙන් ලියාපදිංචි කළ අයගේ
ගණනට අනුව දේශයේ ඉඩම් කො-
ටස්වලට බෙදා උරුමයක් ලෙස
ඔවුන්ට දෙන්න.[17] **54** විශාල පවුල්-
වලට විශාල කොටසක් දෙන්න.
කුඩා පවුල්වලට කුඩා කොටසක්
දෙන්න.[18] එක් එක් පවුල්වල ලියාප-
දිංචි කළ අයගේ ගණනට ප්‍රමාණවත්
වන ලෙසින් උරුමය ලබා දෙන්න.
**55** දේශයේ ඉඩම් බෙදා දිය යුත්තේ
ආදූ දැමීමෙන්ය.[19] එක් එක් පවුල්
අයිති වන්නේ කුමන ගෝත්‍රයටද
කියා සොයා බලා ඒ අනුව ඔවුන්ගේ
උරුමය තීරණය කරන්න. **56** ආදූ
දමා විශාල පවුල්වලට හා කුඩා
පවුල්වලට ලබා දිය යුතු කොටස
තීරණය කළ යුතුයි.”
**57** ලෙවීවරුන්ගේ[1] පෙළපත් මේ-
වාය. ගේර්ෂොන්ගෙන්[2] ගේර්ෂොන්ව-
රුද කෝහාත්ගෙන්[3] කෝහාත්වරුද
මෙරාරීගෙන්[4] මෙරාරීවරුද බිහි වූහ.
ඒ සියලුදෙනාවම ලියාපදිංචි කරනු
ලැබීය. **58** ලෙවීවරුන්ගේ පෙළ-
පත්වලට අයත් ලිබ්නි,[5] හෙබ්‍රොන්,[6]
මාලි,[7] මූෂී[8] හා කෝරා[9] යන අයගේ
නම්වලින් එක් එක් පවුල්ද බිහි විය.
කෝහාත්ට[10] අම්රාම්[11] නම් පුත්‍ර-
යෙක් සිටියේය. **59** අම්රාම්ගේ
භාර්යාවගේ නම යොකෙබෙද්ය.[12]
ඇය ලෙවීගේ දුවක්ය. ඇය ඉපදුණේ
ඊජිප්තු දේශයේදීය. අම්රාම් හා යො-
කෙබෙද්ගේ දරුවෝ වූයේ ආරොන්,
මෝසෙස් හා ඔවුන්ගේ සහෝදරිය
වූ මිරියම්ය.[13] **60** නාදාබ්, අබිහු,[14]
එලියාසර් හා ඉතමාර්[15] ආරොන්ගේ
පුත්‍රයෝ වූහ. **61** නමුත් යෙහෝවා
දෙවිගේ නීතියට පටහැනිව දෙවි ඉදි-
රියේ ගින්නක් ඔප්පු කළ නිසා නාදාබ්
හා අබිහු මිය ගියෝය.[16]
**62** මාසයක් හෝ ඊට වඩා වැඩි
වයසැති ලෙවී පුරුෂයන්ගේ ලියාප-
දිංචි කළ මුළු ගණන විසිතුන්දහ-
සක් විය.[17] ඊශ්‍රායෙල් සෙනඟට මෙන්
ඔවුන්ට දේශයේ උරුමයක් ලැබු-
ණේ නැති නිසා[18] ලෙවීවරුන්ව ඊශ්‍රා-
යෙල් සෙනඟ සමඟ ලියාපදිංචි කළේ
නැත.[19]
**63** මෝසෙස් හා පූජක එලියාසර්
යොර්දාන් හා යෙරිකෝව[20] අසල
තිබෙන මෝවබ් පාළුකරයේදී ලියාප-
දිංචි කළ අය ඔවුහුය. **64** සීනයි
පාළුකරයේදී මෝසෙස් හා පූජක
ආරොන් ලියාපදිංචි කළ අයගෙන්
එක් කෙනෙක්වත් මෝවබ් පාළුකර-
යේදී ලියාපදිංචි කළ සෙනඟ අත-

**26 පරි.**
**1** ගණන් 1:39
**2** උත් 30:13, උත් 35:26
**3** උත් 46:17
**4** 1ලේක 7:30
**5** උත් 46:17
**6** 1ලේක 7:30
**7** උත් 49:20, ද්වි 33:24
**8** ගණන් 1:41
**9** උත් 30:8, උත් 35:25
**10** උත් 46:24
**11** 1ලේක 7:13
**12** උත් 46:24
**13** 1ලේක 7:13
**14** උත් 49:21
**15** ගණන් 1:43
**16** නික් 38:26, ගණන් 1:46, ගණන් 1:49, ගණන් 2:32, ගණන් 14:29, නෙහෙ 9:23
**17** යොෂු 11:23, යොෂු 14:1
**18** ගණන් 33:54, යොෂු 17:14
**19** ගණන් 34:13, යොෂු 14:2, යොෂු 17:4, යොෂු 18:6, හිතෝ 16:33

**2 තීරුව**
**1** නික් 6:19, ගණන් 3:15, යොෂු 18:7
**2** උත් 46:11, ගණන් 3:17, යොෂු 21:6
**3** නික් 6:16, ගණන් 3:19, යොෂු 21:4
**4** යොෂු 21:7, 1ලේක 6:1
**5** නික් 6:17, ගණන් 3:18
**6** ගණන් 3:27, 1ලේක 6:2
**7** නික් 6:19, ගණන් 3:33, 1ලේක 23:21
**8** ගණන් 3:20, 1ලේක 23:23
**9** නික් 6:24, 1ලේක 6:33, 1ලේක 6:37
**10** 1ලේක 23:12
**11** නික් 6:18, ගණන් 3:19
**12** නික් 2:1, නික් 6:20
**13** නික් 15:20, මීකා 6:4
**14** නික් 6:23, නික් 24:9, ලෙවී 10:1
**15** ලෙවී 10:16, ගණන් 3:2

**16** ලෙවී 10:2; ගණන් 3:4; 1ලේක 24:2; **17** ගණන් 3:39; **18** ගණන් 18:24; ද්වි 10:9; ද්වි 14:27; යොෂු 14:3; **19** ගණන් 1:49; **20** ගණන් 26:3.

රේ සිටියේ නැත.[1] 65 මන්ද ඔවුන්
අනිවාර්යයෙන්ම පාළුකරයේදී මිය
යන බව යෙහෝවා දෙවි කලින්
පවසා තිබිණ.[2] එබැවින් යෙෆුන්-
නෙගේ පුත්‍රයා වන කාලෙබ් හා
නූන්ගේ පුත්‍රයා වන යොෂුවා හැර
කලින් ලියාපදිංචි කරනු ලැබූ අය-
ගෙන් වෙන කිසිවෙක් ඔවුන් අතරේ
සිටියේ නැත.[3]

**27** මනස්සේ[4] යෝසෙප්ගේ පුත්‍ර-
යාය. මාකීර් මනස්සේගේ
පුත්‍රයාය. ගිලියද් මාකීර්ගේ පුත්‍රයාය.
ගිලියද්ගේ පුත්‍රයා වන හේෆෙර්, ෂෙ-
ලොපෙහාද්ගේ[5] පියාය. ෂෙලොපෙ-
හාද්ගේ දූවරුන් මාලාහ්, නෝවා,
හොග්ලා, මිල්කා සහ තිර්ෂාය.[6]
එක් දිනක් ඔහුගේ දූවරු පස්දෙනා
**2** සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල්
වන ස්ථානය වෙතට ඇවිත්[7] මෝ-
සෙස්, පූජක එලියාසර්, අධිපතීන් හා
මුළු සෙනඟ ඉදිරියේ මෙසේ කීවෝය.
**3** "අපේ පියා පාළුකරයේදී මිය ගියා.[8]
නමුත් ඔහු මිය ගියේ යෙහෝවා දෙ-
විට විරුද්ධව කැරලිගැසූ කෝරාගේ
සෙනඟට එකතු වුණ නිසා නෙ-
වෙයි.[9] ඔහු මිය ගියේ ඔහුගේම පාපය
නිසයි.[10] අපේ පියාට පුත්‍රයන් සිටි-
යේ නැහැ. **4** පුත්‍රයන් නැති නිසාම
ඔහුගේ පෙළපතෙන් ඔහුගේ නම
ඉවත් කරන්න එපා.[11] අපේ පියා-
ගේ සහෝදරයන්ට උරුමයක් දෙන
විට අපටත් උරුමයක් දෙන්න."[12]
**5** පසුව මෝසෙස් ඔවුන් කී කාරණය
ගැන යෙහෝවා දෙවිගෙන් විමසූ-
වේය.[13]

**6** එවිට යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ පිළිතුරු දුන්නේය.
**7** "ෂෙලොපෙහාද්ගේ දූවරුන්ගේ ඉල්-
ලීම සාධාරණයි. ඔවුන්ගේ පියා-
ගේ සහෝදරයන්ට උරුමයක් දෙන
විට ඔවුන්ටත් උරුමයක් ලබා දිය
යුතුයි. ඔවුන්ගේ පියාගේ උරුමය
ඔවුන්ට ලබා දෙන්න.[14] **8** ඔබ ඊශ්‍රා-
යෙල් සෙනඟට මෙසේ කියන්න. 'යම්
මිනිසෙකු පුත්‍රයෙකු නොලැබ මිය
ගියොත් ඔහුගේ උරුමය ඔහුගේ දූව-
රුන්ට අයිති විය යුතුයි. **9** ඔහුට
දුවක් නැත්නම් ඔහුගේ උරුමය
ඔහුගේ සහෝදරයන්ට දිය යුතුයි.
**10** ඔහුට සහෝදරයොත් නැත්නම්
ඔහුගේ පියාගේ සහෝදරයන්ට ඔහු-
ගේ උරුමය දිය යුතුයි. **11** ඔහුගේ
පියාටත් සහෝදරයන් නැත්නම් ඔහු-
ගේ ළඟම ලේ නෑයෙකුට එය දිය
යුතුයි.[1] ඒ තැනැත්තාට උරුමය
අයිති වන්නේය. යෙහෝවා දෙවි වන
මා තීන්දු කර මෝසෙස් ලවා දැන්වූ
මේ දේ ඊශ්‍රායෙල් සෙනඟ පනතක්
ලෙස පැවැත්විය යුතුයි.' "

**12** පසුව යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. "ඔබ මේ ළඟ
තිබෙන අබරිම් කන්දට යන්න.[2] ඊශ්‍රා-
යෙල් සෙනඟට මා ලබා දෙන දේ-
ශය ඔබට එතැන සිට දැකගන්න
පුළුවන්.[3] **13** ඉන්පසු ඔබේ සහෝ-
දරයා වූ ආරොන් හා ඔබේ ආදිපි-
යවරුන් මෙන්[4] ඔබත් මිය යනු
ඇත.[5] **14** මන්ද ශීන් පාළුකරයේ[6]
කාදෙෂ්[7] නම් ස්ථානයේ මෙරිබාහි දිය
පහර අසල[8] සෙනඟ මැසිවිලි නැඟූ
අවස්ථාවේදී[9] ඔබයි ආරොනුයි මා
දුන් ආඥාව කඩ කළෝය. ශුද්ධ
තැනැත්තා මා බව පෙන්වමින් ඔබ
සෙනඟ ඉදිරියේ මාව ගෞරවයට පත්
කළේ නැත."[10]

**15** පසුව මෝසෙස් යෙහෝවා දෙ-
විට මෙසේ කීවේය. **16** "සියල්-
ලන්ට[11] ජීවනය දෙන යෙහෝවා
දෙවියනි,[12] සෙනඟව බලාගන්න ඔබ
කාව හරි පත් කරන්න.[13] **17** ඔවුන්-
ගේ සියලු කාරණාවලදී ඔවුන්ට
මඟ පෙන්වන්න පුළුවන් කෙනෙක්ව
පත් කරන්න.[14] නැත්නම් යෙහෝවා
දෙවිගේ සෙනඟ එඬේරෙක් නැති
බැටළුවන් මෙන් මංමුළා වෙයි."[15]
**18** එවිට යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. "නූන්ගේ
පුත්‍රයා වන යොෂුවාව ඔබ ඉදිරියට
කැඳවන්න. ඔහු සිහිකල්පනාවෙන්
වැඩ කරන පුද්ගලයෙක්.[16] ඒ වගකීම

**26 පරි.**
1 ගණන් 1:2
දිවි 2:14
1කොරි 10:5
2 ගණන් 14:29
හෙබ්‍රෙ 3:17
3 ගණන් 14:30
යොෂු 14:14
යොෂු 19:49

**27 පරි.**
4 ගණන් 26:28
5 ගණන් 26:33
1ලේක 7:15
6 යොෂු 17:3
7 නික් 18:26
දිවි 17:8
8 ගණන් 14:35
9 ගණන් 16:2
ගණන් 16:19
ගණන් 16:35
10 එස 18:4
රෝම 5:12
රෝම 6:23
11 ගණන් 26:64
12 යොෂු 17:4
13 නික් 18:15
නික් 33:11
ලෙවී 24:12
14 ගණන් 36:2
යොෂු 17:6

**2 තීරුව**
1 ලෙවී 25:25
ලෙවී 25:49
රූත් 4:3
යෙරෙ 32:8
2 ගණන් 33:47
දිවි 32:49
3 උත් 13:15
දිවි 3:27
දිවි 32:52
දිවි 34:1
4 ගණන් 20:24
ගණන් 20:28
ගණන් 33:38
දිවි 10:6
දිවි 32:50
5 ගණන් 31:2
දිවි 34:7
6 ගණන් 13:21
යොෂු 15:1
7 දිවි 1:2
දිවි 32:51
8 ගීතා 106:32
9 ගණන් 20:10
දිවි 1:37
ගීතා 106:33
10 ගණන් 20:12
11 ගණන් 16:22
යෝබ් 12:10
12 ගණන් 27:18
ගීතා 31:5
ගීතා 104:29
13 දිවි 31:14
14 දිවි 31:2
15 1රාජා 22:17
මතෙ 9:36

16 ගණන් 14:24; 2රාජා 2:9; ලූක් 1:17.

දරන්න ඔහුට පුළුවන්. ඔබේ අත ඔහු
පිට තබන්න.[1] 19 ඉන්පසු පූජක
එලියාසර් හා ඊශ්‍රායෙල් සෙනඟ ඉදිරි-
යට ඔහුව ගෙන යන්න. ඒ සියලුදෙනා
ඉදිරියේ ඔහුව ඔවුන්ගේ නායකයා
ලෙස පත් කරන්න.[2] 20 ඔබට හිමි
වුණු ගෞරවයෙන් කොටසක් ඔහුට
දෙන්න.[3] එවිට මුළු සෙනඟ ඔහුට
කීකරු වෙයි.[4] 21 යම් කාරණයක්
පිළිබඳව යෙහෝවා දෙවිගේ තීරණය
ගැන දැනගන්න අවශ්‍ය වූ විට යො-
ෂුවා පූජක එලියාසර් ඉදිරියට යා
යුතුයි.[5] පූජක එලියාසර් ඌරීම්[6] මාර්-
ගයෙන් ඒ කාරණය සම්බන්ධයෙන්
දෙවිගේ තීරණය දැනගෙන එය දැන්-
විය යුතුයි. ඉන්පසු ඔහුත් මුළු ඊශ්‍රා-
යෙල් සෙනඟත් දෙවිගේ තීරණයට
එකඟව ක්‍රියා කළ යුතුයි.”
22 මෝසෙස්, යෙහෝවා දෙවි අණ
කළ ලෙස කළේය. ඔහු පූජක
එලියාසර්[7] හා මුළු සෙනඟ ඉදිරි-
යට යොෂුවාව කැඳවා 23 ඔහු මත
අත තැබුවේය. මෙසේ ඔහු යොෂු-
වාව සෙනඟගේ නායකයා ලෙස පත්
කළේය.[8] යෙහෝවා දෙවි කී ලෙසම
මෝසෙස් කළේය.[9]

**28** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. 2 “ඊශ්‍රා-
යෙල් සෙනඟට මෙසේ අණ කරන්න.
‘ප්‍රසන්න සුවඳක්[10] ගෙනෙන පිණිස
මට අයිති ආහාර[11] වන ගින්නෙන්
දවා ඔප්පු කරන පූජා ඔබට නියම
කළ කාලවලදී[12] මා ඉදිරියේ ඔප්පු
කරන්න.’
3 “ඔබ ඔවුන්ට මේ දේත් කියන්න.
‘යෙහෝවා දෙවි වන මට ගින්නෙන්
දවා ඔප්පු කළ යුතු පූජා මේ-
වායි. දිනපතාම අවුරුද්දක් වයසැති
නිකැළැල් බැටළු පැටවුන් දෙදෙ-
නෙකු දවන පූජාවක් ලෙස ඔප්පු කළ
යුතුයි.[13] 4 එක බැටළු පැටියෙකුව
උදෑසන ඔප්පු කරන්න. අනික් පැටි-
යාව සවස* ඔප්පු කරන්න.[14] 5 ඒ
එක් එක් පූජාව සමඟ ධාන්‍ය පූජා-
වක්ද ඔප්පු කරන්න. ධාන්‍ය පූජාව
ලෙස[1] ඔලීව ගෙඩි කොටා සාදා-
ගත් තෙල්[2] හින මිනුමකින් හතරෙන්
කොටසක් සමඟ මිශ්‍ර කළ සිහින්
පිටි ඒපාවකින් දහයෙන් කොටසක්[3]
ඔප්පු කරන්න. 6 සීනයි කන්දේදී
නියම කළ ලෙස ඒ දවන පූජා[4]
යෙහෝවා දෙවි වන මට ප්‍රසන්න
සුවඳක් ගෙනෙන පිණිස නිතිපතා
ඔප්පු කළ යුතුයි.[5] 7 දවන පූජාවක්
ලෙස ඔප්පු කරන ඒ එක් එක් බැට-
ළුවා[6] සමඟ පාන පූජාවක්ද[7] ඔප්පු
කරන්න. පාන පූජාව සඳහා මත්පැන්
හින මිනුමකින් හතරෙන් කොටසක්
ඔප්පු කරන්න.[8] එය ශුද්ධස්ථානයේ
යෙහෝවා දෙවි ඉදිරියේ වත් කරන්න.
8 සවස් වරුවේ බැටළුවාව ඔප්පු
කරන විට උදෑසන ඔප්පු කළ ලෙ-
සම ධාන්‍ය පූජාවක් හා පාන පූජා-
වක් ඔප්පු කරන්න. යෙහෝවා දෙවි
වන මට ප්‍රසන්න සුවඳක් ගෙනෙන
පිණිස දවන පූජාවක් ලෙස එය ඔප්පු
කරන්න.[9]
9 “‘සබත් දවසේදී[10] දවන පූජාවක්
ලෙස අවුරුද්දක් වයසැති නිකැළැල්
බැටළු පැටවුන් දෙදෙනෙකුද ධාන්‍ය
පූජාවක් ලෙස තෙල් මිශ්‍ර කළ සිහින්
පිටි ඒපාවකින් දහයෙන් කොටස් දෙ-
කක්ද පාන පූජාවක්ද ඔප්පු කරන්න.
10 දිනපතා ඔප්පු කරන දවන පූජා[11]
හා ඒවා සමඟ ඔප්පු කරන පාන පූජා-
වලට[12] අමතරව එම දවන පූජාද
සබත් දවසේදී ඔප්පු කළ යුතුයි.
11 “‘මාසයක් ආරම්භ වන විට
වස්සන් දෙදෙනෙකුව, බැටළුවෙකුව
හා අවුරුද්දක් වයසැති නිකැළැල්
බැටළු පැටවුන් හත්දෙනෙකුව දවන
පූජා ලෙස යෙහෝවා දෙවි වන මට
ඔප්පු කරන්න.[13] 12 ඒ සතුන් සමඟ
ධාන්‍ය පූජාද[14] ඔප්පු කළ යුතුයි. සෑම
වස්සෙකු සමඟ තෙල් මිශ්‍ර කළ සිහින්
පිටි ඒපාවකින් දහයෙන් කොටස්
තුනක්ද බැටළුවා[15] සමඟ තෙල් මිශ්‍ර
කළ සිහින් පිටි ඒපාවකින් දහයෙන්

**27 පරි.**
1 ද්වි 34:9, ක්‍රියා 6:6, 1තිමෝ 4:14
2 ද්වි 31:7
3 ද්වි 1:38, ද්වි 31:3, ද්වි 34:10
4 යොෂු 1:17
5 1සාමු 22:10, 1සාමු 28:6
6 නික් 28:30, ලෙවී 8:8, ද්වි 33:8, 1සාමු 23:9, 1සාමු 28:6, නෙහෙ 7:65
7 ගණන් 20:28
8 ගණන් 27:18, ද්වි 31:14
9 ද්වි 3:28, ද්වි 31:23

**28 පරි.**
10 උත් 8:21, නික් 29:18, එෆී 5:2, පිලි 4:18
11 ලෙවී 3:11, ලෙවී 21:6, ගණන් 28:24, මලා 1:7
12 නික් 23:14, 2ලේක 8:13, එස්රා 3:5, නෙහෙ 10:33
13 නික් 29:38, ලෙවී 6:9, ගණන් 29:11, එස 46:15
14 නික් 12:6, නික් 29:39, ද්වි 16:6

**2 තීරුව**
1 ගණන් 15:4
2 නික් 29:40
3 නික් 16:36
4 නික් 29:42, 2ලේක 2:4, එස්රා 3:3
5 ලෙවී 8:21
6 නික් 29:40
7 ලෙවී 23:13
8 ගණන් 15:10, ගණන් 28:14, ද්වි 14:26
9 නික් 29:41
10 නික් 16:29, නික් 20:10, එස 20:12
11 ගණන් 28:3
12 ගණන් 28:7
13 ගණන් 10:10, 1ලේක 23:31, 2ලේක 2:4, නෙහෙ 10:33, කොලො 2:16

ගණන් **28:4*** නික් 12:6හි පාදසටහන බලන්න.

**14** ලෙවී 2:11; **15** ලෙවී 1:10.

කොටස් දෙකක්ද **13** සෑම බැටළු පැටවෙකු සමඟ තෙල් මිශ්‍ර කළ සිහින් පිටි ඒපාවකින් දහයෙන් කොටසක්ද ගෙනා යුතුයි. ප්‍රසන්න සුවඳක්[1] ගෙනෙන පිණිස එම දවන පූජා යෙහෝවා දෙවි වන මට ඔප්පු කරන්න. **14** සෑම වස්සෙකු සමඟ වයින් හින මිනුමකින් දෙකෙන් කොටසක්[2] පාන පූජාවක් ලෙස ඔප්පු කරන්න. බැටළුවා සමඟ වයින් හින මිනුමකින් තුනෙන් කොටසක්[3] පාන පූජාවක් ලෙස ඔප්පු කරන්න. සෑම බැටළු පැටවෙකු සමඟ වයින් හින මිනුමකින් හතරෙන් කොටසක්[4] පාන පූජාවක් ලෙස ඔප්පු කරන්න. අවුරුද්දේ සෑම මාසයක් සඳහාම එම දවන පූජා ඔප්පු කරන්න.[5] **15** දිනපතා ඔප්පු කරන දවන පූජා හා එම පූජා සමඟ ඔප්පු කරන පාන පූජාවලට[6] අමතරව පාප පූජාවක් ලෙස එළු පැටියෙකුවද[7] යෙහෝවා දෙවි වන මට ඔප්පු කළ යුතුයි.

**16** “‘පළමුවෙනි මාසයේ දහහතරවෙනි දින යෙහෝවා දෙවි වන මට ගෞරව කරන පිණිස පාස්කුව[8] සැමරිය යුතුයි. **17** එම මාසයේ පහළොස්වෙනි දින උත්සවයක් පැවැත්විය යුතුයි. ඔබ දවස් හතක් මුහුන් නොදැමූ රොටි කන්න.[9] **18** පළමුවෙනි දවසේදී ශුද්ධ එක්රැස්වීමක් පැවැත්විය යුතුයි.[10] ඔබ එදින වෙහෙස මහන්සි වී කිසි වැඩක් නොකරන්න.[11] **19** වස්සන් දෙදෙනෙකු, බැටළුවෙකු හා අවුරුද්දක් වයසැති බැටළු පැටවුන් හත්දෙනෙකු[12] දවන පූජා[13] ලෙස යෙහෝවා දෙවි වන මට එදින ඔප්පු කරන්න. එම සතුන් නිකැළැල් සතුන් විය යුතුයි.[14] **20** ඒ සතුන් සමඟ ධාන්‍ය පූජාද[15] ඔප්පු කරන්න. සෑම වස්සෙකු සමඟ තෙල් මිශ්‍ර කළ සිහින් පිටි ඒපාවකින් දහයෙන් කොටස් තුනක් ඔප්පු කරන්න. බැටළුවා සමඟ තෙල් මිශ්‍ර කළ සිහින් පිටි ඒපාවකින් දහයෙන් කොටස් දෙකක්[16] ඔප්පු කරන්න. **21** සෑම බැටළු පැටවෙකු සමඟ තෙල් මිශ්‍ර කළ සිහින් පිටි ඒපාවකින් දහයෙන් කොටසක්[1] ඔප්පු කරන්න. **22** ඔබේ පාපවලට සමාව ලබාගන්නා පිණිස පාප පූජාවක් ලෙස එළුවෙකුවද ඔප්පු කරන්න.[2] **23** සෑම උදෑසනකම[3] ඔප්පු කරන දවන පූජාවට[4] අමතරව එම පූජාද ඔප්පු කරන්න. **24** එම දවස් හත පුරාම යෙහෝවා දෙවි වන මට ප්‍රසන්න සුවඳක් ගෙනෙන පිණිස මට අයිති ආහාර[5] වන ගින්නෙන් දවා ඔප්පු කරන පූජා එලෙස ඔප්පු කරන්න.[6] දිනපතා ඔප්පු කරන දවන පූජා හා ඒවා සමඟ ඔප්පු කරන පාන පූජාවලට අමතරව එම පූජාද ඔප්පු කරන්න. **25** හත්වෙනි දවසේදීද ශුද්ධ එක්රැස්වීමක් පැවැත්විය යුතුයි.[7] ඔබ එදින වෙහෙස මහන්සි වී කිසි වැඩක් නොකළ යුතුයි.[8]

**26** “‘සති උත්සවය[9] පවත්වන කාලයේදී ඔබේ අස්වැන්නේ ප්‍රථම ඵලවලින්[10] යෙහෝවා දෙවි වන මට අලුත් ධාන්‍ය ඔප්පු කරන විට ඔබ ශුද්ධ එක්රැස්වීමක් පැවැත්විය යුතුයි. ඔබ එදින වෙහෙස මහන්සි වී කිසි වැඩක් නොකරන්න.[11] **27** ඒ අවස්ථාවේදී යෙහෝවා දෙවි වන මට ප්‍රසන්න සුවඳක් ගෙනෙන පිණිස වස්සන් දෙදෙනෙකු, බැටළුවෙකු හා අවුරුද්දක් වයසැති බැටළු පැටවුන් හත්දෙනෙකු දවන පූජා ලෙස ඔප්පු කරන්න.[12] **28** ඒ සෑම සතෙකු සමඟ ධාන්‍ය පූජාවක්ද ඔප්පු කරන්න. සෑම වස්සෙකු සමඟ තෙල් මිශ්‍ර කළ සිහින් පිටි ඒපාවකින් දහයෙන් කොටස් තුනක් ඔප්පු කරන්න. බැටළුවා සමඟ තෙල් මිශ්‍ර කළ සිහින් පිටි ඒපාවකින් දහයෙන් කොටස් දෙකක්[13] ඔප්පු කරන්න. **29** සෑම බැටළු පැටවෙකු සමඟ තෙල් මිශ්‍ර කළ සිහින් පිටි ඒපාවකින් දහයෙන් කොටසක්[14] ඔප්පු කරන්න. **30** ඔබේ පව්වලට සමාව ලබාගන්නා පිණිස පාප පූජාවක් ලෙස එළු පැටියෙකුවද ඔප්පු කරන්න.[15] **31** දිනපතා ඔප්පු කරන දවන පූජා

**28 පරි.**
1 ලෙවී 1:13
2 ගණන් 15:10
3 ගණන් 15:7
4 ගණන් 15:5
5 ගණන් 29:6
6 ගණන් 29:19
7 ලෙවී 4:23; ගණන් 15:24; ගණන් 28:22
8 නික් 12:14; ලෙවී 23:5; ද්වි 16:1; එස 45:21; ලූක් 22:7; 1කොරි 5:7
9 නික් 12:15; ලෙවී 23:6; 1කොරි 5:8
10 ලෙවී 23:2
11 ලෙවී 23:7
12 ගණන් 28:11
13 ලෙවී 1:9
14 ලෙවී 22:20; ලෙවී 22:22; ද්වි 15:21
15 ලෙවී 2:1
16 ගණන් 28:12

**2 තීරුව**
1 ගණන් 28:13
2 ගණන් 28:15; ගණන් 29:5
3 ගණන් 28:3; දානි 8:11; දානි 11:31; දානි 12:11
4 ගණන් 28:6
5 ලෙවී 3:11; ලෙවී 21:6; ගණන් 28:2
6 ගණන් 28:8
7 නික් 12:16; නික් 13:6; ලෙවී 23:8
8 ද්වි 16:8
9 නික් 34:22; ලෙවී 23:16; ලෙවී 23:21; ද්වි 16:10; ක්‍රියා 2:1
10 නික් 23:16
11 නික් 31:14; ගණන් 28:18
12 ලෙවී 23:18
13 ගණන් 28:12
14 ගණන් 28:13
15 ලෙවී 23:19; ගණන් 28:15

හා ඒ සමඟ ඔප්පු කරන ධාන්‍ය පූජා-
වලට අමතරව එම පූජාද ඔප්පු
කරන්න.[1] පාන පූජාද[2] ඒවා සමඟ
ඔප්පු කරන්න. පූජාවලට ඔප්පු කරන
සතුන් නිකැළැල් සතුන් විය යුතුයි.[3]

**29** “ ‘ඔබ හත්වෙනි මාසයේ පළ-
මුවෙනි දිනයේදී ශුද්ධ එක්-
රැස්වීමක් පැවැත්විය යුතුයි.[4] එදින
වෙහෙස මහන්සි වී කිසි වැඩක් නො-
කරන්න.[5] එදින හොරණෑ පිඹිය යුතු
දවසකි.[6] **2** එම දවසේදී යෙහෝවා
දෙවි වන මට ප්‍රසන්න සුවඳක් ගෙ-
නෙන පිණිස වස්සෙකුව, බැටළුවෙ-
කුව හා අවුරුද්දක් වයසැති බැටළු
පැටවුන් හත්දෙනෙකුව දවන පූජා
ලෙස ඔප්පු කරන්න. ඒ සතුන් නිකැ-
ළැල් සතුන් විය යුතුයි.[7] **3** ඒ එක්
එක් පූජාව සමඟ ධාන්‍ය පූජාවක්ද
ඔප්පු කරන්න. වස්සා සමඟ තෙල්
මිශ්‍ර කළ සිහින් පිටි ඒපාවකින් දහ-
යෙන් කොටස් තුනක්ද බැටළුවා
සමඟ තෙල් මිශ්‍ර කළ සිහින් පිටි ඒපා-
වකින් දහයෙන් කොටස් දෙකක්ද[8]
**4** සෑම බැටළු පැටවෙකු සමඟ තෙල්
මිශ්‍ර කළ සිහින් පිටි ඒපාවකින් දහ-
යෙන් කොටසක්ද ඔප්පු කරන්න.[9]
**5** ඔබේ පාපවලට සමාව ලබාගන්නා
පිණිස පාප පූජාවක් ලෙස එළු පැට-
වෙකුවද ඔප්පු කරන්න.[10] **6** ඔබ
සිරිත් පරිදි සෑම මාසයකදීම ඔප්පු
කරන දවන පූජාවලටත්[11] දිනපතා
ඔප්පු කරන දවන පූජාවලටත්[12] ඒ
එක් එක් පූජා සමඟ ඔප්පු කරන
ධාන්‍ය පූජාවලටත්[13] පාන පූජාවල-
ටත්[14] අමතරව එම පූජාද ඔප්පු කළ
යුතුයි. ඒවා යෙහෝවා දෙවි වන මට
ප්‍රසන්න සුවඳක් ගෙනෙන පිණිස
ගින්නෙන් දවා ඔප්පු කරන පූජා
වෙයි.[15]

**7** “ ‘හත්වෙනි මාසයේ දහවන
දිනයේදීද ඔබ ශුද්ධ එක්රැස්වීමක්
පැවැත්විය යුතුයි.[16] එදින ඔබ යට-
හත්ව ඔබේ පව් ගැන දුක් වෙමින්[17]
කිසි වැඩක් නොකර සිටිය යුතුයි.*[1]
**8** එදින යෙහෝවා දෙවි වන මට
ප්‍රසන්න සුවඳක් ගෙනෙන පිණිස
වස්සෙකුව, බැටළුවෙකුව සහ අවු-
රුද්දක් වයසැති බැටළු පැටවුන් හත්-
දෙනෙකුව දවන පූජා ලෙස ඔප්පු
කරන්න.[2] ඒ සතුන් නිකැළැල් සතුන්
විය යුතුයි.[3] **9** ඒ එක් එක් පූජා
සමඟ ධාන්‍ය පූජාද ඔප්පු කරන්න.
වස්සා සමඟ තෙල් මිශ්‍ර කළ සිහින්
පිටි ඒපාවකින් දහයෙන් කොටස්
තුනක්ද බැටළුවා සමඟ තෙල් මිශ්‍ර
කළ සිහින් පිටි ඒපාවකින් දහයෙන්
කොටස් දෙකක්ද[4] **10** සෑම බැටළු
පැටවෙකු සමඟ තෙල් මිශ්‍ර කළ
සිහින් පිටි ඒපාවකින් දහයෙන් කො-
ටසක්ද ඔප්පු කරන්න.[5] **11** පාපව-
ලට සමාව ලබාගන්නා පිණිස සමඟි
වීමේ දවසේ ඔප්පු කරන පාප පූජාව-
ටත් දිනපතා ඔප්පු කරන දවන පූජා-
වලටත් ඒ එක් එක් දවන පූජා සමඟ
ඔප්පු කරන ධාන්‍ය පූජාවලටත් පාන
පූජාවලටත්[6] අමතරව පාප පූජා-
වක් ලෙස එළු පැටවෙකුවද ඔප්පු
කරන්න.[7]

**12** “ ‘හත්වෙනි මාසයේ පහළොස්-
වන දිනයේදීද[8] ඔබ ශුද්ධ එක්රැස්වී-
මක් පැවැත්විය යුතුයි.[9] ඔබ එදින
වෙහෙස මහන්සි වී කිසි වැඩක්
නොකළ යුතුයි.[10] දවස් හතක් පුරා
යෙහෝවා දෙවි වෙනුවෙන් උත්ස-
වයක් පවත්වන්න.[11] **13** යෙහෝවා
දෙවි වන මට ප්‍රසන්න සුවඳක් ගෙ-
නෙන පිණිස වස්සන් දහතුන්දෙනෙ-
කුව, බැටළුවන් දෙදෙනෙකුව හා
අවුරුද්දක් වයසැති බැටළු පැටවුන්
දහහතරදෙනෙකුව දවන පූජා ලෙස
ඔප්පු කරන්න.[12] එම සතුන් නිකැ-
ළැල් සතුන් විය යුතුයි.[13] **14** සෑම
වස්සෙකු සමඟ ධාන්‍ය පූජාවක් ලෙස
තෙල් මිශ්‍ර කළ සිහින් පිටි ඒපාව-
කින් දහයෙන් කොටස් තුනක් ඔප්පු
කරන්න. සෑම බැටළුවෙකු සමඟ

**28 පරි.**
**1** ගණන් 28:3, ගණන් 28:5, ගණන් 28:23
**2** ගණන් 28:7
**3** ලෙවී 1:3, ගණන් 28:19

**29 පරි.**
**4** ලෙවී 23:24
**5** ලෙවී 23:25
**6** ගණන් 10:2, ගීතා 81:3
**7** ගණන් 28:19
**8** ගණන් 28:20
**9** ගණන් 28:21
**10** ගණන් 28:15, ගණන් 28:22
**11** ගණන් 28:11
**12** ගණන් 28:3
**13** ගණන් 28:5, ගණන් 28:12
**14** ගණන් 28:7
**15** ලෙවී 23:25, ගණන් 28:6
**16** ලෙවී 16:29, ලෙවී 23:27
**17** ලෙවී 16:29, ලෙවී 23:29, ගීතා 35:13, යෙසා 58:5

**2 තීරුව**
**1** ලෙවී 23:31
**2** ගණන් 29:2
**3** ලෙවී 1:3, ලෙවී 22:22, ද්වි 15:21, ද්වි 17:1
**4** ගණන් 28:12, ගණන් 29:3
**5** ගණන් 28:13, ගණන් 29:4
**6** ගණන් 28:7
**7** ලෙවී 16:3
**8** නික් 23:16, ලෙවී 23:34, ද්වි 16:13, නෙහෙ 8:14
**9** ලෙවී 23:37, නෙහෙ 8:18
**10** ලෙවී 23:35
**11** ද්වි 16:15
**12** ලෙවී 1:3, එස්රා 3:4
**13** ලෙවී 22:22, ද්වි 17:1

**ගණන් 29:7*** මේ දුක් වීම පෙන්නුම් කළේ නිරාහාරව සිටීමෙන් විය හැක.

ධාන්‍ය පූජාවක් ලෙස තෙල් මිශ්‍ර
කළ සිහින් පිටි ඒපාවකින් දහයෙන්
කොටස් දෙකක් ඔප්පු කරන්න.[1]
**15** සෑම බැටළු පැටවෙකු සමඟ
ධාන්‍ය පූජාවක් ලෙස තෙල් මිශ්‍ර කළ
සිහින් පිටි ඒපාවකින් දහයෙන් කො-
ටසක් ඔප්පු කරන්න.[2] **16** දිනපතා
ඔප්පු කරන දවන පූජාවලටත් ඒවා
සමඟ ඔප්පු කරන ධාන්‍ය පූජාවලටත්
පාන පූජාවලටත් අමතරව පාප පූජා-
වක් ලෙස එළු පැටවෙකුවද ඔප්පු
කරන්න.[3]

**17** "'දෙවෙනි දවසේදී වස්සන්
දොළොස්දෙනෙකුව, බැටළුවන් දෙ-
දෙනෙකුව හා අවුරුද්දක් වයසැති
නිකැළැල්[4] බැටළු පැටවුන් දහ-
හතරදෙනෙකුව ඔප්පු කළ යුතුයි.
**18** එක් එක් වස්සා සමඟද එක් එක්
බැටළුවා සමඟද එක් එක් බැටළු
පැටවා සමඟද නියම කර තිබෙන
ලෙස[5] ධාන්‍ය පූජාවක්ද[6] පාන පූජා-
වක්ද[7] ඔප්පු කරන්න. **19** දිනපතා
ඔප්පු කරන දවන පූජාවලටත් ඒවා
සමඟ ඔප්පු කරන ධාන්‍ය පූජාවලටත්
පාන පූජාවලටත්[8] අමතරව පාප පූජා-
වක්[9] ලෙස එළු පැටවෙකුවද ඔප්පු
කරන්න.

**20** "'තුන්වෙනි දවසේදී ගවයන්
එකොළොස්දෙනෙකුව, බැටළුවන් දෙ-
දෙනෙකුව හා අවුරුද්දක් වයසැති
නිකැළැල් බැටළු පැටවුන් දහහතර-
දෙනෙකුව ඔප්පු කරන්න.[10] **21** එක්
එක් ගවයා සමඟද එක් එක් බැටළුවා
සමඟද එක් එක් බැටළු පැටවා
සමඟද නියම කර තිබෙන ලෙස
ධාන්‍ය පූජාවක්ද[11] පාන පූජාවක්ද[12]
ඔප්පු කරන්න. **22** දිනපතා ඔප්පු
කරන දවන පූජාවලටත් ඒවා සමඟ
ඔප්පු කරන ධාන්‍ය පූජාවලටත් පාන
පූජාවලටත් අමතරව පාප පූජාවක්[13]
ලෙස එළුවෙකුවද ඔප්පු කරන්න.

**23** "'හතරවෙනි දවසේදී ගව-
යන් දහදෙනෙකුව, බැටළුවන් දෙ-
දෙනෙකුව හා අවුරුද්දක් වයසැති
නිකැළැල්[14] බැටළු පැටවුන් දහහතර-
දෙනෙකුව ඔප්පු කරන්න. **24** එක්
එක් ගවයා සමඟද එක් එක් බැටළුවා
සමඟද එක් එක් බැටළු පැටවා
සමඟද නියම කර තිබෙන ලෙස[1]
ධාන්‍ය පූජාවක්ද[2] පාන පූජාවක්ද[3]
ඔප්පු කරන්න. **25** දිනපතා ඔප්පු
කරන දවන පූජාවලටත්[4] ඒවා සමඟ
ඔප්පු කරන ධාන්‍ය පූජාවලටත් පාන
පූජාවලටත්[5] අමතරව පාප පූජා-
වක්[6] ලෙස එළු පැටවෙකුවද ඔප්පු
කරන්න.

**26** "'පස්වෙනි දවසේදී ගවයන්
නවදෙනෙකුව, බැටළුවන් දෙදෙනෙ-
කුව හා අවුරුද්දක් වයසැති
නිකැළැල්[7] බැටළු පැටවුන් දහහතර-
දෙනෙකුව ඔප්පු කරන්න. **27** එක්
එක් ගවයා සමඟද එක් එක්
බැටළුවා සමඟද එක් එක් බැටළු
පැටවා සමඟද නියම කර තිබෙන
ලෙස[8] ධාන්‍ය පූජාවක්ද[9] පාන පූජා-
වක්ද[10] ඔප්පු කරන්න. **28** දිනපතා
ඔප්පු කරන දවන පූජාවලටත් ඒවා
සමඟ ඔප්පු කරන ධාන්‍ය පූජාවලටත්
පාන පූජාවලටත්[11] අමතරව පාප
පූජාවක්[12] ලෙස එළුවෙකුවද ඔප්පු
කරන්න.

**29** "'හයවෙනි දවසේදී ගවයන්
අටදෙනෙකුව, බැටළුවන් දෙදෙනෙ-
කුව හා අවුරුද්දක් වයසැති
නිකැළැල්[13] බැටළු පැටවුන් දහහතර-
දෙනෙකුව ඔප්පු කරන්න. **30** එක්
එක් ගවයා සමඟද එක් එක්
බැටළුවා සමඟද එක් එක් බැටළු
පැටවා සමඟද නියම කර තිබෙන
ලෙස[14] ධාන්‍ය පූජාවක්ද[15] පාන පූජා-
වක්ද[16] ඔප්පු කරන්න. **31** දිනපතා
ඔප්පු කරන දවන පූජාවලටත් ඒවා
සමඟ ඔප්පු කරන ධාන්‍ය පූජාවලටත්
පාන පූජාවලටත්[17] අමතරව පාප
පූජාවක්[18] ලෙස එළුවෙකුවද ඔප්පු
කරන්න.

**32** "'හත්වෙනි දවසේදී ගවයන්
හත්දෙනෙකුව, බැටළුවන් දෙදෙනෙ-
කුව හා අවුරුද්දක් වයසැති
නිකැළැල්[19] බැටළු පැටවුන් දහහතර-
දෙනෙකුව ඔප්පු කරන්න. **33** එක්
එක් ගවයා සමඟද එක් එක් බැටළුවා

**29 පරි.**
1 ගණන් 28:12 ගණන් 29:3
2 ගණන් 28:13 ගණන් 29:4
3 ගණන් 28:3 ගණන් 28:5 ගණන් 28:7
4 ද්වි 15:21
5 ගණන් 28:12
6 ගණන් 29:3 ගණන් 29:14
7 ගණන් 28:14
8 ගණන් 28:3 ගණන් 28:5 ගණන් 28:7
9 ගණන් 28:15
10 ගණන් 29:13
11 ගණන් 29:9 ගණන් 29:14
12 ගණන් 28:14
13 ගණන් 28:15
14 ලෙවී 22:22 ගණන් 29:13

**2 තීරුව**
1 ගණන් 28:12
2 ගණන් 29:14
3 ගණන් 28:14
4 ගණන් 28:3
5 ගණන් 28:7
6 ලෙවී 4:23 ගණන් 28:15
7 ද්වි 15:21 ද්වි 17:1
8 ගණන් 28:12
9 ගණන් 29:14
10 ගණන් 28:14
11 ගණන් 28:7
12 ලෙවී 4:23 ගණන් 28:15
13 ලෙවී 1:3 ගණන් 29:8
14 ගණන් 28:12
15 ගණන් 29:3 ගණන් 29:14
16 ගණන් 28:14
17 ගණන් 28:7
18 ලෙවී 4:23 ගණන් 28:15
19 ලෙවී 1:3 ලෙවී 22:22

සමඟද එක් එක් බැටළු පැටවා සමඟද නියම කර තිබෙන ලෙස[1] ධාන්‍ය පූජාවක්ද[2] පාන පූජාවක්ද[3] ඔප්පු කරන්න. **34** දිනපතා ඔප්පු කරන දවන පූජාවලටත් ඒවා සමඟ ඔප්පු කරන ධාන්‍ය පූජාවලටත් පාන පූජාවලටත්[4] අමතරව පාප පූජාවක්[5] ලෙස එළුවෙකුවද ඔප්පු කරන්න.

**35** "'අටවෙනි දවසේදී ඔබ විශේෂ එක්රැස්වීමක් පැවැත්විය යුතුයි.[6] ඔබ එදින වෙහෙස මහන්සි වී කිසි වැඩක් නොකරන්න.[7] **36** යෙහෝවා දෙවි වන මට ප්‍රසන්න සුවඳක් ගෙනෙන පිණිස එදින දවන පූජා ඔප්පු කරන්න. ගවයෙකුව, බැටළුවෙකුව හා අවුරුද්දක් වයසැති නිකැළැල් බැටළු පැටවුන් හත්දෙනෙකුව දවන පූජා ලෙස ඔප්පු කරන්න.[8] **37** ගවයා සමඟද බැටළුවා සමඟද එක් එක් බැටළු පැටවා සමඟද නියම කර තිබෙන ලෙස[9] ධාන්‍ය පූජාවක්ද[10] පාන පූජාවක්ද[11] ඔප්පු කරන්න. **38** දිනපතා ඔප්පු කරන දවන පූජාවලටත් ඒවා සමඟ ඔප්පු කරන ධාන්‍ය පූජාවලටත් පාන පූජාවලටත්[12] අමතරව පාප පූජාවක්[13] ලෙස එළුවෙකුවද ඔප්පු කරන්න.

**39** "'ඔබට නියම කළ උත්සව දිනවලදී[14] ඔබ යෙහෝවා දෙවි වන මට ඒ සියලු පූජා ඔප්පු කළ යුතුයි. ඔබ ඔප්පු කරන භාරවලට,[15] කැමැත්තෙන් ඔප්පු කරන පූජාවලට,[16] දවන පූජාවලට,[17] ධාන්‍ය පූජාවලට,[18] පාන පූජාවලට[19] හා හවුල් පූජාවලට[20] අමතරව එම පූජා ඔප්පු කළ යුතුයි.'" **40** මෝසෙස්, යෙහෝවා දෙවි තමාට අණ කළ සියල්ල ඊශ්‍රායෙල් සෙනඟට දැනුම් දුන්නේය.[21]

**30** ඊශ්‍රායෙල්හි ගෝත්‍රවල ප්‍රධානීන්ට[22] මෝසෙස් මෙසේ කීවේය. "යෙහෝවා දෙවි මෙසේ අණ කළා. **2** යම් පුරුෂයෙකු යෙහෝවා දෙවිට භාරයක්[23] වුණොත් හෝ යම් දෙයකින් වැළකී සිටින බවට[24] පොරොන්දු වෙමින් ඒ ගැන දිවුරුවොත්[25] ඔහු එම භාරය නැත්නම් පොරොන්දුව කඩ නොකළ යුතුයි.[1] ඔහු තමා පැවසූ ලෙස සියල්ල ඉටු කළ යුතුයි.[2]

**3** "තරුණියක තම පියා යටතේ සිටින කාලයේදී යෙහෝවා දෙවිට භාරයක් වුණොත්[3] හෝ යම් දෙයකින් වැළකී සිටින බවට පොරොන්දු වෙමින් දිවුරුවොත් ඇය ක්‍රියා කළ යුත්තේ මෙලෙසයි. **4** ඇය වුණු භාරය හෝ ඇය දුන් දිවුරුම ගැන ඇගේ පියාට දැනගන්න ලැබුණු පසු ඔහු ඒ ගැන කිසිවක් නොකිව්වොත් ඇය එම භාරය හෝ පොරොන්දුව එලෙසම ඉටු කළ යුතුයි.[4] **5** නමුත් ඇගේ පියා ඒ ගැන දැනගත් විට එම භාරය හෝ පොරොන්දුව ඉටු කිරීමෙන් ඇයව වැළැක්වුවොත් ඇය එය ඉටු කිරීමට බැඳී නැහැ. ඇගේ පියා ඇයව වැළැක්වූ නිසා යෙහෝවා දෙවිගෙන් ඇයට සමාව ලැබෙයි.[5]

**6** "විවාහක ස්ත්‍රියක භාරයක් හෝ දුර දිග නොබලා දුන් පොරොන්දුවක් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුත්තේ මේ ආකාරයටයි.[6] **7** ඇගේ පුරුෂයාට ඒ පිළිබඳව දැනගන්න ලැබුණු පසු ඔහු ඒ සම්බන්ධයෙන් කිසිවක් නොකිව්වොත් ඇය වුණු භාරය හෝ පොරොන්දුව එලෙසම ඇය ඉටු කළ යුතුයි.[7] **8** නමුත් ඇගේ පුරුෂයා ඒ ගැන දැනගත් විට ඇය දුන් භාරය හෝ දුර දිග නොබලා දුන් පොරොන්දුව ඉටු කිරීමෙන් ඇයව වැළැක්වුවොත්[8] ඇය එය ඉටු කිරීමට බැඳී නැහැ. ඇගේ පුරුෂයා එය අහෝසි කළ නිසා යෙහෝවා දෙවිගෙන් ඇයට සමාව ලැබෙයි.[9]

**9** "වැන්දඹුවක හෝ දික්කසාද වූ ස්ත්‍රියක හෝ භාරයක් වුණොත් ඇය එය ඉටු කිරීමට බැඳී සිටිනවා.

**10** "ස්ත්‍රියක විවාහ වූ පසු භාරයක් වූ විට හෝ යම් දෙයකින් වැළකී සිටින බවට දිවුරුමක් දුන් විට ඇය ක්‍රියා කළ යුත්තේ මෙලෙසයි.[10] **11** ඇගේ පුරුෂයාට ඒ ගැන දැනගන්න ලැබුණු පසු ඔහු ඒ සම්බන්ධයෙන් කිසිවක් නොකිව්වොත් ඔහු

**29 පරි.**
1 ගණන් 28:12
2 ගණන් 29:3, ගණන් 29:14
3 ගණන් 28:14
4 ගණන් 28:7
5 ලෙවී 4:23, ගණන් 28:15
6 ලෙවී 23:36
7 ලෙවී 23:39
8 ගණන් 29:2
9 ගණන් 28:12
10 ගණන් 29:3, ගණන් 29:14
11 ගණන් 28:14
12 ගණන් 28:7
13 ලෙවී 4:23, ගණන් 28:15
14 ලෙවී 23:2, ද්වි 16:16
15 ගණන් 15:3, ද්වි 12:6
16 ලෙවී 7:16, ලෙවී 22:21
17 ලෙවී 1:3
18 ලෙවී 2:1
19 ගණන් 15:5
20 ලෙවී 3:1
21 නික් 40:16, ද්වි 4:5

**30 පරි.**
22 නික් 18:25
23 උත් 28:20, ලෙවී 27:2, විනි 11:30
24 ගණන් 30:11, ක්‍රියා 23:14
25 ගණන් 30:10, ගීතා 132:2

**2 තීරුව**
1 ද්වි 23:21, ගීතා 76:11, ගීතා 116:14, ගීතා 119:106, දේශ 5:4, මතෙ 5:33
2 ගීතා 22:25, ගීතා 50:14, ගීතා 66:13, නාහු 1:15
3 1සාමු 1:11
4 ගණන් 30:10, ගණන් 30:13
5 මාක් 7:10, එෆී 6:1
6 1සාමු 1:11, 1සාමු 1:22
7 1සාමු 1:23
8 රෝම 7:2, 1කොරි 11:3, එෆී 5:22
9 ගණන් 30:5
10 ගණන් 30:6

ඇයව නොවැළැක්වූ බැවින් ඇය වුණු
භාරය හෝ පොරොන්දුව ඇය එලෙ-
සම ඉටු කළ යුතුයි. **12** නමුත්
ඇගේ පුරුෂයා ඒ ගැන දැනගත් විට
එම භාරය හෝ දිවුරුම ඉටු කිරීමෙන්
ඇයව වැළැක්වුවොත් ඇය එය ඉටු
කිරීමට බැඳී නැහැ.[1] ඇගේ පුරුෂයා
එය අහෝසි කළ නිසා යෙහෝවා
දෙවිගෙන් ඇයට සමාව ලැබෙයි.[2]
**13** ඇය භාරයක් වුණොත් එසේත්
නැත්නම් යම් දෙයකින් වැළකී සිටී-
මට පොරොන්දු වෙමින් දිවුරුමක්
දුන්නොත්[3] එය අහෝසි කිරීමට හෝ
ස්ථිර කිරීමට ඇගේ පුරුෂයාට අයිති-
යක් තිබෙනවා. **14** නමුත් ඇගේ
පුරුෂයා දවස් ගණනාවක් යන තෙක්
ඒ සම්බන්ධයෙන් කිසිවක් නොකිව්-
වොත් ඇය වූ භාරය හෝ ඇය දුන්
දිවුරුම ඔහු ස්ථිර කරනවා.[4] ඔහු එය
දැනගත් පසු නිහඬව සිටි නිසා ඇගේ
භාරය හෝ දිවුරුම ස්ථිර වෙයි.
**15** නමුත් කලක් ගෙවුණු පසු ඔහු
එම භාරය හෝ දිවුරුම ඉටු කිරීමෙන්
ඇයව වැළැක්වුවොත් ඇගේ වරදට
ඔහු වග කිව යුතුයි.[5]

**16** “විවාහ වී සිටින ස්ත්‍රියක[6] සම්-
බන්ධයෙන්ද තම පියා යටතේ සිටින
අවිවාහක තරුණියක[7] සම්බන්ධ-
යෙන්ද යෙහෝවා දෙවි මෝසෙස්
මාර්ගයෙන් දුන් ආඥා ඒවාය.”

**31** පසුව යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය.
**2** “මිදියන්වරුන් ඊශ්‍රායෙල් සෙනඟට
කළ දේ නිසා[8] ඔබ ඔවුන්ට දඬුවම්[9]
කරන්න. ඉන්පසු ඔබත් ඔබේ ආදිපි-
යවරුන් මෙන් මිය යනු ඇත.”[10]

**3** මෝසෙස් සෙනඟට මෙසේ
කීවේය. “පුරුෂයෙනි, යෙහෝවා දෙවි
වෙනුවෙන් සටනට යන්න දැන් සූදා-
නම් වෙන්න. ඔබ මිදියන්වරුන්ට
විරුද්ධව සටන් කර ඔවුන්ට දඬු-
වම් කළ යුතුයි.[11] **4** සටනට යෑම
සඳහා ඊශ්‍රායෙල්හි සෑම ගෝත්‍රය-
කින්ම මිනිසුන් දහසක් බැගින්
තෝරාගන්න.” **5** මහත් සේනා-
වක්ව සිටින ඊශ්‍රායෙල්වරුන් අත-
රින්[1] පුරුෂයන් දොළොස්දහසක්[2]
එනම්, එක් එක් ගෝත්‍රයෙන් පුරුෂ-
යන් දහසක් බැගින් ඔවුහු තෝ-
රාගෙන ඔවුන්ව සටනට සූදානම්
කළෝය.

**6** එක් එක් ගෝත්‍රය නියෝජ-
නය කළ ඒ පුරුෂයන් දොළොස්දහස
සමඟ පූජක එලියාසර්ගේ පුත්‍රයා
වන පිනෙහාස්වද[3] මෝසෙස් සට-
නට පිටත් කර හැරියේය. විධාන
දීම සඳහා හොරණෑ[4] හා පරිශුද්ධ
භාණ්ඩ රැගෙන යෑමේ වගකීම පිනෙ-
හාස්ට පැවරී තිබිණ. **7** යෙහෝවා
දෙවි මෝසෙස්ට අණ කළ ලෙසම
ඔවුහු මිදියන්වරුන්ට විරුද්ධව සටන්
කර ඔවුන්ගේ සියලු පුරුෂයන්ව මරා
දැමූහ.[5] **8** ඔවුන්ගේ අතින් මැරුම්
කෑ අය අතර එවී, රෙකෙම්, ෂූර්, හූර්
සහ රෙබා යන මිදියන්වරුන්ගේ රජ-
වරු පස්දෙනාද වූහ.[6] බෙයොර්ගේ
පුත්‍රයා වන බාලාම්වද[7] ඔවුහු කඩු-
වෙන් මරා දැමූහ. **9** එහෙත් ඊශ්‍රා-
යෙල් සෙනඟ මිදියන් ජාතික ස්ත්‍රීන්ව
හා ඔවුන්ගේ දරුදැරියන්ව පැහැ-
රගෙන ගියෝය.[8] මිදියන්වරුන්ට
අයිතිව තිබූ සියලු සතුන්වද ඔවුන්-
ගේ සියලු සම්පත්ද ඔවුහු කොල්ල
කෑවෝය. **10** මිදියන්වරුන් ජීවත්
වූ සියලු නුවරවල්ද ඔවුන්ගේ සියලු
කඳවුරුද ඔවුහු ගින්නෙන් විනාශ
කළෝය.[9] **11** එහෙත් තමන් පැහැ-
රගත් මනුෂ්‍යයන්වද කොල්ල කා
ගත්[10] සියලු සතුන්වද සම්පත්ද ඔවුහු
විනාශ කළේ නැත. **12** ඔවුහු ඒ
සියල්ල මෝසෙස්, පූජක එලියා-
සර් හා ඊශ්‍රායෙල් සෙනඟ කඳවුරු
බැඳගෙන සිටි ස්ථානයට රැගෙන
ගියෝය. ඊශ්‍රායෙල් සෙනඟ කඳවුරු
බැඳගෙන සිටියේ යෙරිකෝව හා
යොර්දාන් ගඟ අසල තිබෙන මෝවබ්
පාළුකරයේය.[11]

**13** මෝසෙස්ද පූජක එලියාසර්ද
සියලු අධිපතීහුද ඔවුන්ව හමු වන
පිණිස කඳවුරෙන් පිටතට ගියෝය.
**14** මෝසෙස් සටනින් ආපසු පැමිණි
සෙනඟ අතරේ සිටි හමුදාපතීන්[12]

**30 පරි.**
1 1කොරි 11:3; 1පේතෘ 3:1
2 ගණන් 30:5; ගණන් 30:8
3 ගීතා 35:13; යෙසා 58:5
4 ගණන් 30:7
5 ද්වි 23:21
6 ගණන් 30:6; ගණන් 30:10
7 ගණන් 30:3

**31 පරි.**
8 ගණන් 25:2; ගණන් 25:17
9 ද්වි 32:41; ගීතා 94:1; යෙසා 1:24; නාහු 1:2
10 ගණන් 27:13; ද්වි 32:50
11 ගණන් 22:7; ගණන් 25:18; 1කොරි 10:8; එළි 2:14

**2 තීරුව**
1 ගණන් 26:51
2 ලෙවී 26:8
3 ගණන් 25:7; ගණන් 25:11
4 ගණන් 10:2; ගණන් 10:9
5 ද්වි 20:13
6 යොෂු 13:21
7 ගණන් 22:12; ගණන් 24:25; යොෂු 13:22; 2පේතෘ 2:15; යූද් 11; එළි 2:14
8 ද්වි 20:14
9 යොෂු 6:24
10 ද්වි 2:35; යොෂු 8:2
11 ගණන් 22:1
12 ගණන් 31:5

සමඟ මහත් සේ උදහස් විය. ඔහු
හමුදාවේ දහසකින් යුත් කණ්ඩායම්
කෙරෙහිද සියයකින් යුත් කණ්ඩායම්
කෙරෙහිද පත් කර සිටි එම ප්‍රධා-
නීන්ට **15** මෙසේ කීවේය. “ඔබ මේ
ස්ත්‍රීන්ව ඉතුරු කළේ මොකටද?[1]
**16** පෙයෝර් හා සම්බන්ධ කාරණ-
යේදී[2] යෙහෝවා දෙවිට විරුද්ධව පව්
කරන්න ඊශ්‍රායෙල් සෙනඟව පෙල-
ඹෙව්වේ මේ ස්ත්‍රීන් කියා ඔබට අමත-
කද?[3] ඔවුන් ක්‍රියා කළේ බාලාම්ගේ
උපදෙස්වලට අනුවයි. ඒ නිසා යෙ-
හෝවා දෙවි සෙනඟට වසංගතය-
කින් පහර දුන් හැටි ඔබට අමතක
වුණාද?[4] **17** සියලු පිරිමි දරුවන්වද
පුරුෂයෙක් සමඟ ලිංගික සම්බන්ධ-
කම් පවත්වා තිබෙන සියලු ස්ත්‍රීන්වද
දැන්මම මරා දමන්න.[5] **18** පුරුෂ-
යෙක් සමඟ සම්බන්ධකම් පවත්වා
නැති කුඩා දැරියන්ව විතරක් ඉතුරු
කරන්න.[6] **19** ඔබ සියලුදෙනා දවස්
හතක් යන තුරු කඳවුරෙන් පිටතට
වී සිටින්න. යමෙකුව මැරූ අය[7] හා
මළ සිරුරක් ඇල්ලූ අය[8] තුන්වෙනි
දවසේදී හා හත්වෙනි දවසේදී පවිත්‍ර
විය යුතුයි.[9] ඔබත් ඔබ සමඟ සිටින
පැහැරගත් අයත් පවිත්‍ර විය යුතුයි.
**20** ඔබ ළඟ තිබෙන ඇඳුම් සියල්ලද
හම්වලින් හා එළු රෝමවලින් සාදා
තිබෙන සියල්ලද ලී භාණ්ඩ සියල්ලද
පවිත්‍ර කරන්න.”[10]

**21** ඉන්පසු පූජක එලියාසර් සට-
නට ගොස් ආ පුරුෂයන්ට
මෙසේ කීවේය. “යෙහෝවා දෙවි,
මෝසෙස් මාර්ගයෙන් දුන් නීතිය
මෙයයි. **22** ‘රන්වලින්, රිදීවලින්,
තඹවලින්, යකඩවලින්, බෙලෙක්ව-
ලින් හා ඊයම්වලින් සෑදූ භාණ්ඩ
**23** එනම්, ගින්නට ඔරොත්තු දෙන
සෑම භාණ්ඩයක්ම[11] ගින්නට දමා
නැවත ගන්න. එවිට ඒවා පවිත්‍ර
වෙයි. පවිත්‍ර කිරීම සඳහා භාවිත
කරන වතුරෙන්ද[12] ඒවා පවිත්‍ර කළ
යුතුයි. ගින්නට ඔරොත්තු නො-
දෙන සෑම භාණ්ඩයක්ම වතුරෙන්
සෝදන්න.[13] **24** හත්වෙනි දවසේදී

31 පරි.
1 යෙරෙ 48:10
2 ගණන් 25:18
ද්වි 4:3
යොෂු 22:17
3 ගණන් 25:2
2පේතෘ 2:15
එළි 2:14
4 ගණන් 25:9
1කොරි 10:8
5 විනි 21:11
6 ගණන් 31:35
7 ගණන් 5:2
ගණන් 19:11
8 ගණන් 19:16
9 ගණන් 19:20
10 ගණන් 31:23
11 හිතෝ 17:3
හිතෝ 25:4
12 ගණන් 19:9
13 ගණන් 31:20

2 තීරුව
1 ගණන් 19:19
ගණන් 19:20
2 යොෂු 22:8
1සාමු 30:24
ගීතා 68:12
3 උත් 14:20
1ලේක 26:27
4 ගණන් 18:20
ගණන් 18:29
5 ගණන් 3:7
ගණන් 18:3
1ලේක 23:32
6 ද්වි 12:12
ද්වි 12:19
යොෂු 13:14
7 ගණන් 31:18

ඔබේ වස්ත්‍ර සෝදාගෙන ඔබ පවිත්‍ර
විය යුතුයි.[1] ඊටපසු ඔබට කඳවුරට
ඇතුල් විය හැකියි.’ ”

**25** පසුව යෙහෝවා දෙවි, මෝ-
සෙස්ට මෙසේ කීවේය. **26** “පූජක
එලියාසර් හා පෙළපත්වල ප්‍රධා-
නීන් සමඟ එකතු වී කොල්ල
කා ගත් මනුෂ්‍යයන්ව හා සතුන්ව
ගණන් කරන්න. **27** කොල්ලය දෙ-
කට බෙදා එක කොටසක් සටනට
ගිය අයට දෙන්න. අනික් කොටස
සටනට නොගිය සියලුදෙනා අතරේ
බෙදන්න.[2] **28** සටනට ගිය අයට
ලැබෙන කොල්ලයෙන් කොටසක්[3]
වෙන් කර එය යෙහෝවා දෙවි වන
මට දිය යුතුයි.* මිනිසුන් පන්සි-
යදෙනාගෙන් එක් කෙනා බැගින්ද
ගවයන්, එළුවන්, බැටළුවන් හා බූරු-
වන් පන්සියදෙනාගෙන් එක් කෙනා
බැගින්ද මට දිය යුතුයි. **29** ඔවුන්ට
ලැබෙන කොල්ලයෙන් වෙන් කරන
එම කොටස පූජක එලියාසර්ට
දෙන්න. එය යෙහෝවා දෙවි වන
මට දෙන පරිත්‍යාගයකි.[4] **30** ඊශ්‍රා-
යෙල් සෙනඟට ලැබෙන කොටසින්ද
යමක් වෙන් කළ යුතුයි. මිනිසුන්
පනස්දෙනාගෙන් එක් කෙනා බැගින්ද
ගවයන්, එළුවන්, බැටළුවන් හා බූරු-
වන් පනස්දෙනාගෙන් එක් කෙනා
බැගින්ද කොටසක් වෙන් කර යෙ-
හෝවා දෙවි වන මාගේ ශුද්ධ කූඩා-
රමේ වැඩකටයුතු කරමින් සිටින[5]
ලෙවීවරුන්ට දෙන්න.”[6]

**31** මෝසෙස් හා පූජක එලියා-
සර් යෙහෝවා දෙවි අණ කළ
ලෙස කළෝය. **32** සටනට ගිය අය
කොල්ල කා ගත් දෙයින් ඉතුරු වූ
කොටස මෙයයි. එළු බැටළු රැළෙන්
හයලක්ෂ හැත්තෑපන්දහසක්ද
**33** ගව රැළෙන් හැත්තෑදෙදහසක්ද
**34** බූරුවන්ගෙන් හැටඑක්දහසක්ද
**35** පුරුෂයෙකු සමඟ ලිංගික සම්-
බන්ධකම් නොපැවැත්වූ[7] ස්ත්‍රීහු

**ගණන් 31:28*** හෝ, “බද්දක් වශයෙන් යෙහෝවා දෙවිට දිය යුතුයි.”

තිස්දෙදහසක්ද ඉතුරුව සිටියෝය.
**36** සටනට ගිය අයට එළු බැටළු
රැළෙන් සතුන් තුන්ලක්ෂ තිස්හත්ද-
හස් පන්සියයක් ලැබිණ. **37** ඔවුහු
එළු බැටළු රැළෙන් සතුන් හය-
සිය හැත්තෑපස්දෙනෙකුව වෙන් කර[1]
එම සතුන්ව යෙහෝවා දෙවිට දුන්-
නෝය. **38** ගව රැළෙන් ඔවුන්ට
සතුන් තිස්හයදහසක් ලැබුණු අතර
ඔවුහු එයින් හැත්තෑදෙදෙනෙකුව
වෙන් කර යෙහෝවා දෙවිට දුන්-
නෝය. **39** ඔවුන්ට බූරුවන් තිස්ද-
හස් පන්සියදෙනෙකු ලැබිණ. එයින්
හැටඑක්දෙනෙකුව ඔවුහු වෙන්
කර යෙහෝවා දෙවිට දුන්නෝය.
**40** ඔවුන්ට ස්ත්‍රීන් දහසයදහස්දෙ-
නෙකුව ලැබුණු අතර ඔවුන්ගෙන්
තිස්දෙදෙනෙකුව යෙහෝවා දෙවිට
දුන්නෝය. **41** යෙහෝවා දෙවි අණ
කළ ලෙස[2] මෝසෙස් කොල්ලයෙන්
වෙන් කළ එම කොටස පූජක එලි-
යාසර්ට දුන්නේය. එය යෙහෝවා
දෙවිට දුන් පරිත්‍යාගයකි.[3]

**42** ඊශ්‍රායෙල් සෙනඟට එනම්,
සටනට නොගිය අයට මෝ-
සෙස් දුන් කොටස මෙයයි. **43** එළු
බැටළු රැළෙන් සතුන් තුන්ලක්ෂ
තිස්හත්දහස් පන්සියයක්ද **44** ගව
රැළෙන් සතුන් තිස්හයදහසක්ද
**45** බූරුවන් තිස්දහස් පන්සියයක්ද
**46** ස්ත්‍රීන් දහසයදහස්දෙනෙකුද
ඔවුන්ට ලැබිණ. **47** මෝසෙස් යෙ-
හෝවා දෙවි අණ කළ ලෙස ඊශ්‍රායෙල්
සෙනඟට ලැබුණු එම කොටසෙන්
යෙහෝවා දෙවිගේ ශුද්ධ කූඩාරමේ
වැඩකටයුතු කරමින් සිටි[4] ලෙවීව-
රුන්ට කොටසක් දුන්නේය.[5] සෙ-
නඟට ලැබුණු සෑම මනුෂ්‍යයන් හා
සතුන් පනස්දෙනාගෙන් එක් කෙනා
බැගින් ලෙවීවරුන්ට දුන්නේය.

**48** පසුව ඊශ්‍රායෙල් හමුදාවේ සිය-
යකින් යුත් කණ්ඩායම් කෙරෙහිද දහ-
සකින් යුත් කණ්ඩායම්[6] කෙරෙහිද
පත් කර සිටි ප්‍රධානීහු[7] මෝසෙස්
ළඟට ඇවිත් **49** මෙසේ කීවෝය.
"අපි යටතේ සේවය කරන පුරුෂයන්ව
අපි ගණන් කර බැලුවා. ඔවුන්ගෙන්
එක් කෙනෙක්වත් අඩු වී නැහැ.[1]
**50** අපි එක් එක් කෙනාට ලැබුණු
රන් ආභරණවලින් එනම්, පාද සලං,
වළලු, මුද්‍රා තබන මුදු,[2] කරාබු හා
අනික් ආභරණවලින්[3] යම් ප්‍රමාණයක්
යෙහෝවා දෙවිට අපි දෙන්න කැම-
තියි.[4] අපේ පව්වලට සමාව ලබාගැ-
නීම සඳහා යෙහෝවා දෙවිට ඒ දේවල්
අපි දෙන්නේ සතුටින්."

**51** මෝසෙස් හා පූජක එලියා-
සර් ඔවුන් ගෙනැවිත් දුන් රන්
ආභරණ සියල්ලම භාරගත්තෝය.[5]
**52** ඊශ්‍රායෙල් හමුදාවේ දහසකින් යුත්
කණ්ඩායම් කෙරෙහිද සියයකින් යුත්
කණ්ඩායම් කෙරෙහිද පත් කර සිටි
ප්‍රධානීන් යෙහෝවා දෙවිට තෑගි කළ
රන් ආභරණවල බර ෂෙකෙල් දහසය-
දහස් හත්සිය පනහක් විය. **53** හමු-
දාවේ සිටි පුරුෂයන් සියලුදෙනාට
කොල්ල කා ගත් දෙයින් කොටසක්
ලැබිණ.[6] **54** මෝසෙස් හා පූජක
එලියාසර් හමුදාවේ දහසකින් යුත්
කණ්ඩායම් කෙරෙහිද සියයකින් යුත්
කණ්ඩායම් කෙරෙහිද පත් කර සිටි
ප්‍රධානීන්ගෙන් එම රන් ආභරණ භාර-
ගත්තෝය. යෙහෝවා දෙවි ඊශ්‍රායෙල්
සෙනඟව සිහි කරන පිණිස[7] ඔවුහු
ඒවා සම්මුඛ වීමේ කූඩාරමේ තැබු-
වෝය.

**32** රූබෙන්වරුන්ට[8] හා ගාද්ව-
රුන්ට[9] බොහෝ සත්ව රැළ-
වල් සිටියෝය. යාසෙර්[10] හා
ගිලියද් යන ප්‍රදේශ සතුන් ඇති
කිරීම සඳහා ඉතා හොඳ බව ඔවුහු
දුටුවෝය. **2** එබැවින් ඔවුහු මෝ-
සෙස්, පූජක එලියාසර් හා සෙ-
නඟ අතරේ සිටි ප්‍රධානීන් වෙත
ගොස් මෙසේ කීවෝය. **3** "අටා-
රොත්,[11] දීබොන්,[12] යාසෙර්, නිම්රා,[13]
හෙෂ්බොන්,[14] එලෙයාලෙ,[15] සෙ-
බාම්, නෙබෝ[16] හා බෙයොන්[17] යන
ප්‍රදේශ **4** යෙහෝවා දෙවි යටත්
කරගෙන[18] ඊශ්‍රායෙල්වරුන්ගේ අතට
භාර දුන්නා. සතුන් ඇති කරන්න ඒ
ප්‍රදේශ කදිමයි. ඔබේ සේවකයන් වන

**31 පරි.**
1 උත් 14:20; 1ලේක 26:27
2 ගණන් 5:9
3 ගණන් 18:8; ගණන් 18:19; 1කොරි 9:14; ගලා 6:6; හෙබ්‍රෙ 7:5
4 ගණන් 3:7; ගණන් 18:3; ගණන් 31:30; 1ලේක 23:32
5 ද්වි 12:12; ද්වි 12:19
6 ගණන් 31:4
7 ගණන් 1:4; ගණන් 1:16; ගණන් 31:14; ද්වි 1:15

**2 තීරුව**
1 නික් 23:27; ලේවී 26:7
2 උත් 41:42
3 නික් 35:22
4 ගීතා 96:8
5 ගණන් 18:8; ගණන් 18:19
6 ද්වි 20:14
7 නික් 30:16

**32 පරි.**
8 ගණන් 26:7; යොෂු 13:15
9 ගණන් 26:18; යොෂු 13:24
10 ගණන් 21:32; යොෂු 13:25; යෙසා 16:8
11 ගණන් 32:34
12 ගණන් 21:30; යොෂු 13:9
13 ගණන් 32:36
14 ගණන් 21:26
15 ගණන් 32:37; යෙරෙ 48:34
16 ගණන් 33:47
17 ගණන් 32:38
18 ගණන් 21:24; ද්වි 2:24; ද්වි 3:18

අපට විශාල සත්ව රැළක් සිටිනවා.[1]
**5** ඒ නිසා අපි කියන මේ දේ ගැන
ටිකක් සිතා බලන්න කියා ඔබෙන්
බැගෑපත්ව ඉල්ලා සිටිනවා. අපට
යොර්දාන් ගඟෙන් එගොඩට යන්න
කියන්න එපා. ඔබේ සේවකයන් වන
අපට මේ ප්‍රදේශ උරුමයක් හැටියට
දෙන්න.”[2]
**6** එවිට මෝසෙස් රූබෙන්වරුන්ට
හා ගාද්වරුන්ට මෙසේ කීවේය. “ඔබ
මෙහේ නතර වී ඔබේ සහෝදර-
යන්ව විතරක් යුද්දෙට යවන එක
හරිද?[3] **7** ඊශ්‍රායෙල් සෙනඟව ඔබ
අධෛර්යයට පත් කරන්නද හදන්-
නේ? ඔබ එසේ කළොත් යෙහෝවා
දෙවි ඔවුන්ට දෙන්න පොරොන්දු වූ
දේශයට ඔවුන් යන්න බැහැ කියයි.
**8** දේශයේ තොරතුරු සොයා බලන්න
මම කාදෙෂ්-බර්නේයේ[4] සිට මිනිස්සු
යැවූ අවස්ථාවේදී ඔබේ පියවරු-
නුත් කළේ ඒ දේමයි.[5] **9** එෂ්-
කොල් නිම්නයේ[6] සිට ඔවුන් දේශය
දෙස බලා ආපසු ඇවිත් යෙහෝවා
දෙවි දෙන්න පොරොන්දු වූ දේශයට
යන්න බැහැයි කියමින් ඊශ්‍රායෙල්
සෙනඟව අධෛර්යයට පත් කළා.[7]
**10** ඒ නිසා යෙහෝවා දෙවි ඊශ්‍රා-
යෙල් සෙනඟ සමඟ උදහස් වී දිවුරා[8]
මෙහෙම කිව්වා. **11** ‘මේ සෙනඟ
මුළු සිතින් මාව විශ්වාස නො-
කළ බැවින් මම ආබ්‍රහම්ට, ඊසාක්ට
හා යාකොබ්ට දෙන්න පොරොන්දු
වූ ඒ දේශය[9] ඔවුන්ට දකින්නවත්
ලැබෙන්නේ නැහැ. ඊජිප්තු දේශ-
යෙන් පිටතට පැමිණි වයස අවු-
රුදු විස්සක් හෝ ඊට වඩා වැඩි[10]
කිසිම කෙනෙකුට ඒ දේශය දකින්න
ලැබෙන්නේ නැහැ. **12** නමුත් කෙ-
නිෂ්ෂිවරයෙක් වූ යෙෆුන්නෙගේ
පුත්‍රයා වන කාලෙබ්[11] හා නූන්ගේ
පුත්‍රයා වන යොෂුවා[12] යෙහෝවා දෙවි
වන මාව මුළු සිතින්ම විශ්වාස කළ
බැවින් ඒ පරම්පරාවෙන් එම දේශයට
යන්නේ ඔවුන් දෙදෙනා පමණයි.’
**13** යෙහෝවා දෙවි ඊශ්‍රායෙල් සෙනඟ
සමඟ උදහස් වූ නිසා යෙහෝවා දෙ-
විට විරුද්ධව කැරලිගැසූ සෑම කෙ-
නෙක්ම විනාශ වන තුරු[1] අවුරුදු
හතළිහක් පුරා ඔවුන්ට පාළුකරයේ
ඇවිදින්න සිදු වුණා.[2] **14** පව්කාර
සෙනඟෙනි, ඔබ ක්‍රියා කරන්නේ ඔබේ
පියවරුන් ක්‍රියා කළ විදිහටමයි. ඔබ
හදන්නේ ඊශ්‍රායෙල් සෙනඟට විරුද්-
ධව ඇවුළුණු යෙහෝවා දෙවිගේ උද-
හස[3] තව තවත් වැඩි කරන්නද?
**15** ඔබ දෙවිට අකීකරු වුණොත්[4]
ඔහු මේ සෙනඟට තවත් කාලයක්
පාළුකරයේ ඉන්න ඉඩහරියි.[5] ඔබ
කරන දෙයින් මේ සෙනඟ පිටට මහත්
විනාශයක් පැමිණෙයි.”[6]
**16** පසුව රූබෙන්වරු හා ගාද්වරු
මෝසෙස්ට මෙසේ කීවෝය. “අපේ
දරුවන්ට ජීවත් වෙන්න මෙහේ නුව-
රවල් ගොඩනඟන්නත් අපේ සතුන්ට
ගාල් හදන්නත් අපට අවසර දෙන්න.
**17** අපේ දරුවන්ව අවට දේශවල
වැසියන්ගෙන් ආරක්ෂා කරන පිණිස
අපි ගොඩනඟන නුවරවල ඔවුන්ව
නතර කරන්නම්. නමුත් අපි, යුද්දෙට
සැරසී[7] ඊශ්‍රායෙල් සෙනඟ ඉදිරියෙන්
ගමන් කරන්නම්. ඔවුන්ට හිමි දේශ-
යට ඔවුන් පැමිණෙන තුරු අපි ඔවුන්
සමඟ ඉන්නම්. **18** ඔවුන් සියලුදෙ-
නාම තම තමන්ගේ උරුමය ලබා-
ගන්නා තුරු අපි අපේ ගෙවල්වලට
හැරී එන්නේ නැහැ.[8] **19** යොර්දාන්
ගඟෙන් එගොඩ තියෙන දේශය අයිති
ඔවුන්ටයි. අපිට ඒ දේශයෙන් උරුම-
යක් එපා. යොර්දාන් ගඟේ නැඟෙන-
හිර පැත්තේ තියෙන මේ ප්‍රදේශ ටික
අපිට උරුමයක් හැටියට දෙන්න.”[9]
**20** එවිට මෝසෙස් ඔවුන්ට මෙසේ
කීවේය. “ඔබ පැවසූ ලෙස යෙ-
හෝවා දෙවි වෙනුවෙන් සටන්
කරන පිණිස යුද්ධයට සැරසෙන්න.[10]
**21** ඔබ සමඟ ඉන්න සෑම පුරුෂ-
යෙක්ම යොර්දාන් ගඟෙන් එගොඩ
වෙන්න. යෙහෝවා දෙවි තම සතු-
රන්ව සම්පූර්ණයෙන්ම විනාශ කර
දමන තුරු ආපසු හැරී නොඑන්න.[11]
**22** යෙහෝවා දෙවි දේශය යටත්

**32 පරි.**
**1** උත් 46:34; ද්වි 2:35
**2** යොෂු 1:12; යොෂු 1:14; යොෂු 13:8
**3** පිලි 2:4
**4** යොෂු 14:7
**5** ගණන් 13:31; යොෂු 14:8
**6** ගණන් 13:23; ද්වි 1:24
**7** ගණන් 13:32; ද්වි 1:26
**8** ගණන් 14:28; ද්වි 1:34; ගීතා 95:11; එස 20:15; හෙබ්‍රෙ 3:18
**9** උත් 13:15; උත් 26:3; උත් 28:13
**10** ගණන් 14:29; ද්වි 1:35; ද්වි 2:14
**11** ගණන් 13:30; ගණන් 14:24; ද්වි 1:36; යොෂු 14:8
**12** ගණන් 14:30; ද්වි 1:38; යොෂු 19:49

**2 තීරුව**
**1** ගණන් 26:64; ද්වි 2:14; 1කොරි 10:5; හෙබ්‍රෙ 3:17
**2** ගණන් 14:33; ද්වි 29:5; යොෂු 5:6; ගීතා 95:10; ක්‍රියා 7:36; ක්‍රියා 13:18
**3** ද්වි 1:34; ක්‍රියා 7:51
**4** හෙබ්‍රෙ 10:38
**5** නික් 23:21
**6** 2ලේක 15:2
**7** ද්වි 3:18; යොෂු 4:12
**8** යොෂු 22:4
**9** ගණන් 32:33; යොෂු 12:1; යොෂු 13:8; 2රාජා 10:33
**10** ද්වි 3:18; යොෂු 1:14; යොෂු 4:13
**11** ගීතා 78:55

කර දෙන තෙක්[1] ඔබ ගොඩනැඟූ
නුවරවලට නොයා[2] දිගටම සටන්
කළොත් ඔබ යෙහෝවා දෙවි හා
ඊශ්‍රායෙල් සෙනඟ ඉදිරියේ නිදොස්.
එවිට යෙහෝවා දෙවි මේ ප්‍රදේ-
ශය උරුමයක් හැටියට ඔබට දෙයි.[3]
**23** නමුත් ඔබ එලෙස ක්‍රියා නොක-
ළොත් යෙහෝවා දෙවි ඔබව පව්කා-
රයන් හැටියට ගණන් ගනියි.[4] එම
පාපයට ඔබට කවදා හරි වන්දි ගෙ-
වන්න සිදු වෙන බව අමතක කරන්න
එපා.[5] **24** දැන් ගිහින් ඔබේ දරු-
වන්ට ජීවත් වෙන්න නුවරවල් ගොඩ-
නඟන්න. ඔබේ සතුන්ට ඉන්න ගාල්
හදන්න. ඔබ පොරොන්දු වූ ලෙසම
කරන්න.”[6]

**25** එවිට ගාද්වරු හා රූබෙන්වරු
මෝසෙස්ට මෙසේ කීවෝය. “ඔබේ
සේවකයන් වන අප ඔබ පැවසූ
ලෙස කරන්නම්.[7] **26** අපේ භාර්යා-
වන්, දරුවන් හා සත්ව රැළවල් ගිලි-
යද් ප්‍රදේශයේ නුවරවල නතර කර[8]
**27** යෙහෝවා දෙවි වෙනුවෙන් සටන්
කරන පිණිස ගඟෙන් එගොඩට යන්න
අපි කැමතියි.[9] ඔබයි අපේ ස්වාමීන්.
ඒ නිසා ඔබ කියන ලෙසම අපි කරන්-
නම්.”

**28** මෝසෙස්, රූබෙන්වරුන් හා
ගාද්වරුන් සම්බන්ධයෙන් පූජක එලි-
යාසර්ටද නූන්ගේ පුත්‍රයා වන
යොෂුවාටද ඊශ්‍රායෙල්හි ගෝත්‍රවල
ප්‍රධානීන්ටද **29** මෙසේ කීවේය.
“ගාද් හා රූබෙන් ගෝත්‍රවලට
අයත් සියලු පුරුෂයන් යොර්දාන්
ගඟෙන් එගොඩට ගොස් දේශය සම්-
පූර්ණයෙන්ම යටත් කරගන්නා තුරු
යෙහෝවා දෙවි වෙනුවෙන් සටන්
කළොත්[10] පමණක් ඔවුන්ට ගිලියද්
දේශය උරුමයක් හැටියට දෙන්න.[11]
**30** නමුත් ඔවුන් යුද්ධයට සැරසී ඔබ
සමඟ ගඟෙන් එගොඩට යන්න ආවේ
නැත්නම් ඔබ ඔවුන්වත් කානාන් දේ-
ශයට ගෙන ගොස් එහි පදිංචි කර-
වන්න.”[12]

**31** එය අසා ගාද් හා රූබෙන්
ගෝත්‍රවලට අයත් පුරුෂයෝ මෙසේ
කීවෝය. “ඔබේ සේවකයන් වන
අපි යෙහෝවා දෙවි පැවසූ ලෙසම
කරන්න කැමතියි.[1] **32** යෙහෝවා
දෙවි වෙනුවෙන් සටන් කරන පිණිස
අපි ගඟෙන් එගොඩ වී කානාන් දේශ-
යට යන්නම්.[2] නමුත් ගඟෙන් මේ
පැත්තේ තියෙන ප්‍රදේශය අපේ උරු-
මය ලෙස අපට ලබා දෙන්න.”[3]
**33** මෝසෙස්, ගාද් ගෝත්‍රයටත්[4]
රූබෙන් ගෝත්‍රයටත්[5] යෝසෙප්ගෙන්
පැවත ආ මනස්සේ ගෝත්‍රයෙන්[6]
එක් කොටසකටත් අමෝරිවරුන්-
ගේ රජු වූ සීහොන්ගේ රාජධානියේ[7]
පිහිටි නුවරවල් හා ඒ අවට ප්‍රදේශද
බාෂාන්හි රජු වූ ඕග්ගේ රාජධානියට[8]
අයිතිව තිබූ නුවරවල් හා ඒ අවට
ප්‍රදේශද දුන්නේය.

**34** පසුව ගාද් ගෝත්‍රයට අයත් අය
දීබොන්,[9] අටාරොත්,[10] අරෝයේර්,[11]
**35** අට්රොත්-ෂොෆාන්, යාසෙර්,
යොග්බෙහා, **36** බෙත්-නිම්රා,[12]
බෙත්-හාරාන්[13] යන නුවරවල් ගොඩ-
නඟා ඒවා වටා පවුරුද ඉදි කළෝය.[14]
ඔවුහු සත්ව රැළවල් සඳහා ගාල්ද
සෑදුවෝය.[15] **37** රූබෙන් ගෝත්‍රයට
අයත් අය හෙෂ්බොන්,[16] එලෙයාලෙ,[17]
කිර්යතායිම්,[18] **38** නෙබෝ,[19] බාල්-
මෙයොන්,[20] සිබ්මා යන නුවර-
වල් නැවත ගොඩනැඟුවෝය. ඉන්පසු
ඔවුහු එම නුවරවලට අලුත් නම්
තැබුවෝය.

**39** මනස්සේගේ පුත්‍රයා වූ මාකීර්-
ගෙන්[21] පැවත ආ අය ගිලියද් දෙසට
ගමන් කර එහි ජීවත් වූ අමෝරිව-
රුන්ව පන්නා දමා එම ප්‍රදේශය
යටත් කරගත්තෝය. **40** එබැවින්
මනස්සේගේ පුත්‍රයා වූ මාකීර්ගෙන්
පැවත ආ අයට මෝසෙස් ගිලියද් නම්
ප්‍රදේශය* දුන්නේය.[22] **41** මනස්සේ
ගෝත්‍රයේ කෙනෙකු වූ යායිර් ගිලි-
යද් ප්‍රදේශයේ තිබූ කුඩා නුවර-
වල් දෙසට ගමන් කර ඒවා යටත්
කරගත්තේය. ඔහු එම නුවරවලට

**ගණන් 32:40*** සමහරවිට ගිලියද් නම් ප්‍රදේශයෙන් කොටසක් විය හැක.

**32 පරි.**
1 ද්වි 3:20, යොෂු 11:23, යොෂු 18:1, ගීතා 44:2
2 යොෂු 22:4, යොෂු 22:9
3 ද්වි 3:12, යොෂු 1:15, යොෂු 13:8
4 ගණන් 15:22, යාකො 4:17
5 හිතෝ 13:21, යෙසා 59:12, ගලා 6:7
6 ගණන් 32:16, ගණන් 32:34, ගණන් 32:37
7 යොෂු 1:13
8 යොෂු 1:14
9 යොෂු 4:12
10 ගණන් 32:20
11 යොෂු 1:15, යොෂු 13:15, යොෂු 13:24
12 ගණන් 32:5

**2 තීරුව**
1 ගණන් 32:25
2 යොෂු 4:13
3 යොෂු 1:15, 2රාජ 10:33
4 ද්වි 3:12
5 යොෂු 13:8
6 ද්වි 29:8, යොෂු 12:6, යොෂු 22:7, 1ලේක 5:18
7 ගණන් 21:23, ගණන් 21:24, ද්වි 2:31, ගීතා 136:19
8 ද්වි 3:4, ගීතා 135:11
9 ගණන් 21:30, ගණන් 33:45, යොෂු 13:17
10 ගණන් 32:3
11 ද්වි 2:36, යොෂු 12:2, විනි 11:26
12 ගණන් 32:3
13 යොෂු 13:27
14 ගණන් 32:17
15 ගණන් 32:24
16 ගණන් 21:26, යොෂු 13:17
17 ගණන් 32:3, යෙරෙ 48:34
18 යොෂු 13:19
19 ගණන් 32:3
20 යොෂු 13:17, එස 25:9
21 ගණන් 26:29
22 ද්වි 3:13, යොෂු 13:31, යොෂු 17:1

හව්වෝත්-යායීර්[1] යන නම තැබු-
වේය. **42** කේනත්[2] දෙසට ගමන්
කළ නෝබා, එම නුවරද ඒ අවට
තිබූ කුඩා නුවරවල්ද යටත් කරගත්-
තේය. ඔහු තමාගේ නමින් එම නුවර
හැඳින්විය.

**33** මෝසෙස් හා ආරොන්ගේ
නායකත්වය යටතේ[3] කණ්-
ඩායම්*[4] වශයෙන් ඊජිප්තු දේශයෙන්[5]
පිටත්ව ආ ඊශ්‍රායෙල් සෙනඟගේ
ගමන් විස්තර මෙසේය. **2** යෙ-
හෝවා දෙවි අණ කළ පරිදි ඔවුන්
නතර වූ එක් එක් ස්ථාන මෝසෙස්
සටහන් කරගත්තේය. ඔවුන් කඳවුරු
බැඳගත් ස්ථාන මේවාය.[6] **3** ඊශ්‍රා-
යෙල් සෙනඟ පාස්කු උත්සවයට[7]
පසුවදා එනම්, පළමුවෙනි මාසයේ[8]
පහළොස්වන දිනයේදී රමෙසේස්[9]
සිට පිටත්ව ගියෝය. ඊජිප්තුවරුන්
බලා සිටියදීම ඊශ්‍රායෙල්වරු ඊජිප්තු
දේශයෙන් ජයග්‍රාහී ලෙස* පිටත්ව
ගියෝය.[10] **4** ඔවුන් පිටත්ව යන
අතරතුර යෙහෝවා දෙවිගෙන් ඊජිප්-
තුවරුන් ලැබූ දඬුවම නිසා ඔවුහු මිය
ගිය තම කුලුඳුලන්ව තැන්පත් කර-
මින් සිටියෝය.[11] එසේ යෙහෝවා
දෙවි ඊජිප්තුවරුන්ගේ දෙවිවරුන්ට
පහර දුන්නේය.[12]

**5** ඊශ්‍රායෙල් සෙනඟ රමෙසේස්[13]
සිට පිටත්ව ගොස් සුක්කොත්හි[14]
කඳවුරු බැඳගත්තෝය. **6** පසුව
ඔවුහු එතැනින් පිටත්ව ගොස් පාළුක-
රය අසල තිබෙන ඒතාම්[15] නම් ස්ථා-
නයේ නතර වූහ. **7** පසුව ඔවුහු
එතැනින් ආපස්සට හැරී මිග්දෝල්[16]
අසල තිබෙන පීහහීරොත්[17] නම්
ස්ථානය වෙතට ගමන් කර එහි
කඳවුරු බැඳගත්තෝය. පීහහීරොත්
තිබෙන්නේ බාල්-ෂෙපොන්[18] ඉදිරි-
පිටය. **8** පීහහීරොත්හි සිටි ඔවුහු
රතු මුහුද හරහා[19] ගමන් කරමින්
පාළුකරයට[20] ගියෝය. ඔවුහු දවස්
තුනක් ඒතාම් පාළුකරයේ[21] ගමන්
කර මාරාහ්[1] නම් ස්ථානයට පැමිණ
එහි කඳවුරු බැඳගත්තෝය.

**9** මාරාහ්හි සිට ඔවුහු ඒලිම් වෙත
ආවෝය.[2] ඒලිම්හි දිය උල්පත් දොළ-
හක්ද තාල වර්ගයේ ගස් හැත්-
තෑවක්ද තිබූ බැවින් ඔවුහු එහි
කඳවුරු බැඳගත්තෝය. **10** පසුව
ඔවුහු එතැනින් පිටත්ව ගොස් රතු
මුහුද අසල නතර වූහ. **11** ඔවුහු
රතු මුහුද ළඟින් පිටත්ව ගිය පසු
සීන් පාළුකරයේ කඳවුරු බැඳගත්-
තෝය.[3] **12** ඊළඟට ඔවුහු එතැ-
නින් පිටත්ව දොප්කා වෙතට
පැමිණ එහි කඳවුරු බැඳගත්තෝය.
**13** පසුව ඔවුහු දොප්කා සිට අලූෂ්
වෙතට ගොස් නතර වූහ. **14** එතැ-
නින් ඔවුහු රෙෆිඩීම්[4] වෙතට ගොස්
කඳවුරු බැඳගත්තෝය. එම ස්ථාන-
යේ සෙනඟට බීමට වතුර නොතිබු-
ණේය. **15** ඉන්පසු ඔවුහු රෙෆිඩීම්හි
සිට සීනයි පාළුකරයට ගොස් එහි
කඳවුරු බැඳගත්තෝය.[5]

**16** සීනයි පාළුකරයෙන් පිටත්ව
ගිය පසු ඔවුහු කිබ්‍රොත්-හත්තාවා[6]
වෙත පැමිණ එහි කඳවුරු බැඳගත්-
තෝය. **17** එතැනින් පිටත්ව ගොස්
ඔවුහු හශේරොත්හි කඳවුරු බැඳ-
ගත්තෝය.[7] **18** පසුව ඔවුහු හශේ-
රොත් සිට රිත්මා දක්වා ගොස්
එහි නතර වූහ. **19** රිත්මාහි සිට
පිටත්ව ගොස් ඔවුහු රිම්මොන්-
පෙරෙෂ්හිද කඳවුරු බැඳගත්තෝය.
**20** ඔවුහු රිම්මොන්-පෙරෙෂ්හි සිට
ලිබ්නා වෙත ගොස් එහි කඳවුරු බැඳ-
ගත්තෝය. **21** පසුව ඔවුහු ලිබ්නා
වෙතින් පිටත්ව රිස්සා වෙත
ගොස් කඳවුරු බැඳගත්තෝය.
**22** ඊළඟට ඔවුහු එතැනින් පිටත්ව
කෙහෙලාතා වෙතට පැමිණ එහි
කඳවුරු බැඳගත්තෝය. **23** ඉන්-
පසු ඔවුහු කෙහෙලාතා සිට ෂේෆර්
කන්ද දක්වා ගොස් එතැන කඳවුරු
බැඳගත්තෝය.

**24** පසුව ඔවුහු එතැනින් පිටත්ව
හරදා දක්වා ගොස් එහි නතර වූහ.[8]
**25** ඊළඟට ඔවුහු හරදා සිට මක්හේ-

**32 පරි.**
1 ද්වි 3:14
යොෂු 13:30
2 1ලේක 2:23

**33 පරි.**
3 යොෂු 24:5
1සාමු 12:8
ගීතා 77:20
මීකා 6:4
4 නික් 13:18
5 නික් 12:51
6 ගණන් 9:17
7 නික් 12:6
ගණන් 9:3
ද්වි 16:1
8 නික් 12:2
නික් 13:4
9 උත් 47:11
නික් 12:37
10 නික් 14:8
11 නික් 12:29
ගීතා 78:51
12 නික් 12:12
නික් 18:11
13 උත් 47:11
14 නික් 12:37
15 නික් 13:20
16 නික් 14:2
17 නික් 14:2
18 නික් 14:9
19 නික් 14:22
ගීතා 106:9
හෙබ්‍රෙ 11:29
20 නික් 15:22
21 නික් 13:20

**2 තීරුව**
1 නික් 15:23
2 නික් 15:27
3 නික් 16:1
4 නික් 17:1
නික් 17:8
5 නික් 18:5
නික් 19:1
නික් 19:2
ගණන් 1:1
ගණන් 3:4
ගණන් 9:1
6 ගණන් 11:34
ද්වි 9:22
7 ගණන් 11:35
ගණන් 12:16
ද්වි 1:1
8 ගණන් 2:3
ගණන් 2:10
ගණන් 2:18
ගණන් 2:25
ගණන් 2:34

**ගණන් 33:1*** මූ.අ., "සේනා." **3*** මූ.අ., "දැත් ඔසවාගෙන."

ලොත් දක්වා ගියෝය. **26** එතැ-
නින් පිටත්ව[1] ඔවුහු තහත්
වෙතට ගොස් කඳවුරු බැඳගත්-
තෝය. **27** පසුව තහත්හි සිට ඔවුහු
ටේරා දක්වා ගමන් කර කඳවුරු
බැඳගත්තෝය. **28** ඊළඟට එතැ-
නින් ඔවුහු මිත්කා වෙත ගියෝය.
**29** මිත්කාහි සිට ඔවුහු හෂ්-
මොනා දක්වා ගියෝය. **30** ඔවුහු
එතැනින් පිටත්ව මොසේරොත් වෙත
ගොස් එහි කඳවුරු බැඳගත්තෝය.
**31** මොසේරොත්හි සිට බෙනෙ-
යායකන් වෙත ගොස් එහිද නතර
වූහ.[2] **32** පසුව එතැනින් පිටත්ව
ගොස් හෝර්-හග්ගිද්ගාද් වෙත පැමිණ
කඳවුරු බැඳගත්තෝය. **33** හෝර්-
හග්ගිද්ගාද්හි සිට ඔවුහු යොත්බාතා
දක්වා ගමන් කළෝය.[3] **34** පසුව
එතැනින් පිටත්ව අබ්රොනා දක්වා
ගොස් එහිද නතර වූහ. **35** ඔවුහු
අබ්රොනා සිට එෂියොන්-ගෙබෙර්[4]
වෙතද ගොස් කඳවුරු බැඳගත්තෝය.
**36** පසුව එෂියොන්-ගෙබෙර්හි සිට
පිටත්ව ගොස් ෂින් පාළුකරයේ[5]
කාදෙෂ් නම් ස්ථානයට පැමිණ ඔවුහු
නතර වූහ.

**37** පසුව ඔවුහු ඒදොම්හි දේශ
සීමාවේ පිහිටි හෝර් කන්ද[6]
වෙතට ගොස් එය අසල කඳවුරු
බැඳගත්තෝය. **38** ඒ අවස්ථාවේදී
යෙහෝවා දෙවි අණ කළ පරිදි පූජක
ආරොන් හෝර් කන්දට ගියේය. ඒ
වන විට ඊශ්‍රායෙල් සෙනඟ ඊජිප්තු
දේශයෙන් පිටත්ව ඇවිත් අවුරුදු
හතළිහක් ගත වී තිබිණ. ඒ හතළිස්-
වෙනි අවුරුද්දේ පස්වෙනි මාසයේ
පළමුවෙනිදා ආරොන් හෝර් කන්දේදී
මිය ගියේය.[7] **39** ආරොන් මිය යන
විට ඔහුට වයස අවුරුදු එකසිය විසි-
තුනක් විය.

**40** ඊශ්‍රායෙල් සෙනඟ තම දේශය
වෙතට පැමිණෙන බව කානාන් ජාති-
කයෙකු වූ ආරද්හි[8] රජුට ආරංචි විය.
ඔහු කානාන් දේශයේ නෙගෙබ්හි[9]
ජීවත් වෙමින් සිටියේය.

**41** ඊශ්‍රායෙල් සෙනඟ හෝර්
කන්ද[1] අසලින් පිටත්ව ෂල්මොනා
දක්වා ගමන් කළෝය. **42** ඔවුහු
එතැනින් පිටත්ව ගොස් පූනොන් වෙ-
තට ඇවිත් කඳවුරු බැඳගත්තෝය.
**43** පූනොන්හි සිට ඔවුහු ඔබොත්
දක්වා ගමන් කළෝය.[2] **44** ඊළඟට
ඔවුහු මෝවබ්හි[3] දේශ සීමාව ළඟ
තිබෙන ඉයෙ-අබරිම්* නම් ස්ථාන-
යට පැමිණියෝය. **45** ඉයිම් සිට
ඔවුහු දීබොන්-ගාද්[4] දක්වා ගියෝය.
**46** දීබොන්-ගාද්හි සිටි ඔවුහු
අල්මොන්-දිබ්ලාතයිම් දක්වා ගමන්
කර එහි නතර වූහ. **47** ඊළඟට
ඔවුහු එතැනින්[5] පිටත්ව නෙ-
බෝ කන්ද[6] ඉදිරිපිට තිබෙන අබරිම්
කඳුකරයේ[7] කඳවුරු බැඳගත්තෝය.
**48** ඔවුහු අබරිම් කඳුකරයේ සිට
යොර්දාන් ගඟ හා යෙරිකෝව අසල
තිබෙන මෝවබ් පාළුකරය[8] වෙත
ගියෝය. **49** මෝවබ් පාළුකරයේ
යොර්දාන් ගඟ අද්දර ඔවුහු කඳවුරු
බැඳගත්තෝය. ඔවුන් කඳවුරු බැඳ-
ගෙන සිටි ප්‍රදේශය බෙත්-යෙෂිමොත්[9]
සිට ආබෙල්-ෂිට්ටිම්[10] දක්වා විහිදී
ගියේය.

**50** යොර්දාන් ගඟ හා යෙරිකෝව[11]
අසල තිබෙන මෝවබ් පාළුකරයේදී
යෙහෝවා දෙවි මෝසෙස්ට මෙසේ
කීවේය. **51** "ඊශ්‍රායෙල් සෙනඟට
ඔබ මෙසේ කියන්න. 'ඔබ යොර්දාන්
ගඟෙන් එගොඩ වී කානාන් දේශ-
යට ගිය පසු[12] **52** ඒ දේශයේ ජීවත්
වන සියලු වැසියන්ව පන්නා දැමිය
යුතුයි. ඔවුන් සාදා තිබෙන ගල්[13] හා
ලෝහ රූප[14] සියල්ල විනාශ කරන්න.
ඔවුන්ගේ සියලු පූජනීය ස්ථානද
සහමුලින්ම විනාශ කර දමන්න.[15]
**53** ඔබ දේශය යටත් කරගෙන එහි
ජීවත් වෙන්න. මම ඔබට ඒ දේ-
ශය උරුමයක් ලෙස දෙන්නෙමි.[16]
**54** එක් එක් ගෝත්‍රයට හා එක් එක්
පවුලට[17] දිය යුතු ප්‍රදේශය තීරණය

**33 පරි.**
**1** ගණන් 9:17
**2** ද්වි 10:6
**3** ද්වි 10:7
**4** ද්වි 2:8
1රාජා 9:26
2ලේක 8:17
**5** ගණන් 13:21
ගණන් 14:25
ගණන් 20:1
ගණන් 27:14
ද්වි 32:51
යොෂු 15:1
**6** ගණන් 20:22
ගණන් 20:23
ද්වි 32:50
**7** ද්වි 10:6
**8** ගණන් 21:1
විනි 1:16
**9** ගණන් 13:17
යොෂු 10:40

**2 තීරුව**
**1** ගණන් 21:4
**2** ගණන් 21:10
**3** උත් 19:37
ගණන් 21:11
ගණන් 21:13
**4** ගණන් 21:30
ගණන් 32:34
**5** යෙරෙ 48:22
**6** ද්වි 34:1
**7** ගණන් 27:12
ද්වි 32:49
**8** ගණන් 22:1
**9** යොෂු 12:3
යොෂු 13:20
**10** ගණන් 25:1
යොෂු 2:1
මීකා 6:5
**11** ගණන් 22:1
යොෂු 2:2
හෙබ්‍රෙ 11:30
**12** ද්වි 7:1
ද්වි 9:1
යොෂු 3:17
**13** ලෙවී 26:1
**14** නික් 34:17
ලෙවී 19:4
ද්වි 27:15
**15** නික් 23:24
නික් 34:13
ද්වි 7:5
ද්වි 12:3
**16** ද්වි 32:8
යෙරෙ 27:5
දානි 4:35
**17** ගණන් 26:53

---

**ගණන් 33:44*** මූ.අ., "අබරිම්හි (ඉයිම් හෙවත්) නටබුන්." 45වන ඡේදයේ එම ස්ථානයම, "ඉයිම්" ලෙස හඳුන්වා තිබෙනවා.

කළ යුත්තේ ආදූ දැමීමෙනුයි.[1] ආදූ
වැටෙන ආකාරයට අනුව ඔවුන්ට
අයිති වන ප්‍රදේශය නියම වෙයි.[2]
විශාල පවුල්වලට විශාල ඉඩම් ප්‍රමා-
ණයක්ද කුඩා පවුල්වලට කුඩා ඉඩම්
ප්‍රමාණයක්ද උරුමයක් ලෙස දිය
යුතුයි.[3] ඔබේ ගෝත්‍රයට අනුව ඔබට
උරුමයක් ලැබෙයි.[4]
**55** “‘ඔබ දේශයේ වැසියන් සිය-
ලුදෙනාව පන්නා දැමුවේ නැත්-
නම්[5] ඇස්වලට උල්වලින් අනින්නාක්
මෙන්ද ඇලපතට කටුවලින් අනින්-
නාක් මෙන්ද ඔවුහු ඔබට හිංසා පීඩා
කරන්නෝය. ඔබ ජීවත් වන දේශ-
යේදීම ඔබට හිරිහැරවලට මුහුණ
දීමට සිදු වෙයි.[6] **56** මම පැවසූ
ලෙස ඔබ නොකළොත් මම ඔවුන්ට
දඬුවම් කළාක් මෙන් ඔබටත් දඬුවම්
කරන්නෙමි.’ ”[7]

**34** යෙහෝවා දෙවි මෝසෙස්ට
මෙසේ කීවේය. **2** “ඊශ්‍රා-
යෙල් සෙනඟට මෙසේ කියන්න. ‘ඔබ
දැන් යන කානාන් දේශයේ[8] ඔබට
උරුමයක්[9] ලෙස ලැබෙන ඉඩම්වල
දේශ සීමා[10] වෙන් කළ යුත්තේ මේ
ආකාරයටයි.
**3** “‘දේශයේ දකුණු සීමාව, ශින්
පාළුකරයේ සිට ඒ අසල පිහිටි ඒදොම්
දේශ සීමාව[11] දිගේ නැඟෙනහිර දෙ-
සින් තිබෙන ලුණු මුහුද[12] දක්වා විහිදී
යන්නේය. **4** ඒ සීමාව දකුණු දෙ-
සින් තිබෙන අක්‍රබ්බිම් බෑවුම[13] හරහා
ශින් දක්වාද කාදෙෂ්-බර්නේයහි[14]
දකුණු දෙසට විහිදී යයි. ඉන්පසු එය
හෂර්-අද්දාර්[15] දෙසට හැරී අෂ්මොන්
හරහා **5** ඊජිප්තු නිම්නය දිගේ මහ
මුහුද දක්වා යයි.[16]
**6** “‘දේශයේ බටහිර සීමාව[17] මහ
මුහුදේ වෙරළ තීරයයි.
**7** “‘දේශයේ උතුරු සීමාව මහ
මුහුදේ සිට හෝර් කන්ද*[18] දක්වා
දිව යයි. **8** එය හෝර් කන්දේ සිට
හමාත්[1] සීමාව හරහා ෂෙදාද්[2] දක්වාද
දිව යයි. **9** එතැන් සිට ශිප්‍රොන්
හරහා ගොස් එය හෂර්-ඒනාන්හිදී[3]
කෙළවර වෙයි. දේශයේ උතුරු සීමාව
එයයි.
**10** “‘දේශයේ නැඟෙනහිර සීමාව
හෂර්-ඒනාන් සිට ෂෙපාම් දක්වා
දිව යයි. **11** එම සීමාව ෂෙපාම්
සිට ආයින්ට නැඟෙනහිරෙන් තිබෙන
රිබ්ලා* හරහා කින්නෙරෙත් මුහු-
දේ#[4] නැඟෙනහිර පැත්ත දක්වා යයි.
**12** එය යොර්දාන් ගඟ දිගේ ලුණු
මුහුද[5] දක්වාම දිව යයි. ඔබට උරුම
වන දේශයේ[6] සීමා ඒවායි.’ ”
**13** පසුව මෝසෙස් ඊශ්‍රායෙල් සෙ-
නඟට මෙසේ කීවේය. “යෙහෝවා
දෙවි උරුමයක් හැටියට ගෝත්‍ර නම-
යටත් මනස්සේ ගෝත්‍රයේ ඉතුරු
කොටසටත්[7] දෙන්න නියම කළ දේ-
ශයේ සීමා ඒවායි. ආදූ දමා එහි
ඉඩම් බෙදා දෙන්න.[8] **14** රූබෙන්
සහ ගාද් ගෝත්‍රයට අයත් සියලුම
පවුල්වලටත් මනස්සේ ගෝත්‍රයෙන්
එක් කොටසකටත් ඔවුන්ගේ උරුමය
දැනටමත් ලැබී අවසන්.[9] **15** එම
ගෝත්‍ර දෙකට සහ මනස්සේ ගෝ-
ත්‍රයෙන් එක් කොටසකට ඔවුන්-
ගේ උරුමය ලෙස යෙරිකෝව අසල
තිබෙන යොර්දාන් ගඟෙන් නැඟෙන-
හිර පැත්තේ තිබෙන ප්‍රදේශය මේ වන
විටත් ලැබී තිබෙනවා.”[10]
**16** යෙහෝවා දෙවි තවදුර-
ටත් මෝසෙස්ට මෙසේ කීවේය.
**17** “ඔබට උරුම වන දේශයේ ඉඩම්
බෙදා දීමේ වගකීම පැවරී තිබෙන්-
නේ පූජක එලියාසර්[11] හා නූන්ගේ
පුත්‍රයා වන යොෂුවාටය.[12] **18** දේ-
ශයේ ඉඩම් බෙදා දීමට ඔවුන්ට
උපකාර කිරීම සඳහා සෑම ගෝත්‍රය-

**33 පරි.**
**1** හිතෝ 16:33
**2** යොෂු 15:1
**3** ගණන් 26:54
**4** යොෂු 16:1; යොෂු 18:11
**5** විනි 1:21; ගීතා 106:34
**6** නික් 23:33; ද්වි 7:4; යොෂු 23:13; විනි 2:3; ගීතා 106:36
**7** ලෙවී 18:28; යොෂු 23:15

**34 පරි.**
**8** උත් 15:18; උත් 17:8; ගීතා 105:11
**9** ද්වි 4:38; යොෂු 1:4; යොෂු 14:1; යෙරෙ 3:19
**10** උත් 10:19; ක්‍රියා 17:26
**11** යොෂු 15:1
**12** උත් 14:3; යොෂු 15:2
**13** විනි 1:36
**14** ගණන් 13:26; ගණන් 32:8
**15** යොෂු 15:3
**16** නික් 23:31; යොෂු 15:4; යොෂු 15:47
**17** යොෂු 1:4; යොෂු 15:12
**18** ගණන් 33:37; ද්වි 32:50

**2 තීරුව**
**1** ගණන් 13:21; 2රාජා 14:25
**2** එස 47:15
**3** එස 47:17
**4** ද්වි 3:17; යොෂු 11:2; ලූක් 5:1; යොහ 6:1
**5** යොෂු 15:2
**6** ද්වි 8:7
**7** යොෂු 14:2
**8** ගණන් 26:55; ගණන් 33:54; යොෂු 14:2; යොෂු 18:6; හිතෝ 16:33
**9** ගණන් 32:33; ද්වි 3:12; ද්වි 3:13; යොෂු 13:8
**10** ගණන් 32:5; ගණන් 32:32

**11** ගණන් 3:32; ගණන් 20:26; යොෂු 14:1; යොෂු 19:51; **12** ගණන් 14:38; ගණන් 27:18.

**ගණන් 34:7*** මෙය නික් 33:37හි සහ ද්වි 32:50හි සඳහන්, “හෝර් කන්ද” නොවේ. මෙම ස්ථානය නිශ්චිත වශයෙන් හඳුනාගෙන නැත. සමහරවිට ලෙබනොන් කඳුවැටියේ ප්‍රධාන කන්දක් විය හැක.

**ගණන් 34:11*** මෙය කානාන් දේශයේ නැඟෙනහිර දේශ සීමාවකි. හමාත් දේශයේ තිබෙන රිබ්ලා නම් ස්ථානය නොවේ. **11#** ගලීල මුහුද කලින් හැඳින්වූයේ මෙම නමින්ය.

කින්ම ප්‍රධානියෙකුව පත් කරන්න.[1]
19 ඔවුන්ගේ නම් මේවාය. යූදා ගෝ-
ත්‍රයෙන්[2] යෙපුන්නෙගේ පුත්‍රයා
වන කාලෙබ්,[3] 20 සිමියොන් ගෝ-
ත්‍රයෙන්[4] අම්හුද්ගේ පුත්‍රයා වන ෂෙමු-
වෙල්, 21 බෙන්ජමින් ගෝත්‍රයෙන්[5]
කිස්ලොන්ගේ පුත්‍රයා වන එලිදාද්,
22 දාන් ගෝත්‍රයෙන්[6] යොග්ලීගේ
පුත්‍රයාද අධිපතියෙකුද වන බුක්කී,
23 යෝසෙප්ගෙන් පැවත ආ[7] මනස්-
සේ ගෝත්‍රයෙන්[8] ඒෆෝද්ගේ පුත්‍ර-
යාද අධිපතියෙකුද වන හන්නියෙල්,
24 යෝසෙප්ගෙන් පැවත ආ එෆ්‍රා-
යිම් ගෝත්‍රයෙන්[9] ෂිප්තාන්ගේ
පුත්‍රයාද අධිපතියෙකුද වන කෙමූ-
වෙල්, 25 සෙබුලුන් ගෝත්‍රයෙන්[10]
පානාක්ගේ පුත්‍රයාද අධිපතියෙ-
කුද වන එලිෂාෆාන්, 26 ඉසා-
කාර් ගෝත්‍රයෙන්[11] අස්සාන්ගේ
පුත්‍රයාද අධිපතියෙකුද වන පල්-
තියෙල්, 27 ආෂේර් ගෝත්‍රයෙන්[12]
ෂෙලොමීගේ පුත්‍රයාද අධිපතියෙකුද
වන අහිහුද්, 28 නෆ්තලී ගෝත්‍ර-
යෙන්[13] අම්හුද්ගේ පුත්‍රයාද අධිපති-
යෙකුද වන පෙදහෙල් යන අයයි.”
29 කානාන් දේශයේ ඉඩම් ඊශ්‍රායෙල්
සෙනඟට බෙදා දෙන පිණිස යෙ-
හෝවා දෙවි පත් කළ අය ඔවුහුය.[14]

**35** යෝර්දාන් ගඟ[15] හා යෙරි-
කෝව අසල පිහිටි මෝවබ්
පාළුකරයේදී යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ කීවේය. 2 “ඊශ්‍රා-
යෙල් සෙනඟට උරුම වන
ඉඩම්වලින් ලෙවීවරුන්ට ජීවත් වීමට
නුවරවල් දිය යුතු බව[16] ඊශ්‍රායෙල්ව-
රුන්ට කියන්න. ඒ නුවරවල් අවට
තිබෙන සියලු තණබිම්ද ලෙවීව-
රුන්ට දිය යුතුයි.[17] 3 එම නුවරවල්
ලෙවීවරුන්ට ජීවත් වීම සඳහාය. එම
තණබිම් ඔවුන්ගේ එළුවන්, බැට-
ළුවන්, ගවයන් හා අනික් සතුන්
සඳහාද ඔවුන්ගේ ගොවිපොළවල් සඳ-
හාද යොදාගත යුතුයි. 4 ඔබ ලෙ-
වීවරුන්ට දෙන තණබිම් මැනිය
යුත්තේ මෙලෙසයි. නුවරෙහි පවුරේ

34 පරි.
1 ගණන් 1:4
ගණන් 1:16
2 යොෂු 15:1
3 ගණන් 14:30
ගණන් 26:65
4 යොෂු 19:1
5 යොෂු 18:11
6 යොෂු 19:40
7 උත් 46:20
උත් 48:5
යොෂු 16:1
8 යොෂු 17:1
9 යොෂු 16:5
10 යොෂු 19:10
11 යොෂු 19:17
12 යොෂු 19:24
13 යොෂු 19:32
14 ගණන් 34:18
ද්වි 32:8
යොෂු 19:51
ක්‍රියා 17:26

35 පරි.
15 ගණන් 22:1
ගණන් 31:12
ගණන් 36:13
16 උත් 49:7
ලෙවී 25:32
ද්වි 18:1
යොෂු 14:4
යොෂු 21:2
17 ලෙවී 25:34
යොෂු 21:3
යොෂු 21:11
1ලේක 6:64
2ලේක 11:14

2 තීරුව
1 ද්වි 4:41
ද්වි 4:42
යොෂු 20:3
2 ගණන් 35:13
යොෂු 20:2
යොෂු 20:7
යොෂු 20:8
යොෂු 21:13
යොෂු 21:21
යොෂු 21:27
යොෂු 21:32
යොෂු 21:36
යොෂු 21:38
3 යොෂු 21:3
4 උත් 49:7
5 ගණන් 26:54
ගණන් 33:54
6 නික් 3:8
නික් 23:23
ගණන් 34:2
7 නික් 21:13
ද්වි 4:42
ද්වි 19:4
8 ද්වි 19:11
ද්වි 19:12
යොෂු 20:5
9 ගණන් 35:19
ද්වි 19:6
යොෂු 20:9

සිට හතර දිශාවටම රියන් දහස
බැගින් මනින්න. 5 මෙසේ තණබි-
මේ පළල රියන් දෙදහසක්ද එහි දිග
ප්‍රමාණය රියන් දෙදහසක්ද වෙයි.*
නුවරවල් වටා තිබෙන තණබිම්
මැනිය යුත්තේ ඒ ආකාරයටයි.
6 “යමෙකු අතින් යම් මිනිසෙකු
මිය ගියොත් එවැනි කෙනෙකුට පලා
යෑම සඳහා[1] ආරක්ෂිත නුවරවල්
හයක්ද[2] තවත් නුවරවල් හතළිස්දෙ-
කක්ද ඔබ ලෙවීවරුන්ට දිය යුතුයි.
7 මෙසේ ඔබ ලෙවීවරුන්ට නුවර-
වල් හතළිස්අටක් දිය යුතුයි. එම
නුවරවල් අවට තිබෙන තණබිම්ද
ඔවුන්ට දෙන්න.[3] 8 ඊශ්‍රායෙල් සෙ-
නඟට උරුම වන ඉඩම්වලින් ලෙවීව-
රුන්ට එම නුවරවල් දෙන්න.[4] විශාල
බිම් කොටසක් උරුම වන අයගෙන්
විශාල ප්‍රමාණයක්ද කුඩා බිම් කොට-
සක් උරුම වන අයගෙන් කුඩා ප්‍රමා-
ණයක්ද ගන්න.[5] එක් ගෝත්‍රයකට
උරුම වන කොටසේ විශාලත්වයට
අනුව ඔවුන්ගෙන් කොටසක් වෙන්
කර ලෙවීවරුන්ගේ නුවරවල් සඳහා
එය දෙන්න.”
9 යෙහෝවා දෙවි මෝසෙස්ට
තවදුරටත් මෙසේ කීවේය.
10 “ඊශ්‍රායෙල් සෙනඟට මේ දේන්
කියන්න. ‘ඔබ යෝර්දාන් ගඟෙන්
එගොඩ වී කානාන් දේශයට ගිය
පසු[6] 11 ආරක්ෂිත නුවරවල් කිහි-
පයක් වෙන් කරගන්න. අත්වැරදීමක්
නිසා යමෙකුගේ අතින් මනුෂ්‍ය-
යෙකු මිය ගියොත් ඔහු ආරක්-
ෂිත නුවරකට පලා යා යුතුයි.[7]
12 සෙනඟගෙන් විනිශ්චයක්[8] ලැබී-
මට පෙර මිනී මරුවාව මරා දැමී-
මට අයිතියක් ඇති තැනැත්තාගේ[9]
අතින් මැරුම් නොකන පිණිස ඔහු
එම ආරක්ෂිත නුවරේ රැඳී සිටිය
යුතුයි. 13 ඔබට දෙන එම නුව-
රවල් හය ආරක්ෂිත නුවරවල්ය.

**ගණන් 35:5*** මුළු තණබිමෙහි දිග හා පළල මැන තිබෙන්නේ එහි මැද පිහිටි නුවරෙහි දිග පළල අත්හැරය.

**14** යොර්දාන් ගඟෙන් නැඟෙනහිර
පැත්තේ නුවරවල් තුනක්ද[1] කානාන්
දේශයේ තවත් නුවරවල් තුනක්ද
ආරක්ෂිත නුවරවල් ලෙස වෙන්
කරගන්න.[2] **15** අත්වැරදීමක් නිසා
ඊශ්‍රායෙල් සෙනඟගෙන් කෙනෙකුගේ
හෝ ඔවුන් සමඟ ජීවත් වන විදේශික-
යෙකුගේ[3] හෝ අතින් යමෙකු මිය
ගියොත් ආරක්ෂාව ලබන පිණිස ඔහු
එම නුවරවලින් එකකට පලා යා
යුතුයි.[4]

**16** “ ‘නමුත් යමෙකු යකඩ ආයුධ-
යකින් මනුෂ්‍යයෙකුට පහර දුන් පසු
ඔහු මිය ගියොත් ඒ තැනැත්තාව මිනී
මරුවෙකු ලෙස ගණන් ගත යුතුයි.[5]
මිනී මරුවාව අනිවාර්යයෙන්ම මරා
දැමිය යුතුයි.[6] **17** යමෙකු හානියක්
කරන අදහසින් මනුෂ්‍යයෙකුට ගල-
කින් පහර දුන් විට ඔහු මිය ගියොත්
පහර දුන් තැනැත්තාව මිනී මරුවෙකු
ලෙස ගණන් ගත යුතුයි. මිනී මරු-
වාව අනිවාර්යයෙන්ම මරා දැමිය
යුතුයි. **18** යමෙකු හානියක් කරන
අදහසින් මනුෂ්‍යයෙකුට ලී ආයුධය-
කින් පහර දුන් විට ඔහු මිය ගියොත්
පහර දුන් තැනැත්තාව මිනී මරුවෙකු
ලෙස ගණන් ගත යුතුයි. මිනී මරු-
වාව අනිවාර්යයෙන්ම මරා දැමිය
යුතුයි.

**19** “ ‘මිනී මරුවෙකුව මරා දැමිය
යුත්තේ මිය ගිය තැනැත්තාගේ
නෑදෑයෙකු[7] විසිනුයි. මිනී මරුවාව
ඔහුගේ අතට හසු වූ විට ඔහුව මරා
දැමිය යුතුයි. **20** යමෙකු තම සතු-
රාට හානියක් කරන අදහසින් ඔහුව
තල්ලු කර[8] ඔහු වැටී මිය ගියොත්
එසේත් නැත්නම් මඟ රැක සිට[9]
ඔහු දෙසට යමක් වීසි කර ඔහු
මිය ගියොත් **21** එසේත් නැත්නම්
ඔහුට අතින් පහර දී ඔහු මිය ගියොත්
එම තැනැත්තාව මිනී මරුවෙකු ලෙස
ගණන් ගත යුතුයි. ඔහුව අනිවාර්ය-
යෙන්ම මරා දැමිය යුතුයි. මිනී මරු-
වාව මරා දැමීමට අයිතිය ඇති
තැනැත්තාගේ අතට ඔහුව හසු වූ විට
ඔහුව මරා දැමිය යුතුයි.[10]

**22** “ ‘නමුත් යමෙකු නපුරු චේත-
නාවක් නොමැතිව හදිස්සියේ කෙ-
නෙකුව තල්ලු කර ඔහු වැටී මිය
ගියොත් එසේත් නැත්නම් නොසිතා
ඒ තැනැත්තා දෙසට යමක් වීසි
කර මිය යන තරමට ඔහු තුවාල
ලැබුවොත්[1] **23** එසේත් නැත්නම්
යමෙකු සිටින බව නොදැක ඒ දෙසට
වීසි කළ හෝ පෙරළුව ගලකින් ඒ
තැනැත්තා දරුණු ලෙස තුවාල වී මිය
ගියොත් වරද සිදු කළ තැනැත්තා එය
හිතාමතා නොකළ බැවින් **24** මිය
ගිය තැනැත්තාගේ නෑදෑයාවද* වරද-
කරුවද විනිශ්චයකරුවන් ඉදිරියට
කැඳවිය යුතුයි.[2] වරදකරු නිදොස්
බව ඔප්පු වූ විට **25** විනිශ්චයකරු-
වන්[3] මිය ගිය තැනැත්තාගේ නෑදෑ-
යාගේ අතින් වරදකරුව බේරාගත
යුතුයි. ඔහු වරද කළ පසු පලා ගිය
ආරක්ෂිත නුවරටම ඔහුව නැවත
යැවිය යුතුයි. ශුද්ධ තෛලයෙන්[4] අභි-
ෂේක කරනු ලැබූ උත්තම පූජකයා
මිය යන තුරු ඔහු එම නුවරේ රැඳී
සිටිය යුතුයි.

**26** “ ‘නමුත් වරද කළ තැනැත්තා
ආරක්ෂිත නුවරෙන් පිටතට ගියොත්
**27** මිය ගිය තැනැත්තාගේ නෑදෑයා-
ගේ[5] අතට ඔහුව හසු වීමට ඉඩ ඇත.
එසේවුණොත් ඔහුව මරා දැමීමට ඒ
තැනැත්තාට අවසර ඇත. ඔහුව මරා
දමන එම තැනැත්තා ඔහුගේ ලේව-
ලට වග කිව යුතු නැත. **28** මන්ද
උත්තම පූජකයා මිය යන තුරු වර-
දකරු ආරක්ෂිත නුවරේ රැඳී සිටිය
යුතුයි.[6] ඔහු තමාගේ නිවස බලා
ආපසු යා යුත්තේ උත්තම පූජකයා
මිය ගිය පසුවයි. **29** ඔබ දේශයේ
කොතැනක ජීවත් වුණත් නඩු විභාග
කරන විට ඔබෙන් පැවතෙන සියලු-
දෙනාම එම නීතිය පිළිපැදිය යුතුයි.

**30** “ ‘මනුෂ්‍යයෙකු හිතාමතාම
යමෙකුව මරා දැමූ බව ඔප්පු කිරී-
මට ප්‍රමාණවත් සාක්ෂි තිබෙනවා

**35 පරි.**
1 ද්වි 4:41; ද්වි 19:9
2 යොෂු 20:7
3 නික් 12:49; ලෙවී 19:34; ලෙවී 24:22; ගණන් 15:16
4 යොෂු 20:3
5 ද්වි 19:11
6 උත් 9:5; නික් 21:12; ලෙවී 24:17; ද්වි 19:12
7 ගණන් 35:12; ද්වි 19:6
8 උත් 4:8; 2සාමු 20:10
9 නික් 21:14; ද්වි 19:11; ගීතා 10:8; හිතෝ 1:18; මාක් 6:19; ක්‍රියා 23:21
10 ගණන් 35:19

**2 තීරුව**
1 නික් 21:13; ද්වි 19:5; යොෂු 20:3; යොෂු 20:5
2 ගණන් 35:12; යොෂු 20:4
3 විනි 20:13
4 නික් 29:7; ලෙවී 21:10; හෙබ්‍රෙ 3:1
5 ගණන් 35:12; ගණන් 35:19
6 යොෂු 20:6

**ගණන් 35:24*** එනම්, මිනී මරුවාව මරා දැමීමට අයිතිය ඇති තැනැත්තාවද.

නම්[1] ඔහුට මරණ දණ්ඩනය නියම කළ යුතුයි.[2] නමුත් සිටින්නේ එක් සාක්ෂිකරුවෙකු පමණක් නම් ඔහුට මරණ දණ්ඩනය නියම කළ නොහැකියි. 31 මරණ දණ්ඩනය නියම කළ මිනී මරුවෙකුව මුදවාගන්නා පිණිස ගෙවන කිසි වන්දියක් භාර නොගන්න.[3] ඔහුව අනිවාර්යයෙන්ම මරා දැමිය යුතුයි.[4] 32 ආරක්ෂිත නුවරකට පලා ගිය කෙනෙකුගෙන් වන්දියක් ගෙන උත්තම පූජකයා මිය යැමට පෙර ඔහුට තම නිවස බලා පිටත්ව යැමට අවසර නොදෙන්න.

33 "'ඔබේ දේශය දූෂ්‍ය වීමට ඉඩ නොදෙන්න. ලේ වැගිරුවොත් දේශය දූෂ්‍ය වන්නේය.[5] දේශය නැවත ශුද්ධ තත්වයකට ගෙන ඒමට හැක්කේ ලේ වැගිරූ තැනැත්තාව මරා දැමුවොත් පමණයි.[6] 34 ඔබ ජීවත් වන දේශය දූෂ්‍ය නොකළ යුතුයි. මන්ද මම ඔබ අතරේ වාසය කරමි. එසේය, යෙහෝවා දෙවි වන මම ඊශ්‍රායෙල් සෙනඟ සමඟ සිටිමි.'"[7]

**36** යෝසෙප්ගේ පුත්‍රයා වූ මනස්සේගේ පුත් මාකීර්ගෙන්[8] පැවත ආ ගිලියද්වරුන්ගේ පවුල්වල ප්‍රධානියෝ මෝසෙස් හා ඊශ්‍රායෙල්වරුන්ගේ ගෝත්‍රවල ප්‍රධානීන් ළඟට පැමිණ 2 මෙසේ කීවෝය. "ආඥා දමා ඊශ්‍රායෙල් සෙනඟට දේශයේ ඉඩම් බෙදා දෙන්න[9] කියා අපේ ස්වාමීන් වන ඔබට යෙහෝවා දෙවි පැවසුවා. අපේ සහෝදරයා වූ ෂෙලොපෙහාද්ගේ උරුමය ඔහුගේ දූවරුන්ට දෙන්න කියාත් යෙහෝවා දෙවි ඔබට පැවසුවා.[10] 3 නමුත් ඔහුගේ දූවරුන් වෙනත් ගෝත්‍රයක අය සමඟ විවාහ වුණොත් ඔවුන්ගේ උරුමය ඒ ගෝත්‍රයට අයිති වෙනවා. එවිට ඒ ගෝත්‍රයට අයිති උරුමය තවත් වැඩි වෙනවා. නමුත් ආඥා දමා ලැබුණු අපේ උරුමය අඩු වෙනවා.[11] 4 විශේෂ අවුරුද්දේදී[12] ඒ ස්ත්‍රීන්ගේ උරුමය ස්ථිර වශයෙන්ම ඔවුන් විවාහ වූ අයගේ ගෝත්‍රයට අයිති වෙනවා. එවිට අපට ඒ උරුමය නැවත ලැබෙන්නේ නැහැ."

5 පසුව ඒ සම්බන්ධයෙන් යෙහෝවා දෙවි දුන් පනත මෝසෙස් ඊශ්‍රායෙල් සෙනඟට මෙසේ දැන්වූවේය. "යෝසෙප්ගේ පුත්‍රයන් කියන දේ හරි. 6 ඒ නිසා යෙහෝවා දෙවි මෙසේ පැවසුවා. 'ෂෙලොපෙහාද්ගේ[1] දූවරුන්ට තමන් කැමති කෙනෙකු සමඟ විවාහ වීමට පුළුවන. නමුත් එම තැනැත්තා ඔවුන්ගේ පියාගේ ගෝත්‍රයට අයත් කෙනෙකු විය යුතුයි.[2] 7 එක් එක් ගෝත්‍රයට ලැබෙන උරුමය ඒ ඒ ගෝත්‍රයේ අය අතරේම තිබිය යුතුයි. ඊශ්‍රායෙල් සෙනඟ තමන්ගේ උරුමය වෙනත් ගෝත්‍රයකට නොදිය යුතුයි. 8 ස්ත්‍රියකට තම පියාගේ උරුමය ලැබුණොත් ඇය විවාහ විය යුත්තේ තම පියාගේ ගෝත්‍රයේ කෙනෙකු සමඟයි.[3] එවිට සෑම ඊශ්‍රායෙල් ජාතිකයෙකුටම තම පියාගෙන් උරුම වන දේ තමන්ටම තබාගත හැක. 9 එක් එක් ගෝත්‍රයට ලැබෙන උරුමය ඒ ඒ ගෝත්‍රයේ අය අතරේම තිබිය යුතුයි. ඊශ්‍රායෙල් සෙනඟ තමන්ගේ උරුමය වෙනත් ගෝත්‍රයකට නොදිය යුතුයි.'"

10 ෂෙලොපෙහාද්ගේ දූවරු යෙහෝවා දෙවි, මෝසෙස් මාර්ගයෙන් අණ කළ ලෙසම කළෝය.[4] 11 ෂෙලොපෙහාද්ගේ දූවරු වූ[5] මාලාහ්, තිර්ෂා, හොග්ලා, මිල්කා සහ නෝවා තමන්ගේ පියාගේ සහෝදරයන්ගේ පුත්‍රයන් සමඟ විවාහ වූහ. 12 ඔවුන්ගේ උරුමය වෙනත් ගෝත්‍රයකට අයිති නොවන පිණිස ෂෙලොපෙහාද්ගේ දූවරු යෝසෙප්ගේ පුත්‍රයා වූ මනස්සේගෙන් පැවත ආ පවුල්වල අය සමඟ විවාහ වූහ.

13 යෙහෝවා දෙවි යෝර්දාන් ගඟ හා යෙරිකෝව අසල පිහිටි මෝවබ් පාළුකරයේදී මෝසෙස් මාර්ගයෙන් ඊශ්‍රායෙල් සෙනඟට දුන් ආඥා හා තීන්දු ඒවාය.[6]

**35 පරි.**
1 ද්වි 17:6; ද්වි 19:15; මතෙ 18:16; යොහ 8:17; 2කොරි 13:1; 1තිමෝ 5:19; හෙබ්‍රෙ 10:28
2 උත් 9:6; නික් 20:13; ද්වි 5:17
3 1යොහ 3:15
4 උත් 9:5; නික් 21:14; ද්වි 19:13
5 උත් 4:10; ගීතා 106:38; ලූක් 11:50
6 උත් 9:6
7 නික් 25:8; නික් 29:46; ලෙවී 26:12; 1රාජා 6:13

**36 පරි.**
8 ගණන් 26:29; යොෂු 17:1
9 ගණන් 26:55; ගණන් 33:54
10 ගණන් 27:1; ගණන් 27:7
11 ගණන් 27:4
12 ලෙවී 25:10

**2 තීරුව**
1 ගණන් 36:2
2 ගණන් 36:12
3 1ලේක 23:22
4 ගණන් 36:6
5 ගණන් 27:1
6 ගණන් 26:3; ගණන් 33:50; ගණන් 35:1; ද්වි 30:8; යොෂු 22:5; දේශ 12:13

# ද්විතීය කතාව

**1** ඊශ්‍රායෙල් සෙනඟ යෝර්දාන්[1]
ගඟ අසල පිහිටි පාළුකරයේ
කඳවුරු බැඳගෙන සිටියදී මෝසෙස්
ඔවුන් සමඟ කතා කිරීමට සූදානම්
විය. ඊශ්‍රයෙල්වරුන් කඳවුරු බැඳ-
ගෙන සිටි එම පාළුකරය පිහිටා තිබු-
ණේ සුෆ් නම් ස්ථානයට ඉදිරියෙන්ය.
පාරාන්[2] පාළුකරයද තෝෆෙල්,
ලාබන්, හශේරොත්[3] හා දීශාහාබ් යන
ස්ථානද ඒ අසල පිහිටා තිබිණ.
**2** (හොරෙබ් කඳුකරයේ සිට සේ-
යිර් කන්ද හරහා කාදෙෂ්-බර්නේය[4]
නම් ස්ථානය දක්වා යෑමට දවස්
එකොළහක් ගත වේ.) **3** හතළිස්-
වන[5] අවුරුද්දේ එකළොස්වන මාස-
යේ පළමුවනදා, මෝසෙස් යෙහෝවා
දෙවි තමාට පැවසූ සියල්ල ගැන ඊශ්‍රා-
යෙල් සෙනඟ සමඟ එම පාළුකරයේදී
කතා කළේය. **4** ඒ අවස්ථාව වන
විට ඊශ්‍රායෙල්වරු හෙෂ්බොන් නුව-
රේ ජීවත් වූ අමෝරිවරුන්ගේ රජු
වූ සීහොන්වද[6] අෂ්ටාරොත්[7] නුවරේ
ජීවත් වූ බාෂාන්හි රජු වූ ඕග්වද[8] පරා-
ජය කර තිබිණ. ඔවුන් ඕග් රජුව පරා-
ජය කළේ එද්රෙයි[9] නම් නුවරේදීය.
**5** යෝර්දාන් ගඟ අසල තිබූ පාළුක-
රය පිහිටා තිබුණේ මෝවබ් දේ-
ශයේය. එම ස්ථානයේදී ඊශ්‍රායෙල්
සෙනඟට දෙවිගේ නීතිය[10] පැහැදිලි
කිරීමට සූදානම් වූ මෝසෙස් මුලින්ම
ඔවුන්ට මෙසේ කීවේය.

**6** "ඔබේ පියවරු සමඟ මම හො-
රෙබ්[11] කඳුකරයේ සිටි කාලයේදී අපේ
දෙවි වන යෙහෝවා අපට මෙසේ
පැවසුවා. 'ඔබ මේ කඳුකරයෙන්
දැන් පිටත්ව යන්න.[12] **7** මෙතැනින්
පිටත් වී අමෝරිවරුන්[13] ජීවත් වන
කඳුකර ප්‍රදේශයටත් ඒ අවට පිහිටි
සියලුම ප්‍රදේශවලටත් යන්න. ඒ අවට
පිහිටි කඳුකර පළාත,[14] නෙගෙබ්
පළාත,[15] පහත් බිම්* හා මහ අරබා[16]
නිම්නය වෙතටත් වෙරළබඩ තීරය[1]
වෙතටත් කානානිවරුන්[2] ජීවත් වන
ප්‍රදේශ වෙතටත් යන්න. ඔබ ලෙබ-
නොන්[3] දේශය දක්වාත් යුප්‍රටීස්[4] නම්
මහ ගඟ දක්වාත් යා යුතුයි. **8** ඒ
මුළු දේශයම මම ඔබට අයිති කර
දෙන්නම්. යෙහෝවා දෙවි වන මම
ඔබේ මුතුන්මිත්තන් වන ආබ්‍රහම්ට,
ඊසාක්ට[5] හා යාකොබ්ට[6] දෙන බවට
පොරොන්දු වූ දේශය එයයි. ඔවුන්-
ටත් ඔවුන්ගෙන් පැවතෙන්නන්ටත් ඒ
දේශය අයිති කර දෙන බවට මම
ඔවුන්ට දිවුරා පොරොන්දු වුණා.[7]
එබැවින් ඔබ දැන් ගිහින් ඒ දේශය
යටත් කරගන්න.'

**9** "දෙවි අපට ඒ ආඥාව දුන් පසු
මම ඔබේ පියවරුන්ට මෙසේ යෝ-
ජනා කළා. 'සෙනඟව බලාගන්න මට
ලැබී තිබෙන මේ වගකීම මට තනි-
යෙන් දරන්න බැහැ.[8] **10** ඔබේ දෙවි
වන යෙහෝවා ඊශ්‍රායෙල් සෙනඟව
අහසේ තාරකා මෙන් බොහෝ සෙ-
යින් වැඩි කර තිබෙනවා.[9] **11** ඔබේ
මුතුන්මිත්තන්ගේ දෙවි වන යෙ-
හෝවා පොරොන්දු වූ ලෙසම[10] ඔබට
ආශීර්වාද[11] කර ඔබේ ගණන තවත්
දහස් ගුණයකින් වැඩි කරන්න[12] කියා
මම ප්‍රාර්ථනා කරනවා. **12** නමුත්
මේ තරම් විශාල සෙනඟක් මම
කොහොමද තනියෙන් බලාගන්නේ?
ඔබේ ප්‍රශ්න, ගැටලු, ආරවුල් මට
තනියෙන් නම් විසඳන්න බැහැ.[13]
**13** ඒ නිසා ඔබේ සියලු ගෝත්‍ර-
වලින් ප්‍රඥාවන්ත, දක්ෂ,[14] අද්දැ-
කීම්[15] ඇති පුරුෂයන්ව තෝරාගෙන
මා වෙතට රැගෙන එන්න. ඔබව
බලාගැනීමට මම ඔවුන්ව පත් කරන්-
නම්.'[16] **14** එවිට ඔබේ පියවරුන්,
'ඔබේ යෝජනාව හොඳයි' කියා මට
පිළිතුරු දුන්නා. **15** එබැවින් ඔවුන්
සෑම ගෝත්‍රයකින්ම වගකීම් දරන,
අද්දැකීම් ඇති, ප්‍රඥාවන්ත පුරුෂ-
යන්ව තෝරාගත්තා. මමද දහස,

**1 පරි.**
1 යොෂු 22:4
2 ගණන් 10:12
3 ගණන් 33:18
4 ගණන් 13:26
ද්වි 9:23
යොෂු 14:7
5 ගණන් 32:13
ගණන් 33:38
6 ගණන් 21:23
යොෂු 12:2
7 යොෂු 9:10
8 ගණන් 21:33
නෙහෙ 9:22
ගීතා 135:11
9 යොෂු 13:12
10 ද්වි 4:8
ද්වි 17:18
නෙහෙ 8:7
11 ද්වි 4:15
1රාජා 8:9
12 නික් 19:1
ගණන් 10:11
ගණන් 10:12
13 උත් 15:16
යොෂු 10:6
14 ගණන් 13:17
15 උත් 12:9
ගණන් 21:1
16 ද්වි 3:17
ද්වි 4:49
යොෂු 12:3

**2 තීරුව**
1 යොෂු 9:1
2 ගණන් 34:2
3 යොෂු 13:1
යොෂු 13:5
1රාජා 9:19
4 උත් 15:18
5 උත් 26:3
6 උත් 28:13
7 උත් 12:7
උත් 13:15
උත් 17:7
8 නික් 18:18
9 උත් 15:5
නික් 32:13
ගණන් 26:51
ද්වි 10:22
10 උත් 12:2
උත් 22:17
11 උත් 26:4
නික් 23:25
හිතෝ 10:22
12 1රාජා 3:8
1ලේක 27:23
ගීතා 115:14
13 නික් 18:18
ගණන් 11:11
ගණන් 20:3
ගණන් 27:14
14 1තිමෝ 3:2
15 1තිමෝ 3:4
1තිමෝ 3:6
16 නික් 18:21

ද්වි **1:7*** මූ.අ., "ෂෙපේලා."

සියය, පනහ හා දහය බැගින් වූ කණ්ඩ-
ඩායම්වලට සෙනඟව බෙදා ඔවුන්ව
බලාගැනීමට ඒ පුරුෂයන්ව පත්
කළා.[1]
**16** "ඒ අවස්ථාවේදී, සෙනඟව
විනිශ්චය කරන්න පත් කළ ඒ පුරුෂ-
යන්ට මම මෙසේ අණ කළා. 'ඔබ
නඩු විසඳන විට සෙනඟට සාධාර-
ණය[2] ඉටු කරන්න. ඊශ්‍රායෙල් ජාතික-
යන් දෙදෙනෙක් අතරේ ගැටලුවක්
ඇති වන විටත් ඊශ්‍රායෙල් ජාති-
කයෙක් හා විදේශිකයෙක් අතරේ
ගැටලුවක් ඇති වන විටත් පැති
නොගෙන යුක්තිය ඉටු කරන්න.[3]
**17** නඩු විභාගයකදී කිසිම කෙනෙකු-
ගේ පැත්ත නොගන්න.[4] තරාතිරම්
නොබලා හැමෝටම එක හා සමානව
සලකන්න.[5] විනිශ්චය කරද්දී ඔබ
නියෝජනය කරන්නේ දෙවිව බව
හොඳින් මතක තබාගන්න.[6] ඒ නිසා
ඔබ මිනිසුන්ට භය විය යුතු නැහැ.[7]
ඔබට විසඳන්න අමාරු නඩු පම-
ණක් මා වෙතට ගේන්න. මම ඒවා
විභාග කරන්නම්.'[8] **18** මෙසේ සෙ-
නඟ කළ යුතු හැම දෙයක්ම මම
ඔවුන්ට ඒ කාලයේදී කියා දුන්නා.
**19** "අපේ දෙවි වන යෙහෝවා
අපට පැවසූ ලෙසම අපි හොරෙබ්
කඳුකරයෙන් පිටත් වී ඒ භයානක
පාළුකරය මැදින් ගමන් කළා.[9] අපි
අමෝරිවරුන්ගේ[10] කඳුකර පළාතට
යන මාර්ගය ඔස්සේ ගමන් කර
කාදෙෂ්-බර්නේය[11] වෙතට පැමිණියා.
**20** ඉන්පසු මම ඔබේ පියවරුන්ට
මෙසේ පැවසුවා. 'අපි දැන් ඉන්නේ
අමෝරිවරුන්ගේ කඳුකර පළාත ළඟ-
මයි. අපේ දෙවි වන යෙහෝවා අපිට
ඒ දේශය ලබා දෙයි.[12] ඒ ගැන කිසිම
සැකයක් නැහැ. **21** ඒ නිසා ඔබේ
මුතුන්මිත්තන්ගේ දෙවි වන යෙ-
හෝවා ඔබට කියූ විදිහටම දැන්
ගිහින් ඒ දේශය යටත් කරගන්න.[13]
ඔබේ දෙවි වන යෙහෝවා අනිවාර්ය-
යෙන්ම ඔබට ඒ දේශය අයිති කර
දෙයි.[14] ඉතින් කිසි දෙයකට භය
වෙන්න එපා. ධෛර්යවත් වෙන්න.'[15]

**22** "නමුත් ඔබේ පියවරුන් මා
ළඟට ඇවිත් මට මෙහෙම පැවසුවා.
'මුලින්ම අපි ඒ දේශයේ තොර-
තුරු සොයා බලන්න මිනිසුන් කිහිප-
දෙනෙකුව යවමු. දේශයට ඇතුළු
වෙන්න ඕනේ මොන මාර්ගයෙන්ද
කියා ඔවුන් අපිට කියයි. අපි අල්ලා-
ගන්න යන නුවරවල් ගැනත් ඔවුන්-
ගෙන් තොරතුරු දැනගන්න පුළුවන්
වෙයි.'[1] **23** ඔවුන් කියූ දේට මම
එකඟ වුණා. ඒ නිසා මම
සෑම ගෝත්‍රයකින්ම එක පුරුෂයෙක්
බැගින් තෝරගෙන දේශයේ තොර-
තුරු සොයා බලන්න ඔවුන්ව පිටත්
කර යැව්වා.[2] **24** ඔවුන් ඒ කඳුකර
පළාතට[3] ගොස් එෂ්කොල්[4] නිම්නය
දක්වාම ගමන් කර දේශයේ තොර-
තුරු සොයා බැලුවා. **25** ඔවුන් ඒ
දේශයෙන් පලතුරු කඩාගෙන ඇවිත්
අපිට පෙන්වා,[5] 'යෙහෝවා දෙවි අපිට
දෙන්න යන දේශය හරිම සරුසාර දේ-
ශයක්' කියා පැවසුවා.[6] **26** නමුත්
ඔබේ පියවරුන් ඒ දේශයට යන්න
කැමති වුණේ නැහැ.[7] ඔවුන් යෙ-
හෝවා දෙවි දුන් ඒ නියෝගයට
විරුද්ධව කැරලිගැසුවා.[8] **27** ඔවුන්
කූඩාරම්වලට වී මැසිවිලි නඟමින්
මෙසේ පැවසුවා. 'යෙහෝවා දෙවි
අපිට වෛර කරනවා.[9] ඔහු ඊජිප්තු[10]
දේශයේ ඉඳන් අපිව මේ දේශයට ගෙ-
නාවේ අමෝරිවරුන් අතින් අපිව
නැති කර දමන්නයි.[11] **28** ඔබ අපිව
කොහෙටද මේ එක්කගෙන යන්නේ?
දේශයේ තොරතුරු බලන්න ගිය අපේ
සහෝදරයන් කිව්ව දේවල් ඔබට
මතක නැද්ද?[12] "ඒ දේශයේ ඉන්න
මිනිස්සු යෝධයෝ වගේ.[13] පවුරුව-
ලින් වට කර තිබෙන ඔවුන්ගේ නුවර-
වල් අහසට ගැවෙන තරම් උසයි.[14]
අනාක්ගෙන්[15] පැවතෙන අයත් එහෙ
ඉන්නවා" කියා ඔවුන් අපිට කිව්වා.
ඉතින් අපේ හිතට මහත් භයක්
දැනෙනවා.'
**29** "එවිට මම ඔවුන්ට මෙසේ
පැවසුවා. 'අධෛර්යයට පත් වෙන්න
එපා. ඒ මිනිසුන්ට භය වෙන්න ඔබට

**1 පරි.**
1 නික් 18:25
2 නික් 23:8; ද්වි 16:18; යොහ 7:24
3 නික් 22:21; ලෙවී 19:34; ලෙවී 24:22
4 ලෙවී 19:15; 1සාමු 16:7; හිතෝ 24:23; ලූක් 20:21; රෝම 2:11
5 නික් 23:3; යාකො 2:4
6 2ලේක 19:6
7 හිතෝ 29:25
8 නික් 18:26
9 ගණන් 10:12; ද්වි 8:15; යෙරෙ 2:6
10 උත් 15:16; ගණන් 13:29
11 ගණන් 13:26; ගණන් 32:8
12 ද්වි 1:7
13 නික් 23:27
14 ද්වි 1:8; ද්වි 31:6
15 ගණන් 14:9; යොෂු 1:9; ගීතා 27:1; යෙසා 41:10; හෙබ්‍රෙ 13:6

**2 තීරුව**
1 ගණන් 13:2
2 ගණන් 13:3
3 ගණන් 13:17
4 ගණන් 13:24
5 ගණන් 13:23; ගණන් 13:26
6 ගණන් 13:27
7 හෙබ්‍රෙ 10:38
8 ගණන් 14:1; ගණන් 14:4; ගීතා 106:24
9 හිතෝ 19:3
10 නික් 3:8; එස 20:6
11 ගණන් 14:3
12 ගණන් 32:9; ද්වි 20:8; යොෂු 14:8
13 ගණන් 13:33; ද්වි 2:10
14 ගණන් 13:28; ද්වි 9:1
15 ගණන් 13:22; යොෂු 11:21

කිසිම හේතුවක් නැහැ.[1] **30** ඔබේ
දෙවි වන යෙහෝවා ඊජිප්තු දේශයේදී
ඔබ වෙනුවෙන් සටන් කළ ආකාරය
ඔබ ඇස් දෙකෙන්ම දැක්කා.[2] ඒ
නිසා ඔහු දැනුත් ඔබ ඉදිරියෙන්
ගමන් කර ඔබ වෙනුවෙන් සටන්
කරන බවට කිසිම සැකයක් නැහැ.[3]
**31** ඔබේ දෙවි වන යෙහෝවා පාළුක-
රයේදීත්[4] ඔබව රැකබලා ගත් ආකා-
රය ඔබට හොඳින් මතක ඇති.
පියෙක් තම පුතාව වඩාගෙන යන්-
නාක් මෙන් ඔබේ මුළු ගමනේදී[5] ඔහු
ඔබව උසුලාගෙන ගියා.'[6] **32** මම
ඒ තරම් දේවල් කියලත් ඔබේ පියවරු
ඔවුන්ගේ දෙවි වන යෙහෝවාව විශ්-
වාස කළේ නැහැ.[7] **33** නමුත් අපිට
ඉදිරියෙන් ගමන් කර අපිට කඳවුරු
බැඳගන්න සුදුසු තැන් සොයා දුන්නේ
දෙවියි.[8] ඔහු රාත්‍රියේදී ගිනි ජාලාවක්
මගින්ද දවාලේදී වලා ටැඹක් මගින්ද
අපිට මඟ පෙන්නුවා.[9]

**34** "ඔවුන් කියූ හැම දෙයක්ම
අසාගෙන සිටි යෙහෝවා දෙවි අන්-
තිමේදී මහත් උදහසකින් මෙසේ
පැවසුවා.[10] **35** 'මා ඔබේ පියව-
රුන්ට දෙන්න පොරොන්දු වූ
දේශය, මේ දුෂ්ට පරම්පරාවේ කිසිවෙ-
කුට දකින්න ලැබෙන්නේ නැහැ.[11]
**36** නමුත් යෙෆුන්නෙගේ පුත්‍රයා[12]
වන කාලෙබ්ට ඒ අවස්ථාව ලැබෙයි.
ඔහු යෙහෝවා දෙවි වන මට මුළු
හදවතින්ම සේවය කරනවා. ඒ නිසා
ඔහු බලන්න ගිය ඒ දේශයෙන් කොට-
සක් මම ඔහුටත් ඔහුගේ පුත්‍රයන්-
ටත් දෙනවා.[13] **37** (ඔබේ පියවරුන්
නිසා යෙහෝවා දෙවි මා සමඟත් උද-
හස් වී මෙසේ පැවසුවා. 'ඔබටත් ඒ
දේශයට යන්න ලැබෙන්නේ නැහැ.[14]
**38** ඒ අවස්ථාව ලැබෙන්නේ ඔබේ
සේවකයා වන නූන්ගේ පුත් යොෂුවා-
ටයි.'[15] ඊශ්‍රායෙල් පුත්‍රයන්ට ඒ දේශය
උරුමයක් ලෙස ලබා දීමට පත්
කර තිබෙන්නේ යොෂුවාවයි. දෙවි
ඒ කාර්යය සඳහා ඔහුව ශක්තිමත්
කළා.)[16] **39** "මේ දේශයට ගියොත්
සතුරන් අපේ දරුදැරියන්ව පැහැර-
ගනී"[1] කියා ඔබ පැවසුවා මතකද?
එහෙත් ඒ දේශයට යන්නේ කිසිම දෙ-
යක් නොතේරෙන ඒ දරුදැරියන් පම-
ණයි. මා ඒ දේශය උරුම කර
දෙන්නේ ඔවුන්ටයි. **40** ඔබ සියලු-
දෙනාම දැන් මෙතැනින් පිටත් වී රතු
මුහුදට යන මාර්ගය ඔස්සේ නැවත
පාළුකරයට යන්න.'[2]

**41** "ඒ අවස්ථාවේදී ඔබේ පියව-
රුන් මෙසේ පැවසුවා. 'අපි යෙහෝවා
දෙවිට විරුද්ධව පව් කළා.[3] යෙ-
හෝවා දෙවි අපට පැවසූ විදිහ-
ටම අපි දැන් ගිහින් ඒ ජාතීන්ට
විරුද්ධව සටන් කරමු.' කඳුකරයට
ගිහින් යුද්ධ කරන එක සුළු දෙයක්
කියා ඔවුන් සිතුවා. ඒ නිසා ඔවුන්
යුද්ධායුධ රැගෙන යන්න සූදානම්
වුණා.[4] **42** නමුත් යෙහෝවා දෙවි
ඔවුන්ට මේ දේ පවසන ලෙස මට
අණ කළා. 'මගේ ආශීර්වාදය ඔබට
නැහැ.[5] ඒ නිසා කඳුකරයට යන්න
එපා. ඔබ ගියොත් ඔබ අනිවාර්ය-
යෙන්ම සතුරන්ගේ අතින් පරාජයට
පත් වෙයි.'[6] **43** නමුත් ඔබේ පියව-
රුන් යෙහෝවා දෙවිගේ ඒ නියෝගය
කිසි ගණනකට ගත්තේ නැහැ. ඔවුන්
කැරලිගසා[7] හිතුවක්කාර ලෙස කඳු-
කරයට ගියා.[8] **44** එවිට කඳුකරයේ
ජීවත් වූ අමෝරිවරුන් ඔවුන්ට විරුද්-
ධව ඇවිත් ඔවුන්ට පහර දුන්නා.[9]
අමෝරිවරුන් මීමැසි රංචුවක් මෙන්
ඔවුන් පසුපස එළවාගෙන ඇවිත්,
සේයිර් කඳුකරයේ පිහිටි හෝර්මා[10]
නම් ස්ථානය දක්වාම ඔවුන්ව පන්නා
දැමුවා. **45** ඉන්පසු ඔවුන් නැවත
කඳවුරට ඇවිත් යෙහෝවා දෙවි ඉදිරි-
යේ හඬා වැලපුණා. නමුත් යෙහෝවා
දෙවි ඔවුන්ට සවන් දුන්නේ නැහැ.[11]
ඔහු ඔවුන්ට කිසි පිළිතුරක් දුන්නේ
නැහැ.[12] **46** එබැවින් අපට බොහෝ
කාලයක් කාදෙෂ්හි ඉන්න සිදු වුණා.[13]

**2** "කලක් ගත වූ පසු යෙහෝවා
දෙවි පැවසූ ආකාරයට අපි එතැ-
නින් පිටත් වී රතු මුහුදට යන මාර්-
ගය දිගේ පාළුකරය වෙතට ගමන්

**1 පරි.**
**1** ගණන් 14:9
**2** ගණන් 14:22; ගීතා 78:12; ගීතා 105:27
**3** නික් 14:14; ද්වි 20:4; යොෂු 10:42; 2ලේක 14:11; ගීතා 46:11
**4** ගීතා 78:15
**5** ගීතා 77:20
**6** නික් 19:4; ද්වි 32:11
**7** ගීතා 78:22; ගීතා 106:24; හෙබ්‍රෙ 3:16; හෙබ්‍රෙ 3:19; යූද් 5
**8** ගණන් 10:33
**9** නික් 13:21; නික් 40:36; ගණන් 10:34; නෙහෙ 9:12; ගීතා 78:14; ගීතා 105:39
**10** ගණන් 14:28; ගණන් 14:35; ගණන් 32:10; ද්වි 2:14; ගීතා 95:11; හෙබ්‍රෙ 3:11
**11** ගණන් 14:29; ක්‍රියා 13:18; 1කොරි 10:5; හෙබ්‍රෙ 3:17
**12** ගණන් 14:30
**13** ගණන් 14:24; යොෂු 14:9
**14** ගණන් 20:12; ගණන් 27:13; ද්වි 3:26; ගීතා 106:32
**15** නික් 33:11; ගණන් 11:28; ගණන් 14:38
**16** ගණන් 27:18; ද්වි 31:7; යොෂු 1:6

**2 තීරුව**
**1** ගණන් 14:3; ගණන් 14:31
**2** ගණන් 14:25
**3** ගණන් 14:39
**4** ගණන් 14:40
**5** ලෙවී 26:17; ගණන් 14:42
**6** ගණන් 14:43
**7** ගණන් 14:41; යෙසා 63:10; යෙරෙ 11:8; ක්‍රියා 7:51
**8** ගණන් 14:44
**9** ද්වි 28:25; ද්වි 32:30
**10** ගණන් 14:45
**11** ගීතා 78:34; හිතෝ 28:9
**12** ගීතා 66:18
**13** ගණන් 13:25

කළා.[1] සේයිර් කන්ද මඟහැර ගිය අපි
දවස් ගණනාවක් ඒ අවට ප්‍රදේශ-
වල ගමන් කළා. **2** අන්තිමේදී යෙ-
හෝවා දෙවි මට මෙසේ පැවසුවා.
**3** ‘ඊශ්‍රායෙල් සෙනඟ බොහෝ දවස්
මේ කන්ද අවට ප්‍රදේශවල ගමන්
කළා.[2] දැන් මේ ප්‍රදේශයෙන් පිටත්
වී උතුරට ගමන් කරන්න. **4** සෙ-
නඟට මේ දේද කියන්න. “තව ටික
දුරක් යන විට ඔබේ සහෝදරයන්[3]
වන ඒසව්ගේ පුත්‍රයන්[4] ජීවත් වන සේ-
යිර්[5] දේශ සීමාවට ඔබ ළඟා වෙයි.
ඔවුන් ඔබව දැක බොහෝ සෙයින්
බියපත් වෙයි.[6] ඒ නිසා ඥානවන්තව
ක්‍රියා කරන්න. **5** ඔවුන්ට විරුද්ධව
සටන් නොකරන්න. මන්ද උරුම-
යක් හැටියට මා සේයිර් කන්ද දී
තිබෙන්නේ ඒසව්ටයි.[7] ඒ නිසා ඒ
දේශයෙන් එක බිම් අඟලක්වත්*
මම ඔබට දෙන්නේ නැහැ. **6** ඔබට
අවශ්‍ය කෑම බීම ඔවුන්ගෙන් ලබා-
ගන්න පුළුවන්. එහෙත් ඒ සඳහා
ඔබ ඔවුන්ට ගෙවිය යුතුයි.[8] **7** ඔබේ
දෙවි වූ යෙහෝවා වන මම මේ අවු-
රුදු හතළිහ[9] පුරාම ඔබව රැකබලා
ගත්තා. ඔබ මේ පාළුකරයේ ගමන්
කළ කාලයේදී මම ඔබ සමඟ සිට
ඔබ කළ හැම දෙයකටම ආශීර්වාද
කළා.[10] යෙහෝවා දෙවි වන මා ඔබට
කිසි දෙයකින් අඩුවක් වෙන්න ඉඩ
තැබුවේ නැහැ.” ’[11] **8** දෙවි කී ලෙස
අපි අපේ සහෝදරයන් වන ඒසව්ගේ[12]
පුත්‍රයන් ජීවත් වූ සේයිර් දේශය මඟ-
හැර ගියා. අපි අරබා[13] මාර්ගය දිගේ-
වත් ඒලත් හා එශියොන්-ගෙබෙර්[14]
වෙතටවත් ගියේ නැහැ.

“ඒ වෙනුවට අපි මෝවබ්[15] පාළුක-
රයට යන මාර්ගය දිගේ ගමන් කළා.
**9** ඒ අවස්ථාවේදී යෙහෝවා දෙවි
මට මෙසේ පැවසුවා. ‘මෝවබ්වරුන්ට
හිරිහැර කරන්නවත් ඔවුන් සමඟ
යුද්ධ කරන්නවත් එපා. ඔවුන්ගේ දේ-
ශයෙන් එක කොටසක්වත් මා ඔබට
දෙන්නේ නැහැ. මන්ද මා උරුමයක්

ද්වි **2:5*** මූ.අ., “අඩියක්වත්.”

**2 පරි.**
**1** ගණන් 14:25
ද්වි 1:40
**2** ද්වි 2:7
**3** උත් 36:8
ගණන් 20:14
ද්වි 23:7
**4** උත් 27:40
උත් 36:10
**5** උත් 27:39
උත් 36:9
ද්වි 2:8
**6** නික් 15:15
නික් 23:27
ද්වි 2:25
**7** උත් 32:3
උත් 36:8
ද්වි 32:8
යොෂු 24:4
2ලේක 20:10
ක්‍රියා 17:26
**8** ගණන් 20:19
**9** ද්වි 8:2
ද්වි 29:5
ගීතා 95:10
ක්‍රියා 13:18
**10** උත් 12:2
හිතෝ 10:22
**11** නෙහෙ 9:21
ගීතා 23:1
ගීතා 34:9
ගීතා 34:10
ගීතා 37:25
පිලි 4:19
**12** ගණන් 20:20
ගණන් 20:21
ගණන් 21:4
විනි 11:18
**13** ද්වි 11:30
**14** 2ලේක 8:17
**15** ගණන් 21:13
විනි 11:17
2ලේක 20:10

**2 තීරුව**
**1** ගණන් 21:15
ද්වි 2:18
යෙසා 15:1
**2** උත් 19:37
**3** උත් 14:5
**4** ගණන් 13:33
යොෂු 14:15
**5** උත් 14:5
ද්වි 3:11
1ලේක 20:6
**6** ගණන් 13:22
ගණන් 13:28
ගණන් 13:33
ද්වි 1:28
ද්වි 9:2
**7** උත් 14:6
උත් 36:20
1ලේක 1:39
**8** උත් 36:10
**9** උත් 27:39
උත් 27:40
**10** ගණන් 21:12

හැටියට ආර්[1] නුවර දුන්නේ ලොත්ගේ
පුත්‍රයන්ටයි.[2] **10** (ඔවුන්ට කලින් ඒ
දේශයේ ජීවත් වූයේ ඒමීවරුන්ය.[3]
විශාල ජාතියක් වූ ඔවුහු අනාක්ව-
රුන්[4] මෙන් ඉතා උස මහත, බලවත්
ජන පිරිසක් වූහ. **11** රෙෆායිවරුන්-
වද[5] අනාක්වරුන්[6] මෙන් සලකන
ලදි. මෝවබ්වරුන් ඔවුන්ව හැඳින්වූ-
යේ ඒමීවරුන් ලෙසය. **12** අතීත-
යේ හෝරිවරුද[7] සේයිර්හි ජීවත් වූහ.
ඒසව්ගේ පුත්‍රයෝ[8] ඔවුන්ව ඒ දේශ-
යෙන් පන්නා දමා ඔවුන්ව විනාශ කර
ඒ දේශයේ පදිංචි වූහ.[9] ඊශ්‍රායෙල්වරුද
යෙහෝවා දෙවි ඔවුන්ට දෙන දේ-
ශය එලෙසම යටත් කරගනු ඇත.)
**13** ඒ දේශය මඟහැර ශේරෙද් නිම්නය
හරහා යන්න.’ අපි දෙවිට කීකරු
වී ශේරෙද්[10] නිම්නය හරහා ගියා.
**14** අපි කාදෙෂ්-බර්නේවලින් පිටත් වූ
දා සිට ඒ දක්වා අවුරුදු තිස් අටක්ම
ගත වී තිබුණා. ඒ කාලයේදී යුද්ධ
කරන්න පුළුවන් වයසක සිටි කලින්
පරම්පරාවේ සියලු පුරුෂයන් මිය
ගියා. යෙහෝවා දෙවි ඔවුන්ට දිවුරූ
ලෙසම ඒ දේ සිදු වුණා.[11] **15** ඊශ්‍රා-
යෙල් සෙනඟ අතරින් ඒ පරම්පරාව
සම්පූර්ණයෙන්ම නැති වී යන තෙක්[12]
යෙහෝවා දෙවි ඔවුන්ට විරුද්ධව
ක්‍රියා කළා.[13]

**16** “යුද්ධ කරන්න පුළුවන් වයසක
සිටි ඒ සියලු පුරුෂයන් මිය ගිය පසු,[14]
**17** යෙහෝවා දෙවි මට මෙසේ පැව-
සුවා. **18** ‘දැන් ඔබ ආර්[15] නුවර
අසල පිහිටි මෝවබ්වරුන්ගේ දේ-
ශය පසු කරගෙන යන්න. **19** ඔබ
අම්මොන්වරුන්ගේ දේශය ළඟටම
ගියත් ඔවුන්ට හිරිහැර නොකරන්න.
ඔවුන්ට විරුද්ධව සටන් නොකරන්න.
අම්මොන්වරුන්ගේ දේශයෙන් කිසිම
කොටසක් මා ඔබට දෙන්නේ නැහැ.
මන්ද උරුමයක් හැටියට මම ඒ දේ-
ශය දුන්නේ ලොත්ගේ පුත්‍රයන්ටයි.[16]

**11** ගණන් 14:33; ගණන් 32:11; ද්වි 1:35; ගීතා 95:11; ගීතා 106:26; එස 20:15; හෙබ්‍රෙ 3:18; යූද් 5; **12** 1කොරි 10:5; **13** හෙබ්‍රෙ 10:31; **14** ගණන් 26:64; **15** ගණන් 21:15; ගණන් 21:28; **16** උත් 19:38; ද්වි 2:9; විනි 11:15; 2ලේක 20:10; ක්‍රියා 17:26.

**20** කලින් එම දේශය අයිතිව තිබු-
ණේ රෙෆායිවරුන්ටයි.[1] (අම්මොන්ව-
රුන්ට කලින් එම දේශයේ ජීවත්
වුයේ රෙෆායිවරුන්ය. අම්මොන්ව-
රුන් ඔවුන්ව හැඳින්වුයේ සම්සුම්මීව-
රුන් ලෙසය. **21** විශාල ජාතියක් වූ
ඔවුහු අනාක්වරුන්[2] මෙන් ඉතා උස
මහත, බලවත් ජන පිරිසක් වූහ.
යෙහෝවා දෙවි ඔවුන්ව සම්පූර්ණ-
යෙන්ම විනාශ කර[3] එම දේශය අම්-
මොන්වරුන්ට යටත් කරගන්න ඉඩ
දුන්නේය. **22** දෙවි හෝරිවරුන්ව[4]
විනාශ කර සේයිර්[5] දේශය යටත්
කරගෙන එහි පදිංචි වීමට ඒසව්-
ගේ පුත්‍රයන්ට උපකාර කළා සේම
අම්මොන්වරුන්ටද උපකාර කළේය.
**23** කප්තෝර්[6] නම් ප්‍රදේශයේ සිට
පැමිණි කප්තෝරිවරු[7] ගාසා[8] දක්වා
විහිදී තිබෙන ගම්මානවල ජීවත් වූ
අව්විවරුන්ව[9] පලවාහැර ඒ දේශයේ
පදිංචි වූහ.)
**24** "'ඔබ ආනොන්[10] නිම්නය
හරහා ගොස් හෙෂ්බොන්හි රජු
වන අමෝරි ජාතික සීහොන්ට[11]
විරුද්ධව සටන් කර ඔහුගේ දේශය
යටත් කරගන්න. මම ඒ දේශය
ඔබේ අතට දෙන්නම්. **25** මම පො-
ළොවේ ජීවත් වන සියලු වැසියන්
තුළ මහත් කැලඹිල්ලක් ඇති කර-
නවා. ඔවුන් ඔබ ගැන අසා භයෙන්
වෙවුලයි. ප්‍රසව වේදනාවෙන් සිටින
ස්ත්‍රියක් මෙන් ඔවුනුත් මහත් වේද-
නාවක් අද්දකියි.'[12]
**26** "දෙවි ඒ දේ කී පසු මම කෙ-
දෙමොත්[13] පාළුකරයේ සිට හෙෂ්-
බොන්හි රජු වූ සීහොන්[14] වෙතට
පණිවිඩකරුවන් යවා ඔහුගෙන් කාරු-
ණිකව[15] මෙසේ ඇසුවා. **27** 'ඔබේ
දේශය හරහා යන්න අපිට ඉඩ දෙන-
වාද? අපි ඔබේ දේශයේ වෙන කිසිම
තැනකට යන්නේ නැහැ. ප්‍රධාන මාර්-
ගයේ විතරක් ගමන් කරන්නම්.[16]
**28** ඒ අතරේ අපි කන බොන දේවල්-
වලට යන වියදම ඔබට ගෙවන්නම්.
අපිට දේශය හරහා යන්න විතරක්
ඉඩ දෙන්න.[17] **29** සේයිර්හි[18] ජීවත්
වන ඒසව්ගේ පුත්‍රයන් හා ආර් නුව-
රෙහි ජීවත් වන මෝවබ්වරුන්[1] අපිට
ඉඩ දුන්නා වගේ ඔබත් අපිට දේ-
ශය හරහා යන්න අවසර දෙන්න.
ඔබ එසේ කළොත් අපට යොර්-
දාන් ගඟෙන් එගොඩ වී අපේ දෙවි
වන යෙහෝවා අපිට දෙන්න පො-
රොන්දු වුණු දේශයට යන්න පුළුවන්
වෙයි.'[2] **30** නමුත් හෙෂ්බොන්හි රජු
වූ සීහොන් තම සිත දැඩි කරගෙන
අපිට ඔහුගේ දේශය හරහා යන්න ඉඩ
දුන්නේ නැහැ. අපේ දෙවි වන යෙ-
හෝවා ඔහුට එසේ මුරණ්ඩු වීමට ඉඩ-
හැරියා.[3] ඒ නිසා අපට හැකි වුණා
ඔහුගෙන් ඒ දේශය ලබාගන්න.[4]
**31** "'මම සීහොන්වයි ඔහුගේ දේ-
ශයයි ඔබේ අතට දෙන්නම්. දැන්
ගිහින් ඒ දේශය යටත් කරගන්න'[5]
කියා යෙහෝවා දෙවි මට පැවසුවා.
**32** සීහොන් ඔහුගේ මුළු සේනාව
සමඟ අපිට විරුද්ධව සටන් කරන්න
යහෂ්[6] වෙතට ආවා. **33** නමුත්
අපේ දෙවි වන යෙහෝවා ඔහුව අපේ
අතට දුන්න නිසා[7] ඔහුවත්[8] ඔහුගේ
පුත්‍රයන්වත් ඔහුගේ මුළු සේනාවත්
පරාජය කරන්න අපිට හැකි වුණා.
**34** අපි ඔහුට අයිතිව තිබුණු සියලු
නුවරවල් අල්ලාගෙන ඒවා සහමු-
ලින්ම විනාශ කර දැමුවා.[9] නුවරවල
ජීවත් වුණු කිසි කෙනෙක්ව ඉතුරු
කළේ නැහැ. අපි එහි සිටි සියලු
පුරුෂයන්ව, ස්ත්‍රීන්ව හා දරුවන්ව
විනාශ කළා. **35** අපි ඒ නුවරව-
ලින් රැගෙන ආවේ ඔවුන්ගේ සතුන්ව
හා එහි තිබූ බඩු බාහිරාදිය පම-
ණයි.[10] **36** ආනොන් නිම්නය අසල
පිහිටි අරෝයේර්[11] නුවරද එම නිම්-
නය මැද පිහිටි නුවරද ගිලියද් දක්වා
පිහිටි සියලු නුවරවල්ද අපි පහසු-
වෙන්ම අල්ලාගත්තා.[12] අපේ දෙවි
වන යෙහෝවා ඒ සියලු නුවරවල්
අපේ අතට දුන්නා. **37** යෙහෝවා
දෙවි අපිට යන්න එපා කියා පැවසූ
කිසිම තැනකට අපි ගියේ නැහැ. අම්-
මොන්වරුන්ගේ[13] දේශයට අයත් වූ
යබ්බොක්[14] ඔය අසල තිබෙන ප්‍රදේ-

**2 පරි.**
1 උත් 15:20; ද්වි 3:11; යොෂු 17:15
2 ගණන් 13:33; ද්වි 2:10; ද්වි 9:2
3 නික් 15:3; ගීතා 24:8
4 උත් 14:6; උත් 36:20; ද්වි 2:12
5 උත් 36:8
6 යෙරෙ 47:4; ආමො 9:7; ක්‍රියා 27:13
7 උත් 10:14; 1ලේක 1:12
8 උත් 10:19; යොෂු 11:22
9 යොෂු 13:3
10 ගණන් 21:13; විනි 11:18
11 ගණන් 21:23; යොෂු 9:10
12 නික් 15:14; නික් 23:27; ද්වි 11:25; යොෂු 2:9
13 යොෂු 13:18; යොෂු 21:37
14 ගණන් 21:21
15 ද්වි 20:10
16 ගණන් 21:22; විනි 11:19
17 ගණන් 20:19
18 ද්වි 2:8

**2 තීරුව**
1 ද්වි 2:9; ද්වි 2:18
2 ද්වි 9:5; යොෂු 1:11
3 යෝබ් 34:11; රෝම 9:18
4 ගණන් 21:25; ගීතා 135:10; ගීතා 136:18
5 ගණන් 32:33; ගීතා 135:12
6 ගණන් 21:23; විනි 11:20
7 ද්වි 20:13; නෙහෙ 9:22; ගීතා 135:11; ගීතා 136:18
8 ගණන් 21:24; ද්වි 29:7
9 ලෙවී 27:28; ගණන් 31:17; ද්වි 20:16; ද්වි 20:17
10 යොෂු 8:27
11 ද්වි 3:12; ද්වි 4:48; යොෂු 13:9
12 යොෂු 1:5; ගීතා 44:3
13 ද්වි 3:16; විනි 11:15
14 ගණන් 21:24; යොෂු 12:2

ශයටවත් කඳුකරයේ තිබුණු නුවරව-
ලටවත් අපි ගියේ නැහැ.

**3** “ඉන්පසු අපි බාෂාන් දේශය වෙ-
තට යන මාර්ගයේ උතුරු දෙසට
ගමන් කළා. ඒ ගැන ආරංචි වූ
බාෂාන්හි රජු වන ඕග්[1] අපට විරුද්ධව
සටන් කරන්න ඔහුගේ මුළු සේ-
නාව සමඟ එද්රෙයි[2] නුවරට පැමි-
ණියා. **2** ඒ අවස්ථාවේදී යෙහෝවා
දෙවි මට මෙසේ පැවසුවා. ‘ඕග්
රජුට භය නොවන්න.[3] මම ඔහුවත්
ඔහුගේ සෙනඟවත් ඔහුගේ දේශයත්
ඔබේ අතට දෙන්නම්. හෙෂ්බොන්හි
ජීවත් වූ අමෝරිවරුන්ගේ රජු වන
සීහොන්ව[4] ඔබ විනාශ කළ ලෙසම
ඔහුවත් විනාශ කරන්න.’ **3** යෙ-
හෝවා දෙවි කී ලෙසම බාෂාන්හි රජු
වූ ඕග්වත් ඔහුගේ මුළු සේනාවත්
අපේ අතට දුන්නා. ඔවුන්ගෙන් කිසි-
වෙකුව අපි ඉතුරු කළේ නැහැ.[5]
**4** ඒ කාලයේදී ඔහු යටතේ තිබුණු
සෑම නුවරක්ම අපි අල්ලාගත්තා.
බාෂාන්[6] දේශයේ රජු වූ ඕග්ගේ රාජ-
ධානිය වූ මුළු අර්ගොබ්[7] පළාත පුරාම
නුවරවල් හැටක් තිබුණා.[8] අපි ඒ
එක නුවරක්වත් අත්හැරියේ නැහැ.
**5** ඒ සෑම නුවරක්ම විශාල පවු-
රුවලින් වට වූ දොරගුලු සහිත
සුරක්ෂිත නුවරවල්. ඊට අමතරව
ඒ ප්‍රදේශයේ තිබූ බොහෝ පිටිසර
ගම්මානද අපි යටත් කරගත්තා.
**6** හෙෂ්බොන්හි රජු වූ සීහොන්ගේ
රාජධානියට කළාක් මෙන් අපි එහි
සෑම නුවරක්ම විනාශ කර දැමුවා.[9]
එහි සිටි කිසි පුරුෂයෙක්වත් ස්ත්‍රියක්-
වත් කුඩා දරුවෙක්වත් අපි ඉතුරු
කළේ නැහැ.[10] **7** නමුත් සියලුම
සතුන්ව හා නුවරවල තිබූ වස්තුවද
අපි අයිති කරගත්තා.[11]

**8** “අපි යොර්දාන් ගඟ අසල සිටි
අමෝරිවරුන්ගේ[12] ඒ රජවරුන් දෙදෙ-
නාට අයිති මුළු ප්‍රදේශයත් අත් පත්
කරගත්තා. එම ප්‍රදේශය ආනොන්[13]
නිම්නය සිට හෙර්මොන්[14] කන්ද
දක්වාම විහිදී ගියා. **9** (සීදොන්
වැසියන් හෙර්මොන් කන්ද හැඳින්-
වූයේ සිරියොන්[1] ලෙසයි. අමෝ-
රිවරුන් එය හැඳින්වූයේ සෙනීර්[2]
ලෙසයි.) **10** අපි උස් තැනිතලාවේ
සියලු නුවරවල්ද මුළු ගිලියද් දේශ-
යද සලේකා[3] හා එද්රෙයි[4] නුවරවල්
ඇතුළුව බාෂාන්හි රජු වූ ඕග්ගේ
රාජධානියට අයත් මුළු ප්‍රදේශයද
අල්ලාගත්තා. **11** ඒ වන විට රෙ-
ෆායිවරුන්ගෙන්[5] ඉතුරු වී සිටියේ
බාෂාන්හි රජු වූ ඕග් පමණයි. ඔහුව
මරා දැමූ පසු ඔහුගේ දේහය රියන්*
නවයක් දිග, රියන් හතරක් පළල
විශාල යහනක් මත තැබුවා. යකඩව-
ලින් සෑදූ එම යහන අද දක්වාම අම්-
මොන්වරුන්ට අයත් රබ්බා[6] නුවරේ
දකින්න තිබෙනවා. **12** ඒ කාල-
යේදී අපි ඒ මුළු ප්‍රදේශයම අයිති කර-
ගත්තා. ඉන්පසු ආනොන් නිම්නයේ
පිහිටි අරෝයේර්[7] නුවර සිට ගිලියද්
දේශ සීමාව දක්වා විහිදී යන ප්‍රදේශ-
යද ගිලියද්හි කඳුකර ප්‍රදේශයෙන්
භාගයක්ද එහි තිබුණු නුවරවල්ද මම
රූබෙන් සහ ගාද් ගෝත්‍රයට[8] භාර
දුන්නා. **13** ගිලියද්[9] දේශයේ ඉතුරු
කොටසත් ඕග් රජුගේ රාජධානිය වූ
බාෂාන්[10] දේශයත් මම භාර දුන්නේ
මනස්සේ ගෝත්‍රයෙන් එක කොටස-
කටයි. මුළු අර්ගොබ්[11] පළාත එනම්,
බාෂාන් දේශය කලින් අයිතිව තිබු-
ණේ රෙෆායිවරුන්ටයි.[12]

**14** “ගෙෂූර්වරුන්ගේ[13] හා මය-
කාත්වරුන්ගේ[14] දේශ සීමා දක්වා
විහිදී යන අර්ගොබ්[15] පළාත
අයිති කරගත්තේ මනස්සේගේ පුත්
යායිර්[16] විසිනුයි. බාෂාන් දේශයේ
පිහිටි එම ගම්මානවලට ඔහු තම
නම තැබුවා. එතැන් පටන් ඒවා
හැඳින්වූයේ හව්වොත්-යායිර්*[17] ලෙ-
සයි. **15** මම ගිලියද්[18] දේශය දුන්-
නේ මාකීර්ටයි.[19] **16** රූබෙන්[20] හා
ගාද් යන ගෝත්‍රවලට මම ගිලියද්[21]
දේශයේ සිට ආනොන් නිම්නය දක්වා

---

**3 පරි.**
**1** ගණන් 21:33 ද්වි 29:7 යොෂු 9:10 නෙහෙ 9:22
**2** යොෂු 12:4 යොෂු 13:12
**3** ගණන් 14:9 ගණන් 21:34 ද්වි 20:3
**4** ගණන් 21:24
**5** ගණන් 21:35 යොෂු 13:12
**6** ද්වි 29:8
**7** 1රාජා 4:13
**8** ගණන් 32:33 යොෂු 13:30
**9** ලෙවී 27:29
**10** ලෙවී 18:25 ද්වි 2:34 එස 9:6
**11** ද්වි 2:35 යොෂු 8:27
**12** ගණන් 32:33
**13** යොෂු 12:2 යොෂු 13:9
**14** යොෂු 11:3 සල 4:8

**2 තීරුව**
**1** ගීතා 29:6
**2** 1ලේක 5:23 එස 27:5
**3** යොෂු 12:5 යොෂු 13:11
**4** ගණන් 21:33 යොෂු 13:12
**5** උත් 14:5
**6** 2සාමු 12:26 යෙරෙ 49:2
**7** ගණන් 32:34 ද්වි 4:48 යොෂු 12:2
**8** ගණන් 32:33
**9** උත් 31:21 ගණන් 32:39 යොෂු 13:31 විනි 10:4
**10** යොෂු 13:30 1ලේක 5:23
**11** 1රාජා 4:13
**12** උත් 15:20
**13** යොෂු 13:13 2සාමු 3:3
**14** යොෂු 12:5
**15** ද්වි 3:4
**16** 1ලේක 2:22
**17** ගණන් 32:41
**18** ගණන් 32:39
**19** උත් 50:23 යොෂු 17:1
**20** ගණන් 32:33
**21** ද්වි 3:8 යොෂු 22:9

---

ද්වි **3:11*** උත් 6:15හි පාදසටහන බලන්න.
**14*** තේරුම, “යායිර්ගේ කුඩාරම් ගම්මාන.”

විහිදෙන ප්‍රදේශය දුන්නා. ආනොන්
නිම්නය මැදින් දිව යන මායිමේ සිට
ගිලියද් දේශයේ අම්මොන්වරුන්ගේ[1]
දේශ සීමාවේ පිහිටි යබ්බොක් නිම්-
නය දක්වා එම ප්‍රදේශය විහිදී යනවා.
**17** මහ අරබා නිම්නය හා යෝර්දාන්
ගඟද එහි ඉවුර දිගේ දිව යන ප්‍රදේශ-
යද ඔවුන්ට අයිතියි. කින්නෙරෙත්[2]
මුහුදේ* දකුණු මායිමේ සිට අරබා
මුහුද ලෙසත් හඳුන්වන ලුණු මුහුදේ[3]
උතුරු මායිම දක්වාද එතැන් සිට
නැඟෙනහිරෙන් පිහිටි පිස්ගා[4] කඳු
පාමුල දක්වාද ඔවුන්ගේ දේශ සීමාව
දිව යයි.

**18** "පසුව මම ඔවුන්ට මෙසේ
පැවසුවා. 'යෙහෝවා දෙවි මේ දේශය
ඔබට උරුමයක් ලෙස දී තිබෙ-
නවා. නමුත් ඔබ අතරේ සිටින
සියලු එඩිතර පුරුෂයන් යුද්ධයට
සැරසී අනික් ගෝත්‍රවල සිටින ඔබේ
සහෝදරයන්ගේ සහයට යා යුතුයි.[5]
**19** ඔබේ භාර්යාවන්ටත් කුඩා දරු-
වන්ටත් මම ඔබට දුන් නුවරවල
සිටිය හැකියි. ඔබට සත්ව රැළවල්
ගණනාවක් සිටින බව මම දන්නවා.
ඒ සතුන්වත් ඔබට ඒ නුවරවල
තබා යන්න පුළුවන්.[6] **20** නමුත්
ඔබ ඔබේ සහෝදරයන් සමඟ යෝර්-
දාන් ගඟෙන් එගොඩ වී යෙහෝවා
දෙවි ඔවුන්ට උරුමයක් ලෙස දෙන
දේශය අත් පත් කරගන්න ඔවුන්ට
උදව් කරන්න. යෙහෝවා දෙවි ඔබට
මෙන් ඔබේ සහෝදරයන්ටත් කර-
දරයක් නැතුව සැනසිල්ලේ ජීවත්
වෙන්න අවස්ථාවක් ලබා දෙන තුරු
ඔබ ඔවුන්ට උදව් කළ යුතුයි. ඉන්පසු
ඔබට පුළුවන් ඔබ හිමි කරගත් මේ
දේශයට නැවත එන්න.'[7]

**21** "ඉන්පසුව කළ යුතු දේ ගැන
මම යෝෂුවාට[8] පැවසුවේ මෙයයි.
'යෙහෝවා දෙවි මේ රජවරුන් දෙදෙ-
නාට කළ දේ ඔබ ඔබේ ඇස් දෙ-
කෙන්ම දැක්කා. යෙහෝවා දෙවි
අනික් සියලුම රාජ්‍යයන්ද ඒ විදිහ-
ටම ඔබට ලබා දෙයි.[1] **22** ඒ නිසා
ඔවුන්ට භය වෙන්න එපා. මන්ද ඔබ
වෙනුවෙන් සටන් කරන්නේ ඔබේ
දෙවි වන යෙහෝවායි.'[2]

**23** "පසුව මම යෙහෝවා දෙවිට
ඉතා බැගෑපත්ව මෙසේ කන්නලව්
කළා. **24** 'විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවියනි, ඔබ හා
සමාන බලවත් ක්‍රියා හා පුදුම දේවල්
කරන වෙන කිසි දෙවි කෙනෙක්
ස්වර්ගයෙහිවත් මේ පොළොවෙහි-
වත් නැහැ.[3] ඔබේ ශ්‍රේෂ්ඨත්වය[4] හා
මහත් බලය[5] දකින්න ඔබේ සේ-
වකයා වන මටත් අවස්ථාව
ලැබුණා. **25** දෙවියනි, යෝර්දාන්
ගඟෙන් එගොඩ තිබෙන ඒ සරු-
සාර දේශයටත්[6] එහි සුන්දර කඳුක-
රයටත්[7] ලෙබනොන්[8] දේශයටත්
යන්න මටත් අවස්ථාවක් දෙන්න
කියා මම ඔබෙන් බැගෑපත්ව ඉල්ලා
සිටිනවා.' **26** නමුත් ඔබේ පියව-
රුන් නිසා මා අතින් සිදු වූ වරදට යෙ-
හෝවා දෙවි මා සමඟ උදහසෙන්
සිටියා.[9] ඒ නිසා යෙහෝවා දෙවි
මගේ ඉල්ලීමට එකඟ නොවී මට
මෙසේ පැවසුවා. 'මා සමඟ මේ
කාරණය ගැන නැවත කතා නොක-
රන්න. මගේ තීරණය වෙනස් වෙන්-
නේ නැහැ. **27** පිස්ගා[10] කඳු මුදුනට
නැඟ මුළු දේශයම බලාගන්න. නමුත්
යෝර්දාන් ගඟෙන් එගොඩ වී ඒ දේශ-
යට යන්න නම් ඔබට ලැබෙන්නේ
නැහැ.[11] **28** ඔබෙන් පසුව නාය-
කයා[12] හැටියට යෝෂුවාව පත්
කරන්න. ඒ සඳහා ඔහුව ධෛර්යවත්
කර ශක්තිමත් කරන්න. ගඟෙන්
එගොඩ වී[13] ඒ දේශයට සෙනඟව
රැගෙන යන්නේ ඔහුයි. ඔබ දකින මේ
දේශය ඊශ්‍රායෙල් සෙනඟ උරුම කර-
ගන්නේ ඔහුගේ නායකත්වය යට-
තෙයි.'[14] **29** ඒ සෑම දෙයක්ම සිදු
වුණේ අපි බෙත්-පෙයෝර්[15] නුවර ඉදි-
රියේ පිහිටා තිබුණු නිම්නයේ සිටි
කාලයේදීයි.

**3 පරි.**
1 ගණන් 21:24, යෝෂු 12:2
2 ගණන් 34:11
3 උත් 14:3, ගණන් 34:12, යෝෂු 12:3
4 ද්වි 34:1
5 ගණන් 32:20
6 යෝෂු 1:14
7 යෝෂු 1:15, යෝෂු 22:4, යෝෂු 22:8
8 ගණන් 11:28, ගණන් 14:30, ගණන් 27:18

**2 තීරුව**
1 යෝෂු 10:25
2 නික් 14:14, නික් 15:3, ගණන් 21:34, ද්වි 1:30, ද්වි 20:4, යෝෂු 10:42
3 නික් 15:11, 2සාමු 7:22, 1රාජා 8:23, ගීතා 71:19, ගීතා 86:8, යෙරෙ 10:6, යෙරෙ 49:19
4 නික් 34:6, ද්වි 11:2, ගීතා 145:3, යෙරෙ 32:18
5 නික් 15:16, ගීතා 44:3
6 නික් 3:8, ද්වි 4:22, ද්වි 11:12, එස 20:6
7 ද්වි 1:7
8 යෝෂු 13:5, 1රාජා 9:19
9 ගණන් 20:12, ගණන් 27:14, ද්වි 31:2, ගීතා 106:32
10 ගණන් 21:20, ගණන් 27:12, ද්වි 34:1
11 ද්වි 34:4
12 ගණන් 27:19, ද්වි 1:38, ද්වි 31:7
13 යෝෂු 1:2, ක්‍රියා 7:45
14 යෝෂු 3:7
15 ද්වි 4:46, ද්වි 34:6, යෝෂු 13:20

**ද්වි 3:17*** ගලීල මුහුදු මුලින් හැඳින්වූයේ මෙම නමින්ය.

4 “ඊශ්‍රායෙල්වරුනි, මම දැන් ඔබට
දෙන නීති හා තීන්දු හොඳින්
සිතට ගන්න. ඔබ ඒවා පිළිපදි-
මින් ඔබේ ජීවිතය රැකගන්න.[1] ඔබ
එසේ කළොත් ඔබේ මුතුන්මිත්-
තන්ගේ දෙවි වන යෙහෝවා ඔබට
ලබා දෙන දේශය හිමි කරගන්නත්
ඔබට හැකි වෙයි. **2** මම දැන් ඔබට
කියන්න යන මේ දේවලට කිසිම දෙ-
යක් එකතු කරන්නවත් එයින් කිසිම
දෙයක් ඉවත් කරන්නවත් ඔබට අව-
සර නැහැ.[2] ඔබේ දෙවි වන යෙහෝවා
දුන් ඒ සෑම නීතියක්ම ඔබ පිළිපැදිය
යුතුයි.

**3** “පෙයෝර් කන්දේ බාල් දෙවි-
යාට[3] වන්දනාමාන කළ ඊශ්‍රායෙල්ව-
රුන්ට යෙහෝවා දෙවි කළ දේ
දැන් මතක් කරගන්න. යෙහෝවා
දෙවි ඔවුන්ව විනාශ කළ හැටි ඔබේ
ඇස් දෙකෙන්ම දැක්කා. ඔවුන්ගෙන්
එක් කෙනෙක්වත් ඔහු ඉතුරු කළේ
නැහැ.[4] **4** නමුත් අද ඔබ ජීවතුන්
අතර සිටින්නේ ඔබේ දෙවි වන යෙ-
හෝවාට ඔබ ළංව[5] සිටින නිසයි.
**5** මගේ දෙවි වන යෙහෝවා මට අණ
කළ ආකාරයටම, ඔහුගේ නීති[6] හා
තීන්දු[7] මම ඔබට කියා දුන්නා.
ඔබට උරුමයක් ලෙස ලැබෙන දේශ-
යට ගොස් එහි පදිංචි වූ පසුත්
ඔබ ඉගෙනගත් මේ දේවල් පිළි-
පැදිය යුතුයි. **6** ඔබ මේ අණප-
නත්වලට එකඟව ජීවත් වුණොත්
ප්‍රඥාවන්තව[8] හා දැනුම් තේරුම්[9]
ඇතුව කටයුතු කිරීමට ඔබට හැකි
වෙයි. එවිට අවට ජාතීන්ට ඒ නීති
ගැන පැහැදීමක් ඇති වී, ‘මේ මහත්
ජාතිය දැනුම් තේරුම් ඇති බුද්ධි-
මත් සෙනඟක්’ කියා පවසන බවට
කිසිම සැකයක් නැහැ.[10] **7** ඇත්-
තෙන්ම, ඊශ්‍රායෙල් ජාතිය තරම්
ආශීර්වාද ලත් සෙනඟක්[11] මේ පො-
ළොවේ කොතැනකවත් සිටිනවාද?
නිතරම අපේ උපකාරයට සිටින
අපේ දෙවි වන යෙහෝවා තරම්
ශ්‍රේෂ්ඨ දෙවි කෙනෙක් සිටින්නේ
වෙන කාටද?[12] **8** මා ඔබට කියා
දෙන මේ නීති මාලාව තරම් ධර්මිෂ්ඨ
නීති මාලාවක් තිබෙන්නේ වෙන කා
ළඟද?[1]

**9** “නමුත් කල්පනාකාරීව සිටින්න.[2]
ඔබ දුටු කිසි දෙයක් අමතක නො-
කර[3] ඔබේ මුළු ජීවිත කාලය පුරාම
ඒවා සිතේ තබාගැනීමට වගබලා
ගන්න.[4] ඔබේ පුතුන්ටත් මුනුපුරන්ටත්
ඒ සෑම දෙයක්ම ඔබ කියා දිය
යුතුයි.[5] **10** ඊශ්‍රායෙල් සෙනඟ හො-
රෙබ්[6] කඳුකරයේ යෙහෝවා දෙවි ඉදි-
රියේ රැස්ව සිටි අවස්ථාව ගැනත්
ඔවුන්ට කියන්න. යෙහෝවා දෙවි එදා
මට මෙසේ පැවසුවා. ‘මා පවසන දේ-
වලට සවන් දෙන පිණිස සෙනඟව රැස්
කරන්න. ඔවුන් මට සවන් දී[7] ජීවිත
කාලය පුරාම මට ගරුබිය[8] දක්වමින්
තම දරුවන්ටත් ඒ කාරණා ගැන
ඉගැන්විය යුතුයි.’[9]

**11** “ඔබේ පියවරුන් දෙවි කී ලෙ-
සම කන්ද පාමුල රැස් වුණා. ඒ අවස්-
ථාවේදී මුළු ප්‍රදේශයම ඝන දුමකින්
හා වලාකුළකින් වැසී තිබුණා. ඉන්ප-
සුව ඒ කන්දෙන් ගින්නක් ඇති වී
අහස උසට ඇවිළී ගියා.[10] **12** යෙ-
හෝවා දෙවි ගින්න තුළින් සියල්-
ලන්ට ඇසෙන සේ කතා කළා.[11] ඒ
අවස්ථාවේදී දෙවිගේ හඬ පැහැදිලිව
ඇසුණත්[12] අපිට ඔහුව[13] දැකගන්න
ලැබුණේ නැහැ. **13** දෙවි ඊශ්‍රායෙල්
සෙනඟට ආඥා දහය*[14] දුන්නේ ඒ
අවස්ථාවේදීයි. ඔහු ඒවා ගල් පුවරු[15]
දෙකක් මත ලියා දී ඒවා පවත්වන
ලෙස අණ කරමින් ඔබ සමඟ ගිවි-
සුමක්[16] ඇති කරගත්තා. **14** යෙ-
හෝවා දෙවි ඔහුගේ නීති හා තීන්දු
ගැන ඔබට කියා දෙන්න මාව පත්
කළේ ඒ අවස්ථාවේදීයි. ඔබට උරුම-
යක් ලෙස ලැබෙන දේශයට ගිය
පසුත් ඔබ ඒ අණපනත්වලට එකඟව
ජීවත් විය යුතුයි.[17]

**4 පරි.**

**1** ලෙවී 18:5
එස 20:11
රෝම 10:5
**2** ද්වි 12:32
යොෂු 1:7
හිතෝ 30:6
එළි 22:18
**3** ගණන් 25:3
යොෂු 22:17
ගීතා 106:28
හොෂෙ 9:10
1කොරි 10:7
**4** ගණන් 25:5
ගණන් 25:9
1කොරි 10:8
**5** ද්වි 10:20
ද්වි 13:4
යොෂු 22:5
**6** ලෙවී 10:11
ලෙවී 26:46
ගණන් 30:16
**7** ලෙවී 25:18
ගණන් 36:13
ද්වි 6:1
**8** 1රාජා 2:3
ගීතා 19:7
ගීතා 107:43
ගීතා 111:10
ගීතා 119:98
හිතෝ 10:8
යෙරෙ 8:9
**9** ගීතා 119:100
හිතෝ 4:7
**10** 1රාජා 4:34
1රාජා 10:7
දානි 1:20
**11** 2සාමු 7:23
**12** නික් 25:8
ලෙවී 26:12
ද්වි 5:26
ගීතා 46:1
ගීතා 145:18

**2 තීරුව**

**1** ගීතා 78:5
ගීතා 147:19
**2** හිතෝ 4:23
හිතෝ 19:16
**3** හිතෝ 4:21
**4** හිතෝ 3:1
හිතෝ 7:1
හෙබ්‍රෙ 2:1
**5** උත් 18:19
ද්වි 6:7
ගීතා 78:5
**6** ද්වි 5:2
**7** නික් 19:9
හෙබ්‍රෙ 12:25
**8** නික් 20:20
ද්වි 5:29
1සාමු 12:24
ලූක් 1:50
**9** හිතෝ 22:6
එෆී 6:4
**10** නික් 19:18
ද්වි 5:23
හෙබ්‍රෙ 12:18
**11** ද්වි 9:10
ද්වි 10:4
**12** නික් 20:22
හෙබ්‍රෙ 12:19

**13** ද්වි 4:15; යෙසා 40:18; යොහ 1:18; යොහ 4:24; **14** නික් 20:1; නික් 34:28; ද්වි 10:4; **15** නික් 24:12; නික් 31:18; නික් 32:19; නික් 34:1; **16** නික් 19:5; ද්වි 5:2; ද්වි 9:9; හෙබ්‍රෙ 9:20; **17** ගීතා 105:44.

ද්වි **4:13*** නික් 34:28හි පාදසටහන බලන්න.

**15** “ඔබ මේ කාරණය කිසිවිටෙ-
කත් අමතක නොකළ යුතුයි.[1] හො-
රෙබ් කඳුකරයේ රැස්ව සිටි ඔබේ
පියවරුන්ට යෙහෝවා දෙවි ගින්න
තුළින් කතා කරද්දී කිසි කෙනෙක්
ඔහුව[2] දැක්කේ නැහැ. **16** ඒ නිසා
ඔබ කොයිම හැඩයකින්වත් දේවතා
රූප සාදා නොගත යුතුයි. එසේ කිරීම
ඉතා පිළිකුල්සහගත දූෂිත[3] දෙයක්.
පුරුෂයෙකුගේ හෝ ස්ත්‍රියකගේ[4] හෝ
**17** පොළොවේ සැරිසරන සතෙකු-
ගේ[5] හෝ අහසේ පියාසර කරන
කුරුල්ලෙකුගේ[6] හෝ **18** පොළො-
වේ බඩ ගා යන සතෙකුගේ හෝ ජල-
යේ සැරිසරන මත්ස්‍යයෙකුගේ[7] හෝ
හැඩයටවත් කිසි රූපයක් සාදා නො-
ගන්න. **19** ඉර, හඳ, තාරකා හා
වෙනත් ආකාශ වස්තූන් දෙස බලා
ඒවා ඉදිරියේ වැඳ වැටී නමස්කාර
නොකරන්න.[8] ඒ සියල්ල මිනිසා-
ගේ ප්‍රයෝජනය පිණිස යෙහෝවා
දෙවි සෑදූ බව අමතක නොකරන්න.[9]
**20** යකඩ ගිනි උදුනක්[10] හා සමාන වූ
ඊජිප්තු දේශයෙන් ඔබව නිදහස් කළේ
යෙහෝවා දෙවි බව මතක තබා-
ගන්න. දෙවි එසේ කළේ ඔබව දෙවිට
පමණක් අයිති වූ විශේෂ සෙනඟක්[11]
ලෙස වෙන් කිරීමටයි.

**21** “ඔබේ පියවරුන් නිසා මා
අතින් සිදු වූ වරදට,[12] යෙහෝවා දෙවි
මා සමඟ උදහස් වී යොර්දාන් ගඟෙන්
එගොඩ වෙන්න මට ඉඩ නො-
දෙන බව දිවුරා පැවසුවා. ඒ නිසා,
ඔබේ දෙවි වන යෙහෝවා ඔබට
උරුම කර දෙන ඒ සරුසාර දේශයට
පය තබන්න මට ඉඩ ලැබෙන්නේ
නැහැ.[13] **22** අපි දැන් සිටින මේ දේ-
ශයේදීම මම මිය යනවා.[14] මට
යොර්දාන් ගඟෙන් එගොඩ වෙන්න
නොලැබුණත් ඔබ හැමෝම අනි-
වාර්යයෙන්ම ගඟෙන් එගොඩ වී ඒ
සරුසාර දේශය අයිති කරගන්නවා.
**23** යෙහෝවා දෙවි ඔබ සමඟ ඇති
කරගත් ගිවිසුම කිසිවිටෙකත් අම-
තක නොකිරීමට වගබලා ගන්න.[15]
යෙහෝවා දෙවි ඔබට අණ කළ ලෙස
කොයිම හැඩයකින්වත් දේවතා රූප
සාදා නොගන්න.[1] **24** මන්ද ඇවි-
ළෙන ගින්නක් හා සමාන වූ ඔබේ
දෙවි වන යෙහෝවා[2] වෙනත් දෙවිව-
රුන්ට කරන නමස්කාරය දැඩි ලෙස
හෙළාදකිනවා.[3]

**25** “ඔබට දරු මුනුපුරන් ලැබී දේ-
ශයේ බොහෝ කල් ජීවත් වූ පසු ඔබ
යෙහෝවා දෙවිව අත්හැර දුෂ්ට ලෙස
ක්‍රියා කරමින්[4] රූපයක් සෑදුවොත්[5]
ඔබේ දෙවි ඔබ සමඟ උදහස් වෙයි.[6]
**26** ස්වර්ගයේ හා පොළොවේ ජීවත්
වන සියලුදෙනා මා දැන් මේ කියන්න
යන දේට සාක්ෂිකරුවන්.[7] ඔබ දෙවිව
එසේ උදහස් කළොත් යොර්දාන්
ගඟෙන් එගොඩ තිබෙන දේශයේ
වැඩි කල් ජීවත් වෙන්න නම් ඔබට
ලැබෙන්නේ නැහැ. ඔබ දේශයෙන්
නැත්තටම නැති වී යයි.[8] **27** යෙ-
හෝවා දෙවි ඔබව ඒ දේශයෙන්
පන්නා දමා විවිධ ජාතීන් අතරට විසු-
රුවාහරියි.[9] යෙහෝවා දෙවි ඔබව
ඒ ජාතීන් අතට පත් කළ විට
ඔබෙන් ඉතුරු වන්නේ ඉතා සුළු[10]
පිරිසක් පමණයි. **28** එවිට ඔබට
සිදු වන්නේ, අහන්න දකින්න බැරි,
කන්න බොන්න බැරි, ගඳ සුවඳ
දැනෙන්නේ නැති[11] ලීවලින් හා ගල්-
වලින් තැනූ[12] ඒ ජාතීන්ගේ දෙවිව-
රුන්ට සේවය කරන්නයි.[13]

**29** “නමුත් ඔබ ඒ තත්වයේ සිටියදී
අවංකවම ඔබේ දෙවි වන යෙහෝවා
වෙතට හැරී[14] ඔබේ මුළු හදවතින්ම
ඔහුගේ මඟ පෙන්වීම් පැතුවොත්
ඔබට නැවතත් ඔහුට ළං වීමට
හැකි වෙයි.[15] **30** මා ඔබට අනතුරු
අඟවමින් පැවසූ මේ සියලු දේවල්
ඉටු වී ඔබට බොහෝ දුෂ්කරතා
විඳින්න සිදු වෙද්දී, නැවත ඔබේ දෙවි
වන යෙහෝවා වෙතට හැරී[16] ඔහුගේ
හඬට සවන් දෙන්න[17] ඔබ පෙලඹෙයි.
**31** ඇත්තෙන්ම ඔබේ දෙවි වන යෙ-

**4 පරි.**

**1** ද්වි 6:24; යොෂු 23:11
**2** ද්වි 4:12
**3** නික් 32:7
**4** නික් 20:4; ද්වි 27:15; යෙසා 40:18; ක්‍රියා 17:29; 1කොරි 10:14
**5** රෝම 1:23
**6** ද්වි 5:8
**7** 1සාමු 5:4
**8** ද්වි 17:3; 2රාජා 17:16; යෙරෙ 8:2; එස 8:16; ශෙප 1:5; ක්‍රියා 7:43
**9** ගීතා 136:7; යෙරෙ 31:35
**10** 1රාජා 8:51; යෙරෙ 11:4
**11** නික් 19:5; ද්වි 9:26; 1රාජා 8:53; ගීතා 135:4
**12** ගණන් 20:12; ද්වි 3:26
**13** ද්වි 31:2; ගීතා 106:32
**14** ද්වි 3:27
**15** නික් 19:5; නික් 24:3

**2 තීරුව**

**1** නික් 20:4; ද්වි 4:16; 1කොරි 10:14
**2** නික් 24:17; ද්වි 9:3; හෙබ්‍රෙ 12:29
**3** නික් 20:5; නික් 34:14; ගණන් 25:11; යොෂු 24:19; නාහු 1:2; ලූක් 10:27
**4** නික් 32:7; ද්වි 4:16
**5** විනි 18:30; 2රාජා 17:16; 2රාජා 21:7; යෙසා 42:8
**6** 2රාජා 17:17
**7** ද්වි 30:19; ද්වි 31:28; යෙසා 1:2
**8** ලෙවී 18:28; ලෙවී 26:32; ද්වි 29:28; යොෂු 23:16; යෙසා 24:1
**9** ද්වි 28:64; නෙහෙ 1:8; එස 12:15
**10** ද්වි 28:62
**11** ගීතා 115:5; ගීතා 135:16; යෙසා 44:9; එළි 9:20

**12** ද්වි 28:36; එස 20:32; **13** යෙරෙ 16:13; එස 20:39; **14** ද්වි 30:10; 2ලේක 15:4; 2ලේක 15:15; **15** ද්වි 30:2; 1රාජා 8:48; යෙරෙ 29:13; යෝවෙ 2:12; **16** ද්වි 30:10; 2ලේක 33:13; නෙහෙ 1:9; **17** යෙරෙ 7:23.

හෝවා දයාවන්ත දෙවි කෙනෙක්.[1]
ඔහු කිසිදා ඔබව අත්හරින්නේවත්
විනාශ වී යන්න ඔබට ඉඩහරින්නේ-
වත් නැති බව මතක තබාගන්න.
ඔබේ මුතුන්මිත්තන් සමඟ ඔහු ඇති
කරගත් ගිවිසුමත්[2] ඔහු කිසිදා අම-
තක කරන්නේ නැහැ.

**32** “දැන් ටිකක් මේ ගැන කල්-
පනා කර බලන්න.[3] දෙවි මිනි-
සාව සාදා මේ පොළොවේ පදිංචි
කළ දා පටන්[4] මේ දක්වා අහස
යට කිසිම තැනක මේ තරම් පුදුම
දේවල් සිදු වී ඇද්ද? එවැනි දේවල්
ගැන ඔබ මීට කලින් අසා තිබෙන-
වාද?[5] **33** ගින්නක් තුළින් දෙවිගේ
හඬට සවන් දෙන්න ඔබට හැකි
වුණා. ඒ හඬ ඇසුණත් ඔබ මිය
ගියේ නැහැ. වෙනත් කිසිම ජාති-
යක් එවැනි අද්දැකීමක් ලබා තිබෙ-
නවාද?[6] **34** ඒ වගේම ඔබේ දෙවි
වන යෙහෝවා ඔහුගේ මහත් බලය[7]
යොදාගෙන[8] පුදුමසහගත ක්‍රියා[9] හා
ආශ්චර්යයන්[10] සිදු කරමින් ඔබ වෙ-
නුවෙන් සටන් කළා.[11] ඔහු පුදු-
මසහගත භයානක දේවල්[12] කර
ඊජිප්තුවෙන් ඔබව නිදහස් කළා. දෙවි
වෙනත් කිසිම ජාතියක් වෙනුවෙන්
එවැනි දේවල් කර තිබෙනවාද?[13]
**35** යෙහෝවා දෙවි එවැනි දේවල්
කළේ තමන් සැබෑ දෙවි බව ඔබට
අවබෝධ කර දෙන පිණිසයි.[14] ඇත්-
තෙන්ම අපේ දෙවි හැර වෙන කිසි
දෙවි කෙනෙක් නැහැ.[15] **36** දෙවි
ස්වර්ගයේ සිට ඔබ සමඟ කතා කර
ඔබට අවශ්‍ය හික්මවීම් ලබා දුන්නා.
ඇවිළෙන ගින්නක් තුළින්ද ඔහු ඔබ
සමඟ කතා කළා.[16]

**37** “දෙවි ඔබේ මුතුන්මිත්තන්ට
බොහෝ සෙයින් ප්‍රේම කළා. ඔවුන්-
ගෙන් පැවතෙන්නන්ව ඔහුගේ සෙනඟ
වශයෙන් තෝරා[17] ඔහුගේ මහත් බල-
යෙන්[18] ඔවුන්ව ඊජිප්තුවෙන් නිදහස්
කළේ ඒ නිසයි. **38** ඔබට වඩා බල-
වත් ජාතීන්ව පන්නා දමා ඔවුන්ගේ
දේශය ඔබට උරුමයක් ලෙස ලබා
දුන්නෙත් ඒ නිසයි.[19] **39** යෙහෝවා
දෙවි සැබෑ දෙවි බවත් ස්වර්ගයේ හෝ
පොළොවේ හෝ ඔහු හැර වෙන
කිසි දෙවි කෙනෙක් නැති බවත්[1]
ඔබ හොඳින් දන්නවා. ඒ කාරණය
නිතරම ඔබේ සිතේ තබාගත යුතුයි.[2]
**40** අද මම ඔබට කියා දෙන දෙවිගේ
අණපනත්[3] හා නියෝග ඔබ පිළිපැදිය
යුතුයි.[4] එසේ කළොත් ඔබටත් ඔබේ
දරුවන්ටත් බොහෝ ආශීර්වාද ලැබී
ඔබේ දෙවි වන යෙහෝවා ඔබට හිමි
කර දෙන දේශයේ බොහෝ කල් ජීවත්
වෙන්න ඔබට හැකි වෙයි.”[5]

**41** මේ දේවල් පැවසීමෙන් පසුව
මෝසෙස් යොර්දාන් ගඟට නැඟෙන-
හිර දෙසින් පිහිටි නුවරවල් තුනක්
වෙන් කර තැබුවේය.[6] **42** ඔහු එම
නුවරවල් වෙන් කළේ යමෙකු අතින්
සිදු වූ අත්වැරදීමක් නිසා කෙනෙකු
මිය ගියොත්[7] මිය ගිය පුද්ගලයා
සමඟ කිසි අමනාපයකින් නොසිටි[8]
වරදකරුට පලා ගොස් ජීවිතය බේරා-
ගැනීමට හැකි වන පිණිසය.[9] **43** ඒ
නුවරවල් තුන මේවාය. බෙෂෙර්[10]
නමින් හැඳින්වූ පළමුවන නුවර වෙන්
කර තිබුණේ රූබෙන්වරුන් සඳ-
හාය. එය පාළුකරයේ උස් තැනිතලා-
වක පිහිටා තිබිණ. ගාද්වරුන් සඳහා
වෙන් කර තිබූ නුවර වූයේ ගිලියද් දේ-
ශයේ පිහිටි රාමොත්ය.[11] මනස්සේ[12]
ගෝත්‍රයේ අය සඳහා බාෂාන් දේශයේ
පිහිටි ගෝලාන්[13] නම් නුවර වෙන්
කරන ලදි.

**44** ඉන්පසුව මෝසෙස් ඊශ්‍රායෙල්-
වරුන්ට නීති[14] මාලාව පිළිබඳ
විස්තර කියා දීමට සූදානම් විය.
**45** ඊජිප්තුවෙන් නිදහස් වී ආ ඊශ්‍රා-
යෙල්වරුන්ට මෝසෙස් ඒ සිහිගැන්-
වීම්,[15] නියෝග[16] සහ තීන්දු[17] කියා
දුන්නේය. **46** ඒ කාලයේදී ඊශ්‍රා-
යෙල්වරුන් කඳවුරු බැඳගෙන සිටියේ
යොර්දාන් ගඟ අසල පිහිටි බෙත්-
පෙයෝර්[18] කන්ද ඉදිරිපිට තිබෙන

**4 පරි.**
**1** නික් 34:6 ද්වි 30:3 2ලේක 30:9 නෙහෙ 9:31 ගීතා 86:15 යෙසා 54:7 යෙසා 55:7 2කොරි 1:3
**2** ලෙවී 26:42 ගීතා 105:8 ලූක් 1:72
**3** ගීතා 44:1
**4** උත් 2:7
**5** නික් 15:11
**6** ද්වි 5:26
**7** නික් 13:3 ද්වි 6:21
**8** නික් 6:6
**9** නික් 7:3
**10** ගීතා 105:27
**11** නික් 15:3
**12** ද්වි 26:8 ගීතා 78:49 යෙරෙ 32:21
**13** ද්වි 7:19
**14** නික් 3:14 නික් 6:7 1රාජා 18:37 2රාජා 19:19 ගීතා 83:18
**15** නික් 15:11 ද්වි 32:39 1සාමු 2:2 යෙසා 45:18 මාක් 12:32
**16** නික් 19:18 නික් 20:22 ද්වි 4:12 ද්වි 4:15 ද්වි 4:33 නෙහෙ 9:13 හෙබ්‍රෙ 12:18 හෙබ්‍රෙ 12:25
**17** ද්වි 10:15 ගීතා 105:6
**18** නික් 13:14 යෙරෙ 32:21
**19** නික් 23:28 ද්වි 7:1 ද්වි 9:1 යොෂු 3:10 ගීතා 44:2

**2 තීරුව**
**1** ද්වි 4:35 යෙසා 44:6
**2** යොෂු 2:11 2ලේක 20:6 ගීතා 135:6 දානි 4:35
**3** ද්වි 4:5
**4** ද්වි 5:16
**5** උත් 48:4
**6** ගණන් 35:14
**7** ගණන් 35:11 ගණන් 35:22
**8** ද්වි 19:4
**9** ගණන් 35:25
**10** යොෂු 21:36
**11** යොෂු 21:38
**12** යොෂු 20:8

**13** යොෂු 21:27; **14** ද්වි 17:18; ද්වි 27:3; මලා 4:4; යොහ 1:17; ගලා 3:24; **15** ද්වි 6:17; 1රාජා 2:3; **16** ලෙවී 26:46; ද්වි 4:1; **17** ලෙවී 18:5; ද්වි 4:5; නෙහෙ 9:13; ගීතා 119:164; එස 20:11; **18** ද්වි 1:5; ද්වි 3:29.

නිම්නයේය. එම ප්‍රදේශය හෙෂ්-
බොන්හි[1] ජීවත් වූ අමෝරිවරුන්ගේ
රජු වූ සීහොන්ට අයිතිව තිබුණත්
මෝසෙස් සහ ඊශ්‍රායෙල් සෙනඟ ඔහු
සමඟ සටන් කර ඔහුව පරාජයට පත්
කළෝය.[2] **47** සීහොන්ට අයිති වූ
දේශයද බාෂාන්හි රජු වූ ඕග්ට[3] අයිති
වූ දේශයද ඔවුහු අල්ලාගත්තෝය.
යොර්දාන් ගඟට නැඟෙනහිරින් ජීවත්
වූ අමෝරිවරුන්ගේ එම රජවරුන් දෙ-
දෙනාට අයිති වූ මුළු ප්‍රදේශයම ඔවුහු
යටත් කරගත්තෝය. **48** එම ප්‍රදේ-
ශය ආනොන් ඔයේ එක් ඉවුරක පිහිටි
අරෝයේර්[4] නුවරෙන් ඇරඹී සයොන්
කන්ද එනම්, හෙර්මොන්[5] කන්ද දක්-
වාම විහිදී යයි. **49** යොර්දාන් ගඟට
නැඟෙනහිරින් පිහිටි දේශය ඇතුළුව
මහ අරබා[6] නිම්නයට අයිති මුළු
ප්‍රදේශයද ඊට අයත් වෙයි. එය අරබා
මුහුද[7] අසල පිහිටි පිස්ගා[8] කන්ද
පාමුල දක්වාම විහිදී යයි.

**5** මෝසෙස් සියලුම ඊශ්‍රායෙල්ව-
රුන්ව[9] කැඳවා ඔවුන්ට මෙසේ
පැවසීය. “ඊශ්‍රායෙල්වරුනි, අද මම
ඔබට පැහැදිලි කර දෙන මෙම
තීන්දු සහ නීතිවලට[10] හොඳින් සවන්
දී, ඒවා සිතට ගන්න. ඒවා
පිළිපැදීමට අධිෂ්ඨාන කරගන්න.[11]
**2** යෙහෝවා දෙවි අපි සමඟ හො-
රෙබ් කඳුකරයේදී ගිවිසුමක් කළා.[12]
**3** යෙහෝවා දෙවි මේ ගිවිසුම ඇති
කළේ අපේ මුතුන්මිත්තන් සමඟ
විතරක් නොව අද මෙහි රැස්ව සිටින
අප සියලුදෙනාත් සමඟයි. **4** යෙ-
හෝවා දෙවි ඒ කන්දේදී ගින්නක්
තුළින් ඊශ්‍රායෙල් සෙනඟට කෙළින්ම
කතා කළා.[13] **5** (නමුත් සෙනඟ
ගින්න දැක භය වූ නිසා කන්ද ළඟට-
වත් ගියේ නැහැ.)[14] ඒ අවස්ථාවේදී
මම යෙහෝවා දෙවි සහ සෙනඟ අතර
මැදිහත්කරුවෙකු හැටියට හිටියා.[15]
යෙහෝවා දෙවි පැවසූ දේවල් ඔවුන්ට
කියා දුන්නේ මමයි. දෙවි මෙසේ පැව-
සුවා.
**6** “‘ඔබේ දෙවි වන යෙහෝවා
මමයි.[16] ඔබ වහලුන්ව සිටි ඊජිප්තු
දේශයෙන් ඔබව නිදහස් කළේ
මමයි.[1] **7** ඔබ කවදාවත් මා හැර
වෙන කිසි දෙවි කෙනෙකුට නමස්-
කාර නොකළ යුතුයි.[2]
**8** “‘ඔබ රූප සාදා නොගත
යුතුයි.[3] අහසේ හෝ පොළොවේ හෝ
ජලයේ හෝ තිබෙන කිසිම දෙයක
හැඩයට[4] සමානව රූපයක් සාදා
නොගන්න. **9** ඒ රූප ඉදිරියේ වැඳ
වැටී නමස්කාර නොකරන්න.[5] මන්ද
යෙහෝවා නම් වූ ඔබේ දෙවි වන මම
වෙනත් දෙවිවරුන්ට කරන නමස්කා-
රය දැඩි ලෙස හෙළාදකිමි.[6] මට
වෛර කරන අයගේ වැරදිවලට තුන්-
වන හා හතරවන පරම්පරා දක්වා
ඔවුන්ගේ දරුවන්ට දඬුවම් කරන්-
නෙමි.[7] **10** නමුත් මට ප්‍රේම කරන,
මගේ ආඥා පවත්වන අයගේ පරම්-
පරා දහස් ගණනකට වුවත් මම
මහත් ප්‍රේමයක්* පෙන්වන්නෙමි.[8]
**11** “‘යෙහෝවා යන ඔබේ දෙවිගේ
නාමයට අපහාස වන අයුරින් එම
නාමය සඳහන් නොකරන්න.[9] යෙ-
හෝවා දෙවි වන මම මාගේ නාමයට
අපහාස කරන සියලුදෙනාටම අනි-
වාර්යයෙන්ම දඬුවම් කරන්නෙමි.[10]
**12** “‘ඔබේ දෙවි වන යෙහෝවා
ඔබට අණ කළ ලෙස සබත් දවස
ශුද්ධ දවසක් ලෙස සලකන්න.[11]
**13** දවස් හයක් පුරා වෙහෙස මහන්සි
වී වැඩ කරන්න.[12] **14** නමුත්
හත්වන දවසේදී ඔබේ දෙවි වන
යෙහෝවා වෙනුවෙන් සබතක් පවත්-
වන්න.[13] ඔබවත් ඔබේ දූපුතුන්වත්
ඔබේ දාසදාසීන්වත් ඔබේ සතුන්වත්
ඔබේ නුවරවල ජීවත් වන විදේශික-
යන්වත්[14] එදින කිසි වැඩක් නො-
කළ යුතුයි.[15] එවිට ඔබට මෙන්ම
ඔබේ දාසදාසීන්ටත් එදින නිවාඩු
ගෙන වෙහෙස නිවාගත හැකියි.[16]
**15** ඔබ ඊජිප්තු දේශයේ වහලුන්ව

**4 පරි.**
**1** ගණන් 21:26
**2** ගණන් 21:24
**3** ගණන් 21:33; ද්වි 3:4; ද්වි 29:7
**4** ද්වි 2:36; ද්වි 3:12
**5** ද්වි 3:9; යොෂු 11:3
**6** ද්වි 1:7; යොෂු 12:3
**7** උත් 14:3; ද්වි 3:17
**8** ද්වි 34:1

**5 පරි.**
**9** ද්වි 1:1; ද්වි 29:10
**10** ද්වි 4:5
**11** ද්වි 4:1
**12** නික් 19:5; ද්වි 4:23; හෙබ්‍රෙ 9:19
**13** නික් 19:9; නික් 19:18; නික් 20:22; ද්වි 4:33; ක්‍රියා 7:38
**14** නික් 19:16
**15** නික් 20:19; ද්වි 34:10; ගලා 3:19
**16** ගීතා 81:10; හොෂෙ 13:4

**2 තීරුව**
**1** නික් 13:3; නික් 20:2
**2** නික් 20:3; 2රාජා 17:35; යෙරෙ 25:6
**3** නික් 20:4; ලෙවී 26:1; ද්වි 4:16; ද්වි 4:23; ද්වි 27:15
**4** ක්‍රියා 17:29
**5** නික් 23:24; ආනි 3:18; 1කොරි 10:14
**6** නික් 34:14; ද්වි 4:24; යොෂු 24:19; යෙසා 42:8; නාහු 1:2; මතෙ 4:10
**7** නික් 20:5; නික් 34:7; 1රාජා 21:29; මතෙ 23:35
**8** නික් 20:6; යෙරෙ 32:18; ආනි 9:4; රෝම 11:28
**9** නික් 20:7; නික් 22:28; ලෙවී 19:12
**10** ලෙවී 24:16

**11** නික් 16:23; නික් 20:8; නික් 31:13; **12** නික් 20:9; නික් 23:12; නික් 34:21; **13** නික් 16:29; **14** නික් 20:10; නික් 23:12; ලෙවී 24:22; **15** නෙහෙ 13:15; **16** ද්වි 10:17; රෝම 2:11; එෆී 6:9.

ද්වි **5:10*** හෝ, “ළැදි ප්‍රේමය.”

සිටි කාලය[1] ගැනත් ඔබේ දෙවි වන
යෙහෝවා තම මහත් බලය[2] පාමින්
ඔබව ඊජිප්තුවෙන් නිදහස් කළ ආකා-
රය ගැනත් ඒ දවසේදී මතක් කරගත
යුතුයි. යෙහෝවා දෙවි ඔබට සබත්
දවස පවත්වන්න කියා අණ කළේ ඒ
හේතුව නිසයි.[3]

**16** "'ඔබේ දෙවි වන යෙහෝවා
ඔබට අණ කළ ලෙස ඔබේ පියාටත්
මවටත් ගෞරව කරන්න.[4] එයින්
ඔබට යහපතක් සිදු වෙයි. එවිට යෙ-
හෝවා දෙවි ඔබට දෙන දේශයේ
බොහෝ කාලයක් ජීවත් වෙන්න
ඔබට පුළුවන්.[5]

**17** "'මිනී නොමරන්න.[6]

**18** "'අනාචාරයේ* නොහැසි-
රෙන්න.[7]

**19** "'සොරකම් නොකරන්න.[8]

**20** "'වෙනත් කෙනෙකුට විරුද්ධව
බොරු සාක්ෂි නොදෙන්න.[9]

**21** "'වෙනත් කෙනෙකුගේ භාර්-
යාවට ආශා නොකරන්න.[10] වෙනත්
කෙනෙකුගේ නිවසට හෝ ඔහුගේ
දාසයාට හෝ දාසියට හෝ ගවයාට
හෝ බූරුවාට හෝ ඔහුට අයිති වෙන
ඕනෑම දෙයකට හෝ ආශා නොක-
රන්න.'[11]

**22** "කන්ද අසල රැස්ව සිටි මුළු
ඊශ්‍රායෙල් සමූහයට ගින්නක් තුළින්[12]
කතා කළ යෙහෝවා දෙවි මහත් ශබ්-
දයකින් මේ සියල්ල පැවසුවා. ඊට
අමතරව වෙන කිසි දෙයක් ඔහු
ඔවුන්ට පැවසුවේ නැහැ. ඒ අවස්ථා-
වේදී මුළු ප්‍රදේශයම ගන දුමකින් හා
වලාකුළකින් වැසී තිබුණා. ඉන්පසුව
දෙවි තමන් පැවසූ සියල්ල ගල් පුවරු
දෙකක් මත ලියා මට භාර දුන්නා.[13]

**23** "කන්ද ගින්නෙන් ඇවිළ,[14] ගන
දුමක් නඟිද්දී සෙනඟට දෙවිගේ හඬ
ඇසුණා. එවිට ගෝත්‍රවල ප්‍රධානීන් හා
වැඩිමහල්ලන් සියලුදෙනා මා ළඟට
ඇවිත්, **24** මෙසේ පැවසුවා. 'මේ
දවස නම් අපට කවදාවත් අමතක
වෙන්නේ නැහැ. අපේ දෙවි වන යෙ-
හෝවා අපිට ඔහුගේ තේජස හා බලය
පෙන්නුවා. ගින්න තුළින් ඔහුගේ
හඬත් අපිට ඇහුණා.[1] දෙවි මිනිසුන්
වන අප සමඟ කතා කළත් අපෙන්
කවුරුත් මිය ගියේ නැහැ.[2] **25** ඒ
වුණත් නැවත වතාවක් යෙහෝවා
දෙවිගේ හඬ අපිට ඇසුණොත් අපි
හැමෝම මැරිලා යයි.[3] මේ මහා
ගිනි ජාලාවෙන් අපිව පිලිස්සී යයි.[4]
**26** ගින්නක් තුළින් ජීවමාන දෙවිගේ
හඬට[5] සවන් දීලා බේරුණ කෙනෙක්
ගැන මීට කලින් කවදාවත් අහලා
තියෙනවාද? **27** ඒ නිසා ඊළඟ දව-
සේදී යෙහෝවා දෙවි කතා කරද්දී ඔබ
විතරක් ගිහින් ඔහු කියන දේට ඇහුම්-
කන් දෙන්න. යෙහෝවා දෙවි කියන
දේවල් ඔබ ඇවිත් අපට කියන්න.[6] අපි
ඔබ කියන විදිහට කරන්නම්.'

**28** "ඒ අවස්ථාවේදී යෙහෝවා දෙවි
සෙනඟ කී දේ අසාගෙනයි සිටියේ. ඒ
නිසා යෙහෝවා දෙවි මට මෙසේ
පැවසුවා. 'මේ සෙනඟ ඔබට පැවසූ
දේවල් මා අසාගෙනයි සිටියේ. ඔවුන්
කියන දේ නිවැරදියි.[7] **29** මා කෙ-
රෙහි ගරුබියක් ඇති කරගෙන,[8] මා
දුන් සියලු අණපනත්[9] සැමවිටම පිළි-
පදින්න ඔවුන් මුළු හදවතින්ම කැමති
වෙනවා නම් කොතරම් හොඳද! ඔවුන්
එසේ කරනවා නම් ඔවුන්ටත් ඔවුන්-
ගේ දරුදැරියන්ටත් සදහටම ආශීර්-
වාද ලැබෙයි.[10] **30** දැන් ඔවුන්ගේ
කූඩාරම්වලට යන්න කියා සෙනඟට
පවසන්න. **31** ඔබ විතරක් මා ඉදිරි-
යේ සිටින්න. ඔබ ඔවුන්ට කියා දිය
යුතු සියලුම අණපනත් හා තීන්දු මම
ඔබට පවසන්නම්.[11] මා ඔවුන්ට ලබා
දෙන දේශය හිමි කරගත් පසුත්
ඔවුන් ඒ සියල්ල පිළිපැදිය යුතුයි.'
**32** ජනයෙනි, යෙහෝවා දෙවි ඔබට
අණ කළ සැම දෙයක්ම හොඳින්
ඉටු කරන්න.[12] දෙවි ඔබට පෙන්වා

**ද්වි 5:18*** මූ.අ., "පරදාර සේවනයේ නොයෙදෙන්න."

**5 පරි.**
**1** ද්වි 15:15; ද්වි 24:18
**2** නික් 6:6; ද්වි 4:34; යෙසා 63:12
**3** නික් 31:17
**4** නික් 21:15; ලෙවී 19:3; ද්වි 27:16; හිතෝ 1:8; මාක් 7:10
**5** නික් 20:12; එෆී 6:3
**6** උත් 9:6; නික් 20:13; ගණන් 35:21; මතෙ 5:21; රෝම 13:9
**7** නික් 20:14; හිතෝ 6:32; 1කොරි 6:18; හෙබ්‍රෙ 13:4
**8** නික් 20:15; ලෙවී 19:11; හිතෝ 30:9; 1කොරි 6:10; එෆී 4:28
**9** නික් 20:16; නික් 23:1; ලෙවී 19:16; ද්වි 19:16; හිතෝ 6:19; හිතෝ 19:5
**10** 2සාමු 11:3; මතෙ 5:28
**11** නික් 20:17; 1රාජා 21:4; ලූක් 12:15; රෝම 7:7
**12** නික් 19:9; නික් 19:18; ද්වි 4:12
**13** නික් 24:12; නික් 31:18; ද්වි 4:13
**14** නික් 20:18; හෙබ්‍රෙ 12:18

**2 තීරුව**
**1** නික් 19:18; නික් 24:17; ද්වි 4:36
**2** ද්වි 4:33
**3** නික් 20:19; ද්වි 18:16; ක්‍රියා 7:38; ගලා 3:19
**4** හෙබ්‍රෙ 12:29
**5** ද්වි 4:33; ද්වි 5:5; ගීතා 29:4; 1තෙස 1:9
**6** නික් 20:19; හෙබ්‍රෙ 12:19
**7** ද්වි 18:17
**8** ද්වි 10:12; යෝබ් 28:28; හිතෝ 1:7; මතෙ 10:28; 1පේතෘ 2:17

**9** හිතෝ 4:4; හිතෝ 7:2; දේශ 12:13; යෙසා 48:18; 1යොහ 5:3; **10** ගීතා 19:11; යාකො 1:25; **11** ද්වි 4:45; ද්වි 6:1; එස 20:11; මලා 4:4; ගලා 3:19; **12** ද්වි 6:3; ද්වි 6:25; ද්වි 8:1.

ඇති මේ මාර්ගයෙන් කවදාවත් පිට
යන්න එපා.[1] **33** යෙහෝවා දෙවි
ඔබට අණ කළ සෑම දෙයක්ම ඒ විදි-
හටම පිළිපදින්න.[2] ඔබ එසේ කළොත්
ඔබට යහපතක් මිස අයහපතක් නම්
සිදු වෙන්නේ නැහැ.[3] ඒ වගේම ඔබට
හිමි වන දේශයේ බොහෝ කාලයක්
ජීවත් වෙන්නත් ඔබට හැකි වෙනවා.

**6** “ඔබට උගන්වන්න කියා යෙ-
හෝවා දෙවි මට දුන් අණපනත්
හා තීන්දු මම දැන් ඔබට පවසන්-
නම්.[4] ඔබ හිමි කරගන්නා දේශයේ-
දිත් ඒ සියල්ල ඔබ පිළිපැදිය යුතුයි.
**2** මා ඔබට කියා දෙන මේ සියලුම
අණපනත් ඔබද ඔබේ දරු මුනුපුරන්ද
දිවි ඇති තුරා පිළිපැදිය යුතුයි.[5] යෙ-
හෝවා දෙවිට ගරුබිය[6] පෙන්වමින්
ඒ දේවල් පිළිපදින්න. එවිට බො-
හෝ කාලයක් ජීවත් වෙන්න ඔබට
හැකි වෙයි.[7] **3** ඊශ්‍රායෙල් ජනයෙනි,
හොඳින් සවන් දෙන්න. මා කියන
හැම දෙයක්ම හොඳින් ඉටු කරන්න.[8]
ඔබ එසේ කළොත් යෙහෝවා දෙවි
ඔබේ මුතුන්මිත්තන්ට පොරොන්දු වූ
ලෙස[9] කිරියෙන් හා පැණියෙන් ඉතිරී
යන ඒ දේශයේදී ඔබේ ජීවිතය සෑම
අතින්ම සාර්ථක[10] වෙයි. ඔබ දරුවන්
බිහි කර විශාල සෙනඟක් බවට
පත් වෙයි.

**4** “ඊශ්‍රායෙල්වරුනි, සවන් දෙන්න.
අපගේ දෙවි යෙහෝවා දෙවියි. යෙ-
හෝවා යන නමින් සිටින්නේ එකම
දෙවි කෙනෙක් පමණයි.[11] **5** ඔබේ
දෙවි වන යෙහෝවාට ඔබේ මුළු හද-
වතින්ම ප්‍රේම කරන්න.[12] ඔහු වෙ-
නුවෙන් ඔබේ උපරිමය[13] කරමින්
ඔබේ මුළු ජීවිතයම කැප කරන්න.[14]
**6** මා අද ඔබට කියා දෙන මේ
වචන හොඳින් සිතේ තබාගන්න.[15]
**7** ඒවා ඔබේ දූපුතුන්ගේ සිත්වලට
කාවද්දන්න.[16] නිවසේ සිටින විටත්
ගමන්බිමන් යන විටත් විවේක සුව-
යෙන් සිටින විටත්[17] අවදි වන විටත්
ඔබ ඒ දේවල් ගැන කතා කරන්න.
**8** ඒවා සිහිවටනයක් ලෙස ඔබේ

**5 පරි.**

**1** ද්වි 12:32 යොෂු 1:7 හිතෝ 4:27
**2** ද්වි 10:12 යෙරෙ 7:23
**3** ද්වි 4:40 ද්වි 12:28 හිතෝ 19:16 රෝම 10:5

**6 පරි.**

**4** ද්වි 4:1 ද්වි 4:10
**5** උත් 18:19 ද්වි 4:9
**6** නික් 20:20 යොෂු 24:14 යෝබ් 28:28 ගීතා 111:10 ගීතා 128:1
**7** ද්වි 5:16 හිතෝ 3:2
**8** ද්වි 5:32 2රාජා 21:8
**9** උත් 13:16
**10** දේශ 8:12 යෙසා 3:10
**11** ද්වි 5:7 යෙසා 42:8 සෙක 14:9 මාක් 12:29 1කොරි 8:6
**12** ද්වි 10:12 මතෙ 22:37
**13** මාක් 12:30 ලූක් 10:27
**14** ද්වි 11:13 ද්වි 30:6
**15** ද්වි 11:18 හිතෝ 7:3
**16** උත් 18:19 ද්වි 4:9 ද්වි 11:19 හිතෝ 22:6 එෆී 6:4
**17** හිතෝ 6:22

**2 තීරුව**

**1** හිතෝ 3:3 හිතෝ 7:3
**2** නික් 13:9 නික් 13:16 ද්වි 11:18
**3** ද්වි 11:20
**4** උත් 15:18
**5** යොෂු 24:13 ගීතා 105:44
**6** ද්වි 8:10
**7** විනි 3:7 යෙරෙ 2:32
**8** ද්වි 10:12 ද්වි 13:4 ගීතා 34:9 ගීතා 128:1
**9** ලූක් 4:8
**10** ද්වි 10:20 විනි 21:7 යෙරෙ 12:16

අතේත්[1] නළලේත්[2] බැඳගන්න.
**9** ඔබේ නිවසේ උළුවහුවලත් නුවරේ
දොරටුවලත් ඒවා ලියා තබන්න.[3]

**10** “ඔබේ මුතුන්මිත්තන් වන
ආබ්‍රහම්, ඊසාක් සහ යාකොබ්ට පො-
රොන්දු වූ දේශයට යෙහෝවා දෙවි
ඔබව අනිවාර්යයෙන්ම ගෙන යයි.[4]
ඒ දේශයේ වැසියන් ඉදි කළ ඉතා
විශාල අලංකාර නුවරවල් ඔබ අයිති
කරගනී.[5] **11** හැම සැප සම්පත-
කින්ම පිරී ඔවුන්ගේ නිවෙස්ද ඔවුන්
සෑදූ පොකුණුද ඔවුන් වගා කළ
මිදිවතු හා ඔලීවවතුද දෙවි ඔබට
ලබා දෙයි. එහි ඇති දේවල් භුක්ති
විඳිමින් තෘප්තිමත් ජීවිතයක් ගත
කරන්න ඔබට හැකියි.[6] **12** ඔබට
ඒ දේවල් ලැබෙන විට ඔබ වහ-
ලුන්ව සිටි ඊජිප්තු දේශයෙන් ඔබව
නිදහස් කළේ යෙහෝවා දෙවි බව
කිසිවිටෙකත් අමතක නොකරන්න.[7]
**13** ඔබ ගරුබිය දැක්විය යුත්තේ
ඔබේ දෙවි වන යෙහෝවාටයි.[8] ඔබ
නමස්කාර කළ යුත්තෙත් ඔහුට පම-
ණයි.[9] ඔබ යම් දිවුරුමක් දෙන විට
දෙවිගේ නමින් පමණක් දිවුරා පො-
රොන්දු වෙන්න.[10] **14** අවට සිටින
ජාතීන් නමස්කාර කරන වෙනත් දෙ-
විවරුන් පසුපස ඔබ නොයා යුතුයි.[11]
**15** (මන්ද ඔබේ දෙවි වන යෙහෝවා
වෙනත් දෙවිවරුන්ට කරන නමස්කා-
රය දැඩි ලෙස හෙළාදකින දෙවි
කෙනෙක්.)[12] ඔබ එසේ කළොත් යෙ-
හෝවා දෙවිගේ උදහස ඔබට විරුද්-
ධව ඇවිළී,[13] ඔහු ඔබව දේශයෙන්
තුරන් කර දමයි.[14]

**16** “මස්සාහ් නම් ස්ථානයේ සිදු
වුණාක් මෙන්[15] ඔබේ දෙවි වන යෙ-
හෝවා ඔබ වෙනුවෙන් මැදිහත් වෙ-
යිද නැද්ද කියා පරීක්ෂා නොකළ
යුතුයි.[16] **17** ඔබ යෙහෝවා දෙවිගේ
සිහිගැන්වීම්[17] හා නියෝග[18] වගේම

---

**11** නික් 34:14; ද්වි 8:19; යෙරෙ 25:6; **12** නික් 20:5; ද්වි 4:24; යොෂු 24:19; නාහු 1:2; **13** නික් 32:10; ගණන් 25:3; ද්වි 11:17; විනි 2:14; **14** 1රාජා 13:34; 2රාජා 17:18; **15** නික් 17:2; ද්වි 33:8; ගීතා 95:8; හෙබ්‍රෙ 3:8; **16** මතෙ 4:7; ලූක් 4:12; 1කොරි 10:9; **17** 1රාජා 2:3; **18** ද්වි 11:22; ගීතා 119:4.

ඔහු දුන් සෑම නීතියක්ම[1] අනිවාර්ය-
යෙන්ම පිළිපැදිය යුතුයි.[2] **18** යෙ-
හෝවා දෙවි ඉදිරියේ නිතරම හරි දේ
පමණක් කරන්න. ඔබ එසේ කළොත්
ඔබට යහපතක් මිස අයහපතක් නම්
සිදු නොවෙයි.[3] යෙහෝවා දෙවි ඔබේ
මුතුන්මිත්තන්ට පොරොන්දු වූ සරු-
සාර දේශය අයිති කරගෙන එහි
පදිංචි වෙන්නත් ඔබට අවස්ථාව උදා
වෙයි.[4] **19** එසේම යෙහෝවා දෙවි
පොරොන්දු වූ ආකාරයටම ඒ දේශයේ
සිටින සියලුම සතුරන්ව දේශයෙන්
පන්නා දමන්නත් ඔබට හැකි වෙයි.[5]
**20** "'අපේ දෙවි වන යෙහෝවා
ඔබට දුන් අණපනත් හා සිහිගැන්වීම්-
වල තේරුම අපට පැහැදිලි කර
දෙන්න පුළුවන්ද' කියා අනාගත-
යේදී ඔබේ දරුවන් ඔබෙන් අසන්න
ඉඩ තිබෙනවා.[6] **21** එවැනි අවස්ථා-
වකදී ඔවුන්ට ඔබ මෙසේ පැවසිය
යුතුයි. 'අපි කලින් සිටියේ ඊජිප්තු දේ-
ශයේ පාරාවෝගේ වහලුන් හැටියටයි.
නමුත් යෙහෝවා දෙවි තම මහත්
බලයෙන්[7] අපිව ඒ දේශයෙන් නිදහස්
කළා. **22** යෙහෝවා දෙවි බලවත්
ක්‍රියා හා ආශ්චර්යයන්[8] සිදු කර-
මින් ඊජිප්තු දේශයටත් පාරාවෝ-
ටත් විරුද්ධව බොහෝ විපත් ඇති
කළ හැටි අපි අපේ ඇස් දෙකෙන්ම
දැක්කා.[9] **23** දෙවි අපව එසේ නිද-
හස් කළේ අපේ මුතුන්මිත්තන්ට පො-
රොන්දු වූ දේශය හිමි කර දෙන්නයි.[10]
**24** ඉන්පසු අපේ යෙහෝවා දෙවි මේ
සියලු නීති[11] අපට ලබා දුන්නා.
ඒවාට කීකරු වෙමින් යෙහෝවා දෙ-
විට ගරුබිය දැක්වුවොත් අපිට බො-
හෝ ආශීර්වාද ලැබෙයි.[12] අපට අපේ
ජීවිතය රැකගන්නත් පුළුවන් වෙයි.[13]
**25** අපේ දෙවි වන යෙහෝවා අපට
අණ කළ සෑම දෙයක්ම කරන්න අපි
උපරිම උත්සාහයක් දරනවා නම්[14]
ඔහු අප ගැන අනිවාර්යයෙන්ම සතුටු
වෙයි.'*[15]

**ද්වි 6:25*** මූ.අ., "ඔහු අපව ධර්මිෂ්ඨ අය ලෙස සලකනු ඇත."

**6 පරි.**
**1** ද්වි 4:1, නෙහෙ 9:13
**2** ද්වි 11:13, එස 20:11
**3** ද්වි 5:33
**4** උත් 15:18
**5** නික් 23:30, ගණන් 33:52
**6** නික් 13:14
**7** නික් 15:6
**8** නික් 7:3, ද්වි 7:19
**9** ද්වි 4:34
**10** නික් 13:5, ද්වි 1:8
**11** ද්වි 5:1, 1රාජා 2:3
**12** ද්වි 10:12, ගීතා 111:10, හිතෝ 14:27, දේශ 8:12
**13** ද්වි 4:1, ලූක් 10:28, ගලා 3:12
**14** ලෙවී 18:5, දේශ 12:13
**15** රෝම 10:5

**2 නීරුව**

**7 පරි.**
**1** ද්වි 31:3, ගීතා 44:2
**2** උත් 10:15
**3** උත් 10:16
**4** උත් 15:16
**5** උත් 10:19
**6** යොෂු 11:3
**7** උත් 10:17
**8** 1ලේක 1:14
**9** ද්වි 20:1
**10** නික් 33:2, යොෂු 3:10
**11** ගණන් 33:52, ක්‍රියා 13:19
**12** ලෙවී 27:29, ද්වි 20:17, යොෂු 6:17, යොෂු 10:28
**13** නික් 23:32, නික් 34:15, ද්වි 20:16, විනි 2:2
**14** යොෂු 23:12, 1රාජා 11:2, එස්රා 9:2, නෙහෙ 10:30
**15** නික් 34:16, 1රාජා 11:4
**16** ද්වි 6:15
**17** නික් 34:13, ද්වි 12:2
**18** නික් 23:24, ද්වි 12:3, ද්වි 16:22

**7** "ඔබේ දෙවි වන යෙහෝවා ඔබට
උරුම කර දෙන දේශය
ඔබට අනිවාර්යයෙන්ම ලැබෙයි.[1] එහි
සිටින හිත්තීවරුන්,[2] ගිර්ගාෂිවරුන්,[3]
අමෝරිවරුන්,[4] කානානිවරුන්,[5] පෙ-
රිස්සිවරුන්,[6] හිවීයවරුන්[7] සහ යෙබූ-
සිවරුන්[8] යන ඔබට වඩා බලවත්
ජාතීන් හතම[9] දෙවි ඔබේ ඇස් පනාපි-
ටම ඉවත් කර ඔබට ඒ දේශය උරුම
කර දෙයි.[10] **2** යෙහෝවා දෙවි ඒ
ජාතීන්ව නිසැකවම ඔබේ අතට
හසු කර දෙන නිසා ඔවුන්ව පරා-
ජය කරන්න ඔබට පුළුවන් වෙයි.[11]
ඔබ ඔවුන්ව සහමුලින්ම විනාශ කළ
යුතුයි.[12] ඔවුන් සමඟ ගිවිසුමක් ඇති
කරගන්නවත් ඔවුන්ට කිසි අනු-
කම්පාවක් පෙන්වන්නවත් එපා.[13]
**3** ඔබ ඔවුන් සමඟ විවාහ සම්බන්ධ-
කම් නොපැවැත්විය යුතුයි. ඔබේ
දූවරුන්ව ඔවුන්ගේ පුතුන්ට විවාහ
කර දෙන්නවත් ඔබේ පුතුන්ව ඔවුන්-
ගේ දූවරුන්ට විවාහ කර දෙන්න-
වත් එපා.[14] **4** ඔබ එවැනි දෙයකට
ඉඩ දුන්නොත් ඔබේ දූපුතුන් දෙවි-
ගෙන් ඈත් වී වෙනත් දෙවිවරුන්ට
වන්දනාමාන කරන්න පටන්ගනියි.[15]
එවිට යෙහෝවා දෙවිගේ උදහස ඔබට
විරුද්ධව ඇවිළී, ඔහු ඔබව වහාම
විනාශ කර දමයි.[16]
**5** "ඒ ජාතීන් නමස්කාරය සඳහා
ඉදි කර ඇති පූජාසන,[17] කණු[18] හා
කුලුනු[19] ඔබ කඩා බිඳ විනාශ කර
දැමිය යුතුයි.[20] ඔවුන් සාදා ඇති
රූප ගින්නෙන් දවා දැමිය යුතුයි.[21]
**6** එසේ කළ යුත්තේ ඔබේ දෙවි වන
යෙහෝවා ඉදිරියේ ඔබ ශුද්ධ සෙ-
නඟක් වන නිසයි.[22] මේ පොළොවේ
සිටින සියලුම ජාතීන් අතරින් තමාට
විශේෂ සෙනඟක් ලෙස යෙහෝවා
දෙවි තෝරාගෙන තිබෙන්නේ ඔබව
පමණක් බව නිතරම මතක තබා-
ගන්න.[23]

**19** ද්වි 16:21; **20** විනි 6:25; **21** ද්වි 7:25; ද්වි 12:3; **22** නික් 19:6; ද්වි 14:2; යෙරෙ 2:3; **23** නික් 19:5; ගීතා 135:4; ආමො 3:2; මලා 3:17.

7 “යෙහෝවා දෙවි ඔබට ඇලුම්
කළේ සියලු ජාතීන් අතරින් ඔබ බල-
වත්ම ජාතිය වූ නිසා නොවෙයි.[1]
ඇත්තටම ඉතා කුඩාම ජාතියව සිටි-
යේ ඔබයි.[2] **8** යෙහෝවා දෙවි ඔබව
තෝරාගත්තේ ඔහු ඔබට ප්‍රේම කළ
නිසයි.[3] යෙහෝවා දෙවි තම මහත්
බලය[4] පාමින් ඔබව වහලුන් ලෙස
තබාගත් ඊජිප්තුවේ රජු වන පාරා-
වෝගේ අතින් ඔබව නිදහස් කළේ[5]
ඔබේ මුතුන්මිත්තන්ට ඔහු දිවුරා කළ
පොරොන්දුව නිසයි.[6] **9** ඔබේ දෙවි
වන යෙහෝවා සැබෑ දෙවි බව ඔබ
දන්නවා.[7] ඔහු තමාට ප්‍රේම කරන හා
තමා අණ කරන දේට කීකරු වන
අයගේ පරම්පරා දහසකට වුණත්
මහත් ප්‍රේමයක්* පෙන්වමින්[8] විශ්වා-
සවන්තව[9] තම ගිවිසුමට එකඟව[10]
කටයුතු කරන බවත් ඔබ හොඳින්ම
දන්නවා. **10** නමුත් දෙවි තමාට
වෛර කරන අයගේ ක්‍රියාවලට අනුව
ප්‍රතිඵල දෙමින් ඔවුන්ව විනාශ කර
දමනවා.[11] එසේ කරන්න දෙවි කිසි-
විටෙක පසුබට වෙන්නේ නැහැ.
**11** ඒ නිසා අද මම ඔබට කියා දෙන
මෙම අණපනත් හා තීන්දු පිළිපැදීමට
ඔබ වගබලා ගත යුතුයි.[12]

**12** “ඔබ මෙම නීතිරීති සිතට
ගෙන ඒවා දිගටම පිළිපැද්දොත්[13]
යෙහෝවා දෙවි ඔබේ මුතුන්මිත්-
තන් සමඟ ඇති කරගත් ගිවිසුමට
විශ්වාසවන්තව සිට[14] මහත් ප්‍රේම-
යෙන් ඔබ සමඟ කටයුතු කරයි.[15]
**13** එසේම ඔබට දෙවිගේ ප්‍රේමය
හා ආශීර්වාද නොඅඩුව ලැබෙයි.[16]
දෙවි ඔබට බොහෝ දරු සම්පත්
දී ආශීර්වාද කරයි.[17] ඔබේ වගා-
වේ පලදාවටද[18] ඔබේ ධාන්‍ය අස්-
වැන්නටද ඔබේ අලුත් වයින් හා
තෙල්වලටද ඔබේ එළදෙනුන්ට හා
එළු බැටළුවන්ටද උන්ගේ පැටවුන්-
ටද[19] දෙවි අනිවාර්යයෙන්ම ආශීර්වාද
කරයි. දෙවි ඔබේ මුතුන්මිත්තන්ට
දීමට පොරොන්දු වූ ඒ දේශයේදී
මේ සියල්ල ඔබ අද්දකියි.[1] **14** ඔබ
වෙන කිසිම ජාතියකට වඩා ආශීර්-
වාද ලබන ජාතියක් බවට පත්
වෙයි.[2] දරුවන් නැති කිසි කෙනෙක්
ඔබ අතරේ සොයාගන්නවත් බැරි
වෙයි. ඔබේ සතුන් අතරේ පැට-
වුන් නැති එක සතෙක්වත් සිටින්-
නේ නැහැ.[3] **15** යෙහෝවා දෙවි
ඔබේ සියලු ලෙඩ දුක් තුරන් කර
දමයි. ඒ නිසා ඔබ ඊජිප්තු දේශයේ
දුටු කිසිම දරුණු රෝගයක්[4] ඔබට
වැලඳෙන්න ඉඩ දෙන්නේ නැහැ.
ඒ වෙනුවට දෙවි ඒ රෝගවලින්
ඔබේ සතුරන්ට පහර දෙයි. **16** යෙ-
හෝවා දෙවි ඔබේ අතට හසු කර
දෙන සෑම ජාතියක්ම ඔබ සහමු-
ලින්ම විනාශ කර දැමිය යුතුයි.[5]
ඔවුන්ට කිසිම අනුකම්පාවක් පෙන්-
වන්න එපා.[6] ඔවුන්ගේ දෙවිවරුන්ට
නමස්කාර කරන්නත් එපා.[7] ඔබ
එසේ කළොත් එය ඔබේ විනාශයට
මඟ පාදයි.[8]

**17** “‘මේ ජාතීන් අපට වඩා බල-
වත්. අපි ඔවුන්ව දේශයෙන් පන්නා
දමන්නේ කොහොමද’ කියා ඔබට
සිතෙන්න පුළුවන්.[9] **18** එහෙත් ඔබ
ඔවුන්ට බිය නොවිය යුතුයි.[10] යෙ-
හෝවා දෙවි පාරාවෝටත් මුළු ඊජිප්-
තුවටත් කළ දේ මතක් කරගන්න.[11]
**19** යෙහෝවා දෙවි ඔවුන්ව සෝ-
දිසි කර බැලූ ආකාරයත්[12] තම
මහත් බලයෙන්[13] පුදුමසහගත
ක්‍රියාවන් හා ආශ්චර්යයන්[14] කර-
මින් ඔබව නිදහස් කළ ආකාරයත්[15]
ඔබට මතකද? ඔබේ දෙවි වන යෙ-
හෝවා ඒ සියලු ජාතීන්ට කරන්නෙත්
ඒ දේමයි. ඒ නිසා ඔවුන්ට භය
වෙන්න හේතුවක් නැහැ.[16] **20** යෙ-
හෝවා දෙවිගේ ක්‍රියා දැක ඔවුන් තුළ
මහත් භයක් ඇති වෙයි.[17] ඔවුන්
ඔබෙන් සැඟවී සිටින්න වෑයම් කළත්

ද්වි **7:9*** හෝ, “ඇදි ප්‍රේමය.”

**7 පරි.**
1 ද්වි 4:37; ද්වි 10:15; ගීතා 105:6; රෝම 9:11
2 ද්වි 10:22; ගීතා 105:12; යෙසා 51:2
3 ද්වි 23:5
4 නික් 13:14
5 නික් 6:6; නික් 13:3; යෙසා 51:10
6 උත් 22:16; නික් 32:13; ද්වි 10:15; ගීතා 105:9; ලූක් 1:73
7 ලෙවී 26:45; ද්වි 4:35; ගීතා 68:20
8 නික් 34:7; ද්වි 5:10
9 යෙසා 49:7; 1කොරි 10:13; 2කොරි 1:18; හෙබ්‍රෙ 11:11
10 නෙහෙ 1:5; දානි 9:4
11 ගීතා 21:9; ගීතා 68:2; හිතෝ 2:22; යෙසා 59:18; නාහු 1:2; 2පේතෘ 3:7
12 ද්වි 5:32; යොහ 13:17; යාකො 1:22
13 නික් 15:26; ද්වි 28:1
14 ගීතා 105:8
15 මීකා 7:20; ලූක් 1:55; ලූක් 1:72
16 නික් 23:25; හිතෝ 10:22
17 ලෙවී 26:9; ද්වි 28:4
18 ලෙවී 26:4
19 ගීතා 107:38

**2 තීරුව**
1 උත් 13:15
2 ද්වි 33:29; ගීතා 115:15; ගීතා 147:20
3 නික් 23:26; ද්වි 28:11; ගීතා 127:3
4 ද්වි 28:27; ද්වි 28:60; ආමො 4:10
5 ද්වි 7:2; ද්වි 20:16; යොෂු 10:28
6 උත් 15:16; ලෙවී 18:25; ද්වි 9:5
7 නික් 20:3

**8** නික් 23:33; ද්වි 12:30; විනි 2:3; ගීතා 106:36; **9** ගණන් 13:31; **10** ද්වි 1:29; ද්වි 31:6; ගීතා 27:1; යෙසා 41:10; **11** නික් 14:13; ගීතා 105:27; ගීතා 135:8; ක්‍රියා 13:17; **12** ද්වි 29:3; නෙහෙ 9:11; **13** නික් 13:3; ද්වි 11:2; **14** නෙහෙ 9:10; යෙරෙ 32:20; **15** ද්වි 4:34; **16** නික් 23:28; යොෂු 3:10; **17** ද්වි 2:25; යොෂු 2:9; යොෂු 24:12.

දෙවි ඔවුන් සියලුදෙනාව සහමුලින්ම
විනාශ කර දමයි.[1] **21** ඒ නිසා
ඔවුන්ට භය වෙන්න එපා. ඔබේ උප-
කාරයට සිටින ඔබේ දෙවි වන යෙ-
හෝවා[2] බිය උපදවන ක්‍රියා කරන
බලවත් දෙවි කෙනෙක් බව මතක
තබාගන්න.[3]

**22** "නමුත් ඔබ ඒ ජාතීන්ව එක-
වරම විනාශ කළොත් වනසත්තු
විශාල සංඛ්‍යාවක් බෝ වී ඔබට හානි-
යක් කරන්න ඉඩ තිබෙනවා. ඒ
නිසා යෙහෝවා දෙවි ඒ ජාතීන්ව
එකවර විනාශ කර දමන්න ඔබට
ඉඩ දෙන්නේ නැහැ.[4] **23** යෙහෝවා
දෙවි ඔබේ සතුරන්ව අන්ත පරාජයට
පත් කර ඔවුන්ව දේශයෙන් සහමු-
ලින්ම තුරන් කර දමයි.[5] **24** දෙවි
ඔවුන්ගේ රජවරුන්ව ඔබේ අතට
හසු කර දෙයි.[6] ඔබ ඔවුන්ගේ නම්
සම්පූර්ණයෙන්ම මැකී යන ලෙස
ඔවුන්ගේ මුළු පරම්පරාවම විනාශ
කර දැමිය යුතුයි.[7] ඔබට විරුද්ධව
නැඟී සිටින කිසිවෙකු සාර්ථක වෙන්-
නේ නැහැ.[8] ඔබ ඔවුන්ව දේශයෙන්
තුරන් කර දමයි.[9] **25** ඔවුන්ගේ දෙ-
විවරුන්ගේ රූප සම්පූර්ණයෙන්ම දවා
දමන්න.[10] ඒවා සෑදීමට භාවිත කළ
රන්වලටවත් රිදීවලටවත් ආශා නො-
කරන්න.[11] ඒවා ගත්තොත්[12] ඒවා
ඔබට උගුලක් මෙන් වෙයි.[13] ඒ දේවල්
ඔබේ දෙවි වන යෙහෝවාට පිළිකුල්[14]
බව මතක තබාගන්න. **26** යමෙක්
විනාශ කළ යුතු ඒ පිළිකුල්සහගත
දේවලින් එක දෙයක් හරි ඔහුගේ නිව-
සට රැගෙන ආවොත් ඔහුත් විනාශ-
යට සුදුස්සෙක් වෙයි. ඒවා විනාශ කර
දැමිය යුතු[15] පිළිකුල් දේවල් නිසා ඔබ
ඒවා සම්පූර්ණයෙන්ම හෙළාදැකිය
යුතුයි.[16]

**8** "මා ඔබට කියා දෙන මේ සියලුම
අණපනත් පිළිපදින්න වගබලා
ගන්න.[17] ඔබ එසේ කළොත් ඔබේ
ජීවිතය රැකගන්නත්[18] දරුදැරියන්
බිහි කර යෙහෝවා දෙවි ඔබේ මුතුන්-
මිත්තන්ට දෙන්න පොරොන්දු වූ
දේශය පුරා පැතිර යන්නත් ඔබට

**7 පරි.**

**1** නික් 23:29
**2** ගණන් 14:9 ගීතා 46:5
**3** ද්වි 10:17 1සාමු 4:8 නෙහෙ 1:5 නෙහෙ 9:32
**4** නික් 23:30
**5** ද්වි 9:3
**6** යොෂු 10:24 යොෂු 12:1
**7** නික් 17:14 ගීතා 9:5
**8** ද්වි 11:25 යොෂු 1:5 යොෂු 23:9 රෝම 8:31
**9** යොෂු 11:14
**10** නික් 32:20 ද්වි 12:3 1ලේක 14:12
**11** යෙසා 30:22
**12** යොෂු 7:21
**13** ද්වි 7:16 විනි 8:27
**14** ද්වි 27:15 ද්වි 29:17
**15** ලෙවී 27:28 ද්වි 13:17
**16** රෝම 2:22

**8 පරි.**

**17** ද්වි 5:32 ගීතා 119:4 1තෙස 4:1
**18** හිතෝ 3:2

**2 තීරුව**

**1** උත් 15:18
**2** ද්වි 2:7 ද්වි 29:5 ආමො 2:10
**3** ගීතා 101:5 ලූක් 18:14 1පේතෘ 5:6
**4** ද්වි 13:3 ගීතා 139:23 හිතෝ 17:3
**5** නික් 16:4 නික් 20:20
**6** නික් 16:3
**7** නික් 16:31 ගීතා 78:24
**8** මතෙ 4:4
**9** ද්වි 29:5 නෙහෙ 9:21
**10** 2සාමු 7:14 හිතෝ 3:12 1කොරි 11:32 හෙබ්‍රෙ 12:6 එළි 3:19
**11** 1සාමු 12:24
**12** ද්වි 5:33 2ලේක 6:31 ගීතා 128:1 ලූක් 1:6
**13** නික් 3:8 ලෙවී 26:4 ද්වි 11:12 නෙහෙ 9:25

පුළුවන් වෙයි.[1] **2** පාළුකරයේ මේ
අවුරුදු හතළිහ පුරා ගිය ගමන
කවදාවත් අමතක කරන්න එපා.[2]
යෙහෝවා දෙවි ඒ දේට ඉඩහැරි-
යේ ඔබට නිහතමානිකම උගන්වන්-
නයි.[3] ඔබ හදවතින්ම[4] ඔහුට කීකරු
වෙනවාද නැද්ද කියා සෝදිසි[5] කර
බලන්නත් දෙවිට එයින් හැකි වුණා.
**3** ඒ කාලයේදී කුසගින්නේ සිටින්න
දෙවි ඔබට ඉඩහැරියා.[6] ඉන්පසු ඔබ-
වත් ඔබේ පියවරුන්වත් කවදාවත්
නොදුටු මන්නාවලින්[7] දෙවි ඔබව
පෝෂණය කළා. දෙවි එසේ කළේ
මිනිසාගේ ජීවිතය රඳා පවතින්නේ
කෑම වේලක් මත පමණක් නොව,
යෙහෝවා දෙවි පවසන සෑම දෙ-
යක් මත බව* ඔබට අවබෝධ කර
දෙන්නයි.[8] ඒ හැම අද්දැකීමකින්ම
ඔබ නිහතමානිකම ඉගෙනගත්තා.
**4** ඒ අවුරුදු හතළිහ පුරා ඔබේ ඇඳුම්
පැළඳුම් දිරා ගියේවත් ඔබේ පාද ඉදි-
මුණේවත් නැහැ.[9] **5** පියෙක් තම
පුතාට දැනමුතුකම් දී යහමඟට ගන්-
නාක් මෙන් ඔබේ දෙවි වන යෙහෝවා
ඔබට දැනමුතුකම් දී යහමඟේ ගමන්
කරන්න ඉගැන්වූ බව ඔබ හොඳින්ම
දන්නවා.[10]

**6** "ඔබේ දෙවි වන යෙහෝවා අණ
කළ දේ ඔබ පිළිපැදිය යුතුයි. ඒ
දේ කරන්න නම් ඔබ දෙවිට ගරු-
බිය[11] දක්වන්නත් දෙවි දෙන මඟ
පෙන්වීම්වලට අනුව ජීවත් වෙන්නත්
අවශ්‍යයි.[12] **7** යෙහෝවා දෙවි ඔබව
ගෙන යන්නේ ඉතා සරුසාර දේශය-
කටයි.[13] කඳුකරයෙන්ද නිම්නවලින්ද
දිය උල්පත් මතු වෙන ඒ දේශය, ඇළ-
දොළ ගංගාවලින් ගහන වූ දේශයක්.[14]
**8** තිරිඟු, බාර්ලි, මිදිවැල්, අත්තික්කා
ගස් හා දෙළුම් ගස්වලින්ද[15] තෙල්
නිපදවීමට අවශ්‍ය ඔලීව ගස්වලින්ද
සපිරි ඒ දේශයේ පැණිද ඇති තරම්

---

**14** ද්වි 11:11; **15** ගණන් 13:23.

---

**ද්වි 8:3*** මූ.අ., "මිනිසා ජීවත් වන්නේ ආහාරව-
ලින් පමණක් නොව, යෙහෝවා දෙවිගේ මුවින්
නික්මෙන වචනවලින්."

තිබෙනවා.[1] **9** එහිදී ඔබට ආහාරව-
ලින් නම් කිසි හිඟයක් ඇති වන්නේ
නැහැ. එහි ගල් පර්වතවලින් යකඩත්
කඳුකරයෙන් තඹත් ඔබට අවශ්‍ය
තරම් ලබාගන්න පුළුවන්.

**10** “ඒ සරුසාර දේශයට ගොස් කා
බී සතුටින් ජීවත් වන විට[2] ඒ දේ-
ශය ලබා දුන් යෙහෝවා දෙවිට[3]
ඔබ ප්‍රශංසා කළ යුතුයි.[4] **11** ඔබට
ඒ දේවල් ලැබුණු පසු ඔබ යෙ-
හෝවා දෙවිව අමතක කර[5] මම
ඔබට කියා දෙන දෙවිගේ අණප-
නත් කඩ කරන්නත් ඉඩ තිබෙනවා.
ඒ නිසා ඔබ නිතරම කල්පනාකාරී
විය යුතුයි.[6] **12** ඒ දේශයේදී කා බී
සතුටින් සිට ලස්සන ගෙවල් දොර-
වල් සාදාගෙන ඒවායේ පදිංචි වීමට
ඔබට හැකි වෙයි.[7] **13** ඔබේ එළු
බැටළු රැළවල් ගණනින් වැඩි වී ඔබට
බොහෝ රන් රිදී ලැබෙයි. ඔබට
හැම සැප සම්පතක්ම භුක්ති විඳී-
මට හැකි වෙයි. **14** නමුත් එහෙම
වුණාට පස්සේ ඔබ ආඩම්බර වී,[8]
ඔබ වහලුන්ව සිටි ඊජිප්තු දේ-
ශයෙන් ඔබව නිදහස් කළ ඔබේ
දෙවි වන යෙහෝවාව අමතක කර
දමන්න ඉඩ තිබෙනවා.[9] **15** නමුත්
විෂකුරු සර්පයන්[10] හා ගෝනුස්සන්-
ගෙන් ගහන වූ ඉතා භයානක පාළුක-
රයක්[11] මැදින් ගමන් කරන්න ඔබට
හැකි වුණේ දෙවිගේ උපකාරය ඔබට
ලැබුණු නිසා බව මතක තබාගන්න.
බොන්න වතුර නැති වුණ අවස්ථාව-
ලදී දෙවි ඔබට පර්වතවලින් වතුර
ලබා දුන්නා.[12] **16** ඔබේ පියවරුන්
කවදාවත් නොදුටු මන්නාවලින්[13]
දෙවි ඔබව පාළුකරයේදී පෝෂණය
කළා. දෙවි එසේ කළේ ඔබට නිහත-
මානිකම උගන්වන්නයි.[14] දෙවි ඔබේ
හදවත සෝදිසි කර බලන්න කළ
ඒ දේවල් ඔබේම යහපතට හේතු
වුණා.[15] **17** ඒ නිසා ‘අපි ධනවත්
වුණේ අපේම දහඩිය මහන්සියෙන්’
කියා කිසිවිටෙකත් සිතන්න එපා.[16]
**18** ඔබ එලෙස ධනවත් වන්නේ යෙ-
හෝවා දෙවිගේ ආශීර්වාදය නිසයි.[17]
ඒ නිසා හැමවිටම ඔබේ දෙවිව මතක-
යේ තබාගන්න. මන්ද ඔහු ඔබ වෙනු-
වෙන් ඒ දේ කරන්නේ ඔහු අද වන
තුරුත් ඔබේ මුතුන්මිත්තන් සමඟ
ඇති කරගත් ගිවිසුමට විශ්වාසවන්-
තව සිටින නිසයි.[1]

**19** “එහෙත් ඔබ ඔබේ දෙවි වන
යෙහෝවාව අමතක කර වෙනත් දෙ-
විවරුන් පසුපස ගොස් ඔවුන් ඉදිරි-
යේ වැඳ වැටී ඔවුන්ට නමස්කාර
කරන්න පටන්ගත්තොත් ඔබ සියලු-
දෙනාම අනිවාර්යයෙන්ම විනාශ වෙ-
නවා කියා ස්ථිර වශයෙන්ම මට
කියන්න පුළුවන්.[2] **20** ඔබේ දෙවි
වන යෙහෝවාගේ හඬට ඔබ කීකරු
නොවුණොත් යෙහෝවා දෙවි ඔබේ
ඇස් පනාපිටම ජාතීන්ව විනාශ කර
දමන්නාක් මෙන් ඔබවත් විනාශ කර
දමයි.[3]

**9** “ඊශ්‍රායෙල් ජනයෙනි, අද ඔබ
යොර්දාන් ගඟෙන් එගොඩ[4]
වෙන්නේ ඔබට වඩා විශාල හා බල-
වත් ජාතීන්ව පලවාහැරීමටයි.[5] ඔවුන්
ජීවත් වෙන්නේ අහස උසට තැනූ
දැවැන්ත බලකොටුවලයි.[6] **2** ඔබ
පලවාහරින්නේ අනාක්වරුන්වයි.[7]
ඔවුන් ඉතා උස මහත ශක්තිමත්
සෙනඟක්. ‘අනාක්වරුන්ට විරුද්ධව
සටන් කර කාටද ජය ගන්න පුළුවන්’
කියන කතාව ඔබ අසා තිබෙනවා.
**3** නමුත් ඒ දේශයට යද්දී යෙහෝවා
දෙවි ඔබට ඉදිරියෙන් ගමන් කරන
බව ඔබ හොඳින්ම දන්නවා.[8] ඔහු
ඇවිළෙන ගින්නක්[9] හා සමානයි. ඒ
නිසා ඔහු ඔවුන්ව ඔබට යටත් කර
දෙන බව නම් ස්ථිරයි. යෙහෝවා
දෙවි පොරොන්දු වූ ලෙසම ඔබ ඉතා
කෙටි කාලයකින් ඔවුන්ව දේශයෙන්
පලවාහැර සහමුලින්ම විනාශ කර
දමයි.[10]

**4** “නමුත් යෙහෝවා දෙවි ඔවුන්ව
පලවාහැරිය පසු, ‘යෙහෝවා දෙවි
අපට මේ දේශය උරුම කර දුන්නේ
අපි ඉතා ධර්මිෂ්ඨ සෙනඟක් නිසයි’
කියා කවදාවත් සිතන්න එපා.[11] ඇත්-
තටම යෙහෝවා දෙවි මේ ජාතීන්ව

**8 පරි.**
1 එස 20:6
2 ද්වි 6:11
3 1ලේක 29:14
4 ගීතා 103:2
ගීතා 134:1
5 ගීතා 106:21
6 ද්වි 6:12
7 ද්වි 32:15
යෙරෙ 22:14
හොෂෙ 13:6
8 ද්වි 9:4
1කොරි 4:7
9 ගීතා 106:21
10 ගණන් 21:6
11 ද්වි 1:19
යෙරෙ 2:6
12 ගණන් 20:11
ගීතා 78:15
ගීතා 105:41
ගීතා 114:8
1කොරි 10:4
13 නික් 16:35
යොහ 6:31
යොහ 6:49
14 ද්වි 8:2
15 2කොරි 4:17
හෙබ්‍රෙ 12:11
1පේතෘ 1:7
16 හොෂෙ 12:8
හබ 1:16
1කොරි 4:7
17 ගීතා 127:1
හිතෝ 10:22
හොෂෙ 2:8

**2 තීරුව**
1 ද්වි 7:12
2 ද්වි 4:26
ද්වි 30:18
යොෂු 23:13
1සාමු 12:25
3 දානි 9:11
දානි 9:12
ආමො 3:2

**9 පරි.**
4 ද්වි 11:31
යොෂු 4:19
5 ද්වි 4:38
ද්වි 7:1
ද්වි 11:23
6 ගණන් 13:28
7 ගණන් 13:33
ද්වි 1:28
ද්වි 2:21
8 ද්වි 1:30
ද්වි 20:4
ද්වි 31:3
යොෂු 3:11
9 ද්වි 4:24
නාහු 1:6
හෙබ්‍රෙ 12:29
10 නික් 23:31
ද්වි 7:23
ද්වි 7:24
ද්වි 20:16
11 ද්වි 7:8
එස 36:22

පලවාහරින්නේ ඔවුන්ගේ මහත් දුෂ්-
ටකම් නිසයි.[1] **5** යෙහෝවා දෙවි
ඔවුන්ට මෙසේ කරන්නේ ඔවුන්ගේ
දුෂ්ටකම[2] නිසා මිස, ඔබ ධර්මිෂ්ඨක-
මින්[3] ක්‍රියා කරන නිර්දෝෂ[4] සෙ-
නඟක් නිසා නොවෙයි. යෙහෝවා
දෙවි ඔබට ඒ දේශය උරුම කර දෙන්-
නේ ඔබේ මුතුන්මිත්තන් වන ආබ්‍ර-
හම්ට,[5] ඊසාක්ට[6] හා යාකොබ්ට[7]
තමා කළ පොරොන්දුව ඉටු කරන
පිණිසයි. **6** ඔබ ඉතා මුරණ්ඩු සෙ-
නඟක් බව මතක තබාගන්න. යෙ-
හෝවා දෙවි මේ සරුසාර දේශය
ඔබට හිමි කර දෙන්නේ ඔබ ධර්මිෂ්ඨ
සෙනඟක් නිසයි කියා නම් කොහො-
මටවත් සිතන්න එපා.[8]

**7** "පාළුකරයේ ගමන් කරද්දී ඔබේ
දෙවි වන යෙහෝවාව ඔබ උද-
හස් කළ බව අමතක නොකරන්න.[9]
ඊජිප්තු දේශයෙන් නිදහස් වූ දා සිට
මේ දක්වාම සිදු වුණු දේවලින් ඔබ
යෙහෝවා දෙවිට විරුද්ධව කැරලිග-
සන සෙනඟක් බව හොඳටම පැහැදි-
ලියි.[10] **8** හොරෙබ් කඳුකරයේදී ඔබ
යෙහෝවා දෙවිව කොතරම් උදහස්
කළාද කියනවා නම් ඔබව විනාශ
කර දැමීමට තරම් උදහසක් යෙ-
හෝවා දෙවිට ඇති වුණා.[11] **9** යෙ-
හෝවා දෙවි ඔබ සමඟ ඇති කරගත්
ගිවිසුම ලියා තිබුණු[12] ගල් පුවරු[13]
දෙක රැගෙන එන්න මම කන්දට
නැග්ග අවස්ථාව ඔබට මතකද? දවස්
හතළිහක්[14] පුරා දිවා රෑ දෙකේම මම
ඒ කන්දේ ගත කළා. (ඒ කාලය පුරා
මම කිසි දෙයක් කෑවේවත් බිව්වේවත්
නැහැ.) **10** එහිදී යෙහෝවා දෙවි
තම බලයෙන්*[15] ලියූ ගල් පුවරු දෙක
මට ලබා දුන්නා. මුළු ඊශ්‍රායෙල් සෙ-
නඟ රැස්ව සිටි අවස්ථාවේදී යෙ-
හෝවා දෙවි ගින්නක් තුළින් කතා
කරමින් ඔවුන්ට පැවසූ දේවල් ඒ පුව-
රුවල ලියා තිබුණා.[16] **11** දිවා රෑ
දෙකේම දින හතළිහක් පුරා මා එහි
ගත කළායින් පසු, සෙනඟ සමඟ
ඇති කරගත් ගිවිසුම සඳහන් කර
තිබූ ඒ ගල් පුවරු දෙක යෙහෝවා
දෙවි මට ලබා දුන්නා.[1] **12** ඉන්ප-
සුව යෙහෝවා දෙවි මට මෙසේ පැව-
සුවා. 'ඉක්මන් කර කන්දෙන් බැස
යන්න. ඔබ ඊජිප්තුවෙන් ගෙනා සෙ-
නඟ දැන් රූපයක්[2] සාදාගෙන ඉතා
දුෂ්ට විදිහට ක්‍රියා කරනවා.[3] මා
ඔවුන්ට අණ කළ දේවල් කොත-
රම් ඉක්මනින් ඔවුන්ට අමතක වෙ-
ලාද!' **13** ඊළඟට යෙහෝවා දෙවි
මට මෙසේ පැවසුවා. 'මේ සෙනඟ
දෙස මා හොඳින් බලාගෙනයි සිටින්-
නේ. ඔවුන් ඉතා මුරණ්ඩු සෙනඟක්![4]
**14** ඒ නිසා මාව වළක්වන්න උත්-
සාහ කරන්න එපා.[5] මම ඔවුන්වත්
ඔවුන්ගේ නාමයත් මිහිපිටින් තුරන්
කර දමනවා.[6] ඒ වෙනුවට ඔවුන්ටත්
වඩා බලවත් ජාතියක් ඔබෙන් බිහි
කරන්න මට ඉඩ දෙන්න.'[7]

**15** "මම ගල් පුවරු දෙකත්
රැගෙන[8] එතැනින් පිටත් වී ගින්නෙන්
ඇවිළෙමින් තිබුණු කන්දෙන්[9] පහළට
බැස එද්දී, **16** ඔබේ දෙවි වන යෙ-
හෝවාට විරුද්ධව ඔබ පව් කරමින්
සිටි ආකාරය මම දැක්කා. ඔබ වස්-
සෙකුගේ හැඩයට රූපයක් වාත්තු
කර සාදා තිබුණා.[10] යෙහෝවා දෙවි
අණ කළ දේවල් ඔබට කොතරම්
ඉක්මනින් අමතක වී තිබුණාද![11]
**17** එය දැක මා රැගෙන ආ ගල් පුවරු
දෙක මම ඔබ ඉදිරියේම පොළොවේ
ගසා කැබලිවලට කඩා දැමුවා.[12]
**18** ඉන්පසුව මම නැවත දිවා රෑ දෙ-
කේම දවස් හතළිහක් පුරා යෙහෝවා
දෙවි ඉදිරියේ වැඳ වැටී කන්නලව්
කළා. ඒ අතරතුර මම කිසිම දෙයක්
කෑවේවත් බිව්වේවත් නැහැ.[13] මා
එසේ කළේ ඔබ යෙහෝවා දෙවිට
විරුද්ධව පව් කර ඔහු පිළිකුල් කරන
ආකාරයට හැසිර ඔහුව බොහෝ සෙ-
යින් උදහස් කළ නිසයි.[14] **19** යෙ-
හෝවා දෙවි කොතරම් උදහස් වී
සිටියාද කිව්වොත් ඔබව සහමුලින්ම
විනාශ කිරීමට ඔහු තීරණය කළා.[15]
එය දැනගත් විට මට මහත් භයක්

ද්වි **9:10*** නික් 8:19හි පාදසටහන බලන්න.

**9 පරි.**
**1** උත් 15:16, ද්වි 12:31, ද්වි 18:12
**2** ලෙවී 18:25
**3** 1රාජා 8:46, ගීතා 51:5, රෝම 3:23, රෝම 5:12, තිත 3:5
**4** යෙරෙ 17:9
**5** උත් 13:15, උත් 17:8
**6** උත් 26:3
**7** උත් 28:13
**8** නික් 34:9, ගීතා 78:8, යෙසා 48:4, ක්‍රියා 7:51
**9** ද්වි 9:22, ගීතා 78:40, හෙබ්‍රෙ 3:16
**10** නික් 17:2, ගණන් 11:4, ගණන් 16:2, ගණන් 25:2, ද්වි 31:27, ද්වි 32:5, නෙහෙ 9:16
**11** නික් 32:4, නික් 32:10, ගීතා 106:19
**12** නික් 24:7, ගලා 4:24
**13** නික් 24:12, නික් 31:18, නික් 32:16
**14** නික් 24:18
**15** නික් 31:18, ගීතා 8:3, මතෙ 12:28, ලූක් 11:20
**16** නික් 19:19, ද්වි 4:10, ද්වි 4:12

**2 තීරුව**
**1** නික් 31:18, ද්වි 4:13
**2** නික් 32:4
**3** නික් 32:7, ද්වි 4:16
**4** නික් 32:9
**5** නික් 32:10
**6** ද්වි 7:24, ගීතා 9:5
**7** ගණන් 14:12
**8** නික් 32:15
**9** නික් 19:18, ද්වි 4:11
**10** ක්‍රියා 7:40
**11** නික් 20:3, නික් 20:4, ද්වි 5:8, ක්‍රියා 7:41
**12** නික් 32:19
**13** නික් 34:28
**14** නෙහෙ 9:18
**15** නික් 32:10

ඇනුණා. නමුත් යෙහෝවා දෙවි මගේ
කන්නලව්වලට සවන් දුන්නා.[1]
**20** "යෙහෝවා දෙවි ආරොන්
සමඟත් උදහස් වී ඔහුවත් විනාශ
කර දමන්න තීරණය කළා.[2] නමුත්
ඒ අවස්ථාවේදී මම ආරොන් වෙනු-
වෙනුත් දෙවිට කන්නලව්[3] කළා.
**21** ඉන්පසුව දෙවිට විරුද්ධව පව්
කරමින් ඔබ සෑදූ ඒ වස්සාව[4] මම
පුලුස්සා දමා ඉතුරු වූ කොටස් කුඩු
කර ඇඹුවා. අන්තිමේදී මම දූවිලි
තරම් සිහින් වූ ඒ කුඩු ටික රැගෙන
කන්දෙන් ගලා ආ දිය පහරකට විසි
කළා.[5]
**22** "ඒ විතරක්ද? ඔබ තබේරා[6]
නම් ස්ථානයේදිත් මස්සාහ්[7] නම්
ස්ථානයේදිත් කිබ්‍රොත්-හත්තාවා[8]
නම් ස්ථානයේදිත් යෙහෝවා
දෙවිව උදහස් කළා.[9] **23** කාදෙෂ්-
බර්නේය[10] නම් ස්ථානයේ සිටියදීත්
ඔබ ක්‍රියා කළේ ඒ ආකාරයටමයි.
එහිදී, 'මා ඔබට දෙන දේශය හිමි
කරගැනීමට දැන් සූදානම් වෙන්න.
මම නිසැකවම ඔබට එය අත් කර
දෙනවා' කියා යෙහෝවා දෙවි ඔබට
පැවසුවා. නමුත් ඔබ යෙහෝවා දෙ-
විට අකීකරු වී[11] ඔහුට විරුද්ධව කැරැ-
ලිගැසුවා.[12] ඔබ එසේ කළේ ඔබට
දෙවි ගැන කිසිම විශ්වාසයක්[13] තිබු-
ණේ නැති නිසයි. **24** මම ඔබව
හඳුනාගත් දා සිට මේ දක්වාම ඔබ
යෙහෝවා දෙවිට විරුද්ධව කැරලි-
ගැසුවා.[14]
**25** "යෙහෝවා දෙවි ඔබව විනාශ
කිරීමට තීරණය කර තිබුණ නිසා[15]
මම දවස් හතළිහක් පුරා, දිවා රෑ
දෙකේම[16] යෙහෝවා දෙවි ඉදිරියේ
වැඳ වැටී කන්නලව් කළා. **26** මම
ඒ අවස්ථාවේදී යෙහෝවා දෙවිට
මෙසේ පැවසුවා.[17] 'විශ්වයේ පාලක-
යාණන් වන යෙහෝවා දෙවියනි,
ඔබ මේ ජාතියව ඔබේ විශේෂ සෙ-
නඟක් ලෙස තෝරාගත්තා.[18] ඔබට
අයිති මේ සෙනඟව විනාශ කරන්න
එපා. ඔබ ඔවුන්ව ඊජිප්තුවෙන් නිද-
හස් කළේ[19] මොන තරම් මහත්
බලයක්[1] විදහාපෙන්වමින්ද! එහිදී
ඔබ කොතරම් ශ්‍රේෂ්ඨ දෙවි කෙ-
නෙක්ද කියා ඔප්පු වුණා. **27** දෙවි-
යනි, මා ඔබෙන් අයැද සිටින්නේ
මේ ජනයාගේ මුරණ්ඩුකමත් දුෂ්ටක-
මත් ඔවුන් කළ පාපයත් අමතක
කර දමා[2] ඔබේ සේවකයන් වූ ආබ්‍ර-
හම්ව, ඊසාක්ව හා යාකොබ්ව සිහි
කරන්න කියායි.[3] **28** ඔබ එහෙම
කළේ නැත්නම්, "යෙහෝවා දෙවි මේ
සෙනඟට වෛර කර ඔවුන්ව පාළුක-
රයේදී මරා දැම්මේ පොරොන්දු වූ දේ-
ශයට ඔවුන්ව රැගෙන යන්න බැරි වූ
නිසයි"[4] කියා ඊජිප්තු දේශයේ[5] ජනයා
කියයි. **29** දෙවියනි, මේ සෙනඟ
මොන වරදක් කළත් ඔවුන් ඔබේම
සෙනඟයි.[6] ඔබේ මහත් බලය හා
තේජස පෙන්වමින් ඔවුන්ව නිදහස්
කර විශේෂ සෙනඟක් ලෙස ඔබ
ඔවුන්ව තෝරාගත්තා.'[7]

**10** "ඒ අවස්ථාවේදී යෙහෝවා
දෙවි මට මෙසේ පැවසුවා.
'ඔබට කලින් දුන් ගල් පුවරු දෙ-
කට සමාන පුවරු දෙකක්[8] කපා-
ගෙන කන්ද නැඟ මා ළඟට
එන්න. ඊට අමතරව ඔබ ලී පෙට්-
ටියකුත්*[9] සාදාගන්න. **2** ඔබ බිඳ
දැමූ ගල් පුවරුවල තිබූ වචනම
එම අලුත් පුවරු දෙක මත මම
නැවත ලියා දෙන්නම්. ඉන්පසු එම
පුවරු දෙක ඔබ සාදාගත් පෙට්ටිය
තුළ තබන්න.' **3** දෙවි කී ලෙස
මම ෂිටිම් ලීවලින් පෙට්ටියක් සාදා,
කලින් තිබූ ගල් පුවරු දෙකට සමාන
පුවරු දෙකක්ද කපාගත්තා.[10] පසුව
මා එම පුවරු දෙකත් අරගෙන
කන්ද උඩට ගියා. **4** යෙහෝවා
දෙවි කලින් ලියා දුන් ලෙසම[11] ඒ
පුවරු දෙකේත් ආඥා දහය*[12] ලියා දී
ඒවා නැවත මට භාර දුන්නා. ඒ පුවරු
දෙකේත් ලියා තිබුණේ කන්ද ළඟ

**9 පරි.**
1 නික් 32:11, නික් 32:14, ද්වි 10:10, ගීතා 106:23
2 නික් 32:2, නික් 32:21, නික් 32:35
3 හිතෝ 15:29, යාකො 5:16
4 නික් 32:4
5 නික් 32:20, යෙසා 30:22
6 ගණන් 11:3
7 නික් 17:7, ද්වි 6:16
8 ගණන් 11:4, ගණන් 11:34
9 ද්වි 9:7
10 ගණන් 13:26, ද්වි 1:19
11 ගීතා 106:25
12 ගණන් 14:3, ගණන් 14:4, යෙසා 63:10
13 ද්වි 1:32, ගීතා 106:24, හෙබ්‍රෙ 3:19
14 ද්වි 31:27, ක්‍රියා 7:51
15 ද්වි 9:19
16 නික් 34:28, ද්වි 9:18, මතෙ 4:2
17 ගීතා 99:6, හිතෝ 15:29, යාකො 5:16
18 නික් 19:5, ද්වි 32:9, ගීතා 135:4, ආමො 3:2
19 1රාජා 8:51

**2 තීරුව**
1 නික් 32:11, ගීතා 99:6
2 නික් 32:31, ගීතා 78:8, මීකා 7:18
3 නික් 3:6, නික් 6:8, ද්වි 9:5
4 නික් 32:12, ගණන් 14:16, ගීතා 115:2
5 ද්වි 5:6
6 ද්වි 4:20, 1රාජා 8:51, නෙහෙ 1:10, ගීතා 74:2, ගීතා 95:7, ගීතා 100:3
7 නික් 6:6, ද්වි 4:34, යෙසා 63:12

**10 පරි.**
8 නික් 34:1
9 ද්වි 10:3
10 නික් 34:4

**11** නික් 32:15; නික් 34:28; **12** නික් 20:1; ද්වි 4:13.

ද්වි **10:1*** නික් 16:34හි පාදසටහන බලන්න. **4*** නික් 34:28හි පාදසටහන බලන්න.

රැස්ව සිටි ඊශ්‍රායෙල් සෙනඟට[1] යෙ-
හෝවා දෙවි ගින්න තුළින් කතා
කර[2] පැවසූ දේමයි. **5** මම කන්-
දෙන් බැස ඇවිත්[3] යෙහෝවා දෙවි
මට අණ කළ ලෙසම එම පුවරු දෙක
මා සාදාගත් පෙට්ටිය තුළ තැබුවා.[4]
**6** "ඉන්පසුව බෙයේරොත් බෙනෙ-
යායකන්හි[5] කඳවුරු බැඳගෙන සිටි
ඊශ්‍රායෙල් සෙනඟ ගමන් කළේ මො-
සේරා නම් ස්ථානයටයි. ආරොන් මිය
ගියේ එම ස්ථානයේදීයි. ඔහුව එහි
තැන්පත් කළායින් පසු[6] ඔහු වෙනු-
වට ඔහුගේ පුත් එලියාසර් උත්තම
පූජකයා හැටියට සේවය කරන්න
පටන්ගත්තා.[7] **7** එතැනින් පිටත් වූ
සෙනඟ ගුද්ගොදා වෙතටත් එතැන්
සිට යොත්බාතා වෙතටත් ගමන්
කළා.[8] යොත්බාතා කියන්නේ ඇළ-
දොළවලින් පිරුණු ප්‍රදේශයක්.
**8** "යෙහෝවා දෙවි ලෙවී ගෝ-
ත්‍රය[9] විශේෂ සේවයක් සඳහා වෙන්
කළේ ඒ කාලයේදීයි. යෙහෝවා
දෙවිගේ ගිවිසුම් පෙට්ටිය රැගෙන
යෑමත්[10] යෙහෝවා දෙවි ඉදිරියේම
සේවය කිරීමත්[11] දෙවිගේ නාම-
යෙන් සෙනඟට ආශීර්වාද කිරීමත්
ඔවුන්ගේ වගකීම්වලට අයත් වුණා.[12]
ඔවුන් අද දක්වාම එම කාර්ය-
යන්වල නිරත වෙමින් සිටිනවා.
**9** සෙසු ඊශ්‍රායෙල් ගෝත්‍රවලට යම්
ප්‍රදේශයක් උරුම වුණත් ලෙවීව-
රුන්ට ප්‍රදේශයක් උරුම නොවන්-
නේ ඒ නිසයි.[13] යෙහෝවා දෙවි
ඔවුන්ට පැවසූ ලෙස ඔවුන්ගේ උරු-
මය වන්නේ යෙහෝවා දෙවිමයි.[14]
**10** මම කලින් වතාවේදී මෙන් නැව-
තත් දවස් හතළිහක් රෑ දවල් දෙ-
කේ[15] කන්දට වී දෙවිට කන්නලව්
කළා. මේ වතාවේදීත් යෙහෝවා
දෙවි මට සවන් දුන්නා.[16] ඒ නිසයි
යෙහෝවා දෙවි ඔබව විනාශ නොක-
ළේ.[17] **11** ඉන්පසුව යෙහෝවා දෙවි
මට මෙසේ පැවසුවා. 'ඔබ දැන් සෙ-
නඟ සමඟ මේ ස්ථානයෙන් පිටත්ව
යෑමට සූදානම් වන්න. ඔවුන්ගේ
මුතුන්මිත්තන්ට මා පොරොන්දු වූ
දේශයට ඇතුල් වෙන්න දැන් ඔවුන්ට
අවස්ථාව පැමිණ තිබෙනවා.'[1]
**12** "ඊශ්‍රායෙල්වරුනි, ඔබේ දෙවි
වන යෙහෝවා දැන් ඔබෙන් බලාපො-
රොත්තු වන්නේ මෙපමණයි.[2] ඔබේ
දෙවි වන යෙහෝවාට ඔබ ගරුබිය[3]
දැක්විය යුතුයි. ඔබ එසේ කළොත්
ඔබේ දෙවි වන යෙහෝවාට ප්‍රේම
කරමින්[4] සැමවිටම ඔහු දෙන මඟ
පෙන්වීම්වලට අනුව ජීවත් වෙන්න[5]
ඔබට හැකි වෙයි. ඔබේ මුළු ජීවිත-
යම ඔහු වෙනුවෙන් කැප කර මුළු
හදවතින්ම ඔහුට සේවය කරන්න
ඔබ පෙලඹෙයි.[6] **13** ඔබේම යහ-
පත[7] සඳහා අද මම ඔබට කියා
දෙන යෙහෝවා දෙවිගේ අණපනත්
පිළිපදින්නත් ඔබට හැකි වෙයි.[8]
**14** ජනයෙනි, අහස දෙස බලන්න!
ඉමක් කොනක් නොපෙනෙන අහ-
සත්[9] එහි ඇති සියල්ලත් මේ මහ
පොළොවත්[10] එහි ඇති සියල්ලත්
අයිති වෙන්නේ ඔබේ දෙවි වන
යෙහෝවාටයි. **15** නමුත් මෙතරම්
ශ්‍රේෂ්ඨ දෙවි කෙනෙක් වන යෙ-
හෝවා ඔබේ මුතුන්මිත්තන්ට සමීප
වී ඔවුන්ට ප්‍රේම කළා. ඒ නිසා දෙවි
සියලු ජාතීන් අතරින් තමන්ගේ සෙ-
නඟ වීමට තෝරාගත්තේ ඔවුන්-
ගෙන් පැවතෙන්නන් වන ඔබවයි.[11]
**16** ඒ නිසා ඔබ තවදුරටත් මුරණ්ඩු
ලෙස ක්‍රියා කරන්න එපා.[12] ඔබේ
සිත් පවිත්‍ර කරගන්න.*[13] **17** මන්ද
ඔබේ දෙවි වන යෙහෝවා වෙනත්
සියලු දෙවිවරුන්ට වඩා උසස්.*[14]
ස්වාමිවරුන්ගෙත් ස්වාමීන් ඔහුයි.[15]
දෙවි ශ්‍රේෂ්ඨයි, බලසම්පන්නයි. ඔහු
ගරුබිය ලැබීමට වටින දෙවි කෙ-
නෙක්.[16] සියල්ලන්ටම එක හා සමා-
නව සලකන[17] ඔහු කිසිවෙකුගෙන්
අල්ලසක් ගන්නේ නැහැ.[18] **18** පියා

**10 පරි.**
1 නික් 19:17; ද්වි 5:22
2 ද්වි 4:36; ද්වි 5:4
3 නික් 34:29
4 ද්වි 10:2
5 ගණන් 33:31
6 ගණන් 20:23; ගණන් 20:24; ගණන් 33:38
7 ගණන් 20:28
8 ගණන් 33:33
9 ගණන් 1:50; ගණන් 3:6; ගණන් 8:14; ගණන් 16:9
10 ගණන් 3:31; ගණන් 4:15; 1ලේක 15:15
11 ද්වි 18:5; 2ලේක 29:11
12 ගණන් 6:23; ද්වි 21:5; 2ලේක 30:27
13 ගණන් 18:24; ගණන් 26:62; ද්වි 18:1
14 ගණන් 18:20
15 නික් 24:18; නික් 34:28
16 නික් 32:14
17 එස 33:11

**2 තීරුව**
1 උත් 15:18
2 මීකා 6:8
3 ද්වි 5:29; ද්වි 6:13; ගීතා 34:9; හිතෝ 8:13
4 ද්වි 30:16
5 ද්වි 5:33; යොෂු 22:5; එස 11:20
6 ද්වි 6:5; ද්වි 11:13; ලූක් 10:27
7 ද්වි 6:24
8 නික් 24:7
9 ගීතා 89:11; ගීතා 115:16; යෙසා 66:1
10 1ලේක 29:11; ගීතා 24:1; 1කොරි 10:26
11 ද්වි 4:37; ගීතා 105:6
12 නික් 34:9; ද්වි 9:6; ද්වි 31:27
13 ද්වි 30:6; යෙරෙ 4:4; රෝම 2:29; පිලි 3:3; කොලො 2:11
14 නික් 18:11; 2ලේක 2:5; ගීතා 97:9
15 ගීතා 136:3

16 ද්වි 7:21; නෙහෙ 1:5; නෙහෙ 9:32; 17 යෝබ් 34:19; ක්‍රියා 10:34; රෝම 2:11; එෆී 6:9; 18 2ලේක 19:7.

ද්වි **10:16*** මූ.අ., "ඔබේ හදවත් චර්මච්ඡේදනය කරගන්න." **17*** මූ.අ., "දෙවිවරුන්ගෙත් දෙවියා."

නැති දරුවා හා වැන්දඹුව වෙනුවෙන්
ඔහු සාධාරණය ඉටු කරයි.[1] ඔබ අත-
රේ සිටින විදේශිකයාටත්[2] ඔහු කිසිම
වෙනසක් නොකර ඔහුට ප්‍රේම කර-
මින් කෑම බීම හා ඇඳුම් පැළඳුම්
ලබා දෙයි. **19** ඒ නිසා ඔබ අතරේ
සිටින විදේශිකයන්ට ඔබත් ප්‍රේම කළ
යුතුයි.[3] ඔබත් යම් කාලයක් ඊජිප්තු-
වේ විදේශිකයන් ලෙස ජීවත් වූ බව
කිසි දිනක අමතක කරන්න එපා.[4]
**20** “ඔබ යෙහෝවා දෙවිට ගරුබිය
දැක්විය යුතුයි.[5] ඔබ නමස්කාර කළ
යුත්තේ ඔහුට පමණයි.[6] ඔහු මතම
රඳා සිටින්න.[7] ඔබ යම් දෙයක් ගැන
දිවුරා පොරොන්දු වන විට ඔහුගේ
නාමයෙන් පමණක් එසේ කරන්න.[8]
**21** ඔබේ ප්‍රශංසාව ලැබිය යුත්තේ
ඔහු පමණයි.[9] මන්ද ඔබේ දෙවි වන්-
නේ ඔහුයි. ඔබේ ඇස් දෙකෙන්ම ඔබ
දුටු ඉතා පුදුමසහගත, බිය උපද-
වන දේවල් කළේ ඔහුයි.[10] **22** ඔබේ
මුතුන්මිත්තන් ඊජිප්තුවට යන විට
ඔවුන් අතර සිටියේ හැත්තෑදෙනෙකු
පමණයි.[11] නමුත් දැන් බලන්න! යෙ-
හෝවා දෙවිගේ ආශීර්වාද නිසා ඔබ
දැන් අහසේ තිබෙන තරු මෙන් ඉතා
විශාල ජාතියක් වී සිටිනවා.[12]

**11** “ඔබේ දෙවි වන යෙහෝ-
වාට ඔබ ප්‍රේම කළ යුතුයි.[13]
ඔබ නිතරම දෙවිගේ අණපනත්
හා තීන්දු[14] පිළිපදිමින් ඔහුට පො-
රොන්දු වූ සෑම දෙයක්ම එලෙසම ඉටු
කරන්න. **2** මම දැන් මතක් කර
දෙන කාරණා ඔබ හොඳින්ම දන්-
නවා. (මම අද කතා කරන්නේ ඔබේ
දරුවන්ට නොව ඔබටයි. මන්ද යෙ-
හෝවා දෙවි තම සෙනඟව හික්මවන
ආකාරය ඔවුන් අද්දැක නැහැ.[15] දෙවි-
ගේ තේජස[16] හා අතිමහත් බලය-
වත්,[17] **3** ඊජිප්තුවේදී පාරාවෝ හා
ඔහුගේ මුළු සෙනඟ ඉදිරියේ දෙවි
කළ පුදුම දේවල්වත් ඔවුන් දුටුවේ
නැහැ.[18] **4** පාරාවෝ තම සේනාව
සමඟ ඊශ්‍රායෙල් සෙනඟ ලුහුබැඳ ආ
විට,[19] යෙහෝවා දෙවි ඊජිප්තුවේ
මුළු අශ්ව රථ සේනාවම රතු මුහු-

**10 පරි.**
**1** ගීතා 68:5
ගීතා 146:9
යාකො 1:27
**2** ලෙවී 19:10
ද්වි 24:14
**3** ලෙවී 19:34
**4** නික් 22:21
**5** ද්වි 6:13
**6** ලූක් 4:8
**7** ද්වි 13:4
**8** ද්වි 6:13
**9** නික් 15:2
ගීතා 105:45
එළි 19:6
**10** 2සාමු 7:23
**11** උත් 46:27
නික් 1:5
ක්‍රියා 7:14
**12** උත් 15:5
ද්වි 1:10
නෙහෙ 9:23

**11 පරි.**
**13** ද්වි 6:5
ද්වි 10:12
මාක් 12:30
**14** ද්වි 4:45
**15** ද්වි 8:5
හෙබ්‍රෙ 12:6
**16** ද්වි 5:24
ද්වි 9:26
**17** නික් 13:3
ද්වි 7:19
යෙසා 63:12
**18** ද්වි 4:34
නෙහෙ 9:10
ගීතා 105:27
**19** නික් 14:23
ගීතා 136:15
හෙබ්‍රෙ 11:29

**2 තීරුව**
**1** නික් 14:28
නික් 15:4
**2** ගණන් 16:1
ගීතා 106:17
**3** ගණන් 16:32
**4** ද්වි 7:19
ද්වි 29:3
**5** මතෙ 5:19
**6** ද්වි 1:38
**7** උත් 13:15
උත් 26:3
උත් 28:13
ද්වි 9:5
**8** නික් 3:8
එස 20:6
**9** ද්වි 4:40
ගීතා 91:16
හිතෝ 3:2
හිතෝ 10:27
**10** ද්වි 1:7
ද්වි 8:7
ද්වි 8:9
**11** 1රාජා 9:3
ගීතා 33:18
ගීතා 34:15
**12** නික් 15:26
ද්වි 6:17

දේ ජලයෙන් යට කර විනාශ කර
දැමූ ආකාරයත්[1] ඔවුන් දුටුවේ නැහැ.
**5** ඔබ පාළුකරයේ ගමන් කළ මුළු
කාලය පුරාම දෙවි ඔබ වෙනුවෙන්
කළ දේවල් ඔවුන් අද්දැක්කේ නැහැ.
**6** රූබෙන්ගේ පුත් එලියාබ්ගේ පුත්‍ර-
යන් වන දාතාන් හා අබිරාම්ටද[2]
ඔවුන්ගේ පවුල්වලටද ඔවුන් ජීවත් වූ
කූඩාරම්වලටද ඔවුන්ගේ පැත්ත ගත්
සියලු ඊශ්‍රායෙල්වරුන්ටද දෙවි කළ
දේ ඔබේ දරුවන් දුටුවේ නැහැ. එදා
පොළොව දෙබෑ වී ඔවුන් සියලුදෙනා-
වම ගිලගත් ආකාරය ඔවුන් දැක්කේ
නැහැ.)[3] **7** නමුත් ඔබ යෙහෝවා
දෙවි කළ මේ සෑම පුදුම ක්‍රියාවක්ම
ඔබේ ඇස් දෙකෙන්ම දැක්කා.[4]
**8** “අද මා ඔබට අණ කරන මේ
සියලු දේවල්[5] ඒ විදිහටම පිළිපදින්න.
එවිට ගඟෙන් එගොඩ තිබෙන ඒ
දේශය අල්ලාගන්න අවශ්‍ය ධෛර්-
යය ඔබට ලැබෙයි.[6] **9** එසේම යෙ-
හෝවා දෙවි ඔබේ මුතුන්මිත්තන්ට
හා ඔවුන්ගේ දරු මුනුපුරන්ට පො-
රොන්දු වූ[7] කිරියෙන් හා පැණියෙන්[8]
ඉතිරී යන ඒ දේශයේ ඔබට බොහෝ
කාලයක් ජීවත් වෙන්න ලැබෙයි.[9]
**10** “ඒ දේශය ඔබ වහලුන්ව සිටි
ඊජිප්තු දේශය වගේ නොවෙයි. ඊජිප්-
තුවේදී ඔබට සිදු වුණා දහඩිය මහන්-
සියෙන් බීජ වපුරන්න. ඔබේ එළවළු
වතුවලට අවශ්‍ය වතුර සපයන්න
පවා ඔබට වෙහෙසෙන්න* සිදු වුණා.
**11** නමුත් ඔබ අයිති කරගන්න යන
දේශය නිසි කලට වැසි ලැබෙන, කඳු
හෙල් හා තැනිතලාවලින්[10] නොඅඩු
දේශයක්. **12** යෙහෝවා දෙවි ඒ දේ-
ශය ආදරයෙන් රැකබලා ගන්නවා.
අවුරුද්ද පුරාම යෙහෝවා දෙවි ඒ දේ-
ශය දෙස බලාගෙනයි[11] සිටින්නේ.
**13** “මා අද ඔබට කියා දෙන
මේ අණපනත්වලින්[12] එකක්වත් කඩ
නොකර ඒවාට කීකරු වෙන්න. ඔබ
යෙහෝවා දෙවිට ප්‍රේම කර මුළු හද-

---

**ද්වි 11:10*** ඇතැම්විට ජල රෝද පැගීමෙන් හෝ දිය අගල් කැපීමෙන් හෝ ඔවුන් වතුර සපයාගන්න ඇති.

වතින්ම ඔහුට සේවය කරන්න. ඔබේ
මුළු ජීවිතයම ඔහු වෙනුවෙන් කැප
කරන්න.[1] **14** ඔබ එසේ කළොත්
ඔබට හිමි වන දේශයට දෙවි නියම
කාලයේදී[2] එනම්, වසන්ත සමයේ හා
සරත් සමයේදී වැසි ලබා දෙයි.[3]
අස්වැන්න නෙළන කාලයේදී ඔබට
ධාන්‍ය බහුලව එකතු කරගත හැකි
වන අතර අලුත් වයින්වත් තෙල්වත්
ඔබට කිසි දිනක හිඟ වෙන්නේ
නැහැ. **15** හොඳින් කා බී සතුටින්
සිටින්න ඔබට හැකි වන අතර[4] දෙවි
ඔබ ඇති කරන සතුන්ටද ඇති තරම්
ආහාර ලබා දෙයි.[5] **16** නමුත් කල්-
පනාකාරී වන්න. ඔබේ සිත ඔබව
නොමඟ යවන්න ඉඩ තිබෙනවා.[6]
එහෙම වුණොත් ඔබ දෙවිගෙන් ඈත්
වී වෙනත් දෙවිවරුන් ඉදිරියේ වැඳ
වැටී නමස්කාර කරයි.[7] **17** එසේ
කළොත් යෙහෝවා දෙවිගේ උදහස
ඔබට විරුද්ධව ඇවිළී ඔහු අහ-
සේ කවුළු වසා දමයි. එවිට ඔබට
අවශ්‍ය වැස්ස හා භූමියෙන් නිසි පල-
දාව නොලැබෙයි.[8] යෙහෝවා දෙවි
ඔබට ලබා දෙන ඒ සරුසාර දේශය
ඔබට ඉක්මනින්ම අහිමි වී ඔබත්
විනාශ වී යයි.[9]

**18** “මා ඔබට කියා දෙන මේ
වචන ඔබේ සිතට ගන්න.[10] ඒවා
ඔබේ ජීවිතයට අදාළ කරගන්න.
ඒවා ඔබේ අතෙත් නළලෙත් බැඳ-
ගන්න.[11] **19** ඔබ ඒ දේවල් ඔබේ
දූපුතුන්ට ඉගැන්විය යුතුයි. ඔබ නිව-
සේ සිටින විටත් ගමන්බිමන් යන
විටත් විවේක සුවෙන් සිටින විටත්
අවදි වන විටත් ඒ දේවල් ඔවුන්
සමඟ කතාබහ කරන්න.[12] **20** ඒ
දේවල් ඔබේ නිවසේ උළුවහුවලත්
නුවරේ දොරටුවලත් ලියා තබන්න.[13]
**21** ඔබ එසේ කළොත් යෙහෝවා
දෙවි ඔබේ මුතුන්මිත්තන්ට පො-
රොන්දු වූ ඒ දේශයේ[14] බොහෝ කල්
ජීවත් වෙන්න ඔබටත් ඔබේ දරුදැරි-
යන්ටත් හැකි වෙයි.[15] අහස පො-
ළොව පවතින තාක් කල්[16] ඔබත් ඒ
දේශයේ පදිංචි වී සිටියි.

**11 පරි.**

**1** ද්වි 4:29 ද්වි 6:5 ද්වි 10:12 මතෙ 22:37
**2** ලෙවී 26:4 ද්වි 28:12 ගීතා 65:10 යෙසා 30:23 යෙරෙ 14:22
**3** යෙරෙ 5:24 යෝවෙ 2:23 යාකො 5:7
**4** ද්වි 6:11 ද්වි 8:10 යෝවෙ 2:19
**5** ගීතා 104:14
**6** ද්වි 29:18 යෝබ් 31:27 හෙබ්‍රෙ 3:12
**7** ද්වි 8:19 ද්වි 30:17
**8** ද්වි 28:23 1රාජා 8:35 2ලේක 7:13 ආමො 4:7
**9** ද්වි 4:26 ද්වි 8:19 ද්වි 30:18 යොෂු 23:13
**10** ද්වි 6:6 ගීතා 37:31 හිතෝ 7:3 යෙසා 51:7
**11** නික් 13:9 නික් 13:16 ද්වි 6:8
**12** ද්වි 4:9 ද්වි 6:7 ගීතා 34:11 ගීතා 78:5 හිතෝ 22:6 එෆී 6:4
**13** ද්වි 6:9
**14** උත් 13:15
**15** ද්වි 4:40 ද්වි 6:2 හිතෝ 3:2 හිතෝ 4:10 හිතෝ 9:11
**16** ගීතා 72:5 ගීතා 89:29

**2 තීරුව**

**1** ද්වි 6:17 ද්වි 11:13 දේශ 12:13
**2** ද්වි 6:5 ලූක් 10:27
**3** යොෂු 22:5 ගීතා 81:13 එස 11:20
**4** ද්වි 10:20 ද්වි 13:4
**5** නික් 23:28 ද්වි 9:5 යොෂු 3:10 ගීතා 44:2
**6** ද්වි 4:38 ද්වි 7:1 ද්වි 9:1

**22** “මා ඔබට කියා දෙන මේ අණ-
පනත්වලින්[1] එකක්වත් කඩ නොකර
ඒවා පිළිපැදීමට වගබලා ගන්න.
එසේම ඔබේ දෙවි වන යෙහෝවාට
ප්‍රේම කර[2] ඔහුගේ මඟ පෙන්වීම්වලට
අනුව ජීවත් වෙන්න[3] නිතරම උත්-
සාහ කරන්න. නිතරම ඔහු මත
රඳා සිටින්න.[4] ඔබ එසේ කළොත්
**23** යෙහෝවා දෙවි ඒ දේශයේ සිටින
ජාතීන්ව පලවාහැර ඔබට එය ලබා
දෙයි.[5] ඔබටත් වඩා බලවත් ඒ
ජාතීන්ව දේශයෙන් පන්නා දමන්න
ඔබට පුළුවන් වෙයි.[6] **24** ඔබ පා
තබන සෑම ප්‍රදේශයක්ම ඔබට හිමි
වෙයි.[7] ඔබේ දේශ සීමාව පාළුකරයේ
සිට ලෙබනොන් දේශය දක්වාත් යුප්‍ර-
ටීස් ගඟ සිට බස්නාහිර දෙසට පිහිටි
මුහුද දක්වාත් විහිදී යයි.[8] **25** ඔබට
විරුද්ධව නැඟී සිටින කිසිම කෙනෙක්
සාර්ථක වෙන්නේ නැහැ.[9] ඔබට පො-
රොන්දු වූ ලෙසම ඔබ ඒ දේශයේ
වැසියන් අතරට යන්නත් කලින්ම
ඔවුන් යෙහෝවා දෙවිගේ ක්‍රියා ගැන
අසා භයෙන් වෙවුලයි.[10]

**26** “ඊශ්‍රායෙල්වරුනි, ආශීර්වාද හා
ශාප ගැන යමක් මා ඔබට දැන් පව-
සන්නම්.[11] **27** අද මම ඔබට කියා
දෙන ඔබේ දෙවි වන යෙහෝවාගේ
සියලු අණපනත්වලට ඔබ කීකරු
වුණොත් ඔබට ආශීර්වාද ලැබෙයි.[12]
**28** නමුත් ඔබ යෙහෝවා දෙවිගේ
අණපනත්වලට අකීකරු වී,[13] මා
ඔබට ලබා දෙන මඟ පෙන්වීම් නො-
සලකාහැර ඔබ නොදන්නා වෙනත්
දෙවිවරුන්ට නමස්කාර කළොත්
ඔබට අත් විඳින්න සිදු වෙන්නේ
ශාප[14] පමණයි.

**29** “ඔබට හිමි වන දේශයට යෙ-
හෝවා දෙවි ඔබව රැගෙන ගිය
පසු[15] ඔබ ගෙරිසීම් කන්ද පාමුල
සිට ඒ ආශීර්වාද ගැනත්[16] ඒබාල්

**7** යොෂු 1:3; යොෂු 14:9; **8** උත් 15:18; නික් 23:31; **9** ද්වි 7:24; යොෂු 1:5; **10** නික් 23:27; ද්වි 2:25; යොෂු 2:9; යොෂු 5:1; **11** ද්වි 28:2; ද්වි 28:15; ද්වි 30:1; ද්වි 30:15; **12** ද්වි 28:1; ගීතා 19:11; යෙසා 1:19; **13** රෝම 2:8; රෝම 2:9; **14** ලෙවී 26:16; යෙසා 1:20; **15** නික් 23:23; ද්වි 9:1; **16** ද්වි 27:12; යොෂු 8:33.

කන්ද පාමුල සිට ඒ ශාප ගැනත්[1]
සියලුදෙනාට ඇසෙන සේ ප්‍රකා-
ශයක් කළ යුතුයි. **30** මෙම කඳු
දෙක පිහිටා තිබෙන්නේ යෝර්දාන්
ගඟට බස්නාහිර දෙසින් ජීවත් වන
කානානිවරුන්ගේ දේශයේයි. අරබා[2]
ප්‍රදේශයේ තිබෙන ගිල්ගාල්[3] නුවරට
නුදුරින් මොරේගේ[4] විශාල ගස් අසල
ඒ කඳු දැකගන්න පුළුවන්. **31** ඔබ
යෝර්දාන් ගඟෙන් එගොඩ වන්නේ
යෙහෝවා දෙවි ඔබට ලබා දෙන
දේශය හිමි කරගන්නයි. එමනිසා
ඔබ එය යටත් කරගෙන එහි පදිංචි
වෙන්න.[5] **32** එහි පදිංචි වූ පසුත් මා
අද ඔබට කියා දෙන නීතිරීති හා
තීන්දු[6] සියල්ලම පිළිපැදීමට වගබලා
ගත යුතුයි.[7]

**12** "ඔබේ මුතුන්මිත්තන්ගේ
දෙවි වන යෙහෝවා ඔබට
හිමි කරගන්න අවසර දී ඇති දේශයට
ගිය පසු ඔබ පිළිපැදිය යුතු[8] නීතිරීති[9]
ගැන මා සඳහන් කරන්න කැමතියි.
ඔබේ ජීවිත කාලය පුරාම ඔබ ඒ
නීතිරීති පිළිපැදිය යුතුයි.[10] **2** ඔබ
ඒ දේශයට ගිය පසු, ඔබ පල-
වාහැරිය ජාතීන් තම දෙවිවරුන්ව
ඇදහීම සඳහා කඳු මුදුන්වල හා සරු-
වට වැඩුණු ගස් අසල තනා ඇති
පූජනීය ස්ථාන[11] ඔබ දකියි. ඔබ
ඒවා සහමුලින්ම විනාශ කර දැමිය
යුතුයි.[12] **3** ඔවුන් තම නමස්කාරය
සඳහා ඉදි කළ පූජාසන[13] හා කණු[14]
කඩා බිඳ දමන්න. ඔවුන්ගේ කුලුනු[15]
දවා දමන්න. ඔවුන්ගේ දෙවිවරුන්ගේ
රූපද[16] කඩා දමන්න. ඒ දෙවිවරුන්-
ගේ නම් පවා ඔබ එම ස්ථානවලින්
මකා දැමිය යුතුයි.[17]

**4** "ඔබ යෙහෝවා දෙවිට නමස්-
කාර කළ යුත්තේ ඒ ජාතීන් තම
දෙවිවරුන්ට නමස්කාර කරන ආකා-
රයට නොවෙයි.[18] **5** ඒ වෙනුවට,
ඔබ යෙහෝවා දෙවි තම නාමය දැරී-
මට තෝරාගන්නා ස්ථානයට ගොස්
ඔහුට නමස්කාර කළ යුතුයි. ඔබේ
සියලු ගෝත්‍ර විසිර සිටින දේශය
තුළ දෙවි තෝරාගන්නා ස්ථානයට
ඔබ යා යුතුයි.[1] **6** දවන පූජාවන්[2]
හා වෙනත් පූජාවන්ද ඔබ ඔප්පු
කරන භාර[3] හා ඔබේම කැමැත්තෙන්
ඔප්පු කරන පූජාද[4] ඔබ වෙන් කර-
ගන්නා දසයෙන් කොටස්ද[5] වෙනත්
පරිත්‍යාගයන්ද[6] ඔබේ ගව රැළේ හා
එළු බැටළු රැළේ කුලුඳුල් සතුන්වද[7]
රැගෙන යා යුත්තේ එම ස්ථානයටයි.
**7** ඔබත් ඔබේ පවුලේ සියලුදෙනාත්
ඒ ස්ථානයට ගොස් ඔබේ දෙවි වන
යෙහෝවා ඉදිරියේ කා බී[8] ඔබ කරන
සෑම වැඩක් ගැනම ප්‍රීති විය යුතුයි.[9]
මන්ද ඒ සියල්ල භුක්ති විඳින්න ඔබට
හැකි වෙන්නේ යෙහෝවා දෙවිගෙන්
ලැබෙන ආශීර්වාද නිසයි.

**8** "මේ වන තෙක්ම අපි ක්‍රියා
කළේ අපිට හරියි කියා සිතූ ආකාරය-
ටයි.[10] නමුත් මින් මත්තට ඔබ
එසේ නොකළ යුතුයි. **9** අප මේ
වන තෙක්ම එලෙස ක්‍රියා කළේ
යෙහෝවා දෙවි අපිට උරුම කර
දෙන දේශයේ අප තවමත් පදිංචි-
යට නොගිය නිසයි.[11] **10** නමුත්
දැන් යෝර්දාන්[12] ගඟෙන් එගොඩ වී
යෙහෝවා දෙවි ඔබට උරුම කර
දෙන දේශයේ පදිංචි වෙන්න ඔබට
පුළුවන්.[13] ඉන්පසුව දෙවි අවට සිටින
සතුරු ජාතීන්ගෙන් ඔබට කිසිම හිරි-
හැරයක් වෙන්න ඉඩ නොදෙන නිසා
එහි සුරක්ෂිතව වාසය කරන්න ඔබට
හැකි වෙයි.[14] **11** එහිදී යෙහෝවා
දෙවි තම නාමය දැරීමට විශේෂ ස්ථා-
නයක්[15] තෝරාගනියි. මා අද ඔබට
කියා දෙන ආකාරයට ඔබ දවන පූජා-
වන්[16] හා වෙනත් පූජාවන්ද දසයෙන්
කොටස්[17] හා වෙනත් පරිත්‍යාග-
යන්ද[18] යෙහෝවා දෙවිට භාරයක්[19]
ලෙස ඔප්පු කිරීමට තෝරාගන්නා
සියල්ලද රැගෙන යා යුත්තේ එම
ස්ථානයටයි. **12** ඔබත් ඔබේ දරු-
දැරියනුත් ඔබේ දාසදාසීනුත් යෙ-

**11 පරි.**
**1** ද්වි 27:13
යොෂු 8:34
**2** ද්වි 1:7
ද්වි 3:17
යොෂු 12:3
**3** 2රාජා 4:38
**4** උත් 12:6
**5** ද්වි 9:1
යොෂු 1:11
**6** ද්වි 4:45
**7** ද්වි 5:32
ද්වි 12:32
ගීතා 119:4
1යොහ 5:3

**12 පරි.**
**8** ද්වි 4:40
ද්වි 6:1
යාකො 1:22
**9** ලෙවී 19:37
ලෙවී 25:18
ලෙවී 26:46
ද්වි 4:5
**10** ද්වි 4:10
1රාජා 8:40
**11** එස 20:28
**12** නික් 34:13
**13** විනි 2:2
විනි 6:25
**14** නික් 23:24
2රාජා 18:4
**15** නික් 34:13
1රාජා 15:13
2රාජා 23:14
2ලේක 14:3
**16** ගණන් 33:52
ද්වි 7:5
ද්වි 7:25
**17** නික් 23:13
යොෂු 23:7
**18** ලෙවී 18:3
ද්වි 12:31
2රාජා 17:15

**2 තීරුව**
**1** ද්වි 26:2
2ලේක 7:12
**2** ලෙවී 1:3
**3** ලෙවී 7:16
ලෙවී 22:18
**4** ලෙවී 23:38
1ලේක 29:9
එස්රා 2:68
**5** ද්වි 12:17
ද්වි 14:22
**6** ගණන් 18:19
ද්වි 12:11
**7** ද්වි 12:17
ද්වි 15:19
**8** ද්වි 14:23
ද්වි 15:20
**9** ලෙවී 23:40
ද්වි 12:12
ද්වි 12:18
ද්වි 14:26
ගීතා 32:11
ගීතා 100:2
පිලි 4:4

**10** ගණන් 15:39; විනි 17:6; හිතෝ 21:2; **11** 1රාජා 8:56; 1ලේක 23:25; හෙබ්‍රෙ 4:8; **12** යොෂු 3:17; **13** ද්වි 4:22; ද්වි 9:1; **14** ද්වි 33:28; 1රාජා 4:25; ගීතා 4:8; හිතෝ 1:33; **15** ද්වි 12:6; ද්වි 14:23; ද්වි 16:2; ද්වි 26:2; **16** ලෙවී 1:3; **17** ද්වි 14:22; ද්වි 26:12; **18** ගණන් 18:19; ද්වි 12:6; **19** ලෙවී 7:16; ලෙවී 22:18.

හෝවා දෙවි ඉදිරියේ ප්‍රීති විය[1] යුත්-
තේ එම ස්ථානයේදීයි. උරුමයක්
නොලැබෙන නිසා, ඔබේ නුවරවල
ජීවත් වන ලෙවීවරුනුත් ඔබ සමඟ ඒ
ස්ථානයේදී ප්‍රීති විය යුතුයි.[2] **13** ඒ
ස්ථානයේ හැර වෙන කිසිම ස්ථා-
නයක දවන පූජා ඔප්පු නොකිරී-
මට වගබලා ගන්න.[3] **14** දවන පූජා
ඔප්පු කළ යුතු ස්ථානය නියම
කරන්නේ යෙහෝවා දෙවියි. ඔහු
සියලු ගෝත්‍රවලින් එක ගෝත්‍රයක්
තෝරාගෙන ඒ ගෝත්‍රයට හිමි ප්‍රදේශ-
යේ ස්ථානයක් නියම කරයි. මා අණ
කළ ලෙසම ඔබේ දවන පූජා ඔබ
ඔප්පු කළ යුත්තේ ඒ ස්ථානයේදීයි.[4]
**15** "නමුත් වෙන ඕනෑම අවස්-
ථාවකදී ඔබට මස් කන්න සිතු-
ණොත් ඔබ පදිංචි වී සිටින නුවරේදීම
සතුන්ව මරා ආහාරයට ගත හැකියි.[5]
මුවන්, ගෝනුන් වැනි[6] දඩයම් කර
කන සතුන් වගේම යෙහෝවා දෙවි-
ගේ ආශීර්වාදයෙන් ලැබෙන අනික්
සතුන්වද ඔබට මරා කන්න පුළුවන්.
ඔබ පවිත්‍ර තත්වයක සිටියත් අපවිත්‍ර[7]
තත්වයක සිටියත් උන්ව ආහාරයට
ගත හැකියි. **16** නමුත් එම සතුන්-
ගේ ලේ අනුභව කරන්න ඔබට අවසර
නැහැ.[8] එය වතුර මෙන් බිමට වත්
කළ යුතුයි.[9] **17** ඒ වගේම ඔබේ
ධාන්‍ය අස්වැන්නෙන්,[10] අලුතෙන්
පෙරූ වයින්වලින් හා තෙල්වලින් ඔබ
වෙන් කරන දසයෙන් කොටසවත්
ඔබේ ගව රැළේ හා එළු බැටළු රැළවල
සිටින කුලුඳුල් සතුන්වත්[11] ඔබ භාර-
යක් ලෙස පුද කරන දේවල්වත්
ඔබ කැමැත්තෙන්ම පූජා[12] කරන
දේවල්වත් ඔබ ඔප්පු කරන වෙ-
නත් පරිත්‍යාගයන්වත්[13] ඔබ පදිංචි වී
සිටින ස්ථානයේදී ආහාරයට ගන්න
ඔබට අවසර නැහැ. **18** ඔබත් ඔබේ
දූපුතුනුත් ඔබේ දාසදාසීනුත් ඔබ
සමඟ පදිංචි වී සිටින ලෙවීවරුනුත්
ඒවා අනුභව කළ යුත්තේ යෙහෝවා
දෙවි විසින් තෝරාගත් ස්ථානයේදී[14]
යෙහෝවා දෙවි ඉදිරියේමයි. මෙසේ,
ඔබ කරන සෑම වැඩක්ම යෙහෝවා
දෙවි ඉදිරියේ ප්‍රීතියෙන්[1] කරන්න.
**19** ඔබට උරුම වන දේශයේ ඔබ
ජීවත් වන තාක් කල් ලෙවීවරුන්ගේ
අවශ්‍යතා ගැන සැලකිලිමත් වීමට
වගබලා ගන්න.[2]
**20** "යෙහෝවා දෙවි පොරොන්දු වූ
ලෙස[3] ඔබේ දේශ සීමාවන්[4] පුළුල් කර
දුන් පසු කෙනෙකුට මස් කන්න ආශා-
වක් ඇති වී, 'මට මස් කන්න
අවශ්‍යයි' කියා පැවසුවොත් ඔහුට
හිතේ හැටියට මස් කන්න පුළුවන්.[5]
**21** ඒ තැනැත්තා ජීවත් වන්නේ යෙ-
හෝවා දෙවි තම නාමය[6] දැරීමට
තෝරාගත් ස්ථානයේ සිට බොහෝ
දුරකින් නම් එළු බැටළු රැළෙන් හෝ
ගව රැළෙන් හෝ යෙහෝවා දෙවි
ඔහුට ලබා දී තිබෙන සතුන්ව තම
නුවරේදීම මරා ආහාරයට ගන්න
ඔහුට අවසර තිබෙනවා. මා පැවසූ
ලෙස ඔහුට හිතේ හැටියට මස්
කන්න පුළුවන්.[7] **22** ඔහු පවිත්‍රව
සිටියත් නැතත්[8] මුවන්, ගෝනුන්
වැනි සතුන්ව මරා ආහාරයට ගන්නා
ආකාරයටම[9] ඔහුට අයිති එම සතුන්-
වද මරා ආහාරයට ගත හැකියි.
**23** නමුත් සතාගේ ලේ නොකෑමට
වගබලා ගත යුතුයි.[10] මන්ද සතා-
ගේ ජීවය රැඳී තිබෙන්නේ ලේව-
ලයි.[11] ඒ නිසා ඔබ මස් සමඟ
ලේ නොකෑ යුතුයි. **24** එය කිසි
ලෙසකින්වත් නොකා බිමට වත්
කරන්න.[12] **25** යෙහෝවා දෙවි ඉදි-
රියේ ඔබ හරි දේ කරමින්[13] ලේ
කෑමෙන් වැළකී සිටින්න. ඔබ එසේ
කළොත් එය ඔබෙත් ඔබේ දූපු-
තුන්ගෙත් යහපතට හේතු වෙයි.[14]
**26** ඔබ පරිත්‍යාග කරන ශුද්ධ දේ-
වල්ද[15] භාරයක් ලෙස ඔප්පු කරන
දේවල්ද[16] යෙහෝවා දෙවි නියම
කරන ස්ථානයට රැගෙන යා යුතුයි.[17]
**27** ඔබ දවන පූජාවට[18] ගෙනෙන
සතාගේ මස් සමඟ උගේ ලේද[19] යෙ-
හෝවා දෙවිගේ පූජාසනය මත ඔප්පු
කළ යුතුයි. පූජා කරන සතුන්ගේ ලේ

**12 පරි.**
1 ද්වි 14:26; 1රාජා 8:66; නෙහෙ 8:10; පිලි 4:4
2 ගණන් 18:24; ද්වි 10:9; ද්වි 14:29; යොෂු 13:14
3 ලෙවී 17:4; 1රාජා 12:28
4 2ලේක 7:12
5 ද්වි 12:21; ද්වි 14:26
6 ද්වි 14:5; ද්වි 15:22
7 ලෙවී 5:2; ලෙවී 13:3
8 උත් 9:4; ලෙවී 7:26; ලෙවී 17:10; ද්වි 15:23; 1සාමු 14:33; එස 33:25; ක්‍රියා 15:29
9 ලෙවී 17:13; ද්වි 15:23
10 ද්වි 14:22
11 ද්වි 12:6; ද්වි 14:23
12 ලෙවී 23:38
13 ගණන් 18:11
14 ද්වි 12:11; ද්වි 14:23

**2 තීරුව**
1 ද්වි 12:7; ද්වි 12:12; පිලි 3:1
2 ගණන් 18:21; ද්වි 14:27; 2ලේක 31:4; නෙහෙ 10:38; මලා 3:8
3 උත් 15:18; නික් 34:24; ද්වි 11:24
4 1රාජා 4:21
5 ලෙවී 11:2; ද්වි 14:4
6 ද්වි 14:23; 2ලේක 7:12
7 ද්වි 12:15
8 ලෙවී 15:3; ලෙවී 15:16
9 ද්වි 14:5; ද්වි 15:22
10 ලෙවී 3:17; ද්වි 12:16
11 උත් 9:4; ලෙවී 17:11; ලෙවී 17:14
12 ලෙවී 17:13; ද්වි 15:23
13 ද්වි 6:18; ද්වි 13:18
14 ද්වි 4:40; යෙසා 3:10
15 ගණන් 5:9; ගණන් 18:19
16 ලෙවී 22:18
17 ද්වි 12:11

**18** ලෙවී 1:9; **19** ලෙවී 17:11.

යෙහෝවා දෙවිගේ පූජාසනයේ පාමු-
ලට වත් කළ යුතුයි.[1] නමුත් උගේ
මස් කන්න ඔබට අවසර තිබෙනවා.
**28** “මා ඔබට කියා දෙන මේ සෑම
දෙයකටම කීකරු වන්න ඔබ වගබලා
ගත යුතුයි.[2] ඔබ යෙහෝවා දෙවිට
කීකරු වී ඔහුට ප්‍රසන්න වූ යහපත් දේ
කළොත්[3] ඔබටත් ඔබේ දූපුතුන්ටත්
සදහටම යහපත් ප්‍රතිඵල අත් වෙයි.[4]
**29** “ඔබේ දෙවි වන යෙහෝවා
ඔබ හිමි කරගන්නා දේශයේ
සිටින ජාතීන්ව විනාශ කර දැමූ
පසු[5] ඔබ ඔවුන්ගේ දේශයේ පදිංචි
විය යුතුයි.[6] **30** නමුත් කල්පනා-
කාරී වන්න. ඔවුන්ව විනාශ කළ
පසු ඔබට ඔවුන්ගේ දෙවිවරුන් ගැන
කුතුහලයක් ඇති වුණොත් එය ඔබේ
විනාශයට හේතු වෙන්න පුළුවන්.[7]
‘ඒ ජාතීන් ඔවුන්ගේ දෙවිවරුන්ට
නමස්කාර කළේ කොහොමද’ කියා
ඔබ අතරේ කතා වී, ‘අපිත් ඒ
දේම කරමුද’ කියා ඔබ පවසන්නත්
ඉඩ තිබෙනවා. **31** ඔබේ දෙවි වන
යෙහෝවාට විරුද්ධව එවැනි දෙ-
යක් නොකිරීමට වගබලා ගන්න.[8] ඒ
ජාතීන් තම දෙවිවරුන්ට නමස්කාර
කරද්දී යෙහෝවා දෙවි පිළිකුල් කරන
සෑම දුෂ්ට දෙයක්ම කරනවා. ඔවුන්
නිතරම තමන්ගේ දූපුතුන්ව පවා
ගින්නෙන් දවා ඒ දෙවිවරුන්ට ඔප්පු
කරනවා.[9] **32** ඒ නිසා මා ඔබට
කියා දෙන මේ සෑම අණක්ම පිළිපැදී-
මට ඔබ වගබලා ගත යුතුයි.[10]
එයට කිසි දෙයක් එකතු කරන්නවත්
එයින් කිසි දෙයක් ඉවත් කරන්නවත්
එපා.[11]

**13** “සමහරවිට ඔබ අතරින්
කෙනෙක් අනාගතවක්තෘව-
රයෙකු[12] ලෙස හෝ සිහින දකින්-
නෙකු[13] ලෙස පෙනී සිට ඔබට යම්
ලකුණක් දිය හැකියි.[14] **2** ඔහු දුන්
ලකුණ සැබෑ වෙන්නත් පුළුවන්.[15]
නමුත් ඔහු, ‘අපි දන්නේ නැති වෙ-
නත් දෙවිවරුන් ළඟට ගොස් ඒ දෙ-
විවරුන්ට නමස්කාර කරමු’ කියා
පැවසුවොත් **3** ඒ අනාගතවක්තෘ
හෝ සිහින දකින්නා පවසන දේවලට
ඔබ සවන් නොදිය යුතුයි.[1] එවැනි දෙ-
යකින් යෙහෝවා දෙවි ඇත්තටම
බලන්නේ[2] ඔබේ මුළු හදවතින්ම ඔබ
ඔහුට ප්‍රේම කරනවාද කියායි. ඒ
වගේම ඔහු වෙනුවෙන් ඔබේ මුළු ජීවි-
තයම කැප කර තිබෙනවාද කියාත්
යෙහෝවා දෙවි බලනවා.[3] **4** ඔබ
ජීවත් විය යුත්තේ ඔබේ දෙවි වන
යෙහෝවා දෙන මඟ පෙන්වීම්වලට
අනුවයි. ඔබ ඔහුට ගරුබිය දක්ව-
මින් ඔහුගේ අණපනත් පිළිපැදිය
යුතුයි. ඔබ සවන් දිය යුත්තේ දෙවි-
ගේ හඬට පමණයි. ඔහුට නමස්-
කාර කරමින් නිතරම ඔහු මතම
රඳා සිටින්න.[4] **5** ඒ අනාගතවක්-
තෘවරයා[5] හෝ සිහින දකින්නා උත්-
සාහ කරන්නේ යෙහෝවා දෙවිට
විරුද්ධව කැරලිගැසීමට ඔබව පො-
ළඹවා දෙවි දෙන මඟ පෙන්වීම්වලින්
ඔබව ඉවත් කරන්නයි.[6] ඒ නිසා ඔහුව
මරා දැමිය යුතුයි.[7] ඔහුව මරා දමා
ඒ දුෂ්ටකම ඔබ අතරින් සම්පූර්ණ-
යෙන්ම ඉවත් කරන්න.[8] ඊජිප්තුවේ
වහලුන්ව සිටි ඔබව බේරාගත්තේ
ඔබේ දෙවි වන යෙහෝවා බව මතක
තබාගන්න.
**6** “ඔබේ පුතා හෝ දුව හෝ
ඔබේම ආදරණීය බිරිඳ හෝ එක
කුසේ උපන් ඔබේම සහෝදරයා
හෝ ඔබේ කිට්ටුම මිත්‍රයා[9] හෝ
රහසින් ඇවිත්, ‘අපි ගිහින් වෙ-
නත් දෙවිවරුන්ට නමස්කාර කර-
මුද’[10] කියා අසමින් ඔබව වරදට
පොළඹවන්න ඉඩ තිබෙනවා. මෙසේ,
ඔබවත් ඔබේ මුතුන්මිත්තන්වත් අසා
නැති දෙවිවරුන්ට නමස්කාර කිරීමට
ඔවුන් ඔබව දිරිගන්වන්න පුළුවන්.
**7** නමුත් ඒ දෙවිවරුන් ඔබ අවට
සිටින වෙනත් ජාතීන්ගේ දෙවිව-
රුන් බව මතක තබාගන්න. **8** ඒ
නිසා ඔබ ඔවුන්ගේ ඉල්ලීමට එකඟ
නොවිය යුතුයි. ඊට කොහොමටවත්
සවන් දෙන්න එපා.[11] එවැනි දෙය-
කට ඔබව පොළඹවන්න උත්සාහ
කළ ඒ පුද්ගලයාට කිසිම අනුකම්පා-

**12 පරි.**
1 ලෙවී 4:30
2 ගීතා 89:31
ගීතා 105:45
1යොහ 5:3
3 හිතෝ 4:4
4 ගලා 6:7
5 නික් 23:23
ද්වි 9:3
ද්වි 19:1
ගීතා 44:2
ගීතා 78:55
6 ද්වි 6:10
ගීතා 105:44
7 ද්වි 7:16
ගීතා 106:36
එස 20:28
එෆී 4:17
8 ලෙවී 18:3
ද්වි 12:4
9 ලෙවී 18:21
ලෙවී 20:2
ද්වි 18:10
2රාජා 17:15
යෙරෙ 32:35
10 ද්වි 5:1
යොෂු 22:5
ගීතා 119:4
11 ද්වි 4:2
යොෂු 1:7
හිතෝ 30:6

**13 පරි.**
12 ද්වි 18:22
යෙරෙ 6:13
එස 13:2
සෙක 13:4
13 යෙරෙ 23:25
යෙරෙ 27:9
14 මාක් 13:22
2තෙස 2:9
15 යෙරෙ 28:9
මතෙ 7:22

**2 තීරුව**
1 යෙසා 8:19
2 ද්වි 8:2
ගීතා 66:10
මතෙ 24:24
1කොරි 11:19
2තෙස 2:11
3 ද්වි 6:5
ද්වි 10:12
මතෙ 22:37
4 ද්වි 10:20
5 යෙසා 9:15
6 ද්වි 6:14
7 ද්වි 18:20
යෙරෙ 14:14
සෙක 13:3
8 ද්වි 17:7
1කොරි 5:13
9 1සාමු 18:1
10 1රාජා 11:4
2පේත 2:1
11 හිතෝ 1:10
ගලා 1:8

වක් නොපෙන්වන්න.[1] ඔහුට කිසිම
ආරක්ෂාවක් දෙන්න එපා. ඔහු ගැන
දුක් වෙන්නත් එපා. **9** ඔබ අනිවාර්-
යයෙන්ම ඔහුව මරා දැමිය යුතුයි.[2]
ඔහුව මරා දමන්න මුල්ම ගල එසවිය
යුත්තේ ඔබයි. ඉන්පසුව සෙනඟටත්
ඊට හවුල් විය හැකියි.[3] **10** ගල්
ගසා ඔහුව මරා දැමිය යුත්තේ[4] ඊජිප්-
තුවෙන් ඔබව නිදහස් කළ ඔබේ
දෙවි වන යෙහෝවාගෙන් ඔහු ඔබව
ඈත් කරන්න උත්සාහ කළ නිසයි.[5]
**11** ඒ සිද්ධිය සියලුම ඊශ්‍රායෙල්ව-
රුන්ට ආරංචි වූ විට, ඔවුන් ඒ ගැන
බිය වී ඔබ අතරේ එවැනි දුෂ්ට දෙයක්
නැවත කිසිදා සිදු නොකරයි.[6]

**12** "ඔබේ පදිංචිය සඳහා යෙ-
හෝවා දෙවි ඔබට ලබා දෙන යම්
නුවරකින් ඔබට මෙවැනි දෙයක්
ආරංචි විය හැකියි. **13** 'කිසි කම-
කට නැති පිරිසක්,[7] "අපි දන්නේ
නැති වෙනත් දෙවිවරුන්ට නමස්කාර
කරමු" කියා පවසමින් නුවරේ වැසි-
යන්ව නොමඟ යවන්න උත්සාහ කර-
නවා.'[8] **14** ඔබ ඒ ගැන හොඳින්
සොයා බැලිය යුතුයි.[9] ඊශ්‍රායෙල් සෙ-
නඟ අතරේ එවැනි පිළිකුල්සහගත
දෙයක් සිදු වී ඇති බව ඔප්පු වුණොත්
**15** ඔබ ඒ නුවරේ වැසියන්ව කඩු-
වෙන් මරා දැමිය යුතුයි.[10] ඒ නුවරේ
සිටින සියලුදෙනාවත් ඔවුන් ඇති
කරන සතුන්වත් මරා දමා, එහි
ඇති සියල්ල සම්පූර්ණයෙන්ම විනාශ
කර දැමිය යුතුයි.[11] **16** ඒ නුවරෙන්
එකතු කරගත් සියලු දේ ගෙනැ-
විත් එහි ප්‍රධාන මංසන්ධියේ ගොඩ-
ගසන්න. ඉන්පසුව නුවරත් එයින්
එකතු කරගත් සියලු දේත් යෙහෝවා
දෙවිට පූජාවක් ලෙස මුළුමනින්ම දවා
දැමිය යුතුයි.[12] එය සදහටම නටබුන්
ගොඩක් විය යුතු අතර[13] එය නැවත
ඉදි කිරීමට ඔබට අවසර නැහැ.
**17** දෙවි නියෝග කළ ලෙස විනාශ
කළ යුතු කිසි දෙයක් ඔබේ පෞද්ග-
ලික ප්‍රයෝජනයට නොගත යුතුයි.[14]
ඔබ ඒ සියල්ල විනාශ කළ විට යෙ-
හෝවා දෙවිගේ දැවෙන උදහස පහ වී
යන අතර[1] ඔහු ඔබට දයාව පෙන්-
වයි.[2] දෙවි ඔබේ මුතුන්මිත්තන්ට
පොරොන්දු වූ ලෙස ඔබට ආශීර්වාද
කර ඔබේ සෙනඟ බොහෝ සෙයින්
වැඩිවීමට සලස්වයි.[3] **18** ඔබ නිත-
රම යෙහෝවා දෙවිට ප්‍රසන්න දේ කළ
යුතුයි.[4] ඒ නිසා අද මා ඔබට කියා
දෙන යෙහෝවා දෙවිගේ සියලුම අණ-
පනත් පිළිපැද ඔහුගේ හඬට කීකරු
වන්න.[5]

**14** "ඔබ සියලුදෙනා යෙහෝවා
දෙවිගේ දරුවෝ.[6] ඒ නිසා
මිය ගිය කෙනෙක් වෙනුවෙන් ඔබේ
සිරුර තුවාල[7] කරගන්නවත් ඔබේ
ඇහි බැම් බූ[8] ගාන්නවත් එපා.
**2** ඔබ එසේ නොකළ යුත්තේ ඔබේ
දෙවි වන යෙහෝවා ඉදිරියේ ඔබ
ශුද්ධ සෙනඟක්[9] වන නිසයි. මේ පො-
ළොවේ සිටින සියලුම ජාතීන් අතරින්
තමාට විශේෂ සෙනඟක්[10] ලෙස යෙ-
හෝවා දෙවි තෝරාගෙන තිබෙන්නේ
ඔබව පමණක් බව නිතරම මතක
තබාගන්න.

**3** "ඔබ කිසිම පිළිකුල්සහගත දෙ-
යක් ආහාරයට නොගත යුතුයි.[11]
**4** ගවයන්, බැටළුවන්, එළුවන්,[12]
**5** වල් එළුවන්, වල් බැටළුවන්, විවිධ
මුව වර්ග*[13] සහ **6** කුර දෙකට බෙ-
දුණු, වමාරා කන සියලුම සතුන්ව[14]
ආහාරයට ගන්න ඔබට පුළුවන්.
**7** නමුත් එම සතුන් අතරින් ඔබ
නොකෑ යුතු සතුන් නම් ඔටුවන්,[15]
හාවුන්[16] සහ බෙන්හාවුන්.[17] උන්
වමාරා කන නමුත් උන්ගේ කුර බෙදී
නැති නිසා උන්ව සැලකිය යුත්තේ
අපවිත්‍ර සතුන් ලෙසයි. **8** ඌරාත්[18]
අපවිත්‍ර සතෙක්. උගේ කුර බෙදී තිබු-
ණත් ඌ වමාරා කන්නේ නැති නිසා
ඌව අපවිත්‍ර සතෙක් ලෙස සැල-
කිය යුතුයි. මේ සතුන්ගේ මස් ඔබ
කිසි ලෙසකින්වත් අනුභව නොකළ

**13 පරි.**
1 එස 9:5
2 නික් 22:20; නික් 32:27; ගණන් 25:5
3 ද්වි 17:7
4 ලෙවී 20:2; ලෙවී 20:27; ද්වි 17:5
5 නික් 13:3
6 ද්වි 17:13; ද්වි 19:20; 1තිමෝ 1:20; 1තිමෝ 5:20
7 1සාමු 2:12; 1රාජා 21:10; යූද් 19
8 2රාජා 17:21
9 ද්වි 17:4; ද්වි 19:15; 1තිමෝ 5:19; හෙබ්‍රෙ 10:28
10 2ලේක 28:6
11 නික් 22:20; ලෙවී 27:28
12 යොෂු 6:24
13 යොෂු 8:28; යෙරෙ 49:2; මීකා 1:6
14 යොෂු 6:18; යොෂු 7:1

**2 තීරුව**
1 යොෂු 7:26; යොෂු 22:20
2 නික් 33:19; ගීතා 78:38
3 උත් 22:17; උත් 26:4; උත් 28:14
4 නික් 15:26; ද්වි 6:18
5 ද්වි 12:32; නෙහෙ 1:5; ගීතා 119:4; 1යොහ 5:3

**14 පරි.**
6 යෙසා 63:16; යෙසා 64:8; යෙරෙ 3:19; 1කොරි 8:6
7 ලෙවී 19:28; යෙරෙ 16:6
8 ලෙවී 21:5
9 නික් 19:6; ලෙවී 19:2; ලෙවී 20:26; ද්වි 28:9; එස්රා 9:2; 1පේතෘ 1:15
10 නික් 19:5; ද්වි 7:6; ද්වි 26:18
11 ලෙවී 11:43; ලෙවී 20:25; එස 4:14; ක්‍රියා 10:14
12 ලෙවී 11:2
13 1රාජා 4:23
14 ලෙවී 11:3

**15** ලෙවී 11:4; **16** ලෙවී 11:6; **17** ලෙවී 11:5; **18** ලෙවී 11:7; යෙසා 65:4; යෙසා 66:17.

**ද්වි 14:5*** මුල් භාෂාවේ මුව වර්ග පහක් සඳහන් වේ.

යුතුයි. උන්ගේ මළ කුණකටවත් අත
තබන්න එපා.[1]
**9** “මසුන්ගෙන් ඔබට ආහාරයට
ගත හැක්කේ වරල් සහ කොරපොතු
ඇති මසුන් පමණයි.[2] **10** වරල් සහ
කොරපොතු නැත්නම් උන්ව අනුභව
කරන්න එපා.[3] උන් අපවිත්‍රයි.
**11** “පවිත්‍රයයි සලකන සියලු
කුරුල්ලන් ආහාරයට ගන්න ඔබට
පුළුවන්. **12** නමුත් ඔබ ආහාරයට
නොගත යුතු කුරුල්ලන් නම් රාජා-
ලියන්, කලු ගිජුලිහිණියන්, මාළු
උකුස්සන්,[4] **13** රතු උකුස්සන්,
කලු උකුස්සන්[5] සහ වෙනත් වර්-
ගයේ උකුස්සන්.* **14** කපුටන්වත්[6]
ආහාරයට නොගන්න. **15** පැස්බ-
රුන්,[7] බස්සන්, මුහුදු කපුටන්, කුරු-
ලුගොයන්, **16** කුඩා බස්සන්, කන්
දිග බස්සන්,[8] හංසයන්, **17** පැස්තු-
ඩුවන්,[9] ගිජුලිහිණියන්, දියකාවුන්,
**18** මානකොකුන් ඇතුළු වෙනත්
කොක්කු වර්ග මෙන්ම පොරෝ
කුරුල්ලන් සහ වවුලන්[10] යනාදි පක්-
ෂීන්වද අනුභව නොකරන්න.
**19** මීට අමතරව රංචු පිටින් පියාසර
කරන කෘමීන්ද අපවිත්‍රයයි සැල-
කිය යුතුයි.[11] උන්ව ආහාරයට නො-
ගන්න. **20** නමුත් පියාසර කරන
සතුන් අතරින් පවිත්‍රයයි සැලකෙන
ඕනෑම සතෙක්ව ආහාරයට ගන්න
ඔබට පුළුවන්.
**21** “මිය ගිය සතෙකුව ඔබට සම්බ
වුණොත් ඔබ උෟව ආහාරයට නො-
ගත යුතුයි.[12] ඔබ සමඟ වාසය කරන
විදේශිකයෙක් ඒ සතාව ආහාරයට
ගන්න කැමති නම් ඔහුට ඒ සතාව
දෙන්න පුළුවන්. එසේ නැත්නම් වෙ-
නත් ජාතියකට අයත් කෙනෙකුට ඒ
සතාව විකිණිය හැකියි. යෙහෝවා
දෙවි ඔබව ශුද්ධ සෙනඟක් ලෙස සල-
කන බව සෑමවිටම මතක තබා-
ගන්න.
“එළු පැටියෙකුව උගේම මවගේ
කිරිවලින් පිස කෑමට නොගන්න.[13]

**22** “වර්ෂයක් වර්ෂයක් පාසා ඔබේ
කෙත්වතුවලින් නෙළාගන්නා අස්-
වැන්නෙන් දසයෙන් කොටසක් ඔබ
වෙන් කරගත යුතුයි.[1] **23** ඔබේ
ධාන්‍ය අස්වැන්නෙන්,[2] ඔබ අලුතින්
පෙරූ වයින්වලින් හා ඔබ නිපදවූ
තෙල්වලින් වෙන් කරගත් දසයෙන්
කොටසත් ඔබ ගව රැළෙන් හා එළු
බැටළු රැළෙන් ගත් කුලුඳුල් සතුන්-
වත්[3] යෙහෝවා දෙවි තම නාමය දැරී-
මට තෝරාගත් ස්ථානයට ගෙන
ගොස් ආහාරයට ගත යුතුයි. එසේ
කිරීමෙන් ඔබේ දෙවි වන යෙහෝවාට
නිතරම ගරුබිය ඇතුව ජීවත් වෙන්න
ඔබ ඉගෙනගනියි.[4]
**24** “ඔබ පදිංචි වී සිටින ස්ථානය
යෙහෝවා දෙවි තම නාමය දැරීමට
තෝරාගන්නා ස්ථානයෙන්[5] බොහෝ
ඈතක පිහිටා තිබෙන්න පුළුවන්.[6]
ඔබ වෙන් කරගත් ඒ සියල්ල රැගෙන
දෙවි නියම කළ ස්ථානයට ගමන්
කරන්න ඔබට අපහසු නම් කළ
යුත්තේ මෙයයි. යෙහෝවා දෙවිගේ
ආශීර්වාදය ඇතුව[7] **25** ඔබ එකතු
කරගත් සියල්ල විකුණා ඒ මුදල
රැගෙන යෙහෝවා දෙවි තම නාමය
දැරීමට තෝරාගත් ස්ථානයට ගමන්
කරන්න. **26** ඒ මුදල්වලින් ඔබට
කැමති දෙයක්[8] එනම්, ගවයන්, බැට-
ළුවන්, එළුවන්, වයින් සහ මත්පැන්[9]
ආදි ඕනෑම දෙයක් මිල දී ගන්න පුළු-
වන්. ඉන්පසුව ඔබටත් ඔබේ පවුලේ
සාමාජිකයන්ටත් ඔබේ දෙවි වන යෙ-
හෝවා ඉදිරියේ කෑම කා ප්‍රීති විය
හැකියි.[10] **27** ඔබේ නුවරේ පදිංචි වී
සිටින ලෙවීවරුන්ට දේශයේ කොට-
සක් උරුම වී නැති නිසා[11] ඔවුන්වද
අමතක කරන්න එපා.[12]
**28** “සෑම අවුරුදු තුනකට වරක්,
ඔබට ලැබෙන මුළු අස්වැන්-
නෙන් වෙන් කරගන්නා දසයෙන්
කොටස[13] ඔබ ජීවත් වන නුවරේ
යම් ස්ථානයක ගොඩගසා තැබිය
යුතුයි. **29** ඔබ ගොඩගැසූ එම අස්-
වැන්නෙන් තමන්ට අවශ්‍ය ප්‍රමාණය
රැගෙන යෑමට, ඔබේ නුවරේ ජීවත්

**14 පරි.**
**1** ලෙවී 11:8
**2** ලෙවී 11:9
**3** ලෙවී 11:10
**4** ලෙවී 11:13
**5** ලෙවී 11:14
**6** ලෙවී 11:15
**7** ලෙවී 11:16
**8** ලෙවී 11:17
**9** ලෙවී 11:18
**10** ලෙවී 11:19
**11** ලෙවී 11:20
**12** නික් 22:31, ලෙවී 17:15, ලෙවී 22:8, එස 4:14
**13** නික් 23:19, නික් 34:26

**2 තීරුව**
**1** ද්වි 12:11, ද්වි 26:12
**2** ද්වි 12:6
**3** ද්වි 12:17, ද්වි 15:19
**4** ගීතා 5:7, ගීතා 19:9, ගීතා 111:10, හිතෝ 8:13, යෙසා 8:13, හෙබ්‍රෙ 12:28
**5** ද්වි 12:5
**6** නික් 23:31, ද්වි 11:24, ද්වි 12:21
**7** නික් 23:25, ද්වි 28:5, හිතෝ 10:22, මලා 3:10
**8** ද්වි 12:15
**9** ගණන් 28:7
**10** ද්වි 12:7, ද්වි 26:11, ගීතා 100:2
**11** ගණන් 18:20, ගණන් 26:62, ද්වි 10:9, යොෂු 14:3
**12** ගණන් 18:21, ද්වි 12:19, 2ලේක 31:4, 1කොරි 9:13
**13** ද්වි 26:12

**ද්වි 14:13*** නාඳුනන උකුසු වර්ගයක්.

වන විදේශිකයන්ට,[1] පියා නැති දරු-
වන්ට, වැන්දඹුවන්ට[2] හා දේශයෙන්
උරුමයක් නොලබන ලෙවීවරුන්ට[3]
හැකියි. ඔබ මෙසේ ක්‍රියා කළොත්
ඔබේ දෙවි වන යෙහෝවා ඔබ කරන
සියල්ලට[4] ආශීර්වාද[5] කරයි.

**15** “ඔබට ණය වී සිටින
තැනැත්තාට සෑම හත් අවු-
රුද්දකටම වරක් ඔබ යම් සහනයක්
ලබා දිය යුතුයි. **2** එය සිදු විය
යුත්තේ මෙයාකාරයටයි.[6] ණයහිමියා
තමාගෙන් ණය ලබාගත් තැනැත්-
තාගෙන් ඒ අවුරුද්දේදී ණය පියවීමක්
බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ
නිසා එම අවුරුද්දේදී තමාට ණය ගෙ-
වන ලෙස ණයහිමියා ඔහුට කරදර
නොකළ යුතුයි.[7] එයට හේතුව ඒ
අවුරුද්ද යෙහෝවා දෙවිට ගෞර-
වය ගෙන දීමේ අරමුණින් දේශ-
යේ වැසියන්ට සහනයක් ලබා දීමට
වෙන් කළ අවුරුද්දක් වන නිසයි.[8]
**3** නමුත් විදේශිකයෙකුට[9] මේ සහ-
නය නොලැබෙයි. ඊශ්‍රායෙල් ජාති-
කයෙකු ඔබට ණය වී ඇත්නම්
ඔහුට මෙම සහනය ලබා දිය යුතුයි.
**4** යෙහෝවා දෙවි ඔබට උරුමයක්
ලෙස ලබා දෙන දේශයේදී[10] ඔබ සිය-
ලුදෙනාටම යෙහෝවා දෙවිගේ ආශීර්-
වාද නොඅඩුව ලැබෙයි.[11] ඒ නිසා
ඔබ අතරේ සිටින කිසිම කෙනෙ-
කුට දිළිඳු වීමට හේතුවක් නැහැ.
**5** එවැනි සමෘද්ධිමත් තත්වයක් ඔබ
අතරේ ඇති වෙන්නේ මම අද ඔබට
කියා දෙන යෙහෝවා දෙවිගේ සියලුම
අණපනත් ඔබ පිළිපැද ඔහුගේ වචන-
යට හොඳින් කන් දුන්නොත් පම-
ණයි.[12] **6** ඔබ එසේ කරනවා නම්
යෙහෝවා දෙවි පොරොන්දු වූ ලෙස
ඔහු ඔබට අනිවාර්යයෙන්ම ආශීර්-
වාද කරයි. ඔබට කවදාවත් වෙනත්
ජාතීන්ට ණය[13] වෙන්න සිදු වන්නේ
නැහැ. ඒ වෙනුවට ඔවුන්ට ණයට
දෙන්න ඔබට හැකි වෙයි. එසේම
ඔබට කවදාවත් වෙනත් ජාතීන් යට-
තේ සිටින්න සිදු වන්නෙත් නැහැ.
ඒ වෙනුවට ඔවුන්ට ඔබ යටතේ
සිටින්න සිදු වෙයි.[1]
**7** “නමුත් යෙහෝවා දෙවි ඔබට
ලබා දෙන දේශයේ යම් නුවරක
ජීවත් වන ඔබේම සහෝදරයෙක්
දිළිඳු වී අසරණ වුණොත් ඔබ ඔහුට
අනුකම්පාව දැක්විය යුතුයි. ලෝභ
නොවී ඔහුට අවශ්‍ය උපකාර ලබා
දෙන්න.[2] **8** ත්‍යාගශීලීව ඔහුට අත-
හිත දෙන්න.[3] අදිමදි නොකර ඔහුට
අවශ්‍ය දේ ණයට දෙන්න. **9** නමුත්,
‘ණය සහනය ලබා දෙන හත්වන අවු-
රුද්ද ළඟටම ඇවිත්’[4] කියා සිත-
මින් ඔබේ දුප්පත් සහෝදරයාට කිසි
උපකාරයක් නොකර සිටින්න ඔබ
තීරණය කරන්න පුළුවන්.[5] එවැනි
අවස්ථාවකදී ඔබේ අසරණ සහෝදර-
යාට ඔබ උපකාර නොකළ නිසා ඔහු
යෙහෝවා දෙවිට අඬමින් කන්නලව්
කළොත්[6] ඔබ දෙවි ඉදිරියේ වරදක-
රුවෙක් වෙයි.[7] එවැනි නපුරු සිතුවිල්-
ලකට ඉඩ නොදෙන්න.[8] **10** අදිමදි
නොකර ඔබේ සහෝදරයාට අවශ්‍ය
උපකාරය ලබා දෙන්න.[9] ඔබ එසේ
කළොත් ඔබ කරන සෑම දෙයකදීම
යෙහෝවා දෙවිගේ ආශීර්වාද ඔබට
ලැබෙයි.[10] **11** ‘ඔබ අතරේ ජීවත්
වන ඔබේ දුප්පත් සහෝදරයාට ඔබ
ලෝභ නොවී අතහිත දිය යුතුයි’[11]
කියා මා ඔබට පවසන්නේ දේශයේ
අසරණ වූ දුප්පතුන් හැමදාමත් ඔබ
සමඟ සිටින නිසයි.[12]
**12** “හෙබ්‍රෙව් ජාතික පුරුෂයෙක්ව
හෝ ස්ත්‍රියක්ව[13] මෙහෙකාරක-
මට ඔබට විකුණනු ලැබුවොත් ඒ
තැනැත්තා අවුරුදු හයක් පුරා ඔබට
සේවය කළ යුතුයි. නමුත් හත්-
වන අවුරුද්දේදී ඔහුට නිදහස ලබා
දෙන්න.[14] **13** ඔබ ඔහුව නිදහස් කර
යවන විට හිස් අතින් යවන්න එපා.[15]
**14** ඔහුව නිදහස් කර යවන විට
ඔබේ රැළෙන් සතුන් කිහිපදෙනෙකුත්

**14 පරි.**
1 නික් 22:21, ද්වි 10:18
2 ද්වි 26:12, යාකො 1:27
3 ද්වි 12:12
4 හිතෝ 11:24, හිතෝ 19:17, ලූක් 6:35
5 ද්වි 15:10, ගීතා 41:1, මලා 3:10

**15 පරි.**
6 ලෙවී 25:2
7 යාකො 2:13
8 ද්වි 31:10
9 නික් 12:43, ද්වි 14:21, ද්වි 23:20
10 ගණන් 33:53, ගීතා 135:12
11 ද්වි 14:29, ද්වි 28:8, හිතෝ 11:25, හිතෝ 14:21, හිතෝ 28:27
12 ද්වි 4:40, යොෂු 1:7, යෙසා 1:19
13 ද්වි 28:12, හිතෝ 22:7

**2 තීරුව**
1 ද්වි 28:13, 1රාජා 4:24
2 හිතෝ 21:13, යාකො 2:16, 1යොහ 3:17
3 ලෙවී 25:35, ගීතා 37:26, හිතෝ 19:17, මතෙ 5:42, ලූක් 6:35, ගලා 2:10
4 ද්වි 15:1
5 හිතෝ 28:22, 1පේත්‍ 4:9
6 නික් 22:23, ද්වි 24:15, යෝබ් 34:28, හිතෝ 21:13, යාකො 5:4
7 මතෙ 25:45, යාකො 4:17
8 හිතෝ 4:23, යෙරෙ 17:10, මතෙ 15:19
9 ක්‍රියා 20:35, 2කොරි 9:7, 1තිමෝ 6:18, හෙබ්‍රෙ 13:16
10 ද්වි 15:4, ද්වි 24:19, ගීතා 41:1, හිතෝ 22:9, යෙසා 32:8, 2කොරි 9:8

**11** හිතෝ 3:27; මතෙ 5:42; ලූක් 12:33; ක්‍රියා 2:45; **12** මතෙ 26:11; **13** නික් 21:2; ලෙවී 25:39; **14** ද්වි 15:1; යෙරෙ 34:14; **15** නික් 3:21; නික් 12:36; හිතෝ 3:27; කොලෝ 4:1.

ධාන්‍ය, වයින් සහ තෙල් යනාදියත්
ඔහුට ලබා දෙන්න. යෙහෝවා දෙවි
ඔබට ආශීර්වාද කළ ලෙසම ඔබත්
ඔහුට අවශ්‍ය දේ ලබා දිය යුතුයි.[1]
**15** ඔබ ඊජිප්තු දේශයේ කලක් වහ-
ලුන් ලෙස සිටි බවත් යෙහෝවා දෙවි
ඔබව නිදහස් කරගෙන ආ බවත් කිසි-
විටෙක අමතක නොකරන්න.[2] මා අද
ඔබට මේ දේ අණ කරන්නේ ඒ නිසයි.

**16** “ඔබ මෙහෙකාරකමට ගත්
තැනැත්තා ඔබටත් ඔබේ පවුලේ අය-
ටත් බොහෝ ළැදිව ඉතා ආශාවෙන්
සේවය කළ නිසා, ‘ඔබේ පවුල අත්-
හැර යන්න මම කැමති නැහැ’ කියා
ඔහු පැවසිය හැකියි.[3] **17** එවිට ඔබ
මෙසේ කළ යුතුයි. ඔහුගේ කණ දො-
රට තද කර විදින කටුවකින් විදින්න.
ඔහු ඔබට සැමදා සේවය කරන බවට
එය සංකේතයක් වෙයි.[4] ඔබට දිගටම
සේවය කරන්න කැමති ස්ත්‍රියක-
ටත් ඔබ කළ යුත්තේ ඒ දේමයි.
**18** ඔබට සේවය කළ දාසයෙකුව
නිදහස් කරන්න ඔබ කිසිවිටෙකත්
අදිමදි නොකළ යුතුයි.[5] මන්ද ඔබ
කුලියට ගන්නා සේවකයෙකු කරන
වැඩ මෙන් දෙගුණයක් ඔහු ඔබ වෙනු-
වෙන් කර තිබෙනවා.[6] ඒ විතරක්
නොවෙයි, එම දාසයා ඔබට සේවය
කළ මුළු කාලය පුරා යෙහෝවා දෙවි
ඔබට මොන තරම් ආශීර්වාද කර
තිබෙනවාද![7]

**19** “ඔබේ ගව රැළේ හා එළු බැටළු
රැළේ ඉපදෙන සියලුම පිරිමි කුලුඳුල්
සතුන්ව ඔබ යෙහෝවා දෙවි වෙනු-
වෙන් වෙන් කර තැබිය යුතුයි.[8] රැළේ
සිටින කුලුඳුල් ගවයන්ගෙන් ඔබ
කිසි වැඩක් ගන්න එපා. කුලුඳුල්
බැටළුවන්ගේ ලොම්ද ඔබ නොකැ-
පිය යුතුයි.[9] **20** ඔබත් ඔබේ පවුලේ
අයත් සෑම අවුරුද්දක් පාසාම යෙ-
හෝවා දෙවි තෝරාගන්නා ස්ථාන-
යේදී[10] ඒ සතුන්ව මරා ආහාරයට ගත
යුතුයි. ඔබ යෙහෝවා දෙවි ඉදිරියේ
එය කෑමට ගන්න. **21** නමුත් ඒ
සතුන් ලෙඩ, කොර, අන්ධ සතුන්
නම් උන්ව යෙහෝවා දෙවිට පූජා
නොකරන්න.[1] **22** මුවන් හා ගෝ-
නුන්ව[2] මරා ආහාරයට ගන්නාක්
මෙන් ඔබ පදිංචි වී සිටින ස්ථානයේ
සිටම එම සතුන්ව මරා ආහාරයට
ගන්න ඔබට පුළුවන්. ඔබ පවිත්‍ර තත්-
වයක සිටියත් නැතත් ඔබට ඒ දේ
කළ හැකියි.[3] **23** ඔබට කන්න අව-
සර නැත්තේ උන්ගේ ලේ පමණයි.[4]
එය වතුර මෙන් බිමට වත් කළ
යුතුයි.[5]

**16** “ඔබ යෙහෝවා දෙවිට ගෞ-
රවය දෙන පිණිස පාස්-
කුව සැමරිය යුත්තේ[6] ආබීබ්[7]
මාසයේදීයි. යෙහෝවා දෙවි ඔබව
ඊජිප්තු දේශයෙන් පිටතට ගෙනාවේ
ඒ මාසයේ රාත්‍රියකයි.[8] **2** පාස්කු
උත්සවයේදී ඔප්පු කිරීම සඳහා ඔබේ
රැළෙන් සතෙකුව[9] තෝරාගෙන යෙ-
හෝවා දෙවිට ඔප්පු කරන්න.[10] යෙ-
හෝවා දෙවි තම නාමය දැරීමට
තෝරාගන්නා ස්ථානයේදී උගව ඔප්පු
කරන්න.[11] **3** ඉන්පසුව මුහුන් නො-
දැමූ රොටි සමඟ ඒ සතාව ආහාරයට
ගන්න. එතැන් සිට දවස් හතක් පුරා
මුහුන් දැමූ කිසිවක් ඔබ නොකෑ
යුතුයි.[12] ඔබ ඊජිප්තුවෙන් හදිස්සි-
යේම පිටත් වූ දා[13] කලාක් මෙන්
මුහුන් නොදැමූ රොටි පමණක් ආහා-
රයට ගන්න. එම රොටි ආහාරයට
ගනිද්දී ඔබ අද්දුටු දුක් පීඩා ඔබට සිහි
වෙයි. එසේ කිරීමෙන් ඊජිප්තු දේ-
ශයෙන් ඔබ නිදහස් වූ ආකාරය
ඔබට කිසිදා අමතක නොවෙයි.[14]
**4** ඒ දවස් හත පුරා කිසිවෙක් ළඟ
මුහුන් දැමූ පිටි ටිකක්වත් නොතිබිය
යුතුයි.[15] පළමු දවසේ හවස් වරුවේ
මරා දැමූ සතාගේ මස් ඊළඟ දවස
උදා වන තෙක් තබා නොගන්න.[16]
**5** යෙහෝවා දෙවි ඔබට ලබා දෙන
දේශයේ තෝරාගන්නා ස්ථානයේ
හැර වෙන කිසි නුවරක පාස්කු
උත්සවයට ගන්නා සතාව මැරීමට
ඔබට අවසර නැහැ. **6** නමුත් යෙ-
හෝවා දෙවි තම නාමය දැරීමට
තෝරාගන්නා ස්ථානයට ගොස්[17]
ඔබ ඊජිප්තුවෙන් පිටත් වූ වේලාවේ-

**15 පරි.**
1 හිතෝ 10:22, ක්‍රියා 20:35
2 නික් 20:2, ද්වි 5:15, මතෙ 18:33
3 නික් 21:5
4 නික් 21:6
5 ද්වි 15:10
6 ලෙවී 19:13, ද්වි 24:15
7 උත් 30:30
8 නික් 13:2, නික් 34:19, ලෙවී 27:26, ගණන් 3:13, ගණන් 18:15, ගණන් 18:17
9 නික් 22:30, ද්වි 12:6
10 ද්වි 12:5, ද්වි 14:23, ද්වි 16:11

**2 තීරුව**
1 ලෙවී 22:20, ද්වි 17:1, මලා 1:8, හෙබ්‍රෙ 9:14
2 ද්වි 14:5, 1රාජා 4:23
3 ද්වි 12:15, ද්වි 12:22
4 උත් 9:4, ලෙවී 7:26, ලෙවී 17:10, 1සාමු 14:33, ක්‍රියා 15:20
5 ලෙවී 17:13, ද්වි 12:16

**16 පරි.**
6 නික් 12:14, ලෙවී 23:5, ගණන් 9:2, ගණන් 28:16, 1කොරි 5:7, හෙබ්‍රෙ 11:28
7 නික් 12:2, නික් 13:4
8 නික් 34:18
9 නික් 12:5, 2ලේක 35:7
10 මතෙ 26:17, ලූක් 22:7
11 ද්වි 12:5, 1රාජා 8:29
12 නික් 13:3, ලෙවී 23:6, ගණන් 28:17, 1කොරි 5:8
13 නික් 12:33
14 නික් 12:14, නික් 13:8, නික් 13:9
15 නික් 12:15, නික් 13:7
16 නික් 12:10, නික් 34:25
17 ද්වි 16:2

දීම එනම්, හිරු බැස ගිය වහාම[1]
ඔබ ඒ සතාව මැරිය යුතුයි. **7** යෙ-
හෝවා දෙවි තෝරාගන්නා ස්ථාන-
යේදී[2] එම සතාව පුලුස්සා ආහාරයට
ගන්න.[3] ඔබේ කූඩාරම්වලට ඔබ යා
යුත්තේ පසු දින උදෑසනයි. **8** දවස්
හයක් පුරා මුහුන් නොදැමූ රොටි
ආහාරයට ගන්න. හත්වන දවසේදී
යෙහෝවා දෙවි වෙනුවෙන් විශේෂ
රැස්වීමක්* පවත්වන්න.[4] ඔබ එදින
කිසි වැඩක් නොකළ යුතුයි.

**9** "ඔබේ දැකැත්තෙන් අස්වැන්න
නෙළන්න පටන්ගන්නා දවසේ
සිට සති හතක් ගණන් කරන්න.[5]
**10** යෙහෝවා දෙවිගේ ආශීර්වාද-
යෙන් ඔබට ලැබුණු අස්වැන්නෙන්
දිය හැකි ප්‍රමාණයක්[6] රැගෙන යෙ-
හෝවා දෙවිට ගෞරවය දීම
සඳහා ඒ දවසේදී ඔබ සති උත්සවය
පැවැත්විය යුතුයි.[7] **11** එය පැවැත්-
විය යුත්තේ යෙහෝවා දෙවි තම
නාමය දැරීමට තෝරාගන්නා ස්ථාන-
යේදීයි.[8] එහිදී ඔබද ඔබේ දූපුතුන්ද
ඔබේ දාසදාසීන්ද ඔබේ නුවරේ පදිංචි
වී සිටින ලෙවීවරුන්ද විදේශිකයන්ද[9]
පියා නැති දරුවන්ද[10] වැන්දඹුවන්ද[11]
යෙහෝවා දෙවි ඉදිරියේ ප්‍රීති විය
යුතුයි.[12] **12** ඔබට කියා දී තිබෙන
මේ සෑම නියෝගයක්ම පිළිපැදීමට
වගබලා ගන්න.[13] ඒ වගේම ඔබ ඊජිප්-
තුවේ වහලුන්ව සිටි බව නිතරම
මතක් කරගන්න.[14]

**13** "ඔබේ අස්වැන්න කමතෙන්
ගෙන ගබඩා කළ පසුව හා ඔබේ යන්-
ත්‍රවලින් තෙල් සහ වයින් ගෙන ඒවා
ගබඩා කළ පසුව දවස් හතක් පුරා
පැල් උත්සවය[15] පැවැත්විය යුතුයි.
**14** මේ උත්සවයේදී ඔබේ දූපු-
තුන්ද ඔබේ දාසදාසීන්ද ඔබේ නුවරේ
ජීවත් වන ලෙවීවරුන්ද විදේශිකයන්ද
පියා නැති දරුවන්ද වැන්දඹුවන්ද
ඔබ සමඟ එක්ව ප්‍රීති විය යුතුයි.[16]
**15** යෙහෝවා දෙවිට ගෞරවය දීම
සඳහා ඔබ පවත්වන මෙම උත්සවය
දවස් හතක් පුරා පවත්වන්න.[1] එය
පැවැත්විය යුත්තේ යෙහෝවා දෙවි
තෝරාගන්නා ස්ථානයේදීයි. ඔබේ
අස්වැන්නට මෙන්ම ඔබ කළ සෑම
දෙයකටම යෙහෝවා දෙවිගේ ආශීර්-
වාදය[2] ලැබී තිබෙන නිසා ඔබ ඇත්-
තෙන්ම ප්‍රීතියෙන් ඉපිල යා යුතුයි.[3]

**16** "ඔබේ සෙනඟ අතරේ සිටින
පුරුෂයන් යෙහෝවා දෙවි තෝරා-
ගන්නා ස්ථානයට වසරකට තුන්
වරක් යා යුතුයි.[4] මෙසේ, ඔවුන්
මුහුන් නොදැමූ රොටි උත්සවයේදී,[5]
සති උත්සවයේදී[6] සහ පැල් උත්සව-
යේදී[7] යෙහෝවා දෙවි ඉදිරියේ පෙනී
සිටිය යුතුයි. ඒ සඳහා කිසිවෙකු
හිස් අතින් නොපැමිණිය යුතුයි.[8]
**17** යෙහෝවා දෙවි ඔවුන්ට ආශීර්වාද
කර ඇති ආකාරයට ඔවුනුත් යමක්
පරිත්‍යාග කළ යුතුයි.[9]

**18** "ඔබේ දෙවි වන යෙහෝවා
ඔබට ලබා දෙන සෑම නුවරක-
ටම විනිශ්වයකරුවන්ව[10] හා නිලධා-
රීන්ව[11] පත් කරන්න. ඔවුන්ව එක්
එක් ගෝත්‍ර බලාගැනීමට පත් කළ
යුතු අතර ඔවුන්ගේ වගකීම නම් ජන-
තාව වෙනුවෙන් යුක්තිය හා සාධාර-
ණය ඉටු කිරීමයි. **19** ඔවුන් අතින්
කිසිම ආකාරයක අසාධාරණයක් සිදු
නොවිය යුතුයි.[12] සියල්ලන්ටම එක
හා සමානව සැලකිය යුතු[13] ඔවුන්
අල්ලස් ගැනීමෙන්ද වැළකී සිටිය
යුතුයි. මන්ද හොඳ විනිශ්වයක් දෙන
ඥානවන්තයෙකුව පවා අල්ලසක් දී
නම්මවාගත හැකියි.[14] එයින් ධර්-
මිෂ්ඨ කෙනෙකු වුණත් තමා දුන්
තීන්දුව වෙනස් කරන්න පෙලඹිය
හැකියි. **20** ඔබ යුක්තිය හා සාධා-
රණය ඉටු කළ යුතුමයි.[15] එසේ
කළොත් ඔබේ ජීවිතය ඔබට රැකගත
හැකි වන අතර යෙහෝවා දෙවි ඔබට
ලබා දෙන දේශයේ දිගටම ජීවත්
වෙන්නත් ඔබට හැකි වෙයි.[16]

**16 පරි.**

**1** නික් 12:6
ගණන් 9:3
මතෙ 26:20
**2** 2රාජා 23:23
යොහ 2:13
යොහ 11:55
**3** නික් 12:8
2ලේක 35:13
**4** නික් 12:16
ලෙවී 23:8
**5** නික් 23:16
නික් 34:22
ලෙවී 23:15
**6** ද්වි 16:17
1කොරි 16:2
2කොරි 8:12
**7** ගණන් 28:26
2ලේක 8:13
**8** ද්වි 12:5
**9** ගණන් 15:16
**10** ද්වි 10:18
**11** යාකො 1:27
**12** ද්වි 12:7
**13** දේශ 12:13
1යොහ 5:3
**14** උත් 15:13
නික් 3:7
ද්වි 5:15
**15** නික් 23:16
ලෙවී 23:34
ගණන් 29:12
ද්වි 31:10
සෙක 14:16
යොහ 7:2
**16** ලෙවී 23:40
ද්වි 12:12
ද්වි 26:11
නෙහෙ 8:10
නෙහෙ 8:17
දේශ 5:18

**2 තීරුව**

**1** ලෙවී 23:36
නෙහෙ 8:18
**2** ද්වි 7:13
ද්වි 28:8
ද්වි 30:16
**3** පිලි 4:4
1තෙස 5:16
**4** නික් 23:14
නික් 34:23
**5** නික් 23:15
ලෙවී 23:6
ගණන් 28:17
**6** ද්වි 16:10
**7** ද්වි 16:13
**8** නික් 23:15
නික් 34:20
ගීතා 96:8
**9** ද්වි 16:10
2කොරි 8:12
**10** නික් 18:26
ද්වි 1:16
2ලේක 19:5
**11** ගණන් 11:16
1ලේක 23:4
**12** නික් 23:2
ලෙවී 19:15
1සාමු 8:3

**13** ද්වි 1:17; හිතෝ 24:23; ක්‍රියා 10:34; **14** නික් 23:8; 1සාමු 12:3; දේශ 7:7; ආමො 5:12; **15** ද්වි 25:16; එස 18:8; මීකා 6:8; **16** ද්වි 4:1.

---

**ද්වි 16:8*** ඊජිප්තුවෙන් නිදහස් වූ දා සැමරීමට එදින උත්සවයක් පවත්වන ලදි.

**21** "ඔබ යෙහෝවා දෙවි වෙනු-
වෙන් සාදන පූජාසනය අසල නමස්-
කාර කරන පිණිස කුලුනක් ලෙස
ගසක් පැළ නොකළ යුතුයි.[1]
**22** "නමස්කාර කරන පිණිස කණු-
වක්ද ඉදි නොකළ යුතුයි.[2] මන්ද යෙ-
හෝවා දෙවි එවැනි දේවලට පිළිකුල්
කරයි.[3]

**17** "ඔබ කැළැලක් ඇති කිසි
ගවයෙක්වත් බැටළුවෙක්වත්
යෙහෝවා දෙවිට පූජා නොකළ
යුතුයි. එය ඔබේ දෙවි වන යෙහෝ-
වාට පිළිකුලක් බව මතක තබා-
ගන්න.[4]
**2** "ඔබේ දෙවි වන යෙහෝවා ඔබට
ලබා දෙන නුවරක සිටින පුරුෂ-
යෙක් හෝ ස්ත්‍රියක් සමහරවිට යෙ-
හෝවා දෙවි සමඟ කළ ගිවිසුම කඩ
කර දෙවි නපුරුයයි සලකන දේවල්
කළ හැකියි.[5] **3** මා අණ කළ දේව-
ලට විරුද්ධව ඒ තැනැත්තා කටයුතු
කරන්න පුළුවන්.[6] ඔහු හෝ ඇය
වෙනත් දෙවිවරුන් පසුපස ගොස්
ඒ දෙවිවරුන් ඉදිරියෙන් ඉර, සඳ
හා තාරකා ඉදිරියෙන් වැඳ වැටී
නමස්කාර කරන්න ඉඩ තිබෙනවා.[7]
**4** එවැනි දෙයක් සිදු වන බව ඔබට
ආරංචි වුණොත් ඔබ ඒ ගැන හොඳින්
සොයා බැලිය යුතුයි.[8] එවැනි පිළිකුල්-
සහගත දෙයක් ඊශ්‍රායෙල් දේශයේ සිදු
වන බව ඔප්පු වුණොත් **5** ඒ දුෂ්ට
ක්‍රියාව කළ පුරුෂයාව හෝ ස්ත්‍රියව
ඔබේ නුවරේ දොරටු අසලට ගෙනැ-
වින් ගල් ගසා මරා දැමිය යුතුයි.[9]
**6** නමුත් ඒ තැනැත්තාව මරා දැමිය
හැක්කේ ඔහු හෝ ඇය කළ දේ
ගැන දෙදෙනෙක් හෝ තුන්දෙනෙක්
සාක්ෂි[10] දුන්නොත් පමණයි. එක්
කෙනෙකුගේ සාක්ෂිය මත පමණක් ඒ
තැනැත්තාව මරා නොදැමිය යුතුයි.[11]
**7** ඔහුව හෝ ඇයව මරා දැමීමට
මුල්ම ගල එසවිය යුත්තේ එසේ
සාක්ෂි දුන් අයයි. ඉන්පසුව ඒ සඳහා
සෙනඟද සහභාගි විය යුතුයි.[12] එසේ
කර ඔබ අතරේ හටගත් මේ දුෂ්ටකම
සහමුලින්ම ඉවත් කරන්න.[13]

**16 පරි.**
1 නික් 34:13; විනි 3:7; 2ලේක 33:3
2 නික් 23:24; ලෙවී 26:1; ද්වි 12:3
3 ද්වි 12:31; යෙරෙ 44:4

**17 පරි.**
4 ලෙවී 22:20; ද්වි 15:21; මලා 1:8
5 ද්වි 4:23; ද්වි 13:6; විනි 2:20
6 යෙරෙ 7:18; යෙරෙ 19:5
7 ද්වි 4:19; යෙරෙ 8:2; එස 8:16
8 ද්වි 13:14; යොහ 7:51
9 ද්වි 13:10
10 ගණන් 35:30; මතෙ 18:16; යොහ 8:17; 2කොරි 13:1; 1තිමෝ 5:19; හෙබ්‍රෙ 10:28
11 ද්වි 19:15
12 ද්වි 13:9
13 ද්වි 13:5; 1කොරි 5:13

**2 තීරුව**
1 ද්වි 1:17
2 ගණන් 35:11
3 1රාජා 3:28; යෙසා 1:17; යෙරෙ 5:28
4 1රාජා 3:16
5 ද්වි 12:5; ගීතා 122:2; ගීතා 122:5
6 ද්වි 19:17; ද්වි 21:5; හග් 2:11; මලා 2:7
7 1සාමු 7:16
8 ද්වි 19:17; ද්වි 21:5
9 මලා 2:7
10 ද්වි 5:32; ද්වි 12:32; යොෂු 1:7; හිතෝ 4:27
11 ගීතා 19:13; හිතෝ 11:2; හොෂෙ 4:4
12 හෙබ්‍රෙ 10:28
13 ද්වි 13:5; 1කොරි 5:13
14 ගණන් 15:31; ද්වි 13:11; ද්වි 19:20
15 ද්වි 7:1; යොෂු 1:3; ගීතා 44:2

**8** "ඇතැම්විට තීන්දුවක් දීමට
අසීරු නඩුවක් විසඳන්න ඔබට සිදු
විය හැකියි.[1] එය ඔබේම නුවරේ සිදු
වූ මිනී මැරුමක්[2] හෝ යම් කෙ-
නෙකුට විරුද්ධව ගෙනා පැමිණිල්-
ලක්[3] හෝ සිදු වූ දරුණු අපරාධයක්
හෝ ඇති වූ මතභේදයක් හෝ සම්-
බන්ධ නඩුවක්[4] විය හැකියි. එවිට
ඔබ යෙහෝවා දෙවි තෝරාගන්නා
ස්ථානයට ගොස්[5] **9** පූජකයන්,[6]
ලෙවීවරුන් සහ ඒ කාලයේදී විනිශ්ච-
යකරු[7] ලෙස ක්‍රියා කරන තැනැත්-
තාව හමු වී ඔවුන්ගෙන් මඟ පෙන්වීම්
ලබාගත යුතුයි. එවිට ඔවුන්ගේ තීර-
ණය ගැන ඔවුන් ඔබට පවසයි.[8]
**10** යෙහෝවා දෙවි තෝරාගන්නා
ස්ථානයේ සිටින ඔවුන් ඔබට ලබා
දෙන තීරණයට අනුව ඔබ අවශ්‍ය
පියවර ගත යුතුයි. ඔවුන් දෙන මඟ
පෙන්වීම් ඒ අයුරින්ම පිළිපැදීමට
වගබලා ගන්න. **11** ඔවුන් ඔබට
නීතිය පැහැදිලි කර දී ඔවුන්ගේ තීර-
ණය ගැන ඔබට පවසයි. ඔබ ක්‍රියා
කළ යුත්තේ ඒ තීරණයට අනු-
වයි.[9] ඔවුන් දෙන මඟ පෙන්වීම්වලට
වඩා වෙනස් දෙයක් කරන්න එපා.[10]
**12** නමුත් කෙනෙක් ඔබේ දෙවි වන
යෙහෝවා ඉදිරියේ සේවය කරන පූජ-
කයා හෝ විනිශ්චයකරු ලබා දෙන
මඟ පෙන්වීම්වලට සවන් නොදී තම
හිතුමතේට ක්‍රියා කරනවා නම්[11]
ඔහුව මරා දමන්න.[12] මෙසේ, ඔබ
ඊශ්‍රායෙල් දේශයෙන් දුෂ්ටකම ඉවත්
කළ යුතුයි.[13] **13** සිදු වූ දේ ගැන
සෙනඟට ආරංචි වූ විට ඔවුන් තුළ
බියක් ඇති වෙයි.[14] එවිට ඔවුන්
නැවත කිසිදා තම හිතුමතේට ක්‍රියා
කරන්නේ නැහැ.
**14** "යෙහෝවා දෙවි ඔබට ලබා
දෙන දේශයට ගොස් එය හිමි කර-
ගෙන එහි පදිංචි වුණායින් පසු,[15]
'අනික් ජාතීන්ට මෙන් අපිටත් රජෙක්
අවශ්‍යයි'[16] කියා ඔබ කියන්න ඉඩ
තිබෙනවා. **15** එවිට ඔබ රජෙක්

**16** 1සාමු 8:5; 1සාමු 8:20; 1සාමු 10:19.

ලෙස පත් කළ යුත්තේ ඔබේ
දෙවි වන යෙහෝවා තෝරාගන්නා
තැනැත්තාවයි.[1] ඔබ රජකමට
තෝරාගත යුත්තේ ඔබේම සෙනඟ
අතරේ සිටින කෙනෙකුවයි. විදේශික-
යෙකුව ඔබේ රජු ලෙස පත් කර-
ගන්න ඔබට අවසර නැහැ. **16** ඔබ
රජකමට පත් කරන තැනැත්තා
බොහෝ අශ්වයන් එකතු කර නො-
ගැනීමට වගබලා ගත යුතුයි.[2] අශ්ව-
යන්ව ගෙන්වාගැනීම සඳහා තම
සේවකයන්ව ඊජිප්තුවට යවන්නවත්
ඔහුට අවසර නැහැ.[3] මන්ද ‘ඔබ
නැවතත් ඊජිප්තුවට යන මාර්ග-
යේ ගමන් නොකළ යුතුයි’ කියා
යෙහෝවා දෙවි පවසා තිබෙනවා.
**17** එමෙන්ම, ඔහු බොහෝ ස්ත්‍රීන්ව
විවාහ කර නොගත යුතුයි. එසේ
කළොත් ඔහුගේ සිත දෙවිගෙන් දුරස්
වී ඔහු මුළා වීමට ඉඩ තිබෙනවා.[4]
ඔහු රන් රිදී අධික ලෙස තමන්ටම
රැස් කරගැනීමෙන්ද වැළකී සිටිය
යුතුයි.[5] **18** ඔහුව රජු ලෙස පත්
කළ පසු පූජකයන් හා ලෙවීවරුන්
භාරයේ තිබෙන මේ නීතියේ පිටප-
තක් ඔහු තමන්ට සාදාගත යුතුයි.[6]

**19** “ඔහු එම පිටපත තමන් ළඟම
තබාගෙන තමා ජීවත් වන සෑම දව-
සකදීම එය කියවිය යුතුයි.[7] එසේ
කිරීමෙන් යෙහෝවා දෙවිට ගරුබිය
දක්වන ආකාරය ගැන ඉගෙනගෙන
මේ නීතියේ සඳහන් සියලු අණපනත්
හා නියෝගවලට කීකරු වීමට ඔහුට
හැකි වෙයි.[8] **20** එසේ කළොත් ඔහු
උඩඟු වී තමා අන් අයට වඩා උතුම්
කියා සිතන්නවත්[9] දෙවිගේ අණ-
පනත්වලින් කිසි අන්දමකින් පිට
පනින්නවත්[10] පෙලඹෙන්නේ නැහැ.
ඔහුගේ රජකමත් ඔහුගේ රාජකීය පෙ-
ළපතත් ඊශ්‍රායෙල් සෙනඟ අතරේ
බොහෝ කාලයක් පවතියි.[11]

**18** “ලෙවී ගෝත්‍රයට අයත් කිසි-
වෙකුට ඊශ්‍රායෙල් දේශ-
යේ උරුමයක් ලැබෙන්නේ නැහැ.[12]
නමුත් සෙනඟ ගින්නෙන් පුලුස්සා
යෙහෝවා දෙවිට ඔප්පු කරන පූජාව-
ලින් කොටසක් පූජකයන්ට හා ලෙවී-
වරුන්ට හිමි වන අතර ඒ කොටස
අනුභව කරන්න ඔවුන්ට පුළුවන්.[1]
**2** ඊශ්‍රායෙල්වරුන්ගේ අනිකුත් ගෝ-
ත්‍රවලට මෙන් ඔවුන්ට උරුමයක්
නොලැබෙන්නේ යෙහෝවා දෙවිම
ඔවුන්ගේ උරුමය වන නිසයි.[2] මේ
බව දෙවිම ඔවුන්ට සහතික කර
තිබෙනවා.

**3** “සෙනඟ ඇවිත් ගවයෙකු හෝ
බැටළුවෙකු හෝ පූජා කරන
විට එයින් කොටසක් පූජකයන්ටත්
හිමි විය යුතුයි. ඒ නිසා සතා-
ගේ ඉදිරි ගාතය, බඩ හා හකු
යනාදි කොටස් පූජකයන්ට දෙන්න.
**4** ඔබ මුලින්ම නෙළාගත් ධාන්‍යව-
ලින්, මුලින්ම පෙරූ වයින්වලින්,
මුලින්ම නිපදවූ තෙල්වලින් සහ ඔබේ
බැටළුවන්ගෙන් මුලින්ම කැපූ ලොම්-
වලින්ද කොටසක් ඔවුන්ට දෙන්න.[3]
**5** මන්ද ඔබේ සියලු ගෝත්‍ර අත-
රින් ඔවුන්වත් ඔවුන්ගේ පුත්‍රයන්වත්
තෝරාගෙන තිබෙන්නේ යෙහෝවා
දෙවියි. ඔවුන්ගේ වගකීම වන්නේ
නිතරම යෙහෝවා දෙවිගේ නියෝජි-
තයන් ලෙස කටයුතු කරමින් ඔහුට
සේවය කිරීමයි.[4]

**6** “ඊශ්‍රායෙල් දේශයේ යම් නුවරක
පදිංචිව සිටින ලෙවීවරයෙකුට[5] යෙ-
හෝවා දෙවි තෝරාගන්නා ස්ථාන-
යට[6] ගොස් දිගටම සේවය කරන්න
මහත් ආශාවක් ඇති වුණොත් තම
නුවර අත්හැර ඒ ස්ථානයට යන්න
ඔහුට අවසර තිබෙනවා. ඔහු එතැ-
නට ගිය පසු, **7** යෙහෝවා දෙවි-
ගේ නියෝජිතයන් ලෙස එහි සේවය
කරන සෙසු ලෙවීවරුන් මෙන් ඔහුද
යෙහෝවා දෙවිට සේවය කළ යුතුයි.[7]
**8** ඔහු තමාට හිමි දේපළ විකුණා
එයින් මුදලක් ලැබුවත් අනිකුත් ලෙ-
වීවරුන්ට ලැබෙනවා හා සමාන
ආහාර කොටසක් ඔහුටද ලබා දිය
යුතුයි.[8]

**9** “යෙහෝවා දෙවි ඔබට ලබා
දෙන දේශයට ගොස් එහි පදිංචි වූ
විට, ඔබ ඒ දේශයේ සිටින ජාතීන්

**17 පරි.**
**1** 1සාමු 9:17
1සාමු 10:24
1සාමු 16:12
**2** ද්වි 20:1
2සාමු 8:4
ගීතා 20:7
හිතෝ 21:31
**3** යෙසා 31:1
යෙසා 36:9
එස 17:15
**4** 1රාජා 11:3
නෙහෙ 13:26
**5** යෝබ 31:24
ගීතා 62:10
1තිමෝ 6:9
**6** ද්වි 31:9
ද්වි 31:26
2රාජා 22:8
**7** 2ලේක 34:18
**8** ද්වි 11:18
ගීතා 1:2
ගීතා 119:97
**9** 1සාමු 15:17
2ලේක 32:25
ගීතා 131:1
මාක් 10:42
1පේත 5:5
**10** ද්වි 5:32
1සාමු 13:13
1රාජා 15:5
**11** හිතෝ 10:27

**18 පරි.**
**12** ගණන් 18:24
ද්වි 10:9
යොෂු 13:33

**2 තීරුව**
**1** ගණන් 18:8
යොෂු 13:14
1කොරි 9:13
**2** ගණන් 18:20
**3** නික් 23:19
ගණන් 18:12
ද්වි 26:10
2ලේක 31:4
නෙහෙ 12:44
**4** නික් 28:1
ගණන් 3:10
ද්වි 10:8
ද්වි 17:12
**5** ගණන් 35:2
**6** ද්වි 12:5
ද්වි 16:2
ගීතා 26:8
**7** 2ලේක 31:2
**8** ලෙවී 7:10
ලූක් 10:7
1තිමෝ 5:18

කරන කිසිම පිළිකුල්සහගත දෙ-
යක් කරන්න පුරුදු නොවෙන්න.[1]
**10** ඔබ අතරේ සිටින කිසිම කෙ-
නෙක් තම පුතාව හෝ දුවව හෝ
ගින්නෙන් දවා පූජා නොකළ යුතුයි.[2]
පේන[3] කියන්නවත් මන්තර ගුරුකම්[4]
කරන්නවත් නැකත්[5] බලන්නවත්
මායා බලයෙන්[6] දේවල් කරන්නවත්
ඔබ අතරේ සිටින කිසිම කෙනෙක්
නොපෙලඹිය යුතුයි. **11** කොඩිවින
සහ හදිහූනියම්[7] කරන්නවත් කට්-
ටඩියෙකුගේ[8] හෝ ශාස්ත්‍ර[9] බලන
කෙනෙකුගේ උපකාර ලබන්නවත්
මළවුන්ගෙන් තොරතුරු විචාරන්න-
වත්[10] කිසිම කෙනෙක් නොපෙලඹිය
යුතුයි. එවැනි දේවල් කරන කිසි-
වෙක් ඔබ අතරේ නොසිටිය යුතුයි.
**12** මන්ද එවැනි දේවලට හවුල් වන
සෑම කෙනෙක්ම යෙහෝවා දෙවිට
පිළිකුලක්. යෙහෝවා දෙවි දේශයේ
සිටින ජාතීන්ව ඔබ ඉදිරියෙන් පන්නා
දමන්නේ ඔවුන් කරන මේ පිළිකුල්-
සහගත දේවල් නිසාමයි.[11] **13** ඒ
නිසා ඔබ මේ දේවලට කිසිසේත් සම්-
බන්ධ නොවී යෙහෝවා දෙවි ඉදිරියේ
නිදොස්ව සිටිය යුතුයි.[12]

**14** "ඔබ පලවාහරින ජාතීන් මන්-
තර ගුරුකම්[13] හා පේන කියන අය-
ගේ[14] පිහිට පැතුවත් ඔබේ දෙවි වන
යෙහෝවා එවැනි දේවල් කරන්න
ඔබට අවසර දී නැහැ.[15] **15** ඉදිරි-
යේදී යෙහෝවා දෙවි ඔබේ සහෝ-
දරයන් අතරින් ඔබ උදෙසා මා
වැනි අනාගතවක්තෘ කෙනෙකුව පත්
කරයි. ඔබ ඔහුට සවන් දිය යුතුයි.[16]
**16** යෙහෝවා දෙවි මේ දේ කරන්නේ
හොරෙබ් කඳුකරයේ සිටි අවස්ථා-
වේදී[17] ඔබ දෙවිට කී දේ නිසයි. 'අපි
ආයෙත් නම් යෙහෝවා දෙවිගේ හඬ
අහන්නවත් මේ මහා ගින්න දකින්න-
වත් කැමති නැහැ. එහෙම වුණොත්
අපි අනිවාර්යයෙන්ම මැරෙයි'[18]
කියා ඔබ එදා කිව්වා. **17** එවිට
යෙහෝවා දෙවි මට මෙසේ පැව-
සුවා. 'ඔවුන් කියන දේ නිවැරදියි.[19]
**18** ඊශ්‍රායෙල් සෙනඟ අතරෙන් ඔබ
වැනි අනාගතවක්තෘවරයෙකුව[1] මම
ඔවුන් වෙනුවෙන් පත් කරනවා. මට
සෙනඟට කියන්න යමක් ඇද්ද ඒ දේ
මම දන්වන්නේ ඔහුටයි.[2] ඔහු මා
අණ කරන සියලුම දේවල් ඔවුන්ට
කියා දෙයි.[3] **19** මාගේ නාමයෙන්
ඔහු පවසන දේවලට සවන් නොදෙන
ඕනෑම කෙනෙක් අනිවාර්යයෙන්ම
මට ගණන් දිය යුතුයි.[4]

**20** "'ඒ වගේම අනාගතවක්තෘ-
වරයෙක් පැමිණ මා ඔහුට අණ
නොකළ දෙයක් මාගේ නාමයෙන්
තම හිතුමතේට ප්‍රකාශ කළොත්[5]
එසේ නැත්නම් වෙනත් දෙවිවරුන්ගේ
නාමයෙන් යමක් පැවසුවොත්[6] ඔබ ඒ
තැනැත්තාව මරා දැමිය යුතුයි.[7]
**21** "ඒ තැනැත්තා ප්‍රකාශ කරන දේ
ඇත්තටම පැවසුවේ යෙහෝවා දෙවිද
නැද්ද කියා අප දැනගන්නේ කොහො-
මද"[8] කියා ඔබ කල්පනා කළොත් මේ
දේ මතක තබාගන්න. **22** ඒ අනා-
ගතවක්තෘවරයා යෙහෝවා දෙවිගේ
නාමයෙන් යමක් ප්‍රකාශ කරන විට
එය ඉටු වෙන්නේ නැත්නම් ඔහු පැව-
සුවේ යෙහෝවා දෙවිගෙන් ලැබුණු
දෙයක් නොවන බව ඔබට දැනගන්න
පුළුවන්. ඒ දේ පවසා ඇත්තේ ඔහුගේ
හිතුමතේටයි.[9] ඒ නිසා ඔහුට බිය
නොවන්න.'[10]

**19** "යෙහෝවා දෙවි ඔබට උරුම
කර දෙන දේශයේ ජීවත් වන
ජාතීන්ව ඔබ යෙහෝවා දෙවිගේ උප-
කාරයෙන් පන්නා දමයි.[11] ඉන්පසු එහි
නුවරවල හා නිවෙස්වල පදිංචි වෙන්න
ඔබට පුළුවන්.[12] **2** යෙහෝවා දෙවි
ඔබට හිමි කර දෙන එම දේශයේ ඔබ
පදිංචි වූ පසු එහි ඇති නුවරවල්
තුනක් වෙන් කරන්න.[13] **3** මෙසේ,
යෙහෝවා දෙවි ඔබට ලබා දෙන දේ-
ශය කොටස් තුනකට බෙදා ඒ නුවර-
වලට පහසුවෙන් යෑමට හැකි වන

**18 පරි.**
**1** ලෙවී 18:26
ද්වි 12:30
**2** ලෙවී 18:21
ද්වි 12:31
2රාජා 16:3
2ලේක 28:3
ගීතා 106:37
යෙරෙ 19:5
යෙරෙ 32:35
**3** 2රාජා 17:17
ක්‍රියා 16:16
**4** ලෙවී 19:26
ක්‍රියා 19:19
**5** එස 21:21
**6** නික් 22:18
**7** යෙසා 47:9
**8** ලෙවී 20:27
1ලේක 10:13
**9** ලෙවී 19:31
2ලේක 33:6
**10** 1සාමු 28:3
1සාමු 28:11
යෙසා 8:19
ගලා 5:20
**11** ලෙවී 18:24
ද්වි 9:4
**12** 2සාමු 22:24
ගීතා 37:18
මතෙ 5:48
2පේතෘ 3:14
**13** ලෙවී 19:26
2රාජා 21:2
2රාජා 21:6
**14** යොෂු 13:22
**15** ගීතා 147:20
ක්‍රියා 14:16
**16** උත් 49:10
ගණන් 24:17
ලූක් 7:16
ලූක් 24:19
යොහ 1:45
යොහ 6:14
ක්‍රියා 3:22
ක්‍රියා 7:37
**17** නික් 19:17
ද්වි 9:10
**18** නික් 20:19
**19** ද්වි 5:28

**2 තීරුව**
**1** නික් 34:28
ගණන් 12:3
මලා 3:1
මතෙ 4:2
මතෙ 11:29
ලූක් 24:27
ලූක් 24:44
යොහ 5:46
**2** යොහ 8:28
යොහ 17:8
**3** යොහ 12:49
යොහ 15:15
හෙබ්‍රෙ 1:2
**4** ක්‍රියා 3:23
**5** ද්වි 13:1
යෙරෙ 14:14
යෙරෙ 28:11
එස 13:6
මතෙ 7:15

**6** ද්වි 13:2; 1රාජා 18:19; යෙරෙ 23:13; **7** ද්වි 13:5; යෙරෙ 27:15; සෙක 13:3; **8** 1යොහ 4:1; **9** යෙරෙ 28:15; **10** හිතෝ 29:25; **19 පරි.** **11** නික් 34:24; යොෂු 24:8; **12** ද්වි 6:10; ද්වි 7:1; ද්වි 9:1; ද්වි 12:29; **13** නික් 21:13; ගණන් 35:14; යොෂු 20:7.

පිණිස මාර්ගද පිළියෙල කළ යුතුය.
ඔබ එසේ කළ යුත්තේ යම් පුද්ගල-
යෙක් අතින් කෙනෙකු මිය ගියොත් ඒ
පුද්ගලයාට ඉන් එක් නුවරකට පලා
යැමට හැකි වන පිණිසයි.[1]
**4** “එවැනි පුද්ගලයෙකුට පලා
ගොස් එම නුවරක රැඳී සිටීමට හැකි
වන්නේ මෙවැනි අවස්ථාවකදී පම-
ණයි. ඒ පුද්ගලයා අතින් මිය ගිය
තැනැත්තා මිය ගියේ අන්වැරදීමකින්
නම් එසේම ඒ තැනැත්තා සමඟ
ඔහුට කිසිම අමනාපයක් නොතිබුණු
බවට සාක්ෂි ඇත්නම් ඔහුට එම
නුවරකට පලා ගොස් එහි දිගටම
රැඳී සිටිය හැකියි.[2] **5** උදාහරණය-
කට කෙනෙක් තම මිතුරෙක් සමඟ
එක්ව දර කැපීම සඳහා කැලෑවට
යනවා කියා සිතන්න. ඒ තැනැත්තා
දර කපමින් සිටින අතරතුර පොරෝ
තලය ගැලවී[3] තම මිතුරාට වැදී ඔහු
මිය ගියොත් ඒ තැනැත්තාට එම
නුවරකට පලා ගොස් එහි ජීවත්
විය හැකියි.[4] **6** මිය ගිය පුද්ගලයා
සමඟ ඔහුට කිසි අමනාපයක් නොති-
බුණ නිසාත් එය හිතාමතාම කළ දෙ-
යක් නොවන නිසාත් ඔහුව මරා
දැමීමට තරම් වරදක් ඔහු සිදු කර
නැහැ.[5] නමුත් ඔබ එවැනි නුවරවල්
වෙන් කළේ නැත්නම් මරණය සිදු
කළ තැනැත්තාට බොහෝ ඈතකට
පලා යන්න සිදු වෙයි. එසේ පලා යන
අතරේ ඔහුව මරා දැමීමට අයිතිය
ඇති තැනැත්තා[6] ඔහු පසුපස මහත්
කෝපයකින් ලුහුබැඳ ඔහුව අල්ලා-
ගෙන මරා දමන්න ඉඩ තිබෙනවා.
එවිට ඔහු මිය යන්නේ නිරපරාදෙයි.
**7** ‘ඔබ නුවරවල් තුනක් වෙන් කර-
ගත යුතුයි’[7] කියා මා අණ කරන්නේ
ඒ නිසයි.
**8** “ඔබට හිමි වන ප්‍රදේශය තවත්
පුළුල් කරමින්[8] යෙහෝවා දෙවි
ඔබේ මුතුන්මිත්තන්ට පොරොන්දු
වූ සම්පූර්ණ දේශයම හිමි කර-
ගන්න ඔබට හැකියාව තිබෙනවා.[9]
**9** ඔබට එසේ කළ හැකි වන්නේ මා
අද ඔබට කියා දෙන සියලුම අණප-
නත් පිළිපදිමින්, යෙහෝවා දෙවිට
ප්‍රේම කර ඔහුගේ මඟ පෙන්වීම්වලට
එකඟව ජීවත් වෙනවා නම් පමණයි.[1]
එසේ මුළු දේශයම හිමි කරගන්න
ඔබට හැකි වුණොත් මුල් නුවර-
වල් තුනට අමතරව තවත් නුවර-
වල් තුනක් ඔබ වෙන් කළ යුතුයි.[2]
**10** ඔබ එසේ කළ යුත්තේ යෙ-
හෝවා දෙවි ඔබට උරුමයක් ලෙස
ලබා දෙන දේශයේදී නිරපරාදේ අහිං-
සක කෙනෙකුගේ ලේ[3] නොවගුරුවන
පිණිසයි. නමුත් කෙනෙකුව නිකරු-
ණේ මරා දැමුවොත් ඔහුගේ ලේවලට
වග කිව යුත්තේ ඔබයි.[4]
**11** “නමුත් මිනිසෙක් යම් පුද්ගල-
යෙකුට වෛර කරමින්[5] ඔහුව හිතාම-
තාම මරා දැමුවා කියා සිතමු. ඔහු
මඟ රැක සිට ඒ පුද්ගලයාට පහර දී
ඔහුව මරා දැමූ පසු[6] ඒ එක් නුවරකට
පලා ගියොත් **12** එම නුවරේ සිටින
වැඩිමහල්ලන්, ඔහුව මරා දැමීමට
අයිතිය ඇති තැනැත්තාට ඔහුව භාර
දිය යුතුයි. ඒ තැනැත්තා ඔහුව
මරා දැමිය යුතුයි.[7] **13** එවැනි කෙ-
නෙකුට කිසිම අනුකම්පාවක් නො-
පෙන්වන්න.[8] කිසි වරදක් නොකළ
කෙනෙකුගේ ලේ වැගිරෙවූ ඔහුව මරා
දමා ඒ වරදින් නිදහස් වෙන්න.[9]
ඔබ එසේ කළේ නැත්නම් ඒ වරදට
මුළු ඊශ්‍රායෙල් සෙනඟටම වගකි-
යන්න සිදු වෙයි.
**14** “යෙහෝවා දෙවි ඔබට ලබා
දෙන දේශය ඔබට උරුම වූ පසු, ඔබේ
මුතුන්මිත්තන් විසින් බෙදා වෙන්
කරනු ලැබූ ඉඩම්වල මායිම් වෙ-
නස් නොකිරීමට වගබලා ගන්න.
ඔබේ වාසිය තකා ඔබේ අසල්වාසියා-
ගේ ඉඩමේ මායිම වෙනස් නොකළ
යුතුයි.[10]
**15** “යම් කෙනෙක් අතින් යම් වර-
දක් හෝ පාපයක් සිදු වුණොත්[11]
ඔහුව වරදකරුවෙකු ලෙස තීන්දු
කිරීමට එක් කෙනෙකුගේ සාක්-
ෂිය පමණක් ප්‍රමාණවත් වෙන්නේ

**19 පරි.**
1 යොෂු 20:9
2 ගණන් 35:15; ද්වි 4:42
3 2රාජා 6:5
4 ගණන් 35:25
5 ද්වි 17:8; යොෂු 20:4; 2ලේක 19:10
6 ගණන් 35:12; ගණන් 35:19; යොෂු 20:5; 2සාමු 14:7
7 ද්වි 19:2
8 උත් 15:18; නික් 23:31; ද්වි 11:24
9 උත් 28:14; ද්වි 12:20

**2 තීරුව**
1 ද්වි 11:22; ද්වි 12:32; 1යොහ 5:3
2 යොෂු 20:8
3 ද්වි 21:9; 2රාජා 21:16; හිතෝ 6:17; යෙරෙ 7:6; යෝනා 1:14; මතෙ 27:4
4 ගීතා 5:6; ගීතා 55:23; ක්‍රියා 20:26
5 මතෙ 15:19; 1යොහ 3:15
6 නික් 21:12; ගණන් 35:16; ද්වි 27:24
7 උත් 9:6; 1රාජා 2:5; 1රාජා 2:31
8 ද්වි 19:21
9 ලෙවී 24:17; ලෙවී 24:21; ගණන් 35:33; ද්වි 21:9; 2සාමු 21:1
10 ද්වි 27:17; යෝබ් 24:2; හිතෝ 23:10
11 ගණන් 35:30; ද්වි 17:6

නැහැ. සාක්ෂිකරුවන් දෙදෙනෙකුගේ
හෝ තුන්දෙනෙකුගේ හෝ සාක්ෂි-
යෙන් ඒ කාරණය ස්ථිර කළ යුතුයි.[1]
**16** කෙනෙක් යම් පුද්ගලයෙකුට
හානියක් කිරීමේ අදහසින් ඔහු වරදක්
කළ බවට බොරු චෝදනාවක් කරයි
නම්[2] **17** ඒ දෙදෙනාම යෙහෝවා
දෙවිව නියෝජනය කරන පූජක-
යන් හා විනිශ්චයකරුවන් ඉදිරියේ
පෙනී සිටිය යුතුයි.[3] **18** විනිශ්චය-
කරුවන් ඒ කාරණය ගැන හොඳින්
සොයා බැලිය යුතුයි.[4] චෝදනාව කළ
තැනැත්තා තම සහෝදරයාට විරුද්-
ධව බොරු චෝදනාවක් කර ඇති බව
ඔප්පු වෙනවා නම් **19** ඔබ අත-
රේ එවැනි දුෂ්ටකමක් පැවතීමට
කොහෙත්ම ඉඩ නොදිය යුතුයි.[5]
ඒ තැනැත්තා තමාගේ සහෝදරයා
පිටට ගෙන ඒමට උත්සාහ කළ දඬුව-
මම ඔහුට ලබා දෙන්න.[6] **20** එවිට
ජනයාට ඒ ගැන ආරංචි වී ඔවුන් තුළ
බියක් ඇති වෙයි. ඒ නිසා ඔබ අතරේ
එවැනි දුෂ්ට දෙයක් නැවත කිසිදා සිදු
නොවෙයි.[7] **21** එවැනි කෙනෙකුට
කිසිම විදිහකින් අනුකම්පාව පෙන්-
වන්න එපා.[8] ජීවිතයකට ජීවිතයක්,
ඇසකට ඇසක්, දතකට දතක්, අත-
කට අතක්, පයකට පයක් යන
ප්‍රතිපත්තියට අනුව ඔහුට ප්‍රතිඵල
දෙන්න.[9]

**20** "ඔබේ සතුරන්ට විරුද්ධව
ඔබ යුද්ධයට යන විට ඔවුන්
ඔබට වඩා බොහෝ අශ්වයන් හා
අශ්ව රථ[10] තිබෙන බලවත් සෙ-
නඟක් බව ඔබට පෙනී යනවා නම්
ඒ ගැන බිය වෙන්න එපා. ඔබව
ඊජිප්තු දේශයෙන් නිදහස් කළ[11]
ඔබේ දෙවි වන යෙහෝවා ඔබ සමඟ
සිටින බව නිතරම මතක තබා-
ගන්න.[12] **2** යුද්ධයට යන අවස්ථාව
එළඹෙන විට උත්තම පූජකයා සෙ-
නඟ ළඟට ඇවිත් ඔවුන්ට කතා
කළ යුතුයි.[13] **3** ඔහු ඔවුන්ට පැව-
සිය යුත්තේ මෙයයි. 'ඊශ්‍රායෙල්ව-
රුනි, මට සවන් දෙන්න. ඔබ දැන්
සූදානම් වෙන්නේ ඔබේ සතුරන්ට
විරුද්ධව සටන් කරන්නයි. ඔබ ඔවුන්
වෙතින් භයෙන් පලා යන්න එපා.[1]
ඔවුන්ට භය වෙන්න කිසිම හේතු-
වක් නැහැ.[2] **4** මන්ද ඔබ වෙනු-
වෙන් ඔබේ සතුරන්ට විරුද්ධව සටන්
කරන්න ඔබේ දෙවි වන යෙහෝවා
සිටිනවා. ඔහු ඔබව ගලවාගනී.'[3]

**5** "ඉන්පසු අධිපතීන්[4] සෙනඟට
මෙසේ පැවසිය යුතුයි. 'ඔබ
අතරේ අලුත් ගෙයක් ගොඩනඟා
තවමත් එය වෙනුවෙන් උත්සව-
යක් පවත්වා නැති කෙනෙක් සිටි-
නවා නම් ඔහුට ආපහු තම නිවස
බලා යන්න පුළුවන්. නැත්නම් ඔහු
හදිස්සියේ සටනේදී මිය ගියොත් ඒ
නිවස වෙනුවෙන් පැවැත්විය යුතු
උත්සවය වෙන කෙනෙක් පවත්-
වන්න ඉඩ තිබෙනවා.[5] **6** මිදිවත්-
තක් වවා එහි පලදාව තවමත් නෙළා
නැති කෙනෙක් සිටිනවා නම් ඔහු-
ටත් තම නිවස බලා ආපහු යන්න
පුළුවන්. නැත්නම් ඔහු හදිස්සියේ
සටනේදී මිය ගියොත් එහි පලදාව
වෙන කෙනෙක් එකතු කරගනියි.[6]
**7** ස්ත්‍රියක් හා විවාහ වීමට ගිවිස-
ගෙන තිබෙන කෙනෙක් ඔබ අතරේ
සිටිනවා නම් ඔහු තම නිවස බලා
ගොස් ඒ ස්ත්‍රියව විවාහ කරගත
යුතුයි.[7] නැත්නම් ඔහු හදිස්සියේ
සටනේදී මිය ගියොත් ඔහුගේ භාර්-
යාව වෙනත් පුරුෂයෙකුට අයිති විය
හැකියි.' **8** අධිපතීන් මේ දේත් සෙ-
නඟට කිව යුතුයි. 'ඔබ අතරෙන්
කවුරු හරි කෙනෙක් යුද්ධයට යන්න
භය නම්[8] ඔහුට තම නිවසට හැරී
යන්න පුළුවන්. නැත්නම් ඔහු නිසා
ඔහුගේ සහෝදරයනුත් අධෛර්යයට
පත් වෙයි.'[9] **9** එසේ පැවසුවායින්
පසු අධිපතීන් හමුදාවේ ප්‍රධානීන්
ලෙස කටයුතු කිරීම සඳහා කිහිපදෙ-
නෙකුව පත් කළ යුතුයි.

**10** "ඔබ නුවරක් ළඟට ගොස්
එයට විරුද්ධව සටන් කිරීමට පෙර
ඔවුන්ට ඔබ සමඟ සමාදාන වීමට
ආරාධනා කරන්න.[10] ඒ සඳහා ඔබේ
කොන්දේසි ඔවුන්ට ඉදිරිපත් කළ

**19 පරි.**
1 1රාජා 21:10
මතෙ 18:16
මතෙ 26:60
යොහ 8:17
2කොරි 13:1
1තිමෝ 5:19
හෙබ්‍රෙ 10:28
2 නික් 23:1
1රාජා 21:13
ගීතා 27:12
මාක් 14:56
3 ද්වි 17:9
ද්වි 21:5
4 ද්වි 13:14
ද්වි 17:4
2ලේක 19:6
යෝබ් 29:16
5 ද්වි 21:21
ද්වි 24:7
1කොරි 5:13
6 හිතෝ 19:5
ආනි 6:24
7 ද්වි 13:11
ද්වි 17:13
1තිමෝ 5:20
8 ද්වි 19:13
9 නික් 21:23
ලෙවී 24:20
මතෙ 5:38

**20 පරි.**
10 යොෂු 11:4
11 නික් 13:3
12 ද්වි 3:22
ද්වි 31:6
ගීතා 20:7
ගීතා 46:7
හිතෝ 21:31
රෝම 8:31
13 ගණන් 31:6
විනි 20:28
1සාමු 30:7
2ලේක 13:12

**2 තීරුව**
1 ගීතා 27:3
යෙසා 35:4
යෙසා 41:10
2 ගීතා 3:6
3 නික් 14:14
ද්වි 32:30
යොෂු 23:10
4 ගණන් 31:14
ද්වි 16:18
5 දේශ 2:24
6 ගීතා 145:9
දේශ 3:13
7 ද්වි 24:5
8 විනි 7:3
9 ගණන් 13:33
ගණන් 14:1
ගණන් 32:9
ද්වි 1:28
ක්‍රියා 21:13
10 යොෂු 11:19

යුතුයි. **11** ඔවුන් එම කොන්දේසිව-
ලට එකඟ වී නුවරේ දොරටු ඔබට
විවෘත කළොත් එහි සිටින අයව මෙ-
හෙකාරකමට ගන්න ඔබට පුළුවන්.
එතැන් පටන් ඔවුන් ඔබට යටත්
වී සේවය කළ යුතුයි.[1] **12** නමුත්
ඔවුන් ඔබේ කොන්දේසිවලට එකඟ
නොවී[2] ඔබට විරුද්ධව යුද්ධ කරන්න
සූදානම් වෙනවා නම් ඒ නුවර වට-
ලන්න ඔබට සිදු වෙයි. **13** යෙ-
හෝවා දෙවි අනිවාර්යයෙන්ම ඒ
නුවර ඔබේ අතට පත් කර දෙයි. ඔබ
එහි සිටින සෑම පුරුෂයෙකුවම කඩු-
වෙන් මරා දැමිය යුතුයි.[3] **14** නමුත්
නුවරේ සිටින ස්ත්‍රීන්, කුඩා දරුවන්,[4]
සතුන්[5] හා එහි තිබෙන සෑම වස්තු-
වක්ම ගන්න ඔබට පුළුවන්.[6] ඔබේ
දෙවි වන යෙහෝවා ඔබේ අතට පත්
කර දුන් සතුරන්ට අයිති සෑම දෙ-
යක්ම ඔබේ භාවිතය සඳහා ගන්න
පුළුවන්.[7]

**15** “ඔබ පදිංචි වන දේශයට
බොහෝ දුර බැහැරව තිබෙන නුව-
රවලට ඔබ කළ යුත්තේ එයයි.
**16** නමුත් යෙහෝවා දෙවි ඔබට
උරුම කර දෙන දේශයේ අවට සිටින
ජාතීන්ගේ නුවරවල කිසිම දෙයක්
ඉතුරු නොකර ඒවා සම්පූර්ණයෙන්ම
විනාශ කළ යුතුයි.[8] **17** ඒ අනුව
යෙහෝවා දෙවි අණ කළ ආකාරයටම
හිත්තීවරුන්, අමෝරිවරුන්, කානා-
නිවරුන්, පෙරිස්සිවරුන්, හිවීයවරුන්,
යෙබූසිවරුන් යන ජාතීන්ව ඔබ සහමු-
ලින්ම විනාශ කර දැමිය යුතුයි.[9]
**18** ඔබ අනිවාර්යයෙන්ම එසේ කළ
යුතුයි. නැත්නම් ඔවුන් තම දෙවිව-
රුන්ට නමස්කාර කරද්දී කළ සියලුම
පිළිකුල්සහගත දේවල් කරන්න ඔබත්
පුරුදු වී ඔබේ දෙවි වන යෙහෝවාට
විරුද්ධව පව් කරයි.[10]

**19** “සතුරු නුවරක් අල්ලාගැනීම
සඳහා දින ගණනාවක් පුරා එය
වටලා සිටින්න ඔබට සිදු වුණොත් ඒ
නුවර අවට තිබෙන ගස් කපා නො-
දමන්න.[11] මන්ද ඔබට සතුරුකම්
පාන්නේ ඒ ගස් නොවෙයි. ඒ ගස්වල
පල ආහාරය සඳහා ගන්න ඔබට
පුළුවන්. **20** නමුත් කිසි පලදාවක්
නැති ගස් කපා දමන්න ඔබට අවසර
තිබෙනවා. ඒ ගස්වලින් නුවර වට-
ලෑම සඳහා විශාල වැටක්[1] ගොඩ-
නඟා ඒ නුවර ඔබේ අතට පත් වන
තෙක් සටන් කරන්න ඔබට පුළුවන්.

**21** “යෙහෝවා දෙවි ඔබට ලබා
දෙන දේශයේ තිබෙන යම්
කෙතක කෙනෙක්ව මරා දමා
තිබුණොත් ඔබ කළ යුත්තේ මෙ-
යයි. ඒ තැනැත්තාව මරා දැමුවේ
කවුද කියා කිසිම කෙනෙක් දන්-
නේ නැත්නම්[2] **2** එම තැනැත්තා
මිය ගොස් සිටින ස්ථානයේ සිට
ඊට නුදුරින් පිහිටි සියලු නුවරවලට
ඇති දුර ප්‍රමාණය මැනීමට ඔබේ
වැඩිමහල්ලන් හා විනිශ්චයකරුවන්[3]
පියවර ගත යුතුයි. **3** මරා දැමූ
තැනැත්තා වැටී සිටින ස්ථානයට
වඩාත්ම කිට්ටුවෙන් පිහිටි නුවර
කුමක්ද කියා තීරණය කරන්න එයින්
ඔබට හැකි වෙයි. ඉන්පසු කිට්ටු-
වෙන්ම පිහිටි ඒ නුවරේ වැඩිමහල්ලන්
කිසිම වැඩකට නොයෙදූ, කවදාවත්
බරක් ඇද නැති එළදෙනක්ව තෝරා-
ගෙන, **4** දිය පහරක් ගලා යන
නිම්නයකට රැගෙන යා යුතුයි. එය
බීජ වපුරා හෝ වෙනත් කිසිම වගා-
වක් කර හෝ නැති නිම්නයක් විය
යුතුයි. එහිදී නුවරේ වැඩිමහල්ලන්
එළදෙනගේ බෙල්ලට පහර දී උෟව
මරා දමයි.[4]

**5** “ඉන්පසුව ලෙවී ගෝත්‍රයෙන්
පැවතෙන පූජකයන් කිහිපදෙනෙ-
කුව කැඳවන්න. මන්ද ඔබේ
දෙවි වන යෙහෝවා තමාට සේ-
වය කරන්නත්[5] යෙහෝවා නම් වූ
තම නාමයෙන් සෙනඟට ආශීර්වාද
කරන්නත්[6] යම් දරුණු අපරාධයක්
සිදු වී ඇති අවස්ථාවක ඒ ගැන තීන්-
දුවක් දෙන්නත්[7] පත් කර තිබෙන්-
නේ ඔවුන්වයි. **6** මළ සිරුර තිබුණ
තැනට කිට්ටුවෙන්ම පිහිටි නුවරේ
සියලුම වැඩිමහල්ලන් ඒ තැනිතලා-
වේදී මරා දැමූ එළදෙනට ඉහළින් තම

**20 පරි.**
1 ලෙවී 25:46
ද්වි 20:15
යොෂු 9:22
යොෂු 9:27
2 ගීතා 120:7
3 ගණන් 31:7
4 ගණන් 31:9
ගණන් 31:18
5 යොෂු 8:2
6 ගණන් 31:12
ගණන් 31:27
2ලේක 14:13
ගීතා 68:12
7 යොෂු 22:8
8 යොෂු 6:17
යොෂු 10:28
යොෂු 11:11
9 ද්වි 7:1
10 නික් 34:15
ද්වි 7:4
යොෂු 23:12
ගීතා 106:35
යෙසා 2:6
1කොරි 5:6
1කොරි 15:33
11 නෙහෙ 9:25

**2 තීරුව**
1 2ලේක 26:15
දේශ 9:14
යෙසා 37:33
යෙරෙ 6:6
එස 17:17

**21 පරි.**
2 ගීතා 9:12
හිතෝ 28:17
යෙසා 26:21
3 ද්වි 16:18
4 ගණන් 35:33
5 නික් 28:1
ද්වි 18:5
6 ගණන් 6:23
1ලේක 23:13
7 ද්වි 17:9
ද්වි 19:17
මලා 2:7

අත් සෝදාගත යුතුයි.[1] **7** ඉන්පසුව
ඔවුන් මෙසේ කිව යුතුයි. 'මේ මිනි-
සාගේ ලේ හැළුවේ අපි නොවෙයි.
එය කළ තැනැත්තාවත් අපි දුටුවේ
නැහැ.[2] **8** යෙහෝවා දෙවියනි, ඔබ
නිදහස් කරගෙන ආ ඔබේ සෙනඟ
වන ඊශ්‍රායෙල්වරුන්[3] පිට මේ නිදොස්
තැනැත්තාගේ ලේ වැගිරීමේ වරද
තබන්න එපා.'[4] එවිට ඒ වරදින් නිද-
හස් වෙන්න ඔවුන්ට හැකි වෙයි.
**9** නිදොස් ලේ වැගිරීමේ වරදින් නිද-
හස් වීමට ඔබ පියවර ගත යුත්තේ
එයාකාරයටයි.[5] එසේ කිරීමෙන් යෙ-
හෝවා දෙවි ඉදිරියේ නිතරම හරි දේ
කරන්න ඔබට හැකි වෙයි.[6]

**10** "ඔබේ දෙවි වන යෙහෝවා
ඔබේ සතුරන්ව ඔබේ අතට පත්
කර ඇති නිසා[7] ඔවුන්ව වහල්ක-
මට ගන්න ඔබට අවසර තිබෙනවා.[8]
එම සතුරන්ට විරුද්ධව යුද්ධ කර
ඔවුන්ව වහල්කමට ගත් අවස්ථාව-
කදී, **11** ඒ වහලුන් අතරේ සිටින
ඉතා රුවැති තරුණියකට ඔබේ සිත
ඇදී ගියොත්[9] ඇයව විවාහ කරගන්න
ඔබට පුළුවන්. **12** ඔබ ඇයව ඔබේ
නිවසට ගෙන ගිය පසු, ඇය මුලින්ම
තම හිස බූ ගා[10] තම නියපොතු කපා
දැමිය යුතුයි. **13** ඇයව වහල්කමට
ගන්නා අවස්ථාවේදී ඇය ඇඳ සිටි
වස්ත්‍රත් ඇය ඉවත දැමිය යුතුයි.
ඉන්පසුව ඔබේ නිවසේ ජීවත් වෙන්න
ඇයට පුළුවන්. මිය ගිය තම පියා හා
මව ගැන වැලපෙන්න ඇයට මාස-
යක්[11] කල් දෙන්න. ඉන්පසුව අඹුසැ-
මියන් ලෙස ජීවත් වෙන්න ඔබට
හැකියි. **14** කලක් ගත වූ පසු ඔබට
ඇයව එපා වුණොත් ඇයට කැමති
තැනකට යන්න අවසර දිය යුතුයි.[12]
නමුත් ඇයව මුදල්වලට විකුණන්න
නම් ඔබට කිසිම අවසරයක් නැහැ.
ඔබ ඇයව බලෙන් විවාහ කරගත්
පසුව ඒ වගේ කුරිරු ආකාරයකින්[13]
ඇයට සලකන්න ඔබට කිසිසේත්
නොහැකියි.

**15** "පුරුෂයෙකුට භාර්යාවන් දෙ-
දෙනෙකු සිටිනවා කියා සිතන්න. ඉන්
එක් කෙනෙකුට ඔහු වැඩියෙන් ආද-
රය කරනවා විය හැකියි. ඔවුන් දෙ-
දෙනාටම දරුවන් සිටියත් ඔහුගේ
කුලුඳුල් පුත්‍රයා ලැබුණේ ඔහු එත-
රම් ප්‍රිය නොකරන භාර්යාවගෙන්
විය හැකියි.[1] **16** ඒ කුලුඳුල් පුත්‍රයා
ඔහුට ලැබුණේ ඔහු එතරම් ප්‍රිය නො-
කරන භාර්යාවගෙන් නිසා ඒ පුත්‍රයාට
අඩු සැලකිල්ලකුත් තමන් ප්‍රිය කරන
භාර්යාවගේ පුත්‍රයාට වැඩි සැලකිල්-
ලකුත් දක්වන්න ඔහුට අවසර නැහැ.
ඔහු තම පුතුන් අතරේ උරුමය බෙදා
දෙන විට කුලුඳුල් පුත්‍රයාට හිමි නියම
කොටස ඒ අයුරින්ම ලබා දිය යුතුයි.[2]
**17** ඔහු එතරම් ප්‍රිය නොකරන භාර්-
යාවගේ පුත්‍රයා වුණත්, මුලින්ම බිහි වූ
දරුවා ඔහුයි.[3] ඒ නිසා ඔහුට සෑම දෙ-
යකින්ම කොටස් දෙකක්[4] දෙමින්
කුලුඳුලාට හිමි අයිතිය ලබා දිය
යුතුයි.[5]

**18** "යම් කෙනෙකුට ඉතා මුරණ්ඩු
හා කැරලිකාර පුත්‍රයෙක් සිටිනවා[6]
කියා සිතන්න. ඔහු තමාගේ පියා හෝ
මව කියන කිසි දෙයක් අහන්නේ
නැහැ.[7] ඔවුන් ඔහුව යහමඟට ගන්න
කොතරම් උත්සාහ කළත් ඉන් කිසි
පලක් වී නැහැ.[8] **19** එවැනි අවස්ථා-
වකදී ඔහුගේ දෙමාපියන් ඔහුව නුවරේ
දොරටු අසල රැස්ව සිටින වැඩිම-
හල්ලන් ළඟට රැගෙන යා යුතුයි.[9]
**20** ඔවුන් එම වැඩිමහල්ලන්ට මෙ-
වැනි දෙයක් පැවසිය යුතුයි. 'අපට
ඉන්නේ කැරලිකාර, මුරණ්ඩු පුතෙක්.
අපි කියන කිසිම දෙයක් ඔහු අහන්-
නේ නැහැ.[10] ඔහු හරිම කෑදරයි.[11]
ඒ මදිවට බේබදුකමටත් වැටිලා.'[12]
**21** එවිට ඒ නුවරේ සිටින සියලුම
පුරුෂයන් එකතු වී ඔහුට ගල් ගසා
ඔහුව මරා දැමිය යුතුයි. මෙසේ, දුෂ්ට
ලෙස හැසිරෙන කෙනාව ඔබ අතරින්
ඉවත් කර දමන්න. එවිට සියලුම
ඊශ්‍රායෙල්වරුන්ට ඒ ගැන ආරංචි වී
එවැනි දෙයක් කරන්න ඔවුන් තුළ
බියක් ඇති වෙයි.[13]

**22** "කෙනෙක් මරණ දණ්ඩනය
ලබන්න තරම් සුදුසු වරදක් කළොත්

**21 පරි.**
1 ගීතා 26:6; මතෙ 27:24
2 2සාමු 3:28; ගීතා 7:3
3 ද්වි 13:5; 2සාමු 7:23
4 ගණන් 16:22; යෙරෙ 26:15; යෝනා 1:14
5 ද්වි 19:13
6 ද්වි 13:18; ගීතා 11:4; හිතෝ 15:3; හෙබ්‍රෙ 4:13
7 ද්වි 20:13; යොෂු 21:44
8 ගණන් 31:9; ද්වි 20:14
9 උත් 29:20; උත් 34:3; විනි 14:2
10 යෙසා 3:24; 1කොරි 11:6
11 ගණන් 20:29; ද්වි 34:8
12 ද්වි 24:1
13 ලෙවී 25:46

**2 තීරුව**
1 උත් 29:30; උත් 29:33; 1සාමු 1:4
2 2ලේක 21:3
3 උත් 49:3; ගීතා 105:36
4 1ලේක 5:1
5 උත් 25:31; හෙබ්‍රෙ 12:16
6 හිතෝ 30:11
7 නික් 20:12; ද්වි 27:16; හිතෝ 1:8; හිතෝ 20:20; එස 22:7; එෆී 6:1
8 ද්වි 8:5; හිතෝ 13:24; හිතෝ 19:18; හිතෝ 23:13; හෙබ්‍රෙ 12:9
9 ද්වි 16:18
10 හිතෝ 15:5; හිතෝ 19:26; හිතෝ 30:17
11 හිතෝ 23:20; හිතෝ 28:7
12 හිතෝ 20:1; හිතෝ 23:21; රෝම 13:13; 1කොරි 6:10; එෆී 5:18
13 ද්වි 13:11

ඔහුව මරා[1] ඔහුගේ සිරුර ලී කණු-
වක එල්ලා තැබිය යුතුයි.[2] **23** ඒ
තැනැත්තා දෙවිගෙන් ශාප ලැබූ
නිසා[3] ඔහුගේ මළ සිරුර කණුවක
එල්ලා තැබිය යුතුයි. නමුත් ඒ මළ
සිරුර මුළු රාත්‍රිය පුරාම ඒ කණුවේ
එල්ලා තබන්න එපා.[4] ඔහුව ඒ දවස
ඇතුළත තැන්පත් කරන්න. මෙ-
ලෙස කිරීමෙන් යෙහෝවා දෙවි ඔබට
උරුම කර දෙන දේශය පවිත්‍රව තබා-
ගන්න ඔබට හැකි වෙයි.[5]

**22** “ඔබේ සහෝදරයෙකුගේ ගව-
යෙක් හෝ බැටළුවෙක්
මංමුළා වී ඇති බව ඔබ දුටුවොත්
අහක බලාගෙන යන්න එපා.[6] ඔබ
අනිවාර්යයෙන්ම ඒ සතාව අයිතිකරු
ළඟට රැගෙන යා යුතුයි.[7] **2** අයිති-
කරු කවුද කියා ඔබ දන්නේ නැත්-
නම් ඒ වගේම ඔහු ළඟපාතක ජීවත්
වන කෙනෙක් නොවෙයි නම් ඒ
සතාව ඔබේ ඉඩමට රැගෙන ගොස්
එහි තබාගන්න. අයිතිකරු සතාව
සොයාගෙන පැමිණෙන තෙක් ඌව
හොඳින් බලාගන්න. ඉන්පසු සතාව
අයිතිකරුට භාර දෙන්න.[8] **3** ඔබේ
සහෝදරයෙකුට අයිති බූරුවෙක් හෝ
වස්ත්‍රයක් හෝ ඔහුට අයිති වෙන
ඕනෑම දෙයක් නැති වුණත් ඔබ ක්‍රියා
කළ යුත්තේ එලෙසයි. එවැනි අවස්-
ථාවකදී ඔබේ සහෝදරයා වෙනුවෙන්
කිසිවක් නොකර සිටින්න එපා.

**4** “ඔබේ සහෝදරයෙකුට අයිති
බූරුවෙක් හෝ ගවයෙක් පාරේ වැටී
සිටිනවා ඔබ දැක්කොත් අහක බලා-
ගෙන යන්න එපා. වැටුණු සතාව
නැඟිටුවීමට ඔබේ සහෝදරයාට උප-
කාර කරන්න.[9]

**5** “පුරුෂයෙක් අඳින ඇඳුමක්
අඳින්න ස්ත්‍රියකට අවසර නැහැ.
ඒ වගේම ස්ත්‍රියක් අඳින ඇඳු-
මක් අඳින්න පුරුෂයෙකුටත් අවසර
නැහැ.[10] එවැනි දෙයක් කරන සෑම
කෙනෙක්ම යෙහෝවා දෙවිට පිළි-
කුලක්.

**6** “ඔබ ගමනක් යන විට පාර අයි-
නේ තිබෙන ගසක හෝ බිම හෝ
කුරුලු කූඩුවක් දුටුවායයි සිතන්න.
කිරිල්ලි එහි බිත්තර රකිමින් හෝ
පැටව්[1] පෝෂණය කරමින් සිටිනවා
නම් ඒ කූඩුවේ තිබෙන බිත්තර හෝ
පැටව් පමණක් රැගෙන යන්න ඔබට
අවසර තිබෙනවා. නමුත් කිරිල්ලිව
රැගෙන යන්න එපා.[2] **7** ඒ කිරිල්ලිව
නිදහස් කර යවන්න. නමුත් ඇගේ
පැටව් හෝ බිත්තර ගන්න ඔබට අව-
සර තිබෙනවා. ඔබ එසේ ක්‍රියා කර-
නවා නම් එය ඔබේ යහපතට හේතු
වන අතර ඔබට බොහෝ කාලයක්
ජීවත් වෙන්න හැකි වෙයි.[3]

**8** “ඔබ අලුතෙන් නිවසක් ඉදි කර-
නවා නම් ඒ නිවසේ තිබෙන සඳලු-
තලය* වටා කුඩා තාප්පයක් බැඳිය
යුතුයි.[4] එසේ නොකළොත් යම් කෙ-
නෙක් එයින් වැටී මිය යා හැකියි.
එවිට ඒ පුද්ගලයාගේ ජීවිතයට වග
කිව යුත්තේ ඔබේ නිවසේ සිටින
අයයි.

**9** “ඔබට අයත් වත්තක ඔබ මිදි
වගා කරනවා නම් ඒවා සමඟ වෙනත්
බීජ වපුරන්න ඔබට අවසර නැහැ.[5]
ඔබ එසේ කළොත් ඒ බීජවලින් නෙළූ
අස්වැන්නත් මිදි අස්වැන්නත් ශුද්ධස්-
ථානයට කැප වූ දෙයක් ලෙස දීමට
සිදු වෙයි.

**10** “සීසාන විට ගොනෙකු හා බූරු-
වෙකු එකට බඳින්න එපා.[6]

**11** “ලොම් හා ලිනන් නූල් මිශ්‍ර කර
සෑදූ වස්ත්‍ර අඳින්න එපා.[7]

**12** “ඔබ අඳින සෑම වස්ත්‍රයකම
වාටියේ නූල් රටාවකට ගැටගසා,
එල්ලෙමින් තිබෙන සේ සකස් කර-
ගන්න.*[8]

**13** “පුරුෂයෙක් ස්ත්‍රියක්ව විවාහ
කරගෙන ඇය සමඟ අඹු සැමි ඇසුරක්
පැවැත්වූ පසු ඔහුට ඇය ගැන පිළිකු-
ලක් ඇති වී ඇයව අත්හරින්න තීර-
ණය කළායයි සිතන්න.[9] **14** එවැනි

**21 පරි.**
1 ගණන් 25:5; 2සාමු 4:12
2 යොෂු 10:26; ක්‍රියා 10:39
3 2කොරි 5:21; ගලා 3:13
4 යොෂු 8:29; යොහ 19:31
5 ගණන් 35:34

**22 පරි.**
6 නික් 23:4
7 සෙක 7:9
8 හිතෝ 24:12; මතෙ 7:12
9 නික් 23:5; ලෙවී 19:18; ලූක් 10:27; ගලා 6:10
10 1තිමෝ 2:9

**2 තීරුව**
1 ලූක් 12:6
2 ලෙවී 22:28; ගීතා 36:6; ගීතා 145:9; හිතෝ 12:10; මතෙ 10:29
3 ද්වි 4:40; හිතෝ 3:2
4 2සාමු 11:2; ක්‍රියා 10:9
5 ලෙවී 19:19
6 හිතෝ 12:10
7 ලෙවී 19:19
8 ගණන් 15:38; මතෙ 23:5
9 එෆී 5:28; එෆී 5:33

ද්වි **22:8*** මූ.අ., “වහල.” ඒ කාලයේ නිවෙස්වල සාමාන්‍යයෙන් තිබුණේ පැතලි වහලක්. සමහර අවස්ථාවලදී ජනයා අමුත්තන් සමඟ එකට කෑම වේලක් භුක්ති විඳීමට හෝ නිදාගැනීමට පවා ඒ වහල පාවිච්චි කළා. **12*** එනම්, ටැසල්.

අවස්ථාවකදී ඔහු ඇගේ නමට කැළැ-
ලක්[1] ඇති කිරීමේ අදහසින්, 'මා
සමඟ විවාහ වූ මේ ස්ත්‍රිය නිර්මල
කෙනෙක් නෙවෙයි. ඇගේ නිර්මල-
කම ඔප්පු කරන්න කිසිම සාක්ෂියක්
නැහැ'[2] කියා පැවසිය හැකියි. මෙසේ,
ඇය නොමනා ආකාරයකින් හැසිර
ඇති බවට ඔහු චෝදනා කළොත්
**15** ඒ තරුණියගේ පියා සහ මව නුවර
දොරටුව අසල රැස්ව සිටින වැඩිම-
හල්ලන්[3] ළඟට ගොස් ඇගේ නිර්මල-
කම ඔප්පු කිරීමට තිබෙන සාක්ෂි
ඉදිරිපත් කළ යුතුයි. **16** තරුණිය-
ගේ පියා වැඩිමහල්ලන්ට පැවසිය
යුත්තේ මෙයයි. 'මම මේ මිනිසාට
මගේ දුවව විවාහ කර දුන්නත් දැන්
ඔහු ඇයව පිළිකුල් කරනවා.[4] **17** ඒ
විතරක් නෙවෙයි ඇය නොමනා විදි-
හට හැසිර ඇති බවටත්[5] ඔහු දැන්
චෝදනා කරනවා. "ඇගේ නිර්මල-
කම ඔප්පු කිරීමට කිසිම සාක්ෂියක්
තිබුණේ නැහැ"[6] කියාත් ඔහු කිය-
නවා. නමුත් ඇගේ නිර්මලකම ගැන
සාක්ෂි ඉදිරිපත් කරන්න අපි කැම-
තියි' කියා පවසා ඔවුන් නුවරේ වැඩි-
මහල්ලන් ඉදිරියේ රෙදිකඩ පෙන්විය
යුතුයි. **18** එවිට ඒ නුවරේ වැඩිම-
හල්ලන්[7] එම පුරුෂයාට තද හික්මවී-
මක් දිය යුතුයි.[8] **19** ඊට අමතරව ඒ
පුරුෂයාගෙන් රිදී ෂෙකෙල්* සියයක
දඩයක්ද අය කර ඒ මුදල් තරුණියගේ
පියාට ලබා දිය යුතුයි. මන්ද ඊශ්‍රා-
යෙල් දේශයේ නිර්මල තරුණියකගේ
නමට ඒ පුරුෂයා කැළැලක් ඇති කර
තිබෙනවා.[9] ඒ තරුණිය ඔහුගේ භාර්-
යාව ලෙස දිගටම සිටිය යුතුයි. තම
ජීවිත කාලය පුරාම ඇයව දික්කසාද
කරන්න ඔහුට අවසර නැහැ.

**20** "නමුත් පුරුෂයා කළ චෝදනා-
වේ ඇත්තක් තිබේ නම් කළ යුත්-
තේ මෙයයි. ඒ තරුණිය නිර්මල
කෙනෙක් බවට සාක්ෂි නැත්නම්[10]
**21** ඔවුන් ඒ තරුණියව ඇගේ පියාගේ
නිවසේ දොරටුව අසලට රැගෙන යා
යුතුයි. ඇය තමාගේ පියාගේ නිවසේ
සිටියදී වේශ්‍යාවක් ලෙස හැසිර[1] ඊශ්‍රා-
යෙල් සෙනඟ අතරේ නින්දාසහගතව
කටයුතු කර ඇති නිසා ඇගේ නුවරේ
සිටින පුරුෂයන් ඇයට ගල් ගසා මරා
දැමිය යුතුයි.[2] මෙසේ, ඔබ අතරේ
දුෂ්ට ලෙස හැසිරෙන සියලුදෙනාවම
නැති කර දැමිය යුතුයි.[3]

**22** "පුරුෂයෙක් වෙනත් කෙනෙ-
කුගේ භාර්යාවක් සමඟ අනාචාරයේ
හැසිර එය හසු වුණොත්[4] ඔවුන් දෙ-
දෙනාවම මරා දැමිය යුතුයි.[5] මෙසේ,
ඊශ්‍රායෙල් දේශයෙන් එවැනි දුෂ්ටකම්
නැති කර දැමිය යුතුයි.[6]

**23** "යම් කෙනෙක් වෙනත් පුරුෂ-
යෙකු සමඟ විවාහ වීමට ගිවිස-
ගෙන සිටින තරුණියකව[7] නුවරේදී
දැක ඇය සමඟ අනාචාරයේ හැසිරු-
ණොත්[8] **24** ඔවුන් දෙදෙනාවම එම
නුවරේ දොරටුවෙන් පිටතට ගෙනැ-
විත් ගල් ගසා මරා දැමිය යුතුයි. ඒ
තරුණිය වරදකාරියක් වන්නේ ඒ
අවස්ථාවේදී ඇය කෑගසා නුවරේ සිටි
අයට ඒ ගැන හෙළි නොකළ නිසයි.
පුරුෂයා වරදකරුවෙක් වන්නේ ඔහු
තමන්ගේ සහෝදරයෙකුගේ භාර්යා-
වට නින්දා කළ නිසයි.[9] මෙසේ, ඔබ
අතරේ සිදු වූ දුෂ්ටකම ඔබ ඉවත් කළ
යුතුයි.[10]

**25** "නමුත් යම් පුරුෂයෙක් වෙනත්
පුරුෂයෙකු සමඟ විවාහ වීමට ගිවිස-
ගෙන සිටින තරුණියක් කෙතක
සිටිනවා දැක එහිදී ඇයට බලහත්කා-
රකම් කළොත් මරා දැමිය යුත්තේ ඒ
පුරුෂයාව පමණයි. **26** තරුණියට
කිසිම දඬුවමක් දෙන්න එපා. මරණ
දඬුවම ලබන්න තරම් වරදක් ඇය
අතින් සිදු වී නැහැ. මන්ද ඔහු ඇයට
කළේ තවත් කෙනෙකුගේ ජීවිතය
නැති කරනවා හා සමාන දෙයක්.[11]
**27** වෙනත් කෙනෙකු හා විවාහ වීමට
ගිවිසගෙන සිටි මේ තරුණියට එම
පුරුෂයා බලහත්කාරකම් කළේ කෙ-
තකදී නිසා ඇය කෑගැසුවත් ඇයව
බේරගන්න කිසිම කෙනෙක් එහි සිටි-
යේ නැහැ.

**22 පරි.**
**1** හිතෝ 22:1, දේශ 7:1
**2** නික් 20:16, නික් 23:1, හිතෝ 18:21
**3** ද්වි 16:18
**4** ලෙවී 19:17, ද්වි 22:13
**5** උත් 38:24, ද්වි 22:21, ගීතා 141:4, හොෂෙ 1:2
**6** ද්වි 22:20
**7** නික් 18:21, ද්වි 1:13, ද්වි 16:18, ද්වි 21:19
**8** ද්වි 25:2, හිතෝ 10:13, හිතෝ 19:29, හිතෝ 20:30
**9** මලා 2:16
**10** ද්වි 22:14, ද්වි 22:17

**2 තීරුව**
**1** ලෙවී 21:9
**2** විනි 20:6, විනි 20:10, 2සාමු 13:12, හෙබ්‍රෙ 13:4
**3** ලෙවී 11:45, ද්වි 17:7, දේශ 8:13, 1කොරි 5:13
**4** උත් 20:3, නික් 21:3, යෙසා 62:5
**5** නික් 20:14, ලෙවී 20:10, මලා 3:5, 1කොරි 6:9, 1කොරි 6:18
**6** ද්වි 22:24
**7** ද්වි 20:7, මතෙ 1:18
**8** ද්වි 5:18
**9** ලෙවී 20:10, 1තෙස 4:6, හෙබ්‍රෙ 13:4
**10** 1කොරි 5:2
**11** උත් 4:8, ගණන් 35:20, යාකො 2:11

ද්වි **22:19*** ෂෙකෙලයක් යනු ග්‍රෑම් 11.4කි.

**28** “පුරුෂයෙක් සමඟ විවාහ වීමට ගිවිසගෙන නැති නිර්මල තරුණියකට යම් කෙනෙක් බලහත්කාරකම් කර[1] එය හෙළි වුණොත්[2] **29** බලහත්කාරකම් කළ පුරුෂයා තරුණියගේ පියාට රිදී ෂෙකෙල් පනහක්[3] දී ඇයව විවාහ කරගත යුතුයි. ඔහු ඇයව නින්දාවට පත් කළ නිසා ජීවත් වන තාක් කල් ඇයව දික්කසාද කරන්න ඔහුට අවසර නැහැ.[4]

**30** “කිසි කෙනෙක් තමාගේ පියාගේ භාර්යාවක් සමඟ විවාහ නොවිය යුතුයි. ඔහු එසේ කළොත් ඔහු තමාගේ පියාට කරන්නේ මහත් නින්දාවක්.[5]

**23** “වෘෂණ කෝෂ තුවාල වී[6] ඇති කෙනෙකුට හෝ ලිංගේන්ද්‍රිය කපා ඉවත් කර[7] ඇති කෙනෙකුට යෙහෝවා දෙවි ඉදිරියේ රැස් වන සභාව සමඟ එකතු වෙන්න අවසර නැහැ.

**2** “අනාචාරයේ යෙදීමේ ප්‍රතිඵලයක් ලෙස උපන් පුත්‍රයෙකුට[8] යෙහෝවා දෙවි ඉදිරියේ රැස් වන සභාව සමඟ එකතු වෙන්න අවසර නැහැ. ඔහුගෙන් පැවතෙන අයගේ දහවන පරම්පරාවට පවා යෙහෝවා දෙවි ඉදිරියේ රැස් වන සභාව සමඟ එකතු විය නොහැකියි.

**3** “කිසිම අම්මොන් ජාතිකයෙකුට හෝ මෝවබ් ජාතිකයෙකුට යෙහෝවා දෙවි ඉදිරියේ රැස් වන සභාව සමඟ එකතු වෙන්න අවසර නැහැ.[9] ඔවුන්ගෙන් පැවතෙන අයටද කිසිදා යෙහෝවා දෙවි ඉදිරියේ රැස් වන සභාව සමඟ එකතු වෙන්න අවසර නැහැ. ඔවුන්ගේ දහවන පරම්පරාව දක්වා පවා එසේ කළ නොහැකියි. **4** මන්ද ඊශ්‍රායෙල් සෙනඟ ඊජිප්තුවෙන් නිදහස් වී ගමන් කරන විට[10] ඔවුන් ඊශ්‍රායෙල්වරුන්ට උපකාර කළේවත්[11] ඔවුන්ට කෑම බීම ලබා දුන්නේවත් නැහැ. ඒ විතරක් නොවෙයි, ඊශ්‍රායෙල් සෙනඟට ශාප කිරීමට[12] මෙසපොතේමියාවේ පෙතෝර් නුවරේ සිටි බෙයෝර්ගේ පුත් බාලාම්ව ඔවුන් කුලියට ගත්තා. **5** නමුත් බාලාම් සෙනඟට ශාප කරන්න උත්සාහ කළ අවස්ථාවේදී යෙහෝවා දෙවි එයට ඉඩ දුන්නේ නැහැ.[1] යෙහෝවා දෙවි ඔහු ලවා සෙනඟට ආශීර්වාද කළා.[2] යෙහෝවා දෙවි ඒ දේ කළේ ඔබට ප්‍රේම කළ නිසයි.[3] **6** ඒ නිසා ඔබ කිසිදාක ඒ ජාතීන්ගේ ශුභසිද්ධිය තකා වැඩ නොකළ යුතුයි. මේ තහනම සදහටම අදාළයි.[4]

**7** “ඒදොම්වරුන් ඔබේ සහෝදරයන් වන නිසා ඔවුන්ව පිළිකුල් නොකරන්න.[5]

“ඔබ ඊජිප්තුවරුන්වත් පිළිකුල් නොකළ යුතුයි. මන්ද ඔබ ඔවුන්ගේ දේශයේ විදේශිකයන් ලෙස ජීවත් වුණා.[6] **8** ඔවුන්ගෙන් කැමති කෙනෙකුට යෙහෝවා දෙවි ඉදිරියේ රැස් වන සභාව සමඟ එකතු විය හැකියි. නමුත් එසේ කළ හැක්කේ ඔවුන් ඔබ අතරේ පදිංචි වී පරම්පරා තුනක් ගත වූවායින් පසුවයි.

**9** “ඔබ සතුරන්ට විරුද්ධව යුද්ධයකට ගොස් කඳවුරු බැඳගෙන සිටින විට සියලුම නුසුදුසු දේවලින් වැළකී සිටිය යුතුයි.[7] **10** කඳවුරේ සිටින පුරුෂයෙකුට රාත්‍රියේදී ශුක්‍රාණු පිට වී අපවිත්‍ර තත්වයකට පත් වුණොත්[8] ඔහු කඳවුරෙන් පිටතට යා යුතුයි. ඒ දවසේදී කඳවුරට ඇතුල් වෙන්න ඔහුට අවසර නැහැ.[9] **11** සවස් වන විට ඔහු තමන්ගේ ඇඟපත සෝදාගත යුතුයි. ඔහුට නැවතත් කඳවුරට ඇතුල් වෙන්න අවසර ලැබෙන්නේ හිරු බැස ගියායින් පසුවයි.[10] **12** කඳවුරේ සිටින අයට මලපහ කිරීම සඳහා වෙනම ස්ථානයක් වෙන් කළ යුතුයි. එම ස්ථානය තිබිය යුත්තේ කඳවුරෙන් පිටතයි. **13** ඔබ මලපහ කිරීමට එම ස්ථානයට යන විට කුඩා ආයුධයක්ද රැගෙන යන්න. එයින් වළක් හාරා එහි මලපහ කරන්න. ඉන්පසු එය පස්වලින් වසා දමන්න.[11] **14** ඔබේ දෙවි වන යෙහෝවා ඔබ සමඟ ඔබේ කඳවුරේ

**22 පරි.**
1 උත් 34:2, 2සාමු 13:14
2 උත් 34:5, නික් 22:16
3 උත් 34:11
4 ද්වි 22:19
5 ලෙවී 18:8, ලෙවී 20:11, ද්වි 27:20, 1කොරි 5:1

**23 පරි.**
6 ලෙවී 21:20
7 යෙසා 56:4, මතෙ 19:12
8 නික් 20:14, ලෙවී 20:10, යොහ 8:41, හෙබ්‍රෙ 12:8
9 නෙහෙ 13:1
10 ද්වි 2:29, විනි 11:18
11 මතෙ 25:45
12 ගණන් 22:6, යොෂු 24:9, නෙහෙ 13:2

**2 තීරුව**
1 ගණන් 22:35, මීකා 6:5
2 ගණන් 23:11, ගණන් 23:25, ගණන් 24:10, ගීතා 3:8
3 ද්වි 7:7, ද්වි 33:3, එස 16:8, මලා 1:2
4 2සාමු 8:2, 2සාමු 12:31
5 උත් 25:24, උත් 36:1, ගණන් 20:14, ඔබ 10
6 උත් 15:13, උත් 46:6, නික් 22:21, ලෙවී 19:34, ගීතා 105:23
7 1සාමු 21:5, 2සාමු 11:11
8 ලෙවී 15:16
9 1සාමු 20:26
10 ලෙවී 15:31
11 1සාමු 24:3

සිටින බව නිතරම මතක තබා-
ගන්න.[1] ඔහු ඔබව ආරක්ෂා කරමින්
ඔබේ සතුරන්ව ඔබේ අතට හසු කර
දෙනවා.[2] ඒ නිසා ඔබ සියලුදෙනා
ශුද්ධව සිටිනවා වගේම කඳවුරත් ශුද්-
ධව තබාගත යුතුයි.[3] ඔබ අතරේ යම්
කෙනෙක් නොමනා දෙයක් කරනවා
දෙවි දුටුවොත් දෙවි ඔබව සම්පූර්ණ-
යෙන්ම අත්හරියි.[4]
**15** "දාසයෙක් තමාගේ ස්වාමි-
යාගෙන් පලා ගොස් ඔබ ළඟට
පැමිණියොත් නැවතත් ඔහුව තම
ස්වාමියාට භාර නොදෙන්න.[5]
**16** තමාට කැමති ප්‍රදේශයක,
කැමති නුවරක, තමන් කැමති කෙ-
නෙකු සමඟ වාසය කරන්න ඔහුට
අවසර තිබෙනවා.[6] ඔහුට හිරිහැර
නොකරන්න.[7]
**17** "ඊශ්‍රායෙල් ජනයෙනි, ඔබේ
දූවරුන්ට දේවාලවල ගණිකාවන්
ලෙස හැසිරීමටවත්[8] ඔබේ පුතුන්ට
මුදලට සමලිංගික සේවනයේ යෙදී-
මටවත් ඉඩ නොදිය යුතුයි.[9]
**18** එසේම යම් භාරයක් ඔප්පු කිරීමේ
අදහසින් වේශ්‍යාවක් උපයන මුදල්-
වත්[10] සමලිංගික සේවනයේ යෙ-
දෙන පිරිමියෙක්* උපයන මුදල්වත්[11]
යෙහෝවා දෙවිගේ ගෘහයට නො-
ගෙනා යුතුයි. මන්ද යෙහෝවා දෙවි
ඒවා සලකන්නේ ඉතා පිළිකුල්සහ-
ගත දේවල් ලෙසයි.
**19** "ඔබේ සහෝදරයෙක් මුදල්,
ආහාර[12] හෝ වෙන යම් දෙ-
යක් ඔබෙන් ණයට ගත්තොත් ඒ
සඳහා පොලියක්[13] අය කරන්න එපා.
**20** විදේශිකයෙක් ඔබෙන් ණයක්
ගත්තොත් ඒ සඳහා පොලී අය
කරන්න ඔබට අවසර තිබෙනවා.[14]
නමුත් ඔබේ සහෝදරයෙකුගෙන් නම්
පොලී අය කරන්න එපා.[15] ඔබ
මේ දේවලට කීකරු වුණොත් ඔබට
උරුම වන දේශයේ ඔබ කරන සෑම
දෙයකටම යෙහෝවා දෙවිගේ ආශීර්-
වාදය ඔබට නොඅඩුව ලැබෙයි.[16]

**21** "ඔබ යෙහෝවා දෙවිට භාරයක්
වුණොත්[1] එය ඉටු කිරීමට ප්‍රමාද
නොවන්න.[2] ඔබ ඒ භාරය ඉටු කරයි
කියා යෙහෝවා දෙවි ඔබෙන් බලා-
පොරොත්තු වෙනවා. ඔබ එය ඉටු
නොකළොත් එය පාපයක් වෙයි.[3]
**22** නමුත් භාරයක් නොවී සිටීම පාප-
යක් නොවෙයි.[4] **23** ඔබේ දෙවි වන
යෙහෝවාට ඔබ භාරයක් වුණොත්
එය කඩ නොකළ යුතුයි.[5] ඔබේ
කැමැත්තෙන්ම ඉදිරිපත් වී කළ එම
පොරොන්දුව එලෙසම ඉටු කරන්න.[6]
**24** "ඔබ ඔබේ අසල්වාසියාගේ මිදි-
වත්තට ගියොත් කැමති මිදි ප්‍රමාණ-
යක් කන්න ඔබට පුළුවන්. නමුත් මිදි
කූඩයකට දමා රැගෙන යන්න එපා.[7]
**25** "ඔබේ අසල්වාසියා වගා කළ
කෙතක් මැදින් ඔබ ගමන් කළොත්
එහි ඇති පැසුණු ධාන්‍ය කරල් කඩා-
ගෙන කන්න ඔබට පුළුවන්. නමුත්
ඔබේ අසල්වාසියා වගා කළ ඒ කෙ-
තේ අස්වැන්න දෑකැත්තකින් නෙළා-
ගන්න ඔබට අවසර නැහැ.[8]

**24** "පුරුෂයෙක් තමන් විවාහ
කරගත් ස්ත්‍රිය නොමනා
ආකාරයකින් හැසිරෙන බව දැක ඇය
ගැන පිළිකුලක් ඇති වී ඇයව අත්හ-
රින්න තීරණය කළොත්[9] ඔහු කළ
යුත්තේ මෙයයි. ඔහු ඇගෙන් දික්ක-
සාද වන බවට ලියවිල්ලක් සකස් කර
ඇයට දී[10] ඇයව තම නිවසෙන්
පිටත් කර යැවිය යුතුයි.[11] **2** ඉන්-
පසු ඇයට වෙනත් පුරුෂයෙකු සමඟ
විවාහ විය හැකියි.[12] **3** දෙවන පුරු-
ෂයාත් ඇයට වෛර කර දික්ක-
සාද වන බවට ලියවිල්ලක් සකස්
කර ඇයව තම නිවසෙන් පිටත්
කර යැව්වොත් එසේත් නැත්නම් ඒ
පුරුෂයා මිය ගියොත් **4** මුල්ම පුරු-
ෂයාට ඇයව නැවත විවාහ කරගන්න
අවසර නැහැ. මන්ද ඇය ඔහු ඉදිරි-
යේ සිටින්නේ අපවිත්‍ර තත්වයකයි.[13]
එවැනි දෙයක් කළොත් එය යෙ-
හෝවා දෙවිට පිළිකුලක්. යෙහෝවා

**23 පරි.**
**1** ලෙවී 26:12
**2** ද්වි 7:2
ද්වි 7:23
**3** 1පේතෘ 1:16
**4** ලෙවී 26:17
2පේතෘ 3:14
**5** 1සාමු 30:15
**6** යෙසා 16:3
**7** නික් 22:21
යෙරෙ 7:5
සෙක 7:9
මලා 3:5
**8** ලෙවී 19:29
ලෙවී 21:9
**9** 1රාජා 14:24
1රාජා 15:12
2රාජා 23:7
**10** එස 16:33
**11** උත් 19:5
රෝම 1:27
1තිමෝ 1:10
එළි 22:15
**12** ලෙවී 25:37
**13** නික් 22:25
ලෙවී 25:36
නෙහෙ 5:10
ගීතා 15:5
එස 18:8
එස 22:12
**14** ද්වි 15:6
**15** හිතෝ 28:8
එස 18:17
**16** ද්වි 15:4
ද්වි 15:10
හිතෝ 19:17
ලූක් 6:35

**2 තීරුව**
**1** විනි 11:30
1සාමු 1:11
**2** යෝබ් 22:27
ගීතා 66:13
ගීතා 116:18
දේශ 5:4
යෝනා 2:9
නාහු 1:15
**3** දේශ 5:6
රෝම 1:31
යාකො 4:17
**4** දේශ 5:5
**5** ගණන් 30:2
ගීතා 15:4
හිතෝ 20:25
**6** විනි 11:35
1සාමු 14:24
මතෙ 5:33
**7** මතෙ 6:11
රෝම 13:10
**8** මතෙ 12:1
ලූක් 6:1

**24 පරි.**
**9** මතෙ 19:3
මතෙ 19:8
**10** යෙරෙ 3:8
මතෙ 5:31
මාක් 10:4
**11** මලා 2:16
මතෙ 1:19

**12** ලෙවී 21:7; මතෙ 5:32; මාක් 10:11; **13** යෙරෙ 3:1.

ද්වි **23:18*** මූ.අ., "බල්ලෙක්."

දෙවි ඔබට උරුම කර දෙන දේශයේ
එවැනි පව්කාර ක්‍රියාවල් සිදු නොකිරී-
මට ඔබ වගබලා ගත යුතුයි.
**5** “පුරුෂයෙක් විවාහ වූ අලුත[1]
ඔහුට හමුදා සේවයෙනුත් වෙනත්
සේවාවන්ගෙනුත් අවුරුද්දක නිදහ-
සක් ලැබෙයි. මෙසේ, ඒ අවුරුද්ද පුරා
තම භාර්යාව සමඟ ප්‍රීතියෙන් කල්
ගෙවන්න ඔහුට පුළුවන්.[2]
**6** “යම් කෙනෙක් ඔබෙන් ණයක්
ගත්තොත් ඒ ණයට ඇප වශයෙන්
ඔහුගේ ඇඹරුම් ගලවත් එහි අත්ගල-
වත් ගන්න ඔබට අවසර නැහැ.[3] එසේ
කළොත් ඔහුගේ ජීවිතය රැකගන්න
ඔහුට හැකි වෙන්නේ නැහැ. ඔබ ඇප
වශයෙන් ගන්නේ ඔහුගේ ජීවිතයයි.
**7** “ඊශ්‍රායෙල්වරයෙක් තමන්ගේම
සෙනඟ අතරෙන් කෙනෙකුව පැහැ-
රගෙන[4] ඔහුව මුදල්වලට විකු-
ණුවොත්[5] ඒ කුරිරු ක්‍රියාව කළ
පුද්ගලයාව මරා දමන්න. එසේ කර
ඔබ අතරින් එවැනි දුෂ්ටකම් ඉවත්
කරන්න.[6]
**8** “ලාදුරු රෝගය ගැන අවධාන-
යෙන් සිටින්න.[7] ඒ සම්බන්ධයෙන්
කළ යුතු දේ ගැන මම පූජකයන්ට හා
ලෙවීවරුන්ට විවිධ උපදෙස් දී තිබෙ-
නවා.[8] ඔවුන් ඔබට දෙන සෑම උපදෙ-
සක්ම පිළිපැදීමට වගබලා ගන්න.[9]
**9** ඔබ ඊජිප්තුවෙන් පිටතට ආ පසු
යෙහෝවා දෙවි මිරියම්ට කළ දේත්
අමතක කරන්න එපා.[10]
**10** “ඔබේ අසල්වාසියාට යමක්
ණයට දුන් පසු,[11] ඔහු ඇප වශයෙන්
දීමට පොරොන්දු වූ දේ ගැනීමට ඔහු-
ගේ නිවස ඇතුළට යන්න එපා.[12]
**11** ඔහු එය ගෙනත් දෙන තුරු ඔබ
ඔහුගේ නිවසින් පිටතට වී බලා සිටිය
යුතුයි. **12** ඔහු ඉතා දුගී තත්වය-
කට පත් වී සිටිනවා නම් නින්දට
යන්න කලින් ඔබ ඇප වශයෙන් ගත්
දේ නැවත ඔහුට ලබා දිය යුතුයි.[13]
**13** හිරු බැස ගිය වහාම ඔබ ඔහු-
ගෙන් ගත් දේ ඔහුට නැවත ලබා
දෙන්න.[14] එවිට තමාගේ පිට වස්ත්‍රය
ඇඳගෙන නිදාගන්න ඔහුට පුළුවන්.[15]
එමෙන්ම ඔහු ඔබට ආශීර්වාද[1] කරයි.
ඔබ කළ ඒ දේ ඔබේ දෙවි වන යෙ-
හෝවා ධර්මිෂ්ඨ ක්‍රියාවක් ලෙස සල-
කයි.[2]
**14** “කුලියට යම් වැඩක් කරගැනී-
මට ඔබේ සහෝදරයෙකුව හෝ ඔබේ
දේශයේ පදිංචි වී සිටින විදේශිකයෙ-
කුව ගන්න ඔබට හැකියි. නමුත් ඔහු
දිළිඳු හෝ අසරණ කෙනෙක් වූ පළි-
යට ඔහුගෙන් අයුතු ප්‍රයෝජන ගන්න
එපා.[3] **15** ඔහු අසරණව සිටින නිසා
ඔහු ඔබ ළඟ වැඩ කරන්නේ කුලියක්[4]
බලාපොරොත්තුවෙන්. ඒ නිසා සෑම
දිනකම හිරු බැස ගිය වහාම ඔහුගේ
කුලිය ඔහුට ලබා දෙන්න. ඔබ එසේ
නොකළොත් එය පාපයක්.[5] ඔබ කළ
ඒ අසාධාරණය ගැන ඔහු යෙහෝවා
දෙවිට කන්නලව් කරයි.[6]
**16** “දරුවෙක් කරන වරදක් නිසා
ඔහුගේ පියාව මරා නොදැමිය යුතුයි.
පියෙක් කරන වරදක් නිසා ඔහු-
ගේ දරුවාව මරා නොදැමිය යුතුයි.[7]
මරණ දණ්ඩනය දිය යුත්තේ වරද
කළ තැනැත්තාට පමණයි.[8]
**17** “ඔබ අතරේ සිටින විදේශි-
කයෙකුටවත්[9] පියා නැති දරු-
වෙකුටවත්[10] කිසිම අසාධාරණයක්
නොකරන්න. වැන්දඹුවකගේ වස්ත්‍ර-
යක් ඇපයට නොගන්න.[11] **18** ඔබ
ඊජිප්තු දේශයේ වහලුන් ලෙස සිටි
බවත් යෙහෝවා දෙවි ඔබව නිදහස්
කළ බවත් අමතක නොකරන්න.[12]
මේ දේවල් කරන්න මා ඔබට අණ
කරන්නේ ඒ නිසයි.
**19** “ඔබේ කෙතේ අස්වැන්න නෙ-
ළාගත් පසු[13] අමතක වී එක මිටියක්
කෙතේ තබා ගියොත් එය ගැනීමට
ආපසු නොයන්න. විදේශිකයන්ට,
පියා නැති දරුවන්ට සහ වැන්දඹු-
වන්ට එය ගැනීමට ඉඩ දෙන්න.[14] ඔබ
එසේ කළොත් ඔබ කරන සෑම දෙය-
කටම යෙහෝවා දෙවිගේ ආශීර්වාද
ඔබට නොඅඩුව ලැබෙයි.[15]

**24 පරි.**

**1** ද්වි 20:7; ලූක් 14:20
**2** හිතෝ 5:18; දේශ 9:9
**3** නික් 22:26; නික් 22:27
**4** උත් 40:15; නික් 21:16; 1තිමෝ 1:10
**5** උත් 37:28
**6** ද්වි 19:19; ද්වි 21:21
**7** ලෙවී 13:9; ලෙවී 14:2; ලෙවී 14:34
**8** ලෙවී 13:2; ලෙවී 13:15; 2ලේක 26:20; මලා 2:7; මාක් 1:44; ලූක් 17:14
**9** ගීතා 119:4
**10** ගණන් 12:10; ගණන් 12:15
**11** ද්වි 15:8; හිතෝ 3:27
**12** යෝබ් 24:3
**13** යෝබ් 24:9; යෝබ් 24:10
**14** නික් 22:26; එස 18:7; එස 33:15
**15** නික් 22:27

**2 තීරුව**

**1** 1සාමු 25:14; එස 33:15; 2කොරි 9:13
**2** ද්වි 6:25; ගීතා 112:9; දානි 4:27
**3** ලෙවී 25:40; ලෙවී 25:43; හිතෝ 14:31; මලා 3:5
**4** ලෙවී 19:13; යෙරෙ 22:13; මතෙ 20:8
**5** යාකො 4:17
**6** නික් 22:23; යෝබ් 34:28; ගීතා 25:1; ගීතා 86:4; හිතෝ 22:23; යාකො 5:4
**7** 2ලේක 25:4; යෙරෙ 31:30
**8** එස 18:20
**9** නික් 22:21; එස 22:29
**10** නික් 22:22; යෙසා 1:23; යෙරෙ 5:28; මලා 3:5
**11** නික් 22:27; යෝබ් 24:3
**12** ද්වි 5:15; ද්වි 15:15; ද්වි 16:12
**13** ලෙවී 19:9

---

**14** ලෙවී 23:22; රූත් 2:16; ගීතා 41:1; **15** ද්වි 15:10; හිතෝ 11:24; හිතෝ 14:21; හිතෝ 19:17; ලූක් 6:38; 2කොරි 9:6; 1යොහ 3:17.

**20** “ඔබට අයිති ඔලීව ගස්වලින්
ගෙඩි කඩාගත්* පසු ඒවායේ අතුවල
නවත් ගෙඩි ඉතුරු වී ඇද්දැයි සොයා
බලන්න එපා. ඒවා විදේශිකයන්, පියා
නැති දරුවන් සහ වැන්දඹුවන් වෙනු-
වෙන් ඉතුරු කරන්න.[1]
**21** “ඔබට අයිති මිදිවත්තෙන් ඔබ
මිදි එකතු කරගත් පසු, නැවතත්
ගොස් නවත් මිදි ඉතුරු වී ඇද්දැයි
බලන්න එපා. ඒවා විදේශිකයන්, පියා
නැති දරුවන් හා වැන්දඹුවන් සඳහා
තබා යන්න. **22** ඔබ ඊජිප්තු දේශ-
යේ වහලුන් ලෙස සිටි කාලය අමතක
කරන්න එපා.[2] මා ඔබට මේ දේවල්
අණ කරන්නේ ඒ නිසයි.[3]

**25** “මිනිසුන් දෙදෙනෙකු අතර
යම් ආරවුලක් ඇති
වුණොත්[4] එය විසඳාගැනීමට ඔවුන්
විනිශ්චයකරුවන් ඉදිරියට පැමිණිය
යුතුයි.[5] ඒ විනිශ්චයකරුවන් ධර්මිෂ්-
ඨයා හා දුෂ්ටයා කවුද කියා පැහැදි-
ලිව හඳුනාගෙන නිවැරදි තීන්දුවක්
දිය යුතුයි.[6] **2** වරදකරුව හඳුනා-
ගත් පසු දඬුවමක් ලෙස ඔහුට පහර
දීමට තීන්දු කර ඇත්නම්[7] ඔහුව බිම
දිගා කර, වරදේ බරපතළකම හැටි-
යට ඔහුට ගැසිය යුතුයි.[8] එය සිදු විය
යුත්තේ විනිශ්චයකරුගේ අධීක්ෂණය
යටතෙයි. **3** නමුත් ඔහුට පහරවල්
හතළිහකට වඩා ගැසීමට අවසර
නැහැ. ඔබේ සහෝදරයෙක් වූ ඔහුට
ඊට වැඩියෙන් පහර දුන්නොත්[9] සිය-
ලුදෙනා ඉදිරියේ ඔහු නින්දාවට පත්
වෙයි.
**4** “ගවයෙක් කමතේ කරල් පාගන
විට උගේ කට බඳින්න එපා.[10]
**5** “සහෝදරයන් කිහිපදෙනෙකු
සිටින පවුලක එක් සහෝදරයෙක්
විවාහ වූ පසු දරුවන් නොමැතිව ඔහු
මිය ගියායයි සිතන්න. එවැනි අවස්-
ථාවක ඔහුගේ බිරිඳව වෙනත් පවු-
ලක කෙනෙකුට විවාහ කර නොදිය
යුතුයි. ඒ වෙනුවට ඔහුගේ සහෝදර-
යෙක් මස්සිනාගේ යුතුකම් ඉටු කර-
මින් ඇයව විවාහ කරගත යුතුයි.[1]
**6** එසේ විවාහ වූ පසු ඇය බිහි කරන
කුලුඳුල් පුත්‍රයාට මිය ගිය සහෝදර-
යාගේ නම ලබා දිය යුතුයි.[2] එවිට ඒ
මිය ගිය තැනැත්තාගේ පෙළපත
ඊශ්‍රායෙල් දේශයෙන් නැති වී නො-
යයි.[3]
**7** “නමුත් ඔහු තම මිය ගිය
සහෝදරයාගේ බිරිඳව විවාහ කර-
ගැනීමට අකමැති නම් ඒ වැන්-
දඹුව නුවරේ දොරටු අසල රැස්ව
සිටින වැඩිමහල්ලන් ළඟට ගොස්[4]
මෙසේ පැවසිය යුතුයි. ‘මගේ සැමියා
මිය ගිහින්. නමුත් ඔහුගේ සහෝද-
රයා කැමති නැහැ මාව විවාහ කර-
ගන්න. මගේ සැමියාගේ පෙළපත
ඊශ්‍රායෙල් දේශයෙන් නැති වෙයි කියා
දැන දැනත් ඔහු මස්සිනාගේ යුතු-
කම් ඉටු කරන්න කැමති නැහැ.’
**8** එවිට නුවරේ වැඩිමහල්ලන් ඔහුව
කැඳවා ඔහුගෙන් ඒ ගැන ඇසිය
යුතුයි. ‘ඇයව විවාහ කරගන්න මගේ
කැමැත්තක් නැහැ’[5] කියා ඔහු පැවසු-
වොත් කළ යුත්තේ මෙයයි. **9** ඔහු-
ගේ සහෝදරයාගේ බිරිඳ ඔහුගේ
පාදයෙන් පාවහනක් ගලවා[6] ඔහුගේ
මුහුණට කෙළ ගසා,[7] ‘සහෝදරයාගේ
පවුල ගැන තැකීමක් නැති කෙනෙ-
කුට සැලකිය යුත්තේ මෙහෙමයි’[8]
කියා නුවරේ වැඩිමහල්ලන් ඉදිරියේ
පැවසිය යුතුයි. **10** එතැන් පටන්
ඔහුගේ පෙළපත ඊශ්‍රායෙල් දේශයේ
‘පාවහනක් ගලවනු ලැබූ තැනැත්තා-
ගේ පෙළපත’ ලෙස හැඳින්විය යුතුයි.
**11** “පුරුෂයන් දෙදෙනෙක් අතර
ඩබරයක් ඇති වී ඔවුන් පොර අල්ලන
විට එක් කෙනෙකුගේ භාර්යාව තම
පුරුෂයාට උපකාර කිරීමේ අදහසින්
අනික් තැනැත්තාගේ ලිංගේන්ද්‍රියෙන්
අල්ලාගත්තොත්[9] **12** ඊට දඬුවමක්
වශයෙන් ඇගේ අත කපා ඉවත්
කරන්න. ඇයට කිසි අනුකම්පාවක්
පෙන්වන්න එපා.[10]
**13** “ඔබේ මල්ලේ නියම බර ඇති
මිනුම් පඩියකුත් අඩු බර ඇති

---

**ද්වි 24:20*** පොල්ලකින් ගසා ගෙඩි කඩාගත් පසු යන අදහස මුල් භාෂාවේ සඳහන් වේ.

**24 පරි.**
1 ලෙවී 19:10, ද්වි 26:13
2 නික් 13:3
3 2කොරි 8:8

**25 පරි.**
4 ද්වි 17:8, ද්වි 19:17, ද්වි 21:5
5 ද්වි 16:18, ද්වි 17:9
6 නික් 23:6, 2ලේක 19:6, හිතෝ 17:15, හිතෝ 31:9, යෙසා 5:23
7 හිතෝ 19:29, ලූක් 12:48
8 හිතෝ 10:13, හිතෝ 20:30, හිතෝ 26:3, හෙබ්‍රෙ 2:2
9 2කොරි 11:24
10 හිතෝ 12:10, 1කොරි 9:9, 1තිමෝ 5:18

**2 තීරුව**
1 උත් 38:8, රූත් 4:5, මාක් 12:19
2 උත් 38:9, රූත් 4:10, රූත් 4:14
3 ගණන් 27:4, 2සාමු 18:18
4 රූත් 4:4
5 රූත් 4:6
6 රූත් 4:7
7 ගණන් 12:14
8 ද්වි 25:5
9 ලෙවී 21:20, ද්වි 23:1
10 ද්වි 19:13, ද්වි 19:21

මිනුම් පඩියකුත් තබාගන්න එපා.[1]
**14** ඔබේ නිවසේ නියම ඒපා මිනු-
මක්*[2] සහ හොර ඒපා මිනුමක් තබා-
ගන්න එපා. **15** ඔබේ මිනුම් පඩි
සියල්ල නිවැරදි විය යුතුයි. ඔබේ ඒපා
මිනුමද නිවැරදි එකක් විය යුතුයි.
ඔබ එසේ කළොත් යෙහෝවා දෙවි
ඔබට ලබා දෙන දේශයේ බොහෝ
කාලයක් පුරා ජීවත් වෙන්න ඔබට
හැකි වෙයි.[3] **16** එවැනි වංචනික
දේවල් කරන තැනැත්තන්ව යෙ-
හෝවා දෙවි පිළිකුල් කරයි.[4]

**17** "ඔබ ඊජිප්තුවෙන් නිදහස් වී
ගමන් කරමින් සිටි විට අමලෙක්ව-
රුන් ඔබට කළ දේ හොඳින් මතක
තබාගන්න.[5] **18** ගමන් විඩාව නිසා
ඔබ අතරේ බොහෝදෙනෙක් සිටියේ
හොඳටම හෙම්බත් වෙලයි. නමුත්
දෙවිට කිසිම ගරුබියක්[6] නොදැක්වූ
අමලෙක්වරුන්, හෙම්බත් වී පිටු-
පසින්ම ගමන් කළ අයට පහර
දුන්නා. **19** ඒ නිසා ඔබ අමලෙක්ව-
රුන් කියන ජාතිය සම්පූර්ණයෙන්ම
නැති කර දැමිය යුතුයි.[7] ඔබ එසේ
කළ යුත්තේ යෙහෝවා දෙවි ඔබට
උරුම කර දෙන දේශයට ගොස් එහි
පදිංචි වී කිසිම සතුරෙකුගෙන් හිරි-
හැරයක් නොවිඳිමින් සමාදානයෙන්
ජීවත් වන කාලයේදීයි.[8] යෙහෝවා
දෙවිගේ ආශීර්වාද ලබන ඒ කාලයේදී
අමලෙක්වරුන්ට කළ යුතු දේ අම-
තක කරන්න එපා.

**26** "ඔබේ දෙවි වන යෙහෝවා
ඔබට උරුම කර දෙන දේශ-
යට ගොස් පදිංචි වූ පසු,[9] **2** යෙ-
හෝවා දෙවි ඔබට ලබා දී තිබෙන
ඒ දේශයෙන් නෙළාගන්නා මුල්ම
පලදාවෙන් කොටසක්[10] වෙන් කර-
ගන්න. ඒ වෙන් කරගත් කොටස
කූඩයක දමා යෙහෝවා දෙවි තම
නාමය දැරීමට තෝරාගන්නා ස්ථාන-
යට රැගෙන යන්න.[11] **3** ඉන්පසුව
ඒ කාලයේදී පූජකයා ලෙස සේවය
කරන තැනැත්තා ළඟට ගොස්[12] ඔබ
ප්‍රසිද්ධියේ මෙවැනි ප්‍රකාශයක් කළ
යුතුයි. 'අපේ දෙවි වන යෙහෝවාගේ
පොරොන්දුවට එකඟව අද සෑම දෙ-
යක්ම සිදු වී ඇති බව මම දැන් ප්‍රකාශ
කරන්න කැමතියි. යෙහෝවා දෙවි
අපේ මුතුන්මිත්තන්ට දෙන්න පො-
රොන්දු වූ දේශයට මා දැන් ඇවිත්
පදිංචි වී සිටිනවා.'[1]

**4** "එවිට පූජකයා ඔබ ගෙනා
කූඩය යෙහෝවා දෙවිගේ පූජාස-
නය ඉදිරියේ තැබිය යුතුයි. **5** ඉන්-
පසු යෙහෝවා දෙවි ඉදිරියේ ඔබ
මෙසේ පැවසිය යුතුයි. 'අපේ ආදි-
පියා සිරියානුවෙක්.*[2] ඔහුගේ ජීවි-
තය නිතරම තිබුණේ අනතුරේ. ඔහු
කුඩා පිරිසක්[3] සමඟ ඊජිප්තු දේශයට
ගොස්[4] විදේශිකයෙකු ලෙස වාසය
කරන්න පටන්ගත්තා. ඒ දේශයේදී
ඔවුන් ඉතා විශාල බලවත් ජාතියක්
බවට පත් වුණා.[5] **6** නමුත් අපට
කුරිරු ලෙස හිරිහැර කළ ඊජිප්තු-
වරුන් අපව වහල්කමට ගත්තා.[6]
**7** එවිට අපි ඒ ගැන අපේ මුතුන්-
මිත්තන්ගේ දෙවි වන යෙහෝවාට
කන්නලව් කළා.[7] අප අද්දකිමින්
සිටි දුක් පීඩා හා හිරිහැර[8] දුටු
යෙහෝවා දෙවි අපේ හඬට සවන්
දුන්නා.[9] **8** ඒ නිසා, යෙහෝවා දෙවි
තම මහත් බලයෙන්[10] විවිධ ලකුණු,
ආශ්චර්යයන්[11] හා භයානක දේවල්
කරමින්[12] අපිව ඊජිප්තුවෙන් නිදහස්
කළා. **9** ඉන්පසු දෙවි අපට කිරි-
යෙන් හා පැණියෙන් ගලා යන මේ
දේශය උරුම කර දුන්නා.[13] **10** ඒ
නිසා මම දැන් යෙහෝවා දෙවි අපට
ලබා දුන් මේ දේශයේ අස්වැන්නෙන්
නෙළාගත් මුල්ම පලදාව දෙවිට ලබා
දෙන්න කැමතියි.'[14]

"ඔබ එසේ පැවසූ පසු ඒ දේවල් යෙ-
හෝවා දෙවි ඉදිරියේ තබා ඔබේ
දෙවි වන යෙහෝවා ඉදිරියේ වැඳ

**25 පරි.**

**1** හිතෝ 11:1; හිතෝ 16:11; හිතෝ 20:10; මීකා 6:11
**2** නික් 16:36; ලෙවී 19:36; එස 45:10; ආමො 8:5
**3** ද්වි 4:40; 1පේතෘ 3:10
**4** ලෙවී 19:35; රෝම 9:14
**5** නික් 17:8; ගණන් 24:20
**6** නික් 15:16; ගීතා 36:1; රෝම 3:18
**7** නික් 17:14; 1සාමු 14:48; 1සාමු 15:3; 1ලේක 4:43; එස්ත 3:1; එස්ත 7:10
**8** යොෂු 22:4

**26 පරි.**

**9** ද්වි 6:1; ද්වි 18:9
**10** නික් 23:19; ලෙවී 23:10; ගණන් 18:12; 2ලේක 31:5; නෙහෙ 10:35; හිතෝ 3:9
**11** ද්වි 12:5; 2ලේක 6:6
**12** ගණන් 18:28

**2 තීරුව**

**1** උත් 17:8; උත් 26:3; ගීතා 105:11; හෙබ්‍රෙ 6:13
**2** උත් 28:5; උත් 31:41; උත් 31:42; හොෂෙ 12:12
**3** උත් 46:27; ද්වි 7:7
**4** උත් 46:3; ක්‍රියා 7:15
**5** නික් 1:7; ද්වි 10:22; ගීතා 105:24
**6** නික් 1:11; ද්වි 4:20
**7** නික් 3:9; ගීතා 116:1
**8** නික් 4:31; ක්‍රියා 7:34
**9** ගීතා 102:20; යෙසා 59:1; 1යොහ 5:15
**10** නික් 6:6; නික් 13:3; ද්වි 4:34; ද්වි 6:21
**11** නික් 7:3
**12** නික් 15:16; යෙරෙ 32:21; **13** නික් 3:8; ද්වි 8:8; එස 20:6; **14** ද්වි 26:2.

**ද්වි 25:14*** නික් 16:36හි පාදසටහන බලන්න.

**ද්වි 26:5*** මෙහි කතා කරන්නේ සිරියානු ප්‍රදේශයක් වන හාරාන්හි ජීවත් වූ යාකොබ් ගැනයි.

වැටී ඔහුට නමස්කාර කරන්න.[1]
**11** ඉන්පසුව යෙහෝවා දෙවි ඔබටත්
ඔබේ පවුලේ සාමාජිකයන්ටත් දුන්
සෑම යහපත් දෙයක් ගැනම ඔබට
මෙන්ම ඔබ සමඟ වාසය කරන ලෙ-
වීවරුන්ට හා විදේශිකයන්ටද[2] ප්‍රීති
විය[3] හැකියි.
**12** “සෑම අවුරුදු තුනකට වරක්,
ඔබට ලැබෙන මුළු අස්වැන්නෙන්
දසයෙන් කොටස[4] වෙන් කරගත් පසු[5]
ඔබ එය ලෙවීවරුන්ට, ඔබ අතරේ
වාසය කරන විදේශිකයන්ට, පියා
නැති දරුවන්ට සහ වැන්දඹුවන්ට දිය
යුතුයි. එවිට ඔබේ නුවරේ පදිංචි
වී සිටින ඒ සියලුදෙනාට කා බී
තෘප්තිමත් විය හැකියි.[6] **13** ඒ දේ
කළායින් පසු ඔබ යෙහෝවා දෙවි
ඉදිරියේ මෙසේද කිව යුතුයි. ‘දෙවි-
යනි, ඔබට කැප කළ දේ මගේ
නිවසේ තබාගෙන සිටියේ නැහැ.
ඔබ අණ කළ ආකාරයටම මම
ඒ දේවල් ලෙවීවරුන්ට, අප අතරේ
සිටින විදේශිකයන්ට, පියා නැති දරු-
වන්ට හා වැන්දඹුවන්ට දුන්නා.[7] ඔබ
අණ කළ දේ මම කඩ කළේවත් එය
අමතක කළේවත් නැහැ.[8] **14** මා
ශෝකයෙන් සිටි කාලයේදීවත් මා
චාරිත්‍රානුකූලව අපවිත්‍රව සිටි අවස්-
ථාවලදීවත් මරණයක් සිදු වූ අවස්ථා-
වකදීවත් ඒ කැප කළ දෙයින් කිසිවක්
ගත්තේ නැහැ. යෙහෝවා දෙවියනි,
ඔබ අණ කළ දේට කීකරු වී මම
මගේ යුතුකම් ඉටු කළා. **15** දෙවි-
යනි, ඔබේ ශුද්ධ වාසස්ථානය[9] වන
ස්වර්ගයේ සිට ඔබේ සෙනඟ වන
ඊශ්‍රායෙල් දෙස බලා ඔවුන්ට ආශීර්-
වාද කරන්න.[10] ඔවුන්ගේ මුතුන්මිත්-
තන්ට පොරොන්දු වූ[11] ලෙස ඔබ අපට
ලබා දුන් කිරියෙන් හා පැණියෙන්
ගලා යන මේ දේශයටත්[12] ආශීර්වාද
කරන්න කියා මම ඉල්ලා සිටිනවා.’
**16** “ඔබේ දෙවි වන යෙහෝවා
ඔබට අද අණ කරන්නේ මෙම අණප-
නත් හා නීතිදු පිළිපදින්න කියායි.[13]
ඔබ ඒවා ඔබේ මුළු හදවතින්ම[14] පිළි-
පැදීමට වැයම් කළ යුතු අතර වෙ-
හෙස මහන්සිය නොබලා[1] ඒවා ඉටු
කළ යුතුයි. **17** දෙවි දෙන මඟ
පෙන්වීම්වලට එකඟව ජීවත් වෙමින්
ඔහුගේ නීතිදු[2] හා අණපනත්[3] පිළිපැ-
දීමටත් ඔහුගේ හඬට කීකරු වීමටත්[4]
ඔබ එකඟ වූ නිසා යෙහෝවා දෙවි
අද ඔහුගේ නමස්කාරකයන් ලෙස
ඔබව භාරගන්නවා. **18** යෙහෝවා
දෙවි පොරොන්දු වූ ලෙස[5] ඔහුට අයිති
විශේෂ සෙනඟක්[6] වෙන්නත් ඔහු-
ගේ සියලු අණපනත් පිළිපදින්නත්
කැමති බව ඔබත් අද ප්‍රකාශ කළා.
**19** දෙවි ඔබට පොරොන්දු වූ ලෙස
ඔහු අන් සියලුම ජාතීන්ට වඩා ඔබව
උසස් කරයි.[7] ඔබ දිගටම යෙහෝවා
දෙවි ඉදිරියේ ශුද්ධ සෙනඟක්[8] ලෙස
කටයුතු කරන්න. ඔබ එසේ කළොත්
ඔබ නිසා දෙවිට ප්‍රශංසාව, ගෞරවය
හා කීර්ති නාමයක් ලැබෙන බව
නිසැකයි.”

**27** ඉන්පසුව මෝසෙස් ඊශ්‍රායෙල්
සෙනඟ අතරේ සිටින වැඩිම-
හල්ලන්ව එකතු කරගෙන සෙනඟට
මෙසේ අණ කළේය. “අද මා ඔබට
කියා දෙන සියලුම අණපනත් පිළිපැ-
දීමට ඔබ වගබලා ගත යුතුයි.[9]
**2** ඔබ යොර්දාන් ගඟෙන් එගොඩ වී[10]
යෙහෝවා දෙවි ඔබට ලබා දෙන දේ-
ශයට යන දවසේදී විශාල ගල් කිහිප-
යක් තෝරාගෙන ඒවාට සුදු හුණු
ගාන්න. **3** ඔබේ මුතුන්මිත්තන්ගේ
දෙවි වන යෙහෝවා ඔබට පොරොන්දු
වූ ලෙසම කිරියෙන් හා පැණියෙන්
ගලා යන ඒ දේශය ඔබට ලබා දෙයි.[11]
ඔබේ දෙවි වන යෙහෝවා ඔබට ලබා
දෙන දේශයට ගිය පසු[12] මා ඔබ ඉදි-
රියේ ප්‍රකාශ කළ නීතියේ සඳහන්
සියලුම වචන ඒ ගල් මත ලිවිය
යුතුයි.[13] **4** ඔබ යොර්දාන් ගඟෙන්
එගොඩ වූ පසු මා අද ඔබට අණ කළ
ලෙස ඒබාල්[14] කන්දට ඒ ගල් රැගෙන
ගොස් ඒවාට සුදු හුණු ගා එහි
තබන්න.[15] **5** මීට අමතරව තවත්
ගල් කිහිපයක් ගෙන යෙහෝවා දෙවි

**26 පරි.**
1 ගීතා 95:6
2 ද්වි 16:14
3 ද්වි 12:7; ගීතා 32:11; ගීතා 63:5; ගීතා 68:3; පිලි 4:4
4 ද්වි 14:28
5 ද්වි 12:6; ද්වි 14:22
6 ද්වි 14:29; හිතෝ 14:21; 1යොහ 3:17
7 යාකො 1:27
8 ගීතා 119:141; හිතෝ 3:1; ක්‍රියා 24:16
9 ගීතා 102:19; යෙසා 40:22; යෙසා 63:15
10 නික් 23:25; ගීතා 28:9; ගීතා 115:12
11 උත් 15:18; උත් 26:3; හෙබ්‍රෙ 6:13
12 ද්වි 8:8
13 ද්වි 4:1; ද්වි 6:1; ද්වි 11:1
14 ද්වි 6:6; ගීතා 78:7; ගීතා 119:34; 1යොහ 5:3

**2 තීරුව**
1 ද්වි 13:3
2 ලෙවී 19:37; ගීතා 19:9
3 ලෙවී 10:11; ලෙවී 26:46; ද්වි 13:18; ගීතා 119:5; දේශ 12:13
4 ද්වි 15:5
5 ද්වි 29:13
6 නික් 19:5; ද්වි 14:2; ගීතා 135:4
7 ද්වි 4:8; ද්වි 28:1; ගීතා 148:14
8 ද්වි 7:6; ද්වි 28:9

**27 පරි.**
9 ද්වි 11:32; ද්වි 26:16; ලූක් 11:28
10 ද්වි 6:1; යොෂු 4:1
11 ලෙවී 20:24; ගණන් 13:27; ගණන් 14:8; ද්වි 26:9; යෙරෙ 11:5; යෙරෙ 32:22
12 යොෂු 8:32
13 නික් 24:12

**14** ද්වි 11:29; යොෂු 8:30; **15** ද්වි 27:2.

වෙනුවෙන් පූජාසනයක් එම ස්ථාන-
යේ ගොඩනඟන්න. නමුත් යකඩ
ආයුධයකින් කපාගත් ගල් ඒ සඳහා
භාවිත නොකරන්න.[1] **6** ඔබේ දෙවි
වන යෙහෝවා වෙනුවෙන් සාදන ඒ
පූජාසනය ගොඩනැඟීමට භාවිත කළ
යුත්තේ නොකැපූ ගල්. ඉන්පසුව
ඔබට ඒ මත යෙහෝවා දෙවිට දවන
පූජාද[2] **7** හවුල් පූජාද ඔප්පු කළ
හැකියි.[3] හවුල් පූජාව ඔප්පු කළ පසු,
ඒ ස්ථානයේදීම ඔබේ දෙවි වන යෙ-
හෝවා ඉදිරියේ ප්‍රීති වෙමින්[4] එය අනු-
භව කරන්න.[5] **8** ඔබට ලබා දුන්
මෙම නීතියේ සඳහන් සියල්ල සුදු
හුණු ගෑ ගල්වල[6] ඉතා පැහැදිලිව
ලියා තැබිය යුතුයි.”[7]

**9** ඉන්පසුව මෝසෙස්ද පූජක-
යෝද ලෙවීවරුද එකතු වී ඊශ්‍රායෙල්
ජනයාට මෙසේ පැවසූහ. “ඊශ්‍රායෙල්-
වරුනි, හොඳින් සවන් දෙන්න. අද
ඔබට ඉතා වැදගත් දවසක්. මන්ද අද
ඔබේ දෙවි වන යෙහෝවා ඔහුගේ සෙ-
නඟ වශයෙන් ඔබව භාරගන්නවා.[8]
**10** ඒ නිසා ඔබේ දෙවි වන යෙහෝ-
වාගේ හඬට සවන් දෙන්න. අද ඔබට
පැහැදිලි කර දුන් ඔහුගේ සියලු අණ-
පනත් පිළිපදින්න.”[9]

**11** මෝසෙස් ඒ අවස්ථාවේදී සෙ-
නඟට මෙසේද අණ කළේය.
**12** ඔබ යොර්දාන් ගඟෙන් එගොඩ වූ
පසු සිමියොන්, ලෙවී, යූදා, ඉසකාර්,
යෝසෙප් සහ බෙන්ජමින් යන ගෝ-
ත්‍රවලට ගෙරිසීම් කන්ද පාමුල[10] රැස්
වෙන්න කියන්න. ඔවුන් ඒ ස්ථානයේ
සිට සෙනඟට ආශීර්වාද ප්‍රකාශ කළ
යුතුයි. **13** රූබෙන්, ගාද්, ආෂෙර්,
සෙබුලූන්, දාන් සහ නප්තලී යන
ගෝත්‍රවලට ඒබාල් කන්ද පාමුලට[11]
යන්න කියන්න. ඔවුන් ඒ ස්ථා-
නයේ රැස් විය යුත්තේ සෙනඟට
ශාප ප්‍රකාශ කිරීම[12] සඳහායි. **14** ඒ
අවස්ථාවේදී රැස්ව සිටින මුළු ඊශ්‍රා-
යෙල් සෙනඟට ලෙවීවරුන් පැහැදිලි
හඬකින් මෙසේ පැවසිය යුතුයි.[13]

**15** “‘යමෙක් වඩුවෙකුගේ හෝ
කම්මල්කරුවෙකුගේ උපකාරයෙන්[14]
රූපයක්[1] සාදා එය තමා ළඟ තබා-
ගන්නවා නම් එය යෙහෝවා දෙ-
විට පිළිකුලක්.[2] ඒ පුද්ගලයාට ශාප
වේවා!’ (එවිට සියලුදෙනා ‘ආමෙන්’*
කියා පැවසිය යුතුයි.)[3]

**16** “‘තම පියාට හෝ මවට නින්දා
කරන්නාට ශාප වේවා!’[4] (එවිට සිය-
ලුදෙනා ‘ආමෙන්’ කියා පැවසිය
යුතුයි.)

**17** “‘තම අසල්වාසියාගේ ඉඩමේ
මායිම තමාගේ වාසිය සඳහා වෙ-
නස් කරන්නාට ශාප වේවා!’[5] (එවිට
සියලුදෙනා ‘ආමෙන්’ කියා පැවසිය
යුතුයි.)

**18** “‘අන්ධ කෙනෙකුව නොමඟ
යවන තැනැත්තාට ශාප වේවා!’[6]
(එවිට සියලුදෙනා ‘ආමෙන්’ කියා
පැවසිය යුතුයි.)

**19** “‘ඔබ අතරේ සිටින විදේශික-
යෙකුට,[7] පියා නැති දරුවෙකුට හා
වැන්දඹුවකට[8] යුක්තිය[9] ඉටු නොක-
රන්නාට ශාප වේවා!’[10] (එවිට සියලු-
දෙනා ‘ආමෙන්’ කියා පැවසිය යුතුයි.)

**20** “‘තම පියාගේ භාර්යාව සමඟ
සයනය කර පියාට මහත් නින්දා-
වක් ගෙන දෙන තැනැත්තාට ශාප
වේවා!’[11] (එවිට සියලුදෙනා ‘ආමෙන්’
කියා පැවසිය යුතුයි.)

**21** “‘යම් සතෙකු සමඟ ලිංගි-
කව හැසිරෙන තැනැත්තාට ශාප
වේවා!’[12] (එවිට සියලුදෙනා ‘ආමෙන්’
කියා පැවසිය යුතුයි.)

**22** “‘තමාගේ සහෝදරිය එනම්,
තම පියාගේ දියණිය හෝ තම මව-
ගේ දියණිය සමඟ සයනය කරන
තැනැත්තාට ශාප වේවා!’[13] (එවිට
සියලුදෙනා ‘ආමෙන්’ කියා පැවසිය
යුතුයි.)

**23** “‘තමාගේ නැන්දම්මා සමඟ
සයනය කරන තැනැත්තාට ශාප
වේවා!’[14] (එවිට සියලුදෙනා ‘ආමෙන්’
කියා පැවසිය යුතුයි.)

**24** “‘මඟ රැක සිට තම අසල්වාසි-
යාට පහර දී මරා දමන තැනැත්තාට

**27 පරි.**
1 නික් 20:25, යොෂු 8:31
2 ලෙවී 1:9
3 ලෙවී 3:1
4 ද්වි 12:7, ද්වි 16:11
5 ලෙවී 7:15
6 නික් 24:12
7 හබ 2:2
8 නික් 19:5, ද්වි 26:18
9 නික් 20:6, 1රාජා 2:3, 1රාජා 8:61, මතෙ 19:17, 1යොහ 5:3
10 ද්වි 11:29
11 යොෂු 8:33
12 දානි 9:11
13 ද්වි 33:10, නෙහෙ 8:7
14 හොෂෙ 13:2

**2 තීරුව**
1 නික් 20:4, නික් 34:17, ලෙවී 19:4, ගණන් 33:52, ද්වි 4:16, යෙසා 44:9
2 ද්වි 7:25, ද්වි 29:17
3 ගණන් 5:22, නෙහෙ 5:13
4 නික් 20:12, ලෙවී 19:3, ද්වි 21:18, ද්වි 21:21, හිතෝ 20:20, හිතෝ 30:17, මතෙ 15:4
5 ද්වි 19:14, හිතෝ 22:28, හිතෝ 23:10
6 ලෙවී 19:14
7 නික් 22:21
8 නික් 22:22, ද්වි 10:18, ද්වි 24:17, මලා 3:5, යාකො 1:27
9 ද්වි 16:20
10 හිතෝ 17:23, මීකා 3:11
11 ලෙවී 18:8, 2සාමු 16:22, 1කොරි 5:1
12 නික් 22:19, ලෙවී 18:23, ලෙවී 20:15
13 ලෙවී 18:9, ලෙවී 20:17, 2සාමු 13:14, එස 22:11
14 ලෙවී 18:17, ලෙවී 20:14

ද්වි **27:15*** එනම්, එසේම වේවා!

ශාප වේවා!'[1] (එවිට සියලුදෙනා
'ආමෙන්' කියා පැවසිය යුතුයි.)
25 "'අහිංසක කෙනෙකුව මරා
දමන පිණිස අල්ලසක් ලබාගන්නා
තැනැත්තාට ශාප වේවා!'[2] (එවිට
සියලුදෙනා 'ආමෙන්' කියා පැවසිය
යුතුයි.)
26 "'මේ නීතියේ සඳහන් දේවල්
පිළිපැදීමට උත්සාහ නොකරන
තැනැත්තාට ශාප වේවා!'[3] (එවිට
සියලුදෙනා 'ආමෙන්' කියා පැවසිය
යුතුයි.)

**28** "ඔබ යෙහෝවා දෙවිගේ
හඬට සවන් දී අද මම ඔබට
කියා දෙන ඔහුගේ සියලුම අණපනත්
විශ්වාසවන්තව පිළිපැද්දොත්[4] ඔබේ
දෙවි වන යෙහෝවා මිහිපිට සිටින
සියලුම ජාතීන්ට වඩා ඔබව උසස්
කරයි.[5] **2** ඔබ දිගටම යෙහෝවා
දෙවිගේ හඬට සවන් දුන්නොත් ඔබ
යන යන තැන මෙම ආශීර්වාද අද්ද-
කින* බව ස්ථිරයි.[6]
**3** "ඔබ නුවරේ සිටියත්[7] කෙතෙහි
වැඩ කරමින් සිටියත්[8] ඔබට ආශීර්-
වාද ලැබේවා!
**4** "ඔබට බොහෝ දරුවන් බිහි
කිරීමට ආශීර්වාද ලැබේවා![9] ඔබ
නෙළන අස්වැන්නටත් එළු බැටළු-
වන් හා ගවයන් ඇතුළු ඔබ
ඇති කරන සියලු සතුන්ටත්[10] උන්
බිහි කරන පැටවුන්ටත්[11] ආශීර්වාද
ලැබේවා!
**5** "ඔබේ පලදාව එකතු කරන
කූඩයටත්[12] ඔබේ පිටි අනන භාජන-
යටත්[13] ආශීර්වාද ලැබේවා!
**6** "ඔබ කරන සෑම දෙයකටම
ආශීර්වාද ලැබේවා![14]
**7** "යෙහෝවා දෙවි ඔබට විරුද්-
ධව සටන් කිරීමට පැමිණෙන සතු-
රන්ව ඔබ ඉදිරිපිටම පරාජය කරයි.[15]
ඔබට පහර දෙන්න ඔවුන් එක් දිශා-
වකින් පැමිණියත් දිශා හතකින්
පලා දුවන්න ඔවුන්ට සිදු වෙයි.[16]

**ද්වි 28:2*** මූ.අ., "ආශීර්වාද ඔබ පසුපස ලුහුබැඳ එයි."

**27 පරි.**
1 නික් 20:13, නික් 21:12, ලෙවී 24:17, ගණන් 35:31
2 ද්වි 10:17, එස 22:12, මතෙ 27:4, ක්‍රියා 1:18
3 ද්වි 28:15, ගීතා 119:21, යෙරෙ 11:3, ගලා 3:10

**28 පරි.**
4 නික් 15:26, ලෙවී 26:3, යෙසා 1:19, ලූක් 1:6
5 ද්වි 26:19
6 හිතෝ 10:22
7 ගීතා 107:36
8 ද්වි 11:14
9 ලෙවී 26:9, ද්වි 7:13, ගීතා 127:3, ගීතා 128:3
10 ද්වි 30:9
11 ගීතා 107:38
12 ද්වි 26:2
13 නික් 12:34, නික් 23:25, රූත් 1:6
14 ගණන් 27:17, ද්වි 31:2, 2ලේක 1:10, ගීතා 91:14, ගීතා 121:8
15 ලෙවී 26:7, ද්වි 32:30, යොෂු 10:11, 2සාමු 22:38, ගීතා 89:23
16 ද්වි 7:23, 2ලේක 14:13, හෙබ්‍රෙ 11:34

**2 තීරුව**
1 ලෙවී 26:10, හිතෝ 3:10, මලා 3:10
2 ද්වි 15:10
3 ද්වි 27:1
4 උත් 17:7, නික් 19:6, ද්වි 7:8, හෙබ්‍රෙ 6:13
5 ද්වි 7:6, 1පේත්‍රු 1:15
6 ගණන් 6:27, 2ලේක 7:14, යෙසා 43:10, යෙසා 63:19, දානි 9:19, ක්‍රියා 15:17
7 ගණන් 22:3, ද්වි 11:25, යොෂු 5:1
8 උත් 15:18
9 ද්වි 28:4

**8** ඔබේ ආහාර ගබඩාවටත්[1] ඔබේ
සෑම වැඩකටයුත්තකටත්[2] යෙ-
හෝවා දෙවිගේ ආශීර්වාදය නොඅ-
ඩුව ලැබෙයි. යෙහෝවා දෙවි ඔබට
ලබා දෙන දේශයේදී ඔබට ඔහුගෙන්
ආශීර්වාද ලැබෙන බව නිසැකයි.
**9** ඔබ යෙහෝවා දෙවිගේ අණපනත්
විශ්වාසවන්තව පිළිපදිමින්[3] ඔහුගේ
මඟ පෙන්වීම්වලට එකඟව ජීවත්
වුණොත් යෙහෝවා දෙවි ඔබට පො-
රොන්දු වූ ආකාරයටම[4] ඔහුට අයිති
ශුද්ධ සෙනඟක් ලෙස ඔබව භාරග-
නියි.[5] **10** ඔබ යෙහෝවා දෙවිගේ
නාමය දරන සෙනඟක් බව දැක[6]
පොළොවේ සියලුම ජාතීන් ඔබට
භයෙන් සිටියි.[7]
**11** "යෙහෝවා දෙවිගේ ආශීර්වා-
දය ඔබට නොමඳව ලැබෙයි.
යෙහෝවා දෙවි ඔබේ මුතුන්-
මිත්තන්ට පොරොන්දු වූ දේශයේදී[8]
ඔබට බොහෝ දරු සම්පත්[9] ලැබෙන
අතර ඔබ ඇති කරන සතුන් බො-
හෝ සෙයින් වර්ධනය වෙයි. ඔබේ
වගාබිම්වලින් ඔබට බොහෝ පලදා-
වක්ද ලැබෙයි.[10] **12** සියලුම යහ-
පත් දේවල් ලබා දෙන යෙහෝවා දෙවි
අහසේ කවුළු ඇර නියම කලට
ඔබට වැසි ලබා දෙයි.[11] ඔබ කරන
සෑම දෙයකටම ඔහුගේ ආශීර්වාදය
ලැබෙයි.[12] ඔබට කවදාවත් වෙනත්
ජාතීන්ට ණය වෙන්න සිදු වන්නේ
නැහැ. ඒ වෙනුවට ඔවුන්ට ණයට
දෙන්න ඔබට හැකි වෙයි.[13] **13** අද
මම ඔබට පිළිපදින්න කියා පැවසූ
යෙහෝවා දෙවිගේ සියලු අණපනත්
ඔබ විශ්වාසවන්තව පිළිපැද්දොත්[14]
යෙහෝවා දෙවි අන් අයට වඩා ඔබව
උසස් කරයි.[15] ඔබව යටත් කරගන්න
කිසිවෙකුට ඔහු ඉඩ දෙන්නේ නැහැ.
ඔබ හැම අතින්ම සාර්ථක වෙයි.
**14** අද මා ඔබට කියා දෙන සියලුම
දේවල් හොඳින් සිතට ගන්න. ඉන්
එක වචනයක්වත් පිළිපැදීමට අතපසු

**10** ද්වි 30:9; ගීතා 65:9; **11** ලෙවී 26:4; ද්වි 11:14; යෙරෙ 14:22; **12** ද්වි 14:29; ද්වි 15:10; ගීතා 67:7; ගීතා 115:13; **13** ද්වි 15:6; **14** ගීතා 119:98; **15** 1රාජා 4:21.

කරන්න එපා. මේ මාර්ගයෙන් ඉවත්
වී[1] වෙනත් දෙවිවරුන් පසුපස ගොස්
ඔවුන්ට නමස්කාර කරන්න එපා.[2]
**15** “නමුත් මම අද ඔබට කියා
දෙන යෙහෝවා දෙවිගේ සියලු අණප-
නත් පිළිපැදීමට අසමත් වී ඔහුගේ
හඬට අකීකරු වුණොත් ඔබ යන යන
තැන මෙම ශාප අද්දැකීමට සිදු වන*
බව ස්ථිරයි.[3]
**16** “ඔබ නුවරේ සිටියත්[4] කෙතේ
වැඩ කරමින් සිටියත් ඔබට ශාප
වේවා![5]
**17** “ඔබේ පලදාව එකතු කරන
කූඩයට[6] හා පිටි අනන භාජනයට[7]
ශාප වේවා!
**18** “දරු සම්පත්වත්[8] කිසි අස්-
වැන්නක්වත්[9] නොලැබෙන තරමටම
ඔබට ශාප වේවා! ඔබේ එළු බැටළු
රැළවල් හා ගව රැළවල් වර්ධනය
නොවන තරමටම ශාප වේවා![10]
**19** “ඔබ කරන සෑම දෙයකටම
ශාප වේවා![11]
**20** “ඔබ දෙවිව අත්හැර පිළිකුල්ස-
හගත ක්‍රියා කළොත්[12] ඔබ පිටට ඒ
සෑම ශාපයක්ම පැමිණ[13] ඉක්මනින්ම
ඒ දේශයෙන් ඔබව තුරන් වී යයි. යෙ-
හෝවා දෙවි ඔබ කරන සෑම දෙ-
යක්ම අසාර්ථක වීමට සලස්වා ඔබව
වියවුලට[14] පත් කරයි. ඔහු ඔබට
දඬුවම් කරයි.[15] **21** ඔබට උරුම
වෙන දේශයෙන් ඔබ විනාශ වී යන
තෙක් ඔබ අතරේ වසංගත පැතිර
යෑමට යෙහෝවා දෙවි ඉඩහරියි.[16]
**22** ක්ෂය රෝගය,[17] තද උණ, ඇඟ-
පත ඉදිමීම වැනි රෝග ඔබ අතරේ
පැතිරෙයි. වියළි සුළං[18] හා දිලීර
රෝග[19] නිසා ඔබේ අස්වැන්න විනාශ
වී යයි. දරාගත නොහැකි තරම් රස්-
නයක් ඔබට අද්දකින්න සිදු වන
අතර ඔබ කඩුවෙන් මැරුම් කයි.[20]
ඔබ විනාශ වී යන තෙක් යෙහෝවා
දෙවි මේ සෑම දෙයකින්ම ඔබට දඬු-
වම් කරයි. **23** අහස තඹ මෙන්ද
පොළොව යකඩ මෙන්ද වියළෙයි.[21]
**24** යෙහෝවා දෙවිගෙන් ඔබට වැසි
පොදක්වත් ලැබෙන්නේ නැහැ. වැස්ස
වෙනුවට වැලිවලින්ද දූවිල්ලෙන්ද
ඔබේ දේශය නැහැවී යයි. ඔබ දේශ-
යෙන් නැති වී යන තෙක්ම එසේ
සිදු වෙයි. **25** යෙහෝවා දෙවි ඔබේ
සතුරන්ගේ අතට ඔබව හසු කර
දෙයි.[1] සතුරන්ට පහර දෙන්න ඔබ
එක් දිශාවකින් ගියත් දිශා හතකින්
පලා දුවන්න ඔබට සිදු වෙයි. ඔබට
සිදු වන විනාශය මොන තරම්ද
කිව්වොත් එය දකින පොළොවේ
සියලු ජාතීන් පවා බියෙන් වෙවුලයි.[2]
**26** කුරුල්ලන් හා වනසතුන් ඔබේ
මළ කඳන් ආහාරයට ගනියි. උන්ව
බියගන්වා එළවා දමන්න කිසිවෙකු
ඉතුරු වන්නේ නැහැ.[3]
**27** “ඊජිප්තුවරුන් අතරේ පවතින
රෝගවලින් යෙහෝවා දෙවි ඔබව
ආරක්ෂා කරන්නේ නැහැ.[4] සැරව
ගෙඩි, අර්ශස් ගෙඩි, දද හා සමේ හට-
ගන්නා වෙනත් රෝග ඔබටත් වැල-
දෙයි. එයින් කිසි සුවයක් ඔබට
ලැබෙන්නේ නැහැ. **28** යෙහෝවා
දෙවිගේ ආශීර්වාදය නැති නිසා ඔබ
අන්ත අසරණ තත්වයකට පත් වී
කැලඹී[5] උමතුවෙන්[6] මෙන් ක්‍රියා
කරයි. ඔබේ පෙනීමද නැති වෙයි.[7]
**29** අන්ධ මිනිසෙක් අත පත ගාමින්
යන්නාක් මෙන් මහා දවාලේ පවා
මංමුළා වී යන්න ඔබට සිදු වෙයි.[8] ඔබ
කරන කිසි දෙයක් සාර්ථක වන්නේ
නැහැ. ඔබ නිතරම කොල්ලකරුවන්-
ගේ හා වංචාකරුවන්ගේ ගොදුරක්
වෙයි. කිසි කෙනෙක් ඔබේ උපකා-
රයට එන්නේ නැහැ.[9] **30** වෙනත්
පුරුෂයෙක් පැමිණ ඔබ විවාහ වීමට
ගිවිසගෙන සිටින ස්ත්‍රියව දූෂණය
කරයි.[10] ඔබ ගෙවල් ගොඩනඟුවත්
ඒ ගෙවල්වල ජීවත් වෙන්න ඔබට
ලැබෙන්නේ නැහැ.[11] ඔබ මිදිවතු වගා
කරන නමුත් ඔබට ඒ වතුවල පලදාව

**28 පරි.**

**1** ද්වි 5:32 යොෂු 1:7 හිතෝ 4:27 යෙසා 30:21
**2** ලෙවී 19:4 ද්වි 11:16 ගීතා 96:5 1කොරි 8:4
**3** ලෙවී 26:16 දානි 9:11 මලා 2:2 ගලා 3:13
**4** යෙරෙ 7:12 යෙරෙ 26:6 විලා 1:1
**5** 1රාජා 17:1 යෝවෙ 1:4 හග් 1:6
**6** ද්වි 26:2
**7** ලෙවී 26:26 මීකා 6:14
**8** ද්වි 5:9 විලා 2:11 විලා 2:19 විලා 4:10 හොෂෙ 9:12
**9** ලෙවී 26:20
**10** ලෙවී 26:22
**11** 2ලේක 15:5
**12** ලෙවී 26:31 ද්වි 4:26 යොෂු 23:16
**13** මලා 2:2
**14** 1සාමු 4:10 2රාජා 14:12
**15** ගීතා 39:11 ගීතා 80:16 යෙසා 30:17 යෙසා 51:20 එස 5:15
**16** ලෙවී 26:25 යෙරෙ 21:6 යෙරෙ 24:10
**17** ලෙවී 26:16
**18** 1රාජා 8:37
**19** 2ලේක 6:28 ආමො 4:9 හග් 2:17
**20** ලෙවී 26:33 යෙරෙ 16:4
**21** ලෙවී 26:19 ද්වි 11:17 1රාජා 8:35 1රාජා 17:1 යෙරෙ 14:4 ආමො 4:7

**2 තීරුව**

**1** ලෙවී 26:17 ද්වි 32:30
**2** යෙරෙ 24:9 යෙරෙ 29:18 එස 23:46 ලූක් 21:24
**3** 1සාමු 17:44 ගීතා 79:2 යෙරෙ 7:33
**4** ද්වි 7:15 ආමො 4:10
**5** යෙරෙ 4:9
**6** දේශ 7:7

---

ද්වි **28:15*** මූ.අ., “ශාප ඔබ පසුපස ලුහුබැඳ එයි.”

**7** නික් 4:11; ලෙවී 26:16; **8** යෙසා 59:10; ශෙප 1:17; **9** විනි 3:14; විනි 6:4; නෙහෙ 9:27; ගීතා 106:42; **10** යෙරෙ 8:10; **11** යෙසා 5:9; විලා 5:2; ශෙප 1:13.

නෙළාගන්න ලැබෙන්නේ නැහැ.[1]
**31** ඔබ ඉදිරිපිටම ඔබේ ගවයාව මරා
දැමුවත් උගේ මස් කන්න ඔබට නො-
හැකි වෙයි. ඔබේ ඇස් පනාපිටම ඔබේ
බූරුවාව පැහැරගෙන යයි. ඌව ආපසු
ඔබට ලැබෙන්නේ නැහැ. සතුරන්
ඇවිත් ඔබේ බැටළුවන්ව පැහැරගෙන
යයි. ඔබට උදව් කරන්න කිසිවෙක්
ඉදිරිපත් වෙන්නේ නැහැ.[2] **32** ඔබේ
ඇස් පනාපිටම වෙනත් ජාතීන් ඇවිත්
ඔබේ දූපුතුන්ව රැගෙන යයි.[3] කිසිවක්
කරකියාගත නොහැකිව ඔබට බලා
සිටින්න සිදු වෙයි.[4] ඔවුන්ව නැවත
දකින්න ඔබ මොන තරම් ආශාවෙන්
සිටියත් එයින් පලක් වෙන්නේ නැහැ.
**33** ඔබ නාඳුනන සෙනඟක් ඇවිත්
ඔබ නෙළාගත් අස්වැන්න ආහාරයට
ගනියි.[5] ඔබ නිතරම වංචාකරුවන්ට
හා කුරිරු මිනිසුන්ට ගොදුරු වෙයි.[6]
**34** කවදාවත් නොදුටු ඒ දේවල් දැක
ඔබේ සිහිවිකල් වෙයි.[7]

**35** "යෙහෝවා දෙවි ඔබට දෙන
දඬුවම නිසා ඔබේ දණහිස්වලත් පාද-
වලත් දරුණු කුෂ්ඨයක් හටගනියි.
ඔබේ හිසේ සිට දෙපතුල දක්වා
පැතිර යන ඒ කුෂ්ඨය කිසි දිනක
සුව වෙන්නේ නැහැ.[8] **36** ඔබවත්
ඔබේ මුතුන්මිත්තන්වත් කෙදිනක-
වත් නොදුටු ජාතියක් ඔබව වහලුන්
ලෙස රැගෙන යයි. යෙහෝවා දෙවි
ඔබවත්[9] ඔබ පත් කරගත් ඔබේ රජු-
වත්[10] ඔවුන්ගේ අතට පත් කළ පසු
ඔබට සිදු වෙන්නේ ලී සහ ගල්ව-
ලින් සෑදූ බොරු දෙවිවරුන්ට සේවය
කරන්නයි.[11] **37** ඔබට සිදු වූ දේ
දකින සියලුදෙනාට ඇති වන්නේ
මහත් පුදුමයක්.[12] යෙහෝවා දෙවි
ඔබව විසුරුවාහරින ස්ථානවල ජීවත්
වන වෙනත් ජාතීන්ගේ නින්දා* අප-
හාසවලට ලක් වීමට[13] ඔබට සිදු
වෙයි.

**38** "ඔබේ කෙතේ බොහෝ බීජ
වැපුරුවත් පළඟැටියන් ඇවිත් ඔබේ
අස්වැන්න විනාශ කරන නිසා[1] ඔබට
නෙළාගන්න ලැබෙන්නේ සුළු පලදා-
වක් පමණයි.[2] **39** ඔබේ මිදිවතුවල
ඔබ මිදි වගා කළත් පණුවෝ ඇවිත්
සියල්ල කා දමයි.[3] එහි පලදාව
එකතු කරන්නවත් එයින් වයින් සාදා
බොන්නවත් ඔබට හැකි වෙන්නේ
නැහැ.[4] **40** ඔබ ජීවත් වන සියලු
ප්‍රදේශවල ඔලිව ගස් තිබුණත් ඒවා-
යේ ගෙඩි සියල්ල වැටී යයි.[5] ඔබේ
ඇඟේ ගෑමට තරම්වත් ප්‍රමාණවත්
තෙල් ටිකක් සාදාගන්න ඔබට හැකි
වන්නේ නැහැ. **41** ඔබ කොතරම්
දරුදැරියන් බිහි කළත් අන් සෙනඟක්
ඇවිත් ඔවුන්ව වහලුන් ලෙස රැගෙන
යයි.[6] **42** පළඟැටියන්* ඔබේ සියලු
ගස් හා එහි පලදාව වනසා දමයි.
**43** ඔබ අතරේ වාසය කරන විදේශි-
කයන් ඔබට වඩා ධනවත් වෙයි.
ඔබට සිදු වන්නේ තව තවත් අන්ත
අසරණ දුගී තත්වයකට ඇද වැටෙන්-
නයි.[7] **44** විදේශිකයන්ට ණයට දෙ-
නවා වෙනුවට ඔවුන්ගෙන් ණයට
ගන්න ඔබට සිදු වෙයි.[8] ඔවුන්ට
උසස්ම තැන හිමි වන අතර ඔබට
හිමි වෙන්නේ පහත්ම තැනයි.[9]

**45** "ඔබ යෙහෝවා දෙවිගේ හඬට
සවන් නොදී ඔහුගේ අණපනත් කඩ
කළොත්[10] ඔබ යන යන තැන
මේ සියලු ශාප[11] අද්දකින්න සිදු
වෙයි. ඔබ ඒ සියලු ශාපවලින් පීඩා
විඳ විනාශ වී යයි.[12] **46** ඔබ පිට-
ටත් ඔබෙන් පැවතෙන්නන් පිටටත්
පැමිණෙන එම ශාප සියලුදෙනාටම
කිසිදා අමතක නොවන අනතුරු
ඇඟවීමක් වෙයි.[13] **47** මන්ද ඔබේ
දෙවි වන යෙහෝවා සෑම දෙයක්ම
ලබා දී ඔබව සමෘද්ධිමත් කළත්[14]
ඔබ ඔහුට සතුටු සිතින් සේවය
කළේ නැහැ.[15] **48** ඒ නිසා යෙ-
හෝවා දෙවි ඔබට විරුද්ධව සතුරන්
එවන අතර ඔවුන්ට යටත් වී සේවය
කරන්න ඔබට සිදු වෙයි.[16] කුසගින්-

**28 පරි.**

**1** ආමො 5:11; මීකා 6:15
**2** 2සාමු 22:42
**3** 2ලේක 29:9; යෝවෙ 3:6
**4** නෙහෙ 5:5
**5** ලෙවී 26:16; ද්වි 28:51; නෙහෙ 9:37; යෙසා 1:7; යෙරෙ 5:17
**6** සෙක 11:6
**7** ද්වි 28:67
**8** ද්වි 28:27; යෝබ් 2:7
**9** 2රාජා 17:6; 2රාජා 25:26; යෙසා 39:7
**10** 2රාජා 25:7; 2ලේක 33:11; 2ලේක 36:6; යෙරෙ 22:11
**11** ද්වි 4:28; යෙරෙ 16:13
**12** 1රාජා 9:8; යෙරෙ 25:9
**13** 2ලේක 7:20; ගීතා 44:14; යෙරෙ 24:9

**2 තීරුව**

**1** 1රාජා 8:37; 2ලේක 6:28; යෝවෙ 2:3; යෝවෙ 2:25
**2** යෙසා 5:10; හග් 1:6
**3** යෝනා 4:7
**4** ශෙප 1:13
**5** මීකා 6:15
**6** ද්වි 28:32; 2රාජා 24:14; යෙරෙ 52:15; යෙරෙ 52:30; විලා 1:5
**7** ලෙවී 25:47
**8** ද්වි 15:5; ද්වි 15:6; හිතෝ 22:7
**9** එස්රා 9:7
**10** ද්වි 11:28; ගීතා 119:21; යෙරෙ 7:24
**11** ද්වි 28:15; ද්වි 29:27; යෙරෙ 26:6
**12** ලෙවී 26:28; 2රාජා 17:20; යෙසා 1:20; යෙරෙ 24:10
**13** යෙරෙ 25:18; එස 14:8; 1කොරි 10:11
**14** ද්වි 12:7; ද්වි 32:15; නෙහෙ 9:35
**15** නෙහෙ 8:10; ගීතා 100:2
**16** 2ලේක 12:8; යෙරෙ 5:19; යෙරෙ 17:4.

---

**ද්වි 28:37*** මූ.අ., "ජාතීන් ඔවුන් ගැන අපහාසාත්මක කියමන් ගොතයි."

**ද්වි 28:42*** මූ.අ., "ගුමු හඬ නඟන කෘමීන්."

නෙන්[1] හා පිපාසයෙන් පෙළෙන ඔබ
බොහෝ අඟහිඟකම් විඳිමින්, අඳින්න
සුදුසු වස්ත්‍රයක්වත් නොමැතිව
ඔවුන්ට සේවය කරයි. ඔබ විනාශ වී
යන තුරුම ඔබ දරුණු පීඩා විඳිමින්[2]
ඔවුන්ට මෙහෙකාරකම් කරයි.*

**49** “යෙහෝවා දෙවි දුර ඈත[3]
ජීවත් වන, නොතේරෙන භාෂාවක්
කතා කරන ජාතියක්[4] ඔබට විරුද්-
ධව එවයි. රාජාලියෙක් තම ගො-
දුර ඩැහැගන්නාක් මෙන්[5] ඔවුන්ද
හදිස්සියේම ඔබේ දේශයට කඩාව-
දියි. **50** ඉතා දරුණු ජාතියක්[6] වන
ඔවුන් තරුණ කෙනෙකුට තියා මහලු
කෙනෙකුටවත් කිසිම අනුකම්පාවක්
නොපෙන්වයි.[7] **51** ඔබ විනාශ වී
යන තුරු ඔබ ඇති කරන සතුන්ද
උන්ගේ පැටවුන්ද ඔබ වගා කරන
සියල්ලද ඔවුන් තමන්ගේ ප්‍රයෝජන-
යට ගනී.[8] ඔබේ ධාන්‍ය, අලුත් වයින්,
තෙල්, එළු බැටළු රැළවල් හා ගව
රැළවල් කිසිවක් ඉතුරු නොවෙයි.[9]
**52** ඔවුන් යෙහෝවා දෙවි ඔබට ලබා
දෙන දේශය වටලා ඔබේ සියලු නුව-
රවල් කොටු කරගනියි. එවිට ඔබ
මහත් විශ්වාසයක් තැබූ ඔබට මහත්
ශක්තියක් වූ ඔබේ ඇවැන්ත පවුරු
බිඳ වැටී යයි.[10] **53** ඔබේ සතුරන්
නිසා ඔබට මොන තරම් පීඩා හා දුෂ්-
කරතාවලට මුහුණ දෙන්න සිදු වෙ-
නවාද කිව්වොත් යෙහෝවා දෙවි
ඔබට ලබා දී තිබෙන ඔබේම දූපු-
තුන්ව[11] මරා ආහාරයට ගන්න පවා
ඔබ පෙලඹෙයි.

**54** “ඒ කාලයේදී වංශවත් පවුල-
කින් පැමිණෙන ගුණ යහපත් අය[12]
පවා තමන්ගේ සහෝදරයන් ගැනවත්
තමන්ගේ ආදරණීය භාර්යාව ගැන-
වත් තම දූපුතුන් ගැනවත් කිසි තැකී-
මක් කරන්නේ නැහැ. **55** ඔවුන්
තම දූපුතුන්ව මරා කද්දී පවුලේ අය
සමඟ බෙදාගෙන කන්නවත් කැමති
වෙන්නේ නැහැ. මන්ද ඔබේ සතුරන්
ඔබව සෑම අතින්ම කොටු කරගන්නා
නිසා, ඔබේ නුවරවල කෑමට කිසි-
වක් ඉතුරු නොවෙයි.[1] **56** දෙපාවල
දූවිලි පොදක්වත් නොගෑවුණු, ඉතා
සැප පහසු ජීවිතයක් ගත කළ කාන්-
තාවන් පවා ඒ කාලයේදී අන්ත අස-
රණ තත්වයකට පත් වෙයි.[2] ඔවුන්
තම ආදරණීය පුරුෂයන් හා දූදරු-
වන් ගැන කිසිම තැකීමක් කරන්නේ
නැහැ. **57** ඔවුන් තම පවුලේ අය-
ටත් හොරෙන් තමන්ගේ අලුත උපන්
කිරි කැටි දරුවන්ව විතරක් නොව
ප්‍රසූතියේදී පිට වන සියල්ලත් කා
දමයි.[3] මන්ද ඔබේ සතුරන් ඔබව
සෑම අතින්ම කොටු කරගන්නා නිසා,
ඔබේ නුවරවල කෑමට කිසිවක් ඉතුරු
වන්නේ නැහැ.[4]

**58** “ඔබ මේ නීතියේ සඳහන්
සියල්ල පිළිපැදීමට අපොහොසත් වී[5]
යෙහෝවා[6] දෙවිගේ ගරුබිය[7] ඇති
කරවන ශ්‍රේෂ්ඨ නාමයට[8] අගෞරව
කළොත් **59** ඔබටත් ඔබේ දරුදැරි-
යන්ටත් යෙහෝවා දෙවිගේ ආරක්-
ෂාව අහිමි වෙයි. එවිට බොහෝ
කාලයක් පුරා පවතින[9] ඉතා දරුණු
වසංගතවලින්ද සුව කරන්න බැරි
දරුණු රෝගවලින්ද ඔබ පීඩා විඳියි.[10]
**60** ඊජිප්තුවරුන්ට වැලඳුණ රෝග
දැක ඔබ තුළ මහත් භයක් ඇති
වුණා. ඔබටත් එම රෝග වැලඳෙන
අතර කිසිදාක ඒවායින් සුවයක් නම්
ලැබෙන්නේ නැහැ.[11] **61** මීට අම-
තරව නීතියේ සඳහන් නොවන වසං-
ගත හා රෝගවලිනුත් ඔබට පීඩා
විඳින්න සිදු වෙයි. යෙහෝවා දෙවි මේ
සියල්ල ඔබ පිටට ගෙනැවිත් ඔබව
විනාශ කර දමයි. **62** අහසේ තරු
මෙන් විශාල සෙනඟක්ව[12] සිටින ඔබ,
යෙහෝවා දෙවිගේ හඬට සවන් නො-
දුන්නොත් ඉතා සුළු පිරිසක්[13] බවට
පත් වෙයි.

**63** “යෙහෝවා දෙවි ඔබට ආශීර්-
වාද කරමින් ඔබව විශාල ජාතියක්
බවට පත් කළේ මහත් සතුටකින්.[14]
නමුත් ඔබ දෙවිට අකීකරු වුණොත්
ඔබට උරුම වන දේශයෙන් ඔබව
උදුරා දමා[15] ඔබව විනාශ කර දමන්න

**ද්වි 28:48*** මූ.අ., “යකඩ වියගහක් ඔබට දරන්න සිදු වෙයි.”

**28 පරි.**
1 යෙරෙ 44:27
2 යෙරෙ 28:14
3 යෙරෙ 6:22
හබ 1:6
4 යෙසා 28:11
යෙරෙ 5:15
5 යෙරෙ 4:13
විලා 4:19
හොෂෙ 8:1
6 එස 21:31
7 2ලේක 36:17
යෙසා 47:6
ලූක් 19:44
8 ද්වි 28:33
9 ලෙවී 26:26
යෙරෙ 15:13
10 2රාජ 17:5
2රාජ 25:1
යෙරෙ 39:1
ලූක් 19:43
11 ලෙවී 26:29
2රාජ 6:28
යෙරෙ 19:9
විලා 2:20
විලා 4:10
එස 5:10
12 ද්වි 15:9
හිතෝ 23:6

**2 තීරුව**
1 ද්වි 28:48
යෙරෙ 52:6
2 විලා 4:5
3 යෙසා 49:15
4 ද්වි 28:53
5 නික් 24:7
ලෙවී 26:15
ද්වි 31:26
6 නික් 3:15
නික් 6:3
නික් 20:2
ගීතා 83:18
ගීතා 113:3
යෙසා 42:8
මලා 2:2
7 ද්වි 10:17
නෙහෙ 1:5
ගීතා 99:3
යෙසා 29:23
8 නික් 14:4
ලෙවී 10:3
ගීතා 72:19
9 ලෙවී 26:21
2ලේක 21:14
දානි 9:12
10 ද්වි 28:22
2ලේක 21:15
11 ද්වි 7:12
ද්වි 7:15
ද්වි 28:27
ආමො 4:10
12 ද්වි 10:22
ද්වි 26:5
නෙහෙ 9:23
13 ද්වි 4:27
14 ද්වි 30:9
15 යෙරෙ 12:14
යෙරෙ 18:7

යෙහෝවා දෙවි කොහෙත්ම පසුබට
වෙන්නේ නැහැ.[1]
**64** "යෙහෝවා දෙවි පොළොවේ
එක් කෙළවරක සිට අනික් කෙළවර
දක්වා වාසය කරන ජාතීන් අතරට
ඔබව විසුරුවාහරියි.[2] එහිදී ඔබට සිදු
වෙන්නේ ඔබවත් ඔබේ මුතුන්මිත්-
තන්වත් කෙදිනකවත් නොදැන සිටි
ලීවලින් හා ගල්වලින් සෑදූ බොරු දෙ-
විවරුන්ට සේවය කරන්නයි.[3] **65** ඒ
ජාතීන් අතරේ වාසය කරද්දී
ඔබට කිසිම විවේකයක් ලැබෙන්නේ
නැහැ.[4] නිවිහැනහිල්ලේ වාසය කළ
හැකි ස්ථානයක්වත් ඔබට ලැබෙන්-
නේ නැහැ. යෙහෝවා දෙවිගේ ආරක්-
ෂාව නොමැතිව ජීවත් වන ඔබ
තුළ මහත් බියක්ද[5] කලකිරීමක්ද
ඇති වෙයි. ඔබේ පෙනීම පවා දුර්-
වල වෙයි.[6] **66** ඔබේ ජීවිතය මොන
තරම් අනතුරක තියෙයිද කිව්වොත්
ඔබ දිවා රෑ දෙකේම මහත් භයෙන්
ජීවත් වෙයි. ඔබේ ජීවිතය ගැනවත්
ඔබට කිසි විශ්වාසයක් නොතිබෙයි.[7]
**67** උදෑසන අවදි වන ඔබ, 'ඉක්-
මනට හවස් වෙනවා නම් කොයි
තරම් හොඳද' කියාත් හවස් වරුවේදී
'රාත්‍රිය ගෙවී ඉක්මනින් අලුත් දවසක්
උදා වෙනවා නම් කොයි තරම්
හොඳද' කියාත් පවසයි. මෙසේ ඔබ
දකින දේවල් නිසා නිතරම බියෙන්
ගැහිගැහී සිටින්න ඔබට සිදු වෙයි.[8]
**68** ඔබට නැවත කිසිදා ඊජිප්තු දේශ-
යට යන්න සිදු වෙන්නේ නැහැ[9] කියා
මා ඔබට පැවසුවා මතකද? නමුත්
යෙහෝවා දෙවි ඔබව නැව්වල දමා
නැවතත් ඊජිප්තුවට ගෙන යයි. එහිදී
ඔබට සිදු වෙන්නේ ඔබේ සතුරන්ට
දාසදාසීන් හැටියට ඔබවම විකුණ-
ගන්නයි.[10] නමුත් ඔබව මිල දී ගන්න
කිසි කෙනෙක් ඉදිරිපත් වෙන්නේ
නැහැ."

**29** යෙහෝවා දෙවි හොරෙබ්
කඳුකරයේදී ඊශ්‍රායෙල්වරුන්
සමඟ ඇති කරගත් ගිවිසුමට අමත-
රව මෝවබ් දේශයේදී ඔවුන් සමඟ
තවත් ගිවිසුමක් ඇති කරගත්තේය.[11]
මෝසෙස් මාර්ගයෙන් ඇති කරගත් ඒ
ගිවිසුමේ සඳහන් දේවල් මතු දැක්වේ.
**2** මෝසෙස් මුළු ඊශ්‍රායෙල් සෙනඟ
රැස් කරවා ඔවුන්ට මෙසේ පැවසීය.
"යෙහෝවා දෙවි ඊජිප්තුවේ පාරාවෝ-
ටත් ඔහුගේ සියලුම සේවකයන්ටත්
ඔහුගේ මුළු දේශයටත් කළ දේවල්
ඔබ දුටුවා නේද?[1] **3** එහිදී දෙවි තම
මහත් බලයෙන් කළ පුදුමසහගත
ක්‍රියාවන්[2] හා ආශ්චර්යයන්[3] මාර්ග-
යෙන් ඔවුන්ව සෝදිසි කර බැලූ
ආකාරයත් ඔබ දුටුවා.[4] **4** නමුත්
අද වන තුරු ඔබ ඇසූ දුටු මේ දේවල
නියම අර්ථය තේරුම්ගන්න තරම්
ශක්තියක් ඔබට යෙහෝවා දෙවි-
ගෙන් ලැබී නැහැ.[5] **5** දෙවි ඔබට
මෙසේ පැවසුවා. 'පාළුකරයේ අවුරුදු
හතළිහක් පුරා ගමන් කරද්දී ඔබට
මඟ පෙන්වූයේ මමයි.[6] එහෙත් ඒ
කාලය තුළදී ඔබේ ඇඳුම් පැළඳුම් දිරා
ගියේවත් ඔබේ පාවහන් ගෙවී ගියේ-
වත් නැහැ.[7] **6** ඒ කාලයේදී ඔබට
කන්න රොටිවත්[8] බීමට වයින් හෝ
වෙන කිසි මත්පැන් වර්ගයක්වත්
තිබුණේ නැහැ. ඔබ ඒ තත්වයේ සිටි-
යදී මම ඔබව රැකබලා ගත්තා. එසේ
කළේ මා ඔබේ දෙවි වන යෙ-
හෝවා බව ඔබට වටහා දෙන්නයි.'
**7** කල් යත්ම, අප දැන් සිටින මේ
ස්ථානයට ඔබ පැමිණියා. ඒ කාල-
යේදී හෙෂ්බොන්හි[9] රජු වූ සීහොන්,
බාෂාන්හි රජු වූ ඕග්[10] සමඟ එකතු වී
අපට විරුද්ධව සටනට ආවා. නමුත්
අපිට හැකි වුණා ඔවුන්ව පරාජය
කරන්න.[11] **8** ඔවුන්ට අයත් ප්‍රදේ-
ශය යටත් කරගෙන රූබෙන් සහ ගාද්
ගෝත්‍රවල අයටත් මනස්සේ ගෝත්‍ර-
යෙන් එක් කොටසකටත් ඒ ප්‍රදේ-
ශය උරුමයක් ලෙස ලබා දුන්නා.[12]
**9** දැන් මේ දේ මතක තබාගන්න.
ඔබ කරන සෑම දෙයක්ම සාර්ථක
කරගැනීමට නම් ඔබ මේ ගිවිසු-
මේ සඳහන් සියලුම කොන්දේසිවලට
අනුව ක්‍රියා කළ යුතුයි.[13]
**10** "ඔබේ දෙවි වන යෙහෝවා ඉදි-
රියේ අද ඔබ සියලුදෙනාම රැස්ව සිටි-

**28 පරි.**
1 හිතෝ 1:26
2 ලෙවී 26:33, ද්වි 4:27, නෙහෙ 1:8, ලූක් 21:24
3 ද්වි 4:28, ද්වි 28:36, යෙරෙ 16:13
4 එස 5:12, ආමො 9:4
5 ලෙවී 26:36, එස 12:19
6 ලෙවී 26:16
7 හෙබ්‍රෙ 10:27
8 ද්වි 28:34
9 නික් 14:13, යෙරෙ 44:12, හොෂෙ 9:3
10 නෙහෙ 5:8

**29 පරි.**
11 නික් 24:8, ලෙවී 26:45, ද්වි 5:2

**2 තීරුව**
1 නික් 19:4, ද්වි 7:18, යොෂු 24:5
2 ගණන් 14:11
3 නෙහෙ 9:10, ගීතා 78:43, ගීතා 105:27
4 ද්වි 4:34, ද්වි 7:19, නෙහෙ 9:17, නෙහෙ 9:19
5 හිතෝ 20:12, යෙසා 6:10, මාක් 4:12, රෝම 11:8, එෆී 4:18
6 ද්වි 1:3, ද්වි 8:2, ආමො 2:10
7 ද්වි 8:4, නෙහෙ 9:21, මතෙ 6:31
8 නික් 16:12, නික් 16:31, නෙහෙ 9:15
9 ගණන් 21:26
10 ගණන් 21:33
11 ගීතා 135:10, ගීතා 135:11
12 ගණන් 32:33, ද්වි 3:12
13 ද්වි 4:6, ද්වි 8:18, යොෂු 1:7, 1රාජා 2:3, ගීතා 103:17, ගීතා 103:18, ලූක් 11:28

නවා. ඔබේ ගෝත්‍රවල ප්‍රධානීන්,
ඔබේ වැඩිමහල්ලන් සහ ඔබේ අධි-
පතීන් ඇතුළුව ඊශ්‍රායෙල් සෙනඟ
අතරේ සිටින සියලුම පුරුෂයන්ද[1]
**11** ස්ත්‍රීන්ද[2] දරුදැරියන්ද ඔබ අතරේ
දර කපන්නන් සහ වතුර අදින්නන්[3]
ලෙස සේවය කරන විදේශිකයන්ද[4]
මෙහි රැස්ව සිටිනවා. **12** ඔබ සිය-
ලුදෙනාම මෙහි රැස්ව සිටින්නේ ඔබේ
දෙවි වන යෙහෝවා සමඟ ගිවිසු-
මක්[5] ඇති කරගැනීමටයි. ඒ ගිවිසුමට
එකඟ වන බව ඔබ දැන් දිවුරා පො-
රොන්දු විය යුතුයි.[6] එම ගිවිසුම ඔබ
සමඟ ඇති කරගන්න යෙහෝවා දෙවි
දැන් සූදානමින් සිටිනවා. **13** දෙවි
මේ ගිවිසුම ඔබ සමඟ ඇති කරගන්-
නේ ඔබව ඔහුගේ සෙනඟ ලෙස[7] ඔහු
භාරගත් බව ස්ථිර කිරීමටයි. ඒ
වගේම ඔබටත් ඔබේ මුතුන්මිත්-
තන් වන ආබ්‍රහම්,[8] ඊසාක්[9] සහ
යාකොබ්ටත්[10] දිවුරා පොරොන්දු වූ
ආකාරයටම ඔහු ඔබේ දෙවි[11] බව
පෙන්වීමටයි.

**14** “දෙවි දිවුරුමකින් ස්ථිර කරන
මේ ගිවිසුම ඇති කරගන්නේ ඔබ
සමඟ පමණක් නොවෙයි.[12] **15** අද
යෙහෝවා දෙවි ඉදිරියේ මෙහි
රැස්ව සිටින අප පමණක් නොව,
අපෙන් බිහි වන මතු පරම්පරාවත්*
මේ ගිවිසුමට ඇතුළත්.[13] **16** (අප
ඊජිප්තුවේ ජීවත් වූ ආකාරයත් අප
එතැනින් පිට වී විවිධ ජාතීන්ගේ දේ-
ශයන් මැදින් ගමන් කළ ආකාරයත්
ඔබට හොඳින් මතක ඇති.[14] **17** ඒ
ජාතීන් කළ පිළිකුල්සහගත දේ-
වලුත් ලී, ගල්, රන් රිදී ආදියෙන් සාදා
තිබූ ඔවුන්ගේ පිළිකුල් රූපත්* ඔබට
මතක ඇති.)[15] **18** ඔබ අතරේ
සිටින කිසිම පුරුෂයෙකුටවත් ස්ත්‍රිය-
කටවත් කිසිම පවුලකටවත් ගෝත්‍ර-
යකටවත් යෙහෝවා දෙවිගෙන් ඈත්
වී ඒ ජාතීන්ගේ දෙවිවරුන්ට[16] නමස්-
කාර කරන්න ඉඩ දෙන්න එපා. මන්ද

ද්වි **29:15*** මූ.අ., “අද අප සමඟ මෙහි නොසිටින අයත්.” **17*** ලෙවී 26:30හි පාදසටහන බලන්න.

**29 පරි.**
**1** ද්වි 31:12
**2** නෙහෙ 8:2
**3** යොෂු 9:21
**4** නික් 12:38
ගණන් 11:4
**5** ද්වි 29:1
ද්වි 29:29
**6** ද්වි 1:3
**7** නික් 19:5
ද්වි 7:6
ද්වි 27:9
ද්වි 28:9
**8** උත් 17:7
උත් 22:16
යෙරෙ 11:5
හෙබ්‍රෙ 6:13
**9** උත් 26:3
නික් 2:24
ගීතා 105:9
**10** උත් 28:13
**11** නික් 6:7
නික් 29:45
**12** ද්වි 5:3
එස 16:60
**13** යෙරෙ 32:39
**14** ද්වි 2:4
**15** ගණන් 25:2
එස 20:8
**16** ද්වි 11:16
ද්වි 17:3
හෙබ්‍රෙ 3:12

**2 තීරුව**
**1** යෙරෙ 9:15
හොෂෙ 10:4
ආමො 6:12
ක්‍රියා 8:23
හෙබ්‍රෙ 12:15
**2** ද්වි 29:12
**3** නෙහෙ 9:29
හිතෝ 28:14
යෙසා 30:1
යෙරෙ 3:17
යෙරෙ 6:28
සෙක 7:12
රෝම 1:21
රෝම 2:5
**4** ගීතා 10:6
යෙරෙ 5:12
යෙරෙ 14:19
**5** නික් 34:7
යොෂු 24:19
යෙසා 27:11
**6** නික් 34:14
ගීතා 74:1
ගීතා 79:5
එස 23:25
**7** ගීතා 18:8
හෙබ්‍රෙ 12:29
**8** ද්වි 27:26
ද්වි 28:15
**9** රෝම 2:5
**10** ද්වි 28:59
**11** ගීතා 11:6
**12** විනි 9:45
ගීතා 107:34
යෙරෙ 17:6
**13** යෙරෙ 20:16
ආමො 4:11

එවැනි කෙනෙක් හොඳින් වැඩී විස
සහිත තිත්ත පල හටගන්වන පැළැ-
ටියක මුලක් හා සමානයි.[1]

**19** “දෙවි ඔබ සමඟ ඇති කර-
ගන්නා මේ ගිවිසුමේ සඳහන් ශාප
ගැන ඇසූ විට[2] කෙනෙක් උඩඟු වී,
‘මම කරන්නේ මට ඕන දේ.[3] එහෙම
කළා කියලා මට කිසි කරදරයක්
වෙන්නේ නැහැ’[4] කියා සිතන්න ඉඩ
තිබෙනවා. ඔහු එසේ සිතමින් නැති
බැරි අයව විතරක් නොව අන් සියලු-
දෙනාවත්* විනාශ කර දමන්න උත්-
සාහ කළොත් **20** යෙහෝවා දෙවි
ඔහුට සමාව දෙන්නේ නැහැ.[5] යෙ-
හෝවා දෙවිගේ මහත් උදහස[6] ඒ පුද්-
ගලයාට විරුද්ධව ඇවිළෙන අතර[7]
නීතියේ සඳහන්[8] සියලුම ශාප ඔහු
පිටට පැමිණෙයි. යෙහෝවා දෙවි
ඔහුගේ නාමය සදහටම පොළො-
වෙන් මකා දමයි. **21** යෙහෝවා
දෙවි ඔහුට දඬුවම් කරන පිණිස
ඊශ්‍රායෙල්හි සියලුම ගෝත්‍ර අතරින්
ඔහුව වෙන් කරයි.[9] එවිට ගිවිසුමේ
සඳහන් කළ සියලුම ශාප ඔහු පිටට
පැමිණෙයි.

**22** “ඔබෙන් පැවතෙන ඔබේ දූපු-
තුන් සහ බොහෝ දුර බැහැර දේ-
ශවලින් පැමිණෙන විදේශිකයන්ට
දකින්න ලැබෙන්නේ යෙහෝවා දෙවි-
ගෙන් පහර ලැබූ,[10] විවිධ වසංගත හා
ලෙඩ රෝග නිසා නාස්ති වී ගිය
දේශයක්. **23** ගිනි,[11] ගෙන්දගම් හා
ලුණුවලින්[12] නාස්ති වී ගිය නිසරු
භූමියත් ඔවුන් දකියි. යෙහෝවා දෙවි
මහත් උදහසකින් විනාශ කළ[13] සො-
දොම්, ගොමෝරාව,[14] අද්මා[15] සහ
ෂෙබොයිම්[16] යන දේශවලට සමානව
මුළු දේශයම කිසි වගා කටයුත්තක්
කිරීමටවත් කිසි පැළැටියක් හටගැනී-
මටවත් සුදුසු නැති තත්වයකට පත්
වී ඇති ආකාරය ඔවුන්ට දකින්න

**14** උත් 19:24; යූද් 7; **15** උත් 10:19; **16** උත් 14:2; හොෂෙ 11:8.

ද්වි **29:19*** මූ.අ., “පිපාසයෙන් සිටින්නා සේම වතුරෙන් කිසි හිඟයක් නැති තැනැත්තාවද.”

ලැබෙයි. **24** සියලුම ජාතීන් මේ දේ
දැක, ‘යෙහෝවා දෙවි මේ දේශයට
මේ වගේ දෙයක් කළේ ඇයි?[1] ඔහුගේ
උදහස මෙතරම් දරුණු ලෙස ඇවිළ
ගියේ ඇයි’ කියා අසයි. **25** එවිට
ඔවුන්ට ලැබෙන පිළිතුර මෙයයි.
‘යෙහෝවා දෙවි ඔවුන්ගේ මුතුන්මිත්-
තන්ව ඊජිප්තු දේශයෙන් නිදහස් කළ
පසු[2] ඔවුන් සමඟ ගිවිසුමක් ඇති කර-
ගත්තා. නමුත් ඒ ගිවිසුමට ඔවුන්
ද්‍රෝහි වුණා.[3] ඒ නිසයි මෙවැනි දෙ-
යක් සිදු වුණේ. **26** ඔවුන් දෙවිට
ද්‍රෝහි වී කිසි කලෙක හඳුනාගෙන
නොසිටි බොරු දෙවිවරුන් පසුපස
ගොස් ඔවුන් ඉදිරියේ වැඳ වැටෙන්න
පටන්ගත්තා. එසේ කරන්න දෙවි
කවදාවත් ඔවුන්ට ඉඩ දී තිබුණේ
නැහැ.[4] **27** ඉතින් යෙහෝවා දෙවි-
ගේ උදහස මේ දේශයට විරුද්ධව
ඇවිළී ගියා. ඒ නිසා නීතියේ ලියා
ඇති සියලුම ශාප දේශය පිටට පැමි-
ණියා.[5] **28** යෙහෝවා දෙවි මහත්
උදහසකින් ඔහුගේ සෙනඟව දේශ-
යෙන් උදුරා දමා[6] වෙනත් දේශයකට
පිටමං කළා.’[7]

**29** “ඇතැම් දේවල් අපේ දෙවි වන
යෙහෝවා අපට හෙළි කර නැහැ.[8] ඒ
කාරණා දන්නේ දෙවි පමණයි. නමුත්
දැනගත යුතු කාරණා[9] දෙවි අපටත්
අපේ දූපුතුන්ටත් හෙළි කර තිබෙ-
නවා. ඒ දේවල් අපිට හෙළි කර
තිබෙන නිසා දෙවිගේ නීතියේ සඳ-
හන් සෑම දෙයක්ම පිළිපදින්න අපට
හැකියි.[10]

**30** “ආශීර්වාද[11] හා ශාප[12] ගැන
මා පැවසූ සෑම දෙයක්ම ඒ
ආකාරයටම ඉටු වෙයි. එහි සඳහන්
ශාප ඔබ අද්දකින විට යෙහෝවා දෙවි
ඔබව විවිධ ජාතීන් අතරට විසුරුවා-
හරියි.[13] නමුත් ඒ තත්වයේ සිටින විට
මා දැන් ඔබට පවසන සියල්ල ඔබට
මතක් වෙයි.[14] **2** එවිට යෙහෝවා
දෙවි වෙතට නැවත හැරී[15] මා අද
කියා දෙන මේ සියලු දේවල් පිළි-
පැදීමට ඔබ වෑයම් කරයි. ඔබද
ඔබේ පුතුන්ද මුළු හදවතින්ම දෙවිගේ
හඬට කීකරු වෙන්නත් ඒ සඳහා
මුළු ජීවිතයම කැප කරන්නත් පෙ-
ලඹෙයි.[1] **3** එවිට යෙහෝවා දෙවි
ඔබට දයාව පෙන්වයි.[2] යෙහෝවා
දෙවි ඔබ විසිරී සිටින සෑම ජාති-
යක් අතරින්ම ඔබව එකතු කර,[3]
වහල්කමින් නිදහස් කරයි.[4] **4** ඔබ
පොළොවේ ඈත කෙළවරක සිටි-
යත් යෙහෝවා දෙවි ඔබව නැවතත්
රැගෙන එයි.[5] **5** යෙහෝවා දෙවි
ඔබට හිමි කර දුන් දේශයේ ඔබව
නැවත පදිංචි කරනවා විතරක් නො-
වෙයි, ඔහු ඔබට ආශීර්වාද කර ඔබේ
පියවරුන්ගේ කාලයටත් වඩා ඔබ-
ගේ ගණන බොහෝ සෙයින් වැඩි
වීමට සලස්වයි.[6] **6** යෙහෝවා දෙවි
ඔබෙත් ඔබේ දරුදැරියන්ගෙත් සිත්
පවිත්‍ර කරයි.*[7] එහි ප්‍රතිඵලයක් ලෙස
ඔබේ දෙවි වන යෙහෝවාට ඔබ මුළු
හදවතින්ම ප්‍රේම කර ඔහු වෙනුවෙන්
ඔබේ මුළු ජීවිතයම කැප කරයි.
එයින් ඔබට ජීවනය අත් වෙයි.[8]
**7** ඔබට අද්දකින්න සිදු වූ සියලු ශාප
යෙහෝවා දෙවි ඔබේ සතුරන් පිටටත්
ඔබට වෛර කරන සියලුදෙනා පිට-
ටත් ඔබට පීඩා කරන අය පිටටත්
ගෙන එයි.[9]

**8** “ඔබ නැවත යෙහෝවා දෙවි
වෙතට ළං වී ඔහුගේ හඬට සවන් දෙ-
මින් මා අද ඔබට කියා දෙන දෙ-
විගේ සියලු අණපනත් පිළිපදින්න
පෙලඹෙයි.[10] **9** යෙහෝවා දෙවිගේ
ආශීර්වාද ඔබට ලැබෙන නිසා ඔබ
කරන සෑම දෙයක්ම ඔබ සිතන-
වාටත් වඩා සාර්ථක වෙයි.[11] ඒ
නිසා ඔබට බොහෝ දරුදැරියන්
බිහි වෙයි. ඔබ ඇති කරන සතුන්ද
ගණනින් බොහෝ සෙයින් වර්ධ-
නය වෙයි.[12] ඔබේ වගා කටයුතුව-
ලින් නෙළාගන්නා පලදාවද බහුල
වෙයි.[13] යෙහෝවා දෙවි ඔබේ මුතුන්-

**29 පරි.**
**1** 1රාජා 9:8; 2ලේක 7:21; යෙරෙ 22:8
**2** යෙරෙ 22:9; යෙරෙ 31:32
**3** ද්වි 29:12; 1රාජා 19:10
**4** විනි 2:12; 1රාජා 9:9; 2රාජා 17:7; 2ලේක 7:22; යෙරෙ 19:4
**5** ලෙවී 26:16; ද්වි 27:26; ද්වි 29:20
**6** ද්වි 28:63; 1රාජා 14:15; 2රාජා 17:18; ගීතා 52:5; ලූක් 21:24
**7** එස්රා 9:7; දානි 9:7
**8** යෙසා 55:8; රෝම 11:33; 1කොරි 2:16
**9** ආමෝ 3:7; මතෙ 11:27; එෆි 3:5
**10** ගීතා 78:5; දේශ 12:13; 1යොහ 5:3

**30 පරි.**
**11** ද්වි 11:27; ද්වි 28:2
**12** ද්වි 11:28; ද්වි 28:15
**13** 2රාජා 17:6; 2රාජා 17:23; 2රාජා 25:26; 2ලේක 36:20
**14** 1රාජා 8:47; නෙහෙ 1:9; එස 18:28; යෝවෙ 2:13
**15** යෙසා 55:7; හොෂෙ 3:5; 1යොහ 1:9

**2 තීරුව**
**1** ද්වි 4:29
**2** විලා 3:22
**3** එස්රා 1:3; ගීතා 147:2; යෙසා 56:8; යෙරෙ 32:37; එස 34:13
**4** යෙරෙ 29:14
**5** ද්වි 28:64; යෙසා 11:11; ශෙප 3:20; සෙක 8:7
**6** නෙහෙ 1:9
**7** ද්වි 10:16; යෙරෙ 32:39; රෝම 2:29
**8** ද්වි 6:5

**9** උත් 12:3; යෙසා 10:12; යෙරෙ 25:12; විලා 3:64; රෝම 12:19; **10** ද්වි 30:2; **11** යෙසා 65:21; මලා 3:10; මතෙ 6:33; පිලි 4:19; **12** ද්වි 7:14; ද්වි 28:4; ගීතා 107:38; **13** ලෙවී 26:4; ගීතා 67:6; 2කොරි 9:10.

ද්වි **30:6*** මූ.අ., “සිත් චර්මච්ඡේදනය කරයි.”

මිත්තන්[1] ගැන සතුටු වී ඔවුන්ට
ආශීර්වාද කළා සේම ඔබටත් ආශීර්-
වාද කරන නිසා මහත් සමෘද්ධියක්[2]
භුක්ති විඳින්න ඔබට හැකි වෙයි.
**10** ඒ කාලයේදී නීතිය සඳහන් මෙම
ලියවිල්ලේ තිබෙන සියලුම අණප-
නත් පිළිපදින පිණිස ඔබ යෙහෝවා
දෙවිගේ හඬට සවන් දෙයි.[3] ඔබ මුළු
හදවතින්ම යෙහෝවා දෙවි වෙතට
හැරී ඔහුට සේවය කරන්න ඔබේ මුළු
ජීවිතයම කැප කරයි.[4] එහි ප්‍රතිඵල-
යක් ලෙස ඒ සියලු ආශීර්වාද ඔබට
අද්දකින්න පුළුවන් වෙයි.
**11** "මා අද ඔබට කියා දෙන මේ
අණපනත් ඔබට පිළිපදින්න බැරි
තරම් අමාරු ඒවා නොවෙයි. ඒ
නීති දැනගන්න දුර බැහැර ප්‍රදේශය-
කට යන්නවත්[5] **12** ඉහළ අහසට
නඟින්නවත් අවශ්‍ය නැහැ. ඒ නිසා,
'කවුරුන් හෝ ඉහළ අහසට නැඟ ඒ
නීති දැනගෙන අපිට කියා දෙන්න.
එතකොට අපි ඒවා පිළිපදින්නම්'
කියා පැවසීමට කිසිම අවශ්‍යතාවක්
නැහැ.[6] **13** ඒ වගේම ඒවා තේරුම්-
ගන්න මහ සමුද්‍රය තරණය කරන්න
අවශ්‍ය නැහැ. 'කවුරුන් හෝ මහ සමු-
ද්‍රය තරණය කර ඒ නීතිවල තේ-
රුම දැනගෙන ඇවිත් අපට කියා
දෙන්න. එවිට අපි ඒවා පිළිපදින්නම්'
කියා පැවසීමටත් කිසිම අවශ්‍යතාවක්
නැහැ. **14** මන්ද නීතියේ සඳහන්
සියලුම වචන ඔබ ළඟම තිබෙනවා.
ඒ වචන ඔබේ සිතෙත් දිව අගත්
තිබෙනවා.[7] ඒ නිසා ඒවා පිළිපැදීම
අමාරු දෙයක් කියා පවසන්න ඔබට
බැහැ.[8]
**15** "අද මා ඔබ ඉදිරියේ මාර්ග දෙ-
කක් තබනවා. එකක් යහපත් ප්‍රති-
ඵල අත් කර දෙන ජීවනයට යන
මාර්ගය. අනික නරක ප්‍රතිඵල අත්
කර දෙන මරණයට යන මාර්ගය.[9]
**16** ඒ නිසා අද මා ඔබට කියා දෙන
යෙහෝවා දෙවිගේ සියලුම අණප-
නත්වලට සවන් දෙන්න. ඔබේ දෙවි
වන යෙහෝවාට නිතරම ප්‍රේම කර-
මින්[10] ඔහු ලබා දෙන මහ පෙන්වීම්ව-
ලට අනුව ජීවත් වෙන්න. ඔබ එසේ
ඔහුගේ සියලු අණපනත්[1] හා තීන්දු
පිළිපදින්න[2] තීරණය කළොත් ඔබට
ජීවනය ලැබෙනවා[3] පමණක් නොව
ඔබේ ගණනද බොහෝ සෙයින් වැඩි
වෙයි. ඒ වගේම ඔබට හිමි වන දේශ-
යේදී යෙහෝවා දෙවි ඔබට අනිවාර්ය-
යෙන්ම ආශීර්වාද කරයි.[4]
**17** "නමුත් ඔබ සිතින් මුළා වී දෙ-
විට සවන් දෙන්නේ නැතුව[5] වෙනත්
දෙවිවරුන් ඉදිරියේ වැඳ වැටී නමස්-
කාර කළොත්[6] **18** ඔබ සහමුලින්ම
නැති වී යන බව මට සහතිකවම
කියන්න පුළුවන්.[7] යෝර්දාන් ගඟෙන්
එගොඩ වී ඔබ හිමි කරගන්නා දේශ-
යේ දිගු කාලයක් ජීවත් වෙන්න
ඔබට හැකි වෙන්නේ නැහැ. **19** මා
දැන් ඔබට කියන දේට ස්වර්ග-
යේ හා පොළොවේ වාසය කරන
සියලුදෙනාම සාක්ෂිකරුවන් වෙයි.[8]
ඔබ ඉදිරියේ මාර්ග දෙකක් තිබෙ-
නවා. එකක් ජීවනයේ මාර්ගය. අනික
මරණයේ මාර්ගය.[9] මෙයින් එකක්
තෝරාගන්න. ඔබ තෝරාගන්නා
මාර්ගය අනුව ඔබට ආශීර්වාද[10] හෝ
ශාප[11] හිමි වෙයි. ඔබ තෝරාගත
යුත්තේ ඔබටත් ඔබේ දූපුතුන්ටත්[12]
දිගු කල් ජීවත් වීමට[13] හැකියාව
ලබා දෙන ජීවනයට යන මාර්ගයයි.
**20** ඒ සඳහා ඔබේ දෙවි වන යෙහෝ-
වාට[14] ප්‍රේම කරන්න. ඔහුගේ හඬට
සවන් දී ඔහුට ළංව සිටින්න.[15] ඔබට
ජීවනයත් පොළොවේ බොහෝ කල්
ජීවත් වීමේ ප්‍රස්තාවත් ලබා දෙන්නේ
ඔහුයි.[16] ඔබ එසේ කළොත් යෙහෝවා
දෙවි ඔබේ මුතුන්මිත්තන් වන ආබ්‍ර-
හම්, ඊසාක් සහ යාකොබ්ට පො-
රොන්දු වූ දේශයේ දිගු කාලයක් ජීවත්
වෙන්න ඔබට හැකි වෙයි."[17]

**31** මෝසෙස් මුළු ඊශ්‍රායෙල්
සෙනඟ වෙතට ගොස්
**2** ඔවුන්ට මෙසේ පැවසුවේය. "මගේ
වයස දැන් අවුරුදු එකසිය විස්සයි.[18]
මට තවදුරටත් ඔබේ නායකයා හැටි-
යට කටයුතු කරන්න ඉඩ ලැබෙන්-
නේ නැහැ.[19] 'යෝර්දාන් ගඟෙන්

**30 පරි.**
1 ද්වි 28:63
යෙරෙ 32:41
2 ද්වි 15:4
හිතෝ 10:22
3 ද්වි 26:17
ද්වි 30:2
4 නෙහෙ 1:9
එස 18:21
එස 33:11
ක්‍රියා 3:19
5 ගීතා 147:19
හිතෝ 2:4
යෙසා 45:19
6 රෝම 10:6
7 රෝම 10:8
8 මතෙ 7:21
යාකො 1:25
9 ද්වි 11:26
ද්වි 32:47
10 ද්වි 6:5
ද්වි 30:6

**2 තීරුව**
1 හිතෝ 19:16
1කොරි 7:19
2 ලෙවී 25:18
ද්වි 4:45
ගීතා 19:9
3 ලෙවී 18:5
නෙහෙ 9:29
ගලා 3:12
4 ද්වි 30:5
5 ද්වි 29:18
1සාමු 12:25
හෙබ්‍රෙ 3:12
6 ද්වි 4:19
ද්වි 31:29
ගීතා 96:5
7 ද්වි 8:19
යොෂු 23:15
8 ද්වි 4:26
ද්වි 31:28
යෙසා 1:2
9 ද්වි 32:47
10 ද්වි 11:26
ද්වි 28:2
11 ද්වි 27:26
ද්වි 28:15
12 ද්වි 6:2
යෙරෙ 32:39
13 යොෂු 24:15
14 ද්වි 10:12
15 ද්වි 4:4
16 ද්වි 4:40
17 උත් 12:7
උත් 15:18

**31 පරි.**
18 නික් 7:7
ද්වි 34:7
ක්‍රියා 7:23
19 ගණන් 27:17

එගොඩ වෙන්න ඔබට අවස්ථාවක්
නොලැබෙයි’[1] කියා යෙහෝවා දෙවි
මට පැවසුවා. **3** නමුත් යෙහෝවා
දෙවි අනිවාර්යයෙන්ම ඔබ සමඟ සිටි-
නවා. ඔබ ගඟෙන් එගොඩ වෙද්දී දෙවි
ඔබ ඉදිරියෙන්ම ගමන් කරයි.[2] දේ-
ශයේ වාසය කරන ජාතීන්ව
නැති කර දමන්නේ ඔහුයි. එමනිසා
ඔබට හැකි වෙයි ඔවුන්ව සම්පූර්ණ-
යෙන්ම පන්නා දමන්න.[3] එගොඩ
වෙද්දී ඔබේ නායකයා ලෙස කටයුතු
කරන්නේ යොෂුවායි.[4] ඔහුව පත්
කර තිබෙන්නේ යෙහෝවා දෙවියි.
**4** යෙහෝවා දෙවි අමෝරිවරුන්ගේ
රජවරුන් වූ සීහොන්ට[5] සහ ඕග්ට[6]
මෙන්ම ඔවුන්ගේ දේශයට කළ දේ
ඔබට මතක ඇති. ඔහු මේ දේශයේ
සිටින ජාතීන්ට කරන්නෙත් ඒ දේ-
මයි.[7] **5** යෙහෝවා දෙවි ඔබේ අත-
ටම ඔවුන්ව හසු කර දෙයි.[8] මා ඔබට
කී ලෙසම ඔවුන්ට විරුද්ධව පියවර
ගන්න.[9] **6** ඒ සඳහා ධෛර්යවත්
වන්න.[10] කිසි දෙයකට භය වෙන්න
එපා.[11] මන්ද ඔබේ දෙවි වන යෙ-
හෝවා ඔබ සමඟයි. ඔබ වෙනුවෙන්
සටන් කරන ඔහු කිසි දවසක ඔබව
තනි කරන්නේවත් අත්හැර යන්නේ-
වත් නැහැ.”[12]

**7** ඉන්පසු මෝසෙස් යොෂුවාව
තමන් ළඟට කැඳවා මුළු ඊශ්‍රා-
යෙල් සෙනඟ ඉදිරියේ ඔහුට මෙසේ
පැවසීය. “ධෛර්යවත් වී එඩිත-
රව සිටින්න.[13] යෙහෝවා දෙවි අපේ
මුතුන්මිත්තන්ට දෙන්න පොරොන්දු
වූ දේශයට මේ සෙනඟව ගෙන යන්-
නේ ඔබයි. ඒ දේශය උරුමයක් ලෙස
ඔවුන්ට බෙදා දෙන්නෙත් ඔබයි.[14]
**8** කිසි දෙයකට භය වෙන්න එපා.[15]
යෙහෝවා දෙවි ඔබ සමඟයි.[16] ඔහු
ඔබ වෙනුවෙන් සටන් කරයි. ඔහු කිසි
දවසක ඔබව තනි කරන්නේවත් අත්-
හැර යන්නේවත් නැහැ.”

**9** මෝසෙස් දෙවිගේ නීතියේ සඳ-
හන් සියලු දේ ලියා[17] එය යෙ-
හෝවා දෙවිගේ ගිවිසුම් පෙට්ටිය
උසුලාගෙන යන[18] ලෙවී ගෝත්‍රයට
අයත් පූජකයන්ටත්[1] ඊශ්‍රායෙල්හි සිය-
ලුම වැඩිමහල්ලන්ටත් භාර දුන්-
නේය. **10** මෝසෙස් ඔවුන්ට මෙසේ
අණ කළේය. “සෑම අවුරුදු හතකට
වරක් පැමිණෙන සහන අවුරුද්දේදී[2]
ඔබ කළ යුත්තේ මෙයයි. ඒ අවුරුද්දේ
පැල් උත්සවය[3] පවත්වන කාලයේදී,
**11** මුළු ඊශ්‍රායෙල් සෙනඟ යෙහෝවා
දෙවි තෝරාගන්නා ස්ථානයට[4] රැස්
වී ඔහු ඉදිරියේ පෙනී සිටිය යුතුයි.[5]
එසේ රැස් වන මුළු ඊශ්‍රායෙල් සෙනඟ-
ටම ඇසෙන සේ ඔබ මේ නීතිය කිය-
විය යුතුයි.[6] **12** ඒ අවස්ථාව සඳහා
දේශයේ වාසය කරන සියලුම පුරුෂ-
යන්, ස්ත්‍රීන්, කුඩා දරුවන් මෙන්ම
ඔබ සමඟ ජීවත් වන විදේශිකයන්ද
රැස් විය යුතුයි.[7] එවිට නීතියට
සවන් දෙන්නත් එය හොඳින් ඉගෙ-
නගන්නත්[8] ඔවුන් සියලුදෙනාටම
හැකි වෙයි. එසේ කිරීමෙන් යෙහෝවා
දෙවිට ගරුබිය දක්වන්නත්[9] මේ
නීතියේ සඳහන් සියලු දේ හොඳින්
පිළිපදින්නත් ඔවුන් පුරුදු වෙයි.
**13** එසේම නීතියේ සඳහන් දේවල්
ගැන අවබෝධයක් නැති ඔවුන්ගේ
දරුවන්ටත් ඒවාට සවන් දෙන්න
අවස්ථාවක් ලැබෙයි.[10] මන්ද ඔබ
යොර්දාන් ගඟෙන් එගොඩ වී හිමි
කරගන්නා දේශයේ ජීවත් වන තාක්
කල් යෙහෝවා දෙවිට ගරුබිය දක්-
වන්න ඔවුන් ඉගෙනගත යුතුයි.”[11]

**14** පසුව යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ පැවසීය. “ඔබ තව වැඩි
කලක් ජීවත් වන්නේ නැත.[12] එහෙ-
යින් යොෂුවාව නායකයා ලෙස පත්
කළ යුතුයි. ඔහුව රැගෙන සම්-
මුඛ වීමේ කූඩාරමට එන්න.”[13] මේ
අනුව මෝසෙස් යොෂුවා සමඟ ගොස්
සම්මුඛ වීමේ කූඩාරම අසල සිට-
ගත්තේය.[14] **15** එවිට යෙහෝවා
දෙවිගේ තේජස වලා ටැඹක් සේ
කූඩාරම අසල දක්නට ලැබිණ. ඒ
වලා ටැඹ දක්නට තිබුණේ කූඩාරමට
ඇතුල් වන ස්ථානයෙහිමය.[15]

**16** ඒ අවස්ථාවේදී යෙහෝවා දෙවි
මෝසෙස්ට මෙසේ පැවසීය. “තව

**31 පරි.**
1 ගණන් 20:12
ද්වි 3:27
ද්වි 4:21
2 ද්වි 9:3
3 ගීතා 44:2
4 ගණන් 27:18
ද්වි 3:28
යොෂු 1:2
යොෂු 4:14
ක්‍රියා 7:45
5 ගණන් 21:24
6 ගණන් 21:35
7 නික් 23:23
ද්වි 29:7
8 ද්වි 3:21
ද්වි 7:2
9 ගණන් 33:52
ද්වි 7:24
ද්වි 20:16
10 යොෂු 1:6
ගීතා 27:14
ගීතා 118:6
11 ගණන් 14:9
ද්වි 1:29
ද්වි 7:18
ගීතා 56:3
12 ද්වි 4:31
යොෂු 1:5
හෙබ්‍රෙ 13:5
13 යොෂු 10:25
එෆී 6:10
14 ද්වි 1:38
15 යොෂු 1:9
16 නික් 33:14
17 නික් 34:27
දානි 9:13
18 ගණන් 4:15
ද්වි 31:25

**2 තීරුව**
1 ද්වි 17:18
2 ද්වි 15:1
3 ලෙවී 23:34
4 ද්වි 12:5
5 නික් 23:17
ද්වි 16:16
6 නෙහෙ 8:7
7 ද්වි 4:10
හෙබ්‍රෙ 10:25
8 ද්වි 29:29
9 ගීතා 34:11
හිතෝ 8:13
10 ද්වි 6:7
ද්වි 11:2
ගීතා 78:6
හිතෝ 22:6
එෆී 6:4
11 ද්වි 30:16
12 ගණන් 27:13
ද්වි 31:2
13 ද්වි 3:28
14 නික් 40:2
15 නික් 33:9
නික් 40:38
ගීතා 99:7

කෙටි කලකින් ඔබේ මුතුන්මිත්තන්
මෙන් ඔබත් මිය යනු ඇත.[1] ඔබේ
මරණයෙන් පසු මේ ජාතිය අනිවාර්ය-
යෙන්ම මාව අත්හැර[2] මා සමඟ ඇති
කළ ගිවිසුමද කඩ කරන්නෝය.[3]
ඔවුහු තමන් යන දේශයේ ජීවත්
වන මිනිසුන් අදහන බොරු දෙවිව-
රුන්ව අදහමින් සියල්ලන් ඉදිරියේ
ඉතා පිළිකුල්සහගත දේවල් කරන්-
නෝය.[4] **17** එවිට මාගේ උදහස
ඔවුන්ට විරුද්ධව ඇවිළෙයි.[5] මම
ඔවුන්ව අත්හැර[6] ඔවුන්ගෙන් ඈත්ව
සිටින්නෙමි.[7] බොහෝ ආපදා හා
විපත්වලට මුහුණ දෙන ඔවුහු විනාශ
වී යනු ඇත.[8] එවිට, 'අප මේ විපත්ව-
ලට මුහුණ දෙන්නේ අපගේ දෙවි අපව
අත්හැරිය නිසයි'[9] කියා ඔවුහු පව-
සන්නෝය. **18** ඒ කාලයේදී ඔවුන්
වෙනත් දෙවිවරුන්[10] පසුපස ගොස්
බොහෝ දුෂ්ටකම් කරන නිසා මම
ඔවුන්ට කිසි ලෙසකින්වත් පිහිට
නොවන්නෙමි.

**19** "දැන් මා කියන මේ ගීතය
ලියාගෙන[11] ඊශ්‍රායෙල්වරුන්ට උගන්-
වන්න.[12] ඔවුන්ට එය කටපාඩම්
කරන්න කියා පවසන්න. එවිට මේ
ගීතය ඊශ්‍රායෙල්වරුන්ට විරුද්ධව
සාක්ෂි දෙයි.[13] **20** ඔවුන්ගේ මුතුන්-
මිත්තන්ට මා පොරොන්දු වූ[14] ලෙස
කිරියෙන් හා පැණියෙන් ඉතිරී යන ඒ
දේශයට[15] මම සැබවින්ම ඔවුන්ව
ගෙන යන්නෙමි. ඔවුහුද හොඳින් කා
බී[16] තෘප්තිමත් ජීවිතයක් ගත කරන්-
නෝය.[17] නමුත් තෘප්තියට පත් වූ
පසු ඔවුහු මාව අමතක කර වෙනත්
දෙවිවරුන් පසුපස යන්නෝය.[18] මා
සමඟ ඇති කරගත් ගිවිසුම කඩ කර
මට අගෞරව කරනු ඇත.[19] **21** මම
තවමත් ඔවුන්ට පොරොන්දු වූ දේශ-
යට ඔවුන්ව රැගෙන ගියේ නැත.
නමුත් මේ වන විටත් ඔවුන් තුළ නුසු-
දුසු ආකල්ප[20] වර්ධනය වන ආකාරය
මට පෙනේ. ඒ නිසා ඔවුනුත් ඔවුන්ගේ
දරුදැරියනුත් මේ ගීතයේ වචන අම-
තක නොකළ යුතුයි. අකීකරුකම
හේතුවෙන් ඔවුන් බොහෝ දුක් පීඩා
හා විපත්වලට මුහුණ දෙන විට[1] මේ
ගීතයේ වචන ඔවුන්ට මතක් වනු
ඇත."

**22** මෝසෙස් ඒ ගීතය ඊශ්‍රායෙල්ව-
රුන්ට කියා දීමේ අදහසින් එහි පද
මාලාව ලියාගත්තේය.[2]

**23** ඉන්පසුව දෙවි නූන්ගේ පුත්
යොෂුවාව[3] නායකයා ලෙස පත් කර
ඔහුට මෙසේ පැවසීය. "ධෛර්ය-
වත් වන්න. එඩිතරව සිටින්න.[4] මා
ඊශ්‍රායෙල්වරුන්ට දෙන්න පොරොන්දු
වූ දේශයට ඔවුන්ව ගෙන යන්නේ
ඔබයි.[5] මම නිතරම ඔබ සමඟ සිටින්-
නෙමි."

**24** මෝසෙස් දෙවිගේ නීතිය සම්-
පූර්ණයෙන්ම ලියා අවසන් කළ පසු,[6]
**25** යෙහෝවා දෙවිගේ ගිවිසුම් පෙට්-
ටිය උසුලාගෙන යන ලෙවීවරුන්ට
මෙසේ අණ කළේය.[7] **26** "නීතිය
සඳහන් මෙම ලියවිල්ල ගෙන[8]
යෙහෝවා දෙවිගේ ගිවිසුම් පෙට්-
ටිය ළඟින්ම තබන්න.[9] එය
ඔබට විරුද්ධව සාක්ෂියක් වෙයි.[10]
**27** ඔබ නම් ඉතා මුරණ්ඩු[11] කැරලි-
කාර[12] සෙනඟක්! එය මම හොඳින්ම
අවබෝධ කරගෙන තිබෙනවා. මා
ජීවත්ව සිටින කාලයේදීත් ඔබ යෙ-
හෝවා දෙවිට විරුද්ධව කැරලිගස-
නවා නම්[13] මගේ මරණයෙන් පසු
ඊටත් වඩා කොයි තරම් කැරලිගස-
යිද? **28** දැන් ඔබේ ගෝත්‍රවල ප්‍රධා-
නීන් සහ සියලුම අධිපතීන් මා ළඟට
රැස් කරන්න.[14] මම මේ ගීතයේ
සියලු වචන ඔවුන්ට කියා දෙන්-
නම්. මා පවසන දේට ස්වර්ගයේ හා
පොළොවේ වාසය කරන සියලුදෙ-
නාම සාක්ෂිකරුවන් වෙයි.[15] **29** මා
මිය ගියායින් පසු ඔබ ස්ථිර වශ-
යෙන්ම මා ඔබට දුන් මඟ පෙන්-
වීම් නොසලකාහැර පිළිකුල්සහගත
දේවල් කරයි කියා මම දන්නවා.[16] ඒ

**31 පරි.**

**1** 2සාමු 7:12 යොහ 3:13
**2** නික් 32:6 ද්වි 32:15 විනි 2:12 1රාජා 11:33
**3** විනි 2:20 යෙරෙ 31:32 හෙබ්‍රෙ 8:9
**4** නික් 34:15 විනි 2:17 ගීතා 106:37 ගීතා 106:39 යෙරෙ 3:1 එස 16:15
**5** ද්වි 29:20 ගීතා 74:1
**6** 1ලේක 28:9 2ලේක 15:2 2ලේක 24:20
**7** ද්වි 32:20 යෝබ් 34:29 ගීතා 27:9 ගීතා 104:29 එස 39:23
**8** ද්වි 31:21 ද්වි 32:23 නෙහෙ 9:27 හිතෝ 1:27
**9** විනි 6:13
**10** යෙසා 8:17 යෙසා 59:2
**11** ද්වි 31:30 ද්වි 32:44 කොලො 3:16
**12** ද්වි 4:9 ද්වි 11:19
**13** ද්වි 31:21
**14** උත් 15:18 ද්වි 6:10
**15** නික් 3:8 ගණන් 13:27 එස 20:6
**16** ද්වි 8:12 නෙහෙ 9:25
**17** ද්වි 32:15
**18** ද්වි 32:16
**19** නික් 24:7 ද්වි 29:1 නෙහෙ 9:26
**20** උත් 8:21 නික් 16:4 1ලේක 28:9 ගීතා 139:2

**2 තීරුව**

**1** ද්වි 28:59 ද්වි 29:22
**2** ද්වි 31:19
**3** ගණන් 27:18 ද්වි 31:14
**4** යොෂු 1:6 ගීතා 27:14 ගීතා 118:6
**5** ද්වි 1:38 ද්වි 3:28
**6** නික් 34:27 ද්වි 31:9
**7** ගණන් 4:15 1ලේක 15:12

**8** ද්වි 17:18; ද්වි 31:9; 2රාජා 22:8; 2ලේක 34:14; **9** 1රාජා 8:9; හෙබ්‍රෙ 9:4; **10** ද්වි 31:19; **11** නික් 32:9; ද්වි 9:6; ගීතා 75:5; හිතෝ 29:1; යෙසා 48:4; **12** ද්වි 9:24; ද්වි 32:20; යොෂු 1:18; නෙහෙ 9:26; **13** ද්වි 9:24; ගීතා 78:8; **14** ද්වි 29:10; **15** ද්වි 4:26; ද්වි 30:19; ද්වි 32:1; **16** ද්වි 32:5; විනි 2:19; හොෂෙ 9:9.

නිසා ඉදිරි අනාගතයේදී බොහෝ
දරුණු විපත්වලට[1] මුහුණ දෙන්න
ඔබට සිදු වෙයි. එසේ සිදු වන්නේ
ඔබ යෙහෝවා දෙවිව උදහස් කර
ඔහුට අප්‍රසන්න දේවල් නිතරම කරන
නිසයි.”[2]

30 එවිට මෝසෙස් මෙම ගීතයේ
සම්පූර්ණ පද මාලාව මුළු ඊශ්‍රායෙල්
සමූහයට ඇසෙන්න කියෙව්වේය. එම
ගීතයේ පද මාලාව මතු දැක්වේ.[3]

32 “ස්වර්ගයේ වෙසෙන සියල්-
ලෙනි, මට කන් දෙන්න.
පොළෝ වැසියෙනි, මා පව-
සන දේට සවන් දෙන්න.[4]
2 මා දෙන උපදෙස් පොළොව තෙ-
මන වැසි මෙනි.[5]
මාගේ වචන පිනි බිඳු මෙනි.[6]
ඒවා තණකොළ සිපගන්නා පොද
වැසි මෙන්ද[7]
පැළෑටි මත ඇද හැළෙන වරුසා
මෙන්ද වන්නේය.[8]
3 මම දැන් ඔබට යෙහෝවා දෙවි-
ගේ නාමය* ප්‍රකාශ කරන්-
නෙමි.[9]
ඔබත් අපේ දෙවිගේ ශ්‍රේෂ්ඨත්-
වය ගැන පොළොව පුරා
දන්වන්න.[10]
4 දෙවි පර්වතයකි. ඔහු කුමක්
කළත් එහි කිසි අඩුවක්-
වත් දෝෂයක්වත් දක්නට
නැත.[11]
දෙවි තමන් කරන සියල්ලේදී
යුක්තිය ඉටු කරයි.[12]
ඔහු විශ්වාසවන්ත දෙවි කෙ-
නෙකි.[13] ඔහු අතින් කිසිම
අසාධාරණයක් නම් සිදු
නොවෙයි.[14]
දෙවි ධර්මිෂ්ඨය, ප්‍රතිපත්ති-
ගරුකය.[15]
5 එහෙත් විනාශකාරී මඟක් ඔස්-
සේ කැමැත්තෙන්ම ගමන්
කරන්නේ මිනිසාමය.[16]
ඔවුහු දෙවිගේ දරුවන් ලෙස
ක්‍රියා නොකරති. ඔවුන්ගේ
වැරදිවලට වග කිව යුත්තේ
ඔවුන්මය.[1]
ඔවුන් වංක නොමඟ ගිය සෙ-
නඟක්ය.[2]
6 කිසිවක් වටහා නොගන්නා
අඥාන ජනයෙනි,[3]
ඔබ යෙහෝවා දෙවිට මෙලෙස
සලකන්නේ මන්ද?[4]
ඔබට ජීවිතය දුන් පියාණන් ඔහු
නොවේද?[5]
ඔබව ශක්තිමත් කළ තැනැත්-
තා ඔහු නොවේද?[6]
7 අතීත දවස් සිහි කරන්න.[7]
පසුගිය කාලවලදී සිදු වූ
දේවල් නැවත කල්පනා කර
බලන්න.
ඔබ නොදන්නවා නම් ඒ ගැන
ඔබේ පියාගෙන් අසා දැන-
ගන්න.[8]
ඔබ අතරේ සිටින වැඩිමහල්-
ලෝද ඒ ගැන ඔබට කියා
දෙනු ඇත.[9]
8 මහෝත්තම දෙවි ආදම්ගේ
පුත්‍රයන්ව පොළොව පුරා
විසුරුවාහැර[10]
විවිධ ජාතීන්ට උරුමයක් ලබා
දුන්නේය.[11]
ඔහු සියල්ලන් සඳහා දේශ සීමා
නියම කළ විට,[12]
ඊශ්‍රායෙල්වරුන්ට ප්‍රමාණවත්
ඉඩකඩ වෙන් කිරීමට අම-
තක නොකළේය.[13]
9 යෙහෝවා දෙවිගේ උරුමය වන්-
නේ ඔහුගේ සෙනඟය.[14]
යාකොබ්ගේ පෙළපත ඔහුට
අයිති කොටසය.[15]
10 ඔවුන් පාළු දේශයක සිටියදී දෙවි
ඔවුන් දෙස බලා සිටියේය.[16]
ඔවුන් සිටියේ ජනශූන්‍ය වූ, වන-
සතුන්ගේ හඬින් දෝංකාර
දෙන වැලි කතරකයි.[17]

**31 පරි.**
**1** ද්වි 28:15
**2** යෙරෙ 44:8
**3** ද්වි 32:44

**32 පරි.**
**4** ද්වි 4:26
ද්වි 30:19
**5** යෝබ් 29:22
යෙසා 55:10
**6** හිතෝ 19:12
හොෂෙ 14:5
**7** ගීතා 72:6
**8** මීකා 5:7
**9** නික් 34:5
ගීතා 105:1
යොහ 17:26
**10** 1ලේක 29:11
ගීතා 145:3
**11** 2සාමු 22:31
ගීතා 18:2
ගීතා 19:7
යාකො 1:17
**12** ගීතා 33:5
ගීතා 67:4
දානි 4:37
**13** ද්වි 7:9
නෙහෙ 9:33
ගීතා 98:3
හෙබ්‍රෙ 10:23
1පේතෘ 4:19
**14** ද්වි 25:16
යෝබ් 34:10
රෝම 3:5
**15** උත් 18:25
ගීතා 92:15
ගීතා 99:4
හොෂෙ 14:9
**16** ද්වි 31:27
විනි 2:19
ගීතා 14:1

**2 තීරුව**
**1** යෙසා 1:4
යෙරෙ 15:6
යාකො 1:14
**2** ගීතා 78:8
ලූක් 9:41
පිලි 2:15
**3** යෙරෙ 4:22
**4** යෙසා 1:2
**5** නික් 4:22
ද්වි 32:18
2සාමු 7:23
යෙසා 63:16
**6** ගීතා 55:22
**7** යෙසා 63:11
**8** නික් 13:14
ගීතා 44:1
**9** ගීතා 78:3
**10** උත් 11:9
**11** උත් 10:5
ගීතා 115:16
**12** ද්වි 2:5
ද්වි 2:19
ක්‍රියා 17:26
**13** උත් 15:18
නික් 23:31
ගීතා 105:44

**ද්වි 32:3*** මෙයින් අදහස් වන්නේ නිකම්ම නම කීමක් නොවේ. ඔහුගේ පෞද්ගලිකත්වය, ගති-ගුණ හා ශ්‍රේෂ්ඨ ක්‍රියා ගැන ප්‍රකාශ කිරීමයි.

**14** නික් 15:16; නික් 19:5; ද්වි 7:6; ද්වි 26:19; **15** 1සාමු 10:1; ගීතා 74:2; ගීතා 78:71; **16** ද්වි 8:15; හොෂෙ 13:5; **17** ගීතා 107:4; යෙරෙ 2:6.

නමුත් දෙවි නිරතුරුවම ඔවුන්
ගැන සෝදිසියෙන් සිට*[1]
තම ඇසේ කලු ඉංගිරියාව
මෙන් ඔවුන්ව ආරක්ෂා කර-
ගත්තේය.[2]
ඔවුන්ට රැකවරණය ලබා දුන්-
නේය.[3]
11 රාජාලියෙක් තම පැටවුන්ට
පියාඹන්න උගන්වන විට
පැටවුන්ට ඉහළින් පියාසර කර-
මින් උන්ව ආරක්ෂා කරයි.[4]
උන්ගේ උදව්වට යන රාජාලියා
උන්ව තම පියාපත් මතට
ගෙන උන්ව උසුලාගෙන
යයි.[5]
12 යෙහෝවා දෙවි තම සෙනඟට මඟ
කියා දුන්නෙත් එසේමය.[6]
ඔවුන්ගේ උපකාරයට වෙනත්
කිසිදු දෙවි කෙනෙක් නොසි-
ටියේය.[7]
13 ඔවුන් කඳුකර පළාත් තම අණ-
සක යටතට ගත්තේ දෙවි-
ගේ උපකාරයෙන්ය.[8]
කෙත්වතුවල පලදාවෙන් දෙවි
ඔවුන්ව පෝෂණය කළේය.[9]
ගිරි දුර්ගවලින් මීපැණිද[10]
පර්වතවලින් තෙල්ද ලබා දී
ඒවායින් ඔවුන්ව තෘප්තිමත්
කළේය.[11]
14 සත්ව රැළෙන් ලබාගත් වෙඬරු*
හා කිරිවල රස බැලූ ඔවුහු,[12]
බාෂාන් දේශයෙන් ගෙන්වාගත්
හොඳම ගණයේ බැටළුවන්ද
එළුවන්ද[13] ඉස්තරම්ම තිරිඟුද[14]
ආහාරයට ගත්හ.
ඔවුන් පානය කළේ හොඳම මිදි-
වලින් සාදාගත් වයින්ය.[15]
15 එසේ පෝෂණය වී තර වූ පසු
යෙෂුරුන්*[16] කැරලිකාර වී
පයින් ගැසුවේය.[17]
අනේ යෙෂුරුන්, හොඳින් කා බී
උස් මහත්[18] වූ පසු

ද්වි 32:10* මූ.අ., “ඔවුන් වටා යමින්.” 14* උත් 18:8හි පාදසටහන බලන්න. 15* ඊශ්‍රා-
යෙල් ජාතිය සඳහා භාවිත කරන ගෞරවාන්විත නමක්.

ඔබව ඇතිදැඩි කළ දෙවිව ඔබ
අත්හැරියෙහිය.[1]
ඔබට ගැලවීම ලබා දුන් පර්ව-
තය[2] සුළු කොට තැකු-
වෙහිය.
16 ඔවුහු බොරු දෙවිවරුන්[3] පසුපස
යමින්ද
බොහෝ පිළිකුල්සහගත දේවල්
කරමින්ද දෙවිව උදහස්
කළෝය.[4]
17 ඔවුන් පූජා ඔප්පු කළේ දෙවිට
නොව භූතයන්ටය.[5]
ඔවුන් නමස්කාර කළේ ඔවුන් කිසි
කලක නොදැන සිටි[6]
ඔවුන්ගේ මුතුන්මිත්තන්වත්
නොදැන සිටි දෙවිවරුන්-
ටය.[7]
18 ඔබට පියෙකු හා සමාන වූ ඒ පර්-
වතය ඔබ නොසලකාහැරි-
යහුය.[8]
මවක මෙන් ප්‍රසව වේදනාවෙන්
ඔබව බිහි කළ දෙවිව ඔබ
අමතක කර දැමුවහුය.[9]
19 ඔවුන් කළ දේ දුටු යෙහෝවා දෙවි
උදහස් විය.
ඔහුගේ දූපුතුන්ගේ නොමනා
හැසිරීම නිසා ඔවුන්ව පිළි-
කුල්[10] කරන්න පටන්ගත්-
තේය.
20 එවිට දෙවි මෙසේ කීවේය. ‘මම
ඔවුන්ගෙන් ඈත් වී,*[11]
ඔවුන්ට අද්දකින්න සිදු වන
නරක ප්‍රතිඵල දෙස බලා
සිටින්නෙමි.
මන්ද ඔවුහු හිතුවක්කාර සෙ-
නඟකි.[12]
ඔවුන් මාගේ පුත්‍රයන් වුවත්
ඔවුන් තුළ කිසි විශ්වාසවන්-
තකමක් නැත.[13]
21 ඔවුහු කිසිම වටිනාකමක් නැති
දෙවිවරුන් පසුපස ගොස්
මාව උදහස් කළෝය.[14]
ඔවුන්ගේ නිෂ්ඵල රූපවලින්
මාව කුපිත කළෝය.[15]

ද්වි 32:20* මූ.අ., “ඔවුන්ගෙන් මාගේ මුහුණ ඉව-
තට හරවා.”

**32 පරි.**

1 නෙහෙ 9:19
2 ගීතා 17:8
සෙක 2:8
3 නෙහෙ 9:20
ගීතා 8:4
4 යෙසා 31:5
5 නික් 19:4
6 ද්වි 1:31
7 යෙසා 43:12
8 ද්වි 33:29
යෙසා 58:14
9 ද්වි 8:8
10 ගීතා 81:16
11 යෝබ් 29:6
12 උත් 18:8
13 එස 39:18
14 ගීතා 147:14
15 උත් 49:11
16 ද්වි 33:5
යෙසා 44:2
17 හොෂෙ 4:16
18 ද්වි 31:20
නෙහෙ 9:25
ගීතා 73:7

**2 තීරුව**

1 යෙසා 1:4
යෙසා 51:13
හොෂෙ 13:6
2 2සාමු 22:47
ගීතා 89:26
ගීතා 95:1
3 විනි 2:12
4 1රාජා 14:22
2රාජා 23:13
එස 8:17
1කොරි 10:22
5 ලෙවී 17:7
ගීතා 106:37
1කොරි 10:20
6 ද්වි 28:64
7 විනි 5:8
8 ගීතා 106:21
යෙසා 17:10
යෙරෙ 2:32
යෙරෙ 3:21
9 ද්වි 4:34
10 විනි 2:14
ගීතා 78:59
ගීතා 106:40
11 ද්වි 31:17
යෝබ් 34:29
ගීතා 30:7
12 ද්වි 32:5
යෙසා 65:2
මතෙ 17:17
13 යෙසා 1:2
යෙසා 30:9
14 ගීතා 96:5
යෙසා 44:10
1කොරි 8:4
1කොරි 10:20
15 1සාමු 12:10
1සාමු 12:21
1රාජා 16:13
ක්‍රියා 14:15

ඒ නිසා ඔවුන් වෙනුවට එතරම් වැදගත් නොවන ජනතාවකට මම කරුණාව පෙන්වන්නෙමි. එයින් ඔවුන් තුළ ඊර්ෂ්‍යාවක් ඇති වේ.[1]
මම ඔවුන් වෙනුවට අනුවණයයි සැලකෙන ජාතියක් තෝරාගන්නෙමි. එයින් ඔවුන් තුළ මහත් කෝපයක් ඇති වේ.[2]
22 මාගේ උදහස ගින්නක් මෙන් ඇවිළ ඇත.[3]
පොළෝගැබෙහි පිහිටි මිනී වළ පවා එයින් ඇවී යයි.[4]
එයින් පොළොවද එහි පලදාවද පිලිස්සී යනු ඇත.[5]
කඳුවල අත්තිවාරම්ද සුනුවිසුනු වී යයි.[6]
23 මම ඔවුන් මතට ගෙනෙන විපත් තව තවත් වැඩි කරන්නෙමි.[7]
මාගේ ඊකොපුව හිස් වන තුරු ඊතල විදින්නෙමි.[8]
24 ඔවුහු සාගින්නෙන් මැලවී යන්නෝය.[9]
දරුණු උණ රෝගවලින්[10] හා වේදනාකාරී විපත්වලින් පහර ලබා විනාශ වන්නෝය.[11]
මම ඔවුන් අතරට තියුණු දත් සහිත රුදුරු වනසතුන්ව[12] හා
විෂඝෝර සර්පයන්ව එවන්නෙමි.[13]
25 එළිමහනේ සිටින්නෝ කඩු පහරින්ද,[14]
ගෙවල් ඇතුළත සිටින්නෝ භීතියෙන්ද[15] මිය යනු ඇත.
තරුණ තරුණියෝ[16] මෙන්ම
කිරි බොන ළදරුවෝ සහ මහල්ලෝද[17] ඉතුරු වන්නේ නැත.
26 “ඔවුන්ව විසුරුවාහරින්නෙමි”[18] කියාත්,
“මිහිපිටින් ඔවුන්ගේ නම් මකා දමන්නෙමි”[19] කියාත් පවසන්න මට පුළුවන.
27 නමුත් ඔවුන්ගේ සතුරෝ එය දැක වැරදි නිගමනයකට එළඹී,[1]
“මෙය යෙහෝවා දෙවි කළ දෙයක් නොවේ.[2]
අප ජය ගත්තේ අප ඔවුන්ට වඩා බලවත් නිසා”[3] යයි පවසනු ඇත.
ඔවුන් එසේ සිතනවාට මම කොහෙත්ම කැමති නැත.[4]
28 ඊශ්‍රායෙල් ජාතිය උපදෙස් පිළි නොගන්නා සෙනඟකි.[5]
ඔවුන් අතරේ සිහිකල්පනාවෙන් ක්‍රියා කරන කිසිවෙක් නැත.[6]
29 ඔවුහු නුවණැතිව ක්‍රියා කළා නම්[7] තමන්ට සිදු වන දේ ගැන ගැඹුරින් කල්පනා කරනු ඇත.[8]
තමන් කරන දේවල නරක ප්‍රතිඵල ගැන සලකා බලනු ඇත.[9]
30 ඔවුන් අතරේ සිටින දහස්දෙනෙකු පසුපස එක් කෙනෙකු හඹා යන්නේ කෙසේද?
ඔවුන්ගෙන් දසදහසක් පලවාහරින්න දෙදෙනෙකුට හැකි වන්නේ කෙසේද?[10]
එසේ වන්නේ ඔවුන්ගේ පර්වතය වන යෙහෝවා දෙවි
ඔවුන්ව අත්හැර ඔවුන්ගේ සතුරන් අතට හසු කර දුන් නිසාය.[11]
31 (ඔවුන්ගේ දෙවිවරුන්ව, පර්වතයක් මෙන් සිටින අපේ දෙවිට* සමාන කළ හැකිද?[12]
අපගේ සතුරෝ පවා මේ කාරණය අවිවාදයෙන් පිළිගනිති.)[13]
32 ඊශ්‍රායෙල් නමැති මිදිවැල ගෙන්වාගත්තේ සොදොම් දේශයෙනි.
ඇය ගොමෝරාවේ[14] ජනිත වූ මිදිවැලකි.

**32 පරි.**
1 හොෂෙ 1:10, හොෂෙ 2:23, රෝම 9:25, රෝම 11:11, 1පේතෘ 2:10
2 රෝම 10:19
3 ගීතා 21:9, යෙරෙ 15:14, විලා 4:11
4 ආමො 9:2
5 ශෙප 3:8
6 හබ 3:10
7 ලෙවී 26:24, ද්වි 28:15
8 ගීතා 7:13, එස 5:16
9 ද්වි 28:53
10 ද්වි 28:22
11 ද්වි 28:21, ආමො 4:10
12 ලෙවී 26:22, යෙරෙ 15:3, එස 5:17
13 ගණන් 21:6, යෙරෙ 8:17, ආමො 9:3
14 යෙරෙ 9:16, විලා 1:20
15 යෙරෙ 9:21, එස 7:15
16 2ලේක 36:17
17 විලා 2:21
18 ලෙවී 26:33, ද්වි 28:25, එස 20:23, ලූක් 21:24
19 ද්වි 9:14

**2 තීරුව**
1 නික් 32:12, ගණන් 14:16
2 යෙසා 37:24
3 ගීතා 115:2, ගීතා 140:8
4 1සාමු 12:22, එස 20:14
5 ගීතා 106:13, ගීතා 107:11, ලූක් 7:30
6 යෙසා 6:10, යෙසා 27:11, මතෙ 13:15
7 ගීතා 81:13, හිතෝ 1:5, හිතෝ 27:11
8 ගීතා 107:43, හොෂෙ 14:9, 1තිමෝ 4:15
9 යෙරෙ 2:19, විලා 1:9
10 2ලේක 24:24, යෙසා 30:17
11 විනි 2:14, 1සාමු 12:9, ගීතා 44:12, යෙසා 50:1
12 නික් 14:25, 1සාමු 2:2
13 1සාමු 4:8, එස්රා 1:3, දානි 2:47

14 යෙසා 1:10; යූද් 7.

**ද්වි 32:31*** මූ.අ., “ඔවුන්ගේ පර්වතය අපේ පර්වතයට.”

ඇගේ මිදිගෙඩි විෂ සහිතය.
ඇගේ මිදිපොකුරු තිත්තය.[1]
33 ඔවුන්ගේ වයින් දැවැන්ත සර්පයන්ගේ විෂ මෙන්ද
නාගයෙකුගේ මාරාන්තික විෂ[2] මෙන්ද වන්නේය.
34 ඔවුන් මේ දේවල් කරන බව මම හොඳින් දනිමි.
ඒ සඳහා ඔවුන්ට ලැබෙන ප්‍රතිඵල මම දැනටමත් තීරණය කර මතකයේ තබාගන්නෙමි.*[3]
35 යුක්තිය ඉටු කිරීමේ අයිතිය මා සතුය. වරදකරුවන්ට දඬුවම් කිරීමේ අයිතිය ඇත්තේ මට පමණි.[4]
නියමිත කාලයේදී ඔවුන්ගේ පාද පැටලී ඔවුහු වැටෙනු ඇත.[5]
ඔවුන්ගේ විපත සිදු වන කාලය අත ළඟයි.[6]
ඔවුන්ට අත් විඳින්න සිදු වන දේවල් වේගයෙන් ඔවුන් කරා පැමිණෙයි.'[7]
36 යෙහෝවා දෙවි තම සෙනඟව විනිශ්චය කරන බව ස්ථිරයි.[8]
නමුත් තම සේවකයන් අන්ත අසරණ තත්වයකට පත්ව ඇති නිසාත්
ඔවුන්ගේ උපකාරයට සිටි අය ඔවුන්ව අත්හැර ගොස් ඇති නිසාත් ඔහු ඔවුන් ගැන දුක් වෙයි.[9]
37 එවිට දෙවි ඔවුන්ගෙන් මෙසේ අසයි. 'ඔබ පර්වතයක් මෙන් රැකවරණය සෙවූ[10]
ඔබේ දෙවිවරුන් කොහේද?[11]
38 ඔබ ඒ දෙවිවරුන්ට තෙල් පූජා කළහුය.[12]
පාන පූජා ලෙස වයින් ඔප්පු කළහුය.[13]
එහෙයින් ඔබේ උපකාරයට ඒ දෙවිවරුන්ට එන්න කියන්න.[14]
ඇවිත් ඔබට රැකවරණය ලබා දෙන්න කියන්න.[1]
39 නමුත් එසේ කළ හැකි එකම දෙවි මමය.[2]
මා මිස වෙනත් කිසිම දෙවි කෙනෙකු නැති බව දැන්වත් තේරුම්ගන්න.[3]
යමෙකුට ජීවිතය දෙන්නෙත් ඔහුගෙන් එය නැවත ගන්නෙත් මමය.[4]
යමෙකු මා අතින් දරුණු තුවාල ලැබුවත්[5] ඒ තැනැත්තාව සුව කළ හැක්කේ මට පමණි.[6]
මාගේ අතින් ගැලවී යන්න කිසිවෙකුට නොහැක.[7]
40 මාගේ හස්තය ඔසවා,*
"සදාකල් වාසය කරන ජීවමාන දෙවි මමය"[8] කියා දිවුරන්නෙමි.[9]
41 මාගේ දිදුලන කඩුව මුවහත් කර[10]
යුක්තිය ඉටු කිරීමට මම පියවර ගන්නා විට[11]
මාගේ සතුරන්ට නිසි දඬුවම් ලබා දෙන්නෙමි.[12]
මට ඇඩි ලෙස වෛර කරන අයට දඬුවම් කරන්නෙමි.[13]
42 මාගේ ඊතල සතුරන්ගේ ලෙයින් නහවන්නෙමි.[14]
මාගේ කඩුවෙන් සතුරෝ මැරුම් කන්නෝය.[15]
සතුරු නායකයන්ගේ හිස්[16] කපා දමා
අල්ලාගත් අයගේ සහ මරා දැමූ අයගේ ලෙයින් මගේ කඩුව පොහවන්නෙමි.'
43 ජනයෙනි, දෙවිගේ සෙනඟ සමඟ ප්‍රීති වන්න.[17]
මන්ද දෙවි තම සතුරන්ට නිසි ප්‍රතිඵල දෙමින්[18]

**32 පරි.**
1 යෙසා 5:4 යෙරෙ 2:21
2 ගීතා 58:4 ගීතා 140:3
3 හොෂෙ 13:12 රෝම 2:5
4 ගීතා 94:1 නාහු 1:2 රෝම 12:19 හෙබ්‍රෙ 10:30
5 ගීතා 9:15 ගීතා 73:18 යෙසා 8:15
6 යෙරෙ 10:15 ලූක් 19:44
7 යෙසා 30:13 හබ 2:3 2පේතෘ 2:3
8 ගීතා 7:8 ගීතා 96:13 හෙබ්‍රෙ 10:30
9 විනි 2:18 ගීතා 90:13 ගීතා 106:45 ගීතා 135:14
10 ද්වි 32:31
11 විනි 10:14 යෙරෙ 2:28
12 එස 16:19 1කොරි 10:20
13 හොෂෙ 2:8 1කොරි 10:21
14 විනි 10:14

**2 තීරුව**
1 ආමො 9:2
2 යෙසා 41:4 යෙසා 48:12
3 ද්වි 4:35 යෙසා 45:5
4 1සාමු 2:6 2රාජා 5:7 ගීතා 68:20
5 ගණන් 12:13 2ලේක 21:18
6 යෙරෙ 17:14 හොෂෙ 6:1
7 යෙසා 43:13
8 ගීතා 90:2 1තිමෝ 1:17 එළි 10:6
9 නික් 6:8 යෙසා 45:23 හෙබ්‍රෙ 6:13
10 ගීතා 7:12 එස 21:10
11 යෙසා 66:16 නාහු 1:3
12 ද්වි 32:35 යෙසා 1:24 යෙසා 59:18 යෙසා 66:6 නාහු 1:2
13 නික් 20:5
14 ද්වි 32:23
15 යෙසා 34:6 එස 38:21
16 යොෂු 10:17 යොෂු 10:26 1සාමු 15:33

17 උත් 12:3; 1රාජා 8:43; රෝම 3:29; රෝම 15:10; 18 ද්වි 32:41; මීකා 5:15; ලූක් 21:22.

**ද්වි 32:34*** මූ.අ., "මගේ ගබඩාවේ රැස් කර තබා ඇත."

**ද්වි 32:40*** මූ.අ., "ස්වර්ගය දෙසට ඔසවා." එයින් අදහස් වන්නේ දෙවි තමන්ගේම නමින් දිවුරන බවයි.

මරා දමන ලද තම සේවක-
යන් වෙනුවෙන් යුක්තිය ඉටු
කරන්නේය.[1]
ඔහු එසේ කර තම සෙනඟගේ
දේශය නැවත පවිත්‍ර තත්ව-
යකට පත් කරන්නේය.”

44 මෙසේ, මෝසෙස් සහ නූන්-
ගේ පුත් හෝෂෙයා*[2] මුළු ඊශ්‍රායෙල්
සෙනඟ ඉදිරියේ මෙම ගීතයේ පද
මාලාව ප්‍රකාශ කළෝය.[3] 45 මෝ-
සෙස් මුළු ඊශ්‍රායෙල් සෙනඟට
එය ප්‍රකාශ කළායින් පසු, 46 ඔහු
ඔවුන්ට මෙසේ පැවසීය. “මම අද
ඔබට පැවසූ සෑම වචනයක්ම හොඳින්
මතක තබාගන්න. එය ඔබට අන-
තුරු ඇඟවීමක්.[4] ඔබ මේ ගැන හොඳ
අවධානයකින් සිටියොත් මේ නීති-
යේ සඳහන් සෑම දෙයක්ම පිළිපැදී-
මට ඔබේ පුතුන්ට කියා දෙන්න
ඔබට හැකි වෙයි.[5] 47 මා පවසන
මේ දේවල් කිසි වැදගැම්මකට නැති
දේවල් කියා කෙදිනකවත් නොසි-
තන්න.[6] ඔබේ ජීවිත රඳා පවතින්නේ
ඒ මතයි.[7] ඒවා ඔබ පිළිපැද්දොත්
යෝර්දාන් ගඟෙන් එගොඩ තිබෙන
දේශය හිමි කරගෙන එහි බොහෝ
කාලයක් ජීවත් වෙන්න ඔබට හැකි
වෙයි.”[8]

48 එදිනම යෙහෝවා දෙවි මෝ-
සෙස්ට මෙසේ පැවසුවේය.
49 “නැඟිට මෝවබ් දේශයේ පිහිටා
ඇති අබරිම්[9] කඳුකරයේ තිබෙන
නෙබෝ[10] කන්දට යන්න. එය පිහිටා
තිබෙන්නේ යෙරිකෝවට මුහුණ
ලාය. මා ඊශ්‍රායෙල්වරුන්ට උරුම කර
දෙන්න යන කානාන් දේශය ඒ කන්-
දේ සිට දකින්න ඔබට හැකි වෙයි.[11]
50 ඒ දේශය දැකගත් පසු ඔබ ඒ කන්-
දේදීම මිය යනු ඇත.[12] ඔබේ සහෝදර
ආරොන් හෝර් කන්දේදී මිය ගිය ලෙ-
සම[13] ඔබත් ඔබේ මුතුන්මිත්තන්
මෙන් මිය යනු ඇත. 51 ඔබ දෙදෙ-
නාටම දේශයට ඇතුල් වීමට නොලැ-
බෙන්නේ සීන් පාළුකරයේ කාදේෂ්හි
පිහිටි මෙරිබා දිය පහර අසලදී[1] සිදු වූ
සිද්ධිය නිසාය. එහිදී ඔබ මා වෙනු-
වෙන් ඔබේ යුතුකම් නිසි ලෙස ඉටු
කළේ නැත.[2] ඔබ දෙදෙනා ඒ අවස්-
ථාවේදී ඊශ්‍රායෙල්වරුන් ඉදිරියේ මට
නිසි ගෞරවය ලබා නොදුන්නහුය.[3]
52 මා ඊශ්‍රායෙල්වරුන්ට ලබා දෙන
දේශයට ඇතුල් වන්න ඔබට නො-
හැකි වන්නේ ඒ නිසාය.[4] නමුත් එය
දුර සිට දැකගන්න ඔබට හැකියි.”

**33** සැබෑ දෙවිගේ සේවකයා වූ
මෝසෙස්[5] තම මරණයට
කලින් ඊශ්‍රායෙල් සෙනඟට ආශීර්වාද[6]
කළේය. 2 ඔහු ඔවුන්ට මෙසේ
පැවසුවේය.
“යෙහෝවා දෙවි සීනයි කන්දෙන්
බැස ආවේය.[7]
ඔහුගේ දීප්තිය සේයිර් කඳුකර-
යෙන් පැමිණ ඔවුන් අතරේ
පැතිර ගියේය.[8]
ඔහුගේ ආලෝකය පාරාන් කඳු-
කරයේ සිට විහිදී ආවේය.[9]
දෙවි සමඟ දසදහස් සංඛ්‍යාත වූ
ඔහුගේ ශුද්ධ දේවදූතයෝ
සිටියෝය.[10]
ඔහුගේ දකුණු පැත්තේ සිටියේ
රණශූරයෝය.[11]
3 දෙවි තම සෙනඟට බොහෝ සෙ-
යින් ප්‍රේම කරයි.[12]
දෙවියනි, සියලුම ශුද්ධ
තැනැත්තන් සිටින්නේ ඔබ
අතෙහිය.[13]
ඔවුහු ඔබගේ පාමුලට වී,[14]
ඔබේ ඔවදන්වලට ඕනෑකමින්
සවන් දුන්නෝය.[15]
4 (මෝසෙස් අපට නීතිය ලබා දී
එයට කීකරු වන ලෙස අණ
කළේය.[16]
එම නීතිය යාකොබ්ගේ සෙ-
නඟට පමණක් උරුම
වූවකි.)[17]
5 ඊශ්‍රායෙල් සෙනඟ අතරේ ප්‍රධානීන්
ලෙස පත්ව සිටින අය[18]
සියලුම ගෝත්‍ර එක් රැස් කළ[19]
අවස්ථාවේදී,

**32 පරි.**
1 2රාජා 9:7
එළි 6:10
2 ගණන් 11:28
ද්වි 31:23
3 ද්වි 31:22
එළි 15:3
4 ද්වි 6:6
ද්වි 11:18
5 ද්වි 6:7
6 2තිමෝ 3:16
හෙබ්‍රෙ 4:12
7 ලෙවී 18:5
ද්වි 30:19
රෝම 10:5
8 හිතෝ 3:2
9 ගණන් 27:12
10 ද්වි 34:1
11 උත් 10:19
උත් 15:18
යොෂු 1:3
12 ද්වි 34:5
13 ගණන් 20:28
ගණන් 33:38

**2 තීරුව**
1 ගණන් 20:13
2 ගණන් 20:12
ගණන් 27:14
3 ලෙවී 10:3
ලෙවී 22:32
යෙසා 8:13
මතෙ 6:9
4 ගණන් 27:13
ද්වි 3:27
ද්වි 34:4

**33 පරි.**
5 යොෂු 14:6
ගීතා 90:පෙර
6 උත් 49:28
ලූක් 24:50
7 නික් 19:18
8 විනි 5:4
9 හබ 3:3
10 දානි 7:10
ගලා 3:19
යූද් 14
11 ගීතා 68:17
12 ද්වි 7:8
ද්වි 23:5
ගීතා 47:4
හොෂෙ 11:1
13 නික් 19:6
ගීතා 50:5
14 නික් 19:23
15 නික් 20:19
16 නික් 24:8
යොහ 1:17
ක්‍රියා 15:5
1කොරි 9:9
17 ද්වි 4:8
ක්‍රියා 7:53
18 නික් 18:25
නික් 19:7
ගණන් 1:44
19 ගණන් 1:46

ද්වි **32:44*** යොෂුවාට මුලින් තිබුණේ මේ නමය.

දෙවි යෙෂුරුන්හි*[1] රජු බවට
පත්වූයේය.
6 රූබෙන් දිගු කලක් ජීවත් වේවා![2]
ඔහුට බොහෝ දරුදැරියන්
ලැබේවා!”[3]

7 මෝසෙස් යූදාට හිමි වන ආශීර්-
වාදය[4] ගැන පැවසුවේ මෙයයි.
“යෙහෝවා දෙවියනි, යූදාගේ
හඬට සවන් දෙන්න![5]
ඔබගේ සෙනඟ අතරට ඔහුවද
එකතු කරගන්න.
ඔහු සටන් කරමින් තමා සතු දේ
හිමි කරගත්තේය.
ඔහුගේ සතුරන්ගෙන් ඔහුට
ආරක්ෂාව ලබා දෙන්න.”[6]

8 මෝසෙස් ලෙවී ගැන පැවසුවේ
මෙයයි.[7]
“දෙවියනි, ඔබ තුම්මීම් සහ
ඌරීම්*[8] භාර දී තිබෙන්නේ
ඔබට විශ්වාසවන්තව සිටින
තැනැත්තාටය.[9]
මස්සාහ්[10] නම් ස්ථානයේදී ඔබ
ඔහුව සෝදිසි කර බැලු-
වෙහිය.
මෙරිබා[11] දිය පහර අසලදී ඔහු
සමඟ වාද කළෙහිය.
9 අන් සෑම දෙයකටම වඩා ඔහුට
වටින්නේ ඔබගේ මඟ පෙන්-
වීම්වලට කීකරු වීමය.[12]
‘ඔබට පක්ෂව සිටින්න මට
නොහැකියි’ කියා ඔහු තම
පියාටත් මවටත් පැවසුවේ
ඒ නිසාය.
ඔහු තම සහෝදරයන්ගේවත්
පුත්‍රයන්ගේවත් පැත්ත නොගත්-
තේය.[13]
ඔහු ඔබගේ ගිවිසුමට නිරතුරු-
වම විශ්වාසවන්තව සිටියි.[14]
10 දෙවියනි, ඔබේ තීරණ[15] යා-
කොබ්ටද
ඔබේ නීතිය[16] ඊශ්‍රායෙල් සෙ-
නඟටද කියා දීම ඔහුගේ
වගකීමයි.

ද්වි 33:5* ද්වි 32:15හි පාදසටහන බලන්න.
8* නික් 28:30හි පාදසටහන බලන්න.

**33 පරි.**
1 ද්වි 32:15 යෙසා 44:2
2 උත් 49:3 යොෂු 22:1 1ලේක 5:1
3 ගණන් 26:7 යොෂු 13:15
4 උත් 49:8 1ලේක 5:2
5 ගීතා 78:68
6 විනි 1:2 2සාමු 7:1 2සාමු 7:9
7 උත් 49:5 ගණන් 3:12 ගණන් 18:24
8 නික් 28:30 ලෙවී 8:8 එස්රා 2:63
9 නික් 32:26 හෙබ්‍රෙ 7:26
10 නික් 17:7 ද්වි 6:16
11 ගණන් 20:13
12 ලෙවී 10:7
13 නික් 32:27 ලෙවී 10:6
14 මලා 2:5
15 ලෙවී 10:11 ද්වි 17:9 යෙරෙ 18:18
16 2ලේක 15:3 2ලේක 17:9 මලා 2:7

**2 තීරුව**
1 නික් 30:7 ගණන් 16:40
2 ලෙවී 1:9 ගීතා 51:19
3 ගීතා 18:32 යෙසා 40:29 හබ 3:19 පිලි 4:13
4 ද්වි 18:5 මලා 2:6
5 ක්‍රියා 23:4
6 ගීතා 3:7 ආමො 5:10
7 උත් 49:27
8 2සාමු 7:16
9 ගීතා 4:8
10 යොෂු 18:11 ගීතා 68:27
11 යොෂු 18:28 විනි 1:21 2සාමු 5:9 ගීතා 125:2
12 උත් 49:22
13 යොෂු 16:1 හිතෝ 10:22
14 උත් 27:28 සෙක 8:12
15 උත් 49:25
16 2සාමු 23:4
17 ලෙවී 26:5 ගීතා 65:9
18 උත් 37:25 යොෂු 17:18

ඔබ ඉදිරියේ සුවඳ දුම්ද[1]
ඔබේ පූජාසනය මත දවන
පූජාද[2] ඔප්පු කරන්නේ
ඔහුය.
11 යෙහෝවා දෙවියනි, ඔහුව ශක්ති-
මත් කර ඔහුට ආශීර්වාද
කරන්න.[3]
ඔහු කරන සියල්ල ගැන සතුටු
වන්න.[4]
දෙවියනි, ඔහුට විරුද්ධව නැඟී
සිටින අයටත්[5]
ඔහුට දැඩි ලෙස වෛර කරන
අයටත් නැවත හිස එසවිය
නොහැකි වන සේ[6] ඔවුන්ගේ
තුනටියට පහර දෙන්න.”

12 මෝසෙස් බෙන්ජමින් ගැන
පැවසුවේ මෙයයි.[7]
“යෙහෝවා දෙවිට හිතවත්[8] වූ ඔහු
දෙවි සමඟ සිටීවා![9]
දවස පුරාම ඔහු දෙවිගෙන් රැක-
වරණය ලබයි.[10]
ඔහු ලැගුම් ගන්නේ දෙවිගේ
උරහිස් මතය.”[11]

13 මෝසෙස් යෝසෙප් ගැන පැව-
සුවේ මෙයයි.[12]
“ඔහුගේ දේශයට යෙහෝවා දෙවි-
ගේ ආශීර්වාද නිරතුරුවම
ලැබේවා![13]
අහස්කුසේ සම්පත්ද පිනි බිඳුද
ඒ මත පතිත වේවා![14]
භූමියේ දිය දහරාවන්ගෙන්ද එය
තෙත් වේවා![15]
14 හිරුගේ ආලෝකයෙන් සරුවට
වැඩෙන අස්වැන්නක්ද[16]
මාසයක් මාසයක් පාසා හොඳ
පලදාවක්ද එයින් නෙළා-
ගනු ලැබේවා![17]
15 පෙරදිග කඳුකරයෙන්[18]
සදාතනික කඳු ශිඛරවලත්
තිබෙන සියලු සම්පතින්ද
16 මුළු පොළෝතලයේ තිබෙන
සියලු වස්තුවෙන්ද[19] ඔහුට
ආශීර්වාද ලැබේවා!

19 ද්වි 8:8; ගීතා 24:1.

කටු පඳුරේ සිට කතා කළ
තැනැත්තාණන්ගේ ආශීර්-
වාදය[1]
යෝසෙප් මත වැගිරේවා![2]
ඒ සියලු ආශීර්වාද තම සහෝද-
රයන් අතරින් තෝරාගනු
ලැබූ ඒ තැනැත්තාගේ හිස
මතට වැගිරේවා![3]
17 ඔහුගේ ශ්‍රේෂ්ඨත්වය කුලුඳුල් ගව-
යෙකු මෙන්ය.[4]
ඔහුගේ අං හීලෑ නොවූ ගවයෙ-
කුගේ අං මෙන්ය.[5]
ඒ අංවලින් ඔහු ජනයන්ව තල්ලු
කරයි.[6]
පොළොවේ ඈත එපිටටම
ඔවුන්ව තල්ලු කර දමයි.
එෆ්‍රායිම් ගෝත්‍රයේ දසදහස්
ගණනද[7]
මනස්සේ ගෝත්‍රයේ දහස්
ගණනද ඒ සියලු ජන-
යාට විරුද්ධව නැඟී සිටින්-
නෝය.”
18 මෝසෙස් සෙබ්‍යුලන් ගැන
පැවසුවේ මෙයයි.[8]
“සෙබ්‍යුලන්, ඔබ දුර බැහැර ස්ථා-
නවල සිදු කරන ව්‍යාපාර
කටයුතු ගැන ප්‍රීති වන්න.[9]
ඉසකාර්, ඔබට හිමි ප්‍රදේශයේ-
දීම* ඔබ ප්‍රීති වන්නහුය.[10]
19 සත් සමුදුරේ සියලුම සම්පත්ද[11]
වැලි කතරෙහි සැඟවුණු නිධා-
නද ඔවුන්ට හිමි වන්නේය.
එහෙයින් ඔවුහු ජනයාව කඳු-
කරයට එක් රැස් කර
ධර්මිෂ්ඨකමින් දෙවිට පූජා
ඔප්පු කරන්නෝය.”[12]
20 මෝසෙස් ගාද් ගැන පැවසුවේ
මෙයයි.[13]
“ගාද්ගේ දේශ සීමා පුළුල්
කරන තැනැත්තාට ප්‍රශංසා
වේවා![14]
ඔහු සිංහයෙකු මෙන් ලැගුම්
ගනියි.[15]
ඔහු තම ගොදුරේ ගාතයද හිසද
ඉරා දමයි.[1]
21 දේශයේ සරුසාරම කොටස හිමි
වන්නේ ඔහුටය.[2]
ඒ කොටස ඔහුට වෙන් කර
දෙන්නේ නීති සම්පාදක-
යෙක්ය.[3]
සෙනඟ අතරේ සිටින ප්‍රධානීන්
එකට රැස් වන විට,
ඔහු යෙහෝවා දෙවිගේ නාම-
යෙන් ධර්මිෂ්ඨ ලෙස විනිශ්-
චය කරන්නේය.
ඊශ්‍රායෙල් සෙනඟට දෙවිගේ
තීරණ දැනුම් දෙන්නේද
ඔහුය.”
22 මෝසෙස් දාන් ගැන පැවසුවේ
මෙයයි.[4]
“දාන් සිංහ පැටියෙකි.[5]
ඔහු බාෂාන් වෙතින් පැන එන්-
නේය.”[6]
23 මෝසෙස් නෆ්තලී ගැන පැව-
සුවේ මෙයයි.[7]
“යෙහෝවා දෙවිගේ අනුමැතිය
ලැබීමටත්
ඔහුගෙන් පූර්ණ ආශීර්වාද ලැබී-
මටත් නෆ්තලී සතුටු වෙයි.
බස්නාහිර හා දකුණු දිග පෙ-
දෙස් හිමි වන්නේ ඔහුටයි.”[8]
24 මෝසෙස් ආෂේර් ගැන පැවසු-
වේ මෙයයි.[9]
“ආෂේර් බොහෝ පුත්‍රයන් බිහි කර
ආශීර්වාද ලබන්නේය.[10]
ඔහු තම සහෝදරයන්ගේ අනු-
මැතිය ලැබ[11]
තම පාද තෙල්වල නහවමින්[12]
සමෘද්ධිය අද්දකින්නේය.
25 ඔහුගේ දොරගුල් යකඩින් හා තඹ-
වලින් සාදන ලද ඒවාය.[13]
දිවි ඇති තුරා ඔහු නිස්කලංකව
වාසය කරන්නේය.
26 යෙෂුරුන්ගේ[14] සැබෑ දෙවිට
සමාන වෙනත් කිසිවෙක්
නැත.[15]
දෙවි ඔබේ උපකාරයට ස්වර්ග-
යේ සිට පැමිණෙයි.[16]

ද්වි **33:18*** මූ.අ., “කූඩාරම්වල.”

**33 පරි.**
1 නික් 3:4; ක්‍රියා 7:30
2 උත් 49:26; 1ලේක 5:1
3 උත් 37:7; 1ලේක 5:2
4 යොෂු 17:1
5 ගීතා 22:21; ගීතා 92:10
6 1රාජා 22:11; ගීතා 44:5
7 උත් 48:19
8 උත් 49:13
9 යොෂු 19:10; විනි 5:14
10 උත් 49:14; යොෂු 19:17
11 උත් 49:13; මතෙ 4:13
12 ගීතා 4:5
13 උත් 49:19
14 යොෂු 13:8; යොෂු 13:24
15 1ලේක 12:8; හිතෝ 28:1

**2 තීරුව**
1 1ලේක 5:18; 1ලේක 5:20
2 ගණන් 32:1
3 ගණන් 32:21; ගණන් 32:27; ගණන් 32:33; යොෂු 1:14; යොෂු 1:15; යොෂු 4:12; යොෂු 22:1
4 උත් 49:16
5 විනි 13:2; විනි 13:24; විනි 15:8; විනි 15:20; විනි 16:30
6 යොෂු 19:47; විනි 18:27; විනි 18:29; 1ලේක 12:35
7 උත් 49:21
8 යොෂු 19:32
9 උත් 49:20
10 ගීතා 127:3; ගීතා 128:3
11 හිතෝ 3:4
12 ද්වි 32:13; යෝබ් 29:6
13 ද්වි 8:9
14 ද්වි 32:15; ද්වි 33:5; යෙසා 44:2
15 නික් 15:11; ගීතා 86:8; ගීතා 89:6; යෙරෙ 10:6
16 ගීතා 68:33

ඔහුගේ ශ්‍රේෂ්ඨත්වය අහස්තලය
සිසාරා යයි.[1]
27 සදාතන* දෙවි රක්ෂස්ථාන-
යක්ය.[2]
ඔහුගේ සව්මත් දෑතින් ඔහු
ඔබව සදහටම උසුලයි.[3]
ඔහු 'ඔවුන්ව නැති කර දමන්න'[4]
කියා පවසමින්,
ඔබ ඉදිරිපිටම ඔබේ සතුරන්ව
එළවා දමයි.[5]
28 ඊශ්‍රායෙල් සෙනඟ සුරක්ෂිතව
වාසය කරයි.[6]
යාකොබ්ගෙන් උනන දිය උල්-
පත කිසිදා නොහිඳී ගලා
යයි.[7]
අහස්තලයෙන් වැටෙන පිනි බිඳු,[8]
ධාන්‍යයෙන් සහ අලුත් වයින්ව-
ලින් ගහන ඒ දේශය[9] සිප-
ගනියි.
29 ඊශ්‍රායෙල් ජනයෙනි ප්‍රීති වන්න.[10]
ඔබ හා සමාන සෙනඟක්
නැත.[11]
යෙහෝවා දෙවි දෙන ගැලවීම[12]
අද්දකින
ඔහුගේ පලිහෙන් රැකවරණය[13]
ලබන ඔබ ඉතා ප්‍රීතිමත්
සෙනඟකි.
දැවැන්ත කඩුවක් මෙන් වූ
දෙවි ඔබ වෙනුවෙන් සටන්
කරයි.[14]
එහෙයින් ඔබේ සතුරෝ ඔබ ඉදි-
රිපිට බියෙන් ගැහිගැහී
සිටිති.[15]
ඔබද කිසි බියක් නොමැතිව
ඔවුන්ගේ කඳුකර ප්‍රදේශ
මත පා තබන්නහුය."[16]

**34** ඉන්පසුව මෝවබ් දේශයේ
පාළුකරයේ සිටි මෝසෙස්
නෙබෝ[17] කඳුකරයට ගොස් යෙරි-
කෝවට[18] මුහුණ ලා පිහිටි පිස්ගා[19]
කඳු මුදුනට නැග්ගේය. යෙහෝවා
දෙවි එහිදී මෝසෙස්ට මුළු දේශයම
පෙන්වූවේය. ගිලියද් දේශයේ සිට
දාන්[20] දක්වාද, **2** නප්තලී දේශයද
එප්‍රායිම් සහ මනස්සේ දේශද බස්නා-
හිර දෙසින් පිහිටි මුහුද[1] දක්වාම විහිදී
ගිය මුළු යූදා දේශයද මෝසෙස් දුටු-
වේය. **3** නෙගෙබ්[2] ප්‍රදේශයද යොර්-
දාන් දිස්ත්‍රික්කයද[3] තාල වර්ගයේ
ගස්වලට ප්‍රසිද්ධ යෙරිකෝ නුවර[4]
අවට තැනිතලාවද ෂෝවර් නුවරද[5]
දැකගැනීමට ඔහුට හැකි විය.
**4** එහිදී යෙහෝවා දෙවි ඔහුට
මෙසේ පැවසීය. "මා ආබ්‍රහම්ට,
ඊසාක්ට සහ යාකොබ්ට දිවුරා පො-
රොන්දු වූයේ මේ දේශය ගැනයි.
ඔවුන්ගෙන් පැවතෙන අයට දෙන
බවට මා පොරොන්දු වූ දේශය මෙ-
යයි.[6] මේ දේශයට පය තබන්න ඔබට
ලැබෙන්නේ නැත. නමුත් ඔබේ ඇස්
දෙකෙන්ම එය දැකගැනීමට මම
ඔබට අවස්ථාව ලබා දුන්නෙමි."[7]
**5** ඉන්පසුව යෙහෝවා දෙවි පැවසූ
ආකාරයටම යෙහෝවා දෙවිගේ සේ-
වකයා වූ මෝසෙස්[8] මෝවබ් දේශ-
යේදී මිය ගියේය.[9] **6** දෙවි මෝවබ්
දේශයේ බෙත්-පෙයෝර්[10] නුවර ඉදි-
රිපිට තිබූ නිම්නයේ ඔහුව භූම-
දාන කළේය. නමුත් ඔහුව භූමදාන
කළ ස්ථානය කොතැනද කියා මේ
දක්වා කිසිවෙක් දන්නේ නැත.[11]
**7** මෝසෙස් මිය යන විට ඔහුගේ
වයස අවුරුදු එකසිය විස්සකි.[12] මිය
යන තුරුම ඔහුගේ ඇස් පෙනීමේ
කිසි දුර්වලතාවක්වත්[13] ඔහුගේ ශරීර
ශක්තියේ කිසි අඩුවක්වත්[14] දක්-
නට නොතිබිණ. **8** මෝවබ් පාළුක-
රයේ සිටි ඊශ්‍රායෙල්වරු මෝසෙස්
වෙනුවෙන් දවස් තිහක් පුරා වැලපු-
ණෝය.[15]
**9** මිය යෑමට පෙර මෝසෙස් නූන්-
ගේ පුත් යොෂුවා පිට අත් තබමින්[16]
ඔහුව නායකයා ලෙස පත් කළේය.
යොෂුවා තුළ දෙවිගේ බලය ක්‍රියාත්-
මක වූ නිසා[17] ප්‍රඥාවන්තව කටයුතු
කිරීමට ඔහුට හැකි විය. එහෙ-
යින් ඊශ්‍රායෙල්වරු ඔහුට කීකරු වී

ද්වි **33:27*** මූ.අ., "පුරාතන."

**33 පරි.**
**1** ගීතා 68:34; ගීතා 93:1; ගීතා 104:3
**2** ගීතා 46:11; ගීතා 90:1; ගීතා 91:2; ගීතා 125:2
**3** යෙසා 40:11; හොෂෙ 11:3
**4** ද්වි 31:4
**5** ද්වි 9:3
**6** යෙරෙ 23:6; යෙරෙ 33:16
**7** ගීතා 68:26; යෙසා 48:1
**8** ද්වි 11:11; ද්වි 33:13
**9** ද්වි 8:8
**10** ගීතා 33:12; ගීතා 144:15; ගීතා 146:5
**11** ද්වි 4:7; 2සාමු 7:23; ගීතා 147:20
**12** ගීතා 27:1; යෙසා 12:2
**13** උත් 15:1; ගීතා 115:9
**14** විනි 7:20
**15** 2සාමු 22:45; ගීතා 66:3; ගීතා 81:15
**16** ද්වි 32:13

**34 පරි.**
**17** ගණන් 27:12; ද්වි 32:49
**18** ගණන් 36:13
**19** ගණන් 21:20; ද්වි 3:27
**20** යොෂු 19:47; විනි 18:29

**2 තීරුව**
**1** නික් 23:31; ගණන් 34:6; ද්වි 11:24
**2** යොෂු 15:1
**3** උත් 13:10; 1රාජා 7:46
**4** 2ලේක 28:15
**5** උත් 19:22; යෙසා 15:5
**6** උත් 12:7; උත් 26:3; උත් 28:13
**7** ගණන් 20:12; ද්වි 32:52
**8** ගණන් 12:7; මලා 4:4
**9** ද්වි 32:50; යොෂු 1:2
**10** ද්වි 3:29
**11** ක්‍රියා 2:31; යූද් 9
**12** ද්වි 31:2; ක්‍රියා 7:23; ක්‍රියා 7:30; ක්‍රියා 7:36
**13** උත් 27:1; උත් 48:10; **14** යොෂු 14:11; **15** ගණන් 20:29; **16** ගණන් 27:18; ද්වි 31:14; ක්‍රියා 6:6; 1තිමෝ 4:14; **17** විනි 3:10; විනි 6:34; 1රාජා 3:12.

යෙහෝවා දෙවි මෝසෙස් මාර්ගයෙන්
අණ කළ සියල්ල පිළිපැද්දෝය.[1]
**10** මෝසෙස් හා සමාන අනාගත-
වක්තෘවරයෙක් මෙතෙක් ඊශ්‍රායෙල්
දේශයේ ජීවත් වී නැත.[2] ඔහු යෙ-
හෝවා දෙවිව ඉතා හොඳින් හඳු-
නාගත් කෙනෙකි.*[3] **11** යෙහෝවා
දෙවි ඔහුව ඊජිප්තු දේශයට යවා
ඔහු මාර්ගයෙන් පාරාවෝටත් ඔහුගේ
සියලු සේවකයන්ටත් ඔහුගේ මුළු දේ-
ශයටත් විරුද්ධව බොහෝ ආශ්චර්ය-
යන් හා බලවත් ක්‍රියාද කළේය.[1]
**12** මීට අමතරව මෝසෙස් මුළු ඊශ්‍රා-
යෙල් ජාතිය ඉදිරියෙහි බොහෝ පුදුම
ක්‍රියා කරමින් මහත් බලයක්ද විදහා-
පෙන්වීය.[2]

**ද්වි 34:10*** මු.අ., “යෙහෝවා දෙවි සමඟ මුහුණට මුහුණ ලා කතා කළ කෙනෙකි.”

**34 පරි.**
**1** ගණන් 27:21; යොෂු 1:16; හෙබ්‍රෙ 13:17
**2** ද්වි 18:15; ක්‍රියා 3:22; ක්‍රියා 7:37
**3** නික් 33:11; නික් 33:20; ගණන් 12:8

**2 තීරුව** **1** ද්වි 4:34; ගීතා 78:43; **2** නික් 3:19; ද්වි 26:8; ලූක් 24:19.

# යොෂුවා

**1** යෙහෝවා දෙවිගේ සේවකයා වූ
මෝසෙස් මිය යෑමෙන් පසු ඔහු-
ගේ සේවකයා වූ[1] නූන්ගේ පුත් යොෂු-
වාට[2] යෙහෝවා දෙවි මෙසේ කීවේය.
**2** “මාගේ සේවකයා වූ මෝසෙස් මිය
ගියේය.[3] දැන් ඔබත් මේ මුළු සෙ-
නඟත් යොර්දාන් ගඟෙන් එගොඩ වී
මා ඊශ්‍රායෙල්වරුන්ට දෙන දේශයට
ඇතුල් වන්න.[4] **3** මම මෝසෙස්ට
පොරොන්දු වූ ලෙසම ඔබ පා තබන
සෑම ප්‍රදේශයක්ම මම ඔබට උරුම-
යක් ලෙස දෙන්නෙමි.[5] **4** පාළුකර-
යේ සිට ඔබට පෙනෙන ලෙබනොන්
දේශය දක්වාත් යුප්‍රටීස් නම් මහ ගඟ
දක්වාත් ඇති හිත්තීවරුන්ට[6] අයිති
මුළු ප්‍රදේශයම ඔබට අයිති වන්-
නේය. බස්නාහිර දෙසින් පිහිටි මහ
මුහුද* දක්වා විහිදී යන ප්‍රදේශ-
යද ඔබට දෙන්නෙමි.[7] **5** ඔබ ජීවත්
වන තාක් කල් ඔබට විරුද්ධව නැඟී
සිටින කිසිවෙක්වත් සාර්ථක වන්නේ
නැත.[8] මම මෝසෙස් සමඟ සිටියාක්
මෙන් ඔබ සමඟත් සිටින්නෙමි.[9] මම
ඔබව කිසි දවසක තනි කරන්නේ-
වත් අත්හැර යන්නේවත් නැත.[10]
**6** එහෙයින් දැන් ධෛර්යවත් වන්න.
එඩිතරව සිටින්න.[11] මා මේ සෙනඟ-
ගේ මුතුන්මිත්තන්ට ලබා දීමට පො-
රොන්දු වූ දේශයට[1] මේ සෙනඟව
රැගෙන යන්නේ ඔබයි.[2]
**7** “මාගේ සේවකයා වූ මෝසෙස්
ඔබට කියා දුන් නීතියට ඇතුළත්
සෑම දෙයක්ම ඉටු කරන පිණිස
ධෛර්යවත්ව, එඩිතරව සිටීමට වග-
බලා ගන්න.[3] මා දුන් නීතියෙන් දකු-
ණටවත් වමටවත් නොහැරී[4] එය
පිළිපදින්න. එවිට සෑමවිටම ප්‍රඥා-
වන්තව ක්‍රියා කිරීමට ඔබට හැකි
වනු ඇත.[5] **8** මේ නීතියේ සඳහන්
සියල්ල එලෙසම පිළිපදින පිණිස
දිවා රෑ දෙකේම එය කියවා ඒ ගැන
හොඳින් කල්පනා කර බලන්න.[6]
එහි සඳහන් දේවල් ගැන නිතරම
අන් අය සමඟ කතා කරන්න.[7]
එවිට ඥානවන්තව තීරණ ගෙන
ජීවිතය සාර්ථක කරගැනීමට ඔබට
හැකි වන්නේය.[8] **9** ධෛර්යවත්ව,
එඩිතරව සිටින්න කියා මා ඔබට අණ
කළ බව සිහි කරන්න.[9] ඔබ කොතැ-
නකට ගියත් ඔබේ දෙවි යෙහෝවා
වන මම ඔබ සමඟ සිටින්නෙමි.[10]
එහෙයින් භය නොවන්න. තැති නො-
ගෙන එඩිතරව සිටින්න.”[11]
**10** සෙනඟව බලාගැනීමට පත්
කළ නායකයන්ට යොෂුවා මෙසේ
අණ කළේය. **11** “කඳවුරේ සෑම

**යොෂු 1:4*** එනම්, මධ්‍යධරණී මුහුද.

**1 පරි.**
**1** නික් 24:13; ගණන් 11:28
**2** ද්වි 31:14
**3** ද්වි 34:5
**4** ගණන් 27:21; ද්වි 3:28
**5** ද්වි 11:24
**6** ගණන් 13:29; යොෂු 11:3
**7** උත් 15:18; නික් 23:31; ගණන් 34:3; ද්වි 1:7; යොෂු 15:4
**8** ද්වි 7:24; ද්වි 11:25; රෝම 8:31
**9** නික් 3:12; යොෂු 3:7
**10** ද්වි 31:6; හෙබ්‍රෙ 13:5
**11** ද්වි 1:38; ද්වි 31:23; ගීතා 27:14

**2 තීරුව**
**1** උත් 12:7; උත් 15:18; උත් 26:3
**2** ගණන් 34:17
**3** ද්වි 31:7
**4** ද්වි 5:32; ද්වි 28:14
**5** ද්වි 29:9; 1රාජා 2:3
**6** ද්වි 17:19; ගීතා 1:2; 1තිමෝ 4:15; යාකො 1:25
**7** ද්වි 6:6; ද්වි 30:14
**8** 1ලේක 22:13
**9** ද්වි 31:7

**10** නික් 23:27; ගීතා 46:7; **11** ද්වි 31:8; යොෂු 8:1.

තැනකටම ගොස් සෙනඟට මෙසේ
කියන්න. ‘තව දවස් තුනකින් ඔබ
යොර්දාන් ගඟෙන් එගොඩ වී ඔබේ
දෙවි වන යෙහෝවා ඔබට උරුමයක්
ලෙස දෙන දේශය ඔබ යටත් කර-
ගන්නවා.[1] ඒ සඳහා අවශ්‍ය කෑම බීම
දැන් සූදානම් කරගන්න.’ ”
**12** ඉන්පසු යොෂුවා, රූබේන්
ගෝත්‍රයට, ගාද් ගෝත්‍රයට හා
මනස්සේ ගෝත්‍රයෙන් එක් කොටස-
කට අයත් සෙනඟට මෙසේ කීවේය.
**13** “යෙහෝවා දෙවිගේ සේව-
කයා වූ මෝසෙස් ඔබට කී ලෙස
කරන්න.[2] ‘ඔබේ දෙවි වන යෙ-
හෝවා ඔබට කරදරයක් නැතුව
සැනසිල්ලේ ජීවත් වීමට මේ දේශය
දී තිබෙනවා. **14** මෝසෙස් යොර්-
දාන් ගඟෙන් නැඟෙනහිර පැත්-
තේ ඔබට දී තිබෙන මේ දේශයේ
ඔබේ භාර්යාවන්වද දරුවන්වද සත්ව
රැළවල්ද පදිංචි කරන්න.[3] ඉන්පසු
ඔබ අතර සිටින යුද්ධයට දක්ෂ
සියලු පුරුෂයන්[4] ඔබේ සහෝදර-
යන්ට උදව් කළ යුතුයි. ඒ නිසා
ඔබ යුද්ධයට සැරසී ඔබේ සහෝදර-
යන් සමඟ ගඟෙන් එගොඩ වෙන්න.[5]
**15** යෙහෝවා දෙවි ඔබට මෙන් ඔබේ
සහෝදරයන්ටත් කරදරයක් නැතුව
සැනසිල්ලේ ජීවත් වීමට අවස්ථාව
ලබා දෙන තෙක් ඔබ ඔවුන්ට උදව්
කළ යුතුයි. යෙහෝවා දෙවි ඔවුන්ට
දේශය උරුම කර දෙන තෙක් ඔබ
ඔවුන්ට අතහිත දිය යුතුයි.[6] ඉන්-
පසු යෙහෝවා දෙවිගේ සේවකයා වූ
මෝසෙස් ඔබට දුන් මේ දේශයට
එනම්, යොර්දාන් ගඟෙන් නැඟෙන-
හිර පැත්තේ පිහිටි මේ දේශයට[7]
ආපසු ඇවිත් පදිංචි වෙන්න ඔබට
පුළුවන්.’ ”[8]
**16** එවිට ඔවුහු යොෂුවාට මෙසේ
කීවෝය. “ඔබ අපට අණ කළ සෑම
දෙයක්ම අපි කරනවා. ඔබ අපව
යවන ඕනෑම තැනකට අපි යනවා.[9]
**17** අපි සෑම කාරණයකදීම මෝ-
සෙස්ට කීකරු වුණාක් මෙන් ඔබටත්
කීකරු වෙනවා. ඔබේ දෙවි යෙ-
හෝවා, මෝසෙස් සමඟ සිටි ලෙසම[1]
ඔබ සමඟත් සිටීවා![2] **18** යම් කෙ-
නෙක් ඔබේ අණට කීකරු නොවී
ඔබට විරුද්ධව කැරලිගැසුවොත්[3]
ඔහුව මරා දැමිය යුතුයි.[4] ඒ නිසා
ඔබ ධෛර්යවත්ව සිටින්න. එඩිතරව
සිටින්න.”[5]

**2** නූන්ගේ පුත් යොෂුවා දේශයේ
තොරතුරු සොයා බැලීමට මිනි-
සුන් දෙදෙනෙකුව තෝරාගෙන, “ඔබ
යෙරිකෝව හා ඒ අවට දේශය සෝදිසි
කර බලන්න” කියා ඔවුන්ට කීවේය.
එසේ කියා ඔහු ඔවුන්ව ෂිට්ටිම්[6] නම්
ප්‍රදේශයේ සිට රහසිගතව පිටත් කර
යැව්වේය. ඔවුහු රාහබ්[7] නම් ගණිකා-
වකගේ නිවසට පැමිණ එහි නවා-
තැන් ගැනීමට තීරණය කළෝය.
**2** මේ අතරතුර යෙරිකෝවේ රජුට
මෙසේ දන්වන ලදි. “අද රෑ ඊශ්‍රායෙල්
ජාතිකයන් කිහිපදෙනෙක් නගරයට
ආවා. ඔවුන් ඇවිත් ඉන්නේ දේශ-
යේ තොරතුරු සොයා බලන්නයි.”
**3** එවිට රජ රාහබ්ට පණිවිඩයක් යව-
මින් මෙසේ දැන්වූවේය. “ඔබේ ගෙද-
රට ආ මිනිසුන්ව අපට භාර දෙන්න.
ඔවුන් ඇවිත් ඉන්නේ මේ දේශයේ
තොරතුරු සොයා බලන්නයි.”[8]
**4** නමුත් රාහබ් ඒ මිනිසුන් දෙදෙ-
නාව සඟවා තමන් වෙතට පැමිණි
රජුගේ පණිවිඩකරුවන්ට මෙසේ
කීවාය. “මිනිස්සු නම් ආවා.
නමුත් ඒ අය කොහේ ඉඳන් ආවාද
කියා කියන්න මම දන්නේ නැහැ.
**5** ඔවුන් කළුවර වැටෙද්දී නගරයෙන්
පිට වෙලා ගියා. නගරයේ දො-
රටු වහන වේලාවේදී[9] වගේ තමයි
ඔවුන් ගියේ. නමුත් ඔවුන් කොහේට
ගියාද කියන්න නම් මම දන්නේ
නැහැ. ඉක්මනට ගියොත් ඒ මිනි-
සුන්ව අල්ලගන්න ඔබට පුළුවන්
වෙයි.” **6** (මේ වන විට රාහබ් ඒ
මිනිසුන් දෙදෙනාව තම පියස්සට[10]
රැගෙන ගොස් එහි පේළියට දමා
තිබුණු හණ දඬු යට සඟවා තිබු-
ණාය.) **7** එහෙයින් රජුගේ පණිවිඩ-
කරුවෝ ඒ මිනිසුන්ව අල්ලාගැනීමට

**1 පරි.**
1 ද්වි 9:1; ද්වි 11:31; යොෂු 3:2
2 ගණන් 32:20; යොෂු 22:2
3 ද්වි 3:19; ද්වි 29:8; යොෂු 13:8
4 ගණන් 1:3; ගණන් 26:2
5 නික් 13:18; ගණන් 32:21; ද්වි 3:18
6 ගණන් 32:17; ගණන් 32:22; ද්වි 3:20
7 ගණන් 32:33; යොෂු 22:9
8 යොෂු 22:4
9 ගණන් 32:25; හෙබ්‍රෙ 13:17

**2 තීරුව**
1 ගණන් 27:20; ද්වි 34:9
2 1සාමු 16:18; 1සාමු 17:37
3 1සාමු 12:15; 1සාමු 15:23; හිතෝ 17:11
4 ද්වි 17:12; 1සාමු 11:12
5 ද්වි 31:7; යොෂු 1:6

**2 පරි.**
6 ගණන් 25:1; ගණන් 33:49
7 යොෂු 6:17; මතෙ 1:5; හෙබ්‍රෙ 11:31; යාකො 2:25
8 උත් 42:9; 2සාමු 10:3
9 නෙහෙ 13:19
10 ද්වි 22:8; 2සාමු 11:2; ක්‍රියා 10:9

යෝර්දාන් ගඟේ තොටුපොළ[1] පැත්-
තට දිව ගියෝය. පණිවිඩකරුවන්
නුවරෙන් පිටත්ව ගිය විගස නුවරේ
දොරටුව වසන ලදි.
**8** පියස්සෙ උඩ සිටි ඔත්තුකරුවන්
නිදාගැනීමට පෙර රාහබ් ඔවුන් ළඟට
ගොස් **9** මෙසේ කීවාය. "යෙහෝවා
දෙවි ඔබට මේ දේශය ලබා දෙයි කියා
මට හොඳටම විශ්වාසයි.[2] ඔබේ සෙ-
නඟ අපේ දේශය ළඟටම ඇවිත්
කියලා දැනගත්තාම අපි හැමෝම
හොඳටම භය වුණා.[3] ඒ නිසා දේශයේ
කිසි වැසියෙකුට ඔබට විරුද්ධව නැඟී
සිටින්න තරම් ධෛර්යයක් නැහැ.[4]
**10** ඔබ ඊජිප්තු දේශයෙන් පිටත්ව
එද්දී යෙහෝවා දෙවි ඔබ ඉදිරියේ රතු
මුහුදේ ජලය වියළෙන්න සැලැස්වූ
හැටි අපිට ආරංචි වුණා.[5] ඒ වගේම
යෝර්දාන් ගඟෙන් නැඟෙනහිර පැත්-
තේ ජීවත් වූ සීහොන්[6] සහ ඕග්[7] යන
අමෝරිවරුන්ගේ රජවරුන් දෙදෙ-
නාව ඔබ විනාශ කළ හැටිත්[8] අපිට
අහන්න ලැබුණා. **11** මේ දේවල්
ආරංචි වුණාම අපි හොඳටම භය
වුණා.[9] අහසටත් පොළොවටත් අධි-
පති[10] වෙන කවුරුත් නෙමෙයි, ඔබේ
දෙවි යෙහෝවා බව ස්ථිරයි. ඒ
නිසා අපෙන් කාටවත් ඔබට විරුද්-
ධව නැඟී සිටින්න තරම් ශක්තියක්
නැහැ.[11] **12** මම ඔබට ප්‍රේමණීයව*
සැලකුවා වගේ ඔබත් මගේ පියා-
ගේ නිවසේ ඉන්න හැමෝටම[12] ප්‍රේ-
මය# පෙන්වනවා කියා යෙහෝවා
දෙවිගේ නමින් දිවුරා පොරොන්දු
වෙන්න.[13] ඔබ ඒ පොරොන්දුව ස්ථිර
වශයෙන්ම ඉටු කරන බවට මට ලකු-
ණක් දෙන්න.[14] **13** ඔබ මගේ පියා-
ගෙත්[15] මවගෙත් මගේ සහෝදර
සහෝදරියන්ගෙත් ඔවුන්ගේ ගෙයි
වැසියන්ගෙත් ජීවිත බේරා දෙනවා
කියා පොරොන්දු වෙන්න."[16]
**14** එවිට ඒ මිනිසුන් දෙදෙනා
ඇයට මෙසේ කීවෝය. "අප ගැන
කාටවත් කියන්න එපා. ඔබ අපට
ප්‍රේමණීයව සැලකූ නිසා යෙහෝවා
දෙවි අපට මේ දේශය උරුමයක් හැටි-
යට දුන් පසු අපිත් ඔබට ප්‍රේමණීයව*
සලකන්නම්. අපි ඔබට පොරොන්දු වූ
දේ ඒ විදිහටම ඉටු කරන්නම්.[1] අපි
අපේ පොරොන්දුව කඩ කළොත්
දෙවිගෙන් අපට දඬුවම් ලැබේවා!"[2]
**15** රාහබ්ගේ නිවස නගරය වටා
ඉදි කර තිබූ පවුරට අලළා තනා
තිබිණ. එහෙයින් ඇය ලණුවක ආධා-
රයෙන් නිවසේ ජනේලයෙන් පහළට
බහින්න ඔත්තුකාරයන්ට උපකාර
කළාය.[3] **16** ඔවුන් පිටත්ව යන්න
කලින් ඇය ඔවුන්ට මෙසේ කීවාය.
"කඳුකර ප්‍රදේශයට ගිහින් එහේ දවස්
තුනක් හැංගිලා ඉන්න. ඔබව අල්ල-
ගන්න එන අයට ඔබව හොයාගන්න
බැරුව ගියාම නැවත හැරිලා නගර-
යට යයි. ඊටපස්සේ ඔබ ඔබේ ගමන
යන්න."
**17** එවිට ඒ මිනිසුන් දෙදෙනා
ඇයට මෙසේ කීවෝය. "ඔබේ ඉල්ලීම
පිට අපි දිවුරලා ඔබට වුණු පො-
රොන්දුව කඩ කළා කියා කාට-
වත් කියන්න ලැබෙන්නේ නැහැ.
මොකද අපි ඒ පොරොන්දුව ඒ
විදිහටම ඉටු කරනවා.[4] **18** අපි
ඔබේ දේශය අල්ලගන්න ළඟදීම
එනවා. අපි දැන් බැහැලා යන ජනේ-
ලයේ ගැටගසා තිබෙන මේ රතු
ලණුව ගලවන්න එපා. මේ ලණුව
නිසා අපට ඔබේ නිවස හඳුනා-
ගන්න පුළුවන් වෙයි. ඔබේ පියා-
වත් මවවත් ඔබේ සහෝදරයන්වත්
ඔබේ පියාගේ සියලු ගෙයි වැසියන්-
වත් මේ නිවසට රැගෙන එන්න.[5]
**19** නමුත් කාටවත් මේ නිවසින් පිට-
තට යන්න දෙන්න එපා. කවුරු
හරි කෙනෙක් මේ නිවසින් පිටතට
ගියොත්[6] අපි ඒ තැනැත්තාගේ ජීවිත-
යට වග කියන්නේ නැහැ. නමුත් ඔබ
සමඟ මේ නිවසේ ඉන්න කාටවත්
කරදරයක් වෙන්න අපි ඉඩ තියන්නේ

**2 පරි.**
**1** විනි 3:28, විනි 12:5
**2** උත් 13:15, උත් 15:18, නික් 3:8
**3** නික් 23:27, ද්වි 2:25, ද්වි 11:25
**4** නික් 15:15, යොෂු 5:1, ගීතා 112:10
**5** නික් 14:21, නික් 15:14, යොෂු 4:23, යොෂු 9:9
**6** ගණන් 21:21, ගණන් 21:24
**7** ගණන් 21:34, ද්වි 3:3, යොෂු 9:10, ගීතා 135:11
**8** ලෙවී 27:29
**9** යොෂු 5:1
**10** ද්වි 4:39, 2ලේක 20:6, ගීතා 83:18, ගීතා 135:6, දානි 4:35
**11** නික් 15:15
**12** එස්ත 8:6
**13** ද්වි 10:20
**14** නික් 12:13, යොෂු 2:18, විනි 6:17
**15** එෆී 6:2
**16** යොෂු 6:23

**2 තීරුව**
**1** විනි 1:24, 1සාමු 30:15, මතෙ 10:41
**2** ගණන් 30:2, මතෙ 5:33
**3** හෙබ්‍රෙ 11:31
**4** ගණන් 30:2
**5** යොෂු 6:23, එස්ත 8:6
**6** ගණන් 35:26

---

යොෂු **2:12*** හෝ, "ළැදි ප්‍රේමයකින්." **12#** හෝ, "ළැදි ප්‍රේමය."

යොෂු **2:14*** හෝ, "ළැදි ප්‍රේමයකින්."

නැහැ. එහෙම වුණොත් ඒ තැනැත්-
තාගේ ජීවිතයට අපි වග කියනවා.
**20** ඒත් ඔබ අපව පාවා දුන්නොත්[1]
ඔබට දුන් පොරොන්දුවෙන් අපි නිද-
හස්. අපට දොස් කියන්න කිසිම
කෙනෙකුට බැහැ.” **21** එවිට ඇය
මෙසේ කීවාය. “හොඳයි. හැම දෙ-
යක්ම ඒ විදිහටම සිදු වේවා!”
ඇය එසේ කී පසු ඔවුහු පිටත්ව
ගියෝය. ඇය රතු ලණුව ජනේලයේ
ගැටගසා තැබුවාය. **22** ඔත්තුකා-
රයෝ කඳුකර ප්‍රදේශයට ගොස් දවස්
තුනක් සැඟවී සිටියෝය. ඔවුන්ව
සොයා ගිය මිනිස්සු සෑම තැනම
ඔවුන්ව සෙවූ නමුත් ඔවුන්ව සොයා-
ගැනීමට නොහැකි වූ නිසා ආපසු
නගරය බලා ගියෝය. **23** ඉන්පසු
කඳුකරයේ සැඟවී සිටි ඔත්තුකරු-
වෝ දෙදෙනා එතැනින් පිටත් වී
ගඟෙන් එගොඩ වූහ. ඔවුහු නූන්ගේ
පුත් යොෂුවා වෙතට ගොස් සිදු
වූ සියල්ල ඔහුට දන්වමින් මෙසේ
කීවෝය. **24** “යෙහෝවා දෙවි මුළු
දේශයම අපේ අතට භාර දී තිබෙ-
නවා.[2] දේශයේ වැසියන් අප ගැන
හොඳින් දන්නවා. ඒ නිසා අපිට
විරුද්ධව නැඟී සිටින්න තරම් ශක්ති-
යක් ඔවුන්ට නැහැ.”[3]

**3** යොෂුවා හා මුළු ඊශ්‍රායෙල් සෙ-
නඟ උදෑසනින්ම නැඟිට ෂිට්-
ටිම්[4] නම් ප්‍රදේශයෙන් පිටත්ව
ගියෝය. ඉන්පසු ඔවුහු යෝර්දාන්
ගඟ අසලට පැමිණ එහි රාත්‍රිය ගත
කළෝය.
**2** දින තුනකට පසු[5] සෙනඟව
බලාගැනීමට පත් කර සිටි නායක-
යෝ[6] කඳවුර පුරා ගොස් **3** සෙ-
නඟට මෙසේ අණ කළෝය. “ලෙවී
ගෝත්‍රයට අයිති පූජකයන් ඔබේ දෙවි
වන යෙහෝවාගේ ගිවිසුම් පෙට්ටිය
උසුලාගෙන[7] යනවා දකින විට ඔබත්
ඔබේ කූඩාරම් අකුළාගෙන ඔවුන්
පසුපස යන්න. **4** ඔබ මීට පෙර මේ
ප්‍රදේශය හරහා ගමන් කර නැති නිසා
ඔබට මඟ පෙන්වීමට ගිවිසුම් පෙට්-
ටිය උසුලාගෙන යන පූජකයන් ඔබට
ඉදිරියෙන් ගමන් කරයි. නමුත් ඔබත්
ගිවිසුම් පෙට්ටියත් අතර රියන් දෙද-
හසක* පමණ පරතරයක් තිබිය
යුතුයි.[1] ගිවිසුම් පෙට්ටියට ළං නො-
වීමට වගබලා ගන්න.”
**5** පසුව යොෂුවා සෙනඟ අමතා,
“හෙට යෙහෝවා දෙවි ඔබ සියලු-
දෙනා ඉදිරියේ පුදුම දනවන දේවල්[2]
කරන්න යන බැවින් දැන් පවිත්‍ර
වෙන්න”[3] කියා කීවේය.
**6** යොෂුවා පූජකයන්ට මෙසේ
කීවේය. “ඔබ සියලුදෙනා ගිවිසුම්
පෙට්ටිය[4] ඔසවාගෙන සෙනඟට ඉදි-
රියෙන් යන්න.” එහෙයින් ඔවුහු ගිවි-
සුම් පෙට්ටිය ඔසවාගෙන සෙනඟට
ඉදිරියෙන් ගමන් කළෝය.
**7** එවිට යෙහෝවා දෙවි යොෂුවාට
මෙසේ පැවසුවේය. “අද මම මුළු ඊශ්‍රා-
යෙල් සෙනඟ ඉදිරියේ ඔබව ගෞරව-
යට පත් කරන්නෙමි.[5] එවිට මා
මෝසෙස් සමඟ සිටියාක් මෙන්[6] ඔබ
සමඟත් සිටින බව සෙනඟ තේරුම්-
ගනු ඇත.[7] **8** ගිවිසුම් පෙට්ටිය ඔස-
වාගෙන යන පූජකයන්ට ඔබ මෙසේ
පවසන්න.[8] ‘ඔබ යෝර්දාන් ගඟ අද්ද-
රට පැමිණි විට වතුරට පා තබා එත-
නම නතර වී සිටින්න.’ ”[9]
**9** පසුව යොෂුවා ඊශ්‍රායෙල්වරුන්ට
මෙසේ කීවේය. “ළඟට ඇවිත් ඔබේ
දෙවි වන යෙහෝවා කියන දේට
ඇහුම්කන් දෙන්න. **10** දෙවි දැන්
කානානිවරුන්වද හිත්තීවරුන්වද
හිවීයවරුන්වද පෙරිස්සිවරුන්වද ගිර්-
ගාෂිවරුන්වද අමෝරිවරුන්වද යෙබූ-
සිවරුන්වද[10] ඔබ ඉදිරියෙන්
අනිවාර්යයෙන්ම පන්නා දමයි. එවිට
ඔබ අතරේ සිටින[11] ඔබේ දෙවි ජීව-
මාන දෙවි කෙනෙක් බව ඔබ ස්ථිර
වශයෙන්ම තේරුම්ගනියි. **11** පූජ-
කයන් ඔබට පෙරටුවෙන් ගමන් කර
මුළු පොළොවටම අධිපති වන දෙ-
විගේ ගිවිසුම් පෙට්ටිය යෝර්දාන්
ගඟ මැදට ගෙන යයි. **12** ඊශ්‍රා-
යෙල් ගෝත්‍ර දොළහ නියෝජනය

**2 පරි.**
**1** යොෂු 2:14
**2** නික් 23:31; යොෂු 6:2; යොෂු 21:44; නෙහෙ 9:24
**3** නික් 15:15; යොෂු 2:9; යොෂු 2:11; යොෂු 5:1

**3 පරි.**
**4** ගණන් 25:1; යොෂු 2:1
**5** යොෂු 1:11
**6** ද්වි 1:15; ද්වි 20:5; ද්වි 31:28; යොෂු 1:10
**7** ගණන් 4:15; ද්වි 31:9; 1ලේක 15:2

**2 තීරුව**
**1** නික් 19:12
**2** නික් 34:10; ගීතා 72:18; ගීතා 86:10
**3** නික් 19:10; ලෙවී 20:7
**4** නික් 25:10; ගණන් 4:15
**5** යොෂු 4:14
**6** නික් 3:12; නික් 14:31
**7** ද්වි 31:8; යොෂු 1:5; යොෂු 1:17
**8** යොෂු 1:18
**9** යොෂු 3:17
**10** නික් 3:8; ද්වි 7:1; ගීතා 24:1; ගීතා 44:2; සෙක 4:14
**11** නික් 17:7; ලෙවී 26:11; ගණන් 11:20; ද්වි 7:21

යොෂු **3:4*** එනම්, මීටර් 890ක පමණ.

කිරීම සඳහා සෑම ගෝත්‍රයෙන්ම එක්
පුරුෂයෙක් බැගින් තෝරාගන්න.[1]
**13** මුළු පොළොවටම අධිපති වන
යෙහෝවා දෙවිගේ ගිවිසුම් පෙට්ටිය
ඔසවාගෙන යන පූජකයන් යෝර්දාන්
ගඟට පා තබන සැණින් ගඟේ ඉහළ
සිට ගලා බසින ජල පහර නතර
වෙයි. ගඟ හරහා වේල්ලක් බැන්දාක්
මෙන් එම ජල කඳ එක තැන නතර
වෙයි.”[2]

**14** පසුව සෙනඟ කූඩාරම් අකුළා-
ගෙන යෝර්දාන් ගඟෙන් එගොඩ
වීමට සූදානම් වූහ. පූජකයෝ ගිවිසුම්
පෙට්ටිය[3] ඔසවාගෙන සෙනඟට ඉදි-
රියෙන් ගියෝය. **15** එය අස්වැන්න
නෙළන කාලය විය. සාමාන්‍යයෙන්
ඒ කාලයේදී යෝර්දාන් ගඟේ ජලය
පිටාර ගලන්නේය.[4] නමුත් ගිවිසුම්
පෙට්ටිය ඔසවාගෙන ගිය පූජක-
යන් යෝර්දාන් ගඟ අද්දරට පැමිණ
වතුරට පා තැබූ සැණින් **16** ගඟේ
ඉහළ සිට ගලා ආ ජල පහර නැවතු-
ණේය. ජල පහර නතර වූයේ සෙනඟ
සිටි ස්ථානයට ඈතින් පිහිටි ෂාරෙ-
තාන්[5] ප්‍රදේශය අසල තිබූ ආදම් නම්
නුවර ළඟය. ජල කඳ වේල්ලකින් සිර
කර තබන්නාක් මෙන් එක තැන
නතර විය.[6] ඉතුරු ජලය මහ අරබා
නිම්නයේ පිහිටි ලුණු මුහුදට[7] ගලා
ගියේය. මෙසේ යෝර්දාන් ගඟේ ජලය
සිඳී ගිය අතර සෙනඟ එතැනින්
එගොඩ වී යෙරිකෝව දෙසට ගමන්
කළෝය. **17** මුළු ඊශ්‍රායෙල් සෙ-
නඟ වියළි භූමිය හරහා ගමන් කර-
මින් යෝර්දාන් ගඟෙන් එගොඩ විය.[8]
ඔවුහු සියල්ලන්ම එගොඩ වන තෙක්
යෙහෝවා දෙවිගේ ගිවිසුම් පෙට්ටිය
ඔසවාගෙන සිටි පූජකයෝ යෝර්දාන්
ගඟ මැද සිටගෙන සිටියෝය.[9]

**4** මුළු ඊශ්‍රායෙල් සෙනඟ යෝර්-
දාන් ගඟෙන් එගොඩ වූ
පසු[10] යෙහෝවා දෙවි යොෂුවාට
මෙසේ කීවේය. **2** “ගෝත්‍ර දොළහ
නියෝජනය වන ලෙස පුරුෂයන්
දොළොස්දෙනෙකුව තෝරාගෙන[11]
**3** ඔවුන්ට මෙසේ පවසන්න. ‘යෝර්-
දාන් ගඟ මැද පූජකයන් සිටගෙන
සිටි[1] ස්ථානයෙන් ගල් දොළහක්
ගන්න.[2] ඒවා අද රෑ ඔබ කූඩාරම්
ගසාගන්නා ස්ථානයේ තබන්න.’ ”[3]

**4** යොෂුවා, ඊශ්‍රායෙල්වරුන් අත-
රින් සෑම ගෝත්‍රයක්ම නියෝජ-
නය වන ලෙස තමන් තෝරාගත්
පුරුෂයන් දොළොස්දෙනාව[4] කැඳවා
**5** ඔවුන්ට මෙසේ කීවේය. “ඔබේ
දෙවි වන යෙහෝවාගේ ගිවිසුම් පෙට-
ටිය ඔසවාගෙන යෝර්දාන් ගඟ මැද
සිටින පූජකයන්ව පසු කරගෙන
ගොස් ඔබ එක් එක් කෙනා යෝර්දාන්
ගඟ මැදින් ගලක් බැගින් ගෙන
එය කරේ තබාගෙන එන්න. එම
ගල් රැගෙන ආ යුත්තේ ඊශ්‍රායෙල්ව-
රුන්ගේ ගෝත්‍ර දොළහ නියෝජනය
කිරීම සඳහායි. **6** ඒ ගල් සිහිවටන-
යක් ලෙස[5] තබන්න. ඉදිරියේදී ඔබේ
පුත්‍රයෝ, ‘මේ ගල් මෙසේ තබා
තිබෙන්නේ ඇයි’ කියා ඇසුවොත්[6]
**7** ඔබ ඔවුන්ට මෙසේ කිව යුතුයි.
‘යෙහෝවා දෙවිගේ ගිවිසුම් පෙට්ටිය
යෝර්දාන් ගඟ මැදින් ගෙන යද්දී දෙවි
ගඟේ වතුර සිඳී යන්න සැලැස්සුවා.[7]
ඊශ්‍රායෙල්වරුන්ට මේ සිද්ධිය සඳහ-
ටම මතක් වීම සඳහායි මේ ගල් මෙ-
තැන ගොඩගසා තිබෙන්නේ.’ ”[8]

**8** ඊශ්‍රායෙල්වරු, යොෂුවා පැවසූ
සෑම දෙයක්ම කළෝය. යෙහෝවා
දෙවි යොෂුවාට පැවසූ පරිදි ඔවුහු
ඊශ්‍රායෙල්වරුන්ගේ ගෝත්‍ර දොළහ[9]
නියෝජනය කිරීම සඳහා යෝර්-
දාන් ගඟ මැද්දෙන් ගල් දොළ-
හක් ගත්තෝය. ඔවුහු ඒවා තමන්
කූඩාරම් ගසාගත් ස්ථානයේ ගොඩ-
ගැසුවෝය.[10]

**9** පූජකයන් ගිවිසුම් පෙට්ටිය ඔස-
වාගෙන යෝර්දාන් ගඟ මැද සිටගෙන
සිටි ස්ථානයේ යොෂුවා තවත් ගල්
දොළහක් තැබුවේය.[11] අද දක්වාම ඒ
ගල් එම ස්ථානයේ තිබේ.

**10** යෙහෝවා දෙවි යොෂුවා මාර්-
ගයෙන් සෙනඟට අණ කළ දේ
සහ මෝසෙස් යොෂුවාට පවසා තිබූ

**3 පරි.**
1 යොෂු 4:2
2 නික් 15:8; ගීතා 114:3
3 නික් 25:10; යොෂු 3:6; ක්‍රියා 7:45
4 යොෂු 4:18; 1ලේක 12:15
5 1රාජා 7:46
6 යොෂු 3:13
7 උත් 14:3; ගණන් 34:3; ද්වි 3:17; යොෂු 12:3
8 ගීතා 66:6
9 යොෂු 4:3; 2රාජා 2:8

**4 පරි.**
10 ගණන් 14:29; ගණන් 26:51; ගණන් 26:65
11 යොෂු 3:12

**2 තීරුව**
1 යොෂු 3:17
2 ද්වි 27:2
3 යොෂු 4:19; යොෂු 4:20
4 යොෂු 3:12
5 උත් 31:45
6 නික් 12:26; නික් 13:14; ද්වි 6:20; යොෂු 4:21; ගීතා 78:3; යෙසා 38:19
7 යොෂු 3:13; යොෂු 3:16
8 ද්වි 4:9
9 යොෂු 4:2; ක්‍රියා 26:7
10 ද්වි 27:2; යොෂු 4:3; යොෂු 4:19
11 යොෂු 3:17

සියල්ල ඉටු කරන තෙක්[1] ගිවිසුම්
පෙට්ටිය ඔසවාගෙන සිටි පූජකයෝ
යෝර්දාන් ගඟ මැද සිටගෙන සිටි-
යෝය.[2] ඒ අතරතුර සෙනඟ හැකි
ඉක්මනින් ගඟෙන් එගොඩ වූහ.[3]
**11** මුළු සෙනඟ ගඟෙන් එගොඩ
වූ පසු යෙහෝවා දෙවිගේ ගිවිසුම්
පෙට්ටිය[4] ඔසවාගෙන සිටි පූජක-
යෝද සෙනඟ බලා සිටියදීම ගඟෙන්
එගොඩ වූහ. **12** රූබෙන් ගෝත්‍ර-
යද ගාද් ගෝත්‍රයද මනස්සේ ගෝ-
ත්‍රයේ එක් කොටසක්ද[5] යුද්ධයට
සැරසී,[6] මෝසෙස් පවසා තිබූ ලෙ-
සම ඊශ්‍රායෙල් සෙනඟ සමඟ ගඟෙන්
එගොඩ වූහ.[7] **13** හතළිස්දහස්දෙ-
නෙක් පමණ යුද්ධයට සූදානම් වී
යෙරිකෝවේ තැනිතලා බිම් පෙදෙ-
සට පිටත්ව ගියෝය. යෙහෝවා දෙ-
විද ඔවුන් සමඟ සිටියේය.
**14** එදින යෙහෝවා දෙවි මුළු
ඊශ්‍රායෙල් සෙනඟ ඉදිරියේ යොෂු-
වාව ගෞරවයට පත් කළේය.[8] එදා
සිට සෙනඟ මෝසෙස්ට ගෞරවය
දැක්වූ ආකාරයටම යොෂුවාටද ගෞ-
රව කරන්න පටන්ගත්තෝය. යො-
ෂුවාගේ මුළු ජීවිත කාලය පුරාම
සෙනඟ ඔහුට ඉතා ගෞරවයෙන්
සැලකුවෝය.[9]
**15** යෙහෝවා දෙවි යොෂුවාට
මෙසේ පැවසුවේය. **16** "ගිවිසුම්
පෙට්ටිය[10] ඔසවාගෙන සිටින පූජක-
යන්ට යෝර්දාන් ගඟෙන් එගොඩ
වෙන්න කියන්න." **17** එවිට යො-
ෂුවා, "යෝර්දාන් ගඟෙන් එගොඩ
වෙන්න" කියා පූජකයන්ට කීවේය.
**18** යෙහෝවා දෙවිගේ ගිවිසුම් පෙට්-
ටිය[11] ඔසවාගෙන ගිය පූජකයන්
යෝර්දාන් ගඟෙන් එගොඩ වූ විගස[12]
නතර වී තිබූ ගඟේ ජල පහර නැවත
ගලා බසින්න පටන්ගත්තේය. කලින්
මෙන් ගඟ පිටාර ගැලුවේය.[13]
**19** පළමුවන මාසයේ දහවනදා
යෝර්දාන් ගඟෙන් එගොඩ වූ ඊශ්‍රා-
යෙල්වරු යෙරිකෝවේ නැඟෙනහිර
සීමාවේ පිහිටි ගිල්ගාල් නගරයේ[14]
කඳවුරු බැඳගත්තෝය.

**20** යෝර්දාන් ගඟෙන් ගත් ගල්
දොළහ යොෂුවා ගිල්ගාල් නගර-
යේ යම් ස්ථානයක ගොඩගැසුවේය.[1]
**21** ඔහු ඊශ්‍රායෙල්වරුන්ට මෙසේ
කීවේය. "'මේ ගල් මෙසේ තබා
තිබෙන්නේ ඇයි' කියා අනාගතයේදී
ඔබේ දරුවන් ඔබෙන් ඇසුවොත්[2]
**22** ඔබ ඔවුන්ට මෙසේ කියන්න.
'ඊශ්‍රායෙල් සෙනඟ යෝර්දාන් ගඟෙන්
එගොඩ වන විට එහි ජලය සිඳී ගොස්
තිබුණා.[3] **23** ඊශ්‍රායෙල් ජාතිය රතු
මුහුදෙන් එගොඩ වන අවස්ථාවේදී
යෙහෝවා දෙවි එහි වතුර සිඳී යන්න
සැලැස්වූ ලෙසම සෙනඟ යෝර්දාන්
ගඟෙන් එගොඩ වෙන අවස්ථාවේ-
දීත් යෙහෝවා දෙවි ගඟේ වතුර
සිඳී යන්න සැලැස්සුවා.[4] **24** දෙවි
එහෙම කළේ පොළොවේ සියලු වැසි-
යන් යෙහෝවා දෙවි බලවත් බව
තේරුම්ගන්නා පිණිසයි.[5] ඒ වගේම
ඔබත් ඔබේ දෙවි වන යෙහෝවාට
සැමදා ගරුබිය ඇතුව සේවය කරන
පිණිසයි.'"[6]

**5** යෙහෝවා දෙවි ඊශ්‍රායෙල් සෙ-
නඟට යෝර්දාන් ගඟෙන්
එගොඩ වීම සඳහා එහි වතුර සිඳී
යෑමට සැලැස්වූ බව ගඟෙන් බස්නා-
හිර පැත්තේ සිටි අමෝරිවරුන්ගේ
රජවරුන්ට[7] හා වෙරළබඩ තීරයේ
සිටි කානානිවරුන්ගේ රජවරුන්ට[8]
ආරංචි විය. එම ආරංචිය ලැබුණු විට
ඔවුහු මහත් සේ තැතිගත්තෝය.[9]
ඊශ්‍රායෙල්වරුන් ගැන අසන්න ලැබුණු
ඒ දේවල් නිසා ඊශ්‍රායෙල්වරුන්ට
විරුද්ධව කිසිවක් කිරීමට ශක්තියක්
ඔවුන් තුළ නොවීය.[10]
**2** යෙහෝවා දෙවි යොෂුවාට
මෙසේ කීවේය. "ගල් මුවහත් කර
පිහි සාදා ඊශ්‍රායෙල් පුත්‍රයන්ව චර්-
මච්ඡේදනය කරන්න."*[11] **3** එවිට
යොෂුවා තමන් සෑදූ පිහි රැගෙන
ගිබෙයාත්-හාඅරලොත්හිදී[12] ඊශ්‍රායෙල්
පුත්‍රයන්ව චර්මච්ඡේදනය කළේය.

යොෂු **5:2*** මු.අ., "නැවත වරක් නැත්නම් දෙවන වතාවටත් චර්මච්ඡේදනය කරන්න."

**4 පරි.**
**1** ද්වි 27:2, ද්වි 34:9
**2** යොෂු 3:13
**3** ගීතා 119:60
**4** යොෂු 3:8, යොෂු 3:17
**5** යොෂු 1:12
**6** නික් 13:18, ගණන් 32:27, යොෂු 1:14
**7** ගණන් 32:21, ගණන් 32:29
**8** යොෂු 3:7, ගීතා 75:7
**9** නික් 14:31
**10** නික් 25:22
**11** ගණන් 4:15
**12** යොෂු 3:13
**13** යොෂු 3:15
**14** යොෂු 4:3, යොෂු 5:9, යොෂු 10:6, මීකා 6:5

**2 තීරුව**
**1** ද්වි 27:2, යොෂු 4:8
**2** යොෂු 4:6, ගීතා 44:1
**3** යොෂු 3:17, ගීතා 66:6
**4** නික් 14:21, නෙහෙ 9:11, ගීතා 78:13, යෙසා 43:16, යෙසා 63:12, හෙබ්‍රෙ 11:29
**5** නික් 9:16, නික් 15:6, ද්වි 28:10, 1සාමු 17:46, 1රාජා 8:42, 2රාජා 5:15, 2රාජා 19:19, ගීතා 89:13, ගීතා 106:8
**6** ද්වි 6:2, ගීතා 76:7, යෙරෙ 10:7, 1පේතෘ 2:17

**5 පරි.**
**7** උත් 10:16
**8** උත් 12:6, ගණන් 13:29, විනි 3:3
**9** නික් 15:15, යොෂු 2:9, යොෂු 2:11
**10** යොෂු 2:24
**11** උත් 17:11, නික් 4:25
**12** යොෂු 5:9

4 යොෂුවා ඔවුන්ව චර්මච්ඡේදනය
කළේ මේ හේතුව නිසාය. ඊජිප්තු දේ-
ශයෙන් පිටත්ව ආ ඊශ්‍රායෙල් සෙනඟ
අතරෙන් යුද්ධයට යා හැකි වයසක
සිටි සියලු පුරුෂයෝ පාළුකරයේදී
මිය ගියෝය.[1] 5 ඊජිප්තු දේශයෙන්
පිටත්ව ආ සියලු පුරුෂයන්ව චර්මච්-
ඡේදනය කර තිබුණත් පාළුකරය
හරහා ගමන් ගන්නා අතරතුරදී ඉප-
දුණු පිරිමි දරුවන්ව චර්මච්ඡේදනය
කර නොතිබිණ. 6 ඊශ්‍රායෙල් සෙ-
නඟ අතරේ යුද්ධයට යා හැකි වයසක
සිටි සියලුම පුරුෂයෝ මිය යන තෙක්
ඔවුන්ට අවුරුදු හතළිහක්[2] පුරා පාළු-
කරයේ ගමන් කිරීමට සිදු විය. යෙ-
හෝවා දෙවි තම සෙනඟට කිරියෙන්
හා පැණියෙන් ඉතිරෙන දේශයක්[3]
දෙන බවට ඔවුන්ගේ මුතුන්මිත්තන්ට
පොරොන්දු වී තිබිණ.[4] නමුත් ඒ
සියලුදෙනා යෙහෝවා දෙවිට අකී-
කරු වූ නිසා ඔවුන්ට කවදාවත් ඒ
දේශය දකින්න නොලැබෙන[5] බව යෙ-
හෝවා දෙවි ස්ථිරවම පවසා තිබිණ.
7 නමුත් දෙවි ඒ දේශය ඔවුන්ගේ පුත්‍ර-
යන්ට හිමි කර දුන්නේය.[6] පාළුකරය
හරහා ගමන්ගන්නා අතරතුරදී ඉපදුණු
ඒ දරුවන්ව චර්මච්ඡේදනය කර තිබු-
ණේ නැත. එමනිසා යොෂුවා ඔවුන්ව
චර්මච්ඡේදනය කළේය.

8 ඒ සියලුදෙනාව චර්මච්ඡේදනය
කළ පසු ඔවුහු සුව වන තෙක් කඳවු-
රේම රැඳී සිටියෝය.[7]

9 පසුව යෙහෝවා දෙවි යොෂු-
වාට මෙසේ කීවේය. “ඊජිප්තුවරුන්
මාගේ සෙනඟට කළ අපහාස අද මම
නවතා දැමුවෙමි.”[8] එහෙයින් අද වන
තුරු ඒ ස්ථානය ගිල්ගාල්*[9] යන
නමින් හඳුන්වනු ලැබේ.

10 යෙරිකෝවේ පාළුකරයේ පිහිටි
ගිල්ගාල් නගරයේ කඳවුරු බැඳගෙන
සිටි ඊශ්‍රායෙල්වරු ඒ මාසයේ දහහ-
තරවනදා සවස පාස්කුව පැවැත්-
වූහ.[10] 11 පාස්කුවට පසුවදා ඔවුහු
එම දේශයේ පලදාවෙන් සාදාගත්
මුහුන් නොදැමූ රොටි[1] සහ බැදපු
ධාන්‍ය කෑවෝය. 12 ඊශ්‍රායෙල් සෙ-
නඟ දේශයේ පලදාව ආහාරයට ගත්
දවසේ සිට භූමිය මතට මන්නා වැටීම
නතර විය.[2] ඒ අවුරුද්දේ සිට ඔවුහු
කානාන් දේශයේ පලදාව ආහාරයට
ගැනීමට පටන්ගත්තෝය.[3]

13 දිනක් යොෂුවා යෙරිකෝව
අසල සිටියදී කඩුවක් අතට ගත්[4]
මිනිසෙකු[5] තමාට ඉදිරියෙන් සිට-
ගෙන සිටිනවා දුටුවේය. යොෂුවා ඔහු
වෙතට ගොස්, “ඔබ අපේ මිත්‍රයෙක්ද
නැත්නම් සතුරෙක්ද” කියා ඔහුගෙන්
ඇසුවේය. 14 එවිට ඔහු, “මම යෙ-
හෝවා දෙවිගේ සේනාවේ අධිපති”[6]
කියා පැවසුවේය. එය ඇසූ විගස යො-
ෂුවා දණින් වැටී තම හිස නමා[7]
ඉතා ගෞරවයෙන් මෙසේ ඇසුවේය.
“මාගේ ස්වාමීනි, ඔබ පැමිණියේ ඔබේ
සේවකයා වන මට කුමක් පැවසීම-
ටද?” 15 එවිට යෙහෝවා දෙවිගේ
සේනාවේ අධිපති, යොෂුවාට මෙසේ
කීවේය. “ඔබ සිටගෙන සිටින භූමිය
ශුද්ධයි. ඒ නිසා ඔබේ පාවහන් ගල-
වන්න.” නොපමාව යොෂුවා එසේ
කළේය.[8]

**6** යෙරිකෝවේ වැසියන් ඊශ්‍රායෙල්-
වරුන්ට බියෙන් සිටි නිසා නග-
රයේ ආරක්ෂාව තර කර තිබිණ.
එහෙයින් නගරයට ඇතුල් වෙන්නත්
එයින් පිට වී යන්නත් කාටවත් නො-
හැකි විය.[9]

2 යෙහෝවා දෙවි යොෂුවාට
මෙසේ කීවේය. “මම යෙරිකෝවත්
එහි රජුවත් එහි බලවත් හමුදා-
වත් ඔබේ අතට පත් කරන්නෙමි.[10]
3 ඔබේ මුළු හමුදාවම දවසට එක්
වරක් ඒ නගරය වටා ගමන් කළ
යුතුයි. ඔබ එලෙස දවස් හයක් ගමන්
කරන්න. 4 ගිවිසුම් පෙට්ටිය ඔස-
වාගෙන යන පූජකයන්ට ඉදිරියෙන්
තවත් පූජකයන් හත්දෙනෙකු හො-
රණෑ* හතක් රැගෙන යා යුතුයි. හත්-
වන දවසේදී ඔබ ඒ නගරය වටා හත්

**5 පරි.**
1 ගණන් 14:29, ගණන් 26:65, ද්වි 2:14, 1කොරි 10:5, හෙබ්‍රෙ 3:17
2 ගණන් 14:33, ද්වි 1:3, ගීතා 95:10
3 නික් 3:8, ගණන් 13:27, ද්වි 27:3, එස 20:6
4 උත් 13:15, නික් 33:1, ක්‍රියා 7:5
5 ගණන් 14:23, ද්වි 1:35, ගීතා 106:26
6 ගණන් 14:31, ද්වි 1:39
7 උත් 34:25
8 උත් 34:14, ගීතා 119:39, යෙරෙ 9:25, යෙරෙ 9:26
9 යොෂු 4:19, යොෂු 5:3
10 නික් 12:24, ගණන් 9:5

**2 තීරුව**
1 නික් 12:18, නික් 13:6, ලෙවී 23:6
2 නික් 16:35
3 ද්වි 6:11, ද්වි 8:10
4 ගණන් 22:23, 1ලේක 21:16
5 උත් 18:2, නික් 23:23, විනි 13:6, ක්‍රියා 1:10
6 නික් 23:20, 1රාජා 22:19, ගීතා 103:20, ගීතා 148:2, දානි 10:13
7 උත් 17:3
8 නික් 3:5

**6 පරි.**
9 යොෂු 2:9
10 ගණන් 14:9, ද්වි 7:24, විනි 11:24, නෙහෙ 9:24

යොෂු **5:9*** තේරුම, “ඉවත් කළා.”

යොෂු **6:4*** මූ.අ., “බැටළුවන්ගේ අං.”

වරක් ගමන් කරන්න. ඒ අතර-
තුර පූජකයන් තම හොරණෑ පිඹිය
යුතුයි.[1] **5** හත්වන වරට හොරණෑ
පිඹින ශබ්දය ඇසුණු විට හමුදා හට-
යන් සියලුදෙනා එක හඬින් මහත්
ඝෝෂාවක් නැඟිය යුතුයි.[2] එවිට
නගරයේ පවුරු බිමට කඩා වැටෙයි.[3]
ඉන්පසු ඔවුන් සියලුදෙනාම කිසි
භයක් නැතුව නගරයට ඇතුළ් විය
යුතුයි."

**6** එවිට නූන්ගේ පුත් යොෂුවා
පූජකයන්ව[4] කැඳවා ඔවුන්ට මෙසේ
කීවේය. "ගිවිසුම් පෙට්ටිය[5] රැගෙන
යෑමට සූදානම් වෙන්න. යෙහෝවා
දෙවිගේ ගිවිසුම් පෙට්ටිය[6] ඔසවා-
ගෙන යන පූජකයන්ට ඉදිරියෙන්
තවත් පූජකයන් හත්දෙනෙකු හො-
රණෑ රැගෙන යා යුතුයි." **7** පසුව
යොෂුවා හමුදා හටයන්ට මෙසේ
කීවේය. "ඔබ සියලුදෙනා නගරය
වටා ගමන් කරන්න. යෙහෝවා දෙවි-
ගේ ගිවිසුම් පෙට්ටිය ඔසවාගෙන
යන පූජකයන්ට ඉදිරියෙන් යුධ සේ-
නාව[7] යා යුතුයි." **8** ඔවුහු යොෂුවා
පැවසූ ලෙසම කළෝය. හොරණෑ
හතක් රැගත් පූජකයෝ හත්දෙනෙක්
යෙහෝවා දෙවිගේ ගිවිසුම් පෙට-
ටියට ඉදිරියෙන් ගමන් කළෝය.
මෙසේ ඔවුහු තම හොරණෑ පිඹිමින්
යෙහෝවා දෙවිට ඉදිරියෙන් ගමන්
කළෝය. **9** හොරණෑ පිඹිමින් ගිය
පූජකයන්ට ඉදිරියෙන් යුධ සේනාව
ගමන් කළෝය. ගිවිසුම් පෙට්ටියට
පිටුපසින් තවත් යුධ සේනාවක්[8] හො-
රණෑ හඬ මැද ගමන් කළෝය.

**10** යොෂුවා හමුදා හටයන්ට මේ
ආඥාව දී තිබිණ.[9] " 'හඬ නඟා කෑග-
සන්න' කියා මම ඔබට පවසන දවස
පැමිණෙන තෙක් නිහඬව සිටින්න.
එම දවස පැමිණි විට මහත් හඬින්
ඔබ සියලුදෙනාම කෑගැසිය යුතුයි."[10]
**11** යොෂුවාගේ අණ පරිදි යෙහෝවා
දෙවිගේ ගිවිසුම් පෙට්ටිය නගරය
වටා එක වතාවක් ගෙන යනු ලැබීය.
ඉන්පසු ඔවුහු කඳවුරට ගොස් එහි
රාත්‍රිය ගත කළෝය.

**12** යොෂුවා පසුවදා උදෑසනින්ම
අවදි වී[1] යෙහෝවා දෙවිගේ ගිවිසුම්
පෙට්ටිය ඔසවාගෙන[2] යන පූජක-
යන්ව පිටත් කර යැව්වේය. **13** යෙ-
හෝවා දෙවිගේ ගිවිසුම් පෙට්ටිය
ඔසවාගෙන ගිය පූජකයන්ට ඉදි-
රියෙන් තවත් පූජකයන් හත්දෙ-
නෙක් හොරණෑ හතක් පිඹිමින් ගමන්
කළෝය. ඒ පූජකයන් හත්දෙනාට
ඉදිරියෙන් යුධ සේනාවක් ගමන් කළ
අතර යෙහෝවා දෙවිගේ ගිවිසුම්
පෙට්ටිය ඔසවාගෙන ගිය පූජකයන්ට
පිටුපසින් තවත් යුධ සේනාවක් හො-
රණෑ හඬ මැද ගමන් කළෝය.[3]
**14** ඔවුහු දෙවන දවසේද නගරය
වටා එක වතාවක් ගමන් කර නැවත
කඳවුරට පැමිණියෝය. දවස් හයක්
ඔවුහු එලෙස කළෝය.[4]

**15** නමුත් හත්වන දවසේදී එළිය
වැටුණු විගස ඔවුහු අවදි වී නගරය
වටා හත් වතාවක් ගියෝය. මේ හත්
වතාවේදීම ඔවුන් ගමන් කළේ කලින්
දවස්වලදී ගමන් කළ ආකාරයට-
මය.[5] **16** හත්වන වටයේදී පූජක-
යන් හොරණෑ පිඹින විට යොෂුවා
හමුදා හටයන්ට මෙසේ කීවේය. "දැන්
ශබ්ද නඟා කෑගසන්න.[6] යෙහෝවා
දෙවි මේ නගරය ඔබේ අතට භාර
දී තිබෙනවා.[7] **17** මුළු නගරයත්
එහි ඇති සියල්ලත් විනාශ කිරීමට
නියම කර තිබෙනවා.*[8] ඒත් රාහබ්[9]
නම් ගණිකාව අපේ ඔත්තුකාරයන්ව
ආරක්ෂා කළ නිසා ඇයවයි ඇගේ
ගෙයි වැසියන්වයි විනාශ කරන්න
එපා.[10] මේ නගරය හා එහි තිබෙන
සෑම දෙයක්ම දැන් අයිති යෙහෝවා
දෙවිටයි. **18** විනාශ කිරීමට නියම
කර තිබෙන කිසිම දෙයකට අතවත්
තියන්න එපා.[11] එසේ කළොත් ඒ
දේවලට ආශාවක් ඔබ තුළ ඇති
වෙයි.[12] එවිට ඒවා ඔබ සතු කර-
ගන්න ඔබ පෙලඹිය හැකියි.[13] එය
අපිට ශාපයක් විතරක් නෙමෙයි මුළු

**6 පරි.**

**1** විනි 3:27; විනි 7:22; 2සාමු 2:28; ශෙප 1:16
**2** යෙරෙ 50:15; හොෂෙ 5:8
**3** හෙබ්‍රෙ 11:30
**4** ද්වි 20:2
**5** ද්වි 31:25
**6** ගණන් 4:15
**7** ගණන් 10:14; ගණන් 10:18; ගණන් 10:22; යොෂු 1:14; යොෂු 4:13
**8** ගණන් 10:25
**9** ද්වි 34:9
**10** යොෂු 1:18

**2 තීරුව**

**1** යොෂු 3:1
**2** ගණන් 3:31; ගණන් 4:15; ද්වි 31:9; 1ලේක 15:2
**3** යොෂු 6:4
**4** යොෂු 6:3
**5** යොෂු 6:4
**6** යොෂු 6:5; යොෂු 6:10; 2ලේක 13:15
**7** ද්වි 9:1; යොෂු 6:1
**8** ලෙවී 27:28; ගණන් 21:3; ද්වි 7:2; ද්වි 20:16
**9** යොෂු 2:1; මතෙ 1:5; හෙබ්‍රෙ 11:31
**10** උත් 12:3; යොෂු 2:4; යොෂු 2:6; මතෙ 25:40; හෙබ්‍රෙ 6:10; යාකො 2:25
**11** ද්වි 7:26
**12** ද්වි 13:17; යොෂු 7:21; හෙබ්‍රෙ 13:5
**13** යොෂු 7:11

යොෂු **6:17*** මූ.අ., "විනාශයට කැප කර තිබෙ-නවා."

ඊශ්‍රායෙල් ජාතියේම විනාශයට හේතු විය හැකියි.[1] **19** නමුත් ඒ නගරයේ තිබෙන රන්, රිදී, තඹ සහ යකඩවලින් සෑදූ භාණ්ඩ සියල්ල යෙහෝවා දෙවිට කැප කළ යුතුයි.[2] ඒවා යෙහෝවා දෙවිගේ භාණ්ඩාගාරයේ තැන්පත් කළ යුතුයි."[3]

**20** පූජකයෝ තම හොරණෑ පිම්බෝය. එය ඇසුණු සැණින් හමුදා භටයෝ ශබ්ද නඟා කෑගැසුවෝය.[4] සියලුදෙනාම එක හඬින් මහත් සෝෂාවක් නැඟුවෝය. එවිට ඒ නගරයේ පවුර බිමට කඩා වැටිණ.[5] ඉන්පසු හමුදා භටයෝ කිසි භයක් නැතුව නගරය ඇතුළටම ගොස් එය යටත් කරගත්තෝය. **21** ඔවුහු ඒ නගරයේ සිටි සියලු පුරුෂයන්ටද ස්ත්‍රීන්ටද තරුණ මහලු සියලුදෙනාටද ගොනුන්ටද බැටළුවන්ටද බූරුවන්ටද කඩුවෙන් පහර දී විනාශ කළෝය.[6]

**22** ඒ අතරතුර දේශයේ තොරතුරු බැලීමට ගිය මිනිසුන් දෙදෙනාට යොෂුවා මෙසේ කීවේය. "ඔබට හමු වූ ගණිකාවගේ නිවසට ගොස් ඔබ ඇයට පොරොන්දු වූ ලෙස ඇයවත් ඇගේ ගෙයි වැසියන්වත් පිටතට ගෙනෙන්න."[7] **23** ඒ තරුණයෝ දෙදෙනා රාහබ්ගේ නිවසට ගිය විට ඇය සමඟ ඇගේ පියා සහ මවද ඇගේ සහෝදරයන්ද ඇගේ නෑදෑයන්ද සිටිනවා දුටුවෝය.[8] ඔවුහු ඒ සියලුදෙනාවම ඊශ්‍රායෙල් සෙනඟ කඳවුරු බැඳගෙන සිටි ස්ථානයට ගෙනාවෝය.

**24** ඔවුහු මුළු නගරයටම ගිනි තැබුවෝය.[9] නමුත් ඔවුහු රන්, රිදී, තඹ සහ යකඩවලින් සෑදූ භාණ්ඩ විනාශ නොකර ඒවා යෙහෝවා දෙවිගේ ගෘහයේ තිබෙන භාණ්ඩාගාරයට භාර දුන්නෝය.[10] **25** රාහබ් නමැති ගණිකාවද ඇගේ පියාගේ ගෙයි වැසියන්වද ඒ අවස්ථාවේදී ඇගේ නිවසේ රැස්ව සිටි සියලුදෙනාවද යොෂුවා විනාශ නොකළේය.[11] යොෂුවා යෙරිකෝවට යැවූ ඔත්තුකරුවන්ව රාහබ් ආරක්ෂා කළ නිසා[1] ඇය මේ දක්වාම ඊශ්‍රායෙල් සෙනඟ සමඟ ජීවත් වන්නීය.[2]

**26** පසුව යොෂුවා මේ ශාපය ප්‍රකාශ කළේය. "මේ යෙරිකෝ නගරය නැවත ගොඩනඟන්න උත්සාහ කරන ඕනෑම කෙනෙකු පිට යෙහෝවා දෙවිගේ ශාපය පැමිණේවා! යමෙක් එහි අත්තිවාරම දැමුවොත් ඔහුගේ කුලුඳුල් දරුවාගේ ජීවිතය නැති වෙයි. යමෙක් නුවර දොරටු සෑදුවොත් ඔහුගේ බාල දරුවාගේ ජීවිතය නැති වෙයි."[3]

**27** යෙහෝවා දෙවි සැමවිටම යොෂුවා සමඟ සිටියේය.[4] ඔහුගේ කීර්තිය ලොව පතළ විය.[5]

**7** යූදා ගෝත්‍රයට අයත් ආකාන්*[6] නම් තැනැත්තා දෙවි විනාශ කිරීමට නියම කළ දේවලින් සමහරක් සොරකම් කළේය.[7] ආකාන්, සේරාගේ පුත්‍රයා වූ සබ්දීගේ පුත් කාමීගේ පුත්‍රයා විය. ආකාන්ගේ අවකල් ක්‍රියාව නිසා යෙහෝවා දෙවි ඊශ්‍රායෙල්වරුන් සමඟ බොහෝ සෙයින් උදහස් විය.[8] මන්ද ඔවුහු දෙවි දුන් ආඥාවක් කඩ කරමින් දෙවිට අවිශ්වාසවන්ත වූහ.

**2** යෙරිකෝව අල්ලාගත් පසු යොෂුවා එතැන සිට බෙතෙල් නගරයට[9] නැඟෙනහිරෙන් පිහිටි බෙත්-ආවෙන්[10] නගරය අසල තිබෙන ආයි නගරයට[11] කිහිපදෙනෙකුව යැව්වේය. ඔවුන්ව පිටත් කර යැවීමට පෙර යොෂුවා මෙසේ කීවේය. "රහසින් ගොස් ඒ නගරය ගැන තොරතුරු සොයාගෙන එන්න." එවිට ඔවුහු ආයි නගරයට ගොස් තොරතුරු සොයා බැලුවෝය.[12] **3** ඉන්පසු ඔවුහු යොෂුවා වෙතට පැමිණ මෙසේ දැන්වූවෝය. "ඒ නගරයේ ඉන්නේ ටිකදෙනයි. ඒ නිසා ලොකු හමුදාවක් එතැනට යන්න අවශ්‍ය

**6 පරි.**
**1** යොෂු 7:25; 1ලේක 2:7
**2** ගණන් 31:22
**3** යොෂු 6:24; 2සාමු 8:11; 1රාජා 7:51; 1ලේක 18:11
**4** යොෂු 6:4; යොෂු 6:16
**5** යොෂු 6:5; හෙබ්‍රෙ 11:30
**6** ලෙවී 27:29; ද්වි 7:2; ද්වි 20:16; 1සාමු 15:3
**7** යොෂු 2:14; හෙබ්‍රෙ 11:31
**8** යොෂු 2:13; යොෂු 2:18
**9** ද්වි 13:16
**10** යොෂු 6:19
**11** යොෂු 2:14; යොෂු 6:17; යොෂු 6:22

**2 තීරුව**
**1** හෙබ්‍රෙ 6:10; යාකො 2:25
**2** මතෙ 1:5
**3** 1රාජා 16:34
**4** ද්වි 31:6; යොෂු 1:5; රෝම 8:31
**5** යොෂු 9:1; යොෂු 9:9

**7 පරි.**
**6** යොෂු 22:20; 1ලේක 2:7
**7** ද්වි 7:26; යොෂු 6:17
**8** යොෂු 6:18
**9** උත් 28:19
**10** යොෂු 18:12
**11** උත් 12:8; යොෂු 12:9
**12** යොෂු 2:1

යොෂු **7:1*** තේරුම, "ශාප නැත්නම් විපත්ති ගෙනෙන තැනැත්තා." 1ලේක 2:7හි සඳහන් වන, "ආකාර්" යන නමට සමානය.

නැහැ. මිනිස්සු තුන්දහසක් විතර
ගියොත් ඇති. මුළු හමුදාවම එහි
යවා සියලුදෙනාවම මහන්සි කර-
වන්න අවශ්‍ය නැහැ.”
**4** එහෙයින් තුන්දහස්දෙනෙකු-
ගෙන් පමණ සමන්විත හමුදා-
වක් ආයි නගරය අල්ලාගැනීමට
ගියෝය. නමුත් ආයි නගරයේ වැසි-
යෝ ඔවුන් පසුපස පන්නාගෙන
ආවෝය.[1] **5** ඔවුහු ඊශ්‍රායෙල්වරුන්
තිස්හයදෙනෙකුව පමණ මරා දැමූහ.
ඔවුහු ඉතුරු අයව නුවර දොරටු-
වේ සිට කඳු බෑවුම දිගේ ලුහුබැඳ-
ගෙන ආවෝය.[2] ෂෙබාරීම්* දක්වාම
ඔවුන් පසුපස ලුහුබැඳ ඇවිත් ඔවුන්ට
පහර දුන්නෝය. එහෙයින් ඊශ්‍රායෙල්-
වරු හොඳටම භය වී අධෛර්යයට
පත් වූහ.[3]
**6** එය ඇසූ යොෂුවා තම වස්ත්‍ර
ඉරාගෙන ඊශ්‍රායෙල්හි වැඩිමහල්ලන්
සමඟ යෙහෝවා දෙවිගේ ගිවිසුම්
පෙට්ටිය ඉදිරියේ හවස් වන තුරුම
මුණින් අතට බිම වැටී සිටියේය.[4]
ඔවුහු තම හිස් මත දූවිලි දමාගත්-
තෝය.[5] **7** යොෂුවා මෙසේ කීවේය.
“විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවියනි, ඔබ මේ සෙනඟව
යොර්දාන් ගඟ හරහා ගෙනැවිත්
මෙපමණ දුරක් එන්න සැලැස්සුවේ
අමෝරිවරුන් අතින් මැරුම් කන්-
නද? අපි යොර්දාන් ගඟෙන් එගොඩ
නොවී එහිම සිටියා නම් මීට වඩා
හොඳයි.[6] **8** අනේ, යෙහෝවා දෙවි-
යනි, මම මෙහෙම කතා කරන-
වාට සමාවෙන්න. ඊශ්‍රායෙල්වරුන්
ඔවුන්ගේ සතුරන් ඉදිරියෙන් පලා
යද්දී මම මේ විදිහට කතා නොකර
වෙන කුමක් කරන්නද? **9** කානා-
නිවරුන්ටත් මේ දේශයේ සිටින
අනිකුත් සියලු වැසියන්ටත් මේ
ගැන අහන්න ලැබුණාම ඔවුන් අපිව
වටලා, අපිව නැත්තටම නැති කර
දමයි. අපේ ජාතියේ නාමය මේ පො-
ළොවෙන් තුරන් වෙලා යයි.[7] එහෙම-
වුණොත් ඔබේ ශ්‍රේෂ්ඨ නාමයට ඉන්
සිදු වන අගෞරවය මොන තරම්ද!”[1]
**10** එවිට යෙහෝවා දෙවි යොෂු-
වාට මෙසේ කීවේය. “ඔබ මෙලෙස
බිම වැතිර සිටින්නේ ඇයි? දැන්
නැඟිටින්න! **11** ඊශ්‍රායෙල් සෙනඟ
මා ඉදිරියේ පාපයක් කළෝය. ඔවුහු
මාගේ අණට අකීකරු වී මාගේ
ගිවිසුම කඩ කළෝය.[2] මා විනාශ
කිරීමට නියම කළ[3] දේවල්ව-
ලින් සමහරක් ඔවුහු සොරකම් කර[4]
ඒවා ඔවුන්ගේ බඩු අතරේ[5] සඟවා-
ගෙන සිටිති.[6] **12** ඒ නිසා දැන්
මා ඊශ්‍රායෙල් සෙනඟවත් විනාශ-
යට නියම කර තිබේ. ඊශ්‍රායෙල්ව-
රුන්ට ඔවුන්ගේ සතුරන්ට විරුද්ධව
නැඟී සිටින්න ලැබෙන්නේ නැත.[7]
ඔවුන්ට සිදු වන්නේ සතුරන් වෙ-
තින් පලා දුවන්නයි. විනාශ
කිරීමට නියම කළ දේ ඔබ අතරෙන්
ඉවත් කළේ නැත්නම් මාගේ උප-
කාරය නැවත ඔබට නොලැබේ.[8]
**13** එහෙයින් දැන් නැඟිට, සෙ-
නඟව පවිත්‍ර තත්වයකට ගෙනෙන
පිණිස ඔවුන්ව සූදානම් කරන්න.[9]
ඔබ ඔවුන්ට මෙසේ පවසන්න. ‘හෙට
දෙවි ඉදිරියේ ඔබ පවිත්‍රව සිටිය
යුතුයි. මන්ද ඊශ්‍රායෙල්හි දෙවි වන
යෙහෝවා මෙසේ පැවසුවා. “ඊශ්‍රා-
යෙල්වරුනි, මා විනාශ කිරීමට නියම
කළ දේ තවමත් ඔබේ කඳවුරේ
තිබේ.[10] ඔබ ඒ දේ විනාශ කළේ
නැත්නම් ඔබට නැවතත් ඔබේ සතු-
රන්ට විරුද්ධව නැඟී සිටීමට නොලැ-
බෙන්නේය. **14** හෙට උදෑසන මුළු
ඊශ්‍රායෙල් සෙනඟ ගෝත්‍රවලට අනුව
රැස් විය යුතුයි. එවිට යෙහෝවා දෙවි
වන මම ඒ ගෝත්‍ර අතරින් එක
ගෝත්‍රයක් වෙන් කරන්නෙමි.[11] ඒ
ගෝත්‍රයට අයිති සෙනඟ තමන්-
ගේ පෙළපත්වලට අනුව බෙදී ඉදිරි-
යට පැමිණිය යුතුයි. යෙහෝවා දෙවි
වන මම ඒ පෙළපත් අතරින් එක
පෙළපතක් වෙන් කරන්නෙමි. ඒ
පෙළපතට අයිති අය පවුල් වශ-
යෙන් බෙදී ඉදිරියට පැමිණිය යුතුයි.

**7 පරි.**
1 ලෙවී 26:17, ද්වි 28:25, ද්වි 32:30, යෙසා 30:17, යෙසා 59:2
2 ද්වි 28:45
3 ලෙවී 26:36, යෙසා 13:7
4 ගණන් 16:22, ගණන් 20:6
5 නෙහෙ 9:1, යෝබ් 2:12
6 යොෂු 3:1
7 ගීතා 83:4

**2 තීරුව**
1 නික් 32:12, ද්වි 32:27, ගීතා 106:8, ගීතා 143:11, එස 20:9
2 නික් 24:7, 1සාමු 2:25
3 යොෂු 6:17
4 නික් 20:15, යෙසා 61:8, මතෙ 15:19
5 යොෂු 7:21
6 යෙරෙ 32:19, හෙබ්‍රෙ 4:13
7 විනි 2:14
8 ද්වි 7:26, යොෂු 6:18
9 නික් 19:10
10 යොෂු 6:18
11 හිතෝ 16:33

---

**යොෂු 7:5*** තේරුම, “පතල.”

යෙහෝවා දෙවි වෙන් කරන පවුලේ
එක් එක් සාමාජිකයා ඉදිරියට පැමි-
ණිය යුතුයි. **15** එවිට විනාශයට
නියම කළ දේවල් සොරකම් කළ
තැනැත්තා කවුද කියා ඔබට හඳු-
නාගැනීමට හැකි වන්නේය. ඔහු
යෙහෝවා දෙවි වන මාගේ අණට
අකීකරු වී[1] මාගේ ගිවිසුම කඩ කර
මුළු ඊශ්‍රායෙල් ජාතියටම මහත් නින්-
දාවක් ගෙනා නිසා[2] ඔබ ඔහුවත් ඔහු-
ගේ පවුලේ සියලුදෙනාවත් මරා ඔහුට
අයිති සියල්ල සමඟ ඔවුන්ව ගින්-
නෙන් දවා දැමිය යුතුයි." ' "[3]

**16** යොෂුවා පසුවදා උදෑසනින්ම
අවදි වී මුළු ඊශ්‍රායෙල් සෙනඟව ගෝ-
ත්‍රවලට අනුව රැස් කළේය. එවිට
රැස් වූ ගෝත්‍ර අතරින් යූදා ගෝ-
ත්‍රය වෙන් කරනු ලැබීය. **17** ඉන්-
පසු තම තමන්ගේ පෙළපතට අනුව
බෙදී ඉදිරියට එන්න කියා යොෂුවා
යූදා ගෝත්‍රයේ අයට කීවේය. ඔවුන්
අතරින් සේරාගේ පෙළපතට[4] අයිති
අයව වෙන් කරනු ලැබීය. ඉන්පසු
ඔහු ඒ පෙළපතට අයිති සියලු පවුල්
මූලිකයන්ව වෙන වෙනම කැඳෙව්-
වේය. ඔවුන් අතරින් සබ්දීව කැඳෙව්-
වේය. **18** ඉන්පසු යොෂුවා සබ්දීගේ
පවුලේ සියලු සාමාජිකයන්ට ඉදිරියට
එන්න කියා කීවේය. ඔවුන් අතරින්
කාමීගේ පුත්‍රයා වන ආකාන්ව තෝ-
රාගනු ලැබීය.[5] කාමී යූදා ගෝත්‍රයට
අයිති සේරාගේ පුත් සබ්දීගේ පුත්‍රයා
විය. **19** එවිට යොෂුවා ආකාන්ට
මෙසේ කීවේය. "මගේ පුත්‍රය, ඊශ්‍රා-
යෙල්හි දෙවි වන යෙහෝවාට නිසි
ගෞරවය දී[6] ඔබේ වරද පිළිගන්න.[7]
ඔබ කළ සියල්ල දැන් මට කියන්න.[8]
කිසිවක් මගෙන් සඟවන්න එපා."[9]

**20** එවිට ආකාන් යොෂුවාට
මෙසේ පිළිතුරු දුන්නේය. "මම ඊශ්‍රා-
යෙල්හි දෙවි වන යෙහෝවාට විරුද්-
ධව පව් කළා.[10] කළ හැම දෙයක්ම
මම ඔබට කියන්නම්. **21** අපි
යටත් කරගත්ත දේශයේ තිබූ වටිනා
දේවල් එකතු කරගනිද්දී ෂිනාර් දේශ-
යේ[11] සෑදූ වටිනා, ලස්සන ඇඳුමක්ද
රිදී ෂෙකෙල්* දෙසීයක්ද ෂෙකෙල්
පනහක් බර රත්තරන් පොල්ලක්ද
තිබුණා. මට ඒවා දැක්කාම[1] ආස
හිතුණා.[2] ඒ නිසා මම ඒවා අරගෙන[3]
මගේ කූඩාරම ඇතුළේ වළක් හාරා
සඟවා තැබුවා. බඩුවලට යටින් මම
මුදල් සැඟෙව්වා."[4]

**22** යොෂුවා එය ඇසූ වහාම
ආකාන්ගේ කූඩාරම පරීක්ෂා කර
බැලීමට කිහිපදෙනෙකුව යැව්වේය.
ඔවුන් කූඩාරමට දුව ගොස් බැලූ විට
මුදල් සමඟ සඟවා තිබුණු සියල්ල
ඔවුන්ට සම්බ විය. **23** ඔවුහු ඒ බඩු
එතැනින් ගෙන යොෂුවා සහ සියලු
ඊශ්‍රායෙල්වරුන්ට පෙනෙන සේ යෙ-
හෝවා දෙවි ඉදිරියේ තැබුවෝය.
**24** එවිට යොෂුවා සහ මුළු ඊශ්‍රායෙල්
සෙනඟ, සේරාගේ පුත් ආකාන්වද[5]
ඔහු සඟවාගත් රිදීද ඇඳුමද රත්ත-
රන් පොල්ලද[6] ඔහුගේ දූදරුවන්-
වද ඔහුගේ ගොනුන්වද බූරුවන්වද
බැටළුවන්වද කූඩාරමද ඔහුට අයිති
සියල්ලද ආකෝර් තැනිතලාවට[7]
ගෙන ගියෝය. **25** ඉන්පසු යො-
ෂුවා මෙසේ කීවේය. "අප සියලුදෙනා
පිටට ඔබ ශාපයක් ගෙනා නිසා[8] යෙ-
හෝවා දෙවි අද ඔබව ප්‍රතික්ෂේප
කළා." එවිට මුළු ඊශ්‍රායෙල් සෙනඟ
ඔවුන්ට ගල් ගසා ඔවුන්ව මරා,[9] ගින්-
නෙන් දවා දැමුවෝය.[10] **26** ඉන්පසු
ඔවුහු ආකාන්ගේ මළ සිරුරට උඩින්
ගල් ගොඩගැසුවෝය. එය අද දක්-
වාම පවතියි.[11] මෙය සිදු වූ පසු යෙ-
හෝවා දෙවිගේ කෝපය පහ විය.[12]
අද දක්වාම ඒ ස්ථානය ආකෝර්*
තැනිතලාව[13] ලෙස හඳුන්වන්නේ එම
සිද්ධිය නිසාය.

**8** ඉන්පසු යෙහෝවා දෙවි යො-
ෂුවාට මෙසේ කීවේය. "දැන්
සතුරන්ට භය නොවන්න. එඩිතරව
සිටින්න.[14] මුළු හමුදාව සමඟ නැවත
ආයි නගරයට යන්න. මම ආයි නග-
රයේ රජුත් ඔහුගේ සෙනඟත් ඔහුගේ

**7 පරි.**
1 නික් 24:7; යොෂු 7:11; විනි 2:20
2 විනි 20:6; 2සාමු 13:12
3 යොෂු 1:18; යොෂු 7:25
4 උත් 38:30; ගණන් 26:20; 1ලේක 2:4
5 1සාමු 14:42; හිතෝ 13:21; හිතෝ 16:33; යෙරෙ 2:26; යෝනා 1:7; ක්‍රියා 5:3
6 2ලේක 19:6; යෙරෙ 13:16
7 ගීතා 32:5; ගීතා 51:4; 1තිමෝ 5:24
8 1සාමු 14:43; හිතෝ 28:13
9 යෝබ 31:33
10 1සාමු 2:25
11 උත් 10:10

**2 තීරුව**
1 1යොහ 2:16
2 නික් 20:17; ලූක් 12:15; 2පේත 2:14
3 මීකා 2:2; යාකො 1:15
4 ගීතා 10:11; යෙසා 29:15
5 යොෂු 7:1; යොෂු 22:20
6 යොෂු 6:19
7 යොෂු 15:7; යෙසා 65:10; හොෂෙ 2:15
8 යොෂු 6:18; 1ලේක 2:7
9 ලෙවී 24:14; යොෂු 1:18
10 උත් 38:24; ලෙවී 20:14; ලෙවී 21:9; යොෂු 7:15
11 යොෂු 8:29; යොෂු 10:27; 2සාමු 18:17
12 ද්වි 13:17
13 යොෂු 15:7; යෙසා 65:10; හොෂෙ 2:15

**8 පරි.**
14 ද්වි 1:21; ද්වි 7:18; ද්වි 31:8; යොෂු 1:9; ගීතා 27:1; යෙසා 12:2; රෝම 8:31

යොෂු **7:21*** ෂෙකෙලයක් යනු ග්‍රෑම් 11.4කි.
**26*** තේරුම, "ශාපය නැත්නම් විපත."

මුළු රාජධානියත් ඔබේ අතට පත්
කරන්නෙමි.[1] **2** ඔබ යෙරිකෝවට
හා එහි රජුට කළ දේම ආයි නගරය-
ටත් එහි රජුටත් කළ යුතුයි.[2] නමුත්
ආයි නගරයේ වස්තු සම්භාරය සහ
එහි සතුන්ව ඔබට ගන්න පුළුවන්.[3] ඒ
නගරයට පහර දීම සඳහා නගරයේ
පිටුපසට ගොස් සැඟවී බලා සිටින්න
කියා ඔබේ හමුදාවේ හටයන් කිහිප-
දෙනෙකුට අණ කරන්න.”[4]

**3** යොෂුවාද මුළු යුධ හමුදාවද[5]
ආයි නගරයට යෑමට සූදානම් වූහ.
යොෂුවා ඔවුන් අතරින් යුද්ධයට
දක්ෂ බලවත් පුරුෂයන් තිස්දහ-
සක් තෝරාගෙන[6] ඔවුන්ව රාත්‍රියේදී
පිටත් කර යැව්වේය. **4** ඔවුන්ව
පිටත් කර යැවීමට පෙර යො-
ෂුවා ඔවුන්ට මෙසේ කීවේය. “ඔබ
නගරයට පහර දීම සඳහා නගර-
යේ පිටුපස සැඟවී සිටින්න.[7] වැඩි
දුරක් නොයා නගරයට කිට්ටුවෙන්ම
සිටින්න. නගරයට පහර දීම සඳහා
ඔබ සියලුදෙනා සූදානමින් සිටින්න.
**5** මාත් මා සමඟ සිටින අනික්
හැමෝමත් නගරය ළඟටම යනවා.
ආයි නගරයේ වැසියන් කලින් වතා-
වේදී වගේ අපට විරුද්ධව සටන්
කරන්න පැමිණෙයි.[8] එවිට අපි ඔවුන්
ඉදිරියෙන් පලා යනවා. **6** නග-
රයේ ඉඳන් සෑහෙන දුරක් අපව
එළවාගෙන එන්න ඔවුන්ට ඉඩහ-
රින්න. ඊශ්‍රායෙල්වරුන් කලින් වතා-
වේදී වගේ මේ වතාවේදීත් අපට බයේ
දුවනවා කියා සිතමින් ඔවුන් අපි
පසුපස ලුහුබැඳ එයි.[9] අපි පලා
යන අතරතුර **7** ඔබ සැඟවී සිටින
තැන්වලින් එළියට ඇවිත් නගරය
අල්ලාගන්න. ඔබේ දෙවි වන යෙ-
හෝවා අනිවාර්යයෙන්ම ඒ නගරය
ඔබේ අතට භාර දෙයි.[10] **8** ඔබ ඒ
නගරය යටත් කරගත් විගස ඊට
ගිනි තැබිය යුතුයි.[11] යෙහෝවා දෙවි
ඔබට පැවසූ ලෙසම ඔබ ඒ සියල්ල
කළ යුතුයි.”[12]

**9** ඉන්පසු යොෂුවා ඔවුන්ව පිටත්
කර යැව්වේය. ඔවුහු යොෂුවා පැවසූ
ලෙස ආයි නගරයට බස්නාහිරෙන්
සැඟවී සිටියෝය. ඔවුන් සැඟවී සිටි-
යේ බෙතෙල් නගරයත් ආයි නගර-
යත් අතරේය. නමුත් ඒ රාත්‍රියේදී
යොෂුවා සිටියේ හමුදාවේ ඉතුරු අය
සමඟයි.

**10** යොෂුවා පසුවදා උදැසනින්ම
අවදි වී[1] හමුදාව හොඳින් සූදා-
නම් කරගෙන ආයි නගරය වෙ-
තට ගියේය. යොෂුවා හා ඊශ්‍රායෙල්හි
වැඩිමහල්ලෝ හමුදාවට පෙරටුවෙන්
ගමන් කළෝය. **11** හමුදාව[2] ආයි
නගරය දෙසට ගමන් කර ඊට උතු-
රෙන් කඳවුරු බැඳගත්තෝය. ඔවුන්
කඳවුරු බැඳගත් ස්ථානය හා ආයි
නගරය අතර තැනිතලාවක් තිබු-
ණේය. **12** ආයි නගරයට බස්නාහි-
රෙන්, බෙතෙල් නගරය[3] සහ ආයි
නගරය අතර සැඟවී සිටින ලෙස[4]
යොෂුවා හමුදාවෙන් පන්දහසකට
නියම කර තිබිණ. **13** හමුදාවේ
ප්‍රධාන හට පිරිස නගරයට උතුරෙන්[5]
කඳවුරු බැඳගෙන සිටි අතර අනික්
අය නගරයට බස්නාහිරෙන්[6] සැඟවී
සිටියෝය. යොෂුවා එදින රාත්‍රියේ
තැනිතලාවට ගොස් එහි සිටියේය.

**14** ඊශ්‍රායෙල්වරුන් තමන්ට
විරුද්ධව සටනට ඇවිත් සිටින බව
ආයි නගරයේ රජුට ආරංචි විය. එහෙ-
යින් ඔහු උදේ පාන්දරින්ම තම හමු-
දාව රැස් කරගෙන ඊශ්‍රායෙල්වරුන්ට
විරුද්ධව සටන් කරන පිණිස පිටත්
විය. ඔවුහු සටනට නියම කර තිබූ
වේලාවේදී තැනිතලාව ඉදිරියේ රැස්
වූහ. නමුත් ඊශ්‍රායෙල් හමුදාවේ තවත්
හට පිරිසක් නගරයට පිටුපසින්
සැඟවී සිටින බව රජ දැන සිටියේ
නැත.[7] **15** පැරදුණු බව මවාපා-
මින්[8] යොෂුවා හා ඊශ්‍රායෙල් හමු-
දාව පාළුකරය හරහා පලා යන්න
පටන්ගත්තෝය.[9] **16** ඒ අවස්ථා-
වේදී ඊශ්‍රායෙල්වරුන්ව ලුහුබැඳ ගොස්
අල්ලාගන්නා ලෙස ආයි නගරයේ
සියලුම හටයන්ට අණ දෙන ලදි.
නගරයෙන් බොහෝ ඈතට යන
තෙක්ම ඔවුහු යොෂුවාගේ හමුදාව

**8 පරි.**
1 යොෂු 2:24, ගීතා 44:3, ක්‍රියා 7:45
2 යොෂු 6:21
3 යෝබ් 27:17, හිතෝ 13:22, දේශ 2:26
4 හිතෝ 20:18
5 යොෂු 8:11
6 ද්වි 3:18, ද්වි 20:8, හෙබ්‍රෙ 11:34
7 විනි 20:29, 2ලේක 13:13
8 යොෂු 7:5
9 නික් 15:9, යොෂු 8:16
10 යොෂු 2:24, හිතෝ 21:31
11 යොෂු 8:19, යොෂු 8:28
12 යොෂු 1:9, යොෂු 1:16

**2 තීරුව**
1 යොෂු 3:1, යොෂු 6:12
2 යොෂු 8:1, යොෂු 8:3
3 උත් 28:19
4 යොෂු 8:2, විනි 20:29
5 යොෂු 8:5
6 යොෂු 8:4
7 විනි 20:34, හිතෝ 14:15
8 විනි 20:36
9 යොෂු 8:6, යොෂු 16:1, යොෂු 18:12

පසුපස ලුහුබැන්දෝය.[1] **17** ආයි
නගරය හා බෙතෙල් නගරය තුළ
එක් හමුදා භටයෙක්වත් ඉතුරු වූයේ
නැත. මන්ද ඒ සියලුදෙනාම ඊශ්‍රා-
යෙල්වරුන් පසුපස ලුහුබැඳ ගිය නිසා
නගරය ආරක්ෂා කිරීමට කිසිවෙකු
නොසිටියේය.

**18** එවිට යෙහෝවා දෙවි යොෂු-
වාට මෙසේ කීවේය. “ඔබේ අතේ
තිබෙන හෙල්ලය ආයි නගරය දෙසට
දිගු කරන්න.[2] මම දැන් ඒ නගරය
ඔබේ අතට යටත් කර දෙන්නෙමි.”[3]
එවිට යොෂුවා තමාගේ අතේ තිබුණු
හෙල්ලය ආයි නගරය දෙසට දිගු
කළේය. **19** ඔහු එසේ කළ විගස
නගරයට පිටුපසින් සැඟවී සිටි භට
පිරිස නගරයට ඇතුල් වී එය යටත්
කරගත්තෝය.[4] ඉන්පසු ඔවුහු නගර-
යට ගිනි තැබුවෝය.[5]

**20** ඊශ්‍රායෙල්වරුන් පසුපස එළවා-
ගෙන ගිය ආයි නගරයේ භට පිරිස
පිටුපස හැරී බැලූ විට තම නගරයෙන්
දුමක් නඟිනවා දුටුවෝය. ඊශ්‍රායෙල්-
වරුන්ගෙන් බේරීම සඳහා කොයි
අතටවත් පලා දිවීමට ඔවුන්ට නො-
හැකි විය. මන්ද පාළුකරය හරහා
පලා ගිය ඊශ්‍රායෙල්වරුද නැවත හැරී
ඔවුන් පසුපස ලුහුබැඳ ආවෝය.
**21** ආයි නගරය අල්ලාගෙන[6] ඊට
ගිනි තබා ඇති බව දුටු යොෂුවා සහ
ඔහුගේ හමුදාව තම සතුරන්ට පහර
දීමට පටන්ගත්තෝය. **22** නගර-
යට ගිනි තැබූ හමුදාවද යොෂුවාගේ
උපකාරයට ඇවිත් සතුරු සේනාවට
පහර දුන්නෝය. මෙසේ ආයි නගර-
යේ පුරුෂයන් දෙපැත්තෙන්ම කොටු
වූ අතර ඊශ්‍රායෙල්වරු ඔවුන් සියලු-
දෙනාවම මරා දැමූහ. ඔවුන්ගෙන්
එක් කෙනෙකුටවත් බේරී යෑමට
නොහැකි විය.[7] **23** නමුත් ඊශ්‍රා-
යෙල්වරු ආයි නගරයේ රජුව[8] නො-
මරා යොෂුවා ළඟට ගෙනාවෝය.

**24** තමන් පසුපස ලුහුබැඳ පැමිණි
ආයි නගරයේ සියලු පුරුෂයන්ව ඊශ්‍රා-
යෙල්වරු පාළුකරයේදීම මරා දැමූහ.
ඉන්පසු මුළු ඊශ්‍රායෙල් හමුදාව ආයි
නගරයට පැමිණ එහි සියලු වැසියන්-
ටද පහර දුන්නෝය. **25** එදින ආයි
නගරයේ සියලුම වැසියෝ මැරුම්
කෑවෝය. මැරුම් කෑ ස්ත්‍රීන් හා පුරු-
ෂයන්ගේ මුළු ගණන දොළොස්දහ-
සක් විය. **26** ආයි නගරයේ සෑම
වැසියෙකුවම මරණයට පත් කරන
තුරු[1] යොෂුවා තමා ඔසවාගෙන සිටි
හෙල්ලය පහතට දැමුවේ නැත.[2]
**27** යෙහෝවා දෙවි යොෂුවාට අණ
කළ ලෙස ඊශ්‍රායෙල්වරු ආයි නගර-
යේ වස්තු සම්භාරය හා එහි සතුන්ව
පමණක් ගත්තෝය.[3]

**28** ඉන්පසු යොෂුවා ආයි නගරය
සදහටම නටබුන් ගොඩක් වන සේ
එය ගිනිබත් කළේය.[4] එය අද දක්-
වාම පාළුවට ගොස් තිබේ. **29** යො-
ෂුවා, ආයි නගරයේ රජුව[5] මරා, හවස්
වන තුරු කණුවක එල්ලා තැබුවේය.[6]
හිරු බැස යන වේලාවේදී යොෂුවාගේ
අණ පරිදි මළ සිරුර පහතට ගෙන[7]
නගරයේ දොරටුව අසලට වීසි කරනු
ලැබීය. ඉන්පසු ඊට උඩින් ගල් ගො-
ඩගසනු ලැබීය. ඒ ගල් ගොඩ අද දක්-
වාම පවතියි.

**30** මේ සියල්ලෙන් පසු යොෂුවා
ඒබාල් කන්ද[8] මත ඊශ්‍රායෙල්වරුන්ගේ
දෙවි වන යෙහෝවාට පූජාසනයක්[9]
ගොඩනැඟුවේය. **31** යෙහෝවා දෙ-
විගේ සේවකයෙකු වූ මෝසෙස් මාර්-
ගයෙන් දුන් නීතියේ සඳහන්
ආකාරයට[10] ඔහු පූජාසනය ගොඩ-
නැඟුවේය. එහි සඳහන් වූයේ, “නො-
කැපූ ගල්වලින් පූජාසනය සෑදිය
යුතුයි”[11] කියාය. එම පූජාසනය මත
ඊශ්‍රායෙල්වරු යෙහෝවා දෙවිට දවන
පූජා සහ හවුල් පූජා ඔප්පු කළෝය.[12]

**32** මෝසෙස්, ඊශ්‍රායෙල් සෙනඟ
සමඟ සිටියදී ලියා තිබූ නීතිය[13]
යොෂුවා එහිදී ගල් මත පිටපත්
කළේය.[14] **33** ඉන්පසු විදේශිකයන්-
ගෙන් හා ඊශ්‍රායෙල්වරුන්ගෙන්[15] දෙ-
කෙන් කොටසක් ගෙරිසීම් කන්ද
පාමුලත්[16] දෙකෙන් කොටසක් ඒබාල්
කන්ද පාමුලත්[17] සිටගෙන සිටි-
යෝය. යෙහෝවා දෙවිගේ ගිවිසුම්

**8 පරි.**
1 නික් 15:9, විනි 20:31, ගීතා 9:16
2 නික් 17:11, යොෂු 8:7, යොෂු 8:26
3 ද්වි 7:24, යොෂු 1:5
4 යොෂු 8:7
5 යොෂු 8:8, යොෂු 8:28
6 යොෂු 8:2, විනි 20:29
7 ලෙවී 27:29, ද්වි 7:2
8 යොෂු 8:29, යොෂු 12:9

**2 තීරුව**
1 ලෙවී 27:29
2 නික් 17:11, යොෂු 8:18
3 ගණන් 31:26, යොෂු 8:2, යෝබ් 27:17, හිතෝ 13:22, දේශ 2:26
4 යොෂු 8:8
5 යොෂු 12:9
6 ද්වි 21:22
7 ද්වි 21:23, යොෂු 10:27
8 ද්වි 11:29, ද්වි 27:5
9 නික් 20:24
10 ද්වි 31:9, යොෂු 1:8, 2ලේක 34:14, දානි 9:13, මලා 4:4
11 නික් 20:25, ද්වි 27:6
12 නික් 20:24, ද්වි 27:7
13 නික් 24:4, නික් 34:27
14 ද්වි 27:3, ද්වි 27:8, 2කොරි 3:3
15 ලෙවී 24:22, ගණන් 15:16
16 ද්වි 27:12
17 ද්වි 27:13

පෙට්ටිය ඔසවාගෙන සිටි[1] ලෙවී ගෝ-
ත්‍රයට අයත් පූජකයෝ[2] ඒ කණ්-
ඩායම් දෙකට මැද්දෙන් සිටගෙන
සිටියෝය. මුළු ඊශ්‍රායෙල් සෙනඟද
ඔවුන්ගේ වැඩිමහල්ලන්ද[3] ඔවුන්ගේ
නායකයන්ද විනිශ්චයකරුවන්ද ඒ
පූජකයන්ට මුහුණ ලා සිටගෙන සිටි-
යෝය. ඒ සියල්ල සිදු කෙරුණේ
යෙහෝවා දෙවිගේ සේවකයෙකු වූ
මෝසෙස් කලින් දුන් උපදෙස්වලට
අනුවය.[4] මුලින්ම රැස්ව සිටි ඊශ්‍රායෙල්
සෙනඟට ආශීර්වාද කරනු ලැබීය.[5]
**34** ඉන්පසු යොෂුවා නීතිය පිළිපැදී-
මෙන් අත් වන ආශීර්වාදත්[6] නීතිය
කඩ කිරීමෙන් අත් වන ශාපත්[7]
ඇතුළුව නීතියේ සඳහන් සියල්ලම
ඔවුන්ට ඇසෙන සේ කියෙව්වේය.[8]
**35** මෙසේ මෝසෙස් මාර්ගයෙන් දුන්
නීතියේ සඳහන් සියල්ල යොෂුවා
අකුරක් නැර ශබ්ද නඟා කියෙව්-
වේය.[9] ස්ත්‍රීන්ද[10] කුඩා දරුවන්ද[11]
ඊශ්‍රායෙල්වරුන් සමඟ ආ විදේශික-
යන්ද[12] ඇතුළු රැස්ව සිටි සියලුදෙනා
ඉදිරියේ ඔහු එම වචන කියෙව්වේය.

**9** ඊශ්‍රායෙල්වරුන් කළ දේ යොර්-
දාන් ගඟේ බස්නාහිර පැත්-
තේ තිබූ කඳුකර පළාතේද
පහත් බිම්වලද* මහ මුහුද[13] අස-
බඩද ලෙබනොන්[14] දක්වා විහිදී
ගිය ප්‍රදේශයේද ජීවත් වූ සියලු
රජවරුන්ට[15] ආරංචි විය. හිත්තීව-
රුන්ගේද[16] අමෝරිවරුන්ගේද කානා-
නිවරුන්ගේද[17] පෙරිස්සිවරුන්ගේද[18]
හිවීයවරුන්ගේද යෙබූසිවරුන්ගේද[19]
රජවරුන් වූ ඔවුන්ට ඒ ගැන ආරංචි වූ
විගස **2** ඔවුහු සියලුදෙනාම එකා
මෙන් යොෂුවාට සහ ඊශ්‍රායෙල් සෙ-
නඟට විරුද්ධව සටන් කිරීමට සැරසු-
ණෝය.[20]

**3** යොෂුවා යෙරිකෝවටත්[21] ආයි
නගරයටත්[22] කළ දේ ගැන ගිබි-
යොන් නගරයේ[23] වැසියන්ටද ආරංචි
විය. **4** එහෙයින් ඔවුහු යොෂුවා-
ගෙන් ගැලවෙන පිණිස නැණවත්
ලෙස කටයුතු කළෝය.[1] ඔවුහු පැළී
තිබූ පරණ සම් භාජන සොයා-
ගෙන ඒවායේ පැළුණු තැන්
ගැටගසා සකසාගත්තෝය.[2] පරණ
මලුවලට ආහාර ද්‍රව්‍යද දමාගෙන
ඒ සියල්ල බූරුවන් පිට පටවාගත්-
තෝය. **5** ඉන්පසු ඔවුහු ගෙවී ගිය
පාවහන්ද පරණ වස්ත්‍රද ඇඳගෙන
වේළී ගිය රොටිද තම මලුවලට දමා-
ගත්තෝය. **6** පසුව ඔවුහු ගිල්ගාල්
නගරයේ කඳවුර[3] වෙතට ගොස් යො-
ෂුවාටද ඊශ්‍රායෙල්වරුන්ටද මෙසේ
කීවෝය. “අප මෙහි ආවේ හුඟක් දුර
සිටයි. අපි ඔබ සමඟ ගිවිසුමක්[4]
ඇති කරගන්න කැමතියි.” **7** මෙය
ඇසූ ඊශ්‍රායෙල්හි නායකයෝ හිවී-
යවරුන්ට[5] මෙසේ කීවෝය. “ඔබ
මේ දේශයේ අය නොවෙයි කියා
අපි කොහොමද හරියටම දැනගන්-
නේ? ඔබ මේ අවට පදිංචි වී සිටින
ජාතියක් නම් අපට කොහොමටවත්
ඔබ සමඟ ගිවිසුමක් ඇති කරගන්න
බැහැ.”[6] **8** එවිට ඔවුහු යොෂුවාට
මෙසේ කීවෝය. “අපි ඔබට යටත් වී
සේවය කරන්න කැමතියි.”[7]

යොෂුවා ඔවුන්ගෙන් මෙසේ ඇසු-
වේය. “ඔබේ ජාතිය කුමක්ද? ඔබ
ආවේ කොයි දේශයෙන්ද?” **9** ඔවුහු
යොෂුවාට මෙසේ පිළිතුරු දුන්-
නෝය. “ඔබ නමස්කාර කරන යෙ-
හෝවා දෙවි ගැන හැමෝම අහලා
තියෙනවා.[8] ඔහු කළ දේවල් ගැන
හැම තැනම කතා කරනවා. ඊජිප්තු
දේශයේ ඔහු කළ බලවත් දේවල්
ගැනත් අපිට ආරංචි වුණා.[9] ඒ නිසයි
ඔබේ සේවකයන් වන අපි, ඔබව
හමු වෙන්න මෙපමණ දුරක් ගෙවා-
ගෙන ආවේ.[10] **10** යොර්දාන් ගඟේ
නැඟෙනහිර පැත්තේ සිටි අමෝ-
රිවරුන්ගේ රජවරුන් දෙදෙනා
වූ හෙෂ්බොන්හි රජු වන සීහොන්-
වත්[11] අෂ්ටාරොත් නගරයේ[12] සිටි
බාෂාන්හි රජු වන ඕග්වත්[13] ඔබේ
දෙවි විනාශ කළ හැටින් අපිට දැන-
ගන්න ලැබුණා. **11** ඒ නිසා අපේ
දේශයේ නායකයන් හා වැසියන්

**8 පරි.**
1 ද්වි 31:25
2 ද්වි 31:9
3 ද්වි 29:10
4 ද්වි 11:29
5 හිතෝ 10:6
6 ලෙවී 26:3; ද්වි 28:2
7 ද්වි 27:15; ද්වි 28:15; ද්වි 29:21
8 ද්වි 31:9; නෙහෙ 8:3
9 ද්වි 4:2; ද්වි 12:32
10 ද්වි 31:12; නෙහෙ 8:2
11 ද්වි 29:11
12 ලෙවී 24:22; ගණන් 15:16

**9 පරි.**
13 ගණන් 34:6
14 ද්වි 1:7
15 යොෂු 12:7
16 උත් 15:20
17 නික් 3:17; නික් 23:23
18 ද්වි 7:1
19 නික් 13:5
20 යොෂු 24:11; ගීතා 83:4; ගීතා 83:5
21 යොෂු 6:20
22 යොෂු 8:24
23 යොෂු 10:2; යොෂු 11:19

**2 තීරුව**
1 හිතෝ 14:15; හිතෝ 22:3
2 මතෙ 9:17
3 යොෂු 5:10; යොෂු 10:43
4 ලූක් 14:32
5 උත් 10:17; උත් 34:2; නික් 3:8
6 නික් 23:32; නික් 34:12; ද්වි 7:2; ද්වි 20:16; ද්වි 20:18; විනි 2:2
7 2රාජා 10:5
8 1රාජා 8:41; 2ලේක 6:32; හිතෝ 18:10
9 නික් 9:16; නික් 15:14; යොෂු 2:10
10 ද්වි 20:15
11 ගණන් 21:21; ගණන් 21:24; ද්වි 2:34
12 ද්වි 1:4; යොෂු 12:4
13 ගණන් 21:33; ගණන් 21:35; ද්වි 3:3

යොෂු **9:1*** මූ.අ., “ෂෙෆේලා.”

අපිට මෙහෙම කිව්වා.[1] 'ගමනට
අවශ්‍ය කරන දේවලුත් රැගෙන ඊශ්‍රා-
යෙල් සෙනඟ ඉන්න තැනට ගමන්
කරන්න. ඔබ ඔවුන් ළඟට ගිහින්
මෙහෙම කියන්න. "අපි ඔබ යට-
තේ සේවය කරන්න කැමතියි.[2] අප
සමඟ ගිවිසුමක් ඇති කරගන්න." '[3]
**12** මේ රොටි දිහා බලන්න. අප
මේවා මලුවලට දමාගත්තේ උණු
උණුවෙන්මයි. නමුත් අපි මෙපමණ
දුරක් ගෙවාගෙන ආ නිසා ඒවා දැන්
හොඳටම වේළිලා.[4] **13** අපි වයින්
පුරවාගත්තේ අලුත් සම් භාජනවල-
ටයි. ඒත් දැන් ඒවා පැළිලා ගිහින්.[5]
අපි කොපමණ දුරක් ඇවිදගෙන ආවද
කිව්වොත් අපේ පාවහනුත් ගෙවිලා.
අපේ ඇඳුනුත් දැන් හොඳටම දිරලා
ගිහින්."

**14** මෙය ඇසූ ඊශ්‍රායෙල්වරු ඔවුන්
ළඟ තිබුණු ආහාර පරීක්ෂා කර
බැලූ නමුත් ගත යුතු පියවර ගැන
යෙහෝවා දෙවිගෙන් මඟ පෙන්වීම්
පැතුවේ නැත.[6] **15** පසුව යොෂුවා
ඔවුන්ට විරුද්ධව යුද්ධ නොකරන
බවට පොරොන්දු වී ඔවුන් සමඟ ගිවි-
සුමක් ඇති කරගත්තේය.[7] ඊශ්‍රායෙල්
සෙනඟගේ අධිපතීහුද[8] දිවුරා ඒ ගිවි-
සුමට එකඟව ක්‍රියා කරන බවට පො-
රොන්දු වූහ.[9]

**16** ගිවිසුම ඇති කරගෙන දවස්
තුනක් ගත වූ පසු තමන්ව හමු
වීමට ආ පිරිස ඒ අවටම ජීවත්
වන ජාතියක් බව ඊශ්‍රායෙල්වරුන්ට
දැනගන්න ලැබිණ. **17** එහෙයින්
ඊශ්‍රායෙල්වරු තම කූඩාරම් අකු-
ළාගෙන ගිබියොන්වරුන්ගේ නගර
වන ගිබියොන්,[10] කෙෆීරා,[11] බෙ-
යේරොත්[12] සහ කිර්යත්-යෙයාරීම්[13]
යන නගර වෙතට ගමන් කළෝය.
දවස් තුනකින් ඔවුහු ඒ නගර වෙ-
තට පැමිණියෝය. **18** ඊශ්‍රායෙල්-
වරු ගිබියොන්වරුන්ගේ නගරවලට
පැමිණියත් ඔවුන්ට පහර දුන්නේ
නැත. මන්ද ඊශ්‍රායෙල්වරුන්ගේ අධි-
පතීන් ගිබියොන්වරුන්ට කිසි හානි-
යක් නොකරන බවට තම දෙවි

**9 පරි.**
1 යෝබ් 12:12 යෝබ් 32:7
2 ද්වි 20:11
3 යොෂු 9:6
4 යොෂු 9:5
5 යොෂු 9:4 මාක් 2:22
6 නික් 28:30 ගණන් 27:21 1සාමු 30:7 හිතෝ 3:5 හිතෝ 3:6
7 යොෂු 11:19
8 ගණන් 34:18 2ලේක 5:2
9 2සාමු 21:2
10 යොෂු 10:2 යොෂු 18:25
11 එස්රා 2:25
12 නෙහෙ 7:29
13 යොෂු 15:9 යොෂු 18:14 1සාමු 7:1 1ලේක 13:5

**2 තීරුව**
1 ද්වි 6:13
2 ගණන් 30:2 මතෙ 5:33
3 නික් 22:28 පිලි 2:14
4 ගීතා 15:4 දේශ 5:4 දේශ 5:6
5 2සාමු 21:1 හිතෝ 6:17 හිතෝ 8:13 සෙක 5:4 සෙක 8:17 මලා 3:5
6 යොෂු 9:15
7 ද්වි 29:11
8 යොෂු 9:6
9 යොෂු 9:16
10 උත් 9:25 උත් 9:26
11 1රාජා 9:21
12 ද්වි 29:11 එස්රා 8:17
13 යෝනා 3:9 රෝම 3:29 හෙබ්‍රෙ 11:31
14 නික් 15:15 ද්වි 2:25 ද්වි 11:25 යොෂු 5:1
15 නික් 23:31 ගණන් 33:52 ද්වි 7:1 ද්වි 20:16
16 උත් 16:6 විනි 10:15 2සාමු 24:14 යෙරෙ 26:14

වන යෙහෝවාගේ නාමයෙන්[1] දිවුරා
පොරොන්දු වී තිබිණ.[2] එහෙයින්
ඊශ්‍රායෙල් සෙනඟ තමන්ගේ අධිප-
තීන්ට දොස් නැඟුවෝය.[3] **19** එවිට
ඊශ්‍රායෙල්හි අධිපතීහු සෙනඟට
මෙසේ කීවෝය. "අපි ඔවුන්ට පහර
නොදෙන බවට ඊශ්‍රායෙල්වරුන්ගේ
දෙවි වන යෙහෝවාගේ නාමයෙන්
දිවුරා පොරොන්දු වුණා. ඒ නිසා
ඔවුන්ට විරුද්ධව දැන් අපට කිසි දෙ-
යක් කරන්න බැහැ.[4] **20** අපි ඒ
පොරොන්දුව ඉටු කරන්න ඕනේ. අපි
ඔවුන්ගේ ජීවිතවලට කිසි හානියක්
කරන්නේ නැහැ. අපි එහෙම ඔවුන්ට
හානියක් කළොත් දෙවි අප සමඟ
උදහස් වෙයි."[5] **21** අධිපතීහු තවදු-
රටත් මෙසේ කීවෝය. "අපි පො-
රොන්දු වුණ වගේ[6] ඔවුන්ට ජීවත්
වෙන්න ඉඩහරිමු. නමුත් අපි හැමෝ-
ටම අවශ්‍ය දර එකතු කර දෙන්නත්
වතුර ඇද දෙන්නත් ඔවුන්ට නියම
කරමු."[7]

**22** පසුව යොෂුවා ගිබියොන්ව-
රුන්ව කැඳවා ඔවුන්ගෙන් මෙසේ
ඇසුවේය. "බොහෝ දුර ඉඳන් ආ
බව කියමින් ඔබ අපිව රැවැට්ටුවේ
ඇයි?[8] ඔබ ජීවත් වෙන්නෙත් අප
සිටින ප්‍රදේශයේමයි.[9] **23** ඒ නිසා
අද ඉඳන් ඔබ ශාප ලත් සෙනඟක්.[10]
හැමදාටම ඔබට දාසකම් කරන්න
සිදු වෙයි.[11] මගේ දෙවිගේ ගෘහ-
යට අවශ්‍ය දර එකතු කර දීම
හා වතුර ඇද දීම ඔබට පැවරෙන
වැඩ කොටසයි."[12] **24** එවිට ඔවුහු
යොෂුවාට මෙසේ කීවෝය. "අනේ,
අපි එහෙම කළේ[13] ඔබ අපව මරයි
කියා භය වූ නිසයි.[14] ඔබ නමස්කාර
කරන යෙහෝවා දෙවි දේශයේ සිටින
සියලුදෙනාවම විනාශ කර ඔබට
මුළු දේශයම දෙනවා කියා ඔහු-
ගේ සේවකයා වන මෝසෙස්ට කියූ
බව අපි දැනගෙන සිටියා.[15] **25** අපි
ඔබට යටත් වෙන්න කැමතියි. ඔබට
හොඳයි කියා සිතෙන ඕනෑම දෙ-
යක් අපට කරන්න."[16] **26** යො-
ෂුවා ගිබියොන්වරුන්ව මරා දැමීමට

ඊශ්‍රායෙල්වරුන්ට ඉඩ නොදුන්නේය.[1]
**27** ඒ වෙනුවට ඊශ්‍රායෙල් සෙනඟට
හා යෙහෝවා දෙවිගේ පූජාසනයට
අවශ්‍ය දර එකතු කර දීමටත් වතුර
ඇද දීමටත්[2] ඔහු එදින ඔවුන්ට නියම
කළේය.[3] ඔවුහු අද දක්වාම දෙවි තම
පූජාසනය ඉදි කිරීමට තෝරාගන්නා
සෑම ස්ථානයකදීම[4] එම සේවයේ යෙ-
දෙති.

**10** යොෂුවා, ආයි නගරය[5] අල්-
ලාගෙන එය විනාශ කළ
බව[6] යෙරුසලමේ රජු වූ අදොනි-
ෂෙදෙක්ට ආරංචි විය. යෙරිකෝව-
ටත් එහි රජුටත්[7] කළ දේම[8] යොෂුවා
ආයි නගරයටත් එහි රජුටත්[9] කළ
බවද ගිබියොන් නගරයේ වැසියන්
ඊශ්‍රායෙල්වරුන් සමඟ සාම ගිවිසුමක්
ඇති කරගත් බවද ඔහුට දැනගන්න
ලැබිණ.[10] **2** අදොනි-ෂෙදෙක් එය
අසා හොඳටම භය විය.[11] මන්ද ගිබි-
යොන් ඉතා විශාල නගරයකි. එය
ආයි නුවරටත් වඩා විශාලය.[12] රජෙ-
කුගේ පාලනය යටතේ පැවති නගර
මෙන් එයද ඉතා වැදගත් නග-
රයක් විය. එහි සියලු පුරුෂයෝ
යුද්ධයට දක්ෂ, බලවත් අය වූහ.
**3** එහෙයින් යෙරුසලමේ[13] රජු වූ
අදොනි-ෂෙදෙක්, හෙබ්‍රොන් නගර-
යේ[14] රජු වූ හෝහාම්ටද යාමුත්
නගරයේ[15] රජු වූ පීරාම්ටද ලාකිෂ්
නගරයේ[16] රජු වූ යාෆියාටද එග්-
ලොන් නගරයේ[17] රජු වූ දෙබීර්ටද
මෙම පණිවිඩය යැව්වේය. **4** “ගිබි-
යොන් නගරයට විරුද්ධව යුද්ධයට
යෑම සඳහා මට ඔබේ උපකාරය
ලබා දෙන්න. මන්ද ගිබියොන්වරු,
යොෂුවා හා ඊශ්‍රායෙල්වරුන් සමඟ
සාම ගිවිසුමක් ඇති කරගෙන තිබෙ-
නවා.”[18] **5** එහෙයින් එම අමෝරිව-
රුන්ගේ[19] රජවරු පස්දෙනාම එකතු
වූහ. යෙරුසලමේ රජද හෙබ්‍රොන්හි
රජද යාමුත්හි රජද ලාකිෂ්හි රජද
එග්ලොන්හි රජද තම තමන්ගේ
හමුදා රැස් කරගෙන ගිබියොන් නගර-
යට විරුද්ධව යුද්ධයට සැරසුණෝය.

**6** එය දුටු ගිබියොන්වරු ගිල්-
ගාල්හි කඳවුරු බැඳගෙන සිටි[1]
යොෂුවාට පණිවිඩයක් යවා මෙසේ
දැන්වූහ. “කඳුකරයේ ජීවත් වන
අමෝරිවරුන්ගේ රජවරුන් සියලුදෙ-
නාම අපිට විරුද්ධව යුද්ධ කිරීමට
සැරසී සිටිනවා. ඉක්මනට ඇවිත්
අපව බේරගන්න. මේ වගේ අසරණ වූ
වෙලාවක ඔබේ සේවකයන් වන අපිව
තනි කරන්න එපා.”[2] **7** එහෙයින්
යොෂුවා මුළු හමුදාව සමඟ ගිල්ගාල්
නගරයෙන් පිටත්ව ආවේය.[3] යුද්ධ-
යට දක්ෂ සියලු පුරුෂයෝ[4] ඔහු
සමඟ ගියෝය.

**8** යෙහෝවා දෙවි යොෂුවාට
මෙසේ කීවේය. “ඔවුන්ට බිය නො-
වන්න.[5] මන්ද මම ඔවුන්ව ඔබේ
අතට භාර දෙන්නෙමි.[6] ඔවුන්-
ගෙන් කිසිවෙකුට ඔබට විරුද්ධව
නැඟී සිටිය නොහැක.”[7] **9** යො-
ෂුවා ගිල්ගාල් නගරයේ සිට මුළු
රාත්‍රිය පුරාම ගමන් කර රහ-
සින්ම අමෝරිවරුන් සිටි ස්ථානයට
පැමිණ ඔවුන්ට පහර දීමට පටන්-
ගත්තේය. **10** ඒ අවස්ථාවේදී යෙ-
හෝවා දෙවි අමෝරිවරුන්ව වියවුලට
පත් කළේය.[8] ඊශ්‍රායෙල්වරුද ගිබි-
යොන් නගරය[9] අසල අමෝරිවරුන්
බොහෝදෙනෙකුව මරා දැමූහ. ඔවුහු
ඉතුරු අයව බෙත්-හෝරොන් නගර-
යට නැඟ යන මාර්ගය දිගේ ලුහුබැඳ
ගියෝය. අෂේකා[10] හා මක්කේදා[11]
යන නගර දක්වාම ගොස් ඔවුන්ට
පහර දුන්නෝය. **11** අමෝරිවරුන්
බෙත්-හෝරොන්හි බෑවුම දිගේ ඊශ්‍රා-
යෙල් සෙනඟ වෙතින් පලා යන විට
යෙහෝවා දෙවි විශාල හිම කැට වර්-
ෂාවකින්[12] ඔවුන්ට පහර දුන්නේය.
අෂේකා නගරය දක්වාම හිම කැට
වර්ෂාවෙන් ඔවුහු පහර ලැබූහ. ඊශ්‍රා-
යෙල්වරුන් මරා දැමූ අයගේ ගණනට
වඩා හිම කැට වර්ෂාවෙන් මැරුම් කෑ
අයගේ ගණන අධික විය.

**12** යෙහෝවා දෙවි ඊශ්‍රායෙල්ව-
රුන්ගේ අතට අමෝරිවරුන්ව හසු
කර දුන් ඒ දවසේදී යොෂුවා

**9 පරි.**
1 යෙරෙ 39:18
2 ද්වි 29:11; යොෂු 9:21
3 1ලේක 9:2; එස්රා 7:24; එස්රා 8:17; නෙහෙ 3:26; නෙහෙ 7:60
4 ද්වි 12:5; 1රාජා 8:29; 2ලේක 6:6

**10 පරි.**
5 යොෂු 8:2
6 යොෂු 8:24
7 යොෂු 6:2
8 යොෂු 6:21
9 යොෂු 8:29
10 යොෂු 9:15; යොෂු 11:19
11 නික් 15:16; ද්වි 2:25; ද්වි 11:25; යොෂු 2:11; යොෂු 5:1
12 යොෂු 8:25
13 යොෂු 12:10; යොෂු 18:28
14 උත් 23:2; ගණන් 13:22
15 යොෂු 12:11
16 2රාජා 18:14
17 යොෂු 12:12; යොෂු 15:39
18 යොෂු 9:15; යොෂු 11:19
19 උත් 15:16

**2 තීරුව**
1 යොෂු 5:10; යොෂු 9:6
2 යොෂු 9:15; යොෂු 9:25
3 යොෂු 8:1
4 යොෂු 8:3
5 ද්වි 3:2; ද්වි 20:1
6 ද්වි 7:24; යොෂු 11:6
7 යොෂු 1:5
8 ගීතා 44:3; ගීතා 78:55
9 යෙසා 28:21
10 යොෂු 15:35
11 යොෂු 15:41
12 යෝබ් 38:22; ගීතා 18:13; ගීතා 148:8; යෙසා 30:30

යෙහෝවා දෙවිට යාච්ඤා කර ඊශ්‍රා-
යෙල් හමුදාව ඉදිරියේ මෙසේ කීවේය.

“හිරු,[1] ඔබ ගිබියොන් නගරයට[2]
ඉහළින් නැවතී සිටින්න.
සඳු, ඔබ ආයාලොන්[3] තැනි-
තලාවට ඉහළින් නැවතී
සිටින්න.”

**13** එහෙයින් ඊශ්‍රායෙල්වරුන් තම
සතුරන්ට පහර දී ඔවුන්ව පරාජයට
පත් කරන තුරු[4] හිරුද සඳුද නැවතී
සිටියේය. මේ සිද්ධිය ගැන යාෂාර්ගේ
ලියවිල්ලෙහිද[5] සටහන් කර තිබේ.
එදින හිරු බැස ගියේ නැත. සම්-
පූර්ණ දවසක් ගත වන තෙක්ම
හිරු අහසේ පෙනෙන්න තිබිණ.[6]
**14** එදින සුවිශේෂී දිනයක් විය. මන්ද
මීට පෙර කවදාවත් යෙහෝවා දෙවි
මිනිසෙකුගේ ඉල්ලීම පිට එතරම් පුදු-
මාකාර දෙයක් සිදු කර නොතිබිණ.[7]
පසු කලෙකවත් එවැනි දෙයක් සිදු
නොකළේය. එදින ඊශ්‍රායෙල් සෙනඟ
වෙනුවෙන් සටන් කළේ යෙහෝවා
දෙවියි.[8]

**15** ඉන්පසු යෝෂුවා හා මුළු ඊශ්‍රා-
යෙල් හමුදාවම නැවත ගිල්ගාල්හි
තම කඳවුර බලා පිටත්ව ගියෝය.[9]

**16** ඒ අතරතුර අමෝරිවරුන්-
ගේ රජවරු පස්දෙනා,[10] මක්කේදා
නගරයේ[11] ගුහාවක සැඟවුණෝය.
**17** අමෝරිවරුන්ගේ රජවරුන් පස්-
දෙනා මක්කේදා නගරයේ ගුහාවක
සැඟවී සිටින බව ආරංචි වූ විට[12]
**18** යෝෂුවා මෙසේ අණ කළේය.
“ඔබ ගුහාවේ කට ළඟට විශාල ගල්
පෙරළා එය වසන්න. එය මුර කිරීම
සඳහා මිනිසුන් කිහිපදෙනෙකුව එහි
තබා යන්න. **19** ඔබ ඔබේ සතු-
රන් පසුපස ලුහුබැඳ ගිහින් ඔවුන්ට
පහර දෙන්න.[13] ඔවුන්ගේ නගරවලට
ඇතුල් වෙන්න ඔවුන්ට ඉඩ දෙන්න
එපා. ඔබේ දෙවි වන යෙහෝවා
ඔවුන්ව ඔබේ අතට දැනටමත් හසු
කර දී තිබෙනවා.”[14]

**20** යෝෂුවා හා ඊශ්‍රායෙල් සෙනඟ
තම සතුරන්ගෙන් විශාල පිරිසක්
මරා දැමූහ.[15] ඔවුන්ගෙන් බේරු-
ණේ අතළොස්සක් පමණි. බේරුණු
අය පවුරුවලින් වට වූ නුවරවලට
පලා ගියෝය.[1] **21** ජයග්‍රහණයෙන්
පසු ඊශ්‍රායෙල් හමුදාව මක්කේදා නග-
රයේ කඳවුරු බැඳගෙන සිටි යෝ-
ෂුවා වෙතට නැවත ගියෝය. ඉන්පසු
කිසිවෙක් ඊශ්‍රායෙල්වරුන්ට වචන-
යකින්වත් විරෝධය පෑවේ නැත.[2]
**22** පසුව යෝෂුවා මෙසේ කීවේය.
“ගුහාවේ කට ළඟින් ගල් අහක්
කර ඇතුළේ සැඟවී ඉන්න රජව-
රුන් පස්දෙනාව මා ළඟට ගේන්න.”
**23** ඔවුහු යෝෂුවා කී ලෙසම ඒ රජව-
රුන් පස්දෙනාව ගුහාවෙන් පිටතට
ගෙනාවෝය. යෙරුසලමේ රජුවද[3]
හෙබ්‍රොන්හි[4] රජුවද යාමූත්හි රජුවද
ලාකිෂ්හි රජුවද[5] එග්ලොන්හි රජුවද[6]
**24** ඔවුහු යෝෂුවා වෙතට ගෙනා-
වෝය. ඉන්පසු යෝෂුවා තම හමුදාවේ
සියලුදෙනාවම එතැනට කැඳවා තමා
සමඟ එකට සටන් කළ හමුදාපතීන්ට
මෙසේ කීවේය. “ඇවිත්, මේ රජවරුන්-
ගේ බෙලි පාගන්න.”[7] එවිට ඔවුහු
ඉදිරියට ඇවිත් ඒ රජවරුන් පස්දෙනා-
ගේ බෙලි පෑගුවෝය.[8] **25** යෝෂුවා
ඔවුන්ට මෙසේද කීවේය. “දැන් භය
වෙන්න එපා.[9] ධෛර්යවත්ව, එඩිත-
රව සිටින්න. අද යෙහෝවා දෙවි ඔබේ
සතුරන්ව යටත් කර දුන් ආකාරයටම
ඔබට විරුද්ධව යුද්ධ කරන සෑම සතු-
රෙක්වම ඔබට යටත් කර දෙයි.”[10]

**26** ඉන්පසු යෝෂුවා ඒ රජවරුන්
පස්දෙනාව මරා ඔවුන්ගේ මළ සිරුරු
කණුවල එල්ලුවේය. සවස් වන තුරු
ඔවුන්ගේ මළ කඳන් එලෙස එල්ලා
තිබිණ.[11] **27** හිරු බැස යන වේලා-
වේදී යෝෂුවාගේ අණ පරිදි රජවරුන්-
ගේ මළ කඳන් කණුවලින් බා,[12]
කලින් ඔවුන් සැඟවී සිටි ගුහාවටම
වීසි කළෝය. පසුව විශාල ගල්වලින්
ගුහාවේ කට වසන ලදි. අද දක්වාම
ඒ ගල් එතැන තිබේ.

**28** එදින යෝෂුවා මක්කේදා නග-
රයත්[13] අල්ලාගෙන එය විනාශ කර
දැමුවේය. ඒ නගරයේ රජුවද එහි
සියලු වැසියන්වද ඔහු කඩුවෙන් මරා

**10 පරි.**
1 උත් 1:16; 2රාජා 20:10; ගීතා 135:6; යෙසා 38:8
2 යෙසා 28:21
3 යොෂු 19:42
4 යොෂු 21:44
5 2සාමු 1:18
6 ගීතා 74:16; ගීතා 135:6; ගීතා 136:8; මතෙ 19:26
7 ද්වි 9:19; 1රාජා 17:22; ගීතා 113:6; යාකො 5:16
8 නික් 14:14; ද්වි 1:30; ද්වි 3:22; යොෂු 23:3; ගීතා 33:20; යෙසා 42:13; සෙක 14:3
9 යොෂු 5:10; යොෂු 9:6
10 ගීතා 48:5
11 යොෂු 10:10
12 යොෂු 10:28; ගීතා 139:7; ආමො 9:3
13 ද්වි 28:7
14 ලෙවී 26:8; නෙහෙ 9:24
15 යොෂු 8:24

**2 තීරුව**
1 2සාමු 20:6
2 නික් 11:7
3 යොෂු 10:3; යොෂු 12:10
4 යොෂු 15:13
5 යොෂු 12:11
6 යොෂු 10:5; යොෂු 12:12
7 උත් 49:8; 2සාමු 22:41; ගීතා 18:40
8 නික් 23:27; ද්වි 33:29; ගීතා 110:1
9 ද්වි 1:29; ද්වි 31:6; යොෂු 1:9; ගීතා 27:14
10 ද්වි 3:21; ද්වි 7:19
11 ද්වි 21:22
12 ද්වි 21:23; යොෂු 8:29
13 යොෂු 10:10; යොෂු 12:16; යොෂු 15:41

ඇමුවේය.[1] ඔහු එක වැසියෙකුවත්
ඉතුරු කළේ නැත. ඔහු යෙරිකෝවේ
රජුට කළ දේම මක්කේදාහි රජුටත්[2]
කළේය.

**29** ඉන්පසු යොෂුවා ඊශ්‍රායෙල්
හමුදාව සමඟ මක්කේදා නගර-
යෙන් පිටත් වී ලිබ්නා නගරය[3] බලා
ගියේය. එහිදීද ඔවුහු යුද්ධ කළෝය.
**30** යෙහෝවා දෙවි ලිබ්නා නගරයත්
එහි රජුවත් ඊශ්‍රායෙල්වරුන්ගේ අතට
පත් කළේය. ඔවුහු ඒ නගරය විනාශ
කර එහි සිටි සියලු වැසියන්වද කඩු-
වෙන් මරා දැමුවෝය. එක් වැසියෙක්-
වත් ඉතුරු වුණේ නැත. යෙරිකෝවේ
රජුට සිදු වූ දේම ලිබ්නා නගරයේ
රජුටත් සිදු විය.[4]

**31** ලිබ්නා නගරය අල්ලාගත් පසු
යොෂුවාද ඊශ්‍රායෙල් හමුදාවද ලාකිෂ්
නගරය[5] බලා පිටත් විය. ඔවුහු
එම නගරය අසල කඳවුරු බැඳ-
ගෙන ඊට විරුද්ධව යුද්ධ කළෝය.
**32** ලාකිෂ් නගරය දවස් දෙකක්
ඇතුළත අල්ලාගැනීමට යෙහෝවා
දෙවි ඊශ්‍රායෙල්වරුන්ට උපකාර
කළේය. ඔවුහු ලිබ්නා නගරය විනාශ
කළාක් මෙන් ලාකිෂ් නගරයද විනාශ
කර එහි සියලු වැසියන්ව කඩුවෙන්
මරා දැමුවෝය.[6]

**33** ඊශ්‍රායෙල්වරුන් ලාකිෂ් නගර-
යට විරුද්ධව යුද්ධ කරමින් සිටියදී
ගෙෂෙර් නගරයේ[7] රජු වූ හොරාම්,
ලාකිෂ් නගරයේ වැසියන්ගේ උපකා-
රයට පැමිණියේය. නමුත් යොෂුවා,
ඔහුවත් ඔහුගේ හමුදාවත් පරාජය
කර ඔවුන් සියලුදෙනාවම කඩුවෙන්
මරා දැමුවේය.[8]

**34** ලාකිෂ් නගරය අල්ලාගත් පසු
යොෂුවාද ඊශ්‍රායෙල් හමුදාවද එග්-
ලොන් නගරය[9] බලා පිටත් විය.
ඔවුහු එම නගරය ළඟ කඳවුරු බැඳ-
ගෙන ඊට විරුද්ධව යුද්ධ කළෝය.
**35** ඔවුහු එග්ලොන් නගරය අල්ලා-
ගෙන එදිනම එය විනාශ කර දැමු-
වෝය. ලාකිෂ් නගරය විනාශ කළාක්
මෙන් ඔවුහු එහි සියලු වැසියන්වද
කඩුවෙන් මරා දැමුවෝය.[10]

**36** ඉන්පසු යොෂුවා ඊශ්‍රායෙල්
හමුදාව සමඟ එග්ලොන් නගරයෙන්
පිටත් වී හෙබ්‍රොන් නගරයට[1] ගොස්
එහිදීද යුද්ධ කළෝය. **37** ඔවුහු
හෙබ්‍රොන් නගරය හා එහි කුඩා
නගරවල් සියල්ල අල්ලාගෙන ඒවා
විනාශ කර එහි රජු ඇතුළු එම නග-
රවල සිටි සියලු වැසියන්ව කඩු-
වෙන් මරා දැමුවෝය. ඔවුහු එහි එක්
වැසියෙකුවත් ඉතුරු කළේ නැත.
යොෂුවා එග්ලොන් නගරය විනාශ
කළාක් මෙන් හෙබ්‍රොන් නගරයද
විනාශ කර එහි සියලු වැසියන්ව මරා
දැමුවේය.[2]

**38** පසුව යොෂුවා ඊශ්‍රායෙල් හමු-
දාව සමඟ දෙබීර් නගරයට[3] ගොස්
ඊට විරුද්ධව යුද්ධ කළේය. **39** ඔහු
දෙබීර් නගරය හා කුඩා නගරවල්
සියල්ල අල්ලාගෙන ඒවා විනාශ කර
එහි සියලු වැසියන්ව කඩුවෙන් මරා
දැමුවේය.[4] යොෂුවා හෙබ්‍රොන් නග-
රයටත් ලිබ්නා නගරයටත් ඒවා-
යේ සිටි රජවරුන්ටත් කළාක් මෙන්
දෙබීර් නගරයට හා එහි රජුටත්
කළේය.[5] එහි එක් වැසියෙක්වත්
ඉතුරු වුණේ නැත.[6]

**40** මෙසේ යොෂුවා කඳුකරයට,[7]
නෙගෙබ් පළාතට,[8] පහත් බිම්ව-
ලට*[9] හා කඳු බෑවුම්වලට[10] අයිති
මුළු දේශයම අල්ලාගත්තේය. එහි
සිටි සියලු වැසියන්වද ඔවුන්ගේ
රජවරුන්වද ඔහු පරාජය කළේය.
ඊශ්‍රායෙල්වරුන්ගේ දෙවි වන යෙ-
හෝවා අණ කළ ලෙස[11] යොෂුවා
එක් මනුෂ්‍යයෙකුවත් ඉතුරු නො-
කර ඔවුන් සියලුදෙනාවම#[12] මරා
දැමුවේය.[13] **41** යොෂුවා, කාදෙෂ්-
බර්නේය ප්‍රදේශයේ[14] සිට ගාසා නග-
රය[15] දක්වාද මුළු ගෝෂෙන්
දේශය[16] ඇතුළුව ගිබියොන් නග-
රය[17] දක්වාද සිටි සියලු වැසියන්ව
විනාශ කළේය. **42** තමන් දියත්
කළ එක් යුධ මෙහෙයුමකින් ඒ සියලු

---

යොෂු **10:40*** මූ.අ., "ෂෙපේලා." **40#** මූ.අ., "පණ ඇති සියල්ලන්."

---

**10 පරි.**
1 ලෙවී 27:29, ද්වි 20:16, ගීතා 21:8
2 යොෂු 12:16
3 යොෂු 12:15, යොෂු 15:42, යොෂු 21:13
4 යොෂු 6:21, යොෂු 8:2, යොෂු 8:29
5 යොෂු 10:3, යොෂු 12:11, යොෂු 15:39
6 ද්වි 7:2, ද්වි 20:16
7 යොෂු 12:12, යොෂු 16:10, යොෂු 21:21, විනි 1:29, 1රාජා 9:16
8 ලෙවී 27:29
9 යොෂු 10:3, යොෂු 12:12, යොෂු 15:39
10 ද්වි 20:16, යොෂු 10:32

**2 තීරුව**
1 උත් 13:18, උත් 23:19, ගණන් 13:22, යොෂු 10:3, යොෂු 14:13, යොෂු 15:13, යොෂු 21:13, විනි 1:10
2 ලෙවී 27:29, යොෂු 6:21
3 යොෂු 12:13, යොෂු 15:15, විනි 1:11
4 ද්වි 7:2, ද්වි 20:16
5 යොෂු 10:30, යොෂු 10:32
6 යොෂු 11:14
7 ද්වි 1:7
8 උත් 20:1
9 යොෂු 9:1, යොෂු 15:33, විනි 1:9
10 යොෂු 12:8
11 ද්වි 7:2, ද්වි 9:5
12 ද්වි 20:16, යොෂු 11:14
13 ලෙවී 27:29
14 ගණන් 34:4, ද්වි 9:23, යොෂු 15:3
15 උත් 10:19, ද්වි 2:23
16 යොෂු 11:16, යොෂු 15:51
17 යොෂු 11:19

රජවරුන්ව පරාජය කරන්නත් ඔවුන්-
ගේ දේශ අල්ලාගන්නත් යොෂුවාට
හැකි විය.[1] මෙසේ කිරීමට හැකි වූයේ
ඊශ්‍රායෙල්වරුන්ගේ දෙවි වන යෙ-
හෝවා ඔවුන් වෙනුවෙන් සටන් කළ
නිසාය.[2] **43** මෙම නගර සියල්ල
අල්ලාගත් පසු යොෂුවා සහ ඊශ්‍රා-
යෙල් හමුදාව නැවත ගිල්ගාල්හි තම
කඳවුර වෙතට හැරී ගියෝය.[3]

**11** ඊශ්‍රායෙල් හමුදාව කළ
දේවල් ගැන හාෂෝර් නගර-
යේ යාබින් රජුට ආරංචි වූ විට ඔහු
මාදොන් නගරයේ රජු වූ[4] යෝබාබ්-
ටද ෂිම්රොන් හා අක්ෂාප් නම් නගර-
වල රජවරුන්ටද[5] පණිවිඩ යැව්වේය.
**2** උතුරු දෙසට තිබෙන කඳුකර
ප්‍රදේශයේද කින්නෙරෙත්ට*[6] දකු-
ණෙන් පිහිටි පාළුකරයේද පහත් බිම්-
වලද#[7] බස්නාහිර දෙසට තිබෙන
දෝර්හි[8] උස්බිම්වලද සිටි රජව-
රුන්ටත් ඔහු පණිවිඩ යැව්වේය.
**3** නැඟෙනහිර සහ බස්නාහිර දිශා-
වල වාසය කළ කානානිවරුන්-
ටත්[9] කඳුකර ප්‍රදේශවල වාසය කළ
අමෝරිවරුන්,[10] හිත්තීවරුන්,[11] පෙ-
රිස්සිවරුන්[12] සහ යෙබූසිවරුන්ටත්[13]
හෙර්මොන් කන්ද[14] පාමුල පිහිටි
මිෂ්පා දේශයේ[15] සිටි හිවීයවරුන්-
ටත්[16] පණිවිඩ යැව්වේය. **4** එවිට
එම රජවරු සියලුදෙනාම තම තමන්-
ගේ හමුදා රැස් කරගෙන පිටත්ව
ආවෝය. මුහුදු වෙරළේ වැලි මෙන්
ගණන් කළ නොහැකි මහත් සෙ-
නඟක්[17] පිටත්ව ආවෝය. අශ්වයන්[18]
හා අශ්ව රථ බොහෝ ප්‍රමාණ-
යක් ඇතුව ඔවුහු පිටත්ව ආවෝය.
**5** එම රජවරු කලින් නියම කරගත්
ස්ථානයක හමු වූහ. පසුව ඔවුහු සිය-
ලුදෙනාම ඊශ්‍රායෙල්වරුන්ට විරුද්ධව
සටන් කරන පිණිස මෙරොම්හි ජලාශ
ළඟ කඳවුරු බැඳගත්තෝය.[19]

**6** ඒ අවස්ථාවේදී යෙහෝවා දෙවි
යොෂුවාට මෙසේ කීවේය. "එම හමු-
දාවන් ගැන භය නොවන්න.[1] හෙට
මේ වේලාව වන විට මම ඒ සියලු-
දෙනාවම ඔබේ අතට භාර දෙන්-
නෙමි. ඔබ ඔවුන් සියලුදෙනාවම
විනාශ කර දමනු ඇත. ඔබ ඔවුන්ගේ
අශ්වයන්ට නැඟිටින්න බැරි වන
ලෙස තුවාල කර[2] ඔවුන්ගේ අශ්ව
රථ ගින්නෙන් පුලුස්සා දමන්න."[3]
**7** ඉන්පසු යොෂුවා තම හමුදාවත්
සමඟ මෙරොම්හි ජලාශ අසල කඳ-
වුරු බැඳගෙන සිටි හමුදා වෙතට රහ-
සින් ගොස් ඔවුන්ට පහර දුන්නේය.
**8** යෙහෝවා දෙවි ඔවුන්ව ඊශ්‍රායෙල්
හමුදාව අතට පත් කළේය.[4] ඊශ්‍රා-
යෙල් හමුදාව තම සතුරන්ව ජනා-
කීර්ණ නගරයක් වූ සීදොන්[5] දක්වාද
මිස්රෙපොත්-මායිම්[6] දක්වාද නැඟෙ-
නහිර දෙසින් පිහිටි මිෂ්පේ තැනිත-
ලාව[7] දක්වාද ලුහුබැඳ ගොස් පහර
දී සියලුදෙනාවම මරා දැමුවේය.[8]
**9** ඉන්පසු යෙහෝවා දෙවි කී ලෙසම
යොෂුවා ඔවුන්ගේ අශ්වයන්ගේ පාද
තුවාල කර[9] ඔවුන්ගේ අශ්ව රථ ගින්-
නෙන් දවා දැමුවේය.[10]

**10** හාෂෝර්, ඒ පළාතේ තිබූ සිය-
ලුම රාජ්‍යයන්ට වඩා බලවත්
විය. එහෙයින් යොෂුවා ආපසු හැරී[11]
හාෂෝර්[12] වෙතට ගොස් එය යටත්
කරගෙන එහි රජුව කඩුවෙන් මරා
දැමුවේය.[13] **11** ඊශ්‍රායෙල් හමුදාව
එහි සියලු වැසියන්වද කඩුවෙන්
මරා දැමූහ.[14] එහි එක වැසියෙකුවත්
ඔවුහු ඉතුරු නොකළෝය.[15] ඉන්-
පසු යොෂුවා හාෂෝර් නගරයට ගිනි
තැබුවේය. **12** යොෂුවා ඊශ්‍රායෙල්-
වරුන්ට විරුද්ධව නැඟී සිටි අනික්
සියලු රාජ්‍යයන් යටත් කරගෙන
ඔවුන්ගේ රජවරුන්වද කඩුවෙන් මරා
දැමුවේය.[16] යෙහෝවා දෙවිගේ සේ-
වකයෙකු වූ මෝසෙස් අණ කළ
පරිදි[17] යොෂුවා ඔවුන් සියල්ලන්-
වම විනාශ කිරීමට නියම කළේය.[18]
**13** නමුත් හාෂෝර් හැර, හෙල් මත
පිහිටා තිබුණු වෙන කිසි නගරය-
කට යොෂුවා ගිනි තැබුවේ නැත.
**14** ඊශ්‍රායෙල්වරු එම නගරවල සිටි

---

යොෂු **11:2*** ගලීල මුහුද කලින් හැඳින්වූයේ මෙම
නමින්ය. **2#** මූ.අ., "ෂෙපේලා."

**10 පරි.**
**1** යොෂු 11:18
**2** නික් 14:14
ද්වි 1:30
ද්වි 3:22
**3** යොෂු 4:19

**11 පරි.**
**4** යොෂු 12:19
**5** යොෂු 12:20
**6** ගණන් 34:11
**7** යොෂු 10:40
**8** යොෂු 12:23
යොෂු 17:11
විනි 1:27
**9** ද්වි 20:17
**10** උත් 15:16
ආමො 2:9
**11** ද්වි 7:1
**12** නික් 3:8
**13** ගණන් 13:29
**14** ද්වි 4:48
යොෂු 13:11
**15** යොෂු 11:8
**16** විනි 3:3
**17** 1සාමු 13:5
**18** ගීතා 33:17
හිතෝ 21:31
**19** ගීතා 3:6
ගීතා 118:10

**2 තීරුව**
**1** යොෂු 10:8
ගීතා 27:1
ගීතා 46:1
**2** ද්වි 17:16
යොෂු 11:9
2සාමු 8:4
**3** ගීතා 20:7
යෙසා 31:1
**4** යොෂු 21:44
යොෂු 23:10
නෙහෙ 9:24
**5** උත් 10:19
යොෂු 19:28
**6** යොෂු 13:6
**7** යොෂු 11:3
**8** ද්වි 20:16
**9** ද්වි 17:16
යොෂු 11:6
**10** යෙසා 31:1
**11** යොෂු 11:18
**12** යොෂු 19:36
**13** යොෂු 12:19
ගීතා 136:17
**14** ලෙවී 27:29
යොෂු 11:14
**15** ද්වි 20:16
යොෂු 10:40
**16** ද්වි 9:5
**17** ගණන් 33:52
ද්වි 7:2
යොෂු 9:24
**18** ද්වි 7:16
යොෂු 11:20

සියලු වැසියන්ව කඩුවෙන් මරා දැමු-
වෝය.[1] ඔවුන්ගෙන් එක වැසියෙකු-
වත් ඔවුහු ඉතුරු නොකළෝය.[2]
නමුත් ඔවුහු ඔවුන්ගේ සියලු වස්තු-
වද සතුන්වද ගත්තෝය.[3] **15** යෙ-
හෝවා දෙවි තම සේවක මෝසෙස්ට
අණ කළ දේ මෝසෙස් යොෂුවාට
දැනුම් දී තිබිණ.[4] යෙහෝවා දෙවි
මෝසෙස්ට අණ කළ ලෙසම යොෂුවා
කළේය. ඔහු ඒ සියල්ල අකුරටම පිළි-
පැද්දේය.[5]
**16** මෙසේ යොෂුවා ඒ මුළු දේශ-
යම අල්ලාගත්තේය. එනම්, යූදාහි
කඳුකර පළාතද ඒ අවට තිබෙන
පහත් බිම්ද*[6] මුළු නෙගෙබ් ප්‍රදේශ-
යද[7] මුළු ගෝෂෙන් දේශයද[8] අරබා
ප්‍රදේශද[9] ඊශ්‍රායෙල්හි කඳුකර පළාත
හා ඒ අවට තිබෙන පහත් බිම්ද[10]
අල්ලාගත්තේය. **17** සේයිර්[11] දෙ-
සට විහිදී යන හලක් කන්දේ[12]
සිට හෙර්මොන් කඳු[13] පාමුල පිහිටි
ලෙබනොන් තැනිතලාවේ බාල්-ගාද්
නගරය[14] දක්වා තිබෙන මුළු ප්‍රදේශ-
යම ඔහු අල්ලාගත්තේය. ඔහු එම
ප්‍රදේශයේ සිටි සියලු රජවරුන්ව අල්-
ලාගෙන ඔවුන්ව මරා දැමුවේය.[15]
**18** එම රජවරුන්ට අයත් ප්‍රදේශ අල්-
ලාගැනීම සඳහා යොෂුවාට බොහෝ
කාලයක් පුරා සටන් කිරීමට සිදු
විය. **19** ගිබියොන් නගරයේ[16] වැසි-
යන් වූ හිවීයවරුන්[17] හැර වෙන කිසි
නගරයක වැසියන් ඊශ්‍රායෙල්වරුන්
සමඟ සාම ගිවිසුමක් ඇති කරගත්-
තේ නැත. ඊශ්‍රායෙල්වරු සටන් කර
අනික් නගර සියල්ල යටත් කරගත්-
තෝය.[18] **20** එම නගරවල වැසි-
යෝ මුරණ්ඩු වී[19] ඊශ්‍රායෙල්වරුන්ට
විරුද්ධව යුද්ධ කිරීමට තෝරාගත්හ.
යෙහෝවා දෙවිද ඔවුන්ට එලෙස
ක්‍රියා කිරීමට ඉඩහැර ඔවුන්ව විනාශ
කිරීමට නියම කළේය. දෙවි කිසි
අනුකම්පාවක් නොපෙන්වා[20] ඔවුන්ව
සම්පූර්ණයෙන්ම විනාශ වී යෑමට
ඉඩහැරියේය. යෙහෝවා දෙවි මෝ-
සෙස්ට පවසා තිබූ ලෙසම සියල්ල
සිදු විය.[1]
**21** යොෂුවා එම ජාතීන් සමඟ
යුද්ධ කළ කාලයේදීම කඳුකර පළා-
තේ විසූ අනාක්වරුන්වද[2] විනාශ
කළේය. එනම්, හෙබ්‍රොන්, දෙබීර් සහ
අනාබ්[3] යන නගරවලද යූදාහි හා
ඊශ්‍රායෙල්හි කඳුකර පළාත්[4] පුරාද
වාසය කළ අනාක්වරුන් සහ ඔවුන්-
ගේ නගර ඔහු විනාශ කළේය.[5]
**22** බේරුණු අනාක්වරු ගාසා,[6]
ගාත්[7] සහ අෂ්දොද්[8] යන ප්‍රදේශවල
ජීවත් වූහ.[9] නමුත් ඊශ්‍රායෙල්වරුන්ට
අයිති ප්‍රදේශයේ අනාක්වරුන්-
ගෙන් කිසිවෙකුවත් ඉතුරු නොවීය.
**23** යෙහෝවා දෙවි මෝසෙස්ට පො-
රොන්දු වූ ලෙස යොෂුවා ඒ මුළු
දේශයම අල්ලාගත්තේය.[10] ඉන්පසු
යොෂුවා දේශය කොටස්වලට බෙදා
ඊශ්‍රායෙල්වරුන්ට උරුමයක් ලෙස
දුන්නේය.[11] ඊශ්‍රායෙල්වරුන්ට තම
තමන්ගේ ගෝත්‍රවලට අනුව උරුම-
යක් ලැබිණ. ඒ කාලයේදී යුද්ධයෙන්
තොර සාමකාමී වාතාවරණයක් දේ-
ශය පුරා පැවතිණ.[12]

**12** ඊශ්‍රායෙල්වරු, යොර්දාන්
ගඟට නැඟෙනහිරෙන් පිහිටි
ප්‍රදේශ පාලනය කළ රජවරුන්ව පරා-
ජය කර ඔවුන්ගේ දේශ අත් පත් කර-
ගත්තෝය.[13] ආනොන් නිම්නයේ[14]
සිට හෙර්මොන් කන්ද[15] දක්වා විහිදී
ගිය ප්‍රදේශයද මහ අරබා[16] නිම්න-
යේ නැඟෙනහිර පැත්තට අයත් මුළු
ප්‍රදේශයද ඔවුහු අත් පත් කරගත්-
තෝය. ඊශ්‍රායෙල්වරුන් පරාජය කළ
රජවරුන් පිළිබඳ විස්තර මෙසේය.
**2** හෙෂ්බොන් නගරයේ[17] වාසය කළ
අමෝරිවරුන්ගේ රජු වූ සීහොන්ව[18]
ඊශ්‍රායෙල්වරු පරාජය කළෝය. ඔහු
ආනොන් නිම්නයේ එක් පැත්තක
පිහිටි අරෝයේර් නගරයේ[19] පාලකයා

**11 පරි.**
**1** ද්වි 7:2
**2** ද්වි 20:16
**3** ගණන් 31:23; ද්වි 20:16; යොෂු 8:2; යොෂු 8:27
**4** ද්වි 3:28; ද්වි 4:5; ද්වි 7:1; ද්වි 31:7
**5** ද්වි 4:2; ද්වි 12:32; ගීතා 119:4
**6** විනි 1:9
**7** ගණන් 13:17; ද්වි 1:7; යොෂු 10:40; යොෂු 12:8
**8** යොෂු 10:41; යොෂු 15:51
**9** ද්වි 3:17; යොෂු 12:1; යොෂු 12:8; යොෂු 18:18
**10** යොෂු 9:1
**11** උත් 32:3; ද්වි 2:1
**12** යොෂු 12:7
**13** ද්වි 4:48; යොෂු 13:11
**14** යොෂු 13:5
**15** ද්වි 7:24; ගීතා 136:18
**16** යොෂු 9:15; යොෂු 10:4
**17** යොෂු 9:7
**18** ද්වි 20:17
**19** ද්වි 2:30; රෝම 9:18
**20** නික් 34:12; ද්වි 7:2

**2 තීරුව**
**1** ද්වි 20:16; යොෂු 11:14
**2** ගණන් 13:22; ද්වි 1:28; යොෂු 15:13
**3** යොෂු 15:50
**4** යොෂු 11:16
**5** ලෙවී 27:29; යොෂු 11:12; යොෂු 24:11
**6** යොෂු 10:41; විනි 1:18
**7** 1සාමු 17:4
**8** යොෂු 15:46; 2ලේක 26:6; නෙහෙ 13:23
**9** නික් 23:29; නික් 23:30; ගීතා 105:44
**10** නික් 23:27; ගණන් 34:2; ද්වි 11:23
**11** ගණන් 26:53; යොෂු 14:1; යොෂු 15:1; යොෂු 16:1; යොෂු 17:1

**12** යොෂු 14:15; යොෂු 21:44; යොෂු 23:1; ගීතා 29:11; හිතෝ 16:7; **12 පරි.** **13** ද්වි 4:47; යොෂු 1:15; **14** ගණන් 21:24; ද්වි 2:24; **15** ද්වි 3:8; ද්වි 4:48; **16** ද්වි 4:49; **17** ද්වි 2:26; **18** ගණන් 21:23; නෙහෙ 9:22; **19** ද්වි 3:12; විනි 11:26.

යොෂු **11:16*** මු.අ., “ෂෙපේලා.”

විය. ආනොන් නිම්නයේ[1] මැද සිට
යබ්බොක් නිම්නය දක්වා වූ මුළු
ප්‍රදේශයම ඔහු යටතේ තිබිණ. ගිලි-
යද් දේශයෙන් භාගයක්ද පාලනය
කළේ ඔහුය. යබ්බොක් නිම්නය[2]
අම්මොන්වරුන්ගේ දේශ සීමාව විය.
**3** මහ අරබා නිම්නයේ[3] නැඟෙනහිර
පැත්තට අයිති කින්නෙරෙත් මුහුද*[4]
සහ අරබා මුහුද අතර වූ ප්‍රදේශ-
යක්ද ඔහුගේ රාජධානියට අයත් විය.
ඔහුගේ රාජධානියට අයත් ප්‍රදේශය
අරබා මුහුද හෙවත් ලුණු මුහුද[5] අසල
පිහිටි බෙත්-යෙෂිමොත්[6] හරහා දිව
ගොස් දකුණු දෙසින් පිහිටි පිස්ගා
කඳු[7] පාමුල දක්වා විහිදී ගියේය.
**4** ඊශ්‍රායෙල්වරු බාෂාන් දේශයේ
රජු වූ ඕග්වද[8] පරාජය කළෝය. රෙ-
ෆායිවරුන්ගෙන් ඉතුරු වී සිටියේ ඔහු
පමණි.[9] ඔහු අෂ්ටාරොත්[10] සහ එද්-
රෙයි[11] යන නගර දෙකෙහිම වාසය
කළේය. **5** ඔහු හෙර්මොන් කන්ද,[12]
සලෙකා නගරය සහ මුළු බාෂාන්
දේශයම[13] පාලනය කළේය. ගෙ-
ෂූර්වරුන්ගේ[14] දේශ සීමාව දක්වාද
මයකාත්වරුන්ගේ[15] දේශ සීමාව දක්-
වාද හෙෂ්බොන්හි[16] රජු වූ සීහොන්ගේ
රාජ්‍යයේ සීමාව දක්වාද විහිදී ගිය
ඔහුගේ රාජධානියට ගිලියද් දේශයේ
ඉතුරු භාගයද අයත් විය.[17]
**6** ඊශ්‍රායෙල්වරුන් ඒ රජවරුන්ව
පරාජයට පත් කළේ යෙහෝවා දෙ-
විගේ සේවකයෙකු වූ මෝසෙස්ගේ
අණසක යටතේය.[18] ඉන්පසුව යෙ-
හෝවා දෙවිගේ සේවකයෙකු වූ මෝ-
සෙස්, රූබෙන් ගෝත්‍රයටද[19] ගාද්
ගෝත්‍රයටද[20] මනස්සේ ගෝත්‍රයෙන්
එක් කොටසකටද එම දේශ උරුම
කර දුන්නේය.[21]
**7** ඊශ්‍රායෙල්වරුන් යොර්දාන් ගඟට
බස්නාහිරෙන් පිහිටි ප්‍රදේශ පාලනය
කළ රජවරුන්ව පරාජය කර එම දේ-
ශයන් අත් පත් කරගත්තේ යොෂුවා-
ගේ අණසක යටතේය. ලෙබනොන්
තැනිතලාවේ[22] බාල්-ගාද් නගරයේ[23]
සිට සේයිර්[1] දෙසට විහිදී යන හලක්
කන්ද[2] දක්වා තිබෙන මුළු ප්‍රදේශයම
ඔවුහු අත් පත් කරගත්තෝය. යො-
ෂුවා ඊශ්‍රායෙල්වරුන්ගේ ගෝත්‍රවලට
අනුව එම දේශය බෙදා ඔවුන්ට උරු-
මයක් ලෙස දුන්නේය.[3] **8** ඔවුන්ට
උරුමයක් ලෙස දුන් එම ප්‍රදේශයට
කඳුකරයද පහත් බිම්ද අරබා මහ
නිම්නයද කඳු බෑවුම්ද පාළුකරයද
නෙගෙබ් පළාතද[4] අයත් විය. එම
ප්‍රදේශවල කලින් ජීවත් වුණේ හිත්-
තීවරුන්, අමෝරිවරුන්,[5] කානානි-
වරුන්, පෙරිස්සිවරුන්, හිවීයවරුන්
හා යෙබූසිවරුන්ය.[6] ඊශ්‍රායෙල්වරුන්
පරාජය කළ ඔවුන්ගේ රජවරුන්ගේ
විස්තර මෙසේය.

**9** යෙරිකෝවේ රජ,[7] බෙතෙල්
අසල පිහිටි ආයිහි රජ,[8]
**10** යෙරුසලමේ රජ,[9] හෙබ්‍රොන්හි
රජ,[10]
**11** යාමුත්හි රජ,[11] ලාකිෂ්හි රජ,[12]
**12** එග්ලොන්හි රජ,[13] ගෙෂෙර්හි
රජ,[14]
**13** දෙබීර්හි රජ,[15] ගේදෙර්හි රජ,
**14** හොර්මාහි රජ, ආරද්හි රජ,
**15** ලිබ්නාහි රජ,[16] අදුල්ලාම්හි රජ,
**16** මක්කේදාහි රජ,[17] බෙතෙල්හි
රජ,[18]
**17** තප්පුවාහි රජ, හේෆෙර්හි රජ,[19]
**18** අපෙක්හි රජ, ලෂ්ෂා-
රොන්හි රජ,
**19** මාදොන්හි රජ,[20] හාෂෝර්හි
රජ,[21]
**20** ෂිම්රොන්-මෙරොන්හි රජ, අක්-
ෂාප්හි රජ,[22]
**21** තයනාක්හි රජ, මෙගිද්දෝහි
රජ,[23]
**22** කෙදෙෂ්හි රජ, කර්මෙල් ප්‍රදේ-
ශයේ පිහිටි යොක්නෙයාම්හි
රජ,[24]
**23** දෝර් කඳුවල පිහිටි දෝර් නග-
රයේ රජ,[25] ගිල්ගාල්හි පිහිටි
ගොයිම්හි රජ සහ
**24** තිර්ෂාහි රජය. ඊශ්‍රායෙල්වරුන්
පරාජය කළ රජවරුන්ගේ මුළු ගණන
තිස්එකකි.[26]

---

**යොෂු 12:3*** යොෂු 11:2හි පළමුවෙනි පාදසටහන බලන්න.

**12 පරි.**
**1** ගණන් 21:13 යොෂු 13:9
**2** විනි 11:13
**3** ද්වි 3:17
**4** යොහ 6:1
**5** යොෂු 3:16
**6** යොෂු 13:20
**7** ද්වි 3:27
**8** ගණන් 21:33 ද්වි 3:1
**9** ද්වි 3:11 යොෂු 13:12
**10** ද්වි 1:4
**11** ද්වි 3:10
**12** යොෂු 12:1
**13** ද්වි 29:7 යොෂු 9:10
**14** ද්වි 3:14
**15** යොෂු 13:13
**16** ගණන් 21:26 ද්වි 3:6
**17** යොෂු 12:2
**18** ගණන් 21:24 ගණන් 21:35
**19** ද්වි 3:12
**20** ගණන් 32:33
**21** ද්වි 3:13
**22** යොෂු 1:4
**23** යොෂු 13:5

**2 තීරුව**
**1** ද්වි 2:12
**2** යොෂු 11:17
**3** යොෂු 11:23
**4** යොෂු 10:40 යොෂු 11:16
**5** උත් 15:16 නික් 3:8 ගීතා 136:19
**6** නික් 23:23 ද්වි 7:1
**7** යොෂු 6:2
**8** යොෂු 8:29
**9** යොෂු 10:1
**10** යොෂු 10:23
**11** යොෂු 10:3
**12** යොෂු 10:23
**13** යොෂු 10:23
**14** යොෂු 10:33
**15** යොෂු 10:38
**16** යොෂු 10:29
**17** යොෂු 10:28
**18** යොෂු 8:17 විනි 1:22
**19** 1රාජා 4:10
**20** යොෂු 11:1
**21** යොෂු 11:10
**22** යොෂු 11:1
**23** 1ලේක 7:29
**24** යොෂු 21:34
**25** යොෂු 11:2
**26** ද්වි 28:1

**13** යොෂුවා මහලු වියේ පසු වූ
බැවින්[1] යෙහෝවා දෙවි ඔහුට
මෙසේ කීවේය. “යොෂුවා, දැන් ඔබ
මහලුය. එහෙත් යටත් කරගැනීමට
මේ දේශයෙන් තව විශාල කොට-
සක් ඉතුරු වී ඇත.[2] **2** පිලිස්තිව-
රුන්ට[3] හා ගෙෂූර්වරුන්ට[4] අයිති
ප්‍රදේශ සියල්ලම තවමත් යටත් කර-
ගෙන නැත.[5] **3** ඊජිප්තු දේශයට
නැඟෙනහිරෙන් පිහිටි නයිල් ගඟේ
අතු ගංගාවේ සිට උතුරේ එක්‍රොන්
නගරය[6] දක්වා තිබෙන ප්‍රදේශයත්
යටත් කරගැනීමට තිබේ. (එම ප්‍රදේ-
ශය කලින් කානානිවරුන්ගේ පළා-
තක්[7] ලෙස සලකනු ලැබීය.) එම
ප්‍රදේශයේ ගාසා,[8] අෂ්දොද්,[9] අෂ්-
කෙලොන්,[10] ගාත්[11] සහ එක්‍රොන්[12]
යන නගර පිහිටා තිබේ. එම නගර
පාලනය කරනු ලබන්නේ පිලිස්-
තීය ජාතික අධිපතීන් පස්දෙනෙකු[13]
විසිනි. අව්වීවරු[14] ජීවත් වන්නේද
එම ප්‍රදේශයේමය. **4** දකුණු දිශා-
වේ තිබෙන කානානිවරුන්ගේ ප්‍රදේශ-
යද තවමත් යටත් කරගෙන නැත.
එපමණක්ද නොව සීදොන්වරුන්ට[15]
අයිති මෙයාරා නගරයේ සිට අමෝ-
රිවරුන්ගේ දේශ සීමාවේ තිබෙන
අපෙක් නගරය දක්වා ඇති ප්‍රදේ-
ශයත් යටත් කරගැනීමට ඉතුරු
වී ඇත. **5** ගෙබල්වරුන්ගේ[16] දේශ-
යද අත් කරගත යුතුයි. හෙර්මොන්
කඳු පාමුල පිහිටි බාල්-ගාද් නගර-
යේ[17] සිට හමාත්ට[18] ඇතුල් වන
තැන දක්වා තිබෙන ලෙබනොන්හි
මුළු නැඟෙනහිර කොටසද අත් කර-
ගත යුතුයි. **6** ලෙබනොන්[19] සිට
මිස්රෙපොත්-මායිම්[20] දක්වා ඇති
කඳුකරයේ වාසය කරන සීදොන්ව-
රුන්ව[21] මම ඊශ්‍රායෙල්වරුන්ගේ ඇස්
පනාපිටම දේශයෙන් පන්නා දමන්-
නෙමි.[22] මම ඔබට අණ කළ ලෙස
ඔබ ඒ දේශයත් ඊශ්‍රායෙල්වරුන්ට
උරුමයක් ලෙස දිය යුතුයි.[23] **7** ඒ
දේශයේ ඉඩම් ඉතුරු ගෝත්‍ර නවයට
සහ මනස්සේ ගෝත්‍රයෙන් කොටස-
කට බෙදා දෙන්න.”[24]

**8** මනස්සේ ගෝත්‍රයේ අනික් කො-
ටසටත් රූබෙන් ගෝත්‍රයටත් ගාද්
ගෝත්‍රයටත් ඒ වන විට තම උරුමය
ලැබී තිබිණ. යෙහෝවා දෙවිගේ සේ-
වකයෙකු වූ මෝසෙස් ඔවුන්ට යොර්-
දාන් ගඟට නැඟෙනහිරෙන් පිහිටි
දේශය උරුමයක් ලෙස දුන්නේය.[1]
ඔවුන්ට උරුමයක් ලෙස ලැබුණු එම
දේශයට **9** ආනොන් නිම්නය[2] කෙ-
ළවරේ පිහිටි අරෝයේර් නගරයද[3] එම
නිම්නය මැද පිහිටි නගරයද දීබොන්
නගරය[4] දක්වා දිව යන මුළු මේ-
දෙබා උස් තැනිතලාවද[5] අයත් විය.
**10** හෙෂ්බොන් නගරයේ සිට පාලනය
කළ අමෝරිවරුන්ගේ රජු වූ සීහොන්
යටතේ තිබුණු අනික් සියලු නගරද
ඊට ඇතුළත් විය. එම නගර අම්-
මොන්වරුන්ගේ දේශ සීමාව දක්වා
දිව ගියේය.[6] **11** ගිලියද් දේශයත්
ගෙෂූර්වරුන්ට[7] සහ මයකාත්වරුන්ට
අයිති ප්‍රදේශත් මුළු හෙර්මොන් කන්-
දත්[8] සලේකා නගරය[9] දක්වා විහිදී
ගිය මුළු බාෂාන් දේශයත්[10] ඔවුන්ට
උරුම විය. **12** අෂ්ටාරොත් සහ එද්-
රෙයි[11] යන නගර දෙකේ සිට බාෂාන්
දේශය පාලනය කළ ඕග් රජුගේ මුළු
රාජධානියද[12] ඔවුන්ට උරුම විය. රෙ-
ෆායිවරුන්ගෙන්[13] ඉතුරු වී සිටියේ
ඕග් රජු පමණි. මෝසෙස් මේ සියලු
ජාතීන්ට පහර දී ඔවුන්ව දේශයෙන්
පන්නා දැමුවේය.[14] **13** එහෙත් ඊශ්‍රා-
යෙල්වරු ගෙෂූර්වරුන්ව සහ මය-
කාත්වරුන්ව ඔවුන්ගේ දේශයෙන්
පන්නා දැමුවේ නැත.[15] ගෙෂූර්වරු[16]
සහ මයකාත්වරු අද වන තුරු ඊශ්‍රා-
යෙල්වරුන් අතරේ වාසය කරති.

**14** මෝසෙස් ලෙවී ගෝත්‍රයට පම-
ණක් උරුමයක් ලබා දුන්නේ නැත.[17]
මන්ද ඊශ්‍රායෙල්වරුන්ගේ දෙවි වන
යෙහෝවාට ඔප්පු කරන දවන
පූජාවන්[18] ඔවුන්ට උරුමයක් ලෙස
ලැබෙන බවට[19] දෙවි පොරොන්දු වී
තිබිණ.[20]

**15** පසුව මෝසෙස් රූබෙන් ගෝ-
ත්‍රයට අයත් පවුල්වලට ලැබීමට නියා-
මිත වූ උරුමය බෙදා දුන්නේය.

**13 පරි.**
1 යොෂු 23:1 යොෂු 24:29
2 යොෂු 12:7
3 නික් 23:31 ශෙප 2:5
4 1සාමු 27:8
5 නික් 23:29
6 යොෂු 15:11
7 උත් 10:19
8 යොෂු 10:41
9 යොෂු 15:46
10 විනි 14:19
11 2සාමු 21:19
12 1සාමු 5:10
13 විනි 3:3 1සාමු 6:4
14 ද්වි 2:23
15 විනි 1:31
16 1රාජා 5:18 එස 27:9
17 යොෂු 11:17
18 ගණන් 34:8
19 ද්වි 3:25
20 යොෂු 11:8
21 විනි 3:3
22 නික් 23:30
23 ගණන් 34:17 යොෂු 14:1
24 ගණන් 33:54

**2 තීරුව**
1 ගණන් 32:33 යොෂු 22:4
2 ගණන් 21:13
3 ද්වි 3:12 යොෂු 12:2
4 ගණන් 32:3
5 ගණන් 21:30
6 ගණන් 21:24
7 ද්වි 3:14 යොෂු 12:5
8 ද්වි 4:48
9 1ලේක 5:11
10 යොෂු 17:1
11 යොෂු 12:4
12 ද්වි 3:10
13 ද්වි 3:11
14 ගණන් 21:24 ගණන් 21:35
15 ගණන් 33:55 යොෂු 23:12
16 ද්වි 3:14
17 ගණන් 18:20 ද්වි 10:9 ද්වි 12:12 යොෂු 14:3
18 ලෙවී 7:33 1කොරි 9:13
19 ලෙවී 7:35 ද්වි 18:1
20 ගණන් 18:24 යොෂු 21:45

**16** ආනොන් නිම්නය කෙළවරේ
පිහිටි අරෝයේර් නගරයත්[1]
ආනොන් නිම්නය මැද පිහිටි නග-
රයත් මේදෙබා අසල පිහිටි
උස් තැනිතලාවත්[2] **17** හෙෂ්බොන්
නගරයත්[3] ඒ අවට තැනිතලා-
වේ පිහිටි කුඩා නගරත්[4] ඔවුන්ට
උරුම විය. දීබොන්,[5] බාමොත්-බාල්,[6]
බෙත්-බාල්-මෙයොන්,[7] **18** යහෂ්,[8]
කෙදෙමොත්,[9] මෙෆයත්,[10] **19** කිර්-
යතායිම්,[11] සිබ්මා,[12] නිම්නය අසල
පිහිටි කන්දේ තිබූ ෂෙරෙත්-
ෂහර්, **20** බෙත්-පෙයෝර්, පිස්ගා
කඳු බෑවුම්,[13] බෙත්-යෙෂිමොත්[14] සහ
**21** උස් තැනිතලාවේ පිහිටි සියලු
නගර[15] රූබෙන් ගෝත්‍රයට උරුම විය.
හෙෂ්බොන් නගරයේ[16] සිට පාලනය
කළ අමෝරිවරුන්ගේ රජු වූ සීහොන්-
ගේ රාජධානිය ඔවුන්ට අයිති විය.[*]
මෝසෙස් සීහොන් රජුවද එම දේශයේ
ජීවත් වූ එවී, රෙකෙම්, ෂූර්, රෙබා
සහ හූර්[17] යන මිදියන් ජාතිකයන්වද
මරා දැමුවේය.[18] කලින් මිදියන්හි
පාලකයන්ව සිටි ඔවුහු සීහොන් රජු
යටතේ අධිපතියෝ ලෙසද සේවය
කරමින් සිටියෝය. **22** ඊශ්‍රායෙල්-
වරු බෙයෝර්ගේ[19] පුත්‍රයා වූ බාලාම්
නමැති ශාස්ත්‍ර කියන්නාවද[20] කඩු-
වෙන් මරා දැමුවෝය. **23** රූබෙන්
ගෝත්‍රයට උරුම වූ දේශයේ එක්
මායිමක් වූයේ යොර්දාන් ගඟය. ඉහත
සඳහන් සියලු ප්‍රදේශද එම ප්‍රදේශවල
තිබූ නගරද ගම්මානද රූබෙන් ගෝ-
ත්‍රයට[21] අයත් පවුල්වලට උරුමයක්
වශයෙන් ලැබිණ.

**24** පසුව මෝසෙස්, ගාද් ගෝත්‍ර-
යට අයත් පවුල්වලට ඔවුන්ගේ උරු-
මය බෙදා දුන්නේය.[22] **25** ඔවුන්ට
යාසේර් නගරයද[23] ගිලියද් දේශයේ[24]
සියලු නගරද අම්මොන්වරුන්ට අයත්
දේශයෙන් භාගයක්ද උරුම විය.[25]
අම්මොන්වරුන්ගේ දේශයේ, රබ්බා
නගරයට[1] මුහුණ ලා පිහිටි අරෝයේර්
නගරය[2] දක්වා තිබූ ප්‍රදේශය ඔවුන්ට
අයිති විය. **26** හෙෂ්බොන් නගර-
යේ[3] සිට රාමත්-මිෂ්පේ සහ බෙතො-
නිම් දක්වාද මහනායිම් නගරයේ[4]
සිට දෙබීර් නගරයේ[5] මායිම දක්වාද
**27** නිම්නයේ පිහිටි බෙත්-හාරාම්,[6]
බෙත්-නිම්රා,[7] සුක්කොත්[8] සහ
ෂපොන් යන නගරද ඔවුන්ට ලැබිණ.
හෙෂ්බොන්හි[9] රජු වූ සීහොන්ගේ රාජ-
ධානියේ ඉතුරු කොටස ගාද් ගෝත්‍ර-
යට උරුම විය. යොර්දාන් ගඟට
නැඟෙනහිරෙන් කින්නෙරෙත් මුහුද[10]
දක්වාම තිබෙන ප්‍රදේශ ඔවුන්ට අයිති
විය. **28** ඉහත සඳහන් වූ මුළු දේශ-
යද එහි නගර සහ ගම්මානද ගාද්
ගෝත්‍රයට[11] අයත් පවුල්වලට උරුම-
යක් වශයෙන් ලැබිණ.

**29** පසුව මෝසෙස් මනස්සේ ගෝ-
ත්‍රයේ එක් කොටසකට ඔවුන්ගේ
උරුමය බෙදා දුන්නේය. ඔවුන්-
ගේ පවුල් අනුව එය බෙදා
දුන්නේය.[12] **30** ඔවුන්ට මහනායිම්
නගරයේ[13] පටන් බාෂාන්හි රජු වූ
ඕග්ගේ මුළු රාජධානියම එනම්,
මුළු බාෂාන් ප්‍රදේශයත්[14] යායිර්ගේ
කූඩාරම් ගම්මාන[15] සියල්ලත් උරුම
විය. ඊට නගර හැටක් ඇතුළත්
විය. **31** ගිලියද් දේශයෙන් භාග-
යක්ද බාෂාන්හි රජු වූ ඕග්ගේ රාජධා-
නියේ අෂ්ටාරොත්[16] සහ එද්රෙයි[17]
යන නගර දෙකද මනස්සේ ගෝත්‍ර-
යට අයත් මාකීර්ගේ පුත්‍රයන්ගෙන්[18]
අඩකට තම තමන්ගේ පවුල්වලට
අනුව උරුම විය.

**32** මෝසෙස්, යෙරිකෝව අසල
තිබෙන යොර්දාන් ගඟට නැඟෙනහි-
රෙන් පිහිටි මෝවබ් පාළුකරයේ සිටි-
යදී, ඉහත සඳහන් වූ මුළු දේශය
ඔවුන්ට උරුම කර දුන්නේය.[19]

**33** එහෙත් ලෙවී ගෝත්‍රයට මෝ-
සෙස් උරුමයක් නොදුන්නේය.[20]
මන්ද දෙවි පොරොන්දු වූ ලෙස
ඔවුන්ට ලැබුණු උරුමය නම් ඊශ්‍රා-
යෙල්වරුන්ගේ දෙවි වන යෙහෝවාට
සේවය කිරීමය.[21]

**13 පරි.**

**1** ද්වි 3:12
යොෂු 12:2
**2** යොෂු 13:9
**3** ගණන් 21:26
**4** ගණන් 21:25
**5** ගණන් 32:3
**6** ගණන් 21:20
**7** ගණන් 32:38
**8** ගණන් 21:23
**9** ද්වි 2:26
**10** යොෂු 21:37
**11** ගණන් 32:37
**12** ගණන් 32:38
**13** ද්වි 3:17
යොෂු 12:3
**14** ගණන් 33:49
**15** ද්වි 3:10
**16** ගණන් 21:25
**17** ගණන් 31:8
**18** ද්වි 2:30
ගීතා 135:10
**19** ගණන් 22:5
2පේතෘ 2:15
**20** ගණන් 22:7
ද්වි 18:10
**21** ගණන් 32:33
**22** ද්වි 3:12
**23** ගණන් 32:35
**24** ගණන් 32:26
**25** යොෂු 12:2
විනි 11:13

**2 තීරුව**

**1** ද්වි 3:11
2සාමු 11:1
**2** ද්වි 2:36
විනි 11:26
**3** ගණන් 21:26
**4** උත් 32:2
යොෂු 21:38
**5** 2සාමු 9:5
2සාමු 17:27
**6** ගණන් 32:36
**7** ගණන් 32:36
**8** උත් 33:17
විනි 8:5
1රාජා 7:46
ගීතා 60:6
**9** ගණන් 21:26
**10** ගණන් 34:11
ද්වි 3:17
යොහ 6:1
**11** ද්වි 3:16
**12** ද්වි 3:13
**13** 1ලේක 6:80
**14** ගණන් 32:33
**15** ගණන් 32:41
ද්වි 3:14
**16** යොෂු 12:4
**17** ගණන් 21:33
**18** ගණන් 32:39
**19** ගණන් 32:33
ද්වි 3:12
**20** ද්වි 10:9
යොෂු 13:14
යොෂු 18:7
**21** ගණන් 18:24
ගණන් 26:62
ද්වි 18:1
යොෂු 14:3

---

**යොෂු 13:21*** මෙහි සඳහන් වන්නේ 15-20 ඡේද-
වල විස්තර කරන සීහොන්ගේ රාජධානියට අයත්
මුළු ප්‍රදේශය ගැන විය හැකියි. 27වන ඡේදයත්
බලන්න.

**14** පසුව කානාන් දේශයේ[1]
ඉඩම්ද ඊශ්‍රායෙල් සෙනඟට
උරුමයක් ලෙස දෙනු ලැබීය.
පූජක එලියාසර්ද නූන්ගේ පුත්‍රයා
වූ යොෂුවාද ඊශ්‍රායෙල් ගෝත්‍රවල
ප්‍රධානියෝද ඔවුන්ට උරුමය බෙදා
දුන්නෝය.[2] **2** යෙහෝවා දෙවි
මෝසෙස්ට අණ කර තිබූ ලෙස දාදු
දමා[3] ඉතුරු ගෝත්‍ර නවයටත් මනස්-
සේ ගෝත්‍රයේ අනික් කොටසටත්
දේශයේ ඉඩම් බෙදා දෙන ලදි.[4]
**3** මෝසෙස් ඒ වන විටත් යොර්-
දාන් ගඟට නැඟෙනහිරෙන් පිහිටි
ප්‍රදේශය අනික් ගෝත්‍ර දෙකටත්
මනස්සේ ගෝත්‍රයෙන් කොටසක-
ටත් උරුමයක් ලෙස දී තිබිණ.[5]
එහෙත් ඊශ්‍රායෙල්හි අනික් ගෝත්‍රව-
ලට මෙන් ලෙවී ගෝත්‍රයට ඔහු දේශ-
යේ උරුමයක් ලබා දුන්නේ නැත.[6]
**4** යෝසෙප්ගේ පුතුන් දෙදෙනාගෙන්
පැවතෙන්නන් මේ වන විට මනස්-
සේ[7] සහ එෆ්‍රායිම්[8] ලෙස ගෝත්‍ර දෙක-
කට බෙදා තිබිණ.[9] ලෙවී ගෝත්‍රයට
තමන්ටම කියා උරුමයක් ලැබුණේ
නැත. වාසය කිරීම සඳහා නග-
රද[10] සතුන් සඳහා තණබිම්ද හැර
වෙන කිසිවක් ඔවුන්ට නොලැබිණ.[11]
**5** යෙහෝවා දෙවි මෝසෙස්ට අණ
කළ ආකාරයටම ඊශ්‍රායෙල්වරු දේශ-
යේ ඉඩම් බෙදුවෝය.

**6** එක් දිනක් යූදා ගෝත්‍රයේ සෙ-
නඟ යොෂුවාව හමු වීමට ගිල්ගාල්
නගරයට[12] පැමිණියෝය. ඔවුන්ගෙන්
කෙනෙකු වන කෙනිෂ්ෂිවරයෙකු[13] වූ
යෙෆුන්නෙගේ පුත් කාලෙබ්[14] යොෂු-
වාට මෙසේ කීවේය. “සැබෑ දෙවි[15]
වන යෙහෝවා තම සේවකයෙක් වූ
මෝසෙස්ට කාදෙෂ්-බර්නේයේදී[16] මා
ගැනත් ඔබ ගැනත් කියූ දේ[17] ඔබ
හොඳාකාරයෙන්ම දන්නවා. **7** යෙ-
හෝවා දෙවිගේ සේවකයෙකු වූ මෝ-
සෙස් දේශයේ තොරතුරු සොයා
බලන්න කාදෙෂ්-බර්නේයේ ඉඳන්
මාව යැව්වා.[18] ඒ කාලයේදී මගේ
වයස අවුරුදු හතළිහයි. එහි තිබූ
සැබෑ තත්වය ගැන මම ඇවිත් මෝ-
සෙස්ට වාර්තා කළා.[1] **8** එහෙත්
මා සමඟ ගිය අනික් අය කියූ දේවල්
නිසා ඊශ්‍රායෙල් සෙනඟ හොඳටම
භය වුණා.[2] මම මුළු හදවතින්ම
මගේ දෙවි වන යෙහෝවාව විශ්-
වාස කළා.[3] **9** ඒ නිසා එදා මෝ-
සෙස් දිවුරා මෙහෙම කිව්වා. ‘ඔබ
මගේ දෙවි යෙහෝවාව මුළු හද-
වතින්ම විශ්වාස කළ නිසා ඔබ
තොරතුරු බලන්න ගිය දේශය[4] ඔබ-
ටත් ඔබේ දරුවන්ටත් සදාකාලය-
ටම උරුමයක් ලෙස ලැබෙනවා.’[5]
**10** යෙහෝවා දෙවි එම පොරොන්දුව[6]
මෝසෙස් මාර්ගයෙන් දුන්නේ ඊශ්‍රා-
යෙල් සෙනඟ පාළුකරයේ ගමන් කළ
කාලයේදීයි.[7] ඒ පොරොන්දුව ඉටු
වෙනවා දකින්න යෙහෝවා දෙවි
මගේ ජීවිතය මේ අවුරුදු හතළිස්පහ
පුරාම ආරක්ෂා කර තිබෙනවා.[8] දැන්
මට වයස අවුරුදු අසූපහයි. **11** ඒත්
මෝසෙස් මාව දේශයේ තොරතුරු
සොයා බලන්න යැවූ දා වගේම මම
තවමත් ශක්තිමත්ව ඉන්නවා.[9] එදා
වගේම අදත් මම යුද්ධ කරන්න දක්-
ෂයි.[10] **12** එදා යෙහෝවා දෙවි මට
දෙන බවට පොරොන්දු වූ ඒ කඳුකර
පළාත යටත් කරගන්න දැන් මට
අවසර දෙන්න.[11] එහි අනාක්වරු[12]
ඉන්න බවද පවුරුවලින් වට කළ
විශාල නුවරවල්[13] එහි තිබෙන බවද
ඔබටත් දැනගන්න ලැබුණා. නමුත්
යෙහෝවා දෙවි පොරොන්දු වූ ලෙස
මට ඔවුන්ව පන්නා දමන්න පුළුවන්
වෙයි.[14] ඒ සඳහා යෙහෝවා දෙවි මට
ශක්තිය දෙන බවත් මට විශ්වා-
සයි.”[15]

**13** එවිට යොෂුවා යෙෆුන්නෙ-
ගේ පුත් කාලෙබ්ට ආශීර්වාද කර
ඔහුට හෙබ්‍රොන් උරුමයක් ලෙස
දුන්නේය.[16] **14** කෙනිෂ්ෂිවරයෙකු
වූ යෙෆුන්නෙගේ පුත් කාලෙබ් මුළු
හදවතින්ම ඊශ්‍රායෙල්වරුන්ගේ දෙවි
වන යෙහෝවාව විශ්වාස කළ නිසා
ඔහුට හෙබ්‍රොන් උරුම විය. අද

**14 පරි.**
**1** ගණන් 34:2
**2** ගණන් 34:17
යොෂු 19:51
**3** ගණන් 26:55
ගණන් 33:54
නෙහෙ 11:1
හිතෝ 16:33
ක්‍රියා 13:19
**4** ගණන් 34:13
**5** ගණන් 32:29
යොෂු 13:8
**6** ද්වි 10:9
යොෂු 13:14
**7** උත් 48:19
**8** උත් 48:20
**9** උත් 48:5
1ලේක 5:2
**10** ගණන් 35:7
යොෂු 21:2
1ලේක 6:54
**11** ලෙවී 25:34
ගණන් 35:2
ගණන් 35:5
**12** යොෂු 4:19
යොෂු 10:43
**13** ගණන් 32:12
යොෂු 15:17
**14** ගණන් 13:6
ගණන් 14:30
**15** ගණන් 12:7
ද්වි 33:1
ගීතා 90:පෙර
**16** ගණන් 13:26
ද්වි 1:19
**17** ද්වි 1:36
**18** ගණන් 13:2
ගණන් 13:6
එස 20:6

**2 තීරුව**
**1** ගණන් 13:30
ගණන් 14:6
**2** ගණන් 13:32
**3** ගණන් 14:24
ගණන් 32:12
**4** ද්වි 1:36
**5** ගීතා 101:6
හිතෝ 28:20
**6** ගණන් 14:30
යොෂු 21:45
**7** ගණන් 14:33
යොෂු 11:18
**8** ගණන් 14:29
**9** ගීතා 90:10
**10** ද්වි 31:2
**11** යොෂු 14:9
**12** ගණන් 13:22
ගණන් 13:33
යොෂු 11:21
**13** ගණන් 13:28
**14** යොෂු 15:14
විනි 1:20
**15** ගණන් 14:8
ගීතා 60:12
රෝම 8:31
පිලි 4:13

**16** යොෂු 10:37; යොෂු 15:13; යොෂු 21:11; 1ලේක 6:56.

වන තුරු එය ඔහුට අයිතිය.[1]
**15** මීට කලින් හෙබ්‍රොන් නග-
රය හැඳින්වූයේ කිර්යත්-අර්බා[2] යන
නමින්ය. (අර්බා[3] යනු අනාක් ජාති-
කයන්ගේ මහත් ගෞරවයට පාත්‍ර වූ
මනුෂ්‍යයෙකි.) ඒ දේවල් සිදු වූ පසු
යුද්ධයෙන් තොර සාමකාමී වාතාවර-
ණයක් දේශය පුරා පැවතිණ.[4]

**15** යූදා ගෝත්‍රයට අයිති පවුල්-
වලට ආදු දැමීමෙන්[5] ලැබුණු
ප්‍රදේශය ඒදොම්හි[6] දේශ සීමාව
දක්වාද ෂීන් පාළුකරය[7] සහ නෙ-
ගෙබ් ප්‍රදේශයේ[8] දකුණු මායිම දක්-
වාද විහිදී ගියේය. **2** එම ප්‍රදේශයේ
දකුණු මායිම ආරම්භ වන්නේ ලුණු
මුහුදේ[9] දකුණු කෙළවරේ සිටය.
**3** එතැන් සිට එම මායිම දකුණු දෙ-
සින් තිබෙන අක්‍රබ්බීම් බෑවුම[10] හරහා
ෂීන්[11] දක්වා දිව ගියේය. පසුව එය
කාදෙෂ්-බර්නේය[12] දෙසට හැරී හෙ-
ස්‍රොන් සහ අද්දාර් නගර හරහාද
කර්කා නම් ස්ථානය හරහාද දිව
ගියේය. **4** එය එතැන් සිට අෂ්-
මොන්[13] දක්වාද ඊජිප්තු නිම්නය[14]
දිගේ ගොස් මහ මුහුදෙන් කෙළවර
විය. යූදා ගෝත්‍රයට අයිති ප්‍රදේශයේ
දකුණු සීමාව එයයි.

**5** ඔවුන්ගේ නැඟෙනහිර සීමාව
ලුණු මුහුදේ සිට යොර්දාන් ගඟේ
මෝයකට දක්වා විහිදී යයි.[15] ඔවුන්-
ගේ උතුරු සීමාව එම මෝයකෙ-
ටේ සිට **6** බෙත්-හොග්ලා නගරය[16]
දක්වාද බෙත්-අරබා නගරයට[17] උතු-
රින් ගොස් බොහන් නමින් හැඳින්වූ
ගල[18] දක්වාද දිව ගියේය. (බො-
හන්, රූබෙන් ගෝත්‍රයෙන් පැවතෙන්-
නෙකි.) **7** ඒ දේශ සීමාව ආකෝර්
තැනිතලාවේ[19] තිබෙන දෙබීර්
නම් ස්ථානය දක්වාද උතුරු දෙ-
සට තිබෙන ගිල්ගාල් නගරය[20] දක්-
වාද විහිදී ගියේය. ගිල්ගාල් නගරය
අදුම්මීම් බෑවුමට මුහුණ ලා පිහිටා
තිබෙන්නේය. එම බෑවුම නිම්නයට
දකුණින් පිහිටා ඇත. දේශ සීමාව
ගිල්ගාල් සිට ඒන්-ෂෙමෙෂ්[21] දිය පහර
හරහා ඒන්-රොගෙල්[1] දිය උල්පත
දක්වා විහිදී ගියේය. **8** එතැනින්
දේශ සීමාව හින්නොම් පුත්‍රයන්-
ගේ නිම්නය[2] පසු කරගෙන යෙබූසි-
වරුන්ගේ[3] නගරය වූ යෙරුසලම[4]
පිහිටි කන්දේ දකුණු පැත්තේ තිබෙන
බෑවුම හරහා දිව ගියේය. හින්නොම්
නිම්නයට බස්නාහිරෙන් පිහිටි කඳු
මුදුන දක්වා ඒ දේශ සීමාව විහිදී
ගියේය. එම කන්ද පිහිටා තිබෙන්නේ
රෙෆායිම් තැනිතලාවේ[5] උතුරු කෙ-
ළවරේය. **9** කඳු මුදුනේ සිට නෙෆ්-
තෝවා දිය උල්පත[6] දක්වාද එෆ්‍රොන්
කන්දේ පිහිටි නගර දක්වාද බායලා
නගරය[7] දක්වාද දේශ සීමාව විහිදී
ගියේය. බායලා කිර්යත්-යෙයාරීම්[8]
යනුවෙන්ද හැඳින්වේ. **10** බායලා
නගරයේ සිට බස්නාහිරෙන් පිහිටි
සේයිර් කන්ද දක්වාද යෙයාරීම් කන්-
දේ උතුරු පැත්තේ බෑවුම එනම්,
කෙසාලොන් හරහාද එම දේශ සීමාව
විහිදී ගියේය. එතැනින් එය බෙත්-
ෂෙමෙෂ් නගරය[9] හරහා තිම්නාහ්[10]
දක්වාද විහිදී ගියේය. **11** එම දේශ
සීමාව එක්‍රොන් නගරයේ[11] උතුරු
පැත්තේ තිබෙන බෑවුම දක්වා ගොස්
ෂික්කෙරොන් දෙසට හැරී ගියේය.
එය එතැනින් බායලා කන්ද දක්වාද
යබ්නෙයෙල් දක්වාද විහිදී ගොස් මහ
මුහුදෙන් කෙළවර විය.

**12** ඔවුන්ගේ බස්නාහිර දේශ
සීමාව වූයේ මහ මුහුදේ[12] වෙරළබඩ
තීරයයි. යූදා ගෝත්‍රයට අයිති පවුල්-
වලට ලැබුණු දේශයේ මායිම් ඒවාය.

**13** යෙහෝවා දෙවි යොෂුවාට
පැවසූ ලෙස යෙෆුන්නෙගේ පුත්
කාලෙබ්ට,[13] යූදා ගෝත්‍රයට
ලැබුණු ප්‍රදේශයේ පිහිටි කිර්යත්-
අර්බා හෙවත් හෙබ්‍රොන් නමැති
නගරය[14] උරුමයක් ලෙස ලැබිණ.
(අර්බා, අනාක්වරුන්ගේ පියාය.)
**14** කාලෙබ් අනාක්ගේ පුත්‍රයන්[15] වූ
ෂේෂයිවද[16] අහිමාන්වද තල්මයිවද[17]

**14 පරි.**
1 ගණන් 14:24; ද්වි 1:36; යොෂු 14:8
2 උත් 23:2; යොෂු 15:13
3 යොෂු 21:11
4 ලෙවී 26:6; යොෂු 11:23

**15 පරි.**
5 ගණන් 26:55
6 උත් 36:19
7 ගණන් 33:36
8 ද්වි 1:7
9 ගණන් 34:3
10 විනි 1:36
11 ගණන් 34:4
12 ගණන් 32:8
13 ගණන් 34:5
14 උත් 15:18; යොෂු 13:3; 1රාජ 8:65
15 ගණන් 34:12
16 යොෂු 18:19
17 යොෂු 18:22
18 යොෂු 18:17
19 යොෂු 7:26
20 යොෂු 4:19; යොෂු 5:9
21 යොෂු 18:17

**2 තීරුව**
1 1රාජ 1:9
2 යොෂු 18:16; 2රාජ 23:10; යෙරෙ 7:31; මතෙ 5:22
3 යොෂු 18:28; විනි 1:21
4 විනි 19:10; 2සාමු 5:6
5 යොෂු 18:16; 2සාමු 5:18
6 යොෂු 18:15
7 2සාමු 6:2; 1ලේක 13:6
8 යොෂු 9:17
9 යොෂු 21:16; 1සාමු 6:12; 2රාජ 14:11; 1ලේක 6:59
10 යොෂු 19:43; විනි 14:2; 2ලේක 28:18
11 යොෂු 19:43; 1සාමු 5:10; 1සාමු 7:14; 2රාජ 1:2
12 ගණන් 34:6; ද්වි 11:24; යොෂු 15:47
13 ගණන් 13:30; ද්වි 1:36; යොෂු 14:13; යොෂු 21:12

**14** උත් 23:2; උත් 35:27; යොෂු 14:15; යොෂු 20:7; **15** ගණන් 13:33; යොෂු 11:21; විනි 1:20; **16** ගණන් 13:22; **17** විනි 1:10.

ඒ නගරයෙන් පන්නා දැමුවේය.
**15** ඉන්පසු ඔහු දෙබීර් නගරයේ
වැසියන්ට විරුද්ධව සටන් කිරී-
මට පිටත්ව ගියේය.[1] (දෙබීර් නග-
රය මීට කලින් හැඳින්වූයේ
කිර්යත්-සේෆර් කියාය.)[2] **16** එතැ-
නට පිටත්ව යන විට කාලෙබ් මෙසේ
කීවේය. “කිර්යත්-සේෆර් නගරයේ
වැසියන්ට පහර දී නගරය අල්ලා-
ගන්නා තැනැත්තාට මගේ දුව අක්-
සාව[3] මම විවාහ කර දෙනවා.”
**17** කාලෙබ්ගේ සහෝදරයා වූ කෙ-
නෂ්ගේ[4] පුත් ඔත්නියෙල්[5] එම නගර-
යට පහර දී එය යටත් කරගත්තේය.
එහෙයින් කාලෙබ් ඔහුට තම දියණිය
වූ අක්සාව[6] විවාහ කර දුන්නේය.
**18** අක්සා ඇගේ පියාගේ ගෙදරින්
පිටත්ව යන විට පියාගෙන් කෙතක්
ඉල්ලන ලෙස ඇය තම ස්වාමිපුරුෂ-
යාට ඇවිටිලි කළාය. ගමන යෑම
සඳහා බූරුවා පිට නැඟ සිටි ඇය අත්-
පුඩි ගසා පියාට අඬගැසුවාය. එවිට
කාලෙබ්, “මගේ දුවේ, ඔබට මොන-
වද ඕනේ” කියා ඇගෙන් ඇසුවේය.[7]
**19** “මට තවත් තෑග්ගක් දෙන්න.
ඔබ මට දුන්නේ දකුණු දිශාවේ
තියෙන වියළි බිම් කොටසක්. ඒ
නිසා මට ගුල්ලොත්-මායිම්* ප්‍රදේශ-
යත් දෙන්න පුළුවන්ද” කියා ඇය
ඇසුවාය. කාලෙබ් ඇයට ගුල්ලොත්
ප්‍රදේශයේ ඉහළ කොටසද පහළ කො-
ටසද දුන්නේය.[8]

**20** යූදා ගෝත්‍රයට[9] අයත් පවුල්ව-
ලට ලැබුණු උරුමය මෙයයි.[10]

**21** යූදා ගෝත්‍රයට ලැබුණු දේශ-
යේ දකුණු කොටස ඒදොම් දේශ
සීමාව[11] දක්වා විහිදී ගියේය.
දකුණු කොටසෙහි කෙළවරේ පිහිටි
නගර මේවාය. කබ්ෂෙයෙල්,[12] ඒදෙර්
සහ යාගුර්, **22** කීනා, දිමෝනා සහ
අදාදා, **23** කෙදෙෂ්, හාෂෝර් සහ
ඉත්නාන්, **24** ශිප්, ටෙලෙම්[13] සහ
බෙයාලොත්, **25** හාෂෝර්-හදත්තා,
හාෂෝර් කියාද හැඳින්වූ කෙරියොත්-

යොෂු **15:19*** තේරුම, “දිය පොකුණු.”

**15 පරි.**
**1** යොෂු 10:39
**2** විනි 1:11
**3** විනි 1:13
**4** විනි 1:13
1ලේක 4:13
**5** විනි 3:9
විනි 3:11
**6** 1ලේක 2:49
**7** විනි 1:14
**8** විනි 1:15
**9** උත් 49:8
ද්වි 33:7
**10** ගණන් 33:54
**11** ගණන් 34:3
ද්වි 2:5
**12** නෙහෙ 11:25
**13** 1සාමු 15:4

**2 තීරුව**
**1** යොෂු 19:2
1ලේක 4:28
**2** නෙහෙ 11:26
**3** යොෂු 19:3
1ලේක 4:28
**4** උත් 21:31
යොෂු 19:2
**5** යොෂු 19:3
**6** 1ලේක 4:29
**7** ගණන් 14:45
ද්වි 1:44
යොෂු 19:4
විනි 1:17
**8** යොෂු 19:5
1සාමු 27:6
1ලේක 12:1
**9** 1ලේක 4:32
**10** යොෂු 19:7
නෙහෙ 11:29
**11** ද්වි 1:7
යොෂු 9:1
විනි 1:9
**12** යොෂු 19:41
විනි 13:25
විනි 16:31
**13** නෙහෙ 11:29
**14** නෙහෙ 11:30
**15** යොෂු 10:3
**16** යොෂු 12:15
1සාමු 22:1
**17** 1සාමු 17:1
**18** යොෂු 10:10
**19** 1සාමු 17:52
**20** යොෂු 10:3
2රාජා 18:14
**21** 2රාජා 22:1
**22** යොෂු 10:3
**23** යොෂු 10:28
**24** යොෂු 10:29
2රාජා 8:22
**25** යොෂු 19:7
**26** 1සාමු 23:1
**27** උත් 38:5
**28** මීකා 1:15
**29** යොෂු 13:3
**30** 1සාමු 5:1
**31** උත් 10:19

හෙෂ්රොන්, **26** අමාම්, ෂෙමා,
මොලාදා,[1] **27** හෂර්-ගද්දා, හෙෂ්-
මොන්, බෙත්-පෙලෙත්,[2] **28** හෂර්-
ෂූවාල්,[3] බෙයර්-ෂෙබා,[4] බිසියො-
තියා, **29** බායලා,[5] ඉයීම්, ඒෂෙම්,[6]
**30** එල්තෝලද්, කේසිල්, හොර්මා,[7]
**31** ශික්ලග්,[8] මද්මන්නා, සන්සන්නා,
**32** ලෙබායොත්, ශිල්හිම්, ආයින්[9] සහ
රිම්මොන්ය.[10] එම නගරවල ගණන
විසිනවයකි. ඒ එක් එක් නගරයට
අයිති ගම්මානද තිබිණ.

**33** පහත් බිම්වල*[11] තිබූ නගර
මේවාය. එෂ්තායොල්,[12] ෂොරා,[13]
අෂ්නා, **34** ෂානොවා,[14] ඒන්-ගන්-
නිම්, තප්පුවා, ඒනාම්, **35** යාමුත්,[15]
අදුල්ලාම්,[16] සෝකෝ,[17] අෂේකා,[18]
**36** ෂායරයිම්,[19] අදීතයිම්, ගෙදේරා
සහ ගෙදේරොතායිම්ය. එම නගරවල
ගණන දහහතරකි. ඒ එක් එක් නගර-
යට අයිති ගම්මානද තිබිණ.

**37** ෂෙනාන්, හදාෂා, මිග්දල්-ගාද්,
**38** දිලෙයන්, මිෂ්පේ, යොක්තෙයේල්,
**39** ලාකිෂ්,[20] බොෂ්කත්,[21] එග්-
ලොන්,[22] **40** කබ්බොන්, ලාමාම්,
කිත්ලිෂ්, **41** ගෙදේරොත්, බෙත්-
දාගොන්, නයමා සහ මක්කේදාය.[23]
එම නගරවල ගණන දහසයකි. ඒ
එක් එක් නගරයට අයිති ගම්මානද
තිබිණ.

**42** ලිබ්නා,[24] එතෙර්,[25] ආෂාන්,
**43** ඉෆ්තා, අෂ්නා, නේෂිබ්, **44** කෙ-
යිලා,[26] අක්ෂිබ්[27] සහ මරේෂාහ්ය.[28]
එම නගරවල ගණන නවයකි. ඒ
එක් එක් නගරයට අයිති ගම්මානද
තිබිණ.

**45** එක්‍රොන් නගරයද[29] ඒ අවට
තිබෙන කුඩා නගර සහ ගම්මානද
ඔවුන්ට උරුම විය. **46** එක්‍රොන්
සිට බටහිර දෙසින් පිහිටි අෂ්දොද්
දක්වා තිබෙන නගර සහ ගම්මාන
සියල්ලද ඔවුන්ට අයිති විය.

**47** අෂ්දොද් නගරයද[30] ඒ අවට
තිබෙන කුඩා නගර සහ ගම්මානද
ගාසා නගරය[31] සහ ඒ අවට තිබෙන

යොෂු **15:33*** මූ.අ., “ෂෙපේලා.”

කුඩා නගර සහ ගම්මානද ඊජිප්තු
නිම්නය දක්වා තිබෙන ගම්මානද
මහ මුහුද දක්වා තිබෙන ගම්මානද
වෙරළබඩ තීරයද ඔවුන්ට අයිති
විය.[1]
**48** කඳුකර පළාතේ තිබූ නගර
මේවාය. ෂාමීර්, යත්තීර්,[2] සෝකෝ,
**49** දන්නා, දෙබීර් කියාද හැඳින්වූ
කිර්යත්-සන්නා, **50** අනාබ්, එෂ්-
තෙමෝ,[3] ආනිම්, **51** ගෝෂෙන්,[4]
හෝලොන් සහ ගීලොය.[5] එම නගර-
වල ගණන එකොළහකි. ඒ එක් එක්
නගරයට අයිති ගම්මානද තිබිණ.
**52** අරාබ්, දූමා, ඒෂාන්,
**53** යානිම්, බෙත්-තප්පුවා, අපේකා,
**54** හුම්තා, හෙබ්‍රොන්[6] කියාද හැඳින්වූ
කිර්යත්-අර්බා සහ ෂියෝර්ය. එම
නගරවල ගණන නවයකි. ඒ එක් එක්
නගරයට අයිති ගම්මානද තිබිණ.
**55** මායොන්,[7] කර්මෙල්, ෂීප්,[8]
යුත්තා, **56** යෙෂ්‍රෙයෙල්, යොක්-
දෙයාම්, ෂානොවා, **57** කායන්,
ගිබෙයා සහ තිම්නාහ්ය.[9] එම නගර-
වල ගණන දහයකි. ඒ එක් එක් නග-
රයට අයිති ගම්මානද තිබිණ.
**58** හල්හුල්, බෙත්-ෂූර්, ගෙදොර්,
**59** මයරාත්, බෙත්-අනොත් සහ එල්-
තෙකොන්ය. එම නගරවල ගණන
හයකි. ඒ එක් එක් නගරයට අයිති
ගම්මානද තිබිණ.
**60** කිර්යත්-යෙයාරීම්[10] කියාද
හැඳින්වූ කිර්යත්-බාල්[11] සහ රබ්බාය.
එම නගරවල ගණන දෙකකි. ඒ
එක් එක් නගරයට අයිති ගම්මානද
තිබිණ.
**61** පාළුකරයේ තිබූ නගර මේ-
වාය. බෙත්-අරබා,[12] මිද්දින්, සෙ-
කාකා, **62** නිබ්ෂාන්, ලුණු නුවර
සහ ඒන්-ගෙදීය.[13] එම නගරවල
ගණන හයකි. ඒ එක් එක් නගරයට
අයිති ගම්මානද තිබිණ.
**63** යෙරුසලමේ[14] වාසය කළ යෙ-
බුසිවරුන්ව[15] පන්නා දැමීමට යූදා
ගෝත්‍රයේ අයට නොහැකි විය.[16]
අද දක්වා යෙබුසිවරු, යුදෙව්වරුන්
සමඟ යෙරුසලමේ වාසය කරති.

**16** ආදූ දමා[1] යෝසෙප්ගේ පුත්‍ර-
යන්ට[2] උරුම වූ ප්‍රදේශය
මෙයයි. ඔවුන්ගේ දේශ සීමාව යොර්-
දාන් ගඟ[3] යෙරිකෝව අසලින් ගලා
යන ස්ථානයෙන් පටන්ගෙන යෙරි-
කෝවේ දිය උල්පත්වලට නැඟෙනහි-
රෙන් ගොස් යෙරිකෝවට ඉදිරියෙන්
තිබෙන පාළුකරය හරහාද බෙතෙල්හි
කඳුකර පළාත හරහාද දිව ගියේය.[4]
**2** ඒ මායිම ලූෂ් නගරය[5] අසල
තිබෙන බෙතෙල් සිට අර්කීවරුන්-
ගේ[6] දේශ සීමාව වන අටාරොත් නග-
රය දක්වා දිව ගියේය. **3** එතැන්
සිට එය බස්නාහිර දෙසට හැරී
යප්ලේතිවරුන්ගේ දේශ සීමාව දෙ-
සට විහිදී ගියේය. එය පහළ බෙත්-
හෝරොන්හි[7] දේශ සීමාව දක්වාද
ගෙෂෙර් නගර[8] දක්වාද ගොස් මහ
මුහුදෙන් කෙළවර විය.[9]
**4** යෝසෙප්ගේ පුත්‍රයන්ගෙන්[10]
පැවත ආ මනස්සේ ගෝත්‍රයේ
අය සහ එෆ්‍රායිම් ගෝත්‍රයේ[11] අය
තමන්ට උරුම වූ දේශයේ පදිංචි
වූහ.[12] **5** එෆ්‍රායිම් ගෝත්‍රයට අයත්
පවුල්වලට උරුම වූ දේශයේ සීමාව
නැඟෙනහිර දෙසින් පිහිටි අටාරොත්-
අද්දර් නගරයේ[13] සිට ඉහළ බෙත්-
හෝරොන්[14] දක්වාම විහිදී ගියේය.
**6** එය මහ මුහුද දක්වාද විහිදී ගොස්
එතැනින් කෙළවර විය. එය උතුරු
දෙසින් පිහිටි මික්මෙතාත්[15] සිට
නැඟෙනහිර දෙසින් පිහිටි තයනත්-
ශීලෝ දක්වාද යනෝවා දක්-
වාද විහිදී ගියේය. **7** යනෝවා සිට
අටාරොත් නගරය දක්වාද එතැ-
නින් නයරා නගරය දක්වාද යෙරි-
කෝව[16] දක්වාද ගොස් යොර්දාන්
ගඟෙන් කෙළවර විය. **8** ඔවුන්ගේ
දේශ සීමාවට තප්පුවා නගරයද[17]
අයත් විය. දේශ සීමාව තප්පුවා සිට
බස්නාහිර දෙසට දිව ගොස් කානාහ්
ඔය[18] දිගේ මහ මුහුදෙන් කෙළවර
විය.[19] එෆ්‍රායිම් ගෝත්‍රයේ පවුල්වලට
ලැබුණු උරුමය එයයි. **9** ඊට අම-
තරව මනස්සේ ගෝත්‍රයට ලැබුණු
ප්‍රදේශයේ තිබූ සමහර නගරද එෆ්‍රා-

**15 පරි.**
1 උත් 15:18; ගණන් 34:5
2 යොෂු 21:14
3 1සාමු 30:28; 1ලේක 6:57
4 යොෂු 10:41; යොෂු 11:16
5 2සාමු 15:12
6 උත් 23:2; යොෂු 14:15; යොෂු 15:13
7 1සාමු 23:25; 1සාමු 25:2
8 1සාමු 23:14
9 උත් 38:12
10 යොෂු 9:17; 1සාමු 7:1
11 යොෂු 18:14
12 යොෂු 18:22
13 1සාමු 23:29; 2ලේක 20:2
14 විනි 1:8; 1ලේක 11:4
15 උත් 10:16; විනි 1:21
16 නික් 23:29; ගණන් 33:55; විනි 1:21; විනි 2:23; විනි 3:4; විනි 19:11; 2සාමු 5:6

**2 තීරුව**

**16 පරි.**
1 ගණන් 26:55; ගණන් 33:54; හිතෝ 16:33
2 උත් 49:22; ද්වි 33:13
3 ගණන් 35:1; යොෂු 18:12
4 යොෂු 18:13
5 උත් 28:19
6 2සාමු 16:16
7 යොෂු 18:13; 1ලේක 7:24
8 1ලේක 7:28
9 ගණන් 34:6
10 උත් 48:5; යොෂු 17:14
11 යොෂු 14:4
12 ද්වි 33:15
13 යොෂු 18:13
14 2ලේක 8:5
15 යොෂු 17:7
16 යොෂු 6:20; යොෂු 6:26
17 යොෂු 17:8
18 යොෂු 17:9
19 ගණන් 34:6; යොෂු 16:3

යිම් ගෝත්‍රය සඳහා වෙන් කරන ලදි.[1]
එම නගරද ඒවාට අයිති ගම්මානද
ඔවුන්ට ලැබිණ.
**10** ඔවුහු ගෙෂෙර් නගරයේ[2]
වාසය කළ කානානිවරුන්ව පන්නා
දැමුවේ නැත.[3] ඒ වෙනුවට ඔවුන්ව
මෙහෙකාරකම සඳහා තබාගත්-
තෝය.[4] කානානිවරු අද වන තුරු
එෆ්‍රායිම්වරුන් අතරේ වාසය කරති.[5]

**17** ඊළඟට ආදූ දමා[6] යෝසෙප්-
ගේ කුලුඳුල් පුත්‍රයා වූ මනස්-
සේ ගෝත්‍රයට[7] ලැබිය යුතු කොටස
වෙන් කළේය. මනස්සේගේ කුලුඳුල්
පුත්‍රයා[8] වූ මාකීර්[9] යුධ දක්ෂයෙක්
විය.[10] ඔහුට ගිලියද්[11] සහ බාෂාන්
නම් ප්‍රදේශ ලැබුණේය. මාකීර්ගේ
පුත්‍රයාගේ නම ගිලියද්ය.[12] **2** පසුව
මනස්සේගෙන් පැවතෙන්නන් වන
අබි-එෂෙර්ගේ,[13] හේලෙක්ගේ,[14] අස්‍රි-
යෙල්ගේ, ෂෙකෙම්ගේ,[15] හේෆෙර්ගේ
සහ ෂෙමීදාගේ[16] පවුල් උදෙ-
සාද ආදූ දමා දේශයෙන් කොටසක්
වෙන් කර දුන්නේය. යෝසෙප්ගේ
පුත්‍රයා වන මනස්සේගෙන් පැවත
ආ පවුල් ඒවාය. **3** මනස්සේගෙන්
පැවත ආ ෂෙලොපෙහාද්[17] නම් මිනි-
සෙක් සිටියේය. මාකීර්ගේ පුත්‍රයා
වන ගිලියද්ගේ පුත් හේෆෙර් ඔහු-
ගේ පියාය. ෂෙලොපෙහාද්ට පුත්‍රයෝ
සිටියේ නැත. ඔහුට සිටියේ දූවරුන්
පමණයි. ඔවුන් නම් මාලාහ්, නෝවා,
හොග්ලා, මිල්කා සහ තිර්ෂාය.[18]
**4** එම දූවරු පූජක එලියාසර්වද[19]
නූන්ගේ පුත් යොෂුවාවද අධිපතීන්වද
හමු වී මෙසේ කීවෝය. "අපේ ගෝත්‍ර-
යට අයත් කොටස බෙදා දෙන විට
අපටත් උරුමයක් දෙන්න කියා යෙ-
හෝවා දෙවි මෝසෙස්ට කිව්වා."[20]
යෙහෝවා දෙවි එසේ පවසා තිබූ
නිසා ඔවුන්ගේ පියාගේ සහෝදර-
යන්ට මෙන් ඔවුන්ටද උරුමයක්
ලැබිණ.[21]
**5** යොර්දාන් ගඟට නැඟෙනහි-
රෙන් පිහිටි ගිලියද් දේශයට සහ
බාෂාන් දේශයට අමතරව යොර්දාන්
ගඟට බස්නාහිරෙන් පිහිටි දේශයෙන්
බිම් කොටස් දහයක්ද මනස්-
සේ ගෝත්‍රයට ලැබිණ.[1] **6** මන්ද
මනස්සේගෙන් පැවත ආ දූවරුන්ටත්
පුත්‍රයන්ට මෙන් උරුමයක් ලැබිණ.
මනස්සේ ගෝත්‍රයේ අනික් අයට
ගිලියද් දේශය තම උරුමය ලෙස
ලැබිණ.
**7** මනස්සේ ගෝත්‍රයට ලැබුණු දේ-
ශයේ මායිම ආෂෙර් සිට ෂීකෙම්
නගරයට[2] ඉදිරියෙන් පිහිටි මික්මෙ-
තාත්[3] දක්වා දිව ගියේය. එය දකුණු
දෙසින් පිහිටි එන්-තප්පුවාහි වැසි-
යන් ජීවත් වූ ප්‍රදේශය දක්වාද දිව
ගියේය. **8** තප්පුවා නගරය[4] අවට
ප්‍රදේශය මනස්සේ ගෝත්‍රයට උරුම
වූ අතර මනස්සේ ගෝත්‍රයේ දේශ
සීමාව අසල පිහිටි තප්පුවා නග-
රය එෆ්‍රායිම් ගෝත්‍රයට උරුම විය.
**9** එතැනින් මනස්සේ ගෝත්‍රයේ දේශ
සීමාව දකුණු දෙසට තිබෙන කානාහ්
නිම්නය දිගේ දිව ගියේය.[5] එම දේශ
සීමාවේ එෆ්‍රායිම් ගෝත්‍රයට අයත්
නගරද තිබිණ. මනස්සේ ගෝත්‍ර-
යට අයත් දේශය කානාහ් නිම්නයට
උතුරෙන් පිහිටා තිබුණු අතර එම
දේශ සීමාව මහ මුහුදෙන් කෙළ-
වර විය.[6] **10** නිම්නයට දකුණෙන්
එෆ්‍රායිම් ගෝත්‍රයට අයත් දේශයද
නිම්නයට උතුරෙන් මනස්සේ ගෝ-
ත්‍රයට අයත් දේශයද පිහිටා තිබිණ.
එම ගෝත්‍රයන්ට අයත් දේශ සීමා-
වන් දෙකෙහිම මායිම මහ මුහුදය.[7]
මනස්සේ ගෝත්‍රයට අයත් දේශය
උතුරින් පිහිටි ආෂෙර් ගෝත්‍රයේ දේශ
සීමාව දක්වාද නැඟෙනහිරෙන් පිහිටි
ඉසකාර් ගෝත්‍රයේ දේශ සීමාව දක්-
වාද විහිදී ගියේය.
**11** ඉසකාර් ගෝත්‍රයට සහ ආෂෙර්
ගෝත්‍රයට අයිති ප්‍රදේශවල තිබූ
නගර කිහිපයක්ද ඒවායේ ගම්මා-
නද මනස්සේ ගෝත්‍රයට[8] අයිති විය.
ඒවා නම් බෙත්-ෂෙයාන්,[9] ඉබ්ලෙ-
යාම්,[10] දෝර්* යන නගරත්[11] ඒවාට

**16 පරි.**
1 යොෂු 17:9
2 යොෂු 16:3
3 නික් 23:29 ගණන් 33:55 ද්වි 7:22 යොෂු 23:13 විනි 1:29
4 යොෂු 17:13 1රාජා 9:21
5 ගණන් 33:52 ද්වි 7:1 විනි 3:1

**17 පරි.**
6 ගණන් 26:55 ගණන් 33:54 හිතෝ 16:33
7 උත් 46:20
8 උත් 41:51 උත් 48:18 ද්වි 21:17
9 උත් 50:23 ගණන් 32:40
10 උත් 49:24
11 ද්වි 3:13 යොෂු 13:31
12 ගණන් 26:29 1ලේක 2:23 1ලේක 7:14
13 විනි 6:11 විනි 8:2 1ලේක 7:18
14 ගණන් 26:30
15 ගණන් 26:31
16 ගණන් 26:32
17 ගණන් 26:33 ගණන් 36:2
18 ගණන් 27:1
19 ගණන් 27:2 ගණන් 34:17 යොෂු 14:1
20 ගණන් 27:7
21 ගණන් 27:11 ගණන් 36:2 ගණන් 36:6 ගණන් 36:12

**2 තීරුව**
1 යොෂු 13:29
2 යොෂු 20:7 යොෂු 24:1 1ලේක 6:67
3 යොෂු 16:6
4 යොෂු 16:8
5 යොෂු 16:9
6 යොෂු 16:3 යොෂු 16:8
7 ගණන් 34:6
8 1ලේක 7:29
9 1සාමු 31:10 1රාජා 4:12
10 2රාජා 9:27
11 යොෂු 12:23 විනි 1:27

යොෂු **17:11*** ජනාවාස නගර යන අදහස මුල් භාෂාවේ ඇතුළත් වී තිබේ.

අයිති ගම්මානත්ය. එමෙන්ම උස්
ප්‍රදේශවල පිහිටි ඒන්-දෝර්,[1] තය-
නක්[2] සහ මෙගිද්දෝ[3] යන ජනාවාස
නගරත් ඒවාට අයිති ගම්මානත්
ඔවුන්ට ලැබිණ.

**12** මනස්සේ ගෝත්‍රයේ සෙනඟට
එම නගර උරුම වුණත් එහි වාසය
කළ කානානිවරුන්ව පන්නා දැමීමට
ඔවුන්ට නොහැකි විය.[4] **13** ඊශ්‍රා-
යෙල්වරු දේශයෙහි තම බලය තහ-
වුරු කරගත් නමුත්[5] තම සතුරන්
සියලුදෙනාවම දේශයෙන් පන්නා
දැමුවේ නැත.[6] ඔවුහු ඔවුන්ව මෙහෙ-
කාරකමට තබාගත්තෝය.[7]

**14** යෝසෙප්ගෙන් පැවතෙන්නෝ
යොෂුවාට මෙසේ පැමිණිලි කළෝය.
“යෙහෝවා දෙවි අපිට ආශීර්වාද
කළ නිසයි අපේ සෙනඟ මෙත-
රම් වර්ධනය වුණේ.[8] ඒත් ඔබ
අපිට දුන්නේ දේශයෙන් කුඩා කොට-
සක්.”*[9] **15** එවිට යොෂුවා ඔවුන්ට
මෙසේ කීවේය. “එෆ්‍රායිම් දේශයේ
කඳුකරයේ[10] ජීවත් වෙන්න ඔබට
ඉඩ මදි නම් පෙරිස්සිවරුන්[11] සහ
රෙෆායිවරුන්[12] ජීවත් වන කඳු-
කර ප්‍රදේශයේ වනාන්තර එළි පෙ-
හෙළි කරගෙන එහි ජීවත් වෙන්න.”
**16** එවිට යෝසෙප්ගෙන් පැවතෙන්-
නෝ ඔහුට මෙසේ පිළිතුරු දුන්-
නෝය. “අපට ජීවත් වීමට කඳුකර
ප්‍රදේශයේ ඉඩ මදි බව ඇත්තයි.
ඒත් අපි කොහොමද තැනිතලාවේ
ජීවත් වන කානානිවරුන්ට විරුද්-
ධව සටන් කරන්නේ? බෙත්-ෂෙයාන්
නගරයේ[13] හා ඒ අවට ගම්මානවල
විතරක් නෙමෙයි යෙෂ්‍රෙයෙල් තැනි-
තලාවේ[14] ජීවත් වෙන හැමෝටම
රෝදවලට යකඩ උල් සවි කළ
රථ තිබෙනවා.”[15] **17** එවිට යො-
ෂුවා යෝසෙප්ගෙන් පැවතෙන්නන්
වන එෆ්‍රායිම් සහ මනස්සේ යන ගෝ-
ත්‍රවලට මෙසේ කීවේය. “එෆ්‍රායිම්
සහ මනස්සේ ගෝත්‍රවල සෙනඟගේ
සංඛ්‍යාව ඉතා විශාලයි. ඒ වගේම ඔබ
හරිම බලවත්.[1] ඔබට දැන් තිබෙන
ප්‍රදේශයේ ඉඩ මදි බව මම දන්නවා.[2]
**18** ඒ නිසා මුළු කඳුකර ප්‍රදේශයම
ඔබ ගන්න.[3] ඔබට අයිති දේශයේ
සීමාව එයයි. ඒ ප්‍රදේශයේ වනාන්තර
එළි පෙහෙළි කරගන්න ඔබට සිදු
වෙයි. එහි ජීවත් වන කානානිවරුන්
බලවත් අය වෙන්න පුළුවන්. ඔවුන්-
ගේ රථවල රෝදවලට යකඩ උල් සවි
කර තිබෙන්න පුළුවන්. ඒ මොන දේ
තිබුණත් ඔබ ඔවුන්ව පන්නා දැමිය
යුතුයි.”[4]

**18** ඊශ්‍රායෙල්වරු ශීලෝ නගර-
යේ[5] රැස් වී සම්මුඛ වීමේ
කූඩාරම එහි පිහිටුවාගත්තෝය.[6]
ඒ වන විට ඊශ්‍රායෙල්වරුන් දේශය
යටත් කරගෙන තිබිණ.[7] **2** එහෙත්
ඊශ්‍රායෙල්වරුන් අතරින් ගෝත්‍ර හත-
කට ඒ වන විටත් ඔවුන්ට හිමි
දේශයන් බෙදා දී තිබුණේ
නැත. **3** එහෙයින් යොෂුවා ඊශ්‍රා-
යෙල්වරුන්ට මෙසේ කීවේය. “ඔබ
තවත් බලාගෙන ඉන්නේ ඇයි?[8]
ඔබේ මුතුන්මිත්තන්ගේ දෙවි වූ
යෙහෝවා ඔබට දුන් දේශය ඔබ
සම්පූර්ණයෙන්ම අයිති කරගන්න.[9]
**4** සෑම ගෝත්‍රයකින්ම සුදුසුකම් ඇති
මනුෂ්‍යයන් තුන්දෙනෙකුව තෝරා-
ගෙන ඔවුන්ව මා ළඟට එවන්න. එක්
එක් ගෝත්‍රයට දෙන උරුමය තීර-
ණය කරන පිණිස ඔවුන් දේශය පුරා
ගමන් කර එහි සිතියමක් සාදාගත
යුතුයි. ඉන්පසු ඔවුන් නැවත මා වෙ-
තට පැමිණිය යුතුයි.[10] **5** දකුණු
දිශාවේ යූදාට දී තිබෙන කොටසත්[11]
උතුරු දිශාවේ යෝසෙප්ගේ පුත්‍ර-
යන්ට දී තිබෙන කොටසත්[12] ඒ විදි-
හටම තිබෙන්න හරින්න. දේශයේ
ඉතුරු වී තිබෙන ප්‍රදේශය කො-
ටස් හතකට බෙදන්න.[13] **6** ඒ කො-
ටස් හත පිළිබඳ විස්තර සටහන්
කරගෙන මා ළඟට පැමිණෙන්න.

යොෂු **17:14*** මූ.අ., “මැන වෙන් කර දුන්නේ එක කොටසක්.”

**10** ගණන් 27:20; ගණන් 34:17; **11** යොෂු 15:1; **12** යොෂු 16:1; යොෂු 16:4; **13** ගණන් 34:13; යොෂු 19:51.

**17 පරි.**
**1** 1සාමු 28:7 ගීතා 83:10
**2** යොෂු 12:21 විනි 5:19
**3** 1ලේක 7:29
**4** නික් 23:29 විනි 1:27
**5** විනි 1:28
**6** නික් 23:33 ගණන් 33:55 ද්වි 20:17 යොෂු 23:13 විනි 2:23 විනි 3:2
**7** ද්වි 20:16 යොෂු 16:10 විනි 1:30 2ලේක 8:8
**8** උත් 48:19 ගණන් 26:34 ගණන් 26:37 ද්වි 33:17
**9** ගණන් 33:54
**10** යොෂු 19:50 යොෂු 24:33 විනි 7:24
**11** නික් 33:2 එස්රා 9:1
**12** උත් 15:20
**13** යොෂු 17:11 1රාජා 4:12
**14** යොෂු 19:18 විනි 6:33
**15** ද්වි 20:1 විනි 1:19 විනි 4:3 හිතෝ 21:31

**2 තීරුව**
**1** උත් 49:24
**2** යොෂු 17:14
**3** ගණන් 33:53 යොෂු 20:7 විනි 4:5
**4** ද්වි 20:1 ද්වි 31:6 යොෂු 13:6 ගීතා 27:1 රෝම 8:31 හෙබ්‍රෙ 13:6

**18 පරි.**
**5** යොෂු 19:51 යොෂු 21:2 යොෂු 22:9 විනි 21:19
**6** 1සාමු 1:3 1සාමු 4:3 ගීතා 78:60 යෙරෙ 7:12
**7** ගණන් 14:8 ද්වි 7:22 ද්වි 33:29 යොෂු 13:2 ක්‍රියා 7:45
**8** ගණන් 33:55 විනි 18:9 හිතෝ 10:4
**9** ගණන් 33:53 ද්වි 20:16

ඊටපස්සේ ඔබ එක් එක් කෙනාට
ලැබෙන කොටස දැනගැනීම සඳහා
අපේ දෙවි වන යෙහෝවා ඉදිරියෙහි
මම ආදු දමන්නම්.[1] **7** යෙහෝවා
දෙවිගේ ගෘහයේ පූජකයන් ලෙස සේ-
වය කිරීම ලෙවී ගෝත්‍රයේ අයගේ
උරුමය වන නිසා[2] ඔබට මෙන්
ඔවුන්ට දේශයේ උරුමයක් ලැබෙන්-
නේ නැහැ.[3] ඒ වගේම යෙහෝවා
දෙවිගේ සේවකයෙක් වූ මෝසෙස්,
යොර්දාන් ගඟේ නැඟෙනහිර පැත්තේ
තිබෙන දේශය ගාද් ගෝත්‍රයටත්
රූබේන් ගෝත්‍රයටත්[4] මනස්සේ ගෝ-
ත්‍රයෙන් එක් කොටසකටත්[5] දැනට-
මත් දී අවසානයි."[6]

**8** දේශයේ සිතියම් අඳින්න තෝ-
රාගත් අය පිටත් වෙන්න සූදා-
නම් වන විට යෝෂුවා ඔවුන්ට
මෙසේ පැවසුවේය.[7] "ඔබ දේශයේ
සෑම තැනටම ගිහින් එහි මායිම් හඳු-
නාගන්න. ඒ හැම විස්තරයක්ම සට-
හන් කරගෙන ආපහු ශීලෝ
නගරයට[8] එන්න. ඊටපස්සේ මම
යෙහෝවා දෙවි ඉදිරියෙහි ආදු දමන්-
නම්."[9] **9** ඔවුහු දේශය පුරාම ගොස්
එහි විස්තර ලියවිල්ලක සටහන් කර-
ගත්තෝය.[10] දේශයේ එක් එක් නගර
පිළිබඳ විස්තරද ඔවුහු ඊට ඇතු-
ළත් කළෝය. දේශය කොටස් හත-
කට වෙන් කර තිබිණ. පසුව ඔවුහු
ශීලෝ නගරයේ කඳවුරක සිටි යෝෂු-
වාට එම ලියවිල්ල භාර දුන්නෝය.
**10** යෝෂුවා, යෙහෝවා දෙවි ඉදිරි-
යේ[11] ආදු දමා ඒ එක් එක් ගෝත්‍රයට
අයිති කොටස වෙන් කර දුන්නේය.[12]

**11** ආදු දමා[13] බෙන්ජමින් ගෝත්‍ර-
යට[14] අයිති ප්‍රදේශය වෙන් කරනු
ලැබීය. ඔවුන්ට ලැබුණේ යූදා ගෝත්‍ර-
යට අයිති ප්‍රදේශයත්[15] යෝසෙප්-
ගේ පුත්‍රයන්ට අයිති ප්‍රදේශයත්[16]
අතර තිබූ කොටසය. **12** බෙන්ජ-
මින් ගෝත්‍රයේ උතුරු දේශ සීමාව
යොර්දාන් ගඟෙන් ආරම්භ වී යෙ-
රිකෝවේ[17] උතුරු පැත්තේ ඇති
බෑවුම දක්වා දිව ගියේය. එය එතැ-
නින් බස්නාහිර දෙසින් පිහිටි කන්ද
හරහා ගොස් බෙත්-ආවෙන් පාළු-
කරය[1] දක්වා විහිදී ගියේය.
**13** එතැන් සිට කලින් ලූෂ්[2]
කියා හැඳින්වූ බෙතෙල් නගරයට[3]
දකුණු දෙසින් පිහිටි බෑවුම පසු කර-
ගෙන ගොස් පහළ බෙත්-හෝරොන්
නගරයට[4] දකුණින් තිබෙන කන්-
දේ පිහිටි අටාරොත්-අද්දර් නගරය[5]
දක්වා දිව ගියේය. **14** දේශ සීමාව
බෙත්-හෝරොන් නගරයට මුහුණ ලා
තිබෙන කන්දේ සිට දකුණු දෙසට
හැරී බෙන්ජමින්වරුන්ගේ දේශ සීමා-
වේ බස්නාහිර මායිම දක්වා විහිදී
ගියේය. එම බස්නාහිර මායිම යූදා
ගෝත්‍රයට අයිති කිර්යත්-යෙයාරීම්[6]
කියාද හැඳින්වූ කිර්යත්-බාල් නගරය
අසලින් කෙළවර විය.

**15** එහි දකුණු සීමාව, කිර්යත්-
යෙයාරීම් නගරයේ කෙළවර සිට බස්-
නාහිර දෙසට ගොස් නෙප්තෝවා
දිය උල්පත[7] දක්වාද **16** හින්නොම්
පුත්‍රයන්ගේ නිම්නයට[8] ඉදිරියෙන්
පිහිටි කන්දේ පාමුල දක්වාද විහිදී
ගියේය. එම කන්ද පිහිටා තිබුණේ
රෙෆායිම් තැනිතලාවේ[9] උතුරු කෙ-
ළවරේය. දේශ සීමාව එතැන් සිට
හින්නොම් නිම්නය දක්වාත් යෙබූ-
සිවරුන්ගේ නගරය[10] පිහිටි කන්-
දේ දකුණු පැත්තේ තිබෙන බෑවුම
හරහාත් දිව ගොස් ඒන්-රොගෙල්[11]
දිය උල්පත අසලදී අවසන් විය.
**17** එතැනින් දේශ සීමාව උතුරට
වෙන්න පිහිටි ඒන්-ෂෙමෙෂ් දක්-
වාද අදුම්මිම් බෑවුමට[12] ඉදිරියෙන්
පිහිටි ගෙලීලොත් දක්වාද බොහන්[13]
නමින් හැඳින්වූ ගල[14] දක්වාද දිව
ගියේය. (බොහන්, රූබේන් ගෝ-
ත්‍රයට අයත් කෙනෙකි.) **18** එතැ-
නින් දේශ සීමාව මහ අරබා
නිම්නයට ඉදිරියෙන් ඇති කන්දේ
උතුරු බෑවුම දක්වාද අරබා නිම්නය
දක්වාද බැස ගියේය. **19** එතැන්
සිට බෙත්-හොග්ලා නගරයේ[15] පිහිටි
කන්දේ උතුරු බෑවුම දක්වා ගොස්
ලුණු මුහුදේ[16] උතුරු කෙළවරින්
සීමාව අවසන් විය. එය යොර්දාන්

**18 පරි.**
1 ගණන් 26:55; ගණන් 33:54; යෝෂු 14:2; හිතෝ 16:33; ක්‍රියා 13:19
2 ද්වි 10:9; ද්වි 18:1
3 ගණන් 18:20; යෝෂු 13:33
4 ද්වි 3:12
5 ද්වි 3:13
6 ද්වි 4:47
7 ගණන් 27:21
8 විනි 21:19
9 යෝෂු 19:51
10 යෝෂු 18:4
11 හිතෝ 16:33
12 ගණන් 33:54; ක්‍රියා 13:19
13 ගණන් 26:55
14 ද්වි 33:12
15 යෝෂු 15:1
16 යෝෂු 16:1
17 යෝෂු 2:1; යෝෂු 3:16; යෝෂු 6:1

**2 තීරුව**
1 යෝෂු 7:2
2 යෝෂු 16:2
3 උත් 28:19
4 යෝෂු 10:11; යෝෂු 16:3; යෝෂු 21:22
5 යෝෂු 16:5
6 යෝෂු 15:9; යෝෂු 15:60; 2සාමු 6:2; 1ලේක 13:6
7 යෝෂු 15:9
8 යෝෂු 15:8; 2ලේක 28:3; යෙරෙ 7:31; යෙරෙ 19:2; මතෙ 5:22
9 ද්වි 2:11; 2සාමු 5:18; යෙසා 17:5
10 යෝෂු 15:63; විනි 1:8; විනි 19:10
11 යෝෂු 15:7; 1රාජා 1:9
12 යෝෂු 15:7
13 යෝෂු 15:6
14 ද්වි 19:14
15 යෝෂු 15:6
16 ගණන් 34:12; ද්වි 3:17

ගහේ දකුණු කෙළවරයි. බෙන්ජමින්
ගෝත්‍රයට ලැබුණු දේශයේ දකුණු
සීමාව සටහන් වූයේ එම මායිම්ව-
ලින්ය. **20** එහි නැඟෙනහිර දේශ
සීමාව වූයේ යොර්දාන් ගඟය. බෙන්-
ජමින් ගෝත්‍රයේ පවුල්වලට උරුම වූ
දේශයේ සීමාවන් ඒවාය.

**21** බෙන්ජමින් ගෝත්‍රයේ පවුල්ව-
ලට ලැබුණු ප්‍රදේශයේ තිබූ නගර මේ-
වාය. යෙරිකෝව,[1] බෙත්-හොග්ලා,
ඒමෙක්-කෙෂිෂ්, **22** බෙත්-අරබා,[2]
ෂෙමරායිම්, බෙතෙල්,[3] **23** අව්-
විම්, පාරා, ඔෆ්රා,[4] **24** කේෆර්-
අම්මෝනි, ඔෆ්නී සහ ගෙබාය.[5]
එම නගරවල ගණන දොළහකි. ඒ
එක් එක් නගරයට අයිති ගම්මානද
තිබිණ.

**25** ගිබියොන්,[6] රාමා, බෙයේ-
රොත්, **26** මිශ්පේ,[7] කෙෆිරා,[8] මෝ-
ෂාහ්, **27** රෙකෙම්, ඉර්පෙයෙල්,
තරලා, **28** ෂේලාහ්,[9] හා-එලෙෆ්,
යෙරුසලම[10] කියාද හැඳින්වූ යෙබූසි,
ගිබෙයා[11] සහ කිර්යත් යන නගරත්
ඊට අයත් විය. එම නගරවල ගණන
දහහතරකි. ඒ එක් එක් නගරයට
අයිති ගම්මානද තිබිණ.

එම දේශයත් එහි තිබුණු නගරත්
බෙන්ජමින් ගෝත්‍රයට උරුම විය.[12]

**19** දෙවන වතාවට ආදු දැමූ[13]
විට වෙන් කරනු ලැබු-
වේ සිමියොන් ගෝත්‍රයට[14] අයිති
කොටසයි. ඔවුන්ට උරුම වූ කො-
ටස පිහිටා තිබුණේ යූදා ගෝ-
ත්‍රයට ලැබුණු ප්‍රදේශය තුළය.[15]
**2** ඔවුන්ට උරුම වූ නගර මේ-
වාය. බෙයර්-ෂෙබා,[16] ෂෙබා, මො-
ලාදා,[17] **3** හෂර්-ෂුවාල්,[18] බාලා,
ඒෂෙම්,[19] **4** එල්තෝලද්,[20] බෙතුල්,
හොර්මා, **5** ෂික්ලග්,[21] බෙත්-මර්-
කාබොත්, හෂර්-සූසා,[22] **6** බෙත්-
ලෙබායොත්[23] සහ ෂාරුහෙන්ය.
ඒ නගරවල ගණන දහතුනක් වූ
අතර ඒවාට අයිති ගම්මානද තිබිණ.
**7** ආයින්,[24] රිම්මොන්,[25] එතෙර් සහ
ආෂාන්[26] යන නගර හතර හා ඒවාට
අයිති ගම්මානද **8** ඒ අවට පිහිටි
සියලුම ගම්මානද ඊට ඇතුළත්
විය. දකුණේ රාමා[1] කියාද හඳුන්වන
බාලාත්-බෙයේර් නගරය[2] දක්වාම
ඔවුන්ට අයිති විය. සිමියොන් ගෝත්‍ර-
යේ පවුල්වලට උරුම වූ ප්‍රදේශය
එයයි. **9** යූදා ගෝත්‍රයට ලැබුණු
කොටස ඔවුන්ට පමණට වඩා විශාල
වූ නිසා[3] සිමියොන් ගෝත්‍රයට එම
දේශයෙන් කොටසක් උරුම විය.[4]

**10** තුන්වන වතාවට ආදු දැමූ[5]
විට වෙන් කරනු ලැබුවේ සෙබ්‍යු-
ලන් ගෝත්‍රයට[6] අයිති ප්‍රදේශයයි.
ඔවුන්ට උරුමයක් ලෙස ලැබුණු
ප්‍රදේශයේ සීමාව සාරිද් නගරය දක්වා
විහිදී ගියේය. **11** සාරිද් සිට දේශ
සීමාව බස්නාහිර දෙසින් තිබෙන මරි-
යල් දක්වාද දබ්බෙෂෙත් නගරය
දක්වාද විහිදී ගියේය. එය එතැ-
නින් යොක්නෙයාම් නගරය[7] ඉදිරි-
යේ තිබෙන නිම්නය දක්වා ගොස්
එතැනින් කෙළවර විය. **12** සාරිද්
සිට නැඟෙනහිර දෙසට දේශ
සීමාව කිස්ලොත්-තාබෝර් නගරයේ
මායිම දක්වාද දාබෙරත් නගරය[8]
සහ යාෆියා දක්වාද විහිදී ගියේය.
**13** එතැන් සිට එය ආපසු නැඟෙන-
හිර දෙසට හැරී ගාත්-හේෆෙර් නග-
රය[9] දක්වාද එත්-කාෂින් දක්වාද
රිම්මොන් නගරය සහ නෙයා නගරය
දක්වාද විහිදී ගියේය. **14** එතැන්
සිට දේශ සීමාව උතුරු දෙසින් පිහිටි
හන්නාතොන් නගරය දක්වා ගොස්
ඉප්තා-යෙල් නිම්නයෙන් කෙළවර
විය. **15** කට්ටාත්, නහලාල්, ෂිම්-
රොන්,[10] ඉදලා සහ බෙත්ලෙහෙම[11]
ඇතුළු නගර දොළහක් සහ ඒවාට
අයිති ගම්මානත් ඔවුන්ට අයිති විය.
**16** සෙබ්‍යුලන් ගෝත්‍රයට[12] උරුම-
යක් ලෙස ලැබුණු දේශය[13] හා ඊට
අයත් නගරද ගම්මානද ඒවාය.

**17** හතරවන වතාවට ආදු දැමූ විට
වෙන් කරනු ලැබුවේ ඉසකාර් ගෝත්‍ර-
යට[14] අයත් කොටසයි. **18** ඔවුන්ට
උරුම වූ දේශයේ මායිම්වල පිහිටි

**18 පරි.**
1 යොෂු 6:21; යොෂු 6:24
2 යොෂු 15:6
3 උත් 12:8; යොෂු 8:17; 1රාජා 12:29
4 1සාමු 13:17
5 යොෂු 21:17; එස්රා 2:26
6 යොෂු 9:17; 1රාජා 3:4
7 විනි 20:3
8 එස්රා 2:25
9 2සාමු 21:14
10 යොෂු 15:8; විනි 19:10; 1ලේක 11:4; 2ලේක 3:1
11 විනි 19:12; 1සාමු 10:26
12 ගණන් 26:54; ගණන් 33:54

**19 පරි.**
13 ගණන් 26:56; යොෂු 18:6
14 උත් 46:10
15 උත් 49:7
16 උත් 21:31; උත් 26:33; යොෂු 15:28
17 යොෂු 15:26; නෙහෙ 11:26
18 යොෂු 15:28; 1ලේක 4:28
19 යොෂු 15:29
20 යොෂු 15:30; 1ලේක 4:29
21 යොෂු 15:31; 1සාමු 27:6; 1සාමු 30:1; 1ලේක 4:30
22 1ලේක 4:31
23 යොෂු 15:32
24 1ලේක 4:32
25 නෙහෙ 11:29
26 යොෂු 15:42; 1ලේක 4:32; 1ලේක 6:59

**2 තීරුව**
1 1සාමු 30:27
2 1ලේක 4:33
3 ගණන් 33:54
4 විනි 1:3
5 යොෂු 18:6
6 උත් 49:13; ද්වි 33:18
7 යොෂු 12:22
8 යොෂු 21:28; 1ලේක 6:72
9 2රාජා 14:25
10 යොෂු 11:1; යොෂු 12:20
11 විනි 12:8
12 ගණන් 26:27
13 ගණන් 26:55

14 උත් 49:14; ගණන් 33:54; ද්වි 33:18.

ස්ථාන මේවාය. යෙෂ්‍රෙයෙල්,[1] කෙ-
සුල්ලොත්, ෂූනෙම්,[2] **19** හෆරායිම්,
ෂියොන්, අනාහරාත්, **20** රබ්බිත්,
කිෂියොන්, ඒබෙෂ්, **21** රෙමෙත්,
ඒන්-ගන්නිම්,[3] ඒන්-හද්දා සහ බෙත්-
පෂ්ෂෙෂ්ය. **22** ඔවුන්ගේ දේශ සීමාව
තාබෝර්[4] දක්වාද ෂහෂූමා දක්-
වාද බෙත්-ෂෙමෙෂ් නගරය දක්වාද
ගොස් යොර්දාන් ගඟෙන් කෙළවර
විය. ඔවුන්ට උරුම වූ මුළු නගර
ගණන දහසයකි. ඒවාට අයිති ගම්මා-
නද ඔවුන්ට උරුම විය. **23** ඉසකාර්
ගෝත්‍රයට[5] උරුමයක් ලෙස ලැබුණු
දේශයද ඊට අයිති නගර සහ ගම්මා-
නද ඒවාය.

**24** පස්වන වතාවට ආදූ දැමූ[6] විට
වෙන් කරනු ලැබුවේ ආෂේර් ගෝත්‍ර-
යට[7] අයිති දේශයයි. **25** ඔවුන්ට
උරුම වූ දේශයේ මායිම්වල පිහිටා
තිබුණු නගර නම් හෙල්කාත්,[8] හලී,
බෙටෙන්, අක්ෂාප්,[9] **26** අල්ලම්මෙ-
ලෙක්, අමාද් සහ මිෂාල්ය.[10] එම දේශ
සීමාව බස්නාහිර දෙසින් පිහිටි කර්-
මෙල් කඳුවැටිය[11] දක්වාද ෂීහෝර්-
ලිබ්නාත් නගරය දක්වාද විහිදී
ගියේය. **27** එය නැඟෙනහිර දෙ-
සට වෙන්න පිහිටි බෙත්-දාගොන්
නගරය හා සෙබුලූන් ගෝත්‍රයේ[12]
දේශ සීමාව දක්වාද ඉප්තා-යෙල්
නිම්නයේ උතුරු ප්‍රදේශය හරහාද
දිව ගියේය. ඔවුන්ගේ දේශ සීමාවේ
බෙත්-ඒමෙක් සහ නෙයියෙල් නගරද
පිහිටා තිබිණ. එය කාබුල් නගරයේ
වම් පැත්තෙන් ගොස් **28** ඒබ්‍රොන්,
රෙහොබ්, හම්මොන් සහ කානාහ්
යන නගර දක්වාද දිව ගියේය.
ඒ වගේම ඉතා ජනාකීර්ණ නගර-
යක් වන සීදොන්[13] දක්වාද එය
විහිදී ගියේය. **29** රාමා නගරයේ
සිට බලකොටු සහිත නගරයක් වන
තීර්හි[14] සීමාව අසලටත් ඔවුන්ගේ
දේශ සීමාව විහිදී ගියේය. එතැ-
නින් ඔවුන්ගේ දේශ සීමාව හෝසා
නගරය දක්වා දිව ගියේය. මහ
මුහුද අසබඩ පිහිටි අක්ෂිබ් නගර-
යෙන්[15] එය කෙළවර විය. **30** මුහු-
දුබඩ ප්‍රදේශ වූ උම්මා, අපෙක්[1]
සහ රෙහොබ්[2] යන නගරද ඔවුන්ගේ
දේශ සීමාවට ඇතුළත් විය. ඔවුන්ට
උරුම වූ මුළු නගර ගණන විසිදෙ-
කකි. ඒවාට අයිති ගම්මානද ඔවුන්ට
උරුම විය. **31** ආෂේර් ගෝත්‍රයේ[3]
පවුල්වලට උරුමයක් ලෙස ලැබුණු
දේශයද ඊට අයත් නගර සහ ගම්මා-
නද ඒවාය.

**32** හයවන වතාවට ආදූ දැමූ[4]
විට වෙන් කරනු ලැබුවේ නෆ්-
තලී ගෝත්‍රයට[5] අයිති කොටසයි.
**33** ඔවුන්ගේ දේශ සීමාව හේලෙෆ්
සහ ෂයනන්නිම්හි[6] විශාල ගස ළඟින්
පටන්ගෙන අදාමි-නෙකෙබ්, යබ්-
නෙයෙල් සහ ලක්කුම් යන ප්‍රදේශ
දක්වා දිව ගියේය. එය යොර්දාන්
ගඟෙන් කෙළවර විය. **34** එතැන්
සිට දේශ සීමාව බස්නාහිර දෙසට
වෙන්න පිහිටි අෂ්නොත්-තාබෝර්
දක්වාද එතැනින් හුක්කොක් දක්-
වාද විහිදී ගියේය. ඔවුන්ගේ
දේශයට දකුණු දිශාවෙන් තිබු-
ණේ සෙබුලූන් ගෝත්‍රයේ[7] දේශ
සීමාවයි. බටහිර දෙසින් තිබුණේ
ආෂේර් ගෝත්‍රයේ[8] දේශ සීමාවයි.
ඔවුන්ගේ නැඟෙනහිර දේශ සීමාව
යොර්දාන් ගඟ අසල යූදා දේශය*[9]
දක්වා විහිදී ගියේය. **35** ඔවුන්-
ගේ දේශ සීමාව තුළ තිබූ බල-
කොටු සහිත නගර වූයේ
ෂිද්දිම්, ෂේර්, හම්මත්,[10] රක්කත්,
කින්නෙරෙත්,[11] **36** අදාමා, රාමා,
හාෂෝර්,[12] **37** කෙදෙෂ්,[13] එද්රෙයි,
ඒන්-හාෂෝර්, **38** ඉරොන්, මිග්දල්-
එල්, හෝරෙම්, බෙත්-අනාත් සහ
බෙත්-ෂෙමෙෂ්ය.[14] ඔවුන්ට නගර දහ-
නවයක් උරුම විය. ඒවාට අයිති
ගම්මානද ඔවුන්ට උරුම විය.
**39** නෆ්තලී ගෝත්‍රයට[15] උරුමයක්
ලෙස ලැබුණු[16] දේශයද ඊට අයිති
නගර සහ ගම්මානද ඒවාය.

**40** හත්වන වතාවට ආදූ දැමූ[17] විට

---

**යොෂු 19:34*** මෙයින් අදහස් කරන්නේ යූදා ගෝත්‍රයට හිමි දේශය නොවේ. නමුත් යූදා ගෝත්‍රයට අයත් කෙනෙකුට හිමි ඉඩමකටය.

**19 පරි.**
1 යොෂු 17:16 විනි 6:33 1රාජා 21:1
2 1සාමු 28:4 1රාජා 1:3 1රාජා 2:17 2රාජා 4:8
3 යොෂු 21:29
4 විනි 4:6 යෙරෙ 46:18
5 ගණන් 26:25
6 ගණන් 26:55 යොෂු 18:6
7 උත් 49:20 ද්වි 33:24 ලූක් 2:36
8 යොෂු 21:31 1ලේක 6:75
9 යොෂු 11:1 යොෂු 12:20
10 යොෂු 21:30 1ලේක 6:74
11 1රාජා 18:19 2රාජා 2:25 යෙසා 35:2 යෙරෙ 46:18
12 යොෂු 19:10
13 උත් 10:15 යොෂු 11:8 විනි 1:31 මතෙ 11:21
14 2සාමු 5:11 යෙසා 23:17 ක්‍රියා 12:20
15 විනි 1:31

**2 තීරුව**
1 විනි 1:31
2 යොෂු 21:31 1ලේක 6:75
3 ගණන් 26:47
4 ගණන් 26:55 යොෂු 18:6
5 ද්වි 33:23
6 විනි 4:11
7 යොෂු 19:10
8 යොෂු 19:24
9 යොෂු 13:30 1ලේක 2:22
10 යොෂු 21:32
11 ද්වි 3:17
12 යොෂු 11:1 යොෂු 11:10 විනි 4:2 1සාමු 12:9
13 යොෂු 20:7
14 විනි 1:33
15 ගණන් 26:50
16 ගණන් 26:54
17 යොෂු 18:6

වෙන් කරනු ලැබුවේ දාන් ගෝත්‍රයට[1]
අයත් දේශයයි. **41** ඔවුන්ගේ දේ-
ශයේ මායිම්වල පිහිටි නගර හා
ස්ථාන මේවාය. ෂොරා,[2] එෂ්තායොල්,
ඉර්-ෂෙමෙෂ්, **42** ෂායල්අබ්බීන්,[3]
ආයාලොන්,[4] ඉත්ලා, **43** ඒලොන්,
තිම්නාහ්,[5] එක්‍රොන්,[6] **44** එල්තෙ-
කේහ්, ගිබ්බෙතොන්,[7] බාලාත්,[8]
**45** යෙහුද්, බෙනේ-බෙරක්, ගාත්-
රිම්මොන්,[9] **46** මේ-යර්කොන් සහ
රක්කොන්ය. ඔවුන්ගේ දේශ සීමාව
යොප්පා නගරය[10] ඉදිරියෙන් කෙළ-
වර විය. **47** දාන් ගෝත්‍රයට ලැබුණු
ප්‍රදේශය ඔවුන්ට ප්‍රමාණවත් නො-
වුණු නිසා[11] ඔවුහු ලේෂම් නගරයට[12]
විරුද්ධව සටන් කර, එහි සිටි වැසි-
යන්ව කඩුවෙන් මරා දමා එහි පදිංචි
වූහ. පසුව ඔවුහු ඒ නගරයට ඔවුන්ගේ
මුතුන්මිත්තාගේ නමද එකතු කර
එය ලේෂම් දාන් කියා හැඳින්වූහ.[13]
**48** දාන් ගෝත්‍රයට උරුමයක් ලෙස
ලැබුණු දේශයද ඊට අයත් වූ නගර
සහ ගම්මානද ඒවාය.

**49** එයාකාරයට එක් එක් ගෝ-
ත්‍රයට දේශයේ කොටසක් උරුම
විය. ඉන්පසු ඊශ්‍රායෙල්වරු නූන්-
ගේ පුත් යොෂුවාට නගරයක් උරුම
කර දුන්නෝය. **50** යොෂුවා එෆ්‍රා-
යිම් ගෝත්‍රයට අයත් කඳුකරයේ
පිහිටි තිම්නත්-සේරා නගරය[14] ඉල්ලු-
වේය. යෙහෝවා දෙවිද එය ඔහුට
දෙන ලෙස අණ කළේය. ඔවුහු එය
ඔහුට දුන්නෝය.[15] යොෂුවා ඒ නග-
රය වැඩි දියුණු කර එහි වාසය
කළේය.

**51** පූජක එලියාසර්ද නූන්ගේ
පුත්‍රයා වූ යොෂුවාද ඊශ්‍රායෙල් ගෝත්‍ර-
වල නායකයෝද ෂීලෝ නගරයේ[16]
තිබූ සම්මුඛ වීමේ කූඩාරම අස-
ළදී[17] යෙහෝවා දෙවි ඉදිරියේ දාදු
දමා එලෙස ඊශ්‍රායෙල්වරුන්ට දේශය
බෙදා දුන්නෝය.[18]

**20** පසුව යෙහෝවා දෙවි යො-
ෂුවාට මෙසේ කීවේය.
**2** "ඊශ්‍රායෙල්වරුන්ට මෙසේ පව-
සන්න. 'මම කලින් මෝසෙස්ට
පැවසූ ලෙස ඔබ දැන් දේශයේ
නගර කිහිපයක් ආරක්ෂිත නුවර-
වල්[1] වශයෙන් වෙන් කරගත යුතුයි.
**3** අත්වැරදීමක් නිසා යමෙකු අතින්
මිනිසෙකු මිය ගියොත්[2] එම
තැනැත්තා ප්‍රමාද නොවී ආරක්ෂිත
නුවරකට පලා යා යුතුයි. එවිට ඔහුව
මරා දැමීමට අයිති ඇති තැනැත්තා-
ගෙන්[3] ඔහුට ආරක්ෂාව ලැබෙයි.
**4** ඔහු එම නගරයේ දොරටුව[4] අස-
ලට පැමිණ[5] එහි සිටින වැඩිම-
හල්ලන්ට තමා අතින් සිදු වූ දේ
කිව යුතුයි.[6] ඉන්පසු ඔහුව භාරගෙන
ඔහුට ජීවත් වෙන්න තැනක් සූදා-
නම් කර දීම එම වැඩිමහල්ලන්-
ගේ වගකීමයි. **5** ඔහුව මරා දැමීමට
අයිතිය ඇති තැනැත්තා ඔහුව සොය-
යාගෙන පැමිණියොත් වැඩිමහල්ලන්
ඔහුව එම තැනැත්තාගේ අතට භාර
නොදිය යුතුයි.[7] මන්ද එය අත්-
වැරදීමකින් සිදු වූ මරණයක් මිස
පළිගැනීමේ චේතනාවෙන් සිදු කළ
මරණයක් නොවෙයි.[8] **6** නඩු විභා-
ගය අවසන් වන තුරු ඔහු ඒ නගරයේ
රැඳී සිටිය යුතුයි.[9] මරණය අත්වැරදී-
මකින් සිදු වුණා කියා ඔප්පු වූ
විට ඔහුට දිගටම ජීවත් විය හැක.
නමුත් උත්තම පූජකයා මිය යන
තුරු[10] ඔහු එම නගරයෙන් පිටතට
නොයා යුතුයි. ඔහුට තම නගරයටත්
නිවසටත් ආපසු හැරී යා හැක්කේ
උත්තම පූජකයා මිය යැමෙන් අනතු-
රුවයි.' "[11]

**7** නෆ්තලී ගෝත්‍රයට අයත් කඳු-
කර පළාතේ තිබෙන ගලීලය නම්
ප්‍රදේශයේ පිහිටි කෙදෙෂ් නගරයද[12]
එෆ්‍රායිම් ගෝත්‍රයට අයත් කඳුකර
ප්‍රදේශයේ පිහිටි ෂීකෙම් නගරයද[13]
යූදා ගෝත්‍රයට අයත් කඳුකර ප්‍රදේ-
ශයේ පිහිටි කිර්යත්-අර්බා නගර-
යද[14] ආරක්ෂිත නගර ලෙස වෙන්
කරන ලදි. කිර්යත්-අර්බා නග-
රය හෙබ්‍රොන් ලෙසද හැඳින්වෙයි.

**13** උත් 33:18; යොෂු 21:21; 2ලේක 10:1; **14** යොෂු 14:15; යොෂු 21:13.

**19 පරි.**
1 උත් 49:17; ද්වි 33:22
2 යොෂු 15:33; විනි 13:2; 2ලේක 11:10
3 විනි 1:35; 1රාජා 4:9
4 යොෂු 10:12; යොෂු 21:24
5 යොෂු 15:10; විනි 14:1
6 යොෂු 15:45
7 යොෂු 21:23
8 1රාජා 9:18
9 යොෂු 21:24
10 යෝනා 1:3; ක්‍රියා 9:36; ක්‍රියා 10:8
11 ගණන් 26:54; ගණන් 33:54
12 විනි 18:7
13 විනි 18:29
14 යොෂු 24:30; විනි 2:9
15 ගීතා 21:2; ගීතා 37:4
16 යොෂු 18:1; විනි 21:19; 1සාමු 1:3; යෙරෙ 7:12
17 යොෂු 18:8
18 ගණන් 34:17; යොෂු 14:1

**2 තීරුව**

**20 පරි.**
1 නික් 21:13; ගණන් 35:6; ගණන් 35:14; ද්වි 4:41
2 ගණන් 35:15
3 උත් 9:6; නික් 21:23; ගණන් 35:27
4 ද්වි 16:18; ද්වි 22:15; රූත් 4:1; යෝබ් 29:7; හිතෝ 31:23
5 ද්වි 19:3
6 ද්වි 17:8
7 ගණන් 35:25; ද්වි 19:10
8 ලෙවී 19:17; ගණන් 35:22; ද්වි 19:6
9 ගණන් 35:12; ගණන් 35:24
10 ගණන් 35:25; හෙබ්‍රෙ 7:23
11 ගණන් 35:28
12 යොෂු 21:32; 2රාජා 15:29

**8** යොර්දාන් ගඟේ නැඟෙනහිර පැත්-
තේ යෙරිකෝවට ළඟින් පිහිටි
රූබෙන් ගෝත්‍රයේ[1] දේශ සීමාව තුළ
තිබෙන බෙෂෙර් නම් නගරයත්[2]
ආරක්ෂිත නුවරක් ලෙස වෙන් කරන
ලදි. බෙෂෙර් නගරය පාළුකරයේ
තිබෙන උස් තැනිතලාව මත පිහිටා
තිබේ. ගාද් ගෝත්‍රයට ලැබුණු ප්‍රදේශ-
යේ ගිලියද්හි පිහිටි රාමොත් නගර-
යත්[3] මනස්සේට ලැබුණු ප්‍රදේශයේ
බාෂාන්හි පිහිටි ගෝලාන් නගර-
යත්[4] ආරක්ෂිත නුවරවල් ලෙස වෙන්
කරන ලදි.

**9** මෙම නගර වෙන් කර තිබුණේ
අත්වැරදීමක් නිසා ඊශ්‍රායෙල් ජාතික-
යෙකුගේ හෝ ඊශ්‍රායෙල්වරුන් අතරේ
ජීවත් වන විදේශිකයෙකුගේ හෝ
අතින් යමෙකු මැරුණොත්[5] වරදක-
රුට ආරක්ෂාව ලබා දීම සඳහාය.
නඩු විභාගය අවසන් වන තුරු[6] ඔහුව
මරා දැමීමට අයිතිය ඇති තැනැත්-
තාගෙන් ආරක්ෂා වන පිණිස ඔහු එහි
රැඳී සිටිය යුතුය.

# 21

ලෙවී ගෝත්‍රයට අයත් පවුල්-
වල ප්‍රධානියෝ පූජක එලි-
යාසර්වද[7] නූන්ගේ පුත්‍රයා වූ
යොෂුවාවද[8] ඊශ්‍රායෙල්හි අනික් ගෝ-
ත්‍රවලට අයත් පවුල්වල ප්‍රධානීන්-
වද හමු වීමට ගියෝය. **2** ඔවුහු
කානාන් දේශයේ ෂීලෝ නගර-
යට[9] ගොස් ඔවුන්ට මෙසේ කීවෝය.
“අපිට ජීවත් වෙන්න නගර හා අපේ
සතුන්ට තණබිම් දෙන්න කියා යෙ-
හෝවා දෙවි මෝසෙස්ට කිව්වා.”[10]
**3** එහෙයින් යෙහෝවා දෙවිගේ අණට
අනුව ඊශ්‍රායෙල්වරු තමන්ට ලැබුණු
උරුමයෙන්[11] නගරද තණබිම්ද ලෙ-
වීවරුන්ට[12] දුන්නෝය.

**4** ආදූ දමා කෝහාත්වරුන්ට[13]
ලැබෙන නගර වෙන් කරන ලදි. යූදා
ගෝත්‍රයට,[14] සිමියොන් ගෝත්‍රයට[15]
සහ බෙන්ජමින් ගෝත්‍රයට[16] අයිති
නගරවලින් නගර දහතුනක් කෝ-
හාත්වරුන්ගේ පවුල් අතරින් පූජක
ආරොන්ගේ පුත්‍රයන්ට ලැබිණ.

**5** එෆ්‍රායිම් ගෝත්‍රයට,[1] දාන්
ගෝත්‍රයට[2] සහ මනස්සේ ගෝ-
ත්‍රයෙන්[3] එක් කොටසකට අයිති
නගරවලින් නගර දහයක් කෝහාත්-
වරුන්ගේ[4] ඉතුරු අයට ආදූ දමා
බෙදා දෙන ලදි.

**6** ඉන්පසු ඉසකාර් ගෝත්‍රයට,[5]
ආෂේර් ගෝත්‍රයට,[6] නෆ්තලී ගෝත්‍ර-
යට[7] සහ බාෂාන්හි[8] විසූ මනස්සේ
ගෝත්‍රයේ අයට අයිති නගරවලින්
නගර දහතුනක් ආදූ දමා ගේර්ෂොන්-
වරුන්ට[9] දෙන ලදි.

**7** ඉන්පසු රූබෙන් ගෝත්‍රයට,[10]
ගාද් ගෝත්‍රයට[11] සහ සෙබූලන්
ගෝත්‍රයට[12] අයිති නගරවලින් නගර
දොළහක් මෙරාරිවරුන්ට[13] දෙන ලදි.

**8** යෙහෝවා දෙවි මෝසෙස් මාර්-
ගයෙන් ඊශ්‍රායෙල්වරුන්ට අණ කළ
ලෙස[14] ඔවුහු ආදූ දමා[15] එම නගර
සහ ඒවා අවට ඇති තණබිම්[16] ලෙවී-
වරුන්ට දුන්නෝය.

**9** යූදා ගෝත්‍රයට සහ සිමියොන්
ගෝත්‍රයට අයිති වූ නගර කිහිපයක්
වෙන් කරන ලදි. ඒවා නම් වශයෙන්
සඳහන් කෙරිණ.[17] **10** ආදූ දැමූ
විට කෝහාත්වරුන්ගේ පවුල් අතරින්
පූජක ආරොන්ගේ පුත්‍රයන්ව මුලින්ම
තෝරාගනු ලැබූ නිසා ඒ නගර
ඔවුන්ට දෙන ලදි.[18] **11** යූදාහි කඳු-
කර ප්‍රදේශයේ[19] පිහිටි කිර්යත්-අර්බා[20]
හෙවත් හෙබ්‍රොන් නමැති නගරයද[21]
ඒ අවට තණබිම්ද ඔවුන්ට ලැබිණ.
(අර්බා, අනාක්වරුන්ගේ පියාය.)[22]
**12** ඒ නගරයේ කෙත්වතු සහ ගම්-
මාන යෙෆුන්නෙගේ පුත් කාලෙබ්ට
උරුමයක් ලෙස දී තිබුණේය.[23]

**13** පූජක ආරොන්ගේ පුත්‍රයන්ට
ලැබුණු නගර මේවාය. යමෙකුව මරා
දැමූ බවට චෝදනාවක් ලැබූ කෙ-
නෙකුට[24] පලා යෑම සඳහා ආරක්-
ෂිත නගරයක්[25] වන හෙබ්‍රොන්[26]
හා ඒ අවට තිබූ තණබිම් ඔවුන්ට

**20** පරි.
**1** ද්වි 4:43
**2** ද්වි 4:43; යොෂු 21:36; 1ලේක 6:78
**3** යොෂු 21:38; 1රාජා 22:3; 2රාජා 8:28; 1ලේක 6:80
**4** ද්වි 4:43; යොෂු 21:27; 1ලේක 6:71
**5** ගණන් 35:11; ගණන් 35:15
**6** ගණන් 35:12; ගණන් 35:24; ද්වි 21:5

**21** පරි.
**7** ගණන් 34:17; යොෂු 14:1
**8** යොෂු 17:4
**9** යොෂු 18:1
**10** ලෙවී 25:34; ගණන් 35:2; ගණන් 35:4; යොෂු 14:4; 1ලේක 6:64
**11** ගණන් 35:8
**12** උත් 49:7; ද්වි 33:8
**13** උත් 46:11; ගණන් 3:27; ගණන් 3:28; ගණන් 3:31
**14** යොෂු 15:1; 1ලේක 6:55
**15** යොෂු 19:1
**16** යොෂු 18:11; 1ලේක 6:60

**2** තීරුව
**1** යොෂු 16:5; 1ලේක 6:66
**2** යොෂු 19:40
**3** යොෂු 17:1; 1ලේක 6:70
**4** 1ලේක 6:61
**5** යොෂු 19:17
**6** යොෂු 19:24
**7** යොෂු 19:32
**8** ගණන් 32:33
**9** නික් 6:17; ගණන් 3:22; 1ලේක 6:62
**10** යොෂු 13:15
**11** යොෂු 13:24
**12** යොෂු 19:10
**13** නික් 6:19; ගණන් 3:20; 1ලේක 6:63
**14** ගණන් 35:2
**15** හිතෝ 16:33
**16** ගණන් 35:5
**17** 1ලේක 6:65
**18** යොෂු 21:4
**19** යොෂු 20:7

**20** උත් 23:2; උත් 35:27; යොෂු 15:13; විනි 1:10; **21** 2සාමු 2:1; 2සාමු 15:10; **22** යොෂු 14:15; **23** යොෂු 15:13; විනි 1:20; 1ලේක 6:56; **24** ගණන් 35:15; යොෂු 20:3; 1ලේක 6:57; **25** ගණන් 35:6; **26** යොෂු 15:54.

ලැබිණ. ලිබ්නා,[1] **14** යත්තීර්,[2]
එෂ්තෙමෝවා[3] සහ ඒ නගර අවට
තිබූ තණබිම්ද **15** හෝලොන්,*[4]
දෙබීර්[5] සහ ඒවා අවට තිබූ තණ-
බිම්ද **16** ආයින්,*[6] යුත්තා,[7] බෙත්-
ෂෙමෙෂ්[8] සහ ඒවා අවට තිබූ
තණබිම්ද ඔවුන්ට දෙන ලදී. යූදා
ගෝත්‍රයටද සිමියොන් ගෝත්‍රයටද
අයිති නගරවලින් ඒ නගර නවය
ඔවුන්ට ලැබිණ.

**17** බෙන්ජමින් ගෝත්‍රයෙන් ගිබි-
යොන්,[9] ගෙබා,[10] **18** අනාතොත්[11]
සහ අල්මොන්*[12] යන නගර
හතර සහ ඒවායේ තණබිම්ද ඔවුන්ට
ලැබිණ.

**19** මෙසේ, පූජකයන් වූ ආරොන්-
ගේ පුත්‍රයන්ට[13] නගර දහතුනක් හා
ඒවායේ තණබිම්ද ලැබිණ.[14]

**20** ලෙවී ගෝත්‍රයට අයත් කෝ-
හාත්වරුන්ගේ ඉතුරු අයට එෆ්‍රායිම්
ගෝත්‍රයට[15] අයිති නගරවලින් නගර
කිහිපයක් ආදු දමා බෙදා දෙන ලදී.
**21** යමෙකුව මරා දැමූ බවට චෝද-
නාවක් ලැබූ කෙනෙකුට[16] පලා යෑම
සඳහා එෆ්‍රායිම් ගෝත්‍රයට අයත් කඳු-
කර ප්‍රදේශයේ පිහිටි ආරක්ෂිත නග-
රයක්[17] වන ෂීකෙම්[18] හා ඒ අවට ඇති
තණබිම්ද[19] ගෙෂෙර්[20] හා ඒ අවට
ඇති තණබිම්ද ඔවුන්ට දෙන ලදී.
**22** එමෙන්ම කිබ්ෂයිම්,*[21] බෙත්-
හෝරොන් යන නගර[22] හා ඒවා අවට
ඇති තණබිම්ද ඔවුන්ට දෙන ලදී.

**23** දාන් ගෝත්‍රයට අයත් නගර-
වලින් එල්තෙකේ, ගිබ්බෙතොන්,[23]
**24** ආයාලොන්[24] සහ ගාත්-
රිම්මොන්[25] යන නගර හතර හා ඒවා
අවට ඇති තණබිම්ද ඔවුන්ට ලැබිණ.

**25** මනස්සේ ගෝත්‍රයෙන් එක්
කොටසකට අයත් නගරවලින් තය-
නාක්[26] සහ ගාත්-රිම්මොන් යන නගර
දෙක සහ ඒවා අවට ඇති තණබිම්ද
ඔවුන්ට ලැබිණ.

**26** කෝහාත්වරුන්ගේ ඉතුරු
අයට නගර දහයක් සහ ඒවා අවට
ඇති තණබිම්ද ලැබිණ.

**27** යමෙකුව මරා දැමූ බවට චෝ-
දනාවක් ලැබූ කෙනෙකුට පලා
යෑම සඳහා ලෙවී ගෝත්‍රයට අයත්
ගේර්ෂොන්වරුන්ට[1] මනස්සේ ගෝ-
ත්‍රයෙන්[2] එක් කොටසකට අයත්
නගරවලින් බාෂාන්හි පිහිටි ආරක්-
ෂිත නගරයක් වන ගෝලාන්[3] සහ
ඒ අවට ඇති තණබිම්ද බෙයෙෂ්-
තෙරා*[4] නගරය සහ ඒ අවට ඇති
තණබිම්ද ලැබිණ.

**28** ඉසකාර් ගෝත්‍රයට[5] අයත්
නගරවලින් කිෂියොන්,[6] දාබෙරත්,[7]
**29** යාමුත්*[8] සහ ඒන්-ගන්නිම්[9] යන
නගර හතර සහ ඒවා අවට ඇති
තණබිම්ද ඔවුන්ට ලැබිණ.

**30** ආෂෙර් ගෝත්‍රයට[10] අයත්
නගරවලින් මිෂාල්,[11] අබ්දොන්,[12]
**31** හෙල්කාත්[13] සහ රෙහොබ්[14] යන
නගර හතර සහ ඒවා අවට ඇති
තණබිම්ද ඔවුන්ට ලැබිණ.

**32** යමෙකුව මරා දැමූ බවට චෝ-
දනාවක් ලැබූ කෙනෙකුට[15] පලා යෑම
සඳහා, නප්තලී ගෝත්‍රයට[16] අයත්
නගරවලින් ගලීලයේ පිහිටි ආරක්-
ෂිත නගරයක්[17] වන කෙදෙෂ්[18] හා ඒ
අවට ඇති තණබිම්ද හම්මොත්-
දෝර්[19] සහ කර්තාන්* යන නගර
දෙක හා ඒවා අවට ඇති තණබිම්ද
ඔවුන්ට ලැබිණ.

**33** ගේර්ෂොන්වරුන්ට නගර දහ-
තුනක් සහ ඒවා අවට ඇති තණබිම්ද
ලැබිණ.

**34** ලෙවී ගෝත්‍රයේ ඉතුරුව සිටි

**21 පරි.**
**1** යොෂු 10:29 යොෂු 15:42 යෙසා 37:8
**2** යොෂු 15:48 1සාමු 30:27
**3** යොෂු 15:50
**4** යොෂු 15:51 1ලේක 6:58
**5** යොෂු 15:49
**6** යොෂු 15:42 යොෂු 19:7 1ලේක 6:59
**7** යොෂු 15:55
**8** යොෂු 15:10 1සාමු 6:9
**9** යොෂු 9:3 යොෂු 18:25
**10** යොෂු 18:24
**11** 1රාජා 2:26 යෙසා 10:30 යෙරෙ 1:1
**12** 1ලේක 6:60
**13** නික් 6:23 නික් 6:25 ගණන් 3:4
**14** ලෙවී 25:34 ගණන් 35:4
**15** 1ලේක 6:66
**16** ගණන් 35:15 යොෂු 20:3
**17** ගණන් 35:11
**18** යොෂු 20:7 විනි 9:1 1රාජා 12:1
**19** ලෙවී 25:34 ගණන් 35:4
**20** යොෂු 16:10 විනි 1:29 1රාජා 9:15 1ලේක 6:67
**21** 1ලේක 6:68
**22** යොෂු 16:3 යොෂු 18:13
**23** යොෂු 19:44
**24** යොෂු 10:12 යොෂු 19:42 විනි 1:35 1ලේක 8:13 2ලේක 28:18
**25** යොෂු 19:45 1ලේක 6:69
**26** යොෂු 17:11 විනි 5:19

**2 තීරුව**
**1** යොෂු 21:6
**2** යොෂු 13:29
**3** යොෂු 20:8
**4** 1ලේක 6:71
**5** යොෂු 19:17
**6** යොෂු 19:20
**7** යොෂු 19:12 1ලේක 6:72
**8** යොෂු 19:21 1ලේක 6:73
**9** යොෂු 19:21
**10** යොෂු 19:24
**11** යොෂු 19:26
**12** 1ලේක 6:74
**13** යොෂු 19:25
**14** යොෂු 19:28; විනි 1:31; 1ලේක 6:75; **15** ගණන් 35:15; **16** යොෂු 19:32; **17** ගණන් 35:14; **18** යොෂු 19:37; යොෂු 20:7; **19** යොෂු 19:35.

යොෂු **21:15*** 1ලේක 6:58හි සඳහන් වන්නේ, “හීලෙන්” ලෙසය. **16*** 1ලේක 6:59හි සඳහන් වන්නේ, “ආෂාන්” ලෙසය. **18*** 1ලේක 6:60හි සඳහන් වන්නේ, “අලෙමෙත්” ලෙසය. **22*** 1ලේක 6:68හි සඳහන් වන්නේ, “යොක්මෙයාම්” ලෙසය.

යොෂු **21:27*** 1ලේක 6:71හි සඳහන් වන්නේ, “අෂ්ටාරොත්” ලෙසය. **29*** යොෂු 19:21හි, “රෙමෙත්” ලෙසත් 1ලේක 6:73හි, “රාමොත්” ලෙසත් සඳහන් වේ. **32*** 1ලේක 6:76හි සඳහන් වන්නේ, “කිර්යතායිම්” ලෙසය.

අය වන මෙරාරීවරුන්ට[1] සෙබුලූන්
ගෝත්‍රයට[2] අයිති නගරවලින් යොක්-
නෙයාම්,[3] කර්තා, **35** දිම්නා*[4] සහ
නහලාල්[5] යන නගර හතර සහ ඒවා
අවට ඇති තණබිම්ද ලැබිණ.
**36** රූබෙන් ගෝත්‍රයට[6] අයත්
නගරවලින් බෙෂෙර්,[7] යහෂ්,[8]
**37** කෙදෙමොත්[9] සහ මෙෆයත්[10]
යන නගර හතර සහ ඒවා අවට ඇති
තණබිම්ද ලැබිණ.
**38** යමෙකුව මරා දැමූ බවට චෝ-
දනාවක් ලැබූ කෙනෙකුට පලා යෑම
සඳහා, ගාද් ගෝත්‍රයට[11] අයත් නග-
රවලින් ගිලියද්හි[12] පිහිටි ආරක්-
ෂිත නගරයක් වන රාමොත් හා ඒ
අවට ඇති තණබිම්ද මහනායිම්,[13]
**39** හෙෂ්බොන්[14] සහ යාසෙර්[15] යන
නගර තුන හා ඒවා අවට ඇති තණ-
බිම්ද ඔවුන්ට ලැබිණ.
**40** මෙසේ ලෙවී ගෝත්‍රයට අයත්
මෙරාරීවරුන්ට[16] නගර දොළහක්
දෙන ලදි.
**41** ඊශ්‍රායෙල්වරුන්ට උරුම වූ
නගරවලින් ලෙවීවරුන්ට නගර හත-
ළිස්අටක්[17] සහ ඒවා අවට ඇති තණ-
බිම්ද[18] ලැබිණ. **42** ඔවුන්ට ලැබුණු
ඒ සෑම නගරයක් වටා තණබිම්
තිබිණ.[19]
**43** මෙසේ යෙහෝවා දෙවි ඊශ්‍රා-
යෙල්වරුන්ගේ මුතුන්මිත්තන්ට පො-
රොන්දු වූ ලෙස[20] ඊශ්‍රායෙල්වරුන්ට ඒ
දේශය උරුමයක් ලෙස[21] දුන්නේය.
ඔවුහු එහි පදිංචි වූහ. **44** යෙහෝවා
දෙවි ඔවුන්ගේ මුතුන්මිත්තන්ට පො-
රොන්දු වූ ලෙස[22] ඒ කාලයේදී යුධ
බියෙන් තොර, සාමකාමී වාතාව-
රණයක්[23] දේශය පුරා පැවතිණ.
යෙහෝවා දෙවි ඊශ්‍රායෙල්වරුන්-
ගේ සියලු සතුරන්ව ඔවුන්ට යටත්
කර දුන්නේය.[24] **45** යෙහෝවා දෙවි
ඊශ්‍රායෙල් සෙනඟට දුන් එක පො-
රොන්දුවක්වත් කඩ නොවී සියල්ල ඒ
අයුරින්ම ඉටු විය.[25]

යොෂු **21:35*** 1ලේක 6:77හි සඳහන් වන්නේ, “රිම්මෝනො” ලෙසය.

**21 පරි.**
**1** යොෂු 21:7, 1ලේක 6:77
**2** යොෂු 19:10
**3** යොෂු 12:22, යොෂු 19:11
**4** යොෂු 19:13, 1ලේක 6:77
**5** විනි 1:30
**6** යොෂු 13:15
**7** ද්වි 4:43, යොෂු 20:8, 1ලේක 6:78
**8** යොෂු 13:18
**9** ද්වි 2:26, යොෂු 13:18
**10** 1ලේක 6:79
**11** යොෂු 13:24
**12** ද්වි 4:43, යොෂු 20:8, 1රාජා 22:3, 1ලේක 6:80
**13** උත් 32:2, 2සාමු 2:8
**14** ගණන් 21:26, ගණන් 32:37, යොෂු 13:17, 1ලේක 6:81
**15** ගණන් 32:1, යොෂු 13:25, යෙසා 16:8, යෙරෙ 48:32
**16** 1ලේක 6:63
**17** ගණන් 35:7
**18** ගණන් 35:5
**19** ගණන් 35:5
**20** උත් 13:15, උත් 15:18, උත් 26:3, උත් 28:4
**21** නික් 23:30, ගීතා 44:3
**22** ද්වි 12:10, ද්වි 25:19
**23** නික් 33:14, යොෂු 1:13, යොෂු 11:23, යොෂු 22:4, හිතෝ 16:7
**24** ද්වි 7:24, ද්වි 28:7, ද්වි 31:3
**25** යොෂු 23:14, 1සාමු 15:29, 1රාජා 8:56, හෙබ්‍රෙ 6:18

**2 තීරුව**

**22 පරි.**
**1** ගණන් 32:33
**2** ගණන් 32:20, ද්වි 3:18
**3** යොෂු 1:16
**4** යොෂු 11:18
**5** ගණන් 32:27
**6** යොෂු 21:44
**7** ගණන් 32:33, ද්වි 29:8, යොෂු 13:8

**22** ඒ කාලයේදී යොෂුවා,
රූබෙන් ගෝත්‍රයත් ගාද්
ගෝත්‍රයත් මනස්සේ ගෝත්‍රයත්*[1]
කැඳවා **2** ඔවුන්ට මෙසේ කීවේය.
“යෙහෝවා දෙවිගේ සේවකයෙකු වූ
මෝසෙස් ඔබට අණ කළ සෑම දෙය-
කටම ඔබ කීකරු වුණා.[2] ඒ වගේම
ඔබ මගේ උපදෙස්වලටත් ඇහුම්කන්
දුන්නා.[3] **3** මේ වන තෙක්ම ඔබ
ඔබේ සහෝදරයන්ට සහයෝගය දෙ-
මින්[4] ඔබේ දෙවි වන යෙහෝවා
ඔබට අණ කළ සියල්ල හොඳින්
ඉටු කළා.[5] **4** ඔබේ දෙවි වන යෙ-
හෝවා පොරොන්දු වූ විදිහටම ඔබේ
සහෝදරයන් මේ දේශයේ සැනසිල්-
ලේ ජීවත් වෙනවා. ඔවුන්ට සතුරන්-
ගෙන් කිසිම හිරිහැරයක් නැහැ.[6] ඒ
නිසා යෙහෝවා දෙවිගේ සේවකයෙකු
වූ මෝසෙස්ගෙන් ඔබට උරුමයක්
හැටියට ලැබුණු දේශය වෙතට ඔබට
දැන් හැරී යන්න පුළුවන්. යොර්දාන්
ගඟෙන් එගොඩ තියෙන ඔබේ වාසස්-
ථානවලට ගිහින් පදිංචි වෙන්න.[7]
**5** නමුත් යෙහෝවා දෙවිගේ සේවක-
යෙකු වූ මෝසෙස් ඔබට දුන් අණ-
පනත් කඩ නොකිරීමට වගබලා
ගන්න.[8] ඔබේ දෙවි වන යෙහෝවාට
ප්‍රේම කරන්න.[9] සෑමවිටම ඔහු දෙන
මඟ පෙන්වීම්වලට අනුව ජීවත් වෙ-
මින්[10] ඔහුගේ ආඥාවලට කීකරු
වන්න.[11] ඔබේ මුළු හදවතින්ද[12] ඔබේ
මුළු ශක්තියෙන්ද[13] ඔහුට සේවය
කරන්න.[14] දිවි ඇති තුරා ඔහුව අත්
නොහරින්න.”[15]
**6** යොෂුවා ඔවුන්ට ආශීර්වාද[16]
කළ පසු ඔවුහු තම නිවෙස්

**8** ද්වි 5:1; ද්වි 6:6; ද්වි 12:32; 2රාජා 21:8; **9** නික් 20:6; ද්වි 6:5; ද්වි 11:1; මතෙ 22:37; **10** ද්වි 8:6; ද්වි 10:12; 1තෙස 2:12; **11** ද්වි 11:22; ද්වි 13:4; 1යොහ 5:3; **12** 1සාමු 12:20; **13** ද්වි 4:29; ද්වි 6:5; ද්වි 11:13; මාක් 12:30; **14** ද්වි 6:13; යොෂු 24:15; ලූක් 4:8; **15** ද්වි 4:4; ද්වි 10:20; යොෂු 23:8; **16** නික් 39:43; යොෂු 14:13; 2සාමු 6:18.

යොෂු **22:1*** එනම්, යොර්දාන් ගඟෙන් නැඟෙනහිර පැත්තේ උරුමය ලැබුණු මනස්සේ ගෝත්‍රයේ කොටස.

බලා පිටත්ව ගියෝය. 7 යොෂුවා,
මනස්සේ ගෝත්‍රයෙන් එක් කොටස-
කට යොර්දාන් ගඟට බස්නාහිරෙන්
තිබූ දේශයෙන් කොටසක් දුන්නේය.[1]
එම ගෝත්‍රයේ ඉතුරු අයට මෝ-
සෙස්, බාෂාන් දේශය[2] කලින් දී තිබු-
ණේය. යොෂුවා ඔවුන්ට ආශීර්වාද
කරමින් තම නිවෙස් බලා යන්න
කියා කීවේය. 8 ඔහු ඔවුන්ට මෙ-
සේද කීවේය. “අපි පරාජය කළ
සතුරන්ගෙන් ගත් රන්, රිදීද තඹ
හා යකඩද සතුන්ද වස්ත්‍රද වෙනත්
වටිනා දේවල්ද බොහොමයක් තිබෙ-
නවා.[3] යන්න කලින් ඔබේ කොටස
ගන්න.[4] ඒවා ඔබේ සහෝදරයන්
සමඟ බෙදාගන්න.”
9 ඉන්පසු රූබෙන් ගෝත්‍රයටත්
ගාද් ගෝත්‍රයටත් මනස්සේ ගෝත්‍රය-
ටත් අයත් සෙනඟ, ඊශ්‍රායෙල්හි අනික්
ගෝත්‍රවලට අයත් සෙනඟගෙන් සමු-
ගත්තෝය. ඔවුහු කානාන් දේශ-
යේ පිහිටි ෂීලෝ නගරයෙන් පිටත්ව
තමන්ට උරුම වූ ගිලියද් දේශය[5] වෙ-
නට ගියෝය. යෙහෝවා දෙවිගේ අණ
පරිදි මෝසෙස් ඔවුන්ට එම දේ-
ශය දී තිබුණේය.[6] 10 එම ගෝත්‍ර
තුනට අයත් සෙනඟ කානාන් දේශ-
යෙන් පිටත් වීමට පෙර යොර්දාන්
ගඟ අසල විශාල පූජාසනයක් ගො-
ඩනැඟුවෝය.[7] 11 පසුව ඊශ්‍රායෙල්හි
ඉතුරු සෙනඟට ඒ ගැන ආරංචි
වී[8] ඔවුහු මෙසේ කීවෝය. “රූබෙන්,
ගාද් හා මනස්සේ ගෝත්‍රවල අය
කරලා තියෙන දේ බලන්න! ඔවුන්
කානාන් දේශයෙන් පිට වෙලා යන්න
කලින් යොර්දාන් ගඟ ළඟ පූජාස-
නයක් හදාගෙන. ඔවුන් පූජාසනය
හදලා තියෙන්නේ අපිට අයිති පැත්-
තෙයි.” 12 මෙය ඇසූ විට ඊශ්‍රායෙල්
සෙනඟ[9] ඔවුන්ට විරුද්ධව යුද්ධයට
යෑම සඳහා[10] ෂීලෝහිදී රැස් වූහ.[11]
13 ඉන්පසු ඊශ්‍රායෙල්වරු ගිලියද්
දේශයේ සිටි ගෝත්‍ර තුන වෙතට[12]
පූජක එලියාසර්ගේ පුත් පීනෙහාස්ව[13]

**22 පරි.**
1 යොෂු 17:5
2 යොෂු 13:30
3 ද්වි 28:8; හිතෝ 10:22
4 ගණන් 31:27; 1සාමු 30:24; ගීතා 68:12
5 ගණන් 32:1; ද්වි 3:15; යොෂු 13:25; ගීතා 60:7
6 ගණන් 32:33; ද්වි 3:12
7 යොෂු 22:28
8 ද්වි 13:12
9 විනි 20:1
10 හිතෝ 14:15
11 යොෂු 18:1; යොෂු 19:51
12 ද්වි 13:14
13 නික් 6:25; ගණන් 25:11; විනි 20:28

**2 තීරුව**
1 ගණන් 1:16; ද්වි 1:13; යොෂු 14:1; යොෂු 22:21
2 ද්වි 13:14; හිතෝ 18:13; යාකො 1:19
3 යොෂු 22:12
4 යොෂු 22:11
5 ද්වි 12:13
6 ලෙවී 17:9; ද්වි 12:11; ද්වි 12:14; ද්වි 12:27
7 ගණන් 25:2; ගණන් 25:3; ද්වි 4:3
8 ගණන් 25:9
9 ගණන් 16:22; යොෂු 7:1; 1ලේක 21:14
10 ලෙවී 18:25
11 යොෂු 18:1
12 ගණන් 34:2; යොෂු 1:11
13 ද්වි 12:13; ද්වි 12:27; යොෂු 22:11; 1රාජා 12:28
14 යොෂු 7:1

හා 14 සෑම ගෝත්‍රයක්ම නියෝජ-
නය කරන පිණිස අධිපතීන් දසදෙ-
නෙකුවද පිටත් කර යැව්වෝය. ඒ
දසදෙනා ඊශ්‍රායෙල් ගෝත්‍රවල* සිටි
පවුල් මූලිකයන්ය.[1] 15 ඒ අය ගිලි-
යද් දේශයේ සිටි රූබෙන්, ගාද් සහ
මනස්සේ ගෝත්‍රවලට අයත් සෙනඟ
වෙතට පැමිණ මෙසේ කීවෝය.[2]
16 “යෙහෝවා දෙවිගේ සෙනඟ[3]
ඔබෙන් මෙහෙම අහනවා. ‘ඔබ ඊශ්‍රා-
යෙල්වරුන්ගේ දෙවිට විරුද්ධව මේ
වගේ මහත් පාපයක් කළේ ඇයි?[4] ඔබ
යෙහෝවා දෙවිව අත්හැර[5] වෙනම
පූජාසනයක් ගොඩනඟා ගෙන තිබෙ-
නවා.[6] ඇයි ඔබ යෙහෝවා දෙවිට
විරුද්ධව මේ විදිහට කැරලිගසන්-
නේ? 17 පෙයෝර්හිදී අපේ අතින්
සිදු වූ බරපතළ පාපය[7] ඔබට මතක
නැද්ද? අපි කළ ඒ පාපය නිසා යෙ-
හෝවා දෙවි මුළු ඊශ්‍රායෙල් සෙනඟට
වසංගතයකින් පහර දුන්නා.[8] ඒත්
තවමත් ඒ වැරදි පෙලඹීම සෙනඟ
අතරේ තිබෙනවා. 18 අද ඔබ යෙ-
හෝවා දෙවිව අත්හැර ඔහුට විරුද්-
ධව කැරලිගැසුවොත් හෙට දවසේදී
යෙහෝවා දෙවි මුළු ඊශ්‍රායෙල් සෙ-
නඟ සමඟ උදහස් වෙයි.[9] 19 ඔබට
ලැබුණු දේශය අපවිත්‍රයි[10] කියා ඔබට
හැඟෙනවා නම් යෙහෝවා දෙවිගේ
ශුද්ධ කූඩාරම තිබෙන දේශයට[11]
එන්න. යෙහෝවා දෙවි වාසය කරන
ඒ දේශයට[12] ඇවිත් අප සමඟ ජීවත්
වන්න. අපේ දෙවි වන යෙහෝවාට
දැනටමත් ඒ දේශයේ පූජාසනයක්
ගොඩනඟා තිබෙනවා. ඉතින් ඇයි
ඔබ තවත් පූජාසනයක් ගොඩනැඟු-
වේ?[13] එහෙම කරලා යෙහෝවා දෙ-
විට විරුද්ධව කැරලිගසන්න එපා.
ඔබ එහෙම කළොත් අපත් ඒ වර-
දට හවුල්කාරයෝ වෙයි. 20 දෙවි
විනාශ කරන්න නියම කළ දේවල්
සේරාගේ පුත් ආකාන්[14] තමා ළඟ

යොෂු **22:14*** මූ.අ., “ඊශ්‍රායෙල්හි දහස් ගණන් අතරේ.”

තබාගත් නිසා මුළු ඊශ්‍රායෙල් සෙනඟ
සමඟ දෙවි උදහස් වුණා.[1] ඔහු කළ ඒ
වරද නිසා අනික් අයටත් ඔවුන්ගේ
ජීවිතවලින් වන්දි ගෙවන්න සිදු වුණු
බව අමතක කරන්න එපා.’ ”[2]
**21** එවිට රූබෙන්, ගාද් සහ
මනස්සේ ගෝත්‍රවලට අයිති සෙ-
නඟ ඊශ්‍රායෙල් ගෝත්‍රවල ප්‍රධානීන්ට[3]
මෙසේ කීවෝය.[4] **22** “වෙන කිසි
දෙවි කෙනෙක්[5] යෙහෝවා[6] දෙවි
තරම් බලවත් නැහැ.[7] අපි කළේ
ද්‍රෝහිකමක් නම් යෙහෝවා දෙවි
ඒක දන්නවා.[8] ඒ විතරක් නෙ-
වෙයි, මුළු ඊශ්‍රායෙල් සෙනඟත් ඒක
දැනගනීවි.[9] යෙහෝවා දෙවියනි, අපි
ඔබට විරුද්ධව කැරලිගසා[10] ඔබට
ද්‍රෝහි වී ඇත්නම්[11] දැන්මම අපිව
මරා දමන්න. **23** අපි මේ පූජාසනය
හැදුවේ යෙහෝවා දෙවිව අත්හැර,
වෙනත් දෙවිවරුන්ට විවිධ පූජා ඔප්පු
කරන්න නම්[12] යෙහෝවා දෙවිගෙන්
එය අපට සඟවන්න පුළුවන් කියා
ඔබ සිතනවාද?[13] **24** එහෙම දෙය-
කට නෙවෙයි අපි මේ පූජාසනය ගො-
ඩනැඟුවේ. නමුත් ඔබේ දරුවන් පසු
කාලයකදී අපේ දරුවන්ට මෙහෙම
කියයි කියා අපිට භය හිතුණා. ‘ඊශ්‍රා-
යෙල්වරුන්ගේ දෙවි වන යෙහෝවාට
නමස්කාර කරන්න ඔබට අයිති-
යක් නැහැ. **25** රූබෙන් ගෝත්‍රය
හා ගාද් ගෝත්‍රය අපෙන් වෙන් කර
තියන්න ඕනේ නිසයි යෙහෝවා දෙවි
යොර්දාන් ගඟෙන් එපිට දේශයක්
ඔබට දුන්නේ. ඒ නිසා යෙහෝවා දෙ-
විට නමස්කාර කරන්න ඔබට කිසිම
අයිතියක් නැහැ.’[14] ඔබේ දරුවෝ ඒ
විදිහට කියද්දී අපේ දරුවන් යෙ-
හෝවා දෙවිට ගරුබියෙන් සේවය
කරන එක අත්හරියි කියා අපට
භයක් දැනුණා.[15]

**26** “ඒ නිසා අපි පූජාසනයක් ගො-
ඩනඟන්න තීරණය කළා. ඒ පූජා-
සනය ගොඩනැඟුවේ දවන පූජා ඔප්පු
කරන්නවත් වෙනත් පූජා ඔප්පු
කරන්නවත් නෙවෙයි. **27** ඔබ
වගේම අපිත් අපේ දරුවනුත් නමස්-
කාර කරන්නේ යෙහෝවා දෙවිට
විතරයි. අපි දවන පූජා, හවුල් පූජා හා
වෙනත් පූජා[1] ඔප්පු කරන්නේ දෙවි
ඉදිරියේ පමණයි. අපි දෙගොල්ලෝ
අතර කිසිම භේදයක් නැහැ. ඒ
බව සිහිගැන්වීමටයි[2] අපි මේ පූජාස-
නය ගොඩනැඟුවේ. එවිට යම් දව-
සක, ‘යෙහෝවා දෙවිට නමස්කාර
කරන්න ඔබට අයිතියක් නැහැ’ කියා
ඔබේ දරුවන්ට පැවසීමට හැකි වන්-
නේ නැහැ. **28** අනාගතයේදී අපට
හෝ අපේ දරුවන්ට ඒ වගේ දෙයක්
කවුරු හරි කිව්වොත් අපට මේ දේ
කියන්න පුළුවන් වෙයි. ‘අපේ මුතුන්-
මිත්තෝ යෙහෝවා දෙවිගේ පූජාස-
නයට සමාන පූජාසනයක් මෙතැන
ගොඩනැඟුවේ දවන පූජා හෝ වෙ-
නත් පූජා ඔප්පු කරන්න නෙවෙයි.
නමුත් අපිත් ඔබත් අතරේ කිසි භේද-
යක් නැහැ කියා සිහිගන්වන්නයි.’
**29** යෙහෝවා දෙවිගේ ශුද්ධ කූඩාරම
ඉදිරියේ තිබෙන පූජාසනයට අමත-
රව තවත් පූජාසනයක් ගොඩනඟා
එහි පූජා ඔප්පු කරන එක ගැන
අපිට හිතන්නවත් බැහැ.[3] අපේ දෙවි
වන යෙහෝවාට විරුද්ධව හිතාමතා
කැරලිගසන්නවත් යෙහෝවා දෙවිව
අත්හැර යන්නවත් අපි කොහෙත්ම
අදහස් කළේ නැහැ.”[4]

**30** රූබෙන්, ගාද් සහ මනස්සේ
ගෝත්‍රවල සෙනඟ පැවසූ දේවල් අසා
පූජක පිනෙහාස්ද[5] ඔහු සමඟ සිටි
ඊශ්‍රායෙල්වරුන්ගේ අධිපතීහුද[6] ගෝ-
ත්‍රවල නායකයෝද සතුටු වුණෝය.
**31** එහෙයින් එලියාසර්ගේ පුත්‍රයා
වූ පූජක පිනෙහාස් ඔවුන්ට මෙසේ
කීවේය. “ඔබ යෙහෝවා දෙවිට ද්‍රෝහි
වුණේ නැති නිසා යෙහෝවා දෙවිත්
අපිව අත්හරින්නේ නැති බව විශ්වා-
සයි.[7] යෙහෝවා දෙවි දැන් අපට දඬු-
වම් කරන එකක් නැහැ.”[8]

**32** එසේ කී පසු එලියාසර්-
ගේ පුත්‍රයා වූ පූජක පිනෙහාස්ද

**22 පරි.**
1 යොෂු 7:11; යොෂු 7:15
2 යොෂු 7:5; යොෂු 7:24; යොෂු 7:25
3 යොෂු 22:14
4 හිතෝ 15:1; හිතෝ 18:17
5 උත් 2:4; යෙරෙ 10:10
6 නික් 3:15; නික් 6:3; ද්වි 10:17; ගීතා 83:18
7 ගීතා 50:1; ක්‍රියා 17:29
8 1රාජා 8:39; ගීතා 139:3; යෙරෙ 12:3
9 ගීතා 37:6
10 1සාමු 15:23
11 යෝබ 31:5; ගීතා 7:3
12 ද්වි 12:11; ද්වි 12:13
13 ගීතා 44:21; දේශ 12:14; යෙරෙ 32:19; හෙබ්‍රෙ 4:13
14 1රාජා 12:16
15 ද්වි 13:4; දේශ 8:13

**2 තීරුව**
1 ද්වි 12:6; ද්වි 12:27
2 උත් 31:48; යොෂු 24:27
3 ද්වි 12:14; 2ලේක 32:12
4 ද්වි 6:14
5 යොෂු 22:13
6 ගණන් 1:16; යොෂු 22:14
7 2ලේක 15:2
8 ද්වි 1:13

ඊශ්‍රායෙල්වරුන්ගේ අධිපතීහුද ගිලි-
යද් දේශයේ සිටි රූබෙන් සහ
ගාද් ගෝත්‍රවලට අයත් සෙනඟ-
ගෙන් සමුගෙන කානාන් දේශයේ
සිටි අනික් ඊශ්‍රායෙල්වරුන් වෙත
ගොස්[1] ඒ සියලු විස්තර දැනුම් දුන්-
නෝය.[2] **33** ඊශ්‍රායෙල්වරු ඒ ආරං-
චිය අසා සතුටු වෙමින් දෙවිට ප්‍රශංසා
කළෝය.[3] රූබෙන් සහ ගාද් ගෝත්‍රව-
ලට විරුද්ධව යුද්ධ කර ඔවුන්ගේ දේ-
ශය විනාශ කරන්න ගත් තීරණය
ඔවුහු වෙනස් කළෝය.

**34** රූබෙන් සහ ගාද් ගෝත්‍රවලට
අයත් සෙනඟ තමන් ගොඩනැඟූ
පූජාසනයට නමක්* දී, "යෙහෝවා
දෙවි සැබෑ දෙවි[4] බවට මෙය අපි දෙ-
ගොල්ලන්ටම සාක්ෂියක් වේවා" යයි
කීවෝය.

**23** සතුරු ආක්‍රමණවලින් තොර
සාමකාමී කාලයක් යෙ-
හෝවා දෙවි ඊශ්‍රායෙල්වරුන්ට උදා
කර දී තිබිණ.[5] එසේ බොහෝ කාල-
යක් ගත විය. යොෂුවාද මහලු
වියේ පසු විය.[6] **2** එහෙයින් යො-
ෂුවා ඊශ්‍රායෙල්වරුන්ගේ වැඩිමහල්-
ලන්, නායකයන්, විනිශ්චයකරුවන්
සහ නිලධාරීන්[7] ඇතුළු මුළු සෙනඟ
කැඳවා[8] ඔවුන්ට මෙසේ උපදෙස් දුන්-
නේය. "මම දැන් හොඳටම වය-
සට ගිහින්. **3** ඔබේ දෙවි යෙහෝවා
ඔබට මේ දේශය ලබා දීම සඳහා
මෙහි කලින් ජීවත් වූ ජාතීන්ට කළ
සෑම දෙයක්ම ඔබ ඔබේ ඇස්වලින්ම
දුටුවා.[9] ඒ කාලය පුරා ඔබ වෙනුවෙන්
සටන් කළේ ඔබේ දෙවි වන යෙහෝ-
වායි.[10] **4** යොර්දාන් ගඟේ සිට බස්-
නාහිර දෙසින් පිහිටි මහ මුහුද දක්වා
විහිදී ගිය ප්‍රදේශවලින්[11] සෙනඟව
පන්නා දමා[12] ඒ දේශය මම ආදු දමා[13]
ඔබට බෙදා දුන්නා. වෙනත් ජාතීන්
තවමත් ඒ ප්‍රදේශයේ තැනින් තැන
ජීවත් වුණත් ඒ ප්‍රදේශය අයිති ඔබ-
ටයි. **5** එහෙත් ඔවුන්ව පන්නා දමා
ඔවුන්ගේ දේශය ඔබට ලබා දුන්නේ
ඔබේත් මගේත් දෙවි වන යෙහෝ-
වායි.[1] යෙහෝවා දෙවි පොරොන්දු වූ
ලෙසම ඒ දේශය ඔබට උරුම කර
දුන්නා.[2]

**6** "මෝසෙස් මාර්ගයෙන් ලබා දුන්
නීතියේ සඳහන් සෑම දෙයක්ම ඉටු
කිරීමට අධිෂ්ඨාන කරගන්න.[3] එයින්
දකුණටවත් වමටවත් නොහැරී එය
පිළිපදින්න.[4] එසේ කිරීමට ඔබ එඩි-
තර විය යුතුයි.[5] **7** මේ දේශයේ
කලින් ජීවත් වූ ජාතීන්ගෙන් තවමත්
ඉතුරු වී සිටින සෙනඟ සමඟ ආශ්‍ර-
යට නොයන්න.[6] ඔවුන්ගේ දෙවිව-
රුන්ට නමස්කාර කරන්නවත් ඒවා
ඉදිරියේ වැඳ වැටෙන්නවත් එපා.[7] ඒ
දෙවිවරුන්ගේ නම්වලින් දිවුරන්න-
වත්[8] ඒ නම් සඳහන් කරන්නවත්
එපා.[9] **8** මේ දක්වාම ඔබේ දෙවි
වන යෙහෝවාට ඔබ විශ්වාසවන්-
තව සිටියා.[10] දිගටම එලෙස ජීවත්
වෙන්න. **9** අද වන තුරු කිසි කෙ-
නෙකුට ඔබට විරුද්ධව නැඟී සිටීමට
හැකි වුණේ නැහැ.[11] මින් ඉදිරි-
යටත් යෙහෝවා දෙවි ඔබ ඉදිරි-
යෙන් බලවත් ජාතීන් පන්නා දමයි.[12]
**10** ඔබෙන් එක් කෙනෙකුට මිනිසුන්
දහසක් පන්නා දමන්න හැකි වෙයි.[13]
මන්ද ඔබත් මමත් නමස්කාර කරන
යෙහෝවා දෙවි පොරොන්දු වූ ලෙස[14]
ඔහු ඔබ වෙනුවෙන් සටන් කරයි.[15]
**11** යෙහෝවා දෙවි කෙරෙහි ඇති
ඔබේ ප්‍රේමය[16] කිසිදාක නැති වී
යෑමට ඉඩ නොදෙන්න.[17] එයින් ඔබේ
ජීවිතයට ආරක්ෂාවක් ලැබෙයි.

**12** "නමුත් ඔබ දෙවිව අත්-
හැර[18] ඔබ අතරේ තවමත් ජීවත්
වන වෙනත් ජාතීන්[19] සමඟ කිට්ටු
ඇසුරක් පවත්වමින් ඔවුන් සමඟ
විවාහ ගිවිසුම් ඇති කරගත්තොත්[20]

**22 පරි.**
1 යොෂු 22:12
2 හිතෝ 12:25
හිතෝ 25:13
3 දානි 2:20
4 උත් 5:22
යොෂු 24:1
යෙසා 44:8

**23 පරි.**
5 නික් 33:14
ලෙවී 26:6
යොෂු 21:44
6 යොෂු 13:1
7 ද්වි 16:18
8 ද්වි 31:28
9 ලෙවී 26:7
ද්වි 4:9
යොෂු 10:11
යොෂු 10:13
යොෂු 10:40
යොෂු 11:17
10 ද්වි 20:4
යොෂු 10:14
යොෂු 10:42
ගීතා 44:3
11 යොෂු 13:2
යොෂු 13:6
12 ද්වි 7:1
13 ගණන් 26:55
යොෂු 18:10

**2 තීරුව**
1 නික් 23:30
නික් 33:2
නික් 34:11
ද්වි 11:23
2 ගණන් 33:53
3 නික් 24:7
ද්වි 17:18
ද්වි 31:26
යොෂු 1:8
4 ද්වි 5:32
ද්වි 12:32
හිතෝ 30:6
5 යොෂු 1:7
6 නික් 23:33
ද්වි 7:2
හිතෝ 4:14
7 නික් 20:5
8 යෙරෙ 5:7
9 නික් 23:13
10 ද්වි 10:20
ද්වි 11:22
යොෂු 22:5
11 යොෂු 1:5
12 ද්වි 11:23
13 ලෙවී 26:8
විනි 3:31
1සාමු 14:6
2සාමු 23:8
14 ද්වි 28:7
15 නික් 23:27
ද්වි 3:22
ද්වි 20:4
රෝම 8:31

යොෂු **22:34*** එම පූජාසනය, "සාක්ෂියක්" යන නමින් හැඳින්වූවා විය හැකියි.

**16** නික් 20:6; ද්වි 6:5; මතෙ 22:37; 1කොරි 8:3; **17** ද්වි 4:9; යොෂු 22:5; **18** හෙබ්‍රෙ 10:38; 2පේතෘ 2:20; **19** නික් 23:29; යොෂු 13:2; **20** නික් 34:16; ද්වි 7:3; විනි 3:6; 1රාජා 11:4; එස්රා 9:2; නෙහෙ 13:23.

**13** ඔබේ දෙවි වන යෙහෝවා මින්
මතුවට ඔබ ඉදිරියෙන් ඒ ජාතීන්ව
පන්නා නොදමන බව ස්ථිරයි.[1] ඔබේ
දෙවි වන යෙහෝවා ඔබට දුන් මේ
සරුසාර දේශයෙන් ඔබ සම්පූර්ණ-
යෙන්ම තුරන් වී යන තුරු[2] ඒ ජාතීන්
ඔබට උගුලක් මෙන් වෙයි. ඔබේ
පිටට කසයකින් පහර දෙන්නාක්
මෙන්ද ඔබේ ඇස්වලට කටුවලින්
අනින්නාක් මෙන්ද ඔවුන් ඔබට හිංසා
පීඩා කරයි.[3]
**14** “මම තව වැඩි කාලයක් ජීවත්
වෙන එකක් නැහැ.[4] ඔබත් මමත්
නමස්කාර කරන යෙහෝවා දෙවි
අපට දුන් එක පොරොන්දුවක්වත්
කඩ කළේ නැහැ කියා ඔබ හොඳින්
දන්නවා. ඔහු දුන් සෑම පොරොන්දු-
වක්ම ඒ විදිහටම ඔහු ඉටු කළා.[5]
**15** ඔබේ දෙවි වන යෙහෝවා ඔබට
දුන් සෑම යහපත් පොරොන්දුවක්ම
ඉටු වුණා වගේම[6] ඔබ යෙහෝවා දෙ-
විට අකීකරු වුණොත් යෙහෝවා
දෙවි ඔබට දුන් මේ සාරවත් දේශ-
යෙන් ඔබ තුරන් වී යන තුරු
ඔහු පැවසූ සෑම විපත්තියක්ම ඔබට
අද්දකින්න සිදු වන බවත් ස්ථි-
රයි.[7] **16** ඔබ යෙහෝවා දෙවි සමඟ
ඇති කරගත් ගිවිසුම කඩ කර වෙ-
නත් දෙවිවරුන්ට නමස්කාර කර-
මින් ඒවා ඉදිරියේ වැඳ වැටුණොත්[8]
යෙහෝවා දෙවිගේ උදහස අනිවාර්ය-
යෙන්ම ඔබට විරුද්ධව ඇවිළෙයි.[9]
එවිට ඔහු ඔබට දුන් මේ සරුසාර
දේශයෙන් ඔබ විගස තුරන් වී යයි.”[10]

**24** පසුව යොෂුවා ඊශ්‍රායෙල්-
වරුන්ගේ වැඩිමහල්ලන්,[11]
නායකයන්, විනිශ්චයකරුවන් සහ
නිලධාරීන් ඇතුළු සියලු ඊශ්‍රා-
යෙල් ගෝත්‍ර ෂීකෙම් නගරයට
රැස් කළේය.[12] සැබෑ දෙවි[13] ඉදිරියේ
රැස්ව සිටි සෙනඟ අමතා **2** යො-
ෂුවා මෙසේ කීවේය. “ඊශ්‍රායෙල්ව-
රුන්ගේ දෙවි වන යෙහෝවා මෙසේ
පවසනවා. ‘බොහෝ කලකට පෙර
ආබ්‍රහම්ගේද නාහෝර්ගේද[14] පියා වූ
ටෙරා ඇතුළු ඔබේ අනික් මුතුන්මිත්-
තන්[1] ගඟෙන්* එගොඩ[2] ජීවත් වුණා.
ඔවුන් නමස්කාර කළේ වෙනත් දෙවි-
වරුන්ටයි.
**3** “‘පසුව මම ගඟෙන් එගොඩ[3]
ජීවත් වූ ඔබේ මුතුන්මිත්තෙකු වන
ආබ්‍රහම්ව[4] කැඳවා කානාන් දේශය
පුරා ඔහුව ගෙන ගියා. මම ඔහුට
ඊසාක් නමින් පුතෙකු ලබා දුන්නා.[5]
එමගින් ඔහුගෙන් පැවතෙන්නන්-
ගේ ගණන බොහෝ සෙයින් වැඩි
කළා.[6] **4** ඊසාක්ට යාකොබ් සහ
ඒසව්[7] යන පුතුන් දෙදෙනා ලබා
දුන්නා. මම ඒසව්ට සේයිර් කඳුකර
ප්‍රදේශය උරුමයක් හැටියට දුන්නා.[8]
යාකොබ් සහ ඔහුගේ පුත්‍රයන් ඊජිප්-
තුවට ගිහින් එහි පදිංචි වුණා.[9]
**5** කාලයක් ගත වූ පසු ඔවුන්ව
බේරාගැනීමට මම මෝසෙස්ව සහ
ආරොන්ව ඔවුන් වෙතට යැව්වා.[10]
මම ඊජිප්තු දේශයට පීඩාවලින් පහර
දී[11] ඔවුන්ව එතැනින් පිටතට ගෙන
ආවා.[12] **6** ඔවුන් ඊජිප්තුවෙන් පිට
වී[13] රතු මුහුද ළඟට පැමිණෙද්දී ඊජිප්-
තුවරුන් යුධ රථවල හා අසු පිට
නැඟ ඔවුන් පසුපස ලුහුබැඳ එතැ-
නට ආවා.[14] **7** ඒ අවස්ථාවේදී කිසි-
වක් කරකියාගත නොහැකිව ඔබේ
මුතුන්මිත්තන් යෙහෝවා දෙවි වන
මාගෙන් උපකාර ඉල්ලා මොරගැ-
සුවා.[15] එවිට මම ඔබේ මුතුන්මිත්-
තන් හා ඊජිප්තුවරුන් අතරේ අඳුරු
වලා ටැඹක් තබා[16] ඔබේ මුතුන්මිත්-
තන්ව ආරක්ෂා කළා. ඉන්පසු ඊජිප්-
තුවරුන්ව මුහුදු පත්ලටම ගිලී යන්න
සැලැස්සුවා.[17] මම ඊජිප්තු දේශයේදී
කළ සෑම පුදුම දෙයක්ම[18] ඔබේ
මුතුන්මිත්තන් ඔවුන්ගේ ඇස් දෙ-
කෙන්ම දැක්කා. ඔවුන් බොහෝ
කාලයක් පුරා පාළුකරයේ ජීවත්
වුණා.[19]

**23 පරි.**
1 විනි 2:3; විනි 2:21; විනි 3:8
2 ද්වි 4:26; ද්වි 28:63
3 ගණන් 33:55; ද්වි 7:16
4 1රාජා 2:2; දේශ 9:10
5 යොෂු 21:45; 1රාජා 8:56
6 ලෙවී 26:3; ද්වි 28:1
7 ලෙවී 26:14; ද්වි 28:15; ද්වි 28:63; 2ලේක 36:16; ලූක් 21:24
8 විනි 3:6; ගීතා 106:36; යෙරෙ 5:19
9 2රාජා 24:20
10 යොෂු 23:13

**24 පරි.**
11 යෙසා 44:8; 1කොරි 8:4
12 1රාජා 12:1
13 නික් 18:25; ගණන් 1:16; යොෂු 23:2
14 උත් 11:27

**2 තීරුව**
1 උත් 11:26
2 උත් 11:28; උත් 11:31; උත් 15:18; යොෂු 24:15
3 යොෂු 1:4
4 උත් 12:1; නෙහෙ 9:7; ක්‍රියා 7:2
5 උත් 21:3; ගීතා 127:3
6 උත් 15:5; රෝම 4:18; හෙබ්‍රෙ 6:14
7 උත් 25:26
8 උත් 36:8; ද්වි 2:5
9 උත් 46:3; ගීතා 105:23; ක්‍රියා 7:15
10 නික් 3:10
11 නික් 11:1
12 ගීතා 78:52
13 නික් 12:37; මීකා 6:4
14 නික් 14:9
15 නික් 14:10
16 නික් 14:20; ගීතා 78:14; ගීතා 105:39

**17** නික් 14:27; ගීතා 78:53; ගීතා 106:11; ගීතා 136:15; **18** නික් 3:20; ද්වි 4:34; **19** ගණන් 14:34; ක්‍රියා 13:18.

යොෂු **24:2*** එනම්, යුප්‍රටීස් ගඟෙන්.

8 "'කාලයක් ගත වූ පසු යෝර්-
දාන් ගඟට නැඟෙනහිර පැත්තේ
වාසය කළ අමෝරිවරුන්ගේ දේශ-
යට මම ඔබව ගෙන ආවා. ඔවුන්
ඔබට විරුද්ධව සටන් කළ නමුත්[1]
ඔවුන්ට ජය ගැනීමට නොහැකි වුණා.
මන්ද ඔවුන්ට විරුද්ධව නැඟී සිටින්න
මම ඔබට උපකාර කළා. ඔබට
ඒ දේශය උරුම කර දීම සඳහා
මම ඔවුන්ව දේශයෙන් පන්නා දමා
ඔබේ ඇස් පනාපිටම ඔවුන්ව විනාශ
කළා.[2] 9 ඉන්පසු මෝවබ් දේශයේ
රජු වූ ෂිප්පෝර්ගේ පුත්‍රයා[3] වන
බාලාක්, ඊශ්‍රායෙල්වරුන්ට එරෙහි වී[4]
ඔවුන්ට ශාප කිරීමට බෙයෝර්ගේ
පුත්‍රයා වූ බාලාම්ව ගෙන්වාගත්තා.[5]
10 නමුත් ඔබට ශාප කිරීමට මම
බාලාම්ට ඉඩ දුන්නේ නැහැ.[6] ඒ වෙ-
නුවට කිහිප වතාවක්ම ඔබට ආශීර්-
වාද කිරීමට මම ඔහුව පෙලඹුවා.[7]
එලෙස මම ඔහුගෙන් ඔබව බේරා-
ගත්තා.[8]

11 "'පසුව ඔබ යෝර්දාන් ගඟෙන්
එගොඩ වී[9] යෙරිකෝවට[10] පැමිණියා.
යෙරිකෝවේ වැසියන්ද* අමෝරිව-
රුන්ද පෙරිස්සිවරුන්ද කානානිව-
රුන්ද හිත්තීවරුන්ද ගිර්ගාෂිවරුන්ද
හිවීයවරුන්ද යෙබූසිවරුන්ද ඔබට
විරුද්ධව සටන් කළත් මම ඔවුන්ව
ඔබට යටත් කර දුන්නා.[11] 12 ඔබ
ඔවුන් අතරට යන්නත් කලින් මම
ඔවුන් තුළ ඔබ ගැන මහත් භයක්
ඇති කළා. ඒ නිසා ඔවුන් ඔබ
එන බව දැක කලබල වී ඔබ ඉදි-
රියෙන් පලා ගියා.[12] ඔබ ඔවුන්ව
පරාජය කළේ ඔබේ කඩුවෙන්වත්
දුන්නෙන්වත් නොවෙයි.[13] අමෝරිව-
රුන්ගේ රජවරුන් දෙදෙනාත් පරාජ-
යට පත් වුණේ ඒ ආකාරයටමයි.
13 මෙසේ මම දේශය ඔබේ අතට
භාර දුන්නා. එය ඔබ ලබාගත්තේ
ඔබේ මහන්සියෙන් නොවේ. පදිංචි වීම
සඳහා නගර ගොඩනඟන්න ඔබට සිදු
වුණේ නැහැ.[1] ඔබට පෙර මේ දේශයේ
ජීවත් වූ වැසියන් වගා කළ මිදි සහ
ඔලීවවතුවල පලදාව දැන් භුක්ති
විඳින්නේ ඔබයි.'"[2]

14 යොෂුවා තවදුරටත් ඔවුන්ට
මෙසේ කීවේය. "යෙහෝවා දෙවි
ඔබ වෙනුවෙන් කළ මේ දේවල්
නිසා ඔහුට ගරුබිය පෙන්වමින්[3]
අවංක සිතින් ඔහුට නමස්කාර
කරන්න. දිගටම ඔහුට විශ්වාසවන්-
තව සිටින්න.[4] ගඟෙන් එගොඩ හා
ඊජිප්තුවේ ජීවත් වූ ඔබේ මුතුන්මිත්-
තන් නමස්කාර කළ දෙවිවරුන්ව
සම්පූර්ණයෙන්ම අත්හැර[5] යෙහෝවා
දෙවිට පමණක් නමස්කාර කරන්න.
15 නමුත් යෙහෝවා දෙවිට නමස්-
කාර කරන්න ඔබ තුළ කැමැත්තක්
නැත්නම් ඔබ නමස්කාර කරන්නේ
කාටද කියා අදම තීරණය කරන්න.[6]
කැමති නම් ගඟෙන් එගොඩ
ජීවත් වූ ඔබේ මුතුන්මිත්තන් නමස්-
කාර කළ දෙවිවරුන්ට නමස්කාර
කරන්න.[7] එහෙමත් නැත්නම් මේ
දේශයේ කලින් ජීවත් වූ අමෝ-
රිවරුන්ගේ දෙවිවරුන්ට නමස්කාර
කරන්න.[8] නමුත් මමත් මගේ පවු-
ලේ අයත් යෙහෝවා දෙවිට මිස
වෙන කිසිවෙකුට නමස්කාර කරන්-
නේ නැහැ."[9]

16 එවිට සෙනඟ මෙසේ පිළිතුරු
දුන්නෝය. "යෙහෝවා දෙවිව අත්-
හැර වෙනත් දෙවිවරුන්ට නමස්කාර
කිරීම ගැන අපිට හිතන්නවත් බැහැ.
17 ඊජිප්තුවේ වහලුන් හැටියට සිටි[10]
අපවත් අපේ මුතුන්මිත්තන්වත් නිද-
හස් කළේ අපේ දෙවි වන යෙහෝ-
වායි.[11] ඔහු අප වෙනුවෙන් පුදුම
දේවල් කළා.[12] මේ දේශයට එන
තුරුම ඔහු අපව සතුරන්ගෙනුත් වෙ-
නත් උවදුරුවලිනුත් ආරක්ෂා කළා.[13]
18 යෙහෝවා දෙවි මේ දේශයේ සිටි
අමෝරිවරුන් ඇතුළු සියලු ජාතීන්ව
පන්නා දැමුවා.[14] අපේ දෙවි ඔහුයි. ඒ
නිසා ඔබ වගේම අපත් නමස්කාර
කරන්නේ යෙහෝවා දෙවිටයි."[15]

**24 පරි.**
1 ගණන් 21:23
2 නෙහෙ 9:22
ගීතා 135:11
3 ගණන් 22:2
4 විනි 11:25
5 ගණන් 22:5
ද්වි 23:4
6 ගණන් 22:12
මීකා 6:5
7 ගණන් 23:11
ගණන් 23:25
ගණන් 24:10
8 උත් 12:3
ගණන් 25:17
ගණන් 31:7
ගණන් 31:49
9 යොෂු 3:17
ගීතා 114:3
10 යොෂු 5:10
11 යොෂු 11:16
යොෂු 21:44
නෙහෙ 9:24
ගීතා 78:55
ගීතා 105:44
ක්‍රියා 7:45
ක්‍රියා 13:19
හෙබ්‍රෙ 11:30
12 නික් 23:28
ද්වි 7:20
යොෂු 2:9
13 ගීතා 44:3

**2 තීරුව**
1 ද්වි 6:10
යොෂු 11:14
හිතෝ 13:22
2 ද්වි 6:11
ද්වි 8:8
3 ද්වි 10:12
1සාමු 12:24
ක්‍රියා 9:31
4 උත් 17:1
ද්වි 18:13
ගීතා 119:80
යොහ 4:24
5 ලෙවි 17:7
එස 23:8
6 ද්වි 30:19
1රාජා 18:21
7 යොෂු 24:2
8 නික් 23:32
ද්වි 7:25
ද්වි 13:7
විනි 6:10
විනි 10:6
9 උත් 18:19
ද්වි 30:19
10 ද්වි 6:12
1සාමු 2:27
11 නික් 19:4
ද්වි 32:12
ආමො 2:10
12 නික් 14:31
ද්වි 4:34
ද්වි 29:2
13 නික් 23:23
14 යොෂු 24:8
15 නික් 15:2
යොෂු 24:15
මීකා 4:5

යොෂු **24:11*** මූ.අ., "ඉඩම් හිමියෝ."

**19** එවිට යොෂුවා සෙනඟට මෙසේ
කීවේය. “යෙහෝවා දෙවිට දිගටම
නමස්කාර කරන්න ඔබට පුළුවන් වෙ-
යිද? ඔහු ශුද්ධ දෙවි කෙනෙක්.[1] ඔහුට
නමස්කාර කරන අතරේදී වෙනත්
දෙවිවරුන්ටත් වැඳුම්පිදුම් කිරීම ඔහු
දැඩි ලෙස හෙළාදකිනවා.[2] ඔබ එසේ
කළොත් ඔබේ පව්වලට දෙවිගෙන්
සමාව ලැබෙන්නේ නැහැ.[3] **20** ඔබ
යෙහෝවා දෙවිව අත්හැර[4] වෙනත්
දෙවිවරුන්ට නමස්කාර කළොත්[5] ඔහු
ඔබ වෙනුවෙන් යහපත් දේවල් කළ
ලෙසම ඔබට දඬුවම් කරන බවත්
ස්ථිරයි. ඔබේ මුළු ජාතියම විනාශ වී
යන්නත් ඉඩ තිබෙනවා.”[6]

**21** එවිට ඒ සෙනඟ යොෂුවාට
මෙසේ කීවෝය. “අපි නමස්කාර
කරන්නේ යෙහෝවා දෙවිට විත-
රයි.”[7] **22** යොෂුවා ඔවුන්ට මෙසේ
පිළිතුරු දුන්නේය. “ඔබ ඔබේ
කැමැත්තෙන්මයි යෙහෝවා දෙවිට
නමස්කාර කිරීමට තෝරගත්තේ.[8] ඒ
කාරණයට අද ඔබ සියලුදෙනාම
සාක්ෂිකරුවන් වෙයි.”[9] ඔවුහුද, “අපි
දුන් පොරොන්දුවට අපිම සාක්ෂිකරු-
වෝ” කියා පිළිතුරු දුන්නෝය.

**23** “එහෙමනම් දැන් ඔබ වෙ-
නත් දෙවිවරුන්ව සම්පූර්ණයෙන්ම
අත්හැර[10] ඔබේ මුළු සිතින්ම ඊශ්‍රා-
යෙල්වරුන්ගේ දෙවි වන යෙහෝවාට
නමස්කාර කරන්න.” **24** සෙනඟද,
“අපි නමස්කාර කරන්නේ යෙහෝවා
දෙවිට විතරයි. ඔහු කියන දේට අපි
කීකරු වෙනවා”[11] කියා යොෂුවාට
කීවෝය.

**25** එවිට යොෂුවා ෂීකෙම් නගර-
යේදීම සෙනඟ සමඟ ගිවිසුමක් ඇති
කරගෙන ඒ ගිවිසුමට අයත් නීති
හා කොන්දේසි සම්මත කළේය.[12]
**26** එම කොන්දේසි දෙවිගේ නීති සඳ-
හන් වූ ලියවිල්ලෙහි[13] සටහන් කළ
යොෂුවා, ඒ අසල තිබූ විශාල ගස[14]
යට ලොකු ගලක්[15] තැබුවේය. ඔහු
එය තැබුවේ යෙහෝවා දෙවිට කැප
කළ ස්ථානය අසලය.

**27** ඉන්පසු යොෂුවා, “මේ ගල අපි
ඇති කරගත් ගිවිසුමට සාක්ෂියක්.[1]
මන්ද දෙවි අපි සමඟ කතා කළ හැම
දෙයක්ම ප්‍රකාශ කළේ මේ ගල ඉදිරි-
යේයි. ඒ නිසා ඔබ යෙහෝවා දෙ-
විව අත්හැරියොත් ඔබ වරදකරුවන්
බවට මේ ගල සාක්ෂියක් වෙයි”
කියා සෙනඟට කීවේය. **28** ඉන්පසු
යොෂුවා, සෙනඟව තම තමන්ගේ
නිවෙස්වලට පිටත් කර යැව්වේය.[2]

**29** මේ දේවල් සිදු වී කලක් ගත
වූ පසු නූන්ගේ පුත් යොෂුවා මිය
ගියේය. යෙහෝවා දෙවිගේ සේවක-
යෙකු වූ යොෂුවා මිය යන විට ඔහුට
වයස අවුරුදු එකසිය දහයක් විය.[3]
**30** ඔහුට උරුමයක් ලෙස ලැබුණු
තිම්නත්-සේරා නගරයේ ඊශ්‍රායෙල්-
වරු ඔහුව තැන්පත් කළෝය.[4] එම
නගරය පිහිටා තිබෙන්නේ එෆ්‍රායිම්
ගෝත්‍රයට අයත් කඳුකර ප්‍රදේශ-
යේ තිබූ ගයෂ් කන්දට උතුරින්ය.
**31** යොෂුවා ජීවත්ව සිටි කාලයේදී
ඊශ්‍රායෙල්වරු යෙහෝවා දෙවිට විශ්-
වාසවන්තව සේවය කළෝය. ඔහු
මිය යෑමෙන් අනතුරුව ඊශ්‍රායෙල්-
වරුන් වෙනුවෙන් යෙහෝවා දෙවි
ක්‍රියා කළ ආකාරය දැක තිබූ[5] වැඩිම-
හල්ලන් ජීවත්ව සිටින තාක් කල්
සෙනඟ දෙවිට විශ්වාසවන්තව සිටි-
යෝය.[6]

**32** යාකොබ්, ෂීකෙම්ගේ පියා වූ
හාමෝර්ගේ පුත්‍රයන්ගෙන් රිදී කාසි
සියයකට[7] මිල දී ගෙන තිබූ ඉඩමක්
ෂීකෙම් නගරයේ තිබුණේය.[8] ඊශ්‍රා-
යෙල්වරු ඊජිප්තුවේ සිට රැගෙන ආ
යෝසෙප්ගේ ඇටකටු[9] එහි තැන්පත්
කළෝය. ඒ බිම් කොටස යෝසෙප්-
ගේ පුත්‍රයන්ට උරුම විය.[10]

**33** පසුව ආරොන්ගේ පුත්‍රයා වූ
එලියාසර්ද මිය ගියේය.[11] ඔවුහු
එලියාසර්ගේ පුත්‍රයා වූ පිනෙහාස්-
ගේ[12] නමින් හැඳින්වූ කන්දේ ඔහුව
තැන්පත් කළෝය. ඒ කන්ද පිහිටා
තිබුණේ එෆ්‍රායිම් ගෝත්‍රයට අයත්
ප්‍රදේශයේ පිහිටි කඳුකරයේය.

**24 පරි.**

**1** ලෙවී 19:2 1සාමු 6:20 ගීතා 99:5 යෙසා 6:3 1පේතෘ 1:15
**2** නික් 20:5 නික් 34:14 ගණන් 25:11 ද්වි 6:13 නාහු 1:2 මතෙ 4:10
**3** නික් 23:21 ගණන් 14:35 1සාමු 3:14 2පේතෘ 2:9
**4** යොෂු 23:12 2ලේක 15:2 එස්රා 8:22 යෙසා 1:28 යෙරෙ 17:13
**5** යොෂු 23:16
**6** ද්වි 28:20 යෙසා 63:10
**7** නික් 19:8 යොෂු 24:18 යෙසා 44:5
**8** යොෂු 24:15 ගීතා 119:57
**9** ද්වි 26:17 දේශ 5:4
**10** නික් 20:23 විනි 10:16 1සාමු 7:3 1කොරි 8:5
**11** ද්වි 5:27 ද්වි 28:1
**12** නික් 24:3
**13** ද්වි 31:26
**14** උත් 12:6 උත් 35:4
**15** උත් 31:45

---

**2 තීරුව**

**1** උත් 31:48
**2** විනි 2:6
**3** විනි 2:8
**4** යොෂු 19:50 විනි 2:9
**5** ද්වි 11:2 ද්වි 31:13
**6** විනි 2:7
**7** උත් 33:19
**8** ක්‍රියා 7:16
**9** උත් 50:25 නික් 13:19 හෙබ්‍රෙ 11:22
**10** යොෂු 20:7
**11** ගණන් 3:4 ගණන් 20:26
**12** නික් 6:25 විනි 20:28

# විනිශ්චයකරුවෝ

**1** යොෂුවාගේ මරණයෙන් පසු[1]
ඊශ්‍රායෙල්වරු රැස් වී යෙහෝවා
දෙවිගේ මඟ පෙන්වීම් පතමින්,[2]
“කානානිවරුන්ට විරුද්ධව සටන්
කරන්න අප අතරින් මුලින්ම යැවිය
යුත්තේ කාවද” කියා දෙවිගෙන් විම-
සුවෝය. **2** යෙහෝවා දෙවි ඔවුන්ට
මෙසේ පිළිතුරු දුන්නේය. “යූදා ගෝ-
ත්‍රයේ සෙනඟව යවන්න.[3] දේශය
අල්ලාගන්න මම ඔවුන්ට උපකාර
කරන්නෙමි.” **3** එවිට යූදා ගෝත්‍ර-
යේ සෙනඟ තම සහෝදර ගෝත්‍රය
වූ සිමියොන් ගෝත්‍රයේ වැසි-
යන්ට කතා කරමින්, “ආදූ දමා
අපට ලැබුණු ප්‍රදේශය අල්ලාගන්න
ඔබත් අප සමඟ හවුල් වෙන්න.[4]
අපි එකතු වෙලා කානානිවරුන්ට
විරුද්ධව සටන් කරමු. ඔබේ වාර-
යේදී අපිත් ඔබට උදව් කරන්නම්”[5]
කියා පැවසුවෝය. එහෙයින් සිමි-
යොන් ගෝත්‍රයේ සෙනඟ ඔවුන් සමඟ
ගියෝය.[6]

**4** යෙහෝවා දෙවි සටනට ගිය
යූදා ගෝත්‍රයේ සෙනඟට කානා-
නිවරුන්වද පෙරිස්සිවරුන්වද යටත්
කර දුන්නේය.[7] ඔවුහු බෙෂෙක්
නම් ස්ථානයේදී දසදහස්දෙනෙකුට
පහර දී ඔවුන්ව පරාජය කළෝය.
**5** අදොනි-බෙෂෙක් එහි සිටින බව
දැනගත් ඔවුහු ඔහුට විරුද්ධව සටන්
කර කානානිවරුන්ව[8] හා පෙරිස්සිව-
රුන්ව[9] පරාජය කළෝය. **6** නමුත්
අදොනි-බෙෂෙක් ඔවුන් වෙතින්
පලා ගියේය. එවිට ඔවුහු ඔහු පසු-
පස ලුහුබැඳ ගොස් ඔහුව අල්ලා-
ගෙන ඔහුගේ අත් පාවල මාපටැඟිලි
කපා දැමුවෝය. **7** එවිට අදොනි-
බෙෂෙක් මෙසේ පැවසීය. “අත් පාවල
මාපටැඟිලි නැති රජවරුන් හැත්-
තෑදෙනෙක් මා යටතේ ඉන්නවා.
ඔවුන් ජීවත් වෙන්නේ මගේ මේ-
සයෙන් වැටෙන කෑම අහුලාගෙන
කාලයි. මම කළ ඒ දේ නිසයි දෙවි
මට දඬුවම් දීලා තියෙන්නේ.”[1] ඉන්-
පසු ඔවුහු ඔහුව යෙරුසලමට[2] ගෙනා-
වෝය. එහිදී ඔහු මිය ගියේය.

**8** යූදා ගෝත්‍රයේ සෙනඟ යෙරු-
සලමට විරුද්ධව යුද්ධ කර[3] එය
අල්ලාගත්තෝය. ඔවුහු එහි වැසි-
යන්ව කඩුවෙන් මරා දමා නුවර
ගිනිබත් කළෝය. **9** ඉන්පසු ඔවුහු
කඳුකරයේද නෙගෙබ්[4] හා ෂෙපේලා
ප්‍රදේශවලද*[5] වාසය කළ කානානිව-
රුන්ට විරුද්ධව සටනට ගියෝය.
**10** පසුව ඔවුහු හෙබ්‍රොන්හි වාසය
කළ කානානිවරුන්ට විරුද්ධවද යුද්ධ
කර[6] ෂේෂයි, අහිමාන් සහ තල්-
මයි යන අයව මරා දැමුවෝය.[7]
(හෙබ්‍රොන් නුවර කලින් හැඳින්වූයේ
කිර්යත්-අර්බා ලෙසයි.)[8]

**11** එතැන් සිට ඔවුහු දෙබීර්
බලා ගොස් එහි වැසියන්ට විරුද්-
ධව සටන් කළෝය.[9] (දෙබීර් නුවර
කලින් හැඳින්වූයේ කිර්යත්-සේෆර්
ලෙසයි.)[10] **12** එවිට කාලෙබ්,[11]
“කිර්යත්-සේෆර් නුවරට පහර දී
එය අල්ලාගන්නා තැනැත්තාට මම
මගේ දුව අක්සාව[12] විවාහ කර දෙ-
නවා”[13] කියා පැවසීය. **13** කාලෙබ්-
ගේ බාල සොහොයුරු වූ[14] කෙනෂ්ගේ
පුත්[15] ඔත්නියෙල්[16] එය අල්ලාගත්-
තේය. එහෙයින් කාලෙබ් තම දිය-
ණිය වූ අක්සාව ඔහුට විවාහ කර
දුන්නේය.[17] **14** ඔත්නියෙල් ඇයව
බූරුවෙකු පිට තබාගෙන තම නිව-
සට රැගෙන යමින් සිටියදී තම
පියාගෙන් ඉඩමක් ලබාගන්න කියා
අක්සා ඔහුට පෙරැත්ත කළාය. පසුව
ඇය අත්පුඩි ගසා තම පියාට අඬගැ-
සුවාය.[18] එවිට කාලෙබ්, “මගේ දුවේ,
ඔබට මොනවද ඕනේ” කියා ඇගෙන්
ඇසුවේය. **15** ඇය මෙසේ පිළිතුරු
දුන්නාය. “තාත්තේ, ඔබ මට දුන්-
නේ දකුණු දේශයේ තියෙන වියළි

---

**1 පරි.**
**1** යොෂු 24:29
**2** ගණන් 27:21 විනි 20:18 හිතෝ 3:5
**3** උත් 49:8 ද්වි 33:7 1ලේක 5:2 1ලේක 28:4
**4** යොෂු 15:1 යොෂු 19:1
**5** යොෂු 19:9
**6** විනි 1:17
**7** ද්වි 9:3 යොෂු 10:8
**8** උත් 10:6 ද්වි 20:17
**9** උත් 15:20 නික් 3:8 යොෂු 9:1 විනි 3:5 1රාජා 9:20

**2 තීරුව**
**1** නික් 21:23 ලෙවී 24:19 ද්වි 19:21 1සාමු 15:33 රෝම 2:6 ගලා 6:7
**2** යොෂු 15:8
**3** යොෂු 15:63 විනි 1:21
**4** ගණන් 21:1
**5** ද්වි 1:7 යොෂු 11:16 යොෂු 15:33
**6** යොෂු 11:21 යොෂු 15:13
**7** යොෂු 15:14
**8** යොෂු 14:15
**9** යොෂු 10:38
**10** යොෂු 15:15
**11** ගණන් 13:6 ගණන් 14:24 ද්වි 1:36 යොෂු 14:13
**12** 1ලේක 2:49
**13** යොෂු 15:16
**14** විනි 3:9
**15** 1ලේක 4:13
**16** යොෂු 15:17 විනි 3:9
**17** 1සාමු 17:25
**18** යොෂු 15:18

---

විනි **1:9*** හෝ, “පහත් බිම්වලද.”

බිම් කොටසක්. මම කැමතියි ඔබේ
ආශීර්වාදය ඇතුව ගුල්ලොත්-මායිම්*
ප්‍රදේශයත් තෑග්ගක් හැටියට මට දෙ-
නවා නම්.”[1] එහෙයින් කාලෙබ් ඇයට
ගුල්ලොත් ප්‍රදේශයේ ඉහළ කොටසද[2]
පහළ කොටසද දුන්නේය.
**16** කේනිවරුන්ගෙන් පැවතෙන්-
නන්[3] යූදා ගෝත්‍රයේ සෙනඟ සමඟ
තාල වර්ගයේ ගස්වලට ප්‍රසිද්ධ වූ නුව-
රින්[4] පිටත් වී යූදාහි පාළුකරයට
ගියෝය. (එම කේනිවරු මෝසෙස්ගේ
මාමණ්ඩිගෙන්[5] පැවත ආ අයයි.) යූදා
පාළුකරය පිහිටා තිබුණේ ආරද් නම්
නුවරට[6] දකුණින්ය. ඔවුහු එම ප්‍රදේශ-
යෙහි ඒ වන විටත් පදිංචිව සිටි
අය සමඟ වාසය කරන්න පටන්ගත්-
තෝය.[7] **17** එහෙත් යූදා ගෝත්‍රයේ
සෙනඟ තම සහෝදරයන් වූ සිමියොන්
ගෝත්‍රයේ අය සමඟ දිගින් දිගටම තම
සතුරන්ට විරුද්ධව සටනට ගියෝය.
ඔවුහු ෂෙපත් නම් නුවරෙහි වාසය කළ
කානානිවරුන්ට පහර දී එය සහමු-
ලින්ම විනාශ කළෝය.[8] එම නුවරේ
නම හොර්මා*[9] ලෙස වෙනස් කරන
ලද්දේ ඒ නිසාය. **18** ඉන්පසු යූදා
ගෝත්‍රයේ සෙනඟ ගාසා[10] සහ ඒ අවට
ප්‍රදේශයද අෂ්කෙලොන්[11] සහ ඒ අවට
ප්‍රදේශයද එක්‍රොන්[12] සහ ඒ අවට ප්‍රදේ-
ශයද අල්ලාගත්තෝය. **19** ඔවුන්ට
යෙහෝවා දෙවිගේ ආශීර්වාදය දිගටම
ලැබුණු නිසා කඳුකර ප්‍රදේශය අත් පත්
කරගැනීමට හැකි විය. එනමුත් තැනි-
තලාවල ජීවත් වූ වැසියන්ට යකඩ
උල් සවි කළ[13] යුධ රථ තිබූ නිසා[14]
ඔවුන්ව පන්නා දැමීමට යූදා ගෝත්‍රයේ
සෙනඟට නොහැකි විය. **20** මෝ-
සෙස් පොරොන්දු වූ පරිදි[15] හෙබ්‍රොන්
නුවර කාලෙබ්ට දෙනු ලැබූ විට ඔහු
එම නුවරින් අනාක්ගේ පුත්‍රයන් තිදෙ-
නාව[16] පන්නා දැමුවේය.
**21** යෙරුසලමෙහි වාසය කරමින්
සිටි යෙබූසිවරුන්ව පන්නා දැමීමට
බෙන්ජමින් ගෝත්‍රයේ සෙනඟට නො-
හැකි විය.[1] එහෙයින් යෙබූසිවරු අද
දක්වාම බෙන්ජමින් ගෝත්‍රයේ අය
සමඟ යෙරුසලමෙහි වාසය කරති.[2]
**22** යෝසෙප් ගෝත්‍රයේ සෙනඟ[3]
බෙතෙල් නුවරට[4] විරුද්ධව සටනට
ගියෝය. ඒ සඳහා ඔවුන්ට යෙ-
හෝවා දෙවිගේ උපකාරය ලැබිණ.[5]
**23** ඔවුහු බෙතෙල් නුවර ගැන
තොරතුරු සොයා බැලීමට ඔත්-
තුකාරයන්ව යැව්වෝය.[6] (බෙතෙල්
නුවර කලින් හැඳින්වූයේ ලූෂ් යන
නමින්ය.)[7] **24** එම නුවරින් පිටතට
එන මිනිසෙකුව දුටු ඔත්තුකරුවෝ
ඔහුට මෙසේ පැවසුවෝය. “නුවරට
ඇතුල් වෙන හැටි අපිට පෙන්වා
දෙන්න. ඔබ එහෙම කළොත් අපි
ඔබට කරුණාවන්තව සලකන්නම්.”[8]
**25** එම මිනිසා නුවරට ඇතුල් වන
ආකාරය ඔවුන්ට පෙන්වා දුන්නේය.
ඔවුහු නුවරට ඇතුල් වී එහි සිටි
සියලුදෙනාව කඩුවෙන් මරා දැමු-
වෝය.[9] නමුත් ඔවුන්ට උපකාර කළ
ඒ මිනිසාටවත් ඔහුගේ පවුලේ අයට-
වත් ඔවුහු කිසිම හිරිහැරයක් කළේ
නැත.[10] **26** පසුව ඒ මිනිසා හිත්තී-
වරුන්ගේ දේශයට[11] ගොස් එහි නුව-
රක් ගොඩනඟා එයට ලූෂ් යන නම
තැබීය. අද දක්වාම එම නුවර හඳුන්-
වන්නේ එම නමින්ය.
**27** බෙත්-ෂෙයාන්[12] සහ ඒ අවට
පිහිටි කුඩා නුවරවල්ද තයනක්[13] සහ
ඒ අවට පිහිටි කුඩා නුවරවල්ද දෝර්[14]
සහ ඒ අවට පිහිටි කුඩා නුවරවල්ද
ඉබ්ලෙයාම්[15] සහ ඒ අවට පිහිටි කුඩා
නුවරවල්ද මෙගිද්දෝ[16] සහ ඒ අවට
පිහිටි කුඩා නුවරවල්ද අල්ලාගැනීමට
මනස්සේ ගෝත්‍රයේ සෙනඟට[17] නො-
හැකි විය. එමනිසා කානානිවරු එම
ප්‍රදේශවල දිගටම වාසය කළෝය.[18]
**28** ඊශ්‍රායෙල්වරු බලවත් වූ විට[19]
ඔවුහු කානාන් වැසියන්ව මෙහෙකා-
රකමට ගත්තෝය.[20] නමුත් ඊශ්‍රා-
යෙල්වරු ඔවුන්ව සම්පූර්ණයෙන්ම
දේශයෙන් පන්නා දැමුවේ නැත.[21]

**1 පරි.**
**1** යොෂු 14:13, යොෂු 21:12
**2** යොෂු 15:19
**3** ගණන් 24:21, විනි 4:11
**4** ද්වි 34:3, විනි 3:13, 2ලේක 28:15
**5** නික් 3:1, නික් 4:18, නික් 18:1, ගණන් 10:29
**6** ගණන් 21:1
**7** ගණන් 10:32
**8** ලෙවී 27:29, ද්වි 20:16, යොෂු 6:21
**9** ගණන් 21:3, යොෂු 19:4, 1ලේක 4:30
**10** උත් 10:19, යොෂු 11:22, යෙරෙ 25:20
**11** යොෂු 13:3, විනි 14:19, යෙරෙ 47:5
**12** යොෂු 13:3, යොෂු 15:45
**13** යොෂු 17:16
**14** ද්වි 20:1
**15** ගණන් 14:24, යොෂු 14:9
**16** ගණන් 13:22

**2 තීරුව**
**1** විනි 3:5
**2** යොෂු 15:63, 2සාමු 5:6
**3** යොෂු 14:4, යොෂු 16:1
**4** විනි 21:19
**5** උත් 49:24, ගීතා 44:3
**6** ගණන් 13:2, යොෂු 2:1, යොෂු 7:2
**7** උත් 35:6
**8** යොෂු 2:14, 1සාමු 20:14, 1සාමු 30:15
**9** යොෂු 8:24
**10** යොෂු 6:25, 1සාමු 15:6
**11** ද්වි 7:1, යොෂු 9:1
**12** යොෂු 17:11
**13** යොෂු 21:25, විනි 5:19
**14** යොෂු 12:23, යොෂු 17:12
**15** 2රාජා 9:27, 1ලේක 6:70
**16** 1රාජා 9:15, 2රාජා 9:27
**17** යොෂු 17:1
**18** යොෂු 16:10, යොෂු 17:12, විනි 1:19
**19** ද්වි 11:8
**20** උත් 9:25; යොෂු 17:13; 1රාජා 9:21; **21** ගණන් 33:55; ද්වි 7:2; ද්වි 20:16.

**විනි 1:15*** තේරුම, “දිය පොකුණු.” **17*** තේරුම, “සහමුලින්ම විනාශ කළ ස්ථානයක්.”

**29** ගෙෂෙර්හි වාසය කළ කානා-
නිවරුන්ව පන්නා දැමීමට එෆ්‍රායිම්
ගෝත්‍රයේ සෙනඟටද නොහැකි විය.
එමනිසා කානානිවරු ඔවුන් සමඟ
ගෙෂෙර්හි දිගටම වාසය කළෝය.[1]
**30** සෙබූලන් ගෝත්‍රයේ සෙනඟ-
ටද[2] කිට්‍රෝන්හි හා නහලොල්හි[3] විසූ
කානානිවරුන්ව පලවාහැරීමට නො-
හැකි විය. එහෙයින් කානානිවරුන්
ඔවුන් සමඟ වාසය කළ අතර[4]
ඔවුහු කානානිවරුන්ව මෙහෙකාරක-
මට ගත්තෝය.[5]
**31** ආෂෙර් ගෝත්‍රයේ සෙනඟටද[6]
අක්කෝ, සීදොන්,[7] අහ්ලාබ්, අක්-
ෂිබ්,[8] හෙල්බා, අපික්[9] සහ රෙහොබ්[10]
යන නුවරවල විසූ කානානිව-
රුන්ව පන්නා දැමීමට නොහැකි විය.
**32** එමනිසා ආෂෙර් ගෝත්‍රයේ සෙ-
නඟ ඔවුන් සමඟ ඒ දේශයෙහි වාසය
කරති.[11]
**33** බෙත්-ෂෙමෙෂ් සහ බෙත්-
අනාත්[12] යන නුවරවල වැසියන්ව
පන්නා දැමීමට නොහැකි වූ නප්තලී
ගෝත්‍රයේ සෙනඟද[13] එහි වාසය කළ
කානානිවරුන් අතර ජීවත් වූහ.[14]
ඔවුහු කානානිවරුන්ව මෙහෙකාරක-
මට ගත්තෝය.[15]
**34** දාන් ගෝත්‍රයේ සෙනඟට[16]
තැනිතලාවට පැමිණ පදිංචි වීමට
අමෝරිවරු ඉඩ දුන්නේ නැත.[17] ඒ
නිසා ඔවුහු කඳුකරයේම ජීවත් වූහ.
**35** අමෝරිවරු දිගටම හෙරෙස් කන්-
දේද ආයාලොන්[18] සහ ෂායල්බිම්හිද[19]
වාසය කළෝය. නමුත් යෝසෙප්
ගෝත්‍රයේ සෙනඟ අමෝරිවරුන්ට
වඩා බලවත් වූ නිසා ඔවුන්ව පරාජය
කර ඔවුන්ව මෙහෙකාරකමට ගත්-
තෝය.[20] **36** අමෝරිවරුන්ට හිමිව
තිබූ ප්‍රදේශය අක්‍රබ්බිම් නම් බෑවුමේ[21]
හා සේලා නම් ස්ථානයේ සිට ඉහළට
විහිදී ගියේය.

**2** දිනක් දේවදූතයෙක්[22] ගිල්ගාල්[23]
සිට බෝකිම්[24] දක්වා ගොස්
යෙහෝවා දෙවි දුන් මේ පණිවිඩය
දැන්වූවේය. “මම ඔබව ඊජිප්තුවෙන්
නිදහස් කර ඔබේ මුතුන්මිත්තන්ට
පොරොන්දු වූ දේශයට[1] ගෙනාවෙමි.
එමෙන්ම, ‘ඔබ සමඟ මා ඇති කර-
ගත් ගිවිසුම මම කිසිදා කඩ නොක-
රන්නෙමි.[2] **2** ඔබත් මේ දේශයේ
වැසියන් සමඟ කිසිම ගිවිසුමක් ඇති
කර නොගන්න.[3] ඔවුන් ඉදි කර
ඇති පූජාසනද කඩා දමන්න’[4] කියා
මම ඔබට පැවසුවෙමි. එසේනම් ඔබ
මාගේ හඬට ඇහුම්කන් නොදුන්නේ
ඇයි?[5] **3** ඔබ එසේ ක්‍රියා කළ නිසා
මම ඔවුන්ව ඔබ අතරින් පන්නා නො-
දමන්නෙමි. ඔවුහු ඔබට උගුලක්
මෙන් වන්නෝය.[6] ඔබ ඔවුන්ගේ දෙ-
විවරුන්ට නමස්කාර කර ඔබේ විනා-
ශය ස්ථිර කරගන්නහුය.”[7]
**4** යෙහෝවා දෙවිගේ දූතයා මෙම
වචන පැවසූ විට සියලුම ඊශ්‍රායෙල්-
වරු මහත් හඬින් හඬා වැලපුණෝය.[8]
**5** ඔවුන් එම ස්ථානයට බෝකිම්*
යන නම තැබුවේ එමනිසාය. ඔවුහු
එහිදී යෙහෝවා දෙවිට පූජා ඔප්පු
කළෝය.
**6** යොෂුවා ඊශ්‍රායෙල් සෙනඟ විසු-
රුවාහැරිය විට සියලුදෙනාම තමන්ට
උරුම වූ ප්‍රදේශවලට පිටත්ව
ගියෝය.[9] **7** යොෂුවා ජීවත් වූ
කාලය පුරාද ඔහු මිය ගිය පසු ජීවත්ව
සිටි වැඩිමහල්ලන්ගේ එනම්, යෙ-
හෝවා දෙවි ඊශ්‍රායෙල් සෙනඟ වෙනු-
වෙන් සිදු කළ පුදුම ක්‍රියා දැක
තිබූ වැඩිමහල්ලන්ගේ[10] ජීවිත කාලය
පුරාද ඊශ්‍රායෙල් සෙනඟ දිගටම යෙ-
හෝවා දෙවිට විශ්වාසවන්තව සේ-
වය කළෝය. **8** කල් යත්ම නූන්ගේ
පුත්‍රයා වූ යොෂුවා මිය ගියේය. යෙ-
හෝවා දෙවිගේ සේවකයෙක් වූ ඔහු
මිය යන විට ඔහුට වයස අවු-
රුදු එකසිය දහයකි.[11] **9** සෙනඟ
ඔහුව තැන්පත් කළේ ඔහුට උරුම
වූ තිම්නාත්-හේරෙස් නම් ප්‍රදේශ-
යේය.[12] එය පිහිටා තිබුණේ එෆ්‍රායිම්
ගෝත්‍රයට අයත් කඳුකර ප්‍රදේශයේ
පිහිටි ගයෂ් කන්දට උතුරින්ය.[13]
**10** කල් යත්ම යොෂුවාගේ කාලයේ

විනි **2:5*** තේරුම, “හඬා වැලපෙන්නෝ.”

**1 පරි.**

1 යොෂු 16:10; 1රාජා 9:16
2 යොෂු 19:10
3 යොෂු 19:15
4 ද්වි 20:17
5 විනි 2:2
6 යොෂු 19:24
7 යොෂු 11:8; යොෂු 19:28
8 යොෂු 19:29
9 යොෂු 19:30
10 යොෂු 21:31
11 ගීතා 106:34; යෙරෙ 48:10
12 යොෂු 19:38
13 යොෂු 19:32
14 ද්වි 7:2
15 විනි 1:28
16 යොෂු 19:40
17 යොෂු 19:47; විනි 18:1
18 යොෂු 10:12
19 යොෂු 19:42
20 යොෂු 16:10; යොෂු 17:13
21 ගණන් 34:4; යොෂු 15:3

**2 පරි.**

22 නික් 3:2; නික් 23:20; නික් 23:23; යොෂු 5:13
23 යොෂු 5:9
24 විනි 2:5

**2 තීරුව**

1 උත් 12:7; උත් 26:3
2 උත් 17:7; ලෙවී 26:42; ගීතා 105:8; මලා 3:6; හෙබ්‍රෙ 6:18
3 නික් 23:32; ද්වි 7:2; 2කොරි 6:14
4 නික් 34:13; ගණන් 33:52
5 නික් 23:21; යොෂු 17:13; විනි 1:19; විනි 1:28; ගීතා 106:34
6 ගණන් 33:55; යොෂු 23:13
7 නික් 23:33; නික් 34:12; ද්වි 7:16; 1රාජා 11:2; ගීතා 78:58; ගීතා 106:36
8 1සාමු 7:6
9 යොෂු 24:28
10 යොෂු 23:3; යොෂු 24:31
11 යොෂු 24:29
12 යොෂු 19:50
13 යොෂු 24:30

සිටි පරම්පරාව මිය ගියේය.[1] ඔවුන්වද
ඔවුන්ගේ පියවරුන් මෙන් තැන්පත්
කරන ලදි. එම පරම්පරාවට පසු යෙ-
හෝවා දෙවිව දැන හඳුනා නොගත්,
ඊශ්‍රායෙල්වරුන් වෙනුවෙන් දෙවි කළ
කිසිම දෙයක් ගැන අවබෝධයක්
නැති පරම්පරාවක් බිහි විය.[2]
**11** ඊශ්‍රායෙල්වරු යෙහෝවා දෙවි
පිළිකුල් කරන දේවල් කිරීමට
පටන්ගත් අතර[3] බාල් දෙවිවරුන්ටද
නමස්කාර කළෝය.[4] **12** මෙසේ
ඔවුහු තම පියවරුන්ව ඊජිප්තු දේශ-
යෙන් නිදහස් කරගෙන ආ යෙ-
හෝවා දෙවිව අත්හැර,[5] අවට ජාතීන්
නමස්කාර කළ දෙවිවරුන් පසුපස
ගොස් ඔවුන්ට වැඳුම්පිදුම් කිරීමට
පටන්ගත්තෝය.[6] ඔවුන් එසේ ක්‍රියා
කළ නිසා යෙහෝවා දෙවි ඔවුන්
සමඟ උදහස් විය.[7] **13** ඔවුහු යෙ-
හෝවා දෙවිව අත්හැර, බාල් හා
අෂ්ටෝරෙත් යන දෙවි දේවතාවන්-
ගේ[8] රූපවලට නමස්කාර කළෝය.
**14** ඒ ගැන බොහෝ සෙයින් උද-
හස් වූ යෙහෝවා දෙවි[9] ඔවුන්ව
කොල්ලකරුවන් අතට හසු වීමට
ඉඩහැරියේය.[10] එම කොල්ලකරුවෝ
ඔවුන්ගෙන් බොහෝ දේවල් කොල්ල
කෑවෝය. මෙසේ ඔවුන්ව යටත්
කරගැනීමට අවට ජාතීන්ට දෙවි
ඉඩහැරියේය.[11] තවදුරටත් ඒ සතු-
රන්ට එරෙහිව නැඟී සිටීමට ඔවුන්ට
හැකියාවක් නොතිබිණ.[12] **15** යෙ-
හෝවා දෙවි ඔවුන්ට කී ලෙසම
ඔවුන් කළ කිසිම සටනකදී ඔවුන්ට
යෙහෝවා දෙවිගෙන් උපකාරයක්
නොලැබිණ.[13] මෙසේ යෙහෝවා
දෙවි පැවසූ ලෙසම[14] ඔවුහු බොහෝ
දුෂ්කරතාවලට මුහුණ දුන්නෝය.[15]
**16** එනමුත් යෙහෝවා දෙවි ඔවුන්ට
මඟ පෙන්වීම් ලබා දීම සඳහා
ඔවුන් අතරේ විනිශ්වයකරුවන්ව පත්
කළේය.[16] ඔවුහු කොල්ලකරුවන්
අතින් ඊශ්‍රායෙල් සෙනඟව බේරාගත්-
තෝය.[17]
**17** එහෙත් ඒ විනිශ්වයකරුවන්
දුන් මඟ පෙන්වීම් පිළි නොගත් සෙ-
නඟ, දෙවිව අත්හැර වෙනත් දෙවිව-
රුන්ට නමස්කාර කරමින්[1] බොහෝ
පිළිකුල්සහගත දේවල් කළෝය.[2]
යෙහෝවා දෙවිගේ ආඥාවලට කීකරු
වෙමින් ජීවත් වූ ඔවුන්ගේ මුතුන්මිත්-
තන්ව ආදර්ශයට ගන්නවා වෙනුවට
ඔවුහු ඉක්මනින් යහපත් මාර්ග-
යෙන් ඉවත්ව ගියෝය.[3] **18** යෙ-
හෝවා දෙවි සෙනඟට මඟ පෙන්වීම්
ලබා දීම සඳහා විනිශ්වයකරු-
වන්ව පත් කළ විට[4] ඒ විනිශ්ව-
යකරුවන්ට අවශ්‍ය උපකාරද ඔහු
ලබා දුන්නේය. විනිශ්වයකරුවෙකු
දේශයේ සිටි කාලයේදී යෙහෝවා
දෙවි ඊශ්‍රායෙල්වරුන්ව සතුරන් අතින්
ගලවාගත්තේය. මන්ද සෙනඟ සතු-
රන් අතින් බොහෝ පීඩා විඳිමින්
කන්නලව් කරන විට[5] යෙහෝවා දෙ-
විට ඔවුන් ගැන මහත් දුකක් ඇති
විය.[6]
**19** නමුත් දෙවි පත් කර සිටි
විනිශ්වයකරුවෙකු මිය ගිය පසු ඔවුහු
නැවතත් දෙවිව අත්හැර වෙනත් දෙ-
විවරුන් වෙතට හැරී ඔවුන්ට නමස්-
කාර කිරීමට පටන්ගත්තෝය.[7] ඔවුහු
තම පියවරුන්ට වඩා පිළිකුල්සහගත
දේවල් කළෝය. ඔවුහු ඒ වැරදි
දේවලින් ඉවත් වුණේවත් ඔවුන්ගේ
මුරණ්ඩු ආකල්ප වෙනස් කරගත්-
තේවත් නැත.[8] **20** එහෙයින් ඊශ්‍රා-
යෙල්වරුන් සමඟ බොහෝ සෙයින්
උදහස් වූ යෙහෝවා දෙවි[9] මෙසේ
පැවසීය. "ඔවුන්ගේ මුතුන්මිත්තන්
සමඟ මම ගිවිසුමක් ඇති කරගත්-
තෙමි. නමුත් මේ ජාතිය ඒ ගිවිසුම
කඩ කර ඇත.[10] ඔවුහු මාගේ හඬට
අකීකරු වූහ.[11] ඒ නිසා **21** යො-
ෂුවා මිය යන විට දේශයේ ඉතුරුව
සිටි එක ජාතියක්වත්[12] මේ දේශ-
යෙන් මම පන්නා නොදමන්නෙමි.
**22** මන්ද ඔවුන් මාර්ගයෙන් ඊශ්‍රායෙල්
ජාතියට දෙවි කෙරෙහි වූ විශ්වාසය

**2 පරි.**
1 විනි 2:7; දේශ 1:4
2 ද්වි 6:12; ද්වි 31:13; විනි 2:17; 1ලේක 28:9
3 විනි 6:1; 2ලේක 33:2
4 විනි 3:7; විනි 10:6; 1රාජා 18:18; 2ලේක 28:2; යෙරෙ 2:23; හොෂෙ 2:13
5 ද්වි 13:5; ද්වි 28:15; ද්වි 31:16
6 ද්වි 6:14; විනි 10:6
7 නික් 20:5; ද්වි 7:4
8 විනි 3:7; විනි 10:6; 1සාමු 7:3; 1රාජා 11:5; 2රාජා 23:13; ගීතා 106:36
9 විනි 3:8; 2ලේක 36:16; ගීතා 106:40
10 ලෙවී 26:17; 2රාජා 17:20; ගීතා 106:41
11 විනි 4:2; ගීතා 44:12; යෙසා 50:1
12 ලෙවී 26:37; ද්වි 28:25
13 ද්වි 28:15; යෙරෙ 21:10
14 ද්වි 4:25; ද්වි 4:26; ද්වි 7:4
15 ද්වි 4:30; විනි 10:9
16 විනි 3:9; 1සාමු 12:11
17 නෙහෙ 9:27; ගීතා 106:43

**2 තීරුව**
1 නික් 34:15; ලෙවී 17:7
2 ගීතා 73:27; යෙරෙ 3:8; යෙරෙ 3:14; එස 23:3; එස 23:30; යාකො 4:4
3 නික් 32:8; ද්වි 9:12; විනි 2:7
4 විනි 3:9
5 නික් 2:24; විනි 4:3; 2රාජා 13:4
6 ද්වි 32:36; ගීතා 90:13; ගීතා 106:45
7 විනි 4:1; විනි 8:33

**8** ගීතා 78:8; යෙසා 48:4; **9** නික් 32:10; ද්වි 7:4; ද්වි 32:22; විනි 10:7; ගීතා 106:40; **10** නික් 24:3; නික් 24:8; නික් 34:27; ද්වි 29:1; යොෂු 23:16; **11** ලෙවී 26:14; ද්වි 28:15; ගීතා 106:34; **12** යොෂු 13:2.

සෝදිසියට ලක් වනු ඇත.[1] ඊශ්‍රා-
යෙල්වරුන් තම පියවරුන් කළාක්
මෙන් යෙහෝවා දෙවි වන මා පව-
සන දේට කීකරු වෙයිද නැත්නම්
මාව අත්හරියිද කියා එමගින් දැකගැ-
නීමට හැකි වන්නේය.” **23** එහෙ-
යින් යෙහෝවා දෙවි ඒ ජාතීන්ව
දේශයෙන් පන්නා නොදමා, යම්
කාලයකට එහි රැඳී සිටීමට ඉඩහැරි-
යේය.[2] යොෂුවාටද ඔවුන්ව යටත්
කරගැනීමට නොහැකි විය.

**3** කානාන් දේශයේ ජීවත් වූ සිය-
ලුම ජාතීන්ව[3] යෙහෝවා දෙවි
ඊශ්‍රායෙල්වරුන් වෙතින් පන්නා දැමු-
වේ නැත. ඔවුහු දිගටම ඊශ්‍රායෙල්-
වරුන් සමඟ දේශයේ ජීවත් වූහ.
එමගින් කානාන් දේශයේදී කිසිම යුද්-
ධයකට සම්බන්ධ නොවූ අලුත් ඊශ්‍රා-
යෙල් පරම්පරාව[4] වෙනත් ජාතීන්
හමුවේ ක්‍රියා කරන ආකාරය දැක-
ගැනීමට හැකි විය.[5] **2** එමෙන්ම
යුද්ධ කිරීම සම්බන්ධයෙන් අද්දැකීම්
නොලබා සිටි ඊශ්‍රායෙල් සෙනඟට
සටන් කරන ආකාරය ගැන අද්දැ-
කීම් ලබා යුද්ධවලට හොඳින් සූදා-
නම් වීමටද අවස්ථාවක් උදා විය.
**3** දේශයේ විසූ එම ජාතීන් අතර
පිලිස්තිවරුන්ගේ[6] අධිපතීන් පස්දෙ-
නාද[7] සියලුම කානානිවරුද[8] සීදොන්-
වරු[9] සහ බාල්-හෙර්මොන් කන්දේ[10]
සිට හමාත් දේශයට[11] ඇතුල් වන
ස්ථානය දක්වා විහිදී යන ලෙබ-
නොන් කඳුකරයේ[12] ජීවත් වූ හිවීය-
වරුද[13] සිටියෝය. **4** දේශයේ සිටි
එම ජාතීන් නිසා[14] යෙහෝවා දෙවි
මෝසෙස් මාර්ගයෙන් තම පියව-
රුන්ට ආඥා කර තිබූ දේට ඊශ්‍රායෙල්-
වරුන් කොතරම් දුරට කීකරු වනු
ඇද්ද කියා හෙළි විය.[15] **5** එහෙ-
යින් ඊශ්‍රායෙල්වරු කානානිවරුන්,[16]
හිත්තීවරුන්, අමෝරිවරුන්, පෙරිස්-
සිවරුන්, හිවීයවරුන් සහ යෙබූසිව-
රුන්[17] අතර දිගටම වාසය කළෝය.
**6** ඊශ්‍රායෙල්වරු එම ජාතීන්ගේ දූව-
රුන්ව විවාහ කරගත් අතර[18] තම
දූවරුන්ව ඔවුන්ගේ පුත්‍රයන්ටද විවාහ
කර දුන්නෝය.[1] එමෙන්ම ඔවුහු
ඔවුන්ගේ දෙවිවරුන්ටද නමස්කාර
කළෝය.[2]

**7** මෙසේ ඊශ්‍රායෙල්වරු යෙහෝවා
දෙවි පිළිකුල් කරන දේවල් කළෝය.
ඔවුහු තම දෙවි වන යෙහෝවාව
අමතක කර[3] බාල් දෙවිවරුන්ට[4]
හා ඔවුන් වෙනුවෙන් ඉදි කර තිබූ
කුලුනුවලට[5] නමස්කාර කළෝය.
**8** යෙහෝවා දෙවි ඊශ්‍රායෙල්වරුන්
සමඟ කොතරම් උදහස් වූවාද[6] කිව-
හොත් දෙවි ඔවුන්ව මෙසපොතේමි-
යාවේ* රජු වූ[7] කූෂාන්-රිෂාතයිම්ගේ
අතට හසු වෙන්න ඉඩහැරියේය.[8]
කූෂාන්-රිෂාතයිම් ඊශ්‍රායෙල්වරුන්ව
අට අවුරුද්දක් යටත් කරගෙන
සිටියේය. **9** කල් යත්ම ඊශ්‍රායෙල්-
වරු යෙහෝවා දෙවිගේ උපකාර
ඉල්ලා දෙවිට කන්නලව් කළෝය.[9]
ඔවුන්ට සවන් දුන් යෙහෝවා
දෙවි ඔවුන්ව බේරාගැනීම සඳහා[10]
කාලෙබ්ගේ බාල සොහොයුරු වූ[11]
කෙනෂ්ගේ පුත්[12] ඔත්නියෙල්ව[13] පත්
කළේය. **10** ඔහු ඊශ්‍රායෙල් ජාති-
යේ විනිශ්චයකරුවෙකු ලෙස ක්‍රියා
කළේය. යෙහෝවා දෙවිගේ බලය[14]
ඔහු තුළ ක්‍රියාත්මක විය. ඔහු යුද්ධ-
යට ගිය විට යෙහෝවා දෙවි සිරියා-
වේ රජු වූ කූෂාන්-රිෂාතයිම්ව ඔහුට
යටත් කර දුන්නේය.[15] **11** ඉන්පසු
අවුරුදු හතළිහක් පුරා යුද්ධයෙන්
තොර සාමකාමී වාතාවරණයක් දේ-
ශයේ පැවතිණ. කල් යත්ම කෙනෂ්-
ගේ පුත් ඔත්නියෙල් මිය ගියේය.

**12** ඊශ්‍රායෙල්වරු නැවතත් යෙ-
හෝවා දෙවි පිළිකුල් කරන දේවල්
කිරීමට පටන්ගත්තෝය.[16] එසේ
ඔවුන් යෙහෝවා දෙවිට පිටු පෑ
නිසා[17] මෝවබ්හි රජු වූ[18] එග්ලොන්ට
ඔවුන්ව යටත් කරගැනීමට යෙහෝවා

**2 පරි.**
**1** ගණන් 33:55 ද්වි 8:2 යොෂු 23:13 විනි 3:4 හිතෝ 17:3
**2** නික් 23:30 ද්වි 7:22

**3 පරි.**
**3** නික් 23:30
**4** විනි 2:10
**5** ද්වි 8:2 2ලේක 32:31
**6** උත් 21:32 විනි 1:19
**7** යොෂු 13:3 1සාමු 6:18
**8** උත් 10:15
**9** යොෂු 13:4 විනි 1:31
**10** ද්වි 3:9 යොෂු 13:5
**11** ගණන් 34:8
**12** ද්වි 1:7 යොෂු 13:6
**13** උත් 10:17 නික් 3:17 යොෂු 9:1
**14** නික් 23:33 ගණන් 33:55
**15** විනි 2:22
**16** විනි 1:29 ගීතා 106:34
**17** නික් 3:8 නික් 3:17 ද්වි 7:1 යොෂු 9:1
**18** නික් 34:16

**2 තීරුව**
**1** ද්වි 7:3 එස්රා 9:12
**2** ගණන් 25:2 1රාජා 11:4
**3** විනි 2:11
**4** ද්වි 31:16 විනි 10:6
**5** නික් 34:13 ද්වි 12:3 ද්වි 16:21 1රාජා 16:33
**6** විනි 2:20
**7** උත් 24:10
**8** ලෙවී 26:17 විනි 2:14 1සාමු 12:9
**9** ද්වි 4:30 විනි 2:18 විනි 3:15 ගීතා 107:19
**10** විනි 2:16
**11** විනි 1:13
**12** 1ලේක 4:13
**13** යොෂු 15:17

**14** ගණන් 11:17; විනි 6:34; විනි 11:29; විනි 14:6; විනි 15:14; 1සාමු 11:6; 1සාමු 16:13; 2ලේක 15:1; යෙසා 63:11; **15** සෙක 4:6; හෙබ්‍රෙ 11:33; **16** විනි 2:19; හොෂෙ 6:4; **17** ලෙවී 26:14; **18** උත් 19:37.

විනි **3:8*** හෝ, “සිරියාවේ.” 10වෙනි පදය බලන්න.

දෙවි ඉඩහැරියේය.[1] **13** අම්මොන්-
වරුන්ගේ[2] සහ අමලෙක්වරුන්ගේ[3]
සහය ලබාගත් එග්ලොන්, ඊශ්‍රා-
යෙල්වරුන්ට පහර දී තාල වර්ග-
යේ ගස්වලට ප්‍රසිද්ධ වූ ඔවුන්ගේ
නුවර[4] අල්ලාගත්තේය. **14** ඊශ්‍රා-
යෙල්වරුන්ට අවුරුදු දහඅටක් පුරා
මෝවබ්හි රජු වූ එග්ලොන් යට-
තේ සිටීමට සිදු විය.[5] **15** කලක්
ගත වූ පසු ඊශ්‍රායෙල්වරු යෙහෝවා
දෙවිගේ උපකාරය ඉල්ලා ඔහුට
කන්නලව් කළෝය.[6] එහෙයින් යෙ-
හෝවා දෙවි ඔවුන්ව බේරාගැනීමට
බෙන්ජමින් ගෝත්‍රයට අයත්[7] ගෙ-
රාගේ පුත් ඒහුද්ව[8] පත් කළේය.
ඒහුද් වමත හුරු කෙනෙකි.[9] දිනක්
මෝවබ්හි රජු වූ එග්ලොන්ට ගෙ-
විය යුතු කප්පම ඊශ්‍රායෙල්වරු ඒහුද්
අත යැව්වෝය. **16** ඒහුද් පිටත්ව
යෑමට පෙර රියනක්* දිග, දෙපැත්ත
කැපෙන මුවහත් කඩුවක්[10] සාදාගෙන
එය තම වස්ත්‍රයට යට වන සේ දකුණු
කළවයේ බැඳගත්තේය.[11] **17** පසුව
ඔහු කප්පම ගෙවීම සඳහා මෝවබ්හි[12]
රජු වූ එග්ලොන්ව හමු වීමට ගියේය.
එග්ලොන් ඉතාමත් තරබාරු කෙ-
නෙකි.

**18** කප්පම රජුට දුන් ඒහුද්[13] එහි
මොහොතක්වත් රැඳී නොසිට තමන්
කැටුව ආ පිරිස සමඟ පිටත් වී
**19** ගිල්ගාල්හි[14] පිහිටි ගල් වළවල්
දක්වා ආවේය. එහිදී ඔවුන්ව පිටත්
කළ ඒහුද් නැවත රජු වෙතට පැමිණ
මෙසේ පැවසීය. “රජ්ජුරුවනි, රහ-
සිගත කාරණයක් මට ඔබතුමාට
කියන්න තියෙනවා.” රජ එය ඇසූ
වහාම අවට සිටි අයට, “නිහඬ වනු”
කියා අණ කළේය. එවිට රජු සමඟ
සිටි සියලුදෙනා එතැනින් ඉවත්ව
ගියෝය.[15] **20** ඒ අවස්ථාවේදී රජු
සිටියේ උඩුමහලේ තමාටම කියා
වෙන් කර තිබූ කාමරයකයි. ඒහුද්
ඔහු ළඟට පැමිණ මෙසේ පැවසීය.
“රජ්ජුරුවනි, ඔබතුමාට කියන්න
දෙවිගෙන් පණිවිඩයක් මට ලැබී
තිබෙනවා.” එය ඇසූ විට හිඳගෙන
සිටි රජ සිංහාසනයෙන් නැඟිට්ටේය.
**21** එවිට ඒහුද් තම දකුණු කළවයේ
බැඳ තිබූ කඩුව වමතින් ඇද එයින්
රජුගේ බඩට ඇන්නේය. **22** කඩුව
එහි මිටත් සමඟම ඔහුගේ බඩ පසාරු
කරගෙන ගියේය. ඒහුද් කඩුව නැවත
ඉවතට නොගත් නිසා එය ඔහුගේ
බඩේ තිබූ තෙලින් සම්පූර්ණයෙන්ම
වැසී ගියේය. එවිට රජුගේ සිරුරෙන්
මලපහ පිට විය. **23** ඒහුද්, උඩුම-
හල් කාමරයේ දොරේ ඇතුල් පැත්-
තෙන් අගුලු දමා කාමරයට වාතාශ්‍රය
ලැබීමට තනා තිබූ කවුළුවෙන් පැන
**24** එතැනින් පිට විය.[1]

රජුව සොයා ආ ඔහුගේ සේවකයෝ
උඩුමහල් කාමරයේ දොරට අගුල්
දමා ඇති බව දැක, රජතුමා මල-
පහ කිරීම සඳහා[2] උඩුමහල් කාමර-
යට ගොස් ඇතැයි කියා සිතුවෝය.
**25** ඔවුන් බොහෝ වේලාවක් බලා-
ගෙන සිටියත් කිසිවෙක් උඩුමහල්
කාමරයේ දොර විවෘත කරන බවක්
නම් පෙනෙන්න තිබුණේ නැත. කිසි-
වක් කරකියාගත නොහැකි වූ ඔවුහු
තවදුරටත් බලා සිටිය නොහැකි නිසා
එම කාමරයේ යතුර ගෙන දොර
විවෘත කළෝය. එවිට ඔවුන් දුටුවේ
තම ස්වාමියා බිම වැටී මිය ගොස්
සිටින අයුරුයි.

**26** රජු දොර විවෘත කරන තෙක්
සේවකයන් බලා සිටි කාලය අතර-
තුර, ඒහුද් එතැනින් පලා ගොස්
ගල් වළවල්[3] පසු කරගෙන සෙ-
යිරා දක්වා පැමිණියේය. **27** එතැ-
නට පැමිණි ඔහු මුළු එෆ්‍රායිම්
කඳුකරයටම[4] ඇසෙන සේ හොරණෑ-
වක් පිම්බේය.[5] ඉන්පසු ඔහු එහි
සිටි ඊශ්‍රායෙල්වරුන් සමඟ කඳුකර-
යෙන් බැස ආවේය. ඔවුන්ට ඉදිරි-
යෙන් ගමන් කළ ඔහු **28** මෙසේ
පැවසීය. “යෙහෝවා දෙවි ඔබේ සතු-
රන් වන මෝවබ් ජාතිකයන්ව ඔබේ
අතට හසු කර දී තිබෙනවා.[6] ඒ
නිසා අපි එකතු වෙලා ඔවුන්ට

**3 පරි.**
**1** විනි 2:14; යොහ 19:11
**2** උත් 19:38; විනි 11:4
**3** නික් 17:8; විනි 6:3; ගීතා 83:7
**4** ද්වි 34:3; විනි 1:16; 2ලේක 28:15
**5** ලෙවී 26:25; ද්වි 28:48
**6** විනි 3:9; ගීතා 50:15; ගීතා 78:34; ගීතා 107:13; යෙරෙ 29:12
**7** උත් 49:27
**8** විනි 4:1
**9** විනි 20:16; 1ලේක 12:2
**10** ගීතා 149:6
**11** ගීතා 45:3
**12** විනි 11:18
**13** 2රාජා 23:35
**14** යොෂු 4:19; යොෂු 5:9
**15** හිතෝ 14:15

**2 තීරුව**
**1** දේශ 10:10
**2** 1සාමු 24:3; 1රාජා 18:27
**3** විනි 3:19
**4** යොෂු 16:5; විනි 7:24
**5** යොෂු 6:5; විනි 6:34; 1සාමු 13:3; 2සාමු 2:28; යෝවෙ 2:1
**6** විනි 7:15; 1සාමු 17:47

විනි **3:16*** රියනක් යනු සෙන්ටිමීටර් 44.5කි.

විරුද්ධව සටන් කරමු.”[1] ඊශ්‍රායෙල්ව-
රුද ඔහු සමඟ එකතු වී යෝර්දාන්
ගඟේ පිහිටි තොටුපොළවල් අල්ලා-
ගත්තෝය.[2] ඒ තොටුපොළවල්වලින්
එගොඩ වීමට ඔවුහු වෙන කිසිවෙ-
කුට ඉඩ දුන්නේ නැත. එය මෝ-
වබ්වරුන්ගේ පසුබෑමට හේතු විය.
**29** ඉන්පසු ඔවුහු මෝවබ් සේනාවට
අයත් එඩිතර, බලසම්පන්න, හැඩි-
දැඩි[3] පුරුෂයන් දසදහස්දෙනෙකුව[4]
මරා දැමුවෝය. ඔවුන්ගෙන් එක් කෙ-
නෙකුවත් ඔවුහු ඉතුරු කළේ නැත.[5]
**30** මෝවබ් ජාතිය සම්පූර්ණයෙන්ම
යටත් කරගැනීමට එදින ඊශ්‍රායෙල්ව-
රුන්ට හැකි විය. ඉන්පසු අවුරුදු අසූ-
වක් පුරා යුද්ධයෙන් තොර සාමකාමී
වාතාවරණයක් දේශයේ පැවතිණ.[6]

**31** ඒහුද්ට පසුව අනාත්ගේ පුත්
ෂම්ගර්[7] විනිශ්චයකරුවෙකු ලෙස
සේවය කළේය. ඔහු උල් කළ කෙ-
විටකින් පිලිස්තිවරුන් හයසියදෙ-
නෙකුට පහර දී[8] ඊශ්‍රායෙල් ජාතිය
ගලවාගත්තේය.[9]

**4** ඒහුද්ගේ මරණයෙන් පසු ඊශ්‍රා-
යෙල්වරු නැවතත් යෙහෝවා
දෙවි පිළිකුල් කරන දේවල් කරන්න
පටන්ගත්තෝය.[10] **2** එහෙයින් යෙ-
හෝවා දෙවි, ඔවුන්ව හාෂෝර් නුව-
රේ[11] සිට පාලනය කළ කානාන්
දේශයේ රජු වූ යාබින්ගේ අතට හසු
වීමට ඉඩහැරියේය.[12] යාබින්ගේ සේ-
නාවේ අධිපතියා වූයේ හාරොෂෙත්-
හාගොයිම් නම් ස්ථානයෙහි[13] විසූ
සිසෙරාය.[14] **3** යකඩ උල් සවි කර
තිබූ රෝද සහිත යුධ රථ[15] නවසිය-
යක් යාබින්ගේ හමුදාව සතුව තිබු-
ණේය. ඔහු අවුරුදු විස්සක් පුරා
ඊශ්‍රායෙල්වරුන්ට දරුණු ලෙස පීඩා
කළේය.[16] අසරණව සිටි ඊශ්‍රායෙල්-
වරු යෙහෝවා දෙවිගේ පිහිට ඉල්ලා
කන්නලව් කළෝය.[17]

**4** ඒ කාලයේදී ඊශ්‍රායෙල් දේශයේ
විනිශ්චයකාරිය ලෙස සේවය කළේ
ලප්පිදොත්ගේ භාර්යාව වූ දෙබෝ-
රාය. ඇය අනාගතවක්තෘවරියකි.[18]
**5** ඇගේ නිවස පිහිටා තිබුණේ එෆ්‍රා-
යිම් කඳුකරයේ රාමා[1] සහ බෙතෙල්[2]
අතර තිබූ දෙබෝරාගේ ගස ලෙස
ප්‍රසිද්ධ වූ විශාල තාල වර්ගයේ ගසක්
අසලය. දෙවිගේ තීන්දු දැනගැනීමට
ඊශ්‍රායෙල්වරුන් ගියේ ඇය ළඟටය.
**6** ඇය නෆ්තලී ගෝත්‍රයට අයත්
නුවරක් වූ කෙදෙෂ්හි[3] වාසය කළ අබි-
නොවම්ගේ පුත් බාරාක්ව[4] කැඳවා
ඔහුට මෙසේ පැවසුවාය. “ඊශ්‍රායෙල්හි
දෙවි වන යෙහෝවා මෙසේ අණ කර
තිබෙනවා. ‘නෆ්තලී ගෝත්‍රයෙනුත්[5]
සෙබුලන් ගෝත්‍රයෙනුත්[6] පුරුෂයන්
දසදහස්දෙනෙකුව එකතු කරගෙන
තාබෝර් කන්දට[7] නැඟ එහි රැඳී
සිටින්න. **7** එවිට මම යාබින්ගේ[8]
හමුදාවේ අධිපතියා වන සිසෙරාවද[9]
ඔහුගේ යුධ රථද ඔහුගේ මුළු සේනා-
වද කීෂොන් නිම්නය[10] වෙත යෑමට
සලස්වන්නෙමි.[11] එහිදී මම ඔවුන්ව
ඔබේ අතට හසු කර දෙන්නෙමි.’ ”[12]

**8** එවිට බාරාක් ඇයට මෙසේ
පැවසුවේය. “ඔබත් මා සමඟ
ආ යුතුයි. ඔබ එන්නේ නැත්නම්
මම යන්නෙත් නැහැ.” **9** එවිට ඇය
මෙසේ පැවසුවාය. “මම අනිවාර්ය-
යෙන්ම ඔබ සමඟ එනවා. හැබැයි මේ
සටනේ ජයග්‍රහණයේ කීර්තිය ඔබට
හිමි වෙන්නේ නැහැ. යෙහෝවා දෙවි
සිසෙරාව හසු කර දෙන්නේ ස්ත්‍රී-
යකටයි.”[13] ඉන්පසු ඇය බාරාක්
සමඟ කෙදෙෂ්[14] බලා පිටත්ව ගියාය.
**10** කෙදෙෂ්හි රැස් වන්න කියා
සෙබුලන්[15] සහ නෆ්තලී ගෝත්‍ර-
වල පුරුෂයන්ට බාරාක් ආරාධනා
කළේය. ඔහුගේ හඬට කීකරුව දසද-
හස්දෙනෙක් පැමිණියෝය.[16] දෙබෝ-
රාද ඔහු සමඟ ගියාය.

**11** මේ අතර කේනිවරුන්ගෙන්
පැවතෙන හෙබෙර් නම් තැනැත්තා,[17]
කෙදෙෂ් අසල ඇති ෂයනන්නිම් නම්
ස්ථානයෙහි තිබූ විශාල ගසක් ළඟ
තම කූඩාරම ගසාගෙන සිටියේය. ඔහු
තම නෑදෑ කේනිවරුන්ගෙන්[18] වෙන්ව

---

**12** ද්වි 20:1; **13** විනි 5:24; විනි 5:26; විනි 9:54; **14** යොෂු 20:7; යොෂු 21:32; විනි 4:6; **15** විනි 5:18; **16** විනි 4:6; **17** විනි 1:16; **18** උත් 15:19; ගණන් 24:21; 1සාමු 15:6.

**3 පරි.**
**1** විනි 2:16
**2** යොෂු 2:7 විනි 12:5
**3** විනි 3:17 ගීතා 17:10
**4** ලෙවී 26:8 ද්වි 28:7
**5** ලෙවී 26:7
**6** ලෙවී 26:6 විනි 3:11
**7** විනි 5:6
**8** නික් 23:31 යොෂු 13:2 විනි 15:3
**9** විනි 15:15 1සාමු 13:19 1සාමු 13:22 1සාමු 17:47 1සාමු 17:50

**4 පරි.**
**10** විනි 2:19
**11** යොෂු 19:36
**12** ලෙවී 26:17 ද්වි 28:25 ද්වි 32:30 විනි 2:14 විනි 3:8 විනි 10:7
**13** විනි 4:16
**14** 1සාමු 12:9
**15** ද්වි 20:1 යොෂු 17:16 විනි 1:19
**16** ද්වි 28:48 ගීතා 106:42
**17** විනි 2:18 විනි 3:9 ගීතා 107:19 ගීතා 145:19
**18** නික් 15:20 2රාජා 22:14 ලූක් 2:36 ක්‍රියා 21:9 1කොරි 11:5

**2 තීරුව**
**1** යොෂු 18:25 විනි 19:13 1රාජා 15:17 යෙරෙ 40:1
**2** උත් 28:17 උත් 28:19 යෙරෙ 48:13 ආමො 3:14
**3** යොෂු 21:32
**4** හෙබ්‍රෙ 11:32
**5** උත් 30:8 උත් 35:25 යොෂු 19:32
**6** උත් 30:20 උත් 35:23 යොෂු 19:10
**7** ගීතා 89:12 යෙරෙ 46:18
**8** විනි 4:2
**9** 1සාමු 12:9
**10** 1රාජා 18:40 ගීතා 83:9
**11** නික් 14:4

ජීවත් විය. එම කේනිවරුන් පැව-
තෙන්නේ මෝසෙස්ගේ මාමණ්ඩි වූ[1]
හොබාබ්ගෙනි.
**12** අබිනොවම්ගේ පුත් බාරාක්[2]
තාබෝර් කන්දට ගොස් ඇති
බව[3] සිසෙරාට ආරංචි විය. **13** එවිට
සිසෙරා යකඩ උල් සහිත තම යුධ රථ
නවසියයද[4] තම මුළු හමුදාවද සමඟ
හාරොෂෙත්-හාගොයිම් නම් ස්ථාන-
යෙන් පිටත් වී කීෂොන් නිම්නය
බලා ගියේය.[5] **14** එවිට දෙබොරා
බාරාක්ට මෙසේ පැවසුවාය. “සූදානම්
වෙන්න! අද යෙහෝවා දෙවි සිසෙරාව
ඔබේ අතට හසු කර දෙනවා. ඔබට
ඉදිරියෙන් ගොස් යෙහෝවා දෙවි ඔබ
වෙනුවෙන් සටන් කරනවා.”[6] එය ඇසූ
බාරාක් තමන් සමඟ සිටි පුරුෂයන්
දසදහස්දෙනා සමඟ තාබෝර් කන්-
දෙන් බැස ආවේය. **15** එවිට යෙ-
හෝවා දෙවි සිසෙරාවද ඔහුගේ සියලු
යුධ රථද ඔහුගේ මුළු හමුදාවද වියවුල්
තත්වයකට පත් කළේය.[7] බාරාක් සහ
ඔහුගේ හමුදාව ඔවුන්ට කඩුවෙන්
පහර දුන්නෝය. එවිට සිසෙරා තම
යුධ රථයෙන් බැස පයින් පලා ගියේය.
**16** නමුත් බාරාක් යුධ රථ[8] පසුප-
සත් හමුදාව පසුපසත් හාරොෂෙත්-
හාගොයිම් නුවර දක්වාම ලුහුබැඳ
ගියේය.[9] මෙසේ සිසෙරාගේ මුළු හමු-
දාව කඩු පහරින් මැරුම් කෑවෝය.
ඔවුන්ගෙන් එක් කෙනෙක්වත් ඉතුරු
නොවීය.[10]
**17** පයින් පලා ගිය සිසෙරා[11] කේ-
නිවරුන්ගෙන් පැවතෙන හෙබෙර්ගේ
භාර්යාව වූ[12] යායෙල්ගේ[13] කූඩාරම
වෙතට ගියේය. හාෂෝර්හි රජු වූ
යාබින්[14] සහ කේනිවරුන්ගෙන් පැව-
තෙන හෙබෙර්ගේ පවුල අතර සතුරු-
කමක් නොතිබුණු නිසා ඔහු කිසිම
බියකින් තොරව එතැනට ගියේය.
**18** සිසෙරාව දුටු යායෙල් ඔහුට මෙසේ
පැවසුවාය. “මාගේ ස්වාමීනි, කිසි දෙ-
යකට භය වෙන්න එපා. ඔබට පුළුවන්
මෙහෙ නතර වෙන්න.” කූඩාරමට
ඇතුල් වූ ඔහුව ඇය ගන රෙද්දකින්
වැසුවාය. **19** ඉන් ටික වේලාවකට
පසු, “මට හරිම තිබහයි. මට බොන්න
වතුර ටිකක් දෙන්න පුළුවන්ද” කියා
ඔහු ඇයගෙන් ඇසුවේය. ඇය කිරි
පුරවා තිබූ සම් භාජනයකින්[1] ඔහුට
කිරි ටිකක් දී[2] ඔහුව නැවතත් රෙද්-
දෙන් වැසුවාය. **20** එවිට ඔහු ඇයට
මෙසේ පැවසුවේය. “කූඩාරමට ඇතුල්
වන තැනට වෙලා ඉන්න. කෙනෙක්
ඇවිත්, ‘මෙහෙට කවුරු හරි ආවද’
කියලා ඇහුවොත්, ‘නැහැ’ කියලා
කියන්න.”
**21** ඉන්පසු හෙබෙර්ගේ භාර්යාව වූ
යායෙල් කූඩාරමට ගසන කූඤ්ඤයක්
හා මිටියක් ගෙන සිසෙරා ළඟට හෙ-
මිහිට ගියාය. ඇය කූඤ්ඤය ගෙන
හොඳටම හෙම්බත්ව නිදාගෙන සිටි
සිසෙරාගේ නළලට තබා[3] එය පො-
ළොවට පසාරු කරගෙන යන තෙක්
මිටියෙන් ගැසුවාය.[4] මෙසේ සිසෙරා
මිය ගියේය.
**22** එවිට සිසෙරා පසුපස ලුහුබැඳ
ආ බාරාක් එතැනට පැමිණියේය.
ඔහුව දුටු යායෙල් කූඩාරමෙන් පිටතට
පැමිණ, “ඔබ හොයන කෙනා මෙහෙ
ඉන්නවා. ඇවිත් බලන්න” කියා පැව-
සුවාය. බාරාක් ඇය සමඟ ඇතුළට
ගිය විට හිසට කූඤ්ඤයක් ගසා මරා
දමා ඇති සිසෙරාව ඔහු දුටුවේය.
**23** එසේ කානාන් දේශයේ රජු වූ
යාබින්ව එදින ඊශ්‍රායෙල්වරුන් ඉදිරි-
යේ දෙවි පරාජය කළේය.[5] **24** ඊශ්‍රා-
යෙල්වරු කානාන් දේශයේ රජු වූ
යාබින්ට විරුද්ධව තව තවත් ප්‍රහාර
එල්ල කළෝය.[6] අවසානයේදී ඔහුවද
මරා දමන ලදි.[7]

**5** ඒ දිනයේදී දෙබොරා[8] හා අබි-
නොවම්ගේ පුත්[9] බාරාක්[10] මෙම
ගීය ගැයුවෝය.[11]

**2** “ඊශ්‍රායෙල් සෙනඟ සිය කැමැත්-
තෙන්ම[12] දෙවිට වූ භාරය
ඔප්පු කිරීම* සඳහා
එඩිතරව යුද්ධයට ගියෝය.

**4 පරි.**
1 ගණන් 10:29
2 විනි 5:12
3 විනි 4:6
4 ද්වි 20:1; විනි 4:3
5 විනි 4:7; විනි 5:21; ගීතා 83:9
6 ද්වි 9:3; රෝම 8:31
7 නික් 14:24; යොෂු 10:10; 2රාජා 7:6
8 යෙසා 43:17
9 ලෙවී 26:7; යොෂු 10:19
10 ද්වි 7:23
11 විනි 4:2; 1සාමු 12:9
12 ගණන් 24:21; විනි 1:16; විනි 4:11
13 විනි 5:6; විනි 5:24
14 විනි 4:2

**2 තීරුව**
1 උත් 21:19
2 විනි 5:25
3 විනි 4:9; විනි 5:27
4 විනි 5:26
5 1ලේක 22:18; නෙහෙ 9:24; ගීතා 18:47; ගීතා 47:3; ගීතා 81:14; හෙබ්‍රෙ 11:33
6 උත් 9:25; ද්වි 28:13
7 ලෙවී 26:7; ද්වි 7:24

**5 පරි.**
8 විනි 4:4
9 විනි 4:6
10 හෙබ්‍රෙ 11:32
11 නික් 15:1; ද්වි 31:19; ද්වි 31:30; 1ලේක 16:9; ගීතා 18:පෙර
12 විනි 4:10; ගීතා 110:3

---
විනි **5:2*** හෙබ්‍රෙව් බසින්, හිසකෙස් නොබැඳ සිටීම. එසේ කරන්නේ ඔවුන්ගේ භාරයට සංකේතයක් ලෙසය.

එහෙයින් යෙහෝවා දෙවිට
ප්‍රශංසා කරන්න.[1]
3 මම යෙහෝවා දෙවිට ගී ගයන්-
නෙමි.[2]
ඊශ්‍රායෙල්වරුන්ගේ දෙවි[3] වන
යෙහෝවාව පසසන්නෙමි.
රජවරුනි! අසන්න.[4] අධිපති-
යෙනි! සවන් දෙන්න.
4 යෙහෝවා දෙවියනි, ඔබ සේයිර්
සිට පිටත්ව යන විටත්[5]
ඒදොම් සිට නික්මෙන විටත්[6]
පොළොව දෙදරුම් කෑවේය.[7] අහ-
සින් වැසි ඇද හැළුණේය.[8]
වලාගැබෙන් දිය වැස්සුණේය.
5 යෙහෝවා දෙවි ඉදිරියේ කඳු දිය වී
යන්නේය.[9]
අර පෙනෙන සීනයි කන්ද[10]
පවා ඊශ්‍රායෙල්වරුන්ගේ
දෙවි[11] වන යෙහෝවා ඉදිරි-
යේ කිසිත් නැති තරම්ය.[12]
6 අනාත්ගේ පුත් ෂම්ගර්ගේ දවස්ව-
ලදීද[13]
යායෙල්ගේ දවස්වලදීද[14] මංමා-
වත් පාළුව හිස්ව තිබුණේය.
මඟීන් ගමන් කළේ අතුරු
මාවත්වලය.[15]
7 දෙබොරා වන මා[16] ඊශ්‍රායෙල් දේ-
ශයේ මවක් මෙන් කටයුතු
කරන තුරු[17]
එහි ගම්මානවල කිසි වැසියෙක්
වාසය නොකළේය.[18]
8 ඊශ්‍රායෙල් සෙනඟ වෙනත් දෙවිව-
රුන්ව තෝරාගත්තෝය.[19]
එවිට යුද්ධය දොරටු අබියසටම
පැමිණියේය.[20]
හතළිස්දහසක් වූ ඔවුන්ගේ
අතෙහි
පලිහක්වත් හෙල්ලයක්වත්
නොතිබුණේය.[21]
9 කැමැත්තෙන්ම ඉදිරියට ආ හමු-
දාපතීන්ට[22]
මාගේ මුළු හදවතින්ම අගය
ප්‍රකාශ කරන්නෙමි.[23]
මම යෙහෝවා දෙවිව පසසන්-
නෙමි.[24]

10 ගිනි පැහැයෙන් යුත් බූරුදෙනුන්
පිට නැඟී යන්නෙනි,[1]
අගනා බුමුතුරුණු මත සැතපී
සිටින්නෙනි,
මඟ තොටේ ගමන්ගන්නෙනි,
මේ ගැන සිතන්න.[2]
11 දිය පුරවාගැනීමට පැමිණි අය[3]
යෙහෝවා දෙවිගේ ධර්මිෂ්ඨ
ක්‍රියා ගැන කතා කරති.[4]
ඊශ්‍රායෙල් දේශයේ වැසියන්ගේ
ධර්මිෂ්ඨ ක්‍රියා ගැනද ඔවුහු
කතා කරති.
එවිට යෙහෝවා දෙවිගේ සෙ-
නඟ නුවරේ දොරටු වෙත
ගමන් කරති.
12 අවදි වන්න, දෙබොරා අවදි
වන්න![5]
අවදි වී ගීයක් ගයන්න![6]
නැඟිටින්න, අබිනොවම්ගේ
පුත්[7] බාරාක්, නැඟිටින්න![8]
ඔබ අල්ලාගත් අයව රැගෙන
යන්න!
13 ඉතුරු වූ අය බලවතුන් ළඟට
ආවෝය.
සතුරන්ට විරුද්ධව සටන් කිරී-
මට යෙහෝවා දෙවිගේ සෙ-
නඟ මා ළඟට ආවෝය.
14 සටන සඳහා එෆ්‍රායිම්වරුද තැනි-
තලාවට ආවෝය.[9]
ඔවුහු බෙන්ජමින්වරුන් පසුපස
පියමැන්නෝය.
මාකීර්ගෙන්[10] ආඥාපතීහුද
සෙබූලන්ගෙන් ලිපිකරුවෝද
ඒ සමඟ ආවෝය.[11]
15 ඉසකාර්ගෙන් අධිපතීහුද[12] දෙ-
බොරා සමඟ ආවෝය.
ඉසකාර් ගෝත්‍රයෙන් බාරාක්ද
ඔවුන් සමඟ ආවේය.[13]
ඔහුද තැනිතලාවට බැස
ගියේය.[14]
නමුත් රූබෙන්වරුන් සිටියේ
සිතේ දෙගිඩියාවෙනි.[15]
16 ඔබ බඩු මලු අතරේ සැඟවී සිටින්-
නේ මන්ද?
එඬේරුන්ගේ නළා හඬ අසන්-
නද?[16]

5 පරි.
1 නික් 18:10
2ලේක 20:26
ගීතා 145:2
2 2සාමු 22:50
ගීතා 7:17
3 නික් 5:1
නික් 20:2
4 ගීතා 119:46
5 ද්වි 33:2
ගීතා 68:7
6 හබ 3:3
7 2සාමු 22:8
8 ගීතා 68:8
9 ද්වි 4:11
ගීතා 97:5
10 නෙහෙ 9:13
11 නික් 5:1
නික් 20:2
12 නික් 19:18
13 විනි 3:31
14 විනි 4:17
15 ලෙවී 26:22
යෙසා 33:8
16 විනි 4:4
17 විනි 4:5
18 විනි 4:2
19 ද්වි 32:16
විනි 2:12
විනි 4:1
20 ගණන් 33:56
විනි 4:2
21 විනි 4:3
1සාමු 13:19
22 විනි 4:10
ගීතා 110:3
23 විනි 4:6
24 විනි 5:2
ගීතා 103:1

2 තීරුව
1 විනි 10:4
විනි 12:14
2 ගීතා 105:2
ගීතා 145:5
3 නික් 2:16
4 ද්වි 32:4
1සාමු 12:7
ගීතා 145:7
මීකා 6:5
5 විනි 4:4
6 විනි 5:1
7 විනි 5:1
8 විනි 4:6
9 යොෂු 16:4
10 ගණන් 32:39
11 2රාජා 25:19
2ලේක 26:11
12 උත් 49:15
1ලේක 12:32
13 විනි 4:6
හෙබ්‍රෙ 11:32
14 විනි 4:14
15 හිතෝ 3:27
16 ගණන් 32:1
ගණන් 32:24

රූබෙන්වරුනි, ඔබ සිටියේ සිතේ දෙගිඩියාවෙනි.[1]
17 ගිලියද්හි වැසියෝ යොර්දාන් ගඟෙන් එතෙරට වී සිටියෝය.[2]
දාන්, ඇයි ඔබ නැව්වල ලැගුම් ගෙන සිටියේ?[3]
ආෂේර්වරුද මුහුදු වෙරළේ නිකරුණේ කාලය ගත කරමින්,
නොටුපොළවල් අතරේ වාසය කළෝය.[4]
18 නමුත් සෙබුලන්වරු තම දිවි පරදුවට තැබුවෝය.[5]
නෆ්තලීවරු[6] රණබිමේ ජය කෙහෙලි නැඟුවෝය.[7]
19 රජවරු ඇවිත් සටන් කළෝය.
මෙගිද්දෝ[8] ජල ධාරා ළඟ තයනක්හිදී[9]
කානාන්හි රජවරු සටන් කළෝය.[10]
නමුත් රිදී ඔවුන්ට නොලැබුණේය.[11]
20 අහස්තලයේ තාරකාවෝ තම වාසස්ථානයේ සිට
සිසෙරාට විරුද්ධව සටන් කළෝය.[12]
21 ඉපැරණි කීෂොන් නදියේ දිය පහරට ඔවුහු ගසාගෙන ගියෝය.[13]
මම බලසම්පන්න සතුරන්ගේ ශක්තිය බෙලහීන කළෙමි.[14]
22 අශ්වයන්ගේ කුර පොළොවේ ගැටෙන හඬ දසත විහිදී ගියේය.[15]
මන්ද අශ්වයෝ පිම්මේ දිව ගියෝය.
23 'මේරොෂ්ට ශාප වේවා![16] එහි වැසියන්ට සදා ශාප වේවා' කියා යෙහෝවා දෙවිගේ දේවදූතයා[17] කීවේය.
මන්ද ඔවුහු යෙහෝවා දෙවිගේ සහයට නොපැමිණියෝය.
ඔවුහු යෙහෝවා දෙවිට සහය වූ බලවන්තයන්ට අතහිත නොදුන්නෝය.
24 කේනීය ජාතික හෙබෙර්ගේ බිරිඳ වූ[1] යායෙල්[2] ස්ත්‍රීන් අතරින් බොහෝ ආශීර්වාද ලත් තැනැත්තියකි.
කූඩාරම්වල වෙසෙන තැනැත්තියන් අතර ඇය ආශීර්වාද ලද්දියකි.[3]
25 ඔහු ඇගෙන් වතුර ඉල්ලුවේය. ඇය ඔහුට බීමට කිරි දුන්නාය.
මුදවාපු කිරි ඇය රන් තැටියක ඔහුට පිළිගැන්වූවාය.[4]
26 ඇය දකුණතට මිටියක්ද අනික් අතට කූඤ්ඤයක්ද ගෙන,[5]
සිසෙරාගේ හිස පසාරු කරගෙන යන ලෙස ගැසුවාය.[6]
ඇය ඔහුගේ නළල දෙපළු කළාය.
27 ඇගේ දෙපාමුල ඔහු වැටී සිටියේය.
ඇගේ පාමුල ඔහු වැතිර සිටියේය.
ඔහු වැටී සිටි තැනම මිය ගියේය.[7]
28 සිසෙරාගේ මව, 'ඔහුගේ රථ පෙළ පමා වන්නේ මන්ද?[8]
ඔහුගේ අශ්වයන්ගේ කුර හඬ තවමත් නෑසෙන්නේ මන්ද'[9]
කියමින් කවුළු අතරින් එබී බැලුවාය.[10]
29 එවිට ඇයට ගුරුහරුකම් දුන් අය[11] පිළිතුරු දුන්නෝය.
ඇයද තමාටම මෙසේ කියාගත්තාය.
30 'ඔවුන් කොල්ලය එකතු කරගන්නවා ඇති.[12]
තම තමන්ට කාන්තාවන් එක් කෙනෙක් හෝ දෙන්නෙක් සොයනවා ඇති.[13]
සිසෙරා සඳහා වැඩ දැමූ වර්ණවත් වස්ත්‍රයක්ද
කොල්ලය ලබාගන්නා අය සඳහා ගෙල පළඳනාද සොයනවා ඇති.'
31 යෙහෝවා දෙවියනි! ඔබේ සියලු සතුරෝ විනාශ වේවා![14]
දෙවිට ප්‍රේම කරන්නෝ[15] දීප්තියෙන් බැබළෙන හිරු මෙන් වේවා!"[16]

**5 පරි.**

1 යාකො 4:17
2 යොෂු 22:9
3 යොෂු 19:46 යෝනා 1:3
4 යොෂු 19:24
5 විනි 4:10 විනි 6:35 1ලේක 12:33 ගීතා 68:27
6 විනි 4:6
7 විනි 4:14
8 යොෂු 12:21
9 විනි 1:27
10 ද්වි 7:24 විනි 4:13
11 විනි 4:16 විනි 5:30
12 උත් 18:14 යොෂු 10:11 විනි 4:15 1සාමු 7:10 ගීතා 135:7
13 විනි 4:7 විනි 4:13 ගීතා 44:3 ගීතා 83:9
14 ගීතා 44:5 යෙසා 25:10 මීකා 7:10
15 ගීතා 20:7 ගීතා 147:10 හිතෝ 21:31 යෙසා 5:28
16 යෙරෙ 48:10
17 නික් 23:23 විනි 2:1

**2 තීරුව**

1 ගණන් 24:21 විනි 1:16 විනි 4:11
2 විනි 4:17
3 හිතෝ 31:31
4 විනි 4:19
5 හිතෝ 31:17
6 විනි 4:21
7 විනි 4:22
8 විනි 4:15 1සාමු 15:33
9 විනි 4:16
10 හිතෝ 7:6 සල 2:9
11 2සාමු 14:2 2සාමු 20:16
12 නික් 15:9
13 ද්වි 20:14 ද්වි 21:11
14 ගීතා 68:2 ගීතා 83:9 ගීතා 92:9
15 නික් 20:6 ගීතා 91:14 ගීතා 97:10 රෝම 8:28 1කොරි 8:3
16 ගීතා 110:3 ආනි 12:3 මතෙ 13:43

එතැන් පටන් වසර හතළිහක්
පුරා දේශයේ සාමකාමී වාතාවරණ-
යක් පැවතිණ.[1]

6 ඊශ්‍රායෙල්වරු නැවතත් යෙ-
හෝවා දෙවි පිළිකුල් කරන
දේවල් කරන්න පටන්ගත්තෝය.[2]
එමනිසා මිදියන්වරුන්ට යටත් වී
අවුරුදු හතක් ජීවත් වීමට යෙ-
හෝවා දෙවි ඔවුන්ට ඉඩහැරියේය.[3]
2 මිදියන් දේශයේ වැසියෝ ඊශ්‍රා-
යෙල්වරුන්ට පීඩා කළෝය.[4] තම
අස්වැන්න මිදියන්වරුන්ගෙන් සඟවා
තැබීමට ඊශ්‍රායෙල්වරු කඳුවල, ගුහා-
වල සහ වෙනත් දුෂ්කර තැන්-
වල ගබඩා සාදාගත්තෝය.[5] 3 ඒ
කාලයේදී ඊශ්‍රායෙල්වරුන් යම් දේවල්
වගා කළ විට[6] මිදියන්වරුද අම-
ලෙක්වරුද[7] නැඟෙනහිර ප්‍රදේශවල
වැසියෝද[8] පැමිණ ඔවුන්ට හිරි-
හැර කළෝය. 4 ඔවුහු ඊශ්‍රායෙල්ව-
රුන් වටා කඳවුරු බැඳගෙන ගාසා
දක්වා තිබූ ඔවුන්ගේ වගාබිම් විනාශ
කර දැමුවෝය. ඊශ්‍රායෙල් දේශ-
යෙහි කිසි වගාබිමක්වත් බැටළුවෙකු-
වත් ගවයෙකුවත් බූරුවෙකුවත් ඔවුහු
ඉතුරු නොකළෝය.[9] 5 දේශයක්
නැති නාස්ති කිරීමට පැමිණෙන
විනාශකාරී පළඟැටි රංචුවක් මෙන්[10]
ඔවුහු තම එළු බැටළුවන් හා විශාල
ඔටු රංචු රැගෙන ඇවිත්[11] ඊශ්‍රායෙල්
දේශය පුරා කඳවුරු බැඳගෙන එය
නැති නාස්ති කළෝය.[12] 6 මිදි-
යන්වරුන් නිසා ඊශ්‍රායෙල් සෙනඟ
ඉතා දුගී තත්වයකට ඇද වැටිණ.
එමනිසා ඔවුහු යෙහෝවා දෙවිගේ
උපකාරය පතා ඔහුට කන්නලව්
කළෝය.[13]
7 මෙසේ මිදියන්වරුන් අතින් පීඩා
විඳිමින් සිටි ඊශ්‍රායෙල්වරුන් යෙ-
හෝවා දෙවිගේ උපකාරය ඉල්ලා
කන්නලව් කළ විට[14] 8 යෙහෝවා
දෙවි ඔවුන් වෙතට අනාගතවක්තෘව-
රයෙකුව යවා[15] ඔවුන්ට මෙසේ දැන්-
වීය. “ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝවා
පවසන්නේ මෙයයි. ‘බොහෝ අයව
වහලුන් ලෙස තබාගත්[16] ඊජිප්තු දේ-
ශයෙන් ඔබව නිදහස් කළේ මමයි.[1]
9 මම ඔබව ඊජිප්තුවරුන් අතින් බේ-
රාගත්තෙමි. ඔබට පීඩා කළ ඔබේ
සතුරන් අතිනුත් ඔබව ගලවාගෙන
ඔබේ ඇස් පනාපිටම ඔවුන්ව මේ දේ-
ශයෙන් පන්නා දමා ඔවුන්ගේ දේශ-
යද මම ඔබට දුන්නෙමි.[2] 10 “ඔබේ
දෙවි වන යෙහෝවා මමය.[3] ඒ නිසා
ඔබ ජීවත් වන මේ දේශයේ වෙසෙන[4]
අමෝරිවරුන්ගේ දෙවිවරුන්ට භය
නොවන්න”[5] කියාත් මම ඔබට නිත-
රම මතක් කර දුනිමි. එහෙත් ඔබ මට
කීකරු වුණේ නැත.’ ”[6]

11 පසුව යෙහෝවා දෙවිගේ දූත-
යෙක් පැමිණ[7] ඔෆ්රාහි පිහිටි විශාල
ගසක් යට වාඩි විය. එම ගස
අබි-එෂෙර්ගෙන් පැවතෙන යෝවාෂ්ට
අයිතිව තිබූ ගසකි.[8] මේ අවස්ථාවේදී
යෝවාෂ්ගේ පුත් ගිඩියොන්[9] මිදියන්-
වරුන්ගෙන් තම තිරිඟු අස්වැන්න
සඟවාගන්නා පිණිස ඒවා මිදි මඬින
යන්ත්‍රයක දමා ලඟි ලඟියේ තිරිඟු
ඇට ටික වෙන් කරගනිමින් සිටි-
යේය. 12 එවිට යෙහෝවා දෙවිගේ
දූතයා ඔහු ළඟට පැමිණ, “ඔබ එඩි-
තර, බලසම්පන්න කෙනෙක්. ඔබේ
උපකාරයට යෙහෝවා දෙවි ඉන්-
නවා”[10] කියා පැවසුවේය. 13 එවිට
ගිඩියොන් ඔහුට මෙසේ පැවසුවේය.
“මාගේ ස්වාමිනි, මේ විදිහට කතා
කරනවාට මට සමාවෙන්න. නමුත්
අපට උපකාර කරන්න යෙහෝවා
දෙවි අප සමඟ ඉන්නවා නම් ඇයි
අපිට මෙච්චර දුක් කරදරවලට මුහුණ
දෙන්න සිදු වෙලා තියෙන්නේ?[11] අපේ
පියවරුන් කිව්වේ,[12] ‘ඊජිප්තුවෙන්
අපිව බේරගත්තේ යෙහෝවා දෙවි’[13]
කියලයි. එහෙමනම් ඒ කාලයේ කළ
පුදුම ක්‍රියා දෙවි දැන් කරන්නේ
නැත්තේ ඇයි?[14] යෙහෝවා දෙවි
අපිව අත්හැරලා.[15] ඒ බව හොඳටම
පැහැදිලියි. ඒ නිසයි අපි මිදියන්ව-
රුන් අතින් මෙච්චර පීඩා විඳින්නේ.”

**5 පරි.**
**1** ලෙවී 26:6, විනි 3:11, විනි 3:30

**6 පරි.**
**2** ද්වි 28:15, විනි 2:19, නෙහෙ 9:28
**3** උත් 25:2, ලෙවී 26:17, ගණන් 25:17, ද්වි 28:48, විනි 2:14
**4** ලෙවී 26:21, ගණන් 33:55, ද්වි 28:51
**5** 1සාමු 13:6
**6** ලෙවී 26:16, ද්වි 28:33
**7** විනි 3:13
**8** උත් 29:1, විනි 8:10, 1රාජා 4:30
**9** ද්වි 28:31, ද්වි 28:48, මීකා 6:15
**10** විනි 8:10
**11** විනි 7:12
**12** ගීතා 83:4
**13** ද්වි 4:30, ගීතා 50:15
**14** විනි 2:18, ගීතා 86:7, ගීතා 107:19, හොෂෙ 5:15
**15** ගණන් 12:6, ආමො 3:7
**16** විනි 2:1, ගීතා 78:52, ගීතා 136:11

**2 තීරුව**
**1** නික් 20:2, ලෙවී 26:13
**2** ද්වි 7:2, යොෂු 10:42, නෙහෙ 9:24, ගීතා 44:2, ගීතා 78:55
**3** ද්වි 6:4, ගීතා 81:10, හොෂෙ 13:4
**4** යොෂු 24:15
**5** 2රාජා 17:35, යෙරෙ 10:2
**6** ද්වි 28:15, විනි 2:2, යෙරෙ 3:13, ශෙප 3:2
**7** විනි 2:1
**8** යොෂු 17:2, විනි 6:24, විනි 8:32
**9** උත් 49:24, හෙබ්‍රෙ 11:32
**10** යොෂු 1:5, විනි 2:18
**11** විනි 6:2

**12** ද්වි 4:9; ද්වි 6:7; ගීතා 44:1; ගීතා 78:3; **13** නික් 13:14; **14** යෙසා 63:15; **15** ද්වි 31:17; 2ලේක 15:2.

**14** එවිට යෙහෝවා දෙවි* ඔහු ඉදි-
රියට පැමිණ ඔහුට මෙසේ පැව-
සීය. “ඔබේ එඩිතරකම ඔබට මහත්
ප්‍රයෝජනයක් වෙයි.[1] මන්ද මිදියන්ව-
රුන් අතින් ඊශ්‍රායෙල්වරුන්ව බේර-
ගන්නේ ඔබයි.[2] ඒ සඳහා මම ඔබව
පත් කරන්නෙමි.”[3] **15** නමුත් ගිඩි-
යොන්, “යෙහෝවා දෙවියනි, මට
සමාවෙන්න. මම කොහොමද ඊශ්‍රා-
යෙල් සෙනඟව බේරගන්නේ?[4] අපේ
පවුල* මනස්සේ ගෝත්‍රයේ කුඩාම
පවුලයි. මගේ පියාගේ දරුවන්ගෙන්
මම තමයි කුඩාම තැනැත්තා”[5] කියා
කීවේය. **16** නමුත් යෙහෝවා දෙවි
ඔහුට මෙසේ පැවසීය. “මා ඔබේ
උපකාරයට සිටින නිසා[6] ඔබ පහ-
සුවෙන්ම මිදියන්වරුන්ට පහර දී
ඔවුන්ව පරාජය කරන්නෙහිය.”[7]

**17** එවිට ගිඩියොන් දෙවිට මෙසේ
පැවසුවේය. “දෙවියනි, මට ඔබේ
අනුමැතිය තිබෙනවා නම්[8] මගේ
මේ ඉල්ලීම ඉටු කරන්න. මට මේ
කතා කරන්නේ ඔබමු බව ස්ථිරවම
දැනගන්න මට ලකුණක් දෙන්න.[9]
**18** මම දැන් ගිහින් ඔබට යමක්
ගෙනෙන තුරු[10] ඔබ මෙතනටම
වෙලා ඉන්න.”[11] එවිට ඔහු, “මම ඔබ
පැමිණෙන තෙක් මෙතැනටම වී
සිටිමි” කියා පැවසුවේය. **19** ගිඩි-
යොන් තම නිවසට ගොස් එළු පැට-
වෙකුව කැමට පිළියෙල කළේය.[12]
ඔහු පිටි ඒපාවක්ද* ගෙන එයට මුහුන්
නොදමා රොටි සෑදුවේය.[13] ඔහු කූඩ-
යක එළු මස්ද හැළියක මස් හොද්ද
දමාගෙන ඒවා විශාල ගස ළඟ සිටි
දේවදූතයා වෙත ගෙන ගොස් ඔහුට
පිළිගැන්වීය.

**20** සැබෑ දෙවිගේ දූතයා ගිඩි-
යොන්ට මෙසේ පැවසුවේය. “මෙම
මස් සහ මුහුන් නොදැමූ රොටි මෙ-
තැන තිබෙන විශාල ගල උඩ තබා[14]
ඒවා මත හොදි වත් කරන්න.” එවිට
ගිඩියොන් ඔහු කී ලෙසම කළේය.
**21** ඉන්පසු යෙහෝවා දෙවිගේ දූතයා
තම අතේ තිබූ සැරයටිය දිගු කර
මස් සහ මුහුන් නොදැමූ රොටිවලට
තට්ටු කළේය. එවිට ගලෙන් ගින්-
නක් ඇවිළී එය මත තිබූ මස් සහ
රොටි දවා දැමුවේය.[1] ඒ සමඟම යෙ-
හෝවා දෙවිගේ දූතයා නොපෙනී
ගියේය. **22** තමා සමඟ කතා කළේ
යෙහෝවා දෙවිගේ දූතයෙකු බව ගිඩි-
යොන් නිසැකවම වටහාගත්තේ එවි-
ටය.[2]

එය තේරුම්ගත් වහාම ඔහු, “විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවියනි, මගේ ඇස්වලින්ම මම යෙ-
හෝවා දෙවි වන ඔබේ දූතයෙකුව
දැක්කා.[3] ඒ නිසා මට දැන් ලොකු
භයක් දැනෙනවා” කියා පැවසුවේය.
**23** එවිට යෙහෝවා දෙවි ඔහුට
මෙසේ පැවසීය. “සන්සුන් වන්න.*[4]
කිසි දෙයකට භය නොවන්න.[5] ඔබ
මිය යන්නේ නැත.”[6] **24** ගිඩියොන්
එම ස්ථානයේ යෙහෝවා දෙවිට පූජා-
සනයක් ගොඩනැඟුවේය.[7] අද දක්-
වාම එය යෙහෝවා-ෂාලොම් යන
නමින් හැඳින්වෙයි.[8] එය තවමත් අබි-
එෂෙර්ගෙන් පැවතෙන්නන් වෙසෙන
ඔෆ්රාහි[9] දක්නට තිබේ.

**25** එදින රාත්‍රියේදී යෙහෝවා දෙවි
ඔහුට මෙසේ පැවසුවේය. “මුලින්ම
ඔබේ පියාට අයිති අවුරුදු හතක්
වයසැති වස්සෙකුව තෝරාගන්න.
ඊළඟට, ඔබේ පියාට අයිති බාල්ගේ
පූජාසනයද[10] ඒ අසල පිහිටි කුලුනද
කඩා දමන්න.[11] **26** ඉන්පසු එම
පර්වතය මත ගල් පිළිවෙළකට ගො-
ඩගසා ඔබේ දෙවි වන යෙහෝ-
වාට පූජාසනයක් ගොඩනඟන්න. ඔබ
තෝරාගත් වස්සාව මරා එය දවන
පූජාවක් හැටියට එහි ඔප්පු කරන්න.
ඔබ කඩා දැමූ කුලුනේ ලී කැබලි දර
සඳහා භාවිත කරන්න.” **27** එහෙ-
යින් ගිඩියොන් තම සේවකයන් දස-
දෙනෙකුව රැගෙන ගොස් යෙහෝවා
දෙවි කී ලෙසම කළේය.[12] එහෙත් ඔහු

---

විනි **6:14*** එනම්, යෙහෝවා දෙවිගේ දූතයා. **15*** මූ.අ., “දහස.” **19*** ඒපාවක් යනු ලීටර් 22ක් ඇමිය හැකි මිනුම් භාජනයකි.

විනි **6:23*** මූ.අ., “ඔබට සමාදානය ලැබේවා!”

---

**6 පරි.**
**1** උත් 49:24
**2** විනි 6:32, විනි 8:22, 1සාමු 12:11, හෙබ්‍රෙ 11:32
**3** යොෂු 1:9, විනි 4:6, රෝම 8:31
**4** ගීතා 44:3
**5** 1සාමු 9:21, ලූක් 14:11, පිලි 2:3
**6** ද්වි 3:22, ද්වි 20:4, විනි 2:18, යෙසා 41:10
**7** ලෙවී 26:8, ගීතා 83:9
**8** නික් 33:13
**9** නික් 3:12
**10** උත් 18:5, විනි 6:19
**11** උත් 18:3, උත් 19:3, විනි 13:15
**12** උත් 18:7
**13** උත් 18:6
**14** විනි 13:19

**2 තීරුව**
**1** ලෙවී 9:24, විනි 13:20, 1රාජා 18:38, 1ලේක 21:26, 2ලේක 7:1
**2** විනි 13:8, විනි 13:9, විනි 13:21, හෙබ්‍රෙ 13:2
**3** උත් 16:7, උත් 16:13, උත් 32:24, උත් 32:30, විනි 13:22, ලූක් 1:12
**4** ලූක් 24:36
**5** ආනි 10:19
**6** උත් 32:30
**7** විනි 13:20
**8** උත් 22:14, නික් 17:15
**9** විනි 8:32, විනි 9:5
**10** නික් 23:24, ද්වි 12:3
**11** නික් 34:13, ද්වි 7:5, 1කොරි 8:4
**12** ද්වි 12:1

එම කාර්යය කළේ දහවල් කාලයේදී
නොව රාත්‍රියේදීය.[1] එයට හේතුව ඔහු
තම පියාගේ පවුලේ සාමාජිකයන්ට
හා නුවරේ වැසියන්ට බිය වූ නිසාය.
**28** හිමිදිරියේ අවදි වූ නුවරේ වැසි-
යෝ, බාල්ගේ පූජාසනයද ඒ අසල
පිහිටි කුලුනද කඩා දමා තිබෙන
බවත්[2] අලුතෙන් පූජාසනයක් ගොඩ-
නගා ඒ මත වස්සෙකුව ඔප්පු කර
තිබෙන බවත් දුටුවෝය. **29** ඔවුහු,
"කවුද මේ වගේ දෙයක් කළේ" කියා
එකිනෙකාගෙන් අසමින් ඒ ගැන සො-
යන්න පටන්ගත්තෝය. "ඒක කළේ
යෝවාෂ්ගේ පුත් ගිඩියොන්" කියා
අවසානයේදී ඔවුන්ට පවසන ලදි.
**30** එහෙයින් නුවරේ වැසියෝ යෝ-
වාෂ් ළඟට ගොස්, "ඔබේ පුතාව
මෙහෙට ගේන්න. ඔහු බාල්ගේ පූජා-
සනයත් ඒ ළඟ තිබුණු කුලුනත්
කඩා දාලා. ඒ නිසා ඔහුව මරා
දැමිය යුතුයි"[3] කියා පැවසුවෝය.
**31** යෝවාෂ්[4] තමා වටා රැස්ව සිටි
සියලුදෙනාට[5] කතා කරමින්, "බාල්
දෙවි කෙනෙක් නම්[6] ඔහුම ඇවිත්
තමන්ගේ පූජාසනය කඩා දැමූ කෙ-
නාට දඬුවම් කරයි.[7] ඒක ඔහුගේ
වැඩක්. ඉතින් ඔහු වෙනුවෙන් දඬුවම්
ලබා දෙන්න ඔබ සියලුදෙනා ඉදිරි-
පත් වෙන්නේ ඇයි? බාල් වෙනුවෙන්
ඉදිරිපත් වන සියලුදෙනාවම මේ
උදෑසනම මරා දැමිය යුතුයි"[8] කියා
කීවේය. **32** "බාල්ම ඇවිත් තමන්-
ගේ පූජාසනය කඩා දැමූ කෙනාට
දඬුවම් කරපුදෙන්"[9] කියා පවසමින්
යෝවාෂ් තම පුත් ගිඩියොන්ට යෙ-
රුබ්බාල් යන නම දුන්නේය.[10]
**33** මේ අතර එකම පිරිසක් ලෙස[11]
සංවිධානය වූ මිදියන්වරු,[12] අම-
ලෙක්වරු[13] සහ නැඟෙනහිර ප්‍රදේශව-
ලින් පැමිණි අය,[14] ගඟෙන් එගොඩ වී
යෙස්‍රෙයෙල් තැනිතලාවට ගොස් එහි
කඳවුරු බැඳගත්තෝය.[15] **34** යෙ-
හෝවා දෙවිගේ බලය[16] ගිඩියොන්
තුළ ක්‍රියාත්මක විය. ඔහු හොරණෑ-
වක් පිම්බ විට[17] අබි-එෂෙර්ගෙන් පැව-
තෙන්නෝ[18] පැමිණ ඔහුට එකතු වූහ.
**35** ඔහු මනස්සේ ගෝත්‍රයට අයත්
ප්‍රදේශය පුරාද පණිවිඩකරුවන්ව යැවූ
අතර,[1] ඔවුහුද ඔහුට එකතු වූහ. ඔහු
ආෂෙර්, සෙබුලූන් සහ නප්තලී
යන ගෝත්‍රවලට අයත් ප්‍රදේශවලටත්
පණිවිඩකරුවන්ව යැවීය. එහි සිටි
අයත් ඔහු වෙතට පැමිණියෝය.
**36** එවිට ගිඩියොන් සැබෑ දෙවිට
මෙසේ පැවසුවේය. "ඔබ පොරොන්දු
වුණේ මා ලවා ඊශ්‍රායෙල්වරුන්ට
ගැලවීම ලබා දෙනවා කියායි.[2]
**37** එහෙමනම් මම මේ බැටළු ලොම්
මිටිය කමතේ තබා යනවා. අවට මුළු
බිමම පිනිවලින් තෙමෙන්නේ නැතුව
මේ ලොම් මිටිය විතරක් තෙමී තිබු-
ණොත් ඔබ මා ලවා ඊශ්‍රායෙල්ව-
රුන්ට ගැලවීම ලබා දෙනවා කියා
ඔබ මට දුන් පොරොන්දුව ගැන මා
තුළ කිසිම සැකයක් ඇති නොවෙයි."
**38** ඔහු ඉල්ලූ දේ එලෙසම ඉටු විය.
ඔහු පසුදා හිමිදිරියේ පැමිණ ලොම්
මිටිය මිරිකූ විට එයින් විශාල භාජන-
යක් පිරෙන තරමට වතුර බේරු-
ණේය. **39** නමුත් ගිඩියොන්, දෙවිට
නැවතත් කතා කරමින්, "අනේ දෙ-
වියනි, මා සමඟ උදහස් වෙන්න
එපා. මට තව එක වතාවක් සවන්
දෙන්න. ඒ කාරණය මට තවත්
ස්ථිර කරගන්න මේ ලොම් මිටියෙන්
මට තව එක පරීක්ෂණයක් කරන්න
පුළුවන්ද? මේ වතාවේ අවට මුළු
බිමම පිනිවලින් තෙමුණත් මේ ලොම්
මිටිය විතරක් නොතෙමී තිබෙන්න
හරින්න" කියා පැවසුවේය. **40** දෙවි
ඒ රාත්‍රියේදී ඔහුගේ එම ඉල්ලීමද ඉටු
කළේය. එහෙයින් අවට මුළු බිමම
පිනිවලින් තෙමුණද ලොම් මිටිය පම-
ණක් තෙමී නොතිබුණේය.

**7** යෙරුබ්බාල්[3] යන නම ලැබූ
ගිඩියොන්ද[4] ඔහුට එකතු වූ සිය-
ලුදෙනාද හිමිදිරියේ නැඟිට හාරොද්
උල්පත අසලට ගොස් එහි කඳවුරු
බැඳගත්තෝය. ඊට උතුරින් පිහිටි
පහත් තැනිතලාවේ මොරේ නම්
කන්ද අසල මිදියන්වරු කඳවුරු බැඳ-
ගෙන සිටියෝය. **2** යෙහෝවා දෙවි

**6 පරි.**
1 මතෙ 10:16
2 ද්වි 12:3; 2රාජා 18:4; 2ලේක 31:1
3 යෙරෙ 26:11; යොහ 16:2
4 විනි 6:11
5 නික් 23:2; විනි 6:28
6 නික් 15:11; ගීතා 115:5; දානි 2:47; 1කොරි 8:5
7 1රාජා 18:26; 1රාජා 18:39; යෙසා 41:23; යෙරෙ 10:5; 1කොරි 8:4
8 ද්වි 13:5; ද්වි 17:3; ද්වි 17:5
9 1රාජා 18:27
10 1සාමු 12:11; 2සාමු 11:21
11 විනි 7:12
12 උත් 25:2; ගණන් 25:17; විනි 6:2
13 උත් 36:12; නික් 17:16; ගණන් 24:20; ද්වි 25:19
14 උත් 29:1; විනි 6:3
15 යොෂු 17:16; යොෂු 19:18
16 විනි 3:10; විනි 11:29; විනි 13:25; විනි 14:6; විනි 15:14; යෙසා 63:11; සෙක 4:6
17 විනි 3:27; ශෙප 1:16
18 යොෂු 17:2; විනි 8:2

**2 තීරුව**
1 විනි 11:12; 2ලේක 30:6
2 විනි 6:14

**7 පරි.**
3 විනි 6:32; 1සාමු 12:11
4 විනි 6:11

ගිඩියොන්ට මෙසේ පැවසීය. "ඔබ
සමඟ සිටින අයගේ ගණන වැඩියි.[1]
ඒ නිසා මා මිදියන්වරුන්ව පරා-
ජය කර ඔබට ජය ලබා දුන් පසු,
'අපි මේ ජයග්‍රහණය ලබාගත්තේ
අපේම ශක්තියෙන්'[2] කියා ඊශ්‍රායෙල්-
වරුන් පුරසාරම් දෙඩීමට[3] ඉඩ තිබේ.
**3** එහෙයින් සියලුදෙනාටම ඇසෙන
සේ මෙසේ කියන්න. 'ඔබ අතරේ
සිටින කවුරු හරි කෙනෙක් යුද්ධයට
යන්න භය නම් දැන් ඔහුට පුළුවන්
හැරී ආපසු නිවෙස්වලට යන්න.'"[4]
ගිඩියොන් එසේ පැවසූ විට මිනිසුන්
විසිදෙදහසක් තම නිවෙස්වලට හැරී
ගියෝය. එවිට සෙනඟගේ ගණන
දසදහසක් දක්වා අඩු විය.
**4** එහෙත් යෙහෝවා දෙවි නැවතත්
ගිඩියොන්ට කතා කරමින් මෙසේ
පැවසීය. "තවමත් ඔබ සමඟ සිටින
අයගේ ගණන වැඩියි.[5] ඔවුන්ව දිය
පහර ළඟට ගෙන යන්න. එහිදී ඔබ
සමඟ සටනට යෑමට සුදුස්සන්ව මම
තෝරා දෙන්නෙමි. 'මේ පුද්ගලයා සුදු-
සුයි' කියා පවසමින් මා යමෙකුව
තෝරාගන්නා විට ඔහුව ඔබේ කණ්-
ඩායමට ඇතුළත් කරගන්න. 'මේ පුද්-
ගලයා සුදුස්සෙක් නොවෙයි' කියා
මා යමෙකු ගැන පැවසුවොත් ඔහුව
ඔබේ කණ්ඩායමට ඇතුළත් කර නො-
ගන්න." **5** එහෙයින් ගිඩියොන් සෙ-
නඟ සමඟ දිය පහර අසලට ගියේය.[6]
එහිදී යෙහෝවා දෙවි ගිඩියොන්ට
මෙසේ පැවසුවේය. "වතුර අතට
ගෙන බල්ලෙකු වතුර බොන්නාක්
මෙන් දිවෙන් ලෙව කා වතුර බොන
අයව එක පැත්තකටද දණ ගසා හිස
පහත් කරගෙන වතුර බොන අයව
තවත් පැත්තකටද වෙන් කරන්න."[7]
**6** වතුර අතට ගෙන බල්ලෙකු
වතුර බොන්නාක් මෙන් බිවූ අයගේ
සංඛ්‍යාව තුන්සියයකි. අනිකුත් සිය-
ලුදෙනාම වතුර බිව්වේ දණ ගසා හිස
පහත් කරගෙනය.
**7** යෙහෝවා දෙවි ගිඩියොන්ට
මෙසේ කීවේය. "මා ඔබේ ජන-
තාවට නිදහස ලබා දෙන්නේ වතුර

**7 පරි.**
1 1සාමු 14:6
2ලේක 14:11
2 1සාමු 17:47
ගීතා 44:7
යෙසා 10:13
1කොරි 1:29
2කොරි 4:7
3 යෙසා 2:11
4 ද්වි 20:8
5 2ලේක 32:8
ගීතා 33:16
6 ගීතා 7:9
7 1පේතෘ 5:8

**2 තීරුව**
1 විනි 7:2
1සාමු 14:6
යෙසා 41:14
හෙබ්‍රෙ 11:34
2 යොෂු 6:4
විනි 3:27
3 විනි 6:33
4 යෝබ් 4:13
යෝබ් 33:15
5 ද්වි 7:2
විනි 3:10
විනි 4:14
2ලේක 16:8
2ලේක 20:17
6 2කොරි 13:5
7 විනි 7:13
8 1සාමු 23:16
එස්රා 6:22
නෙහෙ 6:9
යෙසා 35:3
9 විනි 6:33
10 යෙරෙ 46:23
11 විනි 6:5
12 මතෙ 2:12

අතට ගෙන බිවූ මේ තුන්සියදෙනා
මාර්ගයෙනි. මම ඔවුන් ලවා මිදි-
යන්වරුන්ව ඔබේ අතට හසු කර
දෙන්නෙමි.[1] ඒ නිසා අනික් අයට
ඔවුන්ගේ නිවෙස්වලට යෑමට ඉඩ
දෙන්න." **8** ඉන්පසු ගිඩියොන් එම
තුන්සියදෙනාව රඳවාගෙන ඉතුරු
අයව ඔවුන්ගේ නිවෙස් කරා යැව්-
වේය. ඔවුන්ගේ ආහාර සහ හොරණෑ[2]
එම තුන්සියදෙනා තමන් ළඟ තබා-
ගත්තෝය. මිදියන්වරුන්ගේ කඳවුර
පිහිටා තිබුණේ ගිඩියොන් සිටි ස්ථා-
නයට පහතින් පිහිටි තැනිතලා-
වේය.[3]
**9** එදින රාත්‍රියේදී[4] යෙහෝවා දෙවි
ගිඩියොන්ට මෙසේ පැවසුවේය.
"සූදානම් වෙන්න. මිදියන්වරුන්ගේ
මුළු කඳවුරම මම ඔබේ අතට හසු
කර දෙන්නෙමි. ඔබ කඳවුර තිබෙන
තැනට බැස ගොස් ඔවුන්ට පහර
දෙන්න.[5] **10** එහෙත් එසේ කිරීමට
ඔබ තුළ බියක් ඇත්නම් මුලින්ම පූරා
නමැති ඔබේ සහයකයා සමඟ කඳවුර
තිබෙන තැනට ගොස්[6] **11** කඳවු-
රේ සිටින අයගේ කතාබහට සවන්
දෙන්න.[7] ඔබට ඇසෙන දේවලින්
නිසැකවම ඔබ දිරිමත් වනු ඇත.[8]
එවිට කිසිම සැකයක් නැතුව කඳවු-
රට පහර දෙන්න ඔබට හැකි වෙයි."
එහෙයින් ඔහු තම සහයකයා වූ පූරා
සමඟ කඳවුර දෙසට බැස ගොස් ඒ
අසලටම පැමිණියේය.
**12** මිදියන්වරු, අමලෙක්වරු සහ
නැඟෙනහිර ප්‍රදේශවල වැසියෝ[9]
අතිවිශාල සංඛ්‍යාවක් ඒ වන
විට තැනිතලාවේ එක් රොක්ව සිටි-
යෝය. ඔවුන් පළඟැටි රංචුවක් මෙන්
විය.[10] ඔවුන් සතු ඔටුවන්ගේ[11] ගණන
මුහුදු වෙරළක වැලි කැට මෙන්ය.
**13** ගිඩියොන් ඔවුන්ගේ කඳවුර අස-
ලට පැමිණි විට එහි සිටි එක් මිනි-
සෙක් තම මිතුරෙකුට තමා දුටු
සිහිනයක් ගැන විස්තර කරමින්
සිටියේය. ඔහු පැවසුවේ මෙසේය.
"මම පුදුම හීනයක් දැක්කා.[12] මම
දැක්කා බාර්ලිවලින් හදපු රොටියක්

මිදියන්වරුන්ගේ කඳවුරට පෙරළී-
ගෙන එනවා. ඒක කූඩාරමක
වැදී ඒ කූඩාරම බිමටම සමතලා
වුණා.”[1] **14** එවිට ඔහුගේ මිතුරා
පිළිතුරු දෙමින්,[2] “මේක නම් ඊශ්‍රා-
යෙල් ජාතිකයෙක් වන යෝවාෂ්ගේ
පුත් ගිඩියොන්ගේ කඩුවම[3] තමයි.
සැබෑ දෙවි[4] මිදියන්වරුන්වත් ඔවුන්
සමඟ කඳවුරු බැඳගෙන සිටින සිය-
ලුදෙනාවත් ඔහුට යටත් කර දෙන
බවට නම් කිසිම සැකයක් නැහැ.”[5]
**15** ඒ මිනිසා දුටු සිහිනය ගැනත්
ඔවුන් එය විස්තර කළ ආකාරය
ගැනත්[6] ඇසූ ගිඩියොන් දණින් වැටී
දෙවිට නමස්කාර කළේය.[7] ඉන්
අනතුරුව ඔහු ඊශ්‍රායෙල් කඳවුරට
ගොස්, “සියලුදෙනාම දැන් සූදානම්
වෙන්න.[8] යෙහෝවා දෙවි මිදියන්ව-
රුන්ගේ කඳවුර අපට යටත් කර දෙන
අවස්ථාව දැන් ඇවිත්” කියා පැවසීය.
**16** එවිට ඔහු ඒ තුන්සියදෙනා කණ්-
ඩායම් තුනකට බෙදා සෑම කෙ-
නෙකුටම හොරණෑවක්[9] සහ විශාල
මැටි භාජනයක් බැගින් දුන්නේය. ඒ
සෑම මැටි භාජනයක් තුළම පන්ද-
මක් සඟවා තිබිණ. **17** ඔහු ඔවුන්ට
මෙසේ පැවසීය. “මා කරන දේ බලා
ඔබත් ඒ විදිහටම කරන්න. මා කඳ-
වුර අසලට ගොස් කරන දේ ඔබත්
කරන්න. **18** මාත් මා සමඟ සිටින
අයත් හොරණෑ පිඹින විට කඳවුර
වටකර සිටින ඔබ සියලුදෙනාත්
ඔබේ හොරණෑ පිඹ,[10] ‘යෙහෝවා දෙ-
විට[11] හා ගිඩියොන්ට ජය නියතයි’
කියා කෑගසන්න.”
**19** ගිඩියොන්ද ඔහුගේ කණ්ඩාය-
මට අයත් සියලුදෙනාද කඳවුර අස-
ලට ගියෝය. ඔවුන් එසේ ගියේ
මධ්‍යම රාත්‍රියට කලින් ඇරඹෙන
වැඩමුරය[12] සඳහා මුරකරුවන් මාරු
වන වේලාවේදීය. කඳවුර අසල සිටි
ඔවුහු තම හොරණෑ පිඹ[13] තම
අත්වල තිබූ විශාල මැටි භාජන
බිඳ දැමුවෝය.[14] **20** මෙසේ කණ්-
ඩායම් තුනම එකවර තම හො-
රණෑ පිඹ[15] තම අත්වල තිබූ විශාල
මැටි භාජන බිඳ දැමුවෝය. එහි
සඟවා තිබූ පන්දම් වමතට ගත්
ඔවුහු දකුණතින් හොරණෑ ගෙන
ඒවා පිඹින අතරතුර, “යෙහෝවා දෙ-
විට[1] හා ගිඩියොන්ට ජය නියතයි”
කියා කෑගැසුවෝය. **21** ඒ අවස්ථා-
වේදී සියලුදෙනාම තමාට නියමිත
ස්ථානයෙහි රැඳී සිටියෝය. මේ අතර
කඳවුරේ සිටි අය කලබල වී කෑගස-
මින් පලා ගියෝය.[2] **22** තුන්සිය-
දෙනා[3] දිගටම හොරණෑ පිඹිමින්[4]
සිටියෝය. එවිට යෙහෝවා දෙවි කඳ-
වුරේ සිටි සියලුදෙනාට තම තමා-
ගේ කඩුවෙන් එකිනෙකාටම පහර
දීමට සැලැස්වීය.[5] ඔවුහු බෙත්-ෂිට්ටා
දක්වාද එතැන් සිට ෂෙරේරා දක්-
වාද ටබ්බාත් අසල පිහිටි ආබෙල්-
මෙහෝලා නම් ප්‍රදේශයේ[6] මායිම
දක්වාද පලා ගියෝය.
**23** මේ අතරතුර නෆ්තලී,[7]
ආෂෙර්[8] සහ මනස්සේ[9] යන ගෝත්‍ර-
වලින් ඊශ්‍රායෙල්වරුන්ව රැස් කර-
වන ලදි. ඔවුහු මිදියන්වරුන් පසුපස
හඹා ගියෝය.[10] **24** එසේම එප්‍රායිම්
කඳුකරයේ විසූ අය වෙතට පණිවි-
ඩකරුවන් යැවූ ගිඩියොන්,[11] “මිදි-
යන්වරුන්ට කලින් බෙත්-බාරා සහ
යොර්දාන් ගඟ අසලට යන්න. මිදි-
යන්වරුන්ට ගඟෙන් එතෙර වෙන්න
ඉඩ දෙන්න එපා. මිනිසුන්ව එහි රඳවා
තබන්න” කියා දන්වා යැවීය. එප්‍රා-
යිම් ගෝත්‍රයේ සියලුදෙනා එක් රැස් වී
බෙත්-බාරා සහ යොර්දාන් ගඟ අස-
ලට ගොස් එහි රැඳී සිටියෝය.[12]
**25** ඔවුහු ඔරෙබ් සහ ශීබ්[13] යන නම්-
වලින් හැඳින්වූ මිදියන්වරුන්ගේ අධි-
පතීන් දෙදෙනෙකුව අල්ලාගෙන මරා
දැමුවෝය. ඔරෙබ්ව මරා දමන ලද්දේ
ඔරෙබ් නම් පර්වතය මතය.[14] ශීබ්ව
මරා දමන ලද්දේ ශීබ් නම් ස්ථාන-
යෙහි පිහිටි වයින් ගබඩාව අසලය.
ඔවුහු දිගටම මිදියන්වරුන් පසුපස
හඹා ගියෝය.[15] පසුව ඔවුහු ඔරෙබ්
සහ ශීබ්ගේ හිස් රැගෙන යොර්දාන්
ගඟ අසල සිටි ගිඩියොන්ව හමු වීමට
ගියෝය.[16]

**7 පරි.**
1 විනි 6:16
2 ගණන් 23:5
3 විනි 6:11; විනි 6:14
4 යෙසා 42:8
5 විනි 7:7
6 උත් 40:8; විනි 7:11
7 නික් 4:31; 2ලේක 20:18; ගීතා 95:6
8 විනි 4:14
9 විනි 7:8; හිතෝ 20:18
10 විනි 7:20
11 1සාමු 17:47; 2ලේක 20:17
12 ගීතා 63:6; ලූක් 12:38
13 විනි 7:8
14 විනි 7:16
15 යොෂු 6:4; විනි 7:18

**2 තීරුව**
1 නික් 14:13; 2ලේක 20:17
2 නික් 14:25; ද්වි 28:7; 2රාජා 7:7
3 යොෂු 7:4; විනි 7:6
4 යොෂු 6:6; විනි 7:8; විනි 7:16
5 1සාමු 14:20; 2ලේක 20:23; යෙසා 19:2; එස 38:21; සෙක 14:13
6 1රාජා 4:12; 1රාජා 19:16
7 යොෂු 19:32; විනි 6:35
8 යොෂු 19:24
9 යොෂු 17:1
10 1සාමු 14:22
11 විනි 3:27
12 විනි 3:28
13 විනි 8:3; ගීතා 83:11
14 යෙසා 10:26
15 විනි 8:4
16 1සාමු 17:54

**8** ඉන්පසු එෆ්‍රායිම් ගෝත්‍රයේ
මනුෂ්‍යයෝ ගිඩියොන්ට කතා
කර, “ඔබ මිදියන්වරුන්ට විරුද්ධව
සටන් කරන්න යද්දී ඇයි අපිට කතා
කළේ නැත්තේ”[1] කියා තරහෙන්
අසමින් ඔහුට නොනවත්වාම දොස්
තබන්න පටන්ගත්තෝය. ඔවුන්
එසේ කළේ ගිඩියොන් සමඟ ආරවුල-
කට පැටලීමේ අදහසිනි.[2] **2** ඔවුන්
නිහඬ වූ පසු ඔහු මෙසේ පැවසීය.
“ඔබ කළ දේවල් එක්ක බලද්දී මම
මොනවාද කරලා තියෙන්නේ![3] එෆ්‍රා-
යිම්වරුනි, ඔබ කළ ඒ පොඩි දේ[4] අබි-
එෂෙර්ගෙන් පැවතෙන[5] අප කළ හැම
දෙයකටම වඩා කොයි තරම් වටි-
නවාද!* **3** මිදියන්වරුන්ගේ අධිප-
තීන් වූ ඔරෙබ් සහ ශීබ්ව[6] දෙවි හසු
කර දුන්නේ ඔබේ අතටයි. ඉතින් ඔබ
කළ ඒ දේ එක්ක බලද්දී මම මොන-
වාද කරලා තියෙන්නේ?” ඔහුගේ ඒ
වචන ඇසූ විට ඔවුන්ගේ තරහ නිවී
ගියේය.[7]

**4** ඉන්පසු ගිඩියොන් සහ ඔහු
සමඟ සිටි තුන්සියදෙනා යොර්දාන්
ගඟ අද්දරට පැමිණ ඉන් එගොඩ
වූහ. ඔවුහු වෙහෙසට පත්ව සිටියත්
දිගටම සතුරන්ව ලුහුබැඳ ගියෝය.
**5** ඔවුන් සුක්කොත්[8] ළඟට පැමිණි
විට ගිඩියොන් එහි වැසියන්ගෙන්
මෙසේ ඉල්ලීය. “අපි මේ මිදියන්-
වරුන්ගේ රජවරුන් වන සෙබාහ්[9]
සහ ශල්මුන්නා[10] පසුපස ලුහුබැඳ
යන ගමන්. මා සමඟ සිටින මේ
මිනිසුන්ට දැන් හොඳටම මහන්-
සියි. ඒ නිසා අපිට රොටි ටිකක්
දෙන්න පුළුවන්ද?”[11] **6** නමුත් සුක්-
කොත්හි අධිපතිහු මෙසේ කීවෝය.
“ඔබේ හමුදාවට කෑම දෙන්න
කියා අපිට කියන්නේ මොන හේතු-
වක් නිසාද?[12] සෙබාහ් සහ ශල්-
මුන්නාව දැනටමත් අල්ලගෙන
වගෙයිනේ ඔබ කතා කරන්නේ.”

**7** එවිට ගිඩියොන්, “යෙහෝවා දෙවි
සෙබාහ් සහ ශල්මුන්නා මගේ අතට
හසු කර දුන් විට වෙන දේ අපි බලා-
ගමු. මම වනයේ කටු පඳුරුවලින් ඔබ
හැමෝටම හොඳ පාඩමක් උගන්ව-
නවා”[1] කියා පැවසීය. **8** ඔහු එතැන්
සිට පෙනුයෙල්[2] බලා ගියේය. ඔහු
පෙනුයෙල්හි වැසියන්ගෙන් උපකාර
ඉල්ලූ විට ඔවුන්ද පිළිතුරු දුන්-
නේ සුක්කොත්හි වැසියන් පිළිතුරු
දුන් ආකාරයටමය. **9** එහෙයින් ඔහු
පෙනුයෙල්හි වැසියන්ට මෙසේ පැව-
සීය. “මම ජය අරගෙන ඇවිල්ලා මේ
පෙනෙන මුරටැඹ බිමටම සමතලා
කරනවා.”[3]

**10** ඒ වන විට සෙබාහ් සහ ශල්-
මුන්නාද[4] ඔවුන් සමඟ ඉතුරුව සිටි
හමුදා පිරිසද කර්කෝර් නම් ස්ථාන-
යේ කඳවුරු බැඳගෙන සිටියෝය.
නැඟෙනහිර ප්‍රදේශවලින් පැමිණි[5]
ඔවුන්ගේ යුධ හමුදාවෙන් කඩු ශිල්-
පයට දක්ෂ පුරුෂයන් එක්ලක්ෂ
විසිදහසක් මිය ගොස්[6] සිටි අතර
ඔවුන්ගෙන් ඉතුරුව සිටියේ පහ-
ළොස්දහසක් පමණි. **11** නෝබා
සහ යොග්බෙහා[7] යන නුවරව-
ලට නැඟෙනහිරින් කූඩාරම්වල ජීවත්
වූ වැසියන්ව පසු කරගෙන ගිය
ගිඩියොන් මිදියන්වරුන්ගේ කඳවු-
රට පැමිණියේය. කඳවුරේ සිටි අය
විමසිලිමත්ව නොසිටි අවස්ථාවක්
බලා[8] ඔවුහු ඔවුන්ට පහර දුන්නෝය.
**12** එතැනින් පලා ගිය මිදියන්ව-
රුන්ගේ රජවරුන් වූ සෙබාහ් සහ
ශල්මුන්නා[9] පසුපස ලුහුබැඳ ගිය ගිඩි-
යොන් ඔවුන් දෙදෙනාව අල්ලාගත්-
තේය. සිදු වූ දේ ආරංචි වූ විට
කඳවුරේ සිටි සියලුදෙනාම බිය වූහ.

**13** යුද්ධයෙන් ජය ලබා ආපසු
පැමිණි යෝවාෂ්ගේ පුත් ගිඩියොන්,
හෙරෙස් වෙතට යන දුර්ගය ඔස්-
සේ ගමන් කළේය. **14** ඒ අතරතුර
ඔහු සුක්කොත් නම් නුවරේ[10] වාසය
කළ තරුණයෙකුව අල්ලාගෙන ඔහු-
ගෙන් තොරතුරු විමසුවේය.[11] එවිට
ඔහු සුක්කොත්හි සිටි අධිපතීන්[12]

**8 පරි.**
1 විනි 7:2; හිතෝ 8:13; හිතෝ 16:18
2 විනි 12:1; 2සාමු 19:41; 2ලේක 25:10
3 හිතෝ 15:28; පිලි 2:3; 2තිමෝ 2:24
4 විනි 7:25; හිතෝ 11:2
5 විනි 6:11; විනි 6:34
6 විනි 7:25; ගීතා 83:11
7 හිතෝ 14:29; හිතෝ 15:1; හිතෝ 25:15; දේශ 10:4; ගලා 5:23
8 උත් 33:17; යොෂු 13:27; ගීතා 108:7
9 විනි 8:21
10 ගීතා 83:11
11 1සාමු 25:8; 2සාමු 17:28
12 ද්වි 23:4; විනි 5:23; 1සාමු 25:10; 1සාමු 25:11; හිතෝ 3:27; යාකො 2:16

**2 තීරුව**
1 විනි 8:16; ගලා 6:7
2 උත් 32:31; 1රාජා 12:25
3 විනි 8:17
4 විනි 8:5; ගීතා 83:11
5 විනි 7:12; හෙබ්‍රෙ 11:34
6 ද්වි 28:7
7 ගණන් 32:35
8 විනි 18:27; හිතෝ 20:18
9 ගීතා 83:11
10 විනි 8:5
11 විනි 1:24; 1සාමු 30:15
12 විනි 8:6

**විනි 8:2*** මූ.අ., “එෆ්‍රායිම්වරුන් වන ඔබ නිකම් අහුලගත් මිදි ටික, අබි-එෂෙර්ගෙන් පැවතෙන අප නෙළාගත් මහා මිදි අස්වැන්නට වඩා කොයි තරම් වටිනවාද?”

හා වැඩිමහල්ලන් හැත්තෑහත්දෙනා-
ගේ නම් ගිඩියොන්ට ලියා දුන්නේය.
**15** ඉන්පසු ඔහු සුක්කොත්හි වැසි-
යන් වෙතට ගොස් මෙසේ පැව-
සීය. “ඔබට පේනවද මේ කවුද
කියලා? මම සෙබාහ් සහ ෂල්-
මුන්නාව අල්ලාගෙන ආවා. ‘හෙම්-
බත්ව සිටින ඔබේ හමුදාවට කෑම
දෙන්න කියා අපිට කියන්නේ මොන
හේතුවක් නිසාද?[1] සෙබාහ් සහ ෂල්-
මුන්නාව දැනටමත් අල්ලගෙන වගෙ-
යිනේ ඔබ කතා කරන්නේ’ කියා
කියමින් ඔබ අපට නින්දා කළා මත-
කද?” **16** එසේ පවසා ඔහු ගොස්
වනයෙන් කටු පඳුරු කිහිපයක් එකතු
කරගත්තේය. පසුව ඔහු නුවරේ සිටි
සියලුම වැඩිමහල්ලන්ව අල්ලාගෙන
ඒවායින් ඔවුන්ට හොඳටම තැළු-
වේය.[2] **17** ඉන්පසු ඔහු පෙනුයෙල්
නුවරට[3] ගොස් එහි ඉදි කර තිබූ මුර-
ටැඹ බිමටම සමතලා කර[4] නුවරේ
සිටි පුරුෂයන්ව මරා දැමුවේය.
**18** ගිඩියොන් සෙබාහ් සහ ෂල්-
මුන්නාගෙන්[5] මෙසේ ඇසුවේය.
“ඔබ දෙදෙනා තාබෝර්හිදී[6] කිහිපදෙ-
නෙකුව මරා දැමුවා නේද? ඔවුන්
මොන වගේ අයද කියා ඔබට මත-
කද?” එවිට ඔවුහු, “ඔවුන් හරියට
ඔබ වගෙයි. ඔවුන්ගේ පෙනුම රජ
කෙනෙකුගේ පුත්‍රයන්ගේ පෙනුමට
සමානයි” කියා පිළිතුරු දුන්නෝය.
**19** එවිට ඔහු මෙසේ පැවසීය. “ඔවුන්
මගේම සහෝදරයන්. මගේම මවගේ
පුත්‍රයන්. ඔබ ඔවුන්ව මරා දැම්-
මේ නැත්නම් මම ඔබ දෙදෙනා-
වත් මරන්නේ නැහැ.[7] මම මේ
කියන්නේ ජීවමාන යෙහෝවා දෙ-
විගේ නාමයෙන්.” **20** ඉන්පසු ඔහු
තම කුලුඳුල් පුත් යෙතෙර්ට, “දැන්
මේ දෙන්නාව මරා දමන්න” කියා අණ
කළේය. නමුත් තරුණ වියේ සිටි[8]
යෙතෙර් ඔවුන්ව මරා දැමීමට බිය
වූ නිසා තම කඩුව පිටතට නො-
ගත්තේය. **21** එවිට සෙබාහ් සහ
ෂල්මුන්නා ගිඩියොන්ට මෙසේ පැවසු-
වෝය. “කෙනෙක් නියම පුරුෂයෙක්
කියා ඔප්පු කරන්නේ ඔහුගේ එඩිතර
ක්‍රියාවලින්.[1] ඉතින් ඔබම ඇවිත් අපිව
මරා දමන්න.” එහෙයින් ගිඩියොන්
සෙබාහ් සහ ෂල්මුන්නාව මරා දැමු-
වේය.[2] ඔවුන්ගේ ඔටුවන්ගේ ගෙල
වටා තිබූ හඳක හැඩැති ආභරණද
ඔහු ගලවාගත්තේය.
**22** කලක් ගත වූ පසු ඊශ්‍රායෙල්
ජනයා ගිඩියොන්ට මෙසේ පැවසූහ.
“මිදියන්වරුන්ගෙන් අපිව ගලවාගත්-
තේ ඔබයි.[3] ඒ නිසා අපි කැමතියි
ඔබත් ඔබට පසුව ඔබේ පුතාත් ඔහුට
පසුව ඔබේ මුනුපුරාත් අපිව පාල-
නය කරනවාට.”[4] **23** නමුත් ගිඩි-
යොන්, “මමවත් මගේ පුතාවත් ඔබව
පාලනය කරන්නේ නැහැ.[5] ඔබේ
පාලකයා යෙහෝවා දෙවියි”[6] කියා
පිළිතුරු දුන්නේය. **24** පසුව ඔහු
තවදුරටත් ඔවුන්ට මෙසේ පැවසීය.
“මම ඔබ සියලුදෙනාගෙන්ම එක ඉල්-
ලීමක් කරනවා. ඔබ සියලුදෙනා මට
නාසාභරණය[7] බැගින් දෙන්න.” (ඔවුන්
ඉෂ්මායෙල්වරුන්[8] වූ නිසා ඔවුන්ට
රන් නාසාභරණ තිබිණ.) **25** එවිට
ඔවුහු, “අපි ඒවා ඔබට දෙන්නම්”
කියා පැවසුවෝය. පසුව ඔවුහු රෙදික-
ඩක් අතුරා නාසාභරණය බැගින් ඒ
මත දැමූහ. **26** ගිඩියොන්ගේ ඉල්-
ලීම පරිදි එකතු කරගත් රන් නාසාභ-
රණවල මුළු බර රන් ෂෙකෙල්*
එක්දහස් හත්සියයකි. මීට අමතරව
මිදියන්වරුන්ගේ රජවරුන් පැළඳ සිටි
හඳක හැඩැති ආභරණද[9] කරාබුද රත්-
නිල් පැහැති ලොම්[10] වස්ත්‍රද ඔටුවන්-
ගේ ගෙල වටා දමා තිබූ ආභරණද[11]
එකතු කරගන්නා ලදි.
**27** ගිඩියොන් ඒ රන්වලින් ඒෆොද්
හැට්ටයක්[12] සාදා එය ඔෆ්රා[13] නම්
තම නුවරෙහි ප්‍රදර්ශනය කළේය.
පසුව සියලුම ඊශ්‍රායෙල්වරු දෙවිට
ද්‍රෝහී වී ඊට නමස්කාර කළෝය.[14] ඒ
හැට්ටය නිසා ගිඩියොන්ටත් ඔහුගේ
පවුලේ සාමාජිකයන්ටත් ප්‍රශ්න රැස-
කට මුහුණ පාන්න සිදු විය.[15]

**8 පරි.**
1 විනි 8:6, හිතෝ 3:27
2 විනි 8:7, හිතෝ 10:13, හිතෝ 19:29
3 උත් 32:31, විනි 8:8, 1රාජා 12:25
4 විනි 8:9
5 ගීතා 83:11
6 ගීතා 89:12
7 උත් 9:6, ගණන් 35:19
8 1සාමු 17:33

**2 තීරුව**
1 විනි 6:12
2 1සාමු 15:33, ගීතා 83:11
3 විනි 6:14
4 ද්වි 17:14, විනි 9:8, 1සාමු 8:6, 1සාමු 12:12, හොෂෙ 13:10
5 2සාමු 22:26, හිතෝ 2:8
6 නික් 15:18, 1සාමු 10:19, ගීතා 10:16, ගීතා 29:10, ගීතා 146:10, යෙසා 33:22, යෙසා 43:15, ආනි 4:3
7 උත් 24:22
8 උත් 16:11, උත් 25:13, උත් 28:9, උත් 37:28
9 විනි 8:21, යෙසා 3:18
10 එස්ත 8:15, යෙරෙ 10:9, එස 27:7
11 විනි 8:21
12 නික් 28:6, විනි 17:5, විනි 18:14
13 විනි 6:11
14 නික් 23:33, විනි 2:17, ගීතා 106:39, හොෂෙ 4:12
15 විනි 8:33

විනි **8:26*** ෂෙකෙලයක් යනු ග්‍රෑම් 11.4කි.

**28** එලෙස ඊශ්‍රායෙල්වරු මිදියන්-
වරුන්ව[1] පරාජය කළෝය. ඊශ්‍රා-
යෙල්වරුන්ට ඔවුන්ගෙන් නැවතත්
තර්ජන එල්ල නොවීය. ගිඩියොන්
ජීවත් වූ කාලයේදී දේශයෙහි අවුරුදු
හතළිහක් පුරා සාමකාමී වාතාවරණ-
යක් පැවතිණ.[2]
**29** ඒ සියල්ල සිදු වූ පසු යෝවාෂ්-
ගේ පුත් යෙරුබ්බාල්*[3] තම නිවසට
ගොස් එහි වාසය කළේය.
**30** ගිඩියොන්ට භාර්යාවෝ බො-
හෝදෙනෙක් සිටියෝය. එහෙයින්
ඔහුට දාව පුත්‍රයෝ සැත්තෑදෙනෙක්
උපන්නෝය.[4] **31** ඔහුට ෂීකෙම්හි
වාසය කළ උපභාර්යාවක්ද සිටියාය.
ඔහුට දාව ඇයටත් පුතෙක් උපන්-
නේය. ගිඩියොන් ඔහුට අබිමෙලෙක්[5]
යන නම දුන්නේය. **32** තෘප්තිමත්
ජීවිතයක් ගත කළ යෝවාෂ්ගේ පුත්
ගිඩියොන් වයසට ගොස් මිය ගියේය.
ඔහුව තැන්පත් කරන ලද්දේ අබි-
එෂෙර්ගෙන් පැවතෙන්නන්ට[6] අයත්
ඔෆ්රා නම් නුවරෙහි ඔහුගේ පියා වූ
යෝවාෂ්ට අයිතිව තිබූ සොහොනේය.
**33** ගිඩියොන් මිය ගිය පසු ඊශ්‍රා-
යෙල්වරු දෙවිට ද්‍රෝහී වී බාල්
දෙවිවරුන්ට නමස්කාර කරන්න
පටන්ගත්තෝය.[7] ඔවුහු නමස්කාර
කිරීමට තෝරාගත්තේ බාල්-බෙරිත්
නම් දෙවියාවය.[8] **34** මෙසේ ඊශ්‍රා-
යෙල්වරු තමන් අවට සිටි සියලුම
සතුරන්ගෙන් තමන්ට ගැලවීම ලබා
දුන්[9] තම දෙවි වන යෙහෝවාව
අමතක කර දැමුවෝය.[10] **35** යෙ-
රුබ්බාල් ලෙසත් හැඳින්වූ ගිඩියොන්
ඊශ්‍රායෙල් සෙනඟ වෙනුවෙන් ඉටු කළ
ඉමහත් සේවයට කෙළෙහි ගුණ නො-
දැක්වූ[11] ඔවුහු ගිඩියොන්ගේ පවුලට
ප්‍රේමණීයව* සැලකුවේ නැත.[12]

**9** කල් යත්ම යෙරුබ්බාල්ගේ පුත්
අබිමෙලෙක්[13] තම මවගේ නෑදෑ-
යන් විසූ ෂීකෙම් නුවරට[14] ගියේය.
ඔහු තම සීයාගේ* පවුලේ අය වෙ-
තට ගොස් ඔවුන්ට මෙසේ කීවේය.
**2** "ෂීකෙම් නුවරේ වාසය කරන සිය-
ලුදෙනාව කැඳවා ඔවුන්ට මෙහෙම
කියන්න. 'ඔබ කැමති යෙරුබ්බාල්-
ගේ පුතුන් හැත්තෑදෙනාම[1] ඔබව
පාලනය කරනවාටද? නැත්නම් මා
වැනි තනි මිනිසෙක් පාලනය කරන-
වාටද? තීරණයක් ගන්න කලින් මම
ඔබේම ලේ නෑයෙක්*[2] බව මතක
තියාගන්න.' "
**3** පසුව ඔහුගේ මවගේ නෑදෑයන්
ගොස් ෂීකෙම්හි වැසියන්ට මේ දේවල්
කියූ විට, "ඔහු අපේම කෙනෙක්-
නේ"[3] කියා පවසමින් ඔවුහු අබි-
මෙලෙක්ට පක්ෂ වූහ.[4] **4** එහෙයින්
ඔවුහු බාල්-බෙරිත්ගේ දේවාලයෙන්[5]
රිදී ෂෙකෙල් හැත්තෑවක් අබිමෙ-
ලෙක්ට දුන්නෝය. ඔහු ඒ මුදල්ව-
ලින් තමන් සමඟ ගමන්බිමන් යෑමට
දාමරිකයන්[6] කිහිපදෙනෙකුව කුලි-
යට ගත්තේය. **5** ඔහු ඔවුන් සමඟ
ඔෆ්රාහි[7] පිහිටි තම පියාගේ නිව-
සට ගොස් යෙරුබ්බාල්ගේ පුතුන්
හැත්තෑදෙනා වන ඔහුගේම සහෝද-
රයන්ව එකම ගලක් මත මරා දැමු-
වේය.[8] නමුත් යෙරුබ්බාල්ගේ බාලම
පුත් යෝතම් ඒ වන විට සැඟවී සිටි
නිසා ඔහුගේ ජීවිතය පමණක් බේරු-
ණේය.
**6** කල් යත්ම ෂීකෙම්හි සියලුම
වැසියෝ මිල්ලෝ නම් බලකොටුවේ[9]
විසූ සියලුදෙනා සමඟ එකතු වී
ෂීකෙම්හි[10] තිබූ කණුව අසල පිහිටි
විශාල ගස[11] ළඟට ගොස් අබිමෙ-
ලෙක්ව රජු ලෙස පත් කළෝය.[12]
**7** යෝතම්ට මේ ගැන ආරංචි වූ
වහාම ඔහු ගෙරිසීම් කන්ද[13] මුදුනට
ගොස් මහා හඬින් ඔවුන්ට මෙසේ
පැවසුවේය. "ෂීකෙම්හි වැසියෙනි, මා
කියන මේ කතාවට සවන් දෙන්න.
එවිට දෙවිත් ඔබට සවන් දෙයි.
**8** "එකමත් එක රටක සියලුම ගස්
එකතු වී රජ කෙනෙක්ව පත් කරන්න

**විනි 8:29*** එනම්, ගිඩියොන්. **35*** හෝ, "ලැදි ප්‍රේමයකින්." **9:1*** මූ.අ., "මවගේ පියාගේ."

**විනි 9:2*** මූ.අ., "ඔබේම මාංසය, ඔබේම ඇට-කටු."

**8 පරි.**
**1** විනි 6:1, ගීතා 83:9
**2** ලෙවී 26:6, විනි 3:11, විනි 5:31
**3** විනි 6:32, 1සාමු 12:11
**4** විනි 9:2
**5** විනි 9:1, 2සාමු 11:21
**6** විනි 6:11, විනි 6:24
**7** විනි 2:17, විනි 2:19, විනි 10:6
**8** විනි 9:4
**9** ගීතා 106:43
**10** විනි 3:7, ගීතා 106:36
**11** විනි 9:16, දේශ 9:15, 2තිමෝ 3:2
**12** උත් 40:23, හිතෝ 3:27

**9 පරි.**
**13** විනි 8:31, 2සාමු 11:21
**14** උත් 12:6, උත් 33:18, උත් 34:27, 1රාජා 12:1, ක්‍රියා 7:16

**2 තීරුව**
**1** විනි 8:30
**2** උත් 29:14, 1ලේක 11:1
**3** විනි 8:31
**4** 2සාමු 15:6
**5** විනි 8:33, විනි 9:46
**6** 2ලේක 13:7, ක්‍රියා 17:5
**7** විනි 6:11, විනි 8:27
**8** 2රාජා 11:1, 2ලේක 21:4
**9** විනි 9:20
**10** විනි 9:1
**11** උත් 35:4, යොෂු 24:26
**12** ද්වි 17:14, විනි 8:22, 1සාමු 8:7
**13** ද්වි 11:29, යොෂු 8:33, යොහ 4:20

තීරණය කළා. මුලින්ම ඔවුන් ඔලීව
ගසට,[1] ‘ඔබ අපේ රජ වෙන්න’[2] කියා
ආරාධනා කළා. **9** නමුත් ඔලීව
ගස අනික් සියලුම ගස්වලට මෙහෙම
කිව්වා. ‘දෙවිටත් මිනිසුන්ටත් ගෞ-
රවයක් ලබා දීම සඳහා මගෙන්
ගන්නා වටිනා තෙල් පාවිච්චි කර-
නවා.[3] ඉතින් ඒ වගේ වටිනා සේ-
වාවක් අත්හැරලා අනික් ගස්වලට
වඩා ඉහළින් වැජඹෙන්න මට අවශ්‍ය
නැහැ.’[4] **10** එවිට සියලුම ගස් අත්-
තික්කා ගස[5] ළඟට ගොස්, ‘ඔබට
පුළුවන්ද අපේ රැජින වෙන්න’ කියා
ඇසුවා. **11** නමුත් අත්තික්කා ගස
එයට අකමැති වී, ‘රසවත් පල උපද-
වන මගේ කාර්යය අත්හැරලා අනික්
ගස්වලට වඩා ඉහළින් වැජඹෙන්න
මට අවශ්‍ය නැහැ’[6] කියා පැවසුවා.
**12** ඊළඟට සියලුම ගස් ගියේ මිදිවැල
ළඟටයි. ‘ඔබ කැමතිද අපේ රැජින
වෙන්න’ කියා මිදිවැලෙන් ඇසූ විට,
**13** ‘මගෙන් නිපදවන අලුත් වයින්ව-
ලින් දෙවිත් මිනිස්සුත් බොහෝ සෙ-
යින් සතුටු වෙනවා.[7] ඉතින් ඒ වගේ
සේවාවක් අත්හැරලා අනික් ගස්වලට
වඩා ඉහළින් වැජඹෙන්න මට අවශ්‍ය
නැහැ’ කියා මිදිවැල පිළිතුරු දුන්නා.
**14** අන්තිමේදී මොකද වුණේ? සිය-
ලුම ගස් එකතු වෙලා කටු පඳුරක්[8]
ළඟට ගොස්, ‘ඔබ කැමතිද අපේ
රජ වෙන්න’ කියා ඇසුවා. **15** කටු
පඳුර එම ගස්වලට මෙහෙම කිව්වා.
‘ඔබ සියලුදෙනාම මට රජකම දෙන්-
නේ අවංක චේතනාවෙන් නම් ඇවිත්
මගේ සෙවණෙහි වාසය කරන්න.[9]
හැබැයි ඔබ රජකම දෙන්නේ වැරදි
චේතනාවකින් නම් මගෙන් ගින්නක්
පිට වෙලා[10] ලෙබනොන් රටේ[11] සිය-
ලුම දේවදාර ගස් පිච්චිලා යයි.’[12]

**16** “ඉතින් ජනයෙනි, ඔබ සියලු-
දෙනා එකතු වී අබිමෙලෙක්ව රජු
හැටියට පත් කළේ අවංක චේත-
නාවෙන්ද කියලා හොඳට හිතලා
බලන්න.[13] ඔබ යෙරුබ්බාල් සහ
ඔහුගේ පවුලට කළ දේ කෙළෙහි
ගුණ සැලකීමක්ද කියලත් හිතලා
බලන්න. ඔබ ක්‍රියා කළේ සාධාරණ-
වද කියලත් හොඳට කල්පනා කරලා
බලන්න. **17** මගේ පියා ඔබ වෙනු-
වෙන් සටන් කළා.[1] ඔහු තම ජීවිතය
පරදුවට තබමින්[2] මිදියන්වරුන්ට
විරුද්ධව සටන් කර[3] ඔබව ගලවා-
ගත්තා. **18** නමුත් ඔබ කළේ මො-
කක්ද? සියලුදෙනාම එකතු වෙලා
මගේ පියාගේ පුතුන් හැත්තෑදෙනාව[4]
එකම ගලක් මත මරා දැමුවා.[5] ඊට-
පස්සේ ඔහුගේ දාසියකගේ පුතෙක්[6]
වන අබිමෙලෙක්ව ෂීකෙම්හි රජු හැටි-
යට පත් කළා.[7] ඔබ එහෙම කළේ
ඔහු ඔබේම නෑයෙක් නිසයි. **19** ඔබ
යෙරුබ්බාල්ටත් ඔහුගේ පවුලේ අය-
ටත් කළ දේ සාධාරණයි කියා හිත-
නවා නම් ඔබ අද අබිමෙලෙක්ව රජු
හැටියට පත් කළ එක ගැන සතුටු
වෙන්න. ඔහුත් ඔබ සියලුදෙනා ගැන
සතුටු වෙයි.[8] **20** හැබැයි මේ දේ
මතක තියාගන්න. මේ කාරණයේදී
අසාධාරණයක් වෙලා තියෙනවා නම්
ෂීකෙම් වැසියන්ටත් මිල්ලෝ බල-
කොටුවේ[9] ජීවත් වන අයටත් අබිමෙ-
ලෙක්ගෙන් පහර කන්න සිදු වෙයි.
ඔහු ඔබව පුලුස්සා දමයි.[10] ඒ වගේම
ඔවුනුත් අබිමෙලෙක්ට දරුණු ලෙස
පහර දී[11] ඔහුව නැති කර දමයි.”[12]

**21** ඒ දේවල් පැවසූ වහාම යෝ-
තම්[13] එතැනින් පලා ගොස් බෙයර්
බලා පිටත් වූයේය. තම සහෝදරයා
වූ අබිමෙලෙක්ගෙන් ඔහුට තර්ජන
එල්ල වූ නිසා ඔහු එම ස්ථානයේ දිග-
ටම වාසය කළේය.

**22** අබිමෙලෙක් අවුරුදු තුනක්
පුරා ඊශ්‍රායෙල් දේශය පාලනය කළ
අතර එහි වැසියන්ව තම අණසක
යටතේ තබාගත්තේය.[14] **23** කල්
යත්ම අබිමෙලෙක් සහ ෂීකෙම්හි
වැසියන් අතර අමනාපයක් ඇති
වීමට දෙවි ඉඩහැරියේය.[15] ඒ නිසා
ෂීකෙම්හි වැසියෝ අබිමෙලෙක්ට
ද්‍රෝහී වූහ.[16] **24** එසේ වීමට දෙවි
ඉඩහැරියේ යෙරුබ්බාල්ගේ පුතුන්
හැත්තෑදෙනාගේ ලේ වගුරුවා අබි-
මෙලෙක් කළ ඒ මහත් අසාධාරණ-

**9 පරි.**
**1** හොෂෙ 14:6
**2** විනි 8:22
**3** නික් 29:2; ලෙවී 2:1
**4** හිතෝ 29:23; මතෙ 23:12; රෝම 12:16
**5** යෝවෙ 2:22
**6** හිතෝ 16:19
**7** ගීතා 104:15; හිතෝ 31:6; දේශ 2:3; දේශ 10:19
**8** විනි 9:6; 2රාජා 14:9; ගීතා 58:9; හිතෝ 15:25; හිතෝ 16:18
**9** විනි 9:19; ගලා 6:3
**10** විනි 9:20; විනි 9:45; විනි 9:49; යෙසා 13:11
**11** ද්වි 11:24; යොෂු 1:4
**12** 2රාජා 14:9; යෙසා 2:13; යෙසා 37:24; එස 31:3; ආමො 2:9; සෙක 11:2
**13** ද්වි 17:15; විනි 9:6; විනි 9:15

**2 තීරුව**
**1** විනි 7:9
**2** එස්ත 4:16; රෝම 16:4
**3** විනි 8:28; ගීතා 83:9
**4** විනි 8:30
**5** විනි 9:5
**6** විනි 8:31
**7** විනි 9:6
**8** හිතෝ 10:28; හිතෝ 29:2
**9** විනි 9:6; විනි 9:45; විනි 9:49
**10** විනි 9:15
**11** ගීතා 28:4
**12** විනි 9:39; විනි 9:53
**13** විනි 9:5
**14** හිතෝ 28:2
**15** 1සාමු 16:14; 1රාජා 12:15
**16** හිතෝ 13:15; යෙසා 33:1; මතෙ 7:2; ගලා 6:7

යට[1] ඔහු වන්දි ගෙවන පිණිසය.[2]
එසේම ඔහු කළ දේට අතහිත දුන්
ශීකෙම්හි වැසියන්ද එයට වන්දි ගෙ-
වන පිණිසය.[3] **25** මඟ තොටේ යන
එන සියලුදෙනාගේ වස්තු කොල්ල
කෑම සඳහා ශීකෙම්හි වැසියෝ කඳු
මුදුන්වල මිනිසුන්ව රැඳෙව්වෝය.
ඔවුන් එසේ කළේ ප්‍රශ්න ඇති කර-
මින් අබිමෙලෙක්ගේ පාලනය අඩපණ
කිරීමේ අරමුණෙනි. පසුව මේ දේවල්
අබිමෙලෙක්ටද ආරංචි විය.

**26** කලක් ගත වූ පසු ඒබෙද්-
ගේ පුත් ගාල්[4] ඔහුගේ සහෝදරයන්
සමඟ ශීකෙම් නුවරට[5] පැමිණියේය.
ටික දවසක් ඇතුළත ශීකෙම්හි වැසි-
යන්ගේ විශ්වාසය දිනාගැනීමට ඔහු
සමත් විය.[6] **27** දිනක් ශීකෙම්හි
වැසියෝ සුපුරුදු පරිදි තම වතුපිටිව-
ලට ගොස් මිදිපල නෙළා, ඒවා මඬින
යන්ත්‍රයක දමා වයින් සෑදුවෝය.
ඉන්පසු උත්සවයක්[7] පැවැත්වූ ඔවුහු
දේවාලයට[8] ගොස් කා බී,[9] අබි-
මෙලෙක්ට ශාප කළෝය.[10] **28** ඒ
අවස්ථාවේදී ඒබෙද්ගේ පුත් ගාල්
මෙසේ පැවසීය. "කවුද මේ අබිමෙ-
ලෙක් කියන්නේ?[11] ශීකෙම්හි අධි-
පතියා හැටියට ඔහු පත් කරපු
ෂෙබුල්ව[12] අපි මොකටද ගණන් ගන්-
නේ? අබිමෙලෙක් කියන්නේ අර යෙ-
රුබ්බාල්ගේ[13] පුතෙක් නේද? ඔය
කියන අධිපති ෂෙබුල් වැඩකට ඇති
කෙනෙක්ද! අපි ශීකෙම් නුවර පිහි-
ටෙවූ හාමෝර්ගේ පුතුන්ට[14] සේවය
කරමු. අපි මොකටද අබිමෙලෙක්ට
යටත් වෙලා ඉන්නේ! **29** ඔබ සිය-
ලුදෙනා මට සහයෝගය දෙනවා
නම්[15] මම අනිවාර්යයෙන්ම අබි-
මෙලෙක්ව බලයෙන් පහ කරනවා."
ඉන්පසු ගාල් පණිවිඩයක් යවා අබි-
මෙලෙක්ට මෙසේ දැන්වීය. "ඔබ හමු-
දාවක් සූදානම් කරගෙන අපිත් එක්ක
සටනට එන්න."[16]

**30** ඒබෙද්ගේ පුත් ගාල්[17] පැවසූ දේ
නුවරේ අධිපතියා වූ ෂෙබුල්ට ආරංචි
වූ විට ඔහු කෝපයෙන් පුපුරන්නට
විය. **31** ඔහු රහසින් පණිවිඩකරු-
වන්ව යවා අබිමෙලෙක්ට මේ දේ
දැන්වීය. "ඒබෙද්ගේ පුත් ගාල් සහ
ඔහුගේ සහෝදරයන් දැන් ශීකෙම්
නුවරට[1] ඇවිත් සිටිනවා. ඔවුන් නුව-
රේ මිනිසුන්ව ඔබට විරුද්ධව උසි-
ගන්වනවා. **32** ඒ නිසා ඔබ හමුදාව
සමඟ රාත්‍රියේම[2] ඇවිත් තණබිමේ
සැඟවී සිටින්න.[3] **33** ඊළඟ දවසේ
එළිය වැටෙද්දීම ඔබයි ඔබේ හමුදා-
වයි නුවරට කඩාවදින්න. ගාල් ඔහු-
ගේ සේනාවත් සමඟ ඔබට විරුද්ධව
සටනට එද්දී පුළුවන් හැම උපායක්ම
යොදලා කොහොමහරි ඔවුන්ව පරා-
ජය කරන්න."

**34** එහෙයින් අබිමෙලෙක් රාත්‍රි-
යේදී පිරිසක් සමඟ ශීකෙම් නුවර අස-
ලට ගියේය. කණ්ඩායම් හතරකට
බෙදී සිටි ඔහුගේ පිරිස තණබිමේ
සැඟවී සිටියෝය. **35** මේ අතරතුර
ඒබෙද්ගේ පුත් ගාල්,[4] නුවරේ දොර-
ටුව අසලට වී සෝදිසියෙන් සිටි-
යේය. එවිට අබිමෙලෙක් සහ ඔහුගේ
පිරිස තමන් සැඟවී සිටි ස්ථානවලින්
එළියට ඇවිත් නුවර දෙසට ගමන්
කරන්න පටන්ගත්තෝය. **36** පැමි-
ණෙන පිරිස දුටු ගාල්, "අර බලන්න!
කඳු මුදුන්වලින් මිනිසුන් පිරිසක්
බැස එනවා" කියා ෂෙබුල්ට පැවසීය.
එහෙත් ෂෙබුල්, "ඔබට ඔය පෙනෙන්-
නේ මිනිසුන් නෙවෙයි. ඔබ රැවටී
සිටින්නේ කඳුවල සෙවණැල්ලටයි"[5]
කියා පිළිතුරු දුන්නේය.

**37** පසුව ගාල් නැවත වරක්, "අර
බලන්න! මිනිසුන් පිරිසක් දේශය මැද
තිබෙන කන්දෙන් බැහැගෙන එනවා.
එක පිරිසක් එන්නේ මෙයොනෙනිම්-
ගේ* විශාල ගස පැත්තෙන්" කියා
පැවසීය. **38** එවිට ෂෙබුල් ඔහුට
මෙසේ පැවසීය. "ඔබ දවසක්, 'කවුද
මේ අබිමෙලෙක් කියන්නේ? අපි
මොකටද ඔහුට සේවය කරන්නේ'[6]
කියලා කිව්වා මතකද?[7] ඔය එන්-
නේ ඔබ එදා හෙළාදුටු ඒ තැනැත්-
තායි ඔහුගේ හමුදාවයි.[8] පුළුවන්

විනි **9:37*** තේරුම, "ශාස්ත්‍ර කියන්නන්."

**9 පරි.**

**1** උත් 9:6, ගණන් 35:16, විනි 9:5, 1රාජ 2:32, ගීතා 7:16, මතෙ 23:35
**2** ද්වි 32:35, 1සාමු 15:33, එස්ත 9:25
**3** නික් 23:7, විනි 9:3
**4** විනි 9:28, විනි 9:41
**5** උත් 33:18, උත් 35:4, යොෂු 21:21, යොෂු 24:1, විනි 9:1
**6** ගීතා 146:3
**7** යෙසා 16:10, යෙරෙ 25:30, යෙරෙ 48:33
**8** විනි 8:33, විනි 9:4, විනි 9:46
**9** නික් 32:6, දානි 5:4, ආමො 2:8
**10** 1සාමු 17:43, 2සාමු 16:5, ගීතා 4:4, ගීතා 39:1
**11** 1සාමු 25:10, 2සාමු 20:1, 1රාජ 12:16
**12** විනි 9:41
**13** විනි 6:32, 1සාමු 12:11
**14** උත් 34:2
**15** 2සාමු 15:4, ගීතා 10:3, රෝම 1:30
**16** හිතෝ 30:33
**17** විනි 9:26

**2 තීරුව**

**1** යොෂු 21:21, යොෂු 24:1, විනි 8:31
**2** යෝබ් 24:14
**3** යොෂු 8:4
**4** විනි 9:26
**5** විනි 9:32
**6** විනි 9:28
**7** ගීතා 94:4, හිතෝ 21:24, යාකො 3:5
**8** විනි 9:29

නම් ගිහින් ඔවුන්ට විරුද්ධව සටන් කරන්න.”

**39** ගාල්, ෂීකෙම්හි වැසියන් සමඟ ගොස් අබිමෙලෙක්ට විරුද්ධව සටන් කළේය. **40** නමුත් අබිමෙලෙක් ඔහුට පහර දෙන්න උත්සාහ කළ නිසා ඔහුට පලා යෑමට සිදු විය. ඒ සටනේදී කොතරම් පිරිසක් මිය ගියාද කිවහොත් නුවරේ දොරටුව දක්වාම බොහෝදෙනෙකුගේ මළ කඳන් වැටී තිබිණ.

**41** ගාල්[1] සහ ඔහුගේ සහෝදරයන්ව ෂීකෙම් නුවරින්[2] ෂෙබුල්[3] පන්නා දැමුවේය. මේ අතර අබිමෙලෙක් අරුමා නම් නුවරට ගියේය. **42** ඊළඟ දිනයේදී ෂීකෙම්හි වැසියන් නුවර අවට පිහිටි තණබිම්වලට පැමිණි බව අබිමෙලෙක්ට[4] ආරංචි විය. **43** ඔහු තමා සමඟ සිටි පිරිස කණ්ඩායම් තුනකට බෙදා[5] ඔවුන් සමඟ පැමිණ තණබිමේ සැඟවී සිටියේය. එසේ සැඟවී සිටි අබිමෙලෙක් සහ ඔහුගේ පිරිස නුවරින් පිට වී කෙත්වතු බලා යන මිනිසුන්ට පහර දී ඔවුන්ව මැරුවෝය. **44** අබිමෙලෙක් සහ ඔහු සමඟ සිටි කණ්ඩායම නුවරේ දොරටු අසලට කඩාපැන්නෝය. ඒ අතරතුර අනික් කණ්ඩායම් දෙක තණබිමේ සිටි අයට පහර දී ඔවුන්ව මරා දැමුවෝය.[6] **45** මුළු දවස පුරාම සටන් කළ අබිමෙලෙක් අවසානයේදී නුවර අල්ලාගෙන නුවරේ සිටි සියලුදෙනාවම මරා දැමුවේය.[7] ඉන්පසු ඔහු එය සුනුවිසුනු කර[8] සෑම තැනකම ලුණු[9] ඉසුවේය.

**46** සිදු වූ දේ ෂීකෙම් බලකොටුවේ වැසියන්ට ආරංචි වූ විට ඔවුහු ඉක්මනින්ම එල්-බේරිත් දේවාලයට[10] යාබදව පිහිටි උමඟට ගොස් සැඟවුණෝය. **47** නමුත් ඔවුන් එම උමඟෙහි සැඟවී සිටින බව අබිමෙලෙක්ට ආරංචි විය. **48** එවිට අබිමෙලෙක් තමා සමඟ සිටි පිරිස සමඟ ෂල්මොන් කන්දට[11] නැඟ ගියේය. අබිමෙලෙක් පොරවක් ගෙන ගසක් ළඟට ගොස් එහි අත්තක් කපා එය තම කර මත තබාගෙන තමා සමඟ සිටි අයට මෙසේ කීවේය. “ඉක්මන් කර මම කළ දේම ඔබත් කරන්න.”[1] **49** සියලුදෙනාම එක් අත්තක් බැගින් කපාගෙන එය කර පිට තබාගනිමින් අබිමෙලෙක් පසුපස ගියෝය. ඔවුන් උමඟ අසලට පැමිණි විට සියලුදෙනා තමන් රැගෙන ආ අතු උමඟට ඇතුල් වන ස්ථානයේ දමා ඒවාට ගිනි තැබුවෝය. ඒ නිසා එහි සැඟවී සිටි ෂීකෙම් බලකොටුවේ සියලුම වැසියෝ එනම්, පුරුෂයෝ හා ස්ත්‍රීහු දහසක් පමණ මරණයට පත් වූහ.[2]

**50** ඊළඟට තේබේෂ් නුවරට[3] විරුද්ධව සටනට ගිය අබිමෙලෙක් එය අල්ලාගත්තේය. **51** තේබේෂ් නුවර මැද ආරක්ෂිත බලකොටුවක් තිබූ නිසා නුවරේ සියලුදෙනා එය වෙතට පලා ගියෝය. ඔවුහු එහි දොරටු වසාගෙන එහි මුදුනටම වී සිටියෝය. **52** අබිමෙලෙක් බලකොටුව වෙත ගොස් එහි සිටි වැසියන්ට විරුද්ධව සටන් කරමින් එයට ගිනි තැබීම සඳහා[4] එහි දොරටුව අසලට ගියේය. **53** බලකොටුවේ මුදුනේ සිටි එක්තරා ස්ත්‍රියක් එය දැක ඇඹරුම් ගලක් ගෙන එය අබිමෙලෙක්ගේ හිසට අතහැරියාය. එය වැදී ඔහුගේ හිස්කබල බිඳී ගියේය.[5] **54** ඔහු තම ආයුධ දරන්නාව වහා කැඳවා, “‘මොහු ස්ත්‍රියක් අතින් මැරුම් කෑවා’ කියා මිනිසුන් මා ගැන කියනවාට මම කැමති නැහැ. ඒ නිසා ඔබේ කඩුවෙන් මාව මරා දමන්න.”[6] ඔහුගේ වචනයට කීකරු වූ සේවකයා ඔහුට කඩුවෙන් ඇන ඔහුව මරා දැමීය.[7]

**55** අබිමෙලෙක් මිය ගිය බව ඊශ්‍රායෙල්වරුන්ට ආරංචි වූ විට ඔවුහු තම නිවෙස් බලා ගියෝය. **56** මෙසේ අබිමෙලෙක් තම සහෝදරයන් හැත්තෑදෙනාව මරණයට පත් කිරීමෙන් තම පියාට විරුද්ධව කළ මහා අපරාධයට වන්දි ගෙවීය. එසේ වීමට සැලැස්වූයේ දෙවිය.[8] **57** ෂීකෙම්හි වැසියෝද තමන් කළ අපරාධයට

**9 පරි.**

1 විනි 9:26
2 උත් 35:4 යොෂු 21:21 යොෂු 24:1
3 විනි 9:30
4 විනි 8:31 විනි 9:1 විනි 9:6
5 හිතෝ 20:18
6 විනි 9:15
7 විනි 9:20
8 1රාජා 12:25
9 ද්වි 29:23 යෝබ 39:6 ගීතා 107:34 යෙරෙ 17:6
10 විනි 8:33 විනි 9:4 විනි 9:27
11 ගීතා 68:14

**2 තීරුව**

1 විනි 7:17
2 විනි 9:15 විනි 9:20
3 2සාමු 11:21
4 විනි 9:48 විනි 9:49
5 විනි 4:9 විනි 5:26 2සාමු 11:21 2සාමු 20:22 යෝබ 31:3
6 1සාමු 31:4
7 ගීතා 37:2
8 උත් 9:6 විනි 9:5 විනි 9:24 1සාමු 25:39 ගීතා 58:10 ගීතා 94:23 හිතෝ 5:22 ගලා 6:7

වන්දි ගෙවූහ. මෙසේ යෙරුබ්බාල්ගේ[1]
පුත් යෝතම්[2] ඔවුන්ට කළ ශාපය[3]
ඔවුන් පිටට පැමිණියේය.[4] එසේ වීමට
සැලැස්වූයේ දෙවිය.

**10** අබිමෙලෙක්ගේ මරණයෙන්
පසු දෝදෝගේ පුත්‍රයෙකු වූ
පුවාගේ පුත් තෝලා, ඊශ්‍රායෙල්ව-
රුන්ට සේවය කිරීම සඳහා විනිශ්ච-
යකරුවෙකු ලෙස පත් විය.[5] ඔහු
ඉසකාර් ගෝත්‍රයේ කෙනෙකි. ඔහු
ජීවත් වූයේ එෆ්‍රායිම් කඳුකරයේ[6]
ෂාමීර් නම් ස්ථානයෙහිය. **2** ඔහු
ඊශ්‍රායෙල් දේශයේ අවුරුදු විසිතුනක්
පුරා විනිශ්චයකරුවෙකු ලෙස සේවය
කළේය. ඔහු මිය ගිය විට ඔහුව
තැන්පත් කරන ලද්දේ ෂාමීර් නම්
ස්ථානයෙහිය.

**3** ඉන්පසු ඊශ්‍රායෙල්හි විනිශ්චය-
කරුවෙකු ලෙස පත් වූයේ ගිලි-
යද් දේශයේ වැසියෙකු වූ[7] යායීර්ය.
ඔහු අවුරුදු විසිදෙකක් පුරා විනිශ්ච-
යකරුවෙකු ලෙස සේවය කළේය.
**4** ඔහුට පුතුන් තිස්දෙනෙක් සිටි-
යෝය. හොඳින් වැඩුණු බූරුවන්[8]
තිස්දෙනෙකු පිට ගමන් කළ ඔවුහු
නුවරවල් තිහක් පාලනය කළෝය.
ගිලියද් දේශයේ තිබූ මෙම නුවරවල්
තිහම ඔවුහු හව්වෝත්-යායීර්[9] යන
නමින් හැඳින්වූහ. අද දක්වාම ඒ
නුවරවල් හඳුන්වන්නේ ඒ නමින්ය.
**5** යායීර් මිය ගිය විට ඔහුව තැන්පත්
කරන ලද්දේ කාමොන් නම් ස්ථාන-
යෙහිය.

**6** ඔහුගේ මරණයෙන් පසු ඊශ්‍රා-
යෙල්වරු නැවතත් යෙහෝවා
දෙවි පිළිකුල් කරන දේවල් කිරී-
මට පටන්ගත්තෝය.[10] ඔවුහු බාල්
දෙවිවරුන්ටත්[11] අෂ්ටොරෙත්[12] දෙ-
වඟනගේ රූපවලටත් සිරියාවේ දෙ-
විවරුන්ටත්[13] සීදොන් වැසියන්ගේ
දෙවිවරුන්ටත්[14] මෝවබ්වරුන්ගේද[15]
අම්මොන්වරුන්ගේද[16] පිලිස්තිවරුන්-
ගේද[17] දෙවිවරුන්ටත් වැඳුම්පිදුම්
කිරීමට පටන්ගත්තෝය. මෙසේ යෙ-
හෝවා දෙවිට නමස්කාර කිරීම අත්-
හැර දැමූ ඔවුහු දෙවිගෙන් ඈත් වූහ.[18]

**7** ඔවුන් කළ මේ දේවල් නිසා බො-
හෝ සෙයින් උදහස් වූ යෙහෝවා
දෙවි[1] ඔවුන්ව පිලිස්තිවරුන්ගේ[2] හා
අම්මොන්වරුන්ගේ[3] අතට හසු වීමට
ඉඩහැරියේය.[4] **8** ඔවුහු ඊශ්‍රායෙල්
සෙනඟට අවුරුදු දහඅටක් පුරා දරුණු
ලෙස හිරිහැර කළෝය. යොර්දාන්
ගඟෙන් එගොඩ අමෝරිවරුන්ගේ දේ-
ශයේ එනම්, ගිලියද් දේශයේ විසූ සිය-
ලුම ඊශ්‍රායෙල්වරු ඔවුන්ගේ කුරිරු
පාලනය නිසා බොහෝ සේ හිංසා පීඩා
වින්දෝය. **9** එපමණක්ද නොව අම්-
මොන්වරු යොර්දාන් ගඟෙන් මෙගො-
ඩට ඇවිත් එහි සිටි යූදා, බෙන්ජමින්
සහ එෆ්‍රායිම් යන ගෝත්‍රවලට විරුද්-
ධව සටන් කළෝය. මෙසේ ඔවුහු
ඊශ්‍රායෙල් දේශයේ සිටි සියලුදෙනා-
ටම බොහෝ සේ හිරිහැර කළෝය.[5]
**10** එවිට ඊශ්‍රායෙල්වරු යෙහෝවා දෙ-
විගේ පිහිට පතමින්[6] දෙවිට මෙසේ
පැවසූහ. “දෙවියනි, අපි ඔබව අත්-
හැර බාල් දෙවිවරුන්ට පුදපූජා ඔප්පු
කළා.[7] එය අප අතින් සිදු වූ බරපතළ
පාපයක්.”[8]

**11** පසුව යෙහෝවා දෙවි ඊශ්‍රා-
යෙල්වරුන්ට මෙසේ පැවසීය. “මම
ඔබව ඊජිප්තුවරුන් අතින්ද[9] අමෝ-
රිවරුන්,[10] අම්මොන්වරුන්[11] හා
පිලිස්තිවරුන් අතින්ද[12] **12** සීදොන්-
වරුන්,[13] අමලෙක්වරුන්[14] හා මිදියන්-
වරුන් අතින්ද[15] ගලවාගත්තේ නැද්ද?
ඔවුන් ඔබට හිංසා පීඩා කළ විට[16]
මම ඔබේ මොරගැසීම්වලට ඇහුම්-
කන් දී ඔබව ඔවුන්ගෙන් බේරා-
ගත් ආකාරය ඔබට මතක නැද්ද?
**13** නමුත් ඔබ මාව අත්හැර[17] වෙ-
නත් දෙවිවරුන්ට නමස්කාර කළ-
හුය.[18] එමනිසා මම නැවත වරක් ඔබේ
සතුරන්ගෙන් ඔබව ගලවා නොගන්-
නෙමි.[19] **14** ඔබ නමස්කාර කරන
ඔබේ දෙවිවරුන්[20] වෙනටම දැන්
යන්න. ඔවුන්ගෙන් පිහිට පතන්න.[21]

**13** විනි 3:3; විනි 5:19; **14** විනි 6:3; **15** විනි 6:1; **16** ගීතා 106:42; **17** ද්වි 32:15; 2ලේක 15:2; **18** විනි 2:12; **19** විලා 3:44; මීකා 3:4; **20** ද්වි 32:37; 1රාජා 18:27; යෙරෙ 2:28; **21** ගීතා 115:6; යෙසා 45:20; යෙසා 46:7.

**9 පරි.**
1 විනි 6:32, විනි 7:1, විනි 8:35
2 විනි 9:7
3 විනි 9:20
4 විනි 9:45

**10 පරි.**
5 විනි 2:16
6 යොෂු 17:15
7 උත් 31:48, ගණන් 32:29
8 විනි 5:10, විනි 12:14
9 ද්වි 3:14
10 ද්වි 28:15, විනි 2:11, විනි 2:19, විනි 4:1, විනි 6:1, නෙහෙ 9:28
11 විනි 3:7, ගීතා 106:36, ගීතා 106:38
12 ද්වි 27:15, විනි 2:13, 1සාමු 7:3
13 විනි 2:12, 2ලේක 28:23
14 1රාජා 11:33, 1රාජා 16:31
15 ගණන් 25:2, රූත් 1:15, 2රාජා 23:13
16 1රාජා 11:5
17 විනි 16:23, 1සාමු 5:4, 2රාජා 1:2
18 ද්වි 32:18, 2ලේක 15:2

**2 තීරුව**
1 ලෙවී 26:18, ද්වි 31:17, විනි 2:14
2 1සාමු 12:9
3 ගණන් 33:56, විනි 3:13
4 ද්වි 28:48, විනි 4:2, ගීතා 44:12
5 ද්වි 28:25, 2ලේක 15:6
6 ද්වි 4:30, විනි 2:18, ගීතා 106:44, ගීතා 107:13
7 විනි 2:13, විනි 3:7
8 1සාමු 12:10
9 නික් 14:30, 1සාමු 12:8, ගීතා 78:51, හෙබ්‍රෙ 11:29
10 ගණන් 21:25, ගීතා 135:11
11 විනි 3:13
12 විනි 3:31

ඔබ දැන් අද්දකින මේ හිංසා පීඩාවලින්
ඔබව ගලවාගන්න කියා ඔවුන්ටම
පවසන්න.” **15** නමුත් ඊශ්‍රායෙල්වරු
යෙහෝවා දෙවිට මෙසේ පැවසූහ. “දෙ-
වියනි, අප කළේ බරපතළ පාපයක්.[1]
ඒ නිසා ඔබ කැමති විදිහට අපට දඬු-
වම් කරන්න.[2] ඒත් අප ඔබෙන් ඉතා
බැගෑපත්ව ඉල්ලා සිටින්නේ මේ අවස්-
ථාවේදී අපේ සතුරන්ගෙන් අපව ගල-
වාගන්න කියලයි.”[3] **16** එසේ පැවසූ
ඊශ්‍රායෙල්වරු තමන් පුදපූජා ඔප්පු
කරමින් සිටි සියලුම බොරු දෙවිව-
රුන්ව ඉවත් කර,[4] යෙහෝවා දෙවිට
නමස්කාර කරන්න පටන්ගත්තෝය.[5]
ඔවුන් කළ ඒ දේ දෙවි දුටුවේය. ඔහුට
තවදුරටත් ඊශ්‍රායෙල්වරුන් අද්දකිමින්
සිටි ඒ මහත් වේදනාව බලා සිටීමට
නොහැකි විය.[6]

**17** කල් යත්ම අම්මොන්වරු[7]
ගිලියද් දේශයට[8] විරුද්ධව යුද්ධ
කිරීම සඳහා එහි ගොස් කඳවුරු බැඳ-
ගත්තෝය. එහෙයින් ඊශ්‍රායෙල්වරුද
යුද්ධ කිරීම සඳහා මිෂ්පාහි[9] කඳවුරු
බැඳගත්තෝය. **18** ඒ අවස්ථාවේදී
ගිලියද්හි වැසියන් හා එහි අධිප-
තීන් අතරේ සාකච්ඡාවක් ඇති විය.
ඔවුහු මෙසේ කතා වූහ. “අම්මොන්ව-
රුන්ට විරුද්ධව යුද්ධයට යද්දී අපේ
නායකයා හැටියට අපි කාව හරි
පත් කරගන්න ඕනේ.[10] ඒ නිසා
ඊට සුදුසු කෙනෙක්ව ගිලියද්හි වැසි-
යන්ගේ ප්‍රධානියා හැටියට අපි පත්
කරමු.”[11]

**11** යෙප්තා[12] නම් ඉතා එඩිතර
බලසම්පන්න පුරුෂයෙක්[13]
සිටියේය. ඔහු ගිලියද්හි වැසියෙකි.[14]
ඔහුගේ මව ගණිකාවකි.[15] ඔහුගේ
පියාගේ නම ගිලියද්ය. **2** ගිලියද්-
ගේ භාර්යාව* ගිලියද්ට ආව පුතුන්
කිහිපදෙනෙකුව බිහි කළාය. එම
පුතුන් ලොකු මහත් වූ විට ඔවුහු
යෙප්තාට මෙසේ පැවසූහ. “ඔබ වෙ-
නත් ස්ත්‍රියකගේ පුතෙක්. ඒ නිසා
අපේ පියාගෙන් ඔබට කිසිම උරු-
මයක් ලැබෙන්නේ නැහැ.”[1] ඔවුහු
එසේ පවසා ඔහුව ගෙදරින් පන්නා
දැමූහ. **3** තම සහෝදරයන් නිසා
පලා ගිය යෙප්තා, ටෝබ් නම් දේශ-
යෙහි[2] වාසය කිරීමට පටන්ගත්තේය.
ආදායම් මාර්ගය අහිමි වූ කිහිපදෙ-
නෙක් ඒ කාලය අතරතුර යෙප්-
තාට එකතු වූහ.[3] ඔවුහු කණ්ඩායමක්
ලෙස සංවිධානය වී සතුරන්ට ප්‍රහාර
එල්ල කළෝය.

**4** කලක් ගත වූ පසු අම්මොන්-
වරු ඊශ්‍රායෙල්වරුන්ට විරුද්ධව
සටනට ආවෝය.[4] **5** ඔවුන් එසේ
සටනට පැමිණි වහාම[5] ගිලියද් දේ-
ශයෙහි වැඩිමහල්ලෝ ටෝබ් දේ-
ශයට ගොස්[6] එහි සිටි යෙප්තාව
මුණගැසුණෝය. **6** ඔවුහු යෙප්තාට
මෙසේ පැවසූහ. “ඔබ කැමතිද අපේ
හමුදාපති වෙන්න? එතකොට අපිට
පුළුවන් අම්මොන්වරුන්ට විරුද්ධව
සටන් කරන්න.” **7** එහෙත් යෙප්තා
ඔවුන්ට[7] මෙසේ පිළිතුරු දුන්නේය.
“ඔබම නේද මට වෛර කරලා
මගේ පියාගේ නිවසෙන් මාව
පන්නා දැමුවේ?[8] ඔබ දැන් කරදරේක
වැටිලා ඉන්න නිසා මා ළඟට ඇවිත්
උදව් ඉල්ලනවා.”[9] **8** එවිට ගිලි-
යද්හි වැඩිමහල්ලෝ යෙප්තාට මෙසේ
පැවසූහ. “අප අතින් වරදක් සිදු වුණා
කියා අපි පිළිගන්නවා.[10] ඒකයි අපි
ඔබ ළඟට ආවේ. ඉතින් දැන් අපිට
එකතු වෙන්න. අපි අම්මොන්වරුන්ට
විරුද්ධව සටන් කරමු. අපි කැමතියි
ඔබව ගිලියද් දේශයේ වැසියන්ගේ
ප්‍රධානියා හැටියට පත් කරන්න.”[11]
**9** එහෙයින් යෙප්තා මෙසේ පැවසු-
වේය. “ඔබ මට එන්න කියන්නේ
අම්මොන්වරුන්ට විරුද්ධව සටන්
කරන්න නිසා මම ඔබ සමඟ එන්-
නම්. මේ සටනේදී යෙහෝවා දෙවි
මට ජය අත් කර දුන්නොත්[12] මම
ඔබේ දේශයේ ප්‍රධානියා හැටියට සේ-
වය කරන්නම්.” **10** ගිලියද්හි වැඩි-
මහල්ලෝ යෙප්තාට මෙසේ පැවසූහ.
“ඔබ පැවසූ සෑම දෙයක්ම ඒ විදිහටම

**විනි 11:2*** බොහෝදුරට ඇය ගිලියද්ගේ තවත් භාර්යාවක් විය හැකියි.

**10 පරි.**
1 1රාජා 8:46, යෙරෙ 3:25
2 1සාමු 3:18, 1සාමු 12:10, 2සාමු 15:26
3 ද්වි 4:29, විනි 10:8
4 ද්වි 7:26, 2ලේක 7:14, 2ලේක 15:8, 2ලේක 33:15
5 නික් 20:2, යෙරෙ 18:8
6 2ලේක 33:13, ගීතා 106:44, යෙසා 63:9, යෙරෙ 31:20
7 උත් 19:38, විනි 3:13, විනි 10:7
8 උත් 31:21, ගණන් 32:29
9 විනි 11:29
10 විනි 11:1
11 විනි 11:11, විනි 12:7

**11 පරි.**
12 1සාමු 12:11, හෙබ්‍රෙ 11:32
13 විනි 6:12, 2රාජා 5:1
14 විනි 12:7
15 යොෂු 2:1, 1කොරි 6:11

**2 තීරුව**
1 උත් 21:10, ද්වි 21:15
2 විනි 11:5
3 1සාමු 22:2
4 විනි 10:17
5 විනි 10:9
6 විනි 11:3
7 යොෂු 20:4, විනි 8:14
8 උත් 26:27, ද්වි 21:17, විනි 11:2
9 හිතෝ 17:17
10 ලූක් 17:4
11 විනි 10:18
12 ද්වි 7:23, ගීතා 44:3, හිතෝ 3:6

ඉටු කරනවා කියා අපි යෙහෝවා
දෙවි ඉදිරියේ[1] පොරොන්දු වෙනවා.”[2]
**11** එහෙයින් යෙප්තා ගිලියද්හි වැඩි-
මහල්ලන් සමඟ පිටත්ව ගියේය.
ජනතාව ඔහුව ඔවුන්ගේ ප්‍රධානියා
හා හමුදාපති ලෙස පත් කළෝය.[3]
යෙප්තා වැඩිමහල්ලන් සමඟ මිෂ්පා[4]
වෙතට ගොස් ඔවුන් ඇති කරගත්
ගිවිසුම යෙහෝවා දෙවි ඉදිරියෙහි[5]
ස්ථිර කරගත්තේය.

**12** ඉන්පසු යෙප්තා පණිවිඩකරු-
වන්ව යවා අම්මොන්වරුන්ගේ[6] රජුට
මෙසේ දැන්විය. “ඔබ මගේ දේශයට
ඇවිත් අපට විරුද්ධව සටනට සූදා-
නම් වී සිටින්නේ කුමන හේතුවක්
නිසාද?”[7] **13** ඊට පිළිතුරු වශයෙන්
අම්මොන්වරුන්ගේ රජ යෙප්තාට
මෙසේ දන්වා එවීය. “ඊශ්‍රායෙල්වරුන්
ඊජිප්තුවෙන් නිදහස් වී පැමිණි විට
ඔවුන් මගේ දේශය එනම්, ආනොන්
ඔයේ[8] සිට යබ්බොක් ඔය දක්වා
යොර්දාන් ගඟට[9] එගොඩින් පිහිටි මුළු
දේශය පැහැරගත්තා.[10] ඒ නිසයි මම
ඔබට විරුද්ධව යුද්ධයට සැරසෙන්-
නේ. ඔබේ සෙනඟ අයිති කරගත්
ඒ දේශය නැවත අපට සමාදා-
නයෙන් භාර දෙන්න කියා මම
ඔබෙන් ඉල්ලා සිටිනවා.” **14** එවිට
අම්මොන්වරුන්ගේ රජු වෙතට
යෙප්තා නවත් පණිවිඩකරුවන්ව
යවා **15** ඔහුට මෙසේ දැන්වීය.

“යෙප්තා පවසන මේ දේට සවන්
දෙන්න. ‘ඊශ්‍රායෙල්වරුන් මෝවබ්
දේශයත්[11] අම්මොන්වරුන්ගේ දේශ-
යත්[12] පැහැරගත් බව ඔබ පවසනවා.
නමුත් ඒ කතාව වැරදියි. **16** ඔවුන්
ඊජිප්තුවෙන් නිදහස ලබා පැමි-
ණෙන විට රතු මුහුද[13] දක්වා විහිදී
යන පාළුකරය පුරා ගමන් කර ඔවුන්
කාදේෂ්[14] වෙතට ආවා. **17** ඉන්පසු
ඊශ්‍රායෙල්වරුන් ඒදොම්හි[15] රජු වෙ-
තට පණිවිඩකරුවන්ව යවා, “ඔබේ
දේශය මැදින් ගමන් කරන්න අපට
අවසර දෙන්න” කියා ඉල්ලා සිටියා.
ඒත් ඒදොම්හි රජ ඔවුන්ට අවසර දුන්-
නේ නැහැ. ඔවුන් මෝවබ්හි[16] රජු-
ගෙන්ද අවසර ඉල්ලුවත් ඔහුත් ඊට
එකඟ වුණේ නැහැ. ඒ නිසා ඊශ්‍රා-
යෙල්වරුන් දිගටම කාදේෂ්හි[1] රැඳී
සිටියා. **18** ඉන්පසු ඔවුන් ඒදොම්
දේශ සීමාවටත්[2] මෝවබ් දේශයේ[3]
නැඟෙනහිර දේශ සීමාවටත් එපිටින්
බොහෝ දුරක් පාළුකරයේ ගමන් කර
ආනොන් ඔය ළඟට ඇවිත් ඒ අවට
කඳවුරු බැඳගත්තා. මෝවබ් දේශයේ
මායිම[4] වූ ආනොන් ඔය[5] පසු කර
ඔවුන් කිසි දවසක මෝවබ් දේශයට
නම් ඇතුල් වුණේ නැහැ.

**19** “ ‘ඉන්පසු ඊශ්‍රායෙල්වරුන්,
හෙෂ්බොන් නුවරේ සිට අමෝරිව-
රුන්ව පාලනය කළ සීහොන් රජුට[6]
පණිවිඩකරුවන්ව යවා, “ඔබේ දේශය
මැදින් ගමන් කර අපේ දේශයට
යන්න අපට අවසර දෙන්න පුළු-
වන්ද”[7] කියා ඔහුගෙන් ඉල්ලා සිටියා.
**20** ඊශ්‍රායෙල්වරුන්ට තමාගේ දේශය
මැදින් ගමන් කිරීමට ඉඩ දීම අවදා-
නම් සහිත දෙයක් කියා සිතූ සීහොන්,
තමාගේ ජනතාව එක් රැස් කරවා
යහෂ්හි[8] කඳවුරු බැඳගෙන ඊශ්‍රා-
යෙල්වරුන්ට විරුද්ධව සටන් කළා.[9]
**21** ඒ අවස්ථාවේදී යෙහෝවා දෙවි
මැදිහත් වී සීහොන්වත් ඔහුගේ හමු-
දාවත් ඊශ්‍රායෙල්වරුන් අතට හසු
කර දුන්නා. ඔවුන්ට ප්‍රබල ප්‍රහාරයක්
එල්ල කළ ඊශ්‍රායෙල්වරුන් අමෝරිව-
රුන්ට අයිතිව තිබූ මුළු දේශයම
අත් පත් කරගත්තා.[10] **22** ආනොන්
ඔයේ සිට යබ්බොක් ඔය දක්වාද
පාළුකරයේ සිට යොර්දාන් ගඟ දක්-
වාද වූ අමෝරිවරුන්ට අයිතිව තිබූ ඒ
දේශය ඊශ්‍රායෙල්වරුන්ට අයිති වූයේ
එයාකාරයටයි.[11]

**23** “ ‘මේ හැම දෙයක්ම සිදු කළේ
ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝ-
වායි. ඊශ්‍රායෙල් සෙනඟට අමෝරිව-
රුන්ව පලවාහරින්න පුළුවන් වුණේ
ඒ නිසයි.[12] ඒත් ඔබ හදන්නේ
දෙවි අත් කර දුන් ඒ දේශයෙන්
ඊශ්‍රායෙල්වරුන්ව පන්නා දමන්-
නද? **24** කෙමොෂ්[13] නම් ඔබේ දෙ-
වියාගේ පිහිටෙන් ඔබත් ඒ වගේ

**11 පරි.**
1 උත් 31:50; 1සාමු 12:5; යෙරෙ 42:5
2 නික් 20:7; ලෙවී 19:12
3 විනි 11:8
4 විනි 10:17; විනි 11:34
5 ද්වි 6:13
6 උත් 19:38; විනි 10:17
7 යොෂු 22:24; 2සාමු 16:10
8 ගණන් 21:26
9 ද්වි 3:16; ද්වි 3:17
10 ගණන් 21:24; හිතෝ 19:5
11 උත් 19:37; ද්වි 2:9
12 ද්වි 2:19; ද්වි 2:37; 2ලේක 20:10
13 ගණන් 14:25; ද්වි 1:40
14 උත් 16:14; ගණන් 20:1
15 උත් 36:1; ගණන් 20:14; ද්වි 2:4
16 උත් 19:37; ද්වි 2:9

**2 තීරුව**
1 ගණන් 20:22
2 ගණන් 21:4
3 ගණන් 21:11
4 ගණන් 21:13
5 ගණන් 22:36
6 ගණන් 21:21; ද්වි 2:26; යොෂු 13:10
7 ගණන් 21:22; ද්වි 2:27
8 ද්වි 2:32
9 ගණන් 21:23
10 ගණන් 21:24; ද්වි 2:33; යොෂු 13:15; යොෂු 13:21; ගීතා 135:11
11 ද්වි 2:36; යොෂු 12:2
12 ගණන් 21:26; නෙහෙ 9:22
13 ගණන් 21:29; 1රාජා 11:7; යෙරෙ 48:7

දේවල් කරලා ඇති. ඒ විදිහටම
තමයි අපිත් කටයුතු කරන්නේ.
අපේ දෙවි වන යෙහෝවා දෙන
තීරණයට අනුවයි අපිත් යම් දේ-
ශයකට විරුද්ධව සටන් කර එහි
සිටින මිනිසුන්ව පන්නා දමන්නේ.[1]
**25** මෝවබ්හි රජු වූ ශිප්පෝර්ගේ පුත්
බාලාක්[2] ඊශ්‍රායෙල්වරුන්ට විරුද්ධව
කිසිවිටක සටන් කළාද? ඔවුන්ට
විරුද්ධව යුද්ධ කිරීමට පැමිණියාද?
ඉතින් ඔබ හිතන්නේ ඔබ බාලාක්ට
වඩා බලවත් කියාද? **26** ඊශ්‍රායෙල්
සෙනඟ අවුරුදු තුන්සියයක් පුරා
හෙෂ්බොන් නුවර හා ඒ අවට පිහිටි
කුඩා නුවරවලත්[3] අරෝයේර් නුවර[4]
හා ඒ අවට පිහිටි කුඩා නුවර-
වලත් ආනොන් ඔයේ ඉවුර දිගේ
තිබෙන සියලුම නුවරවලත් වාසය
කරමින් සිටි කාලයේදී ඇයි ඔබ
ඔවුන්ව පන්නා දැමුවේ නැත්තේ?[5]
**27** ඉතින් මෙහිදී වරදක් කරන්නේ
අපි නෙවෙයි. වරද ඔබේ අතෙයි.
ඔබයි අපට විරුද්ධව සටන් කරන්-
නේ. ඊශ්‍රායෙල්වරුන් හා අම්මොන්ව-
රුන් අතර තිබෙන මේ ප්‍රශ්නය
නිරාකරණය කරන්නේ ශ්‍රේෂ්ඨ විනිශ්-
චයකරු වන යෙහෝවා දෙවියි.’ ”[6]

**28** එහෙත් යෙප්තා එවූ පණිවිඩ-
යට අම්මොන්වරුන්ගේ රජ ඇහුම්-
කන් දුන්නේ නැත.[7]

**29** එවිට යෙහෝවා දෙවිගේ බලය
යෙප්තා තුළ ක්‍රියාත්මක වීමට පටන්-
ගත්තේය.[8] ඔහු ගිලියද් සහ මනස්සේ
දේශ මැදින් ගොස් ගිලියද් දේශයේ
මිෂ්පේ නම් නුවර[9] හරහා ගමන්
කර අම්මොන්වරුන් අසලටම පැමි-
ණියේය.

**30** ඒ අවස්ථාවේදී යෙප්තා යෙ-
හෝවා දෙවිට පොරොන්දුවක්[10]
වෙමින් මෙසේ පැවසීය. “දෙවියනි,
ඔබ අම්මොන්වරුන්ව මගේ අතට
හසු කර දුන්නොත් **31** යුද්ධයෙන්
ජය ලබාගෙන[11] මම මගේ නිවසට
යන විට මාව හමු වීමට මුලින්ම පැමි-
ණෙන කෙනාව යෙහෝවා දෙවි වන
ඔබට පූජා කරනවා.[12] මම ඒ පූජාව
ඔබට දවන පූජාවක් ලෙස ඔප්පු
කරන බවට පොරොන්දු වෙනවා.”[1]

**32** යෙප්තා අම්මොන්වරුන්ට
විරුද්ධව සටන් කිරීම සඳහා ඔයෙන්
එගොඩ වූ විට යෙහෝවා දෙවි
ඔවුන්ව ඔහුගේ අතට හසු කර දුන්-
නේය. **33** ඔවුහු ඔහු ඉදිරියේ අන්ත
පරාජයකට ලක් වූහ. අරෝයේර් සිට
මින්නිත්[2] දක්වා වූ නුවරවල් විස්සටද
ආබෙල්-කෙරාමීම් නුවරටද ඔහු පහර
දුන් අතර එයින් බොහෝදෙනෙක්
මරුමුවට පත් වූහ. ඊශ්‍රායෙල් සෙනඟ
අම්මොන්වරුන්ව පරාජය කළේ එයා-
කාරයෙනි.

**34** සටනින් ජය ගත් යෙප්තා මිෂ්-
පාහි[3] පිහිටි තම නිවස බලා ගියේය.
තම නිවසට ළඟා වූ විට ඔහු දුටු දේ
ඔහුට අදහාගත නොහැකි විය. රබා-
නක් අතැතිව නටමින්[4] ඔහුව හමු
වීමට පැමිණියේ ඔහුගේම දුවයි. ඒ දුව
හැර ඔහුට තවත් පුතෙක්වත් දුවෙක්-
වත් සිටියේ නැත. ඔහුගේ එකම
දරුවා ඇයයි. **35** ඇයව දුටු ඔහු
තම වස්ත්‍ර ඉරාගනිමින්[5] මෙසේ පැව-
සීය. “අනේ මගේ දුවේ! මට දැනෙන
මේ දුක විස්තර කරන්න මට වචන
නැහැ. මා යෙහෝවා දෙවිට වූ පො-
රොන්දුව නිසා ඔබට ලොකු ප්‍රශ්නය-
කට මුහුණ දෙන්න සිදු වෙනවා. දුවේ,
මම දුන් ඒ පොරොන්දුව කඩ කරන්න
නම් මට කොහොමටවත් බැහැ.”[6]

**36** එහෙත් ඇය ඔහුට මෙසේ පැව-
සුවාය. “තාත්තේ, යෙහෝවා දෙවි
ඔබ වෙනුවෙන් සටන් කර ඔබේ සතු-
රන් වූ අම්මොන්වරුන්ව පරාජය
කරන්න ඔබට උදව් කළා! ඉතින්
ඔබ යෙහෝවා දෙවිට පොරොන්දුවක්
වෙලා තියෙනවා නම් ඒ පොරොන්-
දුව ඉටු කරන්න මම කැමතියි.[7]
**37** නමුත් තාත්තේ මට මාස දෙකක
කාලයක් දෙන්න. මම දන්නවා මට
කවදාවත් විවාහ වෙන්න ලැබෙන්නේ
නැති බව. ඒ නිසා මගේ යෙහෙළියන්
සමඟ කඳුකරයට ගිහින් ඒ ගැන
ශෝක වෙන්න[8] මට කාලයක් දෙ-
නවා නම් මම කැමතියි.”

**11 පරි.**

**1** නික් 23:28, නික් 34:11, ගණන් 33:53, ද්වි 7:16, ද්වි 9:5, ද්වි 18:12, 2ලේක 20:7, ගීතා 44:2
**2** ගණන් 22:2, ද්වි 23:3, යොෂු 24:9
**3** ගණන් 21:25, ද්වි 2:24, ද්වි 3:2, යොෂු 12:2, යොෂු 13:10
**4** ද්වි 2:36, ද්වි 3:12
**5** ගණන් 21:26
**6** උත් 18:25, 1සාමු 24:15, යෙසා 33:22
**7** විනි 11:14
**8** විනි 3:10, සෙක 4:6
**9** විනි 10:17
**10** උත් 28:20, ගණන් 30:2, ද්වි 23:21, 1සාමු 1:11, දේශ 5:4
**11** උත් 28:21, යොෂු 10:21
**12** විනි 13:5, 1සාමු 1:11, 1සාමු 1:22

**2 තීරුව**

**1** ද්වි 18:10, 1සාමු 1:24, 1සාමු 1:28, ගීතා 66:13, යෙරෙ 7:31
**2** එස 27:17
**3** විනි 10:17, විනි 11:11
**4** නික් 15:20, 1සාමු 18:6, ගීතා 68:25
**5** උත් 37:34
**6** ගීතා 15:4, ගීතා 76:11, මතෙ 5:33
**7** විනි 11:30, විනි 11:31, එෆී 6:1, කොලො 3:20
**8** උත් 24:16, උත් 30:23, රූත් 4:14, 1සාමු 1:6

**38** ඔහුද, “ඒ සඳහා ඔබට යන්න
පුළුවන්” කියා ඇයට පැවසීය. ඔහු-
ගෙන් ඒ සඳහා මාස දෙකක කාලයක්
ඇයට ලැබිණ. ඒ කාලයේදී ඇය තම
යෙහෙළියන් සමඟ කඳුකරයේ සැරිස-
රමින්, තමාට විවාහ වීමට නොලැබීම
ගැන දුක් වෙමින් කඳුළු සැලුවාය.
**39** ඒ මාස දෙක අවසන් වූ පසු ඇය
තම පියා වෙතට නැවත පැමිණියාය.
එවිට ඔහු තමා දෙවිට දුන් පො-
රොන්දුව ඉටු කළේය.[1] ඔහු ඇයව
කිසිම පුරුෂයෙකුට විවාහ කර දුන්නේ
නැත. ඇය වෙනුවෙන් ඊශ්‍රායෙල් දේශ-
යේ චාරිත්‍රයක්ද ආරම්භ කරන ලදි.
**40** එය නම් අවුරුද්දකට වතාවක්
ඊශ්‍රායෙල් දේශයේ කාන්තාවන් ගිලියද්
දේශයේ වැසියෙකු වූ යෙප්තාගේ දිය-
ණිය හමු වීමට පැමිණ දවස් හතරක්
පුරා ඇයට ප්‍රශංසා කිරීමේ චාරිත්‍රයයි.[2]

**12** දිනක් එෆ්‍රායිම්හි පුරුෂයෝ
ගඟෙන් එගොඩ වී උතුරු
ප්‍රදේශයට ගමන් කර එහි සිටි යෙප්-
තාව හමු වීමට ගියෝය. ඔවුහු ඔහුට
මෙසේ පැවසූහ. “ඔබ අම්මොන්වරුන්
සමඟ සටන් කරන්න ගඟෙන් එගොඩ
වූ විට අපවත් ඒ සටනට එකතු කර
නොගත්තේ ඇයි?[3] ඒ යුද්ධයට ඔබ
අපව එකතු කර නොගත් නිසා අපි
ඔබවත් ඔබේ නිවසත් ගිනිබත් කර-
නවා.”[4] **2** එවිට යෙප්තා ඔවුන්ට
මෙසේ පැවසීය. “දිගු කාලයක් පුරා
මාත් මගේ සෙනඟත් අම්මොන්වරුන්
සමඟ ලොකු වෛරයකින් සිටියා.[5]
ඔවුන්ට එරෙහිව ක්‍රියා කරන්න මම
ඔබෙන් උපකාර ඉල්ලුවත් ඔබ මට
උපකාර කළේ නැහැ. **3** අපේ උප-
කාරයට කවුරුත් නැති බව අපට
වැටහුණා. ඒ නිසයි මම තීරණය
කළේ මගේ ජීවිතය පරදුවට තියලා[6]
හරි අම්මොන්වරුන්ට විරුද්ධව සටන්
කරන්න.[7] ඒ සටනේදී යෙහෝවා දෙවි
ඔවුන්ව මගේ අතට හසු කර දුන්නා.
ඉතින් දැන් ඇයි ඔබ මාත් එක්ක
රණ්ඩු කරන්න හදන්නේ?”

**4** එවිට යෙප්තා වහාම ගිලියද්හි[8]
සියලුම පුරුෂයන්ව එකතු කරගෙන
එෆ්‍රායිම්හි වැසියන්ට විරුද්ධව සට-
නට ගියේය. එෆ්‍රායිම්වරුන් ගිලි-
යද්හි වැසියන්ව හෙළාදකිමින් මෙසේ
පවසා තිබිණ. “එෆ්‍රායිම්වරුන්ටත්
මනස්සේවරුන්ටත් අයිති දේශයේ
වාසය කරන ගිලියද්හි වැසියෙනි, ඔබ
එෆ්‍රායිම් දේශයෙන් පලා ගිය කිසික-
මකට නැති මිනිස්සු පිරිසක්.” ඒ
හේතුව නිසා ගිලියද්හි පුරුෂයෝ
එෆ්‍රායිම්වරුන්ව මරා දැමූහ. **5** ගිලි-
යද්හි පුරුෂයෝ යොර්දාන් ගඟෙන්
එෆ්‍රායිම් දේශයට එගොඩ වන තැන්
අල්ලාගත්තෝය.[1] පලා යන එෆ්‍රා-
යිම්වරු එම ස්ථානවලට ඇවිත්, “මට
ගඟෙන් එගොඩ වෙන්න ඉඩ දෙන්න”
කියා පැවසූ විට, “ඔබ එෆ්‍රායිම්හි
වැසියෙක්ද” කියා ගිලියද්හි පුරුෂ-
යෝ ඔවුන්ගෙන් ඇසුවෝය. ඔවුන්,
“නැහැ” කියා පිළිතුරු දුන් විට,
**6** “එසේනම් ඔබ ෂිබොලෙත් කියා
පවසන්න”[2] යයි ඔවුන්ට පැවසූහ.
නමුත් ඔවුන් ඒ වචනය පැවසුවේ,
“සිබොලෙත්” ලෙසයි. එවිට ගිලියද්හි
පුරුෂයෝ ගඟෙන් එගොඩ වන ස්ථා-
නයේදීම එවැනි අයව මරා දැමුවෝය.
එසේ එෆ්‍රායිම්හි පුරුෂයන් හතළිස්දෙ-
දහස්දෙනෙකුව මරා දමන ලදි.[3]

**7** ගිලියද්හි වැසියෙකු වූ යෙප්තා
ඊශ්‍රායෙල් දේශයේ විනිශ්චයකරුවෙකු
ලෙස අවුරුදු හයක් සේවය කළේය.
ඔහු මිය ගිය පසු ගිලියද් දේශයේ ඔහු
ජීවත් වූ නුවරේම ඔහුව තැන්පත්
කරන ලදි.

**8** ඔහුට පසුව විනිශ්චයකරුවෙකු[4]
ලෙස සේවය කළේ බෙත්ලෙහෙම්
නුවරින්[5] පැමිණි ඉබ්ෂාන්ය. **9** ඉබ්-
ෂාන්ට පුත්‍රයෝ තිස්දෙනෙක්ද දූවරු
තිස්දෙනෙක්ද සිටියෝය. ඔහු තම
පුතුන් තිස්දෙනා සඳහා ඔවුන්ගේ
නෑයන් නොවූ වෙනත් පවුල්වලින්
භාර්යාවන් තිස්දෙනෙකුව සොයා දුන්-
නේය. ඉබ්ෂාන් ඊශ්‍රායෙල් දේශයේ අවු-
රුදු හතක් පුරා විනිශ්චයකරුවෙකු
ලෙස සේවය කළේය. **10** ඔහු මිය
ගිය විට ඔහුව බෙත්ලෙහෙමේ තැන්-
පත් කරන ලදි.

**11 පරි.**
**1** 1සාමු 1:22
1සාමු 1:24
**2** 1කොරි 7:34
1කොරි 7:37

**12 පරි.**
**3** විනි 8:1
හිතෝ 8:13
හිතෝ 16:18
යාකො 3:16
**4** විනි 14:15
විනි 15:6
2ලේක 25:10
**5** විනි 11:6
විනි 11:9
**6** විනි 9:17
1සාමු 19:5
1සාමු 28:21
2සාමු 23:17
යෝබ් 13:14
ගීතා 119:109
**7** විනි 11:29
**8** ද්වි 3:12
ද්වි 3:13

**2 තීරුව**
**1** යොෂු 2:7
විනි 3:28
විනි 7:24
**2** මතෙ 26:73
**3** හිතෝ 16:5
හිතෝ 17:19
දේශ 10:12
**4** විනි 2:16
**5** යොෂු 19:10
යොෂු 19:15

**11** ඉන්පසු ඊශ්‍රායෙල් දේශයේ
විනිශ්චයකරු ලෙස සෙබුලූන් ගෝ-
ත්‍රයට[1] අයත් ඒලොන් පත් විය. ඔහු
අවුරුදු දහයක් පුරා එහි සේවය
කළේය. **12** ඔහු මිය ගිය විට ඔහුව
තැන්පත් කරන ලද්දේ සෙබුලූන්
ගෝත්‍රයට අයත් දේශයේ පිහිටි ආයා-
ලොන් නම් ස්ථානයෙහිය.

**13** ඔහුගෙන් පසුව පිරතොන් නුව-
රේ වැසියෙකු වූ[2] හිල්ලෙල්ගේ පුත්
අබ්දොන් ඊශ්‍රායෙල් දේශයේ විනිශ්ච-
යකරුවෙකු ලෙස සේවය කළේය.
**14** ඔහුට පුතුන් හතළිස්දෙනෙකු හා
මුනුපුරන් තිස්දෙනෙකු සිටි අතර
ඔවුහු හොඳින් වැඩුණු බූරුවන් හැත්-
තෑදෙනෙකු පිට ගමන් කළෝය.[3]
අබ්දොන් අවුරුදු අටක් පුරා ඊශ්‍රායෙල්
දේශයේ විනිශ්චයකරුවෙකු ලෙස
සේවය කළේය. **15** පිරතොන් නුව-
රේ වැසියෙකු වූ හිල්ලෙල්ගේ පුත්
අබ්දොන් මිය ගිය විට ඔහුව තැන්පත්
කරන ලද්දේ එෆ්‍රායිම් දේශයේ අම-
ලෙක්වරුන්ගේ[4] කන්දේ පිහිටි පිර-
තොන් නුවරෙහිය.

**13** ඊශ්‍රායෙල්වරු නැවතත් යෙ-
හෝවා දෙවි පිළිකුල් කරන
දේවල් කිරීමට පටන්ගත්තෝය.[5]
එහෙයින් යෙහෝවා දෙවි අවුරුදු හත-
ළිහක් පුරා ඔවුන්ව පිලිස්තිවරුන්ගේ
පීඩාකාරී පාලනය යටතේ තැබූ-
වේය.[6]

**2** ඒ කාලයේදී මානෝවා[7] නම්
මිනිසෙක් සිටියේය. දාන් ගෝත්‍රයට[8]
අයත් ඔහු ජීවත් වූයේ ෂෝරා[9] නම්
නුවරෙහිය. ඔහුට භාර්යාවක් සිටි
අතර ඇයට දරුවෝ සිටියේ නැත.[10]
**3** දිනක් යෙහෝවා දෙවිගේ දූත-
යෙක් ඇය ළඟට ඇවිත්[11] මෙසේ
පැවසීය. “ඔබට දරුවන් නැති බව
මම දන්නවා. නමුත් ඔබ ගැබ්ගෙන
පුතෙක් බිහි කරනවා.[12] **4** එමනිසා
ඔබ පරෙස්සම් විය යුතුයි. ඔබ වයින්-
වත් වෙන කිසි මත්පැන් වර්ගයක්වත්
පානය කරන්න එපා.[13] අපවිත්‍රයයි
සැලකෙන කිසිම දෙයක් කන්නත්
එපා.[1] **5** මන්ද ඔබ බිහි කරන පුතා
උපන් දා සිට[2] දෙවිට කැප වී සේ-
වය කරන නසරීතවරයෙක්.[3] එම-
නිසා ඔහුගේ හිසට දැළි පිහියක්
ළං කරන්නවත් එපා.[4] පිලිස්තිවරුන්
යටතේ සිටින ඊශ්‍රායෙල්වරුන්ව බේ-
රාගන්නේ ඔහුයි.”[5]

**6** ඉන්පසු ඒ ස්ත්‍රිය තම පුරුෂයා
වෙතට ගොස් මෙසේ පැවසුවාය.
“සැබෑ දෙවිගේ සේවකයෙක් මාව හමු
වෙන්න ආවා. ඔහු දෙවිගේ දූතයෙක්
වගෙයි.[6] ඔහුව දුටුවාම මට ලොකු
භයක් ඇති වුණා.[7] ඉතින් ඔහු ආවේ
කොහෙන්ද කියාවත් මම ඔහුගෙන්
ඇහුවේ නැහැ. ඔහු ඔහුගේ නමවත්
මට කිව්වේ නැහැ.[8] **7** හැබැයි ඔහු
මට මේ වගේ දෙයක් කිව්වා. ‘ඔබ
ගැබ්ගෙන පුතෙක් බිහි කරනවා.[9] ඒ
දරුවා උපන් දා සිට මිය යන තුරුම
දෙවිට සේවය කරන නසරීතවර-
යෙක්.[10] එමනිසා ඔබ වයින්වත් වෙන
කිසි මත්පැන් වර්ගයක්වත් බොන්න
එපා. අපවිත්‍රයයි සැලකෙන කිසිම
දෙයක් කන්නත් එපා.’ ”

**8** එවිට මානෝවා යෙහෝවා දෙ-
විට කන්නලව් කරමින් මෙසේ පැව-
සීය. “යෙහෝවා දෙවියනි, මෙහෙම
කතා කරනවාට මට සමාවෙන්න.[11]
ඔබ එවූ තැනැත්තා සැබෑ දෙවි
වන ඔබේ සේවකයෙකු විය යුතුයි.
මා ඔබෙන් බැගෑපත්ව ඉල්ලන්නේ
ඔහුව නැවතත් අප වෙතට එවන්න
කියායි. එතකොට අපට පුළුවන් අපට
ලැබෙන්න යන දරුවාව අපි ඇතිදැඩි
කරන්නේ කොහොමද[12] කියලා ඔහු-
ගෙන් මඟ පෙන්වීම් ලබාගන්න.”[13]
**9** සැබෑ දෙවි, මානෝවා කී දේට
ඇහුම්කන් දුන්නේය.[14] මානෝවාගේ
භාර්යාව තණබිමේ සිටින විට දෙවි-
ගේ දූතයා ඇයව හමු වීමට නැව-
තත් පැමිණියේය. ඒ අවස්ථාවේදී
මානෝවා ඇය සමඟ නොසිටි නිසා,
බෙන්ජමින්වරුන් අතින් ඊශ්‍රායෙල්-
වරු තිස්දෙනෙක් පමණ මරුමුවට
පත් වූහ.[4] එය දුටු බෙන්ජමින්-
වරු, “කලින් සටනේදී වගේ අදත්
ඔවුන් අන්ත පරාජයක් අද්දකින්-
නයි යන්නේ”[5] කියා පැවසුවෝය.
**40** මේ අතරතුර නුවරින් දුමක්[6] ඉහ-
ළට නඟින්න පටන්ගත්තේය.[7] බෙන්-
ජමින්වරු ඒ දෙස හැරී බැලූ විට මුළු
නුවරම ගිනිගනිමින් තිබෙන බව
ඔවුහු දුටුවෝය.[8] **41** එවිට ඊශ්‍රා-
යෙල්වරු හැරී බෙන්ජමින්වරුන්ට
විරුද්ධව සටන ඇරඹූහ.[9] මෙවර
තමන්ට අන්ත පරාජයක් අද්දැකීමට
සිදු වන බව තේරුම්ගත්[10] බෙන්-
ජමින්වරු බොහෝ සෙයින් කල-
බල වූහ.[11] **42** ඊශ්‍රායෙල්වරුන්ගේ
දැඩි ප්‍රහාරයට හසු වූ ඔවුහු පාළුක-
රය දෙසට පලා ගියෝය. එවිට
ඊශ්‍රායෙල් භට පිරිසද ඔවුන් පසු-
පස ගියෝය. නුවරට පහර දුන්
භට පිරිසද බෙන්ජමින්වරුන්ව ලුහු-
බැඳ ගොස් ඔවුන්ව මරා දැමීමට
පටන්ගත්තෝය. **43** ඔවුහු බෙන්ජ-
මින්වරුන්ව සෑම පැත්තකින්ම වට
කළෝය.[12] ඒ නිසා ඔවුන් අතින්
බේරීමට බෙන්ජමින්වරුන්ට නො-
හැකි විය. ඊශ්‍රායෙල්වරු ඔවුන්ව
ගිබෙයා නුවරට[13] නැඟෙනහිරෙන්
පිහිටි ස්ථානයක් දක්වා ලුහුබැඳ
ගොස් ඔවුන්ට නොනවත්වා පහර
දී[14] ඔවුන්ව මරා දැමුවෝය.
**44** එයින් මිය ගිය බෙන්ජමින්වරුන්-
ගේ සංඛ්‍යාව දහඅටදහසකි. ඔවුහු
සියලුදෙනාම එඩිතර පුරුෂයෝය.[15]
**45** ඊශ්‍රායෙල්වරු මහාමාර්ගවල
සිටි බෙන්ජමින්වරුන් පන්දහ-
සක්වද[1] ගිදොම් දක්වා පලා ගිය
බෙන්ජමින්වරුන් දෙදහසක්වද මරා
දැමුවෝය. ඉතුරු බෙන්ජමින්වරු
පාළුකරය දෙසට පලා ගොස් රිම්-
මොන් නම් පර්වතයේ[2] සැඟවුණෝය.
**46** එදින මිය ගිය බෙන්ජමින්වරුන්-
ගේ මුළු සංඛ්‍යාව විසිපන්දහසකි.[3]
ඔවුහු සියලුදෙනාම යුද්ධයට දක්ෂ,
එඩිතර පුරුෂයෝය. **47** පාළුකර-
යට පලා ගොස් රිම්මොන් නම් පර්ව-
තයේ සැඟවුණු පුරුෂයන්ගේ සංඛ්‍යාව
හයසියයකි. ඔවුහු රිම්මොන් පර්වත-
යේ මාස හතරක් සැඟවී සිටියෝය.[4]
**48** සටන අවසන් කර පැමිණි
ඊශ්‍රායෙල්වරු බෙන්ජමින්වරුන්
ජීවත්ව සිටි සෑම නුවරකටම ගොස්
එහි සිටි සියලුදෙනාවම මරා දැමු-
වෝය. මිනිසුන්ව පමණක් නොව එහි
සිටි සියලු සතුන්වද මරා දැමූ[5] ඔවුහු
ඒ සෑම නුවරකටම ගිනි තැබුවෝය.[6]

**21** ඊශ්‍රායෙල්වරුන් මිෂ්පා නුව-
රෙහි[7] රැස් වූ අවස්ථාවේදී,
“අපෙන් කිසිම කෙනෙක් අපේ දුවෙ-
කුව බෙන්ජමින්වරුන්ට විවාහ කර
දෙන්නේ නැහැ”[8] කියා පොරොන්දු
වී තිබිණ. **2** සටනින් පසු සිය-
ලුම ඊශ්‍රායෙල්වරු බෙතෙල් නුවරට
රැස්ව[9] සවස් වන තුරුම සැබෑ දෙවි[10]
ඉදිරියේ මහත් හඬින් වැලපෙමින්[11]
**3** මෙසේ පැවසූහ. “යෙහෝවා, ඊශ්‍රා-
යෙල්හි දෙවියනි, මේ වගේ දෙයක්
ඊශ්‍රායෙල් දේශයේ සිදු වුණේ ඇයි?
බලන්න, දැන් ඊශ්‍රායෙල් ජාතියට එක
ගෝත්‍රයක් අහිමි වෙලා!”[12] **4** පසු
දින උදෑසනින්ම අවදි වූ ඔවුහු එහි
පූජාසනයක් ඉදි කර ඒ මත දවන
පූජා[13] හා හවුල් පූජා[14] ඔප්පු කළෝය.
**5** ඉන්පසු ඊශ්‍රායෙල්වරු මෙසේ
පැවසූහ. “අපි මිෂ්පා නුවරේ රැස් වූ
අවස්ථාවේදී යෙහෝවා දෙවි ඉදි-
රියේ ඉතා බැරෑරුම් පොරොන්දු-
වක් වුණා.[15] ඒ පොරොන්දුවට අනුව
බෙන්ජමින්වරුන්ට විරුද්ධව අප කළ
සටනට අප හා එක් නොවූ අයව අනි-
වාර්යයෙන්ම මරා දැමිය යුතුයි.[16]
ඉතින් යෙහෝවා දෙවිගේ සෙනඟ

**20 පරි.**
**1** යොෂු 8:19
**2** යොෂු 8:24
**3** යොෂු 8:19
**4** විනි 20:31
**5** විනි 20:21, විනි 20:25
**6** විනි 20:38
**7** උත් 19:28
**8** යොෂු 8:20
**9** යොෂු 8:21
**10** විනි 20:34
**11** යෙසා 13:8
**12** යොෂු 8:22
**13** හොෂෙ 9:9, හොෂෙ 10:9
**14** යොෂු 10:19
**15** විනි 11:1, විනි 20:15

**2 තීරුව**
**1** විනි 20:31
**2** විනි 20:47, විනි 21:13
**3** විනි 20:15, විනි 20:35
**4** විනි 20:45, විනි 21:13
**5** ද්වි 13:15, විනි 20:34
**6** යොෂු 8:19

**21 පරි.**
**7** විනි 20:1, 1සාමු 7:5, 1රාජා 15:22, යෙරෙ 40:6
**8** විනි 21:18
**9** විනි 20:18, විනි 20:26
**10** විනි 20:2, ගීතා 83:18
**11** 1සාමු 30:4, දේශ 3:4
**12** ද්වි 28:63, විනි 21:6
**13** නික් 10:25, ලෙවී 1:3
**14** ලෙවී 3:1, ලෙවී 19:5, විනි 20:26, 2සාමු 24:25
**15** විනි 21:7
**16** විනි 5:23, විනි 21:10

වන අප සමඟ සටනට යෑමට ඊශ්‍රා-
යෙල්වරුන් අතරින් එකතු නොවුණේ
කවුද?” 6 ඒ අවස්ථාවේදී ඊශ්‍රායෙල්-
වරුන් සිටියේ තමන්ගේ සහෝදරයන්
වූ බෙන්ජමින්වරුන්ට සිදු වූ දේ ගැන
මහත් කනගාටුවෙනි. ඔවුහු දුකින්
මෙසේ පැවසූහ. “අද ඊශ්‍රායෙල් ජාති-
යට එක ගෝත්‍රයක් අහිමි වෙලා!
7 ඔවුන්ගෙන් ඉතුරු වෙලා ඉන්න
අයට අපි මොනවාද කරන්නේ? අපි
යෙහෝවා දෙවිගේ නාමයෙන් පො-
රොන්දු වුණා[1] නේද අපේ එක දුවෙක්-
වත් ඔවුන්ට විවාහ කර දෙන්නේ
නැහැ කියලා.[2] එහෙමනම් ඔවුන්
භාර්යාවන් හොයාගන්නේ කොහො-
මද?”

8 ඉන්පසු ඔවුහු, “මිශ්පා නුවරේදී
යෙහෝවා දෙවි ඉදිරියේ අපි එක් රැස්
වූ විට ඊට සහභාගි නොවුණේ කවුද”[3]
කියා නැවතත් ඇසූහ. ඔවුන් ඒ
ගැන සොයා බලද්දී යාබේෂ්-ගිලියද්
නම් නුවරින්[4] කිසිම කෙනෙකු
පැමිණ තිබුණේ නැති බව හෙළි විය.
9 ඉන්පසු ඔවුහු රැස්ව සිටි සියලුදෙ-
නාව ගණන් කර බැලුවෝය. යාබේෂ්-
ගිලියද් නුවරෙන් කිසිවෙක් සිටියේ
නැත. 10 එහෙයින් රැස්ව සිටි සෙ-
නඟ එඩිතර පුරුෂයන් දොළොස්දහ-
සක් තෝරාගෙන ඔවුන්ට මෙසේ
නියෝග කළෝය. “ඔබ සියලුදෙනාම
යාබේෂ්-ගිලියද් නුවරට ගිහින් එහි
ජීවත් වන සෑම කෙනෙකුවම කඩු-
වෙන් මරා දමන්න. කාන්තාවක්වත්
දරුවෙක්වත් ඉතුරු නොකර සියල්-
ලන්වම මරා දමන්න.[5] 11 සෑම
පුරුෂයෙක්වද විවාහ වූ සෑම කාන්-
තාවක්වද ඔබ මරා දැමිය යුතුයි.”[6]
12 එහෙයින් ඔවුහු යාබේෂ්-ගිලියද්
නුවරට ගොස් තමන්ට නියෝග කළ
දේ එයාකාරයෙන්ම ඉටු කළෝය.
ඉන්පසු ඔවුහු එහි සිටි,[7] කිසිම
පුරුෂයෙකු සමඟ සම්බන්ධකම්
පවත්වා නොතිබූ[8] අවිවාහක තරුණි-
යන් හාරසියදෙනෙකුව කානාන් දේ-
ශයේ ෂීලෝ නුවර[9] අසල පිහිටි හමුදා
කඳවුරට ගෙනාවෝය.

13 මේ සිදුවීම්වලින් පසු ඊශ්‍රා-
යෙල් සෙනඟ රිම්මොන් පර්වතයේ
සැඟවී සිටි[1] බෙන්ජමින්වරුන් වෙ-
තට පණිවිඩකරුවන් යවා ඔවුන්
සමඟ සමාදාන වීමට කැමති බව
දැන්වූහ. 14 එහෙයින් බෙන්ජමින්-
වරු තමන් සැඟවී සිටි ස්ථාන-
යෙන් පිටතට ආවෝය. එවිට
ඊශ්‍රායෙල්වරු යාබේෂ්-ගිලියද් නුව-
රින්[2] ගෙනා තරුණියන්ව ඔවුන්ට
භාර්යාවන් ලෙස දුන්නෝය. එහෙත්
ඔවුන් සියලුදෙනාටම විවාහ වීමට
අවශ්‍ය තරම් තරුණියෝ සංඛ්‍යාවක්
එහි සිටියේ නැත.[3] 15 බෙන්ජමින්-
වරුන් හා සෙසු ඊශ්‍රායෙල්වරුන් අතර
භේදයක් ඇති වීමට යෙහෝවා දෙවි
ඉඩහැරීමෙන් බෙන්ජමින්වරුන්ට සිදු
වූ දේ ගැන සියලුදෙනාම දුක් වූහ.[4]
16 ඊශ්‍රායෙල් සෙනඟ අතරේ සිටි
වැඩිමහල්ලෝ සෙනඟගෙන් මෙසේ
ඇසුවෝය. “බෙන්ජමින්වරුන් අතරේ
එක ස්ත්‍රියක්වත් ඉතුරු වී නැති
නිසා භාර්යාවන් නැති පුරුෂයන්
වෙනුවෙන් අපිට මොනවද කරන්න
පුළුවන්?” 17 එවිට සෙනඟ මෙසේ
පිළිතුරු දුන්නෝය. “ඊශ්‍රායෙල් සෙ-
නඟ අතරින් එක ගෝත්‍රයක්වත්
තුරන් නොවිය යුතුයි. ඒ නිසා ඉතුරු
වී සිටින බෙන්ජමින්වරුන්ට ජීවත්
වීම සඳහා ප්‍රදේශයක් ඔවුන්ගේ උරු-
මය ලෙස වෙන් කරන්න.[5] 18 ඒත්
ඔවුන්ට අපේ දූවරුන්ව විවාහ කර
දෙන්න අපිට බැහැ. මොකද, ‘බෙන්-
ජමින්වරුන්ට දුවක් විවාහ කර දෙන
තැනැත්තාට ශාප වේවා’ කියා අපිම
කිව්වා.”[6]

19 ඉන්පසු ඔවුන් අතරේ මෙවැනි
සාකච්ඡාවක් ඇති විය. “බෙතෙල්
නුවරේ සිට ෂීකෙම්[7] දක්වා දිවෙන
මහාමාර්ගයේ නැඟෙනහිරෙන්ද බෙ-
තෙල් නුවරට උතුරෙන් හා ලෙ-
බෝනා නුවරට දකුණෙන්ද පිහිටි
ෂීලෝ නුවරේ,[8] අවුරුදු පතා යෙ-
හෝවා දෙවි වෙනුවෙන් පවත්වන
උත්සවයේදී අපි මේකට මොනවා හරි
කරන්න බලමු.” 20 ඉන්පසු ඔවුහු

**21 පරි.**
1 ලෙවී 5:4
ලෙවී 19:12
ගීතා 15:4
මතෙ 5:33
2 විනි 21:1
විනි 21:18
3 විනි 20:1
4 1සාමු 11:1
1සාමු 31:11
2සාමු 21:12
1ලේක 10:11
5 විනි 21:5
6 ගණන් 31:17
7 විනි 21:8
8 උත් 24:16
එස්ත 2:3
9 යොෂු 18:1
විනි 18:31
1සාමු 1:3

**2 තීරුව**
1 විනි 20:47
2 විනි 21:8
3 විනි 20:47
විනි 21:12
4 විනි 21:6
5 විනි 20:47
6 ලෙවී 19:12
විනි 21:1
ගීතා 15:4
මතෙ 5:33
7 උත් 33:18
විනි 9:6
විනි 9:45
1රාජා 12:1
8 යොෂු 18:1
විනි 21:12

බෙන්ජමින්වරුන්ට මෙසේ පැවසූහ.
“උත්සව දවසේදී ගොස් මිදිවතුවල
සැඟවී සිටින්න. **21** එදාට ශීලෝ
නුවරේ තරුණියන් නටන්න පිටත්ව
එයි.[1] එවිට ඔබ මිදිවතුවලින් පිටතට
ඇවිත් ඔවුන්ගෙන් කැමති කෙනෙකුව
අල්ලගන්න. ඊටපස්සේ ඔබ තෝ-
රාගත් තරුණියව ඔබේ ප්‍රදේශයට
රැගෙන ගිහින් ඇයව විවාහ කරගන්න.
**22** හදිස්සියේවත් ඒ තරුණියන්ගේ
පියවරුන් හෝ සහෝදරයන් හෝ
ඇවිත් සිදු වූ දේ ගැන අපිට පැමි-
ණිලි කළොත් අපි ඔවුන්ට මෙහෙම
කියන්නම්. ‘අපිට බැරි වුණා ඉතුරු
වී සිටින බෙන්ජමින්වරු සැම කෙ-
නෙකුටම භාර්යාවන් ලබා දෙන්න.[2]
ඉතින් ඔබ මේ කාරණයේදී අපට සහ-
යෝගය දැක්වුවොත් ඔබ කරන්නේ
ලොකු උදව්වක්. ඔබ මේ දේට ඉඩ-
හැරියා කියලා ඔබේ පොරොන්දුව
කඩ වෙන්නේ නැහැ. මොකද ඔබ ඒ
තරුණියන්ව දුන්නේ කැමැත්තෙන්
නෙවෙයිනේ.’ ”[1]
**23** එහෙයින් බෙන්ජමින්වරු, නට-
මින් සිටි තරුණියන්[2] අතරින් තමන්ට
කැමති අයව අල්ලාගෙන ගොස්
විවාහ කරගත්තෝය.[3] ඉන්පසු ඔවුහු
තමන්ට උරුම වූ ප්‍රදේශයට ගොස් එහි
නුවරවල් ගොඩනගා[4] පදිංචි වූහ.
**24** මෙසේ සියලුම ඊශ්‍රායෙල්වරු
තම තමන්ගේ ගෝත්‍ර හා පෙළපත්ව-
ලට අනුව තමන්ට උරුම වූ ප්‍රදේශ
බලා ගියෝය.[5]
**25** ඒ කාලයේදී ඊශ්‍රායෙල්වරුන්ව
පාලනය කිරීමට රජෙක් සිටියේ
නැත.[6] එහෙයින් සැම කෙනෙක්ම
තමාට හරියි කියා සිතූ දේට අනුව
ජීවත් වූහ.[7]

**21 පරි.**
1 නික් 15:20
විනි 11:34
1සාමු 18:6
ගීතා 149:3
ගීතා 150:4
2 විනි 21:12
විනි 21:14

**2 තීරුව**
1 විනි 21:1
විනි 21:18
2 විනි 21:21
3 විනි 20:47
විනි 21:12
4 විනි 20:48
5 යොෂු 14:2
විනි 2:6
විනි 20:8
6 විනි 8:23
විනි 17:6
විනි 18:1
විනි 19:1
7 ද්වි 12:8
ද්වි 16:18
විනි 17:6
1සාමු 9:17
හිතෝ 3:5

# රූත්

**1** විනිශ්චයකරුවන්[1] ඊශ්‍රායෙල් දේ-
ශය විනිශ්චය කළ කාලයේදී එහි
සාගතයක්[2] ඇති විය. ඒ නිසා එක්-
තරා මිනිසෙක් යූදාහි බෙත්ලෙහෙ-
මෙන්[3] පිටත් වී මෝවබ්[4] දේශයට
ගොස් එහි විදේශිකයෙකු ලෙස ජීවත්
විය. ඔහුගේ බිරිඳද පුත්තු දෙදෙනාද
ඔහු සමඟ ගියෝය. **2** එම මිනිසා-
ගේ නම එලිමෙලෙක්ය. ඔහුගේ බිරිඳ
නායොමිය. පුත්තු දෙදෙනා මාලන්*
සහ කිලියොන්ය.# ඔවුන් යූදාහි
බෙත්ලෙහෙම් නුවරේ සිට පැමිණි
එෆ්‍රාත්වරුන්ය.[5] ඔවුහු මෝවබ් දේශ-
යට පැමිණ එහි පදිංචි වූහ.
**3** ටික කලකට පසු නායොමිගේ
ස්වාමිපුරුෂයා වූ එලිමෙලෙක් මිය
ගියේය. ඇය පුතුන් දෙදෙනා සමඟ
තනි වූවාය. **4** ඇගේ පුත්තු දෙ-
දෙනා මෝවබ් ජාතික[1] ස්ත්‍රීන් සමඟ
විවාහ වූහ. ඔවුන්ගේ නම් ඕපා සහ
රූත්ය.[2] ඔවුහු එහි තවත් අවුරුදු දහ-
යක් පමණ ජීවත් වූහ. **5** කලක්
ගෙවුණු පසු, මාලන් සහ කිලියොන්ද
මිය ගියෝය. මෙසේ, නායොමිට
ස්වාමිපුරුෂයා මෙන්ම දරුවන් දෙදෙ-
නාද අහිමි විය. **6** යෙහෝවා දෙවි
තම සෙනඟට ආශීර්වාද කර තිබූ
බැවින්[3] ඊශ්‍රායෙල්වරුන්ට කෑමෙන්
කිසි අඩුවක් නැති බව[4] මෝවබ් දේශ-
යේ සිටි නායොමිට ආරංචි විය. එම-
නිසා ඇගේ ලේලියන් දෙදෙනා සමඟ
ඇය මෝවබ් දේශය අත්හැර තම මව්-
රට බලා යෑමට සූදානම් වූවාය.
**7** ඇය තමා ජීවත් වෙමින් සිටි
ප්‍රදේශයෙන් පිටත් වී[5] ඇගේ ලේලි-
යන් දෙදෙනා සමඟ යූදා දේශය
බලා ගමන් කළාය. **8** ඒ අතර-
තුරේදී නායොමි ඇගේ ලේලියන්

**1 පරි.**
1 විනි 2:16
2 ද්වි 28:15
ද්වි 28:38
3 උත් 35:19
විනි 17:7
මීකා 5:2
4 උත් 19:37
ගණන් 21:20
ද්වි 2:9
ද්වි 34:1
විනි 3:30
5 උත් 35:19
උත් 48:7
1සාමු 17:12

**2 තීරුව**
1 1රාජා 11:1
2 මතෙ 1:5
3 ද්වි 4:31
ද්වි 28:11
4 ගීතා 37:25
ගීතා 104:14
ගීතා 132:15
මතෙ 6:11
5 රූත් 1:4
2රාජා 8:3

---

රූත් **1:2*** තේරුම, “නිතරම ලෙඩ වන්නා, රෝගියා.” **2#** තේරුම, “දුර්වල.”

දෙදෙනාට මෙසේ කීවාය. “ඔබ දෙ-
දෙනා දැන් ආපහු ගෙදර යන්න.
ගිහින් ඔබේ අම්මලා එක්ක ජීවත්
වෙන්න. මටයි මිය ගිය මගේ පුත්‍රයන්-
ටයි නොසැලෙන ආදරයක්* පෙන්වූ[1]
ඔබ දෙදෙනාට සැමදා යෙහෝවා
දෙවිගෙන් ප්‍රේමය ලැබෙන්න කියා
මම ප්‍රාර්ථනා කරනවා.[2] **9** යෙ-
හෝවා දෙවිගේ ආශීර්වාදය[3] වගේම
ඔබ දෙදෙනාට නැවත සන්තෝෂවත්
යුග දිවියක් ගත කරන්නත්[4] හැකියාව
ලැබේවා කියා මම ප්‍රාර්ථනා කර-
නවා.” ඉන්පසු ඇය ඔවුන්ව සිපගත්-
තාය.[5] එවිට ඇගේ ලේලියෝ දෙදෙනා
හඬා වැලපෙමින් **10** ඇයට මෙසේ
පැවසුවෝය. “අනේ, අපිට හැරිලා
යන්න නම් කියන්න එපා. ඔබත්
එක්ක ඔබේ සෙනඟ ළඟට ගිහින්
ජීවත් වෙන්න අපිට ඉඩ දෙන්න.”[6]
**11** නමුත් නායොමි මෙසේ කීවාය.
“අනේ මගේ දරුවෙනි, ආපහු යන්න.
මාත් එක්ක එන එකෙන් ඔබ දෙදෙ-
නාට කිසි ප්‍රයෝජනයක් තියෙන-
වාද? ඔබ දෙදෙනාට විවාහ කර
දෙන්න මගේ කුසෙන් තවත් දරු-
වන් බිහි කරන්න මට පුළුවන්ක-
මක් තියෙනවාද?[7] **12** මම කියන
දේ අහලා දැන් ආපහු යන්න. දැන්
මම ගොඩක් වයසයි. මට ආපහු
විවාහ වෙන්න බැහැ. මම අදම විවාහ
වෙලා පුතුන් බිහි කරලා දෙන්නම්
කියලා කිව්වොත්[8] **13** ඔවුන් උස්
මහත් වෙනකම් ඔබ දෙන්නා බලා-
ගෙන ඉන්නවද? ඒ තරම් කාලයක්
විවාහ නොවී ඉන්න ඔබට පුළුවන්ද?
ඒක කරන්න පුළුවන් දෙයක් නෙ-
මෙයි. අනේ මගේ දරුවෙනි, ඔබ මේ
තත්වයට පත් වුණේ යෙහෝවා දෙ-
විගේ ආශීර්වාදය මට නැති වුණු
නිසයි.[9] ඒ ගැන හිතද්දී මට දරාගන්න
බැරි දුකක් දැනෙනවා.”

**14** එවිට ඔවුහු නැවතත් හයි-
යෙන් ඇඬුවෝය. ඉන්පසු ඕපා, නැන්-
දම්මාව සිප ඇගෙන් සමුගත්තාය.

රූත් **1:8*** හෝ, “ළැදි ප්‍රේමය.”

**1 පරි.**
**1** හිතෝ 11:17 හිතෝ 19:22
**2** නික් 34:6 රූත් 2:20 ගීතා 31:16 ගීතා 31:21
**3** යාකො 1:17
**4** රූත් 3:1
**5** උත් 31:55 ක්‍රියා 20:37
**6** ගීතා 119:63
**7** උත් 38:11 ද්වි 25:5
**8** උත් 17:17
**9** රූත් 1:20 1සාමු 3:18 යෝබ් 19:21

**2 තීරුව**
**1** රූත් 1:16 හිතෝ 17:17 හිතෝ 18:24 හෙබ්‍රෙ 10:39
**2** ගණන් 21:29 ගීතා 96:5 1කොරි 8:5 2පේතෘ 2:22
**3** 2සාමු 15:19
**4** 2රාජා 2:2 හෙබ්‍රෙ 11:15
**5** රූත් 2:11 එස්ත 8:17 ගීතා 45:10 යෙසා 14:1
**6** ද්වි 4:4 ද්වි 10:20 රූත් 2:12 1රාජා 8:41
**7** 2සාමු 15:21
**8** 1සාමු 3:17 2සාමු 19:13
**9** ක්‍රියා 21:14
**10** රූත් 1:1
**11** මතෙ 21:10
**12** රූත් 1:2
**13** උත් 17:1 නික් 6:3 යෙසා 46:9
**14** රූත් 1:13 1සාමු 3:18 යෝබ් 19:21 යෙසා 12:1
**15** 1සාමු 2:7
**16** යෝබ් 1:21
**17** රූත් 1:5
**18** යෝබ් 10:17 යෙසා 54:8

නමුත් රූත් දිගටම ඇය සමඟ සිටි-
යාය.[1] **15** එවිට නායොමි ඇයට
පැවසුවේ මෙයයි. “දූවේ, වැන්දඹුවක්
වන ඔබේ නැනා ඇගේ සෙනඟ වෙත-
ටත් දෙවිවරුන්[2] වෙතටත් ආපහු
ගියා. ඉතින් ඔබත් යන්න.”[3]

**16** එවිට රූත් මෙසේ කීවාය.
“ඔබව අත්හැර යන්න කියලා නම්
මට කියන්න එපා. ඔබ යන ඕනෑම
තැනකට මමත් යනවා. ඔබ නිදා-
ගන්න තැනම මමත් නිදාගන්නවා.[4]
ඔබේ සෙනඟ මගෙත් සෙනඟයි.[5]
ඔබේ දෙවි මගෙත් දෙවියි.[6] **17** ඔබ
මැරෙන තැනම මමත් මැරෙනවා.[7]
මාව තැන්පත් කරන්න ඕනෙත් එතැ-
නමයි. මරණය හැර වෙන කිසිම දෙ-
යක් නිසා අපි දෙන්නා වෙන් වුණොත්
යෙහෝවා දෙවිගෙන් මට දඬුවම්
ලැබේවා!”[8]

**18** රූත්, ඇය සමඟ යෑමට ගත්
තීරණය කොයි ලෙසකින්වත් වෙ-
නස් නොකරන බව නායොමි තේ-
රුම්ගත් විට[9] ඇය තවදුරටත් ඒ
ගැන කතා නොකළාය. **19** ඔවුහු
බෙත්ලෙහෙම[10] දක්වා දිගටම ගමන්
කළහ. ඔවුන් බෙත්ලෙහෙමට පැමිණි
විට මුළු නුවරම කැලඹුණේය.[11] නුව-
රේ ස්ත්‍රීහු, “මේ නායොමි නේද”[12]
කියා එකිනෙකා අතරේ කතා වූහ.
**20** එවිට ඇය ඔවුන්ට මෙසේ කීවාය.
“මට නායොමි* කියලා කියන්න
එපා. සියලු බලැති දෙවි[13] මාව
අත්හැරලා. මගේ ජීවිතේ දැන් මට
තිත්ත වෙලා.[14] ඒ හින්දා මට මාරා#
කියලා කතා කරන්න. **21** මෙහෙන්
පිට වී යන කොට මට හැම දෙ-
යක්ම තිබුණා.[15] ඒත් යෙහෝවා
දෙවි අද මාව මෙතැනට ගෙනා-
වේ හිස් අතින්.[16] යෙහෝවා දෙවි
මාව අවමානයට ලක් කළා.[17] සියලු
බලැති දෙවි මා පිටට දුක් කරදර
ගෙනාවා.[18] ඉතින් මට තවදුරටත්
නායොමි කියලා කතා කරන්න එපා.”

රූත් **1:20*** තේරුම, “ප්‍රියමනාපයි.” **20#** තේරුම, “තිත්ත.”

**22** මෙසේ, නායොමි මෝවබ් දේ-
ශයේ[1] සිට ආපසු ආවාය. මෝවබ්
ජාතික ඇගේ ලේලි වූ රූත්ද ඇය
සමඟ ආවාය. ඔවුන් බෙත්ලෙහෙමට[2]
පැමිණියේ බාර්ලි අස්වැන්න නෙ-
ළන්න පටන්ගත් කාලයේදීය.[3]

**2** නායොමිට ඉතා ධනවත්[4] නෑදෑ-
යෙක් සිටියේය. ඔහු ඇගේ ස්වා-
මිපුරුෂයා වූ එලිමෙලෙක්ගේ පවුලේ
කෙනෙකි.[5] ඔහුගේ නම බෝවස්ය.[6]

**2** කලක් ගෙවුණු පසු මෝ-
වබ් ජාතික රූත්, නායොමිගෙන්
මෙසේ ඇසුවාය. "කෙතේ අතහැ-
රුණු ධාන්‍ය කරල් එකතු කරන්න
යන්න මට අවසර දෙන්න.[7] මට
කරුණාවෙන් සලකන කෙනෙක්ගේ
කෙතකට ගිහින් මම කරල් අහු-
ලන්නම්." නායොමිද, "යන්න දුවේ.
ගිහින් කරල් එකතු කරගෙන එන්න"
කියා ඇයට කීවාය. **3** ඇයද අස්-
වැන්න කපන්නන් පිටුපස යමින්
කෙතේ අතහැරුණු ධාන්‍ය කරල්
ඇහින්දාය.[8] මෙසේ, ඇය අහම්බෙන්
මෙන් එලිමෙලෙක්ගේ[9] පවුලට අයත්
බෝවස් නම් තැනැත්තාගේ කෙ-
තට ඇතුල් වුණාය.[10] **4** ඒ අතරතු-
රේදී, බෝවස් බෙත්ලෙහෙමේ සිට
එතැනට පැමිණියේය. "යෙහෝවා
දෙවි ඔබ සමඟ සිටීවා"[11] යයි කිය-
මින් ඔහු අස්වැන්න නෙළන්නන්ට
ආචාර කළේය. ඔවුහුද ඔහුට ආචාර
කරමින්, "ඔබට යෙහෝවා දෙවිගේ
ආශීර්වාද ලැබේවා"[12] යයි පැවසූහ.

**5** ඉන්පසු බෝවස්,[13] "මේ තරුණිය
කාගේ කවුද" කියා අස්වැන්න නෙ-
ළන්නන්ගේ වැඩ අධීක්ෂණය කළ
තරුණයාගෙන් ඇසීය. **6** ඔහු පිළි-
තුරු දෙමින් මෙසේ කීවේය.
"ඇය මෝවබ් ජාතික තරුණියක්.[14]
නායොමි එක්ක මෝවබ් දේශයේ[15]
ඉඳලයි මෙහෙට ඇවිත් තියෙන්නේ.
**7** 'මට කෙතේ අත්හැරුණු කරල් අහු-
ලන්න අවසර දෙනවාද?[16] මම කපන
අය පිටිපස්සේ ගිහින් තැනින් තැන
වැටිලා තියෙන කරල් අහුලන්නද'
කියා ඇය ඇසුවා. ඉතින් ඇය කෙතට
ඇවිත් උදේ ඉඳන් මේ වෙනකම්ම
කරල් ඇහින්දා. ඇය පැලට ඇවිත්
ඉඳගත්තේ සුළු මොහොතකට ඉස්-
සෙල්ලයි."[1]

**8** පසුව බෝවස් රූත්ට මෙසේ
කීවේය. "මේ අහන්න දුවේ. මේ
කෙත අත්හැරලා යන්න එපා.[2]
මගේ සේවිකාවන් එක්ක මේ කෙ-
තේ කරල් අහුලන්න.[3] **9** ඔවුන් අස්-
වැන්න එකතු කරන්නේ කොහේද
කියලා සොයා බලා ඔවුන් සමඟ
එතැනට යන්න. ඔබට කිසි කරදර-
යක් කරන්න එපා[4] කියලා මම තරු-
ණයන්ට කිව්වා. ඔබට පිපාස වුණහම
වතුර ඇදලා දෙන තරුණයන් ළඟට
ගිහින් ඔවුන් පුරවන භාජනවලින්
අරං වතුර බොන්න."[5]

**10** එවිට ඇය දණින් වැටී හිස
නමා[6] ඔහුගෙන් මෙසේ ඇසු-
වාය. "මම විදේශිකයෙක්[7] වෙලත්
ඔබ මට කරුණාවෙන් සලකන්නේ
ඇයි?" **11** බෝවස් ඇයට උත්තර
දෙමින් මෙසේ කීවේය. "ඔබේ ස්වාමි-
පුරුෂයා මිය ගියාට පස්සේ නැන්-
දම්මා වෙනුවෙන් ඔබ කළ හැම
දෙයක් ගැනම[8] මට ආරංචි[9] වුණා.
ඔබේ අම්මා තාත්තා විතරක් නෙ-
මෙයි ඔබේ නෑදෑයන් ඉන්න දේ-
ශය පවා අත්හැර, ඔබ නාඳුනන
මේ දේශයට ආ බව මට දැන-
ගන්න ලැබුණා.[10] **12** ඔබේ යහ-
පත් ක්‍රියාවලට යෙහෝවා දෙවිගෙන්
ඔබට ආශීර්වාද ලැබේවා![11] ඊශ්‍රා-
යෙල්හි දෙවි වන යෙහෝවාගේ පියා-
පත් සෙවණේ රැකවරණය සොයන
ඔබට[12] ඔහුගෙන් බොහෝ ආශීර්-
වාද ලැබේවා!"[13] **13** ඇයද ඔහුට
මෙසේ කීවාය. "මාගේ ස්වාමීනි, මා
ඔබේ මෙහෙකාරියන්ට වඩා ගො-
ඩක් වෙනස්.[14] එහෙත් ඔබ ඔබේ
මෙහෙකාරිය වන මාව සනසා මගේ
බිය සැක දුරු කළා.[15] මට හැම-
දාම මේ විදිහට ඔබෙන් කරුණාව

**13** රූත් 4:11; රූත් 4:17; ගීතා 20:5; මතෙ 1:5; මතෙ 1:16; හෙබ්‍රෙ 11:6; **14** 1සාමු 25:41; පිලි 2:3; **15** උත් 50:21.

**1 පරි.**
**1** ගණන් 21:13
රූත් 1:1
**2** උත් 35:19
මීකා 5:2
**3** රූත් 2:23

**2 පරි.**
**4** ද්වි 8:18
**5** රූත් 3:2
රූත් 3:12
**6** රූත් 4:21
1ලේක 2:11
මතෙ 1:5
ලූක් 3:32
**7** ලෙවී 19:9
ලෙවී 23:22
ද්වි 24:19
**8** 2තෙස 3:10
**9** රූත් 1:2
**10** රූත් 2:20
හිතෝ 16:9
**11** විනි 6:12
2තිමෝ 4:22
**12** ගණන් 6:24
**13** රූත් 2:1
රූත් 4:21
1ලේක 2:11
**14** රූත් 1:4
**15** රූත් 1:16
රූත් 1:22
**16** ලෙවී 23:22
රූත් 2:2

**2 තීරුව**
**1** හිතෝ 13:4
හිතෝ 31:27
හිතෝ 31:31
1තෙස 4:11
**2** හිතෝ 28:27
1තිමෝ 6:18
**3** රූත් 2:22
**4** 1තිමෝ 5:2
**5** හිතෝ 11:25
යාකො 1:27
**6** 1සාමු 25:23
**7** නික් 22:21
නික් 23:9
ලෙවී 19:34
**8** රූත් 1:14
රූත් 1:16
**9** හිතෝ 31:31
**10** ගීතා 45:10
**11** 1සාමු 24:19
යෝබ් 34:11
හිතෝ 28:20
හෙබ්‍රෙ 6:10
**12** ගීතා 17:8
ගීතා 36:7
ගීතා 57:1
ගීතා 63:7
ගීතා 91:4

ලබාගන්න පුළුවන් නම් එය මොන
තරම් ආශීර්වාදයක්ද!”
**14** කෑම කන වේලාවේදී, බෝවස්
ඇයට මෙසේ කීවේය. “ඇවිත් මෙ-
තැන තියෙන රොටි අරං කන්න.[1]
ඒවා මේ ඇඹුල් වයින්වල පොඟවා
කන්න.” එබැවින් ඇය අස්වැන්න
කපන්නන් ළඟ හිඳගත්තාය. බෝ-
වස් බැදපු ධාන්‍ය ඇගේ අතට දුන්-
නේය.[2] ඇය එයින් කා තෘප්තියට
පැමිණි පසුත් කෑම ඉතුරු වී තිබිණ.
**15** ඉන්පසු ඇය නැඟිට ආපසු කරල්
අහුලන්න ගියාය.[3] එවිට බෝවස් ඔහු-
ගේ තරුණයන්ට අණ දෙමින් මෙසේ
කීවේය. “ඇයට හිරිහැර කරන්න
එපා.[4] ධාන්‍ය මිටි අතරේ වැටිලා
තියෙන කරල් අහුලගන්න ඇයට
ඉඩ දෙන්න. **16** ඇයට අහුලගන්න
ධාන්‍ය මිටිවලින් කරල් කිහිපයකුත්
අරන් බිමට දාන්න.[5] ඇයට කරුණා-
වෙන් කතා කරන්න.”
**17** ඇය සවස් වන තෙක් කෙ-
තේ කරල් ඇහින්දාය.[6] ඇය අහුලා-
ගත් කරල් තළා[7] සුද්ද කරගත් විට
බාර්ලි ඒපාවක්*[8] පමණ තිබිණ.
**18** ඇය එම ධාන්‍ය රැගෙන නුවරට
ගොස් ඇගේ නැන්දම්මාට පෙන්වූ-
වාය. දහවල් කෑමෙන් ඉතුරු කරගත්
ධාන්‍ය ටිකද[9] නැන්දම්මාට දුන්නාය.
**19** නායෝමි රූත්ගෙන් මෙසේ
ඇසුවාය. “අද කරල් ඇහින්දේ කො-
හෙද? අද දුව වැඩ කළේ කාගේ කෙ-
තේද? දුවට හොඳින් සැලකූ
තැනැත්තාට ආශීර්වාද ලැබෙන්න
ඕනේ!”[10] එවිට රූත්, “අද මම
වැඩ කළේ බෝවස් කියන මිනිසා-
ගේ කෙතේ” යයි තම නැන්දම්-
මාට පැවසුවාය. **20** එවිට නායෝමි
ඇගේ ලේලිට මෙසේ පැවසුවාය. “ජීව-
තුන් වගේම මළවුන්වත්[11] කිසිදා
අමතක නොකර නොසැලෙන ප්‍රේ-
මයක්*[12] පෙන්වූ යෙහෝවා දෙවි-
ගෙන් ඔහුට ආශීර්වාද ලැබේවා!”[13]
නායෝමි මෙසේද කීවාය. “බෝවස්
අපේ නෑදෑයෙක්.*[1] ඒ නිසා නෑදෑයෙකු
අතින් ඉටු විය යුතු වගකීම් ඔහු
ඉෂ්ට කරාවි.”[2] **21** එවිට මෝවබ්
ජාතික රූත් මෙසේ කීවාය. “‘මගේ
සේවකයන් අස්වැන්න කපා අවසන්
වෙනකම් ඔවුන් සමඟම ඉන්න’ කිය-
ලත් ඔහු මට කිව්වා.”[3] **22** නායො-
මිද,[4] “ඒක හොඳයි. වෙන කෙතකට
ගියොත් දුවට කරදරයක් වෙන්න පුළු-
වන්.[5] ඒ නිසා බෝවස්ගේ සේවිකාවන්
එක්කම ඉන්න” කියා රූත්ට[6] පැවසු-
වාය.
**23** රූත් බෝවස්ගේ සේවිකා-
වන් සමඟ දිගටම කරල් ඇහින්-
දාය. බාර්ලි[7] හා තිරිඟු අස්වැන්න
නෙළා අවසන් වන තෙක්ම ඇය එසේ
කළාය. රූත් දිගටම ඇගේ නැන්-
දම්මා සමඟ ජීවත් වුණාය.[8]

**3** රූත්ගේ නැන්දම්මා වන
නායෝමි ඇයට මෙසේ කීවාය.
“දුවට සන්තෝෂයෙන් ඉන්න පුළුවන්
හොඳ නිවහනක් හොයලා දෙන එක
මගේ යුතුකමක්.[9] **2** දුව මේ වෙන-
කම් වැඩ කළේ අපේම නෑදෑයෙක්[10]
වන බෝවස්ගේ සේවිකාවන් එක්ක
නේද? අද රෑ ඔහු කමතේ බාර්ලි
පොළනවා.[11] **3** දුව ඇඟපත සෝදා-
ගෙන ඇඟ පුරා සුවඳ තෙල් ආලේප
කරගන්න.[12] හොඳ ඇඳුමක් ඇඳ-
ගෙන[13] කමතට යන්න. ඔහු කා බී
ඉවර වෙනකම් දුව එතැන ඉන්න බව
ඔහුට අඟවන්න එපා. **4** ඔහු නිදි-
යන තැන හොඳින් බලාගන්න. ඔහු
නිදාගත්තට පස්සේ ඔහුගේ පාදවලින්
පොරවන වස්ත්‍රය අයින් කරලා ඔහු-
ගේ පාද ළඟින් නිදාගන්න. ඊටපස්සේ
කරන්න ඕනෙ මොනවද කියලා ඔහු
දුවට කියයි.”
**5** එවිට රූත් නායෝමිට මෙසේ
කීවාය. “ඔබ කියන විදිහටම මම
කරන්නම්.” **6** ඉන්පසු ඇය කමතට
ගොස් ඇගේ නැන්දම්මා අණ කළ
ලෙස සියල්ල කළාය. **7** බෝවස්

**2 පරි.**
**1** ගීතා 112:9, හිතෝ 22:9, යෙසා 58:7, එස 18:7
**2** 1සාමු 17:17, 1සාමු 25:18, 2සාමු 17:28
**3** ලෙවී 19:9, රූත් 2:2
**4** රූත් 2:9, 1තිමෝ 5:2
**5** හිතෝ 14:21, හිතෝ 19:17, ක්‍රියා 20:35
**6** රූත් 2:7, හිතෝ 31:27
**7** යෙසා 28:27
**8** නික් 16:36, එස 45:11
**9** රූත් 2:14, යොහ 6:12, 1තිමෝ 5:4
**10** ගීතා 41:1
**11** රූත් 1:8
**12** නික් 34:6, රූත් 1:8, ගීතා 36:7, ගීතා 62:12, විලා 3:22
**13** රූත් 2:4, රූත් 3:10, 2සාමු 2:5

**2 තීරුව**
**1** රූත් 2:1
**2** ලෙවී 25:25, ද්වි 25:5, රූත් 3:9, රූත් 3:12, එෆී 1:7, හෙබ්‍රෙ 2:14
**3** රූත් 2:8
**4** රූත් 1:2
**5** යෝබ් 12:12, හිතෝ 12:15, 1කොරි 15:33, තීත 2:3
**6** රූත් 1:4
**7** රූත් 1:22
**8** රූත් 1:14, රූත් 1:16, රූත් 3:11

**3 පරි.**
**9** ද්වි 25:6, රූත් 1:9
**10** ලෙවී 25:25, ද්වි 25:5, රූත් 2:1, රූත් 2:20, රූත් 3:12
**11** යෙසා 30:24
**12** 2සාමු 12:20, 2සාමු 14:2, දේශ 9:8
**13** 1තිමෝ 2:9

රූත් **2:17*** නික් 16:36හි පාදසටහන බලන්න. **20*** හෝ, “ළැදි ප්‍රේමය.”

රූත් **2:20*** මූ.අ., “අපේ මුදවාගන්නෙක්.”

කා බී සතුටු සිතින් සිටියේය.[1] ඉන්
අනතුරුව ඔහු ධාන්‍ය ගොඩ කෙළව-
රට ගොස් නිදාගත්තේය. පසුව රූත්
හීන් සැරේ එතැනට ගොස් ඔහුගේ
පාදවලින් පොරවන වස්ත්‍රය ඉවත්
කර ඔහුගේ පාද ළඟින් නිදාගත්තාය.
**8** මධ්‍යම රාත්‍රියේදී බෝවස් තිගැස්සී
ඇහැරුණේය. එවිට තම පාද ළඟ
ස්ත්‍රියක නිදා සිටිනවා ඔහු දුටුවේය.
**9** ඔහුද, "ඔබ කවුද" කියා ඇගෙන්
ඇසුවේය. ඇයද, "මම ඔබේ දාසිය
වන රූත්. ඔබේ දාසියට ඔබේ රැකව-
රණය ලබා දෙන්න.* ඔබ අපේ
නෑදෑයෙක්# නිසා නෑදෑයෙකු අතින්
ඉටු විය යුතු වගකීම්[2] ඉටු කරන
මෙන් මම ඔබෙන් ඉල්ලා සිටිනවා"
කියා ඔහුට පැවසුවාය. **10** එවිට
ඔහු මෙසේ පැවසුවේය. "යෙහෝවා
දෙවිගෙන් ඔබට ආශීර්වාද ලැබේවා![3]
ඔබ කලින් කළ[4] සියලු ක්‍රියාවලට
වඩා දැන් කළ මේ දෙයින් ඔබේ ප්‍රේ-
මය*[5] ඔප්පු කර පෙන්නුවා. ඔබට
ධනවත් හෝ දුප්පත් තරුණයෙක්ව
තෝරාගන්න පුළුවන්කම තිබියදීත්
ඔබ එහෙම කළේ නැහැ. **11** ඉතින්
දුවේ, දැන් භය වෙන්න එපා. ඔබ
කියන හැම දෙයක්ම මම කරන්නම්.[6]
ඔබ ඉතා අගනා කාන්තාවක් කියලා
මගේ නුවරේ* වැසියන් සියලුදෙනාම
දන්නවා.[7] **12** මම ඔබේ නෑදෑයෙක්
බව ඇත්තයි.[8] ඒත් මට වඩා ළඟින්
නෑ වෙන තවත් කෙනෙක් ඉන්නවා.[9]
**13** අද රෑ ඔබ මෙහෙ ඉන්න. හෙට
උදේට මම ඔහු සමඟ කතා කරන්-
නම්. නෑදෑයෙකු අතින් ඉටු විය යුතු
වගකීම ඔබ වෙනුවෙන් ඉෂ්ට කරන්න
ඔහු කැමති වුණොත්*[10] හොඳයි.
නමුත් ඔහු අකමැති වුණොත් මම ඒ
වගකීම භාරගන්න බවට ජීවමාන
දෙවි වන යෙහෝවාගේ නාමයෙන්
දිවුරා පොරොන්දු වෙනවා.[11] ඒ නිසා
උදේ වෙනකම් මෙහෙ ඉන්න."

**14** එබැවින් ඇය අලුයම වන තුරු
ඔහුගේ පාද ළඟ නිදා සිටියාය.
කිසිවෙකු ඇයව නොදකින පිණිස
ඇය එළිය වැටෙන්න කලින් පිටත්ව
යෑමට සූදානම් වූවාය. එවිට බෝවස්,
"කමතට ස්ත්‍රියක් ආ බව කිසි කෙ-
නෙකුට දැනගන්න ඉඩ තියන්න
එපා"[1] යයි ඇයට කීවේය. **15** ඔහු
තවදුරටත්, "ඔබ පොරවාගෙන ඉන්න
සළුව දිගහරින්න" යයි කීවේය. ඇය
තම පිට සළුව දිගහැරිය විට ඔහු
බාර්ලි මිනුම් හයක් මැන එයට දැමු-
වේය. ඉන්පසු ඔහු නුවරට ගියේය.
**16** රූත් ඇගේ නැන්දම්මා වෙත
ගියාය. නැන්දම්මා, "මේ මගේ දුව
රූත් නේද" කියා ඇගෙන් ඇසුවාය.
රූත්ද බෝවස් කළ සියල්ල ගැන
ඇයට කීවාය. **17** තවද, "'ඔබේ
නැන්දම්මා ළඟට හිස් අතින් යන්න
එපා'[2] කියලා ඔහු මේ බාර්ලි මිනුම්
හයත් මට දුන්නා" කියා ඇය කීවාය.
**18** එවිට නායොමි, "ඊළඟට මොන-
වද වෙන්නේ කියලා ටිකක් ඉවසලා
බලා ඉන්න. ඔහු කොහොමහරි අදම
මේ කාරණය විසඳන බව මට විශ්වා-
සයි"[3] කියා පැවසුවාය.

**4** බෝවස් නුවර දොරටුව[4] ළඟට
ගොස් එහි හිඳගත්තේය. ටික
වේලාවකට පසුව, බෝවස් රූත්ට
කියූ ඒ නෑදෑයා[5] එතැනට ආවේය.
එවිට බෝවස්, "පොඩ්ඩක් නවතින්න.
මෙතැනට ඇවිත් ටිකක් ඉඳගන්න"
කියා ඒ නැනැත්තාට* කීවේය.
ඔහුද එතැනට ඇවිත් හිඳගත්තේය.
**2** ඉන් අනතුරුව, බෝවස් නුවරේ
වැඩිමහල්ලන්[6] දසදෙනෙකුව කැඳවා,
"මෙතැන ඉඳගන්න" යයි ඔවුන්ට
කීවේය. ඔවුහුද එහි හිඳගත්තෝය.
**3** ඉන්පසු බෝවස් එම නෑදෑයාට[7]
මෙසේ කීවේය. "අපේ නෑයෙක් වන
එලිමෙලෙක්ගේ[8] බිම් කොටස මෝ-
වබ්[9] දේශයෙන් ආ නායොමිට විකු-
ණන්න සිද්ධ වෙලා. **4** ඔබට ඒ
ගැන දැන්වීම මගේ යුතුකමක් කියලා

---

රූත් **3:9*** මූ.අ., "ඔබේ වස්ත්‍රයෙන් ඔබේ දාසි-
යව වසන්න." **9#** මූ.අ., "අපේ මුදවාගන්නෙක්."
**10*** හෝ, "ලැදි ප්‍රේමය." **11*** මූ.අ., "දොරටුව
අසල." **13*** මූ.අ., "ඔහු ඔබව මුදවාගත්තොත්."

රූත් **4:1*** ඔහුගේ නම සඳහන් කර නැත.

---

**3 පරි.**
1 විනි 19:6, ගීතා 104:15, දේශ 3:13, දේශ 10:19
2 ලෙවී 25:25, ද්වි 25:5, රූත් 2:20
3 රූත් 2:4
4 රූත් 1:16
5 හිතෝ 11:17, හිතෝ 19:22
6 රූත් 3:9
7 හිතෝ 31:30, හිතෝ 31:31, 1තිමෝ 2:10, 1පේතෘ 3:4
8 ලෙවී 25:25, රූත් 2:20
9 රූත් 4:1
10 රූත් 3:9, රූත් 4:5, මතෙ 22:24
11 ද්වි 6:13, විනි 8:19, 1සාමු 14:39, 2කොරි 1:23

**2 තීරුව**
1 රෝම 12:17, රෝම 14:16, 1කොරි 10:32
2 ගීතා 37:5, යාකො 1:27
3 ගීතා 138:8, රෝම 8:28, 1පේතෘ 5:7

**4 පරි.**
4 ද්වි 16:18, ද්වි 21:19, ද්වි 22:15, ද්වි 25:7
5 රූත් 3:12
6 ද්වි 19:12, ද්වි 29:10, යොෂු 20:4, විනි 8:14, 1රාජා 21:8, හිතෝ 31:23, ක්‍රියා 6:12
7 ලෙවී 25:25, ද්වි 25:5, රූත් 2:20
8 රූත් 1:2
9 රූත් 1:1, රූත් 1:6

මට හිතුණා. මගේ නුවර වැසියන් ඉදි-
රියෙන් වැඩිමහල්ලන් ඉදිරියෙන්[1] ඒ
ඉඩම මිල දී ගන්න[2] ඔබට පුළුවන්. ඒ
ඉඩම මිල දී ගන්න වැඩි අයිතිය
තියෙන්නේ ඔබටයි.[3] ඔබට පස්සේ
ඒක මිල දී ගන්න අයිතිය තියෙන්නේ
මට. ඔබ ඒක මිල දී ගන්නවා නම්*
එහෙම කරන්න. ඒත් ඔබ ඒකට අක-
මැති නම් මට කියන්න.” එවිට ඒ
මනුෂ්‍යයා, “මම ඒක මිල දී ගන්-
නම්”[4] කියා කීවේය. **5** එවිට බෝ-
වස්, “එම කෙත නායොමිට විතරක්
නෙවෙයි ඇගේ මිය ගිය පුතාගේ
බිරිඳ වූ මෝවබ් ජාතික රූත්ටත්
අයිති බව අමතක කරන්න එපා.
ඒ නිසා ඒ දෙදෙනාගෙන්ම කෙත
මිල දී ගත යුතුයි. එතකොට මිය
ගිය තැනැත්තාගේ නමින්ම උරුමය
පවත්වාගන්න පුළුවන්”[5] කියා ඔහුට
පැවසුවේය. **6** ඉන්පසු ඒ නෑදෑයා
මෙසේ කීවේය. “මට ඒක මිල දී
ගන්න හැකියාවක් නැහැ. මොකද
එහෙම කළොත් මගේ උරුමයට
අලාභයක් සිදු වෙයි. මට ඒක මිල දී
ගන්න බැරි නිසා මිල දී ගැනීමේ අයි-
තිය ඔබට පවරනවා. ඔබම ඒක මිල
දී ගන්න.”

**7** ඒ දවස්වලදී, යමක් මුදවාගැනී-
මට තමන් සතු අයිතිය හෝ තමන්ට
අයිති වෙන යම් දෙයක් හෝ වෙ-
නත් කෙනෙකුට භාර දීමට මිනි-
සෙකුට අවශ්‍ය වූ විට ඔහු
කළේ මෙලෙසයි. එම කාරණය ස්ථිර
කරගැනීම සඳහා ඔහු තම පාව-
හනක්[6] ගලවා අනික් මිනිසාට දුන්-
නේය. එය ඊශ්‍රායෙල් දේශයෙහි පැවති
චාරිත්‍රයකි. **8** එබැවින්, “ඔබම ඒක
මිල දී ගන්න” කියා බෝවස්ට
කියද්දී ඒ මිනිසා තම පාවහන[7]
ගැලෙව්වේය. **9** එවිට බෝවස්
වැඩිමහල්ලන්ටත් එතැන රැස්ව සිටි
සියලුදෙනාටත් මෙසේ කීවේය. “එලි-
මෙලෙක්ටද කිලියෝන්ට හා මාලන්-
ටද අයිති සියල්ල මම නායොමිගෙන්
මිල දී ගන්න බවට ඔබ සියලුදෙනාම
අද සාක්ෂිකරුවන්.[1] **10** මාලන්ගේ
බිරිඳ වූ මෝවබ් ජාතික රූත්වත්
මගේ බිරිඳ හැටියට මම මිල දී ගන්-
නවා. එතකොට මිය ගිය මිනිසාගේ
නමින්ම[2] ඔහුගේ උරුමය පවතියි.
ඔහුගේ සහෝදරයන් අතරෙනුත් ඔහු-
ගේ නුවරෙනුත් ඔහුගේ නම මැකී
යන්නේ නැහැ. මේකට අද ඔබ සියලු-
දෙනාම සාක්ෂිකරුවන්.”[3]

**11** එවිට නුවර දොරටුවේ සිටි
සියලුදෙනාද වැඩිමහල්ලෝද මෙසේ
කීවෝය. “අපි සාක්ෂිකරුවෝ. ඔබේ
නිවසට එන බිරිඳට යෙහෝවා දෙවි-
ගෙන් ආශීර්වාද ලැබේවා! ඇය ඊශ්‍රා-
යෙල් පෙළපත ගොඩනැඟූ[4] රාකෙල්[5]
හා ලෙයා[6] මෙන් වේවා! ඔබත් එෆ්‍රා-
තාහි[7] හොඳ නමක් ඇති කරගන්න.
බෙත්ලෙහෙමේ[8] වැසියන්ගේ ගෞර-
වය දිනාගන්න. **12** යෙහෝවා දෙවි
මේ තරුණියගෙන්[9] ඔබට ලබා දෙන
දරුවා නිසා ඔබේ පවුලත් යූදාට දාව
තාමර් බිහි කළ පේරෙස්ගේ පවුල
මෙන් වේවා!”[10]

**13** මෙසේ, බෝවස් රූත්ව ඔහු-
ගේ බිරිඳ ලෙස භාරගත්තේය.
ඔවුහු අඹුසැමියන් ලෙස ජීවත් වූහ.
යෙහෝවා දෙවි රූත්ට ආශීර්වාද
කළේය. ඇය පිළිසිඳගෙන පුතෙකු
බිහි කළාය.[11] **14** ස්ත්‍රීහු නායොමිට
මෙසේ කීවෝය.[12] “යෙහෝවා දෙ-
විට ප්‍රශංසා වේවා![13] ඔබට පිහිට
වෙන්න නෑදෑයෙකු දෙන්න ඔහු අම-
තක කළේ නැහැ. ඔහු එසේ කළේ
ඔහුගේ නාමය ඊශ්‍රායෙල්හි ප්‍රකාශ වන
පිණිසයි. **15** ඔබට ආදරේ කරන
ඔබේ ලේලි[14] පුතුන් හත්දෙනෙකුටත්
වඩා වටිනවා.[15] ඇය බිහි කළ මේ
දරුවා නිසා ඔබට අලුත් ජීවිතයක්
ලැබුණා. මේ දරුවා ඔබේ මහලු
වයසේදී ඔබව රැකබලා ගනියි.”[16]
**16** නායොමි දරුවාව රැගෙන තුරුල්
කරගත්තාය. ඔහුව රැකබලා ගත්-
තේ ඇයයි. **17** අසල්වැසි කාන්-
තාවෝ,[17] “නායොමිට පුතෙක් බිහි

රූත් **4:4*** මු.අ., “මුදවාගන්නවා නම්.”

**4 පරි.**
1 උත් 23:18, යෙරෙ 32:10
2 යෙරෙ 32:7
3 ලෙවී 25:25, රූත් 2:20
4 රූත් 3:13
5 උත් 38:8, ද්වි 25:5, ලූක් 20:28
6 ද්වි 25:9
7 ද්වි 25:9

**2 තීරුව**
1 උත් 23:18, ද්වි 19:15, රූත් 4:4, යෙරෙ 32:12
2 උත් 38:8, ද්වි 25:6, රූත් 2:20, රූත් 4:5
3 රූත් 4:4, යෙසා 8:2
4 උත් 28:3, උත් 35:23, උත් 35:24, උත් 46:15, උත් 46:18, උත් 46:22, උත් 46:25
5 උත් 29:30
6 උත් 29:23
7 උත් 35:19, උත් 48:7
8 රූත් 1:1, මීකා 5:2
9 ද්වි 28:4, ගීතා 127:3
10 උත් 38:29, ගණන් 26:20, 1ලේක 2:4, මතෙ 1:3
11 උත් 29:31, 1සාමු 1:27, ගීතා 127:3
12 ලූක් 1:58, රෝම 12:15
13 උත් 24:27, ගීතා 145:1, ලූක් 1:68
14 රූත් 1:16, 1කොරි 13:5
15 1සාමු 1:8
16 ගීතා 55:22, යෙසා 46:4, හෙබ්‍රෙ 11:6
17 ලූක් 1:58

වෙලා” යයි කියමින් ඔහුට ඕබෙද්*[1]
යන නම දුන්නෝය. ඕබෙද් යෙස්-
සේගේ පියාය.[2] යෙස්සේ දාවිත්ගේ
පියාය.
18 පේරෙස්ගේ[3] පරම්පරාව මෙ-
යයි. පේරෙස්ගේ පුත්‍රයා හෙ-
ස්‍රොන්ය.[4] 19 හෙස්‍රොන්ගේ පුත්‍රයා
රාම්ය.[5] රාම්ගේ පුත්‍රයා අමිනදාබ්ය.
20 අමිනදාබ්ගේ[1] පුත්‍රයා නාෂොන්ය.[2]
නාෂොන්ගේ පුත්‍රයා සල්මොන්ය.
21 සල්මොන්ගේ[3] පුත්‍රයා බෝ-
වස්ය. බෝවස්ගේ[4] පුත්‍රයා ඕබෙද්ය.
22 ඕබෙද්ගේ පුත්‍රයා යෙස්සේය.[5]
යෙස්සේගේ පුත්‍රයා දාවිත්ය.[6]

රූත් **4:17*** තේරුම, “සේවය කරන්නා.”

**4 පරි.**
1 මතෙ 1:5; ලූක් 3:32
2 1සාමු 17:12; යෙසා 11:1; රෝම 15:12
3 රූත් 4:12
4 උත් 46:12; ගණන් 26:21; 1ලේක 2:5
5 1ලේක 2:9; මතෙ 1:3

**2 තිරුව** **1** නික් 6:23; 1ලේක 2:10; ලූක් 3:33; **2** ගණන් 1:7; **3** 1ලේක 2:11; ලූක් 3:32; **4** 1ලේක 2:12; **5** රූත් 4:17; 1සාමු 16:1; **6** 2සාමු 7:12; 1ලේක 2:15; මතෙ 1:6; ලූක් 3:31.

# පළමුවෙනි
# සාමුවෙල්*

නැතහොත් ග්‍රීක සෙප්තුඅජින්ට් පරිවර්තනයට අනුව
පළමුවෙනි රාජාවලිය

**1** එෆ්‍රායිම් කඳුකරයේ[1] රාමතායිම්-
ෂෝපිම්[2] නම් පළාතේ එල්-
කානා[3] නම් වූ මනුෂ්‍යයෙක් ජීවත්
විය. ඔහු එෆ්‍රායිම්වරයෙකු* වූ
යෙරොහාම්ගේ පුත්‍රයාය. යෙරොහාම්
එලිහුගේ පුත්‍රයාය. එලිහු තොහුගේ
පුත්‍රයාය. තොහු ෂූප්ගේ[4] පුත්‍රයාය.
**2** එල්කානාට භාර්යාවෝ දෙදෙ-
නෙක් සිටියෝය. එක් භාර්යාවක-
ගේ නම හන්නාය. අනික් භාර්යාව
පෙනින්නාය. පෙනින්නාට දරුවන්
සිටි නමුත් හන්නාට දරුවෝ සිටියේ
නැත.[5] **3** එල්කානා අවුරුදු පතා
ස්වර්ගයේ සේනාවල අධිපති වන
යෙහෝවා දෙවිට නමස්කාර කරන
පිණිස[6] තමන් ජීවත් වූ නුවරේ සිට
ශීලෝ නුවරට ගියේය.[7] එහිදී ඔහු දෙ-
විට පුදපූජාද ඔප්පු කළේය. ඒලීගේ
පුත්‍රයන් වූ හොප්නී සහ පිනෙහාස්,[8]
යෙහෝවා දෙවිගේ පූජකයන් ලෙස
එහි සේවය කළෝය.[9]
**4** එල්කානා පූජා ඔප්පු කළ අවස්-
ථාවලදී ඔහුගේ භාර්යාව වූ පෙනින්-
නාටද ඇගේ පුත්‍රයන්ටද දූවරුන්ටද
පූජා කළ දෙයින් කොටස බැගින්
දුන්නේය.[1] **5** ඔහු හන්නාට දුන්-
නේ එක කොටසක් පමණි. එහෙත්
ඔහු වැඩියෙන්ම ප්‍රේම කළේ
ඇයටය.[2] යෙහෝවා දෙවි ඒ වන
විටත් මවක් වීමේ ආශීර්වාදය ඇයට
ලබා දී තිබුණේ නැත.*[3] **6** ඇයට
යෙහෝවා දෙවිගෙන් ඒ ආශීර්වා-
දය නොලැබුණු නිසා එල්කානාගේ
අනික් භාර්යාව ඇයව ලැජ්ජාවට
පත් කරවන පිණිස නිතරම ඇයට
නින්දා අපහාස කළාය.[4] **7** ඇය
අවුරුදු පතා[5] යෙහෝවා දෙවිගේ
ගෘහයට යන විට[6] හන්නාට එසේ
කළාය. ඇය මොන තරම් හන්නාට
නින්දා අපහාස කළාද කිවහොත්
හන්නා නොකා නොබී හඬමින් සිටි-
යාය. **8** එවිට එල්කානා ඇගෙන්
මෙසේ ඇසුවේය. “හන්නා, ඇයි ඔබ
මේ විදිහට අඬන්නේ? ඇයි ඔබ
නොකා නොබී දුකෙන් ඉන්නේ?[7]

1සාමු නම* තේරුම, “දෙවිගේ නම.” එනම්, දෙවිගේ නාමයෙන් අයැදිනවා. **1:1*** එල්කානාව එෆ්‍රායිම්වරයෙකු ලෙස හැඳින්වූයේ ඔහු එෆ්‍රායිම් ගෝත්‍රයට අයත් දේශයේ පදිංචිව සිටි නිසාය. ඇත්තෙන්ම ඔහු ලෙවී ගෝත්‍රයට අයත් කෙනෙකි.

1සාමු **1:5*** මූ.අ., “ගර්භය වසා තැබුවේය.”

**1 පරි.**
1 යොෂු 16:5; යොෂු 17:16
2 1සාමු 1:19; 1සාමු 7:17; 1සාමු 28:3
3 1ලේක 6:27
4 1ලේක 6:35
5 උත් 16:1; උත් 29:31
6 ගීතා 95:6
7 නික් 23:14; නික් 34:23; ද්වි 12:5; යොෂු 18:1; විනි 21:19; ලූක් 2:41
8 1සාමු 2:12; 1සාමු 2:22; 1සාමු 2:34; 1සාමු 4:17
9 ගණන් 3:10; ද්වි 33:10; මලා 2:7

**2 තිරුව**
1 ලෙවී 7:15; ද්වි 12:6
2 උත් 29:30; ද්වි 21:15
3 උත් 20:18; උත් 30:2
4 උත් 16:4
5 ද්වි 16:16; 1සාමු 1:3
6 1සාමු 2:19
7 උත් 30:1

පුත්තු දහදෙනෙකුට වඩා ඔබට මාව
වටින්නේ නැද්ද?"[1]
**9** ෂීලෝහිදී ඔවුන් කා බී අවසන් වූ
පසු හන්නා නැඟිට එතැනින් පිටත්ව
ගියාය. ඒ වේලාවේ පූජක ඒලී, යෙ-
හෝවා දෙවිගේ මාලිගාවට*[2] ඇතුල්
වන ස්ථානයේ තිබෙන ආසනයේ හිඳ-
ගෙන සිටියේය. **10** හන්නා ඇගේ
සිතේ තිබූ ශෝකය[3] නිසා හඬහඬා[4]
යෙහෝවා දෙවිට යාච්ඤා කළාය.[5]
**11** ඈ දෙවිට භාරයක් වෙමින්[6] මෙසේ
කීවාය. "අනේ, ස්වර්ගයේ සේනා-
වල අධිපති වන යෙහෝවා දෙවියනි,
ඔබේ දාසියක වන මා විඳින දුක් වේ-
දනා දිහා බලා[7] මාව සිහි කරන්න.[8]
අනේ, ඔබේ දාසියගේ කන්නලව් අම-
තක නොකර ඔබේ දාසියට පිරිමි
දරුවෙකු ලබා දෙන්න. යෙහෝවා දෙ-
වියනි, මම ඔහුව මුළු ජීවිත කාලය
පුරාම ඔබට සේවය කිරීම සඳහා කැප
කරන්නම්. කවදාවත් ඔහුගේ හිස-
කෙස් නොකපන්නත් මම පොරොන්දු
වෙනවා."[9]
**12** ඇය බොහෝ වේලාවක්[10] යෙ-
හෝවා දෙවි ඉදිරියේ මෙසේ
යාච්ඤා කරමින් සිටියදී ඒලී ඇය
දෙස බලා සිටියේය. **13** ඇය දෙවි
සමඟ නිහඬව කතා කරමින් සිටි
නිසා[11] ඇගේ තොල් සෙලවුණු නමුත්
කටහඬ ඇසුණේ නැත. එබැවින්
ඒලී ඇය බීමත්ව සිටිනවා කියා
සිතා[12] **14** ඇගෙන් මෙසේ ඇසු-
වාය. "තව කොච්චර වෙලාවක් ඔබ
බීමත්ව ඉන්නද හදන්නේ?[13] මෙ-
තැනින් යන්න. ඔබේ වෙරි මත
හිඳෙන තුරු එන්න එපා." **15** එවිට
හන්නා මෙසේ කීවාය. "මගේ ස්වා-
මීනි, මා ගැන එහෙම හිතන්න එපා.
මා වයින්වත් වෙන කිසි මත්පැන් වර්-
ගයක්වත් බිව්වෙ නැහැ. මම හිටියේ
යාච්ඤා කරමින්. මම ගොඩක් හිතේ
දුකෙන් ඉන්නේ. මගේ හිතේ තියෙන
දුක මම යෙහෝවා දෙවිට කිව්වා.[14]
**16** ඔබේ දාසිය කිසි කමකට නැති
කෙනෙක්[1] කියා හිතන්න එපා. මම
මෙතරම් වෙලාවක් දෙවිට කතා
කළේ මගේ හිතේ තියෙන දුක මට
දරාගන්න බැරි නිසයි."[2] **17** එවිට
ඒලී මෙසේ කීවේය. "දැන් ඉතින්
සමාදානයෙන් යන්න.[3] ඊශ්‍රායෙල්හි
දෙවි ඔබේ ඉල්ලීම ඉටු කර දෙනු
ලැබේවා!"[4] **18** එවිට ඇය මෙසේ
කීවාය. "ඔබේ දාසියට ඔබෙන් කරු-
ණාව ලැබේවා!"[5] ඉන්පසු ඇය එතැ-
නින් පිටත්ව ගොස් කෑම කෑවාය.[6]
ඇය තවදුරටත් ඇගේ ප්‍රශ්නය ගැන
කනස්සලු වූයේ නැත. ඇගේ මුහුණෙද
මලානිකව නොතිබුණේය.[7]
**19** පසුවදා උදෑසන ඔවුහු අවදි වී
යෙහෝවා දෙවිට නමස්කාර කළ
පසු රාමාහි[8] ඔවුන්ගේ නිවස බලා
පිටත් වූහ. යෙහෝවා දෙවි හන්නාගේ
ඉල්ලීම අමතක නොකළේය.[9] එල්-
කානා ඔහුගේ භාර්යාව වන හන්නා
සමඟ සයනය කළේය.[10] **20** අවු-
රුද්දක් පමණ ගෙවුණු පසු ඇය ගැබ්-
ගෙන පුතෙකු බිහි කළාය. ඇය ඔහුට
සාමුවෙල් යන නම[11] තබමින් මෙසේ
කීවාය. "මා ඔහුව ඉල්ලුවේ[12] යෙ-
හෝවා දෙවිගෙන්ය."
**21** එල්කානා සෑම අවුරුද්දකම
කරන්නාක් මෙන් යෙහෝවා දෙ-
විට පූජා ඔප්පු කිරීම සඳහාත්[13]
ඔහු වූ භාර ඔප්පු කිරීම සඳහාත්[14]
ඔහුගේ නිවසේ සියලුදෙනා සමඟ
පිටත්ව ගියේය. **22** නමුත් හන්නා
ඔහු සමඟ ගියේ නැත.[15] මන්ද
ඇය ඔහුට මෙසේ කියා තිබිණ.
"දරුවා කිරි වැරුවට පස්සේ[16] මම
ඔහුව යෙහෝවා දෙවි ඉදිරියට ගෙන
යන්නම්. එවිට ඔහුට ජීවිත කාලය
පුරාම එහි සේවය කරන්න පුළුවන්."[17]
**23** එල්කානා[18] ඇයට මෙසේ කීවේය.
"ඔබට හොඳයි කියා හිතෙන දෙ-
යක් කරන්න.[19] දරුවාගේ කිරි වරන
කාලය ඉවර වෙනකම් ගෙදර ඉන්න.
යෙහෝවා දෙවි ඔහුගේ පොරොන්දු

**1 පරි.**
**1** රූත් 4:15 සල 8:6
**2** නික් 25:8 නික් 40:2 1සාමු 1:24 1සාමු 3:3 2සාමු 7:2 2සාමු 22:7 ගීතා 27:4
**3** යෝබ් 7:11 යෙසා 38:15
**4** 2රාජා 20:3
**5** ගීතා 55:22 ගීතා 65:2
**6** ගණන් 30:7 ගණන් 30:14 ද්වි 23:23 දේශ 5:4
**7** යෙසා 66:2 ලූක් 1:38 හෙබ්‍රෙ 4:16
**8** උත් 30:22
**9** ගණන් 6:5 විනි 13:5 ලූක් 1:15
**10** ලූක් 18:1 කොලො 4:2 1තෙස 5:17
**11** උත් 24:45 නෙහෙ 2:4
**12** ක්‍රියා 2:13
**13** හිතෝ 18:13 යාකො 1:19
**14** ගීතා 42:4 ගීතා 42:6 ගීතා 62:8 ගීතා 142:2

**2 තීරුව**
**1** ද්වි 13:13 1සාමු 10:27 1සාමු 25:25 1සාමු 30:22
**2** යෝබ් 6:2 යෝබ් 10:1
**3** විනි 18:6 1සාමු 25:35 මාක් 5:34 ලූක් 7:50 ලූක් 8:48
**4** 1සාමු 1:11 ගීතා 20:4 ගීතා 65:2
**5** උත් 33:15 රූත් 2:13
**6** දේශ 9:7
**7** පිලි 4:7 1පේතෘ 5:7
**8** 1සාමු 1:1
**9** 1සාමු 1:11 ගීතා 66:19 හිතෝ 15:29
**10** උත් 4:1 රූත් 4:13
**11** උත් 5:29 උත් 41:51 නික් 2:22 මතෙ 1:21
**12** මතෙ 7:7 1යොහ 5:14
**13** 1සාමු 1:3
**14** ගණන් 15:3; ගණන් 15:8; ද්වි 23:23; **15** ද්වි 16:16; **16** 2ලේක 31:16; යෙසා 28:9; **17** 1සාමු 1:11; 1සාමු 2:11; 1සාමු 3:1; **18** එෆී 5:25; 1පේතෘ 3:7; **19** ගණන් 30:7.

**1සාමු 1:9*** එනම්, දෙවිගේ ශුද්ධ කූඩාරමට.

ඉෂ්ට කරනු ලැබේවා!”[1] එබැවින් ඇ
ගෙදර නතර වී ඇගේ පුතා කිරි වරන
තෙක්[2] ඔහුව රැකබලා ගත්තාය.

**24** දරුවා කිරි වැරූ පසු හන්නා
අවුරුදු තුනක් වයසැති වස්සෙකු-
වද පිටි ඒපාවක්ද* විශාල වයින්
භාජනයක්ද[3] රැගෙන දරුවා සමඟ
ෂීලෝහි[4] තිබෙන යෙහෝවා දෙ-
විගේ ගෘහයට ගියාය. **25** වස්සාව
මැරූ පසු ඔවුහු දරුවාව ඒලී[5] වෙත
ගෙනාවෝය. **26** එවිට ඇය මෙසේ
කීවාය. “මගේ ස්වාමීනි, මේ ස්ථාන-
යට ඇවිත් ඔබ ඉදිරියේ යෙහෝවා
දෙවිට යාච්ඤා කරමින්[6] සිටිය ස්ත්‍රිය
මමයි. ඒ ස්ත්‍රිය මම මිස වෙන කවු-
රුත් නෙමෙයි කියා මම දිවුරලා
කියනවා.[7] **27** මට දරුවෙක් ලබා
දෙන්න කියලයි මම එදා යෙහෝවා
දෙවිට යාච්ඤා කළේ.[8] දෙවි මගේ ඒ
ඉල්ලීම ඉෂ්ට කළා.[9] මේ ඉන්නේ ඒ
දරුවා. **28** ඒ නිසා දැන් මම මේ
දරුවාව යෙහෝවා දෙවිට භාර දෙ-
නවා.[10] ඔහුගේ මුළු ජීවිත කාලය
පුරාම ඔහු අයිති යෙහෝවා දෙවිටයි.”

එවිට ඔහු* යෙහෝවා දෙවි ඉදිරියේ
හිස නමා නමස්කාර කළේය.[11]

**2** එවිට හන්නා මෙසේ යාච්ඤා
කළාය.[12]

“යෙහෝවා දෙවියනි, ඔබ නිසා
මගේ සිත ප්‍රීතියෙන් ඉපිල
යන්නේය.[13]
යෙහෝවා දෙවියනි, සැබවින්ම
ඔබ මගේ සවිය* වැඩි කළෙ-
හිය.[14]
ඔබ මා ගැලවූ නිසා මම ප්‍රීති
වෙමි.[15]
නිර්භීතව මගේ සතුරන්ට
විරුද්ධව කතා කරන්නෙමි.

**2** යෙහෝවා දෙවියනි, ඔබ තරම්
ශුද්ධ වෙන කිසිවෙක් නැත.
මන්ද ඔබ හැර වෙන කිසි
දෙවි කෙනෙක් නැත.[1]
අපේ දෙවිට සමාන වූ පර්වත-
යක් නැත.[2]

**3** ජනයෙනි, උඩඟු ලෙස පුරසාරම්
නොදොඩන්න.
අහංකාර ලෙස කතා නොක-
රන්න.[3]
මන්ද යෙහෝවා දෙවි සියල්ල
දන්නා දෙවි කෙනෙකි.[4]
ඔහු සෑම ක්‍රියාවක්ම සාධාරණව
විනිශ්චය කරන්නේය.[5]

**4** දක්ෂ දුනුවායෝ නැතිගෙන
සිටින්නෝය.[6]
නමුත් බෙලහීන අය ශක්ති-
මත්ව සිටින්නෝය.*[7]

**5** කා බී තෘප්තිමත්ව සිටි අය දැන්
කෑම සොයාගැනීමට කුලී
වැඩ කරන්නෝය.[8]
නමුත් බඩගින්නේ සිටි අයට
තවත් බඩගිනි නොවන්-
නේය.[9]
වඳ ස්ත්‍රියට දැන් දරුවන් හත්දෙ-
නෙක් සිටින්නෝය.[10]
නමුත් බොහෝ දරුවන් වැදූ
තැනැත්තිය දැන් දුබලව
සිටියි.[11]

**6** දිවි රකින්නෙත් දිවි තුරන් කරන්-
නෙත් යෙහෝවා දෙවිය.[12]
මිනී වළට[13] යවන්නෙත් එයින්
ගොඩගන්නෙත් ඔහුමය.[14]

**7** යමෙකුව දිළිඳුකමට පත් කරන්-
නෙත්[15] පොහොසත් කරන්-
නෙත් යෙහෝවා දෙවිය.[16]
යමෙකුව පහත් කරන්නෙත්
උසස් කරන්නෙත් ඔහුය.[17]

**8** පොළොවේ අත්තිවාරම තිබෙන්-
නේ යෙහෝවා දෙවිගේ
අතේය.[18]

**1 පරි.**
1 යෙසා 55:11, තීත 1:2, හෙබ්‍රෙ 6:18
2 2ලේක 31:16, යෙසා 28:9
3 ගණන් 15:10
4 යොෂු 18:1, 1සාමු 1:9
5 1සාමු 1:3
6 1සාමු 1:15
7 1සාමු 17:55, 1සාමු 20:3, 2සාමු 11:11, 2රාජා 2:2, 2රාජා 4:30, දේශ 9:5
8 ගීතා 21:2, ගීතා 37:4
9 1සාමු 1:11, 1සාමු 1:17, ගීතා 66:19, මතෙ 7:7, 1යොහ 5:15
10 විනි 11:31
11 ගීතා 95:6

**2 පරි.**
12 පිලි 4:6
13 ගීතා 13:6, ලූක් 1:46, රෝම 5:11
14 ගීතා 18:2, ගීතා 89:17, ගීතා 92:10
15 ගීතා 9:14, ගීතා 13:5

**2 තීරුව**
1 නික් 15:11, ද්වි 3:24, ද්වි 4:35, ගීතා 73:25, ගීතා 86:8, ගීතා 89:6
2 ද්වි 32:4, 2සාමු 22:32
3 ගීතා 94:4, යාකො 1:26, යාකො 3:8
4 යෝබ් 36:4, යෝබ් 37:16, ගීතා 147:5, රෝම 11:33
5 හිතෝ 16:2, හිතෝ 24:12
6 ගීතා 37:15, ගීතා 76:3
7 යෙසා 40:29
8 ගීතා 34:10
9 ලූක් 1:53
10 1සාමු 1:11, 1සාමු 1:20, ගීතා 113:9
11 යෙසා 54:1, ගලා 4:27
12 ද්වි 32:39, ගීතා 68:20
13 ගීතා 89:48
14 යෝබ් 14:13; ගීතා 30:3; ගීතා 49:15; ගීතා 86:13; යොහ 11:24; 1කොරි 15:55; **15** ද්වි 28:15; **16** ද්වි 8:18; ද්වි 28:12; 2ලේක 1:12; යෝබ් 42:12; හිතෝ 10:22; 2කොරි 9:11; **17** ගීතා 75:7; පිලි 2:9; **18** යෝබ් 38:4; ගීතා 102:25.

**1සාමු 1:24*** ඒපාවක් යනු ලීටර් 22ක් ඇමිය හැකි මිනුම් භාජනයකි. **28*** මෙහි සඳහන් වන්නේ එල්කානා ගැනයි. 1සාමු 2:11 බලන්න. **2:1*** මූ.අ., “මාගේ අඟ උසස් කළේය.” සාමාන්‍යයෙන් බයිබලයේ බලය සහ අධිකාරිය සංකේතවත් කිරීමට අඟ හෝ අං යන වචන යොදා තිබේ.

**1සාමු 2:4*** මූ.අ., “ශක්තියෙන් සැරසෙන්නෝය.”

ඔහු ඒ මත පොළොව පිහිටුවන්-
නේය.
එබැවින් අධිපතීන් සමඟ හිඳු-
වන පිණිසත් තේජවත්
සිංහාසනයක්[1] උරුම කර
දෙන පිණිසත්[2]
ඔහු දුප්පතුන්ව දූවිලි ගොඩෙන්
නැඟිටුවන්නේය.[3]
අළු ගොඩෙන් ඔවුන්ව ඔසවා-
ගන්නේය.[4]
9 ඔහු තම පක්ෂපාත සේවකයන්-
ගේ පය නොලිස්සන ලෙස
ඔවුන්ව ආරක්ෂා කරන්-
නේය.[5]
එහෙත් ඔහු දුෂ්ටයන්ව අන්ධ-
කාරයේ විනාශ කරන්නේය.[6]
මිනිසෙකුට කිසිදා තමන්ගේම
බලයෙන් ජය ගත නො-
හැක.[7]
10 යෙහෝවා දෙවිට විරුද්ධව
නැඟී සිටින්නෝ තැතිගන්-
නෝය.[8]
ඔවුන්ට විරුද්ධව ඔහුගේ උදහස
ප්‍රකාශ කරන විට අහස ගිගු-
රුම් දෙන්නේය.[9]
තම රජුව ශක්තිමත් කරන
පිණිසත්[10]
තම අභිෂේක ලත් තැනැත්තාගේ
සවිය වැඩි කරන පිණිසත්[11]
යෙහෝවා දෙවි මුළු පොළොවම
විනිශ්චය කරන්නේය."[12]

11 ඉන්පසු එල්කානා රාමාහි තිබූ
තම නිවසට ගියේය. දරුවා පූජක
ඒලී යටතේ යෙහෝවා දෙවිට සේවය
කළේය.[13]

12 ඒලීගේ පුත්‍රයෝ යෙහෝවා දෙ-
විට කොහෙත්ම ගෞරව නොකළ[14]
කිසි කමකට නැති මිනිස්සු වූහ.[15]
13 යම් කෙනෙකු පූජාවක් ඔප්පු කළ
විට සිදු වූයේ මෙයයි. පූජකයන්ට හිමි
මස් කොටස්[16] තැම්බෙන්න පටන්-
ගත් විගස[17] පූජකයාගේ සේවක-
යෙක් කොක්කක් අතැතිව එතැනට
ආවේය. 14 ඔහු මස් තැම්බෙන
හට්ටිය හෝ හැළිය හෝ කල්දේරම
හෝ වළඳ හෝ තුළට කොක්ක
දමා මස් කෑබලි එළියට ඇදගත්-
තේය. කොක්කට හසු වූ ඕනෑම
කොටසක් පූජකයා තම ප්‍රයෝජ-
නය සඳහා තබාගත්තේය. ෂීලෝ
නුවර වෙත පැමිණි සෑම ඊශ්‍රායෙලි-
තයෙකුටම ඔවුහු එසේ කළෝය.[1]
15 එපමණක්ද නොව තෙල් කොටස්
දැවෙන්නත් කලින්[2] පූජකයාගේ සේ-
වකයෙක් පැමිණ පූජාව ඔප්පු කරන
තැනැත්තාට මෙසේ කීවේය. "අපිට
තම්බපු මස් එපා. පූජකයා කැමති
මස් පුලුස්සා කන්නයි. ඒ නිසා අපිට
අමු මස් දෙන්න."[3] 16 නමුත් පූජා
ඔප්පු කරන තැනැත්තා, "තෙල් කො-
ටස් ටික දැවෙන තුරු ඉන්න.[4] ඊට-
පස්සේ ඔබ කැමති ඕනෑම කොටසක්
ගන්න"[5] කියා පැවසූ විට සේවකයා
මෙලෙස පැවසුවේය. "නැහැ, දැන්-
මම දෙන්න! නැත්නම් මම බලෙන්
ගන්නවා!"[6] 17 මෙසේ ඒ පුරුෂයෝ
යෙහෝවා දෙවිගේ පූජාවලට අගෞ-
රව කළෝය.[7] එබැවින් ඔවුන්ගේ පව්
යෙහෝවා දෙවි ඉදිරියේ ඉතා බරප-
තළ විය.[8]

18 ලිනන් රෙදිවලින් මැසූ ඒෆොද්
හැට්ටයක්[9] ඇඳ සිටි කුඩා සාමු-
වෙල්, යෙහෝවා දෙවි ඉදිරියේ සේවය
කළේය.[10] 19 ඔහුගේ මව අවුරුදු
පතා ඇගේ පුරුෂයා සමඟ පූජා ඔප්පු
කරන පිණිස ඒ ස්ථානයට පැමිණි
විට[11] අත් නැති කුඩා වස්ත්‍රයක්ද
ඔහුට ගෙනැවිත් දුන්නාය. 20 එල්-
කානාට සහ ඔහුගේ භාර්යාවට ආශීර්-
වාද[12] කරමින් ඒලී මෙසේ කීවේය.
"යෙහෝවා දෙවිගෙන් ඔබට ආශීර්වාද
ලැබේවා! ඔබ යෙහෝවා දෙවිට දුන්
මේ දරුවා[13] වෙනුවට මේ බිරිඳගෙන්
තවත් දරුවෙක් ඔබට ලැබේවා!" ඉන්-
පසු ඔවුහු තම නිවස බලා පිටත්ව
ගියෝය. 21 යෙහෝවා දෙවිද හන්-
නාට ආශීර්වාද කළේය.[14] ඇය නැවත
ගැබ්ගත්තාය. කල් යත්ම ඇය පුතුන්
තුන්දෙනෙකුද දූවරුන් දෙදෙනෙකුද
බිහි කළාය.[15] කුඩා සාමුවෙල් යෙ-

**2 පරි.**

1 1රාජා 3:13; මතෙ 18:4
2 උත් 41:40
3 ගීතා 113:7
4 ලූක් 1:52; 1පේතෘ 5:6
5 ගීතා 91:11; ගීතා 97:10; ගීතා 121:3; හිතෝ 2:8; ලූක් 1:79
6 ගීතා 37:28; ශෙප 1:15
7 1සාමු 14:6; 1සාමු 17:50; ගීතා 33:16
8 නික් 15:6; ගීතා 21:8; ගීතා 92:9
9 1සාමු 7:10; 2සාමු 22:14; ගීතා 18:13
10 ගීතා 2:6; ගීතා 45:1; ගීතා 110:1; යෙසා 32:1; මතෙ 28:18
11 ගීතා 75:10; ගීතා 89:17; ලූක් 1:69; ක්‍රියා 4:27; ක්‍රියා 10:38
12 ගීතා 50:4; ගීතා 96:13; ක්‍රියා 17:31
13 1සාමු 1:11; 1සාමු 3:1; 1සාමු 3:15
14 තීත 1:16; හෙබ්‍රෙ 3:12
15 1සාමු 2:22; හිතෝ 17:25
16 ලෙවී 7:34
17 ලෙවී 6:28; ගණන් 6:19

**2 තීරුව**

1 මලා 1:6
2 ලෙවී 3:5
3 පිලි 3:19; යූද් 12
4 ලෙවී 3:16; ලෙවී 7:25; ලෙවී 7:31
5 ද්වි 12:15
6 විනි 18:25; නෙහෙ 5:15; මීකා 2:1; 1පේතෘ 5:2
7 1සාමු 2:14; මලා 2:8
8 1සාමු 2:29; යෙසා 9:16
9 1සාමු 22:18; 2සාමු 6:14
10 1සාමු 2:11; 1සාමු 3:15; හිතෝ 20:11
11 නික් 23:14; 1සාමු 1:3; 1සාමු 1:21

**12** උත් 14:19; ගණන් 6:23; **13** 1සාමු 1:28; **14** උත් 21:1; ද්වි 7:14; 1සාමු 1:19; **15** ගීතා 127:3.

හෝවා දෙවිට ප්‍රසන්න ලෙස* හැදී
වැඩුණේය.[1]
**22** ඒලී ඉතා මහලුව සිටියේය.
ඔහුගේ පුත්‍රයන් ඊශ්‍රායෙලිතයන්ට
කළ සෑම දෙයක්ම[2] ඔහුට ආරංචි විය.[3]
සම්මුඛ වීමේ කූඩාරම[4] අසල සේවය
කරමින් සිටි ස්ත්‍රීන් සමඟ ඔවුන් දුරා-
චාරයේ යෙදුණු බවත්[5] ඔහුට දැන-
ගන්න ලැබිණ. **23** එබැවින් ඔහු
ඔවුන්ට කතා කර මෙසේ කීවේය.[6]
“පුතාලා මේ විදිහට හැසිරෙන්නේ
ඇයි?[7] ඔබ කරන නරක දේවල්
ගැන මට හැමෝම ඇවිත් කිය-
නවා.[8] **24** අනේ මගේ දරුවෙනි,
යෙහෝවා දෙවිගේ සෙනඟ අතරේ
පැතිර යන මේ කතා එච්චර හොඳ
දේවල් නෙමෙයි.[9] **25** මනුෂ්‍යයෙක්
තවත් මනුෂ්‍යයෙකුට විරුද්ධව පව්
කළොත්[10] දෙවිට පුළුවන් ඔහු වෙ-
නුවෙන් මැදිහත් වෙන්න.[11] නමුත්
මනුෂ්‍යයෙක් යෙහෝවා දෙවිට විරුද්-
ධව පව් කළොත්[12] ඔහු වෙනුවෙන්
යාච්ඤා කරන්නේ කවුද?”[13] නමුත්
ඔවුහු තම පියාගේ හඬට සවන් දුන්-
නේ නැත.[14] මන්ද යෙහෝවා දෙවි
ඒ වන විටත් ඔවුන්ව මරණයට
පත් කිරීමට තීරණය කර තිබිණ.[15]
**26** ඒ සියල්ල එසේ සිදු වෙද්දී සාමු-
වෙල් යෙහෝවා දෙවි හා මනුෂ්‍යයන්
ඉදිරියේ ප්‍රසාදය ලබමින් වැඩුණේය.[16]
**27** පසුව දෙවිගේ අනාගතවක්තෘ-
වරයෙක්[17] ඒලී වෙත පැමිණ මෙසේ
කීවේය. “යෙහෝවා දෙවි ඔබට මෙසේ
කීවේය. ‘ඊජිප්තු දේශයේ පාරාවෝගේ
වහලුන් ලෙස සිටි කාලයේදී මම ඔබේ
මුතුන්මිත්තාට ප්‍රකාශ වුණේ නැද්ද?[18]
**28** මට සේවය කරන පිණිස ඊශ්‍රා-
යෙල්වරුන්ගේ සියලු ගෝත්‍ර අතරින්
මම ඔහුව තෝරාගත්තෙමි.[19] ඒෆොද්
හැට්ටය ඇඳ මා ඉදිරියේ පූජකයා
ලෙස සේවය කරන්නත් පූජාසනයට[20]
නැඟ මට ප්‍රසන්න සුවඳක් ගෙනෙන
පූජා ඒ මත දවා ඔප්පු කරන්නත් මම

**1සාමු 2:21*** හෝ, “‘යෙහෝවා දෙවි ඉදිරියේ’ එනම්, යෙහෝවා දෙවිගේ ශුද්ධ කූඩාරමේ.”

**2 පරි.**

**1** විනි 13:24
1සාමු 2:26
1සාමු 3:19
ලූක් 1:80
ලූක් 2:52
**2** 1සාමු 2:14
1සාමු 2:17
1තිමෝ 5:20
**3** ද්වි 13:12
**4** යෙරෙ 7:10
එස 22:26
**5** ලෙවී 21:6
**6** හිතෝ 13:24
හිතෝ 19:13
හිතෝ 19:18
**7** 1සාමු 2:14
1සාමු 2:17
1සාමු 2:22
1රාජා 1:6
යාකො 5:20
**8** හිතෝ 13:14
යෙසා 3:9
යෙරෙ 8:12
පිලි 3:19
**9** 1තිමෝ 3:7
තීත 1:7
**10** ද්වි 25:1
**11** ද්වි 17:12
1රාජා 8:31
**12** ගණන් 15:31
ගණන් 18:22
ද්වි 28:15
1සාමු 2:17
1සාමු 3:14
2රාජා 22:17
**13** හෙබ්‍රෙ 10:26
**14** හිතෝ 29:1
හිතෝ 30:17
**15** යොෂු 11:20
යෝබ් 34:11
හිතෝ 15:10
රෝම 9:18
හෙබ්‍රෙ 3:13
**16** 1සාමු 2:21
හිතෝ 3:4
ලූක් 2:52
**17** විනි 6:8
හෙබ්‍රෙ 1:1
**18** නික් 4:14
නික් 4:27
**19** නික් 28:1
නික් 39:1
ලෙවී 8:12
ගණන් 16:5
ගණන් 17:5
ගණන් 17:8
ගීතා 99:6
**20** ගණන් 18:7

**2 තීරුව**

**1** ලෙවී 2:3
ලෙවී 6:16
ලෙවී 10:14
ගණන් 5:9
ගණන් 18:9
**2** නික් 25:8
යොෂු 18:1
1සාමු 1:3
**3** මලා 1:6
**4** හොෂෙ 4:9

ඔහුව තෝරාගත්තෙමි. ඊශ්‍රායෙල් සෙ-
නඟ ගින්නෙන් දවා ඔප්පු කරන සෑම
පූජාවක්ම ඔහුගේ ගෙයි වැසියන්ට
දෙන පිණිස මම එසේ කළෙමි.[1]
**29** මාගේ ගෘහයේ[2] ඔප්පු කරන්න
කියා මා අණ කළ මාගේ යාගවලටත්
පූජාවලටත් ඔබ පයින් ගසන්නේ
ඇයි?[3] ඔබ මට වඩා ඔබේ පුත්‍රයන්ට
ගෞරව කරන්නේ ඇයි?[4] මාගේ සෙ-
නඟ වන ඊශ්‍රායෙල්වරුන් ඔප්පු කරන
සෑම පූජාවකින්ම හොඳම කොටස
ගෙන ඔබවම තර කරගන්නේ ඇයි?’[5]
**30** “ඒ නිසා ඊශ්‍රායෙල්හි දෙවි වන
යෙහෝවා ඔබට මෙසේ කියන්නේය.
‘ඔබේ ගෙයි වැසියන් ඇතුළු ඔබේ පෙ-
ළපතට අයත් සියලුදෙනා නිරතු-
රුවම මා ඉදිරියේ සේවය කරනු
ඇත කියා මා කලින් කී බව ඇත්-
තයි.’[6] නමුත් යෙහෝවා දෙවි තව-
දුරටත් මෙසේ කියන්නේය. ‘දැන්
මම එයට කිසිසේත්ම ඉඩ නොදෙන්-
නෙමි. මන්ද මට ගෞරව කරන
අයට[7] මමත් ගෞරව කරමි.[8] නමුත්
මට අගෞරව කරන අය අවමානයට
ලක් වන්නේය.[9] **31** ඔබේ පවුලේ
කිසිවෙකු මහලු විය දක්වා ජීවත්
නොවන්නේය. මා ඔබටත් ඔබෙන්
පැවතෙන්නන්ටත් හිමි සියලු බල-
තල ඉවත් කරන කාලයක් පැමි-
ණෙන්නේය.[10] **32** ඊශ්‍රායෙල්වරුන්
මාගේ අතින් යහපත් දේවල් භුක්ති
විඳින විට ඔබ මාගේ වාසස්ථාන-
යේදී සතුරන්ගේ අතින් පීඩා විඳිනු
ඇත.[11] ඔබේ පවුලේ කිසිවෙකු මහලු
විය දක්වා ජීවත් නොවන්නේය.
**33** එහෙත් ඔබෙන් පැවතෙන්නන්ට
මාගේ පූජාසනය ඉදිරියේ සේවය
කිරීමට මම ඉඩහරින්නෙමි. නමුත්
ඔවුන්ට දැකීමට සිදු වන විපත්ති
නිසා ඔවුන්ගේ පෙනීම දුර්වල වී
ඔවුන්ගේ ශක්තිය හීන වී යනු ඇත.

**5** 1සාමු 2:14; **6** නික් 28:43; **7** ගීතා 50:23; හිතෝ 3:9; 1තිමෝ 1:17; **8** ගීතා 18:20; ගීතා 91:14; යොහ 12:26; **9** ද්වි 28:45; 2රාජා 2:24; එස 18:24; මලා 2:9; **10** 1සාමු 3:14; 1සාමු 4:11; 1සාමු 4:18; 1සාමු 14:3; 1සාමු 22:18; 1රාජා 2:27; 1ලේක 24:3; ගීතා 37:17; **11** 1සාමු 4:22; ගීතා 78:61.

ඔබෙන් පැවතෙන්නන්ගෙන් බහුතර-
යක් කඩුවෙන් මැරුම් කනු ඇත.[1]
**34** හොප්නී හා පිනෙහාස්[2] වන ඔබේ
පුතුන් දෙදෙනාට සිදු වන දේ ඔබට
ලකුණක් වන්නේය. ඔවුහු එකම දව-
සේ මිය යනු ඇත.[3] **35** මට සේවය
කිරීමට විශ්වාසවන්ත පූජකයෙකුව
මම පත් කරන්නෙමි.[4] ඔහු මාගේ
කැමැත්තට එකඟව මාගේ සිත සතුටු
වන ආකාරයෙන් ක්‍රියා කරයි. මම
ඔහුගේ පෙළපත ස්ථිර ලෙස පිහිටු-
වන්නෙමි. ඔහු මාගේ අභිෂේක ලත්[5]
තැනැත්තා ඉදිරියේ සැමදා සේවය
කරනු ඇත. **36** ඔබෙන් පැවතෙන
කිසිවෙකු ඉතුරු වේ නම්[6] ඔහු කෑම
ලබාගැනීමට මුදල් ටිකක් උපයාගැ-
නීම සඳහා අභිෂේක ලත් තැනැත්තා
වෙත ගොස් හිස නමා මෙසේ කියනු
ඇත. "අනේ, පූජකයකු ලෙස මාව
පත් කරන්න. එතකොට මට කෑමට
මොනවා හරි ලැබෙයි." ' "[7]

**3** සාමුවෙල්, ඒලී යටතේ යෙ-
හෝවා දෙවිට සේවය කළේය.[8]
ඒ කාලයේ යෙහෝවා දෙවිගේ වච-
නය[9] අසන්න ලැබුණේ කලාතුර-
කින්ය.[10] දර්ශන[11] ගැනද එතරම්
කතාබහ කළේ නැත.
**2** එක් දිනක් ඇස් නොපෙනෙන
තරමට දුර්වල[12] වී සිටි ඒලී තම කාම-
රයේ නිදාගෙන සිටියේය. **3** සාමු-
වෙල්ද දෙවිගේ ගිවිසුම් පෙට්ටිය තබා
තිබූ යෙහෝවා දෙවිගේ මාලිගා-
වේ*[13] නිදාගෙන සිටියේය. මාලිගා-
වේ පහනද දැල්වෙමින් තිබුණේය.
**4** එවිට යෙහෝවා දෙවි සාමු-
වෙල්ට කතා කළේය. සාමුවෙල්ද,
"මම මෙතැනය"[14] කියා කීවේය.
**5** ඔහු ඒලී වෙත දුව ගොස් මෙසේ
කීවේය. "මගේ ස්වාමීනි, ඔබ මට
කතා කළාද? මම ආවේ ඒ නිසයි."
නමුත් ඒලී, "මම ඔබට කතා කළේ
නැහැ. ගිහින් නිදාගන්න" යයි කීවේය.
සාමුවෙල්ද නැවත ඔහුගේ ස්ථාන-
යට ගොස් නිදාගත්තේය. **6** ඉන්පසු
යෙහෝවා දෙවි, "සාමුවෙල්"[1] කියා
නැවතත් හඬගැසුවේය. එවිට සාමු-
වෙල් නැඟිට ඒලී වෙත ගොස්, "ඔබ
මට දැන් කතා කළා නේද? ඒ
නිසයි මම ආවේ" කියා කීවේය.
නමුත් ඒලී, "මම ඔබට කතා කළේ
නැහැ පුතේ.[2] දැන් ගිහින් නිදාගන්න"
යයි කීවේය. **7** (ඒ වන විට සාමු-
වෙල්, යෙහෝවා දෙවිව හොඳින් දැන
හඳුනා ගෙන සිටියේ නැත. යෙහෝවා
දෙවි තම පණිවිඩ ඔහුට ප්‍රකාශ
කර තිබුණේද නැත.)[3] **8** යෙහෝවා
දෙවි තුන්වෙනි වරටත්, "සාමුවෙල්"
කියා හඬගැසුවේය. එවිට ඔහු නැඟිට
ඒලී වෙත ගොස්, "ඔබ මට කතා
කරන හඬ මේ සැරේ නම් හොඳට
ඇහුණා" කියා කීවේය.
දරුවාට කතා කරන්නේ යෙ-
හෝවා දෙවි බව මේ අවස්ථාවේදී ඒලී
තේරුම්ගත්තේය. **9** එබැවින් ඒලී
සාමුවෙල්ට මෙසේ කීවේය. "ගිහින්
නිදාගන්න. ඔහු ඔබට නැවත කතා
කළොත් මෙහෙම කියන්න. 'යෙ-
හෝවා දෙවියනි, ඔබේ සේවකයාට
දැන් කතා කරන්න. මම අහගෙනයි
ඉන්නේ.' " ඉන්පසු සාමුවෙල් නැවත
ඔහුගේ ස්ථානයට ගොස් හාන්සි
වුණේය.
**10** යෙහෝවා දෙවි නැවත වරක්,
"සාමුවෙල්, සාමුවෙල්" කියා කතා
කළේය. එවිට සාමුවෙල්, "ඔබේ
සේවකයාට කතා කරන්න. මම
අහගෙනයි ඉන්නේ"[4] කියා කීවේය.
**11** යෙහෝවා දෙවි සාමුවෙල්ට
මෙසේ කීවේය. "ඊශ්‍රායෙල් දේශය තුළ
මා කිරීමට යන දේ[5] ගැන යමෙකුට
දැනගන්න ලැබුණොත් ඔහු භයෙන්
තිගැස්සෙයි.[6] **12** ඒ දවසේදී ඒලී-
ගෙන් පැවතෙන්නන් ගැන මා පැවසූ
සියල්ල මම මුල පටන් අග දක්වාම
ඉටු කරන්නෙමි.[7] **13** ඔහුගේ පුත්‍ර-
යන් මට නින්දා අපහාස කරද්දී[8] ඔහු
ඔවුන්ට තරවටු නොකළේය.[9] ඔහු
ඔවුන් කළ වැරදි දැක දැකත්[10] ඒ
ගැන කිසිවක් නොකළ නිසා මා ඔහු-
ගේ මුළු පරම්පරාවම විනිශ්චයකට[11]

**2 පරි.**
**1** 1සාමු 22:18
1සාමු 22:21
**2** 1සාමු 1:3
**3** 1සාමු 4:11
1සාමු 4:17
**4** 1රාජා 2:35
1ලේක 29:22
**5** 1සාමු 2:10
1සාමු 24:6
2ලේක 6:42
**6** 1රාජා 2:27
**7** ලෙවී 2:3
ගණන් 5:9

**3 පරි.**
**8** 1සාමු 2:11
1සාමු 2:18
**9** 2සාමු 7:4
**10** ගීතා 74:9
**11** ගණන් 12:6
1ලේක 17:15
**12** උත් 27:1
1සාමු 4:15
දේශ 12:3
**13** 1සාමු 1:9
1සාමු 3:15
ගීතා 5:7
**14** උත් 22:1

**2 තීරුව**
**1** ගීතා 99:6
**2** 1සාමු 3:16
1සාමු 4:16
**3** ආමො 3:7
**4** ගීතා 85:8
යෙසා 55:2
දානි 10:19
**5** ආමො 3:7
හබ 1:5
**6** 2රාජා 21:12
යෙරෙ 19:3
**7** ගණන් 23:19
1සාමු 2:31
යෙසා 46:11
යෙසා 55:11
සෙක 1:6
**8** ගණන් 15:30
1සාමු 2:12
1සාමු 2:17
1සාමු 2:30
**9** 1සාමු 2:23
හිතෝ 19:18
දේශ 8:11
1තිමෝ 5:20
**10** ලෙවී 5:1
1සාමු 2:22
යොහ 15:22
යාකො 4:17
**11** එස 7:8
එස 18:30

---

**1සාමු 3:3*** 1සාමු 1:9හි පාදසටහන බලන්න.

ලක් කරන බව ඔබ ඔහුට කියන්න.
මම ඔවුන්ට විරුද්ධව තීන්දු කළ
දේ කිසිදා වෙනස් නොකරන්නෙමි.
**14** එබැවින් ඔවුන් කළ වරදට ඔවුන්
අනිවාර්යයෙන්ම දඬුවම් විඳින බව
මම ඒලීගෙන් පැවතෙන්නන්ට දිවුරා
කියන්නෙමි. පූජා ඔප්පු කිරීමෙන්-
වත් යාග ඔප්පු කිරීමෙන්වත් ඔවුන්ට
එයින් නිදහස් විය නොහැක.”[1]

**15** සාමුවෙල් උදෑසන වන තෙක්
හාන්සි වී සිටියේය. ඉන්පසු ඔහු යෙ-
හෝවා දෙවිගේ ගෘහයේ[2] දොරවල්
ඇරියේය. රාත්‍රියේ තමා දුටු දර්-
ශනය ගැන ඒලීට කියන්න සාමු-
වෙල් භය විය.[3] **16** එහෙත් ඒලී
සාමුවෙල්ට කතා කර, “සාමුවෙල්,
මගේ පුතේ, මෙහෙට එන්න” යයි
කීවේය. සාමුවෙල්ද, “මගේ ස්වාමීනි,
ඔබ මට කතා කළාද” කියා ඇසුවේය.
**17** එවිට ඒලී ඔහුගෙන් මෙසේ ඇසු-
වේය. “ඔහු ඔබට මොනවද කිව්-
වේ? ඔහු කියූ දේවල් මගෙන් වසං
කරන්න එපා.[4] ඔබ ඔහු කියූ එක
වචනයක්වත් මගෙන් වසං කළොත්
ඔබට දෙවිගෙන් දඬුවම් ලැබේවා!”[5]
**18** සාමුවෙල්, දෙවි තමාට පැවසූ
සියලු දේ ඒලීට කීවේය. ඔහුගෙන්
කිසිවක් නොසඟවා සියල්ල කීවේය.
එවිට ඒලී, “එය යෙහෝවා දෙවි-
ගේ කැමැත්ත. ඔහුට යහපත් කියා
සිතෙන දෙයක් ඔහු කරාවි”[6] යයි
කීවේය.

**19** සාමුවෙල් වයසින් වැඩුණේය.
යෙහෝවා දෙවි ඔහු සමඟ සිටියේය.[7]
සාමුවෙල් පැවසූ සෑම දෙයක්ම එලෙ-
සම ඉටු වීමට දෙවි සැලැස්වූවේය.[8]
**20** යෙහෝවා දෙවිගේ අනාගතවක්තෘ
ලෙස පත්වීමට නියමිත කෙනා සාමු-
වෙල් බව[9] දාන් සිට බෙයර්-ෂෙබා[10]
දක්වා ජීවත් වූ සියලු ඊශ්‍රායෙල්වරු
දැන සිටියෝය. **21** යෙහෝවා දෙවි
ෂීලෝහිදී නැවතත් ප්‍රකාශ වුණේය.[11]
යෙහෝවා දෙවි සාමුවෙල්ට තම පණි-
විඩය හෙළි කළේය.[12] යෙහෝවා දෙවි
ඔහුට තම පණිවිඩය හෙළි කළේ
ෂීලෝ නුවරේදීය.

**4** තමාට හෙළි කළ වචන සාමු-
වෙල් දිගටම ඊශ්‍රායෙල් සෙනඟට
ප්‍රකාශ කළේය.

ඒ කාලයේදී පිලිස්තිවරුන්ට විරුද්-
ධව සටන් කරන පිණිස ඊශ්‍රායෙල්වරු
පිටත්ව ගොස් එබෙන්එසෙර්හි[1] කඳ-
වුරු බැඳගත්තෝය. පිලිස්තිවරුන්
කඳවුරු බැඳ සිටියේ අපෙක්[2] යන
ස්ථානයේය. **2** පිලිස්තිවරු ඊශ්‍රා-
යෙල්වරුන්ට විරුද්ධව සටනට සැර-
සුණෝය.[3] සටන ඉතා දරුණු විය.
ඊශ්‍රායෙල්වරු පිලිස්තිවරුන්ගේ අතින්
පරාජයට පත් වූහ.[4] පිලිස්තිවරු යුධ
පිටියේ සටන් කරමින් සිටි ඊශ්‍රා-
යෙල්වරුන් හාරදහසක් පමණ මරා
දැමුවෝය. **3** පරාජයට පත් වූ ඊශ්‍රා-
යෙල්වරු නැවත ඔවුන්ගේ කඳවුර
වෙතට හැරී ගියෝය. ඒ අවස්ථාවේදී
ඊශ්‍රායෙල්හි වැඩිමහල්ලෝ එකිනෙකා
අතරේ මෙසේ කතා වූහ. “යෙහෝවා
දෙවි පිලිස්තිවරුන්ට අපිව පරද්දන්න
ඉඩ දුන්නේ ඇයි?[5] අපි ෂීලෝ නුවර
තියෙන යෙහෝවා දෙවිගේ ගිවිසුම්
පෙට්ටිය අරගෙන එමු.[6] ඒක ගෙනැ-
විත් අපි ළඟ තියාගමු. එතකොට
අපේ සතුරන්ගෙන් අපිට ආරක්ෂාව
ලැබෙයි.” **4** එබැවින් ඔවුහු ෂීලෝ
වෙත මිනිසුන් යවා ස්වර්ගයේ සේනා-
වල අධිපති වන කෙරුබ්වරුන් පිට
හිඳගෙන සිටින[7] යෙහෝවා දෙවිගේ
ගිවිසුම් පෙට්ටිය එතැනට ගෙන්වා-
ගත්තෝය. ඒලීගේ පුත්‍රයෝ දෙදෙනා
වන හොප්නී හා පිනෙහාස්ද[8] ගිවිසුම්
පෙට්ටිය තැබූ තැන සිටියෝය.

**5** යෙහෝවා දෙවිගේ ගිවිසුම්
පෙට්ටිය කඳවුරට රැගෙන ආ විට
සියලු ඊශ්‍රායෙල්වරු මහත් හඬින්
කෑගැසුවෝය.[9] ඔවුන්ගේ ශබ්දය මුළු
ප්‍රදේශය පුරාම දෝංකාර දුන්නේය.
**6** ඒ ශබ්දය ඇසුණු පිලිස්තිවරු එකි-
නෙකාගෙන් මෙසේ ඇසුවෝය.
“හෙබ්‍රෙව්වරුන්ගේ කඳවුරෙන් ඝෝ-
ෂාවක්[10] ඇහෙන්නේ ඇයි?” පසුව
යෙහෝවා දෙවිගේ ගිවිසුම් පෙට්-
ටිය ඊශ්‍රායෙල්වරුන්ගේ කඳවුර
තුළට ගෙනැවිත් තිබෙන බව

**3 පරි.**
1 ද්වි 5:9; 1සාමු 2:24; 1සාමු 4:11; 1සාමු 22:21; 1රාජා 2:27; හෙබ්‍රෙ 10:26
2 1සාමු 2:11; 1සාමු 3:1
3 යෙරෙ 1:6
4 ගීතා 141:5
5 රූත් 1:17; 1සාමු 20:13; 2සාමු 19:13
6 යෝබ් 1:21; විලා 3:39; ක්‍රියා 21:14
7 උත් 39:3; 1සාමු 2:21
8 1සාමු 9:6; යෙසා 44:26
9 1සාමු 2:7; ගීතා 75:7
10 විනි 20:1
11 1සාමු 3:1
12 1සාමු 3:4; ගීතා 99:6; ආමො 3:7

**2 තීරුව**

**4 පරි.**
1 1සාමු 5:1
2 යොෂු 12:18
3 1සාමු 17:21
4 යොෂු 7:12; ගීතා 44:9; ගීතා 79:7; ගීතා 106:41
5 ද්වි 28:25; ද්වි 32:30; විනි 2:14
6 ගණන් 14:44; යොෂු 6:4; 1සාමු 14:18; 2සාමු 15:25
7 නික් 25:18; ගණන් 7:89; 2සාමු 6:2; 2රාජා 19:15; ගීතා 80:1; ගීතා 99:1
8 ගණන් 4:15; 1සාමු 2:12
9 යෙරෙ 7:4
10 නික් 32:17

ඔවුන්ට ආරංචි විය. **7** එය දැන-
ගත් විට පිලිස්තිවරු භය වී මෙසේ
කීවෝය. “කඳවුර ඇතුළට දෙවි-
යන් ඇවිල්ලා![1] මේ වගේ දෙයක්
මීට කලින් වෙලා නැහැ! අපිට
දැන් කිසි ගැලවීමක් නැහැ!
**8** මේ බලවත් දෙවියන්ගේ අතින්
අපිව ගලවාගන්නේ කවුද? ඊජිප්තුව-
රුන්ට විරුද්ධව විවිධ පීඩා ගෙනැ-
විත් පාළුකරයේදී ඔවුන්ව විනාශ
කළේ මේ දෙවියන් නේද?[2] අපිට
දැන් කොහෙත්ම ගැලවෙන්න බැහැ!”
**9** “පිලිස්තිවරුනි, භය වෙන්න
එපා, ධෛර්යවත් වෙන්න! පුරුෂයන්
වගේ සටන් කරන්න. අපි කාල-
යක් හෙබ්‍රෙව්වරුන්ව යටත් කර-
ගෙන සිටියා කියලා අමතක
කරන්න එපා.[3] දැන් අපිව යටත්
කරගන්න ඔවුන්ට ඉඩ නොදී පුරු-
ෂයන් වගේ සටන් කරමු!” **10** ඉන්-
පසු පිලිස්තිවරු සටනට පිටත්ව
ගියෝය. ඊශ්‍රායෙල්වරු අන්ත පරාජ-
යට පත් වී[4] තම තමන්ගේ කූඩාරම්
වෙත පලා ගියෝය.[5] එදින විශාල
සෙනඟක් පිලිස්තිවරුන්ගේ අතින්
මැරුම් කෑවෝය.[6] ඊශ්‍රායෙල්වරුන්ගේ
පාබළ හමුදාවෙන් තිස්දහසක්ම මිය
ගියෝය.[7] **11** ඒලීගේ පුත්‍රයෝ වන
හොප්නී හා පිනෙහාස්ද මිය ගියෝය.[8]
දෙවිගේ ගිවිසුම් පෙට්ටියද පිලිස්ති-
වරු පැහැරගත්තෝය.[9]

**12** බෙන්ජමින් ගෝත්‍රයේ මිනි-
සෙක් යුධ පිටියේ සිට ශීලෝ නුවර
වෙත දුවගෙන ආවේය. ඔහු වස්ත්‍ර
ඉරාගෙන[10] හිසේ දූවිලි දමාගෙන[11]
සිටියේය. **13** ඔහු පැමිණෙන විට
ඒලී පාර අසල බංකුවක් උඩ හිඳගෙන
මඟ බලාගෙන සිටියේය. මන්ද ඔහු
සැබෑ දෙවිගේ ගිවිසුම් පෙට්ටිය[12] ගැන
බියෙන් සිටියේය. ඒ මිනිසා නුවරට
ඇතුල් වී සිදු වූ සියල්ල දැනුම් දුන්-
නේය. නුවර වැසියෝ එය අසා
කෑගසමින් හැඬුවෝය. **14** ඒ මහත්
ඝෝෂාව ඇසුණු විට ඒලී මෙසේ
ඇසුවේය. “මිනිස්සු මෙච්චර භයි-
යෙන් කෑගහන්නේ ඇයි?”[13] ඉන්පසු ඒ
මිනිසා සිදු වූ සියල්ල ඒලීට දන්වන
පිණිස ඔහු ළඟට ගියේය. **15** (ඒ
වන විට ඒලීට වයස අවුරුදු අනූඅටක්
විය. ඔහුගේ ඇස් නොපෙනෙන තර-
මටම දුර්වලව තිබිණ.)[1] **16** ඔහු
ඒලීට මෙසේ කීවේය. “මම දැන් ආවේ
යුධ පිටියේ ඉඳන්. මට එහෙන් පලා
එන්න සිද්ධ වුණා.” එවිට ඒලී මෙසේ
ඇසුවේය. “ඇයි පුතේ, එහෙ මොනවද
සිද්ධ වුණේ?” **17** එවිට පණිවිඩ-
කරු ඔහුට මෙසේ කීවේය. “ඊශ්‍රා-
යෙල්වරු අන්ත පරාජයකට පත්
වුණා. පිලිස්තිවරුන් වෙතින් ඔවුන්ට
පලා යන්න සිද්ධ වුණා.[2] ඔබේ පුතුන්
දෙන්නා වන හොප්නී සහ පිනෙහා-
සුත් මැරුණා.[3] පිලිස්තිවරු සැබෑ
දෙවිගේ ගිවිසුම් පෙට්ටියත් පැහැර-
ගත්තා.”[4]

**18** ඔහු සැබෑ දෙවිගේ ගිවිසුම්
පෙට්ටිය ගැන සඳහන් කළ විට දො-
රටුව අසල බංකුවක් මත හිඳගෙන
සිටි ඒලී පිටුපසට වැටුණේය. ඔහු
මහලු තරබාරු කෙනෙක් වූ නිසා
බෙල්ල කැඩී ඔහු මිය ගියේය. ඔහු
අවුරුදු හතළිහක් පුරා විනිශ්චයකරු-
වෙකු ලෙස ඊශ්‍රායෙල්වරුන්ට සේ-
වය කළේය. **19** ඔහුගේ ලේලි වන
පිනෙහාස්ගේ බිරිඳ ඒ වන විට දරු
ප්‍රසූතියට ආසන්නව සිටියාය. සැබෑ
දෙවිගේ ගිවිසුම් පෙට්ටිය පැහැර-
ගත් බවත් ඇගේ මාමා හා පුරුෂයා
මිය ගිය බවත් ආරංචි වූ විගස
ඇයට ප්‍රසව වේදනාව ඇති වී[5] එවෙ-
ලේම දරුවා බිහි කළාය. **20** පසුව
ඇය මිය ගියාය. නමුත් ඇය මිය
යන මොහොතේදී ඇය ළඟ සිටි
ස්ත්‍රීහු ඇයට මෙසේ පැවසුවෝය.
“භය වෙන්න එපා. ඔබට පුතෙක්
ලැබුණා.”[6] නමුත් ඇය ඒ ගැන සතුටු
වුණේවත් ඔවුන්ට කිසි දෙයක් පැවසු-
වේවත් නැත. **21** ඇය තම පුත්‍ර-
යාට ඊකාබොද්*[7] යන නම තබමින්
මෙසේ කීවාය. “ඊශ්‍රායෙල්හි තේජස
නැති වී ගිහින්.”[8] ඇය එසේ පැවසුවේ

1සාමු **4:21*** තේරුම, “තේජස කොතැනද?”

**4 පරි.**
**1** නික් 14:25
නික් 15:14
**2** නික් 7:5
ගීතා 78:43
ගීතා 78:51
**3** ගණන් 33:56
ද්වි 28:48
විනි 10:7
විනි 13:1
**4** ලෙවී 26:17
ද්වි 28:25
1සාමු 4:2
**5** 1රාජා 22:36
**6** ද්වි 28:25
විනි 2:14
**7** ගීතා 78:62
**8** 1සාමු 2:31
1සාමු 2:34
1සාමු 4:17
ගීතා 78:64
දේශ 8:8
දේශ 8:13
**9** 1සාමු 4:3
ගීතා 78:61
විලා 2:17
**10** 2සාමු 1:2
**11** යොෂු 7:6
2සාමු 13:19
2සාමු 15:32
නෙහෙ 9:1
යෝබ් 2:12
**12** 1සාමු 4:4
**13** 1සාමු 4:10

**2 තීරුව**
**1** 1සාමු 3:2
ගීතා 90:10
**2** 1සාමු 3:11
1සාමු 4:10
**3** 1සාමු 2:34
ගීතා 78:64
**4** 1සාමු 4:11
ගීතා 78:61
විලා 2:17
**5** උත් 35:16
**6** උත් 35:17
**7** 1සාමු 14:3
**8** 1සාමු 4:5
1සාමු 4:11
ගීතා 78:61

සැබෑ දෙවිගේ ගිවිසුම් පෙට්ටිය සතු-
රන් පැහැරගෙන ගිය නිසාත් ඇගේ
මාමාද පුරුෂයාද මිය ගොස් සිටි
නිසාත්ය.[1] **22** ඇය නැවත මෙසේ
කීවාය. "සැබෑ දෙවිගේ ගිවිසුම් පෙට්-
ටිය සතුරන් අතට හසු වූ නිසා[2] ඊශ්‍රා-
යෙල්හි තේජස දැන් නැති වී ගිහින්."[3]

**5** පිලිස්තිවරු සැබෑ දෙවිගේ ගිවි-
සුම් පෙට්ටිය[4] එබෙන්එසෙර් සිට
අෂ්දොද් නුවර[5] වෙත ගෙනාවෝය.
**2** ඔවුහු සැබෑ දෙවිගේ ගිවිසුම් පෙට්-
ටිය දාගොන්ගේ දේවාලයට ගෙන
ගොස් දාගොන්ගේ රූපය ළඟ තැබූ-
වෝය.[6] **3** අෂ්දොද්හි වැසියන් පසු-
වදා උදෑසන නැඟිට බලන විට
දාගොන්ගේ රූපය යෙහෝවා දෙවිගේ
ගිවිසුම් පෙට්ටිය ඉදිරිපිට මුණින්
අතට වැටී තිබිණ.[7] ඔවුහු දාගොන්-
ගේ රූපය රැගෙන කලින් තිබූ
ස්ථානයේම එය තැබූහ.[8] **4** ඊළඟ
දවසෙත් උදෑසන ඔවුන් බැලූ විට
දාගොන්ගේ රූපය යෙහෝවා දෙවිගේ
ගිවිසුම් පෙට්ටිය ඉදිරිපිට මුණින්
අතට වැටී තිබිණ. දාගොන්ගේ හිස
සහ අත් දෙක කපා දමා දේවාලයේ
පඩිය මත තිබිණ.[9] ඉතුරුව තිබුණේ
මාළුවෙකුගේ වලිගය මෙන් වූ රූපයේ
කඳ කොටස පමණයි.* **5** අද වන
තුරු අෂ්දොද්හි සිටින දාගොන්ගේ
පූජකයන් හා ඔහුගේ දේවාලයට යන
කිසිවෙකු ඒ පඩිය මත පය නොත-
බන්නේ ඒ නිසාය.

**6** අෂ්දොද්හි වැසියන්ට යෙහෝවා
දෙවි දරුණු වසංගතයකින් පහර දී[10]
ඔවුන් තුළ මහත් භීතියක් ඇති
කළේය. අෂ්දොද් හා ඊට අයත්
පළාත්වල ජීවත් වූ ජනයාට දෙවි දුන්
දඬුවම නිසා ඔවුහු අර්ශස් රෝග-
යෙන්[11] පීඩා වින්දෝය. **7** ඒ නිසා
අෂ්දොද්හි වැසියෝ මෙසේ කීවෝය.
"ඊශ්‍රායෙල්වරුන්ගේ දෙවියන් අපිටත්
අපේ දෙවියන්[12] වන දාගොන්ටත්
දරුණු විදිහට පහර දුන්නා. ඔහුගේ
ගිවිසුම් පෙට්ටිය මෙහෙන් රැගෙන
යන්න." **8** එබැවින් ඔවුහු පණිවිඩ
යවා පිලිස්තිවරුන්ගේ සියලු අධිප-
තීන්ව කැඳවා ඔවුන්ගෙන් මෙසේ
ඇසුවෝය. "අපි ඊශ්‍රායෙල්වරුන්ගේ
දෙවියන්ගේ ගිවිසුම් පෙට්ටියට මො-
නවද කරන්නේ?" ඔවුහු ඒ ගැන කල්-
පනා කළ පසු මෙසේ කීවෝය.
"ඊශ්‍රායෙල්වරුන්ගේ දෙවියන්ගේ ගිවි-
සුම් පෙට්ටිය අපි ගාත් නුවරට[1]
යවමු." එබැවින් ඔවුහු ඊශ්‍රායෙල්ව-
රුන්ගේ දෙවිගේ ගිවිසුම් පෙට්ටිය
එතැනට ගෙන ගියෝය.

**9** ඔවුන් ගිවිසුම් පෙට්ටිය එතැ-
නට ගෙන ගිය පසු යෙහෝවා දෙවි
ඒ නුවරේ වැසියන්ටත් පහර දුන්-
නේය.[2] දෙවි දුන් දඬුවමේ ප්‍රතිඵලයක්
ලෙස ලොකු කුඩා සියලුදෙනා අර්ශස්
රෝගයෙන්[3] පීඩා වින්දෝය. එබැවින්
නුවරේ වැසියෝ මහත් සේ කැලඹු-
ණෝය. **10** එමනිසා ඔවුහු සැබෑ
දෙවිගේ ගිවිසුම් පෙට්ටිය එක්‍රොන්
නුවර[4] වෙත යැව්වෝය. සැබෑ
දෙවිගේ ගිවිසුම් පෙට්ටිය එක්‍රොන්
වෙත ගෙනා විට එක්‍රොන්හි වැසියෝ
කෑ මොර ගසමින් මෙසේ කීවෝය.
"ඊශ්‍රායෙල්වරුන්ගේ දෙවියන්ගේ ගිවි-
සුම් පෙට්ටිය මෙහෙට ගෙනැවිත්!
ඔවුන් අපිවත් අපේ සෙනඟවත් මරන්-
නයි හදන්නේ."[5] **11** එබැවින් ඔවුහු
පණිවිඩ යවා පිලිස්තිවරුන්ගේ සියලු
අධිපතීන්ව කැඳවා ඔවුන්ට මෙසේ
කීවෝය. "ඊශ්‍රායෙල්වරුන්ගේ දෙවි-
යන්ගේ ගිවිසුම් පෙට්ටිය මෙතැනින්
රැගෙන යන්න. ඒක තිබුණ තැනටම
ගෙන යන්න. නැත්නම් අපත් අපේ
සෙනඟත් විනාශ වෙයි." මන්ද ඒ වන
විට සැබෑ දෙවි ඔවුන්ටද දරුණු ලෙස
පහර දී තිබිණ.[6] නුවර පුරා මනුෂ්‍ය-
යෝ මිය ගොස් සිටි බැවින් නුවරේ
වැසියෝ මහත් සේ කැලඹී සිටි-
යෝය.[7] **12** මිය නොගිය අය අර්-
ශස් රෝගයෙන් පීඩා වින්දෝය.[8]
නුවර වැසියෝ අහස දෙස බලා විලාප
නඟමින්[9] උපකාර පැතුවෝය.

**1සාමු 5:4*** දාගොන්ගේ රූපයේ එක් කොටසක් මාළුවෙකුගේ හැඩයටද ඉතුරු කොටස මිනිසෙකුගේ හැඩයටද තිබිණ.

**4 පරි.**
1 1සාමු 2:32, 1සාමු 2:34
2 1සාමු 4:11, 2ලේක 8:11, යෙරෙ 7:12
3 ද්වි 28:15

**5 පරි.**
4 1සාමු 4:11, 1සාමු 4:17, ගීතා 78:61
5 යොෂු 11:22, 1සාමු 6:17, ක්‍රියා 8:40
6 විනි 16:23, 1ලේක 10:10, ගීතා 115:4
7 නික් 12:12, 1ලේක 16:26, ගීතා 95:3, ගීතා 96:5, ගීතා 97:7, යෙසා 19:1, ශෙප 2:11
8 යෙසා 46:7
9 යෙසා 2:18, යෙරෙ 10:11
10 නික් 9:3, 1සාමු 5:9, 1සාමු 5:11, 1සාමු 7:13
11 ද්වි 28:27, 1සාමු 6:5
12 1කොරි 8:5

**2 තීරුව**
1 1සාමු 17:4
2 ද්වි 2:15, 1සාමු 7:13
3 1සාමු 5:6
4 යොෂු 15:45, විනි 1:18, 2රාජා 1:2, ආමො 1:8
5 1සාමු 5:7
6 1සාමු 5:9
7 හෙබ්‍රෙ 10:31
8 ද්වි 28:27
9 ගීතා 115:6, ආනි 5:23, හබ 2:19

**6** යෙහෝවා දෙවිගේ ගිවිසුම් පෙට්-
ටිය[1] මාස හතක් පුරා පිලිස්තිව-
රුන්ගේ දේශයේ තිබිණ. **2** පසුව
පිලිස්තිවරු ඔවුන්ගේ පූජකයන්ව හා
පේන කියන්නන්ව[2] කැඳවා ඔවුන්-
ගෙන් මෙසේ ඇසුවෝය. “යෙහෝවා
දෙවියන්ගේ ගිවිසුම් පෙට්ටියට
අපි මොනවද කරන්නේ? ඒක තිබුණු
තැනටම නැවත යවද්දී ගිවිසුම් පෙට්-
ටිය සමඟ අපි මොනවා හරි යැවිය
යුතුද?” **3** එවිට ඔවුහු මෙසේ පැව-
සුවෝය. “තෑග්ගක් නැතුව නම් ඊශ්‍රා-
යෙල්වරුන්ගේ දෙවියන්ගේ ගිවිසුම්
පෙට්ටිය නැවත යවන්න එපා. වර-
දට සමාව ලබාගන්න නම් අනිවාර්-
යයෙන්ම ඔහුට තෑග්ගක් යවන්න
වෙයි.[3] එහෙම කළොත් ඔබට සුවය
ලැබෙයි. ඔහු ඔබට මේ විදිහට
පහර දුන්නේ ඇයි කියාත් ඔබට
දැනගන්න පුළුවන් වෙයි.” **4** එවිට
ජනයා මෙසේ ඇසුවෝය. “අපේ වර-
දට සමාව ලබාගන්න අපි මොනවද
යවන්නේ?” එවිට පූජකයෝද පේන
කියන්නෝද ඔවුන්ට මෙසේ පැවසු-
වෝය. “ඔබටත් ඔබේ අධිපතීන්ටත්
ලැබුණේ එකම දඬුවමයි. ඒ නිසා
පිලිස්තිවරුන්ගේ අධිපතීන් පස්දෙනා
වෙනුවෙන්[4] අර්ශස් ගෙඩිවල හැඩයට
රත්තරන් රූප පහකුත් මීයන්ගේ
හැඩයට රත්තරන් රූප පහකුත් සාදා
යවන්න. **5** ඔබ ඊශ්‍රායෙල්වරුන්ගේ
දෙවියන්ට ගෞරව කළ යුතුයි.[5] ඔබට
සැදුණු අර්ශස් ගෙඩිවල හැඩයටත්
දේශය නාස්ති කරන මීයන්ගේ[6] රූප-
වල හැඩයටත් රූප සාදා යවන්න.
ඔබ එහෙම කළොත් සමහරවිට ඔබ-
ටත් ඔබේ දෙවියන්ටත් ඔබේ දේශ-
යටත් විරුද්ධව ගෙනා පීඩා ඔහු
නතර කරයි.[7] **6** ඔබ ඊජිප්තුවරුන්
හා පාරාවෝ මෙන් සිත මුරණ්ඩු කර-
ගන්නේ ඇයි?[8] ඔවුන් ඊශ්‍රායෙල්ව-
රුන්ට යන්න දුන්නේ නැති නිසා
ඊශ්‍රායෙල්වරුන්ගේ දෙවියන් ඔවුන්ට
දරුණු ලෙස පහර දී[9] ඊශ්‍රායෙල්-
වරුන්ව ගලවාගත් හැටි අමතක
කරන්න එපා.[10] **7** ඒ නිසා දැන් ඔබ
මෙහෙම කරන්න. අලුත් කරත්තයක්
සාදන්න.[1] කවදාවත් වියගහක් බැඳ
නැති[2] කිරි එළදෙනුන් දෙන්නෙක්ව
තෝරගන්න. උන්ව ඒ කරත්තයට
බඳින්න. උන්ගේ පැටවුන්ව ගාල් කර
තියාගන්න. **8** යෙහෝවා දෙවියන්-
ගේ ගිවිසුම් පෙට්ටිය ඒ කරත්තය උඩ
තියන්න. ඔබ සමාව ලබාගන්න[3] සැදූ
රත්තරන් රූපත්[4] පෙට්ටියක දමා
ඒක ළඟින් තියන්න. ඉන්පසු එළදෙ-
නුන්ට යන්න හරින්න. **9** උන් යන්-
නේ කොයි පැත්තටද කියා බලාගෙන
ඉන්න. ගිවිසුම් පෙට්ටිය අයිති ප්‍රදේ-
ශය වන බෙත්-ෂෙමෙෂ්[5] වෙත යන
මාර්ගයේ උන් ගමන් කළොත් මේ
මහත් විපත ගෙනාවේ ඔවුන්ගේ දෙවි-
යන් බව ස්ථිරයි. නමුත් උන් වෙන
මාර්ගයක ගමන් කළොත් අපිට පහර
දුන්නේ ඔහු නෙවෙයි කියලා අපිට
දැනගන්න පුළුවන්. ඒක ඉබේ සිද්ධ
වුණු විපතක්.”[6]

**10** එබැවින් පිලිස්තිවරු ඔවුන්
පැවසූ ලෙසම කළෝය. ඔවුහු කිරි
එළදෙනුන් දෙදෙනෙකු ගෙන කරත්-
තයට බැන්දෝය. උන්ගේ පැට-
වුන්ව ඔවුහු ගාල් කර තැබුවෝය.
**11** ඉන්පසු ඔවුහු, යෙහෝවා දෙවි-
ගේ ගිවිසුම් පෙට්ටිය කරත්තයේ
තැබුවෝය.[7] මීයන්ගේ හැඩයට හා
අර්ශස් ගෙඩිවල හැඩයට සාදාගත්
රත්තරන් රූප දමා තිබූ පෙට්ටි-
යද ඔවුහු කරත්තයේ තැබුවෝය.
**12** එළදෙන්නු බෙත්-ෂෙමෙෂ් වෙත
යන මාර්ගය දිගේ ගියෝය.[8] උන්
හඬ නඟමින් වමටවත් දකුණට-
වත් නොහැරී දිගටම ඒ මාර්ග-
යේ ගමන් කළෝය. පිලිස්තිවරුන්ගේ
අධිපතියෝද[9] බෙත්-ෂෙමෙෂ් දේශ
සීමාව දක්වාම උන් පිටුපසින්
ඇවිදගෙන ගියෝය. **13** කරත්තය
පැමිණි විට බෙත්-ෂෙමෙෂ් නුවරේ
වැසියෝ තැනිතලාවේ තිරිඟු අස්-
වැන්න[10] කපමින් සිටියෝය. ඔවුහු
ගිවිසුම් පෙට්ටිය දුටු විගස මහත්
ප්‍රීතියෙන් කැගැසුවෝය. **14** එළ-
දෙන්නු බෙත්-ෂෙමෙෂ්හි වැසියෙකු

**6 පරි.**
1 1සාමු 4:11; 1සාමු 5:1; ගීතා 78:61
2 නික් 7:11; ලෙවී 19:31; ද්වි 18:12; යෙසා 2:6
3 1සාමු 6:4; 1සාමු 6:17
4 යොෂු 13:3; විනි 3:3; 1සාමු 6:16
5 1ලේක 16:28; ගීතා 18:44; යෙසා 42:12
6 ලෙවී 11:29; 1සාමු 6:18; යෙසා 66:17
7 නික් 9:3; 1සාමු 5:6; 1සාමු 5:11
8 නික් 7:13; නික් 8:15; නික් 14:17; රෝම 9:18
9 නික් 9:14; නික් 9:16; රෝම 9:17
10 නික් 6:1; නික් 11:1; නික් 12:33; ගීතා 105:38

**2 තීරුව**
1 2සාමු 6:3; 1ලේක 13:7
2 ගණන් 19:2
3 1සාමු 6:3
4 1සාමු 6:4
5 යොෂු 15:10; යොෂු 21:16; 2රාජා 14:11; 1ලේක 6:59; 2ලේක 28:18
6 දේශ 9:11
7 2සාමු 6:3; 1ලේක 13:7
8 1සාමු 6:9
9 යොෂු 13:3; විනි 3:3; 1සාමු 6:4
10 රූත් 2:2; රූත් 2:23

වන යොෂුවාගේ කෙතට ඇතුල් වී
ලොකු ගලක් අසල නැවතුණෝය.
පසුව එහි වැසියෝ කරත්තය කඩා
දැමුවෝය. ඔවුහු එහි ලී, දර ලෙස
පාවිච්චි කරමින් එළදෙනුන්[1] දෙදෙ-
නාව දවන පූජාවක් ලෙස යෙහෝවා
දෙවිට ඔප්පු කළෝය.[2]
**15** ලෙවීවරු[3] යෙහෝවා දෙවිගේ
ගිවිසුම් පෙට්ටිය හා රත්තරන් රූප
තිබූ පෙට්ටිය බිමට ගෙන විශාල ගල
මත තැබුවෝය. බෙත්-ෂෙමෙෂ්හි[4]
වැසියෝ එදින මුළු දවසම යෙ-
හෝවා දෙවිට දවන පූජාද යාගද
ඔප්පු කළෝය.
**16** ඉන්පසු පිලිස්තිවරුන්ගේ අධි-
පතීහු[5] පස්දෙනා නැවත එක්‍රොන්
වෙතට හැරී ගියෝය. **17** පිලිස්ති-
වරුන් තමන්ගේ වරදට සමාව ලබා-
ගැනීමට යෙහෝවා දෙවිට[6] තෑගි
වශයෙන් අර්ශස් ගෙඩිවල හැඩයට
සාදා යැවූ රූප ගණන මෙසේය. ඔවුහු
අෂ්දොද් නුවර[7] වෙනුවෙන් එකක්ද
ගාසා නුවර[8] වෙනුවෙන් එකක්ද අෂ්-
කෙලොන් නුවර[9] වෙනුවෙන් එකක්ද
ගාත් නුවර[10] වෙනුවෙන් එකක්ද
එක්‍රොන් නුවර[11] වෙනුවෙන් එකක්ද
සාදා යැවූහ. **18** ඔවුහු පිලිස්තිව-
රුන්ගේ අධිපතීන් පස්දෙනා පාලනය
කළ පවුරුවලින් වට වූ නුවරවල හා
ගම්බද පළාත්වල ගණනට අනුව
මීයන්ගේ හැඩයටද රත්තරන් රූප
සාදා යැවූහ.

බෙත්-ෂෙමෙෂ්හි වැසියෙකු වූ යො-
ෂුවාගේ කෙතෙහි තිබූ විශාල
ගල මේ දක්වාම තිබේ. යෙහෝවා
දෙවිගේ ගිවිසුම් පෙට්ටිය තැබූ ඒ
ගල සිදු වූ සියල්ලට සාක්ෂියකි.
**19** බෙත්-ෂෙමෙෂ්හි[12] මිනිසුන් යෙ-
හෝවා දෙවිගේ ගිවිසුම් පෙට්ටිය දෙස
බැලූ නිසා දෙවි ඔවුන්ට පහර දුන්-
නේය. ඔහු පුරුෂයන් හැත්තෑදෙනෙ-
කුව (පනස්දහසක්ව)* මරා දැමුවේය.
යෙහෝවා දෙවි මෙතරම් විශාල සෙ-
නඟක් මරා දැමූ නිසා ඒ නුවරේ වැසි-
යෝ හඬා වැලපුණෝය.[1] **20** ඔවුහු
මෙසේ කීවෝය. "මේ ශුද්ධ දෙවි[2] වන
යෙහෝවා ඉදිරියේ සිටින්න පුළුවන්
කාටද? අනේ, ඔහු අපෙන් ඈත් වී වෙ-
නත් නුවරකට ගියා නම් හොඳයි!"[3]
**21** පසුව ඔවුහු කිර්යත්-යෙයාරීම්
නුවර[4] වෙත පණිවිඩකරුවන් යවා
මෙසේ දැන්වූවෝය. "පිලිස්තිවරු
යෙහෝවා දෙවිගේ ගිවිසුම් පෙට්ටිය
අපිට භාර දුන්නා. ඇවිත් එය ඔබේ
නුවරට රැගෙන යන්න."[5]

**7** පසුව කිර්යත්-යෙයාරීම්හි[6] වැසි-
යෝ පැමිණ කන්දක් උඩ පිහිටි
අබිනාදාබ්ගේ[7] නිවසට යෙහෝවා
දෙවිගේ ගිවිසුම් පෙට්ටිය රැගෙන
ගියෝය. ඔවුහු යෙහෝවා දෙවි-
ගේ ගිවිසුම් පෙට්ටිය ආරක්ෂා කිරීම
සඳහා අබිනාදාබ්ගේ පුත්‍රයා වන එලි-
යාසර්ව පත් කළෝය.
**2** ගිවිසුම් පෙට්ටිය අවුරුදු විස්සක්
පුරාම කිර්යත්-යෙයාරීම්හි තිබිණ.
ඊශ්‍රායෙල් සෙනඟ හඬා වැලපෙමින්[8]
යෙහෝවා දෙවිගේ පිහිට පැතුවෝය.
**3** සාමුවෙල් ඊශ්‍රායෙල් සෙනඟට
මෙසේ කීවේය. "ඔබ මුළු සිතින්ම
යෙහෝවා දෙවිගේ මඟ පෙන්වීම් පත-
නවා නම් ඔබ ළඟ තිබෙන අෂ්-
ටොරෙත් රූප[9] හා වෙනත් බොරු
දෙවිවරුන්ගේ රූප ඉවත් කර[10] යෙ-
හෝවා දෙවි වෙතට හැරෙන්න.[11]
ඔහුට පමණක් නමස්කාර කරන්න.[12]
එවිට ඔහු ඔබව පිලිස්තිවරුන්-
ගේ අතින් ගලවාගනියි."[13] **4** ඉන්-
පසු ඊශ්‍රායෙල් සෙනඟ ඔවුන් ළඟ තිබූ
බාල් රූපද[14] අෂ්ටොරෙත් රූපද[15]
ඉවත් කර යෙහෝවා දෙවිට පමණක්
නමස්කාර කිරීමට පටන්ගත්තෝය.
**5** පසුව සාමුවෙල් මෙසේ කීවේය.
"ඊශ්‍රායෙල් සෙනඟෙනි, සියලුදෙනාම
මිෂ්පා නුවරට[16] රැස් වෙන්න.[17] එහිදී
මම යෙහෝවා දෙවිට ඔබ වෙනුවෙන්

**6 පරි.**
1 උත් 15:9; 1සාමු 6:7; 1සාමු 16:2
2 නික් 20:24; විනි 21:4
3 ගණන් 3:31
4 යොෂු 21:16
5 1සාමු 6:12
6 1සාමු 6:4
7 1සාමු 5:1; 2ලේක 26:6; යෙරෙ 25:20; සෙක 9:6; ක්‍රියා 8:40
8 විනි 16:1; විනි 16:21; ආමො 1:7; ක්‍රියා 8:26
9 විනි 1:18; සෙක 9:5
10 1සාමු 5:8; 1සාමු 17:4; 2සාමු 21:22
11 යොෂු 13:3; 1සාමු 5:10; 2රාජා 1:2; ආමො 1:8
12 යොෂු 15:10; යොෂු 21:16; 1සාමු 6:9

**2 තීරුව**
1 ගණන් 4:6; ගණන් 4:15; ගණන් 4:20; 1ලේක 13:10
2 ලෙවී 11:45; 1සාමු 2:2
3 ගණන් 17:12; 2සාමු 6:9; 1ලේක 13:12; ගීතා 76:7
4 යොෂු 18:14; විනි 18:12; 1ලේක 13:5
5 1ලේක 13:6; 1ලේක 16:1; 2ලේක 1:4

**7 පරි.**
6 2සාමු 6:2; 1ලේක 13:5
7 2සාමු 6:4; 1ලේක 13:7
8 විනි 2:4; නෙහෙ 9:28; 2කොරි 7:10
9 විනි 2:13
10 යොෂු 24:14; යොෂු 24:23; විනි 3:7; විනි 10:6
11 ද්වි 30:2; 1සාමු 12:24; 1රාජා 8:48; යෙසා 55:7; යෝවෙ 2:12

**12** ද්වි 6:13; ද්වි 10:20; ද්වි 13:4; ලූක් 4:8; **13** ද්වි 28:1; **14** විනි 10:16; **15** 1රාජා 11:33; **16** යොෂු 18:26; විනි 20:1; විනි 21:1; 1සාමු 10:17; 1රාජා 15:22; 2රාජා 25:23; යෙරෙ 40:6; **17** යෝවෙ 2:16.

**1සාමු 6:19*** 'පනස්දහසක්' යන අදහස මේ පද-යට පසු කලෙක ඇතුළත් කළ බව ඇතමෙක් විශ්වාස කරති.

යාච්ඤා කරන්නම්."[1] **6** ඔවුහු සිය-
ලුදෙනාම මිෂ්පාහි රැස් වී වතුර ඇද
යෙහෝවා දෙවි ඉදිරියේ වතුර බිමට
වත් කළෝය. ඔවුහුද, "අපි යෙහෝවා
දෙවිට විරුද්ධව කළේ පාපයක්"[2] යයි
කියමින් එදින නිරාහාරව සිටියෝය.[3]
සාමුවෙල්, මිෂ්පා නුවරේදී විනිශ්චය-
කරුවෙකු[4] ලෙස ඊශ්‍රායෙල් සෙනඟට
සේවය කිරීමට පටන්ගත්තේය.

**7** ඊශ්‍රායෙල් සෙනඟ මිෂ්පාහි රැස්ව
සිටින බව පිලිස්තිවරුන්ට ආරංචි විය.
පිලිස්තිවරුන්ගේ අධිපතීහු[5] ඊශ්‍රායෙල්
සෙනඟට විරුද්ධව සටනට යෑමට
සූදානම් වූහ. ඊශ්‍රායෙල් සෙනඟ මෙය
දැනගත් විට මහත් සේ භය වී[6]
**8** සාමුවෙල්ට මෙසේ කීවෝය. "අනේ,
යෙහෝවා දෙවිගෙන් උපකාර ඉල්ලා
අපි වෙනුවෙන් කන්නලව් කරන්න.[7]
පිලිස්තිවරුන්ගේ අතින් අපිව ගලවා-
ගන්න කියා ඔහුගෙන් ඉල්ලන්න."
**9** පසුව සාමුවෙල් කිරි බොන වය-
සැති බැටළු පැටවෙකු ගෙන මුළු
සතාවම දවන පූජාවක් ලෙස යෙ-
හෝවා දෙවිට ඔප්පු කළේය.[8] ඉන්පසු
සාමුවෙල් ඊශ්‍රායෙල්වරුන් වෙනුවෙන්
යෙහෝවා දෙවිට කන්නලව් කළේය.[9]
යෙහෝවා දෙවිද ඔහුට සවන් දුන්-
නේය.[10] **10** සාමුවෙල් දවන පූජාව
ඔප්පු කරමින් සිටියදී පිලිස්තිවරු යුද්-
ධයට සැරසී ඊශ්‍රායෙල්වරුන් ඉදිරියට
ආවෝය. එහෙත් යෙහෝවා දෙවි
මහත් ගිගුරුම් හඬක්[11] ඇති කර-
මින් පිලිස්තිවරුන්ව වියවුලට පත්
කළේය.[12] එබැවින් ඊශ්‍රායෙල්වරුන්ට
ඔවුන්ව පරාජය කිරීමට හැකි විය.[13]
**11** ඊශ්‍රායෙල්වරු මිෂ්පා සිට බෙත්-
කාර්හි දකුණු මායිම දක්වාම පිලිස්-
තිවරුන්ව ලුහුබැඳ ගොස් ඔවුන්ව
මරා දැමුවෝය. **12** පසුව සාමුවෙල්
ගලක් ගෙන[14] මිෂ්පා හා යෙෂානා
නුවර අතර තබා එයට එබෙන්-
එසෙර්* යන නම දෙමින් මෙසේ
කීවේය. "මේ දක්වාම යෙහෝවා දෙවි
අපට උපකාර කළා."[15] **13** මෙසේ
ඊශ්‍රායෙල්වරු පිලිස්තිවරුන්ව යටත්
කරගත්තෝය. ඔවුහු ඊශ්‍රායෙල්ව-
රුන්ගේ දේශ සීමාවට නැවත නොපැ-
මිණියෝය.[1] සාමුවෙල් ජීවත් වූ සියලු
දවස්වලදී යෙහෝවා දෙවි පිලිස්තිව-
රුන්ට විරුද්ධව තම මහත් බලය
පෙන්වූවේය.[2] **14** එක්‍රොන් සිට
ගාත් දක්වා පිලිස්තිවරු යටත් කර-
ගෙන තිබූ නුවරවල් ඊශ්‍රායෙල්වරු
නැවත ලබාගත්තෝය. ඒ නුවරවල්
අවට තිබූ සියලු ප්‍රදේශද ඔවුහු යටත්
කරගත්තෝය.

ඉන්පසු ඊශ්‍රායෙල්වරු හා අමෝරි-
වරු[3] එකිනෙකා සමඟ සමාදානයෙන්
සිටියෝය.

**15** සාමුවෙල් ජීවත් වූ සියලු දවස්-
වලදී විනිශ්චයකරුවෙකු ලෙස ඊශ්‍රා-
යෙල් සෙනඟට සේවය කළේය.[4]
**16** ඔහු අවුරුදු පතා බෙතෙල් නුවර[5]
වෙනටත් ගිල්ගාල්[6] වෙනටත් මිෂ්පා[7]
වෙනටත් ගමන් කර ඒ ඒ ස්ථාන-
වල සිටි ඊශ්‍රායෙල් සෙනඟගේ නඩු
විභාග කළේය.[8] **17** ඔහු එම ස්ථා-
නවල වැඩකටයුතු අවසන් කළ පසු
නැවත තම නිවස තිබූ ස්ථානය වන
රාමා[9] වෙනට හැරී ආවේය. ඔහු එහි
ජීවත් වූ ඊශ්‍රායෙල් සෙනඟගේ නඩුද
විභාග කළේය. ඔහු යෙහෝවා දෙ-
විට රාමාහි පූජාසනයක් ගොඩනැඟු-
වේය.[10]

**8** සාමුවෙල් මහලු වූ විට ඔහු
තම පුත්‍රයන්ව ඊශ්‍රායෙල් දේ-
ශයේ විනිශ්චයකරුවන් ලෙස පත්
කළේය.[11] **2** ඔහුගේ කුලුඳුල් පුත්‍ර-
යාගේ නම යෝවෙල්ය.[12] ඔහුගේ දෙ-
වන පුත්‍රයාගේ නම අබියාය.[13] ඔවුහු
බෙයර්-ෂෙබා නුවරේ සිට විනිශ්ච-
යකරුවන් ලෙස සේවය කළෝය.
**3** නමුත් ඔහුගේ පුත්‍රයෝ ඔහුගේ අඩි-
පාරේ ගමන් කළේ නැත.[14] අයුතු
ලෙස ලාභ උපයාගත්[15] ඔවුහු අල්ලස්
ගනිමින්[16] යුක්තිය පෙරළුවෝය.[17]

**7 පරි.**

**1** 1සාමු 12:23; හිතෝ 15:8; යාකො 5:16
**2** ලෙවී 26:40; විනි 10:10; 1රාජා 8:47; ගීතා 106:6
**3** 2ලේක 20:3; නෙහෙ 9:1; යෝවෙ 2:12
**4** විනි 2:18
**5** යොෂු 13:3; 1සාමු 6:4
**6** ගීතා 56:3; හිතෝ 29:25; මතෙ 10:28
**7** 1සාමු 12:19; ගීතා 78:34; ගීතා 86:7; යෙසා 37:4
**8** ලෙවී 1:10; විනි 6:26; 1රාජා 18:38
**9** ගීතා 99:6
**10** ගීතා 28:6; ගීතා 50:15; 1යොහ 5:14
**11** 1සාමු 2:10; 2සාමු 22:14
**12** යොෂු 10:10; විනි 4:15
**13** ද්වි 20:4; ද්වි 28:7
**14** උත් 31:45; උත් 35:14; යොෂු 4:9; යොෂු 24:26
**15** ගීතා 44:3; ක්‍රියා 26:22

**2 තීරුව**

**1** 1සාමු 9:16; 1සාමු 13:5
**2** 1සාමු 14:23; 1සාමු 17:51
**3** උත් 15:18; උත් 15:21; විනි 11:23
**4** විනි 2:16; 1සාමු 3:20; 1සාමු 12:11; 1සාමු 25:1; ක්‍රියා 13:20
**5** යොෂු 16:1
**6** යොෂු 15:7; 1සාමු 11:15
**7** 1සාමු 7:5
**8** 1සාමු 3:20; 1සාමු 12:11
**9** 1සාමු 1:1; 1සාමු 8:4; 1සාමු 19:18
**10** නික් 20:25

**8 පරි.**

**11** 1තිමෝ 5:22
**12** 1ලේක 6:28
**13** 1ලේක 6:28
**14** දේශ 2:19
**15** නික් 18:21; 1තිමෝ 3:3; 1පේතෘ 5:2; **16** නික් 23:8; ද්වි 16:19; ගීතා 15:5; ගීතා 26:10; හිතෝ 29:4; යෙසා 1:23; යෙසා 33:15; මීකා 3:11; **17** ද්වි 24:17; යෝබ් 34:12; හිතෝ 31:5; යෙරෙ 22:17.

**1සාමු 7:12*** තේරුම, "උපකාරය නමැති ගල."

**4** කල් යත්ම ඊශ්‍රායෙල් දේශ-
යේ වැඩිමහල්ලෝ[1] එකතු වී රාමාහි
ජීවත් වූ සාමුවෙල් හමු වීමට ගියෝය.
**5** ඔවුහු සාමුවෙල්ට මෙසේ කීවෝය.
“ඔබේ පුත්‍රයන් ඔබට වඩා ගො-
ඩක් වෙනස්. ඔවුන් කටයුතු
කරන්නේ ඔබේ ආදර්ශයට අනුව නෙ-
වෙයි. අනික ඔබත් දැන් වයසයි. ඒ
නිසා වෙනත් ජාතීන්ට මෙන් අපි-
ටත් රජෙක්[2] හිටියා නම් හොඳයි.
අපිව පාලනය කරන්න රජෙක්ව
පත් කරන්න.” **6** එහෙත් සාමුවෙල්
ඔවුන් කළ ඉල්ලීම ගැන කනගාටු වී
යෙහෝවා දෙවිට ඒ ගැන යාච්ඤා
කළේය.[3] **7** එවිට යෙහෝවා දෙවි
සාමුවෙල්ට මෙසේ කීවේය.[4] “සෙ-
නඟ පවසන දේට සවන් දෙන්න.[5]
මන්ද ඔවුන් ප්‍රතික්ෂේප කරන්නේ
ඔබව නොව, ඔවුන්ගේ රජු වන
මාවය.[6] **8** මා ඊජිප්තු දේශයෙන්
ඔවුන්ව පිටතට ගෙනා දවසේ සිට[7]
මේ දක්වා ඔවුහු මාව අත්හැර[8] වෙ-
නත් දෙවිවරුන් පසුපස ගියෝය.[9]
ඔවුන් දැන් ඔබව අත්හැර යන්නෙත්
මාව අත්හැර ගිය ආකාරයටමයි.
**9** ඒ නිසා දැන් ඔවුන් පවසන දේට
සවන් දෙන්න. නමුත් ඔවුන්ව පාල-
නය කිරීමට පත් කරන රජුගේ අයිති-
වාසිකම් ගැන ඔබ ඔවුන්ට කලින්ම
දැන්විය යුතුයි.”[10]

**10** එබැවින් සාමුවෙල්, රජෙකුව
පත් කරන්න කියා තමන්ට පැවසූ
අයට යෙහෝවා දෙවි කී සෑම දෙ-
යක්ම පැවසුවේය. **11** ඔහු ඔවුන්ට
තවදුරටත් මෙසේ කීවේය. “ඔබව
පාලනය කිරීමට පත් කරන රජුගේ
අයිතිවාසිකම්[11] මේවායි. රජුට දාස-
කම් කරන්න ඔබේ පුත්‍රයන්ට සිදු
වෙයි.[12] ඔවුන්ගෙන් සමහරෙකුට රජු-
ගේ අශ්ව රථ පදවන්නන්[13] හා අසරු-
වන්[14] ලෙස සේවය කරන්න සිදු වෙයි.
තවත් සමහරෙකුට රජුගේ අශ්ව රථ-
වලට පෙරටුවෙන් දුවන්න සිදු වෙයි.[15]
**12** තවත් අයව රජු තම නිලධාරීන්
ලෙස සේවය කරන්න තෝරාගනියි.
දහසකින් යුත් කණ්ඩායම්[16] හා පන-
හකින් යුත් කණ්ඩායම්[1] බලාගැනීමට
රජු ඔවුන්ව පත් කරයි. කෙත්වතු
හාන්න,[2] අස්වනු නෙළන්න,[3] යුධා-
යුධ සාදන්න,[4] අශ්ව රථවලට අවශ්‍ය
උපකරණ සාදන්න[5] වැනි කාර්ය-
යන්වලට රජු සමහරෙකුව යොද-
වයි. **13** සුවඳ ද්‍රව්‍ය සාදන්න, කෑම
පිසින්න හා රොටි පුලුස්සන්න රජු
ඔබේ දූවරුන්ව සේවයට ගනියි.[6]
**14** ඔබේ හොඳම කෙත්වතු, මිදිවතු[7]
හා ඔලීවවතු[8] රජු ඔහුගේ සේවක-
යන්ට දෙයි. **15** රජු ඔබේ කෙත්වල
පලදාවෙන්ද මිදිවතුවල පලදාවෙන්ද
දහයෙන් කොටසක්[9] ගෙන ඔහුගේ
නිලධාරීන්ටද[10] ඔහුගේ සේවකයන්-
ටද දෙයි. **16** රජු තමන්ගේ වැඩ
කරගන්නා පිණිස ඔබේ දාසදාසීන්වද
ඔබේ ගව රැළේ හොඳම සතුන්වද
ඔබේ බූරුවන්වද ගනියි.[11] **17** ඔබේ
එළු බැටළු රැළවල් අතරින්[12] රජු දහ-
යෙන් කොටසක් ගනියි. රජුට සේ-
වය කරන්න ඔබටත් සිදු වෙයි.
**18** ඔබව පාලනය කරන්න ඔබ තෝ-
රගන්න රජු නිසා ඔබ යම් දවසක
හඬා වැලපුණත්[13] යෙහෝවා දෙවි
ඔබට සවන් නොදෙයි.”[14]

**19** සාමුවෙල් පැවසූ දේවලට
සවන් නොදුන් ජනයා[15] ඔහුට
මෙසේ කීවෝය. “ඔබ අපව පාලනය
කරන්න රජෙක්ව පත් කළ යුතුමයි.
**20** වෙනත් ජාතීන්ට මෙන්[16] අපටත්
රජෙක් අවශ්‍යයි. ඔහු අපේ ප්‍රශ්න
ගැටලු විසඳයි. ඔහු යුද්ධවලදී පෙර-
මුණ ගෙන අප වෙනුවෙන් සටන්
කරයි.” **21** සාමුවෙල් ඔවුන් පැවසූ
සියල්ල ඇසූ පසු යෙහෝවා දෙ-
විට ඒ ගැන කීවේය.[17] **22** එවිට
යෙහෝවා දෙවි සාමුවෙල්ට මෙසේ
කීවේය. “ඔවුන් කියන දේට සවන්
දී ඔවුන්ව පාලනය කිරීමට රජෙ-
කුව පත් කරන්න.”[18] දෙවි එසේ කී
පසු සාමුවෙල් ඊශ්‍රායෙල්හි වැඩිමහල්-
ලන්ට මෙසේ කීවේය. “දැන් එක් එක්
කෙනා තම තමාගේ නුවරට හැරී
යන්න.”

**8 පරි.**

**1** නික් 18:25, විනි 21:16, 1සාමු 4:3, 2සාමු 5:3, 1රාජා 20:7
**2** ද්වි 17:14, 1සාමු 12:13, හොෂෙ 13:10, ක්‍රියා 13:21
**3** ගීතා 143:10, මතෙ 6:10
**4** 1සාමු 15:10, ගීතා 99:6
**5** ගීතා 81:12
**6** විනි 8:23, 1සාමු 10:19, 1සාමු 12:12, ගීතා 74:12, යෙසා 33:22
**7** නික් 14:30
**8** ද්වි 9:24, යෙරෙ 22:21
**9** ද්වි 32:16, විනි 2:19, ගීතා 78:58
**10** ද්වි 17:15
**11** 1සාමු 10:25
**12** 1සාමු 14:52, 1රාජා 12:4
**13** 1රාජා 9:22, 1රාජා 10:26
**14** 1රාජා 4:26
**15** 2සාමු 8:4, 2සාමු 15:1, 1රාජා 1:5
**16** 2සාමු 18:1, 1ලේක 27:1

**2 තීරුව**

**1** 2රාජා 1:14
**2** 1ලේක 27:26
**3** 1රාජා 4:7
**4** 1ලේක 12:37
**5** 1රාජා 4:26
**6** 1රාජා 4:22
**7** 1රාජා 21:7
**8** 1ලේක 27:28
**9** 1රාජා 12:10
**10** උත් 37:36, 1ලේක 28:1
**11** 1රාජා 5:16
**12** 1රාජා 4:23
**13** 1රාජා 12:4
**14** යෝබ් 27:9, ගීතා 18:41, හිතෝ 1:26, මීකා 3:4
**15** ගීතා 81:11, යෙරෙ 7:13, එස 33:31
**16** ලෙවී 20:24, ගණන් 23:9, ද්වි 7:6, 1සාමු 8:5, ගීතා 106:35
**17** ගීතා 99:6
**18** 1සාමු 8:7, හොෂෙ 13:11

9 බෙන්ජමින් ගෝත්‍රයට[1] අයත්
කිෂ්[2] නම් මිනිසෙක් සිටියේය.
ඉතා ධනවත් මිනිසෙකු වූ[3] ඔහු
අබියෙල්ගේ පුත්‍රයාය. අබියෙල් ෂෙ-
රොර්ගේ පුත්‍රයාය. ෂෙරොර් බෙ-
කොරත්ගේ පුත්‍රයාය. බෙකොරත්
බෙන්ජමින්වරයෙකු වූ අෆියාගේ පුත්‍ර-
යාය. **2** කිෂ්ට සාවුල්[4] නම් පුත්‍ර-
යෙක් සිටියේය. ඔහු ඉතා කඩවසම්
තරුණයෙකි. ඊශ්‍රායෙල් සෙනඟ අත-
රේ ඔහු තරම් කඩවසම් කෙනෙක්
තවත් නොවීය. ඔහු මොන තරම්
උසද කිවහොත් ඔහුගේ උරහිසට
වඩා උස් වූ කිසිවෙක් සිටියේ නැත.[5]
**3** දිනක් සාවුල්ගේ පියා වන කිෂ්ට
අයිති බූරුදෙනුන්[6] නැති විය. එබැ-
වින් කිෂ් තම පුත්‍රයා වන සාවුල්ට
මෙසේ කීවේය. “සේවකයෙක් එක්ක
ගිහින් නැති වුණු අපේ බූරුදෙනුන්ව
හොයාගෙන එන්න.” **4** සාවුල් බූරු-
දෙනුන්ව සොයමින් එෆ්‍රායිම් කඳුක-
රය[7] පසු කර ෂාලිෂා නම් පළාත[8]
දක්වා ගිය නමුත් උන්ව සම්බ වුණේ
නැත. ඔවුහු ෂායලිම් දේශය හරහාද
ඇවිදගෙන ගියෝය. එහෙත් උන්ව
සම්බ වුණේ නැත. බෙන්ජමින්වරුන්-
ගේ දේශය හරහාද ඔවුන් ඇවිදගෙන
ගිය නමුත් උන්ව සම්බ නොවීය.
**5** පසුව ඔවුහු ෂූප් නම් පළාතට
ආවෝය. සාවුල් ඔහු සමඟ සිටි සේව-
කයාට මෙසේ කීවේය. “අපි දැන් ගෙ-
දර යමු. නැත්නම් තාත්තා නැති වුණු
බූරුදෙනුන් ගැන දුක් වෙන එක අත්-
හැරලා අපිට මොනවද වුණේ කියලා
කල්පනා කරයි.”[9] **6** නමුත් සේව-
කයා ඔහුට මෙසේ කීවේය. “දෙවිගේ
අනාගතවක්තෘ කෙනෙක්[10] මේ නුව-
රේ ඉන්නවා. ඔහුට හැමෝම ගෞ-
රව කරනවා. ඔහු යමක් කිව්වොත්
ඒක අනිවාර්යයෙන්ම ඉටු වෙනවා.[11]
නැති වුණු අපේ සත්තු හොයාගන්න
අපි යන්න ඕනේ කොයි පැත්තටද
කියලා අපි ගිහින් ඔහුගෙන් අහමු.”
**7** එවිට සාවුල් ඔහුගේ සේවකයා-
ගෙන් මෙසේ ඇසුවේය. “අපි ඔහු
ළඟට යද්දී ඔහුට මොනවාද අර-
ගෙන යන්නේ?[1] සැබෑ දෙවිගේ අනා-
ගතවක්තෘට තෑග්ගක්[2] දෙන්න අපි
ළඟ මොකුත් නැහැ. අපේ මලුවල
තිබුණු කෑමත් ඉවරයි.” **8** සේව-
කයා සාවුල්ට මෙසේ කීවේය. “මා
ළඟ රිදී ෂෙකෙල්* කාලක්[3] තියෙ-
නවා. මම ඒක සැබෑ දෙවිගේ අනාග-
තවක්තෘට දෙන්නම්. එවිට අපේ
සත්තු හොයාගන්න අපි යන්න ඕනේ
මොන පැත්තටද කියලා ඔහු කියයි.”
**9** (පෙර කාලයේදී ඊශ්‍රායෙල් දේශයේ
මනුෂ්‍යයෙක් දෙවිගෙන් යමක් විමසී-
මට යන විට සාමාන්‍යයෙන් පැවසු-
වේ මෙවැනි දෙයකි. “එන්න! අපි
දිවැසිවරයා[4] ළඟට යමු.” ඒ දවස්-
වල අනාගතවක්තෘවරුන්ව හැඳින්වූ-
යේ දිවැසිවරුන් ලෙසය.) **10** එවිට
සාවුල් ඔහුගේ සේවකයාට මෙසේ
කීවේය. “ඒක හොඳ අදහසක්.[5] අපි
ගිහින් ඔහුව මුණගැහෙමු.” ඉන්පසු
ඔවුහු සැබෑ දෙවිගේ අනාගතවක්තෘ
සිටි නුවර වෙතට ගියෝය.
**11** ඔවුන් නුවර වෙතට නැඟ
යද්දී වතුර අදින්න[6] නුවරින් පිට-
තට ආ තරුණියන්ව ඔවුන්ට මුණ-
ගැසුණා. ඔවුහු ඒ තරුණියන්ගෙන්
මෙසේ ඇසුවෝය. “දිවැසිවරයා[7] මෙ-
හේ ඉන්නවාද?” **12** එවිට ඔවුහු
මෙසේ කීවෝය. “ඔව්, අර ඔබට ඉදි-
රියෙන් ඉන්නේ ඔහු තමයි. ඉක්මනට
ගියොත් ඔබට ඔහුව මුණගැහෙන්න
පුළුවන් වෙයි. අද සෙනඟ වෙනු-
වෙන් පූජාවක්[8] ඔප්පු කරන්න තියෙ-
නවා. ඔහු අද නුවරට ආවේ ඒ
නිසයි. දැන් ඔහු පූජා ඔප්පු කරන
ස්ථානයට[9] යනවා ඇති. **13** පූජා-
වට ආශීර්වාද කරන්නේ ඔහුයි.[10]
ඔහු එයට ආශීර්වාද කරන තෙක්
කෑමට ආරාධනා කළ අය කන්-
නේ නැහැ. ඒ නිසා සෙනඟ ඔහු
එන තුරු බලා ඉන්නවා ඇති. ඔහු
කෑම කන්න එතැනට යන්න කලින්
ගිහින් ඔහුව හමු වෙන්න. ඉක්මනට
යන්න. නුවරට ඇතුල් වුණ ගමන්ම

**9 පරි.**
1 විනි 21:17
2 1සාමු 14:51 1ලේක 8:33 1ලේක 9:39 ක්‍රියා 13:21
3 1සාමු 25:2 2සාමු 19:32 යෝබ 1:3
4 1සාමු 11:15 1සාමු 13:13 1සාමු 15:26 1සාමු 16:23 1සාමු 28:7 1සාමු 31:4 2සාමු 1:23 ක්‍රියා 13:21
5 1සාමු 10:23
6 විනි 5:10 විනි 10:4
7 යොෂු 17:10 යොෂු 17:16
8 2රාජා 4:42
9 1සාමු 9:20 1සාමු 10:2
10 ද්වි 33:1 1සාමු 2:27 1රාජා 13:1 2රාජා 6:6
11 1සාමු 3:19 යෙසා 44:26 සෙක 1:6 හෙබ්‍රෙ 1:1

**2 තීරුව**
1 1රාජා 14:3 2රාජා 4:42 ගලා 6:6
2 2රාජා 5:15 2රාජා 8:8 හිතෝ 17:8 හිතෝ 18:16
3 උත් 24:22
4 1සාමු 9:19 2සාමු 15:27 1ලේක 9:22 1ලේක 29:29
5 හිතෝ 13:10 හිතෝ 15:22
6 උත් 24:20 නික් 2:16
7 1සාමු 9:19 2සාමු 15:27
8 උත් 31:54 1සාමු 7:9 1සාමු 16:5
9 1රාජා 3:2 1ලේක 16:39 2ලේක 1:3
10 මාක් 6:41 ලූක් 9:16

**1සාමු 9:8*** ෂෙකෙලයක් යනු ග්‍රෑම් 11.4කි.

ඔබට ඔහුව හම්බ වෙයි.” **14** එබැ-
වින් ඔවුහු නුවරට ගියෝය. ඔවුහු
නුවරට ඇතුල් වූ විට සාමුවෙල්
ඔවුන්ව හමු වීමට ඉදිරියට ආවේය.
සාමුවෙල් ඔවුන්ව හමු වීමට ආවේ
පූජාව ඔප්පු කරන ස්ථානයට ඔවුන්-
වත් රැගෙන යෑම සඳහාය.

**15** සාවුල් ඒ නුවරට පැමිණීමට
දවසකට කලින් යෙහෝවා දෙවි
සාමුවෙල්ට මෙසේ හෙළි කර
තිබිණ.[1] **16** “හෙට මේ වෙලාවට
බෙන්ජමින් දේශයේ[2] මිනිසෙකුව මම
ඔබ වෙතට එවන්නෙමි. මාගේ සෙ-
නඟ වන ඊශ්‍රායෙල්වරුන්ගේ නාය-
කයා ලෙස ඔබ ඔහුව අභිෂේක
කරන්න.[3] ඔහු මාගේ සෙනඟව පිලිස්-
තිවරුන්ගේ අතින් ගලවාගන්නේය.[4]
මන්ද මාගේ සෙනඟ විඳින දුක්ගැ-
හැට මට පෙනෙන්නේය. උපකාරය
පතා ඔවුන් නඟන මොරගැසීමත්
මට ඇසෙන්නේය.”[5] **17** සාමුවෙල්
සාවුල්ව දුටු විට යෙහෝවා දෙවි ඔහුට
මෙසේ කීවේය. “ ‘මාගේ සෙනඟ නො-
මඟ යැමෙන් වළක්වන්නේ ඔහුයි’
කියා මම ඔබට කලින් කිව්වේ මේ
තැනැත්තා ගැනයි.”[6]

**18** සාවුල් නුවර මැද* සිටි සාමු-
වෙල් වෙත ගොස් මෙසේ ඇසුවේය.
“දිවැසිවරයාගේ නිවස තියෙන්නේ
කොහෙද කියලා මට කියන්න පුළු-
වන්ද?” **19** එවිට සාමුවෙල් සාවුල්ට
මෙසේ කීවේය. “මම තමයි ඔබ සො-
යන දිවැසිවරයා. අපි පූජාව ඔප්පු
කරන ස්ථානයට දැන් යමු. ඔබ
මට ඉදිරියෙන් ගමන් කරන්න. අද
ඔබ දෙදෙනා කෑම කන්නේ මා
සමඟයි.[7] ඔබේ හිතේ තියෙන හැම
දෙයක් ගැනම මම ඔබට කියන්නම්.[8]
හෙට උදේ ඔබට යන්න පුළුවන්.
**20** දවස් තුනකට කලින් නැති වුණු
බූරුදෙනුන්[9] ගැන කරදර වෙන්න
එපා.[10] උන්ව හම්බ වුණා. මුළු
ඊශ්‍රායෙල් දේශයේම තියෙන වටිනා
දේවල්[11] අයිති ඔබටයි ඔබේ පියාගේ

**1සාමු 9:18*** මූ.අ., “දොරටුව මැද.”

පරම්පරාවටයි නොවේද?” **21** එවිට
සාවුල් මෙසේ කීවේය. “මම බෙන්ජ-
මින් ගෝත්‍රයේ කෙනෙක්. එය
ඊශ්‍රායෙල් දේශයේ[1] තියෙන කුඩාම
ගෝත්‍රයයි.[2] අනික බෙන්ජමින් ගෝ-
ත්‍රයේ අනික් පවුල් සමඟ සසඳා
බලද්දී මගේ පවුල වැදගත් පවුලක්
කියා කියන්න බැහැ.[3] ඉතින් ඇයි ඔබ
ඒ වගේ දෙයක් මට කිව්වේ?”[4]

**22** පසුව සාමුවෙල් කෑම කන
ස්ථානයට සාවුල්වද ඔහුගේ සේවක-
යාවද රැගෙන ගියේය. එදින මිනිසුන්
තිස්දෙනෙකුට පමණ කෑමට ආරා-
ධනා කර තිබිණ. සාමුවෙල් සාවුල්ට
සහ ඔහුගේ සේවකයාට හිඳගැනීමට
මේසයේ ප්‍රධාන තැන්[5] දුන්නේය.
**23** ඉන්පසු සාමුවෙල් කෑම පිසින
තැනැත්තාට මෙසේ කීවේය. “ ‘මේක
පැත්තකින් අරං තියන්න’ කියලා
මම ඔබට දුන්න මස් කොටස දැන්
ගේන්න.” **24** එවිට ඔහු ගාත් කො-
ටස ගෙන සාවුල් ඉදිරියේ තබමින්
මෙසේ කීවේය. “මෙන්න, ඔබට වෙන්
කළ කොටස. මෙතැන ඉන්න අනික්
අය සමඟ දැන් ඔබත් කන්න. මේ
අවස්ථාව සඳහායි මේ කෑම කොටස
වෙන් කළේ.” එදින සාවුල්, සාමුවෙල්
සමඟ එකට හිඳගෙන කෑම කෑවේය.
**25** පසුව ඔවුහු එම ස්ථානයේ[6] සිට
නුවර වෙතට ගියෝය. ඉන් අනතුරුව
සාමුවෙල් සහ සාවුල් ඔහුගේ නිව-
සේ සඳැල්ලට*[7] වී කතා කරමින්
සිටියේය. **26** ඔවුහු පසුවදා උදෑස-
නින්ම නැඟිට්ටෝය. එළිය වැටී-
ගෙන එද්දී සාමුවෙල් සඳැල්ලේ සිටි
සාවුල්ට කතා කර මෙසේ කීවේය.
“දැන් ඔබ ගෙදර යන්න සූදානම්
වෙන්න.” එබැවින් සාවුල් සූදානම් වී
සාමුවෙල් සමඟ නිවසින් පිටත්ව
ගියේය. **27** ඔවුන් නුවරේ සීමාව
ළඟට පැමිණ කන්දෙන් බැස එද්දී
සාමුවෙල් සාවුල්ට මෙසේ කීවේය.
“ඔබේ සේවකයාට[8] අපට පෙරටුවෙන්

**1සාමු 9:25*** එනම්, වහලයක් නැතුව සාදා ඇති, සඳ එළිය වැටෙන උඩුමහලට.

**9 පරි.**
**1** 1සාමු 20:2; 2සාමු 7:27; යෝබ් 33:16; ගීතා 25:14; ගීතා 99:6; ආමො 3:7
**2** යොෂු 18:11
**3** 1සාමු 10:1; 1සාමු 15:1; 2රාජා 9:3
**4** උත් 49:27
**5** නික් 2:25; ගීතා 106:44; ගීතා 107:19
**6** 1සාමු 10:24; 1සාමු 15:17; ක්‍රියා 13:21
**7** 1සාමු 9:13; 1සාමු 9:24
**8** 1ලේක 28:9; හෙබ්‍රෙ 4:13
**9** 1සාමු 9:3
**10** 1සාමු 4:20
**11** 1සාමු 8:5; 1සාමු 8:19; 1සාමු 12:13

**2 තීරුව**
**1** විනි 21:3
**2** විනි 20:46; විනි 20:47; විනි 21:6; ගීතා 68:27
**3** විනි 6:15; හිතෝ 3:34; හිතෝ 11:2; හිතෝ 18:12; හිතෝ 22:4; ලූක් 14:11; යාකො 4:6; 1පේතෘ 5:5
**4** 1සාමු 2:8
**5** ලූක් 14:10
**6** 1සාමු 9:13; 1සාමු 9:19; 1රාජා 3:2; 1රාජා 3:3
**7** නෙහෙ 8:16; ක්‍රියා 10:9
**8** 1සාමු 9:3; 1සාමු 9:10; 1සාමු 20:38

යන්න කියන්න." සේවකයාද ඔවුන්ට
පෙරටුවෙන් ගියේය. සාමුවෙල් තවදු-
රටත් මෙසේ කීවේය. "මම දෙවි-
ගේ පණිවිඩය ඔබට පවසන තෙක්
ඔබ මෙතැන ටික වේලාවකට නතර
වෙන්න."

**10** සාමුවෙල් තෙල් බඳුන[1] ගෙන
සාවුල්ගේ හිස මත තෙල්
වත් කර ඔහුව සිපගනිමින්[2] මෙසේ
කීවේය. "යෙහෝවා දෙවි අද ඔබව
අභිෂේක කරනවා. ඔහු තම උරු-
මය[3] වන ඊශ්‍රායෙල් ජාතිය පාල-
නය කරන්න තෝරාගත් තැනැත්තා
ඔබයි.[4] **2** අද ඔබ මෙහෙන් පිටත්ව
යද්දී බෙන්ජමින්වරුන්ගේ පළාතේ
ෂෙල්ෂාහි තියෙන රාකෙල්ගේ සො-
හොන් ගේ[5] ළඟදී ඔබට මිනිස්සු
දෙන්නෙක්ව හමු වෙයි. ඔවුන්
ඔබට මෙහෙම කියයි. 'ඔබ හො-
යාගෙන ගිය බූරුදෙනුන්ව[6] හම්බ
වුණා. ඔබේ පියා දැන්, "අනේ,
මගේ පුතාට මොනවාද වුණේ"
කියමින් ඔබ ගැන කනගාටු වෙ-
නවා.'[7] **3** ඊටපස්සේ ඔබ එතැන
ඉඳන් තාබෝර්හි විශාල ගහ තියෙන
තැනට යන්න. එහිදී සැබෑ දෙවිට
නමස්කාර කරන්න බෙතෙල්[8] වෙත
යන මිනිස්සු තුන්දෙනෙක්ව ඔබට
හමු වෙයි. ඔවුන්ගෙන් එක් කෙනෙක්
එළු පැටවුන්[9] තුන්දෙනෙක්ව රැගෙන
යයි. අනික් කෙනා ළඟ රොටි[10]
තුනක් තියෙයි. තුන්වෙනි කෙනා
ලොකු වයින් භාජනයක්[11] රැගෙන
යයි. **4** ඔවුන් ඔබෙන් සැප දුක්
විමසා[12] ඔබට රොටි දෙකක් දෙයි.
ඔබ ඒවා පිළිගන්න. **5** ඔබ දිගටම
ඇවිදගෙන යද්දී ඔබට සැබෑ දෙවි-
ගේ[13] කන්ද පෙනෙයි. පිලිස්තිවරු
කඳවුරු බැඳගෙන ඉන්නේත්[14] එතැ-
නයි. ඔබ නුවරට ඇතුල් වුණ ගමන්ම
පූජා ඔප්පු කරන ස්ථානයේ[15] ඉඳන්
එන අනාගතවක්තෘවරුන් කිහිපදෙ-
නෙක්ව[16] ඔබට මුණගැසෙයි. කුඩා
වීණාව,[17] වීණාව,[18] රබාන[19] හා බට
නළාව[20] වාදනය කරන කණ්ඩාය-
මක් ඔවුන්ට ඉදිරියෙන් එයි. ඒ සංගීත
හඬ මැද ඔවුන් අනාවැකි කියමින්*
ගමන් කරයි. **6** එවිට යෙහෝවා
දෙවිගේ බලය[1] ඔබ තුළ ක්‍රියාත්මක
වී ඔබ තුළ සැබෑ වෙනසක් දකින්න
ලැබෙයි. ඔබත් ඒ අනාගතවක්තෘව-
රුන් වගේ මහත් උද්‍යෝගයෙන් කතා
කරයි.[2] **7** ඔබ මේ ලකුණු[3] සිද්ධ
වෙනවා දකිද්දී සැබෑ දෙවි ඔබ සමඟ
ඉන්න බව ඔබට ස්ථිර වෙයි.[4] එබැ-
වින් ඒ අවස්ථාවේදී ඔබට කළ හැකි
දේ කරන්න.[5] **8** ඔබ මට පෙරටු-
වෙන් ගිල්ගාල්[6] වෙත යන්න. මම
එනකම් ඔබ දවස් හතක්[7] එතැන
ඉන්න. ඊටපස්සේ මම ඇවිත් දවන
පූජා හා හවුල් පූජා[8] ඔප්පු කරන්නම්.
ඔබ කරන්න ඕනෙ මොනවාද කියලා
මම පසුව ඔබට කියන්නම්."

**9** සාවුල්, සාමුවෙල්ගෙන් සමුග-
නිද්දීම දෙවි ඔහු තුළ සැබෑ වෙනසක්
ඇති කළේය.[9] එදින සාමුවෙල් කී
සෑම ලකුණක්ම[10] එලෙසම ඉටු විය.
**10** සාවුල් සහ ඔහුගේ සේවකයා
කන්ද වෙත ඇවිදගෙන යද්දී ඔවුන්ට
අනාගතවක්තෘවරුන් කණ්ඩායමක්
හමු විය. ඒ මොහොතේදීම දෙවිගේ
බලය සාවුල් තුළ ක්‍රියාත්මක විය.[11]
ඔහු ඒ අනාගතවක්තෘවරුන් අතරේ
සිට ඔවුන් මෙන් මහත් උද්‍යෝ-
ගයකින් කතා කිරීමට පටන්ගත්-
තේය.[12] **11** ඔහු එලෙස කතා කළ
නිසා ඔහුව හඳුනන අය එකිනෙ-
කාගෙන් මෙසේ ඇසුවෝය. "කිෂ්-
ගේ පුත්‍රයාට මොකද්ද මේ සිද්ධ
වෙලා තියෙන්නේ? සාවුලුත් අනාග-
තවක්තෘ කෙනෙක්ද?"[13] **12** එතැන
සිටි මිනිසෙක්, "මේ අනාගතවක්තෘ-
වරු කාගෙන් පැවතෙන අයද" කියා
ඇසුවේය. "සාවුලුත් අනාගතවක්තෘ
කෙනෙක්ද" යන ප්‍රසිද්ධ කියමන[14]
ආරම්භ වූයේ ඒ සිද්ධියෙන් පසුවය.

**10 පරි.**

**1** 1සාමු 16:13; 2රාජා 9:3
**2** උත් 31:55; උත් 48:10; උත් 50:1; 2සාමු 19:39
**3** නික් 19:5; ද්වි 32:9
**4** උත් 49:27; 1සාමු 8:9; 1සාමු 9:16; ක්‍රියා 13:21
**5** උත් 35:19
**6** 1සාමු 9:3; 1සාමු 10:16
**7** 1සාමු 9:5
**8** උත් 28:19; උත් 28:22; 1සාමු 7:16
**9** විනි 6:19; විනි 15:1
**10** යෙරෙ 37:21
**11** ලෙවී 23:13; ගණන් 15:5
**12** විනි 18:15
**13** උත් 5:22
**14** 1සාමු 13:3
**15** 1සාමු 9:12
**16** 1සාමු 19:20; 2රාජා 2:3; 2රාජා 4:38; 2රාජා 6:1
**17** 1ලේක 13:8
**18** 2සාමු 6:5; 1රාජා 10:12; 1ලේක 16:5
**19** 1සාමු 18:6
**20** 1රාජා 1:40; යෙසා 5:12

**2 තීරුව**

**1** ගණන් 11:25; ක්‍රියා 28:25; 2පේතෘ 1:21
**2** 1සාමු 10:10; 1සාමු 19:23; 1රාජා 18:29; 1රාජා 22:10
**3** නික් 4:8; 1සාමු 10:9; යෙරෙ 44:29
**4** ද්වි 20:1; විනි 6:12
**5** විනි 9:33
**6** 1සාමු 7:16; 1සාමු 11:14
**7** 1සාමු 13:8
**8** 1සාමු 13:9
**9** 1සාමු 10:6; 1රාජා 3:12; ගීතා 51:10
**10** 1සාමු 10:7; යෙසා 38:7
**11** විනි 14:6; 1සාමු 11:6; 1සාමු 16:13; සෙක 4:6; 2කොරි 3:5
**12** 1සාමු 10:6; 1සාමු 19:23
**13** 1සාමු 19:24; මතෙ 13:54; ක්‍රියා 6:15; **14** යෝබ් 27:1; ගීතා 78:2.

**1සාමු 10:5*** මෙහි, 'අනාවැකි කියමින්' ලෙස පරිවර්තනය කර ඇති හෙබ්‍රෙව් වචනයෙන් අඟවන්නේ, ඔවුන් ඉතා හැඟීම්බරව හා මහත් උද්‍යෝගයකින් දෙවිට ප්‍රශංසා කළ බවයි.

**13** සාවුල් එලෙස කතා කර අව-
සන් වූ පසු පූජා ඔප්පු කරන ස්ථාන-
යට පැමිණියේය. **14** පසුව කිෂ්ගේ
සහෝදරයෙක් ඔහුගෙන් හා ඔහුගේ
සේවකයාගෙන් මෙසේ ඇසුවේය. “ඔබ
කොහෙද ගියේ?” එවිට සාවුල්, “අපි
බූරුදෙනුන්ව[1] හොයාගෙන හුඟක් දුර
ඇවිදගෙන ගියා. නමුත් උන්ව අපිට
හම්බ වුණේ නැති නිසා අපි සාමු-
වෙල් ළඟට ගියා” කියා පැවසුවේය.
**15** එවිට කිෂ්ගේ සහෝදරයා ඔවුන්-
ගෙන් මෙසේ ඇසුවේය. “සාමුවෙල්
ඔබට මොනවාද කිව්වේ?” **16** එවිට
සාවුල් ඔහුට මෙසේ කීවේය. “බූරුදෙ-
නුන්ව හම්බ වුණා කියා ඔහු අපිට
කිව්වා.” නමුත් සාමුවෙල් රජකම
ගැන තමාට පැවසූ දේවල් සාවුල්
ඔහුට පැවසුවේ නැත.[2]

**17** සාමුවෙල් මිෂ්පාහිදී[3] යෙහෝවා
දෙවි වෙතට සෙනඟ කැඳෙව්වේය.
**18** ඔහු ඊශ්‍රායෙල් සෙනඟට මෙසේ
කීවේය. “ඊශ්‍රායෙල්වරුන්ගේ දෙවි
වන යෙහෝවා මෙසේ පවසනවා.[4]
‘ඊශ්‍රායෙල්වරුන්ව ඊජිප්තු දේශයෙන්
පිටතට ගෙනාවේ මමයි.[5] ඊජිප්තුව-
රුන්ගේ අතින්ද ඔබට පීඩා කළ අන්
සියලු ජාතීන්ගේ අතින්ද ඔබව ගල-
වාගත්තේ මමයි.[6] **19** නමුත් ඔබ,
“අපිව පාලනය කරන්න රජෙක්ව පත්
කළ යුතුමයි” කියමින් මාව ප්‍රතික්-
ෂේප කළහුය. ඔබේ සියලු දුක් කරද-
රවලින්ද පීඩාවලින්ද ඔබව ගැලවූ
ඔබේ දෙවිව ඔබ ප්‍රතික්ෂේප කළහුය.[7]
ඔබ එක් එක් කෙනා තම තමාගේ
ගෝත්‍රවලට අනුවද තම තමාගේ
පවුල්වලට* අනුවද යෙහෝවා දෙවි
වන මා ඉදිරියේ රැස් වන්න.’ ”[8]

**20** එබැවින් සාමුවෙල් ඔහු ළඟට
පැමිණෙන ලෙස ඊශ්‍රායෙල්හි සියලුම
ගෝත්‍රවලට පැවසුවේය.[9] පසුව ඔවුන්
අතරින් බෙන්ජමින් ගෝත්‍රය තෝරා-
ගනු ලැබීය.[10] **21** ඉන්පසු බෙන්-
ජමින් ගෝත්‍රයට අයත් එක් එක්
පවුල් ඔහු ළඟට කැඳවන ලදි.
එවිට මට්රීගේ පවුල තෝරාගනු
ලැබීය.[1] අන්තිමට කිෂ්ගේ පුත්‍රයා වූ
සාවුල්ව තෝරාගනු ලැබීය.[2] ඔවුන්
සාවුල්ව සෙවූ නමුත් ඔහුව සම්බ
නොවීය. **22** එබැවින්, “සාවුල් මෙ-
තැනට ඇවිත් ඉන්නවාද” කියා
ඔවුහු යෙහෝවා දෙවිගෙන් විමසු-
වෝය.[3] යෙහෝවා දෙවිද, “ඔහු බඩු
මලු අතරේ සැඟවී සිටිනවා”[4] කියා
පැවසුවේය. **23** එවිට ඔවුහු සාවුල්
වෙත දුව ගොස් ජනයා ඉදිරියට ඔහුව
ගෙනාවෝය. ඔහු මොන තරම් උසද
කිව්වොත් ඔහුගේ උරහිසට වඩා
උස් වූ කිසිවෙක් එතැන නොසි-
ටියේය.[5] **24** එවිට සාමුවෙල් මුළු
සෙනඟ අමතා මෙසේ කීවේය. “යෙ-
හෝවා දෙවි තෝරාගත් තැනැත්-
තාව ඔබ දුටුවාද?[6] ජනයා අතරේ
ඔහුට සමාන තවත් කෙනෙක් ඉන්-
නවාද?” එවිට සෙනඟ කෑගසමින්
මෙසේ කීවේය. “රජතුමා දිගු කල්
ජීවත් වේවා!”[7]

**25** ඉන්පසු සාමුවෙල්, රජුගේ අයි-
තිවාසිකම්[8] ගැන සෙනඟ ඉදිරියේ
කීවේය. තවද ඔහු ඒ සියල්ල ලියවිල්-
ලක සටහන් කර යෙහෝවා දෙවි
ඉදිරියේ තැබුවේය. පසුව සාමුවෙල්
ජනයාව තම තමන්ගේ නිවෙස්ව-
ලට පිටත් කර යැවීය. **26** සාවුල්ද
ගිබෙයාහි[9] තම නිවසට හැරී
ගියේය. සාවුල් සමඟ එඩිතර පුරුෂ-
යෝද ගියෝය. මන්ද එසේ කිරීමට
දෙවි ඔවුන්ගේ සිත් පෙලඹුවේය.[10]
**27** නමුත් එතැන සිටි කිසි කමකට
නැති මිනිස්සු,[11] “මොහු කොහො-
මද අපිව බේරගන්නේ”[12] යයි කිය-
මින් සාවුල්ට අපහාස[13] කළෝය.
ඔවුහු සාවුල්ට තෑගි දුන්නේද නැත.[14]
නමුත් සාවුල් ඔවුන්ට වචනයක්වත්
පැවසුවේ නැත.[15]

**11** අම්මෝන්[16] ජාතික නාහාෂ්
ගිලියද් ප්‍රදේශයේ පිහිටි
යාබෙෂ් නුවරට[17] විරුද්ධව යුද්ධ
කරන පිණිස එහි කඳවුරු බැඳ-
ගත්තේය. එවිට යාබෙෂ්හි සියලු

---

**1සාමු 10:19*** හෝ, “දහස් ගණන් සෙනඟ බෙදා සිටි කණ්ඩායම්වලට.”

**10 පරි.**
**1** 1සාමු 9:3
**2** ගීතා 141:3, හිතෝ 10:19, හිතෝ 13:3, හිතෝ 21:23, හිතෝ 27:2, යෙරෙ 9:23
**3** 1සාමු 7:5
**4** ද්වි 18:20
**5** නික් 13:14, නික් 14:30, ද්වි 4:34, විනි 6:8, නෙහෙ 9:9
**6** නෙහෙ 9:27, ගීතා 107:19
**7** 1සාමු 8:7, 1සාමු 12:12
**8** 2ලේක 30:6
**9** යොෂු 7:14, ක්‍රියා 1:24
**10** යොෂු 7:16, 1සාමු 9:21

**2 තීරුව**
**1** යොෂු 7:17
**2** යොෂු 7:18, ක්‍රියා 13:21
**3** විනි 1:1, විනි 20:18, විනි 20:28, 1සාමු 23:2
**4** 1සාමු 9:21, හිතෝ 11:2, ලූක් 9:48
**5** 1සාමු 9:2
**6** ද්වි 17:15, 1සාමු 9:17
**7** 1රාජා 1:25, 1රාජා 1:39, 2රාජා 11:12, මතෙ 21:9
**8** 1සාමු 8:11
**9** යොෂු 18:28, විනි 20:14, 1සාමු 11:4, 1සාමු 13:2, 2සාමු 21:6
**10** එස්රා 1:5
**11** 2සාමු 20:1, 2ලේක 13:7, නාහු 1:15
**12** 1සාමු 11:12, ක්‍රියා 7:51
**13** දේශ 10:20
**14** 1රාජා 10:10, 2ලේක 17:5, හිතෝ 18:16, මතෙ 2:11
**15** හිතෝ 17:27, ගලා 5:23, යාකො 1:19

**11 පරි.**
**16** ද්වි 2:19
**17** විනි 21:8, 1සාමු 31:11

පුරුෂයෝ, “අපි ගිවිසුමක් ඇති කර-
ගමු. අපි ඔබට සේවය කරන්නම්”[1]
කියා නාහාෂ්ට කීවෝය. **2** නමුත්
අම්මොන් ජාතික නාහාෂ් මෙසේ
කීවේය. “මම නුඹලාගේ දකුණු
ඇස් උගුල්ලා[2] දමා මුළු ඊශ්‍රා-
යෙල් ජාතියවම නින්දාවට ලක් කර-
නවා.[3] ඒ දේ කළාට පස්සේ මම
නුඹලා සමඟ ගිවිසුමක් ඇති කරගන්-
නම්.” **3** එවිට යාබෙෂ්හි වැඩිමහල්-
ලෝ මෙසේ කීවෝය. “අපිට දවස්
හතක් කල් දෙන්න. අපි ඊශ්‍රායෙල් දේ-
ශයේ සෑම පළාතකටම මේ ගැන
දන්වා යවන්නම්. අපිව ගලවගන්න
කවුරුත් ආවේ නැත්නම්[4] අපි ඔබට
යටත් වෙන්නම්.” **4** පසුව පණිවිඩ-
කාරයෝ සාවුල් සිටි දේශය වන
ගිබෙයා[5] වෙතට පැමිණ එහි වැසි-
යන්ට ඒ ගැන කීවෝය. එය අසා මුළු
සෙනඟ ශබ්ද නඟා හැඬුවෝය.[6]

**5** ඒ අවස්ථාවේ සාවුල් ගව රැළ
දක්කාගෙන කෙතේ සිට එතැනට
ආවේය. එවිට ඔහු, “මිනිස්සු ඇයි
මේ විදිහට අඬන්නේ” කියා ඇසු-
වේය. යාබෙෂ්හි පණිවිඩකරුවන් කී
සියල්ල ඔවුහු ඔහුට දැන්වූවෝය.
**6** මේ වචන ඇසූ විට දෙවිගේ බලය[7]
සාවුල් තුළ ක්‍රියාත්මක විය. ඔහු
මහත් සේ කෝප වී[8] **7** ගවයන් දෙ-
දෙනෙකු මරා උන්ව කෑලි කෑලිවලට
කපා පණිවිඩකරුවන් අතේ ඊශ්‍රායෙල්
දේශයේ සියලු පළාත්වලට යැව්-
වේය.[9] ඔවුන්ට මෙසේ දන්වන ලෙසද
ඔහු කීවේය. “සාවුල්ගේ හා සාමුවෙල්-
ගේ පැත්ත නොගන්න ඕනෑම කෙ-
නෙක්ගේ ගවයන්ට කරන්නෙත් මේ
දේමයි!”[10] යෙහෝවා දෙවි[11] සෙනඟ
තුළ මහත් භීතියක්[12] ඇති කළේය.
එබැවින් ඔවුහු එකා මෙන් ඉදිරි-
යට ආවෝය.[13] **8** සාවුල් සටනට
ආ සෙනඟ කොතෙක්ද කියා බෙ-
ෂෙක්හිදී ගණන් කළේය.[14] ඊශ්‍රායෙල්
සෙනඟගේ ගණන තුන්ලක්ෂයක්ද
යූදාහි පුරුෂයන්ගේ ගණන තිස්දහ-
සක්ද විය. **9** පසුව ඔවුහු යාබෙෂ්හි
පණිවිඩකරුවන්ට මෙසේ කීවෝය.
“යාබෙෂ්-ගිලියද්හි වැසියන්ට මෙ-
හෙම කියන්න. ‘හෙට ඉර මුදුන් වෙද්දී
ඔබට ගැලවීම අත් වෙයි.’ ”[1] පණිවිඩ-
කරුවන් යාබෙෂ්හි මනුෂ්‍යයන්ට ඒ
ගැන පැවසූ විට ඔවුහු ප්‍රීතියෙන්
ඉපිල ගියෝය. **10** පසුව යාබෙෂ්හි
මනුෂ්‍යයෝ, “හෙට අපි ඔබ ඉදිරියට
එන්නම්. ඔබට හොඳයි කියා සිතෙන
ඕනෑම දෙයක් කරන්න”[2] යයි අම්-
මොන්වරුන්ට කීවෝය.

**11** පසුවදා සාවුල්[3] සෙනඟ කණ්-
ඩායම් තුනකට බෙදුවේය.[4] ඔවුහු
අන්තිම රැකවල් යාමයේ[5] අම්මොන්-
වරුන්ගේ කඳවුර මැදට ගොස් ඉර
මුදුන් වන වේලාව දක්වාම ඔවුන්ට
පහර දුන්නෝය.[6] ඉතුරු වූ ස්වල්-
පදෙනාව ඔවුහු විසුරුවාහැරියෝය.
දෙදෙනෙකුට එක ළඟ සිටීමට
ඔවුහු කිසිසේත් ඉඩහැරියේ නැත.[7]
**12** එවිට සෙනඟ සාමුවෙල්ට මෙසේ
කීවෝය. “ ‘අපේ රජු වෙන්න සාවුල්ට
පුළුවන්ද’[8] කියා පැවසූ මිනිසුන්ව
මෙතැනට ගෙනෙන්න. අපි ඔවුන්ව
මරලා දාමු.”[9] **13** නමුත් සාවුල්,
“අද ඊශ්‍රායෙල් දේශයට ගැලවීම දුන්-
නේ යෙහෝවා දෙවියි.[10] ඒ නිසා අද
කිසි කෙනෙක්ව මරන්න එපා”[11] යයි
කීවේය.

**14** පසුව සාමුවෙල් සෙනඟට
මෙසේ කීවේය. “එන්න, අපි ගිල්ගාල්
නුවරට[12] යමු. එහිදී අපි සාවුල්ගේ
රජකම ස්ථිර කරමු.”[13] **15** එබැවින්
සෙනඟ ගිල්ගාල් වෙතට ගොස් යෙ-
හෝවා දෙවි ඉදිරියේ සාවුල්ව රජ-
කමට පත් කළෝය. පසුව ඔවුහු
යෙහෝවා දෙවි ඉදිරියේ හවුල් පූජා
ඔප්පු කළෝය.[14] සාවුල්ද ඊශ්‍රායෙල්හි
සියලු පුරුෂයෝද බොහෝ සෙයින්
ප්‍රීති වූවෝය.[15]

**12** පසුව සාමුවෙල් මුළු ඊශ්‍රා-
යෙල් සෙනඟ අමතා මෙසේ
කීවේය. “මම ඔබ පැවසූ විදිහටම[16]
ඔබව පාලනය කරන්න රජෙකුව පත්
කළා.[17] **2** මා පත් කළ ඒ රජු දැන්
මෙතැන ඉන්නවා.[18] මගේ පුත්‍රයනුත්

**11 පරි.**
1 ද්වි 23:3
2 විනි 16:21; 2රාජා 25:7
3 හිතෝ 18:3
4 විනි 3:9
5 1සාමු 10:26; 1සාමු 14:2
6 විනි 2:4; විනි 21:2; 1සාමු 30:4
7 විනි 3:10; විනි 6:34; විනි 11:29; විනි 14:6; 1සාමු 10:10; 1සාමු 16:13
8 නික් 11:8; නික් 32:19; රෝම 12:9
9 විනි 19:29
10 විනි 21:5
11 උත් 35:5; 2ලේක 14:14; 2ලේක 17:10
12 1ලේක 14:17
13 විනි 20:8
14 1සාමු 13:15

**2 තීරුව**
1 ගීතා 18:17
2 1සාමු 11:3
3 1සාමු 9:16
4 විනි 7:16; විනි 9:43; හිතෝ 24:6
5 නික් 14:24
6 1සාමු 11:1
7 ද්වි 28:7; ගීතා 21:8; ගීතා 21:12
8 1සාමු 10:27; හිතෝ 24:21
9 හිතෝ 25:5; ලූක් 19:27
10 1සාමු 19:5; 1ලේක 11:14; ගීතා 44:7; යෙසා 59:16
11 2සාමු 19:22; හිතෝ 20:28; රෝම 12:19
12 1සාමු 7:16
13 1සාමු 10:17; 1සාමු 10:24
14 ලෙවී 7:11; 1සාමු 10:8
15 1රාජා 1:40; 2රාජා 11:14; 1ලේක 12:40; එළි 19:6

**12 පරි.**
16 1සාමු 8:5; 1සාමු 8:21
17 1සාමු 10:24; 1සාමු 11:14
18 ගණන් 27:17; 1සාමු 8:20

සෙනඟ අතරේ ඉන්නවා.[1] මම දැන්
මහලුයි.[2] මගේ හිසකෙසුත් පැහිලා.[3]
තරුණ වයසේ ඉඳන් මේ දක්වාම මම
ඔබට සේවය කළා.[4] **3** මම සේවය
කළ කාලයේදී ඔබට වරදක් කරලා
තියෙනවා නම් ඒ ගැන කියන්න. මම
කාගෙන් හරි ගවයෙක් හෝ බූරුවෙක්
අරගෙන තියෙනවාද?[5] මම කාටවත්
වංචාවක් කරලා තියෙනවාද? පීඩා
කරලා තියෙනවාද? වරදක් දැක
දැකත් මගේ ඇස් කන් පියාගෙන
ඉඳලා තියෙනවාද? මම කාගෙන් හරි
අල්ලසක් ගත්තාද?[6] මම ඒ එක දෙ-
යක් හරි කරලා තියෙනවා නම්
යෙහෝවා දෙවි සහ ඔහුගේ අභි-
ෂේක ලත් තැනැත්තා[7] ඉදිරියේ දැන්
සාක්ෂි දෙන්න. මම මගේ වරදට
වන්දි ගෙවන්නම්."[8] **4** එවිට සෙ-
නඟ මෙසේ කීවෝය. "ඔබ කවදා-
වත් අපිට වංචාවක් හෝ පීඩාවක්
කළේ නැහැ. කාගෙන්වත් අල්ල-
සක් අරගෙනත් නැහැ."[9] **5** එබැවින්
ඔහු ඔවුන්ට මෙසේ කීවේය. "මම
ඔබට කිසි වරදක් කරලා නැති බව[10]
ඔබ අද පිළිගත්තා. යෙහෝවා දෙවි
එයට සාක්ෂිකරුවෙක්. ඔහුගේ අභි-
ෂේක ලත් තැනැත්තාත්[11] සාක්ෂික-
රුවෙක්." එවිට සෙනඟ, "අපි එකඟයි.
ඔහු ඒ දේට සාක්ෂිකරුවෙක්" කියා
පැවසුවෝය.

**6** සාමුවෙල් තවදුරටත් සෙනඟ
අමතා මෙසේ කීවේය. "ඔබේ මුතුන්-
මිත්තන්ව ඊජිප්තු දේශයෙන් පිට-
තට ගෙන ඒමට මෝසෙස්ව සහ
ආරොන්ව පත් කළ[12] යෙහෝවා දෙවි
අද ඔබ පැවසූ මේ දෙයට සාක්ෂිකරු-
වෙක් වෙයි. **7** මා දැන් කියන්න
යන දේට සවන් දෙන්න. ඔබ වෙනු-
වෙනුත් ඔබේ මුතුන්මිත්තන් වෙනු-
වෙනුත් යෙහෝවා දෙවි කළ සෑම
ධර්මිෂ්ඨ ක්‍රියාවක්[13] ගැනම මම ඔබට
මතක් කර දෙන්නම්. ඔබ කළ වැරදි
යෙහෝවා දෙවි ඉදිරියේ දැන් මම
ඔබට කියා දෙන්නම්.

**8** "යාකොබ් ඊජිප්තු දේශයට
පැමිණි පසු[14] ඔබේ මුතුන්මිත්තන්
යෙහෝවා දෙවිගෙන් උපකාර ඉල්ලා
කන්නලව් කළා.[1] එවිට යෙහෝවා
දෙවි මෝසෙස්ව[2] හා ආරොන්ව ඔවුන්
වෙතට යැව්වා. ඔහු එසේ කළේ
ඔබේ මුතුන්මිත්තන්ව ඊජිප්තු දේශ-
යෙන් පිටතට ගෙනැවිත් මේ දේශයේ
පදිංචි කරවීමටයි.[3] **9** නමුත් ඔවුන්-
ගේ දෙවි වන යෙහෝවාව ඔවුන්
අමතක කළා.[4] එවිට හාෂෝර්හි හමු-
දාපති වන සීසෙරාගේ[5] අතටත් පිලිස්-
තිවරුන්ගේ[6] අතටත් මෝවබ් රජුගේ[7]
අතටත් දෙවි ඔවුන්ව භාර දුන්නා.*[8]
ඔවුන් සියලුදෙනා ඊශ්‍රායෙල් සෙනඟට
විරුද්ධව සටන් කළා. **10** එවිට සෙ-
නඟ යෙහෝවා දෙවිට කන්නලව් කර-
මින්[9] මෙසේ පැවසුවා. 'යෙහෝවා
දෙවියනි, අපි ඔබව අත්හැර බාල් රූප-
වලටත්[10] අෂ්ටොරෙත් රූපවලටත්[11]
නමස්කාර කළා. අපි කළේ පාප-
යක්.[12] අනේ දෙවියනි, අපේ සතු-
රන්ගේ අතින් අපිව ගලවාගන්න.[13]
අපි ඔබට නමස්කාර කරන්නම්.'
**11** පසුව යෙහෝවා දෙවි යෙරුබ්-
බාල්වද[14] බෙදාන්වද යෙප්තාවද[15]
සාමුවෙල්වද[16] එවා ඔබව වට කර සිටි
ඔබේ සතුරන්ගේ අතින් ඔබව ගල-
වාගත්තා. ඒ නිසා ඔබට සුරක්ෂි-
තව ජීවත් වෙන්න පුළුවන් වුණා.[17]
**12** නමුත් අම්මොන්වරුන්ගේ රජු
වන නාහාෂ්[18] ඔබට විරුද්ධව නැඟී
සිටි විට, 'අපිව පාලනය කරන්න
රජෙක්ව පත් කළ යුතුමයි'[19] කියා
ඔබ මට පෙරැත්ත කළා. ඔබේ දෙවි
වන යෙහෝවා ඔබේ රජුව සිටි-
යදීත්[20] ඔබ එසේ ඉල්ලා සිටියා.
**13** දැන් ඔබ ඉදිරියේ සිටින්නේ ඔබ
තෝරාගත් ඒ රජුයි.[21] ඔබ ඉල්ලූ
ලෙසම යෙහෝවා දෙවි ඔබව පාල-
නය කිරීමට රජෙකුව පත් කළා.[22]
**14** ඔබ යෙහෝවා දෙවිට ගරුබිය
දක්වමින්[23] ඔහුට අවංකව සේවය

**12 පරි.**
**1** 1සාමු 8:3; එස 18:20
**2** 1සාමු 8:1
**3** ගීතා 71:18; හිතෝ 16:31; හිතෝ 20:29; යෙසා 46:4
**4** 1සාමු 3:19; ගීතා 99:6
**5** ගණන් 16:15
**6** ද්වි 16:19
**7** 1සාමු 9:16; 1සාමු 10:1; 1සාමු 24:6; 2සාමු 1:14; ක්‍රියා 4:27; ක්‍රියා 10:38
**8** නික් 22:4; ලෙවී 6:4; ලූක් 19:8
**9** ගීතා 37:6; දානි 6:4; 1තිමෝ 3:2
**10** ගීතා 17:3; ගීතා 37:37; යොහ 18:38; ක්‍රියා 20:33; 1තෙස 2:5
**11** 1සාමු 26:11
**12** නික් 6:26; නෙහෙ 9:14; ගීතා 77:20; ගීතා 105:26; හොෂෙ 12:13; මීකා 6:4
**13** විනි 5:11
**14** උත් 46:6; ගණන් 20:15; ක්‍රියා 7:15

**2 තීරුව**
**1** නික් 2:23; නික් 3:9
**2** නික් 3:10
**3** යොෂු 1:2; යොෂු 11:23; ගීතා 44:3
**4** ද්වි 32:18; විනි 2:12; ගීතා 106:39
**5** විනි 4:2
**6** විනි 10:7; විනි 13:1
**7** විනි 3:12
**8** ද්වි 32:30; විනි 2:14
**9** විනි 2:18; විනි 3:9; විනි 6:7
**10** විනි 3:7
**11** විනි 2:13
**12** විනි 10:10
**13** විනි 10:15
**14** විනි 6:32
**15** විනි 11:1
**16** හෙබ්‍රෙ 11:32
**17** ලෙවී 26:6; ගීතා 4:8
**18** 1සාමු 11:1
**19** 1සාමු 8:5; 1සාමු 8:19

---

**20** ද්වි 33:5; විනි 8:23; 1සාමු 8:7; ගීතා 74:12; යෙසා 33:22; **21** 1සාමු 8:5; **22** 1සාමු 9:16; 1සාමු 10:24; හොෂෙ 13:11; **23** ද්වි 10:12; ද්වි 17:19.

---

1සාමු **12:9*** මූ.අ., "වික්කා."

කරන්න.[1] යෙහෝවා දෙවිට විරුද්ධව
කැරලි නොගසා[2] ඔහුගේ ආඥාවලට
කීකරු වෙන්න.[3] ඔබ එසේ කළොත්
යෙහෝවා දෙවි ඔබවත් ඔබව පාල-
නය කරන ඔබේ රජුවත් අත්හරින්නේ
නැහැ.* **15** නමුත් ඔබ යෙහෝවා
දෙවිගේ ආඥාවලට අකීකරු වෙමින්[4]
යෙහෝවා දෙවිට විරුද්ධව කැරලිගැ-
සුවොත්[5] යෙහෝවා දෙවි ඔබටත්
ඔබේ පියවරුන්ටත් විරුද්ධව ක්‍රියා
කරන බව නම් ස්ථිරයි.[6] **16** දැන්
යෙහෝවා දෙවි ඔබ ඉදිරියේ පුදුම
ක්‍රියාවක් සිදු කරයි. **17** මේ තිරිඟු
කපන කාලයයි.[7] නමුත් මම දැන් යෙ-
හෝවා දෙවිට කන්නලව් කර[8] ගිගු-
රුම් සහිත වැසි වස්සවන්න කියා
ඔහුගෙන් ඉල්ලා සිටිනවා.[9] රජෙකුව
පත් කරන්න කියා ඔබ කළ ඉල්ලීම
යෙහෝවා දෙවි ඉදිරියේ කොතරම්
දුෂ්ට දෙයක්ද[10] කියා ඔබ එයින් දැන-
ගනීවි.”

**18** ඉන්පසු සාමුවෙල් වැසි වස්සන
ලෙස යෙහෝවා දෙවිට කන්නලව්
කළේය.[11] යෙහෝවා දෙවිද එදින
ගිගුරුම් සහිතව වැසි වහින්න
සැලැස්වූවේය.[12] එය දුටු සෙනඟට
යෙහෝවා දෙවි කෙරෙහිද සාමු-
වෙල් කෙරෙහිද මහත් බියක් ඇති
විය. **19** ඔවුහු සියල්ලෝම සාමු-
වෙල්ට මෙසේ කීවෝය. “අපි රජෙකුව
ඉල්ලා අපේ පව් තව තවත් වැඩි කර-
ගත්තා. අපි කළේ මහා දුෂ්ට දෙයක්.
අනේ, අපි මැරෙන්න කැමති නැහැ. ඒ
නිසා ඔබේ සේවකයන් වන අපි වෙනු-
වෙන් ඔබේ දෙවි වන යෙහෝවාට
යාච්ඤා කරන්න.”[13]

**20** එවිට සාමුවෙල් ඔවුන්ට මෙසේ
කීවේය. “භය වෙන්න එපා.[14] ඔබ මේ
දුෂ්ට දේවල් කළ බව ඇත්තයි. නමුත්
දැන් ඔබේ මුළු සිතින්ම යෙහෝවා
දෙවිට නමස්කාර කරන්න.[15] යෙ-
හෝවා දෙවිව අත් නොහැර[16] දිගටම
ඔහුට නමස්කාර කරන්න. **21** කිසි
වැදගැම්මකට නැති දෙවිවරුන් පස්-
සේ යන්න එපා.[1] ඔවුන්ට බැහැ
ඔබව ගලවාගන්න. ඔවුන්ගෙන් ඔබට
කිසි ප්‍රයෝජනයක් නැහැ.[2] මන්ද
ඔවුන් බොරු දෙවිවරුන්. **22** යෙ-
හෝවා දෙවි ඔහුගේ ශ්‍රේෂ්ඨ නාමය
අවමානයට ලක් වෙන්න කිසිදා ඉඩ-
හරින්නේ නැහැ.[3] ඒ නිසා ඔහු ඔහුගේ
සෙනඟව අත්හරින්නේ නැති බව
ස්ථිරයි.[4] මන්ද ඔහුගේ සෙනඟ හැටි-
යට ඔබව තෝරාගත්තේ යෙහෝවා
දෙවිමයි.[5] **23** මම ඔබ වෙනුවෙන්
යාච්ඤා නොකළොත්[6] එය යෙහෝවා
දෙවිට විරුද්ධව කරන වරදක්. එවැනි
දෙයක් මට කොහොමටවත් කරන්න
බැහැ. ඒ නිසා ඔබ යා යුතු හරි
මඟ[7] මම කියා දෙන්නම්.[8] **24** ඔබ
යෙහෝවා දෙවිට ගරුබිය දැක්විය
යුතුයි.[9] ඔබ වෙනුවෙන් ඔහු කළ
පුදුම දේවල්[10] කිසිදා අමතක නොකර
ඔබේ මුළු සිතින් ඔහුට නමස්කාර
කරන්න.[11] සැමදා ඔහුට විශ්වාස-
වන්තව* සිටින්න. **25** නමුත් ඔබ
මුරණ්ඩු වී දිගින් දිගටම දුෂ්ටකම්
කළොත් ඔබත් ඔබේ රජුත්[12] විනාශ
වන බව නම් නිසැකයි.”[13]

**13** සාවුල් රජකම් කරන්න
පටන්ගත් විට[14] ඔහුට වයස
අවුරුදු . . . ක්* විය. ඔහු ඊශ්‍රා-
යෙල්හි අවුරුදු දෙකක් රජකම්
කළේය. **2** සාවුල් රජ ඊශ්‍රායෙල්ව-
රුන් අතරින් පුරුෂයන් තුන්දහසක්
තෝරාගත්තේය. ඔවුන්ගෙන් දෙදහ-
සක් සාවුල් රජු සමඟ මික්මාෂ්හිද[15]
බෙතෙල් නම් කඳුකර ප්‍රදේශයේද
සිටියෝය. ඔවුන්ගෙන් දහසක් යො-
නාතාන්[16] සමඟ බෙන්ජමින්වරුන්-
ගේ දේශයේ තිබූ ගිබෙයා නුවරේ[17]
සිටියෝය. ඔහු ඉතුරු මනුෂ්‍යයන්ව
තම තමාගේ නිවෙස්වලට පිටත්

**12 පරි.**
**1** ද්වි 6:13, යොෂු 24:14
**2** ගණන් 14:9, යොෂු 22:29
**3** ද්වි 13:4, ද්වි 28:2
**4** ලෙවී 26:14, ද්වි 28:15
**5** යොෂු 24:20
**6** ලෙවී 26:17, ගණන් 33:56, ද්වි 28:45
**7** හිතෝ 26:1
**8** 1සාමු 7:9, යාකො 5:16
**9** යාකො 5:17
**10** 1සාමු 8:7, හොෂෙ 13:11
**11** 1රාජා 18:37
**12** 1රාජා 18:1
**13** 1සාමු 7:5, 1සාමු 12:23, හිතෝ 15:8, ක්‍රියා 8:24, යාකො 5:16
**14** නික් 20:20
**15** ද්වි 6:5, මතෙ 22:37
**16** ද්වි 11:16, ද්වි 31:29, යොෂු 23:6, 1සාමු 12:15

**2 තීරුව**
**1** ද්වි 32:21, යෙරෙ 2:5, යෙරෙ 2:11, 1කොරි 8:4
**2** ගීතා 115:5, යෙරෙ 10:15, යෙරෙ 16:19, හබ 2:18
**3** යොෂු 7:9, ගීතා 23:3, ගීතා 106:8, යෙරෙ 14:21, එස 20:14
**4** 1රාජා 6:13, ගීතා 94:14, රෝම 11:1
**5** නික් 19:5, ද්වි 7:7, ද්වි 14:2, ද්වි 32:9, යෙසා 43:21
**6** රෝම 1:9, කොලො 1:9, 2තිමෝ 1:3
**7** 1රාජා 8:36, 2ලේක 6:27
**8** ගීතා 34:11, හිතෝ 4:11
**9** 1සාමු 12:14, ගීතා 111:10, දේශ 12:13
**10** ද්වි 10:21
**11** ද්වි 10:12
**12** ද්වි 28:36

**13** යොෂු 24:20; **13 පරි.** **14** ක්‍රියා 13:21; **15** 1සාමු 14:5; යෙසා 10:28; **16** 1සාමු 18:1; 2සාමු 1:4; 2සාමු 21:7; **17** යොෂු 18:28; 1සාමු 10:26; 1සාමු 15:34.

**1සාමු 12:14*** මූ.අ., “ඔබත් ඔබේ රජත් යෙහෝවා දෙවිගේ අනුගාමිකයන් වනු ඇත.”

**1සාමු 12:24*** මූ.අ., “සැබෑකමින්.” **13:1*** මුල් හෙබ්‍රෙව් පිටපතේ අවුරුදු ගණන සඳහන් වී නැත.

කර යැව්වේය. **3** පසුව යොනා-
තාන් ගෙබාහි[1] සිටි පිලිස්තිවරුන්ගේ[2]
හමුදා භටයන්ට[3] පහර දී ඔවුන්ව
මරා දැමුවේය. මේ ගැන පිලිස්තිව-
රුන්ට ආරංචි විය. පසුව සාවුල්
රජ මුළු දේශය පුරා හොරණෑව
පිඹින[4] ලෙස අණ කරමින් මෙසේ
කීවේය. "හෙබ්‍රෙව්වරුන්ට මේ ගැන
දන්වන්න." **4** එවිට සියලු ඊශ්‍රා-
යෙල්වරුන්ට මෙසේ දන්වනු ලැබීය.
"සාවුල් රජු පිලිස්තිවරුන්ගේ භට පිරි-
සකට පහර දී ඔවුන්ව මරා දැමූ නිසා
දැන් පිලිස්තිවරුන් ඊශ්‍රායෙල්වරුන්ට
වෛර කරනවා."[5] එය දැන්වූ පසු ගිල්-
ගාල්හි[6] සිටි සාවුල් රජු වෙතට සෙ-
නඟව රැස් කළෝය.

**5** පිලිස්තිවරුද ඊශ්‍රායෙල්වරුන්ට
විරුද්ධව සටන් කිරීමට සූදානම්
වූහ. අශ්ව රථ[7] තිස්දහසක්ද* අස-
රුවන් හයදහසක්ද මුහුදු වෙරළේ
වැලි මෙන්[8] ගණන් කළ නොහැකි
මිනිසුන් පිරිසක්ද ඔවුහු රැස් කර-
ගත්තෝය. ඉන්පසු ඔවුහු බෙත්-
ආවෙන්ට[9] නැඟෙනහිරෙන් පිහිටි
මික්මාෂ්හි කඳවුරු බැඳගත්තෝය.
**6** ඊශ්‍රායෙල්වරු ඉතා දුෂ්කර තත්-
වයකට මුහුණ දෙමින් සිටියෝය.
තමන් අනතුරේ සිටින බව[10]
තේරුම්ගත් ඔවුහු ගුහාවලද[11] කඳු
අතරේද පර්වතවලද උමංවලද වළ-
වල්වලද සැඟවුණෝය. **7** හෙබ්‍රෙව්-
වරු යොර්දාන් ගඟෙන් එගොඩ වී[12]
ගාද්[13] හා ගිලියද් දක්වාද ගියෝය.
නමුත් සාවුල් රජ ගිල්ගාල්හි රැඳී
සිටියේය. ඔහු සමඟ ගිය සෙනඟ
මහත් සේ බියට පත්ව සිටියෝය.[14]
**8** සාමුවෙල් කී ලෙස සාවුල් රජ දවස්
හතක් ඔහු එන තෙක් බලා සිටි-
යේය.[15] නමුත් සාමුවෙල් ගිල්ගාල්
වෙතට පැමිණියේ නැත. සෙනඟද
එතැනින් විසිර යෑමට පටන්ගත්-
තෝය. **9** එවිට සාවුල් රජ මෙසේ
කීවේය. "දවන පූජාව හා හවුල් පූජා
මා ළඟට ගෙනෙන්න." ඉන්පසු ඔහු
දවන පූජාව ඔප්පු කළේය.[1]

**10** සාවුල් රජු දවන පූජාව ඔප්පු
කර අවසන් වෙනවාත් සමඟම
සාමුවෙල් එතැනට ආවේය. එවිට
සාවුල් රජ ඔහු ළඟට ගොස් ඔහුට
ආචාර කළේය.[2] **11** සාමුවෙල් ඔහු-
ගෙන් මෙසේ ඇසුවේය. "ඔබ මොන-
වාද මේ කළේ?"[3] එවිට සාවුල් රජ
මෙසේ පැවසුවේය. "පිලිස්තිවරු අපිට
විරුද්ධව මික්මාෂ්හි කඳවුරු බැඳ-
ගෙන ඉන්නවා.[4] සෙනඟ මාව අත්-
හැර යන්න පටන්ගත්තා.[5] ඔබත්
එනවා කියා කියූ දවසේ ආවේ නැහැ.[6]
**12** මම යෙහෝවා දෙවිගේ අනුමැතිය
දිනාගන්න ඉස්සෙල්ලා පිලිස්තිවරු
ඇවිත් මාත් එක්ක සටන් කරයි කියා
මට හිතුණා.[7] ඒ නිසා මමම දවන
පූජාව ඔප්පු කළා.[8] මට කරන්න
වෙන දෙයක් තිබුණේ නැහැ."

**13** එවිට සාමුවෙල් සාවුල් රජුට
මෙසේ කීවේය. "ඔබ ක්‍රියා කර
තියෙන්නේ මෝඩ විදිහටයි![9] යෙ-
හෝවා දෙවි ඔබට දුන් ආඥාව ඔබ
කඩ කළා.[10] ඔබ දෙවිගේ ආඥාව
පැවැත්වුවා නම්[11] යෙහෝවා දෙවි
ඔබේ රජකම ස්ථිර කර බොහෝ
කාලයකට ඊශ්‍රායෙල්වරුන්ව පාල-
නය කරන්න ඔබටත් ඔබෙන්
පැවතෙන්නන්ටත් ඉඩ දෙන බව
ස්ථිරයි. **14** නමුත් ඔබ යෙහෝවා
දෙවිගේ ආඥාව කඩ කළ නිසා[12]
ඔබේ රාජ්‍යය වැඩි කල් පවතින්නේ
නැහැ.[13] යෙහෝවා දෙවි ඔහුගේ සිත
සතුටු කරන කෙනෙකුව තෝරග-
නියි.[14] යෙහෝවා දෙවි ඔහුගේ සෙ-
නඟ පාලනය කරන්න පත් කරන්නේ
ඒ තැනැත්තාවයි."[15]

**15** පසුව සාමුවෙල් ගිල්ගාල් වෙ-
තින් පිටත්ව බෙන්ජමින්වරුන්ගේ දේ-
ශයේ තිබෙන ගිබෙයා වෙතට ගියේය.
සාවුල් රජ ඔහු සමඟ සිටි මිනිසුන්ව

---

**1සාමු 13:5*** සෙප්ටුඅජින්ට් පරිවර්තනයේ සමහර අත්පිටපත්වල හා සිරියැක් පෙෂිටා පරිවර්තනයේ සඳහන් වන්නේ, "තුන්දහසක්" කියායි.

**14** 1සාමු 16:1; 2සාමු 7:15; ගීතා 78:70; ගීතා 89:20; ක්‍රියා 13:22; **15** උත් 49:10; 2සාමු 5:2; 2සාමු 7:8; 1ලේක 28:4.

**13 පරි.**

**1** යොෂු 18:24
යොෂු 21:17
සෙක 14:10
**2** යොෂු 13:2
1සාමු 9:16
**3** 1සාමු 10:5
2සාමු 23:14
**4** විනි 3:27
විනි 6:34
2සාමු 2:28
2සාමු 20:1
**5** උත් 34:30
නික් 5:21
**6** යොෂු 5:9
1සාමු 7:16
1සාමු 11:14
**7** ද්වි 20:1
**8** උත් 22:17
යොෂු 11:4
විනි 7:12
**9** යොෂු 7:2
යොෂු 18:12
1සාමු 14:23
**10** ද්වි 4:30
**11** ද්වි 20:3
1සාමු 14:11
**12** ලෙවී 26:36
**13** ගණන් 32:1
යොෂු 13:24
**14** 1සාමු 10:26
හිතෝ 24:10
**15** 1සාමු 10:8

**2 තීරුව**

**1** 1සාමු 15:11
1සාමු 15:22
1සාමු 15:23
ගීතා 37:7
හිතෝ 11:2
හිතෝ 13:10
හිතෝ 21:24
**2** උත් 47:7
රූත් 2:4
1සාමු 15:13
1සාමු 25:14
**3** යොෂු 7:19
රෝම 14:12
**4** 1සාමු 13:5
**5** ද්වි 20:1
1සාමු 13:6
**6** 1සාමු 13:8
**7** හිතෝ 3:5
හිතෝ 14:12
හිතෝ 19:21
**8** හිතෝ 11:2
හිතෝ 21:24
මීකා 6:8
**9** හිතෝ 13:21
දේශ 7:17
යෙරෙ 5:4
**10** 1සාමු 10:8
1සාමු 15:11
**11** ගීතා 119:4
දේශ 12:13
1යොහ 5:3
**12** 1සාමු 10:8
යෙරෙ 7:23
යෙරෙ 11:7
**13** ද්වි 17:20
1සාමු 15:28

ගණන් කළේය. ඔහු සමඟ මිනි-
සුන් හයසියයක් පමණ සිටියෝය.[1]
16 සාවුල් රජද ඔහුගේ පුත් යොනා-
තාන්ද ඔහු සමඟ රැඳී සිටි මිනි-
සුන්ද බෙන්ජමින්වරුන්ගේ දේශයට
අයත් ගෙබා නුවරේ[2] සිටියෝය.
පිලිස්තිවරු කඳවුරු බැඳ සිටියේ
මික්මාෂ්හිය.[3] 17 කොල්ලකරුවෝ
කණ්ඩායම් තුනකට බෙදී[4] පිලිස්තිව-
රුන්ගේ කඳවුරේ සිට නික්ම ආවෝය.
එක් කණ්ඩායමක් ඔෆ්රා නගරයට[5]
යන මාර්ගයෙන් ෂුවාල් නම් පළාත
දෙසට ගියේය. 18 අනික් කණ්ඩා-
යම බෙත්-හෝරොන්[6] වෙතට යන
මාර්ගයේ ගමන් කළේය. තුන්වෙනි
කණ්ඩායම ෂෙබෝයිම් නිම්නය හා
පාළුකරයට ඉහළින් තිබෙන දේශ
සීමාවට යන මාර්ගයේ ගියේය.

19 "හෙබ්‍රෙව්වරු කඩුවක්වත්
හෙල්ලයක්වත් නොසෑදිය යුතුයි"
කියා පිලිස්තිවරු පවසා තිබූ
නිසා ඊශ්‍රායෙල් දේශයේ කොතැන-
කවත් කම්හල්කරුවෙක් නොසිටි-
යේය.[7] 20 සෑම ඊශ්‍රායෙලිතයෙක්ම
තම තමන්ගේ නගුල් තලද උද-
ලුද පොරෝද දෑකැතිද මුවහත්
කරගැනීම[8] සඳහා පිලිස්තිවරුන් වෙ-
තට ගියෝය. 21 ඔවුහු කෙවිටක්[9]
සකස් කිරීමට එසේත් නැත්නම්
නගුල් තලයක් හෝ උදැල්ලක් හෝ
මුල්ලුවක් හෝ පොරොවක් හෝ මුව-
හත් කිරීමට රිදී ග්‍රෑම් අටක්* අය
කළෝය. 22 සටනට නික්ම යන
විට සාවුල් රජුට[10] සහ ඔහුගේ පුත්‍රයා
වන යොනාතාන්ට හැර ඔවුන් සමඟ
සිටි වෙන කිසිවෙකුට කඩුවක්වත්[11]
හෙල්ලයක්වත් තිබුණේ නැත.

23 පිලිස්තිවරුන්ගේ මුර හමුදා-
වක්[12] මික්මාෂ් කඳුකරයේ[13] පිහිටි
දුෂ්කර ස්ථානය වෙත ගියේය.

**14** දිනක් සාවුල් රජුගේ පුත්‍රයා
වූ යොනාතාන්[14] තමාගේ
ආයුධ රැගෙන ගිය සේවකයාට මෙසේ
කීවේය. "අපි දෙන්නා එහා පැත්තේ
තියෙන පිලිස්තිවරුන්ගේ මුරපොළ
ළඟට යමු." නමුත් ඔහු ඒ ගැන තම
පියාට නොකීවේය.[1] 2 ඒ කාලයේ
සාවුල් රජ ගිබෙයාහි[2] දේශ සීමාව
අසල තිබුණු මිග්‍රොන්හි දෙළුම් ගස
යට සිටියේය. ඔහු සමඟ මිනිස්සු
හයසියයක් පමණ සිටියෝය.[3] 3 (ඒ
දවස්වල ඒෆොද් හැට්ටය[4] ඇඳ සිටි-
යේ අහියාය. අහියා, ඊකාබොද්ගේ[5]
සහෝදරයා වූ අහිතුබ්ගේ[6] පුත්‍රයා විය.
අහිතුබ්ගේ පියා පිනෙහාස්ය.[7] පිනෙ-
හාස්ගේ පියා, යෙහෝවා දෙවි ඉදිරියේ
පූජකයෙකු ලෙස ෂීලෝහි[8] සේවය
කළ ඒලීය.)[9] යොනාතාන් තමන් සිටි
ස්ථානයෙන් පිටත්ව ගිය බව සෙනඟද
දැනගෙන සිටියේ නැත. 4 පිලිස්ති-
වරුන්ගේ මුරපොළට[10] යෑමට යොනා-
තාන් මාර්ගයක් සෙව්වේය. ඒ මාර්ග
දෙපස උල් පර්වත දෙකක් තිබිණ.
ඉන් එක් පර්වතයක් බෝෂෙෂ් ලෙ-
සද අනික සෙනේ ලෙසද හඳුන්වනු
ලැබීය. 5 එක් පර්වතයක් උතුරේ
පිහිටා තිබිණ. මික්මාෂ්[11] නම් ස්ථාන-
යට ඉදිරියෙන් පිහිටි එම පර්වතය
කණුවක් මෙන් දිස් විය. ගෙබාට[12]
මුහුණ ලා තිබුණු අනික් පර්වතය
දකුණු දෙසින් පිහිටා තිබිණ.

6 එබැවින් යොනාතාන් ඔහුගේ
ආයුධ රැගෙන ගිය සේවකයාට මෙසේ
කීවේය. "අපි දෙන්නා අර අචර්මච්ඡේ-
දිතයන්ගේ[13] මුරපොළ ළඟට යමු.
යෙහෝවා දෙවිට අවශ්‍ය නම් දෙතුන්-
දෙනෙක් මාර්ගයෙන් වුණත් ගැලවීම
ලබා දෙන්න පුළුවන්. විශාල හමුදා-
වක් අවශ්‍ය නැහැ. ඒ නිසා යෙ-
හෝවා දෙවි අපිට උදව් කරන්න
ඉඩ තියෙනවා."[14] 7 එවිට ඔහුගේ
ආයුධ දරන්නා ඔහුට මෙසේ කීවේය.
"ඔබ කැමති ඕනෑම දෙයක් කරන්න.
ඔබට හොඳයි කියා හිතෙන පාරේ අපි
යමු. මම ඔබ කියන ඕනෑම දෙ-
යක් කරන්න සූදානම්."[15] 8 එවිට
යොනාතාන් මෙසේ කීවේය. "අපි
ඒ පැත්තට ගිහින් අපේ සතුරන්ට
අපිව දැකගන්න පුළුවන් තැනක ඉමු.

---

**1සාමු 13:21*** මූ.අ., "පිම් එකක්." එනම්, ෂෙකෙලයකින් තුනෙන් දෙකක් පමණ.

**13 පරි.**
1 1සාමු 13:7, 1සාමු 14:2
2 යොෂු 18:24, 1සාමු 13:3
3 1සාමු 13:2, යෙසා 10:28
4 1සාමු 11:11
5 යොෂු 18:23
6 යොෂු 10:11, යොෂු 18:13, 1ලේක 6:68, 2ලේක 8:5
7 2රාජා 24:14
8 උත් 4:22, හිතෝ 27:17
9 විනි 3:31
10 1සාමු 9:16
11 විනි 7:20, 1සාමු 17:47, 1සාමු 17:50, ගීතා 44:3, සෙක 4:6
12 1සාමු 14:4
13 1සාමු 13:2, 1සාමු 14:5, යෙසා 10:28

**14 පරි.**
14 1සාමු 13:22, 1සාමු 14:49, 1සාමු 18:1, 2සාමු 1:4, 2සාමු 21:7

**2 තීරුව**
1 විනි 14:6
2 1සාමු 10:26
3 1සාමු 13:15
4 නික් 29:5, ගණන් 27:21
5 1සාමු 4:21
6 1සාමු 22:9
7 1සාමු 2:12, 1සාමු 4:17
8 යොෂු 18:1, 1සාමු 1:3
9 1සාමු 1:9
10 1සාමු 13:23
11 1සාමු 13:2
12 1සාමු 13:3
13 උත් 17:10, විනි 14:3, විනි 15:18, 1සාමු 17:36, 2සාමු 1:20, 1ලේක 10:4, යෙරෙ 9:26
14 විනි 7:2, 2රාජා 6:16, 2ලේක 14:11, ගීතා 115:11, හෙබ්‍රෙ 11:33
15 2රාජා 10:15, හිතෝ 17:17

**9** ‘අපි නුඹලා ළඟට එනකම් ඔතැන
ඉන්න’ කියා ඔවුන් කිව්වොත් අපි
කිසිවක් නොකර එතැනට වී ඉමු.
**10** නමුත්, ‘සටනට එන්න’ කියා
ඔවුන් කිව්වොත් යෙහෝවා දෙවි
සතුරන්ව අපේ අතට හසු කර දෙන
බවට එය ලකුණක්.[1] එහෙම කිව්-
වොත් අපි ඔවුන්ට පහර දෙමු.”
**11** පසුව ඔවුහු පිලිස්තිවරුන්ගේ
මුර හමුදාවට පෙනෙන සේ සිටි-
යෝය. එවිට පිලිස්තිවරු මෙසේ
කීවෝය. “අන්න, ගුහාවල හැංගිලා
හිටිය හෙබ්‍රෙව්වරු දැන් එළියට
ඇවිල්ලා!”[2] **12** ඉන්පසු මුරපොළේ
සිටි හටයෝ යොනාතාන්ට සහ ඔහු-
ගේ ආයුධ දරන්නාට මෙසේ කීවෝය.
“සටනට එන්න. අපි නුඹලාට හොඳ
පාඩමක් උගන්වන්නම්!”[3] එවිට යො-
නාතාන්, “අපි ඔවුන්ට පහර දෙමු.
යෙහෝවා දෙවි නිසැකවම ඊශ්‍රා-
යෙල්වරුන්ගේ අතට ඔවුන්ව හසු
කර දෙයි”[4] කියා ඔහුගේ සේවක-
යාට කීවේය. **13** යොනාතාන් දණ
ගාගෙන කඳු බෑවුම දිගේ ඔවුන් වෙ-
තට ගියේය.[5] ඔහුගේ ආයුධ දරන්නාද
ඔහු පිටුපසින් ගියේය. යොනාතාන්[6]
පිලිස්තිවරුන්ට පහර දුන් අතර ඔහු-
ගේ පිටුපසින් සිටි ආයුධ දරන්නාද
ඔවුන්ට පහර දී ඔවුන්ව මරා දැමු-
වේය.[7] **14** යොනාතාන් සහ ඔහුගේ
ආයුධ දරන්නා සටන් කළ බිම් කො-
ටසේ විශාලත්වය අක්කර භාගයක්
පමණ විය. ඔවුහු මුල් වතාවේදී මිනි-
සුන් විසිදෙනෙකුව පමණ ඝාතනය
කළෝය.

**15** එළිමහනේ තිබූ කඳවුරේ හා
මුරපොළේ සිටි සියලුදෙනා මෙන්ම
කොල්ලකරුවන්ගේ කණ්ඩායමද[8]
බොහෝ සෙයින් කැලඹුණෝය.[9]
පොළොවද දෙදරන්න පටන්-
ගත්තේය.[10] මෙසේ දෙවි ඔවුන් අත-
රේ මහත් කැලඹීමක් ඇති කළේය.[11]
**16** පිලිස්තිවරුන්ගේ කඳවුරේ සිටි
සියලුදෙනාම මහත් සේ වියවුලට
පත්ව[12] සිටින බව බෙන්ජමින්වරුන්-
ගේ දේශයට අයත් ගිබෙයාහි[13] සිටි
සාවුල් රජුගේ මුරකරුවෝ දුටුවෝය.

**17** එවිට සාවුල් රජ, “සෙනඟ
ගණන් කර කිසිවෙකු අඩුද කියා
බලන්න” යයි තමා සමඟ සිටි අයට
කීවේය. සෙනඟ ගණන් කර බැලූ
විට යොනාතාන් සහ ඔහුගේ ආයුධ
දරන්නා එහි නොසිටි බව පෙනී
ගියේය. **18** එවිට සාවුල් රජ අහි-
යාට[1] මෙසේ කීවේය. “සැබෑ දෙ-
විගේ ගිවිසුම් පෙට්ටිය[2] මෙතැනට
ගෙනෙන්න.” (එදින සැබෑ දෙවි-
ගේ ගිවිසුම් පෙට්ටිය ඊශ්‍රායෙල් සෙ-
නඟ අතරේ තිබිණ.)[3] **19** සාවුල්
රජු පූජකයා සමඟ කතා කරමින්
සිටියදී[4] පිලිස්තිවරුන්ගේ කඳවුරේ
තිබූ වියවුල්සහගත තත්වය තව
තවත් වැඩි විය. එවිට සාවුල් රජ
පූජකයාට, “ඔබ කරන්න යන දේ
නතර කරන්න” කියා පැවසුවේය.
**20** ඉන්පසු සාවුල් රජ තමා සමඟ
සිටි සියලුදෙනාව කැඳවාගෙන සට-
නට ගියේය.[5] ඔවුහු සටන් බිමට
පැමිණි විට පිලිස්තිවරුන් එක් එක්
කෙනා තම තමාගේ සහෝදරයාට
විරුද්ධව සටන් කරමින් සිටින බව
ඔවුහු දුටුවෝය.[6] එදින පිලිස්ති-
වරු අන්ත පරාජයක් අද්දුටුවෝය.
**21** කලින් පිලිස්තිවරුන්ට එකතු වී[7]
කඳවුරේ විසිරී සිටි හෙබ්‍රෙව්වරුන්
පවා සාවුල් රජු හා යොනාතාන්ගේ
පැත්තේ සිටි ඊශ්‍රායෙල්වරුන්ට සහය
දුන්නෝය. **22** පිලිස්තිවරුන් පලා
ගිය බව දැනගත් විට එෆ්‍රායිම් කඳු-
කරයේ සැඟවී සිටි ඊශ්‍රායෙල්වරුද[8]
පිලිස්තිවරුන් පසුපස හඹා ගොස්
ඔවුන්ට පහර දුන්නෝය. **23** ඔවුහු
බෙත්-ආවෙන්[9] දක්වාම සටන් කර-
මින් ගියෝය. එදින යෙහෝවා දෙවි
ඊශ්‍රායෙල්වරුන්ට ගැලවීම අත් කර
දුන්නේය.[10]

**24** ඊශ්‍රායෙල්වරු බොහෝ වෙහෙ-
සට පත්ව සිටියෝය. නමුත් ඒ
අවස්ථාවේ සාවුල් රජ දිවුරා පො-
රොන්දුවක් දෙමින්[11] සෙනඟට මෙසේ
නියෝග කළේය. “මගේ සතුරන්ට
පහර දී මම ඔවුන්ව පරාජයට පත්

**14 පරි.**
**1** උත් 24:14
විනි 7:11
1සාමු 10:7
**2** 1සාමු 13:6
1සාමු 14:22
**3** 1සාමු 14:10
1සාමු 17:44
2රාජා 14:8
**4** 1සාමු 14:6
2සාමු 5:24
2රාජා 6:16
හිතෝ 3:5
හිතෝ 16:3
**5** ගීතා 18:29
හෙබ්‍රෙ 11:34
**6** 2සාමු 1:23
**7** ලෙවී 26:7
යොෂු 23:10
ගීතා 44:3
රෝම 8:31
**8** 1සාමු 13:17
**9** විනි 7:21
2රාජා 7:6
**10** නික් 19:18
නාහු 1:5
මතෙ 27:51
ක්‍රියා 16:26
**11** උත් 35:5
ගීතා 48:5
ආනි 5:6
**12** විනි 7:22
1සාමු 14:20
2ලේක 20:23
**13** 1සාමු 10:26
1සාමු 14:2

**2 තීරුව**
**1** 1සාමු 14:3
**2** නික් 25:22
**3** 1සාමු 4:3
1සාමු 5:2
1සාමු 7:1
**4** ගණන් 27:21
**5** ගණන් 10:9
**6** විනි 7:22
2ලේක 20:23
යෙසා 19:2
එස 38:21
**7** විනි 15:11
**8** 1සාමු 13:6
1සාමු 14:11
**9** 1සාමු 13:5
**10** ද්වි 33:29
විනි 2:18
2රාජා 19:34
ගීතා 17:7
ගීතා 44:7
යෙසා 63:8
හොෂෙ 1:7
1තිමෝ 4:10
**11** ලෙවී 5:4
ගණන් 30:2
විනි 21:1
හිතෝ 20:25
දේශ 5:6

කරන තෙක්[1] කිසිවෙකු කෑම නොකෑ
යුතුයි. යමෙක් හවස් වෙන්න කලින්
කෑවොත් ඔහු ශාප ලද්දෙක් වේවා!"
එබැවින් කිසිවෙක් කෑම කෑවේ නැත.[2]
**25** පසුව මුළු සෙනඟ කැලෑවට
ගියෝය. කැලෑවේ සෑම තැන-
කම මීවද[3] පෙනෙන්න තිබුණේය.
**26** ඒවායින් මීපැණි[4] වෑස්සෙන බව
දුටුවද කිසිවෙක් එහි රස බැලුවේ
නැත. මන්ද සාවුල් රජු දුන් දිවුරුම
නිසා ඔවුහු එහි රස බැලීමට භය
වූවෝය.[5] **27** එහෙත් සාවුල් රජුගේ
දිවුරුම ගැන නොදැන සිටි[6] යොනා-
තාන් තම අතේ තිබූ සැරයටියෙන්
මීපැණි ටිකක් ගෙන එහි රස බැලු-
වේය. එවිට ඔහු යළි ප්‍රාණවත් විය.*[7]
**28** එය දුටු මිනිසෙක් ඔහුට මෙසේ
කීවේය. "ඔබේ පියා සෙනඟට කෑම
කන්න එපා කියා දැඩි නියෝගයක්
පැනෙව්වා. 'අද කවුරු හරි කෑම
කෑවොත් ඔහු ශාප ලද්දෙක් වේවා'[8]
කියා ඔහු ප්‍රකාශ කළා." (සෙනඟ වෙ-
හෙසට පත්ව සිටියෝය.)[9] **29** එවිට
යොනාතාන් මෙසේ කීවේය. "මගේ
පියා මේ සෙනඟට කරලා තියෙන්නේ
මොන අපරාධයක්ද![10] මීපැණි ටික කෑ
ගමන්ම මගේ ඇඟට මෙච්චර ශක්-
තියක් ලැබුණා නම්[11] **30** කොල්ල
කා ගත් දේවලින්[12] සෙනඟට කන්න
දුන්නා නම් අද අපිට කොයි තරම්
ලොකු ජයග්‍රහණයක් ලබාගන්න තිබු-
ණාද![13] අපට මීට වඩා විශාල සෙ-
නඟක් මරලා දාන්න තිබුණා."[14]
**31** ඔවුහු එදින මික්මාෂ්හි[15] සිට
ආයාලොන් නුවර[16] දක්වා යමින්
පිලිස්තිවරුන්ට පහර දී ඔවුන්ව මරා
දැමුවෝය. ඒ අවස්ථාව වන විට
සෙනඟ බොහෝ සෙයින් වෙහෙ-
සට පත්ව සිටියෝය.[17] **32** එබැවින්
ඔවුහු තමන් කොල්ල කා ගත්[18] බැට-
ළුවන්, ගවයන් හා වස්සන් මතට
කඩා පැන උන්ව බිම පෙරළා මරා-
ගෙන ඉතා කෑදර ලෙස ලේත් සමඟම
උන්ගේ මස් කෑවෝය.[19] **33** පසුව
සාවුල් රජුට මෙසේ දන්වනු ලැබිය.
"සෙනඟ යෙහෝවා දෙවිගේ නීතිය
කඩ කරන හැටි බලන්න! ඔවුන් ලේ
සමඟම මස් කනවා."[1] එවිට ඔහු
මෙසේ පැවසුවේය. "ඔබ ඇයි මෙ-
වැනි පාපයක් කරන්නේ? දැන් මා
ළඟට ලොකු ගලක් අරගෙන එන්න."
**34** පසුව සාවුල් රජ මෙසේ කීවේය.
"සෙනඟට මෙහෙම කියන්න. 'ගව-
යන් හා බැටළුවන් මා ළඟට අර-
ගෙන එන්න. උන්ව මෙතැනදී මරලා
කන්න. ලේ සමඟ මස් කන්න එපා.
එහෙම කළොත් ඒක යෙහෝවා දෙ-
විට විරුද්ධව කරන පාපයක්.' "[2] එදින
රාත්‍රියේ සියලුදෙනාම තමන් කොල්ල
කා ගත් ගවයන් එතැනට ගෙනැවිත්
මැරුවෝය. **35** සාවුල් රජ එතැනදී
යෙහෝවා දෙවිට පූජාසනයක් ගොඩ-
නැඟුවේය.[3] එය ඔහු යෙහෝවා දෙවිට
ගොඩනැඟූ පළමුවෙනි පූජාසනයයි.[4]
**36** පසුව සාවුල් රජ මෙසේ
කීවේය. "අපි අද රෑට පිලිස්තිවරුන්
ඉන්න තැනට ගිහින් ඔවුන් සියලුදෙ-
නාව මරලා දාමු.[5] එළිය වැටෙන
තුරු[6] ඔවුන්ගේ බඩු කොල්ල කමු."
එවිට සෙනඟ, "ඔබට හොඳයි කියා
හිතෙන ඕනෑම දෙයක් කරන්න" යයි
කීවෝය. නමුත් පූජකයා, "අපි සැබෑ
දෙවිගෙන් මේ ගැන විමසා බලමු"[7]
යයි කීවේය. **37** එබැවින් සාවුල් රජ
දෙවිගෙන් මෙසේ විමසුවේය. "මම
පිලිස්තිවරුන් පසුපස ලුහුබැඳ යන්-
නද?[8] ඔබ ඊශ්‍රායෙල්වරුන්ගේ අතට
ඔවුන්ව යටත් කර දෙනවද?"[9] නමුත්
එදින දෙවි ඔහුට පිළිතුරු දුන්-
නේ නැත.[10] **38** එබැවින් සාවුල් රජ
මෙසේ කීවේය. "සෙනඟ අතරේ සිටින
ප්‍රධානියෙනි,[11] මෙතැනට එන්න.[12]
අද මේ වගේ දෙයක් සිද්ධ වුණේ
කාගේ පාපයක් නිසාද කියා සොයා
බලන්න. **39** වරද කළ තැනැත්තා
කවුරු වුණත් ඔහුව මරා දැමිය යුතුයි.
ඒ වරද කළේ මගේ පුත් යොනාතාන්
වුණත් මම ඒ දඬුවමින් ඔහුව නිදහස්
කරන්නේ නැහැ කියලා ඊශ්‍රායෙල්ව-
රුන්ගේ ගැලවුම්කරු හා ජීවමාන

**14 පරි.**
**1** යොෂු 10:13, විනි 11:36, විනි 16:28
**2** ද්වි 23:21, විනි 8:5, 2සාමු 17:29, ගීතා 15:4
**3** ද්වි 8:8, ද්වි 27:3, යොෂු 5:6
**4** නික් 3:8, ලෙවී 20:24, ගණන් 13:27, මතෙ 3:4
**5** ගීතා 15:4
**6** 1සාමු 14:17
**7** 1සාමු 30:12
**8** 1සාමු 14:24
**9** විනි 8:4, 2සාමු 17:29
**10** 1රාජා 18:18
**11** 1සාමු 14:27
**12** ද්වි 20:14
**13** 1සාමු 14:26, ක්‍රියා 9:19
**14** දේශ 9:18
**15** 1සාමු 13:2
**16** යොෂු 10:12, යොෂු 19:42
**17** විනි 8:5, යෙසා 44:12
**18** ද්වි 20:14, 1සාමු 15:19
**19** උත් 9:4, ලෙවී 3:17, ලෙවී 17:10, ද්වි 12:16, එස 33:25, ක්‍රියා 15:29

**2 තීරුව**
**1** ද්වි 12:23, ද්වි 15:23
**2** 1සාමු 14:32
**3** 1සාමු 7:17, 2සාමු 24:18, 2සාමු 24:25
**4** උත් 4:26
**5** ද්වි 7:2, ද්වි 7:16
**6** යොෂු 10:9, 1සාමු 11:11, යෙරෙ 6:5
**7** ගණන් 27:21, 1සාමු 30:7, ගීතා 65:4, ගීතා 73:28, මලා 2:7
**8** විනි 1:1, 1සාමු 30:8, 2සාමු 5:19, හිතෝ 3:5
**9** ගණන් 27:21
**10** 1සාමු 28:6, ගීතා 66:18, යෙසා 1:15, එස 20:3
**11** විනි 20:2
**12** යොෂු 7:14, 1සාමු 10:19

1සාමු **14:27*** මු.අ., "ඔහුගේ දෑස් දීප්තිමත් විය."

දෙවි වන යෙහෝවාගේ නමින් මම
දිවුරලා කියනවා."[1] නමුත් කිසි-
වෙක් ඔහුට පිළිතුරු දුන්නේ නැත.
**40** එබැවින් ඔහු නැවතත් ඔවුන්ට
කතා කරමින් මෙසේ කීවේය. "සිය-
ලුදෙනාම එක පැත්තකට යන්න.
මාත් යොනාතානුත් විතරක් අනික්
පැත්තට යන්නම්." එවිට සෙනඟ,
"ඔබට හොඳයි කියලා හිතෙන දෙයක්
කරන්න"[2] කියා සාවුල් රජුට කීවෝය.

**41** පසුව සාවුල් රජ යෙහෝවා දෙ-
විට මෙසේ කීවේය. "අනේ ඊශ්‍රා-
යෙල්හි දෙවියනි, තුම්මීම්[3] ලවා අපට
පැහැදිලි උත්තරයක් දෙන්න." එවිට
සෙනඟ අතරින් සාවුල් රජුව හා
යොනාතාන්ව තෝරාගනු ලැබීය.[4]
**42** ඉන්පසු සාවුල් රජ, "වරදක-
රුවා මමද නැත්නම් මගේ පුත්
යොනාතාන්ද කියා හරියටම දැන-
ගන්න ආදු දමන්න"[5] කියා පැවසු-
වේය. ඒ අවස්ථාවේදී වරදකරු ලෙස
තෝරාගනු ලැබුවේ යොනාතාන්වයි.
**43** එවිට සාවුල් රජ යොනාතාන්-
ගෙන් මෙසේ ඇසුවේය. "ඔබ මොන-
වද කළේ?"[6] යොනාතාන් මෙසේ
පිළිතුරු දුන්නේය. "මම මගේ සැරය-
ටියෙන් මීපැණි ටිකක් අරගෙන රස
බැලුවා.[7] මා කළ වරදට දැන් මාව
මරලා දාන්න."

**44** සාවුල් රජද, "ඔබව මරා දැමු-
වේ නැත්නම්[8] දෙවිගෙන් මට දඬුවම්
ලැබේවා"[9] කියා කීවේය. **45** නමුත්
සෙනඟ සාවුල් රජුට මෙසේ කීවෝය.
"ඊශ්‍රායෙල්වරුන්ට මේ මහත් ගැලවීම
අත් කර දුන්[10] යොනාතාන්ව මරලා
දාන්නේ කොහොමද? එය කවදා-
වත් අපිට කරන්න බැරි දෙයක්.[11]
යොනාතාන්ගේ එක කෙස්ගහක්වත්
බිම වැටෙන්න ඉඩ දෙන්නේ නැහැ[12]
කියලා ජීවමාන දෙවි වන යෙහෝවා-
ගේ නමින් අප ස්ථිරවම කියා සිටි-
නවා.[13] ඔහු අද මේ ජයග්‍රහණය
ලැබුවේ දෙවිගේ උපකාරයෙන්."[14]
මෙසේ යොනාතාන්ට ලැබිය යුතු
දඬුවමින් සෙනඟ ඔහුව බේරාගත්-
තෝය.[15]

**46** එබැවින් සාවුල් රජ පිලිස්-
තිවරුන්ව ලුහුබැඳීම අත්හැරියේය.
පිලිස්තිවරුද තම තමන්ගේ වාසස්-
ථාන වෙතට හැරී ගියෝය.[1]

**47** සාවුල් රජ තම සියලු සතු-
රන්ට විරුද්ධව සටන් කරමින්
ඊශ්‍රායෙල් දේශය පුරා තම රජ-
කම ස්ථිර කරගත්තේය.[2] අවට සිටි
මෝවබ්වරුන්ටද[3] අම්මොන්වරුන්-
ටද[4] ඒදොම්වරුන්ටද[5] ෂොබාහි[6] රජ-
වරුන්ටද පිලිස්තිවරුන්ටද[7] විරුද්ධව
ඔහු සටන් කළේය. ඔහු ගිය
සෑම තැනකම සිටි තම සතුරන්ව
යටත් කරගෙන ඔවුන්ට දඬුවම් නියම
කළේය.[8] **48** ඔහු දිගින් දිගටම එඩි-
තරව ක්‍රියා කළේය.[9] ඔහු අමලෙක්ව-
රුන්ට[10] පහර දී කොල්ලකරුවන්
අතින් ඊශ්‍රායෙල්වරුන්ව ගලවාගත්-
තේය.

**49** සාවුල් රජුගේ පුත්‍රයෝ නම්
යොනාතාන්,[11] ඉෂ්වී සහ මල්කී-
ෂුවාය.[12] ඔහුට දූවරු දෙදෙනෙක්ද
සිටියෝය. වැඩිමල් දියණියගේ නම
මේරබ්ය.[13] බාල දියණියගේ නම
මීකල්ය.[14] **50** සාවුල් රජුගේ භාර්-
යාවගේ නම අහිනොවම්ය. ඇය අහි-
මයාෂ්ගේ දියණිය විය. සාවුල් රජුගේ
හමුදාපති ඔහුගේ මාමා වන අබ්-
නේර්[15] විය. අබ්නේර් නේර්ගේ පුත්‍ර-
යාය. **51** සාවුල්ගේ පියා කීෂ්ය.[16]
අබ්නේර්ගේ පියා වන නේර්[17] අබි-
යෙල්ගේ පුත්‍රයාය.

**52** සාවුල් රජ බලසම්පන්න හෝ
එඩිතර හෝ පුරුෂයෙකු දුටු විට
ඔහුව තම හමුදාවට බඳවාගත්-
තේය.[18] සාවුල් රජු ජීවත් වූ සියලු
දවස්වලදී පිලිස්තිවරුන්ට විරුද්ධව
දරුණු සටන් පැවතිණ.[19]

**15** සාමුවෙල්, සාවුල් රජුට
මෙසේ කීවේය. "යෙහෝවා
දෙවි තම සෙනඟ වන ඊශ්‍රායෙල්ව-
රුන්ගේ රජු හැටියට ඔබව අභි-
ෂේක කරන්න[20] පත් කළේ මාවයි.

**14 පරි.**
**1** ද්්ශ 5:2
**2** 2සාමු 15:15; ද්්ශ 8:4
**3** නික් 28:30; ලෙවී 8:8; ද්වි 33:8; එස්රා 2:63
**4** යොෂු 7:16; 1සාමු 10:21
**5** හිතෝ 16:33; යෝනා 1:7
**6** යොෂු 7:19
**7** 1සාමු 14:27
**8** උත් 38:24; 1සාමු 14:24; 2සාමු 12:5; යාකො 2:13
**9** රූත් 1:17; 1සාමු 3:17; 1සාමු 25:22; 2සාමු 3:9; 2සාමු 19:13
**10** 1සාමු 11:13; 1සාමු 14:14; 1සාමු 19:5; නෙහෙ 9:27
**11** උත් 44:7; යොෂු 22:29
**12** 1රාජා 1:52; ලූක් 21:18; ක්‍රියා 27:34
**13** 1සාමු 19:6; 1සාමු 28:10
**14** 1සාමු 14:6
**15** යෝබ් 6:23

**2 තීරුව**
**1** ගණන් 33:55; විනි 2:3
**2** 1සාමු 13:1
**3** 1සාමු 12:9
**4** ද්වි 2:19; 1සාමු 11:11
**5** උත් 36:8; උත් 36:43; මලා 1:4
**6** 2සාමු 10:6; 1රාජා 11:23
**7** 1සාමු 9:16
**8** යොෂු 13:1; යොෂු 23:10
**9** 2සාමු 1:23
**10** නික් 17:14; ද්වි 25:19; 1සාමු 15:3
**11** 1සාමු 13:2; 1සාමු 14:1; 1ලේක 9:39
**12** 1සාමු 31:2; 1ලේක 8:33
**13** 1සාමු 18:17
**14** 1සාමු 18:27; 1සාමු 25:44; 2සාමු 3:13; 2සාමු 6:20
**15** 1සාමු 17:55; 2සාමු 2:8; 2සාමු 3:27
**16** 1සාමු 9:1; 1ලේක 9:39; ක්‍රියා 13:21
**17** 1රාජා 2:5; **18** 1සාමු 8:11; 1සාමු 10:26; **19** උත් 49:27; 1සාමු 9:16; **15 පරි.** **20** 1සාමු 9:16; 1සාමු 10:1.

යෙහෝවා දෙවි කියන දේට
දැන් සවන් දෙන්න.[1] **2** ස්වර්ගයේ
සේනාවල අධිපති[2] වන යෙහෝවා
දෙවි මෙසේ පැවසුවා. 'ඊශ්‍රා-
යෙල්වරු ඊජිප්තුවෙන් පිටතට එන
විට අමලෙක්වරු ඔවුන්ට විරුද්-
ධව නැඟී සිටි නිසා[3] මම දැන්
ඔවුන්ට දඬුවම් කරන්නෙමි.[4] **3** ඔබ
අමලෙක්වරුන්ට පහර දී[5] ඔවුන්වද
ඔවුන්ට අයිති සියලු දේද සහමුලින්ම
විනාශ කළ යුතුයි.[6] ඔවුන්ට කිසිම
අනුකම්පාවක් නොපෙන්වන්න. ඔබ
ඔවුන් සියලුදෙනාවම මරා දමන්න.[7]
පුරුෂයන්වද ස්ත්‍රීන්වද දරුවන්වද
ළදරුවන්වද[8] ඔවුන්ගේ ගවයන්වද
බැටළුවන්වද ඔටුවන්වද බූරුවන්-
වද විනාශ කර දමන්න.' "[9] **4** පසුව
සාවුල් රජ, තෙලායිම්[10] නම් ස්ථාන-
යේදී මිනිසුන්ව එක් රැස් කර ඔවුන්ව
ගණන් කළේය. පාබළ හමුදාවේ
මනුෂ්‍යයෝ දෙලක්ෂයක් සිටියෝය.
යූදා ගෝත්‍රයට අයත් මනුෂ්‍යයෝ
දසදහසක් සිටියෝය.[11]
**5** සාවුල් රජ අමලෙක්වරුන්ගේ
නුවර දක්වා ගොස් ඒ අසල තිබූ නිම්-
නයේ සැඟවී සිටියේය. **6** ඔහු එහි
සිටි කේනිවරුන්ට[12] මෙසේ කීවේය.
"ඊජිප්තුවෙන් පිටත්ව එන විට[13]
ඔබ ඊශ්‍රායෙල් සෙනඟට ප්‍රේමණී-
යව* සැලකුවා.[14] ඒ නිසා අම-
ලෙක්වරුන්ව විනාශ කරන්න කලින්
ඔබ මෙහෙන් යන්න.[15] නැත්නම්
ඔබත් ඔවුන් සමඟ විනාශ වෙයි.
ඒ නිසා ඔබ මෙතැනින් පිටත්ව
යන්න." එබැවින් කේනිවරු අම-
ලෙක්වරුන් අතරින් ඉවත්ව ගියෝය.
**7** ඉන්පසු සාවුල් රජ, හවිලා[16] සිට
ඊජිප්තු දේශයට යාබදව පිහිටි ෂූර්[17]
දක්වා අමලෙක්වරු[18] පසුපස ලුහු-
බැඳ ගොස් ඔවුන්ට පහර දුන්නේය.
**8** සාවුල් රජ අමලෙක්වරුන්ගේ රජු
වන ආගග්ව[19] අල්ලාගත්තේය. අන්
සියලුදෙනාවම ඔහු කඩුවෙන් මරා
දැමුවේය.[20] **9** සාවුල් රජද ඊශ්‍රා-
යෙල් සෙනඟද ආගග්ට අනුකම්පාව
පෙන්වමින් ඔහුව නොමරන්න තීර-
ණය කළෝය. එමෙන්ම එළු හා ගව
රැළේ හොඳ තර සතුන්වද බැටළුවන්-
වද මරා දැමීමට ඔවුහු අකමැති
වූහ.[1] ප්‍රයෝජනයට ගත හැකි සියලු
දේද ඔවුහු විනාශ නොකළෝය.[2]
නමුත් කිසි වටිනාකමක් නැති සෑම
දෙයක්ම ඔවුහු සහමුලින්ම විනාශ
කළෝය.
**10** පසුව යෙහෝවා දෙවි සාමු-
වෙල්ට මෙසේ කීවේය. **11** "සාවුල්
මා පැවසූ ලෙස කළේ නැත.[3] ඔහු
මාව අත්හැර තිබේ.[4] ඔහුව රජක-
මට පත් කිරීම ගැන මම
කනගාටු වෙමි."[5] මෙය ඇසූ විට
සාමුවෙල් බොහෝ සෙයින් දුක් වී[6]
මුළු රාත්‍රියේම හඬමින් යෙහෝවා
දෙවිට ඒ ගැන යාච්ඤා කළේය.[7]
**12** සාමුවෙල් පසුවදා උදෑසනින්ම
අවදි වී සාවුල් රජුව හමු වීමට පිටත්ව
ගියේය. ඒ අතරතුර සාමුවෙල්ට මේ
ආරංචිය ලැබිණ. "සාවුල් රජු, කර්-
මෙල්[8] වෙත ඇවිත් ඔහුගේ නමින්
ස්මාරකයක් ඉදි කළා.[9] ඊටපස්සේ
ඔහු නැවත ගිල්ගාල් වෙත ගියා."
**13** ඉන්පසු සාමුවෙල්, සාවුල් රජු
සිටි ස්ථානයට පැමිණියේය. සාමු-
වෙල් පැමිණි විට සාවුල් රජ ඔහුට
මෙසේ කීවේය. "යෙහෝවා දෙවිගෙන්
ඔබට ආශීර්වාද ලැබේවා![10] යෙ-
හෝවා දෙවි පැවසූ දේ මම කළා."[11]
**14** නමුත් සාමුවෙල්, "එහෙනම් මට
මේ එළුවන්, බැටළුවන් සහ ගවයන්
කෑගසන ශබ්දයක් ඇහෙන්නේ කො-
හොමද"[12] කියා ඔහුගෙන් ඇසුවේය.
**15** එවිට සාවුල් රජ මෙසේ කීවේය.
"ඒ කෑගහනවා ඇහෙන්නේ අමලෙක්-
වරුන්ගේ සත්ව රැළේ හිටිය හොඳම
එළුවන්, බැටළුවන් සහ ගවයන්.
උන්ව මරන්න සෙනඟ කැමති වුණේ
නැහැ.[13] ඔබේ දෙවි වන යෙහෝවාට

**15 පරි.**
**1** ද්වි 17:20; 1සාමු 12:14; දේශ 12:13
**2** 2සාමු 7:26
**3** නික් 17:8; ගණන් 24:20; ද්වි 25:17; ද්වි 25:18
**4** උත් 12:3; සෙක 2:8
**5** නික් 17:14; ද්වි 25:19; 1ලේක 4:43
**6** ලෙවී 27:28; ලෙවී 27:29; 1සාමු 15:18
**7** ද්වි 9:3
**8** නික් 20:5; යෙසා 14:21
**9** ද්වි 13:17; යොෂු 6:18
**10** යොෂු 15:24
**11** 1සාමු 11:8; 1සාමු 13:15
**12** ගණන් 10:29; ගණන් 10:32; ගණන් 24:21; විනි 1:16; විනි 4:11
**13** ද්වි 5:15; ද්වි 16:3
**14** උත් 12:3; නික් 18:9; නික් 18:12; ගණන් 10:29; හෙබ්‍රෙ 6:10
**15** උත් 18:25; උත් 19:12; ගණන් 16:26; 1රාජා 20:31; හිතෝ 20:28
**16** උත් 25:18
**17** උත් 16:7; 1සාමු 27:8
**18** ද්වි 25:19; 1සාමු 14:48
**19** 1සාමු 15:33
**20** ලෙවී 27:29; 1සාමු 15:3

**2 තීරුව**
**1** ලෙවී 27:28; යොෂු 7:12; 1සාමු 13:9; හිතෝ 11:2; හිතෝ 14:12; හිතෝ 21:24
**2** යෙරෙ 48:10
**3** 1සාමු 13:13; 1සාමු 15:3
**4** ගීතා 36:2; ගීතා 125:5; දේශ 4:13; මලා 3:7
**5** උත් 6:6; 1සාමු 15:26; 1සාමු 15:35; යෙරෙ 18:8
**6** 1සාමු 16:1; ගීතා 119:136
**7** ගීතා 55:2

**8** යොෂු 15:55; 1සාමු 25:2; **9** 2සාමු 18:18; ගීතා 49:11; හිතෝ 8:13; හිතෝ 15:25; **10** 1සාමු 13:10; **11** හිතෝ 12:15; හිතෝ 18:17; හිතෝ 26:12; **12** 1සාමු 15:3; ගීතා 36:2; **13** උත් 3:12; නික් 32:22; 1සාමු 15:21.

**1සාමු 15:6*** හෝ, "ළැදි ප්‍රේමයකින්."

පූජා ලෙස ඔප්පු කරන්නයි උන්ව
තියාගත්තේ.[1] අනික් සෑම දෙයක්ම
අපි සම්පූර්ණයෙන්ම විනාශ කළා.”
**16** එවිට සාමුවෙල්, සාවුල් රජුට
මෙසේ කීවේය. “ඔය කතාව දැන්
නවත්වගන්න! ඊයේ රෑ යෙහෝවා
දෙවි මට පැවසූ දේ[2] දැන් මම
ඔබට කියන්නම්.” එවිට සාවුල් රජ,
“කියන්න” යයි කීවේය.

**17** සාමුවෙල් මෙසේ කීවේය. “ඔබ
කිසි වැඩකට නැති කෙනෙක්
කියා ඔබම සිතූ වෙලාවක[3] නො-
වෙයිද ඔබව ඊශ්‍රායෙල්හි ගෝත්‍ර-
වල නායකයා හැටියට පත්
කළේ? යෙහෝවා දෙවි ඔබව ඊශ්‍රා-
යෙල්හි රජු හැටියට අභිෂේක කළේ[4]
ඔබ එවැනි තත්වයක සිටින විට
නොවේද? **18** පසුව යෙහෝවා දෙවි
ඔබට මෙසේ පැවසුවා. ‘ඔබ පව්කාර
අමලෙක්වරුන්ව සහමුලින්ම විනාශ
කරන්න.[5] ඔවුන් සියලුදෙනාම විනාශ
වෙන තෙක් ඔවුන්ට විරුද්ධව සටන්
කරන්න.’[6] **19** එහෙමනම් ඇයි ඔබ
යෙහෝවා දෙවිගේ වචනයට අකීකරු
වුණේ? කෑදර විදිහට කොල්ල කා
ගත් දේ[7] මතට කඩාපැන ඔබ යෙ-
හෝවා දෙවි ඉදිරියේ මේ වගේ නපුරු
දෙයක් කළේ ඇයි?”[8]

**20** එවිට සාවුල් රජ සාමුවෙල්ට
මෙසේ කීවේය. “මම යෙහෝවා
දෙවි පැවසූ දේට කීකරු වුණා.[9]
යෙහෝවා දෙවි මට කියූ විදිහ-
ටම මම අමලෙක්වරුන්ව සම්පූර්ණ-
යෙන්ම විනාශ කළා.[10] මම රැගෙන
ආවේ ඔවුන්ගේ රජු වන ආගග්ව[11]
විතරයි. **21** විනාශ කරන්න නියම
කළ හොඳම බැටළුවන් සහ ගවයන්ව
තියාගත්තේ සෙනඟ.[12] ඔවුන් ගිල්-
ගාල්හිදී[13] ඔබේ දෙවි වන යෙහෝවාට
පූජා ලෙස ඔප්පු කරන්නයි[14] උන්ව
තියාගත්තේ.”

**22** එවිට සාමුවෙල් මෙසේ කීවේය.
“යෙහෝවා දෙවි කැමති තමාට යාග
හා දවන පූජා ඔප්පු කරනවාටද[15]
නැත්නම් තමාට කීකරුකම[16] පෙන්-
වනවාටද? පූජාවලට වඩා කීකරුකම
වටිනවා.[1] බැටළුවන්ගේ තෙලට[2]
වඩා යෙහෝවා දෙවිගේ හඬට සවන්
දීම වටිනවා. **23** කැරලිකාරකම[3]
පේන කීම තරම්ම බරපතළ පාප-
යක්.[4] අහංකාරකම* මන්තර ගුරු-
කම් හා රූපවලට#[5] නමස්කාර කිරීම
තරම්ම දුෂ්ටකමක්. ඔබ යෙහෝවා
දෙවිගේ වචනය ප්‍රතික්ෂේප කළ
නිසා[6] ඔහුද ඔබව ප්‍රතික්ෂේප කර රජ-
කමෙන් පහ කරනවා.”[7]

**24** පසුව සාවුල් රජ සාමුවෙල්ට
මෙසේ කීවේය. “මම කළේ පාප-
යක්.[8] මම සෙනඟට භය වී[9] ඔවුන්-
ගේ කැමැත්තට ඉඩ දුන්නා. ඒ
නිසයි මම ඔබ කියූ විදිහට දේවල්
නොකර යෙහෝවා දෙවිගේ අණ
කඩ කළේ. **25** අනේ, දැන් මාත්
එක්ක එන්න. ඔබ ආවොත් මට යෙ-
හෝවා දෙවි ඉදිරියේ වැඳ වැටී[10] ඔහු-
ගේ අනුමැතිය අයැදින්න පුළුවන්.”[11]
**26** නමුත් සාමුවෙල්, “නැහැ, මම
ඔබ සමඟ එන්නේ නැහැ. ඔබ යෙ-
හෝවා දෙවිගේ වචනය ප්‍රතික්ෂේප
කළා. ඒ නිසා යෙහෝවා දෙවිත්
දැන් ඔබව ප්‍රතික්ෂේප කර ඊශ්‍රා-
යෙල්හි රජකමෙන් ඔබව පහ කර-
නවා”[12] කියා සාවුල් රජුට කීවේය.
**27** සාමුවෙල් පිටත්ව යන්න හැරුණු
විට සාවුල් රජ ඔහුව නවත්වන්න
උත්සාහ කරමින් ඔහු ඇඳ සිටි
අත් නැති සළුවෙන් ඇද්දේය. එවිට
සළුව ඉරී ගියේය.[13] **28** සාමුවෙල්,
සාවුල් රජුට මෙසේ කීවේය. “යෙ-
හෝවා දෙවි අද ඊශ්‍රායෙල්හි රාජ්‍ය-
යද ඔබේ අතින් උදුරාගන්නවා.*[14]
ඔහු ඔබට වඩා යහපත් කෙනෙකුට
රාජ්‍යය භාර දෙයි.[15] **29** ඊශ්‍රායෙල්හි

**15 පරි.**
**1** 1ලේක 28:9; හිතෝ 28:13
**2** 1සාමු 15:10
**3** 1සාමු 9:21; 1සාමු 10:22
**4** 1සාමු 9:16; 1සාමු 10:1
**5** 1සාමු 15:3; යෝබ් 31:3; හිතෝ 10:29; හිතෝ 13:21
**6** ද්වි 25:19
**7** ද්වි 13:17; 1සාමු 15:9; හිතෝ 28:20; එෆී 5:5
**8** 1සාමු 15:24
**9** හිතෝ 21:29; හිතෝ 28:14
**10** ද්වි 7:16; 1සාමු 15:3
**11** ලෙවී 27:29; 1රාජා 20:42; යෙරෙ 48:10
**12** නික් 32:22; 1සාමු 15:15
**13** 1සාමු 13:4
**14** දේශ 5:1
**15** ගීතා 50:8; යෙසා 1:11; මීකා 6:6
**16** යෙරෙ 7:23; යෙරෙ 38:20

**2 තීරුව**
**1** හිතෝ 21:3; හොෂෙ 6:6; මාක් 12:33
**2** ලෙවී 3:16
**3** ගණන් 14:9; ද්වි 9:7; 1සාමු 12:15
**4** ලෙවී 20:6; ද්වි 18:10; 1සාමු 28:3; 1ලේක 10:13; යෙසා 8:19
**5** උත් 31:19; උත් 31:30; 2රාජා 23:24
**6** 1සාමු 15:3
**7** 1සාමු 13:14; 1සාමු 16:1; 1ලේක 28:9; ක්‍රියා 13:22
**8** 1සාමු 2:25; 2කොරි 7:10; යාකො 4:17
**9** හිතෝ 29:25; යෙසා 51:12
**10** 1සාමු 15:30
**11** 1සාමු 2:25
**12** ද්වි 17:20; 1සාමු 12:25; 1සාමු 13:14; 1සාමු 16:1
**13** 1රාජා 11:30
**14** 1රාජා 11:31

**15** 1සාමු 13:14; 1සාමු 16:12; 1සාමු 28:17; ක්‍රියා 13:22.

**1සාමු 15:23*** “අහංකාරකම” ලෙස පරිවර්තනය කළ හෙබ්‍රෙව් වචනයට, ක්‍රියාවෙන් හා සිතුවිලිවලින් නුසුදුසු එඩිතරකමක් පෙන්වීම, තමන්ට අයිති නැති දේ කිරීම හා ස්වාධීනව කටයුතු කිරීම යන අදහසද ඇතුළත්ය. **23#** මූ.අ., “ටෙරෆිම්.” එනම්, පවුලේ දෙවිවරුන් හෝ රූප. **28*** මූ.අ., “ඉරාගන්නවා.”

ශ්‍රේෂ්ඨ තැනැත්තා[1] තමන් කියූ දෙ-
යක් කවදාවත් ඉෂ්ට නොකර ඉන්-
නේ නැහැ.[2] ඔහු තමන් ගත් තීරණ
ගැන පසුතැවෙන්නෙත් නැහැ. පසු-
තැවෙන්න ඔහු මනුෂ්‍යයෙක් නො-
වෙයි.”[3]
**30** එවිට සාවුල් රජ මෙසේ
කීවේය. “මම කළේ පාපයක්.
අනේ, දැන් වැඩිමහල්ලන් ඉදිරියෙත්
මගේ සෙනඟ ඉදිරියෙත් මට ගෞරව
කරන්න.[4] මාත් සමඟ යන්න එන්න.
ඔබ ආවොත් මට යෙහෝවා දෙවි
ඉදිරියේ වැඳ වැටී ඔහුගේ අනුමැ-
තිය අයැදින්න පුළුවන්.”[5] **31** එබැ-
වින් සාමුවෙල් ආපසු හැරී සාවුල් රජු
සමඟ ගියේය. සාවුල් රජද යෙහෝවා
දෙවි ඉදිරියේ වැටී නමස්කාර කළේය.
**32** ඉන්පසු සාමුවෙල්, “අමලෙක්ව-
රුන්ගේ රජු වන ආගග්ව මා ළඟට
ගෙනෙන්න” යයි කීවේය. ආගග්,
සාමුවෙල් වෙතට යෑමට මැළි විය.
නමුත් ඔහුව එතැනට ගෙන ගිය විට,
‘මාව මරන එකක් නැහැ’ කියා
ඔහු සිතුවේය. **33** එහෙත් සාමු-
වෙල්, “ඔබ කඩුවෙන්[6] දරුවන්ව මරා
ඔවුන්ගේ මව්වරුන්ව දුකට පත් කළ
ලෙසම අද ඔබේ මවත්[7] මහත් සේ
දුකට පත් වෙනවා”[8] යයි කියමින්
ආගග්ව කෑලි කෑලිවලට කපා දැමු-
වේය. මෙසේ සාමුවෙල් ගිල්ගාල්හිදී
යෙහෝවා දෙවි ඉදිරියේ ආගග්ව මරා
දැමුවේය.[9]
**34** පසුව සාමුවෙල් රාමා බලා
පිටත් විය. සාවුල් රජද තම නිවස
තිබූ ස්ථානය වන ගිබෙයා[10] වෙත
ගියේය. **35** සාමුවෙල් මිය යන
තෙක්ම නැවත සාවුල්ව දුටුවේ නැත.
මන්ද ඔහු සාවුල් ගැන දුක් වුණේය.[11]
යෙහෝවා දෙවිද සාවුල්ව ඊශ්‍රායෙල්හි
රජු ලෙස පත් කළ බැවින් කනගාටු
විය.[12]

**16** යෙහෝවා දෙවි සාමුවෙල්ට
මෙසේ කීවේය. “ඔබ තව
කොපමණ කාලයක් සාවුල් ගැන
දුක් වෙවී සිටිනවාද?[13] මම ඔහුව
ඊශ්‍රායෙල්හි රජු හැටියට ප්‍රතික්ෂේප
කළෙමි.[1] ඒ නිසා දැන් ඔබේ තෙල්
බඳුන[2] රැගෙන බෙත්ලෙහෙම්හි ජීවත්
වන යෙස්සේ[3] ළඟට යන්න. මන්ද
ඔහුගේ පුත්‍රයන්ගෙන් එක් කෙනෙ-
කුව රජු හැටියට මම තෝරාගත්-
තෙමි.”[4] **2** නමුත් සාමුවෙල් දෙවිට
මෙසේ කීවේය. “අනේ දෙවියනි,
මම කොහොමද එතැනට යන්නේ?
සාවුල්ට ඒ ගැන ආරංචි වුණොත්
ඔහු මාව මරලා දායි.”[5] එවිට යෙ-
හෝවා දෙවි ඔහුට මෙසේ කීවේය.
“ඔබ ගව රැළෙන් වැස්සියක තෝරා-
ගෙන ඌව එතැනට රැගෙන යන්න.
‘මම ආවේ යෙහෝවා දෙවිට පූජාවක්
ඔප්පු කරන්නයි’[6] කියා එහෙ සිටින
අයට කියන්න. **3** ඒ පූජාවට සහ-
භාගි වීමට එන්න කියා යෙස්සේට
දන්වන්න. ඉන්පසු කළ යුතු දේ
කුමක්ද කියා මා ඔබට කියන්නම්.[7]
මා ඔබට කියන තැනැත්තාව ඔබ
අභිෂේක කරන්න.”[8]
**4** සාමුවෙල්, යෙහෝවා දෙවි කී
ලෙස කළේය. ඔහු බෙත්ලෙහෙමට[9]
පැමිණි විට ඒ නුවරේ වැඩිමහල්-
ලෝ ඔහුව දැක භය වී,[10] “ඔබ
අප සමඟ අමනාපයෙන්ද”[11] කියා
ඔහුගෙන් ඇසුවෝය. **5** එවිට ඔහු,
“නැහැ, ඔබ සමඟ මගේ අමනාපයක්
නැහැ. මම ආවේ යෙහෝවා දෙ-
විට පූජාවක් ඔප්පු කරන්න. දැන්
පවිත්‍ර වී[12] මා සමඟ පූජාවට සහ-
භාගි වෙන්න එන්න.” ඔහු යෙස්-
සේව හා ඔහුගේ පුත්‍රයන්ව පවිත්‍ර
කළ පසු පූජාවට සහභාගි වන
ලෙස ඔවුන්ට ආරාධනා කළේය.
**6** එවිට යෙස්සේ සහ ඔහුගේ පුත්‍ර-
යෝ පූජාව ඔප්පු කරන තැනට
පැමිණියෝය. සාමුවෙල් එලියාබ්ව[13]
දුටු විගස, “යෙහෝවා දෙවිගේ අභි-
ෂේක ලත් තැනැත්තා මොහු විය
යුතුයි” කියා තමාටම කියාගත්-
තේය. **7** නමුත් යෙහෝවා දෙවි
සාමුවෙල්ට මෙසේ කීවේය. “ඔහුගේ
පෙනුම දෙසවත් ඔහුගේ උස මහත
දෙසවත් නොබලන්න.[14] මා තෝ-
රාගත් තැනැත්තා ඔහු නොවෙයි.

**15 පරි.**
**1** 1ලේක 29:11
යෝබ් 37:22
යෙසා 43:3
යෙසා 44:6
**2** ගීතා 89:35
තීත 1:2
හෙබ්‍රෙ 6:18
**3** ගණන් 23:19
ගීතා 110:4
එස 24:14
**4** හිතෝ 26:1
**5** 1සාමු 15:25
යෙසා 29:13
මතෙ 15:8
**6** මතෙ 26:52
**7** විනි 5:28
**8** උත් 9:6
ලෙවී 24:17
ද්වි 19:21
විනි 1:7
මතෙ 7:2
**9** නික් 17:14
ද්වි 25:19
1සාමු 15:3
**10** 1සාමු 11:4
**11** 1සාමු 16:1
**12** 1සාමු 15:11

**16 පරි.**
**13** 1සාමු 15:35
දේශ 3:4

**2 තීරුව**
**1** 1සාමු 15:23
1සාමු 15:26
**2** නික් 30:25
1රාජා 1:39
ගීතා 133:2
**3** රූත් 4:17
1ලේක 2:12
යෙසා 11:1
**4** උත් 49:10
1සාමු 13:14
ගීතා 78:70
ගීතා 89:20
ක්‍රියා 13:22
**5** 1සාමු 22:17
**6** 1සාමු 9:12
1සාමු 20:29
මතෙ 10:16
**7** ආමො 3:7
**8** ගීතා 89:20
**9** රූත් 4:11
1සාමු 20:6
**10** 1සාමු 21:1
ලූක් 8:37
**11** 1රාජා 2:13
2රාජා 9:22
**12** නික් 19:10
ලෙවී 11:44
ලෙවී 20:7
**13** 1සාමු 17:28
1ලේක 2:13
**14** 1සාමු 10:23

දෙවි දේවල් දෙස බලන්නේ මනුෂ්‍ය-
යන් බලන ආකාරයට නොවෙයි.[1]
මනුෂ්‍යයන් දකින්නේ පිටතින් පෙ-
නෙන දේ පමණය.[2] නමුත් යෙහෝවා
දෙවි වන මම සිතේ තිබෙන දේ
දකිමි."[3] **8** ඉන්පසු යෙස්සේ අබිනා-
දාබ්ව[4] සාමුවෙල් ඉදිරියට කැඳෙව්-
වේය. නමුත් සාමුවෙල්, "යෙහෝවා
දෙවි ඔහුවත් තෝරාගත්තේ නැහැ"
කියා කීවේය. **9** ඉන්පසු යෙස්සේ
ෂම්මාහ්ව[5] කැඳෙවූ නමුත් සාමුවෙල්,
"නැහැ, යෙහෝවා දෙවි ඔහුවත්
තෝරාගත්තේ නැහැ" කියා පැවසු-
වේය. **10** යෙස්සේ මේ විදිහට තම
පුතුන් හත්දෙනෙකුව සාමුවෙල් ඉදිරි-
යට කැඳෙව්වේය. නමුත්, "යෙහෝවා
දෙවි මේ එක් කෙනෙක්වත් තෝරා-
ගෙන නැහැ" කියා සාමුවෙල් ඔහුට
කීවේය.

**11** පසුව සාමුවෙල් යෙස්සේගෙන්
මෙසේ ඇසුවේය. "ඔබේ පුතුන් සියලු-
දෙනාම මෙතැන ඉන්නවාද?" එවිට
යෙස්සේ, "බාලම පුතා මෙතැන
නැහැ.[6] ඔහු බැටළුවන්ව බලාගන්න
ගිහින්"[7] කියා පැවසුවේය. එය ඇසූ
විට සාමුවෙල්, "ඉක්මනින් කවුරු
හරි යවලා ඔහුව මෙතැනට කැඳ-
වාගෙන එන්න. ඔහු එනකම් අපි
කෑම කන්නේ නැහැ" කියා පැවසු-
වේය. **12** එබැවින් යෙස්සේ ඔහුව
කැඳවාගෙන ඒමට කෙනෙකුව යැව්-
වේය. යෙස්සේගේ බාල පුතා ඉතා
කඩවසම්ය. ඔහුගේ ඇස් ඉතා දීප්-
තිමත් වූ අතර රතට හුරු[8]
සමක්ද ඔහුට තිබිණ. ඔහු එතැ-
නට පැමිණි විට, "දැන් නැඟිට
ඔහුව අභිෂේක කරන්න. මා තෝරා-
ගත් තැනැත්තා ඔහුයි"[9] කියා යෙ-
හෝවා දෙවි සාමුවෙල්ට පැවසුවේය.
**13** එබැවින් සාමුවෙල් තෙල් භාජනය
ගෙන,[10] ඔහුගේ සහෝදරයන් ඉදිරියේ
ඔහුව අභිෂේක කළේය. ඒ මොහො-
තේ සිට යෙහෝවා දෙවිගේ බලය
දාවිත් තුළ ක්‍රියාත්මක වීමට පටන්-
ගත්තේය.[11] පසුව සාමුවෙල් රාමා[12]
බලා පිටත් විය.

**14** යෙහෝවා දෙවි තම බලය
සාවුල් රජුගෙන් ඉවත් කළේය.[1]
සාවුල් රජු තුළ වියවුල්සහගත සිතු-
විලි*[2] ඇති වූ අතර යෙහෝවා දෙ-
විද එයට ඉඩහැරියේය. ඒ නිසා
ඔහු බොහෝ සෙයින් පීඩා වින්දේය.
**15** සාවුල් රජුගේ සේවකයෝ ඔහුට
මෙසේ කීවෝය. "ස්වාමීනි, දෙවි ඔබේ
සිත අවුල් කරලයි තියෙන්නේ. ඔබ
මේ විදිහට පීඩා විඳින්නේ ඒ නිසයි.
**16** දක්ෂ ලෙස වීණාව වාදනය කරන
මිනිසෙකුව[3] සොයා ඔහුව ඔබ ඉදිරි-
යට ගෙනෙන්න කියා අණ කරන්න.
දෙවි ඔබේ සිත අවුල් කරන අවස්ථා-
වලදී වීණාව වාදනය කරමින් ඔබේ
සිත සන්සුන් කරන්න ඔහුට හැකි
වෙයි." **17** එබැවින් සාවුල් රජ ඔහු-
ගේ සේවකයන්ට මෙසේ අණ කළේය.
"හොඳට වීණාව වාදනය කරන්න
පුළුවන් කෙනෙකුව සොයා ඔහුව මා
ළඟට ගෙනෙන්න."[4]

**18** එවිට එතැන සිටි සේවක-
යෙක් ඔහුට මෙසේ කීවේය. "යෙස්-
සේ නම් මිනිසෙක් බෙත්ලෙහෙම්
නුවර ජීවත් වෙනවා. ඔහුගේ එක
පුතෙක් ඉතා මිහිරි ලෙස වීණාව වය-
නවා මම අසා තිබෙනවා.[5] ඔහු
කඩවසම්,[6] නිර්භීත තරුණයෙක්.[7]
ඔහු යුද්ධයට දක්ෂ ශක්තිමත් කෙ-
නෙක්.[8] ඒ වගේම ඔහු දක්ෂ කථි-
කයෙක්.[9] යෙහෝවා දෙවිගේ
ආශීර්වාදයත් ඔහුට තියෙනවා."[10]
**19** සාවුල් රජ පණිවිඩකරුවන්
අත යෙස්සේට මෙසේ දන්වා යැව්-
වේය. "බැටළුවන්ව බලාගන්න ඔබේ
පුත් දාවිත්ව මා ළඟට එවන්න."[11]
**20** එබැවින් යෙස්සේ බූරුවෙකු පිට
රොටිද වයින් භාජනයක්ද*[12] පටවා
ඒවා සමඟ එළු පැටවෙකුද තම පුත්
දාවිත් අතේ සාවුල් රජුට යැව්වේය.[13]
**21** පසුව දාවිත් සාවුල් රජුගේ මාලි-
ගාවට පැමිණ ඔහුට සේවය කළේය.[14]
සාවුල් රජ ඔහුට බොහෝ සෙයින්

**1සාමු 16:14*** ඇතැම්විට භූතයන්ගේ බලපෑමක් විය හැකියි. **20*** මුල් භාෂාවට අනුව වයින් පිරි සම් භාජනයක්.

**16 පරි.**
**1** යෝබ් 10:4 යෙසා 55:8
**2** 2කොරි 5:12 2කොරි 10:7
**3** 1රාජා 8:39 1ලේක 28:9 2ලේක 16:9 ගීතා 7:9 හිතෝ 24:12 යෙරෙ 17:10 ක්‍රියා 1:24
**4** 1සාමු 17:13 1ලේක 2:13
**5** 2සාමු 13:3
**6** 1සාමු 17:14
**7** 2සාමු 7:8 ගීතා 78:70
**8** 1සාමු 17:42 සල 5:10 විලා 4:7
**9** 1සාමු 13:14 1සාමු 16:1 ගීතා 89:20 ක්‍රියා 13:22
**10** 1සාමු 16:1 1රාජා 1:39
**11** ගණන් 11:17 විනි 3:10 1සාමු 10:6 2සාමු 23:2
**12** 1සාමු 1:1 1සාමු 1:19

**2 තීරුව**
**1** 1සාමු 18:12 1සාමු 28:15
**2** 1සාමු 18:10 1සාමු 19:9 යෝබ් 34:11 යෝබ් 34:12 රෝම 2:6 හෙබ්‍රෙ 3:12 යාකො 1:13
**3** උත් 4:21 ගීතා 33:2 හිතෝ 22:29
**4** 1සාමු 8:11
**5** 1සාමු 16:23
**6** 1සාමු 16:12
**7** 1සාමු 14:52 1සාමු 17:36
**8** 1සාමු 17:32 1සාමු 17:46
**9** 1සාමු 26:19 හිතෝ 16:23
**10** 1සාමු 18:12
**11** 1සාමු 17:15 ගීතා 78:70
**12** මතෙ 9:17
**13** 1සාමු 10:27 2ලේක 17:5 හිතෝ 17:8 හිතෝ 18:16
**14** හිතෝ 22:29

ආදරේ විය. ඔහු සාවුල් රජුගේ ආයුධ
දරන්නා ලෙසත් සේවය කළේය.[1]
**22** පසුව සාවුල් රජ යෙස්සේට මෙසේ
දන්වා යැව්වේය. "දාවිත් මගේ හිත
දිනාගත්තා. ඒ නිසා ඔහුට දිගටම
මා සමඟ ඉන්න අවසර දෙන්න."
**23** සාවුල් රජු තුළ වියවුල්සහගත
සිතුවිලි ඇති වීමට දෙවි ඉඩහැරිය
අවස්ථාවලදී දාවිත් වීණාව ගෙන
ඔහු ඉදිරියේ වාදනය කළේය. එවිට
සාවුල් රජුගේ සිත සන්සුන් වී විය-
වුල්සහගත සිතුවිලි ඔහුගෙන් පහව
ගියේය.[2]

**17** පිලිස්තිවරු[3] තමන්ගේ හමු-
දාව රැස් කරගෙන යුද්ධයට
සැරසුණෝය. ඔවුහු යූදා දේශයට
අයිති සෝකෝ නම් ප්‍රදේශයේ[4] එක්
රැස් වී සෝකෝ සහ අෂේකා[5] අතර
තිබූ ඒපෙස්-දම්මිම්[6] නම් ප්‍රදේශයේ
කඳවුරු බැඳගත්තෝය. **2** සාවුල්
රජ සහ ඊශ්‍රායෙල් හමුදාව එක් රැස්
වී පිලිස්තිවරුන්ට විරුද්ධව සටන්
කරන පිණිස ඒලාහ් නම් තැනි-
තලාවේ*[7] කඳවුරු බැඳගත්තෝය.
**3** පිලිස්තිවරු එක් කන්දක රැස්ව
සිටියෝය. ඊශ්‍රායෙල්වරු තවත් කන්-
දක රැස්ව සිටියෝය. එම කඳු දෙක
අතර නිම්නයක් තිබුණේය.
**4** පිලිස්තිවරුන් වෙනුවෙන් සටන්
කිරීමට ගොලියත්[8] නම් මිනිසා ඉදිරි-
යට ආවේය. ඔහු ගාත්හි[9] වැසියෙකි.
ඔහුගේ උස අඩි නවයහමාරක් පමණ
විය.*[10] **5** ඔහු තඹ තොප්පියක් සහ
යුධ ඇඳුමක් පැළඳ සිටියේය. එම
ඇඳුම පුරාම ලෝහ කැබලි අල්ලා
තිබිණ.[11] එහි බර තඹ ෂෙකෙල්
පන්දහසක්* විය. **6** ඔහුගේ පාද-
වල දණහිස් දක්වා තඹ වැස්මක්
තිබිණ. ඔහුගේ පිටේ තඹ හෙල්-
ලයක්ද[12] තිබිණ. **7** ඔහුගේ මහා
හෙල්ලයේ මිට රෙදි විවීම සඳහා
භාවිත කරන පොල්ලක් මෙන් විය.[13]

**1සාමු 17:2*** ඉතා පහත් තැනිතලාවක්. **4*** මූ.අ., "රියන් හයයි වියතක්." **5*** කිලෝග්‍රෑම් 57ක් පමණ.

එහි තලයේ බර යකඩ ෂෙකෙල් හය-
සියයක්* විය. ඔහුගේ විශාල පලිහ
රැගෙන ගිය තැනැත්තා ඔහුට ඉදිරි-
යෙන් ගමන් කළේය. **8** ගොලියත්
ඊශ්‍රායෙල් හමුදාව ඉදිරියට ඇවිත්
කෑගසමින් මෙසේ කීවේය.[1] "නුඹලා
මොකටද සටන් බිමට ආවේ? නුඹලා
සාවුල්ගේ සේවකයෝ නේද? මම
පිලිස්තිවරුන් වෙනුවෙන් තනියෙන්
සටන් කරන්න සූදානම්. ඉතින් දැන්
නුඹලා වෙනුවෙනුත් සටන් කරන්න
එක් කෙනෙක්ව තෝරාගෙන මා
ළඟට එවන්න. **9** එම තැනැත්තා
මාව මරලා දැම්මොත් පිලිස්ති-
වරුන් නුඹලාගේ දාසයෝ වෙනවා.
නමුත් මම ඔහුව මරලා දැම්-
මොත් නුඹලා අපේ දාසයන් වෙන්න
ඕනේ."[2] **10** පිලිස්තියා තවදුරටත්
මෙසේ කීවේය. "මාත් එක්ක සටන්
කරන්න පුළුවන් කෙනෙක් ඉන්නවා
නම් දැන් ඉදිරියට එන්න[3] කියා මම
ඊශ්‍රායෙල් හමුදාවට අභියෝග කර-
නවා."[4]
**11** සාවුල් රජ[5] සහ ඊශ්‍රායෙල් සෙ-
නඟ පිලිස්තියා පැවසූ දේ ඇසූ විට
බොහෝ සෙයින් භය වූහ.[6]
**12** යූදා දේශයේ බෙත්ලෙහෙම්හි
ජීවත් වූ එෆ්‍රාත්වරයෙකු[7] වන යෙස්-
සේට පුත්‍රයෝ අටදෙනෙක් සිටි-
යෝය.[8] දාවිත්ද ඔහුගේ පුත්‍රයෙකි.
සාවුල් රජකම් කළ කාලයේදී යෙස්-
සේ මහලුව සිටියේය. **13** යෙස්-
සේගේ වැඩිමල් පුත්‍රයෝ තුන්දෙනා
සාවුල් රජු සමඟ යුද්ධයට ගියෝය.[9]
ඔහුගේ කුලුඳුලා එලියාබ්ය.[10] දෙ-
වෙනියා අබිනාදාබ්ය.[11] තුන්වෙනියා
ෂම්මාහ්ය.[12] **14** දාවිත් ඔහුගේ
බාල පුත්‍රයාය.[13] සාවුල් රජු සමඟ යුද්-
ධයට ගියේ යෙස්සේගේ වැඩිමල් පුත්‍ර-
යන් තිදෙනාය.
**15** දාවිත් කලින් කලට සාවුල්
රජුට සේවය කරන පිණිස මාලිගාවට
ගියේය. ඔහු ඒ අතරතුර තම පියාගේ
බැටළුවන් බලාගැනීම සඳහා[14] බෙත්-

**1සාමු 17:7*** කිලෝග්‍රෑම් 6.84ක් පමණ.

**16 පරි.**
1 විනි 9:54
1සාමු 14:13
1සාමු 31:4
2 1සාමු 16:14
1සාමු 18:10
2රාජා 3:15

**17 පරි.**
3 යොෂු 13:2
විනි 3:1
විනි 3:3
1සාමු 9:16
1සාමු 14:52
ආමෝ 9:7
4 2ලේක 11:7
2ලේක 28:18
5 යොෂු 15:35
යෙරෙ 34:7
6 1ලේක 11:13
7 1සාමු 21:9
8 1සාමු 17:23
9 යොෂු 11:22
2සාමු 21:22
1ලේක 20:8
10 උත් 6:15
ද්වි 3:11
2සාමු 21:20
11 1සාමු 17:38
1රාජා 22:34
2ලේක 26:14
යෙරෙ 51:3
12 1සාමු 17:45
13 1ලේක 11:23
1ලේක 20:5

**2 තීරුව**
1 ගණන් 33:55
2 ද්වි 28:15
ද්වි 28:48
3 ගීතා 33:16
හිතෝ 16:18
යෙරෙ 9:23
4 1සාමු 17:26
2රාජා 19:22
ගීතා 80:6
5 1සාමු 8:20
6 ද්වි 20:1
යොෂු 1:9
1සාමු 17:24
ගීතා 27:1
යෙසා 51:12
7 උත් 35:16
උත් 35:19
රූත් 1:2
රූත් 4:22
1සාමු 16:1
1සාමු 17:58
මීකා 5:2
මතෙ 2:6
8 1සාමු 16:10
1ලේක 2:13
9 ගණන් 1:3
10 1සාමු 16:6
11 1සාමු 16:8
1ලේක 2:13
12 1සාමු 16:9
2සාමු 13:3
13 1ලේක 2:15
14 1සාමු 16:11
1සාමු 16:19

ලෙහෙමටත් ගියේය. **16** පිලිස්තියා
උදේ හවා ඊශ්‍රායෙල් හමුදාව ඉදිරියට
පැමිණියේය. ඔහු දවස් හතළිහක්ම
එසේ කළේය.
**17** යෙස්සේ තම පුත් දාවිත්ට
මෙසේ කීවේය. “පුතා ඉක්මනට
කඳවුරට ගිහින් මේ බැදපු ධාන්‍ය[1]
ඒපාවයි රොටි දහයයි ඔබේ සහෝදර-
යන්ට දෙන්න. **18** මේ මුදවපු කිරි*
පංගු දහය ඔවුන්ගේ හට පිරිස භාරව
ඉන්න ප්‍රධානියාට දෙන්න.[2] ඔබේ
සහෝදරයන්ගේ සැප දුක් කොහො-
මද කියලා බලගෙන එන්න.[3] ඔවුන්
කියන දේවල් ඇවිත් මට කියන්න.”
**19** සාවුල් රජද දාවිත්ගේ සහෝදර-
යෝ තිදෙනාද ඊශ්‍රායෙල් හමුදාවේ
අනික් පුරුෂයෝද පිලිස්තිවරුන්ට[4]
විරුද්ධව සටන් කරන පිණිස ඒලාහ්
නම් තැනිතලාවේ[5] රැස්ව සිටියෝය.
**20** දාවිත් උදෑසනින්ම අවදි වී
බැටළුවන්ව රැකවලෙකුට භාර දුන්-
නේය. පසුව ඔහු තම පියා දුන් ආහාර
ටික රැගෙන කඳවුර වෙත ගියේය.[6]
ඔහු කඳවුරට ගිය විට[7] හමුදාව
එකිනෙකාව දිරිගන්වමින් යුධ පිටිය
දෙසට ගමන් කරමින් සිටියෝය.[8]
**21** ඊශ්‍රායෙල් හමුදාව සහ පිලිස්තිව-
රුන්ගේ හමුදාව ඉදිරියට ඇවිත් එකි-
නෙකාට මුහුණ ලා සිටගත්තෝය.
**22** දාවිත් තමා ගෙනා බඩු මල්ල[9]
බඩු භාරව සිටි කෙනාට[10] භාර දී යුධ
පිටිය දෙසට දිව ගියේය. ඔහු එතැ-
නට ගොස් තම සහෝදරයන්ගෙන්
සැප දුක් විමසුවේය.[11]
**23** දාවිත් ඔවුන් සමඟ කතා කර-
මින් සිටියදී ගාත්හි[12] වැසියෙකු වන
ගොලියත්[13] නම් පිලිස්තියා ඉදිරියට
ඇවිත් කලින් වතාවලදී මෙන් ඊශ්‍රා-
යෙල්වරුන්ට අභියෝග කළේය.[14]
එය දාවිත්ටද ඇසුණේය. **24** ඊශ්‍රා-
යෙල් හමුදාව ගොලියත්ව දැක මහත්
සේ භය වී එතැනින් පලා ගියෝය.[15]
**25** ඔවුහු එකිනෙකා අතරේ මෙසේ
කතා වූහ. “ඇවිත් ඉන්න අර මනුෂ්‍යා-
යාව දැක්කාද? ඔහු නිතරම මෙතැ-
නට ඇවිත් ඊශ්‍රායෙල්වරුන්ට අපහාස
කරනවා.[1] කවුරු හරි ඔහු සමඟ
සටන් කරලා ඔහුව මරා දැම්මොත්
එම තැනැත්තාට ධන සම්භාරයක්
දෙන්න රජු පොරොන්දු වෙලා තියෙ-
නවා. රජුගේ දුවවත් ඔහුට විවාහ
කරලා දෙන්න පොරොන්දු වෙලා
තියෙනවා.[2] ඒ විතරක් නෙමෙයි ඔහු-
ගේ පවුලේ අයව බදු බරෙන් හා රජුට
කළ යුතු සේවාවන්ගෙන් නිදහස් කර-
නවා.”[3]
**26** පසුව දාවිත් ඔහු ළඟ සිටි
මනුෂ්‍යයන්ගෙන් මෙසේ ඇසුවේය.
“ජීවමාන දෙවිගේ[4] සේනාවට අප-
හාස කරන්න[5] අර පිලිස්තියාට[6]
තියෙන අයිතිය මොකක්ද? මේ
අචර්මච්ඡේදිතයාව[7] මරලා ඊශ්‍රායෙල්-
වරුන්ගේ නින්දාව[8] ඉවත් කරන
කෙනාට මොනවාද ලැබෙන්නේ?”
**27** එතැන සිටි මනුෂ්‍යයෝ, “ගොලි-
යත්ව මරන කෙනාට ලැබෙන්නේ
මේවායි” කියමින් කලින් ඔවුනොවුන්
අතරේ කතා කළ දේවල් ඔහුට
කීවෝය. **28** දාවිත් එතැන සිටි
මනුෂ්‍යයන් සමඟ කතා කළ දේවල්
ඔහුගේ වැඩිමල් සහෝදරයා වන එලි-
යාබ්ට[9] ඇසුණේය. එවිට ඔහු දාවිත්
සමඟ මහත් සේ කෝප වී[10] මෙසේ
කීවේය. “ඇයි ඔබ මෙහෙට ආවේ?
පාළුකරයේ ඉන්න අපේ බැටළුවෝ
කාට භාර දීලාද ඔබ මෙහේ ආවේ?[11]
ඔබ හරි හිතුවක්කාරයි. මෙහේ සිද්ධ
වෙන දේවල් බලන්න නේද ඔබ
ආවේ?[12] ඔබ මෙතැනට ආවේ හොඳ
චේතනාවකින් නෙමෙයි කියලා මම
දන්නවා.”[13] **29** එවිට දාවිත්, “මො-
කක්ද මම කළ වරද? මම ප්‍රශ්න-
යක් ඇහුවා විතරයි”[14] කියා කීවේය.
**30** ඉන්පසු දාවිත් වෙනත් කෙනෙකු
වෙතට ගොස් තමා කලින් ඇසූ ප්‍රශ්-
නයම ඔහුගෙන්ද ඇසුවේය.[15] එතැන
සිටි මනුෂ්‍යයෝද කලින් වතාවේදී
ඔහුට කියූ දේම නැවත කීවෝය.[16]

---

**1සාමු 17:18*** මූ.අ., “කිරි පංගු දහයක්.” කිරි-වලින් නිෂ්පාදනය කළ යමක් මෙයින් අදහස් කෙරේ.

**17 පරි.**
**1** රූත් 2:14, 1සාමු 25:18, 2සාමු 17:28
**2** 1සාමු 16:20, හිතෝ 3:27, හිතෝ 18:16
**3** උත් 37:14
**4** 1සාමු 9:16
**5** 1සාමු 17:2, 1සාමු 21:9
**6** කොලො 3:20
**7** 1සාමු 26:5
**8** 1සාමු 4:2, 1සාමු 23:3
**9** 1සාමු 10:22, 1සාමු 17:17
**10** 1සාමු 30:24
**11** උත් 37:14, 1සාමු 17:18
**12** යොෂු 11:22, 2සාමු 21:22, 1ලේක 20:8
**13** 1සාමු 17:4, 1ලේක 20:5
**14** 1සාමු 17:10
**15** ගණන් 13:33, ද්වි 20:3, 1සාමු 17:11, යෙසා 7:2

**2 තීරුව**
**1** 1සාමු 17:10, 2රාජා 19:22
**2** යොෂු 15:16, 1සාමු 14:49, 1සාමු 18:17, 1සාමු 18:21
**3** 1සාමු 8:11, මතෙ 17:26
**4** යෙරෙ 10:10, 1තෙස 1:9
**5** 1සාමු 17:10
**6** 1සාමු 17:37
**7** 1සාමු 14:6, 1සාමු 18:25
**8** ගීතා 74:18, ගීතා 74:22, ගීතා 79:12
**9** 1සාමු 16:6, 1ලේක 2:13
**10** ගීතා 37:8, හිතෝ 14:17, හිතෝ 14:29, හිතෝ 27:4
**11** 1සාමු 17:20
**12** හිතෝ 18:13, දේශ 7:9, මතෙ 7:1, රෝම 14:4, යාකො 4:12
**13** 1සාමු 16:7, 2ලේක 6:30
**14** හිතෝ 15:1, 1පේතෘ 3:9
**15** 1සාමු 17:26
**16** 1සාමු 17:25

**31** දාවිත් පැවසූ දේවල් සාවුල්
රජුට ආරංචි විය. එබැවින් සාවුල්
රජ දාවිත්ව තමා ඉදිරියට කැඳෙව්-
වේය. **32** ඉන්පසු දාවිත් සාවුල්
රජුට මෙසේ කීවේය. "මගේ ස්වා-
මීනි, කිසි කෙනෙකුට භය
වෙන්න හේතුවක් නැහැ.[1] මම අර
පිලිස්තියා සමඟ සටන් කරන්නම්."[2]
**33** නමුත් සාවුල් රජ, "ඔබ කොහො-
මද ඒ පිලිස්තියා සමඟ සටන් කරන්-
නේ?[3] ඔහු තරුණ වයසේ පටන්
සටනට දක්ෂ කෙනෙක්. ඉතින් ඔබ
වගේ පොඩි කොල්ලෙක්[4] කොහොමද
ඔහු සමඟ සටන් කරන්නේ" කියා
ඇසුවේය. **34** එවිට දාවිත් සාවුල්
රජුට මෙසේ කීවේය. "මගේ ස්වාමීනි,
මම මගේ පියාගේ බැටළුවන්ව රැක-
බලා ගන්න විට සිංහයෙක්[5] ඇවිත්
බැටළුවෙක්ව ඩැහැගෙන ගියා. තවත්
දවසක වලහෙක් බැටළුවන්ව ඩැහැ-
ගන්න ආවා. **35** මම උන් පස්-
සේ ගොස් උන්ට පහර දී[6] උන්ගේ
කටින් බැටළුවන්ව බේරාගත්තා. උන්
මාව ගොදුරු කරගන්න හදද්දී මම
උන්ගේ බෙල්ලෙන් අල්ලලා උන්ව
පොළොවේ ගහලා මරලා දැම්මා.
**36** සිංහයාවත් වලහාවත් මම මරලා
දැම්මා. මේ අචර්මච්ඡේදිත පිලිස්ති-
යාටත්[7] මම කරන්නේ ඒ දේමයි. ජීව-
මාන දෙවිගේ[8] සේනාවට[9] තවදුරටත්
අපහාස[10] කරන්න මම ඔහුට ඉඩ
දෙන්නේ නැහැ." **37** දාවිත් තවදුර-
ටත් මෙසේ කීවේය. "සිංහයාගෙනුත්
වලහාගෙනුත් මාව බේරාගත් යෙ-
හෝවා දෙවි මේ පිලිස්තියාගේ අති-
නුත් මාව බේරාගනියි."[11] එවිට සාවුල්
රජ, "එහෙනම් ඔබ දැන් යන්න. යෙ-
හෝවා දෙවි ඔබට උදව් කරයි"[12]
කියා කීවේය.

**38** ඉන්පසු සාවුල් රජ තම ඇඳුම්
දාවිත්ට අන්දවා ඔහුට තඹ තොප්පි-
යක් පැළඳෙව්වේය. ඔහුට යුධ ඇඳු-
මක්ද ඇන්දුවේය. **39** දාවිත් සාවුල්
රජුගේ කඩුව තම ඉණේ බැඳගෙන
ඇවිදින්න උත්සාහ කළේය. ඔහු
එම ඇඳුම් සහ ආයුධ මීට පෙර
භාවිත කර නොතිබූ නිසා ඒවා
පැළඳගෙන ඔහුට ඇවිදින්න අපහසු
විය. එවිට ඔහු සාවුල් රජුට, "මීට
කලින් මම මේවා ඇඳලා නැති නිසා
මට ඇවිදින්න අමාරුයි" කියමින්
ඒවා ගලවා දැමුවේය.[1] **40** ඉන්පසු
දාවිත් නිම්නයෙන් රවුම් ගල් පහක්
අහුලාගෙන ඒවා තමන් ළඟ තිබූ
මල්ලේ දමාගත්තේය. ඔහු එක අත-
කට සැරයටියද අනික් අතට ගල්පටි-
යද[2] ගෙන පිලිස්තියා සිටි ස්ථානය
දෙසට ගියේය.

**41** පිලිස්තියාද දාවිත් සිටි ස්ථා-
නය වෙතට ඇවිදගෙන ආවේය.
ඔහුට ඉදිරියෙන් ඔහුගේ පලිහ
දරන්නා ගමන් කළේය. **42** පිලිස්-
තියා, දාවිත් තරුණයෙකු බව දුටු
විට[3] ඔහුට සමච්චල්[4] කරන්න පටන්-
ගත්තේය. මන්ද ඔහු රතට හුරු
සමක්[5] තිබූ කඩවසම් තරුණයෙක්
විය.[6] **43** පිලිස්තියා දාවිත්ට මෙසේ
කීවේය. "පොල්ලක් අරගෙන නුඹ
මගේ ඉස්සරහට එන්නේ මං බල්-
ලෙක්[7] කියා සිතූ නිසාද?" එසේ කියා
පිලිස්තියා තම දෙවිවරුන්ගේ නමින්
දාවිත්ට ශාප කළේය.[8] **44** පිලිස්-
තියා තවදුරටත්, "මා ළඟට වර. මං
තගේ මස් පක්ෂීන්ටත් වනමෘගයන්-
ටත් කන්න දෙනවා"[9] යයි දාවිත්ට
කීවේය.

**45** එවිට දාවිත් පිලිස්තියාට
මෙසේ කීවේය. "නුඹ මා ළඟට
එන්නේ කඩුවක්, ලොකු හෙල්ල-
යක් හා කුඩා හෙල්ලයක්[10] රැගෙ-
නයි. නමුත් මම නුඹ ළඟට එන්නේ
නුඹ නින්දා කළ[11] ස්වර්ගයේ සේනා-
වල අධිපති වන යෙහෝවා දෙවි-
ගේ නාමයෙන්.[12] ඊශ්‍රායෙල්වරුන්ගේ
සේනාවේ දෙවි ඔහුයි. **46** අද යෙ-
හෝවා දෙවි මගේ අතට නුඹව
හසු කර දෙන බව ස්ථිරයි.[13] මම
නුඹව මරලා නුඹේ හිස කපලා
දානවා. මම අද පිලිස්තිවරුන්ගේ මළ
සිරුරු පක්ෂීන්ටත් වනමෘගයන්ටත්
කන්න දෙනවා.[14] ඊශ්‍රායෙල්වරුන්ට
දෙවි කෙනෙක් ඉන්න බව පොළොවේ

**17 පරි.**
1 ද්වි 20:3
ගීතා 27:3
2 1සාමු 16:18
ගීතා 118:6
හිතෝ 28:1
3 ගණන් 13:31
ද්වි 9:2
4 1සාමු 17:42
5 විනි 14:5
හිතෝ 30:30
යෙසා 31:4
ආමෝ 3:12
6 විනි 14:6
2සාමු 23:20
7 1සාමු 17:26
8 යෙරෙ 10:10
1තෙස 1:9
9 1සාමු 17:20
1ලේක 12:38
10 1සාමු 17:10
2රාජා 19:22
11 ද්වි 7:21
2රාජා 6:16
ගීතා 18:3
ගීතා 115:11
2කොරි 1:10
හෙබ්‍රෙ 11:34
12 1සාමු 14:6
ගීතා 97:10
ගීතා 124:8

**2 තීරුව**
1 සෙක 4:6
2 විනි 20:16
1සාමු 25:29
2ලේක 26:14
3 1සාමු 17:33
4 ගීතා 123:4
5 සල 5:10
විලා 4:7
6 1සාමු 16:12
7 1සාමු 24:14
2සාමු 9:8
2සාමු 16:9
2රාජා 8:13
ලූක් 14:11
8 විනි 16:23
2රාජා 1:2
9 හිතෝ 18:12
යෙරෙ 9:23
10 1සාමු 17:6
යෙසා 54:17
11 1සාමු 17:10
2රාජා 19:22
12 2සාමු 5:10
2සාමු 22:33
ගීතා 44:5
ගීතා 125:1
හෙබ්‍රෙ 11:34
13 ද්වි 7:2
ද්වි 9:3
යොෂු 10:8
14 යෙසා 56:9
එළි 19:17

සියලු වැසියන් එයින් දැනගනීවි.[1]
47 යෙහෝවා දෙවි ගැලවීම ලබා
දෙන්නේ කඩුවෙන්වත් හෙල්ලයෙන්-
වත් නොවෙයි කියලා මේ මුළු සේනා-
වම දැනගනීවි.[2] මේ යුද්දේ යෙහෝවා
දෙවිගේයි.[3] ඔහු අද නුඹලාව අපේ
අතට හසු කර දෙන බවට කිසිම
සැකයක් නැහැ.”[4]
48 පිලිස්තියා ටිකෙන් ටික දාවිත්
ළඟට ආවේය. දාවිත්ද වේග-
යෙන් පිලිස්තියා දෙසට දිව ගියේය.[5]
49 ඉන්පසු දාවිත් තම මල්ලේ තිබූ
ගලක් ගෙන ගල්පටියේ තබා කිහිප
වතාවක්ම එය කරකවා පිලිස්තියාට
එයින් දමාගැසුවේය. ගල පිලිස්ති-
යාගේ නළලේ තදින් වැදුණේය.[6]
එවිට ඔහු මුණින් අතට වැටුණේය.[7]
50 මෙසේ දාවිත් පිලිස්තියාට වඩා
ශක්තිමත් බව ඔප්පු විය. ඔහු ගල්ප-
ටියක් හා ගලක් පමණක් භාවිත
කර පිලිස්තියාව බිම හෙළුවේය.
ඉන්පසු ඔහු පිලිස්තියාට පහර දී
ඔහුව මරා දැමුවේය. සටන් කළ
අවස්ථාවේදී දාවිත්ගේ අතේ කඩුවක්
නොතිබුණේය.[8] 51 එබැවින් දාවිත්
දුව ගොස් පිලිස්තියාගේ ඇඟ උඩට
නැඟ ඔහුගේම කඩුවෙන්[9] ඔහුගේ හිස
කපා දැමුවේය.[10] පිලිස්තිවරු ඔවුන්-
ගේ වීරයා මැරුණු බව දැක එතැනින්
පලා දිව්වෝය.[11]
52 එවිට ඊශ්‍රායෙල්හි හා යූදාහි
මනුෂ්‍යයෝ කෑගසමින් පිලිස්තිවරුන්
පසුපස ලුහුබැඳ ගියෝය.[12] ඔවුහු
නිම්නය[13] දක්වාත් එක්‍රොන්හි[14] දො-
රටුව දක්වාත් ඔවුන්ව ලුහුබඳිමින්
ගියෝය. දරුණු ලෙස තුවාල ලැබූ
පිලිස්තිවරු ෂායරයිම්ට[15] යන මාර්-
ගය දිගේ මැරී වැටුණෝය. ගාත් දක්-
වාත් එක්‍රොන් දක්වාත් යන මාර්ග
දිගේ ඔවුන්ගේ මළ සිරුරු වැටී
තිබිණ. 53 පසුව ඊශ්‍රායෙල් සෙ-
නඟ පිලිස්තිවරුන් පසුපස ලුහුබැඳ
යෑම අත්හැර පිලිස්තිවරුන්ගේ කඳවු-
රට පැමිණ ඔවුන්ගේ බඩු කොල්ල
කෑවෝය.[16]
54 දාවිත් පිලිස්තියාගේ හිස[17] යෙ-
රුසලමට ගෙනාවේය. පිලිස්තියාගේ
ආයුධ ඔහු තම කූඩාරමට ගෙන
ගියේය.[1]
55 දාවිත්, පිලිස්තියා වෙත යන
විට සාවුල් රජ තමාගේ හමුදා-
පති වන අබ්නේර්ගෙන්[2] මෙසේ ඇසු-
වේය. “අබ්නේර්, අර තරුණයා කාගේ
පුතාද?”[3] එවිට අබ්නේර්, “රජ්ජුරු-
වනි, ඇත්තටම මම ඒ තරුණයා
කවුද කියා දන්නේ නැහැ” කියා පැව-
සුවේය. 56 එවිට රජ, “ඒ තරුණයා
කාගේ පුතාද කියා සොයා බලන්න”
යයි කීවේය. 57 දාවිත් පිලිස්තියා
මරා නැවත හැරී ආ ගමන්ම අබ්-
නේර් ඔහුව සාවුල් රජු ඉදිරියට
ගෙන ගියේය. දාවිත් පිලිස්තියාගේ
හිසත්[4] එතැනට රැගෙන ගියේය.
58 සාවුල් රජ දාවිත්ගෙන් මෙසේ
ඇසුවේය. “පුතේ, ඔබේ පියා කවුද?”
එවිට දාවිත්, “මම බෙත්ලෙහෙම්හි[5]
ජීවත් වෙන ඔබේ සේවකයා වන
යෙස්සේගේ පුතා”[6] කියා කීවේය.

**18** දාවිත් සාවුල් රජුට පැවසූ
දේවල් ඇසූ විට යොනාතාන්-
ගේ[7] සිත දාවිත් වෙත ඇදී ගියේය.[8]
එදා පටන් ඔහු තම පණට මෙන්
දාවිත්ට ආදරේ කිරීමට පටන්ගත්-
තේය.[9] 2 එදින සාවුල් රජ, දාවිත්ව
ඔහුගේ පියාගේ නිවසට නොයවා
තම මාලිගාවේ නවත්වාගත්තේය.[10]
3 යොනාතාන් දාවිත්ට තම පණට
මෙන් ආදරේ කළ නිසා[11] ඔවුහු එකි-
නෙකා අතරේ ගිවිසුමක් ඇති කර-
ගත්තෝය.[12] 4 පසුව යොනාතාන්
තමා ඇඳගෙන සිටි අත් නැති සළුවද
අනික් වස්ත්‍රද දාවිත්ට දුන්නේය.
ඔහු තම කඩුවද දුන්නද ඉණපටියද
දාවිත්ට දුන්නේය. 5 දාවිත් සාවුල්
රජුගේ හමුදාව සමඟ යුධ මෙහෙයුම්-
වලට යෑමට පටන්ගත්තේය. සාවුල්
රජු තම හමුදාව යැවූ සෑම තැන-
ටම දාවිත්ද ගියේය. දාවිත් සිහි-
කල්පනාවෙන් යුතුව කටයුතු කළ

**17 පරි.**
1 නික් 9:16
ද්වි 28:10
1රාජා 8:43
1රාජා 18:36
2රාජා 19:19
ගීතා 46:10
යෙසා 52:10
දානි 3:29
2 ගීතා 44:6
හොෂෙ 1:7
සෙක 4:6
3 2ලේක 20:15
ගීතා 46:11
හිතෝ 21:31
4 ද්වි 20:4
5 ගීතා 27:1
හිතෝ 28:1
6 1සාමු 17:57
7 1සාමු 17:37
2සාමු 21:22
2සාමු 22:39
ගීතා 44:7
8 විනි 3:31
විනි 15:15
1සාමු 13:22
1සාමු 17:47
9 1සාමු 21:9
10 ගීතා 18:40
11 ද්වි 28:7
යොෂු 23:10
හෙබ්‍රෙ 11:34
12 ගීතා 18:37
13 1සාමු 17:2
1සාමු 17:19
14 යොෂු 15:45
15 යොෂු 15:36
16 යෙරෙ 30:16
17 1සාමු 31:9

**2 තීරුව**
1 1සාමු 21:9
2 1සාමු 14:50
3 නික් 5:2
1සාමු 16:19
1සාමු 16:21
1සාමු 25:10
4 1සාමු 17:54
5 1සාමු 17:12
1සාමු 20:6
6 රූත් 4:22
1සාමු 16:1
1ලේක 2:13
යෙසා 11:1
මතෙ 1:6
ලූක් 3:32
ක්‍රියා 13:22
රෝම 15:12

**18 පරි.**
7 1සාමු 14:1
1සාමු 14:49
2සාමු 1:4
8 උත් 44:30
1පේත 1:22
9 1සාමු 19:2
1සාමු 20:17
1සාමු 20:41
2සාමු 1:26

**10** 1සාමු 8:11; 1සාමු 16:22; 1සාමු 17:15; **11** හිතෝ 17:17; හිතෝ 18:24; කොලො 3:14; **12** 1සාමු 20:8; 1සාමු 20:42; 1සාමු 23:18; 2සාමු 9:1; 2සාමු 21:7.

නිසා[1] සාවුල් රජ ඔහුව තම හමුදාවේ
ප්‍රධානියා ලෙස පත් කළේය.[2] මුළු
සෙනඟද සාවුල් රජුගේ සේවකයෝද
ඒ ගැන සතුටු වූහ.

**6** දාවිත් පිලිස්තිවරුන්ව පරාජය
කර නැවත පැමිණි විට ඊශ්‍රායෙල්හි
සෑම නුවරකින්ම ස්ත්‍රීහු ගී ගය-
මින්,[3] නටමින් පිටත්ව ආවෝය.
ඔවුහු රබන්* ගසමින්,[4] වීණා# වය-
මින්, ප්‍රීති ඝෝෂා නඟමින්[5] සාවුල් රජු
ඉදිරියට ආවෝය. **7** ප්‍රීති ඝෝෂා
නඟමින් සිටි ඒ ස්ත්‍රීහු මෙසේ ගායනා
කළෝය.

“සාවුල් දහස් ගණන් මැරුවෝය.
දාවිත් දසදහස් ගණන් මැරු-
වෝය.”[6]

**8** ඔවුන් කී දේ අසා සාවුල් රජ
මහත් සේ කෝප වී[7] මෙසේ සිතු-
වේය. “දාවිත් දසදහස් ගණන් මැරුවා
කියලා ඔවුන් කියනවා. නමුත්
මම මැරුවා කියලා කියන්නේ දහස්
ගණන් විතරයි. තව ඔහුට ලබාගන්න
ඉතුරු වෙලා තියෙන්නේ රජකම
විතරයි!”[8] **9** එදා පටන් සාවුල් රජ,
දාවිත් දෙස සැකෙන් බලන්න පටන්-
ගත්තේය.[9]

**10** පසුවදා[10] සාවුල් රජු තුළ අවුල්-
සහගත සිතුවිලි ඇති වීමට දෙවි
ඉඩහැරියේය.[11] එබැවින් ඔහු මාලි-
ගාවේදී වියරු වැටුණු කෙනෙකු*
ලෙස හැසිරෙන්න පටන්ගත්තේය.[12]
ඒ අවස්ථාවේදී දාවිත් සුපුරුදු
ලෙස සංගීතය වාදනය කර-
මින් සිටියේය.[13] හෙල්ලයක් අතැතිව
සිටි[14] **11** සාවුල් රජ ඒ මොහොතේ,
“මම දාවිත්ට මැරෙන්නම අනිනවා”[15]
යයි කියමින් දාවිත් දෙසට හෙල්-
ලය වීසි කළේය.[16] ඔහු දෙවරක්ම
දාවිත්ට හෙල්ලයෙන් අනින්න උත්-
සාහ කළ නමුත් දාවිත් ඔහුගෙන්
බේරී පලා ගියේය.[1] **12** යෙහෝවා
දෙවි තමන්ගෙන් දුරස් වී[2] දාවිත්ට
සමීප වී සිටින බව සාවුල් රජු තේ-
රුම්ගත් නිසා[3] ඔහු දාවිත්ට භයෙන්
සිටියේය.[4] **13** එබැවින් ඔහු දාවිත්ව
දහස්දෙනෙකුගෙන් යුත් කණ්ඩායමේ
ප්‍රධානියා ලෙස පත් කර රජමාලිගා-
වෙන් පිටත් කර යැව්වේය.[5] හමුදාවේ
පෙරමුණ ගෙන ක්‍රියා කළේ දාවිත්ය.[6]
**14** දාවිත් සෑමවිටම සිහිකල්පනා-
වෙන් ක්‍රියා කළේය.[7] යෙහෝවා දෙවි-
ගේ ආශීර්වාදයද ඔහුට ලැබිණ.[8]
**15** ඔහු සිහිකල්පනාවෙන් ක්‍රියා කළ
බව[9] සාවුල් රජටද පෙනී ගියේය.
එබැවින් ඔහු දාවිත්ට භයෙන් සිටි-
යේය. **16** යුද්ධයට ගිය අවස්ථාව-
ලදී දාවිත් පෙරමුණ ගෙන ක්‍රියා කළ
නිසා ඊශ්‍රායෙල්හි සහ යුදාහි සියලු
වැසියෝ ඔහුට මහත් සේ ප්‍රේම
කළෝය.

**17** කලක් ගෙවුණු පසු සාවුල්
රජ මෙසේ සිතුවේය. “මගේ අතින්
දාවිත්ව මරන්නේ නැහැ. ඔහු පිලිස්-
තිවරුන්ගේ අතින් මැරුම් කාපු-
දෙන්.”[10] එබැවින් ඔහු දාවිත්ට මෙසේ
කීවේය. “මගේ වැඩිමල් දියණිය
වන මේරබ්ව[11] ඔබට විවාහ කර
දෙන්න මම කැමතියි.[12] හැබැයි ඊට
කලින් යෙහෝවා දෙවි වෙනුවෙන්
සටන් කර[13] ඔබ නිර්භීත කෙනෙක්
කියා පෙන්විය යුතුයි.” **18** එවිට
දාවිත්, “මගේ පියාගේ පවුලේ අයයි
මගේ නෑදෑයනුයි ඊශ්‍රායෙල් දේශයේ ඒ
තරම් වැදගත් මිනිස්සු නෙවෙයි.
ඉතින් මම කොහොමද රජ්ජුරුවන්ගේ
බෑනා වෙන්නේ”[14] කියා සාවුල් රජුට
පැවසුවේය. **19** සාවුල් රජුගේ දිය-
ණිය වන මේරබ්ව දාවිත්ට විවාහ කර
දීමට පොරොන්දු වූ දවසට කලින්
ආබෙල්-මෙහෝලාහි[15] ජීවත් වූ අද්‍රි-
යෙල්[16] නම් මිනිසාට ඇයව විවාහ
කර දී තිබිණ.

**20** පසුව සාවුල් රජුගේ දියණිය

---

**1සාමු 18:6*** මූ.අ., “කිංකිණි රබන්.” **6#** මූ.අ.,
“තත් තුනේ සංගීත භාණ්ඩ.” **10*** හෝ, “අනාග-
තවක්තෘවරයෙකු ලෙස හැසිරුණේය.” අනාගත-
වක්තෘවරුන් සමහර අවස්ථාවලදී දේවල් ප්‍රකාශ
කළ ආකාරය හා හැසුරුණු ආකාරය අසාමාන්‍ය වූ
නිසා එවැනි යෙදුමක් භාවිත කළා විය හැක.

---

**14** 2සාමු 7:18; හිතෝ 15:33; හිතෝ 18:12; හිතෝ 22:4;
යාකො 4:6; 1පේත්‍ර 5:6; **15** විනි 7:22; 2සාමු 21:8;
**16** 2සාමු 21:8.

---

**18 පරි.**

**1** යොෂු 1:7
1සාමු 18:30
හිතෝ 14:35
**2** 1සාමු 14:52
හිතෝ 20:18
**3** නික් 15:21
විනි 5:1
**4** නික් 15:20
විනි 11:34
ගීතා 68:25
**5** යෙරෙ 31:13
**6** 1සාමු 21:11
1සාමු 29:5
හිතෝ 15:30
**7** උත් 4:5
හිතෝ 14:30
හිතෝ 27:4
යාකො 3:16
**8** 1සාමු 13:14
1සාමු 15:28
1සාමු 16:13
1සාමු 20:31
1සාමු 24:20
**9** 1සාමු 20:33
1සාමු 21:10
හිතෝ 27:4
1තිමෝ 6:4
**10** එෆී 4:26
**11** විනි 9:23
1සාමු 16:14
1සාමු 19:9
යෝබ් 34:12
**12** 1සාමු 10:6
1සාමු 10:11
1සාමු 19:24
**13** 1සාමු 16:16
1සාමු 16:23
**14** 1සාමු 19:9
**15** හිතෝ 27:4
1යොහ 3:15
1යොහ 4:20
**16** 1සාමු 19:10
1සාමු 20:33

**2 තීරුව**

**1** ගීතා 37:32
ලූක් 4:30
යොහ 8:59
**2** 1සාමු 16:14
1සාමු 28:15
**3** 1සාමු 16:13
**4** 1සාමු 18:29
**5** 1සාමු 18:5
**6** ගණන් 27:17
2සාමු 5:2
ගීතා 121:8
**7** 1සාමු 18:5
**8** උත් 39:2
යොෂු 6:27
1සාමු 10:7
1සාමු 16:18
**9** යොෂු 1:7
හිතෝ 20:18
**10** 1සාමු 18:25
2සාමු 11:15
2සාමු 12:9
ගීතා 7:16
**11** 1සාමු 14:49
**12** 1සාමු 17:25
**13** 1සාමු 25:28

වන මීකල්[1] දාවිත්ට ආදරේ කරන
බව සාවුල් රජුට දන්වනු ලැබීය. රජද
ඒ ගැන සතුටු විය. **21** මන්ද ඔහු
මෙසේ සිතුවේය. “මේක දාවිත්ව අල්-
ලගන්න හොඳ අවස්ථාවක්. පිලිස්ති-
වරුන්ගේ අතින් ඔහුව මරන්න මට
සැලසුම් කරන්න පුළුවන්.”[2] ඉන්පසු
සාවුල් රජ, “මම මගේ අනික් දුවව
ඔබට විවාහ කර දෙන්නම්. මේ විවා-
හයට ඔබ කැමති වෙන්න” කියා
දාවිත්ට කීවේය. **22** සාවුල් රජ තම
සේවකයන්ටද මෙසේ අණ කළේය.
“දාවිත්ට රහසින් මෙහෙම කියන්න.
‘රජ ඔබට ගොඩක් ආදරෙයි. ඔහුගේ
සියලු සේවකයනුත් ඔබට ආදරෙයි.
ඒ නිසා ඔබ රජුගේ දියණිය සමඟ
විවාහ වෙන්න.’” **23** සාවුල් රජු-
ගේ සේවකයෝ ඔහු කී සියල්ල
දාවිත්ට කීවෝය. නමුත් දාවිත්, “මම
නිකම්ම නිකම් දුප්පත් මිනිහෙක්.[3]
රජුගේ බෑනා වෙන්න තරම් වත්ක-
මක් මට නැහැ” කියා ඔවුන්ට කීවේය.
**24** පසුව සාවුල් රජුගේ සේවකයෝ,
“දාවිත් අපිට කිව්වේ මෙයයි” කියමින්
දාවිත් පැවසූ සියල්ල සාවුල් රජුට
කීවෝය.

**25** එවිට සාවුල් රජ ඔහුගේ සේවක-
යන්ට මෙසේ කීවේය. “‘රජු ඔහුගේ දුව
වෙනුවෙන් ඉල්ලන්නේ මුදල් නෙ-
මෙයි.[4] ඔහුට අවශ්‍ය ඔහුගේ සතුරන්-
ගෙන් පළිගන්නයි.[5] ඒ නිසා ඔහුට
පිලිස්තිවරුන් සියදෙනෙකුගේ චර්-
මාග්‍ර[6] විතරක් ගෙනත් දෙන්න’ කියා
දාවිත්ට කියන්න.” නමුත් සාවුල් රජු
එසේ කීවේ යටි අදහසක් ඇතුවය.
පිලිස්තිවරුන් ලවා දාවිත්ව මරා දැමී-
මට ඔහුට අවශ්‍ය විය. **26** සාවුල්
රජුගේ සේවකයෝ ඔහු පැවසූ සියල්ල
දාවිත්ට දැන්වූවෝය. දාවිත්ද රජුගේ
දුව සමඟ විවාහ වීමට කැමති විය.[7]
රජුගේ ඉල්ලීම ඉටු කිරීමට තව ටික
දවසක් ඉතුරුව තිබිණ. **27** එබැවින්
දාවිත්ද ඔහුගේ සේවකයෝද ගොස්
පිලිස්තිවරුන් දෙසීයදෙනෙකුව මරා
දැමුවෝය.[8] පසුව රජුගේ දියණියව
විවාහ කරගන්නා පිණිස දාවිත් තමා
මරා දැමූ සියලුදෙනාගේම චර්මාග්‍ර[1]
රජු ඉදිරියට ගෙනාවේය. සාවුල් රජද
තම දියණිය වන මීකල්ව ඔහුට විවාහ
කර දුන්නේය.[2] **28** යෙහෝවා දෙවි-
ගේ ආශීර්වාදය දාවිත්ට තිබූ බව
සාවුල් රජ තේරුම්ගත්තේය.[3] ඔහුගේ
දියණිය වන මීකල් දාවිත්ට මුළු හදව-
තින්ම ආදරේ කළාය.[4] **29** සාවුල්
රජ දාවිත්ට තව තවත් භය විය.
එහෙත් ඔහු ජීවිතාන්තය දක්වාම
දාවිත්ට සතුරුකම් කළේය.[5]

**30** පිලිස්තිවරුන්ගේ අධිපතියෝ[6]
විටින් විට යුද්ධයට ගියෝය. ඒ සෑම
අවස්ථාවකදීම දාවිත් ඉතා සිහිකල්-
පනාවෙන් කටයුතු කළේය.[7] ඔහු
සාවුල් රජුගේ අන් සියලු සේවකයන්ට
වඩා සිහිකල්පනාවෙන් ක්‍රියා කළ
බැවින් හොඳ නමක් දිනාගත්තේය.[8]

**19** කලක් ගෙවුණු පසු දාවිත්ව
මරා දැමිය යුතු බව සාවුල්
රජ තම පුත් යොනාතාන්ටද තම
සේවකයන්ටද කීවේය.[9] **2** නමුත්
යොනාතාන් දාවිත්ට බොහෝ සෙ-
යින් ප්‍රේම කළ නිසා[10] ඔහු දාවිත්ට
මෙසේ කීවේය. “මගේ පියා ඔබව
මරන්න හදනවා. ඔබ කල්පනාවෙන්
කටයුතු කරන්න. හෙට උදෑසන
කාටවත් නොපෙනී සැඟවී ඉන්න.[11]
**3** මම මගේ පියා සමඟ ඔබ සැඟවී
ඉන්න කෙතට ඇවිත් ඔබ වෙනුවෙන්
කතා කරන්නම්. පසුව මම ඔබ ළඟට
ඇවිත් මගේ පියා පැවසූ සෑම දෙයක්ම
ඔබට කියන්නම්.”[12]

**4** පසුව යොනාතාන් දාවිත් වෙනු-
වෙන් කතා කරමින්[13] සාවුල්
රජුට මෙසේ කීවේය. “රජතුමනි,
ඔබේ සේවකයා වන දාවිත්ට විරුද්-
ධව කටයුතු කරන්න එපා. එය
ඇත්තෙන්ම පාපයක්.[14] ඔහු මේ
දක්වාම ක්‍රියා කළේ ඔබේ යහ-
පත වෙනුවෙන්. ඔහු ඔබට විරුද්ධව
කිසි වරදක් කරලා නැහැ.[15] **5** ඔහු
තමන්ගේ ජීවිතය පරදුවට තබා[16]

**18 පරි.**
**1** 1සාමු 14:49
1සාමු 19:11
1සාමු 25:44
2සාමු 3:13
2සාමු 6:16
1ලේක 15:29
**2** නික් 10:7
1සාමු 18:17
ගීතා 7:14
ගීතා 38:12
හිතෝ 26:24
යෙරෙ 9:8
**3** 1සාමු 18:18
ගීතා 119:141
**4** උත් 29:18
උත් 34:12
නික් 22:16
**5** 1සාමු 14:24
**6** විනි 14:3
1සාමු 17:26
1සාමු 17:36
1සාමු 21:11
2සාමු 1:20
2සාමු 3:14
**7** 1සාමු 18:21
**8** විනි 14:19

**2 තීරුව**
**1** 2සාමු 3:14
**2** 1සාමු 17:25
**3** 1සාමු 16:13
1සාමු 24:20
**4** 1සාමු 18:20
**5** 1සාමු 18:9
1සාමු 18:12
1සාමු 20:33
ගීතා 37:12
**6** 1සාමු 29:3
**7** 1සාමු 18:5
1රාජා 2:3
ගීතා 119:99
**8** 2සාමු 7:9
හිතෝ 22:1
දේශ 7:1

**19 පරි.**
**9** 1සාමු 18:9
හිතෝ 27:4
යාකො 1:20
**10** 1සාමු 18:1
හිතෝ 18:24
**11** හිතෝ 22:3
හිතෝ 27:12
**12** 1සාමු 20:9
1සාමු 20:13
හිතෝ 17:17
**13** 1සාමු 20:32
1සාමු 22:14
හිතෝ 31:9
**14** උත් 42:22
2ලේක 6:23
1යොහ 3:15
**15** ගීතා 35:12
ගීතා 109:5
හිතෝ 17:13
යෙරෙ 18:20

**16** විනි 9:17; විනි 12:3; 1සාමු 28:21; ගීතා 119:109; ක්‍රියා 20:24; පිලි 2:30.

අර පිලිස්තියාට පහර දුන්නා.[1] යෙ-
හෝවා දෙවි එදා ඔහු මාර්ගයෙන්
ඊශ්‍රායෙල් සෙනඟට මහත් ගැලවීමක්
ලබා දුන්නා.[2] ඔබත් එය දැකලා
ගොඩක් සතුටු වුණා නේද? ඉතින්
කිසිම හේතුවක් නැතුව[3] ඔබ දාවිත්ව
මරලා දාන්න හදන්නේ ඇයි? නිර්-
දෝෂ මනුෂ්‍යයෙකුගේ ලේ වගුරු-
වලා ඔබ පාපයක් කරන්න හදන්නේ
ඇයි?”[4] **6** යොනාතාන් කියූ දේ පිලි-
ගත් සාවුල් රජ ඔහුට මෙසේ පැවසු-
වේය. “මම දාවිත්ව මරන්නේ නැහැ
කියලා ජීවමාන දෙවි වන යෙහෝවා-
ගේ නමින් දිවුරලා පොරොන්දු වෙ-
නවා.”[5] **7** පසුව යොනාතාන් සිදු වූ
සියල්ල දාවිත්ට කීවේය. ඉන්පසු
යොනාතාන් දාවිත්ව සාවුල් රජු ඉදිරි-
යට ගෙන ගියේය. දාවිත් පෙර දවස්-
වලදී මෙන් සාවුල් රජු ඉදිරියේ සේවය
කළේය.[6]

**8** කල් යත්ම පිලිස්තිවරුන් සමඟ
නැවත යුද්ධයක් ඇති විය. දාවිත්
ඔවුන්ට විරුද්ධව යුද්ධ කරමින්
පිලිස්තිවරුන් විශාල පිරිසක් මරා
දැමූ අතර[7] ඉතුරු වූ අය ඔහු වෙතින්
පලා ගියෝය.[8]

**9** දිනක් දාවිත් රජමාලිගාවේ
සාවුල් රජු ඉදිරියේ සංගීතය වාදනය
කරමින් සිටියේය. ඒ අවස්ථාවේදී
සාවුල් රජු තුළ අවුල්සහගත සිතු-
විලි* ඇති වීමට යෙහෝවා දෙවි
ඉඩහැරියේය.[9] සාවුල් රජුගේ අතේ
හෙල්ලයක්ද තිබිණ. **10** දාවිත්ට
මැරෙන්නම අනිනවා කියා සිතා-
ගෙන සාවුල් රජ ඔහුට හෙල්ලයෙන්
දමාගැසුවේය.[10] නමුත් දාවිත් එතැ-
නින් ඉවතට පැන්නේය.[11] හෙල්ලය
ගොස් බිත්තියේ රැඳුණේය. එදින
රාත්‍රියේ දාවිත් සාවුල් රජුගේ නිව-
සින් පලා ගියේය.[12] **11** දාවිත්ව
පසුවදා උදෑසන මරා දමන
ලෙස තම සේවකයන්ට අණ කර-
මින් සාවුල් රජ ඔවුන්ව ඔහුගේ
නිවසට යැව්වේය.[13] ඔවුහු උදෑසන
වන තෙක්ම ඔහුව අල්ලාගැනීමට
රැක සිටියෝය.[1] දාවිත්ගේ භාර්යාව
වන මීකල් දාවිත්ට මෙසේ අන-
තුරු ඇඟෙව්වාය. “ඔබ අද මෙහෙන්
පැනලා යන්න. ඔබ ගියේ නැත්නම්
හෙට ඔබව මරලා දායි.” **12** ඉන්-
පසු මීකල් දාවිත්ට කවුළුවෙන් බැස
යෑමට උදව් කළාය. සාවුල් රජුගෙන්
ගැලවෙන පිණිස දාවිත් පලා ගියේය.[2]
**13** පසුව මීකල් ටෙරපිම් රූපයක්[3]
ගෙන එය දාවිත්ගේ ඇඳ මත තබා
එළු රෝමවලින් සෑදූ රෙද්දක් රූපයේ
හිස ළඟ තැබුවාය. ඉන්පසු ඇය
රූපය රෙද්දකින් වැසුවාය.

**14** පසුව දාවිත්ව අල්ලාගැනීමට
සාවුල් රජුගේ සේවකයන් පැමිණි
විට මීකල්, “ඔහුට සනීප නැහැ”
කියා ඔවුන්ට කීවාය.[4] **15** එය
ඇසූ සාවුල් රජ ඔහුගේ සේවක-
යන්ට මෙසේ කීවේය. “ඇඳත් එක්කම
ඔහුව මෙහාට අරගෙන එන්න! මමම
ඔහුව මරලා දාන්නම්.”[5] **16** සේව-
කයෝ දාවිත්ව රැගෙන යෑමට පැමිණි
විට ඔහුගේ ඇඳේ ටෙරපිම් රූපයක්ද
හිස තබන තැන එළු රෝමවලින් සෑදූ
රෙද්දක්ද තබා තිබෙන බව දුටු-
වෝය. **17** එය ආරංචි වූ සාවුල් රජ,
“ඇයි ඔබ මාව මේ විදිහට රැවැට්ටු-
වේ?[6] මගේ සතුරාට[7] පැනලා යන්න
ඔබ උදව් කළේ ඇයි” කියා මීකල්-
ගෙන් ඇසුවේය. එවිට මීකල් ඔහුට
මෙසේ කීවාය. “‘මට දැන් යන්න
දෙන්න. ඔබ මට යන්න දුන්නේ
නැත්නම් මම ඔබව මරලා දානවා’
කියා දාවිත් මට තර්ජනය කළා.”

**18** දාවිත් සාවුල් රජුගෙන් ගැලවී[8]
රාමාහි[9] සාමුවෙල් සිටි ස්ථානයට
ගොස් සාවුල් රජු තමාට කළ සියල්ල
ගැන ඔහුට කීවේය. ඉන්පසු දාවිත්,
සාමුවෙල් සමඟ නායොත්[10] නම්
ස්ථානය වෙත ගොස් එහි ජීවත්
විය. **19** ටික කලකට පසු, “දාවිත්
දැන් ඉන්නේ රාමාහි නායොත් කියන
ස්ථානයේ” බව සාවුල් රජුට ආරංචි
විය. **20** එවිට සාවුල් රජ විගස
තම සේවකයන්ව එතැනට යැව්වේය.

**19 පරි.**
**1** 1සාමු 17:49
**2** නික් 14:13
1සාමු 11:13
1සාමු 14:45
1ලේක 11:14
**3** ගීතා 69:4
යොහ 15:25
**4** 1සාමු 20:32
යෙරෙ 26:15
මතෙ 27:4
**5** ද්වි 6:13
1සාමු 14:39
යෙරෙ 10:10
**6** 1සාමු 16:21
1සාමු 18:2
1සාමු 18:13
**7** ද්වි 7:2
ගීතා 27:3
**8** ලෙවී 26:7
**9** 1සාමු 16:14
1සාමු 18:10
යෝබ 34:12
හෙබ්‍රෙ 3:12
**10** 1සාමු 18:11
1සාමු 19:6
ගීතා 5:6
දේශ 4:13
**11** ගීතා 18:17
ගීතා 34:19
යෙසා 54:17
**12** ගීතා 18:2
ගීතා 18:48
ගීතා 59:16
ගීතා 124:7
මතෙ 10:23
**13** ගීතා 59:පෙර
ගීතා 59:3

**2 තීරුව**
**1** විනි 16:2
**2** යොෂු 2:15
ක්‍රියා 9:25
2කොරි 11:33
**3** උත් 31:19
උත් 31:30
විනි 17:5
1සාමු 15:23
2රාජා 23:24
හොෂෙ 3:4
**4** යොෂු 2:5
මතෙ 10:16
**5** 1සාමු 18:9
ගීතා 37:12
හිතෝ 27:4
**6** 1සාමු 28:12
**7** 1සාමු 18:29
**8** ගීතා 144:2
**9** 1සාමු 7:17
හිතෝ 17:17
**10** 1සාමු 20:1

1සාමු **19:9*** 1සාමු 16:14හි පාදසටහන බලන්න.

ඔවුහු එතැනට ගිය විට වයස්ගත
අනාගතවක්තෘවරුන් කණ්ඩායමක්
අනාවැකි කියමින් සිටියෝය. සාමු-
වෙල්ද ඔවුන් අතරේ පෙරමුණ ගෙන
කටයුතු කරමින් සිටියේය. සාවුල්
රජුගේ සේවකයන් එතැනට ගිය
විට දෙවිගේ බලය[1] ඔවුන් තුළ
ක්‍රියාත්මක වී ඔවුහු වියරුවෙන්*[2]
හැසිරෙන්න පටන්ගත්තෝය.
**21** මේ ගැන සාවුල් රජුට දැන්වූ
විට ඔහු තවත් සේවකයන් කිහිප-
දෙනෙකුව ඒ ස්ථානයට යැව්-
වේය. ඔවුහුද වියරුවෙන් හැසිරෙන්න
පටන්ගත්තෝය. පසුව සාවුල් රජ
තුන්වෙනි වරටත් සේවකයන්ව යැව්-
වේය. ඔවුහුද එලෙසම හැසිරුණෝය.
**22** අන්තිමට සාවුල් රජද රාමා බලා
පිටත් විය. රජ සේකුහි තිබෙන විශාල
පොකුණ ළඟට පැමිණ එතැන සිටි
අයගෙන් මෙසේ ඇසුවේය. “සාමු-
වෙල් හා දාවිත් කොහෙද ඉන්-
නේ?” එවිට ඔවුහු, “ඔවුන් ඉන්නේ
රාමාහි නායොත්[3] කියන ස්ථානයේ”
කියා ඔහුට පැවසුවෝය. **23** එබැ-
වින් ඔහු එතැන සිට නායොත් බලා
ගමන් කළේය. ඔහු ගමන් කරමින්
සිටියදී ඔහු තුළත් දෙවිගේ බලය[4]
ක්‍රියාත්මක වීමට පටන්ගත්තේය. ඒ
නිසා රාමාහි නායොත් නම් ස්ථාන-
යට පැමිණෙන තෙක්ම ඔහු වියරු-
වෙන් හැසිරුණේය. **24** සාවුල් රජ,
සාමුවෙල් ඉදිරියේ තම වස්ත්‍ර ගලවා
වියරුවෙන් හැසිරුණේය. පසුවදා
උදෑසන වන තෙක්ම ඔහු නිර්වස්ත්‍රව
බිම වැතිරී සිටියේය.[5] “සාවුලුත් අනා-
ගතවක්තෘ කෙනෙක්ද”[6] යන කියමන
ප්‍රසිද්ධ වූයේ ඒ නිසාය.

**20** දාවිත් රාමාහි නායොත් නම්
ස්ථානයෙන් පලා ගියේය.[7]
ඔහු යොනාතාන් ළඟට පැමිණ,
“මම ඔබේ පියාට විරුද්ධව කළ
වරද මොකද්ද?[8] මම මොන අපරාධ-
යක් කළාටද ඔහු මාව මරන්න
හදන්නේ” කියා ඔහුගෙන් ඇසුවේය.
**2** එවිට යොනාතාන් ඔහුට මෙසේ
කීවේය. “මට ඒක විශ්වාස කරන්න
බැහැ.[1] මගේ පියා ඔබව මරන්න
හදනවා නම් ඒ ගැන ඔහු මට
නොකියා ඉදියිද? ඔහු මට කියන්-
නේ නැතුව කිසිම දෙයක් කරන්නේ
නැහැ.[2] භය වෙන්න එපා. ඔහු ඔබව
මරන්නේ නැහැ.” **3** නමුත් දාවිත්
ඔහුට මෙසේ කීවේය. “ඔබ මට ගො-
ඩක් ආදරෙයි කියලා ඔබේ පියා දන්-
නවා.[3] ඒ නිසා, ‘දාවිත්ව මම මරන්න
හදනවා කියලා යොනාතාන් දැන-
ගත්තොත් ඔහුට දුක හිතෙයි. ඒ
හින්දා ඔහුට ඒ ගැන දැනගන්න ඉඩ
තියන්න හොඳ නැහැ’ කියලා ඔහු
හිතන්න ඇති. ජීවමාන දෙවි වන යෙ-
හෝවා ඉදිරියෙන්[4] ඔබ ඉදිරියෙන්[5]
මම මේ කියන දේ සත්‍යයක්.[6] කොයි
මොහොතේ හරි මගේ ජීවිතය නැති
වෙන බව නම් මට විශ්වාසයි.”[7]
**4** ඉන්පසු යොනාතාන්, “ඔබ
කියන ඕනෑම දෙයක් මම කරන්-
නම්” කියා දාවිත්ට කීවේය. **5** එවිට
දාවිත් ඔහුට මෙසේ කීවේය. “හෙට
නව සඳ[8] පායන දවස. ඒ නිසා මම රජු
සමඟ කෑමට ඉඳගත යුතුයි. නමුත්
මාලිගයට යන්නේ නැතුව කෙතට
ගිහින් දවස් තුනක් එහි හැංගිලා
ඉන්න මට අවසර දෙන්න. අනිද්දා
හවස් වෙනකම්ම මම කෙතේ හැංගිලා
ඉන්නම්.[9] **6** ඔබේ පියා මම කො-
හේද කියලා ඇහුවොත් ඔබ මෙ-
හෙම කියන්න. ‘දාවිත් ඔහුගේ නුවර
වන බෙත්ලෙහෙමට[10] යන්න මගෙන්
අවසර ඉල්ලුවා. හැම අවුරුද්දකම
ඔහුගේ පවුලේ අය එහිදී පූජාවක්
ඔප්පු කරනවා. ඒ පූජාවට සහභාගි
වෙන්න ඔහු ගියා.’[11] **7** එතකොට
ඔබේ පියා, ‘ඒකට කමක් නැහැ’
කියලා කිව්වොත් ඔබේ සේවකයා
වන මට අනතුරක් නැහැ. නමුත්
ඔහුට කේන්ති ගියොත් ඔහු මාව
මරන්න තීරණය කරලා තියෙන බව
ස්ථිරයි.[12] **8** යෙහෝවා දෙවි ඉදිරි-
යේ ඔබ මා සමඟ ගිවිසුමක්[13] ඇති

**19 පරි.**
**1** ගණන් 11:25, යෝවෙ 2:28
**2** 1සාමු 10:5, 1සාමු 10:6, 1සාමු 10:10
**3** 1සාමු 19:18
**4** 1සාමු 19:20
**5** යෙසා 20:2, මීකා 1:8
**6** 1සාමු 10:11

**20 පරි.**
**7** 1සාමු 19:10, 1සාමු 23:26, 2පේතෘ 2:9
**8** 1සාමු 12:3, 1සාමු 24:11, ගීතා 7:3, ගීතා 18:20

**2 තීරුව**
**1** 1සාමු 19:6
**2** 1සාමු 20:12
**3** 1සාමු 18:1, 1සාමු 19:2
**4** 2සාමු 15:21, 2රාජා 2:2, යෙරෙ 10:10, යෙරෙ 38:16
**5** 1සාමු 1:26, 1සාමු 17:55
**6** ද්වි 6:13, හෙබ්‍රෙ 6:16
**7** 1සාමු 27:1, ගීතා 116:3, 2කොරි 1:9
**8** ගණන් 10:10, ගණන් 28:11, 2රාජා 4:23, 1ලේක 23:31, 2ලේක 2:4, නෙහෙ 10:33, කොලො 2:16
**9** 1සාමු 19:2, හිතෝ 22:3
**10** 1සාමු 16:4, 1සාමු 16:18, යොහ 7:42
**11** 1සාමු 9:12, 1සාමු 20:29
**12** එස්ත 7:7, දේශ 4:13
**13** ගණන් 30:2, 1සාමු 18:3, 1සාමු 23:18

**1සාමු 19:20*** 1සාමු 18:10හි පාදසටහන බලන්න.

කරගත් බව අමතක කරන්න එපා. ඒ
නිසා දැන් ඔබේ සේවකයා වන මට
ප්‍රේමය* පෙන්වන්න.[1] නමුත් ඔබ
හිතනවා නම් ඇත්තටම මගේ අතේ
වරදක් තියෙනවා කියලා[2] මාව ඔබේ
පියා ළඟට ගෙන යන්න අවශ්‍ය නැහැ.
ඔබම මාව මරලා දාන්න."
**9** එවිට යොනාතාන් දාවිත්ට
මෙසේ කීවේය. "ඔබේ අතේ කිසි වර-
දක් නැහැ. ඒ නිසා මට කවදාවත් ඒ
වගේ දෙයක් කරන්න බැහැ. මගේ
පියා ඔබට අනතුරක් කරන්න හදන
බව මම දැනගත්තොත් ඒක ඔබට
නොකියා ඉදියි කියලා ඔබ හිත-
නවාද?"[3] **10** එවිට දාවිත් යොනා-
තාන්ගෙන් මෙසේ ඇසුවේය. "ඔබේ
පියා කේන්තියෙන් කතා කළාද නැද්ද
කියලා මට ඇවිත් කියන්නේ කවුද?"
**11** එවිට යොනාතාන්, "එන්න, අපි
දෙන්නා දැන් කෙතට යමු" යයි කිය-
මින් දාවිත් සමඟ කෙතට ගියේය.
**12** යොනාතාන් මෙසේ කීවේය. "මම
හෙට නැත්නම් අනිද්දා මේ වෙලාවට
මගේ පියා සමඟ කතා කරලා ඔහුගේ
හිතේ තියෙන්නේ මොනවාද කියලා
දැනගන්නම්. ඔහුගේ හිතේ ඔබ ගැන
අමනාපයක් නැත්නම් මම ඔබට
ඒ ගැන දන්වන්නම්. මම ඔබට
දුන් මේ පොරොන්දුවට ඊශ්‍රායෙල්හි
දෙවි වන යෙහෝවා[4] සාක්ෂිකරු-
වෙක්.[5] **13** මගේ පියා ඔබට අනතු-
රක් කරන්න යන බව මම දැන
දැනත් ඒ ගැන ඔබට නොකියා
ඔබව සමාදානයෙන් පිටත් කර හැරි-
යොත් යෙහෝවා දෙවිගෙන් මට දඬු-
වම් ලැබේවා![6] යෙහෝවා දෙවි මගේ
පියාට ආශීර්වාද කළ ලෙසම[7] දෙවි-
ගෙන් ඔබටත් ආශීර්වාද ලැබේවා
කියලා මම ප්‍රාර්ථනා කරනවා.[8]
**14** යෙහෝවා දෙවි වගේ ඔබත් මගේ
ජීවිත කාලය පුරාම[9] මාව කිසිදා අත්
නොහැර මා සමඟ විශ්වාසවන්තව
කටයුතු කරන්න. එතකොට මගේ
ජීවිතය රැකෙයි.[10] **15** ඔබ කවදා-
වත් මගේ පවුලේ අයට ප්‍රේමණීයව*
සලකන්න අමතක කරන්නේ නැහැ
කියලා මට පොරොන්දු වෙන්න.[1] යෙ-
හෝවා දෙවි ඔබේ සියලු සතුරන්ව
විනාශ කළ පසුත් **16** මගේ පවු-
ලේ අයව ඔබේ පවුලෙන් ඉවත්
කරන්නේ නැහැ කියලා මට පො-
රොන්දු වෙන්න.[2] ඔබේ සතුරන්ගේ
ක්‍රියාවන් නිසා ඒ පොරොන්දුව කඩ
වුණොත් ඔවුන් යෙහෝවා දෙවිට
ගණන් දිය යුතුයි." **17** මෙසේ යො-
නාතාන් නැවත දාවිත්ට දිවුරා පො-
රොන්දු වුණේය. මන්ද ඔහු තමාගේ
පණට මෙන් දාවිත්ට ප්‍රේම කළේය.[3]
**18** ඉන්පසු යොනාතාන් තවදුර-
ටත් මෙසේ කීවේය. "හෙට නව
සඳ[4] පායන දවසයි. ඔබ ඉඳගන්න
තැන හෙට හිස්ව තියෙන නිසා
ඔබ ආවේ නැති බව මගේ පියා
දැනගනී. **19** අනිද්දා වෙද්දී ඔබ
ආවේ නැත්තේ ඇයි කියලා හොයලා
බලයි. මේ ගල ළඟ ඔබ කලින් දව-
සක* හැංගිලා හිටියා වගේ එදාටත්
හැංගිලා ඉන්න.[5] **20** මම ඉලක්-
කයකට විදිනවා වගේ ගලේ එක
පැත්තකට ඊතල තුනක් විදින්නම්.
**21** ඊටපස්සේ, 'ඊතල ටික හොයා-
ගෙන එන්න' කියලා මම මගේ
සේවකයාට කියන්නම්. 'ඊතල ටික
තියෙන්නේ ඔබට එහා පැත්තෙන්.
ඒවා අරගෙන එන්න' කියලා මම සේ-
වකයාට කිව්වොත් එයින් අදහස්
කරන්නේ මගේ පියාගෙන් ඔබට කිසි
අනතුරක් නැහැ කියන එකයි. ජීව-
මාන දෙවි වන යෙහෝවාගේ නමින්
මම ඔබට දිවුරලා කියන්නේ,[6] මම
මගේ සේවකයාට එහෙම කිව්වොත්
ඔබට සැඟවී ඉන්න තැනින් එළියට
එන්න පුළුවන්. **22** නමුත්, 'ඊතල
ටික තියෙන්නේ තව ඈතට වෙන්-
නයි' කියලා මම මගේ සේවකයාට
කිව්වොත් එයින් අදහස් කරන්නේ
යෙහෝවා දෙවි ඔබට මේ ස්ථාන-

**20 පරි.**
1 යොෂු 2:14; රූත් 1:8; හිතෝ 17:17; හිතෝ 19:22
2 1සාමු 20:1
3 1සාමු 19:2
4 නික් 34:23; ද්වි 6:13; යොෂු 24:23
5 යෝබ් 31:4; ගීතා 17:3; ගීතා 139:1
6 රූත් 1:17; 1සාමු 3:17; 1සාමු 25:22; 2සාමු 3:9
7 1සාමු 10:7; 1සාමු 11:6; 1සාමු 14:47; 2සාමු 1:22
8 1සාමු 16:13; 1සාමු 17:37
9 යොහ 15:13
10 2සාමු 9:3; 2සාමු 9:7

**2 තීරුව**
1 2සාමු 9:1; 2සාමු 21:7
2 1සාමු 18:3; 2සාමු 21:7
3 1සාමු 18:1; 2සාමු 1:26; හිතෝ 18:24
4 1සාමු 20:5; එස්රා 3:5; යෙසා 1:13
5 1සාමු 19:2; 1සාමු 20:5
6 ද්වි 6:13; ද්වි 10:20; විනි 8:19; 1සාමු 14:39; 1සාමු 19:6; 1සාමු 20:3; 1සාමු 25:26; මතෙ 5:33

1සාමු **20:8*** හෝ, "ළැදි ප්‍රේමය."

1සාමු **20:15*** හෝ, "ළැදි ප්‍රේමයකින්."
**19*** මූ.අ., "වැඩ කරන දවසක."

යෙන් පලා යන්න කියලා කියන
බවයි. **23** අපි දෙන්නා ඇති කර-
ගත් මේ ගිවිසුමට[1] යෙහෝවා දෙවි
හැමදාටම සාක්ෂිකරුවෙක් වෙයි."[2]
**24** පසුව දාවිත් කෙතේ සැඟවු-
ණේය.[3] නව සඳ පායන දවසේදී
රජ කෑමට හිඳගත්තේය.[4] **25** රජ
වෙනදා මෙන් බිත්තිය අසල තිබූ
පුටුවෙහි හිඳගත්තේය. ඔහුට ඉදිරි-
යෙන් යොනාතාන් හිඳගෙන සිටි-
යේය. සාවුල් රජුගේ එක් පැත්තක
අබ්නේර්ද[5] හිඳගෙන සිටියේය.
නමුත් දාවිත්ගේ පුටුව හිස්ව තිබිණ.
**26** සාවුල් රජ එදින දාවිත් කෑමට
නැවිත් සිටියේ ඇයි කියා ඇසු-
වේ නැත. මන්ද ඔහු මෙසේ සිතු-
වේය. "යම් හේතුවක් නිසා ඔහු
අපවිත්‍ර[6] වෙලා ඇති." **27** නමුත්
ඊට පසුවදාත් දාවිත්ගේ පුටුව
හිස්ව තිබුණු බැවින් සාවුල් රජ
තම පුත් යොනාතාන්ගෙන් මෙසේ
ඇසුවේය. "යෙස්සේගේ පුතා[7] මේ
දවස් දෙකේම කෑමට ආවේ නැත්තේ
ඇයි?" **28** එවිට යොනාතාන් ඔහුට
මෙසේ කීවේය. "දාවිත් බෙත්ලෙහෙ-
මට යන්න මගෙන් අවසර ඉල්ලුවා.[8]
**29** ඔහු මට මෙහෙම කිව්වා. 'මට
ගෙදර යන්න අවසර දෙන්න. අපේ
පවුලේ අයට නුවරේදී පූජාවක් ඔප්පු
කරන්න තියෙනවා. එයට සහභාගි
වෙන්න එන්න කියා මගේ සහෝද-
රයා මට කිව්වා. ඉතින් දැන් ඔබ මට
කරුණාව පෙන්වා මගේ සහෝදර-
යන්ව මුණගැහෙන්න යන්න මට අව-
සර දෙන්න.' ඒ නිසයි ඔහු රජු
සමඟ කෑම කන්න ආවේ නැත්තේ."
**30** එවිට සාවුල් රජ මහත් කෝප-
යෙන්[9] යොනාතාන්ට මෙසේ කීවේය.
"නුඹ කැරලිකාර පුත්‍රයෙක්!*[10] යෙස්-
සේගේ පුතාගේ පැත්ත අරගෙන නුඹ
නුඹටම ලැජ්ජා කරගන්නයි හදන්-
නේ! නුඹ වැදූ මවටත්[11] නුඹ ලැජ්ජා-
වක්! **31** යෙස්සේගේ පුතා ජීවත්
වන තාක් කල් නුඹට නුඹේ රජකම
ස්ථිර කරගන්න ලැබෙන්නේ නැහැ.[1]
ඉන්න තැනකින් වහාම ඔහුව මෙතැ-
නට කැඳවන්න. ඔහුව මරා දැමිය
යුතුමයි."[2]
**32** නමුත් යොනාතාන්, "ඇයි
දාවිත්ව මරන්න හදන්නේ?[3] මොකද්ද
ඔහු කළ වරද"[4] කියා තම පියා-
ගෙන් ඇසුවේය. **33** එවිට සාවුල්
රජ යොනාතාන් දෙසට හෙල්ලය විසි
කළේය.[5] තම පියා දාවිත්ව මරන්න
තීරණය කර තිබූ බව තේරුම්ගත්[6]
**34** යොනාතාන් මහත් කෝපයෙන්[7]
යුතුව මේසයෙන් නැඟිට ගියේය.
එදින ඔහු කෑම නොකෑවේය. මන්ද
ඔහුගේ පියා දාවිත්ට නින්දා කළ
බැවින්[8] ඔහු ඉතා දුකෙන් සිටියේය.[9]
**35** පසුවදා උදැසන යොනාතාන්
දාවිත්ට පොරොන්දු වූ ලෙස තම සේ-
වකයෙකු සමඟ කෙතට ගියේය.[10]
**36** ඔහුද, "ඉක්මන් කරන්න. ගොස්
මම විදින ඊතල හොයාගෙන එන්න"[11]
කියා තම සේවකයාට කීවේය. සේ-
වකයා දුවගෙන යද්දී යොනාතාන්
ඔහුව පසු කරගෙන යන ලෙසට ඊත-
ලය විද්දේය. **37** සේවකයා ඊතලය
තිබුණු තැනට පැමිණි විට යොනා-
තාන් ශබ්ද නඟා මෙසේ කීවේය. "ඊත-
ලය තියෙන්නේ ඔතන නෙමෙයි. ඒක
තියෙන්නේ තව ඈතට වෙන්න.[12]
**38** ඉක්මන් කරන්න. බලං ඉන්-
නේ නැතුව දුවලා යන්න." සේවක-
යාද ඊතල ටික අහුලගෙන ඇවිත්
තම ස්වාමියාට දුන්නේය. **39** යො-
නාතාන් කී දේවල අර්ථය දැන
සිටියේ ඔහු සහ දාවිත් පමණය. ඔහු-
ගේ සේවකයා ඒ කිසිවක් දැන සිටි-
යේ නැත. **40** ඉන්පසු යොනාතාන්
තම ආයුධ ටික සේවකයාට දී ඔහුට
මෙසේ කීවේය. "මේවා අරගෙන නුව-
රට යන්න."
**41** දාවිත්, යොනාතාන් සිටි ස්ථා-
නයෙන් දකුණු දෙසට වෙන්න
සැඟවී සිටියේය. සේවකයා එතැනින්
පිටත්ව ගිය පසු දාවිත් සැඟවී සිටි
තැනින් පිටතට පැමිණ දණින් වැටී[13]

**20 පරි.**
1 1සාමු 20:14
2 උත් 16:5; 1සාමු 20:42
3 හිතෝ 27:12
4 1සාමු 20:5
5 1සාමු 14:50; 1සාමු 17:55
6 ලෙවී 11:24; ලෙවී 15:5; ලෙවී 15:16; ලෙවී 15:18; ගණන් 19:16
7 රූත් 4:22; 1සාමු 17:12; 1සාමු 22:7
8 1සාමු 20:6
9 හිතෝ 14:29; හිතෝ 22:24
10 හිතෝ 15:2; හිතෝ 21:24; එෆී 4:31
11 1සාමු 14:50

**2 තීරුව**
1 1සාමු 18:8
2 1සාමු 19:6; ගීතා 79:11; දේශ 4:13; දේශ 8:4
3 1සාමු 19:5; ගීතා 69:4; හිතෝ 17:17; හිතෝ 18:24
4 මතෙ 27:23; ලූක් 23:22
5 1සාමු 18:11; 1සාමු 19:10; යොහ 15:13
6 1සාමු 20:7
7 නික් 11:8; නික් 32:19; එෆී 4:26
8 1සාමු 20:33
9 1සාමු 18:1
10 1සාමු 20:19
11 1සාමු 20:20
12 1සාමු 20:22
13 උත් 43:28; 1සාමු 24:8; 1සාමු 25:23; 2සාමු 9:6

**1සාමු 20:30*** හෝ, "කැරලිකාර ස්ත්‍රියකගේ පුත්‍රයෙක්!" මෙය යොනාතාන්ට අපහාස කිරීමට කියූ දෙයකි.

තුන් වරක් හිස නමා යොනාතාන්ට
ආචාර කළේය. ඔවුහු එකිනෙකාව
සිපගනිමින්[1] බොහෝ වේලා හැඬු-
වෝය. වැඩියෙන්ම හැඬුවේ දාවිත්ය.[2]
42 එවිට යොනාතාන් මෙසේ පැවසු-
වේය. "'අපි ඇති කරගත් ගිවිසු-
මට[3] යෙහෝවා දෙවි හැමදාටම අපි
දෙන්නා ඉදිරියෙත් අපේ දරුදැරියන්
ඉදිරියෙත් සාක්ෂිකරුවෙක් වෙයි'[4]
කියා අපි දෙන්නාට දෙන්නා යෙ-
හෝවා දෙවිගේ නාමයෙන් දිවුරලා
පොරොන්දු වුණා. ඒ නිසා ඔබ දැන්
සමාදානයෙන් යන්න."[5]

පසුව දාවිත් එතැනින් පිටත්ව
ගියේය. යොනාතාන්ද නුවරට හැරී
ගියේය.

21 පසුව දාවිත් නොබ් නුව-
රේ[6] සිටි පූජක අහිමෙලෙක්[7]
වෙත ගියේය. අහිමෙලෙක් දාවිත්ව
දැක මහත් සේ භය වී ඔහුගෙන්
මෙසේ ඇසුවේය. "ඇයි ඔබ තනි-
යම මෙහෙට ආවේ?"[8] 2 එවිට දාවිත්
මෙසේ කීවේය. "රජු මට විශේෂ
වැඩක් භාර දීලා,[9] 'මම ඔබට කරන්න
අණ කළ මේ වැඩේ ගැන කාටවත්
කියන්න එපා' කියලා මට පැවසුවා.
මේ වැඩේ සඳහා මාත් එක්ක යන
අනික් පුරුෂයන්ව වෙනත් තැනකදී
හමු වෙන්න මම සැලසුම් කරලා
තියෙනවා. 3 ඉතින් ඔබ ළඟ රොටි
පහක් හරි වෙනත් කෑමක් හරි තියෙ-
නවා නම් අපිට කන්න දෙන්න."[10]
4 එවිට පූජකයා, "නිකං රොටි නම් මා
ළඟ නැහැ. මා ළඟ තියෙන්නේ දෙවිට
කැප කළ රොටි[11] විතරයි. ඔබත්
සමඟ යන පුරුෂයන් මේ දවස්වල
ස්ත්‍රීන් සමඟ සම්බන්ධකම් පවත්වා
නැත්නම්[12] ඒ රොටි දෙන්න පුළුවන්"
කියා දාවිත්ට කීවේය. 5 දාවිත් පූජ-
කයාට මෙසේ කීවේය. "සාමාන්‍යයෙන්
පුරුෂයන් යුද්දෙට යන්නේ පවිත්‍ර වෙ-
ලයි. ඒ වගේම අපි යම් රාජකාරියක
නිරත වෙද්දී ස්ත්‍රීන් සමඟ සම්බන්ධ-
කම් පවත්වන්නේ නැහැ.[13] එහෙමනම්
මේ වගේ විශේෂ වැඩකට යද්දී අපි
ඊටත් වඩා පවිත්‍රව ඉන්න උත්සාහ
කරයි කියලා ඔබ හිතන්නේ නැද්ද?"
6 එදින යෙහෝවා දෙවි ඉදිරියේ අලුත්
රොටි තබන පිණිස පරණ රොටි ඉවත්
කර තිබිණ.[1] එබැවින් පූජකයා ඒ
රොටි දාවිත්ට දුන්නේය. මන්ද දෙවි
ඉදිරියේ පිදූ රොටි[2] හැර ඔවුන්ට
කන්න දීමට වෙන කිසිවක් ඔහු ළඟ
තිබුණේ නැත.

7 සාවුල් රජුගේ සේවකයෙක් වූ
ඒදොම්[3] ජාතික දොවෙග්[4] එදින
එතැන සිටියේය. ඔහු සාවුල් රජුගේ
බැටළුවන් බලාගන්නන්ගේ ප්‍රධානි-
යාය.[5] ඔහු එදින යෙහෝවා දෙවි ඉදි-
රියේ යම් වගකීමක් ඉටු කිරීමට[6] එහි
නැවතී සිටියේය.

8 දාවිත්ද, "ඔබ ළඟ කඩුවක් හරි
හෙල්ලයක් හරි තියෙනවාද? මේ
විශේෂ වැඩේට මම හදිස්සියේ ආව
නිසා මට මගේ කඩුවවත් අනික් ආයු-
ධවත් ගන්න වෙලාවක් ලැබුණේ
නැහැ" කියා අහිමෙලෙක්ට කීවේය.
9 එවිට පූජකයා මෙසේ කීවේය. "ඔබ
ඒලාහ් තැනිතලාවේ මරලා දාපු[7]
පිලිස්තියාගේ කඩුව[8] මා ළඟ තියෙ-
නවා. ඒක රෙද්දකින් ඔතලා ඒෆොද්
හැට්ටයට[9] එහායින් තියලා තියෙ-
නවා. ඔබ කැමති නම් ඒක ගන්න.
මා ළඟ වෙන ආයුධ නම් නැහැ."
දාවිත්ද, "ගොලියත්ගේ කඩුව තරම්
හොඳ එකක් තවත් නැහැ. ඒක මට
දෙන්න" කියා පූජකයාට කීවේය.

10 ඉන්පසු දාවිත් සාවුල් රජු-
ගෙන් ගැලවෙන පිණිස එතැනින් පලා
ගියේය.[10] පසුව ඔහු ගාත්හි රජු
වන ආකිෂ්[11] වෙතට පැමිණියේය.
11 එවිට ආකිෂ් රජුගේ සේවකයෝ
මෙසේ කීවෝය. "මේ ඊශ්‍රායෙල් දේශ-
යේ රජු වන දාවිත්[12] නේද? මිනිස්සු ගී
ගයමින් නටමින්,[13]

'සාවුල් දහස් ගණන් මැරුවෝය.
දාවිත් දසදහස් ගණන් මැරු-
වෝය' කියා කිව්වේ ඔහු
ගැන නේද?"[14]

20 පරි.
1 උත් 29:13
උත් 45:15
1සාමු 10:1
2සාමු 19:39
ක්‍රියා 20:37
2 2සාමු 1:26
3 1සාමු 20:17
1සාමු 20:23
4 1සාමු 20:23
1සාමු 23:18
2සාමු 9:7
5 ගණන් 6:26
1සාමු 1:17
ලූක් 7:50
ක්‍රියා 16:36

21 පරි.
6 1සාමු 22:19
නෙහෙ 11:32
යෙසා 10:32
7 1සාමු 22:9
8 1සාමු 18:13
9 මතෙ 10:16
10 ගීතා 37:25
11 නික් 25:30
ලෙවී 24:5
ලෙවී 24:9
මතෙ 12:4
ලූක් 6:4
12 නික් 19:15
ලෙවී 15:16
2සාමු 11:11
13 ලෙවී 15:18
ද්වි 23:10

2 තීරුව
1 ලෙවී 24:8
2 ලෙවී 24:9
මතෙ 12:4
මාක් 2:26
ලූක් 6:4
3 උත් 36:1
නික් 12:49
ලෙවී 19:34
ද්වි 2:4
1සාමු 14:47
4 1සාමු 22:9
ගීතා 52:පෙර
5 1සාමු 8:17
1සාමු 11:5
1ලේක 27:29
2ලේක 26:10
6 ලෙවී 13:2
ගණන් 5:2
ගීතා 66:13
7 1සාමු 17:2
1සාමු 17:50
8 1සාමු 17:51
1සාමු 17:54
9 නික් 28:6
10 1සාමු 27:1
11 යොෂු 11:22
1සාමු 5:8
1සාමු 17:4
1සාමු 27:2
1රාජා 2:39
2රාජා 12:17
ගීතා 56:පෙර

12 1සාමු 16:1; 1සාමු 16:13; 1සාමු 18:8; 13 1සාමු 18:6; ගීතා 150:4; යෙරෙ 31:4; 14 1සාමු 18:7; 1සාමු 29:5.

**12** තමා ගැන පැවසූ දේවල් අසා
දාවිත්ට ගාත්හි රජු වන ආකිෂ් ගැන
මහත් භයක් දැනුණේය.[1] **13** එබැ-
වින් ඔවුන් දාවිත්ව අල්ලාගත් විට
ඔහු දොරවල් සූරමින් රැවුල දිගේ
කෙළ පෙරාගනිමින් ඔවුන් ඉදිරියේ[2]
පිස්සෙක් මෙන්[3] හැසිරීමට පටන්ගත්-
තේය. **14** ආකිෂ් රජ තම සේවක-
යන්ට මෙසේ කීවේය. "මේ මිනිහා
පිස්සෙක් කියා ඔබට පෙනෙන්නේ
නැද්ද? ඔහුව මා ඉදිරියට ගෙනාවේ
ඇයි? **15** මේ වගේ කෙනෙක්ගෙන්
මට කිසි ප්‍රයෝජනයක් තියෙනවාද?
පිස්සෙක්ව මගේ ගෙදරට වැද්දගන්න
කියාද ඔබ මට කියන්නේ?"

**22** දාවිත් එතැනින් පලා ගොස්[4]
අදුල්ලාම්හි[5] ගුහාව වෙත
පැමිණියේය.[6] ඒ ගැන ආරංචි වූ විට
ඔහුගේ සහෝදරයෝද ඔහුගේ පියාගේ
සියලු ගෙයි වැසියෝද ඔහුව හමු වීමට
එතැනට ගියෝය. **2** විපතට පත් වූ
මනුෂ්‍යයන් සියලුදෙනාද ණය බරින්
මිරිකී සිටි[7] සියල්ලෝද විවිධ ප්‍රශ්න
ගැටලු නිසා කලකිරී සිටි[8] සියල්ලෝද
දාවිත් වෙතට ගියෝය.[9] ඔහු වෙත
පැමිණි පුරුෂයන්ගේ ගණන හාරසිය-
යක් පමණ විය. දාවිත් ඔවුන්ගේ නාය-
කයා ලෙස කටයුතු කළේය.[10]

**3** පසුව දාවිත් මෝවබ්හි මිෂ්පේ
නම් ස්ථානය වෙතට ගොස් මෝ-
වබ්හි[11] රජුට මෙසේ කීවේය. "දෙවිගේ
කැමැත්ත කුමක්ද කියා මම දැන-
ගන්න තුරු මගේ මවටයි පියාටයි[12]
ඔබේ සෙනඟ සමඟ ජීවත් වෙන්න
ඉඩ දෙන්න." **4** ඉන්පසු දාවිත් තම
දෙමාපියන්ව මෝවබ් රජු වෙතට ගෙ-
නාවේය. දාවිත් දුෂ්කර ස්ථානවල
සැඟවී සිටි කාලයේදී[13] ඔවුහු ඒ රජුගේ
දේශයේ ජීවත් වූහ.

**5** කලක් ගෙවුණු පසු අනාගත-
වක්තෘවරයෙකු වූ ගාද්[14] දාවිත්ට
මෙසේ කීවේය. "ඔබ සැඟවී සිටින
තැනින් ඉවතට ඇවිත් යූදා දේශයට[15]
යන්න." එබැවින් දාවිත් තමා සිටි
තැනින් පිටත්ව හෙරෙත් නම් කැලෑ-
වට ගියේය.

**6** සාවුල් රජු ගිබෙයාහි කන්දක
පිහිටි කිහිරි ගස*[1] යට හිඳගෙන සිටි-
යදී දාවිත්ව සහ ඔහු සමඟ සිටි සෙ-
නඟව සොයාගත් බව රජුට ආරංචි
විය. ඒ අවස්ථාවේදී සාවුල් රජුගේ
සියලු සේවකයෝ ඔහු සමඟ සිටි-
යෝය. ඔහුගේ අතේ හෙල්ලයක්ද[2]
තිබිණ. **7** එවිට සාවුල් රජ ඔහුගේ
සේවකයන්ට මෙසේ කීවේය. "බෙන්-
ජමින්වරුනි, මම දැන් කියන දේට
සවන් දෙන්න. යෙස්සේගේ පුතාට[3]
පුළුවන්ද ඔබට කෙත් හා මිදිවතු[4]
දෙන්න? දහසකින් යුත් කණ්ඩායම්-
වල[5] සහ සියයකින් යුත් කණ්ඩායම්-
වල ප්‍රධානීන් ලෙස ඔහු ඔබව පත්
කරයි කියලා හිතනවාද? **8** මෙ-
තැන ඉන්න සෑම කෙනෙක්ම මට
විරුද්ධව කුමන්ත්‍රණය කළා. මගේම
පුතා පවා යෙස්සේගේ පුතා සමඟ
ගිවිසුමක්[6] ඇති කරගත්තා. සතුරෙක්
වගේ මාව අල්ලගන්න මඟ රැක
සිටින මගේ සේවකයාට ඔහු උදව්
කරනවා. ඔබ හැමෝම ඒ ගැන
මගෙන් හැංගුවා.[7] කිසි කෙනෙකුට මා
ගැන කිසිම අනුකම්පාවක් නැහැ."

**9** එවිට සාවුල් රජුගේ සේවකයන්-
ගේ ප්‍රධානියෙක් වූ ඒදොම් ජාතික
දොවෙග්[8] සාවුල් රජුට මෙසේ කීවේය.
"යෙස්සේගේ පුතා නොබ් වෙතට
ඇවිත් අහිතුබ්ගේ පුතා[9] වන අහිමෙ-
ලෙක්[10] ළඟට යනවා මම දැක්කා.
**10** අහිමෙලෙක් දාවිත් වෙනුවෙන්
යෙහෝවා දෙවිගෙන් විමසුවා.[11] ඔහු
දාවිත්ට කන්න දීලා[12] ගොලියත්ගේ
කඩුවත්[13] ඔහුට දුන්නා." **11** එවිට
රජ අහිතුබ්ගේ පුත්‍රයා වන අහිමෙ-
ලෙක්වද නොබ්හි[14] සිටි ඔහුගේ පියා-
ගේ සියලු ගෙයි වැසියන්වද ඔහු වෙත
කැඳවාගෙන ඒමට අණ කළේය.
පසුව ඔවුහු සියලුදෙනාම රජු ඉදිරියට
ආවෝය.

**21 පරි.**
**1** ගීතා 56:3
**2** ගීතා 56:6
**3** ගීතා 34:පෙර මතෙ 10:16

**22 පරි.**
**4** 1සාමු 21:10
**5** උත් 38:1 යොෂු 15:35 2සාමු 23:13 1ලේක 11:15 මීකා 1:15
**6** ගීතා 34:19 ගීතා 56:13 ගීතා 57:පෙර ගීතා 142:පෙර හෙබ්‍රෙ 11:38
**7** ආමො 2:6 මතෙ 18:26
**8** විනි 11:3 මතෙ 11:28
**9** ගීතා 142:7
**10** 1සාමු 30:22 2සාමු 5:2 1ලේක 11:15
**11** රූත් 4:10 රූත් 4:17 1සාමු 14:47 1සාමු 20:33
**12** උත් 47:11 නික් 20:12 හිතෝ 23:24 මතෙ 19:19
**13** 1සාමු 22:1 2සාමු 23:13 ගීතා 57:1 ගීතා 142:පෙර
**14** 2සාමු 24:11 1ලේක 21:9 1ලේක 29:29 2ලේක 29:25
**15** 1සාමු 23:3

**2 තීරුව**
**1** උත් 21:33 1සාමු 31:13 1ලේක 10:12
**2** 1සාමු 18:10 1සාමු 19:9 1සාමු 20:33
**3** රූත් 4:22 1සාමු 20:27 1සාමු 25:10
**4** 1සාමු 8:14
**5** නික් 18:21 1සාමු 8:12
**6** 1සාමු 18:3 1සාමු 20:17
**7** 1සාමු 17:31 හිතෝ 15:22
**8** 1සාමු 21:7 ගීතා 52:පෙර
**9** 1සාමු 14:3 1සාමු 22:20
**10** 1සාමු 21:1

**11** නික් 20:16; ගීතා 52:2; ගීතා 52:3; හිතෝ 19:5; හිතෝ 25:18; හිතෝ 29:12; එස 22:9; මතෙ 26:59; **12** 1සාමු 21:6; **13** 1සාමු 21:9; **14** 1සාමු 21:1.

1සාමු **22:6*** මූ.අ., "ටැමරිස්ක් ගස."

**12** එවිට සාවුල් රජ, “අහිතුබ්-
ගේ පුත්‍රය, මට සවන් දෙන්න”
කියා අහිමෙලෙක්ට කීවේය. අහිමෙ-
ලෙක්ද, “ඔබේ සේවකයාට කියන්න
තියෙන්නේ කුමක්ද” කියා ඇසුවේය.
**13** එවිට සාවුල් රජ මෙසේ කීවේය.
“ඇයි ඔබ යෙස්සේගේ පුතා සමඟ
එකතු වී මට විරුද්ධව කුමන්ත්‍ර-
ණය කළේ?[1] මාව අල්ලගන්න මඟ
රැක සිටින මගේ සතුරාට කෑම හා
කඩුවක් දීලා ඔහු වෙනුවෙන් දෙවි-
ගෙන් විමසන්න පවා ඔබ පෙලඹු-
ණේ ඇයි?”[2] **14** එවිට අහිමෙලෙක්
රජුට මෙසේ කීවේය. “රජුගේ සේවක-
යන් අතරේ දාවිත් තරම් විශ්වාස-
වන්ත[3] කෙනෙක් තවත් නැහැ.[4] ඔහු
ඔබේම බෑනා.[5] ඒ වගේම ඔබේ ආරක්-
ෂක නිලධාරීන්ගේ ප්‍රධානියා. ඔහු
ඔබේ නිවසේ සියලුදෙනාගේම ගෞර-
වය දිනාගෙන තියෙනවා.[6] **15** මම
ඔහු වෙනුවෙන් දෙවිගෙන් විමසන්න[7]
පටන්ගත්තේ අද ඊයේ නෙවෙයි.
අනේ, මගේ ස්වාමීනි, ඔබ පවසන මේ
කිසිවක් ගැන මම කලින් දැනගෙන
හිටියේ නැහැ.[8] රජතුමනි, මම ඔබට
විරුද්ධව කුමන්ත්‍රණය කරනවා තියා
එහෙම දෙයක් ගැන කවදාවත් හිත-
ලාවත් නැහැ. අනේ, ඔබේ සේවකයා
වන මටවත් මගේ පවුලේ අයටවත්
විරුද්ධව ඒ වගේ චෝදනාවක් නම්
එල්ල කරන්න එපා.”

**16** නමුත් රජ, “මම ඔබවත් ඔබේ
පියාගේ සියලු ගෙයි වැසියන්වත්[9]
මරලා දානවා”[10] කියා අහිමෙලෙක්ට
කීවේය. **17** එසේ කී පසු රජ ඔහු
ඉදිරියේ සිටි ආරක්ෂක නිලධාරීන්ට[11]
මෙසේ කීවේය. “මෙතැන ඉන්න යෙ-
හෝවා දෙවිගේ පූජකයන්ව මරලා
දාන්න. ඔවුන් සහයෝගය දෙන්නේ
දාවිත්ට. ඔවුන් දාවිත් පලා යන බව
දැන දැනත් මට ඒ ගැන කිසිම දෙයක්
කිව්වේ නැහැ.”[12] නමුත් සාවුල් රජුගේ
සේවකයෝ යෙහෝවා දෙවිගේ පූජ-
කයන්ට විරුද්ධව අත ඔසවන්න
අකමැති වූහ.[13] **18** එබැවින් රජ,
දොවෙග්ට[14] මෙසේ අණ කළේය. “මේ
පූජකයන්ව මරලා දාන්න!” ඒදොම්
ජාතික[1] දොවෙග් විගස පූජකයන්ට
පහර දී ඔවුන්ව මරා දැමුවේය.[2]
එදින ඔහු ලිනන් රෙදිවලින් මැසූ
ඒෆොද් හැට්ට[3] ඇඳගෙන සිටි පූජක-
යන් අසූපස්දෙනෙකුව මරා දැමුවේය.
**19** පූජකයන්ගේ නුවර වන නොබ්-
වද[4] පහර දී එහි සිටි පුරුෂයන්වද
ස්ත්‍රීන්වද දරුවන්වද කිරිදරුවන්වද
ගවයන්වද බූරුවන්වද බැටළුවන්වද
ඔහු කඩුවෙන් මරා දැමුවේය.

**20** එහෙත් අහිතුබ්ගේ පුත් වන
අහිමෙලෙක්ගේ එක් පුත්‍රයෙක් එතැ-
නින් ගැලවී ගියේය. ඔහුගේ නම අබි-
යාතර්ය.[5] ඔහු එතැනින් බේරී දාවිත්
ළඟට ගියේය. **21** ඔහු දාවිත් වෙ-
නට පැමිණ, “සාවුල් රජු යෙහෝවා
දෙවිගේ පූජකයන් සියලුදෙනාවම
මරලා දැම්මා” කියා දැනුම් දුන්නේය.
**22** එවිට දාවිත්, “ඔබේ පියාගේ ගෙයි
වැසියන් සියලුදෙනාගේම මරණයට
වග කිව යුත්තේ මමයි. එදා පූජකයා
ළඟට මම ගිය වෙලාවේ ඒදොම්
ජාතික දොවෙග් එතැන ඉන්නවා මම
දැක්කා. මම එතැනට ආ වග ඔහු
සාවුල් රජුට කියයි කියලා[6] මට ඒ
වෙලාවේම හිතුණා.[7] **23** දැන් භය
වෙන්න එපා. ඔබව මරන්න සොයන
සෑම කෙනෙක්ම මාවත් මරන්න සො-
යනවා. ඔබ මා සමඟ ඉන්න. මම
ඔබව ආරක්ෂා කරන්නම්”[8] කියා
කීවේය.

**23** කලක් ගෙවුණු පසු දාවිත්ට,
“පිලිස්තිවරු කෙයිලා නුව-
රට[9] විරුද්ධව යුද්ධ කරමින් එහි
කමත්වල තියෙන ධාන්‍ය කොල්ල
කනවා”[10] කියා ආරංචි විය. **2** එවිට
දාවිත්, “මම ගොස් පිලිස්තිව-
රුන්ට පහර දෙන්නද” කියා යෙ-
හෝවා දෙවිගෙන් විමසුවේය.[11]
යෙහෝවා දෙවිද, “යන්න, පිලිස්-
තිවරුන්ට පහර දී ඔවුන්ගේ
අතින් කෙයිලා නුවර බේරගන්න”
කියා දාවිත්ට කීවේය. **3** නමුත්
දාවිත් සමඟ සිටි පුරුෂයෝ ඔහුට

**22 පරි.**

**1** ගණන් 35:30, ද්වි 19:15, 1තිමෝ 5:19
**2** ගීතා 119:69
**3** 1සාමු 24:11, 1සාමු 26:23, 2සාමු 22:23
**4** 1සාමු 19:4, 1සාමු 20:32
**5** 1සාමු 17:25, 1සාමු 18:27
**6** 1සාමු 18:5, 1සාමු 18:13
**7** 1සාමු 22:10, 1සාමු 28:6
**8** 1සාමු 21:1, 1සාමු 21:2
**9** ද්වි 24:16, 1සාමු 2:32
**10** 1සාමු 14:44, 1සාමු 20:31, හිතෝ 28:5, හිතෝ 28:15
**11** 1සාමු 8:11, 2සාමු 15:1, 1රාජා 1:5, 2රාජා 10:25
**12** හිතෝ 28:16, දේශ 4:13
**13** නික් 1:17, ද්වි 19:10, ක්‍රියා 4:19, ක්‍රියා 5:29
**14** 1සාමු 22:9, ගීතා 52:පෙර

**2 තීරුව**

**1** උත් 25:30, උත් 36:43, ගණන් 24:18, 2රාජා 8:21
**2** 1සාමු 2:31, 2ලේක 24:21, හිතෝ 29:10
**3** 1සාමු 2:28
**4** 1සාමු 21:1, 1සාමු 22:9
**5** 1සාමු 2:31, 1සාමු 14:3, 1සාමු 23:6, 1සාමු 30:7, 2සාමු 20:25, 1රාජා 2:27
**6** හිතෝ 14:15
**7** 1සාමු 21:7
**8** 1රාජා 2:26

**23 පරි.**

**9** යොෂු 15:44, 1ලේක 4:19, නෙහෙ 3:17
**10** ලෙවී 26:16, ද්වි 28:33, විනි 6:6
**11** විනි 1:1, 1සාමු 28:6, 1සාමු 30:8, 2සාමු 5:19, ගීතා 37:5, හිතෝ 3:5

මෙසේ කීවෝය. "යූදා දේශයේ[1] මේ
පළාත්වලත් අපි ඉන්නේ භයෙන්.
ඉතින් අපි කොහොමද කෙයිලාව-
ලට ගිහින් පිලිස්තිවරුන්ට[2] විරුද්-
ධව සටන් කරන්නේ?" **4** එබැවින්
දාවිත් නැවතත් යෙහෝවා දෙවි-
ගෙන් විමසුවේය.[3] එවිට යෙහෝවා
දෙවි, "කෙයිලා වෙත දැන්මම යන්න.
මම පිලිස්තිවරුන්ව ඔබට යටත්
කර දෙන්නෙමි"[4] කියා පැවසුවේය.
**5** දාවිත්ද ඔහු සමඟ සිටි පුරුෂ-
යෝද කෙයිලා වෙත ගොස් පිලිස්ති-
වරුන්ට විරුද්ධව සටන් කළෝය.
ඔවුහු පිලිස්තිවරුන් විශාල සංඛ්‍යා-
වක් මරා දමා ඔවුන්ගේ සත්ව රැළවල්
අල්ලාගත්තෝය. මෙසේ දාවිත් කෙ-
යිලා නුවරේ වැසියන්ව ගලවාගත්-
තේය.[5]

**6** අහිමෙලෙක්ගේ පුත්‍රයා වූ අබියා-
තර්[6] කෙයිලා නුවරේ සිටි දාවිත්
වෙත පලා ගිය අවස්ථාවේදී ඔහු
ඒෆොද් හැට්ටයත්[7] රැගෙන ගියේය.
**7** ටික කාලයකට පසු දාවිත් කෙ-
යිලා නුවරේ[8] සිටින බව සාවුල් රජුට
ආරංචි විය. එවිට සාවුල් රජ, "දෙවි
දාවිත්ව මගේ අතට හසු කර දුන්නා.[9]
ඔහු දොරටු තියෙන නුවරකට ඇතුල්
වී සිටින නිසා දැන් එහි කොටු වෙලා
ඇති" කියා සිතුවේය. **8** එබැවින්
සාවුල් රජ තම හමුදාව යුද්ධයට රැස්
කරගෙන දාවිත්ව සහ ඔහුගේ සෙ-
නඟව වැටලීමට කෙයිලා නුවර වෙත
ගියේය. **9** තමාව අල්ලාගැනීමට
සාවුල් රජු උගුලක් අටවන[10] බව
දාවිත්ට දැනගන්න ලැබිණ. එබැවින්
දාවිත්, "ඒෆොද් හැට්ටය මෙතැනට
ගෙනෙන්න"[11] කියා පූජක අබියාතර්ට
කීවේය. **10** ඉන්පසු දාවිත් දෙවි-
ගෙන් මෙසේ විමසුවේය. "ඊශ්‍රායෙල්හි
දෙවි වන යෙහෝවා,[12] සාවුල් රජු
මා නිසා මේ මුළු නුවරම විනාශ
කරන්න එන බව මට ආරංචි වුණා.[13]
**11** සාවුල් රජු ඇත්තටම මෙම ස්ථා-
නයට පැමිණෙයිද? කෙයිලා නුවරේ
වැසියන් මාව සාවුල් රජුගේ අතට
භාර දෙයිද? අනේ, ඊශ්‍රායෙල්හි දෙවි
වන යෙහෝවා, ඔබේ සේවකයාට
පිළිතුරු දෙන්න." එවිට යෙහෝවා
දෙවි, "සාවුල් රජු ඔබ සිටින ස්ථා-
නයට පැමිණෙයි"[1] කියා කීවේය.
**12** දාවිත් නැවතත්, "කෙයිලා නුවරේ
වැසියන් මාවත් මගේ සෙනඟවත්
සාවුල් රජුගේ අතට භාර දෙයිද" කියා
දෙවිගෙන් ඇසුවේය. යෙහෝවා දෙ-
විද, "ඔව්, ඔවුන් ඔබ සියලුදෙනාවම
සාවුල් රජුගේ අතට භාර දෙනු ඇත"[2]
කියා කීවේය.

**13** එය ඇසූ විගස දාවිත්ද ඔහු
සමඟ සිටි හයසියයක් පමණ සෙ-
නඟද[3] කෙයිලා නුවරින් පිටත්ව
ගොස් තැනින් තැන ජීවත් වූහ.
දාවිත්, කෙයිලා වෙතින් පලා ගිය බව
සාවුල් රජුට ආරංචි වූ නිසා ඔහු කෙ-
යිලා වෙත නොගියේය. **14** දාවිත්
පාළුකරයේ දුෂ්කර ස්ථානවල ජීවත්
විය. ඔහු කලක් ෂිප් පාළුකරයේ[4] කඳු-
කර ප්‍රදේශයේ ජීවත් විය. සාවුල් රජු
නිතරම දාවිත්ව අල්ලාගැනීමට උත්-
සාහ කළ නමුත්[5] දෙවි එසේ කිරී-
මට සාවුල්ට ඉඩ දුන්නේ නැත.[6]
**15** දාවිත්, ෂිප් පාළුකරයේ හෝ-
රෙෂ්*[7] නම් ස්ථානයේ සිටි විටද
සාවුල් රජු තමාව මරන්න සෙවූ නිසා
භයෙන් ජීවත් විය.

**16** සාවුල් රජුගේ පුත් යොනා-
තාන්, දාවිත්ව හමු වීමට හෝරෙෂ්
වෙත ගියේය. ඔහු දාවිත්ව දිරිගන්ව-
මින්[8] දෙවි කෙරෙහි ඔහුට තිබූ විශ්වා-
සය ශක්තිමත් කරමින්[9] **17** මෙසේ
කීවේය. "භය වෙන්න එපා.[10] මගේ
පියාට කවදාවත් ඔබව අල්ලගන්න
ලැබෙන්නේ නැහැ. ඔබ ඊශ්‍රායෙල්හි
රජ වන බව[11] ස්ථිරයි. මම කැමැත්-
තෙන්ම ඔබට යටත් වෙනවා. මගේ
පියාත් ඒ ගැන හොඳාකාරවම දන්-
නවා."[12] **18** පසුව ඔවුහු යෙහෝවා
දෙවි ඉදිරියේ ගිවිසුමක් ඇති කරගත්-
තෝය.[13] යොනාතාන් නැවත තම

**23 පරි.**
**1** 1සාමු 22:5
**2** 1සාමු 13:5
1සාමු 14:52
**3** විනි 6:39
**4** යොෂු 8:7
විනි 7:7
1සාමු 14:6
2සාමු 5:19
2රාජා 3:18
**5** 1සාමු 22:5
1සාමු 23:1
**6** 1සාමු 22:20
**7** නික් 28:30
1සාමු 14:3
**8** 1සාමු 23:1
**9** නික් 15:9
1සාමු 23:14
ගීතා 71:11
**10** හිතෝ 12:20
හිතෝ 14:22
හිතෝ 16:30
හිතෝ 24:8
**11** ගණන් 27:21
1සාමු 30:7
**12** ගීතා 17:6
ගීතා 50:15
යෙරෙ 33:3
**13** 1සාමු 22:19
හිතෝ 28:15

**2 තීරුව**
**1** ගීතා 118:21
**2** ගීතා 31:8
ගීතා 62:2
ගීතා 94:11
ගීතා 118:8
**3** 1සාමු 22:2
1සාමු 25:13
1සාමු 30:9
**4** යොෂු 15:55
1සාමු 23:24
1සාමු 26:1
1ලේක 2:42
ගීතා 54:පෙර
**5** 1සාමු 18:29
1සාමු 20:33
1සාමු 27:1
ගීතා 54:3
**6** 1සාමු 2:9
ගීතා 33:18
ගීතා 54:4
ගීතා 124:7
හිතෝ 21:30
රෝම 8:31
**7** 1සාමු 23:18
**8** ද්වි 3:28
නෙහෙ 2:18
යෝබ් 16:5
හිතෝ 17:17
හිතෝ 27:9
ලූක් 22:32
ක්‍රියා 15:32
හෙබ්‍රෙ 10:25
**9** ගීතා 37:5
1පේතෘ 5:7
**10** ගීතා 27:1
යෙසා 41:10
**11** 1සාමු 16:13
2සාමු 2:4
2සාමු 5:3

**12** 1සාමු 20:31; 1සාමු 24:20; **13** 1සාමු 18:3; 1සාමු 20:42; 1සාමු 22:8; 2සාමු 21:7.

**1සාමු 23:15*** තේරුම, "කැලෑබද ප්‍රදේශය."

නිවස බලා පිටත්ව ගියේය. දාවිත්
දිගටම හෝරෙෂ්හි ජීවත් විය.
**19** ෂිප්හි වැසියෝ[1] ගිබෙයාහි[2] සිටි
සාවුල් රජු වෙත ගොස් මෙසේ
කීවෝය. “දාවිත් සැඟවී ඉන්-
නේ[3] අපිට කිට්ටු ස්ථානයක. ඔහු
ඉන්නේ හෝරෙෂ්[4] කියන ස්ථාන-
යේ දුෂ්කර පැත්තක් වන හකීලා
කන්දේ.[5] හකීලා කන්ද තියෙන්නේ
යෙෂිමොන්ට*[6] දකුණු පැත්තෙන්.
**20** රජතුමනි, අපි ඔහුව ඔබේ අතටම
අල්ලලා දෙන්නම්.[7] එවිට ඔබේ සිතේ
ආශාව[8] ඉෂ්ට කරගන්න ඔබට පුළු-
වන් වෙයි.” **21** එවිට සාවුල් රජ
ඔවුන්ට මෙසේ කීවේය. “ඔබ මට
අනුකම්පා කරලා මේ ගැන දැනුම්
දුන් නිසා ඔබට යෙහෝවා දෙ-
විගෙන් ආශීර්වාද ලැබේවා![9]
**22** දාවිත් ක්‍රියා කරන්නේ හරිම කපටි
විදිහටයි[10] කියලා මට දැනගන්න
ලැබුණා. ඒ නිසා ඔබ දැන් ගිහින්
දාවිත් හරියටම ඉන්නේ කොහෙද
කියලා හොයලා බලන්න. ඔහු ඉන්න
තැන දැක්ක කෙනෙකුගෙන් විස්තර
දැනගෙන එන්න. **23** ඔහු හැංගෙන
තැන් ගැන විස්තර දැනගෙන ඇවිත්
මට කියන්න. එවිට මම ඔබ සමඟ
එන්නම්. ඔහු ඇත්තටම එතැන
හැංගිලා ඉන්නවා නම් මම යූදා දේශ-
යේ හැම පවුලක්ම*[11] සෝදිසි කර
කොහොමහරි ඔහුව හොයාගන්නවා.”
**24** එබැවින් ඔවුහු සාවුල් රජු සිටි
ස්ථානයෙන් පිටත්ව ෂිප්[12] වෙත
ගියෝය. එම අවස්ථාවේදී දාවිත් හා
ඔහුගේ සෙනඟ සිටියේ අරබාහි*[13]
මායොන් පාළුකරයේය.[14] එම පාළුක-
රය තිබෙන්නේ යෙෂිමොන්ට දකුණු
දෙසින්ය. **25** සාවුල් රජ හා ඔහු-
ගේ සෙනඟ දාවිත්ව සොයන පිණිස
පිටත්ව ගියෝය.[15] දාවිත් එය දැන-
ගත් විගස මායොන් පාළුකරයේ
තවත් ඇතුළට වෙන්න තිබූ පර්ව-

**1සාමු 23:19*** හෝ, “කාන්තාරයට.” **23*** 1සාමු 10:19හි පාදසටහන බලන්න. **24*** රතු මුහුදේ අකබා බොක්ක දක්වා විහිදී යන මහා සුවිහේද නිම්නයේ දකුණු කොටස.

තය[1] දෙසට බැස ගියේය. ඔහු දිගටම
එහි සිටියේය. සාවුල් රජුට එය ආරංචි
වූ විට ඔහු මායොන් පාළුකරයේ
සිටි දාවිත් පසුපස ලුහුබැඳ[2] ගියේය.
**26** මෙසේ සාවුල් රජ, දාවිත් පසු-
පස ලුහුබැඳ ගොස් ඔහු අසලටම
ආවේය. එවිට සාවුල් රජ කන්දේ
එක් පැත්තකද දාවිත් සහ ඔහු-
ගේ සෙනඟ කන්දේ අනික් පැත්-
තේද සිටියෝය. සාවුල් රජු සහ
ඔහුගේ සෙනඟ ඔවුන්ට ළංව සිටි
බැවින්[3] දාවිත් කලබල වී ගැලවීමට
මහක් සෙව්වේය.[4] **27** ඒ අවස්ථා-
වේදී පණිවිඩකරුවෙක් සාවුල් රජු
වෙත පැමිණ මෙසේ දැන්වූවේය.
“ඉක්මනින්ම එන්න. පිලිස්තිවරු දේ-
ශය අල්ලගන්න උත්සාහ කරනවා.”
**28** එවිට සාවුල් රජ, දාවිත් පසු-
පස ලුහුබැඳ යෑම අත්හැර[5] පිලිස්-
තිවරුන්ට විරුද්ධව සටන් කරන
පිණිස ගියේය. ඒ පර්වතය සීලා-
හම්මාහ්ලීකොත්* ලෙස නම් කර
ඇත්තේ ඒ නිසාය.
**29** දාවිත් එතැනින් පිටත්ව ඒන්-
ගෙදී ප්‍රදේශයේ[6] තිබූ දුෂ්කර තැන්වල
ජීවත් විය.

**24** සාවුල් රජු පිලිස්තිවරුන්[7]
සමඟ සටනට ගොස් පැමිණි
විට ඔහුට මෙසේ ආරංචි විය. “දාවිත්
දැන් ඉන්නේ ඒන්-ගෙදී නම් පාළුකර-
යේයි.”[8]
**2** එවිට සාවුල් රජ ඊශ්‍රායෙල් සෙ-
නඟ අතරින් මිනිසුන් තුන්දහසක්
තෝරාගෙන[9] දාවිත්ව සහ ඔහු-
ගේ සෙනඟව අල්ලාගැනීමට පිටත්ව
ගියේය.[10] ඔවුහු කඳු එළුවන්[11]
ගැවසෙන තැන්වල ඔවුන්ව සොයා
ගියෝය. **3** මෙසේ ගමන් කරමින්
සිටියදී සාවුල් රජ බැටළු ගාල්
තිබෙන ස්ථානයකට පැමිණියේය.
එහි ගුහාවක්ද තිබිණ. සාවුල් රජට
මලපහ කිරීමේ අවශ්‍යතාවක් ඇති
වී[12] ඒ සඳහා ඔහු ගුහාව ඇතුළට
ගියේය. දාවිත් සහ ඔහුගේ සෙ-

**1සාමු 23:28*** තේරුම, “වෙන්ව යෑමේ පර්වතය.”

**23 පරි.**
**1** 1ලේක 2:42
**2** 1සාමු 10:26; 1සාමු 15:34
**3** 1සාමු 22:17; 1සාමු 26:1; ගීතා 54:පෙර
**4** 1සාමු 23:15
**5** 1සාමු 26:3
**6** 1සාමු 23:24; 1සාමු 26:1
**7** ගීතා 54:3; ගීතා 70:2; හිතෝ 29:26
**8** 1සාමු 18:29; 1සාමු 20:33; ගීතා 112:10; හිතෝ 11:23
**9** විනි 17:2
**10** මතෙ 10:16
**11** යොෂු 22:30; 1සාමු 10:19
**12** 1සාමු 23:14
**13** ද්වි 1:7
**14** යොෂු 15:55; 1සාමු 25:2
**15** 1සාමු 26:2; ගීතා 54:3

**2 තීරුව**
**1** 1සාමු 23:28
**2** හිතෝ 11:19
**3** 2ලේක 20:12; ගීතා 17:9; 2කොරි 1:8
**4** 1සාමු 19:12; 2සාමු 15:14; ගීතා 31:22
**5** 2සාමු 22:1; ගීතා 18:පෙර; ගීතා 18:2; ගීතා 54:7
**6** යොෂු 15:62; 2ලේක 20:2; සල 1:14; එස 47:10

**24 පරි.**
**7** 1සාමු 23:28
**8** 1සාමු 23:29
**9** 1සාමු 13:2
**10** ගීතා 37:32; ගීතා 38:12
**11** ගීතා 104:18
**12** ද්වි 23:13; විනි 3:24; 1රාජා 18:27

නඟ එම ගුහාවේම[1] ඇතුළට වෙන්න
හිඳගෙන සිටියෝය. **4** එවිට දාවිත්
සමඟ සිටි අය ඔහුට මෙසේ කීවෝය.
"යෙහෝවා දෙවි අද ඔබේ සතු-
රාව ඔබේ අත ළඟටම ගෙනැවිත්
තිබෙනවා.[2] ඒ නිසා ඔබට හොඳයි
කියලා හිතෙන ඕනෑම දෙයක් ඔහුට
කරන්න.[3] ඒ සඳහා දෙවිගේ අවසරය
ඔබට ලැබෙයි." එබැවින් දාවිත් එතැ-
නින් නැඟිට සාවුල් රජුට නොපෙ-
නෙන සේ ඔහුගේ අත් නැති සළුව
තිබූ ස්ථානයට ගොස් එහි වාටියෙන්
කොටසක් කපාගත්තේය. **5** නමුත්
ඔහු කළ ඒ දේ නිසා ඔහුගේ සිත
ඔහුට වද දීමට[4] පටන්ගත්තේය.
**6** එබැවින් ඔහු තමා සමඟ සිටි
අයට මෙසේ කීවේය. "සාවුල් රජු,
යෙහෝවා දෙවිගේ අභිෂේක ලත්
තැනැත්තා.[5] ඉතින් මම කොහොමද
යෙහෝවා දෙවිගේ අභිෂේක ලත්
තැනැත්තාට විරුද්ධව මගේ අත ඔස-
වන්නේ?[6] මගේ ස්වාමියාට විරුද්-
ධව කටයුතු කරන්න මම කවදාවත්
හිතන්නේවත් නැහැ. යෙහෝවා දෙ-
විත් ඒ වගේ දෙයක් අනුමත කරන්-
නේ නැහැ කියලා මට විශ්වාසයි."
**7** දාවිත් එසේ කියා සාවුල් රජුට
හානියක් කිරීමෙන් තම සේවකයන්ව
වැළැක්වූවේය.[7] සාවුල් රජද ගුහා-
වෙන් පිටත්ව ගියේය.

**8** එවිට දාවිත් ගුහාවෙන් පිට-
තට ගොස්, "මගේ ස්වාමීනි,[8]
රජතුමනි" කියා සාවුල් රජුට හඬගැ-
සුවේය. එවිට සාවුල් රජු හැරී බැලූ
විට දාවිත් හිස නමා[9] රජුට ආචාර
කරමින් මෙසේ කීවේය. **9** "'දාවිත්
ඔබට හානියක් කරන්න හදනවා'
කියලා මිනිසුන් කියන දේ ඔබ
විශ්වාස කරන්නේ ඇයි?[10] **10** අද
ඔබ ගුහාව ඇතුළට එද්දී යෙහෝවා
දෙවි ඔබට හානියක් කරන්න මට
අවස්ථාවක් ලබා දුන්නා. සමහරු
ඔබව මරන්න කියලත් මට පෙරැත්ත
කළා.[11] එහෙත් මම ඔබට අනුකම්පා
කළා. 'මම මගේ ස්වාමියාට විරුද්ධව
අත ඔසවන්නේ කොහොමද? ඔහු
යෙහෝවා දෙවිගේ අභිෂේක ලත්
තැනැත්තා'[1] කියලත් මම ඔවුන්ට
කිව්වා. **11** මේ බලන්න මගේ පියා-
ණෙනි,[2] ඔබේ අත් නැති සළුවේ කැල්-
ලක් මගේ අතේ තියෙනවා. මම
ඔබට කිසි හානියක් කරන්නේ නැතුව
එය කපාගත්තා. මෙයින් ඔබට දැන-
ගන්න පුළුවන් මගේ අතේ කිසි වරදක්
නැති බව.[3] ඔබ මාව මරන්න හැඳු-
වත්[4] මම ඔබට විරුද්ධව කිසි නපු-
රක්වත් පාපයක්වත් කළේ නැහැ.
**12** යෙහෝවා දෙවි අපි දෙන්නාව
විනිශ්චය කරයි.[5] යෙහෝවා දෙවි
අනිවාර්යයෙන්ම මා වෙනුවෙන් යුක්-
තිය ඉටු කරයි.[6] ඒත් මම කවදාවත්
ඔබට අතක්වත් තියන්නේ නැහැ.[7]
**13** 'දුෂ්ටයන් කරන්නේ දුෂ්ට දේ-
මය'[8] කියලා පුරාණ හිතෝපදේශයක
සඳහන් වෙනවා. නමුත් මම නම්
කවදාවත් ඔබට දුෂ්ට දෙයක් කරන්-
නේ නැහැ. **14** රජතුමනි, ඔබ මේ
ලුහුබඳින්නේ කා පස්සෙද? පණ නැති
බල්ලෙක් පස්සේ නෙමෙයිද?[9] ඔබ මේ
ලුහුබඳින්නේ නිකම්ම නිකම් මැක්-
කෙක් පස්සේ නෙමෙයිද?[10] **15** යෙ-
හෝවා දෙවි අපි දෙන්නව විනිශ්චය
කරයි. ඔහු කාරණා විමසා බලලා,[11]
මා වෙනුවෙන් කතා කරලා ඔබේ
අතින් මාව ගලවාගනියි."

**16** දාවිත් ඒ දේවල් කියූ පසු සාවුල්
රජ ඔහුට කතා කර, "දාවිත්, මගේ
පුතේ, මේ කතා කරන්නේ ඔබ-
මද"[12] කියා ඇසුවේය. රජ එසේ
කියා ශබ්ද නඟා හඬන්න පටන්ගත්-
තේය.[13] **17** රජ දාවිත්ට තවදුරටත්
මෙසේ කීවේය. "ඔබ මට වඩා ධර්මිෂ්-
ඨයි.[14] මම ඔබට නපුරු විදිහට සැල-
කුවත් ඔබ මට හොඳින් සැලකුවා.[15]
**18** අද යෙහෝවා දෙවි මාව ඔබේ
අතටම අල්ලලා දුන්නත්[16] ඔබ මාව
මැරුවේ නැහැ. ඔබ මට හොඳින්
සැලකූ බව මම එයින් දැනගත්තා.
**19** සාමාන්‍යයෙන් සතුරෙක්ව අත-
ටම අහු වුණොත් ඔහුට ගැලවී

**15** හිතෝ 25:21; රෝම 12:17; **16** 1සාමු 24:4; 1සාමු 24:10; 1සාමු 26:8.

**24 පරි.**
**1** ගීතා 57:පෙර
ගීතා 142:පෙර
**2** 1සාමු 26:8
1සාමු 26:23
**3** හිතෝ 24:29
මතෙ 7:12
**4** 2සාමු 24:10
රෝම 2:15
1යොහ 3:20
**5** නික් 22:28
1ලේක 16:22
ගීතා 105:15
ක්‍රියා 23:5
**6** 1සාමු 26:11
2සාමු 1:14
**7** ලෙවී 19:18
ගීතා 7:4
මතෙ 5:44
රෝම 12:17
රෝම 12:19
රෝම 12:21
**8** 1සාමු 26:17
**9** 1සාමු 20:41
1සාමු 25:23
රෝම 12:10
රෝම 13:7
**10** ලෙවී 19:16
1සාමු 26:19
ගීතා 101:5
හිතෝ 16:28
හිතෝ 17:4
**11** 1සාමු 24:4

**2 තීරුව**
**1** 1සාමු 9:16
1සාමු 10:1
1සාමු 26:9
ගීතා 105:15
**2** 1සාමු 18:27
1සාමු 22:14
හිතෝ 15:1
හිතෝ 25:15
**3** 1සාමු 26:18
ගීතා 7:3
ගීතා 35:7
**4** 1සාමු 23:14
ගීතා 140:1
**5** 1සාමු 26:23
ගීතා 7:8
**6** ද්වි 32:35
ගීතා 94:1
නාහු 1:2
රෝම 12:19
හෙබ්‍රෙ 10:30
**7** 1සාමු 26:11
**8** උත් 4:7
හිතෝ 11:5
මතෙ 7:17
ගලා 6:7
**9** 1සාමු 17:43
2සාමු 9:8
හිතෝ 22:4
මතෙ 23:12
**10** 1සාමු 26:20
**11** ගීතා 35:1
ගීතා 43:1
ගීතා 119:154
මීකා 7:9
**12** 1සාමු 26:17
**13** උත් 27:38
**14** 1සාමු 26:21

යන්න දෙන්නේ කවුද?[1] එහෙත් අද
ඔබ මට ගැලවී යන්න ඉඩ දුන්නා. ඒ
නිසා යෙහෝවා දෙවි ඔබට අනිවාර්-
යයෙන්ම ආශීර්වාද කරයි.[2] **20** මම
දන්නවා ඔබට රජකම ලැබෙන
බව.[3] ඊශ්‍රායෙල්හි රජකම හැමදාටම
ඔබේ පෙළපතට උරුම වෙයි කිය-
ලත් මම දන්නවා. **21** දැන් ඉතින්
මගේ දරුදැරියන්ව විනාශ කරන්නේ
නැහැ කියලත් මගේ පියාගේ පෙළප-
තින් මගේ නම ඉවත් කරන්නේ
නැහැ කියලත්[4] යෙහෝවා දෙවිගේ
නාමයෙන් මට දිවුරලා පොරොන්දු
වෙන්න."[5] **22** දාවිත්ද සාවුල් රජුට
දිවුරා පොරොන්දු විය. ඉන්පසු සාවුල්
රජ තම නිවස බලා පිටත් විය.[6] පසුව
දාවිත් සහ ඔහුගේ සෙනඟ නැවත
දුෂ්කර ස්ථානවලට ගොස් එහි ජීවත්
වූහ.[7]

**25** කාලයක් ගෙවුණු පසු සාමු-
වෙල්[8] මිය ගියේය. මුළු ඊශ්‍රා-
යෙල් සෙනඟ ඔහු නිසා හඬා
වැලපුණෝය.[9] රාමාහි[10] ඔහුගේ
නිවස ළඟ ඔහුව තැන්පත් කරන ලදි.
පසුව දාවිත් පාරාන් නම් පාළුකරය[11]
වෙත ගියේය.

**2** මායොන් නුවරේ[12] එක්තරා
ධනවතෙක් සිටියේය. ඔහුට බැට-
ළුවෝ තුන්දහසක්ද එළුවෝ දහ-
සක්ද සිටියෝය. ඔහුගේ සත්ව
රැළ කර්මෙල්හි*[13] සිටියෝය. කර්-
මෙල්හිදී ඔහුගේ සේවකයෝ ඔහුගේ
බැටළුවන්ගේ ලොම් කපමින් සිටි-
යෝය.[14] **3** ඒ ධනවත් මිනිසාගේ
නම නාබල්ය.[15] ඔහුගේ භාර්යාව-
ගේ නම අබිගායිල්ය.[16] අබිගායිල්,
රුවැති මෙන්ම නුවණැති ස්ත්‍රියක්
විය.[17] නමුත් ඇගේ පුරුෂයා ඉතා
නපුරු, සැරපරුෂ කෙනෙක් විය.[18]
ඔහු කාලෙබ්ගෙන් පැවතෙන්නෙකි.[19]
**4** නාබල් තම බැටළුවන්ගේ ලොම්
කප්පවමින්[1] සිටින බව පාළුකර-
යේදී දාවිත්ට ආරංචි විය. **5** දාවිත්
තමා සමඟ සිටි පුරුෂයන් දහදෙනෙ-
කුව නාබල් වෙත යැවීමට තීරණය
කළේය. ඔහු ඔවුන්ට මෙසේ කීවේය.
"කර්මෙල් වෙත ගිහින් නාබල්ට
කියන්න මම ඔහුගේ සැප සනීප විම-
සුවා කියලා.[2] **6** මගේ සහෝදරයා
වන නාබල්ට මේ දේත් කියන්න.
'ඔබටත් ඔබේ ගෙයි වැසියන්ටත්
ඔබට අයිති සියල්ලටත් ආශීර්වාද
ලැබේවා![3] **7** මේ දවස්වල ඔබේ
බැටළුවන්ගේ ලොම් කපනවා කියලා
මට දැනගන්න ලැබුණා. කර්මෙල්
නුවරේ ඔබේ රැළ බලාගන්න අය සිටි-
යේ අපි ළඟ.[4] ඔවුන් අපි ළඟ සිටි
දවස්වලදී අපි ඔවුන්ට කිසි හිරිහැර-
යක් කළේ නැහැ.[5] ඔවුන්ට අයිති
කිසි දෙයක් නැති වුණෙත් නැහැ.
**8** ඔබේ සේවකයන්ගෙන් ඇහුවොත්
ඔවුනුත් ඔබට ඒ ගැන කියයි. දැන්
මගේ සේවකයන්ට කරුණාව පෙන්-
වන්න. මම ඔවුන්ව ඔබ වෙතට
එවන්නේ හොඳ දවසකයි. ඔබේ පුත්‍ර-
යෙක් වගේ ඉන්න මටත් මගේ
සේවකයන්ටත් ඔබ කැමති දෙයක්
දෙන්න.' "[6]

**9** දාවිත්ගේ සේවකයෝද නාබල්
වෙත ගොස් දාවිත් පැවසූ සියල්ල
ඔහුට කීවෝය. **10** එවිට නාබල්
ඔවුන්ට මෙසේ කීවේය. "කවුද ඔය
දාවිත්?[7] යෙස්සේගේ පුතා කියන්-
නේ කාටද? මේ දවස්වල තමන්-
ගේ ස්වාමියාගේ ගෙදරින් පැනලා
යන සේවකයෝ ගොඩක් ඉන්නවා.[8]
**11** කොහේදෝ ඉඳන් ආව මිනිසුන්ට[9]
මොකටද මගේ රොටියි[10] වතුරයි
දෙන්නේ? මං මොකටද මගේ බැටළු-
වන්ගේ ලොම් කපන අයට කන්න
දෙන මස් වෙන කාටවත් දෙන්නේ?"

**12** ඉන්පසු දාවිත්ගේ සේවකයෝ
නැවත ඔහු වෙත පැමිණ නාබල්
පැවසූ සියල්ල ඔහුට කීවෝය.
**13** එය ඇසූ විගස දාවිත්, "හැමෝම

**1සාමු 25:2*** මෙහි සඳහන් වන්නේ කාර්මෙල් කන්ද ගැන නොව, යූදාහි කඳුකර පළාතේ පිහිටි නුවරක් ගැනය. එය හෙබ්‍රොන් නුවරේ සිට කිලෝමීටර් 12ක් ඈතින් දකුණු දෙසින් පිහිටා තිබේ.

**24 පරි.**
**1** මතෙ 5:44 රෝම 12:17
**2** 1සාමු 26:25 2ලේක 16:9 ගීතා 18:20
**3** 1සාමු 13:14 1සාමු 15:28 1සාමු 18:8 1සාමු 20:31 1සාමු 23:17
**4** 2සාමු 9:1 2සාමු 21:7
**5** ලෙවී 19:12 ද්වි 6:13
**6** 1සාමු 15:34
**7** 1සාමු 23:29 හිතෝ 14:15 මතෙ 10:16

**25 පරි.**
**8** 1සාමු 1:20 1සාමු 2:18 1සාමු 3:20 ගීතා 99:6
**9** ගණන් 20:29 ද්වි 34:8 ක්‍රියා 8:2
**10** 1සාමු 7:17 1සාමු 28:3
**11** උත් 21:21 ගණන් 13:26
**12** 1සාමු 23:24
**13** යොෂු 15:1 යොෂු 15:48 යොෂු 15:55
**14** 2සාමු 13:23
**15** 1සාමු 25:25 1සාමු 25:38
**16** 1සාමු 27:3 1සාමු 30:5
**17** හිතෝ 14:1 හිතෝ 24:3 හිතෝ 31:26
**18** 1සාමු 25:17 1සාමු 25:21 යෙසා 32:5
**19** ගණන් 13:6 ගණන් 32:12

**2 තීරුව**
**1** 2සාමු 13:23
**2** 1සාමු 17:22
**3** මතෙ 10:12 ලූක් 10:5
**4** 1සාමු 22:2
**5** 1සාමු 25:15 ලූක් 3:14
**6** ද්වි 15:7 හිතෝ 3:27 ලූක් 11:41 ක්‍රියා 20:35 හෙබ්‍රෙ 13:16
**7** නික් 5:2 ගීතා 123:4
**8** 1සාමු 22:2 යෙසා 32:6
**9** හිතෝ 21:13; දේශ 9:15; යෙසා 32:6; ලූක් 6:38; යාකො 2:16; **10** ද්වි 8:17; විනි 8:6; 2කොරි 9:10.

තම තමන්ගේ කඩුව ඉණේ බැඳ-
ගෙන ලැස්ති වෙන්න”[1] කියා තම
සේවකයන්ට කීවේය. එවිට ඔවුහු
තම තමන්ගේ කඩුව ඉණේ බැඳගත්-
තෝය. දාවිත්ද තම කඩුව ඉණේ
බැඳගෙන මිනිසුන් හාරසියයක් සමඟ
පිටත්ව ගියේය. මිනිස්සු දෙසියයක්
බඩු මලු රැකබලා ගැනීමට නැවතු-
ණෝය.[2]

**14** මේ අතරතුර නාබල්ගේ සේව-
කයෙක් ඔහුගේ භාර්යාව වන අබිගා-
යිල්ට මෙසේ දැන්වූවේය. “දාවිත්
අපේ ස්වාමියා වෙතට පාළුකරයේ
ඉඳන් පණිවිඩකරුවන් එව්වා. ඔහු
අපේ ස්වාමියාට ආශීර්වාද කළත්
අපේ ස්වාමියා ඔහුට බැණවැදුණා.[3]
**15** ඒ මිනිස්සු අපිට හොඳින් සැල-
කුවා. ඔවුන් අපිට කිසි හිරිහැරයක්
කළේ නැහැ. ඔවුන් සමඟ අපි තණ-
බිම්වල හිටිය දවස්වලදී අපිට අයිති
කිසි දෙයක් නැති වුණේ නැහැ.[4]
**16** රෑ දාවල් දෙකේම ඔවුන් පවු-
රක් වගේ[5] අපි වටේට ඉඳලා අපිව
ආරක්ෂා කළා. අපි බැටළු රැළ බලා-
ගෙන හිටිය සියලු දවස්වලදී ඔවුන්
අපිව ආරක්ෂා කළා. **17** දැන් අපේ
ස්වාමියාටත් ඔහුගේ නිවසේ සිටින
සියලුදෙනාටත් අනතුරක් වෙන බව
නම් ස්ථිරයි.[6] නමුත් අපේ ස්වාමියා
ඉතා සැරපරුෂ කෙනෙක්*[7] නිසා මේ
ගැන ඔහු සමඟ කතා කරන්න බැහැ.
මේ අනතුරෙන් බේරෙන්න ඔබට කළ
හැකි දෙයක් ගැන හිතලා බලන්න.”

**18** එය ඇසූ විගස අබිගායිල්[8]
රොටි දෙසියයක්ද විශාල වයින්
භාජන දෙකක්ද[9] කෑමට සූදානම් කළ
බැටළුවන් පස්දෙනෙක්ද[10] බැදපු[11]
ධාන්‍ය සෙයා මිනුම්* පහක්ද වියළි
මිදි කුට්ටි#[12] සියයක්ද වියළි අත්-
තික්කා කුට්ටි දෙසියයක්ද[13] ගෙන
බූරුවන් පිට තැබුවාය. **19** ඉන්-
පසු ඇය, “මේවා මට ඉස්සරහින්
ගෙන යන්න.[1] මම පිටුපසින් එන්-
නම්” කියා ඇගේ සේවකයාට කීවාය.
නමුත් ඇගේ පුරුෂයා වන නාබල්ට
ඇය ඒ කිසිවක් කීවේ නැත.

**20** ඇය බූරුවෙකු පිට[2] නැඟ රහ-
සින් පිටත්ව ගියාය. ඇය කන්දෙන්
පහළට බැස යද්දී දාවිත්ද ඔහුගේ සෙ-
නඟද කන්දෙන් පහතට බැස එමින්
සිටියෝය. ඒ අවස්ථාවේදී ඇයට
ඔවුන්ව මුණගැසිණ. **21** ඊට ටික-
කට කලින් දාවිත් මෙසේ කියා තිබු-
ණේය. “මේ මනුෂ්‍යයාට අයිති හැම
දෙයක්ම පාළුකරයේදී මම ආරක්ෂා
කරලා දුන්නා. ඔහුට අයිති කිසිම
දෙයක් නැති වෙන්න ඉඩ දුන්නේ
නැහැ.[3] ඒත් ඔහු ඒ එක දෙයක්වත්
අගය කළේ නැහැ. මම ඔහුට හොඳක්
කළත් ඔහු මට සැලකුවේ නපුරු
විදිහටයි.[4] **22** හෙට එළි වෙන්න
කලින්[5] මම නාබල්ගේ නිවසේ හැම
පුරුෂයෙක්වම[6] මැරුවේ නැත්නම්
දෙවිම මගේ සතුරන්ට දඬුවම් දෙයි.
ඔහු අනිවාර්යයෙන්ම ඔවුන්ට දඬුවම්
දෙයි.”[7]

**23** දාවිත්ව දුටු විගස අබිගායිල්
බූරුවාගේ පිටින් බැස ඔහු ඉදි-
රියේ දණින් වැටී පොළොව දෙ-
සට හිස පහත් කළාය.[8] **24** ඔහුගේ
පාමුල දණින් වැටී[9] සිටි ඇය මෙසේ
කීවාය. “අනේ, මගේ ස්වාමීනි, සිදු
වූ වරදට මම වන්දි ගෙවන්නම්.[10]
ඔබේ දාසියට යමක් කියන්න අවසර
දෙන්න.[11] මං කියන දේට සවන්
දෙන්න. **25** අනේ, මගේ ස්වාමීනි,
නාබල් කියන්නේ කිසි කමකට නැති
මනුෂ්‍යයෙක්.[12] ඔහු කියූ දේවල් එච්-
චර ගණන් ගන්න එපා. ඔහුගේ නම
වගේමයි ඔහුගේ වැඩත්. ඔහු වැඩ
කරන්නේ හරිම මෝඩ විදිහටයි. ඔහු-
ගේ නමේ තේරුමත් ඒකමයි.[13] අනේ,
මගේ ස්වාමීනි, ඔබ අපේ නිවසට එවූ
සේවකයන්ව ඔබේ දාසිය වන මම
දැක්කේ නැහැ. **26** මගේ ස්වාමීනි,
මම ජීවමාන දෙවි වන යෙහෝවා ඉදි-
රියෙන්[14] ඔබ ඉදිරියෙන් කියන මේ
දේ සත්‍යයක්.[15] යුක්තිය ඉටු කිරීම

---

**1සාමු 25:17*** හෝ, “කිසි කමකට නැති කෙ-
නෙක්.” **18*** සෙයා මිනුමක් ලීටර් 7.33කට
සමානය. **18#** පලතුරු වර්ගයක් වේළා, එකට
තද කර සාදාගන්නා ලදි.

**25 පරි.**
**1** ගීතා 37:8
හිතෝ 15:1
දේශ 7:9
**2** 1සාමු 10:22
1සාමු 17:22
1සාමු 30:24
**3** 1සාමු 25:10
2සාමු 16:7
**4** 1සාමු 25:7
**5** 1සාමු 23:1
යෝබ් 1:10
හිතෝ 18:11
**6** 1සාමු 20:9
1සාමු 25:13
එස්ත 7:7
**7** 1සාමු 25:3
2ලේක 13:7
යෙසා 32:7
**8** 1සාමු 25:3
1සාමු 25:23
1සාමු 25:32
**9** උත් 32:13
**10** 2සාමු 17:29
**11** රූත් 2:14
1සාමු 17:17
2සාමු 17:28
**12** 1සාමු 30:12
2සාමු 16:1
**13** 1ලේක 12:40
හිතෝ 25:21
හිතෝ 25:22

**2 තීරුව**
**1** උත් 32:16
**2** යොෂු 15:18
2රාජා 4:24
**3** 1සාමු 25:7
**4** 1සාමු 25:10
ගීතා 35:12
ගීතා 38:20
ගීතා 109:5
හිතෝ 17:13
**5** හිතෝ 12:16
හිතෝ 14:17
හිතෝ 26:4
රෝම 12:21
**6** 1රාජා 14:10
1රාජා 16:11
1රාජා 21:21
2රාජා 9:8
2රාජා 10:7
**7** රූත් 1:17
1සාමු 3:17
1සාමු 14:44
1සාමු 20:13
2සාමු 3:9
**8** 1සාමු 24:8
1සාමු 25:41
**9** 2රාජා 4:37
එස්ත 8:3
**10** 2සාමු 14:9
**11** උත් 44:18
2සාමු 14:12
**12** 1සාමු 25:17
**13** යෙසා 32:6
**14** 1සාමු 20:21
1රාජා 2:24
**15** 1සාමු 1:26
2සාමු 14:19
2රාජා 2:2

ඔබේ අතට ගෙන[1] ක්‍රියා කිරීමෙන්
ඔබව වැළැක්වුවේ යෙහෝවා දෙවියි.[2]
ලේ වැගිරවීමෙන්[3] දෙවි අද ඔබව
වැළැක්වුවා. නාබල්ට සිදු වන දේම
ඔබේ සතුරන්ටත් ඔබට හානියක්
කරන්න සොයන අයටත් සිදු වේවා![4]
**27** ඔබේ දාසිය වන මම ගෙනා මේ
තෑග්ග*[5] පිළිගන්න. මගේ ස්වාමීනි,
ඔබ සමඟ සිටින සෙනඟට ඒවා
දෙන්න.[6] **28** ඔබේ දාසිය කළ වර-
දට දැන් සමාව දෙන්න.[7] ඔබ සටන්
කරන්නේ යෙහෝවා දෙවි වෙනු-
වෙන්.[8] ඒ නිසා යෙහෝවා දෙවි
බොහෝ කාලයකට රජකම ඔබේ
පෙළපතට ලබා දෙයි.[9] ඔබ මිය යන
තුරුම ඔබේ අතින් කිසිම නපුරු දෙ-
යක් සිද්ධ වෙන්නේ නැති බව ස්ථි-
රයි.[10] **29** මිනිසුන් ඔබට විරුද්ධව
නැඟිට ඔබව මරන්න සොයද්දී වටිනා
වස්තුවක් මල්ලක දමා ආරක්ෂා කර-
නවා වගේ ඔබේ දෙවි වන යෙ-
හෝවා[11] ඔබේ ජීවිතය ආරක්ෂා
කරලා දෙයි.[12] නමුත් ගල්පටියකින්
ගලක් වීසි කරනවා වගේ ඔහු ඔබේ
සතුරන්ව ඈතට වීසි කරලා දායි.[13]
**30** යෙහෝවා දෙවි ඔබට පොරොන්දු
වුණු සෑම යහපත් දෙයක්ම ඔබට
ලැබෙන බව ස්ථිරයි. දෙවි අනි-
වාර්යයෙන්ම ඔබව ඊශ්‍රායෙල් දේශ-
යේ නායකයා ලෙස පත් කරනවා.[14]
**31** ඉතින් මගේ ස්වාමීනි, හේතුවක්
නැතුව ඔබ ලේ වගුරුවන්න ඉක්මන්
වෙන්නේ ඇයි?[15] යුක්තිය ඉටු කිරීම
ඔබේ අතට ගන්න හදන්නේ ඇයි?[16]
ඔබ එහෙම කළොත් පසු කලෙක
ඔබට ඒ ගැන පසුතැවෙන්න සිදු
වෙයි. යෙහෝවා දෙවි ඔබට යහපත
කරයි කියලා මට හොඳටම විශ්වා-
සයි. ඒ කාලයේදී ඔබේ දාසිය වන
මාව සිහි කරන්න."[17]

**32** එවිට දාවිත් අබිගායිල්ට
මෙසේ කීවේය. "ඊශ්‍රායෙල්හි දෙවි
වන යෙහෝවාට ප්‍රශංසා වේවා![18] අද
ඔබව මා වෙතට එව්වේ ඔහුයි.
**33** ඔබ සිහිනුවණින් ක්‍රියා කළ නිසා
ඔබට ආශීර්වාද ලැබේවා![1] යුක්තිය
ඉටු කිරීම මගේ අතට ගෙන ක්‍රියා
කිරීමෙන් මාව වැළැක්වූ නිසාත්[2]
ලේ වැගිරවීමෙන්[3] මාව වැළැක්වූ
නිසාත් ඔබට ආශීර්වාද ලැබේවා!
**34** ඔබට හානියක් කිරීමෙන් මාව
වැළැක්වූ[4] ඊශ්‍රායෙල්වරුන්ගේ දෙවි
වන යෙහෝවා ඉදිරියේ මම මේ
කියන දේ සත්‍යයක්. ඔබ මාව හමු
වෙන්න එන්න ප්‍රමාද වුණා නම්[5] මම
නාබල්ගේ නිවසේ එක පුරුෂයෙක්-
වත් ඉතුරු කරන්නේ නැහැ. හෙට
උදෑසන වෙන්න කලින් ඔවුන් සිය-
ලුදෙනාවම මම මරලා දානවා."[6]
**35** ඉන්පසු දාවිත් ඈ ගෙනා ආහාර
ද්‍රව්‍ය භාරගෙන, "ඔබ දැන් සමාදාන-
යෙන් ගෙදර යන්න.[7] ඔබ කියූ දේට
මම සවන් දීලා ඔබේ ඉල්ලීම ඉටු
කළා"[8] කියා කීවේය.

**36** පසුව අබිගායිල් තම නිවසට
පැමිණියාය. නාබල් එදින විශාල
භෝජන සංග්‍රහයක් පිළියෙල කර
තිබිණ. ඔහු රජෙකු මෙන් කමින්
බොමින් විනෝද වෙමින් සිටියේය.[9]
ඔහු හොඳටම මත් වී සිටියේය.[10] අබි-
ගායිල් පසුවදා උදෑසන වන තෙක්
එදින සිදු වූ කිසිවක් ගැන නාබල්ට
පැවසුවේ නැත. **37** පසුවදා උදෑ-
සන නාබල් පියවි සිහියෙන් සිටින
විටදී ඔහුගේ භාර්යාව සිදු වූ සියල්ල
ගැන ඔහුට පැවසුවාය. එය ඇසූ විට
ඔහුගේ හදවත කම්පනය වී ඔහුගේ
මුළු ශරීරයම පණ නැති වී ගියේය.[11]
**38** දවස් දහයකට පමණ පසු යෙ-
හෝවා දෙවි නාබල්ට පහර දුන්-
නේය.[12] ඔහු මිය ගියේය.

**39** නාබල් මිය ගිය බව ඇනගත්
විට දාවිත් මෙසේ කීවේය. "යෙ-
හෝවා දෙවිට ප්‍රශංසා වේවා! ඔහු
නාබල් මට කළ නින්දාව[13] දැකලා
මා වෙනුවෙන් යුක්තිය ඉටු කර

**25 පරි.**
**1** රෝම 12:19
**2** උත් 20:6; මතෙ 6:13
**3** උත් 9:6; ගණන් 35:30
**4** 1සාමු 25:25; යෙරෙ 29:22
**5** උත් 33:11; 1සාමු 25:18; 1සාමු 30:26; 2රාජා 5:15; හිතෝ 18:16; හිතෝ 25:21; හිතෝ 25:22
**6** 1සාමු 22:2
**7** හිතෝ 18:12; හිතෝ 22:4
**8** 1සාමු 17:45; 1සාමු 18:17; 2සාමු 5:2
**9** 1සාමු 15:28; 2සාමු 7:11; 1රාජා 9:5
**10** 1සාමු 24:11; 1රාජා 15:5; ගීතා 119:1
**11** උත් 15:1; ද්වි 33:29; ගීතා 66:9
**12** ගීතා 41:2
**13** යෙරෙ 10:18
**14** 1සාමු 13:14; 1සාමු 15:28; 1සාමු 23:17; 2සාමු 6:21; 2සාමු 7:8; 1ලේක 17:7; ගීතා 89:20
**15** 1සාමු 25:26; එෆී 4:26
**16** ද්වි 32:35; 1සාමු 24:15; ගීතා 94:1; රෝම 12:19
**17** උත් 40:14
**18** ගීතා 41:13; ගීතා 72:18

**2 තීරුව**
**1** ගීතා 141:5; හිතෝ 9:9; හිතෝ 25:12
**2** 1සාමු 25:31; ගීතා 56:13; රෝම 12:19
**3** ද්වි 19:10; 1සාමු 25:26; ගීතා 73:2; හිතෝ 15:1; යාකො 5:20
**4** 1සාමු 25:24
**5** 1සාමු 25:18; හිතෝ 29:8
**6** 1සාමු 25:22
**7** 1සාමු 20:42; 2සාමු 15:9; 2රාජා 5:19
**8** උත් 19:21; හිතෝ 28:23

---

**1සාමු 25:27*** හෝ, "ආශීර්වාදය."

**9** 2සාමු 13:23; 1රාජා 4:22; එස්ත 1:5; **10** 1රාජා 20:16; හිතෝ 20:1; හොෂෙ 4:11; 1කොරි 6:10; එෆී 5:18; **11** ද්වි 28:28; ගීතා 102:4; ගීතා 143:4; **12** උත් 38:7; උත් 38:10; 2සාමු 6:7; 2රාජා 19:35; ක්‍රියා 12:23; **13** 1සාමු 25:10; 1සාමු 25:14.

දුන්නා.[1] මගේ අතින් සිදු වෙන්න
ගිය දුෂ්ටකම ඔහු වැළැක්වුවා.[2]
යෙහෝවා දෙවි නාබල්ගේ දුෂ්ට-
කම් ඔහු පිටටම හැරෙව්වා."[3] පසුව
දාවිත් තම සේවකයන් ලවා අබිගා-
යිල්ට විවාහ යෝජනාවක් කළේය.[4]
**40** ඔහුගේ සේවකයෝ කර්මෙල්හි
සිටි අබිගායිල් වෙත පැමිණ මෙසේ
කීවෝය. "දාවිත් ඔබව විවාහ කර-
ගන්න කැමතියි." **41** එය ඇසූ විට
ඇය නැඟිට ඔවුන්ට ආචාර කර-
මින්[5] මෙසේ කීවාය. "මගේ ස්වාමියා-
ගේ සේවකයන්ගේ පාද සෝදන්න[6]
ඔබේ දාසිය වන මම සූදානම්."[7]
**42** ඒ මොහොතේම අබිගායිල්[8] බූරු-
වෙකු පිට නැඟ[9] දාවිත්ගේ සේවකයන්
සමඟ ගියාය. ඇයට පිටුපසින් ඇගේ
සේවිකාවෝ පස්දෙනෙක්ද ඇවිදගෙන
ගියෝය. පසුව ඇය දාවිත් සමඟ
විවාහ වූවාය.
**43** දාවිත් යෙෂ්‍රෙයෙල්හි[10] අහිනෝ-
වම්[11] සමඟද විවාහ විය. අබිගා-
යිල් සහ අහිනෝවම් යන දෙදෙනාම
දාවිත්ගේ භාර්යාවෝ වූහ.[12]
**44** සාවුල් රජ, දාවිත්ට භාර්යාවක්
ලෙස දුන් තම දියණිය වන මීකල්ව[13]
පල්තීට[14] විවාහ කර දුන්නේය. පල්තී
ගල්ලිම්හි[15] ජීවත් වූ ලායිෂ්ගේ පුත්‍ර-
යාය.

**26** කල් යත්ම ෂිප්හි[16] වැසි-
යෝ ගිබෙයා[17] වෙතට
පැමිණ, "දාවිත්, යෙෂිමොන්[18] ඉදිරි-
යේ තියෙන හකීලා කන්දේ[19] හැංගිලා
ඉන්නවා" කියා සාවුල් රජුට කීවෝය.
**2** එය ඇසූ විට සාවුල් රජ[20] ඊශ්‍රා-
යෙල්වරුන් අතරින් තෝරාගත් පුරු-
ෂයන් තුන්දහසක් සමඟ[21] දාවිත්ව
සොයා ෂිප් පාළුකරයට ගියේය.
**3** සාවුල් රජ යෙෂිමොන්ට ඉදිරි-
යෙන් තිබෙන හකීලා කන්දට නැඟ
යන මාර්ගයේ කඳවුරු බැඳගත්-
තේය. ඒ අවස්ථාවේදී දාවිත් සිටියේ
පාළුකරයේය. සාවුල් රජු පාළුකර-
යට පැමිණ තමාව සොයන බව
දාවිත්ට ආරංචි වූ විට **4** එය සත්‍ය-
යක්ද කියා දැනගැනීමට ඔහු ඔත්තු-

**25 පරි.**
1 අදි 32:35
1සාමු 24:15
ගීතා 35:1
ගීතා 43:1
හිතෝ 22:23
2 1සාමු 25:34
3 විනි 9:57
1රාජා 2:44
ගීතා 7:16
4 හිතෝ 18:22
හිතෝ 31:10
හිතෝ 31:31
5 රූත් 2:10
6 උත් 18:4
ලූක් 7:44
යොහ 13:5
1තිමෝ 5:10
7 හිතෝ 15:33
හිතෝ 18:12
8 1සාමු 25:3
9 උත් 24:61
10 යොෂු 15:56
11 1සාමු 27:3
2සාමු 3:2
1ලේක 3:1
12 1සාමු 30:5
2සාමු 5:13
2සාමු 12:8
13 1සාමු 18:20
14 2සාමු 3:15
15 යෙසා 10:30

**26 පරි.**
16 යොෂු 15:55
1සාමු 23:14
ගීතා 54:පෙර
17 විනි 19:14
1සාමු 10:26
1සාමු 11:4
18 1සාමු 23:24
19 1සාමු 23:19
20 1සාමු 23:23
1සාමු 24:17
21 1සාමු 24:2

**2 තීරුව**
1 යොෂු 2:1
මතෙ 10:16
2 1සාමු 14:50
1සාමු 17:55
2සාමු 2:8
2සාමු 3:27
3 1සාමු 17:20
4 උත් 10:15
උත් 15:20
5 2සාමු 2:18
2සාමු 23:18
1ලේක 2:16
6 2සාමු 16:9
2සාමු 18:5
7 විනි 7:10
1සාමු 14:7
8 1සාමු 24:4
1සාමු 26:23
9 1සාමු 10:1
1සාමු 24:6
2සාමු 1:14

කාරයන්ව[1] පිටත් කර යැව්වේය.
**5** පසුව දාවිත්, සාවුල් රජු කඳවුරු
බැඳගෙන සිටි ස්ථානයට ගියේය.
එවිට සාවුල් රජුද ඔහුගේ හමුදාපති වූ
නේර්ගේ පුත්‍රයා වන අබ්නේර්ද[2] නිදා-
ගෙන සිටිනවා ඔහු දුටුවේය. සාවුල්
රජු කඳවුරේ නිදාගෙන සිටි අතර[3]
ඔහුගේ ආරක්ෂාව සඳහා සෙනඟ ඔහු
වටා කූඩාරම් ගසාගෙන සිටියෝය.
**6** දාවිත් හිත්තීවරයෙකු[4] වූ අහිමෙ-
ලෙක්ගෙන් හා ෂෙරුයියාගේ පුත්‍රයාද[5]
යෝවාබ්ගේ සහෝදරයාද වන අබිෂ-
යිගෙන්[6] මෙසේ ඇසුවේය. "සාවුල්
රජුගේ කඳවුර ඇතුළට යන්න මා
සමඟ එන්නේ කවුද?" එවිට අබිෂයි,
"මම ඔබ සමඟ එන්නම්"[7] කියා
කීවේය. **7** එදින රාත්‍රියෙහි සාවුල්
රජු කඳවුරු බැඳගෙන සිටි තැනට
දාවිත්, අබිෂයි සමඟ ගියේය. සාවුල්
රජ කඳවුරේ නිදාගෙන සිටියේය. රජු-
ගේ හෙල්ලය ඔහුගේ හිස අසල බිම
සිටුවා තිබිණ. රජුගේ ආරක්ෂාව
සඳහා අබ්නේර්ද සෙනඟද ඔහු වටා
නිදාගෙන සිටියෝය.
**8** අබිෂයි දාවිත්ට මෙසේ කීවේය.
"දෙවි ඔබේ සතුරාව ඔබේ අත ළඟටම
ගෙනැවිත් තිබෙනවා.[8] මේ හෙල්ල-
යෙන් මට එක සැරයක් ඔහුට අනින්න
ඉඩ දෙන්න. මම එකපාරින්ම ඔහුව
මරලා දාන්නම්." **9** නමුත් දාවිත්
අබිෂයිට මෙසේ කීවේය. "ඔහුට කිසි
හානියක් කරන්න එපා. යෙහෝවා
දෙවිගේ අභිෂේක ලත් තැනැත්තාට[9]
විරුද්ධව අත ඔසවලා කිසිම කෙනෙ-
කුට නිදොස්ව ඉන්න පුළුවන්ද?[10]
**10** යෙහෝවා දෙවිම ඔහුට පහර
දෙයි[11] කියලා ජීවමාන දෙවි වන
යෙහෝවා ඉදිරියේ[12] මට නිසැකවම
කියන්න පුළුවන්. එහෙමත් නැත්නම්
යුද්ධයකදී[13] හෝ ඔහුගේ ආයු කාලය
සම්පූර්ණ වූ දවසක[14] ඔහු මිය යයි.[15]
**11** යෙහෝවා දෙවිගේ අභිෂේක ලත්

**10** 1ලේක 16:22; ගීතා 20:6; ගීතා 105:15; ලූක් 18:7; **11** අදි 32:35; 1සාමු 24:12; 1සාමු 25:38; ගීතා 94:1; ගීතා 94:23; රෝම 12:19; යූද් 9; **12** 1සාමු 20:21; 1සාමු 25:26; **13** 1සාමු 31:3; 1සාමු 31:6; **14** යෝබ් 14:5; ගීතා 37:13; ගීතා 90:10; දේශ 8:13; **15** 1සාමු 12:25.

තැනැත්තාට[1] විරුද්ධව[2] මම අත ඔස-
වන්නේ කොහොමද?[3] යෙහෝවා දෙවි
එය කවදාවත් අනුමත කරන්නේ
නැහැ කියලා මම දන්නවා.[4] අපි දැන්
රජුගේ හිස ළඟ තියෙන හෙල්ලයත්
වතුර භාජනයත් අරගෙන මෙහෙන්
යමු.” **12** දාවිත් සාවුල් රජුගේ හිස
ළඟ තිබූ හෙල්ලයද වතුර භාජනයද
තම අතට ගත් පසු ඔවුහු එතැ-
නින් ගියෝය. ඔවුන් එතැනට පැමිණි
බව කඳවුරේ සිටි කිසිවෙක් දුටුවේ
නැත.[5] කිසිවෙක් අවදි වුණේද නැත.
මන්ද ඔවුන් සියලුදෙනාම සිටියේ
තද නින්දේය.[6] යෙහෝවා දෙවි එසේ
සිදු වීමට සැලැස්වූවේය. **13** පසුව
දාවිත්, සාවුල් රජු සිටි ස්ථානයට
අනික් පැත්තේ බොහෝ දුරකින් තිබූ
කන්දකට ගොස් එහි මුදුනේ සිටගත්-
තේය.

**14** දාවිත්, සාවුල් රජු සමඟ සිටි
සෙනඟටද නේර්ගේ පුත්‍රයා වන අබ්-
නේර්ටද හඬ නඟා කතා කළේය.
ඔහුද, “අබ්නේර්, මා කියන දේ ඔබට
ඇහෙනවාද” කියා ඇසුවේය. අබ්-
නේර්ද,[7] “ඔබ කවුද? රජතුමාට කතා
කරන ඔබ කවුද” කියා ඇසුවේය.
**15** දාවිත් නැවතත් අබ්නේර්ට මෙසේ
කීවේය. “ඔබ එඩිතර මිනිසෙක් නො-
මෙයිද? ඊශ්‍රායෙල් දේශයේ ඔබ වගේ
තවත් කෙනෙක් ඉන්නවාද? එහෙම-
නම් ඔබේ ස්වාමියා වන රජුට ඔබ
නිසි ආරක්ෂාවක් දුන්නේ නැත්තේ
ඇයි? දැන් සුළු මොහොතකට ඉස්-
සෙල්ලා යමෙක් ඔබේ ස්වාමියා ළඟට
ඇවිත් ඔහුව මරන්න උත්සාහ කළා.[8]
**16** ඔබේ වගකීම ඔබ හරියට ඉටු
කළේ නැහැ. ජීවමාන දෙවි වන යෙ-
හෝවාගේ නමින්[9] මම කියන මේ දේ
සත්‍යයක්. යෙහෝවා දෙවිගේ අභි-
ෂේක ලත් තැනැත්තා[10] වන ඔබේ
ස්වාමියාව ඔබ ආරක්ෂා[11] කළේ නැති
නිසා ඇත්තෙන්ම ඔබ මරණයට
සුදුස්සෙක්.[12] රජුගේ හිස ළඟ තිබුණු
ඔහුගේ හෙල්ලයත් වතුර භාජනයත්[13]
දැන් කොහෙද තියෙන්නේ කියලා
බලන්න.”

**17** දාවිත්ගේ කටහඬ හඳුනාගත්
සාවුල් රජ ඔහුගෙන් මෙසේ ඇසු-
වේය. “දාවිත්, මගේ පුතේ! මේ
කතා කරන්නේ ඔබද?”[1] එවිට දාවිත්,
“මගේ ස්වාමීන් වන රජ්ජුරුවනි,
මම දාවිත්” කියා උත්තර දුන්නේය.
**18** ඔහු තවදුරටත් මෙසේ කීවේය.
“මගේ ස්වාමීනි, ඔබ ඔබේ සේව-
කයා පසුපස ලුහුබඳින්නේ ඇයි?[2] මම
ඔබට මොනවද කළේ? මගේ අතේ
තියෙන වරද මොකක්ද?[3] **19** දැන්
මගේ ස්වාමීනි, ඔබේ සේවකයා වන
මම කියන දේට ඇහුම්කන් දෙන්න.
මට විරුද්ධව නැඟී සිටින්න ඔබව
පෙලඹුවේ යෙහෝවා දෙවි නම් ඔහු
මගේ අතින් ධාන්‍ය පූජාවක් පිළිග-
නීවා![4] නමුත් එසේ කරන්න ඔබව
පෙලඹුවේ මනුෂ්‍යයන් නම්[5] ඔවුහු
යෙහෝවා දෙවි ඉදිරියේ ශාප ලද්-
දෝ වෙත්වා![6] යෙහෝවා දෙවිට
උරුම දේශයේ ඉන්න මට කිසි අයිති-
යක් නැහැයි කියලා සෙනඟ මට
හැඟෙන්න සැලැස්සුවා.[7] ‘මෙහෙන්
යන්න. ගිහින් වෙනත් දෙවිවරුන්ට
නමස්කාර කරන්න’[8] කියන්නාක්
මෙන් ඔවුන් මාව එහෙන් පන්නා
දැමුවා. **20** යෙහෝවා දෙවි ඉදිරි-
යේ මගේ ලේ වගුරුවන්න එපා.[9]
ඊශ්‍රායෙල්හි රජතුමනි, කඳු මුදුන්වල
ඉන්න වටුවෙක් පස්සේ ලුහුබඳින්-
නාක් මෙන්[10] ඔබ මේ ලුහුබඳින්නේ
කා පස්සෙද? නිකම්ම නිකම් මැක්-
කෙක් පස්සේ නෙමෙයිද?”[11]

**21** එවිට සාවුල් රජ දාවිත්ට මෙසේ
පැවසුවේය. “අනේ දාවිත්, මගේ පුතේ!
මම කළේ පාපයක්.[12] දැන් ඉතින් මා
ළඟට එන්න. මම ආයෙත් නම් ඔබට
හිරිහැර කරන්නේ නැහැ. අද ඔබට
මාව මරන්න අවස්ථාවක් ලැබුණත්
ඔබ එහෙම කළේ නැහැ.[13] මම ඔබට
විරුද්ධව කළේ පාපයක්. මම හැසිරු-
ණේ මෝඩයෙක් වගෙයි.” **22** එවිට
දාවිත් රජුට මෙසේ කීවේය. “මෙන්න
රජුගේ හෙල්ලය. සේවකයෙක්ව එවා
ඒක රැගෙන යන්න. **23** යෙහෝවා
දෙවි අද ඔබව මගේ අතටම අල්ලලා

**26 පරි.**
**1** 1ලේක 16:22; ගීතා 20:6; ගීතා 105:15
**2** ලෙවී 19:18; හිතෝ 24:29; රෝම 12:17
**3** 1සාමු 14:45; 1සාමු 24:6
**4** ගීතා 40:8; ගීතා 119:97
**5** 1සාමු 24:4
**6** උත් 2:21; උත් 15:12
**7** 1සාමු 14:50; 1සාමු 17:55; 2සාමු 2:8; 2සාමු 3:8
**8** 1සාමු 26:8
**9** 1සාමු 14:45
**10** 1සාමු 9:16; 1සාමු 10:1
**11** 1සාමු 14:16
**12** 2සාමු 12:5; 2සාමු 19:28
**13** 1සාමු 26:11; 1රාජා 19:6

**2 තීරුව**
**1** 1සාමු 24:8; 1සාමු 24:16
**2** ගීතා 35:7; ගීතා 69:4
**3** 1සාමු 24:9; 1සාමු 24:11; ගීතා 7:3; යොහ 10:32; යොහ 18:23
**4** ලෙවී 19:5; 2සාමු 24:25
**5** 1සාමු 24:9
**6** හිතෝ 30:10
**7** නික් 19:5; ද්වි 26:18; ද්වි 32:9; 2සාමු 20:19; ගීතා 135:4
**8** රෝම 14:13
**9** යාකො 5:6
**10** විලා 3:52
**11** 1සාමු 24:14
**12** නික් 9:27; 1සාමු 15:24; 1සාමු 24:17; මතෙ 27:4
**13** 1සාමු 24:10; 1සාමු 26:11

දුන්නත් මම යෙහෝවා දෙවිගේ අභි-
ෂේක ලත් තැනැත්තාට විරුද්ධව
අත ඔසවන්න කැමති වුණේ නැහැ.[1]
අපි එක් එක් කෙනාගේ ධර්මිෂ්-
ඨකමත් විශ්වාසවන්තකමත් යෙ-
හෝවා දෙවි දන්නවා. ඔහු ඒ අනුව
අපිට ආශීර්වාද කරයි.[2] **24** මම අද
ඔබේ ජීවිතය ආරක්ෂා කළා වගේම
යෙහෝවා දෙවි මගේ සියලු දුක් කරද-
රවලින් මාව මුදාගෙන,[3] මගේ ජීවිතය
අනර්ඝ වස්තුවක් ලෙස ආරක්ෂා
කරනු ලැබේවා!”[4] **25** එවිට සාවුල්
රජ දාවිත්ට මෙසේ කීවේය. “මගේ
පුත් දාවිත්, ඔබට දෙවිගෙන්
ආශීර්වාද ලැබේවා! ඔබ කරන සෑම
දෙයක්ම අනිවාර්යයෙන්ම සාර්ථක
වෙයි. ඒ විතරක් නෙවෙයි, ඔබ
ජය ගන්නවා[5] කියලත් මට විශ්වා-
සයි.” ඉන්පසු දාවිත් එතැනින් පිටත්ව
ගියේය. සාවුල් රජද තම නිවස බලා
ගියේය.[6]

**27** දාවිත් මෙසේ සිතුවේය.
“කොයි වෙලාවේ හරි මම
සාවුල් රජුගේ අතට අහු වෙයි. ඔහු-
ගේ අතින් ගැලවෙන්න නම් පිලිස්-
තිවරුන්ගේ[7] දේශයට පලා යනවා
හැරෙන්න වෙන කරන්න දෙයක්
ඉතුරු වෙලා නැහැ.[8] ඊශ්‍රායෙල් දේ-
ශයෙන් මම පලා ගිහින් කියලා
ඔහු දැනගත්තාම මාව හොයන එක
ඔහු අත්හරියි.”[9] **2** පසුව දාවිත් සහ
ඔහු සමඟ සිටි මිනිසුන් හයසිය-
දෙනා[10] ගාත්හි රජු වන ආකිෂ්[11]
වෙත ගියෝය. ආකිෂ් මායොක්ගේ
පුත්‍රයාය. **3** දාවිත් ගාත්හි ආකිෂ්
සමඟ දිගටම වාසය කළේය. ඔහු-
ගේ භාර්යාවන් දෙදෙනා වන
යෙෂ්‍රෙයෙල්හි අහිනොවම්[12] හා කර්-
මෙල්හි නාබල්ගේ භාර්යාව වූ අබිගා-
යිල්ද[13] ඔහු සමඟ සිටියෝය. දාවිත්
සමඟ සිටි පුරුෂයෝද ඔවුනොවුන්-
ගේ පවුල් සමඟ එහි සිටියෝය.[14]
**4** කල් යත්ම දාවිත් ගාත් වෙත පලා
ගිය බව සාවුල් රජුට ආරංචි විය. එබැ-
වින් ඔහු දාවිත් පසුපස හඹා යෑම
අත්හැරියේය.[15]

**26 පරි.**
1 1සාමු 24:6
1සාමු 26:9
2 1රාජා 8:32
ගීතා 7:8
ගීතා 18:20
ගීතා 28:4
3 උත් 48:16
ගීතා 34:19
2පේතෘ 2:9
4 ගීතා 18:25
මතෙ 5:7
මතෙ 7:2
5 1සාමු 24:19
යෙසා 54:17
6 උත් 18:33
ගණන් 24:25
1සාමු 24:22
1සාමු 27:4
2සාමු 19:39

**27 පරි.**
7 1සාමු 28:1
1සාමු 29:2
8 1සාමු 19:18
1සාමු 22:1
1සාමු 22:5
9 1සාමු 18:29
1සාමු 23:23
10 1සාමු 25:13
1සාමු 30:9
11 1සාමු 21:10
1සාමු 27:12
12 1සාමු 25:43
13 1සාමු 25:39
1සාමු 25:42
14 1තිමෝ 5:8
15 1සාමු 23:14
1සාමු 26:25

**2 තීරුව**
1 යොෂු 19:5
1සාමු 30:1
2සාමු 1:1
1ලේක 4:30
1ලේක 12:1
1ලේක 12:20
නෙහෙ 11:28
2 1සාමු 29:3
3 යොෂු 13:2
4 උත් 36:12
නික් 17:8
නික් 17:14
ගණන් 13:29
1සාමු 15:2
2සාමු 1:1
1ලේක 4:43
5 1සාමු 15:4
6 උත් 25:18
නික් 15:22
7 ද්වි 25:19
1සාමු 15:3
8 යොෂු 15:2
9 1ලේක 2:9
10 ගණන් 24:21
1සාමු 15:6
11 මතෙ 10:16
12 හිතෝ 22:3

**5** පසුව දාවිත් ආකිෂ් රජුට මෙසේ
කීවේය. “මගේ ස්වාමීනි, මම ඔබ
සමඟ මේ රාජකීය නුවරේ ජීවත් වෙන
එක සුදුසු නැහැ. ඔබේ කරුණාව
ලබන්න තරම් මම වටිනවා නම් මට
ගම්බද පළාතක ජීවත් වෙන්න අව-
සර දෙන්න.” **6** එදින ආකිෂ් රජ,
දාවිත්ට ෂික්ලග්[1] නුවරෙහි ජීවත්
වීමට අවසර දුන්නේය. ෂික්ලග් නුවර
මේ දක්වාම යූදාහි රජවරුන්ට උරුම
නුවරක් ලෙස වෙන් කර තිබෙන්නේ
ඒ නිසාය.

**7** දාවිත් පිලිස්තිවරුන්ගේ ගම්බද
පළාතේ අවුරුද්දකුත් මාස හතරක්
ජීවත් විය.[2] **8** දාවිත් හා ඔහු සමඟ
සිටි පුරුෂයෝ ගෙෂූර්වරුන්ටද[3] ගිර්ෂි-
වරුන්ටද අමලෙක්වරුන්ටද[4] විරුද්-
ධව සටනට ගියෝය. ඒ ජාතීහු
තේලාම්[5] සිට ෂූර්[6] දක්වාත් ඊජිප්තුව
දක්වාත් ජීවත් වූහ. **9** දාවිත් ඒ
ජාතීන්ට පහර දී සියලු පුරුෂයන්වද
ස්ත්‍රීන්වද මරා දැමුවේය.[7] ඔහු ඔවුන්-
ගේ ඇඳුම් පැළඳුම්ද එළු බැටළු රැළ-
වල්ද ගව රැළවල්ද ඔටුවන්ද බූරුවන්ද
පැහැරගත්තේය. පසුව ඔහු ආකිෂ් රජු
වෙත හැරී ගියේය. **10** එවිට ආකිෂ්
රජ, “ඔබ අද මේ දේවල් පැහැරගත්-
තේ කාගෙන්ද” කියා දාවිත්ගෙන්
ඇසුවේය. දාවිත්ද, “මේ දේවල් ගත්-
තේ, යූදාහි දකුණු පැත්තේ[8] ජීවත්
වන වැසියන්ගෙන් හා යෙරාමෙයෙල්-
වරුන්ගේ දේශයට දකුණින්[9] ජීවත්
වන වැසියන්ගෙන් හා කේනිවරුන්-
ගේ දේශයට දකුණින්[10] ජීවත් වන
වැසියන්ගෙන්” කියා රජුට පැවසීය.[11]
**11** දාවිත් තමා පහර දුන් දේශ-
යන්හි සිටි කිසි පුරුෂයෙකුවත් ස්ත්‍රී-
යකවත් ගාත් වෙත ගෙන ආවේ
නැත. “ඔවුන්ව අපි ගාත් වෙත ගෙන
ආවොත්, ‘මෙන්න මෙහෙම තමයි
දාවිත් අපිට කළේ’ කියමින් ඔවුන්
අපිව පාවා දෙයි” කියා ඔහු සිතුවේය.
එබැවින් ඔහු ඔවුන් එක් කෙනෙකුවත්
ඉතුරු නොකර විනාශ කළේය.[12]
(දාවිත් පිලිස්තිවරුන්ගේ ගම්බද පළා-
තේ ජීවත් වූ සියලු දවස්වලදී එසේ

කළේය.) **12** ආකිෂ් රජද දාවිත්ව
විශ්වාස කළේය.[1] ඔහු මෙසේ සිතු-
වේය. “දාවිත්ගේ සෙනඟ ඔහුට වෛර
කරන නිසා[2] ඔහු හැමදාටම මගේ සේ-
වකයෙක් ලෙස ජීවත් වෙයි.”

**28** ඒ දවස්වලදී පිලිස්තිවරු
ඊශ්‍රායෙල්වරුන්ට විරුද්ධව
යුද්ධයකට සැරසුණෝය.[3] ඒ අවස්ථා-
වේදී ආකිෂ් රජ දාවිත්ට මෙසේ
කීවේය. “ඔබත් ඔබේ සෙනඟත් මා
සමඟ යුද්ධයට යා යුතුයි.”[4] **2** එවිට
දාවිත්, “මගේ ස්වාමීනි, මම ඔබ
සමඟ එන බව ඔබ හොඳින්ම දන්-
නවා නේද” කියා ආකිෂ් රජුගෙන්
ඇසුවේය. ආකිෂ් රජද, “ඔව්, මම දන්-
නවා. ඒ නිසයි මම ඔබව හැමදාටම
මගේ ආරක්ෂක නිලධාරියා ලෙස පත්
කරන්නේ”[5] කියා දාවිත්ට පැවසුවේය.
**3** ඒ වන විට සාමුවෙල් ජීව-
තුන් අතර සිටියේ නැත. ඊශ්‍රායෙල්
දේශයේ සියලු වැසියෝ ඔහු ගැන
වැලපුණෝය. ඔහුගේම නුවර වන
රාමාහි[6] ඔහුව තැන්පත් කර තිබිණ.
ඒ කාලයේදී සාවුල් රජ මායාකාර-
යන්වද ශාස්ත්‍ර කියන්නන්වද දේශ-
යෙන් පන්නා දමා තිබිණ.[7]
**4** පසුව පිලිස්තිවරු තම හමුදාව
රැස් කරගෙන ෂුනෙම්[8] නුවරෙහි කඳ-
වුරු බැඳගත්තෝය. සාවුල් රජද
ඊශ්‍රායෙල්හි මුළු හමුදාවම රැස් කර-
ගෙන ගිල්බෝවා කන්දේ[9] කඳවුරු
බැඳගත්තේය. **5** පිලිස්තිවරුන්ගේ
කඳවුර දැක සාවුල් රජ බොහෝ සෙ-
යින් භය විය.[10] **6** සාවුල් රජු විටින්
විට යෙහෝවා දෙවිගෙන් කාරණා
විමසූ[11] නමුත් යෙහෝවා දෙවි ඔහුට
පිළිතුරු දුන්නේ නැත.[12] සිහිනයක්
මාර්ගයෙන්වත්[13] ඌරීම් මාර්ගයෙන්-
වත්[14] අනාගතවක්තෘවරුන් මාර්ග-
යෙන්වත්[15] දෙවි සාවුල් රජුට පිළිතුරු
දුන්නේ නැත. **7** අන්තිමට සාවුල්
රජ, “මට මායාකාරියක්ව[16] සොයා
දෙන්න. මට දැනගන්න අවශ්‍ය දේ
ඇගෙන් විමසලා දැනගන්නම්” කියා
තම සේවකයන්ට කීවේය. ඔවුහුද,
“ඒන්-දෝර්හි[1] දක්ෂ මායාකාරියක්
ඉන්නවා” කියා සාවුල් රජුට කීවෝය.
**8** ඉන්පසු සාවුල් රජු තමාව හඳු-
නාගැනීමට නොහැකි වන සේ
වෙස්වලා ගෙන[2] තවත් පුරුෂයන් දෙ-
දෙනෙකු සමඟ ඇයව හමු වීමට
ගියේය. රාත්‍රිය වන විට[3] ඔවුහු ඇය
සිටි ස්ථානයට පැමිණියෝය. එවිට
සාවුල් රජ ඇයට මෙසේ කීවේය.
“ඔබේ මන්තර බලයෙන්[4] මම ඔබට
කියන පුද්ගලයාව මෙතැනට කැඳ-
වන්න.” **9** නමුත් ඒ ස්ත්‍රිය, “සාවුල්
රජු සියලුම මායාකාරයන්වයි ශාස්ත්‍ර
කියන්නන්වයි දේශයෙන් පන්නා
දැම්මා[5] කියලා ඔබ හොඳින් දන්-
නවා. ඒ ගැන දැනගෙනත් ඔබ මට
විරුද්ධව උගුලක් අටවන්න හදන්-
නේ ඇයි? ඔබ මාව මරලා දාන්න
සැලසුම් කරනවාද”[6] කියා ඔහුගෙන්
ඇසුවාය. **10** එවිට සාවුල් රජ, යෙ-
හෝවා දෙවිගේ නාමයෙන් ඇයට දිවු-
රමින්[7] මෙසේ කීවේය. “ඔබට කිසි
දඬුවමක් ලැබෙන්නේ නැහැ කියලා
මම ජීවමාන දෙවි වන යෙහෝ-
වාගේ නමින් දිවුරලා කියන්නම්.”
**11** එවිට ස්ත්‍රිය, “ඔබ වෙනුවෙන් මා
කැඳවිය යුත්තේ කාවද” කියා සාවුල්
රජුගෙන් ඇසුවාය. රජද, “සාමුවෙල්ව
කැඳවන්න” කියා ඇයට කීවේය.[8]
**12** ඒ ස්ත්‍රිය, “සාමුවෙල්ව”* දුටු විගස[9]
මහා හයියෙන් කෑගසමින් සාවුල් රජු-
ගෙන් මෙසේ ඇසුවාය. “ඔබ සාවුල්
රජු නේද? ඇයි ඔබ මාව රැවැට්ටුවේ?”
**13** එවිට රජ, “භය වෙන්න එපා.
ඔබ මොනවද දැක්කේ කියලා මට
කියන්න” යයි ඇයට කීවේය. ඇයද,
“මම දෙවි කෙනෙක්[10] භූමියෙන් මතු
වෙනවා දැක්කා” කියා පැවසුවාය.
**14** එවිට සාවුල් රජ, “ඔහුගේ හැඩරුව
මොන වගේද” කියා ඇසුවේය. ඇයද,

**27 පරි.**
**1** හිතෝ 14:15
**2** උත් 34:30
1සාමු 13:4

**28 පරි.**
**3** විනි 3:2
1සාමු 14:52
**4** 1සාමු 27:12
1සාමු 29:3
**5** 1සාමු 29:2
**6** 1සාමු 25:1
යෙසා 57:1
**7** නික් 22:18
ලෙවී 19:31
ලෙවී 20:6
ලෙවී 20:27
ද්වි 18:11
එළි 21:8
**8** යොෂු 19:18
1රාජා 1:3
2රාජා 4:8
සල 6:13
**9** 1සාමු 31:1
2සාමු 1:21
2සාමු 21:12
**10** ද්වි 28:20
1සාමු 28:20
හිතෝ 10:24
යෙසා 57:21
**11** 1සාමු 14:37
1ලේක 10:14
**12** හිතෝ 1:28
හිතෝ 28:9
යෙසා 1:15
එස 20:3
මීකා 3:4
**13** ගණන් 12:6
මතෙ 1:20
**14** නික් 28:30
ගණන් 27:21
ද්වි 33:8
**15** ගීතා 74:9
විලා 2:9
**16** නික් 22:18
ලෙවී 19:31
ලෙවී 20:6
1සාමු 15:23
1සාමු 28:3
යෙසා 8:19
හෙබ්‍රෙ 3:12

**2 තීරුව**
**1** යොෂු 17:11
ගීතා 83:10
**2** 1රාජා 14:2
1රාජා 22:30
**3** 1සාමු 28:25
**4** ද්වි 18:10
1ලේක 10:13
යෙසා 8:19
**5** 1සාමු 28:3
**6** නික් 22:18
ලෙවී 20:27
**7** 1සාමු 14:39
යෙසා 48:1
යෙරෙ 44:26
**8** රෝම 1:28

**9** 1සාමු 28:3; ගීතා 146:4; දේශ 9:5; 2කොරි 4:4; 2කොරි 11:14; **10** ගීතා 82:6; යොහ 10:34.

**1සාමු 28:12*** මෙම වාර්තාවේ සිද්ධීන් විස්තර කර තිබෙන්නේ මායාකාරියගේ දෘෂ්ටිකෝණයෙනි. සාමුවෙල් මෙන් වෙස්වලා ගෙන සිටි භූතයා ඇයව රවටා තිබිණ.

“භූමියෙන් උඩට මතු වුණේ වයසක
මනුෂ්‍යයෙක්. ඔහු අත් නැති සළුවක්[1]
ඇඳගෙන ඉන්නවා” කියා කීවාය. එය
ඇසූ විට ඒ, “සාමුවෙල්” විය යුතුයයි
සිතමින්[2] සාවුල් රජ දණින් වැටී පො-
ළොව දෙසට හිස නමා ඔහුට ආචාර
කළේය.
**15** එවිට, “සාමුවෙල්” සාවුල් රජු-
ගෙන් මෙසේ ඇසුවේය. “ඇයි ඔබ මට
කරදර කරන්නේ? මාව මෙතැනට
කැඳෙව්වේ ඇයි?”[3] එවිට සාවුල් රජ
ඔහුට මෙසේ කීවේය. “මම ඉන්නේ
ලොකු කනස්සල්ලකින්.[4] පිලිස්තිවරු
මට විරුද්ධව සටන් කරනවා. දෙ-
වින් මාව අත්හැරලා.[5] මම ඔහුට
කතා කළත් ඔහු අනාගතවක්තෘව-
රුන් මාර්ගයෙන්වත් සිහිනයකින්වත්
මට උත්තර දෙන්නේ නැහැ.[6] මම
දැන් ඔබට කතා කළේ මම මොනවාද
කරන්න ඕනේ කියලා දැනගන්නයි.”[7]
**16** එවිට, “සාමුවෙල්” රජුට මෙසේ
උත්තර දුන්නේය. “යෙහෝවා දෙවින්
ඔබට විරුද්ධ වී[8] ඔබව අත්හැර ගිහින්
කියා දැන දැනත්[9] ඔබ මගෙන් විම-
සන්නේ ඇයි? **17** යෙහෝවා දෙවි
මා ලවා කියූ හැම දෙයක්ම ඒ විදිහ-
ටම ඉටු වෙන්න සලස්වයි. යෙහෝවා
දෙවි ඔබේ අතින් රාජ්‍යය උදුර-
ගෙන[10] ඔබේම ජාතියේ කෙනෙකු වන
දාවිත්ට එය භාර දෙයි.[11] **18** ඔබ
යෙහෝවා දෙවිගේ හඬට අකීකරු
වුණා.[12] යෙහෝවා දෙවි අමලෙක්ව-
රුන්ට විරුද්ධව තම මහත් උදහස
වගුරුවන්න තීරණය කළ නමුත් ඔබ
දෙවි නියම කළ දඬුවම ඔවුන්ට දුන්-
නේ නැහැ.[13] ඒ නිසා දෙවි ඔබට විරුද්-
ධව නියම කර තිබෙන දේ මම දැන්
කියන්නම්. **19** යෙහෝවා දෙවි ඔබ-
වත් ඊශ්‍රායෙල් සෙනඟවත් පිලිස්තිව-
රුන්ගේ අතට භාර කර දෙනවා.[14]
හෙට ඔබයි[15] ඔබේ පුත්‍රයනුයි[16] මම
ඉන්න තැනට එනවා. යෙහෝවා දෙවි
මුළු ඊශ්‍රායෙල් කඳවුරම පිලිස්තිව-
රුන්ට යටත් කර දෙනවා.”[17]
**20** “සාමුවෙල්” කියූ දේ අසා සාවුල්
රජ බොහෝ සෙයින් භය වී බිම දිගා
විය. මුළු දවස පුරා කිසි දෙයක්
නොකෑ නිසා ඔහු තුළ කිසි ශක්තියක්
නොතිබිණ. **21** මායාකාරිය සාවුල්
රජු ළඟට පැමිණි විට ඔහු බොහෝ
සෙයින් කැලඹී සිටි බව ඇය දුටුවාය.
එබැවින් ඇය රජුට මෙසේ කීවාය.
“ඔබේ දාසිය වන මම මගේ ජීවිතය
පරදුවේ තබමින්[1] ඔබේ ඉල්ලීම ඉටු
කළා. **22** අනේ, දැන් ඔබේ දාසිය
වන මම කියන දේ අහන්න. මම
ඔබට කන්න රොටි ගෙනත් දෙන්-
නම්. ඔබ කෑවොත් ඔබේ ගමන
යන්න ඔබට ශක්තියක් ලැබෙයි.”
**23** ඔහු ඇය කී දේට අකමැති වී, “මට
කන්න බැහැ” කියා කීවේය. නමුත්
ඇයද ඔහුගේ සේවකයන්ද ඔහුට පෙ-
රැත්ත කළ නිසා ඔහු නැඟිට එතැන
තිබූ ඇඳ මත හිඳගත්තේය. **24** ඒ
ස්ත්‍රිය ළඟ තර වස්සෙක් සිටියේය.[2]
ඇය ඉක්මනින් වස්සාව මරා* ඌව
පිළියෙල කළාය.[3] ඇය පිටි අනා නුමු-
හුන් රොටිද සෑදුවාය. **25** පසුව ඇය
සාවුල් රජුට සහ ඔහුගේ සේවක-
යන්ට කන්න දුන්නාය. ඔවුහු කෑ පසු
එදින රාත්‍රියේම එතැනින් පිටත්ව
ගියෝය.[4]

**29** පිලිස්තිවරු[5] තම මුළු සේ-
නාව සමඟ අපෙක් නගරය
වෙත පැමිණ එහි කඳවුරු බැඳ-
ගත්තෝය. ඊශ්‍රායෙල්වරුන් කඳවුරු
බැඳගත්තේ යෙෂ්‍රෙයෙල්[6] නම් ප්‍රදේශ-
යේ තිබූ උල්පත ළඟය. **2** පිලිස්-
තිවරුන්ගේ අධිපතීහු[7] යුද්ධයට
සැරසී ඉදිරියට ආවෝය. සියයකින්
හා දහසකින් යුත් කණ්ඩායම්වලට
බෙදා තිබූ ඔවුන්ගේ සේනාද ඉදිරියට
ආවෝය. දාවිත් සහ ඔහුගේ සෙ-
නඟද ආකිෂ් රජු[8] සමඟ ආවෝය.
**3** එවිට පිලිස්තිවරුන්ගේ අධිපතීහු
ආකිෂ් රජුගෙන් මෙසේ ඇසුවෝය.
“ඇයි හෙබ්‍රෙව්වරු[9] මෙතැනට ඇවිත්
ඉන්නේ?” ආකිෂ් රජද, “මේ ඊශ්‍රා-
යෙල් දේශයේ සාවුල් රජුගේ සේව-
කයා වන දාවිත්. ඔහු සාවුල්ගේ

**28 පරි.**
**1** 1සාමු 15:27
**2** 2තෙස 2:10
2තෙස 2:11
**3** 2සාමු 12:23
ගීතා 115:17
ගීතා 146:4
දේශ 9:5
දේශ 9:10
**4** හිතෝ 14:14
යෙරෙ 2:17
ගලා 6:7
**5** 1සාමු 15:23
**6** 1සාමු 28:6
**7** ලෙවී 19:31
**8** ද්වි 28:15
**9** 1සාමු 15:23
1සාමු 16:14
2රාජා 6:27
**10** 1සාමු 13:14
1සාමු 15:28
**11** 1සාමු 16:13
1සාමු 24:20
**12** 1සාමු 13:11
1ලේක 10:13
**13** 1සාමු 15:9
යෙරෙ 48:10
**14** 1සාමු 12:25
1සාමු 28:1
1සාමු 31:1
**15** 1සාමු 31:5
**16** 1සාමු 31:2
2සාමු 2:8
**17** 1සාමු 31:7

**2 තීරුව**
**1** ලෙවී 20:27
විනි 12:3
1සාමු 19:5
යෝබ් 13:14
**2** උත් 18:7
ලූක් 15:23
**3** ද්වි 12:15
**4** 1සාමු 28:8

**29 පරි.**
**5** 1සාමු 28:1
**6** යොෂු 19:18
1සාමු 29:11
2සාමු 4:4
**7** යොෂු 13:3
විනි 3:3
1සාමු 5:8
**8** 1සාමු 28:2
**9** 1සාමු 13:19
2කොරි 11:22

1සාමු **28:24*** මූ.අ., “පූජා කර.”

නිවසින් පැනලා මා ළඟට ආවා. ඔහු අවුරුද්දක් දෙකක් විතර මා ළඟමයි හිටියේ.[1] මේ වෙනකම් ඔහු මට කිසි වරදක් කළේ නැහැ”[2] කියා ඔවුන්ට කීවේය. **4** මෙය ඇසූ විට පිලිස්තිවරුන්ගේ අධිපතීහු ආකිෂ් රජු සමඟ උදහස් වී ඔහුට මෙසේ කීවෝය. “ඔහුව මෙහෙන් පිටත් කර යවන්න.[3] ඔබ ඔහුව පදිංචි කරපු තැනටම ඔහුට ආපසු යන්න කියන්න. ඔහු අපිත් එක්ක යුද්දෙට ආවොත් අපිට විරුද්ධව සටන් කරයි.[4] ඔහුගේ ස්වාමියා එක්ක නැවත සමාදාන වෙන්න ඔහු අපේ හිස් කපාගෙන ගිහින් ස්වාමියාට දෙයිද කියලා කවුද දන්නේ! ඒ නිසා ඔහුට අපිත් එක්ක යුද්දෙට යන්න අවසර දෙන්න බැහැ. **5** ‘සාවුල් දහස් ගණන්ද දාවිත් දසදහස් ගණන්ද මැරුවෝය’ කියලා ඊශ්‍රායෙල්වරුන් නටමින් ගී ගැයුවේ ඔහු ගැන නේද?”[5]

**6** පසුව ආකිෂ් රජ[6] දාවිත්ට මෙසේ කීවේය. “ජීවමාන දෙවි වන යෙහෝවාගේ නමින් මම දිවුරලා කියන මේ දේ සත්‍යයක්.[7] ඔබ අවංක කෙනෙක් බව මට විශ්වාසයි. ඔබ සටන් කරන්න මාත් එක්ක ආව එක ගැන මම සතුටු වෙනවා.[8] ඔබ අද වන තුරු මට කිසි වරදක් කළේ නැහැ.[9] නමුත් ඔබ අපි එක්ක සටනට සහභාගි වෙනවාට අපේ අධිපතීන්[10] කැමති නැහැ. **7** පිලිස්තිවරුන්ගේ අධිපතීන් ඔබව වරදකට හසු කරන්න කලින් ඔබ මෙහෙන් සමාදානයෙන් පිටත් වෙලා යන්න.” **8** එවිට දාවිත්, “මගේ ස්වාමීනි, ඔබේ සතුරන්ට විරුද්ධව සටන් කරන්න මට අවසර නොදෙන්නේ මම මොන වරදක් කළාටද?[11] ඔබ ළඟට ආ දවසේ පටන් මේ දක්වා මම ඔබට කිසි වරදක් කරලා තියෙනවාද”[12] කියා ආකිෂ් රජුගෙන් ඇසුවේය. **9** එවිට ආකිෂ් රජ දාවිත්ට මෙසේ කීවේය. “ඔබ හොඳ කෙනෙක් බව මට විශ්වාසයි. ඔබ දේවදූතයෙක් වගෙයි.[13] නමුත් අපිත් එක්ක යුද්දෙට යන්න පිලිස්තිවරුන්ගේ අධිපතීන් ඔබට අවසර දෙන්නේ නැහැ. **10** ඒ නිසා ඔබත් ඔබ සමඟ ආ ඔබේ ස්වාමියාගේ සේවකයනුත් හෙට උදෙන්ම මෙහෙන් පිට වෙලා යන්න.”[1]

**11** දාවිත් සහ ඔහුගේ සෙනඟ පසුවදා උදෑසනින්ම පිලිස්තිවරුන්ගේ දේශයට හැරී ගියෝය.[2] පිලිස්තිවරු යෙෂ්‍රෙයෙල්[3] වෙත ගියෝය.

**30** දාවිත් සහ ඔහුගේ සෙනඟ ශික්ලග්[4] වෙත ගමන් කරමින් සිටි තුන්වෙනි දවසේදී අමලෙක්වරු[5] දකුණු දෙසින් තිබෙන ප්‍රදේශවලටත්* ශික්ලග් නගරයටත් පහර දුන්නෝය. ඔවුහු ශික්ලග් නුවර ගින්නෙන් දවා **2** එහි සිටි ස්ත්‍රීන්වද[6] බාල මහලු සියලුදෙනාවද පැහැරගෙන ගියෝය. ඔවුහු කිසිවෙකු නොමරා සියලුදෙනාවම වහල්කමට ගෙන ගියෝය. **3** දාවිත් සහ ඔහුගේ සෙනඟ එතැනට පැමිණි විට මුළු නුවරම ගිනිබත් වී තිබුණු බවත් තම භාර්යාවන් හා දූපුතුන් පැහැරගෙන ගොස් තිබුණු බවත් දුටුවෝය. **4** දාවිත් සහ ඔහු සමඟ සිටි සියලුදෙනාම එය දැක මහත් හඬින් හඬන්න පටන්ගත්තෝය.[7] තවත් කඳුළු සැලීමට නොහැකි වන තරමටම ඔවුහු හැඬුවෝය. **5** දාවිත්ගේ භාර්යාවන් දෙදෙනා වන යෙෂ්‍රෙයෙල්හි අහිනොවම්වද[8] කර්මෙල්හි වැසියෙකු වූ නාබල්ගේ බිරිඳව සිටි අබිගායිල්වද[9] පැහැරගෙන ගොස් තිබිණ. **6** දාවිත් බොහෝ සෙයින් අධෛර්යයට පත් විය.[10] මන්ද සෙනඟ තම තමන්ගේ දූපුතුන් නැති වූ නිසා මහත් කෝපයෙන් සිටියෝය.[11] ඔවුහු දාවිත්ට ගල් ගසන්න පවා සූදානම් වූහ.[12] එබැවින් දාවිත් තම දෙවි වන යෙහෝවාගෙන් උපකාර පැතුවේය. ඉන්පසු ඔහු ධෛර්යයවත් විය.[13]

**29 පරි.**
**1** 1සාමු 27:7
**2** 1සාමු 27:12 හිතෝ 14:15
**3** 1ලේක 12:19
**4** 1සාමු 14:21
**5** 1සාමු 18:7 1සාමු 21:11
**6** 1සාමු 21:10 1සාමු 27:2
**7** 1සාමු 20:21 යෙරෙ 12:16
**8** ගණන් 27:17 1සාමු 28:2 ගීතා 121:8
**9** 1සාමු 27:11 1සාමු 27:12 1සාමු 29:3 මතෙ 10:16
**10** 1සාමු 29:2
**11** 1සාමු 27:11
**12** 1සාමු 28:2
**13** 1සාමු 27:12 2සාමු 14:17 2සාමු 14:20 2සාමු 19:27 හිතෝ 14:35 ගලා 4:14

**2 තීරුව**
**1** ගීතා 37:23 හිතෝ 16:9 හිතෝ 21:1 යෙරෙ 10:23 2පේතෘ 2:9
**2** ගීතා 91:11 ගීතා 119:133
**3** යොෂු 19:18 1සාමු 29:1 2සාමු 4:4

**30 පරි.**
**4** යොෂු 15:31 1සාමු 27:6
**5** උත් 36:12 නික් 17:14 1සාමු 15:2 1සාමු 27:8
**6** විනි 5:30 1සාමු 27:3
**7** විනි 21:2
**8** 1සාමු 25:43 2සාමු 2:2
**9** 1සාමු 25:42 1සාමු 27:3
**10** ගීතා 25:17 ගීතා 116:3
**11** විනි 18:25 1සාමු 22:2 2සාමු 17:8 2රාජා 4:27
**12** නික් 17:4 ගණන් 14:10

**13** ගීතා 18:6; ගීතා 27:1; ගීතා 31:1; ගීතා 31:9; ගීතා 34:19; ගීතා 43:5; ගීතා 56:4; ගීතා 143:5; හිතෝ 18:10; හබ 3:18; ලූක් 22:43.

1සාමු **30:1*** එනම්, යූදාහි දකුණු ප්‍රදේශය.

7 ඉන්පසු දාවිත්, “ඒෆොද් හැට්-
ටය[1] මා ළඟට ගෙනෙන්න” කියා
අහිමෙලෙක්ගේ පුත්‍රයා වූ පූජක අබි-
යාතර්ට[2] කීවේය. අබියාතර්ද ඒෆොද්
හැට්ටය දාවිත් ළඟට ගෙන ගියේය.
8 එවිට දාවිත්, යෙහෝවා දෙවිගෙන්
මෙසේ ඇසුවේය.[3] “මම මේ කොල්ල-
කරුවන්ව ලුහුබැඳ යන්නද? මට
ඔවුන්ව අල්ලගන්න පුළුවන් වෙ-
යිද?” දෙවිද,[4] “යන්න. ඔබට නිසැක-
වම ඔවුන්ව අල්ලාගැනීමට හැකි
වන්නේය. ඔවුන් පැහැරගෙන ගිය
සෙනඟවද ඔබට නිදහස් කරගැනී-
මට හැකි වනු ඇත”[5] කියා දාවිත්ට
කීවේය.

9 එය ඇසූ විගස දාවිත් මිනි-
සුන් හයසියයක්[6] සමඟ එතැ-
නින් පිටත් වී බෙසෝර් නිම්නය
දක්වා ගමන් කළේය. සෙනඟ අත-
රින් කිහිපදෙනෙක් ඉන් එහාට ගමන්
නොකළෝය. 10 සෙනඟගෙන් දෙ-
සීයදෙනෙක් බොහෝ වෙහෙසට පත්ව
සිටි නිසා ඔවුන්ට බෙසෝර් නිම්නය[7]
හරහා ගමන් කිරීමට නොහැකි විය.
නමුත් දාවිත් සහ අනික් හාරසියදෙනා
දිගින් දිගටම කොල්ලකරුවන් පසුපස
ලුහුබැඳ ගියෝය.[8]

11 කොල්ලකරුවන්ව ලුහුබැඳ
යන විට ඊජිප්තු ජාතිකයෙකුව[9]
ඔවුන්ට හමු විය. ඔහු සිටියේ කෙ-
තකය. ඔවුහු ඒ මිනිසාව දාවිත්
ළඟට ගෙන ගොස් ඔහුට කන්න
රොටිද බොන්න වතුරද දුන්නෝය.
12 ඔවුහු වියළි අත්තික්කා කුට්ටිය-
කින් කැබැල්ලක්ද වියළි මිදි කුට්ටි
දෙකක්ද ඔහුට කන්න දුන්නෝය.[10]
ඔහු කෑ පසු ප්‍රාණවත් විය.[11] මන්ද
දවස් තුනක්ම ඔහුට කෑමවත් වතුර-
වත් ලැබී තිබුණේ නැත. 13 ඉන්-
පසු දාවිත්, “ඔබ කොහේ ඉඳන්ද
ආවේ? ඔබ කාගේ කවුද” කියා ඔහු-
ගෙන් ඇසුවේය. ඔහු මෙසේ පැවසු-
වේය. “මම ඊජිප්තු ජාතිකයෙක්. මම
අමලෙක් ජාතිකයෙකුගේ දාසයෙක්.
දවස් තුනකට කලින් මම ලෙඩ වුණා.
ඒ නිසා මගේ ස්වාමියා මාව මෙහෙ
දාලා ගියා.[1] 14 අපි තමයි කෙරෙ-
තිවරුන්ගේ දේශයේ[2] දකුණු පළා-
තටත් යූදා දේශයටත් කාලෙබ්ගේ
දේශයේ[3] දකුණු පළාතටත් පහර දුන්-
නේ. අපි ෂික්ලග් නුවර සම්පූර්ණ-
යෙන්ම පුලුස්සා දැම්මා.” 15 එවිට
දාවිත්, “ඔබ සමඟ සිටිය කොල්ලක-
රුවන් ළඟට මාව එක්කගෙන යන්න
පුළුවන්ද” කියා ඔහුගෙන් ඇසුවේය.
ඔහුද, “ඔබ මාව මරන්නේ නැහැ කිය-
ලත් මගේ ස්වාමියාගේ අතට මාව
පාවා දෙන්නේ නැහැ[4] කියලත් දෙවි-
ගේ නමින් දිවුරුවොත්[5] මම ඔවුන්
ළඟට ඔබව ගෙන යන්නම්” කියා
දාවිත්ට කීවේය.

16 එසේ කී පසු ඔහු දාවිත්ව
කොල්ලකරුවන් සිටි තැනට ගෙන
ගියේය.[6] කොල්ලකරුවෝ සෑම තැන-
කම විසිර සිටියෝය. ඔවුහු පිලිස්තිව-
රුන්ගේ දේශයෙන් හා යූදා දේශයෙන්
බොහෝ වස්තු කොල්ල කෑ
නිසා[7] කමින් බොමින් විනෝද වෙමින්
සිටියෝය.[8] 17 ඔවුන්ව සම්පූර්ණ-
යෙන්ම විනාශ කර දැමීමට තීර-
ණය කළ දාවිත් උදෑසන සිට සවස්
වන තුරුම ඔවුන්ට පහර දුන්නේය.
ඔටුවන් පිට පලා ගිය තරුණයන්
හාරසියදෙනෙකු හැර වෙන කිසි-
වෙක් ගැලවුණේ නැත.[9] 18 දාවිත්,
අමලෙක්වරුන් පැහැරගත් සියල්-
ලම නැවත ලබාගත්තේය.[10] ඔහුගේ
භාර්යාවන් දෙදෙනාවද ඔහු ගලවා-
ගත්තේය. 19 නැති වූ සියල්ලම
ඔවුහු නැවත ලබාගත්තෝය. පැහැර-
ගෙන ගිය ඔවුන්ගේ පුත්‍රයන්වද දූව-
රුන්වද බාල මහලු සියලුදෙනාවද
දාවිත් ගලවාගත්තේය.[11] ඔවුන්ගෙන්
කොල්ල කෑ සියලු වස්තුද ඔහු නැවත
ලබාගත්තේය. 20 දාවිත් අමලෙක්-
වරුන් ළඟ තිබූ සියලු සතුන්වද ගත්-
තේය. ඔවුහු තමන්ගෙන් කොල්ල කෑ
සතුන්ට ඉදිරියෙන් අමලෙක්වරුන්ගේ
සතුන්වද දක්කාගෙන ගියෝය. සෙ-
නඟ උන්ව පෙන්වමින්, “මේ දාවිත්ගේ
කොල්ලය” කියා කීවෝය.[12]

**30 පරි.**
1 1සාමු 23:9
2 1සාමු 22:20; 1රාජා 2:26
3 ගණන් 27:21; විනි 18:5; විනි 20:28; 1සාමු 23:2; 1සාමු 23:11; 1සාමු 28:6; හිතෝ 3:5
4 1සාමු 14:37; ගීතා 28:6
5 1සාමු 30:18; ගීතා 34:19; හිතෝ 11:8; හිතෝ 24:16
6 1සාමු 23:13; 1සාමු 27:2
7 1සාමු 30:21
8 විනි 8:4
9 ද්වි 23:7
10 1සාමු 25:18
11 විනි 15:19

**2 තීරුව**
1 හිතෝ 12:10
2 2සාමු 8:18; 1රාජා 1:38; 1ලේක 18:17; එස 25:16; ශෙප 2:5
3 යොශු 14:13; යොශු 21:12
4 ද්වි 23:15; ද්වි 23:16
5 ද්වි 6:13; යොශු 2:12; යොශු 9:15
6 විනි 1:25
7 යොශු 15:1; යෝබ් 20:5
8 ආනි 5:1; ලූක් 12:19
9 නික් 17:14; ගීතා 73:19
10 1සාමු 30:3
11 1සාමු 30:8; ගීතා 34:19
12 ගණන් 31:9; 2ලේක 20:25

**21** පසුව දාවිත් බෙසොර් නිම්නය
ළඟට පැමිණියේය. බොහෝ වෙ-
හෙසට පත්ව එහි නතර වී සිටි
මිනිස්සු දෙසීයදෙනා[1] දාවිත් සහ ඔහු-
ගේ සෙනඟ ළඟට පැමිණියෝය.
එවිට දාවිත් ඔවුන්ගෙන් සැප දුක් විම-
සුවේය. **22** නමුත් දාවිත් සමඟ සිටි
වැදගැම්මකට නැති දුෂ්ට පුරුෂයෝ[2]
මෙසේ කීවෝය. “ඔවුන් අපිත් එක්ක
ආවේ නැහැ. ඒ නිසා අපි කොල්ල කෑ
කිසිම දෙයක් ඔවුන්ට දෙන්න අවශ්‍ය
නැහැ. ඔවුන්ගේ භාර්යාවන් හා දරු-
වන් විතරක් රැගෙන ඔවුන්ට මෙහෙන්
යන්න කියමු.” **23** නමුත් දාවිත්
ඔවුන්ට මෙසේ කීවේය. “සහෝදර-
යෙනි, එහෙම කරන එක හොඳ
නැහැ. අපිට මේ හැම දෙයක්ම
දුන්නේ යෙහෝවා දෙවියි.[3] අපිව
ආරක්ෂා කරලා[4] කොල්ලකරුවන්ව
අපේ අතටම හසු කර දුන්නේ[5] ඔහුයි.
**24** ඉතින් ඔබ කියූ කතාවට එකඟ
වෙන්නේ කොහොමද? යුද්ධයට ගිය
අයට වගේම බඩු මලු ළඟ නැවතී සිටි
අයටත් කොටසක් ලැබෙනවා.[6] දෙ-
ගොල්ලන්ටම කොල්ලය එක සමා-
නව බෙදා දිය යුතුයි.”[7] **25** එදා
පටන් අද දක්වාම දාවිත් කී ඒ දේ
ඊශ්‍රායෙල්හි පනතක් හා නියෝගයක්
ලෙස පවතින්නේය.[8]

**26** දාවිත් ෂික්ලග් වෙත පැමිණි
විට ඔහු තම මිත්‍රයන් වන
යූදාහි සිටි වැඩිමහල්ලන්ට කොල්ල-
යෙන් කොටසක් යැව්වේය.[9] ඔහු
ඔවුන්ට මෙසේද දන්වා යැවීය.
“මේ යෙහෝවා දෙවිගේ සතුරන්-
ගෙන් කොල්ල කෑ දෙයින් ඔබේ
කොටසයි. ඒක තෑග්ගක්* හැටි-
යට පිළිගන්න.”[10] **27** බෙතෙල්හිද[11]
රාමොත්හි[12] දකුණු දිශාවේද යත්තීර්-
හිද[13] සිටි අයටත් **28** අරෝයේර්හිද
සිප්මොත්හිද එෂ්තෙමෝවාහිද[14] සිටි
අයටත් **29** රාකල්හිද යෙරාමෙ-
යෙල්වරුන්ගේ[15] හා කේනිවරුන්ගේ
නුවරවලද විසූ අයටත්[16] **30** හොර්-
මාහිද[1] බෝර්ආෂාන්හිද[2] ආතක්හිද
**31** හෙබ්‍රොන්හිද සිටි අයටත්[3] දාවිත්
කොටසක් බැගින් යැව්වේය. දාවිත්
හා ඔහුගේ සෙනඟ ගිය සියලු ස්ථාන-
වල විසූ අයට කොටසක් ලැබිණ.

**31** පිලිස්තිවරු ඊශ්‍රායෙල්ව-
රුන්ට විරුද්ධව සටන්
කළෝය.[4] පරාජයට පත්වූ ඊශ්‍රා-
යෙල්වරුන් පිලිස්තිවරුන් වෙතින්
පලා ගිය අතර ගිල්බෝවා කන්දේදී[5]
ඔවුන්ගෙන් බොහෝදෙනෙක් මැරුම්
කෑවෝය.[6] **2** පිලිස්තිවරු සාවුල්
රජු සහ ඔහුගේ පුත්‍රයන්ව លුහුබඳිමින්
ඔවුන් කිට්ටුවටම ආවෝය. බොහෝ
වේලාවක් සටන් කළ පසු පිලිස්තිවරු
සාවුල් රජුගේ පුත්‍රයන් වන යො-
නාතාන්වද[7] අබිනාදාබ්වද[8] මල්කී-
ෂුවාවද[9] මරා දැමුවෝය. **3** සාවුල්
රජුට විරුද්ධව එල්ල කළ ප්‍රහාර
එන්න එන්නම දරුණු අතට හැරිණ.
දුනුවායන්ගේ ඉලක්කයට ගොදුරු වූ
සාවුල් රජ බරපතළ ලෙස තුවාල
ලැබුවේය.[10] **4** එවිට සාවුල් රජ තම
ආයුධ රැගෙන ගිය තැනැත්තාට
මෙසේ කීවේය. “මේ අපවිත්‍රයන්*[11]
අතින් මැරුම් කන එක මට නින්දා-
වක්. ඒ නිසා ඊට කලින් ඔබේ කඩු-
වෙන් මාව මරලා දාන්න.”[12] නමුත්
ඔහුගේ ආයුධ රැගෙන ගිය තැනැත්තා
ඒ ගැන මහත් සේ භය වී එසේ කිරී-
මට අකමැති විය.[13] එබැවින් සාවුල්
රජ කඩුව ගෙන තමාටම ඇනගත්-
තේය.[14] **5** සාවුල් රජු මිය ගිය බව
දැක[15] ඔහුද තම කඩුවෙන් තමාටම
ඇනගෙන මිය ගියේය.[16] **6** සාවුල්
රජද ඔහුගේ පුත්‍රයන් තිදෙනාද ඔහු-
ගේ ආයුධ දරන්නාද ඔහු සමඟ
සිටි මුළු සෙනඟද එදින මැරුම්
කෑවෝය.[17] **7** ඊශ්‍රායෙල් හමුදාව
පලා ගිය බවත් සාවුල් රජු සහ ඔහු-
ගේ පුත්‍රයන් මිය ගිය බවත් ආරංචි
වූ විට තැනිතලාවේ හා යෝර්දාන්

**30 පරි.**
1 1සාමු 30:10
2 1සාමු 10:27 නාහු 1:15
3 1ලේක 29:12 ගීතා 33:16
4 ගණන් 31:49
5 1සාමු 30:8 ගීතා 44:3
6 1සාමු 10:22 1සාමු 17:22 1සාමු 25:13 1සාමු 30:10
7 ගණන් 31:27 යොෂු 22:8 ගීතා 68:12 1තිමෝ 6:18
8 ගණන් 27:11
9 යෙසා 32:8
10 උත් 33:11 2රාජා 5:15 හිතෝ 11:24 හිතෝ 18:16 ක්‍රියා 20:35
11 යොෂු 19:4
12 යොෂු 19:8
13 යොෂු 15:48 යොෂු 21:14
14 යොෂු 15:50 යොෂු 21:14
15 1සාමු 27:10 1ලේක 2:9 1ලේක 2:26
16 විනි 1:16 1සාමු 15:6

**2 තීරුව**
1 යොෂු 19:4 විනි 1:17
2 යොෂු 19:7
3 යොෂු 14:13 2සාමු 2:1

**31 පරි.**
4 1සාමු 14:52 1සාමු 29:1
5 1සාමු 28:4 2සාමු 1:21
6 1සාමු 12:25 1ලේක 10:1
7 1සාමු 13:2
8 1ලේක 8:33
9 1ලේක 9:39
10 2සාමු 1:4 2සාමු 1:6
11 1සාමු 14:6 1සාමු 17:26 2සාමු 1:20 එස 44:7
12 විනි 9:54 1ලේක 10:4
13 1සාමු 22:17 2සාමු 1:14 ගීතා 105:15
14 නික් 20:13 2සාමු 17:23 1රාජා 16:18 1ලේක 10:4 මනෙ 27:5

**15** 1සාමු 26:10; 1ලේක 10:13; හොෂෙ 13:11; **16** 1ලේක 10:5; **17** 1සාමු 28:19; 1ලේක 10:6.

**1සාමු 30:26*** මූ.අ., “ආශීර්වාදයක්.”

**1සාමු 31:4*** මූ.අ., “අචර්මච්ඡේදිතයන්.”

ගහ අසල පදිංචිව සිටි ඊශ්‍රායෙල්වරු
තම තමන්ගේ ගම්බිම් අත්හැර පලා
ගියෝය.[1] පසුව පිලිස්තිවරු ඒ නුවර-
වලට පැමිණ ඒවායේ පදිංචි වූහ.[2]
**8** මිය ගිය අයගේ වටිනා ඇඳුම් හා
ආයුධ පැහැරගන්නා පිණිස[3] පසු-
වදා පිලිස්තිවරු ගිල්බෝවා කන්-
දට ආවෝය. එවිට සාවුල් රජුගේ
සහ ඔහුගේ පුත්‍රයන් තිදෙනාගේ මළ
සිරුරු එහි තිබෙන බව ඔවුහු දුටු-
වෝය.[4] **9** ඔවුහු සාවුල් රජුගේ හිස
කපා[5] ඔහුගේ ආයුධ ගලවා දැමු-
වෝය. ඉන්පසු ඔවුහු පිලිස්තිවරුන්-
ගේ දේශය පුරාම තිබූ දේවාලවලට[6]
හා දේශයේ ජීවත් වූ සෙනඟට ඒ ගැන
දැනුම් දුන්නෝය.[7] **10** පසුව ඔවුහු
සාවුල් රජුගේ ආයුධ[8] අෂ්ටොරෙත්ගේ
දේවාලයේ[9] තැබුවෝය. රජුගේ මළ

**31 පරි.**
**1** ද්වි 28:25
1සාමු 13:6
**2** ගණන් 33:56
ද්වි 28:33
1ලේක 10:7
**3** 1ලේක 10:8
2ලේක 20:25
**4** 1සාමු 28:4
1සාමු 31:1
2සාමු 1:6
2සාමු 21:12
**5** 1සාමු 17:51
1ලේක 10:9
**6** විනි 16:23
**7** 2සාමු 1:20
**8** 1සාමු 21:9
1ලේක 10:10
**9** විනි 2:13

**2 තීරුව**
**1** යොෂු 17:11
විනි 1:27
2සාමු 21:12

සිරුර බෙත්-ෂාන් නුවරේ පවුර මත
එල්ලුවෝය.[1] **11** පිලිස්තිවරුන්
සාවුල් රජුට කළ දේ යාබෙෂ්-
ගිලියද්හි[2] වැසියන්ට ආරංචි විය.
**12** එවිට ඒ නුවරේ සිටි නිර්භීත
මනුෂ්‍යයෝ රාත්‍රිය පුරා ගමන් කර
බෙත්-ෂාන් නුවර වෙත ගියෝය.
ඔවුහු පවුර මත එල්ලා තිබුණු සාවුල්
රජුගේ සහ ඔහුගේ පුත්‍රයන්ගේ මළ
සිරුරු බිමට බා ඒවා යාබෙෂ් වෙත
ගෙන ගොස් ගින්නෙන් දවා දැමු-
වෝය.[3] **13** පසුව ඔවුහු ඔවුන්ගේ
ඇටකටු[4] ගෙන යාබෙෂ්හි තිබූ කිහිරි
ගස[5] යට වළලා[6] දවස් හතක් පුරා
නිරාහාරව සිටියෝය.[7]

**2** 1සාමු 11:1; 2සාමු 2:4; 2සාමු 21:12; 1ලේක 10:11; **3** ආමො 6:10; **4** 2සාමු 21:12; **5** උත් 21:33; 1සාමු 22:6; 1ලේක 10:12; **6** උත් 35:8; 2සාමු 2:5; **7** උත් 50:10.

## දෙවෙනි
# සාමුවෙල්
නැතහොත් ග්‍රීක සෙප්ටුඅජින්ට් පරිවර්තනයට අනුව
දෙවෙනි රාජාවලිය

**1** දාවිත් අමලෙක්වරුන්ට පහර
දී[1] ආපසු ෂික්ලග්[2] වෙත හැරී
ආවේය. ඒ වන විට සාවුල් රජ ජීව-
තුන් අතර සිටියේ නැත. දාවිත් දවස්
දෙකක් ෂික්ලග්හි නැවතී සිටියේය.
**2** තුන්වන දවසේදී සාවුල් රජුගේ
කඳවුරේ සිට එක්තරා මිනිසෙක්[3]
දාවිත් ළඟට දුවගෙන ඇවිත් ඔහු ඉදි-
රියේ දණින් වැටී[4] පොළොව දෙසට
හිස පහත් කළේය. ඒ මිනිසා තම
වස්ත්‍ර ඉරාගෙන[5] හිස මත දූවිලි දමා-
ගෙන[6] සිටියේය.
**3** "ඔබ කොහේ ඉඳන්ද ආවේ"
කියා දාවිත් ඒ මිනිසාගෙන් ඇසුවේය.
"මම ඊශ්‍රායෙල්වරුන්ගේ කඳවුරෙන්
පැනලා ආවා" කියා ඔහු කීවේය.
**4** එවිට දාවිත්, "ඇයි, එහේ මොනවද
සිද්ධ වුණේ" කියා ඔහුගෙන් ඇසු-

**1 පරි.**
**1** 1සාමු 30:17
**2** 1සාමු 27:6
1සාමු 30:26
**3** 2සාමු 4:10
**4** 1සාමු 25:23
2සාමු 14:4
**5** උත් 37:29
ගණන් 14:6
යොෂු 7:6
**6** 1සාමු 4:12

**2 තීරුව**
**1** 1සාමු 31:1
**2** 1සාමු 31:6
1ලේක 10:4
**3** 1සාමු 31:2
1ලේක 10:6
**4** හිතෝ 14:15
හිතෝ 25:2
**5** 1සාමු 28:4
1ලේක 10:1
**6** 1සාමු 18:10
1සාමු 19:9
1සාමු 22:6
1සාමු 26:12

වේය. එවිට ඔහු මෙසේ පැවසුවේය.
"ඊශ්‍රායෙල් සෙනඟ යුධ පිටියෙන් පලා
ගියා. හුඟදෙනෙක් මැරුණා.[1] සාවුල්
රජුත්[2] ඔහුගේ පුත් යොනාතානුත්[3]
මැරුණා." **5** එවිට දාවිත් ඒ තරු-
ණයාගෙන් මෙසේ ඇසුවේය. "සාවුල්
රජුයි යොනාතානුයි මැරුණා කියලා
ඔබ කොහොමද දන්නේ?"[4] **6** තරු-
ණයා මෙසේ උත්තර දුන්නේය. "මම
අහම්බෙන් වගේ ගිල්බෝවා කන්දට[5]
ආවා. එතකොට සාවුල් රජ ඔහු-
ගේ හෙල්ලය අල්ලගෙන[6] අමාරු-
වෙන් ඉන්නවා මම දැක්කා. අශ්ව රථ
පදවන අයයි අසරුවනුයි ඔහු ළඟටම
ඇවිත් හිටියා.[7] **7** සාවුල් රජ පිටු-
පස හැරී බලද්දී මාව දැකලා මට

**7** 1සාමු 31:3; 1ලේක 10:3.

හඬගැසුවා. එතකොට මම, 'ඇයි
මගේ ස්වාමීනි' කියලා ඔහුගෙන්
අහද්දී, 8 'ඔබ කවුද' කියලා ඔහු
මගෙන් ඇහුවා. 'මම අමලෙක්වර-
යෙක්'[1] කියලා ඔහුට කිව්වා. 9 ඒ
අවස්ථාවේදී ඔහු මට මෙහෙම කිව්වා.
'මට තවම පණ[2] තිබුණත් කිසිම දෙ-
යක් කරගන්න බැරි වේදනාවකිනුයි
මම ඉන්නේ. මගේ ළඟට ඇවිත් මාව
මරලා දාන්න.' 10 ඔහු දරුණු විදි-
හට තුවාල වෙලා හිටිය නිසා ඔහු
ජීවත් වෙන එකක් නැහැයි කියලා
මම දැනගත්තා. ඒ නිසා මම ඔහු
ළඟට ගිහින් ඔහුව මරලා දැම්මා.[3]
ඊටපස්සේ ඔහුගේ ඔටුන්නයි[4] ඔහුගේ
අතේ තිබුණ වළල්ලයි ගලවගෙන
ආවා. මගේ ස්වාමීනි, මම ඒවා ගෙ-
නාවේ ඔබට භාර දෙන්න."

11 එවිට දාවිත්ද ඔහු සමඟ සිටි
සියලුදෙනාද ඔවුන්ගේ වස්ත්‍ර ඉරා-
ගත්තෝය.[5] 12 සාවුල් රජු සහ
ඔහුගේ පුත් යොනාතාන්ද යෙහෝවා
දෙවිගේ සෙනඟද ඊශ්‍රායෙලිතයන්ද
යුද්ධයේදී මිය ගිය බැවින්[6] ඔවුහු
සවස් වන තුරු නිරාහාරව[7] සිට හඬා
වැලපුණෝය.[8]

13 පසුව ඒ ආරංචිය ගෙනා තරු-
ණයාගෙන් දාවිත් මෙසේ ඇසුවේය.
"ඔබ කාගේ කවුද?" තරුණයාද,
"මගේ පියා අමලෙක් ජාතිකයෙක්.[9]
ඔහු විදේශිකයෙක්" කියා කීවේය.
14 එවිට දාවිත්, "යෙහෝවා දෙවි-
ගේ අභිෂේක ලත් තැනැත්තාව[10]
ඔබ මරා දැමුවේ ඇයි? ඔබට ඒ
වගේ දෙයක් කරන්න භය හිතුණේ
නැද්ද"[11] කියා ඔහුගෙන් ඇසුවේය.
15 ඉන්පසු දාවිත්, "මේ මනුෂ්‍යයාව
මරලා දාන්න" කියා ඔහු ළඟ සිටි
තරුණයෙකුට කීවේය. ඔහුද එසේ
කළේය.[12] 16 දාවිත් ඒ අවස්ථාවේදී
මෙසේ කීවේය. "ඔබේ මරණයට වග
කිව යුත්තේ ඔබමයි.[13] 'යෙහෝවා
දෙවිගේ අභිෂේක ලත් තැනැත්තාව
මැරුවේ මමයි'[14] කියලා කිව්වේ ඔබ-
මයි. ඔබ ඔබටම විරුද්ධව සාක්ෂි
දුන්නා."[15]

**1 පරි.**
1 නික් 17:16
ගණන් 24:20
ද්වි 25:19
1සාමු 15:20
1සාමු 30:1
1සාමු 30:18
2 උත් 2:7
3 1සාමු 31:4
ගීතා 5:6
යොහ 8:44
4 2රාජා 11:12
5 2සාමු 3:31
2සාමු 13:31
2ලේක 34:27
ක්‍රියා 14:14
6 1සාමු 31:1
2සාමු 1:4
7 1සාමු 31:13
8 ද්වි 34:8
9 2සාමු 1:8
10 1සාමු 24:6
1සාමු 26:9
ගීතා 105:15
11 ගණන් 12:8
1සාමු 31:4
12 2සාමු 4:10
1රාජා 2:25
13 යොෂු 2:19
විනි 9:24
2සාමු 4:11
1රාජා 2:37
එස 18:13
ක්‍රියා 18:6
14 2සාමු 1:10
15 හිතෝ 19:5
හිතෝ 21:28

**2 තීරුව**
1 1සාමු 31:6
2 2සාමු 3:33
2ලේක 35:25
3 1සාමු 20:36
1සාමු 31:3
2සාමු 1:22
4 උත් 49:8
1සාමු 30:26
5 යොෂු 10:13
6 1සාමු 31:8
විලා 2:1
7 ද්වි 32:27
1සාමු 31:9
8 ද්වි 28:37
9 යොෂු 13:3
විනි 16:23
1සාමු 6:17
10 1සාමු 31:1
1ලේක 10:1
11 ලෙවී 27:16
12 යෙසා 21:5
13 1සාමු 18:4
1සාමු 20:20
14 1සාමු 14:47
15 1සාමු 18:1
16 1සාමු 31:6
1ලේක 10:6
17 යෝබ් 9:26
යෙරෙ 4:13
විලා 4:19
හබ 1:8

17 පසුව සාවුල් රජු හා ඔහු-
ගේ පුත් යොනාතාන් වෙනුවෙන්[1]
දාවිත් විලාප ගීයක්[2] ගායනා කළේය.
18 "දුන්න"[3] ලෙස හැඳින්වූ එම ගීය
යූදා[4] ජනයාට උගන්වන ලෙස දාවිත්
නියම කළේය. ඒ ගීය යාෂාර් නම්
ලියවිල්ලෙහිද[5] සටහන් කර තිබේ.

19 "අනේ ඊශ්‍රායෙල්, ඔබේ තේජස
කඳු මුදුනෙහි පහව ගියේය.[6]
ඔබේ තේජවත් බලවතුන් වැටී
ගිය හැටි බලන්න!
20 පිලිස්තිවරුන්ගේ දූවරු ප්‍රීති නො-
වන පිණිස
ඒ පුවත ගාත්හි ප්‍රසිද්ධ නොක-
රන්න.[7]
අචර්මච්ඡේදිතයන්ගේ දූවරු ප්‍රීති
ඝෝෂා නොනඟන පිණිස[8]
ඒ ගැන අෂ්කෙලොන්හි[9]
මාවත්වල දැනුම් නො-
දෙන්න.
21 ගිල්බෝවා කඳුකරයට[10] පිනි-
වත් වර්ෂාවවත් නොවැ-
ටේවා! දෙවිට ඔප්පු කරන
පිණිස[11] එහි කෙත්වතුවලින්
කිසි පලදාවක් නොලැබේවා!
මන්ද බලවතුන්ගේ පලිස් පාගා
දැමුවේ එතැනය.
සාවුල් රජුගේ පලිහ පාගා දැමු-
වේද එතැනය. තෙලින්
ආලේප කළ එක් පලිහක්වත්
ඉතුරු නොවීය.[12]
22 යොනාතාන්ගේ ඊතල කිසිවිටක-
වත් සතුරන්ගේ ලේ නොව-
ගුරුවා හැරී ආවේ නැත.[13]
බලවතුන්ගේ මාංස තුවාල
නොකර හැරී ආවේ නැත.
එසේම සාවුල් රජුගේ කඩුව ජය
නොලබා කිසිවිටකවත් හැරී
ආවේ නැත.[14]
23 සැමගේ සිත් දිනාගත්, බොහෝ
ප්‍රේම ලත් අය වූ සාවුල් හා
යොනාතාන්[15]
මරණයේදීවත් වෙන් වූයේ
නැත.[16]
රාජාලීන්ටත් වඩා වේගයෙන්[17]
ගමන් කළ ඔවුහු

සිංහයන්ටත් වඩා බලවත්[1]
වුණෝය.
24 ඊශ්‍රායෙල් දියණියෙනි, ඔබට අලං-
කාර රතු වස්ත්‍ර අන්දවා
ඔබව රන් ආභරණවලින් සැරසූ[2]
සාවුල් රජු වෙනුවෙන් හඬා
වැලපෙන්න.
25 අනේ, තේජවත් බලවතුන් යුධ
පිටියේ වැටී ගිය හැටි
බලන්න![3]
යොනාතාන් කඳු මුදුනෙහි
මැරුම් කෑවේය.[4]
26 අනේ මගේ සහෝදර යොනා-
තාන්, මම ඔබ ගැන බො-
හෝ සෙයින් දුක් වෙමි.
ඔබේ මිතුදම මට කොතරම්
ප්‍රියද![5]
ඔබ මට දැක්වූ ප්‍රේමය මොන
තරම්ද! එය ස්ත්‍රීන්ගෙන් ලද
ආදරයටත් වඩා අගනේය![6]
27 අනේ, තේජවත් බලවතුන් වැටී
ගිය හැටි බලන්න![7]
යුධ අවි සුනුවිසුනු වූ හැටි
බලන්න!"

2 දාවිත් යෙහෝවා දෙවිගෙන්
මෙසේ විමසුවේය.[8] "දැන් මම
යූදා ගෝත්‍රයේ නුවරකට යන්නද?"
යෙහෝවා දෙවිද, "යන්න" කියා ඔහුට
කීවේය. එවිට දාවිත්, "මම යා යුත්-
තේ කොයි නුවරටද" කියා ඇසු-
වේය. දෙවිද, "හෙබ්‍රොන් නුවරට[9]
යන්න" කියා කීවේය. 2 දාවිත්ද
ඔහුගේ භාර්යාවෝ දෙදෙනා වන යෙ-
ෂ්‍රෙයෙල්හි අහිනොවම්ද[10] කර්මෙල්හි
නාබල්ගේ භාර්යාවව සිටි අබිගා-
යිල්ද[11] හෙබ්‍රොන් නුවරට ගියෝය.
3 දාවිත් සමඟ සිටි පුරුෂයෝද[12] ඔවු-
නොවුන්ගේ පවුල්ද හෙබ්‍රොන් නුවර
හා ඒ අවට නගරවල පදිංචි වූහ.
4 යූදා ගෝත්‍රයේ[13] පුරුෂයෝ එතැ-
නට පැමිණ දාවිත්ව ඔවුන්ගේ රජු[14]
ලෙස අභිෂේක කළෝය.[15]
"සාවුල් රජුගේ මළ සිරුර තැන්-
පත් කළේ යාබෙෂ්-ගිලියද්හි වැසියන්"
කියා දාවිත්ට ආරංචි විය. 5 එබැ-
වින් දාවිත් යාබෙෂ්-ගිලියද්[16] වෙත
පණිවිඩකරුවන් යවා මෙසේ දන්වන
ලදි. "ඔබ ඔබේ ස්වාමියා වන සාවුල්
රජුගේ මළ සිරුර තැන්පත්[1] කළ බව
මට ආරංචි වුණා. ඔබ ඔහුට ප්‍රේමය*[2]
පෙන්වූ නිසා යෙහෝවා දෙවිගෙන්
ඔබට ආශීර්වාද ලැබේවා![3] 6 ඔබ
කළ ඒ යහපත් ක්‍රියාව නිසා යෙ-
හෝවා දෙවිත් ඔබට ප්‍රේමය*[4] පෙන්-
වයි. ඔහු ඔබ සමඟ විශ්වාසවන්තව
ක්‍රියා කරයි. මමත් ඔබට එලෙසම
සලකනවා.[5] 7 ඔබේ ස්වාමියා වන
සාවුල් රජු දැන් ජීවතුන් අතර නැති
බව ඇත්තයි. නමුත් ඔබ දැන් ශක්ති-
මත් වී ඔබේ නිර්භීතකම පෙන්-
වන්න.[6] යූදා ගෝත්‍රයේ ජනයා මාව
අභිෂේක කර ඔවුන්ගේ රජු හැටියට
පත් කළා."[7]
8 සාවුල් රජුගේ හමුදාපතිව සිටි
නේර්ගේ පුත්‍රයා වන අබ්නේර්[8]
සාවුල් රජුගේ පුත්‍රයා වූ ඉෂ්බෝ-
ෂෙත්ව[9] මහනායිම් නුවරට[10] ගෙනා-
වේය. 9 ඉන්පසු ඔහු අෂූර්වරුන්ද
ගිලියද්,[11] යෙෂ්‍රෙයෙල්[12] හා එෆ්‍රායිම්[13]
නම් පළාත්ද බෙන්ජමින් ගෝත්‍ර-
යට[14] අයිති ප්‍රදේශයද ඉෂ්බෝෂෙත්ට
යටත් කර දී මුළු ඊශ්‍රායෙල් දේශ-
යේ රජු ලෙස ඔහුව පත් කළේය.
10 ඉෂ්බෝෂෙත්ට ඊශ්‍රායෙල්හි රජ-
කම භාර දෙන විට ඔහුට වයස
අවුරුදු හතළිහක් විය. ඔහු අවු-
රුදු දෙකක් රජකම් කළේය. යූදා
ගෝත්‍රය[15] පමණක් දාවිත් යටතේ
තිබුණේය. 11 දාවිත් අවුරුදු හත-
කුත් මාස හයක් යූදාහි රජු ලෙස
කටයුතු කළේය.[16] ඔහු රජකම් කළේ
හෙබ්‍රොන් සිටය.
12 ටික කලකට පසු නේර්ගේ
පුත්‍රයා වූ අබ්නේර්ද සාවුල්
රජුගේ පුත්‍රයා වූ ඉෂ්බෝෂෙත්ගේ

**1 පරි.**
1 විනි 14:18; හිතෝ 30:30
2 උත් 24:53
3 2සාමු 1:19
4 1සාමු 31:8; 2සාමු 1:19
5 1සාමු 18:1
6 රූත් 1:17; 1සාමු 18:3; 1සාමු 19:2; 1සාමු 20:17; 1සාමු 20:41; 1සාමු 23:16; හිතෝ 17:17; හිතෝ 18:24
7 2සාමු 1:19

**2 පරි.**
8 ගණන් 27:21; විනි 1:1; 1සාමු 28:6; 1සාමු 30:8
9 උත් 23:2; ගණන් 13:22; යොශු 14:14; යොශු 20:7; යොශු 21:11; යොශු 21:12; 1සාමු 30:31; 2සාමු 5:1; 1රාජා 2:11
10 1සාමු 25:43; 1සාමු 30:5
11 1සාමු 25:42
12 1සාමු 22:2; 1සාමු 27:2; 1ලේක 12:1
13 උත් 49:10; 2සාමු 19:11; 2සාමු 19:42
14 1සාමු 15:28; 2සාමු 5:5; 1ලේක 11:3
15 1සාමු 16:13
16 1සාමු 31:11

**2 තීරුව**
1 1සාමු 31:13
2 1සාමු 15:6; හිතෝ 19:22; හොෂෙ 6:6; මීකා 6:8
3 රූත් 3:10
4 2සාමු 15:20; ගීතා 40:11; ගීතා 57:3
5 2සාමු 9:7; 2සාමු 10:2; හිතෝ 11:10
6 2සාමු 10:12
7 උත් 49:10; 2සාමු 2:4
8 1සාමු 14:50; 1සාමු 17:55; 1සාමු 26:5; 2සාමු 4:1; 1රාජා 2:5; 1ලේක 26:28

**9** 2සාමු 3:7; 2සාමු 4:5; 2සාමු 4:12; **10** උත් 32:2; යොශු 13:30; 2සාමු 17:24; **11** ගණන් 32:1; යොශු 13:11; **12** යොශු 19:18; **13** යොශු 16:5; **14** යොශු 18:11; **15** 2සාමු 2:4; **16** 2සාමු 5:5; 1රාජා 2:11; 1ලේක 3:4; 1ලේක 29:27.

**2සාමු 2:5*** හෝ, "ලැදි ප්‍රේමය." **6*** හෝ, "ලැදි ප්‍රේමය."

සේවකයෝද මහනායිම්[1] සිට ගිබ්-
යොන් නුවරට[2] ගියෝය. **13** පසුව
ෂෙරුයියාගේ[3] පුත්‍රයා වූ යෝවාබ්ද[4]
දාවිත්ගේ සේවකයෝද අබ්නේර්ගේ
කණ්ඩායම හමු වීමට ගිබියොන්හි
පොකුණ ළඟට ගියෝය. කණ්ඩායම්
දෙක වෙන වෙනම පොකුණ දෙපැත්-
තේ හිඳගත්තෝය. **14** ටික වේලා-
වක් ගිය පසු අබ්නේර්, යෝවාබ්ට
මෙසේ කීවේය. "තරුණයන්ට අපි ඉදි-
රියේ සටන් කරන්න කියමු." යෝ-
වාබ්ද, "නැඟිට සටන් කරන්න" කියා
තරුණයන්ට කීවේය. **15** සාවුල්
රජුගේ පුත්‍රයා වූ ඉෂ්බෝෂෙත්ගේ[5]
කණ්ඩායමට අයිති බෙන්ජමින්වරු
දොළොස්දෙනෙක්ද දාවිත්ගේ සේව-
කයෝ දොළොස්දෙනෙක්ද නැඟිට
සටනට සූදානම් වූහ. **16** ඔවුහු එක්
එක් කෙනා තම තමාගේ සතුරාගේ
හිසකෙස්වලින් ඇද කඩුවෙන් ඇන්-
නෝය. ඒ සියලුදෙනාම මැරී වැටු-
ණෝය. පසුව ගිබියොන්හි[6] තිබෙන
එම ස්ථානයට හෙල්කත්හෂ්ෂූරිම්*
යන නම තබන ලදි.

**17** එදින ඔවුහු ඉතා දරුණු ලෙස
සටන් කළෝය. දාවිත්ගේ සේවකයෝ
අබ්නේර්ව[7] සහ ඊශ්‍රායෙල් සෙනඟව
පරාජයට පත් කළෝය. **18** ෂෙරු-
යියාගේ[8] පුත්‍රයන් වන යෝවාබ්ද[9]
අබිෂයිද[10] අසහෙල්ද[11] එතැන සිටි-
යෝය. අසහෙල් දිවීමට දක්ෂයෙකි.
මුවෙකු*[12] මෙන් වේගයෙන් දිවීමට
ඔහුට හැකියාව තිබිණ. **19** එදින
ඔහු අබ්නේර් පසුපස ලුහුබැඳ ගියේය.
ඔහු දකුණටවත් වමටවත් නො-
හැරී දිගටම අබ්නේර්ව ලුහුබැන්දේය.
**20** ටික වේලාවකට පසු අබ්නේර්
පිටුපස හැරී මෙසේ ඇසීය. "ඔබ කවුද?
අසහෙල්ද?" "ඔව්, මම අසහෙල්" කියා
ඔහු පිළිතුරු දුන්නේය. **21** එවිට
අබ්නේර් ඔහුට මෙසේ කීවේය. "ඔබේ
දෙපැත්තේ ඉන්න ඕනෑම තරුණ-
යෙක්ව අල්ලගන්න. ඔහු ළඟ තියෙන
හැම දෙයක්ම අරගෙන යන්න."[1]
නමුත් අසහෙල් ඔහුට සවන් දුන්නේ
නැත. **22** එබැවින් අබ්නේර් අස-
හෙල්ට මෙසේ කීවේය. "මගේ පස්සේ
එළවගෙන එන්න එපා. ඔබ දැන් මෙ-
හෙන් යන්න. නැත්නම් මට ඔබව
මරන්න සිදු වෙනවා.[2] එහෙමවුණොත්
මම කොහොමද ඔබේ සහෝදරයා
වන යෝවාබ්ගේ මූණ බලන්නේ?"
**23** නමුත් අසහෙල් හැරී යැමට අක-
මැති විය. එබැවින් අබ්නේර් හෙල්ල-
යේ මිටෙන් ඔහුගේ බඩට ඇන්නේය.[3]
හෙල්ලය ඔහුගේ බඩ පසාරු කරගෙන
පිටෙන් එළියට මතු විය. ඔහු එතැ-
නම මැරී වැටුණේය. අසහෙල්ගේ මළ
සිරුර තිබූ තැනට පැමිණි සියලුදෙනා
එය දැක එතැනම නතර වූහ.[4]

**24** ඉන්පසු යෝවාබ් සහ අබිෂයි,
අබ්නේර් පසුපස හඹා ගියෝය. හිරු
බැස යන වේලාවේදී ඔවුහු ගිබියොන්
පාළුකරයට[5] යන මඟෙහි තිබෙන
අම්මාහ් නම් කන්දට පැමිණියෝය.
එම කන්ද තිබෙන්නේ ගීයා නම්
ස්ථානයට ඉදිරියෙනි. **25** බෙන්ජ-
මින්වරු අබ්නේර් වටා රැස් වූහ.
ඔවුහු එක කණ්ඩායමක් ලෙස කන්-
දක් මුදුනට ගොස් සිටගත්තෝය.
**26** පසුව අබ්නේර්, යෝවාබ්ගෙන්
මෙසේ ඇසුවේය. "තව කොච්චර වෙ-
ලාවක් මේ සටන[6] ගෙන යන්න
ඔබ හිතාගෙන ඉන්නවාද? මේක
නතර කළේ නැත්නම් අපි දෙ-
ගොල්ලෝ අතර ලොකු වෛරයක්
ඇති වෙයි කියලා ඔබට තේරෙන්නේ
නැද්ද?[7] එක් එක් කෙනා තම තමා-
ගේ සහෝදරයාට විරුද්ධව කරන
මේ සටන නතර කරන්න කියලා
ඔබ අණ කරන්නේ නැත්තේ ඇයි?"[8]
**27** එවිට යෝවාබ් මෙසේ කීවේය.
"ජීවමාන, සැබෑ දෙවි ඉදිරියේ මා
කියන මේ දේ සත්‍යයක්.[9] ඔබ මේ
කාරණය ගැන මට කතා කළේ
නැත්නම්[10] උදේ වෙන තුරු කිසි-
වෙකු සටන අත්හරින්නේ නැති බව
ස්ථිරයි." **28** ඉන්පසු යෝවාබ් හො-
රණෑව පිඹ්බේය.[11] එවිට සෙනඟ,

**2 පරි.**
1 2සාමු 2:8
2 යොෂු 10:1
යොෂු 10:12
යොෂු 18:25
යොෂු 21:17
2සාමු 20:8
1රාජා 3:5
1ලේක 14:16
2ලේක 1:3
යෙසා 28:21
3 1ලේක 2:16
4 2සාමු 8:16
2සාමු 20:23
1රාජා 1:7
5 2සාමු 2:8
6 2සාමු 2:12
7 2සාමු 2:8
8 1ලේක 2:16
9 2සාමු 10:7
2සාමු 18:2
2සාමු 24:2
1රාජා 11:15
1ලේක 11:6
10 1සාමු 26:6
2සාමු 10:10
2සාමු 20:6
1ලේක 11:20
1ලේක 19:11
11 2සාමු 3:27
2සාමු 23:24
1ලේක 11:26
1ලේක 27:7
12 1ලේක 12:8
සල 2:17
සල 8:14

**2 තීරුව**
1 විනි 14:19
2ලේක 20:25
2 හිතෝ 29:1
දේශ 6:10
3 2සාමු 3:27
2සාමු 4:6
2සාමු 20:10
4 2සාමු 20:12
5 2සාමු 2:12
6 2සාමු 11:25
යෙසා 1:20
යෙරෙ 2:30
යෙරෙ 12:12
යෙරෙ 46:10
7 හිතෝ 17:14
8 ක්‍රියා 7:26
9 1සාමු 25:26
1රාජා 2:24
2රාජා 2:2
10 හිතෝ 20:18
ලූක් 14:31
11 1සාමු 13:3
2සාමු 18:16
2සාමු 20:22

**2සාමු 2:16*** තේරුම, "මුවහත් පිහි ඇති කෙත."
**18*** මූ.අ., "ගසෙල් මුවෙකු."

ඊශ්‍රායෙල්වරුන් පසුපස හඹා යෑම
නතර කළෝය. ඔවුහු තවදුරටත්
ඔවුන් සමඟ සටන් නොකළෝය.
**29** අබ්නේර් සහ ඔහුගේ සෙනඟ
මුළු රාත්‍රිය පුරා අරබා නිම්-
නය[1] හරහා ගමන් කර යෝර්දාන්
ගඟෙන් එතෙර වූහ.[2] ඉන්පසු ඔවුහු
නිම්නයෙන් උඩට නැඟ අවසාන-
යේදී මහනායිම් නුවරට[3] ආවෝය.
**30** යෝවාබ්, අබ්නේර් පසුපස ලුහු-
බැඳ යෑම අත්හැර සෙනඟ නැවත
තමා වෙතට රැස් කරගත්තේය. එවිට
ඔහු දාවිත්ගේ සේවකයන් අතරින්
අසහෙල් ඇතුළුව තවත් දහනවදෙ-
නෙකු මිය ගොස් ඇති බව දැනගත්-
තේය. **31** අබ්නේර්ගේ සෙනඟ හා
බෙන්ජමින් ගෝත්‍රයට අයත් අය අත-
රින් තුන්සිය හැටදෙනෙක් දාවිත්-
ගේ සේවකයන්ගේ අතින් මැරුම්
කෑවෝය.[4] **32** ඔවුහු අසහෙල්ගේ[5]
මළ සිරුර බෙත්ලෙහෙම් නගරයේ[6]
තිබූ ඔහුගේ පියාගේ සොහොන් ගෙට
ගෙන ගොස් එහි තැන්පත් කළෝය.[7]
යෝවාබ් සහ ඔහුගේ සෙනඟ මුළු
රාත්‍රිය පුරාම ගමන් කර එළිය වැටී-
ගෙන එන විට හෙබ්‍රොන් නුවරට[8]
ආවෝය.

**3** සාවුල්ගේ සෙනඟ හා දාවිත්-
ගේ සෙනඟ අතරේ තිබූ ගැටුම
බොහෝ කාලයක් පුරා පැවතුණේය.[9]
දාවිත් වඩ වඩා බලවත් වූ අතර[10]
සාවුල්ගේ පෙළපතේ අයට තිබූ බලය
ක්‍රමක්‍රමයෙන් අඩු වී ගියේය.[11]
**2** හෙබ්‍රොන් නුවරෙහි[12] ජීවත් වූ
කාලයේදී දාවිත්ට පුත්‍රයෝ[13] උපන්-
නෝය. ඔහුගේ වැඩිමල් පුත්‍රයාගේ
නම අම්නොන්ය.[14] ඔහුගේ මව යෙ-
ෂ්‍රෙයෙල්හි අහිනොවම්ය.[15] **3** ඔහු-
ගේ දෙවන පුත්‍රයාගේ නම
කිලෙයාබ්ය.[16] ඔහුගේ මව කර්මෙල්හි
නාබල්ගේ භාර්යාවව සිටි අබිගා-
යිල්ය.[17] ඔහුගේ තුන්වන පුත්‍රයා-
ගේ නම අබ්සලොම්ය.[18] ඔහුගේ මව
ගෙෂූර්හි රජු වූ තල්මයිගේ[19] දිය-
ණිය වන මයකාය. **4** හග්ගිත්ගේ[20]
පුත්‍රයා වන අදොනියා[21] ඔහුගේ හත-
රවන පුත්‍රයාය. අබිටල්ගේ පුත්‍රයා වන
ෂෙපටියා[1] ඔහුගේ පස්වන පුත්‍රයාය.
**5** දාවිත්ගේ භාර්යාව වන එග්ලා බිහි
කළ ඉත්රෙයාම්[2] ඔහුගේ හයවන පුත්‍ර-
යාය. ඒ සියලුදෙනා හෙබ්‍රොන්හිදී
දාවිත්ට ආව උපන් පුත්‍රයෝය.
**6** සාවුල්ගේ සෙනඟ හා දාවිත්-
ගේ සෙනඟ අතරේ දිගටම ගැටුම්
පැවතුණේය. ඒ කාලයේදී අබ්නේර්[3]
සාවුල් රජුගේ නිවසේ තම බලය තහ-
වුරු කරගනිමින් සිටියේය. **7** සාවුල්
රජුට රිෂ්පා[4] නම් වූ උපභාර්යා-
වක් සිටියාය. ඇය ආයාගේ[5] දියණිය
වූවාය. දවසක් ඉෂ්බෝෂෙත්,[6] අබ්-
නේර්ගෙන් මෙසේ ඇසුවේය. "ඔබ
මගේ පියාගේ උපභාර්යාව සමඟ සය-
නය කළේ ඇයි?"[7] **8** එය ඇසූ විට
අබ්නේර් ඉතා කෝප වී[8] මෙසේ
කීවේය. "මම යුදා දේශයෙන් ආපු බල්-
ලෙක් කියලා ඔබ හිතුවාද?[9] මම අද
වෙනකම්ම ඔබේ පියා වන සාවුල්ගේ
ගෙයි වැසියන්ටත් ඔහුගේ සහෝදර-
යන්ටත් ඔහුගේ කිට්ටු මිතුරන්ටත්
ප්‍රේමණීයව* සැලකුවා. මම ඔබව
දාවිත්ගේ අතින් බේරගත්තා. මම
එතරම් දේවල් ඔබේ පවුල වෙනුවෙන්
කර තිබියදීත් ස්ත්‍රියක් නිසා ඔබ මට
දොස් කියනවාද? **9** ඔබ මට කළ
මේ අපහාසය නිසා යෙහෝවා දෙවි
දාවිත්ට දුන් පොරොන්දුව[10] ඒ විදිහ-
ටම ඉෂ්ට වන බවට මම වගබලා ගන්-
නවා. එහෙම කළේ නැත්නම් දෙවි මට
දඬුවම් කළ යුතුයි.[11] **10** මම සාවුල්-
ගේ පෙළපතින් රාජ්‍යය ගෙන එය
දාවිත්ට දෙනවා. දාන් ඉඳන් බෙයර්-
ෂෙබා දක්වා[12] තිබෙන සියලුම පළාත්
දාවිත්ට යටත් කර දී ඊශ්‍රායෙල් දේශය
හා යුදා දේශය පුරාම ඔහුගේ රජකම
මම ස්ථිර කරනවා." **11** ඒ අවස්ථා-
වේදී ඉෂ්බෝෂෙත් අබ්නේර්ට භය වූ
නිසා[13] ඔහු ඒ සම්බන්ධයෙන් අබ්-
නේර්ට කිසිවක් කීවේ නැත.

**2 පරි.**
**1** ද්වි 1:7; යොෂු 12:3
**2** උත් 32:10; යොෂු 4:1
**3** උත් 32:2; යොෂු 21:38; 2සාමු 2:8; 2සාමු 17:24
**4** 2සාමු 2:26
**5** 2සාමු 2:18; 1ලේක 2:15; 1ලේක 2:16
**6** උත් 35:19; විනි 17:7; රූත් 1:19; රූත් 4:11; 1සාමු 16:1
**7** උත් 47:30; විනි 8:32; විනි 16:31; 2සාමු 17:23; 2සාමු 19:37
**8** 2සාමු 2:1; 2සාමු 2:3; 1ලේක 11:1

**3 පරි.**
**9** 1රාජා 14:30; 1රාජා 15:16
**10** 1සාමු 15:28; 1සාමු 24:20; 1සාමු 26:25; යෝබ් 17:9
**11** 2සාමු 2:17
**12** 1ලේක 3:4
**13** ගීතා 127:3
**14** 2සාමු 13:1
**15** 1සාමු 25:43
**16** 1ලේක 3:1
**17** 1සාමු 25:42
**18** 2සාමු 15:12
**19** 2සාමු 13:37
**20** 1ලේක 3:2
**21** 1රාජා 1:5

**2 තීරුව**
**1** 1ලේක 3:3
**2** 1ලේක 3:3
**3** 2සාමු 2:8
**4** 2සාමු 21:8
**5** 2සාමු 21:11
**6** 2සාමු 2:10
**7** 2සාමු 16:21; 2සාමු 16:22; 1රාජා 2:22; හිතෝ 9:7
**8** හිතෝ 9:8
**9** 1සාමු 17:43; 1සාමු 24:14; 2සාමු 16:9
**10** 1සාමු 15:28; 1සාමු 28:17; 1ලේක 12:23; ගීතා 78:70; ගීතා 89:20
**11** රූත් 1:17; 1සාමු 3:17; 1සාමු 14:44
**12** විනි 20:1; 2සාමු 17:11; 2සාමු 24:2; 1රාජා 4:25;
**13** 2සාමු 3:39; හිතෝ 29:25.

2සාමු **3:8*** හෝ, "ලැදි ප්‍රේමයකින්."

**12** එවෙලේම අබ්නේර් දාවිත්
වෙත පණිවිඩකරුවන් යවා මෙසේ
දැන්වූවේය. “මේ දේශය තියෙන්නේ
කාගේ යටතේද? මා සමඟ ගිවිසු-
මක් ඇති කරගන්න. එවිට මම මුළු
ඊශ්‍රායෙල් සෙනඟවම ඔබේ පැත්-
තට හරවගන්න උදව් කරන්නම්.”[1]
**13** දාවිත්ද ඔහුට මෙසේ කියා යැව්-
වේය. “මම ඒ යෝජනාවට එකඟයි.
නමුත් අපි දෙන්නා ගිවිසුමක් ඇති
කරගන්න කලින් ඔබ මගේ එක ඉල්-
ලීමක් ඉටු කරන්න ඕනේ. සාවුල් රජු-
ගේ දුව වන මීකල්ව[2] මගේ ළඟට
එක්කගෙන එන්න. ඇය නැතුව මා
ළඟට ඔබ එන්න එපා.”[3] **14** දාවිත්
සාවුල් රජුගේ පුත්‍රයා වන ඉෂ්බෝ-
ෂෙත්[4] වෙත පණිවිඩකරුවන් යවා
මෙසේ දැන්වූවේය. “මගේ භාර්යාව
වන මීකල්ව මට ආපසු භාර දෙන්න.
මම පිලිස්තියන් සියදෙනෙකුගේ චර්-
මාග්‍ර[5] දීලයි ඇයව ලබාගත්තේ.”
**15** එබැවින් ඉෂ්බෝෂෙත්, ලායිෂ්-
ගේ පුත්‍රයා වූද මීකල්ගේ පුරුෂයාද
වන පල්තියෙල්[6] වෙත මිනිසුන් යවා
ඇයව ගෙන්වාගත්තේය. **16** නමුත්
මීකල්ගේ පුරුෂයා හඬහඬා බහු-
රීම්[7] දක්වාම ඇය පසුපස ඇවිදගෙන
ආවේය. එවිට අබ්නේර්, “දැන් ගෙදර
යන්න” කියා ඔහුට කීවේය. ඔහුද
ආපසු හැරී ගෙදර ගියේය.

**17** අබ්නේර් ඊශ්‍රායෙල්හි වැඩිම-
හල්ලන්ට පණිවිඩයක් යවා මෙසේ
දැන්වූවේය. “ඔබ මුල ඉඳන්ම[8]
දාවිත්ව ඔබේ රජු ලෙස පත් කර-
ගන්න උත්සාහ කළා. **18** ‘මගේ
සෙනඟ වන ඊශ්‍රායෙල්වරුන්ව පිලිස්-
තිවරුන්ගේ අතින් හා අන් සියලු
සතුරන්ගේ අතින් මම ගලවාගන්-
නේ මගේ සේවකයා වන දාවිත්
මාර්ගයෙන්’[9] කියා යෙහෝවා දෙ-
විම දාවිත්ට දන්වා තිබෙනවා.
ඒ නිසා දැන් දාවිත්ට ඔබේ උප-
කාරය ලබා දෙන්න.” **19** ඉන්පසු
අබ්නේර් බෙන්ජමින්වරුන්ටත්*[10] ඒ
සම්බන්ධයෙන් කතා කළේය. පසුව
මේ කාරණයට ඊශ්‍රායෙල් සෙනඟ
හා බෙන්ජමින්වරුන් එකඟ වූ බව
දාවිත්ට දැන්වීම සඳහා ඔහු හෙබ්‍රොන්
නුවරට ගියේය.

**20** අබ්නේර් දාවිත්ව හමු වීමට
හෙබ්‍රොන් වෙත ගියේ තවත්
පුරුෂයන් විසිදෙනෙකු සමඟය. ඒ
අවස්ථාවේදී දාවිත් ඔවුන් සියලු-
දෙනාටම භෝජන සංග්‍රහයක් පිළි-
යෙල කළේය.[1] **21** ඉන්පසු අබ්නේර්
දාවිත්ට මෙසේ කීවේය. “මගේ ස්වා-
මීනි, රජතුමනි, මට දැන් යන්න
අවසර දෙන්න. මම ගිහින් මුළු ඊශ්‍රා-
යෙල් සෙනඟවම ඔබ වෙත රැස් කර
ඔබ සමඟ ගිවිසුමක් ඇති කරගන්න
කියලා ඔවුන්ට කියන්නම්. මුළු දේශ-
යම ඔබට යටත් වෙයි. ඒ ගැන මට
කිසිම සැකයක් නැහැ. ඔබේ හිතේ
ආශාව[2] ඉෂ්ට කරගන්න මම ඔබට
උදව් කරන්නම්.” එබැවින් දාවිත්,
අබ්නේර්ව සමාදානයෙන්[3] පිටත් කර
යැව්වේය.

**22** ඉන්පසු දාවිත්ගේ සේවකයෝද
යෝවාබ්ද සතුරන්ට පහර දී
මහත් වස්තුවක් කොල්ල කා[4] නැවත
හෙබ්‍රොන් වෙත ආවෝය. ඒ වන
විට දාවිත්, අබ්නේර්ව සමාදානයෙන්
පිටත් කර යවා තිබිණ. **23** යෝ-
වාබ්ද[5] ඔහු සමඟ සිටි මුළු හමුදාවද
හෙබ්‍රොන් වෙත පැමිණි විට යෝ-
වාබ්ට මෙසේ දන්වනු ලැබීය. “නේර්-
ගේ[6] පුත් අබ්නේර්,[7] රජුව හමු වෙන්න
ආවා. දැන් ටිකකට කලින් රජු ඔහුව
සමාදානයෙන් පිටත් කර යැව්වා.”
**24** එවිට යෝවාබ්, රජු වෙත ගොස්
මෙසේ ඇසුවේය. “ඔබ මොනවද මේ
කළේ?[8] අබ්නේර් ඔබ ළඟට ආවාම
ඔහුට කිසි දෙයක් නොකර යන්න
දුන්නේ ඇයි? **25** නේර්ගේ පුත් අබ්-
නේර් මෙහෙට ආවේ ඔබව රවට්-
ටන්න කියලා ඔබ දන්නේ නැද්ද? ඔබ
යන එන ගමන් ගැන[9] සහ ඔබ කරන
හැම දෙයක් ගැනම දැනගන්නයි ඔහු
මෙහෙට ආවේ.”[10]

**3 පරි.**
1 2සාමු 5:3; 1ලේක 11:3; ක්‍රියා 13:22
2 1සාමු 18:20; 1සාමු 18:27; 1සාමු 19:11; 1සාමු 25:44; 1ලේක 15:29
3 උත් 43:3; උත් 44:26
4 2සාමු 2:10
5 1සාමු 18:25; 1සාමු 18:27
6 1සාමු 25:44
7 2සාමු 16:5; 2සාමු 17:18; 1රාජා 2:8
8 2සාමු 5:2; 1ලේක 11:2
9 1සාමු 13:14; 1සාමු 15:28; 1සාමු 16:1; 1සාමු 16:13; ගීතා 89:3; ගීතා 89:20; ගීතා 132:17; ක්‍රියා 13:22
10 1සාමු 10:20; 1සාමු 10:21; 1ලේක 12:29

**2 තීරුව**
1 උත් 26:30
2 ද්වි 14:26; 1රාජා 11:37; ගීතා 20:4
3 රෝම 12:18
4 1සාමු 30:22; 1සාමු 30:24
5 2සාමු 8:16
6 1සාමු 14:51
7 1සාමු 14:50; 1සාමු 20:25; 2සාමු 2:8; 2සාමු 2:22
8 2සාමු 19:6
9 ගණන් 27:17; ද්වි 28:6; 1සාමු 29:6; ගීතා 121:8; යෙසා 37:28
10 උත් 42:12; උත් 42:16

**2සාමු 3:19*** මූ.අ., “බෙන්ජමින්ට.”

**26** ඉන්පසු යෝවාබ්, දාවිත් වෙ-
නින් පිටත්ව ඇවිත් පණිවිඩකරුවන්
යවා අබ්නේර්ව නැවත ගෙන්වා-
ගත්තේය.[1] නමුත් දාවිත් ඒ ගැන
කිසිවක් දැන සිටියේ නැත. යෝවාබ්-
ගෙන් පණිවිඩය ලැබෙන විට අබ්-
නේර් සිටියේ සිරාහි පොකුණ ළඟය.
**27** ඔහු ආපසු හෙබ්‍රෝන් නුවරට[2]
ආවේය. එවිට යෝවාබ්, අබ්නේර්
සමඟ රහසින් යමක් කතා කරන[3]
මුවාවෙන් ඔහුව නුවර දොරටුව වෙත
ගෙන ගියේය. නමුත් දොරටුව ළඟදී
ඔහු අබ්නේර්ගේ බඩට ඇන[4] ඔහුව
මරා දැමුවේය. මෙසේ යෝවාබ් තම
සහෝදරයා වන අසහෙල් වෙනුවෙන්
පළිගත්තේය.[5] **28** දාවිත්ට ඒ ගැන
ආරංචි වූ විට ඔහු මෙසේ කීවේය.
“නේර්ගේ පුත්‍රයා වන අබ්නේර්ගේ
මරණයට මමවත් මගේ රාජ්‍යයවත්
සම්බන්ධ නැහැ.[6] ඒ කාරණයේදී යෙ-
හෝවා දෙවි ඉදිරියේ අපි හැමදාටම
නිර්දෝෂයි. **29** අබ්නේර්ගේ ලේව-
ලට වන්දි ගෙවිය යුත්තේ[7] යෝවාබ්
සහ ඔහුගේ පවුලේ අයයි. යෝවාබ්
කළ ඒ දේ නිසා ලිංගේන්ද්‍රියේ රෝ-
ගයකින්[8] හෝ ලාදුරු රෝගයෙන්[9]
හෝ කුසගින්නෙන් පෙළෙන කෙ-
නෙක් ඔහුගේ පවුලේ[10] හැමදාමත්
සිටීවා! එහෙමත් නැත්නම් කඩුවෙන්
මැරුම් කන හෝ නූල් කටින තත්ව-
යට පත් වන පුරුෂයෙක්[11] හැමදාමත්
ඔහුගේ පවුලේ සිටීවා!”[12] **30** යෝ-
වාබ් සහ ඔහුගේ සහෝදර අබිෂයි,[13]
අබ්නේර්ව[14] මරා දැමුවේ ඔහු ඔවුන්ගේ
සහෝදරයා වූ අසහෙල්ව ගිබියෝන්හි
කළ සටනේදී මරා දැමූ නිසාය.[15]
**31** පසුව දාවිත් යෝවාබ්ට සහ
ඔහු සමඟ සිටි සියලුදෙනාට මෙසේ
කීවේය. “ඔබ වස්ත්‍ර ඉරාගෙන[16]
ගෝණි රෙදි ඇඳගන්න.[17] අබ්නේර්
වෙනුවෙන් වැලපෙන්න.” අබ්නේර්-
ගේ මළ සිරුර රැගෙන යන විට
දාවිත් රජද ඒ පිටුපස ගමන් කළේය.
**32** ඔවුහු හෙබ්‍රෝන්හිදී අබ්නේර්ව
තැන්පත් කළෝය. ඒ අවස්ථාවේදී
රජද මුළු සෙනඟද හඬා වැලපු-
ණෝය.[1] **33** රජ, අබ්නේර් ගැන
විලාප ගීයක්ද ගයමින් මෙසේ කීවේය.

“අබ්නේර්, ඔබ කාලකණ්ණියෙකු[2]
මෙන් මිය ගියේ ඇයි?
**34** කිසිදා ඔබේ අත්වලට මාංචු දමා
නොතිබුණේය.[3]
ඔබේ පාදවලට තඹ විලංගු දමා
නොතිබුණේය.[4]
නමුත් ඔබ වැටී ගියේ දුෂ්ටයන්
ඉදිරියේ යමෙකු වැටී යන්-
නාක් මෙනි.”[5]

එම ගීය ඇසූ පසු මුළු සෙනඟ නැවත
හඬන්න පටන්ගත්තෝය.[6]
**35** දහවල් වේලාවේදී සෙනඟ
දාවිත් වෙත පැමිණ ඔහුව සනසන
පිණිස ඔහුට කෑම දුන්නෝය.[7] නමුත්
දාවිත් ඔවුන්ට මෙසේ කීවේය. “ඉර
බහින්න පෙර[8] මම මොනවා හරි
කටේ තිබ්බොත් දෙවි මට දඬුවම්
කරන්න ඕනේ.”[9] **36** සෙනඟ ඔහු
දුකෙන් සිටින බව දැක ඔහුගේ කීමට
එකඟ වූහ. රජු කළ සෑම දෙ-
යකටම ඔවුන් එකඟ වූවාක්
මෙන් මේ කාරණයේදීත් ඔවුහු එකඟ
වූහ.[10] **37** නේර්ගේ පුත්‍රයා වන අබ්-
නේර්ව මරා දැමීමට සැලසුම් කළේ
දාවිත් නොවන බව දාවිත්ට සහ-
යෝගය දුන් සෙනඟ හා ඊශ්‍රායෙල්හි
සියලු වැසියෝ තේරුම්ගත්තෝය.[11]
**38** රජ ඔහුගේ සේවකයන්ට මෙසේ
කීවේය. “අද ඊශ්‍රායෙල්හි මිය
ගියේ අධිපතියෙක්. ශ්‍රේෂ්ඨ මනුෂ්‍ය-
යෙක්.[12] **39** මාව රජු හැටියට පත්
කර තිබුණත්[13] මට ෂෙරුයියාගේ
පුත්‍රයන්ට[14] විරුද්ධ වෙන්න තරම්
ශක්තියක් නැහැ.[15] ඔවුන් හරිම දරු-
ණුයි. ඔවුන් කළ දුෂ්ටකම්වලට යෙ-
හෝවා දෙවිගෙන් සුදුසු දඬුවමක්
ඔවුන්ට ලැබේවා!”[16]

**4** හෙබ්‍රෝන්හිදී අබ්නේර් මිය ගිය
බව[17] සාවුල් රජුගේ පුත්‍රයා[18]
දැනගත් විට ඔහු අධෛර්යයට

**3 පරි.**
1 හිතෝ 26:24
2 2සාමු 2:1; 2සාමු 3:20
3 ගීතා 55:21; හිතෝ 26:23; හිතෝ 26:25
4 ද්වි 27:24; 1රාජා 2:5
5 2සාමු 2:22; 2සාමු 2:23
6 උත් 4:10; උත් 9:6; නික් 21:12; ගණන් 35:21; ගණන් 35:33; ද්වි 21:9
7 ද්වි 32:43; විනි 9:57; 2සාමු 1:16; 1රාජා 2:37; ගීතා 7:16; ගීතා 55:23; ගීතා 94:23; හිතෝ 5:22; හිතෝ 28:17
8 ලෙවී 15:2; ගණන් 5:2
9 ලෙවී 13:44; 2රාජා 5:27
10 නික් 34:7
11 ලෙවී 21:18
12 ද්වි 27:24; ගීතා 109:10
13 2සාමු 2:24
14 2සාමු 2:8; 2සාමු 2:14; 2සාමු 3:27
15 ලෙවී 19:18; 2සාමු 2:23; රෝම 12:19
16 යොෂු 7:6; 2සාමු 1:11
17 උත් 37:34; 2රාජා 19:1

**2 තීරුව**
1 1සාමු 30:4; 2සාමු 1:12
2 2සාමු 13:13
3 ගීතා 107:10
4 විනි 16:21
5 1රාජා 2:32
6 දේශ 7:2
7 යෙරෙ 16:7; එස 24:17
8 විනි 20:26; 2සාමු 1:12
9 රූත් 1:17
10 2සාමු 2:10
11 2සාමු 3:28; 1රාජා 2:5
12 1සාමු 14:50; 2සාමු 2:8; 2සාමු 3:12
13 2සාමු 2:4
14 1ලේක 2:16
15 2සාමු 19:13; 2සාමු 20:10; 2සාමු 20:23

16 2සාමු 3:29; 1රාජා 2:6; 1රාජා 2:34; ගීතා 28:4; ගීතා 62:12; ගලා 6:7; **4 පරි.** 17 2සාමු 3:27; 18 2සාමු 2:8; 2සාමු 3:7.

පත් විය.[1] මුළු ඊශ්‍රායෙල් සෙනඟද
එම ආරංචිය අසා කැලඹුණෝය.
**2** සාවුල් රජුගේ පුත්‍රයාගේ හට පිරිස්[2]
භාරව හමුදාපතීහු දෙදෙනෙක් සිටි-
යෝය. ඔවුන්ගේ නම්, බානාහ් හා
රේකාබ්ය. ඔවුහු බෙන්ජමින් ගෝත්‍ර-
යට අයත් බෙයේරොත්හි වැසියෙකු
වූ රිම්මොන්ගේ පුත්‍රයෝය. බෙයේ-
රොත් නුවර[3] පිහිටා තිබුණේ බෙන්ජ-
මින් ගෝත්‍රයට අයිති ප්‍රදේශයේය.
**3** බෙයේරොත්හි වැසියෝ ගිත්තා-
යිම්[4] නම් ස්ථානයට පලා ගියෝය.
ඔවුහු අද දක්වාම විදේශිකයන් ලෙස
එහි ජීවත් වන්නෝය.

**4** සාවුල් රජුගේ පුත් යොනා-
තාන්ට[5] පාද කොර වූ[6] පුත්‍රයෙක් සිටි-
යේය. ඔහුගේ නම මෙෆිබොෂෙත්ය.[7]
සාවුල් රජු සහ යොනාතාන් මිය
ගොස් ඇති බව යෙශ්‍රෙයෙල්[8] සිට
පණිවිඩය ලැබෙන විට ඔහු වයස අවු-
රුදු පහක දරුවෙකි. ඒ අවස්ථාවේදී
ඔහුව බලාගත් තැනැත්තිය කලබල
වී ඔහුව උසුලාගෙන එතැනින් පලා
ගියාය. මෙසේ පලා යද්දී ඔහු වැටී
ඔහුගේ පාද කොර විය.

**5** එක් දිනක් බෙයේරොත්හි රිම්-
මොන්ගේ පුත්‍රයෝ වූ රේකාබ් සහ
බානාහ් ඉෂ්බෝෂෙත්ගේ[9] නිවසට
ගියෝය. ඔවුහු ඔහුගේ නිවසට ගියේ
දහවල් කාලයේදීය. ඒ අවස්ථාවේදී
ඉෂ්බෝෂෙත් නිදාගෙන සිටියේය.
**6** රේකාබ් සහ බානාහ්[10] තිරිඟු
ගන්න ආ මිනිසුන් මෙන් හැසිරෙමින්
ගේ ඇතුළටම ගියෝය. ඉන්පසු ඔවුහු
ඉෂ්බෝෂෙත්ගේ බඩට ඇන[11] ඔහුව
මරා දැමූහ. ඔවුන් කළ දේ කිසිවෙක්
දුටුවේ නැත. **7** ඔවුහු ගෙට ඇතුල්
වූ විට ඉෂ්බෝෂෙත් ඔහුගේ කාමරයේ
නිදා සිටියේය. ඔවුහු ඔහුව මරා දැමූ[12]
පසු ඔහුගේ හිස කපා දැමුවෝය.[13]
ඉන්පසු ඔහුගේ හිස රැගෙන අරබා
නිම්නය වෙත යන මාර්ගය දිගේ මුළු
රාත්‍රිය පුරාම ඇවිදගෙන ගියෝය.
**8** පසුව ඔවුහු ඉෂ්බෝෂෙත්ගේ හිස[14]
රැගෙන හෙබ්‍රොන්හි සිටි දාවිත් වෙත
ගොස් මෙසේ කීවෝය. "අපේ ස්වා-
මීනි, මේ බලන්න! අපි ඔබව මරන්න
සෙවූ[1] ඔබේ සතුරාගේ[2] පුතාගේ හිස
කපා ගෙනාවා. අද යෙහෝවා දෙවි
සාවුල්ගෙනුත් ඔහුගේ පුත් ඉෂ්බෝ-
ෂෙත්ගෙනුත් පළිගත්තා."[3]

**9** දාවිත් බෙයේරොත්හි රිම්-
මොන්ගේ පුත්‍රයන් වූ රේකාබ්ට සහ
බානාහ්ට මෙසේ කීවේය. "සියලු දුක්
කරදරවලින්[4] මාව[5] ගලවාගත්[6] ජීව-
මාන දෙවි වන යෙහෝවා ඉදිරි-
යේ මම කියන මේ දේ සත්‍යයක්.[7]
**10** මා ළඟට ඇවිත්, 'සාවුල් රජු මිය
ගියා' කියලා කියූ කෙනාත්[8] හිතුවේ
ඔහු මට හොඳ ආරංචියක් ගෙනාවා
කියලයි. නමුත් මම ශික්ලග් නුවරේදී
ඔහුව මරලා දැම්මා.[9] ඔහු ගෙනා
පණිවිඩයට මගෙන් ඔහුට ලැබුණු
දීමනාව ඒකයි. **11** එසේනම් තමා-
ගේම නිවසේ නිදාගෙන සිටි ධර්මිෂ්ඨ
මිනිසෙක්ව මරලා දැමූ දුෂ්ටයන්ට[10]
ඊටත් වඩා වැඩියෙන් දඬුවම් කළ
යුතු නැද්ද? ඉෂ්බෝෂෙත්ගේ ලේ
වැගිරෙවූ නුඹලාව මම මරලා දාලා[11]
යුක්තිය ඉටු කරනවා."[12] **12** ඉන්-
පසු දාවිත් ඔවුන්ව මරා දමන ලෙස
තම සේවකයන්ට අණ කළේය. ඔවු-
හුද ඔවුන්ව මරා[13] ඔවුන්ගේ අත්
පා කපා හෙබ්‍රොන්හි පොකුණ ළඟ
ඔවුන්ගේ ශරීර එල්ලුවෝය.[14] පසුව
හෙබ්‍රොන්හි තිබූ අබ්නේර්ගේ සො-
හොන් ගෙයි ඉෂ්බෝෂෙත්ගේ හිස
තැන්පත් කළෝය.[15]

**5** කල් යත්ම ඊශ්‍රායෙල්හි සියලු
ගෝත්‍ර හෙබ්‍රොන්හි[16] සිටි
දාවිත්ව[17] මුණගැසී මෙසේ කීවෝය.
"අපි හැමෝම සහෝදරයන්.*[18]
**2** සැහෙන කාලයක ඉඳන්[19] ඊශ්‍රා-
යෙල් හමුදාවේ පෙරමුණ ගෙන කට-
යුතු කළේ ඔබයි.[20] සාවුල් අපේ
රජ වෙලා ඉන්න කාලේ පවා පෙ-
රමුණ ගත්තේ ඔබයි. ඒ වගේම,

**4 පරි.**
**1** 2සාමු 17:2; එස්රා 4:4; යෙසා 13:7
**2** 2රාජා 5:2; 2රාජා 6:23
**3** යොෂු 9:17; යොෂු 18:25
**4** නෙහෙ 11:33
**5** 1සාමු 20:16
**6** 2සාමු 9:3
**7** 2සාමු 9:13; 1ලේක 8:34; 1ලේක 9:40
**8** 1සාමු 29:1; 1සාමු 29:11
**9** 2සාමු 2:8; 2සාමු 3:7
**10** 2සාමු 4:2
**11** 2සාමු 2:23; 2සාමු 3:27; 2සාමු 20:10
**12** 2ලේක 24:25; 2ලේක 33:24
**13** 1සාමු 17:54; 1සාමු 31:9; 2රාජා 10:6; මාක් 6:28
**14** 2සාමු 2:10

**2 තිරුව**
**1** 1සාමු 20:1; 1සාමු 20:33; 1සාමු 23:15
**2** 1සාමු 18:11; 1සාමු 18:29; 1සාමු 19:2
**3** ද්වි 32:35; 2සාමු 22:48; රෝම 12:19
**4** 1රාජා 1:29; ගීතා 34:7
**5** ගීතා 71:23
**6** 1සාමු 24:12; 1සාමු 26:25; 2සාමු 12:7
**7** 1සාමු 20:3
**8** 2සාමු 1:2
**9** 2සාමු 1:15
**10** 2සාමු 4:5; 1රාජා 8:32
**11** නික් 9:15; ගීතා 109:15
**12** උත් 9:6; නික් 21:12; ගණන් 35:16; ගණන් 35:30
**13** 2සාමු 1:15; ගීතා 55:23
**14** ද්වි 21:22
**15** 2සාමු 3:32

**5 පරි.**
**16** 2සාමු 2:1; 2සාමු 2:11
**17** 1ලේක 11:1; 1ලේක 12:23

**18** උත් 29:14; ද්වි 17:15; විනි 9:2; 2සාමු 19:12; **19** 2සාමු 3:17; **20** ගණන් 27:17; 1සාමු 18:13; 1සාමු 25:28.

2සාමු **5:1*** මූ.අ., "අපි ඔබේම මාංසය, ඔබේම ඇටකටු."

‘මගේ සෙනඟ වන ඊශ්‍රායෙල් ජාති-
යව රැකබලා ගැනීමට[1] මම පත්
කරන්නේ ඔබවයි. ඔබව අනිවාර්ය-
යෙන්ම ඊශ්‍රායෙල්හි නායකයා[2] ලෙස
මම පත් කරමි’ කියා යෙහෝවා
දෙවිම ඔබට පැවසුවා.” **3** පසුව
ඊශ්‍රායෙල්හි සියලු වැඩිමහල්ලෝද[3]
හෙබ්‍රොන්හි සිටි දාවිත් වෙත
ආවෝය. දාවිත්, යෙහෝවා දෙවි ඉදි-
රියේ ඔවුන් සමඟ ගිවිසුමක් ඇති කර-
ගත්තේය.[4] ඉන්පසු ඔවුහු දාවිත්ව
මුළු ඊශ්‍රායෙල් දේශයේම රජු[5] ලෙස
අභිෂේක කළෝය.[6]

**4** දාවිත් රජකමට පත් වන විට
ඔහුට වයස අවුරුදු තිහක් විය.
ඔහු අවුරුදු හතළිහක්[7] පුරා රජකම්
කළේය. **5** ඔහු හෙබ්‍රොන් සිට අවු-
රුදු හතකුත් මාස හයක් යූදා ගෝ-
ත්‍රය කෙරෙහි රජකම් කළේය.[8] ඔහු
මුළු ඊශ්‍රායෙල් ජාතිය කෙරෙහිද යූදා
ගෝත්‍රය කෙරෙහිද අවුරුදු තිස්තුනක්
යෙරුසලමේ සිට[9] රජකම් කළේය.
**6** රජද ඔහුගේ හමුදාවද යෙරුසලමේ
පදිංචිව සිටි යෙබූසිවරුන්ට විරුද්ධව
සටන් කිරීමට ගියෝය.[10] නමුත් යෙ-
බූසිවරු, දාවිත් මෙතැනට පැමිණෙන
එකක් නැහැ කියා සිතමින්, “ඔබට
අපේ නුවරට ඇතුල් වෙන්න අව-
සර නැහැ. නුවරේ ඉන්න අන්ධයන්
හා කොරුන් පවා ඔබව පන්නා
දමයි”[11] කියා දාවිත් රජුට කීවෝය.
**7** එහෙත් දාවිත් රජු සියොන් නම්
බලකොටුව[12] අල්ලාගත් අතර පසුව
එය දාවිත්ගේ නුවර[13] ලෙස හඳුන්වන
ලදි. **8** එදින දාවිත් රජ තම සෙ-
නඟට මෙසේ අණ කළේය. “යෙබූ-
සිවරුන්ට විරුද්ධව සටන් කරන
හැමෝම[14] ජල මාර්ගය[15] දිගේ ගොස්
ඔවුන්ගේ අන්ධයන්ටත් කොරුන්ටත්
පහර දිය යුතුයි. ඔවුන් මට පිළිකු-
ලක්!” පසු කලෙක, “අන්ධයන්ට හා
කොරුන්ට ගෙට ඒමට අවසර නැත”
යන කියමන ඇති වූයේ ඒ නිසාය.
**9** පසුව දාවිත් රජ සියොන් බලකො-
ටුවේ පදිංචි විය. පසු කලෙක එය
දාවිත්ගේ නුවර ලෙස හැඳින්විය.
දාවිත් රජ එම නුවරේ සීමා* වටා[1] හා
නුවර තුළ ඉදි කිරීම් කටයුතු ඇරඹු-
වේය. **10** ඔහු වඩ වඩා බලවත්[2] වූ
අතර ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි[3] දිගටම ඔහුට
උපකාර කළේය.[4]

**11** තීර්හි රජු වන හීරාම්,[5] දාවිත්
රජු වෙතට දූත පිරිසක්ද[6] දාවිත් රජුට
මාලිගාවක්[7] ගොඩනැඟීමට අවශ්‍ය
දේවදාර ලීද[8] බිත්ති බඳින්නන්වද වඩු
වැඩ කරන්නන්වද යැවීය. **12** යෙ-
හෝවා දෙවි ඊශ්‍රායෙල් දේශයේ රජු
ලෙස තමාව පත් කර එය ස්ථිර ලෙස
පිහිටුවා තිබෙන බව දාවිත්ට තහවුරු
විය.[9] එමෙන්ම දෙවි ඔහුගේ සෙනඟ[10]
වෙනුවෙන් තම රාජ්‍යය ගෞරවයට
පත් කළ[11] බවත් දාවිත් වටහාගත්-
තේය.

**13** දාවිත් හෙබ්‍රොන්හි සිට යෙරුස-
ලමට පැමිණි පසු තවත් භාර්යාවන්[12]
විවාහ කරගත් අතර උපභාර්යාවන්ද[13]
වැඩි කරගත්තේය. එහිදී ඔහුට ආව
තව පුත්‍රයෝද දූවරුද උපන්නෝය.
**14** යෙරුසලමේදී ඔහුට ආව උපන්
දරුවන්ගේ නම් මේවාය. ෂම්මුවා,[14]
ෂෝබාබ්,[15] නාතන්,[16] සලමොන්,[17]
**15** ඉබ්හාර්, එලිෂූවා,[18] නෙෆෙග්,[19]
යාෆියා,[20] **16** එලිෂාමා,[21] එලියාදා
සහ එලිෆෙලෙත්ය.[22]

**17** දාවිත්ව ඊශ්‍රායෙල්හි රජු ලෙස
අභිෂේක කර[23] තිබූ බව පිලිස්තිව-
රුන්ට ආරංචි වූ විට ඔවුහු සියලුදෙනා
දාවිත් රජුව අල්ලාගැනීමට ආවෝය.
දාවිත් රජ ඒ ගැන දැනගත් විට
තමා වෙතට පහසුවෙන් ළඟා වීමට
නොහැකි ස්ථානයකට ගියේය.[24]
**18** පිලිස්තිවරු රෙෆායිම් තැනිතලා-
වට[25] පැමිණ එහි සෑම තැනකම
විසිර සිටියෝය. **19** එවිට දාවිත්

**5 පරි.**

**1** 1සාමු 16:1; 2සාමු 7:7; ගීතා 78:71
**2** උත් 49:10; 1සාමු 25:30; 2සාමු 6:21; 2සාමු 7:8; 1ලේක 28:4
**3** නික් 3:16; 1ලේක 11:3
**4** 2රාජා 11:17
**5** ක්‍රියා 13:22
**6** 1සාමු 16:13; 2සාමු 2:4
**7** 1ලේක 29:27
**8** 2සාමු 2:11
**9** උත් 14:18
**10** නික් 23:23; යොෂු 15:63; විනි 1:8; විනි 1:21
**11** ගීතා 5:5
**12** 1ලේක 11:5
**13** 2සාමු 12:28; 1රාජා 2:10; නෙහෙ 12:37
**14** 1ලේක 11:6
**15** 2රාජා 20:20; 2ලේක 32:30

**2 තීරුව**

**1** 1රාජා 9:15; 1රාජා 9:24; 1රාජා 11:27; 1ලේක 11:8; 2ලේක 32:5
**2** 1සාමු 16:13; 2සාමු 3:1; යෝබ් 17:9
**3** 1සාමු 17:45
**4** ගීතා 46:7; රෝම 8:31
**5** 1රාජා 5:1; 1රාජා 5:8; 1ලේක 14:1
**6** 1රාජා 20:9
**7** 2සාමු 7:2
**8** 2ලේක 2:3
**9** 2සාමු 7:16; 1ලේක 14:2; ගීතා 41:11; ගීතා 89:21
**10** 1රාජා 10:9; 2ලේක 2:11
**11** ගීතා 89:27
**12** 1ලේක 14:3
**13** උත් 25:6; 2සාමු 15:16; 1ලේක 3:9
**14** 1ලේක 14:4
**15** 1ලේක 3:5
**16** සෙක 12:12; ලූක් 3:31
**17** 2සාමු 12:24
**18** 1ලේක 14:5
**19** 1ලේක 14:6
**20** 1ලේක 3:7
**21** 1ලේක 14:7
**22** 1ලේක 3:8; **23** 2සාමු 5:3; 1ලේක 14:8; ගීතා 2:2; **24** 1සාමු 22:1; 1සාමු 22:5; 1සාමු 24:22; 2සාමු 23:14; **25** යොෂු 15:8; 1ලේක 11:15; 1ලේක 14:9; යෙසා 17:5.

**2සාමු 5:9*** මෙය සමහරවිට බලකොටුවක් විය හැකියි.

රජ යෙහෝවා දෙවිගෙන් මෙසේ
විමසුවේය.[1] "මම පිලිස්තිවරුන්ට
පහර දෙන්නද? ඔවුන්ව යටත් කර-
ගන්න ඔබ මට උදව් කරනවාද?"
යෙහෝවා දෙවිද, "ගොස් ඔවුන්ට
පහර දෙන්න. මම ඔවුන්ව ඔබට
යටත් කර දෙන්නෙමි"[2] කියා දාවිත්
රජුට කීවේය. **20** එබැවින් දාවිත්
රජ බාල්-පෙරාෂිම්[3] වෙතට ගොස්
පිලිස්තිවරුන්ට පහර දුන්නේය. ඒ
අවස්ථාවේදී, "වේගයෙන් ගලා යන
ජල පහරක් මෙන් යෙහෝවා දෙවි
මට ඉදිරියෙන් ගොස් මගේ සතු-
රන්ව විනාශ කළා"[4] කියා දාවිත්
රජ කීවේය. ඔහු එම ස්ථානයට
බාල්-පෙරාෂිම්*[5] යන නම තැබුවේ
ඒ නිසාය. **21** පිලිස්තිවරු ඔවුන්ගේ
දේවතා රූප[6] එහි අත්හැර දමා පලා
ගියෝය. දාවිත් රජ සහ ඔහුගේ
සෙනඟ එම රූප එතැනින් ඉවත්
කළෝය.[7]

**22** පසුව පිලිස්තිවරු නැවතත්[8]
රෙෆායිම් තැනිතලාවට[9] පැමිණ එහි
සෑම තැනකම විසිර සිටියෝය.
**23** ඔවුන්ට විරුද්ධව සටනට යන්නද
කියා දාවිත් රජු යෙහෝවා දෙවිගෙන්
විමසූ[10] විට ඔහු දාවිත් රජුට මෙසේ
කීවේය. "මේ අවස්ථාවේදී ඔවුන්ව
ලුහුබැඳ ගොස් පහර නොදෙන්න.
වටෙන් ගොස් ඔවුන්ගේ පිටුපසින්
තිබෙන බේකා පඳුරු[11] ඉදිරියේ සැඟවී
සිටින්න. **24** බේකා පඳුරු අතරින්
ඔබට අඩි ශබ්දයක් ඇසෙයි. පිලිස්ති-
වරුන්ට පහර දීමට යෙහෝවා දෙවි
වන මා ඔබට ඉදිරියෙන් ගිය බවට
එය ඔබට ලකුණක් වෙයි.[12] ඒ ශබ්දය
ඇසුණු සැණින් ඔබ ඔවුන්ට පහර
දෙන්න."[13] **25** දාවිත් රජ යෙහෝවා
දෙවි අණ කළ ලෙසම කළේය.[14] ඔහු
ගෙබා* නුවර[15] සිට ගෙෂෙර් නුවර[16]
දක්වා ගොස් පිලිස්තිවරුන්ට පහර
දුන්නේය.[17]

---

2සාමු **5:20*** තේරුම, "කඩා බිඳගෙන යන."
**25*** 1ලේක 14:16හි, "ගිබියොන්" ලෙස සඳ-
හන් වේ.

**5 පරි.**
**1** ගණන් 27:21
1සාමු 23:2
2සාමු 2:1
1ලේක 14:10
හිතෝ 3:6
**2** විනි 20:28
1සාමු 30:8
**3** 1ලේක 14:11
**4** 2සාමු 22:41
ගීතා 29:2
**5** 1ලේක 14:11
යෙසා 28:21
**6** 1සාමු 31:9
ගීතා 115:7
යෙසා 2:20
හබ 2:18
1කොරි 8:4
**7** ද්වි 7:5
ද්වි 7:25
1ලේක 14:12
**8** 1ලේක 14:13
**9** යොෂු 15:8
2සාමු 5:18
1ලේක 11:15
**10** 1සාමු 30:8
2සාමු 5:19
හිතෝ 3:5
**11** 1ලේක 14:14
ගීතා 84:6
**12** 1ලේක 14:15
**13** විනි 7:15
යෙරෙ 48:10
**14** 1ලේක 14:16
ගීතා 119:4
**15** යොෂු 18:24
**16** යොෂු 16:10
**17** ලෙවී 26:7

---

**2 තීරුව**

---

**6 පරි.**
**1** 2සාමු 5:1
1රාජා 8:1
1ලේක 13:1
**2** 1සාමු 7:2
**3** නික් 25:22
1සාමු 4:4
ගීතා 80:1
**4** ද්වි 20:4
1සාමු 1:3
1සාමු 15:2
1රාජා 18:15
1ලේක 17:24
**5** නික් 6:3
ලෙවී 24:11
යෙසා 42:8
**6** 1ලේක 13:6
**7** නික් 25:14
ගණන් 7:9
යොෂු 3:14
**8** 1සාමු 7:1
**9** 1ලේක 13:7
**10** 1සාමු 16:16
**11** 1සාමු 10:5
ගීතා 150:3
**12** නික් 15:20
ගීතා 150:4
**13** 1ලේක 13:8
ගීතා 150:5

**6** දාවිත් රජ නැවත ඊශ්‍රායෙල් සෙ-
නඟ අතරින් තෝරාගනු ලැබූ
පුරුෂයන්[1] තිස්දහසක් තමා වෙ-
නට රැස් කරගත්තේය. **2** පසුව ඔහු
රැස් කරගත් සෙනඟ සමඟ බායලෙ-
යූදා නුවරට[2] ගියේය. කෙරුබ්ව-
රුන් පිට හිඳගෙන[3] සිටින ස්වර්ගයේ
සේනාවල අධිපති වන යෙහෝවා
දෙවිගේ[4] නාමය[5] දරන සැබෑ දෙ-
විගේ ගිවිසුම් පෙට්ටිය[6] එතැනින්
රැගෙන ඒමට ඔවුහු අදහස් කළෝය.
**3** ඔවුහු සැබෑ දෙවිගේ ගිවිසුම් පෙට්-
ටිය අලුත් කරත්තයක තබා[7] අබිනා-
දාබ්ගේ[8] නිවසේ සිට ගෙනාවෝය.
අබිනාදාබ්ගේ නිවස පිහිටා තිබු-
ණේ කන්දක් මතය. අබිනාදාබ්-
ගේ පුත්‍රයන් දෙදෙනා වන උස්සාහ්
හා අහියෝ[9] කරත්තය දක්කාගෙන
ගියෝය.

**4** ඔවුහු අබිනාදාබ්ගේ නිවසේ සිට
සැබෑ දෙවිගේ ගිවිසුම් පෙට්ටිය ගෙන
ගියෝය. ගිවිසුම් පෙට්ටියට ඉදිරියෙන්
අහියෝ ගමන් කළේය. **5** දාවිත් රජ
හා මුළු ඊශ්‍රායෙල් සෙනඟ ජුනිපර්
ලීයෙන් සාදන ලද සංගීත භාණ්ඩද
වීණාද[10] කුඩා වීණාද[11] රබන්ද[12] අත්-
තාළම්ද[13] වෙනත් සංගීත භාණ්ඩද
වාදනය කරමින් යෙහෝවා දෙවි-
ගේ නමස්කාරයේ කොටසක් වූ එම
අවස්ථාවට සතුටින් සහභාගි වූහ.
**6** ඔවුන් නාකොන්* නම් කමත
ළඟට පැමිණි විට හරකුන් කුලප්පු වූ
නිසා කරත්තය පෙරළෙන්න ගියේය.
එවිට සැබෑ දෙවිගේ ගිවිසුම් පෙට්-
ටිය වැටෙන්න නොදී උස්සාහ්[14] එය
අල්ලාගත්තේය.[15] **7** ඒ මොහොතේ
යෙහෝවා දෙවි උස්සාහ් සමඟ මහත්
සේ උදහස් විය.[16] ඔහු කළ ඒ අගෞර-
වනීය ක්‍රියාව නිසා සැබෑ දෙවි ඔහුට
පහර දුන්නේය.[17] සැබෑ දෙවිගේ ගිවි-

---

**14** 1ලේක 13:9; **15** ගණන් 4:15; ගණන් 4:19; ගණන් 4:20; 1ලේක 15:2; හිතෝ 11:2; හිතෝ 21:24; **16** ගණන් 12:9; 2රාජා 24:20; **17** ලෙවී 10:2; 1සාමු 6:19.

---

2සාමු **6:6*** 1ලේක 13:9හි, "කීදොන්" ලෙස සඳ-
හන් වේ.

සුම් පෙට්ටිය අසල ඔහු මැරී වැටු-
ණේය.[1] **8** යෙහෝවා දෙවි උදහස් වී
උස්සාහ්ට ඒ මොහොතේදීම පහර දුන්
නිසා දාවිත් රජුගේ සිතේ කෝපයක්
ඇති විය. ඒ සිද්ධිය නිසා එම ස්ථා-
නයට පෙරෙෂ්-උස්සාහ්* යන නම
තබන ලදි. අද දක්වාම එම ස්ථානය
හඳුන්වන්නේ ඒ නමින්ය.[2] **9** එදින
දාවිත් රජට යෙහෝවා දෙවි ගැන
මහත් බියක් ඇති වී,[3] "යෙහෝවා දෙ-
විගේ ගිවිසුම් පෙට්ටිය මා ළඟට ගෙ-
නෙන්නේ කොහොමද"[4] කියා කීවේය.
**10** ඉන්පසු යෙහෝවා දෙවිගේ ගිවිසුම්
පෙට්ටිය තම නුවරට*[5] ගෙන යෑමට
අකමැතිව, එය ගාත්හි# වැසියෙකු
වූ[6] ඕබෙද්-ඒදොම්ගේ[7] නිවසට ගෙන
යෑමට ඔහු අණ කළේය.

**11** යෙහෝවා දෙවිගේ ගිවිසුම්
පෙට්ටිය ගාත්හි වැසියෙකු වූ
ඕබෙද්-ඒදොම්ගේ නිවසේ මාස
තුනක් පුරා තිබිණ. යෙහෝවා
දෙවි ඕබෙද්-ඒදොම්ටත් ඔහුගේ ගෙයි
වැසියන්ටත්[8] ආශීර්වාද කළේය.[9]
**12** කලක් ගෙවුණු පසු දාවිත් රජුට
මෙසේ ආරංචි විය. "සැබෑ දෙවිගේ
ගිවිසුම් පෙට්ටිය ඕබෙද්-ඒදොම්ගේ
නිවසේ තියෙන නිසා ඔහුටත් ඔහුට
අයිති සියල්ලටත් යෙහෝවා දෙවි
ආශීර්වාද කරලා." එය ඇසූ පසු
ඔහු සැබෑ දෙවිගේ ගිවිසුම් පෙට්ටිය
ඕබෙද්-ඒදොම්ගේ නිවසේ සිට ප්‍රීති
ඝෝෂා මැද දාවිත්ගේ නුවරට ගෙනා-
වේය.[10] **13** යෙහෝවා දෙවිගේ ගිවි-
සුම් පෙට්ටිය උසුලාගෙන ගිය අය[11]
පියවර හයක් ගමන් කළ පසු දාවිත්
රජ ගවයෙකුව හා තර වස්සෙකුව
පූජා කළේය.[12]

**14** ඉන්පසු දාවිත් රජ යෙහෝවා
දෙවි ඉදිරියේ මහත් උද්‍යෝගයෙන්
නැටුවේය. ඒ අවස්ථාවේදී ඔහු ඇඳ
සිටියේ ලිනන් රෙදිවලින් මසා තිබූ
ඒෆොද් හැට්ටයක්ය.[13] **15** දාවිත්
රජ ඊශ්‍රායෙල් සෙනඟ සමඟ ප්‍රීති
ඝෝෂා නඟමින්[1] හොරණෑ හඬ[2] මැද
යෙහෝවා දෙවිගේ ගිවිසුම් පෙට්ටිය[3]
රැගෙන ආවේය. **16** යෙහෝවා දෙ-
විගේ ගිවිසුම් පෙට්ටිය දාවිත්ගේ
නුවරට ගෙනෙන විට සාවුල්ගේ දිය-
ණිය වූ මීකල්[4] ජනේලයෙන් ඒ දෙස
බලා සිටියාය. දාවිත් රජු යෙහෝවා
දෙවි ඉදිරියේ උඩ පැනපැන නටන
ආකාරය දැක ඇය තම සිතින්[5]
ඔහුව හෙළාදකින්න පටන්ගත්තාය.[6]
**17** ඔවුහු යෙහෝවා දෙවිගේ ගිවි-
සුම් පෙට්ටිය නුවරට ගෙනැවිත්
දාවිත් රජු ඒ සඳහා සූදානම් කළ
කූඩාරමට එය ගෙන ගියෝය.[7] එහි
නියමිත ස්ථානයේ එය තැබුවෝය.
ඉන්පසු දාවිත් රජ යෙහෝවා දෙවිට
දවන පූජා[8] හා හවුල් පූජා[9] ඔප්පු
කළේය. **18** දාවිත් රජ පූජා ඔප්පු
කර අවසන් වූ පසු ස්වර්ගයේ සේනා-
වල අධිපති වන යෙහෝවා දෙවි-
ගේ නාමයෙන්[10] සෙනඟට ආශීර්වාද
කළේය.[11] **19** ඔහු මුළු ඊශ්‍රායෙල්
සෙනඟට එනම්, එහි සිටි සෑම ස්ත්‍රිය-
කටම හා සෑම පුරුෂයෙකුටම මුද්දක
හැඩැති රොටිය බැගින්ද රටඉඳි කුට්-
ටියක්* බැගින්ද වියළි මිදි කුට්ටියක්
බැගින්ද[12] දුන්නේය.[13] ඉන්පසු සියලු-
දෙනා තම තමාගේ නිවසට හැරී
ගියෝය.

**20** දාවිත් රජ තම ගෙයි වැසි-
යන්ට ආශීර්වාද කරන[14] පිණිස තම
නිවසට ආවේය. එවිට සාවුල්ගේ
දියණිය වූ මීකල්[15] ඔහු ඉදිරියට
පැමිණ මෙසේ කීවාය. "අද ඊශ්‍රා-
යෙල්හි රජ හැසුරුණු විදිහ හරි අපූ-
රුයි![16] ඔබේ සේවකයන්ගේ දාසියන්
ඉදිරියේ ඇඳුම් ගලවලා විළි ලැජ්ජා-
වක් නැති මෝඩයෙක් වගෙයි ඔබ
හැසිරුණේ."[17] **21** එවිට දාවිත් රජ
මීකල්ට මෙසේ කීවේය. "මම අද
ප්‍රීති වුණේ යෙහෝවා දෙවි ඉදිරි-
යේයි. යෙහෝවා දෙවි ඔබේ පියා
සහ ඔහුගේ පවුලේ අය වෙනුවට

---

**2සාමු 6:8*** තේරුම, "උස්සාහ්ට පහර දීම."
**10*** මු.අ., "දාවිත්ගේ නුවර." **10#** ගාත්-
රිම්මොන් නම් නුවරට යොමු දැක්වුවා විය හැක.

**2සාමු 6:19*** පලතුරු වර්ගයක් වේළා, එකට තද
කර සාදාගන්නා ලදි.

---

**6 පරි.**
**1** 1ලේක 13:10
**2** 1ලේක 13:11
**3** 1සාමු 6:20
ගීතා 119:120
**4** 1ලේක 13:12
**5** 2සාමු 5:7
**6** 1ලේක 13:13
**7** 1ලේක 13:14
1ලේක 15:25
**8** 1ලේක 13:14
**9** උත් 30:27
උත් 39:5
හිතෝ 10:22
මලා 3:10
**10** 1ලේක 15:25
ගීතා 24:7
ගීතා 68:24
**11** ගණන් 4:15
ගණන් 7:9
යොෂු 3:3
1ලේක 15:2
1ලේක 15:15
**12** 1ලේක 15:26
**13** 1සාමු 2:18
1ලේක 15:27

**2 තීරුව**
**1** 1ලේක 15:16
1ලේක 15:28
ගීතා 47:1
**2** 2ලේක 15:14
ගීතා 150:3
**3** නික් 37:1
ගීතා 132:8
**4** 1සාමු 14:49
1සාමු 18:20
1සාමු 18:27
2සාමු 3:14
**5** යෙරෙ 17:9
මතෙ 15:19
**6** 1ලේක 15:29
**7** 1ලේක 15:1
1ලේක 16:1
2ලේක 1:4
**8** ලෙවී 1:3
**9** ලෙවී 3:1
ලෙවී 19:5
**10** 1ලේක 16:2
**11** 1රාජා 8:55
**12** 1ලේක 16:3
**13** 2සාමු 3:36
හෙබ්‍රෙ 13:16
**14** 1ලේක 16:43
**15** 1සාමු 18:27
**16** ගීතා 69:7
**17** නික් 22:28
1ලේක 15:29
එෆී 5:33

තමන්ගේ සෙනඟ වන ඊශ්‍රායෙල්ව-
රුන්ව පාලනය කරන්න තෝරාගත්-
තේ මාවයි.[1] ඒ නිසා මම දිගටම
යෙහෝවා දෙවි ඉදිරියේ ප්‍රීති වෙ-
නවා.[2] **22** මම මාවම පහත් කර-
ගෙන මීටත් වඩා නින්දා අපහාස
විඳින්න වුණත් සූදානම්.[3] නමුත් ඔබ
දැන් කියූ ඒ දාසීන් මාව ඉමහත් ගෞ-
රවයෙන් සලකයි කියලා මට විශ්වා-
සයි."[4] **23** ඒ සිද්ධිය නිසා සාවුල්ගේ
දියණිය වූ මීකල්ට[5] මිය යන තෙක්
දරුවෝ ලැබුණේ නැත.

**7** යෙහෝවා දෙවිගේ ආශීර්වාදය
නිසා දාවිත් රජ සතුරු උවදුරු-
වලින් තොර සාමකාමී ජීවිතයක්
භුක්ති වින්දේය.[6] ඔහුට තමන්ටම
කියා නිවසක්ද[7] තිබිණ. **2** පසුව
රජ, අනාගතවක්තෘ නාතන්ට[8]
මෙසේ කීවේය. "සැබෑ දෙවිගේ ගිවි-
සුම් පෙට්ටිය කූඩාරමක[9] තියෙද්දී
මම දේවදාර ලීවලින් සෑදූ නිවසක[10]
ජීවත් වෙනවා." **3** එවිට නාතන්,
"යෙහෝවා දෙවිගේ ආශීර්වාදය ඔබට
ලැබිලා තියෙනවා. ඒ නිසා ඔබේ
හිතේ තියෙන සියල්ල ඉටු කර-
ගන්න"[11] කියා දාවිත් රජුට කීවේය.

**4** එදින රාත්‍රියේ යෙහෝවා දෙවි
නාතන්ට මෙසේ කීවේය.[12] **5** "ඔබ
මාගේ සේවකයා වන දාවිත්ට මෙසේ
කියන්න. 'යෙහෝවා දෙවි ඔබට
මෙසේ පැවසුවා. "මට වාසය කිරීමට
ඔබ නිවසක් සෑදිය යුත්තේ මන්ද?[13]
**6** මම ඊශ්‍රායෙල්වරුන්ව ඊජිප්තු-
වෙන් පිටතට ගෙනා දවසේ සිට අද
වන තුරු[14] නිවසක වාසය නොක-
ළෙමි. මම එදා සිටම කූඩාරමක[15]
වාසය කරමින් තැනින් තැනට ගමන්
කළෙමි.[16] **7** ඊශ්‍රායෙල්වරුන් සමඟ
තැනින් තැන ගමන් කළ ඒ කාල-
යේදී,[17] 'මට දේවදාර ලීවලින් නිව-
සක් නොසෑදුවේ මන්ද' කියා මා
කිසි දිනක අසා තිබේද? මගේ සෙ-
නඟ වන ඊශ්‍රායෙල් ජාතිය රැකබලා
ගැනීමට පත් කළ එක ගෝත්‍රය-
කින්වත්[18] මා එවැනි දෙයක් අසා
තිබේද?"' **8** මාගේ සේවකයා වන
දාවිත්ට මේ දේත් කියන්න. 'ස්වර්ග-
යේ සේනාවල අධිපති වන යෙහෝවා
දෙවි ඔබට මෙහෙම කියනවා. "ඔබ
තණබිම්වල බැටළුවන් බලාගනිමින්
සිටි කාලයේදී මම ඔබව තෝරා-
ගෙන[1] මාගේ සෙනඟ වන ඊශ්‍රායෙල්-
වරුන්ගේ පාලකයා[2] හැටියට පත්
කළෙමි. **9** ඔබ යන්නේ කොතැන-
ටද මමත් එතැනට ඔබ සමඟ එන්-
නෙමි.[3] ඔබේ සියලු සතුරන්ව ඔබ
ඉදිරියේම විනාශ කර දමන්නෙමි.[4]
මිහිපිට ජීවත් වන ශ්‍රේෂ්ඨ මනුෂ්‍ය-
යන්ට මෙන් ඔබටත් මම ශ්‍රේෂ්ඨ
නාමයක් ලබා දෙන්නෙමි.[5] **10** මම
මාගේ සෙනඟ වන ඊශ්‍රායෙල්වරුන්ට
ජීවත් වීමට ස්ථානයක්[6] වෙන් කර
හැමදාටම ඔවුන්ව එහි පදිංචි කරවන්-
නෙමි.[7] කිසි කෙනෙකුගෙන් හිරිහැර-
යක් නොමැතිව ඔවුහු එහි දිගටම
ජීවත් වනු ඇත. දුෂ්ටයෝ යළි කෙදි-
නකවත් ඔවුන්ට හිරිහැර කරන්නේ
නැත.[8] **11** මාගේ සෙනඟ වන ඊශ්‍රා-
යෙල්වරුන්ව බලාගැනීමට මා විනිශ්-
චයකරුවන්ව පත් කළ[9] කාලයේ සිට
මේ දක්වාම ඔවුන් එලෙස පීඩා වින්ද
නමුත් නැවත එසේ සිදු නොවනු
ඇත. සතුරු උවදුරුවලින් තොර නිද-
හස් ජීවිතයක් මම ඔබට ලබා දෙන්-
නෙමි.[10]

"'"යෙහෝවා දෙවි වන මම
ඔබෙන් රාජකීය පෙළපතක්[11] බිහි
කරන්නෙමි. ඒ බව යෙහෝවා දෙවි
වන මමම ඔබට ස්ථිර ලෙස පො-
රොන්දු වෙමි. **12** ඔබ මිය ගොස්[12]
ඔබේ මුතුන්මිත්තන් සමඟ ඔබව
තැන්පත් කළ[13] පසු ඔබේ පෙළප-
තින් පැමිණෙන ඔබේ පුත්‍රයෙකුට
මම ඔබේ රාජ්‍යය භාර දෙන්නෙමි.
මම ඔහුගේ රාජ්‍යය ස්ථිරව පිහි-
ටුවන්නෙමි.[14] **13** මාගේ නාමයට

**6 පරි.**
1 1සාමු 13:14; 1සාමු 15:28; 1සාමු 16:1; 1සාමු 16:12; ක්‍රියා 13:22
2 2සාමු 6:5; 2සාමු 6:14
3 යෙසා 51:7; මතෙ 5:11
4 1සාමු 2:30; 2සාමු 5:13; ගීතා 127:3
5 1සාමු 14:49; 2සාමු 6:16

**7 පරි.**
6 ලෙවී 26:6; 1රාජා 5:4
7 1ලේක 17:1
8 2සාමු 12:1; 1ලේක 29:29
9 2සාමු 6:17; 1ලේක 15:1; 1ලේක 16:1
10 2සාමු 5:11; 1ලේක 14:1
11 1රාජා 8:17; 1ලේක 17:2; 1ලේක 22:7
12 ගණන් 12:6; 1ලේක 17:3; හෙබ්‍රෙ 1:1
13 1රාජා 5:3; 1රාජා 8:19; 1ලේක 17:4; 1ලේක 22:8
14 යොෂු 18:1; 1රාජා 8:16
15 නික් 40:18; නික් 40:34; 1ලේක 17:5; ක්‍රියා 7:44
16 නික් 33:14; ද්වි 23:14
17 ලෙවී 26:12
18 1ලේක 17:6

**2 තීරුව**
1 1සාමු 16:11; 1ලේක 17:7; ගීතා 78:70
2 2සාමු 5:2; 2සාමු 6:21; 1ලේක 28:4; ගීතා 78:71
3 1සාමු 18:14; 2සාමු 5:10
4 ද්වි 28:7; 2සාමු 22:1; ගීතා 18:37
5 1සාමු 2:7; 1ලේක 14:2; 1ලේක 14:17; 1ලේක 17:8; දේශ 7:1
6 එස 20:6
7 1ලේක 17:9; ගීතා 80:8

**8** විනි 2:14; විනි 3:4; ගීතා 89:22; **9** විනි 2:16; **10** ද්වි 25:19; **11** 2සාමු 7:27; 1රාජා 2:24; 1ලේක 17:10; 1ලේක 22:10; ගීතා 89:4; **12** 1රාජා 2:1; 1ලේක 17:11; ක්‍රියා 2:29; **13** ද්වි 31:16; 1රාජා 1:21; ක්‍රියා 13:36; **14** උත් 49:10; 1රාජා 8:20; ගීතා 132:11; යෙසා 9:7; යෙසා 11:1; මතෙ 21:9; මතෙ 22:42; ලූක් 1:32; යොහ 7:42; ක්‍රියා 2:30.

ගෞරවය ගෙනෙන පිණිස ගෘහ-
යක් ගොඩනැඟීමට මා තෝරගන්නේ
ඔහුවයි.[1] මම ඔහුගේ සිංහාසනය
සදහටම පවතින ලෙස ස්ථිර කරන්-
නෙමි.[2] **14** මම ඔහුට පියෙක් වන්-
නෙමි.[3] ඔහු මට පුත්‍රයෙක් වන්නේය.[4]
ඔහු අතින් වරදක් සිදු වුණොත්
පියවරුන්* තම පුත්‍රයන්ට වේවැ-
ලෙන් දඬුවම් කරන්නාක් මෙන් මම
ඔහුට අවවාද කර ඔහුව හික්මවන්-
නෙමි.[5] **15** සාවුල් මාගේ කරුණාව
අහිමි කරගත්තේය.[6] මම ඔබ ඉදිරි-
යේ ඔහුව රජකමෙන් ඉවත් කළෙමි.
නමුත් ඔබේ පුත්‍රයාට මම කවදාවත්
එසේ නොකරන්නෙමි. මම හැමදා-
මත් ඔබෙන් පැවතෙන පුත්‍රයාට ප්‍රේ-
මණීයව* සලකන්නෙමි. **16** ඔබේ
රාජ්‍යයත් ඔබෙන් බිහි වන රාජකීය
පෙළපතත් කවදාවත් පහ නොවන්-
නේය. මම එය සදහටම පිහිටුවන්-
නෙමි. ඔබේ සිංහාසනයද සදහටම
පවතින්නේය.” ’ ”[7]

**17** දෙවි, නාතන්ට හෙළි කළ මේ
සියලු දේවල් ඔහු දාවිත් රජුට දැන්වූ-
වේය.[8]

**18** නාතන් ඔහු සමඟ කතා කළ
පසු දාවිත් රජ නිවස තුළට ගොස්
හිඳගෙන, යෙහෝවා දෙවිට මෙසේ
යාච්ඤා කළේය. “විශ්වයේ පාලක-
යාණන් වන යෙහෝවා දෙවියනි,
ඔබ මා වෙනුවෙන් මෙතරම් දේවල්
කරන්න මම කවුද?[9] මම උසස් පවුල-
කින් පැවතෙන කෙනෙක් නෙමෙයි.
ඔබ දුන් ආශීර්වාද ලබන්න තරම් මම
වටින්නේ නැහැ. **19** විශ්වයේ පාල-
කයාණන් වන යෙහෝවා දෙවියනි,
ඔබේ සේවකයා වන මා වෙනුවෙන්
මෙතරම් දේවල් ඔබ කර තිබිය-
දීත් මගේ පෙළපත දීර්ඝ කාලයක්
පුරා පවතිනවා කියාත් ඔබ දැන්
මට දැන්නුවා. විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවියනි,[10] ඔබ
ගත් ඒ තීරණය මුළු මිනිස් වර්-
ගයාටම බලපානවා.[1] **20** විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවි-
යනි, ඔබ ඔබේ සේවකයාව හොඳින්
අඳුනනවා.[2] මම ඔබට තව කුමක්
කියන්නද? **21** ඔබ මේ සෑම පුදුම
දෙයක්ම කළේ ඔබේ කැමැත්තට
එකඟවයි.[3] ඔබ ඒ දේවල් කළේ
ඔබේ වචනය ඉටු කිරීම සඳහායි.[4]
ඔබේ සේවකයා වන මටත් දැන් ඒ
සියල්ල ඔබ දැන්නුවා.[5] **22** විශ්ව-
යේ පාලකයාණන් වන යෙහෝවා දෙ-
වියනි, ඔබ ඇත්තෙන්ම ශ්‍රේෂ්ඨයි.[6]
ඔබට සමාන වෙන කිසි කෙනෙක්
නැහැ.[7] අපි වෙනත් බොහෝ දෙවිව-
රුන් ගැන අසා තිබුණත් ඔබ හැර
වෙන කිසි දෙවි කෙනෙක් නැහැ.[8]
**23** ඔබේ සෙනඟ වන ඊශ්‍රායෙල්ව-
රුන්ට සමාන තවත් ජාතියක් සිටීද?[9]
ඔබ ඔවුන්ව ඔබේ සෙනඟ කරගන්නා
පිණිස ඔවුන්ව ගලවාගෙන[10] ඔවුන්
වෙනුවෙන් බිය උපදවන පුදුමාකාර
දේවල් කළා.[11] එසේ කිරීමෙන් ඔබ
ඔබටම ශ්‍රේෂ්ඨ නාමයක් ඇති කර-
ගත්තා.[12] ඔබ ඊජිප්තුවෙන් බේරා-
ගත්[13] ඔබේ සෙනඟ වෙනුවෙන් අවට
ජාතීන්වත් ඔවුන්ගේ දෙවිවරුන්වත්
දේශයෙන් පන්නා දැමුවා. **24** ඔබ
ඊශ්‍රායෙල්වරුන්ව හැමදාටම ඔබේම
සෙනඟ ලෙස භාරගත්තා.[14] යෙ-
හෝවා දෙවියනි, දැන් ඔවුන්ගේ දෙවි
ඔබයි.[15]

**25** “යෙහෝවා දෙවියනි, ඔබේ
සේවකයා ගැනත් ඔහුගෙන් පැව-
තෙන පෙළපත ගැනත් ඔබ
කියූ දේ එලෙසම ඉටු වේවා! ඔබ
කියූ දේ හැමදාටම ස්ථිර වේවා![16]
**26** ඔබේ නාමය සදහටම ශ්‍රේෂ්ඨ
නාමයක් ලෙස පවතීවා![17] එවිට සෙ-
නඟ, ‘ස්වර්ගයේ සේනාවල අධි-
පති වන යෙහෝවා දෙවි සැබවින්ම
ඊශ්‍රායෙල්හි දෙවිය’[18] කියා පවසයි.
ඔබේ සේවකයා වන මාගේ පෙළපත

---

**2සාමු 7:14*** මූ.අ., “ආදම්ගෙන් පුත්‍රයන්.”
**15*** හෝ, “ළැදි ප්‍රේමයකින්.”

**7 පරි.**
**1** 1රාජා 5:5
1රාජා 6:12
1ලේක 17:12
1ලේක 22:10
සෙක 6:13
හෙබ්‍රෙ 3:6
1පේතෘ 2:5
**2** 1රාජා 1:37
1ලේක 28:7
ගීතා 89:4
ගීතා 89:36
ලූක් 1:33
**3** 1ලේක 17:13
1ලේක 28:6
හෙබ්‍රෙ 1:5
**4** මතෙ 3:17
**5** ලෙවී 26:18
1රාජා 8:46
ගීතා 89:30
ගීතා 89:32
යෙරෙ 52:3
**6** 1සාමු 15:23
**7** 2සාමු 7:12
1ලේක 17:14
ගීතා 45:6
ගීතා 89:36
දානි 2:44
හෙබ්‍රෙ 1:8
එළි 11:15
**8** 2සාමු 7:4
1ලේක 17:15
2පේතෘ 1:21
**9** උත් 32:10
1සාමු 2:8
1සාමු 18:18
1ලේක 17:16
මීකා 6:8
**10** උත් 15:2

**2 තීරුව**
**1** 1ලේක 17:17
**2** 1සාමු 16:7
1ලේක 17:18
ගීතා 17:3
ගීතා 139:1
හෙබ්‍රෙ 4:13
**3** 1ලේක 17:19
**4** උත් 49:10
ගණන් 24:17
ද්වි 9:5
යොෂු 23:14
යෙසා 55:11
ලූක් 1:55
**5** ගීතා 25:14
ආමො 3:7
**6** ද්වි 3:24
1ලේක 16:25
ගීතා 86:10
ගීතා 96:4
**7** නික් 15:11
1සාමු 2:2
1ලේක 17:20
ගීතා 83:18
ගීතා 89:6
යෙරෙ 10:6
**8** ද්වි 4:35
යෙසා 45:5
1කොරි 8:4
**9** ද්වි 4:7
1ලේක 17:21
ගීතා 147:20

**10** නික් 3:8; නික් 19:5; යෙසා 63:9; **11** ද්වි 10:21; **12** නික් 9:16; **13** ද්වි 9:26; නෙහෙ 1:10; **14** ද්වි 26:18; 1ලේක 17:22; **15** නික් 15:2; **16** 1ලේක 17:23; ගීතා 89:28; **17** 1ලේක 17:24; 1ලේක 29:11; ගීතා 72:19; මතෙ 6:9; යොහ 12:28; **18** 2සාමු 6:18; යෙසා 9:7.

ඔබ ඉදිරියේ ස්ථිර කරනු ලැබේවා![1]
27 ස්වර්ගයේ සේනාවල අධිපති වන
යෙහෝවා දෙවියනි, 'මම ඔබෙන්
රාජකීය පෙළපතක් බිහි කරන්-
නෙමි'[2] කියා ඔබ මට පැවසුවා. මෙ-
ලෙස යාච්ඤා කරන්න තරම් මට
ධෛර්යයක් ලැබුණේ ඔබ කිරීමට
යන දේ ගැන ඔබේ සේවකයාට දැන්වූ
නිසයි.[3] 28 විශ්වයේ පාලකයාණෙනි
වන යෙහෝවා දෙවියනි, සැබෑ දෙවි
ඔබයි. මේ යහපත් දේවල් කරන
බවට ඔබේ සේවකයාට දුන් පො-
රොන්දු[4] සැබෑ වේවා![5] 29 විශ්වයේ
පාලකයාණෙනි, යෙහෝවා දෙවියනි,
ඔබේ සේවකයාගේ පෙළපත හැමදා-
ටම ඔබ ඉදිරියේ පවතින පිණිස[6]
එයට ආශීර්වාද කරන්න.[7] ඔබ පො-
රොන්දු වුණ ලෙසම ඔබේ සේවක-
යාගේ පෙළපතට හැමදාටම ඔබේ
ආශීර්වාද ලැබේවා!"[8]

8 කලක් ගෙවුණු පසු දාවිත් රජ
පිලිස්තිවරුන්ට[9] පහර දී ඔවුන්ව
යටත් කරගත්තේය.[10] පිලිස්තිව-
රුන්ට අයිති මෙතෙග්-අම්මාහ් නම්
ප්‍රදේශය දාවිත් රජ තමා යටතට
ගත්තේය.

2 පසුව දාවිත් රජ මෝවබ්වරුන්-
ටද පහර දුන්නේය.[11] පේළියට බිම
දිගා වන ලෙස ඔහු ඔවුන්ට අණ
කළේය. ඉන්පසු ඔවුන්ව ලණුවකින්
මැන ඔවුන්ගෙන් තුනෙන් දෙකොට-
සක් මරා දැමුවේය.[12] පසුව මෝවබ්-
වරු දාවිත් රජුට යටත් වී[13] ඔහුට
කප්පම් ගෙව්වෝය.[14]

3 රෙහොබ්ගේ පුත්‍රයා වූ ෂොබාහි
රජු වූ[15] හදද්එෂෙර්, යුප්‍රටීස් ගඟ[16]
අවට ප්‍රදේශය නැවත තම බලය යට-
තට ගන්නා පිණිස පිටත්ව ගියේය. ඒ
අවස්ථාවේදී දාවිත් රජ හදද්එෂෙර්
රජුට[17] පහර දී 4 ඔහුට අයිතිව
තිබූ අසරුවන් එක්දහස් හත්සියයක්ද
පාබළ හමුදාවෙන් මිනිසුන් විසිදහ-
සක්ද අල්ලාගත්තේය.[18] දාවිත් රජ
අශ්ව රථ සියයකට අවශ්‍ය අශ්වයන්
පමණක් තබාගෙන අනික් සියලුම
අශ්වයන්ගේ[19] පාද තුවාල කළේය.[20]

7 පරි.
1 උත් 49:10; යෙරෙ 33:22
2 2සාමු 7:11
3 1ලේක 17:25; ගීතා 10:17
4 1ලේක 17:26
5 ගණන් 23:19; 1රාජා 2:4; ගීතා 89:35; ගීතා 132:11; යෙසා 55:11; යොහ 17:17; තීත 1:2
6 ගීතා 89:36; ගීතා 132:12
7 1ලේක 17:27
8 2සාමු 22:51; ගීතා 72:17

8 පරි.
9 යොෂු 13:2; 2සාමු 21:15
10 2සාමු 22:18; 1ලේක 18:1
11 ගණන් 24:17; විනි 3:29; 1සාමු 14:47; ගීතා 60:8
12 ද්වි 23:4; ද්වි 23:6
13 1ලේක 18:2
14 2රාජා 3:4; 2ලේක 26:8; ගීතා 72:10
15 1සාමු 14:47; 2සාමු 10:6; 1රාජා 11:23; ගීතා 60:පෙර
16 උත් 15:18; නික් 23:31; ද්වි 11:24; 1රාජා 4:21; ගීතා 72:8
17 1ලේක 18:3
18 1ලේක 18:4
19 ද්වි 17:16; ගීතා 20:7; ගීතා 33:17
20 යොෂු 11:6

2 තීරුව
1 1රාජා 11:24; යෙසා 7:8
2 1ලේක 18:5
3 1සාමු 13:3
4 1ලේක 18:6
5 ද්වි 7:24; 2සාමු 8:14; 1ලේක 18:13
6 1ලේක 18:7; ලූක් 11:22
7 1ලේක 18:8
8 2රාජා 14:28
9 1ලේක 18:9
10 උත් 43:27; යෙසා 39:1
11 1ලේක 18:10

5 දමස්කයේ[1] ජීවත් වූ සිරියන්ව-
රුන් ෂොබාහි රජු වූ හදද්එෂෙර්ගේ
උපකාරයට පැමිණි විට දාවිත් රජ
ඔවුන්ගෙන් විසිදෙදහසක් මරා දැමු-
වේය.[2] 6 දාවිත් රජ තම හමුදාව
සිරියාවේ දමස්කය නම් නුවරට යවා
මුර කඳවුරු එහි පිහිටෙව්වේය.[3] පසුව
සිරියන්වරුද දාවිත් රජුගේ සේවක-
යෝ වූහ. ඔවුහු දාවිත් රජුට කප්පම්
ගෙව්වෝය.[4] දාවිත් රජු ගිය ගිය
තැන්වල යෙහෝවා දෙවි ඔහුට ජය
අත් කර දුන්නේය.[5] 7 දාවිත් රජ
හදද්එෂෙර් රජුගේ සේවකයන්ගේ රන්
පලිස්[6] යෙරුසලමට ගෙන ගියේය.
8 ඔහු බෙටා* සහ බෙරොතයි නම්
නුවරවලින් විශාල තඹ ප්‍රමාණයක්
රැගෙන ගියේය.[7] ඒ නුවරවල් අයිතිව
තිබුණේ හදද්එෂෙර් රජුටය.

9 හදද්එෂෙර් රජුගේ මුළු යුධ හමු-
දාවම දාවිත් රජු පරාජයට පත් කළ
බව හමාත්හි[8] රජු වූ තොයිට* ආරංචි
විය.[9] 10 එවිට ඔහු දාවිත් රජුගේ
සැප දුක් විමසීමටත්[10] හදද්එෂෙර්
රජුට එරෙහිව දාවිත් රජු ලද ජයග්‍රහ-
ණයට සුබ පැතීමටත් ඔහුගේ පුත්
යෝරාම්ව පිටත් කර යැව්වේය. (මීට
පෙරාතුව හදද්එෂෙර් රජු සහ තොයි
රජු අතර නිතර ගැටුම් පැවතිණ.)
යෝරාම් යන විට රන්, රිදී සහ තඹව-
ලින් නිමැවූ භාණ්ඩ රැගෙන ගියේය.[11]
11 ඒ සියලු වස්තුද තමන් යටත්
කරගත් ජාතීන්ගෙන් ලබාගත් රන්ද
රිදීද දාවිත් රජ, යෙහෝවා දෙ-
විට කැප කළේය.[12] 12 සිරියන්-
වරුන්ගෙන්ද මෝවබ්වරුන්ගෙන්ද[13]
අම්මොන් පුත්‍රයන්ගෙන්ද පිලිස්-
තිවරුන්ගෙන්ද[14] අමලෙක්වරුන්-
ගෙන්ද[15] ලබාගත් සියලු වස්තු හා
රෙහොබ්ගේ පුත්‍රයා වූ ෂොබාහි රජු
වන හදද්එෂෙර්ගෙන්[16] කොල්ල කෑ

**12** යොෂු 6:19; 1රාජා 7:51; 1ලේක 18:11; 1ලේක 22:14; 1ලේක 26:27; **13** 2සාමු 8:2; **14** 2සාමු 8:1; **15** 1සාමු 30:18; **16** 2සාමු 8:7; 1ලේක 18:7.

**2සාමු 8:8*** 1ලේක 18:8හි, "තිබ්හත්" ලෙස සඳහන් වේ. **9*** 1ලේක 18:9, 10හි, "තොයු" ලෙස සඳහන් වේ.

සියලු වස්තුද දාවිත් රජ එසේ කැප
කළේය. **13** ඒදොම්වරුන් දහඅටද-
හසක්[1] ලුණු නිම්නයේදී[2] මරා දැමූ
නිසා දාවිත් රජ කීර්තියට පත් විය.
**14** ඔහු ඒදොම්හි සෑම තැනකම මුර
කඳවුරු පිහිටෙව්වේය.[3] ඒදොම්වරුද
දාවිත් රජුගේ සේවකයෝ වූහ.[4] දාවිත්
රජු ගිය ගිය තැන්වල යෙහෝවා දෙවි
ඔහුට ජය අත් කර දුන්නේය.[5]

**15** දාවිත් රජ මුළු ඊශ්‍රායෙල් දේශ-
යම පාලනය කළේය.[6] දාවිත් රජ
තම සෙනඟට ධර්මිෂ්ඨ ලෙස පාල-
නය කළේය.[7] ඔහු ඔවුන්ට යුක්තිය
ඉටු කර දුන්නේය.[8] **16** ඔහුගේ හමු-
දාපති ලෙස කටයුතු කළේ ෂෙ-
රුයියාගේ පුත්‍රයා වූ යෝවාබ්ය.[9]
අහිලුද්ගේ පුත්‍රයා වූ යෙහෝෂපාට්[10]
දේශයේ වාර්තාකරු ලෙස සේවය
කළේය. **17** අහිතුබ්ගේ පුත්‍රයා වූ
සාදොක්[11] සහ අබියාතර්ගේ පුත්‍රයා වූ
අහිමෙලෙක්[12] පූජකයන් ලෙස සේ-
වය කළෝය. සෙරායා ලේකම් ලෙස
කටයුතු කළේය. **18** යෙහෝයාදා-
ගේ පුත්‍රයා වූ බෙනායා[13] කෙරෙති-
වරුන්ගේ[14] හා පෙලෙතිවරුන්ගේ[15]
අධිපතියා ලෙස කටයුතු කළේය.
දාවිත් රජුගේ පුත්‍රයෝද අධිපතීන්
ලෙස සේවය කළෝය.[16]

**9** දාවිත් රජ තම සේවකයන්ට
මෙසේ කීවේය. "සාවුල්ගේ පවුලේ
කෙනෙක් තවමත් ජීවත්ව ඉන්නවා
නම් මට කියන්න. යොනාතාන්ට දුන්
පොරොන්දුවට එකඟව[17] ඔහුට ප්‍රේම-
ණීයව*[18] සලකන්න මම කැමතියි."
**2** සාවුල්ගේ නිවසේ ශීබා[19] නම් සේව-
කයෙක් සිටියේය. ඔහුව දාවිත් රජු
වෙතට කැඳවනු ලැබූ විට රජ ඔහු-
ගෙන් මෙසේ ඇසුවේය. "ශීබා කියන්-
නේ ඔබටද?" එවිට ශීබා, "එසේය. මම
ඔබේ සේවකයා වන ශීබා" කියා රජුට
පිළිතුරු දුන්නේය. **3** ඉන්පසු රජ
ඔහුගෙන් මෙසේ ඇසුවේය. "සාවුල්ගේ
පවුලේ එක් කෙනෙක් හරි තාම ජීව-
තුන් අතර ඉන්නවාද? එහෙම කෙ-
නෙක් ඉන්නවා නම් දෙවි ප්‍රේමය*
පෙන්වනවා වගේම මමත් කැමතියි
ඔහුට ප්‍රේමණීයව සලකන්න."[1] එවිට
ශීබා, "යොනාතාන්ගේ පුතෙක් තව-
මත් ජීවතුන් අතර ඉන්නවා. ඔහුගේ
කකුල් දෙකම කොරයි"[2] කියා රජුට
කීවේය. **4** රජද, "ඔහු කොහෙද ඉන්-
නේ" කියා ඇසුවේය. ශීබා මෙසේ
පිළිතුරු දුන්නේය. "ඔහු ඉන්නේ ලො-
දේබාර්හි[3] ජීවත් වන අම්යෙල්ගේ පුත්
මාකීර්ගේ[4] ගෙදර."

**5** එවෙලේම දාවිත් රජ ලො-
දේබාර්හි විසූ අම්යෙල්ගේ පුත්‍රයා
වන මාකීර්ගේ නිවසට සේවකයන්
යවා යොනාතාන්ගේ පුත්‍රයාව ගෙන්-
වාගත්තේය. **6** සාවුල්ගේ මුනුපුරා
එනම්, යොනාතාන්ගේ පුත්‍රයා වන
මෙෆිබොෂෙත් දාවිත් රජු ළඟට
පැමිණි විට ඔහු දාවිත් රජු ඉදිරියේ
බිම වැටී පොළොව දෙසට හිස පහත්
කළේය.[5] එවිට දාවිත් රජ, "මෙ-
ෆිබොෂෙත්" කියා කතා කළේය.
මෙෆිබොෂෙත්ද, "ස්වාමීනි, ඔබේ
සේවකයා ඔබ ඉදිරියේ" කියා දාවිත්
රජුට කීවේය. **7** එවිට දාවිත් රජ
ඔහුට මෙසේ කීවේය. "භය වෙන්න
එපා. මම ඔබට ප්‍රේමණීයව*[6] සලකා-
නවා. මම ඔබේ පියා වන යොනා-
තාන්ට පොරොන්දු වුණ විදිහටම[7]
ඔබව හොඳින් බලාගන්නම්. ඔබේ
සීයා වන සාවුල්ගේ සියලු ඉඩකඩම්
මම ආයෙත් ඔබට පවරනවා.[8] හැම-
දාම මාත් එක්ක එකට වාඩි වෙලා
කෑම කන්න ඔබට පුළුවන්."[9]

**8** එය ඇසූ විට මෙෆිබොෂෙත්
පොළොව දෙසට හිස පහත් කර,
"පණ නැති බල්ලෙක් වගේ ඉන්න මට
ඔබ මෙතරම් කරුණාවෙන් සලකන්-
නේ ඇයි"[10] කියා දාවිත් රජුගෙන්
ඇසුවේය. **9** ඉන්පසු රජ සාවුල්-
ගේ සේවකයෙකු වූ ශීබාව කැඳවා
ඔහුට මෙසේ කීවේය. "සාවුල්ටත්
ඔහුගේ පවුලේ අයටත් අයිතිව තිබුණු

**8 පරි.**
1 1ලේක 18:12
2 ගීතා 60:පෙර
3 2සාමු 8:6
4 උත් 25:23, උත් 27:29, උත් 27:37, ගණන් 24:18
5 1ලේක 18:13, ගීතා 37:28, ගීතා 60:12
6 2සාමු 5:3, 2සාමු 5:5
7 2සාමු 23:3, 1රාජා 3:6
8 1ලේක 18:14, හිතෝ 29:4, හිතෝ 29:14
9 2සාමු 20:23, 1ලේක 11:6
10 2සාමු 20:24, 1රාජා 4:3, 1ලේක 18:15
11 2සාමු 15:27, 1ලේක 6:8, 1ලේක 6:53, 1ලේක 18:16, 1ලේක 24:3
12 1ලේක 24:31
13 2සාමු 23:20, 1රාජා 1:44, 1රාජා 2:35, 1ලේක 18:17
14 2සාමු 15:18
15 2සාමු 20:7
16 2සාමු 20:26, 1රාජා 4:5, 1ලේක 18:17

**9 පරි.**
17 1සාමු 18:3, 1සාමු 20:15, 1සාමු 20:42, හිතෝ 17:17
18 හිතෝ 19:22, මීකා 6:8, සෙක 7:9
19 2සාමු 16:1, 2සාමු 19:17

**2 තීරුව**
1 1සාමු 20:14
2 2සාමු 4:4, 2සාමු 9:13, 2සාමු 19:26
3 යොෂු 13:26
4 2සාමු 17:27
5 1සාමු 24:8, 1සාමු 25:23
6 යෝබ් 6:14, හිතෝ 11:17
7 2සාමු 9:1
8 රූත් 4:5
9 2සාමු 19:28, 1රාජා 2:7, හිතෝ 11:25, යෙසා 32:8
10 1සාමු 24:14, ලූක් 14:11

2සාමු **9:1*** හෝ, "ලැදි ප්‍රේමයකින්."

2සාමු **9:3*** හෝ, "ලැදි ප්‍රේමය." **7*** හෝ, "ලැදි ප්‍රේමයකින්."

හැම දෙයක්ම මම ඔබේ ස්වාමියාගේ
මුනුපුරාට භාර දෙනවා.[1] **10** ඔබ
ඔහු වෙනුවෙන් ගොවිතැන් කරන්න.
ඔබයි ඔබේ පුත්‍රයනුයි ඔබේ සේවකය-
නුයි ඒ ලැබෙන අස්වැන්නෙන් ඔබේ
ස්වාමියාගේ මුනුපුරාගේ පවුලේ අයට
කන්න දෙන්න. නමුත් ඔබේ ස්වාමි-
යාගේ මුනුපුරා කෑම කන්නේ මා
සමඟයි."[2]

ශීබාට පුත්‍රයෝ පහළොස්දෙ-
නෙක්ද සේවකයෝ විසිදෙනෙක්ද
සිටියෝය.[3] **11** එවිට ශීබා, රජුට
මෙසේ කීවේය. "මගේ ස්වාමීනි,
ඔබේ සේවකයා වන මම ඔබ අණ
කළ ලෙස කරන්නම්. නමුත් මෙෆි-
බොෂෙත්ට[4] පුළුවන් රජුගේ පුත්‍ර-
යෙක් වගේ මාත් එක්ක* එකට
වාඩි වී කෑම කන්න." **12** මෙෆිබො-
ෂෙත්ට මීකා[5] නම් වූ කුඩා පුත්‍ර-
යෙක් සිටියේය. ශීබාගේ සෑම ගෙයි
වැසියෙක්ම මෙෆිබොෂෙත්ට සේවය
කළෝය. **13** මෙෆිබොෂෙත් ජීවත්
වුණේ යෙරුසලමෙහිය. ඔහු දිනප-
තාම රජු සමඟ එකට වාඩි වී කෑම
කෑවේය.[6] ඔහුගේ දෙපයම කොරව
තිබුණි.[7]

**10** කල් යත්ම අම්මොන්වරුන්-
ගේ[8] රජ මිය ගියේය. ඉන්පසු
ඔහුගේ පුත් හානුන් ඔහු වෙනුවට රජ
වුණේය.[9] **2** ඒ ගැන ආරංචි වූ දාවිත්
රජ මෙසේ කීවේය. "නාහාෂ් රජු
ජීවතුන් අතර සිටියදී මට ප්‍රේම-
ණීයව* සැලකුවා. ඒ නිසා මමත් ඔහු-
ගේ පුත් හානුන්ට ප්‍රේමය# පෙන්විය
යුතුයි."[10] එබැවින් වියෝ දුකින් පෙ-
ළුණු හානුන්ව සැනසීම සඳහා දාවිත්
රජ තම සේවකයන් කිහිපදෙනෙකුව
ඔහු වෙතට යැව්වේය.[1] දාවිත් රජු-
ගේ සේවකයන් අම්මොන්වරුන්ගේ
දේශයට පැමිණි විට **3** ඒ දේශ-
යේ අධිපතීහු තමන්ගේ ස්වාමියා වූ
හානුන් රජුට මෙසේ කීවෝය. "දාවිත්
ඔබව සනසන්න මිනිසුන්ව එවලා
තියෙන්නේ ඔබේ පියාට කරන ගෞ-
රවයක් හැටියට කියලා ඔබ හිතන-
වාද? අපේ නුවරේ ඔත්තු බලලා[2]
ඒක අල්ලගැනීමේ අදහසිනුයි ඔහු
තම සේවකයන්ව මෙහෙට එවලා
තියෙන්නේ."[3] **4** එය ඇසූ හානුන්
රජ, දාවිත් රජුගේ සේවකයන්ගේ රැවු-
ලෙන් එක පැත්තක් සම්පූර්ණයෙන්ම
කපා දමා[4] ඔවුන්ගේ ඇඳුම්, තට්ටම්
පෙනෙන තරමට කොටට කපා ඇමු-
වේය. ඉන්පසු ඔහු ඔවුන්ව පිටත් කර
යැව්වේය.[5] **5** පසුව පිරිසක් පැමිණ
දාවිත් රජුට ඒ ගැන දැන්වූහ. ඒ ඇසූ
දාවිත් රජ බොහෝ සෙයින් ලැජ්ජා-
වට පත්ව සිටි ඒ මිනිසුන්ව හමු වීමට
තවත් සේවක පිරිසක් යවා ඔවුන්ට
මෙසේ දැන්වීය. "ඔබේ රැවුල් නැවත
වැවෙන තෙක් යෙරිකෝවට[6] වෙලා
ඉන්න."

**6** තමන් සමඟ දාවිත් රජු දැඩි
වෛරයකින්[7] සිටින බව අම්මොන්ව-
රුන් දැනගත් විට ඔවුහු බෙත්-
රෙහොබ්හි[8] හා ෂොබාහි[9] ජීවත් වූ
සිරියන්වරුන්ගේ පාබල හමුදාවෙන්
විසිදහසක්ද මයකාහි රජු[10] හා ඔහුගේ
සෙබළු දහසක්ද ඉෂ්ටොබ්හි සෙ-
බළු දොළොස්දහසක්ද කුලියට ගත්-
තෝය. **7** ඒ ගැන දැනගත් දාවිත්
රජ යෝවාබ්වද එඩිතර මිනිසුන්ගෙන්
යුත්[11] තම මුළු යුධ හමුදාවද සටනට
පිටත් කර යැවීය. **8** අම්මොන්වරු
නුවර දොරටුව ඉදිරිපිටට ගොස් යුද්-
ධයට සැරසී සිටියෝය. රෙහොබ්හි[12]
හා ෂොබාහි සිට පැමිණි සිරියන්වරුද
ඉෂ්ටොබ්හි හා මයකාහි හට පිරිසද
තණබිමේ[13] රැස්ව සිටියෝය.

**9** සතුරු හමුදාව දෙපැත්තෙන්ම
පහර දීමට සූදානම්ව සිටින බව
දුටු යෝවාබ්, ඊශ්‍රායෙල් හමුදාවේ
සිටි දක්ෂතම සෙබළුන් කණ්ඩාය-

**9 පරි.**
1 2සාමු 9:1, 2සාමු 16:4, 2සාමු 19:29
2 2සාමු 9:7, 2සාමු 19:28
3 2සාමු 19:17
4 2සාමු 9:3
5 1ලේක 8:34, 1ලේක 9:40
6 2සාමු 9:7, 2සාමු 19:28
7 2සාමු 4:4

**10 පරි.**
8 උත් 19:38, විනි 10:7, විනි 11:12, විනි 11:33, 1සාමු 11:1
9 1ලේක 19:1
10 1ලේක 19:2

**2 තීරුව**
1 2සාමු 2:5
2 උත් 42:9, ගණන් 13:2, යොෂු 2:1
3 1ලේක 19:3
4 ලෙවී 19:27
5 1ලේක 19:4
6 යොෂු 6:24, යොෂු 18:21, 1ලේක 19:5
7 උත් 34:30, නික් 5:21, 1සාමු 13:4, 1සාමු 27:12
8 ගණන් 13:21
9 2සාමු 8:5, 1ලේක 19:6
10 යොෂු 13:13, 1ලේක 19:7
11 2සාමු 23:8, 1ලේක 19:8
12 ගණන් 13:21
13 1ලේක 19:9

**2සාමු 9:11*** මැසොරෙටික් හෙබ්‍රෙව් පිටපත හා ලතින් වල්ගේට් පරිවර්තනයට අනුව, 'මගේ මේසයේ.' සෙප්ටුඅජින්ට් ග්‍රීක පිටපතට අනුව, 'දාවිත්ගේ මේසයේ.' සිරියැක් පෙෂිටා පරිවර්තනයට අනුව, 'රජුගේ මේසයේ.' මේ පදයේ, 'මගේ මේසයේ' වෙනුවට, 'දාවිත්ගේ මේසයේ' කියා සඳහන් විය යුතු බව ඇතමෙකුගේ මතයයි. සමහරවිට ශීබා, දාවිත් කියූ දේ නැවත සඳහන් කළා විය හැක. **10:2*** හෝ, "ලැදි ප්‍රේමයකින්." **2#** හෝ, "ලැදි ප්‍රේමය."

මක්[1] තෝරාගෙන සිරියන්වරුන්ට
පහර දීමට සූදානම් විය. **10** ඔහු
ඉතුරු සෙබළුන්ව තම සහෝදරයා
වූ අබිෂයිගේ[2] නායකත්වය යටතේ
අම්මොන්වරුන්ට[3] පහර දීම සඳහා
යැව්වේය. **11** එසේ යැවීමට පෙර
යෝවාබ්, අබිෂයිට මෙසේ කීවේය.
“සිරියන්වරුන්ට මුහුණ දෙන්න අපිට
බැරි වුණොත් ඔබ ඔබේ පිරිස සමඟ
අපේ උදව්වට එන්න. ඒ වගේම අම්-
මොන්වරුන්ට මුහුණ දෙන්න ඔබට
බැරි වුණොත් අපි ඔබේ උදව්වට
එන්නම්.[4] **12** කිසිම දේකට භය
වෙන්න එපා. අපේ සෙනඟ වෙනුවෙ-
නුත් අපේ දෙවිගේ නුවරවල් වෙනුවෙ-
නුත්[5] අපි එඩිතරව සටන් කරමු.[6]
හරියි කියලා යෙහෝවා දෙවි සිතන
දේ අනිවාර්යයෙන්ම සිදු වෙයි.”[7]

**13** යෝවාබ් සහ ඔහුගේ හමු-
දාව ඉදිරියට පැමිණ සිරියන්වරුන්ට
පහර දුන්නෝය. සිරියන්වරු ඔවුන්
වෙතින් පලා ගියෝය.[8] **14** සිරි-
යන්වරුන් පලා යන බව දුටු අම්-
මොන්වරුද අබිෂයි වෙතින් පලා
ගොස් නුවරට ඇතුල් වූහ.[9] ඉන්-
පසු යෝවාබ් ආපසු යෙරුසලමට
ගියේය.[10]

**15** ඊශ්‍රායෙල්වරුන් අතින් පරාජ-
යට පත් වූ නිසා සිරියන්වරු
නැවත තම සේනා රැස් කරගත්-
තෝය. **16** හදද්එෂෙර් රජ[11] පණිවි-
ඩකරුවන් යවා මහ ගඟ*[12] අවට
ප්‍රදේශයේ වාසය කළ සිරියන්වරුන්ව
කැඳෙව්වේය. පසුව ඔවුහු හදද්එෂෙර්
රජුගේ හමුදාපති වූ ෂෝබාක්[13] සමඟ
හෙලාම් නුවරට පැමිණියෝය.

**17** ඒ ගැන දාවිත් රජුට ආරංචි වූ
විට ඔහු විගස ඊශ්‍රායෙල් හමුදාව රැස්
කරගෙන යොර්දාන් ගඟෙන් එගොඩ
වී හෙලාම් නුවරට ගියේය. සිරියන්ව-
රුද ඉදිරියට ඇවිත් දාවිත් රජුට විරුද්-
ධව සටන් කළෝය.[14] **18** දාවිත් රජ
සිරියන්වරුන්ගේ අශ්ව රථ පදවන්-
නන් හත්සියයක්ද[15] අසරුවන් හත-
ළිස්දහසක්ද ඔවුන්ගේ හමුදාපති වූ
ෂෝබාක්වද මරා දැමුවේය.[1] ඊශ්‍රායෙල්
හමුදාව අතින් පරාජයට පත් වූ සිරි-
යන්වරු පලා ගියෝය.[2] **19** හදද්එ-
ෂෙර් රජු යටතේ සිටි සියලු රජවරුන්[3]
ඊශ්‍රායෙල්වරුන් අතින් පරාජයට පත්
වූ[4] නිසා ඔවුහු ඉක්මනින් ගොස් ඊශ්‍රා-
යෙල්වරුන් සමඟ සමාදාන වී ඔවුන්ට
සේවය කරන්න පටන්ගත්තෝය.[5]
අම්මොන්වරුන්ට උපකාර කිරීමට
ඉන්පසු සිරියන්වරු භය වූහ.[6]

**11** අලුත් අවුරුද්දක ආරම්භ-
යත් සමඟම[7] දාවිත් රජ,
යෝවාබ්වද තම සේවකයන්වද මුළු
ඊශ්‍රායෙල් හමුදාවද යුද්ධයට පිටත්
කර යැව්වේය. ඔවුන්ගේ අරමුණ
වූයේ අම්මොන්වරුන්ට පහර දී[8]
රබ්බා නුවර වටලාගැනීමයි.[9] නමුත්
දාවිත් යෙරුසලමෙහි රැඳී සිටියේය.
(සාමාන්‍යයෙන් රජවරුන් යුද්ධවලට
ගියේ අවුරුද්දේ මුල් කාලයේදීය.)[10]

**2** සැන්දෑ වරුවක දාවිත් තම
යහනෙන් නැඟිට නිවසේ සැඳැල්-
ලට*[11] ගොස් එහි සක්මන් කර-
මින් සිටියේය. ඒ අවස්ථාවේදී දිය
නාමින් සිටි කාන්තාවක ඔහුගේ
නෙත ගැටුණේය.[12] ඇය ඉතා රූමත්
කාන්තාවක් වූවාය.[13] **3** දාවිත් ඇය
ගැන විමසා[14] බැලූ විට එක්තරා
පුද්ගලයෙක් ඔහුට මෙසේ කීවේය.
“ඇය එලියාම්ගේ* දුව[15] බැත්-ෂෙබා.[16]
ඇගේ පුරුෂයාගේ නම උරියා.[17]
ඔහු හිත්තී ජාතිකයෙක්.”[18] **4** ඒ
කාලයේදී බැත්-ෂෙබා පවිත්‍ර වීමේ
පිළිවෙත්[19] අනුගමනය කරමින් සිටි-
යාය. දාවිත් මිනිසුන් යවා ඇයව තම
නිවසට ගෙන්වාගත්තේය.[20] ඉන්පසු
ඔහු ඇය සමඟ සයනය කළේය.[21]
පසුව ඇය තම නිවසට ගියාය.

---

**2සාමු 10:16*** එනම්, යුප්‍රටීස් ගඟ.

**19** ලෙවී 12:2; ලෙවී 15:19; ලෙවී 15:29; ලෙවී 18:19; **20** නික් 20:17; ලෙවී 19:11; 1කොරි 7:1; **21** නික් 20:14; ලෙවී 18:20; ලෙවී 20:10; ද්වි 22:22; හිතෝ 6:32; දේශ 8:4; හෙබ්‍රෙ 13:4; යාකො 1:15.

**2සාමු 11:2*** එනම්, වහලයක් නැතුව සාදා ඇති, සඳ එළිය වැටෙන උඩුමහලට. **3*** 1ලේක 3:5හි, “අම්යෙල්” ලෙස සඳහන් වේ.

---

**10 පරි.**

**1** 1ලේක 19:10
**2** 1සාමු 26:6
2සාමු 2:18
2සාමු 23:18
1ලේක 2:16
**3** උත් 19:38
ගණන් 21:24
1ලේක 19:11
**4** 1ලේක 19:12
හිතෝ 20:18
**5** 1ලේක 19:13
**6** ද්වි 31:6
2ලේක 32:7
**7** 1සාමු 3:18
1සාමු 14:6
2සාමු 15:26
ගීතා 37:5
ගීතා 44:5
හිතෝ 29:25
**8** 1ලේක 19:14
**9** 1ලේක 19:15
**10** 2සාමු 5:5
**11** 2සාමු 8:3
**12** උත් 15:18
නික් 23:31
ද්වි 11:24
2සාමු 8:5
1රාජා 4:21
ගීතා 72:8
**13** 1ලේක 19:16
**14** 1ලේක 19:17
**15** ද්වි 20:1
ගීතා 18:38

**2 තීරුව**

**1** 1ලේක 19:18
**2** 2සාමු 8:4
**3** 2සාමු 10:6
**4** ගීතා 18:37
**5** උත් 15:18
ද්වි 20:11
යොෂු 1:4
**6** 1ලේක 19:19

**11 පරි.**

**7** 1රාජා 20:22
2ලේක 36:10
**8** 1ලේක 20:1
**9** 2සාමු 12:26
**10** 1සාමු 8:20
දේශ 3:8
**11** 1සාමු 9:26
ක්‍රියා 10:9
**12** යෝබ් 31:1
හිතෝ 5:20
මතෙ 5:28
**13** හිතෝ 6:25
**14** 1කොරි 10:12
යාකො 1:14
**15** 1ලේක 3:5
**16** 2සාමු 12:24
1රාජා 1:11
**17** 2සාමු 23:39
1රාජා 15:5
1ලේක 11:41
**18** උත් 10:15
උත් 15:20
ද්වි 20:17

**5** බැත්-ෂෙබා තමන් ගැබ්ගෙන
සිටි බව දැනගත් විට, “මට දරු-
වෙක් ලැබෙන්න ඉන්නවා” කියා
දාවිත්ට දැන්වූවාය. **6** එය දැනගත්
විට දාවිත් රජ, යෝවාබ් වෙත පණිවි-
ඩකරුවන් යවා මෙසේ දැන්වූවේය.
“හිත්තී ජාතික උරියාව මා ළඟට
එවන්න.” යෝවාබ්ද එසේ කළේය.
**7** උරියා ඔහු වෙත පැමිණි විට දාවිත්
රජ ඔහුගෙන් යෝවාබ්ගේ හා ඊශ්‍රා-
යෙල් සෙබළුන්ගේ සැප දුක් ගැනද
යුද්ධයේ තොරතුරු ගැනද විමසු-
වේය. **8** පසුව දාවිත් රජ, “ඔබ දැන්
ගෙදර ගිහින් ඇඟපත සෝදාගන්න”[1]
කියා උරියාට කීවේය. ඉන්පසු උරියා
රජු වෙතින් ගියේය. රජද තම සේව-
කයන් අතේ උරියාට තෑග්ගක්* යැව්-
වේය. **9** එහෙත් උරියා තම නිවසට
ගියේ නැත. ඔහු තම ස්වාමියාගේ
අනික් සේවකයන් සමඟ රජුගේ නිව-
සේ දොරකඩ අසල නිදාගත්තේය.
**10** “උරියා නිවසට ගියේ නැහැ” කියා
රජුට දන්වන ලදි. එය දැනගත් විට
දාවිත් රජ, “ඔබ දුර ගමනක් ගිහින්
නේද ආවේ? ඉතින් ඇයි ඔබ ගෙදර
යන්නේ නැත්තේ” කියා උරියාගෙන්
ඇසුවේය. **11** එවිට උරියා දාවිත්
රජුට මෙසේ කීවේය. “ගිවිසුම් පෙට්-
ටිය[2] තියෙන්නේ කූඩාරමකයි. ඊශ්‍රා-
යෙල්වරුන් හා යූදාවරුන් ඉන්නෙත්
කූඩාරම්වලයි. මගේ ස්වාමියා වන
යෝවාබ් හා ඔහුගේ සේවකයන්[3] එළි-
මහනේ කඳවුරු බැඳගෙන ඉන්නවා.
මේ වගේ අවස්ථාවක මම කොහොමද
ගෙදර ගිහින් කාලා බීලා මගේ භාර්-
යාව එක්ක සතුටු වෙන්නේ?[4] මම ඔබ
ඉදිරියේ දිවුරා කියන්නම්,[5] මට කව-
දාවත් එහෙම දෙයක් නම් කරන්න
බැහැ!”

**12** එවිට දාවිත් රජ, “එහෙම-
නම් අදත් ඔබ මෙහෙ ඉන්න. හෙට
මම ඔබව ආපසු පිටත් කර අරින්-
නම්” කියා උරියාට කීවේය. එබැවින්
උරියා එදිනද පසුවදාද යෙරුසල-
මෙහි නැවතී සිටියේය. **13** දාවිත්
රජ තමා සමඟ කෑම කන්න එන්න
කියා උරියාට ආරාධනා කළේය. ඒ
අවස්ථාවේදී දාවිත් රජ මත් වන
තරමටම උරියාට බොන්න දුන්-
නේය.[1] එහෙත් රාත්‍රියේදී උරියා
තම නිවසට නොගියේය. ඔහු
තම ස්වාමියාගේ සේවකයන් නිදාගත්
ස්ථානයේම නිදාගත්තේය. **14** පසු-
වදා උදෑසන දාවිත් රජ යෝවාබ්ට
ලිපියක් ලියා[2] එය උරියාගේ අතේ
යැව්වේය. **15** ඔහු එම ලිපියේ මෙ-
ලෙස ලියා තිබුණේය.[3] “ඉතා දරුණු
විදිහට සටන් කරන තැනක් බලා උරි-
යාව සතුරන් ඉදිරියටම යවන්න.[4]
ඊටපසු ඔබ සියලුදෙනාම එතැනින්
ඉවත්ව යන්න. සතුරන් අතින් ඔහුට
මැරුම් කෑමට ඉඩ දෙන්න.”[5]

**16** ඒ අවස්ථාවේදී යෝවාබ්,
රබ්බා නුවර අවට කඳවුරු බැඳ-
ගෙන සිටියේය. එවිට ඔහු දක්ෂ-
තම සටන්කරුවන් සිටින තැනක්
බලා උරියාව එතැනට යැව්වේය.[6]
**17** ඒ නුවරේ මිනිස්සු පිටතට
ඇවිත් යෝවාබ්ට විරුද්ධව සටන්
කරන්න පටන්ගත්තෝය. ඒ අවස්ථා-
වේදී දාවිත්ගේ සේවකයන් කිහිපදෙ-
නෙක්ම මැරුම් කැවෝය. හිත්තී
ජාතික උරියාද මැරුම් කෑවේය.[7]
**18** යෝවාබ්, යුද්ධයේ සියලු තොර-
තුරු දාවිත් රජුට දැන්වීම සඳහා
පණිවිඩකරුවෙකු කැඳවා **19** ඔහුට
මෙසේ කීවේය. “යුද්ධයේ හැම තො-
රතුරක්ම රජුට කියන්න. **20** ඔහු
කෝප වී, ‘එතරම් ළඟට ගිහින් සටන්
කෙරුවේ ඇයි? ඔවුන් පවුරේ ඉඳන්
පහර දෙයි කියලා ඔබ දැනගෙන හිටි-
යේ නැද්ද? **21** යෙරුබ්බෙෂෙත්ගේ[8]
පුත් අබිමෙලෙක් මැරුණේ කොහො-
මද කියලා ඔබට මතක නැද්ද?[9] ගෑනු
කෙනෙක් පවුර උඩ ඉඳං ඔහුගේ හිසට
කුරහන් ගලක් අතහැරලා[10] තේබේෂ්-
හිදී[11] ඔහුව මරලා දාපු හැටි ඔබට
මතක නැද්ද? ඒ ගැන දැන දැනත්
ඔබ පවුර කිට්ටුවටම ගියේ ඇයි’

**11 පරි.**
1 1සාමු 25:41
2 2සාමු 6:17; 2සාමු 7:2
3 2සාමු 20:6
4 ලෙවී 15:16; ද්වි 23:9; 1සාමු 21:5
5 1සාමු 17:55; 1සාමු 20:3; 1සාමු 25:26; 2සාමු 14:19

**2 තීරුව**
1 උත් 19:33; හිතෝ 20:1; හොෂෙ 4:11
2 ගීතා 19:13
3 දේශ 8:4
4 1සාමු 18:17; 1සාමු 18:25
5 2සාමු 12:9; ගීතා 51:14; හිතෝ 3:29; හිතෝ 17:13; සෙක 8:17; මාක් 7:21
6 ලෙවී 19:17; 1ලේක 21:3
7 2සාමු 12:9
8 විනි 6:32; විනි 7:1
9 විනි 9:52
10 විනි 9:53
11 විනි 9:50

---
2සාමු **11:8*** හෝ, “රජුගේ කොටස.” නැත්නම් ගෞරවනීය අමුත්තෙකුට ලබා දෙන පංගුව. උත් 43:34 බලන්න.

කියා ඇහුවොත් ඔබ රජුට මෙහෙම
කියන්න. 'ඔබේ සේවකයා වූ උරියාත්
සටනේදී මැරුණා.' "[1]

**22** පණිවිඩකරු දාවිත් රජු වෙත
ගොස් යෝවාබ් කී ලෙස ඔහුට
දැන්වූවේය. **23** ඔහු දාවිත් රජුට
මෙසේ කීවේය. "ඒ මිනිස්සු අපිට
වඩා බලවත්. ඔවුන් නුවරෙන් පිට-
තට ඇවිත් අපිට විරුද්ධව සටන්
කළා. අපිත් නුවර දොරටුව දක්වාම
ගොස් ඔවුන්ට විරුද්ධව සටන් කළා.
**24** නමුත් පවුර උඩ හිටපු දුනුවායෝ
ඔබේ සේවකයන්ට පහර දුන්නා.[2] ඒ
අවස්ථාවේදී රජුගේ සේවකයන් කිහි-
පදෙනෙක්ම මැරුණා. ඔබේ සේව-
කයා වන හිත්තී ජාතික උරියාත්
මැරුණා."[3] **25** එය ඇසූ විට දාවිත්
රජ පණිවිඩකරුවාට මෙසේ කීවේය.
"ඔබ යෝවාබ්ට මෙහෙම කියන්න.
'සිදු වුණු දේ ගැන කනගාටු වෙන්න
එපා. යුද්ධයකදී අනිවාර්යයෙන්ම
සුළු පිරිසක් හෝ මැරෙනවා.[4] ඒ නුව-
රට ඊට වඩා දරුණු විදිහට පහර
දී ඒක යටත් කරගන්න.'[5] එහෙම
කියලා යෝවාබ්ව දිරිගන්වන්න."

**26** තම ස්වාමිපුරුෂයා මිය ගිය
බව උරියාගේ බිරිඳට ආරංචි වූ විට
ඇය ඔහු ගැන[6] හඬා වැලපුණාය.[7]
**27** වැලපීමේ කාලය[8] අවසන් වූ විගස
දාවිත් රජ මිනිසුන් යවා ඇයව ඔහුගේ
නිවසට ගෙන්වාගත්තේය. පසුව ඔහු
ඇයව විවාහ කරගත්තේය.[9] කල්
යත්ම ඇය පුතෙකු බිහි කළාය.
දාවිත් කළ දේ යෙහෝවා දෙවි සැල-
කුවේ[10] ඉතා දුෂ්ට ක්‍රියාවක් ලෙසය.[11]

**12** යෙහෝවා දෙවි, දාවිත් රජු
වෙත නාතන්ව[12] යැව්වේය.
නාතන්, දාවිත් රජු ළඟට ගොස්[13]
මෙසේ කීවේය. "එක්තරා නුවරක
මිනිස්සු දෙන්නෙක් ජීවත් වුණා. එක්
කෙනෙක් ධනවත්. අනික් කෙනා
දුප්පත්. **2** ධනවත් මිනිසා සතුව
විශාල බැටළු හා ගව රැළක් සිටියා.[14]
**3** නමුත් දුප්පතාට සිටියේ එකම එක
කුඩා බැටළු පැටියෙක් විතරයි. ඌ
ගැනු සතෙක්. මුදල් දී ලබාගත් එම
බැටළු පැටියාව[1] ඔහු ඉතා ආදරයෙන්
රැකබලා ගත්තා. ඌ වැඩුණේ ඔහු-
ගේ දරුවන් එක්කමයි. ඔහු තමා
කන බොන දෙයින් ඌටත් කොට-
සක් දුන්නා. පැටියා නිදාගත්තෙත්
ඔහු එක්කමයි. ඔහු තමාගේම දුව-
කට වගේ ඌට සැලකුවා. **4** දව-
සක් ධනවතාගේ ගෙදරට අමුත්තෙක්
ආවා. ධනවතා ඔහුගේ බැටළු හෝ ගව
රැළෙන් සතෙකුව ගන්නේ නැතුව දුප්-
පතාගේ බැටළු පැටියාව රැගෙන ඌව
මරලා කෑමක් සූදානම් කර අමුත්තාට
කන්න දුන්නා."[2]

**5** එය ඇසූ දාවිත් රජ මහත්
සේ උදහස් වී[3] නාතන්ට මෙසේ
කීවේය. "ඒ දේ කළ මිනිසාව මරා
දැමිය යුතුයි[4] කියලා ජීවමාන දෙවි
වන යෙහෝවා ඉදිරියේ මම දිවුරලා
කියනවා.[5] **6** ධනවතා කිසි අනු-
කම්පාවක් නැතුව[6] මේ දේ කළ නිසා
මැරූ බැටළු පැටියා වෙනුවට ඒ දුප්ප-
තාට තව බැටළු පැටවුන් හතරදෙ-
නෙක්[7] දිය යුතුයි."[8]

**7** එවිට නාතන් දාවිත් රජුට මෙසේ
කීවේය. "ඔබ තමයි ඒ මිනිසා! ඊශ්‍රා-
යෙල්හි දෙවි වන යෙහෝවා ඔබට
මෙසේ පවසනවා. 'ඊශ්‍රායෙල් දේශයේ
රජ හැටියට ඔබව අභිෂේක කළේ
මමයි.[9] සාවුල්ගේ අතින් ඔබව ගල-
වාගත්තෙත් මමයි.[10] **8** මම ඔබේ
ස්වාමියාගේ ගෙයි වැසියන්ව[11] හා
ඔහුගේ භාර්යාවන්ව[12] කැමැත්තෙන්ම
ඔබට භාර දුන්නෙමි. මම ඔබව යූදා
සෙනඟ කෙරෙහි පමණක් නොව ඊශ්‍රා-
යෙල් සෙනඟ කෙරෙහිත් රජු ලෙස
පත් කළෙමි.[13] ඔබ මගෙන් තවත්
දේවල් ඉල්ලුවා නම් මම ඒවාත්
ඔබට දෙන්නෙමි.[14] **9** ඔබ වෙනු-
වෙන් ඒ හැම දෙයක්ම කර තිබිය-
දීත් ඇයි ඔබ යෙහෝවා දෙවි වන
මාගේ වචනය සැහැල්ලුවට ගෙන
දුෂ්ට ලෙස ක්‍රියා කළේ?[15] ඔබ හිත්තී
ජාතික උරියාව අම්මෝන්වරුන් ලවා
කඩුවෙන් මරන්න සැලසුම් කළෙ-
හිය.[16] ඔබ ඔහුව මරා ඔහුගේ භාර්-
යාව ඔබේ භාර්යාව හැටියට විවාහ

**11 පරි.**
1 2සාමු 3:34
2සාමු 11:3
2 2ලේක 26:15
3 2සාමු 11:17
4 2සාමු 2:26
යෙසා 1:20
යෙරෙ 2:30
යෙරෙ 46:10
5 2සාමු 12:26
6 උත් 20:3
යෝවෙ 1:8
7 2සාමු 3:31
8 1සාමු 31:13
9 2සාමු 5:13
2සාමු 12:9
10 1රාජා 15:5
1ලේක 21:7
ගීතා 11:4
යෙරෙ 32:19
හෙබ්‍රෙ 4:13
11 උත් 39:9
ගීතා 5:6
හෙබ්‍රෙ 13:4

**12 පරි.**
12 1රාජා 1:8
1ලේක 17:1
1ලේක 29:29
13 ගීතා 51:පෙර
14 2සාමු 5:13
2සාමු 15:16

**2 තීරුව**
1 2සාමු 11:3
හිතෝ 5:15
2 2සාමු 11:4
3 ලූක් 6:41
4 1සාමු 26:16
5 ද්වි 6:13
6 2සාමු 21:7
7 නික් 22:1
8 නික් 21:34
9 1සාමු 16:13
2සාමු 7:8
10 1සාමු 18:11
1සාමු 19:10
1සාමු 23:14
ගීතා 18:පෙර
11 1සාමු 13:14
1සාමු 15:28
12 2සාමු 3:7
1රාජා 2:22
13 2සාමු 2:4
2සාමු 5:5
14 2සාමු 7:19
ගීතා 84:11
යාකො 1:17
15 නික් 20:13
නික් 20:14
නික් 20:17
16 2සාමු 11:15

කරගත්තෙහිය.[1] **10** ඔබ මට අව-
මන් කර, හිත්තී ජාතික උරියාගේ
භාර්යාව ඔබේ භාර්යාව හැටියට ගත්
නිසා ඔබේ ගෙයි වැසියෝ හැම-
දාම[2] කඩුවෙන් පීඩා විඳිනු ඇත.'[3]
**11** යෙහෝවා දෙවි ඔබට මෙසේද පව-
සනවා. 'ඔබේම ගෙයි වැසියන් මාර්ග-
යෙන් ඔබ පිටට පීඩා ගෙනෙන්නෙමි.[4]
මම ඔබේ ඇස් ඉදිරිපිටම ඔබේ භාර්යා-
වන්ව ඔබෙන් ගෙන වෙනත් කෙ-
නෙකුට දෙන්නෙමි.[5] ඔහු සියල්ලන්
ඉදිරියේ ඔබේ භාර්යාවන් සමඟ සය-
නය කරනු ඇත.[6] **12** ඔබ ඒ දේ
කළේ රහසින්ය.[7] නමුත් මම මේ දේ
මුළු ඊශ්‍රායෙල් සෙනඟ ඉදිරියේ කරන්-
නෙමි.[8] මම කිසිවෙකුගෙන් එය නො-
සඟවන්නෙමි.' "[9]

**13** එය ඇසූ දාවිත් රජ,[10] "මම යෙ-
හෝවා දෙවිට විරුද්ධව පව්
කළා"[11] කියා නාතන්ට කීවේය. එවිට
නාතන්, දාවිත් රජුට මෙසේ කීවේය.
"යෙහෝවා දෙවි ඔබේ පාපයට සමාව
දෙනවා.[12] ඒ නිසා ඔබ දැන් මැරෙන්-
නේ නැහැ.[13] **14** නමුත් ඔබ යෙ-
හෝවා දෙවිට විශාල අගෞරවයක්
කළා.[14] ඒ නිසා ඔබට දාව අලුත
උපන් බිලිඳා මිය යනවා."[15]

**15** ඉන්පසු නාතන් තම නිවස
බලා පිටත්ව ගියේය.

උරියාගේ භාර්යාව බිහි කළ දරු-
වාට යෙහෝවා දෙවි පහර දුන්-
නේය.[16] දරුවා ලෙඩ විය. **16** දාවිත්
රජ, දරුවා වෙනුවෙන් සැබෑ දෙවිට
කන්නලව් කළේය. ඔහු නිරාහාරව
සිටිමින්[17] මුළු රාත්‍රියේම බිම වැතිර
සිටියේය.[18] **17** ඔහුගේ නිවසේ සිටි
වැඩිමහල්ලන් ඔහුව නැඟිටුවන්න
උත්සාහ කළ නමුත් ඔහු නැඟිට්ටේ
නැත. දාවිත් රජ ඔවුන් සමඟ කෑම
කෑවේද නැත.[19] **18** සත්වන දව-
සේදී දරුවා මිය ගියේය. එවිට දාවිත්-
ගේ සේවකයෝ එකිනෙකා අතරේ
මෙසේ කතා වූහ. "දරුවා ජීවතුන්
අතර සිටින විට අපි ඔහුට කතා
කළත් ඔහු අපිට සවන් දුන්නේ නැහැ.
ඉතින් දැන් අපි කොහොමද ඔහුට,
'දරුවා මිය ගියා' කියලා කියන්නේ?
එහෙම කිව්වොත් ඔහු මොනවා කර-
ගනීද දන්නේ නැහැ!" එබැවින් දරුවා
මිය ගිය බව දාවිත් රජුට පවසන්න
ඔවුහු භය වූහ.

**19** දාවිත් රජ තම සේවකයන්
එකිනෙකා අතරේ රහසින් කතා කර-
නවා දැක දරුවා මිය ගොස් ඇති
බව තේරුම්ගත්තේය. එබැවින් ඔහු
තම සේවකයන්ගෙන්, "දරුවා මැරු-
ණාද" කියා ඇසුවේය. ඔවුහුද, "ඔව්,
දරුවා මිය ගියා" කියා කීවෝය.
**20** එවිට දාවිත් රජ නැඟිට ඇඟපත
සෝදා තෙල් ආලේප කරගෙන[1] අලුත්
වස්ත්‍ර ඇඳගත්තේය. ඉන්පසු ඔහු
යෙහෝවා දෙවිගේ ගෘහයට ගොස්[2]
දෙවිට නමස්කාර කළේය.[3] පසුව
ඔහු තම නිවසට පැමිණ සේවක-
යන්ගෙන් කෑම ඉල්ලුවේය. ඔවුහුද
විගස ඔහුට කෑම ගෙනැවිත් දුන්-
නෝය. **21** එවිට ඔහුගේ සේවක-
යෝ ඔහුගෙන් මෙසේ ඇසුවෝය.
"දරුවා ජීවතුන් අතර සිටින විට
ඔබ කෑම නොකා හඬා වැලපුණා.
නමුත් දරුවා මැරුණා කියලා දැන-
ගත් විට ඔබ නැඟිට කෑම කෑවා.
ඇයි ඔබ මේ විදිහට හැසිරෙන්-
නේ?" **22** එවිට ඔහු ඔවුන්ට මෙසේ
කීවේය. "දරුවා ජීවත්ව සිටින විට
මම නොකා නොබී[4] හැඬුවේ,[5] 'සමහ-
රවිට යෙහෝවා දෙවි මට කරු-
ණාව පෙන්වා දරුවාට ජීවත් වෙන්න
ඉඩ දෙයි'[6] කියලා සිතූ නිසයි.
**23** දරුවා මැරුණාට පස්සේ මම
නිරාහාරව සිටීමෙන් ප්‍රයෝජනයක්
තියෙනවාද? එහෙම ඉඳලා දරුවාව
ආයෙත් ජීවත් කරවන්න මට පුළු-
වන්ද?[7] ඔහුට දැන් මා ළඟට එන්න
බැහැ.[8] කවදා හරි දවසක මමත්
මැරෙනවා."[9]

**24** දාවිත් රජ තම භාර්යාව වූ
බැත්-ෂෙබාව සැනසුවේය.[10] පසුව
ඔහු ඇය සමඟ සයනය කළේය. කල්
යත්ම ඇය පුතෙකු බිහි කළාය.[11]

**12 පරි.**

**1** 2සාමු 11:27, හෙබ්‍රෙ 13:4
**2** ගණන් 14:18, ගලා 6:7
**3** 2සාමු 13:32, 2සාමු 18:33
**4** 2සාමු 12:19, 2සාමු 13:14, 2සාමු 15:14
**5** නික් 21:24, යෝබ් 31:10, යෝබ් 34:11
**6** 2සාමු 16:21
**7** 2සාමු 11:4, 2සාමු 11:8, 2සාමු 11:13, 2සාමු 11:15
**8** 2සාමු 16:22
**9** මතෙ 10:26, ලූක් 12:2
**10** ගීතා 51:පෙර
**11** උත් 39:9, ගීතා 32:5, ගීතා 38:3, ගීතා 51:4, හිතෝ 28:13
**12** නික් 34:6, ගීතා 32:1, ගීතා 130:4, මීකා 7:18
**13** ලෙවී 20:10, ගීතා 103:10
**14** ගීතා 51:4
**15** නික් 34:7, ද්වි 23:2, ගීතා 89:32, හිතෝ 3:11, හෙබ්‍රෙ 12:6
**16** 1සාමු 25:38, 2සාමු 24:15
**17** 2සාමු 12:22, යෝනා 3:9
**18** 2සාමු 13:31
**19** 2සාමු 3:35

**2 තීරුව**

**1** රූත් 3:3, 2සාමු 14:2
**2** 2සාමු 6:17, ගීතා 5:7
**3** උත් 24:26, 1ලේක 29:20, නෙහෙ 8:6, ගීතා 95:6
**4** 2සාමු 12:16, යෝවෙ 1:14
**5** යෙසා 38:3
**6** යෙසා 38:5, යෝවෙ 2:14, ආමො 5:15, යෝනා 3:9
**7** දේශ 9:6, යෙසා 26:14
**8** දේශ 9:5
**9** යෝබ් 30:23, දේශ 3:20, දේශ 9:10, ක්‍රියා 2:29, ක්‍රියා 2:34, ක්‍රියා 13:36, රෝම 5:12

**10** 2සාමු 11:3; 2සාමු 12:9; **11** ගීතා 127:3.

ඔහුට සලමොන්*[1] යන නම දෙන
ලදි. යෙහෝවා දෙවි ඔහුට බොහෝ
සෙයින් ප්‍රේම කළේය.[2] **25** දෙවි
අනාගතවක්තෘ නාතන්[3] මාර්ගයෙන්
දරුවාට යෙදිදීයා* යන නම තබන්න
කියා පැවසුවේය. මන්ද යෙහෝවා
දෙවි ඔහුට ප්‍රේම කළේය.
**26** යෝවාබ්[4] රබ්බාහි සිටි අම්-
මොන්වරුන්ට විරුද්ධව දිගටම
සටන් කර[5] ඔවුන්ගේ අගනුවර අල්-
ලාගත්තේය. **27** පසුව යෝවාබ්,
දාවිත් රජු වෙත පණිවිඩකරුවන් යවා
මෙසේ දැන්වූවේය. “මම රබ්බා නුව-
රට විරුද්ධව සටන් කර[6] එහි ජල
මාර්ග තිබෙන ප්‍රදේශය* යටත් කර-
ගත්තා. **28** මම මේ නුවර අල්-
ලගත්තොත් ඒකේ ගෞරවය
ලැබෙන්නේ මටයි. ඒ නිසා දැන් ඔබ
අනික් සටන්කරුවන් සමඟ ඇවිත්
නුවර වටේ කඳවුරු බැඳගෙන එය
අල්ලගන්න.”
**29** දාවිත් රජද මුළු හමුදාවම රැස්
කරගෙන රබ්බා නුවරට ගොස් සටන්
කර එය අල්ලාගත්තේය. **30** ඔහු
මල්කාම්ගේ* හිසේ තිබූ ඔටුන්න
ගලවාගත්තේය.[7] එම ඔටුන්නේ බර
රත්තරන් තලෙන්තයක්# විය. එහි
අනර්ඝ මැණික්ද අල්ලා තිබිණ.
පසුව එය දාවිත් රජුගේ හිස මත
තබන ලදි. දාවිත් රජ ඒ නුවරින්
බොහෝ වස්තු කොල්ල කෑවේය.[8]
**31** ඒ නුවරේ සිටි වැසියන්ව ඔහු
ගෙනැවිත් ඔවුන්ගෙන් වැඩ ගත්-
තේය. ඔහු ඔවුන්ට යකඩින් සෑදූ
තියුණු උපකරණද[9] යකඩ පොරෝද
දී ඔවුන් ලවා ගල් කප්පවාගත්තේය.
ඔවුන් ලවා ගඩොල්ද සාදාගත්තේය.
ඔහු අම්මොන්වරුන්ගේ නුවරවල සිටි
සියලු වැසියන්ගෙන් එසේ වැඩ ගත්-
තේය. පසුව දාවිත් රජ සහ ඔහු සමඟ
සිටි සියලුදෙනා නැවත යෙරුසලමට
ගියෝය.

**13** පසුව දාවිත් රජුගේ පුත්‍රයා
වූ අම්නොන්ට[1] තාමර් ගැන
ආදරයක් ඇති විය.[2] තාමර්[3]
දාවිත් රජුගේ පුත්‍රයා වූ අබ්සලෝම්-
ගේ[4] සහෝදරිය වූවාය. ඇය ඉතා
රූමත් තරුණියකි. **2** තම සහෝ-
දරිය වූ තාමර් කන්‍යාවකව සිටි
බැවින් තම අරමුණ ඉටු කරගැනීමට[5]
අම්නොන්ට අවස්ථාවක් නොලැබු-
ණේය.[6] එබැවින් ඔහු ලෙඩ වන
තරමටම කනස්සල්ලෙන් සිටියේය.[7]
**3** අම්නොන්ට යෙහොනාදාබ්[8] නම් වූ
මිත්‍රයෙක් සිටියේය. යෙහොනාදාබ්
දාවිත් රජුගේ සහෝදරයා වූ ෂිමෙ-
යාහ්ගේ[9] පුත්‍රයා විය. ඔහු ඉතා
උපායශීලී මිනිසෙකි. **4** එක් දව-
සක් යෙහොනාදාබ් අම්නොන්ගෙන්
මෙසේ ඇසුවේය. “රජුගේ පුතා වෙ-
ලත් ඇයි ඔබ දවස් ගණනාවක් තිස්-
සේ මේ විදිහට දුකෙන් ඉන්නේ?”[10]
එවිට අම්නොන්, “මම අබ්සලෝම්ගේ
සහෝදරිය වන තාමර්ට[11] ගොඩක්
ආදරෙයි”[12] කියා කීවේය. **5** එය
අසා යෙහොනාදාබ් ඔහුට මෙසේ
කීවේය. “ඔබ ලෙඩින් වගේ ඇඳට
වෙලා ඉන්න.[13] එවිට ඔබේ පියා ඔබව
බලන්න එයි. ඔහු ආවාම ඔබ ඔහුට
මෙහෙම කියන්න. ‘මගේ සහෝදරිය
වන තාමර්ව මා ළඟට එවන්න. මම
ලෙඩින් ඉන්න නිසා ඇයට කියන්න
මට සුදුසු කෑම හදලා දෙන්න කියලා.
මගේ ඉස්සරහම ඒවා හදලා ඇගේ
අතින්ම මට කන්න දෙන්න කියලා
ඇයට කියන්න.’ ”[14]
**6** අම්නොන් යෙහොනාදාබ්ගේ
කීම අසා අසනීපයෙන් සිටින කෙ-
නෙකු මෙන් තම ඇඳට වී සිටියේය.[15]
රජද ඔහුව බලන්න ආවේය. එවිට
අම්නොන්, රජුගෙන් මෙසේ ඉල්ලා
සිටියේය. “මෙහෙට ඇවිත් මට කෑම
ටිකක් හදලා දෙන්න කියලා මගේ
සහෝදරිය වන තාමර්ට කියන්න.
මම ඉස්සරහම රොටි දෙකක් හදලා
ඇගේ අතින්ම මට කන්න දෙන්න

---

**2සාමු 12:24*** තේරුම, “සාමය.” **25*** තේරුම, “යෙහෝවා දෙවිගේ ප්‍රේමය දිනාගත් තැනැත්තා.” **27*** මූ.අ., “ජලාශ නගරය.” **30*** මෙහි සඳහන් වන්නේ අම්මොන්වරුන්ගේ දෙවි කෙනෙකු වන මෝලෙක්ගේ නැතහොත් මිල්කොම්ගේ රූපය ගැනයි කියා පිළිගැනීමක් තිබේ. **30#** තලෙන්තයක් යනු කිලෝග්‍රෑම් 34.2ක් පමණය.

**12 පරි.**
**1** 1ලේක 3:5, 1ලේක 22:9, 1ලේක 28:5, මතෙ 1:6
**2** 2සාමු 7:12, 1ලේක 29:1
**3** 2සාමු 7:4, 2සාමු 12:1, 1රාජා 1:8
**4** 2සාමු 11:25, 1ලේක 20:1
**5** ද්වි 3:11, ද්වි 23:6, යොෂු 13:25, යෙරෙ 49:3
**6** 2සාමු 11:1
**7** 1ලේක 20:2
**8** යොෂු 22:8, 1සාමු 30:20, 2සාමු 3:22, 2සාමු 8:11
**9** 1ලේක 20:3

**2 තීරුව**

**13 පරි.**
**1** 2සාමු 3:2, 1ලේක 3:1
**2** උත් 34:3, මතෙ 5:28
**3** 1ලේක 3:9
**4** 2සාමු 3:3, 1ලේක 3:2
**5** හිතෝ 11:19
**6** 2පේතෘ 2:14
**7** හිතෝ 4:23, කොලො 3:5
**8** 2සාමු 13:35
**9** 1සාමු 16:9, 1ලේක 2:13
**10** 1රාජා 21:5
**11** ලෙවී 18:9
**12** ලෙවී 20:17, මතෙ 15:19, 1තෙස 4:5
**13** හිතෝ 24:8
**14** ගීතා 50:19
**15** ගීතා 10:9

කියලත් ඇයට කියන්න.” **7** එවිට
දාවිත් රජ තාමර්ට පණිවිඩයක් යවා
මෙසේ දැන්වූවේය. “ඔබේ සහෝදරයා
වන අම්නොන්ට සනීප නැහැ. ඔහුගේ
ගෙදරට ගිහින් ඔහුට කෑම ටිකක්
හදලා දෙන්න.” **8** ඉන්පසු තාමර්
තම සහෝදරයා වන අම්නොන්-
ගේ[1] නිවසට ගියාය. ඒ අවස්ථාවේ
ඔහු ඇඳේ නිදාගෙන සිටියේය. ඇය
පිටි ගෙන එය අනා ඔහු ඉදිරිපි-
ටම රොටි සෑදුවාය. **9** ඉන්පසු ඇය
තාච්චියෙන් රොටි ගෙන ඔහු ඉදිරියේ
තැබුවාය. නමුත් අම්නොන් රොටි
නොකෑවේය. ඔහුද, “හැමෝම මෙතැ-
නින් යන්න”[2] කියා කෑගැසුවේය.
එවිට සියලුදෙනාම එතැනින් පිට වී
ගියෝය.

**10** ඉන්පසු අම්නොන් තාමර්ට
මෙසේ කීවේය. “කෑම ටික මගේ ඇඳ
ළඟට අරං එන්න. මම ලෙඩින් ඉන්න
නිසා ඔබේ අතින්ම මට කවන්න.”
තාමර් තමා සෑදූ රොටි ඇගේ සහෝ-
දරයා වන අම්නොන්ගේ ඇඳ ළඟට
රැගෙන ගියාය. **11** ඇය ඔහු ළඟට
පැමිණි විට ඔහු ඇයව අල්ලා,[3]
“මගේ සහෝදරිය,[4] මා එක්ක එකට
ඉන්න”[5] කියා කීවේය. **12** නමුත්
ඇය, “අනේ, එහෙම කරන්න එපා.
මාව ලැජ්ජාවට පත් කරන්න එපා.[6]
ඒක මහා නින්දිත ක්‍රියාවක්.[7] ඒ වගේ
නින්දිත ක්‍රියාවක් ඊශ්‍රායෙල් දේශයේ
සිදු වෙන එක සුදුසු දෙයක් නෙමෙයි.[8]
**13** ඔබ ඒ වගේ දෙයක් කළොත් මට
වෙන නින්දාව කොහොම හංගන්-
නද? මිනිස්සු ඔබව ඊශ්‍රායෙල් දේශයේ
මෝඩයෙකු ලෙස සලකයි. ඒ නිසා
ඔබේ හිතේ තියෙන ආශාව ගැන
රජුට කියන්න. ඔහු ඔබට මාව නොදී
ඉන්න එකක් නැහැ.” **14** නමුත්
ඔහු, ඇය කී දේ ගණනකටවත් නො-
ගෙන ඇයට බලහත්කාරකම් කර[9]
ඇයව නින්දාවට පත් කළේය.[10]
**15** ඉන්පසු අම්නොන් ඇයට ද්වේෂ
කරන්න පටන්ගත්තේය. ඔහු ඇයට
ආදරේ කළාටත් වඩා වැඩියෙන්
ඇයට ද්වේෂ කරන්න පටන්ගත්-
තේය. ඒ නිසා ඔහු, “දැන් මෙතැ-
නින් නැඟිටලා යන්න” කියා ඇයට
කීවේය. **16** එවිට ඇය, “අනේ මගේ
සහෝදරයා, එහෙම කියන්න එපා.
මට මෙතැනින් යන්න කියන එක ඔබ
මට කළ වරදටත් වඩා දුෂ්ට දෙයක්”
කියා ඔහුට කීවාය. නමුත් ඇය කී දේ
ඔහු ගණනකටවත් ගත්තේ නැත.

**17** ඔහු තමාට උපස්ථාන කළ
සේවකයාව කැඳවා, “මෙයාව මෙතැ-
නින් අරං යන්න. මෙයාව එළියට
දාලා දොර වහන්න” කියා කීවේය.
**18** ඔහුගේ සේවකයාද ඇයව කාමර-
යෙන් පිටතට ගෙන ගොස් දොර
වැසුවේය. (තාමර් ඉරි වැටුණු[1] අත්
නැති සළුවක් ඇඳගෙන සිටියාය.
සාමාන්‍යයෙන් රජුගේ දූවරු කන්‍යා-
වන්ව සිටියදී එවැනි සළු ඇන්දෝය.)
**19** තාමර් ඇගේ හිස මත අළු දමා-
ගෙන[2] ඇගේ සළුව ඉරාගත්තාය.
ඉන්පසු ඇය හිස මත අත් දෙක තබා-
ගෙන[3] මහත් හඬින් හඬහඬා එතැ-
නින් පිටත්ව ගියාය.

**20** ඇගේ සහෝදරයා වන අබ්ස-
ලොම්[4] ඇයව දැක ඇගෙන් මෙසේ
ඇසුවේය. “ඔබට මේ දේ කළේ ඔබේ
සහෝදරයා වන අම්නොන්[5] නේද?
ඔහු ඔබේ සහෝදරයා[6] නිසා මේ ගැන
කිසිම දෙයක් කතා කරන්න එපා.
සිදු වුණ දේ ගැන දුක් වෙවී ඉන්-
නත් එපා.” ඉන්පසු තාමර් තම
සහෝදරයා වන අබ්සලොම්ගේ නිව-
සේ නැවතුණාය. ඒ සිද්ධියෙන් පසු
ඇය කිසිවෙකු ආශ්‍රය නොකළාය.
**21** තාමර්ට සිදු වූ දේ ගැන දාවිත්
රජුට ආරංචි වූ[7] විට ඔහු අති-
ශයින් කෝප විය.[8] **22** අම්නොන්
තම සහෝදරිය වන තාමර්ව නින්දා-
වට පත් කළ බැවින් අබ්සලොම්
ඔහුට වෛර කළේය.[9] නමුත් ඔහු ඒ
ගැන අම්නොන්ට කිසිවක් පැවසුවේ
නැත.

**23** එම සිද්ධිය සිදු වී අවුරුදු දෙ-
කක් ගත විය. ඒ කාලයේදී එෆ්‍රායිම්[10]
අසල පිහිටා තිබෙන බාල්-හාෂෝර්
නම් ස්ථානයේ අබ්සලොම් තමාට

**13 පරි.**
**1** 1ලේක 3:1; 1ලේක 3:9
**2** යෝබ් 24:15; යොහ 3:20
**3** උත් 39:12
**4** ද්වි 27:22; එස 22:11
**5** උත් 39:7
**6** උත් 34:2
**7** උත් 34:7; විනි 20:6; හිතෝ 7:7
**8** ලෙවී 18:9; ලෙවී 20:17
**9** යාකො 1:15
**10** ලෙවී 18:9; ලෙවී 18:29

**2 තීරුව**
**1** උත් 37:3
**2** යොෂු 7:6; එස්ත 4:1; යෝබ් 2:8; යෙරෙ 6:26
**3** යෙරෙ 2:37
**4** 2සාමු 3:3; 2සාමු 13:1
**5** 2සාමු 3:2; 1ලේක 3:1
**6** ලෙවී 18:9; ද්වි 27:22
**7** 1සාමු 2:24
**8** හිතෝ 19:13
**9** උත් 34:7; ලෙවී 19:17; හිතෝ 18:19; හිතෝ 26:24; එෆී 4:26; 1යොහ 3:15
**10** යොහ 11:54

අයිතිව සිටි බැටළුවන්ගේ ලොම් කප්-
පවමින්[1] සිටියේය. අබ්සලෝම් තම
බැටළුවන්ගේ ලොම් කපන ස්ථාන-
යට තමන් සමඟ යෑමට එන්න
කියා රජුගේ සියලු පුත්‍රයන්ට ආරා-
ධනා කළේය.[2] **24** අබ්සලෝම්,
රජුටද මෙසේ කීවේය. “මගේ ස්වා-
මීනි, මේ දවස්වල මගේ බැටළු-
වන්ගේ ලොම් කපනවා. රජතුමනි,
ඔබත් මා සමඟ එතැනට යන්න
එන්න. ඔබේ සේවකයන්වත් එතැ-
නට රැගෙන එන්න.” **25** නමුත් රජ,
“අපි හැමෝම එහෙට ආවොත් ඔබට
කරදරයක් වෙයි. ඒ නිසා මගේ පුතේ,
මම නැවිත් ඉන්නම්” කියා අබ්ස-
ලෝම්ට කීවේය. අබ්සලෝම් කොත-
රම් පෙරැත්ත කළත්[3] රජ ඔහු සමඟ
යෑමට එකඟ වුණේ නැත. නමුත්
ඔහු අබ්සලෝම්ට ආශීර්වාද කළේය.[4]
**26** එවිට අබ්සලෝම්, “ඔබ මා සමඟ
එන්නේ නැත්නම් මගේ සහෝද-
රයා වන අම්නොන්ට අපි සමඟ
එන්න අවසර දෙන්න”[5] කියා රජුගෙන්
ඉල්ලා සිටියේය. එවිට රජ, “මොන
හේතුවක් නිසාද ඔහුව එක්කගෙන
යන්නේ” කියා ඔහුගෙන් ඇසුවේය.
**27** අම්නොන්ට සහ රජුගේ අනික්
පුත්‍රයන්ට යන්න රජු අවසර දෙන
තෙක් අබ්සලෝම් ඔහුට පෙරැත්ත
කළේය.[6]

**28** පසුව අබ්සලෝම් තම සේවක-
යන්ට මෙසේ කීවේය. “අම්නොන්
වයින් බී විනෝද වෙමින් සිටින විට,[7]
‘අම්නොන්ව මරලා දාන්න’ කියලා
මම ඔබට පවසනවා. එවිට ඔබ ඔහුව
මරලා දාන්න. කිසි දේකට භය
වෙන්න එපා.[8] මමයි මේ දේ කරන්න
කියලා ඔබට අණ කරන්නේ. ඒ
නිසා ඔබ නිර්භීතව ඒ දේ කරන්න.”
**29** අබ්සලෝම්ගේ සේවකයෝ ඔහු
අණ කළ ලෙසම අම්නොන්ව මරා
දැමුවෝය.[9] රජුගේ අනික් පුත්‍රයෝ
එය දැක තම තමන්ගේ කොටළුවන්
පිට නැඟ එතැනින් පලා ගියෝය.
**30** ඔවුන් පලා යන අතරතුර දාවිත්ට
මෙසේ ආරංචි විය. “අබ්සලෝම්, රජු-
ගේ පුත්‍රයන් සියලුදෙනාවම මරලා
දාලා! කිසි කෙනෙකුට බේරෙන්න
ලැබුණේ නැහැ.” **31** එය අසා රජ
තම වස්ත්‍ර ඉරාගෙන[1] බිම වැතිරු-
ණේය.[2] ඔහුගේ සියලු සේවකයෝද
තමන්ගේ වස්ත්‍ර ඉරාගෙන ඔහු ළඟට
වී සිටියෝය.[3]

**32** නමුත් දාවිත් රජුගේ සහෝද-
රයා වූ ෂිමෙයාහ්ගේ[4] පුත්‍රයා වන
යෙහොනාදාබ්[5] දාවිත් රජුට මෙසේ
කීවේය. “මගේ ස්වාමීනි, භය වෙන්න
එපා. ඔබේ පුත්‍රයන් සියලුදෙනා-
වම මරලා දාලා නැහැ. මරලා
දාලා තියෙන්නේ අම්නොන්ව විත-
රයි.[6] ඔහුව මරන්න කියලා අණ
කළේ අබ්සලෝම්.[7] අම්නොන් ඔහුගේ
සහෝදරිය වන තාමර්ව[8] නින්දාවට
පත් කළ[9] දවසේ ඉඳන් ඔහු අම්-
නොන්ව මරන්න බලාගෙනයි හිටි-
යේ. **33** මගේ ස්වාමීනි, රජතුමනි,
‘ඔබේ පුත්‍රයන් හැමෝම මැරුණා’
කියලා ඔබට ආරංචි වුණත් ඒ ගැන
කලබල වෙන්න එපා. මරලා දාලා
තියෙන්නේ අම්නොන්ව විතරයි.”

**34** අම්නොන්ව මරා දැමූ පසු අබ්-
සලෝම් ඒ දේශයෙන් පලා ගියේය.[10]
ඒ අතරතුර නුවරේ මුරකරු[11]
හැරී බලද්දී කඳුකරයේ සිට විශාල
සෙනඟක් නුවර දෙසට පැමිණෙ-
නවා දුටුවේය. **35** එවිට යෙහොනා-
දාබ්,[12] “අර බලන්න, ඔබේ පුත්‍රයන්
දැන් එනවා. ඔබේ සේවකයා වන
මම කිව්වේ ඇත්ත”[13] කියා රජුට
කීවේය. **36** ඔහු කතා කර අව-
සන් වනවාත් සමඟම රජුගේ පුත්‍ර-
යෝ එතැනට ආවෝය. ඔවුහු මහත්
හඬින් හඬන්න පටන්ගත්තෝය. රජද
ඔහුගේ සේවකයෝද මහත් හඬින්
ඔවුන් සමඟ හැඬුවෝය. **37** දාවිත්
රජ දවස් ගණනාවක්ම අම්නොන්
ගැන හඬා වැලපුණේය.[14] අබ්සලෝම්
ගෙෂූර් දේශයේ රජු වන අම්හුද්ගේ
පුත්[15] තල්මයි[16] වෙත පලා ගොස්
**38** එහි[17] අවුරුදු තුනක් ජීවත් විය.

**39** අම්නොන් නැති දුක තුනී
වී ගිය පසු අබ්සලෝම්ව නැවත

**13 පරි.**
1 1සාමු 25:4; 1සාමු 25:11
2 1රාජා 1:9; 1රාජා 1:19; 1රාජා 1:25
3 ක්‍රියා 18:20
4 රූත් 2:4
5 ගීතා 55:21; හිතෝ 10:18; හිතෝ 26:24
6 හිතෝ 26:25; හිතෝ 26:26
7 රූත් 3:7; 1සාමු 25:36; එස්ත 1:10; ගීතා 104:15; දේශ 2:3; දේශ 10:19
8 1සාමු 28:10; 1සාමු 28:13
9 1සාමු 22:18; 1රාජා 21:11

**2 තීරුව**
1 උත් 37:34; 2සාමු 3:31
2 2සාමු 12:16
3 2සාමු 1:11
4 1සාමු 16:9; 1ලේක 2:13
5 2සාමු 13:3
6 2සාමු 12:10
7 උත් 27:41; ගීතා 7:14; හිතෝ 18:19
8 ලෙවී 18:9; ලෙවී 18:29
9 2සාමු 13:14
10 2සාමු 13:38; හිතෝ 28:17
11 2සාමු 18:24; 2රාජා 9:17
12 2සාමු 13:3
13 2සාමු 13:32
14 දේශ 7:2
15 1ලේක 3:2
16 2සාමු 3:3
17 අවි 3:14; යොෂු 12:5; 2සාමු 14:23; 2සාමු 15:8

දැකගන්න මහත් ආශාවක් දාවිත් රජු
තුළ ඇති විය.

14 අබ්සලොම්ව නැවත දැක-
ගන්න රජු මහත් ආශාව-
කින්[1] සිටින බව ෂෙරුයියාගේ
පුත්‍රයා වූ[2] යෝවාබ්[3] තේරුම්ගත්-
තේය. 2 එබැවින් ඔහු තෙකෝවා
නුවරේ[4] සිටි බුද්ධිමත් ස්ත්‍රියකව[5]
තමා වෙතට ගෙන්වා ඇයට මෙසේ
කීවේය. "ඔබේ ඇඟේ තෙල් ආලේප
කරගන්නේ නැතුව[6] වියෝ දුකෙන්
සිටින කෙනෙක් වගේ ඇඳගන්න.
ඔබ දවස් ගණනාවක් වියෝ දුකෙන්
සිටින කෙනෙක් වගේ රඟපාමින්[7]
3 රජ ඉදිරියට යන්න. ඔහු ඉදිරියේ
පැවසිය යුත්තේ මොනවාද කියලා
මම දැන් ඔබට කියලා දෙන්නම්."
පසුව යෝවාබ්, රජු ඉදිරියේ කිව යුතු
දේ ඇයට කියා දුන්නේය.[8]

4 තෙකෝවා සිට පැමිණි ඒ ස්ත්‍රිය
රජු ළඟට ගොස් ඔහු ඉදිරියේ බිම වැටී[9]
ඔහුට මෙසේ කීවාය. "අනේ රජතු-
මනි, මාව බේරගන්න!"[10] 5 එවිට
රජ, "ඇයි ඔබට මොනවද වුණේ" කියා
ඇගෙන් ඇසුවේය. ඇයද, "මම වැන්-
දඹුවක්.[11] 6 ඔබේ දාසිය වන මට
පුත්‍රයන් දෙදෙනෙක් සිටියා. දවසක්
කෙතේදී ඒ දෙන්නා රණ්ඩු කරමින්
පොර ඇල්ලුවා.[12] රණ්ඩුව බේරන්න
කවුරුත් හිටියේ නැහැ.[13] ටික වෙලාව-
කට පස්සේ එක පුත්‍රයෙක් අනික්
පුත්‍රයාව මරලා දැම්මා. 7 ඊටපස්-
සේ මගේ පවුලේ සියලුදෙනාම මට
බැණවදිමින් මෙහෙම කිව්වා. 'ඔබේ
පුතා ඔහුගේම සහෝදරයාව මරලා
දැම්මා.[14] ඒ නිසා දැන් ඔහුව අපිට භාර
දෙන්න. ඔහුගේ සහෝදරයාගේ ජීවි-
තය වෙනුවෙන් ඔහු වන්දි ගෙවිය
යුතුයි.[15] ඔබේ පවුලේ නම ගෙන
යන්න ඉතුරු වෙලා ඉන්නේ ඔහු විත-
රක් වුණත් අපිට ඔහුව මරලා දාන්න
සිද්ධ වෙනවා.' අනේ රජතුමනි, අපේ
පවුලේ නම ගෙන යන්න ඉන්න එකම
පුත්‍රයාවත් ඔවුන් මරලා දාන්න හද-
නවා. එහෙමවුණොත් මගේ පුරුෂයා-
ගේ නම ගෙන යන්නේ කවුද?"[16]

**14 පරි.**
1 2සාමු 13:39; 2සාමු 18:33; 2සාමු 19:2
2 1ලේක 2:16
3 2සාමු 2:18
4 2ලේක 11:6; 2ලේක 20:20; නෙහෙ 3:5; ආමො 1:1
5 2සාමු 20:16
6 දේශ 9:8; දානි 10:3
7 උත් 27:41
8 2සාමු 14:19
9 1සාමු 24:8; 2සාමු 1:2
10 2රාජා 6:26; මතෙ 21:9
11 නික් 22:22; යාකො 1:27
12 උත් 4:8; නික් 2:13
13 නික් 2:14
14 ගණන් 35:19; ද්වි 19:12
15 උත් 4:14
16 ගණන් 27:4; ද්වි 25:6

**2 තීරුව**
1 1සාමු 8:20
2 උත් 27:13; 1සාමු 25:24
3 උත් 14:22; උත් 24:3
4 ගණන් 35:19; ගණන් 35:27; ද්වි 19:6
5 1සාමු 14:45; 1රාජා 1:52; ක්‍රියා 27:34
6 ද්වි 6:13; 1සාමු 28:10; දේශ 8:4
7 1සාමු 25:41
8 උත් 44:18
9 ක්‍රියා 26:1
10 නික් 19:5; ගණන් 6:27
11 ද්වි 1:17
12 2සාමු 12:7
13 2සාමු 13:38
14 දේශ 3:19; දේශ 9:5

8 එවිට රජ, "ඔබ දැන් ගෙදර
යන්න. ඔබට සාධාරණය ඉටු කර
දෙන බවට මම වගබලා ගන්නම්"[1]
කියා ඇයට කීවේය. 9 එවිට ඒ
ස්ත්‍රිය රජුට මෙසේ කීවාය. "අනේ
මගේ ස්වාමීනි, මගේ පුත්‍රයාගේ වර-
දට මමයි මගේ පියාගේ ගෙයි වැසිය-
නුයි වන්දි ගෙවන්නම්.[2] එවිට ඔබත්
ඔබේ රාජ්‍යයත් ඒ වරදින් නිදහස්
වෙයි." 10 එවිට රජ, "මේ කාර-
ණය ගැන නැවත කවුරු හරි ඔබට
කරදර කළොත් ඔහුව මා ළඟට
රැගෙන එන්න. ඔබට ආයෙත් කර-
දර කරන්න මම ඔහුට ඉඩ දෙන්-
නේ නැහැ" කියා ඇයට කීවේය.
11 නමුත් ඇය ඔහුට මෙසේ කීවාය.
"අනේ රජතුමනි, ඔබේ දෙවි වන යෙ-
හෝවාව සිහි කරන්න.[3] මගේ පුත්‍රයා
කළ දේ නිසා ඔහුව මරා දැමීමට අයි-
තිය ඇති තැනැත්තාට[4] මගේ පවුලට
තවත් කරදර කරන්න ඉඩ දෙන්න
එපා. අනේ, ඉතුරු වී සිටින මගේ
එකම පුත්‍රයාව මරන්න ඔහුට ඉඩ
දෙන්න එපා." එවිට රජ ඇයට මෙසේ
කීවේය. "ඔබේ පුත්‍රයාගේ එක කෙස්-
ගහක්වත්[5] බිමට වැටෙන්න මම ඉඩ
දෙන්නේ නැහැ කියලා ජීවමාන දෙවි
වන යෙහෝවාගේ නමින් දිවුරා ඔබට
පොරොන්දු වෙනවා."[6] 12 පසුව ඒ
ස්ත්‍රිය, "රජතුමනි, ඔබේ දාසිය[7] වන
මට තව එක දෙයක් කියන්න අව-
සර දෙන්න"[8] කියා පැවසුවාය. රජද,
"කියන්න"[9] යයි ඇයට කීවේය.

13 එවිට ඇය ඔහුට මෙසේ කීවාය.
"රජතුමනි, දෙවිගේ සෙනඟට[10] හානි-
යක් වන අයුරින් ඔබ ක්‍රියා කරන්-
නේ ඇයි?[11] ඔබ මට කියූ දෙයින්
ඔබත් වරදකරුවෙක් කියලා පැහැ-
දිලියි.[12] මන්ද ඔබ ඔබේම පුත්‍ර-
යාව රටෙන් පන්නා දැමුවා. නමුත්
ඔහුව නැවත ගෙන්වාගත්තේ නැහැ.[13]
14 බිමට වත් කළ වතුර කිසිවි-
ටක නැවත එකතු කරගන්න බැහැ.
ඒ වගේ තමයි අපේ ජීවිතත්. අපි
හැමෝම යම් දවසක මැරෙනවා.[14]
ඒක වෙනස් කරන්න කාටවත් බැහැ.

නමුත් දෙවි කැමති හැමෝම ජීවත් වෙනවා දකින්නයි.[1] ඔහු බලන්නේ පන්නා දැමූ කෙනෙකුව පවා කොහොමහරි නැවත ගෙන්වාගන්නයි. **15** මගේ ස්වාමීනි, සෙනඟ කියූ දේවල් නිසා මට මහත් බියක් දැනුණා. ඔබ ඉදිරියට ඇවිත් මේ කාරණය ගැන කතා කරන්න තීරණය කළේ ඒ නිසයි. 'රජුට මේ කාරණය ගැනත් කතා කරන්න ඕනේ. සමහරවිට ඔහුගේ දාසිය කියන දේට ඔහු සවන් දෙයි. **16** මාවත් මට ඉතුරුව සිටින මගේ එකම පුත්‍රයාවත් විනාශ කරලා දෙවිගෙන් අපිට ලැබුණු උරුමය ගන්න හදන කෙනාගෙන් අපිව ගලවගන්න[2] කියා මා කළ ඉල්ලීමට රජු සවන් දුන් නිසා මේ දේටත් සවන් දෙයි' කියලා ඔබේ දාසිය වන මම හිතුවා. **17** මගේ ස්වාමීනි, සැබෑ දෙවිගේ දූතයෙක් වගේ[3] හොඳ නරක විනිශ්චය කරන්න[4] ඔබට පුළුවන්. ඒ නිසා, 'ඔබ අපිට සැනසිලිදායක වචන කතා කරයි' කියලත් මම හිතුවා. රජතුමනි, ඔබේ දෙවි වන යෙහෝවා ඔබට උපකාර කරයි කියලා මම ප්‍රාර්ථනා කරනවා."

**18** එවිට රජ, "කිසිම දෙයක් හංගන්නේ නැතුව මම අහන දේට උත්තර දෙන්න"[5] කියා ඇයට කීවේය. ස්ත්‍රියද, "එසේය මගේ ස්වාමීනි" කියා පිළිතුරු දුන්නාය. **19** එවිට රජ, "ඔබට මේ දේ කරන්න කිව්වේ යෝවාබ්[6] නේද"[7] කියා ඇගෙන් ඇසුවේය. ඇයද, "අනේ, මගේ ස්වාමීන් වන රජ්ජුරුවනි, ඔබ හිතූ දේ හරි. මම ඔබ ඉදිරියේ දිවුරා කියන මේ දේ සත්‍යයක්.[8] ඔබේ සේවකයා වන යෝවාබ් තමයි මට මේ දේ කරන්න කිව්වේ. ඔබ ඉදිරියේ පැවසිය යුත්තේ මොනවාද කියලත් ඔහු මට කියා දුන්නා.[9] **20** ඔබේ සේවකයා වන යෝවාබ් මේ දේ කළේ ඔබේ හිත වෙනස් කරන්නයි. එහෙත් දේශයේ සිදු වන කිසිම දෙයක් ඔබෙන් හංගන්න බැහැ. මගේ ස්වාමීනි, සැබෑ දෙවිගේ දූතයෙක් වගේ[10] ඔබත් ප්‍රඥාවන්තයි."

**21** පසුව රජ යෝවාබ්ට මෙසේ කීවේය. "ඔබ කියූ දේ කරන්න මම කැමතියි.[1] දැන් ගිහින් අබ්සලොම්ව එක්කගෙන එන්න."[2] **22** එය අසා යෝවාබ්, රජු ඉදිරියේ දණින් වැටී පොළොව දෙසට හිස නමා, රජුට ආශීර්වාද කරමින්[3] මෙසේ කීවේය. "මගේ ස්වාමීනි, මගේ ඉල්ලීම ඉටු කරන්න ඔබ කැමති වුණා. රජතුමනි, මට ඔබෙන් කරුණාව ලැබිලා තියෙන බව මම අද එයින් දැනගත්තා."[4] **23** පසුව යෝවාබ් ගෙෂූර්[5] වෙත ගොස් අබ්සලොම්ව නැවත යෙරුසලමට[6] රැගෙන ආවේය. **24** නමුත් රජ යෝවාබ්ට මෙසේ කීවේය. "අබ්සලොම්ට මාව බලන්න එන්න එපා කියන්න.[7] ඔහුට ඔහුගේම ගෙදරට යන්න කියන්න." එබැවින් අබ්සලොම්, රජු වෙත නොගොස් තම නිවසට ගියේය.

**25** ඊශ්‍රායෙල් දේශය පුරාම අබ්සලොම් තරම් කඩවසම් පුද්ගලයෙකු තවත් නොවීය.[8] ඔහුගේ පෙනුමේ කිසි අඩුපාඩුවක් තිබුණේ නැත. ඔහුගේ පෙනුම නිසා ඔහුව බොහෝ සෙයින් වර්ණනා කරනු ලැබීය. **26** ඔහුගේ හිසකෙස් ප්‍රමාණය මොන තරම්ද[9] කිවහොත් සෑම අවුරුද්දකම අවසානයේදී ඔහු තම හිසකෙස් කැපුවේය. කැපූ හිසකෙස් රජමාලිගාවේ තිබූ ෂෙකෙලයට* අනුව මැන බලද්දී එහි බර ෂෙකෙල් දෙසියයක් විය. **27** අබ්සලොම්ට දාව පුත්තු තුන්දෙනෙක්ද[10] එක් දියණියක්ද උපන්නෝය. ඔහුගේ දියණියගේ නම තාමර්ය. ඇය ඉතා රූමත් කාන්තාවකි.[11]

**28** අබ්සලොම් අවුරුදු දෙකක්ම යෙරුසලමෙහි වාසය කළේය. නමුත් ඒ මුළු කාලයේදීම ඔහු රජුව දුටුවේ නැත.[12] **29** පසුව අබ්සලොම් තමාව හමු වීමට එන ලෙස යෝවාබ්ට පණිවිඩයක් යැව්වේය. ඔහු එසේ කළේ යෝවාබ්ව රජු ළඟට

**14 පරි.**
1 ද්වි 10:17
2 2සාමු 14:2; 2සාමු 14:7
3 1සාමු 29:9; 2සාමු 19:27
4 1රාජා 3:9; 1රාජා 3:28
5 1සාමු 3:17; එෆී 4:25
6 2සාමු 14:1
7 හිතෝ 20:5
8 1සාමු 1:26; 1සාමු 17:55
9 2සාමු 14:3
10 2සාමු 14:17

**2 තීරුව**
1 2සාමු 14:13
2 2සාමු 13:38
3 ගණන් 6:23
4 රූත් 2:2; 1සාමු 20:3; එස්ත 5:8
5 ද්වි 3:14; 2සාමු 3:3; 2සාමු 13:37
6 2සාමු 5:5
7 නික් 10:28; 2සාමු 3:13
8 1සාමු 9:2
9 දේශ 9:8
10 2සාමු 18:18
11 එස්ත 2:7
12 2සාමු 14:24

2සාමු **14:26*** ෂෙකෙලයක් යනු ග්‍රෑම් 11.4කි.

යැවීමේ අදහසින්ය. නමුත් යෝ-
වාබ් ඔහු වෙතට ආවේ නැත. එබැ-
වින් ඔහු නැවත වරක් යෝවාබ්ට
පණිවිඩයක් යැව්වේය. ඒ වතාවේදී-
වත් යෝවාබ් ආවේ නැත. **30** එබැ-
වින් අබ්සලෝම් තම සේවකයන්ට
මෙසේ අණ කළේය. "මගේ ඉඩම
ළඟ තියෙන යෝවාබ්ගේ බාර්ලි
කෙතට ගිනි තියන්න."[1] අබ්සලෝම්-
ගේ සේවකයෝද ඔහු අණ කළ
ලෙසම කළෝය.[2] **31** ඉන්පසු යෝ-
වාබ් අබ්සලෝම්ගේ නිවසට පැමිණ
ඔහුගෙන් මෙසේ ඇසුවේය. "ඔබේ
සේවකයන් මගේ බාර්ලි කෙතට
ගිනි තිබ්බේ ඇයි?" **32** එවිට අබ්ස-
ලෝම්, "මාව හමු වෙන්න මෙහෙට
එන්න කියලා මම ඔබට පණිවිඩ එව්-
වේ, මං වෙනුවෙන් ඔබ රජු ඉදිරියට
ගිහින් මේ දේ රජුට දැන්වීමටයි. 'මාව
ගෙෂූර් ඉඳන් ගෙන්නගත්තේ ඇයි?[3]
මම එහෙට වෙලාම හිටියා නම් මීට
වඩා හොඳයි. දැන් ඔබ ඉදිරියට
එන්න මට අවසර දෙන්න. මම වරදක්
කරලා තියෙනවා නම්[4] ඔබම මාව
මරලා දාන්න.'"

**33** පසුව යෝවාබ්, රජු ඉදිරියට
ගොස් අබ්සලෝම් කී දේ ඔහුට පැවසු-
වේය. එවිට අබ්සලෝම්ව රජු ඉදිරියට
කැඳවනු ලැබීය. අබ්සලෝම් දණින්
වැටී පොළොව දෙසට හිස නමා රජුට
ආචාර කළේය. ඉන්පසු රජ අබ්ස-
ලෝම්ව සිප වැළඳගත්තේය.[5]

**15** ටික කලකට පසු අබ්සලෝම්
තමන්ට අශ්ව රථයක් සාදා-
ගත්තේය. රථයට ඉදිරියෙන් දුවන්න
මිනිසුන් පනස්දෙනෙකුවද අශ්වයන්ද
ඔහු සූදානම් කරගත්තේය.[6] **2** අබ්-
සලෝම් පාන්දරින්ම නැඟිට[7] නුවර
දොරටුව අසලට ගොස්,[8] නඩු විභාග
සඳහා රජු ළඟට යන මිනිසුන්ව[9]
කතාවට අල්ලාගත්තේය. ඔහු ඔවුන්-
ගෙන්, "ඔබ කොයි නුවරේ ඉඳන්ද
ආවේ" කියා මුලින්ම ඇසුවේය.
එවිට ඔවුහු, "ඔබේ සේවකයන් වන
අප ඊශ්‍රායෙල්හි අහවල් ගෝත්‍රයට
අයිති අය" කියා පිළිතුරු දුන්නෝය.
**3** අබ්සලෝම් ඔවුන්ගෙන් කාරණා
විමසූ පසු ඔවුන්ට මෙසේ කීවේය.
"ඔබ කියන දේ සාධාරණයි. හැබැයි
ඔබේ පැමිණිල්ලට ඇහුම්කන් දෙන්න
රජ කිසි කෙනෙකුව පත් කරලා
නැහැ."[1] **4** ඔහු ඔවුන්ට තවදුරටත්
මෙසේ කීවේය. "මාව මේ දේශයේ
විනිශ්චයකාරයා හැටියට පත් කළා
නම්[2] නඩු විසඳගන්න මා ළඟට එන
හැමෝටම මම සාධාරණය ඉටු කර
දෙනවා."[3]

**5** එමෙන්ම යමෙක් අබ්සලෝම්ට
ආචාර කිරීමට පැමිණෙද්දී ඔහු ඉක්ම-
නින් ඉදිරියට ගොස්[4] එම පුද්ගලයාව
සිප වැළඳගත්තේය. **6** නඩු විභාග-
යක් සඳහා රජු ළඟට ගිය සෑම කෙ-
නෙකුටම ඔහු සැලකුවේ එලෙසය.
මෙසේ අබ්සලෝම් සූක්ෂ්ම ලෙස
ඊශ්‍රායෙල් ජනයාගේ සිත් දිනාගත්-
තේය.[5]

**7** හතළිස් වන අවුරුද්දේ* අගභා-
ගයේදී අබ්සලෝම්, රජුගෙන් මෙසේ
ඉල්ලුවේය. "මම යෙහෝවා දෙවිට
භාරයක් වුණා.[6] ඒක ඔප්පු කරන්න
මට හෙබ්‍රොන් නුවරට[7] යන්න අව-
සර දෙන්න. **8** මම සිරියාවේ ගෙෂූර්
නුවරේ ජීවත් වුණු කාලයේදී,[8] 'යෙ-
හෝවා දෙවි මට ආපහු යෙරුසලමට
යන්න අවස්ථාව දුන්නොත් මම යෙ-
හෝවා දෙවිට පූජා ඔප්පු කරනවා'[9]
කියලා දෙවිට පොරොන්දු වුණා."[10]
**9** එවිට රජ, "පරෙස්සමෙන් ගිහින්
එන්න"[11] කියා ඔහුට කීවේය. අබ්ස-
ලෝම්ද හෙබ්‍රොන් නුවරට ගියේය.

**10** පසුව අබ්සලෝම්, ඊශ්‍රායෙල්හි
සියලු පළාත්වලට ඔත්තුකරුවන්
පිටත් කර යැව්වේය.[12] "හොරණෑවේ
ශබ්දය ඇසුණු වහාම, 'දැන් හෙ-
බ්‍රොන්හි[13] රජ අබ්සලෝම්'[14] කියලා
හැමෝටම දන්වන්න" කියා ඔහු
ඔවුන්ට උපදෙස් දුන්නේය. **11** අබ්-
සලෝම් සමඟ මිනිස්සු දෙසියයක්

**14 පරි.**
1 නික් 22:6
විනි 15:5
2 1රාජා 21:11
3 2සාමු 14:23
4 ගීතා 36:2
5 උත් 45:15

**15 පරි.**
6 1සාමු 8:11
1රාජා 1:5
හිතෝ 11:2
7 හිතෝ 1:16
8 ද්වි 22:15
ද්වි 25:7
රූත් 4:1
9 1සාමු 8:20
2සාමු 8:15

**2 තීරුව**
1 ගීතා 12:2
හිතෝ 30:17
මතෙ 15:4
2පේතෘ 2:10
2 නික් 20:17
හිතෝ 25:6
මාක් 7:22
3 ගීතා 12:2
හිතෝ 27:2
2පේතෘ 2:19
4 ගීතා 10:9
ගීතා 55:21
හිතෝ 26:25
5 හිතෝ 11:9
රෝම 16:18
2පේතෘ 2:3
6 හිතෝ 21:27
7 2සාමු 3:2
8 2සාමු 13:38
2සාමු 14:23
9 යෙරෙ 9:3
10 ලෙවී 22:21
11 1සාමු 1:17
12 2සාමු 13:28
2සාමු 14:30
13 2සාමු 2:1
2සාමු 5:1
2සාමු 5:5
1ලේක 3:4
14 යෝබ් 20:5
ගීතා 73:18
මීකා 7:6
මතෙ 23:12

**2සාමු 15:7*** 1සාමු 16:13හි සඳහන් දාවිත්ගේ අභිෂේක කිරීමේ දවසේ සිට අවුරුදු 40ක් විය හැක.

යෙරුසලමේ සිට හෙබ්‍රොන් වෙත
ගියෝය. ඔවුන්ගෙන් කිසිවෙක්වත්
අබ්සලෝම්ගේ කූට උපාය ගැන දැන
සිටියේ නැත.[1] **12** අබ්සලෝම් පූජා
ඔප්පු කළ පසු දාවිත් රජුගේ උපදේ-
ශකයා[2] වන අහිතොෆෙල්ව[3] තමා
ළඟට කැඳවාගත්තේය. ඒ අවස්ථාවේ
අහිතොෆෙල් තම නුවර වන ගීලෝහි[4]
සිටියේය. රජුට විරුද්ධව අබ්සලෝම්
කළ කුමන්ත්‍රණයට[5] හවුල් වූ පිරිස
තව තවත් වැඩි විය.[6]

**13** ටික දවසකට පසු පණිවිඩකරු-
වෙක් පැමිණ දාවිත් රජුට මෙසේ දැන්-
වූවේය. “ඊශ්‍රායෙල්වරු අබ්සලෝම්ගේ
පැත්තට ගිහින්.”[7] **14** එය ඇසූ විගස
දාවිත් රජ තමා සමඟ යෙරුසල-
මේ සිටි සියලු සේවකයන්ට මෙසේ
කීවේය. “ඉක්මනට අපි මෙහෙන් යමු.[8]
අබ්සලෝම් මෙහෙට ආවොත් අපිට
බේරෙන්න ලැබෙන එකක් නැහැ. ඔහු
අපිව අල්ලගෙන අපි හැමෝවම විනාශ
කරලා දායි. මේ නුවරත් විනාශ කරලා
දායි.”[9] **15** එවිට රජුගේ සේවකයෝ,
“ස්වාමීනි, ඔබ කියන ඕනෑම දෙ-
යක් කරන්න අපි සූදානම්”[10] කියා
ඔහුට කීවෝය. **16** රජද තම ගෙයි
වැසියන් සියලුදෙනා සමඟ පිටත්ව
ගියේය.[11] රජ තම මාලිගාව බලාගැ-
නීමට උපභාර්යාවන්[12] දසදෙනෙකුව
නතර කර ගියේය. **17** ඔහු තම
සියලු සෙනඟ සමඟ නුවරින් පිටත්ව
ගොස් බෙත්-මෙර්හාක්* දක්වා ගමන්
කර එහි නතර විය.

**18** පසුව රජුගේ සේවකයෝ සිය-
ලුදෙනාද කෙරෙතිවරුද පෙලෙතිව-
රුද[13] ඔහු* සමඟ පැමිණි ගාත්හි
වැසියන්[14] හයසියදෙනාද නිම්නයෙන්
අනික් පැත්තට ගියෝය. ඔවුහු සිය-
ලුදෙනාම දාවිත් රජුව පසු කර-
ගෙන ගියෝය. **19** එවිට දාවිත් රජ
ගාත් සිට පැමිණි ඉත්තයිට[15] මෙසේ
කීවේය. “ඔබ ආපහු හැරිලා යන්න.[16]
අප සමඟ එන්න අවශ්‍ය නැහැ. ඔබ
විදේශිකයෙක් නිසා ඔබට රජු සමඟ
ජීවත් වෙන්න පුළුවන්. අනික ඔබ
ඔබේ දේශය අත්හැරලයි මෙහෙට
ඇවිත් ඉන්නේ. **20** ඔබ මේ දේශ-
යට ආවේ ළඟදී. ඒ නිසා මම යන යන
තැනට ඔබව රැගෙන යන එක හොඳ
නැහැ.[1] ඔබේ සහෝදරයන් සමඟ ඔබ
ආපහු යන්න. යෙහෝවා දෙවි ඔබට
ප්‍රේමය*[2] පෙන්වා ඔබ සමඟ විශ්වා-
සවන්තව[3] කටයුතු කරයි කියලා
මට විශ්වාසයි.” **21** එහෙත් ඉත්-
තයි, රජුට මෙසේ කීවේය. “මගේ
ස්වාමීනි, ඔබ යන ඕනෑම තැන-
කට මාත් ඔබ සමඟ එනවා කියලා
ජීවමාන දෙවි වන යෙහෝවා ඉදි-
රියෙත් ඔබ ඉදිරියෙත් මම දිවු-
රලා පොරොන්දු වෙනවා.[4] ඔබ සමඟ
මැරෙන්න වුණත් මම ලෑස්තියි!”[5]
**22** දාවිත් රජ එය අසා, “එහෙමනම්
ඔබත් අපි සමඟ එන්න” කියා ඉත්ත-
යිට[6] කීවේය. එවිට ගාත් සිට පැමිණි
ඉත්තයිද ඔහුගේ සෙනඟද ඔවුන්-
ගේ දරුදැරියෝද නිම්නයෙන් අනික්
පැත්තට ගියෝය.

**23** රජු සමඟ ගිය සෙනඟ නිම්නය
හරහා යන විට ඒ අවට ජීවත් වූ
ජනයා මහත් හඬින් හඬන්න පටන්-
ගත්තෝය.[7] රජු බලා සිටියදී සෙ-
නඟ කිද්‍රොන් නිම්නය[8] හරහා
ගමන් කර පාළුකරය දෙසට ගියෝය.
**24** සාදොක්ද[9] සියලු ලෙවීවරුද[10]
සැබෑ දෙවිගේ ගිවිසුම් පෙට්ටිය[11]
රැගෙන[12] රජු සිටි ස්ථානයට ආවෝය.
රජු සමඟ ගිය මුළු සෙනඟ නිම්න-
යෙන් අනික් පැත්තට යන තෙක්
ඔවුහු සැබෑ දෙවිගේ ගිවිසුම් පෙට්ටිය
අබියාතර්[13] සිටගෙන සිටි ස්ථාන-
යේ තැබුවෝය. **25** රජ සාදොක්ට
මෙසේ කීවේය. “සැබෑ දෙවිගේ ගිවිසුම්
පෙට්ටිය ආපහු නුවරට[14] රැගෙන
යන්න.[15] මට යෙහෝවා දෙවිගෙන්
කරුණාව ලැබුණොත් ඔහු මට ආපහු

**15 පරි.**
**1** රෝම 16:18
**2** ගීතා 41:9; ගීතා 55:13; මීකා 7:5; යොහ 13:18
**3** 2සාමු 16:23; 2සාමු 17:14
**4** යොෂු 15:51; 2සාමු 23:34
**5** 2රාජා 12:20; 2රාජා 17:4; 2ලේක 25:27
**6** ගීතා 3:1; ගීතා 43:1; හිතෝ 24:21
**7** විනි 9:3
**8** 2සාමු 19:9; ගීතා 3:පෙර; හිතෝ 19:26
**9** 2සාමු 12:11
**10** හිතෝ 18:24; ලූක් 22:28; යොහ 15:14; 1කොරි 4:2
**11** විනි 4:10; 1සාමු 25:27
**12** 2සාමු 12:11; 2සාමු 16:21; 2සාමු 20:3
**13** 2සාමු 8:18; 2සාමු 20:7; 1රාජා 1:38; 1ලේක 18:17
**14** යොෂු 13:3; 1සාමු 27:4; 1ලේක 18:1
**15** 2සාමු 18:2
**16** රූත් 1:8

**2 තීරුව**
**1** හෙබ්‍රෙ 11:38
**2** ගීතා 25:10; ගීතා 57:3; ගීතා 61:7; ගීතා 85:10; ගීතා 89:14
**3** 2සාමු 2:6
**4** 1සාමු 20:3; 1සාමු 25:26
**5** රූත් 1:17; හිතෝ 17:17; හිතෝ 18:24; මතෙ 8:19
**6** 2සාමු 18:2
**7** රෝම 12:15
**8** 1රාජා 2:37; 2ලේක 30:14; යොහ 18:1
**9** 2සාමු 8:17; 2සාමු 20:25; 1රාජා 1:8; 1රාජා 2:35; 1රාජා 4:2; 1ලේක 6:8
**10** ගණන් 8:19; 1ලේක 23:32
**11** නික් 37:1; ලෙවී 16:2
**12** ගණන් 4:15; ගණන් 7:9; 1සාමු 4:4; 1ලේක 15:2;
**13** 1සාමු 22:20; 1සාමු 30:7; **14** 2සාමු 6:17; **15** 1සාමු 4:3.

**2සාමු 15:17*** තේරුම, “ඈතින් පිහිටි නිවස.” **18*** මෙහි කතා කරන්නේ 19වන පදයේ සඳහන් වන ඉත්තයි ගැනය.

**2සාමු 15:20*** හෝ, “ලැදි ප්‍රේමය.”

මෙහෙට එන්න ඉඩ සලසයි. එවිට
ගිවිසුම් පෙට්ටියත් එහි කූඩාරමත්
මට ආපහු දැකගන්න පුළුවන් වෙයි.[1]
**26** නමුත් දෙවිට මාව ප්‍රසන්න නැත්-
නම් ඔහු ඉඩහරින ඕනෑම තත්වය-
කට මුහුණ දෙන්න මම සතුටුයි.”[2]
**27** රජ, පූජක සාදොක්ට තවදුරටත්
මෙසේ කීවේය. “ඔබ දිවැසිවරයෙක්.[3]
ඒ නිසා ඔබ ඔබේ පුත් අහිමයාෂ් හා
අබියාතර්ගේ පුත් යොනාතාන් සමඟ[4]
ආපහු නුවරට යන්න. ඔබ දෙදෙනාට
ඔබේ පුත්‍රයන් සමඟ කිසි කරදර-
යක් නැතුව නුවරට යන්න ලැබේවා!
**28** මම ඔබෙන් පණිවිඩයක් ලැබෙන
තුරු පාළුකරයට වී බලාගෙන ඉන්-
නවා.[5] මම ගඟෙන් එගොඩ වෙන්න
පුළුවන් තැනකට වෙලා ඉන්නම්.”
**29** එබැවින් සාදොක් හා අබියාතර්
සැබෑ දෙවිගේ ගිවිසුම් පෙට්ටිය නැවත
යෙරුසලමට ගෙන ගොස් එහි වාසය
කළෝය.

**30** දාවිත් රජ තම හිස වසාගෙන[6]
පාවහන් නොමැතිව හඬමින් ඔලීව
කන්දට[7] නැග්ගේය. ඔහු සමඟ සිටි
සෙනඟද තම තමන්ගේ හිස් වසා-
ගෙන හඬමින් කන්දට නැග්ගෝය.[8]
**31** පසුව දාවිත් රජුට මෙසේ ආරංචි
විය. “ඔබට විරුද්ධව අබ්සලොම්[9]
කරන කුමන්ත්‍රණයට අහිතොෆෙලුත්
සම්බන්ධයි.”[10] එය අසා දාවිත් රජ,
“අනේ යෙහෝවා දෙවියනි,[11] අහිතො-
ෆෙල් දෙන උපදෙස් මෝඩයෙකුගේ
උපදෙස් මෙන් වේවා”[12] කියා දෙවි-
ගෙන් ඉල්ලුවේය.[13]

**32** පසුව දාවිත් රජ කන්ද මුදුනට
පැමිණියේය. සාමාන්‍යයෙන් දෙවිට
නමස්කාර කරන පිණිස මිනිස්සු ඒ
ස්ථානයේ නතර වූහ. දාවිත් රජු
එතැන සිටියදී අර්කීවරයෙක්[14] වන
හූෂයි[15] තම සළුව ඉරාගෙන හිස මත
දූවිලි දමාගෙන[16] ඔහු ළඟට ආවේය.
**33** එවිට දාවිත් රජ ඔහුට මෙසේ
කීවේය. “ඔබ මා සමඟ ආවොත් ඒක
මට බරක් වෙයි.[17] **34** හැබැයි ඔබට
මං වෙනුවෙන් එක දෙයක් කරන්න
පුළුවන්. නුවරට නැවත යන්න.
අබ්සලොම් ළඟට ගිහින් ඔහුට
මෙහෙම කියන්න. ‘රජ්ජුරුවනි, මම
ඔබට සේවය කරන්න කැමතියි. මම
ඔබේ පියාටත් සේවය කළා. නමුත්
දැන් මම ඔබට සේවය කරන්න
කැමතියි.’[1] ඊටපස්සේ ඔබ ඔහු
ළඟට වෙලා අහිතොෆෙල් දෙන උප-
දෙස් අසාර්ථක වෙන්න සලස්වන්න.[2]
**35** පූජක සාදොක් හා අබියාතරුත්
නුවරේ ඉන්නවා.[3] රජමාලිගාවේදී
ඔබට අහන්න ලැබෙන හැම තොරතු-
රක්ම ඒ දෙන්නාට කියන්න.[4] **36** ඒ
දෙන්නාගේ පුත්‍රයන් වන අහිමයාෂ්[5]
හා යොනාතානුත්[6] ඔවුන් සමඟ ඉන්-
නවා. ඔබට අහන්න ලැබෙන හැම
තොරතුරක්ම ඒ දෙන්නා මාර්ගයෙන්
මට දන්වන්න.” **37** එබැවින් දාවිත්
රජුගේ මිත්‍රයා[7] වන හූෂයි, නුවරට
ගියේය. අබ්සලොම්ද[8] යෙරුසලමට
පැමිණියේය.

**16** දාවිත් රජ කඳු මුදුනේ[9] සිට
ටික දුරක් බැස යද්දී මෙෆි-
බොෂෙත්ගේ[10] සේවකයා වන ශීබා[11]
තමාව හමු වීමට එන බව දුටුවේය.
ශීබා පැමිණියේ ගමනට සූදානම් කළ
බූරුවන් දෙදෙනෙකු සමඟය.[12] බූරු-
වන් පිට රොටි දෙසියයක්ද[13] වියළි
මිදි කුට්ටි සියයක්ද[14] වෙනත් වියළි
පලතුරු* කුට්ටි සියයක්ද[15] විශාල
වයින් භාජනයක්ද[16] පටවා තිබිණ.
**2** රජ එය දැක, “ඔබ මේවා ගෙනාවේ
ඇයි”[17] කියා ශීබාගෙන් ඇසුවේය.
එවිට ශීබා ඔහුට මෙසේ කීවේය.
“ඔබේ ගෙයි වැසියන්ගේ ගමනට උප-
කාරයක් හැටියටයි මම මේ බූරු-
වන්ව රැගෙන ආවේ. රොටි සහ
පලතුරු කුට්ටි ගෙනාවේ ඔබේ සේ-
වකයන්ට කන්න දෙන්න.[18] පාළු-
කරයේදී[19] වෙහෙසට පත් වුණොම[20]
ඔබට බොන්න වයිනුත් ගෙනාවා.”

**15 පරි.**
1 2සාමු 7:2; ගීතා 26:8; ගීතා 27:4
2 1සාමු 3:18; 1පේතෘ 5:6
3 1සාමු 9:9; 2ලේක 16:7
4 2සාමු 17:17
5 2සාමු 15:36; 2සාමු 17:16; 2සාමු 17:21
6 එස්ත 6:12; යෙරෙ 14:3
7 මතෙ 21:1; මතෙ 24:3; ලූක් 19:29; ක්‍රියා 1:12
8 රෝම 12:15
9 ගීතා 3:පෙර
10 ගීතා 41:9; ගීතා 55:12; මතෙ 26:15; යොහ 13:18
11 ගීතා 3:7; ගීතා 50:15
12 2සාමු 16:23; 2සාමු 17:14; යෝබ් 12:20; 1කොරි 3:19
13 පිලි 4:6
14 යොෂු 16:2
15 2සාමු 16:16
16 1සාමු 4:12; 2සාමු 1:2
17 2සාමු 19:35

**2 තීරුව**
1 2සාමු 16:19
2 2සාමු 17:7; 2සාමු 17:14
3 2සාමු 17:15
4 2සාමු 17:16
5 2සාමු 15:27; 2සාමු 18:19
6 2සාමු 17:17; 1රාජා 1:42
7 2සාමු 16:16; 1ලේක 27:33; හිතෝ 17:17
8 2සාමු 16:15

**16 පරි.**
9 2සාමු 15:30
10 2සාමු 9:6
11 2සාමු 9:2; 2සාමු 9:9
12 1සාමු 25:18
13 1සාමු 17:17; 2සාමු 17:28
14 1සාමු 30:12
15 යෙරෙ 40:10; ආමො 8:1; මීකා 7:1
16 1සාමු 10:3
17 හිතෝ 17:8; හිතෝ 18:16

**18** 1සාමු 25:27; **19** 2සාමු 15:23; **20** 2සාමු 17:29.

---

**2සාමු 16:1*** මූ.අ., “ගිම්හාන පලතුරු.” මෙය විශේෂයෙන්ම යොමු දක්වන්නේ අත්තික්කාව-ලටය. සමහරවිට රටඉඳිත් ඊට ඇතුළත් විය හැකියි.

**3** එවිට රජ, "ඔබේ ස්වාමියාගේ පුත්
මෙෆිබොෂෙත් කොහේද"[1] කියා ඔහු-
ගෙන් ඇසුවේය. ෂීබා දාවිත් රජුට
මෙසේ කීවේය. "'ඊශ්‍රායෙල් සෙනඟ
මගේ පියාගේ රාජ්‍යය අද නැවත
මගේ අතට දෙයි' කියලා ඔහු යෙරු-
සලමේම නතර වුණා."[2] **4** එය අසා
රජ, "මෙෆිබොෂෙත්ට අයිති සෑම දෙ-
යක්ම අද මම ඔබට දෙනවා"[3] කියා
ෂීබාට කීවේය. එවිට ෂීබා ඔහුට
මෙසේ කීවේය. "මගේ ස්වාමීනි, රජ්-
ජුරුවනි, හැමදාමත් මේ විදිහට මට
කරුණාවෙන් සලකන්න කියලා මම
ඔබෙන් බැගෑපත්ව[4] ඉල්ලා සිටිනවා."
**5** දාවිත් රජු බහුරීම් නුවරට[5]
පැමිණි විට සාවුල්ගේ පවුලට
අයිති කෙනෙකු වූ ගෙරාගේ පුත්‍රයා
වන ෂිමෙයි[6] එතැනට පැමිණ ඔහුට
අපහාස කරන්න පටන්ගත්තේය.[7]
**6** ඔහු දාවිත් රජුට හා ඔහුගේ සේව-
කයන්ට ගල් ගැසුවේය. ඒ අවස්ථා-
වේ සෙනඟද සියලු බලසම්පන්න
පුරුෂයෝද රජුගේ දෙපැත්තේ සිට-
ගෙන සිටියෝය. **7** ෂිමෙයි, දාවිත්
රජුට අපහාස කරමින් මෙසේ කීවේය.
"මිනී මරුවා![8] මෙහෙන් පලයං.
නුඹ කිසි කමකට නැති මිනිහෙක්.[9]
**8** නුඹ සාවුල්වත් ඔහුගේ පවුලේ අය-
වත් විනාශ කරලා ඔහුගෙන් රජකම
පැහැරගත්තා. අද යෙහෝවා දෙවි
නුඹට දඬුවම් කරන්නේ ඒ නිසයි. යෙ-
හෝවා දෙවි රජකම නුඹෙන් පැහැර-
ගෙන නුඹේ පුත් අබ්සලොම්ට ඒක
දුන්නා. නුඹ මිනී මරුවෙක්![10] ඒ
නිසයි නුඹට මේ හැම විපතක්ම සිදු
වුණේ."
**9** එවිට ෂෙරුයියාගේ පුත්‍රයා[11] වන
අබිෂයි රජුගෙන් මෙසේ ඇසු-
වේය. "රජ්ජුරුවනි, මගේ ස්වාමීනි,
ඔබට අපහාස කරන්න මේ බල්-
ලාට*[12] ඉඩ දෙන්නේ මොකටද?[13]
මම දැන්මම ගිහින් ඔහුගේ බෙල්ල
කපලා දාන්නම්!"[14] **10** නමුත් රජ
මෙසේ කීවේය. "ෂෙරුයියාගේ පුත්‍ර-
යෙනි,[1] මේ මනුෂ්‍යයා මොනවා කිව්-
වත් ඔබ කලබල වෙන්නේ ඇයි?[2]
ඔහුට ඕනේ දෙයක් කියන්න ඉඩ
දෙන්න.[3] මට අපහාස කරන්න ඔහුව
එවලා තියෙන්නේ යෙහෝවා දෙ-
වියි.[4] ඉතින්, 'ඔබ මේ දේ කළේ
ඇයි' කියලා ඔහුගෙන් අහන්න අපිට
අයිතියක් තියෙනවාද?"[5] **11** දාවිත්
රජ අබිෂයිටද ඔහුගේ සේවක-
යන්ටද තවදුරටත් මෙසේ කීවේය.
"මගේම පුතා මාව මරන්න හො-
යද්දී[6] බෙන්ජමින් ගෝත්‍රයේ කෙ-
නෙක්[7] මට මේ විදිහට කතා කරන
එක පුදුමයක්ද? යෙහෝවා දෙවියි
ඔහුව එවලා තියෙන්නේ. ඒ නිසා
ඔහුට ඕනේ දෙයක් කියන්න ඉඩ
දෙන්න. **12** සමහරවිට යෙහෝවා
දෙවි මං දිහා බලලා[8] මට කළ මේ
අපහාසය වෙනුවට යෙහෝවා දෙවි
මට යහපතක් වෙන්න සලස්වයි."[9]
**13** ඉන්පසු දාවිත් රජද ඔහුගේ සෙ-
නඟද එතැනින් යන්න ගියෝය.
නමුත් ෂිමෙයි කන්ද දිගේ ඔවුන් පසු-
පස ආවේය. ඔහු දාවිත් රජු ළඟටම
පැමිණ ඔහුට අපහාස කරමින්[10] ගල්
ගැසුවේය. ඔහු දාවිත් රජු දෙසට
වැලිද වීසි කළේය.[11]
**14** බොහෝ වේලාවකට පසුව
විඩාවට පත්ව සිටි දාවිත් රජ සහ
ඔහුගේ සෙනඟ ගිමන්හැරීමට නතර
වූහ.[12]
**15** ඒ අතරතුර අබ්සලොම් හා
ඊශ්‍රායෙල්හි ජනයා යෙරුසලමට
ඇතුල් වූහ.[13] අහිතොෆෙල්ද[14] ඔහු
සමඟ සිටියේය. **16** පසුව දාවිත්
රජුගේ මිත්‍රයා[15] වන අර්කීවර-
යෙකු වූ[16] හූෂයි[17] අබ්සලොම් වෙත
පැමිණ මෙසේ කීවේය. "රජු බොහෝ
කල් ජීවත් වේවා![18] රජු බොහෝ
කල් ජීවත් වේවා!" **17** අබ්සලොම්
එය අසා, "ඔබේ මිතුරාට ප්‍රේමය*
පෙන්වන්නේ මෙහෙමද? ඇයි ඔබ

**16 පරි.**
1 2සාමු 9:3
2 ලෙවී 19:16; 2සාමු 19:27; ගීතා 15:3; හිතෝ 6:19; හිතෝ 26:22
3 ද්වි 19:15; 2සාමු 9:10
4 2සාමු 14:22
5 2සාමු 3:16; 1රාජා 2:8
6 2සාමු 19:16; 1රාජා 2:44
7 නික් 22:28; 1සාමු 17:43; හිතෝ 1:22; හිතෝ 26:2; දේශ 10:20; ක්‍රියා 23:5
8 1සාමු 24:6; 1සාමු 26:11
9 ද්වි 13:13; 1සාමු 2:12; 1සාමු 25:17; යෝබ් 34:18
10 ගීතා 3:1; ගීතා 3:2; ගීතා 7:1; ගීතා 71:11
11 1ලේක 2:16
12 1සාමු 24:14; 2සාමු 3:8
13 නික් 22:28; ක්‍රියා 23:5
14 1සාමු 26:8; ලූක් 9:54; රෝම 12:19

**2 තීරුව**
1 1රාජා 2:5
2 2සාමු 19:22; 2රාජා 3:13; ලූක් 9:55
3 ගීතා 37:8; 1පේතෘ 2:23
4 2සාමු 12:10
5 රෝම 9:20
6 2සාමු 12:11; 2සාමු 15:14; 2සාමු 17:12
7 2සාමු 19:16
8 උත් 29:32; නික් 2:25; නික් 3:7; ගීතා 25:18; හිතෝ 15:3
9 ද්වි 23:5; ගීතා 109:28
10 නික් 22:28; 2සාමු 16:5; දේශ 10:20
11 ක්‍රියා 22:23
12 2සාමු 16:2
13 2සාමු 15:37
14 2සාමු 15:12; 2සාමු 15:31
15 2සාමු 15:37; 1ලේක 27:33
16 යොෂු 16:2
17 2සාමු 15:32

18 1සාමු 10:24; 1රාජා 1:25; 2රාජා 11:12; ආනි 2:4.

**2සාමු 16:9*** මූ.අ., "මේ මළ බල්ලාට."

**2සාමු 16:17*** හෝ, "ළැදි ප්‍රේමය."

ඔබේ මිතුරා සමඟ ගියේ නැත්-
තේ”[1] කියා හූෂයිගෙන් ඇසුවේය.
**18** එවිට හූෂයි ඔහුට මෙසේ පැවසු-
වේය. “මම කොහොමද ඔහු සමඟ
යන්නේ? මම සේවය කරන්න ඕනේ
යෙහෝවා දෙවි තෝරාගත් තැනැත්-
තාටයි. මේ සෙනඟත් ඊශ්‍රායෙල් ජන-
යාත් තෝරාගත්තේ ඔබවයි. ඒ නිසා
මම ඉන්නෙත් ඔබ සමඟයි. **19** මම
නැවතත් මේ දේ ඔබට කියන්න කැම-
තියි. මම සේවය කරන්නේ ඔබටයි.
ඔබේ පියාට සේවය කළා වගේම මම
දැන් ඔබටත් සේවය කරනවා.”[2]

**20** පසුව අබ්සලොම් අහිතො-
ෆෙල්ට මෙසේ කීවේය. “මම දැන්
මොනවාද කරන්න ඕනේ කියලා
මට කියන්න.”[3] **21** එවිට අහිතො-
ෆෙල් ඔහුට මෙසේ කීවේය. “ඔබේ
පියා මාලිගාව බලාගන්න තියලා
ගිය[4] ඔහුගේ උපභාර්යාවන් සමඟ
ලිංගික සම්බන්ධකම් පවත්වන්න.[5]
ඔබ මේ විදිහට ඔබේ පියාට[6] නින්දා
කළා[7] කියලා මුළු ඊශ්‍රායෙල් සෙනඟ
දැනගත්තාම ඔබේ පැත්තේ සිටින
සියලුදෙනාගේ සිත්[8] තව තවත්
ධෛර්යවත් වෙයි.” **22** පසුව අහි-
තොෆෙල්ගේ උපදෙස්වලට අනුව
අබ්සලොම්ගේ සේවකයෝ රජමා-
ලිගාවේ සැඳැල්ල මත[9] කූඩාරමක්
සෑදුවෝය. ඉන්පසු අබ්සලොම් එළිපි-
ටම[10] තම පියාගේ උපභාර්යාවන්
සමඟ ලිංගික සම්බන්ධකම් පැවැත්වූ-
වේය.[11] මුළු ඊශ්‍රායෙල් සෙනඟට ඒ
ගැන ආරංචි විය.

**23** ඒ කාලයේදී මිනිසුන් අහිතො-
ෆෙල්ගේ[12] උපදෙස් මොන තරම් ඉහ-
ළින් සැලකුවාද කිවහොත් එය සැබෑ
දෙවිගෙන්ම ලැබුණු උපදෙස් හා සමා-
නව සලකනු ලැබීය. දාවිත් රජු හා
අබ්සලොම්ද ඔහුගේ උපදෙස් සැලකු-
වේ එලෙසය.[13]

**17** පසුව අහිතොෆෙල්, අබ්ස-
ලොම්ට මෙසේ කීවේය. “අද
රෑ මිනිස්සු දොළොස්දහසක් සමඟ
දාවිත් පසුපස ලුහුබැඳගෙන යන්න
මට අවසර දෙන්න.[1] **2** රජ වෙහෙ-
සට පත්ව දුර්වලව ඉන්න කොට[2] මම
ඔහු ඉන්න තැනට කඩාපැනලා ඔහුව
බය ගන්වන්නම්. එතකොට ඔහු
සමඟ ඉන්න මිනිස්සු එතැනින් පලා
යයි. ඔහු තනි වුණාම මම ඔහුව
මරලා දාන්නම්.[3] **3** ඔහු සමඟ ගිය
සෙනඟ මම ආපහු ඔබ ළඟට රැගෙන
එන්නම්. ඔබ අල්ලගන්න හදන
කෙනාව මරලා දැම්මොත් සෙනඟ
නිකම්ම ඔබේ පැත්තට එයි. එත-
කොට මුළු සෙනඟ සමාදානයෙන්
ජීවත් වෙයි.” **4** අබ්සලොම්ද ඊශ්‍රා-
යෙල්හි සියලු වැඩිමහල්ලෝද අහි-
තොෆෙල් දුන් උපදෙස් ඉතා හොඳ
බව පිළිගත්තෝය.[4]

**5** එහෙත් අබ්සලොම්, “අර්කීව-
රයෙක් වන හූෂයිවත්[5] මෙතැනට
කැඳවන්න. මේ ගැන ඔහු මො-
නවද හිතන්නේ කියලා ඔහු-
ගෙන් අහලා බලමු” කියා කීවේය.
**6** හූෂයි අබ්සලොම් ඉදිරියට පැමිණි
විට අබ්සලොම් ඔහුට මෙසේ කීවේය.
“අහිතොෆෙල් අපිට දුන් උපදෙස්
හොඳයිද කියලා කියන්න. ඔහු කියූ
විදිහට අපි කරන්නද? නැත්නම් ඔබට
හොඳයි කියලා හිතෙන වෙන විදිහක්
තියෙනවද?” **7** එවිට හූෂයි අබ්ස-
ලොම්ට මෙසේ කීවේය. “අහිතො-
ෆෙල් ඔබට දුන් උපදෙස් හොඳ
නැහැ.”[6]

**8** හූෂයි තවදුරටත් මෙසේ කීවේය.
“ඔබ හොඳින්ම දන්නවා ඔබේ පියාත්
ඔහු සමඟ ඉන්න අයත් කොච්-
චර බලවත්ද කියලා.[7] අනික ඔවුන්
ඉන්නේ හරියට පැටව් නැති වුණු
වැලහින්නියක් වගෙයි.[8] ඔබේ පියා
ගොඩක් දක්ෂ සටන්කරුවෙක්[9] කිය-
ලත් අමතක කරන්න එපා. ඔහු
අද රෑ සෙනඟ සමඟ ඉන්න එකක්
නැහැ. **9** ඔහු පර්වත අතරේ නැත්-
නම් වෙන කොහේ හරි හැංගිලා ඉන්-
නවා ඇති.[10] ඔහු හැංගිලා ඉන්න
තැනකින් ඇවිත් ඔබේ මිනිසුන්ට
පහර දුන්නොත්, ‘අබ්සලොම්ගේ සෙ-
නඟ පරාජය වෙලා’ කියලා කතාවක්

**16 පරි.**
**1** උත් 26:26, 1රාජා 4:5, හිතෝ 17:17, හිතෝ 18:24
**2** 2සාමු 15:34, හිතෝ 14:15
**3** ගීතා 37:12, හිතෝ 21:30, යෙසා 8:10, මතෙ 27:1
**4** 2සාමු 15:16
**5** ලෙවී 18:8, ලෙවී 20:11, 2සාමු 12:11, 1රාජා 2:22, යෝබ් 31:10
**6** උත් 49:4
**7** උත් 34:30, 1සාමු 13:4, 1සාමු 27:12
**8** 2සාමු 2:7
**9** 2සාමු 11:2
**10** ගණන් 25:6, 2සාමු 12:12, යෙසා 3:9
**11** ද්වි 22:30, 2සාමු 12:11, 2සාමු 20:3
**12** 2සාමු 15:12, 2සාමු 17:23
**13** 2සාමු 17:14

**2 තීරුව**

**17 පරි.**
**1** හිතෝ 1:16, හිතෝ 4:16
**2** ද්වි 25:18, 2සාමු 16:14
**3** 1රාජා 22:31, ගීතා 37:12, ගීතා 41:9, ගීතා 55:12
**4** මතෙ 15:4, 2තිමෝ 3:3
**5** 2සාමු 15:32, 2සාමු 16:16
**6** 2සාමු 15:34
**7** 1සාමු 16:18, 2සාමු 15:18, 2සාමු 23:8, 2සාමු 23:18, 1ලේක 11:26
**8** විනි 18:25, 2රාජා 2:24, හිතෝ 17:12, හොෂෙ 13:8
**9** 1සාමු 17:50, 1සාමු 18:7, 1සාමු 19:8, 2සාමු 10:18
**10** 1සාමු 22:1, 1සාමු 23:19

පැතිරෙයි. 10 එතකොට ඔබේ සෙ-
නඟ අතරේ සිංහයන් වගේ[1] එඩිතරව
ඉන්න අයත් අධෛර්යයට පත් වෙයි.[2]
මුළු ඊශ්‍රායෙල් සෙනඟම දන්නවා
ඔබේ පියා කොච්චර දක්ෂ සටන්කරු-
වෙක්ද[3] කියලා. ඔහු සමඟ සටනට
දක්ෂ, එඩිතර මිනිසුන් ඉන්නවා.[4]
11 ආන් ඉඳන් බෙයර්-ෂෙබා දක්වා[5]
මුහුදු වෙරළේ වැලි වගේ[6] ඉන්න මුළු
මහත් ඊශ්‍රායෙල් සෙනඟව ඔබ ළඟට
රැස් කරගන්න. ඊටපස්සේ ඒ සෙනඟ
සමඟ ඔබ සටනට යන්න.[7] 12 අපි
ඔහු හැංගිලා ඉන්න තැන හොයාගෙන
යමු.[8] ඊටපස්සේ පොළොවට පිනි[9]
වැටෙනවා වගේ අපි හැමෝම හෙමින්
සැරේ ගිහින් ඔහුට පහර දෙමු. ඔවුන්-
ගෙන් එක් කෙනෙක්වත් ඉතුරු නො-
කර පහර දෙමු. 13 ඔහු නුවරක
හැංගිලා හිටියොත් අපි මුළු ඊශ්‍රායෙල්
සෙනඟ සමඟ එතැනට ගිහින් ගල්
කැටයක්වත් ඉතුරු නොවෙන්න[10] ඒ
නුවර විනාශ කරලා දාමු. නුවරේ හැම
දෙයක්ම කඹවලින් ඇදලා ගඟට වීසි
කරමු.”

14 එය අසා අබ්සලොම්ද සියලු
ඊශ්‍රායෙල් පුරුෂයෝද මෙසේ
කීවෝය. “අහිතොෆෙල්ගේ උපදෙස්-
වලට වඩා අර්කීවරයෙක් වන හූෂයි
දුන් උපදෙස් හොඳයි.”[11] අහිතො-
ෆෙල්ගේ උපදෙස් නැණවත් වුවත්[12]
එය අසාර්ථක වන බවට[13] යෙහෝවා
දෙවි කලින්ම නියම කර තිබිණ.[14]
යෙහෝවා දෙවි එසේ කළේ අබ්ස-
ලොම්ව විපතට පමුණුවන පිණිසය.[15]

15 පසුව හූෂයි, පූජකයන් වන
සාදොක්ට[16] හා අබියාතර්ට මෙසේ
කීවේය. “අහිතොෆෙල්, අබ්සලොම්ට
හා ඊශ්‍රායෙල්හි වැඩිමහල්ලන්ට මේ
විදිහට තමයි උපදෙස් දුන්නේ. නමුත්
මම අබ්සලොම්ට මේ විදිහට උපදෙස්
දුන්නා. 16 දැන් ඉක්මනට දාවිත්
රජුට මෙහෙම දන්වලා යවන්න.[17] ‘අද
රෑ පාළුකරයේ රැඳිලා ඉන්නේ නැතුව
ගඟෙන් එගොඩ වෙලා යන්න.[18] නැත්-
නම් මේ අය ඇවිත් ඔබවත් ඔබ සමඟ
ඉන්න සියලුදෙනාවත් මරලා දායි.’ ”[19]

17 යොනාතාන්ට[1] හා අහිම-
යාෂ්ට[2] නුවරට ඇතුල් වීමට නො-
හැකි වූ නිසා ඔවුහු ඒන්-රොගෙල්[3]
අසලට වී පණිවිඩයක් ලැබෙන තෙක්
බලා සිටියෝය. එවිට මෙහෙකා-
රියක් ඔවුන් සිටි තැනට පැමිණ
ඔවුන්ට සියල්ල දැන්වූවාය. ඉන්පසු
ඒ සියල්ල දාවිත් රජුට දන්වන පිණිස
ඔවුහු පිටත්ව ගියෝය. 18 නමුත්
තරුණයෙක් ඔවුන් දෙදෙනාව දැක ඒ
ගැන අබ්සලොම්ට කීවේය. එබැවින්
ඔවුහු ඉක්මන් කර බහුරීම් නම්
ගම්මානයේ[4] ජීවත් වූ මිනිසෙකුගේ
නිවසට ආවෝය. ඔහුගේ ගෙයි මිදු-
ලේ ළිඳක් තිබුණේය. ඔවුහු ළිඳට
බැස සැඟවුණෝය. 19 ඒ මිනිසා-
ගේ භාර්යාව ළිං කට වසා ඊට උඩින්
කෙටූ ධාන්‍ය ඇතුරුවාය.[5] ඔවුන් ළිඳ
ඇතුළේ සැඟවී සිටින බව කිසිවෙක්
දැන සිටියේ නැත. 20 පසුව අබ්-
සලොම්ගේ සේවකයෝ ඒ නිවසට
පැමිණ ස්ත්‍රියගෙන් මෙසේ ඇසුවෝය.
“අහිමයාෂ් හා යොනාතාන් කො-
හේද?” එවිට ඇය, “ඔවුන් මෙහේ
ඉඳන් ගඟ පැත්තට ගියා”[6] කියා
කීවාය. අබ්සලොම්ගේ සේවකයන්
ඔවුන්ව සෙවූ නමුත් ඔවුන්ව සම්බ
වූයේ නැත.[7] එබැවින් ඔවුහු හැරී
නැවත යෙරුසලමට ගියෝය.

21 පසුව යොනාතාන් හා අහිම-
යාෂ් ළිඳෙන් පිටතට පැමිණ දාවිත්
සිටින තැනට ගොස් ඔහුට සියල්ල
දන්වා මෙසේ කීවෝය. “අහිතොෆෙල්
ඒ විදිහට උපදෙස් දීලා තියෙන නිසා[8]
ඔබ ඉක්මන් කරලා ගඟෙන් එගොඩ
වෙලා යන්න.” 22 එබැවින් දාවිත්
රජ හා ඔහු සමඟ සිටි සෙනඟ විගස
යොර්දාන් ගඟෙන් එගොඩ වීමට
පටන්ගත්තෝය.[9] උදැසන වන විට
ඔවුහු සියලුදෙනාම ගඟෙන් එගොඩ වී
සිටියෝය.

23 තමා දුන් උපදෙස් පිළි නො-
ගත්[10] බව දුටු අහිතොෆෙල් බූරුවෙ-
කුව ගමනට සූදානම් කරගෙන තම
නුවර[11] බලා පිටත් විය. ඔහු තම
නිවසට පැමිණි පසු පවුලේ කාරණා

**17 පරි.**

1 උත් 49:9
ගණන් 24:9
2සාමු 1:23
යෙසා 31:4
2 ද්වි 1:28
යොෂු 2:9
යොෂු 7:5
1සාමු 17:11
3 1සාමු 18:5
හෙබ්‍රෙ 11:34
4 2සාමු 17:8
5 විනි 20:1
6 උත් 32:12
1රාජා 4:20
7 ගීතා 7:15
ගීතා 9:16
8 1සාමු 23:23
2සාමු 17:9
9 ගීතා 110:3
10 මතෙ 24:2
11 හිතෝ 21:1
12 2සාමු 16:23
13 2සාමු 15:31
2සාමු 15:34
යෝබ් 5:12
හිතෝ 19:21
හිතෝ 21:30
යෙසා 8:10
1කොරි 3:19
14 ද්වි 2:30
2ලේක 25:20
ගීතා 91:11
15 1සාමු 2:6
යෝබ් 34:11
යෙසා 46:10
16 2සාමු 8:17
2සාමු 15:35
1ලේක 12:28
17 2සාමු 15:28
18 2සාමු 15:14
19 2සාමු 20:19
ගීතා 35:25

**2 තීරුව**

1 2සාමු 15:27
1රාජා 1:42
2 2සාමු 15:36
2සාමු 18:19
3 යොෂු 15:7
යොෂු 18:16
1රාජා 1:9
4 2සාමු 3:16
2සාමු 16:5
2සාමු 19:16
5 යොෂු 2:6
6 නික් 1:19
යොෂු 2:5
1සාමු 19:14
1සාමු 21:2
මතෙ 10:16
7 යොෂු 2:22
8 2සාමු 17:2
9 හිතෝ 27:12
10 හිතෝ 16:18
11 යොෂු 15:51
2සාමු 15:12

සැලසුම් කළේය.[1] ඉන්පසු ඔහු එල්ලී[2]
මැරුණේය.[3] ඔහුගේ මුතුන්මිත්තන්-
ගේ සොහොන් ගෙයි ඔහුව තැන්පත්
කරනු ලැබීය.[4]
**24** පසුව දාවිත් රජ මහ-
නායිම්[5] වෙත පැමිණියේය. අබ්ස-
ලොම්ද සියලු ඊශ්‍රායෙල් පුරුෂයෝද
යොර්දාන් ගඟෙන් එගොඩ වූවෝය.
**25** අබ්සලොම්, යෝවාබ්[6] වෙනුවට
හමුදාපති ලෙස පත් කළේ අමාසා-
වය.[7] අමාසාගේ පියා ඊශ්‍රායෙල් ජාති-
කයෙකු වූ ඉත්රාය.[8] අමාසාගේ මව
නාහාෂ්ගේ දියණිය වන අබිගායිල්ය.[9]
ඇයට ෂෙරුයියා නම් වූ සහෝදරි-
යක් සිටියාය. ෂෙරුයියා යෝවාබ්-
ගේ මවය. **26** අබ්සලොම් ඊශ්‍රායෙල්
සෙනඟ සමඟ ගිලියද්හි[10] කඳවුරු
බැඳගත්තේය.
**27** දාවිත් රජ මහනායිම් නුව-
රට පැමිණි විට අම්මොන්ව-
රුන්ගේ[11] නුවරක් වූ රබ්බා[12]
සිට පැමිණි නාහාෂ්ගේ පුත්‍රයා වන
ෂෝබිද ලො-දේබාර්හි අම්යෙල්ගේ
පුත්‍රයා[13] වන මාකීර්ද[14] රොගේලිම්
නුවරේ[15] ගිලියද්වරයෙකු වන බාසිල්-
ලයිද[16] ඔහුව හමු වීමට ආවෝය.
**28** ඔවුහු ඇඳන්ද බේසම්ද මැටි භාජ-
නද රැගෙන ආවෝය. ඔවුහු
තිරිඟු, බාර්ලි, පිටි,[17] බැදපු ධාන්‍ය,[18]
වියළි ධාන්‍ය, බෝංචි,[19] පරිප්පු,[20]
**29** මීපැණි,[21] වෙඬරු,*[22] මුදවපු කිරි
හා බැටළු මස්ද රැගෙන ආවෝය.[23]
ඔවුහුද, “පාළුකරයේ ඉන්න නිසා සෙ-
නඟට හුඟක් මහන්සි ඇති. ඔවුන්ට
බඩගිනි ඇති. තිබහත් ඇති” යයි
කියමින් ඒවා දාවිත් රජුට හා ඔහු
සමඟ සිටි සෙනඟට දුන්නෝය.[24]

**18** දාවිත් තමා සමඟ සිටි සෙ-
නඟව ගණන් කර දහස-
කින් යුත් කණ්ඩායම් හා සියයකින්
යුත් කණ්ඩායම් කෙරෙහි අධිප-
තීන් පත් කළේය.[25] **2** ඔහු සටනට
යවන සෙනඟගෙන් තුනෙන් එකක්[26]
යෝවාබ් යටතේද[27] තුනෙන් එකක්
ෂෙරුයියාගේ පුත්‍රයාද යෝවාබ්ගේ
සහෝදරයාද[1] වන අබිෂයි යටතේද[2]
අනික් තුනෙන් එක ගාත්හි වැසියෙකු
වන ඉත්තයි යටතේද[3] තැබුවේය.
ඉන්පසු රජ, “මමත් ඔබ සමඟ සට-
නට යන්න එනවා” කියා සෙනඟට
කීවේය. **3** නමුත් සෙනඟ ඔහුට
මෙසේ කීවේය. “ඔබ අප සමඟ එන්න
එපා.[4] මිනිස්සු දසදහසකට වඩා
ඔබව වටිනවා.[5] අපි පලා ගියත් සතු-
රන්ට එයින් වැඩක් නැහැ.[6] අපෙන්
භාගයක්ම මැරුණත් ඔවුන්ට කිසි
ප්‍රයෝජනයක් නැහැ. ඒ නිසා ඔබ
නුවරේම රැඳිලා ඉන්න. එතැන ඉඳන්
අපට මඟ පෙන්වන්න.”[7] **4** එබැවින්
රජ ඔවුන්ට මෙසේ කීවේය. “ඔබට
හොඳයි කියලා හිතෙන දෙයක් මම
කරන්නම්.”[8] රජු නුවර දොරටුව ළඟ[9]
බලා සිටියදී සෙනඟ සියය සියය
බැගින්ද දහස දහස බැගින්ද[10] පිටත්ව
ගියෝය. **5** රජ යෝවාබ්ටද අබිෂ-
යිටද ඉත්තයිටද මෙසේ අණ කළේය.
“අබ්සලොම්ට නපුරු විදිහට සල-
කන්න එපා.[11] ඔහු මගේ පුතා.” රජු
හමුදාපතීන්ට එසේ අණ කළ විට මුළු
සෙනඟ අසාගෙන සිටියෝය.
**6** සෙනඟ ඊශ්‍රායෙල්වරුන් සමඟ
සටන් කරන පිණිස පිටත්ව ගියෝය.
ඔවුන් සටන් කළේ එෆ්‍රායිම්හි වනාන්-
තරයකය.[12] **7** අන්තිමේදී දාවිත්ගේ
සේවකයෝ ඊශ්‍රායෙල් සෙනඟ[13] පරා-
ජයට පත් කළෝය.[14] එදින මහත්
සෙනඟක් මැරුම් කෑවෝය. මැරුම්
කෑ මිනිසුන් ගණන විසිදහසක් විය.
**8** බලන බලන සෑම තැනම සෙනඟ
එකිනෙකා සමඟ සටන් කරමින් සිටි-
යෝය. තවද එදින කඩුවෙන් මැරුම්
කෑ ප්‍රමාණයට වඩා විශාල පිරි-
සක් වනාන්තරයේ උපද්‍රව නිසා මිය
ගියෝය.
**9** සෙනඟ එසේ සටන් කරමින්
සිටියදී අබ්සලොම් කොටළුවෙකු පිට
නැඟ යනවා දාවිත්ගේ සේවකයෝ
දුටුවෝය. කොටළුවා විශාල ගසක්

**17 පරි.**
1 2රාජා 20:1
2 නික් 20:13
1සාමු 31:4
1රාජා 16:18
මතෙ 27:5
ක්‍රියා 1:18
3 ගීතා 5:10
ගීතා 55:23
4 දේශ 8:10
5 උත් 32:2
යොෂු 13:26
2සාමු 2:8
6 2සාමු 8:16
7 2සාමු 19:13
2සාමු 20:4
2සාමු 20:10
8 1ලේක 2:17
9 1ලේක 2:16
10 ගණන් 32:1
ද්වි 3:15
11 2සාමු 12:26
12 ද්වි 3:11
යොෂු 13:25
2සාමු 12:29
13 2සාමු 9:5
14 2සාමු 9:4
15 2සාමු 19:31
16 2සාමු 19:32
1රාජා 2:7
17 උත් 18:6
1සාමු 28:24
18 1සාමු 25:18
19 එස 4:9
20 උත් 25:34
2සාමු 23:11
21 නික් 3:8
22 උත් 18:8
හිතෝ 30:33
23 හිතෝ 11:25
ක්‍රියා 28:2
24 2සාමු 16:2

**18 පරි.**
25 1සාමු 8:12
1ලේක 13:1
1කොරි 14:40
26 විනි 7:16
හිතෝ 20:18
27 2සාමු 8:16
2සාමු 10:7

**2 තීරුව**
1 1ලේක 2:16
2 2සාමු 23:18
3 2සාමු 15:19
2සාමු 15:21
4 2සාමු 21:17
5 2සාමු 17:3
විලා 4:20
6 2සාමු 17:2
1රාජා 22:31
7 නික් 17:10
8 රූත් 3:5
යාකො 3:17
9 2සාමු 18:24
10 1සාමු 29:2
11 2සාමු 18:12
12 2සාමු 17:26
13 2සාමු 16:15

**2සාමු 17:29*** එනම්, බටර්වලට සමාන කෑමකි.

14 2සාමු 2:17; 2ලේක 13:16; 2ලේක 28:6; ගීතා 3:7; හිතෝ 24:22.

යටින් දුවද්දී අබ්සලොම්ගේ හිස එහි
අතු අතරේ හිර විය. කොටළුවා නතර
නොවී දිගටම ගමන් කළ නිසා ඔහු
එම ගසේ පැටලී එල්ලී සිටියේය.
**10** එක්තරා මිනිසෙක් ඔහුව දැක,
“අබ්සලොම් ලොකු ගහක අතු අතරේ
හිර වෙලා ඉන්නවා” කියා යෝවාබ්ට[1]
කීවේය. **11** එවිට යෝවාබ් ඔහුට
මෙසේ කීවේය. “ඔබ ඔහුව මරලා දැම්-
මේ නැත්තේ ඇයි? ඔබ එහෙම කළා
නම් මම ඔබට රිදී ෂෙකෙල් දහයකුත්
ඉණට බඳින පටියකුත් දෙනවා.”[2]
**12** නමුත් ඔහු යෝවාබ්ට මෙසේ
කීවේය. “ ‘අබ්සලොම්ට කිසිම අනතු-
රක් කරන්න එපා’ කියලා රජු ඔබටයි
අබිෂයිටයි ඉත්තයිටයි කියද්දී අපිත්
එතැන හිටියා.[3] ඒ නිසා රිදී ෂෙකෙල්
දහසක් මගේ අතට දුන්නත් මම රජු-
ගේ පුත්‍රයාට විරුද්ධව අත ඔසවන්නේ
නැහැ. **13** අනික රජු පැවසූ දේ
ගණන් ගන්නේ නැතුව මම අබ්ස-
ලොම්ව මරලා දැම්මා නම් ඒක මම
රජුට කරන ද්‍රෝහිකමක්. ඒ ගැන
රජුත් අනිවාර්යයෙන්ම දැනගනියි.[4]
එතකොට රජුගේ අතින් මාව බේර-
ගන්න ඔබ එන්නේ නැහැ කියලා මම
දන්නවා.” **14** එවිට යෝවාබ්, “මට
ඔබත් එක්ක මෙතැනට වෙලා කාලේ
නාස්ති කර කර ඉන්න බැහැ” කියමින්
විශාල ගහේ අතු අතරේ එල්ලී සිටි
අබ්සලොම් ළඟට ගියේය. ඒ වන විට
අබ්සලොම් මිය ගොස් සිටියේ නැත.[5]
යෝවාබ් ඊගස් තුනක් රැගෙන ඔහුගේ
පපුවට ඇන්නේය.[6] **15** යෝවාබ්ගේ
ආයුධ රැගෙන ගිය සේවකයෝ දසදෙ-
නෙක්ද එතැනට පැමිණ අබ්සලොම්ව
මරා දැමුවෝය.[7] **16** ඉන්පසු යෝ-
වාබ් සටන නතර කරන පිණිස
හොරණෑව පිම්බේය.[8] එවිට සෙ-
නඟ ඊශ්‍රායෙල්වරුන්ව ලුහුබැඳීම අත්-
හැරියෝය. **17** ඔවුහු අබ්සලොම්ගේ
මළ කඳ වනාන්තරයේ තිබූ විශාල
වළක දමා ඊට උඩින් ලොකු ගල් ගො-
ඩක් ගැසුවෝය.[9] පසුව ඊශ්‍රායෙල්වරු
සියලුදෙනාම තම තමන්ගේ නිවෙස්-
වලට පලා ගියෝය.

**18** අබ්සලොම් ජීවත්ව සිටියදී,
“මගේ නම ගෙන යන්න මට පුතෙක්
නැහැ”[1] කියමින් තමාගේ නමින්[2]
ස්මාරකයක් තැනුවේය.[3] ඔහු එය
තැනුවේ රජුගේ තැනිතලාවේය.[4] එය
අද දක්වාම හඳුන්වනු ලබන්නේ අබ්-
සලොම්ගේ ස්මාරකය ලෙසය.
**19** සාදොක්ගේ පුත්‍රයා වන අහිම-
යාෂ්,[5] “අද යෙහෝවා දෙවි සතුරන්-
ගේ අතින් රජුව බේරාගත්තා![6] මම
දුවලා ගිහින් රජුට ඒ ගැන කියන්-
නද” කියා යෝවාබ්ගෙන් ඇසුවේය.
**20** නමුත් යෝවාබ් ඔහුට මෙසේ
කීවේය. “ඔබට පුළුවන් වෙන දවසක
ආරංචියක් රැගෙන යන්න. අද රජුගේ
පුතා මැරුණ නිසා[7] ඔබ ඒ ආරං-
චිය රැගෙන යන්න එපා. ඒ ආරං-
චිය වෙන කෙනෙක් අතේ යවමු.”
**21** ඉන්පසු යෝවාබ් එතැන සිටි කූෂ්
ජාතිකයෙකුට[8] මෙසේ කීවේය. “දැන්
රජු ළඟට ගිහින් ඔබ දැක්ක දේ
ඔහුට කියන්න.” ඒ මිනිසා යෝ-
වාබ්ට ආචාර කළ පසු ආරංචිය
රජුට රැගෙන යන පිණිස එතැනින්
දිව ගියේය. **22** නමුත් සාදොක්ගේ
පුත්‍රයා වන අහිමයාෂ් යෝවාබ්ට
නැවතත් මෙසේ කීවේය. “කූෂ් ජාති-
කයා ගියාට කමක් නැහැ. මටත් ඔහු
පිටුපසින් දුවන්න අවසර දෙන්න.”
එහෙත් යෝවාබ්, “ඔබ ගිහින් වැඩක්
තියෙනවාද මගේ පුතේ? ඔබට ගිහින්
කියන්න දෙයක් නැහැ” කියා ඔහුට
කීවේය. **23** එහෙත් ඔහු, “ඒකට
කමක් නැහැ. මටත් යන්න දෙන්න”
කියා කීවේය. එබැවින් යෝ-
වාබ්, “එහෙමනම් යන්න” කියා ඔහුට
කීවේය. අහිමයාෂ් නිම්නය හරහා
වැටී ඇති මාර්ගය[9] දිගේ දිව ගියේය.
ඔහු කූෂ් ජාතිකයාව පසු කර ගියේය.
**24** නුවර දොරටු දෙක අතරේ
දාවිත් රජ හිඳගෙන සිටියේය.[10] ඒ
අතරතුර මුරකාරයා[11] පවුරට නැඟ
දොරටුවේ පියස්සට ගොස් බැලුවේය.
එවිට මිනිසෙකු තනිවම දුවගෙන
එනවා ඔහු දුටුවේය. **25** ඔහු රජුට
ඒ ගැන දැන්වූ විට රජ ඔහුට මෙසේ

**18 පරි.**
1 2සාමු 8:16; 2සාමු 18:2
2 1සාමු 17:25; 1ලේක 11:6
3 2සාමු 18:5
4 හිතෝ 16:14; හිතෝ 24:21
5 2සාමු 18:9
6 විනි 4:21; විනි 5:31; ගීතා 45:5
7 ද්වි 27:16; ද්වි 27:20; 2සාමු 12:10; ගීතා 63:9; හිතෝ 2:22; හිතෝ 20:20; හිතෝ 30:17
8 2සාමු 2:28
9 යොෂු 7:26; යොෂු 8:29; යොෂු 10:27

**2 තීරුව**
1 ගණන් 27:4; 2සාමු 14:27
2 ගීතා 49:11
3 1සාමු 15:12
4 උත් 14:17
5 2සාමු 15:36; 2සාමු 17:17
6 2සාමු 15:25; ගීතා 9:4
7 2සාමු 18:5
8 උත් 10:6; ගණන් 12:1; 2ලේක 14:9
9 1රාජා 7:46; 2ලේක 4:17
10 2සාමු 18:4
11 2සාමු 13:34; 2රාජා 9:17; යෙසා 21:6

කීවේය. “ඔහු තනියම එනවා නම්
ඔහුට කියන්න ආරංචියක් ඇති.” ඒ
මිනිසා ටිකෙන් ටික නුවරට ළඟා
විය. **26** ඉන්පසු මුරකරුවා තව
මිනිසෙකු දුවගෙන එනවා දැක,
“අර බලන්න, තවත් කෙනෙක් මේ
පැත්තට දුවගෙන එනවා! ඔහුත් එන්-
නේ තනියෙන්” කියා දොරටු පාලක-
යාට පැවසුවේය. එවිට රජ, “ඔහුත්
එනවා ඇත්තේ ආරංචියක් අරගෙන”
කියා කීවේය. **27** මුරකාරයා තවදු-
රටත් මෙසේ කීවේය. “පළමුවෙනි
මිනිසා සාදොක්ගේ පුතා වන අහිම-
යාෂ්[1] වෙන්න ඇති. ඔහු දුවගෙන එන
විදිහෙන්[2] ඒ බව කියන්න පුළුවන්.”
රජද, “ඔහු හොඳ කෙනෙක්.[3] ඔහු අරං
එන්නේ හොඳ ආරංචියක් වෙන්න
ඇති”[4] කියා කීවේය. **28** ටික වේ-
ලාවකට පසු අහිමයාෂ්, රජු දෙ-
සට දුවගෙන ඇවිත්, “හැම දෙයක්ම
හොඳට සිද්ධ වුණා” යයි කියමින් හිස
නමා රජුට ආචාර කළේය. ඔහු මෙ-
සේද කීවේය. “ඔබේ දෙවි වන යෙ-
හෝවාට ප්‍රශංසා වේවා![5] ඔහු මගේ
ස්වාමීන් වන රජ්ජුරුවන්ට විරුද්ධව
නැඟී සිටි මිනිසුන්ව අපේ අතටම අල්-
ලලා දුන්නා.”[6]
**29** නමුත් රජ, “අබ්සලොම්
හොඳින් ඉන්නවාද” කියා ඔහු-
ගෙන් ඇසුවේය. එවිට අහිමයාෂ්
මෙසේ පිළිතුරු දුන්නේය. “යෝවාබ්
ඔබේ සේවකයාවයි මාවයි පිටත් කර
එවූ වෙලාවේදී ලොකු කෝලාහලයක්
තිබුණා. නමුත් ඒ මොකක් ගැනද
කියලා නම් මම දන්නේ නැහැ.”[7]
**30** ඉන්පසු රජ, “ඔබ දැන් මෙතැනට
වෙලා ඉන්න” කියා ඔහුට කීවේය.
ඔහුද පැත්තකට වී බලා සිටියේය.
**31** පසුව කූෂ් ජාතිකයාද[8] රජු
ළඟට පැමිණ මෙසේ කීවේය. “මගේ
ස්වාමීන් වන රජ්ජුරුවනි, ඔබට
කියන්න ආරංචියක් තියෙනවා. අද
ඔබට විරුද්ධව නැඟී සිටි ඔබේ සතු-
රන්ගේ අතින් යෙහෝවා දෙවි ඔබව
බේරාගත්තා!”[9] **32** එවිට රජ, “අබ්-
සලොම් හොඳින් ඉන්නවාද” කියා
කූෂ් ජාතිකයාගෙන් ඇසුවේය. එවිට
කූෂ් ජාතිකයා ඔහුට මෙසේ කීවේය.
“මගේ ස්වාමීන් වන රජ්ජුරුවනි,
ඔහුට සිදු වූ දේම ඔබේ සතුරන්ට හා
ඔබට විරුද්ධව නැඟී සිටි සැම කෙ-
නෙකුටම සිදු වේවා!”[1]
**33** එය අසා රජ කැලඹුණේය.
ඔහු දොරටුවට ඉහළින් තිබූ කාමර-
යට[2] ගොස් එහෙට මෙහෙට ඇවිදි-
මින්, “අනේ අබ්සලොම්, අනේ මගේ
පුතේ අබ්සලොම්.[3] ඔබ වෙනුවට මම
මැරුණා නම් හොඳයි. අනේ මගේ
පුතේ අබ්සලොම්”[4] කියමින් හඬා
වැලපුණේය.

**19** පසුව යෝවාබ්ට මෙසේ
ආරංචි විය. “රජ තවමත්
අබ්සලොම් ගැන හඬා වැලපෙනවා.”[5]
**2** සෙනඟටද මෙසේ දන්වන ලදි.
“රජ ඔහුගේ පුත්‍රයාගේ මරණය ගැන
බොහෝ සෙයින් දුක් වෙනවා.” එබැ-
වින් එදින ඔවුන්ට ජයග්‍රහණය අත් වී
තිබුණද මුළු සෙනඟ ඉතා ශෝක-
යෙන් සිටියෝය. **3** යුධ පිටියෙන්
පලා යැමට සිදු වීම නිසා ලැජ්ජා-
වට පත් වූ සෙනඟක් මෙන් ඔවුහු
හොර රහසින්ම නුවරට ඇතුල් වූහ.[6]
**4** රජද තම මුහුණ වසාගෙන, “අනේ
මගේ පුතා අබ්සලොම්, අනේ මගේ
පුතා” යයි කියමින් මහත් හඬින් හඬා
වැලපුණේය.[7]
**5** අන්තිමේදී යෝවාබ්, රජු ළඟට
පැමිණ ඔහුට මෙසේ කීවේය. “ඔබේ
ජීවිතෙත්[8] ඔබේ දූපුතුන්ගේ ජීවි-
තත්[9] ඔබේ භාර්යාවන්ගේ[10] හා උප-
භාර්යාවන්ගේ ජීවිතත්[11] බේරාගත්
ඔබේ සේවකයන්ව අද ඔබ ලැජ්ජා-
වට පත් කළා. **6** ඔබේ නිලධාරීන්-
ගෙන්වත් ඔබේ සේවකයන්ගෙන්වත්
ඔබට කිසි වැඩක් නැහැයි කියලා ඔබ
අද පෙන්වුවා. ඔබට ප්‍රේම කරන
අයට ඔබ වෛර කරනවා. ඔබට
වෛර කරන අයට ඔබ ප්‍රේම කර-
නවා. අපි හැමෝම මැරිලා අබ්ස-
ලොම් විතරක් ඉතුරු වුණා නම් අද
ඔබ සතුටින් ඉඳියි කියලා දැන් මම
දන්නවා. **7** ඒ නිසා දැන් මෙතැ-

**18 පරි.**
1 2සාමු 18:19
2 2රාජා 9:20
3 හිතෝ 25:13
4 1රාජා 1:42; හිතෝ 25:25
5 උත් 14:20; 2සාමු 22:47; ගීතා 124:6; ගීතා 144:1
6 1සාමු 26:8; ගීතා 31:8
7 2සාමු 18:19
8 2සාමු 18:21
9 2සාමු 22:49; ගීතා 55:18; ගීතා 94:1; ගීතා 124:2

**2 තීරුව**
1 විනි 5:31; ගීතා 27:2; ගීතා 68:1
2 2සාමු 18:24
3 2සාමු 19:1
4 2සාමු 12:10; 2සාමු 17:14; හිතෝ 10:1; හිතෝ 19:13

**19 පරි.**
5 2සාමු 18:5; 2සාමු 18:14
6 2සාමු 17:24; 2සාමු 19:32
7 2සාමු 18:33
8 ගීතා 18:48
9 2සාමු 3:3; 2සාමු 5:14; 2සාමු 13:1
10 2සාමු 5:13
11 2සාමු 15:16

නින් නැඟිටලා ඔබේ සේවකයන් ඉදි-
රියට ගිහින් ඔවුන්ගේ හිත සැනසෙන
විදිහට කතා කරන්න.[1] මම යෙ-
හෝවා දෙවි ඉදිරියේ දිවුරලා කියන්-
නේ, ඔබ ඔවුන් සමඟ කතා කළේ
නැත්නම් අද රෑ වෙද්දී ඔබේ එක
සේවකයෙකුවත් මෙහෙ රැඳී ඉන්න
එකක් නැහැ.[2] ඔවුන් හැමෝම ඔබව
අත්හැරලා යයි. ඔබේ තරුණ වයසේ
ඉඳන් මේ වෙනකම් ඔබට සිදු වුණ
හැම විපතකටම වඩා එය දරුණු
වෙයි.” **8** එය අසා රජ නුවර දො-
රටුව ළඟට ගොස් හිඳගත්තේය.[3]
පසුව, “රජු නුවර දොරටුව අසල ඉන්-
නවා” කියා සෙනඟට දන්වන ලදි.
එය අසා සෙනඟ රජු වෙතට එන්න
පටන්ගත්තෝය.

ඊශ්‍රායෙල්වරු* තම තමන්ගේ
නිවෙස්වලට පලා ගොස් සිටියෝය.[4]
**9** පසුව ඊශ්‍රායෙල්හි සියලු ගෝත්‍ර
අතරේ විවාදයක් හටගත්තේය. ඔවුහු
එකිනෙකා අතරේ මෙසේ කතා වූහ.
“රජ්ජුරුවෝ තමයි අපේ සතුරන්ගේ
අතින් අපිව බේරගත්තේ.[5] පිලිස්-
තිවරුන්ගේ අතිනුත් අපිව බේර-
ගත්තා. නමුත් අබ්සලෝම් නිසා
ඔහු දේශයෙන් පලා ගියා.[6] **10** අපි
රජ හැටියට අභිෂේක කළ අබ්ස-
ලෝම්[7] යුද්ධයේදී මැරුණා.[8] රජ්ජුරු-
වන්ව ආපහු මෙහෙට කැඳවාගෙන
එන්නේ නැත්තේ ඇයි?”[9]

**11** දාවිත් රජ පූජකයන් වන
සාදොක්ට[10] සහ අබියාතර්ට[11] මෙසේ
දැන්වූවේය. “යූදා ගෝත්‍රයේ වැඩිම-
හල්ලන්ට[12] මෙහෙම කියන්න. ‘ඊශ්‍රා-
යෙල් සෙනඟ එකිනෙකා අතරේ කතා
වන දේ රජුට දැනගන්න ලැබුණා.
නමුත් රජුගේම ගෝත්‍රයේ අය ඔහුව
මාලිගාවට ගෙන්වාගැනීමට කිසි-
වක් නොකරන්නේ ඇයි? **12** මාගේ
සහෝදරයෙනි, ඔබ මගේම පවුලේ
අය.*[13] ඇයි ඔබ මාව ආපහු ගෙන්-
වාගන්න කිසිවක් නොකරන්නේ?’

**2සාමු 19:8*** එනම්, අබ්සලෝම්ට උපකාර කළ සෙනඟ. **12*** මූ.අ., “අපි ඔබේම මාංසය, ඔබේම ඇටකටු.”

**19 පරි.**
1 යෙසා 40:2
2 හිතෝ 14:28
3 2සාමු 18:4, 2සාමු 18:24, 1රාජා 22:10, යෙරෙ 38:7
4 2සාමු 18:17, 1රාජා 22:36
5 1සාමු 17:50, 1සාමු 18:7, 1සාමු 19:5, 2සාමු 5:25, 2සාමු 8:5
6 2සාමු 15:14
7 2සාමු 15:10, 2සාමු 15:12
8 2සාමු 18:14
9 2සාමු 3:17
10 2සාමු 8:17, 2සාමු 15:25, 1රාජා 1:8
11 1සාමු 22:20, 1සාමු 30:7, 2සාමු 15:24, 1ලේක 15:11
12 2සාමු 2:4
13 විනි 9:2, 2සාමු 5:1

**2 තීරුව**
1 2සාමු 17:25, 1ලේක 2:17
2 2සාමු 8:16, 2සාමු 18:5, 2සාමු 18:14
3 රූත් 1:17, 1සාමු 3:17
4 විනි 20:1
5 යොෂු 5:9, 1සාමු 11:14
6 2සාමු 3:16, 2සාමු 17:18
7 1රාජා 2:8
8 2සාමු 16:5, 1රාජා 2:36, 1රාජා 2:44
9 2සාමු 9:2, 2සාමු 16:1
10 2සාමු 9:10
11 2සාමු 15:28
12 ගීතා 66:3, ගීතා 81:15, දේශ 10:4
13 1සාමු 26:21, 2සාමු 16:5

**13** ඔබ අමාසාට මෙහෙම කියන්න.[1]
‘ඔබ මගේම සහෝදරයෙක්.* ඒ නිසා
මම යෝවාබ් වෙනුවට ඔබව[2] හමුදා-
පති හැටියට පත් කරනවා. මම
එහෙම කළේ නැත්නම් දෙවි මට දැඩි
ලෙස දඬුවම් කළ යුතුයි.’ ”[3]

**14** එසේ පවසමින් ඔහු යූදාහි
සියලු පුරුෂයන්ගේ සිත් දිනාගත්-
තේය. එබැවින් ඔවුහු එකා මෙන්[4]
රජුට මෙසේ දන්වාහැරියෝය. “රජ්-
ජුරුවනි, ඔබේ සේවකයන් සමඟ
ආපහු මෙහෙට එන්න.”

**15** එබැවින් රජ නැවත ආවේය.
ඔහු යොර්දාන් ගඟ අසලට පැමිණි
නතර විය. රජුව යොර්දාන් ගඟෙන්
මෙගොඩට කැඳවාගෙන එන පිණිස
යූදාහි මනුෂ්‍යයෝ ගිල්ගාල් නුව-
රට[5] ගියෝය. **16** ඒ අවස්ථාවේදී
බෙන්ජමින් ගෝත්‍රයට අයත් බහු-
රීම්හි[6] ජීවත් වූ ගෙරාගේ පුත්‍රයා[7] වන
ශිමෙයි[8] යූදාහි මනුෂ්‍යයන් සමඟ
දාවිත් රජුව හමු වීමට කඩිමුඩියේ
ගියේය. **17** ඔහු සමඟ බෙන්ජමින්
ගෝත්‍රයට අයත් මිනිස්සු දහසක්ද
සිටියෝය. (සාවුල්ගේ නිවසේ සේ-
වය කළ ශීබාද[9] ඔහුගේ පුත්‍රයෝ
පහළොස්දෙනාද[10] ඔහුගේ සේවක-
යෝ විසිදෙනෙක්ද ශිමෙයි සමඟ සිටි-
යෝය. රජු යොර්දාන් ගඟ ළඟට
පැමිණෙන්න කලින් ඔවුහු සියලුදෙ-
නාම එතැනට ආවෝය. **18** රජුව
හා ඔහුගේ ගෙයි වැසියන්ව මෙගො-
ඩට කැඳවාගෙන එන පිණිසත් රජුගේ
කැමැත්ත ඉටු කර දෙන පිණිසත්
ශීබා ගඟෙන් එගොඩට ගියේය.)[11] රජු
ගඟෙන් එගොඩ වීමට යන විට ගෙ-
රාගේ පුත්‍රයා වන ශිමෙයි එතැ-
නට පැමිණ ඔහු ඉදිරියේ වැටී[12]
**19** මෙසේ කීවේය. “අනේ මගේ ස්වා-
මීනි, ඔබ යෙරුසලම අත්හැර ගිය
දවසේදී මම ඔබට කළ වරදට මට
සමාවෙන්න. අනේ, ඒක මතක තියා-
ගන්න එපා.[13] ඒක ඔබේ හිතෙන්

**2සාමු 19:13*** 2සාමු 19:12හි පාදසටහන බලන්න.

අයින් කරන්න.[1] **20** මම කළේ වරදක් කියලා මම දන්නවා. මගේ ස්වාමීන් වන රජ්ජුරුවනි, යෝසෙප්ගේ පෙළපතේ[2] අනික් හැමෝටම ඉස්සෙල්ලා මම ඔබව හමු වෙන්න ආවේ ඒ නිසයි.”

**21** එය ඇසූ විගස ෂෙරුයියාගේ පුත්‍රයා[3] වන අබිෂයි,[4] රජුට මෙසේ කීවේය. “ෂිමෙයි, යෙහෝවා දෙවිගේ අභිෂේක ලත් තැනැත්තාට අපහාස කළ නිසා ඔහුව මරලා දාන්න ඕනේ.”[5] **22** නමුත් දාවිත් රජ මෙසේ කීවේය. “ෂෙරුයියාගේ පුත්‍රයෙනි, ඔබ මගේ කැමැත්තට විරුද්ධව කටයුතු කරන්නේ ඇයි?[6] ඔබ මේ කාරණය ගැන කරදර වෙන්න ඕනේ නැහැ.[7] මේක මගේ ප්‍රශ්නයක්. අද ඊශ්‍රායෙල් කෙරෙහි මගේ රජකම ස්ථිර වුණා. ඒ නිසා අද ඊශ්‍රායෙල් දේශයේ එක මනුෂ්‍යයෙක්වත් මරන්න අවසර නැහැ.”[8] **23** ඉන්පසු රජ, “ඔබව මරන්නේ නැහැ” කියා ෂිමෙයිට පැවසුවේය. රජ එසේ නොකරන බවට ෂිමෙයිට දිවුරුවේය.[9]

**24** සාවුල්ගේ මුනුපුරා වන මෙෆිබොෂෙත්ද[10] රජුව හමු වීමට ආවේය. රජු ගිය දා සිට ආපසු සමාදානයෙන් පැමිණි දවස දක්වාම ඔහු තම පාද සෝදාගෙන තිබුණේවත්[11] රැවුල කපා තිබුණේවත්[12] ඇඳුම් සෝදාගෙන තිබුණේවත් නැත. **25** ඔහු යෙරුසලමේදී රජුව හමු වීමට ගිය විට රජ ඔහුගෙන් මෙසේ ඇසුවේය. “මෙෆිබොෂෙත්, ඇයි ඔබ මා සමඟ ආවේ නැත්තේ?” **26** එවිට ඔහු මෙසේ පැවසුවේය. “මගේ ස්වාමීනි, රජ්ජුරුවනි, ඔබේ සේවකයා වන මට ඇවිදින්න අපහසු නිසා,[13] ‘මම බූරුදෙනක්ව ගමනට සූදානම් කරගෙන උගේ පිටේ නැඟලා රජු සමඟ යනවා’ කියලා මගේ සේවකයාට කිව්වා. හැබැයි ඔහු[14] මාව රැවැට්ටුවා. **27** ඔහු මගේ ස්වාමීන් වන රජ්ජුරුවන්ට මං ගැන බොරු කිව්වා.[15] මගේ ස්වාමීනි, රජ්ජුරුවනි, ඔබ සැබෑ දෙවිගේ දූතයෙක් වගේ.[16] ඒ නිසා ඔබට යහපත් කියලා හිතෙන දෙයක් කරන්න. **28** මගේ පියාගේ මුළු පෙළපතම නැත්තටම නැති කරලා දාන්න මගේ ස්වාමීන් වන රජ්ජුරුවන්ට තිබුණා. නමුත් ඔබ එසේ නොකර ඔබ සමඟ එකට වාඩි වෙලා කෑම කන්න ඔබේ සේවකයාට ඉඩ දුන්නා.[1] ඉතින් තවත් දේවල් ඔබෙන් ඉල්ලන්න මට අයිතියක් තියෙනවාද?”[2]

**29** එහෙත් රජ, “ඔබ මේ ගැන තවත් කතා කරන්නේ ඇයි? ගිහින් ෂිබා සමඟ කෙත බෙදාගන්න”[3] කියා මෙෆිබොෂෙත්ට කීවේය. **30** එවිට මෙෆිබොෂෙත්, “ඔහු මුළු කෙතම ගත්තාවේ.[4] මගේ ස්වාමීන් වන රජ්ජුරුවන් දැන් සමාදානයෙන් මාලිගාවට ආව නිසා ඒ ගැන මම සතුටු වෙනවා. මට ඒ ඇති” කියා දාවිත්ට කීවේය.

**31** ගිලියද්හි ජීවත් වූ බාසිල්ලයි,[5] රොගේලීම් සිට පැමිණ රජුව යොර්දාන් ගඟ ළඟට කැඳවාගෙන ගියේය. **32** බාසිල්ලයි ඉතා මහලු කෙනෙකි. ඔහුට වයස අවුරුදු අසූවක් විය.[6] ඔහු ඉතා ධනවත් පුද්ගලයෙකි.[7] රජු මහනායිම්හි සිටි දවස්වලදී ඔහුට කෑම බීම සැපයුවේ බාසිල්ලයිය.[8] **33** රජද, “ඔබත් මා සමඟ ගඟෙන් එගොඩ වී යෙරුසලමට යන්න එන්න. එහිදී මම ඔබට කන්න බොන්න දී ඔබව රැකබලා ගන්නම්”[9] කියා බාසිල්ලයිට කීවේය. **34** නමුත් බාසිල්ලයි රජුට මෙසේ කීවේය. “මම තව වැඩි කල් ජීවත් වෙන්නේ නැහැ. ඒ නිසා රජ්ජුරුවන් සමඟ යෙරුසලමට ගියාට ප්‍රයෝජනයක් නැහැ. **35** මට දැන් වයස අවුරුදු අසූවක් වෙනවා.[10] ඒ නිසා ඔබේ සේවකයා වන මට දැන් හොඳ නරක තෝරන්න බැහැ. මට කන බොන දේවල රසවත් හරියට දැනෙන්නේ නැහැ.[11] ගායක ගායිකාවන්ගේ[12] ගීත රස විඳින්නත් බැහැ.[13] මම කොහොමද මගේ ස්වාමීන් වන රජ්ජුරුවන්ට බරක් වෙන්නේ?[14] **36** ඔබේ සේවකයා වන මම ඔබ සමඟ ආවේ යොර්දාන් ගඟ ළඟට වෙනකම් විත-

**19 පරි.**

1 2සාමු 13:20; 2සාමු 13:33
2 2සාමු 19:43; 1ලේක 5:2
3 2සාමු 2:18
4 2සාමු 23:18
5 නික් 22:28; 2සාමු 16:7; 1රාජා 21:13; ගීතා 105:15; දේශ 10:20; ක්‍රියා 23:5; 2පේතෘ 2:10
6 1සාමු 29:4; 1රාජා 5:4; මතෙ 16:23; යාකො 1:20
7 2සාමු 3:39; 2සාමු 16:10
8 1සාමු 11:13
9 1රාජා 2:8; 1රාජා 2:37; 1රාජා 2:46; හෙබ්‍රෙ 6:16
10 2සාමු 9:6; 2සාමු 16:4
11 2සාමු 9:3
12 එස්රා 9:3
13 2සාමු 4:4
14 2සාමු 9:9
15 ලෙවී 19:16; 2සාමු 16:3; ගීතා 101:5; හිතෝ 6:19; හිතෝ 21:6
16 1සාමු 29:9; 2සාමු 14:17

**2 තීරුව**

1 2සාමු 9:1; 2සාමු 9:7; 2සාමු 9:10; 2සාමු 9:13
2 2සාමු 9:8
3 2සාමු 16:4; හිතෝ 18:17; හිතෝ 29:4
4 මතෙ 5:40; 1කොරි 6:7
5 2සාමු 17:27; 1රාජා 2:7
6 ගීතා 90:10
7 1සාමු 25:2; යෝබ් 1:3
8 2සාමු 17:28; හිතෝ 3:27; හෙබ්‍රෙ 13:16
9 2සාමු 9:10; හිතෝ 11:25; මතෙ 7:12; ලූක් 6:38
10 ගීතා 90:10
11 දේශ 8:15; දේශ 12:5
12 එස්රා 2:65; නෙහෙ 7:67; දේශ 2:8
13 යෝබ් 12:11; දේශ 12:4
14 2සාමු 13:25; 2සාමු 15:33

රයි. ඒ වගේ පොඩි දෙයකට මේ
තරම් හොඳින් මට සලකන්නේ ඇයි?[1]
**37** ඔබේ සේවකයා වන මට ආපහු
යන්න අවසර දෙන්න. මට ඕනේ
මගේම නුවරේ මැරෙන්නයි.[2] මාව
මගේ පියා හා මව ළඟ තැන්පත් කර-
නවාට මම කැමතියි.[3] හැබැයි ඔබේ
සේවකයා වන කිම්හාම්[4] මෙතැන
ඉන්නවා. මගේ ස්වාමීනි, රජ්ජුරුවනි,
ඔබ කැමති නම් ගඟෙන් එගොඩට
යද්දී ඔහුව රැගෙන යන්න. ඔබට
හොඳයි කියලා හිතෙන දෙයක් ඔහු
වෙනුවෙන් කරන්න.”

**38** එබැවින් රජ ඔහුට මෙසේ
කීවේය. “ගඟෙන් එගොඩට යද්දී මම
කිම්හාම්වත් එක්කගෙන යන්නම්. ඔබ
කැමති ඕනෑම දෙයක් මම ඔහු වෙනු-
වෙන් කරන්නම්. මම ඔබ වෙනුවෙ-
නුත් ඕනෑම දෙයක් කරන්න සූදානම්.”
**39** ඉන්පසු මුළු සෙනඟ යොර්දාන්
ගඟෙන් එතෙර වූහ. රජද බාසිල්ලයිව
සිපගෙන[5] ඔහුට ආශීර්වාද[6] කළ පසු
ගඟෙන් එගොඩ විය. ඉන්පසු බාසිල්-
ලයි ආපසු තම නුවරට හැරී ගියේය.
**40** රජු ගඟෙන් එගොඩ වී ගිල්ගාල්
නුවරට[7] යද්දී කිම්හාම්ද ඔහු සමඟ
ගියේය. යූදාහි මුළු සෙනඟද ඊශ්‍රා-
යෙල් සෙනඟගෙන් දෙකෙන් කොට-
සක්ද ඔහු සමඟ ගියෝය.

**41** පසුව ඊශ්‍රායෙල්හි පුරුෂයෝ
රජු ළඟට පැමිණ මෙසේ ඇසුවෝය.
“යූදා ගෝත්‍රයේ අපේ සහෝදරයන්,
ඔබවයි ඔබේ ගෙයි වැසියන්වයි ඔබේ
සේවකයන්වයි යොර්දාන් ගඟෙන්
මෙගොඩට රැගෙන ආවේ හොර රහ-
සින්.[8] ඇයි ඔවුන් අපිට නොකියා
එහෙම දෙයක් කළේ?”[9] **42** එවිට
යූදාහි මනුෂ්‍යයෝ ඊශ්‍රායෙල් සෙ-
නඟට මෙසේ පැවසුවෝය. “අපි තමයි
රජුගේ කිට්ටුම නෑයෝ.[10] අපි රජුගේ
වියදමින් කිසි දෙයක් කෑවාද? ඔහුව
රැගෙන ආවා කියලා අපිට තෑග්ගක්
ලැබුණාද? ඉතින් ඇයි ඔබ අමනාප
වෙන්නේ?”

**43** නමුත් ඊශ්‍රායෙල් සෙනඟ යූදාහි
මනුෂ්‍යයන්ට මෙසේ කීවෝය. “රාජ්‍ය-
යෙන් කොටස් දහයක් අපට අයිතියි.[1]
ඒ නිසා දාවිත් රජු හා සම්බන්ධ කාර-
ණාවලදී ඔබට වඩා අයිතියක් අපට
තියෙනවා. ඇයි ඔබ අපිට මෙත-
රම් පහත් විදිහට සැලකුවේ? අපේ
රජුව ආපහු රැගෙන එන්න වැඩි අයි-
තියක් තියෙන්නේ අපිට නේද?”[2]
නමුත් යූදා මනුෂ්‍යයෝ වඩා සැරප-
රුෂ ලෙස ඊශ්‍රායෙල් මනුෂ්‍යයන්ට
බැණවැදුණෝය.

**20** බෙන්ජමින් ගෝත්‍රයට අයත්
බික්‍රිගේ පුත්‍රයා වන ෂෙබා[3]
නම් වූ මනුෂ්‍යයෙක් සිටියේය. ඔහු
කිසි කමකට නැති මනුෂ්‍යයෙකි.[4]
ඔහු හොරණෑව පිඹිමින්[5] මෙසේ
කීවේය. “දාවිත්ගේ රාජධානියේ අපට
කොටසක් නැහැ. යෙස්සේගේ පුත්‍ර-
යාගෙන් අපට උරුමයක් ලැබෙයි
කියලා බලාපොරොත්තු වෙන්න
බැහැ.[6] ඊශ්‍රායෙල් ජනයෙනි, ඔබ එක්
එක් කෙනා ඔබේ දෙවිවරුන් වෙනට
ගොස් ඔවුන්ට නමස්කාර කරන්න.”[7]
**2** එවිට ඊශ්‍රායෙල්හි ජනයා දාවිත්
රජුව අත්හැර බික්‍රිගේ පුත්‍රයා වන ෂෙ-
බාගේ පැත්තට ගියෝය.[8] නමුත්
යොර්දාන් සිට යෙරුසලම දක්වා
ජීවත් වූ යූදාහි සියලු ජනයා තමන්-
ගේ රජුට පක්ෂව සිටියෝය.[9]

**3** දාවිත් රජ යෙරුසලමේ තිබූ
තම මාලිගාවට පැමිණියේය.[10] ඔහු
මාලිගාව බලාගන්නා පිණිස තබා
ගිය උපභාර්යාවන් දසදෙනාව[11] වෙ-
නම නිවසක තැබුවේය. ඒ නිවස
රැකවලුන් යටතේ තිබිණ. දාවිත් රජු
ඒ දසදෙනාට කෑම බීම සැපයූ නමුත්
ඔහු ඔවුන් සමඟ සයනය කළේ
නැත.[12] ස්වාමිපුරුෂයෙකු සිටියත්
ඔවුහු මැරෙන තුරුම වැන්දඹුවන් සේ
එම නිවසේ ජීවත් වූහ.

**4** රජ අමාසාට[13] කතා කර මෙසේ
කීවේය. “දවස් තුනක් ඇතුළත යූදාහි
පුරුෂයන්ව රැස් කරගෙන ඔවුන්
සමඟ මා ළඟට එන්න.” **5** එබැ-
වින් අමාසා යූදාහි පුරුෂයන්ව රැස්
කරගන්නා පිණිස ගියේය. නමුත්
රජු ඔහුට නියම කළ දවසේදී ඔහු

**19 පරි.**
1 ලූක් 6:38
2 යොෂු 23:14
ලූක් 2:29
3 උත් 47:30
උත් 49:29
උත් 50:13
4 1රාජා 2:7
5 උත් 31:55
රූත් 1:14
1සාමු 20:41
1රාජා 19:20
ක්‍රියා 20:37
6 උත් 14:19
උත් 47:7
යොෂු 22:6
7 1සාමු 11:14
8 2සාමු 19:15
9 විනි 8:1
විනි 12:1
10 රූත් 4:12
රූත් 4:22
2සාමු 2:4
ගීතා 78:68
මතෙ 1:3
මතෙ 1:6

**2 තීරුව**
1 1රාජා 11:31
1රාජා 12:16
2 දේශ 4:4
ලූක් 22:24
ලූක් 22:26
ගලා 5:26
පිලි 2:3

**20 පරි.**
3 2සාමු 20:21
4 ද්වි 13:13
1සාමු 2:12
5 විනි 3:27
2සාමු 15:10
6 2සාමු 19:43
7 ද්වි 13:6
ද්වි 13:9
1රාජා 12:16
2ලේක 10:16
8 2සාමු 15:12
හිතෝ 6:19
හිතෝ 24:21
ගලා 5:20
9 2සාමු 19:15
2සාමු 19:42
10 2සාමු 5:11
11 2සාමු 15:16
2සාමු 16:21
12 2සාමු 16:22
13 2සාමු 17:25
2සාමු 19:13
1ලේක 2:17

ආවේ නැත. **6** එබැවින් දාවිත් රජ
අබිෂයිට[1] මෙසේ කීවේය. “අබ්ස-
ලොම්ට වඩා බික්‍රිගේ පුත්‍රයා වන
ෂෙබා[2] අපිට තර්ජනයක් වෙයි.[3]
අපි තවත් බලාගෙන හිටියොත් ඔහු
මෙහෙන් පැනලා ගිහින් ආරක්ෂිත
නුවරක හැංගෙයි. ඒ නිසා ඔබේ
ස්වාමියාගේ සේවකයන් සමඟ[4] ඔහු
පසුපස ලුහුබැඳ යන්න.” **7** යෝ-
වාබ්ගේ සේවකයෝද[5] කෙරෙතිවරුද[6]
පෙලෙතිවරුද[7] සටනට දක්ෂ වූ සියලු
පුරුෂයෝද ඔහු සමඟ යෙරුසල-
මෙන් පිටත්ව ගොස් බික්‍රිගේ පුත්‍රයා
වන ෂෙබා පසුපස ලුහුබැඳ ගියෝය.
**8** ඔවුන් ගිබියොන්හි[8] තිබෙන විශාල
ගල අසලට පැමිණි විට අමාසාද[9]
ඔවුන්ව හමු වීමට එතැනට ආවේය.
යෝවාබ් යුධ ඇඳුමින් සැරසී සිටි-
යේය. ඔහු තම ඉණපටියේ තිබූ කො-
පුවට කඩුවක්ද දමාගෙන සිටියේය.
ඔහු අමාසාව හමු වීමට ඇවිදගෙන
යද්දී කඩුව බිම වැටුණේය.

**9** යෝවාබ් අමාසාගෙන් මෙසේ
ඇසුවේය. “මගේ සහෝදරයා,
ඔබ හොඳින් ඉන්නවාද?”[10] ඉන්-
පසු ඔහු අමාසාව සිපගන්නා
පිණිස තම දකුණු අතින් ඔහුගේ
මුහුණ ඇල්ලුවේය.[11] **10** යෝවාබ්-
ගේ අනික් අතේ කඩුව තිබූ නමුත්
අමාසා එය එතරම් ගණනකට ගත්-
තේ නැත. යෝවාබ් තම කඩුවෙන්
අමාසාගේ බඩට ඇන්නේය.[12] ඔහුගේ
බඩවැල් පවා පිටතට ආවේය. ඔහු
පණ අදිමින් සිටි නිසා ඔහුට නැවත
අනින්න අවශ්‍ය වූයේ නැත. පසුව
යෝවාබ්ද ඔහුගේ සහෝදරයා වන
අබිෂයිද බික්‍රිගේ පුත්‍රයා වන ෂෙබා
පසුපස ලුහුබැඳ ගියෝය.

**11** යෝවාබ්ගේ සේවකයන්ගෙන්
එක් කෙනෙක් අමාසා ළඟ සිටගෙන
මෙසේ කීවේය. “දාවිත්ට හා යෝ-
වාබ්ට පක්ෂව ඉන්න හැමෝම[13] දැන්
යෝවාබ් සමඟ යන්න.” **12** ඒ අවස්-
ථාවේදීත් අමාසා පාර මැද පණ අදි-
මින් සිටියේය. ඔහු ලේ විලක් මැද
වැටී සිටියේය.[14] සෙනඟ අමාසා වැටී
සිටි තැනට පැමිණ එතැන නතර වූ[1]
බව දුටු යෝවාබ්ගේ සේවකයා අමා-
සාව පාරෙන් උසුලාගෙන ගොස් කෙ-
තක තැබුවේය. ඉන්පසු ඔහු අමාසාව
රෙද්දකින් වැසුවේය. **13** ඔහු අමා-
සාව පාරෙන් ඉවත් කළ පසු සෙනඟ
බික්‍රිගේ පුත්‍රයා වන ෂෙබා[2] පසුපස
ලුහුබැඳ යන පිණිස යෝවාබ් සමඟ
ගියෝය.

**14** ෂෙබා, ඊශ්‍රායෙල් ගෝත්‍රවලට
අයිති සියලු පළාත් පසු කරගෙන
ගොස් ආබෙල් බෙත්-මයකා නම්
නුවර[3] වෙත ආවේය. බික්‍රිවරුද එතැ-
නට පැමිණ ඔහු සමඟ නුවරට
ඇතුල් වූහ.

**15** යෝවාබ් සහ ඔහුගේ සෙනඟ
ආබෙල් බෙත්-මයකා වෙත පැමිණ
ඒ නුවර වටලුවෝය.[4] ඒ නුවරේ
බලකොටුව වටා පවුරක් තිබිණ.
ඔවුහු නුවරට පහර දෙන පිණිස
ඒ පවුරට ඉදිරියෙන් තවත් පවු-
රක් ගොඩනැඟුවේය. යෝවාබ් සමඟ
සිටි සියලුදෙනා ඒ නුවරේ බලකො-
ටුව බිඳ දමන්න උත්සාහ කළෝය.
**16** ඒ අවස්ථාවේදී නුවරේ සිටි නැණ-
වත් ස්ත්‍රියක්[5] ඔවුන්ට කතා කර
මෙසේ කීවාය. “පුරුෂයෙනි, මං කියන
දේ අහන්න. යෝවාබ්ට මෙතැනට
එන්න කියන්න. මට ඔහු සමඟ
කතා කරන්න අවශ්‍යයි.” **17** යෝ-
වාබ් ඒ ස්ත්‍රිය ළඟට ගිය විට ඇය,
“ඔබ යෝවාබ්ද” කියා ඇසුවාය. එවිට
ඔහු, “ඔව්, මම යෝවාබ්” කියා පිළි-
තුරු දුන්නේය. ඉන්පසු ඇය ඔහුට
මෙසේ කීවාය. “ඔබේ දාසිය කියන
දේට සවන් දෙන්න.”[6] එවිට යෝවාබ්,
“කියන්න. මම අහගෙනයි ඉන්නේ”
කියා ඇයට කීවේය. **18** ඇය කතා
කරමින් මෙසේ කීවාය. “ ‘දැනමු-
තුකම් ලබාගන්න ආබෙල් නුවරට
යමු. එවිට ප්‍රශ්නය විසඳෙයි’ කියා
පුරාණ කාලයේ කියමනක් තිබුණා.
**19** ඊශ්‍රායෙල්හි සිටින විශ්වාසවන්ත[7]
හා සාමකාමී ජනතාව[8] වෙනුවෙනුයි
මම කතා කරන්නේ. ඔබ හදන්නේ
ඊශ්‍රායෙල්හි ප්‍රධාන නුවරක් විනාශ

**20 පරි.**

1 1සාමු 26:6; 2සාමු 10:10; 2සාමු 23:18; 1ලේක 11:20; 1ලේක 18:12
2 2සාමු 20:1
3 2සාමු 15:12
4 2සාමු 11:11; 1රාජා 1:33
5 2සාමු 8:16
6 2සාමු 8:18; 1ලේක 18:17
7 2සාමු 15:18; 1රාජා 1:38
8 යොෂු 18:25; යොෂු 21:17
9 2සාමු 17:25; 2සාමු 19:13
10 ගීතා 55:21; හිතෝ 26:24; මීකා 7:2
11 ලූක් 22:47
12 ගණන් 35:16; 2සාමු 3:27; 1රාජා 2:5; ගීතා 55:23
13 2සාමු 20:2; 2සාමු 20:4
14 උත් 4:10; උත් 9:5

**2 තීරුව**

1 2සාමු 2:23
2 2සාමු 20:1
3 1රාජා 15:20; 2රාජා 15:29; 2ලේක 16:4
4 දේශ 9:14; යෙරෙ 33:4; ලූක් 19:43
5 1සාමු 25:3; 2සාමු 14:2
6 1සාමු 25:24
7 උත් 18:23
8 හිතෝ 12:20

කරන්නයි.[1] ඔබ යෙහෝවා දෙවිගේ
උරුමය[2] නැති කරන්න හදන්නේ
ඇයි?”[3] **20** එවිට යෝවාබ් ඇයට
මෙසේ පැවසුවේය. “මේ නුවර විනාශ
කරන්න මට කිසි අදහසක් තිබුණේ
නැහැ. **21** අපි මෙහෙට ආවේ දාවිත්
රජුට විරුද්ධ වුණු කෙනෙක්ව අල්ල-
ගන්නයි.[4] ඔහු එෆ්‍රායිම් කඳුකර පළා-
තේ[5] මිනිහෙක්. ඔහුගේ නම ෂෙබා.[6]
ඔහු බික්‍රිගේ පුත්‍රයා. අපිට ඔහුව භාර
දුන්නොත්[7] අපි මේ නුවර අත්හැරලා
යන්නම්.”[8] එය අසා ස්ත්‍රිය, “අපි ඔහු-
ගේ ඔළුව[9] කපලා තාප්පෙන් එහා
පැත්තට වීසි කරන්නම්” කියා යෝ-
වාබ්ට කීවාය.

**22** ඒ ස්ත්‍රිය එවෙලේම සෙනඟ
ළඟට ගොස් ඔවුන් සමඟ බුද්ධිමත්
ලෙස කතා කළාය.[10] ඉන්පසු ඔවුහු
බික්‍රිගේ පුත්‍රයා වන ෂෙබාගේ හිස
කපා යෝවාබ් දෙසට වීසි කළෝය.
එවිට යෝවාබ් හොරණෑව පිඹ[11] සෙ-
නඟ විසුරුවාහැරියේය. සෙනඟ තම
තමාගේ නිවසට හැරී ගියෝය. යෝ-
වාබ්ද යෙරුසලමෙහි සිටි රජු ළඟට
ගියේය.

**23** යෝවාබ් ඊශ්‍රායෙල්හි හමුදාපති
විය.[12] යෙහෝයාදාගේ[13] පුත්‍රයා වූ
බෙනායා[14] කෙරෙතිවරුන්ගේ[15] හා
පෙලෙතිවරුන්ගේ[16] අධිපතියා විය.
**24** අදොරාම්[17] වහල් සේවකයන්ගේ
අධිපතියා විය. අහිලුද්ගේ පුත්‍රයා වූ
යෙහෝෂපාට්[18] වාර්තාකරු ලෙස සේ-
වය කළේය. **25** ෂෙවා[19] ලේකම්[20]
ලෙස කටයුතු කළේය. සාදොක්[21]
සහ අබියාතර්[22] පූජකයෝ වූහ.
**26** යායිරිය ඊරාද දාවිත් යටතේ අධි-
පතියෙකු*[23] ලෙස සේවය කළේය.

**21** දාවිත් රජුගේ පාලන සමයේදී
සාගතයක් ඇති විය.[24] එම
සාගතය අවුරුදු තුනක් පුරා පැව-
තිණ. දාවිත් රජු යෙහෝවා දෙවි-
ගෙන් ඒ ගැන විමසූ විට යෙහෝවා
දෙවි ඔහුට මෙසේ කීවේය. “සාවුල්
ගිබ්යොන්වරුන්ව මරා දැමූ නිසා
ඔහුත් ඔහුගේ පවුලේ අයත් ඔවුන්-
ගේ ලේවලට වග කිව යුතුයි. මෙ-
වැනි විපතක් සිදු වුණේ ඒ නිසයි.”[1]
**2** පසුව රජ ගිබ්යොන්වරුන්ව[2] ඔහු
ඉදිරියට කැඳවා ඔවුන් සමඟ ඒ
ගැන කතා කළේය. (ගිබ්යොන්-
වරු ඊශ්‍රායෙල් ජාතිකයන් නොවූහ.
ඔවුන් දේශයේ ඉතුරුව සිටි අමෝරිව-
රුන්ගෙන්[3] පැවත ආ කොටසකි.
ඔවුන්ව විනාශ නොකරන බවට ඊශ්‍රා-
යෙල්වරුන් ඔවුන්ට දිවුරා පොරොන්දු
වී තිබුණද[4] සාවුල් එම පොරොන්-
දුව නොතකා ජාත්‍යාලයෙන් පෙළඹී[5]
ගිබ්යොන්වරුන්ව නැත්තටම නැති
කර දමන්න උත්සාහ කළේය.)[6]
**3** ගිබ්යොන්වරුන්ගෙන් දාවිත් රජ
මෙසේ ඇසුවේය. “මම කොහොමද
මේ වරදට වන්දි ගෙවන්නේ?[7] ඔබ
යෙහෝවා දෙවිගේ උරුමයට[8] ආශීර්-
වාද කරන්න නම් මම ඔබ වෙනුවෙන්
මොනවාද කරන්න ඕනේ?” **4** එවිට
ගිබ්යොන්වරු, “සාවුල් හා ඔහුගේ
පවුලේ අය සමඟ අපිට තියෙන මේ
ගැටලුව රන් හා රිදීවලින් විසඳගන්න
පුළුවන් එකක් නෙමෙයි.[9] අනික ඊශ්‍රා-
යෙල් දේශයේ කිසිවෙකුවත් මරන්න
අපට අයිතියක් නැහැ” කියා දාවිත්
රජුට කීවෝය. එය අසා දාවිත්
රජ ඔවුන්ට මෙසේ කීවේය. “ඔබ
කියන ඕනෑම දෙයක් මම කරන්නම්.”
**5** එවිට ඔවුහු රජුගෙන් මෙසේ ඉල්ලා
සිටියෝය. “අපිව ඊශ්‍රායෙල් දේශ-
යෙන් මුළුමනින්ම නැති කර දමන්න
කුමන්ත්‍රණය කළ[10] මනුෂ්‍යයාගේ[11]
**6** පුත්‍රයන් හත්දෙනෙකුව අපේ අතට
භාර දෙන්න.[12] අපි ඔවුන්ව මරලා
යෙහෝවා දෙවි ඉදිරියේ ඔවුන්ගේ
මළ කඳන් එල්ලනවා.[13] යෙහෝවා
දෙවි තෝරාගත්,[14] කලින් රජුව සිටි
සාවුල්ගේ නුවර වන ගිබෙයාහි[15] අපි
ඔවුන්ගේ මළ කඳන් එල්ලනවා.”
එවිට රජ, “මම ඔවුන්ව ඔබට භාර
දෙන්නම්” කියා ඔවුන්ට කීවේය.

**20 පරි.**
1 ද්වි 20:10
2 නික් 19:5 ද්වි 32:9 2සාමු 21:3
3 2සාමු 17:16 ගීතා 124:3
4 2සාමු 20:6
5 යොෂු 17:15 විනි 2:9
6 2සාමු 20:1
7 ගණන් 16:24 යොෂු 7:13 හිතෝ 17:11
8 ගණන් 16:26
9 1සාමු 17:51 1සාමු 31:9 2රාජා 10:7
10 දේශ 9:15 දේශ 9:18
11 2සාමු 2:28 2සාමු 18:16
12 2සාමු 8:16 2සාමු 19:13 1ලේක 18:15
13 1ලේක 12:27
14 2සාමු 23:20 1රාජා 1:38 1ලේක 27:5
15 2සාමු 8:18
16 2සාමු 15:18 1රාජා 1:44
17 1රාජා 4:6 1රාජා 12:18
18 1රාජා 4:3
19 1ලේක 18:16
20 2සාමු 8:17
21 2සාමු 15:27 2සාමු 17:15 1රාජා 4:4
22 2සාමු 19:11
23 1ලේක 18:17

**21 පරි.**
24 ලෙවී 26:20 ද්වි 11:17

**2 තීරුව**
1 උත් 9:6 නික් 20:13 නික් 21:23 ගණන් 35:30 ගණන් 35:33
2 යොෂු 9:3 යොෂු 9:17 යොෂු 9:27
3 උත් 10:16 උත් 48:22
4 යොෂු 9:15
5 හිතෝ 27:4
6 එස 17:18
7 නික් 32:30 ලෙවී 1:4
8 2සාමු 20:19
9 ගණන් 35:31
10 එස්ත 9:24
11 2සාමු 21:1 මතෙ 7:2
12 ද්වි 19:21 ගීතා 9:12

**2සාමු 20:26*** මුල් භාෂාවේ පූජකයෙකු කියා සඳ-හන් වේ.

**13** උත් 40:19; ගණන් 25:4; ද්වි 21:22; **14** 1සාමු 9:17; **15** 1සාමු 10:26.

7 එහෙත් රජ, තමා සාවුල්ගේ පුත්
යොනාතාන් සමඟ යෙහෝවා දෙවි-
ගේ නමින් ඇති කර ගත් ගිවිසුම[1]
සිහි කළේය. එබැවින් යොනාතාන්ගේ
පුත්‍රයා වන මෙෆිබොෂෙත්ට[2] ඔහු
අනුකම්පා කළේය. 8 එහෙත් රජ,
ආයාගේ දියණිය වූ රිෂ්පා[3] සාවුල්ට
දාව බිහි කළ පුත්‍රයන් දෙදෙනා
වන ආර්මෝනි සහ මෙෆිබොෂෙත්වද
ආබෙල්-මෙහෝලාහි ජීවත් වූ බාසිල්-
ලයිගේ පුත්‍රයා වන අද්‍රියෙල්ට[4] දාව
සාවුල්ගේ දියණිය වන මීකල්*[5] බිහි
කළ පුත්‍රයන් පස්දෙනාවද 9 ගිබි-
යොන්වරුන්ගේ අතට භාර දුන්-
නේය. ඉන්පසු ගිබියොන්වරු ඔවුන්ව
මරා ඔවුන්ගේ මළ සිරුරු කන්ද
උඩදී යෙහෝවා දෙවි ඉදිරියේ එල්ලු-
වෝය.[6] ඒ හත්දෙනාම එකම දවසේ
මිය ගියෝය. ඔවුන්ව මරනු ලැබුවේ
අස්වනු නෙළීමට පටන්ගත් කාල-
යේදී එනම්, බාර්ලි අස්වනු නෙළීමට
පටන්ගත් කාලයේදීය.[7] 10 ආයා-
ගේ දියණිය[8] වන රිෂ්පා කන්ද මත
ගෝණි රෙදි[9] අතුරා අස්වනු නෙළීමට
පටන්ගත් දවසේ සිට වැසි වසින
කාලය[10] දක්වාම එතැනට වී සිටි-
යාය. ඇය දවල් කාලයේදී පක්ෂීන්ට-
වත්[11] රාත්‍රියේදී වනමෘගයන්ටවත්[12]
ඔවුන්ගේ මළ කඳන් ළඟට එන්න
නොදුන්නාය.

11 කාලයක් ගෙවුණු පසු සාවුල්-
ගේ උපභාර්යාව වූ ආයාගේ දිය-
ණිය වන රිෂ්පා කළ දෙය
දාවිත් රජුට ආරංචි විය.[13] 12 පසුව
දාවිත් රජ සාවුල්ගේ හා ඔහුගේ
පුත්‍රයා වූ යොනාතාන්ගේ ඇටකටු[14]
යාබෙෂ්-ගිලියද්හි වැසියන්ගෙන් ඉල්-
ලාගත්තේය.[15] පිලිස්තිවරුන් ගිල්-
බෝවාහිදී[16] සාවුල්ව මරා දැමූ
දවසේදී සාවුල්ගේ හා යොනාතාන්ගේ
මළ කඳන් බෙත්-ෂාන්හිදී[17] ප්‍රසිද්ධි-
යේ එල්ලා තබා තිබිණ.[18] ඒ නිසා
යාබෙෂ්-ගිලියද්හි වැසියෝ බෙත්-
ෂාන් වෙත ගොස් ඔවුන්ගේ මළ
කඳන් හොර රහසින් තම නුව-
රට ගෙනැවිත් තිබිණ. 13 දාවිත්
රජ, යාබෙෂ්-ගිලියද්හි වැසියන්ගෙන්
සාවුල්ගේ හා යොනාතාන්ගේ ඇට-
කටු ඉල්ලාගත්තේය. දාවිත් රජුගේ
සේවකයෝ කන්දේ එල්ලා තැබූ මිනි-
සුන්ගේ ඇටකටුද එකතු කළෝය.[1]
14 ඉන්පසු ඔවුහු රජු අණ කළ ලෙ-
සම සාවුල්ගේ හා ඔහුගේ පුත් යොනා-
තාන්ගේ ඇටකටු සාවුල්ගේ පියා වූ
කිෂ්ගේ[2] සොහොන් ගෙයි තැන්පත්
කළෝය. එම සොහොන් ගෙය තිබු-
ණේ බෙන්ජමින්වරුන්ගේ පළාතට
අයත් ෂේලා[3] නම් නුවරෙහිය. මේ
සියල්ල සිදු වූ පසු ජනයා දේශය වෙ-
නුවෙන් කළ කන්නලව්වලට දෙවි
සවන් දුන්නේය.[4]

15 පිලිස්තිවරු[5] නැවත වරක්
ඊශ්‍රායෙල්වරුන්ට විරුද්ධව යුද්ධ-
යට ආවෝය. දාවිත් රජද ඔහුගේ
සේවකයෝද පිලිස්තිවරුන් ඉදිරි-
යට ගොස් සටන් කළෝය. නමුත්
දාවිත් රජ බොහෝ වෙහෙසට පත්
විය. 16 ඒ අවස්ථාවේදී රෙෆායිවර-
යෙකු*[6] වූ ඉෂ්බි-බෙනොබ් දාවිත්
රජුව මරා දමන්න උත්සාහ කළේය.
ඔහුගේ හෙල්ලයේ තිබූ තඹවල
බර[7] ෂෙකෙල් තුන්සියයක්# විය.
ඔහු ළඟ අලුත් කඩුවක්ද තිබිණ.
17 ෂෙරුයියාගේ පුත්‍රයා වන අබිෂයි[8]
එවෙලේම දාවිත් රජුගේ උපකාරයට
පැමිණ[9] ඒ පිලිස්තියාව මරා දැමු-
වේය. එවිට දාවිත් රජුගේ සේවක-
යෝ, "ඊශ්‍රායෙල්හි පහන[10] නිවෙන්න
ඉඩ දෙන්න බැහැ![11] ඒ නිසා ඔබ
අපි සමඟ නැවත යුද්ධවලට එන්න
එපා"[12] කියා ඔහුට කීවෝය.

18 පසුව නැවත වරක් ගොබ්-
හිදී* පිලිස්තිවරුන්ට විරුද්ධව යුද්-

**21 පරි.**
1 1සාමු 18:3; 1සාමු 20:42
2 2සාමු 4:4; 2සාමු 9:10; 2සාමු 19:24
3 2සාමු 3:7
4 1සාමු 18:19
5 1සාමු 18:20; 1සාමු 25:44; 2සාමු 3:14; 2සාමු 6:23
6 ගණන් 35:31; ද්වි 19:21; 1සාමු 15:33
7 රූත් 1:22
8 2සාමු 3:7
9 1රාජා 21:27; යෝවෙ 1:13
10 ද්වි 11:14; යෙරෙ 5:24
11 උත් 40:19
12 එස 39:4
13 රූත් 2:11
14 1සාමු 31:13
15 2සාමු 2:5
16 1සාමු 28:4; 1සාමු 31:1; 2සාමු 1:6; 2සාමු 1:21; 1ලේක 10:8
17 1සාමු 31:10
18 1සාමු 31:12

**2 තීරුව**
1 2සාමු 21:9
2 1සාමු 9:1; 1සාමු 10:11
3 යොෂු 18:28
4 යොෂු 7:26; 2සාමු 24:25
5 2සාමු 5:17; 2සාමු 5:22
6 ද්වි 2:11
7 1සාමු 17:7; 1ලේක 11:23
8 2සාමු 23:18
9 2සාමු 22:19
10 1රාජා 11:36; 1රාජා 15:4; 2රාජා 8:19
11 2සාමු 14:7
12 2සාමු 18:3

**2සාමු 21:8*** ටාගම් ලියවිල්ලේ සඳහන් වන්නේ, 'මේරබ් බිහි කළ (සාවුල්ගේ දියණිය වන මීකල් බලාගත්) පුත්‍රයන් පස්දෙනාවද' කියාය. 2සාමු. 6:23 බලන්න.

**2සාමු 21:16*** මූ.අ., "රාෆා ගෝත්‍රිකයෝ." යෝධයන් මෙන් උස මහත වූ එම ගෝත්‍රයේ අයව හඳුන්වනු ලැබුවේ මුල් පියාගේ නමින්ය. **16#** එනම්, කිලෝග්‍රෑම් 3.42ක් පමණ. **18*** 1ලේක 20:4හි, "ගෙෂෙර්" ලෙස සඳහන් වේ.

ධයක් පටන්ගත්තේය. හූෂා නම් නුව-
රින් පැමිණි[1] සිබ්බෙකයි,[2] රෙෆායිවර-
යෙකු[3] වන සාෆ්ව මරා දැමුවේ එම
යුද්ධයේදීය.
**19** ගොබ්හිදී පිලිස්තිවරුන්ට
විරුද්ධව තවත් යුද්ධයක් ඇති විය. ඒ
යුද්ධයේදී බෙත්ලෙහෙම්හි වැසියෙකු
වූ යයරේ-ඔරෙගීම්ගේ පුත්‍රයා වන
එල්හානාන්,[4] ගාත්හි වැසියෙකු වන
ගොලියත්ව මරා දැමුවේය. ගොලි-
යත්ගේ හෙල්ලය රෙදි විවීම සඳහා
භාවිත කරන පොල්ලක් මෙන් විය.[5]
**20** පසුව ගාත්හිදීත් යුද්ධයක් හට-
ගත්තේය.[6] එහි අත්වල ඇඟිලි
හය බැගින්ද පාදවල ඇඟිලි හය
බැගින්ද තිබූ යෝධයෙක් සිටියේය.
ඔහු රෙෆායිවරයෙකි.[7] **21** ඔහු ඊශ්‍රා-
යෙල්වරුන්ට බොහෝ නින්දා අප-
හාස කළේය.[8] අන්තිමේදී දාවිත්ගේ
සහෝදරයා වූ ෂිමෙයිගේ*[9] පුත්‍රයා
වන යොනාතාන්[10] ඔහුව මරා දැමු-
වේය.
**22** ගාත්හි ජීවත් වූ රෙෆායිවරු
සතරදෙනා[11] දාවිත් සහ ඔහුගේ සේ-
වකයන්ගේ අතින් මැරුම් කෑවෝය.[12]

**22** යෙහෝවා දෙවි දාවිත් රජුව
ඔහුගේ සතුරන් අතින්ද[13]
සාවුල් අතින්ද[14] ගැලෙවූ පසු ඔහු යෙ-
හෝවා දෙවිට මේ ගීතය ගැයුවේය.[15]
**2** ඔහු මෙසේ කීවේය.

“යෙහෝවා දෙවි වූ ඔබ මාගේ පර්-
වතයය.[16] මාගේ බලකොටු-
වය.[17] මට ගැලවීම ලබා
දෙන තැනැත්තාණන්ය.[18]
**3** මාගේ දෙවි මාගේ පර්වතයය.[19]
මම ඔහුගේ ආරක්ෂාව පතමි.
ඔහු මාගේ පලිහය.[20] මාගේ
ගැලවීමේ අඟය.[21] මට
ආරක්ෂාව ලබා දෙන උස්
බලකොටුව ඔහුය.[22]
ඔහු මට පලා ගොස් සැඟවී සිටිය
හැකි ස්ථානයකි.[23] මාගේ
ගැලවුම්කරුය.[24] සැහැසික-
යන්ගෙන් ඔබ මා ගලවාගන්-
නෙහිය.[1]
**4** ප්‍රශංසාව ලබන්න වටින තැනැත්-
තාණන්[2] වන යෙහෝවා දෙ-
විට මම හඬගසන්නෙමි.
එවිට ඔහු මාගේ සතුරන්ගේ
අතින් මාව බේරාගනු ඇත.[3]
**5** භයානක රළ පහර මා වට
කළේය.[4]
සැඩ පහරක් මෙන් කිසි කමකට
නැති මිනිස්සු නොසිතූ මො-
හොතක මා වෙත පැමිණ මා
බිය ගැන්වූහ.[5]
**6** මිනී වළෙහි බැම් මා වට කළේය.[6]
මරණයේ උගුල් මට තර්ජනය
කළේය.[7]
**7** මාගේ විපතේදී මම දිගටම යෙ-
හෝවා දෙවිට හඬගැසු-
වෙමි.[8]
මාගේ දෙවිට මම නොකඩවාම
හඬගැසුවෙමි.[9]
තම මාලිගාවේ සිටි ඔහුට මාගේ
හඬ ඇසිණ.[10]
උපකාරය පතා මා කළ මො-
රගැසීම් ඔහුගේ දෙසවනට
වැටිණ.[11]
**8** ඔහුගේ කෝපය නිසා පොළොව
සෙලවී කම්පනය විය.[12]
අහසේ අත්තිවාරම් පවා කම්ප-
නය විය.[13]
ඒවා තදින් දෙදරුම් කන්නට
විය.[14]
**9** ඔහුගේ නාසයෙන් දුම් නැග්ගේය.
ඔහුගේ මුවින් පිට වූ ගින්-
නෙන් අවට දැවී ගියේය.[15]
ඇවිළෙන ගින්නක් ඔහු වෙතින්
නික්මුණේය.[16]
**10** ඔහු අහස නමා පහතට බැස
ආවේය.[17]
අඳුරු වලාකුළු ඔහුගේ පාද යට
තිබුණේය.[18]
**11** ඔහු කෙරුබ්වරයෙකු පිට නැඟී[19]
පියාසර කරමින් ආවේය.

**21 පරි.**
**1** 2සාමු 23:27
**2** 1ලේක 11:29; 1ලේක 20:4; 1ලේක 27:11
**3** උත් 14:5; 2සාමු 21:16
**4** 1ලේක 20:5
**5** 1සාමු 17:7
**6** 1ලේක 20:6
**7** 2සාමු 21:16
**8** 1සාමු 17:10; 1සාමු 17:45; 2රාජා 19:22
**9** 1සාමු 16:9; 1සාමු 17:13; 1ලේක 2:13
**10** 1ලේක 20:7
**11** 1ලේක 20:8
**12** ගීතා 60:12; ගීතා 108:13; එස 32:27

**22 පරි.**
**13** ගීතා 18:පෙර; ගීතා 34:19
**14** 1සාමු 23:14
**15** නික් 15:1; විනි 5:1
**16** ගීතා 18:2
**17** ගීතා 31:3
**18** ගීතා 144:2
**19** ද්වි 32:4; 1සාමු 2:2; ගීතා 144:1
**20** උත් 15:1; ද්වි 33:29; ගීතා 3:3
**21** 1සාමු 2:1
**22** ගීතා 9:9; ගීතා 18:2; ගීතා 61:3; හිතෝ 18:10
**23** ගීතා 59:16; යෙරෙ 16:19
**24** යෙසා 12:2; ලූක් 1:47; තීත 3:4

**2 තීරුව**
**1** ගීතා 72:14
**2** ගීතා 148:1
**3** ගීතා 18:3
**4** ගීතා 69:14
**5** ගීතා 18:4
**6** ගීතා 116:3
**7** ගීතා 18:5
**8** ගීතා 120:1; ගීතා 142:1; යෝනා 2:2
**9** ගීතා 116:4
**10** ගීතා 18:6
**11** නික් 3:7; ගීතා 34:15
**12** විනි 5:4
**13** යෝබ් 26:11
**14** ගීතා 18:7; ගීතා 77:18; ගීතා 97:4

**15** ගීතා 97:3; යෙසා 30:27; **16** ගීතා 18:8; **17** ගීතා 144:5; යෙසා 64:1; **18** ද්වි 4:11; 1රාජා 8:12; ගීතා 18:9; ගීතා 97:2; **19** 1සාමු 4:4; ගීතා 80:1; ගීතා 99:1.

2සාමු **21:21*** 1ලේක 20:7හි, “ෂිමෙයා” ලෙසද 1සාමු 16:9හි, “ෂම්මාහ්” ලෙසද සඳහන් වේ.

ඔහු දේවදූතයෙකුගේ පියාපත්*
පිට නැඟී එනවා දුටුවේය.[1]
12 අන්ධකාරය ඔහුගේ කූඩාරම විය.[2]
අඳුරු වැහි වලාවන් ඔහු වටා
තිබිණ.[3]
13 ඔහු ඉදිරියෙන් නික්මුණු දීප්-
තිය නිසා ගිනි අඟුරු දැල්වී
ගියේය.[4]
14 අහස ගිගුරුම් දෙන්නට යෙහෝවා
දෙවි සැලැස්වූවේය.[5]
මහෝත්තමයාණන්ගේ හඬ
දසත පැතිරුණේය.[6]
15 ඔහු ඔවුන්ව විසුරුවාහැරීමට
ඊතල විද්දේය.[7]
ඔවුන්ව වියවුල් කිරීමට අකුණු-
වලින් පහර දුන්නේය.[8]
16 යෙහෝවා දෙවිගේ තරවටුව
නිසාද
ඔහු හුස්ම හෙළූ විට ඇති වූ
පිපිරීම නිසාද[9] මුහුදු පතුල
මතු විය.[10]
පොළොවේ අත්තිවාරම් පවා
පෙනුණේය.[11]
17 ඉහළ සිට තම හස්තය දිගු කර
ඔහු මා අල්ලාගත්තේය.[12]
ගැඹුරු ජලයෙන් ඔහු මාව ඉහ-
ළට ඇදගත්තේය.[13]
18 මට වෛර කරන මාගේ බලවත්
සතුරන් අතින් ඔහු මාව
ගැලෙව්වේය.[14]
එසේ කළේ ඔවුන් මට වඩා
ශක්තිමත් වූ බැවිනි.[15]
19 මා විපත්තිවලට මුහුණ දුන් විට
ඔවුහු දිගටම මට තර්ජනය
කළෝය.[16]
නමුත් යෙහෝවා දෙවි මාගේ
උපකාරයට පැමිණියේය.[17]
20 ඔහු මාව ආරක්ෂිත ස්ථානයකට
ගෙනාවේය.[18]
ඔහු මා ගැන සතුටු වූ නිසා මාව
බේරාගත්තේය.[19]
21 මාගේ ධර්මිෂ්ඨ ක්‍රියාවලට අනුව
යෙහෝවා දෙවි මට ආශීර්-
වාද කරන්නේය.[20]
මා පවිත්‍ර ජීවිතයක් ගත කරන
නිසා ඔහු මට ආශීර්වාද
කරන්නේය.[1]
22 මම යෙහෝවා දෙවිගේ මාර්ගයේ
ගමන් කළෙමි.[2]
දුෂ්ට ලෙස ක්‍රියා කර මාගේ දෙ-
විව අත්හැර නොගියෙමි.[3]
23 ඔහු දුන් සියලු තීන්දු[4] මාගේ සිතේ
තබාගත්තෙමි.
ඔහුගේ පනත්වලින් මම ඉවත්ව
නොයන්නෙමි.[5]
24 මම නිර්දෝෂ බව ඔහුට ඔප්පු කර
පෙන්වන්නෙමි.[6]
වැරදි කිරීමෙන් වැළකී සිටින්-
නෙමි.[7]
25 එවිට මාගේ ධර්මිෂ්ඨ ක්‍රියාවලට
අනුවද[8]
ඔහු ඉදිරියේ මා ගත කරන
පවිත්‍ර ජීවිතයට අනුවද[9] යෙ-
හෝවා දෙවි මට ආශීර්වාද
කරන්නේය.
26 ඔබව අත් නොහරින කෙනෙකුව
ඔබත් කිසි කලෙක අත්
නොහරින්නෙහිය.[10]
ඔබ නිර්දෝෂ තැනැත්තාව කිසි
කලෙක අත් නොහරින්නෙ-
හිය.[11]
27 පවිත්‍ර සිතක් ඇති තැනැත්තාට
ඔබ ආශීර්වාද කරන්නෙ-
හිය.[12]
වංක තැනැත්තාට ඔහුගේ
ක්‍රියාවලට අනුව ප්‍රතිඵල
දෙන්නෙහිය.[13]
28 යටහත්පහත් අයව ඔබ ගලවා-
ගන්නෙහිය.[14]
නමුත් උඩඟු අයව ඔබ පහත්
කරන්නෙහිය.[15] ඔබ ඔවුන්
දෙස පිළිකුලෙන් බලන්-
නෙහිය.
29 යෙහෝවා දෙවියනි, මාගේ පහන
ඔබය.[16]

**22 පරි.**

**1** ගීතා 18:10
හෙබ්‍රෙ 1:7
**2** යෝබ් 36:29
**3** ගීතා 18:11
**4** ගීතා 18:12
**5** නික් 19:16
1සාමු 2:10
**6** ගීතා 18:13
යෙසා 30:30
**7** ගීතා 7:13
ගීතා 77:17
**8** ගීතා 18:14
ගීතා 144:6
**9** නික් 15:8
ගීතා 18:15
**10** නික් 14:21
ගීතා 106:9
ගීතා 114:3
නාහු 1:4
**11** 1සාමු 2:8
1ලේක 16:30
ගීතා 9:8
ගීතා 33:8
ගීතා 77:18
**12** ගීතා 18:16
ගීතා 144:7
**13** ගීතා 32:6
ගීතා 124:4
විලා 3:54
**14** ගීතා 3:7
ගීතා 56:9
**15** ගීතා 18:17
**16** 1සාමු 19:11
1සාමු 23:26
2සාමු 15:10
**17** ගීතා 18:18
ගීතා 118:10
යෙසා 50:10
**18** ගීතා 31:8
ගීතා 118:5
**19** ගීතා 18:19
ගීතා 149:4
**20** 1සාමු 26:23
1රාජා 8:32

**2 තීරුව**

**1** ගීතා 18:20
ගීතා 24:4
**2** හිතෝ 8:32
දේශ 12:13
**3** ගීතා 18:21
**4** ද්වි 6:1
ද්වි 7:12
ගීතා 19:9
ගීතා 119:30
**5** ද්වි 8:11
ගීතා 18:22
**6** උත් 6:9
උත් 17:1
ද්වි 18:13
ගීතා 84:11
**7** ගීතා 18:23
හිතෝ 14:16
**8** යෝබ් 34:11
ගීතා 7:8
යෙසා 3:10
හෙබ්‍රෙ 11:6
**9** ගීතා 18:24
හිතෝ 5:21

**2සාමු 22:11*** හෝ, "සුළඟේ පියාපත්."

**10** ගීතා 37:28; ගීතා 86:2; ගීතා 97:10; යෙරෙ 3:12; **11** ගීතා 18:25; **12** ගීතා 18:26; මතෙ 5:8; 1පේතෘ 1:16; **13** ද්වි 28:62; ගීතා 125:5; රෝම 1:28; **14** යෝබ් 34:28; ශෙප 3:12; **15** යෝබ් 40:11; ගීතා 18:27; ගීතා 101:5; දානි 4:37; 1පේතෘ 5:5; **16** යෝබ් 29:3; ගීතා 27:1; යෙසා 60:19.

යෙහෝවා දෙවියනි, අන්ධකාර-
යේ සිටියදී මාගේ ආලෝකය
ඔබය.[1]
30 ඔබේ උපකාරය ඇතුව මට සේ-
නාවකට විරුද්ධව වුවත්
නැඟී සිටිය හැක.[2]
මාගේ දෙවිගේ උපකාරය ඇතුව
මට මහා පවුරකට වුවත්
නැඟිය හැක.[3]
31 සැබෑ දෙවිගේ මාර්ගය පරිපූර්-
ණය.[4]
යෙහෝවා දෙවිගේ වචනය පවි-
ත්‍රය.[5]
ඔහුගේ රැකවරණය සොයන
සියල්ලන්ට ඔහු පලිහක්ය.[6]
32 යෙහෝවා දෙවි හැර වෙන දෙවි
කෙනෙක් සිටීද?[7]
අපේ දෙවි පර්වතයකි. ඔහුට
සමාන නවත් කෙනෙක්
සිටීද?[8]
33 සැබෑ දෙවි මාගේ බලකොටුවය.[9]
ඔහු මාගේ මාවත සමතලා
කරන්නේය.[10]
34 මුවදෙනෙකු මෙන් දිවීමට ඔහු මට
උපකාර කරන්නේය.[11]
මට තනිව යා නොහැකි උස්
තැන්වලට ඔහු මාව ගෙන
යන්නේය.[12]
35 ඔහු මට සටන් කිරීමට උගන්වන්-
නේය.[13]
ඔහුගේ උපකාරය ඇතුව මාගේ
දෑතින් මම තඹ දුන්නක්
වුවත් නමන්නෙමි.[14]
36 ඔබේ ගැලවීම නමැති පලිහ ඔබ
මට දෙන්නෙහිය.[15]
ඔබ යටහත්පහත් නිසා මාව
උසස් තත්වයකට ගෙනා-
වෙහිය.[16]
37 ඔබ මා ගමන් කරන මඟෙහි අව-
හිර තැන් සකසන්නෙහිය.[17]
එබැවින් මාගේ පාද කිසිසේත්
නොලිස්සන්නේය.[18]
38 මම මාගේ සතුරන් පසුපස ලුහු-
බැඳ ගොස් ඔවුන්ව විනාශ
කර දමන්නෙමි.
ඔවුන්ව මුළුමනින්ම විනාශ

22 පරි.

1 ගීතා 18:28 ගීතා 97:11 මතෙ 13:43
2 පිලි 4:13 හෙබ්‍රෙ 11:34
3 ද්වි 2:36 ගීතා 18:29
4 ද්වි 32:4
5 ගීතා 12:6 ගීතා 119:140 හිතෝ 30:5
6 2සාමු 22:3 ගීතා 18:30 ගීතා 35:2 ගීතා 91:4
7 යෙසා 44:6 යෙසා 45:5 1කොරි 8:4
8 ද්වි 32:31 1සාමු 2:2 ගීතා 18:31 ගීතා 94:22 ගීතා 95:1
9 ගීතා 27:1 ගීතා 31:4 යෙසා 12:2
10 ගීතා 18:32 යෙසා 26:7
11 ගීතා 18:33 හබ 3:19
12 ද්වි 32:13 යෙසා 33:16 යෙසා 58:14
13 ගීතා 144:1
14 ගීතා 18:34
15 ගීතා 18:35
16 ගීතා 113:6
17 ගීතා 4:1 ගීතා 18:36
18 ගීතා 17:5

2 තීරුව

1 ගීතා 18:37
2 ගීතා 110:6
3 නික් 14:13
4 ගීතා 18:38 ගීතා 110:1 මලා 4:3
5 1සාමු 23:5 ගීතා 44:3
6 1සාමු 17:49 ගීතා 18:39 ගීතා 44:5 ගීතා 144:2
7 උත් 49:8 නික් 23:27 යොෂු 10:24
8 ගීතා 18:40 ගීතා 21:8
9 ගීතා 18:41
10 1සාමු 28:6 යෝබ් 27:9 හිතෝ 1:28 යෙසා 1:15 එස 20:3 මීකා 3:4
11 ගීතා 18:42 යෙසා 10:6 මීකා 7:10 සෙක 10:5

කරන තුරු ආපසු හැරී නො-
එන්නෙමි.[1]
39 මම ඔවුන්ව කැබලි කර නැත්න-
ටම නැති කර දමන්නෙමි.[2]
ඔවුන් ආපසු කිසිදා නොනැඟි-
ටින සේ[3] පාගා දමන්නෙමි.[4]
40 ඔබ මාගේ ඉඟටිය ශක්තිය නමැති
පටියෙන් බැඳ මාව සටනට
සූදානම් කරන්නෙහිය.[5]
මට විරුද්ධව නැඟී සිටින අයව
ඔබ මා ඉදිරියේම වැටෙන්න
සලස්වන්නෙහිය.[6]
41 ඔබ මාගේ සතුරන්ව මට යටත්
කර දෙන බැවින් ඔවුහු මා
වෙතින් පලා දුවන්නෝය.[7]
මට දැඩි සේ වෛර කරන අයව
මම විනාශ කරන්නෙමි.[8]
42 ඔවුන් උපකාරය පතා මොරගසන
නමුත් ඔවුන්ව ගලවාගන්න
කිසිවෙක් පැමිණියේ නැත.[9]
ඔවුන් යෙහෝවා දෙවිට මොර-
ගසන නමුත් ඔහු පිළිතුරු
දෙන්නේ නැත.[10]
43 මම ඔවුන්ව පොඩි කර පොළොවේ
දූවිලි මෙන් වීමට සලස්වන්-
නෙමි.
පාරේ තිබෙන මඩ මෙන් මම
ඔවුන්ව පාගා දමන්නෙමි.
ඔවුන්ව විසුරුවාහරින්නෙමි.[11]
44 මාගේම සෙනඟ මට විරුද්ධව
කරන චෝදනාවලින් ඔබ
මාව නිදහස් කරන්නෙහිය.[12]
ඔබ මාව ආරක්ෂා කර ජාතීන්
කෙරෙහි නායකයා ලෙස
මාව පත් කරන්නෙහිය.[13]
මා කලින් නොදත් සෙනඟක්
මට සේවය කරනු ඇත.[14]
45 විදේශිකයෝ භයෙන් වෙවුලමින්
මා ළඟට පැමිණ මට යටත්
වනු ඇත.[15]
ඔවුහු මට සවන් දී මට කීකරු
වනු ඇත.[16]

12 1සාමු 30:6; 2සාමු 15:12; 13 ද්වි 28:13; 2සාමු 8:3; ගීතා 2:8; ගීතා 60:8; 14 ගීතා 18:43; යෙසා 55:5; යෙසා 65:1; හොෂෙ 2:23; ක්‍රියා 15:14; 15 ද්වි 33:29; 1රාජා 10:24; යෙසා 61:5; සෙක 8:23; 16 ගීතා 18:44.

46 විදේශිකයෝ පසුබසිති.
ඔවුහු භයෙන් ගැහිගැහී තමුන්ගේ බලකොටුවලින් එළියට පැමිණෙති.[1]
47 යෙහෝවා දෙවි ජීවමානය.[2] මාගේ පර්වතය වන දෙවිට ප්‍රශංසා ලැබේවා![3]
ගැලවීම දෙන මාගේ දෙවි, මාගේ පර්වතය සියල්ලන්ගේ පැසසුමට ලක් වෙත්වා![4]
48 සැබෑ දෙවි මා වෙනුවෙන් යුක්තිය ඉටු කරන්නේය.[5]
ජාතීන්ව මට යටත් කර දෙන්නේය.[6]
49 මාගේ සතුරන්ගෙන් මා බේරාගන්නේ ඔහුය.[7]
මට විරුද්ධව නැඟී සිටින අයට හසු නොවන සේ ඔබ මාව ඉහළින් තබන්නෙහිය.[8]
දාමරිකයාගේ අතින් ඔබ මා මුදාගන්නෙහිය.[9]
50 එබැවින් යෙහෝවා දෙවියනි, ජාතීන් ඉදිරියේ මම ඔබට ස්තුති කරන්නෙමි.[10]
ඔබේ නාමයට ප්‍රශංසා ගී ගයන්නෙමි.[11]
51 තමා පත් කළ රජුව ගලවාගැනීමට දෙවි මහත් ක්‍රියා කරන්නේය.[12]
ඔහුගේ අභිෂේක ලත් තැනැත්තාට ප්‍රේමය* පෙන්වන්නේය.[13]
දෙවි, දාවිත්ටත් ඔහුගෙන් පැවතෙන්නන්ටත් සදහටම එසේ කරන්නේය."[14]

23 දාවිත් රජු පැවසූ අවසාන වදන් මේවාය.[15]
"යාකොබ්ගේ දෙවි විසින් අභිෂේක කර,[16]
උසස් කරනු ලැබූ තැනැත්තාද[17]
ඊශ්‍රායෙල් දේශයේ ගයන ගීවල විස්තර කරනු ලබන ප්‍රියමනාප පුද්ගලයාද වූ*[18]
යෙස්සේගේ පුත් දාවිත් පැවසූ වදන් මේවාය.[1]
2 යෙහෝවා දෙවිගේ බලය, කතා කිරීමට මා පෙලඹුවේය.[2]
ඔහුගේ වචන මාගේ දිවෙහි තිබුණේය.[3]
3 ඊශ්‍රායෙල්හි දෙවි මට කතා කළේය.
ඊශ්‍රායෙල්හි පර්වතය මට කතා කර[4] මෙසේ කීවේය.
'දෙවිට ගරුබිය ඇති[5] ධර්මිෂ්ඨ කෙනෙකුගේ පාලනය[6]
4 වලාකුළු නැති අහසක හිරුගෙන් විහිදෙන ආලෝකය මෙනි.[7]
වර්ෂාවකින් පසු හිරු පායා පොළොවේ තණකොළ පිබිදෙන්නේය.[8]
ධර්මිෂ්ඨයාගේ පාලනයද එලෙසම වන්නේය.'
5 දෙවි මාගේ පවුල දෙස බලන්නේ ඒ හා සමානවය.[9]
ඔහු පිළිවෙළකට සකස් කළ[10] ස්ථිර ගිවිසුමක්[11] මා සමඟ ඇති කළේය.
එය සදහටම පවතින්නේය.
මට ගැලවීම ලැබෙන්නේ එමගිනි.[12] එය මාගේ ප්‍රීතියද වන්නේය.
දෙවි එය සාර්ථක වීමට සලස්වන්නේ එනිසාය.[13]
6 කිසි කමකට නැති මිනිසුන්[14] කපා වීසි කරන[15] කටු පඳුරු මෙනි.[16]
ඒවා අතින් ඇල්ලීමට නොහැකිය.
7 ඒවා ඇල්ලීමට යකඩ ආයුධයක් හා හෙල්ලයක් ගෙන යා යුතුය.
ඒවා ගින්නෙන් සහමුලින්ම දවා දමන්නේය."[17]
8 දාවිත් රජු යටතේ සේවය කළ

**22 පරි.**
**1** ගීතා 18:45 මීකා 7:17
**2** ද්වි 32:40
**3** ද්වි 32:4
**4** ගීතා 18:46 ගීතා 89:26
**5** 1සාමු 25:29 2සාමු 18:19 ගීතා 94:1
**6** ගීතා 18:47 ගීතා 110:1 ගීතා 144:2 1කොරි 15:25
**7** ගීතා 18:48
**8** 2සාමු 5:12 2සාමු 7:9
**9** ගීතා 140:1
**10** ද්වි 32:43 ගීතා 18:49 ගීතා 117:1 රෝම 15:9
**11** 1ලේක 16:9 ගීතා 145:2 ගීතා 146:2
**12** ගීතා 2:6 ගීතා 21:1
**13** ගීතා 18:50 ගීතා 89:20
**14** ගීතා 89:29 ගීතා 89:36 ලූක් 1:33

**23 පරි.**
**15** උත් 49:1 ද්වි 33:1
**16** 1සාමු 16:13 ගීතා 89:20
**17** 2සාමු 7:8
**18** 1ලේක 16:9 ආමො 6:5

**2 තීරුව**
**1** රූත් 4:22 1සාමු 17:58 මතෙ 1:6
**2** සෙක 7:12 මාක් 12:36 2තිමෝ 3:16
**3** ක්‍රියා 1:16 2පේතෘ 1:21
**4** ද්වි 32:4 ගීතා 144:1
**5** නික් 18:21 2ලේක 19:7 නෙහෙ 5:15 යෙසා 11:3
**6** හිතෝ 29:2 යෙසා 9:7 යෙසා 32:1
**7** මලා 4:2 මතෙ 17:2 එළි 1:16
**8** ද්වි 32:2 ද්වි 33:14 ගීතා 72:6 යෙසා 55:10 මීකා 5:7
**9** 2සාමු 7:19
**10** 1රාජා 11:38

**11** 2සාමු 7:16; 1රාජා 9:5; 1ලේක 17:11; ගීතා 89:3; ගීතා 89:28; ගීතා 132:11; **12** ගීතා 62:2; **13** යෙසා 9:7; යෙසා 11:1; ආමො 9:11; **14** 2සාමු 20:1; 2සාමු 22:5; ගීතා 18:4; **15** ගීතා 37:10; නාහු 1:15; **16** යෙසා 33:12; **17** යෙසා 27:4; මතෙ 13:40; යොහ 15:6; හෙබ්‍රෙ 6:8.

**2සාමු 22:51*** හෝ, "ලැදි ප්‍රේමය." **23:1*** හෝ, "ඊශ්‍රායෙල්හි මිහිරි ගී ගයන තැනැත්තා වූ."

බලවත්[1] මනුෂ්‍යයන්ගේ විස්තර මෙ-
වාය. එඩිතර පුරුෂයෝ තුන්දෙනෙක්
සිටියෝය. ඔවුන්ගේ ප්‍රධානියා තාකෙ-
මෝනිගෙන් පැවතෙන යොෂෙබ්-
බෂ්ෂෙබෙත්ය.[2] ඔහු එක් අවස්ථාවකදී
අටසියදෙනෙකුව තම හෙල්ලයෙන්
මරා දැමුවේය. **9** ඔහුට දෙවනුව
සිටියේ අහෝහිගේ පුත්‍රයා වූ දෝදෝ-
ගේ[3] පුත් එලියාසර්ය.[4] එක් අවස්ථාව-
කදී පිලිස්තිවරු ඊශ්‍රායෙල් හමුදාවට
විරුද්ධව යුද්ධයට සැරසී සිටියෝය. ඒ
වෙලාවේ දාවිත් සමඟ සිටි බල-
වත් පුරුෂයන් තිදෙනෙක් පිලිස්තිව-
රුන්ට අපහාස කළෝය. එලියාසර්
ඔවුන්ගෙන් එක් කෙනෙකි. ඒ අවස්-
ථාවේදී ඊශ්‍රායෙල් හමුදාව පිලිස්-
තිවරුන් ඉදිරියෙන් පලා ගියෝය.[5]
**10** එහෙත් එලියාසර් එදින තම අත
හිරි වැටෙන තෙක්ම පිලිස්තිවරුන්ට
කඩුවෙන් පහර දුන්නේය. ඔහු ඔවුන්ට
පහර දී අවසන් වූ පසුත් තම කඩුව බිම
තැබුවේ නැත.[6] එදින යෙහෝවා දෙවි
ඊශ්‍රායෙල්වරුන්ට මහත් ජයග්‍රහණයක්
අත් කර දුන්නේය.[7] පසුව පලා ගිය
සෙනඟ නැවත පැමිණ මැරුම් කෑ අය-
ගේ වස්තුව පැහැරගත්තෝය.[8]

**11** එලියාසර්ට පසුව හරාරිය[9] අගී-
ගේ පුත්‍රයා වන ෂම්මාහ් සිටියේය.
පිලිස්තිවරු එක් රැස් වී ලේහී නම්
ප්‍රදේශයේ තිබූ ධාන්‍ය කෙතකදී[10]
යුද්ධයට සැරසුණෝය. ඊශ්‍රායෙල්-
වරු ඔවුන්ට භය වී එතැනින් පලා
ගියෝය. **12** එහෙත් ෂම්මාහ් කෙත
මැදට ගොස් පිලිස්තිවරුන්ට දිග-
ටම පහර දී කෙත බේරාගත්තේය.
එදින යෙහෝවා දෙවි ඊශ්‍රායෙල්ව-
රුන්ට මහත් ජයග්‍රහණයක් අත් කර
දුන්නේය.[11]

**13** අස්වනු කපන කාලයේදී ප්‍රධා-
නීන් ලෙස කටයුතු කළ මනුෂ්‍ය-
යන් තිස්දෙනාගෙන් තුන්දෙනෙක්[12]
අදුල්ලාම්හි[13] ගුහාවේ සිටි දාවිත්
වෙත ගියෝය. ඒ වන විට
පිලිස්තිවරු රෙෆායිම් තැනිතලා-
වේ[14] කඳවුරු බැඳගෙන සිටියෝය.
**14** ඔවුන්ගේ මුර හමුදාවක්[15] බෙත්-
ලෙහෙම්හි රඳවා තිබිණ. ඒ දවස්ව-
ලදී දාවිත් ඉතා දුෂ්කර ස්ථානයක
ජීවත් විය.[1] **15** දිනක් මහත් පිපාස-
යකින් සිටි දාවිත් මෙසේ කීවේය.
“බෙත්ලෙහෙමට ඇතුල් වන දොර-
ටුව ළඟ තියෙන පොකුණෙන් මට
වතුර ටිකක් බොන්න තිබුණා නම්!”[2]
**16** එවිට දාවිත්ට සේවය කළ එඩිතර
පුරුෂයෝ තිදෙනා පිලිස්තිවරුන්ගේ
කඳවුරට කඩාවැද බෙත්ලෙහෙම්හි
දොරටුව අසල තිබූ පොකුණෙන්
වතුර ඇද දාවිත් වෙත ගෙන
ගියෝය.[3] නමුත් දාවිත් එය බිව්වේ
නැත. ඔහු යෙහෝවා දෙවි ඉදිරියේ
එය බිමට වත් කළේය.[4] **17** ඔහු ඒ
අවස්ථාවේදී මෙසේ කීවේය. “අනේ
යෙහෝවා දෙවියනි, මම කොහොමද
මේ වතුර බොන්නේ?[5] මේ මිනිස්සු
ඔවුන්ගේ ජීවිත පරදුවට තබලයි මේ
වතුර ටික ගෙනාවේ. මම මේ වතුර
බිව්වොත් ඒක හරියට ඔවුන්ගේ ලේ
බොනවා වගෙයි.”[6] ඒ නිසා ඔහු එම
වතුර නොබීවේය.

එඩිතර පුරුෂයන් තිදෙනා කළ වීර
ක්‍රියා අතරින් ඒවා සමහරකි.

**18** ෂෙරුයියාගේ පුත්‍රයාද[7] යෝ-
වාබ්ගේ සහෝදරයාද වන අබිෂයි,[8]
ප්‍රධානීන් ලෙස කටයුතු කළ තිස්දෙ-
නාගේ නායකයා විය. ඔහු තුන්සිය-
දෙනෙකුව තම හෙල්ලයෙන් මරා
දැමුවේය. එඩිතර පුරුෂයන් තුන්-
දෙනා හා සමානව ඔහුත් කීර්ති නාම-
යක් දිනාගෙන තිබිණ.[9] **19** ඔහු
අනික් ප්‍රධානීන් තිස්දෙනාට වඩා
කැපීපෙනුණ නිසා ඔවුන්ගේ නාය-
කයා ලෙස ඔහුව පත් කරන ලදි.
නමුත් ඔහු කවදාවත් එඩිතර පුරුෂ-
යන් තිදෙනාගේ තත්වයට පැමිණියේ
නැත.[10]

**20** දක්ෂ සටන්කරුවෙකු වූ යෙ-
හෝයාදාගේ පුත්‍රයා[11] වන බෙ-
නායා,[12] කබ්ෂෙයෙල් නුවරෙහි[13]
බොහෝ වීර ක්‍රියා කර තිබිණ. ඔහු
මෝවබ්හි අරියෙල්ගේ පුත්‍රයන් දෙදෙ-
නාව මරා දැමුවේය. හිම වැටෙන දව-
සකදී[14] ඔහු වළක සිටි සිංහයෙකුවද

**23 පරි.**
1 2සාමු 10:7
2සාමු 20:7
1ලේක 11:10
2 1ලේක 11:11
1ලේක 27:2
3 1ලේක 27:4
4 1ලේක 11:12
5 1ලේක 11:13
6 විනි 8:4
7 විනි 15:14
1සාමු 14:6
1සාමු 19:5
1ලේක 11:14
ගීතා 144:10
8 ගීතා 68:12
9 2සාමු 23:33
1ලේක 11:34
10 උත් 25:34
2සාමු 17:28
එස 4:9
11 ගීතා 3:8
ගීතා 44:3
හිතෝ 21:31
12 1ලේක 11:15
13 යොෂු 15:35
1සාමු 22:1
මීකා 1:15
14 යොෂු 15:8
2සාමු 5:22
1ලේක 14:9
15 1සාමු 13:23
1සාමු 14:4
1ලේක 11:16

**2 තීරුව**
1 1සාමු 22:4
1ලේක 12:16
2 1ලේක 11:17
3 1ලේක 11:18
4 ලෙවී 9:9
ලෙවී 17:13
5 1ලේක 11:19
6 උත් 9:4
ලෙවී 17:10
ද්වි 12:23
ක්‍රියා 15:29
7 2සාමු 2:18
1ලේක 2:16
8 1සාමු 26:6
2සාමු 21:17
9 1ලේක 11:20
10 1ලේක 11:21
11 1ලේක 27:5
12 2සාමු 8:18
2සාමු 20:23
1රාජා 1:8
1රාජා 2:29
1ලේක 18:17
13 යොෂු 15:21
14 1ලේක 11:22

මැරුවේය.[1] **21** ඊජිප්තු ජාතික
යෝධයෙකුවද ඔහු මරා දැමුවේය.[2] ඒ
යෝධයාගේ අතේ හෙල්ලයක් තිබු-
ණත් ඔහු නිර්භීතව යෝධයා වෙත
ගියේය. ඒ අවස්ථාවේදී ඔහුගේ අතේ
තිබුණේ පොල්ලක් පමණි. ඔහු යෝ-
ධයාගේ අතින් හෙල්ලය උදුරාගෙන
ඒ හෙල්ලයෙන්ම ඔහුට ඇන ඔහුව
මරා දැමුවේය.[3] **22** යෙහෝයාදාගේ
පුත්‍රයා වන බෙනායා[4] කළ වීර ක්‍රියා
ඒවාය. එඩිතර පුරුෂයන් තිදෙනා හා
සමානව ඔහුත් කීර්ති නාමයක් දිනා-
ගෙන තිබිණ.[5] **23** ඔහු අනික් ප්‍රධා-
නීන් තිස්දෙනාට වඩා කැපීපෙනුණ
නමුත් ඔහු කවදාවත් එඩිතර පුරුෂ-
යන් තිදෙනාගේ තත්වයට පත් වූයේ
නැත. දාවිත් ඔහුව තම ආරක්ෂක
නිලධාරියා ලෙස පත් කළේය.[6]

**24** යෝවාබ්ගේ සහෝදරයා වන
අසහෙල්ද[7] ප්‍රධානීන් තිස්දෙනා-
ගෙන් කෙනෙක් විය. එඩිතර පුරු-
ෂයන් සමහරකගේ නම් මේවාය.
බෙත්ලෙහෙම්හි වැසියෙකු වූ දෝ-
දෝගේ පුත්‍රයා වන එල්හානාන්,[8]
**25** හාරොද්හි වැසියන් වූ ෂම්-
මාහ්[9] හා එලිකා, **26** පල්තිය හෙ-
ලෙෂ්,[10] තෙකෝවා නුවරේ වැසියෙකු
වූ ඉක්කෙෂ්ගේ පුත්‍රයා[11] වන
ඊරා,[12] **27** අනාතොත් නුවරේ වැසි-
යෙකු වූ[13] අබි-එෂෙර්,[14] හූෂාතිය[15] මෙ-
බුන්නයි, **28** අහෝහිය[16] ෂල්මොන්,
නෙටොෆා නම් ගම්මානයේ වැසියෙකු
වූ මහරයි,[17] **29** නෙටොෆාහි වැසි-
යෙකු වූ බානාහ්ගේ පුත්‍රයා වන හෙ-
ලෙබ්,[18] බෙන්ජමින් ගෝත්‍රයට අයත්
නුවරක් වන ගිබෙයාහි වැසියෙකු
වූ රීබයිගේ පුත්‍රයා වන ඉත්තයි,[19]
**30** පිරතොන් නගරේ වැසියෙකු
වූ බෙනායා,[20] ගයෂ් තැනිතලාවේ[21]
ජීවත් වූ හිද්දයි, **31** බෙත්-අරබා
නුවරේ වැසියෙකු වූ අබි-අල්බොන්,
බහුරීම්හි වැසියෙකු වූ අෂ්මාවෙත්,[22]
**32** ෂායල්බිම් නුවරේ වැසියෙකු වූ
එලියාබා, යාෂෙන්ගේ පුත්‍රයන් අතරින්
යොනාතාන්,[23] **33** හරාරිය ෂම්මාහ්,
හරාරිය ෂාරාර්ගේ පුත්‍රයා වන අහි-

**23 පරි.**
**1** හිතෝ 30:30
**2** 1ලේක 11:23
**3** 1සාමු 17:51
**4** 2සාමු 23:20, 1ලේක 27:6
**5** 1ලේක 11:24
**6** 1ලේක 11:25
**7** 2සාමු 2:18, 2සාමු 2:23, 1ලේක 2:16, 1ලේක 27:7
**8** 1ලේක 11:26
**9** 1ලේක 27:8
**10** 1ලේක 27:10
**11** 1ලේක 11:28
**12** 1ලේක 27:9
**13** යොෂු 21:18, 1ලේක 6:60, යෙරෙ 1:1
**14** 1ලේක 27:12
**15** 1ලේක 27:11
**16** 1ලේක 11:29
**17** 1ලේක 27:13
**18** 1ලේක 11:30
**19** 1ලේක 11:31
**20** 1ලේක 27:14
**21** විනි 2:9, 1ලේක 11:32
**22** 1ලේක 11:33
**23** 1ලේක 11:34

**2 තීරුව**
**1** 1ලේක 11:35
**2** 2සාමු 15:31, 2සාමු 16:23, 2සාමු 17:23, 1ලේක 27:33
**3** 1ලේක 11:37
**4** 1ලේක 11:38
**5** 1ලේක 11:39
**6** 1ලේක 2:53
**7** 1ලේක 11:40
**8** 2සාමු 11:3, 1රාජා 15:5, 1ලේක 11:41

**24 පරි.**
**9** 2සාමු 21:1
**10** 1ලේක 21:1, 1ලේක 27:23
**11** 2සාමු 8:16, 2සාමු 20:23
**12** විනි 20:1, 2සාමු 3:10
**13** 1ලේක 21:2
**14** 2ලේක 32:25, හිතෝ 18:12, යෙරෙ 17:5
**15** 1ලේක 21:3
**16** 1ලේක 21:4, දේශ 8:4
**17** ගණන් 1:2

යාම්,[1] **34** මයකාත්හි වැසියෙකු වූ
අහස්බයිගේ පුත්‍රයා වන එලිෆෙලෙත්,
ගීලොහි වැසියෙකු වූ අහිතොෆෙල්ගේ[2]
පුත්‍රයා වන එලියාම්, **35** කර්මෙල්හි
වැසියෙකු වූ හෙෂ්රො,[3] අරාබ් නුව-
රේ වැසියෙකු වූ පයරයි, **36** ෂො-
බාහි වැසියෙකු වූ නාතාන්ගේ[4] පුත්‍රයා
වන ඉගාල්, ගාද් ගෝත්‍රයට අයත්
වන බානි, **37** අම්මොන් ජාතික-
යෙකු වන ෂෙලෙක්[5] හා බෙයේරොත්හි
වැසියෙකු වන නහරයිය. ෂෙලෙක්
හා නහරයි ෂෙරුයියාගේ පුත්‍රයා වූ
යෝවාබ්ගේ ආයුධ දරන්නෝ වූහ.
**38** ඉත්රිය[6] ඊරා, ඉත්රිය ගාරෙබ්[7] සහ
**39** හිත්තී ජාතික උරියා[8] යන අයද
එඩිතර පුරුෂයන් අතර සිටියෝය.
ඔවුහු සියල්ලෝ තිස්හත්දෙනෙකි.

**24** යෙහෝවා දෙවි නැවත වරක්[9]
ඊශ්‍රායෙල් සෙනඟ සමඟ
මහත් සේ උදහස් විය. මන්ද,
“ඊශ්‍රායෙල් හා යූදා සෙනඟව ගණන්
කරන්න”[10] යයි කියමින් ඊශ්‍රායෙල්ව-
රුන්ට හානියක් වන අයුරින් කටයුතු
කිරීමට දාවිත් රජුව යමෙක්* පෙලඹු-
වේය. **2** රජ තමා සමඟ සිටි යුධ
හමුදාවේ ප්‍රධානියා වන යෝවාබ්ට
මෙසේ කීවේය.[11] “දැන් සිට බෙයර්-
ෂෙබා දක්වා[12] ගමන් කරලා ඊශ්‍රායෙල්
දේශයේ සෑම ගෝත්‍රයකම සිටින මිනි-
සුන්ව ගණන් කරන්න.[13] ඔවුන්ගේ මුළු
ගණන මට දන්වන්න.”[14] **3** නමුත්
යෝවාබ්, රජුට මෙසේ කීවේය. “මගේ
ස්වාමීනි, රජ්ජුරුවනි, ඔබේ ඇස් ඉදිරි-
පිටම සෙනඟ සිය ගුණයකින් වැඩි
කරන්න ඔබේ දෙවි වන යෙහෝවාට
පුළුවන්. ඉතින් ඇයි ඔබ මේ වගේ දෙ-
යක් කරන්න හිතුවේ?”[15]

**4** එහෙත් යෝවාබ් සහ යුධ හමුදා-
වේ අනික් ප්‍රධානීන්ට රජුගේ අණට
යටත් වෙන්න සිදු විය.[16] එබැවින්
ඔවුහු ඊශ්‍රායෙල් සෙනඟ ගණන් කරන
පිණිස පිටත්ව ගියෝය.[17] **5** පසුව
ඔවුහු යොර්දාන් ගඟෙන් එගොඩ වී
නිම්නය මැද පිහිටි අරෝයේර් නම්

**2සාමු 24:1*** හෝ, “ඔහු.” 1ලේක 21:1 බලන්න.

නුවරට[1] දකුණින් කඳවුරු බැඳගත්-
තෝය. ඔවුහු යාසෙර් නුවර[2] දක්වාත්
ගාද් ගෝත්‍රයට අයිති පළාත[3] දෙස-
ටත් ගමන් කළෝය. **6** පසුව ඔවුහු
ගිලියද් දේශය[4] වෙතටත් තාතිම්-
හොද්ෂි දේශය වෙතටත් දාන්-යායන්
හා සීදොන් නුවර[5] වෙතටත් ගමන්
කළෝය. **7** ඉන්පසු තීර් බලකොටු-
වටත්[6] හිවීයවරුන්ගේ සියලු නුව-
රවලටත්[7] කානානිවරුන්ගේ සියලු
නුවරවලටත් ඔවුහු ගියෝය. අවසාන-
යේදී ඔවුහු යූදා දේශයේ නෙගෙබ්හි[8]
පිහිටි බෙයර්-ෂෙබා[9] දක්වාම ගියෝය.
**8** මෙසේ ඔවුහු මුළු දේශය පුරාම
ගමන් කර නැවත යෙරුසලමට පැමි-
ණියෝය. මුළු ගමනට මාස නවයකුත්
දවස් විස්සක් ගත විය. **9** යෝවාබ්,
සෙනඟගේ මුළු ගණන රජුට දැන්වූ-
වේය.[10] ඊශ්‍රායෙල් දේශයෙහි යුද්ධයට
දක්ෂ පුරුෂයෝ අටලක්ෂයක්ද යූදා
දේශයෙහි පුරුෂයෝ පන්ලක්ෂයක්ද
සිටියෝය.[11]

**10** පසුව සෙනඟව ගණන් කළ
නිසා දාවිත් රජුගේ සිත ඔහුට මහත්
සේ වද දෙන්න පටන්ගත්තේය.[12]
එබැවින් ඔහු යෙහෝවා දෙවිට මෙසේ
කීවේය. "මා කළේ ලොකු වර-
දක්.[13] අනේ යෙහෝවා දෙවියනි,
ඔබේ සේවකයාගේ වරදට සමාව
දෙන්න.[14] මම ක්‍රියා කළේ මෝඩ-
යෙකු ලෙසයි."[15] **11** දාවිත් රජ පසු-
වදා උදෑසන අවදි විය. ඒ අතරතුර
දෙවිගෙන් දර්ශන ලැබූ, අනාගත-
වක්තෘවරයෙකු ලෙස දාවිත් රජු යට-
තේ සේවය කළ[16] ගාද්ට[17] යෙහෝවා
දෙවි මෙසේ කීවේය. **12** "ඔබ දාවිත්
ළඟට ගොස් මෙසේ කියන්න. 'යෙ-
හෝවා දෙවි ඔබට මෙසේ පවස-
නවා. "මම ඔබට කියන මේ දඬුවම්
තුනෙන් එකක් තෝරගන්න.[18] ඔබ
තෝරගන්න දඬුවම මම ඔබ පිටට
ගෙනෙන්නෙමි." ' "[19] **13** ගාද්, දාවිත්
රජු ළඟට පැමිණ ඒ සියල්ල ඔහුට
ප්‍රකාශ කළේය.[20] ඉන්පසු ඔහු දාවිත්
රජුට මෙසේද කීවේය. "ඔබ කැමති
අවුරුදු හතක් පුරා දේශයේ සාගත-
යක් පවතිනවාටද?[1] නැත්නම් මාස
තුනක් තිස්සේ ඔබේ සතුරන් ඔබව
පරදවා ඔබ පසුපස ලුහුබැඳ එන-
වාටද?[2] එහෙමත් නැත්නම් ඔබේ
දේශයේ දවස් තුනක් පුරා වසංගත-
යක් පවතිනවාටද?[3] මේවායින් ඔබ
තෝරගන්නේ කුමන දේද කියලා
මට කියන්න. එතකොට මාව එවූ
තැනැත්තාට ඒ ගැන මම ගිහින්
කියන්නම්." **14** එවිට දාවිත් රජ
ගාද්ට මෙසේ කීවේය. "මෙය මට දරා-
ගන්න බැරි දුකක්. ඒත් යෙහෝවා
දෙවි ඉතා දයාන්විත දෙවි කෙනෙක්[4]
නිසා මනුෂ්‍යයන්ගේ අතින් දඬුවම්
විඳිනවාට වඩා[5] දෙවිගේම අතින් දඬු-
වම් ලැබීම හොඳයි."[6]

**15** එබැවින් යෙහෝවා දෙවි ඊශ්‍රා-
යෙල් දේශය පිටට වසංගතයක් ගෙ-
නාවේය.[7] එදින උදෑසන සිට දෙවි
නියම කළ කාලය දක්වා එය පැව-
තිණ. දාන් සිට බෙයර්-ෂෙබා දක්වා[8]
ජීවත් වූ මනුෂ්‍යයෝ හැත්තෑදහ-
සක් වසංගතය නිසා මිය ගියෝය.[9]
**16** යෙරුසලමේ ජනයාව විනාශ
කරන පිණිස දේවදූතයෙක්[10] ඒ නුවර
දෙසට තම අත දිගු කළේය. පසුව සිදු
වී තිබූ විනාශය දැක යෙහෝවා දෙවි
දුක් වී,[11] සෙනඟ පිටට පීඩා ගෙනා දේ-
වදූතයාට මෙසේ කීවේය. "දැන් ඔබේ
අත පහත දමන්න." ඒ අවස්ථාවේදී
යෙහෝවා දෙවිගේ දූතයා සිටියේ යෙ-
බූසිවරයෙකු වූ[12] අරව්නාගේ[13] කමත
අසලය.

**17** දාවිත් රජ, සෙනඟ පිටට පීඩා
ගෙනා දේවදූතයාව දැක යෙහෝවා
දෙවිට මෙසේ කීවේය. "පව් කළේ
මමයි. වරද මගේ අනේ. බැටළුවන්
වගේ ඉන්න[14] මේ සෙනඟ අනේ
කිසි වරදක් නැහැ. ඒ නිසා මටයි[15]
මගේ පියාගේ පවුලේ අයටයි දඬුවම්
කරන්න."

**18** පසුව ගාද් නැවත වරක් දාවිත්
රජු ළඟට පැමිණ මෙසේ කීවේය.

**24 පරි.**
**1** ද්වි 2:36
යොෂු 13:9
**2** ගණන් 32:1
ගණන් 32:35
**3** ගණන් 32:34
**4** උත් 31:21
ගණන් 32:40
**5** උත් 10:15
උත් 49:13
යොෂු 11:8
**6** යොෂු 19:29
**7** යොෂු 9:7
යොෂු 11:19
**8** යොෂු 15:1
**9** උත් 21:31
යොෂු 15:28
**10** 1ලේක 21:5
**11** ගණන් 2:32
ගණන් 26:51
1ලේක 27:23
**12** 1සාමු 24:5
ක්‍රියා 2:37
රෝම 2:15
2කොරි 7:10
1යොහ 3:20
**13** ගීතා 130:3
හොෂෙ 14:2
1යොහ 1:9
**14** 2සාමු 12:13
1ලේක 21:8
**15** 1සාමු 13:13
ගීතා 107:17
දේශ 10:1
**16** 1ලේක 29:29
**17** 1සාමු 22:5
1ලේක 21:9
**18** 1ලේක 21:10
**19** හිතෝ 3:12
**20** 1ලේක 21:11

**2 තීරුව**
**1** ලෙවී 26:20
ද්වි 28:23
2සාමු 21:1
1ලේක 21:12
**2** ලෙවී 26:17
ලෙවී 26:36
ද්වි 28:25
**3** ලෙවී 26:16
ලෙවී 26:25
ද්වි 28:22
**4** නෙහෙ 9:17
ගීතා 103:8
ගීතා 119:156
**5** විනි 6:6
2ලේක 28:5
යෙසා 47:6
**6** 1ලේක 21:13
හෙබ්‍රෙ 12:6
**7** ගණන් 16:46
ද්වි 28:21
1ලේක 21:14
1ලේක 27:24
**8** 2සාමු 24:2
**9** ද්වි 32:4
යෝබ් 34:12
විලා 3:22
**10** 1ලේක 21:15
**11** ගීතා 78:38
යෙරෙ 26:19
යෝවේ 2:13

**12** උත් 10:16; යොෂු 15:8; 2සාමු 5:9; **13** 2ලේක 3:1; **14** 1රාජා 22:17; ගීතා 44:11; ගීතා 95:7; **15** උත් 44:33; 1ලේක 21:17.

“දැන් ගිහින් යෙබූසිවරයෙක් වන
අරව්නාගේ කමතේ යෙහෝවා දෙ-
විට පූජාසනයක් ගොඩනඟන්න.”[1]
**19** ඉන්පසු යෙහෝවා දෙවි, ගාද් මාර්-
ගයෙන් දාවිත් රජුට පැවසූ දේ ඉටු
කරන පිණිස ඔහු පිටත්ව ගියේය.[2]
**20** අරව්නා, රජු සහ ඔහුගේ සේවක-
යන් තමන් සිටි ස්ථානයට පැමිණෙ-
නවා දැක ඔවුන් ඉදිරියට දුව ගොස්
හිස නමා[3] රජුට ආචාර කළේය.[4]
**21** අරව්නාද, “මගේ ස්වාමීනි, රජ්-
ජුරුවනි, ඔබේ සේවකයා වන මා
ළඟට ඔබ ආවේ ඇයි” කියා රජු-
ගෙන් ඇසීය. එවිට දාවිත් රජ, “මම
ආවේ ඔබේ කමත මිල දී ගන්නයි.[5]
මට ඕනේ මෙතැන යෙහෝවා දෙවිට
පූජාසනයක් ගොඩනඟන්නයි. එහෙම
කළොත් සෙනඟ අතරේ පැතිරෙන
මේ වසංගතය[6] නවතියි” කියා ඔහුට
කීවේය. **22** එවිට අරව්නා, දාවිත්
රජුට මෙසේ කීවේය. “මගේ ස්වාමීනි,
රජ්ජුරුවනි, ඔබ මේ කමත ගන්න.[7] ඒ
වගේම ඔබට කැමති ඕනෑම දෙයක්
පූජාව සඳහා මෙතැනින් ගන්න. දවන

**24 පරි.**
1 1ලේක 21:18, 2ලේක 3:1
2 1ලේක 21:19
3 1ලේක 21:21
4 රූත් 2:10, 2සාමු 9:8
5 1ලේක 21:22
6 ගණන් 16:47, ගණන් 25:8, 2සාමු 24:15
7 උත් 23:11

**2 තීරුව**
1 1සාමු 6:14, 1රාජා 19:21, 1ලේක 21:23
2 ගීතා 20:3
3 උත් 23:13
4 1ලේක 21:24
5 1ලේක 21:25
6 නික් 20:25, 1ලේක 21:26, 1ලේක 22:1
7 2සාමු 21:14, 1ලේක 21:27, 2ලේක 33:13, යෙසා 19:22

පූජාව සඳහා ගවයන් ඉන්නවා. මෙ-
තැන ධාන්‍ය මඩින ආයුධ හා වියගස්
තියෙනවා. ඒවා දර සඳහා පාවිච්චි
කරන්න.[1] **23** රජ්ජුරුවනි, මම මේ
හැම දෙයක්ම ඔබට දෙනවා.” අරව්නා
තවදුරටත් මෙසේ කීවේය. “ඔබේ දෙවි
වන යෙහෝවා ඔබේ පූජාව සතුටින්
පිළිගනු ලැබේවා!”[2]
**24** නමුත් රජ අරව්නාට මෙසේ
කීවේය. “මට ඔබෙන් මේ කමත
මිල දී ගන්න ඕනේ.[3] කිසිම වියද-
මක් දරන්නේ නැතුව මම මගේ
දෙවි වන යෙහෝවාට දවන පූජාවක්
ඔප්පු කරන්නේ කොහොමද!”[4] එබැ-
වින් දාවිත් රජ රිදී ෂෙකෙල් පනහක්
ගෙවා ඒ කමතද ගවයන්වද මිල දී
ගත්තේය.[5] **25** දාවිත් රජ එහි යෙ-
හෝවා දෙවිට පූජාසනයක් ගොඩ-
නඟා[6] ඔහුට දවන පූජාද හවුල් පූජාද
ඔප්පු කළේය. ඉන්පසු දේශය වෙනු-
වෙන් කළ කන්නලව්වලට යෙහෝවා
දෙවි සවන් දුන්නේය.[7] එබැවින් ඊශ්‍රා-
යෙල් සෙනඟ අතරේ පැතිර ගිය වසං-
ගතය නතර විය.

## පළමුවෙනි
# රාජාවලිය

නැතහොත් ග්‍රීක සෙප්ටුඅජින්ට් පරිවර්තනයට අනුව
තුන්වෙනි රාජාවලිය

**1** දාවිත් රජ මහලු වියේ පසු
විය.[1] ඔහුට උණුසුම ලබා දීම
සඳහා ඔහුගේ සේවකයන් ඔහුව රෙදි-
වලින් පෙරෙව්වූ නමුත් ඉන් පලක්
වූයේ නැත. **2** එබැවින් ඔහුගේ සේ-
වකයෝ ඔහු ළඟට පැමිණ මෙසේ
කීවෝය. “අපේ ස්වාමීනි, රජ්ජුරුවනි,
ඔබට සාත්තු සප්පායම් කරන්නත්[2]
ඔබව රැකබලා ගන්නත්[3] තරුණ
කන්‍යාවක්[4] සොයාගෙන එන්න අපට
අවසර දෙන්න. එවිට ඇයට පුළු-
වන් ඔබ ළඟින්ම ඉඳ[5] ඔබට උණු-

**1 පරි.**
1 2සාමු 5:4, 1රාජා 2:11, 1ලේක 23:1, 1ලේක 29:27, ගීතා 90:10
2 2සාමු 13:5, 1රාජා 1:15
3 රූත් 4:16, 2සාමු 4:4
4 එස්ත 2:2
5 උත් 16:5

**2 තීරුව**
1 දේශ 4:11
2 යොෂු 19:18, 2රාජා 4:8

සුමක් ලබා දෙන්න.”[1] **3** ඉන්පසු
ඔවුහු රූමත් තරුණියකව සොයාගැ-
නීමට මුළු ඊශ්‍රායෙල් දේශය පුරාම
ගියෝය. ෂූනෙම් ජාතික[2] කාන්-
තාවක වූ අබිෂග්[3] ඔවුන්ට හමු
වූයේ මේ අවස්ථාවේදීය. ඔවුහු ඇයව
රජු ඉදිරියට ගෙනාවෝය. **4** ඈ
ඉතා රූමත් තරුණියකි.[4] ඇය රජුට
සාත්තු සප්පායම් කරමින් ඔහුව රැක-
බලා ගත්තාය. නමුත් රජ ඇය

**3** 1රාජා 2:17; 1රාජා 2:22; **4** සල 4:7.

සමඟ ලිංගික සම්බන්ධකම් පැවැත්-
වූයේ නැත.

**5** ඒ කාලයේදී හග්ගිත්ගේ[1] පුත්
අදොනියා[2] තමාවම උසස් කරගනි-
මින්,[3] "ඊළඟට රජකමට පත් වෙන්-
නේ මමයි"[4] කියා කීවේය. එමෙන්ම
ඔහු තමන් සඳහා අශ්ව රථයක් සාදා-
ගෙන ඒ රථය සඳහා අසරුවන්ද
තමන්ට පෙරටුවෙන් දිවීමට මිනිසුන්
පනස්දෙනෙකුවද සූදානම් කරගත්-
තේය.[5] **6** නමුත් ඔහුගේ පියා ඔහු-
ගේ සිත රිදවීමට අකමැති වූ නිසා,
"ඔබ ඇයි මේ වගේ දෙයක් කරන්-
නේ"[6] කියා ඔහුගෙන් ඇසුවේ නැත.
අදොනියා ඉතා කඩවසම් පෙනුමක්
ඇති තරුණයෙකි.[7] ඔහු අබ්සලොම්-
ගේ බාල සහෝදරයාය. **7** ඔහු ෂෙ-
රුයියාගේ පුත් යෝවාබ් සමඟද පූජක
අබියාතර්[8] සමඟද කිට්ටු ඇසුරක්
පැවැත්වූවේය. ඔවුහුද අදොනියාට
උපකාර කළෝය.[9] **8** නමුත් පූජක
සාදොක්,[10] යෙහෝයාදාගේ පුත් බෙ-
නායා,[11] අනාගතවක්තෘ නාතන්,[12]
ෂිමෙයි[13] සහ රේයි ඔහුට එකතු නො-
වූහ. දාවිත් රජුට සේවය කළ බලවත්
පුරුෂයෝද[14] ඔහුට එකතු නොවූහ.[15]

**9** පසුව අදොනියා, ඒන්-රොගෙල්[16]
අසල පිහිටි ෂොහෙලෙත් ගල අසල
බැටළුවන්, ගවයන් හා තර වස්සන්ව
පූජා කර[17] උත්සවයක් පැවැත්වීය.
ඔහු ඒ අවස්ථාවට සහභාගි වීම සඳහා
රජුගේ පුත්‍රයන්[18] වන තම සියලු
සහෝදරයන්ටද රජුගේ සේවකයන්
වන යුදාහි සියලු මිනිසුන්ටද ආරා-
ධනා කළේය. **10** නමුත් ඔහු අනා-
ගතවක්තෘ නාතන්ට, බෙනායාට,
බලවත් පුරුෂයන්ට සහ තම සහෝ-
දර සලමොන්ට ආරාධනා කළේ
නැත. **11** පසුව නාතන්,[19] සල-
මොන්ගේ මව[20] වන බැත්-ෂෙබාට[21]
මෙසේ කීවේය. "හග්ගිත්ගේ[22] පුත්
අදොනියා රජ වී සිටින බව ඔබට
ආරංචි වුණේ නැද්ද? අපේ ස්වාමීන්
වන දාවිත් රජු ඒ ගැන කිසිවක් දන්-
නේ නැහැ. **12** ඔබට යම් උපදෙසක්
දීමට මට දැන් අවසර දෙන්න.[23] ඔබේ

**1 පරි.**
**1** 1ලේක 3:2
**2** 2සාමු 3:4
**3** හිතෝ 16:18; ලූක් 14:11; රෝම 12:16
**4** ද්වි 17:15
**5** 2සාමු 15:1
**6** හිතෝ 13:24; හිතෝ 29:17; ගලා 6:1
**7** 2සාමු 14:25
**8** 2සාමු 20:25
**9** 1රාජා 2:22
**10** 2සාමු 8:17; එස 44:15
**11** 2සාමු 20:23; 1ලේක 27:5
**12** 2සාමු 7:2; 2සාමු 12:1
**13** 1රාජා 4:18
**14** 2සාමු 23:8; 1ලේක 11:10
**15** හිතෝ 24:21
**16** 2සාමු 17:17
**17** 2සාමු 15:12
**18** 2සාමු 13:23
**19** 2සාමු 7:4; 2සාමු 7:17
**20** 2සාමු 12:24
**21** 2සාමු 11:3; 2සාමු 11:27
**22** 2සාමු 3:4
**23** හිතෝ 20:18; හිතෝ 27:9; හෙබ්‍රෙ 1:1

**2 තීරුව**
**1** විනි 9:5; 1රාජා 1:21; 2රාජා 11:1; මතෙ 21:38
**2** 1ලේක 22:9; 1ලේක 28:5; 1ලේක 29:1; ගීතා 132:11
**3** ද්වි 19:15; 2කොරි 13:1
**4** උත් 43:30; විනි 15:1; 2සාමු 13:10
**5** 1රාජා 1:1
**6** 1රාජා 1:3
**7** 1සාමු 25:23
**8** 1රාජා 2:20; එස්ත 7:2
**9** උත් 18:12; 1පේත්‍ර 3:6
**10** 1රාජා 1:13; 1ලේක 22:10
**11** 1රාජා 1:5
**12** 1රාජා 1:11
**13** 1රාජා 1:9
**14** 2සාමු 20:25; 1රාජා 1:7
**15** 2සාමු 8:16; 1රාජා 2:28
**16** 1රාජා 1:10

ජීවිතයත් ඔබේ පුත් සලමොන්ගේ
ජීවිතයත් බේරාගැනීම සඳහා[1] ඔබ
කළ යුතු දේ මම කියා දෙන්නම්.
**13** ඔබ දාවිත් රජු ළඟට ගොස්, 'මගේ
ස්වාමීන් වන රජ්ජුරුවනි, "මට පසුව
රජ වෙන්නේ ඔබේ පුත් සලමොන්.
මගේ සිංහාසනයේ ඉඳගන්නේ ඔහුයි"[2]
කියා ඔබේ දාසියට දිවුරා කීවේ ඔබම
නොවේද? එසේනම් අදොනියාට රජ-
කම ලැබුණේ කොහොමද' කියා ඔහු-
ගෙන් අසන්න. **14** ඔබ රජු සමඟ
කතා කරන විට මමත් ඔබට පිටුප-
සින් ඇවිත් ඔබ කියන දේ සැබෑ බව
ස්ථිර කරන්නම්."[3]

**15** ඉන්පසු බැත්-ෂෙබා, රජුව හමු
වීමට ඔහුගේ නිදන කාමරයට[4]
ගියාය. රජ මහලු වියේ පසු විය.[5]
ෂූනෙම් ජාතික අබීෂග්,[6] රජුට සාත්තු
කරමින් සිටියාය. **16** එවිට බැත්-
ෂෙබා, රජු ඉදිරියේ දණින් වැටී හිස
නමා රජුට ආචාර කළාය.[7] රජද,
"ඔබට අවශ්‍ය කරන්නේ කුමක්ද"[8]
කියා ඇගෙන් ඇසීය. **17** එවිට ඇය
ඔහුට මෙසේ කීවාය. "මගේ ස්වා-
මීනි,[9] 'මට පසුව රජ වෙන්නේ ඔබේ
පුත් සලමොන්. මගේ සිංහාසන-
යේ ඉඳගන්නේ ඔහුයි' කියා ඔබ
ඔබේ දාසියට ඔබේ දෙවි වන යෙ-
හෝවාගේ නාමයෙන් දිවුරා පැවසුවා
නේද?[10] **18** නමුත් බලන්න! දැන්
අදොනියා[11] රජ වෙලා. මගේ ස්වාමීන්
වන රජ්ජුරුවෝ ඒ ගැන කිසිවක්
දන්නේ නැහැ.[12] **19** ඔහු ගවයන්,
තර වස්සන් හා බැටළුවන් විශාල
ප්‍රමාණයක් පූජා කර උත්සවයක්
පැවැත්වුවා. ඒ උත්සවයට රජුගේ
සියලු පුත්‍රයන්ටත්[13] පූජක අබියාතර්-
ටත්[14] හමුදාවේ ප්‍රධානියා වන යෝ-
වාබ්ටත්[15] ආරාධනා කළා. නමුත් ඔහු
ඔබේ සේවක සලමොන්ට ආරාධනා
කළේ නැහැ.[16] **20** මගේ ස්වාමීන්
වන රජ්ජුරුවනි, ඔබට පසුව ඔබේ
සිංහාසනයේ ඉඳගන්නේ කවුද කියා[17]
ඔබ කියන තුරු ඊශ්‍රායෙල් දේශයේ

---

**17** 2සාමු 23:2; 1රාජා 2:15; 1රාජා 2:24; 1ලේක 29:1.

සියලු වැසියන් නොඉවසිල්ලෙන් බලා
සිටිනවා.[1] **21** මගේ ස්වාමීන් වන
රජ්ජුරුවනි, යම් දවසක ඔබත් ඔබේ
මුතුන්මිත්තන් වගේ මිය යනවා.[2]
ඔබෙන් පසුව රජකමට පත් වන්නේ
කවුද කියා ඔබ දැන් දැන්නුවේ නැත්-
නම් ඔබ මිය ගියාට පසු මාවත් මගේ
පුත් සලමොන්වත් ඔවුන් සතුරන්
ලෙස සලකයි.”

**22** ඈ රජු සමඟ කතා කරමින් සිටි-
යදී අනාගතවක්තෘ නාතන් ඇතුළට
පැමිණියේය.[3] **23** රජුගේ සේවක-
යෝ ඒ අවස්ථාවේදීම, “අනාගත-
වක්තෘ නාතන් ඇවිත් ඉන්නවා” කියා
රජුට දැන්වූහ. ඉන්පසු ඔහු රජු ළඟට
පැමිණ රජු ඉදිරියේ දණින් වැටී හිස
නමා ආචාර කළේය.[4] **24** ඉන්පසු
නාතන් මෙසේ කීවේය. “මගේ ස්වා-
මීන් වන රජ්ජුරුවනි, ‘මට පසුව රජ
වෙන්නේ අදොනියාය. මගේ සිංහාසන-
යේ ඉඳගන්නේ ඔහුයි’ කියා ඔබ පැව-
සුවාද?[5] **25** මන්ද ඔහු අද ගවයන්,
තර වස්සන් හා බැටළුවන් විශාල ප්‍රමා-
ණයක් පූජා කර[6] උත්සවයක් සූදානම්
කර, රජුගේ සියලු පුත්‍රයන්ටත් හමුදා-
වේ ප්‍රධානීන්ටත් පූජක අබියාතර්ටත්[7]
ආරාධනා කර තිබෙනවා. ඔවුන් ඔහු
ඉදිරියේ කමින් බොමින්, ‘අදොනියා
රජු දිගු කල් ජීවත් වේවා’[8] කියා පවස-
නවා. **26** නමුත් ඔහු ඔබේ සේව-
කයා වන මටත් පූජක සාදොක්ටත්[9]
යෙහෝයාදාගේ පුත් බෙනායාටත්[10]
ඔබේ සේවක සලමොන්ටත් ආරාධනා
කළේ නැහැ.[11] **27** මගේ ස්වාමීන්
වන රජ්ජුරුවනි, මේ දේ කරන්න කියා
පැවසුවේ ඔබද? ඔබෙන් පසුව රජක-
මට පත් වන්නේ කවුද කියා ඔබේ සේ-
වකයා වන මට නොදන්වා[12] ඔබ මේ
දේ කළාද?”

**28** එවිට දාවිත් රජ, “බැත්-
ෂෙබාට[13] එන්න කියන්න” යයි පැව-
සුවේය. ඇය පැමිණ රජු ඉදිරියේ
සිටගත්තාය. **29** එවිට රජ මෙසේ
පැවසුවේය. “සියලු කරදරවලින්[14]
මාව බේරාගත්[15] ජීවමාන දෙවි වන
යෙහෝවාගේ නාමයෙන්[16] දිවුරා[17] මම
මේ දේ ඔබට පවසනවා. **30** ‘මට
පසුව රජ වෙන්නේ ඔබේ පුත් සල-
මොන්. මා වෙනුවට මගේ සිංහාස-
නයේ ඉඳගන්නේ ඔහුයි’ කියා මා
ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝවාගේ
නාමයෙන් ඔබට දිවුරා දුන් පොරොන්-
දුව අද මම ඒ ආකාරයටම ඉටු කර-
නවා.”[1] **31** එවිට බැත්-ෂෙබා, රජු
ඉදිරියේ දණින් වැටී,[2] “මගේ ස්වාමීන්
වන දාවිත් රජු සදහටම ජීවත් වේවා”[3]
කියා පැවසුවාය.

**32** එකෙණෙහිම දාවිත් රජ මෙසේ
කීවේය. “පූජක සාදොක්ට,[4] අනාගත-
වක්තෘ නාතන්ට හා යෙහෝයාදාගේ
පුත් බෙනායාට[5] එන්න කියන්න.”
එවිට ඔවුහු රජු ඉදිරියට පැමිණියෝය.
**33** රජ ඔවුන්ට මෙසේ කීවේය. “මගේ
පුත් සලමොන්ව මගේ කොටළුදෙන[6]
පිට නංවාගෙන ගීහොන්[7] දක්වා ගෙන
යන්න. ඔබේ ස්වාමීන්ගේ සේවක-
යන්වත්[8] එතැනට රැගෙන යන්න.
**34** එහිදී පූජක සාදොක් හා අනාගත-
වක්තෘ නාතන් ඔහුව ඊශ්‍රායෙල්හි රජු
ලෙස අභිෂේක කළ යුතුයි.[9] ඔබ හො-
රණෑව[10] පිඹ, ‘සලමොන් රජු දිගු
කල් ජීවත් වේවා’[11] කියා ප්‍රසිද්ධියේ
කියන්න. **35** ඉන්පසු ඔබ ඔහු සමඟ
මෙතැනට එන්න. ඔහු මගේ සිංහාස-
නයේ ඉඳගත යුතුයි. මා වෙනුවට රජ
වෙන්නේ ඔහුයි. ඊශ්‍රායෙල් හා යූදා
සෙනඟගේ නායකයා හැටියට මම
ඔහුව පත් කරනවා. **36** එවෙලේම
යෙහෝයාදාගේ පුත් බෙනායා, රජුට
මෙසේ පැවසීය. “එසේම වේවා!*[12]
මගේ ස්වාමීන් වන රජ්ජුරුවනි, ඔබ
කී දේ ඔබේ දෙවි වන යෙහෝවා
ස්ථිර කරනු ලැබේවා![13] **37** යෙ-
හෝවා දෙවි මගේ ස්වාමීන් වන රජ්ජු-
රුවන් සමඟ සිටි ලෙසම[14] සලමොන්
සමඟත් සිටීවා![15] දෙවි මගේ ස්වාමීන්
වන දාවිත් රජුගේ සිංහාසනයට වඩා
සලමොන්ගේ සිංහාසනය බලයෙන්
උසස් කර දේවා!”[16]

**38** එවිට පූජක සාදොක්ද[17] අනා-

**1 පරි.**

**1** ගීතා 123:2
**2** උත් 15:15; 1රාජා 2:10
**3** 1රාජා 1:14
**4** 1සාමු 24:8; රෝම 13:7; 1පේතෘ 2:17
**5** 1රාජා 1:5; 1රාජා 1:18
**6** 2සාමු 15:12; 1රාජා 1:9
**7** 1රාජා 1:7
**8** 2සාමු 16:16; 2ලේක 23:11
**9** 1රාජා 1:8
**10** 1ලේක 27:5
**11** 1රාජා 1:10
**12** යොහ 15:15
**13** 2සාමු 12:24; 1රාජා 1:15
**14** 2සාමු 4:9; 2කොරි 1:10
**15** ගීතා 19:14; ගීතා 31:5; ගීතා 71:23; ගීතා 103:4
**16** 1සාමු 20:21
**17** ගණන් 30:2; දේශ 5:4; මතෙ 5:33

**2 තීරුව**

**1** 1රාජා 1:13; 1රාජා 1:17
**2** 1රාජා 1:16
**3** නෙහෙ 2:3; දානි 2:4
**4** 1රාජා 1:8
**5** 2සාමු 20:23; 2සාමු 23:20; 1ලේක 27:5
**6** උත් 41:43; 1රාජා 1:38; එස්ත 6:8; සෙක 9:9; ලූක් 19:35
**7** 2සාමු 5:8; 2ලේක 32:30
**8** 2සාමු 20:6
**9** 1සාමු 10:1; 1සාමු 16:13; 2රාජා 9:3
**10** 2සාමු 15:10
**11** 1සාමු 10:24; 2රාජා 11:12; 2ලේක 23:11
**12** ගීතා 72:19
**13** 1ලේක 17:27; යෙරෙ 11:5; යෙරෙ 28:6
**14** 1සාමු 16:13
**15** 1ලේක 28:20
**16** 1රාජා 3:12; 1රාජා 10:23; 2ලේක 9:22; ගීතා 72:8
**17** 1රාජා 1:8

---

**1රාජා 1:36*** හෙබ්‍රෙව් බසින්, ආමෙන්.

ගතවක්තෘ නාතන්ද[1] යෙහෝයාදා-
ගේ පුත් බෙනායාද[2] කෙරෙත්වරුද[3]
පෙලෙත්වරුද[4] සලමොන්ව දාවිත්
රජුගේ කොටළුදෙන[5] පිට නංවා-
ගෙන ගීහොන්[6] දක්වා ගෙන ගියෝය.
**39** එහිදී පූජක සාදොක් කූඩාරමෙන්[7]
තෙල් කුළාව[8] රැගෙන සලමොන්ව
අභිෂේක කළේය.[9] ඉන්පසු ඔවුන්
හොරණෑව පිඹ විට සියලුදෙනාම
ශබ්ද නඟා, "සලමොන් රජු දිගු කල්
ජීවත් වේවා"[10] කියා පැවසුවෝය.
**40** පසුව සියලුදෙනාම සලමොන්
පසුපස ගමන් කළෝය. සෙනඟ බට
නළා[11] වාදනය කරමින් බොහෝ සේ
ප්‍රීති වූහ.[12] ඒ ශබ්දය මුළු දේශය පුරාම
පැතිර ගියේය.[13]

**41** ආහාර ගනිමින් සිටි අදො-
නියාටද ඔහු සමඟ සිටි ආරා-
ධිතයන් සියලුදෙනාටද ඒ ශබ්දය
ඇසිණ.[14] යෝවාබ්ට හොරණෑ ශබ්දය
ඇසුණු විට, "නුවරෙන් ඇසෙන ඒ
ශබ්දය කුමක්ද? එය හරියට කෝ-
ලහලයක්[15] වගෙයි" කියා පැවසු-
වේය. **42** ඔහු කතා කරමින් සිටියදී
පූජක අබියාතර්ගේ පුත් යොනා-
තාන්[16] එතැනට පැමිණියේය. එවිට
අදොනියා මෙසේ කීවේය. "ඇතුළට
එන්න. ඔබ නිර්භීත මනුෂ්‍යයෙක්. ඔබ
හොඳ ආරංචියක් රැගෙන ආ බව
නිසැකයි."[17] **43** නමුත් යොනාතාන්
අදොනියාට මෙසේ පිළිතුරු දුන්-
නේය. "මම ගෙනාවේ හොඳ ආරංචි-
යක් නෙවෙයි! අපේ ස්වාමීන් වන
දාවිත් රජ සලමොන්ව රජකමට පත්
කළා.[18] **44** රජ්ජුරුවෝ ඔහු සමඟ
පූජක සාදොක්වත් අනාගතවක්තෘ
නාතන්වත් යෙහෝයාදාගේ පුත් බෙ-
නායාවත් කෙරෙත්වරුන්ව හා පෙ-
ලෙත්වරුන්වත් යැව්වා. ඔවුන් රජුගේ
කොටළුදෙන පිට සලමොන්ව රැගෙන
ගියා.[19] **45** පූජක සාදොක් හා අනා-
ගතවක්තෘ නාතන් ගීහොන්හිදී ඔහුව
රජු ලෙස අභිෂේක කළා.[20] ඊට-
පස්සේ ඔවුන් ප්‍රීති ඝෝෂා නඟමින්
මුළු නගරයම දෙවනත් කළා! ඔබට
ඇසුණෙත් ඒ ශබ්දයයි.[1] **46** දැන්
රජුගේ සිංහාසනයේ ඉඳගෙන සිටින්-
නේ සලමොන්.[2] **47** ඒ විතරක් නෙ-
වෙයි අපේ ස්වාමීන් වන දාවිත් රජුගේ
සේවකයන් දාවිත් රජු ළඟට ගොස්,
'ඔබේ දෙවි, සලමොන්ගේ නාමය
ඔබේ නාමයට වඩා තේජවත් කර,
ඔහුගේ සිංහාසනය ඔබේ සිංහාසනයට
වඩා බලයෙන් උසස් කර දේවා'[3]
කියා ඔහුට සුබ පැතුවා. එවිට රජ,
යහන මත වැටී,[4] **48** 'ඊශ්‍රායෙල්හි
දෙවි වන යෙහෝවාට ප්‍රශංසා වේවා![5]
මගේ සිංහාසනයේ ඉඳගැනීමට ඔහු
කෙනෙකුව පත් කළා. මගේ ඇස් දෙ-
කෙන්ම මට එය දැකගන්න ලැබුණා'[6]
කියා පැවසුවා."

**49** එවිට අදොනියාගේ උත්සවයට
පැමිණි ආරාධිතයෝ භයෙන් වෙවුල-
මින් තම තමන්ගේ නිවෙස් බලා
ගියෝය.[7] **50** සලමොන්ට භය වූ
අදොනියාද ගොස් පූජාසනයේ අං අල්-
ලාගත්තේය.[8] **51** පසුව සලමොන්
රජුට මෙසේ ආරංචි විය. "අදොනියා
සලමොන් රජුට භයෙන් පූජාසනයේ
අං අල්ලාගෙන, 'තම සේවකයාව කඩු-
වෙන් නොමරන බවට සලමොන් රජු
දිවුරා පොරොන්දු වෙන තුරු මම මෙ-
තැනින් යන්නේ නැහැ' කියා ඔහු
පවසනවා." **52** එවිට සලමොන් රජ
මෙසේ කීවේය. "ඔහු යහපත් මනුෂ්‍ය-
යෙක් ලෙස හැසිරුණොත් ඔහුගේ
එක කෙස්ගසක්වත් බිම වැටෙන්නේ
නැහැ.[9] නමුත් ඔහු දුෂ්ටයෙක් ලෙස
හැසිරුණොත්[10] ඔහුව මරා දමන්න සිදු
වෙයි."[11] **53** ඉන්පසු සලමොන් රජ
මිනිසුන් යවා ඔහුව එතැනින් ගෙන්වා-
ගත්තේය. එවිට ඔහු ඇවිත් සල-
මොන් රජු ඉදිරියේ දණින් වැටුණේය.
සලමොන් රජ, "දැන් ඔබේ නිවසට
යන්න"[12] කියා ඔහුට කීවේය.

**2** දාවිත් සිටියේ මරණාසන්න-
වයි.[13] එබැවින් ඔහු තම පුත්
සලමොන්ව කැඳවා මෙසේ කීවේය.
**2** "මම ජීවත් වෙන්නේ තව ටික
කාලයයි.[14] ඒ නිසා ඔබ හිතට
ධෛර්යය ගෙන එඩිතරව කටයුතු

**1 පරි.**

1 2සාමු 7:2
2 1ලේක 27:5
3 1සාමු 30:14 2සාමු 8:18
4 2සාමු 15:18 1ලේක 18:17
5 1රාජා 1:33 මතෙ 21:7
6 2ලේක 32:30
7 2සාමු 6:17
8 නික් 30:25 1සාමු 16:13
9 1සාමු 10:1 1ලේක 29:22
10 1රාජා 1:34
11 යෙසා 5:12 යෙසා 30:29
12 1සාමු 11:15 2රාජා 11:14 ගීතා 97:1
13 1සාමු 4:5
14 1රාජා 1:9 1රාජා 1:25
15 ක්‍රියා 21:30
16 2සාමු 15:36 2සාමු 17:17
17 2සාමු 18:27
18 1රාජා 1:30
19 1රාජා 1:33
20 1රාජා 1:34

**2 තීරුව**

1 1රාජා 1:40
2 1රාජා 2:12 1ලේක 29:23 ගීතා 132:11
3 1රාජා 1:37 ලූක් 19:38
4 උත් 47:31 හෙබ්‍රෙ 11:21
5 1ලේක 29:10 නෙහෙ 9:5 ගීතා 34:1 ගීතා 72:18 ආනි 4:34 එෆී 1:3
6 2සාමු 24:3
7 හිතෝ 28:1
8 නික් 21:14 නික් 38:2 1රාජා 2:28
9 1සාමු 14:45 2සාමු 14:11 ක්‍රියා 27:34
10 ද්වි 1:17 1රාජා 2:23 හිතෝ 13:6 හිතෝ 21:12
11 එස 3:19
12 හිතෝ 16:15

**2 පරි.**

13 ගීතා 89:48 දේශ 12:7
14 යොෂු 23:14 යෝබ 30:23 දේශ 9:10 හෙබ්‍රෙ 9:27

කරන්න.[1] **3** ඔබේ දෙවි වන යෙ-
හෝවාට කීකරු වී ඔහු දෙන මඟ
පෙන්වීම්වලට අනුව ජීවත් වෙන්න.[2]
දෙවි මෝසෙස්ට දුන් නීතියේ[3] ලියා
තිබෙන අණපනත්, නීතිරීති[4] සහ
සිහිගැන්වීම්වලට* කීකරු වෙන්න.
එවිට ඔබ කොතැනට ගියත් මොන
දේ කළත් ඔබට සිහිබුද්ධියෙන් කට-
යුතු කරන්න හැකි වෙයි. **4** 'ඔබේ
පුත්‍රයන්[5] විශ්වාසවන්තව[6] මා දෙන
මඟ පෙන්වීම් පිළිපදිමින්[7] ඔවුන්ගේ
මුළු ජීවිතයම මට කැප කර, මුළු
හදවතින්ම[8] මට සේවය කළොත්
ඊශ්‍රායෙල්හි රජකම හැමදාමත් ඔබේ
පෙළපතට හිමි වෙයි'[9] කියා යෙ-
හෝවා දෙවි මට පොරොන්දු වුණා.
ඔහු එම පොරොන්දුව එලෙසම ඉටු
කරයි.[10]

**5** "ෂෙරුයියාගේ පුත් යෝවාබ් මට
විරුද්ධව ක්‍රියා කර,[11] ඊශ්‍රායෙල්
හමුදාවේ ප්‍රධානීන් දෙදෙනෙක් වූ
නේර්ගේ පුත් අබ්නේර්ව[12] හා යෙ-
තෙර්ගේ[13] පුත් අමාසාව[14] මරා දැමූ
බව ඔබ හොඳින් දන්නවා. සාම-
කාමී කාලයකදී නිරපරාදේ ලේ වැගි-
රෙවූ[15] යෝවාබ්ගේ ඉණපටිය හා
පාවහන් ඔවුන්ගේ ලෙයින් නැහැවී
තිබෙනවා. **6** දැන් ඔබ ප්‍රඥාවන්-
තව ක්‍රියා කරන්න.[16] වයස්ගතව
සිටින ඔහුට සැනසිල්ලේ මැරෙන්න[17]
නම් ඉඩ දෙන්න එපා.[18]

**7** "නමුත් ගිලියද්හි පදිංචිව සිටි
බාසිල්ලයිගේ[19] පුත්‍රයන්ට ඔබ ප්‍රේ-
මණීයව* සැලකිය යුතුයි. ඔවුන්ට
ඔබත් සමඟ එකට වාඩි වී ඔබේ මේ-
සයෙන්ම කෑම කන්න[20] ඉඩ දෙන්න.
මන්ද ඔබේ සහෝදරයා වූ[21] අබ්ස-
ලොම් වෙතින් මම පලා ගිය දවස්ව-
ලදී ඔවුන් මට ප්‍රේමණීයව සැලකුවා.[22]

**8** "බහුරීම්[23] සිට පැමිණි බෙන්-
ජමින්වරයෙක් වන ගෙරාගේ පුත්
ෂිමෙයි[24] ජීවත් වෙන්නේ ඔබට කිට්ටු
ස්ථානයකයි. මම මහනායිම්[25] බලා

**1රාජා 2:3*** මූ.අ., "සාක්ෂි." **7*** හෝ, "ලැදි ප්‍රේ-මයකින්."

**2 පරි.**

**1** ද්වි 31:6
යොෂු 1:6
1රාජා 3:7
1ලේක 28:20
එෆි 6:10
**2** ද්වි 17:19
ද්වි 29:9
දේශ 12:13
**3** ද්වි 17:20
**4** ද්වි 4:1
**5** 2සාමු 7:19
**6** ගීතා 15:2
යොහ 4:24
**7** උත් 17:1
ලෙවී 26:3
2රාජා 20:3
2රාජා 23:3
2ලේක 17:3
ලූක් 1:6
**8** ද්වි 6:5
ද්වි 10:12
මතෙ 22:37
**9** 2සාමු 7:12
1රාජා 8:25
ගීතා 89:29
ගීතා 132:12
**10** 2සාමු 7:16
1ලේක 17:11
1ලේක 22:9
1ලේක 28:7
ගීතා 89:35
ගීතා 132:11
**11** 2සාමු 3:39
**12** 2සාමු 3:27
**13** 2සාමු 17:25
1ලේක 2:17
**14** 2සාමු 20:10
**15** ගණන් 35:33
2සාමු 3:28
2සාමු 3:30
1රාජා 2:31
**16** හිතෝ 20:26
**17** උත් 37:35
උත් 42:38
යෝබ් 7:9
එළි 20:13
**18** 2සාමු 3:29
1රාජා 2:34
හිතෝ 28:17
යෙසා 48:22
මතෙ 26:52
**19** 2සාමු 19:31
**20** 2සාමු 9:7
2සාමු 19:28
**21** 2සාමු 15:14
**22** 2සාමු 17:27
**23** 2සාමු 16:5
**24** 2සාමු 16:7
**25** 2සාමු 17:24

**2 තීරුව**

**1** 2සාමු 16:7
**2** 2සාමු 19:17
**3** 2සාමු 19:23
**4** නික් 22:28
ගීතා 105:15
හිතෝ 11:21
2පේත්‍රු 2:9
**5** 1රාජා 3:12
1රාජා 3:28
හිතෝ 2:6

ගිය දවසේදී ඔහු ඉතා දුෂ්ට විදිහට
මට ශාප කළා.[1] නමුත් මාව පිළි-
ගන්න ඔහු යොර්දාන් ගඟ[2] ළඟට ආ
විට, 'මම ඔබව කඩුවෙන් මරා දමන්-
නේ නැහැ'[3] කියා යෙහෝවා දෙවිගේ
නමින් ඔහුට දිවුරා පොරොන්දු වුණා.
**9** නමුත් ඔබ ඔහුට දඬුවම් නොකර
ඉන්න එපා.[4] ඔබ ප්‍රඥාවන්ත කෙ-
නෙක්[5] නිසා ඔහුට කළ යුත්තේ
කුමක්ද කියා ඔබ දන්නවා. වයස්ග-
තව සිටින[6] ඔහුවත් ඔබ මරා දැමිය
යුතුයි."[7]

**10** පසුව දාවිත් රජ මිය ගියේය.
ඔහුගේ මුතුන්මිත්තන් මෙන් ඔහුවද
තැන්පත් කරන ලදි.[8] ඔහුව තැන්පත්
කරන ලද්දේ දාවිත්ගේ නුවරේය.[9]
**11** දාවිත් රජ අවුරුදු හතළිහක් ඊශ්‍රා-
යෙල් දේශය පාලනය කළේය.[10] ඔහු
හෙබ්‍රොන්හි[11] අවුරුදු හතක්ද[12] යෙරු-
සලමේ අවුරුදු තිස්තුනක්ද පාලනය
කළේය.[13]

**12** පසුව සලමොන් තම පියා
වූ දාවිත්ගේ සිංහාසනයේ හිඳගත්-
තේය.[14] කල් යත්ම ඔහු ඉතා බලවත්
රජෙකු විය.[15]

**13** දිනක් හග්ගිත්ගේ පුත් අදො-
නියා සලමොන් රජුගේ මව වන බැත්-
ෂෙබා[16] හමු වීමට ගියේය. ඇය,
"ඔබ ආවේ සුහදශීලීව කතා කරන්-
නද"[17] කියා ඇසූ විට, "ඔව්, මම
ආවේ ඔබ සමඟ සුහදව කතා කරන්-
නයි" කියා ඔහු කීවේය. **14** තවදුර-
ටත් ඔහු මෙසේ කීවේය. "මට ඔබට
යමක් කියන්න තිබෙනවා." එවිට
ඇය, "කියන්න"[18] යයි පැවසුවාය.
**15** ඔහු මෙසේ පැවසීය. "හරි නම් රජ-
කම ලැබෙන්න තිබුණේ මටයි කියා
ඔබ හොඳින්ම දන්නවා. ඊශ්‍රායෙල්
දේශයේ සියලුම ජනයා බලාපො-
රොත්තු වුණේ මම ඔවුන්ගේ රජ වෙයි

**6** උත් 42:38; උත් 44:31; **7** 1රාජා 2:46; **8** 1ලේක 29:28; යෝබ් 14:1; දේශ 12:5; ක්‍රියා 13:36; **9** 2සාමු 5:7; 1රාජා 3:1; 1රාජා 11:43; 1ලේක 11:7; ක්‍රියා 2:29; **10** 2සාමු 5:4; **11** 1ලේක 12:23; **12** 1ලේක 29:27; **13** 2සාමු 5:5; 1ලේක 3:4; **14** 1රාජා 1:46; 1ලේක 29:23; 2ලේක 1:1; ගීතා 132:12; **15** 2සාමු 7:12; ගීතා 89:37; **16** 2සාමු 12:24; **17** 1සාමු 16:4; 1ලේක 12:17; **18** 2සාමු 14:12.

කියලයි.[1] ඒත් අන්තිමේදී රජකම
ලැබුණේ මගේ බාල සහෝදරයාටයි.
ඔහුට එය ලැබුණේ යෙහෝවා දෙවි-
ගෙන්.[2] **16** දැන් මම ඔබෙන් එක
දෙයක් ඉල්ලනවා. මගේ ඉල්ලීම නම්
අහක දමන්න එපා."[3] එවිට ඇය,
"මට කියන්න" යයි කීවාය. **17** ඔහු
මෙසේ කීවේය. "අනේ, දැන් මගේ
ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්න එපා.
ෂූනෙම් ජාතික[4] අබිෂග්ව[5] මට විවාහ
කර දෙන්න කියා සලමොන් රජුට
කියන්න. ඔබ කියන දේට ඔහු ඇහුම්-
කන් දෙයි කියා මට විශ්වාසයි."
**18** එවිට බැත්-ෂෙබා, "හොඳයි! මම
ඔබ වෙනුවෙන් රජ්ජුරුවන්ට කතා
කරන්නම්" කියා කීවාය.

**19** පසුව බැත්-ෂෙබා, අදොනියා[6]
වෙනුවෙන් කතා කිරීමට සලමොන්
රජු ළඟට පැමිණියාය. ඇය දුටු විගස
රජ නැඟිට[7] හිස නමා ඇයව පිළිගත්-
තේය.[8] ඉන්පසු සිංහාසනයේ හිඳගත්
ඔහු තම මව තමාගේ දකුණු පැත්-
තේ[9] හිඳවගන්නා පිණිස ඇයට සිංහා-
සනයක් ගෙන්වාගත්තේය. **20** ඇය
ඔහුට මෙසේ පැවසුවාය. "මම ඔබෙන්
සුළු ඉල්ලීමක් කරන්නයි ආවේ. එය
අහක දමන්න එපා." එවිට රජ,
"කියන්න. මම ඔබේ ඉල්ලීම ඉටු කර
දෙන්නම්" කියා කීවේය. **21** එවිට
ඇය මෙසේ කීවාය. "ෂූනෙම් ජාතික
අබිෂග්ව ඔබේ සහෝදර අදොනි-
යාට විවාහ කර දෙන්න." **22** එවිට
සලමොන් රජ ඔහුගේ මවට මෙසේ
කීවේය. "අදොනියාට ෂූනෙම් ජාතික
අබිෂග්ව විවාහ කර දෙන්න කියා ඔබ
කියන්නේ ඇයි? ඔහු මගේ වැඩි-
මල් සහෝදරයා.[10] ඔහුට රජකම
දෙන්න කියාත් ඔබට මගෙන් ඉල්-
ලන්න තිබුණානේ.[11] ඔහුටත් පූජක
අබියාතර්ටත්[12] ෂෙරුයියාගේ පුත්[13]
යෝවාබ්ටත්[14] රාජ්‍යය භාර දෙන්න
කියාද ඔබ මට කියන්නේ?"

**23** එවිට සලමොන් රජ යෙහෝවා
දෙවිගේ නාමයෙන් දිවුරා මෙසේ
කීවේය. "අදොනියා කළ මේ ඉල්ලීම
නිසා ඔහුව මරා දැමිය යුතුයි.[15] ඔහු-
ගේ ලේවලට වග කිව යුත්තේ ඔහු-
මයි. මම ඔහුට ඒ දඬුවම නියම
නොකළොත් දෙවි මට දඬුවම් කළ
යුතුයි.[1] **24** මගේ පියා වූ දාවිත්ගේ
සිංහාසනය මට දී[2] මගේ රජකම ස්ථිර
කර,[3] පොරොන්දු වූ ලෙස[4] මට රාජ-
කීය පෙළපතක්[5] ලබා දුන් ජීවමාන
දෙවි වන යෙහෝවාගේ නමින්[6] මම
දිවුරා කියන්නේ අදොනියාව මම අදම
මරා දමනවා."[7] **25** එසේ පවසා අව-
සන් වූ විගස සලමොන් රජ යෙහෝ-
යාදාගේ පුත් බෙනායාට[8] අදොනියාව
මරා දමන ලෙස අණ කළේය. බෙනා-
යාද ගොස් ඔහුව මරා දැමුවේය.[9]

**26** තවදුරටත් රජ, පූජක අබියා-
තර්ට[10] මෙසේ කීවේය. "ඔබ දැන්
වහාම අනාතොත්හි[11] තිබෙන ඔබේ
කෙත්වලට යන්න. ඔබත් මරණ දණ්-
ඩනය ලබන්න සුදුසු කෙනෙක්.[12]
එහෙත් ඔබ මගේ පියා වූ දාවිත්-
ගේ[13] කාලයේ විශ්වයේ පාලකයා වන
යෙහෝවා දෙවිගේ[14] ගිවිසුම් පෙට්-
ටිය ඉසිලුවා. ඒ වගේම මගේ පියා
දුක් වින්ද කාලය පුරාම ඔබත් දුක්
වින්දා.[15] ඒ නිසා මම අද ඔබව මරන්-
නේ නැහැ." **27** සලමොන් රජ එසේ
කියා අබියාතර්ව එතැනින් පිටත් කර
හැරියේය. තවදුරටත් යෙහෝවා දෙ-
විගේ පූජකයෙකු ලෙස සේවය කිරීමට
ඔහුට ඉඩ නොදුන්නේය. මෙසේ යෙ-
හෝවා දෙවි ඒලීගෙන්[16] පැවතෙන්-
නන්ට විරුද්ධව ෂීලෝහිදී[17] ප්‍රකාශ
කළ වදන් ඉටු විය.

**28** මේ පුවත යෝවාබ්ට[18] ආරංචි වූ
විට ඔහු යෙහෝවා දෙවිගේ කූඩා-
රමට[19] දුව ගොස් පූජාසනයේ අං
අල්ලාගත්තේය.[20] මන්ද ඔහු අබ්-
සලොම්ගේ කැරැල්ලට හවුල් නො-
වුණත්[21] ඔහු අදොනියාට අතහිත
දුන්නේය.[22] **29** "යෝවාබ් යෙහෝවා
දෙවිගේ ශුද්ධ කූඩාරමට ගොස් පූජාස-
නය ළඟ සැඟවී ඉන්නවා" කියා
සලමොන් රජුට ආරංචි විය. එවිට
සලමොන් රජ යෙහෝයාදාගේ පුත්

**2 පරි.**
1 1රාජා 1:5; 1රාජා 1:25
2 1ලේක 22:9; 1ලේක 28:5; හිතෝ 21:30; අනි 2:21
3 2ලේක 29:6; යෙරෙ 2:27; යෙරෙ 18:17
4 යොෂු 19:18
5 1රාජා 1:3
6 1රාජා 1:7
7 නික් 20:12; ලෙවී 19:32; හිතෝ 23:22
8 උත් 33:3; උත් 48:12; නික් 18:7
9 ගීතා 110:1; මතෙ 25:33
10 1ලේක 3:2; 1ලේක 3:5
11 2සාමු 12:8; 2සාමු 16:21
12 1රාජා 1:7
13 2සාමු 2:18
14 2සාමු 8:16
15 ගීතා 64:8; ගීතා 140:9

**2 තීරුව**
1 ද්වි 6:13; රූත් 1:17; 1සාමු 3:17; 2සාමු 19:13
2 1ලේක 29:23; 2ලේක 1:8
3 1රාජා 10:9; 1ලේක 22:10
4 යෙසා 55:11
5 1සාමු 25:28; 2සාමු 7:11; 1ලේක 17:10; ගීතා 127:1
6 1සාමු 20:21
7 1රාජා 1:52; දේශ 8:11
8 2සාමු 8:18; 1රාජා 1:8; 1ලේක 27:5
9 1රාජා 2:34
10 1සාමු 22:20; 1රාජා 1:7
11 යොෂු 21:18; 1ලේක 6:60; යෙරෙ 1:1
12 1රාජා 2:22
13 1සාමු 23:6; 2සාමු 15:24; 1ලේක 15:12
14 උත් 15:2
15 1සාමු 22:23
16 1සාමු 2:31; 1සාමු 3:12
17 යොෂු 18:1
18 1රාජා 2:22
19 1රාජා 3:4; 1ලේක 16:39; 1ලේක 21:29
20 1රාජා 1:50

**21** 2සාමු 18:14; **22** 1රාජා 1:7.

බෙනායාව කැඳවා, “ගිහින් ඔහුව මරා
දමන්න”[1] කියා ඔහුව පිටත් කර
යැව්වේය. **30** එවිට බෙනායා, යෙ-
හෝවා දෙවිගේ ශුද්ධ කූඩාරමට ගොස්
යෝවාබ්ට මෙසේ කීවේය. “‘ඔතැ-
නින් පිටතට එන්න’ කියා රජ්ජුරු-
වෝ ඔබට කිව්වා.” එහෙත් ඔහු,
“බැහැ. මට මෙතැනම මැරෙන්න ඉඩ
දෙන්න.”[2] එවිට බෙනායා රජු වෙතට
ගොස්, “යෝවාබ් මට පැවසුවේ මෙහෙ-
මයි” කියා යෝවාබ් පැවසූ දේ රජුට
දැන්වූවේය. **31** රජ ඔහුට මෙසේ
කීවේය. “ඔහු කී ලෙසම කරන්න.
ඔහුව මරා වළලා දමන්න. යෝ-
වාබ් නිකරුණේ වැගිරෙවූ ලේවලට[3]
මමවත් මගේ පියාගේ පෙළපතවත්
වග කිව යුතු නැහැ. **32** යෝවාබ්
වැගිරෙවූ ලේ වෙනුවෙන් යෙහෝවා
දෙවි ඔහුට දඬුවම් කරයි.[4] මන්ද
ඔහු තමාට වඩා ධර්මිෂ්ඨ, තමාට
වඩා යහපත්[5] මිනිසුන් දෙදෙනෙක් වූ
ඊශ්‍රායෙල් හමුදාවේ ප්‍රධානියාව සිටි[6]
නේර්ගේ පුත් අබ්නේර්වත්[7] යූදාහි
හමුදාවේ ප්‍රධානියාව සිටි[8] යෙතෙර්-
ගේ පුත් අමාසාවත්[9] කඩුවෙන් මරා
දැමුවා. නමුත් මගේ පියා වූ දාවිත් ඒ
ගැන කිසිවක් දැන සිටියේ නැහැ.[10]
**33** මරා දැමූ ඒ අයගේ ලේවලට යෝ-
වාබ් සහ ඔහුගෙන් පැවතෙන්නන්
සදහටම වග කිව යුතුයි.[11] නමුත්
යෙහෝවා දෙවි දාවිත්ටත්[12] ඔහුගේ
පවුලේ අයටත් ඔහුගෙන් පැවතෙන්-
නන්ටත් ඔහුගේ සිංහාසනයටත් යහප-
තක් මිස කිසි අයහපතක් නම් සිදු
කරන්නේ නැහැ.”[13] **34** ඉන්පසු යෙ-
හෝයාදාගේ පුත් බෙනායා ගොස්[14]
යෝවාබ්ව මැරුවේය.[15] පාළුකරයේ
තිබුණු ඔහුගේ නිවසේ ඔහුව වළලා
දමන ලදි. **35** පසුව රජ, යෝවාබ්
වෙනුවට යෙහෝයාදාගේ පුත් බෙනා-
යාව[16] හමුදාවේ ප්‍රධානියා හැටියට පත්
කළේය.[17] අබියාතර් වෙනුවට පූජක
සාදොක්ව පත් කළේය.[18]

**36** ඉන්පසු රජ, ෂිමෙයිව[19] කැඳවා
ඔහුට මෙසේ කීවේය. “ඔබ යෙ-
රුසලමෙහි ගෙයක් සාදාගෙන එහි
පදිංචි වෙන්න. ඔබ යෙරුසලමෙන්
පිට කොතැනකටවත් නොයා යුතුයි.
**37** ඔබ එතැනින් පිටත් වී කිද්‍රොන්
නිම්නය[1] පසු කර ගියොත් අනි-
වාර්යයෙන්ම ඔබට මැරුම් කන්න
සිදු වෙනවා.[2] ඒ බව මතක තබා-
ගන්න. එසේ ඔබ මැරුම් කෑවොත්
ඔබගේ මරණයට වග කිව යුත්තේ
ඔබමයි.”[3] **38** එවිට ෂිමෙයි, රජුට
මෙසේ කීවේය. “හොඳමයි. මගේ ස්වා-
මීන් වන රජ්ජුරුවන් කී ලෙසම ඔබේ
සේවකයා කරන්නම්.” ඉන්පසු ෂිමෙයි
යෙරුසලමේ කලක් පදිංචිව සිටියේය.

**39** අවුරුදු තුනක් ගත වූ පසු ෂිමෙ-
යිගේ දාසයෝ[4] දෙදෙනෙක් ගාත්හි රජු
වූ[5] මයකාගේ පුත් ආකිෂ්[6] වෙතට පලා
ගියෝය. එවිට මිනිස්සු පැමිණ, “ඔබේ
දාසයෝ ගාත්හි ඉන්නවා” කියා ෂිමෙ-
යිට පැවසූහ. **40** එය ඇසූ වහාම
ෂිමෙයි තමාගේ බූරුවාව ගමනට සූදා-
නම් කරගෙන තම දාසයන්ව සොයා-
ගැනීමට ගාත්හි සිටින ආකිෂ් රජු
වෙතට ගියේය. ෂිමෙයි ගොස්, ගාත්හි
සිටි තම දාසයන්ව නැවත ගෙනා-
වේය. **41** සලමොන් රජුට, “ෂිමෙයි
යෙරුසලමෙන් පිටත් වී ගාත් නුවරට
ගොස් නැවත පැමිණියා” කියා ආරංචි
විය. **42** මෙය ඇසූ රජ ෂිමෙයිව
කැඳවා[7] ඔහුට මෙසේ කීවේය. “‘ඔබ
නුවරෙන් පිටතට ගියොත් අනිවාර්ය-
යෙන්ම මැරුම් කනවා’ කියා මම
ඔබට අනතුරු අඟෙව්වා නේද?[8] මා
පැවසූ ඒ දේට එකඟ වන බවට
යෙහෝවා දෙවිගේ නාමයෙන් දිවුරා
පොරොන්දු වෙන්න කියාත් ඔබට
පැවසුවා. එවිට ඔබ, ‘රජ්ජුරුවන් කී
ලෙසම කරන්නම්’[9] කියා මට පො-
රොන්දු වුණා නේද? **43** එසේනම්
ඔබ යෙහෝවා දෙවි ඉදිරියේ දුන්
ඒ දිවුරුම කඩ කර[10] මම ඔබට
දුන් ආඥාව ඉටු නොකළේ ඇයි?”[11]
**44** රජ ෂිමෙයිට මෙසේද කීවේය. “ඔබ
මගේ පියා වූ දාවිත්ට කළ සියලු
නපුරුකම් ගැන ඔබේ සිත දන්-
නවා.[12] ඔබ කළ නපුරු දේවලට යෙ-
හෝවා දෙවි ඔබට දඬුවම් කරයි.[13]

**2 පරි.**
1 1රාජා 2:25
2 නික් 21:14
3 උත් 9:6
ගණන් 35:33
ද්වි 19:13
ද්වි 21:9
2සාමු 3:28
1රාජා 2:5
2රාජා 9:26
හිතෝ 28:17
4 විනි 9:57
ගීතා 7:16
ගීතා 9:16
5 නික් 23:7
2සාමු 4:11
2ලේක 21:13
6 2සාමු 2:8
7 2සාමු 3:27
8 2සාමු 17:25
9 2සාමු 20:10
10 2සාමු 3:26
11 2සාමු 3:29
ගීතා 109:9
මතෙ 27:25
12 2සාමු 3:28
13 ගීතා 89:29
ගීතා 132:12
හිතෝ 25:5
යෙසා 9:7
14 1රාජා 2:28
1ලේක 21:29
15 1රාජා 2:25
ගීතා 37:38
දේශ 12:14
16 1ලේක 11:24
1ලේක 27:5
17 යෝබ් 34:24
18 1සාමු 2:35
1ලේක 6:53
1ලේක 12:28
1ලේක 16:39
1ලේක 24:3
ගීතා 109:8
19 1රාජා 2:8

**2 තීරුව**
1 2සාමු 15:23
2රාජා 23:6
යොහ 18:1
2 ගණන් 35:27
හිතෝ 20:8
හිතෝ 20:26
3 ගණන් 35:26
යොෂු 2:19
එස 18:13
4 ද්වි 23:15
5 1සාමු 27:2
6 1සාමු 21:10
7 හිතෝ 16:14
8 නිත 3:1
9 1රාජා 2:38
10 එස 17:19
11 හිතෝ 16:12
දේශ 8:2
12 2සාමු 16:5
2සාමු 16:13
13 1රාජා 2:37
ගීතා 7:16
හිතෝ 5:22
එස 18:20

**45** නමුත් සලමොන් රජට ආශීර්වාද ලැබෙයි.[1] දාවිත්ගේ සිංහාසනයද යෙහෝවා දෙවි ඉදිරියේ සදහටම පවතියි.”[2] **46** ඉන්පසු රජ යෙහෝයාදාගේ පුත්‍රයා වන බෙනායාට ෂිමෙයිව මරා දමන ලෙස අණ කළේය. බෙනායා ගොස් ඔහුට පහර දී ඔහුව මරා දැමුවේය.[3]

සලමොන්ගේ රාජ්‍ය බලය තව තවත් තහවුරු විය.[4]

**3** පසුව සලමොන් රජ ඊජිප්තුවේ රජ්ජුරුවන් වන පාරාවෝ සමඟ එකඟත්වයකට පැමිණ ඔහුගේ දූවව[5] විවාහ කරගත්තේය.[6] ඔහු ඇයව දාවිත්ගේ නුවරට[7] රැගෙන ගියේය. සලමොන් රජ තමාගේ මාලිගාවද[8] යෙහෝවා දෙවිගේ ගෘහය[9] හා යෙරුසලම වටා ඇති පවුරද[10] සාදා නිම කරන තුරු ඇයව ඒ නුවරේ තබාගත්තේය. **2** ඒ වන විට යෙහෝවා දෙවිගේ නාමය දරන ගෘහයක් ගොඩනඟා නොතිබුණු බැවින්[11] ජනයා විවිධ ස්ථානවල පූජා ඔප්පු කළෝය.[12] **3** සලමොන් රජ තම පියා වූ දාවිත්ගේ අණපනත් පිළිපදිමින්[13] දිගටම යෙහෝවා දෙවිට ප්‍රේම කළේය.[14] ඔහු පූජා ඔප්පු කරන පිණිස නිතරම පූජනීය ස්ථානවලට ගියේය.[15]

**4** ඒ කාලයේදී පූජා ඔප්පු කරන ප්‍රධානතම ස්ථානය[16] වූයේ ගිබියොන් නගරයයි.[17] එබැවින් සලමොන් රජ පූජා ඔප්පු කරන පිණිස එතැනට ගියේය. රජ එහි තිබූ පූජාසනය මත දවන පූජා දහසක් ඔප්පු කළේය.[18] **5** රාත්‍රියේ සලමොන් රජු ගිබියොන් නුවරෙහි නිදා සිටියදී යෙහෝවා දෙවි ඔහුට සිහිනයකින්[19] පෙනී,[20] “ඔබට අවශ්‍ය දෙයක් ඇත්නම් එය මගෙන් ඉල්ලන්න”[21] කියා කීවේය. **6** එවිට සලමොන් රජ මෙසේ කීවේය. “ඔබේ සේවකයාද මගේ පියාද වූ දාවිත් ඔබට විශ්වාසවන්තව සේවය කළා. ඔහු ඔබ ඉදිරියේ ධර්මිෂ්ඨ[22] හා අවංක ජීවිතයක් ගත කළා. ඔබත් ඔහුට ඉමහත් ප්‍රේමයක්* පෙන්නුවා.[1] අද ඔහුගේ පුත්‍රයෙක් ඔහුගේ සිංහාසනයේ ඉඳගෙන සිටින්නේ ඔබ පෙන්වූ ඒ මහත් ප්‍රේමය# නිසයි.[2] **7** මාගේ දෙවියනි, යෙහෝවා, ඔබ මගේ පියා වන දාවිත්ගෙන් පසුව ඔබේ සේවකයා වන මාව රජකමට පත් කළා. නමුත් මට මේ වගකීම් දරන්න අද්දැකීම් නැහැ.[3] මම තරුණයෙක්.[4] **8** ඔබ තෝරාගත් ඔබේ සෙනඟගේ[5] පාලකයා මමයි. ඔවුන් ගණන් කරන්නවත් බැරි තරම් අතිවිශාල සෙනඟක්.[6] **9** මේ සෙනඟ විනිශ්චය කළ හැක්කේ කාටද?[7] එය ලෙහෙසි පහසු කාර්යයක් නම් නෙවෙයි.[8] ඒ නිසා ඔබේ සෙනඟව විනිශ්චය කිරීමටත්[9] හරි වැරැද්ද අතර වෙනස හොඳින් වටහාගැනීමටත්[10] අවශ්‍ය මඟ පෙන්වීම් ඔබ ලබා දෙන විට ඒවා පිළිගැනීමට ඔබේ සේවකයාට කීකරු හදවතක් ලබා දෙන්න.”

**10** සලමොන් රජ එවැනි ඉල්ලීමක් කළ නිසා යෙහෝවා දෙවි සතුටු විය.[11] **11** එබැවින් දෙවි ඔහුට මෙසේ කීවේය. “ඔබ දීර්ඝායුෂවත් ධන සම්පත්වත්[12] ඔබේ සතුරන්ගෙන් පළිගන්න කියාවත් ඉල්ලුවේ නැත. ඒ වෙනුවට නිවැරදි තීන්දු දීම සඳහා තේරුම්ගැනීමේ ශක්තිය ලබා දෙන මෙන් ඔබ ඉල්ලුවෙහිය.[13] **12** ඔබේ ඉල්ලීම මම අනිවාර්යයෙන්ම ඉටු කරන්නෙමි.[14] ඔබ හා සමාන කිසිවෙක් මින් පෙර කිසි දිනක සිටියේවත් මින්පසු සිටින්නේවත් නැති වන ලෙස[15] මම ඔබට ප්‍රඥාවන්ත සිතක්ද නිවැරදිව තීරණ ගැනීමට තේරුම්ගැනීමේ ශක්තියද[16] ලබා දෙන්නෙමි.

**2 පරි.**
**1** ගීතා 21:6 ගීතා 72:17
**2** 1රාජා 2:24 හිතෝ 25:5 යෙසා 9:7
**3** 1රාජා 2:9 1රාජා 2:25 1රාජා 2:34
**4** 1රාජා 2:12 2ලේක 1:1 හිතෝ 16:12 හිතෝ 29:4

**3 පරි.**
**5** ද්වි 7:4 1රාජා 7:8 1රාජා 9:24 1රාජා 11:1 එස්රා 10:10 නෙහෙ 13:27
**6** එස්රා 9:2 එස්රා 9:14
**7** 2සාමු 5:7 1ලේක 11:7
**8** 1රාජා 7:1
**9** 1රාජා 8:19
**10** 1රාජා 9:15
**11** 1රාජා 5:3 1ලේක 17:4 1ලේක 17:12 1ලේක 28:6 ක්‍රියා 7:47
**12** ලෙවී 17:4 ලෙවී 26:30 ද්වි 12:6 1රාජා 15:14 1රාජා 22:43 2ලේක 33:17
**13** 2ලේක 17:3
**14** ද්වි 6:5 ද්වි 10:12 ගීතා 145:20 මතෙ 22:37 1කොරි 8:3 1යොහ 5:3
**15** 1සාමු 7:9 1සාමු 10:8 1රාජා 15:14 1රාජා 22:43 1ලේක 21:26 2ලේක 1:3
**16** 1ලේක 16:39 1ලේක 21:29
**17** යොෂු 9:3 1රාජා 9:2
**18** 2ලේක 1:6
**19** ගණන් 12:6 යෝබ් 33:15
**20** 1රාජා 9:2 2ලේක 1:3
**21** 2ලේක 1:7
**22** ගීතා 11:7

**2 තීරුව**
**1** 2ලේක 1:8
**2** 1රාජා 2:4
**3** ගණන් 27:17 ද්වි 31:2 2සාමු 5:2

**4** 1ලේක 29:1; යෙරෙ 1:6; මතෙ 23:12; 2කොරි 12:9; **5** නික් 19:6; ද්වි 7:6; **6** උත් 13:16; උත් 22:17; **7** 1සාමු 8:6; **8** නික් 32:9; ද්වි 9:6; **9** 2ලේක 1:10; ගීතා 72:1; ගීතා 119:34; **10** 2සාමු 14:17; හෙබ්‍රෙ 5:14; **11** හිතෝ 15:8; **12** හිතෝ 27:24; 1තිමෝ 6:9; **13** 1ලේක 22:12; 1ලේක 29:19; හිතෝ 16:16; **14** ගීතා 10:17; දේශ 1:16; යෙසා 65:24; 1යොහ 5:14; **15** මතෙ 12:42; **16** 1රාජා 4:29; 1රාජා 5:12; 2ලේක 1:11; හිතෝ 3:13.

**1රාජා 3:6*** හෝ, “ළැදි ප්‍රේමය.” **6#** හෝ, “ළැදි ප්‍රේමය.”

**13** ඔබ නොඉල්ලූ දේ පවා මම ඔබට
දෙන්නෙමි.[1] ඔබේ මුළු ජීවිත කාලය
පුරාවට මහත් ධන සම්භාරයක්ද[2]
ගෞරවයද ඔබට ලබා දෙන්නෙමි.
ඔබෙන් පසුව වෙන කිසි රජෙක්
ඒ තත්වයට පත් නොවනු ඇත.[3]
**14** ඔබේ පියා වන දාවිත් මෙන්[4]
ඔබත් මාගේ නියෝග සහ ආඥා පිළි-
පදිමින්[5] මා පෙන්වන ලෙස ජීවත්
වුණොත් මම ඔබේ ආයු කාලයද වැඩි
කරන්නෙමි."[6]

**15** සලමොන් රජ අවදි වූ විට,[7]
දෙවි තමාට සිහිනයකින් කතා කළ
බව ඔහුට වැටහිණ. පසුව ඔහු යෙ-
රුසලමට පැමිණ යෙහෝවා දෙවි-
ගේ ගිවිසුම් පෙට්ටිය[8] ඉදිරියේ දවන
පූජා හා හවුල් පූජා[9] ඔප්පු කර,
තමාගේ සියලු සේවකයන්[10] සඳහා
විශාල භෝජන සංග්‍රහයක් පිළියෙල
කළේය.[11]

**16** පසුව ගණිකාවෝ[12] දෙදෙ-
නෙක් රජු ඉදිරියට පැමිණියෝය.[13]
**17** එක් ස්ත්‍රියක් මෙසේ කීවාය.
"මගේ ස්වාමීනි,[14] අපි දෙදෙනා ඉන්-
නේ එකම නිවසේ. මට දරුවෙක්
ලැබෙද්දී මේ ස්ත්‍රියත් මා ළඟ සිටියා.
**18** දරුවා ලැබී දවස් තුනකට පසුව
ඇයටත් දරුවෙක් ලැබුණා. අප දිග-
ටම ජීවත් වුණේ එකම නිවසේ. අප
දෙදෙනා හැර වෙන කිසිවෙක් එහි
සිටියේ නැහැ. **19** දිනක් ඈ නින්-
දෙන් දරුවාගේ ඇඟ උඩට පෙර-
ළුණු නිසා ඇගේ පුතා මැරුණා.
**20** ඔබේ සේවිකාව වන මම නිදා
සිටින අතරේදී ඈ රාත්‍රියේම අවදි වී
ඇගේ මිය ගිය පුතාව මා ළඟ
තබා මගේ පුතාව ඇය ළඟින් තබා-
ගත්තා. **21** මා උදේ නැඟිට මගේ
පුතාට කිරි දෙන්න[15] බලද්දී පුතා
මිය ගොස් සිටින බව මම දැක්කා.
නමුත් දරුවා දෙස බලද්දී ඔහු මගේ
පුතා නොවන බව මම හඳුනගත්තා."
**22** නමුත් අනික් ස්ත්‍රිය මෙසේ පැවසු-
වාය. "නැහැ. ඔබ කියන්නේ බොරු.
පණපිටින් ඉන්නේ මගේ පුතා. ඔබේ
පුතා තමයි මැරුණේ!" එවිට මේ
ස්ත්‍රිය, "නැහැ. මැරුණේ ඔබේ පුතා.
මගේ පුතා නෙවෙයි" කියා පැවසුවාය.
ඔවුහු රජු ඉදිරියේ මෙසේ වාද කරමින්
සිටියෝය.[1]

**23** අවසානයේදී රජ මෙසේ පැවසු-
වේය. "එක ස්ත්‍රියක්, 'පණපිටින් ඉන්-
නේ මගේ පුතා. ඔබේ පුතා මැරුණා'
කියා කියනවා. අනික් ස්ත්‍රිය, 'නැහැ.
මැරුණේ ඔබේ පුතා, මගේ පුතා
නෙවෙයි' කියා පවසනවා. **24** මේ
ප්‍රශ්නේ විසඳන්න මට කඩුවක් ගෙ-
නත් දෙන්න."[2] රජුගේ සේවකයෝ
කඩුවක් ගෙනාවෝය. **25** එවිට රජ
මෙසේ කීවේය. "දරුවාව දෙකට කපා
එක කොටසක් එක් ස්ත්‍රියකටද අනික්
කොටස අනික් ස්ත්‍රියටද දෙන්න."
**26** පණපිටින් සිටි දරුවාගේ මවට
තම පුත්‍රයා ගැන දැනුණු මව් සෙනෙ-
හස[3] නිසා ඇය එකෙනෙහිම රජුට
මෙසේ පැවසුවාය. "අනේ මගේ ස්වා-
මීනි,[4] දරුවාව ඇයටම දෙන්න. දරු-
වාව මරන්න නම් එපා." නමුත් අනික්
ස්ත්‍රිය, "දරුවා අප දෙදෙනාගෙන්
කාටවත් අයිති වෙන්නේ නැහැ. දරු-
වාව දෙකට කපන්න"[5] යයි පැවසුවාය.
**27** එය අසා රජ මෙසේ කීවේය. "දරු-
වාව මරන්න එපා. ඔහුව අර ස්ත්‍රියට
දෙන්න. ඇයයි දරුවාගේ සැබෑ මව."

**28** රජු දුන් මේ තීන්දුව මුළු ඊශ්‍රා-
යෙල් දේශය පුරා පතළ විය.[6] රජු
නිසා ඔවුහු භය වූහ.[7] මන්ද යුක්තිය
ඉටු කිරීමට ඔහුට දෙවිගෙන් ප්‍රඥාව[8]
ලැබී තිබෙන බව ඔවුන්ට වැටහිණ.

**4** සලමොන් රජ මුළු ඊශ්‍රායෙල්
දේශයම පාලනය කළේය.[9]
**2** ප්‍රධාන තනතුරු සඳහා ඔහු පත්
කළ නිලධාරීන්[10] පිළිබඳ විස්තර මෙ-
සේය. සාදොක්ගේ[11] පුත් අෂරියාව ඔහු
පූජකයා ලෙස පත් කළේය. **3** ෂීෂා-
ගේ පුත්‍රයන් වන එලිහොරෙෆ් සහ
අහියා ලේකම්වරුන්[12] ලෙස කටයුතු
කළෝය. අහිලුද්ගේ පුත් යෙහෝෂ-
පාට්[13] වාර්තාකරු විය. **4** යෙහෝ-

**3 පරි.**
**1** ගීතා 84:11, මතෙ 6:33, එෆී 3:20
**2** 1රාජා 4:21, හිතෝ 3:16, දේශ 7:11
**3** 1රාජා 10:23, 2ලේක 1:12
**4** 1රාජා 15:5, 2ලේක 7:17
**5** 1ලේක 22:12
**6** ද්වි 25:15, ගීතා 21:4, ගීතා 91:16, හිතෝ 3:16
**7** උත් 41:7, යෙරෙ 31:26
**8** 2සාමු 6:17, 1ලේක 16:1
**9** ලෙවී 7:11, 2සාමු 6:18, 1ලේක 21:29
**10** 1රාජා 1:33
**11** උත් 31:54, එස්ත 1:3, දානි 5:1
**12** උත් 38:15, ද්වි 23:17, යොෂු 6:17, විනි 11:1
**13** 1සාමු 8:20
**14** රෝම 13:7, 1පේත 2:17
**15** 1සාමු 1:23, 1තෙස 2:7

**2 තීරුව**
**1** හිතෝ 20:8
**2** හිතෝ 20:26
**3** උත් 43:30, යෙසා 49:15, යෙරෙ 31:20, හොෂෙ 11:8, 1තෙස 2:7
**4** 1සාමු 1:26, 1රාජා 3:17
**5** රෝම 1:31, 2තිමෝ 3:3
**6** 1රාජා 2:3, 1රාජා 3:9
**7** යොෂු 4:14, 1සාමු 12:18, 1ලේක 29:24, ගීතා 72:5, හිතෝ 24:21
**8** එස්රා 7:25, හිතෝ 2:3, දේශ 7:19, කොලො 2:3, යාකො 1:5

**4 පරි.**
**9** 1රාජා 1:20, 2ලේක 9:30, දේශ 1:12
**10** නික් 18:21
**11** 1ලේක 6:8, 1ලේක 27:17, එස 44:15

**12** 2සාමු 8:17; 1ලේක 27:32; **13** 2සාමු 8:16; 2සාමු 20:24; 1ලේක 18:15.

යාදාගේ පුත් බෙනායා[1] හමුදාවේ ප්‍රධා-
නියා[2] ලෙසද සාදොක් සහ අබියාතර්[3]
පූජකයන් ලෙසද කටයුතු කළෝය.
**5** ඔහු දිසාපතීන්ව අධීක්ෂණය කිරී-
මට නාතන්ගේ[4] පුත් අෂරියාව පත්
කළේය. පූජකයෙකු ලෙස කටයුතු
කළ නාතන්ගේ පුත් සාබුද්, රජුගේ
මිත්‍රයෙකු[5] විය. **6** අහිෂාර්ව ගෙයි
වැසියන්ගේ ප්‍රධානියා ලෙසද අබ්දාගේ
පුත් අදොනිරාම්ව[6] රජුගේ හමුදාවට
බඳවාගත් අයව[7] අධීක්ෂණය කිරීමටද
පත් කළේය.

**7** සලමොන් රජ ඊශ්‍රායෙල් දේ-
ශය කෙරෙහි දිසාපතීන් දොළොස්-
දෙනෙකුව පත් කළේය. රජුටත්
රජමාලිගාවේ සියලුදෙනාටත් ආහාර
පාන සැපයීමට පවරා තිබුණේ ඔවුන්-
ටය. අවුරුද්දට මාසයක් බැගින්
ඔවුහු එක් එක් කෙනා රජුගේ
නිවසට ආහාර සැපයූහ.[8] **8** ඔවුන්-
ගේ නම් මෙසේය. එෆ්‍රායිම් කඳුක-
රය[9] භාරව සිටියේ හූර්ගේ පුත්‍රයාය.
**9** මාකෂ්, ෂායල්බිම්,[10] බෙත්-
ෂෙමෙෂ්[11] සහ ඒලොන්-බෙත්-හානාන්
යන නගර භාරව සිටියේ දෙකෙර්ගේ
පුත්‍රයාය. **10** අරුබ්බොත් නගරය
භාරව සිටියේ හෙසෙද්ගේ පුත්‍රයාය.
(මොහුට සෝකෝ සහ මුළු හේෆෙර්
දේශයද භාරව තිබිණ.)[12] **11** මුළු
දෝර් කඳුවැටියම[13] භාරව සිටියේ අබි-
නාදාබ්ගේ පුත්‍රයාය. (මොහු සල-
මොන්ගේ දියණිය වන ටාෆත්ව
විවාහ කරගත්තේය.) **12** තයනක්
නුවර,[14] මෙගිද්දෝ[15] සහ මුළු බෙත්-
ෂෙයාන් පළාත භාරව සිටියේ අහි-
ලූද්ගේ පුත් බානාය. ඔහුට බෙත්-
ෂෙයාන්[16] සිට ආබෙල්-මෙහෝලා[17]
දක්වාද යොක්මෙයාම්[18] දක්වාද තිබූ
පළාත් භාරව තිබිණ. (බෙත්-ෂෙයාන්
පිහිටා තිබුණේ යෙෂ්‍රෙයෙල්ට[19] පහ-
ළින් පිහිටි ෂාරෙතාන්[20] අසලය.)
**13** රාමොත්-ගිලියද් නුවර[21] භාරව
සිටියේ ගෙබර්ගේ පුත්‍රයාය. (ගිලි-
යද්හි[22] පිහිටි, මනස්සේ ගෝත්‍රයට
අයත් යායිර්ගේ කූඩාරම් ගම්මානද[23]
ඔහුගේ භාරයේ තිබිණ. බාෂාන්හි[24]

**4 පරි.**
**1** 1රාජා 1:8; 1ලේක 27:5
**2** 1රාජා 2:35
**3** 1රාජා 2:26
**4** 2සාමු 12:1; 1රාජා 1:10
**5** 2සාමු 15:37; 1ලේක 27:33
**6** 2සාමු 20:24; 1රාජා 5:14; 1රාජා 12:18
**7** 1රාජා 9:15
**8** 1ලේක 27:1
**9** යොෂු 17:18
**10** යොෂු 19:42
**11** 1සාමු 6:12
**12** යොෂු 12:17
**13** යොෂු 12:23
**14** යොෂු 17:11
**15** 2රාජා 23:29
**16** 1සාමු 31:10
**17** 1රාජා 19:16
**18** යොෂු 21:34
**19** 1රාජා 18:46
**20** යොෂු 3:16
**21** ද්වි 4:43; යොෂු 20:8; 1රාජා 22:3; 2රාජා 9:1
**22** ගණන් 32:1; යොෂු 22:9
**23** ගණන් 32:41; ද්වි 3:14
**24** ගණන් 21:33; යොෂු 13:11; ගීතා 22:12

**2 තීරුව**
**1** ද්වි 3:4
**2** උත් 32:2; 2සාමු 2:8; 2සාමු 17:24
**3** යොෂු 19:32
**4** 1සාමු 18:18
**5** යොෂු 19:24
**6** යොෂු 19:17
**7** යොෂු 18:11
**8** 1රාජා 1:8
**9** යොෂු 17:1
**10** ගණන් 21:21
**11** ද්වි 2:26
**12** ද්වි 1:4
**13** ද්වි 3:4
**14** උත් 22:17; හිතෝ 14:28
**15** දේශ 2:24; දේශ 9:7
**16** උත් 15:18; නික් 23:31; ද්වි 11:24; 2සාමු 8:3; 1ලේක 19:16; ගීතා 72:8
**17** ගීතා 72:10
**18** 1රාජා 5:11

පිහිටි අර්ගොබ්[1] පළාතද ඔහුට භාර
විය. පවුරුවලින් වට වූ තඹ දොර
අගුල් සහිත විශාල නුවරවල් හැටක්
එහි තිබිණ.) **14** මහනායිම් නුවර[2]
භාරව සිටියේ ඉද්දෝගේ පුත් අහින-
දාබ්ය. **15** නෆ්තලී දේශය[3] භාරව
සිටියේ අහිමයාෂ්ය. (මොහුද සල-
මොන්ගේ දියණියක විවාහ කර-
ගත්තේය.[4] ඇගේ නම බසෙමත්ය.)
**16** ආෂේර් දේශය[5] සහ බෙයාලොත්
නම් පළාත භාරව සිටියේ හූෂයි-
ගේ පුත් බානාය. **17** ඉසකාර් දේ-
ශය[6] භාරව සිටියේ පරුවාගේ පුත්
යෙහෝෂාපාට්ය. **18** බෙන්ජමින් දේ-
ශය[7] භාරව සිටියේ ඒලාගේ පුත්
ෂිමෙයිය.[8] **19** ගිලියද් දේශය[9] භාරව
සිටියේ උරීගේ පුත් ගෙබර්ය. මෙය
කලින් අමෝරිවරුන්ගේ රජු වූ[10]
සීහොන්[11] විසින්ද බාෂාන්හි රජු වූ[12]
ඕග්[13] විසින්ද පාලනය කරන ලදි. ඒ
දිසාපතීන් සියලුදෙනාව අධීක්ෂණය
කිරීම සඳහා එක් නිලධාරියෙකුව පත්
කර තිබිණ.

**20** යූදා සහ ඊශ්‍රායෙල් දේශයේ
ජනගහනය මුහුදු වෙරළේ වැලි මෙන්
ගණනින් බොහෝ සේ වර්ධනය
වූහ.[14] ඒ කාලයේදී ඔවුන්ට කෑම බීම
නොඅඩුව තිබුණු අතර ඔවුහු සතුටින්
ජීවිතය ගත කළෝය.[15]

**21** මහ ගංගාවේ*[16] සිට පිලිස්තිව-
රුන්ගේ දේශය දක්වාද ඊජිප්තුවේ
දේශ සීමාව දක්වාද තිබුණු සියලු
රාජ්‍යයන් සලමොන් රජුගේ පාලනය
යටතේ තිබිණ. සලමොන් රජුගේ මුළු
ජීවිත කාලය පුරාම ඒ ඒ රාජ්‍යයන්
ඔහුට කප්පම් ගෙවූ අතර ඔවුහු ඔහුට
සේවය කළෝය.[17]

**22** සලමොන් රජුගේ මාලිගාවට
දිනකට අවශ්‍ය වූ ආහාර ද්‍රව්‍ය මේ-
වාය. සිහින් පිටි කෝර් මිනුම්*[18]
තිහක්ද සාමාන්‍ය පිටි කෝර් මිනුම්
හැටක්ද අවශ්‍ය විය. **23** තර කළ
ගවයන් දසදෙනෙක්ද තණබිමෙන්

---

**1රාජා 4:21*** එනම්, යුප්‍රටීස් ගඟේ. **22*** කෝර් මිනුමක් යනු ලීටර් 220කි.

ගත් ගවයන් විසිදෙනෙක්ද බැටළු-
වන් සියදෙනෙක්ද මුවන්ද*[1] තර කළ
කුරුල්ලන්ද කෑමට පිළියෙල කරනු
ලැබීය. **24** තිප්සා සිට ගාසා[2] දක්වා
තිබූ මහා ගඟෙන්[3] මෙගොඩ පිහිටි මුළු
ප්‍රදේශයම ඔහුගේ අණසක යටතේ
තිබිණ. එම ප්‍රදේශවල විසූ සියලු රජ-
වරුද ඔහුට යටත්ව සිටියෝය.[4] ඒ
මුළු ප්‍රදේශය පුරාම සාමය පැවතිණ.[5]
**25** යූදා[6] සහ ඊශ්‍රායෙල් දේශවල විසූ
ජනයා සුරක්ෂිතව කල් ගෙවූහ.[7] සල-
මොන් රජකම් කළ මුළු කාලය පුරාම
දාන් සිට බෙයර්-ෂෙබා[8] දක්වා වාසය
කළ සියලුදෙනා තම තමාගේ මිදිවැල
යටද තම තමාගේ අත්තික්කා ගස
යටද සුවසේ වාසය කළෝය.[9]

**26** සලමොන් රජුට අසරුවන් දො-
ළොස්දහසක් සිටි අතර ඔහුගේ අශ්ව
රථ[10] ඇදගෙන ගිය අශ්වයන් සඳහා
ගාල් හතළිස්දහසක් තිබිණ.[11]

**27** දිසාපතිහු[12] සියලුදෙනාම සල-
මොන් රජු සඳහාත් ඔහුගේ මේස-
යෙන් කන සියලුදෙනා සඳහාත් තම
තමාට නියමිත මාසයේදී කිසි අඩුපා-
ඩුවක් නැතුව ආහාර සැපයුවෝය.
**28** හමුදාවට යොදාගත් අශ්ව කණ්-
ඩායම්වලට[13] හා අනිකුත් අශ්වයන්ට
අවශ්‍ය වූ බාර්ලි සහ පිදුරු සැපයීමට
වගබලා ගත්තේද එම දිසාපතීන්මය.
ඔවුහු එක් එක් කෙනා තම තමන්ට
පවරා තිබුණු ප්‍රදේශය සඳහා ඒ ආහාර
ද්‍රව්‍ය සැපයුවෝය.[14]

**29** දෙවි, සලමොන් රජුට ප්‍රඥා-
වත්[15] තේරුම්ගැනීමේ හැකියාවත්[16]
නොඅඩුව දුන්නේය. මුහුදු වෙරළේ
වැලිවලට සමාන වූ[17] පුළුල් අවබෝධ-
යක්ද*[18] දෙවි ඔහුට ලබා දුන්නේය.
**30** සලමොන් රජුට තිබූ ප්‍රඥාව
පෙරදිග රටවල විසූ සියලු වැසියන්-
ගේ[19] හා ඊජිප්තුවේ විසූ සියලු වැසි-
යන්ගේ[20] ප්‍රඥාව අභිභවා ගියේය.[21]
**31** ඒ කාලයේ ජීවත් වූ සියලු මිනි-
සුන්ට වඩා ඔහු ප්‍රඥාවන්තයෙකු
විය. ඔහු සේරාගෙන් පැවතෙන්නෙකු
වූ ඒතන්ටද[1] මාහොල්ගේ පුත්‍රයන්
වූ හේමාන්ටද[2] කල්කොල්ටද[3] දර්-
දාටද වඩා ප්‍රඥාවන්ත විය. ඔහු-
ගේ කීර්තිය සියලු දේශවල පැතිර
ගියේය.[4] **32** හිතෝපදේශ තුන්දහ-
සක් පැවසීමට ඔහුට හැකියාව
තිබිණ.[5] ඔහු ගීතිකා[6] එක්දහස්පහක්
රචනා කළේය. **33** ලෙබනොන්හි
වැඩෙන දේවදාර වැනි අතිවිශාල
ගස්[7] ගැන පමණක් නොව බිත්තිවල
වැවෙන හිසොප්[8] වැනි කුඩා පැළ
ගැනද ඔහු විස්තර කළේය. එමෙන්ම
මෘගයන්[9] ගැනත් පක්ෂීන්[10] ගැනත්
කුඩා සතුන්[11] ගැනත් මත්ස්‍යයන්[12]
ගැනත් විස්තර කිරීමේ හැකියාව
ඔහුට තිබිණ. **34** සියලු ජාතීන්ට
අයත් ජනයා සලමොන් රජුගේ ප්‍රඥාව
ගැන දැනගන්නා පිණිස ඔහු වෙත
පැමිණියෝය.[13] ඔහුගේ ප්‍රඥාව ගැන
ආරංචි වී සෑම රටකම සිටි රජවරුද
ඔහු වෙතට තම දූතයන් එවූහ.[14]

**5** දාවිත් රජුගෙන් පසුව ඔහුගේ පුත්
සලමොන්ව රජු ලෙස අභිෂේක
කළ බව තීර්හි[15] රජු වූ හීරාම්ට[16]
ආරංචි විය. දාවිත්ගේ කිට්ටු මිත්‍ර-
යෙකු වූ[17] හීරාම් රජ එය අසා සල-
මොන් රජු වෙත තම සේවකයන්ව[18]
යැව්වේය. **2** එවිට සලමොන් රජ
ඔවුන් අත පණිවිඩයක් යවා හීරාම්
රජුගෙන් මෙම ඉල්ලීම කළේය.[19]
**3** “යෙහෝවා දෙවි මගේ පියා වූ
දාවිත්ගේ සතුරන්ව ඔහුට යටත් කර
දෙන තෙක් බොහෝ කාලයක් පුරා
සතුරු සේනාවලට විරුද්ධව යුද්ධ
කරන්න ඔහුට සිදු වුණා. ඔහුගේ දෙවි
වන යෙහෝවාගේ නාමයට ගෞර-
වය ගෙනන පිණිස ගෘහයක් ගො-
ඩනැඟීමට ඔහුට නොහැකි වුණේ
ඒ නිසයි කියා ඔබ හොඳින් දන්-
නවා.[20] **4** නමුත් දැන් මගේ දෙවි
වන යෙහෝවා මට සෑම අතින්ම

**4 පරි.**
1 ද්වි 12:15; ද්වි 14:5; ද්වි 15:22; විලා 1:6
2 උත් 10:19
3 උත් 2:14; ද්වි 1:7; යොෂු 1:4
4 ද්වි 28:13
5 1රාජා 5:4; 1ලේක 22:9; ගීතා 72:7
6 2රාජා 8:19
7 යෙසා 60:18
8 විනි 20:1; 2සාමු 17:11; 2සාමු 24:15
9 මීකා 4:4; සෙක 3:10
10 2ලේක 1:14
11 ද්වි 17:16; 2සාමු 8:4; 1රාජා 10:25; 2ලේක 1:17
12 1රාජා 4:7
13 එස්ත 8:14; මීකා 1:13
14 1කොරි 14:40
15 1රාජා 10:23; 2ලේක 1:10; හිතෝ 2:6
16 හිතෝ 4:7
17 උත් 41:49
18 ගීතා 119:32
19 උත් 25:6; යෝබ් 1:3; මතෙ 2:1
20 යෙසා 19:11; ක්‍රියා 7:22
21 ලූක් 11:31; කොලො 2:3

**2 තීරුව**
1 1ලේක 2:8; ගීතා 89:පෙර
2 ගීතා 88:පෙර
3 1ලේක 2:6
4 1රාජා 10:1; 1රාජා 10:7
5 හිතෝ 1:1; දේශ 12:9
6 සල 1:1
7 2රාජා 19:23; ගීතා 92:12
8 නික් 12:22; ගණන් 19:18; ගීතා 51:7; හෙබ්‍රෙ 9:19
9 උත් 1:24; හිතෝ 30:30
10 උත් 1:20; යෝබ් 12:7; හිතෝ 7:23; හිතෝ 30:19
11 උත් 1:25; හිතෝ 6:6; හිතෝ 30:25
12 උත් 1:21
13 හිතෝ 13:20
14 2ලේක 9:1; 2ලේක 9:23

**1රාජා 4:23*** මුල් භාෂාවේ මුව වර්ග තුනක් ගැන සඳහන් වේ. **29*** මූ.අ., “පුළුල් සිතක්.”

**5 පරි.** **15** එස 26:15; එස 27:3; **16** 2ලේක 2:3; 2ලේක 2:12; **17** 2සාමු 5:11; 1ලේක 14:1; **18** 1රාජා 9:27; **19** 2ලේක 2:3; **20** 2සාමු 7:5; 1ලේක 22:8; 2ලේක 6:8.

සමාදානය දී තිබෙනවා.[1] කිසිවෙක්
මට එරෙහිව නැඟී සිටින්නේ නැහැ.
මේ දේශය තුළ කිසිදු දුෂ්ටකමක්ද
සිදු වෙන්නේ නැහැ.[2] **5** එබැවින්
මගේ දෙවි වන යෙහෝවාගේ නාමයට
ගෞරවය ගෙනෙන පිණිස ගෘහයක්
ගොඩනැඟීමට දැන් කාලය එළඹී
තිබෙනවා කියා මට සිතෙනවා.[3]
මන්ද, 'ඔබට පසුව ඔබේ සිංහාසනයේ
හිඳගැනීමට මම ඔබේ පුත්‍රයාව පත්
කරන්නෙමි. මාගේ නාමයට ගෞර-
වය ගෙනෙන පිණිස ගෘහයක් ගොඩ-
නඟන්නේ ඔහුය'[4] කියා යෙහෝවා
දෙවි මගේ පියා වූ දාවිත්ට පොරොන්දු
වුණා. **6** ඒ නිසා ඒ ගෘහය ගොඩ-
නැඟීමට අවශ්‍ය ලී සඳහා ලෙබ-
නොන් දේශයෙන් දේවදාර ගස්[5] කපා
දෙන ලෙස ඔබේ සේවකයන්ට අණ
කරන්න. ඔබේ සේවකයන් සමඟ වැඩ
කරන්න මගේ සේවකයන්වත් මම
එවන්නම්. ඔබේ සේවකයන්ට දිය
යුතු කුලිය මට කියන්න. මම ඔබ
කියන ලෙස ඔවුන්ට දෙන්නම්. මන්ද
සීදොන් වැසියන්[6] මෙන් ගස් කැපීමට
සමත් කිසිවෙක් අප අතරේ නැති බව
ඔබ හොඳින් දන්නවා."

**7** සලමොන් රජුගේ පණිවිඩය
හීරාම් රජුට[7] ලැබුණු විගස ඔහු ඉතා
සතුටු වී මෙසේ කීවේය. "මේ විශාල
සෙනඟ පාලනය කරන්න[8] දාවිත්
රජුට ඥානවන්ත[9] පුතෙක් ලබා දුන්
යෙහෝවා දෙවිට ප්‍රශංසා වේවා!"[10]
**8** පසුව හීරාම් රජ සලමොන් රජුට
මෙසේ කියා යැවීය. "ඔබේ පණිවිඩය
මට ලැබුණා. ඔබට අවශ්‍ය දේවදාර ලී
සහ ජුනිපර් ලී[11] මම ඔබට එවන්නම්.
**9** මගේ සේවකයන් ඒවා ලෙබනොන්[12]
සිට මුහුද ළඟට ගෙන එයි. ඉන්පසු
මගේ සේවකයන් එම ලීවලින් පාරු
සාදා ඔබ කියන තැනකට මුහුදෙන්
ගෙනැවිත් ඒවා ලිහා දෙයි.[13] එවිට
ඔබට ඒවා රැගෙන යෑමට හැකියි. ඒ
වෙනුවෙන් ඔබ මගේ ගෙයි වැසියන්ට
අවශ්‍ය ආහාර පමණක් සපයන්න."[14]

**10** මෙසේ හීරාම් රජ සලමොන්
රජුට අවශ්‍ය තරම් දේවදාර සහ
ජුනිපර් ලී සැපයුවේය. **11** ඒ සඳහා
සලමොන් රජ හීරාම් රජුගේ ගෙයි
වැසියන්ට තිරිඟු කෝර් මිනුම් විසිදහ-
සක්ද[1] ඔලීව ගෙඩිවලින් සෑදූ තෙල්[2]
කෝර් මිනුම් විස්සක්ද දුන්නේය.
සලමොන් රජ අවුරුදු පතා හීරාම්
රජුට එම ආහාර තොගය යැව්වේය.[3]
**12** යෙහෝවා දෙවි සලමොන් රජුට
පොරොන්දු වූ ලෙස ඔහුට ප්‍රඥාව දුන්-
නේය.[4] හීරාම් රජු සහ සලමොන් රජු
අතර සාමකාමී සබඳතා පැවතිණ.
ඔවුහු එකිනෙකා සමඟ ගිවිසුමක්ද
ඇති කරගත්හ.

**13** සලමොන් රජ ඊශ්‍රායෙල්වරුන්
අතරින් කම්කරුවන්[5] තිස්දහසක්
සේවයට බඳවාගත්තේය. **14** ඔහු
සෑම මාසයකම කම්කරුවන් දසදහ-
සකින් යුත් කණ්ඩායමක් ලෙබනොන්
වෙත යැව්වේය. ඔවුහු මාසයක් ලෙබ-
නොන්හි වැඩ කළ පසු තම නිවෙස්ව-
ලට පැමිණියෝය.[6] මාස දෙකකින්
පසුව ඔවුහු නැවත වැඩට ගියෝය.
කම්කරුවන්ගේ[7] වැඩ අධීක්ෂණය
කිරීමට[8] අදොනිරාම්ව[9] පත් කරනු
ලැබිණ. **15** බර උසුලන්නෝ හැත්-
තෑදහසක්ද[10] කඳුවලින්[11] ගල් කඩන්-
නෝ අසූදහසක්ද[12] සලමොන් රජු
යටතේ සේවය කළෝය.[13] **16** ඊට
අමතරව කම්කරුවන්ගේ වැඩ බැලී-
මට නිලධාරීහු[14] තුන්දහස් තුන්සිය-
යක්[15] සලමොන් රජු යටතේ සේවය
කළෝය. **17** ඒ ගෘහයේ අත්තිවා-
රම[16] දැමීම සඳහා කඳුවලින් විශාල,
වටිනා ගල්[17] කඩා ඒවා රැගෙන එන
ලෙස[18] රජ ඔවුන්ට අණ කළේය.
**18** සලමොන් රජුගේ වැඩකරුවෝද
හීරාම් රජුගේ වැඩකරුවෝද ගෙබල්ව-
රුද[19] ඒ ගෘහය සෑදීමට අවශ්‍ය ලීද
ගල්ද කපා සූදානම් කළෝය.

**6** ඊශ්‍රායෙල්වරුන් ඊජිප්තුවෙන්
පිටත්ව[20] ආ දවසේ සිට අවුරුදු
හාරසිය අසූවක් ගත වී තිබිණ.
සලමොන් රජ යෙහෝවා දෙවිට

**5 පරි.**

**1** 1රාජා 4:24; යෙසා 9:7; ක්‍රියා 9:31
**2** හිතෝ 16:7
**3** 2ලේක 2:4
**4** 2සාමු 7:13; 1ලේක 17:12; 1ලේක 22:10; 1ලේක 28:6; සෙක 6:12
**5** 1රාජා 6:9; 1රාජා 6:20; 2ලේක 2:8; ගීතා 104:16
**6** යොෂු 19:28; එස්රා 3:7
**7** 2සාමු 5:11
**8** 2ලේක 2:11
**9** 1රාජා 3:9; හිතෝ 10:1; හිතෝ 13:1; හිතෝ 15:20; හිතෝ 23:24
**10** 1රාජා 10:9; 2ලේක 2:12
**11** 2සාමු 6:5; 1රාජා 6:15; 2ලේක 3:5
**12** ද්වි 3:25
**13** 2ලේක 2:16
**14** 2ලේක 2:15; එස්රා 3:7; ක්‍රියා 12:20

**2 තීරුව**

**1** 1රාජා 4:22; 2ලේක 2:10
**2** නික් 29:40; ලෙවී 24:2
**3** මතෙ 10:10; 1තිමෝ 5:18
**4** 1රාජා 3:12; 1රාජා 4:29; 2ලේක 1:12; යාකො 1:5
**5** 1රාජා 4:6; 1රාජා 9:15; 1රාජා 9:21
**6** දේශ 4:6
**7** යොෂු 16:10; යොෂු 17:13; විනි 1:28; 1රාජා 9:22; 2ලේක 8:9
**8** 1රාජා 12:18
**9** 2සාමු 20:24; 1රාජා 4:6
**10** 2ලේක 2:18
**11** 2ලේක 2:2
**12** 1ලේක 22:15
**13** 2ලේක 2:17
**14** 1රාජා 9:23
**15** 2ලේක 2:18
**16** යෙසා 28:16; 1කොරි 3:11; 1පේතෘ 2:6; එළි 21:14
**17** 1රාජා 7:9; 1ලේක 22:2
**18** 1රාජා 6:7

---

**19** යොෂු 13:5; එස 27:9; **6 පරි.** **20** නික් 12:14; නික් 12:51.

නමස්කාර කිරීම සඳහා ගෘහයක්
ගොඩනඟන්න[1] පටන්ගත්තේ හාරසිය
අසූවන අවුරුද්දේදීය. එය ඊශ්‍රායෙල්හි
රජු වන සලමොන්ගේ පාලන සමයේ
හතරවන අවුරුද්දේ[2] දෙවන මාසය[3]
එනම්, ෂීව් මාසය[4] විය. **2** යෙ-
හෝවා දෙවිට නමස්කාර කිරීම සඳහා
සලමොන් රජු ගොඩනැඟූ ගෘහයේ[5]
දිග රියන්* හැටකි.[6] පළල රියන් විස්-
සකි. උස රියන් තිහකි.[7] **3** ගෘහයේ
ශුද්ධස්ථානයට* ඉදිරියෙන් තිබෙන
ප්‍රවේශ ශාලාවේ[8] පළල රියන් විස්සක්
විය. එහි පළල ගෘහයේ පළලට
සමාන විය. ප්‍රවේශ ශාලාවේ දිග රියන්
දහයක් විය.

**4** ඔහු ගෘහයට කවුළුද සෑදුවේය.
ඒ කවුළු සාදා තිබුණේ ගෘහ-
යේ බිත්තියේ ඇතුල් පැත්තේ
සිට පිට පැත්ත දක්වා ක්‍රමක්‍රම-
යෙන් පටු වී යන ආකාරයටය.[9]
**5** තවද ශුද්ධස්ථානය* සහ අති-
ශුද්ධස්ථානය#[10] පිහිටි එම ගෘහය
වටා ඔහු තවත් ගොඩනැඟිල්ලක් ඉදි
කළේය. ගෘහයේ බිත්තියට සම්බන්ධ
කර තිබූ එම ගොඩනැඟිල්ල තුළ
කුටි තනා තිබිණ.[11] **6** එම ගො-
ඩනැඟිල්ලේ පහළ තට්ටුවේ පළල
රියන් පහක්ද මැද තට්ටුවේ පළල
රියන් හයක්ද තුන්වන තට්ටුවේ
පළල රියන් හතක්ද විය. ගෘහයේ
බිත්තිවල පිට පැත්ත පඩි බැම්මක්
සේ තනා තිබිණ.[12] එම පඩි බැම්ම
සාදා තිබුණේ ගොඩනැඟිල්ලේ බාල්ක
රැඳවීම සඳහාය. එමනිසා ගෘහයේ
බිත්ති තුළට ඒවා සවි කිරීමට අවශ්‍ය
වූයේ නැත.[13]

**7** ගෘහය සෑදීමට අවශ්‍ය වූ ගල්,
ඉදි කරන ස්ථානයට රැගෙන ආවේ
අවශ්‍ය හැඩයට කපා නිම කළ
පසුවය.[14] එබැවින් මිටියක හෝ
පොරවක හෝ වෙන කිසි යකඩ
ආයුධයක හෝ ශබ්දය ඒ ස්ථාන-
යෙන් නොඇසිණ.[1] **8** ගෘහය වටා
තිබූ ගොඩනැඟිල්ලට තට්ටු තුනක්
තිබිණ. පහළ තට්ටුවට ඇතුල් වූයේ[2]
ගොඩනැඟිල්ලේ දකුණු පැත්තෙනි.
තවද පහළ තට්ටුවෙන් මැද තට්-
ටුවට නැඟීම සඳහාත් මැද තට්-
ටුවෙන් තුන්වන තට්ටුවට නැඟීම
සඳහාත් සර්පිලාකාර පඩි පෙළක්
තිබිණ. **9** සලමොන් රජ ගෘහයේ[3]
වහලට දේවදාර පරාල සවි කර දේව-
දාර ලෑලිවලින් එය සෙවිලි කළේය.[4]
**10** ගෘහය වටා තැනූ ගොඩනැඟිල්-
ලේ කුටියක[5] උස රියන් පහක් විය. ඒ
කුටි ගෘහයට සම්බන්ධ කර තිබුණේ
දේවදාර ලී බාල්කවලිනි.[6]

**11** ඒ අතරතුර යෙහෝවා දෙවි[7]
සලමොන්ට[8] මෙසේ පැවසුවේය.
**12** “ඔබ මාගේ අණපනත්වලට
කීකරු වී[9] මා දුන් තීන්දුවලට අවනත
වෙමින්[10] මාගේ සියලු ආඥා පැවැත්වූ-
වහොත්[11] ඔබ ගැනත් ඔබ ගො-
ඩනඟන මේ ගෘහය ගැනත් ඔබේ
පියා වූ දාවිත්ට පොරොන්දු වූ දේ
මම ඉෂ්ට කරන්නෙමි.[12] **13** මම
ඊශ්‍රායෙල් පුත්‍රයන් සමඟම වාසය
කරන්නෙමි.[13] මාගේ සෙනඟ වන
ඊශ්‍රායෙල්වරුන්ව මම කිසි දිනක අත්
නොහරින්නෙමි.”[14]

**14** සලමොන් රජ ගෘහයේ අනික්
වැඩකටයුතුද නිම කළේය.[15]
**15** ගෘහයේ ඇතුළත බිත්ති ඔහු දේව-
දාර ලෑලිවලින් ආවරණය කළේය.
ඔහු පොළොවේ සිට සිවිලිමේ පරාල
දක්වාම බිත්ති දේවදාර ලීයෙන් ආව-
රණය කළේය. ගෘහයේ බිම ජුනි-
පර් ලෑලිවලින් ආවරණය කළේය.[16]
**16** පසුව ඔහු ගෘහයේ කෙළවරින්
රියන් විස්සක් දිග කොටසක් වෙන්
කර අතිශුද්ධස්ථානය සෑදුවේය.[17] ඔහු
එම කොටස වෙන් කිරීම සඳහා පො-
ළොවේ සිට සිවිලිමේ පරාල දක්වා
දිග දේවදාර ලෑලි භාවිත කළේය.
**17** රියන් හතළිහක් දිග ගෘහයේ ඉදිරි
කොටස[18] ශුද්ධස්ථානය ලෙස හැඳින්-
විය.[19] **18** ගෘහයේ ඇතුළත තිබුණු

---

**1රාජා 6:2*** රියනක් යනු සෙන්ටිමීටර් 44.5කි. **3*** මූ.අ., “දේවමාළිගාවට.” එයින් අදහස් කරන්නේ ශුද්ධස්ථානය විය යුතුයි. **5*** 1රාජා 6:3හි පාදසටහන බලන්න. **5#** මූ.අ., “ගෘහය කෙළවරේම තිබෙන කාමරය.”

**6 පරි.**
**1** 1ලේක 28:12; 1ලේක 29:19
**2** 2ලේක 3:2
**3** ගණන් 1:1
**4** 1රාජා 6:37
**5** ක්‍රියා 7:47
**6** 2ලේක 3:3
**7** එස්රා 6:3
**8** 1ලේක 28:11; 2ලේක 3:4
**9** එස 40:16; එස 41:26
**10** ලෙවී 16:2; 2ලේක 4:20; 2ලේක 5:7; හෙබ්‍රෙ 9:3
**11** 1රාජා 6:10; එස 41:5; එස 41:26
**12** එස 41:7
**13** එස 41:6
**14** 1රාජා 5:17; 1පේතෘ 2:5

**2 තීරුව**
**1** එෆී 2:21; 1පේතෘ 2:5
**2** එස 41:11
**3** 1රාජා 6:38
**4** 1රාජා 5:6; 1රාජා 6:20; 2ලේක 2:8
**5** 1රාජා 6:5
**6** එස 41:6
**7** ගීතා 11:4; හිතෝ 15:3
**8** 1ලේක 17:12
**9** ද්වි 6:2; ද්වි 10:13; ද්වි 17:19
**10** ද්වි 11:1
**11** 1සාමු 12:14; 1රාජා 8:25; 1ලේක 28:9
**12** 2සාමු 7:13; 1ලේක 22:9
**13** නික් 25:8; ලෙවී 26:12; ගීතා 132:13; 2කොරි 6:16; එළි 21:3
**14** 1සාමු 12:22; 1ලේක 28:20; හෙබ්‍රෙ 13:5
**15** ක්‍රියා 7:47
**16** 1රාජා 5:8; 2ලේක 3:5
**17** 1රාජා 6:5; 2ලේක 3:8; හෙබ්‍රෙ 9:3
**18** 1රාජා 6:5
**19** හෙබ්‍රෙ 9:2

දේවදාර ලෑලිවල කොමඩු හැඩැති
ගෙඩිද[1] මල් මාලාද කැටයම් කර
තිබිණ.[2] ඒ සියල්ල දේවදාර ලීයෙන්
නිම කරන ලදි. ගෘහයේ ගල් පෙ-
නෙන්න නොතිබිණ.

**19** යෙහෝවා දෙවිගේ ගිවිසුම්
පෙට්ටිය[3] තැබීම සඳහා ඔහු ගෘහය
කෙළවරේම තිබූ අතිශුද්ධස්ථානය[4]
පිළියෙල කළේය. **20** අතිශුද්ධස්-
ථානයේ දිග රියන් විස්සක්ද පළල
රියන් විස්සක්ද[5] උස රියන් විස්-
සක්ද විය. පසුව ඔහු එය පිරිසිදු
රනින් ආවරණය කළේය.[6] පූජා-
සනය දේවදාර ලීයෙන් ආවරණය
කළේය.[7] **21** ගෘහයේ අනික් කොට-
සේ ඇතුල් පැත්තද පිරිසිදු රනින්[8]
ආවරණය කරන ලදි.[9] සලමොන් රජ
රනින් ආවරණය කරන ලද අතිශුද්-
ධස්ථානයට[10] ඉදිරියෙන් රන් දම්-
වැල් සවි කළේය.[11] **22** ඔහු මුළු
ගෘහය සම්පූර්ණයෙන්ම රනින් ආවර-
ණය කළේය.[12] එමෙන්ම ඔහු අති-
ශුද්ධස්ථානයට ඉදිරියෙන් තිබුණු
පූජාසනයද[13] සම්පූර්ණයෙන්ම රනින්
ආවරණය කළේය.[14]

**23** ඔහු අතිශුද්ධස්ථානයේ තැබීම
සඳහා පයින් ගසේ* ලීවලින් කෙරුබ්-
වරුන්ගේ රූප දෙකක්[15] සෑදුවේය. ඒ
එක් රූපයක උස රියන් දහයක් විය.[16]
**24** රියන් පහක් දිග පියාපත් දෙකක්
කෙරුබ්වරුන්ට තිබිණ. එක් පියා-
පතක අග සිට අනික් පියාපතේ
අග දක්වා දිග රියන් දහයක් විය.[17]
**25** දෙවන කෙරුබ්වරයාගේ උසද
රියන් දහයක් විය. ඒ කෙරුබ්වරුන්
දෙදෙනාව සාදන ලද්දේ එකම ප්‍රමා-
ණයෙන් සහ හැඩයෙන්ය. **26** එක්
කෙරුබ්වරයෙකුගේ උස රියන් දහ-
යක් විය. **27** ඉන්පසු ඔහු එක් කෙ-
රුබ්වරයෙකුගේ පියාපතක් එක්
බිත්තියකටද අනික් කෙරුබ්වරයාගේ
පියාපත අනික් බිත්තියටද වැදෙන
සේ ඔවුන් දෙදෙනාව අතිශුද්ධස්-
ථානය ඇතුළේ තැබුවේය.[1] ඔවුන්-
ගේ ඉතුරු පියාපත් දෙක ගෘහයේ
හරි මැද එකිනෙකට වැදෙන සේ
තබා තිබිණ.[2] **28** ඔහු කෙරුබ්ව-
රුන්වද රනින් ආවරණය කළේය.[3]

**29** ඔහු අතිශුද්ධස්ථානයේ හා ශුද්-
ධස්ථානයේ බිත්තිවල කෙරුබ්වරුන්-
ගේ රූපද[4] තාල වර්ගයේ ගස්ද[5]
මල්ද කැටයම් කළේය.[6] **30** අතිශුද්-
ධස්ථානයේ හා ශුද්ධස්ථානයේ බිම[7]
රනින් ආවරණය කළේය. **31** අති-
ශුද්ධස්ථානයට ඇතුල් වීම සඳහා
ඔහු පයින් ගසේ ලීවලින්[8] දොරවල්
දෙකක්[9] සෑදුවේය. ඒවායේ උළුවහු
බිත්තියෙන් පහෙන් කොටසක් විය.*
**32** පයින් ගසේ ලීවලින් සෑදූ දො-
රවල් දෙකෙහි ඔහු කෙරුබ්වරුන්-
ගේ රූපද තාල වර්ගයේ ගස්ද මල්ද
කැටයම් කර ඒවා රනින් ආවරණය
කළේය. තළාගත් රනින් එම රූප
ආවරණය කළේය. **33** ඔහු ශුද්ධස්-
ථානයට ඇතුල් වන දොරකඩද එලෙ-
සම සෑදුවේය. පයින් ගසේ ලීවලින්
සෑදූ එම උළුවස්ස හරි හතරැස් විය.
**34** එහි දොරවල් දෙක ජුනිපර් ලීවලින්
සාදා තිබිණ.[10] එක් දොරකට අකුළන
පියන් දෙකක්ද අනික් දොරට අකුළන
පියන් දෙකක්ද තිබුණු අතර ඒවා සර-
නේරුවලින් සවි වී තිබිණ.[11] **35** ඔහු
කෙරුබ්වරුන්ගේ රූපද තාල වර්ගයේ
ගස් හා මල්වල රූපද කැටයම් කර,
ඒ රූප තළාගත් රනින් ආවරණය
කළේය.[12]

**36** ඔහු ඇතුල් මළුවේ[13] තාප්පය,
කැපූ ගල් පේළි තට්ටු තුනකින්ද[14]
දේවදාර ලී පේළියකින්ද ගොඩනැඟු-
වේය.

**37** යෙහෝවා දෙවිගේ ගෘහයේ
අත්තිවාරම[15] දැමුවේ හතරවන අවු-
රුද්දේ ශීව් මාසයේදීය.[16] **38** එකො-
ළොස්වන අවුරුද්දේ අටවන මාසය
වන බූල් මාසයේදී සම්පූර්ණ

**6 පරි.**
**1** 1රාජා 7:24
**2** නික් 25:33; 1රාජා 7:26; 1රාජා 7:49
**3** නික් 24:7; නික් 40:21; ද්වි 4:13; ද්වි 9:9; 1රාජා 8:6; 1රාජා 8:9; 2ලේක 5:7
**4** 1රාජා 6:5; හෙබ්‍රෙ 9:3
**5** 1රාජා 6:16
**6** 2ලේක 3:8
**7** නික් 30:1; 1රාජා 7:48
**8** 2ලේක 3:7
**9** නික් 26:29
**10** නික් 26:33
**11** 1රාජා 7:17
**12** 2ලේක 3:7
**13** නික් 40:5
**14** නික් 30:3
**15** උත් 3:24; 2රාජා 19:15; 2ලේක 3:10; ගීතා 99:1
**16** 2ලේක 5:8
**17** 2ලේක 3:11

**2 තීරුව**
**1** ගීතා 80:1; යෙසා 37:16; හෙබ්‍රෙ 9:5
**2** 2ලේක 3:12; 2ලේක 5:8
**3** 2ලේක 3:10
**4** 2රාජා 19:15; 2ලේක 3:14
**5** එස 40:16; එස 41:18
**6** නික් 25:33; 1රාජා 6:18; 1රාජා 7:26
**7** එළි 21:21
**8** 1රාජා 6:23
**9** යොහ 10:9; යොහ 14:6
**10** 2සාමු 6:5; 1රාජා 6:15
**11** එස 41:24
**12** එස 41:25
**13** නික් 27:9; 2ලේක 4:9; 2ලේක 7:7
**14** 1රාජා 7:12; 2රාජා 11:15
**15** 1පේතෘ 2:6
**16** 1රාජා 6:1; 2ලේක 3:2

**1රාජා 6:23*** මෙහි සඳහන් වන ගස කුමක්ද කියා නිශ්චිතව කිව නොහැක. හෙබ්‍රෙව් භාෂාවේ තෙල් ගස යන අර්ථය ඇති එට්ෂ්මෙන් යන නම යොදා ඇත.

**1රාජා 6:31*** මූ.අ., “උළුවස්ස පහෙන් කොටසක් විය.”

සැලැස්මට අනුව ගෘහය සාදා නිම
කරන ලදි.[1] එය ගොඩනැඟීමට[2] සල-
මොන් රජුට අවුරුදු හතක් ගත විය.

**7** සලමොන් රජුට තම මාලිගාව
සෑදීමට අවුරුදු දහතුනක් ගත
විය.[3]

**2** ඔහු ලෙබනොන් වනාන්තරය
කියා හැඳින්වූ ගෘහයද ගොඩනැඟු-
වේය.[4] එය දේවදාර කණු පේළි හත-
රක් මත දේවදාර ලීයෙන් තැනූ
බාල්ක දමා ඉදි කරන ලදි.[5] එහි දිග
රියන් සියයක්ද පළල රියන් පනහක්ද
උස රියන් තිහක්ද විය. **3** එහි කණු
හතළිස්පහ මත දේවදාර ලීවලින් වේ-
දිකාවක් තනන ලදි. ඒ වේදිකාව මත
දේවදාර ලැලිවලින් ගොඩනැඟිල්ලක්
සාදා තිබිණ.[6] පේළියකට කණු* පහ-
ළවක් බැගින් තිබිණ. **4** ආලෝකය
ලබා දීමට[7] ගොඩනැඟිල්ල වටේටම
රාමු කළ කවුළු පේළි තුනක් තිබිණ.
ඒවා සාදා තිබුණේ කවුළුවක් ඉදිරිපිට
කවුළුවක් සිටින සේය. **5** උළුවහුද
ඇතුළුව සෑම දොර රාමුවක්ම හරි
හතරැස් විය.[8] ආලෝකය සඳහා සෑදූ
කවුළුවල පිට පැත්තද හතරැස් හැඩ-
යට තිබිණ.

**6** එමෙන්ම ඔහු රියන් පනහක් දිග,
රියන් තිහක් පළල ශාලාවක් ගොඩ-
නැඟුවේය. එය කුලුනු ශාලාව ලෙස
හැඳින්විය. ඊට ඉදිරියෙන් කුලුනු සහ
වියනක් සහිත තවත් ශාලාවක් ඔහු
ගොඩනැඟුවේය.

**7** ඔහු සෙනඟ විනිශ්චය කිරීම
සඳහා[9] සිංහාසන ශාලාව ලෙස
හැඳින්වූ ගොඩනැඟිල්ලද ඉදි
කළේය.[10] එහි බිම සිට පරාල
දක්වා දේවදාර ලීවලින් ආවරණය
කර තිබිණ.[11]

**8** සිංහාසන ශාලාවට එහා පැත්-
තේ තිබූ මළුවේ[12] රජුගේ මාලිගාව
ගොඩනඟා තිබිණ. රජුගේ මාලිගාවද
සිංහාසන ශාලාව හා සමානව ගොඩ-
නඟා තිබිණ. සලමොන් රජ තමා
විවාහ කරගත් පාරාවෝගේ දියණිය-
ටත්[1] ඒ ශාලාව හා සමාන ගෘහයක්
ගොඩනැඟුවේය.

**9** එම ගොඩනැඟිලි සියල්ලම ඉතා
අනර්ඝ ගල්වලින් සාදන ලදි.[2] ඒවායේ
ඇතුල් පැත්තත් පිට පැත්තත් කියත්-
වලින් නිසි මිම්මට කපා තිබිණ.
ගොඩනැඟිලිවල අත්තිවාරමේ සිට
පියස්ස දක්වා සාදා තිබුණේ එම ගල්-
වලිනි. ගොඩනැඟිලි අවට තිබූ භූමිය-
ටද එම ගල් අල්ලා තිබිණ. මහ
මළුව[3] දක්වාම එසේ වූ අතර මළුවේ
තාප්පයටද එම ගල් යොදා තිබිණ.
**10** රියන් දහයේ සහ රියන් අටේ ඉතා
අනර්ඝ, විශාල ගල්වලින් අත්තිවාරම
දමා තිබිණ. **11** ඊට ඉහළින් නිසි
මිම්මට කපාගත් ඉතා අනර්ඝ ගල්ද
දේවදාර ලී තට්ටුවක්ද දමා තිබිණ.
**12** මහ මළුව වටා තිබුණු තාප්පය
කැපූ ගල් පේළි තුනකින්ද[4] දේවදාර ලී
පේළියකින්ද ගොඩනැඟුවේය. යෙ-
හෝවා දෙවිගේ ගෘහය[5] හා ශුද්ධස්ථා-
නයට ඉදිරියෙන් තිබූ ප්‍රවේශ ශාලාව[6]
වටාද එවැනි තාප්පයක් ගොඩනඟා
තිබිණ. ඒ තාප්පය ඇතුළත තිබූ
ප්‍රදේශය හැඳින්වූයේ ඇතුල් මළුව[7]
ලෙසය.

**13** පසුව සලමොන් රජ මිනිසුන්ව
යවා තීර්හි පදිංචිව සිටි හීරාම්ව[8]
ගෙන්වාගත්තේය. **14** ඔහු නප්තලී
ගෝත්‍රයට අයත් වැන්දඹු ස්ත්‍රියකගේ
පුත්‍රයෙකි. තඹ කර්මාන්තයේ යෙදී
සිටි[9] ඔහුගේ පියා තීර්හි වැසියෙකි.[10]
තඹ කර්මාන්තය ගැන මනා දැනුමක්
හා අවබෝධයක් ඔහුට තිබිණ.[11]
එබැවින් හීරාම්, සලමොන් රජු වෙතට
පැමිණ ඔහුගේ සියලු වැඩකටයුතුව-
ලට හවුල් විය.

**15** ඔහු රියන් දහඅට බැගින් උස
තඹ කුලුනු දෙකක් සෑදුවේය.[12] එක්
කුලුනක වටප්‍රමාණය රියන් දොළහක්
විය.[13] **16** ඒ කුලුනු මුදුනේ තබන
පිණිස ගෝලාකාර කොටස් දෙකක්
තඹවලින් වාත්තු කළේය.[14] කුලුනු
මුදුනේ තැබූ ඒ එක් කොටසක උස

**6 පරි.**
**1** නික් 40:2
එස්රා 6:14
**2** 1ලේක 28:11
1ලේක 28:12

**7 පරි.**
**3** 1රාජා 9:10
දේශ 2:4
දේශ 2:5
**4** 1රාජා 10:17
2ලේක 9:16
යෙසා 22:8
**5** 1රාජා 5:8
**6** 1රාජා 6:18
**7** උත් 6:16
**8** නික් 12:22
**9** 1රාජා 3:9
1රාජා 3:28
හිතෝ 16:12
හිතෝ 20:8
**10** 1රාජා 10:18
ගීතා 122:5
යෙසා 9:7
**11** 1රාජා 6:15
**12** 2රාජා 20:4

**2 තීරුව**
**1** 1රාජා 3:1
1රාජා 9:24
2ලේක 8:11
**2** 1රාජා 5:17
**3** 2ලේක 4:9
**4** 1රාජා 6:36
යොහ 10:23
ක්‍රියා 5:12
**5** 1රාජා 6:1
**6** 1රාජා 6:3
**7** නික් 27:9
1රාජා 6:36
2ලේක 4:9
2ලේක 7:7
එළි 11:2
**8** 1රාජා 7:40
2ලේක 2:13
2ලේක 4:11
**9** 2ලේක 4:16
**10** 2ලේක 2:14
**11** නික් 31:3
නික් 35:31
නික් 36:1
දානි 1:17
**12** 1රාජා 7:21
2රාජා 25:17
2ලේක 3:15
යෙරෙ 52:21
**13** 2රාජා 25:13
2ලේක 4:12
**14** නික් 36:38
නික් 38:17
නික් 38:28

---

**1රාජා 7:3*** හෝ, “කාමර” නැත්නම්, “බාල්ක.” හෙබ්‍රෙව් භාෂාවේ නිකම්ම පේළියකට පහළවක් ලෙස සඳහන් වේ.

රියන් පහක් විය. **17** කුලුනු මුදුනේ[1]
තිබූ ඒ කොටස දැල්වලින් සරසනු
ලැබිණ.[2] ඒ මත දම්වැල්ද එල්ලා
තිබිණ. ඒ එක් එක් කොටසට සැරසිලි
හත බැගින් තිබිණ. **18** එම කොටස්
දෙක ආවරණය කරන පිණිස සෑදූ දැල්
මත එල්ලීමට ඔහු දෙළුම් ගෙඩි සෑදු-
වේය. එක දැලක් මත ඔහු දෙ-
ළුම් ගෙඩි පේළි දෙකක් ඇල්ලුවේය.[3]
**19** ප්‍රවේශ ශාලාව අසල තිබූ මේ කුලු-
නුවල මුදුනේ තිබූ කොටස් ලිලී මලක
හැඩයට කැටයම් කර තිබිණ. ලිලී මල
මෙන්[4] වූ කොටසේ උස රියන් හතරක්
විය. **20** ලිලී මලට යටින් තිබූ බඳ
කොටස දැල්වලින් සරසා තිබූ අතර ඒ
දැල් මත දෙළුම් ගෙඩි[5] දෙසියයක්
පේළි දෙකකට සවි කර තිබිණ.

**21** ඔහු ශුද්ධස්ථානයට ප්‍රවේශ
වන ශාලාවට[6] ඉදිරිපිට ඒ කුලුනු
තැබුවේය.[7] දකුණු පැත්තේ කුලුන,
යාකින්* කියාද වම් පැත්තේ කුලුන,
බෝවස්# කියාද ඔහු හැඳින්විය.
**22** ඒ කුලුනු මුදුනේ ලිලී මලක පෙති
කැටයම් කර තිබිණ. මෙසේ ඒ කුලුනු
සාදා නිම කරන ලදි.

**23** ඔහු වතුර දැමීමට විශාල වට-
කුරු තඹ භාජනයක්* සෑදුවේය.[8] ඒ
භාජනයේ කටේ එක් පැත්තක සිට
අනික් පැත්ත දක්වා දිග රියන් දහ-
යක් විය. එහි උස රියන් පහක් වූ අතර
එහි වටප්‍රමාණය රියන් තිහක් විය.[9]
**24** එහි කටට යටින් භාජනය වටේට
කොමඩු හැඩැති ගෙඩි[10] පේළි දෙ-
කක් කැටයම්[11] කර තිබිණ. එක්
රියනකට ගෙඩි දහයක් ඇතුළත්
වන ආකාරයට එම ගෙඩි පේළි ඒ
වටා කැටයම් කර තිබිණ.[12] **25** එම
භාජනය ගොනුන්ගේ රූප දොළහක්
මත තබා තිබිණ.[13] ඒ ගොනුන්-
ගෙන් තුන්දෙනෙක් උතුරු දෙස-
ටත් තුන්දෙනෙක් බස්නාහිර දෙසටත්
තුන්දෙනෙක් දකුණු දෙසටත් තුන්-
දෙනෙක් නැඟෙනහිර දෙසටත් මුහුණ
ලා සිටින සේ සාදා තිබිණ. ඒ භාජනය
උන්ගේ පිට මත තබා තිබූ අතර උන්-
ගේ පිටුපස ඇතුළට පිහිටන සේ
සාදා තිබිණ.[1] **26** භාජනයේ ගන-
කම අල්ලක්* පළලය.[2] කෝප්පයක
හැඩැති එහි කට පිපුණු ලිලී මලක් හා
සමාන විය.[3] එහි බාත් ඒකක දෙදහ-
සක්#[4] ජලය රැස් කර තිබිණ.[5]

**27** ඔහු රියන් හතරක් දිග, රියන්
හතරක් පළල, රියන් තුනක් උස තඹ
කරත්ත දහයක්ද සෑදුවේය.[6] **28** ඒ
කරත්ත සාදා තිබුණේ මෙලෙසිනි.
එහි පැති, රාමුවලට බෙදා තිබුණු
අතර එම රාමු ඇතුළේ පැතලි තහඩු
ගසා තිබිණ. **29** ඒ රාමු අතරේ
තිබූ පැතලි තහඩුවල සිංහයන්වද[7]
ගොනුන්වද[8] කෙරුබ්වරුන්වද[9] කැට-
යම් කර තිබිණ. රාමු මතද එසේ
කැටයම් කර තිබිණ. සිංහයන් සහ
ගොනුන්ට ඉහළින්ද පහළින්ද මල්
මාලා වාත්තු කර සවි කරන ලදි.[10]
**30** සෑම කරත්තයකටම තඹ රෝද
හතරක්ද ඒ රෝද සම්බන්ධ කරන
පිණිස තඹ අලවංගුද තිබිණ. අලවංගු
දෙකේ කොන්වලට ආධාරක පොලු
හතරක් සවි කර තිබුණු අතර ඒවා
කරත්තය මත තිබුණු භාජනයටද
සවි වී තිබිණ. එසේ භාජනයට සවි වී
තිබූ ආධාරකවලට මල් මාලා වාත්තු
කර සවි කරන ලදි. **31** භාජනයේ
කටේ සිට ආධාරකය දක්වාද භාජන-
යේ පතුලේ සිට එහි කට දක්වාද උස
රියන් … විය. එහි කට වටකුරුය.
භාජනය තැබීම සඳහා කරත්තය
මත රියන් එකහමාරක් උස වටකුරු
ආධාරකයක් සාදා තිබිණ. ඒ ආධාර-
කයේ ඉහළ කොටස වටේටම රූප
කැටයම් කර තිබිණ. ඒවා කරත්ත-
යේ පැති හතරේ කැටයම් කළ රූප
මෙන් විය. ආධාරකය වටා ගසා තිබූ
තහඩුවල හැඩය වටකුරු නොව හත-
රැස්ය. **32** පැතලි තහඩු ගසා තිබූ
කරත්තයේ පැති හතරට පහළින් එහි

**7 පරි.**
1 2ලේක 4:12
2 නික් 28:14; 2රාජා 25:17
3 2ලේක 4:13
4 1රාජා 6:35
5 2රාජා 25:17; 2ලේක 3:16; 2ලේක 4:13; යෙරෙ 52:23
6 1රාජා 6:3; 1රාජා 7:12; එස 40:48
7 2ලේක 3:17; එළි 3:12
8 නික් 30:18; නික් 38:8; 2රාජා 25:13; යෙරෙ 52:17
9 2ලේක 4:2
10 1රාජා 6:18; 2රාජා 4:39
11 නික් 33:4; 2සාමු 1:24
12 2ලේක 4:3
13 2ලේක 4:15; යෙරෙ 52:20; එළි 4:7

**2 තීරුව**
1 2ලේක 4:4
2 යෙරෙ 52:21
3 1රාජා 6:18; 1රාජා 6:35
4 එස 45:14
5 2ලේක 4:5
6 2රාජා 25:16; 2ලේක 4:14; යෙරෙ 52:17
7 1රාජා 10:19; 2ලේක 9:19; එස 41:19; හොෂෙ 5:14
8 එස 1:10; එළි 4:7
9 උත් 3:24; නික් 25:18; 1රාජා 6:27; 1ලේක 28:18; 2ලේක 3:7; එස 41:18
10 හිතෝ 1:9; හිතෝ 4:9

**1රාජා 7:21*** තේරුම, “ඔහු ස්ථිර කරනු ඇත.” **21#** සමහරවිට මෙහි අර්ථය, “ශක්තිමත්” යන්න විය හැක. **23*** මූ.අ., “තඹ මුහුද.”

**1රාජා 7:26*** සෙන්ටිමීටර් 7.4ක් පමණ. **26#** ලීටර් 44,000කට සමානයි.

රෝද හතර පිහිටා තිබිණ. රෝද
රඳවා තැබීමට භාවිත කළ කඩ
ඇණද කරත්තයේ පැති හතරට පහ-
ළින් පිහිටා තිබිණ. එක් රෝදයක
උස රියන් එකහමාරක් විය. **33** ඒ
රෝද අශ්ව රථයක රෝද මෙන්[1] සාදා
තිබිණ. ඒ රෝදද ඒවා රඳවා තැබීමට
භාවිත කළ කඩ ඇණද රෝද මැද
පිහිටි බොස්ගෙඩියද බොස්ගෙඩියේ
සිට විහිදී යන ගරාදි සියල්ලද වාත්තු
කර සවි කර තිබුණේය. **34** ඒ එක්
එක් කරත්තයේ කොන් හතරේ ආධා-
රක හතරක් තිබුණු අතර ඒ ආධා-
රක සියල්ල කරත්තයට සම්බන්ධ
කර තිබිණ. **35** කරත්තයට ඉහ-
ළින් රියන් භාගයක් උස වටකුරු
ආධාරකයක් තිබුණේය. එම ආධාර-
කයද ඒ වටේට ගසා තිබූ රාමුද තහ-
ඩුද කරත්තයටම සම්බන්ධ කර
වාත්තු කර තිබුණේය. **36** ඔහු ඒ
ආධාරකය වටා ගසා තිබූ රාමුවල
ආවරණ මතුපිටද තහඩු මතුපිටද
කෙරුබ්වරුන්ගේ සහ සිංහයන්ගේ
රූප, තාල වර්ගයේ ගස්වල රූප
සහ මල් මාලා කැටයම් කළේය.[2]
**37** ඔහු ඒ ආකාරයට කරත්ත දහයම
සෑදුවේය.[3] ඒ සියල්ල එකම ආකාරය-
කට වාත්තු කර තිබුණු අතර ඒවායේ
ප්‍රමාණයද හැඩයද එක සමාන විය.[4]

**38** ඔහු තඹ භාජන[5] දහයක් සෑදු-
වේය. එක් භාජනයක ජලය බාත්
ඒකක හතළිහක් රැස් කර තබන
ලදි. භාජනයක උස රියන් හත-
රකි. කරත්ත දහයටම භාජ-
නය බැගින් සාදා තිබිණ. **39** ඔහු
කරත්ත පහක් ගෘහයේ දකුණු පැත්-
තේද අනික් කරත්ත පහ ගෘහයේ වම්
පැත්තේද තැබුවේය.[6] වතුර දැමීමට
තිබූ විශාල වටකුරු භාජනය ඔහු
ගෘහයේ දකුණු පැත්තේ එනම්, ගිනි-
කොන දෙසට වෙන්න තැබුවේය.[7]

**40** හීරාම්,[8] බේසම්ද[9] සවල්ද[10]
භාජනද[11] සාදා තම වැඩකටයුතු නිම
කළේය.[12] මේ අනුව යෙහෝවා දෙවි-
ගේ ගෘහය සෑදීම සඳහා සලමොන් රජු
හිරාම්ට පැවරූ සියලුම කාර්යයන් ඔහු
නිම කළේය. **41** ඔහු කුලුනු දෙ-
කද[1] කුලුනු දෙක මුදුනේ තිබුණු
ගෝලාකාර කොටස්ද සෑදුවේය.[2] ඒ
ගෝලාකාර කොටස් දෙක දැල් සැර-
සිලි[3] දෙකකින් ආවරණය කරන ලදි.
**42** දැල් මත එල්ලීමට දෙළුම් ගෙඩි[4]
හාරසියයක් සාදා තිබිණ. දැලකට දෙ-
ළුම් ගෙඩි පේළි දෙකක් බැගින් තිබු-
ණේය. **43** ඔහු කරත්ත දහයද[5] ඒ
කරත්ත මත තැබීමට භාජන දහයද[6]
**44** විශාල ජල භාජනයද[7] ඒ භාජනය
රඳවා තැබීමට ගොනුන් දොළොස්දෙ-
නාද[8] සෑදුවේය. **45** ඔහු අඟුරු දැමී-
මට භාජනද සවල්ද අවශ්‍ය අනිකුත්
සියලු භාජනද උපකරණද සෑදුවේය.[9]
සලමොන් රජු, යෙහෝවා දෙවිගේ
ගෘහය වෙනුවෙන් සෑදීමට පැවසූ මේ
සියල්ල හීරාම් ඔප් නැංවූ තඹවලින්
සෑදුවේය. **46** රජ, යෝර්දාන් දිස්-
ත්‍රික්කයේ[10] සුක්කොත්[11] සහ ෂාරෙ-
තාන්[12] අතර පිහිටි මැටි භූමියෙහි මේ
සියල්ල සෑදුවේය.

**47** උපකරණ අතිවිශාල ප්‍රමාණ-
යක් තිබුණු නිසා[13] සලමොන් රජ
ඒවා[14] කිරා මැන බැලීමට උත්සාහ
කළේ නැත. ඒ සඳහා භාවිත කළ
තඹ ප්‍රමාණය ගණනය කළ නොහැකි
තරම්ය.[15] **48** කල් යත්ම යෙහෝවා
දෙවිගේ ගෘහයට අවශ්‍ය සියලු බඩු
බාහිරාදියද රන් පූජාසනයද[16] දෙවිට
පුදන රොටි තබන රන් මේසයද[17]
සලමොන් රජ සාදා නිම කළේය.
**49** පිරිසිදු රනින්[18] පහන් රුක්ද[19]
සෑදූ අතර ඒවා අතිශුද්ධස්ථානයට
ඉදිරියෙන් තබන ලදි. පහන් රුක්
පහක් ශුද්ධස්ථානයේ දකුණු පැත්තේද
අනික් පහන් රුක් පහ එහි වම් පැත්-
තේද තබා තිබිණ. මල්ද[20] පහන්ද[21]
පහන් තිර අල්ලන අඬුද[22] රනින්
සෑදුවේය. **50** පිරිසිදු රනින් බේසම්ද
පහන් තිර නිවා දැමීමට උපකරණද[23]
භාජනද[24] කුසලානද[25] අඟුරු දමන
භාජනද[26] සෑදුවේය. එමෙන්ම අතිශුද්-
ධස්ථානයේ දොර පියන්වලට[27] හා

**7 පරි.**

**1** නික් 14:25; යෙසා 5:28; යෙසා 28:27
**2** නික් 28:9; නික් 39:6; නික් 39:30; 1රාජා 6:29; 1රාජා 6:32; 1රාජා 7:29
**3** 1රාජා 7:27
**4** 1රාජා 7:15; 1රාජා 7:46; 2ලේක 4:3
**5** නික් 30:18; හෙබ්‍රෙ 9:10
**6** 2ලේක 4:6
**7** 2ලේක 4:10
**8** 1රාජා 7:13; 2ලේක 2:13; 2ලේක 4:11
**9** 2ලේක 4:6
**10** නික් 27:3; 2රාජා 25:14; 2ලේක 4:16; යෙරෙ 52:18
**11** නික් 24:6; 2ලේක 4:8
**12** නික් 39:32; නික් 39:43

**2 තීරුව**

**1** 1රාජා 7:15
**2** 2ලේක 4:12
**3** 1රාජා 7:17
**4** 1රාජා 7:20
**5** 1රාජා 7:27
**6** 1රාජා 7:38
**7** 1රාජා 7:23
**8** 2ලේක 4:15
**9** 1රාජා 7:40
**10** 2ලේක 4:17
**11** උත් 33:17
**12** යොෂු 3:16; 1රාජා 4:12
**13** 2ලේක 4:18
**14** නික් 38:3
**15** 1ලේක 22:14; 1ලේක 22:16
**16** නික් 37:25
**17** නික් 37:10; 2ලේක 4:19
**18** 2ලේක 4:20
**19** නික් 25:37; නික් 37:17; එළි 1:20; එළි 2:5
**20** 1රාජා 6:18
**21** නික් 37:23; ගණන් 8:2; 2ලේක 29:7; ලූක් 12:35
**22** නික් 25:38; ගණන් 4:9; 2ලේක 4:21
**23** 2රාජා 12:13; යෙරෙ 52:18
**24** 2ලේක 4:22

**25** නික් 25:29; ගණන් 7:86; **26** ලෙවී 16:12; **27** 1රාජා 6:31.

ශුද්ධස්ථානයේ[1] දොර පියන්වලට[2]
රන් සරනේරු සෑදුවේය.
**51** මෙසේ සලමොන් රජ යෙ-
හෝවා දෙවිගේ ගෘහයට අවශ්‍ය සියලු
බඩු බාහිරාදිය සාදා නිම කළේය.[3]
සලමොන් රජ තම පියා වූ දාවිත්
විසින් කැප කරන ලද[4] රන්, රිදී
හා අන් සියලු දේ ගෙනැවිත් යෙ-
හෝවා දෙවිගේ ගෘහයේ භාණ්ඩාගාර-
යේ තැබුවේය.[5]

**8** ඉන්පසු සලමොන් රජ,[6] ඊශ්‍රා-
යෙල්හි සියලුම වැඩිමහල්-
ලන්වද[7] ගෝත්‍රවල ප්‍රධානීන්වද[8]
ඊශ්‍රායෙල්වරුන්ගේ පෙළපත්වල අධි-
පතීන්වද[9] යෙරුසලමට එක් රැස්
කළේය.[10] එසේ කළේ දාවිත්ගේ
නුවර[11] වන සියොන්හි[12] තිබූ යෙ-
හෝවා දෙවිගේ ගිවිසුම් පෙට්ටිය[13]
දේවමාලිගාවට ගෙන ඒමේ අවස්ථා-
වට සහභාගි වීම සඳහාය. **2** ඊශ්‍රා-
යෙල්හි සිටි ඒ සියලු පුරුෂයෝ
හත්වන මාසය[14] වන ඒතානිම් මාස-
යේදී සලමොන් රජු ළඟට පැමිණි-
යෝය. ඔවුන් එසේ රැස් වූයේ ඒතානිම්
මාසයේ උත්සවය පවත්වන කාලයේ-
**17** ගණන් 11:15
යෝබ් 3:21
යෝනා 4:3
**18** යෝබ් 30:4
**19** ගීතා 34:7
**20** දානි 10:10
ක්‍රියා 12:7
**21** 1රාජා 17:12
යෙසා 33:16

**2 තීරුව**

**1** හෙබ්‍රෙ 1:14
**2** ගීතා 103:13
**3** නික් 24:18
ද්වි 9:9
ලූක් 4:2
**4** නික් 3:1
නික් 19:18
මලා 4:4
**5** නික් 33:22
හෙබ්‍රෙ 11:38
**6** උත් 16:8
ගීතා 139:7
**7** නික් 20:5
ගණන් 25:11
2රාජා 10:16
ගීතා 69:9
ගීතා 119:139
2කොරි 11:2
**8** ද්වි 29:25
විනි 2:20
1රාජා 8:9
2රාජා 17:15
හෙබ්‍රෙ 8:9
**9** රෝම 11:3
**10** 1රාජා 18:4

**11** 1රාජා 18:22; හිතෝ 24:10; රෝම 11:3; **12** 1රාජා 19:2; **13** නික් 34:2; **14** නික් 33:22; හබ 3:3; **15** යෝබ් 38:1; ගීතා 50:3; යෙසා 29:6; **16** 1සාමු 14:15; යෝබ් 9:6; ගීතා 68:8; නාහු 1:5; **17** ද්වි 4:11.

එම ගින්න තුළද නොසිටියේය. ගින්-
නෙන් පසු සන්සුන්, මෘදු කටහඬක්
ඇසුණේය.[1] **13** එලියාට එම කට-
හඬ ඇසුණු විගස ඔහු තම වස්-
ත්‍රයෙන් මුහුණ වසාගෙන[2] පිටතට
පැමිණ ගුහාවේ කට ළඟ සිටගත්-
තේය. කටහඬක් ඔහුගෙන් මෙසේ
ඇසුවේය. “එලියා, ඔබ මෙතැනට
ආවේ ඇයි?”[3] **14** ඔහු පිළිතුරු දෙ-
මින්, “ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවියනි, මගේ මුළු
හදවතින්ම මම ඔබට කැප වී සේ-
වය කරනවා. නමුත් ඊශ්‍රායෙල්වරුන්
ඔබේ ගිවිසුම කඩ කර[4] ඔබේ පූජාසන
කඩා දමා, ඔවුන් ඔබේ අනාගතවක්-
තෘවරුන්ව කඩුවෙන් මරා දැමුවා.
බේරුණේ මම විතරයි. ඔවුන් දැන්
මාවත් මරන්න සොයනවා”[5] යයි
කීවේය.

**15** යෙහෝවා දෙවි ඔහුට මෙසේ
කීවේය. “ඔබ ආපසු දමස්කයේ පාළු-
කරය[6] වෙතට යන්න. එහිදී
හසායෙල්ව[7] සිරියාවේ රජු ලෙස අභි-
ෂේක කරන්න.[8] **16** නිම්ෂිගේ[9] මුනු-
පුරා වන යේහුව[10] ඊශ්‍රායෙල්හි රජු
ලෙස අභිෂේක කරන්න. ආබෙල්-
මෙහෝලාහි[11] වැසියෙකු වන ෂාපාත්-
ගේ පුත් එලිෂාව[12] ඔබෙන් පසුව
අනාගතවක්තෘ ලෙස පත් කරන්න.[13]
**17** හසායෙල්ගේ කඩුවෙන් බේරෙන
අයව[14] යේහු මරා දමයි.[15] යේහු-
ගේ කඩුවෙන් බේරෙන අයව එලිෂා
මරා දමයි.[16] **18** බාල් ඉදිරියේ දණ
නොනැමූ,[17] ඔහුව සිප නොගත්[18]
හත්දහස්දෙනෙක්[19] තවමත් ඊශ්‍රායෙල්
දේශයේ ජීවත් වෙති.”

**19** එලියා දෙවිගේ අණට කීකරු වී
ෂාපාත්ගේ පුත් එලිෂාව හමු වීමට
ගියේය. ඔහු එතැනට ගිය විට සීසා-
මින් සිටි[20] ගොන් බාන් දොළොසක්
ළඟ එලිෂා සිටිනවා දුටුවේය. එලිෂා
දොළොස්වන ගොන් බාන දක්කමින්
සිටියේය. එලියා ඔහු වෙතට ගොස්
තමාගේ පිට වස්ත්‍රය[21] එලිෂාට ඇන්දු-
වේය. **20** එවිට එලිෂා තමා කරමින්
සිටි වැඩය අත්හැර, “මට මගේ පියා-
ගෙනුයි මවගෙනුයි සමුගෙන එන්න
අවසර දෙන්න.[1] ඉන්පසු මම ඔබ
සමඟ එන්නම්” යයි කියමින් එලියා
පසුපස දිව ගියේය. එවිට එලියා, “ඔව්,
ගිහින් එන්න. ඒකට මගෙන් විරුද්-
ධත්වයක් නැහැ” කියා ඔහුට කීවේය.
**21** එලිෂා ආපසු ගොස් තමන් දක්ක-
මින් සිටි ගොනුන් දෙදෙනා ආහාරයට
ගැනීම පිණිස මැරුවේය.*[2] සීසෑම
සඳහා ඒ ගොනුන්ට සවි කර තිබුණු ලී
උපකරණවලින්[3] ගින්නක් අවුළවා
එයින් උන්ගේ මස් තම්බා සෙනඟට
දුන්නේය. ඔවුන් කෑ පසු එලියාට සේ-
වය කිරීම සඳහා[4] එලිෂා පිටත්ව
ගියේය.

**20** සමාරියට[5] විරුද්ධව සටන්
කරන පිණිස සිරියාවේ රජු වූ
බෙන්-හාදද්[6] තමාගේ මුළු හමුදා-
වද අශ්වයන්ද[7] අශ්ව රථද[8] ඇතුළුව
තවත් රජවරුන් තිස්දෙදෙනෙකුද[9]
සමඟ ගොස් එය වැටලුවේය.[10] **2** ඒ
අතරතුර තමන් වැටලූ නුවරෙහි සිටි
ඊශ්‍රායෙල්හි රජු වූ ආහබ් වෙතට ඔහු
පණිවිඩකරුවන් යවා[11] මෙසේ දැන්වූ-
වේය. “බෙන්-හාදද්ගේ නියෝගය මෙ-
යයි. **3** ‘ඔබේ රන් හා රිදී සියල්ල
මට භාර දෙන්න. මනා පෙනුමක් ඇති
ඔබේ භාර්යාවන් හා ඔබේ පුත්‍රයන්
තෝරා මට භාර දෙන්න.’ ”[12] **4** ඊට
පිළිතුරු වශයෙන් ඊශ්‍රායෙල්හි රජ
මෙසේ කියා යැව්වේය. “මගේ ස්වා-
මීනි, මගේ රජ්ජුරුවනි, මම ඔබට
යටත් වෙනවා. ඔබ කැමති ඕනෑම
දෙයක් මට කරන්න. මා සතු සියල්-
ලද ඔබ ගන්න.”[13]

**5** පණිවිඩකරුවෝ නැවත පැමිණ
ආහබ්ට මෙසේ කීවෝය. “බෙන්-හාදද්
මෙසේ කීවේය. ‘ඔබේ රන් හා රිදී
සියල්ලද ඔබේ භාර්යාවන්ද ඔබේ
පුත්‍රයන්ද මට දෙන්න’ කියා මම
කලින් ඔබෙන් ඉල්ලුවා. **6** හෙට
මේ වේලාව වන විට මගේ සේව-
කයන්ව ඔබේ මාලිගාවටත් ඔබේ

**19 පරි.**
1 නික් 34:6; ද්වි 4:33
2 නික් 3:6
3 1රාජා 19:9
4 ද්වි 31:20; ගීතා 78:37; යෙසා 1:4; යෙරෙ 22:9; රෝම 11:3
5 1රාජා 19:10
6 2රාජා 8:7
7 2රාජා 8:8; 2රාජා 8:12; ආමො 1:4
8 1සාමු 2:7
9 2රාජා 9:14
10 2රාජා 9:2; 2රාජා 9:30
11 විනි 7:22; 1රාජා 4:12
12 2රාජා 2:9; ලූක් 4:27
13 2රාජා 2:15
14 2රාජා 8:12; 2රාජා 9:14; 2රාජා 10:32; 2රාජා 13:3
15 2රාජා 9:24; 2රාජා 10:6; 2රාජා 10:25
16 2රාජා 2:24
17 නික් 20:5
18 හොෂෙ 13:2
19 යෙසා 1:9; රෝම 11:4; රෝම 11:5; 2තිමෝ 2:19
20 නික් 3:1; විනි 6:11; 2සාමු 7:8
21 2රාජා 2:8

**2 තීරුව**
1 උත් 31:28
2 ලෙවී 19:5
3 2සාමු 24:22
4 නික් 24:13; 2රාජා 2:3; 2රාජා 3:11

**20 පරි.**
5 2රාජා 6:24; 2රාජා 17:5
6 2රාජා 6:24; 2රාජා 8:7
7 හිතෝ 21:31
8 ද්වි 20:1
9 යෙසා 10:8; එස 26:7
10 ලෙවී 26:25; ද්වි 28:52
11 2රාජා 19:9; 2රාජා 19:23; යෙසා 37:9
12 නික් 15:9; යෝබ් 40:12; යෙසා 10:13
13 ලෙවී 26:28; ද්වි 28:48

**1රාජා 19:21*** මූ.අ., “පූජාවක් ලෙස ඔප්පු කළේය.”

සේවකයන්ගේ නිවෙස්වලටත් එව-
නවා. ඔවුන් ඇවිත්, මා කලින් ඉල්ලූ
දේවල් පමණක් නොව ඔබ වටිනවා-
යයි සලකන සෑම දෙයක්ම[1] රැගෙන
යයි.”
7 එය ඇසූ ඊශ්‍රායෙල්හි රජ, දේ-
ශයේ සිටි සියලු වැඩිමහල්ලන්ව
කැඳවා[2] ඔවුන්ට මෙසේ කීවේය. “මම
කියන මේ දේ ගැන සිතා බලන්න.
ඔහු මගේ භාර්යාවන්ව, මගේ පුත්‍ර-
යන්ව හා මගේ රන්, රිදී ඉල්ලූ
විට මම ඒ සියල්ල දෙන්න සූදානම්
වුණා. ඔහුගේ අරමුණ අපිව නැත්ත-
ටම නැති කර දමන්න කියා දැන්
මට පැහැදිලියි.”[3] 8 එවිට වැඩිම-
හල්ලන් සියලුදෙනා ඇතුළු මුළු සෙ-
නඟ රජුට මෙසේ කීවෝය. “ඔහුට
යටත් වෙන්න එපා. ඔහු කියන
කිසිම දෙයකට එකඟ වෙන්නත්
එපා.” 9 පසුව රජ බෙන්-හාදද්ගේ
පණිවිඩකරුවන්ට මෙසේ කීවේය.
“මගේ ස්වාමීන් වන රජ්ජුරුවන්ට මෙ-
හෙම කියන්න. ‘ඔබ මුලින් ඉල්ලූ
සියල්ල දෙන්න මම එකඟ වෙ-
නවා. නමුත් ඔබ දැන් ඉල්ලා සිටින
දේට මට කොහෙත්ම එකඟ වෙන්න
බැහැ.’” එවිට එම පණිවිඩකරුවෝ
එතැනින් පිටත්ව ගොස් රජුට එය
දැන්වූවෝය.
10 බෙන්-හාදද් නැවත පණිවිඩයක්
යවමින්, “මගේ හමුදාව කොතරම්
විශාලද කියා ඔබ දන්නේ නැද්ද?
මගේ හමුදාව කොතරම් විශාලද කිය-
නවා නම් ඔවුන් සියලුදෙනාට අහු-
රක් බැගින් ගන්නවත් සමාරියේ වැලි
ඉතුරු නොවන ලෙස ඔවුන් සමාරිය
නැත්තටම නැති කර දමයි.[4] එහෙම
කළේ නැත්නම් මා අදහන දෙවිවරු[5]
මට දඬුවම් කළ යුතුයි”[6] කියා ඔහුට
කීවේය. 11 ඊශ්‍රායෙල්හි රජ ඊට පිළි-
තුරු වශයෙන්, “‘යුද්ධය පටන්ගන්-
නත් කලින්[7] යුද්ධෙන් ජය ලැබුවා
සේ පුරසාරම් දොඩන්න එපා’[8] කියා
ගිහින් ඔහුට කියන්න” යයි කීවේය.
12 බෙන්-හාදද් සහ අනික් රජ්ජුරුවන්
කූඩාරම්වල මත්පැන් බොමින් සිටියදී[9]
ඔහුට ඒ පණිවිඩය ලැබිණ. එය ඇසූ
වහාම ඔහු, “සටනට සැරසෙන්න”
කියා තම සේවකයන්ට අණ කළේය.
ඔවුහු ඒ නුවරට විරුද්ධව සටන් කිරී-
මට සූදානම් වූහ.
13 පසුව එක්තරා අනාගතවක්තෘ-
වරයෙක් ඊශ්‍රායෙල්හි රජු[1] වන ආහබ්
වෙතට ගොස් මෙසේ කීවේය. “යෙ-
හෝවා දෙවිගේ වචනය මෙයයි.[2] ‘මේ
හමුදාව කොතරම් විශාල වුණත් මා
යෙහෝවා දෙවි බව ඔබ නිසැකවම
තේරුම්ගන්නා පිණිස මම ඒ සියලුදෙ-
නාවම ඔබේ අතට යටත් කර දෙමි.’”[3]
14 එවිට ආහබ් රජ, “ඔබ ඒ දේ කරන්-
නේ කවුරු මාර්ගයෙන්ද” කියා ඇසු-
වේය. එවිට ඔහු මෙසේ කීවේය.
“‘අධිපතීන්* යටතේ සේවය කරන
තරුණයන් මාර්ගයෙන් ජය ලබා දෙ-
නවා’ කියායි යෙහෝවා දෙවි පැවසු-
වේ.” එවිට රජ, “යුද්ධය පටන්ගන්නේ
කවුද” කියා ඇසුවේය. ඔහුද, “යුද්-
ධය පටන්ගන්න ඕනේ ඔබයි” කියා
කීවේය.
15 ඉන්පසු රජ අධිපතීන් යටතේ
සේවය කරන තරුණයන් කොපමණ
සිටිනවාද කියා විමසා බැලුවේය.
තරුණයෝ දෙසිය තිස්දෙදෙනෙක්
සිටියෝය.[4] ඊශ්‍රායෙල්හි යුධ භට-
යන් කොපමණ සිටිනවාද කියාත්
ඔහු විමසා බැලුවේය. යුධ භට-
යෝ හත්දහස්දෙනෙක් සිටියෝය.
16 ඔවුහු මධ්‍යාහ්නයේදී යුද්ධයට
පිටත්ව ගියෝය. ඒ අවස්ථාවේදී
බෙන්-හාදද් සහ ඔහුගේ උපකාර-
යට පැමිණි රජවරු තිස්දෙදෙනා
කූඩාරමේ මත් වන තරම් මත්-
පැන් බොමින් සිටියෝය.[5] 17 ඊශ්‍රා-
යෙල් හමුදාවේ පෙරමුණේ ගමන්
කළේ අධිපතීන් යටතේ සේවය කළ
තරුණයෝය.[6] ඔවුන් කවුරුන්දැයි
විමසීමට බෙන්-හාදද් මිනිසුන් කිහිප-
දෙනෙකුව යැව්වේය. ඔවුහු නැවත
පැමිණ, “අප දෙසට ගමන් කරන මේ

**20 පරි.**
1 විනි 5:30, එස්රා 8:27
2 හිතෝ 11:14
3 හිතෝ 11:27
4 හිතෝ 16:18, යෙසා 37:24
5 1රාජා 19:2, යෙරෙ 5:7
6 ක්‍රියා 23:12
7 1සාමු 2:3, 1සාමු 25:13, ගීතා 45:3
8 හිතෝ 27:1, දේශ 7:8, දේශ 8:7
9 හිතෝ 31:4

**2 තීරුව**
1 1රාජා 16:29
2 යෙසා 55:11
3 නික් 14:18, ගීතා 37:20
4 1සාමු 14:6, 2ලේක 14:11
5 හිතෝ 31:4, දේශ 10:17, හොෂෙ 4:11
6 1රාජා 20:14

**1රාජා 20:14*** එනම්, විවිධ පළාත් පාලනය කළ අධිපතීන්.

අය සමාරියේ වැසියන්” කියා බෙන්-
හාදද්ට කීවෝය. 18 එවිට ඔහු,
“ඔවුන් සමාදාන වෙන්න ආවත් යුද්-
ධයට ආවත් මට කමක් නැහැ.
ඔවුන්ව මරන්නේ නැතුව පණපිටින්
අල්ලගෙන එන්න”[1] යයි කීවේය.
19 අධිපතීන් යටතේ සේවය කරන
තරුණයන් සමාරියේ සිට පැමිණි
අතර ඔවුන් පිටුපසින් මුළු හමු-
දාවම ගමන් කරමින් සිටියෝය.
20 සිරියානුවන් තමන්ව අල්ලාගැනී-
මට පැමිණි විට ඊශ්‍රායෙල් සෙනඟ
තමන්ට විරුද්ධව සටන් කළ අයට
පහර දී ඔවුන්ව මරා දැමුවෝය. ඒ
ප්‍රහාරය හමුවේ සිරියානු හමුදාව[2]
පලා ගිය අතර[3] ඊශ්‍රායෙල්වරු ඔවුන්
පසුපස ලුහුබැඳ ගියෝය. නමුත් සිරි-
යාවේ රජු වූ බෙන්-හාදද් අශ්වයෙකු
පිට නැඟී ඔහුගේ අසරුවන් කණ්-
ඩායම සමඟ බේරී පලා ගියේය.
21 ඊශ්‍රායෙල්හි රජ සිරියානු භටයන්-
වද අශ්වයන්වද අශ්ව රථද විනාශ
කර දැමීය.[4]

22 පසුව අනාගතවක්තෘවරයා[5]
ඊශ්‍රායෙල්හි රජු වෙතට පැමිණ මෙසේ
කීවේය. “ලබන අවුරුද්ද මුලදී සිරියා-
වේ රජ නැවත ඔබට පහර දෙන්න
උත්සාහ කරාවි.[6] ඉතින් දැන්මම
ඔබේ හමුදාව ශක්තිමත් කර[7] ඔවුන්-
ගේ ප්‍රහාරවලට මුහුණ දෙන්නේ කො-
හොමද කියා හොඳින් කල්පනා කර
බලන්න.”[8]

23 සිරියාවේ රජුගේ සේවකයෝ
පැමිණ රජුට මෙසේ කීවෝය. “ඔවුන්-
ගේ දෙවි, කඳුවලට අධිපති දෙවි-
යෙක්.[9] අපව පරාජය කරන්න ඔවුන්ට
පුළුවන් වුණේ ඒ නිසයි. නමුත් අපි
තැනිතලා භූමියක ඔවුන්ට විරුද්ධව
සටන් කළොත් අපට ජය ගන්න
පුළුවන් වේවි. 24 ඔබට සහය දුන්
රජවරුන් වෙනුවට[10] ආණ්ඩුකාර-
යන් කිහිපදෙනෙකුව තෝරාගන්න.[11]
25 මේ වතාවෙත් පැරදුණ හමුදාව
තරම්ම විශාල හමුදාවක් රැස් කර-
ගන්න. කලින් තිබුණු අශ්වයන් හා
අශ්ව රථ ප්‍රමාණයම තිබිය යුතුයි.
කලින් සිටි හමුදාවට සමාන හමුදා-
වක් සමඟ අපි තැනිතලා භූමියක
ඔවුන්ට විරුද්ධව සටන් කළොත්
අපට ජය ගන්න හැකි වේවි.”[1] රජ
ඔවුන් දුන් උපදෙස් පිළිගෙන ඔවුන් කී
ලෙසම කළේය.

26 බෙන්-හාදද් ඊළඟ අවුරුද්ද
මුලදී සිරියානු හමුදාව[2] රැස් කරගෙන
ඊශ්‍රායෙල්වරුන්ට විරුද්ධව යුද්ධ කිරී-
මට අපෙක් නගරයට[3] ගියේය.
27 නමුත් ඊශ්‍රායෙල් හමුදාවත් යුද්ධ-
යට සූදානම් වූහ. ඔවුහු යුද්ධයට
අවශ්‍ය සියලු දේ රැගෙන සටනට
ගියෝය.[4] මුළු දේශයම සිරියානු හමුදා
භටයන්ගෙන් පිරී තිබිණ. ඔවුන් සමඟ
සන්සන්දනය කළ විට ඔවුන්ට එරෙ-
හිව කඳවුරු බැඳගෙන සිටි ඊශ්‍රා-
යෙල් හමුදාව කුඩා එළු රැළවල්
දෙකක් මෙන් පෙනිණ.[5] 28 එවිට
සැබෑ දෙවිගේ[6] අනාගතවක්තෘවරයා
ඊශ්‍රායෙල්හි රජු ළඟට පැමිණ මෙසේ
කීවේය. “යෙහෝවා දෙවි මෙසේ පැව-
සුවා. ‘සිරියානු ජාතිකයන් සිතන්නේ,
‘යෙහෝවා දෙවි කඳුවලට පමණක්
අධිපති දෙවි කෙනෙක් මිස තැනිත-
ලාවන් කෙරෙහි බලයක් නැති දෙවි
කෙනෙක් කියායි.’ එබැවින් ඔබ සිය-
ලුදෙනාම මම යෙහෝවා දෙවි බව[7]
ස්ථිර වශයෙන්ම දැනගන්නා පිණිස
මම ඒ මුළු සමූහයම ඔබේ අතට
යටත් කර දෙන්නෙමි.’ ”[8]

29 හමුදා දෙකම දවස් හතක් පුරා
මුහුණට මුහුණ ලා කඳවුරු බැඳගෙන
සිටියෝය.[9] හත්වන දවසේදී සටන
ඇරඹීය. ඊශ්‍රායෙල් හමුදාව දවසක්
ඇතුළතදී සිරියානු පාබළ හමුදාවේ
භටයන් ලක්ෂයක් මරා දැමුවෝය.
30 ඉතුරු වූ භටයෝ අපෙක් නගර-
යට[10] පලා ගියෝය. ඔවුන් නගරයට
ඇතුල් වනවාත් සමඟම එහි පවුර
භටයන් විසිහත්දහසක් පිට කඩා වැටී
ඔවුහු මිය ගියෝය.[11] බෙන්-හාදද්
නගරය ඇතුළට පලා ගොස්[12] එහි
ගොඩනැඟිල්ලක ඇතුල් කාමරයක
සැඟවුණේය.[13]

**20 පරි.**
1 හිතෝ 16:18; හිතෝ 18:12; ලූක් 14:11
2 උත් 25:20; ද්වි 26:5; 2සාමු 8:6; 2රාජ 5:2; යෙසා 9:12
3 ලෙවී 26:8; ද්වි 28:7; ගීතා 33:16; ගීතා 46:6
4 යොෂු 11:6
5 1රාජ 20:13; ආමෝ 3:7
6 2සාමු 11:1; 1ලේක 20:1; 2ලේක 36:10
7 2ලේක 25:8; ගීතා 25:8; ගීතා 27:14
8 හිතෝ 20:18
9 ගීතා 47:7; ගීතා 83:18; ගීතා 97:9; ගීතා 115:2; රෝම 1:21; 1කොරි 8:4
10 1රාජ 20:1; 1රාජ 20:16
11 හිතෝ 21:30

**2 තීරුව**
1 ගීතා 10:3
2 1රාජ 20:20
3 1සාමු 29:1; 2රාජ 13:17
4 යොෂු 1:11
5 විනි 6:5; 1සාමු 13:5; 2ලේක 32:7; හෙබ්‍රෙ 11:34
6 ගීතා 18:30
7 නික් 6:7; නික් 7:5; නික් 8:10; එස 6:14; එස 39:7
8 ද්වි 32:27; ගීතා 58:10; එස 20:9; එස 36:22
9 යොෂු 6:15
10 1රාජ 20:26
11 යෙසා 24:18; යෙරෙ 48:44; ආමෝ 2:14; ආමෝ 9:3
12 1රාජ 20:20
13 1රාජ 22:25

**31** එවිට ඔහුගේ සේවකයෝ
පැමිණ ඔහුට මෙසේ කීවෝය. “ඊශ්‍රා-
යෙල්හි රජවරුන් කරුණාවන්ත*[1]
අය බව අපි අසා තිබෙනවා. ඒ
නිසා ගෝණි රෙදි[2] ඉණ වටා බැඳ-
ගෙන,[3] හිස් මත ලණු දමාගෙන
ඊශ්‍රායෙල්හි රජුව හමු වීමට යන්න
අපට අවසර දෙන්න. සමහරවිට ඔහු
ඔබට අනුකම්පා කර ඔබේ ජීවිතය
ඉතුරු කරන්න තීරණය කරාවි.”[4]
**32** ඉන්පසු ඔවුහු ගෝණි රෙදි ඉණ
වටා බැඳගෙන, තමුන්ගේ හිස් මත
ලණු දමාගෙන ඊශ්‍රායෙල්හි රජුව හමු
වී මෙසේ කීවෝය. “‘මාව මරන්න
එපා’ කියා ඔබේ සේවක බෙන්-හාදද්
ඔබෙන් කරුණාවෙන් ඉල්ලා සිටි-
නවා.” එය ඇසූ රජ, “ඔහු මට
සහෝදරයෙක් වගෙයි. ඔහු තවමත්
ජීවතුන් අතරේ ඉන්නවාද” කියා
ඇසුවේය. **33** රජතුමා අවංක චේ-
තනාවෙන් එය පැවසූ බව තේරුම්-
ගත් ඔවුහු[5] එය හොඳ ලකුණක් කියා
සිතුවෝය. ඒ නිසා ඔවුහු, “එසේය
රජතුමනි, බෙන්-හාදද් ඔබට සහෝ-
දරයෙක් වගෙයි” කියා කීවෝය. එවිට
රජතුමා, “ඔහුව රැගෙන එන්න” යයි
කීවේය. බෙන්-හාදද් සැඟවී සිටි ස්ථා-
නයෙන් පිටතට පැමිණි විට රජතුමා
තම අශ්ව රථයට ඔහුව නංවාගත්-
තේය.[6]
**34** පසුව බෙන්-හාදද් ඔහුට මෙසේ
පොරොන්දු විය. “මගේ පියා ඔබේ
පියාගෙන් අල්ලාගත් නගරවල්[7] මම
නැවත ඔබට දෙන්නම්. මගේ පියා
සමාරියේ මංමාවත් අයිති කරගත්
ලෙස දැන් ඔබ දමස්කයේ මංමාවත්
අයිති කරගන්න.”
ඊට ආහබ් රජ මෙසේ කීවේය.
“හොඳයි, මේ කොන්දේසි මත අපි දෙ-
දෙනා ගිවිසුමක්[8] ඇති කරගනිමු.
ඉන්පසු මම ඔබව නිදහස් කරන්නම්.”
රජ, ඔහුත් සමඟ ගිවිසුමක් ඇති
කරගත් පසු ඔහුව නිදහස් කර යැව්-
වේය.
**35** අනාගතවක්තෘවරුන්ගේ පුත්‍ර-
යන්ගෙන්*[1] කෙනෙක් යෙහෝවා දෙ-
විගේ අණ පරිදි[2] තම මිතුරෙකුට, “මට
පහරක් ගසන්න” යයි කීවේය. නමුත්
ඒ මිතුරා ඔහුට පහර දෙන්න අකමැති
විය. **36** එබැවින් ඔහු තම මිතුරාට
මෙසේ කීවේය. “ඔබ යෙහෝවා දෙවි-
ගේ අණට අකීකරු වුණ නිසා ඔබ
මෙතැනින් ගියායින් පසු සිංහයෙක්[3]
ඇවිත් ඔබව මරා දමයි.” ඒ මිනිසා
එතැනින් පිටත්ව යන අතරේදී සිංහ-
යෙක් ඇවිත් ඔහුව මරා දැමුවේය.[4]
**37** පසුව ඔහු තවත් කෙනෙක්
ළඟට ගොස්, “මට පහරක් ගසන්න”
යයි කීවේය. ඒ තැනැත්තා ඔහුට
තුවාල වන තෙක්ම පහර දුන්නේය.
**38** එවිට ඒ අනාගතවක්තෘවරයා
තමන්ව හඳුනාගැනීමට නොහැකි වන
සේ[5] රෙදි පටියකින් ඇස් බැඳගෙන
රජතුමා එන තුරු මඟ බලා සිටියේය.
**39** රජු ඒ පාරෙන් යද්දී ඔහු හඬ නඟා
රජුට මෙසේ කීවේය.[6] “ඔබේ සේව-
කයා වන මම යුද්ධයට ගියා. එවිට
එක් මිනිසෙක් යුධ පිටියේ සිට තවත්
මිනිසෙකුව උසුලාගෙන මා ළඟට
ආවා. ඔහු ඇවිත්, ‘මේ මිනිසාව
බලාගන්න. මා එන විට ඔහු මෙ-
තැන සිටියේ නැත්නම්, මම ඔබව
මරා දමනවා.[7] නැත්නම් වන්දියක්
හැටියට රිදී තලෙන්තයක් ගෙවන්න
ඔබට සිදු වෙයි’[8] කියා මට පැවසුවා.
**40** නමුත් ඔබේ සේවකයාට බොහෝ
වැඩ තිබුණ නිසා ඒ වැඩකටයුතුවලට
තැනින් තැනට යන්න සිදු වුණා.
පසුව මම ඇවිත් බලන විට ඒ
මිනිසා එතැන හිටියේ නැහැ.” මෙය
ඇසූ ඊශ්‍රායෙල්හි රජ ඔහුට මෙසේ
කීවේය. “ලැබිය යුතු දඬුවමට ඔබ
එකඟ වුණා නේද? දැන් ඔබට එය
විඳින්න සිදු වෙයි.”[9] **41** රජතුමා ඒ
දේ කී විගස ඔහු තම දෑස් වසා
තිබූ රෙදි පටිය ගැලෙව්වේය. එවිට

**20 පරි.**
1 හිතෝ 20:28; යෙසා 16:5
2 යෝනා 3:8
3 උත් 37:34; 1රාජා 21:27; එස්ත 4:1; යෙසා 22:12; එළි 11:3
4 යෝනා 3:9
5 හිතෝ 25:13
6 2රාජා 10:15
7 1රාජා 15:20; 2ලේක 16:4
8 නික් 23:32

**2 තීරුව**
1 2රාජා 2:3; ආමො 7:14
2 1රාජා 17:14
3 1රාජා 13:24
4 හිතෝ 16:25
5 2සාමු 14:2
6 2සාමු 12:1; 2සාමු 14:4
7 උත් 2:7; ලෙවී 17:11; 2රාජා 10:24; ක්‍රියා 12:19; ක්‍රියා 16:27
8 නික් 21:30; හිතෝ 13:8
9 යෝබ් 34:4; ලූක් 19:22; ගලා 6:7

**1රාජා 20:31*** හෝ, “ළැදි ප්‍රේමයකින් යුත්.”

**1රාජා 20:35*** මෙම යෙදුම අනාගතවක්තෘවරුන්ගෙන් උපදෙස් ලැබූ පන්තියකට හෝ අනාගතවක්තෘවරුන්ගෙන් යුත් කණ්ඩායමකට යොමු දැක්වූවා විය හැක.

ඔහු අනාගතවක්තෘවරුන්ගෙන් කෙ-
නෙක් බව[1] ඊශ්‍රායෙල්හි රජ හඳු-
නාගත්තේය. **42** එවිට ඔහු රජුට
මෙසේ කීවේය. "යෙහෝවා දෙවි ඔබට
පැවසුවේ මෙයයි. 'මම විනාශ කිරී-
මට නියම කළ තැනැත්තාව ඔබ
නිදහස් කළ නිසා[2] ඔහු වෙනුවට
ඔබව මරා දැමීමට නියම කරනවා.[3]
ඔහුගේ සෙනඟට නියම වූ දඬුවම
දැන් ඔබේ සෙනඟට ලැබෙනවා.' "[4]
**43** ඊශ්‍රායෙල්හි රජ එය අසා ඉතා
ශෝකයෙන්[5] සමාරියේ[6] තිබූ තම
මාලිගාව බලා පිටත්ව ගියේය.

**21** යෙස්‍රෙයෙල් නගරයේ[7] වැසි-
යෙකු වූ නාබොත් නම්
මිනිසෙක් සිටියේය. ඔහුට සමාරියේ
රජු වූ ආහබ්ගේ මාලිගාවට කිට්ටු-
වෙන්ම මිදිවත්තක් තිබිණ. **2** දව-
සක් ආහබ් රජ නාබොත්ට මෙසේ
කීවේය. "ඔබේ මිදිවත්ත[8] මගේ මාලි-
ගාවට කිට්ටුවෙන් තිබෙන නිසා මට
එය දෙන්න.[9] ඒ වත්තේ[10] එළවළු[11]
වගා කරන්නයි මම හිතාගෙන ඉන්-
නේ. මම ඊට වඩා හොඳ මිදිවත්තක්
ඔබට දෙන්නම්. නැත්නම් එහි වටි-
නාකම මම මුදලින් ගෙවන්නම්."
**3** නමුත් නාබොත් ආහබ් රජුට
මෙසේ කීවේය. "රජතුමනි, මම ඒ
වගේ දෙයක් කළොත් යෙහෝවා දෙවි
එය කොහොමටවත් අනුමත කරන්-
නේ නැහැ.[12] ඒ නිසා මගේ මුතුන්-
මිත්තන්ගෙන් මට ලැබුණු උරුමය
ඔබට දෙනවා තියා[13] එවැනි දෙ-
යක් කරන එක ගැන හිතන්නවත්
බැහැ."[14] **4** "මගේ මුතුන්මිත්තන්-
ගෙන් මට ලැබුණු උරුමය ඔබට
දෙන්න බැහැ" කියා නාබොත් කී නිසා
ආහබ් රජ අමනාප විය. ඔහු බොහෝ
සෙයින් කලකිරී තම නිවසට පැමිණ,
නොකා නොබී තම ඇඳට වී කල්-
පනා කරමින් සිටියේය. ඔහු කිසිවෙකු
සමඟ කතා කළේද නැත.[15]

**5** පසුව ඔහුගේ බිරිඳ වූ යෙසබෙල්[16]
ඔහු ළඟට පැමිණ, "ඔබ කෑම නොකා
දුකින් ඉන්නේ ඇයි"[17] කියා ඔහු-

**20 පරි.**
1 1රාජා 20:35
2 ලෙවී 27:29; යොෂු 6:18; 1සාමු 15:9; 1ලේක 2:7; යෙරෙ 48:10
3 1රාජා 22:31; 1රාජා 22:35; 2ලේක 18:33
4 2රාජා 6:24; 2රාජා 8:12; 2ලේක 18:16
5 1රාජා 21:4; ගීතා 2:10
6 1රාජා 16:29

**21 පරි.**
7 යොෂු 19:18; 1රාජා 18:45; හොෂෙ 2:22
8 1සාමු 8:14
9 නික් 20:17; ද්වි 5:21; හබ 2:9; ලූක් 12:15; රෝම 7:7; යාකො 1:14; 2පේතෘ 2:14
10 දේශ 2:5
11 ද්වි 11:10
12 යොෂු 22:5; 1සාමු 24:6; 1සාමු 26:11
13 ලෙවී 25:23; ගණන් 36:7; එස 46:18
14 ලෙවී 25:18; ගීතා 97:10; ආමො 5:15
15 හිතෝ 15:13; හිතෝ 18:14
16 1රාජා 16:31; 1රාජා 18:4; 1රාජා 19:2; 1රාජා 21:25; 2රාජා 9:34
17 නෙහෙ 2:2

**2 තීරුව**
1 1රාජා 21:3
2 1සාමු 8:14
3 මීකා 2:1; මීකා 7:3
4 2සාමු 11:14
5 නෙහෙ 9:38; එස්ත 8:8
6 ගණන් 11:16; ද්වි 16:18
7 හිතෝ 6:18
8 1සාමු 2:12; 2සාමු 20:1; හිතෝ 17:23
9 ද්වි 17:6
10 නික් 22:28; ලෙවී 24:16; මතෙ 26:65; ක්‍රියා 23:5

ගෙන් ඇසුවාය. **6** ඔහු ඇයට මෙසේ
කීවේය. "මම නාබොත්ට කිව්වා.
'ඔබේ මිදිවත්ත මට විකුණන්න.
ඔබට මුදල් එපා නම් ඒ වෙනු-
වට මම ඊට වඩා හොඳ මිදිවත්තක්
ඔබට දෙන්නම්' කියලා. නමුත් ඔහු,
'මගේ මිදිවත්ත ඔබට දෙන්න බැහැ'[1]
කියලා මට පැවසුවා." **7** එවිට ඔහු-
ගේ බිරිඳ වූ යෙසබෙල්, "ඊශ්‍රායෙල් දේ-
ශයේ රජ්ජුරුවන් ඔබ නෙවෙයිද?[2]
දැන් ගිහින් කෑම ටිකක් කාලා සතු-
ටින් ඉන්න. නාබොත්ගේ මිදිවත්ත
ගැන මම බලාගන්නම්"[3] කියා ඔහුට
කීවාය. **8** පසුව ඇය ආහබ් රජුගේ
නමින් ලිපි ලියා[4] ඔහුගේ මුද්‍රාවෙන් ඒ
ලිපි මුද්‍රා කළාය.[5] නාබොත් වාසය
කළ නගරයේ සිටි වැඩිමහල්ලන්ටද[6]
වංශවත් අයටද ඇය ඒ ලිපි යැව්-
වාය. **9** ඇය ඒ ලිපිවල මෙසේ ලියා
තිබිණ.[7] "ජනයාව රැස් කර ඔවුන්ට
නිරාහාරව සිටින ලෙස පවසන්න.
එහිදී නාබොත්ව ප්‍රධාන අසුනේ වාඩි
කරවන්න. **10** කිසි වැදගැම්මකට
නැති[8] මිනිසුන් දෙදෙනෙකුව[9] සොයා,
නාබොත් ඉදිරියේ හිඳගෙන, 'ඔබ දෙ-
විටත් රජුටත් ශාප කළා[10] කියා අපි
දන්නවා' කියමින් ඔහුට විරුද්ධව
සාක්ෂි දෙන්න කියා ඔවුන් දෙදෙනාට
පවසන්න.[11] ඉන්පසු ඒ චෝදනාව මත
ඔහුව පිටතට ගෙන ගොස් ඔහුට ගල්
ගසා මරන්න."[12]

**11** නාබොත් වාසය කළ නගරයේ
සිටි වැඩිමහල්ලෝ සහ වංශවත් අය
යෙසබෙල් යැවූ ලිපිවල තිබූ උප-
දෙස් අකුරටම ක්‍රියාත්මක කළෝය.[13]
**12** ඔවුහු නිරාහාරව[14] සිටීමට ජන-
යාව රැස් කර නාබොත්ට ප්‍රධාන
අසුනේ හිඳගන්න කියා කීවෝය.
**13** ඉන්පසු කිසි වැදගැම්මකට නැති
මිනිස්සු දෙදෙනෙක් පැමිණ ඔහුට ඉදි-
රියෙන් හිඳගත්තෝය. ඒ දෙදෙනා
සියල්ලන් ඉදිරියේ නාබොත්ට විරුද්-
ධව චෝදනා කරමින්, "නාබොත්

**11** නික් 20:16; ද්වි 5:20; හිතෝ 6:19; හිතෝ 24:28; යෙසා 32:7; ක්‍රියා 6:13; **12** ලෙවී 24:16; යොහ 10:33; ක්‍රියා 7:58; **13** නික් 23:1; ලෙවී 19:15; **14** යෙසා 58:4.

දෙවිටත් රජුටත් ශාප කළා"[1] යයි
කීවෝය. පසුව ඔවුහු ඔහුව නගර-
යෙන් පිටතට ගෙන ගොස් ඔහුට ගල්
ගසා මැරුවෝය.[2] **14** ඔහුව මරා
දැමූ පසු ඔවුහු යෙසබෙල්ට පණිවිඩ-
යක් යවා, "අපි ගල් ගසා නාබොත්ව
මරා දැම්මා"[3] කියා දැන්වූවෝය.

**15** නාබොත්ට ගල් ගසා මැරූ
බව යෙසබෙල්ට ආරංචි වූ වහාම
ඇය ආහබ් රජුට මෙසේ කීවාය.
"යෙෂ්‍රෙයෙල් නගරයේ ජීවත් වුණු
නාබොත් මැරිලා. ඉතින් ඔහු ඔබට
විකුණන්න අකමැති වූ මිදිවත්ත දැන්
ඔබට අයිති කරගන්න පුළුවන්."[4]
**16** නාබොත් මිය ගිය බව ආහබ් රජ
යෙසබෙල් මාර්ගයෙන් දැනගත් විගස
ඔහු නාබොත්ගේ මිදිවත්ත අයිති
කරගැනීමට එතැනට ගියේය.[5]

**17** ඒ අතරතුර තිෂ්බේ නම් ගමෙහි
ජීවත් වූ එලියාට[6] යෙහෝවා
දෙවි කතා කර[7] මෙසේ කීවේය.
**18** "සමාරියේ[8] පදිංචිව සිටින ඊශ්‍රා-
යෙල්හි රජු වන ආහබ්ව හමු වීමට
දැන්මම යන්න. ඔහු දැන් ඉන්නේ
නාබොත්ගේ මිදිවත්තේ. ඔහු එතැ-
නට ගියේ එම වත්ත අයිති කරගන්-
නයි. **19** ඔබ ඔහුට මේ පණිවිඩය
කියන්න. 'යෙහෝවා දෙවි ඔබට
මෙසේ පවසනවා. "ඔබ මිදිවත්-
තක් අයිති කරගන්න[9] මිනී මැරුමක්
කළාද?" '[10] ඉන්පසු ඔහුට මේ තීන්-
දුව දැනුම් දෙන්න. 'යෙහෝවා දෙවි
මෙසේ පැවසුවා. "බල්ලෝ නාබොත්-
ගේ ලේ ලෙව කෑ තැනම[11] ඔබේ ලේත්
ලෙව කන්නෝය." ' "[12]

**20** ආහබ් රජුට එලියාව හමු වූ විට
ආහබ් රජ, "එලියා, ඔබ ආයෙත්
ආවද මාව හමු වෙන්න"[13] කියා ඔහුට
කීවේය. එවිට එලියා, "මා ඔබව හමු
වීමට ආවේ මේ දේ කියන්නයි. 'ඔබ
හිතාමතාම යෙහෝවා දෙවි වන මා
පිළිකුල් කරන දේ කරන නිසා[14]
**21** මම දැන් ඔබේ ගෙයි වැසියන් පිටට
විපතක් ගෙනෙන්නෙමි.[15] ඔබේ පවු-
ලේ සිටින ලොකු කුඩා සියලුම පුරුෂ-
යන්ව මම විනාශ කර දමන්නෙමි.[16]

**21 පරි.**
1 1රාජා 21:10 දේශ 3:16 ආමො 5:12 හබ 1:4
2 2රාජා 9:26 දේශ 4:1
3 දේශ 5:8 දේශ 8:14 හබ 1:13
4 1රාජා 21:7 හිතෝ 4:17 යෙරෙ 22:17
5 ගීතා 50:18 හබ 2:12 රෝම 1:32 2පේතෘ 2:15
6 1රාජා 17:1
7 ගීතා 9:12 යෙසා 26:21
8 1රාජා 16:29
9 හබ 2:9
10 උත් 4:10
11 නික් 21:23 ගීතා 7:15
12 1රාජා 22:38 2රාජා 9:25 මතෙ 7:2
13 1රාජා 18:17 ආමො 5:10 ගලා 4:16
14 1රාජා 16:30
15 2රාජා 9:7
16 නික් 20:5 2රාජා 9:8 2රාජා 10:7

**2 තීරුව**
1 2රාජා 10:17 2රාජා 10:30
2 1රාජා 16:26
3 1රාජා 15:29
4 1රාජා 16:3 1රාජා 16:11
5 2රාජා 9:10 2රාජා 9:35 ගීතා 7:16
6 1රාජා 14:11 1රාජා 16:4 යෙරෙ 15:3 එළි 19:18
7 1රාජා 16:30
8 ද්වි 13:6 විනි 16:16 2ලේක 22:3 එළි 2:20
9 1රාජා 16:31
10 නික් 23:28 ද්වි 9:5 2ලේක 33:2
11 1සාමු 12:21 ගීතා 96:5 යෙරෙ 10:14 1කොරි 8:4
12 1රාජා 20:31 2කොරි 7:10
13 හිතෝ 15:13
14 ගීතා 78:34
15 ගීතා 86:15 මීකා 7:18

කිසි කමකට නැති ඒ එක පුරුෂයෙකු-
වත්[1] මම ඊශ්‍රායෙල් දේශයේ ඉතුරු
නොකරන්නෙමි. **22** ඔබ මාව උද-
හස් කරන අයුරින් පව් කර, ඊශ්‍රායෙල්-
වරුන්වත් පාපයට පෙලඹූ බැවින්[2]
නෙබාත්ගේ පුත් යෙරොබෝවම්ගේ
පවුලටත්[3] අහියාගේ පුත් බාෂාගේ පවු-
ලටත්[4] සිදු වූ දේම මම ඔබේ පවුල-
ටත් සිදු කරන්නෙමි.' **23** යෙසබෙල්
ගැන යෙහෝවා දෙවිගේ තීන්දුව මෙ-
යයි. 'යෙසබෙල්ගේ මළ සිරුර, යෙෂ්‍රෙ-
යෙල්හි තිබෙන ඉඩමේදී බල්ලෝ කා
දමනු ඇත.[5] **24** ආහබ්ගේ පවුලේ
යමෙකු නුවර තුළ මැරුණොත් බල්-
ලෝ ඔහුගේ මළ සිරුර කා දමති.
යමෙකු නුවරෙන් පිට මැරුණොත්
පක්ෂීහු ඔහුගේ මළ සිරුර කා දමති.[6]
**25** හිතාමතාම යෙහෝවා දෙවි පිළි-
කුල් කරන දේවල් කළ ආහබ් මෙන්
දුෂ්ට කෙනෙක් අද වන තුරු සිටියේ
නැත.[7] ඒ වැරදි කිරීමට ඔහුව නිතරම
පෙලඹුවේ[8] ඔහුගේ බිරිඳ වන යෙස-
බෙල්ය.[9] **26** යෙහෝවා දෙවි ඊශ්‍රා-
යෙල්වරුන් ඉදිරියෙන් පන්නා දැමූ[10]
අමෝරිවරුන් මෙන් ඔහුත් පිළිකුල්
රූපවලට*[11] නමස්කාර කරමින් ඉතා
පිළිකුල්සහගත ලෙස ක්‍රියා කළේය.' "

**27** ආහබ් රජට මේ වචන ඇසුණු
වහාම ඔහු තම වස්ත්‍ර ඉරාගෙන
ගෝණි රෙදි ඇඳගෙන, නිරාහා-
රව සිටියේය. ඔහු විටෙක ගෝණි
රෙදි[12] මත වැතිර සිටියේය. තවත්
විටෙක බොහෝ සේ කලකිරී ඒ මේ
අත ඇවිද්දේය.[13] **28** එබැවින් තිෂ්-
බේ ගමෙහි ජීවත් වූ එලියාට යෙ-
හෝවා දෙවි නැවත කතා කර මෙසේ
කීවේය. **29** "මා කී දේ නිසා නිහත-
මානීව තම වරද පිළිගෙන ඒ ගැන දුක්
වෙමින් සිටින ආහබ්ව ඔබ දුටුවෙ-
හිද?[14] ඔහු මා කී දේ අසා යටහත්ප-
හත් වූ නිසා මම ඔහුගේ පවුල පිට
ගෙනෙන විපත ඔහුගේ ජීවිත කාල-
යේදී සිදු නොකරන්නෙමි.[15] ඔහුගේ

**1රාජා 21:26*** 1රාජා 15:12හි පාදසටහන බලන්න.

පුත්‍රයාගේ කාලයේදී එය සිදු වීමට
සලස්වන්නෙමි.”[1]

**22** අවුරුදු තුනක් පුරා සිරියානු
ජාතිකයන් සහ ඊශ්‍රායෙල්ව-
රුන් අතර කිසිදු ගැටුමක් නොති-
බිණ. **2** තුන්වන අවුරුද්දේදී යූදාහි
රජු වූ යෙහෝෂාපාට්[2] ඊශ්‍රායෙල්හි රජුව
හමු වීමට ගියේය. **3** එවිට ඊශ්‍රා-
යෙල්හි රජ තම සේවකයන්ට මෙසේ
පැවසීය. “රාමොත්-ගිලියද්[3] ඇත්ත-
ටම අයිති අපට බව ඔබ දන්නවාද?
නමුත් සිරියාවේ රජුගෙන් එය නැවත
ලබාගන්න අප තවමත් පියවර ගෙන
නැහැ.” **4** ඉන්පසු ඔහු යෙහෝෂ-
පාට් රජු වෙතට හැරී, “රාමොත්-
ගිලියද් වෙනුවෙන් සටන් කරන්න ඔබ
මා සමඟ එනවාද”[4] කියා ඇසුවේය.
එවිට යෙහෝෂාපාට් රජ ඊශ්‍රායෙල්හි
රජුට මෙසේ කීවේය. “මම ඔබ සමඟ
එන්නම්. මගේ හමුදාව ඔබේ හමුදාව
කියා සිතන්න.[5] මගේ අශ්වයන් ඔබේ
අශ්වයන් කියා සිතන්න.”

**5** නමුත් යෙහෝෂාපාට් රජ, “යුද්ධ-
යට යන්න කලින් යෙහෝවා දෙවි-
ගෙන් ඒ ගැන විමසා බලමුද”[6] කියා
ඊශ්‍රායෙල්හි රජුගෙන් ඇසීය. **6** එබැ-
වින් ඊශ්‍රායෙල්හි රජ, අනාගතවක්තෘ-
වරුන් හාරසියදෙනෙකු පමණ රැස්
කර,[7] “රාමොත්-ගිලියද් නිදහස් කර-
ගැනීමට මම යුද්ධයට යන්නද එපාද
කියා මට කියන්න” යයි ඔවුන්ට
කීවේය. ඔවුහුද, “යන්න.[8] රජතුමාට
ඒ නගරය අල්ලගන්න යෙහෝවා දෙවි
උදව් කරන බවට සැකයක් නැහැ”
කියා පිළිතුරු දුන්නෝය.

**7** නමුත් යෙහෝෂාපාට් රජ ඒ ගැන
සෑහීමට පත් නොවී, “යෙහෝවා දෙවි-
ගෙන් මේ කාරණය ගැන හරියට
දැනගෙන කියන්න පුළුවන් වෙනත්
අනාගතවක්තෘවරයෙක් මෙහි නැද්ද”[9]
කියා ඇසුවේය. **8** එවිට ඊශ්‍රා-
යෙල්හි රජ යෙහෝෂාපාට් රජුට මෙසේ
කීවේය. “මේ ගැන යෙහෝවා දෙවි-
ගෙන් අහන්න පුළුවන් තව එක මිනි-
සෙක් ඉන්නවා.[10] නමුත් මම ඔහුට
කොහොමටවත් කැමති නැහැ.[1] ඔහු
මා ගැන කියන්නෙම නරක අනා-
වැකි.[2] ඔහු මා ගැන හොඳ අනාවැකි-
යක් කියනවා මම අහලම නැහැ.
ඔහු තමයි ඉම්ලාහ්ගේ පුත් මීකායා.”
මෙය ඇසූ යෙහෝෂාපාට් රජ, “එහෙම
කියන්න එපා. අපි ඔහුගෙනුත් අසා
බලමු”[3] කියා පැවසුවේය.

**9** එබැවින් ඊශ්‍රායෙල්හි රජ තම
මාළිගාවේ සේවය කළ නිලධාරියෙ-
කුව[4] කැඳවා, “වහාම ඉම්ලාහ්ගේ
පුත් මීකායාව මෙතැනට කැඳවාගෙන
එන්න”[5] යයි කීවේය. **10** ඒ අවස්ථා-
වේදී ඊශ්‍රායෙල්හි රජද යූදාහි රජු වූ
යෙහෝෂාපාට්ද රාජකීය වස්ත්‍රවලින්
සැරසී,[6] සමාරියේ දොරටුව අසල තිබූ
කමතේ තම තමන්ගේ සිංහාසන
තබා එහි හිඳගෙන සිටියෝය. අනාග-
තවක්තෘවරු සියලුදෙනා ඔවුන් ඉදිරි-
යේ අනාවැකි පළ කරමින් සිටියෝය.[7]
**11** එවිට කෙනානාගේ පුත් ශෙදකියා
යකඩ අං දෙකක් සාදා මෙසේ කීවේය.
“ ‘ඔබ සිරියානුවන්ට මේ අංවලින් ඇන
ඔවුන්ව සම්පූර්ණයෙන්ම නැති කර
දමනවා’[8] කියා යෙහෝවා දෙවි පැව-
සුවා.”[9] **12** අන් සියලු අනාගතවක්-
තෘවරුද ඒ හා සමාන අනාවැකි
කියමින්, “ඔබ රාමොත්-ගිලියද් නග-
රයට යන්න. ජය ගන්නවා නියතයි.
රජතුමාට ඒ නගරය අල්ලගන්න යෙ-
හෝවා දෙවි උදව් කරන බව ස්ථි-
රයි”[10] කියා කීවෝය.

**13** මීකායාව කැඳවාගෙන එන්න
ගිය පණිවිඩකරු මීකායාව හමු වී
ඔහුට මෙසේ කීවේය. “අනාගත-
වක්තෘවරුන් සියලුදෙනාම කියන්-
නේ රජතුමා සාර්ථක වන
බවයි. ඉතින් ඔබත් ඔවුන් කියන
දේට සමාන දෙයක් කියන්න.”[11]
**14** නමුත් මීකායා, “යෙහෝවා දෙවි
මට කියන දෙයක් මිස වෙන කිසිම
දෙයක් කියන්න නම් මට බැහැ.[12]
මම ඒ ගැන ඔබට ජීවමාන දෙවි
වන යෙහෝවාගේ නමින්ම දිවුරා
කියන්නම්”[13] යයි කීවේය. **15** පසුව
මීකායා, රජු ඉදිරියට පැමිණි විට රජ

**21 පරි.**
1 නික් 20:5
2රාජා 9:25
2රාජා 10:7
2රාජා 10:11

**22 පරි.**
2 1රාජා 15:24
2ලේක 18:3
3 ද්වි 4:43
යොෂු 20:8
1රාජා 4:13
4 2ලේක 18:2
5 2රාජා 3:7
2ලේක 18:3
හිතෝ 13:20
2කොරි 6:14
6 ගණන් 27:21
හිතෝ 3:6
7 1රාජා 18:19
මතෙ 15:14
8 2ලේක 18:5
යෙරෙ 5:31
යෙරෙ 23:30
9 2රාජා 3:11
2ලේක 18:6
10 1රාජා 18:4

**2 තීරුව**
1 1රාජා 21:20
2ලේක 36:16
ගීතා 34:21
හිතෝ 9:8
2 2ලේක 18:7
යෙසා 30:10
යෙරෙ 38:4
3 හිතෝ 5:12
හිතෝ 5:13
තීත 1:13
4 1සාමු 8:16
2රාජා 9:32
5 2ලේක 18:8
6 එස්ත 6:8
මතෙ 11:8
ක්‍රියා 12:21
7 2ලේක 18:9
එස 13:2
8 2ලේක 18:10
9 ද්වි 18:20
යෙරෙ 23:16
යෙරෙ 23:17
එස 13:6
10 2ලේක 18:11
11 2ලේක 18:12
12 ගණන් 22:35
2ලේක 18:13
යෙරෙ 1:7
යෙරෙ 23:28
එස 2:4
2පේතෘ 1:21
13 ද්වි 6:13
යෙරෙ 12:16

මෙසේ ඇසුවේය. “මීකායා, රාමොත්-
ගිලියද් නගරයට ගිහින් අපි යුද්ධ
කරන්නද?” ඒ අවස්ථාවේදී මීකායා
රජුට මෙසේ කීවේය. “යන්න, ඔබ
ජය ගන්නවා නියතයි. රජතුමාට
ඒ නගරය අල්ලගන්න යෙහෝවා
දෙවි උදව් කරයි.”[1] **16** එවිට රජ,
“යෙහෝවා දෙවිගේ නාමයෙන් දිවුරා
මට ඇත්ත කියන්න කියා මම
ඔබට කී වතාවක් කියා තිබෙනවාද”[2]
කියා ඔහුගෙන් ඇසීය. **17** එවිට
මීකායා මෙසේ පැවසුවේය. “එඬේ-
රෙක් නැති බැටළුවන් මෙන්[3] ඊශ්‍රා-
යෙල්වරු කඳුකරයේ ඒ මේ අත විසිර
සිටින ආකාරය මට පෙනෙනවා.[4] ඒ
ගැන යෙහෝවා දෙවි මෙසේ පවස-
නවා. ‘ඔවුන්ව බලාගැනීමට ස්වාමි-
වරු නැත. එබැවින් ඔවුන් එක් එක්
කෙනාට තම තමන්ගේ නිවෙස්වලට
සමාදානයෙන් යන්න ඉඩ දෙන්න.’ ”[5]
**18** එවිට ඊශ්‍රායෙල්හි රජ, යෙහෝ-
ෂාපාට් රජුට මෙසේ කීවේය. “ ‘ඔහු මා
ගැන කිව්වොත් කියන්නේ නරක දෙ-
යක්. ඔහු මා ගැන හොඳ අනා-
වැකියක් කියනවා මම කවදාවත්
අහලම නැහැ’ කියා මම ඔබට කිව්වේ
නැද්ද?”[6]
**19** නමුත් මීකායා මෙසේ කීවේය.
“යෙහෝවා දෙවිගේ පණිවිඩයට සවන්
දෙන්න.[7] යෙහෝවා දෙවි තම සිංහාස-
නයේ ඉඳගෙන සිටිනවා මම දුටුවා.[8]
ස්වර්ගයේ සේනාවන් ඔහුගේ දකුණු
පැත්තෙන් හා වම් පැත්තෙන් සිටින-
වාත් මම දුටුවා.[9] **20** එවිට යෙ-
හෝවා දෙවි මෙසේ ඇසුවා.
‘ආහබ්, රාමොත්-ගිලියද් නගරයට
ගොස් යුද්ධ කර, එහිදී මිය යන
පිණිස එහි යෑමට ඔහුව පොලඹ-
වන්න ඉදිරිපත් වෙන්නේ කවුද?’
එවිට ඔහු ඉදිරියේ සිටි අය නොයෙක්
අදහස් ප්‍රකාශ කළා.[10] **21** අන්ති-
මේදී එක දේවදූතයෙක්*[11] යෙහෝවා
දෙවි ඉදිරියට ඇවිත්, ‘මම ඔහුව
රවට්ටන්නම්’ කියා පැවසුවා. එවිට
යෙහෝවා දෙවි, ‘ඔබ කොහොමද
ඒ දේ කරන්නේ’[1] කියා ඔහුගෙන්
ඇසුවා. **22** ඔහු මෙසේ පැවසුවා.
‘මම ගිහින් ඔහුගේ අනාගතවක්තෘව-
රුන් සියලුදෙනා[2] මාර්ගයෙන් ඔහුව
රවට්ටන්නම්.’ එවිට දෙවි, ‘හොඳයි,
ඔබ ගිහින් ඔහුව රවට්ටන්න.[3] ඔබේ
වෑයම සාර්ථක වෙයි’[4] කියා පැවසුවා.
**23** ඒ නිසයි යෙහෝවා දෙවි දේවදූත-
යාට ඉඩ දුන්නේ අනාගතවක්තෘව-
රුන් මාර්ගයෙන් ඔබට ඒ විදිහට
දේවල් පවසන්න.[5] නමුත් ඇත්තටම
යෙහෝවා දෙවි තීරණය කර තිබෙන්-
නේ ඔබට විපතක් ගෙනෙන්නයි.”[6]
**24** එවිට කෙනානාගේ පුත් ශෙද-
කියා, මීකායාට කම්මුල් පහරක් දී[7]
මෙසේ කීවේය. “යෙහෝවා දෙවිගේ
දූතයා මා සමඟ කතා නොකර ඔබට
ඒ පණිවිඩය දුන්නා කියාද ඔබ කියන්-
නේ?”[8] **25** මීකායාද, “ළඟදීම මම
කියූ දේ ඇත්තක් කියා ඔබ තේරුම්ග-
නියි. නමුත් එදාට ඔබට සිදු වෙන්-
නේ ඇතුල් කාමරයට[9] ගොස් සැඟවී
සිටින්නයි”[10] කියා කීවේය. **26** එවිට
ඊශ්‍රායෙල්හි රජ මෙසේ කීවේය. “මීකා-
යාව රැගෙන ගිහින් නගරයේ ප්‍රධානියා
වන ආමොන්ට හා රජුගේ පුත් යෝ-
වාෂ්ට භාර දෙන්න.[11] **27** මම කියන
මේ දේ ඔබ ඔවුන්ට දැන්විය යුතුයි.
‘ “මම ජය ගෙන එන තෙක්[12] මොහුව
සිරගෙහි තබාගන්න.[13] වැඩිය කන්න
බොන්න දෙන්න එපා”[14] කියා රජතුමා
පැවසුවා.’ ”[15] **28** ඊට මීකායා මෙසේ
කීවේය. “ඔබ මේ යුද්ධයෙන් ජය
ගෙන ආවොත් යෙහෝවා දෙවි මා
සමඟ කතා කළේ නැහැ කියා මම
පිළිගන්නම්.”[16] තවදුරටත් මීකායා
මෙසේ කීවේය. “ජනයෙනි, මා මේ
දේවල් කියන්නේ ඔබ සියලුදෙනා
ඉදිරිපිටයි.”[17]
**29** පසුව ඊශ්‍රායෙල්හි රජද යූදාහි
රජු වූ යෙහෝෂාපාට්ද රාමොත්-ගිලියද්
බලා පිටත් වුණෝය.[18] **30** ඊශ්‍රා-
යෙල්හි රජ යෙහෝෂාපාට් රජුට මෙසේ
කීවේය. “මම වෙස්වලා ගෙන යුද්ධ

**22 පරි.**
1 2ලේක 18:14
2 ද්වි 5:11; 2ලේක 18:15
3 හිතෝ 10:24; සෙක 10:2; සෙක 13:7; මතෙ 9:36
4 ද්වි 28:25
5 2ලේක 18:16; එස 33:9
6 2ලේක 18:17
7 2ලේක 18:18
8 යෙසා 6:1; එස 1:26; දානි 7:9
9 යෝබ් 1:6; දානි 7:10; මතෙ 18:10; එළි 5:11
10 2ලේක 18:19
11 ගීතා 104:4; හෙබ්‍රෙ 1:7; හෙබ්‍රෙ 1:14

**2 තීරුව**
1 2ලේක 18:20
2 1රාජා 22:6
3 2ලේක 18:21
4 2තෙස 2:11; 1යොහ 4:1
5 එස 14:9
6 ගණන් 23:19; 1රාජා 20:42; 2ලේක 18:22; යෙසා 55:11
7 1ලේක 16:22; ගීතා 105:15
8 2ලේක 18:23
9 1රාජා 20:30
10 2ලේක 18:24
11 2ලේක 18:25
12 2ලේක 18:26
13 හෙබ්‍රෙ 11:36
14 ගීතා 104:15
15 රෝම 9:18
16 ගණන් 16:29
17 2ලේක 18:27
18 2ලේක 18:28

**1රාජා 22:21*** මුල් භාෂාවේ භාවිත කර ඇත්තේ, රුවා යන වචනයයි. “අදෘශ්‍යමාන ජීවියෙක්” යන අරුත ඊට ඇතුළත්ය.

කරන්නම්.[1] නමුත් ඔබ රාජකීය වස්ත්‍ර
පැළඳගෙන[2] යුද්ධයට යන්න.” ඊශ්‍රා-
යෙල්හි රජ එලෙස වෙස්වලා ගෙන[3]
යුද්ධයට ගියේය.[4] **31** ඒ අතරතුර
සිරියාවේ රජ, තමන්ගේ අශ්ව රථ
සේනා පාලනය කළ අධිපතීන් තිස්-
දෙදෙනාට[5] මෙසේ අණ කර තිබිණ.
“ඔවුන්ගේ සේනාවල සිටින ලොකු
පොඩි කාගෙන්වත් මට වැඩක් නැහැ.
ඔබ ඊශ්‍රායෙල්හි රජුව සොයාගෙන
ඔහුට පහර දිය යුතුයි.”[6] **32** අශ්ව
රථ සේනා පාලනය කළ අධිපතීහු
යෙහෝෂාපාට් රජුව දුටු විට, “අර ඉන්-
නේ ඊශ්‍රායෙල්හි රජ්ජුරුවෝ”[7] කියා
තම තමන් අතරේ කියාගත්තෝය.
එබැවින් ඔවුහු සියලුදෙනාම ඔහු සිටි
දිශාවට හැරී ඔහුට පහර දීමට සූදානම්
වූහ. මෙය වටහාගත් යෙහෝෂාපාට්
රජ උපකාරය පතා කෑගැසුවේය.[8]
**33** ඔහු ඊශ්‍රායෙල්හි රජු නොවන බව
අශ්ව රථ සේනා පාලනය කළ අධිප-
තීන් දැනගත් විට ඔවුහු තවදුරටත්
ඔහු පසුපස ගියේ නැත.[9]

**34** යුද්ධය පවතින අතරතුර ඊශ්‍රා-
යෙල්හි රජු පැළඳ සිටි ආයුධ කට්ටල-
යේ තිබූ හිදැසක් තුළින් ඊතලයක්
පැමිණ ඔහුට වැදුණේය. ඔහු ඊශ්‍රා-
යෙල්හි රජු බව ඒ ඊතලය විද්ද
තැනැත්තා දැන සිටියේ නැත. එවිට
රජ තම අශ්ව රථය පදවමින් සිටි
තැනැත්තාට මෙසේ කීවේය.[10] “මට
හොඳටම තුවාලයි. මාව යුධ බිමෙන්
පිටතට ගෙන යන්න.” **35** එදින
යුද්ධය තව තවත් උග්‍ර වූ නිසා රජුව
යුධ බිමෙන් ඉවතට ගෙන යෑමට
නොහැකි විය. තම සේවකයන්ගේ
උපකාරය ඇතුව ඔහු සිරියානු හමුදාව
දෙසට මුහුණ ලා අශ්ව රථයේ සිට-
ගෙන සිටියේය. ඔහුගේ තුවාලෙන්
වැගිරුණු ලේ අශ්ව රථය පුරා ගලා
ගියේය.[11] සවස් වන විට ඔහු මිය
ගියේය.[12] **36** හිරු බැස යන වේලා-
වේදී පමණ, “දැන් සියල්ල අවසන්.
එක් එක් කෙනා තම තමාගේ නගර-
යටත් තම තමාගේ ගමටත් හැරී
යන්න”[13] කියා යුධ බිම පුරා නිවේද-
නය කළේය. **37** රජු මිය ගිය පසු
ඔවුහු ඔහුගේ මළ සිරුර සමාරියට
ගෙනැවිත් එහි තැන්පත් කළෝය.[1]
**38** පසුව ඔවුහු සමාරියේ පිහිටි පො-
කුණකින් වතුර රැගෙන ඒ අශ්ව රථ-
යේ තිබූ ලේ සෝදාහැරියෝය. (ඒ
පොකුණ ගණිකාවන් ස්නානය කරන
තැනකි.) යෙහෝවා දෙවි කී ලෙසම[2]
එහි සිටි බල්ලෝ ඔහුගේ ලේ ලෙව
කෑවෝය.[3]

**39** ආහබ් රජුගේ ජීවිතයේ අනිකුත්
සිදුවීම්ද ඔහු කළ දේවල්ද ඔහු ඇත්ද-
ළවලින්[4] සෑදූ මාලිගාව ගැනද ඔහු
ගොඩනැඟූ නුවරවල් ගැනද ඊශ්‍රා-
යෙල්හි රජවරුන්ගේ ඉතිහාසය
වාර්තා කර ඇති ලියවිල්ලෙහි සඳහන්
කර තිබේ.[5] **40** ආහබ් රජද මිය ගිය
අතර ඔහුගේ මුතුන්මිත්තන් මෙන්
ඔහුවද තැන්පත් කරන ලදි.[6] ඉන්-
පසු ඔහුගේ පුත් අහසියා[7] රජකමට
පත් විය.

**41** ආසාගේ පුත් යෙහෝෂාපාට්[8]
යූදාහි රජකමට පත් වූයේ ආහබ්
ඊශ්‍රායෙල්හි රජකම් කළ හතරවන
අවුරුද්දේදීය. **42** යෙහෝෂාපාට් රජ-
කමට පත් වන විට ඔහුගේ වයස අවු-
රුදු තිස්පහකි. අවුරුදු විසිපහක් ඔහු
යෙරුසලමේ රජකම් කළේය. ඔහුගේ
මව ෂිල්හීගේ දියණිය වූ අෂූබාය.
**43** ඔහු තම පියා වූ ආසාගේ අඩි-
පාරේ ගමන් කරමින් දිගටම යෙ-
හෝවා දෙවි යහපත්යයි සලකන දේ
කළේය.[9] නමුත් බොරු නමස්කාරය
සඳහා වෙන් කර තිබූ පූජනීය ස්ථාන
සමහරක් දේශයේ තිබුණේය. ඒ නිසා
ජනයාද දිගටම ඒ පූජනීය ස්ථාන මත
සුවඳ දුම්ද පූජාද ඔප්පු කළෝය.[10]
**44** යෙහෝෂාපාට් රජු හා ඊශ්‍රායෙල්හි
රජු අතර සුහදශීලී වාතාවරණයක්
පැවතිණ.[11] **45** යෙහෝෂාපාට් රජුගේ
ජීවිතයේ අනිකුත් සිදුවීම් ගැනද ඔහු-
ගේ බලවත් ක්‍රියා ගැනද ඔහු යුද්ධ කළ
ආකාරය ගැනද යූදාහි රජවරුන්ගේ
ඉතිහාසය වාර්තා කර ඇති ලියවිල්-
ලෙහි සඳහන් කර තිබේ.[12] **46** තම
පියා වූ ආසාගේ කාලයේ දේවාලවල

**22 පරි.**
**1** 1සාමු 8:20
**2** 1රාජා 22:10
**3** 2ලේක 35:22; හිතෝ 21:30
**4** 2ලේක 18:29
**5** 1රාජා 20:1
**6** 2ලේක 18:30
**7** 2ලේක 18:31
**8** ගීතා 50:15; ගීතා 91:15; ගීතා 130:1
**9** 2ලේක 18:32
**10** 2ලේක 18:33
**11** උත් 9:6
**12** 1රාජා 20:42; 2ලේක 18:34
**13** 1රාජා 22:17

---

**2 තීරුව**
**1** 1රාජා 16:28
**2** ද්වි 32:35; ගීතා 119:89; යෙසා 14:27; යෙසා 46:10; යෙසා 48:3
**3** 1රාජා 21:19
**4** 1රාජා 10:22; එස 27:15
**5** 1රාජා 14:19; 1රාජා 16:5; 1රාජා 16:27
**6** 1රාජා 16:28
**7** 2රාජා 1:2; 2ලේක 20:35
**8** 1ලේක 3:10; 2ලේක 17:1; 2ලේක 20:31; මතෙ 1:8
**9** 1රාජා 15:11; 2ලේක 14:2; 2ලේක 14:11; 2ලේක 15:8; 2ලේක 17:3; දේශ 12:13
**10** ද්වි 12:14; 1රාජා 14:23; 1රාජා 15:14; 2රාජා 12:3; 2රාජා 14:4; 2රාජා 15:4; 2රාජා 18:22; 2ලේක 20:33
**11** 2රාජා 8:18; 2ලේක 18:1; 2ලේක 19:2
**12** 1රාජා 14:29

මුදලට සමලිංගික සේවනයේ යෙදුණු
පිරිමින්ගෙන්[1] ඉතුරු වූ අයවද ඔහු දේ-
ශයෙන් පන්නා දැමුවේය.[2]

**47** ඒ කාලයේ ඒදොම්හි[3] රජෙක්
නොසිටියේය. ඒ දේශය පාලනය
කළේ අධිපතියෙකි.[4]

**48** යෙහෝෂපාට් රජ තර්ෂිෂ්[5] කියා
හැඳින්වූ නැව් සාදා ඕෆීර් සිට රත්ත-
රන් ගෙන ඒමට ඒවා යැව්වේය. නමුත්
ඒ නැව් එෂියොන්-ගෙබෙර්හිදී මුහුදු-
බත් වූ නිසා[6] ඕෆීර්වලට යැමට ඒවාට
නොහැකි විය. **49** එකල ආහබ්-
ගේ පුත් අහසියා, “මගේ සේවක-
යන්ට ඔබේ සේවකයන් සමඟ නැව්වල
යන්න පුළුවන්ද” කියා යෙහෝෂපාට්
රජුගෙන් ඇසුවේය. නමුත් යෙහෝෂ-
පාට් රජ ඊට එකඟ වූයේ නැත.[7]

**50** කල් යත්ම යෙහෝෂපාට් රජුද
මිය ගිය අතර ඔහුගේ මුතුන්මිත්තන්
මෙන් ඔහුවද තැන්පත් කරනු ලැබීය.[8]
ඔහුව තැන්පත් කරන ලද්දේ ඔහුගේ
මුතුන්මිත්තා වන දාවිත්ගේ නුවරෙ-
හිය.[1] ඔහුගෙන් පසුව ඔහුගේ පුත් යෙ-
හෝරම්[2] රජකමට පත් විය.

**51** ආහබ්ගේ පුත් අහසියා[3] ඊශ්‍රා-
යෙල්හි රජකමට පත් වූයේ යෙහෝෂ-
පාට් යූදාහි රජකම් කළ දහහත්වන
අවුරුද්දේදීය. අහසියා අවුරුදු දෙකක්
ඊශ්‍රායෙල්හි රජකම් කළේය. **52** ඔහු
තම පියාගේද[4] මවගේද[5] ඊශ්‍රායෙල්ව-
රුන්ව පාපයට පෙලඹවූ[6] නෙබාත්-
ගේ පුත් යෙරොබොවම්ගේද[7] අඩිපාරේ
ගමන් කරමින් යෙහෝවා දෙවි පිළි-
කුල් කළ දේ කළේය.[8] **53** ඔහු දිග-
ටම බාල්[9] ඉදිරියේ වැඳ වැටී ඔහුට
නමස්කාර කළේය. මෙසේ ඔහු තම
පියා කළ සෑම වරදකම නියැලෙමින්
ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝවාව උද-
හස් කළේය.[10]

**22 පරි.**
**1** ලෙවී 20:13; රෝම 1:27; 1කොරි 6:9; 1තිමෝ 1:10; යූද් 7
**2** 1රාජා 15:12
**3** උත් 36:1; උත් 36:9
**4** 2සාමු 8:14; 2රාජා 8:20; ගීතා 108:9
**5** 1රාජා 10:22; 2ලේක 9:21
**6** 1රාජා 9:26; 2ලේක 20:37
**7** හිතෝ 1:10; 2කොරි 6:14
**8** 1රාජා 2:10; 2ලේක 21:1

**2 තීරුව**
**1** 1රාජා 11:43; 1රාජා 14:31; 1රාජා 15:24
**2** 2රාජා 8:16; 2ලේක 21:5
**3** 2රාජා 1:2
**4** 1රාජා 16:30; 2රාජා 8:27; 2ලේක 22:3
**5** 1රාජා 21:25
**6** 1රාජා 14:9; 2රාජා 3:3; **7** 1රාජා 12:28; 1රාජා 13:33; **8** ද්වි 28:15; **9** විනි 2:11; 1රාජා 16:32; 2රාජා 1:2; **10** නික් 20:3; නික් 34:14.

## දෙවෙනි
# රාජාවලිය

නැතහොත් ග්‍රීක සෙප්ටුඅජින්ට් පරිවර්තනයට අනුව
හතරවෙනි රාජාවලිය

**1** ආහබ් රජුගේ මරණයෙන් පසු[1]
මෝවබ්[2] දේශයේ වැසියෝ ඊශ්‍රා-
යෙල්වරුන්ට විරුද්ධව කැරලිගැසීමට
පටන්ගත්තෝය.[3]

**2** දිනක් අහසියා රජ සමාරියේ
පිහිටි තම මාලිගාවේ උඩුමහල් කාම-
රයේ[4] කවුළුවෙන් වැටී[5] රෝගාතුර
විය. තමාට කුමක් සිදු වේදැයි දැන-
ගන්නා පිණිස ඔහු සේවකයන් කිහිප-
දෙනෙකුව කැඳවා ඔවුන්ට මෙසේ
කීවේය. “එක්‍රොන් නගරයේ[6] දෙවි-
යන් වන බාල්-සේබුබ්[7] ළඟට ගිහින්
මා මේ රෝගයෙන් සුව වෙනවාද
නැද්ද කියා[8] විමසන්න.”[9] **3** එවිට
යෙහෝවා දෙවිගේ දේවදූතයෙක්[1]
තිෂ්බේ නම් ගමෙහි විසූ[2] එලියාට
මෙසේ කීවේය. “ඔබ දැන් ගිහින් සමා-
රියේ රජුගේ සේවකයන්ව හමු වී
ඔවුන්ගෙන් මෙසේ අසන්න. ‘ඔබේ
රජු එක්‍රොන් නගරයේ බාල්-සේබුබ්
දෙවියන්ගෙන් තොරතුරු විමසන්න
සූදානම් වෙන්නේ ඊශ්‍රායෙල්හි දෙවි
කෙනෙක් නැති නිසාද?’[3] **4** ඔබේ
රජු කළ මේ දේ නිසා, ‘ඔබට කවදා-
වත් ඇඳෙන් බහින්න ලැබෙන්නේ
නැත. තව වැඩි කාලයක් ඔබ ජීවත්

**1 පරි.**
**1** 2රාජා 3:5
**2** උත් 19:37; ගණන් 24:17; ගීතා 60:8
**3** 2රාජා 3:5; 2රාජා 8:22
**4** විනි 3:20; 1රාජා 17:19
**5** දේශ 9:11
**6** යොෂු 13:3; 1සාමු 5:10
**7** 2රාජා 1:16
**8** 1සාමු 28:7; 1රාජා 14:3; 2රාජා 8:8
**9** නික් 20:3; 1සාමු 15:23

**2 තීරුව** **1** 2රාජා 1:15; ක්‍රියා 8:26; **2** 1රාජා 17:1; **3** 1රාජා 18:36; යෙසා 8:19; යෙරෙ 2:11; යෝනා 2:8.

වෙන්නෙත් නැත'[1] කියා යෙහෝවා
දෙවි ඔබේ රජුට පවසනවා." එලියා
ඔවුන්ව හමු වී ඒ පණිවිඩය කීවේය.
**5** සේවකයන් අහසියා රජු වෙතට
නැවත පැමිණි විට, "ඔබ මෙතරම්
ඉක්මනින් ආවේ කොහොමද" කියා
ඔහු ඔවුන්ගෙන් ඇසුවේය. **6** ඔවුහු
ඔහුට මෙසේ කීවෝය. "මනුෂ්‍යයෙක්
අපව හමු වෙන්න ඇවිත් මෙහෙම
කිව්වා. 'ඔබව එවූ රජු ළඟට ගොස්
මෙහෙම කියන්න. "ඔබ එක්‍රොන්
නගරයේ බාල්-සේබුබ් දෙවියන්ගෙන්
තොරතුරු විමසන්න සූදානම් වෙන්-
නේ ඊශ්‍රායෙල්හි දෙවි කෙනෙක් නැති
නිසාද? ඔබ මේ දේ කළ නිසා
ඔබට කවදාවත් ඇඳෙන් බහින්න
ලැබෙන්නේ නැත. තව වැඩි කාල-
යක් ඔබ ජීවත් වෙන්නෙත් නැත"[2]
කියා යෙහෝවා දෙවි රජුට කිය-
නවා.' "[3] **7** එවිට අහසියා රජ ඔවුන්-
ගෙන් මෙසේ ඇසුවේය. "ඔබව හමු වී
මේ දේවල් කියූ මිනිසාගේ හැඩ-
රුව කොයි වගේද?" **8** එවිට ඔවුහු,
"ඔහු ලෝම වස්ත්‍රයක් ඇඳ,[4] ඉණ
වටේ හම් පටියක් බැඳගෙනයි සිටි-
යේ"[5] කියා රජුට කීවෝය. රජ එය
ඇසූ විගස, "ඒ තිෂ්බේ ගමේ ඉන්න
එලියා" යයි කීවේය.
**9** එවිට අහසියා රජ පනස්දෙනෙ-
කුගෙන් යුත් හට පිරිසක්ද ඔවුන්ගේ
නායකයාවද එලියාව හමු වීමට පිටත්
කර යැව්වේය.[6] කණ්ඩායමේ නාය-
කයා කන්දක් මුදුනේ වාඩි වී සිටි
එලියා වෙත ගොස් මෙසේ කීවේය.
"සැබෑ දෙවිගේ අනාගතවක්තෘවර-
යෙක් වන ඔබට[7] රජතුමා, 'කන්-
දෙන් බැස එන්න' කියා කියනවා."
**10** නමුත් එලියා කණ්ඩායමේ නාය-
කයාට මෙසේ කීවේය. "මම ඇත්ත-
ටම දෙවිගේ අනාගතවක්තෘවරයෙක්
නම් අහසෙන් ගින්නක්[8] ඇවිත් ඔබ-
වයි ඔබේ කණ්ඩායමේ සිටින පනස්-
දෙනාවයි දවා දැමිය යුතුයි." ඔහු එසේ
පැවසූ විට අහසෙන් ගින්නක් ඇවිත්
ඔහුවත් ඔහුගේ කණ්ඩායමේ සිටි
පනස්දෙනාවත් දවා දැමුවේය.[9]

**11** එවිට අහසියා රජ පනස්දෙනෙ-
කුගෙන් යුත් තවත් හට පිරිසක්ද
ඔවුන්ගේ නායකයාවද ඔහු වෙත යැව්-
වේය.[1] එම නායකයාද එලියාට මෙසේ
කීවේය. "සැබෑ දෙවිගේ අනාගතවක්-
තෘවරයෙක් වන ඔබට, 'ඉක්මනින්
කන්දෙන් බැස එන්න'[2] කියා රජතුමා
කියනවා." **12** නමුත් එලියා ඔවුන්ට
මෙසේ කීවේය. "මම සැබෑ දෙවිගේ
අනාගතවක්තෘවරයෙක් නම් අහසෙන්
ගින්නක් ඇවිත් ඔබවයි ඔබේ කණ්ඩා-
යමේ සිටින පනස්දෙනාවයි දවා දැමිය
යුතුයි." ඔහු එසේ පැවසූ විට දෙවි වෙ-
තින් ගින්නක් නික්ම ඇවිත් ඔහුවත්
ඔහුගේ කණ්ඩායමේ සිටි පනස්දෙනා-
වත් දවා දැමුවේය.
**13** එවිට අහසියා රජ තුන්වන
වතාවටත් පනස්දෙනෙකුගෙන් යුත්
හට පිරිසක්ද ඔවුන්ගේ නායකයාවද
පිටත් කර යැව්වේය.[3] එහෙත් එම
කණ්ඩායමේ නායකයා එලියා වෙත
ගොස් ඔහු ඉදිරියේ දණින් වැටී[4] ඉතා
බැගෑපත්ව[5] මෙසේ කීවේය. "සැබෑ
දෙවිගේ අනාගතවක්තෘවරයෙක් වන
ඔබගෙන් ඉල්ලා සිටින්නේ මගේ
ජීවිතයත්[6] ඔබේ සේවකයන් වන
මේ පනස්දෙනාගේ ජීවිතත් විනාශ
කරන්න එපා[7] කියායි. **14** ඔබව හමු
වීමට කලින් ආ නායකයන් දෙදෙ-
නාත් ඔවුන්ගේ හට පිරිසත් ගින්නෙන්
විනාශ වී ගියා.[8] අනේ, මට අනුකම්පා
කරන්න. මට අනතුරක් කරන්න
එපා."
**15** එවිට යෙහෝවා දෙවිගේ දූතයා
එලියාට මෙසේ කීවේය. "භය
වෙන්න එපා.[9] ඔබ කන්දෙන් බැස ඔහු
සමඟ යන්න." එවිට එලියා කන්දෙන්
බැස ඔහු සමඟ රජු වෙතට ගියේය.
**16** රජු ඉදිරියට පැමිණි විට එලියා,
රජුට මෙසේ කීවේය. "යෙහෝවා දෙවි
ඔබට මෙසේ පවසනවා. 'ඔබ එක්‍රොන්
නගරයේ[10] බාල්-සේබුබ් දෙවියන්ගෙන්
තොරතුරු විමසන්න සේවකයන්ව
යැව්වේ[11] ඊශ්‍රායෙල්හි දෙවි කෙනෙක්
නැති නිසාද? ඔබ මේ දේ කළ නිසා
ඔබට කවදාවත් ඇඳෙන් බහින්න

**1 පරි.**
1 හිතෝ 11:19, හිතෝ 14:32, දේශ 8:13
2 1ලේක 10:14
3 යෙසා 46:10, යෙසා 55:11
4 1රාජා 19:19, සෙක 13:4
5 මතෙ 3:4, හෙබ්‍රෙ 11:37
6 ගීතා 105:15
7 ද්වි 33:1, 1සාමු 2:27
8 ගණන් 11:1, ගණන් 16:35, ගීතා 106:18, ලූක් 9:54, යූද් 7
9 හිතෝ 13:17

**2 තීරුව**
1 යෙසා 26:11
2 ගීතා 140:11, හිතෝ 22:3
3 හිතෝ 27:22, යෙරෙ 5:3
4 මතෙ 17:14, මාක් 1:40, මාක් 10:17
5 යෙසා 60:14
6 උත් 2:7
7 1සාමු 26:21, ගීතා 72:14
8 2රාජා 1:10
9 ගීතා 27:1, යෙරෙ 1:17, එස 2:6
10 යොෂු 13:3
11 2රාජා 1:3

ලැබෙන්නේ නැත. තව වැඩි කාල-
යක් ඔබ ජීවත් වෙන්නෙත් නැත.’”
**17** යෙහෝවා දෙවි, එලියා මාර්ග-
යෙන් පැවසූ ලෙස[1] අහසියා රජ තව
තවත් දුර්වල වී මිය ගියේය.[2] අහසි-
යාට පුත්‍රයෙකු නොසිටි නිසා ඔහුට
පසුව යෙහෝරම්*[3] රජකමට පත් විය.
මොහු රජකමට පත් වූයේ යූදාහි රජු වූ
යෙහෝෂපාට් රජුගේ පුත් යෙහෝ-
රම්ගේ පාලන සමයේ දෙවන අවුරුද්-
දේදීය.[4]
**18** අහසියා රජු[5] කළ අනිකුත්
දේවල් ගැන ඊශ්‍රායෙල්හි රජවරුන්ගේ
ඉතිහාසය වාර්තා කර ඇති ලියවිල්-
ලෙහි සඳහන් කර තිබේ.[6]

**2** යෙහෝවා දෙවි එලියාව[7] තද
සුළඟක් මාර්ගයෙන් අහසට ඔස-
වාගන්න[8] තීරණය කර තිබිණ. එදින
එලියා සහ එලිෂා[9] ගිල්ගාල් නගර-
යෙන් පිටත්ව ගියෝය.[10] **2** එලියා
එලිෂාට මෙසේ කීවේය. “යෙහෝවා
දෙවි මට බෙතෙල් නගරයට යන්න
කිව්වා. ඒ නිසා ඔබ මෙහි නවතින්න.”
නමුත් එලිෂා, “මම ඔබව අත්හැර
යන්නේ නැහැ[11] කියා ජීවමාන යෙ-
හෝවා දෙවි ඉදිරියෙත්[12] ඔබ ඉදිරි-
යෙත්[13] දිවුරා පොරොන්දු වෙනවා”
යයි කීවේය. ඔහු එසේ කී නිසා ඔවුහු
එක්ව බෙතෙල් වෙතට ගියෝය.[14]
**3** බෙතෙල්හි සිටි අනාගතවක්තෘ-
වරුන්ගේ පුත්‍රයෝ[15] එලිෂා ළඟට
පැමිණ ඔහුගෙන් මෙසේ ඇසුවෝය.
“අද යෙහෝවා දෙවි ඔබේ ස්වාමියා-
ගෙන් ඔබව වෙන් කරන්න යන බව
ඔබ දන්නවද?”[16] එවිට එලිෂා, “ඔව්,
මම එය දන්නවා.[17] දැන් නිශ්ශබ්දව
ඉන්න” යයි කීවේය.
**4** පසුව එලියා එලිෂාට මෙසේ
කීවේය. “යෙහෝවා දෙවි මට යෙ-
රිකෝ නගරයට[18] යන්න කිව්වා.
ඒ නිසා ඔබ දැන් මෙතැන නව-
තින්න.” නමුත්, “මම ඔබව අත්හැර
යන්නේ නැහැ කියා ජීවමාන දෙවි
වන යෙහෝවා ඉදිරියෙත් ඔබ ඉදිරි-
යෙත් දිවුරා පොරොන්දු වෙනවා” කියා
එලිෂා කීවේය. ඔහු එසේ කී නිසා
ඔවුහු එක්ව යෙරිකෝවට ගියෝය.
**5** යෙරිකෝවෙහි සිටි අනාගතවක්-
තෘවරුන්ගේ පුත්‍රයෝ එලිෂා ළඟට
පැමිණ ඔහුගෙන් මෙසේ ඇසුවෝය.
“අද යෙහෝවා දෙවි ඔබේ ස්වාමියා-
ගෙන් ඔබව වෙන් කරන්න යන බව
ඔබ දන්නවද?” එවිට එලිෂා, “ඔව්,
මම එය දන්නවා. දැන් නිශ්ශබ්දව
ඉන්න”[1] යයි කීවේය.
**6** පසුව එලියා එලිෂාට මෙසේ
කීවේය. “යෙහෝවා දෙවි මට යොර්-
දාන් ගඟ[2] ළඟට යන්න කිව්වා. ඒ
නිසා ඔබ දැන් මෙතැන නවතින්න.”
නමුත් එලිෂා, “මම ඔබව අත්හැර
යන්නේ නැහැ[3] කියා ජීවමාන දෙවි
වන යෙහෝවා ඉදිරියෙත් ඔබ ඉදිරි-
යෙත් දිවුරා පොරොන්දු වෙනවා” යයි
කීවේය. ඔහු එසේ කී නිසා ඔවුහු එක්ව
ඉදිරියට ගමන් කළෝය. **7** අනාග-
තවක්තෘවරුන්ගේ පුත්‍රයෝ පනස්දෙ-
නෙක් ඔවුන් පසුපස ගොස් පෙනෙන
දුරකින් සිටගෙන සිටියෝය.[4] එලියා
සහ එලිෂා යොර්දාන් ගඟ ළඟ සිටි-
යෝය. **8** එවිට එලියා තම නිල
වස්ත්‍රය[5] ගලවා එයින් වතුරට ගැසු-
වේය. වතුර ටිකෙන් ටික දෙබෑ වූ පසු
ඔවුහු වියළි බිමෙන් එගොඩ වූහ.[6]
**9** ඔවුන් දෙදෙනා එගොඩ වූ පසු
එලියා එලිෂාට කතා කර, “මාව
ඔබෙන් වෙන් කරන්න කලින් ඔබ
කැමති දෙයක් මගෙන් ඉල්ලන්න”[7]
යයි කීවේය. එලිෂා මෙසේ පැවසුවේය.
“ඔබට ලැබුණු බලයෙන්[8] දෙකො-
ටසක්[9] මට දෙන්න.”*[10] **10** එවිට
එලියා, “ඔබ ඉල්ලන්නේ[11] මට දෙන්න
අමාරු දෙයක්. ඔබෙන් වෙන් වී යන
විට ඔබට මාව පෙනුණොත් ඔබට එය
ලැබේවි. නමුත් මාව ඔබට පෙනු-
ණේ නැත්නම් ඔබට එය ලැබෙන්නේ
නැහැ” කියා කීවේය.

**1 පරි.**
1 යෙසා 44:26
2 හිතෝ 13:21
3 2රාජා 3:1; 2රාජා 9:22
4 2රාජා 8:16
5 1රාජා 22:51
6 1රාජා 14:19; 1රාජා 22:39

**2 පරි.**
7 1රාජා 17:1
8 2රාජා 2:11
9 1රාජා 19:16
10 2රාජා 4:38
11 2සාමු 15:21; හිතෝ 18:24
12 එදි 6:13; යෙරෙ 4:2; යෙරෙ 12:16
13 1සාමු 17:55; 2රාජා 4:30
14 උත් 28:19; 1රාජා 12:29; 1රාජා 13:1; 2රාජා 2:23
15 1රාජා 18:13; 1රාජා 20:35; 2රාජා 4:1
16 1රාජා 19:16
17 ආමො 3:7
18 යොෂු 6:26; 1රාජා 16:34

**2 තීරුව**
1 2රාජා 2:3
2 2සාමු 19:15
3 උත් 32:26; රූත් 1:16; 2රාජා 2:2
4 1රාජා 18:13
5 1රාජා 19:19; 2රාජා 2:13
6 නික් 14:22; යොෂු 3:17; 2රාජා 2:14; ගීතා 114:5; යෙසා 11:15
7 ලූක් 24:51; හෙබ්‍රෙ 7:7
8 එදි 34:9; ලූක් 1:17; ක්‍රියා 1:8; ක්‍රියා 8:17
9 එදි 21:17
10 1රාජා 19:16
11 මතෙ 7:7; 1යොහ 5:14

**2රාජා 1:17*** මෙහි කතා කරන්නේ අහසියාගේ සහෝදරයෙක් වන යෙහෝරාම් ගැනයි.

**2රාජා 2:9*** හෝ, “ඔබ හා සමානව උද්‍යෝග-යෙන් කටයුතු කිරීමට ඔබට ලැබුණු බලයෙන් දෙකොටසක් දෙන්න.”

**11** ඔවුන් දෙදෙනා කතා කරමින්
යන විට එකපාරටම යුධ රථයක්ද[1]
අශ්වයෝද ඔවුන් අතරට පැමිණ
ඔවුන් දෙදෙනාව වෙන් කළෝය.
රථයද අශ්වයන්ද ගින්නෙන් ඇවි-
ළෙන්නාක් මෙන් තිබිණ. ඒ සමඟම
හැමූ තද සුළඟකින් එලියාව අහසට
ඔසවාගන්නා ලදි.[2] **12** මේ සියල්ල
දුටු එලිෂා කෑගසා මෙසේ කීවේය.
“මගේ පියාණෙනි, මගේ පියාණෙනි,[3]
මේ ඊශ්‍රායෙල්හි යුධ රථය හා එහි
අසරුවන් නොවේද!”[4] ඉන්පසු ඔහුට
එලියාව නොපෙනී ගියේය. එවිට
එලිෂා තමාගේ පිට වස්ත්‍රය දෙ-
කට ඉරුවේය.[5] **13** එලියාව ඔස-
වාගන්නා විට බිම වැටුණු ඔහුගේ
නිල වස්ත්‍රය[6] එලිෂා අතට ගෙන
නැවත යොර්දාන් ගං ඉවුරට ගියේය.
**14** එලිෂා එලියාගේ නිල වස්ත්‍රයෙන්
වතුරට ගසා[7] මෙසේ කීවේය. “එලියා-
ගේ දෙවි වන යෙහෝවා, ඔබ ඉන්නේ
කොහේද?”[8] ඔහු වතුරට ගැසූ විට
වතුර ටිකෙන් ටික දෙබෑ විය. එලිෂා
එතැනින් එගොඩ වූයේය.

**15** යෙරිකෝවෙහි සිටි අනාගත-
වක්තෘවරුන්ගේ පුත්‍රයෝ එලිෂා පැමි-
ණෙනවා දුර සිටම දැක මෙසේ
කීවෝය. “එලියාට ලැබුණු බලය[9]
දැන් එලිෂාටත් ලැබිලා.”* ඉන්පසු
ඔවුහු එලිෂාව හමු වී ඔහු ඉදිරි-
යේ දණින් වැටුණෝය.[10] **16** ඔවුහු
ඔහුට මෙසේ කීවෝය. “ඔබේ සේවක-
යන් අතරේ හොඳ ශක්තිමත් මිනි-
සුන් පනස්දෙනෙක් සිටිනවා. ඔබේ
ස්වාමියාව සොයන්න ඔවුන්ව යව-
මුද? යෙහෝවා දෙවිගේ බලයෙන්[11]
ඔහුව ඔසවාගෙන ගිය පසු ඔහු
සමහරවිට කන්දක් උඩට නැත්-
නම් නිම්නයකට වැටෙන්න ඇති.”
නමුත් එලිෂා, “ඔවුන්ව යවන්න
එපා” යයි කීවේය. **17** නමුත් ඔවුන්
ඔහුට පෙරැත්ත කළ නිසා තවදුරටත්
ඔවුන්ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට
නොහැකිව ඔහු අන්තිමේදී, “එහෙම-
නම් යවන්න” යයි කීවේය. එබැ-
වින් ඔවුහු මිනිසුන් පනස්දෙනෙකුව
යැව්වෝය. දවස් තුනක් පුරා ඔහුව
සොයාගැනීමට උත්සාහ දැරුවත්
ඔවුන්ට ඔහුව සොයාගැනීමට නො-
හැකි විය. **18** ඔවුන් ආපසු හැරී එන
විට එලිෂා සිටියේ යෙරිකෝවේය.[1]
එලිෂා ඔවුන්ට මෙසේ කීවේය. “ ‘ඔහුව
සොයන්න යන්න එපා’ කියලා මම
ඔබට කිව්වා නේද?”

**19** පසුව ඒ නගරයේ මිනිස්සු
පැමිණ එලිෂාට මෙසේ කීවෝය. “අප-
ගේ ස්වාමීනි, මේ නගරය පිහිටා
තිබෙන්නේ ඉතා හොඳ තැනක[2] කියා
ඔබ හොඳින් දන්නවා. නමුත් මෙහි
වතුර[3] නම් හොඳ නැහැ. ඒ නිසා දේ-
ශයේ ජීවත් වන ස්ත්‍රීන්ට ගබ්සා සිදු
වුණා.”[4] **20** එවිට ඔහු, “භාවිතයට
නොගත් කුඩා භාජනයකට ලුණු
ටිකක් දමා මට ගෙනත් දෙන්න” යයි
කීවේය. ඔවුහු එය ඔහුට ගෙනැ-
විත් දුන්නෝය. **21** ඔහු එම නුවරේ
දිය උල්පත ළඟට ගොස් ඊට ලුණු
වීසි කරමින්[5] මෙසේ කීවේය. “ ‘මම
මේ වතුර පිරිසිදු කරනවා.[6] මෙතැන්
පටන් මේ වතුර නිසා කිසි මරණයක්
සිදු වෙන්නේ නැහැ. මේ වතුර නිසා
ස්ත්‍රියකට ගබ්සා වීමක් සිදු වෙන්-
නෙත් නැහැ’ කියා යෙහෝවා දෙවි
පැවසුවා.” **22** එලිෂා කී ලෙස අද
දක්වාම ඒ වතුර පිරිසිදුව පවතියි.[7]

**23** ඉන්පසු එලිෂා එතැනින් පිටත්
වී බෙතෙල් නගරයට ගියේය.[8] ඔහු
බෑවුම දිගේ ගමන් කරද්දී ඒ නගර-
යෙන් පිටතට පැමිණි කුඩා පිරිමි
ළමයි[9] කාණ්ඩායමක් ඔහුට උසුළු-
විසුළු කරමින්[10] මෙසේ කීවෝය.
“තට්ටයා, මෙහෙන් යන්න![11] තට්-
ටයා, මෙහෙන් යන්න!” **24** අන්ති-
මේදී ඔහු ඔවුන් දෙසට හැරී යෙහෝවා
දෙවිගේ නාමයෙන් ඔවුන්ට ශාප
කළේය.[12] ඉන්පසු වැලහින්නියෝ දෙ-
දෙනෙක්[13] වනයෙන් පිටතට පැමිණ
ඒ ළමුන්ගෙන් හතළිස්දෙදෙනෙකුව
කෑලි කෑලිවලට ඉරා දැමුවෝය.[14]

**2 පරි.**

**1** 2රාජා 6:17; ගීතා 68:17; හබ 3:8
**2** 2ලේක 21:12
**3** 2රාජා 5:13; ක්‍රියා 7:2; 1කොරි 4:15
**4** 2රාජා 13:14
**5** 2සාමු 1:11; යෝබ් 1:20
**6** 1රාජා 19:19; 2රාජා 1:8; සෙක 13:4; මතෙ 3:4
**7** යොෂු 3:13; 2රාජා 2:8
**8** 1රාජා 18:36; හෙබ්‍රෙ 10:39
**9** ගණන් 11:25; ගණන් 27:20; 2රාජා 2:9; යෙසා 11:2
**10** යොෂු 4:14; රෝම 12:10
**11** 1රාජා 18:12

---

**2 තීරුව**

**1** යොෂු 6:26; 1රාජා 16:34
**2** ද්වි 34:3
**3** නික් 15:23
**4** ද්වි 28:18; හොෂෙ 9:14
**5** නික් 15:25; 2රාජා 4:41
**6** එස 47:8
**7** දේශ 3:14
**8** 2රාජා 2:2
**9** හිතෝ 20:11; හිතෝ 22:15
**10** උත් 21:9; 2ලේක 36:16; ලූක් 10:16; 1තෙස 4:8
**11** යෙසා 22:12
**12** විනි 9:20; විනි 9:57; 2රාජා 1:10; ක්‍රියා 8:20
**13** හිතෝ 17:12; හිතෝ 28:15; හොෂෙ 13:8
**14** 1රාජා 19:17; හිතෝ 9:12; හිතෝ 19:25; හිතෝ 19:29; නාහු 1:2

---

**2රාජා 2:15*** හෝ, “එලියාට සමාන උද්‍යෝගය-
කින් එලිෂාත් කටයුතු කරනවා.”

25 එලිෂා එතැනින් පිටත්ව කර්මෙල්
කන්දට ගියේය.[1] පසුව ඔහු නැවත
සමාරියට ගමන් කළේය.

3 යූදාහි රජු වූ යෙහෝෂාපාට්ගේ
පාලන සමයේ දහඅටවන අවු-
රුද්දේදී ආහබ් රජුගේ පුත් යෙහෝ-
රම්[2] ඊශ්‍රායෙල්හි රජකමට පත් විය.
සමාරියේ විසූ ඔහු අවුරුදු දොළොසක්
රජකම් කළේය. 2 ඔහු යෙහෝවා
දෙවි පිළිකුල් කළ දේවල් දිගටම
කළේය.[3] එහෙත් තම පියා හා මව
තරම් දුෂ්ට දේ නොකළේය.[4] ඔහුගේ
පියා බාල්ගේ නාමයට සෑදූ[5] කණුව
ඔහු ඉවත් කළේය.[6] 3 එහෙත් ඊශ්‍රා-
යෙල්වරුන්ව පාපයට පෙලඹවූ[7] නෙ-
බාත්ගේ පුත් යෙරොබොවම් කළ
පාප[8] ඔහුත් කළේය. ඒ දුෂ්ට දේවල්
අත්හැරීමට ඔහු කිසිම පියවරක් නො-
ගත්තේය.

4 ඒ කාලයේ මෝවබ් දේශයේ
රජු වූ මේෂාට[9] බොහෝ බැටළු
රැළවල් සිටියෝය. ඔහු ඊශ්‍රායෙල්හි
රජුට කප්පමක් හැටියට බැටළු පැට-
වුන් ලක්ෂයකුත් ලොම් නොකැපූ
බැටළුවන් ලක්ෂයකුත් යැව්වේය.
5 නමුත් ආහබ් රජු මිය ගිය පසු[10]
මෝවබ්හි රජ ඊශ්‍රායෙල්හි රජුට විරුද්-
ධව කැරලිගසන්න පටන්ගත්තේය.[11]
6 එබැවින් යෙහෝරම් රජ සමාරි-
යෙන් පිටත්ව ගොස් සියලු ඊශ්‍රායෙල්-
වරුන්ව සටනට රැස් කරගත්තේය.[12]
7 මීට අමතරව ඔහු යූදාහි යෙහෝ-
ෂාපාට් රජුට පණිවිඩ යවා මෙසේ
කීවේය. "මෝවබ් දේශයේ රජු මට
විරුද්ධව කැරලිගසනවා. මෝවබ් දේ-
ශයට විරුද්ධව යුද්ධයට යන්න මා
සමඟ එන්න ඔබ කැමතිද?" යෙ-
හෝෂාපාට් රජ මෙසේ කීවේය. "මම
ඔබ සමඟ එන්නම්.[13] මගේ සෙ-
නඟ ඔබේ සෙනඟ කියා සිතන්න.[14]
මගේ අශ්වයන් ඔබේ අශ්වයන් කියා
සිතන්න." 8 ඔහු තවදුරටත්, "අපි
මොන පාරෙන් ගියොත්ද හොඳ" කියා
ඇසුවේය. "අපි ඒදොම්හි පාළුකරය[15]
මැදින් වැටී ඇති පාරෙන් යමු" කියා
යෙහෝරම් රජ කීවේය.

9 එබැවින් ඊශ්‍රායෙල්හි රජද යූදාහි
රජද ඒදොම්හි රජද[1] සටනට පිටත්ව
ගියෝය. ඔවුහු කෙළින් පාරේ නො-
ගොස් දවස් හතක් පුරා වෙනත් පාර-
කින් ගමන් කළෝය. ඔවුන් යන
අතරතුර ඔවුන් සමඟ ගමන් කළ හට-
යන්ටත් ඔවුන්ගේ සතුන්ටත් බීමට
වතුර තිබුණේ නැත. 10 අන්ති-
මේදී ඊශ්‍රායෙල්හි රජ, "යෙහෝවා දෙවි
අපි තුන්දෙනාව මෙතැනට ගෙනැවිත්
තිබෙන්නේ මෝවබ්වරුන්ගේ අතට
අපව හසු කර දෙන්න"[2] යයි කීවේය.
11 එවිට යෙහෝෂාපාට් රජ[3] මෙසේ
කීවේය. "මේ අවට යෙහෝවා දෙවි-
ගේ අනාගතවක්තෘවරයෙක් නැද්ද?[4]
එහෙම කෙනෙක් ඉන්නවා නම් අපි
වෙනුවෙන් යෙහෝවා දෙවිගෙන් මේ
ගැන විමසන්න කියා[5] ඔහුට කියන්න
පුළුවන්." ඊශ්‍රායෙල්හි රජුගේ සේවක-
යෙක් පිළිතුරු දෙමින්, "ෂාපාත්ගේ
පුත් එලිෂා ඉන්නවා.[6] එලියාට අත්
සෝදන්න වතුර වත් කළේ ඔහුයි"[7]
කියා පැවසුවේය. 12 එවිට යෙහෝ-
ෂාපාට් රජ, "ඔව්, යෙහෝවා දෙවි
ඔහු මාර්ගයෙන් කතා කරනවා" යයි
කීවේය. පසුව ඊශ්‍රායෙල්හි රජද යෙ-
හෝෂාපාට් රජද ඒදොම්හි රජද එලි-
ෂාව හමු වීමට ගියෝය.

13 එවිට එලිෂා ඊශ්‍රායෙල්හි රජුට
මෙසේ කීවේය. "ඔබ මා ළඟට ආවේ
ඇයි?[8] ඇයි ඔබේ දෙමාපියන් විශ්වාස
කළ අනාගතවක්තෘවරුන් නැද්ද?
ගිහින් ඔවුන්ගෙන් විමසන්න."[9]
එහෙත් ඊශ්‍රායෙල්හි රජ ඔහුට මෙසේ
කීවේය. "එහෙම කියන්න එපා. යෙ-
හෝවා දෙවි අපව මේ විදිහට එක්
රැස් කළේ අපි තුන්දෙනාව මෝවබ්-
වරුන්ගේ අතට හසු කර දෙන්-
නයි."[10] 14 එය ඇසූ එලිෂා මෙසේ
කීවේය. "මා සේවය කරන ස්වර්ග-
යේ සේනාවල අධිපතිද ජීවමාන දෙ-
විද වන යෙහෝවාගේ නමින් දිවුරා
මම ඔබට කියන්නේ,[11] අද යූදාහි
රජු වන යෙහෝෂාපාට් ඔබ සමඟ
මෙතැනට ආවේ නැත්නම්[12] මම
ඔබේ මුහුණවත් බලන්නේ නැහැ.[13]

**2 පරි.**
1 2රාජා 4:25

**3 පරි.**
2 2රාජා 1:17
3 යෝබ් 34:21
4 1රාජා 16:30
5 1රාජා 16:33
6 නික් 23:24; නික් 34:13
7 1රාජා 14:16
8 1රාජා 12:28; 2රාජා 10:29
9 2රාජා 3:27
10 1රාජා 22:37
11 2සාමු 8:2; 2රාජා 1:1
12 1රාජා 20:27
13 2ලේක 19:2
14 1රාජා 22:4; 2කොරි 6:14
15 ගණන් 21:4

**2 තීරුව**
1 2සාමු 8:14; 1රාජා 22:47; දේශ 4:12
2 1ලේක 15:13; ගීතා 78:34; හිතෝ 19:3; යෙසා 8:21
3 1රාජා 22:7
4 ආමො 3:7
5 විනි 20:18
6 1රාජා 19:16; 2රාජා 2:15
7 1රාජා 19:21; ලූක් 22:26
8 1සාමු 2:30; එස 14:3; 1කොරි 10:21
9 විනි 10:14; 1රාජා 18:19; 1රාජා 22:6; 1රාජා 22:22
10 ද්වි 32:39; හොෂෙ 6:1
11 ද්වි 6:13; යෙරෙ 12:16
12 2ලේක 17:3; 2ලේක 19:4
13 යෝබ් 34:18; හිතෝ 15:29; මීකා 3:4

**15** දැන් ගිහින් වීණාවක් වාදනය
කරන්න පුළුවන් මනුෂ්‍යයෙකුව මෙ-
තැනට කැඳවාගෙන එන්න.”[1] පසුව ඒ
මනුෂ්‍යයා පැමිණ වීණාව වාදනය
කිරීමට පටන්ගත් විගස යෙහෝවා
දෙවිගේ බලය[2] එලිෂා තුළ ක්‍රියාත්-
මක වීමට පටන්ගත්තේය. **16** ඉන්-
පසු ඔහු මෙසේ කීවේය. “යෙහෝවා
දෙවි මෙසේ පැවසුවා. ‘මේ නිම්න-
යේ සෑම තැනකම කානු කපන්න.’[3]
**17** මන්ද යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ පැවසුවා. ‘සුළං හමනවාවත්
වැසි වැටෙනවාවත් ඔබ නොදකියි.
නමුත් මේ නිම්නය වතුරෙන් පිරී
යයි.[4] ඔබටත් ඔබ ළඟ සිටින සියලු
සතුන්ටත් එයින් බොන්න පුළුවන්
වෙයි.’[5] **18** එවැනි දෙයක් කිරීම
යෙහෝවා දෙවිට එතරම් දෙයක් නෙ-
වෙයි.[6] ඔහු මෝවබ්වරුන්වත් ඔබේ
අතට හසු කර දෙයි.[7] **19** පවුරුව-
ලින් වට වී තිබෙන ඔවුන්ගේ නුවර-
වල් සියල්ලම විනාශ කර දමන්න.[8]
ඔවුන්ගේ හොඳම නගර එකක්වත්
ඉතුරු නොකරන්න. ඔවුන්ගේ දේශ-
යේ තිබෙන හොඳ ගස්[9] සියල්ල කපා
දමා,[10] දිය උල්පත් සියල්ලද වසා
දැමිය යුතුයි. සාරවත් වූ වගාබිම්
සියල්ලට ගල් දමා නාස්ති කර
දමන්න.”

**20** පසුවදා උදෑසන[11] ධාන්‍ය පූජාව
ඔප්පු කරන වේලාවේදී[12] ඒදොම් නග-
රය දෙසින් වතුර ගලා ඇවිත් මුළු දේ-
ශයම වතුරෙන් පිරී ගියේය.

**21** තමන්ට විරුද්ධව සටන් කිරී-
මට රජවරුන් පැමිණ සිටින බව
මෝවබ්වරුන්ට ආරංචි විය. එබැවින්
ඔවුහු යුද්ධ කිරීමට පුළුවන් වයසක
සිටි සියලු පුරුෂයන්ව රැස් කරගෙන
දේශ සීමාව අසලට පැමිණියෝය.
**22** උදෑසන අවදි වූ විට කානුවල පිරී
තිබූ වතුර මතට හිරු එළිය වැටී
තිබුණු බැවින් ඊට විරුද්ධ පැත්තේ
සිටි මෝවබ්වරුන්ට ඒ වතුර ලේ
මෙන් රතුව පෙනුණේය. **23** එබැ-
වින් ඔවුහු, “මේ නම් ලේ තමයි!
කිසිම සැකයක් නැහැ රජවරුන්ව
මරලා දාලා. ඔවුන් එකිනෙකා මරා-
ගන්න ඇති. ඉතින් මෝවබ්වරුනි,
අපි දැන් ගිහින් ඔවුන්ගේ වස්තුව
පැහැරගමු”[1] යයි කීවෝය. **24** මෝ-
වබ්වරුන් ඊශ්‍රායෙල් හමුදාවේ කඳ-
වුරට ළඟා වූ විට ඊශ්‍රායෙල්වරු[2]
ඔවුන්ට පහර දීමට පටන්ගත්තෝය.
මෝවබ්වරුන් ඔවුන් වෙතින් පලා
ගිය[3] නමුත් ඊශ්‍රායෙල්වරු ඔවුන්
පසුපස ලුහුබැඳ ගොස් මෝවබ් දේ-
ශයට ඇතුල් වී ඔවුන්ට පහර දුන්-
නෝය. **25** ඔවුහු ඔවුන්ගේ සියලු
නගර විනාශ කළෝය.[4] එමෙන්ම
සෑම පුරුෂයෙකුම ගලක් බැගින්
ගෙන ගොස් ඔවුන්ගේ සාරවත් කෙත්
වතු සියල්ලම ගල්වලින් පිරෙව්වෝය.
ඔවුහු සෑම දිය උල්පතක්ම වසා දමා,[5]
හොඳ ගස් සියල්ලද කපා දැමුවෝය.[6]
ඉතුරු වූයේ කිර්-හරෙසෙත් නගර-
යේ[7] ගොඩනැඟිලි පමණි. ගල්පටිව-
ලින් විදින්නෝ ඒවා වටා ගමන්
කරමින් ඊට පහර දුන්නෝය.

**26** සටනෙන් පරාජය වන බව දුටු
මෝවබ්හි රජ, කඩුගත් මනුෂ්‍යයන්
හත්සියදෙනෙක් සමඟ ඒදොම්හි රජු
වෙතට සේනාව මැද්දෙන් යෑමට උත්-
සාහ කළේය.[8] නමුත් ඔවුන්ට එසේ
කිරීමට හැකි වූයේ නැත. **27** අව-
සානයේදී ඔහු තමාට පසුව රජකම
ලබන්න නියමිතව සිටි තම කුලුඳුල්
පුත්‍රයාව පවුර මත තබා ඔහුව දවන
පූජාවක් ලෙස ඔප්පු කළේය.[9] පසුව
ඔවුහු ඒදොම්හි රජු වෙතින් පිටත්ව
තමන්ගේ දේශයට නැවත ගියෝය.
නමුත් ඊශ්‍රායෙල්වරුන් ගැන මහත්
උදහසක් ඔවුන් තුළ ඇති විය.

**4** දිනක් එලිෂාව හමු වීමට එක්-
තරා කාන්තාවක් පැමිණි-
යාය. ඇය අනාගතවක්තෘවරුන්ගේ
පුත්‍රයන්ගෙන් කෙනෙකුගේ බිරිඳකි.[10]
ඇය එලිෂාට ඉතා දුකින් මෙසේ
කීවාය. “ඔබේ සේවකයා වන මගේ
ස්වාමිපුරුෂයා මිය ගියා. ඔහුට යෙ-
හෝවා දෙවි කෙරෙහි මොන
තරම් ගරුබියක් තිබුණද[11] කියා ඔබ
හොඳින් දන්නවා. නමුත් දැන් සිදු වී

**3 පරි.**
1 1සාමු 10:5; 1ලේක 25:1
2 1රාජා 18:46; එස 1:3; එස 3:14; එස 8:1; ක්‍රියා 11:21
3 යෙරෙ 14:3
4 ගීතා 84:6; ගීතා 107:35
5 යෙසා 41:17
6 යෙරෙ 32:17; මාක් 10:27
7 ද්වි 28:7
8 ද්වි 3:5
9 ද්වි 20:19
10 2රාජා 3:25
11 නික් 29:39
12 නික් 29:41

**2 තීරුව**
1 නික් 15:9; විනි 5:30
2 1රාජා 12:19
3 ලෙවී 26:7; 1තෙස 5:3
4 යෙසා 37:26
5 උත් 26:15; 2ලේක 32:4
6 2රාජා 3:19
7 යෙසා 15:1; යෙසා 16:7
8 2රාජා 3:9
9 ද්වි 12:31; 1රාජා 11:7; 2රාජා 17:17; 2ලේක 28:3; ගීතා 106:37; යෙරෙ 7:31; එස 16:20; 1කොරි 10:20

**4 පරි.**
10 2රාජා 2:3; 2රාජා 2:5
11 1රාජා 19:18; හිතෝ 8:13

තිබෙන දේ බලන්න. ණය හිමියා[1]
මගේ දරුවන් දෙදෙනාවම වහල්කමට
ගෙන යන්න හදනවා.” **2** එය ඇසූ
එලිෂා, “මට ඔබ වෙනුවෙන් මොන-
වද කරන්න පුළුවන් කියලා බලමු”[2]
යයි පවසමින් ඇගෙන් මෙසේ ඇසු-
වේය. “දැනට ඔබේ ගෙදර ඉතුරු වී
තිබෙන්නේ මොනවද?” ඇය පිළි-
තුරු දෙමින්, “තෙල් බඳුනක් හැර
වෙන කිසිම දෙයක් ඔබේ සේවිකාව-
ගේ ගෙදර ඉතුරු වී නැහැ”[3] කියා
කීවාය. **3** එවිට ඔහු මෙසේ කීවේය.
“දැන් ගිහින් ඔබේ සෑම අසල්වැසියෙ-
කුගෙන්ම හිස් භාජන ඉල්ලගන්න.
හිස් භාජන පුළුවන් තරම් ප්‍රමාණයක්
අරගෙන එන්න. **4** ඉන්පසු ඔබත්
ඔබේ පුත්‍රයනුත් ගෙට ගිහින් දොර
වසාගෙන ඔබ ළඟ තිබෙන තෙල්
ටික ඒ භාජනවලට වත් කරන්න.
තෙල් පිරවූ භාජන ටික වෙනම
තබන්න.” **5** ඉන්පසු ඇය එතැනින්
පිටත්ව ගියාය.

ඇයත් ඇගේ පුත්‍රයනුත් ගෙට
ගොස් දොර වැසූ පසු ඇගේ පුත්‍රයෝ ඒ
එක් එක් භාජන ඇයට ගෙනැවිත් දුන්-
නෝය. ඇය ඒවාට තෙල් පිරෙව්-
වාය.[4] **6** ඒ භාජන සියල්ලම පිරුණු
පසු, “තව භාජනයක් මට ගෙනත්
දෙන්න”[5] යයි ඇය තම පුත්‍රයෙකුට
කීවාය. නමුත් ඔහු, “තව භාජන
ඉතුරු වී නැහැ” කියා ඇයට පැවසු-
වේය. ඒ මොහොතේදීම ඇගේ බඳුනේ
තිබූ තෙල් සිඳී ගියේය.[6] **7** ඉන්පසු
ඇය ගොස් සැබෑ දෙවිගේ අනාගත-
වක්තෘට මේ ගැන පැවසූ විට, “දැන්
ගිහින් තෙල් ටික විකුණා ඔබේ ණය
ගෙවා[7] ඉතුරු මුදලින් ඔබත් ඔබේ
පුත්‍රයනුත් ජීවත් වෙන්න”[8] කියා ඔහු
කීවේය.

**8** දවසක් එලිෂා ෂුනෙම් නගරයට[9]
ගියේය. එහි සිටි ධනවත් ස්ත්‍රියක් තම
නිවසට ඇවිත් කෑම කන්න කියා
ඔහුට පෙරැත්ත කළාය.[10] එබැවින්
ඔහු ඒ නිවස පසු කර ගිය සෑම අවස්-
ථාවකදීම එහි නැවතී කෑම කෑවේය.
**9** ටික කලකට පසුව ඈ තම ස්වාමි-
පුරුෂයාට මෙසේ කීවාය.[1] “නිතරම
මේ පැත්තෙන් යන එන ඔහු දෙ-
විට ඉතා කැපවීමෙන් සේවය කරන
කෙනෙක් බව පැහැදිලියි.[2] **10** අපට
බැරිද උඩුමහලේ කුඩා කාමරයක්[3]
ඔහුට හදලා දෙන්න? ඇඳකුයි, මේස-
යකුයි, පුටුවකුයි, පහන් රුකකුයි[4] අපි
එහි තබමු. එවිට අපේ ගෙදරට ආවාම
ඔහුට ඒ කාමරයේ විවේක ගන්න පුළු-
වන් වෙයි.”[5]

**11** දිනක් එලිෂා සුපුරුදු පරිදි
ඒ ගෙදරට පැමිණ උඩුමහල් කාමර-
යට ගොස් ටිකක් නිදාගත්තේය.
**12** පසුව ඔහු තම සේවකයා වූ ගෙහා-
සීට[6] කතා කර, “ඇවිත් මාව හම්බ
වෙන්න කියා අර ෂුනෙම් ජාතික ස්ත්‍රි-
යට[7] කියන්න” යයි කීවේය. ගෙ-
හාසී ගොස් ඇයට ඒ බව කී විට
ඇය එලිෂාව හමු වීමට පැමිණියාය.
**13** එලිෂා ගෙහාසීට මෙසේ කීවේය.
“ඇයට මෙහෙම කියන්න. ‘ඔබ
අපිට ඔබේ නිවසේ කාමරයක් හදලා
දුන්නා. ඔබ අපි වෙනුවෙන් මොන
තරම් කරදර වෙනවාද![8] ඔබ වෙනු-
වෙන් අපිට කරන්න පුළුවන් දෙයක්
තියෙනවාද?[9] රජතුමාගෙන්[10] හෝ
හමුදාවේ ප්‍රධානියාගෙන්[11] හෝ ඔබට
අවශ්‍ය දෙයක් තියෙනවා නම් අපි
ගිහින් ඔබ වෙනුවෙන් කතා කර එය
ඉල්ලා දෙන්නම්.’ ” එවිට ඇය මෙසේ
කීවාය. “මගේම සෙනඟත් එක්ක කිසි
කරදරයක් නැතුව මම ජීවත් වෙන
නිසා මට උපකාරයක් නම් අවශ්‍ය
නැහැ.”[12] **14** එවිට එලිෂා, “මොන-
වාද ඇය වෙනුවෙන් අපට කරලා
දෙන්න පුළුවන්” කියා ගෙහාසීගෙන්
ඇසුවේය. ගෙහාසී මෙසේ කීවේය.
“ඇයට තාම පුතෙක් නැහැ.[13] ඇගේ
ස්වාමිපුරුෂයත් දැන් වයසට ගිහින්.”
**15** එලිෂා එය ඇසූ විගස, “ඇයට මෙ-
තැනට එන්න කියන්න” යයි කීවේය.
ඔහු ඇයට එන්න කී විට ඇය
ඇවිත් දොරකඩ ළඟ සිටගෙන සිටි-
යාය. **16** එවිට ඔහු මෙසේ කීවේය.
“ඊළඟ අවුරුද්දේ මේ කාලය වෙද්දී
ඔබට පුතෙක් ලැබෙයි.”[14] නමුත් ඇය

**4 පරි.**
1 1සාමු 22:2
2 නිතෝ 3:27; ගලා 6:10; හෙබ්‍රෙ 13:16; යාකො 1:27
3 1රාජා 17:12
4 මාක් 6:41; මාක් 8:6; යොහ 2:9
5 මතෙ 14:19; මතෙ 15:37
6 යොෂු 5:12; 1රාජා 17:14; යොහ 6:12
7 ගීතා 37:21; රෝම 13:8
8 ගීතා 128:4
9 යොෂු 19:18; 1රාජා 1:3; සල 6:13
10 උත් 19:3; විනි 13:15; ක්‍රියා 16:15

**2 තීරුව**
1 නිතෝ 31:11; 1කොරි 11:3
2 2රාජා 2:9
3 විනි 3:20; 1රාජා 17:19
4 මාක් 4:21
5 මතෙ 10:41; රෝම 12:13; හෙබ්‍රෙ 13:2
6 2රාජා 4:29; 2රාජා 5:20; 2රාජා 5:27; 2රාජා 8:4
7 යොෂු 19:18; 1සාමු 28:4
8 රෝම 16:6; හෙබ්‍රෙ 6:10
9 2රාජා 2:9; 2රාජා 4:2
10 2රාජා 8:3
11 2රාජා 9:5
12 2රාජා 8:1
13 උත් 15:2; උත් 30:1
14 උත් 18:10

මෙසේ ඇසුවාය. “මගේ ස්වාමීනි, ඒ
වගේ දෙයක් වෙන්නේ කොහොමද?
සැබෑ දෙවිගේ අනාගතවක්තෘවර-
යෙක් වන ඔබ, ඇයි ඔබේ සේවිකාවට
බොරු කියන්නේ?”
**17** නමුත් එලිෂා කී ලෙසම[1] ඈ
ගැබ්ගෙන ඊළඟ අවුරුද්දේ ඔහු පැවසූ
කාලයේදීම පුත්‍රයෙකු බිහි කළාය.[2]
**18** දරුවා දිනෙන් දින වැඩුණේය.
දිනක් දරුවා සුපුරුදු පරිදි තම
පියා වෙතට ගියේය. ඒ අවස්ථාවේදී
පියා කෙතේ අස්වැන්න නෙළමින්
සිටි මනුෂ්‍යයන් සමඟ සිටියේය.[3]
**19** පසුව ඔහු තම පියාට, “අනේ
තාත්තේ, මගේ ඔළුව රිදෙනවා” යයි
කියමින් කෙඳිරිගාන්න පටන්ගත්-
තේය.[4] අවසානයේදී පියා එතැන සිටි
සේවකයාට කතා කර, “පුතාව අම්මා
ළඟට රැගෙන යන්න”[5] කියා කීවේය.
**20** සේවකයා දරුවාව ඔසවාගෙන
ඔහුගේ මව ළඟට ගෙන ගියේය.
දරුවා දවල් වන තුරු මවගේ උකු-
ළේ සිටියේය. අන්තිමේදී ඔහු මිය
ගියේය.[6] **21** එවිට ඇය සැබෑ දෙ-
විගේ අනාගතවක්තෘවරයාගේ[7] ඇඳ
උඩ දරුවාව තබා[8] දොර වසා නිව-
සින් පිටත්ව ගියාය. **22** ඇය ගොස්
තම ස්වාමිපුරුෂයාට කතා කර, “මට
සැබෑ දෙවිගේ අනාගතවක්තෘව හමු
වෙන්න ඕනේ. මම ඉක්මනින් ගිහින්
එන්නම්.[9] මට ගිහින් එන්න සේවක-
යෙක්වයි බූරුදෙනක්වයි දෙන්න පුළු-
වන්ද” කියා කීවාය. **23** නමුත් ඔහු,
“අද නව සඳ පායන දවසක්වත්[10]
සබත් දවසක්වත් නෙවෙයි. ඉතින්
ඇයි ඔබ දැන් ඔහුව හමු වෙන්න යන්-
නේ” කියා ඇසුවේය. එහෙත් ඇය
මෙසේ කීවාය. “ඒකට කමක් නැහැ.
මම ගිහින් එන්නම්.” **24** පසුව ඇය
බූරුදෙනව ගමනට සූදානම් කර[11]
සේවකයාට මෙසේ පැවසුවාය. “මා
ගැන කරදර වෙන්නේ නැතුව බූරුදෙ-
නව දක්කගෙන දිගටම යන්න. මම
කියන තුරු නතර වෙන්න එපා.”
**25** මෙසේ ඈ කර්මෙල් කන්දේ
සිටි සැබෑ දෙවිගේ අනාගතවක්තෘ
වෙතට පැමිණියාය. ඇය පැමිණෙ-
නවා දුර සිටම දුටු සැබෑ දෙවිගේ
අනාගතවක්තෘ තම සේවක ගෙහා-
සීට මෙසේ කීවේය.[1] “අර බලන්න!
ෂූනෙම් ජාතික ස්ත්‍රිය මේ පැත්තට
එනවා. **26** ඉක්මනට ගිහින්, ‘ඔබේ
සැප සනීප කොහොමද? ඔබේ ස්වාමි-
පුරුෂයාට කොහොමද? ඔබේ පුතා
සනීපෙන් ඉන්නවාද’ කියා ඇගෙන්
අහන්න.” ඔහු ගොස් ඇගෙන් එසේ
ඇසූ විට ඇය මෙසේ කීවාය. “අපි
හොඳින් ඉන්නවා.” **27** ඇය කන්දේ
සිටි සැබෑ දෙවිගේ අනාගතවක්තෘ
ළඟට ආ විගස ඔහුගේ දෙපා ළඟ වැටු-
ණාය.[2] එය දුටු ගෙහාසී ඇයව තල්ලු
කර දැමීමට[3] පැමිණි විට සැබෑ දෙවි-
ගේ අනාගතවක්තෘ[4] ඔහුට මෙසේ
කීවේය. “ඇයට කිසිවක් කරන්න
එපා.[5] ඇය බොහෝ දුකින් ඉන්නේ.[6]
යෙහෝවා දෙවි ඒ කාරණය මට නො-
කියා මගෙන් සැඟෙව්වා.”[7] **28** එවිට
ඇය මෙසේ කීවාය. “මට පුතෙක් ලබා
දෙන්න කියා මම මගේ ස්වාමීන්ගෙන්
ඉල්ලුවේ නැහැ. ‘මට බොරු පො-
රොන්දු දෙන්න එපා’ කියාත් මම
ඔබට කිව්වේ නැද්ද?”[8]
**29** එකෙණෙහිම ඔහු ගෙහාසීට
මෙසේ කීවේය.[9] “ඉක්මනට සූදානම්
වෙලා*[10] මගේ සැරයටියත්[11] අර-
ගෙන යන්න. ඔබට කවුරු මුණගැසු-
ණත් ආචාර කරන්න එපා.[12] ඔබට
කවුරු හෝ ආචාර කළොත් ඔහුට
උත්තර දෙන්නත් එපා. ඔබ ගිහින්
මගේ සැරයටිය දරුවාගේ මුහුණ
මත තබන්න.”[13] **30** එවිට දරුවා-
ගේ මව, “ජීවමාන යෙහෝවා දෙවිගේ
නමිනුත්[14] ඔබේ නමිනුත්[15] දිවුරා
කියන්නේ ඔබ මා සමඟ පැමිණියොත්
මිස මම මෙතැනින් යන්නේ නැහැ”[16]
කියා එලිෂාට කීවාය. එබැවින් එලි-
ෂාද නැඟිට ඇය සමඟ ගියේය.
**31** ගෙහාසී ඔවුන්ට කලින් දරුවා
වෙතට ගොස් ඔහුගේ මුහුණ මත
සැරයටිය තැබුවේය. නමුත් කිසිවක්

**4 පරි.**
1 අදි 18:22
2 ගීතා 127:3; මතෙ 10:41
3 මතෙ 13:30
4 යෝබ් 14:1
5 යෙසා 49:15; යෙසා 66:13
6 1රාජා 17:17; දේශ 9:12
7 2රාජා 4:9
8 2රාජා 4:10
9 යොහ 11:3; ක්‍රියා 9:38
10 ගණන් 10:10; ගණන් 28:11; එස 46:3
11 නික් 4:20; 1සාමු 25:20

**2 තීරුව**
1 2රාජා 4:12
2 මතෙ 28:9
3 මාක් 10:13
4 2රාජා 4:9
5 යෝබ් 29:25; 2කොරි 1:4; 1තෙස 5:11
6 හිතෝ 15:13; හිතෝ 17:22
7 උත් 18:17; ආමො 3:7
8 2රාජා 4:16
9 2රාජා 4:12
10 1රාජා 18:46
11 නික් 4:17
12 ලූක් 10:4
13 ක්‍රියා 19:12
14 අදි 6:13; යෙරෙ 12:16
15 1සාමු 1:26; 2රාජා 2:4
16 මතෙ 15:28; යොහ 11:40

**2රාජා 4:29*** මූ.අ., “ඉහටි බැඳගෙන.”

සිදු වූයේ නැත.[1] එබැවින් ගෙහාසී
නැවත එලිෂා වෙතට පැමිණ, “දරුවා
නැඟිට්ටේ නැහැ”[2] කියා කීවේය.
**32** එලිෂා ගෙදරට පැමිණි විට දරු-
වාගේ මළ මිනිය තම ඇඳ මත තබා
තිබෙනවා දුටුවේය.[3] **33** ඔහු තනි-
වම කාමරයට ඇතුල් වී දොර වසා[4]
යෙහෝවා දෙවිට යාච්ඤා කළේය.[5]
**34** ඉන්පසු ඔහු ඇඳ ළඟට ගොස්
නැමී දරුවාව වැලඳගෙන,[6] ඔහුගේ
අත් දරුවාගේ අත් මතද ඔහුගේ කට
දරුවාගේ කට මතද ඔහුගේ ඇස් දරු-
වාගේ ඇස් මතද තබාගෙන
සිටියේය. දරුවාගේ ශරීරය ටිකෙන්
ටික උණුසුම් වෙන්න පටන්ගත්තේය.
**35** එවිට එලිෂා නැවත වරක් නිවසේ
එක් පැත්තක සිට අනික් පැත්-
තට ඇවිදගෙන ගියේය. ඉන්පසු ඔහු
ආපස්සට ඇවිදගෙන ආවේය. පසුව
ඔහු ඇඳ ළඟට ගොස් දණ නමා
දරුවාව වැලඳගත්තේය. ඔහු එසේ
කළ විට දරුවා හත් වතාවක් කිඹු-
හුම් හැර ඇස් ඇරියේය.[7] **36** එවිට
එලිෂා ගෙහාසීව කැඳවා, “ෂූනෙම්
ජාතික ස්ත්‍රියට එන්න කියන්න”[8] යයි
කීවේය. ඔහු ඇයව කැඳවාගෙන ආ
විට, “ඔබේ පුතාව වඩාගන්න”[9] යයි
එලිෂා ඇයට කීවේය. **37** ඒ මො-
හොතේ ඇය ඔහුගේ දෙපා ළඟ වැටී
පොළොව දෙසට හිස පහත් කළාය.[10]
ඉන්පසු ඈ තම පුත්‍රයාව වඩාගෙන
කාමරයෙන් පිටතට ගියාය.[11]
**38** එලිෂා ආපසු ගිල්ගාල් නුව-
රට ගියේය.[12] ඒ කාලයේදී දේශ-
යේ සාගතයක් ඇති වී තිබිණ.[13]
දිනක් එලිෂා, අනාගතවක්තෘවරුන්-
ගේ පුත්‍රයන්[14] සමඟ එකට වාඩි
වී සිටියේය.[15] ඔහු තම සේවකයාට
කතා කර,[16] “මේ අයට කන්න කෑම
ටිකක් හදලා දෙන්න”[17] යයි කීවේය.
**39** එතැන සිටි එක් තැනැත්තෙක්
පලා කඩන්න කෙතට ගියේය.[18] එහිදී
ඔහු වැලක ගෙඩි වර්ගයක් තිබෙනවා
දැක තමාගේ වස්ත්‍රයට එකතු කර-
ගත හැකි ප්‍රමාණයක් කඩාගත්තේය.
ඉන්පසු ඔහු පැමිණ ඒවා කපා කෑම
පිසින භාජනයට දැමුවේය. නමුත්
ඒවා කුමන ගෙඩි වර්ගයක්දැයි කිසි-
වෙක් දැන සිටියේ නැත. **40** පසුව
ඔවුහු පිසින ලද ආහාරය එතැන සිටි
අයට කන්න බෙදා දුන්නෝය. ඔවුන්
එම කෑම කටට ගත් විගස, “මේ
කෑමේ විස තියෙනවා![1] සැබෑ දෙවි-
ගේ අනාගතවක්තෘ,[2] අපි මොනවාද
කරන්නේ” කියා කෑගසා කීවෝය.
ඔවුන්ට එය කන්න නොහැකි විය.
**41** එවිට එලිෂා, “මට පිටි ටිකක් ගෙ-
නත් දෙන්න” යයි කීවේය. ඔහු පිටි
ටික එම භාජනයට දැමූ පසු, “දැන්
කන්න දෙන්න” යයි කීවේය. එවිට එහි
කිසිම විසක් නොතිබිණ.[3]
**42** දිනක් බාල්-ෂාලිෂා නම් ප්‍රදේ-
ශයේ[4] සිට මිනිසෙක් තම ප්‍රථම
අස්වැන්නෙන් සෑදූ[5] බාර්ලි රොටි
විස්සකුත්[6] අලුත් ධාන්‍ය ටිකකුත්
තම රොටි මල්ලේ දමාගෙන සැබෑ
දෙවිගේ අනාගතවක්තෘට ගෙනැ-
විත් දුන්නේය.[7] එවිට එලිෂා, “මෙ-
තැන ඉන්න අයට මේවා කන්න
දෙන්න”[8] යයි කීවේය. **43** නමුත්
කෑම බෙදමින් සිටි තැනැත්තා, “මම
කොහොමද සියදෙනෙකුට මේ කෑම
ටික කන්න දෙන්නේ” කියා ඇසු-
වේය.[9] එවිට එලිෂා මෙසේ කීවේය.
“‘ඔවුන් කෑවට පස්සේ තව කෑම
ඉතුරු වෙයි’[10] කියා යෙහෝවා දෙවි
මට කිව්වා. ඒ නිසා දැන් කෑම ටික
ඔවුන්ට කන්න දෙන්න.” **44** එබැ-
වින් ඔහු කෑම ටික එතැන සිටි මිනි-
සුන්ට කන්න දුන්නේය. යෙහෝවා
දෙවි කී ලෙස ඔවුන් කෑ පසුත් කෑම
ඉතුරු විය.[11]

**5** ඒ කාලයේ සිරියාවේ රජුගේ හමු-
දාපති හැටියට සේවය කළේ
නාමන්[12] නමැති තැනැත්තෙකි. යෙ-
හෝවා දෙවි ඔහු මාර්ගයෙන් සිරියා-
වට ජයග්‍රහණය අත් කර දී තිබූ
නිසා[13] රජ ඔහුගේ සේවය ඉතා
අගේ කොට සැලකුවේය. ඔහු යුද්ධ-
යට දක්ෂ, එඩිතර පුද්ගලයෙකු වූ
නමුත් ඔහුට ලාදුරු රෝගය වැළඳී
තිබුණේය. **2** සිරියාවේ හමුදාවෙන්

**4 පරි.**
**1** මතෙ 17:16
මාක් 9:18
**2** මාක් 5:39
ලූක් 8:52
යොහ 11:11
**3** 2රාජා 4:21
**4** 1රාජා 17:19
මතෙ 6:6
**5** 1රාජා 17:20
යොහ 11:41
ක්‍රියා 9:40
**6** 1රාජා 17:21
ක්‍රියා 20:10
**7** 2රාජා 8:1
2රාජා 8:5
**8** 2රාජා 4:12
**9** හෙබ්‍රෙ 11:35
**10** 1සාමු 25:23
**11** 1රාජා 17:24
ක්‍රියා 20:12
**12** 2රාජා 2:1
**13** ද්වි 28:23
2රාජා 8:1
එස 14:13
**14** 2රාජා 2:3
2රාජා 2:5
**15** හිතෝ 8:34
ක්‍රියා 22:3
**16** 2රාජා 4:12
**17** ගීතා 37:19
ගීතා 37:25
**18** යෙසා 26:19

**2 තීරුව**
**1** යෝබ 12:11
**2** 1රාජා 17:24
යෙසා 44:26
**3** නික් 15:25
2රාජා 2:21
**4** 1සාමු 9:4
**5** නික් 23:16
1සාමු 9:7
ගලා 6:6
**6** ද්වි 8:8
යොහ 6:9
**7** හෙබ්‍රෙ 13:16
**8** 1කොරි 9:11
**9** මතෙ 14:17
මාක් 8:4
**10** ගීතා 132:15
මතෙ 14:20
මාක් 8:8
**11** ලූක් 9:17
යොහ 6:13

**5 පරි.**
**12** 2රාජා 5:14
ලූක් 4:27
**13** හිතෝ 21:31

පිටත් කර යැවූ කොල්ලකරුවෝ[1]
ඊශ්‍රායෙල් දේශයෙන් කුඩා දැරියකව
රැගෙන ආවෝය.[2] ඇයව නාමන්ගේ
බිරිඳට සේවිකාවක් ලෙස දෙන ලදි.
**3** දවසක් එම දැරිය ඇයට මෙසේ
කීවාය.[3] "මගේ ස්වාමියා සමාරියේ
ඉන්න අනාගතවක්තෘවරයාව[4] මුණ-
ගැහෙන්න ගියොත් ඔහුට පුළුවන්
මගේ ස්වාමියාගේ ලාදුරු රෝගය සුව
කරන්න."[5] **4** පසුව ඊශ්‍රායෙල් දේශ-
යෙන් ගෙනා ඒ දැරිය කී දේ සිරියාවේ
රජුට පවසනු ලැබීය.[6]

**5** එබැවින් සිරියාවේ රජ, නාමන්ට
මෙසේ කීවේය. "මම ඊශ්‍රායෙල්හි රජුට
ලිපියක් දෙන්නම්. ඔබ ඒ ලිපියත්
රැගෙන එහෙට යන්න." නාමන්, රිදී
තලෙන්ත* දහයක්ද රන් ෂෙකෙල්#
හයදහසක්ද[7] ඇඳුම් කට්ටල දහයක්ද[8]
රැගෙන පිටත් විය.[9] **6** සිරියාවේ රජු
ඊශ්‍රායෙල්හි රජුට ඉදිරිපත් කළ එම
ලිපියේ[10] මෙසේ සඳහන් වී තිබිණ.
"මේ ලිපිය රැගෙන එන තැනැත්තා
මගේ සේවක නාමන්ය. ඔහුගේ ලාදුරු
රෝගය සුව කර එවන්න." **7** නමුත්
ඊශ්‍රායෙල්හි රජ ඒ ලිපිය කියවා තම
පිට වස්ත්‍රය ඉරාගනිමින්[11] මෙසේ
කීවේය. "මිනිසෙකුගේ ලාදුරු රෝගය
සුව කරන්න කියා මට කියන්නේ මම
දෙවි කියලා හිතාගෙනද?[12] කෙනෙ-
කුව ජීවත් කරන්න හෝ මරණයට
පත් කරන්න අයිතිය තිබෙන්නේ දෙ-
විට නොවේද?[13] සිරියාවේ රජු උත්-
සාහ කරන්නේ මා සමඟ ආරවුලක්
ඇති කරගන්නයි."[14]

**8** ඊශ්‍රායෙල්හි රජු තම පිට වස්ත්‍ර
ඉරාගත් බව[15] සැබෑ දෙවිගේ
අනාගතවක්තෘවරයා වන එලිෂාට
ආරංචි වූ විගස ඔහු රජුට පණිවිඩ-
යක් යවා මෙසේ දැන්වූවේය. "රජතු-
මනි, ඔබ පිට වස්ත්‍ර ඉරාගත්තේ
ඇයි? ඔහුව මා වෙතට එවන්න.
එවිට ඊශ්‍රායෙල්හි අනාගතවක්තෘවර-
යෙක් සිටින බව ඔහුට දැනගන්න
ලැබේවි."[1] **9** නාමන් තම අශ්වයන්
හා අශ්ව රථ සමඟ එලිෂාගේ නිවසේ
දොරකඩට පැමිණියේය. **10** එවිට
එලිෂා පණිවිඩකරුවෙක් ලවා ඔහුට
මෙසේ දැන්වූවේය. "ගොස් යොර්දාන්
ගඟෙන් හත් වතාවක්[2] නාන්න.[3] එවිට
ඔබේ සම සුව වී[4] ඔබ පවිත්‍ර වෙයි."
**11** නමුත් නාමන්, ඔහු කී දේ ගැන
උදහස් වී[5] එතැනින් පිටත්ව යන අත-
රතුර මෙසේ කීවේය. "මම හිතු-
වේ,[6] 'ඔහු මා ළඟටම ඇවිත් ඔහුගේ
දෙවි වන යෙහෝවාගෙන් උපකාරය
ඉල්ලා, මගේ තුවාලය මත ඔහුගේ
අත තබා මාව සුව කරයි' කියායි.
**12** දමස්කයේ[7] තිබෙන අබානා ගඟ
සහ ෆාපර් ගඟ ඊශ්‍රායෙල්හි තිබෙන
සියලු ගංගාවලට වඩා හොඳ නැද්ද?[8]
මට ඒ ගඟක නා පවිත්‍ර වෙන්න
බැරිද?"[9] එසේ කියා ඔහු කෝපයෙන්
හැරී ගියේය.[10]

**13** එවිට ඔහුගේ සේවකයෝ ඔහු
ළඟට පැමිණ මෙසේ කීවෝය. "පියා-
ණෙනි,[11] අනාගතවක්තෘවරයා මීට
වඩා අමාරු දෙයක් කරන්න කියා
පැවසුවා නම් ඔබ එය කරන්නේ
නැද්ද? ඔහු ඔබට කිව්වේ, 'දිය
නා පවිත්‍ර වෙන්න' කියායි. එය
සුළු දෙයක් නොවෙයිද?" **14** එබැ-
වින් නාමන්, යොර්දාන් ගඟට ගොස්
සැබෑ දෙවිගේ අනාගතවක්තෘවරයා
කී ලෙස හත් වතාවක් ගඟේ ගිලී
නෑවේය.[12] එවිට ඔහුගේ සම කුඩා
දරුවෙකුගේ සම මෙන් මෘදු වී[13] ඔහු
සම්පූර්ණයෙන්ම සුව වුණේය.[14]

**15** පසුව නාමන් තම මුළු හමුදා-
වත් සමඟ සැබෑ දෙවිගේ අනාගත-
වක්තෘවරයා වෙනට ආපසු ගොස්[15]
ඔහුට මෙසේ කීවේය. "ඊශ්‍රායෙල්හි
මිස පොළොවේ වෙන කොතැනකවත්
දෙවි කෙනෙක් නැති බව දැන් මම
ස්ථිර වශයෙන්ම දන්නවා.[16] දැන්
ඔබේ සේවකයාගේ අතින් මේ තෑග්ග
පිළිගන්න."[17] **16** එහෙත් එලිෂා
මෙසේ කීවේය. "මා සේවය කරන ජීව-
මාන දෙවි වන යෙහෝවාගේ නමින්
දිවුරා කියන්නේ,[18] මට මේ තෑග්ග

**5 පරි.**
1 විනි 9:34, 1සාමු 13:17, 2රාජා 6:23
2 1සාමු 30:2
3 ගීතා 148:12, ගීතා 148:13
4 ගණන් 11:29, 1රාජා 19:16
5 මතෙ 8:2, මතෙ 11:5, ලූක් 4:27
6 ගීතා 8:2
7 1රාජා 10:16
8 උත් 45:22, විනි 14:12
9 ගණන් 22:7, 1සාමු 9:8
10 2සාමු 11:14
11 ගණන් 14:6, මතෙ 26:65
12 උත් 30:2, ද්වි 32:39
13 1සාමු 2:6, ආනි 5:19, හොෂෙ 6:1
14 2සාමු 10:3, දේශ 7:9
15 යෝබ් 2:12

**2 තීරුව**
1 1රාජා 17:24, 1රාජා 19:16, 2රාජා 3:12, 2රාජා 4:9, 2රාජා 6:32, 2රාජා 8:4
2 ලෙවී 14:7, ගණන් 19:4
3 ද්වි 8:2, යොහ 9:7
4 නික් 4:7
5 හිතෝ 8:13, යාකො 4:10
6 යෙසා 55:8
7 2සාමු 8:5, ක්‍රියා 9:2
8 යොෂු 3:15
9 යෝනා 2:8
10 හිතෝ 14:17, දේශ 7:9
11 2රාජා 2:12, 2රාජා 6:21
12 2රාජා 5:10, 2ලේක 20:20, 1පේත්‍ර 5:5
13 යෝබ් 33:25
14 ලූක් 4:27, ලූක් 5:13
15 ලූක් 17:15
16 ගීතා 96:5, යෙසා 43:10, යෙසා 44:6, යෙසා 45:5, 1කොරි 8:4
17 1සාමු 25:27
18 ද්වි 6:13, යෙරෙ 12:16

**2රාජා 5:5*** තලෙන්තයක් යනු කිලෝග්‍රෑම් 34.2ක් පමණය. **5#** ෂෙකෙලයක් යනු ග්‍රෑම් 11.4කි.

පිළිගන්න බැහැ.”[1] නාමන් එය පිළි-
ගන්නා ලෙස ඔහුට පෙරැත්ත
කළත් ඔහු එය ප්‍රතික්ෂේප කළේය.
**17** අවසානයේදී නාමන් මෙසේ
කීවේය. “ඔබ තෑග්ග පිළිගන්නේ
නැත්නම් කොටළුවන් දෙදෙනෙකුට
ඉසිලිය හැකි ප්‍රමාණයට පස් ටිකක්
ඔබේ සේවකයා වන මට දෙන්න.[2]
ඔබේ සේවකයා මෙතැන් පටන් යෙ-
හෝවා දෙවිට මිස වෙන කිසි දෙවි
කෙනෙකුට දවන පූජාවක්වත් වෙ-
නත් පූජාවක්වත් ඔප්පු කරන්නේ
නැහැ.[3] **18** නමුත් මේ කාරණයේදී
ඔබේ සේවකයාට සමාව දෙන්න කියා
මම යෙහෝවා දෙවිගෙන් ඉල්ලනවා.
මගේ ස්වාමියා රිම්මොන්ට නමස්-
කාර කරන්න දේවාලයට යනවා.[4]
ඔහු මගේ අතට හේත්තු වී[5] රිම්-
මොන්ට වැඳ වැටෙද්දී මටත් ඒ
දේවාලයේ වැඳ වැටෙන්න සිදු වෙ-
නවා.[6] ඒ නිසා ඔබේ සේවකයා වන
මට ඒ කාරණයේදී සමාව දෙන්න
කියා මම යෙහෝවා දෙවිගෙන් ඉල්ල-
නවා.”[7] **19** එවිට එලිෂා, “සමාදාන-
යෙන් යන්න”[8] යයි ඔහුට කීවේය.
නාමන් ඔහු වෙතින් පිටත් වී සැහෙන
දුරක් ගමන් කළේය.

**20** එවිට සැබෑ දෙවිගේ අනාගත-
වක්තෘවරයා වන එලිෂාගේ[9] සේ-
වක ගෙහාසි[10] මෙසේ සිතුවේය.
“මගේ ස්වාමියා මේ සිරියානු ජාතික
නාමන්[11] ගෙනා දේ පිළිගන්නේ
නැතුව ඔහුට යන්න හැරියා. ජීවමාන
දෙවි වන යෙහෝවාගේ නාමයෙන්
මම මේ කියන්නේ,[12] මම ඔහු පසුපස
දුව ගොස් ඔහුගෙන් මොනව හරි ඉල්-
ලගන්නවා.”[13] **21** එසේ කියා ගෙ-
හාසි, නාමන් පසුපස දිව ගියේය.
යමෙක් තමා පසුපස දිව එනවා
නාමන් දුටු විට ඔහු වහාම තම
අශ්ව රථයෙන් බැස, “ඔබට කුමක්
හෝ කරදරයක්ද” කියා ඇසුවේය.[14]
**22** එවිට ගෙහාසි මෙසේ පිළිතුරු
දුන්නේය. “නැහැ, කරදරයක් නැහැ.
ඔබට මෙසේ කියන්න කියා මගේ
ස්වාමියා[15] පැවසුවා.[16] ‘එෆ්‍රායිම් කඳු-
කර පළාතේ සිට අනාගතවක්තෘව-
රුන්ගේ පුත්‍රයන් දෙන්නෙක් මගේ
ගෙදරට දැන් ආවා.[1] ඔවුන්ට රිදී
තලෙන්තයකුයි ඇඳුම් කට්ටල දෙක-
කුයි දෙන්න පුළුවන්ද?’ ”[2] **23** එවිට
නාමන්, “තලෙන්ත දෙකක්ම ගන්න”
යයි කීවේය. නාමන් එසේ ඔහුට පෙ-
රැත්ත කර[3] රිදී තලෙන්ත දෙකක්
මලු දෙකක ඔතා, ඒ මලුවලට ඇඳුම්
කට්ටලයක් බැගින් දැමුවේය. ඉන්පසු
ඔහුගේ සේවකයන් දෙදෙනෙකුට ඒ
මලු දෙක දී ඒවා ගෙහාසිට පෙරටු-
වෙන් උසුලාගෙන යන ලෙස ඔවුන්ට
අණ කළේය.

**24** ගෙහාසි, ඕෆෙල් නම් ප්‍රදේශයට
පැමිණි විට ඒ භාණ්ඩ සේවකයන් දෙ-
දෙනා අතින් ගෙන නිවසේ තබා[4]
ඔවුන්ව ආපසු පිටත් කර හැරියේය.
**25** ඉන්පසු ඔහු තම ස්වාමියා ළඟට
ආවේය.[5] එවිට එලිෂා, “ගෙහාසි, ඔබ
කොහේද ගියේ” කියා ඔහුගෙන් ඇසු-
වේය. ඔහුද, “ඔබේ සේවකයා කොහේ-
වත් ගියේ නැහැ” කියා කීවේය.[6]
**26** එවිට එලිෂා ඔහුට මෙසේ කීවේය.
“ඒ මිනිසා ඔබට කතා කරන්න
අශ්ව රථයෙන් බහිද්දීම කුමක්ද සිදු
වුණේ කියා මම දැනගත්තා. රිදීවත්
ඇඳුම්වත් ඔලීවවතුවත් මිදිවතුවත්
බැටළුවන්වත් ගොනුන්වත් සේවක
සේවිකාවන්වත් තෑගි හැටියට පිළි-
ගන්න මෙය සුදුසු අවස්ථාවක් කියා
ඔබ හිතනවාද ගෙහාසි?[7] **27** ඔබ
කළ මේ දේ නිසා නාමන්ට වැලඳී තිබූ
ලාදුරු රෝගය[8] දැන් ඔබට වැලඳෙ-
නවා. එම රෝගය වැලඳුණු කෙනෙක්
හැමදාටම ඔබේ පවුල තුළ ඉදීවි.”[9]
එය ඇසූ විගස ගෙහාසි එතැනින්
පිටත්ව ගියේය. ඔහු පිටත්ව යන විට
ලාදුරු රෝගය වැලඳී ඔහුගේ ශරීරය
හිම මෙන් සුදු විය.[10]

**6** අනාගතවක්තෘවරුන්ගේ පුත්‍ර-
යෝ[11] එලිෂාට මෙසේ කීවෝය.
“මේ ස්ථානයේ[12] අපිට ඉන්න ඉඩ
මදි.[13] ඒ නිසා අපි සියලුදෙනාටම තව-
දුරටත් එකට ඉන්න බැහැ. **2** අපිට
යෝර්දාන් ගඟ ළඟට යන්න අවසර

**5 පරි.**
1 මතෙ 10:8; 1කොරි 9:18; 2කොරි 11:9; එළි 22:17
2 නික් 20:24; නික් 20:25
3 1තෙස 1:9
4 යෙරෙ 10:14; 1කොරි 8:5
5 2රාජා 7:2
6 නික් 20:5; 1රාජා 19:18; 2රාජා 17:35
7 2ලේක 30:18; 2ලේක 30:19
8 2සාමු 3:22
9 1රාජා 17:24; යෙසා 44:26
10 2රාජා 4:12; 2රාජා 8:4
11 2රාජා 5:1; ලූක් 4:27
12 2සාමු 12:5
13 ගීතා 10:3; යෙරෙ 17:9; ලූක් 12:15; 1තිමෝ 6:10
14 2රාජා 4:26
15 2රාජා 2:3
16 යොහ 8:44; එෆී 4:25

**2 තීරුව**
1 හිතෝ 6:17; හිතෝ 21:6; කොලො 3:9
2 2රාජා 5:5
3 2රාජා 5:16
4 යොෂු 7:21
5 2රාජා 2:3; යෙරෙ 6:15
6 ගීතා 63:11; හිතෝ 12:19; හිතෝ 12:22; යෙසා 59:3; හොෂෙ 12:8; ක්‍රියා 5:9
7 මතෙ 10:8; යොහ 12:6; ක්‍රියා 20:33
8 2රාජා 5:1; 1තිමෝ 6:9
9 2සාමු 3:29
10 නික් 4:6; ගණන් 12:10; හිතෝ 21:6

**6 පරි.**
11 2රාජා 2:3; 2රාජා 2:5; 2රාජා 9:1
12 2රාජා 4:38
13 යෙසා 49:20

දෙන්න. අපි එක් එක් කෙනාට පුළුවන්
ගස් කපා ඒවායින් එහි නවාතැනක්
සාදාගන්න.”[1] එලිෂා, “ගිහින් ඔබ
කියූ විදිහට කරන්න” යයි කීවේය.
**3** එවිට ඔවුන්ගෙන් එක් කෙනෙක්
එලිෂාට කතා කර, “ඔබත් ඔබේ සේ-
වකයන් සමඟ එහි යන්න එන්න” යයි
කීවේය. එවිට ඔහු, “හොඳයි, මමත්
ඔබ සමඟ එන්නම්” කියා කියමින්
**4** ඔවුන් සමඟ ගියේය. අවසානයේදී
ඔවුහු යොර්දාන් ගඟ අසලට පැමිණ ඒ
අවට තිබුණු ගස් කැපීමට පටන්-
ගත්තෝය.[2] **5** තමන්ට අවශ්‍ය ලී
කපාගන්නා අතරතුර එක් කෙනෙකු-
ගේ පොරෝ තලය[3] ගැලවී වතුරට
වැටුණේය. එවිට ඔහු, “අනේ මගේ
ස්වාමීනි,[4] ඒක මම වෙන කෙනෙකු-
ගෙන් ඉල්ලගත්ත පොරොවක්”[5] යයි
කීවේය. **6** සැබෑ දෙවිගේ අනාගත-
වක්තෘවරයා, “එය වැටුණේ කො-
තැනටද” කියා ඔහුගෙන් ඇසූ විට
එය වැටුණු තැන ඔහුට පෙන්වූවේය.
එවෙලේම එලිෂා ලී කෑල්ලක් කපා
එතැනට වීසි කළේය. එවිට පොරෝ
තලය උඩට මතු වී පාවුණේය.[6]
**7** “දැන් අත දමා පොරෝ තලය
ගන්න” යයි එලිෂා ඒ තැනැත්තාට
කීවේය. ඔහුද පොරෝ තලය ගත්-
තේය.

**8** සිරියාවේ රජ,[7] ඊශ්‍රායෙල් දේශ-
යට විරුද්ධව යුද්ධයට ආවේය. ඔහු
තම සේවකයන් සමඟ සාකච්ඡා කර,[8]
“අපි මේ මේ තැන්වල කඳවුරු බැඳග-
නිමු”[9] යයි කීවේය. **9** නමුත් සැබෑ
දෙවිගේ අනාගතවක්තෘවරයා[10] ඊශ්‍රා-
යෙල්හි රජුට පණිවිඩයක් යවා, “සිරි-
යානු හමුදාව මේ ස්ථානයට එන
නිසා[11] ඒ අසලින් නොයන්න වගබලා
ගන්න”[12] කියා කීවේය. **10** එබැ-
වින් ඊශ්‍රායෙල්හි රජ, සැබෑ දෙවිගේ
අනාගතවක්තෘවරයා කී දේ සනාථ
කරගැනීමට ඒ ස්ථානයට මිනිසුන්ව
යැව්වේය.[13] වරක් දෙවරක් නොව
කිහිප වතාවක්ම එලිෂා මෙසේ අන-
තුරු ඇඟවූ[14] නිසා රජ ඔහු කී තැන්ව-
ලට යැමෙන් වැළකී සිටියේය.

**11** එබැවින් සිරියාවේ රජ කුපිත
වී[1] තම සේවකයන්ව කැඳවා,
“ඊශ්‍රායෙල්හි රජුට පක්ෂව කටයුතු
කරන කෙනෙක් මෙතැන ඉන්න-
වාද” කියා ඔවුන්ගෙන් ඇසුවේය.[2]
**12** එවිට ඔහුගේ සේවකයෙක් මෙසේ
කීවේය. “මගේ ස්වාමීනි, ඊශ්‍රායෙල්හි
රජුට පක්ෂව කටයුතු කරන කවුරුත්
මෙහි නැහැ. ඔබේ නිදන කාමරයේ
කතා වෙන දේ පවා[3] ඊශ්‍රායෙල්හි
රජුට දන්වන්නේ[4] ඒ දේශයේ ජීවත්
වන එලිෂා නම් අනාගතවක්තෘ-
වරයායි.”[5] **13** එබැවින් රජ මෙසේ
කීවේය. “ගිහින් ඔහු ඉන්න තැන
සොයාගන්න. ඉන්පසු මම මිනිසුන්ව
යවා ඔහුව අල්ලගන්නම්.”[6] ටික කල-
කට පසු, “ඔහු සිටින්නේ දොතාන්
නගරයේ”[7] කියා රජුට දන්වන ලදී.
**14** එවෙලෙහිම ඔහු විශාල හමුදාවක්
රැස් කර ඔවුන්ට අවශ්‍ය අශ්වයන්වද
අශ්ව රථද සපයා දී ඔවුන්ව එම ස්ථා-
නයට යැව්වේය.[8] ඔවුහු රාත්‍රි කාල-
යේදී ඒ නගරය වටලුවෝය.

**15** එලිෂාගේ සේවකයා[9] හිමිදිරියේ
අවදි වී පිටතට ගොස් වටපිට බැලූ
විට අශ්වයන්ද අශ්ව රථද ඇතුළුව
විශාල හමුදාවක් නුවර වටලා සිටි-
නවා දුටුවේය. එවිට සේවකයා, එලිෂා
ළඟට ගොස්, “අනේ මගේ ස්වාමීනි,[10]
අපි දැන් මොනවද කරන්නේ” කියා
ඇසුවේය. **16** නමුත් ඔහු, “භය
වෙන්න එපා.[11] ඒ අයට වඩා විශාල
පිරිසක් අප සමඟ ඉන්නවා”[12] යයි
කීවේය. **17** ඉන්පසු එලිෂා මෙසේ
යාච්ඤා කළේය.[13] “අනේ යෙහෝවා
දෙවියනි, ඔහුගේ ඇස් පහදා[14] ඔහුට
පැහැදිලිව දකින්න සලස්වන්න.” ඒ
අවස්ථාවේදීම යෙහෝවා දෙවි, සේව-
කයාගේ ඇස් පැහැදුවේය. එලිෂා සිටි
ස්ථානය අවට[15] තිබූ කඳුකර පළාත
පුරාම ගිනි වැනි වූ අශ්වයන් සහ අශ්ව
රථ තිබෙනවා ඔහුගේ සේවකයා දුටු-
වේය.[16]

**18** සිරියානු හමුදාව තමා වෙතට
එන විට එලිෂා යෙහෝවා දෙවිට
නැවතත් යාච්ඤා කරමින්, “අනේ

**6 පරි.**
1 2කොරි 9:8
2තෙස 3:8
2 ද්වි 19:5
3 යෙසා 10:34
4 2රාජා 6:15
5 නික් 22:14
2රාජා 4:7
6 ලූක් 18:27
7 1රාජා 20:1
1රාජා 20:34
1රාජා 22:31
8 1රාජා 20:23
හිතෝ 21:30
9 නෙහෙ 4:11
10 1රාජා 17:24
යෙසා 44:26
11 ආමො 3:7
12 හිතෝ 20:18
13 නික් 9:20
හිතෝ 27:12
14 එස 3:18
මතෙ 2:12
හෙබ්‍රෙ 11:7

**2 තීරුව**
1 යෙසා 57:20
2 1සාමු 22:8
3 ගීතා 139:2
දේශ 10:20
ආනි 2:22
4 ආනි 2:28
ආනි 4:9
5 2රාජා 5:3
2රාජා 5:8
ආමො 3:7
6 ගීතා 37:12
7 උත් 37:17
8 2රාජා 1:9
මතෙ 26:55
9 1රාජා 19:21
2රාජා 3:11
10 මතෙ 8:25
11 නික් 14:13
ගීතා 3:6
ගීතා 11:1
ගීතා 18:2
ගීතා 118:11
12 2සාමු 22:31
2ලේක 32:7
ගීතා 27:3
ගීතා 46:7
ගීතා 55:18
රෝම 8:31
13 2ලේක 20:12
ගීතා 91:15
14 ක්‍රියා 7:56
15 ගීතා 34:7
මතෙ 26:53
16 2රාජා 2:11
ගීතා 68:17
සෙක 6:1

දෙවියනි, මේ අයගේ ඇස් අන්ධ
කරන්න"[1] කියා කීවේය. එවිට දෙවි,
එලිෂාගේ ඉල්ලීම ලෙස ඔවුන්ගේ ඇස්
අන්ධ කළේය. **19** ඉන්පසු එලිෂා ඒ
හමුදාවට මෙසේ කීවේය. "ඔබ යන්-
නේ වැරදි පාරේ. ඔබ යා යුත්තේ මේ
නුවරට නෙවෙයි. මාත් එක්ක එන්න.
ඔබ සොයන මිනිසා ළඟට මම ඔබව
ගෙන යන්නම්." එහෙත් ඔහු ඔවුන්ව
ගෙන ගියේ සමාරියටය.[2]

**20** ඔවුන් සමාරියට ආ විගස
එලිෂා, "යෙහෝවා දෙවියනි, ඔවුන්ගේ
ඇස් ඇර ඔවුන්ට පැහැදිලිව දකින්න
සලස්වන්න"[3] යයි කීවේය. ඒ මො-
හොතේදීම යෙහෝවා දෙවි ඔවුන්ගේ
ඇස් ඇරියේය. ඔවුහු වටපිට බැලූ විට
තමන් සමාරිය මැද සිටින බව දුටු-
වෝය. **21** ඊශ්‍රායෙල්හි රජ ඔවුන්ව
දුටු විගස, "මම මොවුන්ට පහර
දෙන්නද? පියාණෙනි,[4] මම මො-
වුන්ට පහර දෙන්නද"[5] කියා එලිෂා-
ගෙන් ඇසුවේය. **22** නමුත් එලිෂා,
"ඔවුන්ට පහර දෙන්න එපා. සටන්
කර ඔබ යටත් කරගත් අයට පහර
දෙන එක සුදුසු නැහැ.[6] ඔවුන්ට
කන්න බොන්න දී[7] නැවතත් ඔවුන්-
ගේ ස්වාමියා ළඟට යන්න ඉඩ-
හරින්න" යයි කීවේය. **23** රජ ඔවුන්
සඳහා විශාල භෝජන සංග්‍රහයක් පිළි-
යෙල කළේය. ඔවුන් කා බී නිම වූ පසු
රජ ඔවුන්ට යන්න හැරියේය. ඔවුන්
නැවත තමන්ගේ ස්වාමියා වෙතට
ගිය අතර සිරියානු ජාතික කොල්ලක-
රුවෝ[8] නැවත කිසි දිනක ඊශ්‍රායෙල්
දේශය ආක්‍රමණය කළේ නැත.

**24** පසු කාලයකදී සිරියාවේ රජු වූ
බෙන්-හාදද් තම මුළු හමුදාව රැස් කර-
ගෙන සමාරිය වැටලුවේය.[9] **25** මේ
වැටලීම නිසා සමාරියේ දරුණු
සාගතයක් ඇති විය.[10] බූරුවෙකු-
ගේ හිසක්[11] රිදී ෂෙකෙල් අසූවකටත්
පරෙවියන්ගේ අසූචි[12] මිටවල් දෙ-
කක්* රිදී ෂෙකෙල් පහකටත් විකි-
ණෙන තරමටම බඩුවල මිල ඉහළ
ගියේය. **26** දවසක් ඊශ්‍රායෙල්හි රජු
නගරයේ පවුර ළඟින් ගමන් කරද්දී
ස්ත්‍රියක් හඬ නගමින්, "මගේ ස්වා-
මීනි, මගේ රජ්ජුරුවනි, අපිව බේරා-
ගන්න"[1] යයි කීවාය. **27** එවිට රජ
මෙසේ කීවේය. "යෙහෝවා දෙවි ඔබට
උපකාර කරන්නේ නැත්නම් මම
කොහොමද ඔබට උපකාර කරන්-
නේ?[2] කමතෙන්වත් වයින් හෝ තෙල්
යන්ත්‍රයෙන්වත් ඔබට දෙන්න දෙ-
යක් මා ළඟ නැහැ." **28** තවදුරටත්
රජ ඇගෙන් මෙසේ ඇසුවේය. "ඔබට
කුමක්ද සිදු වුණේ?" ඇය මෙසේ
කීවාය. "එක ස්ත්‍රියක් මගේ පුතාව
කෑමට ගන්න ඉල්ලුවා. ඊළඟ දවසේ
ඇගේ පුතාව කන්න දෙන්නම් කියා
ඇය මට කියා සිටියා.[3] **29** ඉතින්
මගේ පුතාව තම්බා[4] අපි දෙන්නා
කෑවා.[5] නමුත් පසුවදා ඇගේ පුතාව
කන්න මම ඉල්ලූ විට ඇය දරුවාව
සඟවාගත්තා."

**30** රජුට මේ සිද්ධිය ගැන අසන්න
ලැබුණු විට ඔහු තම පිට වස්ත්‍රය ඉරා-
ගත්තේය.[6] එවිට පවුර ළඟ සිටි
ජනයා ඔහු තම වස්ත්‍රයට යටින්
ගෝණි රෙදි පැළඳ සිටි බව දුටුවෝය.
**31** තවදුරටත් රජ මෙසේ කීවේය.
"අද මම ෂාපාත්ගේ පුත් එලිෂාගේ හිස
කපා දැමුවේ නැත්නම් දෙවි මට දඬු-
වම් කළ යුතුයි!"[7]

**32** එලිෂා වැඩිමහල්ලන් සමඟ
තමාගේ නිවසෙහි ඉඳගෙන සිටියදී[8]
රජ තමාට පෙරටුවෙන් එලිෂා වෙත
පණිවිඩකරුවෙකු යැව්වේය. පණිවිඩ-
කරු පැමිණීමටත් පෙර එලිෂා වැඩිම-
හල්ලන්ට මෙසේ කීවේය. "අර මිනී
මරුවා*[9] මගේ හිස ගසා දමන්න කෙ-
නෙක්ව එවා තිබෙනවා. ඔහු ආ විගස
දොර වසා ඔහුට ඇතුල් වෙන්න බැරි
වන ලෙස දොරට හේත්තු වී සිටින්න.
ඔහුට පිටුපසින් එන ඔහුගේ ස්වාමියා-
ගේ අඩි ශබ්දයත් මට ඇහෙනවා."[10]
**33** එලිෂා ඔවුන් සමඟ කතා කරමින්

---

**2රාජා 6:25*** ලීටරයකින් තුනෙන් පංගුවක් පමණ.

**2රාජා 6:32*** මූ.අ., "මිනී මරුවාගේ පුත්‍රයා."

---

**6 පරි.**

**1** උත් 19:11; හිතෝ 4:19; යෙසා 59:10; යොහ 9:39
**2** 1රාජා 16:29
**3** ලූක් 24:31
**4** 2රාජා 2:12; 2රාජා 5:13; 2රාජා 13:14
**5** 1සාමු 24:19
**6** ද්වි 20:11
**7** හිතෝ 25:21; මතෙ 5:44; ලූක් 6:35; රෝම 12:20
**8** 2රාජා 5:2
**9** ද්වි 28:52; 1රාජා 20:1
**10** ලෙවී 26:26; ද්වි 28:17; 2රාජා 7:4; විලා 4:9
**11** ද්වි 14:3; එස 4:14; ක්‍රියා 10:12
**12** එස 4:15

**2 තීරුව**

**1** 2සාමු 14:4; ලූක් 18:3
**2** ගීතා 60:11; ගීතා 118:8; ගීතා 146:3; යෙසා 2:22; යෙරෙ 17:5
**3** ලෙවී 26:29; ද්වි 28:53; යෙසා 49:15; එස 5:10
**4** විලා 4:10
**5** ද්වි 28:55; ද්වි 28:57
**6** උත් 37:29; 1රාජා 21:27; 2රාජා 19:1
**7** ගීතා 105:15; යෙරෙ 38:4
**8** එස 8:1; එස 14:1; එස 20:1
**9** 1රාජා 18:13; 1රාජා 21:10
**10** 1රාජා 14:6

සිටියදී පණිවිඩකරුවා ඔවුන් ළඟටම
ආවේය. ඔහු සමඟ පැමිණි රජ මෙසේ
කීවේය. “මේ විපත පැමිණියේ යෙ-
හෝවා දෙවිගෙන්.[1] ඒ නිසා යෙහෝවා
දෙවි උපකාර කරයි කියා මම තවත්
බලාපොරොත්තු තියාගෙන ඉන්නේ
මොකටද?”[2]

**7** එවිට එලිෂා මෙසේ කීවේය. “යෙ-
හෝවා දෙවිගේ වචනයට ඇහුම්-
කන් දෙන්න.[3] ‘හෙට මේ වෙලාවට
සමාරියේ දොරටුව අසල සිහින් පිටි
සෙයා මිනුම්* එකක් ෂෙකෙලය-
කට විකිණෙයි. බාර්ලි සෙයා දෙක-
කුත් ෂෙකෙලයකට ගන්න පුළුවන්
වෙයි’ කියා යෙහෝවා දෙවි පැව-
සුවා.”[4] **2** එවිට රජුගේ උපකාරයට
සිටි නිලධාරියා,[5] දෙවිගේ අනාගත-
වක්තෘට මෙසේ කීවේය. “යෙහෝවා
දෙවි අහසේ කවුළු ඇරියත්[6] ඔබ
කියන දේ වෙයි කියා විශ්වාස කරන්-
නේ කොහොමද?”[7] එලිෂා මෙසේ
කීවේය. “මා කියූ දේ අනිවාර්යයෙන්ම
සිදු වෙනවා. ඔබේ ඇස් දෙකෙන්ම
ඔබට එය දැකගන්න ලැබුණත්[8] ඔබට
ඒ දේවල් කන්න ලැබෙන්නේ නැහැ.”[9]
**3** එදින නගරයේ දොරටුව අසල
ලාදුරු රෝගීහු හතරදෙනෙක් සිටි-
යෝය.[10] ඔවුහු තම තමන් අතරේ
මෙසේ කතා කරගත්තෝය. “ඇයි අපි
මැරිලා යනකම් මෙතැනට වෙලා
බලාගෙන ඉන්නේ? **4** නුවර ඇතු-
ළෙත් සාගතය තියෙන නිසා නුවරට
ගියත් අපට මැරෙන්නයි සිදු වෙන්-
නේ.[11] ඒ නිසා අපි දැන් සිරියානු හමු-
දාවේ කඳවුරට යමු. ඔවුන් අපිව
මැරුවත් කරන්න දෙයක් නැහැ.[12]
මෙතන හිටියත් අපි මැරෙනවා. සම-
හරවිට ඔවුන් එසේ නොකර ඉන්නත්
පුළුවන්.” **5** සවස අඳුර වැටීගෙන
එන විට ඔවුහු සිරියානු හමුදාවේ කඳ-
වුර බලා ගියෝය. ඔවුන් කඳවුරේ
මායිමට පැමිණියත් එක සිරියානු-
වෙක්වත් ඔවුන්ට දැකගන්න ලැබුණේ
නැත.

**6** යෙහෝවා දෙවි, අශ්වයන් හා
යුධ රථ සමඟ එන විශාල හමුදා-
වක ශබ්දයක්[1] සිරියානු භටයන්ට
ඇසීමට සලස්වා තිබිණ.[2] එබැවින්
ඔවුහු එකිනෙකා අතරේ මෙසේ කියා-
ගත්තෝය. “ඊශ්‍රායෙල්හි රජු අපිට
විරුද්ධව සටන් කිරීමට හිත්තීවරුන්-
ගේ රජවරුන්ව[3] හා ඊජිප්තුවේ රජව-
රුන්ව[4] එවලා!” **7** එබැවින් ඔවුහු
එවෙලේම තම තමන්ගේ කූඩාරම්ද
අශ්වයන්වද[5] බූරුවන්වද අත්හැර දමා
කඳවුරෙන් පලා ගියෝය. සවස අඳුර
වැටීගෙන එන වේලාවේදී පලා ගිය
ඔවුහු[6] කඳවුරෙන් කිසිවක් රැගෙන
ගියේ නැත.
**8** ලාදුරු රෝගීහු සිරියානු කඳවු-
රේ මායිමේ තිබූ කූඩාරමකට ඇතුල්
වී එහි තිබූ කෑම බීම හොඳින් භුක්ති
විඳ, එහි තිබූ රන්, රිදී හා වස්ත්‍ර
රැගෙන ගොස් සඟවා තැබුවෝය.
ඔවුහු ආපසු පැමිණ කඳවුරේ තවත්
කූඩාරමකට ඇතුල් වී එහි තිබූ දේ-
වල්ද රැගෙන ගියෝය.[7]
**9** පසුව ඔවුහු එකිනෙකා අතරේ
මෙසේ කතා වූහ. “අපි කරන මේ දේ
හරි නැහැ. අපි අනික් අයටත් මේ ගැන
කියන්න ඕනේ.[8] අපි මේ ගැන අනික්
අයට නොකියා සිටියොත් උදේ වෙද්දී
අපිට ප්‍රශ්න රැසකට මුහුණ දෙන්න
සිදු වෙයි.[9] ඒ නිසා අපි දැන්මම ගිහින්
මේ ගැන රජමාලිගාවට දැනුම් දෙමු.”
**10** එබැවින් ඔවුහු ගොස් නුවරේ දො-
රටු පාලකයන්ට[10] මෙසේ කීවෝය.
“අපි සිරියානු කඳවුරට ගියා. එහි
කවුරුත් හිටියේ නැහැ. කිසිවෙකුගේ
කටහඬක්වත් අපිට ඇසුණේ නැහැ.
කඳවුරේ හිටියේ අශ්වයන් හා බූරුවන්
විතරයි. කූඩාරම්වල බඩුමුට්ටු සියල්-
ලත් තියෙනවා.”[11] **11** එවිට දොරටු
පාලකයෝ හඬ නඟා රජමාලිගාවේ
සිටි අයට ඒ ගැන දැනුම් දුන්නෝය.
**12** ඒ පණිවිඩය ලැබුණු විට රජ
ඒ රාත්‍රියේම නැඟිට තම සේව-
කයන්ට මෙසේ පැවසුවේය.[12] “සිරි-
යානු හමුදාව අපිට කරන්න යන දේ
මම දන්නවා.[13] ඒ නිසා මම දැන්

**6 පරි.**
1 හිතෝ 19:3 යෙසා 8:21 ආමො 3:6
2 ගීතා 27:14 හිතෝ 14:29 හිතෝ 30:9 2පේතෘ 3:9 එළි 16:9

**7 පරි.**
3 ආමො 3:7 හෙබ්‍රෙ 1:1
4 ද්වි 32:36 විනි 5:11 2රාජා 7:18
5 2රාජා 5:18
6 උත් 7:11 ගීතා 78:23 මලා 3:10
7 ගණන් 14:11 2තෙස 3:2
8 ගණන් 11:23 2ලේක 20:20
9 2රාජා 7:17
10 ලෙවී 13:46 ද්වි 24:8
11 2රාජා 6:25
12 විලා 4:9

**2 තීරුව**
1 ද්වි 28:7 2සාමු 5:24 2රාජා 19:7
2 හිතෝ 20:12
3 1රාජා 10:29 2ලේක 1:17
4 2ලේක 12:2
5 ගීතා 33:17 හිතෝ 21:31
6 ගීතා 48:5 හිතෝ 28:1
7 යෙරෙ 41:8
8 නාහු 1:15 1කොරි 10:24 පිලි 2:4 1තෙස 5:15
9 1තිමෝ 6:10
10 2සාමු 18:26 ගීතා 127:1 මාක් 13:34
11 2රාජා 7:7
12 2රාජා 6:8
13 හිතෝ 14:15

**2රාජා 7:1*** සෙයා මිනුමක් ලීටර් 7.33ට සමානය.

කියන දේ හොඳින් අහගන්න. අපි
දැන් හොඳටම බඩගින්නේ ඉන්න බව
ඔවුන් දන්නවා.[1] ඉතින් ඔවුන් කඳවුර
අත්හැර කැලේට ගිහින් හැංගිලා බලා-
ගෙන ඉන්නවා ඇති.[2] ඔවුන් එකි-
නෙකා අතරේ මෙහෙම කියනවා
ඇති. 'දැන් ඔවුන් නුවරෙන් එළියට
එයි. එවිට අපිට පුළුවන් ඔවුන්ව
අල්ලගන්න. ඊටපස්සේ අපි නුවරට
ඇතුල් වෙමු.'" **13** එවිට රජුගේ සේ-
වකයෙක් මෙසේ කීවේය. "රජතුමනි,
අපි මිනිසුන් කිහිපදෙනෙකුව තෝරා-
ගෙන නුවරේ ඉන්න අශ්වයන් පස්දෙ-
නෙක්ව ඔවුන්ට දී මේකේ ඇත්ත
නැත්ත කුමක්ද කියා දැනගෙන
එන්න කියමු.[3] ඊශ්‍රායෙල්වරුන් බො-
හෝදෙනෙක් දැනටමත් මිය ගිහින්. ඒ
නිසා ඔවුන් නුවරෙන් පිටතට ගියත්
නුවරට වෙලා හිටියත් ඔවුන්ට සිදු
වෙන්නේ එකම දේයි.[4] අපි මිනි-
සුන් කිහිපදෙනෙක්ව යවලා බලමු."
**14** එබැවින් ඔව්හු අශ්ව රථ දෙකක්
සූදානම් කළෝය. රජද, "ගිහින් මෙහි
ඇත්ත නැත්ත දැනගෙන එන්න" යයි
කියමින් ඒ මිනිසුන්ව සිරියානු කඳ-
වුරට පිටත් කර යැව්වේය. **15** ඔව්හු
ඔවුන්ව සොයාගෙන යොර්දාන් ගඟ
දක්වාම ගියෝය. සිරියානු හමුදාව
පලා යන විට දමා ගිය[5] ඇඳුම් සහ
භාණ්ඩ[6] මඟ දිගේ විසිරී තිබෙන බව
දුටු පණිවිඩකරුවෝ ආපසු ගොස්
රජුට ඒ ගැන දැන්වූවෝය.

**16** ඊශ්‍රායෙල්වරු ගොස් සිරියානු
හමුදාවේ කඳවුර කොල්ල කෑවෝය.[7]
එබැවින් යෙහෝවා දෙවි කී ලෙසම[8]
සිහින් පිටි සෙයා මිනුම් එකක් ෂෙකෙ-
ලයකටද බාර්ලි සෙයා මිනුම් දෙකක්
ෂෙකෙලයකටද ගැනීමට ඔවුන්ට
හැකි විය. **17** ඒ අවස්ථාව වන විට
රජ, ඔහුගේ උපකාරයට සිටි නිලධා-
රියාව[9] නුවර දොරටුව මුර කිරීමට
පත් කර තිබුණේය. සෙනඟ එම දො-
රටුවෙන් දිව යන විට ඔහු පෑගී[10] මිය
ගියේය. මෙසේ රජු දෙවිගේ අනාගත-
වක්තෘව හමු වීමට ගිය විට ඔහු
පැවසූ දේ ඒ ආකාරයටම ඉටු විය.[11]

**7 පරි.**
1 2රාජා 6:25
2රාජා 6:29
2 යොෂු 8:4
යොෂු 8:12
විනි 20:29
විනි 20:37
3 2රාජා 6:25
4 විලා 4:9
5 ගීතා 68:12
යෙසා 2:20
මතෙ 16:26
6 එස්ත 1:7
යෙසා 22:24
7 2ලේක 20:25
ගීතා 68:12
යෙසා 33:1
8 ගණන් 23:19
2රාජා 7:1
යෙසා 44:26
යෙසා 55:11
9 2රාජා 5:18
10 2රාජා 9:33
යෙසා 25:10
11 ද්වි 32:35
2රාජා 7:2
2ලේක 36:16
යෙසා 5:24
යෙසා 28:22
නාහු 1:2

**2 තීරුව**
1 2රාජා 7:1
යෙසා 44:26
2 ගණන් 20:12
ගීතා 78:19
3 2රාජා 7:2
4 2ලේක 20:20
5 යෙසා 41:25

**8 පරි.**
6 2රාජා 4:35
7 උත් 41:27
2සාමු 24:13
ආමො 3:2
8 ලෙවි 26:19
ද්වි 28:23
2සාමු 21:1
1රාජා 17:1
ගීතා 105:16
ක්‍රියා 11:28
9 උත් 12:10
උත් 26:1
උත් 47:4
රූත් 1:1
10 හිතෝ 27:12
11 උත් 15:3
1තිමෝ 5:8
12 යොෂු 13:3
1සාමු 27:1
13 1සාමු 8:5
2සාමු 14:4
2රාජා 6:26
ලූක් 18:3
14 2රාජා 4:12

**18** එනම්, "හෙට මේ වෙලාවට සමා-
රියේ දොරටුව අසල සිහින් පිටි සෙයා
මිනුම් එකක් ෂෙකෙලයකට විකි-
ණෙයි. බාර්ලි සෙයා මිනුම් දෙකකුත්
ෂෙකෙලයකට ගන්න පුළුවන් වෙයි"
කියා සැබෑ දෙවිගේ අනාගතවක්තෘ
රජුට කී දේ ඒ ආකාරයටම ඉටු
විය.[1] **19** නමුත් රජුගේ උපකාරයට
සිටි නිලධාරියා ඒ අවස්ථාවේදී දෙවි-
ගේ අනාගතවක්තෘගෙන්, "යෙහෝවා
දෙවි අහසේ කවුළු ඇරියත් ඔබ
කියන දේ සිදු වෙයි කියා විශ්වාස
කරන්නේ කොහොමද" කියා ඇසු-
වේය.[2] එවිට එලිෂා මෙසේ කීවේය.
"මා කියූ දේ අනිවාර්යයෙන්ම සිදු වෙ-
නවා. ඔබේ ඇස් දෙකෙන්ම ඔබට
එය දැකගන්න ලැබුණත් ඔබට ඒ
දේවල් කන්න ලැබෙන්නේ නැහැ."[3]
**20** මෙසේ එලිෂා ඔහුට පැවසූ දේ ඒ
ආකාරයටම ඉටු විය.[4] සෙනඟ දොර-
ටුවෙන් දිව යන විට ඔහු පෑගී[5] මිය
ගියේය.

**8** දිනක් එලිෂා තමන් නැවත
නැඟිටවූ දරුවාගේ මවට මෙසේ
කීවේය.[6] "මේ දේශයට අවුරුදු හතක්
පුරා[7] නියඟයක් ඇති වීමට යෙහෝවා
දෙවි නියම කර තිබෙනවා.[8] දැන්
ඔබේ ජීවිතය බේරගන්න ඔබේ ගෙයි
වැසියන් සමඟ මෙතැනින් පිටත් වී
වෙන දේශයකට ගොස් එහි තාවකා-
ලිකව පදිංචි වෙන්න."[9] **2** එබැවින්
ඒ ස්ත්‍රිය සැබෑ දෙවිගේ අනාගත-
වක්තෘ කී පරිදි කළාය.[10] ඈ තම
ගෙයි වැසියන් සමඟ[11] පිලිස්තිවරුන්-
ගේ දේශයට[12] ගොස් එහි අවුරුදු
හතක් වාසය කළාය.

**3** අවුරුදු හත අවසානයේදී ඒ
ස්ත්‍රිය නැවත පිලිස්තිවරුන්ගේ දේශ-
යෙන් ඇවිත් ඇයට අයිතිව තිබූ නිව-
සත් ඉඩමත් නැවත ලබා දෙන ලෙස
රජතුමාගෙන් ඉල්ලීමට ගියාය.[13]
**4** ඒ අතරතුර රජතුමා සැබෑ දෙවිගේ
අනාගතවක්තෘගේ සේවක ගෙහාසී[14]
සමඟ කතා කරමින් සිටියේය. රජ
ගෙහාසීට මෙසේ පැවසුවේය. "එලිෂා
කර තිබෙන පුදුම දේවල් හැම එකක්

ගැනම මට කියන්න."[1] **5** එලිෂා
මිය ගිය දරුවාව නැවත නැඟිටවූ
ආකාරය ගැන ගෙහාසී රජතුමාට විස්-
තර කරමින් සිටියදීම[2] ඒ දරුවාගේ
මව එතැනට පැමිණ, තම නිවසත්
ඉඩමත් නැවත ලබා දෙන ලෙස රජු-
ගෙන් ඉල්ලුවාය.[3] එවිට ගෙහාසී,
"මගේ ස්වාමීනි,[4] මගේ රජ්ජුරුවනි,
මේ කාන්තාව ගැන තමයි මම ඔබට
කිව්වේ. එලිෂා නැවත ජීවත් කෙරෙව්-
වේ මෙන්න මේ දරුවාව තමයි" කියා
කීවේය. **6** රජතුමා සිදු වූ දේ ගැන
ඇගෙන් ඇසූ විට ඇය මුළු විස්-
තරයම ඔහුට කීවාය.[5] එවිට රජ-
තුමා ඇයට උපකාර කිරීම සඳහා
නිලධාරියෙකුව පත් කර[6] මෙසේ
කීවේය. "ඇයට අයිති හැම දෙයක්ම
නැවත ලබා දෙන්න. ඒ වගේම ඇය
මේ දේශයෙන් ගිය දා සිට මේ
දක්වා කෙතෙන් ලැබුණු මුළු ආදාය-
මම ඇයට දෙන්න."[7]

**7** පසුව එලිෂා දමස්කයට පැමිණි-
යේය.[8] එකල සිරියාවේ රජු වූ බෙන්-
හාදද්[9] අසනීපව සිටියේය. "සැබෑ
දෙවිගේ අනාගතවක්තෘ[10] අපේ දේශ-
යට ඇවිත් සිටිනවා" කියා රජුට දන්-
වන ලදි. **8** එවිට රජ, හසායෙල්[11]
අමතා, "තෑග්ගක් රැගෙන[12] දෙවිගේ
අනාගතවක්තෘව හමු වීමට යන්න.
'මගේ මේ අසනීපය සුව වෙයිද'
කියා යෙහෝවා දෙවිගෙන් විමසන
ලෙස[13] ඔහුගෙන් ඉල්ලා සිටින්න"
කියා කීවේය. **9** එබැවින් හසායෙල්
එලිෂාට තෑග්ගක් ලෙස දමස්කයේ
ඇති වටිනාම දේවල් රැස් කරගෙන
ඒවා ඔටුවන් හතළිස්දෙනෙකු පිට
පටවා එලිෂාව හමු වීමට ගියේය.
ඔහු එලිෂාව හමු වී ඔහුට මෙසේ
කීවේය. "ඔබව හමු වීමට මාව එව්වේ
ඔබේ පුත්‍රයා[14] වන සිරියාවේ බෙන්-
හාදද් රජුයි. ඔහුට සුවය ලැබෙයිද
කියා ඔබෙන් අසා දැනගන්නා ලෙස
රජු මට පැවසුවා." **10** එවිට එලිෂා
ඔහුට මෙසේ කීවේය. "'ඔබ අනිවාර්-
යයෙන්ම සුව වෙනවා' කියා ගිහින්
රජුට කියන්න. නමුත් ඔහු මිය යන
බව[1] යෙහෝවා දෙවි මට පැවසුවා."[2]
**11** මෙසේ කියා එලිෂා එක දිගට
හසායෙල් දෙස බලාගෙන සිටියේය. ඒ
නිසා හසායෙල් මහත් අපහසුතාවකට
පත් විය. ඉන්පසු සැබෑ දෙවිගේ
අනාගතවක්තෘ එක පාරටම හඬන්න
පටන්ගත්තේය.[3] **12** එය දුටු හසා-
යෙල්, "මගේ ස්වාමීනි, ඇයි ඔබ
අඬන්නේ" කියා ඇසුවේය. එලිෂා
මෙසේ කීවේය. "ඔබ ඊශ්‍රායෙල්ව-
රුන්ට කරන්න යන විනාශය ගැන
මම හොඳින් දන්නවා.[4] ඔබ ඔවුන්ගේ
බලකොටුවලට ගිනි තබා ඔවුන්ගේ
හොඳම යුධ භටයන්ව කඩුවෙන් මරා
දමනවා. ඔබ ඔවුන්ගේ දරුවන්ව පො-
ළොවේ ගසා මරා දමනවා.[5] ගැබිනි
ස්ත්‍රීන්ව කඩුවෙන් කපා දමනවා."[6]
**13** එවිට හසායෙල්, "ඔබේ සේවකයා
වන මම වගේ පහත් තත්වයක ඉන්න
කෙනෙක්*[7] කොහොමද ඒ තරම් දෙ-
යක් කරන්නේ" කියා ඇසුවේය. නමුත්
එලිෂා මෙසේ පැවසුවේය. "අනාගත-
යේදී ඔබ සිරියාවේ රජු හැටියට පත්
වන බව යෙහෝවා දෙවි මට පැව-
සුවා."[8]

**14** පසුව ඔහු එලිෂා වෙතින් ගොස්
තම ස්වාමියා ළඟට පැමිණියේය.
"එලිෂා මොනවාද ඔබට කිව්වේ"
කියා රජු හසායෙල්ගෙන් ඇසුවේය.
ඔහු මෙසේ පිළිතුරු දුන්නේය. "'රජ-
තුමා අනිවාර්යයෙන්ම සනීප වෙ-
නවා' කියා එලිෂා මට පැවසුවා."[9]
**15** පසුවදා හසායෙල් ගොරෝසු රෙද්-
දක් ගෙන එය වතුරට දමා පොඟවා,
එම රෙද්දෙන් රජුගේ මුහුණ වසා ඔහු-
ගේ හුස්ම හිර කර[10] මැරුවේය.[11] ඉන්-
පසු හසායෙල්[12] රජකමට පත් විය.

**16** යූදාහි රජු වූ යෙහෝෂාපාට්ගේ
පුත් යෙහෝරම්[13] රජකමට පත් වූයේ
ඊශ්‍රායෙල්හි රජකම් කළ ආහබ්ගේ
පුත් යෙහෝරම් පාලනය කළ පස්වන
අවුරුද්දේදීය.[14] **17** යෙහෝරම් රජ-
කමට පත් වන විට ඔහුගේ වයස

---

**2රාජා 8:13*** මූ.අ., "නිකම්ම නිකම් බල්ලෙක් වගේ ඉන්න මම."

**8 පරි.**

**1** 2රාජා 2:14
2රාජා 2:20
2රාජා 3:17
2රාජා 4:4
2රාජා 5:14
2රාජා 5:27
2රාජා 6:6
2රාජා 7:1
**2** 2රාජා 4:35
**3** ගණන් 36:9
**4** 1සාමු 26:17
2රාජා 6:26
1පේතෘ 2:17
**5** 2රාජා 4:32
**6** 2රාජා 9:32
**7** ගීතා 82:3
හිතෝ 21:1
හිතෝ 29:4
හිතෝ 31:9
**8** යෙසා 7:8
**9** 1රාජා 20:1
2රාජා 6:24
**10** 1රාජා 17:24
**11** 1රාජා 19:15
**12** 1සාමු 9:8
1රාජා 14:3
2රාජා 5:5
**13** උත් 25:22
1රාජා 14:2
2රාජා 3:11
2රාජා 22:13
**14** 1සාමු 25:8
2රාජා 6:21
2රාජා 13:14

---

**2 තීරුව**

**1** 2රාජා 8:15
**2** යෙසා 44:26
ආමො 3:7
**3** යෙරෙ 9:1
ලූක් 19:41
ක්‍රියා 20:19
**4** 2රාජා 10:32
2රාජා 12:17
2රාජා 13:3
ආමො 1:3
**5** ද්වි 28:45
ද්වි 28:63
2රාජා 15:16
හොෂෙ 10:14
**6** යෙසා 13:16
හොෂෙ 13:16
ආමො 1:13
**7** 1සාමු 17:43
2සාමු 9:8
ගීතා 22:20
**8** 1සාමු 2:7
1රාජා 19:15
**9** 2රාජා 8:10
**10** ගීතා 36:1
මීකා 2:1
**11** 1රාජා 16:10
2රාජා 11:1
2රාජා 15:10
යෙසා 33:1
**12** 1රාජා 19:15
**13** 1රාජා 22:50
2ලේක 21:3
**14** 2රාජා 1:17

අවුරුදු තිස්දෙකකි. ඔහු යෙරුස-
ලමේ සිට අවුරුදු අටක් පාලනය
කළේය.[1] **18** ඔහු ඊශ්‍රායෙල්හි රජව-
රුන්ගේ ක්‍රියාකලාපයම අනුගමනය
කළේය.[2] ආහබ්ගේ දියණියව විවාහ
කරගෙන සිටි ඔහු,[3] ආහබ්ගේ පවුලේ
අය කළ ආකාරයටම[4] යෙහෝවා දෙවි
පිළිකුල් කරන දේවල් කිරීමට පෙලඹු-
ණේය. **19** නමුත් යෙහෝවා දෙවි
තම සේවකයා වූ දාවිත්ට වූ පො-
රොන්දුව නිසා[5] යූදා රාජ්‍යය විනාශ
කළේ නැත.[6] දාවිත්ගෙන් පැවතෙන්-
නෙක්* සදහටම එහි පාලනය කරන
බවට[7] දෙවි, දාවිත්ටත් ඔහුගේ පුත්‍ර-
යන්ටත් පොරොන්දු වී තිබිණ.
**20** යෙහෝරම් යූදාහි රජකම් කළ
කාලයේදී ඔහු යටතේ සිටි ඒදොම්-
වරු[8] ඔහුට විරුද්ධව කැරලිගසා
තමන්ව පාලනය කිරීමට වෙනත්
රජෙකුව පත් කරගත්තෝය.[9] **21** ඒ
කැරැල්ල මර්දනය කිරීමට යෙහෝරම්
රජ තම සියලු අශ්ව රථ රැගෙන
ෂායීර් ප්‍රදේශයට ගියේය. ඒදොම්ව-
රුන් ඔහුවත් ඔහුගේ අශ්ව රථ භාරව
සිටි අධිපතීන්වත් වට කරගැනීමට
සමත් වුවත් රාත්‍රියේදී ඔහු ඒදොම්ව-
රුන්ට පහර දුන්නේය. එවිට ඒදොම්-
වරු තම තමන්ගේ කූඩාරම්වලට
පලා ගියෝය. **22** එහෙත් ඒදොම්-
වරු, යූදාහි රජුට විරුද්ධව දියත් කළ
කැරැල්ල අද දක්වාම නොනවත්වා
පවත්වාගෙන ගොස් ඇත. ඒදොම්ව-
රුන් කැරලිගැසීමට පටන්ගත් කාල-
යේදීම ලිබ්නා නුවරේ[10] වැසියෝද
කැරැල්ලක් දියත් කළෝය.
**23** යෙහෝරම්ගේ ජීවිතයේ අනි-
කුත් සිදුවීම්ද ඔහු කළ දේවල්ද
යූදාහි රජවරුන්ගේ ඉතිහාසය වාර්තා
කර ඇති ලියවිල්ලෙහි සඳහන් කර
තිබේ.[11] **24** අවසානයේදී යෙහෝ-
රම් රජු මිය ගිය අතර ඔහුගේ
මුතුන්මිත්තන් මෙන් ඔහුවද තැන්-
පත් කරන ලදි.[12] ඔහුව දාවිත්ගේ නුව-
රෙහි තැන්පත් කරන ලදි.[13] ඔහුගෙන්
පසුව ඔහුගේ පුත් අහසියා[1] රජකමට
පත් විය.
**25** ඊශ්‍රායෙල්හි රජු වූ ආහබ්ගේ
පුත් යෙහෝරම්ගේ දොළොස්වන අවු-
රුද්දේදී යූදාහි රජකම් කළ යෙ-
හෝරම්ගේ පුත් අහසියා රජකමට
පත් විය.[2] **26** අහසියා රජකමට පත්
වන විට ඔහුගේ වයස අවුරුදු විසි-
දෙකකි. ඔහු යෙරුසලමේ සිට අවුරුද්-
දක් පාලනය කළේය.[3] ඔහුගේ මවගේ
නම අතලියාය.[4] ඈ ඊශ්‍රායෙල්හි රජ-
කම් කළ ඔම්රීගේ මිනිපිරිය වූවාය.[5]
**27** අහසියා රජ ආහබ් රජුගේ පවුලේ
අය මෙන්[6] යෙහෝවා දෙවි පිළි-
කුල් කළ දේවල් කළේය.[7] ඔහුගේ
පියා ආහබ්ගේ පවුලට අයත් ස්ත්‍රියක
විවාහ කරගෙන සිටි නිසා ඔහු ක්‍රියා
කළෙත් ආහබ්ගේ පවුලේ අය ක්‍රියා
කළ ආකාරයටය.[8] **28** දිනක් අහ-
සියා රජ ආහබ්ගේ පුත් යෙහෝරම්
සමඟ සිරියාවේ රජු වන හසායෙල්ට
විරුද්ධව යුද්ධ කිරීමට[9] රාමොත්-
ගිලියද් නගරය[10] බලා ගියේය. එහෙත්
සිරියානු හමුදාව යෙහෝරම් රජුට
පහර දුන්නෝය.[11] **29** සිරියාවේ රජු
වන හසායෙල්ට විරුද්ධව යුද්ධ කරන
විට රාමාහිදී* තුවාල ලැබූ යෙහෝරම්
රජ[12] තම තුවාල සනීප කරගැනීමට
නැවත යෙෂ්‍රෙයෙල් නගරයට පැමිණි-
යේය.[13] යූදාහි රජු වූ යෙහෝරම්ගේ
පුත් අහසියාද[14] අසනීපයෙන් සිටි
ආහබ්ගේ පුත් යෙහෝරම් රජුව බැලී-
මට යෙෂ්‍රෙයෙල් බලා ගියේය.

**9** එලිෂා අනාගතවක්තෘවරුන්ගේ
පුත්‍රයෙකුව කැඳවා[15] මෙසේ
කීවේය. "දැන් ඉක්මනට සූදානම් වී*[16]
මේ තෙල් බඳුන රැගෙන[17] රාමොත්-
ගිලියද්[18] වෙත යන්න. **2** නිම්ෂිගේ
පුත්‍රයා වන යෙහෝෂාපාට්ගේ පුත්

---

**2රාජා 8:19*** 1රාජා 11:36හි පාදසටහන බලන්න.

**2රාජා 8:29*** රාමා ලෙස හඳුන්වන්නේ රාමොත්-ගිලියද් නගරයයි. **9:1*** 2රාජා 4:29හි පාදසටහන බලන්න.

---

**8 පරි.**
**1** 2ලේක 21:5
**2** 1රාජා 12:28; 1රාජා 16:32
**3** 2රාජා 8:26; 2ලේක 18:1; 2ලේක 21:6
**4** 1රාජා 16:33; 1රාජා 21:25; 2රාජා 21:3; 2ලේක 21:13
**5** 2සාමු 7:16; 2ලේක 21:7
**6** උත් 49:10
**7** 1රාජා 11:36; ගීතා 132:17; ලූක් 1:69; ක්‍රියා 15:16
**8** උත් 27:40; 2සාමු 8:14; 2රාජා 3:9; 2ලේක 21:8
**9** 2සාමු 8:14; 1රාජා 22:47
**10** යොෂු 21:13; 2රාජා 19:8; 2ලේක 21:10
**11** 1රාජා 14:29; 1රාජා 15:23; 2රාජා 15:6; 2රාජා 15:36
**12** 1රාජා 2:10; 1රාජා 11:43; 1රාජා 14:31; 2ලේක 21:19
**13** 2ලේක 21:20

**2 තීරුව**
**1** 1ලේක 3:11; 2ලේක 21:17
**2** 2රාජා 9:29; 2ලේක 22:1
**3** 2ලේක 22:2
**4** 2රාජා 8:18; 2රාජා 11:1; 2රාජා 11:13; 2රාජා 11:16
**5** 1රාජා 16:16; 1රාජා 16:23; 1රාජා 16:27; 2ලේක 22:2
**6** 1රාජා 16:33; 2ලේක 22:3
**7** 2රාජා 19:22
**8** 2රාජා 8:18; 2කොරි 6:14
**9** 2රාජා 9:15; 2ලේක 22:5
**10** යොෂු 21:38; 1රාජා 22:3
**11** 1රාජා 19:17
**12** 2රාජා 9:15
**13** යොෂු 19:18; 1රාජා 21:1; 2ලේක 22:6
**14** 2රාජා 9:16

**9 පරි.** **15** 2රාජා 4:1; 2රාජා 6:1; **16** 1රාජා 18:46; 2රාජා 4:29; ලූක් 12:35; **17** 1සාමු 10:1; **18** 2රාජා 8:28; 2ලේක 22:5.

යේහුව[1] ඔහුගේ සහෝදරයන් අතරින්
කැඳවන්න. ඔබ ඔහුව ඇතුල් කාමර-
යට රැගෙන ගොස්[2] **3** ඔහුගේ හිස
මත තෙල් වත් කර[3] මෙසේ පව-
සන්න. ‘“මම ඔබව ඊශ්‍රායෙල්හි රජු
ලෙස[4] අභිෂේක කරන්නෙමි”[5] කියා
යෙහෝවා දෙවි ඔබට පැවසුවා.’ එය
පැවසූ විගස එතැන තවදුරටත් නො-
රැඳී පිටත්ව එන්න.”

**4** එබැවින් අනාගතවක්තෘවරයා-
ගේ සේවකයා රාමොත්-ගිලියද් බලා
ගියේය. **5** නගරයට ඇතුල් වූ විට
ඔහු හමුදාපතීන් එහි එකට රැස්
වී සිටිනවා දුටුවේය. එවිට ඔහු,
“හමුදාපතිතුමනි, ඔබට පණිවිඩයක්
දෙන්න තිබෙනවා”[6] යයි කීවේය.
එවිට යේහු, “ඔබට ඒ පණිවිඩය
දෙන්න අවශ්‍ය අපෙන් කාටද” කියා
ඇසුවේය. ඔහුද, “හමුදාපතිතුමනි,
මම මේ පණිවිඩය ගෙනාවේ ඔබ-
ටයි” කියා කීවේය. **6** එවිට යේහු
එතැනින් නැඟිට ඔහු සමඟ නිවස
තුළට ගියේය. අනාගතවක්තෘවරයා-
ගේ සේවකයා, යේහුගේ හිස මත
තෙල් වත් කරමින් මෙසේ කීවේය.
“ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝවා
මෙසේ පැවසුවා. ‘අද යෙහෝවා දෙවි
වන මම ඔබව ඊශ්‍රායෙල්වරුන්ගේ
රජු ලෙස[7] අභිෂේක කරන්නෙමි.[8]
**7** ඔබේ ස්වාමියා වන ආහබ්ගේ පවුල
ඔබ සහමුලින්ම විනාශ කර දැමිය
යුතුයි. යෙහෝවා දෙවි වන මම යෙස-
බෙල්ට දඬුවම් කරන්නෙමි.[9] මාගේ
සේවකයන් වන අනාගතවක්තෘව-
රුන්ගෙත් මාගේ අන් සියලු සේවක-
යන්ගෙත් ලේ වැගිරවූ නිසා මම ඇයට
දඬුවම් කරන්නෙමි.[10] **8** ආහබ්ගේ
මුළු පවුලම විනාශ කළ යුතුයි. ආහබ්-
ගේ පවුලට අයිති ලොකු කුඩා සිය-
ලුම පුරුෂයන්ව[11] මම විනාශ කර
දමන්නෙමි.[12] වැදගැම්මකට නැති ඒ
පුරුෂයන්[13] එක් කෙනෙකුවත් මම
ඊශ්‍රායෙල් දේශයේ ඉතුරු නොකරන්-
නෙමි. **9** නෙබාත්ගේ පුත් යෙරො-
බොවම්ගේ පවුලටත්[14] අහියාගේ පුත්
බාෂාගේ පවුලටත්[15] සිදු වූ දේ මම
ආහබ්ගේ පවුලටත් සිදු කරන්නෙමි.
**10** යෙසබෙල්ගේ මළ සිරුර යෙෂ්‍රෙ-
යෙල්හි තිබෙන ඉඩමේදී බල්ලෝ කා
දමනු ඇත.[1] කිසිවෙක් ඇගේ මළ
සිරුර තැන්පත් කරන්නේ නැත.’”
එසේ කී පසු සේවකයා දොර ඇරගෙන
එතැනින් පලා ගියේය.[2]

**11** ඉන්පසු යේහු කාමරයෙන් පිට-
තට පැමිණ රජුගේ හමුදාවේ අනි-
කුත් නිලධාරීන් සිටි තැනට ආවේය.
ඔවුහුද, “ඇයි, කරදරයක්වත්ද?[3] අර
පිස්සු මිනිහා ඔබ ළඟට ආවේ ඇයි”[4]
කියා ඇසුවෝය. ඔහු ඔවුන්ට මෙසේ
කීවේය. “නැහැ. කලබල වෙන්න දෙ-
යක් නැහැ. ඔහු කියන්නේ කිසිම
තේරුමක් නැති කතා බව ඔබ දන්න-
වානේ.” **12** නමුත් ඔවුහු, “බොරු
කියන්න එපා. ඔහු කියූ දේ අපටත්
කියන්න” යයි කීවෝය. එවිට ඔහු
මෙසේ කීවේය. “‘මම ඔබව ඊශ්‍රායෙල්-
වරුන්ගේ රජු ලෙස අභිෂේක කරන්-
නෙමි’ කියා යෙහෝවා දෙවි පවසා
තිබෙනවා කියා ඔහු මට කිව්වා.”[5]
**13** එය ඇසූ වහාම ඔවුහු තම තමන්-
ගේ පිට වස්ත්‍ර ගලවා[6] පඩි පෙළ මත
එළුවෝය. ඉන්පසු ඔවුහු පඩි පෙළ
මත ඔහුව සිටුවා හොරණෑවක් පිඹ,[7]
“යේහු රජ වෙලා”[8] කියා කෑගැසු-
වෝය. **14** පසුව නිම්ෂිගේ පුත්‍රයා
වූ[9] යෙහෝෂාපාට්ගේ පුත් යේහු[10] යෙ-
හෝරම් රජුට විරුද්ධව කුමන්ත්‍රණ-
යක් දියත් කළේය.[11]

ඒ කාලයේදී යෙහෝරම් රජ මුළු
ඊශ්‍රායෙල් හමුදාවත් සමඟ රාමොත්-
ගිලියද්[12] වෙත පැමිණ සිරියාවේ රජු
වන හසායෙල්ට[13] විරුද්ධව යුද්ධයක්
දියත් කළේය. **15** එම සටනේදී ඔහු
තුවාල ලැබීය.[14] ඒවා සුව කරගැනීම
සඳහා ඔහු[15] යෙෂ්‍රෙයෙල් නුවරට[16]
ගියේය.

යේහු තමන් සමඟ සිටි අයට
මෙසේ කීවේය. “යෙෂ්‍රෙයෙල් නුවරේ
සිටින අය මේ කාරණය ගැන දැනගත
යුතු නැහැ. ඔබ මා කියන දේට එකඟ
නම්[17] කාටවත් නුවරින් පිටතට ගිහින්
එය දැනුම් දෙන්න ඉඩ තියන්න එපා.”

**9 පරි.**
1 1රාජා 19:17
2 1රාජා 20:30; 1රාජා 22:25
3 නික් 29:7; 1රාජා 19:16
4 යෙරෙ 27:5; ආනි 2:21
5 2ලේක 22:7
6 විනි 3:19
7 1රාජා 16:2
8 1රාජා 19:16; 2ලේක 22:7
9 1රාජා 18:4; 1රාජා 19:2; 1රාජා 21:15; 1රාජා 21:25
10 ද්වි 32:35; ද්වි 32:43; ගීතා 94:1; ලූක් 18:7; රෝම 12:19; රෝම 13:4; හෙබ්‍රෙ 10:30
11 1රාජා 14:10
12 1රාජා 21:21
13 ද්වි 32:36; 1රාජා 21:21
14 1රාජා 15:29
15 1රාජා 16:11

**2 තීරුව**
1 1රාජා 21:23
2 2රාජා 9:3
3 2රාජා 4:26
4 1සාමු 21:14
5 2රාජා 9:6
6 මතෙ 21:7
7 2සාමු 15:10; 1රාජා 1:34
8 1රාජා 1:39
9 2රාජා 9:2
10 1රාජා 19:16
11 2රාජා 10:9
12 1රාජා 22:3; 2රාජා 8:28
13 1රාජා 19:15; 2රාජා 8:15; 2රාජා 10:32
14 2ලේක 22:6
15 2රාජා 8:29
16 යොෂු 19:18; 1රාජා 21:1
17 හිතෝ 20:18

**16** යෙහෝරම් රජ තුවාල වී සිටි නිසා
යෙෂ්‍රෙයෙල්හි විවේක ගනිමින් සිටි-
යේය. එබැවින් යේහු අශ්ව රථයකට
නැඟී යෙෂ්‍රෙයෙල් බලා ගියේය. ඒ වන
විට යූදාහි රජු වූ අහසියාද[1] යෙ-
හෝරම්ව බැලීමට එතැනට පැමිණ
සිටියේය. **17** යෙෂ්‍රෙයෙල් නගරයේ[2]
මුරපළ ඇතුළේ[3] සිටි මුරකරුවා[4] යේ-
හුගේ විශාල සේනාව පැමිණෙනවා
දැක, "විශාල සේනාවක් මේ පැත්තට
එනවා" කියා කෑගැසුවේය. එවිට යෙ-
හෝරම් රජ මෙසේ කීවේය. "අසරු-
වෙක්ව ඔවුන් වෙතට යවා, 'ඔබ මෙහි
එන්නේ මොන අරමුණකින්ද' කියා
ඔවුන්ගෙන් අසන්න."[5] **18** එබැවින්
අසරුවෙක් ඔහුව හමු වීමට ගොස්,
"'ඔබ මෙහි එන්නේ මොන අරමු-
ණකින්ද' කියා රජතුමා අසනවා" යයි
ඔහුට කීවේය. නමුත් යේහු, "මං එන්-
නේ මොන අරමුණකින්ද කියන එක
ඔබට වැඩක් නැහැ.[6] දැන් ඔබත් මගේ
හමුදාවට එකතු වෙන්න" යයි කීවේය.
එවිට මුරකරු[7] මෙසේ දැනුම් දුන්-
නේය. "අපි යැවූ පණිවිඩකරු සේනාව
ළඟටම ගියා. නමුත් ඔහු ආයෙත්
එන පාටක් නම් පේන්න නැහැ."
**19** එබැවින් යෙහෝරම් රජ දෙවන
වරටත් අසරුවෙකු යැව්වේය. ඔහුද
ඔවුන් හමු වී, "'ඔබ මෙහි එන්නේ
මොන අරමුණකින්ද' කියා රජතුමා අස-
නවා" යයි කීවේය. නමුත් යේහු, "මං
එන්නේ මොන අරමුණකින්ද කියන එක
ඔබට වැඩක් නැහැ.[8] දැන් ඔබත් මගේ
හමුදාවට එකතු වෙන්න" යයි කීවේය.
**20** එවිට මුරකරු, "ඒ පණිවිඩක-
රුත් සේනාව ළඟට ගියා. නමුත්
ඔහුත් එන පාටක් පේන්න නැහැ"
කියා කීවේය. එමෙන්ම ඔහු මෙසේද
දැනුම් දුන්නේය. "අර එන්නේ නිම්ෂි-
ගේ මුනුපුරා වන[9] යේහු[10] කියා අශ්ව
රථය පදවාගෙන එන විදිහෙන් මට
කියන්න පුළුවන්. ඔහු අශ්ව රථය පද-
වන්නේ හරිම වේගයෙන්."[11] **21** එය
ඇසූ යෙහෝරම් රජ, "අශ්ව රථය සූදා-
නම් කරන්න"[12] යයි කීවේය. ඔවුහු
ඔහුගේ අශ්ව රථය සූදානම් කළෝය.
එවිට ඊශ්‍රායෙල්හි රජු වන යෙහෝරම්ද
යූදාහි රජු වන අහසියාද[1] තම තමා-
ගේ අශ්ව රථවලට නැඟ පිටත්ව
ගියෝය. යේහු, යෙෂ්‍රෙයෙල් නගරයේ
වැසියෙකු වූ නාබොත්ට[2] අයිතිව තිබූ
ඉඩමේ සිටිනවා ඔවුහු දුටුවෝය.
**22** යෙහෝරම් රජ යේහුව හමු
වූ විගස, "යේහු, ඔබ අපේ මිත්‍ර-
යෙක් නේද" කියා ඇසුවේය. නමුත්
යේහු මෙසේ කීවේය. "ඔබේ මව වන
යෙසබෙල් මේ තරම් වේශ්‍යාකම්[3]
හා මන්ත්‍ර ගුරුකම්[4] කරද්දී මම
කොහොමද ඔබ සමඟ මිතුරුකම්
පවත්වන්නේ?"[5] **23** යෙහෝරම් රජ
එය ඇසූ වහාම, "අහසියා, මොහු
ඇවිත් තිබෙන්නේ අපිව අල්ලගන්-
නයි"[6] කියමින් අශ්ව රථය හරවා-
ගෙන පලා ගියේය. **24** නමුත් යේහු
දුන්න ගෙන[7] යෙහෝරම්ගේ පිටට
ඊතලයක් විද්දේය. ඒ ඊතලය ඔහුගේ
හදවත පසාරු කරගෙන අනික් පැත්-
තෙන් මතු විය. ඔහු තම රථය තුළම
වැටී මිය ගියේය.[8] **25** එවිට යේහු
තමාගේ සහයට සිටි නිලධාරියා[9]
වන බිද්කර්ට මෙසේ කීවේය. "ඔහුව
රථයෙන් ගෙන නාබොත්ගේ ඉඩ-
මට වීසි කරන්න.[10] අපි ඔහුගේ
පියා වූ ආහබ්ගේ පිටුපසින් අශ්ව
රථ පදවාගෙන ගිය අවස්ථාවේදී
යෙහෝවා දෙවි ඔහුට නියම කළ
දඬුවම ඔබට මතකද?[11] **26** 'යෙ-
හෝවා දෙවි ඔහුට මෙසේ පැවසුවා.
"ඊයේ ඔබ නාබොත්වත්[12] ඔහුගේ
පුත්‍රයන්වත්[13] මරා දැමූ ආකාරය මම
දුටුවෙමි." ඒ විතරක් නෙවෙයි, "ඔබ
කළ වරදට මම අනිවාර්යයෙන්ම
ඔබට දඬුවම් කරන්නෙමි.[14] ඒ දඬුවම
මෙම ඉඩමේදීම ඔබ අද්දකින්නෙහිය"
කියාත් යෙහෝවා දෙවි එදා පැව-
සුවා.' යෙහෝවා දෙවි දුන් විනිශ්ච-
යට අනුව දැන් ඔහුගේ මළ සිරුර මේ
ඉඩමට වීසි කරන්න."[15]
**27** යූදාහි රජු වන අහසියා[16] සිදු වූ
දේ දැක එහි තිබූ විශාල උයනක්*[17]

**9 පරි.**
**1** 2ලේක 22:7
**2** 1රාජා 21:1
**3** 2ලේක 14:7
**4** යෙසා 21:6, යෙසා 62:6, එස 33:2
**5** 1සාමු 16:4, 1රාජා 2:13
**6** යෙසා 48:22, රෝම 3:17
**7** 2සාමු 18:24, 2සාමු 18:26
**8** යෙසා 57:21
**9** 2රාජා 9:2
**10** 1රාජා 19:16
**11** සෙක 12:4
**12** මීකා 1:13

**2 තීරුව**
**1** 2රාජා 8:25, 2රාජා 8:29, 2ලේක 22:7
**2** 1රාජා 21:1, 1රාජා 21:15, 1රාජා 21:19
**3** 1රාජා 16:31, 1රාජා 18:4, 1රාජා 19:2, 1රාජා 21:7, එළි 9:21
**4** ලෙවී 20:6, ද්වි 18:10, 1රාජා 18:19, මලා 3:5
**5** යෙසා 48:22, යෙසා 57:21, යෙසා 59:8, යෙරෙ 16:5, රෝම 3:17
**6** 2රාජා 11:14
**7** ගීතා 7:12
**8** 1ලේක 28:9, ගීතා 50:22, දේශ 8:13
**9** 2රාජා 7:17
**10** 2රාජා 9:21
**11** 1රාජා 21:29, 1ලේක 16:12
**12** උත් 4:10, ගීතා 9:12, ගීතා 72:14, යෙසා 26:21
**13** 2ලේක 24:25, 2ලේක 25:4
**14** උත් 9:5, නික් 20:5, ලෙවී 24:17, ද්වි 5:9
**15** 1රාජා 21:24
**16** 2රාජා 8:29, 2ලේක 22:7
**17** 1රාජා 21:2

**2රාජා 9:27*** මූ.අ., "උයන් ගෙයි."

අසල තිබුණු පාරෙන් පලා ගියේය.
නමුත් පසුව යේහු ඔහු පසුපස ලුහුබැඳ
ගොස්, "මොහුවත් මරා දමන්න" යයි
තම පිරිසට කීවේය. ඔවුහුද ඔහුගේ
අණට කීකරු වී අහසියා රජු ඉබ්ලෙ-
යාම් නුවර[1] අසල පිහිටි ගුර් වෙත තම
අශ්ව රථය පදවාගෙන යන විට
ඔහුට පහර දී බරපතළ ලෙස තුවාල
කළෝය. අහසියා රජු මෙගිද්දෝ[2]
දක්වා පලා ගියත් එහිදී ඔහු මිය
ගියේය.[3] **28** එවිට ඔහුගේ සේවක-
යෝ ඔහුගේ මළ සිරුර අශ්ව රථයක
දමා යෙරුසලමට ගෙනැවිත් ඔහුගේ
මුතුන්මිත්තන් මෙන් ඔහුවද දාවිත්-
ගේ නුවරෙහි තැන්පත් කළෝය.[4]
**29** අහසියා[5] යූදාහි රජකමට පත්
වූයේ ආහබ්ගේ පුත් යෙහෝරම් රජු
පාලනය කළ එකොළොස්වන අවු-
රුද්දේදීය.[6]

**30** පසුව යේහු, යෙෂ්‍රෙයෙල් නුව-
රට[7] පැමිණියේය. යෙසබෙල්ට[8] මේ
ගැන ආරංචි වූ විට ඇ තම දෙනෙත්
වටා කලු අඳුන් ආලේප කොට,[9]
හිසකෙස් ලස්සනට සකසාගෙන[10]
ජනේලය ළඟට වී බලා සිටියාය.[11]
**31** යේහු දොරටුවෙන් ඇතුල් වූ විට
ඇ මෙසේ ඇසුවාය. "සිම්රී ඔහුගේ
ස්වාමියාව මරා දැමූ පසු ඔහුට සිදු
වූ දේ ඔබට අමතකද?"[12] **32** එවිට
යේහු ජනේලය දෙස බලා, "මට සහය
දක්වන්නේ කවුද"[13] කියා ඇසුවේය.
එවිට එහි සිටි නිලධාරීහු දෙතුන්-
දෙනෙක්[14] ජනේලයෙන් ඔහු දෙස
බැලුවෝය. **33** "ඇයව ජනේලයෙන්
එළියට තල්ලු කරන්න"[15] කියා යේහු
ඔවුන්ට කීවේය. ඔවුහු ඇයව ඔසවා
ජනේලයෙන් එළියට අතහැරියෝය.
ඇගේ ලේ බිත්තිය දිගේත් අශ්ව-
යන් පිටත් වීසි විය. එවිට යේහුගේ
අශ්වයෝ ඇයව පාගා දැමුවෝය.[16]
**34** යේහු මාලිගාවට ඇතුල් වී කා බී
අවසන් වූ පසු, "ඇය ශාප ලත්
තැනැත්තියක්[17] වුණත් ඇය රජෙකු-
ගේ දුවක්.[18] ඒ නිසා දැන් ගිහින්
ඇයව තැන්පත් කරන්න" යයි කීවේය.
**35** නමුත් ඔවුන් ඇගේ මළ සිරුර තිබූ
ස්ථානයට ගිය විට ඇගේ හිස්කබලත්
පාදත් අත් දෙකත් හැර වෙන කිසිවක්
ඔවුන්ට සම්බ නොවීය.[1] **36** ඔවුන්
ආපසු පැමිණ ඒ ගැන යේහුට දැන්වූ
විට යේහු මෙසේ කීවේය. "යෙහෝවා
දෙවි තිෂ්බේ ගමේ වැසියෙක් වූ
එලියා මාර්ගයෙන් පැවසූ දේ ඉටු වී
තිබෙනවා.[2] දෙවි මෙසේ පැවසුවා.
'යෙෂ්‍රෙයෙල්හි තිබෙන ඉඩමේදී යෙස-
බෙල්ගේ මළ සිරුර බල්ලෝ කා
දමනු ඇත.[3] **37** "මේ යෙසබෙල්"
කියා කියන්නවත් බැරි වන ලෙ-
සින්[4] යෙසබෙල්ගේ මළ සිරුර යෙ-
ෂ්‍රෙයෙල්හි තිබෙන ඉඩමේ කුණු වී
පොහොර මෙන් වනු ඇත.' "[5]

**10** ආහබ් රජුගේ පුත්‍රයන් හැත්-
තෑදෙනෙක්[6] සමාරියේ[7] සිටි-
යෝය. යේහු ලිපි ලියා, ඒවා සමාරියේ
සිටි යෙෂ්‍රෙයෙල් නුවරෙහි අධිපතීන්-
ටත්[8] වැඩිමහල්ලන්ටත්[9] ආහබ්ගේ
පුත්‍රයන්ගේ භාරකරුවන්ටත් යැවීය.
එම ලිපිවල මෙසේ සඳහන්ව තිබිණ.
**2** "ඔබේ ස්වාමියාගේ පුත්‍රයන් ඔබ
ළඟ සිටින නිසාත් අශ්ව රථ හා අශ්ව-
යන්ද[10] පවුරෙන් වට වූ සුරක්ෂිත නුව-
රක්ද යුධායුධද ඔබට භාරව තිබෙන
නිසාත් මේ ලිපිය ලැබුණු වහාම
**3** ඔබේ ස්වාමියාගේ පුත්‍රයන්ගෙන්
හොඳම සහ සුදුසුම තැනැත්තාව
තෝරා ඔහුගේ පියාගේ රජකම ඔහුට
භාර දෙන්න.[11] ඉන්පසු ඔබේ ස්වාමි-
යාගේ පෙළපත වෙනුවෙන් සටන්
කරන්න."

**4** නමුත් ඔවුහු බොහෝ සෙයින්
භය වී තම තමන් අතරේ මෙසේ කියා-
ගත්තෝය. "යේහුට විරුද්ධ වෙන්න
රජවරුන් දෙන්නෙකුටත්[12] බැරි වුණා
නම් අපි කොහොමද ඔහුට විරුද්ධ
වෙන්නේ?"[13] **5** ඉන්පසු මාලිගාව
භාරව සිටි තැනැත්තාද නුවරෙහි
ආණ්ඩුකාරයාද වැඩිමහල්ලෝද පුත්‍ර-
යන්ගේ භාරකරුවෝද[14] මෙම පණිවි-
ඩය යේහුට යැව්වෝය. "අපි ඔබේ
සේවකයෝ. ඔබ අපට කියන
ඕනෑම දෙයක් කරන්න අපි සූදානම්.
නමුත් අපි රජකමට කිසිවෙකුව පත්

**9 පරි.**
1 යොෂු 17:11
විනි 1:27
2 1රාජා 9:15
3 2ලේක 22:7
4 2සාමු 5:7
5 2රාජා 8:24
2ලේක 22:2
6 2රාජා 8:25
7 1රාජා 21:1
8 1රාජා 16:31
1රාජා 21:25
9 යෙරෙ 4:30
එස 23:40
10 යෙසා 3:18
1පේත 3:3
11 හිතෝ 7:6
12 1රාජා 16:16
1රාජා 16:18
13 නික් 32:26
1ලේක 12:18
ගීතා 94:16
14 උත් 37:36
1සාමු 8:15
2රාජා 8:6
එස්ත 1:10
15 යෝබ් 31:3
16 2රාජා 7:20
යෙසා 25:10
මලා 4:3
රෝම 16:20
17 ද්වි 27:15
ද්වි 27:25
1රාජා 21:25
ගීතා 119:21
18 1රාජා 16:31

**2 තීරුව**
1 2රාජා 9:10
යෙසා 14:20
යෙරෙ 22:19
2 යෙසා 44:26
යෙසා 55:11
3 1රාජා 21:23
4 හිතෝ 10:7
5 ගීතා 83:10
යෙරෙ 8:2
යෙරෙ 16:4

**10 පරි.**
6 විනි 8:30
විනි 12:14
7 1රාජා 16:29
8 ද්වි 16:18
9 1රාජා 21:8
10 හිතෝ 21:31
11 2රාජා 10:1
12 2රාජා 9:24
2රාජා 9:27
13 ලූක් 14:31
14 2රාජා 10:1

කරන්නේ නැහැ. ඔබට හොඳයි කියා
හිතෙන දෙයක් කරන්න.”
**6** එවිට යේහු මෙසේ සඳහන් කර-
මින් නැවත ඔවුන්ට ලිපියක් යැව්-
වේය. “ඔබ මට පක්ෂව සිට[1] මම
කියන දේට කීකරු වෙනවා නම් ඔබේ
ස්වාමියාගේ පුත්‍රයන්ගේ හිස් ගසා
දමා,[2] හෙට මේ වේලාවට ඔවුන්ගේ
හිස් යෙෂ්‍රෙයෙල් නුවරට[3] රැගෙන
ඇවිත් මට භාර දෙන්න.”
ඒ වන විට රජුගේ පුත්‍රයන් හැත්-
තෑදෙනා සිටියේ තමන්ව ඇතිදැඩි
කළ නුවරේ කීර්තිමත් පුද්ගල-
යන් සමඟය. **7** මෙම ලිපිය ලැබුණු
වහාම ඔවුහු රජුගේ පුත්‍රයන්
හැත්තෑදෙනාගේ හිස් ගසා දමා,[4]
ඒවා කූඩවල දමා යෙෂ්‍රෙයෙල්හි සිටි
යේහු වෙතට යැව්වෝය. **8** එවිට
පණිවිඩකරුවෙක්[5] පැමිණ, “රජුගේ
පුත්‍රයන්ගේ හිස් ගෙනැවිත්”[6] කියා
යේහුට දැනුම් දුන්නේය. යේහු මෙසේ
කීවේය. “ඒවා රැගෙන ගොස් නුවර
දොරටුව අසල ගොඩවල් දෙකක් ගසා
උදේ වන තුරු තබන්න.”[7] **9** පසු-
වදා උදෑසන ඔහු පිටතට ගොස් ජන-
යාට මෙසේ කීවේය. “ඔබ සියලුදෙනා
ධර්මිෂ්ඨයි.[8] මගේ ස්වාමියාට විරුද්-
ධව කුමන්ත්‍රණය කර[9] ඔහුව මරා
දැමුවේ මමයි.[10] නමුත් මොවුන්ව
මරා දැමුවේ කවුද? **10** යෙහෝවා
දෙවි ආහබ් රජුගේ පවුලට විරුද්ධව
පැවසූ සෑම දෙයක්ම[11] ඉටු වෙන
බව අමතක කරන්න එපා. යෙ-
හෝවා දෙවි පැවසූ එක් දෙයක්-
වත් ඉටු නොවී තිබෙන්නේ නැහැ.[12]
යෙහෝවා දෙවි තම සේවකයා වූ
එලියා මාර්ගයෙන් පැවසූ දේ දැන්
ඉටු කර තිබෙනවා.”[13] **11** ඉන්පසු
යේහු, යෙෂ්‍රෙයෙල් නුවරෙහි ආහබ්
රජුගේ පවුලේ ඉතුරු වී සිටි සියල්-
ලන්වද ඔහුගේ කීර්තිමත් පුරුෂයන්[14]
හා ඔහුගේ මිත්‍රයන් සියලුදෙනාවද
ඔහුගේ පූජකයන්වද[15] මරා දැමුවේය.
ආහබ්ව කිට්ටුවෙන් ඇසුරු කළ කිසි-
වෙකුව යේහු ඉතුරු කළේ නැත.[16]
**12** ඉන්පසු ඔහු එතැනින් පිටත්ව
සමාරිය බලා ගියේය. ඔහු යන මඟෙහි
බැටළුවන්ගේ ලොම් කපන මඩුවක්
තිබිණ. **13** ඒ අසලදී යේහුට යූදාහි
රජු වූ අහසියාගේ[1] සහෝදරයන්ව
මුණගැසිණ.[2] “ඔබ කවුද” කියා ඔහු
ඔවුන්ගෙන් ඇසූ විට ඔවුහු මෙසේ පිළි-
තුරු දුන්නෝය. “අපි අහසියා රජුගේ
සහෝදරයෝ. අපි යන්නේ රජුගේ
පුත්‍රයන් හා මව් බිසවගේ පුත්‍රයන්
හොඳින් ඉන්නවද කියා බලන්නයි.”
**14** එවිට ඔහු, “මොවුන්ව අල්ල-
ගන්න”[3] කියා කෑගැසුවේය. ඔවුහු ඒ
හතළිස්දෙදෙනාව අල්ලාගෙන මඩුව
අසල තිබූ පොකුණ ළඟ ඔවුන්ව
මරා දැමුවෝය. ඔවුන්ගෙන් කිසිවෙ-
කුව ඉතුරු කළේ නැත.[4]
**15** යේහු එතැනින් පිටත්ව යන
විට ඔහුව හමු වීමට පැමිණෙන රේ-
කාබ්ගේ පුත්[5] යෙහොනාදාබ්ව[6] ඔහුට
මුණගැසිණ. යේහු, යෙහොනාදාබ්ට
ආචාර කර ඔහුට ආශීර්වාද කළ පසු,[7]
“මට ඔබව විශ්වාසයි. ඔබත් මුළු හද-
වතින්ම මාව විශ්වාස කර මට පක්ෂව
කටයුතු කරනවාද”[8] කියා ඔහුගෙන්
ඇසුවේය.
යෙහොනාදාබ්ද, “ඔව්” කියා පිළි-
තුරු දුන්නේය.
“එසේනම් මට ඔබේ අත දෙන්න.”
යෙහොනාදාබ් තම අත ඔහු වෙත
දිගු කළේය. ඉන්පසු යේහු තම
අශ්ව රථයට ඔහුව නංවාගත්තේය.[9]
**16** යේහු ඔහුට මෙසේ කීවේය. “දැන්
ඔබ මා සමඟ එන්න. යෙහෝවා දෙ-
විට විරුද්ධව කරන මේ ද්‍රෝහිකම්ව-
ලට මම තවදුරටත් ඉඩ දෙන්නේ
නැහැ.[10] මම දැන් කරන්න යන දේ
ඔබට බලාගන්න පුළුවන්.” මෙසේ
යෙහොනාදාබ්ව යේහුගේ යුධ රථ-
යේ ගෙන යනු ලැබුවේය. **17** යේහු
සමාරියට පැමිණ ආහබ් රජුගේ පවු-
ලේ ඉතුරු වී සිටි නෑදෑ හිතවතුන්
සියලුදෙනාට පහර දී මරා දැමුවේය.[11]
යෙහෝවා දෙවි එලියා මාර්ගයෙන්
පවසා තිබූ දේ මෙසේ ඉටු විය.[12]
**18** පසුව යේහු, සමාරියේ සියලු
වැසියන්ව රැස් කර ඔවුන්ට මෙසේ

**10 පරි.**
1 2රාජා 9:32
2 ද්වි 5:9; යෝබ් 21:19; යෙසා 14:21; එළි 2:23
3 2රාජා 9:30
4 විනි 9:5; 1රාජා 21:21; ගීතා 109:13
5 2සාමු 4:10; 2සාමු 11:19
6 2සාමු 20:22
7 ද්වි 21:23
8 1සාමු 24:17
9 2රාජා 9:14
10 2රාජා 9:24
11 1රාජා 21:24
12 1සාමු 15:29; යෙසා 14:27; යෙසා 44:26; යෙසා 55:11
13 1රාජා 21:19; 1රාජා 21:22; 2රාජා 9:7; 2රාජා 9:36
14 ගීතා 125:5; හිතෝ 13:20
15 1රාජා 18:19; 1රාජා 22:6; 2රාජා 23:20
16 1රාජා 21:21

**2 තීරුව**
1 2රාජා 8:29; 2රාජා 9:21; 2ලේක 22:1
2 2ලේක 22:8
3 1රාජා 20:18
4 2ලේක 22:8
5 1ලේක 2:55
6 යෙරෙ 35:6; යෙරෙ 35:19
7 උත් 47:7; ගණන් 6:23; රූත් 2:4; රෝම 12:14
8 1ලේක 12:17; හිතෝ 17:17
9 සෙක 8:23
10 ගණන් 25:11; 1රාජා 19:10
11 2රාජා 9:8; 2ලේක 22:7; ගීතා 58:10
12 1රාජා 21:21; 2රාජා 9:26; ගීතා 9:16

කීවේය. “ආහබ් රජු යම් දුරකට
බාල්ට නමස්කාර කළා.[1] නමුත්
යේහු ඊට වඩා වැඩියෙන්
බාල්ට නමස්කාර කිරීමටයි සූදා-
නම් වෙන්නේ. **19** එබැවින් බාල්ට
සේවය කරන අනාගතවක්තෘවරුන්-
වද[2] ඔහුට නමස්කාර කරන අයවද[3]
ඔහුගේ පූජකයන්වද[4] මා වෙතට
කැඳවන්න. එක් කෙනෙක් නැර
සියල්ලන්ව මා වෙතට කැඳවන්න.
මම බාල්ට මහා පූජාවක් ඔප්පු
කරන්නයි යන්නේ. පූජාවට නොඑන
කිසිවෙකුට තවදුරටත් ජීවත් වෙන්න
ලැබෙන්නේ නැහැ.” එහෙත් යේහු ඒ
දේ පැවසුවේ බාල්ට නමස්කාර කරන
සියලුදෙනාව විනාශ කර දැමීමට
ඔහුට අවශ්‍ය වූ නිසාය.[5]
**20** යේහු තවදුරටත් මෙසේ
කීවේය. “බාල්ට නමස්කාර කිරීම
සඳහා විශේෂ රැස්වීමක් සූදානම්
කර සියලුදෙනාටම ඒ ගැන දැනුම්
දෙන්න.” එබැවින් ඔවුහු ඒ ගැන දැනුම්
දුන්නෝය. **21** ඉන්පසු යේහු ඊශ්‍රා-
යෙල් දේශය පුරාම[6] පණිවිඩ යවා
බාල්ට නමස්කාර කරන සියලුදෙනාව
කැඳවාගත්තේය. එක් කෙනෙක් නැර
සියලුදෙනා බාල්ගේ දේවාලයට පැමි-
ණියෝය.[7] බාල්ගේ දේවාලය අතුරු
සිදුරු නැතුව පිරී ගියේය. **22** එවිට
යේහු, වස්ත්‍ර තබා තිබූ කාමරය භාරව
සිටි තැනැත්තා අමතා, “ගිහින් බාල්ට
නමස්කාර කරන සියලුදෙනාට විශේෂ
වස්ත්‍ර ගෙනැවිත් දෙන්න” යයි කීවේය.
එවිට ඔහු ඔවුන්ට ඒ වස්ත්‍ර ගෙනැවිත්
දුන්නේය. **23** පසුව යේහු, රේකාබ්-
ගේ පුත් යෙහොනාදාබ්[8] සමඟ බාල්ගේ
දේවාලයට ඇතුල් වී බාල්ට නමස්කාර
කරන අයට මෙසේ කීවේය. “යෙ-
හෝවා දෙවිට නමස්කාර කරන එක්
කෙනෙක් හෝ ඔබ අතරේ සිටිනවාද
කියා හොඳින් පරීක්ෂා කර බලන්න.
මෙහි සිටිය යුත්තේ බාල්ට නමස්කාර
කරන අය පමණයි.”[9] **24** පසුව ඔවුහු
බාල්ට පූජා ඔප්පු කිරීමට සූදානම් වූහ.
යේහු, මිනිසුන් අසූදෙනෙකුව දේවාල-
යෙන් පිටත සිටුවා, “මෙහි සිටින සිය-
ලුදෙනාවම ඔබ මරා දැමිය යුතුයි. එක්
කෙනෙක්ටවත් බේරී යන්න ඔබ ඉඩ
දුන්නොත් ඒ වෙනුවට ඔබෙන් කෙ-
නෙක්ව මම මරා දමනවා”[1] යයි
කීවේය.

**25** දවන පූජාව ඔප්පු කර අවසන්
වූ විගස, යේහු පණිවිඩකරුවන්ටද
තමන්ගේ සහයට සිටි නිලධාරීන්ටද[2]
මෙසේ කීවේය. “ඉක්මනට ඇවිත්
මොවුන්ව මරා දමන්න! එක් කෙ-
නෙක්ටවත් මෙතනින් බේරී යන්න
ඉඩ දෙන්න එපා.”[3] එවිට ඔවුහු ඒ සිය-
ලුදෙනාටම කඩුවෙන් පහර දී ඔවුන්ව
එළියට ඇද දැමුවෝය. පසුව ඔවුහු
බාල්ගේ දේවාලයේ ඇතුල් මළුව-
ටම* ගොස් **26** නමස්කාරය සඳහා
එහි ඉදි කර තිබුණු කණු ගලවා[4]
පිටතට ගෙනැවිත් පුලුස්සා දැමු-
වෝය.[5] **27** ඉන්පසු ඔවුහු බාල්ගේ
කණුවද කඩා දමා[6] ඒ දේවාලය
විනාශ කළෝය.[7] අද දක්වාම ඒ
ස්ථානය වැසිකිළියක් ලෙස භාවිත
කෙරේ.[8]

**28** මෙසේ යේහු, ඊශ්‍රායෙල් දේශ-
යෙන් බාල් නමස්කාරය සම්පූර්ණ-
යෙන්ම තුරන් කළේය. **29** එහෙත්
බෙතෙල් සහ දාන් නුවරෙහි රන්
වස්සන් තබා,[9] ඊශ්‍රායෙල්වරුන්වත්
පාපයට පොලඹවමින්[10] නෙබාත්ගේ
පුත් යෙරොබෝවම් කළ පාපවලින්[11]
වැළකී සිටීමට යේහු අසමත් විය.
යේහුද එම රන් වස්සන්ට නමස්-
කාර කළේය.[12] **30** යෙහෝවා දෙවි
යේහුට මෙසේ කීවේය. “මා යහපත්-
යයි සලකන දේ ඔබ කළේය.[13]
මා ආහබ්ගේ පවුල සම්බන්ධයෙන්
පැවසූ සියල්ලත් ඔබ කළේය.[14] එබැ-
වින් ඔබෙන් පැවතෙන්නන් පරම්-
පරා හතරක් ඊශ්‍රායෙල්හි රජකම්
කරනු ඇත.”[15] **31** නමුත් යේහු,
ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝවා
දුන් නීතියට මුළු හදවතින්ම කීකරු
වීමට වගබලා ගත්තේ නැත.[16]

**10 පරි.**
**1** 1රාජා 16:32, 1රාජා 18:22, 1රාජා 18:40, 2රාජා 3:2
**2** 2රාජා 3:13
**3** 2රාජා 10:21
**4** 2රාජා 10:11
**5** හිතෝ 24:6, දේශ 9:12
**6** 1රාජා 11:35
**7** 1රාජා 16:32
**8** 2රාජා 10:15, යෙරෙ 35:6, යෙරෙ 35:19
**9** 1රාජා 18:22

**2 තීරුව**
**1** 1රාජා 20:39
**2** 2රාජා 7:17, 2රාජා 9:25
**3** නික් 32:27, ද්වි 13:6, ද්වි 13:8, එස 9:5
**4** ලෙවී 26:1, 1රාජා 14:23
**5** ද්වි 7:25, 2සාමු 5:21, 2රාජා 19:18
**6** ලෙවී 26:30, ද්වි 7:5
**7** 1රාජා 16:32
**8** එස්රා 6:11, දානි 2:5
**9** 1රාජා 12:29
**10** 1රාජා 14:16, 2රාජා 14:24
**11** 1රාජා 13:33
**12** 1රාජා 12:28, හොෂෙ 8:6
**13** එස 29:20
**14** 1රාජා 21:21
**15** 2රාජා 13:1, 2රාජා 13:10, 2රාජා 14:23, 2රාජා 15:8, 2රාජා 15:12, යෝබ් 34:11, හෙබ්‍රෙ 6:10
**16** ද්වි 10:12, 1රාජා 2:4, ගීතා 78:10, හිතෝ 4:23, හොෂෙ 1:4, හෙබ්‍රෙ 10:38

**2රාජා 10:25*** මූ.අ., “නුවර.” මෙය දේවාලය ඇතුළේ බලකොටුවක හැඩයට ඉදි කළ ස්ථානයක් විය හැක.

ඊශ්‍රායෙල්වරුන්ව පාපයට පෙලඹූ යෙ-
රොබොවම් රජු කළ පාපවලින් ඔහු
වැළකී සිටියේද නැත.[1]
**32** ඒ කාලයේදී ඊශ්‍රායෙල්වරුන්ගේ
දේශය ක්‍රමක්‍රමයෙන් අල්ලාගැනීමට
යෙහෝවා දෙවි හසායෙල්ට[2] ඉඩහැරි-
යේය. හසායෙල් ඊශ්‍රායෙල් දේශයේ
සියලු පළාත්වලට පහර දුන්නේය.
**33** යොර්දාන් ගඟට නැඟෙනහිරෙන්
පිහිටි මුළු ගිලියද් දේශයම[3] එනම්,
ගාද් ගෝත්‍රයට අයත් ප්‍රදේශයද[4]
රූබෙන් ගෝත්‍රයට අයත් ප්‍රදේශයද[5]
මනස්සේ ගෝත්‍රයට අයත් ප්‍රදේශයද[6]
ඔහු අල්ලාගත්තේය. ඔහු ආනොන්
නිම්නය අසල පිහිටි අරෝයේර් නගර-
යේ සිට[7] ගිලියද් දේශය දක්වාද
බාෂාන් දේශය දක්වාද[8] තිබූ සියලු
පළාත් අල්ලාගත්තේය.
**34** යේහු රජුගේ ජීවිතයේ අනිකුත්
සිදුවීම්ද ඔහු කළ දේවල්ද ඔහුගේ බල-
වත් ක්‍රියාද ඊශ්‍රායෙල් රජවරුන්ගේ
ඉතිහාසය වාර්තා කර ඇති ලියවිල්-
ලෙහි සඳහන් කර තිබේ.[9] **35** අව-
සානයේදී යේහු රජුද මිය ගිය අතර
ඔහුගේ මුතුන්මිත්තන් මෙන් ඔහුවද
තැන්පත් කරන ලදි.[10] ඔහුව තැන්පත්
කරන ලද්දේ සමාරියේය. ඔහුගෙන්
පසුව ඔහුගේ පුත් යෙහෝයහාෂ්[11] රජ-
කමට පත් විය. **36** යේහු රජ සමා-
රියේ සිට අවුරුදු විසිඅටක් පාලනය
කළේය.

**11** අහසියා රජුගේ[12] මව වූ අත-
ලියා[13] තම පුත්‍රයා මිය ගිය
බව දැනගත් වහාම රාජකීය පෙ-
ළපතට අයත් සියලුදෙනාවම මරා
දැමුවාය.[14] **2** නමුත් ඊට කලින් යෙ-
හෝරම් රජුගේ දියණියද අහසියා රජු-
ගේ සහෝදරියද වූ යෙහෝෂෙබා,[15]
මරණයට නියම වූ රජුගේ පුත්‍ර-
යන් සිටින ස්ථානයට ගොස් අහසියා-
ගේ පුත් යෙහෝයාෂ්ව[16] එතැනින්
රැගෙන ගියාය. ඇය දරුවාවත් ඔහුගේ
කිරි මවවත් අතලියාට සොයාගැනීමට
බැරි වන පිණිස යහන් සහිත ඇතුල්
කාමරයකට ගෙන ගොස් සඟවා තැබු-
වාය.[17] එබැවින් ඔහුගේ ජීවිතය බේරු-
ණේය. **3** දරුවා අවුරුදු හයක් පුරා
ඇය සමඟ යෙහෝවා දෙවිගේ ගෘහයේ
ඇනිදැඩි වූයේය. ඒ කාලයේදී අතලියා
දේශය පාලනය කරමින් සිටියාය.[1]
**4** හත්වන අවුරුද්දේදී යෙහෝ-
යාදා[2] පණිවිඩ යවා, කාරීය
ආරක්ෂක භටයන්ගේ[3] හා පණිවිඩ-
කරුවන්ගේ[4] ප්‍රධානීන්ට* යෙහෝවා
දෙවිගේ ගෘහයට පැමිණෙන ලෙස
ආරාධනා කළේය. ඔවුන් එතැනට
පැමිණි පසු යෙහෝයාදා, යෙහෝවා
දෙවිගේ ගෘහයේදීම ඔවුන් සමඟ
ගිවිසුමක් ඇති කරගෙන[5] ඔවුන්-
ගෙන් දිවුරුම් ගත්තේය.[6] පසුව ඔහු
රජුගේ පුත්‍රයාව ඔවුන්ට පෙන්වා
**5** ඔවුන්ට මෙසේ අණ කළේය. “ඔබ
කළ යුත්තේ මෙයයි. කණ්ඩායම්
තුනකට බෙදෙන්න. සබත් දවසේදී
එක කණ්ඩායමක් ඇවිත් රජමා-
ලිගාව[7] හොඳින් මුර කළ යුතුයි.
**6** තව කණ්ඩායමක් යෙසොද් දොර-
ටුවත්*[8] අනික් කණ්ඩායම පණිවි-
ඩකරුවන් සිටින ස්ථානය පිටුපස
තිබෙන දොරටුවත් මුර කළ යුතුයි.
මෙලෙස ඔබ එක් එක් කෙනා-
ගේ වාරය පැමිණෙන විට දේවමාලි-
ගාව[9] හොඳින් මුර කරන්න. **7** ඔබ
අතරේ සිටින කණ්ඩායම් දෙකකට
සබත් දවසේදී නිවාඩු ලැබෙනවා.
නමුත් ඔවුන්ද රජතුමා වෙනුවෙන්
යෙහෝවා දෙවිගේ ගෘහය මුර කළ
යුතුයි. **8** එකිනෙකා තම තමාගේ
ආයුධ අතට ගෙන රජතුමා වටා
සිටිය යුතුයි. කවුරු හෝ මුරකාවල්
කඩාගෙන ඇතුල් වෙන්න උත්සාහ
කළොත් ඔහුව මරා දැමිය යුතුයි.
රජතුමා යන එන විට ඔහු සමඟ
ගමන් කරන්න.”
**9** එම ප්‍රධානියෝ[10] පූජක යෙහෝ-
යාදා අණ කළ සියල්ල එලෙසම
කළෝය. ඒ එක් එක් කෙනා තමන්
යටතේ සේවය කළ අය අතරින් සබත්

**10 පරි.**
1 1රාජා 12:30; 1රාජා 13:34; 1රාජා 14:16
2 1රාජා 19:17; 2රාජා 8:12; 2රාජා 13:22; ආමො 1:4
3 ද්වි 3:15; යොෂු 22:9
4 ද්වි 3:16
5 ගණන් 32:33
6 ද්වි 3:13
7 යොෂු 13:9
8 ද්වි 28:63; යොෂු 13:12
9 1රාජා 14:19; 2රාජා 13:8
10 2සාමු 7:12
11 2රාජා 13:1; 2රාජා 13:7

**11 පරි.**
12 2රාජා 9:27; 2ලේක 22:1
13 2රාජා 8:26; 2රාජා 11:20; 2ලේක 21:6; 2ලේක 22:10; 2ලේක 24:7
14 2ලේක 21:4; රෝම 1:29
15 2ලේක 22:11
16 2රාජා 12:1
17 විනි 9:5; 2රාජා 8:19; ගීතා 27:5

**2 තීරුව**
1 2ලේක 22:12; ගීතා 12:8; යෙසා 3:12; මලා 3:15; 1තිමෝ 2:12
2 2රාජා 11:9; 2ලේක 23:1
3 2රාජා 11:15; 2රාජා 11:19
4 1සාමු 8:11; 1සාමු 22:17; 2සාමු 18:19; 1රාජා 14:27
5 1සාමු 18:3; 2රාජා 23:3; 2ලේක 15:12
6 ද්වි 6:13; යෙරෙ 12:16; හෙබ්‍රෙ 6:16
7 1රාජා 7:1
8 2ලේක 23:5
9 1රාජා 6:1
10 2රාජා 11:4

**2රාජා 11:4*** මූ.අ., “සියයකින් යුත් කණ්ඩා-
යම් කෙරෙහි පත් කර සිටි ප්‍රධානීන්.” **6*** යෙ-
සොද් නම් හෙබ්‍රෙව් වචනයෙහි අර්ථය, ‘අත්තිවා-
රම’ වේ.

දවසේදී සේවය සඳහා පැමිණි අය-
වත්[1] සබත් දවසේදී සේවයෙන් නිවාඩු
ලැබූ අයවත් රැගෙන පූජක යෙ-
හෝයාදාව හමු වීමට පැමිණියෝය.
**10** එවිට පූජකයා, යෙහෝවා දෙවි-
ගේ ගෘහයේ තිබුණු දාවිත් රජුගේ
සියලු හෙල්ලද පලිස්ද ගෙන ඒවා
එම ප්‍රධානීන්ට දුන්නේය.[2] **11** පණි-
විඩකරුවෝ[3] තම තමාගේ ආයුධ
අතට ගෙන දේවමාලිගාවේ දකුණු
පැත්තේ සිට වම් පැත්ත දක්වා
මුර කළෝය. ඔවුහු පූජාසනයත්[4]
දේවමාලිගාවත් අසල සිටි රජු වටා
සිටියෝය. **12** එවිට පූජක යෙහෝ-
යාදා, රජුගේ පුත්‍රයාව පිටතට ගෙ-
නැවිත්[5] ඔහුට ඔටුන්න පළඳවා[6]
ඔහුගේ හිසට ඉහළින් නීතිය සඳ-
හන් ලියවිල්ල[7] ඇල්ලුවේය. මෙසේ
ඔවුහු, ඔහුව රජු ලෙස[8] අභිෂේක
කළෝය.[9] ඔවුහු අත්පොළසන් ගස-
මින්[10] හඬ නඟා, “රජතුමා දිගු කල්
ජීවත් වේවා”[11] කියා කීවෝය.

**13** ඒ මේ අත දිව ගිය සෙනඟ-
ගේ ඝෝෂාව අතලියාට ඇසුණු විගස
ඈ යෙහෝවා දෙවිගේ ගෘහයේ රැස්ව
සිටි සෙනඟ වෙතට පැමිණියාය.[12]
**14** එවිට සිරිත් පරිදි රජතුමා කුලුන
ළඟ සිටගෙන[13] සිටින ආකාරයත්
ප්‍රධානීන් සහ හොරණෑ පිඹින්නන්[14]
රජුව වට කරගෙන සිටින ආකා-
රයත් ඇය දුටුවාය. දේශයේ සිටි
සියලු මිනිස්සු හොරණෑ ශබ්දය මැද
ප්‍රීති වෙමින් සිටියෝය.[15] එය දුටු
අතලියා[16] තම පිට වස්ත්‍ර ඉරාගනි-
මින්, “මෙය මහා කුමන්ත්‍රණයක්! මහා
කුමන්ත්‍රණයක්”[17] කියා කෑගැසුවාය.
**15** එවිට පූජක යෙහෝයාදා, යුධ සේ-
නාව භාරව සිටි ප්‍රධානීන්ට*[18] මෙසේ
අණ කළේය. “මුරකාවල් මැදට ඇවිත්
සිටින ඇයව පිටතට රැගෙන යන්න.
ඇයව බේරගන්න යමෙක් ආවොත්
ඔහුව කඩුවෙන් මරා දමන්න!”[19] මන්ද,
“යෙහෝවා දෙවිගේ ගෘහයේදී ඇයව
මරන්න එපා” කියා ඔහු කලින්ම පවසා
තිබිණ. **16** එබැවින් ඔවුහු ඇයව
අල්ලාගෙන රජමාලිගාවේ[1] අශ්ව දො-
රටුව අසලට[2] ගෙන ගොස් එතැනදී
ඇයව මරා දැමුවෝය.[3]

**17** පසුව රජු[4] ඇතුළු සෙනඟ හා
යෙහෝවා දෙවි අතර[5] ගිවිසු-
මක් ඇති කිරීමට යෙහෝයාදා පිය-
වර ගත්තේය.[6] එම ගිවිසුමට අනුව
සැමදා යෙහෝවා දෙවිට විශ්වාසවන්-
තව සිටීමට ඔවුහු පොරොන්දු වූහ.
රජු සහ සෙනඟ අතරත් ගිවිසුමක්
ඇති කිරීමට ඔහු පියවර ගත්තේය.[7]
**18** ඉන්පසු දේශයේ වැසියෝ සියලු-
දෙනා බාල්ගේ දේවාලයට ගොස් පූජා-
සන කඩා දමා[8] එහි තිබුණු බාල් රූප
සියල්ල සුනුවිසුනු කළෝය.[9] බාල්ගේ
පූජකයා වූ මත්තාන්වද[10] ඒ පූජාසන
ඉදිරිපිටම මරා දැමුවෝය.[11]

පසුව පූජකයා යෙහෝවා දෙවිගේ
ගෘහය බලාගැනීමට අධිපතීන්ව පත්
කළේය.[12] **19** ඔහු රජතුමාව යෙ-
හෝවා දෙවිගේ ගෘහයේ සිට රජමාලි-
ගාවට ගෙන ඒම සඳහා සියයකින්
යුත් කණ්ඩායම් කෙරෙහි පත් කර
සිටි අධිපතීන්වද කාරීය ආරක්-
ෂක භට පිරිසවද[13] පණිවිඩකරුවන්-
වද[14] දේශයේ සියලු වැසියන්වද රැස්
කළේය. ඉන්පසු ඔවුහු රජතුමාව
පණිවිඩකරුවන්ගේ දොරටුවෙන් රජ-
මාලිගාවට ගෙන ආවෝය.[15] රජ-
තුමා සිංහාසනයේ හිඳගත්තේය.[16]
**20** දේශයේ සියලුදෙනා මේ ගැන
සතුටු වූහ.[17] ඒ වන විට රජමාලිගාව
අසල අතලියාව මරා දමා තිබිණ.[18]
නගරය පුරාම සාමකාමී වාතාවරණ-
යක් පැවතිණ.

**21** යෙහෝයාෂ් රජකමට පත් වන
විට[19] ඔහුගේ වයස අවුරුදු හතකි.[20]

# 12

යේහුගේ[21] පාලන සමයේ
හත්වන අවුරුද්දේදී යෙහෝ-
යාෂ්[22] රජකමට පත් විය. ඔහු යෙ-
රුසලමේ සිට අවුරුදු හතළිහක්
පාලනය කළේය. ඔහුගේ මව

**11 පරි.**
**1** 2ලේක 23:8
**2** 2ලේක 23:9
**3** 1සාමු 8:11; 2සාමු 15:1; 1රාජා 14:27
**4** නික් 40:6; 1රාජා 8:22; 2ලේක 4:1
**5** 2රාජා 11:2; 2ලේක 23:11
**6** 2සාමු 1:10; ගීතා 132:18
**7** නික් 25:21; නික් 31:18
**8** 1රාජා 1:38
**9** නික් 30:23; 1රාජා 1:39
**10** 1රාජා 1:40; ගීතා 47:1
**11** 1රාජා 1:34; ගීතා 72:15; දේශ 10:17
**12** 2ලේක 23:12
**13** 2රාජා 23:3; 2ලේක 34:31
**14** 2ලේක 5:12
**15** 1රාජා 1:40; හිතෝ 29:2
**16** 2රාජා 11:1; 2රාජා 11:3
**17** 2ලේක 23:13
**18** 2රාජා 11:4; 2ලේක 23:9
**19** 2ලේක 23:14

**2 තීරුව**
**1** 1රාජා 7:1
**2** 2ලේක 23:15
**3** උත් 9:6; නික් 21:12; ලෙවී 24:17; ගණන් 35:30
**4** 1සාමු 10:25; 2සාමු 5:3
**5** ද්වි 5:3
**6** යොෂු 24:25
**7** 2ලේක 23:16
**8** ද්වි 12:3
**9** ද්වි 7:25
**10** 2ලේක 23:17
**11** ද්වි 13:5; ද්වි 13:9
**12** 2ලේක 23:18
**13** 2රාජා 11:4; 2රාජා 11:15
**14** 1රාජා 14:27
**15** 2ලේක 23:20
**16** 2සාමු 7:16; 1ලේක 29:23; යෙරෙ 17:25; යෙරෙ 22:4
**17** හිතෝ 11:10; හිතෝ 29:2
**18** 2ලේක 23:21
**19** 2ලේක 24:1
**20** 2රාජා 11:2

**12 පරි.** **21** 1රාජා 19:16; 2රාජා 10:30; **22** 2රාජා 11:2; 1ලේක 3:11; 2ලේක 24:1.

**2රාජා 11:15*** 2රාජා 11:4හි පාදසටහන බලන්න.

බෙයර්-ෂෙබාහි වාසය කළ ෂිබියාහ්ය.
**2** පූජක යෙහෝයාදාගෙන් උපදෙස්
ලැබුණු මුළු කාලය පුරාම යෙහෝයාෂ්
රජ යෙහෝවා දෙවි යහපත්යයි සල-
කන දේ කළේය.[1] **3** නමුත් දේශයේ
බොරු නමස්කාරය සඳහා වෙන් කර
තිබූ පූජනීය ස්ථාන ඉවත් කිරීමට ඔහු
අපොහොසත් විය.[2] එබැවින් ජනයාද
දිගටම ඒ පූජනීය ස්ථාන මත සුවඳ
දුම්ද වෙනත් පූජාද ඔප්පු කළෝය.

**4** දිනක් යෙහෝයාෂ් රජ පූජක-
යන්ට[3] මෙසේ කීවේය. “යෙහෝවා
දෙවිගේ ගෘහයට[4] පරිත්‍යාගයක් ලෙස
ගෙන එන මුදල්[5] එනම්, එක් එක් කෙ-
නාට ගෙවීමට නියම වූ මුදල්ද[6] භාර-
යක් වූ අයගෙන් ලැබෙන මුදල්ද[7]
එකිනෙකාගේ කැමැත්ත පරිදි යෙ-
හෝවා දෙවිගේ ගෘහයට සම්මාදම්
කරන මුදල්ද[8] **5** පූජකයන් ජනයා-
ගෙන් එකතු කරගත යුතුයි.[9] ඒ මුදල්
දේවමාලිගාව අලුත්වැඩියා කිරීම
සඳහා භාවිත කරන්න.”[10]

**6** එහෙත් යෙහෝයාෂ් රජුගේ
පාලන සමයේ විසිතුන් වන අවුරුද්ද
වන තුරුත් පූජකයෝ දේවමාලිගාව
අලුත්වැඩියා කර තිබුණේ නැත.[11]
**7** එබැවින් යෙහෝයාෂ් රජ, පූජක
යෙහෝයාදාව[12] සහ සෙසු පූජකයන්ව
කැඳවා ඔවුන්ට මෙසේ කීවේය. “ඔබ
දේවමාලිගාව අලුත්වැඩියා නොකළේ
මන්ද? ඔබ ජනයාගෙන් තවදුරටත්
මුදල් එකතු නොකරන්න. දැනටමත්
එකතු වී තිබෙන මුදල් දේවමාලිගාවේ
අලුත්වැඩියා කටයුතු කරන අයට
භාර දෙන්න.”[13] **8** එවිට පූජකයෝ
ජනයාගෙන් මුදල් එකතු කිරීමේ වග-
කීමද දේවමාලිගාව අලුත්වැඩියා කිරී-
මේ වගකීමද රජුට භාර දුන්නෝය.

**9** එබැවින් පූජක යෙහෝයාදා
පෙට්ටියක් ගෙන[14] එහි පියනේ සිදුරක්
සාදා යෙහෝවා දෙවිගේ ගෘහයට
පැමිණෙන අයට පෙනෙන සේ එය
පූජාසනයේ දකුණු පැත්තේ තැබු-
වේය. දොරටු පාලකයන්[15] ලෙස
සේවය කළ පූජකයෝ, යෙහෝවා දෙ-
විගේ ගෘහයට ගෙනෙන ලද මුදල්
සියල්ල එම පෙට්ටියට දැමුවෝය.[1]
**10** පෙට්ටියේ මුදල් පිරී තිබෙන බව
දැනගත් විට රජුගේ ලේකම්ද[2] උත්-
තම පූජකයාද යෙහෝවා දෙවිගේ
ගෘහයට පැමිණ එම මුදල් ගණන්
කර මලුවලට දැමුවෝය.[3] **11** ඉන්-
පසු ඔවුහු ගණන් කළ එම මුදල්
සියල්ල යෙහෝවා දෙවිගේ ගෘහයේ
වැඩකටයුතු බලා කියා ගැනීමට පත්
කර සිටි අයට භාර දුන්නෝය.[4] ඒ අය
එම මුදල්වලින් යෙහෝවා දෙවිගේ
ගෘහයේ වැඩ කළ වඩුවන්ට, ගොඩ-
නැඟිලි ඉදි කරන්නන්ට, **12** බිත්ති
බඳින්නන්ට හා ගල් කපන්නන්ට[5]
කුලී ගෙව්වෝය. යෙහෝවා දෙවි-
ගේ ගෘහය අලුත්වැඩියා කිරීම සඳහා
අවශ්‍ය දැව, ගල් සහ වෙනත් සියලු දේ
ගැනීමටද ඔවුහු එම මුදල් භාවිත
කළෝය.

**13** යෙහෝවා දෙවිගේ ගෘහයට
ගෙනෙන ලද මුදල්වලින් කිසිම රන්
භාණ්ඩයක් හෝ රිදී භාණ්ඩයක් සෑදු-
වේ නැත.[6] යෙහෝවා දෙවිගේ ගෘහ-
යට අවශ්‍ය රිදී භාජන, පහන් තිර
නිවා දමන උපකරණ,[7] බේසම්[8] සහ
හොරණෑ[9] සෑදීමට ඔවුහු එම මුදල්
භාවිත කළේ නැත. **14** ඔවුන් එම
මුදල් යෙහෝවා දෙවිගේ ගෘහයේ
වැඩකටයුතු බලා කියා ගැනීමට පත්
කර සිටි අයට දුන් නිසා එය භාවිත
කරනු ලැබුවේ ගෘහයේ අලුත්වැ-
ඩියා කිරීමේ කටයුතු සඳහා පමණි.[10]
**15** වැඩ කරන අයට මුදල් දීමට පත්
කරනු ලැබූ අය[11] මුදල් පරිහරණය
කළ ආකාරය ගැන ඔවුහු සොයා
බැලුවේ නැත.[12] මන්ද ඔවුහු අවංක
පුද්ගලයෝ වූහ.[13] **16** වන්දි පූජාව-
ලින්[14] සහ පාප පූජාවලින් ලැබුණු
මුදල් යෙහෝවා දෙවිගේ ගෘහය සඳහා
යෙදෙව්වේ නැත. එම මුදල් පූජක-
යන්ට දෙන ලදි.[15]

**17** ඒ කාලයේ සිරියාවේ රජු වූ
හසායෙල්,[16] ගාත් නුවරට විරුද්-
ධව යුද්ධ කර[17] එය අල්ලාගත්තේය.
පසුව ඔහු යෙරුසලමට විරුද්ධව[18]
යුද්ධ කිරීමට තීරණය කළේය.[19]

**12 පරි.**
1 2රාජා 14:3
2ලේක 24:2
2 ගණන් 33:52
යෙරෙ 2:20
3 නික් 28:1
2ලේක 35:2
4 1රාජා 7:51
5 1ලේක 18:11
2ලේක 31:12
6 නික් 30:13
2ලේක 24:9
7 ලෙවී 27:2
ලෙවී 27:12
8 නික් 25:2
නික් 35:21
නෙහෙ 10:39
2කොරි 9:11
9 ගණන් 18:8
ගණන් 18:28
10 2ලේක 24:7
11 2ලේක 24:5
රෝම 12:11
කොලො 3:23
12 2රාජා 11:4
2ලේක 23:1
2ලේක 24:15
13 2ලේක 24:6
14 2ලේක 24:8
මාක් 12:41
ලූක් 21:1
15 2රාජා 11:6
ගීතා 84:10

**2 තීරුව**
1 2ලේක 24:10
මතෙ 6:4
2කොරි 9:7
2 2සාමු 20:25
2රාජා 18:18
3 2ලේක 24:11
4 2රාජා 22:5
2ලේක 24:12
2ලේක 34:10
5 1රාජා 5:17
එස්රා 5:8
6 2ලේක 24:14
7 1රාජා 7:50
8 2ලේක 4:22
9 ගණන් 10:2
2ලේක 5:12
10 2ලේක 24:13
11 2ලේක 34:12
12 2රාජා 22:7
13 1කොරි 4:2
14 ලෙවී 5:15
ලෙවී 7:7
15 ගණන් 18:8
16 1රාජා 19:15
2රාජා 8:13
2රාජා 10:32
ආමො 1:4
17 1ලේක 18:1
18 2ලේක 24:23
19 යෙරෙ 42:15
ලූක් 9:51

**18** එබැවින් යූදාහි රජු වූ යෙහෝයාෂ්
තම පියා වන අහසියා විසින්ද තම
මුතුන්මිත්තන් වන යූදාහි රජකම්
කළ යෙහෝෂාපාට් සහ යෙහෝරම්
විසින්ද දේවමාලිගාවට කැප කළ
සියලු වස්තු[1] හා තමන් විසින් දේවමා-
ලිගාවට කැප කළ වස්තු එකතු කර-
ගත්තේය. යෙහෝවා දෙවිගේ ගෘහයේ
භාණ්ඩාගාරයේ හා රජමාලිගාවේ තිබූ
සියලු රන්ද ඔහු එකතු කරගත්තේය.
ඉන්පසු ඔහු ඒ සියල්ල සිරියාවේ රජු
වන හසායෙල්ට යැව්වේය.[2] එබැවින්
හසායෙල් රජ යෙරුසලමට විරුද්ධව
යුද්ධ නොකර හැරී ගියේය.

**19** යෙහෝයාෂ් රජුගේ ජීවිතයේ
අනිකුත් සිදුවීම් ගැනද ඔහු කළ
දේවල් ගැනද ඊශ්‍රායෙල් රජවරුන්-
ගේ ඉතිහාසය වාර්තා කර ඇති
ලියවිල්ලෙහි සඳහන් කර තිබේ.[3]
**20** අවසානයේදී ඔහුගේම සේවක-
යෝ[4] ඔහුට විරුද්ධව කුමන්ත්‍රණය
කර[5] නුවර සීමාවේ[6] පිහිටි බලකො-
ටුව අසල[7] සිල්ලා නමැති ස්ථානයට
යන මාර්ගයේදී ඔහුව මරා දැමුවෝය.
**21** ඔහුව මරා දැමුවේ ඔහුගේ සේවක-
යන් වූ ෂිමෙයාත්ගේ පුත් යෝෂාකාර්
සහ ෂෝමෙර්ගේ පුත් යෙහොෂාබාද්[8]
යන අයය. මෙසේ යෙහෝයාෂ් රජු
මිය ගිය අතර ඔහුගේ මුතුන්මිත්තන්
මෙන් ඔහුවද තැන්පත් කරන ලදි.
ඔහුව තැන්පත් කරන ලද්දේ දාවිත්-
ගේ නුවරේය. ඉන්පසු ඔහුගේ පුත් අම-
ෂියා[9] රජකමට පත් විය.

**13** යූදාහි රජු වූ අහසියාගේ[10] පුත්
යෙහෝයාෂ්ගේ[11] පාලන සම-
යේ විසිතුන්වන අවුරුද්දේදී යේහුගේ
පුත්[12] යෙහෝයහාෂ්[13] ඊශ්‍රායෙල්හි රජ-
කමට පත් විය. ඔහු සමාරියේ සිට
අවුරුදු දහහතක් පාලනය කළේය.
**2** නමුත් ඔහු යෙහෝවා දෙවි පිළිකුල්
කළ ක්‍රියා දිගටම කළේය.[14] ඊශ්‍රා-
යෙල්වරුන්ව පාපයට පෙලඹවූ[15] නෙ-
බාත්ගේ පුත් යෙරොබොවම් කළ
පාපයෙන් වැළකී සිටිනවා[16] වෙනුවට
ඔහු දිගටම එම පාපයේ නියැලුණේය.
**3** එබැවින් යෙහෝවා දෙවි ඊශ්‍රායෙල්
සෙනඟ සමඟ මහත් සේ උදහස් වී[1]
සිරියාවේ රජු වූ හසායෙල්ගේ අතටත්[2]
හසායෙල්ගේ පුත් බෙන්-හාදද්ගේ අත-
ටත්[3] ඊශ්‍රායෙල්වරුන්ව කිහිප වතා-
වක්ම හසු වීමට ඉඩහැරියේය.

**4** පසුව යෙහෝයහාෂ් රජු යෙ-
හෝවා දෙවිට කන්නලව් කළ නිසා
යෙහෝවා දෙවිගේ උදහස පහව
ගියේය.[4] දෙවි යෙහෝයහාෂ් රජුට
සවන් දුන්නේය.[5] මන්ද සිරියාවේ
රජු නිසා ඊශ්‍රායෙල් සෙනඟ අද්දුටු
පීඩා ඔහු දුටුවේය.[6] **5** එබැවින් ඊශ්‍රා-
යෙල්වරුන්ව සිරියානු ජාතිකයන්-
ගෙන් ගලවාගැනීමට යෙහෝවා දෙවි
ගැලවුම්කරුවෙකු එව්වේය.[7] ඉන්පසු
පෙර මෙන් තම තමන්ගේ නිවෙස්ව-
ලට වී සාමකාමීව ජීවත් වීමට ඊශ්‍රා-
යෙල්වරුන්ට හැකි විය.[8] **6** නමුත්
ඊශ්‍රායෙල්වරු තමන්ව කලින් පාපයට
පෙලඹවූ[9] යෙරොබොවම් රජු කළ
පාපවලින් වැළකී සිටිනවා වෙනුවට
දිගටම එම පාපවල නියැලුණෝය.[10]
බොරු නමස්කාරය සඳහා ඉදි කළ
කුලුන[11] පවා සමාරියේ දක්නට තිබු-
ණේය. **7** යෙහෝයහාෂ් රජුට ඉතුරු
වූයේ අසරුවන් පනස්දෙනෙකුත් අශ්ව
රථ දහයකුත් පාබළ හමුදාවේ භටයන්
දසදහසකුත් පමණි.[12] මන්ද කමතේ
පාගා දමන බොල් මෙන්[13] ඔවුන්ව
සහමුලින්ම විනාශ කර දැමීමට සිරි-
යාවේ රජ කටයුතු කර තිබිණ.[14]

**8** යෙහෝයහාෂ් රජුගේ ජීවිතයේ
අනිකුත් සිදුවීම් ගැනද ඔහු කළ
දේවල් හා ඔහුගේ බලවත් ක්‍රියා ගැනද
ඊශ්‍රායෙල්හි රජවරුන්ගේ ඉතිහාසය
වාර්තා කර ඇති ලියවිල්ලෙහි සඳහන්
කර තිබේ.[15] **9** කලක් ගත වූ පසු
යෙහෝයහාෂ් රජුද මිය ගිය අතර
ඔහුගේ මුතුන්මිත්තන් මෙන් ඔහුවද
තැන්පත් කරන ලදි. ඔහුව තැන්පත්
කරන ලද්දේ සමාරියේය.[16] ඔහුගෙන්
පසුව ඔහුගේ පුත් යෙහෝයාෂ්[17] රජ-
කමට පත් විය.

**10** යූදාහි රජු වූ යෙහෝයාෂ්ගේ
පාලන සමයේ තිස්හත්වන අවුරුද්දේදී
යෙහෝයහාෂ්ගේ පුත් යෙහෝයාෂ්[18]

**12 පරි.**
1 1රාජා 15:18
2 2රාජා 16:8, 2රාජා 18:15
3 1රාජා 14:29, 2රාජා 8:23
4 2රාජා 14:5
5 2ලේක 24:25, 2ලේක 25:27
6 2සාමු 5:9, 1රාජා 9:24, 1රාජා 11:27, 2ලේක 32:5
7 1රාජා 9:15
8 2ලේක 24:26
9 2ලේක 24:27

**13 පරි.**
10 2රාජා 8:26, 2රාජා 9:27
11 2රාජා 11:2, 2රාජා 11:21
12 2රාජා 10:30
13 2රාජා 10:35
14 ද්වි 28:15
15 1රාජා 14:16
16 1රාජා 12:28, 1රාජා 13:33

**2 තීරුව**
1 ලෙවී 26:17, ද්වි 6:15, ද්වි 7:4, ගීතා 7:11, හෙබ්‍රෙ 12:29
2 1රාජා 19:17, 2රාජා 8:12
3 2රාජා 13:24
4 විනි 6:6, විනි 10:10, 2ලේක 33:13, ගීතා 78:34
5 ද්වි 4:7, ගීතා 50:15, ගීතා 65:2, 1යොහ 5:14
6 උත් 31:42, නික් 3:7, විනි 10:16, 2රාජා 14:26
7 නෙහෙ 9:27
8 ගීතා 130:4
9 2රාජා 10:29, 2රාජා 17:21
10 1රාජා 16:26
11 ද්වි 7:5, 1රාජා 14:15, 1රාජා 16:33
12 2රාජා 10:32
13 ආමො 1:3
14 ද්වි 28:45, 2රාජා 8:12
15 1රාජා 14:19, 2රාජා 10:34
16 2රාජා 10:35
17 2රාජා 14:8
18 2රාජා 14:1

ඊශ්‍රායෙල්හි රජකමට පත් විය. ඔහු
සමාරියේ සිට අවුරුදු දහසයක් පාල-
නය කළේය. **11** නමුත් ඔහු යෙ-
හෝවා දෙවි පිළිකුල් කළ දේවල්
දිගටම කළේය.[1] ඊශ්‍රායෙල්වරුන්ව
පාපයට පෙලඹවූ නෙබාත්ගේ පුත්
යෙරොබෝවම් කළ පාපවලින් වැළකී
සිටිනවා වෙනුවට ඔහු දිගටම ඒ පාප-
වල නියැලුණේය.[2]

**12** යෙහෝයාෂ් රජුගේ ජීවිතයේ
අනිකුත් සිදුවීම් ගැනද ඔහු කළ දේ-
වල්ද ඔහුගේ බලවත් ක්‍රියා ගැනද ඔහු
යුදාහි රජු වූ අමෂියාට විරුද්ධව සටන්
කළ ආකාරය[3] ගැනද ඊශ්‍රායෙල්හි රජ-
වරුන්ගේ ඉතිහාසය වාර්තා කර ඇති
ලියවිල්ලෙහි සඳහන් කර තිබේ.[4]
**13** කලක් ගත වූ පසු යෙහෝයාෂ්
රජු මිය ගිය අතර ඔහුගේ මුතුන්-
මිත්තන් ඔහුවද තැන්පත් කරන ලදි.
ඊශ්‍රායෙල්හි අනිකුත් රජවරුන් මෙන්
ඔහුවද සමාරියේ තැන්පත් කරන
ලදි.[5] පසුව යෙරොබෝවම්*[6] රජකමට
පත් විය.

**14** ඒ කාලයේදී එලිෂා[7] අසනීප වී
මරණාසන්නව සිටියේය.[8] එක් දිනක්
ඊශ්‍රායෙල්හි රජු වූ යෙහෝයාෂ් ඔහුගේ
සුව දුක් බැලීමට පැමිණියේය. එවිට
රජ එලිෂාගේ මුහුණ සිපගෙන, "මගේ
පියාණෙනි,[9] මගේ පියාණෙනි, ඊශ්‍රා-
යෙල්හි යුධ රථයත් එහි අසරුවනුත්
අපට අවශ්‍යයයි"*[10] කියමින් හැඬු-
වේය. **15** එවිට එලිෂා ඔහුට මෙසේ
කීවේය. "දුන්නකුත් ඊතල කිහිපය-
කුත් ගන්න." ඔහු එසේ කළේය.
**16** පසුව එලිෂා, "දැන් දුන්නෙන්
විදින්න සූදානම් වෙන්න" කියා ඊශ්‍රා-
යෙල්හි රජුට කීවේය. ඔහු දුන්න අතට
ගත් විට එලිෂා තම අත් රජුගේ අත්
දෙක මත තබා,[11] **17** "නැඟෙනහිර
දිශාවේ පිහිටි කවුළුව අරින්න" යයි
කීවේය. රජු කවුළුව විවෘත කළ විට
එලිෂා, "දැන් විදින්න" යයි රජුට
කීවේය. රජද දුන්නෙන් විද්දේය. එවිට
එලිෂා, "එය ගැලවීම සලසා දෙන
යෙහෝවා දෙවිගේ ඊතලයයි![1] සිරි-
යානුවන්ගෙන් නිදහස ලබා දෙන
ඊතලයයි! ඔබ අපෙක් නුවරේදී[2] සිරි-
යානුවන්ව මුළුමනින්ම නැති කර
දමන බව ස්ථිරයි" කියා කීවේය.

**18** තවදුරටත් එලිෂා, "අනික්
ඊතල ටිකත් ගන්න" යයි කීවේය.
ඔහු ඒවා ගත් පසු එලිෂා ඊශ්‍රා-
යෙල්හි රජුට මෙසේ කීවේය. "ඊතල-
වලින් පොළොවට ගහන්න." ඔහු
තුන් වරක් පමණක් පොළොවට ගසා
නතර කළේය.[3] **19** එවිට දෙවිගේ
අනාගතවක්තෘ[4] කෝප වී මෙසේ
කීවේය. "ඔබට තිබුණා පස් වතා-
වක් හෝ හය වතාවක් පොළොවට
ගහන්න! එසේ කළා නම් ඔබට සිරි-
යානුවන්ව සම්පූර්ණයෙන් නැති කර
දමන්න හැකිකම තිබුණා. නමුත් ඔබ
කළ දේ නිසා ඔබට ඔවුන්ට පහර
දෙන්න ලැබෙන්නේ තුන් වතාවක්
පමණයි."[5]

**20** එලිෂා මිය ගිය පසු ඔහුව තැන්-
පත් කරන ලදි.[6] ඔහුගේ මරණයෙන්
පසු මෝවබ් ජාතික[7] කොල්ලකා-
රුවෝ[8] දේශය ආක්‍රමණය කිරීමට
පටන්ගත්තෝය. ඔවුහු සෑම අවුරුද්ද-
කම ආරම්භයේදී දේශයට ඇතුල්
වූවෝය. **21** දිනක් ඊශ්‍රායෙල්වරු
කිහිපදෙනෙක් මළ මිනියක් තැන්පත්
කරමින් සිටියදී එම කොල්ලකරු-
වන් එනවා දැක භය වී, එම මළ
සිරුර එලිෂාගේ සොහොන් ගෙට වීසි
කර එතැනින් පලා ගියෝය. මළ
සිරුර එලිෂාගේ ඇටකටුවල වැදුණ
විගස මිය ගොස් සිටි තැනැත්තා
නැවත ජීවත් විය.[9]

**22** සිරියාවේ රජු වූ හසායෙල්[10]
යෙහෝයහාෂ් රජුගේ පාලන සමය
පුරාම ඊශ්‍රායෙල්වරුන්ට පීඩා
කළේය.[11] **23** එහෙත් යෙහෝවා
දෙවි තමන් ආබ්‍රහම්,[12] ඊසාක්[13] සහ
යාකොබ්[14] සමඟ කළ ගිවිසුම සිහි
කරමින්[15] ඊශ්‍රායෙල්වරුන්ට කරු-
ණාව[16] හා දයාව[17] පෙන්වූවේය. ඔවුන්

**13 පරි.**
1 2රාජා 13:2; හොෂෙ 5:11
2 2රාජා 10:29
3 2රාජා 14:8; 2රාජා 14:13; 2ලේක 25:17
4 1රාජා 14:19; 2රාජා 10:34
5 2රාජා 10:35; 2රාජා 13:9
6 2රාජා 14:28
7 1රාජා 19:16; 2රාජා 5:8
8 සෙක 1:5
9 2රාජා 5:13
10 2රාජා 2:12
11 ගීතා 144:1

**2 තීරුව**
1 ගීතා 18:14
2 1සාමු 29:1; 1රාජා 20:26
3 ගලා 6:9
4 යෙසා 44:26
5 2රාජා 13:25
6 ගීතා 139:8
7 2රාජා 1:1
8 2රාජා 24:2
9 යොහ 11:44; හෙබ්‍රෙ 11:35; එළි 11:11
10 1රාජා 19:15; 2රාජා 10:32
11 2රාජා 8:12; ගීතා 106:41
12 උත් 13:16; උත් 17:7; උත් 22:17; නික් 32:13
13 උත් 26:3
14 උත් 28:13; ලෙවී 26:42
15 නික් 2:24
16 විනි 10:16; 2රාජා 14:27; නෙහෙ 9:31; ගීතා 86:15; යෙසා 30:18; විලා 3:32
17 ගීතා 145:8; 2කොරි 1:3; එෆී 2:4

**2රාජා 13:13*** මෙහි සඳහන් වන්නේ 2වන යෙරොබෝවම් රජු ගැනයි. **14*** යෙහෝයාෂ් රජු සමහරවිට මෙහිදී දෙවිගෙන් හෝ දෙවිගේ නියෝජිතයාගෙන් උපකාර පතනවා විය හැකිය.

සම්පූර්ණයෙන්ම විනාශ වී යනවාට
දෙවි අකමැති වූ නිසා[1] ඔහු මේ
දක්වාම ඔවුන්ව අත් නොහැරියේය.
**24** අවසානයේදී සිරියාවේ රජු වූ හසා-
යෙල් මිය ගියේය. ඔහුගෙන් පසු ඔහු-
ගේ පුත් බෙන්-හාදද් රජකමට පත්
විය. **25** හසායෙල්, යෙහෝයහාෂ්
රජුට විරුද්ධව යුද්ධ කර ඊශ්‍රායෙල්හි
නුවරවල් කිහිපයක්ම අල්ලාගෙන
තිබිණ. එහෙත් යෙහෝයහාෂ්ගේ පුත්
යෙහෝයාෂ් රජ, හසායෙල්ගේ පුත්
බෙන්-හාදද්ව තුන් වතාවක්ම පරාජය
කර, ඔහු අතින් ඒ නුවරවල් නැවත
තමන් යටතට ගත්තේය.[2]

**14** ඊශ්‍රායෙල්හි රජු වූ යෙහෝ-
යහාෂ්ගේ පුත් යෙහෝයාෂ්
පාලනය කළ දෙවන අවුරුද්දේදී[3]
යුදාහි රජු වූ යෙහෝයාෂ්ගේ පුත් අම-
ෂියා[4] රජකමට පත් විය. **2** අම-
ෂියා රජකමට පත් වන විට ඔහුගේ
වයස අවුරුදු විසිපහකි. ඔහු යෙරුස-
ලමේ සිට අවුරුදු විසිනවයක් පාලනය
කළේය. ඔහුගේ මව යෙරුසලමේ
ජීවත් වූ යෙහෝයද්දින්ය.[5] **3** අම-
ෂියා රජ යෙහෝවා දෙවි යහපත්යයි
සලකන දේ දිගටම කළත්[6] ඔහුගේ
මුතුන්මිත්තා වූ දාවිත් මෙන් ක්‍රියා
කළේ නැත.[7] ඔහුගේ පියා වූ යෙහෝ-
යාෂ් රජු කළ සියලු වැරදි ක්‍රියා ඔහුද
කළේය.[8] **4** ඔහු ඒ දේශයේ බොරු
නමස්කාරය සඳහා පිහිටුවා තිබූ පූජ-
නීය ස්ථාන ඉවත් කිරීමට අපොහො-
සත් විය.[9] එබැවින් ජනයාද ඒ පූජනීය
ස්ථාන මත සුවඳ දුම් හා වෙනත්
පූජා දිගටම ඔප්පු කළෝය.[10] **5** ඔහු
තම පාලන බලය තහවුරු කරගත්
වහාම තම පියාව ඝාතනය කළ ඔහු-
ගේ සේවකයන්ව[11] මරා දැමුවේය.[12]
**6** නමුත් ඔහු ඒ මිනී මරුවන්ගේ පුත්‍ර-
යන්ව මරා දැමුවේ නැත. මන්ද යෙ-
හෝවා දෙවි මෝසෙස්ට දුන් නීතිය
ඇතුළත් ලියවිල්ලෙහි මෙසේ සඳ-
හන්ව තිබිණ.[13] "යමෙකුව මරණයට
පත් කළ යුත්තේ ඔහුගේම වර-
දකට මිස වෙන කෙනෙකු කළ
වරදකට නොවේ. පුත්‍රයන් නිසා පිය-
වරුන්වත් පියවරුන් නිසා පුත්‍රයන්-
වත් මරණයට පත් නොකළ යුතුයි."[1]
**7** එමෙන්ම අමෂියා රජ, ලුණු නිම්-
නයේදී[2] ඒදොම්වරුන්[3] දසදහසක්ව
මරා, සේලා නුවර යටත් කරගත්-
තේය. අද දක්වා ඒ නුවර යොක්තෙ-
යේල් යන නමින් හැඳින්වේ.

**8** පසුව අමෂියා රජ, යේහුගේ මුනු-
පුරාද යෙහෝයහාෂ්ගේ පුත්‍රයාද වූ
ඊශ්‍රායෙල්හි රජු වූ යෙහෝයාෂ් වෙතට
පණිවිඩකරුවන් යවා, "මට විරුද්-
ධව සටනට එන්න" යයි කීවේය.[4]
**9** එවිට ඊශ්‍රායෙල්හි රජු වූ යෙහෝ-
යාෂ්, යුදාහි රජු වූ අමෂියාට පණිවිඩ-
යක් යවා මෙසේ කීවේය. "දවසක්
ලෙබනොන් රටේ තිබූ කටු පඳු-
රක් ඒ දේශයේ තිබූ දේවදාර ගස-
කට කතා කර,[5] 'ඔබේ දුවව මගේ
පුතාට විවාහ කර දෙන්න' කියා පැව-
සුවා. නමුත් ලෙබනොන් වනයේ
සැරිසරන මෘගයෙක් ඇවිත් ඒ කටු
පඳුර පාගා දැමුවා.[6] **10** ඒදොම්ව-
රුන්ව පරාජය කළ නිසා[7] දැන් ඔබ
ඉන්නේ හරි ආඩම්බරයෙන්.[8] ඔබ
ලබාගත් ගෞරවය රැකගෙන[9] ඔබේ
ගෙදරටම වී සිටියොත් හොඳයි. යුද්ධ-
යට ආවොත්[10] පරදින්නේ ඔබමයි.[11]
ඔබත් යුදා වැසියනුත් නිකරුණේ
අනතුරට වැටෙන්න හදන්නේ ඇයි?"
**11** එහෙත් අමෂියා රජ ඔහුට සවන්
දුන්නේ නැත.[12]

එබැවින් ඊශ්‍රායෙල්හි රජු වූ යෙ-
හෝයාෂ් යුදාහි රජු වූ අමෂියාට
විරුද්ධව යුද්ධ කිරීමට පිටත් විය.
ඔවුහු යුදා දේශයේ පිහිටි බෙත්-
ෂෙමෙෂ් නගරයේදී[13] එකිනෙකා සමඟ
යුද්ධ කළෝය.[14] **12** එහිදී ඊශ්‍රා-
යෙල්වරුන් අතින් පරාජයට පත්
වූ යුදා හමුදාව[15] තමන්ගේ කූඩා-
රම්වලට පලා ගියෝය. **13** ඊශ්‍රා-
යෙල්හි රජු වූ යෙහෝයාෂ් යුදාහි රජු
වූ අමෂියාව බෙත්-ෂෙමෙෂ් නුවරේදී
අල්ලාගත්තේය. අමෂියා රජු අහසි-
යාගේ පුත් යෙහෝයාෂ්ගේ පුත්‍රයා
විය. ඉන්පසු ඊශ්‍රායෙල්වරු යෙරු-
සලමට පැමිණ එෆ්‍රායිම් දොරටුවේ

**13 පරි.**
1 ගීතා 105:8; මීකා 7:20; හෙබ්‍රෙ 6:18
2 2රාජා 13:19

**14 පරි.**
3 2රාජා 13:10
4 1ලේක 3:12
5 2ලේක 25:1
6 2ලේක 25:2
7 1රාජා 15:5
8 2ලේක 24:2; 2ලේක 24:18; සෙක 1:4
9 1රාජා 15:14; 2රාජා 12:3
10 2රාජා 15:4; 2රාජා 15:35
11 2රාජා 12:20; 2ලේක 24:25; 2ලේක 25:3
12 උත් 9:6; නික් 21:12; ලෙවී 24:17; ගණන් 35:33
13 2ලේක 25:4

**2 තීරුව**
1 ද්වි 24:16; එස 18:20
2 2සාමු 8:13; 1ලේක 18:12; ගීතා 60:පෙර
3 2රාජා 8:20; 2ලේක 25:11
4 2සාමු 2:14; 2ලේක 25:17; හිතෝ 13:10; හිතෝ 18:6
5 විනි 9:15
6 2ලේක 25:18
7 2රාජා 14:7
8 2ලේක 26:16; හිතෝ 16:18; හබ 2:4; ගලා 6:3; යාකො 4:6
9 1සාමු 18:8
10 2ලේක 35:21; හිතෝ 3:30; හිතෝ 20:3
11 ලූක් 14:31
12 2ලේක 25:16; 2ලේක 25:20
13 යොෂු 15:10; යොෂු 21:16; 1සාමු 6:9; 1ලේක 6:59
14 2ලේක 25:21
15 2ලේක 25:22; හිතෝ 16:18

සිට[1] කොණේ දොරටුව[2] අතර තිබූ
යෙරුසලමේ පවුරෙන් රියන් හාරසි-
යයක කොටසක්* බිඳ දැමුවෝය.
**14** ඉන්පසු ඔහු යෙහෝවා දෙවිගේ
ගෘහයේ[3] සහ රජමාලිගාවේ භාණ්ඩා-
ගාරයේ තිබූ සියලු රන් හා රිදී භාණ්-
ඩද එහි සිටි මිනිසුන්වද පැහැරගෙන
නැවත සමාරිය බලා පිටත්ව ගියේය.
**15** යෙහෝයාෂ් රජුගේ ජීවිතයේ
අනිකුත් සිදුවීම්ද ඔහු කළ දේවල්ද
ඔහුගේ බලවත් ක්‍රියා ගැනද ඔහු යූදාහි
රජු වූ අමෂියාට විරුද්ධව සටන් කළ
ආකාරය ගැනද ඊශ්‍රායෙල්හි රජවරුන්-
ගේ ඉතිහාසය වාර්තා කර ඇති
ලියවිල්ලෙහි සඳහන් කර තිබේ.[4]
**16** අවසානයේදී යෙහෝයාෂ් රජ මිය
ගියේය. ඔහුගේ මුතුන්මිත්තන් මෙන්
ඔහුවද තැන්පත් කරන ලදි.[5] ඊශ්‍රා-
යෙල්හි අනිකුත් රජවරුන් මෙන් ඔහු-
වද සමාරියේ තැන්පත් කරන ලදි.[6]
ඔහුගෙන් පසුව ඔහුගේ පුත් යෙරො-
බොවම්*[7] රජකමට පත් විය.
**17** යූදාහි රජු වූ යෙහෝයාෂ්ගේ
පුත් අමෂියා,[8] ඊශ්‍රායෙල්හි රජු වූ යෙ-
හෝයහාෂ්ගේ පුත් යෙහෝයාෂ්ගේ[9]
මරණයට පසු තව අවුරුදු පහළ-
වක් ජීවත් විය.[10] **18** අමෂියා රජු-
ගේ ජීවිතයේ අනිකුත් සිදුවීම් ගැන
යූදාහි රජවරුන්ගේ ඉතිහාසය වාර්තා
කර ඇති[11] ලියවිල්ලෙහි සඳහන් කර
තිබේ.[12] **19** අමෂියා රජුට විරුද්ධව
සෙනඟ කුමන්ත්‍රණය කළ[13] නිසා ඔහු
ලාකිෂ් නුවරට[14] පලා ගියේය. නමුත්
ඔවුන් අමෂියාව අල්ලාගැනීමට මිනි-
සුන්ව යැවූ අතර ලාකිෂ්හිදී ඔහුව මරා
දමන ලදි.[15] **20** පසුව ඔවුහු ඔහුගේ
මළ සිරුර අශ්වයන් පිට තබා යෙරු-
සලමට රැගෙන ආවෝය. ඔහුගේ
මුතුන්මිත්තන් මෙන් ඔහුවද දාවිත්-
ගේ නුවරෙහි[16] තැන්පත් කරන ලදි.[17]
**21** ඉන්පසු යූදාහි වැසියෝ දහසය
හැවිරිදි[18] අෂරියාව*[19] ඔහුගේ පියා වූ
අමෂියා[20] වෙනුවට රජකමට පත්
කළෝය. **22** අමෂියා රජු මිය ගිය
අතර ඔහුගේ මුතුන්මිත්තන් මෙන්
ඔහුවද තැන්පත් කරන ලදි. ඉන්පසු
අෂරියා, ඒලත් නගරය[1] නැවත යූදා
දේශයෙහි පාලනය යටතට ගෙනැවිත්
එය ගොඩනැඟුවේය.
**23** යූදාහි රජු වූ යෙහෝයාෂ්ගේ
පුත් අමෂියා පාලනය කළ පහ-
ළොස්වන අවුරුද්දේදී ඊශ්‍රායෙල්හි
රජු වූ යෙහෝයාෂ්ගේ පුත් යෙරො-
බොවම්[2] රජකමට පත් විය. ඔහු
සමාරියේ සිට අවුරුදු හතළිස්එකක්
පාලනය කළේය. **24** නමුත් ඔහු
යෙහෝවා දෙවි පිළිකුල් කළ දේවල්
දිගටම කළේය. ඊශ්‍රායෙල්වරුන්ව
පාපයට පෙලඹවූ නෙබාත්ගේ පුත්
යෙරොබොවම් කළ පාපවලින් වැළකී
සිටිනවා වෙනුවට ඔහු ඒ සියලු පාප-
වල නියැලුණේය.[3] **25** ඔහු හමාත්
නගරයට ඇතුල් වන තැන[4] පටන්
අරබා මුහුද දක්වා[5] විහිදී ගිය මුළු
ප්‍රදේශයම නැවත ඊශ්‍රායෙල්හි පාල-
නය යටතට ගෙනාවේය. ඊශ්‍රායෙල්හි
දෙවි යෙහෝවා තම සේවකයා වන
යෝනා[6] මාර්ගයෙන් කී දේ මෙසේ ඉටු
විය. යෝනා, ගාත්-හේෆෙර් නගරයේ[7]
අනාගතවක්තෘවරයෙකු වූ අමිත්තයි-
ගේ පුත්‍රයා විය. **26** ඊශ්‍රායෙල්වරුන්
කොතරම් දරුණු පීඩාවලට මුහුණ
දුන්නාද කිවහොත් ඔවුන් අතරේ සිටි
අන්ත අසරණ දිළිඳු අය පවා දේශ-
යෙන් තුරන් වී ගියෝය. ඔවුන්ගේ
උපකාරයට කිසිවෙක් සිටියේ නැත.[8]
යෙහෝවා දෙවි මේ සියල්ල දුටුවේය.[9]
**27** මේ පොළොවෙන් ඊශ්‍රායෙල් යන
නාමය මකා නොදමන බවට යෙ-
හෝවා දෙවි පොරොන්දු වී තිබූ නිසා[10]
දෙවි යෙහෝයාෂ්ගේ පුත් යෙරොබො-
වම් මාර්ගයෙන් ඔවුන්ව ගලවාගත්-
තේය.[11]

**28** යෙරොබොවම් රජුගේ ජීවිතයේ
අනිකුත් සිදුවීම්ද ඔහු කළ දේවල්ද
ඔහුගේ බලවත් ක්‍රියාද ඔහු කළ යුධ
මෙහෙයුම් ගැනද ඔහු දමස්කය[12] සහ
හමාත්[13] නම් නගරවල් නැවත යූදා
සහ ඊශ්‍රායෙල්හි පාලනය යටතට

**14 පරි.**
1 2ලේක 25:23; නෙහෙ 8:16; නෙහෙ 12:39
2 යෙරෙ 31:38; සෙක 14:10
3 2රාජා 12:13
4 1රාජා 14:19; 2රාජා 13:12
5 2රාජා 10:35
6 2රාජා 13:9
7 2රාජා 13:13; හොෂෙ 1:1; ආමො 1:1; ආමො 7:10
8 2රාජා 14:1
9 2රාජා 13:10
10 2ලේක 25:25
11 2ලේක 25:26
12 1රාජා 14:29; 2රාජා 12:19; 2රාජා 20:20
13 2රාජා 12:20
14 යොෂු 10:31; මීකා 1:13
15 2ලේක 25:27
16 1රාජා 2:10; 2රාජා 12:21
17 2ලේක 25:28
18 2රාජා 15:2
19 2ලේක 26:1; මතෙ 1:8
20 1ලේක 3:12

**2 තීරුව**
1 ද්වි 2:8; 1රාජා 9:26; 2රාජා 16:6; 2ලේක 26:2
2 හොෂෙ 1:1; ආමො 1:1
3 1රාජා 12:28; 1රාජා 13:34; ගීතා 106:20
4 ගණන් 13:21; ගණන් 34:8; එස 47:16; ආමො 6:14
5 උත් 14:3; ද්වි 3:17
6 යෝනා 1:1; මතෙ 12:39
7 යොෂු 19:13
8 1රාජා 14:10; 1රාජා 21:21
9 නික් 3:7; විනි 10:16; ගීතා 106:44
10 ද්වි 25:19; ද්වි 29:20
11 2රාජා 13:5; ගීතා 86:15; යෙරෙ 31:20; හොෂෙ 1:7
12 2සාමු 8:6
13 2ලේක 8:3

**2රාජා 14:13*** එනම්, මීටර් 178ක් පමණ. **16*** එනම්, 2වන යෙරොබොවම්. **21*** අෂරියාව උසියා යන නමින්ද හඳුන්වනු ලැබීය.

ගෙනා ආකාරය ගැනද ඊශ්‍රායෙල්හි
රජවරුන්ගේ ඉතිහාසය වාර්තා කර
ඇති ලියවිල්ලෙහි සඳහන් කර තිබේ.
**29** අවසානයේදී යෙරොබොවම් රජද
මිය ගියේය. ඊශ්‍රායෙල්හි රජවරුන් වූ
ඔහුගේ මුතුන්මිත්තන් මෙන් ඔහු-
වද තැන්පත් කරන ලදි. ඔහුගෙන්
පසු ඔහුගේ පුත් සෙකරියා[1] රජකමට
පත් විය.

**15** ඊශ්‍රායෙල්හි රජු වූ යෙරො-
බොවම්ගේ පාලන සමයේ
විසිහත්වන අවුරුද්දේදී යූදාහි රජු
වූ අමෂියාගේ[2] පුත් අෂරියා*[3] රජ-
කමට පත් විය. **2** අෂරියා රජක-
මට පත් වන විට ඔහුගේ වයස
අවුරුදු දහසයකි. ඔහු යෙරුසලමේ
සිට අවුරුදු පනස්දෙකක් පාලනය
කළේය.[4] ඔහුගේ මව යෙරුසලමෙහි
ජීවත් වූ යෙකොලියාය. **3** ඔහුගේ
පියා වූ අමෂියා මෙන් ඔහුද යෙ-
හෝවා දෙවි යහපත්යයි සලකන දේ
දිගටම කළේය.[5] **4** නමුත් ඔහු ඒ
දේශයේ බොරු නමස්කාරය සඳහා
වෙන් කර තිබූ පූජනීය ස්ථාන ඉවත්
කිරීමට අපොහොසත් විය.[6] එබැ-
වින් ජනයාද ඒ පූජනීය ස්ථාන මත
සුවඳ දුම් හා පූජා දිගටම ඔප්පු
කළෝය.[7] **5** පසුව යෙහෝවා දෙවි,
අෂරියා රජුට ලාදුරු රෝගයෙන් පහර
දුන්නේය.[8] ඔහු මිය යන තෙක්ම
ලාදුරු රෝගියෙකුව සිටියේය.[9] ඔහු
වෙනම නිවසක ජීවත් වූ අතර ඔහුට
පැවරී තිබුණු සියලුම වගකීම්වලින්
ඔහුව නිදහස් කර තිබිණ.[10] ඒ අතර-
තුර රජමාලිගාවේ සියලු වැඩකටයුතු
බලා කියා ගනිමින් දේශය පාලනය
කළේ[11] ඔහුගේ පුත් යෝතම්ය.[12]
**6** අෂරියා රජුගේ ජීවිතයේ අනිකුත්
සිදුවීම් සහ ඔහු කළ දේවල් ගැන
යූදාහි රජවරුන්ගේ ඉතිහාසය වාර්තා
කර ඇති ලියවිල්ලෙහි සඳහන් කර
තිබේ.[13] **7** කාලයක් ගත වූ පසු
අෂරියා රජ මිය ගියේය.[14] ඔහුගේ
මුතුන්මිත්තන් මෙන් ඔහුවද දාවිත්-
ගේ නුවරෙහි තැන්පත් කරන ලදි.
ඔහුගෙන් පසුව ඔහුගේ පුත් යෝතම්
රජකමට පත් විය.[1]

**8** යූදාහි රජු වූ අෂරියාගේ පාලන
සමයේ තිස්අටවන අවුරුද්දේදී[2] යෙ-
රොබොවම්ගේ පුත් සෙකරියා[3] ඊශ්‍රා-
යෙල්හි රජකමට පත් විය. ඔහු
සමාරියේ සිට මාස හයක් පාලනය
කළේය. **9** නමුත් ඔහු තම මුතුන්-
මිත්තන් මෙන් යෙහෝවා දෙවි පිළි-
කුල් කළ දේවල් දිගටම කළේය.[4]
ඊශ්‍රායෙල්වරුන්ව පාපයට පෙලඹවූ[5]
නෙබාත්ගේ පුත් යෙරොබොවම්
කළ පාපවලින් ඔහු වැළකී සිටියේ
නැත.[6] **10** පසුව යාබෙෂ්ගේ පුත්
ෂල්ලුම් ඔහුට විරුද්ධව කුමන්ත්‍රණය
කර,[7] ඉබ්ලෙයාම් නගරයේදී[8] ඔහුව
මරා[9] රජකම තම අතට ගත්තේය.
**11** සෙකරියාගේ ජීවිතයේ අනිකුත්
සිදුවීම් ගැන ඊශ්‍රායෙල්හි රජවරුන්-
ගේ ඉතිහාසය වාර්තා කර ඇති
ලියවිල්ලෙහි සඳහන් කර තිබේ.[10]
**12** "ඔබෙන් පැවතෙන්නන්[11] පරම්-
පරා හතරක් ඊශ්‍රායෙල්හි රජකම්
කරනු ඇත" කියා[12] යෙහෝවා දෙවි
යේහුට දුන් පොරොන්දුව[13] එලෙසම
ඉටු විය.[14]

**13** යූදාහි රජු වූ උසියාගේ[15] පාලන
සමයේ තිස්නවවන අවුරුද්දේදී
යාබෙෂ්ගේ පුත් ෂල්ලුම් රජකමට
පත් විය. ඔහු සමාරියේ සිට මාස-
යක්* පාලනය කළේය.[16] **14** ඉන්-
පසු ගාදීගේ පුත් මෙනහෙම්,[17] තිර්ෂා
නගරයේ[18] සිට සමාරියට පැමිණ
යාබෙෂ්ගේ පුත් ෂල්ලුම්ව මරා[19] රජ-
කම තම අතට ගත්තේය. **15** ෂල්-
ලුම්ගේ ජීවිතයේ අනිකුත් සිදුවීම්ද
ඔහු කළ කුමන්ත්‍රණය ගැනද[20]
ඊශ්‍රායෙල්හි රජවරුන්ගේ ඉතිහාසය
වාර්තා කර ඇති ලියවිල්ලෙහි සඳ-
හන් කර තිබේ. **16** පසුව මෙන-
හෙම්, තිර්ෂා නගරයෙන් පිටත්ව
තිප්සා නගරයට පහර දීමට ගියේය.

**14 පරි.**
1 2රාජා 15:8

**15 පරි.**
2 2රාජා 14:1
3 2රාජා 14:21, 2ලේක 26:1
4 2ලේක 26:3
5 2රාජා 14:3, 2ලේක 26:4
6 ගණන් 33:52, ද්වි 12:14, 2ලේක 6:6, 2ලේක 32:12
7 1සාමු 14:35, 1රාජා 22:43, 2රාජා 14:4
8 2ලේක 26:19, යෝබ් 34:19
9 ගණන් 12:10, 2රාජා 5:27
10 ලෙවී 13:46, ද්වි 24:8
11 1සාමු 8:5, 1රාජා 3:9, ගීතා 72:1
12 2රාජා 15:32, 1ලේක 3:12, 2ලේක 26:21
13 1රාජා 14:29, 2ලේක 26:22
14 යෙසා 6:1

**2 තීරුව**
1 2ලේක 26:23
2 2රාජා 14:21
3 2රාජා 14:29
4 2රාජා 13:2, 2රාජා 14:24
5 නික් 32:21, 1රාජා 14:16
6 1රාජා 12:28, 1රාජා 13:33
7 ගණන් 35:20, ද්වි 19:11
8 යොෂු 17:11, 2රාජා 9:27
9 හොෂෙ 1:4, ආමො 7:9
10 1රාජා 14:19
11 2රාජා 13:1, 2රාජා 13:10, 2රාජා 14:23, 2රාජා 14:29
12 2රාජා 10:30
13 යෙසා 14:27, යෙසා 44:26, යෙසා 55:11
14 ගණන් 23:19
15 2ලේක 26:1, මතෙ 1:8
16 හොෂෙ 5:7
17 2රාජා 15:17
18 1රාජා 14:17, 1රාජා 15:21, 1රාජා 16:8, 1රාජා 16:17
19 2රාජා 15:10
20 ද්වි 19:11

**2රාජා 15:1*** 2රාජා 14:21හි පාදසටහන බලන්න.

**2රාජා 15:13*** මුල් භාෂාවේ භාවිත කර ඇති වචනය නව සඳ පෙනීමත් සමඟ ආරම්භ වන මාසයට යොමු දැක්වේ.

එහි වැසියන් නගරයේ දොරටු විවෘත
නොකළ නිසා ඔහු ඒ නගරය සම්පූර්-
ණයෙන්ම විනාශ කර, එහි ගැබිනි
ස්ත්‍රීන් සියලුදෙනාවම කඩුවෙන් කපා
දැමුවේය.[1]
**17** යූදාහි රජු වූ අෂරියාගේ පාලන
සමයේ තිස්නවවන අවුරුද්දේදී[2] ගාදී-
ගේ පුත් මෙනහෙම් ඊශ්‍රායෙල්හි රජක-
මට පත් විය. ඔහු සමාරියේ සිට
අවුරුදු දහයක් පාලනය කළේය.
**18** නමුත් ඔහු යෙහෝවා දෙවි පිළි-
කුල් කළ දේවල් දිගටම කළේය.[3]
ඊශ්‍රායෙල්වරුන්ව පාපයට පෙලඹවූ[4]
නෙබාත්ගේ පුත් යෙරොබොවම් කළ
පාපවලින් ඔහු වැළකී සිටියේ නැත.[5]
ඔහු තම ජීවිත කාලය පුරාම එම පාප-
වල නියැලුණේය. **19** ඒ කාලයේ
ඇසිරියාවේ රජු වූ[6] පූල්[7] විසින් දේ-
ශය ආක්‍රමණය කරනු ලැබීය. එවිට
මෙනහෙම් රජ, තම රාජ්‍ය බලය
තහවුරු කරගැනීම සඳහාත් පූල්-
ගෙන් උපකාර ලබාගැනීම සඳහාත්[8]
ඔහුට රිදී තලෙන්ත දහසක්[9] දුන්-
නේය.[10] **20** මෙනහෙම් රජ එම රිදී
සියල්ල ඊශ්‍රායෙල්හි සිටි ධනවතුන්-
ගෙන්[11] එකතු කරගත්තේය. ඔහු
එක් අයෙකුගෙන් රිදී ෂෙකෙල් පනහ
බැගින් ලබාගෙන ඇසිරියාවේ රජුට
දුන්නේය. එය ලබාගත් පසු ඇසිරි-
යාවේ රජ ඊශ්‍රායෙල්වරුන්ට පහර
නොදී ආපසු හැරී ගියේය. **21** මෙන-
හෙම්[12] රජුගේ ජීවිතයේ අනිකුත් සිදු-
වීම් ගැනත් ඔහු කළ සියල්ල ගැනත්
ඊශ්‍රායෙල්හි රජවරුන්ගේ ඉතිහාසය
වාර්තා කර ඇති ලියවිල්ලෙහි සඳහන්
කර තිබේ.[13] **22** අවසානයේදී මෙ-
නහෙම් රජු මිය ගිය අතර ඔහුගේ
මුතුන්මිත්තන් මෙන් ඔහුවද තැන්-
පත් කරන ලදි. ඔහුගෙන් පසුව
ඔහුගේ පුත් පෙකහියා[14] රජකමට
පත් විය.
**23** යූදාහි රජු වූ අෂරියාගේ පාලන
සමයේ පනස්වන අවුරුද්දේදී මෙන-
හෙම්ගේ පුත් පෙකහියා ඊශ්‍රායෙල්හි
රජකමට පත් විය. ඔහු සමාරියේ සිට
අවුරුදු දෙකක් පාලනය කළේය.[15]
**24** ඔහුත් යෙහෝවා දෙවි පිළිකුල්
කළ දේවල් දිගටම කළේය.[1] ඊශ්‍රා-
යෙල්වරුන්ව පාපයට පෙලඹවූ[2] නෙ-
බාත්ගේ පුත් යෙරොබොවම් කළ
පාපවලින් ඔහු වැළකී සිටියේ නැත.[3]
**25** පසුව ඔහුගේ සහයට සිටි
නිලධාරියා[4] වන රෙමලියාගේ පුත්
පේකා[5] ඔහුට විරුද්ධව කුමන්ත්‍රණය
කළේය.[6] පේකා, ගිලියද් දේශයේ
වැසියන් පනස්දෙනෙකුගේ උපකාරය
ඇතුව සමාරියේ පිහිටි රජමාලිගා-
වේ බලකොටුවේදීම[7] රජුටත් අර්-
ගොබ්ටත් අරියාටත් පහර දී ඔවුන්ව
මරා රජකම තම අතට ගත්තේය.
**26** පෙකහියා රජුගේ ජීවිතයේ අනි-
කුත් සිදුවීම්ද ඔහු කළ සියල්ලද
ඊශ්‍රායෙල්හි රජවරුන්ගේ ඉතිහාසය
වාර්තා කර ඇති ලියවිල්ලෙහි සඳහන්
කර තිබේ.[8]
**27** රෙමලියාගේ පුත්[9] පේකා[10]
ඊශ්‍රායෙල්හි රජකමට පත් වූයේ යූදාහි
රජු වූ අෂරියාගේ පාලන සමයේ
පනස්දෙවන අවුරුද්දේදීය. ඔහු සමා-
රියේ සිට අවුරුදු විස්සක් පාල-
නය කළේය. **28** ඔහුද යෙහෝවා
දෙවි පිළිකුල් කළ දේවල් දිගටම
කළේය.[11] ඊශ්‍රායෙල්වරුන්ව පාපයට
පෙලඹවූ[12] නෙබාත්ගේ පුත් යෙරො-
බොවම් කළ පාපවලින් ඔහු වැළකී
සිටියේ නැත.[13] **29** ඊශ්‍රායෙල්හි රජු
වූ පේකාගේ කාලයේදී ඇසිරියාවේ
රජු වූ[14] තිග්ලත්-පිලෙසෙර්,[15] දේශ-
යට පැමිණ ඊයොන්,[16] ආබෙල්-බෙත්-
මයකා,[17] යනෝවා, කෙදෙෂ්[18] සහ
හාෂෝර්[19] අල්ලාගත්තේය. ඔහු ගිලි-
යද් දේශයද[20] ගලීලයද[21] මුළු නෆ්තලී
දේශයද[22] අල්ලාගෙන, එහි වැසි-
යන්ව ඇසිරියාවට ගෙන ගියේය.[23]
**30** පසුව ඒලාහ්ගේ පුත් හෝෂෙයා,[24]
රෙමලියාගේ පුත් පේකාට විරුද්ධව
කුමන්ත්‍රණයක් දියත් කර,[25] ඔහුව
මරා[26] රජකම තම අතට ගත්තේය.
මෙය සිදු වූයේ උසියාගේ පුත් යෝ-
තම්ගේ පාලන සමයේ විසිවන අවු-

**15 පරි.**
1 2රාජා 8:12 ආමො 1:13
2 2රාජා 15:13
3 1රාජා 11:38
4 නික් 32:21 1රාජා 14:16
5 1රාජා 12:28 1රාජා 13:33
6 උත් 2:14 2රාජා 17:23
7 1ලේක 5:26
8 යෙරෙ 17:5
9 1රාජා 16:24
10 ද්වි 28:45 2රාජා 12:18 2රාජා 16:8
11 2රාජා 23:35
12 2රාජා 15:14
13 1රාජා 14:19 1කොරි 10:11
14 2රාජා 15:26
15 යෝබ් 20:5 හිතෝ 28:2

**2 තීරුව**
1 1රාජා 11:38 2රාජා 15:28
2 1රාජා 14:16
3 1රාජා 12:28 1රාජා 13:33
4 2රාජා 7:17 2රාජා 9:25
5 2ලේක 28:6
6 ගණන් 35:20 ද්වි 19:11
7 1රාජා 16:18
8 1රාජා 14:19
9 යෙසා 7:4 යෙසා 7:9
10 2ලේක 28:6 යෙසා 7:1
11 දේශ 12:13
12 නික් 20:3 1රාජා 14:16
13 1රාජා 12:28 1රාජා 13:33
14 යෙසා 8:4
15 2රාජා 16:7 1ලේක 5:6 1ලේක 5:26 2ලේක 28:20
16 1රාජා 15:20
17 2සාමු 20:18 1රාජා 15:20
18 යොෂු 19:37 යොෂු 20:7
19 යොෂු 11:10 විනි 4:2
20 ගණන් 32:40 ද්වි 3:15
21 යොෂු 20:7 1රාජා 9:11 යෙසා 9:1 මතෙ 4:15
22 යොෂු 19:32
23 ලෙවී 26:38 ද්වි 28:64 2රාජා 17:23
24 2රාජා 17:1

---

**25** ද්වි 19:11; **26** මතෙ 26:52.

රුද්දේදීය.[1] **31** පේකාගේ ජීවිතයේ
අනිකුත් සිදුවීම්ද ඔහු කළ සියල්ලද
ඊශ්‍රායෙල්හි රජවරුන්ගේ ඉතිහාසය
වාර්තා කර ඇති ලියවිල්ලෙහි සඳහන්
කර තිබේ.[2]

**32** ඊශ්‍රායෙල්හි රජු වූ රෙමලියාගේ
පුත් පේකාගේ පාලන සමයේ දෙවන
අවුරුද්දේදී යූදාහි රජු වූ උසියා-
ගේ පුත්[3] යෝතම්[4] රජකමට පත්
විය. **33** යෝතම් රජකමට පත් වන
විට ඔහුගේ වයස අවුරුදු විසිපහකි.
ඔහු යෙරුසලමේ සිට අවුරුදු දහස-
යක් පාලනය කළේය. ඔහුගේ මව
සාදොක්ගේ දියණිය වූ යෙරුෂාය.[5]
**34** ඔහු තම පියා වූ උසියා මෙන්[6] යෙ-
හෝවා දෙවි යහපත්යයි සලකන දේ
දිගටම කළේය.[7] **35** නමුත් දේශයේ
බොරු නමස්කාරය සඳහා තිබූ පූජ-
නීය ස්ථාන ඉවත් කිරීමට ඔහු අපො-
හොසත් විය. එබැවින් ජනයාද ඒ
පූජනීය ස්ථාන මත සුවඳ දුම් හා පූජා
දිගටම ඔප්පු කළෝය.[8] යෙහෝවා
දෙවිගේ ගෘහයේ ඉහළ දොරටුව ගො-
ඩනැඟුවේ ඔහුය.[9] **36** යෝතම්ගේ
ජීවිතයේ අනිකුත් සිදුවීම්ද ඔහු කළ
සියල්ලද යූදාහි රජවරුන්ගේ ඉතිහා-
සය වාර්තා කර ඇති ලියවිල්ලෙහි
සඳහන් කර තිබේ.[10] **37** ඒ කාල-
යේදී යෙහෝවා දෙවි යූදා දේශයට
විරුද්ධව යුද්ධ කිරීමට සිරියාවේ රජු වූ
රෙෂීන්ට[11] සහ රෙමලියාගේ පුත් පේ-
කාට[12] ඉඩ දුන්නේය.[13] **38** අවසා-
නයේදී යෝතම් රජ මිය ගියේය.
ඔහුගේ මුතුන්මිත්තන් මෙන් ඔහුවද
දාවිත්ගේ නුවරෙහි තැන්පත් කරන
ලදි.[14] ඔහුගෙන් පසුව ඔහුගේ පුත්
ආහස්[15] රජකමට පත් විය.

**16** රෙමලියාගේ පුත් පේකාගේ
පාලන සමයේ දහහත්වන
අවුරුද්දේදී යූදාහි රජු වූ යෝතම්ගේ
පුත් ආහස්[16] රජකමට පත් විය.
**2** ආහස් රජකමට පත් වන විට ඔහු-
ගේ වයස අවුරුදු විස්සකි. ඔහු යෙරු-
සලමේ සිට අවුරුදු දහසයක් පාලනය
කළේය. නමුත් ඔහු යෙහෝවා දෙවි
යහපත්යයි සලකන දේ කළ ඔහු-
ගේ මුතුන්මිත්තා වූ දාවිත් මෙන්
ක්‍රියා කළේ නැත.[1] **3** ඔහු ක්‍රියා
කළේ ඊශ්‍රායෙල්හි අනිකුත් රජව-
රුන් ක්‍රියා කළ ආකාරයටමය.[2] යෙ-
හෝවා දෙවි ඊශ්‍රායෙල්වරුන් අතරින්
පන්නා දැමූ ජාතීන් කළ පිළිකුල්සහ-
ගත ක්‍රියාවලද[3] ඔහු නිරත වූයේය.
ඔහු තමාගේම පුත්‍රයාව පවා පූජාවක්
ලෙස ගින්නෙන් දවා ඔප්පු කළේය.*[4]
**4** ඔහු පූජනීය ස්ථාන හා කඳු මුදුන්
මතද[5] සරුසාරව වැඩුණු සෑම ගසක්
යටද[6] පූජා හා සුවඳ දුම් ඔප්පු
කළේය.[7]

**5** ඒ කාලයේදී සිරියාවේ රජු වූ රෙ-
ෂීන්ද[8] ඊශ්‍රායෙල්හි රජු වූ රෙමලියාගේ
පුත් පේකාද[9] යුද්ධ කිරීම සඳහා යෙ-
රුසලමට පැමිණ ආහස් සිටි ප්‍රදේශය
වටලූ නමුත් ඔවුන්ට ආහස්ව පරාජය
කිරීමට හැකි වූයේ නැත.[10] **6** පසුව
සිරියාවේ රජු වූ රෙෂීන්, ඒලත් නග-
රය[11] නැවත ඒදොම් දේශයේ පාලනය
යටතට ගෙන, එහි සිටි යුදෙව්වන්ව
පන්නා දැමුවේය. ඉන්පසු ඒදොම්-
වරු ඒ නගරයේ පදිංචි වූහ. ඔවුහු
අද වන තුරුම එහි ජීවත් වන්-
නෝය. **7** එවිට ආහස් රජ ඇසිරියා-
වේ රජු වන තිග්ලත්-පිලෙසෙර්[12]
වෙතට පණිවිඩකරුවන් යවා මෙසේ
කීවේය. “මම ඔබේ සේවකයාය.[13]
ඔබේ පුත්‍රයාය. ඒ නිසා මට විරුද්-
ධව සටනට එන සිරියාවේ රජුගෙන්
හා ඊශ්‍රායෙල්හි රජුගෙන් මාව බේරා-
ගන්නා ලෙස ඔබෙන් ඉල්ලා සිටිමි.”[14]
**8** එමෙන්ම ආහස් රජ යෙහෝවා දෙ-
විගේ ගෘහයේ හා රජමාලිගාවේ භාණ්-
ඩාගාරයේ තිබූ රන් හා රිදී ගෙන,[15]
ඒවා ඇසිරියාවේ රජුට අල්ලසක් ලෙස
යැවීය.[16] **9** එබැවින් ඇසිරියාවේ රජ
ඔහු කී දේට ඇහුම්කන් දී දමස්කයට[17]
ගොස් එය යටත් කරගත්තේය.[18]

**15 පරි.**

**1** 2ලේක 27:1
**2** 1රාජා 14:19
**3** 2රාජා 14:21
2රාජා 15:1
1ලේක 3:12
**4** 1ලේක 3:12
2ලේක 27:7
මතෙ 1:9
**5** 2ලේක 27:1
**6** 2ලේක 27:2
**7** ද්වි 28:1
දේශ 12:13
**8** ගණන් 33:52
ද්වි 12:14
2ලේක 6:6
2ලේක 32:12
**9** 2ලේක 27:3
**10** 2රාජා 15:6
2ලේක 27:7
**11** 2රාජා 16:5
යෙසා 7:2
**12** 2රාජා 15:27
2ලේක 28:6
යෙසා 7:1
**13** ද්වි 28:49
ගීතා 78:49
යෙසා 10:5
යෙරෙ 43:10
**14** 1රාජා 14:31
**15** 1ලේක 3:13

**16 පරි.**

**16** යෙසා 1:1
යෙසා 7:1
හොෂෙ 1:1
මීකා 1:1
මතෙ 1:9

**2 තීරුව**

**1** 2ලේක 28:1
**2** 1රාජා 12:28
1රාජා 16:33
1රාජා 21:26
2රාජා 8:18
2ලේක 28:2
**3** ද්වි 12:31
ගීතා 106:35
එස 16:47
**4** ලෙවී 20:2
ද්වි 18:10
2රාජා 23:10
2ලේක 28:3
2ලේක 33:6
ගීතා 106:37
යෙසා 57:5
යෙරෙ 7:31
එස 16:20
එස 23:37
**5** 1රාජා 14:23
යෙරෙ 17:2
**6** ද්වි 12:2
**7** ගණන් 33:52
**8** 2රාජා 15:37
**9** 2ලේක 28:6
**10** 2ලේක 28:5
**11** 2රාජා 14:22
**12** 2රාජා 15:29
**13** 1රාජා 20:4

**14** ගීතා 146:3; යෙරෙ 17:5; විලා 4:17; **15** 1රාජා 15:18; 2රාජා 14:14; 2ලේක 16:2; **16** 2ලේක 19:7; **17** 2සාමු 8:6; 2රාජා 14:28; 2ලේක 28:5; යෙසා 7:6; **18** ආමො 1:5.

**2රාජා 16:3*** මු.අ., “ගින්න මැදින් යැමට සැලැස්වූවේය.”

පසුව එහි ජීවත් වූ වැසියන්ව කිර් නම්
ප්‍රදේශයට[1] ගෙන ගියේය. ඔහු රෙෂින්
රජුව[2] මරා දැමුවේය.
**10** පසුව ආහස් රජ[3] ඇසිරියාවේ
රජු වන තිග්ලත්-පිලෙසෙර්ව[4] හමු
වීමට දමස්කයට ගියේය. ඔහු දමස්ක-
යේ තිබූ පූජාසනය දැක[5] ඒ පූජාසනය
සාදා තිබූ ආකාරය පිළිබඳ විස්තර-
යක් ඇතුළත් සැලැස්මක් පූජක උරි-
යාහ්ට යැව්වේය.[6] **11** එවිට පූජක
උරියාහ්,[7] දමස්කයේ සිටි ආහස් රජු
එවූ විස්තරයට අනුව පූජාසනයක්
සෑදුවේය.[8] ඔහු දමස්කයේ සිට ආපසු
පැමිණීමට කලින් පූජක උරියාහ්
එම පූජාසනය සාදා නිම කළේය.
**12** රජ දමස්කයේ සිට පැමිණ සාදා
තිබූ ඒ පූජාසනය[9] මත පූජා ඔප්පු
කළේය.[10] **13** ඔහු ඒ පූජාසනය මත
දවන පූජාවක්ද[11] ධාන්‍ය පූජාවක්ද[12]
ඔප්පු කර[13] ඒ මත පාන පූජාවක්ද
වත් කළේය.[14] හවුල් පූජාවන් සඳහා
ඔප්පු කළ සතුන්ගේ ලේද පූජාසනය
මත ඉස්සේය. **14** ඉන්පසු ඔහු යෙ-
හෝවා දෙවිට පූජා ඔප්පු කිරීම සඳහා
දේවමාලිගාවට ඉදිරියෙන් තිබූ තඹ
පූජාසනය[15] එතැනින් ඉවත් කර තමා
සෑදූ පූජාසනයට උතුරින් එය තැබු-
වේය. කලින් තඹ පූජාසනය තිබුණේ
ඔහු ගොඩනැඟූ පූජාසනයත් යෙ-
හෝවා දෙවිගේ මාලිගාවත් අතරය.[16]
**15** එමෙන්ම ආහස් රජ පූජක උරි-
යාහ්ට[17] මෙසේ අණ කළේය. "මින්
ඉදිරියට උදැසන ඔප්පු කරන දවන
පූජාවත්[18] සවස ඔප්පු කරන ධාන්‍ය
පූජාවත්[19] මේ මහා පූජාසනය මත
ඔප්පු කළ යුතුයි. රජු ඔප්පු කරන
දවන පූජා[20] හා ධාන්‍ය පූජා මෙන්ම
දේශයේ වැසියන් ඔප්පු කරන දවන
පූජා, ධාන්‍ය පූජා හා පාන පූජා සියල්-
ලත් මේ මත ඔප්පු කරන්න. දවන
පූජාවක් ලෙස ඔප්පු කරන සතුන්ගේ
ලේ සහ අන් සියලු පූජාවන් සඳහා
ඔප්පු කරන සතුන්ගේ ලේ මේ මත
ඉසින්න. තඹ පූජාසනය භාවිත කළ
යුත්තේ කෙසේද කියා මම සිතා
බලා පසුව ඔබට දැනුම් දෙන්නම්."
**16** පූජක උරියාහ්,[1] ආහස් රජු කී
සියල්ල කළේය.[2]
**17** ආහස් රජ දේවමාලිගාවේ මළු-
වේ තිබූ කරත්තවල[3] පැතලි තහඩු[4]
කැලිවලට කපා[5] ඒ මත තිබුණු භාජන
ගලවා දැමුවේය.[6] ඔහු තඹවලින් සාදා
තිබූ ගොනුන් මත තබා තිබූ වට-
කුරු භාජනය[7] රැගෙන[8] ගල් වේදිකා-
වක් මත තැබුවේය. **18** එපමණක්ද
නොව සබත් දවසේදී භාවිත කිරීම
සඳහා සාදා තිබුණු ශාලාවද රජතු-
මාට ඇතුල් වීමට තිබූ මාර්ගයද යෙ-
හෝවා දෙවිගේ ගෘහයෙන් ඔහු ඉවත්
කළේය. ඇසිරියාවේ රජු කෙරෙහි තිබූ
භය නිසා ආහස් රජ ඒ දේවල් කළේය.
**19** ආහස් රජුගේ ජීවිතයේ අනිකුත්
සිදුවීම් හා ඔහු කළ දේවල් ගැන
යූදාහි රජවරුන්ගේ ඉතිහාසය වාර්තා
කර ඇති ලියවිල්ලෙහි සඳහන් කර
තිබේ.[9] **20** කලක් ගත වූ පසු ආහස්
රජ මිය ගියේය. ඔහුගේ මුතුන්-
මිත්තන් මෙන් ඔහුවද දාවිත්ගේ නුව-
රෙහි තැන්පත් කරන ලදි.[10] ඔහුගෙන්
පසුව ඔහුගේ පුත් හෙසකියා[11] රජක-
මට පත් විය.

**17** යූදාහි රජු වූ ආහස්ගේ පාලන
සමයේ දොළොස්වන අවු-
රුද්දේදී ඒලාගේ පුත් හෝෂෙයා[12]
ඊශ්‍රායෙල්හි රජකමට පත් විය. ඔහු
සමාරියේ සිට[13] අවුරුදු නවයක් පාල-
නය කළේය. **2** ඔහු යෙහෝවා දෙවි
පිළිකුල් කළ දේවල් කළත් ඔහුට
කලින් ඊශ්‍රායෙල්හි පාලනය කළ රජ-
වරුන් මෙන් ඔහු කටයුතු නො-
කළේය.[14] **3** ඇසිරියාවේ රජ[15] වන
ෂල්මනෙසෙර්[16] ඊශ්‍රායෙල්වරුන්ට
විරුද්ධව යුද්ධ කිරීමට පැමිණියේ
ඔහුගේ පාලන සමයේදීය. හෝෂෙයා
රජ ඔහුට යටත් වී කප්පම් ගෙ-
වීමට පොරොන්දු විය.[17] **4** නමුත්
ටික කලකට පසු හෝෂෙයා රජ ඇසි-
රියාවේ රජුට අවුරුද්දක් අවුරුද්දක්
පාසා ගෙවූ කප්පම් නතර කළේය.
ඔහු ඊජිප්තුවේ රජු වන සෝ වෙතට

**16 පරි.**
1 යෙසා 22:6 ආමො 9:7
2 යෙසා 7:1 යෙසා 9:11
3 2රාජා 16:7
4 2රාජා 15:29
5 ද්වි 12:30 2ලේක 28:23 යෙරෙ 10:2
6 ගීතා 106:39
7 යෙසා 8:2
8 යෙරෙ 23:11 එස 22:26
9 2ලේක 26:16 2ලේක 28:25
10 ගණන් 18:4 ගණන් 18:7
11 ලෙවී 1:3
12 ලෙවී 2:1 1ලේක 23:29
13 ලෙවී 2:2
14 ලෙවී 23:13
15 1ලේක 28:12 2ලේක 4:1
16 1රාජා 6:1
17 යෙසා 8:2
18 නික් 29:39 ගණන් 28:2 2ලේක 28:23
19 ගණන් 28:4
20 ලෙවී 4:22 ලෙවී 22:21 2ලේක 7:4 2ලේක 29:21

**2 තීරුව**
1 යෙසා 8:2
2 2රාජා 16:11
3 1රාජා 7:27
4 1රාජා 7:28
5 2ලේක 28:24 2ලේක 29:19
6 1රාජා 7:38 2ලේක 4:6 යෙරෙ 52:20
7 1රාජා 7:23 2රාජා 25:13
8 1රාජා 7:25 යෙරෙ 52:20
9 1රාජා 14:29 2ලේක 28:26
10 2ලේක 28:27
11 2රාජා 18:1 1ලේක 3:13 2ලේක 29:1 යෙසා 1:1 හොෂෙ 1:1 මතෙ 1:9

**17 පරි.**
12 2රාජා 15:30
13 යෙසා 7:9
14 1රාජා 12:28 1රාජා 13:33 1රාජා 16:33
15 යෙසා 10:5
16 2රාජා 18:9 හොෂෙ 10:14

17 ද්වි 28:45; 2රාජා 18:14; එස්රා 7:24.

තම දූත පිරිසක්ද යැවීය.[1] හෝෂෙයා
රජු තමන්ට ද්‍රෝහී වූ බව[2] දැනගත්
විට ඇසිරියාවේ රජ හෝෂෙයා රජුව
සිර අඩස්සියේ තැබුවේය.[3]
**5** පසුව ඇසිරියාවේ රජ ඊශ්‍රායෙල්
දේශයේ සියලුම පළාත් ආක්‍රමණය
කළේය. ඔහු සමාරියටත් පැමිණ අවු-
රුදු තුනක් පුරා එය වටලාගෙන සිටි-
යේය.[4] **6** හෝෂෙයා රජුගේ පාලන
සමයේ නවවන අවුරුද්දේදී ඇසිරියා-
වේ රජ සමාරිය යටත් කරගත්තේය.[5]
ඉන්පසු ඊශ්‍රායෙල්වරුන්ව ඇසිරියා-
වට රැගෙන ගියේය.[6] ඔහු ඔවුන්ව
හලා නම් ස්ථානයේද[7] ගෝසාන් ගඟ[8]
අසල පිහිටි හාබෝර් නම් ස්ථාන-
යේද මේදියවරුන්ට අයත් නුවරවලද[9]
පදිංචි කරවීය.
**7** මේ සියල්ල සිදු වූයේ ඔවුන්
ඊජිප්තුවේ රජු වූ පාරාවෝගේ අතින්
තමන්ව නිදහස් කර, එම දේශයෙන්
පිටතට ගෙනා තමන්ගේ දෙවි වූ
යෙහෝවාට[10] විරුද්ධව පව් කර,[11]
වෙනත් දෙවිවරුන්ට නමස්කාර කිරී-
මට පටන්ගත් නිසාය.[12] **8** ඊශ්‍රා-
යෙල්වරු, යෙහෝවා දෙවි විසින්
පන්නා දැමූ ජාතීන් අනුගමනය කළ
චාරිත්‍ර අනුවද[13] තමන් විසින්ම පත්
කරගත් රජවරුන් පැනවූ නියෝග
අනුවද ක්‍රියා කළෝය. **9** මෙසේ
ඊශ්‍රායෙල්වරු තම දෙවි වන යෙ-
හෝවා අනුමත නොකළ ක්‍රියාවල
නිරත වූවෝය.[14] ඔවුන්ගේ සියලු නුව-
රවල ඔවුහු පූජනීය ස්ථාන සෑදූ-
වෝය.[15] විශාල ජනාවාස නුවරවල
පමණක් නොව ඈත එපිට පිහිටි
කුඩා මුරකොටුවල පවා[16] එම පූජනීය
ස්ථාන දක්නට තිබිණ. **10** ඔවුහු
සෑම කඳු මුදුනකම[17] සහ සරු-
සාරව වැඩුණු සෑම ගසක් යටම[18]
නමස්කාරය සඳහා කණුද[19] කුලුනුද[20]
සෑදූවෝය. **11** ඔවුන්ගේම යහපත
තකා යෙහෝවා දෙවි පන්නා දැමූ
ජාතීන් කළ ලෙසම ඔවුහුද ඒ සියලු
පූජනීය ස්ථාන මත සුවඳ දුම් ඔප්පු
කළෝය.[21] මෙසේ ඔවුහු යෙහෝවා
දෙවිව උදහස් කරවන දුෂ්ට දේවල්
දිගටම කළෝය.[1]
**12** "රූපවලට නමස්කාර නො-
කළ යුතුයි"[2] කියා යෙහෝවා දෙවි
පවසා තිබුණද ඔවුහු පිළිකුල් රූපව-
ලට*[3] දිගටම නමස්කාර කළෝය.
**13** එමෙන්ම යෙහෝවා දෙවි තම
සියලු අනාගතවක්තෘවරුන් මාර්-
ගයෙන්ද[4] දර්ශන මගින් පණිවිඩ
දුන් සියල්ලන් මාර්ගයෙන්ද[5] ඊශ්‍රා-
යෙල්හි[6] සහ යූදාහි[7] වැසියන්ට නැවත
නැවත මෙසේ අනතුරු ඇඟෙව්වේය.[8]
"ඔබ කරන මේ දුෂ්ටකම් නතර
කර,[9] මාගේ ආඥා[10] සහ නියෝග[11]
පිළිපදින්න. ඔබේ මුතුන්මිත්තන්ට
දුන්[12] සියලු නීති[13] රක්ෂා කරන්න.
මාගේ සේවකයන් සහ අනාගත-
වක්තෘවරුන් මාර්ගයෙන් මා ඔබට
දුන් සෑම අවවාදයක්ම පිළිගන්න."[14]
**14** නමුත් ඔවුහු ඊට සවන් දුන්-
නේ නැත. තමන්ගේ දෙවි වන යෙ-
හෝවා කෙරෙහි විශ්වාසය නොතැබූ
ඔවුන්ගේ මුතුන්මිත්තන් මෙන්[15] ඔවු-
හුද මුරණ්ඩු ලෙස ක්‍රියා කළෝය.[16]
**15** දෙවි ඔවුන්ගේ මුතුන්මිත්තන්ට
දුන් නියෝග, අනතුරු ඇඟවීම් හා
සිහිගැන්වීම්[17] ඔවුහු අමතක කළෝය.
මුතුන්මිත්තන් සමඟ දෙවි ඇති කර-
ගත් ගිවිසුමද අමතක කර[18] දිග-
ටම දෙවිට විරුද්ධව ක්‍රියා කළෝය.
තමන් අවට සිටින ජාතීන් මෙන්
නොහැසිරෙන ලෙස යෙහෝවා දෙවි
ඔවුන්ට අණ කර තිබුණත්[19] ඔවුහු ඒ
ජාතීන් මෙන් කිසි වැඩකට නැති දේ-
වතා රූපවලට නමස්කාර කළෝය.[20]
මෙසේ ඔවුහුද කිසි වැඩකට නැති
ජාතියක් බවට පත් වූහ.[21]
**16** ඔවුහු තම දෙවි වන යෙ-
හෝවා දුන් සෑම ආඥාවක්ම කඩ

**17 පරි.**
**1** යෙසා 30:2; යෙසා 31:1
**2** 2රාජා 24:1; 2රාජා 24:20; එස 17:15
**3** ද්වි 28:36
**4** ද්වි 28:52
**5** 2රාජා 18:10; හොෂෙ 13:16
**6** ලෙවී 26:32; ද්වි 4:27; ද්වි 28:64; 1රාජා 14:15
**7** 1ලේක 5:26
**8** 2රාජා 18:11
**9** 2රාජා 18:11
**10** නික් 20:2
**11** ද්වි 31:29; ද්වි 32:15; යොෂු 23:16; නෙහෙ 9:26; ගීතා 106:35; ආමො 5:7
**12** නික් 20:5; 2රාජා 17:35; යෙරෙ 10:5
**13** ගීතා 89:31
**14** ද්වි 13:6; ද්වි 27:15; එස 8:12
**15** 2රාජා 16:4; හොෂෙ 12:11
**16** 2රාජා 18:8
**17** ද්වි 12:2
**18** 2රාජා 16:4; යෙසා 57:5
**19** නික් 34:13; ලෙවී 26:1
**20** ද්වි 7:5; ද්වි 16:21; මීකා 5:14
**21** ලෙවී 20:23; යෙරෙ 44:17

**2 තීරුව**
**1** හිතෝ 15:8
**2** නික් 20:3; ලෙවී 26:1; ද්වි 4:23
**3** නික් 34:14; ලෙවී 26:30; 1රාජා 12:28; 1රාජා 21:26
**4** 2ලේක 24:19; 2ලේක 36:16; හෙබ්‍රෙ 1:1
**5** 1සාමු 9:9; 1ලේක 29:29
**6** හොෂෙ 4:15
**7** යෙරෙ 3:11
**8** ද්වි 8:19; ද්වි 32:46; ගීතා 81:8
**9** යෙසා 55:7; යෙරෙ 18:11; යෙරෙ 25:4; එස 18:31
**10** නික් 24:7; ද්වි 6:1
**11** ද්වි 8:11
**12** ද්වි 5:1

**13** නික් 20:1; නික් 21:1; **14** යෙරෙ 7:25; **15** ද්වි 1:32; **16** ද්වි 31:27; යෙරෙ 5:29; **17** ගීතා 19:7; හොෂෙ 4:6; **18** ද්වි 5:2; ද්වි 29:12; **19** ද්වි 12:30; **20** ද්වි 32:21; 1සාමු 12:21; යෙරෙ 10:15; 1කොරි 8:4; **21** ගීතා 115:8; යෙසා 44:9; යෙරෙ 2:5; රෝම 1:21.

**2රාජා 17:12*** 1රාජා 15:12හි පාදසටහන බලන්න.

කර,[1] වසු රූප දෙකක්ද[2] නමස්කාරය
සඳහා කුලුනක්ද[3] සාදාගත්තෝය.
තවද ඔවුහු ආකාශයේ වස්තූන් ඉදිරි-
යේ[4] මෙන්ම බාල් දෙවියන් ඉදිරි-
යේ[5] වැඳ වැටීමටද පටන්ගත්තෝය.
**17** එපමණක්ද නොව ඔවුහු තම දූපු-
තුන්ව ගින්නෙන් දවා පූජා ලෙස ඔප්පු
කළෝය.[6] මන්තර ගුරුකම් කිරීමටද[7]
නැකත් බැලීමටද[8] ඔවුහු පෙලඹු-
ණෝය. ඔවුහු හිතාමතාම යෙහෝවා
දෙවි පිළිකුල් කළ දේ කරමින්[9] ඔහුව
උදහස් කළෝය.[10]
**18** එබැවින් යෙහෝවා දෙවි ඊශ්‍රා-
යෙල්වරුන් සමඟ බොහෝ සෙයින්
උදහස් වී[11] තම අනුමැතිය ඔවුන්-
ගෙන් ඉවත් කළේය. ඔහු ඔවුන්ව
දේශයෙන් පන්නා දැමුවේය.[12] යූදා
ගෝත්‍රය හැර වෙන කිසි ගෝත්‍ර-
යක් දේශයේ ඉතුරු වීමට ඉඩහැරියේ
නැත.[13]
**19** නමුත් යූදා ගෝත්‍රයද තම
දෙවි වන යෙහෝවාගේ ආඥාවලට
කීකරු වූයේ නැත.[14] ඔවුහු ඊශ්‍රා-
යෙල්වරුන් සාදාගත් චාරිත්‍ර අනුව
ක්‍රියා කළෝය.[15] **20** එබැවින් යෙ-
හෝවා දෙවි මුළු ඊශ්‍රායෙල් ජාතියම
ප්‍රතික්ෂේප කළේය.[16] දෙවි ඔවුන්ට
පීඩා පමුණුවා ඔවුන්ව නැති නාස්ති
කර දැමීමට ඔවුන්ගේ සතුරන්ට ඉඩ
දුන්නේය. මෙසේ දෙවි තම අනු-
මැතිය ඔවුන්ගෙන් ඉවත් කළේය.[17]
**21** දෙවි ඊශ්‍රායෙල්වරුන්ව, දාවිත්ගේ
පෙළපතෙන් වෙන් කළ විට ඔවුහු නෙ-
බාත්ගේ පුත් යෙරොබෝවම්ව තමන්-
ගේ රජු හැටියට පත් කරගත්තෝය.
යෙරොබෝවම් රජ,[18] ඊශ්‍රායෙල්ව-
රුන්ව බරපතළ පාපයක් කිරීමට
පෙලඹවූ[19] නිසා ඔවුහු යෙහෝවා දෙ-
විව අත්හැරියෝය. **22** ඊශ්‍රායෙල්වරු
යෙරොබෝවම් රජු කළ පාපවලින්
වැළකී සිටිනවා වෙනුවට ඔහු කළ
සියලු පාපවල දිගටම නියැළී සිටි-
යෝය.[20] **23** අවසානයේදී යෙහෝවා
දෙවි, තම සේවකයන් වූ සියලු අනා-
ගතවක්තෘවරුන් මාර්ගයෙන් පවසා
තිබූ පරිදි[21] තම අනුමැතිය ඊශ්‍රායෙල්-
වරුන් වෙතින් ඉවත් කර ඔවුන්ව දේ-
ශයෙන් පන්නා දැමුවේය.[1] එබැවින්
ඊශ්‍රායෙල්වරුන්ව වහලුන් ලෙස ඇසිරි-
යාවට ගෙන යන ලදි. ඔවුහු අද දක්-
වාම එහි සිටිති.[2]
**24** ඇසිරියාවේ රජ බැබිලෝනිය,[3]
කූතා, අව්වා,[4] හමාත්[5] සහ සෙෆාර්වා-
යිම්[6] යන ස්ථානවල විසූ ජනයාව
ගෙනැවිත්, ඊශ්‍රායෙල්වරුන් කලින්
පදිංචිව සිටි සමාරියේ නගරවල[7] පදිංචි
කරවීය. ඔවුහු සමාරිය අයිති කරගෙන
එහි නගරවල ජීවත් වූහ. **25** ඔවුහු
එහි වාසය කිරීමට පටන්ගත් මුල්
කාලයේදී යෙහෝවා දෙවිට ගරුබිය
පෙන්වූයේ නැත.[8] එබැවින් යෙහෝවා
දෙවි ඔවුන් වෙතට සිංහයන් එව්වේය.[9]
ඒ සිංහයෝ ඔවුන්ගෙන් සමහරෙකුව
මරා දැමුවෝය. **26** එබැවින් ඔවුහු
ඇසිරියාවේ රජුට පණිවිඩ යවා මෙසේ
කීවෝය. “රජතුමනි, ඔබ සමාරියේ
නගරවල පදිංචි කළ ජාතීන් සමාරියේ
දෙවිව හඳුනන්නේ නැති නිසා ඒ දෙවි
ඔවුන් වෙතට සිංහයන් එව්වා.[10] ඒ
සිංහයන් ඔවුන්ගෙන් සමහරෙකුව මරා
දැමුවා. ඔවුන්ට එවැන්නක් සිදු වී
තිබෙන්නේ ඔවුන් ඒ දේශයේ දෙවිට
නමස්කාර කළ යුත්තේ කෙසේද කියා
නොදන්නා නිසයි.”
**27** එවිට ඇසිරියාවේ රජ මෙසේ
අණ කළේය. “වහල්කමට මෙහි
ගෙනා පූජකයෙකුව[11] ආපසු ඒ දේශ-
යට ගෙන ගොස් එහි සිටින වැසියන්ට
ඒ දේශයේ දෙවිට නමස්කාර කළ
යුත්තේ කෙසේද කියා ඉගැන්වීමට
ඔහුට අණ කරන්න.” **28** එබැවින්
සමාරියෙන් ගෙන ගිය පූජකයන්ගෙන්
එක් කෙනෙක් නැවත බෙතෙල් නග-
රයට[12] පැමිණ, එහි සිටි මනුෂ්‍යයන්ට
යෙහෝවා දෙවි කෙරෙහි ගරුබිය
ඇතුව ජීවත් වීමට ඉගැන්වූවේය.[13]
**29** එහෙත් ඒ දේශයේ පදිං-
චිව සිටි ජාතීන් නමස්කාර කළේ

**17 පරි.**
**1** ද්වි 4:2
**2** 1රාජ 12:28; 2ලේක 13:8; 2ලේක 28:2
**3** 1රාජ 14:15; 1රාජ 16:33
**4** ද්වි 4:19; 2රාජ 23:5; යෙරෙ 8:2
**5** 1රාජ 16:31; 1රාජ 22:53; 2රාජ 10:21
**6** 2රාජ 16:3; 2රාජ 21:6; යෙසා 57:5
**7** ද්වි 18:10; 2ලේක 33:6; මීකා 5:12; ක්‍රියා 16:16
**8** ලෙවී 19:26; 2රාජ 21:6
**9** 1රාජ 21:20
**10** නික් 34:14; 1රාජ 15:30
**11** ද්වි 9:8; ද්වි 29:20; 1රාජ 8:46
**12** යොෂු 23:13; යෙසා 42:24; යෙරෙ 15:1
**13** 1රාජ 11:32; 1රාජ 12:20
**14** 1රාජ 14:22; 2ලේක 21:10; යෙරෙ 3:8
**15** එස 23:11
**16** 2ලේක 20:7; යෙරෙ 6:30
**17** 2රාජ 13:3
**18** 1රාජ 11:31; 1රාජ 12:20
**19** නික් 32:31; 1සාමු 2:17; 1රාජ 14:16
**20** 1රාජ 12:28; 1රාජ 13:33
**21** ද්වි 28:63; 1රාජ 14:16; හොෂෙ 1:4; ආමො 5:27; මීකා 1:6

**2 තීරුව**
**1** ද්වි 32:26; 2රාජ 13:23; 2රාජ 23:27
**2** 2රාජ 18:11
**3** 2රාජ 17:30
**4** 2රාජ 17:31; යෙසා 37:13
**5** 2රාජ 19:13; යෙසා 10:9
**6** 2රාජ 18:34; යෙසා 36:19
**7** මතෙ 10:5
**8** හිතෝ 8:13; දේශ 12:13; යෙරෙ 10:7; දානි 6:26

**9** නික් 23:29; යෙරෙ 5:6; **10** හිතෝ 30:30; **11** එස්රා 7:10; මලා 2:7; **12** උත් 28:19; යොෂු 16:1; 1සාමු 7:16; 1රාජ 12:29; **13** දේශ 8:12; යෙසා 29:13; යොහ 4:22.

තම තමන්ගේ දෙවිවරුන්ටය.[1] ඔවුහු
තමන් නමස්කාර කළ දෙවිවරුන්ගේ
රූප සාදා, කලින් සමාරියේ සිටි
ජනයා සෑදූ පූජනීය ස්ථානවල ඒ
රූප තැබුවෝය. මෙසේ ඒ දේශයේ
වාසය කළ එක් එක් ජාතිය තම
තමන් විසූ නුවරවල තැබීමට දේවතා
රූප සාදාගත්තෝය. **30** බැබිලෝ-
නියෙන් පැමිණි අය සුක්කොත්-
බෙනොත් දෙවියන්ගේද කූත් සිට
පැමිණි අය[2] නේර්ගල් දෙවියන්ගේද
හමාත් සිට පැමිණි අය අෂීමා දෙවි-
යන්ගේද රූප සෑදුවෝය. **31** අව්වා
නගරයෙන් පැමිණි අය[3] නිබ්හස්
සහ තර්තාක් යන දෙවිවරුන්ගේ
රූපද සෑදුවෝය. සෙෆාවායිම් නගර-
යෙන් පැමිණි අය[4] සෙෆාවායිම්වරුන්-
ගේ දෙවිවරුන් වන අද්‍රම්මෙලෙක්
සහ අනම්මෙලෙක්ට තමන්ගේ පුත්‍ර-
යන්ව පූජාවක් ලෙස ගින්නෙන් දවා
ඔප්පු කළෝය.[5] **32** ඔවුන්ට යෙ-
හෝවා දෙවි කෙරෙහිත් බියක් තිබිණ.
පූජනීය ස්ථානවල සේවය කිරීමට
සාමාන්‍ය ජනයා අතරින්ම ඔවුහු
පූජකයන්ව පත් කරගත්තෝය.[6]
**33** ඔවුන්ට යෙහෝවා දෙවි කෙරෙහි
බියක් තිබුණද[7] ඔවුහු තමන්ගේම දෙ-
විවරුන්ට නමස්කාර කිරීම නතර
කළේ නැත.[8] ඔවුහු තමන් කලින්
පදිංචිව සිටි දේශයන්වල තිබූ ආගම්
ඇදහුවෝය.[9]
**34** යෙහෝවා දෙවි යාකොබ්ට
ඊශ්‍රායෙල් යන අලුත් නාමය[10] දී ඔහු-
ගේ පුත්‍රයන්ට[11] තම ආඥා, තීන්දු[12]
හා නියෝග[13] දී තිබිණ. එහෙත්
යෙහෝවා දෙවි දුන් එම නීතිව-
ලට[14] අනුව ජීවත් වූ එක වැසි-
යෙකුවත් දේශයේ සොයාගැනීමට
නොහැකි විය. දෙවි කෙරෙහි ගරු-
බිය දැක්වූ කිසිවෙක් නොසිටියේය.[15]
ඔවුහු සියලුදෙනා මේ දක්වාම තමන්
කලින් නමස්කාර කළ දෙවිවරුන්ට
නමස්කාර කරමින් සිටින්නෝය.[16]
**35** යෙහෝවා දෙවි ඊශ්‍රායෙල්වරුන්
සමඟ ගිවිසුමක් ඇති කරගත්[17] අවස-
ථාවේ මෙසේ අණ කර තිබුණේය.
“ඔබ වෙනත් දෙවිවරුන්ට සේවය
නොකළ යුතුයි.[1] ඔවුන් ඉදිරියේ වැඳ
වැටී ඔවුන්ට නමස්කාර කරන්න-
වත් පුදපූජා ඔප්පු කරන්නවත් එපා.[2]
**36** මම මාගේ මහත් බලය විදහා-
පෙන්වා ඊජිප්තු දේශයෙන් ඔබව නිද-
හස් කළෙමි.[3] එබැවින් ඔබ නමස්කාර
කළ යුත්තේ යෙහෝවා දෙවි වන මට
පමණි.[4] ඔබ වැඳ වැටිය යුත්තේ මා
ඉදිරියේ පමණි.[5] පූජා ඔප්පු කළ යුත්-
තේද මට පමණි.[6] **37** මා ඔබට
ලියා දුන්[7] මාගේ නියෝග[8] හා තීන්-
දුද[9] මාගේ ආඥා හා නීතිද සැමදා
පිළිපදින්න.[10] කිසිවිටෙකත් වෙනත්
දෙවිවරුන්ට නමස්කාර නොකරන්න.
**38** මා ඔබ සමඟ ඇති කරගත්
ගිවිසුම අමතක නොකරන්න.[11] වෙ-
නත් දෙවිවරුන්ට නමස්කාර නොක-
රන්න.[12] **39** ඔබ නමස්කාර කළ
යුත්තේ ඔබේ දෙවි වන යෙහෝවාට
පමණයි.[13] මන්ද ඔබේ සියලු සතුරන්
අතින් ඔබව ගලවාගන්නේ මමය.”[14]
**40** නමුත් ඔවුහු දෙවිට කීකරු
නොවී කලින් ඇදහූ ආගම්වල වත්-
පිළිවෙත්වලට අනුව ජීවත් වූහ.[15]
**41** එම ජාතීන්ට යෙහෝවා දෙවි කෙ-
රෙහි බියක් තිබුණද[16] ඔවුන් නමස්-
කාර කළේ තමන් සාදාගත් දේවතා
රූපවලටය. ඔවුන්ගේ දරුවෝද මුනු-
පුරෝද එලෙසම ක්‍රියා කළෝය. අද
දක්වාම ඔවුහු තම මුතුන්මිත්තන් හා
සමානව ක්‍රියා කරති.

**18** ඊශ්‍රායෙල්හි රජු වූ ඒලාගේ
පුත් හෝෂෙයාගේ[17] පාලන
සමයේ තුන්වන අවුරුද්දේදී යූදාහි රජු
වූ ආහස්ගේ පුත්[18] හෙසකියා[19] රජක-
මට පත් විය. **2** හෙසකියා රජකමට
පත් වන විට ඔහුගේ වයස අවුරුදු විසි-
පහකි. ඔහු යෙරුසලමේ සිට අවුරුදු
විසිනවයක් පාලනය කළේය. ඔහු-
ගේ මව සෙකරියාගේ දියණිය වූ
අබිය.[20] **3** ඔහුගේ මුතුන්මිත්තා වූ

**17 පරි.**
**1** ගීතා 96:5 ගීතා 135:15 යෙසා 44:9 යෙරෙ 10:5 මීකා 4:5 රෝම 1:23 1කොරි 8:4
**2** 2රාජා 17:24
**3** 2රාජා 17:24
**4** 2රාජා 18:34
**5** 2රාජා 17:17 2ලේක 28:3 ගීතා 106:37 යෙසා 57:5 එස 20:31
**6** 1රාජා 12:31 1රාජා 13:33
**7** 2රාජා 17:41 යෙසා 29:13
**8** ලූක් 16:13 2කොරි 6:16
**9** 2රාජා 17:24
**10** උත් 32:28 උත් 35:10 යෙසා 48:1
**11** උත් 28:14 උත් 46:2
**12** ද්වි 5:1 ද්වි 8:11 2රාජා 17:13
**13** ද්වි 6:2
**14** ද්වි 1:5
**15** 2රාජා 17:25
**16** යෙසා 44:8 1කොරි 10:20
**17** නික් 19:5 නික් 24:7 ද්වි 5:2 ද්වි 29:1 යෙරෙ 31:31

**2 තීරුව**
**1** නික් 20:4 විනි 6:10
**2** නික් 20:5 නික් 23:24 නික් 34:14 ද්වි 4:25 ද්වි 5:9
**3** නික් 6:6 ද්වි 5:15 යෙරෙ 32:21
**4** ද්වි 6:13 ගීතා 34:9 හිතෝ 8:13
**5** ගීතා 95:6 ගීතා 96:9
**6** ලෙවී 19:5 ද්වි 12:6
**7** ද්වි 31:9
**8** ද්වි 12:1
**9** ද්වි 11:32
**10** ද්වි 5:29
**11** ද්වි 4:23
**12** ද්වි 5:9
**13** යෙසා 42:8
**14** නෙහෙ 9:27
**15** ද්වි 4:28 2රාජා 17:34
**16** යොෂු 24:14 එස්රා 4:2

**18 පරි.** **17** 2රාජා 15:30; 2රාජා 17:1; **18** 2රාජා 16:2; 2රාජා 16:20; **19** 1ලේක 3:13; 2ලේක 28:27; මතෙ 1:9; **20** 2ලේක 29:1.

දාවිත් මෙන්[1] හෙසකියා රජද යෙ-
හෝවා දෙවි යහපත්යයි සලකන දේ
දිගටම කළේය.[2] **4** ඔහු ඒ දේශයේ
පූජනීය ස්ථාන ඉවත් කළේය.[3] ඔහු
බොරු නමස්කාරය සඳහා සාදා තිබූ
කණු[4] සහ කුලුනු කඩා බිඳ දැමුවේය.[5]
මෝසෙස් විසින් සෑදූ[6] තඹ සර්පයාවද
කුඩු කර දැමුවේය.[7] මන්ද ඊශ්‍රායෙල්-
වරු ඒ වන තුරුම ඊට සුවඳ දුම් ඔප්පු
කරමින් සිටියෝය.[8] එම රූපයට තඹ
සර්පයා යන නම දෙන ලදි.[9] **5** හෙ-
සකියා රජ, ඊශ්‍රායෙල්හි දෙවි වන
යෙහෝවා කෙරෙහි තම විශ්වාසය
තැබුවේය.[10] ඔහුට පෙර හා පසුව යූදා
දේශය පාලනය කළ රජවරුන් අතරේ
ඔහු හා සමාන රජ කෙනෙක් සිටි-
යේ නැත.[11] **6** ඔහු යෙහෝවා දෙවිව
අත් නොහැර[12] දිගටම ඔහුට නමස්-
කාර කළේය. යෙහෝවා දෙවි, මෝ-
සෙස් මාර්ගයෙන් දුන් ආඥා ඔහු
දිගටම පිළිපැද්දේය.[13] **7** යෙහෝවා
දෙවිද හෙසකියා රජු සමඟ දිගටම
සිටියේය.[14] ඒ නිසා හෙසකියා රජ
සියලු අවස්ථාවලදී නුවණැතිව ක්‍රියා
කළේය.[15] ඔහු ඇසිරියාවේ රජුට සේ-
වය නොකර ඔහුට විරුද්ධව කැර-
ලිගැසුවේය.[16] **8** ඔහු ගාසා නුවරේ
දේශ සීමාව[17] දක්වා තිබෙන ප්‍රදේශව-
ලද ගාසාහි සියලු පළාත්වලද ජීවත්
වූ පිලිස්තිවරුන්ව මරා දැමුවේය.[18]
ගාසාහි විශාල ජනාවාස ප්‍රදේශවල
පමණක් නොව ඈත එපිට පිහිටි කුඩා
මුරකොටුවල[19] සිටි අයට පවා ඔහු
පහර දුන්නේය.

**9** හෙසකියා රජු පාලනය කළ
හතරවන අවුරුද්දේදී එනම්, ඊශ්‍රා-
යෙල්හි රජු වූ ඒලාගේ පුත් හෝෂෙයා
පාලනය කළ හත්වන අවුරුද්දේදී[20]
ඇසිරියාවේ රජු වූ ෂල්මනෙසෙර්[21]
සමාරිය වැටලුවේය.[22] **10** අවුරුදු
තුනක කාලයක් ඇතුළතදී ඔහු සමා-
රිය යටත් කරගත්තේය.[23] එය හෙස-
කියා රජුගේ පාලන සමයේ හයවන
අවුරුද්ද වූ අතර ඊශ්‍රායෙල්හි රජු වූ
හෝෂෙයාගේ පාලන සමයේ නවවන
අවුරුද්ද විය.[24] **11** පසුව ඇසිරියා-
වේ රජ[1] ඊශ්‍රායෙල්වරුන්ව ඇසිරි-
යාවට රැගෙන ගොස්,[2] හලා නම්
ස්ථානයේද[3] ගෝසාන් ගඟ අසල
පිහිටි හාබෝර් නම් ස්ථානයේද[4] මේදි-
යවරුන්ට අයත් නුවරවලද[5] පදිංචි
කරවීය. **12** මේ සියල්ල සිදු වූයේ
ඔවුන් තම දෙවි වන යෙහෝවාගේ
හඬට කීකරු නොවී[6] ඔහු සමඟ ඇති
කරගත් ගිවිසුම කඩ කළ නිසාය.[7]
යෙහෝවා දෙවිගේ සේවකයා වූ මෝ-
සෙස්[8] ඔවුන්ට දුන් සියලු ආඥා ඔවුහු
ප්‍රතික්ෂේප කළෝය.[9] ඔවුහු දෙවිට
සවන් දුන්නේවත් ඔහු කී ලෙස ක්‍රියා
කළේවත් නැත.

**13** හෙසකියා රජුගේ පාලන සම-
යේ දහහතරවන අවුරුද්දේදී ඇසිරියා-
වේ රජු වූ[10] සෙනකෙරිබ්,[11] යූදා
දේශයේ පවුරුවලින් වට වී තිබූ සුරක්-
ෂිත නුවරවලට විරුද්ධව යුද්ධ කර
ඒවා යටත් කරගත්තේය. **14** එබැ-
වින් යූදාහි රජු වූ හෙසකියා, ලාකිෂ්
නගරයේ සිටි ඇසිරියාවේ රජුට පණි-
විඩ යවා මෙසේ කීවේය. “මම වරදක්
කළ බව පිළිගන්නවා. ඒ නිසා මට
විරුද්ධව කරන යුද්ධය දැන් නතර
කරන්න. ඔබ මගෙන් ඉල්ලන ඕනෑම
දෙයක් මම ඔබට දෙන්නම්.”[12] එවිට
ඇසිරියාවේ රජ තමාට රිදී තලෙන්ත
තුන්සියයකුත්[13] රන් තලෙන්ත තිහ-
කුත් දෙන ලෙස යූදාහි රජු වූ හෙසකි-
යාට නියම කළේය. **15** එබැවින්
හෙසකියා රජ, යෙහෝවා දෙවිගේ
ගෘහයේද[14] රජමාලිගාවේ භාණ්ඩා-
ගාරයේද[15] තිබූ රිදී සියල්ල ඔහුට
දුන්නේය. **16** හෙසකියා රජ තමන්
විසින්ම රනින් ආවරණය කළ[16] යෙ-
හෝවා දෙවිගේ ගෘහයේ දොරවල්ද[17]
උළුවහුද ගලවා ඇසිරියාවේ රජුට
දුන්නේය.*

**18 පරි.**
**1** 1රාජා 3:14
1රාජා 15:5
2ලේක 29:2
**2** 2රාජා 20:3
2ලේක 31:20
2ලේක 31:21
ගීතා 119:128
**3** ලෙවී 26:30
ගණන් 33:52
1රාජා 3:2
2රාජා 14:4
ගීතා 78:58
**4** ද්වි 7:5
2ලේක 31:1
**5** ද්වි 12:3
**6** ගණන් 21:9
**7** ගණන් 21:8
**8** හිතෝ 15:8
**9** 1කොරි 8:4
**10** 2ලේක 16:9
2ලේක 32:7
ගීතා 91:2
යෙරෙ 17:7
**11** 2රාජා 19:15
2ලේක 15:17
2ලේක 20:33
**12** ද්වි 10:20
යොෂු 23:8
**13** 2රාජා 17:13
යෙරෙ 11:4
**14** 2ලේක 15:2
ගීතා 46:11
ගීතා 60:12
**15** 1සාමු 18:14
හිතෝ 20:18
**16** 2රාජා 16:7
**17** යොෂු 13:3
**18** 2ලේක 28:18
යෙසා 14:29
**19** 2රාජා 17:9
2ලේක 26:10
**20** 2රාජා 17:1
**21** 2රාජා 17:4
**22** 2රාජා 17:5
**23** හොෂෙ 13:16
ආමො 3:11
මීකා 1:6
මීකා 6:16
මීකා 7:13
**24** 2රාජා 17:6

**2 තීරුව**
**1** 2රාජා 19:11
යෙසා 8:4
හොෂෙ 8:9
ආමො 5:3
**2** ආමො 6:7
ආමො 9:4
**3** 2රාජා 17:6
**4** 1ලේක 5:26
**5** 2රාජා 17:6
**6** ද්වි 8:20
1රාජා 14:15
2රාජා 17:7
නෙහෙ 9:17
**7** ද්වි 29:25
2රාජා 17:15
නෙහෙ 9:26
යෙරෙ 34:18

**8** නික් 19:3; නික් 24:12; **9** ද්වි 5:1; **10** යෙසා 10:5; **11** 2ලේක 32:1; යෙසා 36:1; **12** 2රාජා 18:7; හිතෝ 29:25; ලූක් 14:32; **13** 1රාජා 16:24; **14** 2රාජා 16:8; **15** 2රාජා 12:18; 2ලේක 16:2; **16** 2ලේක 29:3; **17** 1රාජා 6:33; 1රාජා 6:35.

**2රාජා 18:16*** ඔහු දුන්නේ එම උළුවහු හා දොර-වල් ආවරණය කර තිබූ රන් බව පැහැදිලිය.

**17** පසුව ඇසිරියාවේ රජ,[1] තර්-
තාන්,*[2] රබ්සාරිස්# සහ රබ්ෂාකේව△[3]
මහත් හමුදාවක් සමඟ යෙරුසලමේ
විසූ හෙසකියා රජු වෙත යැව්වේය.
ඔවුහු ලාකිෂ් නගරයේ[4] සිට යෙරුසල-
මට පැමිණ, රෙදි සෝදන්නන්ගේ පිට්-
ටනියට යන මාර්ගයෙහි[5] පිහිටි ඉහළ
පොකුණේ[6] දිය අගල[7] ළඟ නැවතු-
ණේය. **18** රජුව හමු වීමට අවශ්‍ය
බව ඔවුන් පැවසූ විට, රජමාලිගාවේ
වැඩකටයුතු භාරව සිටි හිල්කියාගේ
පුත් එලියාකීම්ද[8] ලේකම් වූ ෂෙබ්-
නාහ්ද[9] වාර්තාකරු වූ ආසාෆ්ගේ පුත්
යෝවාද ඔවුන්ව හමු වීමට පැමිණි-
යෝය.

**19** එවිට රබ්ෂාකේ[10] ඔවුන්ට
මෙසේ කීවේය. "ඇසිරියාවේ රජු වන
මහ රජ්ජුරුවෝ[11] හෙසකියාට එවූ මේ
පණිවිඩය ගොස් ඔහුට කියන්න. 'ඔබ
දැන් කවුරුන් මතද විශ්වාසය තබා-
ගෙන ඉන්නේ?[12] **20** යුද්ධය මෙ-
හෙයවීමට අවශ්‍ය උපදේශකයන්[13]
සිටින බව හා හමුදා බලය ඔබට
තිබෙන බව ඔබ පැවසුවත් ඒවා
නිකම්ම නිකම් වචන විතරයි. ඔබ
මට විරුද්ධව කැරලිගසන්න[14] තරම්
ධෛර්යයක් උපදවාගත්තේ කාගේ
ශක්තියෙන්ද? **21** තැළුණු බට දණ්-
ඩක් වගේ[15] ඉන්න ඊජිප්තුවෙන්ද ඔබ
පිහිට පතන්නේ?[16] තැළුණු බට දණ්-
ඩක් ඇල්ලුවොත් වෙන්නේ තමාගේම
අත තුවාල වෙන එක විතරයි. ඊජිප්-
තුවේ රජු වන පාරාවෝ[17] කෙරෙහි
විශ්වාසය තැබූ හැමෝටම වෙලා
තියෙන්නේ ඒ දේමයි. **22** එහෙමත්
නැත්නම් ඔබ මට කියන්න හදන්නේ,
ඔබේ දෙවි වන යෙහෝවා[18] මත ඔබ
විශ්වාසය තබනවා කියාද?[19] ඒ දෙවි-
යන්ගේ ශුද්ධස්ථාන[20] හා පූජාසන
නෙවෙයිද හෙසකියා කඩා දැමුවේ?[21]
ඔහු ඒවා කඩා දමා, "යෙරුසලමේ
තිබෙන පූජාසනය ඉදිරියේ නමස්කාර
කරන්න" කියා යූදා සහ යෙරුස-
ලමේ වැසියන්ට පැවසුවේ නැද්ද?[1]
**23** මගේ ස්වාමීන් වන ඇසිරියාවේ
රජු ඔබට දැන් අශ්වයන් දෙදහසක්
දුන්නොත්[2] අඩුම තරමින් ඒ අශ්වයන්
ගණනට අසරුවන් සොයාගන්නවත්
ඔබට පුළුවන් වෙයිද?[3] **24** ඊජිප්තු-
වෙන් අශ්ව රථ[4] සහ අසරුවන්[5]
ලැබෙයි කියා බලාපොරොත්තුවෙන්
ඉන්න ඔබට, මගේ ස්වාමියාට සේ-
වය කරන සුළුම නිලධාරියෙකුටවත්
පහර දෙන්න පුළුවන්ද?[6] **25** මම
මේ නගරය විනාශ කරන්න ආවේ යෙ-
හෝවා දෙවිගේ අනුමැතිය නැතුව
කියාද ඔබ සිතන්නේ? "ඒ දේශ-
යට විරුද්ධව යුද්ධ කර එය විනාශ
කරන්න" කියා මට කිව්වේ යෙහෝවා
දෙවිමයි.' "[7]

**26** එවිට හිල්කියාගේ පුත් එලියා-
කීම්ද[8] ෂෙබ්නාහ්ද[9] යෝවාද[10] රබ්-
ෂාකේට[11] මෙසේ කීවෝය. "ඔබේ
සේවකයන් වන අපට සිරියානු භාෂාව
තේරෙනවා. ඒ නිසා අපට සිරි-
යානු භාෂාවෙන් කතා කරන්න.[12]
යුදෙව් භාෂාවෙන්[13] කතා කළොත්
පවුර උඩ සිටින අයටත් ඔබ කියන
දේ තේරෙයි." **27** එහෙත් රබ්ෂාකේ
ඔවුන්ට මෙසේ කීවේය. "මගේ ස්වා-
මියා මාව එව්වේ ඔබට හා ඔබේ
ස්වාමියාට පමණක් මේ පණිවිඩය
දෙන්න නෙවෙයි. පවුරේ ඉන්න අයත්
මේ පණිවිඩය ඇසිය යුතුයි. මන්ද
තව කෙටි කාලයකින් ඒ සියලුදෙ-
නාටම ඔවුන්ගේම අසූචි කන්නත්[14]
ඔවුන්ගේම මුත්‍රා බොන්නත් සිදු වෙ-
නවා.[15] ඔබට සිදු වෙන්නෙත් ඒ දේ-
මයි."

**28** එසේ පැවසූ රබ්ෂාකේ තවදුර-
ටත් යුදෙව් භාෂාවෙන්ම හඬ නඟා
මෙසේ කීවේය.[16] "ඇසිරියාවේ රජු
වන මහ රජ්ජුරුවන්ගේ පණිවිඩ-
යට ඇහුම්කන් දෙන්න.[17] **29** 'ජන-
යෙනි, හෙසකියා කියන දේට ඔබ
රැවටෙන්න එපා. ඔබව මගේ අතින්
ගලවාගන්න ඔහුට බැහැ.[18] **30** හෙ-
සකියා ඔබට මෙහෙම කියයි. "යෙ-
හෝවා දෙවි අපව ගලවන බවට

**2රාජා 18:17*** හෝ, "හමුදාපති." **17#** හෝ, "රජමාලිගාවේ සිටින ප්‍රධාන නිලධාරියා." **17△** හෝ, "කුසලාන දරන්නන්ගේ ප්‍රධානියා."

**18 පරි.**
**1** 2ලේක 32:9
**2** යෙසා 20:1
**3** යෙසා 36:2
යෙසා 37:8
**4** යොෂු 15:39
2ලේක 11:9
**5** යෙසා 36:2
**6** යෙසා 7:3
**7** 2රාජා 20:20
**8** 2රාජා 19:2
යෙසා 22:20
යෙසා 36:3
මතෙ 10:16
**9** යෙසා 22:15
**10** යෙසා 36:4
**11** යෙසා 10:8
**12** 2රාජා 19:10
2ලේක 32:10
ගීතා 4:2
යෙසා 36:7
යෙසා 37:10
**13** හිතෝ 20:18
**14** 2රාජා 18:7
එස්රා 4:15
**15** යෙසා 36:6
එස 29:6
**16** යෙසා 30:2
යෙසා 31:1
**17** 2රාජා 17:4
**18** 2ලේක 32:8
**19** 2රාජා 18:19
**20** 2ලේක 31:1
2ලේක 32:12
**21** යෙසා 36:7

**2 තීරුව**
**1** ද්වි 12:11
ද්වි 12:13
2ලේක 7:12
**2** යෙසා 36:8
**3** ගීතා 123:4
යෙසා 10:13
**4** ගීතා 20:7
**5** ද්වි 17:16
යෙසා 31:1
යෙසා 36:9
**6** යෙසා 10:8
**7** 2රාජා 19:6
2රාජා 19:22
**8** 2රාජා 18:18
යෙසා 22:20
**9** යෙසා 22:15
**10** යෙසා 36:11
**11** 2රාජා 18:17
යෙසා 36:2
**12** එස්රා 4:7
දානි 2:4
**13** නෙහෙ 13:24
ක්‍රියා 22:2
**14** ද්වි 28:53
2රාජා 6:25
එස 4:15
**15** 2ලේක 32:11
යෙසා 36:12
**16** 2ලේක 32:18
යෙසා 36:13
**17** 2රාජා 18:13
**18** 1රාජා 20:11
2ලේක 32:15
දානි 3:15

කිසිම සැකයක් නැහැ.[1] මේ නගරය
ඇසිරියාවේ රජුගේ අතට පත් වෙන්න
දෙවි කිසිදාක ඉඩ දෙන්නේ නැහැ.”[2]
එහෙම කියා යෙහෝවා දෙවි කෙරෙහි
ඔබ තුළ විශ්වාසයක් ඇති කරන්න
ඔහු උත්සාහ දරයි. එහෙත් ඔහුව විශ්-
වාස කරන්න එපා.[3] **31** ඔහු කියන
දේට ඇහුම්කන් දෙන්න එපා. ඒ
වෙනුවට ඇසිරියාවේ රජුට ඇහුම්-
කන් දෙන්න. ඔහු පැවසුවේ මෙ-
යයි. “දැන් මා ඉදිරියට ඇවිත් මට
යටත් වෙන්න. එවිට ඔබේම මිදිවැලේ
හා අත්තික්කා ගසේ පල කන්න
ඔබට පුළුවන් වෙයි.[4] ඔබේම පොකු-
ණෙන් වතුර බොන්නත් පුළුවන්.[5]
**32** මම ඔබේ දේශය හා සමාන හොඳ
දේශයකට ඔබව ගෙන යන්නම්.[6]
ධාන්‍යයෙන් සහ අලුත් වයින්වලින්ද
රොටි[7] සහ මිදිවතුවලින්ද[8] ඔලීව ගස්
සහ මීපැණිවලින්ද[9] පිරුණු දේශයක
ඔබට සුවසේ ජීවත් වෙන්න පුළු-
වන්. හෙසකියා කියන දේට ඇහුම්-
කන් දෙන්න එපා. ‘යෙහෝවා දෙවි
අපිව ගලවාගනියි’ කියා පවසමින්
ඔහු ඔබව රවටනවා.[10] **33** ඇසි-
රියාවේ රජු[11] වන මම යටත් කර-
ගත් දේශවල වැසියන් නමස්කාර කළ
එක දෙවියෙකුටවත් පුළුවන් වුණාද
තමාගේ දේශය ගලවාගන්න?[12]
**34** හමාත්[13] සහ අර්පාද්[14] නගර-
වල දෙවිවරුන්ට මොනවද වුණේ?
සෙෆාවායිම්,[15] හේනා[16] සහ ඉව්වා[17]
යන නගරවල දෙවිවරුන්ට මොනවද
වුණේ? මගේ අතින් සමාරිය ගල-
වාගන්න ඔවුන්ට පුළුවන් වුණාද?[18]
**35** මම යටත් කරගත් දේශයන්-
වල සිටි එක දෙවියෙකුටවත් බැරි
වුණා නම් තමන්ගේ දේශය බේරා-
ගන්න,[19] යෙහෝවා දෙවිට පුළුවන්
වෙයිද යෙරුසලම මගේ අතින් ගල-
වාගන්න?” ’ ”[20]

**36** එහෙත් ජනයා ඔහුට පිළි-
තුරු නොදී[21] නිශ්ශබ්දව සිටියෝය.[22]
මන්ද, “ඔහුට පිළිතුරු දෙන්න එපා”[23]
කියා රජතුමා අණ කර තිබිණ.
**37** පසුව, රජමාලිගාව භාරව සිටි
හිල්කියාගේ පුත් එලියාකීම්ද[1] ලේකම්
වූ ෂෙබ්නාහ්ද[2] වාර්තාකරු වූ ආසාෆ්-
ගේ පුත් යෝවාද[3] තම වස්ත්‍ර ඉරා-
ගෙන[4] හෙසකියා රජු ළඟට ගොස්
රබ්ෂාකේ පැවසූ දේ ඔහුට දැන්වූහ.

**19** එය ඇසූ විගස හෙසකියා රජ[5]
තම වස්ත්‍ර ඉරා[6] ගෝණි රෙදි
ඇඳගෙන[7] යෙහෝවා දෙවිගේ ගෘහ-
යට ගියේය.[8] **2** ඔහු රජමාලිගාවේ
වැඩකටයුතු භාරව සිටි එලියාකීම්-
ටද[9] ලේකම් වූ ෂෙබ්නාහ්ටද[10] පූජක-
යන්ගේ ප්‍රධානීන්ටද ගෝණි රෙදි
ඇඳ, ආමොෂ්ගේ පුත්[11] අනාගත-
වක්තෘ යෙසායා[12] වෙතට යන ලෙස
පැවසුවේය. **3** ඔවුහු ගොස් යෙසා-
යාව හමු වී මෙසේ කීවෝය. “හෙස-
කියා රජ මෙසේ පැවසුවා. ‘අද ඉතා
දුක්බර දවසක්.[13] අපි දැඩි විවේචනය-
ටත්[14] බොහෝ නින්දා අපහාසවල-
ටත් ලක් වුණා.[15] අපි, දරුවා බිහි
වෙන්න ළංව සිටියත්[16] දරුවාව බිහි
කරන්න තරම් ශක්තියක් නැති ස්ත්‍රි-
යක් හා සමානයි.[17] **4** රබ්ෂාකේගේ
ස්වාමියා වන ඇසිරියාවේ රජ ඔහුව
එව්වේ ජීවමාන දෙවිට සරදම් කරන්-
නයි.[18] සමහරවිට යෙහෝවා දෙවි
රබ්ෂාකේ පැවසූ දේවල් සැලකිල්ලට
ගෙන[19] ඔහුට නිසි දඬුවම් දෙයි.
ඔහු පැවසූ දේවල් ගැන අනිවාර්-
යයෙන්ම යෙහෝවා දෙවිට ගණන්
දෙන්න ඔහුට සිදු වෙයි.[20] නමුත් දැන්
මම ඔබෙන් ඉල්ලා සිටින්නේ ඉතු-
රුව සිටින මේ සෙනඟ වෙනුවෙන්[21]
යාච්ඤා කරන්න කියායි.’ ”[22]

**5** හෙසකියා රජුගේ සේවකයන්
යෙසායාට මෙම පණිවිඩය දුන් පසු[23]
**6** යෙසායා ඔවුන්ට මෙසේ පැවසු-
වේය. “ගිහින් ඔබේ ස්වාමියාට මෙසේ
කියන්න. ‘යෙහෝවා දෙවිගේ පිළි-
තුර මෙයයි.[24] “ඇසිරියාවේ රජුගේ

**18 පරි.**
**1** 1සාමු 14:6 ගීතා 71:12 ගීතා 125:1
**2** 2රාජා 19:32 යෙසා 36:15
**3** 2රාජා 18:19 2රාජා 19:22 ගීතා 11:1 ගීතා 22:8
**4** 1රාජා 4:20 1රාජා 4:25
**5** යෙසා 36:16
**6** 2රාජා 17:6 2රාජා 17:23
**7** 1ලේක 16:3
**8** ද්වි 8:8 යෙසා 36:17
**9** හිතෝ 24:13
**10** 2රාජා 18:29
**11** 2රාජා 18:30
**12** යෙසා 36:18
**13** ගණන් 13:21 2සාමු 8:9 2රාජා 19:13
**14** යෙරෙ 49:23
**15** 2රාජා 17:24 යෙසා 36:19
**16** යෙසා 37:13
**17** 2රාජා 19:13
**18** 2රාජා 17:6 2රාජා 17:23
**19** 2රාජා 19:17
**20** 2රාජා 19:19 2ලේක 32:15 යෝබ් 15:25 ගීතා 2:2 යෙසා 36:20 යෙසා 37:23
**21** හිතෝ 9:7 හිතෝ 26:4 යෙසා 36:21 2තිමෝ 2:24
**22** ගීතා 38:13 ගීතා 39:1 දේශ 3:7
**23** ගීතා 38:15

**2 තීරුව**
**1** 2රාජා 18:18
**2** යෙසා 22:15
**3** යෙසා 36:3 යෙසා 36:22
**4** උත් 37:29 2රාජා 22:11

**19 පරි.**
**5** යෙසා 37:1
**6** 1සාමු 4:12 2රාජා 18:37 එස්රා 9:3 යෝබ් 1:20
**7** උත් 37:34 1රාජා 21:27 2රාජා 6:30 එස්ත 4:1 ගීතා 35:13 යෙසා 22:12
**8** 2ලේක 7:16 ගීතා 73:17

**9** 2රාජා 18:18; **10** යෙසා 37:2; **11** යෙසා 2:1; **12** යෙසා 1:1; **13** 2සාමු 22:7; 2ලේක 20:9; යෝබ් 5:19; හොෂෙ 5:15; **14** හෙබ්‍රෙ 3:15; **15** 2රාජා 18:32; නෙහෙ 4:4; **16** යෙසා 26:17; **17** යෙසා 37:3; **18** 1සාමු 17:45; 2රාජා 18:35; **19** ගීතා 65:2; **20** ගීතා 74:22; **21** යෙසා 37:4; **22** 2ලේක 32:20; ගීතා 50:15; යාකො 5:16; **23** යෙසා 37:5; **24** යෙසා 37:6.

සේවකයෝ මට අපහාස කරමින් කී
දේවලට[1] භය නොවන්න.[2] **7** මම
ඔහුගේ අදහස වෙනස් කරන්නෙමි.[3]
ඔහුට ආරංචියක් ලැබී[4] ඔහු නැවත
තමාගේ රටට හැරී යනු ඇත. පසුව
ඔහුගේ රටේදීම ඔහු කඩුවෙන් මැරුම්
කන්නේය."'"[5]

**8** පසුව ඇසිරියාවේ රජු ලාකිෂ්
නගරයෙන්[6] පිටත්ව ගිය බව රබ්ෂා-
කේට[7] ආරංචි වී ඔහු රජුව හමු
වීමට ගියේය. ඒ අවස්ථාවේදී රජ
ලිබ්නා නගරයට විරුද්ධව යුද්ධ
කරමින් සිටියේය.[8] **9** ඉතියෝපි-
යාවේ රජු වන තිර්හාකා තමාට
විරුද්ධව යුද්ධයට එන බව ඇසිරි-
යාවේ රජුට ආරංචි විය. ඒ ගැන
ඇසූ විගස ඔහු හෙසකියා රජු වෙ-
නට නැවත පණිවිඩකරුවන් යව-
මින්[9] මෙසේ කීවේය. **10** "යූදාහි
රජු වන හෙසකියාව හමු වී මෙසේ
කියන්න. '"යෙරුසලම[10] ඇසිරියා-
වේ රජුගේ අතට පත් වෙන්නේ
නැහැ"[11] කියා ඔබ විශ්වාස කරන
ඔබේ දෙවියන් ඔබට කියයි. නමුත්
ඔබ ඊට රැවටෙන්න එපා.[12] **11** ඇසි-
රියාවේ රජවරු අනික් දේශයන් විනාශ
කළ හැටි ඔබ අසා නැද්ද?[13] එසේ-
නම් ඔබට පමණක් බේරෙන්න
ලැබෙයි කියා ඔබ හිතන්නේ කො-
හොමද?[14] **12** මගේ මුතුන්මිත්තන්
විනාශ කළ දේශවල ජීවත් වූ වැසි-
යන් නමස්කාර කළ එක දෙවියෙ-
කුටවත්[15] පුළුවන් වුණාද ඔවුන්ගේ
සෙනඟ බේරාගන්න? ගෝසාන්,[16]
හාරාන්,[17] රෙෂෙප් හා ටෙල්-අසර් දේ-
ශයේ[18] සිටි ඒදන්හි වැසියන්ටවත්[19]
බේරෙන්න බැරි වුණා. **13** හමාත්,[20]
අර්පාද්,[21] සෙෆාවායිම්, හේනා සහ
ඉව්වා[22] යන නගරවල රජවරුන් දැන්
කොහේද?'"

**14** හෙසකියා රජ එම පණිවිඩ-
කරුවන් තමාට දුන් ලිපිය ගෙන
කියෙව්වේය.[23] ඉන්පසු හෙසකියා රජ
යෙහෝවා දෙවිගේ ගෘහයට ගොස්
එම ලිපිය යෙහෝවා දෙවි ඉදිරි-
යේ තැබුවේය.[24] **15** ඔහු යෙහෝවා
දෙවි ඉදිරියේ යාච්ඤා කරමින්[1]
මෙසේ කීවේය. "අනේ යෙහෝවා දෙ-
වියනි, පොළොවේ[2] සියලු රාජ්‍යයන්ට
වඩා උසස්ව සිටින එකම සැබෑ වූ
දෙවි ඔබයි.[3] කෙරුබ්වරුන් පිට හිඳ-
ගෙන සිටින[4] ඊශ්‍රායෙල්හි දෙවියනි,[5]
අහසත්[6] පොළොවත්[7] නිර්මාණය
කළේ ඔබයි. **16** යෙහෝවා දෙවි-
යනි, අපේ කන්නලව්වලට ඇහුම්කන්
දෙන්න.[8] අනේ යෙහෝවා දෙවියනි,
අප දෙස බලන්න.[9] ජීවමාන දෙවි වන
ඔබට අපහාස කිරීම සඳහා සෙන-
කෙරිබ් ලියා තිබෙන මේ දේවලට
ඔබේ අවධානය යොමු කරන්න.[10]
**17** යෙහෝවා දෙවියනි, ඇසිරියාවේ
රජවරුන් විවිධ ජාතීන්වත් ඔවුන්ගේ
දේශයනුත් විනාශ කළ බව ඇත්-
තයි.[11] **18** ඒ ජාතීන් නමස්කාර කළ
දෙවිවරුන්වත් ඔවුන් පුලුස්සා දැමුවා.
නමුත් ඔවුන් සැබෑ දෙවිවරුන් නෙ-
වෙයි,[12] ලී සහ ගල්වලින් සාදාගත්
රූප පමණයි.[13] ඒ නිසයි ඔවුන්ට ඒ
දෙවිවරුන්ව විනාශ කරන්න පුළුවන්
වුණේ. **19** අනේ යෙහෝවා දෙවි-
යනි,[14] ඇසිරියාවේ රජුගේ අතින් අපව
බේරාගන්න.[15] එවිට යෙහෝවා නම් වූ
ඔබ පමණක් සැබෑ දෙවි බව පොළො-
වේ සියලු රජවරුන් දැනගනීවි."[16]

**20** පසුව ආමොෂ්ගේ පුත් යෙ-
සායා, හෙසකියා රජුට මෙසේ කියා
යැව්වේය. "ඊශ්‍රායෙල්හි දෙවි වන යෙ-
හෝවා මෙසේ පැවසුවා.[17] 'ඇසිරියා-
වේ රජු වන සෙනකෙරිබ් ගැන ඔබ
කළ යාච්ඤාවට[18] මම සවන් දුනිමි.[19]
**21** යෙහෝවා දෙවි වන මම සෙන-
කෙරිබ්ට විරුද්ධව මේ දේ ප්‍රකාශ
කරමි.

"සියොන් කන්‍යා දියණිය ඔබව
හෙළාදකින්නීය.[20] ඔබව
සමච්චලයට ලක් කරන්-
නීය.[21]

**19 පරි.**
1 2රාජා 18:17, ගීතා 74:18
2 ද්වි 20:3, යෙසා 41:10, යෙසා 51:7
3 යෝබ් 4:9, යෙසා 37:7
4 යෝබ් 15:21, හිතෝ 21:1, ඔබ 1
5 2ලේක 32:21, යෙසා 37:38
6 2රාජා 18:14, මීකා 1:13
7 2රාජා 18:17
8 යොෂු 10:29, 2රාජා 8:22, යෙසා 37:8
9 2රාජා 18:17
10 2ලේක 32:2
11 යෙසා 37:10
12 2රාජා 18:5, 2රාජා 18:30, 2ලේක 32:15
13 2රාජා 17:5, 2ලේක 32:13, යෙසා 10:11
14 යෙසා 37:11
15 1ලේක 16:26, 1කොරි 8:4
16 යෙසා 37:12
17 උත් 11:31, උත් 29:4
18 යෙසා 37:12
19 එස 27:23
20 2රාජා 17:24
21 2රාජා 18:34
22 යෙසා 37:13
23 යෙසා 37:14
24 1රාජා 8:30, එස්රා 9:5, ගීතා 74:10

**2 තීරුව**
1 2ලේක 32:20, දානි 9:3, පිලි 4:6
2 2රාජා 5:15, යෙසා 44:6, දානි 4:25
3 1ලේක 29:11
4 නික් 25:22, ලෙවී 16:2, 1සාමු 4:4, ගීතා 80:1
5 1රාජා 8:23
6 උත් 1:1, ගීතා 96:5, ගීතා 102:25, යොහ 1:3
7 යෙසා 37:16
8 1රාජා 8:29, ගීතා 31:2, ගීතා 65:2
9 2ලේක 16:9, දානි 9:18
10 හිතෝ 27:11, යෙසා 37:4, යෙසා 37:17

**11** 2රාජා 16:9; 2රාජා 17:6; 2රාජා 17:24; **12** ගීතා 96:5; යෙසා 37:19; යෙසා 41:29; 1කොරි 8:4; **13** ගීතා 115:4; යෙරෙ 10:3; ක්‍රියා 17:29; **14** ගීතා 135:4; **15** යෙසා 37:20; **16** ගීතා 83:18; යෙසා 45:5; **17** යෙසා 37:21; **18** 2රාජා 19:15; හිතෝ 15:8; **19** යෙසා 58:9; **20** විලා 1:15; විලා 2:13; මීකා 4:8; සෙක 9:9; **21** යෝබ් 22:19.

යෙරුසලම් දියණිය[1] ඔබව විහි-
ළුවට ලක් කරමින් සිනා-
සෙන්නීය.[2]
22 ඔබ අපහාස කරමින්[3] සමච්චල-
යට ලක් කළේ කාවද?[4]
ඔබ අහංකාරකමින් කතා කළේ
කාට විරුද්ධවද?[5]
උඩඟු ලෙස බැලුවේ කා දෙසද?[6]
මේ සෑම දෙයක්ම ඔබ කළේ
ඊශ්‍රායෙල්හි ශුද්ධ තැනැත්තා
වන මට විරුද්ධවයි![7]
23 ඔබේ පණිවිඩකරුවන් ලවා[8] ඔබ
යෙහෝවා දෙවි වන මට
අභියෝග කරමින් මෙසේ
කීවේය.[9]
‘මාගේ යුධ රථ සේනාවන්
සමඟ[10]
මම කඳුකරයේ ඉහළටම නඟිමි.[11]
ලෙබනොන් දේශයේ[12] ඈත
කෙළවරටම ගොස්,
එහි දැවැන්ත දේවදාර ගස්ද[13]
හොඳම ජුනිපර් ගස්ද[14] කපා
දමමි.
එහි පලතුරු උයන් කෙළවරටම
වුවද මම යමි.[15]
24 මම බිම හාරා කිසිදා නොබිව්වා වූ
වතුර බොන්නෙමි.
ඊජිප්තුවේ නයිල් ගඟේ සියලු
අතු ගංගා පිට ඇවිද ඒවා සිඳ-
වන්නෙමි.’[16]
25 බොහෝ කාලයක සිට මා කිරීමට
තීරණය කළ දේ[17] ඔබට
ආරංචි වුණේ නැද්ද?[18]
මුල සිටම මම එය සැලසුම්
කළෙමි.[19]
දැන් මම එය ඉටු කරන්නෙමි.[20]
සුරක්ෂිත නුවරවල් විනාශ කර
පාළු නටබුන් ගොඩක් බවට
පත් කිරීමට මම ඔබව යො-
දාගනිමි.[21]
26 එම නුවරවල වැසියෝ කිසි-
වක් කරකියාගත නොහැ-
කිව අසරණ වනු ඇත.[22]
ඔවුහු භය වී ලැජ්ජාවට පත්
වන්නෝය.[23]

19 පරි.
1 යෙසා 37:22
2 යෝබ් 16:4
ගීතා 22:7
ගීතා 109:25
මතෙ 27:39
3 2රාජා 19:10
4 ගණන් 15:30
5 2රාජා 18:30
යෙසා 10:13
යෙසා 14:13
මතෙ 23:12
6 හිතෝ 30:13
යෙසා 37:23
7 ගීතා 71:22
ගීතා 89:18
යෙරෙ 51:5
8 2රාජා 18:17
9 2රාජා 19:4
2ලේක 32:17
10 යෝබ් 40:11
ගීතා 20:7
ගීතා 68:17
11 යෙසා 10:10
12 1රාජා 5:6
13 විනි 9:15
2රාජා 14:9
14 යෙසා 14:8
යෙසා 37:24
යෙසා 60:13
එස 31:8
15 යෙසා 37:24
16 යෙසා 37:25
17 යෙසා 14:24
18 නික් 9:14
යොෂු 9:9
1සාමු 4:8
යෙසා 37:26
19 ලෙවී 26:33
ගීතා 33:11
යෙසා 46:11
20 යෙසා 46:10
21 ලෙවී 26:32
යෙසා 10:5
යෙසා 37:26
22 ගීතා 48:6
යෙරෙ 51:30
23 ගීතා 48:5

2 තීරුව
1 ගීතා 92:7
යෙසා 40:7
යාකො 1:11
2 ගීතා 102:11
යෙසා 37:27
3 ගීතා 129:6
4 ද්වි 28:6
ගීතා 121:8
හිතෝ 5:21
5 2ලේක 16:9
යෙරෙ 23:24
හෙබ්‍රෙ 4:13
1පේතෘ 3:12
6 යෙසා 37:28
7 ගීතා 10:13
ගීතා 46:6
යෙසා 10:15

ඔවුහු කෙතේ මැලවී යන පැළෑටි
මෙන්ද[1]
නැඟෙනහිර දෙසින් හමන
සුළඟට වියළී යන[2] පියස්-
සේ තණකොළ මෙන්ද[3] වනු
ඇත.
27 ඔබ හිඳගෙන සිටින විටත් පිට වී
යන විටත්[4] නැවත ගෙට
එන විටත් ඔබ කරන හැම
දෙයක්ම මම දනිමි.[5]
මට විරුද්ධව ඔබ කෝපයෙන්
ක්‍රියා කරන හැටිත් මම
දනිමි.[6]
28 ඔබ මහත් කෝපයෙන් මට විරුද්-
ධව කළ[7] චෝදනා මගේ
කනට වැටී ඇත.[8]
මම ඔබේ නාසයට කොක්කක්ද
කටට කටකලියාවක්ද දමා[9]
ඔබ ආ පාරෙන්ම නැවත ඔබව
ඇදගෙන යන්නෙමි.”[10]

29 “‘මෙය ඔබට ලකුණක් වනු
ඇත.[11] පසුගිය අස්වැන්නේදී කෙතේ
වැටුණු බීජවලින් හටගන්නා පලදා-
වෙන් ඔබට මේ අවුරුද්දේ කන්න පුළු-
වන.[12] දෙවන අවුරුද්දේදී ඉබේම
පලදාවක් හටගනී. ඔබට ඒ පල-
දාවෙන් දෙවන අවුරුද්දේදී කන්න
ලැබෙයි. නමුත් තුන්වන අවුරුද්දේදී
ඔබම බීජ වපුරා[13] අස්වැන්න නෙළා-
ගන්න. මිදිවතු වවා ඒවායේ පලදාව
කන්න.[14] 30 යූදා පෙළපතේ බේරී
ජීවත් වන අය[15] ගැඹුරට මුල් බැස
ඇති ගසක් මෙන් පල දරනවා ඇත.[16]
31 මන්ද කුඩා සෙනඟක් යෙරුසල-
මෙන් නික්ම එනු ඇත.[17] බේරී ජීවත්
වන අය සියොන් කන්ද වෙතින්
නික්ම එන්නෝය.[18] ස්වර්ගයේ සේ-
නාවල අධිපති වූ යෙහෝවා දෙවි වන
මම මහත් ආශාවකින්[19] මේ දේ ඉටු
කරන්නෙමි.

**8** 2රාජා 18:35; ගීතා 74:4; ගීතා 83:2; යෙසා 10:13; **9** ගීතා 32:9; එස 38:4; ආමො 4:2; **10** 2රාජා 19:33; යෙසා 37:29; **11** 2රාජා 20:8; ගීතා 65:8; යෙසා 7:11; **12** ලෙවී 25:5; **13** උත් 8:22; **14** යෙසා 37:30; **15** 2ලේක 32:22; යෙසා 10:20; **16** යෙසා 37:31; **17** යෙසා 10:21; යෙරෙ 44:14; රෝම 9:27; රෝම 11:5; **18** යෙසා 37:32; **19** යෙසා 9:7; යෙසා 59:17; එස 5:13; සෙක 1:14.

32 "'එබැවින් යෙහෝවා දෙවි වන
මම ඇසිරියාවේ රජු ගැන මෙසේ පැව-
සුවෙමි.[1] "ඔහුට මේ නුවරට ඇතුල්
වෙන්නවත්[2] මේ දෙසට ඊතලයක්
විදින්නවත්[3] පලිහ අතට ගෙන මෙ-
යට විරුද්ධව යුද්ධ කරන්නවත් මෙය
වටා බැම්මක් ගොඩනඟා නුවර වට-
ලන්නවත්[4] ලැබෙන්නේ නැත.
**33** ඔහු ආ පාරෙන්ම නැවත හැරී
යයි. ඔහුට මේ නුවරට කිසි ලෙස-
කින්වත් ඇතුල් වෙන්න ලැබෙන්නේ
නැති බව යෙහෝවා දෙවි වන මම
පවසමි.[5] **34** මාගේ නාමය වෙනු-
වෙනුත්[6] මාගේ සේවක දාවිත් වෙනු-
වෙනුත්[7] මම මේ නගරය ආරක්ෂා කර
බේරාගන්නෙමි."'"[8]

**35** ඒ රාත්‍රියේදීම යෙහෝවා දෙ-
විගේ දූතයා ඇසිරියානු කඳවුරේ
භටයන්[9] එක්ලක්ෂ අසූපන්දහ-
සක් මරා දැමුවේය.[10] උදෑසනින්ම
අවදි වූ සෙසු භටයන් අවට බැලූ
විට ඔවුන්ට දකින්න ලැබුණේ සෑම
තැනම තිබුණු මළ සිරුරු පමණි.[11]
**36** මේ සිද්ධියෙන් පසු ඇසිරියාවේ
රජු වූ සෙනකෙරිබ්[12] ආපසු නිනි-
වය නගරයට[13] ගොස් එහි වාසය
කළේය.[14] **37** දිනක් ඔහු තම දෙවි
වූ[15] නිස්රොක්ගේ දේවාලයේ[16] නමස්-
කාර කරමින් සිටියදී අද්‍රම්මෙලෙක්
සහ ෂරෙෂෙර් නමැති ඔහුගේ පුත්‍රයෝ
දෙදෙනා ඔහුට කඩුවෙන් පහර දී මරා
දැමුවෝය.[17] ඉන්පසු ඔවුහු අරරත් දේ-
ශයට[18] පලා ගියෝය. සෙනකෙරිබ්
රජුට පසු ඔහුගේ පුත් ඒසර්-හද්දොන්[19]
රජකමට පත් විය.

**20** ඒ කාලයේදී හෙසකියා රජ
අසනීප වී මරණාසන්නව
සිටියේය.[20] දවසක් අනාගතවක්තෘ වූ
ආමොෂ්ගේ පුත් යෙසායා[21] ඔහු වෙ-
තට පැමිණ මෙසේ කීවේය. "යෙ-
හෝවා දෙවි ඔබට මෙසේ පැවසුවා.
'ඔබ සුවය ලබන්නේ නැත. ඔබ මිය
යන්නෙහිය.[22] ඒ නිසා දැන් ඔබේ ගෙයි
වැසියන්ව කැඳවා පවුලේ කාරණා
සැලසුම් කරන්න.'"[23] **2** එවිට හෙ-
සකියා රජ බිත්තිය දෙසට හැරී[24]
යෙහෝවා දෙවිට යාච්ඤා කරමින්[1]
මෙසේ කීවේය. **3** "යෙහෝවා දෙවි-
යනි, මම විශ්වාසවන්තව,[2] මුළු හදව-
තින්ම[3] ඔබට සේවය කළ හැටිත්[4] ඔබ
යහපත්යයි සලකන දේ කළ හැටිත්[5]
සිහි කරන මෙන් බැගෑපත්ව ඔබෙන්
අයැදිමි."[6] එසේ කියමින් හෙසකියා
රජ බොහෝ සෙයින් හැඬුවේය.[7]

**4** යෙසායා එතැනින් පිටත්ව මැද
මළුවට යන්නත් කලින් යෙහෝවා
දෙවි ඔහුට මෙසේ පැවසුවේය.[8]
**5** "නැවත ගොස්, මාගේ සෙනඟගේ
නායකයා[9] වන හෙසකියාට මෙසේ
කියන්න. 'ඔබේ මුතුන්මිත්තා වූ
දාවිත්ගේ දෙවි වන යෙහෝවා[10] ඔබට
මෙසේ පැවසුවා. "මම ඔබ හෙළූ
කඳුළු දුටුවෙමි.[11] ඔබේ යාච්ඤාවටද[12]
මම සවන් දුන්නෙමි.[13] ඒ නිසා දැන්
ඔබව සුව කරන්නෙමි.[14] දවස් තුන-
කින් ඔබට යෙහෝවා දෙවිගේ ගෘහ-
යට යන්න පුළුවන් වෙයි.[15] **6** මම
ඔබට තව අවුරුදු පහළවක් ජීවත්
වීමට ඉඩහරින්නෙමි. ඇසිරියාවේ රජු-
ගේ අතින් ඔබවත් මේ නගරයත්
ගලවාගෙන,[16] මාගේ නාමය නිසාත්
මාගේ සේවක දාවිත් වෙනුවෙනුත් මේ
නගරය ආරක්ෂා කරන්නෙමි."'"[17]

**7** එවිට යෙසායා සේවකයන්ට
මෙසේ කීවේය. "වේළාගත් අත්-
තික්කා කුට්ටියක්* ගෙනෙන්න."[18]
ඔවුහු එය ගෙනැවිත් හෙසකියාගේ
තුවාලය මත තැබුවෝය.[19] ඉන්පසු
හෙසකියාගේ රෝගී තත්වය ටිකෙන්
ටික සුව විය.[20]

**8** හෙසකියා යෙසායාගෙන් මෙසේ
ඇසුවේය. "යෙහෝවා දෙවි මාව සුව
කර දවස් තුනකින් මට යෙහෝවා දෙ-
විගේ ගෘහයට නැවත යන්න ලැබෙන

**19 පරි.**
**1** යෙසා 10:24
**2** 2ලේක 32:22
**3** යෙසා 37:33
**4** 2සාමු 20:15; එස 21:22
**5** යෙසා 37:34
**6** 1සාමු 12:22; යෙසා 43:25; එස 36:22
**7** යෙරෙ 23:5
**8** 2රාජා 20:6; යෙසා 31:5; යෙසා 37:35
**9** 2ලේක 32:21; යෙසා 31:8; යෙසා 37:36
**10** 1ලේක 12:22
**11** නික් 12:30; ගීතා 76:6
**12** 2රාජා 19:7; 2රාජා 19:28
**13** උත් 10:11; යෝනා 1:2; නාහූ 2:8; ශෙප 2:13
**14** යෙසා 37:37
**15** ද්වි 32:31; 2ලේක 32:21
**16** යෙසා 37:38
**17** හිතෝ 3:33; හිතෝ 13:21
**18** උත් 8:4; යෙරෙ 51:27
**19** එස්රා 4:2

**20 පරි.**
**20** 2ලේක 32:24
**21** 2රාජා 19:2
**22** යෙසා 38:1
**23** 2සාමු 17:23
**24** මතෙ 23:12

**2 තීරුව**
**1** ගීතා 50:15; ගීතා 116:2; යෙසා 38:2; මතෙ 6:6; පිලි 4:6
**2** ගීතා 145:18; යොහ 4:24
**3** 2ලේක 31:21; ගීතා 119:4
**4** උත් 17:1; 1රාජා 2:4; 1රාජා 3:6; ලූක් 1:6
**5** 2ලේක 31:20
**6** ගීතා 25:7; ගීතා 119:49; හෙබ්‍රෙ 6:10
**7** 2සාමු 12:22; යෙසා 38:3
**8** යෙසා 38:4
**9** 1සාමු 9:16; 1සාමු 10:1; 2සාමු 5:2
**10** මතෙ 22:32

**11** යෝබ් 16:16; ගීතා 39:12; ගීතා 126:5; **12** 2රාජා 20:2; **13** ගීතා 65:2; ගීතා 66:19; **14** ද්වි 32:39; 2ලේක 7:14; ගීතා 41:3; ගීතා 103:3; ගීතා 147:3; **15** ගීතා 66:13; ගීතා 116:14; ගීතා 121:1; **16** 2ලේක 32:22; යෙසා 10:24; යෙසා 38:6; **17** 2රාජා 19:34; යෙසා 37:35; **18** 1සාමු 25:18; 1සාමු 30:12; 1ලේක 12:40; **19** යෝබ් 2:7; **20** යෙසා 38:21.

**2රාජා 20:7*** 1සාමු 25:18හි පාදසටහන බලන්න.

බවට දෙන ලකුණ කුමක්ද?”[1]
9 එවිට යෙසායා මෙසේ කීවේය. “යෙ-
හෝවා දෙවි තමන් කී දේ ඉටු කරන
බව සහතික කිරීමට ඔබට ලකු-
ණක් දෙයි.[2] යෙහෝවා දෙවි දිය යුතු
ලකුණ කුමක්ද කියා ඔබම කියන්න.
ඔබ කැමති, ලකුණක් හැටියට පඩි
පෙළට වැටෙන සෙවණැල්ල පඩි
දහයක් ඉදිරියට යනවාටද නැත්-
නම් පඩි දහයක් ආපස්සට යනවා-
ටද?” 10 එවිට හෙසකියා රජ මෙසේ
කීවේය. “සෙවණැල්ල පඩි දහයක් ඉදි-
රියට යෑම සාමාන්‍යයෙන් සිදු වන දෙ-
යක්. නමුත් සෙවණැල්ල පඩි දහයක්
ආපස්සට යෑම අසාමාන්‍ය දෙයක්.[3]
එය මට හොඳ ලකුණක් වේවි.”
11 ඉන්පසු අනාගතවක්තෘ යෙසායා
යෙහෝවා දෙවිට යාච්ඤා කළේය.
එවිට දෙවි, ආහස්ගේ පඩි පෙළ ලෙස
හඳුන්වන පඩි පෙළ දිගේ වැටුණු සෙ-
වණැල්ල පඩි දහයක් ආපස්සට යෑමට
සැලැස්වූවේය.[4]

12 හෙසකියා රජ අසනීපව සිටි
බව බැබිලෝනියේ[5] රජු වූ බලදාන්ගේ
පුත් බෙරොදක්-බලදාන්ට[6] ආරංචි වී
ඔහු හෙසකියා රජුට ලිපි ලියා[7] ඒ
සමඟ තෑග්ගක්ද එව්වේය. 13 හෙ-
සකියා රජ එම පණිවිඩකරුවන් කී
දේට සවන් දුන්නේය. ඉන්පසු ඔහු
තම වස්තු ගබඩාවේ තිබුණු සියල්ල
ඔවුන්ට පෙන්වූවේය.[8] ඔහු එහි තිබූ
රන් හා රිදීද[9] බෝල්සම් තෙල්ද[10]
අනර්ඝ තෙල්ද ඔහුගේ යුධායුධ ගබ-
ඩාවද ඔහුගේ අනිකුත් වස්තු සියල්ලද
ඔවුන්ට පෙන්වූවේය. හෙසකියා තම
මාලිගාවෙත් මුළු රාජධානියෙන් තිබූ
සෑම දෙයක්ම ඔවුන්ට පෙන්වූවේය.[11]

14 ඉන්පසු අනාගතවක්තෘ යෙ-
සායා හෙසකියා රජු හමු වීමට
පැමිණ,[12] “රජතුමනි, අර මිනිස්සු
ආවේ කොහෙන්ද? ඔවුන් මොනවද
කිව්වේ”[13] කියා ඇසුවේය. හෙසකියා
රජ මෙසේ කීවේය. “ඔවුන් ආවේ දුර
ඈත පිහිටි බැබිලෝනියේ සිටයි.”
15 එවිට යෙසායා, “ඔවුන් ඔබේ මාලි-
ගාවේ මොනවද බැලුවේ” කියා ඇසු-
වේය. හෙසකියා රජ මෙසේ කීවේය.
“මගේ මාලිගාවේ තිබෙන හැම දෙ-
යක්ම ඔවුන් බැලුවා. ඒ වගේම මගේ
ගබඩාවේ තිබෙන හැම වස්තුවක්ම
මම ඔවුන්ට පෙන්නුවා.”[1]

16 එවිට යෙසායා හෙසකියා රජුට
මෙසේ කීවේය. “යෙහෝවා දෙවි
කියන මේ දේට ඇහුම්කන් දෙන්න.[2]
17 ‘“බලන්න! ඔබේ මාලිගාවේ
තිබෙන සියල්ලත්[3] මේ දක්වා ඔබේ
මුතුන්මිත්තන් රැස් කර තිබෙන
සියල්ලත් බැබිලෝනියට ගෙන යන
දවස් පැමිණෙන්නේය.[4] මෙහි කිසිවක්
ඉතුරු නොවන්නේය”[5] කියා යෙ-
හෝවා දෙවි පැවසුවා. 18 “ඔබේම
පුත්‍රයන්ගෙන් සමහරෙකුව ඔවුහු
ගෙන යන්නෝය.[6] ඔවුහු බැබිලෝනි-
යේ රජුගේ මාලිගාවේ[7] නිලධාරීන්
ලෙස සේවය කරනු ඇත.” ’ ”[8]

19 එය අසා හෙසකියා රජ යෙසා-
යාට මෙසේ කීවේය. “ඔබ මාර්ගයෙන්
යෙහෝවා දෙවි කී දේ මම සතු-
ටින් භාරගන්නවා.[9] මා ජීවත්ව සිටින
තාක් කල් සමාදානයෙන් හා සුරක්ෂි-
තභාවයෙන්*[10] ජීවත් වෙන්න ලැබෙ-
නවා නම් ඒ ඇති.”[11]

20 හෙසකියා රජුගේ ජීවිතයේ
අනිකුත් සිදුවීම්ද ඔහුගේ බලවත්
ක්‍රියාද ඔහු සෑදූ පොකුණ[12] හා අගල[13]
ගැනද නුවරට වතුර ගෙනා ආකාරය
ගැනද යූදාහි රජවරුන්ගේ ඉතිහාසය
වාර්තා කර ඇති ලියවිල්ලෙහි සඳ-
හන් කර තිබේ.[14] 21 කල් යත්ම
හෙසකියා රජ මිය ගියේය. ඔහුගේ
මුතුන්මිත්තන් මෙන් ඔහුවද නැන්-
පත් කරන ලදි.[15] පසුව ඔහුගේ පුත්
මනස්සේ[16] රජකමට පත් විය.

**21** මනස්සේ රජකමට පත් වන
විට ඔහුගේ වයස අවුරුදු දො-
ළොසකි.[17] යෙරුසලමේ සිට ඔහු අවු-
රුදු පනස්පහක් පාලනය කළේය.
ඔහුගේ මවගේ නම හෙප්ෂිබාය.

**20 පරි.**
1 විනි 6:17; යෙසා 7:11; යෙසා 38:22
2 යෙසා 38:7
3 මාක් 10:27
4 යොෂු 10:12; 2ලේක 32:31; යෙසා 38:8
5 උත් 10:10; උත් 11:9
6 යෙසා 39:1
7 2සාමු 10:2
8 2ලේක 32:27; ගීතා 49:6; යෙරෙ 9:23; යාකො 4:16
9 1රාජ 10:15
10 1රාජ 10:10; යෙරෙ 46:11
11 යෙසා 39:2
12 යෙසා 39:3
13 ගීතා 141:5; හිතෝ 25:12

**2 තීරුව**
1 යෙසා 39:4
2 යෙසා 39:5; යෙසා 55:1
3 හිතෝ 15:25
4 2රාජ 24:13; 2රාජ 25:13; 2ලේක 36:18; යෙරෙ 27:21; යෙරෙ 52:17; දානි 1:2
5 යෙසා 39:6
6 ද්වි 28:48; ද්වි 29:22; 2රාජ 24:12; 2රාජ 25:6; 2ලේක 33:11
7 යෙසා 39:7
8 දානි 1:19; දානි 2:49
9 ගීතා 39:9; විලා 3:22; විලා 3:38
10 එස්ත 9:30; ගීතා 25:5; ගීතා 38:3; ගීතා 43:3; ගීතා 86:11; යෙසා 38:3
11 යෙසා 39:8
12 යොහ 9:11
13 2ලේක 32:30; යෙසා 7:3
14 1රාජ 14:29; 2රාජ 16:19
15 1රාජ 2:10; 2ලේක 32:33
16 2රාජ 21:16; 2රාජ 23:26; 2ලේක 33:11; 2ලේක 33:13

**21 පරි.** 17 1ලේක 3:13; 2ලේක 33:1; දේශ 10:16; මතෙ 1:10.

**2රාජ 20:19*** මූ.අ., “සත්‍යයෙන්.”

**2** ඔහු යෙහෝවා දෙවි පිළිකුල් කළ
දේවල් කළේය.[1] යෙහෝවා දෙවි ඊශ්‍රා-
යෙල්වරු වෙතින් පන්නා දැමූ ජාතීන්
කළ පිළිකුල් ක්‍රියාවල ඔහු නියැලු-
ණේය.[2] **3** තම පියා වූ හෙසකියා
රජු කඩා දැමූ පූජනීය ස්ථාන ඔහු
නැවත ගොඩනැඟුවේය.[3] ඊශ්‍රායෙල්හි
රජකම් කළ ආහබ් මෙන්[4] ඔහුද
බාල්ට පූජාසන ගොඩනඟා, නමස්කා-
රය සඳහා කුලුනක් සෑදුවේය. ඔහු
ආකාශ වස්තූන් ඉදිරියේ[5] වැඳ වැටී[6]
ඒවාට නමස්කාර කිරීමටද පටන්ගත්-
තේය.[7] **4** "මාගේ නාමයට ගෞර-
වය ගෙනෙන පිණිස මම යෙරුසලම
තෝරාගත්තෙමි"[8] කියා යෙහෝවා
දෙවි තම ගෘහය ගැන කලින් පවසා
තිබිණ. නමුත් මනස්සේ රජ යෙ-
හෝවා දෙවිගේ ගෘහය තුළම බොරු
නමස්කාරය සඳහා පූජාසන ගො-
ඩනැඟුවේය.[9] **5** එපමණක්ද නොව
ඔහු යෙහෝවා දෙවිගේ ගෘහයේ තිබූ
මළු දෙකෙහි[10] ආකාශ වස්තූන්ව-
ලට නමස්කාර කිරීම සඳහාද පූජා-
සන ගොඩනැඟුවේය.[11] **6** ඔහු තම
පුත්‍රයාව ගින්නෙන් දවා පූජාවක්
ලෙස ඔප්පු කළේය.[12] ඔහු මන්ත්‍ර
ගුරුකම්වල[13] යෙදුණු අතර නිමිති
බැලීමටද පටන්ගත්තේය. ඔහු මායා-
කාරයන්ව[14] සහ ශාස්ත්‍ර කියන්-
නන්ව[15] පත් කළේය. ඔහු යෙහෝවා
දෙවි පිළිකුල් කළ දේවල් බොහොම-
යක් කර දෙවිව උදහස් කළේය.

**7** එපමණක්ද නොව නමස්කාරය
සඳහා ඔහු සෑදූ කුලුනද[16] ඔහු දෙවි-
ගේ ගෘහයේ තැබුවේය.[17] නමුත් ඒ
ගෘහය ගැන යෙහෝවා දෙවි දාවිත්ටද
දාවිත්ගේ පුත් සලමොන්ටද මෙසේ
පවසා තිබිණ. "මේ ගෘහයද ඊශ්‍රායෙල්
ගෝත්‍රවලට අයත් නුවරවල් අත-
රින් මා තෝරගත් මේ නුවර වන
යෙරුසලමද මාගේ නාමය ගෞරව-
යට පත් කිරීම සඳහා මම සදහටම
තෝරාගත්තෙමි.[18] **8** තම මුතුන්-
මිත්තන්ට දුන් දේශයෙන් ඊශ්‍රායෙල්-
වරුන්ව පන්නා නොදමන්නෙමි.[19]
නමුත් මම ඔවුන්ව ආරක්ෂා කරන්-
නේ මා ඔවුන්ට අණ කළ සියල්ලට
අනුව එනම්, මාගේ සේවක මෝසෙස්
මාර්ගයෙන් දුන් සියලු නීතිවලට
අනුව ඔවුන් ක්‍රියා කළොත් පමණි."[1]
**9** නමුත් ඊශ්‍රායෙල්වරු ඊට ඇහුම්කන්
දුන්නේ නැත.[2] ඊශ්‍රායෙල් සෙනඟගේ
ඇස් පනාපිටම යෙහෝවා දෙවි විනාශ
කර දැමූ ජාතීන්[3] කළ දුෂ්ට දේවල-
ටත් වඩා දුෂ්ට දේ කිරීමට මනස්සේ
රජ ඊශ්‍රායෙල් සෙනඟව පෙලඹුවේය.[4]

**10** එබැවින් යෙහෝවා දෙවි තම
සේවකයන් වූ අනාගතවක්තෘවරුන්
මාර්ගයෙන් නිතර නිතර අවවාද කර-
මින්[5] මෙසේ කීවේය. **11** "යූදාහි රජු
වන මනස්සේ,[6] තමාට කලින් දේශ-
යේ සිටි අමෝරිවරුන් කළ සියලු දේ-
වලටත්[7] වඩා දුෂ්ට දේවල් කළේය.
ඔහු පිළිකුල් රූප සාදා[8] යූදා ගෝ-
ත්‍රය පාපයට පෙලඹුවේය.[9] **12** ඒ
නිසා ඊශ්‍රායෙල්හි දෙවි වන යෙ-
හෝවා මෙසේ කියන්නේය. 'මම
යෙරුසලම සහ යූදා පිට විනාශ-
යක් ගෙනෙන්නෙමි.[10] ඒ ගැන
අසන සියල්ලෝ භයෙන් තිගැස්සෙන්-
නෝය.[11] **13** මම සමාරිය[12] මැනී-
මට යොදාගත් ලණුව[13] හා ආහබ්ගේ
පෙළපත මට්ටම් කිරීමට යොදාගත්
ලීය[14] යෙරුසලම සඳහාත් යොදා-
ගනිමි. ඉන්පසු භාජනයක් මුණින්
අතට පෙරළා දමන්නාක් මෙන්[15]
මම යෙරුසලම පෙරළා දමන්නෙමි.[16]
**14** මාගේ උරුමය වන මාගේ සෙ-
නඟ[17] අතරින් ඉතුරු වන අයව මම
අත්හැර දමන්නෙමි.[18] ඔවුන්ව සතු-
රන් අතට පත් වීමට ඉඩහරින්නෙමි.
ඔවුන්ව වහලුන් ලෙස රැගෙන යන
අතර ඔවුන් සතු වස්තු සතුරෝ
විසින් කොල්ල කනු ලබන්නෝය.[19]
**15** මන්ද තම මුතුන්මිත්තන් ඊජිප්තු-
වෙන් පිටතට ආ දවසේ සිට මේ දක්-
වාම ඔවුහු මා පිළිකුල් කරන දේ
කරමින් මාව උදහස් කළෝය.' "[20]

**21 පරි.**
**1** ලෙවී 18:28 ද්වි 28:15 2ලේක 33:2
**2** ලෙවී 18:25 ද්වි 12:31 2ලේක 36:14 එස 16:51
**3** 2රාජා 18:4 2රාජා 18:22 2ලේක 32:12
**4** 1රාජා 16:32
**5** 2රාජා 23:4 යෝබ් 31:26
**6** ද්වි 4:19 ද්වි 17:3
**7** 2ලේක 33:3
**8** ද්වි 12:5 2සාමු 7:13 1රාජා 8:29 1රාජා 9:3 ගීතා 78:68 ගීතා 132:13
**9** යෙරෙ 32:34
**10** 1රාජා 6:36 1රාජා 7:12
**11** යෙරෙ 8:2 එස 8:16
**12** 2ලේක 33:6
**13** ලෙවී 19:26
**14** ලෙවී 20:27
**15** ද්වි 18:11
**16** ගීතා 97:7 1කොරි 8:4
**17** 2රාජා 23:6
**18** 1රාජා 8:29 2රාජා 23:27 2ලේක 7:16
**19** 1ලේක 17:9 2ලේක 33:8

**2 තීරුව**
**1** ලෙවී 26:3 ද්වි 28:1
**2** 2ලේක 36:16 එස්රා 9:10
**3** ද්වි 7:1
**4** 2ලේක 33:9 හිතෝ 16:29 එස 16:47
**5** 2ලේක 33:10 2ලේක 36:15 යෙරෙ 7:25 මතෙ 23:37
**6** 2රාජා 23:26 2රාජා 24:3 යෙරෙ 15:4
**7** උත් 15:16 ලෙවී 18:25 එස 16:3
**8** 1රාජා 21:26
**9** දේශ 9:18
**10** 2රාජා 22:16 දානි 9:12 මීකා 3:12
**11** යෙරෙ 19:3
**12** 2රාජා 17:6 එස 23:33
**13** 2සාමු 8:2 යෙසා 28:17 යෙසා 34:11 විලා 2:8

**14** 1රාජා 21:21; 2රාජා 10:11; **15** යෙරෙ 25:9; **16** ලෙවී 18:28; **17** නික් 19:5; ද්වි 32:9; **18** 2රාජා 17:23; **19** ලෙවී 26:25; ද්වි 28:63; 2පේතෘ 2:9; **20** ද්වි 9:21; ද්වි 31:29; විනි 2:13; ගීතා 106:36; එස 20:4; ක්‍රියා 7:53.

16 මනස්සේ රජ යෙහෝවා දෙවි
පිළිකුල් කළ දේ කරමින් යූදා වැසි-
යන්ව පාපයට පෙලඹුවේය.[1] ඊට අම-
තරව ඔහු නිර්දෝෂ මිනිසුන්ව මරා
දමමින්[2] මුළු යෙරුසලමම ලේ විලක්
කළේය. 17 මනස්සේ රජුගේ ජීවිත-
යේ අනිකුත් සිදුවීම්ද ඔහු කළ දේවල්ද
ඔහුගේ පාප ගැනද යූදාහි රජවරුන්-
ගේ ඉතිහාසය වාර්තා කර ඇති
ලියවිල්ලෙහි සඳහන් කර තිබේ.[3]
18 කලක් ගත වූ පසු මනස්සේ රජ
මිය ගියේය. ඔහුගේ මුතුන්මිත්තන්
මෙන් ඔහුවද තැන්පත් කරන ලදි.[4]
ඔහුව තම මාලිගාවේ උයනේ එනම්,
උස්සාගේ උයනේ තැන්පත් කරන
ලදි.[5] ඉන්පසු ඔහුගේ පුත් ආමොන්
රජකමට පත් විය.

19 ආමොන්[6] රජකමට පත් වන
විට ඔහුගේ වයස අවුරුදු විසිදෙකකි.
යෙරුසලමේ සිට ඔහු අවුරුදු දෙකක්
පාලනය කළේය.[7] ඔහුගේ මව යොත්-
බාහි වැසියෙකු වූ හාරුෂ්ගේ දිය-
ණිය වූ මෙෂුල්ලෙමෙත්ය. 20 ඔහු
තම පියා වූ මනස්සේ මෙන් යෙ-
හෝවා දෙවි පිළිකුල් කළ දේවල්
දිගටම කළේය.[8] 21 ඔහු ක්‍රියා
කළෙත් තම පියා ක්‍රියා කළ ආකාර-
යටමය.[9] ඔහුත් තම පියා මෙන්
පිළිකුල් රූපවලට දිගටම නමස්-
කාර කළේය.[10] 22 මෙසේ ඔහු තම
මුතුන්මිත්තන්ගේ දෙවි වූ යෙහෝවාව
අත්හැරියේය.[11] ඔහු යෙහෝවා දෙවි-
ගේ මාර්ගයේ ගමන් කළේ නැත.[12]
23 කලක් ගත වූ පසු ආමොන්
රජුගේ සේවකයෝ ඔහුට විරුද්ධව
කුමන්ත්‍රණය කර ඔහුව මාලිගාවේදීම
මරා දැමුවෝය.[13] 24 නමුත් දේශ-
යේ වැසියෝ එකතු වී ආමොන් රජුට
විරුද්ධව කුමන්ත්‍රණය කළ සියලුදෙ-
නාවම මරා,[14] ආමොන් රජුගේ පුත්
යොෂියාව[15] රජකමට පත් කළෝය.
25 ආමොන් රජුගේ ජීවිතයේ අනිකුත්
සිදුවීම්ද ඔහු කළ දේවල්ද යූදාහි රජ-
වරුන්ගේ ඉතිහාසය වාර්තා කර ඇති
ලියවිල්ලෙහි සඳහන් කර තිබේ.[16]
26 පසුව ඔවුහු උස්සාගේ උයනේ
පිහිටි සොහොන් ගෙයි ආමොන් රජුව
තැන්පත් කළෝය.[1] ඉන්පසු ඔහුගේ
පුත් යොෂියා[2] රජකමට පත් විය.

22 යොෂියා රජකමට පත් වන
විට ඔහුගේ වයස අවුරුදු
අටකි.[3] යෙරුසලමේ සිට ඔහු අවුරුදු
තිස්එකක් පාලනය කළේය. ඔහුගේ
මව බොෂ්කත් නුවරෙහි[4] වැසියෙකු
වූ අදායාගේ දියණිය වූ යෙදීදාය.
2 ඔහුගේ මුතුන්මිත්තා වූ දාවිත්
මෙන්[5] යෙහෝවා දෙවි යහපත්යයි
සැලකූ දේ ඔහු කළේය.[6] ඔහු දෙවිගේ
ආඥා එලෙසම පිළිපැද්දේය.[7]

3 යොෂියා රජ තම පාලන සමයේ
දහඅටවන අවුරුද්දේදී ලේකම් වූ මෙ-
ෂුල්ලම්ගේ පුත්‍රයා වූ අෂලියාගේ පුත්
ෂාපාන්ට[8] මෙසේ පවසමින් ඔහුව යෙ-
හෝවා දෙවිගේ ගෘහයට යැව්වේය.
4 “දොරටු පාලකයන්[9] යෙහෝවා දෙ-
විගේ ගෘහයට පැමිණෙන සෙනඟ
ගෙනා සම්මාදම්[10] එකතු කර තිබෙ-
නවා. ඔබ දැන් උත්තම පූජක[11]
හිල්කියා[12] වෙතට ගිහින් එම මුදල්
සියල්ල[13] ගණන් කරන්න කියා ඔහුට
කියන්න. 5 ඉන්පසු ඒ මුදල් යෙ-
හෝවා දෙවිගේ ගෘහයේ වැඩකටයුතු
බලා කියා ගැනීමට පත් කළ අයට
භාර දෙන්න කියන්න.[14] යෙහෝවා
දෙවිගේ ගෘහය අලුත්වැඩියා කරන
අයට කුලී ගෙවීමට ඒ මුදල් භාවිත
කළ යුතුයි.[15] 6 කැටයම්කරුවන්ට,
ඉදි කරන්නන්ට සහ බිත්ති බඳින්-
නන්ට කුලී ගෙවීමටත් ගෘහය අලුත්-
වැඩියා කිරීම සඳහා අවශ්‍ය දැව සහ
ගල් මිල දී ගැනීමටත් එම මුදල්
භාවිත කරන්න.[16] 7 ඔවුන් විශ්වාස-
වන්තව වැඩ කරන නිසා[17] ඔවුන්ට
ලැබෙන මුදල් පරිහරණය කරන්නේ
කෙසේද කියා සොයා බැලීමට අවශ්‍ය
නැහැ.”[18]

8 දිනක් පූජක හිල්කියා,[19] ලේකම්
වන[20] ෂාපාන්ට[21] කතා කර, “යෙ-
හෝවා දෙවිගේ ගෘහයේ තිබී නීතිය

**21 පරි.**
1 2ලේක 33:9
2 උත් 9:6, ගණන් 35:33, 2රාජා 24:4, හිතෝ 6:17, යෙසා 59:3, යෙරෙ 2:34, මතෙ 23:30, හෙබ්‍රෙ 11:37
3 1රාජා 14:19
4 1රාජා 2:10, 2රාජා 20:21
5 2රාජා 21:26
6 1ලේක 3:14, මතෙ 1:10
7 2ලේක 33:21
8 ගණන් 32:14, 2ලේක 33:22, ක්‍රියා 7:51
9 2රාජා 21:3
10 ලෙවී 26:30, ද්වි 29:17, 2රාජා 17:12, යෙරෙ 10:15, 1කොරි 8:4
11 ගීතා 73:27
12 විනි 2:12, 2රාජා 22:17, 1ලේක 28:9, යෙරෙ 2:13
13 හිතෝ 28:2
14 හිතෝ 5:22
15 2ලේක 33:25
16 1රාජා 14:19

**2 තීරුව**
1 2රාජා 21:18
2 මතෙ 1:10

**22 පරි.**
3 1රාජා 13:2, 1ලේක 3:14, 2ලේක 34:1, යෙරෙ 1:2, ශෙප 1:1
4 යොෂු 15:39
5 1රාජා 3:6, 1රාජා 15:5
6 2ලේක 17:3, එස 18:14
7 ද්වි 5:32, යොෂු 1:7, හිතෝ 4:27
8 2රාජා 22:9, 2ලේක 34:8
9 2රාජා 12:9, 1ලේක 26:12, 2ලේක 8:14
10 2ලේක 24:8
11 2ලේක 34:9
12 1ලේක 6:13, 1ලේක 9:11
13 2රාජා 12:4
14 2රාජා 12:11
15 2ලේක 34:10
16 2ලේක 24:12, 2ලේක 34:11

17 2ලේක 34:12; හිතෝ 20:6; 1කොරි 4:2; 18 2රාජා 12:15; 19 1ලේක 6:13; 20 2රාජා 22:3; 21 2ලේක 34:8; යෙරෙ 41:2.

සඳහන් ලියවිල්ල[1] මට සම්බ වුණා”
කියා පැවසුවේය. ඔහු නීතිය සඳ-
හන් ලියවිල්ල ෂාපාන්ට දුන්නේය.
ෂාපාන් එය කියවීමට පටන්ගත්තේය.
**9** පසුව ෂාපාන්, රජු ළඟට පැමිණ
මෙසේ පැවසීය. “රජතුමනි, ඔබ පැවසූ
ලෙස, ඔබේ සේවකයෝ යෙහෝවා
දෙවිගේ ගෘහය සඳහා එකතු වන
මුදල් සියල්ල රැගෙන ගෘහයේ වැඩක-
ටයුතු බලා කියා ගැනීමට පත් කළ
අයට භාර දුන්නා.”[2] **10** තවදුරටත්
ඔහු, “පූජක හිල්කියා මට මේ ලිය-
විල්ල[3] දුන්නා” යයි කියමින් රජුට
ඇසෙන්න එය කියෙව්වේය.

**11** රජ නීතිය ඇතුළත් ඒ ලිය-
විල්ලෙහි සඳහන් දේ ඇසූ වහාම
තම වස්ත්‍ර ඉරාගත්තේය.[4] **12** ඉන්-
පසු රජ, පූජක හිල්කියාටද ෂාපාන්ගේ
පුත් අහිකාම්ටද[5] මීකායාගේ පුත් අක්-
බෝර්ටද ලේකම් වූ ෂාපාන්ටද රජු-
ගේ සේවක අසායාටද[6] මෙසේ අණ
කළේය. **13** “අපට සම්බ වූ මේ ලිය-
විල්ලෙහි සඳහන් දේ ගැන යෙහෝවා
දෙවිගෙන් විමසන්න.[7] මා වෙනුවෙ-
නුත් මේ සෙනඟ වෙනුවෙනුත් යූදා
දේශය වෙනුවෙනුත් දෙවිගෙන් විම-
සන්න. මේ ලියවිල්ලෙහි සඳහන් දේට
අපේ මුතුන්මිත්තන්[8] කීකරු නොවූ
නිසයි[9] යෙහෝවා දෙවි අප සමඟ මෙ-
තරම් උදහස් වී සිටින්නේ.”[10]

**14** රජුගේ අණ පරිදි පූජක හිල්-
කියා, අහිකාම්, අක්බෝර්, ෂාපාන්
හා අසායා අනාගතවක්තෘවරියක වූ[11]
හුල්දාව හමු වීමට ගියෝය. ඇය
නිල වස්ත්‍ර භාරව සිටි[12] ෂල්ලුම්-
ගේ භාර්යාව වූවාය. ෂල්ලුම් හර්හස්-
ගේ පුත්‍රයා වූ තික්වාගේ පුත්‍රයා
විය. හුල්දා ජීවත් වූයේ යෙරුසලම්
නුවරේ අලුතින් ගොඩනැඟූ කොට-
සේය. ඔවුහු රජු කී දේ ඇයට පැව-
සුවෝය.[13] **15** එවිට ඇය ඔවුන්ට
මෙසේ කීවාය. “ඊශ්‍රායෙල්හි දෙවි වන
යෙහෝවා මෙසේ කීවේය.[14] ‘ගොස්
ඔබව මා ළඟට එවූ තැනැත්තාට මේ
දේ කියන්න. **16** “යෙහෝවා දෙවි
මෙසේ පැවසුවා. ‘යූදාහි රජු කියවූ
ලියවිල්ලෙහි[1] සඳහන් ආකාරයට[2] මම
මේ දේශය පිටටත් එහි වැසියන්
පිටටත්[3] විනාශයක් ගෙනෙන්නෙමි.[4]
**17** මන්ද ඔවුහු මාව අත්හැර වෙනත්
දෙවිවරුන්ට සුවඳ දුම් ඔප්පු කරන්-
නෝය.[5] ඔවුන් කරන සෑම දෙයකින්ම
ඔවුහු මාව උදහස් කරන්නෝය.[6]
එබැවින් මේ දේශයට විරුද්ධව ඇවිළී
ඇති මාගේ උදහස නිවී යන්නේ
නැත.’ ”’[7] **18** යෙහෝවා දෙවිගෙන්
විමසන්න කියා ඔබව එවූ යූදාහි රජුට
ඔබ ගොස් මේ දේත් කියන්න. ‘ඊශ්‍රා-
යෙල්හි දෙවි වන යෙහෝවා මෙසේ
පවසනවා. “ලියවිල්ලෙහි සඳහන් දේ
අසා[8] **19** ඔබ මුළු හදවතින්ම[9] පසු-
තැවිලි වී යෙහෝවා දෙවි වන මා
ඉදිරියේ නිහතමානී වූවෙහිය.[10] මේ
දේශයටත් එහි වැසියන්ටත් විරුද්ධව
මා ප්‍රකාශ කර තිබෙන දේ ඇසූ විට
ඔබ ඔබේ වස්ත්‍ර ඉරාගෙන[11] මා
ඉදිරියේ හඬා වැලපුණෙහිය. දේශ-
යේ වැසියන් පිටට පැමිණෙන විපත්-
තිය දකින සියල්ලෝ මහත් සේ
පුදුමයට පත් වන බවත් ඔවුන්,
සියල්ලන්ගේ ශාපවලට ලක් වන
බවත්[12] අසා ඔබ මා ඉදිරියේ හඬා
වැලපුණු ආකාරය මම දුටුවෙමි.”
යෙහෝවා දෙවි තවදුරටත් මෙසේ
පවසනවා.[13] **20** “ඒ නිසා මා මේ
දේශයට ගෙනෙන කිසි විපතක් ඔබ
නොදකින්නෙහිය. මම ඔබට ඔබේ
මුතුන්මිත්තන් මෙන් සමාදානයෙන්
මිය යෑමට ඉඩහරින්නෙමි.[14] ඔබට
හිමි සොහොන් ගෙයි ඔබව තැන්පත්
කරනු ලබන්නේය.” ’ ”[15] ඔවුහු පැමිණ
රජුට ඒ සියල්ල දැන්වූවෝය.

**23** පසුව යෝෂියා රජ, යූදා සහ
යෙරුසලමෙහි විසූ වැඩිම-
හල්ලන් සියලුදෙනාව කැඳෙව්වේය.[16]
**2** ඉන්පසු රජ, යූදාහි සියලු පුරුෂ-
යන්ද යෙරුසලමේ සියලු වැසියන්ද
සමඟ යෙහෝවා දෙවිගේ ගෘහයට
ගියේය. ලොකු කුඩා සියලුදෙනා[17]

**22 පරි.**

**1** ද්වි 31:24
ද්වි 31:26
2ලේක 34:14
**2** 2ලේක 34:17
**3** ද්වි 31:9
2ලේක 34:16
නෙහෙ 13:1
**4** උත් 44:13
2සාමු 1:11
2ලේක 34:19
යෙරෙ 36:24
යෝවෙ 2:13
**5** 2රාජා 25:22
යෙරෙ 26:24
**6** 2ලේක 34:20
**7** ගීතා 25:14
**8** 2ලේක 29:6
ගීතා 106:6
යෙරෙ 16:12
දානි 9:8
**9** 2ලේක 34:21
හෙබ්‍රෙ 2:2
**10** ද්වි 4:24
ද්වි 29:27
ද්වි 31:17
ගීතා 76:7
රෝම 4:15
**11** නික් 15:20
විනි 4:4
නෙහෙ 6:14
ලූක් 2:36
ක්‍රියා 21:9
**12** 2රාජා 10:22
නෙහෙ 7:72
**13** 2ලේක 34:22
**14** යෝබ් 34:11
යෙරෙ 23:28

**2 තීරුව**

**1** 2රාජා 22:8
**2** ලෙවී 26:15
ද්වි 28:63
දානි 9:11
**3** 2ලේක 34:24
**4** 2රාජා 21:12
**5** නික් 20:3
ද්වි 32:17
විනි 2:12
1රාජා 9:6
ගීතා 106:36
යෙරෙ 2:11
**6** ගීතා 115:4
යෙසා 2:8
යෙසා 44:17
මීකා 5:13
**7** ද්වි 32:22
2ලේක 36:16
යෙසා 33:14
යෙරෙ 7:20
යෙරෙ 17:27
එස 20:48
**8** 2ලේක 34:26
**9** ගීතා 34:18
ගීතා 51:17
යෙසා 57:15
**10** ලෙවී 26:40
1රාජා 21:29
මීකා 6:8
යාකො 4:6
**11** 2රාජා 22:11

---

**12** ද්වි 28:45; ගීතා 109:17; යෙරෙ 26:6; **13** 2ලේක 34:27; **14** යෙසා 57:1; **15** 2ලේක 34:28; **23 පරි.** **16** 2ලේක 34:29; **17** 1සාමු 5:9; 1සාමු 30:2.

ඇතුළු පූජකයෝද[1] අනාගතවක්තෘවරුද එතැනට ගියෝය. එහිදී රජ, යෙහෝවා දෙවිගේ ගෘහයේ තිබී සම්බ වූ[2] ගිවිසුම සඳහන්[3] වී තිබෙන ලියවිල්ල[4] ඔවුන්ට ඇසෙන්න කියෙව්වේය.[5] **3** එය කියවූ පසු කුලුන ළඟ සිටගෙන සිටි රජ,[6] යෙහෝවා දෙවි සමඟ ගිවිසුමක් ඇති කරගත්තේය.[7] ලියවිල්ලෙහි සඳහන් ගිවිසුමට එකඟව[8] ජීවත් වෙමින්[9] දෙවිගේ ආඥා,[10] සිහිගැන්වීම්*[11] සහ නියෝග[12] මුළු හදවතින්ම[13] පිළිපදින බවට රජ පොරොන්දු විය. එමෙන්ම යෙහෝවා දෙවි කියන දේට එකඟව ජීවත් වීමට වෙහෙස මහන්සිය නොබලා[14] කටයුතු කරන බවටත් ඔහු පොරොන්දු විය. එතැන සිටි සියලුදෙනා ඒ ගිවිසුමට එකඟ වුණෝය.[15]

**4** එවිට රජතුමා, බාල් නමස්කාරය සඳහාත්[16] කුලුනට නමස්කාර කිරීම සඳහාත්[17] ආකාශ වස්තූන්වලට නමස්කාර කිරීම සඳහාත්[18] සාදා තිබූ සියලු භාණ්ඩ යෙහෝවා දෙවිගේ ගෘහයෙන් පිටතට ගෙනෙන ලෙස උත්තම පූජක හිල්කියාටද[19] අනිකුත් පූජකයන්ටද දොරටු පාලකයන්ටද[20] කීවේය. ඉන්පසු ඔහු ඒ සියල්ල යෙරුසලමෙන් පිටත පිහිටි කිද්‍රොන් නිම්නයට[21] ගෙන ගොස් පුලුස්සා දැමුවේය. පසුව ඒවායේ අළු බෙතෙල් නගරයට[22] ගෙන ගොස් වීසි කළේය. **5** යූදාහි රජවරුන් විසින් යූදා නුවරවල සහ යෙරුසලම අවට තිබූ පූජනීය ස්ථානවල සුවඳ දුම් ඔප්පු කිරීම සඳහා පත් කර සිටි පූජකයන්ව රජතුමා ඔවුන්ගේ තනතුරුවලින් පන්නා දැමුවේය. බාල්ට,[23] හිරු සහ සඳුට, රාශි චක්‍රයට හා ග්‍රහ තාරකාවලට[24] සුවඳ දුම් ඔප්පු කළ පූජකයන්වත් ඔහු පන්නා දැමුවේය. **6** යෙහෝවා දෙවිගේ ගෘහයට ගෙනැවිත් තිබූ පිළිකුල් කුලුන,[25] යෙරුසලමෙන් පිටත පිහිටි කිද්‍රොන් නිම්නයට ගෙන ගොස් පුලුස්සා[1] කුඩු කර දැමුවේය. එහි අළු සාමාන්‍ය ජනයාව තැන්පත් කරන ස්ථානයට වීසි කර දැමුවේය.[2] **7** එමෙන්ම ඔහු, යෙහෝවා දෙවිගේ ගෘහය තුළ සමලිංගික සේවනයේ යෙදුණු පිරිමින්[3] සාදාගෙන සිටි නිවාසද කඩා දැමුවේය. බොරු නමස්කාරය සඳහා ඉදි කර තිබූ කුලුනුවලට ස්ත්‍රීන් කූඩාරම් මැසුවේ එම නිවෙස්වල සිටය.

**8** පසුව ඔහු ගෙබා සිට[4] බෙයර්-ෂෙබා දක්වා[5] වූ යූදාහි පිහිටි සෑම නගරයකම තිබූ පූජනීය ස්ථානවල සුවඳ දුම් ඔප්පු කිරීමට නොහැකි වන ලෙස ඒ නගරවල සිටි සියලු පූජකයන්ව පන්නා දැමුවේය. යෙරුසලමේ දොරටුවෙන් ඇතුල් වූ විට වම් පැත්තට වෙන්න නගරාධිපති වූ යොෂුවාගේ නිවස පිහිටා තිබිණ. ඒ නිවසට යන දොරටුව අසල පූජනීය ස්ථානයක් සාදා තිබුණේය. රජ එම පූජනීය ස්ථානයද කඩා දැමුවේය. **9** එම පූජනීය ස්ථාන ඉදිරියේ සේවය කළ පූජකයෝ[6] යෙරුසලමේ පිහිටි යෙහෝවා දෙවිගේ පූජාසනය හා සම්බන්ධ සේවාවල යෙදුණේ නැත. නමුත් ඔවුහු සෙසු පූජකයන්* සමඟ මුහුන් නොදැමූ රොටි කෑවෝය.[7] **10** හින්නොම් පුත්‍රයන්ගේ නිම්නයේ[8] පිහිටි තෝෆෙත් නමැති ස්ථානයේදී[9] කාලයක සිට ජනයා තම දරුවන්ව ගින්නෙන් දවා මෝලෙක්ට[10] පූජා කළෝය. තවදුරටත් එසේ කිරීමට නොහැකි වන සේ[11] ඔහු එම ස්ථානය නමස්කාරය සඳහා නුසුදුසු තත්වයකට පත් කළේය. **11** යෙහෝවා දෙවිගේ ගෘහයේ කුලුනු පෙළ අසල පිහිටි කෑම ශාලාවලින් එකක්[12] රජමාලිගාවේ නාතන්-මෙලෙක් නමැති නිලධාරියාට වෙන් කර තිබිණ. කලින් සිටි යූදාහි රජවරු හිරු දෙවිට කැප කළ අශ්වයන්ව ඒ ශාලාව හරහා දේවමාලිගාවට ගෙනාවෝය. රජ එය

**2රාජා 23:3*** මුල් භාෂාවේ සඳහන් වන්නේ, ‘සාක්ෂි’ කියායි.

**2රාජා 23:9*** මූ.අ., “සහෝදරයන්.”

**23 පරි.**
**1** ගණන් 3:10
**2** 2රාජා 22:8 2ලේක 34:30
**3** නික් 24:8
**4** ද්වි 31:26
**5** ද්වි 31:11
**6** 2රාජා 11:14 2ලේක 23:13
**7** යොෂු 24:25 2ලේක 15:12 2ලේක 23:16
**8** 2ලේක 34:31
**9** ද්වි 8:19
**10** ද්වි 5:1
**11** ද්වි 4:45 1රාජා 2:3
**12** ද්වි 8:11 2රාජා 17:13
**13** ද්වි 6:5 ද්වි 10:12
**14** ද්වි 11:13
**15** යොෂු 24:24 2ලේක 34:32 යෙරෙ 4:2
**16** 2රාජා 21:7
**17** 2ලේක 33:3 2ලේක 34:4
**18** 2ලේක 34:33
**19** 2රාජා 22:4 1ලේක 6:13
**20** 2රාජා 12:9
**21** යොහ 18:1
**22** 1රාජා 12:29
**23** 2රාජා 17:16
**24** 2රාජා 21:3 යෝබ් 31:26 යෙරෙ 8:2
**25** විනි 3:7 2රාජා 21:7

**2 තීරුව**
**1** ද්වි 7:25 ද්වි 9:21
**2** 2ලේක 34:4
**3** ලෙවී 18:22 රෝම 1:27 1කොරි 6:9 1තිමෝ 1:10 යූද් 7
**4** යොෂු 21:17 1රාජා 15:22
**5** උත් 21:31 1රාජා 19:3
**6** එස 44:10 මලා 2:8
**7** 1සාමු 2:36 එස 44:29
**8** යොෂු 15:8
**9** යෙසා 30:33 යෙරෙ 7:31 යෙරෙ 19:6 යෙරෙ 19:11
**10** යෙරෙ 32:35
**11** 2රාජා 16:3
**12** 1සාමු 1:9 නෙහෙ 10:38 යෙරෙ 35:2

තහනම් කර, හිරු දෙවිට[1] කැප
කර තිබූ අශ්ව රථද ගින්නෙන් දවා
දැමීය. **12** යූදාහි රජවරුන් ආහස්
රජුගේ උඩුමහල් කාමරයේ පියස්ස
මත පූජාසන සාදා තිබිණ.[2] රජතුමා
මේ පූජාසනද යෙහෝවා දෙවිගේ
ගෘහයේ තිබූ මළු දෙකෙහි මනස්-
සේ රජු ගොඩනැඟූ පූජාසනද[3] කඩා
කුඩු කර, කිද්‍රොන් නිම්නයට ඒවායේ
කුඩු වීසි කළේය. **13** යෙරුසලමට
ඉදිරියෙන්[4] සීදොන් ජාතිකයන්ගේ
පිළිකුල්සහගත දේවතාවිය වූ අෂ්-
ටොරෙත්ටත්[5] මෝවබ් ජාතිකයන්ගේ
පිළිකුල්සහගත දෙවි වූ කෙමොෂ්ටත්[6]
අම්මොන් පුත්‍රයන්ගේ පිළිකුල්සහ-
ගත දෙවි වූ මිල්කොම්ටත්[7] ඊශ්‍රායෙල්
පාලනය කළ සලමොන් රජ[8] පූජනීය
ස්ථාන ගොඩනඟා තිබුණේය. එම
පූජනීය ස්ථාන පිහිටා තිබුණේ විනා-
ශය නමින් හැඳින්වූ කන්දට* දකුණු
පැත්තෙනි. ඒ පූජනීය ස්ථාන සියල්ල
යෝෂියා රජ විනාශ කර දැමුවේය.
**14** ඔහු බොරු නමස්කාරය සඳහා
තිබූ කණු කුඩු කර,[9] කූලුනු කඩා
දැමුවේය. ඒවා තිබුණු තැන් මිනී
ඇටවලින් පුරවා දැමුවේය. **15** මීට
කලින් ඊශ්‍රායෙල්වරුන්ව පාපයට පෙ-
ළඹවූ[10] නෙබාත්ගේ පුත් යෙරොබෝ-
වම් රජු බොරු නමස්කාරය සඳහා
බෙතෙල්හි සාදා තිබූ පූජනීය ස්ථාන-
යද[11] පූජාසනයද[12] කඩා දැමුවේය. රජ
ඒ පූජනීය ස්ථානයට ගිනි තබා, කුඩු
කර දැමුවේය. බොරු නමස්කාරය
සඳහා එහි තිබූ කූලුනු ඔහු දවා
දැමුවේය.

**16** යෝෂියා රජ ඒ කන්ද මත
තිබූ සොහොන් ගෙවල් දැක, ඒවායේ
තිබුණු ඇටකටු ගෙන්වාගෙන ඒ ඇට-
කටු පූජාසනය මත තබා පුලුස්සා
දැමුවේය.[13] ඔහු එසේ කළේ ඒ පූජාස-
නය නමස්කාරය සඳහා නුසුදුසු තත්-
වයකට පත් කරන පිණිසය. මෙසේ
යෙහෝවා දෙවි අනාගතවක්තෘ මාර්-
ගයෙන් ප්‍රකාශ කළ[1] වචනය ඉටු
විය.[2] **17** රජ, “අර තිබෙන සො-
හොන් කොත කාගේද” කියා ඇසු-
වේය. නුවරේ වැසියෝ ඔහුට මෙසේ
පැවසුවෝය. “ඒ, යූදා දේශයේ සිට
පැමිණි සැබෑ දෙවිගේ අනාගතවක්-
තෘව[3] තැන්පත් කළ ස්ථානයයි.[4] ඔබ
දැන් බෙතෙල්හි පූජාසනයට[5] කළ මේ
සියලු දේ ගැන ඔහු අනාවැකියක් පළ
කර තිබුණා.” **18** එවිට රජ මෙසේ
කීවේය. “ඔහුගේ සොහොන් ගෙට
කිසිවක් කරන්න එපා.[6] ඔහුගේ ඇට-
කටුවලට අත තබන්න කිසිවෙකුට-
වත් ඉඩ දෙන්න එපා.” එබැවින් ඔවුහු
ඔහුගේ ඇටකටුවලට අත නොතැ-
බූහ. සමාරියෙන් පැමිණි අනාගත-
වක්තෘවරයාගේ ඇටකටුවලටද ඔවුහු
කිසිවක් නොකළෝය.[7]

**19** කලින් සිටි ඊශ්‍රායෙල්හි රජ-
වරු,[8] දෙවි ඉදිරියේ පිළිකුලක් වූ[9] පූජ-
නීය ස්ථාන[10] සමාරියේ නුවරවල[11]
සාදා තිබුණෝය. යෝෂියා රජ ඒ
සෑම පූජනීය ස්ථානයක්ම ඉවත් කර,
බෙතෙල්හි තිබූ පූජනීය ස්ථානව-
ලට කළ දේම ඒවාටද කළේය.[12]
**20** එමෙන්ම ඔහු ඒ පූජනීය ස්ථාන-
වල සේවය කරමින් සිටි පූජකයන්ව ඒ
පූජාසන මතම මරා දැමුවේය.[13] ඔහු
මිනී ඇට ගෙන ඒ පූජාසන මත පිලිස්-
සුවේය.[14] ඉන්පසු ඔහු නැවත යෙරුස-
ලමට ගියේය.

**21** යෝෂියා රජ මුළු ජනතාවට
මෙසේ අණ කළේය. “ගිවිසුම සඳ-
හන් වී තිබෙන ලියවිල්ලට අනුව[15]
ඔබේ දෙවි වන යෙහෝවාට ගෞ-
රව කරන පිණිස පාස්කු උත්සවය
පවත්වන්න.”[16] **22** ඊශ්‍රායෙල්හි සිටි
විනිශ්චයකරුවන්ගේ කාලයේදීවත්[17]
ඊශ්‍රායෙල් පාලනය කළ රජවරුන්ගේ
කාලයේදීවත් යූදා දේශය පාලනය
කළ රජවරුන්ගේ කාලයේදීවත්[18] මෙ-
වැනි පාස්කු උත්සවයක් පවත්වා
නොතිබිණ. **23** නමුත් යෝෂියා
රජුගේ පාලන සමයේ දහඅටවන අවු-
රුද්දේදී යෙහෝවා දෙවිට ගෞරව

**23 පරි.**
1 ද්වි 4:19, එස 8:16
2 යෙරෙ 19:13, ශෙප 1:5
3 2රාජා 21:5, 2ලේක 33:5
4 සෙක 14:4, ක්‍රියා 1:12
5 1රාජා 11:5, 1රාජා 11:33
6 ගණන් 21:29, යෙරෙ 48:13
7 ශෙප 1:5
8 1රාජා 11:7
9 නික් 23:24, ද්වි 7:5, 2ලේක 34:3
10 1රාජා 14:16, 1රාජා 15:30
11 1රාජා 12:28, 2ලේක 34:6
12 1රාජා 12:33
13 2ලේක 34:5

**2 තීරුව**
1 1රාජා 13:2
2 ගණන් 23:19, යෙසා 44:26
3 1රාජා 13:1
4 1රාජා 13:30, 1රාජා 13:31
5 1රාජා 12:33
6 යෙසා 57:2
7 1රාජා 13:29
8 1රාජා 13:33, 1රාජා 16:33, මීකා 6:16
9 2රාජා 17:17, ගීතා 78:58, යෙරෙ 7:18
10 1රාජා 12:31, 1රාජා 13:32
11 2රාජා 17:9, 2ලේක 34:6
12 1රාජා 12:29, 2රාජා 10:29
13 නික් 22:20, ද්වි 13:5
14 1රාජා 13:2, 2ලේක 34:5
15 නික් 12:3, නික් 12:14, ලෙවී 23:5, ගණන් 9:13, ගණන් 28:16, ද්වි 16:1
16 2ලේක 35:1
17 2ලේක 35:18
18 2ලේක 30:1, 2ලේක 30:13

**2රාජා 23:13*** එනම්, ඔලීව කන්දට. මෙහි ප්‍රධාන වශයෙන්ම යොමු දක්වන්නේ කන්දේ දකුණු සීමාවටයි.

කරන පිණිස එම පාස්කු උත්සවය
යෙරුසලමේදී පවත්වන ලදි.[1]
**24** යොෂියා රජ යූදා දේශයේ
හා යෙරුසලමේ සිටි මායාකාරයන්[2]
සහ ශාස්ත්‍ර කියන්නන්වද[3] එහි තිබූ
ටෙරපිම් රූප[4] සහ අනිකුත් පිළි-
කුල් රූප[5] ඇතුළු අන් සියලු පිළි-
කුල් දේද[6] විනාශ කළේය. යොෂියා
රජු මෙසේ කළේ යෙහෝවා දෙවිගේ
ගෘහයේදී පූජක හිල්කියාට සම්බ
වූ[7] නීතිය ඇතුළත් ලියවිල්ලෙහි[8]
සඳහන් වචන පිළිපදින පිණිසය.[9]
**25** ඔහුට කලින් හා පසුව පාලනය
කළ රජවරුන් අතරේ ඔහුට සමාන
රජ කෙනෙක් සිටියේ නැත.[10] මන්ද
යොෂියා රජ යෙහෝවා දෙවි වෙතට
හැරී මෝසෙස්ගේ නීතියේ ලියා තිබූ
සියල්ලට අනුව මුළු හදවතින්ම දෙ-
විට නමස්කාර කළේය.[11] ඔහු දෙවි-
ගේ නීති රැකීමට මුළු ශක්තියම
යෙදෙව්වේය.

**26** එහෙත් මනස්සේගේ පෙලඹවීම
මත යූදාහි වැසියන් කළ දුෂ්ට ක්‍රියා
නිසා[12] ඇවුළුණු යෙහෝවා දෙවිගේ
උදහස[13] නිවී ගොස් තිබුණේ නැත.
**27** යෙහෝවා දෙවි ඔවුන් ගැන මෙසේ
කීවේය. “මාගේ අනුමැතිය ඉවත්
කර මා ඊශ්‍රායෙල්වරුන්ව දේශයෙන්
පන්නා දැමූ ලෙසම[14] යූදාහි වැසියන්-
වද[15] මම පන්නා දමන්නෙමි.[16] මා
තෝරාගත් මේ යෙරුසලම් නගරයද,
‘මාගේ නාමය මෙහි දිගටම පවතිනු
ඇත’[17] කියා මා පැවසූ මේ ගෘහයද
මම ප්‍රතික්ෂේප කරන්නෙමි.”

**28** යොෂියා රජුගේ ජීවිතයේ අනි-
කුත් සිදුවීම් ගැනද ඔහු කළ දේවල්
ගැනද යූදාහි රජවරුන්ගේ ඉතිහාසය
වාර්තා කර ඇති ලියවිල්ලෙහි සඳහන්
කර තිබේ.[18] **29** ඒ කාලයේදී ඊජිප්-
තුවේ රජු වූ නෙකෝ නමින් හැඳින්වූ
පාරාවෝ[19] ඇසිරියාවේ රජුට උප-
කාර කිරීම සඳහා යුප්‍රටීස් ගඟ[20]
බලා පිටත්ව ආ විට යොෂියා රජ
ඔහුට විරුද්ධව සටනට ගියේය.[21]
එවිට පාරාවෝ, යොෂියා රජුව මෙගිද්-
දෝහිදී[22] මරා දැමුවේය.[23] **30** රජු-
ගේ සේවකයෝ ඔහුගේ ශරීරය අශ්ව
රථයකින් මෙගිද්දෝහි සිට යෙරු-
සලමට ගෙනැවිත්[1] ඔහුගේම සො-
හොන් ගෙයි තැන්පත් කළෝය. පසුව
දේශයේ වැසියෝ යොෂියාගේ පුත්
යෙහෝයහාෂ්ව[2] රජු ලෙස අභිෂේක
කළෝය.

**31** යෙහෝයහාෂ්[3] රජකමට පත්
වන විට ඔහුගේ වයස අවුරුදු විසිතු-
නකි. ඔහු යෙරුසලමේ සිට මාස
තුනක් පාලනය කළේය. ඔහුගේ මව
ලිබ්නා නගරයෙහි වැසියෙකු වූ යෙ-
රෙමියාගේ දියණිය වූ හමුතල්ය.[4]
**32** ඔහුද ඔහුගේ මුතුන්මිත්තන්
මෙන් යෙහෝවා දෙවි පිළිකුල්
කළ දේවල් කළේය.[5] **33** නෙකෝ
නමින් හැඳින්වූ පාරාවෝ,[6] යෙහෝය-
හාෂ්ව යූදාහි රජකමෙන් ඉවත් කර,
හමාත් දේශයේ රිබ්ලා නගරයෙහි[7]
ඔහුව සිර කර තබා,[8] යූදා දේශ-
යෙන් රිදී තලෙන්ත සියයකුත්[9] රන්
තලෙන්තයකුත්[10] බද්දක් ලෙස අය
කළේය.[11] **34** පසුව පාරාවෝ, යො-
ෂියා රජු වෙනුවට යොෂියාගේ පුත්
එලියාකීම්ව[12] රජකමට පත් කර,
ඔහුගේ නම යෙහෝයාකිම් ලෙස
වෙනස් කළේය. පාරාවෝ, යෙහෝය-
හාෂ්ව ඊජිප්තුවට ගෙන ගියේය. යෙ-
හෝයහාෂ් මිය ගියේ ඊජිප්තුවේදීය.[13]
**35** පාරාවෝ පැනවූ බද්ද ලෙස යෙ-
හෝයාකිම් රන්ද රිදීද[14] ඔහුට ගෙව්-
වේය. ඔහු එය ගෙවීම සඳහා දේශයේ
වැසියන්ගෙන් බදු අය කළේය.[15] එක්
එක් කෙනා තම ඉඩමෙන් ලබාගත්
ආදායමට අනුව දේශයේ වැසියන්-
ගෙන් බද්දක්[16] අය කර එම රන් රිදී
පාරාවෝට දුන්නේය.

**36** යෙහෝයාකිම්[17] රජකමට පත්
වන විට ඔහුගේ වයස අවුරුදු විසිප-
හකි. ඔහු යෙරුසලමේ සිට අවුරුදු
එකොළහක් පාලනය කළේය.[18] ඔහු-
ගේ මව රූමාහි වැසියෙකු වූ පෙදායා-
ගේ දියණිය වූ ෂෙබිදාය. **37** නමුත්

**23 පරි.**
**1** 2ලේක 35:19
**2** ලෙවී 19:31
ලෙවී 20:27
1සාමු 28:3
**3** ද්වි 18:11
2රාජා 21:6
යෙසා 8:19
ක්‍රියා 16:16
**4** උත් 31:19
උත් 31:30
හොෂෙ 3:4
**5** ලෙවී 26:30
යෙරෙ 10:15
**6** ද්වි 29:17
1රාජා 11:5
1රාජා 11:7
**7** 2ලේක 34:14
**8** 2රාජා 22:8
**9** ගණන් 33:52
ද්වි 12:2
**10** 2රාජා 18:5
**11** ද්වි 4:29
**12** 2රාජා 21:11
2රාජා 24:4
යෙරෙ 15:4
**13** 2රාජා 21:12
2රාජා 22:17
2ලේක 36:16
**14** 2රාජා 17:18
2රාජා 18:11
2රාජා 21:13
**15** 2රාජා 25:11
එස 23:33
**16** ද්වි 29:28
2රාජා 24:3
**17** ද්වි 12:5
1රාජා 8:29
1රාජා 9:3
**18** 1රාජා 14:29
2රාජා 21:17
**19** 2රාජා 23:33
යෙරෙ 46:2
**20** උත් 15:18
**21** 2ලේක 35:20
හිතෝ 26:17
ලූක් 14:31
**22** 1රාජා 9:15
සෙක 12:11
**23** යෙසා 57:1

**2 තීරුව**
**1** 2ලේක 35:24
**2** 2ලේක 36:1
**3** 1ලේක 3:15
යෙරෙ 22:11
**4** 2රාජා 24:18
**5** 2රාජා 21:2
2රාජා 21:21
3යොහ 11
**6** 2රාජා 23:29
**7** 2රාජා 25:6
යෙරෙ 39:5
යෙරෙ 52:10
යෙරෙ 52:26
**8** 2ලේක 36:3
**9** 1රාජා 16:24
**10** 2රාජා 18:14
**11** 2ලේක 36:3

**12** 2ලේක 36:4; **13** යෙරෙ 22:12; **14** 2රාජා 23:33; **15** 2රාජා 15:20; **16** රෝම 13:1; රෝම 13:7; **17** 1ලේක 3:15; යෙරෙ 1:3; යෙරෙ 22:19; **18** 2ලේක 36:5.

ඔහුද තම මුතුන්මිත්තන් කළාක්
මෙන්[1] යෙහෝවා දෙවි පිළිකුල් කළ
දේවල් කළේය.[2]

**24** යෙහෝයාකිම් රජුගේ පාලන
සමයේදී බැබිලෝනියේ රජු
වන නෙබුකද්නෙෂර්[3] යෙරුසලම
ආක්‍රමණය කළේය. අවුරුදු තුනක්
යෙහෝයාකිම් රජ ඔහුට යටත් වී සිටි-
යේය.[4] නමුත් පසුව ඔහු නෙබුකද්නෙ-
ෂර් රජුට විරුද්ධව කැරලිගැසුවේය.
**2** කල්දිවරුන්ගේද[5] සිරියානුවන්ගේද
මෝවබ් ජාතිකයන්ගේද[6] අම්මොන්
ජාතිකයන්ගේද කොල්ලකරුවෝ
කලින් කලට යූදා දේශය ආක්‍රම-
ණය කළෝය. එසේ කිරීමට ඔවුන්ව
පෙලඹවූයේ යෙහෝවා දෙවිය. තම
සේවකයන් වූ අනාගතවක්තෘවරුන්
මාර්ගයෙන් යෙහෝවා දෙවි පැවසූ දේ
ඉටු වන පිණිස දෙවි එසේ කළේය.[7]
**3** යෙහෝවා දෙවි එය තීන්දු කළ
නිසා ඒ සියල්ල එසේ සිදු විය.
මනස්සේ රජු කළ පාප නිසා[8] යූදා
දේශය විනාශ කර දැමීමට දෙවි තීර-
ණය කර තිබුණේය.[9] **4** මනස්සේ
රජු නිර්දෝෂ මිනිසුන්ව මරා[10] මුළු
යෙරුසලම ලේ විලක් කළ බැවින්
යෙහෝවා දෙවි සමාව දීමට කැමති
වූයේ නැත.[11]

**5** යෙහෝයාකිම් රජුගේ ජීවිතයේ
අනිකුත් සිදුවීම්ද[12] ඔහු කළ ක්‍රියාද
යූදාහි රජවරුන්ගේ ඉතිහාසය වාර්තා
කර ඇති ලියවිල්ලෙහි සඳහන් කර
තිබේ.[13] **6** කලක් ගත වූ පසු යෙ-
හෝයාකිම් රජ මිය ගියේය. ඔහුගේ
මුතුන්මිත්තන් මෙන් ඔහුවද තැන්-
පත් කරන ලදි.[14] ඔහුට පසුව ඔහු-
ගේ පුත් යෙහෝයාකින් රජකමට
පත් විය.

**7** ඊජිප්තුවේ රජු යටත් කරගෙන
තිබූ මුළු ප්‍රදේශය එනම්, ඊජිප්තු නිම්-
නයේ සිට[15] යුප්‍රටීස් ගඟ දක්වා[16] වූ
ප්‍රදේශය බැබිලෝනියේ රජ යටත්
කරගත්තේය.[17] එබැවින් ඊජිප්තුවේ
රජුට නැවත කිසි දිනක[18] තම දේශ
සීමාවලින් පිටතට පැමිණීමට ලැබු-
ණේ නැත.[19]

**8** යෙහෝයාකින්[1] රජකමට පත්
වන විට ඔහුගේ වයස අවුරුදු දහ-
අටකි. ඔහු යෙරුසලමේ සිට මාස
තුනක් පාලනය කළේය.[2] ඔහුගේ මව
යෙරුසලමේ වැසියෙකු වූ එල්නා-
තාන්ගේ දියණිය වූ නෙහෂ්තාය.
**9** ඔහුද තම පියා මෙන් යෙහෝවා
දෙවි පිළිකුල් කළ දේවල් කළේය.[3]
**10** ඒ කාලයේදී බැබිලෝනියේ රජු වූ
නෙබුකද්නෙෂර්ගේ හමුදාව පැමිණ
යෙරුසලම වැටලුවෝය.[4] **11** තම
හමුදාව යෙරුසලම වැටලූ පසු[5] බැබි-
ලෝනියේ රජු වූ නෙබුකද්නෙෂර්
නගරයට ඇතුල් විය.

**12** එය දැනගත් යූදාහි රජු වූ යෙ-
හෝයාකින් තම මවද[6] සේවකයන්ද
අධිපතීන්ද නිලධාරීන්ද සමඟ බැබි-
ලෝනියේ රජුව මුණගැසීමට ගියේය.[7]
බැබිලෝනියේ රජු පාලනය කළ අට-
වන අවුරුද්දේදී[8] ඔහු යෙහෝයාකින්
රජුව සිරකරුවෙකු ලෙස ගෙන යන
ලදි. **13** එමෙන්ම ඔහු යෙහෝවා
දෙවිගේ ගෘහයේ තිබූ වස්තු සම්භාර-
යද රජමාලිගාවේ තිබූ වස්තු සම්භා-
රයද පැහැරගත්තේය.[9] ඊශ්‍රායෙල්හි
රජු වූ සලමොන්, යෙහෝවා දෙවි-
ගේ ගෘහයේ භාවිතය සඳහා සෑදූ
සියලු රන් භාණ්ඩ[10] ඔහු කෑලි-
වලට කපා රැගෙන ගියේය. මේ
සියල්ල සිදු වූයේ යෙහෝවා දෙවි
පවසා තිබූ ලෙසය. **14** ඔහු යෙ-
රුසලමෙන් දසදහස්දෙනෙකුව වහ-
ලුන් ලෙස රැගෙන ගියේය.[11] ඔවුන්
අතරෙහි සියලු අධිපතීහුද[12] යුද්ධ-
යට දක්ෂ සියලු පුරුෂයෝද[13] සියලු
කර්මාන්තකරුවෝද[14] බලකොටු ඉදි
කරන්නෝද සිටියෝය. දේශයේ
ඉතුරුව සිටියේ දිළිඳුන් පමණි.[15]
**15** ඔහු යෙහෝයාකින් රජුව[16] බැබි-
ලෝනියට රැගෙන ගියේය.[17] එමෙන්ම
යෙහෝයාකින් රජුගේ මවද[18] ඔහුගේ

**10** 1රාජා 7:48; 2ලේක 4:7; 2ලේක 36:10; එස්රා 1:7; යෙරෙ 28:3; දානි 5:2; **11** එස 1:2; **12** නෙහෙ 9:32; **13** එස්ත 2:6; එස 1:2; දානි 1:6; **14** යෙරෙ 24:1; **15** 2රාජා 25:12; **16** 2රාජා 25:27; 1ලේක 3:17; යෙරෙ 22:24; යෙරෙ 52:31; **17** 2ලේක 36:10; එස්ත 2:6; යෙරෙ 22:25; **18** 2රාජා 24:12.

**23 පරි.**
**1** 2ලේක 28:25
2ලේක 33:4
**2** යෙරෙ 26:21
යෙරෙ 36:24

**24 පරි.**
**3** යෙරෙ 25:1
යෙරෙ 46:2
දානි 1:1
දානි 3:1
දානි 4:33
දානි 4:37
**4** 2ලේක 12:8
**5** ද්වි 28:63
යෝබ් 1:17
හබ 1:6
**6** 2රාජා 13:20
**7** ලෙවී 26:27
ද්වි 28:15
2රාජා 23:27
**8** 2රාජා 21:2
2රාජා 21:11
2රාජා 23:26
**9** ලෙවී 26:33
ද්වි 4:26
ද්වි 28:63
2රාජා 23:27
**10** ගණන් 35:33
ද්වි 19:10
2රාජා 21:16
ගීතා 106:38
යෙරෙ 2:34
යෙරෙ 19:4
යෙරෙ 22:17
**11** යෙරෙ 15:1
විලා 3:42
එස 33:25
**12** යෙරෙ 22:18
**13** 2ලේක 36:8
**14** 2ලේක 36:6
යෙරෙ 22:19
යෙරෙ 36:30
**15** උත් 15:18
ගණන් 34:5
යොෂු 15:4
**16** 1රාජා 4:21
යෙසා 27:12
**17** යෙරෙ 37:5
**18** යෙරෙ 46:2
**19** යෙරෙ 37:7

**2 තීරුව**
**1** 1ලේක 3:16
යෙරෙ 24:1
යෙරෙ 37:1
මතෙ 1:11
**2** 2ලේක 36:9
**3** 2රාජා 21:3
2රාජා 21:6
**4** දානි 1:1
**5** 2රාජා 25:2
**6** යෙරෙ 29:2
**7** 2ලේක 36:10
යෙරෙ 24:1
එස 17:12
**8** යෙරෙ 25:1
යෙරෙ 52:28
**9** 2රාජා 20:13
2රාජා 20:17
යෙසා 39:6

භාර්යාවන්වද නිලධාරීන්වද[1] දේශ-
යේ උත්තමයන්වද ඔහු යෙරුසලමේ
සිට බැබිලෝනියට රැගෙන ගියේය.
**16** මෙසේ බැබිලෝනියේ රජු රැගෙන
ගිය අය[2] අතර යුද්ධයට දක්ෂ පුරුෂ-
යෝ හත්දහසක්ද කර්මාන්තකරු-
වෝ සහ බලකොටු ඉදි කරන්නෝ
දහසක්ද සිටියෝය. ඒ සියලුදෙනා
යුධ දක්ෂයෝ වූහ. **17** බැබිලෝනි-
යේ රජ[3] යෙහෝයාකින් රජුගේ බාප්පා
වූ මත්තනියාව[4] යූදාහි රජකමට පත්
කර, මත්තනියාගේ නම ශෙදකියා
ලෙස වෙනස් කළේය.[5]

**18** ශෙදකියා රජකමට පත් වන
විට ඔහුගේ වයස අවුරුදු විසිඑකකි.[6]
ඔහු යෙරුසලමේ සිට අවුරුදු එකොළ-
හක් පාලනය කළේය. ඔහුගේ මව
ලිබ්නා නගරයෙහි වැසියෙකු වූ යෙ-
රෙමියාගේ දියණිය වූ හමුතල්ය.[7]
**19** ඔහුද යෙහෝයාකිම් රජු මෙන්
යෙහෝවා දෙවි පිළිකුල් කළ දේවල්
දිගටම කළේය.[8] **20** යෙරුසලමේ
සහ යූදා දේශයේ වැසියන්ගේ දුෂ්ට-
කම් නිසා යෙහෝවා දෙවිගේ උදහස
ඔවුන්ට විරුද්ධව ඇවුළුණු අතර[9] ඔහු
තම අනුමැතිය ඔවුන්ගෙන් ඉවත්
කළේය.[10] ඒ කාලයේදී ශෙදකියා රජ
බැබිලෝනියේ රජුට විරුද්ධව කැරලි-
ගැසුවේය.[11]

**25** ශෙදකියා රජුගේ පාලන සම-
යේ නවවන අවුරුද්දේ[12]
දහවන මාසයේ දහවන දින,[13] බැබි-
ලෝනියේ රජු වූ නෙබුකද්නෙෂර්[14]
ඔහුගේ මුළු හමුදාව සමඟ යෙරු-
සලමට විරුද්ධව සටනට පැමිණි-
යේය.[15] ඔහු පැමිණ ඒ අවට
කඳවුරු බැඳගෙන යෙරුසලම වටා
පවුරක් ගොඩනැඟුවේය.[16] **2** ශෙද-
කියා රජු පාලනය කළ එකොළොස්-
වන අවුරුද්ද දක්වාම නෙබුකද්නෙෂර්
රජුගේ හමුදාව යෙරුසලම වටලා
සිටියෝය. **3** හතරවන මාසයේ
නවවනදා[17] වන විට ඒ දේශයේ වැසි-
යන්ට රොටි කැබැල්ලක්වත් සොයා-
ගැනීමට නොහැකි වන තරමටම[18]
සාගතය දරුණු විය.[19] **4** ඒ අතර-
තුර කල්දිවරු පවුර කඩාගෙන නුව-
රට ඇතුල් වූහ.[1] ඔවුහු[2] නුවර සෑම
පැත්තෙන්ම වටලුවෝය. එදින රාත්‍රි-
යේ නුවරේ සිටි සියලු යුධ භටයෝ
රජුගේ උයන අසල පිහිටි තාප්ප
දෙක අතරේ තිබූ දොරටුවෙන් පලා
ගියෝය.[3] රජද අරබා නිම්නය[4] දෙසට
පලා ගියේය.[5] **5** නමුත් කල්දිව-
රුන්ගේ භට පිරිසක්[6] රජුව ලුහු-
බැඳ ගොස් යෙරිකෝවේ පාළුකරයේදී[7]
ඔහුව අල්ලාගත්තෝය.[8] එවිට රජුගේ
භට පිරිස ඔහුව අත්හැර දමා ඒ මේ
අත පලා ගියෝය. **6** රජුව අල්-
ලාගත් පසු[9] ඔහුට දිය යුතු දඬු-
වම තීරණය කරන පිණිස ඔහුව
රිබ්ලා නගරයේ සිටි බැබිලෝනි-
යේ රජු වෙතට ගෙන යන ලදි.[10]
**7** ඔවුහු රජුගේ අණ පරිදි ශෙද-
කියා රජු බලා සිටියදීම ඔහුගේ පුත්‍ර-
යන්ව මරා දමා,[11] ඔහුගේ ඇස් අන්ධ
කළෝය.[12] පසුව ඔවුහු ශෙදකියා
රජුට තඹ විලංගු දමා[13] ඔහුව බැබි-
ලෝනියට ගෙන ගියෝය.[14]

**8** බැබිලෝනියේ රජු වූ නෙබු-
කද්නෙෂර්ගේ පාලන සමයේ දහන-
වවන අවුරුද්දේ[15] පස්වන මාසයේ
හත්වන දින, බැබිලෝනියේ රජු-
ගේ සේවකයෙක් වූද ආරක්ෂක
භටයන්ගේ නායකයා වූද නෙබුෂර-
දාන්[16] යෙරුසලමට පැමිණියේය.[17]
**9** ඔහු යෙහෝවා දෙවිගේ ගෘහයද[18]
රජමාලිගාවද[19] යෙරුසලමේ තිබූ
සියලුම නිවාසද[20] උත්තමයන්ගේ
නිවාසද ගිනි තබා විනාශ කළේය.[21]
**10** ආරක්ෂක භටයන්ගේ නායකයා
සමඟ සිටි කල්දිවරුන්ගේ මුළු හමුදාව
යෙරුසලම වටා තිබූ පවුර මුළු-
මනින්ම විනාශ කර දැමුවෝය.[22]
**11** නගරයේ ඉතුරු වී සිටි අයවද[23]
බැබිලෝනියේ රජුට යටත් වූ අයවද

---

**24 පරි.**
**1** යෙරෙ 29:2
**2** යෙරෙ 52:28
**3** යෙරෙ 37:1
**4** 1ලේක 3:15
**5** 2ලේක 36:10
යෙරෙ 52:1
**6** 2ලේක 36:11
**7** 2රාජා 23:31
**8** 2රාජා 23:37
2ලේක 36:12
යෙරෙ 24:8
යෙරෙ 37:2
යෙරෙ 38:5
එස 21:25
**9** ද්වි 4:24
2රාජා 22:17
2රාජා 23:26
**10** 2රාජා 23:27
**11** 2ලේක 36:13
යෙරෙ 27:12
යෙරෙ 38:17
එස 17:15

**25 පරි.**
**12** යෙරෙ 39:1
**13** එස 24:1
**14** 2රාජා 24:1
යෙරෙ 27:8
යෙරෙ 32:28
යෙරෙ 43:10
එස 26:7
දානි 4:1
**15** 2ලේක 36:17
යෙරෙ 34:2
**16** යෙසා 29:3
යෙරෙ 32:2
යෙරෙ 37:11
යෙරෙ 52:4
එස 4:2
එස 21:22
**17** යෙරෙ 52:6
**18** යෙරෙ 37:21
යෙරෙ 38:2
විලා 4:4
එස 5:12
එස 7:15
එස 14:21
**19** ලෙවී 26:26
ද්වි 28:53
ද්වි 28:63
එස 4:16
එස 5:10

**2 තීරුව**
**1** යෙරෙ 39:2
යෙරෙ 52:7
එස 33:21
**2** යෙරෙ 21:4
**3** යෙරෙ 39:4
**4** යොෂු 3:16
**5** එස 12:12
**6** යෙරෙ 39:5
**7** යෙරෙ 52:8
**8** යෙසා 30:16
යෙරෙ 24:8
**9** යෙරෙ 21:7
**10** 2රාජා 23:33
යෙරෙ 52:10
යෙරෙ 52:26

---

**11** ද්වි 28:34; යෙරෙ 39:6; **12** එස 12:13; **13** 2ලේක 33:11; 2ලේක 36:6; **14** යෙරෙ 32:5; යෙරෙ 34:3; එස 17:16; **15** යෙරෙ 52:12; **16** යෙරෙ 39:9; යෙරෙ 40:1; **17** විලා 4:12; **18** 1රාජා 9:8; 2ලේක 36:19; ගීතා 74:3; ගීතා 79:1; යෙසා 64:11; යෙරෙ 7:14; විලා 1:10; විලා 2:7; මීකා 3:12; **19** 1රාජා 7:1; ආමො 2:5; **20** යෙරෙ 34:22; යෙරෙ 37:8; **21** යෙරෙ 52:13; **22** නෙහෙ 1:3; යෙරෙ 39:8; යෙරෙ 52:14; **23** යෙරෙ 15:2; එස 5:2.

නගරයෙන් පිටත සිටි සෙසු ජනයාවද නෙබුෂරදාන් වහලුන් ලෙස රැගෙන ගියේය.[1] **12** ආරක්ෂක භටයන්ගේ නායකයා දේශයේ සිටි දුගී ජනයාගෙන් සමහරදෙනෙකුව[2] මිදිවතු වැවීමටත් ගොවිතැන් කිරීමටත් තබා ගියේය. ඔවුහු එහි වහලුන් ලෙස සේවය කළෝය.[3] **13** කල්දිවරු, යෙහෝවා දෙවිගේ ගෘහයේ තිබූ තඹ කුලුනුද[4] යෙහෝවා දෙවිගේ ගෘහයේ තිබුණු කරත්තද[5] වතුර දැමීමට තිබුණු විශාල වටකුරු තඹ භාජනයද[6] කැබලිවලට කඩා ඒවායේ තිබූ තඹ බැබිලෝනියට ගෙන ගියෝය.[7] **14** අළු දමන භාජනද සවල්ද පහන් තිර නිවා දැමීමට භාවිත කළ උපකරණද කුසලානද ගෘහයේ භාවිත කළ අන් සියලු තඹ භාජනද[8] ඔවුහු ගෙන ගියෝය. **15** ආරක්ෂක භටයන්ගේ නායකයා පිරිසිදු රනින්ද[9] රිදීවලින්ද[10] සාදා තිබූ අඟුරු දමන භාජන ඇතුළු අන් සියලු භාජනද ගෙන ගියේය. **16** යෙහෝවා දෙවිගේ ගෘහය සඳහා සලමොන් රජු සෑදූ කුලුනු දෙකෙහිත් විශාල වටකුරු භාජනයෙහිත් කරත්තවලත් තිබුණු තඹවල බර කොපමණදැයි කිරා මැන බැලීමට නොහැකි විය. මන්ද විශාල තඹ ප්‍රමාණයක් එහි තිබිණ.[11] **17** ඒ එක් කුලුනක උස රියන් දහඅටකි.[12] කුලුන මුදුනේ තිබූ කොටසද[13] තඹවලින් නිමවා තිබිණ. කුලුන මුදුනේ තිබූ එම කොටසේ උස රියන් තුනකි. එය වටා තිබූ දැල් සැරසිල්ලද ඒ දැල් මත සවි කර තිබූ දෙළුම් ගෙඩිද[14] තඹවලින් සාදා තිබිණ. දෙවන කුලුනෙත් දෙළුම් ගෙඩි සවි කළ දැල් සැරසිල්ලක් තිබිණ.

**18** ආරක්ෂක භටයන්ගේ නායකයා, නායක පූජක සෙරායාවද[15] ඔහුගේ උපකාරයට සිටි පූජක ශෙපනියාවද[16] දොරටු පාලකයන්[17] තුන්දෙනෙකුවද අල්ලාගත්තේය. **19** ඊට අමතරව යුධ භටයන් කෙරෙහි පත් කර සිටි නිලධාරියෙකුවද රජුට ඉතා සමීපව සිටි පුද්ගලයන් පස්දෙනෙකුවද නුවරේදී ඔහු අල්ලාගත්තේය. එමෙන්ම යුද්ධයට සෙනඟ රැස් කළ හමුදාපතිගේ ලේකම්වද නගරයේ සිටි දේශයේ වැසියන්ගෙන් පුරුෂයන් හැටදෙනෙකුවද ඔහු අල්ලාගත්තේය.[1] **20** ආරක්ෂක භටයන්ගේ නායකයා වූ නෙබුෂරදාන්[2] ඔවුන්ව රිබ්ලා නගරයේ[3] සිටි බැබිලෝනියේ රජු වෙතට රැගෙන ගියේය.[4] **21** බැබිලෝනියේ රජ ඔවුන්ව හමාත් දේශයේ[5] රිබ්ලා නගරයේදී මරා දැමුවේය.[6] යූදා දේශයේ වැසියන්ව වහලුන් ලෙසද ගෙන යන ලදි.[7]

**22** බැබිලෝනියේ රජු වූ නෙබුකද්නෙෂර් තමන් යූදා දේශයේ ඉතුරු කර ගිය අයගේ[8] වැඩකටයුතු බලා කියා ගැනීමට ෂාපාන්ගේ[9] පුත්‍රයා වූ අහිකාම්ගේ[10] පුත් ගෙදලියාව[11] පත් කළේය. **23** බැබිලෝනියේ රජු, ගෙදලියාව පත් කළ බව හමුදාපතීන්ට[12] ආරංචි වූ විගස ඔවුහු සියලුදෙනා තමුන්ගේ භටයන් සමඟ ගෙදලියාව හමු වීමට මිෂ්පා නගරයට පැමිණියෝය.[13] නෙතනියාගේ පුත් ඉෂ්මායෙල්ද කාරියාගේ පුත් යෝහානාන්ද නෙටෝෆා ගමෙහි වැසියෙකු වූ තන්හුමෙත්ගේ පුත් සෙරායාද මයකාහි වැසියෙකුගේ පුත්‍රයෙකු වූ යයෂනියාද තම භටයන් සමඟ පැමිණියෝය. **24** එවිට ගෙදලියා ඔවුන්ටත් ඔවුන් සමඟ පැමිණි භටයන්ටත් දිවුරමින්[14] මෙසේ පැවසීය. "කල්දිවරුන්ට සේවය කරන්න භය වෙන්න එපා. මේ දේශයේ ඉඳන් බැබිලෝනියේ රජුට සේවය කරන්න. එසේ කළොත් ඔබට කිසි කරදරයක් වෙන්නේ නැහැ."[15]

**25** නමුත් හත්වන මාසයේදී[16] රජ පවුලට අයත් එලිෂාමාගේ පුත්‍රයා වූ නෙතනියාගේ පුත් ඉෂ්මායෙල්[17] තව මිනිසුන් දසදෙනෙකු සමඟ පැමිණ ගෙදලියාව මරා දැමුවේය.[18] ගෙදලියා සමඟ මිෂ්පා නගරයේ[19] සිටි

**12** යෙරෙ 40:7; **13** යෙරෙ 40:8; **14** ද්වි 6:13; යෙරෙ 4:2; යෙරෙ 12:16; **15** යෙරෙ 27:12; යෙරෙ 40:9; **16** යෙරෙ 41:1; **17** යෙරෙ 40:15; **18** යෙරෙ 41:2; **19** යෙරෙ 41:16.

**25 පරි.**
**1** යෙරෙ 39:9
යෙරෙ 52:30
එස 12:15
එස 22:15
**2** 2රාජා 24:14
යෙරෙ 39:10
යෙරෙ 40:7
**3** යෙරෙ 52:16
**4** 1රාජා 7:15
2ලේක 4:12
**5** 1රාජා 7:27
2ලේක 4:14
**6** 1රාජා 7:23
2ලේක 4:15
**7** 2රාජා 20:17
**8** 2ලේක 4:19
**9** 1රාජා 7:50
එස්රා 1:10
**10** 2ලේක 24:14
2ලේක 36:18
එස්රා 1:11
දානි 5:2
**11** 1රාජා 7:47
**12** 1රාජා 7:15
යෙරෙ 52:21
**13** 1රාජා 7:16
යෙරෙ 52:22
**14** 1රාජා 7:20
යෙරෙ 52:23
**15** 1ලේක 6:14
එස්රා 7:1
යෙරෙ 52:24
**16** යෙරෙ 21:1
යෙරෙ 29:25
යෙරෙ 29:29
**17** 2රාජා 22:4
1ලේක 26:12

**2 තීරුව**
**1** යෙරෙ 52:25
**2** 2රාජා 25:8
යෙරෙ 39:9
යෙරෙ 40:1
**3** 2රාජා 23:33
යෙරෙ 39:5
යෙරෙ 52:9
**4** යෙරෙ 52:26
**5** ගණන් 13:21
ගණන් 34:8
1රාජා 8:65
**6** යෙරෙ 52:27
ආමො 3:2
**7** ලෙවී 26:33
ද්වි 4:26
ද්වි 28:36
ද්වි 28:64
2රාජා 23:27
යෙරෙ 24:9
යෙරෙ 25:11
එස 12:25
එස 24:14
**8** යෙරෙ 40:6
**9** 2රාජා 22:8
2ලේක 34:20
**10** 2රාජා 22:12
යෙරෙ 26:24
**11** 2රාජා 25:25
යෙරෙ 39:14
යෙරෙ 41:2

යුදෙව්වරුන්වත් කල්දිවරුන්වත් ඔහු
මරා දැමුවේය. **26** ඉන්පසු ලොකු
කුඩා සියලුදෙනා ඇතුළු හමුදාපතීහුද
කල්දිවරුන්ට භය වී[1] ඊජිප්තුවට පලා
ගියෝය.[2]
**27** යූදාහි රජු වූ යෙහෝයාකින්ව[3]
බැබිලෝනියට ගෙන ගොස් අවුරුදු
තිස්හතක් ගත විය. එම තිස්හත්වන
අවුරුද්දේ එවිල්-මෙරොදක්[4] බැබිලෝ-
නියේ රජකමට පත් විය. ඒ අවුරුද්-
දේ දොළොස්වන මාසයේ විසිහත්වන
දින ඔහු යෙහෝයාකින් රජුව සිර-
ගෙයින් නිදහස් කළේය.[5] **28** එවිල්-
මෙරොදක් රජ යෙහෝයාකින් රජුට
කාරුණිකව සලකා, බැබිලෝනියේ
සිරකරුවන් ලෙස සිටි අනික් රජව-
රුන්ට වඩා ඉහළ තනතුරක් ඔහුට
දුන්නේය.[1] **29** එබැවින් යෙහෝයා-
කින් රජ තම සිර ඇඳුම් ඉවත්
කළේය.[2] මිය යන තුරු රජු සමඟ
ආහාර ගැනීමේ වරප්‍රසාදයද ඔහුට හිමි
විය.[3] **30** මෙලෙස ඔහු මිය යන
තෙක්ම දිනපතා රජුගේ භෝජනයෙන්
පංගුවක් ඔහුට ලැබිණ.[4]

**25 පරි.**
**1** යෙරෙ 41:18
**2** ද්වි 28:68; යෙරෙ 41:17; යෙරෙ 42:14; යෙරෙ 43:7
**3** 2රාජා 24:8; 2රාජා 24:12; යෙරෙ 24:1; යෙරෙ 37:1; මතෙ 1:11
**4** හිතෝ 21:1; යෙරෙ 52:31
**5** උත් 40:13

**2 තීරුව**
**1** ගීතා 90:15; යෙරෙ 52:32
**2** උත් 41:14; උත් 41:42; **3** 2සාමු 9:7; **4** නෙහෙ 11:23.

# පළමුවෙනි
# ලේකම්

**1** ආදම්,[1]
සෙත්,[2]
ඒනොෂ්,[3]
**2** කේනාන්,[4]
මහලලෙල්,[5]
යාරෙද්,[6]
**3** ඒනොක්,[7]
මෙතූසලා,[8]
ලාමෙක්,[9]
**4** නෝවා,[10]
ෂෙම්,[11] හාම්[12] සහ යාෆෙත්.[13]
**5** යාෆෙත්ගේ පුත්‍රයන් නම් ගො-
මෙර්, මාගොග්,[14] මාදයි,[15] යාවාන්,[16]
තූබල්, මෙෂෙක්[17] සහ තීරස්[18] යන
අයයි.
**6** ගොමෙර්ගේ පුත්‍රයන් නම් අෂ්-
කෙනස්,[19] රිෆත්[20] සහ තොගර්මා[21]
යන අයයි.
**7** යාවාන්ගේ පුත්‍රයන් නම් එලි-
ෂාහ්,[22] තර්ෂිෂ්,[23] කිත්තිම්[24] සහ
රොදානිම්[25] යන අයයි.
**8** හාම්ගේ පුත්‍රයන් නම් කූෂ්,[26]
මිස්‍රයිම්,[27] පූට්[28] සහ කානාන්[29] යන
අයයි.
**9** කූෂ්ගේ පුත්‍රයන් නම් සෙබා,[1]
හවිලා, සබ්තා,[2] රයමා[3] සහ සබ්-
තෙකා[4] යන අයයි.
රයමාගේ පුත්‍රයන් නම් ෂෙබා
සහ දෙදාන්ය.[5]
**10** කූෂ්ට නිම්රොද්[6] නමින්
තවත් පුත්‍රයෙක් සිටියේය. පො-
ළොවේ බලවන්තයෙකු වූ[7] මුල්ම
තැනැත්තා මොහුය.
**11** මිස්‍රයිම්ගේ පුත්‍රයන් නම්
ලූදිම්,[8] අනාමිම්, ලෙහාබිම්, නප්-
තුහිම්,[9] **12** පත්රුසිම්,[10] (පිලිස්-
තිවරුන්ගේ[11] ආදිපියා වූ) කස්ලූ-
හිම්[12] සහ කප්තෝරිම්[13] යන අයයි.
**13** කානාන්ගේ කුලුඳුල් පුත්‍රයා
සීදොන්ය.[14] කානාන්ට හෙත්[15]
යන නමින්ද පුත්‍රයෙක් සිටියේය.
**14** එමෙන්ම යෙබූසිවරුන්,[16]
අමෝරිවරුන්,[17] ගිර්ගාෂිවරුන්,[18]

**1 පරි.**
**1** ලූක් 3:38; 1කොරි 15:45
**2** උත් 4:25
**3** උත් 5:9
**4** උත් 5:12
**5** උත් 5:15
**6** උත් 5:18
**7** හෙබ්‍රෙ 11:5; යූද් 14
**8** උත් 5:25
**9** උත් 5:28
**10** උත් 5:29; උත් 6:8; යෙසා 54:9; එස 14:14; මතෙ 24:37
**11** උත් 11:10
**12** උත් 6:10
**13** උත් 10:21
**14** උත් 10:2
**15** 2රාජා 17:6
**16** යෙසා 66:19; යෝවෙ 3:6
**17** එස 27:13
**18** උත් 10:2
**19** යෙරෙ 51:27
**20** උත් 10:3
**21** එස 27:14
**22** එස 27:7
**23** 1රාජා 10:22
**24** යෙසා 23:1
**25** උත් 10:4
**26** යෙසා 11:11
**27** උත් 10:6
**28** යෙරෙ 46:9; නාහු 3:9

**29** උත් 12:5; **2 තීරුව** **1** ගීතා 72:10; **2** උත් 10:7; **3** එස 27:22; 4 උත් 10:7; **5** උත් 10:7; **6** උත් 10:8; මීකා 5:6; **7** උත් 10:9; **8** යෙරෙ 46:9; **9** උත් 10:13; **10** එස 29:14; **11** යොෂු 13:3; **12** උත් 10:14; **13** ද්වි 2:23; යෙරෙ 47:4; ආමො 9:7; **14** යෙසා 23:2; **15** උත් 25:10; උත් 27:46; **16** ගණන් 13:29; විනි 1:21; **17** උත් 15:16; ද්වි 3:8; **18** උත් 10:16; ද්වි 7:1.

**15** හිවියවරුන්,[1] අර්කිවරුන්, සීන්-
වරුන්,[2] **16** අර්වාදිවරුන්,[3] ෂෙ-
මාරිවරුන්[4] හා හමාතියවරුන්[5]
පැවතෙන්නේද කානාන්ගෙනි.

**17** ෂෙම්ගේ පුත්‍රයන්[6] නම්
ඒලාම්,[7] අෂූර්,[8] ආර්පක්සද්,[9] ලූද්,[10]
ආරම්,

ඌෂ්, හුල්, ගෙතෙර් සහ මෂ්[11]
යන අයයි.

**18** ආර්පක්සද්ගේ පුත්‍රයා ෂේ-
ලාය.[12] ෂේලාගේ පුත්‍රයා ඒබර්ය.[13]

**19** ඒබර්ට පුත්‍රයෝ දෙදෙ-
නෙක් සිටියෝය. එක් කෙනෙකු-
ගේ නම පේලෙග්ය.*[14] ඔහුට එම
නම තැබුවේ ඒ කාලයේ පො-
ළොවේ යම් භේදයක් හටගත්
නිසාය. ඔහුගේ සහෝදරයාගේ
නම යොක්තාන්ය.

**20** යොක්තාන්ගේ පුත්‍ර-
යන් නම් අල්මෝදාද්, ෂෙ-
ලෙප්, හසර්මාවෙත්, යේරා,[15]
**21** හදොරාම්, ඌසාල්, දික්ලා,[16]
**22** ඕබාල්, අබිමායෙල්, ෂෙබා,[17]
**23** ඕෆීර්,[18] හවිලා[19] හා යෝ-
බාබ්[20] යන අයයි.

**24** ෂෙම්,[21]
ආර්පක්සද්,[22]
ෂේලා,[23]
**25** ඒබර්,[24]
පේලෙග්,[25]
රෙව්,[26]
**26** සේරග්,[27]
නාහෝර්,[28]
ටේරා,[29]
**27** ආබ්‍රම්[30] හෙවත් ආබ්‍රහම්.[31]

**28** ආබ්‍රහම්ගේ පුත්‍රයන් නම්
ඊසාක්[32] සහ ඉෂ්මායෙල්ය.[33]

**29** ඔවුන්ගෙන් පැවතෙන්නන් මෙ-
සේය. ඉෂ්මායෙල්ගේ කුලුඳුල් පුත්‍රයා
නෙබායොත්ය.[34] ඔහුගේ අනික් පුත්‍ර-
යන් නම් කේදාර්,[35] අද්බෙයෙල්, මිබ්-
සාම්,[36] **30** මිෂ්මා, දූමා,[37] මස්සා,
හදද්,[38] තේමා, **31** යෙතූර්, නාෆිෂ්
හා කේදෙමා[39] යන අයයි.

**32** ආබ්‍රහම්ගේ උපභාර්යාව වූ[1]
කෙටූරාගේ[2] පුත්‍රයන් නම් සිම්රාන්,
යොක්ෂාන්, මේදාන්,[3] මිදියන්,[4] ඉෂ්-
බාක්[5] සහ ෂුවාහ්[6] යන අයයි.

යොක්ෂාන්ගේ පුත්‍රයන් නම්
ෂෙබා හා දෙදාන්ය.[7]

**33** මිදියන්ගේ පුත්‍රයන් නම් ඒෆා,[8]
ඒෆෙර්, හනොක්, අබිදා සහ එල්දායා[9]
යන අයයි.
මොවුන් සියල්ලෝම කෙටූරාගේ පුත්‍ර-
යෝය.

**34** ආබ්‍රහම්ගේ පුත්‍රයා ඊසාක්ය.[10]
ඊසාක්ගේ පුත්‍රයන් නම් ඒසව්[11] සහ
ඊශ්‍රායෙල්ය.[12]

**35** ඒසව්ගේ පුත්‍රයන් නම් එලි-
ෆස්, රුවෙල්,[13] යෙවුෂ්, යාලාම් සහ
කෝරා[14] යන අයයි.

**36** එලිෆස්ගේ පුත්‍රයන් නම් තේ-
මාන්,[15] ඕමාර්, ෂෙපෝ, ගාතම්,
කෙනෂ්,[16] තිම්නා[17] සහ අමලෙක්[18]
යන අයයි.

**37** රුවෙල්ගේ පුත්‍රයන් නම්
නාහත්, සේරා, ෂම්මාහ් සහ
මිෂ්ෂා[19] යන අයයි.

**38** සේයිර්ගේ පුත්‍රයන්[20] නම් ලො-
තන්, ෂෝබාල්, ශිබියොන්, අනා,[21]
දීෂොන්,[22] එෂෙර් සහ දීෂන් යන
අයයි.

**39** ලොතන්ගේ පුත්‍රයන් නම්
හෝරී සහ හෝමාම්ය. ලොතන්ගේ
සහෝදරිය තිම්නාය.[23]

**40** ෂෝබාල්ගේ පුත්‍රයන් නම්
අල්වාන්, මනහාත්, ඒබාල්, ෂෙපො
සහ ඕනාම්ය.[24]

ශිබියොන්ගේ පුත්‍රයන් නම් ආයා
සහ අනාය.[25]

**41** අනාගේ පුත්‍රයා දීෂොන්ය.[26]

දීෂොන්ගේ පුත්‍රයන් නම් හෙම්දන්,
එෂ්බන්, ඉත්රාන් සහ කෙරන්[27] යන
අයයි.

---

1ලේක **1:19*** තේරුම, "වෙන් වීම."

**10** ලූක් 3:34; ක්‍රියා 7:8; **11** උත් 25:25; මලා 1:3; **12** උත් 32:28; **13** උත් 36:4; **14** උත් 36:5; උත් 36:14; **15** යෙරෙ 49:7; ආමො 1:12; ඔබ 9; **16** උත් 36:11; **17** උත් 36:12; **18** උත් 36:12; **19** උත් 36:13; **20** උත් 36:8; **21** උත් 36:20; **22** උත් 36:21; **23** උත් 36:22; **24** උත් 36:23; **25** උත් 36:24; **26** උත් 36:25; **27** උත් 36:26.

**1 පරි.**
**1** නික් 3:8 යොෂු 9:7
**2** උත් 10:17
**3** එස 27:11
**4** උත් 10:18
**5** යොෂු 13:5
**6** උත් 5:32
**7** එස්රා 4:9 ක්‍රියා 2:9
**8** එස 27:23
**9** උත් 11:10
**10** උත් 10:22
**11** උත් 10:23
**12** උත් 11:14
**13** ලූක් 3:35
**14** උත් 11:19
**15** උත් 10:26
**16** උත් 10:27
**17** උත් 10:28
**18** 1රාජා 9:28 යෝබ් 22:24 ගීතා 45:9
**19** උත් 2:11 උත් 25:18
**20** උත් 10:29
**21** උත් 11:10 ලූක් 3:36
**22** උත් 10:22
**23** උත් 11:13 ලූක් 3:35
**24** උත් 11:17 ගණන් 24:24
**25** උත් 11:19
**26** උත් 11:21
**27** උත් 11:23
**28** උත් 11:25
**29** උත් 11:26
**30** උත් 11:26 උත් 12:7
**31** උත් 17:5 නෙහෙ 9:7 යාකො 2:23
**32** උත් 21:3 රෝම 9:7
**33** උත් 16:11
**34** උත් 28:9 යෙසා 60:7
**35** සල 1:5 යෙසා 21:17 එස 27:21
**36** උත් 25:13
**37** උත් 25:14
**38** උත් 25:15
**39** උත් 25:15

**2 තීරුව**
**1** උත් 25:6
**2** උත් 25:1
**3** උත් 25:2
**4** උත් 37:28 නික් 2:15 ගණන් 22:7
**5** උත් 25:2
**6** යෝබ් 2:11
**7** උත් 25:3 යෙසා 21:13
**8** යෙසා 60:6
**9** උත් 25:4

42 එෂෙර්ගේ පුත්‍රයන්[1] නම් බිල්-
හාන්, සයවාන් සහ අකාන්[2] යන
අයයි.
දීෂන්ගේ පුත්‍රයන් නම් ඌෂ් සහ
අරාන්ය.[3]
43 ඒදොම්[4] දේශයේ පාලනය කළ
රජවරුන්ගේ නම් මතු දැක්වේ. ඔවුන්
දේශය පාලනය කළේ ඊශ්‍රායෙල්ව-
රුන් රජ කෙනෙකුව පත් කරගැනීමට
කලින්ය.[5] ප්‍රථමයා බෙයෝර්ගේ පුත්‍රයා
වූ බෙලාය. ඔහු පාලනය කළේ දින්-
හබා යන නුවරේ සිටය.[6] 44 කල්
යත්ම බෙලා මිය ගියේය. ඔහු වෙනු-
වට බොෂ්රා නුවරෙන්[7] පැමිණි සේරා-
ගේ[8] පුත්‍ර යෝබාබ් පාලනය කිරීමට
පටන්ගත්තේය. 45 යෝබාබ් මිය
ගිය පසු ඔහු වෙනුවට තේමාන්වරුන්-
ගේ දේශයේ[9] හූෂාම්[10] රජකම් කිරී-
මට පටන්ගත්තේය. 46 කල් යත්ම
හූෂාම් මිය ගියේය. ඔහු වෙනුවට මෝ-
වබ් ප්‍රදේශයෙහිදී මිදියන්ව[11] පරාජය
කළ බෙදද්ගේ පුත්‍රයා වූ හදද්[12] රජ-
කම් කිරීමට පටන්ගත්තේය. ඔහු-
ගේ නුවරේ නම අවිත්ය.[13] 47 හදද්
මිය ගිය පසු ඔහු වෙනුවට මස්-
රේකා[14] නම් ස්ථානයෙන් පැමිණි
සම්ලා රජකම් කිරීමට පටන්ගත්-
තේය. 48 කල් යත්ම සම්ලා මිය
ගියේය. ඉන්පසු ගඟ අසබඩ පිහිටි රෙ-
හොබොත්[15] නම් ස්ථානයෙන් පැමිණි
ෂාවුල් ඔහු වෙනුවට රජකම් කිරී-
මට පටන්ගත්තේය. 49 ෂාවුල් මිය
ගිය පසු ඔහු වෙනුවට අක්බෝර්-
ගේ[16] පුත්‍ර බාල්-හානාන් රජකම් කිරී-
මට පටන්ගත්තේය. 50 කල් යත්ම
බාල්-හානාන් මිය ගොස් ඔහු වෙනුවට
හදද්* රජකම් කිරීමට පටන්ගත්-
තේය. ඔහුගේ භාර්යාවගේ නම මෙහේ-
ටබෙල්ය. ඇය මේෂාහාබ්ගේ දියණිය
වූ මාත්රෙද්ගේ දියණියයි. ඔහුගේ නුව-
රේ නම පාවිය.[17] 51 කල් යත්ම
හදද් මිය ගියේය.
ඒදොම් දේශයේ අධිපතීන්*

**1ලේක 1:50*** උත් 36:39හි සඳහන් වන්නේ, "හදර්" ලෙසයි. **51*** මූ.අ., "ෂීක්වරුන්."

**1 පරි.**
1 1ලේක 1:38
2 උත් 36:27
3 උත් 36:28
4 උත් 32:3
5 උත් 49:10; ගණන් 24:17
6 උත් 36:32
7 යෙසා 34:6; යෙසා 63:1; යෙරෙ 49:13; ආමෝ 1:12
8 උත් 36:33
9 යෝබ් 2:11
10 උත් 36:34
11 උත් 25:2; නික් 2:15; ගණන් 22:7; විනි 6:2
12 උත් 36:35
13 උත් 36:35
14 උත් 36:36
15 උත් 36:37
16 උත් 36:38
17 උත් 36:39

**2 තීරුව**
1 උත් 36:40
2 උත් 36:41
3 උත් 36:42
4 උත් 36:43
5 නික් 15:15

**2 පරි.**
6 උත් 32:28; උත් 49:2
7 උත් 35:23; උත් 49:3; 1ලේක 5:1
8 උත් 29:33; උත් 49:5
9 උත් 29:34
10 උත් 29:35; උත් 49:8; හෙබ්‍රෙ 7:14
11 උත් 30:18; උත් 49:14
12 උත් 30:20; උත් 49:13
13 උත් 30:6; උත් 49:16
14 උත් 30:24; උත් 49:22
15 උත් 35:18; උත් 49:27
16 උත් 30:8; උත් 49:21
17 උත් 30:11; උත් 49:19
18 උත් 30:13; උත් 49:20
19 උත් 38:3
20 උත් 38:4
21 උත් 38:5
22 උත් 38:7
23 උත් 38:11
24 ලූක් 3:33
25 ගණන් 26:21

නම් තිම්නා, අල්වා, යේතෙත්,[1]
52 ඔහොලිබාමා, ඒලාහ්, පීනොන්,[2]
53 කෙනෂ්, තේමාන්, මිබ්ෂාර්,[3]
54 මග්දියෙල් හා ඊරාම්[4] යන අයයි.
ඔවුහු සියලුදෙනා ඒදොම් දේශයේ
අධිපතීන්[5] ලෙස කටයුතු කළෝය.

**2** ඊශ්‍රායෙල්ගේ පුත්‍රයන්[6] නම්
රූබෙන්,[7] සිමියොන්,[8] ලෙවී,[9]
යූදා,[10] ඉසකාර්,[11] සෙබ්‍යුලන්,[12]
2 දාන්,[13] යෝසෙප්,[14] බෙන්ජමින්,[15]
නප්තලී,[16] ගාද්[17] සහ ආෂේර්[18] යන
අයයි.
3 යූදාගේ පුත්‍රයන් නම් ඒර්,[19]
ඕනාන්[20] සහ ෂේලාය.[21] මේ තිදෙ-
නාගේ මව ෂූවාගේ දියණියයි. ඇය
කානාන් ජාතික ස්ත්‍රියකි. යූදාගේ
කුලුඳුල් පුත්‍ර වූ ඒර් යෙහෝවා දෙවිට
විරුද්ධව ක්‍රියා කළ නිසා දෙවි ඔහුව
මරණයට පත් කළේය.[22] 4 යූදාට
දාව ඔහුගේ ලේලි වූ තාමර්[23] පුතුන්
දෙදෙනෙකු බිහි කළාය. ඔවුන් පේ-
රෙස්[24] සහ සේරාය. යූදාට දාව පුත්‍ර-
යෝ පස්දෙනෙක් උපන්නෝය.
5 පේරෙස්ගේ පුත්‍රයන් නම් හෙ-
ස්‍රොන් සහ හාමුල්ය.[25]
6 සේරාට[26] සිම්රී, ඒතන්, හේ-
මාන්, කල්කොල් සහ දාරා[27] යන
නමින් පුත්‍රයෝ පස්දෙනෙක් සිටි-
යෝය.
7 ඊශ්‍රායෙල් ජාතිය මතට මහා
විපතක් ගෙනා[28] ආකාර්,* කාමී-
ගේ[29] පුත්‍රයාය. විනාශ කිරීමට
නියම කර තිබූ දේ ඔහු ළඟ
තබාගත් නිසා ඔහු දෙවිට ද්‍රෝහි
වූයේය.[30]
8 ඒතන්ගේ[31] පුත්‍රයා අෂරියාය.
9 හෙස්‍රොන්ට[32] දාව උපන්
පුත්‍රයන් නම් යෙරාමෙයෙල්,[33]
රාම්[34] සහ කෙලුබයිය.*

**26** යොෂු 7:1; **27** 1රාජා 4:31; **28** යොෂු 7:25; **29** 1ලේක 4:1; **30** ද්වි 7:26; යොෂු 6:18; යොෂු 7:11; යොෂු 22:20; **31** 1රාජා 4:31; **32** උත් 46:12; **33** 1සාමු 27:10; **34** රූත් 4:19; මතෙ 1:3.

**1ලේක 2:7*** එනම්, ආකාන්. යොෂු 7:1හි පාදසටහන බලන්න. **9*** 18, 19 සහ 42 යන පදවල සඳහන් වන්නේ, "කාලෙබ්" ලෙසයි.

**10** රාම්ගේ පුත්‍රයා අම්න-
දාබ්ය.[1] අම්නදාබ්ගේ පුත්‍රයා
යුදා ගෝත්‍රයේ අධිපති වූ
නාෂොන්ය.[2] **11** නාෂොන්ගේ
පුත්‍රයා සල්මාය.[3] සල්මාගේ
පුත්‍රයා බෝවස්ය.[4] **12** බෝවස්-
ගේ පුත්‍රයා ඕබෙද්ය.[5] ඕබෙද්ගේ
පුත්‍රයා යෙස්සේය.[6] **13** යෙස්-
සේගේ කුලුඳුල් පුත්‍රයා එලි-
යාබ්ය.[7] දෙවෙනියා අබිනා-
දාබ්ය.[8] තුන්වෙනියා ෂිමෙයාය.[9]
**14** හතරවෙනියා නෙතනෙල්ය.
පස්වෙනියා රද්දයිය. **15** සය-
වෙනියා ඔෂෙම්ය. දාවිත්[10] සත්-
වෙනියාය. **16** ෂෙරුයියා සහ
අබිගායිල්[11] ඔවුන්ගේ සහෝද-
රියන්ය. ෂෙරුයියාට අබිෂයි,[12]
යෝවාබ්[13] සහ අසහෙල්[14] යන
නම්වලින් පුත්‍රයෝ තිදෙනෙක්
සිටියෝය. **17** අබිගායිල්ට
අමාසා[15] යන නමින් පුත්‍රයෙක්
සිටියේය. ඔහුගේ පියා ඉෂ්මා-
යෙල්වරයෙකු වූ යෙතෙර්ය.[16]
**18** හෙස්‍රොන්ගේ[17] පුත් කා-
ලෙබ්ට අෂූබා හා යෙරියොත්
යන නම්වලින් භාර්යාවෝ දෙ-
දෙනෙක් සිටියෝය. ඔවුහු ඔහුට
දාව පුත්‍රයෝ බිහි කළෝය. අෂූ-
බාගේ පුත්‍රයන් නම් යේෂෙර්,
ෂෝබාබ් සහ අර්දොන් යන
අයයි. **19** කල් යත්ම අෂූබා
මිය ගියාය. ඉන්පසුව කාලෙබ්
තම බිරිඳ ලෙස එප්‍රාත්ව[18]
විවාහ කරගත්තේය. ඇයට
හූර්[19] නම් පුත්‍රයෙක් උපන්නේය.
**20** හූර්ගේ පුත්‍රයා උරීය.[20] උරී-
ගේ පුත්‍රයා බෙසලෙල්ය.[21]
**21** හෙස්‍රොන් මාකීර්ගේ දුව
සමඟ විවාහ විය. මාකීර්[22] ගිලියද්-
ගේ[23] පියාය. ඒ වන විට හෙ-
ස්‍රොන්ගේ වයස අවුරුදු හැටකි.
ඔහුට දාව ඇයට සේගුබ් උපන්-
නේය. **22** සේගුබ්ගේ පුත්‍රයා
යායීර්ය. යායීර්[24] ගිලියද් දේශ-
යේ නුවරවල් විසිතුනක් පාල-
නය කළේය.[25] **23** (කලකට පසු

2 පරි.
1 රූත් 4:20
මතෙ 1:4
2 ගණන් 2:3
ලූක් 3:32
3 රූත් 4:21
ලූක් 3:32
4 රූත් 2:1
මතෙ 1:5
5 රූත් 4:17
6 රූත් 4:22
1සාමු 16:1
යෙසා 11:1
7 1සාමු 16:6
1සාමු 17:13
1ලේක 27:18
8 1සාමු 16:8
1සාමු 17:13
9 1සාමු 16:9
1ලේක 20:7
10 1සාමු 16:13
1සාමු 17:12
මතෙ 1:6
රෝම 1:3
11 2සාමු 17:25
12 2සාමු 16:9
2සාමු 20:6
2සාමු 21:17
2සාමු 23:18
1ලේක 18:12
13 2සාමු 3:39
2සාමු 8:16
2සාමු 20:10
1ලේක 11:6
14 2සාමු 2:18
2සාමු 3:30
2සාමු 23:24
15 2සාමු 19:13
2සාමු 20:4
1රාජා 2:5
16 1රාජා 2:32
17 1ලේක 2:5
18 1ලේක 2:50
1ලේක 4:4
19 නික් 17:12
නික් 24:14
20 නික් 31:2
21 නික් 35:30
නික් 36:1
නික් 37:1
2ලේක 1:5
22 උත් 50:23
ද්වි 3:15
1ලේක 7:14
23 ගණන් 26:29
යොෂු 17:1
24 ද්වි 3:14
යොෂු 13:30
25 ගණන් 32:41

2 තීරුව
1 1රාජා 4:13
2 ගණන් 32:42
3 2සාමු 3:3
2සාමු 13:38
4 2සාමු 8:6
5 උත් 46:12
ගණන් 26:21
රූත් 4:18
මතෙ 1:3

හව්වෝත්-යායීර්[1] සහ කේනත්[2]
මෙන්ම ඒ අවට තිබෙන කුඩා නුව-
රවල් හැටක් ගෙෂූර්වරුන්[3] හා
සිරියානුවන්[4] අතට පත් විය.)
මේවා ගිලියද්ගේ පියා වූ මාකීර්-
ගෙන් පැවතෙන්නන් පිළිබඳ තො-
රතුරුය.
**24** කාලෙබ්-එප්‍රාතා නම් ස්ථා-
නයේ හෙස්‍රොන්[5] මිය ගියේය. ඔහු
මිය යන විට ඔහුගේ බිරිඳ වූ
අබියා ගැබ්ගෙන සිටියාය. ඔහුට
දාව ඇයට අෂ්හූර් නම් පුත්‍රයෙක්
උපන්නේය. අෂ්හූර්, තෙකෝවා-
ගේ[6] පියාය.*
**25** හෙස්‍රොන්ගේ කුලුඳුල්
පුත්‍රයාගේ නම යෙරාමෙ-
යෙල්ය.[7] යෙරාමෙයෙල්ගේ
කුලුඳුලා රාම්ය.[8] බූනා, ඔරෙන්,
ඔෂෙම් සහ අහියා යන නම්ව-
ලින්ද ඔහුට පුත්‍රයෝ සිටියෝය.
**26** යෙරාමෙයෙල්, අටාරා
නමැති තවත් බිරිඳක විවාහ
කරගත්තේය. ඇයට ඕනාම්
නම් පුත්‍රයෙක් උපන්නේය.
**27** යෙරාමෙයෙල්ගේ කුලුඳුලා
රාම්ය.[9] රාම්ගේ පුත්‍රයන් නම්
මයජ්, යාමින් සහ ඒකෙර්ය.
**28** ඕනාම්ගේ පුත්‍රයන්[10] නම්
ෂම්මයි සහ යාදාය. ෂම්මයි-
ගේ පුත්‍රයන් නම් නාදාබ් සහ
අබිෂූර්ය. **29** අබිෂූර්ගේ බිරිඳ-
ගේ නම අබිහයිල්ය. කල්
යත්ම ඇයට ආබාන් සහ මෝ-
ලිද් උපන්නෝය. **30** නාදාබ්-
ගේ පුත්‍රයන්[11] සෙලෙද් සහ
අප්පයිම්ය. සෙලෙද්ට දරුවෝ
සිටියේ නැත. **31** අප්පයිම්ගේ
පුත්‍රයා ඉෂීය. ඉෂීගේ පුත්‍රයා
ෂේෂාන්ය. ෂේෂාන්ගේ[12] දිය-
ණිය* ආලයිය. **32** ෂම්මයිගේ

**6** 1ලේක 4:5; නෙහෙ 3:5; ආමො 1:1; **7** 1ලේක 2:9; **8** 1ලේක 2:27; **9** 1ලේක 2:25; **10** 1ලේක 2:26; **11** 1ලේක 2:28; **12** 1ලේක 2:34.

**1ලේක 2:24*** හෝ, "තෙකෝවාහි ප්‍රධානියාය."
**31*** මූ.අ., "පුත්‍රයා."

සහෝදරයා වූ යාදාගේ පුත්‍ර-
යන් නම් යෙතෙර් සහ යො-
නාතාන්ය. යෙතෙර්ට දරුවෝ
සිටියේ නැත. **33** යොනා-
තාන්ගේ පුත්‍රයන් නම් පෙලෙත්
සහ සාසාය. මේවා යෙරාමෙ-
යෙල්ගෙන් පැවතෙන්නන් පිළි-
බඳ තොරතුරුය.

**34** ෂේෂාන්ට[1] සිටියේ පුත්‍ර-
යන් නොව දූවරුන්ය. ෂේෂාන්ට
යර්හා නමින් ඊජිප්තු සේව-
කයෙක්[2] සිටියේය. **35** ෂේ-
ෂාන් තම දියණියව යර්-
හාට විවාහ කර දුන්නේය. කල්
යත්ම ඔහුට ආව ඇය අත්-
තයි බිහි කළාය. **36** අත්තයි-
ගේ පුත්‍රයා නාතන්ය. නාතන්ගේ
පුත්‍රයා සාබාද්ය.[3] **37** සාබාද්-
ගේ පුත්‍රයා එප්ලාල්ය. එප්-
ලාල්ගේ පුත්‍රයා ඕබෙද්ය.
**38** ඕබෙද්ගේ පුත්‍රයා යේ-
හුය. යේහුගේ පුත්‍රයා අෂරි-
යාය. **39** අෂරියාගේ පුත්‍රයා
හෙලෙෂ්ය. හෙලෙෂ්ගේ පුත්‍රයා
එලෙයාසාය. **40** එලෙයාසාගේ
පුත්‍රයා සිස්මයිය. සිස්මයිගේ
පුත්‍රයා ෂල්ලුම්ය. **41** ෂල්ලුම්-
ගේ පුත්‍රයා යෙකමියාය. යෙකමි-
යාගේ පුත්‍රයා එලිෂාමාය.

**42** යෙරාමෙයෙල්ගේ සහෝ-
දර වූ කාලෙබ්ගේ[4] කුලුඳුල්
පුත්‍රයා වූයේ මේෂාය. මේෂා-
ගේ පුත්‍රයා ෂීප්ය. මරේෂාහ්ටද
පුත්‍රයෝ සිටියෝය. හෙබ්‍රොන්
ඔහුගේ පුත්‍රයෙකි. **43** හෙ-
බ්‍රොන්ගේ පුත්‍රයන් නම් කෝරා,
තප්පුවා, රෙකෙම් සහ ෂෙමාය.
**44** ෂෙමාගේ පුත්‍රයා රාහම්ය.
රාහම්, යොර්කෙයාම්ගේ
පියාය.* රෙකෙම්ගේ පුත්‍රයා ෂම්-
මයිය. **45** ෂම්මයිගේ පුත්‍රයා
මායොන්ය. මායොන්, බෙත්-
ෂූර්ගේ[5] පියාය.* **46** කාලෙබ්-
ගේ උපභාර්යාව වූ ඒෆා හාරාන්,
මෝෂා හා ගාෂෙෂ් බිහි කළාය.
හාරාන්ගේ පුත්‍රයා ගාෂෙෂ්ය.
**47** යාදයිගේ පුත්‍රයන් නම් රෙ-
ගෙම්, යෝතම්, ගේෂාන්, පෙ-
ලෙට්, ඒෆා හා ෂයප්ය.
**48** කාලෙබ්ගේ උපභාර්යාව වූ
මයකා ෂෙබෙර් හා තිර්හනා බිහි
කළාය. **49** කල් යත්ම ඇය
මද්මන්නාගේ[1] පියා* වූ ෂයප්ද,
මක්බේනාගේ හා ගිබෙයාගේ[2]
පියා# වූ ෂෙවාද බිහි කළාය.
කාලෙබ්ට[3] දියණියක්ද සිටියාය.
ඇගේ නම අක්සාය.[4] **50** මො-
වුහු කාලෙබ්ගෙන් පැවතෙන
අයයි.

එෆ්‍රාතාගේ[5] කුලුඳුලා වූ හූර්-
ගේ[6] පුත්‍රයන් නම්, කිර්යත්-
යෙයාරීම්ගේ[7] පියා වූ ෂෝ-
බාල්,[8] **51** බෙත්ලෙහෙම්ගේ[9]
පියා* වූ සල්මා හා බෙත්-
ගාදෙර්ගේ පියා# වූ හාරෙෆ්ය.
**52** හාරොවේ සහ මෙනුහොත්-
වරුන්ගෙන් දෙකෙන් කොට-
සක් කිර්යත්-යෙයාරීම්ගේ පියා
වූ ෂෝබාල්ගේ[10] පුත්‍රයෝය.
**53** කිර්යත්-යෙයාරීම්ගෙන් බිහි
වූ පවුල් නම් ඉත්රියව-
රුන්,[11] පූතිවරුන්, ෂූමත්ව-
රුන් සහ මිෂ්රාවරුන්ය.
ෂොරත්වරු[12] හා එෂ්තායොල්-
වරු[13] බිහි වූයේ මොවුන්ගෙන්ය.
**54** සල්මාගෙන් පැවත ආ අය
බෙත්ලෙහෙම්,[14] නෙටොෆා[15] හා
අට්රොත්-බෙත්-යෝවාබ් යන
ස්ථානවල ජීවත් වෙති. ෂොරාහි
වැසියන් පැවතෙන්නේද සල්-
මාගෙන්ය. එමෙන්ම මනහාත්හි
ජීවත් වන වැසියන්ගෙන් දෙ-
කෙන් කොටසක් පැවතෙන්නේද
ඔහුගෙන්ය. **55** තිරාත්වරුන්,

**2 පරි.**
1 1ලේක 2:31
2 උත් 16:1; 1සාමු 30:13
3 1ලේක 11:41
4 1ලේක 2:9
5 යොෂු 15:58; 2ලේක 11:7; නෙහෙ 3:16

**2 තීරුව**
1 යොෂු 15:31
2 යොෂු 15:57
3 1ලේක 2:18
4 යොෂු 15:17; විනි 1:13
5 1ලේක 2:19
6 නික් 17:12; නික් 24:14
7 යොෂු 15:9; යොෂු 15:60; 1ලේක 13:5
8 1ලේක 4:1
9 උත් 35:19; රූත් 1:19; රූත් 2:4; මතෙ 2:1; යොහ 7:42
10 1ලේක 4:1
11 2සාමු 23:38; 1ලේක 11:40
12 විනි 13:2; 1ලේක 4:2
13 යොෂු 15:33; යොෂු 19:41; විනි 13:25; විනි 16:31
14 උත් 35:19; රූත් 1:19; රූත් 2:4; මතෙ 2:1; යොහ 7:42
15 2සාමු 23:29

**1ලේක 2:44*** හෝ, "යොර්කෙයාම්හි ප්‍රධානියාය." **45*** හෝ, "බෙත්-ෂූර්හි ප්‍රධානියාය."

**1ලේක 2:49*** හෝ, "මද්මන්නාහි ප්‍රධානියා." **49#** හෝ, "මක්බේනාහි හා ගිබෙයාහි ප්‍රධානියා." **51*** හෝ, "බෙත්ලෙහෙම්හි ප්‍රධානියා." **51#** හෝ, "බෙත්-ගාදෙර්හි ප්‍රධානියා."

ෂිමියත්වරුන් සහ සූකත්වරුන්
යාබෙෂ්හි[1] වාසය කරන පිටපත්-
කරුවන්ය. ඔවුන් රේකාබ්[2] පෙ-
ළපතේ පියා වූ හම්මත්ගෙන් බිහි
වූ කේනිවරුන්ය.[3]

**3** හෙබ්‍රෝන් නුවරෙහි[4] ජීවත් වූ
කාලයේදී දාවිත්ට දාව උපන්[5]
පුත්‍රයන්ගේ නම් මෙසේය. කුලුඳුල්
පුත්‍රයා අම්නොන්ය.[6] ඔහුගේ මව
යෙෂ්‍රෙයෙල්[7] කාන්තාවක වූ අහි-
නොවම්ය.[8] දෙවෙනියා දානියෙල්ය.
ඔහුගේ මව කර්මෙල්[9] කාන්තා-
වක වූ අබිගායිල්ය.[10] **2** තුන්වෙ-
නියා අබ්සලොම්ය.[11] ඔහුගේ මව
ගෙෂූර්හි[12] රජු වූ තල්මයිගේ[13] දියණිය
වූ මයකාය.[14] හතරවෙනියා අදො-
නියාය.[15] ඔහුගේ මව හග්ගිත්ය.[16]
**3** පස්වෙනියා ෂෙපටියාය. ඔහුගේ
මව අබිටල්ය.[17] හයවෙනියා ඉත්-
රෙයාම්ය. ඔහුගේ මව එග්ලාය.[18]
**4** හෙබ්‍රෝන්හි දාවිත්ට දාව උපන්
හයදෙනා මොවුන්ය. ඔහු එහි රජකම්
කළ කාලය අවුරුදු හතක් හා මාස
හයකි. ඔහු යෙරුසලමෙහි අවුරුදු
තිස්තුනක් රජකම් කළේය.[19]

**5** යෙරුසලමෙහි ඔහුට දාව උපන්
දරුවන්[20] නම් ෂිමෙයා,[21] ෂෝබාබ්,[22]
නාතන්[23] සහ සලමොන්ය.[24] මොවුන්
සතරදෙනා අම්යෙල්ගේ[25] දියණිය වූ
බැත්-ෂෙබාගේ[26] පුත්‍රයන්ය. **6** මීට
අමතරව ඉබ්හාර්,[27] එලිෂාමා,*[28]
එලිෆෙලෙත්,[29] **7** නෝගා, නෙ-
ෆෙග්, යාෆියා,[30] **8** එලිෂාමා,[31] එලි-
යාදා සහ එලිෆෙලෙත්[32] යන
නම්වලින් තවත් පුත්‍රයෝ නවදෙ-
නෙක්ද දාවිත්ට සිටියෝය. **9** මීට
අමතරව දාවිත්ට දාව ඔහුගේ උප-
භාර්යාවන්ටද පුත්‍රයෝ සිටියෝය.
තාමර්[33] ඔවුන් සියල්ලන්ගේ සහෝද-
රියකි.

**10** සලමොන්ගේ පුත්‍රයා රෙහබෝ-
වම්ය.[34] ඔහුගේ පුත්‍රයා අබියාය.[35] ඔහු-
ගේ පුත්‍රයා ආසාය.[36] ඔහුගේ පුත්‍රයා
යෙහෝෂාපාට්ය.[1] **11** ඔහුගේ පුත්‍රයා
යෙහෝරම්ය.[2] ඔහුගේ පුත්‍රයා අහසි-
යාය.[3] ඔහුගේ පුත්‍රයා යෙහෝයාෂ්ය.[4]
**12** ඔහුගේ පුත්‍රයා අමෂියාය.[5] ඔහුගේ
පුත්‍රයා අෂරියාය.[6] ඔහුගේ පුත්‍රයා යෝ-
තම්ය.[7] **13** ඔහුගේ පුත්‍රයා ආහස්ය.[8]
ඔහුගේ පුත්‍රයා හෙසකියාය.[9] ඔහු-
ගේ පුත්‍රයා මනස්සේය.[10] **14** ඔහු-
ගේ පුත්‍රයා ආමොන්ය.[11] ඔහුගේ
පුත්‍රයා යොෂියාය.[12] **15** යොෂියාගේ
කුලුඳුල් පුත්‍රයා යෝහානාන්ය. දෙවෙ-
නියා යෙහෝයාකිම්ය.[13] තුන්වෙනියා
ශෙදකියාය.[14] සතරවෙනියා ෂල්-
ලුම්ය. **16** යෙහෝයාකිම්ගේ පුත්‍රයා
යෙකොනියාය.[15] ඔහුගේ පුත්‍රයා ශෙද-
කියාය. **17** සිරභාරයේ සිටි යෙකො-
නියාගේ පුත්‍රයන් නම් ෂෙයල්ටියල්,[16]
**18** මල්කිරාම්, පෙදායා, ෂෙනෂ්ෂර්,
යෙකමියා, හෝෂාමා සහ නෙදබියා
යන අයයි. **19** පෙදායාගේ පුත්‍ර-
යන් නම් සෙරුබාබෙල්[17] සහ ෂිමෙ-
යිය. සෙරුබාබෙල්ගේ පුත්‍රයන් නම්
මෙෂල්ලම් සහ හනනියාය. (ඔවුන්-
ගේ සොහොයුරිය ෂෙලොමිත්ය.)
**20** මීට අමතරව හෂුබා, ඕහෙල්, බෙ-
රෙකියා, හසදියා සහ යූෂබ්-හෙසෙද්
යන නම්වලින් තවත් දරුවෝ පස්දෙ-
නෙක්ද ඔහුට සිටියෝය. **21** හන-
නියාගේ පුත්‍රයන් නම් පෙලතියා[18]
සහ යෙෂායාය. යෙෂායාගේ පුත්‍රයා
රෙෆායාය. රෙෆායාගේ පුත්‍රයා ආර්-
ණන්ය. ආර්ණන්ගේ පුත්‍රයා ඔබදි-
යාය. ඔබදියාගේ පුත්‍රයා ෂෙකනියාය.
**22** ෂෙකනියාගේ පුත්‍රයා ෂෙමායාය.
ෂෙමායාගේ පුත්‍රයන් හයදෙනා නම්
හට්ටුෂ්, ඉගාල්, බාරියා, නෙයරියා සහ
ෂාපාත්ය. **23** නෙයරියාගේ පුත්‍රයන්
තිදෙනා නම් එලියෝනේයයි, හිෂ්කියා
සහ අෂ්‍රිකාම්ය. **24** එලියෝනේයයි-
ගේ පුත්‍රයන් සත්දෙනා නම් හෝදවියා,
එලියාෂිබ්, පෙලායා, අක්කුබ්, යෝහා-
නාන්, දෙලායා සහ අනානීය.

**2 පරි.**
**1** 1ලේක 4:9
**2** 2රාජා 10:15 යෙරෙ 35:6 යෙරෙ 35:19
**3** විනි 1:16 විනි 4:11 1සාමු 15:6

**3 පරි.**
**4** 2සාමු 3:2
**5** ගීතා 127:5
**6** 2සාමු 13:32
**7** යොෂු 15:56
**8** 1සාමු 25:43
**9** 1සාමු 25:2
**10** 1සාමු 25:39
**11** 2සාමු 13:28 2සාමු 14:1 2සාමු 15:10 2සාමු 18:14
**12** යොෂු 12:5
**13** 2සාමු 13:37
**14** 2සාමු 3:3
**15** 1රාජා 1:11 1රාජා 2:24
**16** 1රාජා 1:5
**17** 2සාමු 3:4
**18** 2සාමු 3:5
**19** 2සාමු 5:5
**20** 2සාමු 5:13
**21** 1ලේක 14:4
**22** 2සාමු 5:14
**23** ලූක් 3:31
**24** මතෙ 1:7
**25** 2සාමු 11:3
**26** 2සාමු 11:27 1රාජා 1:11
**27** 1ලේක 14:5
**28** 2සාමු 5:15
**29** 1ලේක 14:5
**30** 1ලේක 14:6
**31** 1ලේක 14:7
**32** 2සාමු 5:16
**33** 2සාමු 13:1
**34** 1රාජා 11:43
**35** 2ලේක 13:1
**36** 2ලේක 14:1

**2 තීරුව**
**1** 2ලේක 20:31
**2** 2ලේක 21:5
**3** 2ලේක 22:2
**4** 2ලේක 24:1
**5** 2ලේක 25:1
**6** 2රාජා 14:21 2ලේක 26:3 මතෙ 1:8
**7** 2ලේක 27:1
**8** 2ලේක 28:1 මතෙ 1:9
**9** 2ලේක 29:1 මතෙ 1:9
**10** 2රාජා 21:1 මතෙ 1:10
**11** 2රාජා 21:19
**12** 2රාජා 22:1 මතෙ 1:10
**13** 2රාජා 23:34; 2ලේක 36:5; **14** 2රාජා 24:17; 2ලේක 36:11; **15** 2රාජා 24:6; 2රාජා 25:27; මතෙ 1:11; **16** මතෙ 1:12; **17** එස්රා 1:8; එස්රා 5:2; හග් 2:2; හග් 2:4; සෙක 4:6; මතෙ 1:12; ලූක් 3:27; **18** නෙහෙ 10:22.

**1ලේක 3:6*** 1ලේක 14:5හි සහ 2සාමු 5:15හි සඳහන් වන්නේ, “එලිෂූවා” ලෙසයි.

4 යූදාගේ පුත්‍රයන් නම් පේරෙස්,[1]
හෙස්‍රොන්,[2] කාමී,[3] හූර්[4] සහ ෂෝ-
බාල්[5] යන අයයි. 2 ෂෝබාල්ගේ
පුත්‍රයා රෙයායාය.[6] ඔහුගේ පුත්‍රයා
යාහත්ය. යාහත්ගේ පුත්‍රයන් නම් අහු-
මයි හා ලාහද්ය. ෂොරත්වරුන්ගේ[7]
පෙළපත සෑදෙන්නේ මොවුන්ගෙනි.
3 ඒටාම් නමැති නුවරේ[8] ප්‍රධානියා-
ගේ* පුත්‍රයන් නම් යෙෂ්‍රෙයෙල්,[9] ඉෂ්මා
සහ ඉඩ්බාෂ්ය. (ඔවුන්ගේ සොහො-
යුරියගේ නම හෂ්ෂෙලෙල්පෝනීය.)
4 මීට අමතරව ඔහුට පෙනුයෙල්
හා එෂෙර් යන නමින් පුත්‍රයෝ දෙ-
දෙනෙක් සිටියෝය. පෙනුයෙල්-
ගේ පුත්‍රයා ගෙදොර්ය.[10] එෂෙර්ගේ
පුත්‍රයා හූෂාය. බෙත්ලෙහෙම්[11] නුවරේ
ප්‍රධානියාද එෆ්‍රාතාගේ කුලුඳුලාද වූ
හූර්ගේ[12] පුත්‍රයෝ මොවුහුය. 5 තෙ-
කෝවා[13] නම් නුවරේ ප්‍රධානියා වූ
අෂ්හූර්ට[14] හේලා සහ නයරා යන නම්-
වලින් භාර්යාවෝ දෙදෙනෙක් සිටි-
යෝය. 6 ඔහුට දාව නයරාට උපන්
පුත්‍රයන් නම් අහුස්සම්, හේෆෙර්, තේ-
මෙනී සහ හයහෂ්තාරිය. 7 හේලා-
ගේ පුත්‍රයන් නම් ෂෙරෙත්, ඉෂ්හාර් සහ
ඒතන්ය. 8 කොෂ්ගේ පුත්‍රයන් නම්
අනුබ් හා ෂොබේබාය. මීට අමතරව
හාරුම්ගේ පුත් අහර්හෙල්ගෙන් පැව-
තෙන අය පැමිණියේද කොෂ්ගෙන්ය.
9 යාබෙෂ්ට[15] ඔහුගේ සහෝදර-
යන්ට වඩා වැඩි ගෞරවයක් හිමි
විය.[16] ඔහුට එම නම තබන ලද්-
දේ ඔහුගේ මව විසිනි. ඇයද, “මා
ඔහුව බිහි කළේ මහත් වේදනාවක්
විඳිමිනුයි”[17] කියා පවසමින් ඔහුට
ඒ නම තැබුවාය. 10 යාබෙෂ් ඊශ්‍රා-
යෙල්හි දෙවිට කන්නලව් කරමින්[18]
මෙසේ පැවසීය. “අනේ දෙවියනි,
මට ආශීර්වාද කරන්න.[19] මට තවත්
ප්‍රදේශ[20] ලබාගන්න උපකාර කරන්න.
ඔබේ රැකවරණය මට ලබා දෙන්න.[21]
මට හිංසාවක් නොවන පිණිස[22] මාව
විපත්වලින් ආරක්ෂා කරන්න.”[23] ඔහු
ඉල්ලූ දේ දෙවි ඉටු කළේය.[24]

11 ෂූහාගේ සහෝදරයා වූ කේ-
ලූබ්ගේ පුත්‍රයා මෙහීර්ය. ඔහුගේ
පුත්‍රයා එෂ්තොන්ය. 12 එෂ්තොන්-
ගේ පුත්‍රයන් නම් බෙත්-රාෆා,
පාසේයා සහ තෙහින්නාය. තෙ-
හින්නා ඉර්-නාහාෂ්ගේ පියාය.* මො-
වුන් සියල්ලෝම රේකා නම්
ප්‍රදේශයෙහි පුරුෂයෝය. 13 කෙ-
නෂ්ගේ පුත්‍රයන්[1] නම් ඔත්නියෙල්[2]
සහ සෙරායාය. ඔත්නියෙල්ගේ පුත්‍රයා
හාතාත්ය. 14 මෙයෝනොතයිගේ
පුත්‍රයා ඔෆ්රාය. සෙරායාට යෝවාබ්
නමින් පුත්‍රයෙක් සිටියේය. ඔහු ගෙ-
හරෂිම් නම් තැනිතලාවේ පදිංචි වී
සිටි අයගේ ප්‍රධානියා විය. ඔවුහු විවිධ
ක්ෂේත්‍රවල නියැලුණු ශිල්පීහු වූහ.[3]
15 යෙෆුන්නෙගේ[4] පුත්‍රයා වූ
කාලෙබ්ගේ[5] පුත්‍රයන් නම් ඊරු,
ඒලාහ් සහ නයම්ය. ඒලාහ්ගේ
පුත්‍රයා කෙනෂ්ය. 16 යෙහල්ලෙ-
ලෙල්ගේ පුත්‍රයන් නම් සිප්, සීපා,
තිරියා සහ අසරෙල්ය. 17 එස්රාහ්-
ගේ පුත්‍රයන් නම් යෙතෙර්, මෙ-
රෙද්, ඒෆෙර් සහ යාලොන්ය. ඔහුගේ
තවත් භාර්යාවකට මිරියම්, ෂම්-
මයි සහ ඉෂ්බා උපන්නෝය.
ඉෂ්බාගේ පුත්‍රයා එෂ්තෙමෝවාය.[6]
18 මෙරෙද්ගේ යුදෙව් ජාතික බිරිඳට
උපන් පුත්‍රයෝ නම් යෙරෙද්, හෙ-
බෙර් සහ යෙකූතියෙල්ය. යෙරෙද්ගේ
පුත්‍රයා ගෙදොර්ය. හෙබෙර්ගේ පුත්‍රයා
සෝකෝය. යෙකූතියෙල්ගේ පුත්‍රයා
ෂානොවාය. මෙරෙද් විවාහ කරගත්
පාරාවෝගේ දුව වූ බිතියාටද පුත්‍රයෝ
සිටියෝය.
19 හෝදියාගේ බිරිඳ නහම්ගේ
සහෝදරියය. හෝදියාට දාව ඇයට
උපන් පුත්‍රයන් නම් ගාමීවරයෙකු
වූ කෙයිලාහි[7] ප්‍රධානියා සහ මය-
කාත්වරයෙකු වූ එෂ්තෙමෝවාය.
20 ෂිමොන්ගේ පුත්‍රයන් නම් අම්-
නොන්, රින්නා, බෙන්-හානාන් සහ
තීලොන්ය. ඉෂීගේ පුත්‍රයන් නම් සෝ-
හෙත් සහ බෙන්-සෝහෙත්ය.

1ලේක 4:3* මූ.අ., “ඒටාම්ගේ පියාගේ පුත්‍රයන්.”

1ලේක 4:12* හෝ, “ඉර්-නාහාෂ්හි ප්‍රධානියාය.”

4 පරි.
1 උත් 38:29
ගණන් 26:20
රූත් 4:18
මතෙ 1:3
2 උත් 46:12
1ලේක 2:5
3 යොෂු 7:1
1ලේක 2:7
4 නික් 17:12
නික් 24:14
1ලේක 2:19
5 1ලේක 2:50
6 1ලේක 2:52
7 යොෂු 15:33
විනි 13:25
1ලේක 2:53
8 2ලේක 11:6
9 යොෂු 15:56
10 යොෂු 15:58
1ලේක 4:18
11 1සාමු 16:1
මීකා 5:2
යොහ 7:42
12 1ලේක 2:19
13 2ලේක 11:6
නෙහෙ 3:5
ආමො 1:1
14 1ලේක 2:24
15 1ලේක 2:55
16 හිතෝ 15:20
17 උත් 3:16
18 උත් 12:8
ගීතා 55:16
ගීතා 99:6
යෙරෙ 33:3
19 උත් 32:26
ගණන් 22:6
හිතෝ 10:22
20 ද්වි 12:20
21 ගීතා 119:173
යෙසා 41:10
22 හිතෝ 12:21
23 උත් 48:16
ගීතා 50:15
24 ගීතා 21:2
ගීතා 66:19
මතෙ 7:7
මතෙ 21:22
1පේතෘ 3:12
1යොහ 5:14

2 නිරුව
1 යොෂු 15:17
2 විනි 1:13
විනි 3:9
විනි 3:11
3 2රාජා 24:14
නෙහෙ 11:35
4 ගණන් 13:6
ගණන් 14:6
යොෂු 14:6
5 ගණන් 32:12
යොෂු 15:13
6 යොෂු 21:14
1සාමු 30:28
1ලේක 6:57
7 යොෂු 15:44
1සාමු 23:1

**21** යුදාගේ පුත් ෂේලාට[1] ඒර් සහ
ලයෙදා යන නම්වලින් පුත්‍රයෝ සිටි-
යෝය. ඒර්ට ලේකා යන නමින් පුත්‍ර-
යෙක් සිටියේය. ලයෙදාට මරේෂාහ්
යන නමින් පුත්‍රයෙක් සිටියේය. අෂ්-
බෙයා නම් පෙළපත පැවතෙන්නේ
ෂේලාගෙන්ය. එම පෙළපත ප්‍රසිද්ධව
සිටියේ සිහින් රෙදි වියන්නන්[2] ලෙසය.
**22** ඔහුගේ පුත්‍රයන් අතර යෝකීම්ද,
මෝවබ් ජාතික ස්ත්‍රීන් විවාහ කරගත්[3]
යෝවාෂ්, සාරාෆ් හා යාෂුබී-ලෙහෙම්ද
සිටියෝය. මීට අමතරව ඔහුගේ පැව-
තෙන්නන් අතර කොෂේබාහි විසූ
පුරුෂයෝද සිටියෝය. මෙම තොර-
තුරු ලැබී ඇත්තේ ඉපැරණි වාර්තාව-
ලිනි.[4] **23** නෙතායිම් සහ ගෙදේරා
යන ප්‍රදේශවල වාසය කරමින් රජුට
සේවය කළ ඔවුහු[5] සියලුදෙනා කුඹල්-
කරුවෝය.[6]

**24** සිමියොන්ගේ පුත්‍රයන් නම් නෙ-
මුවෙල්,[7] යාමින්,[8] යාරිබ්, සේරා සහ
ෂාවුල්ය.[9] **25** ෂාවුල්ගේ පුත්‍රයා ෂල්-
ලුම්ය. ඔහුගේ පුත්‍රයා මිබ්සාම්ය.
මිබ්සාම්ගේ පුත්‍රයා මිෂ්මාය. **26** මිෂ්-
මාගේ පුත්‍රයා හම්මුවෙල්ය. ඔහුගේ
පුත්‍රයා සක්කූර්ය. ඔහුගේ පුත්‍රයා ෂිමෙ-
යිය. **27** ෂිමෙයිට පුත්‍රයෝ දහසය-
දෙනෙක්ද දූවරු හයදෙනෙක්ද
සිටියෝය. එනමුත් ඔහුගේ සහෝදර-
යන්ට බොහෝ පුත්‍රයෝ සිටියේ නැත.
යුදාගේ පුත්‍රයන් තරම් ඔවුන්ගේ කිසි
පවුලකට පුත්‍රයෝ නොසිටියෝය.[10]
**28** ඔවුහු දිගටම බෙයර්-ෂෙබා,[11] මො-
ලාදා[12] සහ හෂර්-ෂුවාල්[13] යන නුව-
රවලද **29** බිල්හා,[14] ඒෂෙම්[15] සහ
තෝලද්[16] යන නුවරවලද **30** බෙතු-
යෙල්,[17] හෝර්මා[18] සහ ෂික්ලග්[19] යන
නුවරවලද **31** බෙත්-මර්කාබොත්,
හෂර්-සූසිම්,[20] බෙත්-බිරි සහ ෂායර-
යිම්[21] යන නුවරවලද වාසය කළෝය.
දාවිත් රජකම් කළ කාලය දක්වා මේ
නුවරවල් ඔවුන් සතු විය.

**32** ඔවුන් පදිංචිව සිටියේ ඒටාම්,
ආයින්, රිම්මොන්, තෝකන් සහ
ආෂාන්[22] යන නුවරවල් පහ අව-
ටය. **33** ඔවුන් පදිංචි වූ එම ස්ථාන

**4 පරි.**
1 උත් 38:5 ගණන් 26:20
2 1ලේක 15:27 2ලේක 3:14
3 රූත් 4:10
4 2තෙස 2:15
5 හිතෝ 22:29
6 හිතෝ 26:23 යෙසා 41:25 විලා 4:2
7 උත් 46:10 නික් 6:15
8 ගණන් 26:12
9 ගණන් 26:13
10 උත් 49:8 ගණන් 26:22
11 උත් 21:14 යොෂු 19:2
12 යොෂු 15:26 නෙහෙ 11:26
13 යොෂු 15:28 යොෂු 19:3 නෙහෙ 11:27
14 යොෂු 19:3
15 යොෂු 15:29
16 යොෂු 15:30
17 යොෂු 19:4
18 විනි 1:17
19 යොෂු 15:31 යොෂු 19:5 1සාමු 27:6 1සාමු 30:1 1ලේක 12:1
20 යොෂු 19:5
21 යොෂු 19:6
22 යොෂු 19:7

**2 තීරුව**
1 යොෂු 19:8
2 1ලේක 5:24
3 ගීතා 65:12
4 යොෂු 11:23 යොෂු 14:15 විනි 18:7
5 උත් 10:6 උත් 10:20
6 2ලේක 29:1
7 2රාජා 18:8
8 2රාජා 19:11 2ලේක 20:23
9 ගණන් 32:1
10 උත් 36:8 ද්වි 1:2
11 නික් 17:14 1සාමු 15:7 2සාමු 8:12

බාල් නුවර[1] දක්වා විහිදී තිබිණ.
ඔවුන් වාසය කළ ස්ථාන හා ඔවුන්-
ගේ පෙළපත් වාර්තා එලෙස දැක්විය
හැක. **34** සිමියොන්ගෙන් පැවත ආ
අය අතර මෙෂෝබාබ්ද යම්ලෙක්ද
අමශියාගේ පුත් යෝෂාද **35** යෝ-
වෙල්ද අසියෙල්ගේ පුත්‍රයා වන සෙරා-
යාගේ පුත් යොෂිබියාගේ පුත්‍රයෙකු
වන යේහුද **36** එලියෝනේයයිද
යයකොබාද යෙෂෝහායාද අසායාද
අදියෙල්ද යෙසිමියෙල්ද බෙනායාද
**37** ෂෙමායාගේ පුත්‍රයා වන ෂිම්රිගේ
පුත් යෙදායාගේ පුත්‍රයෙකු වන අල්-
ලොන්ගේ පුත්‍රයා වන ෂීෆීගේ පුත්
සීසාද සිටියෝය. **38** ඉහත සඳහන්
වූ ඔවුහු ඔවුන්ගේ පවුල්වල ප්‍රධානීන්
ලෙස කටයුතු කළෝය.[2] ඔවුන්ගේ
පෙළපතද බොහෝ සෙයින් වැඩි
විය. **39** ඔවුහු තම සතුන්ට තණබිම්
සොයමින් තැනිතලාවේ නැඟෙනහිර
අන්තයට ගොස් ගෙදොර් නම් නුවරට
ඇතුල් වන ස්ථානය දක්වා පැමිණි-
යෝය. **40** කල් යත්ම ඔවුහු සරු
තණබිම් සොයාගත්තෝය.[3] එය ඉතා
විශාල මෙන්ම නිස්කලංක ප්‍රදේශයක්
විය.[4] අතීතයේ එහි වාසය කළේ හාම්-
ගෙන් පැවතෙන අයයි.[5] **41** ඉහත
සඳහන් වූ අය යුදාහි රජු වූ හෙසකි-
යාගේ[6] සමයේදී පැමිණ හාම්වරුන්-
ගේ කූඩාරම්වලට හා මෙයූනිවරුන්ට
පහර දී[7] ඔවුන්ව සහමුලින්ම විනාශ
කළෝය.[8] අද පවා ඒ පිළිබඳව සාක්ෂි
දැකගත හැකිය. ඉන්පසු ඔවුහු ඒ ප්‍රදේ-
ශයේ වාසය කළෝය. එසේ කළේ
ඔවුන්ගේ සත්ව රැළවලට තණබිම් එම
ප්‍රදේශයේ තිබුණු නිසාය.[9]

**42** ඔවුන් අතරින් සිමියොන්ගේ
පුත්‍රයෝ කිහිපදෙනෙක් එනම්, පුරුෂ-
යෝ පන්සියදෙනෙක් සේයිර් කන්දට[10]
ගියෝය. ඔවුන්ට පෙරටුවෙන් පෙ-
ලතියා, නෙයරියා, රෙෆායා, උස්-
සියෙල් සහ ඉෂීගේ පුත්‍රයෝ
ගියෝය. **43** ඔවුහු අමලෙක්වරුන්-
ගෙන්[11] ඉතුරු වූ අයට පහර දුන්-
නෝය. අද දක්වා ඔවුහු එහි වාසය
කරති.

5 ඊශ්‍රායෙල්ගේ කුලුඳුලා වූ[1]
රූබෙන්ගේ පුත්‍රයන්[2] පිළිබඳ
විස්තර මතු දැක්වේ. ඔහු කුලුඳුලා
වුවත් ඔහු තම පියාගේ විවාහ
යහන කිලිටි කළ බැවින්[3] කුලුඳුලා
ලෙස ඔහු සතු උරුමය ඊශ්‍රායෙල්ගේ
පුත්‍රයා වූ යෝසෙප්ගේ පුත්‍රයන්ට
දෙන ලදි.[4] එහෙයින් කුලුඳුලාට හිමි
උරුමය ලැබෙන්නා ලෙස ඔහුව
ලැයිස්තුගත කළේ නැත. **2** යූදා[5]
තම සහෝදරයන්ට වඩා බලවත්
විය. නායකයා ලෙස පැමිණෙන
තැනැත්තා බිහි වීමට නියමිතව තිබු-
ණේ ඔහුගේ පෙළපතින්ය.[6] එන-
මුත් කුලුඳුලාට හිමි උරුමය
ලැබුණේ යෝසෙප්ටය.[7] **3** ඊශ්‍රා-
යෙල්ගේ කුලුඳුලා වූ රූබෙන්ගේ
පුත්‍රයන් නම් හනොක්,[8] පල්ලූ,[9]
හෙස්‍රොන් සහ කාමී[10] යන අයයි.
**4** යෝවෙල්ගේ පුත්‍රයා ෂෙමායාය.
ෂෙමායාගේ පුත්‍රයා ගොග්ය. ගොග්-
ගේ පුත්‍රයා ෂිමෙයිය. **5** ෂිමෙයිගේ
පුත්‍රයා මීකාය. මීකාගේ පුත්‍රයා රෙයා-
යාය. රෙයායාගේ පුත්‍රයා බාල්ය.
**6** බාල්ගේ පුත්‍රයා බෙයේරාහ්ය.
රූබෙන් ගෝත්‍රයේ අධිපතියෙකු වූ
ඔහුව ඇසිරියාවේ රජු වූ තිල්ගත්-
පිල්නෙසෙර්[11] විසින් වහලෙකු ලෙස
ගෙන යන ලදි. **7** බෙයේරාහ්ගේ
සහෝදරයන්ගේ නම්වලින් පෙළපත්
වාර්තා වී[12] ඇති අතර ඔවුන්ගේ නම්
මෙසේය. මූලිකයා යෙයීයෙල්ය. මීට
අමතරව සෙකරියාද **8** යෝවෙල්-
ගේ පුත්‍රයෙකු වූ[13] ෂෙමාගේ පුත්
ආසාස්ගේ පුත්‍රයා වන බෙලාද ඔවුන්
අතර සිටියෝය. අරෝයේර්හිද[14] නෙ-
බෝ[15] සහ බාල්-මෙයොන්[16] දක්වා
විහිදී යන ප්‍රදේශයෙහිද බෙලා වාසය
කරමින් සිටියේය. **9** ඔහු වාසය
කළ භූමි ප්‍රදේශය නැඟෙනහිර දෙසට
එනම්, යුප්‍රටීස් ගඟ[17] අසල පාළුකර-
යට ඇතුල් වන ස්ථානය දක්වා විහිදී
ගියේය. ඔවුහු එහි වාසය කළේ ඔවුන්
රැකබලා ගත් සතුන් ගිලියද් දේශ-
යේදී[18] බොහෝ සෙයින් වැඩි වූ
නිසාය. **10** සාවුල් රජුගේ කාලයේදී
ඔවුහු හග්රියවරුන්ට විරුද්ධව යුද්ධ
කර ඔවුන්ව පරාජය කළෝය.[1] එහෙ-
යින් ගිලියද් දේශයට නැඟෙනහිරින්
පිහිටි දේශය පුරාම තිබූ ඔවුන්ගේ
කූඩාරම්වල ඔවුහු වාසය කළෝය.
**11** ඔවුන් අසල ජීවත් වූ ගාද්ගෙන්
පැවතෙන්නන්[2] වාසය කළේ බාෂාන්
දේශයේ[3] සලෙකා නම් නුවර[4] දක්වා
ඇති ප්‍රදේශයේය. **12** බාෂාන්හි
වාසය කළ ඔවුන්ගේ ප්‍රධානියා යෝ-
වෙල්ය. දෙවෙනියා ෂාපාම්ය. ඔවුන්
සමඟ යානයි හා ෂාපාත්ද සිටි-
යෝය. **13** ඔවුන්ගේ ඥාති සහෝ-
දරයෝ සත්දෙනෙකි. ඔවුන් නම්
මිකායෙල්, මෙෂල්ලම්, ෂෙබා,
යෝරයි, යාකාන්, ෂීය සහ ඒබර්
යන අයයි. **14** මොවුහු අබිහයිල්ගේ
පුත්‍රයෝය. අබිහයිල් හූරිගේ පුත්‍රයාය.
හූරි යාරොවාගේ පුත්‍රයාය. යාරොවා
ගිලියද්ගේ පුත්‍රයාය. ගිලියද් මිකා-
යෙල්ගේ පුත්‍රයාය. මිකායෙල් යෙෂීෂ-
යිගේ පුත්‍රයාය. යෙෂීෂයි යාඩෝගේ
පුත්‍රයාය. යාඩෝ බූෂ්ගේ පුත්‍රයාය.
**15** ඔවුන්ගේ මුතුන්මිත්තන්ගේ පෙ-
ළපතේ මූලිකයා වූයේ ආහිය. ආහි
අබ්දියෙල්ගේ පුත්‍රයාය. අබ්දියෙල්
ගුනීගේ පුත්‍රයාය. **16** ඔවුහු දිගටම
ගිලියද්[5] හා බාෂාන් දේශවල[6] මෙන්ම
ඒ දේශ අවට තිබූ කුඩා නුවර-
වල[7] හා ෂාරොන්හි තණබිම් පිහිටි
දේශ සීමා තුළ වාසය කළෝය.
**17** ඔවුන් සියලුදෙනාගේ පෙළපත්
ඇතුළත් වාර්තා සකස් කරන ලද්දේ
යූදාහි රජු වූ යෝතම්ගේ[8] කාලයේදී
හා ඊශ්‍රායෙල්හි රජු වූ යෙරොබොවම්-
ගේ*[9] කාලයේදීය.
**18** රූබෙන්ගේ පුත්‍රයන්ගෙන්ද
ගාද්වරුන්ගෙන්ද මනස්සේ නම්
ගෝත්‍රයේ කොටසකින්ද හමුදා-
වට තෝරාගත් පුරුෂයන්ගේ ගණන
හතළිස්හතරදහස් හත්සිය හැටකි.[10]
ඔවුහු දුනු ශිල්පයට දක්ෂ, යුද්ධ-

**5 පරි.**
**1** උත් 49:3
**2** උත් 29:32
**3** උත් 35:22
උත් 49:4
ලෙවී 20:11
ද්වි 27:20
1කොරි 5:1
**4** උත් 49:26
ද්වි 21:17
යොෂු 14:4
**5** උත් 49:8
උත් 49:10
ගණන් 2:3
ගණන් 10:14
විනි 1:2
ගීතා 60:7
**6** මතෙ 2:6
හෙබ්‍රෙ 7:14
**7** උත් 49:26
**8** උත් 46:9
**9** නික් 6:14
**10** ගණන් 26:6
**11** 2රාජා 16:7
**12** 1ලේක 7:40
**13** 1ලේක 5:4
**14** ගණන් 32:34
ද්වි 2:36
**15** ගණන් 32:38
යෙසා 15:2
**16** යොෂු 13:17
එස 25:9
**17** උත් 15:18
ද්වි 1:7
යොෂු 1:4
2සාමු 8:3
**18** යොෂු 22:9
සල 4:1

**2 තීරුව**
**1** නික් 23:30
**2** යොෂු 13:24
**3** ද්වි 3:10
**4** යොෂු 12:5
යොෂු 13:11
**5** උත් 31:21
ගණන් 32:1
ද්වි 3:10
**6** ද්වි 3:13
ද්වි 32:14
යෙරෙ 50:19
**7** ද්වි 3:4
ද්වි 4:43
යොෂු 12:4
යොෂු 20:8
**8** 2රාජා 15:32
2ලේක 27:1
යෙසා 1:1
හොෂෙ 1:1
මීකා 1:1
**9** 2රාජා 14:16
2රාජා 14:28
**10** යොෂු 4:12

**1ලේක 5:17*** එනම්, 2වන යෙරොබොවම් රජුගේ කාලයේදීය. 2රාජා 14:16-29 බලන්න.

යට පුහුණු වූ පලිස් සහ කඩුවලින්
සන්නද්ධ වූ, එඩිතර පුරුෂයෝය.[1]
**19** ඔවුහු හග්රියවරුන්ටද[2] යෙ-
තූර්[3] නාෆිෂ්[4] සහ නෝදාබ් යන ජන
පිරිස්වලටද විරුද්ධව යුද්ධ කළෝය.
**20** ඔවුහු සටන් කරද්දී දෙවිගේ උප-
කාර ඉල්ලා කන්නලව් කළෝය.[5]
දෙවිගේ උපකාරය ඔවුන්ට ලැබුණු
නිසා හග්රියවරුන්ව හා ඔවුන් සමඟ
සිටි සියලුදෙනාවම පරාජය කිරීමට
ඔවුන්ට හැකි විය. දෙවි ඔවුන්ට උප-
කාර කළේ ඔවුන් දෙවි කෙරෙහි
විශ්වාසය තැබූ නිසාය.[6] **21** ඔවුහු
ඔටුවන් පනස්දහසක්ද බැටළුවන්[7] දෙ-
ලක්ෂ පනස්දහසක්ද බූරුවන් දෙ-
දහසක්ද අල්ලාගත් අතර මිනිසුන්
ලක්ෂයක්ද වහලුන් ලෙස යටත් කර-
ගත්තෝය.[8] **22** දෙවි ඔවුන් වෙනු-
වෙන් සටන් කළ නිසා[9] ඔවුන්ගේ
සතුරෝ බොහෝදෙනෙක් සටනේදී
මිය ගියෝය. පසු කලෙක ඔවුහු වහල්-
කමට යන තෙක්ම තමන් අල්ලාගත්
එම ප්‍රදේශයෙහි වාසය කළෝය.[10]
**23** මනස්සේ නම් ගෝත්‍රයේ කො-
ටසකට[11] අයත් පුත්‍රයෝ බාෂාන්[12]
සිට බාල්-හෙර්මොන්[13] දක්වාද එතැන්
සිට සෙනීර්[14] හා හෙර්මොන්
කන්ද[15] දක්වාද විහිදී ගිය දේශ-
යේ වාසය කළෝය. ඔවුහු ගණ-
නින් බොහෝ සෙයින් වැඩි වූහ.
**24** ඔවුන්ගේ මුතුන්මිත්තන්ගේ පෙළ-
පතේ මූලිකයන් නම් ඒෆෙර්, ඉෂී,
එලියෙල්, අශ්‍රියෙල්, යෙරෙමියා, හෝද-
වියා සහ යාදියෙල් යන අයයි. ඔවුහු
එඩිතර, බලවත්, ඉමහත් කීර්තියක්
ඉසිලූ පුරුෂයෝය. තම මුතුන්මිත්-
තන්ගේ පෙළපතේ මූලිකයන් ලෙස
කටයුතු කළේ ඔවුන්ය. **25** එනමුත්
ඔවුහු තම මුතුන්මිත්තන් නමස්කාර
කළ දෙවිට ද්‍රෝහීව කටයුතු කිරී-
මට පටන්ගත්තෝය. එමෙන්ම දෙවි
ඔවුන්ගේ ඇස් පනාපිටම දේශයෙන්
පන්නා දැමූ ජාතීන් ඇදහූ දෙවිව-
රුන්ව[16] අදහමින් ඔවුහු පිළිකුල්සහ-
ගත දේවල් කළෝය.[17] **26** එහෙයින්
ඊශ්‍රායෙල් ජනයාගේ දෙවි, ඇසිරියා-

**5 පරි.**
**1** 2සාමු 17:10
**2** 1ලේක 5:10 ගීතා 83:6
**3** උත් 25:15
**4** 1ලේක 1:31
**5** 2ලේක 14:11 ගීතා 44:3
**6** ගීතා 9:10 ගීතා 20:7 ගීතා 22:4 හෙබ්‍රෙ 11:33
**7** ගණන් 31:32
**8** ගණන් 31:35
**9** ද්වි 20:4 යොෂු 10:42 යොෂු 23:10 1සාමු 17:47 2ලේක 20:15 රෝම 8:31
**10** 2රාජා 15:29 2රාජා 17:6
**11** ගණන් 32:33 යොෂු 13:29
**12** යොෂු 13:30
**13** විනි 3:3
**14** සල 4:8 එස 27:5
**15** ද්වි 4:48 ගීතා 42:6 ගීතා 133:3
**16** ද්වි 5:9 විනි 2:2 ගීතා 106:36
**17** විනි 2:17 විනි 8:33 2රාජා 17:10

**2 තීරුව**
**1** යෙසා 10:5
**2** 2රාජා 15:19
**3** 2රාජා 15:29 2රාජා 16:7
**4** එස්රා 1:1 හිතෝ 21:1
**5** 2රාජා 17:23
**6** 2රාජා 17:6 2රාජා 18:11

**6 පරි.**
**7** උත් 29:34 නික් 6:16
**8** ගණන් 3:17 1ලේක 6:16
**9** නික් 6:18 ගණන් 3:27
**10** ගණන් 26:57
**11** 1ලේක 23:13
**12** නික් 6:21
**13** 1ලේක 15:9 1ලේක 26:30
**14** නික් 6:22 ලෙවී 10:4 1ලේක 15:10
**15** නික් 6:20
**16** 1ලේක 23:13
**17** නික් 6:26 ක්‍රියා 7:38 හෙබ්‍රෙ 3:2

වේ රජු වූ[1] පූල්[2] එනම්, තිල්ගත්-
පිල්නෙසෙර්ව[3] ඔවුන්ට විරුද්ධව නැඟී
සිටීමට පෙළඹුවේය.[4] ඔහු රූබෙන්ව-
රුන්වද ගාද්වරුන්වද මනස්සේ නම්
ගෝත්‍රයේ කොටසකට අයත් අයවද
වහලුන් ලෙස රැගෙන ගොස්[5] හලා,[6]
හාබෝර්, හාරා සහ ගෝසාන් ගඟ
අසල පදිංචි කෙරෙව්වේය. ඔවුහු අද
දක්වා එම ප්‍රදේශවල වාසය කරති.

**6** ලෙවීගේ පුත්‍රයන්[7] නම් ගේර්-
ෂෝන්[8] කෝහාත්[9] සහ මෙ-
රාරීය.[10] **2** කෝහාත්ගේ පුත්‍රයෝ
අම්රාම්,[11] ඉෂ්හාර්,[12] හෙබ්‍රොන්[13] සහ
උස්සියෙල්[14] වූහ. **3** අම්රාම්ගේ පුත්‍ර-
යන්[15] නම් ආරොන්[16] සහ මෝ-
සෙස්ය.[17] ඔහුට මිරියම්[18] යන නමින්
දියණියක්ද සිටියාය. ආරොන්ගේ පුත්‍ර-
යෝ නාදාබ්,[19] අබිහූ,[20] එලියාසර්[21]
සහ ඉතාමාර්ය.[22] **4** එලියාසර්ගේ
පුත්‍රයා[23] පිනෙහාස්ය.[24] පිනෙහාස්-
ගේ පුත්‍රයා අබිෂූවාය.[25] **5** අබිෂූවා-
ගේ පුත්‍රයා බුක්කීය. බුක්කීගේ පුත්‍රයා
උස්සිය.[26] **6** උස්සිගේ පුත්‍රයා සෙර-
හියාය. සෙරහියාගේ පුත්‍රයා මෙරා-
යොත්ය.[27] **7** මෙරායොත්ගේ පුත්‍රයා
අමරියාය. අමරියාගේ පුත්‍රයා අහි-
තුබ්ය.[28] **8** අහිතුබ්ගේ පුත්‍රයා
සාදොක්ය.[29] සාදොක්ගේ පුත්‍රයා අහි-
මයාෂ්ය.[30] **9** අහිමයාෂ්ගේ පුත්‍රයා
අෂරියාය. අෂරියාගේ පුත්‍රයා යෝහා-
නාන්ය. **10** යෝහානාන්ගේ පුත්‍රයා
අෂරියාය.[31] සලමොන් රජු යෙරුසල-
මෙහි ඉදි කළ දේවමාලිගාවේ පූජකයා
ලෙස අෂරියා කටයුතු කළේය.
**11** අෂරියාගේ පුත්‍රයා අමරි-
යාය.[32] අමරියාගේ පුත්‍රයා අහි-
තුබ්ය.[33] **12** අහිතුබ්ගේ පුත්‍රයා
සාදොක්ය.[34] සාදොක්ගේ පුත්‍රයා ෂල්-
ලූම්ය. **13** ෂල්ලූම්ගේ පුත්‍රයා

**18** නික් 2:4; නික් 15:20; ගණන් 12:10; **19** නික් 6:23; නික් 24:1; ලෙවී 10:1; **20** නික් 28:1; 1ලේක 24:2; **21** ගණන් 3:32; ද්වි 10:6; **22** ගණන් 4:28; 1ලේක 24:4; **23** නික් 6:25; **24** ගණන් 25:11; 1ලේක 9:20; ගීතා 106:30; **25** එස්රා 7:5; **26** එස්රා 7:4; **27** එස්රා 7:3; **28** 2සාමු 8:17; **29** 2සාමු 15:27; 2සාමු 20:25; 1රාජා 1:8; 1රාජා 2:35; **30** 2සාමු 15:36; 2සාමු 17:17; 2සාමු 18:19; **31** 2ලේක 26:20; **32** එස්රා 7:3; **33** එස්රා 7:2; **34** නෙහෙ 11:11.

හිල්කියාය.[1] හිල්කියාගේ පුත්‍රයා
අෂරියාය. **14** අෂරියාගේ පුත්‍රයා සෙ-
රායාය.[2] සෙරායාගේ පුත්‍රයා යෙහෝ-
ෂාදාක්ය.[3] **15** යෙහෝවා දෙවි යූදා
සහ යෙරුසලමේ වැසියන්ව වහලුන්
ලෙස ගෙන යෑමට නෙබුකද්නෙෂර්
රජුට ඉඩහැරිය විට යෙහෝෂාදාක්වද
වහලෙකු ලෙස ගෙන ගියේය.

**16** ලෙවීගේ පුත්‍රයන්[4] නම් ගේර්-
ෂොම්,* කෝහාත් සහ මෙරාරීය.
**17** ගේර්ෂොම්ගේ පුත්‍රයන් ලිබ්නි[5] සහ
ෂිමෙයිය.[6] **18** කෝහාත්ගේ පුත්‍ර-
යෝ[7] අම්රාම්,[8] ඉෂ්හාර්, හෙබ්‍රොන් සහ
උස්සියෙල්ය.[9] **19** මෙරාරීගේ පුත්‍ර-
යන් නම් මාලී සහ මූෂීය.[10]

ලෙවීගේ පුත්‍රයන්ගේ නම්වලින්
හඳුන්වනු ලැබූ පෙළපත් මෙසේය.[11]
**20** ගේර්ෂොම්ගේ පුත්‍රයා ලිබ්නිය.[12]
ලිබ්නිගේ පුත්‍රයා යාහත්ය. යාහත්-
ගේ පුත්‍රයා සිම්මාය. **21** සිම්මාගේ
පුත්‍රයා යෝවාය. යෝවාගේ[13] පුත්‍රයා
ඉද්දෝය. ඉද්දෝගේ පුත්‍රයා සේ-
රාය. සේරාගේ පුත්‍රයා යෙයාතෙරයිය.
**22** කෝහාත්ගේ පුත්‍රයා අම්නදාබ්ය.
අම්නදාබ්ගේ පුත්‍රයා කෝරාය.[14] කෝ-
රාගේ පුත්‍රයා අස්සීර්ය. **23** අස්සීර්-
ගේ පුත්‍රයා එල්කානාය. එල්කානාගේ
පුත්‍රයා එබියාසාෆ්ය.[15] එබියාසාෆ්-
ගේ පුත්‍රයා අස්සීර්ය. **24** අස්සීර්-
ගේ පුත්‍රයා තහත්ය. තහත්ගේ
පුත්‍රයා උරියෙල්ය. උරියෙල්ගේ පුත්‍රයා
උසියාය. උසියාගේ පුත්‍රයා ෂාවුල්ය.
**25** එල්කානාගේ පුත්‍රයන්[16] නම්
අමාසායි සහ අහිමොත්ය. **26** එල්-
කානාගේ පුත්‍රයා ෂෝපයි[17] විය. ෂෝප-
යිගේ පුත්‍රයා නාහත්ය. **27** නාහත්-
ගේ පුත්‍රයා එලියාබ්ය.[18] එලියාබ්ගේ
පුත්‍රයා යෙරොහාම්ය. යෙරොහාම්ගේ
පුත්‍රයා එල්කානාය.[19] **28** සාමුවෙල්-
ගේ[20] කුලුඳුල් පුත්‍රයා යෝවෙල්ය.
දෙවෙනියා අබියාය.[21] **29** මෙරාරීගේ
පුත්‍රයන් මාලී[22] සහ ලිබ්නිය. ලිබ්නිගේ
පුත්‍රයා ෂිමෙයිය. ෂිමෙයිගේ පුත්‍රයා
උස්සාහ්ය. **30** උස්සාහ්ගේ පුත්‍රයා
ෂිමෙයාය. ෂිමෙයාගේ පුත්‍රයා හග්ගි-
යාය. හග්ගියාගේ පුත්‍රයා අසායාය.

**31** ගිවිසුම් පෙට්ටිය තැබීමට
නියමිත ස්ථානයක්[1] තීරණය
කළ විට යෙහෝවා දෙවිගේ ගෘහ-
යේ ගීතිකා ගැයීමේ කාර්යය මෙ-
හෙයවීමට දාවිත් රජු විසින්
පත් කළ අය සිටියෝය.[2] **32** සල-
මොන් රජු, යෙහෝවා දෙවිගේ
ගෘහය යෙරුසලමෙහි ඉදි කරන
තෙක්[3] ඔවුහු[4] සම්මුඛ වීමේ කූඩා-
රම ඉදිරියේ ගීතිකා ගැයීමේ[5] කට-
යුත්තෙහි නිරත වූවෝය. ඔවුන්ට
පවරා තිබූ කාර්යය ඔවුහු නිසියාකා-
රව ඉටු කළෝය.[6] **33** මෙම කාර්-
යයෙහි නිරත වූ අය සහ
ඔවුන්ගේ පෙළපත මෙලෙසය. කෝ-
හාත්වරුන්ගේ පුත්‍රයන් අතරින්
හේමාන්[7] නම් ගායකයා එම කාර්ය-
යෙහි නිරතව සිටියේය. හේමාන්-
ගේ පියා යෝවෙල්ය.[8] යෝවෙල්ගේ
පියා සාමුවෙල්ය.[9] **34** සාමුවෙල්ගේ
පියා එල්කානාය.[10] එල්කානාගේ පියා
යෙරොහාම්ය. යෙරොහාම්ගේ පියා
එලියෙල්ය.[11] එලියෙල්ගේ පියා තෝ-
වාය. **35** තෝවාගේ පියා ෂූප්ය.[12]
ෂූප්ගේ පියා එල්කානාය. එල්කා-
නාගේ පියා මාහත්ය. මාහත්ගේ
පියා අමාසායිය. **36** අමාසායිගේ
පියා එල්කානාය. එල්කානාගේ පියා
යෝවෙල්ය. යෝවෙල්ගේ පියා අෂරි-
යාය. අෂරියාගේ පියා ශෙපනියාය.
**37** ශෙපනියාගේ පියා තහත්ය.
තහත්ගේ පියා අස්සීර්ය. අස්සීර්-
ගේ පියා එබියාසාෆ්ය.[13] එබියාසාෆ්-
ගේ පියා කෝරාය.[14] **38** කෝරාගේ
පියා ඉෂ්හාර්ය.[15] ඉෂ්හාර්ගේ පියා
කෝහාත්ය. කෝහාත්ගේ පියා ලෙ-
වීය. ලෙවීගේ පියා ඊශ්‍රායෙල්ය.

**39** හේමාන්ගේ සහෝදරයෙක් වූ
ආසාෆ්[16] හේමාන්ගේ දකුණු
පසින් සිට එම කාර්යයේ නිතර
වූවේය. ආසාෆ්ගේ පියා බෙරෙකි-
යාය.[17] බෙරෙකියාගේ පියා ෂිමෙයාය.

**6 පරි.**
**1** 2ලේක 34:14
**2** 2රාජා 25:18
**3** හග් 1:1
**4** නික් 6:16
**5** ගණන් 3:18
**6** 1ලේක 23:7
**7** 1ලේක 6:2
**8** නික් 6:20; 1ලේක 23:13
**9** නික් 6:22; ගණන් 3:19
**10** ගණන් 3:20; 1ලේක 23:21
**11** ගණන් 26:57
**12** ගණන් 3:18
**13** 2ලේක 29:12
**14** ගණන් 16:1; ගණන් 16:32; ගණන් 26:10; යූද් 11
**15** නික් 6:24
**16** 1ලේක 6:36
**17** 1ලේක 6:35
**18** 1ලේක 6:34
**19** 1සාමු 1:1
**20** 1සාමු 1:20
**21** 1සාමු 8:2
**22** නික් 6:19; ගණන් 3:33; 1ලේක 23:21

**2 තීරුව**
**1** 2සාමු 6:17; ගීතා 132:14
**2** 1ලේක 15:16
**3** 1රාජා 6:14
**4** 1ලේක 16:4; 1ලේක 16:37
**5** 1ලේක 16:42; ගීතා 68:25
**6** 2ලේක 35:15; එස්රා 3:10; 1කොරි 14:40
**7** 1ලේක 15:19; 1ලේක 16:41; 1ලේක 25:1; 2ලේක 5:12
**8** 1සාමු 8:2; 1ලේක 6:28
**9** 1සාමු 1:20; 1සාමු 8:1
**10** 1සාමු 1:19
**11** 1ලේක 6:27
**12** 1සාමු 1:1; 1ලේක 6:26
**13** නික් 6:24
**14** ගණන් 26:11; ගීතා 42:පෙර
**15** ගණන් 3:19
**16** 1ලේක 25:1; 2ලේක 5:12; 2ලේක 29:30; ගීතා 50:පෙර
**17** 1ලේක 15:17

---

**1ලේක 6:16*** පළමුවෙනි පදයේ, “ගේර්ෂොන්” ලෙස හැඳින්වේ.

**40** ෂිමෙයාගේ පියා මිකායෙල්ය.
මිකායෙල්ගේ පියා බාසෙයාය. බාසෙ-
යාගේ පියා මල්කියාය. **41** මල්-
කියාගේ පියා එත්නිය. එත්නිගේ
පියා සේරාය. සේරාගේ පියා අදායාය.
**42** අදායාගේ පියා ඒතන්ය. ඒතන්ගේ
පියා සිම්මාය. සිම්මාගේ පියා ෂිමෙ-
යිය. **43** ෂිමෙයිගේ පියා යාහත්ය.[1]
යාහත්ගේ පියා ගේර්ෂොම්ය.[2] ගේර්-
ෂොම්ගේ පියා ලෙවීය.

**44** හේමාන්ගේ වම් පසින් සිටියේ
ඔවුන්ගේ සහෝදරයෙක් වූ මෙරාරී-
ගෙන්[3] පැවතෙන ඒතන්ය.[4] ඒතන්ගේ
පියා කිෂීය.[5] කිෂීගේ පියා අබ්දීය.
අබ්දීගේ පියා මල්ලූක්ය. **45** මල්-
ලූක්ගේ පියා හෂබියාය. හෂබියා-
ගේ පියා අමෂියාය. අමෂියාගේ පියා
හිල්කියාය. **46** හිල්කියාගේ පියා
අම්ෂීය. අම්ෂීගේ පියා බානිය. බානි-
ගේ පියා ෂෙමෙර්ය. **47** ෂෙමෙර්ගේ
පියා මාලීය. මාලීගේ පියා මූෂීය.[6]
මූෂීගේ පියා මෙරාරීය.[7] මෙරාරීගේ
පියා ලෙවීය.

**48** ශුද්ධ කූඩාරමේ එනම්, සැබෑ
දෙවිගේ ගෘහයේ සේවාවන් ඉටු
කිරීම සඳහා[8] ඔවුන්ගේ සහෝදරයන්
වූ ලෙවීවරුන්ව පත් කර තිබිණ.[9]
**49** පූජාසනය මත ගින්නෙන් දවා
පූජා ඔප්පු කිරීමේ කාර්යයද[10] සුවඳ
ද්‍රව්‍ය ඔප්පු කරන පූජාසනය[11] මත
සුගන්ධවත් ද්‍රව්‍ය[12] දැවීමේ කාර්-
යයද ආරොන්[13] සහ ඔහුගේ පුත්‍ර-
යන් විසින් කරන ලදි. ඔවුන් එසේ
කළේ ඊශ්‍රායෙල් ජනයාගේ[14] පව්-
වලට සමාව ලබාගැනීම[15] ඇතුළු
දෙවිගේ ශුද්ධ නමස්කාරය හා
සම්බන්ධ සියලුම කටයුතු නිසියා-
කාරව ඉටු කිරීම සඳහාය. සැබෑ
දෙවිගේ සේවකයෙක් වූ මෝසෙස්
අණ කර තිබූ ආකාරයටම ඔවුහු
ඒ දේවල් කළෝය. **50** ආරොන්-
ගේ පුත්‍රයා[16] එලියාසර්ය.[17] එලි-
යාසර්ගේ පුත්‍රයා පිනෙහාස්ය.[18]
පිනෙහාස්ගේ පුත්‍රයා අබිෂුවාය.[19]
**51** අබිෂුවාගේ පුත්‍රයා බුක්කීය.
බුක්කීගේ පුත්‍රයා උස්සිය. උස්සිගේ
පුත්‍රයා සෙරහියාය.[1] **52** සෙරහියා-
ගේ පුත්‍රයා මෙරායොත්ය.[2] මෙරා-
යොත්ගේ පුත්‍රයා අමරියාය. අමරියාගේ
පුත්‍රයා අහිතුබ්ය.[3] **53** අහිතුබ්ගේ
පුත්‍රයා සාදොක්ය.[4] සාදොක්ගේ පුත්‍රයා
අහිමයාෂ්ය.[5]

**54** ආදූ දැමීමෙන් කෝහාත්ගේ
පෙළපතට[6] අයත් ආරොන්ගේ පුත්‍ර-
යන්ට හිමි වූ ප්‍රදේශ මතු දැක්-
වේ. ඔවුහු එම ප්‍රදේශයේ කඳවුරුවල
වාසය කළෝය.[7] **55** ඔවුන්ට යූදා
දේශයේ පිහිටි හෙබ්‍රොන් නුවර[8] හා ඒ
අවට පිහිටි තණබිම්ද දෙන ලදි.
**56** නමුත් ඒ නුවර අවට පිහිටි
කෙත් සහ ගම්මාන[9] දෙනු ලැබු-
වේ යෙෆුන්නෙගේ[10] පුත් කාලෙබ්-
ටය.[11] **57** ආරක්ෂිත නුවරක්*[12]
වන හෙබ්‍රොන්ද[13] ලිබ්නා[14] හා එෂ්-
තෙමෝවා[15] යන නුවරවල්ද ඒවා
අවට පිහිටි තණබිම්ද යත්තීර් නුව-
රද[16] ආරොන්ගේ පුත්‍රයන්ට දෙන ලදි.
**58** හීලෙන්[17] හා ඒ අවට පිහිටි තණ-
බිම්ද දෙබීර්[18] හා ඒ අවට පිහිටි තණ-
බිම්ද **59** ආෂාන්[19] හා ඒ අවට පිහිටි
තණබිම්ද බෙත්-ෂෙමෙෂ්[20] සහ ඒ
අවට පිහිටි තණබිම්ද **60** බෙන්ජ-
මින් ගෝත්‍රයට අයත් ප්‍රදේශයෙන්
ගෙබා[21] සහ ඒ අවට පිහිටි තණබිම්ද
අලෙමෙත්[22] සහ ඒ අවට පිහිටි තණ-
බිම්ද අනාතොත්[23] සහ ඒ අවට පිහිටි
තණබිම්ද ඔවුන්ට දෙන ලදි. ඔවුන්-
ගේ පවුල් අතරේ බෙදා දුන් නුවරවල්
ගණන දහතුනකි.[24]

**61** ආදූ දැමීමෙන් කෝහාත්ගේ
පුත්‍රයන්ගෙන් ඉතුරු වූ අයට, මනස්-
සේ ගෝත්‍රයෙන් කොටසකට හිමි වූ
ප්‍රදේශයෙන් නුවරවල්ද වෙනත් ගෝ-
ත්‍රයක පවුලකට හිමි වූ ප්‍රදේශයෙන්
නුවරවල්ද දෙන ලදි. ඔවුන්ට දෙන
ලද නුවරවල් ගණන දහයකි.[25]

**6 පරි.**
**1** 1ලේක 6:20
**2** නික් 6:16
**3** 1ලේක 23:6
**4** 1ලේක 15:19
**5** 1ලේක 15:17
**6** ගණන් 3:20
**7** නික් 6:16
**8** ගණන් 3:7; ගණන් 16:9; 1පේතෘ 4:10
**9** 1ලේක 23:2; 1ලේක 26:20
**10** නික් 29:38; ලෙවී 9:2
**11** නික් 30:7; 2ලේක 26:18
**12** එෆී 5:2
**13** නික් 28:1; ගණන් 3:10
**14** ලෙවී 4:20; ලෙවී 17:11; ගණන් 15:25
**15** නික් 30:10; 2ලේක 29:24
**16** නික් 6:23
**17** නික් 28:1; ගණන් 3:32
**18** 1ලේක 6:4; 1ලේක 9:20
**19** එස්රා 7:5

**2 තීරුව**
**1** එස්රා 7:4
**2** එස්රා 7:3
**3** 2සාමු 8:17
**4** 2සාමු 15:27; 1රාජා 1:8; 1රාජා 2:35
**5** 2සාමු 17:17
**6** යොෂු 21:5
**7** යොෂු 21:3
**8** ගණන් 13:22; යොෂු 21:11
**9** ලෙවී 25:31
**10** යොෂු 21:12
**11** ද්වි 1:36; යොෂු 14:13; විනි 1:20
**12** ගණන් 35:13
**13** යොෂු 20:7; යොෂු 21:13
**14** යොෂු 15:42; යොෂු 21:13
**15** යොෂු 21:14
**16** යොෂු 15:48; 1සාමු 30:27
**17** යොෂු 15:51; යොෂු 21:15
**18** යොෂු 15:15; විනි 1:11
**19** යොෂු 21:16; 1ලේක 4:32
**20** යොෂු 15:10; 1සාමු 6:12

**21** යොෂු 18:24; යොෂු 21:17; **22** යොෂු 21:18; **23** 1රාජා 2:26; යෙසා 10:30; යෙරෙ 1:1; **24** යොෂු 21:4; **25** යොෂු 21:5.

**1ලේක 6:57*** මූ.අ., "නුවරවල්."

**62** ගේර්ෂෝම්ගේ පුත්‍රයන්ගේ[1]
පවුල්වලට, ඉසකාර් ගෝත්‍රයට[2]
අයත් ප්‍රදේශයෙන්ද ආෂේර් ගෝ-
ත්‍රයට[3] අයත් ප්‍රදේශයෙන්ද නෆ්-
තලී ගෝත්‍රයට[4] අයත් ප්‍රදේශයෙන්ද
මනස්සේ ගෝත්‍රයට[5] අයත් බාෂාන්
නම් ප්‍රදේශයෙන්ද නුවරවල් දහතු-
නක් දෙන ලදි.
**63** ආදු දැමීමෙන් රූබෙන් ගෝ-
ත්‍රයෙන්ද[6] ගාද් ගෝත්‍රයෙන්ද[7]
සෙබුලුන් ගෝත්‍රයෙන්ද[8] නුවරවල්
දොළහක් මෙරාරීගේ පුත්‍රයන්ගේ[9]
පවුල්වලට දෙන ලදි.
**64** මෙලෙස ඊශ්‍රායෙල් පුත්‍රයෝ
ලෙවීවරුන්ට[10] නුවරවල්ද ඒවා
අවට පිහිටි තණබිම්ද දුන්නෝය.[11]
**65** මීට අමතරව ආදු දමා යූදා ගෝ-
ත්‍රයෙන්ද[12] සිමියොන් ගෝත්‍රයෙන්ද[13]
බෙන්ජමින් ගෝත්‍රයෙන්ද[14] නුවරවල්
ඔවුන්ට දෙන ලදි. එම නුවරවල නම්-
වලින්ම ඒවා වාර්තා විය.
**66** කෝහාත්ගේ පුත්‍රයන්ට අයත්
ඇතැම් පවුල්වලට එෆ්‍රායිම් ගෝ-
ත්‍රයෙන්[15] නුවරවල් දෙන ලදි.
**67** ආරක්ෂිත නුවරක් වන එෆ්‍රායිම්හි
කඳුකර ප්‍රදේශයේ පිහිටි ෂීකෙම්[16] සහ
ඒ අවට පිහිටි තණබිම්ද ගෙෂේර්[17]
සහ ඒ අවට පිහිටි තණබිම්ද ඔවුන්ට
දෙන ලදි. **68** එමෙන්ම යොක්මෙ-
යාම්[18] සහ ඒ අවට පිහිටි
තණබිම්ද බෙත්-හෝරොන්[19] සහ ඒ
අවට පිහිටි තණබිම්ද **69** ආයා-
ලොන්[20] සහ ඒ අවට පිහිටි තණ-
බිම්ද ගාත්-රිම්මොන්[21] සහ ඒ අවට
පිහිටි තණබිම්ද ඔවුන්ට දෙන ලදි.
**70** මනස්සේ ගෝත්‍රයෙන් එක් කො-
ටසකට අයත් අනෙර්[22] සහ ඒ අවට
පිහිටි තණබිම්ද බිලෙයාම්[23] සහ
ඒ අවට පිහිටි තණබිම්ද කෝහාත්
පුත්‍රයන්ට අයත් ඉතුරු පවුල්වලට
දෙන ලදි.[24]
**71** ගේර්ෂෝම්ගේ පුත්‍රයන්ට[25]
මනස්සේ ගෝත්‍රයෙන් එක් කොටස-
කට අයත් බාෂාන් ප්‍රදේශයේ පිහිටි
ගෝලාන්[26] හා ඒ අවට පිහිටි තණ-
බිම්ද අෂ්ටාරොත්[27] හා ඒ අවට පිහිටි
තණබිම්ද දෙන ලදි. **72** ඉසකාර්
ගෝත්‍රයෙන් කෙදෙෂ්[1] හා ඒ අවට
පිහිටි තණබිම්ද දාබෙරත්[2] හා ඒ අවට
පිහිටි තණබිම්ද **73** රාමොත්[3] හා ඒ
අවට පිහිටි තණබිම්ද ආනෙම්[4] හා
ඒ අවට පිහිටි තණබිම්ද ඔවුන්ට
දෙන ලදි. **74** ආෂේර් ගෝත්‍රයෙන්
මාෂාල් හා ඒ අවට පිහිටි තණ-
බිම්ද අබ්දොන්[5] හා ඒ අවට පිහිටි
තණබිම්ද **75** හුකොක්[6] හා ඒ අවට
පිහිටි තණබිම්ද රෙහොබ්[7] හා ඒ අවට
පිහිටි තණබිම්ද ඔවුන්ට දෙන ලදි.
**76** එමෙන්ම නෆ්තලී ගෝත්‍රයෙන්[8]
ගලීලයේ[9] පිහිටි කෙදෙෂ්[10] හා ඒ අවට
පිහිටි තණබිම්ද හම්මොන් හා ඒ අවට
පිහිටි තණබිම්ද කිර්යතායිම්[11] හා ඒ
අවට පිහිටි තණබිම්ද ඔවුන්ට දෙන
ලදි.
**77** මෙරාරීගේ පුත්‍රයන් අතුරින්
ඉතුරු වූ අයට සෙබුලුන් ගෝ-
ත්‍රයට[12] අයත් රිම්මෝනො[13] සහ
ඒ අවට පිහිටි තණබිම්ද තාබෝර්
සහ ඒ අවට පිහිටි තණබිම්ද දෙන
ලදි. **78** එමෙන්ම යොර්දාන් ගඟට
නැඟෙනහිරින් යෙරිකෝව අවට තිබූ
රූබෙන් ගෝත්‍රයට[14] අයත් ප්‍රදේශ-
යෙන් බෙෂෙර්[15] හා ඒ අවට පිහිටි
තණබිම්ද යහෂ්[16] හා ඒ අවට පිහිටි
තණබිම්ද **79** කෙදෙමොත්[17] හා ඒ
අවට පිහිටි තණබිම්ද මෙෆයත්[18] හා
ඒ අවට පිහිටි තණබිම්ද **80** ගාද්
ගෝත්‍රයට[19] අයත් ගිලියද්හි පිහිටි
රාමොත්[20] හා ඒ අවට පිහිටි තණ-
බිම්ද මහනායිම්[21] හා ඒ අවට පිහිටි
තණබිම්ද **81** හෙෂ්බොන්[22] හා ඒ
අවට පිහිටි තණබිම්ද යාසෙර්[23] හා ඒ
අවට පිහිටි තණබිම්ද දෙන ලදි.

**7** ඉසකාර්ට සිටි පුත්‍රයන් හතර-
දෙනා නම් තෝලා,[24] පූවා,[25]
යාෂුබ් සහ ෂිම්රොන්ය.[26] **2** තෝ-
ලාගේ පුත්‍රයන් නම් උස්සි, රෙෆායා,
යෙරීයෙල්, යාමයි, ඉබ්සාම් සහ ෂෙමු-

**6 පරි.**
**1** 1ලේක 6:17
**2** යොෂු 21:28
**3** යොෂු 21:30
**4** යොෂු 21:32
**5** යොෂු 21:27
**6** යොෂු 21:36
**7** යොෂු 21:38
**8** යොෂු 21:34
**9** යොෂු 21:40
**10** යොෂු 21:41
**11** ගණන් 35:4
**12** 1ලේක 6:57; 1ලේක 6:58
**13** යොෂු 19:1
**14** 1ලේක 6:60
**15** යොෂු 21:20
**16** යොෂු 20:7; විනි 9:1; විනි 9:45; 1රාජා 12:1
**17** යොෂු 16:10; යොෂු 21:21
**18** යොෂු 21:22
**19** යොෂු 10:11; යොෂු 16:5; යොෂු 21:22
**20** යොෂු 10:12; යොෂු 21:24; විනි 1:35; 2ලේක 28:18
**21** යොෂු 19:45; යොෂු 21:24
**22** යොෂු 21:25
**23** යොෂු 17:11; 2රාජා 9:27
**24** යොෂු 21:26
**25** යොෂු 21:27
**26** ද්වි 4:43; යොෂු 20:8
**27** ද්වි 1:4

**2 තීරුව**
**1** යොෂු 21:28
**2** යොෂු 19:12
**3** යොෂු 21:29
**4** යොෂු 21:29
**5** යොෂු 21:30
**6** යොෂු 19:25; යොෂු 21:31
**7** යොෂු 19:28; විනි 1:31
**8** යොෂු 21:32
**9** මතෙ 3:13
**10** යොෂු 20:7; විනි 4:6
**11** යොෂු 21:32
**12** යොෂු 21:34
**13** යොෂු 19:13; යොෂු 21:35
**14** යොෂු 21:36
**15** ද්වි 4:43; යොෂු 20:8
**16** ගණන් 21:23; යොෂු 13:18
**17** ද්වි 2:26; යොෂු 13:18
**18** යොෂු 21:37

**19** යොෂු 21:38; **20** යොෂු 20:8; 1රාජා 4:13; **21** උත් 32:2; 2සාමු 2:8; 2සාමු 19:32; **22** ගණන් 21:26; යොෂු 13:17; **23** ගණන් 32:1; යොෂු 21:39; **7 පරි.** **24** ගණන් 26:23; **25** උත් 46:13; **26** ගණන් 26:24.

වෙල්ය. ඔවුහු ඔවුන්ගේ පෙළපතේ
ප්‍රධානියෝය. තෝලාගේ පෙළපතින්
ඉතා එඩිතර, බලසම්පන්න පුරුෂ-
යෝ බිහි වූහ. දාවිත් රජුගේ කාල-
යේ[1] ඔවුන්ගේ සංඛ්‍යාව විසිදෙදහස්
හයසියයකි. **3** උස්සිට දාව ඉෂ්රා-
හියා උපන්නේය. ඉෂ්රාහියාට පුත්‍ර-
යෝ පස්දෙනෙක් සිටියෝය. ඔවුන්
නම් මිකායෙල්, ඔබදියා, යෝවෙල්,
ඉෂ්ෂියා සහ . . .ය.* ඔවුහු සියලු-
දෙනාම ප්‍රධානියෝය. **4** ඔවුන්ගේ
මුතුන්මිත්තන්ගේ පෙළපතින් පැවත
ආ හමුදා හටයින් තිස්හයදහස්දෙ-
නෙක් ඔවුන් සමඟ සිටියෝය. ඔවුන්-
ගේ ගණන මෙතරම් වැඩි වූයේ
ඔවුන්ට බොහෝ භාර්යාවන් හා පුත්‍ර-
යන් සිටි නිසාය.[2] **5** ඉසකාර්ගෙන්
බිහි වූ සියලුම පවුල්වලට අයත් පුරු-
ෂයන් එඩිතර, බලසම්පන්න අයය.[3]
පෙළපත් වාර්තාවේ සඳහන් ආකාර-
යට ඔවුන්ගේ ගණන අසූහත්දහසකි.[4]

**6** බෙන්ජමින්ගේ පුත්‍රයන්[5]
තිදෙනා නම් බෙලා,[6] බෙකෙර්[7] සහ
යෙදීයයෙල්ය.[8] **7** බෙලාට[9] පුත්‍ර-
යෝ පස්දෙනෙක් සිටියෝය. ඔවුන්-
ගේ නම් එෂ්බොන්, උස්සි,
උස්සියෙල්, යෙරිමොත් සහ ඊරිය.
ඔවුහු තම පෙළපතේ ඉතා එඩිතර
බලසම්පන්න ප්‍රධානියෝය. පෙළ-
පත් වාර්තාවට අනුව[10] ඔවුන්ගෙන්
පැවත ආ අයගේ ගණන විසිදෙ-
දහස් තිස්හතරකි. **8** බෙකෙර්ගේ
පුත්‍රයන් නම් සෙමීරා, යෝවාෂ්, එලි-
යේසර්, එලියෝනේයයි, ඔම්රී, යෙ-
රෙමොත්, අබියා, අනාතොත් සහ
අලෙමෙත්ය. **9** ඔවුන්ගේ පෙළප-
තේ ප්‍රධානීන්ගෙන් පැවතෙන්නෝ
එඩිතර බලසම්පන්න පුරුෂයෝය.
පෙළපත් වාර්තාවල සඳහන් ආකාර-
යට[11] ඔවුන්ගේ ගණන විසිදහස් දෙසි-
යයකි. **10** යෙදීයයෙල්ගේ[12] පුත්‍රයා
බිල්හාන්ය. බිල්හාන්ගේ පුත්‍රයන් නම්
යෙවුෂ්, බෙන්ජමින්, ඒහුද්, කෙනානා,
ෂේතාන්, තර්ෂිෂ් සහ අහිෂාහර්ය.
**11** ඔවුහු සියලුදෙනා යෙදීයයෙල්-
ගෙන් පැවතෙන්නෝය. ඔවුහු තම
පෙළපතේ එඩිතර, බලසම්පන්න
ප්‍රධානියෝය.[1] එමෙන්ම ඔවුහු සෙබ-
ළුන් ලෙස යුද්ධයට සැරසී සිටි පුරුෂ-
යෝය. ඔවුන්ගේ ගණන දාහත්දහස්
දෙසියයකි.

**12** ෂප්පිම්වරු[2] හා හප්පිම්වරු*[3]
ඊර්ගේ[4] පුත්‍රයෝය. හුෂිම්වරු අහෙර්-
ගේ පුත්‍රයෝය.

**13** නප්තලීගේ පුත්‍රයන්[5] නම්
යාෂියෙල්,[6] ගුනී,[7] යේෂෙර් සහ ෂල්-
ලුම්ය.*[8] බිල්හාගෙන්[9] පැවත ආවේ
මොවුන්ය.

**14** මනස්සේට[10] අස්‍රියෙල් නමින්
පුත්‍රයෙක් සිටියේය. ඔහු ඉපදු-
ණේ මනස්සේගේ සිරියානු උපභාර්-
යාවටය. (ඇයට ගිලියද්ගේ පියා
වූ මාකීර්ද[11] උපන්නේය. **15** හප්-
පිම් සඳහා බිරිඳක්ද ෂප්පිම් සඳහා
බිරිඳක්ද මාකීර් සොයා දුන්නේය.
ඔහුගේ සහෝදරියගේ නම මයකාය.)
මනස්සේගේ දෙවෙනි පුත්‍රයාගේ නම
ෂෙලොපෙහාද්ය.[12] ෂෙලොපෙහාද්ට
සිටියේ දූවරුන් පමණි.[13] **16** කල්
යත්ම මාකීර්ගේ බිරිඳ වූ මයකාට
පුත්‍රයෙක් උපන්නේය. ඔහුට පේ-
රෙෂ් යන නම දෙන ලදි. ඔහුගේ
සහෝදරයාගේ නම ෂෙරෙෂ්ය. ෂෙ-
රෙෂ්ගේ පුත්‍රයන් නම් ඌලාම් සහ
රෙකෙම්ය. **17** ඌලාම්ගේ පුත්‍රයා
බෙදාන්ය. මොවුන් ගිලියද්ගේ පුත්‍ර-
යන්ය. ගිලියද්, මාකීර්ගේ පුත්‍ර-
යාය. මාකීර්, මනස්සේගේ පුත්‍රයාය.
**18** ගිලියද්ගේ සහෝදරිය හම්මො-
ලෙකෙත්ය. ඇයට ඉෂ්හොද්, අබි-
එෂෙර්[14] සහ මාලාහ් උපන්නෝය.
**19** ෂෙමිදාගේ පුත්‍රයන් නම් අහියාන්,
ෂෙකෙම්, ලික්හි සහ අනියාම්ය.

**20** එෆ්‍රායිම්ගේ[15] පුත්‍රයා ෂුතෙ-
ලාය.[16] ෂුතෙලාගේ පුත්‍රයා බෙරෙද්ය.
බෙරෙද්ගේ පුත්‍රයා තහත්ය. තහත්ගේ

---

1ලේක **7:3*** මුල් හෙබ්‍රෙව් පිටපත්වල නම සඳහන් වී නැත.

1ලේක **7:12*** හෝ, "ෂප්පිම් හා හප්පිම්." **13*** උත් 46:24හි සඳහන් වන්නේ, "ෂිල්ලෙම්" ලෙසයි.

---

**7 පරි.**
1 2සාමු 24:1, 1ලේක 21:5
2 1ලේක 12:32
3 දේශ 9:11
4 ගණන් 26:25
5 උත් 35:18, උත් 49:27, ගණන් 26:41
6 ගණන් 26:38, 1ලේක 8:1
7 උත් 46:21
8 1ලේක 7:10
9 ගණන් 26:38, 1ලේක 8:1
10 1ලේක 21:2
11 1ලේක 21:2
12 1ලේක 7:6

**2 තීරුව**
1 ගීතා 33:16
2 උත් 46:21, ගණන් 26:39, 1ලේක 8:5
3 උත් 46:21, ගණන් 26:39, 1ලේක 8:5
4 1ලේක 7:7
5 උත් 30:8, උත් 49:21
6 උත් 46:24
7 ගණන් 26:48
8 ගණන් 26:49
9 උත් 30:3, උත් 35:22, උත් 46:25
10 උත් 41:51
11 උත් 50:23, ගණන් 26:29, ගණන් 27:1, ද්වි 3:15
12 ගණන් 26:33
13 ගණන් 27:7, ගණන් 36:2
14 ගණන් 26:30, විනි 6:11, විනි 8:2
15 ගණන් 1:33, ද්වි 33:17, ගීතා 60:7
16 ගණන් 26:35

පුත්‍රයා එලෙයාදාය. එලෙයාදා-
ගේ පුත්‍රයා තහත්ය. **21** තහත්ගේ
පුත්‍රයා සාබාද්ය. සාබාද්ගේ පුත්‍රයා
ෂුතෙලාය. එෆ්‍රායිම්ට එෂෙර් සහ
එලෙයාද් යන නම්වලින් පුත්‍රයෝ දෙ-
දෙනෙක්ද සිටියෝය. ඔවුන් ගාත්
දේශයේ[1] වැසියන්ට අයිති සතුන්
පැහැරගෙන යෑමට පැමිණි නිසා
එම මිනිස්සු ඔවුන්ව මරා දැමුවෝය.
**22** ඔවුන්ගේ පියා වූ එෆ්‍රායිම් දවස්
ගණනාවක් ඔවුන්ගේ වියෝව නිසා
ශෝක විය.[2] ඔහුගේ සහෝදරයෝ
පැමිණ ඔහුව සැනසීමට උත්සාහ
කළෝය. **23** ඉන්පසු ඔහු තම භාර්-
යාව සමඟ සයනය කළේය. ඇය
ගැබ්ගෙන[3] පුතෙකු බිහි කළාය. ඔහු
එම පුත්‍රයාට බෙරීයා* යන නම
තැබීය. එසේ කළේ ඇය මෙම පුත්‍ර-
යාව බිහි කළ කාලයේදී තම පවුලට
මහත් විපතක්[4] සිදු වී තිබුණු නිසාය.
**24** ඔහුගේ දියණියගේ නම ෂෙයෙ-
රාය. ඇය ඉහළ බෙත්-හෝරොන්[5]
හා පහළ බෙත්-හෝරොන්[6] යන
නුවරවල් දෙකද උස්සෙන්-ෂෙයෙරා
යන නුවරද ගොඩනැඟුවාය.
**25** ඉන්පසු ඔහුට දාව රෙෆා හා
රෙෂෙප් යන පුත්‍රයෝ උපන්-
නෝය.* රෙෂෙප්ගේ පුත්‍රයා තෙලාය.
ඔහුගේ පුත්‍රයා තහන්ය. **26** තහන්-
ගේ පුත්‍රයා ලාදාන්ය. ලාදාන්ගේ
පුත්‍රයා අම්හුද්ය. අම්හුද්ගේ පුත්‍රයා
එලිෂාමාය. **27** එලිෂාමාගේ පුත්‍රයා
නූන්ය.[7] නූන්ගේ පුත්‍රයා යෙහොෂු-
වාය.[8]

**28** ඔවුන්ට උරුම වූ දේශයට හා
ඔවුන් වාසය කළ ස්ථානවලට බෙ-
තෙල්[9] හා ඒ අවට පිහිටි කුඩා නුවර-
වල්ද නැඟෙනහිර දෙසින් නයරාන්
නුවරද[10] බටහිර දෙසින් ගෙෂෙර්[11]
හා ඒ අවට පිහිටි කුඩා නුවරවල්ද
ෂීකෙම්[12] හා ඒ අවට පිහිටි කුඩා නුව-
රවල සිට ගාසා හා ඒ අවට පිහිටි නුව-

**1ලේක 7:23*** තේරුම, "විපත්ති සමඟ." **25*** රෙෆා හා රෙෂෙප්, බෙරීයාගේ පුත්‍රයන් විය හැකියි.

**7 පරි.**
1 1සාමු 5:8; 1සාමු 7:14; 1සාමු 17:4
2 උත් 37:34
3 ගීතා 128:3
4 1ලේක 4:10
5 යොෂු 16:5; 2ලේක 8:5
6 යොෂු 16:3
7 නික් 33:11; යොෂු 1:1
8 ගණන් 11:28; ගණන් 14:6; ගණන් 32:12; ද්වි 34:9
9 උත් 28:19; යොෂු 16:2
10 යොෂු 16:7
11 යොෂු 16:3
12 යොෂු 17:7

**2 තීරුව**
1 යොෂු 17:11; 1සාමු 31:10
2 විනි 5:19; 1රාජා 4:12
3 විනි 1:27; 1රාජා 9:15; 2රාජා 23:29; සෙක 12:11
4 යොෂු 12:23; 1රාජා 4:11
5 විනි 1:22
6 උත් 49:20; ද්වි 33:24
7 ගණන් 26:44
8 උත් 46:17
9 ගණන් 26:45
10 ද්වි 1:15; 1රාජා 8:1
11 1සාමු 16:18; 2සාමු 23:20
12 නික් 30:14
13 ගණන් 1:41; ගණන් 2:28; ගණන් 26:47

රවල් දක්වා වූ ප්‍රදේශද ඇතුළත් විය.
**29** මනස්සේගේ පුත්‍රයන්ට හිමි ප්‍රදේ-
ශයේ සීමාව ළඟ තිබූ බෙත්-ෂෙයාන්[1]
හා ඒ අවට පිහිටි කුඩා නුවරවල්ද
තයනක්[2] හා ඒ අවට පිහිටි කුඩා නුව-
රවල්ද මෙගිද්දෝ[3] හා ඒ අවට පිහිටි
කුඩා නුවරවල්ද දෝර්[4] හා ඒ අවට
පිහිටි කුඩා නුවරවල්ද ඔවුන්ට හිමි
විය. ඊශ්‍රායෙල්ගේ පුත්‍රයා වූ යෝසෙප්-
ගේ පුත්‍රයන්[5] වාසය කළේ මෙම ප්‍රදේ-
ශවලය.

**30** ආෂෙර්ගේ පුත්‍රයන්[6] නම් ඉම්-
නාහ්,[7] ඉෂ්වා, ඉෂ්වී[8] සහ බෙරීයාය.[9]
ඔවුන්ගේ සහෝදරියගේ නම සෙරාය.
**31** බෙරීයාගේ පුත්‍රයන් නම් හෙ-
බෙර් සහ මල්කියෙල්ය. මල්කියෙල්
බිර්සායිත්ගේ පියාය. **32** හෙබෙර්-
ගේ දරුවන් නම් යෆ්ලෙත්, ෂෝමෙර්*
සහ හෝතාම්ය. ඔවුන්ගේ සහෝදරිය
ෂුවාය. **33** යෆ්ලෙත්ගේ පුත්‍රයන්
නම් පාසක්, බිම්හාල් සහ අෂ්වාත්ය.
**34** ෂෙමෙර්ගේ පුත්‍රයන් නම් ආහි,
රෝගාහ්, යෙහුබ්බා සහ ආරම්ය.
**35** ඔහුගේ සහෝදර වූ හේලෙම්ගේ
පුත්‍රයන් නම් ෂෝපා, ඉම්නා, ෂේලෙෂ්
සහ අමාල්ය. **36** ෂෝපාගේ පුත්‍ර-
යෝ සුවා, හර්නෙපෙර්, ෂුවාල්, බේරී
සහ ඉම්රාහ්ද **37** බෙෂෙර්, හෝඩ්,
ෂම්මා, ෂිල්ෂාහ්, ඉත්රාන් සහ බෙයේ-
රාද වූහ. **38** යෙතෙර්ගේ පුත්‍රයන්
නම් යෙෆුන්නෙ, පිස්පා සහ ආරාය.
**39** උල්ලාගේ පුත්‍රයන් නම් ආරාහ්,
හන්නියෙල් සහ රිෂීයාය. **40** ඔවුහු
සියල්ලෝම ආෂෙර්ගේ පුත්‍රයෝය.
ඔවුහු තම පෙළපතේ ප්‍රධානියෝය.[10]
ඔවුහු සෙනඟ අතරින් තෝරාගත්,
එඩිතර,[11] බලසම්පන්න අය වූහ.
ඔවුහු අධිපතීන් ලෙස කටයුතු කළ
අයගේ ප්‍රධානියෝය. පෙළපත් වාර්-
තාවල[12] ඔවුන් ලැයිස්තුගත කර
තිබුණේ යුද්ධයට සැරසී සිටි සෙබ-
ළුන් ලෙසය. ඔවුන් ගණනින් විසිහය-
දහසකි.[13]

**1ලේක 7:32*** 34වන පදයෙහි සඳහන් වන්නේ, "ෂෙමෙර්" ලෙසයි.

**8** බෙන්ජමින්ගේ[1] කුලුඳුල් පුත්‍රයා
බෙලාය.[2] ඔහුගේ දෙවෙනියා
අෂ්බෙල්ය.[3] තුන්වෙනියා අහරාය.[4]
**2** හතරවෙනියා නෝහාය.[5] පස්වෙ-
නියා රාෆාය. **3** බෙලාගේ පුත්‍රයන්
නම් අද්දාර්, ගෙරා,[6] අබිහුද්, **4** අබි-
ෂුවා, නාමන්, අහෝවා, **5** ගෙරා,
ෂෙපූපාන්[7] සහ හූරාම්ය.[8] **6** ඒහුද්-
ටද පුත්‍රයෝ සිටියෝය. ඔවුහු ගෙ-
බාහි[9] වාසය කළ ඔවුන්ගේ
මුතුන්මිත්තන්ගේ පෙළපතට අයත්
අයගේ ප්‍රධානීන් ලෙස කටයුතු
කළෝය. කල් යත්ම ඔවුන්ව මන-
හාත් දේශයට වහලුන් ලෙස ගෙන
යන ලදි. **7** ඔවුන්ව එලෙස වහලුන්
ලෙස රැගෙන ගියේ නාමන්, අහියා
සහ ගෙරා යන අයයි. ඒ අවස්ථා-
වේදී ගෙරා පෙරමුණ ගෙන කට-
යුතු කළේය. ගෙරාට උස්සා සහ
අහිහුද් යන නමින් පුත්‍රයෝ දෙ-
දෙනෙක්ද සිටියෝය. **8** ෂහරයිම්,
මෝවබ් තණබිමෙහි වාසය කළ
කාලයේදී ඔහුට දාව දරුවෝ උපන්-
නෝය.[10] ඒ වන විට ඔහු මෝවබ්හි
සෙනඟ එතැනින් පිටත් කර යවා
තිබිණ. ඔහුගේ භාර්යාවන් නම් හුෂිම්
සහ බයරාය. **9** ඔහුට දාව ඔහු-
ගේ තවත් භාර්යාවක් වූ හෝඩෙෂ්ට
යෝබාබ්, ශිබ්යා, මේෂා, මල්කාම්,
**10** යෙවුෂ්, සකියා සහ මිර්මා උපන්-
නෝය. ඔවුහුද ඔවුන්ගේ පෙළපතේ
ප්‍රධානියෝය.

**11** ෂහරයිම්ට දාව හුෂිම්ට අබිතුබ්
හා එල්පයල් උපන්නෝය. **12** එල්-
පයල්ගේ පුත්‍රයන් නම් ඒබර්,
මිෂාම් සහ ෂෙමෙඩ්ය. ඕනෝ[11] හා
ලොද්[12] යන නුවරවල්ද ඒ අවට පිහිටි
නුවරවල්ද ගොඩනැඟුවේ ෂෙමෙඩ්ය.
**13** බෙරීයා සහ ෂෙමාද එල්පයල්ගේ
පුත්‍රයෝය. ඔවුන්ගේ මුතුන්මිත්තන්-
ගේ පෙළපතට අයත් ආයා-
ලොන්හි[13] වැසියන්ගේ ප්‍රධානීන් ලෙස
කටයුතු කළේ ඔවුන්ය. ගාත්හි වාසය
කළ අයව පන්නා දැමුවේද ඔවුන්ය.
**14** ඔවුන් අතරේ අහියෝ, ෂාෂක් හා
යෙරෙමොත්ද **15** සෙබදියා, ආරද්
හා ඒදෙර්ද, **16** බෙරීයාගේ පුත්‍රයන්
වූ[1] මිකායෙල්, ඉෂ්පා හා යෝහාද
**17** සෙබදියා, මෙෂල්ලම්, හිෂ්කී හා
හෙබෙර්ද **18** එල්පයල්ගේ පුත්‍රයන්
වූ ඉෂ්මෙරයි, ඉෂ්ලියා හා යෝ-
බාබ්ද **19** යාකීම්, ශික්රී හා සබ්-
දීද **20** එලියේනයි, ශිල්ලෙතයි හා
එලියෙල්ද **21** ශිමෙයිගේ පුත්‍රයන්
වූ[2] අදායා, බෙරායා හා ශිම්-
රාත්ද **22** ඉෂ්පාන්, ඒබර් හා එලි-
යෙල්ද **23** අබ්දොන්, ශික්රී හා
හානාන්ද **24** හනනියා, ඒලාම් හා
අන්තොතියාද **25** ෂාෂක්ගේ පුත්‍ර-
යන් වූ ඉප්දෙයා හා පෙනුයෙල්ද
**26** ෂම්ෂෙරයි, ෂෙහරියා හා අත-
ලියාද **27** යෙරොහාම්ගේ පුත්‍රයන්
වූ යයරෙෂියා, එලියා හා ශික්රීද
සිටියෝය. **28** පෙළපත් වාර්තාවල
සඳහන් ආකාරයට ඔවුහු තම පෙ-
ළපතේ ප්‍රධානීන් ලෙස කටයුතු
කළෝය. ඔවුන් වාසය කළේ යෙරුස-
ලමෙහිය.[3]

**29** ගිබියොන්වරුන්ගේ පියා වන
යෙයීයෙල් වාසයේ කළේ ගිබියොන්
නුවරේය.[4] ඔහුගේ බිරිඳගේ නම මය-
කාය.[5] **30** ඔහුගේ කුලුඳුල් පුත්‍රයා
අබ්දොන්ය. මීට අමතරව ෂූර්, කිෂ්,
බාල් නාදාබ්,[6] **31** ගෙදොර්, අහි-
යෝ සහ සෙකෙර්[7] යන නම්වලින්ද
ඔහුට පුත්‍රයෝ සිටියෝය. **32** මික්-
ලොත්ගේ පුත්‍රයා ශිමෙයාහ්ය.[8] ශිමෙ-
යාහ් සහ ඔහුගේ පවුලේ අය තම
සහෝදරයන් අසලම එනම්, යෙරු-
සලමෙහි වාසය කළෝය. තවත්
සහෝදරයෝ පිරිසක්ද ඔවුන් සමඟ
වාසය කළෝය.

**33** නේර්ගේ[9] පුත්‍රයා කිෂ්ය.[10] කිෂ්-
ගේ පුත්‍රයා සාවුල්ය.[11] සාවුල්ගේ
පුත්‍රයන් නම් යොනාතාන්,[12] මල්කී-
ෂුවා,[13] අබිනාදාබ්,[14] එෂ්බාල්ය.[15]
**34** යොනාතාන්ගේ පුත්‍රයා මෙරිබ්-
බාල්ය.[16] මෙරිබ්-බාල්ගේ පුත්‍රයා
මීකාය.[17] **35** මීකාගේ පුත්‍රයන් නම්
පීතොන්, මෙලෙක්, තාරෙයා[18] සහ
ආහස්ය. **36** ආහස්ගේ පුත්‍රයා යෙ-
හෝයද්දාය. යෙහෝයද්දාගේ පුත්‍රයන්

**8 පරි.**
1 උත් 35:18, උත් 43:14, උත් 49:27
2 1ලේක 7:6
3 උත් 46:21
4 ගණන් 26:38
5 ගණන් 26:39
6 උත් 46:21
7 1ලේක 7:12
8 ගණන් 26:39
9 යොෂු 21:17, 1සාමු 13:16, 1ලේක 6:60
10 රූත් 1:1
11 එස්රා 2:33, නෙහෙ 6:2
12 නෙහෙ 11:35, ක්‍රියා 9:32
13 යොෂු 19:42, යොෂු 21:24

**2 තීරුව**
1 1ලේක 8:13
2 1ලේක 8:13
3 යොෂු 18:28, 1රාජා 2:36, නෙහෙ 11:4
4 යොෂු 9:17, යොෂු 21:17, 1ලේක 21:29
5 1ලේක 9:35
6 1ලේක 9:36
7 1ලේක 9:37
8 1ලේක 9:38
9 1සාමු 14:50
10 1සාමු 9:1, ක්‍රියා 13:21
11 1සාමු 9:2, 1සාමු 10:11, 1සාමු 11:15, 1සාමු 14:47, 1සාමු 15:23
12 1සාමු 14:45, 1සාමු 18:1, 2සාමු 1:23
13 1සාමු 14:49
14 1සාමු 31:2, 1ලේක 9:39
15 2සාමු 2:8, 2සාමු 4:12
16 2සාමු 4:4, 2සාමු 9:6, 2සාමු 19:24
17 2සාමු 9:12
18 1ලේක 9:41

නම් අලෙමෙත්, අෂ්මාවෙත් සහ
සිම්රීය. සිම්රීගේ පුත්‍රයා මෝෂාය.
**37** මෝෂාගේ පුත්‍රයා බිනෙයාය.
බිනෙයාගේ පුත්‍රයා රාෆාහ්ය.[1] රාෆාහ්-
ගේ පුත්‍රයා එලෙයාසාය. එලෙයාසා-
ගේ පුත්‍රයා ආෂෙල්ය. **38** ආෂෙල්ට
පුත්‍රයෝ හයදෙනෙක් සිටියෝය.
ඔවුන් නම් අෂ්‍රිකාම්, බොකෙරු, ඉෂ්-
මායෙල්, ෂෙයරියා, ඔබදියා සහ
හානාන්ය. ඔවුහු සියල්ලෝ ආෂෙල්-
ගේ පුත්‍රයෝය. **39** ඔහුගේ සහෝ-
දර වූ එෂෙක්ටද පුත්‍රයෝ සිටියෝය.
එෂෙක්ගේ කුලුඳුලා ඌලාම්ය.
දෙවෙනියා යෙවුෂ්ය. තුන්වෙ-
නියා එලිෆෙලෙත්ය. **40** ඌලාම්-
ගේ පුත්‍රයෝ එඩිතර,[2] බලසම්පන්න,
දුනු ශිල්පයට සමත් පුරුෂයෝ
වූහ.[3] ඔවුන්ට පුත්‍රයෝ හා මුනුපුරෝ
බොහෝදෙනෙක් සිටියෝය.[4] ඔවුන්-
ගේ ගණන එකසිය පනස්දෙනෙක්ය.
ඔවුහු සියල්ලෝම බෙන්ජමින්ගෙන්
පැවතෙන්නෝය.

**9** ඊශ්‍රායෙල්වරුන් අයත් සියලුම
පෙළපත් ගැන වාර්තා කරන
ලදි.[5] එම තොරතුරු ඊශ්‍රායෙල්හි රජ-
වරුන්ගේ ඉතිහාසය වාර්තා කර
ඇති ලියවිල්ලෙහි සඳහන් කර තිබේ.
යූදා වැසියන් දෙවිට ද්‍රෝහි වූ නිසා
ඔවුන්ව වහලුන් ලෙස[6] බැබිලෝනි-
යට ගෙන යන ලදි. **2** කල් යත්ම
ඔවුහු තමන්ට උරුම දේශයට ආපසු
පැමිණ එහි නුවරවල පදිංචි වූහ.
මුලින්ම පැමිණි අය අතර සිටියේ
සාමාන්‍ය ඊශ්‍රායෙල් වැසියන්,[7] පූජක-
යන්,[8] ලෙවීවරුන්[9] හා නෙතිනිම්-
වරුන්ය.[10] **3** යූදා ගෝත්‍රයෙන්ද[11]
බෙන්ජමින් ගෝත්‍රයෙන්ද[12] එෆ්‍රායිම්
සහ මනස්සේ ගෝත්‍රවලින්ද කොට-
සක් යෙරුසලමෙහි[13] වාසය කළෝය.
පහත සඳහන් වන්නේ ඔවුන් ගැනය.
**4** යූදා ගෝත්‍රයට අයත් ඌතයි ඔවුන්
අතර සිටියේය. ඌතයි අමිහුද්ගේ
පුත්‍රයාය. අමිහුද් ඔම්රීගේ පුත්‍රයාය.
ඔම්රී ඉම්රිගේ පුත්‍රයාය. ඉම්රි බානි-
ගේ පුත්‍රයාය. බානි පේරෙස්ගේ[14] පුත්‍ර-
යාය. පේරෙස් යූදාගේ පුත්‍රයාය.[15]
**5** එමෙන්ම ෂීලෝවරුන්*[1] අතරේ
කුලුඳුලෙක් වූ අසායා හා ඔහුගේ පුත්‍ර-
යෝද **6** සේරාගේ පුත්‍රයන්[2] අතුරින්
යෙවුයෙල් සහ ඔවුන්ගේ සහෝදර-
යෝ හයසිය අනූදෙනාද ඒ අතර
සිටියෝය.

**7** ඒ අය අතර බෙන්ජමින් ගෝත්‍ර-
යට අයත් සල්ලුද සිටියේය. ඔහු
මෙෂල්ලම්ගේ පුත්‍රයාය. මෙෂල්ලම්
හෝදවියාගේ පුත්‍රයාය. හෝදවියා
හස්සෙනුවාගේ පුත්‍රයාය. **8** එම
ගෝත්‍රයටම අයත් යෙරොහාම්ගේ
පුත්‍ර වූ ඉබ්නෙයාද මික්රිගේ පුත් උස්-
සිගේ පුත්‍රයා වූ ඒලාහ්ද ෂෙපටියාගේ
පුත්‍රයා වූ මෙෂල්ලම්ද එහි සිටි-
යෝය. ෂෙපටියා රුවෙල්ගේ පුත්‍ර-
යාය. රුවෙල් ඉබ්නියාගේ පුත්‍රයාය.
**9** එමෙන්ම ඔවුන්ගේ සහෝදරයෝ
නවසිය පනස්හයදෙනාද ඒ අතර
සිටියෝය. ඔවුහු සියල්ලෝම ඔවුන්-
ගේ මුතුන්මිත්තන්ගේ පෙළපතට
අයත් පවුල්වල ප්‍රධානියෝය.

**10** පූජකයන් අතරේ යෙදායා, යෙ-
හෝයාරිබ් සහ යාකින්ද[3] **11** සැබෑ
දෙවිගේ ගෘහයේ අධිපතියෙකු වූ අහි-
තුබ්ගෙන් පැවත ආ හිල්කියාගේ
පුත්‍රයා වූ අෂරියාද[4] සිටියෝය. හිල්-
කියා මෙෂල්ලම්ගේ පුත්‍රයාය. මෙෂල්-
ලම් සාදොක්ගේ පුත්‍රයාය. සාදොක්
මෙරායොත්ගේ පුත්‍රයාය. මෙරායොත්
අහිතුබ්ගේ පුත්‍රයාය. **12** ඔවුන්
අතර අදායා හා මයසයිද සිටියෝය.
අදායාගේ පෙළපත මෙසේය. අදායා
යෙරොහාම්ගේ පුත්‍රයාය. යෙරොහාම්
පෂ්හූර්ගේ පුත්‍රයාය. පෂ්හූර් මල්කි-
යාගේ පුත්‍රයාය. මයසයිගේ පෙළ-
පත මෙසේය. මයසයි අදියෙල්ගේ
පුත්‍රයාය. අදියෙල් යාෂේරාගේ පුත්‍ර-
යාය. යාෂේරා මෙෂල්ලම්ගේ පුත්‍ර-
යාය. මෙෂල්ලම් මෙෂිල්ලෙමිත්ගේ[5]
පුත්‍රයාය. මෙෂිල්ලෙමිත් ඉම්මේර්-
ගේ පුත්‍රයාය. **13** ඔවුන්ගේ සහෝද-
රයෝද ඒ අය අතර සිටියෝය.

**8 පරි.**
1 1ලේක 9:43
2 1සාමු 16:18; 2සාමු 23:20
3 1ලේක 12:2
4 ගීතා 127:3; ගීතා 128:3; ගීතා 128:6

**9 පරි.**
5 1ලේක 7:9; 1ලේක 7:40; එස්රා 2:59
6 ලෙවී 26:33; යෙරෙ 39:9
7 එස්රා 2:70
8 නෙහෙ 7:73
9 නෙහෙ 11:3
10 යොෂු 9:27; එස්රා 2:43; එස්රා 8:20; නෙහෙ 3:26
11 නෙහෙ 11:4
12 නෙහෙ 11:7
13 නෙහෙ 11:1; එස 37:22; හොෂෙ 1:11
14 1ලේක 2:5; නෙහෙ 11:4
15 උත් 46:12; 1ලේක 2:4

**2 තීරුව**
1 නෙහෙ 11:5
2 1ලේක 2:4; 1ලේක 2:6
3 නෙහෙ 11:10
4 නෙහෙ 11:11
5 නෙහෙ 11:13

---

**1ලේක 9:5*** මොවුන් ෂීලෝ නුවරෙහි වැසියන් නොවේ. යූදාගේ තුන්වෙනි පුත්‍රයා වන ෂේලාගෙන් පැවතෙන්නන්ය.

ඔවුන්ගේ ගණන එක්දහස් හත්සිය
හැටකි. ඔවුහු ඔවුන්ගේ පෙළපතේ
ප්‍රධානියෝය. ඔවුහු සැබෑ දෙවිගේ
ගෘහයෙහි සේවය කිරීමට සුදුසුකම්
ඇති බලසම්පන්න පුරුෂයෝය.[1]
14 ලෙවීවරුන් අතුරින් මෙරාරී-
ගේ පුත්‍රයන්ගෙන් පැවත ආ
ෂෙමායාද ඔවුන් අතර සිටියේය. ෂෙ-
මායාගේ පියා හෂ්ෂුබ්ය. හෂ්ෂුබ්ගේ
පියා අෂ්‍රිකාම්ය. අෂ්‍රිකාම්ගේ පියා
හෂබියාය.[2] 15 එමෙන්ම බක්බක්-
කර්, හෙරෙෂ්, ගාලාල් හා මත්-
තනියාද[3] ඔවුන් අතර සිටියෝය.
මත්තනියාගේ පියා මීකාය.[4] මීකා-
ගේ පියා ෂික්රීය.[5] ෂික්රීගේ පියා
ආසාෆ්ය.[6] 16 ඔබදියාද එල්කානා-
ගේ පුත් ආසාගේ පුත්‍රයා වූ බෙරෙ-
කියාද එහි සිටියෝය. ඔබදියාගේ
පියා ෂෙමායාය.[7] ෂෙමායාගේ පියා
ගාලාල්ය. ගාලාල්ගේ පියා යෙදූ-
තූන්ය.[8] බෙරෙකියා වාසය කළේ
නෙටොෆාතියවරුන්[9] පදිංචි වී සිටි
ස්ථානවලය.

17 දොරටු පාලකයන්[10] ලෙස
කටයුතු කළේ ෂල්ලුම්,[11] අක්-
කුබ්, ටල්මොන් සහ අහිමාන් යන
අයයි. ඔවුන්ගේ සහෝදර වූ ෂල්ලුම්
ඔවුන්ගේ ප්‍රධානියා විය. 18 ඔහු
සේවය කළේ නැඟෙනහිර දෙසින්
පිහිටි රජුගේ දොරටුවෙහිය.[12] ලෙ-
වීවරුන් පදිංචි වී සිටි ස්ථානවල
දොරටු පාලකයන් ලෙස කටයුතු
කළේ ඔවුන්ය.[13] 19 කෝරාගේ[14]
පුත්[15] එබියාසාෆ්ගේ[16] පුත්‍රයා වූ කෝ-
රෙගේ පුත් ෂල්ලුම්ද කෝරාගෙන්
පැවත ආ පවුල්වලට අයත්[17] ඔහු-
ගේ සහෝදරයෝද ශුද්ධ කූඩාරමේ
දොරටු පාලකයන්[18] ලෙස සේවය
කළෝය. එමෙන්ම එම කාර්යය
අධීක්ෂණය කිරීමේ වගකීමද පැවරී
තිබුණේ ඔවුන්ටය. අතීතයේදී යෙ-
හෝවා දෙවිගේ ශුද්ධ කූඩාරමට
ඇතුල් වන ස්ථාන මුර කළ ඔවුන්ගේ
පියවරුන් මෙන් ඔවුහුද එම කාර්-
යය ඉටු කළෝය. 20 අතීතයේදී
ඔවුන්ව අධීක්ෂණය කළේ එලියාසර්-

**9 පරි.**
1 නික් 18:21
1ලේක 26:6
1ලේක 26:30
2 1ලේක 6:45
නෙහෙ 11:15
3 නෙහෙ 13:13
4 නෙහෙ 11:22
5 1ලේක 25:2
6 නෙහෙ 11:17
නෙහෙ 12:35
7 නෙහෙ 11:17
8 1ලේක 25:3
9 1ලේක 2:54
නෙහෙ 12:28
10 නෙහෙ 11:19
11 එස්රා 2:42
12 නෙහෙ 3:29
13 1ලේක 26:12
14 ගණන් 26:9
15 ගණන් 26:11
ගීතා 42:පෙර
ගීතා 44:පෙර
ගීතා 49:පෙර
16 1ලේක 6:23
17 1ලේක 6:37
18 ගීතා 84:10

**2 තීරුව**
1 නික් 6:25
ලෙවී 10:6
ගණන් 3:32
යොෂු 14:1
2 ගණන් 25:11
යොෂු 22:30
විනි 20:28
ගීතා 106:30
3 ගණන් 25:13
ක්‍රියා 7:9
4 1ලේක 26:14
5 නෙහෙ 12:28
නෙහෙ 12:29
6 1ලේක 9:1
7 නික් 18:21
8 1සාමු 9:9
9 1ලේක 25:1
10 1ලේක 23:32
2ලේක 23:19
නෙහෙ 12:45
11 1ලේක 26:17
12 1ලේක 26:16
13 1ලේක 26:14
14 1ලේක 26:15
15 2ලේක 23:8
16 1ලේක 23:28
1ලේක 28:12
17 1ලේක 26:20
2ලේක 31:12
18 1ලේක 23:32
19 1සාමු 3:15
මලා 1:10
20 ගණන් 1:50
ගණන් 3:36

ගේ[1] පුත් පිනෙහාස්ය.[2] යෙහෝවා
දෙවිගේ උපකාරය ඔහුට ලැබිණ.[3]
21 සම්මුඛ වීමේ කූඩාරමට ඇතුල්
වන ස්ථානයේ දොරටු පාලකයා
ලෙස කටයුතු කළේ මෙෂෙලෙමියා-
ගේ පුත් සෙකරියාය.[4]

22 දොරටු පාලකයන් ලෙස සේ-
වය කිරීමට තෝරාගත් අයගේ මුළු
සංඛ්‍යාව දෙසීය දොළහකි. ඔවුන්
පදිංචි වූ ස්ථාන[5] තීරණය වූයේ ඔවුන්-
ගේ පෙළපත් ලියාපදිංචි කර තිබූ
ආකාරයට අනුවය.[6] මෙම බාරදූර
තනතුරුවලට ඔවුන්ව පත් කරන
ලද්දේ[7] දිවැස්වරයා වූ සාමුවෙල්[8]
සහ දාවිත් රජ[9] විසින්ය. 23 සම්මුඛ
වීමේ කූඩාරම පැවති කාලයේදී හා
යෙහෝවා දෙවිගේ ගෘහය ගොඩනඟා
තිබූ කාලයේදී ඔවුන්වත් ඔවුන්ගේ
පුත්‍රයන්වත් එම කාර්යය සඳහා යො-
දවනු ලැබීය.[10] 24 මෙසේ ඔවුන්ව
යොදවා තිබුණේ නැඟෙනහිර,[11] බස්-
නාහිර,[12] උතුරු[13] හා දකුණු[14]
දිශාවල පිහිටි ඇතුල් වන ස්ථාන
මුර කිරීමටය. 25 ගම්වල ජීවත් වූ
ඔවුන්ගේ සහෝදරයෝ කලින් කලට
පැමිණ දින සතක්[15] පුරා ඔවුන් සමඟ
එම සේවයේ හවුල් වූහ. 26 දොරටු
පාලකයන් ලෙස සේවය කිරීමේ බාර-
දූර කටයුත්ත බලාගැනීම සඳහා
ප්‍රධානීන් හතරදෙනෙකුව පත් කර
තිබිණ. ඔවුහු ලෙවීවරුය. භෝජන
ශාලා[16] හා සැබෑ දෙවිගේ ගෘහයේ
වස්තු[17] තිබුණේ ඔවුන්ගේ භාරයේය.
27 ඔවුහු මුළු රාත්‍රිය පුරාම සැබෑ දෙ-
විගේ ගෘහය වටා යමින් එය මුර
කළෝය.[18] සෑම උදෑසනකම දොරටු
විවෘත කිරීම සඳහා ඔවුන්ට එහි යතුර
භාර දී තිබිණ.[19]

28 දෙවිගේ ගෘහයේ විවිධ සේ-
වාවන් ඉටු කිරීම සඳහා භාවිත
කරන භාණ්ඩ බලා කියා ගැනීම-
ටද පිරිසක්ව පත් කර තිබිණ.[20]
මෙම භාණ්ඩ භාවිතය සඳහා දෙන
විටත් ආපසු ඒවා භාර දෙන විටත්
ඔවුහු ඒවා ගණන් කළෝය. 29 එහි
භාවිත කළ වෙනත් භාණ්ඩ හා සියලු

ශුද්ධ භාණ්ඩ[1] බලාගැනීම සඳහාද
සිහින් පිටි,[2] වයින්,[3] තෙල්,[4] කට්ටකු-
මංජල්,[5] බෝල්සම් තෙල්[6] යනාදිය
බලා කියා ගැනීම සඳහාද වග කිව
යුතු පුරුෂයන්ව පත් කර තිබිණ.
**30** එහි භාවිතයට ගත් බෝල්සම්
තෙල් යොදා සෑදූ තෛලය[7] පිළියෙල
කළේ පූජකයන්ගේ පුත්‍රයෝ කිහි-
පදෙනෙකි. **31** තුනී රොටි සෑදීමේ
කාර්යය[8] භාරව සිටියේ කෝරාගේ පෙ-
ළපතින් පැමිණි ලෙවීවරයෙකු වූ ෂල්-
ලුම්ගේ[9] කුලුඳුල් පුත් මත්තිතියාටය.
**32** ඔවුන්ගේ සහෝදරයන් වූ කෝ-
හාත්ගේ පුත්‍රයන්ගෙන් සමහරෙකුට
සෑම සබත් දවසකදීම[10] දෙවි ඉදිරියේ
තබන රොටි පිළියෙල කිරීමේ කාර්යය
භාර දෙන ලදි.[11]
**33** ලෙවීවරුන් අතුරින් ඇතමුන්ව
ගායකයන් ලෙස පත් කර තිබිණ.[12]
ඔවුහු ඔවුන්ගේ පෙළපතට අයත්
පවුල්වල ප්‍රධානියෝය. ඔවුන් රෑදී
සිටියේ භෝජන ශාලාවලය.[13] දිවා
රෑ දෙකෙහිම ඔවුන් එම සේවයෙහි
නියැළී සිටි නිසා[14] ඔවුන්ට වෙ-
නත් වගකීම් පැවරී තිබුණේ නැත.[15]
**34** පෙළපත් වාර්තාවල සඳහන්
වී ඇති ආකාරයට ලෙවීවරුන්ගේ
මුතුන්මිත්තන්ගේ පවුල්වල ප්‍රධා-
නීන්ගේ විස්තර මතු දැක්වේ. ඔවුන්
වාසය කළේ යෙරුසලමෙහිය.[16]
**35** ගිබියොන්වරුන්ගේ පියා වූ
යෙයීයෙල් වාසය කළේ ගිබි-
යොන් නුවරෙහිය.[17] ඔහුගේ බිරිඳගේ
නම මයකාය. **36** ඔහුගේ කුලුඳුල්
පුත්‍රයා අබ්දොන්ය. ඔහුට ෂූර්,
කිෂ්, බාල්, නේර්, නාදාබ්, **37** ගෙ-
දොර්, අහියෝ, සෙකරියා,[18] මික්-
ලොත් යන නම්වලින්ද පුත්‍රයෝ
සිටියෝය. **38** මික්ලොත්ගේ පුත්‍රයා
ෂිමෙයාම්ය. ෂිමෙයාම් සහ ඔහුගේ
පවුලේ අය ඔවුන්ගේ සහෝදරයන්
අසලම එනම්, යෙරුසලමෙහි වාසය
කළෝය. තවත් සහෝදරයෝ පිරි-
සක්ද ඔවුන් සමඟ වාසය කළෝය.
**39** නේර්ගේ[19] පුත්‍රයා කිෂ්ය.[20] කිෂ්ගේ
පුත්‍රයා සාවුල්ය.[21] සාවුල්ගේ පුත්‍රයන්

**9 පරි.**
1 1රාජා 8:4; 1ලේක 22:19
2 ලෙවී 2:1; 1ලේක 23:29
3 ලෙවී 23:13
4 නික් 27:20; ගණන් 18:12
5 ලෙවී 2:2; නෙහෙ 13:5
6 නික් 25:6
7 නික් 30:25
8 ලෙවී 2:5; ලෙවී 2:7; ලෙවී 6:21
9 යෙරෙ 35:4
10 නික් 25:30; ලෙවී 24:8; 1සාමු 21:6
11 ලෙවී 24:6; 2ලේක 2:4; 2ලේක 13:11
12 1ලේක 6:31
13 1ලේක 9:26
14 ගීතා 84:4
15 නෙහෙ 11:22
16 නෙහෙ 11:1
17 යොෂු 21:17
18 1ලේක 8:31
19 1සාමු 14:50
20 ක්‍රියා 13:21
21 1සාමු 9:2; 1සාමු 10:11; 1සාමු 11:15; 1සාමු 14:47; 1සාමු 15:23

**2 තීරුව**
1 1සාමු 14:45; 1සාමු 18:1; 2සාමු 1:23
2 1සාමු 14:49; 1ලේක 8:33
3 1සාමු 31:2
4 2සාමු 2:8; 2සාමු 4:12
5 2සාමු 4:4; 2සාමු 9:6; 2සාමු 19:24
6 2සාමු 9:12
7 1ලේක 8:35
8 1ලේක 8:37
9 1ලේක 8:37

**10 පරි.**
10 1සාමු 31:1
11 ලෙවී 26:17; ද්වි 32:30; 2සාමු 1:21
12 1සාමු 31:2
13 2සාමු 1:25
14 1ලේක 8:33
15 1ලේක 9:39
16 1සාමු 26:10; 1සාමු 31:3
17 1සාමු 31:4
18 විනි 15:18; 2සාමු 1:20

නම් යොනාතාන්,[1] මල්කී-ෂූවා,[2] අබි-
නාදාබ්[3] සහ එෂ්බාල්ය.[4] **40** යො-
නාතාන්ගේ පුත්‍රයා මෙරිබ්-බාල්ය.[5]
මෙරිබ්-බාල්ගේ පුත්‍රයා මීකාය.[6]
**41** මීකාගේ පුත්‍රයන් නම් පීතෝන්,
මෙලෙක්, තාහ්රෙයා සහ ආහස්ය.[7]
**42** ආහස්ගේ පුත්‍රයා යාරාය. යාරාගේ
පුත්‍රයන් නම් අලෙමෙත්, අශ්මාවෙත්
සහ සිම්රීය. සිම්රීගේ පුත්‍රයා මෝෂාය.
**43** මෝෂාගේ පුත්‍රයන් නම් බිනෙයා
සහ රෙෆායාය.[8] රෙෆායාගේ පුත්‍රයා
එලෙයාසාය. එලෙයාසාගේ පුත්‍රයා
ආෂෙල්ය. **44** ආෂෙල්ට[9] පුත්‍රයෝ
හයදෙනෙක් සිටියෝය. ඔවුන් නම්
අශ්‍රිකාම්, බොකෙරු, ඉෂ්මායෙල්, ෂෙ-
යරියා, ඔබදියා සහ හානාන්ය.

**10** පිලිස්තිවරුන්[10] හා ඊශ්‍රා-
යෙල්වරුන් අතර යුද්ධයක්
හටගත්තේය. එයින් පරාජයට පත් වූ
ඊශ්‍රායෙල්වරුන් පිලිස්තිවරුන් වෙ-
තින් පලා ගිය අතර ඔවුන්ගෙන්
බොහෝදෙනෙක් ගිල්බෝවා කන්-
දේදී පිලිස්තිවරුන් අතින් මැරුම්
කෑවෝය.[11] **2** සාවුල් රජු සහ ඔහු-
ගේ පුත්‍රයන්ව ලුහුබැඳ ගිය පිලිස්-
තිවරු ඔවුන් ආසන්නයටම
පැමිණියෝය. ඔවුහු සාවුල් රජුගේ
පුත්‍රයන් වූ[12] යොනාතාන්වත්,[13] අබි-
නාදාබ්වත්,[14] මල්කී-ෂූවාවත්[15] මරා
දැමුවෝය. **3** සාවුල් රජුට විරුද්ධව
එල්ල කළ ප්‍රහාර එන්න එන්නම
දරුණු අතට හැරිණ. අන්තිමේදී දුනු
භේවායන්ගේ ඉලක්කයට ගොදුරු
වූ ඔහු තුවාල ලැබුවේය.[16] **4** එවිට
සාවුල් රජ තම ආයුධ රැගෙන ගිය
තැනැත්තාට කතා කර,[17] “මේ අපවි-
ත්‍රයන්*[18] අතින් මැරුම් කෑම මට
නින්දාවක්.[19] ඒ නිසා ඊට කලින්
ඔබේ කඩුවෙන් මාව මරා දමන්න”[20]
යයි පැවසීය. නමුත් ඔහුගේ ආයුධ
රැගෙන ගිය තැනැත්තා බොහෝ සෙ-
යින් භය වී එසේ කිරීමට අකමැති

**19** විනි 16:21; විනි 16:23; **20** විනි 9:54; 2සාමු 1:9.

1ලේක **10:4*** මූ.අ., “චර්මච්ඡේදනය නොවූ අය.”

විය.[1] එහෙයින් සාවුල් කඩුව ගෙන
තමාටම ඇනගත්තේය.[2] **5** සාවුල්
මිය ගිය බව දුටු ඔහුගේ ආයුධ
රැගෙන ගිය තැනැත්තාද කඩුවෙන්
තමාටම ඇනගෙන මිය ගියේය.[3]
**6** එසේ සාවුල් රජද ඔහුගේ පුත්‍රයන්
තිදෙනාද[4] ඔහු සමඟ සිටි අන් සියලු-
දෙනාද එම යුද්ධයේදී මිය ගියෝය.
**7** ඊශ්‍රායෙල් සෙබළුන් පලා ගිය බවත්
සාවුල් රජු සහ ඔහුගේ පුත්‍රයන්
මිය ගිය බවත් තැනිතලාවේ පදිංචිව
සිටි ඊශ්‍රායෙල්වරුන්ට ආරංචි වූ විට
ඔවුහුද තම ගම්බිම් අත්හැර පලා
ගියෝය.[5] පසුව පිලිස්තිවරු ඒ නුවර-
වලට ගොස් පදිංචි වූහ.

**8** මිය ගිය අයගේ වටිනා දේවල්
පැහැරගන්නා පිණිස[6] ගිල්බෝවා
කන්දට[7] පැමිණි පිලිස්තිවරු, සාවුල්
රජුගේ සහ ඔහුගේ පුත්‍රයන්ගේ මළ
සිරුරු එහි තිබෙනවා දුටුවෝය.
**9** එවිට ඔවුහු සාවුල් රජුගේ හිස
කපා[8] ඔහුගේ ආයුධ ගලවා දැමු-
වෝය. ඉන්පසු ඔවුහු පිලිස්තිවරුන්-
ගේ දේශය පුරා තිබූ දේවාලවලට[9] හා
සෙනඟට ඒ ගැන දැනුම් දුන්නෝය.[10]
**10** පසුව ඔවුහු සාවුල් රජුගේ ආයුධ
ඔවුන්ගේ එක් දේවාලයක තබා[11]
ඔහුගේ හිස දාගොන්ගේ දේවාලයේ[12]
එල්ලා තැබුවෝය.

**11** පිලිස්තිවරුන් සාවුල් රජුට
කළ දේ[13] යාබේෂ්-ගිලියද්හි[14] වැසි-
යන්ට ආරංචි විය. **12** එවිට ඒ නුව-
රේ සිටි නිර්භීත මිනිස්සු සාවුල්
රජුගේද ඔහුගේ පුත්‍රයන්ගේද මළ
සිරුරු යාබේෂ් නුවරට ගෙනාවෝය.
ඔවුහු ඔවුන්ගේ ඇටකටු යාබේෂ්හි[15]
විශාල ගස යට[16] වළලා දවස් සතක්
පුරා නිරාහාරව[17] සිටියෝය.

**13** සාවුල් රජු එලෙස මිය ගියේ
ඔහු යෙහෝවා දෙවිට ද්‍රෝහී වී[18] ක්‍රියා
කළ නිසාය. එමෙන්ම ඔහු යෙ-
හෝවා දෙවි අණ කළ දේට අකී-
කරු වී මායාකාරියකගෙන්[19] උපකාර
පැතීය. **14** ඔහු යෙහෝවා දෙවිගේ
මඟ පෙන්වීම් පැතුවේ නැත.[20] එහෙ-
යින් දෙවි ඔහුව මරණයට පත් කර

**10 පරි.**
**1** 1සාමු 31:4
**2** නික් 20:13
1ලේක 10:13
මතෙ 27:5
**3** 1සාමු 31:5
**4** 1සාමු 12:25
හොෂෙ 13:11
**5** ද්වි 28:25
1සාමු 13:6
1සාමු 31:7
**6** 1සාමු 31:8
**7** 1සාමු 28:4
**8** 1සාමු 31:9
**9** විනි 16:24
දානි 5:23
**10** 2සාමු 1:20
**11** 1සාමු 31:10
**12** විනි 16:23
1සාමු 5:2
**13** 1සාමු 31:9
**14** විනි 21:8
1සාමු 11:1
1සාමු 31:12
**15** 2සාමු 2:5
2සාමු 21:12
**16** උත් 35:8
**17** උත් 50:10
2සාමු 3:35
**18** 1සාමු 13:13
1සාමු 15:23
**19** ලෙවී 19:31
ලෙවී 20:6
1සාමු 28:7
යෙසා 8:19
ක්‍රියා 16:16
**20** 1සාමු 14:19

**2 තීරුව**
**1** රූත් 4:17
1සාමු 13:14
1සාමු 15:28
2සාමු 3:10
2සාමු 5:3

**11 පරි.**
**2** 2සාමු 5:1
1ලේක 12:23
**3** ගණන් 13:22
2සාමු 2:1
2සාමු 5:5
**4** ද්වි 17:15
**5** ගණන් 27:17
1සාමු 18:6
1සාමු 18:13
**6** 2සාමු 7:7
ගීතා 78:71
යොහ 10:11
**7** 1සාමු 25:30
2සාමු 6:21
1ලේක 17:7
**8** 1සාමු 15:28
**9** යෙසා 55:11
**10** 1සාමු 16:13
2සාමු 2:4
2සාමු 5:3
**11** 2සාමු 5:6
**12** යොෂු 15:63
විනි 1:21
විනි 19:10

ඔහුගේ රජකම යෙස්සේගේ පුත්‍රයෙකු
වන දාවිත්ට දුන්නේය.[1]

**11** කල් යත්ම සියලුම ඊශ්‍රා-
යෙල්වරු[2] එකට එකතු වී
හෙබ්‍රොන්හි[3] සිටි දාවිත්ව මුණගැසී
මෙසේ පැවසූහ. "අපි හැමෝම සහෝ-
දරයන්.[4] **2** සැහෙන කාලයක ඉඳන්
ඊශ්‍රායෙල් හමුදාවේ පෙරමුණ ගෙන
කටයුතු කළේ ඔබයි.[5] සාවුල් අපේ
රජ වී සිටිය කාලේ පවා පෙරමුණ
ගත්තේ ඔබයි. ඒ වගේම යෙහෝවා
දෙවි ඔබට මෙසේ පැවසුවා. 'මාගේ
සෙනඟ වන ඊශ්‍රායෙල් ජාතිය රැක-
බලා ගැනීමට[6] මම පත් කරන්නේ
ඔබවයි. මම ඔබව අනිවාර්යයෙන්ම
ඊශ්‍රායෙල්හි නායකයා[7] ලෙස පත්
කරන්නෙමි.' " **3** පසුව ඊශ්‍රායෙල්හි
සියලුම වැඩිමහල්ලෝද දාවිත් වෙ-
තට ආවෝය. දාවිත්, යෙහෝවා
දෙවි ඉදිරියේ ඔවුන් සමඟ ගිවිසු-
මක් ඇති කරගත්තේය. ඉන්පසු යෙ-
හෝවා දෙවි සාමුවෙල් මාර්ගයෙන් දී
තිබුණු[8] මඟ පෙන්වීම්වලට අනුව[9]
ඔවුහු දාවිත්ව මුළු ඊශ්‍රායෙල් දේශයේ
රජු ලෙස අභිෂේක කළෝය.[10]

**4** ඉන්පසු දාවිත් රජ හා මුළු ඊශ්‍රා-
යෙල් සෙනඟ යෙරුසලමට ගියෝය.[11]
එහි යෙබූසිවරුන්[12] වාසය කළ නිසා
කලින් එම නගරය හැඳින්වූයේ යෙ-
බූස[13] යන නමිනි. **5** එවිට යෙබූසි-
වරු, "ඔබට අපේ නුවරට එන්න අවසර
නැහැ"[14] කියා දාවිත්ට පැවසුවෝය.
එහෙත් දාවිත් රජ සියොන්[15] නම් බල-
කොටුව අල්ලාගත්තේය. පසුව එය
දාවිත්ගේ නුවර[16] ලෙස හඳුන්වන
ලදි. **6** දාවිත් රජ තමා සමඟ සිටි
අයව අමතමින්, "මුලින්ම යෙබූසිව-
රුන්ට පහර දෙන තැනැත්තාව[17]
මම ප්‍රධානියෙක් හා අධිපතියෙක්
ලෙස පත් කරනවා" කියා පැව-
සීය. ෂෙරුයියාගේ පුත් යෝවාබ්[18]
මුලින්ම යෙබූසිවරුන්ට පහර දුන්

---

**13** උත් 10:16; උත් 15:21; නික් 3:17; **14** 2සාමු 5:6; **15** 1රාජා 8:1; 2ලේක 5:2; ගීතා 2:6; ගීතා 48:2; **16** 2සාමු 5:9; 2සාමු 6:10; 1රාජා 2:10; **17** යොෂු 15:16; 1සාමු 17:25; **18** 2සාමු 2:18.

නිසා ඔහුව ප්‍රධානියෙකු ලෙස පත්
කරන ලදි. **7** එතැන් සිට දාවිත්
රජු වාසය කළේ ඇතුල් වීමට ඉතා
දුෂ්කර වූ එම නුවරෙහිය.[1] පසුව
එය දාවිත්ගේ නුවර ලෙස හඳුන්-
වනු ලැබීය.[2] **8** දාවිත් රජ නුවරේ
සීමා වටා හා නුවර තුළ බොහෝ
දේවල් ඉදි කළේය. නමුත් නුවරේ
තිබූ ඉතුරු ගොඩනැඟිලි අලුත්වැඩියා
කළේ[3] යෝවාබ් විසින්ය. **9** ස්වර්ග-
යේ සේනාවල අධිපති වන යෙහෝවා
දෙවිගේ උපකාරය දාවිත්ට තිබුණු
නිසා[4] ඔහු තව තවත් බලවත් විය.[5]
**10** දාවිත් රජු යටතේ සේවය
කළ එඩිතර මිනිසුන්ව[6] අධීක්ෂ-
ණය කිරීමට ප්‍රධානීන්ව පත් කර
තිබිණ. දාවිත්ව ඊශ්‍රායෙල් දේශ-
යේම රජු බවට පත් කිරීම සඳහා
ඔවුහු මුළු ඊශ්‍රායෙල් ජාතිය සමඟ
එක්ව දාවිත්ට සහයෝගය දැක්වූහ.
එහි ප්‍රතිඵලයක් ලෙස ඊශ්‍රායෙල් දේ-
ශය ගැන යෙහෝවා දෙවි පවසා
තිබූ දේ[7] ඉටු විය. **11** දාවිත් රජු
යටතේ සේවය කළ එඩිතර මිනිසුන්-
ගේ විස්තර මෙසේය. මුලින්ම සඳ-
හන් වන්නේ ඔවුන් අතරින් එඩිතරම
තුන්දෙනාගේ ප්‍රධානියා වූ හක්මෝ-
නිගෙන් පැවතෙන යෂොබෙයාම්[8]
ගැනය. ඔහු එක් අවස්ථාවකදී ඔහුගේ
හෙල්ලයෙන් තුන්සියදෙනෙකුව මරා
දැමීය.[9] **12** ඊළඟට සඳහන් වන්නේ
අහෝහිගෙන්[10] පැවතෙන දෝදෝගේ
පුත් එලියාසර්[11] ගැනය. ඔහුද එඩි-
තරම තුන්දෙනාගෙන් කෙනෙකි.[12]
**13** පිලිස්තිවරුන් යුද්ධයක් සඳහා
පාස්-දම්මිම්[13] නම් ස්ථානයේ රැස් වූ
විට දාවිත් සමඟ සිටියේ ඔහුය. එම
ස්ථානයේ බාර්ලි වගා කර තිබුණේය.
එහි ජීවත් වූ සෙනඟ පිලිස්තිව-
රුන්ට භය වී එතැනින් පලා ගොස්
තිබිණ.[14] **14** එහෙත් ඔහු එතැනට
ගොස් පිලිස්තිවරුන්ට දිගටම පහර දී
එම ප්‍රදේශය බේරාගත්තේය. ඔහු
ලවා එම ශ්‍රේෂ්ඨ ජයග්‍රහණය[15] අත්
කර දුන්නේ යෙහෝවා දෙවිය.[16]
**15** ප්‍රධානීන් ලෙස කටයුතු කළ
මිනිසුන් තිස්දෙනාගෙන් තුන්දෙ-
නෙක්[1] අදුල්ලාම්හි ගුහාවේ[2]
සැඟවී සිටි දාවිත් ළඟට ගියෝය.
ඒ අවස්ථාවේදී පිලිස්තිවරු රෙෆා-
යිම් තැනිතලාවේ[3] කඳවුරු බැඳ-
ගෙන සිටියෝය. **16** දාවිත් සිටියේ
ඉතා දුෂ්කර ස්ථානයකය.[4] ඒ වන
විට පිලිස්තිවරුන් ඔවුන්ගේ මුර
හමුදාවක්[5] බෙත්ලෙහෙමෙහි රඳවා
තිබිණ. **17** දිනක් මහත් පිපාසය-
කින් සිටි දාවිත් රජ මෙසේ කීවේය.
"බෙත්ලෙහෙමට[6] ඇතුල් වන දොර-
ටුව ළඟ තිබෙන පොකුණෙන් මට
වතුර ටිකක් බොන්න තිබුණා නම්!"[7]
**18** එවිට ඒ තිදෙනා පිලිස්තිවරුන්ගේ
කඳවුරට කඩාවැද බෙත්ලෙහෙමට
ඇතුල් වන දොරටුව අසල තිබූ
පොකුණෙන් වතුර ඇද දාවිත් වෙ-
නට ගෙන ගියෝය.[8] නමුත් දාවිත්
රජ එය බිව්වේ නැත. ඔහු යෙ-
හෝවා දෙවි ඉදිරියේ එය බිමට
වත් කළේය.[9] **19** ඔහු ඒ අවස්-
ථාවේදී මෙසේ කීවේය. "මම දෙ-
විට ගරු කරන කෙනෙක්. ඉතින්
මේ මිනිස්සු ඔවුන්ගේ ජීවිත පරදුවට
තියලා ගෙනාපු මේ වතුර මම කො-
හොම බොන්නද! මම මේ වතුර බිව්-
වොත් ඒක හරියට ඔවුන්ගේ ලේ[10]
බොනවා වගෙයි." එසේ කියා ඔහු ඒ
වතුර නොබීවේය.[11] එඩිතර පුරුෂ-
යන් තිදෙනා කළ වීර ක්‍රියා අතරින්
ඒවා සමහරකි.
**20** යෝවාබ්ගේ[12] සහෝදර වූ අබි-
ෂයි,[13] ඔවුන් අතර සිටි තවත් එඩිතර
තුන්දෙනෙකුගේ ප්‍රධානියා ලෙස කට-
යුතු කළේය. ඔහුද එක අවස්ථාවකදී
ඔහුගේ හෙල්ලයෙන් තුන්සියදෙනෙ-
කුව මරා දැමුවේය. මුලින්ම සඳහන්
කළ තිදෙනා හා සමාන කීර්තියක්
ඔහුටද තිබිණ. **21** ඔහු සමඟ සිටි
අනික් දෙදෙනාට වඩා ඔහු කැපීපෙනු-
ණේය. ඒ නිසා ඔහු ඔවුන්ගේ ප්‍රධා-
නියා ලෙස කටයුතු කළේය. එනමුත්
මුලින්ම සඳහන් කළ තිදෙනා තරම්
ඔහු කැපීපෙනුණේ නැත.[14]
**22** දක්ෂ සටන්කරුවෙකු වූ යෙ-

**11 පරි.**
1 ගීතා 2:6
2 2සාමු 5:7
3 නෙහෙ 4:2
4 1ලේක 9:20 ගීතා 46:7 යෙසා 8:10
5 2සාමු 3:1 2සාමු 5:10
6 2සාමු 23:9
7 1සාමු 16:12
8 2සාමු 23:8 1ලේක 27:2
9 යොෂු 23:10
10 1ලේක 8:4
11 2සාමු 23:9
12 2සාමු 23:10 2සාමු 23:17
13 1සාමු 17:1
14 ද්වි 28:25
15 ගීතා 144:10 හිතෝ 21:31 ලූක් 1:71
16 1සාමු 19:5 2සාමු 23:10 ගීතා 18:50

**2 තීරුව**
1 2සාමු 23:13
2 1සාමු 22:1
3 යොෂු 15:8 යෙසා 17:5
4 1සාමු 23:25
5 1සාමු 10:5 1සාමු 13:4 1සාමු 13:23
6 1සාමු 20:6
7 2සාමු 23:15
8 2සාමු 23:16
9 1සාමු 7:6
10 උත් 9:4 ලෙවී 17:10 ද්වි 12:27 ක්‍රියා 15:29
11 2සාමු 23:17
12 2සාමු 3:30
13 1සාමු 26:6 2සාමු 2:18 2සාමු 18:2 2සාමු 23:18
14 2සාමු 23:19

හෝයාදාගේ[1] පුත්‍රයා වූ බෙනායා,[2]
කබ්ෂෙයෙල් නුවරෙහි[3] බොහෝ වීර
ක්‍රියා කර තිබිණ. ඔහු මෝවබ්හි අරි-
යෙල්ගේ පුත්‍රයන් දෙදෙනාව මරා
දැමුවේය. හිම වැටෙන දවසකදී ඔහු
වළක සිටි සිංහයෙකුවද[4] මැරුවේය.
**23** ඔහු රියන් පහක් උසැති[5] ඊජිප්තු
ජාතික යෝධයෙකුවද මරා දැමුවේය.
ඒ යෝධයාගේ අතේ රෙදි විවීම සඳහා
භාවිත කරන පොල්ලකට සමාන
වූ හෙල්ලයක් තිබිණ.[6] නමුත් ඔහු
පොල්ලක් අතැතිව යෝධයා ළඟ-
ටම ගොස් ඔහුගේ අතින් හෙල්ලය
උදුරාගෙන ඒ හෙල්ලයෙන්ම ඇන
ඔහුව මරා දැමුවේය.[7] **24** යෙහෝ-
යාදාගේ පුත්‍රයා වූ බෙනායා කළ වීර
ක්‍රියා ඒවාය. දෙවෙනියට සඳහන් කළ
එඩිතර පුරුෂයන් තිදෙනා හා සමා-
නව ඔහුත් කීර්ති නාමයක් දිනාගෙන
තිබිණ. **25** ඔහු අනික් තිස්දෙනාට
වඩා කැපීපෙනුණත් මුලින්ම සඳහන්
කළ එඩිතර තිදෙනාගේ තත්වයට
ඔහු කවදාවත් පත් වූයේ නැත.[8]
දාවිත් ඔහුව තම ආරක්ෂක නිලධා-
රියා ලෙස පත් කළේය.[9]

**26** හමුදා බළඇණිවල සිටි එඩි-
තර මිනිසුන් නම්, යෝවබ්ගේ සහෝ-
දර වූ අසහෙල්,[10] බෙත්ලෙහෙම්හි
වැසියෙකු වූ දෝදෝගේ පුත් එල්-
හානාන්,[11] **27** හාරෝර්හි වැසියෙකු
වූ ෂම්මොත්,[12] පෙලොනියවරයෙකු[13]
වූ හෙලෙෂ්, **28** තෙකෝවා නුව-
රෙහි වැසියෙකු වූ ඉක්කෙෂ්ගේ
පුත්‍ර වූ ඊරා,[14] අනාතොත් නුවරෙහි[15]
වැසියෙකු වූ අබී-එෂෙර්, **29** හූෂා-
තිය ජාතික සිබ්බෙකයි,[16] අහෝ-
හිය ජාතික[17] ඉලයි, **30** නෙටෝෆාහි
වැසියෙකු වූ මහරයි,[18] නෙටෝෆාහි[19]
වැසියෙකු වූ බානාහ්ගේ පුත් හේ-
ලෙද්,[20] **31** බෙන්ජමින්[21] ගෝත්‍රයට
අයත් ගිබෙයාහි[22] වැසියෙකු වූ රිබයි-
ගේ[23] පුත්‍රයා වූ ඊතයි, පිරතොන්හි
වැසියෙකු වූ[24] බෙනායා, **32** ගයෂ්[25]
තැනිතලාවේ ජීවත් වූ හූරයි, අර-
බාහි වැසියෙකු වූ අබියෙල්, **33** බහු-
රීම්හි වැසියෙකු වූ[26] අෂ්මාවෙත්,

**11 පරි.**
1 1රාජා 4:4; 1ලේක 27:5
2 2සාමු 23:20; 1ලේක 27:5
3 යොෂු 15:21
4 විනි 14:6; 1සාමු 17:36; 2සාමු 1:23
5 1සාමු 17:4
6 1සාමු 17:7
7 1සාමු 17:51
8 1ලේක 11:19
9 2සාමු 20:23
10 2සාමු 2:18; 2සාමු 2:23; 2සාමු 23:24; 1ලේක 27:7
11 2සාමු 23:24
12 2සාමු 23:25; 1ලේක 27:8
13 2සාමු 23:26
14 1ලේක 27:9
15 2සාමු 23:27; 1ලේක 27:12
16 2සාමු 21:18; 1ලේක 27:11
17 1ලේක 11:12
18 2සාමු 23:28
19 1ලේක 27:13
20 1ලේක 27:15
21 උත් 49:27; විනි 19:14; විනි 20:15; 1ලේක 12:2
22 විනි 19:13
23 2සාමු 23:29
24 2සාමු 23:30
25 යොෂු 24:30; විනි 2:9
26 2සාමු 23:31

**2 තීරුව**
1 2සාමු 23:32
2 2සාමු 23:33
3 2සාමු 23:34
4 2සාමු 23:35
5 2සාමු 23:36
6 2සාමු 23:38
7 1සාමු 26:6; එස්රා 9:1; නෙහෙ 9:8
8 2සාමු 11:3; 2සාමු 11:17; 2සාමු 12:9; 2සාමු 23:39; 1රාජා 15:5

**12 පරි.**
9 1සාමු 27:1
10 1සාමු 27:6; 2සාමු 1:1
11 2සාමු 17:8; 1ලේක 11:10
12 උත් 49:27; 1සාමු 18:4; 1සාමු 20:20
13 1සාමු 17:49

ෂායල්බිම්හි වැසියෙකු වූ එලියාබා,
**34** ගීෂෝනිය හාෂෙම්ගේ පුත්‍රයන්,
හරාරිය ෂාගේගේ පුත්‍රයා වූ යො-
නාතාන්,[1] **35** හරාරිය සාකාර්ගේ
පුත්‍රයා වූ[2] අහියාම්, ඌර්ගේ පුත්‍රයා වූ
එලිෆල්,[3] **36** මෙකේරාහි වැසියෙකු
වූ හේෆෙර්, පෙලොනියවරයෙකු වූ
අහියා, **37** කර්මෙල්හි වැසියෙකු වූ[4]
හෙෂ්රො, එෂ්බයිගේ පුත්‍රයා වූ නයරයි,
**38** නාතන්ගේ[5] සහෝදර වූ යෝ-
වෙල්, හග්රීගේ පුත්‍රයා වූ මිබ්හාර්,
**39** අම්මොන් ජාතික ෂෙලෙක්, ෂෙ-
රුයියාගේ පුත් යෝවාබ්ගේ ආයුධ
රැගෙන යන්නා වූ බියේරොත්හි වැසි-
යෙකු වූ නහරයි, **40** ඉත්රිය ඊරා,
ඉත්රිය ගාරෙබ්,[6] **41** හිත්තී ජාතික[7]
උරියා,[8] ආලයිගේ පුත්‍රයා වූ සාබාද්
**42** සහ රූබෙන් ගෝත්‍රයට අයත්
එහි ප්‍රධානියෙකු වූ ෂීසාගේ පුත්‍රයා
වූ අදිනාය. අදිනා යටතේ රූබෙන්
ගෝත්‍රයට අයත් තවත් තිස්දෙනෙක්
සිටියෝය. **43** එමෙන්ම මයකාගේ
පුත්‍රයා වූ හානාන්, මිත්නිය යො-
ෂාපාට්, **44** අෂ්ටාරොත්හි වැසියෙකු
වූ උස්සියා, අරෝයේර්හි වැසියෙකු
වූ හෝතාම්ගේ පුත්‍රයන් වූ ෂාමා
හා යෙයීයෙල්, **45** ෂිම්රිගේ පුත්‍රයා
වූ යෙදීයයෙල්, ඔහුගේ සහෝදර වූ
තිෂීය යෝහා, **46** මහවියෙහි වැසි-
යෙකු වූ එලියෙල්, එල්නයම්ගේ පුත්‍ර-
යන් වූ යෙරිබයි හා යොෂවියා, මෝවබ්
ජාතික ඉත්මා යන අයද **47** එලි-
යෙල්, ඕබෙද් සහ ෂොබාහි වැසියෙකු
වූ යයසියෙල්ද එඩිතර මිනිසුන් අතර
සිටියෝය.

**12** කිෂ්ගේ පුත්‍රයා වූ සාවුල්ගෙන්
එල්ල වූ තර්ජන නිසා[9] දාවිත්
කලක් ෂික්ලග් නම් නුවරෙහි[10] ජීවත්
වුණේය. එහිදී ඔහුගේ නිදහස සීමා
විය. ඒ කාලයේදී දාවිත්ට යම් පිරිසක්
එකතු වූහ. පසු කාලයකදී ඔවුහු
එඩිතර මිනිසුන්[11] සමඟ එක්ව යුද්ධ-
වලදී දාවිත්ට උපකාර කළෝය.
**2** ඔවුහු දුනු ශිල්පයට[12] හා ගල්-
පටිවලින් විදීමට[13] දක්ෂයෝය. ඒ
දේවල් කිරීමට ඔවුන්ගේ අත් දෙකම

හුරු වී තිබිණ.[1] ඔවුහු බෙන්ජ-
මින් ගෝත්‍රයට අයත් සාවුල්ගේ
සහෝදරයෝය. **3** ඔවුන්ගේ ප්‍රධා-
නියා අහියේසෙර්ය. ඔහුගේ සහෝද-
රයා යෝවාෂ්ය. ඔවුන් දෙදෙනාගේම
පියා ගිබෙයාහි[2] වැසියෙකු වූ ෂෙමෙ-
යාය. ඔවුන් සමඟ අෂ්මාවෙත්ගේ[3]
පුත්‍රයන් වූ යෙෂීයෙල් සහ පෙලෙට්ද
බෙරාකාද අනාතොත්හි[4] වැසියෙකු වූ
යේහුද **4** ගිබියොන්හි[5] වැසියෙකු වූ
ඉෂ්මයියාද සිටියෝය. ඉෂ්මයියා එඩි-
තර මිනිසුන් තිස්දෙනා අතරින් කෙ-
නෙකි.[6] මීට අමතරව යෙරෙමියා,
යහසියෙල්, යෝහානාන්, ගෙදේරාහි[7]
වැසියෙකු වූ යෝෂාබාද්ද **5** එලූ-
සායි, යෙරිමොත්, බෙයලියා, ෂෙ-
මරියා, හාරිෆ්ගෙන් පැවතෙන්නෙකු
වූ ෂෙපටියාද **6** කෝරාගේ පෙළප-
තින්[8] පැමිණි එල්කානා, ඉෂ්ෂියා, අෂ-
රෙල්, යොවේෂෙර් සහ යෂොබෙයාම්ද
**7** ගෙදොර්හි වැසියෙකු වූ යෙරො-
හාම්ගේ පුත්‍රයන් වූ යොවේලා සහ
සෙබදියාද ඔවුන් අතර සිටියෝය.

**8** පාළුකරයේ ඉතා දුෂ්කර ස්ථාන-
යක[9] විසූ දාවිත්ට ගාද් ගෝත්‍රයෙන්
පිරිසක්ද එකතු වූහ. විශාල පලිස් හා
හෙල්ල අතැතිව සිටි[10] ඔවුහු එඩි-
තර, බලවත්, යුද්ධයට දක්ෂ සෙබළු
වූහ. ඔවුහු සිංහයන් මෙන් නිර්භී-
තය.[11] ඔවුන්ගේ ගමන කඳුකරයේ
වේගයෙන් දිව යන මුවන් මෙනි.[12]
**9** ඔවුන්ගේ ප්‍රධානියා එෂෙර්ය. දෙ-
වෙනියා ඔබදියාය. තුන්වෙනියා
එලියාබ්ය. **10** හතරවෙනියා මිෂ්-
මන්නාය. පස්වෙනියා යෙරෙමියාය.
**11** අත්තයි හයවෙනියාය. එලියෙල්
හත්වෙනියාය. **12** අටවෙනියා යෝ-
හානාන්ය. නවවෙනියා එල්සාබාද්ය.
**13** දහවෙනියා යෙරෙමියාය. මක්බන්-
නයි එකොළොස්වෙනියාය. **14** ගාද්-
ගෙන්[13] පැවතෙන්නන් වූ ඔවුහු
හමුදාවේ ප්‍රධානීන් ලෙස කටයුතු
කළෝය. ඔවුන් අතර සිටි කුඩාම
තැනැත්තාට මිනිසුන් සියදෙනෙකුට
වුවත් පහර දී පරාජය කිරීමට හැකි-
යාව තිබූ අතර, බලවත්ම තැනැත්-
තාට මිනිසුන් දහසක් වුවත් පරාජය
කිරීමට හැකියාව තිබිණ.[1] **15** අවු-
රුද්දේ පළමුවෙනි මාසයේ යොර්දාන්
ගඟ පිටාර ගලන කාලයේදී[2] එයින්
එගොඩ වී[3] තැනිතලාවල වාසය කළ
අයව නැඟෙනහිර දෙසටත් බස්නාහිර
දෙසටත් පලවාහැරියේ ඔවුහුය.

**16** බෙන්ජමින් හා යූදා ගෝත්‍රව-
ලට අයත් ඇතැම් අයද දාවිත් විසූ
ස්ථානයට පැමිණියෝය.[4] **17** එවිට
දාවිත් ඔවුන්ව හමු වී මෙසේ පැවසීය.
“ඔබ සියලුදෙනා මා ළඟට ආවේ මට
උපකාර කරන්නද?[5] ඇත්තටම ඔබ
ආවේ මට උදව් කරන්න නම් ඔබ මා
ගැන තැබූ විශ්වාසය මම කඩ කරන්-
නේ නැහැ.[6] නමුත් කිසි වරදක් නො-
කළ මාව[7] මගේ සතුරන් අතට පාවා
දෙන්න ඔබ ආවා නම් අපේ මුතුන්-
මිත්තන්ගේ දෙවි ඊට නිසි පියවර
ගනියි.”[8] **18** එවිට පැමිණ සිටි ඒ
තිස්දෙනාගේ ප්‍රධානියා වූ අමාසායි
තුළ දෙවිගේ බලය[9] ක්‍රියාත්මක වී
ඔහු මෙසේ කීවේය.

“දාවිත්, අපි ඔබ සමඟයි.[10] යෙස්-
සේගේ පුත්‍රය, අපි සහයෝ-
ගය දෙන්නේ ඔබටයි.
ඔබට සමාදානය ලැබේවා!
ඔබට උපකාර කරන අයටත්
සමාදානය ලැබේවා!
දෙවිගේ උපකාරය ඔබට
තිබෙන බව නම් ස්ථිරයි.”[11]

එහෙයින් දාවිත් ඔවුන්ව පිළිගෙන
තම හමුදා බළඇණිවල ප්‍රධානීන්
ලෙස ඔවුන්ව පත් කළේය.[12]

**19** මනස්සේ ගෝත්‍රයට අයත්
සමහරෙක්ද දාවිත්ගේ පැත්ත ගත්-
තෝය. ඒ, පිලිස්තිවරුන්[13] දාවිත්
සමඟ සාවුල් රජුට විරුද්ධව සටන්
කිරීමට පැමිණි කාලයේදීය. නමුත්
පිලිස්තිවරුන්ගේ අධිපතීන්,[14] “දාවිත්
තම ස්වාමියා වන සාවුල්ගේ පැත්ත
ගෙන අපව පාවා දෙයි”[15] කියා පවස-
මින් දාවිත්ව පිටත් කර යැවූ නිසා
දාවිත් එම සටනට සම්බන්ධ වුණේ
නැත. **20** එහෙයින් ඔහු ශික්ලග්

**12 පරි.**
1 විනි 3:15, විනි 20:16
2 1සාමු 11:4
3 1ලේක 11:33
4 1ලේක 11:28
5 යොෂු 9:3
6 1ලේක 11:15
7 1ලේක 27:28
8 ගණන් 26:11, 1ලේක 9:19
9 1සාමු 23:14, 1සාමු 23:29, 1සාමු 24:22, 1ලේක 11:16
10 2ලේක 25:5
11 2සාමු 1:23, 2සාමු 17:10
12 2සාමු 2:18
13 උත් 49:19, ද්වි 33:20

**2 තීරුව**
1 ලෙවී 26:8, ගීතා 18:39
2 යොෂු 3:15
3 යොෂු 4:12
4 1සාමු 22:4, 1සාමු 23:14, 1සාමු 24:22
5 1සාමු 16:4, 1රාජා 2:13
6 2රාජා 10:15, ක්‍රියා 4:32
7 1සාමු 24:12
8 උත් 31:42, 1සාමු 24:15, 1සාමු 26:23, ගීතා 7:6
9 විනි 6:34, විනි 13:25
10 2සාමු 15:21
11 ගීතා 54:4
12 1සාමු 8:12, 1සාමු 22:7
13 1සාමු 29:2
14 විනි 3:3
15 1සාමු 29:4

නුවරට[1] ආවේය. එහිදී ඔහුට එක් වූ
මනස්සේ නම් ගෝත්‍රයට අයත් අය
වන්නේ අද්නාහ්, යෝෂාබාද්, යෙදීය-
යෙල්, මීකායෙල්, යෝෂාබාද්, එලිහු
සහ ෂිල්ලෙතයිය. ඔවුහු මනස්සේ
නම් ගෝත්‍රයේ දහසකින් යුත් කණ්-
ඩායම්වල අධිපතීන්ය.[2] **21** කොල්-
ලකරුවන්ව මර්දනය කිරීමට ඔවුහු
දාවිත්ට උපකාර කළෝය.[3] එඩිතර,
බලසම්පන්න පුරුෂයන්[4] වූ ඔවුන්ව
පසුව හමුදාවේ ප්‍රධානීන් ලෙස පත්
කරන ලදි. **22** දාවිත්ට සහයෝගය
දැක්වීමට දවසින් දවස සෙනඟ එකතු
වූ අතර[5] ඔහුගේ සේනාව ගණනින්
වැඩි විය.[6] එය හරියට දෙවිගේ සේ-
නාව මෙනි.[7]

**23** හෙබ්‍රොන්හි[8] සිටි දාවිත්ට
එකතු වූ සෙබළුන්ගේ සංඛ්‍යාව මතු
දැක්වේ. යෙහෝවා දෙවි තීරණය
කර තිබූ ලෙස[9] සාවුල්ගේ රජකම[10]
දාවිත්ට ලබා දීම සඳහා ඔවුහු සියලු-
දෙනාම දාවිත්ට සහයෝගය දැක්වූහ.
**24** හෙල්ල සහ විශාල පලිස් අතැ-
තිව යුද්ධයට සූදානම්ව සිටි යූදා
ගෝත්‍රයෙන් පැමිණි අයගේ සංඛ්‍යාව
හයදහස් අටසියයකි. **25** සිමියොන්
ගෝත්‍රයෙන් පැමිණි එඩිතර, බලසම්-
පන්න පුරුෂයන්ගේ ගණන හත්දහස්
එකසියයකි.

**26** ලෙවී ගෝත්‍රයෙන් පැමිණි
සංඛ්‍යාව හාරදහස් හයසියයකි.
**27** ආරොන්ගෙන් පැවතෙන අයගේ[11]
ප්‍රධානියා[12] ලෙස කටයුතු කළේ යෙ-
හෝයාදාය. ඔහු සමඟ තවත් තුන්ද-
හස් හත්සියයක්ද දාවිත්ට එකතු
වූහ. **28** ඔවුන් සමඟ තරුණ, එඩි-
තර, බලසම්පන්න පුරුෂයෙක් වූ
සාදොක්ද[13] ඔහුගේ මුතුන්මිත්තන්ගේ
පෙළපතින් පැමිණි තවත් ප්‍රධානීහු
විසිදෙදෙනෙක්ද සිටියෝය.

**29** සාවුල් රජුගේ[14] ඥාතීන් වූ
බෙන්ජමින් ගෝත්‍රයට[15] අයත් අය-
ගෙන් තුන්දහසක් දාවිත්ට එකතු
වූහ. කලින් ඔවුන්ගෙන් වැඩි පිරිසක්
සාවුල්ට හා ඔහුගේ පවුලේ අයට පක්-
ෂව සිටියෝය. **30** එප්‍රායිම් ගෝ-
ත්‍රයෙන් පැමිණි සංඛ්‍යාව විසිදහස්
අටසියයකි. ඔවුහු ඔවුන්ගේ පෙළප-
තින් පැමිණි කීර්තිමත්, එඩිතර, බල-
සම්පන්න පුරුෂයෝය.[1]

**31** මනස්සේ නම් ගෝත්‍රයේ එක්
කොටසකින්[2] පැමිණි අයගේ සංඛ්‍යාව
දහඅටදහසකි. දාවිත්ව රජු ලෙස
පත් කිරීම සඳහා විශේෂයෙන්ම
ඔවුන්ව තෝරාගන්නා ලදි. **32** ඉස-
කාර් ගෝත්‍රයෙන්[3] ප්‍රධානීන් දෙසිය-
යක්ද දාවිත්ට එකතු වූහ. ඔවුන්ට
තැනට සුදුසු ලෙස ක්‍රියා කිරීමේ
හැකියාව තිබිණ.[4] එහෙයින් කළ යුතු
දේ ගැන ඊශ්‍රායෙල්වරුන්ට දැනමුතු-
කම් දීම[5] ඔවුන්ගේ වගකීම විය.
එම ගෝත්‍රයට අයත් අන් සියලු-
දෙනා ඔවුන්ගේ අණ පරිදි ක්‍රියා
කිරීමට කැමැත්තෙන් සිටියෝය.
**33** සෙබුලුන් ගෝත්‍රයෙන්[6] දාවිත්ට
එකතු වූ සංඛ්‍යාව පනස්දහ-
සකි. යුධ බළඇණියක් ලෙස පැමිණි
ඔවුහු සියලුම යුධ අවිවලින් සන්නද්-
ධව සිටියෝය. ඔවුන් සියලුදෙනාගේ
අධිෂ්ඨානය වූයේ විශ්වාසවන්තව*
සිට දාවිත්ට සහයෝගය දැක්වීමයි.
**34** නප්තලී ගෝත්‍රයෙන්[7] ප්‍රධානි-
යෝ දහසක්ද දාවිත්ට එකතු වූහ.
ඔවුන් සමඟ හෙල්ල හා විශාල
පලිස් අතැති තිස්හත්දහස්දෙ-
නෙක්ද සිටියෝය. **35** දාන් ගෝ-
ත්‍රයෙන් සටනට සූදානම්ව පැමිණි
සංඛ්‍යාව විසිඅටදහස් හයසියයකි.
**36** ආෂේර් ගෝත්‍රයෙන්ද[8] හතළිස්ද-
හසක් සටනට සූදානම්ව පැමිණි-
යෝය.

**37** යොර්දාන් ගඟෙන් එගොඩ[9]
සිටි රූබෙන් ගෝත්‍රයෙන්ද ගාද් ගෝ-
ත්‍රයෙන්ද මනස්සේ නම් ගෝත්‍රයේ
අනික් කොටසින්ද පැමිණි අයගේ
මුළු සංඛ්‍යාව එක්ලක්ෂ විසිදහසකි.
ඔවුහු සියලුම යුධ අවිවලින් සන්නද්-
ධව සිටියෝය. **38** යුද්ධයට දක්ෂ
ඔවුන් සියලුදෙනාගේම එකම අධිෂ්-
ඨානය වූයේ[10] දාවිත්ව මුළු ඊශ්‍රායෙල්

**12 පරි.**
1 1සාමු 30:1
2 ද්වි 1:15; ද්වි 33:17
3 1සාමු 30:1
4 1ලේක 5:24; 1ලේක 11:10
5 2සාමු 2:3
6 2සාමු 3:1; යෝබ් 17:9
7 උත් 32:2; යොෂු 5:14
8 2සාමු 2:1; 2සාමු 5:1
9 1සාමු 16:1; 1සාමු 16:13; 1ලේක 11:10
10 1ලේක 10:14
11 1ලේක 6:49; 1ලේක 27:17
12 1ලේක 27:5
13 2සාමු 8:17; 1රාජා 1:8; 1රාජා 2:35; 1ලේක 6:8
14 1ලේක 8:33
15 1ලේක 8:1; 1ලේක 12:2

**2 තීරුව**
1 2සාමු 17:10
2 යොෂු 17:2
3 ද්වි 33:18
4 එස්ත 1:13; ලූක් 12:56
5 හිතෝ 14:8; දේශ 7:19; දේශ 9:18
6 යොෂු 19:10
7 යොෂු 19:32
8 යොෂු 19:24
9 ගණන් 32:33; යොෂු 13:8
10 1ලේක 11:10

1ලේක **12:33*** මූ.අ., “දෙසිතකින් නොසිට.”

දේශයේම රජු කරවීමයි.[1] ඒ සඳහා
ඔවුහු සියලුදෙනාම හෙබ්‍රොන් නුවරට
පැමිණියෝය. **39** එහි අවට ජීවත්
වූ ඔවුන්ගේ සෙසු සහෝදරයන් ඔවුන්
සඳහා කෑම බීම[2] සූදානම් කර තිබූ
නිසා ඔවුහු දාවිත් සමඟ කමින් බො-
මින් දවස් තුනක් එහි ගත කළෝය.
**40** අවට ගෝත්‍රවල අයද ඈත ප්‍රදේශ-
වල ජීවත් වූ ඉසකාර්,[3] සෙබ්‍යු-
ලන්[4] සහ නප්තලී[5] යන ගෝත්‍රවල
අයද ඔටුවන්, බූරුවන්,[6] කොටළු-
වන් සහ ගවයන් පිට ආහාර පාන
තබාගෙන ඔවුන් වෙතට ගෙනා-
වෝය. එම ආහාර පානවලට පිටිව-
ලින් සෑදූ ආහාර,[7] වියළි අත්තික්කා
කුට්ටි,*[8] වියළි මිදි කුට්ටි,[9] වයින්[10]
සහ තෙල්ද[11] ඇතුළත් විය. ඔවුහු
ආහාරයට ගැනීම සඳහා හරකුන්[12]
සහ බැටළුවන්[13] විශාල ප්‍රමාණයක්ද
ගෙනාවෝය. මන්ද ඒ වන විට ඊශ්‍රා-
යෙල් දේශයේ සියලුදෙනාම මහත්
ප්‍රීතියකින් සිටියෝය.[14]

**13** දාවිත් රජ දහසකින් යුත්
කණ්ඩායම් කෙරෙහි පත් කර
තිබූ ප්‍රධානීන්ගෙනුත් සියයකින් යුත්
කණ්ඩායම් කෙරෙහි පත් කර තිබූ
ප්‍රධානීන්ගෙනුත් සියලුම අධිපතීන්-
ගෙනුත් අදහස් විමසා,[15] **2** රැස්ව
සිටි ඊශ්‍රායෙල්වරුන්ට මෙසේ පැව-
සීය. “මා මේ පවසන දේට ඔබ එකඟ
නම් අපේ දෙවි යෙහෝවාගේ අනුමැ-
තියත් මෙයට තිබෙනවා නම් ඊශ්‍රා-
යෙල් දේශය පුරා පදිංචිව සිටින[16]
අපගේ සෙසු සහෝදරයන්වත් ඔවුන්-
ගේ ගම්බිම්වල[17] ජීවත් වන පූජක-
යන්වත්[18] ලෙවීවරුන්වත්[19] කැඳවා,
**3** අපගේ දෙවිගේ ගිවිසුම් පෙට්ටිය[20]
මේ නුවරට රැගෙන එමු.” ඔහු එසේ
පැවසුවේ සාවුල් රජුගේ කාලයේ සිටි
අය ඊට නිසි ගෞරවයක් දක්වා
නොතිබුණු නිසාය.[21] **4** රැස්ව සිටි
සියලුදෙනාම දාවිත් රජුගේ අදහසට
එකඟ වූහ.[22] **5** සැබෑ දෙවිගේ ගිවි-
සුම් පෙට්ටිය කිර්යත්-යෙයාරීම්[1] යන
ස්ථානයේ සිට රැගෙන ඒමේ[2] අවස්-
ථාවට සහභාගි වීම සඳහා දාවිත් රජ
ඊජිප්තු ගඟ[3] අසල සිට හමාත් නුව-
රට[4] ඇතුල් වන ස්ථානය දක්වා විසූ
සියලුම ඊශ්‍රායෙල්වරුන්ව එක් රැස්
කළේය.[5]

**6** කෙරුබ්වරුන් පිට හිඳගෙන
සිටින[6] සැබෑ දෙවි වන යෙහෝවාගේ
නාමය දරන දෙවිගේ ගිවිසුම් පෙට්ටිය
ඒ වන විට තිබුණේ යූදා ගෝත්‍රයට
අයිති ප්‍රදේශයක් වූ බායලා නම් නුව-
රෙහිය.[7] එම නුවර කිර්යත්-යෙයාරීම්
ලෙසද හඳුන්වන ලදි. දාවිත් රජ හා
මුළු ඊශ්‍රායෙල් ජනතාව එය රැගෙන
ඒම සඳහා එම නුවරට ගියෝය.
**7** ඔවුන් සැබෑ දෙවිගේ ගිවිසුම්
පෙට්ටිය අබිනාදාබ්ගේ නිවසේ
සිට රැගෙන ගියේ අලුත් කරත්ත-
යක් මත තබාගෙනය.[8] එය දක්කා-
ගෙන ගියේ උස්සාහ් සහ අහියෝය.[9]
**8** දාවිත් රජ හා මුළු ඊශ්‍රායෙල් සමූ-
හය සංගීත භාණ්ඩ එනම්, හො-
රණෑ,[10] රබන්,[11] අත්තාළම්, වීණා[12]
සහ කුඩා වීණා[13] වාදනය කරමින්ද
ගී ගයමින්ද[14] මහත් උද්‍යෝගයෙන්
සැබෑ දෙවිගේ නමස්කාරයේ කොට-
සක් වූ එම අවස්ථාවට සහභාගි වූහ.[15]
**9** කීදොන් නම් කමත[16] අසලදී හර-
කුන් කුලප්පු වූ නිසා කරත්තය
පෙරළෙන්න ගියේය. එවිට ගිවිසුම්
පෙට්ටිය වැටෙන්න නොදී උස්සාහ්
එය අල්ලාගත්තේය.[17] **10** ගිවිසුම්
පෙට්ටියට අත තැබූ නිසා[18] යෙ-
හෝවා දෙවි උස්සාහ් සමඟ මහත් සේ
උදහස් විය. ඒ අවස්ථාවේදී දෙවි
ඔහුට පහර දුන්නේය. ඔහු දෙවිගේ
ගිවිසුම් පෙට්ටිය ඉදිරියේම මැරී වැටු-
ණේය.[19] **11** යෙහෝවා දෙවි උදහස්
වී උස්සාහ්ට ඒ මොහොතේදීම පහර
දුන් නිසා දාවිත්ගේ සිතේ කෝපයක්
ඇති විය.[20] ඒ සිද්ධිය නිසා එම ස්ථා-
නයට පෙරෙෂ්-උස්සාහ් යන නම
තබන ලදි. අද දක්වාම එම ස්ථානය
හඳුන්වන්නේ ඒ නමින්ය.

**12** මේ සිද්ධිය නිසා දාවිත් රජුට

---

**1ලේක 12:40*** පලතුරු වර්ගයක් වේළා, එකට තද කර සාදාගන්නා ලදි.

---

**12 පරි.**
1 උත් 49:8, උත් 49:10, 2ලේක 30:12, ගීතා 110:3
2 1රාජා 1:25
3 යොෂු 19:17
4 යොෂු 19:10
5 යොෂු 19:32
6 2සාමු 16:2
7 2සාමු 17:28
8 1සාමු 25:18
9 2සාමු 6:19
10 උත් 49:12
11 ද්වි 33:24
12 2සාමු 17:29
13 1සාමු 25:18
14 හිතෝ 11:10, හිතෝ 29:2, දේශ 10:19

**13 පරි.**
15 1ලේක 15:25, හිතෝ 15:22
16 1රාජා 12:7
17 ගණන් 35:2, 1ලේක 6:54
18 නික් 29:9
19 ගණන් 3:6, ගණන් 16:10, 1ලේක 15:2
20 1සාමු 7:2
21 1සාමු 14:18
22 2සාමු 3:36

**2 තීරුව**
1 1සාමු 7:1
2 1සාමු 6:21
3 ගණන් 34:5, යොෂු 13:3
4 ගණන් 34:8, සෙක 9:2
5 1ලේක 15:3
6 නික් 25:22, ගණන් 7:89, 1සාමු 4:4, 2සාමු 6:2, 2රාජා 19:15
7 යොෂු 15:9, යොෂු 15:60
8 නික් 37:5, 1සාමු 6:7
9 2සාමු 6:3
10 2ලේක 5:13
11 නික් 15:20
12 1ලේක 25:1
13 1සාමු 10:5
14 2ලේක 23:18
15 2සාමු 6:5
16 2සාමු 6:6
17 හිතෝ 11:2, හිතෝ 13:10
18 ගණන් 4:15
19 ලෙවී 10:2, 2සාමු 6:7
20 2සාමු 6:8

දෙවි ගැන මහත් බියක් ඇති
වී,[1] “සැබෑ දෙවිගේ ගිවිසුම් පෙට්ටිය
මා ළඟට ගෙනෙන්නේ කොහොමද”[2]
කියා කල්පනා කළේය. **13** පසුව
ඔහු ගිවිසුම් පෙට්ටිය තම නුව-
රට නොගෙනෙන්න තීරණය කර,
එය ගාත්හි[3] වැසියෙකු වූ ඕබෙද්-
ඒදොම්ගේ නිවසට ගෙන ගියේය.[4]
**14** සැබෑ දෙවිගේ ගිවිසුම් පෙට්ටිය
ඔහුගේ නිවසේ[5] මාස තුනක් පුරා
තිබිණ. ඒ නිසා යෙහෝවා දෙවි
ඕබෙද්-ඒදොම්ටත් ඔහුගේ ගෙවැසි-
යන්ටත් ආශීර්වාද කළේය.[6]

**14** තීර්හි[7] රජු වූ හීරාම්,[8] දාවිත්
රජු වෙනට දූත පිරිසක්-
වද දාවිත්ගේ මාලිගාව ගොඩනැඟී-
මට අවශ්‍ය දේවදාර ලීද[9] බිත්ති
බඳින්නන්වද වඩු වැඩ කරන්නන්වද
යැවීය.[10] **2** යෙහෝවා දෙවි ඊශ්‍රා-
යෙල් දේශයේ රජු ලෙස තමාව පත්
කර එය ස්ථිර ලෙස පිහිටුවා තිබෙන
බව දාවිත්ට තහවුරු විය.[11] එමෙන්ම
දෙවි ඔහුගේ සෙනඟ වෙනුවෙන් තම
රාජ්‍යය ගෞරවයට පත් කළ බවත්
දාවිත්ට පැහැදිලි විය.[12]

**3** දාවිත් යෙරුසලමේදී තවත්
භාර්යාවන්[13] විවාහ කරගත් අතර
ඔහුට දාව තවත් පුත්‍රයෝ සහ
දූවරු උපන්නෝය.[14] **4** යෙරුසල-
මේදී ඔහුට දාව උපන් දරුවන්
නම් ෂම්මුවා,[15] ෂෝබාබ්,[16] නාතන්,[17]
සලමොන්,[18] **5** ඉබ්හාර්,[19] එලිෂූවා,
එල්පෙලෙත්,[20] **6** නෝගා, නෙ-
ෆෙග්,[21] යාෆියා, **7** එලිෂාමා,[22] බෙ-
යෙලියාදා සහ එලිෆෙලෙත්ය.[23]

**8** දාවිත්ව මුළු ඊශ්‍රායෙල් දේ-
ශයේම රජු ලෙස අභිෂේක කර
තිබූ බව පිලිස්තිවරුන්ට ආරංචි වූ
විට[24] ඔවුහු දාවිත්ව අල්ලාගැනීමට
ආවෝය.[25] දාවිත් රජු ඒ ගැන දැන-
ගත් විට ඔහු ඔවුන්ට විරුද්ධව සටන්
කිරීමට පිටත්ව ගියේය. **9** පිලිස්ති-
වරු රෙෆායිම් තැනිතලාවට පැමිණ
විටින් විට ප්‍රහාර එල්ල කළෝය.[26]
**10** එවිට දාවිත් දෙවිගෙන් මෙසේ
ඇසීය.[27] “මම පිලිස්තිවරුන්ට පහර

**13 පරි.**
1 ගීතා 119:20
2 2සාමු 6:9
3 යොෂු 21:24
4 2සාමු 6:10
5 2සාමු 6:11
6 උත් 30:27
උත් 39:5
1ලේක 26:5
හිතෝ 3:10
හිතෝ 10:22
මලා 3:10

**14 පරි.**
7 එස 28:2
8 1රාජා 5:1
9 1රාජා 5:6
2ලේක 2:3
10 1ලේක 22:2
11 2සාමු 5:12
ගීතා 89:21
12 ගණන් 24:7
2සාමු 7:8
1රාජා 10:9
13 ද්වි 17:17
14 2සාමු 5:13
ගීතා 127:5
15 1ලේක 3:5
16 2සාමු 5:14
17 ලූක් 3:31
18 1රාජා 1:47
මතෙ 1:6
19 2සාමු 5:15
20 1ලේක 3:6
21 1ලේක 3:7
22 2සාමු 5:16
23 1ලේක 3:8
24 2සාමු 5:17
1ලේක 11:3
25 ගීතා 2:2
26 2සාමු 5:18
2සාමු 5:22
2සාමු 23:13
27 1සාමු 23:2
1සාමු 30:8
2සාමු 5:19
හිතෝ 3:6

**2 තීරුව**
1 2සාමු 5:20
යෙසා 28:21
2 2සාමු 5:20
3 2සාමු 5:21
4 නික් 32:20
ද්වි 7:25
2රාජා 19:18
1කොරි 10:14
5 2සාමු 5:22
6 2සාමු 5:23
හිතෝ 3:6
7 යොෂු 8:2
ගීතා 18:34
8 විනි 7:9
1සාමු 14:10
9 2සාමු 5:24
10 ද්වි 23:14
විනි 4:14
යෙසා 45:2

දෙන්නද? ඔවුන්ව යටත් කරගන්න
ඔබ මට උදව් කරනවාද?” එවිට යෙ-
හෝවා දෙවි ඔහුට මෙසේ පැව-
සීය. “ගොස් ඔවුන්ට පහර දෙන්න.
මම අනිවාර්යයෙන්ම ඔවුන්ව ඔබට
යටත් කර දෙන්නෙමි.” **11** එහෙ-
යින් දාවිත් බාල්-පෙරාෂිම්[1] වෙනට
ගොස් පිලිස්තිවරුන්ට පහර දුන්-
නේය. ඉන්පසු ඔහු, “සැඩ පහරකින්
දේවල් විනාශ වී යන්නාක් මෙන්
සැබෑ දෙවි මා ලවා මාගේ සතු-
රන්ව සම්පූර්ණයෙන්ම විනාශ කළා”
කියා පැවසීය. එම ස්ථානයට[2] බාල්-
පෙරාෂිම් යන නම තැබුවේ ඒ නිසාය.
**12** පිලිස්තිවරුන් ඔවුන්ගේ දේවතා
රූප එහි අත්හැර දමා පලා ගොස්
තිබිණ.[3] දාවිත් රජුගේ අණ පරිදි ඔහු-
ගේ සෙනඟ එම රූපවලට ගිනි තබා
විනාශ කළෝය.[4]

**13** පිලිස්තිවරු නැවතත් එම
තැනිතලාවට පැමිණ ප්‍රහාරයක්
එල්ල කළෝය.[5] **14** ඔවුන්ට විරුද්-
ධව සටනට යන්නද කියා දාවිත්
රජු නැවතත් දෙවිගෙන් විමසූ විට[6]
සැබෑ දෙවි ඔහුට මෙසේ කීවේය.
“මේ අවස්ථාවේදී ඔවුන්ව ලුහුබැඳ
ගොස් පහර නොදෙන්න. වටෙන්
ගොස් බේකා පඳුරු ඉදිරියේ සිට
ඔවුන්ට පහර දෙන්න.[7] **15** නමුත්
ඔබ ඔවුන්ට පහර දීමට පටන්ගත
යුත්තේ[8] බේකා පඳුරු අතරින් අඩි
ශබ්දයක් ඇසෙන විටය.[9] එම ශබ්-
දය පිලිස්තිවරුන්ගේ කඳවුරට පහර
දීම සඳහා සැබෑ දෙවි වන මා
ඔබට ඉදිරියෙන් ගිය බවට ලකු-
ණකි.”[10] **16** දාවිත් රජ දෙවි අණ
කළ ලෙසම කළේය.[11] ඔවුහු ගිබ්-
යෝන්[12] සිට ගෙෂෙර්[13] දක්වා ගොස්
පිලිස්තිවරුන්ගේ හමුදාවට පහර දුන්-
නෝය. **17** දාවිත් රජුගේ කීර්තිය[14]
දසත පැතිර ගියේය. යෙහෝවා දෙවි
ඔහු සමඟ සිටි නිසා සියලුම ජාතීහු
දාවිත් රජුට බිය වූහ.[15]

---

**11** උත් 6:22; නික් 39:32; 1යොහ 5:3; **12** 2සාමු 5:25; **13** යොෂු 16:10; **14** යොෂු 6:27; **15** ද්වි 2:25; ද්වි 11:25; යොෂු 2:9.

**15** දාවිත් රජ තමාගේ නමින්
හැඳින්වූ නුවරෙහි ඔහුට
මාලිගා ගොඩනඟා ගත්තේය.[1] ඔහු
එම නුවරෙහි සැබෑ දෙවිගේ ගිවිසුම්
පෙට්ටිය තැබීමට ස්ථානයක්ද[2] වෙන්
කර එහි කූඩාරමක් ඉදි කළේය.
**2** දාවිත් රජ මෙසේ පැවසීය. “සැබෑ
දෙවිගේ ගිවිසුම් පෙට්ටිය රැගෙන ආ
යුත්තේ ලෙවීවරුන් පමණයි.[3] වෙන
කිසි කෙනෙකුට එසේ කිරීමට අවසර
නැහැ. යෙහෝවා දෙවිගේ ගිවිසුම්
පෙට්ටිය උසුලාගෙන යන්නත් ඔහු
වෙනුවෙන් හැමදාටම සේවය කරන්-
නත්[4] යෙහෝවා දෙවි තෝරාගත්-
තේ ඔවුන්වයි.” **3** ඉන්පසු දාවිත්
රජ තමා සූදානම් කළ ස්ථානයට
යෙහෝවා දෙවිගේ ගිවිසුම් පෙට්ටිය
රැගෙන ඒමේ අවස්ථාවට[5] සහභාගි
වීම සඳහා සියලුම ඊශ්‍රායෙල්වරුන්ව
යෙරුසලමට එක් රැස් කළේය.[6]

**4** ඒ සඳහා ඔහු ආරොන්ගේ පුත්‍ර-
යන්වත්[7] ලෙවීවරුන්වත් රැස්
කළේය. **5** ඔවුන්ගේ තොරතුරු
මෙසේය. කෝහාත්ගේ පුත්‍රයන් අත-
රින් උරියෙල්[8] සහ ඔහුගේ
සහෝදරයන්ය. ඔවුන්ගේ සංඛ්‍යාව
එකසිය විසිදෙනෙකි. උරියෙල් ඔවුන්-
ගේ ප්‍රධානියාය. **6** මෙරාරිගේ පුත්‍ර-
යන්[9] අතරින් අසායා[10] සහ ඔහුගේ
සහෝදරයන්ය. ඔවුන්ගේ සංඛ්‍යාව
දෙසිය විස්සකි. අසායා ඔවුන්ගේ
ප්‍රධානියාය. **7** ගේර්ෂොම්ගේ පුත්‍ර-
යන්[11] අතරින් යෝවෙල්[12] සහ ඔහු-
ගේ සහෝදරයන්ය. ඔවුන් ගණනින්
එකසිය තිහකි. යෝවෙල් ඔවුන්ගේ
ප්‍රධානියාය. **8** එලිෂාෆාන්ගේ පුත්‍ර-
යන්[13] අතරින් ෂෙමායා[14] සහ ඔහුගේ
සහෝදරයන්ය. ඔවුන්ගේ ගණන දෙ-
සියයකි. ෂෙමායා ඔවුන්ගේ ප්‍රධා-
නියාය. **9** හෙබ්‍රොන්ගේ පුත්‍රයන්
අතරින් එලියෙල් සහ ඔහුගේ සහෝ-
දරයන්ය. ඔවුන්ගේ සංඛ්‍යාව අසූ-
වකි. එලියෙල් ඔවුන්ගේ ප්‍රධානියාය.
**10** උස්සියෙල්ගේ පුත්‍රයන්ගෙන්[15]
අම්නදාබ් සහ ඔහුගේ සහෝදරයන්ය.
ඔවුන්ගේ සංඛ්‍යාව එකසිය දොළහකි.
**11** දාවිත් රජ, සාදොක්[1] සහ අබියා-
තර්[2] යන පූජකයන්වද ලෙවීවරුන් වූ
උරියෙල්,[3] අසායා,[4] යෝවෙල්,[5] ෂෙ-
මායා,[6] එලියෙල්[7] සහ අම්නදාබ් යන
අයවද කැඳවා **12** ඔවුන්ට මෙසේ
පැවසීය. “ඔබත් ඔබේ සහෝදරයනුත්
ගොස් පවිත්‍ර වෙන්න.[8] ලෙවී ගෝත්‍ර-
යට අයත් පවුල්වල ප්‍රධානීන්[9] වන
ඔබ සියලුදෙනා මා සූදානම් කළ
ස්ථානයට ඊශ්‍රායෙල්හි දෙවි වන යෙ-
හෝවාගේ ගිවිසුම් පෙට්ටිය රැගෙන
ආ යුතුයි. **13** මුල් වතාවේදී එය
රැගෙන ඒමට අපි ඔබට භාර දුන්නේ
නැහැ.[10] අපේ දෙවි වන යෙහෝවා
ගිවිසුම් පෙට්ටිය රැගෙන ඒම සම්බන්-
ධයෙන් දුන් මඟ පෙන්වීම් පිළිපදින්න
එදා අපි අසමත් වුණා.[11] ඔහු අපිට
විරුද්ධව ක්‍රියා කළේ ඒ නිසයි.”[12]
**14** එහෙයින් පූජකයෝද ලෙවීවරුද
ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝවාගේ
ගිවිසුම් පෙට්ටිය රැගෙන ඒම සඳහා
පවිත්‍ර වූහ.[13]

**15** ලෙවීගෙන් පැවතෙන්නෝ
සැබෑ දෙවිගේ ගිවිසුම් පෙට්ටියේම
සවි කර තිබූ පොලු තම උරහිස් මත
තබාගෙන[14] එය රැගෙන ගියෝය.[15]
ඔවුන් එසේ කළේ යෙහෝවා දෙවි,
මෝසෙස් මාර්ගයෙන් දී තිබූ උප-
දෙස්වලට අනුවය. **16** දාවිත් රජ
ඊළඟට ලෙවීවරුන්ගේ ප්‍රධානීන්ට
යම් මඟ පෙන්වීම් දුන්නේය. ඔවුන්-
ගේ සහෝදරයන් වූ ගායක පිරිස[16]
ඔවුන්ට නියම කළ ස්ථානවල සිටිය
යුතු බවත් වීණා,[17] කුඩා වීණා,[18]
අත්තාළම්[19] යනාදි සංගීත භාණ්ඩ[20]
ඔවුන් මහත් හඬින් වාදනය කළ යුතු
බවත් එම නාදයට තමන්ගේ ප්‍රීතිමත්
හඬ එකතු කළ යුතු බවත් ඔහු
ඔවුන්ට පැවසීය.

**17** ඒ අනුව ලෙවීවරු පහත සඳ-
හන් ලෙස ඔවුන්ව නියමිත ස්ථා-
නවල තැබූහ. යෝවෙල්ගේ පුත්
හේමාන්ද[21] ඔහුගේ සහෝදරයන්
අතරින් බෙරෙකියාගේ පුත් ආසාෆ්ද[22]

**15 පරි.**
1 2සාමු 7:1
2 1ලේක 16:1; ගීතා 132:5; ක්‍රියා 7:46
3 ගණන් 4:15; ද්වි 10:8; ද්වි 31:9; යොෂු 3:3; 1ලේක 15:15
4 නික් 40:15; ගණන් 8:15; ගණන් 18:2; ද්වි 21:5
5 2සාමු 6:12
6 1ලේක 13:5
7 ගණන් 3:3; ගණන් 3:9; 1ලේක 6:49
8 1ලේක 15:11
9 1ලේක 6:1
10 1ලේක 6:30
11 ගණන් 3:17
12 1ලේක 23:8
13 නික් 6:22
14 1ලේක 15:11
15 නික් 6:18; 1ලේක 6:18

**2 තීරුව**
1 2සාමු 8:17; 1ලේක 12:28
2 1සාමු 22:20; 1රාජා 2:35
3 1ලේක 15:5
4 1ලේක 6:30
5 1ලේක 15:7
6 1ලේක 15:8
7 1ලේක 15:9
8 1සාමු 7:1
9 1ලේක 9:34; 1ලේක 24:31
10 2සාමු 6:3; 1ලේක 13:7
11 ගණන් 4:15; ගණන් 7:9; ද්වි 31:9
12 2සාමු 6:8; 1ලේක 13:11
13 2ලේක 29:15; 2ලේක 29:34
14 නික් 37:5; ගණන් 4:6; 2ලේක 5:9
15 නික් 25:14
16 1ලේක 6:31; 1ලේක 15:27
17 ගීතා 149:3
18 1ලේක 16:5; ගීතා 33:2
19 2ලේක 5:12
20 1රාජා 10:12; 2ලේක 5:13
21 1ලේක 6:33; 1ලේක 25:5
22 1ලේක 6:39; 1ලේක 25:2; ගීතා 83:පෙර

ඔවුන්ගේ සහෝදරයන් වූ මෙරා-
රීගේ පුත්‍රයන් අතරින් කුෂායාගේ
පුත් ඒතන්ද[1] **18** දෙවෙනි පන්ති-
යට[2] අයත් ඔවුන්ගේ සහෝදරයන්
වූ සෙකරියා,[3] බෙන්, යයෂීයෙල්,
ෂෙමිරාමොත්, යෙහීයෙල්, උන්නි,
එලියාබ්, බෙනායා, මයසේයා, මත්-
තිතියා, එලිෆෙලෙහු, මික්නේයාද
දොරටු පාලකයන් ලෙස කටයුතු
කළ ඕබෙද්-ඒදොම්[4] සහ යෙයී-
යෙල්ද **19** තඹ අත්තාළම් ගස-
මින්[5] ගායනයෙන් හවුල් වූ හේමාන්,[6]
ආසාෆ්[7] සහ ඒතන්ද **20** ඉහළ ස්ව-
රයට අනුව*[8] සකස් කරන ලද
සංගීත භාණ්ඩ අතැතිව සිටි
සෙකරියා, අසීයෙල්,[9] ෂෙමිරාමොත්,
යෙහීයෙල්, උන්නි, එලියාබ්, මය-
සේයා සහ බෙනායාද **21** පහළ
ස්වරයට අනුව*[10] සකස් කරන ලද
වීණා[11] අතැතිව, සංගීත අධ්‍යක්ෂක-
වරුන් ලෙස කටයුතු කළ මත්-
තිතියා,[12] එලිෆෙලෙහු, මික්නේයා,
ඕබෙද්-ඒදොම්, යෙයීයෙල් සහ අසසි-
යාද යන අයව නියමිත ස්ථානවල
සිටවන ලදි. **22** ගිවිසුම් පෙට්ටිය
රැගෙන යන ලෙවීවරුන්ගේ ප්‍රධානියා
ලෙස කෙනනියාව[13] පත් කළේය.
එය රැගෙන යා යුතු ආකාරය සම්-
බන්ධයෙන් ඔහුට මනා දැනුමක්
තිබිණ.[14] **23** ගිවිසුම් පෙට්ටිය මුර
කිරීමට පත් කළේ[15] බෙරෙකියාව
සහ එල්කානාවය. **24** සැබෑ දෙවි-
ගේ ගිවිසුම් පෙට්ටියට ඉදිරියෙන්
මහත් හඬින් හොරණෑ පිඹීමට[16] පත්
කළේ ෂෙබනියා, යොෂාපාට්, නෙත-
නෙල්, අමාසායි, සෙකරියා, බෙනායා
සහ එලියේසර් යන පූජකයන්වය.
ගිවිසුම් පෙට්ටිය දෙපස මුර කිරීම
සඳහා ඕබෙද්-ඒදොම් සහ යෙහියාව
පත් කර තිබිණ.

**25** ඕබෙද්-ඒදොම්ගේ[1] නිවසේ සිට
යෙහෝවා දෙවිගේ ගිවිසුම් පෙට්-
ටිය රැගෙන ආ පිරිස සමඟ දාවිත්
රජද[2] ඊශ්‍රායෙල්හි වැඩිමහල්ලෝද[3]
දහසකින් යුත් කණ්ඩායම් කෙරෙහි
පත් කර තිබූ ප්‍රධානියෝද[4] ඉතා
ප්‍රීතියෙන්[5] ගමන් කළෝය. **26** යෙ-
හෝවා දෙවිගේ ගිවිසුම් පෙට්ටිය
රැගෙන ගිය ලෙවීවරුන්ට සැබෑ දෙවි-
ගේ අනුමැතිය ලැබූ බව[6] තේරුම්-
ගත් ඔවුහු වස්සන් හත්දෙනෙකුව
සහ බැටළුවන් හත්දෙනෙකුව පූජා
කළෝය.[7] **27** දාවිත් රජ අනර්ඝ
රෙද්දකින් මසා තිබූ අත් නැති වස්ත්‍ර-
යක් ඇඳ සිටියේය. එමෙන්ම ඔහු
ඊට උඩින් ලිනන් රෙදිවලින් මසා
තිබූ ඒෆොද් හැට්ටයක්ද[8] ඇඳ සිටි-
යේය. ගායකයෝද[9] ගිවිසුම් පෙට්-
ටිය රැගෙන ගිය ලෙවීවරුද ඔවුන්ගේ
ප්‍රධානියා වූ කෙනනියාද[10] දාවිත් රජු
මෙන් අනර්ඝ රෙදිවලින් මසා තිබූ
වස්ත්‍ර ඇඳ සිටියෝය. **28** විවිධ වර්-
ගයේ හොරණෑ,[11] අත්තාළම්,[12] වීණා
සහ කුඩා වීණාවල[13] හඬ මැද යෙ-
හෝවා දෙවිගේ ගිවිසුම් පෙට්ටිය
රැගෙන එන ලදි.[14] සියලුම ඊශ්‍රායෙල්-
වරුන් ප්‍රීති ඝෝෂා නඟන හඬද ඒ
මියුරු සංගීතයට මුසු විය.

**29** යෙහෝවා දෙවිගේ ගිවිසුම්
පෙට්ටිය[15] දාවිත්ගේ නුවරට ළඟා වන
විට සාවුල් රජුගේ දියණිය වූ මීකල්[16]
කවුළුවකින් ඒ දෙස බලා සිටියාය.
දාවිත් රජු උඩ පැන පැන නටන ආකා-
රය[17] දැක ඇය තම සිතින් ඔහුව හෙ-
ළාදැකීමට පටන්ගත්තාය.[18]

**16** ඔවුහු සැබෑ දෙවිගේ ගිවිසුම්
පෙට්ටිය ගෙනැවිත්[19] දාවිත්
රජු සූදානම් කළ කූඩාරමෙහි තැබු-
වෝය.[20] පසුව ඔවුහු සැබෑ දෙවිට
දවන පූජා සහ හවුල් පූජා ඔප්පු
කළෝය.[21] **2** දාවිත් රජ පූජා ඔප්පු
කර[22] අවසන් වූ පසු යෙහෝවා දෙවි-
ගේ නාමයෙන්[23] සෙනඟට ආශීර්වාද
කළේය.[24] **3** ඔහු සියලුම ඊශ්‍රායෙල්-
වරුන්ට එනම්, එහි සිටි සෑම පුරුෂ-
යෙකුටම හා ස්ත්‍රියකටම රොටිය

**15 පරි.**
1 1ලේක 6:44
2 1ලේක 25:9
3 1ලේක 16:5
4 1ලේක 15:21, 1ලේක 16:5
5 1ලේක 13:8
6 1ලේක 6:33, 1ලේක 25:1, 2ලේක 5:12
7 1ලේක 15:17
8 ගීතා 46:පෙර
9 1ලේක 15:18
10 ගීතා 6:පෙර
11 1සාමු 10:5, 1ලේක 25:6, ගීතා 92:3
12 1ලේක 16:5
13 1ලේක 15:27
14 1ලේක 25:7, හිතෝ 22:29
15 1ලේක 9:21
16 1ලේක 16:6, 2ලේක 15:14, 2ලේක 23:13

**2 තීරුව**
1 1ලේක 13:14
2 2සාමු 6:12
3 1රාජා 8:1
4 ගණන් 31:14, 1සාමු 8:12
5 2සාමු 6:5
6 ක්‍රියා 26:22
7 2සාමු 6:13
8 1සාමු 2:18
9 1රාජා 10:12, 1ලේක 9:33, 2ලේක 5:12
10 1ලේක 15:22
11 2සාමු 6:15, 1ලේක 16:6
12 1ලේක 15:16
13 2සාමු 6:5
14 2සාමු 6:15, 1ලේක 13:8
15 ගණන් 10:33, 1ලේක 17:1, හෙබ්‍රෙ 9:4
16 1සාමු 18:27, 2සාමු 3:13
17 නික් 15:20, ගීතා 30:11
18 2සාමු 6:16, හිතෝ 11:12

**16 පරි.**
19 2සාමු 6:17
20 1රාජා 8:1, 1ලේක 15:1, 2ලේක 1:4
21 1රාජා 8:5, 2ලේක 5:6
22 ලෙවි 1:3, ලෙවි 3:1
23 2සාමු 6:18
24 ගණන් 6:23, යොෂු 22:6, 2සාමු 6:18, 1රාජා 8:14

**1ලේක 15:20*** හෙබ්‍රෙව් බසින්, ඇලමොත්. උස් හඬින් ගී ගැයූ තරුණියන් හෝ පිරිමි දරු-වන්ව විස්තර කිරීමට මෙම යෙදුම භාවිත කළා විය හැක. **21*** හෙබ්‍රෙව් බසින්, ෂෙමිනිත්. පහළ ස්වරයෙන් වාදනය කිරීමට සැකසූ සංගීත භාණ්ඩයක් විය හැක.

බැගින්ද රටඉඳි කුට්ටියක්* බැගින්ද
වියළි මිදි කුට්ටියක් බැගින්ද දුන්-
නේය.[1] 4 යෙහෝවා දෙවිගේ ගිවි-
සුම් පෙට්ටිය අසල සේවය කිරීම
සඳහා[2] දාවිත් රජ ලෙවීවරුන්ව[3]
පත් කළේය. ඔවුන්ව එසේ පත්
කළේ ඊශ්‍රායෙල්හි දෙවි වන යෙ-
හෝවා තම සෙනඟ වෙනුවෙන් කළ
දේවල් ඔවුන්ට මතක් කර දීමටත්[4]
දෙවිට ස්තුති[5] ප්‍රශංසා[6] කිරීමටත්ය.
5 ඔවුන්ගේ ප්‍රධානියා ආසාෆ්ය.[7] ඔහු-
ගේ දෙවෙනියා සෙකරියාය. මීට අම-
තරව වීණා සහ කුඩා වීණා වාදනය
කිරීම සඳහා[8] යෙයීයෙල්, ෂෙමීරා-
මොත්, යෙහීයෙල්, මත්තිතියා, එලි-
යාබ්, බෙනායා, ඕබෙද්-ඒදොම් සහ
යෙයීයෙල්ව[9] පත් කළෝය. අත්-
තාළම් ගැසීමෙන් හවුල් වුණේ[10]
ආසාෆ්ය.[11] 6 සැබෑ දෙවිගේ ගිවිසුම්
පෙට්ටිය අසල හොරණෑ[12] පිඹීමෙන්
හවුල් වුණේ පූජකයන් වූ බෙනායා
සහ යහෂියෙල්ය. ඔවුහු සියලුදෙනාම
දිගටම ගිවිසුම් පෙට්ටිය අසල එලෙස
සේවය කළෝය.

7 යෙහෝවා දෙවිට ස්තුති කිරීම
සඳහා[13] දාවිත් ගීයක් රචනා කළේය.
ආසාෆ්[14] සහ ඔහුගේ සහෝදරයන්
විසින් මුල් වතාවට එදින එම ගීතය
ගායනා කරන ලදී[15]. එම ගීය මෙ-
සේය.

8 “ජනයෙනි, යෙහෝවා දෙවිට
ස්තුති කරන්න.[16] ඔහුගේ
නාමය කියා ඔහුගෙන් අයැ-
දින්න.[17]
ඔහුගේ ක්‍රියා ගැන ජනයාට පව-
සන්න.[18]
9 ඔහුට ගී ගයන්න.[19] ඔබේ මියුරු
හඬින් ඔහුව පසසන්න.[20]
ඔහු කළ පුදුමසහගත දේවල්
ගැන කල්පනා කරන්න.[21]
10 ඔහුගේ ශුද්ධ නාමය[22] ගැන ආඩම්-
බරයෙන් කතා කරන්න.[23]
යෙහෝවා දෙවිගේ මඟ පෙන්-
වීම් පතන සියල්ලෙනි, ප්‍රීති-
යෙන් ඉපිල යන්න.[1]
11 යෙහෝවා දෙවිගේ මඟ පෙන්වීම්
පතන්න. ඔහුගෙන් ශක්තිය
ඉල්ලන්න.[2]
නිතරම ඔහුගෙන් උපකාර ඉල්-
ලන්න.[3]
12 ඔහු කළ පුදුමසහගත දේවල්ද[4]
ඔහුගේ ආශ්චර්යයන්ද ඔහු දුන්
ආඥාද සිහි කරන්න.[5]
13 ඔහුගේ සේවකයා වූ[6] ඊශ්‍රායෙල්ගේ
දරුවෙනි,
යාකොබ්ගේ පුත්‍රයෙනි, ඔහු
තෝරාගත් සෙනඟෙනි,[7]
ඒවා සිහි කරන්න.
14 ඔහු අපේ දෙවි යෙහෝවාය.[8] ඔහු
දුන් තීන්දු[9] පොළොව පුරා
ක්‍රියාත්මක වේ.
15 ඔහු ඇති කළ ගිවිසුම කිසිදා අම-
තක නොකරන්න.[10]
ඔහු පැවසූ දේ පරම්පරා දහ-
සක්[11] පුරා සිහි කරන්න.
16 ඔහු ඒ ගිවිසුම ආබ්‍රහම් සමඟ ඇති
කරගත්තේය.[12]
ඊසාක්ටද ඒ ගැන පොරොන්දු
වූයේය.[13]
17 ඒ පොරොන්දුව යාකොබ්ට සහති-
කයක් ලෙසද[14]
ඊශ්‍රායෙල්ට සදාකාල ගිවිසුමක්
ලෙසද ඔහු දුන්නේය.[15]
18 ඔහු ඔවුන්ට මෙසේ කීවේය. ‘මම
ඔබට කානාන් දේශය දෙන්-
නෙමි.[16]
එය ඔබට උරුමයක්[17] ලෙස
දෙන්නෙමි.’
19 ඔහු එසේ පවසන විට ඔවුන් කුඩා
පිරිසකි.[18]
ඒ දේශයේ විදේශිකයන් ලෙස[19]
සිටි ඔවුන් ඇත්තෙන්ම කුඩා
පිරිසක්ය.
20 ඔවුහු රටකින් රටකට ඇවිද්-
දෝය.[20]
එක් රාජ්‍යයකින් තවත් රාජ්‍යය-
කට ගියෝය.[21]

**16 පරි.**
**1** 2සාමු 6:19
**2** ගණන් 18:2
**3** 1ලේක 15:16
**4** ගීතා 38:පෙර ගීතා 103:2
**5** 1ලේක 16:7
**6** 1ලේක 23:5
**7** 1ලේක 6:39
**8** 1ලේක 15:21
**9** 1ලේක 15:18
**10** 1ලේක 15:16
**11** 1ලේක 15:17
**12** 2ලේක 15:14 2ලේක 23:13
**13** 2සාමු 22:1 2සාමු 23:1 1ලේක 16:4 2කොරි 9:12
**14** 1ලේක 6:39
**15** 2ලේක 31:14
**16** ගීතා 105:1 ගීතා 106:1 කොලො 4:2
**17** යෙසා 12:4 රෝම 10:13
**18** ගීතා 67:2 ක්‍රියා 2:14
**19** එපී 5:19
**20** 2සාමු 22:50 2සාමු 23:1
**21** ගීතා 71:17 ගීතා 107:43
**22** ලෙවී 22:32
**23** ගීතා 105:3 යෙසා 45:25 යෙරෙ 9:24 2කොරි 10:17

**2 තීරුව**
**1** 1ලේක 28:9 ගීතා 104:34 පිලි 4:4
**2** ආමො 5:6 ශෙප 2:3
**3** ගීතා 24:6 ගීතා 27:8 හොෂෙ 5:15
**4** ගීතා 106:2 ගීතා 111:4
**5** ගීතා 105:5 ගීතා 119:137
**6** යෙසා 41:8
**7** ගීතා 33:12 ගීතා 135:4 1පේතෘ 5:13
**8** නික් 15:2 ගීතා 95:7
**9** ගීතා 119:164
**10** ගීතා 105:8
**11** ද්වි 7:9
**12** උත් 15:18 උත් 17:2
**13** උත් 26:3
**14** උත් 28:14
**15** ගීතා 105:10
**16** උත් 12:7 උත් 17:8 උත් 35:12
**17** ද්වි 32:8

**1ලේක 16:3*** 1ලේක 12:40හි පාදසටහන බලන්න.

**18** උත් 34:30; ද්වි 26:5; **19** හෙබ්‍රෙ 11:13; **20** උත් 20:1; උත් 46:6; **21** ගීතා 105:13.

21 ඔවුන්ට අයිති දේ පැහැරගැනීමට
ඔහු කිසිවෙකුට ඉඩ නොදුන්නේය.[1]
ඔහු ඔවුන් නිසා රජවරුන්ට
තරවටු කරමින්,[2]
22 මෙසේ කීවේය. ‘මා අභිෂේක කළ
අයට අත නොගසන්න.
මාගේ අනාගතවක්තෘවරුන්ට
කිසි නපුරක් නොකරන්න.’[3]
23 පොළොවේ සියලු වැසියෙනි, යෙහෝවා දෙවිට ගී ගයන්න![4]
ඔහු ලබා දෙන ගැලවීම
ගැන සෑම දිනකම කතා කරන්න.[5]
24 ඔහුගේ තේජස ගැන ජාතීන් අතරේද
ඔහු කළ පුදුමසහගත දේවල්
ගැන සියලු ජනයා අතරේද
ප්‍රකාශ කරන්න.
25 යෙහෝවා දෙවි ශ්‍රේෂ්ඨය. ඔහු
බොහෝ සෙයින් ප්‍රශංසාව
ලබන්න වටින්නේය.[6]
ගරුබිය දැක්විය යුතු එකම
දෙවි ඔහුය.[7]
26 මිනිසුන් නමස්කාර කරන අන්
සියලු දෙවිවරුන්ට කිසිවක්
කළ නොහැක.[8]
නමුත් යෙහෝවා දෙවි මුළු
අහස්තලයම නිර්මාණය
කළේය.[9]
27 ගෞරවයත් තේජශ්‍රීයත් ඔහු ඉදිරියෙහිය.[10]
බලයත් ප්‍රීතියත් ඔහුගේ වාසස්ථානයෙහි ඇත.[11]
28 පොළොවේ සියලු ගෝත්‍රයෙනි,
යෙහෝවා දෙවිට ප්‍රශංසා
කරන්න.
යෙහෝවා දෙවිගේ තේජස හා
බලය ගැන කතා කරන්න.[12]
29 යෙහෝවා දෙවිගේ නාමයට දිය
යුතු ගෞරවය දෙන්න.[13]
සතුටු සිතින් යමක් රැගෙන ඔහු
ඉදිරියට එන්න.[14]
ශුද්ධ වස්ත්‍රවලින් සැරසී යෙහෝවා දෙවි ඉදිරියේ වැඳ
වැටෙන්න.[15]

30 පොළොවේ සියලු ජනයෙනි, ඔහු
කෙරෙහි ගරුබිය ඇතුව*
සිටින්න.
පොළොව ස්ථිර ලෙස පිහිටුවා
තිබේ.
එය කෙදිනකවත් නොසෙල්වෙනු ඇත.[1]
31 ස්වර්ගය ප්‍රීති වේවා! පොළොව
ප්‍රීති ඝෝෂා නඟාවා![2]
‘යෙහෝවා දෙවි රජ වී ඇත’
කියා සියලු ජාතීන් අතරේ
ඇනුම් දේවා![3]
32 මුහුදත් එහි ඇති සියල්ලත්
ඝෝෂා නඟත්වා![4]
කෙත්වතුත් එහි ඇති සියල්ලත්
සතුටු වේවා![5]
33 වනයේ සියලු ගස්ද යෙහෝවා දෙවිව ප්‍රශංසා කරමින් ප්‍රීති
ඝෝෂා නඟාවා![6]
මන්ද ඔහු පොළොව විනිශ්චය
කිරීමට පැමිණියේය.[7]
34 ජනයෙනි, යෙහෝවා දෙවිට
ස්තුති කරන්න. මන්ද ඔහු
යහපත්ය.[8]
ඔහුගේ ප්‍රේමය* සදාකල් පවතින්නේය.[9]
35 ‘අපට ගැලවීම අත් කර දෙන දෙවියනි, අපව බේරාගන්න.[10]
ඔබේ ශුද්ධ නාමයට ප්‍රශංසා
කිරීමටත්[11] ඔබව පැසසීමටත් හැකි වන පිණිස[12]
විවිධ දේශයන්වලට විසුරුවාහැරිය අපව නිදහස් කර
එකට එක් රැස් කරන්න.[13]
36 ඊශ්‍රායෙල්ගේ දෙවි යෙහෝවාට
සදාකාලයෙන් සදාකාලයටම ප්‍රශංසාව ලැබේවා!’ ”[14]

ඒ ගීය ගායනා කළ පසු සියලුදෙනාම, “ආමෙන්”* කියා පවසා යෙහෝවා දෙවිට ප්‍රශංසා කළෝය.[15]
37 දිගටම[16] යෙහෝවා දෙවිගේ
ගිවිසුම් පෙට්ටිය අසල සිටීමට

**16 පරි.**
1 උත් 31:42
2 උත් 12:17; උත් 20:3
3 උත් 20:7; ගීතා 105:15
4 ගීතා 96:1
5 ගීතා 40:10
6 ගීතා 145:3; 2කොරි 11:31
7 නික් 15:11
8 ලෙවී 19:4; යෙසා 45:20; 1කොරි 8:4
9 උත් 1:1; ගීතා 102:25; යෙසා 44:24
10 ද්වි 33:26; ගීතා 8:1
11 ගීතා 28:7; 1තිමෝ 1:11
12 ගීතා 63:2; ගීතා 68:34; ගීතා 115:1
13 ද්වි 28:58; නෙහෙ 9:5; ගීතා 66:2; ගීතා 148:13
14 1ලේක 29:5; යෙසා 18:7; මතෙ 5:23
15 ද්වි 26:10; ගීතා 95:6

**2 තීරුව**
1 ගීතා 104:5; දේශ 1:4
2 ගීතා 97:1; ගීතා 98:4
3 ගීතා 96:10; එළි 19:6
4 ගීතා 93:4
5 ගීතා 98:7
6 ගීතා 96:12; යෙසා 55:12
7 ගීතා 96:13
8 2ලේක 5:13; ලූක් 18:19
9 ගීතා 103:17; යෙරෙ 31:3; විලා 3:22
10 ගීතා 68:20
11 ගීතා 122:4
12 ගීතා 149:1; යෙසා 43:21; කොලො 3:16
13 ක්‍රියා 26:17
14 නෙහෙ 9:5; ගීතා 69:30; ගීතා 69:31; ගීතා 72:19
15 නෙහෙ 8:6
16 නික් 29:38; 2ලේක 13:11; එස්රා 3:4

**1ලේක 16:30*** මූ.අ., “භයෙන් වෙවුලමින්.” **34*** හෝ, “ඇදි ප්‍රේමය.” **36*** එනම්, එසේම වේවා!

ආසාෆ්ට[1] සහ ඔහුගේ සහෝදර-
යන්ට දාවිත් රජ නියම කළේය. ඔහු
ඔවුන්ව එසේ පත් කළේ එහි සිදු වන
වැඩකටයුතු බලාගැනීම සඳහාය.[2]
**38** මීට අමතරව ඕබෙද්-ඒදොම් සහ
ඔහුගේ සහෝදරයන් හැටඅටදෙනෙ-
කුවද ඒ සඳහා පත් කරන ලදි. දොරටු
පාලකයන් ලෙස පත් කරන ලද්-
දේ යෙදූතුන්ගේ පුත් ඕබෙද්-ඒදොම්
සහ හෝසාවය. **39** ගිබියෝන් නුව-
රේ[3] ඉදි කළ යෙහෝවා දෙවිගේ
ශුද්ධ කූඩාරමෙහි සේවය කිරීම සඳහා
පූජකයන් වූ සාදොක්[4] සහ ඔහු-
ගේ සහෝදරයන්ව පත් කරන ලදි.
**40** ඔවුන්ගේ කාර්යය වූයේ දවන පූජා
ඔප්පු කරන පූජාසනය මත දිනපතා
උදේ සවස යෙහෝවා දෙවිට දවන
පූජා ඔප්පු කිරීමය. ඔවුන් එසේ කළේ
ඊශ්‍රායෙල්වරුන්ට යෙහෝවා දෙවි
දුන් නීතියට අනුකූලවය.[5] **41** යෙ-
හෝවා දෙවිගේ ප්‍රේමය* සදහටම
පවතින නිසා[6] ඔහුට ස්තුති ප්‍රශංසා
කිරීමට[7] හේමාන්[8] හා යෙදූතුන්-
වත් තෝරාගත් තවත් පුරුෂයන්[9]
කිහිපදෙනෙකුවත් පත් කරන ලදි.
**42** හේමාන්[10] සහ යෙදූතුන්[11] හොර-
ණෑ[12] පිඹීමෙන්, අත්තාළම් ගැසී-
මෙන් හා සැබෑ දෙවිට ගී ගයන
විට භාවිත කළ වෙනත් සංගීත
භාණ්ඩ වාදනය කිරීමෙන් ඒ කාර්-
යය ඉටු කළෝය. යෙදූතුන්ගේ පුත්‍ර-
යෝ[13] සේවය කළේ දොරටුව අසලය.
**43** මෙසේ දාවිත් රජු විවිධ කාර්යයන්
සඳහා ඔවුන්ව පත් කළ පසු රැස්ව සිටි
ජනයා තම තමන්ගේ නිවෙස්වලට
ආපසු ගියෝය.[14] තමාගේ නිවසේ
සිටි අයට ආශීර්වාද කිරීම සඳහා
දාවිත් රජද ඔහුගේ නිවසට ගියේය.

**17** දාවිත් රජ තම මාලිගාවෙහි[15]
පදිංචියට ගිය පසු අනාගත-
වක්තෘ නාතන්ට[16] මෙසේ කීවේය.
“යෙහෝවා දෙවිගේ ගිවිසුම් පෙට්-
ටිය[17] කූඩාරමක තියෙද්දී[18] දේවදාර
ලීයෙන් තැනූ නිවසක[19] මම කො-
හොම ජීවත් වෙන්නද!” **2** එවිට
නාතන් ඔහුට මෙසේ පැවසීය. “නිර-
තුරුවම සැබෑ දෙවි ඔබට ආශීර්වාද
කරනවා.[1] ඒ නිසා ඔබට හොඳයි කියා
සිතෙන දෙයක් කරන්න.”[2]

**3** දෙවි එදින රාත්‍රියේ නාතන්ට
මෙසේ කීවේය.[3] **4** “මගේ සේවකයා
වන දාවිත්ට යෙහෝවා දෙවි වන
මා මෙසේ පැවසූ බව කියන්න.
‘මට වාසය කිරීමට ගෘහයක් ගොඩ-
නඟන්නේ ඔබ නොවෙයි.[4] **5** මම
ඊශ්‍රායෙල් සෙනඟව ඊජිප්තුවෙන් බේ-
රාගත් දවසේ සිට අද වන තුරු ගෘහ-
යක වාසය නොකළෙමි.[5] ඒ වෙනුවට
කූඩාරමක[6] වාසය කළ මම එය
රැගෙන ගිය සෑම තැනකටම ගමන්
කළෙමි.[7] **6** ඊශ්‍රායෙල්වරුන් සමඟ
තැනින් තැනට ගමන් කළ ඒ කාල-
යේදී, ‘මට දේවදාර ලීයෙන් ගෘහයක්
තැනුවේ නැත්තේ ඇයි’ කියා මා
කිසිදා අසා තිබෙනවාද? මාගේ සෙ-
නඟ රැකබලා ගැනීමට පත් කළ
එක විනිශ්චයකරුවෙකුගෙන්වත් මම
එවැනි දෙයක් ඇසුවේ නැත.’

**7** “මගේ සේවකයා වන දාවිත්ට
මේ දේත් කියන්න. ‘ස්වර්ගයේ සේ-
නාවල අධිපති වන යෙහෝවා දෙවි
ඔබට මෙසේ පවසනවා. “ඔබ තණ-
බිම්වල බැටළුවන් බලාගනිමින් සිටි
කාලයේදී[8] මම ඔබව තෝරාගෙන
මාගේ සෙනඟ වන ඊශ්‍රායෙල්වරුන්-
ගේ පාලකයා හැටියට පත් කළෙමි.[9]
**8** ඔබ කොතැනකට ගියත් මම ඔබ
සමඟ සිටිමි.[10] ඔබේ සියලු සතු-
රන්ව ඔබ ඉදිරියේම විනාශ කර
දමන්නෙමි.[11] පොළොවේ ජීවත් වන
ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයන් හා සමානව[12] මම
ඔබේ නාමයත් කීර්තියට පමුණුවන්-
නෙමි.[13] **9** මම මාගේ සෙනඟ වන
ඊශ්‍රායෙල්වරුන්ට ජීවත් වීමට ස්ථා-
නයක් වෙන් කර හැමදාටම ඔවුන්ව
එහි පදිංචි කරවන්නෙමි.[14] කිසි කෙ-
නෙකුගෙන් කරදරයක් නැතුව ඔවුහු
දිගටම එහි ජීවත් වනු ඇත. දුෂ්ට-
යෝ[15] යළි කෙදිනකවත් ඔවුන්ට හිරි-
හැර කරන්නේ නැත.[16] **10** මාගේ

**16 පරි.**
1 1ලේක 15:17
2 1ලේක 16:4
3 1රාජා 3:4
2ලේක 1:3
4 1ලේක 12:28
5 නික් 29:39
ගණන් 28:3
2ලේක 2:4
2ලේක 31:3
6 එස්රා 3:11
ගීතා 86:15
ගීතා 103:17
7 1ලේක 16:4
2ලේක 5:13
8 1ලේක 25:1
9 එස්රා 8:20
10 1ලේක 6:33
11 1ලේක 15:17
12 2ලේක 29:26
13 1ලේක 25:3
14 2සාමු 6:19
1රාජා 8:66

**17 පරි.**
15 2සාමු 7:1
16 1රාජා 1:8
1ලේක 29:29
17 හෙබ්‍රෙ 9:4
18 2සාමු 7:2
1ලේක 15:1
2ලේක 1:4
19 1ලේක 14:1

**2 තීරුව**
1 2සාමු 7:3
2 1ලේක 22:7
3 ගණන් 12:6
4 2සාමු 7:5
1රාජා 8:19
1ලේක 22:8
5 2සාමු 7:6
6 ගණන් 4:25
ගීතා 78:60
7 නික් 40:2
2සාමු 6:17
8 1සාමු 16:12
1සාමු 17:15
ගීතා 78:70
9 1සාමු 25:30
2සාමු 6:21
10 1සාමු 18:14
2සාමු 8:6
11 1සාමු 25:29
1සාමු 26:10
12 2සාමු 7:9
13 උත් 12:2
1සාමු 18:30
ගීතා 75:7
ලූක් 1:52
14 ගීතා 44:2
යෙසා 61:3
15 ගීතා 89:22
16 නික් 2:23
2සාමු 7:10

1ලේක 16:41* හෝ, “ළැදි ප්‍රේමය.”

සෙනඟ වන ඊශ්‍රායෙල්වරුන්ව බලා-
ගැනීමට මා විනිශ්චයකරුවන්ව[1] පත්
කළ කාලයේදී සිදු වූ ඒ දේවල්
නැවත සිදු වන්නේ නැත. මම ඔබේ
සියලු සතුරන්ව අවමානයට ලක්
කරන්නෙමි.[2] යෙහෝවා දෙවි වන
මම ඔබෙන් රාජකීය පෙළපතක් බිහි
කරන්නෙමි. ඒ බව ඔබට ස්ථිර වශ-
යෙන්ම මම පොරොන්දු වෙමි.[3]

**11** “ ‘ “ඔබ මිය ගොස් ඔබේ මුතුන්-
මිත්තන් සමඟ ඔබව තැන්පත් කළ
පසු[4] ඔබේ පෙළපතෙන් පැමිණෙන
ඔබේම පුත්‍රයෙකුට මම රජකම භාර
දෙන්නෙමි.[5] මම ඔහුගේ රජකම
ස්ථිර කරන්නෙමි.[6] **12** මට ගෘහ-
යක් ගොඩනඟන්නේ ඔහුය.[7] මම
ඔහුගේ සිංහාසනය සදහටම පවතින
ලෙස ස්ථිර කරන්නෙමි.[8] **13** මම
ඔහුට පියෙක් වන්නෙමි.[9] ඔහු
මට පුත්‍රයෙක් වන්නේය.[10] ඔබට
කලින් සිටි තැනැත්තා මාගේ කරු-
ණාව අහිමි කරගත්තේය.[11] නමුත්
ඔබේ පුත්‍රයාට මම එසේ නොකරන්-
නෙමි. මම හැමදාටම ඔහුට ප්‍රේමණී-
යව* සලකන්නෙමි.[12] **14** මම ඔහුට
දෙන රජකම[13] හා ඔහුගේ රාජ-
කීය පෙළපත කිසිදා නැති නො-
වන්නේය.[14] ඔහුගේ සිංහාසනයද[15]
සදහටම පවතින්නේය.” ’ ”

**15** දෙවි, නාතන්ට හෙළි කළ මේ
සියලු දේවල් ඔහු දාවිත් රජුට දැන්-
වීය.[16]

**16** ඉන්පසු දාවිත් රජ තම නිවස
ඇතුළට ගොස් හිඳගෙන, යෙහෝවා
දෙවිට මෙසේ යාච්ඤා කළේය.[17]
“යෙහෝවා දෙවියනි, ඔබ මා වෙනු-
වෙන් මෙතරම් දේවල් කරන්න මම
කවුද?[18] මම උසස් පවුලකින් පැව-
තෙන කෙනෙක් නෙමෙයි.[19] ඔබේ
ආශීර්වාද ලබන්න තරම් මම වටින්-
නේ නැහැ.[20] **17** දෙවියනි,[21] ඔබේ
සේවකයා වන මා වෙනුවෙන් ඔබ
දැනටමත් කොතරම් දේවල් කර
තිබෙනවාද![22] ඒ විතරක්ද, මගේ පෙ-
ළපත බොහෝ කාලයක් පුරා පවති-
නවා කියාත් ඔබ දැන් මට දැන්නුවා.[1]
යෙහෝවා දෙවියනි, මෙතරම් උසස්
තනතුරක් ලබන්න මා සුදුසු බව ඔබ
තීරණය කර තිබෙනවා.[2] **18** ඔබ
ඔබේ සේවකයා හොඳින් අඳුනනවා.[3]
ඔබ මට කොතරම් ගෞරවයක් දී
තිබෙනවාද![4] ඒ ගැන මම තව මො-
නවා කියන්නද! **19** යෙහෝවා දෙ-
වියනි, ඔබ මේ සියලු පුදුම දේ
කළේ ඔබේ කැමැත්තට එකඟවයි.[5]
ඒ හැම දෙයක් ගැනම ඔබ ඔබේ සේ-
වකයා වන මට දැන්නුවා.[6] ඔබ
මේ සියල්ල කළේ මා වෙනුවෙ-
නුයි. **20** යෙහෝවා දෙවියනි, ඔබට
සමාන වෙන කිසි දෙවි කෙනෙක්
නැහැ.[7] ඒ බව අපි ඇසූ දුටු දෙයින්
හොඳින්ම පැහැදිලියි. **21** ඔබේ සෙ-
නඟ වන ඊශ්‍රායෙල්වරුන්ට සමාන
තවත් ජාතියක් නැහැ.[8] ඔවුන්ව ඔබේ
සෙනඟ කරගන්නා පිණිස සැබෑ දෙවි
වන ඔබම ඔවුන්ව බේරාගත්තා.[9] ඔබ
ඔවුන් වෙනුවෙන් බිය උපදවන පුදු-
මාකාර දේවල් කර ඔබට ශ්‍රේෂ්ඨ
නාමයක් ඇති කරගත්තා.[10] ඊජිප්තු-
වෙන් බේරාගත් ඔබේ සෙනඟ වෙනු-
වෙන් ඔබ අවට ජාතීන්ව පන්නා
දැමුවා.[11] **22** ඉන්පසු ඔබ ඊශ්‍රායෙල්
ජාතියව සදහටම ඔබේම සෙනඟ
ලෙස පිළිගත්තා.[12] යෙහෝවා දෙවි-
යනි, දැන් ඔවුන්ගේ දෙවි ඔබයි.[13]
**23** දෙවි වූ යෙහෝවා, ඔබේ සේව-
කයා ගැනත් ඔහුගෙන් පැවතෙන
පෙළපත ගැනත් ඔබ පැවසූ දේ
එලෙසම ඉටු වේවා! ඔබ කියූ දේ
හැමදාටම ස්ථිර වේවා! **24** ඔබේ
නාමය[14] නොවෙනස්ව පවතීවා! එය
සදහටම ශ්‍රේෂ්ඨ නාමයක් ලෙස පව-
තීවා![15] එවිට ජනයා, ‘ස්වර්ගයේ සේ-
නාවල අධිපති වන යෙහෝවා දෙවි[16]
සැබවින්ම ඊශ්‍රායෙල්හි දෙවිය’[17] කියා

---

**1ලේක 17:13*** හෝ, “ළැදි ප්‍රේමයකින්.”

**17 පරි.**
**1** විනි 2:16
**2** ගීතා 18:40
**3** 2සාමු 7:11
ගීතා 127:1
**4** 1රාජා 2:10
ක්‍රියා 2:29
**5** 1රාජා 8:20
ගීතා 132:11
**6** 1රාජා 9:5
1ලේක 28:5
යෙරෙ 23:5
**7** 1රාජා 5:5
1ලේක 22:10
**8** ගීතා 89:4
යෙසා 9:7
දානි 2:44
**9** 2සාමු 7:14
ගීතා 89:26
හෙබ්‍රෙ 1:5
**10** ගීතා 2:7
ලූක් 9:35
**11** 1සාමු 15:28
1ලේක 10:14
**12** 2සාමු 7:15
යෙසා 55:3
**13** ගීතා 2:6
දානි 2:44
යොහ 1:49
2පේතෘ 1:11
**14** 2සාමු 7:16
ලූක් 1:33
**15** ගීතා 89:36
යෙරෙ 33:21
ලූක් 1:32
හෙබ්‍රෙ 1:8
එළි 3:21
**16** 2සාමු 7:17
**17** 2සාමු 7:18
**18** උත් 32:10
**19** 1සාමු 9:21
**20** 2සාමු 7:8
**21** එෆී 3:20
**22** 2සාමු 7:19

**2 තීරුව**
**1** මතෙ 22:42
ක්‍රියා 13:34
එළි 22:16
**2** 1සාමු 2:8
ගීතා 89:19
**3** ගීතා 139:1
හිතෝ 15:11
හෙබ්‍රෙ 4:13
**4** 1සාමු 2:30
2සාමු 7:20
**5** 2සාමු 7:21
ගීතා 135:6
**6** ආමො 3:7
**7** නික් 15:11
ද්වි 3:24
ද්වි 4:35
1සාමු 2:2
ගීතා 86:8
යෙසා 43:10
**8** ද්වි 4:7
ද්වි 33:28
ගීතා 147:20
**9** නික් 19:5
ගීතා 77:15
තීත 2:14

---

**10** ද්වි 4:34; නෙහෙ 9:10; යෙසා 63:12; එස 20:9; **11** ද්වි 7:1; යොෂු 10:42; යොෂු 21:44; යොෂු 24:12; ගීතා 44:2; **12** ද්වි 7:6; ද්වි 26:18; 1සාමු 12:22; **13** උත් 17:7; ද්වි 7:9; යෙරෙ 31:33; **14** 2ලේක 6:33; ගීතා 72:19; මතෙ 6:9; **15** ගීතා 99:3; යොහ 12:28; **16** 1සාමු 1:11; **17** ගීතා 33:12; යෙරෙ 31:1; හෙබ්‍රෙ 11:16.

පවසයි. ඔබේ සේවකයා වන මගේ
පෙළපත ඔබ ඉදිරියෙහි සඳහටම පව-
තීවා![1] **25** මාගේ දෙවියනි, ඔබේ
සේවකයාට පෙළපතක් බිහි කර දීම
ඔබේ අරමුණ බව ඔබ පැවසුවා.[2]
ඔබේ සේවකයා වන මා ඔබ ඉදි-
රියේ මෙලෙස යාච්ඤා කරන්නේ
ඒ නිසයි. **26** යෙහෝවා දෙවියනි,
සැබෑ දෙවි ඔබයි.[3] ඔබේ සේවක-
යාට මේ යහපත් දේවල් දෙන බවට
ඔබ පොරොන්දු වුණා.[4] **27** එහෙ-
යින් යෙහෝවා දෙවියනි, ඔබේ සේව-
කයාගේ පෙළපත හැමදාටම ඔබ
ඉදිරියේ පවතින පිණිස[5] එයට ආශීර්-
වාද කරන්න. ඔබේ ආශීර්වාද සඳහ-
ටම ඊට ලැබේවා!”[6]

**18** කලක් ගත වූ පසු දාවිත්
රජ පිලිස්තිවරුන්ට පහර
දී ඔවුන්ව යටත් කරගෙන[7] ඔවුන්
යටතේ තිබූ ගාත්[8] සහ ඒ අවට
පිහිටි කුඩා නුවරවල්ද අල්ලාගත්-
තේය. **2** පසුව ඔහු මෝවබ්වරුන්ට
පහර දුන්නේය.[9] ඔවුන්ද දාවිත් රජු
යටතට පත් වූ අතර ඔවුහු ඔහුට කප්-
පම් ගෙව්වෝය.[10]
**3** ෂොබාහි[11] රජු වූ හදද්එෂේර්,[12]
යුප්‍රටීස් ගඟ[13] අවට ප්‍රදේශය තම පාල-
නය යටතට ගැනීම සඳහා පිටත්ව
ආවේය. එවිට දාවිත් රජ, හමාත්
නම් නුවරේදී[14] ඔහුට පහර දුන්නේය.
**4** ඔහුට අයිතිව තිබූ අශ්ව රථ දහ-
සක්ද අසරුවන් හත්දහසක්ද පාබළ
හමුදාවෙන් මිනිසුන් විසිදහසක්ද
දාවිත් රජ අල්ලාගත්තේය.[15] ඔහු
අශ්ව රථ සියයකට අවශ්‍ය අශ්වයන්
පමණක් තබාගෙන අනිකුත් සියලුම
අශ්වයන්ගේ[16] පාද තුවාල කළේය.[17]
**5** දමස්කයේ ජීවත් වූ සිරියන්වරුන්
ෂොබාහි රජු වූ[18] හදද්එෂේර්ගේ උප-
කාරයට පැමිණි විට දාවිත් රජ ඔවුන්-
ගෙන් විසිදෙදහසක්වද මරා දැමුවේය.
**6** ඉන්පසු දාවිත් රජ සිරියන්වරුන්
විසූ දමස්කයේ[19] මුර කඳවුරු පිහි-
ටෙව්වේය. පසුව සිරියන්වරු දාවිත්
රජුගේ සේවකයන් බවට පත් වී
ඔහුට කප්පම් ගෙව්වෝය.[20] දාවිත්
රජ ගිය ගිය තැන්වල යෙහෝවා
දෙවි ඔහුට ජය අත් කර දුන්නේය.[1]
**7** හදද්එෂේර් රජුගේ සේවකයන්ගේ
රන් පලිස්[2] දාවිත් රජ යෙරුසල-
මට ගෙන ගියේය.[3] **8** හදද්එෂේර් රජු
යටතේ තිබූ තිබ්හත්[4] සහ කූන් යන
නුවරවලින් ගත් විශාල තඹ ප්‍රමාණ-
යක්ද දාවිත් රජ රැගෙන ගියේය. පසු
කාලයකදී දේවමාලිගාවේ කුලුනුද[5]
වතුර දැමීම සඳහා විශාල තඹ භාජන-
යක්ද[6] වෙනත් තඹ භාජනද[7] සෑදීමට
සලමොන් රජු භාවිත කළේ එම
තඹය.
**9** ෂොබාහි රජු වූ හදද්එෂේර්ගේ[8]
මුළු යුධ හමුදාවම දාවිත් රජු පරාජ-
යට පත් කළ බව හමාත්හි රජු වූ[9]
තොයුට ආරංචි විය. **10** එවිට ඔහු
දාවිත් රජුගේ සැප දුක් විමසීමටත්
හදද්එෂේර් රජුට එරෙහිව දාවිත් රජු
ලද ජයග්‍රහණයට සුබ පැතීමටත්
ඔහුගේ පුත් හදොරාම්ව[10] යැව්වේය.
(මීට පෙරාතුව හදද්එෂේර් රජු සහ
තොයු රජු අතර නිතරම ගැටුම් පැව-
තිණ.) ඔහු යන විට රන්, රිදී[11] සහ
තඹවලින් නිමැවූ විවිධාකාර භාණ්ඩද
රැගෙන ගියේය. **11** ඒ සියලු වස්-
තූද ඔහු යටත් කරගත්[12] ඒදොම්-
වරුන්ගෙන්, මෝවබ්වරුන්ගෙන්,[13]
අම්මොන් පුත්‍රයන්ගෙන්,[14] පිලිස්ති-
වරුන්ගෙන්[15] සහ අමලෙක්වරුන්-
ගෙන්[16] ලබාගත් රන් හා රිදීද දාවිත්
රජ යෙහෝවා දෙවිට කැප කළේය.[17]
**12** ෂෙරුයියාගේ[18] පුත් අබි-
ෂයි,[19] ලුණු නිම්නයේදී[20] ඒදොම්ව-
රුන් දහඅටදහසක්ව මරා දැමුවේය.
**13** ඉන්පසු ඔහු ඒදොම් දේශයේ
මුර කඳවුරු පිහිටෙව්වේය. සියලුම
ඒදොම්වරු දාවිත් රජුගේ සේවක-
යන් බවට පත් වූවෝය.[21] දාවිත්
රජු ගිය ගිය තැන්වල යෙහෝවා
දෙවි ඔහුට ජය අත් කර දුන්නේය.[22]
**14** දාවිත් රජ මුළු ඊශ්‍රායෙල් දේශයම
පාලනය කළේය.[23] ඔහු තම සෙ-
නඟට ධර්මිෂ්ඨ ලෙස පාලනය කර-

**17 පරි.**
1 ගීතා 89:36
2 2සාමු 7:27
3 උත් 5:22
4 2සාමු 7:28
5 2සාමු 7:29
6 හිතෝ 10:6

**18 පරි.**
7 2සාමු 8:1
8 1සාමු 5:8
1සාමු 27:4
2සාමු 1:20
9 ගණන් 24:17
ගීතා 60:8
10 2සාමු 8:2
2රාජා 3:4
11 1සාමු 14:47
2සාමු 10:6
ගීතා 60:පෙර
12 2සාමු 8:3
1රාජා 11:23
13 උත් 15:18
නික් 23:31
14 2ලේක 8:3
15 2සාමු 8:4
ගීතා 20:7
16 ගීතා 33:17
17 ද්වි 17:16
යොෂු 11:6
18 1සාමු 14:47
19 යෙසා 7:8
20 2සාමු 8:6
හිතෝ 13:22

**2 තීරුව**
1 1ලේක 17:8
2 1රාජා 10:16
3 2සාමු 8:7
4 2සාමු 8:8
5 1රාජා 7:15
යෙරෙ 52:20
6 1රාජා 7:23
7 1රාජා 7:45
8 2සාමු 8:3
9 2සාමු 8:9
10 2සාමු 8:10
11 2ලේක 9:24
12 2සාමු 8:11
13 2සාමු 8:12
14 1ලේක 20:1
15 2සාමු 5:25
16 1සාමු 27:8
1සාමු 30:20
17 යොෂු 6:19
1ලේක 29:14
2ලේක 5:1
18 2සාමු 21:17
1ලේක 2:16
19 1සාමු 26:6
2සාමු 3:30
2සාමු 10:10
2සාමු 20:6
20 2සාමු 8:13
21 උත් 25:23
උත් 27:40
22 2සාමු 8:14
ගීතා 18:48
ගීතා 144:10
23 1රාජා 2:11

මින් ඔවුන්ට යුක්තිය ඉටු කළේය.[1]
**15** ඔහුගේ හමුදාපති ලෙස කටයුතු
කළේ ෂෙරුයියාගේ පුත්‍රයා වූ යෝ-
වාබ්ය.[2] අහිලූද්ගේ පුත්‍රයා වූ යෙහෝ-
ෂපාට්[3] වාර්තාකරු ලෙස සේවය
කළේය. **16** පූජකයන් ලෙස කට-
යුතු කළේ අහිතුබ්ගේ පුත්‍රයා වූ
සාදොක්[4] සහ අබියාතර්ගේ පුත්‍රයා වූ
අහිමෙලෙක්ය.[5] ෂව්ෂා[6] ලේකම් ලෙස
කටයුතු කළේය. **17** යෙහෝයාදා-
ගේ[7] පුත්‍රයා වූ බෙනායා[8] කෙරෙති-
වරුන්ගේ[9] සහ පෙලෙතිවරුන්ගේ[10]
අධිපතියා ලෙස කටයුතු කළේය.
දාවිත් රජුගේ පුත්‍රයෝ ප්‍රධාන අධිප-
තීන් ලෙස සේවය කළෝය.[11]

**19** කල් යත්ම අම්මොන්වරුන්-
ගේ රජු වූ නාහාෂ්[12] මිය
ගියේය. ඉන්පසු ඔහුගේ පුත්‍රයා රජ-
කම් කිරීමට පටන්ගත්තේය.[13] **2** ඒ
ගැන ආරංචි වූ දාවිත් රජ මෙසේ
පැවසීය. "නාහාෂ් ජීවතුන් අතර
සිටිද්දී මට ප්‍රේමණීයව* සැලකුවා.[14]
ඒ නිසා මමත් ඔහුගේ පුත් හානූන්ට
ප්‍රේමය# පෙන්විය යුතුයි."[15] එහෙ-
යින් දාවිත් රජ වියෝදුකින් පෙළුණු
හානූන් රජුව සැනසීම සඳහා සේවක-
යන් කිහිපදෙනෙකුව ඔහු වෙතට
යැවීය. දාවිත් රජුගේ එම සේවක
පිරිස අම්මොන්වරුන්ගේ[16] දේශයට
ගියෝය. **3** මේ ගැන දැනගත් අම්-
මොන්වරුන්ගේ අධිපතීහු හානූන්
රජුට මෙසේ කීවෝය. "දාවිත් ඔබව
සනසන්න මිනිසුන්ව එවා තිබෙන්-
නේ ඔබේ පියාට කරන ගෞරව-
යක් හැටියට කියාද ඔබ හිතන්නේ?
ඔහු ඔවුන්ව එවා තිබෙන්නේ අපේ
දේශය ගැන ඔත්තු බලා[17] එය
අල්ලාගැනීමේ අදහසිනුයි."[18] **4** එය
ඇසූ හානූන් රජ, දාවිත් රජුගේ[19]
සේවකයන්ගේ රැවුල් කපා[20] තට්-
ටම් පෙනෙන තරමටම ඔවුන්ගේ
ඇඳුම් කොටට කැපුවේය.[21] ඉන්පසු
ඔහු ඔවුන්ව පිටත් කර හැරියේය.[22]

**5** ඔවුන්ට සිදු වූ දේ ගැන පිරිසක්
පැමිණ දාවිත් රජුට දැන්වූවෝය. එය
ඇසූ දාවිත් රජ, බොහෝ සෙයින්
ලැජ්ජාවට පත්ව සිටි ඒ මිනිසුන්ව
හමු වීමට තවත් සේවක පිරිසක්ව
යවා ඔවුන්ට මෙසේ දැන්වීය. "ඔබේ
රැවුල් නැවත වැවෙන තෙක් යෙරි-
කෝවට[1] වෙලා ඉන්න."

**6** තමන් සමඟ දාවිත් රජු දැඩි
වෛරයකින්[2] සිටින බව අම්මොන්-
වරු දැනගත්තෝය. ඒ නිසා හානූන්
රජ[3] තම සෙනඟ වන අම්මොන්ව-
රුන් සමඟ කතා වී, අශ්ව රථ[4]
සහ අසරුවන් කුලියට ගැනීමට
රිදී තලෙන්ත*[5] දහසක් මෙසපො-
තේමියාව හා ආරම්-මයකා[6] යන
ප්‍රදේශවලටත් ෂොබා රාජධානියටත්[7]
යැව්වේය. **7** මෙසේ ඔවුහු අශ්ව රථ
තිස්දෙදහසක්ද[8] මයකාහි රජු සහ
ඔහුගේ සේනාවද[9] කුලියට ගත්-
තෝය. ඒ සමූහය පැමිණ මේ-
දෙබා නම් නුවර[10] අසල කඳවුරු
බැඳගත්තෝය. අම්මොන්වරුද තම
නුවරවලින් පිටත්ව ඇවිත් යුද්ධයට
සූදානම් වූහ.

**8** ඒ ගැන දැනගත් විගස දාවිත්
රජ යෝවාබ්වද[11] එඩිතර මිනිසුන්-
ගෙන්[12] යුත් තම මුළු යුධ හමුදාවද
සටන් කිරීම සඳහා පිටත් කර යැවීය.
**9** එවිට අම්මොන්වරු නුවරට ඇතුල්
වන ස්ථානය ඉදිරිපිටටම ගොස් යුද්-
ධය සඳහා සැරසුණෝය. රජවරුද[13]
ඔවුන්ගේ හමුදා සමඟ තණබිමේ
රැස්ව සිටියෝය.

**10** සතුරු හමුදාව දෙපැත්තෙන්ම
පහර දීමට සූදානම්ව සිටින බව දුටු
යෝවාබ්, ඊශ්‍රායෙල්හි සිටි දක්ෂ-
තම සෙබළුන් කණ්ඩායමක් තෝරා-
ගෙන සිරියන්වරුන්ට පහර දීමට
ගියේය.[14] **11** ඔහු ඉතුරු සෙබළුන්ව
තම සහෝදරයා වූ අබිෂයිගේ[15] නාය-
කත්වය යටතේ අම්මොන්වරුන්ට[16]
පහර දීම සඳහා යැව්වේය. **12** එසේ

---

**1ලේක 19:2*** හෝ, "ලැදි ප්‍රේමයකින්." **2#** හෝ, "ලැදි ප්‍රේමය."

**1ලේක 19:6*** තලෙන්තයක් යනු කිලෝග්‍රෑම් 34.2ක් පමණය.

---

**18 පරි.**
**1** 2සාමු 8:15; 2සාමු 23:3; ගීතා 78:72
**2** 2සාමු 8:16; 1ලේක 11:6
**3** 1රාජා 4:3
**4** 2සාමු 20:25
**5** 2සාමු 8:17
**6** 2සාමු 20:25
**7** 1රාජා 1:38
**8** 2සාමු 8:18
**9** 1සාමු 30:14; ශෙප 2:5
**10** 1රාජා 1:44
**11** 2සාමු 8:18

**19 පරි.**
**12** 1සාමු 11:1
**13** 2සාමු 10:1
**14** 2සාමු 10:2
**15** 2සාමු 9:7; හිතෝ 19:22
**16** උත් 19:38
**17** යොෂු 2:1
**18** යෙසා 32:7
**19** ගීතා 35:12
**20** ලෙවී 19:27
**21** යෙසා 20:4
**22** 2සාමු 10:4

**2 තීරුව**
**1** 1රාජා 16:34
**2** 1සාමු 13:4
**3** 2සාමු 10:1
**4** ගීතා 20:7
**5** 2ලේක 25:6
**6** 2සාමු 10:6
**7** 1සාමු 14:47; 2සාමු 8:3
**8** යෙසා 31:1
**9** 2සාමු 10:6
**10** යොෂු 13:9
**11** 2සාමු 8:16
**12** 2සාමු 23:8
**13** 2සාමු 10:8
**14** 2සාමු 10:9; හිතෝ 20:18
**15** 1ලේක 11:20
**16** 2සාමු 8:12

යැවීමට පෙර යෝවාබ්, අබිෂ-
යිට මෙසේ කීවේය. “සිරියන්වරුන්ට[1]
මුහුණ දෙන්න අපිට බැරි වුණොත්
ඔබ ඔබේ පිරිස සමඟ අපේ උදව්-
වට එන්න.[2] ඔබට අම්මොන්වරුන්ට
මුහුණ දෙන්න බැරි වුණොත් අපි
ඔබේ උදව්වට එන්නම්.[3] **13** කිසිම
දෙයකට භය වෙන්න එපා.[4] අපේ
සෙනඟ වෙනුවෙනුත් අපේ දෙවිගේ
නුවරවල් වෙනුවෙනුත් අපි එඩිතරව
සටන් කරමු.[5] හරියි කියා යෙහෝවා
දෙවි සිතන දේ අනිවාර්යයෙන්ම සිදු
වෙයි.”[6]

**14** යෝවාබ් සහ ඔහු සමඟ සිටි
සෙබළු ඉදිරියට පැමිණ සිරියන්ව-
රුන්ට පහර දුන්නෝය.[7] පසුව සිරි-
යන්වරු ඔවුන් වෙතින් පලා
ගියෝය.[8] **15** සිරියන්වරුන් පලා
යන බව දුටු අම්මොන්වරුද යෝ-
වාබ්ගේ සහෝදරයා වූ අබිෂයි වෙ-
තින් පලා ගොස්[9] නුවරට ඇතුල්
වූහ.[10] ඉන්පසු යෝවාබ්ද ආපසු යෙ-
රුසලමට ගියේය.

**16** ඊශ්‍රායෙල්වරුන් අතින් පරාජ-
යට පත් වූ නිසා[11] සිරියන්වරු පණිවි-
ඩකරුවන් යවා මහ ගඟ*[12] අවට
ප්‍රදේශවල වාසය කළ සිරියන්වරුන්
විශාල පිරිසක්වද ගෙන්වාගත්තෝය.
ඔවුන්ගේ නායකයා වූයේ හදද්එෂෙර්
රජුගේ හමුදාපති ෂෝපාක්ය.

**17** ඒ ගැන දාවිත් රජුට ආරංචි
වූ විට ඔහු ඉක්මනින්ම ඊශ්‍රායෙල්
හමුදාව රැස් කර යොර්දාන් ගඟෙන්
එගොඩ වී ඔවුන්ට විරුද්ධව යුද්ධ-
යට සැරසුණේය.[13] සිරියන්වරුද ඔහුට
විරුද්ධව සටන් කිරීමට පටන්ගත්-
තෝය. **18** නමුත් ඊශ්‍රායෙල් හමුදාව
අතින් පරාජය වූ සිරියන්වරු පලා
ගියෝය.[14] දාවිත් රජ සිරියන්වරුන්-
ගේ අශ්ව රථ පදවන්නන් හත්දහ-
සක්ද පාබළ හමුදාවට අයත් සෙබළුන්
හතළිස්දහසක්ද මරා දැමුවේය. ඔහු
සිරියන්වරුන්ගේ හමුදාපති වූ ෂෝ-
පාක්වද මරා දැමුවේය.[15] **19** තමන්

ඊශ්‍රායෙල්වරුන් අතින් පරාජයට පත්
වූ නිසා[1] හදද්එෂෙර් රජු යටතේ යුද්ධ
කළ සියලුදෙනා ඉක්මනින්ම ගොස්
දාවිත් රජු සමඟ සමාදාන වී ඔහුට සේ-
වය කිරීමට පටන්ගත්තෝය.[2] ඉන්පසු
කිසිදාක අම්මොන්වරුන්ගේ උපකාර-
යට යැමට සිරියන්වරු කැමති වූයේ
නැත.[3]

**20** ඊළඟ අවුරුද්දේ මුල් කාල-
යේදී[4] එනම්, සාමාන්‍යයෙන්
රජවරුන් යුද්ධයට යන කාලයේදී[5]
යෝවාබ් තම හමුදාව සමඟ අම්-
මොන්වරුන්ට විරුද්ධව යුද්ධයට
ගියේය.[6] නමුත් දාවිත් රජ එම යුද්ධ-
යට නොගොස් යෙරුසලමෙහි නැවතී
සිටියේය. යෝවාබ්, අම්මොන්වරුන්-
ගේ දේශය නටබුන් ගොඩක් බවට
පත් කර රබ්බා නුවරද[7] වැටලුවේය.
ඔහු එම නුවරටත් පහර දී එය විනාශ
කළේය.[8] **2** පසුව දාවිත් රජ රබ්බා
නුවරින් බොහෝ වස්තු කොල්ල
කෑවේය.[9] මල්කාම් නම් දෙවියාගේ
හිසේ තිබූ ඔටුන්න දාවිත් ගලවාගත්-
තේය.[10] අනර්ඝ මැණික් අල්ලා තිබූ
එම ඔටුන්නේ බර රත්තරන් තලෙන්-
තයක් විය. පසුව එය දාවිත්ගේ හිස
මත තබන ලදි. **3** දාවිත් රජ ඒ
නුවරේ සිටි වැසියන්ව ගෙනැවිත්
ඔවුන්ගෙන් වැඩ ගත්තේය.[11] ඔහු
ඔවුන්ට යකඩින් සෑදූ තියුණු ආයුධද
පොරෝද දී ඔවුන් ලවා විශාල ගල්
කප්පවාගත්තේය.[12] ඔහු අම්මොන්ව-
රුන්ගේ නුවරවල සිටි සියලු වැසියන්-
ගෙන් එසේ වැඩ ගත්තේය. පසුව
දාවිත් රජ ඔහු සමඟ සිටි සියලුදෙනා
සමඟ නැවත යෙරුසලමට ගියේය.

**4** ගෙෂෙර්හිදී පිලිස්තිවරුන්[13]
සමඟ නැවතත් යුද්ධයක් ඇති විය.[14]
හූෂා නම් නුවරින් පැමිණි සිබ්-
බෙකයි,[15] රෙෆායි[16] ජාතිකයෙකු වූ
සිප්පයිව මරා දැමුවේ මේ යුද්ධයේ-
දීය. එවිට පිලිස්තිවරු දාවිත් රජුට
යටත් වූහ.

**5** පිලිස්තිවරුන්ට විරුද්ධව තවත්
යුද්ධයක් ඇති විය. යායිර්ගේ
පුත් එල්හානාන්,[17] ගාත්හි වැසියෙකු

**19 පරි.**
1 2සාමු 8:5
2 දේශ 4:9
3 2සාමු 10:11
4 ද්වි 31:6; යොෂු 1:7
5 2සාමු 10:12
6 යෙසා 46:10
7 2සාමු 10:13
8 ලෙවී 26:7; ද්වි 28:7
9 ලෙවී 26:8
10 2සාමු 10:14
11 2සාමු 10:15
12 2සාමු 8:3
13 2සාමු 10:17
14 1ලේක 19:14; ගීතා 33:16
15 2සාමු 10:18

**2 තීරුව**
1 ද්වි 28:7; ගීතා 18:39
2 1ලේක 14:17; ගීතා 18:44
3 2සාමු 10:19

**20 පරි.**
4 1රාජා 20:26
5 2සාමු 11:1; දේශ 3:8
6 1ලේක 11:6
7 ද්වි 3:11
8 2සාමු 12:26
9 2සාමු 8:11; 1ලේක 18:11
10 2සාමු 12:30
11 1රාජා 9:21
12 2සාමු 12:31
13 2සාමු 21:15
14 2සාමු 21:18
15 1ලේක 11:29
16 ද්වි 3:13
17 2සාමු 21:19

1ලේක 19:16* එනම්, යුප්‍රටීස් ගංගාව.

වූ ගොලියත්ගේ[1] සහෝදරයා වන
ලාමීව මරා දැම්මේ ඒ යුද්ධයේදීය. ඒ
සඳහා ලාමී භාවිත කළ හෙල්ලය රෙදි
විවීමේදී භාවිත කරන පොල්ලක්
මෙන් විය.[2]

**6** නැවතත් ගාත්හිදී[3] යුද්ධයක්
ඇති විය. අත්වල ඇඟිලි හය බැගින්ද
පාදවල ඇඟිලි හය බැගින්ද එනම්,
ඇඟිලි විසිහතරක්[4] ඇති යෝධ-
යෙක්ද[5] එම යුද්ධයට හවුල් විය.
ඔහු රෙෆායිවරයෙකි.[6] **7** ඔහු එහිදී
ඊශ්‍රායෙල්වරුන්ට නින්දා කරමින්
සිටියේය.[7] අන්තිමේදී දාවිත් රජුගේ
සහෝදරයා වූ ෂිමෙයාගේ[8] පුත්‍රයෙකු
වන යොනාතාන් ඔහුට පහර දී ඔහුව
මරා දැමුවේය.

**8** එසේ දාවිත් රජු සහ ඔහුගේ සේ-
වකයන් අතින් මැරුම් කෑ[9] ඔවුහු
ගාත්හි[10] ජීවත් වූ රෙෆායිවරුන්ගේ[11]
දරුවෝය.

**21** ඊශ්‍රායෙල්වරුන්ට එරෙහිව
සිටින සාතන්, ඔවුන් කීදෙ-
නෙක් සිටිනවාද කියා ගණන් බැලී-
මට දාවිත් රජුව පෙලඹුවේය.[12] **2** ඒ
නිසා දාවිත් රජ, යෝවාබ්ට[13] හා ප්‍රධා-
නීන්ට මෙසේ පැවසීය. “දාන්[14] සිට
බෙයර්-ෂෙබා[15] දක්වා ජීවත් වන ඊශ්‍රා-
යෙල් ජනයාව ගණන් කර[16] ඔවුන්-
ගේ මුළු සංඛ්‍යාව මට දන්වන්න.”[17]
**3** නමුත් යෝවාබ්, රජුට මෙසේ පැව-
සුවේය. “මගේ ස්වාමීන් වන රජ්ජුරු-
වනි, මේ සෙනඟ සියලුදෙනාම ඔබට
අයිති ඔබේම සේවකයන් නොවෙයිද?
එසේනම් මගේ ස්වාමීනි, ඔබ මේ
වගේ දෙයක් කරන්න සූදානම් වන්නේ
ඇයි?[18] දැනට සිටින සෙනඟ සිය ගුණ-
යකින් වුණත් වැඩි කරන්න අපේ දෙවි
යෙහෝවාට පුළුවන්.[19] ඒ නිසා මේ
වගේ දෙයක් කර ඊශ්‍රායෙල්වරුන්ට
නිකරුණේ දඬුවම් විඳීමට ඔබ සලස්-
වන්නේ ඇයි?”

**4** කෙසේනමුත් රජුගේ අණට[20]
යටත් වීමට යෝවාබ්ට සිදු විය.[21]
ඔහු සෙනඟව ගණන් කිරීම සඳහා
මුළු ඊශ්‍රායෙල් දේශය පුරා ගමන්
කර නැවතත් යෙරුසලමට පැමිණි-
යේය.[1] **5** යෝවාබ්, සෙනඟගේ මුළු
ගණන දාවිත් රජුට දැන්වීය. ඊශ්‍රා-
යෙල් ගෝත්‍රවල සිටි යුද්ධයට දක්ෂ
පුරුෂයන්ගේ ගණන එකොළොස්
ලක්ෂයකි.[2] යූදා ගෝත්‍රයේ යුද්ධයට
දක්ෂ පුරුෂයන්ගේ ගණන හාරලක්ෂ
හැත්තෑදහසකි. **6** රජු අණ කළ දේ
කිරීමට යෝවාබ් අකමැති වූ නිසා
ඔහු ඒ ගණනට ලෙවී[3] සහ බෙන්ජමින්
යන ගෝත්‍රවල සිටි සංඛ්‍යාව ඇතුළත්
කළේ නැත.[4]

**7** දාවිත් රජු කිරීමට අණ කළ දේ
ගැන සැබෑ දෙවි සතුටු වූයේ නැත.[5]
එමනිසා ඔහු ඊශ්‍රායෙල්වරුන්ට පහර
දුන්නේය. **8** එහෙයින් දාවිත් රජ
සැබෑ දෙවිට මෙසේ කීවේය. “මා
කළේ ලොකු වරදක්.[6] අනේ දෙවියනි,
ඔබේ සේවකයාගේ වරදට සමාව
දෙන්න.[7] මම කළේ මොන තරම්
මෝඩ දෙයක්ද!”[8] **9** අනාගතවක්-
තෘවරයෙකු ලෙස දාවිත් රජු යටතේ
සේවය කළ ගාද්ට[9] යෙහෝවා දෙවි
මෙසේ පැවසීය.[10] **10** “ඔබ දාවිත්
ළඟට ගොස් යෙහෝවා දෙවි වන මා
පවසන මේ දේ ඔහුට කියන්න. ‘මම
ඔබට කියන මේ දඬුවම් තුනෙන්
එකක් තෝරාගන්න.[11] ඔබ තෝරා-
ගන්නා දඬුවම මම ඔබ පිටට ගෙනෙ-
නවා.’ ”[12] **11** පසුව ගාද්, දාවිත් රජු
ළඟට පැමිණ[13] මෙසේ පැවසීය. “යෙ-
හෝවා දෙවි මේ දේ ඔබට දන්-
වන්න කියා මට පැවසුවා. ‘ඔබට
දැන් තේරීමක් කරන්න සිදු වෙනවා.
**12** ඔබ කැමති වන්නේ දේශය පුරා
අවුරුදු තුනක් සාගතයක් පවතිනවා-
ටද?[14] නැත්නම් මාස තුනක් සතුරන්-
ගේ ප්‍රහාරවලට ලක් වෙමින් ඔවුන්ගේ
අතින් ඔබේ සෙනඟ මැරුම් කනවා-
ටද?[15] එසේත් නැත්නම් ඔබ කැමති
වන්නේ දවස් තුනක් පුරා යෙහෝවා
දෙවිගේ කඩුවෙන් පහර කමින්[16] වසං-
ගතයකට මුහුණ දෙන්නද?[17] ඔබ ඊට
කැමති වුණොත් යෙහෝවා දෙවිගේ
දූතයා අතින් මුළු ඊශ්‍රායෙල් දේශයටම
මහත් විනාශයක් සිදු වෙයි.’[18] ඔබ
තෝරාගන්නේ කුමක්ද කියා දැන්

**20 පරි.**
1 1සාමු 17:4; 1සාමු 21:9; 1සාමු 22:10
2 1සාමු 17:7; 1ලේක 11:23
3 යොෂු 11:22; 1සාමු 7:14
4 2සාමු 21:20
5 ගණන් 13:33; ද්වි 2:10; ද්වි 3:11
6 2සාමු 21:16
7 ද්වි 32:27; 1සාමු 17:10; 2රාජා 19:22
8 1ලේක 2:13
9 1සාමු 20:15
10 1සාමු 17:4
11 ද්වි 2:11

**21 පරි.**
12 2සාමු 24:1
13 2සාමු 8:16
14 විනි 18:29; 2සාමු 3:10
15 2සාමු 17:11
16 1ලේක 27:23
17 2සාමු 24:2
18 2සාමු 24:3
19 ද්වි 1:11
20 දේශ 8:4
21 2සාමු 24:4

**2 තීරුව**
1 2සාමු 24:8
2 2සාමු 24:9
3 ගණන් 1:47
4 1ලේක 27:24
5 2සාමු 11:27
6 2සාමු 12:13
7 ගීතා 25:11; ගීතා 51:1
8 2සාමු 24:10
9 2සාමු 24:11; 1ලේක 29:29
10 1සාමු 9:9
11 2සාමු 24:12
12 හිතෝ 3:12
13 2සාමු 24:13
14 ලෙවී 26:26
15 ලෙවී 26:17; ද්වි 28:25
16 ලෙවී 26:25
17 ද්වි 28:22; ද්වි 28:27; 2සාමු 24:13
18 2රාජා 19:35

මට කියන්න. මම එය ඔබ ළඟට
මාව එවූ තැනැත්තාට දන්වන්නම්.”
**13** එවිට දාවිත් රජ ගාද්ට මෙසේ
කීවේය. “මගේ වරද නිසා සිදු වූ දේ
මට දරාගන්න බැහැ. එහෙත් යෙ-
හෝවා දෙවි දයාන්විත කෙනෙක්[1]
නිසා මනුෂ්‍යයන්ගෙන් පහර කනවාට
වඩා[2] දෙවිගෙන් දඬුවම් ලැබීම මට
යහපතයි.”[3]

**14** එහෙයින් යෙහෝවා දෙවි ඊශ්‍රා-
යෙල් දේශය පිටට මහත් වසංගත-
යක් ගෙනාවේය.[4] එහි ප්‍රතිඵලයක්
ලෙස ඊශ්‍රායෙල් සෙනඟගෙන් හැත්-
තෑදහසක් මිය ගියෝය.[5] **15** සෙ-
නඟ මතට විනාශයක් ගෙන ඒම
සඳහා සැබෑ දෙවි දේවදූතයෙකුව යෙ-
රුසලමට යැව්වේය.[6] නමුත් සිදු වී
තිබූ විනාශය දුටු යෙහෝවා දෙවි දුක්
වී,[7] සෙනඟ පිටට පීඩා ගෙනා දේවදූ-
තයාට මෙසේ කීවේය. “දැන් ඇති.[8]
ඔබේ අත පහතට දමන්න.” ඒ අවස්-
ථාවේදී යෙහෝවා දෙවිගේ දූතයා
සිටියේ යෙබූසිවරයෙකු වූ[9] ඔර්නාන්-
ගේ කමත[10] අසලය.

**16** අහසත් පොළොවත් අතර සිටි
යෙහෝවා දෙවිගේ දූතයා[11] යෙරුස-
ලම දෙසට තම කඩුව දිගු කරගෙන
සිටිනවා[12] දාවිත් රජ දුටුවේය. ගෝණි
රෙදි[13] ඇඳගෙන සිටි දාවිත් රජද වැඩි-
මහල්ලෝද ඒ මොහොතේම බිම දිගා
වූහ.[14] **17** දාවිත් රජ සැබෑ දෙවිට
මෙසේ පැවසීය. “අනේ මාගේ දෙවි
යෙහෝවා, සෙනඟව ගණන් කරන්න
කියා අණ කළේ මමයි. ඒ නිසා
වරද මගේ අතෙයි.[15] බැටළුවන් වගේ
ඉන්න[16] මේ සෙනඟ අතේ කිසි වරදක්
නැහැ. මා කළ වරදට ඔබේ සෙනඟට
දඬුවම් කරන්න එපා.[17] මේ වසංගත-
යෙන් මටයි මගේ පියාගේ පවුලේ අය-
ටයි පහර දෙන්න.”

**18** එවිට යෙහෝවා දෙවිගේ
දූතයා ගාද්ට[18] කතා කර යෙබූ-
සිවරයෙකු වූ ඔර්නාන්ගේ කමතේ
යෙහෝවා දෙවිට පූජාසනයක් ගොඩ-
නඟන ලෙස දාවිත් රජුට පවසන්න
කියා කීවේය.[19] **19** යෙහෝවා දෙවි-

**21 පරි.**
**1** නික් 34:6, ගීතා 51:1, යෙසා 55:7, විලා 3:22
**2** 2ලේක 28:9
**3** 2සාමු 24:14
**4** ගණන් 16:46
**5** 2සාමු 24:15
**6** 2සාමු 24:16
**7** නික් 32:14, ද්වි 32:36
**8** ගීතා 90:13
**9** 2සාමු 5:6
**10** 2සාමු 24:18, 2ලේක 3:1
**11** ගණන් 22:31
**12** යොෂු 5:13
**13** 1රාජා 21:27, 2රාජා 19:1, ගීතා 35:13
**14** ගණන් 16:22
**15** 2සාමු 24:17, ගීතා 51:4
**16** ගීතා 44:11
**17** නික් 32:12
**18** 2සාමු 24:11
**19** 2සාමු 24:18, 2ලේක 3:1

**2 තීරුව**
**1** 2සාමු 24:19
**2** 1ලේක 21:15
**3** 2සාමු 24:20
**4** ගණන් 25:8
**5** 2සාමු 24:21
**6** උත් 23:9
**7** උත් 23:11
**8** 1සාමු 6:14, 1රාජා 19:21
**9** යෙසා 28:27
**10** 2සාමු 24:22
**11** 2සාමු 24:23
**12** උත් 23:13
**13** 2සාමු 24:24
**14** නික් 20:25, 2සාමු 24:25

ගේ නාමයෙන් අනාගතවක්තෘ ගාද්
පැවසූ දේට කීකරු වූ දාවිත් රජ කම-
තට පිටත්ව ගියේය.[1] **20** ඒ අවස්-
ථාවේදී තිරිඟු මඩිමින් සිටි ඔර්නාන්,[2]
කමත ළඟ සිටි දේවදූතයාව දුටුවේය.
ඔර්නාන් සමඟ සිටි ඔහුගේ පුත්‍රයෝ
සතරදෙනා දේවදූතයාව දැක සැඟවු-
ණෝය. **21** දාවිත් රජු ඔර්නාන්ව
හමු වීමට ගිය විට[3] ඔහු විගස කම-
තෙන් ඇවිත් පොළොව දෙසට හිස
නමා දාවිත් රජුට ආචාර කළේය.
**22** දාවිත් රජ ඔහුට මෙසේ පැව-
සීය. “සෙනඟ අතරේ පැතිරෙන මේ
වසංගතය නවතින්න නම්[4] මෙතන
යෙහෝවා දෙවිට පූජාසනයක් ගොඩ-
නඟන්න ඕනේ. ඒ නිසා මට මේ
කමත ලබා දෙන්න.[5] මම ඔබට කම-
තේ සම්පූර්ණ වටිනාකමට අනුව
මුදල් ගෙවන්නම්.”[6] **23** එවිට ඔර්-
නාන්, දාවිත් රජුට මෙසේ කීවේය.
“මගේ ස්වාමීන් වන රජ්ජුරුවනි, ඔබ
මේ කමත ගන්න.[7] ඒ වෙනුවෙන් මට
කිසි දෙයක් එපා. දවන පූජාවට
අවශ්‍ය ගවයන්වත්[8] මම දෙන්නම්.
මෙතන තියෙන ධාන්‍ය මඩින උපක-
රණ[9] දර[10] සඳහා පාවිච්චි කරන්න.
ධාන්‍ය පූජාවට අවශ්‍ය තිරිඟුත් මෙත-
නින් ගන්න. මේ හැම දේම මම ඔබට
දෙන්නම්.”[11]

**24** නමුත් දාවිත් රජ ඔර්නාන්ට
මෙසේ කීවේය. “එහෙම කරන්න
බැහැ. මට ඕනේ කමතේ වටිනාක-
මට අනුව සම්පූර්ණ මුදලම ගෙ-
වලා ඔබෙන් මේක ගන්නයි.[12] මම
කිසි වියදමක් දරන්නේ නැතුව ඔබේ
දේවල් අරගෙන යෙහෝවා දෙවිට
දවන පූජාවක් ඔප්පු කරන්නේ කො-
හොමද?” **25** දාවිත් රජ ඔර්නාන්ට
මුළු ඉඩම සඳහාම රන් ෂෙකෙල්*
හයසියයක් ගෙව්වේය.[13] **26** ඉන්පසු
ඔහු එහි යෙහෝවා දෙවිට පූජා-
සනයක් ගොඩනඟා,[14] දවන පූජාද
හවුල් පූජාද ඔප්පු කළේය. එසේ
කර ඔහු යෙහෝවා දෙවිට කන්නලව්

**1ලේක 21:25*** ෂෙකෙලයක් යනු ග්‍රෑම් 11.4කි.

කළේය.[1] එවිට දෙවි දවන පූජාව තැබූ
පූජාසනය මතට ස්වර්ගයෙන් ගින්-
නක් එවමින් ඔහුට පිළිතුරු දුන්-
නේය.[2] **27** යෙහෝවා දෙවිගේ අණ
පරිදි දේවදූතයා[3] තම කඩුව නැවතත්
කොපුවේ දමාගත්තේය. **28** යෙබූසි-
වරයෙකු වූ ඔර්නාන්ගේ කමතේදී
තමන් කළ කන්නලව්වට යෙහෝවා
දෙවි සවන් දී ඇති බව වටහාගත්
දාවිත් එහි දිගටම පූජා ඔප්පු කළේය.[4]
**29** මෝසෙස් පාළුකරයේදී සෑදූ යෙ-
හෝවා දෙවිගේ ශුද්ධ කූඩාරමද දවන
පූජා ඔප්පු කරන පූජාසනයද ඒ කාල-
යේදී තබා තිබුණේ ගිබියොන් නුවරෙ-
හිය.[5] **30** නමුත් යෙහෝවා දෙවිගේ
දූතයාගේ කඩුවට අතිශයින් බියෙන්[6]
සිටි දාවිත් රජ, දෙවිගෙන් මඟ පෙන්-
වීම් පැතීමට එම ස්ථානයට නො-
ගියේය.

**22** දාවිත් රජ ස්ථානයක්
පෙන්වා මෙසේ කීවේය.
“සැබෑ දෙවි වන යෙහෝවාගේ ගෘහ-
යත්[7] ඊශ්‍රායෙල් ජනයා සඳහා දවන
පූජා ඔප්පු කරන පූජාසනයත්[8] ඉදි
කළ යුත්තේ මෙතැනයි.”
**2** දාවිත් රජ ඊශ්‍රායෙල් දේශයේ
වාසය කළ විදේශිකයන්ව[9] එකට
රැස් කරන්න කියා අණ කළේය.
පසුව ඔහු සැබෑ දෙවිගේ ගෘහය ඉදි
කිරීමට අවශ්‍ය හතරැස් හැඩැති[10]
විශාල ගල් සැපයීම ඔවුන්ට භාර
කළේය.[11] **3** දොරටුවල ඇණ සඳ-
හාත් දොරටු ශක්තිමත්ව තබාගැනී-
මට ගසන පටි* සඳහාත් විශාල
යකඩ ප්‍රමාණයක් දාවිත් රජ සූදා-
නම් කළේය. එමෙන්ම කිරන්න බැරි
තරම් විශාල තඹ ප්‍රමාණයක්ද ඔහු
සූදානම් කළේය.[12] **4** සීදොන් වැසි-
යෝ[13] සහ තීර් වැසියෝ[14] දේවදාර
ලී[15] විශාල ප්‍රමාණයක් දාවිත් රජුට
ලබා දුන්නෝය. එහෙයින් දේවදාර ලී
විශාල ප්‍රමාණයක්ද ඒ සඳහා එකතු
විය. **5** දාවිත් රජ මෙසේ සිතුවේය.
“යෙහෝවා දෙවි වෙනුවෙන් ගොඩ-
නඟන මේ ගෘහය තේජශ්‍රීයෙන් බැබ-
ළිය යුතුයි.[1] එය සියලුම දේශයන්
අතර ප්‍රසිද්ධ වන තරමටම අලංකාර
විය යුතුයි.[2] ඒත් ඒ වගේ ගෘහයක්
හදන්න තරම් මගේ පුත් සලමොන්
තරුණ වැඩියි. ඔහුට එතරම් අද්දැකී-
මුත් නැහැ.[3] ඒ නිසා ඒ කාර්යය
කිරීමට අවශ්‍ය දේවල් මගේ පුතා වෙ-
නුවෙන් මම පුළුවන් තරම් සූදානම්
කළොත් හොඳයි.” එසේ සිතා ඔහු
ඔහුගේ ජීවිතය අවසන් වීමට කලින්
ගෘහය ඉදි කිරීමට අවශ්‍ය බොහෝ
දේවල් සූදානම් කළේය.[4]
**6** පසුව ඔහු තම පුත් සලමොන්ව
කැඳවා ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝ-
වාට ගෘහයක් ගොඩනැඟීමේ කාර්යය
ඔහුට භාර දෙමින් **7** මෙසේ පැවසීය.
“මගේ දෙවි වන යෙහෝවාගේ නාමය
ගෞරවයට පත් කිරීම සඳහා ගෘහයක්
ගොඩනඟන්න[5] මට ලොකු ආශාවක්
තිබුණා.[6] **8** නමුත් යෙහෝවා දෙවි
මට මෙහෙම කිව්වා. ‘ඔබ බොහෝ
යුද්ධවලට සම්බන්ධ වූ නිසාත්[7] මා
ඉදිරියේ විශාල ලෙස ලේ වැගිරෙවූ
නිසාත්[8] මාගේ නාමය වෙනුවෙන්
ගෘහයක් ගොඩනැඟීමට ඔබට අව-
**9** 1රාජා 3:5; 1ලේක 16:39; 1ලේක 21:29
**10** ද්වි 34:5; හෙබ්‍රෙ 3:5
**11** නික් 40:2; ලෙවී 1:1
**12** 2සාමු 6:2
**13** 1ලේක 13:5
**14** 1ලේක 16:1; ගීතා 132:5
**15** 1ලේක 15:1
**16** 1ලේක 2:20
**17** නික් 31:2
**18** නික් 38:1
**19** 1රාජා 3:4
**20** 1රාජා 3:5

**2 තීරුව**
**1** 2සාමු 7:8; ගීතා 89:28
**2** 1ලේක 28:5
**3** 2සාමු 7:12; 1ලේක 17:25; 1ලේක 28:6; ගීතා 132:11
**4** උත් 13:16
**5** 1සාමු 2:7; 1රාජා 3:7
**6** 1රාජා 3:8; ගීතා 72:2
**7** 1රාජා 3:9; හිතෝ 2:6; හිතෝ 3:13; යාකො 1:5
**8** ගණන් 27:17; 2සාමු 5:2
**9** 1සාමු 16:7; 1ලේක 29:17
**10** 1රාජා 3:11
**11** 1රාජා 3:28; හිතෝ 14:8
**12** 1රාජා 3:12; ගීතා 34:10; එෆී 3:20; 1යොහ 5:15

**13** 1ලේක 29:25; 2ලේක 9:22; දේශ 2:9; **14** 1රාජා 3:13; **15** නික් 40:2; **16** 1රාජා 3:4; 1ලේක 16:39; 1ලේක 21:29.

**2ලේක 1:8*** හෝ, "ළැදි ප්‍රේමයක්."

කළේය.[1] **14** ඔහු බොහෝ අශ්ව
රථ හා අශ්වයන් එකතු කරගත්තේය.
එහෙයින් ඔහු සතුව අශ්ව රථ එක්ද-
හස් හාරසියයක් තිබූ අතර ඔහුට අශ්-
වයෝ දොළොස්දහසක් සිටියෝය.[2]
ඔහු ඒ රථ හා අශ්වයන්, ඒ සඳහා
වෙන් කළ නුවරවල තැබුවේය.[3] එම
නුවරවල් පිහිටා තිබුණේ ඔහු වාසය
කළ යෙරුසලම අසලය. **15** සල-
මොන් රජ, රිදී හා රන් විශාල
ප්‍රමාණයක් යෙරුසලමෙහි එක් රැස්
කළ නිසා ඒවා ගල් මෙන් සුලබ
විය.[4] ඔහු විශාල දේවදාර ලී ප්‍රමාණ-
යක්ද එක් රැස් කළේය. ඒවා ෂෙ-
පේලා ප්‍රදේශයේ[5] ඇති සිකමෝර්
ගස් තරම් අධික විය.[6] **16** සල-
මොන් රජ ඊජිප්තුවෙන් අශ්වයන්
ගෙන්වාගත්තේය.[7] රජුගේ වෙළෙන්-
දෝ විටින් විට එහි ගොස් වර-
කට අශ්වයන් විශාල ප්‍රමාණයක්
මිල දී ගත්තෝය.[8] **17** ඊජිප්තුවෙන්
ගෙන්වාගත් අශ්ව රථයක සාමාන්‍ය
මිල රිදී ෂෙකෙල්* හයසියයකි. අශ්ව-
යෙකුගේ මිල රිදී ෂෙකෙල් එකසිය
පනහකි. හිත්තීවරුන්ගේ රජවරුද
සිරියාවේ රජවරුද මේ වෙළෙඳුන්
මාර්ගයෙන් අශ්වයන් සහ අශ්ව රථ
ඊජිප්තුවෙන් මිල දී ගත්තෝය.[9]

**2** සලමොන් රජ, යෙහෝවා දෙවි-
ගේ නාමයට ගෞරවය ගෙනෙන
පිණිස[10] ගෘහයක් ගොඩනැඟීමටත්[11]
තමා වෙනුවෙන් රජමාලිගාවක්[12] ඉදි
කිරීමටත් අණ කළේය. **2** ඒ සඳහා
අවශ්‍ය භාණ්ඩ ගෙන ඒමට පුරුෂ-
යන් හැත්තෑදහසක් හා කඳුවලට
ගොස් ගල් කැඩීමට පුරුෂයන් අසූ-
දහසක් සලමොන් රජ තෝරාගත්
අතර[13] ඔවුන්ගේ වැඩකටයුතු අධීක්ෂ-
ණය කිරීම සඳහා තුන්දහස් හයසි-
යදෙනෙකුව පත් කළේය.[14] **3** ඔහු
තීර්හි රජු වූ හීරාම්ට[15] පණිවිඩයක්
යවමින් මෙසේ පැවසීය. “මගේ පියා වූ
දාවිත් තම මාලිගාව ගොඩනඟද්දී ඒ
සඳහා අවශ්‍ය දේවදාර ලී සැපයී-
මෙන් ඔබ ඔහුට උපකාර කළා.[1]
**4** දැන් මම මගේ දෙවි වන යෙහෝවා-
ගේ නාමය ගෞරවයට පත් කිරී-
මේ අරමුණින්[2] ගෘහයක් ගොඩනඟමින්
සිටිනවා.[3] එම ගෘහය දෙවිට කරන
නමස්කාරය වෙනුවෙන්ම වෙන් කරනු
ලබනවා.[4] එමෙන්ම දෙවි ඉදිරියේ නිර-
තුරුවම සුවඳ ද්‍රව්‍ය දැවීමටත්[5] රොටි
ඔප්පු කිරීමටත්[6] උදේ සවස[7] හා සබත්
දවස්වලදීද[8] නව සඳ පායන දවස්ව-
ලදී[9] හා අපගේ දෙවි වන යෙහෝවා
වෙනුවෙන් උත්සව පවත්වන දවස්ව-
ලදීද[10] එහි දවන පූජා ඔප්පු කිරීමටත්
අපිට හැකි වෙනවා. එමගින් දෙවි
අපෙන් බලාපොරොත්තු වන දේ සදහ-
ටම ඉටු කිරීමට අපිට හැකි වෙ-
නවා.[11] **5** අපේ දෙවි වෙනත් සියලු
දෙවිවරුන්ට වඩා උතුම් නිසා[12] මා
ඉදි කරන මේ ගෘහයත් ශ්‍රේෂ්ඨයි.[13]
**6** ඇත්තටම දෙවිට ගෘහයක් ගො-
ඩනඟන්න පුළුවන් කාටද?[14] මුළු
මහත් ස්වර්ගයටවත් ඔහුගේ තේ-
ජස දරාගත නොහැකියි.[15] එසේනම්
ඔහුට වාසය කිරීමට ගෘහයක් ගොඩ-
නඟන්න මා සුදුස්සෙක්ද?[16] අප මේ
ගෘහය ගොඩනඟන්නේ ඔහුට පූජා
ඔප්පු කිරීමටයි.[17] **7** එහෙයින් රන්,
රිදී, තඹ සහ යකඩ වැඩ කිරී-
මට දක්ෂ,[18] එමෙන්ම රත්නිල් පැහැ-
ගැන්වූ ලොම්වලින්, තද රතු පැහැති
හා නිල් පැහැති නූල්වලින් මැහුම් වැඩ
කිරීමට දක්ෂ කෙනෙකුව මා වෙ-
තට එවන්න. ඔහු කැටයම් කිරීමටත්
දක්ෂයෙකු විය යුතුයි. එවිට මා යට-
තේ යූදාහි හා යෙරුසලමෙහි දැන් සේ-
වය කරමින් සිටින දක්ෂ වැඩකරුවන්
සමඟ එකතු වී ඔහුට වැඩ කළ
හැකියි. එම වැඩකරුවන් මගේ පියා
වූ දාවිත් විසින් පත් කළ අයයි.[19]
**8** මීට අමතරව මට ලෙබනොන් දේශ-
යෙන්[20] දේවදාර ලී,[21] ජුනිපර් ලී[22] සහ
හඳුන් ලීද[23] එවන්න. ඔබේ සේවකයන්
ලෙබනොන් දේශයේ වැවෙන ගස්
කැපීමට දක්ෂයන් බව මම හොඳින්
දන්නවා.[24] (මගේ සේවකයෝ ඔබේ
සේවකයන් සමඟ වැඩ කිරීමට සූදා-

**1 පරි.**
1 1රාජා 4:25
2 ද්වි 17:16; 1රාජා 4:26
3 2ලේක 8:6; 2ලේක 9:25
4 1රාජා 10:21
5 2ලේක 9:27; 2ලේක 26:10
6 1රාජා 10:27
7 2ලේක 9:28
8 1රාජා 10:28
9 1රාජා 10:29

**2 පරි.**
10 ද්වි 12:11; 1ලේක 22:10
11 1රාජා 5:5
12 1රාජා 7:1
13 1රාජා 5:15
14 1රාජා 5:16; 1රාජා 9:22; 2ලේක 2:18
15 1රාජා 5:1

**2 තීරුව**
1 2සාමු 5:11; 1ලේක 14:1
2 2ලේක 6:33
3 1රාජා 8:19
4 1රාජා 8:64
5 නික් 30:7
6 නික් 25:30; ලෙවී 24:8; මතෙ 12:4
7 ගණන් 28:4
8 නික් 20:10; ගණන් 28:9
9 ගණන් 10:10; ගණන් 28:11
10 ලෙවී 23:4; 1ලේක 23:31
11 ලෙවී 23:14; ලෙවී 23:41
12 නික් 15:11; ගීතා 86:8; ගීතා 95:3; ගීතා 135:5
13 1ලේක 29:1; ගීතා 68:29
14 යෙසා 66:1
15 1රාජා 8:27; ක්‍රියා 17:24
16 2සාමු 7:18; 1ලේක 29:14
17 ද්වි 12:6
18 නික් 31:3; 1රාජා 7:14
19 1ලේක 22:15
20 1රාජා 5:14
21 1රාජා 5:6
22 1රාජා 5:8; 2ලේක 3:5
23 1රාජා 10:11
24 1රාජා 5:9

---

**2ලේක 1:17*** ෂෙකෙලයක් යනු ග්‍රෑම් 11.4කි.

නමින් සිටිනවා.) **9** මා ගොඩනඟන
මේ ගෘහය ඉතාමත් අලංකාර, ශ්‍රේෂ්ඨ
ගෘහයක්. එහෙයින් ඒ සඳහා විශාල
දැව ප්‍රමාණයක් මා සූදානම් කළ
යුතුයි. **10** ඔබ මා වෙතට එවන
ඔබේ සේවකයන්ට අවශ්‍ය ආහාර
මම සපයන්නම්. ගස් කපන්නන්
හා දැව අදින්නන් වෙනුවෙන් තිරිඟු
කෝර් ඒකක* විසිදහසක්ද[1] බාර්ලි
කෝර් ඒකක විසිදහසක්ද වයින්[2]
බාත් ඒකක# විසිදහසක්ද තෙල් බාත්
ඒකක විසිදහසක්ද දැනටමත් මම
වෙන් කර තිබෙනවා.”

**11** ඊට පිළිතුරක් ලෙස තීර්හි රජු
වූ හීරාම්[3] සලමොන් රජුට ලිපියක්
මාර්ගයෙන් මෙසේ දැන්වූවේය. “යෙ-
හෝවා දෙවි ඔහුගේ සෙනඟ කෙ-
රෙහි ඔබව රජු ලෙස පත් කර
තිබෙන්නේ[4] ඔහු තම සෙනඟට ප්‍රේම
කරන නිසයි.[5] **12** අහසත් පොළො-
වත් නිර්මාණය කළ[6] ඊශ්‍රායෙල්හි
දෙවි වන යෙහෝවාට ප්‍රශංසා වේවා![7]
ඔහු දාවිත් රජුට ඉතා නැණවත් පුත්‍ර-
යෙකු දී ඇත. ඔහු ඉතා බුද්ධි-
මත් කෙනෙකි. ඔහු අවබෝධයෙන්
ක්‍රියා කරන්නේය.[8] ඔහු යෙහෝවා
දෙවිට ගෘහයක්ද තමා වෙනුවෙන්
රජමාලිගාවක්ද ගොඩනඟන්නේය.[9]
**13** ඔබ ඉල්ලූ පරිදි දැනුම් තේරුම්
ඇති, අතිදක්ෂ පුරුෂයෙකුව මම
ඔබ වෙතට එවන්නෙමි. ඔහු හීරාම්-
ආබිය.[10] **14** ඔහුගේ මව දාන් ගෝ-
ත්‍රයට අයත් ස්ත්‍රියකි. ඔහුගේ පියා
තීර්හි වැසියෙකි. ඔහු රන්, රිදී, තඹ,[11]
යකඩ, ගල්[12] හා ලී යනාදියෙන්
වැඩ කිරීමට අතිදක්ෂයෙකි. රත්නිල්
පැහැගැන්වූ ලොම්වලින්ද[13] තද රතු
පැහැති[14] හා නිල් පැහැති[15] නූල්ව-
ලින්ද සිහින් රෙදිවලින්ද[16] මැහුම්
වැඩ කිරීමට මනා හැකියාවක් ඔහු
සතුය. කැටයම් වැඩවලටද ඔහු
ඉතා දක්ෂය.[17] ඔහු නිර්මාණශීලීය.[18]
ඔහුට පවරන ඕනෑම දෙයක් සෑදීමට
ඔහුට හැකියාව තිබේ. ඔබ යට-
තේ සේවය කරන දක්ෂ පුරුෂයන්
සමඟත් මගේ ස්වාමියාද ඔබේ පියාද
වූ දාවිත් රජු පත් කළ දක්ෂ පුරුෂයන්
සමඟත් වැඩ කිරීමට ඔහු සූදානම්ය.
**15** ඔබ පොරොන්දු වූ පරිදි තිරිඟු,
බාර්ලි, තෙල් සහ වයින් මා එවන
සේවකයන්ට දෙන මෙන් ඉල්ලමි.[1]
**16** අපි ඔබේ අවශ්‍යතාව පරිදි[2] ලෙබ-
නොන් දේශයෙන් ගස් කපා,[3] එම ලී
කොටං එකට ගැටගසා ඒවා මුහුදේ
පා කර[4] යොප්පාවට[5] එවන්නෙමු.
ඉන්පසු ඒවා එතැන් සිට යෙරුසලමට
ගෙන යෑමට ඔබට හැකිය.”

**17** සලමොන් රජ ඊශ්‍රායෙල් දේ-
ශයේ වාසය කළ[6] විදේශිකයන්ගේ
සංඛ්‍යා ලේඛනයක් ගත්තේය. මෙය
ඔහුගේ පියා වූ දාවිත් ගත් සංඛ්‍යා
ලේඛනයට පසුව සිදු වූවකි.[7] ඔවුන්ගේ
ගණන එක්ලක්ෂ පනස්තුන්දහස් හය-
සියයකි. **18** සලමොන් රජ ඔවුන්-
ගෙන් හැත්තෑදහස්දෙනෙකු භාණ්ඩ
අදින්නන්[8] ලෙසත් අසූදහස්දෙනෙකු
කඳුවල ගල් කඩන අය ලෙසත්[9] පත්
කළේය. එමෙන්ම ඔවුන් කළ වැඩ
අධීක්ෂණය කිරීමට තුන්දහස් හයසිය-
දෙනෙකුවද පත් කළේය.[10]

**3** සලමොන් රජ යෙරුසලමේ මො-
රියා කන්ද[11] මත යෙහෝවා දෙවි-
ගේ ගෘහය ගොඩනැඟීමේ වැඩකටයුතු
ආරම්භ කළේය.[12] ඔහුගේ පියා වූ
දාවිත්ට යෙහෝවා දෙවි දර්ශනය වූයේ
එම ස්ථානයේදීය.[13] එම ඉඩම දාවිත්
රජු යෙබූසිවරයෙකු වූ ඕර්නාන්ගෙන්
මිල දී ගෙන තිබිණ.[14] **2** සලමොන්
රජු ගෘහය ගොඩනැඟීමේ කටයුතු
ආරම්භ කළේ තම පාලන සමයේ
හතරවන අවුරුද්දේ දෙවන මාසයේ
දෙවනදාය.[15] **3** දෙවිගේ ගෘහය ඉදි
කිරීමට සලමොන් රජු අත්තිවාරම
දැමුවේ මෙලෙසය. එහි මිනුම් සඳහා
අතීතයේ පාවිච්චි කළ රියන් මිනුම
භාවිත කරන ලදි. ඒ අනුව එහි
දිග රියන්* හැටක් වූ අතර පළල

**2 පරි.**
1 1රාජා 5:11
2 එස්රා 7:22
3 1රාජා 5:1
1රාජා 9:11
1ලේක 14:1
4 1රාජා 10:9
5 ද්වි 7:8
ද්වි 33:3
6 උත් 1:1
ගීතා 33:6
ක්‍රියා 17:24
එළි 4:11
එළි 10:6
7 1රාජා 5:7
ගීතා 72:18
8 2ලේක 1:12
9 2ලේක 2:1
10 1රාජා 7:13
1රාජා 7:40
2ලේක 4:11
2ලේක 4:16
හිතෝ 22:29
11 1රාජා 7:14
12 නික් 31:5
13 නික් 39:1
14 2ලේක 3:14
15 නික් 39:2
16 නික් 39:5
17 නික් 39:6
18 නික් 31:4
නික් 35:32

**2 තීරුව**
1 2ලේක 2:10
2 1රාජා 5:8
3 1රාජා 5:6
4 1රාජා 5:9
5 යොෂු 19:46
එස්රා 3:7
ක්‍රියා 9:36
6 1රාජා 5:13
1රාජා 5:14
2ලේක 8:8
7 1ලේක 22:2
8 1රාජා 5:15
9 1රාජා 5:17
1රාජා 5:18
1ලේක 22:15
10 1රාජා 5:16

**3 පරි.**
11 උත් 22:2
උත් 22:14
12 1රාජා 6:14
1ලේක 29:19
13 2සාමු 24:25
1ලේක 21:18
14 2සාමු 24:18
1ලේක 21:22
15 1රාජා 6:1

2ලේක **2:10*** කෝර් ඒකකයක් යනු ලීටර් 220කි. **10#** බාත් ඒකකයක් යනු ලීටර් 22කි.

2ලේක **3:3*** රියනක් යනු සෙන්ටිමීටර් 44.5කි.

රියන් විස්සකි.[1] 4 ගෘහයේ ශුද්ධස්-
ථානයට ඉදිරියෙන් තිබෙන ප්‍රවේශ
ශාලාවේ[2] පළල රියන් විස්සක් විය.
එහි පළල ගෘහයේ පළලට සමාන විය.
එහි උස රියන් එකසිය විස්සකි. ඔහු
එහි ඇතුළත බිත්ති පවිත්‍ර රනින් ආව-
රණය කළේය. 5 ඔහු ඒ ගෘහය[3]
සම්පූර්ණයෙන්ම ජුනිපර් ලීයෙන් සාදා
පවිත්‍ර රනින් ආවරණය කළේය.[4] ඉන්-
පසු ඒ මත තාල වර්ගයේ ගස්වල රූප
කැටයම් කළ[5] අතර රන් දම්වැල්ද
සවි කරන ලදි.[6] 6 මීට අමතරව
ඒ ගෘහය තවත් අලංකාරවත් කිරී-
මට රන් ආලේප කළ බිත්ති මත
ඔහු වටිනා මැණික් ගල් එබ්බෙව්-
වේය.[7] ඔහු මෙම කාර්යයන් සඳහා
භාවිත කළේ රත්තරන්වලට ප්‍රසිද්ධි-
යක් ඉසිලූ රටකින් ගෙනා රන්ය.[8]
7 ඔහු මුළු ගෘහයම එනම්, එහි පරා-
ලද එහි ශාලාද බිත්තිද දොරටුද
රනින් ආවරණය කළේය.[9] එම බිත්ති
මත කෙරුබ්වරුන්ගේ රූපද කැටයම්
කරන ලදි.[10]

8 ඊළඟට ඔහු සෑදුවේ අතිශුද්-
ධස්ථානයයි.[11] එහි දිග රියන් විස්-
සකි. පළලද රියන් විස්සකි.[12] ඔහු
තලෙන්ත හයසියයක් වටිනා පවිත්‍ර
රනින් එය සම්පූර්ණයෙන්ම ආවර-
ණය කළේය. 9 භාවිත කළ ඇණ-
වල බර[13] රන් ෂෙකෙල් පනහකි. ඔහු
උඩුමහලේ පිහිටි කුටිද රනින් ආවර-
ණය කළේය.

10 ඔහු අතිශුද්ධස්ථානයේ තැබී-
මට කෙරුබ්වරුන් දෙදෙනෙකුගේ
රූප සාදා[14] ඒවා සම්පූර්ණ-
යෙන්ම රනින් ආවරණය කළේය.[15]
11 විහිදුවා තිබූ එම කෙරුබ්වරුන්-
ගේ එක පියාපතක දිග රියන් පහකි.
පියාපත්වල එක් කෙළවරක් අතිශුද්-
ධස්ථානයේ බිත්ති ස්පර්ශ කළේය.
අනික් කෙළවර අනික් කෙරුබ්වරයා-
ගේ පියාපත ස්පර්ශ කළේය.[16] පියා-
පත්[17] හතරේම දිග රියන් විස්සකි.
12 මෙසේ රියන් පහකින් යුත් එක්
පියාපතක් බිත්තියේ ස්පර්ශ වන ලෙ-
සද රියන් පහකින් යුත් අනික් පියා-
පත අනික් කෙරුබ්වරයාගේ පියාපත
ස්පර්ශ වන ලෙසද[1] එම කෙරුබ්ව-
රුන් දෙදෙනාව තබන ලදි. 13 ඒ
පියාපත් හතර එලෙස විහිදුවා තැබූ
විට ඒ හතරේම දිග රියන් විස්සකි.
කෙරුබ්වරුන් කෙළින් සිටගෙන සිටි
අතර ඔවුන්ගේ මුහුණු ශුද්ධස්ථානය
දෙසට යොමු වී තිබිණ.

14 ඔහු නිල් පැහැති[2] හා තද රතු
පැහැති නූල්ද රත්නිල් පැහැගැන්වූ
ලොම්ද සිහින් රෙදිද යොදා තිර රෙදි[3]
සෑදූ අතර ඒවා මත කෙරුබ්වරුන්ගේ
රූප මැසුවේය.[4]

15 ඉන් අනතුරුව ඔහු ගෘහය
ඉදිරිපිට තැබීමට රියන් තිස්පහක්
බැගින් උස කුලුනු දෙකක් සෑදීය.[5] ඒ
කුලුනු දෙක මුදුනේ තිබූ කොට-
සේ[6] උස රියන් පහකි. 16 ඉන්පසු
ඔහු දම්වැල් සාදා[7] ඒවා එම කුලු-
නුවල මුදුනේ තිබූ කොටස වටා
සවි කළේය. එම දම්වැල්වල තඹව-
ලින් සෑදූ දෙළුම් ගෙඩි සියයක්[8] සවි
කළේය. 17 ඔහු මෙම කුලුනු දෙක
තැබුවේ දේවමාලිගාව ඉදිරිපිටය. ඔහු
එකක් දකුණු පසින්ද අනික වම්
පසින්ද තැබුවේය. ඔහු දකුණු පසින්
පිහිටි කුලුනට යාකින් කියාද වම්ප-
සින් පිහිටි කුලුනට බෝවස් කියාද
නම් තැබුවේය.[9]

4 ඔහු තඹ පූජාසනය සෑදුවේය.[10]
එය දිගින් රියන් විස්සක්ද පළ-
ලින් රියන් විස්සක්ද උසින් රියන් දහ-
යක්ද විය.[11]

2 ඔහු වතුර රැස් කර තබාගැනී-
මට විශාල වටකුරු භාජනයක්ද සෑදු-
වේය.[12] එහි උස රියන් පහක් වූ අතර
එහි වටප්‍රමාණය රියන් තිහක් විය.[13]
ඒ භාජනයේ කටේ එක් පැත්තක සිට
අනික් පැත්ත දක්වා දිග රියන් දහ-
යක්ය. 3 එහි කටට යටින් භාජනය
වටේට කොමඩු හැඩැති ගෙඩි[14] පේළි
දෙකක් කැටයම් කර තිබිණ. එක්
රියනකට ගෙඩි දහයක් ඇතුළත් වන
ආකාරයට එම ගෙඩි පේළි ඒ වටා
කැටයම් කර තිබිණ.[15] 4 එම භාජ-
නය තබා තිබුණේ ගොනුන්ගේ රූප

3 පරි.
1 1රාජා 6:2
2 1රාජා 6:3
2ලේක 29:7
3 1රාජා 6:15
4 1රාජා 6:22
1ලේක 29:4
5 1රාජා 6:29
6 1රාජා 6:21
7 1ලේක 29:2
1ලේක 29:8
8 1ලේක 29:4
9 නික් 26:29
10 නික් 26:1
1රාජා 6:29
11 නික් 26:33
1රාජා 8:6
හෙබ්‍රෙ 9:3
හෙබ්‍රෙ 9:24
12 1රාජා 6:20
13 1ලේක 22:3
14 1රාජා 6:23
15 1රාජා 6:28
16 1රාජා 6:24
17 1රාජා 8:6
1ලේක 28:18
2ලේක 5:7

2 තීරුව
1 1රාජා 6:25
1රාජා 6:27
2 නික් 26:31
3 මතෙ 27:51
හෙබ්‍රෙ 10:20
4 නික් 36:35
5 1රාජා 7:15
1රාජා 7:21
2රාජා 25:13
2ලේක 4:12
එළි 3:12
6 1රාජා 7:16
2රාජා 25:17
යෙරෙ 52:22
7 1රාජා 7:17
8 1රාජා 7:20
2රාජා 25:17
2ලේක 4:13
යෙරෙ 52:23
9 1රාජා 7:21

4 පරි.
10 නික් 38:2
1රාජා 8:22
2රාජා 16:14
11 නික් 20:26
12 නික් 30:20
නික් 38:8
2ලේක 4:6
13 1රාජා 7:23
14 1රාජා 6:18
15 1රාජා 7:24

දොළොසක් මතය.[1] ඒ ගොනුන්-
ගෙන් තුන්දෙනෙක් උතුරු දෙස-
ටත් තුන්දෙනෙක් බස්නාහිර දෙසටත්
තුන්දෙනෙක් දකුණු දෙසටත් තුන්-
දෙනෙක් නැඟෙනහිර දෙසටත් මුහුණ
ලා සිටින සේ සාදා තිබිණ. ඒ භාජ-
නය උන්ගේ පිට මත තබා තිබූ අතර
උන්ගේ පිටුපස ඇතුළට පිහිටන සේ
සාදා තිබිණ.[2] **5** භාජනයේ ඝන-
කම අල්ලක්* පළලය. කෝප්පයක
හැඩැති එහි කට පිපුණු ලිලී මලක් හා
සමානය.[3] එහි බාත් ඒකක තුන්දහ-
සක[4] ජලය රැස් කර තබාගත හැක.[5]

**6** ඔහු තවත් භාජන දහයක්ද සෑදු-
වේය. ඒවායින් පහක් ගෘහයට පිටත
දකුණු පසින්ද පහක් වම් පසින්ද
තැබුවේය.[6] ඒවා යොදාගත්තේ දවන
පූජාව සඳහා භාවිත කළ දේවල්[7] සේ-
දීමටය.[8] නමුත් පූජකයන් ඔවුන්ගේ
අත් පා සෝදා පවිත්‍ර කරගත්තේ
විශාල භාජනයේ තිබූ ජලය යොදා-
ගෙනය.[9]

**7** ඔහු රන්වලින් එක හා සමාන
හැඩයකින් යුත්[10] පහන් රුක්[11] දහ-
යක් සාදා ඒවා ශුද්ධස්ථානයේ තැබු-
වේය. ඉන් පහක් දකුණු පැත්තෙහිද
අනික් පහ වම් පැත්තෙහිද තබන
ලදි.[12]

**8** ඔහු මේස දහයක්ද සාදා ශුද්ධස්-
ථානයේ තැබුවේය. ඉන් පහක් දකුණු
පැත්තෙහිද අනික් පහ වම් පැත්තෙ-
හිද තබන ලදි.[13] කුඩා රන් බඳුන් සිය-
යක්ද ඔහු සෑදුවේය.

**9** ඊළඟට ඔහු පූජකයන්ට සීමා
වූ[14] මළුවද[15] ඒ මළුවට ඇතුල් වීම
සඳහා දොරටුද සෑදීය. එම දො-
රටු ඔහු තඹවලින් ආවරණය
කළේය. ඔහු ඇතුල් මළුවද සෑදීය.[16]
**10** විශාල වතුර භාජනය ඔහු තැබු-
වේ ගෘහයේ දකුණු පැත්තේ ගිනි-
කොන දෙසට වෙන්නය.[17]

**11** අඟුරු ඇමීමට භාජනද[18]
සවල්ද[19] වෙනත් බඳුන්ද[20] සාදා හීරාම්
තම වැඩකටයුතු අවසන් කළේය.

ඒ අනුව සැබෑ දෙවිගේ ගෘහය
සෑදීම සඳහා සලමොන් රජු තමාට
පවරා තිබූ සියලුම කාර්යයන් හීරාම්
නිම කළේය. **12** ඔහු කුලුනු දෙ-
කද[1] කුලුනු දෙක මුදුනේ තිබුණු
ගෝලාකාර කොටස්ද[2] සෑදුවේය. ඒ
ගෝලාකාර කොටස් දෙක දැල් සැර-
සිලි දෙකකින්[3] ආවරණය කරන ලදි.
**13** ඒ දැල්වල එල්ලීමට දෙළුම් ගෙඩි
හාරසියයක් සෑදුවේය.[4] එක දැලක්
වටා දෙළුම් ගෙඩි පේළි දෙක බැගින්
තිබිණ.[5] **14** ඔහු කරත්ත දහයද[6] ඒ
කරත්ත මත තැබීමට භාජන දහයද[7]
**15** විශාල ජල භාජනයද[8] එම භාජ-
නය රඳවා තැබීමට ගොනුන් දො-
ළොසද[9] **16** අඟුරු ඇමීමට භාජනද
සවල්ද[10] කොකුද[11] අවශ්‍ය වෙනත්
සියලු උපකරණද[12] සෑදුවේය. හීරාම්-
ආබිව්[13] යන නමින් හැඳින්වූ ඔහු සල-
මොන් රජු පැවසූ ලෙස යෙහෝවා
දෙවිගේ ගෘහය සඳහා මේ සියලු
දේවල් ඔප්නැංවූ තඹවලින් සෑදුවේය.
**17** මේ සියලු දේවල් සාදන ලද්දේ
යොර්දාන් දිස්ත්‍රික්කයේ සුක්කොත්[14]
සහ ෂෙරේදා[15] අතර පිහිටි මැටි බිමෙ-
හිය. **18** ඒ අන්දමින් සලමොන් රජ
විශාල භාණ්ඩ ප්‍රමාණයක් සෑදුවේය.
ඒ සඳහා භාවිත කළ තඹ ප්‍රමාණය
ගණනය කළ නොහැකි තරම්ය.[16]

**19** සලමොන් රජ සැබෑ දෙවිගේ
ගෘහයට අවශ්‍ය සියලු බඩු බාහිරාදි-
යද[17] රන් පූජාසනයද[18] දෙවිට පුදන
රොටි තබන මේසද[19] **20** පහන්
රුක්ද[20] ඒවා මත තබන පහන්ද[21]
පවිත්‍ර රනින් සෑදුවේය. දී තිබූ මඟ
පෙන්වීම්වලට අනුව එම පහන් අති-
ශුද්ධස්ථානය ඉදිරිපිට[22] තබා දල්වන
ලදි. **21** කැටයම් කළ මල්ද පහන්ද
පහන් තිර අල්ලන අඬුද[23] ඔහු රනින්
සෑදීය. (ඒ සඳහා භාවිත කළේ අනර්-
ඝතම රන්ය.) **22** ඔහු පවිත්‍ර රනින්
තිර නිවා ඇමීමට උපකරණද භාජ-
නද කුසලානද අඟුරු ඇමීමට භාජනද
සෑදුවේය.[24] මීට අමතරව දේවමාලි-
ගාවට ඇතුල් වන ස්ථාන[25] එනම්,
ශුද්ධස්ථානයට ඇතුල් වන දොරටුද

**4 පරි.**
**1** යෙරෙ 52:20
**2** 1රාජා 7:25
**3** 1රාජා 6:35
**4** එස 45:14
**5** 1රාජා 7:26
**6** 1රාජා 7:39
**7** ලෙවී 1:9
**8** ලෙවී 9:14
**9** නික් 29:4
**10** 1ලේක 28:12
**11** නික් 37:17 2ලේක 4:20 සෙක 4:2
**12** නික් 40:24
**13** 2ලේක 4:19
**14** 1රාජා 6:36
**15** නික් 27:9 ලෙවී 6:16
**16** 1රාජා 7:12
**17** 1රාජා 7:39
**18** නික් 27:3 1රාජා 7:45
**19** නික් 38:3 2රාජා 25:14
**20** 1රාජා 7:40

**2 තීරුව**
**1** 2ලේක 3:17
**2** 1රාජා 7:41
**3** 1රාජා 7:17
**4** 1රාජා 7:20
**5** 1රාජා 7:42 යෙරෙ 52:22
**6** 1රාජා 7:27 2රාජා 25:16 යෙරෙ 52:17
**7** 1රාජා 7:38
**8** 1රාජා 7:23
**9** 1රාජා 7:25
**10** 1රාජා 7:40
**11** නික් 38:3
**12** යෙරෙ 52:19
**13** 2ලේක 2:13
**14** යොෂු 13:24 යොෂු 13:27
**15** 1රාජා 7:46
**16** 1රාජා 7:47 1ලේක 22:3 1ලේක 22:14 යෙරෙ 52:20
**17** 2රාජා 24:13 එස්රා 1:7 යෙරෙ 28:3
**18** නික් 37:26 1රාජා 7:48 2ලේක 26:16 එළි 8:3
**19** නික් 25:24 2ලේක 4:8
**20** නික් 37:17 1රාජා 7:49
**21** නික් 25:37
**22** 1රාජා 6:16
**23** නික් 37:23
**24** 1රාජා 7:50
**25** 1රාජා 6:32

**2ලේක 4:5*** සෙන්ටිමීටර් 7.4ක් පමණ.

අතිශුද්ධස්ථානයට පිවිසෙන දොර-
ටුද[1] ඔහු රනින් සැදුවේය.

**5** සලමොන් රජ යෙහෝවා දෙවි-
ගේ ගෘහයේ සියලුම වැඩකටයුතු
අවසන් කළේය.[2] ඉන්පසු තම පියා වූ
දාවිත්, දෙවි වෙනුවෙන් කැප කර තිබූ
සියලුම වස්තු ඔහු ගෘහය තුළට ගෙ-
නාවේය.[3] ඔහු රන්ද රිදීද සියලු භාජ-
නද ගෙනැවිත් සැබෑ දෙවිගේ ගෘහයේ
වස්තු ගබඩාවේ තැන්පත් කළේය.[4]
**2** සලමොන් රජ ඊශ්‍රායෙල්හි සිය-
ලුම වැඩිමහල්ලන්ද[5] ගෝත්‍රවල
ප්‍රධානීන්ද[6] ඊශ්‍රායෙල්වරුන්ගේ පෙ-
ළපත්වල අධිපතීන්ද[7] යෙරුසලමට
එක් රැස් කරන මෙන් අණ කළේය.
එසේ කළේ දාවිත්ගේ නුවර[8] වන
සියොන්හි[9] තිබූ යෙහෝවා දෙවි-
ගේ ගිවිසුම් පෙට්ටිය[10] දේවමාලිගා-
වට ගෙන ඒමේ[11] අවස්ථාවට සහභාගි
වීම සඳහාය. **3** එවිට ඊශ්‍රායෙල්හි
සිටි ඒ සියලු පුරුෂයෝ සත්වන මාස-
යේ[12] උත්සවය පවත්වන කාලයේදී
රජු ඉදිරියට පැමිණියෝය.
**4** මෙසේ ඊශ්‍රායෙල්හි වැඩිමහල්ලන්
සියලුදෙනාම පැමිණියෝය.[13] ලෙවී-
වරු ගිවිසුම් පෙට්ටිය උසුලා-
ගෙන ආවෝය.[14] **5** ලෙවී ගෝත්‍රයට
අයත් පූජකයෝ* ගිවිසුම් පෙට්ටි-
යද[15] සම්මුඛ වීමේ කූඩාරමද[16]
කූඩාරමේ තිබූ සියලු ශුද්ධ උපක-
රණද[17] ගෙනාවෝය.[18] **6** සලමොන්
රජද ඔහු සමඟ සිටි මුළු ඊශ්‍රායෙල් සෙ-
නඟද ගිවිසුම් පෙට්ටිය ඉදිරියෙහි සිට
ගණන් කළ නොහැකි තරම් බැටළුවන්
සහ ගවයන් විශාල ප්‍රමාණයක් පූජා
කළෝය.[19] **7** පූජකයෝ යෙහෝවා
දෙවිගේ ගිවිසුම් පෙට්ටිය නියමිත
ස්ථානයට එනම්, ගෘහයේ අතිශුද්-
ධස්ථානයට[20] ගෙනැවිත් කෙරුබ්ව-
රුන්ගේ පියාපත් යට තැබුවෝය.[21]
**8** කෙරුබ්වරු තම පියාපත් ගිවිසුම්
පෙට්ටියට ඉහළින් විහිදුවාගෙන සිටි-
යෝය. ඒ නිසා ගිවිසුම් පෙට්ටිය හා
එහි පොලු[22] මතට කෙරුබ්වරුන්-
ගේ පියාපත්වල සෙවණ වැටිණ.[1]
**9** ගිවිසුම් පෙට්ටියේ සවි කර තිබූ
පොලු දිගට සාදා තිබූ නිසා පොලුවල
අගිස් අතිශුද්ධස්ථානයට ඉදිරියෙන්
පිහිටා තිබූ ශුද්ධස්ථානයට පෙනු-
ණේය. නමුත් ඒ පොලු පිටතට පෙනු-
ණේ නැත. ඒවා අද දක්වා එලෙසම
පවතියි.[2] **10** ගිවිසුම් පෙට්ටිය තුළ
තිබුණේ මෝසෙස් විසින් සුරක්ෂිතව
තබන ලද ගල් පුවරු දෙක පමණි.[3]
එම ගල් පුවරු දෙක මෝසෙස්ට දෙනු
ලැබුවේ ඊශ්‍රායෙල්වරුන් ඊජිප්තුවෙන්
පිටතට ආ පසු[4] යෙහෝවා දෙවි ඔවුන්
සමඟ හොරෙබ් කන්ද අසලදී[5] ගිවිසු-
මක් ඇති කරගත්[6] අවස්ථාවේදීය.
**11** පූජකයෝ ශුද්ධස්ථානයෙන්
පිටතට පැමිණියෝය. (එදින කාණ්ඩ
වශයෙන් සේවය කිරීමේ සැලැස්ම
ක්‍රියාත්මක වුණේ නැත.[7] ඒ වෙනු-
වට සියලුම පූජකයෝ සේවය සඳහා
පවිත්‍ර වී සිටියෝය.)[8] **12** ආසාෆ්,[9]
හේමාන්[10] සහ යෙදුතුන්[11] යටතේද
ඔවුන්ගේ පුත්‍රයන් සහ සහෝදර-
යන් යටතේද සේවය කළ සිය-
ලුම ලෙවීවරු[12] අනර්ඝ රෙදිවලින්
නිමැවූ වස්ත්‍රවලින් සැරසී සිටියෝය.
ඔවුහු අත්තාළම්,[13] වීණා[14] සහ කුඩා
වීණා[15] වාදනය කරමින් පූජාසන-
යට නැඟෙනහිර දෙසින් සිටගෙන
සිටියෝය. ඔවුන් සමඟ පූජකයෝ
එකසිය විසිදෙනෙක් හොරණෑ පිඹි-
මින් සිටියෝය.[16] **13** මෙසේ හො-
රණෑ පිඹිමින්, "දෙවි යහපත්ය.[17]
ඔහුගේ මහත් ප්‍රේමය*[18] සදාකල් පව-
තින්නේය" කියා ගායනා කරමින්
ඔවුහු එක හඬින්[19] යෙහෝවා දෙවිට
ස්තුති ප්‍රශංසා කළෝය. ඔවුන් හො-
රණෑ පිඹිමින් අත්තාළම් හා වෙනත්
සංගීත භාණ්ඩ වාදනය කරමින්[20]
යෙහෝවා දෙවිට ප්‍රශංසා[21] කළ විගස

**4 පරි.**
1 1රාජා 6:34

**5 පරි.**
2 1රාජා 6:38; 1රාජා 7:51
3 1ලේක 22:14
4 1ලේක 26:26; මතෙ 23:17
5 1රාජා 8:1
6 ද්වි 1:13
7 1ලේක 24:6; 1ලේක 24:31; 2ලේක 1:2
8 2සාමු 5:7; 2සාමු 5:9
9 ගීතා 2:6; යෙසා 35:10; මතෙ 21:5
10 නික් 25:10; ගණන් 10:33
11 2සාමු 6:12; 2ලේක 1:4
12 ලෙවී 23:34; 1රාජා 8:2; 2ලේක 7:8
13 යොෂු 23:2
14 නික් 25:14; ගණන් 4:15; 1ලේක 15:15
15 නික් 37:1
16 නික් 40:35; ගණන් 4:31
17 ගණන් 4:15; 1රාජා 7:48
18 1රාජා 8:4
19 2සාමු 6:13; 1රාජා 8:5
20 1රාජා 6:20; 1රාජා 6:23
21 1රාජා 8:6
22 නික් 25:14

**2 තීරුව**
1 1රාජා 8:7
2 1රාජා 8:8
3 නික් 34:1; නික් 40:20; ද්වි 10:2
4 නික් 19:1
5 ද්වි 4:15
6 නික් 19:5; නික් 24:7; ද්වි 29:1; 2ලේක 6:11; යෙරෙ 31:32
7 1ලේක 24:1; 2ලේක 35:4
8 නික් 19:10; ගණන් 8:21; 2ලේක 29:34; 2ලේක 30:24
9 1ලේක 6:39; 1ලේක 15:19
10 1ලේක 6:33; 1ලේක 15:17; 1ලේක 25:6
11 1ලේක 16:41; 1ලේක 25:3
12 1ලේක 15:16; 1ලේක 16:4; 1ලේක 23:3; 1ලේක 25:1; 2ලේක 29:25; එස්රා 3:10; 13 1ලේක 15:16; 14 2සාමු 6:5; 15 2ලේක 9:11; 16 1ලේක 15:24; 17 1ලේක 16:34; 2ලේක 7:10; 18 නික් 34:6; 19 යෙසා 52:8; පිලි 1:27; 20 ගීතා 69:30; 21 ගීතා 84:4.

**2ලේක 5:5*** හෝ, "පූජකයෝ සහ ලෙවීවරු."

**2ලේක 5:13*** හෝ, "ළැදි ප්‍රේමය."

යෙහෝවා දෙවිගේ ගෘහය[1] වලාකුළ-
කින් පිරී ගියේය.[2] **14** එම වලාකුළ
නිසා සේවය කරමින් සිටි පූජකයන්ට
තවදුරටත් එහි සිටීමට නොහැකි
විය.[3] මන්ද යෙහෝවා දෙවිගේ තේජ-
සින්[4] මුළු ගෘහයම පිරී ගියේය.

**6** එවිට සලමොන් රජ මෙසේ
කීවේය.[5] "යෙහෝවා දෙවියනි,
ඔබ ගන වලාකුළක වාසය කරන බව
ඔබම පැවසුවා.[6] **2** එහෙයින් ඔබට
වාසය කිරීමට සුදුසු තේජාන්විත ගෘහ-
යක් මම සෑදූ බව දැන් මට ස්ථිරයි.[7]
ඔබට සැමදා වාසය කිරීමට ස්ථිර
වාසස්ථානයක් මම ගොඩනැඟුවා."[8]
**3** ඉන්පසු රජ රැස්ව සිටි මුළු ඊශ්‍රා-
යෙල් සෙනඟ දෙස බලා ඔවුන්ට
ආශීර්වාද කළේය.[9] ඒ අවස්ථා-
වේදී ඔවුහු සියලුදෙනාම සිටගෙන
සිටියෝය.[10] **4** රජ ඔවුන්ට මෙසේ
කීවේය. "ඊශ්‍රායෙල්වරුන්ගේ දෙවි
වන යෙහෝවාට ප්‍රශංසා වේවා![11]
ඔහු මාගේ පියා වූ දාවිත්ට පො-
රොන්දු වූ දේ[12] එයාකාරයෙන්ම* ඉටු
කළා.[13] දෙවි ඔහුට මෙසේ පැව-
සුවා. **5** 'මාගේ සෙනඟව මම ඊජිප්-
තුවෙන් පිටතට ගෙන ආ දවසේ සිට
මේ දක්වා මාගේ නාමය ගෞර-
වයට පත් කිරීම පිණිස ගෘහයක්
ගොඩනැඟීමට ඊශ්‍රායෙල්හි ගෝත්‍රව-
ලට අයත් වෙන කිසිම නුවරක්
තෝරා නොගත්තෙමි.[14] මාගේ සෙ-
නඟ වන ඊශ්‍රායෙල් ජනයාව පාල-
නය කිරීමට වෙන කිසි මිනිසෙකුවද
තෝරා නොගත්තෙමි.[15] **6** නමුත්
මාගේ නාමය වෙනුවෙන් මම යෙ-
රුසලම තෝරාගත්තෙමි.[16] මාගේ
සෙනඟ වන ඊශ්‍රායෙල්වරුන්ව පාල-
නය කිරීමට මම දාවිත්ව තෝරා-
ගත්තෙමි.'[17] **7** ඊශ්‍රායෙල්හි දෙවි
වන යෙහෝවාගේ නාමය ගෞරවයට
පත් කිරීම සඳහා ගෘහයක් ගොඩ-
නැඟීමට මගේ පියා වූ දාවිත්ට ලොකු
ආශාවක් තිබුණා.[18] **8** නමුත් යෙ-
හෝවා දෙවි මගේ පියාට මෙසේ
පැවසුවා. 'මාගේ නාමය ගෞරවයට
පත් කිරීම සඳහා ගෘහයක් ගො-
ඩනැඟීමට ඔබ මහත් ආශාවකින්
සිටින බව මම දන්නෙමි. ඔබේ සිතේ
තිබෙන ඒ ආශාව මම බොහෝ සෙ-
යින් අගය කරමි.[1] **9** නමුත් මාගේ
නාමය ගෞරවයට පත් කරන ඒ
ගෘහය ගොඩනඟන්නේ ඔබ නොවේ.[2]
එය ගොඩනඟන්නේ ඔබේ පුත්‍රයාය.'[3]
**10** යෙහෝවා දෙවි පැවසූ ඒ දේ එලෙ-
සම ඉටු කළා.[4] යෙහෝවා දෙවි කී
ලෙසම[5] මගේ පියා වූ දාවිත්ගෙන්
පසුව ඊශ්‍රායෙල්හි රජු ලෙස[6] මාව පත්
කළා.[7] එසේ කළේ ඊශ්‍රායෙල්හි දෙවි
වන යෙහෝවාගේ නාමය ගෞරවයට
පත් කිරීම සඳහා ගෘහයක් ගොඩ-
නඟන පිණිසයි.[8] **11** එමෙන්ම යෙ-
හෝවා දෙවි ඊශ්‍රායෙල්වරුන් සමඟ
කළ ගිවිසුම[9] ඇතුළත් ගල් පුවරු
දෙක තබා තිබෙන පෙට්ටිය[10] එම
ගෘහයේ තැන්පත් කරන පිණිසයි.
දෙවි බලාපොරොත්තු වූ මේ සියලු
දේවල් මා ඉටු කළා."
**12** රැස්ව සිටි මුළු ඊශ්‍රායෙල් සෙනඟ
බලා සිටියදීම රජ යෙහෝවා දෙවි-
ගේ පූජාසනය ඉදිරිපිට සිටගෙන,[11]
අහස දෙසට තම දෑත් එසවීය.[12]
**13** (සලමොන් රජ තඹවලින් වේදිකා-
වක් සාදා[13] එය ඇතුල් මළුවෙහි මැද
තැබුවේය.[14] එය දිගින් රියන් පහක්ද
පළලින් රියන් පහක්ද උසින් රියන්
තුනක්ද විය. ඔහු සිටගෙන සිටියේ ඒ
මතය.) මුළු ඊශ්‍රායෙල් සෙනඟ බලා
සිටියදීම ඔහු දණ ගසා[15] අහස දෙ-
සට තම දෑත් ඔසවා,[16] **14** මෙසේ
යාච්ඤා කළේය. "ඊශ්‍රායෙල්හි දෙවි
වන යෙහෝවා,[17] අහසේවත් පොළො-
වේවත් ඔබට සමාන වෙන කිසි දෙවි
කෙනෙක් නැහැ.[18] මන්ද මුළු හදව-
තින්ම ඔබට විශ්වාසවන්තව සේවය
කරන ඔබේ සේවකයන්ට ඔබ දිගටම
ප්‍රේමය* පෙන්වමින්[19] ඔවුන් සමඟ
ඇති කරගත් ගිවිසුමට එකඟව ඔබ

**5 පරි.**
1 නික් 40:34; 1රාජා 8:11
2 1රාජා 8:10
3 නික් 40:35; 2ලේක 7:2
4 නික් 16:10; එස 10:4; එළි 21:23

**6 පරි.**
5 1රාජා 8:12
6 නික් 20:21; ද්වි 4:11; ගීතා 97:2; හෙබ්‍රෙ 12:18
7 1රාජා 8:13
8 2ලේක 2:4; ගීතා 132:14
9 1රාජා 8:55
10 නෙහෙ 8:5
11 ගීතා 41:13; ගීතා 145:10; යාකො 3:9
12 1ලේක 17:12
13 1රාජා 8:15; යෙසා 55:11
14 ද්වි 12:5
15 1රාජා 8:16
16 2ලේක 12:13; ගීතා 48:1
17 2සාමු 7:8; 1ලේක 28:4
18 2සාමු 7:2; 1රාජා 5:3

**2 තීරුව**
1 1රාජා 8:18; 2කොරි 8:12
2 1රාජා 8:19
3 2සාමු 7:12; 1ලේක 17:4
4 යොෂු 21:45; නෙහෙ 9:8
5 1ලේක 17:11
6 1ලේක 28:5; හෙබ්‍රෙ 1:8
7 1ලේක 29:23
8 1රාජා 8:20
9 1රාජා 8:21
10 නික් 40:20; 1රාජා 8:9; 2ලේක 5:10
11 1රාජා 8:22
12 නික් 9:33; ගීතා 28:2; 1තිමෝ 2:8
13 නෙහෙ 8:4
14 1රාජා 6:36
15 1රාජා 8:54; ගීතා 95:6; ක්‍රියා 20:36
16 එස්රා 9:5
17 1ලේක 29:10
18 නික් 15:11; 1සාමු 2:2; ගීතා 86:8; මීකා 7:18
19 ද්වි 7:9; 2රාජා 20:3; 2ලේක 16:9; නෙහෙ 1:5.

**2ලේක 6:4*** මූ.අ., "තම හස්තයෙන්."

**2ලේක 6:14*** හෝ, "ලැදි ප්‍රේමය."

ක්‍රියා කරනවා.[1] **15** ඔබේ සේවකයා
වන මගේ පියා වූ දාවිත්ට පො-
රොන්දු වූ සියල්ල ඔබ ඉටු කළා.[2] අද
ඒ පොරොන්දු ඔබ ඔබේම බලයෙන්
ඉටු කර පෙන්නුවා.[3] **16** යෙහෝවා,
ඊශ්‍රායෙල්හි දෙවියනි, ඔබේ සේවකයා
වන මගේ පියා වූ දාවිත්ට ඔබ මෙසේ
පොරොන්දු වුණා. 'ඔබ මට විශ්වාස-
වන්තව සේවය කළාක් මෙන්[4] ඔබේ
පුත්‍රයන්ද[5] මාගේ නීතිවලට කීකරු
වෙමින් මට විශ්වාසවන්තව සේවය
කළොත්[6] ඊශ්‍රායෙල්හි රජකම කවදා-
වත් ඔබේ පෙළපතින් පිට කෙනෙකු
අතට පත් නොවේ.'[7] ඔබ දුන් ඒ
පොරොන්දුව එලෙසම ඉටු කරන්න.
**17** යෙහෝවා, ඊශ්‍රායෙල්හි දෙවියනි,[8]
ඔබේ සේවකයා වූ දාවිත්ට ඔබ දුන්
පොරොන්දුව[9] ඉටු වේවා![10]

**18** "දෙවි ඇත්තටම මනුෂ්‍යයන්
සමඟ මේ පොළොවේ වාසය කරන-
වාද?[11] ඔබට වාසය කිරීමට මුළු
මහත් විශ්වයම ප්‍රමාණවත් නැහැ.[12]
එහෙමනම් මා ගොඩනැඟූ මේ
ගෘහය ඔබට ප්‍රමාණවත් වෙයිද?[13]
**19** මාගේ දෙවි යෙහෝවා, ඔබේ
සේවකයාගේ යාච්ඤාවටත්[14] දයාව
පෙන්වන්න කියා මා කරන ඉල්ලීම-
ටත්[15] ඇහුම්කන් දෙන්න. මම ඔබ
ඉදිරියේ කරන කන්නලව්වට සවන්
දෙන්න.[16] **20** ඔබේ නාමය දරන
මේ ගෘහය දෙසට[17] දිවා රෑ දෙකෙහිම
ඔබේ නෙත් යොමු කර[18] ඔබේ සේව-
කයා මේ ගෘහය දෙසට හැරී කරන
යාච්ඤාවට සවන් දෙන මෙන් මම
ඉල්ලා සිටිනවා.[19] **21** ඔබේ සේව-
කයාද ඔබේ සෙනඟ වන ඊශ්‍රායෙල්-
වරුන්ද මේ ගෘහය දෙසට හැරී[20]
මහත් ඕනෑකමින් කරන යාච්ඤාව-
ලට සවන් දෙන්න.[21] ඔබේ වාසස්-
ථානය වන ස්වර්ගයේ සිට ඒවාට
සවන් දී[22] ඔවුන්ගේ වැරදිවලට සමාව
දෙන්න.[23]

**22** "තමාට විරුද්ධව වරදක් කර
ඇතැයි කියා යමෙකුට චෝදනා
කළ විට[24] එම තැනැත්තා තමා
නිර්දෝෂයි කියා ප්‍රකාශ කිරීමට
ඉඩ තිබේ. නමුත් චෝදනාව ගෙනා
තැනැත්තා ඔහුගෙන් දිවුරුමක්* ගත
හැකියි.[1] එවැනි දිවුරුමකට යටත්ව
සිටින තැනැත්තෙකු මේ ගෘහයේ
තිබෙන පූජාසනය ඉදිරියට පැමිණි-
යොත්[2] **23** ඔබ ස්වර්ගයේ සිට ඔහු
කියන දේ අසා[3] ඔබේ සේවකයන් දෙ-
දෙනාවම විනිශ්චය කරන්න.[4] ඔවුන්
එක් එක් කෙනාගේ ක්‍රියාවලට අනුව
සුදුසු ප්‍රතිඵල දී[5] දුෂ්ටයා කවුද කියාත්
ධර්මිෂ්ඨයා කවුද කියාත්[6] පෙන්වා
දෙන්න.

**24** "ඔබට විරුද්ධව දිගටම පව්
කිරීම නිසා[7] ඔබේ සෙනඟ වන
ඊශ්‍රායෙල්වරුන් තම සතුරන් අතින්
පරාජය විය හැකියි.[8] නමුත්
ඔවුන් නැවතත් ඔබ වෙතට හැරී[9]
ඔබේ නාමයට ප්‍රශංසා කරමින්[10] මේ
ගෘහයේදීම ඔබේ කරුණාව අයැ-
දමින්[11] ඔබට යාච්ඤා කළොත්[12]
**25** ස්වර්ගයේ සිට ඔවුන්ට සවන්
දෙන මෙන්ද[13] ඔබේ සෙනඟ වන
ඊශ්‍රායෙල්වරුන් කළ පාපයට සමාව
දී[14] ඔබ ඔවුන්ටත් ඔවුන්ගේ මුතුන්-
මිත්තන්ටත් දුන් දේශයට[15] ඔවුන්ව
නැවත ගෙන එන මෙන්ද[16] ඔබෙන්
අයැදිනවා.

**26** "ඔවුන් ඔබට විරුද්ධව දිගටම
වැරදි ක්‍රියාවල නිරත වුණොත්[17] ඔබ
ඔවුන්ට දඬුවම් කර වර්ෂාව නොලැ-
බෙන ලෙස අහසේ කවුළු වසා දමන
බව නිසැකයි.[18] නමුත් ඔවුන් කළ
වැරදි ක්‍රියා අත්හැර මේ ස්ථානය වෙ-
තට හැරී[19] යාච්ඤා කරමින්[20] ඔබේ
නාමයට ප්‍රශංසා කළොත් **27** ස්වර්-
ගයේ සිට ඔවුන්ට සවන් දී ඔබේ සේ-
වකයන් එනම්, ඔබේ සෙනඟ වන
ඊශ්‍රායෙල්වරුන් කළ වැරැද්දට සමාව
දෙන මෙන් මම ඔබෙන් අයැදිනවා.
මන්ද ඔවුන් යා යුතු නිවැරදි මාර්-

**6 පරි.**
**1** 1රාජා 8:23
**2** 1රාජා 3:6; 1රාජා 6:12
**3** 2සාමු 7:12; 1ලේක 22:10
**4** ගීතා 26:3
**5** 1රාජා 6:12
**6** ගීතා 132:12
**7** 1රාජා 8:24
**8** නික් 24:10
**9** 2සාමු 7:25; ගීතා 119:49
**10** 1රාජා 8:26
**11** 1රාජා 8:27; ක්‍රියා 7:48
**12** 2ලේක 2:6; නෙහෙ 9:6; ගීතා 148:13; යෙසා 40:12; ක්‍රියා 17:24
**13** 1රාජා 8:27; යෙසා 66:1
**14** 2ලේක 6:33; ගීතා 65:2; දානි 9:18
**15** 2ලේක 33:13; ගීතා 6:9
**16** 1රාජා 8:28; ගීතා 5:2
**17** ද්වි 26:2; 2ලේක 6:9; නෙහෙ 1:9
**18** 2රාජා 19:16; ගීතා 33:18; ගීතා 34:15
**19** 1රාජා 8:29
**20** 2ලේක 7:12; දානි 6:10
**21** ගීතා 5:1
**22** 2රාජා 19:20; 2ලේක 30:27
**23** 2ලේක 7:14; මීකා 7:18
**24** 1සාමු 2:25

**2 තීරුව**
**1** නෙහෙ 10:29
**2** 1රාජා 8:31
**3** 2ලේක 30:27; ගීතා 123:1
**4** 1රාජා 8:32
**5** ගණන් 5:27; 2රාජා 9:26; යෝබ් 34:11; හිතෝ 1:31; යෙසා 3:10; යෙසා 3:11; එස 18:20; ගලා 6:7
**6** ද්වි 25:1; ගීතා 33:5
**7** යොෂු 7:11; විනි 2:14
**8** ලෙවී 26:17; ද්වි 28:25; යොෂු 7:8
**9** ලෙවී 26:40; නෙහෙ 9:2
**10** දානි 9:19
**11** 1රාජා 8:33; දානි 9:3

**12** එස්රා 9:5; **13** යෙසා 57:15; **14** 1රාජා 8:34; **15** උත් 13:15; නික් 6:8; **16** ගීතා 106:47; **17** එස 14:13; **18** යාකො 5:17; **19** යෙසා 9:13; එස 18:30; **20** 1රාජා 8:35.

**2ලේක 6:22*** 1රාජා 8:31හි පාදසටහන බලන්න.

ගය[1] උගන්වන්නේ ඔබයි.[2] ඔබේ සෙ-
නඟට ඔබ උරුමයක් වශයෙන් දුන්
මේ දේශයට[3] එතැන් පටන් වර්ෂාව
ලබා දෙන්න.[4]

**28** "මේ දේශයේ වැසියන් සාග-
තයකින්[5] හෝ වසංගතයකින්[6]
හෝ පීඩා වින්දොත් නැත්නම් වියළි
සුළඟකින්[7] හෝ දිලීර රෝගයකින්[8]
හෝ පළඟැටියන් නිසා[9] හෝ කැර-
පොත්තන් නිසා[10] හෝ ඔවුන්ගේ
අස්වැන්න විනාශ වුණොත් එසේත්
නැත්නම් ඔවුන්ගේ නුවරවල්[11] සතු-
රන් විසින් ආක්‍රමණය කළොත්[12]
නැත්නම් වෙන ඕනෑම වසංගත-
යක් හෝ රෝගයක්[13] හෝ ඔවුන්
පිටට පැමිණියොත් **29** ඔබේ කරු-
ණාව ඉල්ලා[14] ඔවුන් කරන ඕනෑම
අයැදීමකට[15] සවන් දෙන්න. ඒ ගැන
මුළු ඊශ්‍රායෙල් සෙනඟම එකතු වී
යාච්ඤා කළොත්[16] නැත්නම් ඔවුන්
එක් එක් කෙනා තනිව ඔබට යාච්ඤා
කළොත් ඒවාට සවන් දෙන්න. ඒ එක්
එක් කෙනා තම තමාගේ සිතේ ඇති
වන වේදනාව[17] නිසා මේ ගෘහය දෙ-
සට තම දෑත් ඔසවා යාච්ඤා කරන
විට[18] **30** දෙවියනි, ඔබේ වාසස්ථා-
නය වන ස්වර්ගයේ සිට[19] ඔවුන්ට
සවන් දෙන්න. ඔවුන්ගේ වැරදිවලට
ඔවුන්ට සමාව දෙන්න.[20] ඔවුන් එක්
එක් කෙනාගේ සිතේ තියෙන දේ ඔබ
හොඳින් දන්නා නිසා[21] ඔවුන්ට සුදුසු
ප්‍රතිඵල ලබා දෙන්න.[22] **31** එවිට
ඔබ අපේ මුතුන්මිත්තන්ට දුන් දේශ-
යේ ඔවුන් ජීවත් වන තාක් කල්[23]
ඔබේ ප්‍රමිතිවලට එකඟව ගමන් කර-
මින් ඔබ කෙරෙහි ගරුබිය ඇතුව
ජීවත් වෙයි.[24]

**32** "ඔබේ සෙනඟ වන ඊශ්‍රායෙල්
ජාතියට අයත් නොවන විදේශික-
යෙකු[25] ඔබේ ශ්‍රේෂ්ඨ නාමය ගැනත්[26]
ඔබේ මහත් බලය ගැනත්[27] ඔබ
උපකාර කරන ආකාරය ගැනත්[28]
අසා දුර ඈත පළාතක සිට පැමිණ
මේ ගෘහය දෙසට හැරී යාච්ඤා
කළොත්[29] ඔහුටද සවන් දෙන්න.
**33** ඔබේ ස්ථිර වාසස්ථානය වන
ස්වර්ගයේ සිට[1] ඒ විදේශිකයාට සවන්
දී ඔහු ඔබෙන් ඉල්ලන සියල්ල ඉටු
කර දෙන්න.[2] එවිට පොළොවේ සියලු
වැසියෝ ඔබේ නාමය දැනගෙන,[3]
ඔබේ සෙනඟ වන ඊශ්‍රායෙල්වරුන්
මෙන් ඔවුන්ද ඔබ කෙරෙහි ගරු-
බිය ඇතුව ජීවත් වෙයි.[4] එමෙන්ම
මා ගොඩනැඟූ මේ ගෘහයෙන් ඔබේ
නාමය ගෞරවයට පත් වන බවද
ඔවුන් දැනගනියි.[5]

**34** "ඔබේ මඟ පෙන්වීමට අනුව[6]
ඔබේ සෙනඟ තම සතුරන්ට විරුද්ධව
යුද්ධයට යන විට,[7] ඔබ තෝරාගත්
නුවර දෙසටත් ඔබේ නාමය වෙනු-
වෙන් මා ගොඩනැඟූ මේ ගෘහය දෙස-
ටත් හැරී[8] ඔවුන් ඔබට යාච්ඤා
කළොත්[9] **35** ඔවුන්ගේ යාච්ඤාව-
ටත් කරුණාව පෙන්වන්න කියා
ඔවුන් ඔබට කරන අයැදීමටත් ස්වර්-
ගයේ සිට සවන් දී[10] ඔවුන් වෙනුවෙන්
යුක්තිය ඉටු කර දෙන්න.[11]

**36** "ඔවුන්ද ඔබට විරුද්ධව පව්
කිරීමට ඉඩ තිබේ.[12] (මන්ද පව් නො-
කරන කිසි මනුෂ්‍යයෙක් නැහැ.)[13]
එවැනි අවස්ථාවක ඔබට ඔවුන් ගැන
දැඩි කෝපයක් ඇති වී ඔවුන්ව දුර
හෝ ළඟ හෝ තිබෙන දේශයකට
ගෙන යෑමට ඔවුන්ගේ සතුරන්ට ඔබ
ඉඩ දිය හැකියි.[14] **37** නමුත් ඔවුන්
ඒ සතුරු දේශයේ සිටියදී තමන් කළ
වැරද්ද තේරුම්ගෙන ඔබ වෙතට
හැරී, 'අපි ඔබට විරුද්ධව පව් කළා.[15]
අපි දුෂ්ට ලෙස ක්‍රියා කළා'[16] යයි
කියමින් කරුණාව පෙන්වන්න කියා
ඔබෙන් අයැදිය හැකියි.[17] **38** ඒ දේ-
ශයේදීම[18] ඔවුන් නැවත වරක් මුළු
හදවතින්ම ඔබව පිළිගෙන[19] ඔබ
ඔවුන්ගේ මුතුන්මිත්තන්ට දුන් දේ-
ශය වෙතටත් ඔබ තෝරාගත් නුවර

**6 පරි.**
**1** යෙසා 30:21 යෙරෙ 6:16 යෙරෙ 42:3
**2** ගීතා 86:11 ගීතා 119:102 යෙසා 30:20 යෙසා 54:13
**3** 1රාජා 8:36
**4** 1රාජා 18:1 සෙක 10:1
**5** රූත් 1:1 2රාජා 6:25 2ලේක 20:9
**6** ලෙවී 26:16 ද්වි 28:21
**7** ආමො 4:9 හග් 2:17
**8** ද්වි 28:22 ආමො 4:9
**9** ද්වි 28:38 යෝවෙ 1:4 යෝවෙ 2:25
**10** ගීතා 78:46
**11** 1රාජා 8:37
**12** ලෙවී 26:25 2ලේක 12:2 2ලේක 32:1
**13** එස 14:21
**14** 2ලේක 33:13
**15** 2ලේක 20:6 ගීතා 91:15
**16** 1රාජා 8:38
**17** හිතෝ 14:10
**18** ආනි 6:10
**19** ගීතා 33:14 යෙසා 63:15 මතෙ 23:22
**20** ගීතා 130:4
**21** 1සාමු 16:7 1රාජා 8:39 1ලේක 28:9 යෙරෙ 11:20 යෙරෙ 17:10
**22** යෝබ් 34:11 ගීතා 18:20 එළි 2:23
**23** උත් 12:7 යොෂු 1:2 1රාජා 8:40
**24** නික් 20:20
**25** නික් 12:48 රූත් 1:16 යෙසා 56:3
**26** ගණන් 9:14 යොෂු 9:27 යෙසා 56:6 යොහ 12:20 ක්‍රියා 8:27
**27** ද්වි 3:24 යොෂු 2:11
**28** 1රාජා 8:42
**29** ක්‍රියා 2:10

**2 තීරුව**
**1** 2ලේක 30:27 ගීතා 11:4 ගීතා 123:1 හෙබ්‍රෙ 9:24
**2** 1රාජා 8:43
**3** ගීතා 22:27 ගීතා 46:10

**4** යෙරෙ 10:7; එළි 14:7; **5** 1රාජා 8:43; **6** ගණන් 31:2; යොෂු 8:1; විනි 1:2; 1සාමු 15:3; **7** ද්වි 20:1; 2ලේක 14:11; **8** 2ලේක 3:2; **9** 2ලේක 14:11; 2ලේක 20:6; **10** ගීතා 3:4; ආනි 9:17; **11** යෙසා 37:36; **12** 1රාජා 8:46; **13** ගීතා 130:3; දේශ 7:20; රෝම 3:23; **14** ලෙවී 26:34; ආනි 9:7; **15** ලෙවී 26:40; නෙහෙ 1:6; ගීතා 106:6; **16** එස්රා 9:6; හිතෝ 28:13; ආනි 9:5; **17** 1රාජා 8:47; **18** ආනි 9:3; **19** ද්වි 30:2; 1සාමු 7:3; යෙරෙ 29:13.

වෙතටත්[1] ඔබේ නාමය උදෙසා මා
ගොඩනැඟූ මේ ගෘහය වෙතටත්[2] හැරී
ඔබට යාච්ඤා කළොත් **39** ඔබේ
ස්ථිර වාසස්ථානය වන ස්වර්ගයේ
සිට[3] ඔවුන්ට සවන් දෙන මෙන්
මම අයැදිනවා. ඔවුන්ගේ යාච්ඤාවත්
කරුණාව පෙන්වන්න කියා ඔවුන්
කරන අයැදීමත්[4] අසා ඔවුන්ට යුක්-
තිය ඉටු කර දෙන්න.[5] එමෙන්ම ඔබේ
සෙනඟ ඔබට විරුද්ධව කළ පව්වලට
සමාව දෙන්න.[6]

**40** "මගේ දෙවියනි, මෙම ස්ථානය
වෙනුවෙන් කරන මේ යාච්ඤාවට
සවන් දී[7] අප දෙසට ඔබේ නෙත්[8]
යොමු කරන මෙන් ඔබෙන් ඉල්ල-
නවා. **41** යෙහෝවා දෙවියනි, මේ
ස්ථානයට ඔබේ තේජවත් ගිවිසුම්
පෙට්ටිය[9] රැගෙන එන මේ මොහො-
තේදී ඒ සමඟ ඔබත් මේ ගෘහයට[10]
පිවිසෙන්න.[11] යෙහෝවා දෙවියනි,
ගැලවීම සලසා දෙන්නේ ඔබ බව
ඔබේ පූජකයන් මාර්ගයෙන් පෙන්-
වන්න. ඔබට විශ්වාසවන්තව සිටින
අය මේ යහපත් දේවල් දැක ප්‍රීති
ඝෝෂා නඟත්වා![12] **42** යෙහෝවා
දෙවියනි, ඔබේ සේවකයා වූ දාවිත්ට
ඔබ පෙන්වූ ප්‍රේමය* කිසිදා අමතක
නොකරන්න.[13] ඔබේ අභිෂේක ලත්
තැනැත්තා වෙතින් ඔබේ මුහුණ ඉව-
තට නොගන්නා මෙන් මම ඔබෙන්
අයැදිනවා."[14]

**7** සලමොන් රජ තම යාච්ඤාව
නිම කළ විගස[15] ස්වර්ගයෙන්
ගින්නක් නික්ම ඇවිත්[16] දවන පූජා[17]
සහ අනිකුත් පූජා සියල්ල දවා දැමීය.
එවිට යෙහෝවා දෙවිගේ තේජසින්[18]
ගෘහය පිරී ගියේය. **2** යෙහෝවා
දෙවිගේ තේජසින් යෙහෝවා දෙවිගේ
ගෘහය පිරී ගොස් තිබූ නිසා යෙහෝවා
දෙවිගේ ගෘහයට ඇතුල් වීමට පූජක-
යන්ට නොහැකි විය.[19] **3** ස්වර්ග-
යෙන් ගින්නක් පැමිණි ආකාරයත්
යෙහෝවා දෙවිගේ තේජසින් ගෘහය
පිරී ගිය ආකාරයත් සියැසින් දුටු සිය-
ලුම ඊශ්‍රායෙල්වරු තමන් සිටගෙන
සිටි ගල් ඇල්ලූ භූමිය මතම දණින්
වැටී,[1] නැමී[2] යෙහෝවා දෙවිට ස්තුති
කරමින්, "ඔහු යහපත්ය.[3] ඔහුගේ
මහත් ප්‍රේමය* සදාකල් පවතින්-
නේය"[4] කියා පැවසූහ.

**4** රජද මුළු සෙනඟද යෙහෝවා
දෙවිට පූජා ඔප්පු කළෝය.[5]
**5** සලමොන් රජ ගවයන් විසිදෙදහ-
සක්ද බැටළුවන් එක්ලක්ෂ විසිදහ-
සක්ද ඔප්පු කළේය.[6] එලෙස රජද
මුළු සෙනඟද එක්ව දෙවිගේ ගෘහය
සැබෑ නමස්කාරය වෙනුවෙන් වෙන්
කළෝය.[7] **6** ඒ අතර පූජකයෝ[8]
තමන්ට නියමිත වගකීම් ඉටු කරමින්
සිටියෝය. ලෙවීවරුද[9] දාවිත් රජු සෑදූ
සංගීත භාණ්ඩ[10] වාදනය කරමින්,
"දෙවිගේ මහත් ප්‍රේමය* සදාකල් පව-
තින්නේය" කියා ගායනා කළෝය.[11]
එසේ ඔවුහු යෙහෝවා දෙවිට ස්තුති
කළෝය. මීට පෙර දාවිත් රජු යෙ-
හෝවා දෙවිට ස්තුති ප්‍රශංසා ඔප්පු
කළ අවස්ථාවලදීත් ගායකයන් විසින්
ගායනා කරනු ලැබුවේ එම වචන පෙ-
ළයි. ඔවුන් ඉදිරියේ සිටි පූජකයෝ
මහත් හඬින් හොරණෑ පිඹිමින් සිටි-
යෝය.[12] මේ දේවල් සිදු වන අතරතුර
සියලුම ඊශ්‍රායෙල්වරු සිටගෙන සිටි-
යෝය.

**7** එදින දවන පූජා, ධාන්‍ය පූජා[13]
හා තෙල් කොටස්[14] ඔප්පු කිරී-
මට සලමොන් සෑදූ තඹ පූජාසනය[15]
ප්‍රමාණවත් නොවීය. එහෙයින් පූජා
ඔප්පු කිරීම සඳහා යෙහෝවා දෙවිගේ
ගෘහය ඉදිරිපිට තිබූ මළුවේ මැද කො-
ටස ඔහු පරිශුද්ධ ස්ථානයක් ලෙස
වෙන් කළේය.[16] ඉන්පසු ඔහු එම
ස්ථානයේදී දවන පූජාද[17] හවුල් පූජා-
වල තෙල් කොටස්ද ඔප්පු කළේය.
**8** පසුව සලමොන් රජද මුළු ඊශ්‍රා-
යෙල් සෙනඟද එකතු වී[18] දවස්
සතක් පුරා උත්සවයක් පැවැත්වූහ.[19]
ඊට හාමොත්හි දේශ සීමාවේ සිට[20]

**6 පරි.**
1 2ලේක 33:7; දානි 6:10
2 1රාජා 8:48
3 2ලේක 30:27; ගීතා 123:1; හෙබ්‍රෙ 9:24
4 1රාජා 8:49
5 උත් 15:14; යෙරෙ 51:36
6 මීකා 7:18
7 ගීතා 17:1; ගීතා 31:2; ගීතා 65:2
8 2ලේක 7:15; 2ලේක 16:9; ගීතා 11:4; ගීතා 34:15; යෙසා 37:17
9 යොෂු 3:13; 1සාමු 5:9
10 1ලේක 28:2
11 ගීතා 132:8
12 නෙහෙ 9:25; ගීතා 65:4
13 ක්‍රියා 13:34
14 1රාජා 1:34; ගීතා 18:50

**7 පරි.**
15 1රාජා 8:54
16 1රාජා 18:38
17 ලෙවී 9:24; 1ලේක 21:26
18 නික් 40:34; 1රාජා 8:11
19 නික් 40:35

**2 තීරුව**
1 නික් 4:31
2 ගීතා 95:6
3 ගීතා 31:19; මතෙ 19:17
4 රූත් 2:20; යෙරෙ 31:3; විලා 3:22
5 1රාජා 8:62
6 1රාජා 8:63
7 ගණන් 7:10; 2ලේක 2:4; එස්රා 6:16
8 2ලේක 5:11
9 1ලේක 23:5
10 1රාජා 10:12; ගීතා 138:8
11 1ලේක 25:7
12 2ලේක 5:13
13 ලෙවී 2:1
14 ලෙවී 4:8
15 2ලේක 4:1
16 1රාජා 8:64
17 ලෙවී 1:3
18 1රාජා 8:65
19 ලෙවී 23:34; ද්වි 16:13
20 ගණන් 34:8; 2රාජා 14:25

**2ලේක 6:42*** හෝ, "ළැදි ප්‍රේමය."

**2ලේක 7:3*** හෝ, "ළැදි ප්‍රේමය." **6*** හෝ, "ළැදි ප්‍රේමය."

ඊජිප්තු නිම්නය දක්වා[1] විහිදී ගිය
පළාත්වලින් විශාල පිරිසක්[2] පැමිණි-
යෝය. **9** පූජාසනය පරිශුද්ධ දෙ-
යක් ලෙස කැප කිරීමට දින සතක්
වෙන් කරන ලදි. ඉන්පසු තව දින
සතක් පුරා උත්සවයක් පවත්වන
ලදි. ඒ උත්සවයෙන් පසුව අට-
වන දවසේදී ඔවුහු විශේෂ රැස්-
වීමක් පැවැත්වූහ.[3] **10** ඉන්පසු
සත්වන මාසයේ විසිතුන්වන දින ඔහු
සෙනඟව තම නිවෙස්වලට පිටත් කර
යැවීය. දාවිත් සහ සලමොන් වෙනු-
වෙන්ද තම සෙනඟ වන ඊශ්‍රායෙල්
ජාතිය වෙනුවෙන්ද යෙහෝවා දෙවි
කළ[4] යහපත් දේවල් ගැන ඔවුහු
සතුටු වී[5] ප්‍රීතියෙන්[6] තම නිවෙස්ව-
ලට ගියෝය.

**11** මෙසේ සලමොන් රජ යෙ-
හෝවා දෙවිගේ ගෘහයද[7] තම රජමා-
ලිගාවද[8] ඉදි කර අවසන් කළේය. ඔහු
තමන් සිතූ ආකාරයටම යෙහෝවා
දෙවිගේ ගෘහයේ හා තම මාලිගා-
වේ කටයුතු සාර්ථකව නිම කළේය.
**12** යෙහෝවා දෙවි රාත්‍රියේදී සල-
මොන් රජුට මෙසේ පැවසීය.[9] "මම
ඔබේ යාච්ඤාවට ඇහුම්කන් දුනිමි.[10]
මෙම ගෘහය පූජා ඔප්පු කිරීමට සුදුසු
ස්ථානයක්[11] ලෙස මම පිළිගනිමි.[12]
**13** යම් අවස්ථාවක වැසි නොව-
සින පිණිස මා අහසේ කවුළු වසා
දැමූ විට[13] හෝ දේශය පාළු කර
දමන ලෙස මා පළඟැටියන්ට අණ
කළ විට[14] හෝ මම මාගේ සෙ-
නඟට වසංගතයකින් පහර දුන් විට[15]
හෝ **14** මාගේ නාමය දරන[16] මා
තෝරාගත් සෙනඟ[17] ඔවුන් කරන
වැරදි දේවලින් ඉවත් වී[18] බැගෑ-
පත්ව[19] මට කන්නලව් කරමින්[20]
මාගේ පිහිට පැතුවොත්[21] ස්වර්ගයේ
සිට මම ඔවුන්ට සවන් දෙන්නෙමි.[22]
ඔවුන්ගේ පව්වලට සමාව දී[23] ඔවුන්-
ගේ දේශය යළි සමෘද්ධිමත් කරන්-
නෙමි.[24] **15** මෙම ස්ථානය වෙතට
මාගේ දෑස් යොමු කර[25] මෙහි කරන
යාච්ඤාවලට මම සවන් දෙන්නෙමි.[26]
**16** මම මේ ගෘහය සඳහටම[27] මාගේ
නාමය දරන ශුද්ධ ස්ථානයක් ලෙස[1]
තෝරාගන්නෙමි.[2] මම මේ ගෘහය
රැකබලා ගන්නෙමි. එය කිසිදා අම-
තක නොකරන්නෙමි.[3]

**17** "ඔබේ පියා වූ දාවිත් මෙන්
ඔබත් මාගේ කැමැත්තට අනුව ජීවත්
වෙමින්[4] මා ඔබට අණ කළ[5] මාගේ
සියලු ආඥාවලට[6] හා මා තීන්දු
කර ඇති දේවලට[7] කීකරු වුණොත්
**18** මම ඔබේ රාජකීය පෙළපත ස්ථිර
කරන්නෙමි.[8] 'කිසි දිනක ඊශ්‍රායෙල්හි
රජකම ඔබේ පෙළපතින් පිට කෙ-
නෙකු අතට නොයනු ඇත'[9] කියා
ඔබේ පියා වූ දාවිත්ට මම පොරොන්දු
වූ දේ එලෙසම ඉටු කරන්නෙමි.[10]
**19** නමුත් ඔබත් ඔබේ සෙනඟත් මා
ඔබට දුන් ආඥා[11] සහ පනත්[12] කඩ
කර මාව අත්හැර[13] වෙනත් දෙවිව-
රුන් ඉදිරියේ වැඳ වැටී[14] නමස්කාර
කළොත්[15] **20** මා ඔබට දුන් දේශ-
යෙන් ඔබ සියලුදෙනාවම මම පන්නා
දමන්නෙමි.[16] මාගේ නාමය ගෞරව-
යට පත් කිරීම සඳහා ගොඩනැඟූ
මේ ගෘහයද[17] මම අත්හරින්නෙමි.[18]
එවිට ගෘහයට සිදු වූ දේ නිසා වෙ-
නත් ජාතීන්ගේ නින්දා අපහාසවලට
ඊශ්‍රායෙල් සෙනඟ ලක් වනු ඇත.[19]
**21** මේ ගෘහය නටබුන් ගොඩක් වන්-
නේය.[20] එය පසු කර යන සියල්ලෝ
පුදුමයෙන් ඒ දෙස බලා,[21] 'මේ දේ-
ශයටත් මේ ගෘහයටත් යෙහෝවා
දෙවි මෙවැනි දෙයක් කළේ ඇයි'[22]
කියා විමසනු ඇත. **22** 'ඔවුන් තම
මුතුන්මිත්තන්ව ඊජිප්තු දේශයෙන්
පිටතට ගෙනා තම දෙවි[23] වන යෙ-
හෝවාව අත්හැර[24] වෙනත් දෙවිව-
රුන්[25] ඉදිරියේ වැඳ වැටී නමස්කාර
කළ නිසයි[26] දෙවි මේ සියලු විපත්ති
ඔවුන් පිට ගෙනැවිත් තිබෙන්නේ'[27]
කියා එවිට සෙනඟ පවසනු ඇත."

**7 පරි.**

**1** ගණන් 34:5
2රාජා 24:7
යෙසා 27:12
**2** 2ලේක 30:13
**3** ලෙවී 23:36
ද්වි 16:8
නෙහෙ 8:18
**4** 1රාජා 8:66
**5** 2ලේක 6:41
**6** ද්වි 12:7
ද්වි 16:15
නෙහෙ 8:10
**7** 1රාජා 9:1
**8** දේශ 2:4
**9** 1රාජා 9:2
2ලේක 1:7
**10** 2රාජා 20:5
ගීතා 66:19
ලූක් 1:13
ක්‍රියා 10:31
1පේතෘ 3:12
**11** ද්වි 12:6
2ලේක 2:6
**12** ද්වි 12:5
ගීතා 78:68
**13** 2ලේක 6:26
**14** ද්වි 28:38
**15** ලෙවී 26:16
ගණන් 16:46
එස 14:19
**16** ගණන් 6:27
යෙසා 43:10
යෙසා 63:19
**17** නික් 19:5
ද්වි 32:9
**18** ද්වි 30:2
හිතෝ 28:13
යෙසා 55:7
**19** ලෙවී 26:41
2ලේක 33:12
යාකො 4:10
**20** 2ලේක 6:37
**21** හොෂෙ 5:15
**22** 2ලේක 30:27
**23** 2ලේක 6:39
ගීතා 103:3
**24** ගීතා 60:2
**25** 2ලේක 16:9
**26** 2ලේක 6:40
**27** 1රාජා 9:3

**2 තීරුව**

**1** 1රාජා 8:16
**2** ද්වි 12:21
**3** 2ලේක 6:20
**4** 1රාජා 9:4
ගීතා 26:3
**5** ද්වි 4:40
**6** ද්වි 12:1
**7** ද්වි 4:5
**8** 2සාමු 7:13
**9** 1රාජා 9:5
**10** ගීතා 89:28
**11** ලෙවී 26:15
ගීතා 73:27
**12** ද්වි 28:15
**13** හෙබ්‍රෙ 10:38
**14** නික් 20:5
1රාජා 9:6
**15** යොෂු 23:16

---

**16** ද්වි 4:26; 2රාජා 17:20; **17** 1රාජා 9:7; **18** 2රාජා 25:9; **19** ද්වි 28:37; ගීතා 44:14; යෙරෙ 24:9; **20** 1රාජා 9:8; 2රාජා 25:9; යෙරෙ 7:4; **21** 2ලේක 29:8; යෙරෙ 19:8; දානි 9:12; **22** ද්වි 29:24; යෙරෙ 22:8; **23** නික් 12:51; ද්වි 29:25; **24** 2ලේක 15:2; ගීතා 73:27; **25** ගීතා 115:8; යෙසා 2:8; යෙරෙ 2:11; යෙරෙ 10:14; **26** 1රාජා 9:9; **27** ද්වි 4:26; 2ලේක 36:17; යෙරෙ 22:9.

**8** සලමොන් රජට යෙහෝවා දෙවි-
ගේ ගෘහය[1] හා තම රජමාලි-
ගාව[2] ගොඩනැඟීමට අවුරුදු විස්සක්
ගත විය.[3] ඉන්පසු ඔහු **2** හීරාම්
රජුගෙන්[4] තමාට ලැබුණු නුවරවල්
අලුතෙන් ගොඩනඟා එම නුවරවල
ඊශ්‍රායෙල්වරුන්ව පදිංචි කෙරෙව්වේය.
**3** සලමොන් රජ හමාත්-ෂෝබා යන
ස්ථානයට ගොස් එය යටත් කරගත්-
තේය. **4** ඉන්පසු ඔහු පාළුකරයේ
පිහිටි තද්මෝර් නම් නුවරද අලුතෙන්
ගොඩනැඟූ අතර හමාත් නම් ප්‍රදේශ-
යේ[5] ඔහු විසින් ඉදි කරන ලද ගබඩා[6]
නුවරවල්ද නැවත පිළිසකර කළේය.
**5** ඔහු ඉහළ බෙත්-හෝරොන්[7] සහ
පහළ බෙත්-හෝරොන්[8] යන නුවරවල
පවුරු ඉදි කර ඒවාට දොරවල් සහ
අගුල් දමා[9] ඒවා සුරක්ෂිත නුවරවල්
බවට පත් කළේය.[10] **6** ඔහු බාලාත්
නම් නුවරද[11] යටත් කරගත් සිය-
ලුම ගබඩා නුවරවල්ද අශ්ව රථ
නවතා තැබීමට නුවරවල්ද[12] අසරු-
වන්ට ජීවත් වීම සඳහා වූ නුවරවල්ද[13]
ගොඩනැඟුවේය. ඔහු යෙරුසලමෙහිත්
ලෙබනොන්හිත්[14] තමාගේ පාලනය
යටතේ තිබූ සියලු දේශවලත් තමන්
කැමති සියලු දේ[15] ගොඩනැඟුවේය.

**7** ඊශ්‍රායෙල් ජාතිකයන් නොවූ[16]
හිත්තීවරුන්,[17] අමෝරිවරුන්,[18] පෙ-
රිස්සිවරුන්,[19] හිවීයවරුන්[20] සහ යෙ-
බුසිවරුන්[21] යන ජාතිකයන්ගෙන්
ඉතුරු වූ අයව **8** එනම්, ඊශ්‍රායෙල්-
වරුන් දේශය අත් පත් කරගන්නා
විට නොමරා ඉතුරු කළ අය-
ගේ[22] පුත්‍රයන්ව සලමොන් රජ මෙ-
හෙකාරකමට ගත්තේය.[23] මේ වන
තෙක් ඔවුහු මෙහෙකාරකම් කරති.[24]
**9** නමුත් සලමොන් රජ ඊශ්‍රායෙල්ව-
රුන්ගෙන් කිසිවෙකුව මෙහෙකාර-
කමට නොගත්තේය.[25] ඔවුහු යුධ
භටයන් ලෙසද[26] අධිපතීන් ලෙසද
ඔහුගේ අශ්ව රථ පදවන්නන්ගේ[27]
හා අසරුවන්ගේ[28] ප්‍රධානීන් ලෙසද
සේවය කළෝය. **10** සලමොන් රජු
යටතේ සේවය කළ අයව අධීක්ෂණය
කිරීමට[1] ප්‍රධාන නිලධාරීහු[2] දෙසීය
පනස්දෙනෙක් සිටියෝය.

**11** ඒ වන විට පාරාවෝගේ දිය-
ණිය[3] පදිංචිව සිටියේ දාවිත්ගේ නුව-
රෙහිය.[4] එහෙයින් සලමොන් රජ
මෙසේ කීවේය. “යෙහෝවා දෙවිගේ
ගිවිසුම් පෙට්ටිය තබා තිබෙන ඕනෑම
තැනක් ශුද්ධයි.[5] ඒ නිසා ඇය මගේ
භාර්යාවක් වුණත් ඊශ්‍රායෙල්හි රජු
වූ දාවිත්ගේ මාලිගාවේ ඇය වාසය
නොකළ යුතුයි.” ඉන්පසු සලමොන්
රජ ඇය වෙනුවෙන් සෑදූ මාලිගාවට
ඇයව ගෙන ගියේය.[6]

**12** පසුව ශුද්ධස්ථානයට ඇතුල්
වන ශාලාව ඉදිරියේ[7] තමා විසින්
ඉදි කළ යෙහෝවා දෙවිගේ පූජාස-
නය මත[8] සලමොන් රජ යෙහෝවා
දෙවිට දවන පූජා ඔප්පු කළේය.[9]
**13** මෝසෙස් ආඥා කළ ආකාරයටම
ඔහු දිනපතාද[10] සබත් දිනවලද[11]
නව සඳ පායන දවස්වලද[12] වසරකට
තුන් වතාවක්[13] පවත්වන උත්සව
දවස්වලද[14] එනම්, මුහුන් නොදැමූ
රොටි උත්සවයේදීද[15] සති උත්සව-
යේදීද[16] පැල් උත්සවයේදීද[17] අත-
පසු නොකර පූජා ඔප්පු කළේය.
**14** එසේම ඔහු තම පියා වූ දාවිත් රජු
නියෝග කළ ආකාරයට[18] පූජක-
යන්ව කණ්ඩායම් වශයෙන් බෙදා[19]
සේවය සඳහා යෙදෙව්වේය. දෙවිට
දිනපතා[20] ප්‍රශංසා කිරීම සඳහාත්[21]
පූජකයන්ට උපකාර කිරීම සඳහාත්[22]
ඔහු ලෙවීවරුන්ව[23] යෙදෙව්වේය. දො-
රටු පාලකයන්වද කණ්ඩායම් වශ-
යෙන් බෙදා ඔවුන්ව සෑම දොරටුවකම
සේවය සඳහා යෙදෙව්වේය.[24] ඔහු මේ
සියල්ල කළේ සැබෑ දෙවිගේ විශ්වාස-
වන්ත සේවකයෙක් වූ දාවිත් අණ කළ
ලෙසය. **15** විවිධ කාරණා හැසිරවිය
යුතු ආකාරය ගැනත් ගබඩාව හා සම්-
බන්ධ කාරණා ගැනත් රජ පූජකයන්ට
සහ ලෙවීවරුන්ට උපදෙස් දුන්නේය.

**8 පරි.**
1 1රාජා 6:37
1රාජා 6:38
2 1රාජා 7:1
3 1රාජා 9:10
4 2සාමු 5:11
1රාජා 5:2
5 2සාමු 8:9
2රාජා 14:28
6 1රාජා 9:19
7 යොෂු 16:5
1ලේක 7:24
8 යොෂු 16:3
1රාජා 9:17
9 ද්වි 3:5
10 ගණන් 32:17
ද්වි 28:52
2රාජා 10:2
2ලේක 12:4
11 යොෂු 19:44
1රාජා 9:18
12 1රාජා 4:26
13 1රාජා 9:19
14 විනි 3:3
1රාජා 9:19
15 දේශ 2:10
16 1රාජා 9:20
17 උත් 15:20
ද්වි 7:1
1රාජා 11:1
2රාජා 7:6
18 උත් 15:21
19 නික් 34:11
20 නික් 23:23
21 ගණන් 13:29
22 යොෂු 15:63
යොෂු 17:12
ගීතා 106:34
23 1රාජා 9:21
24 යොෂු 16:10
2ලේක 2:17
25 නික් 19:6
ලෙවී 25:39
26 1සාමු 8:12
27 1සාමු 8:11
28 1රාජා 9:22

**2 තීරුව**
1 1රාජා 9:23
2 1රාජා 5:16
3 1රාජා 3:1
4 1රාජා 9:24
5 නික් 29:43
6 1රාජා 7:8
7 1රාජා 6:3
එස 8:16
8 2ලේක 4:1
9 ලෙවී 1:3
10 නික් 29:38
ගණන් 28:3
11 ගණන් 28:9
12 ගණන් 10:10
ගණන් 28:11
13 ද්වි 16:16
14 නික් 23:14
ලෙවී 23:4
15 ලෙවී 23:6
16 ලෙවී 23:16
ක්‍රියා 2:1
17 ලෙවී 23:34

**18** 1ලේක 23:3; **19** 1ලේක 24:1; 2ලේක 5:11; ලූක් 1:5; **20** 2ලේක 35:10; **21** 1ලේක 6:31; 1ලේක 16:42; **22** 1ලේක 16:4; 1ලේක 24:31; **23** 1ලේක 15:16; 1ලේක 25:1; **24** 1ලේක 9:17; 1ලේක 26:1.

ඔවුහු ඒ උපදෙස්වලට අනුව ක්‍රියා
කළෝය.[1] **16** සලමොන් රජ, යෙ-
හෝවා දෙවිගේ ගෘහයේ අත්තිවාරම
දැමීමේ කාර්යයේ සිට එහි නිමාව
දක්වා[2] සියලුම වැඩකටයුතු සාර්ථකව
ඉටු කළේය.[3] මෙසේ යෙහෝවා දෙවි-
ගේ ගෘහය සම්පූර්ණයෙන්ම සාදා නිම
කරනු ලැබීය.[4]

**17** ඉන්පසු සලමොන් රජ ඒදොම්
දේශයේ[5] පිහිටි එශියොන්-ගෙබෙර්[6]
සහ ඒලොත්[7] යන මුහුදුබඩ ස්ථානව-
ලට ගියේය. **18** හීරාම් රජ[8] සල-
මොන් රජු වෙතට නැව් හා මුහුද ගැන
මනා දැනුමක් ඇති නාවිකයන්ව
නිතරම එවීය.[9] ඔවුහු සලමොන්ගේ
සේවකයන් සමඟ එක්ව ඕෆීර් නම්
ස්ථානයට[10] ගොස් රන්[11] තලෙන්ත[12]
හාරසිය පනහක් ගත්තෝය. ඔවුහු
එය සලමොන් රජු වෙතට ගෙනා-
වෝය.[13]

**9** ෂෙබා දේශයේ රැජිනට[14] සල-
මොන් රජු ගැන ආරංචි විය.
එහෙයින් ඔහුගෙන් සංකීර්ණ ප්‍රශ්න
අසා ඔහුගේ දැනුම මැන බැලී-
මට ඇය යෙරුසලමට පැමිණියාය.[15]
ඇය ඔහුව හමු වීමට පැමිණියේ
බෝල්සම් තෙල්,[16] රත්තරන්[17] සහ
මැණික්[18] විශාල ප්‍රමාණයක් ඔටු-
වන් පිට පටවාගෙන විශාල පිරිව-
රක්ද සමඟය.[19] ඇය සලමොන් රජු
ඉදිරියට පැමිණ තමන් දැනගැනී-
මට ආශාවෙන් සිටි සියල්ල ඔහු-
ගෙන් ඇසුවාය.[20] **2** සලමොන් රජ
ඇය ඇසූ සෑම ප්‍රශ්නයකටම පිළි-
තුරු දුන්නේය.[21] ඔහුට පිළිතුරු දීමට
නොහැකි වූ එක ප්‍රශ්නයක්වත් නො-
තිබුණේය.[22]

**3** ෂෙබාහි රැජින, සලමොන් රජු-
ගේ ප්‍රඥාවත්[23] ඔහු ගොඩනැඟූ මාලි-
ගාවත්[24] **4** ඔහුගේ මේසයේ තිබූ
ආහාරත්[25] කෑමට ඉඳගෙන සිටි ඔහු-
ගේ සේවකයන්වත් මේසයට කෑම
ගෙනා වැඩකරුවන්වත් ඔවුන්ගේ
වස්ත්‍රත්[26] ඔහුගේ බීම වර්ගත්[27] ඔහු
යෙහෝවා දෙවිගේ ගෘහයේ නිතර
ඔප්පු කළ[28] දවන පූජාවනුත්[29] දුටු
විට ඇයට ඒ කිසිවක් අදහාගත නො-
හැකි විය. **5** එවිට ඇය රජුට මෙසේ
කීවාය. "ඔබ කළ දේවල් ගැනත්
ඔබේ ප්‍රඥාව ගැනත් මගේ රටේදී මට
ආරංචි වූ හැම දෙයක්ම ඇත්ත.[1]
**6** නමුත් ඔබව හමු වීමට ඇවිත් ඒ
දේවල් මගේම ඇස් දෙකෙන් දැක-
ගන්නා තුරු[2] මම ඒවා විශ්වාස කළේ
නැහැ.[3] ඔබේ ප්‍රඥාව මොන තරම්ද![4]
ඇත්තටම මට අසන්න ලැබුණේ
ඔබේ මහත් ප්‍රඥාවෙන් අල්පයක් විත-
රයි.[5] **7** ඔබේ සේවකයන්ටත් ඔබේ
සෙනඟටත් නිරතුරුවම ඔබ ඉදිරියේ
සිට[6] ඔබේ ප්‍රඥාවන්ත වදන් අසන්න
ලැබීම මොන තරම් ආශීර්වාදයක්ද![7]
**8** ඔබේ දෙවි වන යෙහෝවා[8] ඔබ
ගැන සතුටු වී[9] ඔහුගේ පාලනය
නියෝජනය කරන සිංහාසනයේ ඉඳ-
ගැනීමට ඔබව පත් කළා.[10] එසේ කළ
ඔබේ දෙවි වන යෙහෝවාට ප්‍රශංසා
වේවා![11] ඊශ්‍රායෙල් සෙනඟ සදහ-
ටම පවතිනවාට කැමති ඔබේ දෙවි
ඔවුන්ට ඇත්තටම ප්‍රේම කරනවා.[12]
ධර්මිෂ්ඨව[13] හා සාධාරණව ඔවුන්ව
විනිශ්චය කිරීමට[14] ඔහු ඔබව රජක-
මට පත් කළේ[15] ඒ නිසයි."

**9** ඉන්පසු ඇය රජුට රන්
තලෙන්ත එකසිය විස්සක්ද[16]
මැණික්ද[17] බෝල්සම් තෙල්[18] අතිවි-
ශාල ප්‍රමාණයක්ද දුන්නාය. එදින
ෂෙබාහි රැජින සලමොන් රජුට දුන්
බෝල්සම් තෙල් ප්‍රමාණයට සමාන
තෙල් ප්‍රමාණයක් කෙදිනකවත් ඔහුට
ලැබුණේ නැත.[19]

**10** ඕෆීර් දේශයේ සිට රන්[20] ගෙනා
හීරාම් රජුගේ සේවකයෝ[21] සහ සල-
මොන් රජුගේ සේවකයෝ හඳුන් ලී[22]
හා මැණික්ද[23] ගෙනාවෝය. **11** රජ
ඒ හඳුන් ලීවලින් යෙහෝවා දෙ-
විගේ ගෘහයේ සහ රජමාලිගාවේ[24]

**8 පරි.**

1 1ලේක 9:29; 1ලේක 26:20
2 1රාජා 6:1; 1රාජා 6:7
3 1රාජා 5:18
4 1රාජා 7:51
5 උත් 36:1; 1රාජා 9:26
6 ගණන් 33:35; 1රාජා 22:48; 2ලේක 20:36
7 ද්වි 2:8; 2රාජා 14:22; 2රාජා 16:6
8 2සාමු 5:11
9 1රාජා 9:27
10 1රාජා 22:48; ගීතා 45:9
11 1රාජා 10:22; 2ලේක 9:13
12 නික් 38:24
13 දේශ 2:8

**9 පරි.**

14 1රාජා 10:1; යෙසා 60:6; ලූක් 11:31
15 මතෙ 12:42; මතෙ 22:46
16 2රාජා 20:13
17 ගීතා 72:15
18 1රාජා 10:2; හිතෝ 17:8
19 උත් 24:10; යෙසා 60:6
20 මතෙ 12:34
21 1රාජා 10:3; හිතෝ 1:5
22 1රාජා 3:12
23 1රාජා 3:28; 1රාජා 10:4; දේශ 12:9
24 1රාජා 6:1; 2ලේක 3:1; 2ලේක 4:11
25 1රාජා 4:22
26 1රාජා 10:5
27 නෙහෙ 1:11
28 2ලේක 8:13
29 ලෙවී 1:3

**2 තීරුව**

1 1රාජා 10:6; මතෙ 11:19
2 1රාජා 10:7; යොහ 20:25
3 හිතෝ 14:15; ලූක් 11:31
4 1රාජා 4:31; 1රාජා 4:34; 2ලේක 1:12
5 දේශ 1:16
6 1රාජා 10:8
7 හිතෝ 3:13; හිතෝ 8:34
8 1රාජා 10:9
9 2සාමු 15:25; ගීතා 18:19

**10** 1ලේක 29:23; **11** 1රාජා 5:7; ගීතා 72:18; **12** ද්වි 7:8; 2ලේක 2:11; **13** 2සාමු 23:3; ගීතා 72:2; යෙසා 11:4; **14** 2සාමු 8:15; 1රාජා 3:9; යෙසා 9:7; **15** යොහ 1:49; **16** 1රාජා 9:14; ගීතා 72:10; **17** හිතෝ 20:15; **18** උත් 43:11; **19** 1රාජා 10:10; **20** 1රාජා 10:22; 2ලේක 8:18; ගීතා 72:10; **21** 1රාජා 9:27; **22** 1රාජා 10:11; **23** 2ලේක 3:6; **24** 1රාජා 7:1.

පඩි පෙළවල්ද[1] ගායකයන් සඳහා[2]
වීණාද[3] වෙනත් සංගීත භාණ්ඩද[4]
සැදෙව්වේය. මීට පෙර කිසිදාක යූදා
දේශයේ එතරම් අනර්ඝ ලී වර්ගයක්
දක්නට තිබුණේ නැත.

**12** සලමොන් රජ ෂෙබාහි රැජින
ආශා කළ සෑම දෙයක්ම ඇයට ලබා
දුන්නා[5] පමණක් නොව ඇය තමාට
දුන් තෑගිබෝග ප්‍රමාණය හා සමානව
ඇයටත් තෑගි ලබා දුන්නේය. ඉන්පසු
ඇය තම සේවකයන් සමඟ ආපසු සිය
රට බලා පිටත්ව ගියාය.[6]

**13** සලමොන් රජුට අවුරුද්දකට
ලැබුණු රත්තරන්වල බර තලෙන්ත
හයසිය හැටහයකි.[7] **14** සලමොන්
රජුට මෙය ලැබුණේ සංචාරක වෙ-
ළෙඳුන්ගෙන්, වෙළඳාම් කටයුතුවල
යෙදුණු වෙනත් අයගෙන්,[8] අරාබිව-
රුන්ගේ සියලු රජවරුන්ගෙන්[9] හා
දේශයේ ආණ්ඩුකාරයන්ගෙන් ඔහුට
ලැබුණු රන් හා රිදීවලට අමතරවය.
**15** සලමොන් රජ මිශ්‍ර කළ රනින්
විශාල පලිස් දෙසියයක් සැදෙව්-
වේය.[10] ඒ එක් පලිහක් සඳහා
ෂෙකෙල් හයසියයක රන් භාවිත කෙ-
රිණ.[11] **16** ඔහු කුඩා පලිස් තුන්සි-
යයක්ද සැදෙව්වේය. මිශ්‍ර කළ රනින්
සෑදූ ඒ එක් පලිහක් සෑදීමට මීනා*
තුනක රන් භාවිත කෙරිණ.[12] පසුව
ඔහු ඒ පලිස් ලෙබනොන් වනය ලෙස
හැඳින්වූ ගෘහයේ තැබුවේය.[13]

**17** ඔහු ඇත්දළවලින් විශාල
සිංහාසනයක් සාදා එය පවිත්‍ර රනින්
ආවරණය කළේය.[14] **18** සිංහාස-
නය වෙත යෑමට පඩි හයක් තිබිණ.
රනින් සෑදූ පා පුටුවක් සිංහාසන-
යට සම්බන්ධ කර තිබුණු අතර
සිංහාසනය දෙපැත්තේම අත්ඇඳි සවි
කර තිබිණ. ඒ අත්ඇඳි අසලම[15]
සිංහ රූප දෙකක් තිබිණ.[16] **19** පඩි
හය දෙපැත්තේම එක් පැත්තකට
හය බැගින් සිංහ රූප දොළොසක්
තිබිණ.[17] වෙන කිසිම රාජ්‍යයක ඒ
හා සමාන දෙයක් දක්නට නො-
ලැබුණේය.[1] **20** සලමොන් රජුගේ
කුසලාන සියල්ලම[2] රනින් සාදා තිබු-
ණේය.[3] ලෙබනොන් වනය ලෙස
හැඳින්වූ ගෘහයේ තිබූ සියලු භාජනද[4]
පිරිසිදු රනින් සාදා තිබිණ. රිදීවලින්
නිම කළ කිසිවක් එහි නොතිබුණේය.
මන්ද සලමොන් රජුගේ කාලයේදී රිදී
එතරම් වටිනා දෙයක් ලෙස සැල-
කුවේ නැත.[5] **21** සලමොන් රජුට
අයත් නැව් හීරාම් රජුගේ සේවකයන්
සමඟ[6] නිතර නිතර තර්ෂිෂ් බලා
යාත්‍රා කරනු ලැබීය.[7] අවුරුදු තුනකට
වරක් "තර්ෂිෂ්"* නැව්වලින් රන්ද
රිදීද[8] ඇත්දළද[9] වඳුරන්ද මොන-
රුන්ද[10] ගෙන්වන ලදි.

**22** සලමොන් රජ ධනයෙන්ද[11]
ප්‍රඥාවෙන්ද[12] පොළොවේ සිටි අන්
සියලු රජවරුන්ට වඩා ශ්‍රේෂ්ඨ විය.
**23** ඔහුට සැබෑ දෙවි ප්‍රඥාව ලබා දුන්
නිසා[13] ඔහුගේ වදන්වලට ඇහුම්කන්
දීමට[14] පොළොවේ සතර දිගින් රජ-
වරු පැමිණියෝය.[15] **24** ඔවුහු අවු-
රුද්දකට වරක් රන් හා රිදී භාණ්ඩද[16]
වස්ත්‍රද[17] යුධායුධද බෝල්සම් තෙල්ද
අශ්වයන්ද කොටළුවන්ද[18] රජුට තෑගි
ලෙස ගෙනාවෝය.[19] **25** සලමොන්
රජු සතුව අශ්ව ගාල්[20] හාරදහසක්ද
අශ්ව රථද[21] තිබූ අතර අශ්වයෝ දො-
ළොස්දහසක්ද සිටියෝය. ඔහු ඒ
රථ හා අශ්වයන් තැබුවේ ඒ සඳහා
වෙන් කළ නුවරවලය.[22] එම නුවර-
වල් පිහිටා තිබුණේ රජු වාසය කළ
යෙරුසලම අසලය. **26** මහ ගංගා-
වේ* සිට පිලිස්තිවරුන්ගේ දේශය
දක්වාද ඊජිප්තු දේශ සීමාව දක්වාද
සිටි සියලුම රජවරු ඔහු යටතේ සේ-
වය කළෝය.[23] **27** සලමොන් රජ
විශාල රිදී ප්‍රමාණයක් යෙරුසලමෙහි
එක් රැස් කළ නිසා එය ගල් මෙන්
සුලබ විය. ඔහු විශාල දේවදාර ලී
ප්‍රමාණයක්ද එක් රැස් කළේය. එය

---

**2ලේක 9:16*** මීනා එකක බර ග්‍රෑම් 570ක් විය.

**19** 2ලේක 26:8; යෝබ් 42:11; **20** ද්වි 17:16; **21** 1රාජා 4:26; **22** 1රාජා 10:26; **23** 1රාජා 4:21.

**2ලේක 9:21*** 1රාජ 10:22හි පාදසටහන බලන්න.
**26*** එනම්, යුප්‍රටීස් ගංගාවේ.

---

**9 පරි.**

**1** 1රාජා 6:8
**2** 1ලේක 9:33 2ලේක 5:12
**3** 1රාජා 10:12 1ලේක 25:1 ගීතා 92:3 ගීතා 150:3
**4** 2සාමු 6:5 1ලේක 23:5
**5** 1රාජා 10:1 හිතෝ 11:25 මතෙ 12:42 ලූක් 6:38 ලූක් 11:31
**6** 1රාජා 10:13
**7** 1රාජා 10:14 2ලේක 1:15 ගීතා 68:29 ගීතා 72:15
**8** උත් 37:28 1රාජා 10:15 යෙසා 23:2 යෙසා 45:14
**9** ගීතා 72:10 යෙරෙ 25:24
**10** 2ලේක 12:9
**11** 1රාජා 10:16
**12** 1රාජා 10:17
**13** 1රාජා 7:2
**14** 1රාජා 10:18
**15** 1රාජා 10:19
**16** උත් 49:9 හිතෝ 28:1 එළි 5:5
**17** ගණන් 23:24

**2 තීරුව**

**1** 1රාජා 10:20
**2** එස්ත 1:7
**3** 1රාජා 10:21
**4** 1රාජා 7:2
**5** 1රාජා 10:27
**6** 1රාජා 9:27
**7** 2ලේක 20:36 ගීතා 72:10 යෙසා 23:1 යෝනා 1:3
**8** 1රාජා 7:51
**9** 1රාජා 10:18 ආමො 3:15
**10** 1රාජා 10:22
**11** 1රාජා 3:13 1රාජා 10:23 ගීතා 89:27 එෆී 3:8
**12** 1රාජා 3:12 1රාජා 4:29 කොලො 2:3
**13** 1රාජා 3:28 2ලේක 1:12 හිතෝ 2:6 දානි 1:17
**14** 1රාජා 10:24 යෙසා 11:10 ලූක් 21:15
**15** 1රාජා 4:34
**16** 2සාමු 8:10
**17** මතෙ 6:29
**18** 1රාජා 10:25

ෂෙපේලා ප්‍රදේශයේ[1] ඇති සිකමෝර්
ගස්[2] තරම් අධික ප්‍රමාණයක් විය.[3]
**28** සලමොන් රජුට ඊජිප්තුවෙන්[4] හා
වෙනත් දේශවලින් අශ්වයන්[5] ගෙ-
නෙන පිරිසක්ද සිටියෝය.
**29** සලමොන් රජුගේ ජීවිතයේ
සියලුම විස්තර[6] අනාගතවක්තෘ
නාතන්ගේ වාර්තාවේද[7] ෂීලෝහි
වැසියෙකු වූ[8] අහියාගේ අනාගත-
වාක්‍යයේද[9] නෙබාත්ගේ පුත්[10] යෙ-
රොබොවම්[11] ගැන අනාගතවක්තෘ
ඉද්දෝ දුටු දර්ශන ඇතුළත් වාර්තා-
වේද[12] ලියා තිබේ. **30** සලමොන්
රජ යෙරුසලමෙහි සිට අවුරුදු හතළි-
හක් පුරා මුළු ඊශ්‍රායෙල් සෙනඟ පාල-
නය කළේය. **31** පසුව ඔහු මිය
ගියේය. ඔහුගේ මුතුන්මිත්තන් මෙන්
ඔහුවද තැන්පත් කරනු ලැබීය. ඔහුව
තැන්පත් කරන ලද්දේ ඔහුගේ පියා වූ
දාවිත්ගේ නුවරෙහිය.[13] ඔහු වෙනුවට
ඔහුගේ පුත් රෙහබෝවම්[14] රජකම්
කිරීමට පටන්ගත්තේය.[15]

**10** රෙහබෝවම්ව[16] රජකමට
පත් කිරීම සඳහා සියලු ඊශ්‍රා-
යෙල්වරු ෂීකෙම් නුවරෙහි[17] රැස්
වූහ. එහෙයින් රෙහබෝවම්ද එතැ-
නට ගියේය. **2** ඒ කාලය වන විට
සලමොන් රජු වෙතින් පලා ගිය නෙ-
බාත්ගේ පුත් යෙරොබොවම්[18] පදිංචිව
සිටියේ ඊජිප්තුවේය.[19] රෙහබෝවම්
රජකමට පත් වූ බව යෙරොබො-
වම්ට ආරංචි වූ විට ඔහු ඊජිප්තුවේ
සිට ආපසු පැමිණියේය.[20] **3** එවිට
ඊශ්‍රායෙල්වරු යෙරොබොවම්වද කැඳ-
වාගෙන ගොස් රෙහබෝවම් රජුව
හමු වී ඔහුට මෙසේ පැවසුවෝය.[21]
**4** "ඔබේ පියා අප පිට දරාගන්න
බැරි බරක් පැටෙව්වා.[22] දැන් ඔබ
අපිට කරුණාවන්තව සලකමින් අපේ
බර[23] සැහැල්ලු කරන්න. අපට පවරා
තිබෙන වැඩ කොටස අඩු කරන්න
කියා අපි ඔබෙන් ඉල්ලනවා. ඔබ
එසේ කළොත් අපි ඔබට සැමදා සේ-
වය කරන්න පොරොන්දු වෙනවා."[24]
**5** ඔහු ඊට මෙසේ පිළිතුරු දුන්-
නේය. "මට දවස් තුනක් කල්
දෙන්න. ඉන්පසු ඇවිත් මාව හමු
වෙන්න." එහෙයින් සෙනඟ එතැ-
නින් පිටත්ව ගියෝය. **6** රෙහබෝ-
වම් රජ තම පියා වූ සලමොන්ට
උපදෙස් දුන් වැඩිමහල්ලන් ළඟට
ගොස්, "ඔබ හිතන හැටියට මම මේ
අයට මොන වගේ පිළිතුරක් දිය
යුතුද"[1] කියා ඇසුවේය.[2] **7** ඔවුහු
රජුට මෙසේ උපදෙස් දුන්නෝය.
"ඔබ මේ සෙනඟගේ ඉල්ලීම ඉටු කර
ඔවුන්ව සතුටු කරනවා නම් එයින්
යහපතක් සිදු වෙයි.[3] ඔවුන් ඔබට
සැමදා සේවය කරයි."[4]
**8** නමුත් ඒ වැඩිමහල්ලන් දුන්
උපදෙස් ගැන ඔහු එතරම් තැකීමක්
නොකළේය.[5] ඒ වෙනුවට ඔහු කුඩා
කාලයේ සිටම තමන් සමඟ එකට
හැදී වැඩුණු එවකට ඔහුගේ උපදේශ-
කයන්ව සිටි[6] තරුණයන්ගෙන් අද-
හස් විමසුවේය.[7] **9** "'ඔබේ පියා අප
පිට පැටවූ බර සැහැල්ලු කරන්න'[8]
කියා මගෙන් ඉල්ලා සිටින මේ සෙ-
නඟට මම මොන වගේ පිළිතුරක් දිය
යුතුද"[9] කියා ඔහු ඔවුන්ගෙන් ඇසු-
වේය. **10** ඔහු සමඟ එකට හැදී
වැඩුණු ඒ තරුණයෝ ඔහුට මෙසේ
පිළිතුරු දුන්නෝය. "'ඔබේ පියා
අපිට දරාගන්න බැරි බරක් අප
පිට පැටෙව්වා. දැන් ඔබ අපට
කරුණාවන්තව සලකමින් ඒ බර
සැහැල්ලු කරන්න' කියා ඔබට පැවසූ
ඒ අයට මෙහෙම කියන්න.[10] 'මම
මගේ පියාට වඩා තදින් ක්‍රියා කර-
නවා.*[11] **11** මගේ පියා දරාගන්න
බැරි බරක් ඔබ පිට පටවන්න ඇති.
නමුත් මම ඊටත් වඩා ලොකු බරක්
ඔබ පිට පටවනවා.[12] මගේ පියා ඔබට
පහර දුන්නේ කසයෙන්. නමුත් මම
ඔබට පහර දෙන්නේ දරුණු කටු
ඇමුණූ කසවලිනුයි.'"[13]

**9 පරි.**
**1** 1ලේක 27:28
**2** 2ලේක 1:15
**3** 1රාජා 10:27
**4** 1රාජා 10:28 යෙසා 31:1
**5** ද්වි 17:16 2ලේක 1:16
**6** 1රාජා 11:41
**7** 2සාමු 7:2 2සාමු 12:1 1රාජා 1:8 1රාජා 1:11 1රාජා 1:32 1ලේක 29:29
**8** 1රාජා 11:29
**9** 1රාජා 11:36 1රාජා 14:2 1රාජා 14:10
**10** 1රාජා 11:26
**11** 2ලේක 13:20
**12** 2ලේක 12:15 2ලේක 13:22
**13** 2සාමු 5:9 1රාජා 2:10 2ලේක 21:20
**14** 1ලේක 3:10 2ලේක 13:7 දේශ 2:19 මතෙ 1:7
**15** 1රාජා 14:21

**10 පරි.**
**16** 1රාජා 12:1
**17** උත් 12:6 යොෂු 20:7 යොෂු 24:1 විනි 9:1
**18** 1රාජා 11:28
**19** 1රාජා 11:40
**20** 1රාජා 12:2
**21** 1රාජා 12:3
**22** හිතෝ 29:2 දේශ 4:1
**23** දේශ 5:8
**24** 1රාජා 12:4

**2 තීරුව**
**1** 1රාජා 12:6
**2** 2සාමු 16:20 යෝබ් 12:12
**3** හිතෝ 12:8 හිතෝ 15:1 දේශ 10:4 සෙක 1:13
**4** 1රාජා 12:7
**5** හිතෝ 1:25 හිතෝ 19:20 දේශ 10:3 යෙසා 30:1
**6** 1රාජා 12:8
**7** හිතෝ 13:20 යෙසා 3:4 2තිමෝ 4:3
**8** 1රාජා 12:9
**9** 1රාජා 22:6 හිතෝ 21:30
**10** 1රාජා 12:10

**11** යෝබ් 31:13; ගීතා 140:11; හිතෝ 10:14; හිතෝ 18:6; හිතෝ 28:25; හිතෝ 29:23; මතෙ 23:4; **12** 1සාමු 8:18; යෙසා 58:6; **13** 1රාජා 12:11.

**2ලේක 10:10*** 1රාජා 12:10හි පාදසටහන බලන්න.

**12** "දවස් තුනකින් ඇවිත් මාව
හමු වෙන්න" කියා රජු පැවසූ නිසා
යෙරොබොවම් සෙනඟ සමඟ තුන්-
වන දින රෙහබෝවම් රජුව හමු
වීමට පැමිණියේය.[1] **13** රෙහබෝ-
වම් රජ වැඩිමහල්ලන් දුන්[2] උපදෙස්
පිළි නොගෙන[3] සෙනඟට සැරප-
රුෂ ලෙස කතා කළේය.[4] **14** ඔහු
තමා සමඟ හැදී වැඩුණු තරුණයන්-
ගේ උපදෙස්වලට අනුව[5] සෙනඟට
මෙසේ කීවේය. "ඔබ පිට තිබෙන
දරාගන්න බැරි බරට මම තවත්
ලොකු බරක් එකතු කරනවා. මගේ
පියා ඔබට පහර දුන්නේ කසවලින්.
නමුත් මම ඔබට පහර දෙන්නේ
දරුණු කටු ඇමුණූ කසවලිනුයි."[6]
**15** මෙසේ පවසමින් රජ සෙනඟගේ
ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය. සැබෑ
දෙවි වන යෙහෝවා එවැනි දෙ-
යක් සිදු වීමට ඉඩහැරියේ[7] ෂීලෝහි
වැසියෙකු වූ[8] අහියා මාර්ගයෙන්[9]
නෙබාත්ගේ පුත් යෙරොබොවම්ට[10]
තමන් කී දේ ඉටු වන පිණිසය.[11]

**16** රජු තම ඉල්ලීම ඉටු නො-
කරන බව තේරුම්ගත් ඊශ්‍රායෙල්-
වරු රජුට මෙසේ කීවෝය. "අපිට
දාවිත්ගේ පෙළපතින් කිසිම ප්‍රයෝජ-
නයක් නැහැ.[12] යෙස්සේගේ පුත්‍ර-
යාගෙන් කිසි උරුමයක් ලැබෙයි
කියා අපට බලාපොරොත්තු වෙන්-
නත් බැහැ.[13] ඊශ්‍රායෙල් සෙනඟෙනි,
ඔබ එක් එක් කෙනා ඔබේ දෙවිව-
රුන් වෙතට ගොස් ඔවුන්ට නමස්-
කාර කරන්න.[14] දාවිත්ගේ පෙළපත
දාවිත්ම බලාගත්තාවේ."[15] එසේ පව-
සමින් සෙනඟ ඔවුන්ගේ නිවෙස් බලා
ගියෝය.

**17** එහෙත් රෙහබෝවම් රජ යූදා
දේශයට අයත් නුවරවල විසූ
ඊශ්‍රායෙල්වරුන්ව දිගටම පාලනය
කළේය.[16]

**18** සේවයට බඳවාගත් කම්ක-
රුවන්ගේ වැඩකටයුතු අධීක්ෂණය
කිරීම සඳහා පත් කර තිබූ හදො-
රාම්ව,[17] රෙහබෝවම් රජ වැඩ බැලී-
මට යැවීය. එවිට ඊශ්‍රායෙල්වරු ඔහුට
ගල් ගසා ඔහුව මරා දැමුවෝය.[1] ඊට
භය වූ රෙහබෝවම් රජ අශ්ව රථයක
නැඟී යෙරුසලමට පලා ගොස් තම
දිවි ගලවාගත්තේය.[2] **19** අද දක්-
වාම ඊශ්‍රායෙල්වරු දාවිත්ගේ පෙළප-
තට විරුද්ධව ක්‍රියා කරති.[3]

**11** රෙහබෝවම් රජ යෙරුසල-
මට පැමිණි වහාම[4] ඊශ්‍රා-
යෙල් රාජ්‍යයට විරුද්ධව සටන් කර
මුළු රාජ්‍යයම නැවත තමන් යට-
තට ගැනීම සඳහා සැලසුම් යෙ-
දුවේය. ඒ සඳහා ඔහු යූදා සහ
බෙන්ජමින්[5] යන ගෝත්‍ර දෙකෙන්
යුද්ධයට දක්ෂ එක්ලක්ෂ අසූදහස්දෙ-
නෙකුව තෝරාගත්තේය.[6] **2** එවිට
සැබෑ දෙවිගේ සේවකයෙකු වූ ෂෙමා-
යාට[7] යෙහෝවා දෙවි මෙසේ පැවසීය.
**3** "යූදාහි රජු වන සලමොන්ගේ පුත්
රෙහබෝවම්ටත්[8] යූදා හා බෙන්ජමින්
ගෝත්‍රවලට අයත් සියලුදෙනාටත්
**4** යෙහෝවා දෙවි වන මම පවසන
මේ දේ කියන්න. 'මේ සියල්ල සිදු
වුණේ මගේ අවසරය ඇතුවයි.[9] ඒ
නිසා ඔබේ සහෝදරයන්ට විරුද්-
ධව සටන් නොකර[10] ආපසු ඔබේ
නිවෙස්වලට යන්න.'" ඔවුහු යෙ-
හෝවා දෙවිගේ වචනයට කීකරු වී
යෙරොබොවම්ට විරුද්ධව යුද්ධයට
නොගොස්[11] ආපසු තම නිවෙස්වලට
ගියෝය.

**5** යෙරුසලමෙහි දිගටම වාසය
කළ රෙහබෝවම් රජ යූදා දේශයෙහි
පවුරුවලින් වට වූ සුරක්ෂිත නුවර-
වල් ඉදි කළේය. **6** ඔහු එලෙස ඉදි
කළ නුවරවල් නම් බෙත්ලෙහෙම,[12]
ඒටාම්,[13] තෙකෝවා,[14] **7** බෙත්-
ෂූර්,[15] සෝකෝ,[16] අදුල්ලාම්,[17]
**8** ගාත්,[18] මරේෂාහ්,[19] ෂිප්,[20]
**9** අදොරයිම්, ලාකිෂ්,[21] අෂේකා,[22]
**10** ෂොරා,[23] ආයාලොන්[24] සහ හෙ-
බ්‍රොන්ය.[25] යූදා සහ බෙන්ජමින් යන
ගෝත්‍රවලට අයිති ප්‍රදේශවල තිබූ එම

**10 පරි.**

**1** 1රාජා 12:12
**2** 1රාජා 12:13; යෝබ් 12:12
**3** හිතෝ 19:27
**4** 1සාමු 20:10; හිතෝ 10:11; හිතෝ 12:13; හිතෝ 14:16; හිතෝ 15:1; එෆී 4:31; එෆී 6:9
**5** 2ලේක 22:4; හිතෝ 12:5
**6** හිතෝ 11:17; දේශ 7:7
**7** ද්වි 2:30; ගීතා 5:10; හිතෝ 21:1; ආමො 3:6
**8** 1රාජා 11:29
**9** 1රාජා 11:30
**10** 1රාජා 12:15
**11** 1සාමු 15:29; 2සාමු 17:14; 2රාජා 10:10; යෙසා 55:11
**12** 1රාජා 11:13
**13** 2සාමු 20:1
**14** නික් 20:3; ද්වි 13:5; 1රාජා 12:16; හිතෝ 11:9
**15** 1රාජා 11:32
**16** 1රාජා 11:36; 2ලේක 11:1
**17** 2සාමු 20:24; 1රාජා 4:6; 1රාජා 12:18

**2 තීරුව**

**1** ගණන් 14:10; 2ලේක 24:21
**2** 1රාජා 12:18
**3** 1සාමු 10:19; 2රාජා 17:21

**11 පරි.**

**4** 1රාජා 12:21
**5** උත් 49:27; විනි 20:14; 2ලේක 14:8
**6** ගීතා 33:16
**7** 2ලේක 12:15
**8** 1රාජා 12:23
**9** 1රාජා 11:31; 2ලේක 10:15
**10** 2සාමු 2:26; ක්‍රියා 7:26
**11** 1රාජා 12:24
**12** උත් 35:19; මතෙ 2:1
**13** 1ලේක 4:3
**14** 2සාමු 14:2; ආමො 1:1
**15** යොෂු 15:58
**16** 2ලේක 28:18
**17** යොෂු 12:15; 1සාමු 22:1
**18** 1ලේක 18:1
**19** යොෂු 15:44; **20** 1සාමු 23:14; **21** යොෂු 10:5; 2ලේක 32:9; **22** යොෂු 10:10; නෙහෙ 11:30; යෙරෙ 34:7; **23** යොෂු 15:33; **24** යොෂු 19:42; **25** උත් 23:2; යොෂු 14:15; 2සාමු 2:1.

නුවරවල් සියල්ල ඔහු විසින් සුරක්-
ෂිත නුවරවල් බවට පත් කරන ලදි.
**11** ඔහු එම නුවරවල ආරක්ෂාව තර
කළ අතර[1] එම නුවරවල් අධීක්ෂණය
කිරීමට ප්‍රධානීන්ව පත් කළේය.[2] පවු-
රුවලින් වට වූ එම නුවරවල ඔහු
ආහාර, තෙල් සහ වයින්ද ගබඩා
කළේය. **12** ඔහු පලිස්ද[3] හෙල්ලද[4]
එම නුවරවල තැබුවේය. ඒ නුවර-
වල ආරක්ෂාව ඉතා ඉහළ මට්ටමක
තිබිණ. මෙසේ යූදා සහ බෙන්ජමින්
ගෝත්‍රවලට අයත් ප්‍රදේශ ඔහු යටතේ
දිගටම තිබිණ.

**13** ඊශ්‍රායෙල් දේශය පුරා විසිරී සිටි
පූජකයෝ සහ ලෙවීවරු රෙහබෝවම්
රජු වෙතට පැමිණියෝය. **14** ලෙවී
ගෝත්‍රයට අයත් සියලුදෙනා තමන්ට
උරුමව තිබූ ඉඩම්[5] හා තණබිම්[6] අත්-
හැර යූදා ගෝත්‍රයට අයත් ප්‍රදේශ-
යට හා යෙරුසලමට පැමිණියෝය.[7]
ඔවුන් එසේ කළේ යෙරොබොවම්
රජු[8] සහ ඔහුගේ පුත්‍රයන් යෙහෝවා
දෙවි ඉදිරියේ පූජකයන් ලෙස සේවය
කළ අයව සේවයෙන් ඉවත් කළ
නිසාය.[9] **15** එමෙන්ම යෙරොබො-
වම් රජ එළුවන්ගේ හැඩයට සමාන
දෙවිවරුන්ගේ[10] සහ වසු පැටවුන්ගේ
රූප සාදා[11] ඒවා තැබීමට පූජනීය
ස්ථාන ඉදි කර එහි සේවය කිරීම
සඳහා වෙනත් පූජක පන්තියක්ද පත්
කළේය.[12] **16** ඊශ්‍රායෙල්හි අනිකුත්
ගෝත්‍රවලට අයත් පිරිසක්ද ලෙවීව-
රුන් සමඟ යෙරුසලමට පැමිණි-
යෝය.[13] මුළු හදවතින්ම යෙහෝවා
දෙවිට ළං වී ඔහුගේ මඟ පෙන්වීම්
පැතීමට අදිටන් කරගත් ඔවුහු යෙ-
රුසලමට පැමිණ තම මුතුන්මිත්-
තන්ගේ දෙවි වන යෙහෝවාට පූජා
ඔප්පු කළෝය.[14] **17** ඔවුහු සල-
මොන් රජුගේ පුත් රෙහබෝවම්ගේ
පාලනයට වසර තුනක් පුරා සහයෝ-
ගය දැක්වූහ. මෙසේ ඔවුන් දැක්වූ
සහයෝගය නිසා යූදා රාජ්‍යයේ බලය
තවත් තහවුරු විය.[15] ඒ කාලය පුරාම
ඔවුහු දාවිත්ව සහ සලමොන්ව ආදර්-
ශයට ගෙන ජීවත් වූහ.[16]

**18** රෙහබෝවම් රජු මහලත් නම්
තැනැත්තිය සමඟ විවාහ විය. ඇගේ
පියා දාවිත් රජුගේ පුත්‍රයෙකු වූ
යෙරිමොත්ය. ඇගේ මව යෙස්සේ-
ගේ පුත් එලියාබ්ගේ[1] දියණිය
වූ අබිහයිල්ය. **19** කල් යත්ම මහ-
ලත්ට යෙවුෂ්, ෂෙමරියා සහ සාහම්
යන පුත්‍රයෝ උපන්නෝය. **20** රෙ-
හබෝවම් රජු අබ්සලොම්ගේ[2] මිනිපි-
රිය වූ මයකා සමඟද විවාහ විය.[3]
ඇයට අබියා,[4] අත්තයි, සීසා සහ
ෂෙලොමිත් උපන්නෝය. **21** රෙහ-
බෝවම් රජුට භාර්යාවෝ දහඅටදෙ-
නෙක්ද උපභාර්යාවෝ හැටදෙනෙක්ද
සිටි අතර ඔහුට දාව පුත්‍රයෝ විසි-
අටදෙනෙක්ද දූවරු හැටදෙනෙක්ද
උපන්නෝය. නමුත් තමාගේ සියලුම
භාර්යාවන්[5] හා උපභාර්යාවන් අත-
රින් ඔහු වැඩියෙන්ම ආදරේ කළේ
අබ්සලොම්ගේ මිනිපිරිය වූ මයකා-
ටය. **22** එමනිසා රෙහබෝවම් රජ
මයකාගේ පුත් අබියාව රජකමට පත්
කිරීමේ අරමුණින් ඔහුගේ සහෝදර-
යන් අතරින් ඔහුව ප්‍රධානියා ලෙස
පත් කළේය. **23** ඔහු බුද්ධිමත්ව
කල්පනා කර[6] ඔහුගේ පුත්‍රයන්ගෙන්
සමහරදෙනෙකුව යූදා හා බෙන්ජමින්
ගෝත්‍රවලට අයත් ප්‍රදේශවල[7] තිබූ
පවුරුවලින් වට වූ සුරක්ෂිත නුවරවෙ-
ලට[8] යැවීය. ඔහු ඔවුන්ට ආහාර
විශාල ප්‍රමාණයක් සපයා දුන් අතර[9]
බොහෝ භාර්යාවන්ද සොයා දුන්-
නේය.[10]

**12** රෙහබෝවම්ගේ රජකම තහ-
වුරු වී[11] ඔහු බලවත් වූ විට
ඔහුද මුළු ඊශ්‍රායෙල් සෙනඟද[12] යෙ-
හෝවා දෙවි දුන් නීතියට තවදුර-
ටත් කීකරු නොවූහ.[13] **2** මෙසේ
ඔවුන් යෙහෝවා දෙවිට ද්‍රෝහි වූ
නිසා[14] රෙහබෝවම් රජුගේ පස්-
වන අවුරුද්දේදී[15] ඊජිප්තුවේ රජු
වූ ශීෂක්[16] යෙරුසලමට විරුද්ධව
යුද්ධ කිරීමට පැමිණියේය. **3** ඔහු-
ගේ යුධ සේනාව යුධ රථ එක්දහස්
දෙසියයකින්ද[17] අසරුවන් හැටදහස-
කින්ද ඊජිප්තුවෙන් පැමිණි අතිවිශාල

**11 පරි.**
1 යෙසා 22:10
2 2ලේක 17:19
3 2ලේක 32:5
4 2ලේක 26:14
5 ගණන් 35:2
6 ගණන් 35:3; යොෂු 21:21
7 නික් 32:26; ද්වි 33:8
8 1රාජා 12:31
9 ද්වි 12:19
10 ලෙවී 17:7; යෙසා 13:21
11 1රාජා 12:28
12 1රාජා 13:33
13 2ලේක 15:9; 2ලේක 30:11
14 ද්වි 12:11; 1ලේක 22:1
15 2ලේක 12:1
16 2ලේක 1:1; 2ලේක 7:17; 2ලේක 8:13; හොෂෙ 6:4

**2 නිරුව**
1 1සාමු 16:6; 1සාමු 17:13
2 2සාමු 13:1; 2සාමු 18:33
3 1රාජා 15:2; 2ලේක 11:21
4 1රාජා 15:1; 2ලේක 12:16; මතෙ 1:7
5 ද්වි 17:17; විනි 8:30; 1රාජා 11:3
6 හිතෝ 16:20
7 යොෂු 18:11
8 2ලේක 11:11
9 2ලේක 21:3
10 ද්වි 17:17

**12 පරි.**
11 2ලේක 11:17
12 දේශ 9:18; මීකා 6:16
13 ද්වි 8:14; ද්වි 32:15; 2ලේක 26:16; හිතෝ 30:9
14 විනි 2:14; 2ලේක 7:19
15 1රාජා 14:21
16 1රාජා 11:40; 1රාජා 14:25
17 නික් 14:9; 1රාජා 10:29

සේනාවකින්ද[1] සමන්විත විය. එම
සේනාවට ලිබියන්වරුද[2] සුක්කිවරුද
ඉතියෝපීය ජාතිකයෝද[3] ඇතුළත්
වූහ. **4** ෂීෂක් රජ යූදා ගෝත්‍රයට
අයත් ප්‍රදේශයේ තිබූ පවුරුවලින් වට
වූ සුරක්ෂිත නුවරවල් යටත් කර-
ගෙන[4] යෙරුසලම දක්වා පැමිණි-
යේය.[5]

**5** ෂීෂක් රජුගෙන් එල්ල වූ තර්ජන
එන්න එන්නම වැඩි වූ නිසා රෙහ-
බෝවම් රජ සහ යූදාහි අධිපතීහු
යෙරුසලමෙහි රැස් වූහ. එවිට අනාග-
තවක්තෘ ෂෙමායා[6] පැමිණ ඔවුන්ට
මෙසේ පැවසීය. "යෙහෝවා දෙවි
මෙසේ පවසනවා. 'ඔබ මාව අත්හැරි-
යහුය.[7] ඒ නිසා මම ඔබවද අත්හරින්-
නෙමි.[8] ඔබ ෂීෂක් රජුගේ අතට
හසු වන බව ස්ථිරයි.'" **6** එය ඇසූ
රජද ඊශ්‍රායෙල්හි අධිපතීහුද පසුතැ-
විලි වී,[9] "යෙහෝවා දෙවි ධර්මිෂ්-
ඨයි"[10] කියා පවසමින් තමන්ට දයාව
පෙන්වන ලෙස දෙවිට කන්නලව්
කළෝය. **7** එසේ ඔවුන් පසුතැවිලි
වූ නිසා යෙහෝවා දෙවි ෂෙමායා[11]
මාර්ගයෙන් ඔවුන්ට මෙසේ පැව-
සීය.[12] "ෂීෂක්ව යොදාගෙන මාගේ
උදහස යෙරුසලමට විරුද්ධව ප්‍රකාශ
කරන්න මම තීරණය කර තිබුණත්[13]
ඔබ පසුතැවිලි වී මට කන්නලව්
කළ නිසා[14] මම ඔබව විනාශ නො-
කරන්නෙමි. වැඩි කල් නොගොස්
යෙහෝවා දෙවි වන මම ඔබව ගල-
වාගන්නෙමි. **8** නමුත් ඔබ ඔහුගේ
සේවකයෝ වන්නහුය.[15] එසේ වන්-
නේ මට සේවය කිරීම[16] හා විදේශීය
රාජ්‍යයන්වලට සේවය කිරීම[17] අතර
තිබෙන වෙනස ඔබ තේරුම්ගන්නා
පිණිසය."

**9** ඊජිප්තුවේ රජු වූ ෂීෂක්[18] යෙරු-
සලම ආක්‍රමණය කර, යෙහෝවා
දෙවිගේ ගෘහයේ තිබූ වස්තු[19] හා රජ-
මාලිගාවේ තිබූ වස්තු[20] ඇතුළු සියලු
දේ පැහැරගෙන ගියේය. සලමොන්
රජ සෑදූ රන් පලිස් සියල්ලද ඔහු
ගෙන ගියේය.[21] **10** පසුව රෙහබෝ-
වම් රජ ඒ වෙනුවට තඹ පලිස්
සෑදුවේය. ඒවා ආරක්ෂා කිරීමට
ඔහු පත් කළේ රජමාලිගාවේ දො-
රටු[1] පාලකයන්ගේ[2] ප්‍රධානීන්වය.[3]
**11** රජු යෙහෝවා දෙවිගේ ගෘහයට
ගිය සෑම අවස්ථාවකදීම ඒ මුරක-
රුවෝ එම පලිස් පිටතට ගෙනා-
වෝය. ඔහු පිටත්ව ගිය පසු ඔවුහු
ඒවා නැවත මුරකුටිවල තැබුවෝය.[4]
**12** රෙහබෝවම් රජු පසුතැවිලි වූ
නිසා යෙහෝවා දෙවිගේ උදහස නිවී
ගිය අතර[5] ඔවුන්ව සම්පූර්ණයෙන්ම
විනාශ කිරීමට ගත් තීරණය දෙවි වෙ-
නස් කළේය.[6] එමෙන්ම යූදාහි සෙ-
නඟ අතරේද යහපත් ක්‍රියා කළ අය
සිටියෝය.[7]

**13** රෙහබෝවම් රජ යෙරුසලමෙහි
තම බලය තව තවත් තහවුරු කරග-
නිමින් දිගටම එය පාලනය කළේය.
ඔහු[8] රජකමට පත් වන විට ඔහුගේ
වයස අවුරුදු හතළිස්එකකි. ඊශ්‍රා-
යෙල්හි සියලු ගෝත්‍රවලට අයත් නුව-
රවල් අතරින් යෙහෝවා දෙවි තම
නාමය වෙනුවෙන්[9] තෝරාගත් නුවර[10]
වන යෙරුසලමේ සිට ඔහු අවුරුදු දාහ-
තක් පාලනය කළේය. ඔහුගේ මව
අම්මොන් ජාතික ස්ත්‍රියකි.[11] ඇගේ
නම නයමාය.[12] **14** නමුත් රෙහ-
බෝවම් රජ මුළු හදවතින්ම යෙහෝවා
දෙවිට ළං වී ඔහුගේ මඟ පෙන්වීම
ලබාගැනීමට උත්සාහ නොකළේය.[13]
එමනිසා දෙවි පිළිකුල් කළ දේවල්ද
ඔහු කළේය.[14]

**15** රෙහබෝවම් රජු[15] සහ යෙරො-
බොවම් රජු[16] අතර නිතර නිතර යුද්ධ
පැවතිණ. රෙහබෝවම් රජුගේ ජීවිත-
යේ සිදු වූ සියලු දේවල්[17] වාර්තා කර
ඇත. ඒවා වාර්තා කර තිබෙන්-
නේ පෙළපත් ලේඛනයක් ලෙස
සකස් කළ අනාගතවක්තෘ ෂෙමායා-
ගේ[18] හා අනාගතවක්තෘ ඉද්දෝගේ[19]
ලිපි ලේඛනවලය. **16** රෙහබෝ-
වම් රජු මිය ගිය අතර ඔහුගේ
මුතුන්මිත්තන් මෙන් ඔහුවද තැන්-
පත් කරනු ලැබීය.[20] ඔහුව තැන්පත්

**12 පරි.**

**1** විනි 6:5
**2** නාහු 3:9
**3** 2ලේක 14:9; 2ලේක 16:8
**4** 2ලේක 11:5; යෙසා 36:1
**5** 2රාජා 18:17
**6** 1රාජා 12:22; 2ලේක 11:2
**7** ද්වි 28:15; 2ලේක 15:2
**8** යෝබ් 34:11; හෙබ්‍රෙ 10:38
**9** 1රාජා 8:38; 2ලේක 33:12; 2ලේක 34:27; යාකො 4:10
**10** නික් 9:27; ගීතා 89:14; යෙරෙ 50:7
**11** 1රාජා 12:22
**12** 1රාජා 21:29; 1පේතෘ 5:5
**13** 2ලේක 12:2
**14** ලෙවී 26:41; ආමො 7:6
**15** යෙසා 26:13
**16** ද්වි 28:47
**17** හොෂෙ 2:7; හොෂෙ 8:10
**18** 1රාජා 14:25
**19** 1රාජා 7:51
**20** 1රාජා 14:26; 2රාජා 14:14
**21** 1රාජා 10:17

**2 තීරුව**

**1** 1රාජා 14:27
**2** 2සාමු 23:23
**3** 1සාමු 22:17
**4** 1රාජා 14:28
**5** 2ලේක 33:12; යෙසා 57:15
**6** විලා 3:22
**7** උත් 18:24; 1රාජා 14:13; 2ලේක 19:3
**8** 1රාජා 14:21
**9** නික් 20:24; ද්වි 12:11
**10** ද්වි 12:5; 2ලේක 6:6; ගීතා 48:2; ගීතා 78:68
**11** ද්වි 23:3; 1රාජා 11:1; නෙහෙ 13:26
**12** 1රාජා 14:21
**13** ද්වි 5:29; 1සාමු 7:3; 1රාජා 18:21; මාක් 12:30; රෝම 12:9; යාකො 5:8
**14** 1රාජා 15:34
**15** 1රාජා 14:30
**16** 1රාජා 12:20
**17** 1ලේක 29:29
**18** 1රාජා 12:22; 2ලේක 11:2

---

**19** 2ලේක 9:29; 2ලේක 13:22; **20** 1රාජා 14:31.

කළේ දාවිත්ගේ නුවරෙහිය.[1] ඔහු-
ගෙන් පසුව ඔහුගේ පුත් අබියා[2] රජක-
මට පත් විය.

**13** අබියා යූදාහි රජකමට පත්
වූයේ යෙරොබොවම් රජු රජ-
කම් කළ දහඅටවන අවුරුද්දේදීය.[3]
**2** ඔහුගේ මවගේ නම මිකායාය.*[4]
ඇය ගිබෙයා නම් නුවරේ[5] විසූ උරි-
යෙල්ගේ දියණියයි. අබියා යෙරුසල-
මේ සිට අවුරුදු තුනක් පාලනය
කළේය. ඒ කාලය අතරතුර අබියා
රජු සහ යෙරොබොවම් රජු අතර
යුද්ධ පැවතිණ.[6]
**3** අබියා රජ, තෝරාගත් බලසම්-
පන්න සෙබළුන් හාරලක්ෂයක් සමඟ
යුද්ධයට ගියේය.[7] යෙරොබොවම්
රජද තෝරාගත් එඬිතර හා බලසම්-
පන්න සෙබළුන් අටලක්ෂයක් සමඟ
ඔහුට විරුද්ධව යුද්ධයට පැමිණි-
යේය.[8] **4** එෆ්‍රායිම් ගෝත්‍රයට අයත්
කඳුකර ප්‍රදේශයේ[9] පිහිටි ෂෙමරායිම්
නම් කන්ද මත සිටගත් අබියා රජ
මෙසේ පැවසුවේය. “යෙරොබොවම්
ඇතුළු ඊශ්‍රායෙල් සෙනඟෙනි, මට
සවන් දෙන්න. **5** ඊශ්‍රායෙල්හි දෙවි
වන යෙහෝවා දාවිත් රජු සමඟ
ස්ථිර ගිවිසුමක්*[10] ඇති කරගත් බව
ඔබට මතක නැද්ද?[11] දෙවි ඒ ගිවි-
සුම මගින් ඔහුටත් ඔහුගේ පුත්‍රයන්-
ටත්[12] ඊශ්‍රායෙල්හි රජකම සදහටම
භාර දුන්නා.[13] **6** නමුත් දාවිත්ගේ
පුත් සලමොන්ගේ සේවකයෙකු වූ[14]
නෙබාත්ගේ පුත් යෙරොබොවම්[15]
තම ස්වාමියාට විරුද්ධව[16] කැරලිගැ-
සුවා.[17] **7** කිසි වැඩකට නැති පිරි-
සක්[18] ඔහු වටා එක් රොක් වෙන්න
පටන්ගත්තා. කල් යත්ම සලමොන්-
ගේ පුත් රෙහබෝවම්ට වඩා ඔවුන්
බලවත් වුණා. රෙහබෝවම් රජු[19] අද්-
දැකීම් අඩු[20] තරුණයෙක් වූ නිසා
ඔවුන්ව මැඩපැවැත්වීමට ඔහුට හැකි
වුණේ නැහැ.

**8** “දැන් ඔබ සියලුදෙනා පැමිණ
සිටින්නේ යෙහෝවා දෙවිගේ රාජ්‍යය
නියෝජනය කරන දාවිත් රජුගේ
පුත්‍රයන්ගේ පාලනයට විරුද්ධව නැඟී
සිටින්නයි.[1] ඒ සඳහා ඔබ සමඟ
විශාල සෙනඟක් සිටිනවා.[2] ඔබ දෙවි-
වරුන් ලෙස සලකන, යෙරොබොවම්
සෑදූ රන් වස්සන් දෙදෙනාගේ උපකා-
රයද ඔබට තිබෙනවා කියා ඔබ සිත-
නවා.[3] **9** ඔබ ආරොන්ගේ පුත්‍රයන්
වන යෙහෝවා දෙවිගේ පූජකයන්ව[4]
හා ලෙවීවරුන්ව පලවාහැරියා. එසේ
කළ ඔබ වෙනත් ජාතීන් සිදු කළ
ආකාරයටම ඔබ අතර සිටි ඕනෑම
කෙනෙකුව පූජකයන් ලෙස පත් කර-
ගත්තා.[5] කිසි කමකට නැති දෙවිව-
රුන්ගේ[6] පූජකයෙක් වෙන්න කැමති
නම් ඒ සඳහා ඔවුන් කළ යුත්තේ වස්-
සෙක් හා බැටළුවන් සත්දෙනෙක්ව
රැගෙන ඒම පමණයි. **10** නමුත් අපි
නමස්කාර කරන්නේ අපේ දෙවි යෙ-
හෝවාට පමණයි.[7] අපි ඔහුව අත්හැර
නැහැ. ආරොන්ගේ පුත්‍රයන් තවමත්
යෙහෝවා දෙවිගේ පූජකයන් ලෙස
සේවය කරනවා. ලෙවීවරුන්ද තමන්-
ගේ කාර්යයන් ඉටු කරමින් සිටිනවා.[8]
**11** ඔවුන් සෑම දිනකම උදේ හවස
යෙහෝවා දෙවිට දවන පූජා[9] සහ
සුවඳ ද්‍රව්‍ය[10] ඔප්පු කරනවා. පවිත්‍ර
රනින් සෑදූ මේස මත දෙවි ඉදි-
රියේ රොටි තබනවා.[11] ඒ විත-
රක් නෙවෙයි ඔවුන් දෙවිගේ ගෘහයේ
තිබෙන රන් පහන් රුක්වල[12] පහන්
සෑම සවසකම දල්වනවා.[13] අපි මේ
දේවල් කරන්නේ අපේ දෙවි යෙ-
හෝවාගේ ආඥාවලට කීකරු වීමක්
හැටියටයි.[14] නමුත් ඔබ දෙවිව අත්-
හැර දෙවිගේ ආඥාවලට පිටු පෑවා.[15]
**12** අපි යුද්ධයට ඇවිත් සිටින්නේ
සැබෑ දෙවි සමඟයි.[16] ඔහුගේ පූජකය-
නුත් අප සමඟ සිටිනවා.[17] හොරණෑ
නාද කරමින්[18] ඔබට විරුද්ධව යුද්ධය
ප්‍රකාශ කිරීමට ඔවුන් සූදානමින් සිටි-
නවා. ඒ නිසා ඊශ්‍රායෙල්වරුනි, ඔබේ

**12 පරි.**
1 2සාමු 5:9
2 මතෙ 1:7

**13 පරි.**
3 1රාජා 15:1
4 1රාජා 15:2
2ලේක 11:20
5 යොෂු 18:28
1සාමු 10:26
6 1රාජා 15:6
7 2ලේක 11:1
8 ගීතා 33:16
9 යොෂු 17:15
10 ගණන් 18:19
ගීතා 89:28
11 උත් 49:10
2සාමු 7:8
ගීතා 78:71
12 1ලේක 17:11
ගීතා 89:29
ලූක් 1:32
13 2සාමු 7:13
1ලේක 17:14
14 1රාජා 11:26
15 2ලේක 10:2
16 1රාජා 11:27
17 1රාජා 12:20
2ලේක 10:18
18 ද්වි 13:13
විනි 9:4
1රාජා 21:10
ක්‍රියා 17:5
19 2ලේක 10:16
20 ද්වි 20:8

**2 තීරුව**
1 2ලේක 9:8
2 ගීතා 33:16
3 ද්වි 32:17
1රාජා 12:28
2ලේක 11:15
හොෂෙ 8:5
4 2ලේක 11:14
5 1රාජා 12:31
1රාජා 12:33
1රාජා 13:33
6 ද්වි 32:17
2රාජා 19:18
ක්‍රියා 19:26
7 නික් 19:5
2ලේක 11:16
8 ගණන් 16:40
9 නික් 29:39
10 නික් 30:1
2ලේක 2:4
11 නික් 25:30
ලෙවී 24:6
1ලේක 23:29
මතෙ 12:4
12 නික් 25:31
නික් 27:20
2ලේක 4:7
13 ලෙවී 24:2
14 උත් 26:5
ගණන් 9:19
ද්වි 11:1
15 ද්වි 28:15
ගීතා 73:27

---

**2ලේක 13:2*** 2ලේක 11:20-22හි සහ 1රාජා 15:2හි සඳහන් වන්නේ, “මයකා” ලෙසයි.
**5*** මූ.අ., “ලුණු ගිවිසුමක්.”

**16** ගණන් 23:21; ද්වි 20:4; ගීතා 20:7; රෝම 8:31;
**17** යොෂු 6:4; **18** ගණන් 10:9.

මුතුන්මිත්තන්ගේ දෙවි වන යෙහෝ-
වාට විරුද්ධව සටන් කරන්න එපා.[1]
ඔබ එසේ කළොත් ඔබේ පරාජය
නියතයි.”[2]

**13** මේ අතර යෙරොබෝවම් රජ
යූදාහි හමුදාවට පිටුපසින් පහර දීම
සඳහා භට පිරිසක්ව රහසින් යැවීය.
මෙසේ යූදාහි හමුදාව යෙරොබෝ-
වම් රජුගේ හමුදාවට දෙපැත්තෙන්ම
කොටු විය.[3] **14** තමන් දෙපැත්-
තෙන්ම කොටු වී සිටින බව දුටු යූදා
හමුදාව[4] යෙහෝවා දෙවිගේ උප-
කාර ඉල්ලා ඔහුට කන්නලව් කිරී-
මට පටන්ගත්තෝය.[5] ඒ අතරතුර
පූජකයෝ මහත් හඬින් හොරණෑ
නාද කළෝය. **15** යූදාහි මනුෂ්‍ය-
යෝ මහත් හඬින් ඝෝෂා නැඟූහ.[6]
ඔවුන් එසේ කළ විට සැබෑ දෙවි,
අබියා සහ යූදාහි සියලුදෙනා ඉදිරිපි-
ටදීම යෙරොබෝවම් රජුවද මුළු ඊශ්‍රා-
යෙල් සේනාවද[7] පරාජය කළේය.[8]
**16** පලා යන ඊශ්‍රායෙල්වරුන්ව දෙවි
යූදා හමුදාව අතට හසු කර දුන්-
නේය.[9] **17** අබියා රජ සහ ඔහුගේ
සෙබළු ඔවුන්ට පහර දී බොහෝදෙ-
නෙකුව මරා දැමුවෝය. මේ යුද්ධයේදී
ඊශ්‍රායෙල්වරුන් අතරේ සිටි යුද්ධයට
දක්ෂ පුරුෂයෝ පන්ලක්ෂයක් මිය
ගියෝය. **18** එය ඊශ්‍රායෙල්වරුන්ට
ප්‍රබල පහරක් විය. යූදාහි මනුෂ්‍යයන්
ජය ගත්තේ ඔවුන් තම මුතුන්-
මිත්තන්ගේ දෙවි වන යෙහෝවා
කෙරෙහි විශ්වාසය තැබූ නිසාය.[10]
**19** යෙරොබෝවම් රජු පසුපස අබියා
රජ ලුහුබැඳ ගිය අතර ඔහු යටතේ
තිබූ නුවරවල් කිහිපයක්ද අල්ලාගත්-
තේය. ඒවා නම් බෙතෙල්[11] සහ ඒ
අවට පිහිටි කුඩා නුවරවල්, යෙෂානා
සහ ඒ අවට පිහිටි කුඩා නුවරවල්,
එෆ්‍රායින් සහ ඒ අවට පිහිටි කුඩා නුව-
රවල්ය.[12] **20** අබියා රජුගේ පාලන
සමයේදී යෙරොබෝවම් රජුට නැවත
තම බලය තහවුරු කරගැනීමට නො-
හැකි විය.[13] යෙහෝවා දෙවි යෙරො-
බෝවම් රජුට පහර දුන් නිසා[14] ඔහු
මිය ගියේය.

**13 පරි.**
1 යෙසා 45:9 ක්‍රියා 5:39
2 යෝබ් 40:9 යෙසා 40:15 හෙබ්‍රෙ 10:31
3 යොෂු 8:4
4 යොෂු 8:20
5 2ලේක 14:11 2ලේක 18:31 ගීතා 46:1 ගීතා 50:15 ගීතා 118:12
6 යොෂු 6:16 විනි 7:18
7 2ලේක 13:1
8 ගණන් 32:4 2ලේක 14:12
9 විනි 1:4
10 2රාජා 18:5 1ලේක 5:20 2ලේක 16:8 ගීතා 22:5 ගීතා 37:5 ගීතා 146:5 නාහු 1:7 1තිමෝ 4:10
11 යොෂු 12:9 විනි 21:19 1සාමු 13:2 1රාජා 12:29
12 යොහ 11:54
13 ගීතා 18:38
14 1සාමු 25:38 2සාමු 12:15 1රාජා 14:20 ක්‍රියා 12:23

**2 තීරුව**
1 2සාමු 5:12
2 ද්වි 17:17 2සාමු 5:13 1රාජා 11:3
3 ගීතා 127:5
4 2ලේක 9:29 2ලේක 12:15

**14 පරි.**
5 ගීතා 49:9 රෝම 5:14
6 2සාමු 5:9 1රාජා 2:10 1රාජා 14:31
7 1ලේක 3:10
8 2ලේක 20:30 හිතෝ 29:2
9 ද්වි 7:5
10 ලෙවී 26:30 1රාජා 11:7 1රාජා 14:23
11 නික් 23:24 ගණන් 33:52 2රාජා 23:14
12 විනි 6:25 2රාජා 18:4 2රාජා 23:6
13 2ලේක 30:19 යෙසා 55:6 ආමො 5:4 ශෙප 2:3 මතෙ 7:7

**21** අබියා රජ තම බලය තව
තවත් තහවුරු කරගත්තේය.[1] කල්
යත්ම ඔහු භාර්යාවන් දාහතරදෙනෙ-
කුව විවාහ කරගත් අතර[2] ඔහුට දාව
පුත්‍රයෝ විසිදෙදෙනෙක්ද[3] දූවරු දහස-
යදෙනෙක්ද උපන්නෝය. **22** අබියා
කළ වෙනත් දේවල් ගැනද ඔහු-
ගේ ගතිපැවතුම් ගැනද ඔහු පැවසූ
දේවල් ගැනද අනාගතවක්තෘ ඉද්දෝ-
ගේ ලේඛනයෙහි වාර්තා වී ඇත.[4]

# 14

කල් යත්ම අබියා රජ මිය
ගියේය. ඔහුගේ මුතුන්මිත්-
තන් මෙන් ඔහුවද තැන්පත් කරනු
ලැබීය.[5] ඔහුව තැන්පත් කළේ දාවිත්-
ගේ නුවරෙහිය.[6] ඔහුගෙන් පසුව ඔහු-
ගේ පුත් ආසා[7] රජකමට පත් විය. ඔහු
පාලනය කළ මුල් වසර දහය පුරාම
දේශයෙහි සාමකාමී වාතාවරණයක්
පැවතිණ.[8]

**2** ආසා රජ තම දෙවි වූ යෙහෝවා-
ගේ ප්‍රතිපත්ති රකිමින් දෙවි යහපත්-
යයි සලකන දේ කළේය. **3** බොරු
දෙවිවරුන්ට ඉදි කළ පූජාසනද[9]
පූජනීය ස්ථානද[10] ඔහු ඉවත් කළ
අතර බොරු නමස්කාරය සඳහා ඉදි
කළ කණුද[11] කුලුනුද[12] කඩා දැමීය.
**4** සෑම කාරණයකදීම තම මුතුන්-
මිත්තන්ගේ දෙවි වන යෙහෝවාගේ
මඟ පෙන්වීම් පතන්නත්[13] දෙවිගේ
නීති[14] හා දෙවි අණ කළ සියලු දේ[15]
පිළිපදින්නත් ඔහු යූදාහි වැසියන්ට
අණ කළේය. **5** ඔහු යූදා දේශයේ
සියලුම නුවරවලින් බොරු දෙවිවරුන්
වෙනුවෙන් ඉදි කළ පූජනීය ස්ථාන හා
සුවඳ ද්‍රව්‍ය ඔප්පු කරන පූජාසන ඉවත්
කළේය.[16] ඔහුගේ රාජධානිය පුරාම
සාමකාමී වාතාවරණයක් පැවතිණ.[17]
**6** යූදා දේශයේ සාමකාමී වාතාවර-
ණයක් තිබූ නිසා ඔහු එහි පවුරුව-
ලින් වට වූ සුරක්ෂිත නුවරවල් ඉදි
කළේය.[18] ආසා රජු පාලනය කළ
දේශයට යෙහෝවා දෙවි සාමකාමී
කාලයක් උදා කර දුන් නිසා ඒ කාලය

**14** නෙහෙ 10:29; **15** ගීතා 119:10; **16** 2ලේක 34:4;
**17** 2රාජා 11:20; **18** 2ලේක 8:2; 2ලේක 11:5.

තුළදී ඔහුට විරුද්ධව කිසිවෙක් යුද්ධ
කිරීමට පැමිණියේ නැත.[1] **7** එහෙ-
යින් ඔහු යුදාහි වැසියන්ට මෙසේ
පැවසුවේය. “එන්න, අපි මේ නුවර-
වල් ගොඩනඟමු. අපි ඒ නුවරවල්
වටා පවුරු[2] හා මුරටැඹවල්[3] ඉදි
කර, සවිමත් දොරවල්ද ඒවාට අගුලුද
සවි කරමු.[4] මේ දේශය අපට අයිති
වුණේ අපේ දෙවි වන යෙහෝවාගේ
මඟ පෙන්වීම් අපි පැතූ නිසයි.[5]
මේ දේශයට දෙවි සාමය උදා කර
දී තිබෙන්නෙත් ඒ නිසයි.”[6] මෙසේ
ඔවුහු එකමුතුව එම ඉදි කිරීම් කට-
යුතු සාර්ථකව නිම කළෝය.[7]

**8** ආසා රජු සතුව එඩිතර හා බල-
සම්පන්න පුරුෂයන්ගෙන් යුත් හමුදා-
වක් සිටියෝය. ඔහුගේ හමුදාවේ
පලිස්[8] හා හෙල්ලවලින්[9] සන්නද්ධ වූ
යූදා ගෝත්‍රයට අයත් පුරුෂයෝ තුන්-
ලක්ෂයක් සිටියෝය.[10] දුනු ශිල්පයට
දක්ෂ, කුඩා පලිස්වලින් සන්නද්ධ වූ[11]
බෙන්ජමින් ගෝත්‍රයට අයත් පුරුෂ-
යෝ දෙලක්ෂ අසූදහසක්ද[12] ඔහුගේ
හමුදාවේ සිටියෝය.

**9** කල් යත්ම ඉතියෝපියානු
ජාතික[13] සේරා විශාල සේනාවක්
සමඟ ඔවුන්ට විරුද්ධව සටනට පැමි-
ණියේය. ඔහුගේ සේනාව අශ්ව රථ
තුන්සියයකින් හා සෙබළුන් දස-
ලක්ෂයකින් සමන්විත විය.[14] ඔවුහු
මරේෂාහ් නම් නුවර දක්වා පැමිණි-
යෝය.[15] **10** එවිට ආසා රජද ඔහුට
විරුද්ධව සටනට සැරසී මරේෂාහ්
අසල පිහිටි ෂෙපාතා නම් නිම්නයට
ගියේය. **11** එහිදී ආසා රජ තම
දෙවි වූ යෙහෝවාට කන්නලව් කර-
මින්[16] මෙසේ පැවසීය. “යෙහෝවා
දෙවියනි, ඔබ උපකාර කිරීමට සූදා-
නම් දෙවි කෙනෙක්. ඒ නිසා අප
සුළු පිරිසක් වුණත් විශාල පිරිසක්
වුණත් අපට උපකාර කිරීමට එය
ඔබට බාධාවක් නොවෙයි.[17] යෙ-
හෝවා අපේ දෙවියනි, අපි විශ්වාසය
තබා තිබෙන්නේ ඔබ මතයි.[18] මේ
විශාල සමූහයට විරුද්ධව අපි යුද්ධ-
යට පැමිණියේ ඔබේ නාමයෙන්.[19] ඒ
නිසා අපට උපකාර කරන්න. යෙ-
හෝවා දෙවියනි, ඔබයි අපේ දෙවි.[1]
ඔබට වඩා තමන් බලවත් කියා
පෙන්වීමට දුව්ලි වැනි මේ මනුෂ්‍ය-
යන්ට ඉඩ දෙන්න එපා.”[2]

**12** යෙහෝවා දෙවි ආසා රජු හා
යූදාහි මනුෂ්‍යයන් ඉදිරිපිටදීම ඉති-
යෝපීය හමුදාව පරාජය කළේය.[3]
පසුව ඔවුහු පලා ගියෝය. **13** නමුත්
ආසා රජ සහ ඔහු සමඟ සිටි මනුෂ්‍ය-
යෝ ඔවුන්ව ගෙරාර් නම් ස්ථානය[4]
දක්වාලුහුබැඳ ගියෝය. ඉතියෝපීය
හමුදාවේ සියල්ලෝම ඔවුන් අතින්
මැරුම් කෑවෝය. කිසිවෙක් ඉතුරු
නොවීය. මෙසේ යෙහෝවා දෙවි සහ
ඔහුගේ සෙනඟ[5] අතින් ඔවුන් සියලු-
දෙනාම මරණයට පත් විය.[6] ඉන්පසු
ආසා රජුගේ හමුදාව ඉතියෝපීය වැසි-
යන්ට අයත් වස්තු විශාල ප්‍රමාණයක්
කොල්ලයක් ලෙස රැගෙන ගියෝය.[7]
**14** ඔවුහු ගෙරාර් අවට පිහිටි සියලු
නුවරවලටද පහර දුන්නෝය. ඒ නුව-
රවල සිටි සියල්ලන්ට යෙහෝවා දෙවි
ගැන මහත් බියක් ඇති වී තිබිණ.[8]
එම නුවරවල තිබූ බොහෝ වස්තුද
ආසා රජුගේ හමුදාව රැගෙන ගියෝය.[9]
**15** සතුන්ව ගාල් කර තිබූ තැන්වල-
ටත්[10] පහර දුන් ඔවුහු ඔටුවන්[11]
ඇතුළු විශාල සතුන් පිරිසක්ද රැගෙන
ගියෝය.[12] ඉන්පසු ඔවුහු යෙරුසලමට
නැවත පැමිණියෝය.

# 15

දෙවිගේ බලය[13] ඕදෙද්ගේ[14]
පුත් අෂරියා තුළ ක්‍රියාත්මක
විය. **2** ඔහු ආසා රජු වෙතට ගොස්
මෙසේ පැවසුවේය. “රජ්ජුරුවනි,
යූදා හා බෙන්ජමින් වැසියෙනි, මට
සවන් දෙන්න. ඔබ යෙහෝවා දෙ-
විට ළංව සිටින තාක් කල් ඔහුත්
ඔබට ළංව සිටිනවා.[15] ඔබ ඔහු-
ගේ මඟ පෙන්වීම් පැතුවොත්[16] ඔහු
ඔබව පිළිගෙන ඔබට උපකාර කරයි.
නමුත් ඔබ ඔහුව අත්හැරියොත්
ඔහුද ඔබව අත්හරියි.[17] **3** කාලයක්

**15 පරි.** **13** ගණන් 24:2; 2සාමු 23:2; **14** 2ලේක 15:8; **15** මලා 3:7; යාකො 4:8; **16** යෙසා 55:6; යෙරෙ 29:13; **17** 1ලේක 28:9; 2ලේක 24:20; හෙබ්‍රෙ 10:38.

**14 පරි.**
**1** යොෂු 23:1
2ලේක 15:15
ගීතා 46:9
හිතෝ 16:7
**2** 2ලේක 11:5
**3** 2ලේක 32:5
**4** ද්වි 3:5
විනි 16:3
1සාමු 23:7
**5** 1ලේක 16:11
ගීතා 105:3
**6** 1රාජා 5:4
**7** ගීතා 127:1
මලා 3:10
ක්‍රියා 9:31
**8** 1සාමු 17:41
**9** 2ලේක 11:12
**10** 2ලේක 11:1
2ලේක 13:3
**11** 2ලේක 26:14
**12** ගීතා 68:27
යෙසා 60:22
**13** 2රාජා 19:9
ක්‍රියා 8:27
**14** 2ලේක 16:8
**15** යොෂු 15:44
මීකා 1:15
**16** නික් 14:10
1ලේක 5:20
2ලේක 32:20
ගීතා 22:5
පිලි 4:6
**17** විනි 7:7
1සාමු 14:6
ආමො 5:9
1කොරි 1:27
2කොරි 12:9
**18** 2ලේක 32:8
ගීතා 37:5
ගීතා 55:22
**19** 1සාමු 17:45
2ලේක 13:12
ගීතා 20:5
හිතෝ 18:10

**2 තීරුව**
**1** ද්වි 32:3
මාක් 12:29
**2** යොෂු 7:9
1සාමු 2:9
ගීතා 9:19
මතෙ 6:9
**3** ද්වි 28:7
**4** උත් 20:1
**5** 1ලේක 12:22
**6** ගීතා 68:21
**7** 1ලේක 20:2
හිතෝ 13:22
**8** උත් 35:5
නික් 15:16
ද්වි 11:25
යොෂු 5:1
2ලේක 17:10
**9** 2ලේක 20:25
ගීතා 68:12
**10** 1ලේක 4:41
**11** 1ලේක 5:21
**12** ගණන් 31:9
ගණන් 31:30

ඊශ්‍රායෙල් ජාතිය[1] සැබෑ දෙවිවත්
ඔවුන්ට උගන්වන්න සිටිය පූජකයා-
වත්[2] ඔවුන් පිළිපැදිය යුතු නීතියත්
අත්හැර දමා තිබුණා. **4** නමුත් යම්
විපතක් සිදු වූ විට[3] ඔවුන් නැව-
තත් ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝවා
වෙතට හැරී[4] ඔහුගේ මඟ පෙන්-
වීම් පැතුවා. එවිට දෙවි ඔවුන්ව
පිළිගෙන ඔවුන්ට උපකාර කළා.[5]
**5** ඒ කාලයේ දේශයේ ගැටුම් සහිත
වාතාවරණයක් තිබූ නිසා[6] ගමන්බි-
මන් ගිය අයට කිසිම ආරක්ෂාවක්
තිබුණේ නැහැ.[7] **6** ගෝත්‍ර අතරත්[8]
නුවරවල් අතරත් නොයෙකුත් ගැටුම්
පැවතුණු නිසා සෙනඟගෙන් බො-
හෝදෙනෙක් මරණයට පත් වුණා.
එසේ සිදු වුණේ නොයෙකුත් විපත්ව-
ලින් ඔවුන්ට පීඩා විඳීමට දෙවි ඉඩහැ-
රිය නිසයි.[9] **7** නමුත් දැන් ඔබ
කරන දේවලට දෙවිගේ ආශීර්වාදය
ලැබෙනවා.[10] ඒ නිසා ඔබ අධෛර්යය
නොවී[11] ශක්තිමත් වන්න.”[12]

**8** ඒ වචනවලටත් අනාගතවක්තෘ
ඕදෙද්ගේ[13] අනාවැකියටත් සවන් දුන්
පසු ආසා රජ මහත් ධෛර්යයක්
උපදවාගත්තේය. ඔහු වහාම මුළු
යූදා දේශයේද බෙන්ජමින් දේශයේද
එප්‍රායිම් ගෝත්‍රයට අයත් කඳුකර
ප්‍රදේශයෙන්[14] අල්ලාගත් නුවරවලද
තිබූ සියලුම පිළිකුල්සහගත දේවල්[15]
විනාශ කර දැමුවේය. එමෙන්ම ඔහු
යෙහෝවා දෙවිගේ ගෘහයේ ශුද්ධස්-
ථානයට ඇතුල් වන ශාලාව ඉදිරියේ
තිබූ යෙහෝවා දෙවිගේ පූජාසනයද
අලුත්වැඩියා කළේය.[16] **9** එප්‍රායිම්,
මනස්සේ සහ සිමියොන් යන ගෝත්‍ර-
වලින් විශාල පිරිසක්* යූදා හා බෙන්-
ජමින් ගෝත්‍රවලට අයත් ප්‍රදේශවල
පදිංචි වීමට පැමිණියෝය. ඔවුන්
ආසා රජුට සහයෝගය දැක්වීමට
තීරණය කළේ ඔහු නමස්කාර කළ
දෙවි වන යෙහෝවා ඔහු සමඟ සිටින
බව ඔවුන් දුටු නිසාය.[17] ඉන්පසු ආසා
රජ ඔවුන්වද[1] යූදා හා බෙන්ජ-
මින් ගෝත්‍රවල සියලුදෙනාවද රැස්
කළේය.[2] **10** එලෙස ඔවුන්ව යෙ-
රුසලමට එක් රැස් කරන ලද්දේ
ආසා රජු පාලනය කළ පහළොස්-
වන අවුරුද්දේ තුන්වන මාසයේ-
දීය. **11** එසේ රැස් වූ අවස්ථාවේදී
ඔවුහු තමන් අල්ලාගත් නුවරවලින්
කොල්ලයක් ලෙස ගෙනා සතුන්ගෙන්
ගවයන් හත්සියයක්ද බැටළුවන්
හත්දහසක්ද යෙහෝවා දෙවිට පූජා
කළෝය. **12** තම මුතුන්මිත්තන්-
ගේ දෙවි වන යෙහෝවාට මුළු හදව-
තින්ම සේවය කරමින් ඔහුගේ මඟ
පෙන්වීම් නිරතුරුවම පතන බවට[3]
පොරොන්දු වෙමින් ඔවුහු එහිදී ගිවිසු-
මක්ද ඇති කරගත්තෝය.[4] **13** ඒ
ගිවිසුමට අනුව ස්ත්‍රී පුරුෂ[5] ලොකු
කුඩා[6] ඕනෑම කෙනෙකු ඊශ්‍රායෙල්හි
දෙවි වන යෙහෝවාගේ මඟ පෙන්වීම
පතන්නේ නැත්නම් ඔහුව මරණයට
පත් කළ යුතුයි.[7] **14** ඔවුහු ඉමහත්
ප්‍රීතියකින් හා මහත් හඬකින් යුතුව
හොරණෑ සහ නළා හඬ මැද තමන්
එසේ කරන බවට යෙහෝවා දෙවිට
පොරොන්දු වූහ.[8] **15** යූදාහි සියලු
වැසියන් තමන් දුන් පොරොන්දුව මුළු
හදවතින්ම ඉටු කිරීමට අදිටන් කර-
ගත් නිසා ඔවුන්ට ඉමහත් ප්‍රීතියක්
දැනිණ.[9] ඔවුහු මහත් ඕනෑකමින් දෙ-
විගේ මඟ පෙන්වීම් පැතුවෝය. ඒ
නිසා දෙවි ඔවුන්ව පිළිගෙන ඔවුන්ට
උපකාර කළෝය.[10] එමෙන්ම දේශය
පුරා සාමය දිගටම පැවතීමට යෙ-
හෝවා දෙවි ඉඩහැරියේය.[11]

**16** බොරු නමස්කාරය සඳහා ඉදි
කර තිබූ කුලුනක් අසල ආසා රජුගේ
ආච්චි වූ මයකා[12] තවත් පිළිකුල්
රූපයක්[13] සාදා තිබූ නිසා ආසා[14]
රජ ඇයව මව් රැජින පදවියෙන්
ඉවත් කළේය.[15] පසුව ඔහු එම පිළි-
කුල් රූපය සම්පූර්ණයෙන්ම සුනුවි-
සුනු කර[16] කිද්‍රොන් නිම්නයේ[17] එය
පුළුස්සා දැමීය.[18] **17** ඔහු ඊශ්‍රායෙල්
දේශයේ තිබූ සියලුම පූජනීය ස්ථාන[19]

---

**2ලේක 15:9*** මූ.අ., “ඔවුන් අතරේ සිටි විදේශික-
යන්.”

**15 පරි.**

**1** 1රාජා 12:28
**2** ද්වි 33:10; 2ලේක 17:9; නෙහෙ 8:9; මලා 2:7
**3** ද්වි 4:30; ගීතා 106:44; රෝම 2:9
**4** විනි 10:10; හොෂෙ 6:1
**5** යෙසා 55:7; මතෙ 7:7
**6** 1සාමු 13:6
**7** විනි 5:6
**8** විනි 9:23; 2ලේක 12:15
**9** ද්වි 28:48; විනි 2:14; ගීතා 106:41; හොෂෙ 9:3
**10** රූත් 2:12; කොලො 3:24; හෙබ්‍රෙ 11:6
**11** යොෂු 1:9; 1ලේක 28:20
**12** දේශ 10:18; හෙබ්‍රෙ 12:12
**13** 2ලේක 15:1
**14** යොෂු 17:15
**15** ද්වි 27:15; 2රාජා 23:24
**16** 2ලේක 8:12
**17** උත් 39:3; 1සාමු 18:28; සෙක 8:23; ක්‍රියා 7:9

**2 තීරුව**

**1** 2ලේක 30:25
**2** 2ලේක 11:16
**3** ද්වි 4:29; යෙරෙ 29:13
**4** 2රාජා 23:3; 2ලේක 34:31; නෙහෙ 10:29
**5** හිතෝ 24:23
**6** ද්වි 1:17
**7** නික් 22:20; ද්වි 17:3
**8** දේශ 5:5; මතෙ 5:33
**9** ගීතා 5:11; ගීතා 40:16
**10** 2ලේක 15:2
**11** හිතෝ 16:7
**12** 1රාජා 15:10
**13** නික් 34:17
**14** ද්වි 13:6; ද්වි 33:9; සෙක 13:3
**15** 1රාජා 15:13; 2ලේක 19:7
**16** ද්වි 7:5; 1රාජා 15:13
**17** 2සාමු 15:23
**18** නික් 32:20
**19** 1රාජා 14:23; 2රාජා 14:4; 2රාජා 23:20; එස 6:3; එස 16:16

විනාශ නොකළත්[1] ඔහුගේ ජීවිත
කාලය පුරාම ඔහු මුළු හදවතින්ම දෙ-
විට විශ්වාසවන්තව සේවය කළේය.[2]
**18** ඔහු තමාගේ පියා විසින්ද තමා
විසින්ද කැප කරන ලද දේවල්[3]
එනම්, රන්, රිදී හා අනිකුත් භාණ්ඩ[4]
සැබෑ දෙවිගේ ගෘහයට ගෙනාවේය.
**19** ආසා රජුගේ පාලනයේ තිස්පස්-
වන අවුරුද්ද දක්වා දේශයෙහි යුද්ධ-
යක් හටගත්තේ නැත.[5]

**16** ආසා රජකම් කළ තිස්හය-
වන අවුරුද්දේදී ඊශ්‍රායෙල්හි
රජු වූ බාෂා[6] යූදා රාජ්‍යයට විරුද්ධව
පැමිණ රාමා නම් නුවරේ[7] ආරක්ෂාව
තර කිරීම සඳහා එහි ඉදි කිරීම් කට-
යුතු ආරම්භ කළේය. ඔහු එසේ කළේ
යූදාහි රජු වූ ආසාගේ බලප්‍රදේශයට
කිසිවෙකුට ඇතුල් වීමටවත් එයින්
කිසිවෙකුට පිට වීමටවත් නොහැකි
වන ලෙසය.[8] **2** එවිට ආසා රජ යෙ-
හෝවා දෙවිගේ ගෘහයේ[9] සහ රජමා-
ලිගාවේ[10] ගබඩා කර තිබූ රන් හා රිදී
රැගෙන දමස්කයේ වාසය කළ[11] සිරි-
යාවේ රජු වූ[12] බෙන්-හාදද්ට යැව්-
වේය.[13] ඔහු මෙම පණිවිඩයද ඔහුට
කියා යැව්වේය. **3** “ඔබ හා මා අත-
රත් ඔබේ පියා හා මගේ පියා අතරත්
ගිවිසුමක් තිබෙනවා. ඒ නිසා මම
ඔබෙන් ඉල්ලන්නේ ඊශ්‍රායෙල්හි රජු වූ
බාෂා[14] සමඟ ඔබ ඇති කරගත් ගිවි-
සුම අහෝසි කරන්න කියායි. එවිට
ඔහු මාගේ දේශයෙන් ඉවත් වෙයි.[15] ඒ
සඳහා තෑග්ගක් හැටියට මේ රන් හා
රිදී මම ඔබට එවනවා.”

**4** බෙන්-හාදද් රජ ආසා රජුට සවන්
දී තම සෙන්පතීන්ව ඊශ්‍රායෙල් දේශයේ
නුවරවලට විරුද්ධව සටනට යැවීය.
ඔවුහු ඊයොන්,[16] දාන්[17] සහ ආබෙල්-
මායිම්[18] යන නුවරවලටද නප්තලී
ප්‍රදේශයට අයත් නුවරවල[19] තිබූ ගබ-
ඩාවලටද[20] පහර දුන්නෝය. **5** මේ
ගැන බාෂා රජුට ආරංචි වූ වහාම ඔහු
රාමා නුවරෙහි කළ ඉදි කිරීම් කටයුතු
සම්පූර්ණයෙන්ම නතර කර දැමු-
වේය.[21] **6** එවිට ආසා රජ යූදාහි සිටි
සියලුදෙනාද එක් රැස් කරගෙන[22]

**15 පරි.**
1 1රාජා 15:14; 1රාජා 22:43
2 1රාජා 8:61
3 1රාජා 7:51; 1ලේක 26:26
4 1රාජා 15:15
5 2ලේක 14:1

**16 පරි.**
6 1රාජා 15:27
7 යොෂු 18:25; එස්රා 2:26; යෙසා 10:29
8 1රාජා 15:17
9 1රාජා 7:51
10 2රාජා 16:8
11 යෙසා 7:8
12 1රාජා 20:1; 2රාජා 8:7; 2රාජා 12:18
13 1රාජා 15:18
14 1රාජා 15:27
15 1රාජා 15:19
16 2රාජා 15:29
17 උත් 14:14; විනි 18:29; විනි 20:1
18 2සාමු 20:14
19 යොෂු 19:32
20 1රාජා 9:19
21 1රාජා 15:21
22 1රාජා 15:22

**2 තීරුව**
1 යොෂු 18:25; එස්රා 2:26
2 1රාජා 15:17
3 යොෂු 18:24; 1ලේක 6:60; යෙසා 10:29; සෙක 14:10
4 යොෂු 18:26; විනි 20:1; 1සාමු 7:5; යෙරෙ 40:6
5 1රාජා 16:1; 2ලේක 19:2; 2ලේක 20:34
6 2රාජා 18:5; හෙබ්‍රෙ 12:1
7 ගීතා 146:3; යෙසා 31:1; යෙරෙ 17:5
8 2ලේක 14:9
9 2ලේක 12:3
10 2ලේක 14:9
11 2ලේක 14:11; ගීතා 9:10; ගීතා 37:40
12 යෝබ් 34:21; හිතෝ 5:21; යෙරෙ 16:17; හෙබ්‍රෙ 4:13; 1පේතෘ 3:12
13 සෙක 4:10
14 1රාජා 8:61
15 1සාමු 13:13
16 1රාජා 15:32

රාමා නුවරට[1] ගියේය. බාෂා රජු ඉදි
කිරීම් කටයුතු සඳහා භාවිත කළ[2]
ගල්ද ලීද ආසා රජ එතැනින් ගෙන
ගොස්, ගෙබා[3] සහ මිෂ්පා[4] යන නුවර-
වල යම් ඉදි කිරීම් කටයුතු සඳහා යො-
දාගත්තේය.

**7** එවිට අනාගතවක්තෘ හනානි[5]
යූදාහි රජු වූ ආසා ළඟට පැමිණ
මෙසේ පැවසීය. “ඔබ ඔබේ දෙවි වන
යෙහෝවා කෙරෙහි විශ්වාසය නො-
තබා[6] සිරියාවේ රජුගෙන් උදව් ඉල්ලූ
නිසා[7] සිරියානු රජුගේ හමුදාව තවදු-
රටත් ඔබේ පාලනය යටතේ තබාගැ-
නීමට ඔබට හැකි වෙන්නේ නැහැ.
**8** ඉතියෝපියානු[8] හා ලිබියානු ජාති-
කයන්[9] ඔබට විරුද්ධව සටනට ආ
හැටි ඔබට මතක නැද්ද? ඔවුන්ට
මොන තරම් විශාල අසරුවන් හා
අශ්ව රථ සේනාවක් සිටියාද![10] නමුත්
එදා ඔබ යෙහෝවා දෙවි කෙරෙහි
විශ්වාසය තැබූ නිසා ඔවුන්ව යටත්
කරගැනීමට දෙවි ඔබට ශක්තිය
දුන්නා.[11] **9** යෙහෝවා දෙවි තම
දෙනෙත්[12] පොළොවෙහි සිදු වන සෑම
දෙයක් වෙතටම යොමු කර තිබෙ-
නවා.[13] ඔහු එසේ කරන්නේ ඔහුට
පූර්ණ හදවතකින් සේවය කරන
අයට[14] තම බලය ලබා දෙමින්
ඔවුන්ට උපකාර කරන්නයි. නමුත්
ඔබ ක්‍රියා කළේ අඥාන ලෙසයි.[15]
එමනිසා මෙතැන් පටන් ඔබට විරුද්-
ධව යුද්ධ ඇති වෙයි.”[16]

**10** එය ඇසූ ආසා රජ බොහෝ
සෙයින් උදහස් වී[17] අනාගතවක්-
තෘවරයාව දඬුකඳේ ගැසුවේය.[18] ඒ
කාලයේදීම ආසා රජ සෙනඟ අත-
රින් සමහරදෙනෙකුටද පීඩා කිරීමට
පටන්ගත්තේය.[19] **11** ආසා රජුගේ
ජීවිතයේ සියලුම තොරතුරු යූදා
සහ ඊශ්‍රායෙල් රජවරුන්ගේ තොර-
තුරු අඩංගු ලියවිල්ලෙහි සඳහන් කර
තිබේ.[20]

**12** ආසා රජකම් කළ තිස්නවවන
අවුරුද්දේදී ඔහුගේ පාදවල රෝගයක්

**17** ගීතා 37:8; ගීතා 141:5; හිතෝ 29:22; ගලා 5:20; **18** 2ලේක 18:26; දේශ 8:4; **19** දේශ 7:7; **20** 1රාජා 15:23.

හටගත් බැවින් ඔහු බොහෝ සෙයින්
රෝගාතුර විය.[1] එම රෝගයෙන් පීඩා
විඳිමින් සිටි ඔහු ඒ සම්බන්ධයෙන්
යෙහෝවා දෙවිගේ මඟ පෙන්වීම් පත-
නවා වෙනුවට[2] ලෙඩ සුව කරන්-
නන්ගෙන් පිහිට පැතීය.[3] **13** ආසා
රජ මිය ගියේ ඔහු රජකම් කළ
හතළිස්එක්වන අවුරුද්දේදීය. ඔහුගේ
මුතුන්මිත්තන් මෙන් ඔහුවද තැන්-
පත් කරනු ලැබීය.[4] **14** ඔහුව තැන්-
පත් කළේ ඔහු විසින්ම දාවිත්ගේ
නුවරෙහි[5] සාදන ලද ඉතා අලංකාර
සොහොන් ගෙයකය.[6] ඔහුගේ මළ
සිරුර තබා තිබූ යහනට බෝල්සම්
තෙල්ද[7] විවිධාකාර සුවඳැති විශේෂ
තෛලද[8] ගල්වා තිබිණ. ඉන්පසු
ඔවුහු ඔහු වෙනුවෙන් විශාල සුවඳ
ද්‍රව්‍ය ප්‍රමාණයක්ද දවා දැමුවෝය.[9]

**17** ආසා රජුගෙන් පසු රජකමට
පත් වූයේ ඔහුගේ පුත් යෙ-
හෝෂපාට්ය.[10] ඔහු මුළු ඊශ්‍රායෙල්
දේශය පුරා තම බලය තහවුරු
කරගත්තේය. **2** මුළු යූදා දේශයේද
තම පියා වූ ආසා එෆ්‍රායිම් දේශයෙන්
අල්ලාගත් නුවරවලද ඔහු මුර කඳ-
වුරු පිහිටෙව්වේය. ඔහු යූදා දේශයේ
තිබූ පවුරුවලින් වට වූ සියලුම සුරක්-
ෂිත නුවරවලට හමුදා භට කණ්ඩා-
යම්ද යැව්වේය.[11] **3** යෙහෝෂපාට්
ක්‍රියා කළේ තම මුතුන්මිත්තා වූ
දාවිත් ක්‍රියා කළ ආකාරයටමය.[12]
ඔහු බාල් දෙවිවරුන්ට වන්දනාමාන
නොකළ නිසා[13] යෙහෝවා දෙවිගේ
ආශීර්වාදය ඔහුට ලැබිණ.[14] **4** ඔහු
නිතරම තම පියා නමස්කාර කළ දෙ-
විගේ මඟ පෙන්වීම් පැතීමට උත්සාහ
කළ කෙනෙකි.[15] එමනිසා ඔහු ඊශ්‍රා-
යෙල් රාජ්‍යයේ ක්‍රියාකලාපය අනුගම-
නය නොකර[16] දෙවි ආඥා කළ
ආකාරයට ක්‍රියා කළේය.[17] **5** යෙ-
හෝවා දෙවිගේ උපකාරය ඔහුට
ලැබුණු නිසා ඔහුගේ බලය රාජ්‍යය
පුරාම තව තවත් තහවුරු විය.[18]
යූදාහි සියලුම වැසියන් යෙහෝෂපාට්
රජුට බොහෝ තෑගිබෝග ගෙනැවිත්
දුන්නෝය.[19] ඔහු ධනයෙන්ද තේ-
ජසින්ද වැජඹුණේය.[1] **6** යෙහෝවා
දෙවිගේ කැමැත්ත ඉටු කිරීමට නිර්භී-
තව ක්‍රියා කළ ඔහු,[2] බොරු නමස්-
කාරය සඳහා භාවිත කළ පූජනීය
ස්ථානද[3] කුලුනුද[4] යූදා දේශයෙන්
ඉවත් කළේය.

**7** ඔහුගේ පාලනයේ තුන්වන අවු-
රුද්දේදී ඔහු තමන් යටතේ සේවය
කළ අධිපතීන් වූ බෙන්-හයිල්, ඔබ-
දියා, සෙකරියා, නෙතනෙල් සහ
මීකායා යන අයව කැඳෙව්වේය.
ඔහු එසේ කළේ යූදාහි නුවරවල
ඉගැන්වීම් කටයුතු සැලසුම් කිරීම
සඳහාය. **8** ඒ අධිපතීන්ට අමතරව
ඔහු ෂෙමායා, නෙතනියා, සෙබදියා,
අසහෙල්, ෂෙමිරාමොත්, යෙහො-
නාතාන්, අදොනියා, ටොබීයා සහ
ටොබ්-අදෝනියා යන ලෙවීවරුන්ද
එලිෂාමා සහ යෙහෝරම් යන පූජක-
යන්ද කැඳෙව්වේය.[5] **9** යූදා දේශ-
යෙහි ඉගැන්වීම් කටයුතු ආරම්භ කළ
ඔවුහු,[6] ඒ සඳහා යෙහෝවා දෙවි-
ගේ නීතිය සඳහන් ලියවිල්ල භාවිත
කළෝය.[7] ඔවුහු නුවරින් නුවරට
ගොස් යූදා දේශයේ සියලුම නුවරවල
සිටි සෙනඟට ඉගැන්වූහ.

**10** යූදා දේශය අවට රාජ්‍යවල්
යටතේ සිටි සෙනඟට යෙහෝවා
දෙවි කෙරෙහි මහත් බියක් ඇති වී
තිබිණ.[8] ඒ නිසා ඔවුහු යෙහෝෂ-
පාට් රජුට විරුද්ධව සටන් කිරීමට
පැමිණියේ නැත.[9] **11** පිලිස්ති-
වරු යෙහෝෂපාට් රජුට නොයෙ-
කුත් තෑගිබෝගද[10] කප්පම් ලෙස
මුදල්ද දුන්නෝය.[11] අරාබි ජාතික-
යෝ[12] ඔහුට බොහෝ සතුන් එනම්,
බැටළුවන් හත්දහස් හත්සියයක්ද
එළුවන් හත්දහස් හත්සියයක්ද ගෙ-
නැවිත් දුන්නෝය.[13]

**12** යෙහෝෂපාට් දිනෙන් දින බල-
වත් වූ අතර ඔහු ඉතා ශ්‍රේෂ්ඨ
රජ කෙනෙක් බවට පත් විය.[14]
ඔහු යූදා දේශයෙහි සුරක්ෂිත නුවර-
වල්ද[15] ගබඩා නුවරවල්ද[16] ගොඩ-
නැඟුවේය. **13** ඔහු යූදාහි නුවරවල
බොහෝ ව්‍යාපෘතිද ආරම්භ කළේය.

**16 පරි.**
1 යෙසා 38:1
2 ද්වි 32:39; 2රාජා 20:8; ගීතා 103:3
3 යෙරෙ 17:5
4 1රාජා 15:24
5 2සාමු 5:7
6 2ලේක 32:33
7 2රාජා 20:13
8 මාක් 16:1; ලූක් 23:56; යොහ 12:7; යොහ 19:40
9 යෙරෙ 34:5

**17 පරි.**
10 1රාජා 15:24; 1රාජා 22:41
11 2ලේක 15:8
12 2සාමු 8:15; 1රාජා 11:6; 1රාජා 15:3
13 1කොරි 10:14
14 යොෂු 1:5; 1ලේක 22:18; ගීතා 46:7; රෝම 8:31
15 ද්වි 4:29; 2ලේක 26:5
16 1රාජා 12:28; 1රාජා 13:33
17 ලූක් 1:6
18 1රාජා 9:5; ගීතා 132:12
19 1සාමු 10:27; 1රාජා 10:25

**2 තීරුව**
1 1රාජා 10:27; 2ලේක 18:1
2 ගීතා 18:21; ගීතා 119:1; හොෂෙ 14:9; යොහ 2:15; ක්‍රියා 4:31
3 1රාජා 22:43; 2ලේක 20:33
4 ද්වි 7:5
5 ද්වි 33:10; මලා 2:7
6 ලෙවී 10:11; නෙහෙ 8:7
7 ද්වි 31:11; යොෂු 1:8; 2තිමෝ 3:16
8 උත් 35:5; ද්වි 11:25
9 හිතෝ 16:7
10 2ලේක 17:5
11 2සාමු 8:2
12 2ලේක 9:14
13 2රාජා 3:4
14 2ලේක 18:1
15 2ලේක 14:6
16 1රාජා 9:19; 2ලේක 8:4

ඔහු එඩිතර හා බලසම්පන්න[1] සෙබ-
ළුන්ව[2] යෙරුසලමෙහි රඳෙව්වේය.
**14** ඔවුන්ගේ මුතුන්මිත්තන්ගේ පෙ-
ළපත්වලට අනුව ඔවුන්ව සංවිධා-
නය කර තිබුණේ මෙලෙසය. යූදා
ගෝත්‍රයේ දහසකින් යුත් කණ්ඩා-
යම්වල ප්‍රධානියා වූයේ අද්නාහ්ය.
ඔහු සමඟ එඩිතර හා බලසම්පන්න
පුරුෂයෝ[3] තුන්ලක්ෂයක් සිටියෝය.
**15** අද්නාහ් යටතේ ප්‍රධානියෙක් සිටි-
යේය. ඔහුගේ නම යෙහෝහානන්ය.
ඔහු සමඟ පුරුෂයෝ දෙලක්ෂ අසූදහ-
සක් සිටියෝය. **16** අද්නාහ් යට-
තේ තවත් ප්‍රධානියෙක් සිටියේය.
ඔහු ෂික්‍රීගේ පුත් අමසියාය. යෙ-
හෝවා දෙවි වෙනුවෙන් සේවය කිරී-
මට ඔහු කැමැත්තෙන්ම ඉදිරිපත්
විය.[4] ඔහු සමඟ එඩිතර හා බලසම්-
පන්න පුරුෂයෝ දෙලක්ෂයක් සිටි-
යෝය. **17** බෙන්ජමින් ගෝත්‍රයට
අයත්[5] එඩිතර හා බලසම්පන්න පුරු-
ෂයෙකු වූ එලියාදා සමඟ පලිස් හා
දුනුවලින් සන්නද්ධ පුරුෂයෝ දෙ-
ලක්ෂයක් සිටියෝය.[6] **18** ඔහු යට-
තේ ප්‍රධානියෙක් සිටියේය. ඔහුගේ
නම යෙහොෂාබාද්ය. ඔහු සමඟ
හමුදා සේවයට සන්නද්ධ පුරුෂ-
යෝ එක්ලක්ෂ අසූදහසක් සිටියෝය.
**19** යූදා දේශය පුරාම තිබූ සුරක්ෂිත
නුවරවල[7] රඳවා සිටි සෙබළුන්ට අම-
තරව මේ අයව යොදවා තිබුණේ
රජුට සේවය කිරීම සඳහා ය.

**18** යෙහෝෂාපාට් රජ ධනයෙන්
හා තේජසින් වැජඹුණේය.[8]
ඔහු ආහබ් රජ සමඟ[9] ගිවිසුමක්
ඇති කරගත් නිසා ඔහුගේ පවු-
ලේ අය සහ ආහබ් රජුගේ පවු-
ලේ අය අතර විවාහයක් සිදු විය.[10]
**2** ඉන් වසර කිහිපයකට පසු ඔහු
සමාරියේ සිටි ආහබ් රජුව හමු
වීමට ගියේය.[11] ආහබ් රජ, යෙහෝෂ-
පාට් රජු හා ඔහු සමඟ පැමිණි
අය වෙනුවෙන් බැටළුවන් හා ගව-
යන් විශාල ප්‍රමාණයක් පූජාවක්
ලෙස ඔප්පු කළේය.[12] ඉන්පසු ඔහු
චාටු බස් දොඩා[13] තමන් සමඟ
රාමොත්-ගිලියද් නුවරට[1] ගොස් යුද්ධ
කිරීමට යෙහෝෂාපාට් රජුව කැමති
කරවාගත්තේය. **3** ඊශ්‍රායෙල්හි රජු
වූ ආහබ් යූදාහි රජු වූ යෙහෝෂ-
පාට්ගෙන් මෙසේ ඇසීය. “රාමොත්-
ගිලියද් නුවරට ගොස් සටන් කිරීමට
ඔබ මා සමඟ එන්න කැමතිද?”[2] එවිට
ඔහු මෙසේ පැවසීය. “මම ඔබ සමඟ
එන්නම්. අපි එකට යුද්ධ කරමු.
මගේ හමුදාව ඔබේ හමුදාව කියා
සිතන්න.”[3]

**4** යෙහෝෂාපාට් රජ ඊශ්‍රායෙල්හි
රජුට මෙසේද පැවසීය. “අපි යුද්ධ-
යට යන්න කලින් යෙහෝවා දෙ-
විගෙන් ඒ ගැන විමසා බලමු.”[4]
**5** එහෙයින් ඊශ්‍රායෙල්හි රජ අනාගත-
වක්තෘවරුන්[5] හාරසියදෙනෙකු රැස්
කර මෙසේ ඇසීය. “රාමොත්-ගිලියද්
නුවරට ගොස් අපි යුද්ධ කරන්නද
එපාද?”[6] ඔවුහුද, “යන්න. ඒ නුවර
අල්ලාගන්න රජතුමාට සැබෑ දෙවි
උපකාර කරන බව නිසැකයි” කියා
පිළිතුරු දුන්නෝය.

**6** නමුත් යෙහෝෂාපාට් රජ ඒ ගැන
සෑහීමට පත් නොවී, “යෙහෝවා දෙ-
විගෙන් මේ කාරණය ගැන හරියට
දැනගෙන කියන්න පුළුවන් වෙ-
නත් අනාගතවක්තෘවරයෙක් මෙහි
නැද්ද”[7] කියා ඇසුවේය. **7** එවිට
ඊශ්‍රායෙල්හි රජ යෙහෝෂාපාට් රජුට
මෙසේ කීවේය.[8] “මේ ගැන යෙහෝවා
දෙවිගෙන් අහන්න පුළුවන් තවත්
එක මිනිසෙක් ඉන්නවා.[9] නමුත්
මම ඔහුට කොහොමටවත් කැමති
නැහැ.[10] ඔහු මා ගැන කියන්නේම
නරක අනාවැකි. ඔහු මා ගැන හොඳ
අනාවැකියක් කියනවා මම අහලම
නැහැ.[11] ඔහු තමයි ඉම්ලාහ්ගේ පුත්
මිකායා.”[12] මෙය ඇසූ යෙහෝෂපාට්
රජ, “එහෙම කියන්න එපා. අපි
ඔහුගෙනුත් අහලා බලමු”[13] කියා
පැවසීය.

**8** එහෙයින් ඊශ්‍රායෙල්හි රජ තම
මාලිගාවේ සේවය කළ නිලධාරියෙ-
කුව කැඳවා,[14] “වහාම ඉම්ලාහ්ගේ
පුත් මිකායාව මෙතැනට කැඳවාගෙන

**17 පරි.**
1 2ලේක 26:12
2 1රාජා 9:22
3 2ලේක 13:3; 2ලේක 14:8
4 විනි 5:2; විනි 5:9; ගීතා 110:3
5 උත් 49:27
6 2සාමු 1:21; 2ලේක 14:8
7 2ලේක 11:12; 2ලේක 11:23

**18 පරි.**
8 1සාමු 2:7; 2ලේක 17:5; හිතෝ 10:22
9 1රාජා 16:28; 1රාජා 16:33; 1රාජා 21:25; 2රාජා 8:18
10 2කොරි 6:14
11 1රාජා 22:2; 2ලේක 19:2
12 ගීතා 141:4
13 1රාජා 22:20; හිතෝ 27:6

**2 තීරුව**
1 ද්වි 4:43; 1ලේක 6:80
2 1රාජා 22:4
3 ගීතා 139:21; එෆී 5:11
4 2සාමු 2:1; 1රාජා 22:5; 2ලේක 34:26; හිතෝ 3:5
5 1රාජා 18:19
6 1රාජා 22:6
7 1රාජා 22:7; 2රාජා 3:11
8 1රාජා 22:8
9 1රාජා 18:4; 1රාජා 19:10
10 1රාජා 18:17; 1රාජා 21:20; ගීතා 34:21
11 හිතෝ 15:10; හිතෝ 27:5; යෙසා 30:10; යෙරෙ 38:4
12 1රාජා 22:8
13 හිතෝ 25:12; මීකා 2:7
14 1සාමු 8:15

එන්න"[1] කියා අණ කළේය. **9** ඒ
අවස්ථාවේදී ඊශ්‍රායෙල්හි රජද යූදාහි
රජු වූ යෙහෝෂාපාට්ද රාජකීය වස්ත්‍රව-
ලින් සැරසී,[2] සමාරියේ දොරටුව අසල
තිබූ කමතේ ඔවුන්ගේ සිංහාසන තබා
එහි හිඳගෙන සිටියෝය. අනාගතවක්-
තෘවරු සියලුදෙනා ඔවුන් ඉදිරියේ
අනාවැකි පළ කරමින් සිටියෝය.[3]
**10** එවිට කෙනානාගේ පුත් ශෙදකියා
යකඩ අං දෙකක් සාදාගෙන[4] මෙසේ
කීවේය. " 'ඔබ සිරියානුවන්ට මේ අංව-
ලින් ඇන ඔවුන්ව සම්පූර්ණයෙන්ම
නැති කර දමනවා'[5] කියා යෙහෝවා
දෙවි පැවසුවා."[6] **11** අන් සියලු අනා-
ගතවක්තෘවරුද ඒ දේම පවසමින්,
"රාමොත්-ගිලියද් නුවරට යන්න. ඔබ
ජය ගන්නවා නියතයි.[7] ඒ නුවර
අල්ලාගන්න යෙහෝවා දෙවි රජතු-
මාට උදව් කරන බව ස්ථිරයි"[8] කියා
පැවසූහ.

**12** මිකායාව කැඳවාගෙන ඒමට
ගිය පණිවිඩකරු මිකායාව හමු වී
මෙසේ කීවේය. "අනාගතවක්තෘවරුන්
සියලුදෙනාම කියන්නේ රජතුමා ජය
ගන්නා බවයි. ඔබත් ඔවුන් කියන
දේට සමාන දෙයක් කියා[9] රජතු-
මාව සතුටු කරන්න."[10] **13** නමුත්
මිකායා, "මගේ දෙවි මට කියන දෙය
මිස වෙන කිසිම දෙයක් කියන්න නම්
මට බැහැ.[11] මම ඒ ගැන ඔබට ජීව-
මාන දෙවි වන යෙහෝවාගේ නමින්ම
දිවුරා කියන්නම්"[12] යයි පැවසීය.
**14** පසුව මිකායා රජු ඉදිරියට පැමිණි
විට රජ මෙසේ ඇසුවේය. "මිකායා,
රාමොත්-ගිලියද් නුවරට ගිහින් අපි
යුද්ධ කරන්නද?" එවිට මිකායා රජුට
මෙසේ කීවේය. "යන්න, ඔබ ජය
ගන්නවා නියතයි. ඒ නුවර අල්-
ලාගන්න දෙවි ඔබට උපකාර කරයි."[13]
**15** නමුත් රජ, "යෙහෝවා දෙවි-
ගේ නාමයෙන් දිවුරා[14] මට ඇත්ත
කියන්න කියා මම ඔබට කී වතාවක්
කියා තිබෙනවාද"[15] කියා පැවසුවේය.
**16** එවිට මිකායා මෙසේ කීවේය.
"එඬේරෙක් නැති බැටළුවන් මෙන්
ඊශ්‍රායෙල්වරුන් කඳුකරයේ ඒ මේ
අත විසිරී සිටින ආකාරය මට පෙ-
නෙනවා.[1] ඒ ගැන යෙහෝවා දෙවි
මෙසේ පවසනවා. 'ඔවුන්ව බලාගැ-
නීමට ස්වාමිවරු නැත.[2] එහෙයින්
ඔවුන් එක් එක් කෙනාට තම තමන්-
ගේ නිවෙස්වලට සමාදානයෙන් යන්න
ඉඩ දෙන්න.' "[3]

**17** එවිට ඊශ්‍රායෙල්හි රජ, යෙහෝ-
ෂාපාට් රජුට මෙසේ කීවේය. " 'ඔහු මා
ගැන කිව්වොත් කියන්නේ නරක දෙ-
යක්. ඔහු මා ගැන හොඳ අනාවැකි-
යක් කියනවා මම කවදාවත් අහලම
නැහැ' කියලා මම ඔබට කිව්වේ
නැද්ද?"[4]

**18** නමුත් මිකායා මෙසේ කීවේය.
"යෙහෝවා දෙවි මට පණිවිඩයක්
දුන්නා. දැන් ඒ දේට සවන් දෙන්න.[5]
යෙහෝවා දෙවි තම සිංහාසනයේ
ඉඳගෙන සිටිනවා මම දැක්කා.[6]
ස්වර්ගයේ සේනාවන්[7] ඔහුගේ දකුණු
පැත්තෙන් හා වම් පැත්තෙන්
සිටිනවාත් මම දැක්කා.[8] **19** එවිට
යෙහෝවා දෙවි මෙසේ ඇසුවා. 'ඊශ්‍රා-
යෙල්හි රජු වන ආහබ්, රාමොත්-
ගිලියද් නගරයට ගොස් යුද්ධ කර
එහිදී මිය යන පිණිස එහි යෑමට
ඔහුව පොළඹවන්න ඉදිරිපත් වන්නේ
කවුද?' එවිට ඔහු ඉදිරියේ සිටි අය
නොයෙකුත් අදහස් ප්‍රකාශ කළා.[9]
**20** අන්තිමේදී එක දේවදූතයෙක්[10]
යෙහෝවා දෙවි ඉදිරියට ඇවිත්, 'මම
ඔහුව රවට්ටන්නම්' කියා පැවසුවා.
එවිට යෙහෝවා දෙවි, 'ඔබ කොහො-
මද ඒ දේ කරන්න යන්නේ'[11] කියා
ඔහුගෙන් ඇසුවා. **21** ඔහු මෙසේ
පැවසුවා. 'මම ගිහින් ඔහුගේ අනාග-
තවක්තෘවරුන් සියලුදෙනා මාර්ග-
යෙන් ඔහුව රවට්ටන්නම්.'[12] එවිට
දෙවි, 'හොඳයි, ඔබ ගිහින් ඔහුව
රවට්ටන්න.[13] ඔබේ වැයම සාර්ථක
වෙයි'[14] කියා පැවසුවා. **22** ඒ නිසයි
යෙහෝවා දෙවි දේවදූතයාට ඉඩ
දුන්නේ අනාගතවක්තෘවරුන් මාර්ග-
යෙන් ඔබට ඒ විදිහට දේවල් පව-
සන්න.[15] නමුත් ඇත්තටම යෙහෝවා

**18 පරි.**
1 1රාජා 22:9
2 ක්‍රියා 12:21
3 1රාජා 22:10
4 යෙරෙ 28:10
5 1රාජා 22:11 යෙරෙ 28:2 යෙරෙ 29:21
6 එස 13:6
7 යෙරෙ 23:25 මීකා 3:5 2පේත්‍ර 2:1
8 1රාජා 22:12
9 ගීතා 10:11 යෙසා 30:10 හොෂෙ 7:3
10 1රාජා 22:13
11 1රාජා 22:14 යෙරෙ 23:28 යෙරෙ 42:4 ක්‍රියා 20:27
12 ද්වි 32:40
13 1රාජා 22:15
14 1සාමු 14:24 මතෙ 26:63
15 1රාජා 22:16

**2 තීරුව**
1 ලෙවී 26:17 ගණන් 27:17 ද්වි 28:25 සෙක 10:2
2 යෙසා 63:11
3 1රාජා 22:17
4 2ලේක 18:7
5 යෙරෙ 2:4
6 යෙසා 6:1 එස 1:26 දානි 7:9 එළි 20:11
7 යෝබ් 1:6 දානි 7:10
8 1රාජා 22:19
9 1රාජා 22:20
10 ගීතා 104:4 හෙබ්‍රෙ 1:7
11 1රාජා 22:21
12 යෝබ් 12:16
13 1රාජා 22:22
14 ගීතා 33:10 2තෙස 2:11
15 යෙසා 19:14 එස 14:9

දෙවි තීරණය කර තිබෙන්නේ ඔබට
විපතක් ගෙනෙන්නයි."[1]
**23** එවිට කෙනානාගේ පුත්[2] ශෙද-
කියා[3] මිකායාට[4] කම්මුල් පහරක් දී[5]
මෙසේ කීවේය. "යෙහෝවා දෙවිගේ
දූතයා මා සමඟ කතා නොකර
ඔබට ඒ පණිවිඩය දුන්නා කියාද
ඔබ කියන්නේ?"[6] **24** මිකායා ඔහුට
මෙසේ කීවේය. "ළඟදීම මම මේ කියූ
දේ ඇත්තක් කියා ඔබ තේරුම්-
ගනියි.[7] නමුත් එදාට ඔබට සිදු
වෙන්නේ ඇතුල් කාමරයට ගොස්
සැඟවී සිටින්නයි."[8] **25** එවිට ඊශ්‍රා-
යෙල්හි රජ මෙසේ කීවේය. "මිකායාව
රැගෙන ගොස් නුවරේ ප්‍රධානියා වන
ආමොන්ට හා රජුගේ පුත් යෝවාෂ්ට
භාර දෙන්න.[9] **26** මම කියන මේ
දේ ඔබ ඔවුන්ට දැන්විය යුතුයි. 'මම
ජය ගෙන එන තෙක්[10] මොහුව සිර-
ගෙයි තබාගන්න.[11] වැඩිය කන්න
බොන්න දෙන්න එපා.' "[12] **27** එවිට
මිකායා මෙසේ කීවේය. "ඔබ මේ යුද්-
ධයෙන් ජය ගෙන ආවොත් යෙහෝවා
දෙවි මා සමඟ කතා කළේ නැහැ
කියා මම පිළිගන්නම්.[13] ජනයෙනි,
මා මේ දේවල් කියන්නේ ඔබ සියලු-
දෙනා ඉදිරිපිටයි."[14]

**28** පසුව ඊශ්‍රායෙල්හි රජද යූදාහි
රජු වූ යෙහෝෂාපාට්ද රාමෝත්-
ගිලියද් නුවර බලා පිටත් වූහ.[15]
**29** ඊශ්‍රායෙල්හි රජ, යෙහෝෂාපාට්
රජුට මෙසේ කීවේය. "මම වෙස්වලා
ගෙන යුද්ධ කරන්නම්.[16] නමුත් ඔබ
රාජකීය වස්ත්‍රයෙන් සැරසී[17] යුද්ධයට
යන්න." ඊශ්‍රායෙල්හි රජ එලෙස වෙස්-
වලා ගත් පසු ඔවුහු සියලුදෙනාම යුද්-
ධයට ගියෝය.[18] **30** ඒ අතරතුර
සිරියාවේ රජ තම අශ්ව රථ සේනා
පාලනය කළ අධිපතීන්ට මෙසේ අණ
කර තිබිණ. "ඔවුන්ගේ සේනාවල
සිටින ලොකු කුඩා කාගෙන්වත් මට
වැඩක් නැහැ. ඔබ ඊශ්‍රායෙල්හි රජුව
සොයාගෙන ඔහුට පහර දිය යුතුයි."[19]
**31** අශ්ව රථ සේනා පාලනය කළ
අධිපතීහු යෙහෝෂාපාට් රජුව දුටු
විට, "අර ඉන්නේ ඊශ්‍රායෙල්හි රජ"[20]

**18 පරි.**
1 ගණන් 23:19
1රාජා 22:23
එස 3:19
2 1රාජා 22:11
3 2ලේක 18:10
4 1රාජා 22:8
2ලේක 18:7
5 යෙරෙ 20:2
මාක් 14:65
ක්‍රියා 23:2
6 1රාජා 22:24
7 යෙසා 9:14
8 1රාජා 22:25
9 1රාජා 22:26
10 1රාජා 22:27
11 2ලේක 16:10
යෙරෙ 20:2
ක්‍රියා 5:18
12 ගීතා 80:5
13 ගණන් 16:29
ද්වි 18:22
14 1රාජා 22:28
15 යොෂු 20:8
2ලේක 18:2
16 1රාජා 14:5
1රාජා 20:38
17 1රාජා 22:10
18 1රාජා 22:30
19 1රාජා 22:31
හිතෝ 24:6
20 1රාජා 22:32

**2 තීරුව**
1 නික් 14:10
2ලේක 13:14
ගීතා 50:15
2 ගීතා 34:7
ගීතා 46:1
ගීතා 94:17
3 ගීතා 1:6
4 1රාජා 22:33
5 2රාජා 9:24
6 1රාජා 22:34
7 2ලේක 35:23
ගීතා 34:21
8 1රාජා 22:35
2ලේක 18:22

**19 පරි.**
9 2ලේක 18:31
2ලේක 18:32
10 1සාමු 9:9
11 2ලේක 16:7
12 1රාජා 16:1
13 1රාජා 21:25
14 1සාමු 2:30
ගීතා 21:8
ගීතා 68:1
15 ගීතා 139:21
හිතෝ 1:10
හිතෝ 9:8
16 2ලේක 32:25
ගීතා 90:7
ගීතා 141:5
17 1රාජා 14:13
2ලේක 17:4
18 2ලේක 17:6

කියා ඔවුන් අතරේ කියාගත්තෝය.
එහෙයින් ඔවුහු ඔහු සිටි දිශාවට
හැරී ඔහුට පහර දීමට සූදානම් වූහ.
මෙය දුටු යෙහෝෂාපාට් රජ උප-
කාරය ඉල්ලා කෑගැසුවේය.[1] එවිට
යෙහෝවා දෙවි ඔහුට උපකාර කර-
මින්[2] සතුරන්ව වෙනතකට යොමු
කළේය.[3] **32** ඔහු ඊශ්‍රායෙල්හි රජු
නොවන බව අශ්ව රථ සේනා පාල-
නය කළ අධිපතීන් දැනගත් විට
ඔවුහු තවදුරටත් ඔහු පසුපස ගියේ
නැත.[4]

**33** යුද්ධය පවතින අතරතුර ඊශ්‍රා-
යෙල්හි රජු පැළඳ සිටි ආයුධ කට්ට-
ලයේ තිබූ හිඩැසක් තුළින් ඊතලයක්
ඇවිත් ඔහුට වැදුණේය.[5] ඔහු ඊශ්‍රා-
යෙල්හි රජු බව ඒ ඊතලය විද්ද
තැනැත්තා දැන සිටියේ නැත. එවිට
රජ ඔහුගේ අශ්ව රථය පදවමින් සිටි
තැනැත්තාට මෙසේ කීවේය.[6] "මට
හොඳටම තුවාලයි.[7] මාව යුධ බිමෙන්
පිටතට ගෙන යන්න." **34** එදින
යුද්ධය තව තවත් උග්‍ර වූ නිසා ඊශ්‍රා-
යෙල්හි රජුව යුධ බිමෙන් ඉවතට
ගෙන යෑමට නොහැකි විය. තම සේ-
වකයන්ගේ උපකාර ඇතුව ඔහු සවස්
කාලය දක්වාම සිරියානු හමුදාව දෙ-
සට මුහුණ ලා අශ්ව රථයේ සිටගෙන
සිටියේය. හිරු බැස යන විටදී ඔහු
මිය ගියේය.[8]

**19** යූදාහි රජු වූ යෙහෝෂ-
පාට් යුද්ධයෙන් අනතුරක්
නොලබා[9] යෙරුසලමෙහි පිහිටි තම
මාලිගාවට හැරී ආවේය. **2** එවිට
අනාගතවක්තෘ[10] හනානිගේ[11] පුත්
යේහු,[12] යෙහෝෂාපාට් රජු ඉදිරියට
ගොස් ඔහුට මෙසේ පැවසීය. "දුෂ්ට-
යන්ට උපකාර කරන එක හරි දෙයක්
කියලා ඔබ සිතනවාද?[13] යෙහෝවා
දෙවිට ද්වේෂ කරන අයට[14] ඇලුම්
කරන එක සුදුසුද?[15] ඔබ කළ දේ
නිසා යෙහෝවා දෙවි ඔබ සමඟ උද-
හස් වී සිටිනවා.[16] **3** ඒ වුණත් ඔබ
යහපත් දේවලුත් කර තිබෙනවා.[17]
බොරු නමස්කාරය සඳහා ඉදි කළ
කුලුනු ඔබ දේශයෙන් ඉවත් කළා.[18]

ඒ වගේම සැබෑ දෙවිට ළං වී ඔහුගේ
මඟ පෙන්වීම පතන්න මුළු සිතින්ම
ඔබ අධිෂ්ඨාන කරගත්තා.”[1]

4 යෙහෝෂාපාට් රජ දිගටම යෙ-
රුසලමෙහි වාසය කළේය. ඉන්-
පසු ඔහු නැවතත් බෙයර්-ෂෙබා
සිට[2] එෆ්‍රායිම්හි කඳුකර ප්‍රදේශය
දක්වා[3] විසූ ජනතාව අතරට ගොස්
ඔවුන්ව යළි තම මුතුන්මිත්තන්-
ගේ දෙවි වන යෙහෝවා වෙතට
හරවාගැනීමට උත්සාහ දැරුවේය.[4]
5 එසේම ඔහු යූදා දේශයේ පිහිටි සෑම
සුරක්ෂිත නුවරකම විනිශ්චයකරු-
වන්ව පත් කළේය.[5] 6 ඒ විනිශ්ච-
යකරුවන්ට ඔහු මෙසේ උපදෙස්
දුන්නේය. “ඔබ කරන මේ කාර්යය
සැහැල්ලුවට ගන්න එපා.[6] මන්ද ඔබ
මේ දේ කරන්නේ යෙහෝවා දෙවි
වෙනුවෙනුයි.[7] ඒ නිසා ඔබ නඩු
විභාග කරද්දී දෙවි ඔබ සමඟ සිටියි.[8]
7 ඔබ තුළ[9] යෙහෝවා දෙවි කෙරෙහි
ගරුබියක් තිබිය යුතුයි.[10] මන්ද අපේ
දෙවි වන යෙහෝවා අධර්මිෂ්ඨකම්
නොකරන,[11] අල්ලස් නොගන්නා[12]
දෙවි කෙනෙකි. ඔහු සියලුදෙනාටම
සලකන්නේ එක හා සමානවයි.[13] ඒ
නිසා ඔබ සෑම කාරණයකදීම එය
මතක තබාගන්න.”[14]

8 යෙහෝෂාපාට් රජ ලෙවීවරුන්[15]
සහ පූජකයන්[16] කිහිපදෙනෙකුවද
ඊශ්‍රායෙල්හි මුතුන්මිත්තන්ගේ පෙළ-
පත්වල ප්‍රධානීන්[17] කිහිපදෙනෙකුවද
යෙරුසලමෙහි පදිංචි කරවා ඔවුන්ට
වගකීම් පැවරුවේය. ඔවුන්ගේ වග-
කීම් වූයේ යෙහෝවා දෙවිගේ නීතිය
ක්‍රියාත්මක කිරීම[18] හා යෙරුසලමෙහි
වැසියන්ගේ නඩු විභාග කිරීමය.[19]
9 ඔහු ඔවුන්ට මෙසේද අණ කළේය.
“ඔබ මෙම වගකීම් ඉටු කරද්දී ඔබට
යෙහෝවා දෙවි කෙරෙහි ගරුබියක්
තිබිය යුතුයි.[20] එමෙන්ම ඔබේ වග-
කීම් ඔබ විශ්වාසවන්තව ඉටු කළ
යුතුයි. ඔබ මේ සියල්ල කළ යුත්තේ
ඔබේ මුළු හදවතින්මයි. 10 ඔබේ
සහෝදරයන් අතින් යම් ලේ වැගිරී-
මක් සිදු වූ විට[21] හෝ යම් නීතියක්,[22]
ආඥාවක්,[1] පනතක්[2] හෝ කලින්
තීන්දු කළ දෙයක්[3] ඔවුන් විසින් කඩ
කළ විට එයට සම්බන්ධ නඩුව විභාග
කළ යුත්තේ ඔබයි. එවිට යෙහෝවා
දෙවිට විරුද්ධව නැවත වැරදි නොක-
රන ලෙස ඔබ ඔවුන්ට අනතුරු
ඇඟවිය යුතුයි. මන්ද එසේ නො-
කළොත් දෙවිගේ උදහස ඔබටත්
ඔබේ සහෝදරයන්ටත් විරුද්ධව ඇවි-
ළෙයි.[4] ඔවුන්ගේ වරද ඔබ පිට නො-
පැමිණෙන පිණිස ඔබ එලෙස ක්‍රියා
කළ යුතුයි. 11 යෙහෝවා දෙවිට
සම්බන්ධ කාරණාවලදී ඔබව අධීක්ෂ-
ණය කිරීමට නායක පූජක අමරියාව
මම පත් කරනවා.[5] රජුට සම්බන්ධ
කාරණාවලදී ඔබව අධීක්ෂණය කිරී-
මට පත් කරන්නේ ඉෂ්මායෙල්ගේ
පුත්‍රයෙකු වන යූදා ගෝත්‍රයේ ප්‍රධා-
නියා වන සෙබදියාවයි. ඔබ යටතේ
සේවය කරන නිලධාරීන් ලෙස මම
ලෙවීවරුන්ව පත් කර තිබෙනවා.
ඔබට මම පැවරූ මේ කාර්යය ඉටු
කරද්දී නිර්භීතව ක්‍රියා කරන්න.[6]
එවිට ඔබ කරන සෑම යහපත් දෙයක-
ටම[7] යෙහෝවා දෙවිගේ ආශීර්වාදය
ලැබෙන බව නිසැකයි.”[8]

**20** කල් යත්ම මෝවබ්වරුන්-
ගෙන්,[9] අම්මොන්වරුන්-
ගෙන්[10] සහ අම්මොනිවරුන්ගෙන්
සමහරෙක්[11] යෙහෝෂාපාට් රජුට
විරුද්ධව යුද්ධයට පැමිණියෝය.[12]
2 සෙනඟ යෙහෝෂාපාට් රජු ළඟට
පැමිණ මෙසේ පැවසූහ. “රජ්ජුරු-
වනි, ඔබට විරුද්ධව යුද්ධ කිරීමට
මුහුද* අවට ප්‍රදේශයෙන්ද ඒදොම්
දේශයෙන්ද[13] විශාල සේනාවක්
පැමිණ සිටිනවා. ඔවුන් දැන් සිටින්-
නේ හෂෂොන්-තාමාර් කියා හඳුන්-
වන ඒන්-ගෙදීවලයි.”[14] 3 එය අසා
බියට පත් වූ යෙහෝෂාපාට් රජ[15]
මහත් ඕනෑකමින් යුතුව යෙහෝවා
දෙවිගේ මඟ පෙන්වීම් පැතුවේය.[16]

**19 පරි.**
1 2ලේක 30:19 එස්රා 7:10
2 උත් 21:33 විනි 20:1
3 යොෂු 17:15 විනි 19:1
4 1සාමු 7:3 2ලේක 15:8
5 ද්වි 16:18
6 ක්‍රියා 5:35
7 ද්වි 1:17 ගීතා 82:1
8 ද්වි 1:16 යොහ 5:30 යොහ 8:16
9 නික් 18:21
10 නෙහෙ 5:15 යෝබ් 31:23 හිතෝ 1:7
11 උත් 18:25 ද්වි 32:4 රෝම 9:14
12 ද්වි 16:19 යෙසා 1:23 මීකා 7:3 තිත 1:7
13 ද්වි 10:17 ක්‍රියා 10:34 රෝම 2:11 එෆී 6:9 1පේතෘ 1:17
14 1තිමෝ 3:2
15 2ලේක 17:8
16 ද්වි 17:9 ද්වි 21:5
17 1ලේක 27:1
18 ද්වි 16:18 ද්වි 25:1
19 ද්වි 1:16
20 2සාමු 23:3
21 ද්වි 17:8
22 ද්වි 4:44

**2 තීරුව**
1 ද්වි 30:11 ගීතා 19:7
2 ද්වි 12:1
3 ද්වි 4:1 ගීතා 147:19
4 ගණන් 16:46
5 1ලේක 26:30 මලා 2:7
6 යොෂු 1:6
7 ගීතා 37:23 දේශ 2:26
8 2ලේක 15:2 ගීතා 18:24

**20 පරි.**
9 උත් 19:37 විනි 3:14 2සාමු 8:2 ගීතා 83:6
10 උත් 19:38
11 2ලේක 20:10
12 2ලේක 19:2
13 උත් 36:8 යොෂු 15:1

14 යොෂු 15:62; 2ලේක 20:16; 2ලේක 20:20; 15 උත් 32:7; 16 2ලේක 19:3.

2ලේක 20:2* එනම්, මළ මුහුද.

යූදා දේශයේ සියලුදෙනාම නිරාහා-
රව සිටිය යුතු බවට ප්‍රකාශයක්ද
ඔහු නිකුත් කළේය.[1] **4** එමෙන්ම ඒ
සම්බන්ධයෙන් යෙහෝවා දෙවිගේ
කැමැත්ත කුමක්ද කියා විමසා දැන-
ගැනීම සඳහා යූදාහි වැසියෝ එකට
රැස් වූහ.[2] එසේ යූදාහි සියලුම නුවර-
වලින් සෙනඟ පැමිණියේ යෙහෝවා
දෙවිගේ මඟ පෙන්වීම් ලබාගැනීමට
ඔවුන් තුළ තිබූ මහත් ඕනෑකම
නිසාය.[3]

**5** මෙසේ යෙහෝෂාපාට් රජද යූදා
හා යෙරුසලමෙහි වැසියෝද යෙ-
හෝවා දෙවිගේ ගෘහයේ[4] අලුතෙන්
ගොඩනැඟූ මළුවෙහි[5] රැස් වූවෝය.
රජ ඔවුන් මැද සිටගෙන **6** මෙසේ
පැවසීය.[6]

“ස්වර්ගයේ වාසය කරන යෙ-
හෝවා දෙවියනි,[7] අපේ මුතුන්මිත්-
තන්ගේ දෙවි ඔබයි.[8] සියලු
රාජ්‍යයන්ට වඩා උසස්ව සිටින්නෙත්
ඔබයි.[9] සියලු බලැති දෙවි වන
ඔබට විරුද්ධව නැඟී සිටින්න කාට
පුළුවන්ද?[10] **7** අපේ දෙවියනි,[11] ඔබ
ඔබේ සෙනඟ වන ඊශ්‍රායෙල්වරුන්
වෙනුවෙන් මේ දේශයේ කලින් ජීවත්
වූ අයව පන්නා දැමුවා.[12] ඉන්-
පසු ඔබට බොහෝ සෙයින් ආදරය
කළ ආබ්‍රහම්ටත්[13] ඔහුගෙන් පැව-
තෙන්නන්ටත් ඔබ මේ දේශය සදහ-
ටම ලබා දුන්නා.[14] **8** එහි පදිංචි වූ
ඔවුන් ඔබේ නාමය ගෞරවයට පත්
කිරීම සඳහා ශුද්ධස්ථානයක් ගො-
ඩනඟා[15] මෙසේ පැවසුවා. **9** ‘අප
යම් විපතකට මුහුණ දුන් විට[16]
හෝ අපට විරුද්ධව කඩුවක් ඔසවනු
ලැබූ විට හෝ අපට ඔබෙන් බරප-
තළ දඬුවමක් ලැබුණු විට එසේත්
නැත්නම් අප සාගතයකින්[17] හෝ
වසංගතයකින්[18] පීඩා විඳින විට අපි
ඔබ ඉදිරියට එනම්, ඔබේ නාමය
දරන[19] මේ ගෘහයට ඇවිත්[20] ඔබේ
උපකාරය පතා ඔබට කන්නලව්
කරන්නම්. එවිට අපේ කන්නලව්වට
සවන් දී අපව ගලවාගන්න කියා අපි
ඔබෙන් අයැද සිටිනවා.’[21] **10** දෙවි-
යනි, දැන් අපට සිදු වී තිබෙන දේ
බලන්න! අම්මොන්වරුන්,[1] මෝවබ්-
වරුන්[2] සහ සේයීර් කඳුකරයේ වැසි-
යන්[3] අපට විරුද්ධව යුද්ධ කරන්න
ඇවිත් සිටිනවා. අපේ මුතුන්මිත්තන්
ඊජිප්තුවෙන් පිට වී පැමිණි කාලයේදී
ඒ ජාතීන්ව ආක්‍රමණය කිරීමට ඔබ
ඔවුන්ට ඉඩ දුන්නේ නැහැ. ඒ නිසා
අපේ මුතුන්මිත්තන් ඔවුන්ව විනාශ
නොකර ඔවුන්ගේ දේශයෙන් ඉවත්ව
ගියා.[4] **11** නමුත් දැන් ඔවුන් අපට
කරන්න යන දේ බලන්න![5] ඔවුන්
උත්සාහ කරන්නේ අපට විරුද්ධව
යුද්ධ කර ඔබ අපට උරුමයක්
ලෙස ලබා දුන් මේ දේශයෙන් අපව
පන්නා දමන්නයි.[6] **12** අපේ දෙවි-
යනි, ඔබ අප වෙනුවෙන් යුක්තිය ඉටු
කරන්නේ නැද්ද?[7] අපට විරුද්ධව
පැමිණෙන මෙම විශාල සමූහයට
එරෙහිව සිටින්න අපිට කිසිම ශක්ති-
යක් නැහැ.[8] කළ යුත්තේ කුමක්ද
කියාවත් අප දන්නේ නැහැ.[9] ඒ නිසා
අප උපකාර පතා බලා සිටින්නේ ඔබ
දෙසයි.”[10]

**13** රජු ඒ සියලු දේ පවසද්දී යූදාහි
සියලුම වැසියෝ ඔවුන්ගේ භාර්-
යාවන්, දරුදැරියන් හා ළදරුවන්[11]
සමඟ යෙහෝවා දෙවි ඉදිරියෙහි සිට-
ගෙන සිටියෝය.[12]

**14** මෙම සමූහය අතරේ ආසාෆ්-
ගේ පුත්‍රයන්ගෙන් පැවත ආ[13] ලෙවී-
වරයෙකු වූ යහසියෙල්ද සිටියේය.
ඔහු සෙකරියාගේ පුත්‍රයාය. සෙක-
රියා බෙනායාගේ පුත්‍රයාය. බෙනායා
යෙයීයෙල්ගේ පුත්‍රයාය. යෙයීයෙල්
මත්තනියාගේ පුත්‍රයාය. ඒ අවස්-
ථාවේදී යහසියෙල් තුළ යෙහෝවා
දෙවිගේ බලය[14] ක්‍රියාත්මක වී
**15** ඔහු මෙසේ පැවසුවේය. “යෙහෝ-
ෂාපාට් රජ්ජුරුවනි, යූදා හා යෙරුසල-
මෙහි සියලු වැසියෙනි, මට සවන්
දෙන්න! යෙහෝවා දෙවි ඔබට මේ දේ
දන්වන්න කියා මට පැවසුවා. ‘මේ
විශාල සමූහයට භය වෙන්න කිසිම

14 ගණන් 11:25; 2ලේක 15:1; 2ලේක 24:20; 2පේතෘ 1:21.

**20 පරි.**
**1** විනි 20:26 යෝවේ 1:14 යෝවේ 2:12
**2** ද්වි 4:29 ගීතා 34:4
**3** 2සාමු 21:1
**4** 2ලේක 6:12 2ලේක 7:15
**5** 1රාජා 6:36 2ලේක 4:9
**6** පිලි 4:6
**7** ද්වි 4:39 යොෂු 2:11 1රාජා 8:23 මතෙ 6:9
**8** නික් 3:6
**9** 1ලේක 29:11 දානි 4:17
**10** 1ලේක 29:12 ගීතා 62:11 යෙසා 14:27 යෙසා 40:15 දානි 4:35
**11** උත් 17:7 නික් 6:7
**12** ගීතා 44:2
**13** යෙසා 41:8 යාකො 2:23
**14** උත් 12:7 නෙහෙ 9:8
**15** 2ලේක 2:4 2ලේක 6:10
**16** 1රාජා 8:33
**17** 2ලේක 6:28
**18** 1රාජා 8:37
**19** 2ලේක 6:20
**20** 2ලේක 6:29
**21** 1රාජා 8:34

**2 තීරුව**
**1** 2සාමු 8:12
**2** 2ලේක 20:1
**3** උත් 36:8 ගණන් 20:18
**4** ගණන් 20:17 ගණන් 20:21 ද්වි 2:5 ද්වි 2:9 ද්වි 2:19 විනි 11:15
**5** ගීතා 7:4 ගීතා 35:12
**6** විනි 11:23 ගීතා 83:4
**7** විනි 11:27 1සාමු 3:13 ගීතා 7:6
**8** 2ලේක 14:11
**9** 2රාජා 6:15 යෙරෙ 10:23
**10** ගීතා 25:15 ගීතා 62:1
**11** ද්වි 29:11
**12** එස්රා 10:1
**13** 1ලේක 15:19 1ලේක 25:1 2ලේක 35:15

හේතුවක් නැහැ.[1] මන්ද මේ සටන
ඔබේ සටනක් නොවෙයි. එය දෙවිගේ
සටනක්.[2] **16** හෙට ඔවුන්ට විරුද්-
ධව සටනට යන්න. ඔවුන් එන්නේ
ෂීෂ් නම් දුර්ගය ඔස්සේයි. ඔබට
ඔවුන්ව නිම්නය කෙළවරේ ඇති
යෙරූයෙල් නම් පාළුකරය ඉදිරි-
යේදී අනිවාර්යයෙන්ම මුණගැසෙයි.
**17** නමුත් එහිදී ඔබට සටන් කරන්න
අවශ්‍ය වෙන්නේ නැහැ.[3] ඔවුන් ඉදිරි-
යට ගොස් නිශ්චලව බලා සිටින්න.[4]
එවිට යෙහෝවා දෙවි ඔබව ගලවන
ආකාරය ඔබේ ඇස් දෙකෙන්ම දැක-
ගැනීමට ඔබට හැකි වෙයි.[5] යූදා හා
යෙරුසලමෙහි වැසියෙනි, කිසි දෙය-
කට භය වෙන්න එපා.[6] හෙට ඔවුන්ට
විරුද්ධව සටනට යන්න. යෙහෝවා
දෙවි ඔබ සමඟයි.’ ”[7]

**18** ඒ මොහොතේදීම යෙහෝෂ-
පාට් රජ නැමී හිස පහත් කළේය.[8]
යූදා හා යෙරුසලමෙහි සියලුම වැසි-
යෝද යෙහෝවා දෙවිට නමස්කාර
කරන පිණිස යෙහෝවා දෙවි ඉදිරි-
යේ වැඳ වැටුණෝය.[9] **19** ඉන්පසු
කෝහාත්ගෙන් පැවත ආ[10] ලෙවී-
වරු[11] සහ කෝරාගෙන් පැවත ආ[12]
ලෙවීවරු නැඟිට, ඊශ්‍රායෙල්හි දෙවි
වන යෙහෝවාට මහත් හඬකින්
ප්‍රශංසා කළෝය.[13]

**20** සෙනඟ හිමිදිරි උදෑසන නැඟිට
තෙකෝවා නම් පාළුකරයට[14]
ගියෝය.[15] ඔවුන් පිටත්ව යෑමට පෙර
යෙහෝෂපාට් රජ ඔවුන්ට මෙසේ
පැවසුවේය. “යූදා හා යෙරුසලමෙහි
වැසියෙනි! මට සවන් දෙන්න![16] ඔබේ
දෙවි වන යෙහෝවා කෙරෙහි විශ්වා-
සය තබන්න.[17] එවිට කිසි දෙයකට
නොසැලී, දිගටම ස්ථිරව සිටින්න
ඔබට හැකි වෙයි. දෙවිගේ අනාගත-
වක්තෘවරුන් පැවසූ දේ විශ්වාස කර[18]
ජය අත් කරගන්න.”

**21** ඔහු සෙනඟගෙන් අදහස් විමසූ
පසු[19] යෙහෝවා දෙවිට ප්‍රශංසා ගී
ගැයීම සඳහා ගායක කණ්ඩායමක්[20]
සූදානම් කළේය. එසේම ඔහු දෙවිට
ප්‍රශංසා කිරීම සඳහා[21] තවත් කණ්ඩා-
යමක් සූදානම් කර ඔවුන්ට විශේෂ
වස්ත්‍ර[1] පැළඳුවේය. ඔහු එම කණ්-
ඩායම් දෙකම හමුදාවට ඉදිරියෙන්
යැවීය.[2] ඔවුහු එසේ හමුදාවට ඉදිරි-
යෙන් ගමන් කරමින්, “යෙහෝවා දෙ-
විට ප්‍රශංසා කරන්න.[3] මන්ද ඔහුගේ
මහත් ප්‍රේමය* සදහටම පවතින්-
නේය”[4] කියා පැවසුවෝය.

**22** ඔවුන් ප්‍රශංසා ගී ගයමින්, ප්‍රීති
ඝෝෂා නගමින් ගමන් ඇරඹූ අවස්ථා-
වේදී යූදා දේශයට ඇතුල් වෙමින්
සිටි අම්මොන්වරුන්, මෝවබ්වරුන්
හා සේයිර් කඳුකරයේ වැසියන් එන
තෙක් මඟ රැක සිටීමට යෙහෝවා
දෙවි පුරුෂයන් පිරිසක් යැවීය.[5] මඟ
රැක සිටි ඔවුන්ව දුටු සතුරෝ කලබල
වී තමන්ගේම අයට පහර දුන්නෝය.[6]
**23** අම්මොන්වරු සහ මෝවබ්වරු
එකට එකතු වී තමන් සමඟ සේ-
යිර් කඳුකරයෙන් පැමිණි අයට පහර
දී[7] ඔවුන්ව සහමුලින්ම නැති කර
දැමුවෝය. මෙසේ සේයිර් වැසියන්ව
ඝාතනය කළායින් පසු අම්මොන්වරු
සහ මෝවබ්වරු එකිනෙකාට පහර
දෙමින් තමන්ගේම සෙබළුන්ව මරා
දැමූහ.[8]

**24** යූදාහි සේනාව පාළුකරයේ ඉදි
කර තිබූ මුරටැඹ අසලට
පැමිණ[9] තමන්ට විරුද්ධව පැමිණි
සේනාව දෙස බැලූ විට ඔවුන්ගේ
මළ කඳන් භූමිය පුරා වැටී තිබෙ-
නවා දුටුවෝය.[10] ඒ අයගෙන් කිසි-
වෙක් ජීවතුන් අතර සිටියේ නැත.
**25** යෙහෝෂපාට් රජ සහ ඔහුගේ
සෙනඟ මිය ගිය අය සතු දේවල්
රැගෙන යෑමට පැමිණි විට[11] ඔවුන්
සතුව බොහෝ වටිනා දේවල්ද වස්-
ත්‍රද භාණ්ඩද තිබුණු බව දුටුවෝය.
ඒවා ඔවුන්ට ගෙන යෑමට නොහැකි
තරම් විශාල ප්‍රමාණයකි.[12] එය කො-
තරම්ද කිවහොත් ඒවා එකතු කරගැ-
නීමට ඔවුන්ට දවස් තුනක් ගත විය.

**20 පරි.**
1 ද්වි 1:29; යොෂු 11:6; 2ලේක 32:7
2 2ලේක 32:8
3 නික් 14:14; නික් 14:25
4 යෙසා 30:15; විලා 3:26
5 නික් 14:13; නික් 15:2; 1සාමු 2:1; 1සාමු 11:13; 1ලේක 16:23
6 ද්වි 31:8; යොෂු 10:25
7 ගණන් 14:9; 2ලේක 15:2; ගීතා 46:7
8 උත් 24:26; නික් 4:31
9 යෝබ් 1:20; ගීතා 95:6
10 1ලේක 23:12
11 1ලේක 15:16
12 ගීතා 44:පෙර; ගීතා 49:පෙර
13 2ලේක 5:13; ගීතා 60:6; ගීතා 81:1
14 2සාමු 14:2; 1ලේක 4:5; 2ලේක 11:6; යෙරෙ 6:1
15 2ලේක 20:16
16 2ලේක 20:15
17 නික් 19:9; යෙසා 7:9; හෙබ්‍රෙ 11:6
18 නික් 14:31; 2ලේක 36:16
19 1ලේක 13:1; හිතෝ 11:14
20 1ලේක 15:16; 2ලේක 5:12; 2ලේක 9:11
21 2ලේක 29:25; එස්රා 3:10; නෙහෙ 12:27

**2 තීරුව**
1 1ලේක 16:29; ගීතා 29:2; ගීතා 96:9
2 යොෂු 6:9
3 ගීතා 106:1
4 නික් 34:6; විලා 3:22
5 විනි 7:22; 1සාමු 14:20
6 යෙසා 19:2
7 උත් 14:6; ද්වි 2:5
8 එස 38:21
9 2ලේක 20:16
10 නික් 14:30; 1ලේක 5:22; ගීතා 110:6; යෙසා 37:36
11 ගීතා 68:12

**12** නික් 12:35; 2රාජා 7:15; හිතෝ 13:22.

2ලේක **20:21*** හෝ, “ඇදි ප්‍රේමය.”

**26** හතරවන දවසේදී ඔවුහු තැනිත-
ලාවක රැස් වී යෙහෝවා දෙවිට
ප්‍රශංසා කළෝය.[1] එදින ඔවුහු එම
ස්ථානයට බෙරාකා තැනිතලාව යන
නම තැබූහ.[2] අද දක්වාම එම ස්ථා-
නය ඒ නමින් හඳුන්වනු ලැබේ.

**27** යූදා සහ යෙරුසලමෙහි සියලු
වැසියෝද ඔවුන්ට ඉදිරියෙන් ගිය යෙ-
හෝෂපාට් රජද මහත් ප්‍රීතියකින්
නැවත යෙරුසලමට පැමිණියෝය.
ඔවුන් එසේ ප්‍රීති වූයේ තම සතුරන්ව
පරදවා යෙහෝවා දෙවි ඔවුන්ට ජය
ලබා දුන් නිසාය.[3] **28** වීණා[4] හා
කුඩා වීණා[5] වාදනය කරමින්ද හො-
රණෑ පිඹිමින්ද[6] යෙරුසලමට පැමිණි
ඔවුහු යෙහෝවා දෙවිගේ ගෘහයට
ගියෝය.[7] **29** යෙහෝවා දෙවි ඊශ්‍රා-
යෙල්වරුන්ගේ සතුරන්ට විරුද්ධව
සටන් කළ බව අවට පිහිටි රාජ්‍යයන්
දැනගත් විට[8] ඔවුන් තුළ දෙවි ගැන
මහත් බියක් ඇති විය.[9] **30** මෙසේ
යෙහෝෂපාට් රජුගේ රාජ්‍යය පුරා
සාමකාමී වාතාවරණයක් පැවතිණ.
ඔහුගේ දෙවි දේශය පුරාම සාමය උදා
කර දුන්නේය.[10]

**31** යෙහෝෂපාට් රජ[11] යූදා දේශ-
යෙහි රජකම් කළේය. ඔහු රජකමට
පත් වන විට ඔහුගේ වයස අවුරුදු
තිස්පහකි. ඔහු යෙරුසලමේ අවුරුදු
විසිපහක් රජකම් කළේය. ඔහුගේ
මව ෂිල්හීගේ දියණිය වූ අෂූබාය.[12]
**32** ඔහු තම පියා වූ ආසාගේ අඩි-
පාරේ ගමන් කරමින්[13] යෙහෝවා
දෙවි යහපත්යයි සලකන දේ දිගටම
කළේය.[14] **33** නමුත් බොරු නමස්-
කාරය සඳහා වෙන් කර තිබූ පූජනීය
ස්ථාන[15] සමහරක් දේශයේ තිබු-
ණේය. සෙනඟද තම මුතුන්මිත්තන්-
ගේ දෙවිට ළං වී ඔහුගේ මඟ පෙන්වීම්
පැතීමට මුළු සිතින්ම අදිටන් කර-
ගෙන සිටියේ නැත.[16]

**34** යෙහෝෂපාට් රජුගේ ජීවිතයේ
අනිකුත් තොරතුරු හනානිගේ[17] පුත්
යේහු පැවසූ දේවල් සඳහන් ලේඛ-
නයෙහි වාර්තා කර ඇත.[18] එම
තොරතුරු ඊශ්‍රායෙල්හි රජවරුන්ගේ
ඉතිහාසය වාර්තා කර ඇති ලියවිල්-
ලෙහිද සඳහන් කර තිබේ.[1] **35** ඉන්-
පසු යූදාහි රජු වූ යෙහෝෂපාට් දුෂ්ට
ලෙස ක්‍රියා කළ[2] ඊශ්‍රායෙල්හි රජු
වූ අහසියා සමඟ මිත්‍රත්වයක් ඇති
කරගත්තේය.[3] **36** ඔහු තර්ෂිෂ් බලා
නැව් යාත්‍රා කරවීමේ අරමුණින් අහ-
සියා සමඟ එකතු වී නැව් සෑදී-
මට පටන්ගත්තේය.[4] ඔවුන් එම නැව්
තැනුවේ එෂියොන්-ගෙබෙර් නම් ස්ථා-
නයෙහිය.[5] **37** නමුත් මරේෂා නම්
නුවරේ වැසියෙකු වූ දෝදාවාහුගේ පුත්
එලියේසර්, යෙහෝෂපාට් රජුට අනා-
තුරු අඟවමින් මෙම අනාවැකිය පළ
කළේය. "ඔබ අහසියා සමඟ මිත්‍රක-
මක් ඇති කරගෙන තිබෙන නිසා[6] යෙ-
හෝවා දෙවි ඔබේ සියලුම සැලසුම්
අසාර්ථක කරන්නේය."[7] එලියේසර්
පැවසූ ලෙස ඒ නැව් සියල්ල මුහුදුබත්
විය.[8] එමනිසා තර්ෂිෂ් බලා නැව්
යැවීමට දැරූ උත්සාහය ඔවුහු අත්-
හැරියෝය.[9]

# 21
කල් යත්ම යෙහෝෂපාට් රජ
මිය ගියේය.[10] ඔහුව තම
මුතුන්මිත්තන් සමඟ දාවිත්ගේ නුව-
රෙහි තැන්පත් කරනු ලැබීය.[11] ඔහු-
ගෙන් පසුව ඔහුගේ පුත් යෙහෝරම්[12]
රජකමට පත් විය. **2** ඔහුට අෂරියා,
යෙහීයෙල්, සෙකරියා, අෂරියා, මිකා-
යෙල් සහ ෂෙපටියා යන නම්වලින්
සහෝදරයෝ සිටියෝය. මේ සියලු-
දෙනා ඊශ්‍රායෙල්හි* රජු වූ යෙහෝෂ-
පාට්ගේ පුත්‍රයෝය. **3** යෙහෝෂපාට්
රජ ඔවුන්ට රන්, රිදී හා වටිනා භාණ්ඩ
බොහොමයක්ද යූදා දේශයේ සුරක්-
ෂිත නුවරවල්ද[13] ත්‍යාග කළේය.[14]
නමුත් ඔහු රජකම ලබා දුන්නේ තම
කුලුඳුල්[15] පුත් යෙහෝරම්ටය.[16]

**4** තම පියාගෙන් පසු රජකම භාර-
ගත් යෙහෝරම් දේශය පුරා ඔහු-
ගේ බලය තහවුරු කරගත්තේය.
ඉන්පසු ඔහු ඔහුගේම සහෝදරයන්

**20 පරි.**
1 නික් 15:2
2සාමු 22:2
ගීතා 103:1
2 නික් 17:15
1සාමු 7:12
3 1සාමු 2:1
නෙහෙ 12:43
ගීතා 20:5
ගීතා 30:1
4 1ලේක 13:8
1ලේක 16:5
5 2සාමු 6:5
1රාජා 10:12
6 ගණන් 10:8
1ලේක 15:24
2ලේක 29:26
7 ගීතා 116:19
8 නික් 15:14
ද්වි 33:26
යොෂු 9:9
9 උත් 35:5
2ලේක 14:14
2ලේක 17:10
10 යොෂු 23:1
2සාමු 7:1
2ලේක 15:15
හිතෝ 16:7
11 1රාජා 22:41
12 1රාජා 22:42
13 1රාජා 15:11
14 2ලේක 17:3
ගීතා 18:21
15 1රාජා 15:14
1රාජා 22:43
2ලේක 17:6
16 1රාජා 18:21
2ලේක 12:14
2ලේක 19:3
17 2ලේක 16:7
18 1රාජා 16:1
2ලේක 19:2

**2 තීරුව**
1 2ලේක 16:11
2 2රාජා 1:2
2රාජා 1:16
2ලේක 19:2
3 1රාජා 22:49
1කොරි 15:33
4 1රාජා 10:22
1රාජා 22:48
5 ගණන් 33:35
ද්වි 2:8
1රාජා 9:26
6 හිතෝ 13:20
7 ගීතා 127:1
8 1රාජා 22:48
9 2ලේක 9:21

**21 පරි.**
10 1රාජා 22:50
11 2ලේක 32:33
12 2රාජා 8:16
13 2ලේක 11:23
හිතෝ 13:22
14 උත් 25:6
15 උත් 43:33
16 2රාජා 8:16

**2ලේක 21:2*** එනම්, යූදාහි. 2 ලේකම් පොතේ අවස්ථා කිහිපයකම, "යූදා" වෙනුවට, "ඊශ්‍රායෙල්" භාවිත කර තිබේ.

සියලුදෙනාවත්[1] ඊශ්‍රායෙල්හි අධිප-
තීන් කිහිපදෙනෙකුවත් කඩුවෙන්
මරා දැමුවේය. **5** යෙහෝරම් රජක-
මට පත් වන විට ඔහුගේ වයස අවු-
රුදු තිස්දෙකකි. ඔහු යෙරුසලමෙහි
සිට අවුරුදු අටක් පාලනය කළේය.[2]
**6** නමුත් ඔහු ආහබ්ගේ දියණියව
විවාහ කරගත් නිසා[3] ආහබ් රජුගේ
පවුලේ අය කළ ආකාරයටම යෙ-
හෝවා දෙවි පිළිකුල් කරන දේවල්
කළේය.[4] මෙසේ ඔහු ඊශ්‍රායෙල්හි රජ-
වරුන්ගේ ක්‍රියාකලාපය දිගටම අනු-
ගමනය කළේය.[5] **7** එහෙත් දෙවි
දාවිත් සමඟ ඇති කරගත් ගිවිසුම
නිසා[6] දාවිත්ගේ පෙළපත නැති කර
දැමීමට දෙවි කැමති වූයේ නැත.[7] එම
ගිවිසුමට අනුව දාවිත්ගෙන් පැව-
තෙන්නෙක් සදහටම එහි පාලනය
කරන බවට* දාවිත්ටත්[8] ඔහුගේ පුත්‍ර-
යන්ටත් යෙහෝවා දෙවි පොරොන්දු
වී තිබිණ.[9]

**8** යෙහෝරම් රජු පාලනය කළ
කාලයේදී ඔහු යටතේ සිටි ඒදොම්
වැසියෝ[10] ඔහුට විරුද්ධව කැරලි-
ගසා[11] ඔවුන්ව පාලනය කිරීමට වෙ-
නත් රජෙකුව පත් කරගත්තෝය.[12]
**9** එහෙයින් යෙහෝරම් රජ තම අධි-
පතීන්වද සියලු අශ්ව රථද
රැගෙන එම කැරැල්ල මර්දනය කිරී-
මට ගියේය. එවිට ඔහුවත් ඔහුගේ
අශ්ව රථ භාරව සිටි අධිපතීන්-
වත් වට කරගැනීමට ඒදොම්වරු
සමත් වූහ. නමුත් රාත්‍රියේදී ඔහුගේ
හමුදාව ඒදොම්වරුන්ට පහර දුන්-
නෝය. **10** යූදාහි රජුට විරුද්ධව
ඒදොම්වරුන් දියත් කළ කැරැල්ල
අද දක්වාම පවතී. ඒදොම්වරුන්
කැරලිගැසීමට පටන්ගත් කාලයේදීම
ලිබ්නා නුවරේ වැසියෝද[13] ඔහුට
විරුද්ධව කැරලිගැසීමට පටන්ගත්-
තෝය. මේ සෑම දෙයක්ම සිදු වූයේ
යෙහෝරම් රජ තම මුතුන්මිත්තන්-
ගේ දෙවි වන යෙහෝවාව අත්හැරිය
නිසාය.[1] **11** ඔහු බොරු නමස්කා-
රය සඳහා යූදා දේශයේ පිහිටි කඳුවල
පූජනීය ස්ථාන ඉදි කළේය.[2] එම-
නිසා යෙරුසලමෙහි වැසියෝ වෙනත්
දෙවිවරුන් අදහමින් පිළිකුල්සහගත
දේවල් කළෝය.[3] මෙසේ යූදා දේශ-
යෙහි වැසියෝ නොමඟ ගියෝය.[4]

**12** කල් යත්ම අනාගතවක්තෘ
එලියාගෙන්[5] ඔහුට ලියවිල්ලක්
ලැබිණ.[6] එහි මෙසේ සඳහන් විය.
"ඔබේ මුතුන්මිත්තා වූ දාවිත්ගේ දෙවි
වන යෙහෝවා මෙසේ පැවසුවේය.
'ඔබ ඔබේ පියා වූ යෙහෝෂාපාට් ක්‍රියා
කළ ආකාරයවත්[7] යූදාහි රජු වූ ආසා
ක්‍රියා කළ ආකාරයවත්[8] අනුගම-
නය නොකර **13** ඊශ්‍රායෙල්හි රජ-
වරුන් ජීවත් වූ ආකාරයට ජීවත්
වෙමින්,[9] යෙරුසලමේ හා යූදාහි වැසි-
යන්ව නොමඟ යවා ඇත. වෙනත්
දෙවිවරුන් අදහමින් පිළිකුල්සහගත
දේවල් කිරීමට[10] ජනයාව පෙලඹූ
ආහබ්ගේ පවුලේ අය මෙන් ඔබ ක්‍රියා
කළෙහිය.[11] එපමණක්ද නොව ඔබේ
පියාගේ පුත්‍රයන්වත් එනම්, ඔබට
වඩා යහපත් වූ ඔබේම සහෝදරයන්-
වත් ඔබ මරා දැමුවෙහිය.[12] **14** ඔබ
කළ ඒ සියලු දේ නිසා යෙහෝවා දෙවි
ඔබේ සෙනඟටත්[13] ඔබේ පුත්‍රයන්-
ටත්[14] ඔබේ භාර්යාවන්ටත් විරුද්ධව
ක්‍රියා කරන්නේය.[15] ඔබ සතු වස්තු-
වත් දෙවි විනාශ කර දමන්නේය.
**15** ඔබ බොහෝ සෙයින් රෝගාතුර
වන්නේය.[16] ඔබේ බඩවැලේ දරුණු
රෝගයක් හටගන්නේය. එම රෝගය
නිසා ඔබේ බඩවැල පිටතට එන
අතර දිනෙන් දින එය දරුණු වන්-
නේය.' "[17]

**16** පසුව යෙහෝවා දෙවි යෙහෝ-
රම් රජුට විරුද්ධව යුද්ධ කිරීමට
පිලිස්තිවරුන්ව[18] හා ඉතියෝපි-
යානු ජාතිකයන්[19] අසල ජීවත් වූ
අරාබි ජාතිකයන්ව[20] පෙලඹුවේය.[21]
**17** එහෙයින් ඔවුහු යූදා දේශය ආක්‍ර-
මණය කර, රජමාලිගාවේ ගබඩා කර
තිබූ සියලු වස්තූද[22] රජුගේ පුත්‍රයන්-
වද ඔහුගේ භාර්යාවන්වද[23] පැහැර-

**21 පරි.**
1 උත් 4:8 විනි 9:5
2 2රාජා 8:17
3 2රාජා 8:18 2ලේක 22:2 නෙහෙ 13:26
4 1සාමු 2:30 1රාජා 16:25 2ලේක 29:6
5 1රාජා 14:9 හොෂෙ 4:1
6 2සාමු 23:5 ගීතා 89:28 යෙරෙ 33:21
7 2සාමු 7:16
8 2සාමු 7:12
9 1රාජා 11:36 2රාජා 8:19 ගීතා 132:11
10 උත් 27:40
11 2රාජා 8:20
12 1රාජා 22:47
13 යොෂු 21:13 2රාජා 19:8

**2 තීරුව**
1 නික් 3:6 ද්වි 32:21 1රාජා 11:33 2ලේක 15:2 යෙරෙ 2:13
2 ද්වි 12:2
3 2රාජා 21:11 එළි 2:20
4 ද්වි 4:27
5 2රාජා 2:1 2රාජා 2:11
6 යොහ 3:13
7 2ලේක 17:3
8 1රාජා 15:11 2ලේක 14:5
9 1රාජා 16:25 1රාජා 16:33
10 නික් 34:15 යෙරෙ 3:8
11 2රාජා 9:22 2ලේක 21:11
12 නික් 20:13 2ලේක 21:4
13 ලෙවී 26:21 හොෂෙ 5:11 මීකා 6:16
14 නික් 20:5
15 ද්වි 28:22
16 ද්වි 28:61 ක්‍රියා 12:23
17 ද්වි 28:21
18 යොෂු 13:2 2සාමු 8:1
19 2රාජා 19:9 2ලේක 12:3 2ලේක 14:12
20 2ලේක 9:14 2ලේක 17:11
21 1රාජා 11:14 2ලේක 33:11 එස්රා 1:1 යෙසා 10:5
22 1රාජා 14:26
23 1සාමු 30:3

**2ලේක 21:7*** මූ.අ., "පහනක් මා ඉදිරියේ දිගටම තිබෙන බවට."

ගෙන ගියෝය. රජුට ඉතුරු වූයේ
ඔහුගේ බාලම පුත්‍රයා වන යෙහෝය-
හාෂ් පමණි.[1] **18** මේ සියල්ල සිදු වූ
පසු ඔහුගේ බඩවැලේ රෝගය හටගැ-
නීමට යෙහෝවා දෙවි සැලැස්වීය.
එම රෝගය සුව කළ නොහැකි විය.[2]
**19** අවුරුදු දෙකක් ගත වූ පසු ඔහුගේ
රෝගය නව නවත් දරුණු අතට හැරී
ඔහුගේ බඩවැල්[3] පිටතට ආවේය.
කල් යත්ම එම රෝගය නිසා ඔහු
බොහෝ වේදනා විඳ මිය ගියේය.
සෙනඟ ඔහුගේ මුතුන්මිත්තන් වෙ-
නුවෙන් කළාක් මෙන් ඔහු වෙනු-
වෙන් සුවඳ ද්‍රව්‍ය දවා දැමුවේ නැත.[4]
**20** ඔහු රජකමට පත් වන විට ඔහුගේ
වයස අවුරුදු තිස්දෙකකි. ඔහු යෙ-
රුසලමෙහි අවුරුදු අටක් රජකම්
කළේය. ඔහුගේ මරණය ගැන කිසි-
වෙකුට දුකක් ඇති නොවීය.[5] ඔහුව
දාවිත්ගේ නුවරේ තැන්පත් කළත්[6]
රජවරුන් තැන්පත් කරන ස්ථානයේ
තැන්පත් කළේ නැත.[7]

**22** පසුව යෙරුසලමෙහි වැසි-
යෝ ඔහුගේ බාලම පුත් අහ-
සියාව*[8] රජු ලෙස පත් කළෝය.
(එයට හේතුව මීට පෙර අරාබි
ජාතිකයන්[9] සමඟ පැමිණි කොල්ල-
කරුවන් ඔහුගේ සියලුම වැඩිමල්
පුත්‍රයන්ව මරා දැමීමය.)[10] මෙසේ යෙ-
හෝරම් රජුගේ පුත් අහසියා යූදාහි
රජු ලෙස රජකම් කිරීමට පටන්-
ගත්තේය. **2** අහසියා රජකමට පත්
වන විට ඔහුගේ වයස අවුරුදු විසි-
දෙකකි.[11] ඔහු යෙරුසලමේ සිට අවු-
රුද්දක් පාලනය කළේය. ඔහුගේ
මවගේ නම අතලියාය.[12] ඇය ඔම්රී-
ගේ මිනිපිරියකි.[13]

**3** අහසියා රජද ආහබ්ගේ පවුලේ
අය මෙන් දුෂ්ට දේවල් කළේය.[14] ඒ
දේවල් කිරීමට ඔහුව දිරිගැන්වූයේ
ඔහුගේ මවය.[15] **4** ඔහුගේ පියාගේ
මරණයෙන් පසු ආහබ් රජුගේ පෙළප-
තෙන් පැමිණි අය ඔහුගේ උපදේශක-

**2ලේක 22:1*** 2ලේක 21:17හි සඳහන් වන්නේ, “යෙහෝයහාෂ්” ලෙසය.

**21 පරි.**
1 2ලේක 22:6
2ලේක 25:23
2 ද්වි 28:59
2ලේක 21:15
දේශ 3:17
ක්‍රියා 12:23
3 2සාමු 20:10
4 2ලේක 16:14
යෙරෙ 34:5
5 හිතෝ 10:7
හිතෝ 11:10
හිතෝ 29:2
දේශ 8:10
යෙරෙ 22:18
6 1රාජා 2:10
7 2ලේක 24:25
2ලේක 28:27

**22 පරි.**
8 2රාජා 8:24
1ලේක 3:11
9 2ලේක 21:16
10 2ලේක 21:17
11 2රාජා 8:26
12 2රාජා 11:1
2රාජා 11:13
13 1රාජා 16:28
14 1රාජා 16:33
2රාජා 8:27
මීකා 6:16
15 2ලේක 22:12
2ලේක 24:7

**2 තීරුව**
1 2ලේක 24:18
හිතෝ 1:10
හිතෝ 12:5
හිතෝ 13:20
2 ගීතා 1:1
3 2රාජා 8:25
4 2රාජා 8:15
2රාජා 10:32
5 1රාජා 22:3
2ලේක 18:14
6 2රාජා 8:28
7 2රාජා 8:29
8 යොෂු 19:18
2සාමු 4:4
2රාජා 9:15
9 1රාජා 22:34
10 2රාජා 3:1
11 2රාජා 8:16
12 2රාජා 9:16
2ලේක 22:1
13 1සාමු 2:6
14 ද්වි 32:35
විනි 14:4
2ලේක 10:15
ගීතා 9:16
ආමො 3:6
15 2රාජා 9:14
16 2රාජා 9:6
17 2රාජා 9:7
18 1රාජා 19:16
2රාජා 9:20
19 2රාජා 9:21
20 2රාජා 10:10
2රාජා 10:11
21 2රාජා 10:13

යන් ලෙස කටයුතු කළ නිසා ඔහු
යෙහෝවා දෙවි පිළිකුල් කළ දේවල්
කළේය.[1] ඒ නිසා භයානක ප්‍රති-
ඵලවලට මුහුණ දීමට ඔහුට සිදු
විය. **5** ඔහු අනුගමනය කළේ ඔවුන්
ලබා දුන් උපදෙස්ය.[2] එහෙයින් ඔහු
ආහබ්ගේ පුත්‍රයෙකු වූ ඊශ්‍රායෙල්හි රජු
වන යෙහෝරම් සමඟ[3] සිරියාවේ රජු
වූ හසායෙල්ට[4] විරුද්ධව යුද්ධ කිරී-
මට රාමොත්-ගිලියද් නුවරට[5] ගියේය.
නමුත් යුද්ධය අතරතුර යෙහෝරම් රජ
සතුරන්ගේ ඊතල පහරට ලක් විය.[6]
**6** සිරියාවේ රජු වූ හසායෙල්ට විරුද්-
ධව රාමා නුවරෙහි[7] කළ යුද්ධයේදී
එසේ තුවාල ලැබූ යෙහෝරම් රජ තම
තුවාල සුව කරගැනීමට යෙෂ්‍රෙයෙල්
නුවරට නැවත පැමිණියේය.[8]

තුවාල ලබා අසනීපයෙන් සිටි[9]
ආහබ්ගේ පුත් යෙහෝරම්ව[10] බැලී-
මට යූදාහි රජු වූ යෙහෝරම්ගේ
පුත්[11] අෂරියාද*[12] යෙෂ්‍රෙයෙල් නුව-
රට ගියේය. **7** දෙවි මෙම අවස්ථාව
අහසියාව විනාශ කර දැමීමට[13] යො-
දාගත්තේය.[14] මන්ද යෙහෝවා දෙවි
නිම්ෂිගේ මුනුපුරා වූ[15] යේහුව අභි-
ෂේක කර තිබුණේ[16] ආහබ්ගේ පෙළ-
පත සම්පූර්ණයෙන්ම විනාශ කර
දැමීමටය.[17] ඒ අවස්ථාවේදී අහසියා
රජ, යෙහෝරාම් රජු සමඟ යේ-
හුව[18] හමු වීමට ගියේය.[19] **8** දෙවි-
ගේ විනිශ්චය ක්‍රියාත්මක කරමින්
ආහබ්ගේ පෙළපත විනාශ කිරීමට
පියවර ගත් යේහු,[20] ඔවුන් අතර
යූදා රාජ්‍යයේ අධිපතීන්ද අහසියාගේ
සහෝදරයන්ගේ පුත්‍රයන්ද[21] අහසියා-
ගේ සේවකයන්ද සිටිනවා දැක ඔවුන්-
වද මරා දැමුවේය.[22] **9** ඉන්පසු පලා
ගිය අහසියා රජුව සෙවීමට යේහු පිය-
වර ගත්තේය. සමාරියේ සැඟවී සිටි[23]
අහසියා රජුව අල්ලාගෙන[24] යේහු ඉදි-
රියට ගෙනෙන ලදි. ඔවුහු අහසියා
රජුව මරා දැමුවෝය. නමුත්, “මොහු,

**22** 2රාජා 10:14; **23** 2රාජා 10:17; **24** 2රාජා 9:27.

**2ලේක 22:6*** 1, 2, 7-11 යන පදවල සඳහන් වන්නේ, “අහසියා” ලෙසය.

මුළු හදවතින්ම යෙහෝවා දෙවිගේ
මඟ පෙන්වීම් පැතූ[1] යෙහෝෂාපාට්
රජුගේ මුනුපුරෙක්"[2] කියා පවසමින්
ඔවුහු ඔහුව භූමදානය කළෝය.[3] අහ-
සියා රජුට පසු රජකම භාරගැනීමට
ඔහුගේ පෙළපතේ කිසිවෙක් නොසිටි-
යේය.

**10** තම පුත්‍රයා වූ අහසියා මිය ගිය
බව අතලියා[4] දැනගත් විට යූදාහි
රාජකීය පෙළපතට අයත් සියලුදෙ-
නාවම මරා දැමුවාය.[5] **11** නමුත්
ඊට කලින් යෙහෝරම් රජුගේ දිය-
ණියද අහසියා රජුගේ සහෝදරියද
වූ යෙහෝෂබියත්,[6] මරණයට නියම
වූ රජුගේ පුත්‍රයන් සිටි ස්ථානයට
ගොස් අහසියාගේ පුත් යෙහෝයාෂ්ව[7]
එතැනින් රැගෙන ගියාය. ඇය දරු-
වාවත් ඔහුගේ කිරි මවවත් අතලි-
යාට සොයාගැනීමට බැරි වන ලෙස
යහන් සහිත ඇතුල් කාමරයකට
ගෙන ගියාය. මෙසේ යෙහෝරම් රජු-
ගේ දියණිය[8] හා පූජක යෙහෝයාදා-
ගේ බිරිඳ වූ[9] යෙහෝෂබියත් දරුවාව
සඟවා තැබුවාය. ඒ නිසා දරුවාව
මරා දැමීමට අතලියාට නොහැකි
විය.[10] **12** දරුවා වසර හයක් පුරා
ඔවුන් සමඟ සැබෑ දෙවිගේ ගෘහයේ
සැඟවී ඇතිදැඩි වූයේය.[11] ඒ කාලයේදී
දේශයේ රැජින ලෙස පාලනය කළේ
අතලියාය.[12]

**23** හත්වන අවුරුද්දේදී යෙහෝ-
යාදා[13] නිර්භීතව ක්‍රියා කර-
මින්, සියයකින් යුත් කණ්ඩායම්වල
ප්‍රධානීන්[14] වන යෙරොහාම්ගේ පුත්
අෂරියාද යෙහෝහානන්ගේ පුත් ඉෂ්-
මායෙල්ද ඕබෙද්ගේ පුත් අෂරියාද
අදායාගේ පුත් මයසේයාද ෂික්රීගේ
පුත් එලිෂාපාට්ද සමඟ ගිවිසුමක් ඇති
කරගත්තේය. **2** ඔවුහු යූදා දේශය
පුරාම ගමන් කර සියලුම නුවරවලින්
ලෙවීවරුන්වද[15] ඊශ්‍රායෙල්හි මුතුන්-
මිත්තන්ගේ පෙළපත්වල[16] ප්‍රධානීන්-
වද[17] එකතු කරගෙන යෙරුසලමට
පැමිණියෝය. **3** එසේ එක් රැස් වූ
සියලුදෙනා සැබෑ දෙවිගේ ගෘහයේදී[18]
රජුගේ පුත්‍රයා සමඟ ගිවිසුමක් ඇති
කරගත්තෝය.[1] ඉන්පසු යෙහෝයාදා
රැස්ව සිටි සියලුදෙනාට මෙසේ පැව-
සුවේය.

"යෙහෝවා දෙවි දාවිත්ගේ පුත්‍රයන්
ගැන පැවසූ දේ ඔබට මතක ඇති.[2]
එමනිසා රජුගේ පුත්‍රයාව[3] අපි අනි-
වාර්යයෙන්ම රජකමට පත් කළ
යුතුයි.[4] **4** ඒ වෙනුවෙන් ඔබ සියලු-
දෙනාම කළ යුත්තේ මෙයයි. සබත්
දවසේදී දෙවිගේ ගෘහයට පැමිණෙන
පූජකයන්ව[5] හා ලෙවීවරුන්ව[6] කණ්-
ඩායම් තුනකට බෙදිය යුතුයි.[7] ඉන්
එක් කණ්ඩායමක් දොරටු පාලක-
යන් ලෙස කටයුතු කළ යුතුයි.[8]
**5** තවත් කණ්ඩායමක් රජමාලිගා-
වේත්[9] ඉතුරු කණ්ඩායම යෙසොද්*
දොරටුව අසලත්[10] සිටිය යුතුයි.
අන් සියලුදෙනා සිටිය යුත්තේ යෙ-
හෝවා දෙවිගේ ගෘහයේ මළුවලයි.[11]
**6** යෙහෝවා දෙවිගේ ගෘහයේ සේවය
කරන පූජකයන් හා ලෙවීවරුන්[12]
ශුද්ධ සෙනඟක්.[13] එමනිසා ඔවුන්ට
මිස වෙන කිසි කෙනෙකුට ගෘහයට
ඇතුල් වෙන්න ඉඩ දෙන්න එපා.[14]
අනිකුත් අය ගෘහයෙන් පිටත සිට
යෙහෝවා දෙවි පවරා ඇති වග-
කීම් ඉටු කළ යුතුයි. **7** ලෙවීවරුන්
තම ආයුධ අතැතිව රජු වටා සිටිය
යුතුයි.[15] යම් කෙනෙක් දෙවිගේ ගෘහ-
යට ඇතුල් වුණොත් ඔහුව මරා දැමිය
යුතුයි. රජු යන එන හැම තැනකම
ඔහු සමඟ යා යුතුයි."

**8** ලෙවීවරු සහ යූදා දේශයෙන්
පැමිණි ඒ සියලුදෙනා පූජක යෙහෝ-
යාදා[16] අණ කළ සියල්ල[17] එලෙසම
කළෝය. එහෙයින් සබත් දවසේදී
සේවය සඳහා පැමිණි අයවත් සබත්
දවසේදී සේවයෙන් නිදහස් වූ අය-
වත් එක් රැස් කරන ලදි.[18] මන්ද
පූජක යෙහෝයාදා ලෙවීවරුන්ගෙන්
කිසි කණ්ඩායමක්[19] එදින සේව-
යෙන් නිදහස් නොකළේය. **9** පූජක

**22 පරි.**
1 2ලේක 17:4
2 2ලේක 17:3
හිතෝ 10:7
3 2රාජා 9:28
4 2ලේක 22:2
5 2රාජා 11:1
6 2රාජා 11:2
7 2රාජා 11:21
8 2රාජා 8:16
9 2ලේක 23:1
10 2සාමු 7:13
1රාජා 15:4
2ලේක 21:7
ගීතා 33:10
11 2රාජා 11:3
12 ද්වි 17:15
ගීතා 12:8
හිතෝ 29:2
යෙරෙ 12:1

**23 පරි.**
13 2රාජා 11:4
14 නික් 18:25
15 ද්වි 33:8
2ලේක 8:14
16 1ලේක 23:11
17 1ලේක 15:12
18 1රාජා 7:51

**2 තීරුව**
1 2සාමු 5:3
2රාජා 11:17
2 2සාමු 7:12
1රාජා 2:4
1රාජා 9:5
2ලේක 6:16
2ලේක 7:18
2ලේක 21:7
ගීතා 89:29
3 2රාජා 11:4
4 2රාජා 11:12
5 1ලේක 24:3
6 1ලේක 23:3
7 1ලේක 9:25
ලූක් 1:8
8 1ලේක 26:1
9 1රාජා 7:1
10 2රාජා 11:6
11 1රාජා 7:12
12 1ලේක 23:28
13 1ලේක 23:32
14 2රාජා 11:7
15 2රාජා 11:8
16 2රාජා 11:4
2ලේක 23:1
17 දේශ 9:17
18 2රාජා 11:9
19 1ලේක 24:1
1ලේක 25:1
1ලේක 26:1

**2ලේක 23:5*** හෙබ්‍රෙව් වචනයක්. තේරුම, "අත්-නිවාරම."

යෙහෝයාදා සැබෑ දෙවිගේ ගෘහ-
යේ තිබූ[1] දාවිත් රජුගේ[2] සියලු
හෙල්ලද පලිස්ද[3] ගෙන ඒවා සිය-
යකින් යුත් කණ්ඩායම්වල ප්‍රධා-
නීන්ට[4] දුන්නේය. **10** පසුව ඔහු
ආයුධ අතැතිව සිටි සියලුදෙනාවම
දේවමාලිගාවේ දකුණු පැත්තේ සිට
වම් පැත්ත දක්වා රඳවා තැබුවේය.[5]
ඒ සියලුදෙනා පූජාසනයත් දේවමාලි-
ගාවත් අසල සිටි රජු වටා සිටගෙන
සිටියෝය. **11** එවිට ඔවුන් රජුගේ
පුත්‍රයාව පිටතට ගෙනැවිත්[6] ඔහුට
ඔටුන්න පළඳවා[7] ඔහුගේ හිසට ඉහ-
ළින් නීතිය සඳහන් ලියවිල්ල[8] අල්-
ලන ලදි. මෙසේ යෙහෝයාදා සහ
ඔහුගේ පුත්‍රයන් ඔහුව රජු ලෙස අභි-
ෂේක කරමින්,[9] “රජතුමා දිගු කල්
ජීවත් වේවා”[10] යයි කීවෝය.

**12** රජුට ප්‍රශංසා කරමින් ඒ මේ
අත දිව ගිය සෙනඟගේ ඝෝෂාව
අතලියාට ඇසුණු විට[11] ඇය විගස
යෙහෝවා දෙවිගේ ගෘහයේ රැස්ව
සිටි සෙනඟ වෙතට පැමිණියාය.
**13** එවිට රජු ශුද්ධස්ථානයට ඇතුල්
වන ශාලාව ඉදිරිපිට තිබෙන කුලු-
නක් ළඟ සිටගෙන[12] සිටින
ආකාරයත් අධිපතීන්[13] සහ හො-
රණෑ පිඹින්නන්[14] රජුව වට කරගෙන
සිටින ආකාරයත් ඇය දුටුවාය. රැස්ව
සිටි දේශයේ සියලු ජනයා හොරණෑ
හඬ මැද[15] ප්‍රීති වෙමින් සිටියෝය.[16]
සංගීත භාණ්ඩ වාදනය කරමින් ගී
ගැයූ අයද[17] ප්‍රශංසා ගී ගැයීමේ මූලි-
කත්වය දැරූ අයද ඔවුන් සමඟ සිටි-
යෝය. එය දුටු අතලියා තම වස්ත්‍ර
ඉරාගනිමින්, “මෙය මහා කුමන්ත්‍රණ-
යක්! මහා කුමන්ත්‍රණයක්”[18] කියා
කෑගැසුවාය. **14** එවිට පූජක යෙ-
හෝයාදා හමුදාවේ සෙන්පතීන් වූ
සියයකින් යුත් කණ්ඩායම්වල ප්‍රධා-
නීන්ව කැඳවා, “මුරකාවල් මැදට
ඇවිත් සිටින ඇයව පිටතට රැගෙන
යන්න.[19] ඇයව බේරාගන්න යමෙක්
ආවොත් ඔහුට කඩුවෙන් පහර දී මරා
දමන්න” කියා පැවසුවේය. ඔහු එසේ
පැවසුවේ, “යෙහෝවා දෙවිගේ ගෘහ-
යේදී ඇයව මරන්න එපා” කියා
ඔහු කලින් අණ කර තිබූ නිසාය.
**15** ඔවුහු ඇයව අල්ලාගෙන රජමාලි-
ගාවේ අශ්ව දොරටුව අසලට ගෙන
ගොස් ඇයව මරා දැමුවෝය.[1]

**16** පසුව යෙහෝයාදා, තමන් සහ
රජු අතරද සෙනඟ අතරද ගිවිසු-
මක් ඇති කරගත්තේය. එම ගිවිසු-
මට අනුව සැමදා යෙහෝවා දෙවිට
විශ්වාසවන්තව සිටීමට ඔවුහු පො-
රොන්දු වූහ.[2] **17** ඉන්පසු සෙනඟ
බාල්ගේ දේවාලයට ගොස් එය කඩා
දැමුවෝය.[3] එහි තිබූ පූජාසන කඩා
දැමූ[4] ඔවුහු බාල් රූප සියල්ලද සුනුවි-
සුනු කළෝය.[5] බාල්ගේ පූජකයා වූ
මත්තාන්වද[6] ඒ පූජාසන ඉදිරිපිටම
මරා දැමුවෝය.[7] **18** ඉන්පසු යෙ-
හෝයාදා, යෙහෝවා දෙවිගේ ගෘහය
අධීක්ෂණය කිරීමට පූජකයන්ව හා
ලෙවීවරුන්ව පත් කළේය. මීට කලින්
දාවිත් රජ ඔවුන්ව කණ්ඩායම් ලෙස
බෙදා සංවිධානය කර තිබිණ.[8] මෝ-
සෙස්ට දුන් නීතියේ සඳහන් වී තිබූ
ආකාරයට යෙහෝවා දෙවිගේ ගෘහ-
යේ දවන පූජා ඔප්පු කිරීම ඔවුන්ගේ
වගකීම විය.[9] දාවිත් රජු විසින් රචනා
කළ ගී ගයමින් ප්‍රීතියෙන් යෙහෝවා
දෙවිට පූජා ඔප්පු කිරීම ඔවුන්ගේ ඒ
වගකීමට ඇතුළත් විය. **19** යෙ-
හෝවා දෙවිගේ ගෘහයට කිසි අපවිත්‍ර
කෙනෙකු ඇතුල් නොවන පිණිස එහි
දොරටු අසල[10] දොරටු පාලකයන්-
වද ඔහු රඳවා තැබුවේය.[11] **20** ඔහු
සියයකින් යුත් කණ්ඩායම්වල ප්‍රධා-
නීන්ව,[12] අධිපතීන්ව, පාලකයන්ව
හා දේශයේ වැසියන්ව රැස් කරගත්
පසු රජුව යෙහෝවා දෙවිගේ ගෘහ-
යෙන් පිටතට ගෙනාවේය.[13] ඔවුහු
ඉහළ දොරටුව මාර්ගයෙන් රජමාලි-
ගාවට පැමිණ රජුව සිංහාසනයේ
හිඳෙව්වෝය.[14] **21** දේශයේ සියලු-
දෙනා ප්‍රීතිමත් වූහ.[15] ඒ වන විට
අතලියාව මරා දමා තිබිණ.[16] නග-
රය පුරාම සාමකාමී වාතාවරණයක්
පැවතිණ.

**23 පරි.**
1 1ලේක 26:27; 2ලේක 5:1
2 2සාමු 8:7
3 2රාජා 11:10
4 2රාජා 11:4; 1ලේක 26:26
5 2රාජා 11:11
6 2රාජා 11:2
7 2සාමු 1:10; 2සාමු 12:30
8 ද්වි 17:18
9 1සාමු 10:1
10 1සාමු 10:24
11 2රාජා 11:13
12 1රාජා 7:15; 2රාජා 23:3
13 2ලේක 23:1
14 ගණන් 10:10; 1ලේක 15:24
15 1රාජා 1:39; 2රාජා 9:13
16 1රාජා 1:40; හිතෝ 11:10
17 1ලේක 25:7
18 2රාජා 11:14
19 2රාජා 11:15

**2 තීරුව**
1 2රාජා 11:16
2 2රාජා 11:17; 2ලේක 34:31
3 2රාජා 10:27
4 ද්වි 12:3; 2ලේක 34:4; 2ලේක 34:7
5 නික් 32:20
6 2රාජා 11:18
7 ද්වි 13:5; ද්වි 13:9; 1රාජා 18:40
8 1ලේක 23:6; 1ලේක 23:30
9 නික් 29:38; ගණන් 28:2
10 1ලේක 9:26
11 1ලේක 26:1; 1ලේක 26:13
12 2රාජා 11:9
13 2රාජා 11:19
14 1රාජා 1:13; 1රාජා 7:7
15 හිතෝ 11:10; හිතෝ 29:2
16 2රාජා 11:20

**24** යෙහෝයාෂ් රජකමට පත්
වන විට ඔහුගේ වයස අවුරුදු
හතකි.[1] ඔහු යෙරුසලමෙහි සිට අවු-
රුදු හතළිහක් පාලනය කළේය.[2]
ඔහුගේ මව බෙයර්-ෂෙබාහි[3] වැසි-
යෙකු වූ ෂිබියාහ්ය. **2** පූජක යෙ-
හෝයාදා ජීවත් වූ කාලය පුරාම[4]
යෙහෝයාෂ් රජ[5] යෙහෝවා දෙවි
යහපත්යයි සලකන දේ කළේය.[6]
**3** යෙහෝයාදා ඔහුට භාර්යාවන් දෙ-
දෙනෙකුව විවාහ කර දුන්නේය. කල්
යත්ම ඔහුට දාව පුත්‍රයෝ සහ දූවරු
උපන්නෝය.[7]
**4** යෙහෝවා දෙවිගේ ගෘහය අලුත්-
වැඩියා කිරීමට යෙහෝයාෂ් රජු තුළ
මහත් ආශාවක් ඇති විය.[8] **5** ඔහු
පූජකයන්ව[9] හා ලෙවීවරුන්ව රැස් කර
ඔවුන්ට මෙසේ පැවසීය. “ඔබේ දෙවි-
ගේ ගෘහය අවුරුදු පතා අලුත්වැඩියා
කිරීම[10] සඳහා අවශ්‍ය මුදල් ලබා-
ගැනීමට යූදා දේශයේ නුවරවලට
ගොස් සියලුම ඊශ්‍රායෙල්වරුන්ගෙන්
මුදල් එකතු කරන්න.[11] ඒ සඳහා ඔබ
දැන්ම පියවර ගත යුතුයි.” නමුත් රජු
පැවරූ ඒ කාර්යය ඉටු කිරීමට ලෙවීව-
රුන් තුළ එතරම් උද්‍යෝගයක් තිබු-
ණේ නැත.[12] **6** එවිට රජ උත්තම
පූජක යෙහෝයාදාව කැඳවා ඔහුට
මෙසේ පැවසීය.[13] “යෙහෝවා දෙවිගේ
සේවකයා වූ මෝසෙස් සම්මුඛ වීමේ
කූඩාරම සඳහා[14] නියම කළ ශුද්ධ බද්ද
යූදා දේශයෙන් හා යෙරුසලමෙන්
එකතු කිරීම ලෙවීවරුන් සතු කාර්ය-
යක්. නමුත් ඔවුන් එම කාර්යය ඉටු
කළේ නැහැ. ඔබ ඒ ගැන සොයා බැලු-
වේ නැත්තේ ඇයි?[15] **7** දුෂ්ට ස්ත්‍රී-
යක් වූ අතලියාගේ පුතුන්[16] සැබෑ
දෙවිගේ ගෘහයට බොහෝ අලාභ-
හානි කළා.[17] යෙහෝවා දෙවිගේ ගෘහ-
යේ තිබෙන සියලුම ශුද්ධ දේවලුත්[18]
ඔවුන් බාල් දෙවිවරුන්ට පුද කළා.”[19]
**8** පසුව ඔවුහු රජුගේ අණ පරිදි පෙට්-
ටියක් සාදා[20] යෙහෝවා දෙවිගේ ගෘහ-
යට ඇතුල් වන දොරටුව අසල එය
තැබුවෝය. **9** ඉන්පසු ඔවුහු ඊශ්‍රා-
යෙල්වරුන් පාළුකරයේ සිටිද්දී සැබෑ
දෙවිගේ සේවකයා වූ මෝසෙස් නියම
කළ[1] ශුද්ධ බද්ද[2] යෙහෝවා දෙවිට
ලබා දෙන ලෙස යූදා දේශය හා යෙරු-
සලම පුරා දන්වා යැවූහ. **10** සිය-
ලුම අධිපතීහුද[3] මුළු සෙනඟද පැමිණ
සතුටු සිතින්[4] එම පෙට්ටියට සම්මා-
දම් දැමුවෝය.[5] සම්මාදමක් නොදුන්
කිසිවෙක් දේශයේ නොසිටියේය.
**11** නියම කළ ආකාරයට ලෙ-
වීවරුන් විසින් එම පෙට්ටිය රජු
වෙතට ගෙනෙන ලදි.[6] පෙට්ටියේ
මුදල් පිරී තිබෙන බව දැනගත්
විට[7] රජුගේ ලේකම්[8] සහ නායක
පූජකයාගේ නියෝජිතයෙක් පැමිණ
පෙට්ටිය හිස් කර එය නැවත නියමිත
ස්ථානයේ තැබුවෝය. ඔවුහු දිනප-
තාම එසේ කළෝය. අවසානයේදී
විශාල මුදල් ප්‍රමාණයක් එකතු විය.
**12** රජ සහ යෙහෝයාදා එම මුදල්
ගෙන යෙහෝවා දෙවිගේ ගෘහයේ
අලුත්වැඩියා කිරීම්[9] භාරව සිටි අයට
ලබා දුන්නෝය.[10] ඔවුහු එම මුදල්-
වලින් යෙහෝවා දෙවිගේ ගෘහයේ
අලුත්වැඩියා කිරීම් සඳහා[11] අවශ්‍ය
ගල් කපාගැනීමට සේවකයන්වද[12]
විවිධ ශිල්ප උගත් අයවද[13] කුලි-
යට ගත්තෝය. එමෙන්ම යකඩ හා
තඹ වැඩවලට දක්ෂ අයවද යෙ-
හෝවා දෙවිගේ ගෘහය අලුත්වැඩියා
කිරීම සඳහා යොදාගත් අතර[14] ඔවුන්-
ගේ කුලී ගෙවීමටද ඒ මුදල් භාවිත
කරනු ලැබීය. **13** සියලුම වැඩක-
රුවෝ අලුත්වැඩියා කටයුතු ආරම්භ
කර[15] ඒවා දිගටම කරගෙන ගියෝය.
එහි ප්‍රතිඵලයක් ලෙස සැබෑ දෙවිගේ
ගෘහය යථා තත්වයට ගෙනෙන ලදි.
**14** ඔවුහු තම වැඩකටයුතු අවසන්
කළ වහාම ඉතුරු වූ මුදල් රජු
හා යෙහෝයාදා වෙතට ගෙනාවෝය.
ඉන්පසු ඒ මුදල්වලින් ඔවුහු යෙ-
හෝවා දෙවිගේ ගෘහයේ භාවිතය
සඳහා භාණ්ඩ එනම්, පූජා ඔප්පු
කිරීම සඳහා අවශ්‍ය භාණ්ඩද අනිකුත්
විවිධ සේවාවන් සඳහා අවශ්‍ය භාණ්-
ඩද[16] රන්[17] හා රිදීයෙන් කුසලාන[18]
හා භාජනද සැදුවෝය. යෙහෝයාදා

**24 පරි.**
1 2රාජා 11:21
2කොරි 3:5
2 2රාජා 12:1
3 උත් 21:14
2සාමු 3:10
4 2රාජා 12:2
5 1ලේක 3:11
6 2ලේක 26:4
7 ගීතා 127:3
8 2රාජා 22:5
2ලේක 34:8
9 2රාජා 12:4
10 2රාජා 12:5
11 2ලේක 29:3
2ලේක 34:9
12 2රාජා 12:6
හිතෝ 10:4
දේශ 10:18
13 2රාජා 12:7
14 ගණන් 1:50
ක්‍රියා 7:44
15 නික් 30:12
නික් 30:13
නික් 30:14
නික් 30:16
16 2ලේක 22:3
17 2ලේක 28:24
18 2රාජා 12:4
2රාජා 14:14
19 ද්වි 32:17
එස 16:17
හොෂෙ 2:13
20 2රාජා 12:9
මාක් 12:41

**2 තීරුව**
1 නික් 30:12
නික් 30:13
නික් 30:14
නික් 30:16
2 නෙහෙ 10:32
මතෙ 17:24
3 1ලේක 28:1
4 1ලේක 29:9
යෙසා 64:5
ක්‍රියා 2:46
5 2රාජා 22:9
6 2ලේක 34:9
7 2රාජා 22:9
8 2රාජා 12:10
9 2රාජා 12:11
10 1තිමෝ 5:18
11 2රාජා 12:12
12 1රාජා 5:17
13 2ලේක 34:11
14 2ලේක 34:8
15 2ලේක 34:12
16 1රාජා 7:50
17 2ලේක 4:21
2ලේක 4:22
18 නික් 37:16
ගණන් 7:84

ජීවත් වූ කාලය පුරාම යෙහෝවා දෙ-
විගේ ගෘහයේ නිරතුරුවම දවන පූජා
ඔප්පු කරන ලදි.[1]
**15** තෘප්තිමත් ජීවිතයක් ගත කළ
යෙහෝයාදා මහලු වී[2] මිය ගියේය.
ඔහු මිය යන විට ඔහුගේ වයස අවුරුදු
එකසිය තිහකි. **16** ඔහු ඊශ්‍රායෙල්
දේශය වෙනුවෙන්ද[3] සැබෑ දෙවි හා
ඔහුගේ ගෘහය උදෙසාද බොහෝ යහ-
පත් දේවල් කළ නිසා ඔහුව තැන්පත්
කළේ දාවිත්ගේ නුවරෙහි රජවරුන්ව
තැන්පත් කළ ස්ථානයෙහිය.[4]
**17** යෙහෝයාදාගේ මරණයෙන්
ටික කලකට පසු යූදා දේශයෙහි අධි-
පතීහු[5] රජු ළඟට පැමිණ දණින් වැටී
ඔහුට ආචාර කළෝය. පසුව රජ
ඔවුන්ගේ අදහස්වලට සවන් දුන්-
නේය.[6] **18** ඔවුහු ක්‍රමානුකූලව තම
මුතුන්මිත්තන්ගේ දෙවි වන යෙ-
හෝවාගේ ගෘහයේ කළ නමස්කාරය
අත්හැර, බොරු නමස්කාරය සඳහා
ඉදි කළ කුලුනුවලට[7] හා රූපවලට[8]
නමස්කාර කිරීමට පටන්ගත්තෝය.
ඔවුන් කළ වැරදි ක්‍රියාවන් නිසා
යූදා දේශයට හා යෙරුසලමට විරුද්-
ධව දෙවිගේ උදහස ඇවුළුණේය.[9]
**19** ඔවුන්ව නැවතත් තමන් වෙතට
හරවාගන්නා පිණිස යෙහෝවා දෙවි
දිගටම ඔවුන් වෙතට අනාගතවක්-
තෘවරුන්ව යැව්වේය.[10] මෙම අනා-
ගතවක්තෘවරුන් ඔවුන්ට අනතුරු
ඇඟෙව්වත් ඔවුහු ඊට සවන් නොදුන්-
නෝය.[11]
**20** පූජක යෙහෝයාදාගේ පුත්[12]
සෙකරියා[13] තුළ දෙවිගේ බලය[14]
ක්‍රියාත්මක විය.[15] එවිට ඔහු සෙ-
නඟට ඇමතිය හැකි උස් ස්ථානය-
කට ගොස් ඔවුන්ට මෙසේ පැවසීය.
"සැබෑ දෙවි ඔබට පවසන්නේ මෙ-
යයි. 'යෙහෝවා දෙවි වන මාගේ
ආඥා ඔබ කඩ කරන්නේ ඇයි?
එසේ කිරීමෙන් කිසි පලක් නැති බව
ඔබට වැටහෙන්නේ නැද්ද?[16] ඔබ යෙ-
හෝවා දෙවි වන මාව අත්හැරිය
නිසා මම ඔබවද අත්හරින්නෙමි.' "[17]
**21** එවිට ජනයා සෙකරියාට විරුද්-
ධව කුමන්ත්‍රණය කර,[1] රජුගේ අණ
පරිදි යෙහෝවා දෙවිගේ ගෘහයේ මළු-
වේදී ඔහුට ගල් ගසා මැරුවෝය.[2]
**22** මෙසේ යෙහෝයාෂ් රජ පූජක යෙ-
හෝයාදා තමාට පෙන්වූ ප්‍රේමය*
අමතක කර දමා[3] ඔහුගේ පුත් සෙක-
රියාව මරා දැමීය. සෙකරියා අවසන්
හුස්ම හෙළන විට මෙසේ පැවසීය.
"ඔබ කළ දේට යෙහෝවා දෙවි ඉදිරි-
යේ ඔබට ගණන් දීමට සිදු වෙයි."[4]
**23** ඊළඟ අවුරුද්දේ මුල් කාල-
යේදී[5] සිරියානු හමුදාව[6] පැමිණ
රජුට විරුද්ධව සටන් කරමින්[7] යූදා
දේශය හා යෙරුසලම ආක්‍රමණය
කළෝය. ඔවුහු ජනයා අතර අධිප-
තීන් ලෙස සිටි සියලුදෙනාව[8] ඝාත-
නය කර, ඔවුන්ගෙන් කොල්ල කා
ගත් දේ දමස්කයේ රජුට යැවූහ.[9]
**24** ඇත්තෙන්ම මෙම ආක්‍රමණයට
සිරියානුවන් යොදාගත්තේ ඔවුන්ගේ
හමුදාවෙන් ඉතා කුඩා පිරිසක්ය.[10]
නමුත් යෙහෝවා දෙවිගේ උපකාර-
යෙන් යූදා දේශයේ සිටි විශාල හමුදාව
පරාජය කිරීමට ඔවුන්ට හැකි විය.[11]
මන්ද යූදාහි සෙනඟ තම මුතුන්-
මිත්තන්ගේ දෙවි වන යෙහෝවාව
අත්හැර තිබිණ. සිරියාවේ හමුදාව
මෙලෙස යෙහෝයාෂ් රජුට විරුද්-
ධව දෙවිගේ විනිශ්චය ක්‍රියාත්මක
කළෝය.[12] **25** ඒ කාලයේදී ඔහුට
බොහෝ රෝග වැලඳුණේය.[13] සිරියා-
නුවන් ඔහුගේ දේශයෙන් පිටත්ව
ගිය පසු ඔහුගේම සේවකයෝ ඔහුට
විරුද්ධව කුමන්ත්‍රණය කර[14] ඔහු
යහනේ වැතිර සිටියදී ඔහුව මරා දැමූ-
වෝය.[15] ඔවුන් එසේ කළේ ඔහු පූජක
යෙහෝයාදාගේ පුත්‍රයන්ව[16] මරා දැමූ
නිසාය.[17] පසුව ඔවුහු, ඔහුව දාවිත්ගේ
නුවරෙහි තැන්පත් කළෝය.[18] නමුත්
රජවරුන් තැන්පත් කරන ස්ථාන-
යෙහි ඔහුව තැන්පත් කළේ නැත.[19]

**24 පරි.**
**1** නික් 29:28
ගණන් 28:3
**2** ගීතා 91:16
**3** 2ලේක 23:1
හිතෝ 10:7
හෙබ්‍රෙ 6:10
**4** 1රාජා 2:10
2ලේක 24:25
ක්‍රියා 2:29
**5** 1ලේක 28:1
**6** හිතෝ 11:9
හිතෝ 29:12
**7** 1රාජා 14:23
**8** 1රාජා 14:9
**9** නෙහෙ 9:26
ගීතා 102:10
**10** 2රාජා 17:13
යෙරෙ 7:25
**11** 2ලේක 36:16
**12** 2ලේක 23:11
**13** ලූක් 11:51
**14** ගණන් 11:25
2ලේක 15:1
2ලේක 20:14
2පේතෘ 1:21
**15** විනි 6:34
1ලේක 12:18
**16** ගණන් 14:41
1සාමු 13:13
සෙක 7:11
**17** ද්වි 29:25
1ලේක 28:9
2ලේක 15:2
යෙරෙ 2:19

**2 තීරුව**
**1** යෙරෙ 11:19
යෙරෙ 18:18
**2** මතෙ 23:35
ලූක් 11:51
ක්‍රියා 7:58
**3** යෝබ් 6:14
හිතෝ 17:13
**4** උත් 9:5
ගීතා 94:1
යෙරෙ 11:20
හෙබ්‍රෙ 10:30
යූද් 9
**5** 1රාජා 20:22
**6** 2රාජා 12:17
**7** ද්වි 32:35
**8** 2ලේක 24:17
**9** උත් 14:15
1ලේක 18:5
**10** ලෙවී 26:37
ද්වි 32:30
**11** ලෙවී 26:25
ද්වි 28:25
**12** 2ලේක 22:8
යෙසා 10:5
හබ 1:12
**13** ද්වි 28:22
2ලේක 21:18
**14** 2රාජා 14:19
**15** 2සාමු 4:7
2රාජා 12:20
**16** 2ලේක 24:20

---

**17** උත් 9:5; 2ලේක 24:21; ලූක් 11:51; එළි 16:6; **18** 2සාමු 5:9; 1රාජා 2:10; **19** 2ලේක 21:20; 2ලේක 28:27; ගීතා 69:28.

---

**2ලේක 24:22*** හෝ, "ළැදි ප්‍රේමය."

**26** ඔහුට විරුද්ධව කුමන්ත්‍රණය
කළේ අම්මොන් ජාතික ස්ත්‍රියක වූ
ෂිමෙයාත්ගේ පුත් සාබාද්[1] සහ මෝ-
වබ් ජාතික ස්ත්‍රියක වූ ෂිම්රිත්ගේ පුත්
යෙහොෂාබාද් යන අයය. **27** රජු-
ගේ පුත්‍රයන් පිළිබඳවත් ඔහුට විරුද්-
ධව දෙවි කළ බොහෝ ප්‍රකාශයන්
පිළිබඳවත්[2] සැබෑ දෙවිගේ ගෘහය
අලුත්වැඩියා කිරීම පිළිබඳවත්[3] රජව-
රුන්ගේ ඉතිහාසය වාර්තා කර ඇති
ලියවිල්ලෙහි සඳහන් කර තිබේ.[4]
ඔහුගෙන් පසු ඔහුගේ පුත් අමෂියා[5]
රජකම් කිරීමට පටන්ගත්තේය.

**25** අමෂියා රජකමට පත් වන
විට ඔහුගේ වයස අවුරුදු විසි-
පහකි.[6] ඔහු යෙරුසලමේ සිට අවුරුදු
විසිනවයක් පාලනය කළේය. ඔහුගේ
මව යෙරුසලමෙහි වැසියෙකු වූ යෙ-
හෝයද්දන්ය.[7] **2** අමෂියා රජ යෙ-
හෝවා දෙවි යහපත්යයි සලකන දේ
කළත්[8] එය මුළු හදවතින්ම කළේ
නැත.[9] **3** ඔහු තම පාලන බලය
තහවුරු කරගත් වහාම තම පියාව
ඝාතනය කළ[10] සේවකයන්ව[11] මරා
දැමුවේය.[12] **4** නමුත් ඔහු එම සේව-
කයන්ගේ පුත්‍රයන්ව මරා දැමුවේ
නැත. මන්ද යෙහෝවා දෙවි මෝ-
සෙස්ට දුන් නීතිය ඇතුළත් ලිය-
විල්ලෙහි මෙසේ සඳහන්ව තිබිණ.[13]
"යමෙකුව මරණයට පත් කළ යුත්තේ
ඔහුගේම වරදකට මිස වෙන කෙනෙ-
කුගේ වරදකට නොවේ.[14] පුත්‍රයන්
නිසා පියවරුන්වත්[15] පියවරුන් නිසා
පුත්‍රයන්වත්[16] මරණයට පත් නොකළ
යුතුයි."

**5** අමෂියා රජ යූදා හා බෙන්ජ-
මින් ගෝත්‍රවලට අයත් සියලුදෙ-
නාවම රැස් කළේය. ඔවුන් රැස්
වූයේ තම මුතුන්මිත්තන්ගේ පෙළ-
පත්වලට අනුවය.[17] ඉන්පසු ඔවුන්ව
දහසකින් යුත් කණ්ඩායම්වල ප්‍රධා-
නීන් යටතේ[18] හා සියයකින් යුත්
කණ්ඩායම්වල ප්‍රධානීන් යටතේ[19]
කාණ්ඩ වශයෙන් බෙදන ලදි. ඔවුන්ව
එසේ බෙදූ පසු අමෂියා රජුගේ අණ
පරිදි වයස අවුරුදු විස්සක් හා ඊට
වැඩි අයව ලියාපදිංචි කරන ලදි.[1]
එවිට හමුදා සේවයට සුදුසු, හෙල්ල-
යක්[2] හා විශාල පලිහක්[3] හැසිරවිය
හැකි හැඩිදැඩි පුරුෂයන් තුන්ලක්ෂ-
යක් ඔවුන් අතර සිටින බව හෙළි
විය. **6** මීට අමතරව ඔහු ඊශ්‍රා-
යෙල් රාජ්‍යයට රිදී තලෙන්ත සියයක්
දී එඩිතර, බලසම්පන්න පුරුෂ-
යන් ලක්ෂයක් කුලියට ගත්තේය.
**7** එවිට සැබෑ දෙවිගේ සේවකයෙක්[4]
ඔහු ළඟට පැමිණ මෙසේ පැවසීය.
"රජ්ජුරුවනි, ඔබේ හමුදාවට ඊශ්‍රා-
යෙල් හමුදාවේ සෙබළුන්ව එකතු
කරගන්න එපා. මන්ද ඊශ්‍රායෙල්ව-
රුන්ට එනම්, එෆ්‍රායිම්වරුන්ට යෙ-
හෝවා දෙවිගේ ආශීර්වාදය නැහැ.[5]
**8** ඔවුන්ව ඔබේ හමුදාවට එකතු
කරගත්තොත් දෙවිට පුළුවන් ඔබව
සතුරා ඉදිරියේ පරාජය කරන්න.
ජය පරාජය තිබෙන්නේ දෙවිගේ
අතෙයි.[6] ඒ නිසා කිසි දෙයකට භය
නොවී ඔබේ හමුදාව විතරක් යුද්ධයට
යවන්න."[7] **9** ඒ වචන ඇසූ අම-
ෂියා රජු[8] සැබෑ දෙවිගේ සේවකයාට
කතා කරමින්, "එහෙම කළොත්
ඊශ්‍රායෙල්වරුන්ගේ හමුදාවට මා දුන්
තලෙන්ත සියයට මොනවාද වෙන්-
නේ"[9] කියා ඇසුවේය. එවිට සැබෑ
දෙවිගේ සේවකයා මෙසේ පැවසීය.
"ඔබ දෙවිව විශ්වාස කරමින් කටයුතු
කළොත් ඊටත් වඩා විශාල මුදල්
ප්‍රමාණයක් ඔබට දෙන්න යෙහෝවා
දෙවිට පුළුවන්."[10] **10** එවිට අමෂියා
රජ එෆ්‍රායිම්වරුන්ගෙන් ගෙන්වාගත්
හමුදා පිරිස තම හමුදාවෙන් ඉවත්
කර ඔවුන්ව ආපසු ඔවුන්ගේ දේශයට
යැවීය. යුදාහි වැසියන්ට විරුද්ධව
උදහස් වූ ඔවුහු තම දේශය බලා
පිටත්ව ගියෝය.[11]

**11** අමෂියා රජ තම හමුදාව
සමඟ නිර්භීතව ලුණු නිම්නය
බලා ගියේය.[12] එහිදී ඔවුහු සේයීර්හි
වැසියන්[13] දසදහස්දෙනෙකුව මරා
දැමුවෝය.[14] **12** තවත් දසදහස්දෙ-
නෙකුව අල්ලාගත් ඔවුහු, ඔවුන්ව

**24 පරි.**
1 2රාජා 12:21
2 2ලේක 24:20
3 2ලේක 24:13
4 2රාජා 12:19; 2ලේක 20:34
5 2රාජා 12:21; 1ලේක 3:12

**25 පරි.**
6 2රාජා 14:1
7 2රාජා 14:2
8 ද්වි 12:32
9 1රාජා 8:61; 1රාජා 11:4; 2රාජා 14:3; ගීතා 78:37
10 2ලේක 24:25
11 2ලේක 24:26
12 උත් 9:6; නික් 21:14; ගණන් 35:31
13 ද්වි 24:16
14 2රාජා 14:6
15 එස 18:20
16 එස 18:4
17 1ලේක 27:1
18 නික් 18:25; 1සාමු 8:12; 1ලේක 13:1
19 ද්වි 1:15

**2 තීරුව**
1 ගණන් 1:3
2 1ලේක 12:24; 2ලේක 11:12
3 2ලේක 32:5
4 1රාජා 13:1
5 2ලේක 13:16; 2ලේක 19:2
6 2ලේක 14:11; 2ලේක 20:6; ගීතා 33:20; යෙරෙ 18:23
7 හිතෝ 24:10
8 2රාජා 14:1
9 2ලේක 25:6
10 1සාමු 2:7; හිතෝ 10:22; හග් 2:8
11 2සාමු 19:43; හිතෝ 29:22
12 2සාමු 8:13; ගීතා 60:පෙර
13 2ලේක 20:10
14 2රාජා 14:7

පර්වත මුදුනට ගෙනැවිත් පහතට
හෙළුවෝය. මෙසේ පහතට හෙළූ
අයගේ සිරුරු පැළී ඔවුහු සියලුදෙ-
නාම මිය ගියෝය.[1] **13** ඒ අතරතුර
අමෂියා රජු තම හමුදාවට බඳවා
නොගෙන ආපසු යැවූ හමුදා පිරිස[2]
යූදා දේශයට අයත් සමාරියේ සිට[3]
බෙත්-හෝරොන් දක්වා[4] පිහිටි නුවර-
වලට පහර දුන්නෝය. ඔවුහු ඒ නුව-
රවල සිටි තුන්දහස්දෙනෙකුව මරා
දැමූ අතර බොහෝ වස්තූද කොල්ල
කෑවෝය.

**14** අමෂියා රජ ඒදොම්වරුන්ට
පහර දී ආපසු පැමිණෙද්දී සේයිර් වැසි-
යන් ඇදහූ දෙවිවරුන්ගේ රූපද රැගෙන
ආවේය.[5] ඔහු ඒවා තමාගේ දෙවිව-
රුන් ලෙස සලකා,[6] ඒවාට නමස්කාර
කරමින්[7] සුවඳ දුම් ඔප්පු කළේය.[8]
**15** යෙහෝවා දෙවි, අමෂියා රජු සමඟ
බොහෝ සෙයින් උදහස් වී ඔහු වෙතට
අනාගතවක්තෘවරයෙකුව යැවීය. ඔහු
රජුට මෙසේ පැවසීය. “ඔබ ඒ දෙවිව-
රුන්ට[9] නමස්කාර කරන්නේ මොන
හේතුවක් නිසාද?[10] ඒ දෙවිවරුන්ට
තමන්ගේ සෙනඟවත් ඔබේ අතින් බේ-
රාගන්න බැරි වූ බව ඔබට මතක
නැද්ද?”[11] **16** ඒ දේ ඇසූ විගස රජ
මෙසේ පැවසීය. “මගේ උපදේශකයා
හැටියට කවුද ඔබව පත් කළේ?[12]
නිකම් මැරුම් කන්නේ නැතුව කට
වහගන්න.”[13] ඒ වචන ඇසූ අනාගත-
වක්තෘවරයා, “ඔබ ඒ දේ කළ නිසාත්[14]
මා දුන් උපදෙස් නොසලකාහැරිය
නිසාත්[15] අනිවාර්යයෙන්ම දෙවි ඔබව
විනාශ කර දමනවා”[16] යයි පවසා
නිහඬ විය.

**17** පසුව යූදාහි රජු වූ අමෂියා තම
උපදේශකයන්ගේ උපදෙස් මත ඊශ්‍රා-
යෙල්හි රජු වූ යෙහෝයාෂ් වෙතට
පණිවිඩකරුවන්ව යවා,[17] “මා සමඟ
සටන් කරන්න එන්න”[18] කියා දැන්-
වීය. ඊශ්‍රායෙල්හි රජු වූ යෙහෝයාෂ්,
යේහුගේ පුත් යෙහෝයහාෂ්ගේ පුත්‍ර-
යාය. **18** එවිට යෙහෝයාෂ් රජ,
යූදාහි රජු වූ අමෂියාට මෙම පණිවි-
ඩය යැවීය.[19] “දවසක් ලෙබනොන්

**25 පරි.**
**1** ඔබ 3
ක්‍රියා 1:18
**2** 2ලේක 25:9
**3** 1රාජා 16:24
1රාජා 16:29
**4** 1රාජා 9:17
2ලේක 8:5
**5** 2ලේක 28:23
**6** නික් 20:3
ද්වි 7:5
ද්වි 7:25
**7** නික් 20:5
**8** 2ලේක 28:25
2ලේක 34:25
**9** ගීතා 96:5
**10** 2ලේක 24:20
යෙරෙ 2:5
**11** ගීතා 115:8
යෙසා 46:2
යෙරෙ 10:5
1කොරි 8:4
1කොරි 10:20
**12** 2ලේක 16:10
2ලේක 18:25
**13** හිතෝ 9:7
හිතෝ 15:10
යෙසා 30:10
2තිමෝ 4:3
**14** 1සාමු 2:25
**15** හිතෝ 29:1
**16** එස 18:26
**17** 2රාජා 14:8
**18** හිතෝ 20:3
**19** 2රාජා 14:9

**2 තීරුව**
**1** 1රාජා 4:33
**2** විනි 9:8
**3** ගීතා 80:13
**4** 2ලේක 25:11
**5** ද්වි 8:14
2ලේක 26:16
2ලේක 32:25
හිතෝ 16:18
හිතෝ 28:25
හිතෝ 29:23
යෙරෙ 9:23
දානි 5:20
හබ 2:4
**6** හිතෝ 12:15
**7** 2රාජා 14:10
**8** 2ලේක 35:21
**9** 1රාජා 12:15
2ලේක 22:7
**10** 2ලේක 25:14
**11** 2රාජා 14:11
**12** යොෂු 21:16
1සාමු 6:9
1සාමු 6:19
**13** 2සාමු 2:14
2ලේක 25:17
**14** 2රාජා 14:12
**15** 1රාජා 22:36
**16** හිතෝ 25:8
**17** 2රාජා 14:13
**18** නෙහෙ 8:16
නෙහෙ 12:39
**19** 2ලේක 26:9
යෙරෙ 31:38
සෙක 14:10

දේශයේ වැවී තිබුණු කටු පඳුරක්
එම දේශයේ තිබූ දේවදාර ගසකට[1]
කතා කර, ‘ඔබේ දුවව මගේ පුතාට
විවාහ කර දෙන්න’[2] කියා පැව-
සුවා. නමුත් ලෙබනොන් වනයේ
සැරිසරන මෘගයෙක්[3] ඇවිත් ඒ කටු
පඳුර පාගා දැමුවා. **19** ඒදොම්ව-
රුන්ව පරාජය කළ නිසා[4] දැන් ඔබ
ඉන්නේ ලොකු ආඩම්බරයකින්.[5] ඔබ
ලබාගත් ගෞරවය රැකගෙන ඔබේ
ගෙදරටම වී සිටියොත් හොඳයි.[6] යුද්-
ධයට ආවොත් පරදින්නේ ඔබමයි.[7]
ඔබත් යූදාහි වැසියනුත් නිකරුණේ
අනතුරට වැටෙන්න හදන්නේ ඇයි?”[8]

**20** එහෙත් අමෂියා රජ ඔහුට
සවන් දුන්නේ නැත. එසේ සිදු වීමට
දෙවි සැලැස්වූයේ[9] ඔවුන්ව සතු-
රන් අතින් පරාජය වන පිණිසය.
මන්ද ඔවුහු දෙවිව අත්හැර ඒදොම්
වැසියන්ගේ දෙවිවරුන්ට නමස්-
කාර කළෝය.[10] **21** එහෙයින් ඊශ්‍රා-
යෙල්හි රජු වූ යෙහෝයාෂ් යූදාහි රජු
වූ අමෂියාට විරුද්ධව යුද්ධ කිරීමට
පිටත් විය.[11] ඔවුහු යූදා දේශයේ
පිහිටි බෙත්-ෂෙමෙෂ් නුවරේදී[12] එකි-
නෙකාට විරුද්ධව යුද්ධ කළෝය.[13]
**22** එහිදී ඊශ්‍රායෙල්වරුන් අතින් පරා-
ජයට පත් වූ යූදා හමුදාව[14] තමන්-
ගේ කූඩාරම්වලට පලා ගියෝය.[15]
**23** නමුත් ඊශ්‍රායෙල්හි රජු වූ යෙ-
හෝයාෂ්, යූදාහි රජු වූ අමෂියාව
බෙත්-ෂෙමෙෂ් නුවරේදී අල්ලාගෙන[16]
යෙරුසලමට ගෙනාවේය.[17] අමෂියා
රජු, යෙහෝයහාෂ්ගේ පුත් යෙහෝ-
යාෂ්ගේ පුත්‍රයා විය. ඊශ්‍රායෙල්වරු
යෙරුසලමට පැමිණ එෆ්‍රායිම් දොරටු-
වේ සිට[18] කොනේ දොරටුව[19] අතර
තිබූ යෙරුසලමේ පවුරෙන් රියන්
හාරසියයක කොටසක් බිඳ දැමු-
වෝය. **24** ඉන්පසු ඔහු සැබෑ දෙවි-
ගේ ගෘහයේ ඕබෙද්-ඒදොම් භාරයේ
තිබූ සියලු රන් හා රිදී භාණ්ඩද[20] රජ-
මාලිගාවේ භාණ්ඩාගාරයේ තිබූ රන්
හා රිදී භාණ්ඩද[21] කොල්ල කා ගත්

**20** 1රාජා 7:51; 1රාජා 15:18; 2රාජා 25:15; 2ලේක 12:9;
**21** 1රාජා 14:26; 2රාජා 24:13.

අතර එහි සිටි මිනිසුන්වද පැහැර-
ගෙන නැවත සමාරිය බලා ගියේය.[1]
**25** යූදාහි රජු වූ යෙහෝයාෂ්-
ගේ පුත් අමෂියා රජ,[2] ඊශ්‍රායෙල්හි
රජු වූ යෙහෝයහාෂ්ගේ පුත් යෙ-
හෝයාෂ්ගේ මරණයට පසු[3] අවුරුදු
පහළවක් ජීවත් විය.[4] **26** අමෂියා
රජුගේ ජීවිතයේ අනිකුත් සිදුවීම්
ගැන[5] යූදාහි හා ඊශ්‍රායෙල්හි රජව-
රුන්ගේ[6] ඉතිහාසය වාර්තා කර ඇති
ලියවිල්ලෙහි සඳහන් කර තිබේ.[7]
**27** අමෂියා රජු යෙහෝවා දෙවිව
අත්හැරිය විට යෙරුසලමෙහි සෙනඟ
ඔහුට විරුද්ධව කුමන්ත්‍රණයක් දියත්
කළෝය.[8] එහෙයින් ඔහු ලාකිෂ් නුව-
රට පලා ගියේය.[9] නමුත් ඔවුන් අම-
ෂියා රජුව අල්ලාගැනීමට මිනිසුන්ව
යැවූ අතර එහිදී ඔහුව මරා දමන
ලදි.[10] **28** පසුව ඔවුහු ඔහුගේ මළ
සිරුර අශ්වයන් පිට තබා රැගෙන
ආවෝය.[11] යූදා දේශයෙහි ඔහුගේ
මුතුන්මිත්තන්ව තැන්පත් කළ නුව-
රෙහි ඔහුවද තැන්පත් කරන ලදි.[12]

**26** ඉන්පසු යූදාහි වැසියෝ[13]
අමෂියා වෙනුවට[14] අවුරුදු
දහසයක් වයසැති ඔහුගේ පුත් උසි-
යාව[15] රජකමට පත් කළෝය.[16]
**2** අමෂියා රජුව තම මුතුන්මිත්තන්
සමඟ තැන්පත් කළ පසු උසියා රජ
ඒලොත් නුවර[17] නැවත යූදා දේශ-
යෙහි පාලනය යටතට ගෙන එය යළි
ගොඩනැඟුවේය.[18] **3** උසියා[19] රජ-
කමට පත් වන විට ඔහුගේ වයස අවු-
රුදු දහසයකි. ඔහු යෙරුසලමෙහි
සිට අවුරුදු පනස්දෙකක් පාලනය
කළේය. ඔහුගේ මව යෙරුසලමෙහි
ජීවත් වූ යෙකොලියාය.[20] **4** ඔහුගේ
පියා වූ අමෂියා මෙන්[21] ඔහුද යෙ-
හෝවා දෙවි යහපත්යයි සලකන
දේ දිගටම කළේය.[22] **5** සැබෑ දෙ-
විට ගරුබිය දැක්විය යුතු ආකාරය
ගැන ඔහුට උපදෙස් දුන්[23] සෙකරියා
ජීවත්ව සිටි කාලය පුරා ඔහු දෙවිගේ
මඟ පෙන්වීම් පැතීමට නිතර උත්-
සාහ කළේය.[24] එසේ ඔහු සැබෑ දෙවි
වූ යෙහෝවාට ළං වී ඔහුගේ මඟ

**25 පරි.**
1 2රාජා 14:14
2 2රාජා 14:1
3 2රාජා 13:10; 2රාජා 14:15
4 2රාජා 14:17
5 2ලේක 12:15
6 2රාජා 14:18
7 1රාජා 14:29; 2රාජා 12:19
8 2රාජා 12:20; 2රාජා 15:10; 2රාජා 21:23
9 යොෂු 10:31; මීකා 1:13
10 2රාජා 14:19
11 2රාජා 14:20
12 1රාජා 2:10; 1රාජා 11:43

**26 පරි.**
13 2ලේක 33:25
14 2රාජා 14:21
15 2රාජා 15:13; මතෙ 1:8
16 2රාජා 21:24
17 1රාජා 9:26; 2රාජා 16:6; 2ලේක 8:17
18 2රාජා 14:22
19 යෙසා 1:1; යෙසා 6:1
20 2රාජා 15:2
21 2රාජා 14:3
22 2රාජා 12:2
23 උත් 18:19
24 ද්වි 4:29; 2ලේක 14:7; 2ලේක 17:4

**2 තීරුව**
1 1රාජා 3:13; ගීතා 1:3; හිතෝ 10:22
2 2සාමු 8:1; 2ලේක 21:16; යෙසා 14:29
3 1ලේක 18:1
4 යොෂු 15:11
5 යොෂු 13:3; 1සාමු 5:1
6 යොෂු 15:46
7 2ලේක 17:11
8 1ලේක 4:41
9 1ලේක 5:20; 2ලේක 14:11; ගීතා 33:20; ක්‍රියා 26:22
10 උත් 19:38; විනි 11:15
11 2සාමු 8:6; 1ලේක 18:6
12 උත් 12:2
13 2රාජා 14:13; යෙරෙ 31:38; සෙක 14:10
14 නෙහෙ 3:13
15 2ලේක 14:7
16 2රාජා 9:17
17 1ලේක 27:28
18 1ලේක 12:18

පෙන්වීම් පැතූ කාලයේදී දෙවි ඔහුට
ආශීර්වාද කළේය.[1]
**6** උසියා රජ පිලිස්තිවරුන්ට
විරුද්ධව සටන් කර[2] ගාත්,[3] යබ්නෙ[4]
සහ අෂ්දොද්[5] යන නුවරවල පවුරු
බිඳ දැමුවේය. ඉන්පසු ඔහු අෂ්දොද්
අවට ප්‍රදේශයෙහි[6] හා පිලිස්තිවරුන්
ජීවත් වූ වෙනත් ස්ථානවල නුවර-
වල් ගොඩනැඟුවේය. **7** ඔහු පිලිස්-
තිවරුන්ටත් ගුර්බාල් නම් ප්‍රදේශයේ
ජීවත් වූ අරාබි ජාතිකයන්ටත්[7] මෙයූ-
නිවරුන්ටත්[8] විරුද්ධව කළ සටන්-
වලදී සැබෑ දෙවි ඔහුට උපකාර
කළේය.[9] **8** අම්මොන්වරුද[10] උසි-
යාට කප්පම් ගෙවූහ.[11] දවසින් දවස
ඔහු තම බලය තහවුරු කරගත්
ආකාරය ගැන ඊජිප්තුවේ පවා ප්‍රසිද්ධ
විය.[12] **9** උසියා රජ යෙරුසලමේ
පිහිටි කොණේ දොරටුව[13] හා නිම්න
දොරටුව[14] අසලද නුවරේ බැම්ම අස-
ලද මුරටැඹවල් ඉදි කර[15] ඒවා-
යේ ආරක්ෂාව තවත් වැඩි කළේය.
**10** ඔහු පාළුකරයේ මුරටැඹවල් ඉදි
කර[16] වතුර රඳවා තබාගැනීමට බො-
හෝ පොකුණුද සෑදුවේය. (එයට හේ-
තුව ඔහු සතුව සත්ව රැළවල් විශාල
ප්‍රමාණයක් තිබීමය.) එමෙන්ම ඔහු
ඒවා ෂෙපේලා නම් ප්‍රදේශයේ[17] හා
තැනිතලා බිම්වල සෑදුවේය. කෘෂි-
කර්මයට මහත් ඇල්මක් දැක්වූ ඔහු,
කඳුකරයේ හා කර්මෙල් ප්‍රදේශයේ
ගොවිතැන් කිරීමටත් මිදිවතු වැවීම-
ටත් ජනයාව එහි පදිංචි කෙරෙව්වේය.
**11** යුද්ධවලට සහභාගි වූ හමුදා
බළඇණි[18] විශාල ප්‍රමාණයක් උසියා
රජු යටතේ සිටියෝය. ඔවුන්ව ලියා-
පදිංචි කරන ලද්දේ[19] ලේකම් වූ[20]
යෙයියෙල් හා මයසේයා විසිනි. මය-
සේයා, රජු යටතේ අධිපතියෙකු ලෙස
සේවය කළ[21] හනනියාගේ අධීක්ෂ-
ණය යටතේ සිටි නිලධාරියෙකි.[22]
**12** මුතුන්මිත්තන්ගේ පෙළපත්වල
ප්‍රධානීන්[23] ලෙස කටයුතු කළ

**19** ගණන් 1:3; 2සාමු 24:9; **20** 1ලේක 27:32; 2ලේක 24:11; **21** 1ලේක 28:1; **22** 1ලේක 26:28; **23** 1ලේක 27:1.

එඩිතර,[1] බලසම්පන්න පුරුෂයෝ[2]
දෙදහස් හයසියයක් ඔවුන් අතර
සිටියෝය. **13** ඔවුන්ගේ අධීක්ෂ-
ණය යටතේ ඉතා බලසම්පන්න
යුධ හමුදාවක් සිටියහ. රජු වෙනු-
වෙන් සටන් කළ ඔවුන්ගේ මුළු
සංඛ්‍යාව තුන්ලක්ෂ හත්දහස් පන්සි-
යයකි.[3] **14** උසියා රජ මුළු හමුදා-
වට හෙල්ල,[4] පලිස්,[5] හිස්වැසුම්,[6] යුධ
ඇඳුම්,[7] දුනු[8] සහ ගල්පටි[9] සාදා දුන්-
නේය. **15** මීට අමතරව ඔහු ඉන්ජි-
නේරුවන් ලවා ඊතල හා විශාල
ගල් විදීමට හැකි යුධ යන්ත්‍ර සාදා
ඒවා යෙරුසලමෙහි මුරටැඹවල[10] හා
පවුරු කොන්වල තැබීය. මෙසේ ඔහු-
ගේ බලය තහවුරු කරගැනීමට දෙවි
ඔහුට සෑම අතින්ම උපකාර කළ
නිසා ඔහුගේ කීර්තිය[11] දසත පැතිර
ගියේය.

**16** නමුත් ඔහු බලවත් පාලකයෙකු
වූ විට උඩඟු ලෙස ක්‍රියා කළේය.[12]
කොතරම් උඩඟු වූවාද[13] කිවහොත්
ඔහු තම දෙවි වන යෙහෝවාට විරුද්-
ධවද ක්‍රියා කළේය. ඔහු සුවඳ ද්‍රව්‍ය
ඔප්පු කරන පූජාසනය මත සුගන්ධ
ද්‍රව්‍ය දැවීම සඳහා යෙහෝවා දෙවිගේ
මාලිගාවට ඇතුල් වීමට තරම් එඩි-
තර විය.[14] **17** ඔහු එසේ ඇතුල්
වූ වහාම පූජක අෂරියා හා එඩි-
තර පුරුෂයන් වූ යෙහෝවා දෙවි-
ගේ පූජකයෝ අසූදෙනෙක් ඔහු සිටි
ස්ථානයට ගියෝය. **18** ඔවුහු උසියා
රජුට විරෝධය පාමින්[15] මෙසේ පැව-
සූහ. "රජ්ජුරුවනි, මොකක්ද ඔබ මේ
කළේ? යෙහෝවා දෙවිට සුවඳ ද්‍රව්‍ය
ඔප්පු කිරීම ඔබේ වගකීමක් නෙ-
මෙයි.[16] ඒක පූජකයන් වන ආරොන්-
ගේ පුත්‍රයන්ට විතරක් පැවරී තිබෙන
වගකීමක්.[17] දැන් කරුණාකර ශුද්ධස්-
ථානයෙන් පිට වී යන්න. ඔබ ක්‍රියා
කර තිබෙන්නේ දෙවිට විරුද්ධවයි.
ඔබ කළ ඒ දේට යෙහෝවා දෙවි-
ගෙන් කිසි පිළිගැනීමක්* ලැබෙන්නේ
නැහැ."[18]

**19** සුවඳ ද්‍රව්‍ය ඔප්පු කරන භාජ-
නය අතැතිව[1] සිටි උසියා රජ එය
අසා මහත් සේ කෝප විය.[2] එවිට
පූජකයන් සියලුදෙනා ඉදිරිපිටම ඔහු-
ගේ නළලේ ලාදුරු රෝගය හටගත්-
තේය.[3] ඒ අවස්ථාවේදී ඔහු සිටියේ
යෙහෝවා දෙවිගේ ගෘහයේ සුවඳ
ද්‍රව්‍ය ඔප්පු කරන පූජාසනය අසලය.
**20** නායක පූජක අෂරියා සහ සෙසු
පූජකයෝ ඔහු දෙස බැලූ විට ඔහුගේ
නළලේ ලාදුරු රෝගය හටගෙන තිබූ
බව දුටුවෝය.[4] එවිට ඔවුහු කලබල
වී, ඔහුව එතැනින් වහාම පිටතට
ගෙන යෑමට පියවර ගත්තෝය. යෙ-
හෝවා දෙවි තමාට දඬුවම් කර ඇති
බව තේරුම්ගත් රජද[5] ඉක්මනින් ඒ
ස්ථානයෙන් පිටත්ව ගියේය.

**21** යෙහෝවා දෙවිගේ ගෘහයෙන්
පිටමං කරනු ලැබූ උසියා රජ,[6] මිය
යන තෙක්ම ලාදුරු රෝගියෙකුව
සිටියේය.[7] ඔහුට පැවරී තිබූ වගකීම්-
වලින් ඔහුව නිදහස් කළ අතර ඔහු
වෙනම නිවසක ජීවත් විය. ඒ අතර-
තුර රජමාලිගාවේ සියලු වැඩකටයුතු
බලා කියා ගනිමින් දේශය පාලනය
කළේ ඔහුගේ පුත් යෝතම්ය.

**22** උසියා රජුගේ ජීවිතයේ අනි-
කුත් සිදුවීම් සියල්ල[8] ආමොෂ්ගේ
පුත්[9] අනාගතවක්තෘ යෙසායා[10] විසින්
ලියනු ලැබුවේය. **23** කල් යත්ම
උසියා රජ මිය ගියේය. ඔහුගේ මුතුන්-
මිත්තන් මෙන් ඔහුවද තැන්පත් කරන
ලදි. නමුත් සියල්ලෝම, "ඔහු ලාදුරු
රෝගියෙක්" කියා පවසමින් රජව-
රුන්ව තැන්පත් කරන ස්ථානයේ
නොව වෙනත් ස්ථානයක ඔහුව තැන්-
පත් කළෝය.[11] ඔහු වෙනුවට ඔහුගේ
පුත් යෝතම්[12] රජකමට පත් විය.

# 27
යෝතම් රජකමට පත් වන
විට ඔහුගේ වයස අවුරුදු විසි-
පහකි. ඔහු යෙරුසලමේ සිට අවුරුදු
දහසයක් පාලනය කළේය.[13] ඔහුගේ
මව සාදොක්ගේ දියණිය වූ යෙරු-
ෂාහ්ය.[14] **2** ඔහු යෙහෝවා දෙවි යහ-
පත්යයි සලකන දේ දිගටම කරමින්[15]
තම පියා වූ උසියා මෙන් කටයුතු

**26 පරි.**
1 1ලේක 5:24; 1ලේක 12:21
2 1ලේක 26:6
3 2ලේක 11:1; 2ලේක 13:3; 2ලේක 17:14
4 2ලේක 11:12; 2ලේක 14:8; 2ලේක 25:5
5 2ලේක 17:17
6 1සාමු 17:5; යෙරෙ 46:4
7 1සාමු 17:38
8 1ලේක 12:2
9 විනි 20:16; 1සාමු 17:49
10 2ලේක 14:7
11 1රාජා 4:31
12 ද්වි 32:15
13 හිතෝ 29:23; 1පේතෘ 5:5
14 ගණන් 1:51
15 හිතෝ 28:1
16 ගණන් 16:40; ගණන් 18:7; හිතෝ 21:24
17 නික් 30:7; 1ලේක 23:13; හෙබ්‍රෙ 5:4
18 ගණන් 3:10; ගණන් 18:7; 1සාමු 2:30

**2 තීරුව**
1 නික් 30:7
2 2ලේක 16:10; 2ලේක 25:16
3 ලෙවී 13:2; ගණන් 12:10; 2රාජා 5:27
4 ලෙවී 13:3; ද්වි 24:8; හිතෝ 11:2
5 ලෙවී 14:34; ද්වි 28:22; ද්වි 28:35
6 2රාජා 15:5
7 ලෙවී 13:46; ගණන් 5:2; ගණන් 12:14; ගණන් 12:15; 2රාජා 7:3
8 2රාජා 15:6
9 යෙසා 1:1
10 යෙසා 6:1
11 2රාජා 15:7
12 2රාජා 15:32

**27 පරි.**
13 1ලේක 3:12; යෙසා 1:1; හොෂෙ 1:1; මීකා 1:1; මතෙ 1:9
14 2රාජා 15:33
15 2රාජා 12:2; 2ලේක 17:3

2ලේක 26:18* මූ.අ., "ගෞරවයක්."

කළේය.[1] නමුත් ඔහු යෙහෝවා දෙ-
විගේ ශුද්ධස්ථානයට ඇතුල් වූයේ
නැත.[2] ඔහු යහපත් දේවල් කළත්
ජනයා දිගටම දුෂ්ටකම් කළෝය.[3]
**3** යෙහෝවා දෙවිගේ ගෘහයේ ඉහළ
දොරටුව[4] ගොඩනඟනු ලැබුවේ ඔහු
විසින්ය. එමෙන්ම ඔහු ඕෆෙල් පවුරේ[5]
බොහෝ ඉදි කිරීම් කටයුතුද කළේය.
**4** ඔහු යූදා දේශයට අයත් කඳුකර
ප්‍රදේශයේ[6] නුවරවල්ද[7] කැලෑබද ප්‍රදේ-
ශවල[8] බලකොටු[9] හා මුරටැඹවල්ද[10]
ඉදි කළේය. **5** අම්මොන්වරුන්ගේ
රජුට විරුද්ධව කාලයක් පුරා යුද්ධ
කළ ඔහු,[11] අවසානයේදී ඔවුන්ව
තම අණසක යටතට ගැනීමට සමත්
විය. එහෙයින් අම්මොන්වරු ඔහුට
ඒ වසරේදී රිදී තලෙන්ත සියයක්ද
තිරිඟු[12] කෝර් ඒකක දසදහසක්ද[13]
බාර්ලි කෝර් ඒකක දසදහසක්ද[14]
දුන්නෝය. ඔවුහු මේ දේවල් ඔහුට
ඊළඟ වසර දෙක පුරාම ලබා දුන්-
නෝය.[15] **6** යෝතම් රජ තම දෙවි
වන යෙහෝවා ඉදිරියේ හරි දේ කළ
නිසා[16] ඔහු දිගටම තම බලය එලෙස
තහවුරු කරගත්තේය.

**7** යෝතම් රජුගේ ජීවිතයේ අනි-
කුත් සිදුවීම්ද[17] ඔහු යුද්ධ කළ ආකා-
රය සහ ඔහු කටයුතු කළ ආකාරය
පිළිබඳ තොරතුරුද ඊශ්‍රායෙල්හි හා
යූදාහි රජවරුන්ගේ ඉතිහාසය වාර්තා
කර ඇති ලියවිල්ලෙහි සඳහන් කර
තිබේ.[18] **8** ඔහු රජකමට පත් වන
විට ඔහුගේ වයස අවුරුදු විසිපහකි.
ඔහු යෙරුසලමෙහි සිට අවුරුදු දහ-
සයක් පාලනය කළේය.[19] **9** කල්
යත්ම යෝතම් රජ මිය ගියේය.
ඔහුවද ඔහුගේ මුතුන්මිත්තන් මෙන්
තැන්පත් කරන ලදි.[20] ඔහුව තැන්-
පත් කළේ දාවිත්ගේ නුවරෙහිය.[21]
ඔහුගෙන් පසුව රජකමට පත් වූයේ
ඔහුගේ පුත් ආහස්ය.[22]

**28** ආහස්[23] රජකමට පත් වන
විට ඔහුගේ වයස අවුරුදු විස්-
සකි. ඔහු යෙරුසලමේ සිට අවු-
රුදු දහසයක් පාලනය කළේය.[24]
නමුත් ඔහු යෙහෝවා දෙවි යහපත්-
යයි සලකන දේ කළ තම මුතුන්-
මිත්තා වූ දාවිත් මෙන් ක්‍රියා කළේ
නැත.[1] **2** ඔහු ක්‍රියා කළේ ඊශ්‍රා-
යෙල්හි රජවරුන් ක්‍රියා කළ ආකාරය-
ටය.[2] ඔහු බාල් දෙවිවරුන්ගේ රූප
සෑදුවේය.[3] **3** ඔහු බෙන්හින්නොම්
නිම්නයේ*[4] සුවඳ දුම් ඔප්පු කළේය.[5]
එපමණක්ද නොව යෙහෝවා දෙවි
ඊශ්‍රායෙල්වරුන් අතරින් පන්නා දැමූ
ජාතීන්ගේ[6] පිළිකුල්සහගත වත්පි-
ළිවෙත් අනුගමනය කරමින්[7] ඔහු
තම පුත්‍රයන්ව ගින්නෙන් දවා පූජා
කළේය.[8] **4** ඔහු බොරු නමස්කා-
රය සඳහා වෙන් කර තිබූ පූජනීය
ස්ථානවලද[9] කඳු මුදුන්වලද[10] සරු-
සාරව වැඩුණු ගස් යටද[11] පූජා සහ
සුවඳ දුම් නිතිපතා ඔප්පු කළේය.[12]

**5** එහෙයින් දෙවි වූ යෙහෝවා
ඔහුව සිරියාවේ රජු[13] අතට හසු කර
දුන්නේය.[14] ඔහුට දරුණු ලෙස පහර
දුන් සිරියානුවෝ සෙනඟගෙන් විශාල
පිරිසක් අල්ලාගෙන දමස්කයට ගෙන
ගියෝය.[15] ආහස් රජුට ඊශ්‍රායෙල්හි
රජුටද යටත් වීමට සිදු විය.[16] ඊශ්‍රා-
යෙල්හි රජුද ඔහුගේ සෙනඟගෙන්
බොහෝදෙනෙකුව ඝාතනය කළේය.
**6** ඔවුන් තම මුතුන්මිත්තන්ගේ දෙවි
වන යෙහෝවාව අත්හැරිය නිසා[17]
රෙමලියාගේ පුත්[18] පේකා[19] යූදාහි
වැසියන් අතර සිටි එඩිතර පුරුෂයන්
එක්ලක්ෂ විසිදහසක් එක් දිනකදී
මරා දැමුවේය. **7** එමෙන්ම එෆ්‍රායිම්
ගෝත්‍රයට අයත් බලසම්පන්න පුරුෂ-
යෙකු[20] වූ ෂික්රී, රජුගේ පුත්‍රයෙකු වූ
මයසේයාවද රජුගේ ගෙයි වැසියන්ව
බලාගත් අශ්‍රිකාම්වද රජුගේ දෙව-
නියා ලෙස සේවය කළ එල්කානාවද
මරා දැමීය. **8** ඊශ්‍රායෙල්වරු ඔවුන්-
ගේ සහෝදරයන් වූ යූදාහි වැසියන්
දෙලක්ෂයක් වහලුන් ලෙස ගෙන

**27 පරි.**
1 2රාජා 15:34
2ලේක 26:4
2 2ලේක 26:16
ගීතා 119:120
3 2රාජා 15:35
4 යෙරෙ 20:2
5 2ලේක 33:14
නෙහෙ 3:26
6 යොෂු 14:12
7 2ලේක 11:5
2ලේක 14:7
8 1සාමු 23:15
9 2ලේක 17:12
10 2රාජා 9:17
2ලේක 26:10
11 විනි 11:4
2සාමු 10:1
2ලේක 20:1
යෙරෙ 49:1
12 1රාජා 5:11
13 2ලේක 2:10
14 ද්වි 8:8
2ලේක 2:15
15 2ලේක 26:8
16 2ලේක 19:3
2ලේක 26:5
17 2රාජා 15:36
18 2රාජා 8:23
2රාජා 12:19
19 2රාජා 15:33
20 2සාමු 7:12
21 2සාමු 5:9
1රාජා 14:31
22 2රාජා 15:38

**28 පරි.**
23 2රාජා 16:2
1ලේක 3:13
යෙසා 7:1
හොෂෙ 1:1
මීකා 1:1
මතෙ 1:9
24 2රාජා 16:2

**2 තීරුව**
1 1රාජා 3:14
2 1රාජා 12:28
1රාජා 16:33
3 නික් 34:17
ලෙවී 19:4
විනි 2:11
4 2රාජා 23:10
යෙරෙ 7:31
5 හොෂෙ 2:13
6 2රාජා 16:3
7 ද්වි 12:31
2රාජා 21:2
2ලේක 33:2
8 2ලේක 33:6
9 ලෙවී 26:30
10 1රාජා 14:23
11 යෙසා 57:5
12 2රාජා 16:4
13 2රාජා 16:6
2ලේක 24:24
14 විනි 2:14
2ලේක 33:11
2ලේක 36:17
ගීතා 76:12

**15** උත් 14:15; 2සාමු 8:6; 1ලේක 18:5; **16** 2රාජා 16:5; **17** ද්වි 6:14; ද්වි 31:16; 2ලේක 15:2; ගීතා 73:27; යෙසා 1:28; යෙරෙ 2:19; **18** යෙසා 7:9; **19** 2රාජා 15:37; යෙසා 7:1; **20** යෙසා 9:21.

**2ලේක 28:3*** මූ.අ., "හින්නොම් පුත්‍රයන්ගේ නිම්නය."

ගියෝය. ඔවුන් අතර ස්ත්‍රීහුද දරු-
වෝද සිටියෝය. ඔවුහු මහත් වස්තු
සම්භාරයක්ද කොල්ල කාගෙන ඒවා
සමාරියට ගෙන ගියෝය.[1]
**9** ඒ කාලයේදී ඕදෙද් නම් යෙ-
හෝවා දෙවිගේ අනාගතවක්තෘවර-
යෙක් සිටියේය. ඔහු සමාරිය බලා
ගමන් කරමින් සිටි හමුදාව වෙතට
ගොස් ඔවුන්ට මෙසේ පැවසීය. “ඔබේ
මුතුන්මිත්තන්ගේ දෙවි වන යෙ-
හෝවා යූදාහි වැසියන්ව ඔබේ අතට
හසු කර දුන්නේ ඔහු ඔවුන් සමඟ උද-
හස්ව සිටි නිසයි.[2] ඔබත් කෝපයෙන්
ඔවුන්ගෙන් බොහෝදෙනෙකුව මරා
දැමුවා.[3] මෙසේ ඔබ කෝපයෙන්
වියරු වැටී කොතරම් දුරට දුෂ්ට ක්‍රියා
කළාද කියනවා නම් එය ස්වර්ගය
දක්වාම නැග්ගා.[4] **10** දැන් ඔබ යූදා
හා යෙරුසලමේ වැසියන්ව ගෙන
යන්නේ ඔබේ මෙහෙකාරකමටයි.[5]
නමුත් ඔබත් යෙහෝවා දෙවිට විරුද්-
ධව බොහෝ වැරදි කළ බව ඔබට
මතක නැද්ද? **11** මම කියන දේට
සවන් දෙන්න. යෙහෝවා දෙවි දැන්
ඔබ සමඟ උදහස් වී සිටිනවා.[6] ඒ
නිසා ඔබ අල්ලාගත් ඔබේ සහෝදර-
යන්ව දැන් නිදහස් කරන්න.”[7]
**12** එප්‍රායිම්වරුන් අතරේ[8] ප්‍රධා-
නීන් ලෙස සේවය කළ[9] යෙ-
හෝහානන්ගේ පුත් අෂරියා,
මෙෂිල්ලෙමොත්ගේ පුත් බෙරෙකියා,
ෂල්ලුම්ගේ පුත් යෙහිෂ්කියා සහ හද්-
ලයිගේ පුත් අමාසා යුද්ධයට ගොස්
පැමිණෙන අයව හමු වී, **13** ඔවුන්ට
මෙසේ පැවසුවෝය. “ඔබ අල්ලා-
ගත් මේ සෙනඟව මෙහාට ගෙ-
නෙන්න එපා. එහෙම කළොත් අපි
යෙහෝවා දෙවිට විරුද්ධවයි ක්‍රියා
කරන්නේ. මේ වෙද්දීත් ඊශ්‍රායෙල්
ජාතියට විරුද්ධව දෙවි උදහස් වෙ-
ලයි ඉන්නේ.[10] අපි දැනටමත් බො-
හෝ වැරදි කර තිබෙනවා.[11] මේ දේ
කළොත් අපේ වැරදි තවත් වැඩි වෙ-
නවා.” **14** එහෙයින් හමුදාව[12] අධි-
පතීන්[13] සහ සෙනඟ ඉදිරිපිටදීම
තමන් රැගෙන ආ වහලුන්ව[14] හා
කොල්ලය අත්හැර දමා එතැනින් පිට
වී ගියෝය. **15** ඉන්පසු තෝරාගත්
පුරුෂයෝ[1] පිරිසක් වහලුන් ළඟට
පැමිණ හමුදාව රැගෙන ආ කොල්ල-
යෙන්, ඇඳුම් අවශ්‍යව සිටි අයට
ඇඳගැනීමට ඇඳුම්ද[2] පාවහන්ද දුන්-
නෝය. එපමණක්ද නොව ඔවුන්ට
අවශ්‍ය කෑම බීමද[3] ඔවුන්ගේ ශරීරයේ
ගැල්වීමට තෙල්ද දෙන ලදි. ඉන්පසු
ඔවුහු අබලදුබල අයව බූරුවන් පිට
නංවාගෙන[4] එතැන සිටි සියලුදෙ-
නාවම ඔවුන්ගේ දේශයට රැගෙන
ගියෝය. තාල වර්ගයේ ගස්වලට,
නම් දැරූ[5] නුවරක් වන යෙරිකෝවට[6]
ඔවුන්ව ගෙන ගිය පසු ඔවුහු ආපසු
සමාරිය[7] බලා පිටත් වූහ.
**16** ඒ කාලයේදී ආහස් රජ[8] ඇසිරි-
යාවේ රජවරුන්ගෙන්[9] උපකාර
පැතීය. **17** ඒදොම්වරු නැවතත්[10]
යූදා දේශයට පැමිණ එහි වැසි-
යන්ට පහර දී ඔවුන්ගෙන් සමහරෙ-
කුව වහල්කමට රැගෙන ගියෝය.
**18** පිලිස්තිවරුද[11] යූදා දේශයට
අයත් ෂෙපේලා නම් ප්‍රදේශයේ නුවර-
වලටද[12] නෙගෙබ් ප්‍රදේශයේ නුවර-
වලටද[13] පහර දී බෙත්-ෂෙමෙෂ්,[14]
ආයාලොන්[15] සහ ගෙදේරොත්[16] යන
නුවරවල්ද සෝකෝ[17] හා ඒ අවට
පිහිටි නුවරවල්ද තිම්නාහ්[18] හා ඒ
අවට පිහිටි නුවරවල්ද ගිම්ෂෝ හා ඒ
අවට පිහිටි නුවරවල්ද අල්ලාගෙන
එහි වාසය කිරීමට පටන්ගත්තෝය.
**19** ඊශ්‍රායෙල්හි* රජු වූ ආහස් යෙ-
හෝවා දෙවිට විරුද්ධව බරපතළ
ලෙස වැරදි කළ නිසා යූදා වැසියන්-
ගේ සදාචාරය පිරිහී ගියේය.[19] එහෙ-
යින් යෙහෝවා දෙවි යූදා දේශයට
දඬුවම් කළේය.[20]
**20** කල් යත්ම ඇසිරියාවේ රජු වූ
තිල්ගත්-පිල්නෙසෙර්[21] ඔහුගේ උප-
කාරයට පැමිණෙනවා වෙනුවට ඔහුට
විරුද්ධව පැමිණ ඔහුට පීඩා කරමින්[22]

**28 පරි.**
1 1රාජා 16:24; 1රාජා 22:51
2 විනි 3:8; ගීතා 69:26; යෙසා 10:5; සෙක 1:15
3 එස 25:12
4 උත් 4:10; එස්රා 9:6; එළි 18:5
5 ලෙවී 25:39; ලෙවී 25:46; 2ලේක 8:9
6 මතෙ 7:2; යාකො 2:13
7 යෙසා 58:6; යෙරෙ 34:15
8 යෙසා 9:21
9 1ලේක 28:1
10 නික් 22:24; යොෂු 22:18; රෝම 2:5
11 ගණන් 32:14
12 1ලේක 12:23
13 1ලේක 28:1; දේශ 12:11
14 2ලේක 28:8

**2 තීරුව**
1 2ලේක 28:12
2 යෝබ් 31:19; ගීතා 106:46; යෙසා 58:7
3 2රාජා 6:22; ලූක් 6:27; රෝම 12:20; යාකො 2:15
4 රෝම 15:1
5 ද්වි 34:3; විනි 1:16
6 ගණන් 22:1; යොෂු 6:1
7 1රාජා 16:24
8 2රාජා 16:7; යෙසා 7:10
9 යෙසා 7:17
10 ලෙවී 26:18; ඔබ 10
11 1සාමු 5:1; 1සාමු 31:11; 2ලේක 26:6
12 ද්වි 1:7; යොෂු 9:1; 2ලේක 26:10
13 ගණන් 21:1; ද්වි 34:3; 2සාමු 24:7
14 යොෂු 15:10; 1සාමු 6:9
15 2ලේක 11:10
16 යොෂු 15:41
17 යොෂු 15:35
18 විනි 14:1
19 නික් 32:25
20 ලෙවී 26:18; ද්වි 28:43; 1සාමු 2:7; යෝබ් 40:12

**21** 2රාජා 15:29; 2රාජා 16:7; 1ලේක 5:26; **22** 2රාජා 17:5; යෙසා 7:20.

2ලේක **28:19*** එනම්, යූදාහි.

ඔහුගේ බලය තවත් දුර්වල කළේය.
**21** ආහස් රජු යෙහෝවා දෙවිගේ
ගෘහයෙන්ද[1] රජමාලිගාවෙන්ද[2] අධිප-
තීන්ගේ මන්දිරයෙන්ද[3] ගත හැකි
සෑම වටිනා දෙයක්ම රැගෙන ඇසිරි-
යාවේ රජුට තෑගි කළත්[4] එයින් කිසි
පලක් වූයේ නැත. **22** ආහස් රජ
මෙතරම් පීඩාවලට මුහුණ දුන්නත්
යෙහෝවා දෙවිට විරුද්ධව කළ දුෂ්ට-
කම් නතර කළේ නැත. ඔහු තව
තවත් වැඩියෙන් දුෂ්ටකම් කළේය.[5]
**23** ඔහු තමාට පීඩා කළ සෙනඟගේ
දෙවිවරුන්ට එනම්, දමස්කයේ දෙවි-
වරුන්ට*[6] පවා පූජා ඔප්පු කිරීමට
පටන්ගත්තේය.[7] ඔහු එසේ කළේ,
“සිරියාවේ රජවරුන්ගේ දෙවිවරුන්
ඔවුන්ට පිහිට වන නිසා[8] ඒ දෙවි-
වරුන්ගේ පිහිට ලබාගන්න මමත්
ඒ දෙවිවරුන්ට පූජා ඔප්පු කරන්න
ඕනේ”[9] කියා සිතූ නිසාය. මෙසේ ඒ
දෙවිවරුන් පසුපස ගිය ඔහුද ඊශ්‍රා-
යෙල් සෙනඟද තව තවත් දුෂ්ටකම්
කිරීමට පෙලඹුණෝය.[10] **24** ආහස්
රජ සැබෑ දෙවිගේ ගෘහයේ භාවිත
කළ භාජන[11] ගෙන ඒවා කැබලි
කළ අතර[12] යෙහෝවා දෙවිගේ ගෘහ-
යේ දොරටු වසා දැමුවේය.[13] ඉන්පසු
ඔහු යෙරුසලම පුරාම පූජාසන ඉදි
කළේය.[14] **25** ඔහු යූදා දේශයෙහි
පිහිටි සෑම නුවරකම බොරු දෙවිව-
රුන්ට සුවඳ දුම් ඔප්පු කිරීම සඳහා[15]
පූජනීය ස්ථානද පිහිටෙව්වේය.[16] එම-
ගින් ඔහු තම මුතුන්මිත්තන්ගේ දෙවි
වන යෙහෝවාව තව තවත් උදහස්
කළේය.[17]

**26** ආහස් රජුගේ ජීවිතයේ අනි-
කුත් සියලු විස්තරද[18] ඔහු කළ සියලු
දේවල්ද යූදාහි හා ඊශ්‍රායෙල්හි රජව-
රුන්ගේ ඉතිහාසය වාර්තා කර ඇති
ලියවිල්ලෙහි සඳහන් කර තිබේ.[19]
**27** කල් යත්ම ආහස් රජු මිය ගියේය.
ඔහුගේ මුතුන්මිත්තන් මෙන් ඔහු-
වද තැන්පත් කළේය. නමුත් ඔහුව
ඊශ්‍රායෙල්හි රජවරුන්ව තැන්පත්
කළ ස්ථානයෙහි තැන්පත් නොක-
ළේය.[1] ඔහුව යෙරුසලමෙහි තැන්-
පත් කළේය. ඔහු වෙනුවට ඔහුගේ
පුත් හෙසකියා රජකමට පත් විය.

**29** හෙසකියා[2] රජකමට පත්
වන විට ඔහුගේ වයස අවුරුදු
විසිපහකි. ඔහු යෙරුසලමේ සිට අවු-
රුදු විසිනවයක් පාලනය කළේය.
ඔහුගේ මව සෙකරියාගේ දියණිය
වූ අබියාය.[3] **2** තම මුතුන්මිත්තා
වූ දාවිත් මෙන්[4] හෙසකියාද යෙ-
හෝවා දෙවි යහපත්යයි සලකන
දේ දිගටම කළේය.[5] **3** ඔහු රජක-
මට පත් වූ අවුරුද්දේ මුල්ම මාස-
යේදීම යෙහෝවා දෙවිගේ ගෘහයේ
දොරටු විවෘත කර ඒවා අලුත්වැ-
ඩියා කළේය.[6] **4** ඔහු පූජකයන්ව
හා ලෙවීවරුන්ව නැඟෙනහිර දෙසින්
පිහිටි එළිමහන් බිමකට රැස් කරවා[7]
**5** ඔවුන්ට මෙසේ පැවසීය. “ලෙවීව-
රුනි, මට සවන් දෙන්න. පවිත්‍ර
වී, පරිශුද්ධ සේවය සඳහා සූදානම්
වෙන්න.[8] ඔබේ මුතුන්මිත්තන්ගේ
දෙවි වන යෙහෝවාගේ ගෘහයද පවිත්‍ර
කරන්න. ශුද්ධස්ථානයෙන් සියලුම
අපවිත්‍ර දේවල් පිටතට ගෙන යන්න.[9]
**6** අපේ පියවරුන් යෙහෝවා දෙවිට
ද්‍රෝහි වී[10] ඔහු පිළිකුල් කරන දේවල්
කළා.[11] ඔවුන් ඔහුට පිටු පා ඔහු-
ගෙන් ඉවත්ව ගියා.[12] යෙහෝවා දෙ-
විගේ ශුද්ධස්ථානයේදී ඔහුට කළ
නමස්කාරයද ඔවුන් අත්හැර ගියා.[13]
**7** ඔවුන් ශුද්ධස්ථානයට ඇතුල් වන
ශාලාවේ දොරටු වසා දැමුවා.[14] ඔවුන්
එහි පහන් දැල්වූයේවත්[15] සුවඳ ද්‍රව්‍ය
දැව්වේවත්[16] නැහැ. ඒ විතරක් නෙ-
වෙයි, ඒ ශුද්ධ භූමිය තුළ ඊශ්‍රා-
යෙල්හි දෙවිට ඔවුන් දවන පූජා
ඔප්පු කළේවත් නැහැ.[17] **8** ඒ නිසා
යෙහෝවා දෙවි යූදා හා යෙරු-
සලමෙහි වැසියන් සමඟ උදහස්
වී[18] ඔවුන්ව වෙනත් ජාතීන් ඉදිරි-
යේ නින්දාවට ලක් වෙන්න ඉඩ-

**28 පරි.**
**1** 2ලේක 12:9
**2** 2රාජා 18:15
**3** 1ලේක 28:1
**4** 2රාජා 18:16
**5** ගීතා 52:7 හිතෝ 19:3
**6** 2රාජා 16:12 2රාජා 16:13
**7** 2ලේක 25:14 යෙරෙ 44:5
**8** හබ 1:11
**9** යෙරෙ 10:5 යෙරෙ 44:18
**10** නික් 23:33 ද්වි 7:16 යෙසා 1:28
**11** 1රාජා 7:45 2ලේක 4:18
**12** 2රාජා 16:17
**13** 1රාජා 6:34 2ලේක 29:7
**14** 2ලේක 33:5 යෙරෙ 2:28
**15** 2ලේක 28:4
**16** 1රාජා 14:23 2රාජා 15:35 2ලේක 21:11 2ලේක 33:3
**17** 1කොරි 10:22
**18** 2ලේක 27:7
**19** 2රාජා 16:19

**2 තීරුව**
**1** 2ලේක 21:20 2ලේක 33:20 හිතෝ 10:7

**29 පරි.**
**2** 2රාජා 18:1 යෙසා 1:1 හොෂෙ 1:1 මකෙ 1:10
**3** 2රාජා 18:2
**4** 1රාජා 3:14 1රාජා 15:5 2රාජා 18:3
**5** 2ලේක 31:20 හිතෝ 10:9
**6** 1රාජා 6:34 2ලේක 28:24
**7** 2ලේක 32:6
**8** නික් 19:15 1ලේක 15:12
**9** 2රාජා 18:4 එස 8:3
**10** 2ලේක 28:23 2ලේක 34:21 එස්රා 5:12 නෙහෙ 9:16
**11** යෙරෙ 44:21
**12** යෙරෙ 2:13
**13** යෙරෙ 2:27 එස 8:16
**14** 1රාජා 6:34
**15** ලෙවී 24:2
**16** නික් 30:8 2ලේක 13:11
**17** නික් 29:38 මලා 1:10

**2ලේක 28:23*** මූ.අ., “තමාට පහර දුන් දමස්කයේ දෙවිවරුන්ට.”

**18** ද්වි 28:15; 2ලේක 24:18.

හැරියා.[1] එය ඔවුන්ව මොන තරම්
පුදුමයට පත් කරවන්නක් වුණාද![2]
ඔවුන්ට සිදු වූ දේ දුටු සියල්ලන්
හොඳටම භය වුණා.[3] ඒ සියල්ලේ
ප්‍රතිඵල දැන් ඔබටත් ඔබේම ඇස්-
වලින් දකින්න ලැබෙනවා නේද?
**9** ඒ ක්‍රියාවන් නිසා අපේ මුතුන්මිත්-
තන් කඩු පහරින් මිය ගියා.[4] අපේ
දූපුතුන්ව හා භාර්යාවන්ව වහලුන්
හැටියට ගෙන ගියා.[5] **10** ඒ නිසා
දැන් මගේ එකම ආශාව ඊශ්‍රායෙල්හි
දෙවි වන යෙහෝවා සමඟ ගිවිසුමක්
ඇති කරගැනීමයි.[6] එතකොට අපිට
විරුද්ධව ඇවුළුණු ඔහුගේ උදහස
පහ වෙලා යයි. **11** මගේ පුත්‍රයෙනි,
ඔබට ලැබී ඇති වගකීම ගැන සුළු-
වෙන් හිතන්න එපා.[7] තමන් ඉදිරියේ
සුවඳ ද්‍රව්‍ය ඔප්පු කරන්නත්[8] දිගටම
සේවය කරන්නත්[9] යෙහෝවා දෙවි
තෝරාගෙන තිබෙන්නේ ඔබවයි."[10]

**12** ලෙවීවරු[11] ඔහු පැවසූ දේට
එකඟව ක්‍රියා කිරීමට වහාම පියවර
ගත්හ. ඔවුන්ගේ නම් මෙසේය. කෝ-
හාත්ගෙන් පැවතෙන්නන්[12] අතරින්
අෂරියාගේ පුත් යෝවෙල් සහ අමාසා-
යිගේ පුත් මාහත්ද මෙරාරීගෙන් පැව-
තෙන්නන්[13] අතරින් අබ්දීගේ පුත් කිෂ්
සහ යෙහල්ලෙලෙල්ගේ පුත් අෂරි-
යාද ගේර්ෂොන්ගෙන් පැවතෙන්නන්[14]
අතරින් සිම්මාගේ පුත් යෝවා සහ
යෝවාගේ පුත් ඒදන්ද **13** එලිෂා-
ෆාන්ගෙන් පැවතෙන්නන්[15] අතරින්
ෂිම්රි සහ යෙවුයෙල්ද ආසාෆ්ගෙන්
පැවතෙන්නන්[16] අතරින් සෙකරියා
සහ මත්තනියාද **14** හේමාන්ගෙන්
පැවතෙන්නන්[17] අතරින් යෙහීයෙල්
සහ ෂිමෙයිද යෙදූතුන්ගෙන් පැව-
තෙන්නන්[18] අතරින් ෂෙමායා සහ
උස්සියෙල්ද යන අයය. **15** සෙසු
ලෙවීවරුන්වද රැස් කරගත් ඔවුහු
මුලින්ම පවිත්‍ර වී,[19] රජු අණ කළ
ලෙස[20] යෙහෝවා දෙවිගේ ගෘහය
පවිත්‍ර කිරීමට පියවර ගත්තෝය.[21]
ඔවුහු එය කළේ යෙහෝවා දෙවි පවසා
තිබූ ආකාරයටය. **16** යෙහෝවා දෙ-
විගේ ගෘහය පවිත්‍ර කිරීම සඳහා එයට
ඇතුල් වූ පූජකයෝ යෙහෝවා දෙවි-
ගේ ගෘහයේ තිබූ සියලුම අපවිත්‍ර
දේවල් යෙහෝවා දෙවිගේ ගෘහයේ
මළුවට ගෙනාවෝය.[1] ඉන්පසු ලෙවී-
වරු මළුවෙන් පිටතට ඒ අපවිත්‍ර
දේවල් රැගෙන ගොස් කිද්‍රොන් නිම්න-
යට වීසි කළෝය.[2] **17** ඔවුන් මෙම
පවිත්‍ර කිරීමේ කාර්යය ආරම්භ කළේ
පළමු මාසයේ මුල්ම දවසේදීය. ඔවුහු
එම මාසයේ අටවන දවස වන විට යෙ-
හෝවා දෙවිගේ ගෘහයේ ශුද්ධස්ථාන-
යට ඇතුල් වන ශාලාව[3] පවිත්‍ර කිරීමට
පටන්ගත්තෝය. යෙහෝවා දෙවිගේ
ගෘහය පවිත්‍ර කිරීමට ඔවුන්ට දවස්
අටක් ගත විය. මෙසේ ඔවුහු සියලුම
පවිත්‍ර කිරීමේ වැඩකටයුතු පළමු මාස-
යේ දහසයවන දිනේදී[4] නිම කළෝය.

**18** ඉන්පසු හෙසකියා රජු ළඟට
පැමිණි ඔවුහු මෙසේ පැවසූහ. "අපි
යෙහෝවා දෙවිගේ මුළු ගෘහයත්
දවන පූජා ඔප්පු කරන පූජාසන-
යත්[5] සියලුම භාජනත්[6] රොටි පිදීමට
භාවිත කරන මේසයත්[7] ඒ සඳහා
භාවිත කරන සියලුම බඳුනුත්[8] පරි-
ශුද්ධ සේවය සඳහා පවිත්‍ර කළා.
**19** ඒ විතරක් නෙවෙයි, ආහස් රජු-
ගේ[9] දුෂ්ට පාලන සමයේදී[10] අහක
දැමූ භාජන[11] වෙනුවට අපි අලුත් ඒවා
හැදුවා. අපි ඒවාත් පවිත්‍ර කළා.[12] දැන්
යෙහෝවා දෙවිගේ පූජාසනය ඉදිරියේ
ඒවා තබා තිබෙනවා."

**20** හෙසකියා රජ[13] උදැසනම
නැඟිට[14] නුවරේ සිටි අධිපතීන්[15]
සමඟ යෙහෝවා දෙවිගේ ගෘහයට
ගියේය. **21** යූදා රාජ්‍යය, ශුද්ධස්-
ථානය හා දේශය වෙනුවෙන් ඔවුහු
පාප පූජාවක් ලෙස[16] ගොනුන් හත්දෙ-
නෙකුවද[17] බැටළුවන් හත්දෙනෙකු-
වද බැටළු පැටවුන් හත්දෙනෙකුවද
එළුවන් හත්දෙනෙකුවද ගෙනාවෝය.
ඉන්පසු එම සතුන්ව යෙහෝවා දෙවි-
ගේ පූජාසනය මත ඔප්පු කරන
ලෙස හෙසකියා රජ ආරොන්ගෙන්
පැවත ආ පූජකයන්ට[18] පැවසුවේය.
**22** මුලින්ම පූජකයෝ ගොනුන්ව

**29 පරි.**
**1** 1රාජා 9:8; යෙරෙ 18:16
**2** ලෙවී 26:32
**3** ද්වි 28:25
**4** ලෙවී 26:17
**5** 2ලේක 28:5
**6** 2ලේක 15:12
**7** යොහ 5:17; 1කොරි 15:58
**8** ගණන් 16:40; ගණන් 18:7
**9** ගණන් 3:6; ගණන් 18:2; ගණන් 18:6; ද්වි 10:8; ලූක් 12:48
**10** 1ලේක 15:2; 1ලේක 23:13; 2ලේක 13:10
**11** 1ලේක 23:3
**12** ගණන් 4:2; 1ලේක 15:5; 1ලේක 23:12
**13** 1ලේක 15:6; 1ලේක 23:21
**14** 1ලේක 15:7; 1ලේක 23:7
**15** 1ලේක 15:8
**16** 1ලේක 15:17; 1ලේක 25:2
**17** 1ලේක 25:5
**18** 1ලේක 25:1; 1ලේක 25:6
**19** 2ලේක 29:5
**20** 2ලේක 30:12
**21** 1ලේක 23:28

**2 තීරුව**
**1** 1රාජා 6:36
**2** 2රාජා 23:4; 2රාජා 23:6; 2ලේක 15:16; යොහ 18:1
**3** 1රාජා 6:3; 1ලේක 28:11; 2ලේක 3:4
**4** නික් 12:2
**5** 2ලේක 4:1
**6** 1රාජා 7:40; 2ලේක 4:11
**7** 1රාජා 7:48; 2ලේක 4:8; 2ලේක 13:11
**8** 1රාජා 7:50
**9** 2ලේක 28:1
**10** 2ලේක 28:2; 2ලේක 28:25
**11** 2ලේක 28:24
**12** 2ලේක 29:5
**13** 2රාජා 18:1; මතෙ 1:10
**14** නික් 24:4; යොෂු 6:12
**15** 1ලේක 28:1
**16** ලෙවී 4:3; ලෙවී 4:14; ගණන් 15:22; ගණන් 15:24
**17** 1ලේක 15:26
**18** ගණන් 18:1

මරා[1] උන්ගේ ලේ[2] පූජාසනය මත
ඉසුවෝය.[3] ඊළඟට ඔවුහු බැටළු-
වන්ව මරා[4] උන්ගේ ලේත් පූජාසනය
මත ඉසුවෝය.[5] පසුව ඔවුහු බැටළු
පැටවුන්ව මරා උන්ගේ ලේත් පූජා-
සනය මත ඉසුවෝය. **23** අවසන්
වශයෙන් පාප පූජාවක් ලෙස ඔප්පු
කිරීමට ගෙනා එළුවන්ව,[6] රජු හා රජු
සමඟ රැස්ව සිටි අය ළඟට ගෙනා
පූජකයෝ එම එළුවන් පිට තම
අත් තැබුවෝය.[7] **24** ඉන්පසු ඔවුහු
උන්ව මරා උන්ගේ ලේ රැගෙන මුළු
ඊශ්‍රායෙල් සෙනඟගේ පව්වලට සමාව
ලබාගන්නා පිණිස[8] පාප පූජාවක්
ලෙස ඔප්පු කළෝය. ඔවුන් එසේ
කළේ දවන පූජාව සහ පාප පූජාව මුළු
ඊශ්‍රායෙල් ජාතිය වෙනුවෙන්ම[9] ඔප්පු
කළ යුතු බව[10] රජු පැවසූ නිසාය.
**25** ඒ අතරතුර රජුගේ අණ පරිදි
ලෙවීවරු[11] යෙහෝවා දෙවිගේ ගෘහ-
යෙහි අත්තාළම්,[12] වීණා[13] සහ කුඩා
වීණා[14] අතැතිව සිටගෙන සිටියෝය.
ඔවුන් එසේ සිටියේ යෙහෝවා දෙවි
දාවිත් රජු මාර්ගයෙන්ද[15] අනාගත-
වක්තෘවරුන් වූ ගාත්[16] සහ නාතන්[17]
මාර්ගයෙන්ද අණ කර තිබූ ආකාරය-
ටය.[18] **26** මෙසේ ලෙවීවරු දාවිත්
රජුගේ කාලයේ සැදූ සංගීත භාණ්ඩ
අතැතිවද[19] පූජකයෝ හොරණෑ අතැ-
තිවද[20] සිටගෙන සිටියෝය.
**27** එවිට හෙසකියා රජ දවන
පූජාව පූජාසනය මත තබා එය ඔප්පු
කරන ලෙස අණ කළේය. දවන පූජාව
ඔප්පු කිරීමට නියමිත වේලාව පැමිණි
විට යෙහෝවා දෙවිට ප්‍රශංසා ගී ගැයී-
මත්[21] හොරණෑ පිඹීමත් ආරම්භ විය.
දාවිත් රජුගේ කාලයේ සැදූ සංගීත
භාණ්ඩ වාදනය කරන අතරතුර ඊට
පසුබිම් වාදනයක් ලෙස හොරණෑ
පිඹිනු ලැබීය. **28** දවන පූජාව ඔප්පු
කරන අතරතුර හොරණෑ හඬ මැදින්
ප්‍රශංසා ගී ගයන ලදි.[22] රැස්ව සිටි සිය-
ලුදෙනා ඒ කටයුතු නිම වන තුරුම
තම හිස් බිමට පහත් කරගෙන සිටි-
යෝය.[23] **29** පූජාව ඔප්පු කර අව-
සන් වූ විගස රජද ඔහු සමඟ සිටි අයද
දණින් වැටුණෝය.[1] **30** දාවිත් රජු[2]
සහ අනාගතවක්තෘ ආසාෆ්[3] රචනා
කළ ගී ගායනා කරමින් යෙහෝවා
දෙවිට ප්‍රශංසා කරන ලෙස හෙසකියා
රජ සහ ඔහුගේ අධිපතීහු[4] ලෙවීව-
රුන්ට පැවසුවෝය. දණින් වැටී හිස
පහත් කරගෙන[5] සිටි ඔවුහු ඉතා ප්‍රීති-
යෙන්[6] ප්‍රශංසා ගී ගායනා කළෝය.
**31** හෙසකියා රජ ඔවුන්ට මෙසේ
පැවසුවේය. "දැන් ඔබ යෙහෝවා දෙ-
විට සේවය කරන්න සූදානම්.[7] ඒ නිසා
යෙහෝවා දෙවිගේ ගෘහයට ස්තුති
පූජා[8] සහ වෙනත් පූජා[9] රැගෙන
යන්න." එවිට රැස්ව සිටි සියලුදෙ-
නාම ස්තුති පූජාද වෙනත් පූජාද
ගෙනාවෝය. දවන පූජා[10] ඉදිරිපත්
කිරීමට සතුටු වූ අය ඒවා ගෙ-
නාවෝය. **32** සෙනඟ දවන පූජා
සඳහා ගවයන් සැත්තෑවක්ද බැටළු-
වන් සියයක්ද බැටළු පැටවුන් දෙසිය-
යක්ද ගෙනාවෝය. මේ සියල්ල දවන
පූජා ලෙස යෙහෝවා දෙවිට ඔප්පු
කරන ලදි.[11] **33** ශුද්ධ පූජා ලෙස
ගවයන් හයසියයක්ද බැටළුවන් තුන්-
දහසක්ද ගෙනෙන ලදි. **34** නමුත්
පූජකයන්[12] සුළු පිරිසක් සිටි නිසා
දවන පූජා සඳහා ගෙනා සියලුම
සතුන්ව හම ගසා පූජාවට සූදා-
නම් කිරීමට ඔවුන්ට නොහැකි විය.[13]
එහෙයින් ඔවුන්ගේ සහෝදරයන් වූ[14]
ලෙවීවරු, දවන පූජා සූදානම් කිරීමේ
කාර්යය නිම වන තුරුත්[15] පූජකයන්
සියලුදෙනාම පවිත්‍ර වන තුරුත්[16] එහි
සිටි පූජකයන්ට සහය වූහ. මන්ද
තමන්ව පවිත්‍ර කරගැනීම ගැන පූජක-
යන්ට වඩා ලෙවීවරු සැලකිලිමත්
වූහ.[17] එමනිසා ඔවුහු ඉක්මනින් එම
කාර්යයට සහයෝගය දැක්වූවෝය.
**35** එපමණක්ද නොව දවන පූජාද[18]
හවුල් පූජා[19] සඳහා ඔප්පු කළ තෙල්
කොටස්ද[20] දවන පූජා සමඟ ඔප්පු

**29 පරි.**

**1** ලෙවී 3:2; ලෙවී 4:4; ලෙවී 8:15
**2** ලෙවී 4:7
**3** ලෙවී 1:5; ලෙවී 4:18; හෙබ්‍රෙ 9:21
**4** ලෙවී 8:18
**5** ලෙවී 8:19
**6** ලෙවී 9:15
**7** ලෙවී 1:4; ලෙවී 4:15
**8** ලෙවී 6:30; රෝම 5:10; හෙබ්‍රෙ 2:17
**9** ලෙවී 4:13
**10** දානි 9:24; කොලො 1:20; 1යොහ 2:2
**11** 1ලේක 9:33; 1ලේක 15:16
**12** 1ලේක 16:5; 2ලේක 5:12
**13** 1ලේක 25:6; 2ලේක 9:11; ගීතා 149:3
**14** 1රාජා 10:12; 1ලේක 25:1
**15** 1ලේක 28:13; 2ලේක 8:14
**16** 2සාමු 24:11; 1ලේක 29:29
**17** 2සාමු 7:2; 2සාමු 12:1
**18** 2ලේක 30:12
**19** 1ලේක 23:5; ගීතා 150:3; යෙසා 38:20
**20** ගණන් 10:8; 1ලේක 15:24; 2ලේක 5:12
**21** 2ලේක 20:21; 2ලේක 23:18
**22** ගීතා 68:25; ගීතා 89:15
**23** 2ලේක 7:3

**2 තීරුව**

**1** 1ලේක 29:20; 2ලේක 20:18; ගීතා 72:11
**2** 2සාමු 23:1
**3** 1ලේක 16:7
**4** 1ලේක 28:1
**5** ගීතා 95:6
**6** ගීතා 32:11; ගීතා 33:1; ගීතා 95:1; පිලි 4:4
**7** නික් 32:29; ලෙවී 8:33; ලෙවී 16:32
**8** ලෙවී 7:12
**9** ලෙවී 1:2
**10** ලෙවී 1:3; ලෙවී 23:38
**11** 1රාජා 3:4; 1රාජා 8:63; 1ලේක 29:21

**12** ගණන් 18:7; 2ලේක 30:16; **13** 2ලේක 30:17; **14** ගණන් 8:15; ගණන් 8:19; ගණන් 18:2; ගණන් 18:6; **15** 2ලේක 35:11; **16** 2ලේක 30:3; **17** 1ලේක 29:17; ගීතා 7:10; ගීතා 94:15; **18** ලෙවී 1:3; 2ලේක 29:32; **19** ලෙවී 3:1; **20** නික් 29:13; ලෙවී 3:15; ලෙවී 3:16.

කරන පාන පූජාද[1] ඉතා විශාල
ප්‍රමාණයක් එදින ඔප්පු කරන ලදි.
මේ අයුරින් යෙහෝවා දෙවිගේ ගෘහ-
යේ වැඩකටයුතු යළි ආරම්භ කරනු
ලැබීය.[2] **36** සැම දෙයක්ම මෙත-
රම් ඉක්මනින් සහ සාර්ථකව ඉටු
කරගැනීමට[3] සැබෑ දෙවි තම සෙ-
නඟට ආශීර්වාද කළ නිසා ඒ ගැන
හෙසකියා රජද මුළු සෙනඟද ප්‍රීති-
යෙන් ඉපිල ගියෝය.[4]

**30** ඊශ්‍රායෙල්හි දෙවි වන යෙ-
හෝවාට ගෞරවය ගෙනෙන
පිණිස යෙරුසලමෙහි පිහිටි යෙ-
හෝවා දෙවිගේ ගෘහයේදී[5] පවත්-
වන පාස්කුවට[6] සහභාගි වන ලෙස
හෙසකියා රජ ඊශ්‍රායෙල් දේශයේ[7]
හා යූදා දේශයෙහි විසූ සියලුදෙ-
නාට ලිපි යවා දැන්වීය. ඔහු එෆ්‍රා-
යිම්[8] හා මනස්සේ[9] යන දේශවල
සිටි අයටද ඒ ගැන ලියා යැවීය.
**2** රජද ඔහුගේ අධිපතීහුද[10] යෙරුස-
ලමෙහි සිටි සියලුදෙනාද[11] පාස්කුව
දෙවන මාසයේ[12] පැවැත්වීමට තීර-
ණය කළෝය. **3** ඔවුන් එය දෙවන
මාසයේ පැවැත්වීමට තීරණය කළේ
පාස්කුව පැවැත්වීමට නියමිත පළමු
මාසයේදී ඔවුන්ට එය පැවැත්වීමට
නොහැකි වූ නිසාය.[13] ප්‍රමාණවත්
පූජකයන් සංඛ්‍යාවක්[14] දෙවි ඉදි-
රියේ පවිත්‍ර තත්වයක නොසිටීමත් ඒ
කාලය වන විට ජනතාව යෙරු-
සලමට රැස්ව නොසිටීමත් එය එසේ
කල් දැමීමට හේතු විය. **4** රජද
මුළු සෙනඟද එම තීරණයට එකඟ
වූහ.[15] **5** එහෙයින් ඊශ්‍රායෙල්හි දෙවි
වන යෙහෝවාට ගෞරවය ගෙ-
නෙන පිණිස යෙරුසලමෙහිදී පාස්-
කුව පවත්වන බවට ප්‍රකාශයක්[16]
බෙයර්-ෂෙබා සිට[17] දාන් දක්වා[18] මුළු
ඊශ්‍රායෙල් දේශය පුරාම පතළ කිරීමට
ඔවුහු තීරණය කළෝය. ඔවුන් එවැනි
තීරණයක් ගත්තේ අණ කර තිබූ
ලෙස[19] සියලුදෙනාටම එකට රැස් වී
පාස්කුව පැවැත්වීමට පසුගිය කාලය
පුරාම නොහැකි වූ නිසාය.[20]

**6** රජුගෙන්ද ඔහුගේ අධිපතීන්-
ගෙන්ද[1] ලද ලියුම් රැගත් පණිවිඩ-
කරුවෝ[2] රජුගේ අණ පරිදි මුළු
ඊශ්‍රායෙල් හා යූදා දේශය පුරා ගොස්
මෙසේ පැවසුවෝය. "ඊශ්‍රායෙල් වැසි-
යෙනි, ඔබේ වැරදි මාර්ග අත්හැර
ආබ්‍රහම්ගේද ඊසාක්ගේද ඊශ්‍රායෙල්-
ගේද දෙවි වන යෙහෝවා වෙතට[3]
නැවත එන්න.[4] එවිට ඇසිරියා-
වේ රජුගෙන්[5] බේරුණු ඔබට දෙවි-
ගේ අනුමැතිය නැවතත් ලැබෙයි.[6]
**7** යෙහෝවා දෙවිට ද්‍රෝහි වූ
ඔබේ මුතුන්මිත්තන් වගේවත්[7] ඔබේ
සහෝදරයන් වගේවත් හැසිරෙන්න
එපා. ඔවුන් එසේ ක්‍රියා කළ නිසා සිය-
ලුදෙනා ඉදිරියේ ඔවුන් නින්දාවට පත්
වුණා.[8] ඒ සියල්ලේ ප්‍රතිඵල දැන්
ඔබ ඔබේ ඇස් දෙකෙන්ම දකිනවා
නේද? **8** එමනිසා ඔබේ මුතුන්මිත්-
තන් වගේ ඔබත් මුරණ්ඩු ලෙස
හැසිරෙන්න එපා.*[9] යෙහෝවා දෙවිට
කීකරු වී[10] ඔහුගේ ශුද්ධස්ථානයට
පැමිණ[11] ඔහුට නමස්කාර කරන්න.[12]
මන්ද පරිශුද්ධ නමස්කාරය සඳහා
එම ස්ථානය වෙන් කළේ යෙහෝවා
දෙවි විසින්මයි.[13] ඔබ දෙවිට එසේ
නමස්කාර කළොත් ඔබට විරුද්-
ධව ඇවිළුණු ඔහුගේ උදහස නිවී
යයි.[14] **9** යෙහෝවා දෙවි වෙතට
හැරී එන්න.[15] එවිට ඔබේ පුත්‍රයන්ව
හා සහෝදරයන්ව වහල් කරගත් අය-
ගෙන් ඔවුන්ට දයාව ලැබී[16] නැවතත්
ඔවුන්ට තම දේශයට පැමිණෙන්න
හැකි වෙයි.[17] මන්ද ඔබේ දෙවි යෙ-
හෝවා දයාන්විත[18] මෙන්ම කරුණා-
වන්ත[19] දෙවි කෙනෙක් නිසා ඔබ ඔහු
වෙතට හැරී ආවොත් ඔහු ඔබව කිසි
දිනක අත් නොහරියි."[20]

**10** මෙසේ පණිවිඩකාරයෝ[21]
මනස්සේ සහ එෆ්‍රායිම් දේශ[22] පුරාත්

**19** නෙහෙ 9:17; ගීතා 86:5; මීකා 7:18; 2කොරි 1:3;
**20** 2ලේක 15:2; යෙසා 55:7; යාකො 4:8; **21** එස්ත 3:13;
**22** 2ලේක 30:1.

**2ලේක 30:8*** මූ.අ., "ඔබේ බෙල්ල දැඩි කර නො-
ගන්න."

**29 පරි.**
**1** ලෙවී 23:13
ගණන් 15:5
**2** 1කොරි 14:40
**3** ගීතා 118:23
**4** 2ලේක 30:12
ගීතා 10:17
ගීතා 136:4

**30 පරි.**
**5** ද්වි 16:2
ද්වි 16:6
**6** නික් 12:43
ලෙවී 23:5
2ලේක 35:1
1කොරි 5:7
**7** 2ලේක 11:16
**8** යොෂු 16:4
2ලේක 17:2
2ලේක 34:6
හොෂෙ 11:8
**9** යොෂු 17:5
යොෂු 17:7
2ලේක 30:11
**10** 1ලේක 28:1
**11** 1ලේක 28:8
**12** ගණන් 9:10
ගණන් 9:11
**13** නික් 12:18
**14** 2ලේක 29:34
**15** 1ලේක 13:4
**16** 2ලේක 24:9
2ලේක 36:22
**17** විනි 20:1
**18** විනි 18:29
1සාමු 3:20
**19** ද්වි 12:32
**20** 2ලේක 35:18

**2 තීරුව**
**1** 1ලේක 28:1
**2** එස්ත 8:14
**3** නික් 3:6
**4** ද්වි 30:10
1සාමු 7:3
යෙරෙ 4:1
යෝවෙ 2:13
මලා 3:7
**5** 1ලේක 5:26
2ලේක 28:20
**6** 2රාජා 15:29
**7** එස 20:18
සෙක 1:4
**8** 2ලේක 29:8
**9** නික් 32:9
ද්වි 10:16
2ලේක 36:13
රෝම 10:21
**10** එස්රා 10:11
**11** ද්වි 12:5
**12** ද්වි 6:13
යොෂු 24:15
මතෙ 4:10
**13** ගීතා 132:13
**14** 2ලේක 29:10
ගීතා 78:49
**15** ද්වි 30:2
**16** 1රාජා 8:50
**17** යෙරෙ 29:14
**18** නික් 34:6

සෙබ්‍යූලන් දේශය පුරාත් තිබූ සෑම
නුවරකටම ගියෝය. නමුත් එහි
වැසියෝ ඔවුන්ව සමච්චලයට ලක්
කරමින් ඔවුන්ගේ ආරාධනය ප්‍රතික්-
ෂේප කළෝය.[1] **11** නමුත් ආෂේර්,
මනස්සේ සහ සෙබ්‍යූලන් යන ප්‍රදේශ-
වල සිටි යම් පිරිසක්[2] ඔවුන්ගේ
මුරණ්ඩු ආකල්ප අත්හැර,[3] එම ආරා-
ධනය පිළිගෙන යෙරුසලමට පැමිණි-
යෝය. **12** යෙහෝවා දෙවිට කරන
නමස්කාරය සම්බන්ධයෙන් රජු හා
ඔහුගේ අධිපතීන් දුන්[4] ආඥා ඉටු කිරී-
මට[5] යූදා දේශයේ වැසියෝ එක්සත් වී
කටයුතු කළෝය.[6] මන්ද ඔවුන් සිය-
ලුදෙනාටම සැබෑ දෙවිගේ උපකාර
ලැබිණ.

**13** මෙසේ මුහුන් නොදැමූ රොටි
උත්සවය පැවැත්වීමට[7] දෙවන මාස-
යේදී[8] ඉතා විශාල සමූහයක් යෙරුස-
ලමෙහි එක් රොක් වූහ.[9] **14** ඔවුහු
යෙරුසලමෙහි බොරු නමස්කාරය
සඳහා පිහිටුවා තිබූ සියලුම පූජා-
සන[10] හා සුවඳ ද්‍රව්‍ය ඔප්පු කිරීම
සඳහා පිහිටුවා තිබූ පූජාසන[11] ඉවත්
කර ඒවා කිද්‍රොන් නිම්නයට වීසි
කළෝය.[12] **15** ඉන්පසු ඔවුහු දෙ-
වන මාසයේ දාහතරවනදා පාස්කුව
සඳහා ඔප්පු කරන සතුන්ව මැරු-
වෝය.[13] සෙනඟ කළ ඒ දේවල් දැක
තමන් ගැන ලැජ්ජාවක් ඇති වූ පූජ-
කයෝ සහ ලෙවීවරු පවිත්‍ර වී[14]
යෙහෝවා දෙවිගේ ගෘහයට දවන
පූජා ගෙනාවෝය. **16** සැබෑ දෙවි-
ගේ සේවකයා වූ මෝසෙස්ට දුන්
නීතියේ සඳහන් ආකාරයට සේවය
කළ ඔවුහු තමන්ට නියම කර තිබූ
ස්ථානවල සිටගෙන සිටියෝය.[15]
ලෙවීවරුන් ගෙනැවිත් දුන් සතුන්ගේ
ලේ රැගෙන පූජකයෝ[16] එය පූජාස-
නය මතට ඉසුවෝය. **17** රැස්ව සිටි
ජනයා අතරින් බොහෝදෙනෙකු යෙ-
හෝවා දෙවි ඉදිරියේ පවිත්‍ර තත්වයක
නොසිටි නිසා ඔවුන් වෙනුවෙන් පාස්-
කුව සඳහා ඔප්පු කරන සතුන්ව මරන
ලද්දේ[17] ලෙවීවරුන්[18] විසිනි. එම-
ගින් ඔවුහුද පවිත්‍ර තත්වයකට පත්
වූහ. **18** එෆ්‍රායිම්,[1] මනස්සේ,[2] ඉස-
කාර් සහ සෙබ්‍යූලන්[3] යන ප්‍රදේශව-
ලින් පැමිණි බොහෝදෙනෙකුද තවත්
විශාල පිරිසක්ද පවිත්‍ර තත්වයක
නොසිටියෝය.[4] නමුත් ඔවුහු නීතියේ
සඳහන් නියමයන් නොසලකා පාස්-
කුවට ඔප්පු කළ සතාව අනුභව
කළෝය.[5] එහෙයින් හෙසකියා රජ
ඔවුන් වෙනුවෙන් යාච්ඤා කරමින්[6]
මෙසේ පැවසුවේය. “යහපත් දෙවි
වන යෙහෝවා,[7] ඔවුන්ට අනුකම්පා
කරන්න. **19** ඔවුන් ශුද්ධ වූ දෙය-
කට සහභාගි වීමට පවිත්‍ර තත්වයක
නොසිටි බව ඇත්තයි.[8] නමුත් ඔවුන්
සියලුදෙනාම තම මුතුන්මිත්තන්-
ගේ දෙවි වන යෙහෝවා වූ ඔබට
ළං වී ඔබේ මඟ පෙන්වීම් පැතීමට
මුළු සිතින්ම අධිෂ්ඨාන කරගත්තා.”[9]
**20** හෙසකියා රජුගේ කන්නලව්වට
සවන් දුන් යෙහෝවා දෙවි ජනයාට
සමාව දුන්නේය.[10]

**21** යෙරුසලමෙහි රැස්ව සිටි ඊශ්‍රා-
යෙල්වරු දින සතක් පුරා මුහුන්
නොදැමූ රොටි උත්සවය[11] මහත්
ප්‍රීතියකින්[12] යුතුව පැවැත්වූහ. ලෙවී-
වරු[13] හා පූජකයෝ[14] සංගීත භාණ්ඩ
වාදනය කරමින් යෙහෝවා දෙවිට
ප්‍රශංසා කළෝය. ඔවුහු ඒ දවස්
සත පුරාම මහත් උද්‍යෝගයෙන්
යෙහෝවා දෙවිට ප්‍රශංසා කිරීමෙහි
හවුල් වූහ.[15] **22** හෙසකියා රජ යෙ-
හෝවා දෙවිට හොඳින් සේවය කළ
සියලු ලෙවීවරුන්ව[16] අගය කර-
මින් ඔවුන්ව දිරිගැන්වූයේය.[17] ලෙවී-
වරු සහ මුළු සෙනඟ දින සතක්
පුරා උත්සවය පැවැත්වූ අතර ඒ
සඳහා පිළියෙල කළ ආහාරද අනුභව
කළෝය.[18] එමෙන්ම ඔවුහු හවුල් පූජා
ඔප්පු කරමින්[19] තම මුතුන්මිත්තන්-
ගේ දෙවි වන යෙහෝවා ඉදිරියේ
තමන් කළ වැරදි පිළිගත්තෝය.[20]

**23** රැස්ව සිටි සියලුදෙනා තවත්
දවස් සතක්[21] එම උත්සවය පැවැත්-
වීමට තීරණය කළෝය.[22] ඔවුහු
එම දවස් සතද ප්‍රීතියෙන් සැමරූහ.
**24** යූදාහි රජු වූ හෙසකියා රැස්ව

**30 පරි.**
**1** 2ලේක 36:16 ක්‍රියා 17:32
**2** 2ලේක 11:16
**3** 2ලේක 12:6
**4** 2ලේක 29:25
**5** ද්වි 4:5 දේශ 8:2 1තෙස 4:2
**6** යෙරෙ 32:39 1කොරි 1:10
**7** ලෙවී 23:6
**8** ගණන් 9:10 ගණන් 9:11
**9** ගීතා 84:7
**10** 2රාජා 18:22 2ලේක 34:7
**11** 2ලේක 28:24
**12** 2සාමු 15:23
**13** නික් 12:3 1කොරි 5:7
**14** 2ලේක 5:11 2ලේක 29:15
**15** 2ලේක 35:10
**16** ලෙවී 1:5
**17** නික් 12:6
**18** 2ලේක 29:34 2ලේක 35:3

**2 තීරුව**
**1** 2ලේක 30:10
**2** 2ලේක 30:1 2ලේක 34:6
**3** 2ලේක 30:11
**4** ගණන් 9:10
**5** ලෙවී 23:5
**6** යාකො 5:14
**7** ගීතා 25:8 ගීතා 86:5 මාක් 10:18
**8** ගණන් 9:6
**9** 2ලේක 19:3 එස්රා 7:10 ගීතා 10:17
**10** ගීතා 103:3 යෙසා 57:18 යාකො 5:16
**11** ලෙවී 23:6 ලූක් 22:1 1කොරි 5:8
**12** ද්වි 12:7 2ලේක 7:10 නෙහෙ 8:10
**13** 2ලේක 29:25
**14** 2ලේක 29:24
**15** ගීතා 150:3
**16** ගීතා 47:7 හිතෝ 12:8
**17** 2ලේක 32:6
**18** ලෙවී 23:6
**19** ලෙවී 3:1
**20** ලෙවී 26:40 එස්රා 10:11
**21** 1රාජා 8:65
**22** 2ලේක 30:2

සිටි අය වෙනුවෙන් ගොනුන් දහ-
සක් හා බැටළුවන් හත්දහසක් දුන්-
නේය.[1] ඔහුගේ අධිපතීහුද[2] ගොනුන්
දහසක් හා බැටළුවන් දසදහසක්
සෙනඟ වෙනුවෙන් දුන්නෝය. පූජක-
යෝ[3] විශාල පිරිසක්ද පවිත්‍ර වූහ.
**25** පූජකයෝද ලෙවීවරුද[4] යූදා දේශ-
යේ වැසියෝද[5] ඊශ්‍රායෙල් දේශයෙන්
පැමිණි වැසියෝද[6] ඊශ්‍රායෙල් දේශ-
යේ[7] හා යූදා දේශයේ සිටි විදේශික-
යෝද[8] ඒ මුළු කාලයම ප්‍රීතියෙන්
ගත කළෝය.[9] **26** මෙසේ යෙරුස-
ලමෙහි රැස්ව සිටි සියලුදෙනා ප්‍රීති-
යෙන් ඉපිල ගියෝය. ඊශ්‍රායෙල්හි රජු
වූ දාවිත්ගේ පුත් සලමොන්ගේ කාල-
යෙන් පසු[10] යෙරුසලමෙහි මෙතරම්
උත්කර්ෂවත් අවස්ථාවක් දක්නට
ලැබුණු ප්‍රථම වතාව මෙය විය.[11]
**27** අවසන් වශයෙන් ලෙවී ගෝත්‍රයට
අයත් පූජකයෝ රැස්ව සිටි අයට
දෙවිගේ ආශීර්වාද ඉල්ලා යාච්ඤා
කළෝය.[12] ඔවුන්ගේ යාච්ඤාවට තම
ශුද්ධ වාසස්ථානය වන ස්වර්ගයේ
සිට[13] දෙවි සවන් දුන්නේය.

**31** මේ සියලු කටයුතු නිම වූ
විගස එහි රැස්ව සිටි සියලුම
ඊශ්‍රායෙල්වරු[14] මුළු යූදා ප්‍රදේශයටද[15]
එහි නුවරවලටද[16] බෙන්ජමින්, එෆ්‍රා-
යිම්[17] සහ මනස්සේ[18] යන ප්‍රදේශවල-
ටද ගොස් බොරු නමස්කාරය සඳහා
එහි ඉදි කර තිබූ කණු[19] සහ කුලුනු[20]
කඩා දමා, පූජනීය ස්ථානද[21] පූජාස-
නද[22] මුළුමනින්ම විනාශ කළෝය.
ඉන්පසු ඊශ්‍රායෙල්වරු තම තමන්ගේ
ගම්බිම් බලා පිටත්ව ගියෝය.
**2** හෙසකියා රජ පූජකයන් සහ
ලෙවීවරුන්[23] අයත්ව සිටි කාණ්ඩ
නැවතත් සංවිධානය කර[24] ඔවුන්ට
පැවරී තිබූ කාර්යයන් ඉටු කිරීම
සඳහා[25] ඔවුන්ව යෙදෙව්වේය. ඒ
අනුව දවන පූජා[26] සහ හවුල්
පූජා[27] ඔප්පු කිරීමේ සේවාවද යෙ-
හෝවා දෙවිගේ ගෘහයේ දොරටු අසල
ස්තුති[28] ප්‍රශංසා[29] කිරීමේ කාර්ය-
යද වෙනත් සේවාවන්ද[30] නැවතත්

**30 පරි.**
**1** 2ලේක 35:7
**2** 2ලේක 35:8
**3** 2ලේක 29:34
**4** 2ලේක 11:13
**5** 1රාජා 12:20; 2ලේක 11:1
**6** 2ලේක 30:11; 2ලේක 30:18
**7** 2ලේක 15:9
**8** නික් 12:49
**9** 1ලේක 16:10; ගීතා 92:4
**10** 1රාජා 8:66
**11** 2ලේක 7:10
**12** ගණන් 6:23; ද්වි 10:8
**13** 1රාජා 8:43; ගීතා 68:5

**31 පරි.**
**14** 2ලේක 11:16
**15** 2ලේක 14:5
**16** 2ලේක 24:5
**17** 2ලේක 30:1
**18** 2ලේක 30:18
**19** නික් 23:24; 2රාජා 10:16; 2ලේක 14:3
**20** ද්වි 7:5; 2රාජා 18:4; 2ලේක 34:3; 1කොරි 10:14
**21** ද්වි 12:2
**22** 2ලේක 23:17
**23** 1ලේක 23:6
**24** 1ලේක 24:1
**25** 2ලේක 5:11; 2ලේක 8:14; 2ලේක 23:8; ලූක් 1:5
**26** 1ලේක 16:40
**27** 1ලේක 16:1; 1ලේක 21:26
**28** 1ලේක 16:4; 1ලේක 23:30
**29** 1ලේක 23:5; ගීතා 22:22
**30** 1ලේක 23:13; 1ලේක 26:12; 2ලේක 13:10

**2 තීරුව**
**1** ගණන් 28:2
**2** නික් 29:39; ගණන් 28:4
**3** 2ලේක 30:24
**4** ගණන් 28:9
**5** 1ලේක 23:31
**6** ලෙවී 23:2
**7** 1ලේක 26:26
**8** නෙහෙ 10:38
**9** ගණන් 18:21
**10** මලා 2:7
**11** නෙහෙ 13:10; 1කොරි 9:9
**12** නෙහෙ 12:44
**13** නික් 23:19

විධිමත්ව ආරම්භ කෙරිණ. **3** යෙ-
හෝවා දෙවි දුන් නීතියට අනුව[1] උදෑ-
සන[2] සහ සවස ඔප්පු කරන දවන
පූජාවන් සඳහාද[3] සබත් දිනවල ඔප්පු
කරන දවන පූජාවන් සඳහාද[4] නව
සඳ පායන දවස්වල[5] හා උත්සව
පවත්වන කාලයේදී[6] ඔප්පු කරන
දවන පූජාවන් සඳහාද රජ තමාට හිමි
දේවලින් කොටසක් වෙන් කළේය.[7]
**4** ඉන්පසු පූජකයන්ට[8] හා ලෙවීව-
රුන්ට[9] අයිති කොටස ලබා දෙන
ලෙස යෙරුසලමෙහි වැසියන්ට රජ
මතක් කළේය. මන්ද ඔවුන්ට අයිති
කොටස සෙනඟ ලබා දුන්නොත් යෙ-
හෝවා දෙවිගේ නීතියේ සඳහන් දේ
කිරීමට[10] තමන්ගේ මුළු කාලයම යෙ-
දවීමට ඔවුන්ට හැකි වනු ඇත.[11]
**5** රජු ඒ ගැන මතක් කළ විගස ඊශ්‍රා-
යෙල්වරු[12] ඉතා ත්‍යාගශීලීව ධාන්‍ය
අස්වැන්නේ මුල් පලවලින්ද[13] අලුත්
වයින්වලින්ද[14] තෙල්,[15] පැණි*[16]
සහ අනිකුත් පලවලින්ද[17] දසයෙන්
කොටස නොඅඩුව ගෙනාවෝය.[18]
**6** ඊශ්‍රායෙල්හි වැසියෝ සහ යූදාහි
නුවරවල විසූ අය[19] ගොනුන්ගෙන්
හා බැටළුවන්ගෙන් දසයෙන් කො-
ටසක් ගෙනා අතර ශුද්ධ දේවල්
ලෙස තම දෙවි වන යෙහෝවාට
වෙන් කළ දේවලින් දසයෙන් කොට-
සක්ද[20] රැගෙන ඇවිත් ඒවා ගොඩ-
වල් වශයෙන් තැබූහ. මෙසේ ඔවුහු
තමන් සතු දෙයින් විශාල ප්‍රමාණයක්
පරිත්‍යාග කළෝය. **7** ඔවුහු තුන්-
වන මාසයේ[21] සිට හත්වන මාසය[22]
දක්වා ඒවා ගෙනැවිත් ගොඩගැසු-
වෝය. **8** ගොඩගසා තිබූ දේවල්
දුටු හෙසකියා රජ සහ ඔහුගේ අධිප-
තීහු[23] යෙහෝවා දෙවිට ප්‍රශංසා කර-
මින්[24] ඔහුගේ සෙනඟ වූ ඊශ්‍රායෙල්
ජනයාට ආශීර්වාද කළෝය.[25]

---

**14** නික් 22:29; නෙහෙ 10:37; **15** ගණන් 18:12; **16** උත් 43:11; **17** නෙහෙ 10:35; **18** හිතෝ 3:9; **19** 2ලේක 11:16; **20** ලෙවී 27:30; ද්වි 14:28; **21** ලෙවී 23:16; **22** ලෙවී 23:24; **23** 1ලේක 28:1; **24** එස්රා 7:27; **25** 2සාමු 6:18; 2ලේක 6:3.

---

**2ලේක 31:5*** ලෙවී 2:11හි පාදසටහන බලන්න.

**9** හෙසකියා රජ එසේ ගො-
ඩගසා තිබූ දේවල් ගැන පූජ-
කයන්ගෙන් සහ ලෙවීවරුන්ගෙන්
විමසුවේය.[1] **10** එවිට සාදොක්ගේ
පෙළපතින් පැමිණි[2] නායක පූජකයා
වූ අෂරියා[3] මෙසේ කීවේය. “සෙනඟ
යෙහෝවා දෙවිගේ ගෘහයට අවශ්‍ය
දේවල් ගෙනෙන්න[4] පටන්ගත් දවසේ
ඉඳන් හැමදෙනාම හොඳට කාලා
බීලා සතුටින් ඉන්නවා.[5] ඒ විත-
රක් නෙවෙයි යෙහෝවා දෙවි තම
සෙනඟට ආශීර්වාද කරලා තියෙන
නිසා[6] අවශ්‍ය ප්‍රමාණයටත් වැඩියෙන්
දේවල් තියෙනවා.[7] බලන්න තව
කොච්චර දේවල් ඉතුරු වෙලා තියෙ-
නවාද කියලා.”

**11** එවිට හෙසකියා රජ යෙහෝවා
දෙවිගේ ගෘහයේ තිබෙන භෝජන
ශාලා[8] සූදානම් කරන්න කියා පැවසු-
වේය. ඔවුහු එසේ කළෝය. **12** සෙ-
නඟ සම්මාදම් කළ දේද[9] දසයෙන්
කොටසද[10] ශුද්ධ දේවල්ද ඔවුහු ඒ
තුළට ගෙනාවෝය. කිසිදු වංචාව-
කින් තොරව ඔවුහු ඒ කාර්-
යය ඉටු කළෝය.[11] ඔවුන් කළ ඒ
කාර්යය අධීක්ෂණය කළේ කො-
නනියා නම් ලෙවීවරයාය. ඔහුගේ
සහෝදරයා වූ ෂිමෙයි ඔහුට සහය
විය. **13** හෙසකියා රජුගේ අණ පරිදි
කොනනියා සහ ඔහුගේ සහෝදරයා
වූ ෂිමෙයි යටතේ යෙහීයෙල්, අස-
සියා, නාහත්, අසහෙල්, යෙරිමොත්,
යෝෂාබාද්, එලියෙල්, ඉස්මාකියා,
මාහත් සහ බෙනායා යන නිලධා-
රීහු සේවය කළෝය. සැබෑ දෙවිගේ
ගෘහයේ සියලු කටයුතුවලදී පෙර-
මුණ ගෙන ක්‍රියා කළේ අෂරියාය.[12]
**14** ලෙවීවරයෙකු වූ ඉම්නාහ්ගේ පුත්
කෝරෙ නැඟෙනහිර දොරටුවේ[13] දො-
රටු පාලකයා විය.[14] සැබෑ දෙවිට සෙ-
නඟ කැමැත්තෙන් පූජා කළ දේද
භාරව සිටියේ ඔහුය.[15] සෙනඟ යෙ-
හෝවා දෙවිට පරිත්‍යාග කළ දේවල්[16]
සහ අතිශුද්ධ දේවල්[17] පූජකයන් හා
ලෙවීවරුන් අතරේ බෙදා දුන්නේද
ඔහුය. **15** එමෙන්ම ඔහු යටතේ
සිටි ඒදන්, මිනියාමින්, යේෂුවා, ෂෙ-
මායා, අමරියා සහ ෂෙකනියා යන
නිලධාරීහු පූජකයන් විසූ නුවරවල
සේවය කළෝය.[1] ඔවුන්ට විශ්වාස-
යෙන් යුතුව[2] භාර දී තිබූ පැවරුම
වූයේ කාණ්ඩවලට අනුව සංවිධානය
වී සිටි[3] සෑම වයස් මට්ටමකටම
අයත් ඔවුන්ගේ සෙසු සහෝදරයන්ට
සෙනඟ පරිත්‍යාග කළ දේවල් එක හා
සමානව බෙදා දීමය.[4] **16** මීට අම-
තරව තම කාණ්ඩය සඳහා නියම කර
තිබූ වාරයේදී යෙහෝවා දෙවිගේ
ගෘහයට පැමිණ දිනපතා තම වගකීම්
ඉටු කරමින් සිටි අයටද ඔවුන්ට හිමි
කොටස බෙදා දෙන ලදි. පෙළපත්
ලේඛනයට ඇතුළත්[5] කර තිබූ වයස
අවුරුදු තුනෙන් ඉහළ සියලුම පුරුෂ-
යන්[6] ඊට අයත් විය.

**17** මෙසේ තම මුතුන්මිත්තන්ගේ
පෙළපතට අනුව පෙළපත් ලේඛනව-
ලට ඇතුළත්ව සිටි පූජකයන්ටද[7]
කාණ්ඩ වශයෙන් තමන් ඉටු කළ යුතු
වගකීම්වලට අනුව සංවිධානය කර
තිබූ,[8] වයස අවුරුදු විස්සක්[9] හා ඊට
වැඩි ලෙවීවරුන්ටද[10] තමන්ට හිමි
කොටස ලැබිණ. **18** ලෙවීවරුන්-
ගේ පෙළපත් ලේඛනයට ඔවුන්ගේ
කුඩා දරුවන් සියලුදෙනාද ඔවුන්ගේ
භාර්යාවන්ද පුත්‍රයන්ද දූවරුන්ද ඇතු-
ළත් කර තිබිණ. එසේ වූයේ විශ්වාස-
යෙන් යුතුව තමන්ට භාර දී තිබූ[11]
පරිශුද්ධ කාර්යයන් ඉටු කිරීම සඳහා
ඔවුන් දෙවි ඉදිරියේ පවිත්‍ර තත්වයක
සිටි නිසාය.[12] **19** මීට අමතරව තම
ගම්බිම්වල විසූ[13] ආරොන්ගෙන් පැව-
තෙන[14] පූජකයන්ගේ පවුල්වල සිටි
සෑම පුරුෂයෙකු සඳහාද ලෙවීවරුන්-
ගේ පෙළපත් ලේඛනවලට ඇතුළත්
වූ සියලුදෙනා සඳහාද නියමිත ආහාර
කොටස බෙදා දීමට සෑම නුවරකටම
පුරුෂයන්ව පත් කර තිබිණ.

**20** හෙසකියා රජ යූදා දේශය
පුරාම ඒ සඳහා අවශ්‍ය සියල්ල සංවි-
ධානය කළේය. ඔහු තම දෙවි වන
යෙහෝවා ඉදිරියේ විශ්වාසවන්තව
කටයුතු කළ අතර,[15] සෑමවිටම දෙවි

**31 පරි.**
1 2ලේක 31:6
2 1ලේක 6:8
3 2ලේක 26:17
4 ගණන් 18:8; ගණන් 31:29
5 මලා 3:10
6 උත් 26:12; ලෙවී 25:21; හිතෝ 10:22
7 2රාජා 4:43
8 1ලේක 28:12; නෙහෙ 10:38
9 ගණන් 31:29
10 ලෙවී 27:30; ද්වි 14:28
11 2රාජා 12:15
12 2ලේක 26:17
13 1ලේක 26:17
14 1ලේක 26:12
15 ගණන් 29:39; ද්වි 12:6; ද්වි 16:10
16 ගණන් 18:8
17 ලෙවී 2:10; ලෙවී 7:1

**2 තීරුව**
1 යොෂු 21:19
2 1ලේක 9:22
3 1ලේක 24:1
4 1ලේක 25:8
5 1ලේක 9:1
6 ගණන් 3:15
7 ගණන් 17:3; 1ලේක 24:4
8 1ලේක 23:6
9 ගණන් 4:3; ගණන් 8:24; 1ලේක 23:24
10 1ලේක 24:30
11 1ලේක 9:22; 2ලේක 31:15
12 2ලේක 29:15
13 ලෙවී 25:34; ගණන් 35:2; යොෂු 21:13
14 1ලේක 24:1
15 හිතෝ 28:20; ක්‍රියා 24:16

යහපත්යයි සැලකූ දේ කරමින්[1] නිවැ-
රදිව ක්‍රියා කළේය.[2] 21 සැබෑ දෙවි-
ගේ ගෘහයේ වැඩකටයුතු සංවිධානය
කළෙත්[3] දෙවිගේ මඟ පෙන්වීම් ලබා-
ගැනීම සඳහා නීතිය[4] හා වෙනත්
අණපනත් අධ්‍යයනය කළෙත්[5] ඔහු
ඔහුගේ මුළු හදවතින්මය.[6] සෑම කාර-
ණයකදීම ඔහු එසේ ක්‍රියා කළ නිසා
ඔහු කළ සෑම දෙයක්ම සාර්ථක විය.[7]

32 හෙසකියා රජු විශ්වාසවන්-
තව ඒ වැඩකටයුතු අවසන්
කර[8] කලක් ගත වූ පසු ඇසිරියාවේ
රජු වූ[9] සෙනකෙරිබ්[10] පැමිණ යූදා දේ-
ශය ආක්‍රමණය කළේය. එහි පිහිටි
පවුරුවලින් වට වූ සුරක්ෂිත නුවරව-
ලට ඔහු ප්‍රහාරයන් දියත් කළ අතර[11]
ඔහුට අවශ්‍ය වූයේ ඒවා කෙසේ හෝ
තමා යටතට ගැනීමය.

2 සෙනකෙරිබ් රජු යෙරුසලමට
විරුද්ධව යුද්ධයට පැමිණි බව දුටු
හෙසකියා රජ,[12] 3 තමා යටතේ
සේවය කළ අධිපතීන්ගේ[13] හා එඩිතර
පුරුෂයන්ගේ උපකාර ඇතුව නුව-
රෙන් පිටත තිබූ දිය උල්පත්[14] වසා
දැමීමට තීරණය කළේය. 4 එහෙ-
යින් බොහෝදෙනෙක්, “අපි මොකටද
ඇසිරියාවේ රජුට පහසුවෙන් වතුර
ලබාගන්න ඉඩ දෙන්නේ” කියා පවස-
මින් දිය උල්පත් හා දේශය මැදින්
ගලා ගිය දිය පහරවල් සියල්ල වසා
දැමීමට එකතු වූහ.[15]

5 මුහුණ දෙමින් සිටි තත්-
වය හමුවේ හෙසකියා රජ එඩිත-
රව ක්‍රියා කළේය. ඔහු ගරාවැටුණු
පවුර නැවතත් ගොඩනඟා[16] ඒ මත
මුරටැඹවල්ද[17] පිටතින් තවත් පවු-
රක්ද ගොඩනැඟුවේය.[18] ඔහු දාවිත්-
ගේ නුවර වටා පිහිටි ආරක්ෂක
බැම්ම අලුත්වැඩියා කළ අතර[19] බො-
හෝ ඊතලද[20] පලිස්ද[21] සෑදුවේය.
6 ඔහු සෙනඟ කෙරෙහි හමුදාප-
තීන්ව පත් කර,[22] නුවරේ දොර-
ටුව අසල තිබූ ප්‍රසිද්ධ ස්ථානයට
ඔවුන්ව රැස් කළේය.[23] පසුව රජ
ඔවුන්ගේ සිත්වලට කාවදින ලෙස
කතා කරමින්[24] මෙසේ පැවසුවේය.
7 “නොසැලී ස්ථිරව ඉන්න.[1] කිසි දෙ-
යකට භය වෙන්න එපා.[2] ඇසිරියාවේ
රජුටවත්[3] ඔහු සමඟ ඉන්න සමූහයට-
වත්[4] භය වෙන්න ඔබට කිසිම හේ-
තුවක් නැහැ.[5] ඔහු සමඟ ඉන්න
සමූහයට වඩා බලවත් පිරිසක් අප
සමඟ ඉන්නවා. 8 ඇසිරියාවේ රජු
බලවත්ව ඉන්නේ ඔහුගේ හමුදාව
නිසයි.[6] නමුත් අපි වෙනුවෙන් සටන්
කරන්නේ[7] අපේ දෙවි වන යෙහෝ-
වායි. ඔහු අපේ උපකාරයට ඉන්-
නවා.”[8] යූදාහි රජු වූ හෙසකියාගේ එම
වදන් අසා සිටි සියලුදෙනාම ඉන්
මහත් ධෛර්යයක් ලැබුවෝය.[9]

9 මේ වන විට ඇසිරියාවේ රජු වූ
සෙනකෙරිබ්[10] තම මහත් සේනාව
සමඟ[11] ලාකිෂ්හි කඳවුරු බැඳගෙන
සිටියේය.[12] යූදාහි රජු වූ හෙසකියා-
ටත් යෙරුසලමෙහි වාසය කළ සිය-
ලුම යුදෙව්වරුන්ටත් මේ දේ දන්වන
ලෙස ඔහු තම පණිවිඩකරුවන්ව යෙ-
රුසලමට පිටත් කර යැවීය.

10 “ඇසිරියාවේ රජු වන සෙනකෙ-
රිබ් පවසන්නේ මෙයයි.[13] ‘අපි දැන්
යෙරුසලම වටලලයි තියෙන්නේ. ඒත්
ඔබ කිසිවක් නොකර නිහඬව ඉන්නේ
කවුරුන් මත විශ්වාසය තබාගෙ-
නද?[14] 11 ඔබ හෙසකියා[15] කියන
දේවල් විශ්වාස කළොත් ඔබට සිද්ධ
වෙන්නේ කන්න බොන්න නැතුව බඩ-
ගින්නෙම මැරිලා යන්නයි. “අපේ දෙවි
යෙහෝවා ඇසිරියාවේ රජුගේ අතින්
අපව බේරගනියි”[16] කියමින් හෙස-
කියා ඔබව සනසවන්නේ බොරුව-
ටයි.[17] 12 හෙසකියා ඔහුගේ දේශයේ
තිබූ පූජනීය ස්ථාන[18] හා පූජාසන[19]
ඉවත් කළා නේද? “ඔබ නමස්කාර
කළ යුත්තේත්[20] සුවඳ දුම් ඔප්පු කළ
යුත්තේත්[21] එකම පූජාසනයක්[22] ඉදි-
රියේ පමණයි” කියා යූදා හා යෙරුස-
ලමෙහි වැසියන්ටත් කිව්වා නේද?
13 හෙසකියා ඔය දේවල් කිව්වට ඔබ

**31 පරි.**
1 2රාජා 20:3; හිතෝ 12:2
2 ද්වි 12:28; 1තෙස 2:10
3 2ලේක 29:35
4 ද්වි 32:46; ගීතා 1:2
5 ද්වි 4:29
6 ද්වි 6:5; ද්වි 10:12; 1රාජා 8:61
7 ද්වි 29:9; යොෂු 1:8

**32 පරි.**
8 2ලේක 31:20
9 යෙසා 8:4
10 2රාජා 18:7; 2රාජා 18:13; යෙසා 36:1
11 2ලේක 19:5
12 ලූක් 9:51
13 1ලේක 28:1; හිතෝ 20:18
14 2රාජා 20:20; යෙසා 22:9
15 2ලේක 30:14
16 2ලේක 25:23
17 2ලේක 26:9
18 යෙරෙ 39:4
19 2සාමු 5:9; 1රාජා 9:24; 1රාජා 11:27; 2රාජා 12:20
20 2ලේක 23:10
21 2සාමු 1:21
22 2ලේක 17:14
23 නෙහෙ 8:1
24 2ලේක 30:22; යෙසා 40:2

**2 තීරුව**
1 ද්වි 31:6; යොෂු 1:6; 1ලේක 28:10
2 2රාජා 19:6; 2ලේක 20:15; මතෙ 10:28
3 2රාජා 18:30
4 2රාජා 6:16; යෙසා 51:12
5 ද්වි 31:8
6 යෙරෙ 17:5; 1යොහ 4:4
7 ද්වි 20:4; යොෂු 10:42; 2ලේක 20:15; රෝම 8:31
8 ගණන් 14:9; ද්වි 20:1; 2ලේක 13:12
9 2ලේක 20:20; ලූක් 22:32
10 2රාජා 18:17
11 යෙසා 36:2
12 යෙසා 37:8
13 2රාජා 18:19
14 ගීතා 39:1; යෙසා 36:4

15 2රාජා 18:27; යෙසා 36:12; 16 2රාජා 18:30; 2රාජා 19:10; ගීතා 50:15; 17 2රාජා 18:29; 18 2රාජා 18:4; 19 2රාජා 18:22; 2ලේක 31:1; යෙසා 36:7; 20 ද්වි 12:13; 21 ලෙවී 1:13; 22 නික් 27:1; 1රාජා 7:48; 2ලේක 4:1.

අහලා නැද්ද මමත් මගේ මුතුන්-
මිත්තනුත් වෙනත් දේශවල හිටිය
වැසියන්ට කළ දේවල් ගැන?[1] ඒ දේශ-
වල මිනිසුන්ටත් දෙවිවරුන් හිටියා.
ඒත් ඒ එක් කෙනෙකුටවත්[2] පුළු-
වන් වුණාද තමන්ගේ දේශය අපේ
අතින් ගලවාගන්න? **14** ඔවුන් මගේ
මුතුන්මිත්තන් අතින් අන්ත පරාජයක්
අද්දැක්කා. ඔවුන්ට කොච්චර දෙවිව-
රුන් හිටියත් ඒ එක දෙවි කෙනෙ-
කුටවත් පුළුවන් වුණාද තමන්ගේ
ජනයාව මගේ අතින් බේරගන්න?
එහෙමනම් මගේ අතින් ඔබව ගලව-
ගන්න ඔබේ දෙවියන්ට පුළුවන් වෙයි
කියා ඔබ හිතනවාද?[3] **15** ඒ නිසා
හෙසකියා කියන දේවල්වලට රැව-
ටෙන්න එපා.[4] ඔහු කියන දේවල් විශ්-
වාස කරන්න පුළුවන් කාටද? මගේ
මුතුන්මිත්තන්ගෙන්වත් මගෙන්වත්
බේරෙන්න කිසිම ජාතියකට හෝ
රාජ්‍යයකට පුළුවන් වුණේ නැහැ.
ඔවුන්ගේ එක දෙවි කෙනෙකුටවත්
බැරි වුණා ඔවුන්ව බේරගන්න. ඉතින්
ඔබව මගේ අතින් බේරගන්න ඔබේ
දෙවියන්ට පුළුවන් වෙයි කියලා නම්
කොහොමටවත් හිතන්න එපා.’ ”[5]

**16** සෙනකෙරිබ්ගේ සේවකයෝ
සැබෑ දෙවි වන යෙහෝවාට හා ඔහු-
ගේ සේවකයා වූ හෙසකියාට විරුද්ධව
තවත් බොහෝ දේවල් පැවසුවෝය.[6]
**17** සෙනකෙරිබ් ඊශ්‍රායෙල්හි දෙවි වන
යෙහෝවාව නින්දාවට පත් කරන
ලෙස[7] ලිපි පවා ලිව්වේය.[8] ඒ ලිපි-
වල මෙසේ සඳහන් විය. “අවට
ජාතීන්ගේ දෙවිවරුන්ට[9] තම ජන-
යාව මගේ අතින් බේරාගත නොහැකි
වූවා සේම[10] හෙසකියාගේ දෙවියන්-
ටත් තම ජනයාව මගේ අතින් බේරා-
ගැනීමට නොහැකිය.” **18** ඔවුහු[11]
පවුර මත සිටි යෙරුසලමේ වැසි-
යන්ට ඇසෙන්න[12] යුදෙව්වන්ගේ
භාෂාවෙන්ම[13] බොහෝ දේවල් පැවසු-
වෝය. ඔවුන් එසේ කළේ ඔවුන්ව
බියට පත් කර[14] නුවර අල්ලාගැනීමේ
අරමුණෙනි. **19** මෙසේ ඔවුහු අවට
දේශවල ජනයා ඔවුන් විසින්ම සාදා-
ගෙන[1] නමස්කාර කළ දෙවිවරුන්
ගැන කතා කළ ආකාරයටම යෙරුස-
ලමෙහි දෙවිට[2] විරුද්ධවත් දිගින් දිග-
ටම කතා කළෝය.[3] **20** එහෙත්
හෙසකියා රජද[4] ආමොෂ්ගේ පුත්[5]
අනාගතවක්තෘ[6] යෙසායාද[7] යාච්ඤා
කරමින්[8] ස්වර්ගයේ දෙවිගෙන් පිහිට
ඉල්ලුවෝය.[9]

**21** එවිට යෙහෝවා දෙවි දේවදූ-
තයෙකු යවා,[10] ඇසිරියාවේ රජුගේ
කඳවුරේ සිටි[11] අධිපතීන්, ප්‍රධානීන්,
එඩිතර, බලසම්පන්න පුරුෂයන්[12]
ඇතුළු සියලුදෙනාවම සහමුලින්ම
විනාශ කර දැමුවේය. එහෙයින් මහත්
ලැජ්ජාවට පත් වූ සෙනකෙරිබ්ට නැව-
තත් සිය රට බලා හැරී යෑමට සිදු විය.
දිනක් ඔහු තමන් වන්දනාමාන කරන
දෙවියාගේ දේවාලයෙහි සිටිද්දී ඔහු-
ගේම දරුවෝ ඔහුට කඩුවෙන් පහර දී
ඔහුව මරා දැමූහ.[13] **22** හෙසකියා
රජුව සහ යෙරුසලමෙහි වැසියන්ව
ඇසිරියාවේ රජු වූ සෙනකෙරිබ්ගේද
අන් සියල්ලන්ගේද අතින් යෙහෝවා
දෙවි ගලවාගත්තේ එයාකාරයටය.[14]
ඉන්පසු දෙවි මුළු දේශයටම සාමය
උදා කර දුන්නේය.[15] **23** බොහෝ-
දෙනෙක් යෙහෝවා දෙවි වෙනුවෙන්
බොහෝ දේවල් රැගෙන[16] යෙරුසල-
මට පැමිණි අතර යුදාහි රජු වූ හෙ-
සකියාටද බොහෝ වටිනා දේවල්
තෑගි කළෝය.[17] එතැන් පටන් හෙස-
කියා රජුගේ කීර්තිය[18] ජාතීන් අතරේ
පතළ විය.

**24** කලක් ගත වූ පසු හෙසකියා
රජ අසනීප වී මරණාසන්න විය.[19]
එවිට ඔහු ඒ ගැන යෙහෝවා දෙවිට
යාච්ඤා කළේය.[20] දෙවිද සිදු වීමට
යන දේ ගැන ඔහුට පැවසූ අතර[21] එය
ස්ථිර කිරීමට ලකුණක්ද දුන්නේය.[22]
**25** එහෙත් පසු කාලයකදී හෙසකියා
රජු තුළ උඩඟුකමක් ඇති විය.[23] දෙවි
තමා වෙනුවෙන් කළ සියලු දේ ඔහු
අමතක කර දැමුවේය.[24] ඒ නිසා ඔහු-

**32 පරි.**
**1** 2රාජා 15:29 2රාජා 17:5 2රාජා 19:11 යෙසා 10:14 යෙසා 37:12
**2** 2රාජා 18:33 2රාජා 19:18 ගීතා 115:8 යෙසා 44:8
**3** නික් 14:3 නික් 15:9 ගීතා 71:11 යෙසා 42:8
**4** 2රාජා 18:29 2රාජා 19:10 යෙසා 36:18
**5** නික් 5:2 ද්වි 32:27 දානි 3:15
**6** ගීතා 73:9
**7** යෙසා 37:29 එළි 13:6
**8** 2රාජා 19:14 නෙහෙ 6:5
**9** 2රාජා 19:12
**10** 2රාජා 17:6
**11** 2රාජා 18:26
**12** 2රාජා 18:28 යෙසා 36:13
**13** යෙසා 36:11
**14** නෙහෙ 6:9

**2 තීරුව**
**1** ද්වි 4:28 2රාජා 19:18 ගීතා 135:15 යෙසා 2:8 හොෂෙ 8:6
**2** ගීතා 76:2 ගීතා 132:13
**3** ගීතා 10:13
**4** 2රාජා 19:14
**5** 2රාජා 19:20
**6** 2රාජා 19:2
**7** යෙසා 37:2
**8** 2රාජා 19:15 පිලි 4:6
**9** 2ලේක 14:11 ගීතා 50:15
**10** 2සාමු 24:16
**11** 2රාජා 19:35
**12** ගීතා 76:5
**13** 2රාජා 19:37 යෙසා 37:38
**14** ගීතා 18:48
**15** 1රාජා 8:56
**16** 2සාමු 8:11 එස්රා 7:15 ගීතා 68:29
**17** 1රාජා 4:21 2ලේක 17:5
**18** 1සාමු 2:7 1ලේක 29:25
**19** 2රාජා 20:1 යෙසා 38:1
**20** ගීතා 5:2 යෙසා 38:2 පිලි 4:6
**21** 2රාජා 20:5 යෙසා 38:4

**22** 2රාජා 20:9; 2ලේක 32:31; යෙසා 38:8; යෙසා 38:22; **23** හිතෝ 8:13; හිතෝ 16:18; හිතෝ 29:23; ගලා 6:3; 1පේතෘ 5:5; **24** ගීතා 116:12.

ටත් යූදා දේශයටත් යෙරුසලමටත්
විරුද්ධව දෙවිගේ උදහස ඇවුළුණි.[1]
**26** කල් යත්ම හෙසකියා රජද යෙරු-
සලමේ වැසියෝද තම උඩඟු ආකල්ප
අත්හැර නිහතමානී වූහ.[2] එහි ප්‍රතිඵ-
ලයක් ලෙස හෙසකියා රජුගේ පාලන
සමය තුළදී යෙහෝවා දෙවිගේ උද-
හස ඔවුන් පිටට පැමිණියේ නැත.[3]

**27** හෙසකියා රජු බොහෝ ධන-
යෙන් හා තේජසින් වැජඹුණේය.[4]
ඔහු රන්,[5] රිදී, මැණික්,[6] බෝල්සම්
තෙල්,[7] පලිස්[8] සහ වෙනත් වටිනා
දේවල්[9] තැබීමට ගබඩා ඉදි කළේය.
**28** ධාන්‍ය සඳහාද අලුතින් නිපදවූ
වයින්[10] සහ තෙල් සඳහාද ගබඩාවන්
ඉදි කරන ලදි.[11] ඔහු තමා සතු විවි-
ධාකාර සතුන් සඳහාද එළු බැටළු
රැළවල් සඳහාද ගාල් තැනුවේය.[12]
**29** ඔහු බොහෝ සත්ව රැළවල්ද
අයිති කරගත්තේය.[13] බොහෝ නුව-
රවල්ද ගොඩනැඟුවේය. එසේ දෙවි
ඔහුට බොහෝ සෙයින් ආශීර්වාද
කළේය.[14] **30** ගීහොන්[15] නම් උල්-
පතෙන් ගලා ගිය[16] එක් දිය පහරක්
අවහිර කර,[17] එම දිය පහර බස්නාහිර
දෙසට සම්පූර්ණයෙන්ම හරවා එය
දාවිත්ගේ නුවර තෙක් ගලා යෑමට
සලස්වනු ලැබුවේද[18] හෙසකියා රජු
විසිනි. හෙසකියා රජු කළ සෑම කට-
යුත්තක්ම සාර්ථක විය.[19] **31** කල්
යත්ම බැබිලෝනියේ අධිපතීහු[20] සිදු
වූ පුදුමසහගත දේ ගැන විමසී-
මට[21] ඔහු වෙතට නියෝජිත පිරිසක්
එවූහ.[22] හෙසකියා රජුගේ සිතේ සැබෑ
තත්වය දැනගැනීම සඳහා[23] සැබෑ
දෙවි ඒ අවස්ථාවේදී ඔහුව අත්හැරි-
යේය.[24]

**32** හෙසකියා රජු කළ අනිකුත්
දේවල්ද[25] ඔහු දෙවිට පක්ෂපාතව*
කටයුතු කළ ආකාරයද[26] ආමොෂ්-
ගේ පුත් අනාගතවක්තෘ යෙසායා-
ගේ අනාවැකි ඇතුළත්[27] යූදා හා
ඊශ්‍රායෙල්හි රජවරුන්ගේ ඉතිහාසය
වාර්තා කර ඇති ලියවිල්ලෙහි සඳ-
හන් කර තිබේ.[1] **33** කල් යත්ම
හෙසකියා රජ මිය ගියේය. ඔහුගේ
මුතුන්මිත්තන් මෙන් ඔහුවද තැන්-
පත් කරන ලදි.[2] ඔහුව තැන්පත්
කරන ලද්දේ දාවිත්ගේ පෙළපතේ
අයව තැන්පත් කළ ස්ථානයේ ඉහ-
ළින්ම පිහිටි කොටසේය.[3] ඔහු මිය
ගිය විට යූදා හා යෙරුසලමෙහි සිය-
ලුම වැසියෝ ඔහුට ගරුබුහුමන් දැක්-
වූවෝය.[4] ඔහුට පසු ඔහුගේ පුත්
මනස්සේ[5] රජකමට පත් විය.

**33** මනස්සේ[6] රජකමට පත් වන
විට ඔහුගේ වයස අවුරුදු
දොළහකි. යෙරුසලමේ සිට ඔහු අවු-
රුදු පනස්පහක් පාලනය කළේය.[7]
**2** ඔහු යෙහෝවා දෙවි පිළිකුල්
කළ දේවල් කළේය.[8] යෙහෝවා
දෙවි ඊශ්‍රායෙල්වරුන් වෙතින් පන්නා
දැමූ ජාතීන් කළ[9] පිළිකුල් ක්‍රියාවල
ඔහු නියැලුණේය.[10] **3** තම පියා වූ
හෙසකියා රජු කඩා දැමූ[11] පූජනීය
ස්ථාන ඔහු නැවත ගොඩනඟා,[12]
බාල් දෙවිවරුන්ට[13] පූජාසනද[14]
බොරු නමස්කාරය සඳහා කුලුනුද[15]
සෑදුවේය. ඔහු අහසේ සියලු වස්තූන්
ඉදිරියේ[16] වැඳ වැටී[17] ඒවාට නමස්-
කාර කිරීමටද පටන්ගත්තේය.[18]
**4** “මාගේ නාමය ගෞරවයට පත්
කිරීම සඳහා මම සඳහටම යෙරුසලම
තෝරාගත්තෙමි”[19] කියා යෙහෝවා
දෙවි තම ගෘහය ගැන පවසා තිබු-
ණත් ඔහු යෙහෝවා දෙවිගේ ගෘහය
තුළම බොරු නමස්කාරය සඳහා
පූජාසන ඉදි කළේය.[20] **5** එපම-
ණක්ද නොව ඔහු යෙහෝවා දෙවි-
ගේ ගෘහයේ[21] තිබුණු මළු දෙකෙහි[22]
අහසේ වස්තූන්වලට[23] නමස්කාර
කිරීම සඳහාද පූජාසන ගොඩ-
නැඟුවේය. **6** ඔහු බෙන්හින්නොම්

**32 පරි.**
**1** හිතෝ 15:25
**2** 2ලේක 33:12; 2ලේක 34:27; යෙරෙ 26:19
**3** 2රාජා 20:19
**4** 2ලේක 1:12; 2ලේක 9:27; 2ලේක 17:5
**5** 1රාජා 10:14
**6** 1රාජා 10:2
**7** 1රාජා 10:10
**8** 1රාජා 10:17
**9** 1රාජා 9:19
**10** 2ලේක 26:10
**11** 2ලේක 8:6
**12** 1රාජා 4:26
**13** 1ලේක 27:29; යෝබ් 1:3
**14** ද්වි 8:18; 1ලේක 29:12; 2ලේක 25:9; හිතෝ 10:22
**15** 1රාජා 1:33; 1රාජා 1:45
**16** යෙසා 22:9; යෙසා 22:11
**17** 2ලේක 32:4
**18** 2සාමු 5:9
**19** යොෂු 1:8; ගීතා 1:3
**20** උත් 10:10; උත් 11:9
**21** 2රාජා 20:8; යෙසා 38:8
**22** 2රාජා 20:12; යෙසා 39:1
**23** උත් 22:1; ද්වි 8:2; ද්වි 8:16; ගීතා 7:9; ගීතා 139:23
**24** විනි 16:20; 1කොරි 10:13
**25** 2රාජා 20:20
**26** 2ලේක 31:20; 2ලේක 31:21
**27** යෙසා 1:1

**2 තීරුව**
**1** 2ලේක 16:11
**2** 1රාජා 1:21
**3** 1රාජා 11:43
**4** උත් 50:10; ද්වි 34:8
**5** 1ලේක 3:13

**33 පරි.**
**6** මතෙ 1:10
**7** 2රාජා 21:1
**8** 2රාජා 16:2
**9** 2රාජා 21:2
**10** ද්වි 18:9; 2ලේක 28:3
**11** 2රාජා 18:22; 2ලේක 32:12
**12** 2රාජා 18:4
**13** විනි 2:11; 2ලේක 28:2

**14** 1රාජා 16:32; 1රාජා 18:26; **15** ද්වි 16:21; 1රාජා 14:23; යෙරෙ 17:2; **16** 2රාජා 23:5; යෝබ් 31:26; **17** ද්වි 4:19; 2රාජා 17:16; **18** 2රාජා 21:3; **19** ද්වි 12:11; 2රාජා 21:4; 2ලේක 6:6; **20** 2රාජා 16:10; 2ලේක 34:4; **21** 2රාජා 21:5; **22** 1රාජා 6:36; 1රාජා 7:12; **23** ද්වි 17:3; 2රාජා 23:5; යෙරෙ 8:2.

**2ලේක 32:32*** හෝ, “ලැදි ප්‍රේමය පෙන්වූ ආකා-රයද.”

නිම්නයේදී[1] තම පුත්‍රයන්ව ගින්-
නෙන් දවා පූජා කළේය.[2] ඔහු පේන
කීමෙහිද[3] මායා බන්ධන ක්‍රියාවලද[4]
නියැලුණු අතර මන්ත්‍ර ගුරුකම්වලද[5]
යෙදුණේය. මායාකාරයන්වද[6] ශාස්ත්‍ර
කියන්නන්වද[7] සේවය සඳහා යොදා-
ගත් ඔහු යෙහෝවා දෙවිව උදහස්
කරමින් දෙවිට පිළිකුල් වූ දේවල්
බොහොමයක් කළේය.[8]

**7** නමස්කාරය සඳහා ඔහු රූප-
යක්[9] සාදා එය සැබෑ දෙවිගේ ගෘහ-
යේ තැබුවේය.[10] නමුත් තම ගෘහය
ගැන දෙවි දාවිත් රජුටද ඔහුගේ පුත්
සලමොන්ටද මෙසේ පවසා තිබිණ.
"මේ ගෘහයද ඊශ්‍රායෙල් ගෝත්‍රවලට
අයත් නුවරවල් අතරින් මා තෝරා-
ගත් මේ නුවර වන යෙරුසලමද
මාගේ නාමය ගෞරවයට පත් කිරීම
සඳහා[11] මම සදහටම[12] තෝරාගත්-
තෙමි.[13] **8** ඊශ්‍රායෙල්වරුන්ව ඔවුන්-
ගේ මුතුන්මිත්තන්ට දුන්[14] දේශයෙන්
මම පන්නා නොදමන්නෙමි.[15] නමුත්
මා ඔවුන්ව ආරක්ෂා කරන්නේ මා
ඔවුන්ට අණ කළ[16] සියල්ලට අනුව
එනම්, මාගේ සේවක මෝසෙස් මාර්-
ගයෙන් දුන්[17] සියලු නීතිරීතිවලට[18]
හා මාගේ තීන්දුවලට[19] අනුව ක්‍රියා
කිරීමට ඔවුන් වගබලා ගත්තොත්
පමණි."[20] **9** යෙහෝවා දෙවි ඊශ්‍රා-
යෙල්වරුන්ගේ ඇස් පනාපිටම විනාශ
කර දැමූ ජාතීන්[21] කළ දුෂ්ට දේවල-
ටත් වඩා දුෂ්ට දේ කිරීමට[22] මනස්සේ
රජ[23] යූදා සහ යෙරුසලමෙහි වැසි-
යන්ව පෙලඹුවේය.[24]

**10** යෙහෝවා දෙවි මනස්සේ රජු-
ටත් ඔහුගේ සෙනඟටත් කොතරම්
අවවාද කළත් ඔවුහු ඊට ඇහුම්-
කන් දුන්නේ නැත.[25] **11** එහෙයින්
යෙහෝවා දෙවි ඇසිරියාවේ රජුට
අයත් සෙන්පතීන්ව[26] ඔවුන්ට විරුද්-
ධව යැවීය.[27] මනස්සේ රජු වළක
සැඟවී සිටියදී ඔවුන් ඔහුව අල්-
ලාගත් අතර[28] තඹ විලංගු දමා[29]
ඔහුව බැබිලෝනියට ගෙන යන
ලදි. **12** තමාට සිදු වූ දෙයින් ඇඩී
සේ කම්පාවට පත් වූ[30] මනස්සේ
රජ තම මුතුන්මිත්තන්ගේ දෙවි
වන යෙහෝවා ඉදිරියේ යටහත් වී[1]
ඔහුගේ අනුමැතිය දිනාගැනීමට උත්-
සාහ කළේය.[2] **13** ඔහු නොකඩවා
දෙවිට යාච්ඤා කළේය. කරුණාව
පෙන්වන්න කියා ඔහු කළ කන්-
නලව්වලට සවන් දුන් දෙවි[3] ඔහුව
නැවත යෙරුසලමෙහි රජු ලෙස
පත් කළේය.[4] යෙහෝවා දෙවි සැබෑ
දෙවි බව මනස්සේ තේරුම්ගත්තේ
එවිටය.[5]

**14** ඉන්පසු ඔහු දාවිත්ගේ නුවරේ[6]
ආරක්ෂාව සඳහා තවත් පවුරක් ගො-
ඩනැඟීය.[7] ගලා ගිය ගීහොන් දිය පහ-
රට බටහිරින් පිහිටි ස්ථානයකින්[8]
ආරම්භ වූ එම පවුර, ඕෆෙල් නුවර
වටා[9] ගොස් මත්ස්‍ය දොරටුව[10] අස-
ලින් අවසන් විය. ඔහු එම පවුර ඉතා
උසට ගොඩනඟන ලදි. ඊට අමතරව
ඔහු යූදා දේශයේ පිහිටි පවුරුවලින්
වට වූ සෑම සුරක්ෂිත නුවරක් සඳ-
හාම හමුදාපතීන්වද පත් කළේය.[11]
**15** යෙහෝවා දෙවිගේ ගෘහයේ තබා
තිබූ රූපය[12] හා වෙනත් දෙවිවරුන්-
ගේ රූප[13] ඔහු ඉවත් කළේය. යෙ-
හෝවා දෙවිගේ ගෘහය පිහිටා තිබූ
කන්ද මත සහ යෙරුසලම් නුවරෙහි
ඔහු විසින්ම ඉදි කරන ලද පූජාසන
සියල්ල[14] ඔහු ඉවත් කළ අතර ඒවා
නුවරින් පිටතට වීසි කිරීමටද පියවර
ගත්තේය. **16** මනස්සේ රජ යෙ-
හෝවා දෙවිගේ පූජාසනය අලුත්-
වැඩියා කර[15] එහි හවුල් පූජාද[16]
ස්තුති පූජාද[17] ඔප්පු කළේය. එසේම
ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝවාට
නමස්කාර කරන ලෙස ඔහු යූදාහි
වැසියන්ට පැවසුවේය.[18] **17** නමුත්
ජනයා යෙහෝවා දෙවිට පූජා ඔප්පු
කළත් ඔවුන් ඒවා ඔප්පු කළේ වෙ-
නත් පූජනීය ස්ථානවලදීය.[19]

**18** මනස්සේ රජුගේ ජීවිතයේ අනි-
කුත් සිදුවීම්ද ඔහු තම දෙවිට කළ
යාච්ඤාවද[20] ඊශ්‍රායෙල්හි දෙවි වන

**33 පරි.**
**1** යොෂු 15:8; 2රාජා 23:10
**2** 2රාජා 16:3; 2ලේක 28:3
**3** ලෙවී 19:26
**4** ද්වි 18:10
**5** 2රාජා 9:22
**6** ලෙවී 20:6
**7** ද්වි 18:11
**8** 2රාජා 21:6
**9** 2රාජා 21:7
**10** 2රාජා 23:6
**11** 2රාජා 23:27
**12** 2ලේක 7:16
**13** ගීතා 132:14
**14** 1ලේක 17:9
**15** 2සාමු 7:10
**16** ද්වි 6:1
**17** ලෙවී 10:11
**18** ද්වි 4:44
**19** ද්වි 11:1; ද්වි 12:1
**20** ද්වි 4:40
**21** ලෙවී 18:24; ද්වි 2:21; යොෂු 24:8
**22** 2රාජා 21:11
**23** 2රාජා 21:16
**24** 1රාජා 14:16; දේශ 9:18
**25** 2ලේක 36:16; හිතෝ 29:1; සෙක 1:4; ක්‍රියා 7:51
**26** නෙහෙ 9:32
**27** ද්වි 28:36
**28** 1සාමු 13:6
**29** යෝබ් 36:8; ගීතා 107:10
**30** ලෙවී 26:40; ද්වි 4:30

**2 තීරුව**
**1** 2ලේක 32:26; ලූක් 18:14; 1පේතෘ 5:6
**2** ගීතා 50:15
**3** 1ලේක 5:20; එස්රා 8:23
**4** යෙසා 1:18
**5** ද්වි 29:6; ගීතා 9:16; දානි 4:25
**6** 2සාමු 5:9
**7** 2ලේක 32:5
**8** 2ලේක 32:30
**9** 2ලේක 27:3
**10** නෙහෙ 3:3
**11** 2ලේක 11:11; 2ලේක 11:12
**12** 2රාජා 21:7; 2ලේක 33:7; යෙසා 30:22
**13** යෙසා 2:18; එස 18:21; හොෂෙ 14:3; මතෙ 3:8

---

**14** 2රාජා 21:4; 2රාජා 21:5; **15** 2ලේක 29:18; **16** ලෙවී 3:1; **17** ලෙවී 7:12; **18** 2ලේක 14:4; **19** 2ලේක 32:12; **20** 2ලේක 33:12.

යෙහෝවාගේ නාමයෙන් ඔහුට නිතර
අවවාද කළ අනාගතවක්තෘවරුන්-
ගේ වදන්ද[1] ඊශ්‍රායෙල්හි රජවරුන්ගේ
ඉතිහාසය වාර්තා කර ඇති ලියවිල්-
ලෙහි සඳහන් කර තිබේ.[2] **19** ඔහු
දෙවිට කළ යාච්ඤාවද[3] ඔහුගේ කන්-
නලව්වට[4] දෙවි ඇහුම්කන් දුන් ආකා-
රයද යටහත් වී පසුතැවිලි වීමට
කලින්[5] ඔහු කළ සියලුම වැරදිද[6] ඔහු
දෙවිට ද්‍රෝහී වූ ආකාරයද[7] ඔහු ඉදි
කළ පූජනීය ස්ථාන ගැනද[8] බොරු
නමස්කාරය සඳහා ඔහු පිහිටෙවූ
කුලුනු[9] හා දේවතා රූප[10] යනාදිය
ගැනද සියලු විස්තර ඔහුගේ අනාග-
තවක්තෘවරුන් පැවසූ දේවල් සඳ-
හන් ලේඛනයේ වාර්තා කර ඇත.
**20** කල් යත්ම මනස්සේ රජ මිය
ගියේය. ඔහුවද ඔහුගේ මුතුන්මිත්-
තන් මෙන් තැන්පත් කරන ලදි.[11]
ඔහුව තැන්පත් කරන ලද්දේ ඔහුගේ
මාලිගාව අසලය.[12] ඔහු වෙනුවට
ඔහුගේ පුත් ආමොන්[13] රජකම් කිරී-
මට පටන්ගත්තේය.

**21** ආමොන්[14] රජකමට පත් වන
විට ඔහුගේ වයස අවුරුදු විසිදෙකකි.
යෙරුසලමේ සිට ඔහු අවුරුදු දෙ-
කක් පාලනය කළේය.[15] **22** ඔහු
තම පියා වූ මනස්සේ රජු මෙන්[16] යෙ-
හෝවා දෙවි පිළිකුල් කළ දේවල් දිග-
ටම කළේය.[17] තම පියා වූ මනස්සේ
රජ[18] විසින් සාදන ලද දේවතා රූප-
වලට[19] පූජා ඔප්පු කරමින්[20] ඔහු
ඒවාට නමස්කාර කළේය.[21] **23** ඔහු-
ගේ පියා වූ මනස්සේ රජු නිහතමානී වී
තම වැරදි ගැන පසුතැවිලි වුවත්[22] ඔහු
පසුතැවිලි වූයේ නැත.[23] ඒ වෙනුවට
ඔහු යෙහෝවා දෙවි පිළිකුල් කළ
දේවල දිගින් දිගටම නියැලුණේය.[24]
**24** පසුව ඔහුගේ සේවකයෝ ඔහුට
විරුද්ධව කුමන්ත්‍රණය කර[25] ඔහුගේම
මාලිගාවේදී ඔහුව මරා දැමුවෝය.[26]
**25** නමුත් දේශයේ වැසියෝ[27] එකතු වී
ආමොන් රජුට විරුද්ධව[28] කුමන්ත්‍ර-
ණය කළ සියලුදෙනාවම[29] මරා,[30]
ආමොන් රජුගේ පුත් යොෂියාව[31] රජ-
කමට පත් කළෝය.

**33 පරි.**
**1** 1සාමු 9:9
යෙසා 29:10
**2** 1රාජා 15:31
**3** 2ලේක 33:12
හිතෝ 15:8
**4** 2ලේක 33:13
1යොහ 1:9
**5** 2ලේක 33:12
**6** 2රාජා 21:2
**7** 2රාජා 21:9
**8** 2රාජා 21:3
**9** 2රාජා 21:7
**10** 2ලේක 33:7
**11** 2රාජා 21:18
**12** 2ලේක 21:20
2ලේක 28:27
**13** 1ලේක 3:14
**14** මතෙ 1:10
**15** 2රාජා 21:19
**16** 2රාජා 21:20
2ලේක 33:2
එස 20:18
**17** 1රාජා 16:19
2ලේක 22:4
**18** 2රාජා 21:7
2ලේක 33:7
**19** නික් 20:4
ද්වි 7:5
**20** යෙසා 44:15
**21** 2රාජා 17:41
යෙසා 44:17
**22** 2ලේක 33:12
**23** 2ලේක 36:12
යෙරෙ 8:12
**24** 2ලේක 28:22
යෙරෙ 7:26
2තිමෝ 3:13
**25** 1රාජා 15:27
2ලේක 24:25
2ලේක 25:27
**26** 2රාජා 21:23
ගීතා 55:23
**27** 2ලේක 36:1
**28** 2රාජා 21:24
**29** 2ලේක 25:3
**30** උත් 9:6
ගණන් 35:31
**31** 2රාජා 21:26

**2 තීරුව**

**34 පරි.**
**1** 1රාජා 13:2
ශෙප 1:1
මතෙ 1:10
**2** 2ලේක 24:1
**3** 2රාජා 22:1
**4** 1රාජා 11:38
**5** 2රාජා 18:3
**6** 2රාජා 22:2
**7** 1ලේක 22:5
ගීතා 119:9
**8** 2ලේක 15:2
**9** 2රාජා 23:14
**10** 2ලේක 33:17
**11** 2ලේක 33:22
**12** 2රාජා 23:4

**34** යොෂියා[1] රජකමට පත් වන
විට ඔහුගේ වයස අවුරුදු
අටකි.[2] යෙරුසලමේ සිට ඔහු අවු-
රුදු තිස්එකක් පාලනය කළේය.[3]
**2** තම මුතුන්මිත්තා වූ දාවිත් මෙන්[4]
යෙහෝවා දෙවි යහපත්යයි සැලකූ
දේ කළ[5] ඔහු දෙවිගේ ආඥා එලෙසම
පිළිපැද්දේය.[6]

**3** ඔහු රජකම් කළ අටවන අවු-
රුද්දේ සිට එනම්, ළාබාල වයසේ[7]
සිටම ඔහු තම මුතුන්මිත්තා වූ දාවිත්
නමස්කාර කළ දෙවිගේ මඟ පෙන්-
වීම් පැතීය.[8] බොරු නමස්කාරය
සඳහා ඉදි කර තිබූ කුලුනු,[9] පූජනීය
ස්ථාන,[10] ගලින් කැපූ රූප[11] සහ ලෝ-
හවලින් තැනූ රූප ඉවත් කර, ඔහු
යූදා දේශය හා යෙරුසලම පවිත්‍ර
කිරීමට පටන්ගත්තේ ඔහු රජකම්
කළ දොළොස්වන අවුරුද්දේදීය.[12]
**4** ඔහුගේ අණ පරිදි බාල් දෙවිවරුන්ට
ඉදි කළ[13] පූජාසන[14] ඔහු ඉදිරිපිටදීම
කඩා දමන ලදි. ඒවාට ඉහළින් සාදා
තිබූ සුවඳ ද්‍රව්‍ය ඔප්පු කරන පූජාස-
නද[15] කඩා බිඳ දමන ලදි. නමස්කා-
රය සඳහා සාදා තිබූ කුලුනුද[16] ගලින්
කැපූ රූපද[17] ලෝහයෙන් තැනූ රූපද
කැබලිවලට කඩා කුඩු කර දැමීම-
ටද[18] ඔහු අණ කළේය. ඉන්පසු එම
කුඩු රැගෙන ගොස් එම රූපවලට
පූජා ඔප්පු කළ අයගේ සොහොන්
මත ඉසින ලදි.[19] **5** ඔහු පූජක-
යන්ගේ ඇටකටු[20] ගෙනැවිත් ඔවුන්
වැඳුම්පිදුම් කළ පූජාසන මතම දවා
දැමීය.[21] යොෂියා රජු යූදා දේශය හා
යෙරුසලම පවිත්‍ර කළේ එයාකාර-
යටය.

**6** ඔහු මනස්සේ,[22] එෆ්‍රායිම්,[23] සිමි-
යොන් සහ නෆ්තලී යන ප්‍රදේශවල
පිහිටි සියලු නුවරවලටද ඒ අවට නට-
බුන් වී තිබූ සියලු ප්‍රදේශවලටද ගොස්
**7** බොරු නමස්කාරය සඳහා ඉදි කර

**13** විනි 2:11; 2ලේක 33:3; **14** ලෙවී 26:30; ද්වි 7:5; **15** 2ලේක 14:5; **16** 2රාජා 23:4; **17** විනි 18:18; **18** නික් 32:20; ද්වි 9:21; **19** 2රාජා 10:25; 2රාජා 23:6; **20** 1රාජා 13:2; **21** 2රාජා 23:16; **22** 2ලේක 30:10; 2ලේක 31:1; **23** 2රාජා 23:19; 2ලේක 30:1.

තිබූ කුලුනු[1] හා පූජාසන[2] කඩා
දැමීය. ඔහු ඒ ප්‍රදේශවල තිබූ ගලින්
නෙළන ලද රූප[3] කඩා කුඩු කර
දැමීය.[4] මුළු ඊශ්‍රායෙල් දේශය පුරා
පිහිටි සුවඳ ද්‍රව්‍ය ඔප්පු කරන පූජාස-
නද[5] කඩා බිඳ දැමීය. මේ සියල්ල
කළ පසු ඔහු නැවතත් යෙරුසලමට
පැමිණියේය.

**8** එසේ යොෂියා රජ දේශය හා දෙ-
විගේ ගෘහය පවිත්‍ර කළේය. ඔහු තමා
පාලනය කළ දහඅටවන අවුරුද්දේදී[6]
අෂලියාගේ පුත් ෂාපාන්වද[7] නුවරේ
ප්‍රධානියා වූ මයසේයාවද යෝවාහාෂ්-
ගේ පුත් යෝවා නම් වාර්තාකරු-
වද තම දෙවි වන යෙහෝවාගේ
ගෘහය අලුත්වැඩියා කිරීමේ වැඩකට-
යුතු සඳහා යැවීය.[8] **9** ඔවුහු උත්-
තම පූජක හිල්කියා[9] වෙත පැමිණ
දොරටු පාලකයන් ලෙස සේවය
කළ ලෙවීවරුන්[10] විසින් දෙවිගේ
ගෘහය සඳහා එකතු කරන ලද මුදල්
ඔහුට භාර දුන්නෝය. මෙම මුදල්
මනස්සේ[11] සහ එෆ්‍රායිම්[12] ප්‍රදේශව-
ලින්ද ඊශ්‍රායෙල් දේශයේ අනිකුත්
ප්‍රදේශවලින්ද[13] යූදා සහ බෙන්ජමින්
යන ප්‍රදේශවලින්ද යෙරුසලමෙහි
වැසියන්ගෙන්ද එකතු කරන ලදි.
**10** පසුව එම මුදල් භාර දෙනු ලැබුවේ
යෙහෝවා දෙවිගේ ගෘහයේ වැඩකට-
යුතු බලා කියා ගැනීමට පත් කළ
අයටය.[14] යෙහෝවා දෙවිගේ ගෘහයේ
වැඩකටයුතුවල කඩිසරව යෙදී සිටි
වැඩකරුවෝ එම මුදල් අලුත්වැ-
ඩියා කටයුතු සඳහා භාවිත කළෝය.
**11** ඔවුහු එම මුදල්, යූදාහි රජවරුන්
විනාශ කළ දෙවිගේ ගෘහය[15] අලුත්-
වැඩියා කිරීමට අවශ්‍ය ගල්ද[16] බාල්ක
හා කලම්ප පටි තනාගැනීමට අවශ්‍ය
දැවද මිල දී ගැනීම සඳහා වඩුවන්ට
හා ගොඩනැඟිලි ඉදි කරන්නන්ට
ලබා දුන්නෝය.[17]

**12** සියලුදෙනාම තම තමන්ට
හිමි කාර්යය විශ්වාසවන්තව ඉටු
කළෝය.[18] ඔවුන්ව අධීක්ෂණය කිරී-
මට මෙරාරීගේ පෙළපතින්[19] යාහත්
සහ ඔබදියා යන ලෙවීවරුන්වද කෝ-
හාත්ගේ පෙළපතින්[1] සෙකරියා සහ
මෙෂුල්ලම් යන ලෙවීවරුන්වද පත්
කරන ලදි. සංගීත භාණ්ඩ වාදනය
කිරීමට දක්ෂ[2] සියලුම ලෙවීවරු,
**13** බඩු බාහිරාදිය උසුලාගෙන ගිය
අයගේ වැඩකටයුතු බලාගත් අතර[3]
වෙනත් සේවාවන් කළ අයවද අධීක්-
ෂණය කළෝය.[4] මීට අමතරව ලේ-
කම්වරුන්,[5] නිලධාරීන් සහ දොරටු
පාලකයන්[6] ලෙස සේවය කිරීමටද
ලෙවීවරුන් අතරින්[7] සමහරදෙනෙකු
තෝරාගන්නා ලදි.

**14** යෙහෝවා දෙවිගේ ගෘහය
සඳහා එකතු කරන ලද මුදල් රැගෙන
ආ අවස්ථාවේදී[8] මෝසෙස් විසින්
ලියන ලද[9] යෙහෝවා දෙවිගේ නීතිය
සඳහන්[10] ලියවිල්ල[11] උත්තම පූජක
හිල්කියාට[12] සම්බ විය. **15** එවිට
පූජක හිල්කියා ලේකම් වූ ෂාපාන්ට
මෙසේ පැවසීය.[13] "යෙහෝවා දෙවිගේ
ගෘහයේ තිබී මට නීතිය සඳහන්
ලියවිල්ල සම්බ වුණා." පසුව හිල්-
කියා ඒ ලියවිල්ල ෂාපාන්ට දුන්නේය.
**16** ෂාපාන් එය රැගෙන රජු ළඟට
ගොස් මෙසේ පැවසීය. "රජතුමනි,
ඔබේ සේවකයන්ට ඔබ භාර දුන්
සියලු දේ ඔවුන් හොඳින් ඉටු කර-
නවා. **17** යෙහෝවා දෙවිගේ ගෘහය
සඳහා එකතු වන මුදල් එහි වැඩක-
ටයුතු භාරව සිටින අයටත් වැඩ
කරන අයටත් ඔබ කිවූ විදිහටම
ඔවුන් ලබා දෙනවා."[14] **18** තවදුර-
ටත් ඔහු, "පූජක හිල්කියා මට මේ
ලියවිල්ල[15] දුන්නා"[16] කියා පවසමින්
එහි සඳහන් දේ රජුට ඇසෙන සේ
කියෙව්වේය.[17]

**19** රජ නීතිය ඇතුළත් ඒ ලියවිල්-
ලෙහි සඳහන් දේ ඇසූ වහාම තම
වස්ත්‍ර ඉරාගත්තේය.[18] **20** ඉන්පසු
රජ, හිල්කියාවද[19] ෂාපාන්ගේ පුත්
අහිකාම්වද[20] මීකාගේ පුත් අබ්දොන්-
වද ලේකම් වූ[21] ෂාපාන්වද[22] රජු-
ගේ සේවකයා වූ අසායාවද[23]
කැඳවා ඔවුන්ට මෙසේ පැවසුවේය.
**21** "අපට සම්බ වූ මේ ලියවිල්ලේ
සඳහන් දේ ගැන[24] යෙහෝවා දෙවි-

**34 පරි.**
1 2රාජා 23:4
2 ද්වි 12:3; 2රාජා 23:12
3 2රාජා 17:41; 2ලේක 33:19
4 ද්වි 9:21
5 2ලේක 14:5
6 2රාජා 22:3
7 2රාජා 22:12
8 2රාජා 22:5
9 2රාජා 22:4
10 1ලේක 26:12
11 2ලේක 30:11
12 2ලේක 31:1
13 2ලේක 30:18
14 2රාජා 22:5
15 2රාජා 16:14; 2ලේක 28:24; 2ලේක 33:4; 2ලේක 33:7; 2ලේක 33:22
16 2රාජා 22:6
17 2රාජා 12:12
18 2රාජා 12:15; නෙහෙ 7:2; හිතෝ 28:20; 1කොරි 4:2
19 1ලේක 23:6; 1ලේක 24:26

**2 තීරුව**
1 1ලේක 9:32; 2ලේක 20:19
2 1ලේක 16:4; 1ලේක 25:1
3 2ලේක 2:10
4 2ලේක 2:18
5 1ලේක 18:16
6 1ලේක 9:17; 2ලේක 8:14
7 1ලේක 23:3
8 2රාජා 22:4
9 ලෙවී 10:11; ලෙවී 26:46
10 ද්වි 17:18; 2ලේක 35:26
11 ද්වි 31:24; ද්වි 31:26
12 2රාජා 22:8
13 2රාජා 22:10
14 2රාජා 22:5
15 ද්වි 31:24; යොෂු 1:8
16 2රාජා 22:8
17 ද්වි 17:19; ගීතා 119:46
18 ගීතා 119:120
19 2රාජා 22:14
20 2රාජා 25:22; යෙරෙ 40:14
21 2රාජා 19:2
22 2රාජා 22:9
23 2රාජා 22:12
24 ද්වි 31:24; යොෂු 1:8

ගෙන් විමසන්න.[1] මා වෙනුවෙනුත්[2]
යූදා හා ඊශ්‍රායෙල් දේශයේ ඉතුරු වී
සිටින සියල්ලන් වෙනුවෙනුත් ඒ දේ
කරන්න. අපේ මුතුන්මිත්තන් මේ
ලියවිල්ලේ සඳහන් දේවල් පිළිපැද්-
දේ නැහැ. ඔවුන් යෙහෝවා දෙ-
විගේ ආඥාවන්ට අකීකරු වුණා.[3]
යෙහෝවා දෙවි අප සමඟ මෙතරම්
උදහස් වී සිටින්නේ ඒ නිසයි.”[4]
**22** රජුගේ අණ පරිදි හිල්කියාද
ඔහු සමඟ සිටි අනික් අයද අනාගත-
වක්තෘවරියක වූ[5] හුල්දාව හමු වීමට
ගියෝය.[6] ඇය නිලවස්ත්‍ර භාරව සිටි[7]
ෂල්ලුම්ගේ භාර්යාව වූවාය. ෂල්ලුම්
හර්හස්ගේ පුත් තික්වාගේ පුත්‍රයෙකි.
හුල්දා ජීවත් වූයේ යෙරුසලම් නුව-
රේ අලුතින් ගොඩනැඟූ කොටසේය.
ඔවුහු රජු කී දේ ඇයට පැවසුවෝය.
**23** ඔවුන් කී දේට සවන් දුන් ඇය
ඔවුන්ට මෙසේ පැවසුවාය.
“ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝවා
මෙහෙම කිව්වා. ‘ගොස් ඔබව
මා ළඟට එවූ තැනැත්තාට මේ
දේ කියන්න. **24** “යෙහෝවා දෙවි
මෙසේ පැවසුවා. ‘යූදාහි රජු ඉදිරියේ
කියවූ ලියවිල්ලෙහි[8] සඳහන් වී ඇති
සියලුම දඬුවම්[9] මම මේ දේශය පිට-
ටත් එහි වැසියන් පිටටත්[10] ගෙනෙන්-
නෙමි. මහත් විනාශයකට මුහුණ
දීමට ඔවුන්ට සිදු වේ.[11] **25** මන්ද
ඔවුහු මාව අත්හැර[12] වෙනත් දෙවිව-
රුන්ට සුවඳ දුම් ඔප්පු කළෝය.[13]
ඔවුන් කරන සෑම දෙයකින්ම[14] ඔවුහු
මාව උදහස් කරන්නෝය.[15] එහෙ-
යින් මේ දේශයට විරුද්ධව ඇවිළී
ඇති මාගේ උදහස[16] නිවී යන්නේ
නැත.’ ”[17] **26** යෙහෝවා දෙවිගෙන්
විමසන්න කියා ඔබව එවූ යූදාහි රජු
ළඟට ගොස් ඔබ මේ දේත් කියන්න.
“ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝවා
මෙසේ පවසනවා.[18] ‘ඔබ ලියවිල්-
ලෙහි සඳහන් දේ[19] අසා **27** මුළු
හදවතින්ම[20] පසුතැවිලි වී මා ඉදිරි-
යේ නිහතමානී විය.[21] මෙම දේ-
ශය ගැනත් එහි වැසියන් ගැනත්
මා පැවසූ දේවලට ඔබ සවන් දුන්

**34 පරි.**
**1** නික් 18:15 1සාමු 9:9 1රාජා 22:7
**2** යෙරෙ 42:2
**3** ද්වි 30:18 ද්වි 31:16 ද්වි 32:15 හෙබ්‍රෙ 10:31
**4** ලෙවී 26:16 ද්වි 28:15
**5** නික් 15:20 විනි 4:4 ලූක් 2:36 ක්‍රියා 21:9
**6** 2රාජා 22:14
**7** 2රාජා 10:22 නෙහෙ 7:72
**8** 2රාජා 22:16
**9** ලෙවී 26:16 ද්වි 28:15 ද්වි 30:18 යොෂු 23:13 ආනි 9:11
**10** යෙරෙ 35:17
**11** යොෂු 23:16 2රාජා 21:12
**12** ද්වි 28:20 2ලේක 24:20
**13** 2රාජා 23:5 2ලේක 28:3
**14** 2රාජා 22:17
**15** 1රාජා 14:9 2රාජා 21:3
**16** ද්වි 29:23 2ලේක 34:21
**17** යෙරෙ 4:4 යෙරෙ 7:20 එස 20:48
**18** 2රාජා 22:18
**19** ද්වි 28:15 2ලේක 34:19
**20** ගීතා 34:18
**21** 2ලේක 32:26

**2 තීරුව**
**1** 2රාජා 22:19
**2** 2ලේක 34:19
**3** 2ලේක 33:13 ගීතා 10:17 ගීතා 86:5
**4** 2රාජා 22:20
**5** 1රාජා 21:29 යෙසා 39:8 1පේත්‍ර 5:5
**6** ගීතා 37:37
**7** 2රාජා 23:1
**8** 2රාජා 23:2
**9** 1රාජා 6:1 1රාජා 8:10
**10** 2රාජා 22:10
**11** 2ලේක 17:9 නෙහෙ 8:3
**12** 2රාජා 23:3
**13** එස්රා 10:3
**14** ද්වි 31:24 2රාජා 22:8
**15** ද්වි 6:5 ද්වි 10:12
**16** ද්වි 5:1 ද්වි 6:1

විට ඔබ මා ඉදිරියෙහි පසුතැවිලි
වී,[1] ඔබේ වස්ත්‍ර ඉරාගෙන[2] හඬා
වැලපුණු ආකාරය මම දුටුවෙමි.[3]
මෙසේ පවසන මා යෙහෝවා දෙවිය.
**28** එහෙයින් මා මේ දේශයට හා එහි
වැසියන් පිටට ගෙනෙන[4] කිසි විප-
තක් ඔබ නොදකින්නෙහිය.[5] මම
ඔබට ඔබේ මුතුන්මිත්තන් මෙන්
සමාදානයෙන් මිය යෑමට ඉඩහ-
රින්නෙමි.[6] ඔබට හිමි සොහොන්
ගෙයි ඔබව තැන්පත් කරනු ලබන්-
නේය.’ ” ’ ”
ඔවුහු පැමිණ ඒ සියල්ල රජුට
දැන්වූවෝය. **29** එවිට රජ, යූදා
සහ යෙරුසලමෙහි විසූ වැඩිමහල්-
ලන් සියලුදෙනාවම කැඳෙව්වේය.[7]
**30** ඉන්පසු රජ, යූදාහි සියලු පුරුෂ-
යන් සහ යෙරුසලමේ සියලු වැසි-
යන්ද පූජකයන්[8] සහ ලෙවීවරුන්ද
ලොකු කුඩා සියලුදෙනාද සමඟ යෙ-
හෝවා දෙවිගේ ගෘහයට ගියේය.[9]
එහිදී රජ, යෙහෝවා දෙවිගේ ගෘහ-
යේ තිබී සම්බ වූ[10] ගිවිසුම සඳ-
හන් වී තිබෙන ලියවිල්ල ඔවුන්ට
ඇසෙන්න කියෙව්වේය.[11] **31** ඉන්-
පසු රජ තමන් සිටගෙන සිටි
ස්ථානයේ සිටම[12] යෙහෝවා දෙවි
සමඟ ගිවිසුමක් ඇති කරගත්තේය.[13]
එනම්, ඒ ලියවිල්ලෙහි සඳහන් ගිවි-
සුම කඩ නොකර[14] මුළු හදවතින්ම[15]
දෙවිගේ ආඥා,[16] සිහිගැන්වීම්[17] සහ
නියෝග[18] පිළිපදින බවටත් යෙ-
හෝවා දෙවි කියන දේට එකඟව
ජීවත් වීමට[19] වෙහෙස මහන්සි නො-
බලා කටයුතු කරන බවටත්[20] රජ
පොරොන්දු විය. **32** ඔහු යෙරුසල-
මෙහි හා බෙන්ජමින් දේශයේ සිය-
ලුම වැසියන්වද එම පොරොන්දුවට
හවුල් කරගත්තේය. එහෙයින් යෙරු-
සලමෙහි වැසියෝ තම මුතුන්මිත්-
තන්ගේ දෙවි ඔවුන් සමඟ ඇති
කරගත් ගිවිසුමට එකඟව ජීවත්
වීමට පියවර ගත්තෝය.[21] **33** ඉන්-
පසු යෝෂියා රජ ඊශ්‍රායෙල්වරුන්ට

**17** ද්වි 4:45; 1රාජා 2:3; **18** ද්වි 12:1; **19** ගීතා 119:106; **20** ද්වි 11:13; **21** 2ලේක 30:12; 2ලේක 33:16.

අයත්ව තිබූ සියලුම ප්‍රදේශවලින්[1]
පිළිකුල්සහගත දේවල් සියල්ල ඉවත්
කළේය.[2] ඔහු ඊශ්‍රායෙල් දේශයෙහි
සියලුදෙනාවම දෙවි වන යෙහෝවාට
නමස්කාර කිරීම සඳහා හවුල් කර-
ගත්තේය. යොෂියා රජු පාලනය කළ
මුළු කාලය පුරාම ඔවුහු තම මුතුන්-
මිත්තන්ගේ දෙවි වන යෙහෝවාට
කළ නමස්කාරයෙන් ඉවත්ව නොගි-
යෝය.[3]

**35** යොෂියා රජ,[4] යෙහෝවා දෙ-
විට ගෞරව කරන පිණිස
යෙරුසලමේදී පාස්කු උත්සවය
පැවැත්වීමට[5] සැලසුම් යෙදුවේය.
පළමු මාසයේ[6] දාහතරවන දින-
යේදී[7] පාස්කුව සඳහා ඔප්පු කරන
සතුන්ව මරන ලදි.[8] **2** තමන්ට
නියමිත වගකීම් නැවත ඉටු
කිරීමට ඔහු පූජකයන්ට නියෝග
කළ අතර[9] යෙහෝවා දෙවිගේ ගෘහ-
යේ ඔවුන් කරන සේවය හොඳින්
කරගෙන යෑමට[10] ඔවුන්ව දිරිගැන්-
වීය.[11] **3** ඉන්පසු ඔහු මුළු ඊශ්‍රා-
යෙල් දේශයෙහි සියලු ලෙවීවරුන්ව
එක් රැස් කළේය. යෙහෝවා
දෙවි විසින් ශුද්ධ අය ලෙස සල-
කන, ඉගැන්වීම් කටයුතුවල නියැ-
ලෙන ඔවුන්ට[12] යොෂියා රජ මෙසේ
පැවසුවේය. "ඊශ්‍රායෙල්හි රජු වූ
දාවිත්ගේ පුත් සලමොන් සෑදූ ගෘහ-
යට[13] ශුද්ධ වූ[14] ගිවිසුම් පෙට්ටිය
රැගෙන ඇවිත් ඊට නියමිත වූ ස්ථා-
නයෙහි එය තබන්න. එය
තවදුරටත් ඔබේ උරහිස් මත තබා-
ගෙන තැනින් තැන ගෙන යෑමට
අවශ්‍ය නැහැ.[15] ඔබේ දෙවි වන
යෙහෝවාටත් ඔහුගේ සෙනඟ වන
ඊශ්‍රායෙල් ජනයාටත් දැන් සේවය
කරන්න.[16] **4** ඊශ්‍රායෙල්හි රජු වූ
දාවිත් සහ ඔහුගේ පුත් සලමොන්
ලියා තිබෙන මඟ පෙන්වීම්වලට
එකඟව,[17] ඔබේ මුතුන්මිත්තන්ගේ
පෙළපත්වලට අනුව[18] නියමිත
කාණ්ඩවලට බෙදී[19] සේවය සඳහා
සූදානම් වන්න. **5** ඔබේ සහෝදර-
යන් වන ඊශ්‍රායෙල් ජනතාව පූජා

**34 පරි.**
1 2රාජා 23:5
2 1රාජා 11:5
3 නික් 3:6

**35 පරි.**
4 2රාජා 23:21
5 නික් 12:11
ලෙවී 23:5
ගණන් 9:2
6 ද්වි 16:1
7 ගණන් 9:3
යොෂු 5:10
එස්රා 6:19
8 නික් 12:21
1කොරි 5:7
9 1ලේක 23:32
2ලේක 23:18
2ලේක 31:2
10 කොලො 4:17
11 ක්‍රියා 20:2
හෙබ්‍රෙ 10:25
1පේතෘ 5:12
12 ද්වි 33:10
2ලේක 17:9
2ලේක 30:22
නෙහෙ 8:8
13 1රාජා 6:38
2ලේක 5:7
14 2ලේක 8:11
15 ගණන් 4:15
1ලේක 23:26
16 ගණන් 16:9
ගීතා 2:11
ගීතා 100:2
තීත 1:1
17 1ලේක 23:6
2ලේක 8:14
18 1ලේක 9:10
1ලේක 9:34
19 1ලේක 24:1

**2 තීරුව**
1 1ලේක 24:30
2 1ලේක 23:11
1ලේක 24:4
3 ගීතා 135:2
4 නික් 12:21
2ලේක 30:15
5 2ලේක 29:5
එස්රා 6:20
6 නික් 12:42
7 2ලේක 30:24
8 1ලේක 29:3
9 1ලේක 28:1
10 හිතෝ 11:25
ක්‍රියා 20:35
11 2රාජා 23:4
2ලේක 34:14
12 2ලේක 35:6
13 එස්රා 6:18
14 ගීතා 135:2

ඔප්පු කිරීම සඳහා තම මුතුන්-
මිත්තන්ගේ[1] පෙළපත්වලට අනුව
බෙදී[2] ශුද්ධස්ථානයට* පැමිණෙයි.
එවිට මුතුන්මිත්තන්ගේ පෙළපත්-
වලට අනුව නියමිත කාණ්ඩවලට
සංවිධානය වී සිටින ඔබ, සෙනඟ
රැගෙන එන ඒ පූජා පිළිගෙන නියම
කර තිබූ ආකාරයට ඒවා සූදානම්
කරන්න.[3] **6** පාස්කුව සඳහා ඔප්පු
කරන සතුන්ව මරා[4] මුලින්ම ඔබ
පවිත්‍ර වෙන්න.[5] ඊළඟට ඔබේ සහෝ-
දරයන් වෙනුවෙනුත් පූජා සූදානම්
කරන්න. ඔබ සියල්ල කළ යුත්තේ
යෙහෝවා දෙවි මෝසෙස් මාර්ගයෙන්
ආඥා කර තිබෙන ආකාරයටයි."[6]

**7** යොෂියා රජ පාස්කුව සඳහා
ඔප්පු කිරීමට ජනතාව වෙනුවෙන්
බැටළු පැටවුන් සහ එළු පැටවුන්
තිස්දහසක් දුන්නේය. ඊට අමතරව
ගවයන් තුන්දහසක්ද ඔහු පරිත්‍යාග
කළේය.[7] ඔහු ඒවා ලබා දුන්නේ ඔහු
සතුව තිබූ සත්ව රැළවලිනි.[8] **8** ඔහු
යටතේ සේවය කළ අධිපතීහු[9] ජන-
තාව වෙනුවෙන්ද[10] පූජකයන් හා
ලෙවීවරුන් වෙනුවෙන්ද කැමැත්-
තෙන්ම දේවල් පරිත්‍යාග කළෝය.
සැබෑ දෙවිගේ ගෘහයේ පෙරමුණ ගෙන
කටයුතු කළ හිල්කියා,[11] සෙකරියා
සහ යෙහීයෙල් පූජකයන් වෙනුවෙන්
පාස්කුව සඳහා ඔප්පු කිරීමට එළු
බැටළු පැටවුන් දෙදහස් හයසිය-
යක් පරිත්‍යාග කළෝය. එමෙන්ම
ඔවුහු ගවයන් තුන්සියයක්ද දුන්-
නෝය. **9** ලෙවීවරුන්ගේ ප්‍රධානීන්
වූ කොනනියාද ඔහුගේ සහෝදරයන්
වූ ෂෙමායා හා නෙතනෙල්ද හෂබියා,
යෙයීයෙල් හා යෝෂාබාද්ද ලෙවී-
වරුන් වෙනුවෙන් පාස්කුව සඳහා
එළු බැටළු පැටවුන් පන්දහසක් දුන්-
නෝය. ඊට අමතරව ඔවුහු ගවයන්
පන්සියයක්ද පරිත්‍යාග කළෝය.

**10** සියලුම කටයුතු සූදානම් කළ
පසු[12] රජුගේ අණ පරිදි[13] පූජක-
යෝ[14] තමන්ට නියමිත ස්ථානව-

**2ලේක 35:5*** එනම්, ගෘහයේ මළුවට.

ලද[1] ලෙවීවරු තමන් සංවිධානය
වී සිටි කාණ්ඩවලට අනුවද[2]
සිටගෙන සිටියෝය. 11 ලෙවීවරු
පාස්කුව සඳහා ඔප්පු කරන සතුන්ව
මරා[3] උන්ගේ ලේ පූජකයන්ට ගෙනැ-
විත් දුන්නෝය. පූජකයෝ[4] එම ලේ
ගෙන පූජාසනය මත ඉසුවෝය.[5]
මැරූ සතුන්ව හම ගසන ලද්දේ
ලෙවීවරුන් විසින්මය.[6] 12 ඉන්පසු
තම මුතුන්මිත්තන්ගේ පෙළපත්ව-
ලට අනුව[7] පැමිණි ඊශ්‍රායෙල් ජනතාව
වෙනුවෙන් ඔවුහු දවන පූජා සූදා-
නම් කර,[8] මෝසෙස්ගේ ලියවිල්-
ලේ සඳහන් පරිදි[9] යෙහෝවා දෙවිට
ඒවා ඔප්පු කළෝය.[10] ගවයන් ඔප්පු
කිරීමේදීද ඒ පිළිවෙතම අනුගම-
නය කරන ලදි. 13 ඔවුහු පාස්කුව
සඳහා ඔප්පු කරන සතුන්ව[11] සිරිත්
පරිදි ගින්නෙන් පිලිස්සූ අතර[12] දෙවිට
කැප කරන ලද වෙනත් පූජාවන්
කල්දේරම්වලද හැළිවලද ඇතිළිව-
ලද පිසුවෝය.[13] පිසින ලද එම ආහාර
ඔවුහු ඉක්මනින්ම ජනතාවට ගෙනැ-
විත් දුන්නෝය.[14] 14 ආරොන්ගෙන්
පැවතෙන පූජකයන් රෑ බෝ වන
තුරුම දවන පූජාද[15] තෙල් කො-
ටස්ද[16] ඔප්පු කරමින් සිටි නිසා ලෙ-
වීවරුන් තමන්ට පමණක් නොව
පූජකයන්ටත් පාස්කුව සඳහා ඔප්පු
කළ සතුන්ව පිසින ලදි.[17]

15 දාවිත් රජු,[18] ආසාෆ්,[19] හේ-
මාන්[20] සහ රජුගේ අනාගතවක්තෘ
වූ[21] යෙදූතුන්[22] නියෝග කර තිබූ
ආකාරයට ආසාෆ්ගෙන් පැවතෙන[23]
ගායකයෝ[24] තම කාර්යයන් හරියා-
කාරව ඉටු කළෝය. එමෙන්ම දොරටු
පාලකයෝ[25] ඔවුන්ට නියමිත ස්ථා-
නවල සිට[26] ඔවුන්ගේ වගකීම නිසි-
යාකාරව ඉටු කළෝය. ඔවුන්ගේ
සහෝදරයන් වූ ලෙවීවරුන් පාස්කුව
සඳහා ඔප්පු කළ සතුන්ව ඔවුන් සිය-
ලුදෙනා වෙනුවෙන් සූදානම් කළ
නිසා[27] ඔවුන්ගේ කාර්යයන් නතර
නොකර දිගටම කරගෙන යෑමට
ඔවුන්ට හැකි විය. 16 යොෂියා රජු-
ගේ අණ පරිදි[28] එම දිනයේදී යෙ-

**35 පරි.**
1 2ලේක 30:16
2 1ලේක 23:6
3 නික් 12:6
4 ගණන් 18:7
5 ලෙවී 1:5; 2ලේක 29:22; 2ලේක 30:16; හෙබ්‍රෙ 9:21
6 ලෙවී 1:6; 2ලේක 29:34
7 1ලේක 23:11; 1ලේක 24:30
8 2ලේක 35:5; 1කොරි 14:40
9 ලෙවී 3:5; ලෙවී 3:11; ලෙවී 3:16
10 ලෙවී 3:9; ලෙවී 3:14
11 නික් 12:8
12 ද්වි 16:7
13 ලෙවී 6:28; ගණන් 6:19
14 රෝම 12:11
15 ලෙවී 3:5
16 ලෙවී 3:3; ලෙවී 3:14
17 2ලේක 31:19; 2ලේක 35:11
18 1ලේක 23:5; 2ලේක 29:26
19 1ලේක 25:2
20 1ලේක 16:41
21 1සාමු 9:9
22 1ලේක 16:42; 1ලේක 25:3
23 1ලේක 16:37; 2ලේක 29:13; ගීතා 50:පෙර
24 1ලේක 15:27; 2ලේක 5:12; එස්රා 2:41
25 1ලේක 9:17; 1ලේක 26:12
26 1ලේක 26:13
27 2ලේක 35:11
28 2රාජා 23:21

**2 තීරුව**
1 ලෙවී 23:5; ගණන් 28:16
2 නික් 12:43; ද්වි 16:1
3 නික් 12:15; ලෙවී 23:6; ගණන් 28:17; ද්වි 16:3; 2ලේක 30:21; 1කොරි 5:8
4 2රාජා 23:22
5 2ලේක 30:5; 2ලේක 30:26
6 2රාජා 23:23
7 2රාජා 23:29
8 යෙරෙ 46:2
9 යෙසා 10:9
10 2රාජා 23:29; හිතෝ 3:30; හිතෝ 26:17
11 2රාජා 22:1

හෝවා දෙවිට ගෞරවය ගෙනෙන
පිණිස පාස්කුව පැවැත්වීමටත් යෙ-
හෝවා දෙවිගේ පූජාසනය මත දවන
පූජා ඔප්පු කිරීමටත් සියලුම කටයුතු
සූදානම් කර තිබිණ.[1]

17 රැස්ව සිටි සියලුම ඊශ්‍රායෙල්-
වරු පාස්කු උත්සවය පැවැත්වූ අතර[2]
මුහුන් නොදැමූ රොටි උත්සවය දවස්
සතක් පුරා පැවැත්වූහ.[3] 18 අනා-
ගතවක්තෘ සාමුවෙල්ගේ කාලයේ
සිට මේ දක්වා ඊශ්‍රායෙල් දේශ-
යෙහි මෙතරම් උත්කර්ෂවත් ලෙස
පාස්කුව පවත්වා තිබුණේ නැත.[4]
යොෂියා රජුද ඔහු සමඟ සිටි පූජක-
යන්ද ලෙවීවරුන්ද යූදා දේශයේ සහ
ඊශ්‍රායෙල් දේශයේ වැසියන්ද යෙරුස-
ලමෙහි වැසියන්ද එකතු වී පැවැත්වූ
මෙම පාස්කුවට සමාන පාස්කුවක්
ඊශ්‍රායෙල්හි වෙනත් කිසිම රජෙකු
විසින් සංවිධානය කර නොතිබිණ.[5]
19 මෙම පාස්කුව පවත්වනු ලැබුවේ
යොෂියා රජකම් කළ දහඅටවන අවු-
රුද්දේදීය.[6]

20 යොෂියා රජ ඒ සියල්ල අව-
සන් කර දෙවිගේ ගෘහය නමස්කා-
රය සඳහා නැවත සූදානම් කළේය.
ඒ කාලයේදී ඊජිප්තුවේ රජු වූ[7]
නෙකෝ,[8] සටනක් සඳහා යුප්‍රටීස්
ගඟ අසල පිහිටි කර්කෙමිෂ්[9] බලා
ගියේය. එවිට ඔහු හා සටන් වැදී-
මට[10] යොෂියා රජද[11] පිටත්ව ගියේය.
21 එවිට නෙකෝ රජ පණිවිඩකරු-
වන් යවා යොෂියා රජුට මෙසේ පැව-
සීය. “යූදාහි රජ්ජුරුවනි, මට ඔබත්
එක්ක කිසිම ප්‍රශ්නයක් නැහැ. මම
යුද්ධයට ආවේ ඔබට විරුද්ධව නෙ-
වෙයි. මම යන්නේ වෙනත් රාජ්‍ය-
යකට විරුද්ධව සටන් කරන්නයි.
ඔවුන් හා සටන් වැදීමට දෙවි මට අණ
කර තිබෙනවා. ඒ නිසා මේ යුද්ධයට
ඔබ හරස් වෙන්න එපා. මට දෙවිගේ
උපකාරය තිබෙන නිසා මේ ගමනට
ඔබ හරස් වුණොත් දෙවි අතින්
ඔබ මරණයට පත් විය හැකියි.”[12]

12 2ලේක 25:19; හිතෝ 27:12.

**22** නමුත් යොෂියා රජ ආපසු හැරී
ගියේ නැත.[1] නෙකෝ රජු[2] මාර්ග-
යෙන් දෙවි පැවසූ ඒ දේ ඔහු ගණනක-
ටවත් නොගෙන, වෙස්වලා ගෙන[3]
නෙකෝ රජු සමඟ සටන් කිරීමට මෙ-
ගිද්දෝ තැනිතලාවට[4] ගියේය.
**23** සටන අතරතුර යොෂියා රජ
දුනුවායන්ගේ[5] ඊතල පහරකට ගො-
දුරු විය. එවිට ඔහු තම සේවක-
යන්ට කතා කර, "මම හොඳටම
තුවාල වෙලයි ඉන්නේ. මාව මෙත-
නින් අරගෙන යන්න"[6] කියා පැවසීය.
**24** ඔහුගේ සේවකයෝ ඔහුව රථ-
යෙන් බස්සවා, ඔහුගේ දෙවන යුධ
රථයට ඔහුව නංවාගෙන යෙරුසල-
මට රැගෙන ගියෝය.[7] එහිදී ඔහු මිය
ගියේය.[8] ඔහුව තම මුතුන්මිත්තන්-
ගේ සොහොන් ගෙයි තැන්පත් කරන
ලදි.[9] යූදා හා යෙරුසලමෙහි සිය-
ලුම වැසියෝ යොෂියා රජුට සිදු වූ
දේ ගැන අසා හඬා වැලපුණෝය.[10]
**25** යොෂියා රජුට සිදු වූ දේ ගැන යෙ-
රෙමියා[11] විලාප ගී කීවේය.[12] සියලුම
ගායක ගායිකාවෝ[13] අද දක්වාම
තමන් ගයන විලාප ගීවල යොෂියා
රජු ගැනද සඳහන් කරති. එම විලාප
ගී ඊශ්‍රායෙල් දේශයෙහි චාරිත්‍රයක්
ලෙස ගයනු ලබන අතර ඒවා විලාප
ගී සමූහයටද ඇතුළත් කර තිබේ.[14]
**26** යොෂියා රජු කළ අනිකුත්
දේවල්ද[15] ඔහු යෙහෝවා දෙවිගේ
නීතියට පක්ෂපාත වෙමින්[16] සිදු
කළ සියලුම ප්‍රේමණීය* ක්‍රියාවන්ද[17]
**27** ඔහුගේ ජීවිතයේ අනිකුත් සිදු-
වීම්ද[18] ඊශ්‍රායෙල්හි සහ යූදාහි රජව-
රුන්ගේ ඉතිහාසය වාර්තා කර ඇති
ලියවිල්ලෙහි සඳහන් කර තිබේ.[19]

**36** දේශයේ වැසියෝ යොෂියා
රජු වෙනුවට ඔහුගේ පුත්
යෙහෝයහාෂ්ව[20] යෙරුසලමේ රජු
ලෙස පත් කළෝය.[21] **2** යෙහෝය-
හාෂ් රජකමට පත් වන විට ඔහුගේ
වයස අවුරුදු විසිතුනකි. ඔහු යෙරුස-
ලමේ සිට මාස තුනක් පාලනය
කළේය.[1] **3** ඒ අතරතුර ඊජිප්තුවේ
රජ පැමිණ ඔහුව යෙරුසලමේ රජක-
මෙන් පහ කර,[2] යූදා දේශයෙන් රිදී
තලෙන්ත සියයක්[3] හා රන් තලෙන්-
තයක් බද්දක් ලෙස අය කළේය.
**4** පසුව ඊජිප්තුවේ රජ[4] යූදා දේශයේ
හා යෙරුසලමෙහි රජු ලෙස යෙහෝ-
යහාෂ්ගේ සහෝදරයා වූ එලියාකීම්ව[5]
පත් කර ඔහුගේ නම යෙහෝයාකිම්
ලෙස වෙනස් කළේය. ඉන්පසු යෙ-
හෝයහාෂ්ව ඊජිප්තුවේ රජු වූ නෙ-
කෝ[6] විසින් ඊජිප්තුවට ගෙන යන
ලදි.[7]
**5** යෙහෝයාකිම්[8] රජකමට පත්
වන විට ඔහුගේ වයස අවුරුදු විසිප-
හකි. ඔහු යෙරුසලමේ සිට අවු-
රුදු එකොළහක් පාලනය කළේය.[9]
ඔහු තම දෙවි වන යෙහෝවා පිළි-
කුල් කරන දේවල් දිගටම කළේය.[10]
**6** බැබිලෝනියේ රජු වූ නෙබුකද්-
නෙෂර්,[11] ඔහුට තඹ විලංගු දමා
ඔහුව බැබිලෝනියට ගෙන යෑමේ[12]
අරමුණින් පැමිණියේය.[13] **7** නෙබු-
කද්නෙෂර් රජ,[14] යෙහෝවා දෙවි-
ගේ ගෘහයේ භාවිත කළ ඇතැම්
භාණ්ඩද[15] බැබිලෝනියට ගෙන ගිය
අතර ඒවා ඔහුගේ රජමාලිගාවෙහි
තැබුවේය.[16] **8** යෙහෝයාකිම් රජු-
ගේ ජීවිතයේ අනිකුත් සිදුවීම්ද[17] ඔහු
කළ පිළිකුල්සහගත දේවල්ද[18] ඔහු
ගත කළ නරක ජීවිතය ගැනද ඊශ්‍රා-
යෙල්හි හා යූදාහි රජවරුන්ගේ ඉති-
හාසය වාර්තා කර ඇති ලියවිල්ලෙහි
සඳහන් කර තිබේ.[19] ඔහුට පසුව ඔහු-
ගේ පුත් යෙහෝයාකින්[20] රජකමට
පත් විය.
**9** යෙහෝයාකින්[21] රජකමට පත්
වන විට ඔහුගේ වයස අවුරුදු දහඅ-
ටකි. ඔහු යෙරුසලමේ සිට මාස තුන-
කුත්[22] දවස් දහයක් පාලනය කළේය.
ඔහු යෙහෝවා දෙවි පිළිකුල් කරන
දේවල් දිගටම කළේය.[23] **10** අලුත්

**35 පරි.**
**1** හිතෝ 15:10
**2** 2රාජා 23:33; යෙරෙ 46:2
**3** 1රාජා 14:2; 1රාජා 22:30; 2ලේක 18:29
**4** විනි 1:27; විනි 5:19; 1රාජා 4:12; 2රාජා 9:27; 2රාජා 23:30; සෙක 12:11; එළි 16:16
**5** 2රාජා 9:24; 2ලේක 18:33
**6** 1රාජා 22:34
**7** 2රාජා 23:30
**8** ගීතා 146:4; දේශ 8:14; දේශ 9:10
**9** 2ලේක 34:28
**10** ද්වි 34:8; 1රාජා 14:18
**11** යෙරෙ 1:1
**12** විලා 4:20
**13** යෙරෙ 9:17; යෙරෙ 9:20
**14** යෙරෙ 22:20
**15** 2රාජා 23:28
**16** ද්වි 31:24
**17** 2ලේක 32:32; හිතෝ 19:22
**18** 2ලේක 26:22
**19** 2ලේක 25:26

**36 පරි.**
**20** 1ලේක 3:15; යෙරෙ 22:11
**21** 2රාජා 23:30

**2 තීරුව**
**1** 2රාජා 23:31
**2** 2රාජා 23:33
**3** 2රාජා 18:14; 2ලේක 27:5
**4** 2ලේක 35:20
**5** 2රාජා 23:34
**6** 2රාජා 23:29; යෙරෙ 46:2
**7** යෙරෙ 22:12
**8** යෙරෙ 26:21; යෙරෙ 36:32
**9** 2රාජා 23:36
**10** 2රාජා 23:37
**11** 2රාජා 25:1; එස්රා 1:7; යෙරෙ 25:1; දානි 1:1
**12** 2රාජා 24:16
**13** 2රාජා 24:1
**14** දානි 1:2
**15** 2රාජා 24:13; එස්රා 1:7; යෙරෙ 27:16
**16** දානි 5:2
**17** 2ලේක 25:26

**18** 1රාජා 11:5; 2ලේක 34:33; **19** 2රාජා 24:5; 2ලේක 35:27; **20** 2රාජා 24:6; **21** යෙරෙ 22:24; මතෙ 1:12; **22** 2රාජා 24:8; **23** 1රාජා 15:26; 1රාජා 22:52; 2රාජා 15:24.

2ලේක **35:26*** හෝ, "ළැදි ප්‍රේමයකින් කළ."

අවුරුද්දක ආරම්භයත් සමඟම[1] නෙ-
බුකද්නෙෂර් රජ ඔහුගේ හමුදා පිරිස්
යවා[2] යෙහෝයාකින් රජුව බැබිලෝ-
නියට ගෙනාවේය.[3] ඔහු සමඟ යෙ-
හෝවා දෙවිගේ ගෘහයේ තිබූ බොහෝ
වටිනා දේවල්ද[4] ගෙනෙන ලදි. ඉන්-
පසු නෙබුකද්නෙෂර් රජ, යෙහෝයා-
කින් රජුගේ බාප්පා වූ ශෙදකියාව[5]
යූදා දේශයේ හා යෙරුසලමෙහි රජු
ලෙස පත් කළේය.[6]
**11** ශෙදකියා[7] රජකමට පත් වන
විට ඔහුගේ වයස අවුරුදු විසිඑකකි.
ඔහු යෙරුසලමේ සිට අවුරුදු එකො-
ළහක් පාලනය කළේය.[8] **12** ඔහුද
යෙහෝවා දෙවි පිළිකුල් කරන දේවල්
දිගටම කළේය.[9] යෙහෝවා දෙවිගේ
අණ පරිදි අනාගතවක්තෘ[10] යෙරෙ-
මියා ඔහුට කොතරම් අවවාද කළත්[11]
ඔහු නිහතමානීව ඒවා පිළිගත්-
තේ නැත.[12] **13** ඔහු නෙබුකද්නෙ-
ෂර් රජුට යටත්ව සිටින බවට දෙවිගේ
නාමයෙන් පොරොන්දු වුවත්[13] පසුව
රජුට විරුද්ධව කැරලිගැසීය.[14] ඔහු
දිගින් දිගටම මුරණ්ඩු ලෙස කට-
යුතු කළ අතර[15] ඊශ්‍රායෙල්හි දෙවි
වන යෙහෝවා වෙතට නැවත හැරී
ආවේ නැත.[16] **14** නායක පූජක-
යෝද[17] ජනයාද අවට ජාතීන් කළ
පිළිකුල්සහගත දේවල් අනුගමනය
කරමින්[18] දෙවිට විරුද්ධව බොහෝ
පව් කළෝය. ප්‍රතිඵලයක් ලෙස පරි-
ශුද්ධ නමස්කාරය සඳහා දෙවි විසින්ම
තෝරාගත් යෙරුසලමෙහි පිහිටි යෙ-
හෝවා දෙවිගේ ගෘහය ඔවුහු කෙලෙ-
සුවෝය.[19]
**15** ඔවුන්ගේ මුතුන්මිත්තන්ගේ
දෙවි වන යෙහෝවා, තම සෙනඟට
අනුකම්පා කළ නිසාත්[20] තම ගෘහය
ගැන ඔහුට සිහි වූ නිසාත්[21] පණිවි-
ඩකරුවන්ව එවා ඔවුන්ට නැවත
නැවතත් අනතුරු ඇඟෙව්වේය.[22]
**16** නමුත් ඔවුහු ඔවුන්ට සරදම් කර-
මින්,[23] දෙවි තම අනාගතවක්තෘ-
වරුන් මාර්ගයෙන් පැවසූ දේවල්
හෙළාදුටුවෝය.[24] ඔවුහු ඒ කිසිවක්

**36 පරි.**
**1** 2සාමු 11:1; 1රාජා 20:22; 2රාජා 13:20
**2** 2රාජා 24:10
**3** යෙරෙ 29:2; එස 1:2; එස 19:9
**4** 2රාජා 24:13; යෙරෙ 27:18; දානි 5:23
**5** යෙරෙ 52:3
**6** 2රාජා 24:17
**7** 1ලේක 3:15; යෙරෙ 37:1
**8** 2රාජා 24:18; යෙරෙ 52:1
**9** 2රාජා 21:2; 2රාජා 23:32
**10** යෙරෙ 38:14
**11** යෙරෙ 21:1; යෙරෙ 34:2
**12** නික් 10:3; 2ලේක 32:26; දානි 5:22; යාකො 4:10; 1පේතෘ 5:6
**13** යොෂු 9:15; 2සාමු 21:2
**14** 2රාජා 24:20; යෙරෙ 52:3; එස 17:15
**15** 2රාජා 17:14; නෙහෙ 9:16; හිතෝ 29:1
**16** නික් 9:17; හිතෝ 28:14
**17** 2රාජා 16:11
**18** 2ලේක 28:3
**19** 2ලේක 33:4
**20** විනි 10:16; 2රාජා 13:23
**21** 2ලේක 6:2
**22** 2ලේක 7:20
**23** 2ලේක 30:10; ගීතා 35:16
**24** හිතෝ 1:24; යෙරෙ 5:12

**2 තීරුව**
**1** යෙරෙ 20:7
**2** හිතෝ 6:15; හිතෝ 29:1
**3** ද්වි 29:28; 2ලේක 34:21; ගීතා 74:1
**4** උත් 11:28; 2රාජා 24:2
**5** එස 9:7
**6** ලෙවී 26:31; ද්වි 28:25; ගීතා 79:2
**7** ද්වි 28:50; විලා 2:21
**8** යෙරෙ 52:17
**9** යෙරෙ 27:18
**10** 2රාජා 12:18; යෙසා 39:6
**11** 2රාජා 20:13; 2ලේක 25:24

පිළිගත්තේ නැත.[1] එහි ප්‍රතිඵලයක්
ලෙස අන්තයටම පිරිහී ගොස් සිටි
ඔවුන්ට[2] විරුද්ධව යෙහෝවා දෙවිගේ
උදහස ඇවුළුණේය.[3]
**17** ඒ නිසා දෙවි ඔවුන්ට විරුද්-
ධව කල්දිවරුන්ගේ රජුව එව්ය.[4] ඔහු
පැමිණ ඔවුන්ගේ තරුණයන්ව දේව-
මාලිගාවෙහිදීම[5] මරා දැමීය.[6] තරුණ
තරුණියන්ටවත් මහලු හෝ අබලදු-
බල අයටවත් ඔහුගෙන් කිසිම අනු-
කම්පාවක් නොලැබුණේය.[7] මෙසේ
දෙවි ඔවුන් සියලුදෙනාවම කල්දිව-
රුන්ගේ රජු අතට හසු වීමට ඉඩහැ-
රියේය. **18** සැබෑ දෙවිගේ ගෘහයේ
භාවිත කළ ලොකු[8] කුඩා සියලු භාජ-
නද[9] යෙහෝවා දෙවිගේ ගෘහයේ රැස්
කර තිබූ වස්තුද[10] රජුට හා ඔහුගේ
අධිපතීන්ට අයත් වූ වස්තුද[11] බැබි-
ලෝනියට ගෙන යන ලදි. **19** ඔහු
සැබෑ දෙවිගේ ගෘහයට ගිනි තබා[12]
යෙරුසලමේ පවුරද බිඳ දැමීය.[13] එහි
සියලුම බලකොටුද එහි තිබූ වෙ-
නත් වටිනා දේවල්ද ගිනිබත් කරන
ලදි.[14] මෙසේ ඔහු සෑම දෙයක්ම
විනාශ කර දැමීය.[15] **20** මීට අමත-
රව කඩු පහරින් මිය නොගිය අයව ඔහු
වහලුන් ලෙස බැබිලෝනියට ගෙන
ගියේය.[16] එසේ වහල්කමට ගිය සිය-
ලුදෙනා පර්සියාවේ රාජකීය පාල-
නය[17] පටන්ගන්නා තෙක් ඔහුටත්
ඔහුගේ පුත්‍රයන්ටත් සේවය කළෝය.[18]
**21** මෙසේ යෙහෝවා දෙවි යෙරෙමියා
මාර්ගයෙන් පැවසූ දේ ඉටු විය.[19] දේ-
ශය අවුරුදු සැත්තෑවක් පුරා පාළුව
පැවතිණ.[20] පාළුව පැවති සියලු දවස්-
වලදී දේශයේ වැසියන් කලින් නොපැ-
වැත්වූ සෑම සබතක් වෙනුවෙන්ම
දේශයට විවේකයක් දෙන ලදි.[21]
**22** පර්සියාවේ රජු වූ[22] සයිරස්[23]
පාලනය කළ පළමු අවුරුද්දේදී

**12** 2රාජා 25:9; ගීතා 74:7; ගීතා 79:1; **13** 2රාජා 25:10; යෙරෙ 52:14; **14** ගීතා 74:6; **15** 1රාජා 9:7; 2ලේක 7:21; **16** 2රාජා 25:21; ගීතා 137:1; **17** එස්රා 1:1; **18** යෙරෙ 27:7; **19** යෙරෙ 25:9; **20** යෙරෙ 25:12; සෙක 1:12; **21** ලෙවී 26:34; **22** එස්රා 1:2; **23** යෙසා 44:28; යෙසා 45:1; දානි 10:1.

යෙරෙමියා මාර්ගයෙන්[1] යෙහෝවා
දෙවි පැවසූ වචන[2] ඉටු කරන
පිණිස යෙහෝවා දෙවි සයිරස් රජුගේ
සිත පෙලඹුවේය.[3] ඒ නිසා සයිරස් රජ
තම රාජධානිය පුරා ප්‍රකාශයක් පතළ
කිරීමට පියවර ගත්තේය. ලිඛිතව
දැනුම් දෙන ලද[4] එම ප්‍රකාශයේ මෙසේ
සඳහන් විය. **23** “පර්සියාවේ රජු වූ
සයිරස් මෙසේ දැනුම් දී ඇත.[5] ‘ස්වර්-
ගයේ සිටින යෙහෝවා දෙවි මේ පො-
ළොවේ සියලු රාජ්‍යයන් මට දී තිබේ.[1]
යූදා දේශයෙහි පිහිටා තිබෙන[2] යෙරු-
සලමෙහි ඔහුට ගෘහයක් ගොඩනැඟී-
මේ කාර්යයද ඔහු මට පවරා ඇත. ඔබ
අතරේ යෙහෝවා දෙවිට නමස්කාර
කරන සියලුදෙනාට[3] ඔහුගේ ආශීර්වාද
ලැබේවා![4] ඔවුන්ට එම නුවරට යෑමට
මම අවසර දෙන්නෙමි.’ ”[5]

**36 පරි.**
1 යෙරෙ 32:42, යෙරෙ 33:10
2 යෙරෙ 29:14
3 හග් 1:14
4 එස්රා 1:1
5 එස්රා 1:2

**2 තීරුව**
1 ගීතා 75:7, දානි 2:37, දානි 4:35, දානි 5:18
2 යෙසා 44:28

**3** 1ලේක 29:5; එස්රා 7:13; **4** රෝම 8:31; **5** 1ලේක 22:16; සෙක 2:7.

# එස්රා*

**1** පර්සියාවේ රජු වූ සයිරස්*[1] පාල-
නය කළ පළමුවන අවුරුද්දේදී,
යෙරෙමියා මාර්ගයෙන් යෙහෝවා
දෙවි පැවසූ වචන[2] ඉටු කරන
පිණිස යෙහෝවා දෙවි සයිරස් රජුගේ
සිත පෙලඹුවේය.[3] ඒ නිසා සයිරස්
රජ තම රාජධානිය පුරා ප්‍රකාශ-
යක් පතළ කිරීමට[4] පියවර ගත්තේය.
ලිඛිතව[5] දැනුම් දෙන ලද එම ප්‍රකාශ-
යේ මෙසේ සඳහන් විය.
**2** “පර්සියාවේ රජු වූ සයිරස් මෙසේ
දැනුම් දී ඇත.[6] ‘ස්වර්ගයේ සිටින යෙ-
හෝවා දෙවි[7] මේ පොළොවේ සියලු
රාජ්‍යයන් මට දී තිබේ.[8] යූදා දේශ-
යෙහි පිහිටා තිබෙන යෙරුසලමෙහි
ඔහුට ගෘහයක් ගොඩනැඟීමේ[9] කාර්-
යයද ඔහු මට පවරා ඇත. **3** සැබෑ
දෙවි ඔහුය.[10] ඔබ අතරේ ඒ දෙ-
විට නමස්කාර කරන සියලුදෙනාට
ඔහුගේ ආශීර්වාද ලැබේවා![11] යූදාහි
පිහිටි යෙරුසලමට[12] ගොස් ඊශ්‍රා-
යෙල්හි දෙවි වන යෙහෝවාගේ ගෘහය
නැවත ගොඩනඟන්න මම ඔබට
අවසර දෙන්නෙමි. **4** යූදා දේශ-
යට නැවත නොයෑමට තීරණය
කරන අය සිටී නම්[13] එම ගමන
යෑමට සූදානම් වන අයට සහය දක්-
වන්න ඔවුන්ට පුළුවන. රන්, රිදී හා
සතුන් මෙන්ම වෙනත් බඩු බාහිරා-
දිය පරිත්‍යාග කිරීමෙන්ද යෙරුසලමේ
පිහිටා තිබූ සැබෑ දෙවිගේ ගෘහයේ
පූජා ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය
සිය කැමැත්තෙන්ම[1] සපයා දීමෙන්ද
ඔවුන්ට සහය දැක්විය හැක.’ ”
**5** එහෙයින් යූදා සහ බෙන්ජමින්
ගෝත්‍රවල ප්‍රධානියෝද[2] පූජකයෝ
සහ ලෙවීවරුද තවත් බොහෝදෙ-
නෙක්ද යෙරුසලමේ තිබූ යෙහෝවා
දෙවිගේ ගෘහය නැවත ගොඩනැඟීම
සඳහා[3] යෑමට සූදානම් වූහ. මන්ද
සැබෑ දෙවි ඒ ගමන යෑමට ඔවුන්ගේ
සිත් තුළ මහත් ආශාවක්[4] ඇති කර
තිබිණ. **6** අවට ජීවත් වූ සියලුදෙ-
නාගෙන්ද ඔවුන්ට මහත් දිරිගැන්වී-
මක් ලැබිණ.[5] ඔවුහු දෙවිගේ ගෘහයේ
පූජා ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය-
යන් සිය කැමැත්තෙන්ම ලබා දුන්
අතර රිදී භාණ්ඩද රන්ද වෙනත් බඩු
බාහිරාදියද සතුන්ද වෙනත් වටිනා
දේවල්ද පරිත්‍යාග කළෝය.[6]
**7** සයිරස් රජද යෙහෝවා දෙවි-
ගේ ගෘහයට අයත් භාණ්ඩ ඔවුන්ට
නැවත භාර දුන්නේය.[7] මීට පෙරාතුව

**1 පරි.**
1 2ලේක 36:22, යෙසා 45:1, දානි 10:1
2 යෙරෙ 25:12, යෙරෙ 29:14, යෙරෙ 33:11
3 හිතෝ 21:1
4 2ලේක 24:9, 2ලේක 30:5
5 එස්ත 3:12, එස්ත 8:10, දානි 6:8
6 2ලේක 36:23
7 1රාජා 8:27, 1රාජා 8:43, ගීතා 96:5, යෙසා 37:16
8 ගීතා 75:7, යෙරෙ 27:5, දානි 2:21, දානි 4:35, දානි 5:21
9 යෙසා 44:28
10 ද්වි 3:24, 2සාමු 22:32, ගීතා 86:10, යෙරෙ 10:10, 1කොරි 8:4
11 1ලේක 28:20, ගීතා 145:18, යෙසා 45:13
12 1රාජා 6:1
13 2රාජා 17:6, යෙරෙ 9:16

**2 තීරුව**
1 නික් 35:21, 1ලේක 29:9, එස්රා 7:16
2 2ලේක 19:8, එස 20:1
3 2ලේක 36:19

**එස්රා නම*** තේරුම, “උපකාරය.” **1:1*** මෙහි සඳහන් වන්නේ, 2වන කයිරොස් හෝ මහ කයිරොස් රජ ගැනයි. පර්සියානු භාෂාවෙන්, “කුරාෂ්.”

**4** නෙහෙ 2:12; පිලි 2:13; **5** නෙහෙ 2:18; යෙසා 41:10; **6** හිතෝ 3:9; 2කොරි 9:7; **7** එස්රා 5:14; එස්රා 6:5.

ඒ භාණ්ඩ යෙරුසලමේ සිට රැගෙන
ආ නෙබුකද්නෙෂර් රජු[1] තමන් ඇදහූ
දෙවියන්ගේ දේවාලයෙහි ඒවා තබා
තිබිණ.[2] **8** පර්සියාවේ රජු වූ සයිරස්
එම භාණ්ඩ නැවත භාර දීමේ වගකීම
පැවරුවේ භාණ්ඩාගාරික මිත්රෙදාත්-
ටය. ඔහු ඒවා ගණන් කර, යූදා ගෝ-
ත්‍රයේ ප්‍රධානියෙකු වූ[3] ෂෙෂ්බෂර්ට*[4]
භාර දුන්නේය.

**9** භාර දුන් භාණ්ඩවල විස්තර මෙ-
සේය. රන් කූඩ තිහක්ද රිදී කූඩ
දහසක්ද වෙනත් භාජන විසිනව-
යක්ද **10** කුඩා රන් බඳුන්[5] තිහක්ද
කුඩා රිදී බඳුන් හාරසිය දහයක්ද
වෙනත් භාණ්ඩ දහසක්ද භාර දෙන
ලදි. **11** රන් සහ රිදී භාණ්ඩවල මුළු
ගණන පන්දහස් හාරසියයකි. සෙනඟ
බැබිලෝනියේ සිට යෙරුසලමට යන
විට[6] ෂෙෂ්බෂර්[7] මේ සියලු භාණ්ඩද
රැගෙන ගියේය.

**2** බැබිලෝනියේ රජු වූ නෙබුකද්-
නෙෂර්, බැබිලෝනියේ[8] වහල්-
භාවයට ගෙන ගිය අය[9] අතරින්
බොහෝදෙනෙක් යෙරුසලමෙහි සහ
යූදාහි[10] පිහිටි තම තමන්ගේ නුවරව-
ලට ආපසු පැමිණියෝය.[11] **2** සෙ-
රුබාබෙල්,[12] යේෂුවා,*[13] නෙහෙමියා,
සෙරායා,#[14] රෙයලායා, මොර්දෙකයි,
බිල්ෂාන්, මිස්පාර්, බිග්වායි, රෙහුම්
සහ බානාහ් සමඟ යූදා දේශයට
පැමිණි ඔවුන්ගේ නම් මතු දැක්වේ.

ඊශ්‍රායෙල් සෙනඟ අතරේ සිටි පුරු-
ෂයන්ගේ සංඛ්‍යාව මෙසේය.
**3** පාරොෂ්ගේ පුත්‍රයන්ගේ[15] ගණන
දෙදහස් එකසිය හැත්තෑදෙකකි.
**4** ෂෙපටියාගේ පුත්‍රයන්ගේ[16] ගණන
තුන්සිය හැත්තෑදෙකකි. **5** ආරාහ්-
ගේ පුත්‍රයන්ගේ[17] ගණන හත්සිය හැත්-
තෑපහකි. **6** පාහත්-මෝවබ්ගේ*[18]
පෙළපතට අයත් යේෂුවාගේ සහ යෝ-
වාබ්ගේ පුත්‍රයන්ගේ[1] ගණන දෙද-
හස් අටසිය දොළහකි. **7** ඒලාම්ගේ
පුත්‍රයන්ගේ[2] ගණන එක්දහස් දෙසිය
පනස්හතරකි. **8** සට්ටුගේ පුත්‍රයන්-
ගේ[3] ගණන නවසිය හතළිස්පහකි.
**9** ෂක්කායිගේ පුත්‍රයන්ගේ[4] ගණන
හත්සිය හැටකි. **10** බානිගේ* පුත්‍ර-
යන්ගේ[5] ගණන හයසිය හතළිස්-
දෙකකි. **11** බෙබායිගේ පුත්‍රයන්ගේ[6]
ගණන හයසිය විසිතුනකි. **12** අස්-
ගාද්ගේ පුත්‍රයන්ගේ[7] ගණන එක්ද-
හස් දෙසිය විසිදෙකකි. **13** අදොනි-
කාම්ගේ පුත්‍රයන්ගේ[8] ගණන හයසිය
හැටහයකි. **14** බිග්වායිගේ පුත්‍රයන්-
ගේ[9] ගණන දෙදහස් පනස්හයකි.
**15** ආදින්ගේ පුත්‍රයන්ගේ[10] ගණන
හාරසිය පනස්හතරකි. **16** හෙසකි-
යාගේ පවුලට අයත් ආටෙර්ගේ පුත්‍ර-
යන්ගේ[11] ගණන අනූඅටකි. **17** බේ-
ෂායිගේ පුත්‍රයන්ගේ[12] ගණන
තුන්සිය විසිතුනකි. **18** යෝරා-
ගේ* පුත්‍රයන්ගේ ගණන එකසිය දො-
ළහකි. **19** හාෂුම්ගේ පුත්‍රයන්ගේ[13]
ගණන දෙසිය විසිතුනකි. **20** ගිබ්-
බාර්ගේ* පුත්‍රයන්ගේ[14] ගණන අනූ-
පහකි. **21** බෙත්ලෙහෙමෙහි පුරුෂ-
යන්ගේ[15] ගණන එකසිය විසිතුනකි.
**22** නෙටෝෆාහි පුරුෂයන්ගේ[16] ගණන
පනස්හයකි. **23** අනාතොත්හි පුරු-
ෂයන්ගේ[17] ගණන එකසිය විසි-
අටකි. **24** අෂ්මාවෙත්ගේ පුත්‍රයන්-
ගේ[18] ගණන හතළිස්දෙකකි.
**25** කිර්යත්-යෙයාරීම්,[19] කෙෆීරා සහ
බෙයේරොත්හි පුරුෂයන්ගේ ගණන
හත්සිය හතළිස්තුනකි. **26** රාමා[20]

**1 පරි.**
1 2රාජා 24:13 2ලේක 36:7 2ලේක 36:18 දානි 5:2
2 දානි 1:2
3 හග් 1:14 සෙක 4:7
4 එස්රා 5:14 එස්රා 5:16 හග් 1:1 හග් 2:21
5 2ලේක 4:8
6 2රාජා 24:15 2ලේක 36:20
7 හග් 2:23

**2 පරි.**
8 නෙහෙ 7:6
9 2රාජා 24:15 2රාජා 24:16 2රාජා 25:11 2ලේක 36:20 විලා 1:3
10 එස්රා 1:3
11 ද්වි 30:3 ගීතා 147:2 යෙරෙ 32:37 එස 34:13
12 එස්රා 1:11 නෙහෙ 7:7 හග් 1:1 හග් 1:14 හග් 2:21 මතෙ 1:12
13 එස්රා 3:8 එස්රා 5:2 හග් 1:12 හග් 2:4 සෙක 3:1
14 නෙහෙ 7:7
15 එස්රා 8:3 නෙහෙ 7:8 නෙහෙ 10:14
16 එස්රා 8:8 නෙහෙ 7:9
17 නෙහෙ 6:18 නෙහෙ 7:10
18 එස්රා 8:4 එස්රා 10:30 නෙහෙ 3:11 නෙහෙ 7:11 නෙහෙ 10:14

**2 තීරුව**
1 එස්රා 8:9 නෙහෙ 7:11
2 එස්රා 8:7 එස්රා 10:26 නෙහෙ 7:12
3 එස්රා 10:27 නෙහෙ 7:13
4 නෙහෙ 7:14
5 එස්රා 10:34
6 එස්රා 8:11 නෙහෙ 7:16
7 එස්රා 8:12 නෙහෙ 7:17
8 නෙහෙ 7:18

**9** එස්රා 8:14; නෙහෙ 7:19; **10** එස්රා 8:6; නෙහෙ 7:20; **11** නෙහෙ 7:21; **12** නෙහෙ 7:23; **13** එස්රා 10:33; නෙහෙ 7:22; **14** නෙහෙ 7:25; **15** 1සාමු 17:12; 1ලේක 4:4; නෙහෙ 7:26; **16** 1ලේක 2:54; නෙහෙ 7:26; **17** යොෂු 21:18; නෙහෙ 7:27; යෙරෙ 1:1; යෙරෙ 32:8; **18** නෙහෙ 7:28; නෙහෙ 12:29; **19** යොෂු 9:17; නෙහෙ 7:29; **20** යොෂු 18:25; 1රාජා 15:17; නෙහෙ 7:30; නෙහෙ 11:33.

**එස්රා 1:8*** එස්රා 2:2හි සහ 3:8හි, "සෙරුබාබෙල්" ලෙස හඳුන්වා ඇත. **2:2*** හෙබ්‍රෙව් බසින්, යේෂුවා. හග් 1:1හි සහ සෙක 3:1හි සඳහන් වන්නේ, "යෝෂුවා" ලෙසයි. සෙප්ටුඅජින්ට් ග්‍රීක පිටපතේ, "යේසුස්" ලෙස සඳහන් වේ. **2#** නෙහෙ 7:7හි සඳහන් වන්නේ, "අෂරියා" ලෙසයි. **6*** තේරුම, "මෝවබ්හි ආණ්ඩුකාරයා."

**එස්රා 2:10*** නෙහෙ 7:15හි සඳහන් වන්නේ, "බින්නුයි" ලෙසයි. **18*** නෙහෙ 7:24හි සඳහන් වන්නේ, "හාරිෆ්" ලෙසයි. **20*** නෙහෙ 7:25හි සඳහන් වන්නේ, "ගිබියොන්" ලෙසයි.

සහ ගෙබාහි[1] පුරුෂයන්ගේ ගණන හය-
සිය විසිඑකකි. **27** මික්මාස්හි පුරුෂ-
යන්ගේ[2] ගණන එකසිය විසිදෙ-
කකි. **28** බෙතෙල්හි[3] සහ ආයිහි[4]
පුරුෂයන්ගේ ගණන දෙසිය විසිතු-
නකි. **29** නෙබෝහි පුරුෂයන්ගේ[5]
ගණන පනස්දෙකකි. **30** මග්බිෂ්හි
පුරුෂයන්ගේ ගණන එකසිය පනස්-
හයකි. **31** ඒලාම්ගේ* පුත්‍රයන්ගේ[6]
ගණන එක්දහස් දෙසිය පනස්හතරකි.
**32** හාරිම්ගේ පුත්‍රයන්ගේ[7] ගණන
තුන්සිය විස්සකි. **33** ලොද්,[8] හාදිද්[9]
සහ ඕනෝගේ[10] පුත්‍රයන්ගේ ගණන
හත්සිය විසිපහකි. **34** යෙරිකෝ-
වෙහි පුරුෂයන්ගේ[11] ගණන තුන්-
සිය හතළිස්පහකි. **35** සෙනායාගේ
පුත්‍රයන්ගේ[12] ගණන තුන්දහස් හයසිය
තිහකි.

**36** පූජකයන්ගේ[13] ගණන මෙසේය.
යේෂුවාගේ[14] පවුලට අයත් යෙදා-
යාගේ[15] පුත්‍රයන්ගේ ගණන නවසිය
හැත්තෑතුනකි. **37** ඉම්මේර්ගේ[16]
පුත්‍රයන්ගේ ගණන එක්දහස් පනස්-
දෙකකි. **38** පෂ්හූර්ගේ[17] පුත්‍රයන්ගේ
ගණන එක්දහස් දෙසිය හත-
ළිස්හතකි. **39** හාරිම්ගේ[18] පුත්‍රයන්-
ගේ ගණන එක්දහස් දහහතකි.

**40** ලෙවීවරුන්ගේ[19] ගණන මෙ-
සේය. හෝදවියාගේ[20] පවුලට අයත්
යේෂුවාගේද[21] කද්මියෙල්ගේද පුත්‍ර-
යන්ගේ[22] ගණන හැත්තෑහතරකි.
**41** ගායකයන් වූ ආසාෆ්ගේ[23] පුත්‍ර-
යන්ගේ ගණන එකසිය විසිඅටකි.
**42** දොරටු පාලකයන්ගේ පුත්‍රයන්
එනම්, ෂල්ලුම්,[24] ආටෙර්,[25] ටල්-
මොන්,[26] අක්කුබ්,[27] හටීටා[28] සහ
ෂෝබයි යන අයගේ පුත්‍රයන්ගේ මුළු
ගණන එකසිය තිස්නවයකි.

**43** නෙතිනිම්වරුන්ගේ*[29] නම්
මෙසේය. ශීහාගේ පුත්‍රයන්ද හසූ-
ෆාගේ පුත්‍රයන්ද ටබ්බාවොත්ගේ පුත්‍ර-
යන්ද[30] **44** කෙරොස්ගේ පුත්‍රයන්ද
සියාහාගේ පුත්‍රයන්ද පාදොන්ගේ
පුත්‍රයන්ද[1] **45** ලෙබානාගේ පුත්‍ර-
යන්ද හගාබාගේ පුත්‍රයන්ද අක්කුබ්-
ගේ පුත්‍රයන්ද **46** හාගාබ්ගේ පුත්‍ර-
යන්ද සල්මයිගේ පුත්‍රයන්ද[2]
හානාන්ගේ පුත්‍රයන්ද **47** ගිද්දෙල්-
ගේ පුත්‍රයන්ද ගහර්ගේ පුත්‍රයන්ද[3]
රෙයායාගේ පුත්‍රයන්ද **48** රෙෂීන්ගේ
පුත්‍රයන්ද[4] නෙකෝදාගේ පුත්‍රයන්ද
ගෂ්ෂාම්ගේ පුත්‍රයන්ද **49** උස්සාගේ
පුත්‍රයන්ද පාසේයාගේ පුත්‍රයන්ද[5] බේ-
සයිගේ පුත්‍රයන්ද **50** අස්නාගේ පුත්‍ර-
යන්ද මෙයූනිවරුන්ගේ පුත්‍රයන්ද නෙ-
ෆූසිම්ගේ පුත්‍රයන්ද[6] **51** බක්බුක්ගේ
පුත්‍රයන්ද හකූෆාගේ පුත්‍රයන්ද හර්-
හූර්ගේ පුත්‍රයන්ද[7] **52** බෂ්ලූත්ගේ
පුත්‍රයන්ද මෙහිදාගේ පුත්‍රයන්ද හර්ෂා-
ගේ පුත්‍රයන්ද[8] **53** බාකොස්ගේ පුත්‍ර-
යන්ද සීසෙරාගේ පුත්‍රයන්ද තෙමාගේ
පුත්‍රයන්ද[9] **54** නෙෂියාගේ පුත්‍රයන්ද
හටීෆාගේ පුත්‍රයන්ද[10] යන සියලුදෙනා
නෙතිනිම්වරුය.

**55** සලමොන්ගේ සේවකයෝ[11]
නම් මොවුහුය. සෝටයිගේ පුත්‍ර-
යන්ද සොෆෙරෙත්ගේ පුත්‍රයන්ද පෙ-
රූදාගේ පුත්‍රයන්ද[12] **56** යයලාහ්ගේ
පුත්‍රයන්ද දර්කොන්ගේ පුත්‍රයන්ද ගිද්-
දෙල්ගේ පුත්‍රයන්ද[13] **57** ෂෙපටියා-
ගේ පුත්‍රයන්ද හට්ටිල්ගේ පුත්‍රයන්ද
පොකෙරෙත්-හෂ්ෂෙබායිම්ගේ පුත්‍ර-
යන්ද ආමීගේ පුත්‍රයන්ද[14] යන අයයි.

**58** නෙතිනිම්වරුන්ගේ[15] සහ සල-
මොන්ගේ සේවකයන්ගේ පුත්‍රයන්ගේ
මුළු ගණන තුන්සිය අනූදෙකකි.[16]

**59** ටෙල්-මේලා, ටෙල්-හර්ෂා, කේ-
රූබ්, අද්දොන් සහ ඉම්මේර්
යන නුවරවලින් පැමිණි අයගේ
නම් මතු දැක්වේ. එහෙත් ඔවුන්-
ගේ පවුල්* ඊශ්‍රායෙල්ගෙන් පැවතෙන්-
නන්[17] බව ඔප්පු කර පෙන්වීමට
ඔවුන්ට නොහැකි විය. **60** දෙලායා-

**2 පරි.**
**1** යොෂු 18:24 සෙක 14:10
**2** 1සාමු 13:5 නෙහෙ 7:31
**3** නෙහෙ 7:32 නෙහෙ 11:31
**4** උත් 12:8 යොෂු 7:2 යොෂු 8:17
**5** එස්රා 10:43 නෙහෙ 7:33
**6** නෙහෙ 7:34
**7** එස්රා 10:31 නෙහෙ 7:35 නෙහෙ 10:27
**8** 1ලේක 8:12 නෙහෙ 11:35
**9** නෙහෙ 7:37 නෙහෙ 11:34
**10** නෙහෙ 6:2
**11** 1රාජා 16:34 නෙහෙ 7:36
**12** නෙහෙ 7:38
**13** ගණන් 3:3
**14** 1ලේක 24:11 නෙහෙ 7:39
**15** 1ලේක 9:10 1ලේක 24:7 නෙහෙ 11:10
**16** 1ලේක 24:14 එස්රා 10:20 නෙහෙ 7:40
**17** 1ලේක 9:12 එස්රා 10:22 නෙහෙ 7:41
**18** 1ලේක 24:8 එස්රා 10:21 නෙහෙ 7:42
**19** ගණන් 3:6
**20** නෙහෙ 7:43
**21** නෙහෙ 10:9 නෙහෙ 12:8 නෙහෙ 12:24
**22** එස්රා 3:9
**23** 1ලේක 6:39 1ලේක 15:17 1ලේක 25:1 නෙහෙ 7:44 නෙහෙ 11:17
**24** යෙරෙ 35:4
**25** නෙහෙ 7:45
**26** 1ලේක 9:17 නෙහෙ 11:19
**27** නෙහෙ 12:25
**28** නෙහෙ 7:45
**29** යොෂු 9:21 යොෂු 9:27 1ලේක 9:2 එස්රා 2:58 නෙහෙ 3:26
**30** නෙහෙ 7:46

**2 තීරුව**
**1** නෙහෙ 7:47
**2** නෙහෙ 7:48
**3** නෙහෙ 7:49
**4** නෙහෙ 7:50
**5** නෙහෙ 7:51
**6** නෙහෙ 7:52
**7** නෙහෙ 7:53

**8** නෙහෙ 7:54; **9** නෙහෙ 7:55; **10** නෙහෙ 7:56; **11** 1රාජා 9:21; **12** නෙහෙ 7:57; **13** නෙහෙ 7:58; **14** නෙහෙ 7:59; **15** එස්රා 2:43; **16** නෙහෙ 7:60; **17** නෙහෙ 7:61.

**එස්රා 2:31*** මූ.අ., "ඒලාම් ලෙස හැඳින්වෙන අනික් පුද්ගලයා." **43*** "නෙතිනිම්" නැත්නම් "දේවමාලිගාවේ සේවකයෝ." මූ.අ., "දෙනු ලැබූවන්."

**එස්රා 2:59*** මූ.අ., "පියාගේ පවුල්."

ගේ පුත්‍රයන්ද ටොබියාගේ පුත්‍රයන්ද
නෙකෝදාගේ පුත්‍රයන්ද[1] යන මො-
වුන්ගේ මුළු ගණන හයසිය පනස්-
දෙකකි. **61** පූජකයන්ගේ පුත්‍රයන්[2]
අතරේ, හබායාගේ පුත්‍රයෝද හක්-
කොෂ්ගේ[3] පුත්‍රයෝද බාසිල්ලයිගේ
පුත්‍රයෝද[4] සිටියෝය. බාසිල්ලයිගේ
පුත්‍රයන්ට එම නම ලැබුණේ, ඔවුන්-
ගේ මුතුන්මිත්තා ගිලියද්වරයෙකු වූ
බාසිල්ලයිගේ දියණියකව[5] විවාහ කර-
ගෙන ඔහුගේ නම ලබාගත් නිසාය.
**62** ඔවුන් තම පෙළපත කුමක්ද කියා
ඔප්පු කිරීම සඳහා පෙළපත් ලේ-
ඛනවල තමන්ගේ නම් තිබෙනවාද
කියා සෙවූ නමුත් සොයාගත නොහැකි
වූ නිසා ඔවුන් පූජකයන් ලෙස සේ-
වය කිරීමට නුසුදුසු අය බව තීරණය
කරන ලදි.[6] **63** එහෙයින් පූජක-
යෙකු ඌරීම්[7] සහ තුම්මීම්* යොදා-
ගෙන තීන්දුවක් දෙන තෙක්, දෙවිට
කැප කළ ආහාර කෑමට ඔවුන්ට අව-
සර නැති[8] බව ආණ්ඩුකාරයා#[9] පැව-
සුවේය.

**64** ඉහත සඳහන් වූ අයගේ[10] මුළු
ගණන හතළිස්දෙදහස් තුන්සිය
හැටකි.[11] **65** ඊට අමතරව ඔවුන්ට
සිටි දාසදාසීන්ගේ ගණන හත්ද-
හස් තුන්සිය තිස්හතකි. එමෙන්ම
ගායක[12] ගායිකාවෝ දෙසියයක්ද
ඔවුන් සමඟ සිටියෝය. **66** ඔවුන්ට
අශ්වයෝ හත්සිය තිස්හයක්ද කොට-
එවෝ දෙසිය හතළිස්පහක්ද[13]
**67** ඔටුවෝ හාරසිය තිස්පහක්ද බූරු-
වෝ හයදහස් හත්සිය විස්සක්ද සිටි-
යෝය.[14]

**68** පෙළපත්වල[15] ප්‍රධානීන්[16] අත-
රින් සමහරෙක් යෙරුසලමේ[17] යෙ-
හෝවා දෙවිගේ ගෘහය[18] පිහිටා
තිබූ ස්ථානයට පැමිණ, සැබෑ දෙවි-
ගේ ගෘහය නැවත එම ස්ථානයේම
ගොඩනැඟීම සඳහා[19] සිය කැමැත්-
තෙන්ම[20] දේවල් පරිත්‍යාග කළෝය.
**69** ගොඩනැඟීමේ කාර්යයට අවශ්‍ය
බඩු බාහිරාදිය සැපයීම සඳහා
ඔවුහු තම තමන්ගේ වත්කමට අනුව
රන්[1] ඩ්‍රැක්මා* හැටඑක්දහසක්ද රිදී[2]
මීනා# පන්දහසක්ද පූජකයන් සඳහා
වස්ත්‍ර[3] සියයක්ද භාර දුන්නෝය.
**70** පූජකයෝද ලෙවීවරුද ගායක-
යෝද දොරටු පාලකයෝද නෙතිනිම්-
වරුද සාමාන්‍ය ජනයා අතරින් යම්
පිරිසක්ද[4] තම තමන්ගේ නුවරවල
පදිංචි වූහ. සියලුම ඊශ්‍රායෙල්වරු තම
තමන්ගේ නුවරවලට ගොස් පදිංචි
වූහ.[5]

**3** අවුරුද්දේ හත්වන මාසය[6] වන
විට සියලුම ඊශ්‍රායෙල්වරු තම
තමන්ගේ නුවරවල පදිංචි වී සිටි-
යෝය. ජනයා එකා මෙන්[7] යෙරුසල-
මට[8] රැස් වූහ. **2** යෙහොෂාදාක්ගේ
පුත් යේෂුවා[9] හා පූජකයන් වූ ඔහුගේ
සහෝදරයෝද ෂෙයල්ටියල්ගේ[10] පුත්
සෙරුබාබෙල්[11] හා ඔහුගේ සහෝදර-
යෝද එකතු වී පූජාසනය නැවත
ගොඩනැඟුවෝය. ඔවුන් එසේ කළේ,
සැබෑ දෙවිගේ සේවකයෙකු වූ මෝ-
සෙස්ට දෙන ලද නීතියේ සඳහන් වන
ආකාරයට[12] ඊශ්‍රායෙල්හි දෙවිට දවන
පූජා ඔප්පු කරන පිණිසය.

**3** ඔවුහු කලින් තිබූ ස්ථානයේම
පූජාසනය ගොඩනඟා[13] ඒ මත යෙ-
හෝවා දෙවිට දවන පූජා ඔප්පු
කළෝය. ඔවුන් ඒ සඳහා පියවර
ගත්තේ අවට සිටි ජාතීන්ට බියෙන්
සිටි නිසාය.[14] උදේ සවස ඔප්පු
කළ යුතු දවන පූජා ඔවුහු ඒ මත
ඔප්පු කළෝය.[15] **4** ඉන්පසු ඔවුහු
නීතියේ ලියා තිබෙන ආකාරයටම[16]
පැල් උත්සවය[17] පැවැත්වූහ. ඔවුහු ඒ

**2 පරි.**
**1** නෙහෙ 7:62
**2** 1ලේක 24:1
**3** 1ලේක 24:10 නෙහෙ 3:21
**4** නෙහෙ 7:63
**5** 2සාමු 17:27 2සාමු 19:31 1රාජා 2:7
**6** ගණන් 3:10 ගණන් 16:40 ගණන් 18:7 නෙහෙ 7:64
**7** නික් 28:30 ලෙවී 8:8 ගණන් 27:21 ද්වි 33:8 1සාමු 28:6
**8** ලෙවී 2:3 ලෙවී 6:26 ගණන් 18:11
**9** නෙහෙ 7:65
**10** එස්රා 9:8 නෙහෙ 1:2 යෙසා 10:21
**11** නෙහෙ 7:66 යෙරෙ 23:3
**12** 2ලේක 35:25 නෙහෙ 7:67 ගීතා 68:25
**13** නෙහෙ 7:68
**14** නෙහෙ 7:69
**15** 1ලේක 23:11
**16** එස්රා 1:5
**17** එස්රා 1:4
**18** එස්රා 1:3
**19** 1ලේක 21:18 2ලේක 3:1
**20** නික් 35:5 1ලේක 29:5 නෙහෙ 7:70 2කොරි 9:7

**2 තීරුව**
**1** නෙහෙ 7:71
**2** එස්රා 8:25
**3** නෙහෙ 7:72
**4** එස්රා 6:16 එස්රා 6:17
**5** නෙහෙ 7:73 නෙහෙ 11:3

**3 පරි.**
**6** ලෙවී 16:29 1රාජා 8:2 නෙහෙ 8:14
**7** ක්‍රියා 4:32
**8** යෙසා 33:20
**9** හග් 1:1
**10** 1ලේක 3:17 මතෙ 1:12
**11** එස්රා 1:8 හග් 2:21 ලූක් 3:27
**12** නික් 20:24 නික් 40:29
**13** 1ලේක 21:18
**14** එස්රා 4:4 ගීතා 56:3 හිතෝ 29:25
**15** ගණන් 28:4; ගණන් 28:23; **16** නික් 23:16; ලෙවී 23:24; ලෙවී 23:34; ගණන් 29:1; ගණන් 29:12; **17** නෙහෙ 8:14; යොහ 7:2.

එස්රා **2:63*** නික් 28:30හි දෙවන පාදසටහන බලන්න. **63#** මූ.අ., “තිර්ෂාතා.”

එස්රා **2:69*** මෙහි සඳහන් වන්නේ ග්‍රීක ලියවිලිවල සඳහන් ඩ්‍රැක්මාව ගැන නොවෙයි. එය පර්සියානු ජාතිකයන් භාවිත කළ දරික් නමින් හැඳින්වූ රන් කාසියක්යයි පිළිගැනේ. එහි බර ග්‍රෑම් 8.4ක් විය. **69#** මෙහි සඳහන් වන්නේ ග්‍රීක ලියවිලිවල සඳහන් මීනාව ගැන නොවෙයි. එහි බර ග්‍රෑම් 570ක් විය.

කාලය අතරතුරේදී සෑම දිනකම ඒ
දවසට නියමිත දවන පූජා ප්‍රමාණය
ඒ අයුරින්ම ඔප්පු කළෝය.[1] **5** ඒ
කාලයෙන් පසුවත් දිනපතා ඔප්පු
කරන දවන පූජාද[2] නව සඳ පායන
දවස්වලදී[3] මෙන්ම යෙහෝවා දෙවි
වෙනුවෙන් පවත්වන උත්සව දවස්ව-
ලදී[4] ඔප්පු කරන පූජාද යෙහෝවා
දෙවිට සෙනඟ සිය කැමැත්තෙන්ම
ගෙනා[5] පූජාද නොකඩවාම පූජාස-
නය මත ඔප්පු කරන ලදි. **6** මෙසේ
ඔවුහු හත්වන මාසයේ පළමුවනදා[6]
සිට යෙහෝවා දෙවිට දවන පූජා
ඔප්පු කරන්න පටන්ගත්තෝය. ඒ
වන විටත් යෙහෝවා දෙවිගේ මාලි-
ගාව නැවත ගොඩනැඟීම සඳහා අත්-
තිවාරම් දමා තිබුණේ නැත.

**7** ඔවුහු දේවමාලිගාව ගොඩනැඟී-
මේ කටයුතු ආරම්භ කිරීම සඳහා
ගල් කඩන්නන්ට[7] හා කැටයම්කරු-
වන්ට[8] අවශ්‍ය මුදල්[9] ලබා දුන්නෝය.
ඔවුහු සීදොන්හි[10] සහ තීර්හි[11] වැසි-
යන්ට කෑම[12] බීමද තෙල්ද[13] ලබා
දෙමින් ලෙබනොන්[14] දේශයේ සිට
යොප්පාව[15] දක්වා මුහුදෙන් දේවදාර
ලී ගෙන්වාගත්තෝය. මේ සෑම දෙ-
යක්ම සිදු වූයේ පර්සියාවේ රජු වූ සයි-
රස්ගේ[16] අවසරය ඇතුවය.

**8** සැබෑ දෙවිගේ ගෘහය පිහිටා තිබූ
ස්ථානය වන යෙරුසලමට පැමිණී-
මෙන් පසු, දෙවන අවුරුද්දේ දෙවන
මාසයේදී[17] ගොඩනැඟීමේ කටයුතු
ආරම්භ කරන ලදි. ෂෙයල්තියල්-
ගේ[18] පුත් සෙරුබාබෙල්ද[19] යෙහො-
ෂාදාක්ගේ පුත් යේෂුවාද[20] ඔවුන්ගේ
සහෝදරයන් වූ පූජකයෝ සහ ලෙවී-
වරුද නිදහස[21] ලබා යෙරුසලමට
පැමිණි අන් සියලුදෙනාද ඒ කාර්ය-
යට හවුල් වූහ. යෙහෝවා දෙවිගේ
ගෘහය ගොඩනැඟීමේ වැඩකටයුතු
අධීක්ෂණය කිරීම සඳහා ඔවුහු ලෙවී-
වරුන්ව[22] පත් කළෝය. ඒ සඳහා
ඔවුන් තෝරාගත්තේ වයස අවුරුදු
විස්සක් හෝ ඊට වඩා වැඩි වයසැති
ලෙවීවරුන්වයි.[23] **9** මේ අනුව යේ-
ෂුවා,[24] ඔහුගේ පුත්‍රයෝ හා ඔහුගේ
සහෝදරයෝද කද්මියෙල් හා ඔහුගේ
පුත්‍රයෝද යූදාගේ* පුත්‍රයෝද සැබෑ
දෙවිගේ ගෘහය ගොඩනැඟීමේ වැඩ-
කටයුතු අධීක්ෂණය කිරීමේ පැව-
රුම භාරගත්තෝය. ලෙවී ගෝත්‍රයට
අයත් වූ හෙනාදාද්ගෙන්[1] පැවත ආ
අයද ඔවුන්ගේ පුත්‍රයෝ හා සහෝද-
රයෝද ඔවුන්ට සහය වූහ. සියලු-
දෙනාම එකා මෙන් ඒ කාර්යයෙහි
හවුල් වූහ.

**10** යෙහෝවා දෙවිගේ මාලිගා-
වේ අත්තිවාරම[2] දැමූ අවස්ථාවේදී
නිලඇඳුමෙන්[3] සැරසී සිටි පූජක-
යෝ හොරණෑ[4] අතැතිවද ලෙවීවරුන්
වූ ආසාෆ්ගේ[5] පුත්‍රයෝ අත්තාළම්[6]
අතැතිවද එහි රැස්ව සිටියෝය. ඊශ්‍රා-
යෙල්හි රජු වූ දාවිත් කලින් උපදෙස්[7]
දී තිබුණු ආකාරයටම ඒ සියලුදෙනා
සිටගෙන යෙහෝවා දෙවිට ප්‍රශංසා
කිරීමට පටන්ගත්තෝය. **11** ඔවුහු
එක් එක් කෙනා යෙහෝවා දෙ-
විට ස්තුති ප්‍රශංසා[8] දෙමින් මාරුවෙන්
මාරුවට මෙසේ ගායනා කළෝය.
"දෙවි යහපත්ය.[9] ඔහු ඊශ්‍රායෙල්ට
පෙන්වන ප්‍රේමය* සදාකාලිකය."[10]
මුළු සෙනඟද යෙහෝවා දෙවිගේ ගෘහ-
යේ අත්තිවාරම් දැමූ අවස්ථාවේදී ප්‍රීති
ප්‍රමෝදයෙන් යෙහෝවා දෙවිට ප්‍රශංසා
කළෝය.[11] **12** රැස්ව සිටි සෙනඟ
අතරේ මහලු පූජකයෝ,[12] ලෙවීවරු
සහ පෙළපත්වල ප්‍රධානීහු[13] බොහෝ-
දෙනෙක්ද සිටියෝය. ඔවුන්, මුලින්
ගොඩනඟා තිබූ දෙවිගේ ගෘහය[14]
දැක තිබුණු අතර ඔවුන්ගෙන් සමහ-
රෙක් අත්තිවාරම දමන අවස්ථාවේදී[15]
ශබ්ද නඟා හඬන්න[16] පටන්ගත්-
තෝය. නමුත් ඔවුන්ගෙන් බො-
හෝදෙනෙක් ප්‍රීති ඝෝෂා නඟමින්
සිටියෝය.[17] **13** එහි රැස්ව සිටි අය-

**3 පරි.**
1 නික් 29:38; ලෙවී 23:37; ගණන් 29:13
2 නික් 29:42; ගණන් 28:3
3 ගණන් 10:10; 2ලේක 2:4; ගීතා 81:3; කොලො 2:16
4 ලෙවී 23:4; 2ලේක 8:13
5 ලෙවී 1:3; ගණන් 29:39; ද්වි 12:6; 2ලේක 29:31
6 ගණන් 29:1
7 1රාජා 5:17; 2ලේක 24:12
8 2ලේක 34:11; එස්රා 5:8
9 2රාජා 12:11; 2රාජා 22:4
10 උත් 10:15; විනි 1:31; 1රාජා 5:6
11 1ලේක 22:4
12 1රාජා 5:11
13 2ලේක 2:10
14 1රාජා 5:9
15 යොෂු 19:46; 2ලේක 2:16
16 එස්රා 1:3; එස්රා 6:3
17 1රාජා 6:1
18 1ලේක 3:17; මතෙ 1:12
19 1ලේක 3:19; එස්රා 2:2
20 හග් 1:1
21 ද්වි 30:3; නෙහෙ 7:6; ශෙප 2:7
22 1ලේක 23:27
23 1ලේක 23:24
24 නෙහෙ 7:43

**2 තීරුව**
1 නෙහෙ 3:18; නෙහෙ 10:9
2 සෙක 4:9
3 නික් 28:40; 1සාමු 22:18
4 ගණන් 10:8; 1ලේක 16:6; 2ලේක 29:26
5 1ලේක 6:39; 1ලේක 25:1; 2ලේක 35:15
6 1ලේක 13:8; 2ලේක 5:12
7 1ලේක 6:31; 1ලේක 23:5; 2ලේක 29:25
8 නික් 15:21; නෙහෙ 12:24
9 1ලේක 16:34; 2ලේක 7:3; ගීතා 73:1; ගීතා 135:3

**10** ගීතා 103:17; ලූක් 1:50; **11** ගීතා 47:1; යෙසා 12:6; **12** එස්රා 1:5; එස්රා 2:36; **13** 1ලේක 23:11; 1ලේක 24:4; **14** 1රාජා 6:22; හග් 2:3; **15** සෙක 4:9; **16** ගීතා 126:6; **17** නෙහෙ 12:43; ගීතා 32:11; ගීතා 126:1; යෙසා 35:10.

**එස්රා 3:9*** එස්රා 2:40හි, "හෝදවියා" ලෙසත් නෙහෙ 7:43හි, "හෝදෙවා" ලෙසත් හැඳින්වේ.
**11*** හෝ, "ඇදි ප්‍රේමය."

ගේ ඝෝෂාව නිසා සෙනඟ හඬනවාද
කියා හෝ ප්‍රීති ඝෝෂා[1] නඟනවාද
කියා හෝ හරියටම හඳුනාගන්න නො-
හැකි විය. ඔවුන්ගේ ඝෝෂාව දසත
පැතිර ගියේය.

4 වහල්භාවයෙන් නිදහස ලැබූ
ඊශ්‍රායෙල්වරුන්[2] තමන්ගේ දෙවි
වන යෙහෝවාට ගෘහයක් ගොඩ-
නඟන බව යුදෙව්වරුන්ගේ හා බෙන්-
ජමින්වරුන්ගේ සතුරන්ට[3] ආරංචි
විය. 2 එය දැනගත් විගස ඔවුහු
සෙරුබාබෙල්[4] හා පෙළපත්වල ප්‍රධා-
නීන්[5] වෙතට ගොස් මෙසේ කීවෝය.
“ඇසිරියාවේ රජු වූ ඒසර්-හද්දොන්[6]
අපිව මේ දේශයට ගෙනා කාලය
පටන්[7] මේ දක්වාම අපි කන්නලව්
කරන්නේ ඔබේ දෙවිටයි.[8] අපි පුද-
පූජා ඔප්පු කරන්නෙත් ඔහුටයි. මේ
ගෘහය ගොඩනඟන කාර්යයට ඔබ
සමඟ හවුල් වෙන්න අපිත් කැමතියි.[9]
ඉතින් ඔබට උදව් කරන්න අපිට ඉඩ
දෙන්න.” 3 නමුත් සෙරුබාබෙල්ද
යේෂුවාද[10] ඊශ්‍රායෙල්හි පෙළපත්වල
අනිකුත් ප්‍රධානීහුද[11] ඔවුන්ට මෙසේ
කීවෝය. “අපිත් එක්ක එකතු වී අපේ
දෙවිට ගෘහයක් ගොඩනඟන්න ඔබට
කිසිම අයිතියක් නැහැ.[12] ඊශ්‍රායෙල්හි
දෙවි වන යෙහෝවාට ගෘහයක් ගො-
ඩනඟන්න කියා පර්සියාවේ රජු වන
සයිරස්[13] අපිට නියෝග කළා. ඒ
කාර්යය ඉටු කිරීමට අපි වෙන කිසිම
කෙනෙකුව හවුල් කරගන්නේ නැහැ.”
4 එදා පටන් යූදා දේශය අවට
ජීවත් වූ ජාතීහු ගොඩනැඟීමේ කට-
යුතු අඩාළ කිරීමට මං සෙවූහ.[14]
යූදාහි වැසියන්ව බියගැන්වීමටත්
අධෛර්යයට පත් කිරීමටත් ඔවුහු
නිතරම වෑයම් කළෝය.[15] 5 ඔවුහු
යූදාහි වැසියන්ගේ සැලසුම් කඩා-
කප්පල් කිරීම සඳහා උපදේශක-
යන් ලෙස කටයුතු කළ අයට මුදල්
පවා ගෙවූහ.[16] පර්සියාවේ රජු වූ
සයිරස් පාලනය කළ කාලයේ සිට
දාරියුස්ගේ පාලන සමය[17] දක්වාම
මේ තත්වය පැවතිණ. 6 අහෂ්වේ-
රොෂ් රජුගේ පාලන සමයේ මුල් අවදි-
යේදී යූදාහි සහ යෙරුසලමෙහි සියලු
වැසියන්ට විරුද්ධව ඔවුහු චෝදනා
පත්‍රයක්ද[1] ලියා යැවූහ. 7 එමෙන්ම
අර්තක්ෂස්තා රජුගේ පාලන සමයේදී
බිෂ්ලාම්ද මිත්රෙදාත්ද ටාබෙයෙල්ද
ඔවුන්ගේ සගයෝද එකතු වී අර්තක්-
ෂස්තා රජුට ලිපියක් ලිව්වෝය. එම
ලිපිය ඇරමයික භාෂාවට[2] පරිවර්ත-
නය කළ පසු ඔවුහු ඇරමයික අක්ෂර-
වලින් එය රජුට ලියා යැව්වෝය.
8* එම පළාතේ ප්‍රධාන රාජ්‍ය
නිලධාරියා වූ රෙහුම්ද ඔහුගේ ලේකම්
වූ ෂිම්ෂයිද යෙරුසලමට විරුද්ධව
චෝදනා කරමින් අර්තක්ෂස්තා රජුට
යැවූ ලිපියෙහි මෙසේ සඳහන් විය.
9 “ප්‍රධාන රාජ්‍ය නිලධාරියා වූ රෙ-
හුම්ද[3] ලේකම් වූ ෂිම්ෂයිද ඔවුන්-
ගේ මිත්‍රයන්ද විනිශ්චයකරුවන්ද මහ
ගඟෙන් එගොඩ[4] ප්‍රදේශවල* සිටින
නියෝජ්‍ය ආණ්ඩුකාරයන්ද ලේ-
කම්වරුන්ද[5] බැබිලෝනියට[6] අයත්
ඒරෙක්හි වැසියන්ද[7] සූසාහි වැසියන්[8]
වන ඒලාම්වරුන්ද[9] 10 ගරු අස-
නපර්[10] උතුමාණන් විසින් රැගෙන
ගොස් සමාරියේ[11] නගරවල පදිංචි
කළ ජාතීන්ද[12] මහ ගඟෙන් එගොඩ
ප්‍රදේශවල සිටින සෙසු ජාතීන්ද යන
අය විසින් මෙම ලිපිය ලියන ලදි.”
11 පහත දැක්වෙන්නේ ඔවුන් යැවූ
ලිපියේ සඳහන් දෙයයි.
“අර්තක්ෂස්තා[13] රජ්ජුරුවන් වෙ-
නටයි. මහ ගඟෙන් එගොඩ ජීවත්
වන ඔබේ සේවකයන් වන අපි රජ්-
ජුරුවන්ට මෙසේ ලියා එවන්නෙමු.
12 රජතුමනි, ඔබ වෙතින් ආ යුදෙව්-
වරුන් දැන් යෙරුසලමට පැමිණ ඒ
කැරලිකාර දුෂ්ට නුවර නැවත ගොඩ-
නඟන බව ඔබට දන්වා එවීම සුදුසු-
යයි අපි සිතුවෙමු. ඔවුහු මේ වන
විටත් එහි අත්තිවාරම් අලුත්වැඩියා
කර, පවුරු[14] නැවත ගොඩනඟමින්
සිටිති. 13 එම නුවර ගොඩනඟා
එහි පවුරුද සම්පූර්ණයෙන් සාදා

**3 පරි.**
1 ගීතා 5:11; සෙක 4:7

**4 පරි.**
2 ද්වි 30:3; 2රාජා 24:15; එස්රා 2:64
3 එස්රා 4:7; එස්රා 4:23; නෙහෙ 4:7; නෙහෙ 4:11
4 එස්රා 1:11; එස්රා 2:2
5 එස්රා 2:68
6 2රාජා 19:37
7 2රාජා 17:24
8 2රාජා 17:33; 2රාජා 17:34
9 ගීතා 55:21; හිතෝ 26:23; හිතෝ 26:25
10 සෙක 3:1
11 එස්රා 1:5
12 නෙහෙ 2:20; යොහ 4:9; යොහ 4:22
13 2ලේක 36:23; එස්රා 1:1; එස්රා 6:3; යෙසා 44:28
14 එස්රා 3:3; නෙහෙ 6:9
15 හග් 1:2
16 නෙහෙ 6:12
17 එස්රා 4:24; එස්රා 5:5; එස්රා 6:1; දානි 11:2

**2 තීරුව**
1 ගීතා 52:2; ගීතා 119:69; එළි 12:10
2 2රාජා 18:26; දානි 2:4
3 එස්රා 4:17; එස්රා 4:23
4 උත් 15:18; ද්වි 11:24
5 2සාමු 8:17; 2ලේක 24:11
6 එස 23:15
7 උත් 10:10
8 නෙහෙ 1:1; එස්ත 1:2; දානි 8:2
9 උත් 10:22; යෙසා 11:11; යෙරෙ 49:36
10 2රාජා 17:27
11 2රාජා 17:26
12 2රාජා 17:24
13 එස්රා 4:8
14 නෙහෙ 1:3

**එස්රා 4:8*** මෙතැන් සිට 6:18 පදය දක්වා එස්රා ලියා තිබෙන්නේ අරාමීය භාෂාවෙනි. **9*** එනම්, යුප්‍රටීස් ගඟෙන් එගොඩ තිබෙන පළාත.

නිම කළ පසු බදු,[1] වරිපණම්[2] හා
රේන්ද බද්ද යන කිසිවක් ඔවුන්-
ගෙන් නොලැබෙනු ඇත. එසේ සිදු
වුවහොත් රාජකීය භාණ්ඩාගාරයට[3]
මහත් අලාභයක් සිදු වන බවද
අපි රජ්ජුරුවන්ට දන්වන්න කැමැත්-
තෙමු. **14** රජුගෙන් යැපෙන* අප
සියලුදෙනාම රජ්ජුරුවන්ට සදා ණය-
ගැතිය. එහෙයින් එවැනි දෙයක්
සිදු වුවහොත් රජ්ජුරුවන්ට සිදු වන
අලාභය දෙස අපට කිසිසේත් බලා
සිටිය නොහැක. එම හේතුව නිසා
අපි මෙම ලිපිය මාර්ගයෙන් රජ්ජු-
රුවන්ට ඒ ගැන දන්වන්න අදහස්
කළෙමු. **15** මීට අමතරව ඔබතු-
මාගේ මුතුන්මිත්තන් ගැන සඳහන්ව
ඇති ලියවිලි[4] පරීක්ෂා කර බලන
මෙන්ද අපි රජ්ජුරුවන්ගෙන් බැගෑ-
පත්ව ඉල්ලා සිටින්නෙමු. එවිට ඒ
නුවර කොතරම් කැරලිකාර නුවරක්ද
කියාත් රජවරුන්ට හා ඔවුන් යටතේ
පැවති පළාත්වලට එම නුවරේ වැසි-
යන් කොතරම් අලාභ සිදු කළාද
කියාත් අතීතයේ සිටම එහි සිදු වූ
කුමන්ත්‍රණ ගැනත් ඔබතුමන්ට එම
ලියවිලිවලින් දැනගත හැකිය. එම
නුවර විනාශ කර දමනු ලැබුවේද
ඒ හේතුව නිසාමය.[5] **16** එම නුවර
නැවත ගොඩනඟා එහි පවුරුද සම්-
පූර්ණයෙන් සාදා නිම කළහොත් මහ
ගඟෙන් එගොඩ[6] තිබෙන මුළු ප්‍රදේශ-
යම රජ්ජුරුවන්ට අහිමි වන බව අපි
සහතිකවම දන්වන්නෙමු.”

**17** රජ එම ලිපිය කියවූ පසු ප්‍රධාන
රාජ්‍ය නිලධාරියා වූ රෙහුම්ටද[7] ලේ-
කම් වූ ෂිම්ෂයිටද සමාරියේ ජීවත් වූ
ඔවුන්ගේ සගයන්ටද[8] මහ ගඟෙන්
එගොඩ ප්‍රදේශවල වෙසෙන අන් සිය-
ලුදෙනාටද මෙසේ දන්වා යැවීය.

“ඔබ සැමට සුබ පැතුම්![9] **18** ඔබ
විසින් එවන ලද ලිපිය මා ඉදි-
රියේ පැහැදිලිව කියවනු ලැබීය.
**19** එහෙයින් ඔබ සඳහන් කළ කාර-
ණය ගැන සොයා බැලීමට[10] මම
මාගේ සේවකයන්ට නියෝග කළෙමි.
ඒ නුවරෙහි වැසියන් අතීතයේ සිටම
රජවරුන්ට විරුද්ධව කැරලිගසමින්
ද්‍රෝහිව කටයුතු කරන ජාතියක් බව
මට දැනගන්න ලැබිණ.[1] **20** මහ
ගඟෙන්[2] එගොඩ ඇති සියලු ප්‍රදේශ
පාලනය කළ බලවත් රජවරුන්[3] යෙ-
රුසලමෙහි පාලනය කළ බවත් එම
රජවරුන් බදු, වරිපණම් හා රේන්ද
බද්ද ජනයාගෙන් අය කළ බවත්
දැනගන්න ලැබිණ.[4] **21** එහෙයින්
මා විසින් ආඥාවක් නිකුත් කරන
තෙක් ඒ නුවර ගොඩනැඟීමේ කටයුතු
සම්පූර්ණයෙන්ම නතර කරන ලෙස
ඔවුන්ට අණ කරන්න. **22** රජ්ජුරු-
වන් වන මට සිදු විය හැකි පාඩුව
තවත් වැඩි නොවන පිණිස මේ කාර-
ණය නොපමාව ඉටු කළ යුතුය.”[5]

**23** අර්තක්ෂස්තා රජු විසින් එවන
ලද රාජකීය ලියවිල්ලේ පිටපතක්
ප්‍රධාන රාජ්‍ය නිලධාරියා වූ රෙ-
හුම්ටද[6] ඔහුගේ ලේකම් වූ ෂිම්ෂයි-
ටද[7] ඔවුන්ගේ සගයන්ටද[8] ඇසෙන
සේ කියවන ලදි. එවිට ඔවුහු
අවිවලින් සන්නද්ධ පිරිසක් රැගෙන
විගස යෙරුසලමේ සිටි යුදෙව්වරුන්
වෙතට ගොස් ඔවුන් කරමින් සිටි
ගොඩනැඟීමේ කාර්යය බලහත්කාර-
යෙන් නවතා දැමූහ.[9] **24** යෙරුස-
ලමේ තිබූ දෙවිගේ ගෘහය නැවත
ගොඩනැඟීමේ වැඩකටයුතු නතර
වූයේ එයාකාරයෙනි. පර්සියාවේ රජු
වන දාරියුස්[10] පාලනය කළ දෙවන
අවුරුද්ද දක්වාම එහි වැඩකටයුතු
නවතා දමා තිබිණ.

**5** ඒ කාලයේදී හග්ගයි[11] සහ ඉද්-
දෝගේ[12] මුනුපුරා වූ සෙකරියා[13]
යන අනාගතවක්තෘවරු දෙදෙනා දෙ-
විගේ නාමයෙන්[14] අනාවැකි කියන්න
පටන්ගත්තෝය. ඊශ්‍රායෙල්හි දෙවි-
ගේ මහ පෙන්වීම[15] ඇතුව ක්‍රියා කළ
ඔවුහු, යෙරුසලමෙහිද යූදාහිද ජීවත්
වූ යුදෙව්වන්ට අනාවැකි කීවෝය.
**2** එහි ප්‍රතිඵලයක් ලෙස ෂෙයල්ටි-
යල්ගේ[16] පුත් සෙරුබාබෙල්ද[17] යෙ-
හොෂාදාක්ගේ පුත් යේෂුවාද[18] එකතු

**4 පරි.**
**1** 2රාජා 23:35
**2** නෙහෙ 5:4
රෝම 13:7
**3** එස්රා 5:17
එස්රා 7:21
**4** එස්ත 2:23
එස්ත 6:1
**5** යෙරෙ 52:3
**6** ද්වි 11:24
2සාමු 8:3
**7** එස්රා 4:8
**8** එස්රා 4:7
එස්රා 5:3
එස්රා 6:6
**9** එස්රා 5:7
ක්‍රියා 23:26
**10** එස්රා 4:15
එස්රා 5:17
එස්රා 6:1
හිතෝ 25:2

**2 තීරුව**
**1** 2රාජා 18:7
2රාජා 24:20
එස 17:15
**2** උත් 15:18
**3** 2සාමු 8:6
1රාජා 4:21
1ලේක 18:3
2ලේක 26:15
**4** 2සාමු 8:2
1ලේක 18:6
2ලේක 9:14
2ලේක 17:11
2ලේක 26:8
**5** එස්රා 4:13
**6** එස්රා 4:8
එස්රා 4:17
**7** එස්රා 4:9
**8** එස්රා 4:7
**9** මීකා 2:1
**10** එස්රා 5:5
එස්රා 6:1
හග් 1:15

**5 පරි.**
**11** හග් 1:1
**12** නෙහෙ 12:4
නෙහෙ 12:16
**13** සෙක 1:1
**14** යෙරෙ 15:16
මීකා 5:4
හග් 1:2
හග් 1:13
සෙක 1:3
සෙක 8:1
**15** හග් 2:4
සෙක 4:6
**16** මතෙ 1:12
**17** එස්රා 1:11
එස්රා 3:2
**18** එස්රා 3:8
සෙක 6:11

**එස්රා 4:14*** මූ.අ., “රජමාලිගාවේ ලුණු කන”

වී යෙරුසලමේ පිහිටි දෙවිගේ
ගෘහය නැවත ගොඩනඟන්න පටන්-
ගත්තෝය. ඒ සඳහා ඔවුන්ට
දෙවිගේ අනාගතවක්තෘවරුන්ගේ[1]
උපකාරද ලැබිණ. **3** මේ ගැන
ආරංචි වූ විට, මහ ගඟෙන් එගොඩ[2]
සිටි ආණ්ඩුකාරයා වූ තත්තෙන-
යිද[3] ෂේතාර්-බෝසෙනයිද ඔවුන්-
ගේ සගයෝද යුදෙව්වරුන් වෙතට
පැමිණ, "මේ ගෘහය හා එහි බිත්ති
නැවත ගොඩනඟන්න ඔබට අව-
සර දුන්නේ කවුද"[4] කියා ඇසුවෝය.
**4** "මේ ගෘහය ගොඩනැඟීමේ කාර්ය-
යට හවුල් වන අයගේ නම් අපට
කියන්න" කියාද ඔවුහු ඔවුන්ට පැවසු-
වෝය. **5** එහෙත් යුදෙව්වරුන් අත-
රේ සිටි වැඩිමහල්ලන්ට දෙවිගේ
උපකාරය තිබුණු නිසා[5] ගොඩනැඟී-
මේ කාර්යය නතර කිරීමට ඔවුන්ට
නොහැකි විය. එහෙයින් ඔවුහු මේ
සම්බන්ධයෙන් ලිපියකින් දාරියුස්
රජුට දන්වා ඊට පිළිතුරක් ලැබෙන
තෙක් බලා සිටියෝය.

**6** මහ ගඟෙන් එගොඩ[6] සිටි ආණ්-
ඩුකාරයා වූ තත්තෙනයිද[7] ෂේතාර්-
බෝසෙනයිද[8] නියෝජ්‍ය ආණ්ඩුකාර-
යන් වූ ඔවුන්ගේ සගයෝද[9] එකතු වී
දාරියුස් රජුට ලියූ ලිපිය[10] මතු දැක්-
වේ. **7** එහි මෙසේ සඳහන් විය.

"දාරියුස් රජතුමනි,

"ඔබතුමාට සමාදානය ලැබේවා![11]
**8** යුදා පළාතේ[12] තිබෙන ශ්‍රේෂ්ඨ දෙ-
විගේ[13] ගෘහයට අපි ගිය බව රජ්ජු-
රුවන්ට දන්වන්න කැමැත්තෙමු.
සෙනඟ විශාල ගල්වලින්* එම ගෘහය
නැවත ගොඩනඟමින් සිටින ආකා-
රය දැකගැනීමට අපට හැකි විය.
මේ වන විටත් එහි බිත්ති මත ලී
බාල්ක තබා අවසන්ය. ගොඩනැඟී-
මේ වැඩකටයුතු ඉතා උනන්දුවෙන්
හා හොඳින් කෙරීගෙන යයි. **9** අපි
එහි සිටි වැඩිමහල්ලන්ගෙන් මෙසේ
ඇසුවෙමු. 'මේ ගෘහය හා එහි බිත්ති
නැවත ගොඩනඟන්න ඔබට අවසර
දුන්නේ කවුද?'[1] **10** එහි මූලිකත්-
වය ගෙන ක්‍රියා කරන අයගේ නම්[2]
මොනවාද කියාත් අපි ඔවුන්ගෙන්
ඇසුවෙමු. අප එසේ කළේ එම තොර-
තුරු ලියා ඔබතුමාට දැන්වීමේ අද-
හසිනි.

**11** "එවිට ඔවුන් අපට දුන් පිළි-
තුර මෙයයි. 'අපි ස්වර්ගය සහ
පොළොව[3] පාලනය කරන දෙවි-
ගේ සේවකයන්. අපි දැන් නැවත
ගොඩනඟන්නේ ඒ දෙවිගේ ගෘහ-
යයි. මීට අවුරුදු ගණනාවකට
කලින් ඊශ්‍රායෙල් දේශයේ රජකම් කළ
ශ්‍රේෂ්ඨ රජෙක් මේ ගෘහය ගොඩ-
නැඟුවා.[4] **12** නමුත් අපේ පියවරුන්
ස්වර්ගයේ දෙවිව උදහසට[5] පත් කළ
නිසා දෙවි ඔවුන්ව බැබිලෝනියේ රජු
වූ කල්දිය ජාතික[6] නෙබුකද්නෙෂර්-
ගේ[7] අතට භාර දුන්නා.[8] ඉන්පසු
නෙබුකද්නෙෂර් රජ, මෙහි ගොඩ-
නඟා තිබූ ගෘහය සම්පූර්ණයෙන්ම
විනාශ කර,[9] සෙනඟව බැබිලෝනියට
රැගෙන ගියා.[10] **13** නමුත් බැබි-
ලෝනියේ රජකම් කළ සයිරස්ගේ
පාලන සමයේ පළමුවන අවුරුද්දේදී[11]
දෙවිගේ මෙම ගෘහය නැවත ගොඩ-
නඟන්න[12] කියා සයිරස් රජ්ජුරුවෝ
අණ කළා. **14** මීට පෙර නෙබුකද්-
නෙෂර් රජු යෙරුසලමේ තිබූ දෙ-
විගේ ගෘහයෙන් රන් රිදී භාණ්ඩ[13]
රැගෙන බැබිලෝනියේ දේවස්ථාන-
යක[14] තබා තිබුණා. නමුත් සයිරස්
රජ්ජුරුවෝ[15] ඒවා එම දේවස්ථාන-
යෙන් රැගෙන නැවත යෙරුසලමට
ගෙන යෑම සඳහා ආණ්ඩුකාරයා[16]
ලෙස පත් කළ ෂෙෂ්බෂර්ට[17] භාර
දුන්නා. **15** "මේ භාණ්ඩ[18] යෙරුස-
ලමට රැගෙන ගොස් දෙවිගේ ගෘහ-
යේ තබන්න. දෙවිගේ ගෘහය කලින්
තිබුණු ස්ථානයේම නැවත ගොඩ-
නඟන්න"[19] කියා රජ්ජුරුවෝ ඒ අවස්-
ථාවේදී ඔහුට පැවසුවා. **16** ඉන්පසු
රජු කී ලෙස ෂෙෂ්බෂර් යෙරුසලමට

**එස්රා 5:8*** එනම්, ඉසිලීමට නොහැකි තරම් විශාල ගල්වලින්.

**5 පරි.**
**1** එස්රා 6:14; හග් 2:4; හග් 2:21; සෙක 4:7
**2** ද්වි 11:24
**3** එස්රා 6:6; එස්රා 6:13
**4** එස්රා 1:3; එස්රා 5:9
**5** 2ලේක 16:9; එස්රා 7:6; එස්රා 7:28; එස්රා 8:22; ගීතා 32:8; ගීතා 33:18; ගීතා 34:15; 1පේතෘ 3:12
**6** යොෂු 1:4
**7** එස්රා 5:3; එස්රා 6:6
**8** එස්රා 6:13
**9** එස්රා 4:7
**10** එස්රා 4:11
**11** එස්රා 4:17; දානි 4:1
**12** නෙහෙ 11:3; එස්ත 1:1
**13** උත් 1:1; ද්වි 10:17; ද්වි 32:31; එස්රා 1:3; ගීතා 145:3; දානි 2:47; දානි 4:34; දානි 6:26

**2 තීරුව**
**1** එස්රා 5:3
**2** එස්රා 5:4
**3** ගීතා 124:8; යෙසා 45:18; යෝනා 1:9; එළි 4:11
**4** 1රාජා 7:51; 2ලේක 5:1
**5** 2රාජා 21:15; 2ලේක 34:25; නෙහෙ 9:26; යෙසා 59:2; යෙරෙ 5:31; දානි 9:5
**6** 2ලේක 36:17
**7** 2රාජා 24:1; 2රාජා 25:1; 2රාජා 25:8; යෙරෙ 39:1
**8** ද්වි 28:49; ද්වි 29:24; ද්වි 31:17; ද්වි 32:30; 1රාජා 9:7
**9** 2රාජා 25:9
**10** 2රාජා 25:11
**11** එස්රා 1:1
**12** එස්රා 1:3
**13** 2රාජා 25:14; 2රාජා 25:15; 2ලේක 36:18; යෙරෙ 52:19
**14** 2ලේක 36:7
**15** හිතෝ 21:1

**16** හග් 1:14; හග් 2:2; **17** එස්රා 1:11; හග් 1:1; **18** එස්රා 1:7; එස්රා 6:5; **19** එස්රා 1:2; එස්රා 6:3.

පැමිණ එහි තිබූ දෙවිගේ ගෘහයේ අත්-
තිවාරම්[1] දැමීමට පියවර ගත්තා. එදා
අපි ආරම්භ කළ මෙම ගොඩනැඟී-
මේ වැඩකටයුතු තවමත් අවසන් වී
නැහැ.'[2]

17 "එහෙයින් රජතුමනි, ඔබ සුදු-
සුයි කියා සිතනවා නම් රජමාලිගා-
වේ වාර්තා පරීක්ෂා කර බැලීමට[3]
නියෝග කරන ලෙස අපි ඔබෙන්
ඉල්ලා සිටින්නෙමු. එවිට යෙරුසල-
මේ තිබෙන දෙවිගේ ගෘහය නැවත
ගොඩනැඟීමට සයිරස් රජු ඇත්තටම
අවසර[4] දුන්නාදැයි රජතුමාට දැනගැ-
නීමට හැකි වනු ඇත. මේ සම්බන්-
ධයෙන් ඔබතුමාගේ තීරණය අපට
දන්වා එවන ලෙස අපි ඔබතුමාගෙන්
ගෞරවයෙන් ඉල්ලා සිටින්නෙමු."

**6** දාරියුස් රජ බැබිලෝනියේ පිහිටි
රාජකීය භාණ්ඩාගාරයේ තැන්-
පත් කර තිබූ වාර්තා[5] පරීක්ෂා කර
බලන මෙන් නියෝගයක් නිකුත්
කළේය. 2 එවිට මේදිය[6] බලප්‍රදේ-
ශයට අයත් එක්බටානා නම් නුවරේ
පිහිටි රජමාලිගාවේ ලියවිල්ලක් තිබී
සම්බ විය. එහි සඳහන් වූයේ මෙයයි.
3 "සයිරස්[7] රජුගේ පාලන සමයේ
පළමුවන අවුරුද්දේදී සයිරස් රජු යෙ-
රුසලමේ තිබූ දෙවිගේ ගෘහය සම්-
බන්ධයෙන් මෙම ආඥාව නිකුත් කර
තිබිණ. 'දෙවිගේ ගෘහය නැවත ගොඩ-
නඟන්න යුදෙව්වරුන්ට ඉඩ දෙන්න.
එවිට ඔවුන්ට එහි පූජා[8] ඔප්පු කළ
හැකියි. එහි අත්තිවාරම ශක්තිමත්ව
දැමිය යුතුයි. ගෘහයේ උස රියන්*
හැටක්ද පළල රියන්[9] හැටක්ද විය
යුතුයි. 4 විශාල ගල් තට්ටු[10] තුනක්
සහ ලී[11] බාල්කයක් සහිතව එහි
තාප්පය සාදගන්න. ගෘහය සෑදීමට
යන මුළු වියදම රාජකීය භාණ්ඩාගාර-
යෙන්[12] ගෙවීමට මම නියෝග කරමි.
5 නෙබුකද්නෙෂර්[13] රජු යෙරුසලමේ
තිබූ දෙවිගේ ගෘහයෙන් බැබිලෝනියට
රැගෙන ආ රන් හා රිදී භාණ්ඩද[14]
ඔවුන්ට නැවත භාර දෙන්න. යෙරුස-
ලමේ ගොඩනඟන දෙවිගේ ගෘහයේ[1]
නියමිත ස්ථානයේ තැන්පත් කිරීම
සඳහා ඔවුන්ට එම භාණ්ඩ භාර දිය
යුතුයි.'

6 "එම ආඥාවට අනුව මෙම ගොඩ-
නැඟීමේ කාර්යයට කිසිවෙකු බාධා
නොකළ යුතුයි. මහ ගඟෙන් එගොඩ[2]
සිටින ආණ්ඩුකාර තත්තෙනයිට[3] හෝ
ෂේතාර්-බෝසෙනයිට[4] හෝ නියෝජ්‍ය
ආණ්ඩුකාරයන්ට[5] හෝ ඔවුන් සමඟ
වැඩ කරන වෙන කිසිවෙකුට හෝ
එම ස්ථානයට යෑමට අවසර නැත.[6]
7 දෙවිගේ ගෘහයේ වැඩකටයුතු
බාධාවකින් තොරව දිගටම කරගෙන
යෑමට යුදෙව්වරුන්ට ඉඩහරින්න.[7]
ඔවුන්ගේ ආණ්ඩුකාරයා සහ ඔවුන්-
ගේ වැඩිමහල්ලෝ දෙවිගේ ගෘහය
තිබිය යුතු නියම ස්ථානයෙහි නැවත
ගොඩනඟනු ඇත. 8 දෙවිගේ ගෘහය
ගොඩනැඟීම සඳහා යුදෙව්වරුන්ගේ
වැඩිමහල්ලන්ට අවශ්‍ය සෑම දෙයක්ම
ලබා දෙන ලෙස මම ඔබට නියෝග[8]
කරමි. මහ ගඟෙන් එගොඩ පිහිටි
ප්‍රදේශවලින් රාජකීය භාණ්ඩාගාරයට[9]
ලැබෙන බදු සියල්ල ඔවුන්ගේ අතට
භාර දිය යුතුයි.[10] 9 ස්වර්ගයෙහි වෙ-
සෙන ඔවුන්ගේ දෙවිට දවන පූජා
ඔප්පු කිරීම සඳහා ඔවුන්ට අවශ්‍ය
වස්සන්ද[11] බැටළුවන්ද[12] බැටළු පැට-
වුන්ද[13] තිරිඟුද[14] ලුණුද[15] වයින්ද[16]
තෙල්ද[17] යන සියල්ල ලබා දෙන්න.
එමෙන්ම යෙරුසලමේ සිටින පූජක-
යන් ඉල්ලන සෑම දෙයක්ම දිනපතා
නොවරදවාම ඔවුන්ට ලබා දිය යුතුයි.
10 එවිට රජ්ජුරුවන්ගේද රජ්ජුරුවන්-
ගේ පුත්‍රයන්ගේද[18] දිවි රැක දෙන
ලෙස ස්වර්ගයේ දෙවිගෙන් ඉල්ලමින්
ඔහුට ප්‍රසන්න වන ආකාරයේ පූජා[19]
නොකඩවා[20] ඔප්පු කිරීමට ඔවුන්ට
හැකි වෙයි. 11 නමුත් යමෙකු මේ
රාජ නියෝගය කඩ කළොත්[21] ඔහු-
ගේ නිවසින් බාල්කයක්[22] ගලවා
ඔහුව එහි එල්ලා මරා[23] දමනු ඇත.
ඔහුගේ නිවසද වැසිකිළියක් බවට

**5 පරි.**
1 එස්රා 3:10 හග් 2:18 සෙක 4:9
2 එස්රා 4:24
3 එස්රා 4:15 හිතෝ 25:2
4 2ලේක 36:22 එස්රා 1:3 එස්රා 6:3

**6 පරි.**
5 එස්ත 10:2
6 එස්ත 1:1 දානි 5:28
7 2ලේක 36:22 එස්රා 1:1 එස්රා 5:13
8 ද්වි 12:5 ද්වි 12:6 ද්වි 12:11 2ලේක 2:6
9 1රාජා 6:2
10 එස්රා 5:8
11 එස්රා 3:7
12 එස්රා 7:20 ගීතා 68:29 යෙසා 49:23
13 2රාජා 25:15 2ලේක 36:7 2ලේක 36:18 යෙරෙ 52:19
14 එස්රා 1:11 එස්රා 5:14 දානි 1:2 දානි 5:2

**2 තීරුව**
1 එස්රා 5:15
2 2සාමු 8:3
3 එස්රා 5:3
4 එස්රා 5:6 එස්රා 6:13
5 එස්රා 4:9
6 ක්‍රියා 5:39 රෝම 8:31
7 ක්‍රියා 5:38
8 එස්රා 4:21
9 එස්රා 7:20
10 එස්රා 5:5 ගීතා 68:29 හග් 2:7
11 ලෙවී 1:5
12 ලෙවී 1:10 ලෙවී 9:2
13 ගණන් 28:3 ගණන් 29:2
14 නික් 29:2 ලෙවී 2:1
15 ලෙවී 2:13
16 ගණන් 15:5 ගණන් 15:7
17 නික් 27:20 ලෙවී 2:4 1ලේක 9:29
18 එස්රා 7:23 යෙරෙ 29:7 1තිමෝ 2:2
19 ලෙවී 1:9

**එස්රා 6:3*** උත් 6:15හි පාදසටහන බලන්න.

**20** නික් 29:38; ගණන් 28:3; **21** එස්රා 7:26; **22** එස්ත 7:10; **23** උත් 40:19; ද්වි 21:22.

පත් වනු ඇත.[1] **12** දෙවි යෙරුසල-
මේ තිබෙන එම ගෘහය තෝරාගෙන
තිබෙන්නේ තම නම දැරීමටයි.[2] ඒ
නිසා යම් රජෙකු හෝ යම් සෙනඟක්
හෝ මෙම රාජ නියෝගය කඩ කර එම
ගෘහය විනාශ කර දමන්න උත්සාහ
කළොත්[3] දෙවි විසින්ම ඔවුන්ව විනාශ
කරනු ලැබේවා! මෙම නියෝගය පන-
වන්නේ දාරියුස් රජු වන මමය. එය
වහාම ක්‍රියාත්මක කළ යුතුය.”

**13** එවිට මහ ගඟෙන් එගොඩ[4]
සිටි ආණ්ඩුකාරයා වූ තත්තෙනයිද
ෂේතාර්-බෝසෙනයිද[5] ඔවුන්ගේ සග-
යෝද දාරියුස් රජු පැනවූ නියෝගය
වහාම ක්‍රියාත්මක කළෝය.
**14** අනාගතවක්තෘ හග්ගයි[6] සහ ඉද්-
දෝගේ[7] මුනුපුරා වූ සෙකරියා[8] පැවසූ
අනාවැකිවලින් දිරියක් ලැබූ යුදෙව්-
වරුන්ගේ වැඩිමහල්ලෝ,[9] දෙවිගේ
ගෘහයේ ගොඩනැඟීමේ වැඩකටයුතු[10]
ඉතා සාර්ථකව කරගෙන ගියෝය.
ඊශ්‍රායෙල්හි දෙවි[11] දුන් ආඥාවට අනුව
ඔවුහු දෙවිගේ ගෘහය ගොඩනඟා අව-
සන් කළෝය. සයිරස්[12] රජු, දාරියුස්[13]
රජු සහ පර්සියාවේ රජු වූ අර්තක්-
ෂස්තා[14] දුන් නියෝගවලට අනුව ඒ
වැඩකටයුතු සියල්ල නිම කරන ලදි.
**15** ඔවුහු ආදාර්[15] නම් මාසයේ තුන්-
වනදා වන විට ගොඩනැඟීමේ කට-
යුතු නිම කළෝය. ඒ වැඩකටයුතු
නිම කළේ දාරියුස් රජු පාලනය කළ
හයවන අවුරුද්දේදීය.

**16** ඊශ්‍රායෙල්වරුද පූජකයෝද
ලෙවීවරුද[16] නිදහස ලබා[17] පැමිණි
අන් සියලුදෙනාද දෙවිගේ ගෘහය
කැප කිරීම සඳහා ඉතා සතුටින්
උත්සවයක්[18] පැවැත්වූහ. **17** ඔවුහු
එම උත්සවය සඳහා ගවයන් සිය-
යක්ද බැටළුවන් දෙසියයක්ද බැටළු
පැටවුන් හාරසියයක්ද ගෙනා-
වෝය. ඊශ්‍රායෙල් සෙනඟ වෙනු-
වෙන් පාප පූජාවක් ඔප්පු කිරීම
සඳහා ඊශ්‍රායෙල්හි ගෝත්‍ර ගණනට[19]
අනුව එළුවන් දොළොස්දෙනෙකුද
ගෙනාවෝය. **18** ඔවුහු මෝසෙස්-
ගේ නීතියේ[20] සඳහන් ආකාරයට පූජ-
කයන්ව තම තමන්ගේ පන්තිවලට
අනුවත් ලෙවීවරුන්ව තම තමන්ගේ
කණ්ඩායම්වලට[1] අනුවත් වෙන් කර,
යෙරුසලමෙහි දෙවිට සේවය කරන
පිණිස ඔවුන්ව පත් කළෝය.

**19** වහල්භාවයෙන් නිදහස ලබා
පැමිණි සියලුදෙනා පළමුවන මාසයේ[2]
දහහතරවන දින පාස්කු උත්සවය[3]
පැවැත්වූහ. **20** පූජකයන් සහ ලෙවී-
වරුන් සියලුදෙනාම පවිත්‍ර වී[4] සිටි හෙ-
යින් ඔවුහු පාස්කු උත්සවය සඳහා
ගෙනා බැටළු පැටවුන්ව මැරුවෝය.[5]
ඉන්පසු ඔවුහු තමන් වෙනුවෙන්ද
පූජකයන් වූ තමන්ගේ සහෝදර-
යන් වෙනුවෙන්ද නිදහස ලබා පැමිණි
සියලුදෙනා වෙනුවෙන්ද උන්ව ඔප්පු
කළෝය. **21** ඉන්පසු නිදහස ලබා
පැමිණි ඊශ්‍රායෙල්වරුද අවට ජාතීන්-
ගේ අපවිත්‍රකම්වලින්[6] ඈත්ව ඊශ්‍රා-
යෙල්හි දෙවි වන යෙහෝවාගෙන් මඟ
පෙන්වීම් පැතූ[7] සියලුදෙනාද පාස්කු
පූජාව අනුභව කළෝය.[8] **22** ඔවුහු
සත් දවසක් පුරා මුහුන් නොදැමූ රොටි
උත්සවයද[9] ඉතා ප්‍රීතියෙන් පැවැත්-
වූහ. ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝවා
තමාගේ ගෘහය ගොඩනැඟීමේ කාර්ය-
යට අතහිත දීම සඳහා ඇසිරියාව
පාලනය කළ රජුගේ සිත පෙලඹවූ[10]
නිසාත් ඒ වැඩකටයුතු සාර්ථකව නිම
කිරීමට ආශීර්වාද කළ නිසාත් ඔවුන්ට
මහත් ප්‍රීතියක් ඇතිණි.

**7** පර්සියාවේ රජු වන අර්තක්ෂස්-
තාගේ[11] පාලන සමයේදී ජීවත්
වූ එස්රාගේ පෙළපත් වාර්තාව මෙ-
යයි. එස්රාගේ[12] පියා සෙරායාය.[13]
සෙරායාගේ පියා අෂරියාය. අෂරියා-
ගේ පියා හිල්කියාය.[14] **2** හිල්කියා-
ගේ පියා ෂල්ලුම්ය.[15] ෂල්ලුම්ගේ පියා
සාදොක්ය. සාදොක්ගේ පියා අහි-
තුබ්ය.[16] **3** අහිතුබ්ගේ පියා අමරි-
යාය.[17] අමරියාගේ පියා අෂරියාය.[18]
අෂරියාගේ පියා මෙරායොත්ය.[19]
**4** මෙරායොත්ගේ පියා සෙරහි-
යාය. සෙරහියාගේ පියා උස්සියාය.

**6 පරි.**

**1** ආනි 2:5
**2** නික් 20:24; ද්වි 12:5; 2ලේක 7:16; ගීතා 132:14
**3** ගීතා 5:10
**4** 2රාජා 23:29
**5** එස්රා 5:6
**6** එස්රා 5:1; හග් 1:12
**7** සෙක 1:7
**8** සෙක 1:1; සෙක 6:15
**9** එස්රා 3:8; එස්රා 4:3
**10** එස්රා 5:2
**11** යෙසා 44:28; හග් 1:8
**12** 2ලේක 36:23; එස්රා 1:3; එස්රා 5:13
**13** එස්රා 6:12
**14** එස්රා 7:13
**15** එස්ත 9:1
**16** 1ලේක 9:2; නෙහෙ 7:73
**17** 2රාජා 24:15; එස්රා 4:1; නෙහෙ 1:2
**18** 1රාජා 8:63
**19** 2ලේක 7:5
**20** ගණන් 3:6

**2 තීරුව**

**1** 1ලේක 23:6
**2** නික් 12:2; ලෙවී 23:5; ද්වි 16:1; එස්ත 3:7
**3** නික් 12:14
**4** නික් 30:20; ලෙවී 21:8; ලෙවී 22:3
**5** නික් 12:5
**6** ගණන් 9:14; 2කොරි 6:17; 2කොරි 7:1
**7** 2ලේක 15:12
**8** නික් 12:48
**9** නික් 12:17; ලෙවී 23:6
**10** එස්රා 7:27; හිතෝ 16:7; හිතෝ 21:1

**7 පරි.**

**11** එස්රා 6:14; නෙහෙ 2:1
**12** එස්රා 7:6; නෙහෙ 8:2; නෙහෙ 12:26
**13** 1ලේක 6:14
**14** 2රාජා 22:8
**15** 1ලේක 6:12
**16** නෙහෙ 11:11
**17** 1ලේක 6:11
**18** 1ලේක 6:10; 2ලේක 31:10; **19** 1ලේක 6:7.

උස්සියාගේ පියා බුක්කීය. **5** බුක්කී-
ගේ පියා අබිෂූවාය.[1] අබිෂූවාගේ පියා
පිනෙහාස්ය.[2] පිනෙහාස්ගේ පියා එලි-
යාසර්ය.[3] එලියාසර්ගේ පියා නායක
පූජක[4] ආරොන්ය.[5] **6** එස්රා හොඳින්
පුහුණුව ලැබූ දක්ෂ පිටපත්කරුවෙකි.[6]
ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝවා මෝ-
සෙස්ට දුන් නීතිය[7] ඔහු මැනවින් පිට-
පත් කළේය. එස්රාට තම දෙවි වූ
යෙහෝවාගේ ආශීර්වාද තිබුණු හෙ-
යින් ඔහුගේ ඕනෑම ඉල්ලීමක්[8] ඉටු
කරන්න රජ කැමති විය. එස්රා බැබි-
ලෝනියෙන් පිටත්ව යෑමට තීරණය
කළේය.

**7** අර්තක්ෂස්තා[9] රජුගේ පාලන
සමයේ හත්වන අවුරුද්දේදී ඊශ්‍රායෙල්
ජනයාගෙන්ද පූජකයන්ගෙන්ද[10] ලෙ-
වීවරුන්ගෙන්ද[11] ගායකයන්ගෙන්ද[12]
දොරටු පාලකයන්ගෙන්ද[13] නෙ-
තිනිම්වරුන්ගෙන්ද[14] කිහිපදෙනෙක්
එස්රා සමඟ යෙරුසලමට ගියෝය.
**8** එස්රා ඔවුන් සමඟ යෙරුසලමට
පැමිණියේ අර්තක්ෂස්තා රජු පාලනය
කළ හත්වන අවුරුද්දේ පස්වන මාස-
යේදීය. **9** එස්රා බැබිලෝනියේ සිට
යෙරුසලම බලා පිටත් වූයේ පළ-
මුවන මාසයේ පළමුවන දිනයේදීය.
ඔහුට දෙවිගේ ආශීර්වාදය ලැබුණු
නිසා[15] පස්වන මාසයේ පළමුවන දින-
යේදී ඔහු යෙරුසලමට පැමිණියේය.
**10** එස්රා යෙහෝවා දෙවිගේ නීතිය[16]
සෝදිසි කර බැලීමට තම සිත යොමු
කළේය.[17] එහි සඳහන් දේ හොඳින්
පිළිපැදීමටත්[18] ඊශ්‍රායෙල්වරුන්ට දෙ-
විගේ අණපනත්[19] හා යුක්තිය[20] ගැන
ඉගැන්වීමටත්[21] ඔහු තම සිතින් අදි-
ටන් කරගත්තේය.

**11** යෙහෝවා දෙවි ඊශ්‍රායෙල් සෙ-
නඟට දුන් අණපනත් සහ නීතිරීති
පිටපත්[22] කළ පූජක එස්රාට අර්තක්-
ෂස්තා රජු ලිපියක් භාර දී තිබිණ. එහි
සඳහන් දේ මතු දැක්වේ.

**12*** "රජවරුන්ගෙත් රජු වූ[23] අර්-
තක්ෂස්තාගෙන්[1] පූජක එස්රා වෙ-
නටයි. ස්වර්ගයෙහි සිටින දෙ-
විගේ[2] නීතිය පිටපත් කරන ඔබට
සමාදානය වේවා![3] **13** මාගේ රාජ-
ධානියේ[4] ජීවත් වන ඊශ්‍රායෙල්වරුන්-
ගෙන් කැමති ඕනෑම කෙනෙකුට ඔබ
සමඟ යෙරුසලම බලා ගමන් කිරී-
මට මම අවසර[5] දෙන්නෙමි. ඔවුන්
අතරේ සිටින පූජකයන්ටද ලෙවීව-
රුන්ටද ඔබ සමඟ යෑමට අවසර
ඇත.[6] **14** යුදා දේශයේ හා යෙරුස-
ලමෙහි පවතින තත්වය ඔබේ භාරයේ
තිබෙන ඔබේ දෙවිගේ[7] නීතියට[8] අනු-
කූලව ඇද්දැයි සෝදිසි කර බැලීමට[9]
ඔබට නියෝග කළේ රජ්ජුරුවන් වන
මා සහ මාගේ උපදේශකයන් සත්දෙ-
නාය.[10] **15** යෙරුසලමෙහි වාසය
කරන[11] ඊශ්‍රායෙල්හි දෙවිට රජ්ජුරු-
වන් වන මම සහ මාගේ උපදේශ-
කයෝ බොහෝ රන් හා රිදී ලබා
දී ඇත.[12] අපි ඒ සියල්ල ඔබට
භාර දෙන්නෙමු. **16** එමෙන්ම බැබි-
ලෝනිය බලප්‍රදේශයට අයත් සියලු
පළාත්වලින් ලබාගත හැකි රන් හා
රිදීද ජනතාව සහ පූජකයන් යෙරු-
සලමෙහි පිහිටා ඇති තම දෙවිගේ
ගෘහය වෙනුවෙන්[13] සිය කැමැත්-
තෙන්ම පරිත්‍යාග කරන සියල්ලද[14]
ඔබට රැගෙන යා හැකියි. **17** පූජා
ඔප්පු කරන පිණිස එම මුදල්වලින්
ගවයන්,[15] බැටළුවන්[16] සහ බැටළු
පැටවුන්ද[17] මිල දී ගන්න. ඒ සතුන්
සමඟ ඔප්පු කරන ධාන්‍ය පූජා[18] හා
පාන පූජා[19] සඳහා අවශ්‍ය සියලු ද්‍රව්‍යද
මිල දී ගන්න. යෙරුසලමෙහි[20] පිහිටා
ඇති ඔබේ දෙවිගේ ගෘහයේ පූජාසනය
මත ඒවා ඔප්පු කළ යුතුයි.[21]

**18** "ඔබේ දෙවිගේ කැමැත්ත[22]
පරිදි තවත් දේවල් කළ යුතු නම්
ඉතුරු රන් හා රිදී[23] ඒ සඳහා භාවිත-
යට ගන්න. ඔබටත් ඔබ සමඟ සේ-
වය කරන අනිකුත් අයටත් ඒ සඳහා
අවසර තිබේ.[24] **19** ඔබේ දෙවිගේ
ගෘහයේ භාවිතය සඳහා ඔබේ අතට

---

**එස්රා 7:12*** මෙතැන් සිට 26වන පදය දක්වා දිවෙන ලිපිය ලියා තිබෙන්නේ අරාමීය භාෂාවෙනි.

**7 පරි.**
**1** 1ලේක 6:4
**2** නික් 6:25, ගණන් 25:11, විනි 20:28
**3** නික් 6:23, ගණන් 3:32, ද්වි 10:6, යොෂු 14:1, 1ලේක 24:1
**4** හෙබ්‍රෙ 5:4
**5** නික් 7:1, නික් 28:1
**6** නෙහෙ 8:1, නෙහෙ 8:4
**7** ද්වි 4:5, ද්වි 5:1, ද්වි 28:1
**8** නෙහෙ 1:11, නෙහෙ 2:8
**9** එස්රා 6:14
**10** එස්රා 8:15
**11** එස්රා 8:18
**12** 1ලේක 6:32
**13** 1ලේක 9:22, 1ලේක 9:26
**14** 1ලේක 9:2, එස්රා 7:24, එස්රා 8:20
**15** එස්රා 8:22
**16** ගීතා 1:2, ගීතා 19:7
**17** ද්වි 30:6, 2ලේක 19:3, ගීතා 78:8
**18** ද්වි 5:1, ද්වි 17:10
**19** ද්වි 12:1
**20** හිතෝ 29:4, යෙසා 1:17, සෙක 7:9
**21** ද්වි 33:10, මලා 2:7
**22** එස්රා 7:6
**23** දානි 2:37

**2 තීරුව**
**1** එස්රා 6:14, නෙහෙ 2:1
**2** එස්රා 5:11
**3** එස්රා 5:7
**4** එස්ත 9:30
**5** එස්රා 5:17
**6** ද්වි 30:3, එස්රා 1:3
**7** එස්රා 5:8, දානි 2:47
**8** ද්වි 17:18, 2රාජා 22:8
**9** එස්රා 6:1
**10** එස්ත 1:14
**11** ගීතා 9:11, ගීතා 76:2, ගීතා 135:21
**12** එස්රා 6:4, ගීතා 68:29
**13** එස්රා 1:6
**14** එස්රා 8:25
**15** ලෙවී 1:5
**16** ලෙවී 1:10
**17** ගණන් 28:3

**18** ගණන් 15:4; **19** ලෙවී 23:13; **20** 1රාජා 11:36; **21** ද්වි 12:6; **22** එෆී 5:17; **23** 2රාජා 22:7; **24** එස්රා 7:26.

භාජන[1] භාර දෙනු ඇත. ඒ සියල්ල
යෙරුසලමට[2] රැගෙන ගොස් ඔබේ
දෙවි ඉදිරියේ භාර දෙන්න. **20** ඔබේ
දෙවිගේ ගෘහයට ඕනෑ කරන සෑම දෙ-
යකටම අවශ්‍ය මිලමුදල් රජුගේ වස්තු
ගබඩාවෙන්[3] ලබාගැනීමට ඔබට අව-
සර ඇත.

**21** “අර්තක්ෂස්තා රජු වන මම
මහ ගඟෙන් එගොඩ[4] සිටින සියලුම
භාණ්ඩාගාර නිලධාරීන්ට[5] නියෝ-
ගයක්[6] නිකුත් කළෙමි. ස්වර්ගයේ
වෙසෙන දෙවිගේ නීතියේ පිටපත්ක-
රුවෙකු හා පූජකයෙකු වන ඔබ[7] ඉල්-
ලන සෑම දෙයක්ම වහාම ඔබට ලබා
දිය යුතු බව මම ඔවුන්ට දැන්වූ-
වෙමි. **22** රිදී තලෙන්ත* සියයක්,[8]
තිරිඟු ගබඩාවෙන් කෝර් මිනුම්# සිය-
යක්,[9] වයින්වලින්[10] බාත්[11] ඒකක△
සියයක්, තෙල්වලින්[12] බාත් ඒකක
සියයක් හා අසීමිත ලුණු[13] ප්‍රමා-
ණයක් වුවද ඔබට ඔවුන්ගෙන්
ලබාගත හැකියි. **23** ස්වර්ගයේ වෙ-
සෙන දෙවි[14] තම ගෘහය වෙනුවෙන්
කිරීමට අණ කළ[15] සෑම දෙයක්ම
ඉටු කිරීමට වහාම[16] පියවර ගත
යුතුයි. එවිට රජ්ජුරුවන්ගේ රාජධානි-
යට විරුද්ධවත් ඔහුගේ පුත්‍රයන්ට[17]
විරුද්ධවත් දෙවිගේ උදහස ඇවි-
ළෙන්නේ නැත. **24** මීට අමතරව
කිසිදු පූජකයෙකුගෙන්වත්[18] ලෙවීවර-
යෙකුගෙන්වත්[19] සංගීතඥයෙකුගෙන්-
වත්[20] දොරටු පාලකයෙකුගෙන්වත්[21]
නෙතිනිම්වරයෙකුගෙන්වත්[22] දෙවිගේ
ගෘහයේ සේවය කරන වෙන කිසි කෙ-
නෙකුගෙන්වත් බද්දක්[23] හෝ ගාස්තු-
වක්[24] හෝ අය නොකළ යුතු බවද මම
ඔවුන්ට දැන්වූවෙමි.

**25** “ඔබේ දෙවි ඔබට ලබා දුන්
නුවණ[25] පාවිච්චි කර, මහ ගඟෙන්
එගොඩ ජීවත් වන සියලුදෙනා අත-
රේ නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා[26]
විනිසුරුවන්ව හා මූලාදෑනීන්ව පත්
කරන්න. ඔවුන් ඔබේ දෙවිගේ නීතිය
ගැන මනා අවබෝධයක් තිබෙන අය
විය යුතුයි. ඒ නීතිය ගැන අවබෝ-
ධයක් නැති අය සිටී නම් ඔබ ඒ
සියලුදෙනාව දැනුවත් කළ යුතුයි.[1]
**26** ඔබේ දෙවිගේ නීතිය[2] හා රජ්ජුරු-
වන්ගේ නීතිය පිළිපැදීමට යමෙකු
අපොහොසත් වුවහොත් ඔහුට වහාම
දඬුවම් කළ යුතුයි. ඔහුට මරණය
නියම කරන්න[3] හෝ ඔහුව පිටුවහල්
කරන්න[4] හෝ ඔහුගෙන් දඩ මුදලක්
අය කරන්න[5] හෝ ඔහුව සිරභාරයට
ගන්න හෝ තීරණය කිරීමට ඔබට
අවසර ඇත.”

**27** අපගේ මුතුන්මිත්තන්ගේ දෙවි
වන යෙහෝවාට ප්‍රශංසා වේවා![6]
මන්ද යෙරුසලමෙහි පිහිටි යෙහෝවා
දෙවිගේ ගෘහය අලංකාරවත් කිරීම[7]
සඳහා මෙම නියෝගය පැනවීමට
රජ්ජුරුවන්ගේ හදවත පෙලඹවූයේ[8]
ඔහුයි. **28** එසේම දෙවිගේ මහත්
ප්‍රේමය*[9] නිසා රජ්ජුරුවන්ගේද ඔහු-
ගේ උපදේශකයන්ගේද[10] ඔහුගේ බල-
වත් අධිපතීන්ගේද සිත දිනාගන්න
එස්රා වන මට හැකි විය. මාගේ දෙවි
වන යෙහෝවාගේ ආශීර්වාදය මට
ලැබුණු නිසා[11] මාගේ සිතට ධෛර්ය-
යක් ආවේය. ඒ නිසා මම ඊශ්‍රායෙල්
සෙනඟ අතරේ සිටි ප්‍රධානීන්ව රැස්
කරවා ඔවුන් සමඟ පිටත්ව යෑමට
සූදානම් වුණෙමි.

**8** අර්තක්ෂස්තා[12] රජුගේ පාලන
සමයේදී මා සමඟ බැබිලෝනි-
යෙන් පිටත් වූ පෙළපත්වල ප්‍රධානීන්-
ගේ[13] නම් සහ ඔවුන්ගේ පවුල්වල
විස්තර[14] මතු දැක්වේ. **2** පිනෙහාස්-
ගේ පුතුන්[15] අතරින් ගේර්ෂොම්ද ඉත-
මාර්ගේ පුතුන්[16] අතරින් දානියෙල්ද[17]
දාවිත්ගේ පුතුන්[18] අතරින් හට්ටුෂ්ද
සිටියෝය. **3** පාරොෂ්ගෙන්[19] පැවත
ආ ෂෙකනියාගේ පුතුන් අතරින් සෙක-
රියාද ඔහු සමඟ පෙළපත් වාර්තාවල

**7 පරි.**
1 එස්රා 1:7; එස්රා 8:30
2 යෙරෙ 3:17
3 එස්රා 6:4; එස්රා 6:8
4 යොෂු 1:4; 1රාජා 4:24; එස්රා 4:20
5 එස්රා 6:8
6 එස්රා 6:12; දේශ 8:4
7 එස්රා 7:6; නෙහෙ 8:2
8 1රාජා 16:24
9 1රාජා 4:22; එස 45:14
10 ගණන් 15:5
11 එස 45:11
12 නික් 27:20; ලෙවී 2:1
13 ලෙවී 2:13
14 එස්රා 1:2; යෙසා 40:22
15 ගීතා 119:4
16 එෆී 6:6; කොලො 3:23
17 උත් 12:3; එස්රා 6:10; යෙසා 60:12
18 එස්රා 2:36
19 එස්රා 2:40
20 1ලේක 15:16
21 එස්රා 2:42
22 1ලේක 9:2; එස්රා 2:58
23 නෙහෙ 5:4
24 එස්රා 4:20
25 හිතෝ 2:6; යාකො 1:5
26 නික් 18:22; ද්වි 16:18; 2ලේක 19:8

**2 තීරුව**
1 2ලේක 17:9; නෙහෙ 8:3; මලා 2:7; මතෙ 13:52
2 ද්වි 4:8
3 එස්රා 6:11
4 උත් 4:11
5 නික් 22:6
6 ද්වි 1:11
7 යෙසා 60:13
8 එස්රා 6:22; හිතෝ 21:1
9 එස්රා 9:9; නෙහෙ 1:11
10 එස්රා 7:14; එස්ත 1:14
11 එස්රා 8:18; නෙහෙ 2:8

**8 පරි.**
12 එස්රා 7:7
13 1ලේක 24:31
14 1ලේක 4:33; 1ලේක 9:1

---

15 1ලේක 6:4; 16 නික් 6:23; 17 නෙහෙ 10:6; 18 1ලේක 3:1; 19 නෙහෙ 10:14.

එස්රා **7:22*** නික් 25:39හි පාදසටහන බලන්න. **22#** කෝර් මිනුමක් යනු ලීටර් 220කි. **22△** බාත් ඒකකයක් යනු ලීටර් 22කි.

එස්රා **7:28*** හෝ, “ලැදි ප්‍රේමය.”

නම් ඇතුළත් කළ පුරුෂයෝ එක-
සිය පනස්දෙනෙක්ද සිටියෝය.
4 පාහත්-මෝවබ්ගේ[1] පුතුන් අත-
රින් සෙරහියාගේ පුත් එලිහෝ-
ඒනයිද ඔහු සමඟ පුරුෂයෝ දෙ-
සියදෙනෙක්ද සිටියෝය. 5 සට්ටු-
ගේ පුතුන්[2] අතරින් යහසියෙල්ගේ
පුත් ෂෙකනියාද ඔහු සමඟ පුරු-
ෂයෝ තුන්සියදෙනෙක්ද සිටියෝය.
6 ආදින්ගේ පුතුන්[3] අතරින් යො-
නාතාන්ගේ පුත් ඒබෙද්ද ඔහු සමඟ
පුරුෂයෝ පනස්දෙනෙක්ද සිටියෝය.
7 ඒලාම්ගේ පුතුන්[4] අතරින් අතලියා-
ගේ පුත් යෙෂායාද ඔහු සමඟ පුරු-
ෂයෝ හැත්තෑදෙනෙක්ද සිටියෝය.
8 ෂෙපටියාගේ පුතුන්[5] අතරින් මීකා-
යෙල්ගේ පුත් සෙබදියාද ඔහු සමඟ
පුරුෂයෝ අසූදෙනෙක්ද සිටියෝය.
9 යෝවාබ්ගේ පුතුන් අතරින් යෙ-
හීයෙල්ගේ පුත් ඔබදියාද ඔහු සමඟ
පුරුෂයෝ එකසිය දහඅටදෙනෙක්ද
සිටියෝය. 10 බානිගේ පුතුන්[6] අත-
රින් යොසිපියාගේ පුත් ෂෙලොමිත්ද
ඔහු සමඟ පුරුෂයෝ එකසිය හැට-
දෙනෙක්ද සිටියෝය. 11 බෙබායි-
ගේ පුතුන් අතරින් බෙබායිගේ පුත්[7]
සෙකරියාද ඔහු සමඟ පුරුෂයෝ විසිඅ-
ටදෙනෙක්ද සිටියෝය. 12 අස්ගාද්-
ගේ පුතුන්[8] අතරින් හක්කාටාන්ගේ
පුත් යෝහානාන්ද ඔහු සමඟ පුරුෂ-
යෝ එකසිය දහදෙනෙක්ද සිටියෝය.
13 අදොනිකාම්ගේ පුතුන්ගෙන්[9] ඉතු-
රුව සිටි අය වන එලිෆෙලෙත්ද
යෙයීයෙල්ද ෂෙමායාද ඔවුන් සමඟ
පුරුෂයෝ හැටදෙනෙක්ද සිටියෝය.
14 බිග්වායිගේ පුතුන්[10] අතරින් ඌත-
යිද සබ්බූද්ද ඔවුන් සමඟ පුරුෂයෝ
හැත්තෑදෙනෙක්ද සිටියෝය.

15 මම අහාවා[11] හරහා ගලා යන
ගංගාව අසලට[12] ඔවුන් සියලුදෙනාව
රැස් කළෙමි. ජනයාව හා පූජක-
යන්ව[13] සෝදිසි කර බලන පිණිස[14]
අපි සියලුදෙනාම එහි දින තුනක්
කඳවුරු බැඳගෙන සිටියෙමු. එහෙත්
ලෙවීගේ පුත්‍රයන්ගෙන්[15] එක් කෙනෙ-
කුවත් මට සොයාගැනීමට නොහැකි

8 පරි.
1 එස්රා 2:6
නෙහෙ 10:14
2 එස්රා 2:8
එස්රා 10:27
3 එස්රා 2:15
නෙහෙ 10:16
4 එස්රා 2:7
5 එස්රා 2:4
නෙහෙ 7:9
6 නෙහෙ 7:15
7 එස්රා 2:11
එස්රා 10:28
8 එස්රා 2:12
නෙහෙ 10:15
9 නෙහෙ 7:18
10 එස්රා 2:14
11 එස්රා 8:21
එස්රා 8:31
12 ගීතා 137:1
13 එස්රා 7:7
14 හිතෝ 27:23
15 ගණන් 3:6

2 තීරුව
1 2ලේක 17:9
2 එස්රා 2:43
3 2සාමු 14:19
යෙරෙ 1:9
4 ගණන් 8:26
ගණන් 18:6
1ලේක 23:32
5 එස්රා 7:28
හිතෝ 3:6
6 1ලේක 6:16
7 ගණන් 3:20
8 හිතෝ 12:8
යෙරෙ 3:15
9 එස්රා 8:24
10 1ලේක 6:16
11 ගණන් 14:3
12 ගීතා 27:11
යෙසා 30:21
13 දානි 10:12
යාකො 4:10
14 රෝම 8:28
15 2ලේක 16:9
එස්රා 7:6
එස්රා 7:28
සෙක 4:6

විය. 16 එහෙයින් මම ප්‍රධානීන් වූ
එලියේසර්, අරියෙල්, ෂෙමායා, එල්නා-
තාන්, යාරිබ්, එල්නාතාන්, නාතන්,
සෙකරියා සහ මෙෂුල්ලම් යන අය-
වද ගුරුවරුන්[1] වූ යෝයාරීබ් සහ
එල්නාතාන් යන අයවද කැඳවා,
17 කසිෆියා නම් ස්ථානයේ ප්‍රධානි-
යෙකු වූ ඉද්දෝ වෙතට යැව්වෙමි.
ඉද්දෝ සමඟත් ඔහුගේ සහෝදර-
යන් වන නෙතිනිම්වරුන්[2] සමඟත්
කතා කර,[3] අපේ දෙවිගේ ගෘහයේ
සේවය කිරීම සඳහා අවශ්‍ය සේවක-
යන්ව[4] රැගෙන ඒමට මම ඔවුන්ට අණ
කළෙමි. 18 අපට දෙවිගේ ආශීර්-
වාදය තිබුණු නිසා[5] ඊශ්‍රායෙල්ගේ
පුත් ලෙවීගේ[6] මුනුපුරෙකු වූ මාලීගේ
පුතුන්[7] අතරින් නුවණැති[8] මිනිසෙකු
වූ ෂෙරෙබියාවද[9] ඔහුගේ පුතුන්වද
ඔහුගේ සහෝදරයන්වද රැගෙන ඒමට
ඔවුන්ට හැකි විය. ඔවුන් එතැනට
රැගෙන ආ මුළු සංඛ්‍යාව දහඅටකි.
19 මීට අමතරව ඔවුහු හෂබියාව සහ
මෙරාරීගේ[10] පුතුන් අතරින් යෙෂායා-
වද ඔහුගේ සහෝදරයන්වද ඔහුගේ
පුතුන්වද රැගෙන ආවෝය. ඔවුන්-
ගේ මුළු සංඛ්‍යාව විස්සකි. 20 දාවිත්
සහ ඔහුගේ අධිපතීන් විසින් ලෙවීව-
රුන්ට සේවය කිරීම සඳහා නියම
කරන ලද නෙතිනිම්වරුන් අතරින්
දෙසිය විසිදෙනෙකුද ඔවුහු රැගෙන
ආවෝය. මෙම නෙතිනිම්වරුන් සිය-
ලුදෙනාගේ නම් පෙළපත් වාර්තාවලට
ඇතුළත් කර තිබිණ.

21 ඉන්පසුව මම අහාවා ගඟ අසල
රැස්ව සිටි සියලුදෙනාට නිරාහා-
රව සිට දෙවිට කන්නලව් කරන්න
කියා පැවසුවෙමි. අපටත් අපගේ කුඩා
දරුවන්ටත්[11] අපගේ බඩු බාහිරාදිය-
ටත් රැකවරණය ලබා දෙමින් නිසි
ලෙස මඟ පෙන්වන මෙන්[12] අපි අප-
ගේ දෙවිට නිහතමානීව[13] කන්නලව්
කළෙමු. 22 අප මීට පෙර රජ්ජුරු-
වන්ට මෙසේ පවසා තිබිණ. “අප-
ගේ දෙවිගෙන් මඟ පෙන්වීම් පතමින්
ඔහුට ළං වන සියලුදෙනාට[14] දෙ-
විගේ ආශීර්වාදය[15] අනිවාර්යයෙන්ම

ලැබෙනවා. නමුත් ඔහුව අත්හරින[1]
අයට විරුද්ධව ඔහුගේ උදහස ඇවි-
ළෙයි.[2] දෙවි නමාගේ මහත් බල-
යෙන් ඔවුන්ට දඬුවම් දෙයි.” ඒ නිසා
අප යන ගමනේ ආරක්ෂාව සඳහා
හමුදා පිරිසක්[3] සහ අසරුවන්[4] ලබා
දෙන මෙන් රජ්ජුරුවන්ගෙන් ඉල්ලී-
මට මම ලැජ්ජා වුණෙමි. **23** එහෙ-
යින් අපි නිරාහාරව[5] සිටිමින් අපගේ
ගමනට ආශීර්වාද කරන මෙන් දෙ-
විට කන්නලව් කළෙමු.[6] දෙවිද අපගේ
කන්නලව්වලට සවන් දුන්නේය.[7]

**24** පසුව මම පූජකයන් අත-
රේ සිටි ප්‍රධානීන්ගෙන් දොළොස්-
දෙනෙකුව එනම්, ෂෙරෙබියාවද[8]
හෂබියාවද[9] ඔවුන්ගේ සහෝදර-
යන් දසදෙනෙකුවද වෙන් කළෙමි.
**25** ඉන්පසුව රජ්ජුරුවන්ද[10] ඔහුගේ
උපදේශකයන්ද[11] අධිපතීන්ද ඒ ප්‍රදේ-
ශයේ සිටි සියලු ඊශ්‍රායෙල්වරුන්ද[12]
අපගේ දෙවිගේ ගෘහය වෙනුවෙන්
සම්මාදම් කළ රන්, රිදී හා සියලු
භාණ්ඩ[13] මම ඔවුන්ට කිරා මැන
භාර දුන්නෙමි. **26** මේ අනුව මම
ඔවුන්ට රිදී තලෙන්ත*[14] හයසිය
පනහක්ද තලෙන්ත දෙකක් බරැති රිදී
බඳුන් සියයක්ද රන් තලෙන්ත සිය-
යක්ද **27** දරික් දහසක් වටිනා කුඩා
රන් බඳුන් විස්සක්ද රත්තරන් තරම්
වටිනා රන්වන් පැහැයෙන් දිලිසෙන
ඉස්තරම්ම තඹවලින් සෑදූ භාජන දෙ-
කක්ද කිරා මැන දුනිමි.

**28** පසුව මම ඔවුන්ට මෙසේ පැව-
සුවෙමි. “ඔබ යෙහෝවා දෙවිගේ සේ-
වය සඳහා කැප වූ ශුද්ධ[15] පිරිසක්.
ඔබට භාර දුන් භාජනත්[16] ශුද්ධයි. ඒ
වගේම ඔබට දුන් රන් සහ රිදී ඔබේ
මුතුන්මිත්තන්ගේ දෙවි වන යෙ-
හෝවාට කැමැත්තෙන්ම පරිත්‍යාග
කළ දේවල් බව මතක තබාගන්න.
**29** ඔබ යෙහෝවා දෙවිගේ ගෘහ-
යේ භෝජන ශාලාවලදී[17] නායක
පූජකයන්ටත් ලෙවීවරුන්ටත් යෙ-
රුසලමෙහි සිටින ඊශ්‍රායෙල්වරුන්-
ගේ පෙළපත්වල අධිපතීන්ටත් මේ
සියල්ල කිරා මැන[1] භාර දිය යුතුයි. ඒ
සියල්ල භාර දෙන තුරු ඔබ සෝදිසි-
යෙන් සිට ඒ දේවල් පරෙස්සමෙන්
තබාගන්න.” **30** එවිට පූජකයෝද
ලෙවීවරුද යෙරුසලමෙහි පිහිටි අප-
ගේ දෙවිගේ ගෘහයට[2] ගෙන යා යුතු
රන්ද රිදීද භාජනද භාරගත්තෝය.

**31** අහාවා ගඟ[3] අසල රැස්ව සිටි
අප, යෙරුසලම බලා යන ගමන
ආරම්භ කළේ පළමු මාසයේ[4] දො-
ළොස්වන දිනයේදීය. අපගේ දෙවි
අපට රැකවරණය ලබා දුන් නිසා
අපට සතුරන්ගේ හිරිහැරවලින් හා
මංකොල්ලකරුවන්ගේ ප්‍රහාරවලින්
බේරීමට[5] හැකි විය. **32** යෙරුසල-
මට[6] පැමිණි අපි එහි දින තුනක් ගත
කළෙමු. **33** හතරවන දිනයේදී අපි
අපගේ දෙවිගේ ගෘහයට ගොස් රන්ද
රිදීද භාජනද[7] කිරා මැන,[8] පූජක උරි-
යාහ්ගේ පුත් මෙරේමොත්ටද[9] පිනෙ-
හාස්ගේ පුත් එලියාසර්ටද ලෙවීවරුන්
වූ යේෂුවාගේ පුත් යෝෂාබාද්ටද[10]
බින්නුයිගේ[11] පුත් නොවදියාටද භාර
දුන්නෙමු. **34** ඒ අවස්ථාවේදී භාර
දුන් සෑම දෙයක්ම ගණන් කර ඒවා-
යේ මුළු බරද ලේඛනගත කරන
ලදි. **35** ඉන්පසු වහල්කමින් නිද-
හස්ව[12] පැමිණි අය එකතු වී ඊශ්‍රා-
යෙල්හි දෙවිට දවන පූජා[13] ඔප්පු
කළෝය. ඒ සඳහා ඔවුහු මුළු ඊශ්‍රා-
යෙල් සෙනඟ වෙනුවෙන් ගවයන්[14]
දොළහක්ද බැටළුවන්[15] අනූහයක්ද
බැටළු පැටවුන් හැත්තෑහතක්ද පාප
පූජාවක් ලෙස එළුවන්[16] දොළහක්ද
ඔප්පු කළෝය. ඒ සියල්ල යෙහෝවා
දෙවිට දවන පූජාවක් ලෙස ඔවුහු
ඔප්පු කළෝය.

**36** ඉන්පසුව අප රජ්ජුරුවන් දුන්
නීති හා නියෝග[17] මහ ගඟෙන්
එගොඩ[18] රජ්ජුරුවන්ට සේවය කරන
දිසාපතීන්ට[19] හා ආණ්ඩුකාරයන්ට[20]
දුන් විට, ඔවුහු ඊශ්‍රායෙල් සෙනඟටත්
සැබෑ දෙවිගේ ගෘහයේ වැඩකටයුතුව-
ලටත් සහයෝගය[21] දැක්වූහ.

**8 පරි.**
1 2ලේක 15:2; ගීතා 73:27
2 යොෂු 23:16; ගීතා 21:9; ගීතා 90:11
3 ගීතා 33:16
4 ගීතා 33:17; හොෂෙ 1:7
5 නෙහෙ 9:1; එස්ත 4:16; ලූක් 2:37
6 යෙරෙ 29:12; යෙරෙ 50:4
7 ද්වි 4:29; 1ලේක 5:20; 2ලේක 7:14; මතෙ 7:7
8 එස්රා 8:18
9 එස්රා 8:19; නෙහෙ 12:21
10 එස්රා 7:15
11 එස්රා 7:14
12 එස්රා 7:16
13 එස්රා 7:19
14 1රාජා 16:24
15 ලෙවී 21:6; ලෙවී 21:8; යෙසා 52:11
16 ගණන් 4:16; 2ලේක 24:14
17 1ලේක 23:28; 1ලේක 28:12

**2 තීරුව**
1 එස්රා 7:19; එස්රා 8:33
2 ගීතා 122:9
3 එස්රා 8:15; එස්රා 8:21
4 නික් 12:2; එස්ත 3:7
5 ගීතා 34:19
6 එස්රා 7:8
7 2ලේක 36:18; එස්රා 7:19
8 එස්රා 8:29
9 නෙහෙ 3:4; නෙහෙ 3:21
10 නෙහෙ 8:7
11 නෙහෙ 12:8
12 ද්වි 30:3; 2ලේක 36:20
13 ලෙවී 1:3; 2ලේක 29:31
14 ලෙවී 1:5; එස්රා 7:17
15 ලෙවී 1:10
16 ලෙවී 22:19; එස්රා 6:17
17 එස්රා 7:21
18 උත් 15:18
19 ආනි 6:1
20 නෙහෙ 2:7; නෙහෙ 3:7
21 එස්රා 6:13

එස්රා **8:26*** නික් 25:39හි පාදසටහන බලන්න.

**9** මේ සියලු කාර්යයන් සම්පූර්ණ වූ
වහාම අධිපතීහු[1] මා ළඟට ඇවිත්
මෙසේ පැවසූහ. "ඊශ්‍රායෙල් ජනයාත්
පූජකයන් සහ ලෙවීවරුනුත් තව-
මත් අවට ජීවත් වන කානානිවරුන්,[2]
හිත්තීවරුන්,[3] පෙරිස්සිවරුන්,[4] යෙබූ-
සිවරුන්,[5] අම්මොන්වරුන්,[6] මෝ-
වබ්වරුන්,[7] ඊජිප්තුවරුන්[8] සහ
අමෝරිවරුන්[9] සමඟ නුසුදුසු සබඳතා
පවත්වනවා.[10] ඒ ජාතීන් කරන පිළි-
කුල් දේවල්ම[11] ඔවුනුත් කරනවා.
**2** ඔවුන් ඒ ජාතීන් අතරින් තමන්ටත්
තමන්ගේ පුතුන්ටත් භාර්යාවන් සො-
යාගෙන තියෙනවා.[12] ඒ නිසා අපේ
ශුද්ධ ජාතිය[13] ඒ ජාතීන් සමඟ මිශ්‍ර වී[14]
දූෂ්‍ය වෙලා. මේ ද්‍රෝහී ක්‍රියාවට මුල්
වී[15] සිටින්නේ අපේ අධිපතීන් සහ
නිලධාරීනුයි."

**3** මට මේ දේ ආරංචි වූ වහාම
මා තුළ මහත් කම්පනයක් ඇති
විය. එවිට මම මාගේ වස්ත්‍ර ඉරා-
ගෙන[16] මාගේ හිසකෙස්[17] සහ රැවුල්-
ගස් උගුලා දමා මහත් ශෝකයෙන්[18]
හිඳගෙන සිටියෙමි. **4** මම සවස්
වරුවේ ධාන්‍ය පූජාව[19] ඔප්පු කරන
අවස්ථාව පැමිණෙන තුරු එසේ හිඳ-
ගෙන සිටියෙමි. වහල්කමින් නිද-
හස් වී පැමිණි අයගේ ද්‍රෝහිකම්වලට
විරුද්ධව ඊශ්‍රායෙල්හි දෙවි පැවසූ දේ
නිසා බොහෝදෙනෙක් බියෙන් ගැහි-
ගැහී[20] මා ළඟට පැමිණියෝය.

**5** වස්ත්‍ර ඉරාගෙන ශෝකයෙන් බිම
හිඳගෙන සිටි මම සවස් වරුවේ ධාන්‍ය
පූජාව[21] ඔප්පු කරන අවස්ථාවේදී
නැඟිට්ටෙමි. ඉන්පසු මම දණ ගසා[22]
ස්වර්ගය දෙසට අත් ඔසවා යෙහෝවා
දෙවිට කන්නලව් කළෙමි.[23] **6** මා
දෙවිට පැවසුවේ[24] මෙයයි. "මාගේ දෙ-
වියනි, ඔබ දෙස බලන්නවත් බැරි
තරම් මහත් ලැජ්ජාවක්[25] මට දැනෙ-
නවා. දෙවියනි, අප කළ වැරදි[26] අපේ
හිසටත් ඉහළින් නැඟ, අහස උස-
ටම[27] ගොඩගැසී තිබෙනවා. **7** අපේ
මුතුන්මිත්තන්ගේ[28] කාලයේ සිට මේ
දක්වාම[29] අපි බරපතළ ලෙස වැරදි
කර තිබෙනවා. වෙනත් දේශවල රජ-
වරුන් අපිට විරුද්ධව යුද්ධ කර[1]
අපිව යටත් කරගත්තා. ඔවුන් අපේ
වස්තු සියල්ල කොල්ල කා[2] අපිව වහ-
ලුන්[3] හැටියට ගෙන ගියා. අද වන
තුරු අපි ඒ විදිහේ නින්දාවලට මුහුණ
දුන්නා.[4] අපිටත් අපේ රජවරුන්-
ටත්[5] අපේ පූජකයන්ටත්[6] මෙවැනි
දේවල් අත් විඳින්න සිදු වුණේ අපේම
වැරදි නිසයි. **8** යෙහෝවා, අපේ දෙ-
වියනි, අපි කාලයක් මේ විදිහට දුක්
වින්දා. ඒත් දැන් ඔබ අපිට අනු-
කම්පා කර,[7] සුළු මොහොතකට හරි
අපිට සහනයක් ලබා දුන්නා. අපෙන්
සුළු පිරිසකට නිදහස් වෙන්න[8] ඉඩ
සලසා දී ඔබේ ශුද්ධස්ථානයේ ස්ථිර
තැනක් අපිට ලබා දුන්නා. අපි කරන
වහල් මෙහෙකාරකම්වලින් අපිට යම්
සහනයක්[9] ලැබී තිබෙන නිසා අපේ
සිතට දැනෙන්නේ මහත් ප්‍රීතියක්.[10]
**9** ඇත්තටම අපි තවමත් සිටින්නේ
වහලුන්[11] ලෙසයි. නමුත් දෙවියනි,
ඔබ අපව අත්හැරියේ නැහැ.[12] පර්සියා-
වේ රජ්ජුරුවන්[13] අපිට හොඳින් සල-
කන්නේ ඔබ අපට පෙන්වන මහත්
කරුණාව* නිසයි. අපිට අපේ දේශයට
පැමිණ ඔබගේ ගෘහය නැවත ගොඩ-
නඟන්න[14] ලැබුණෙත් යූදා දේශයේ හා
යෙරුසලමේ පාළු තැන් ගොඩනඟා[15]
එහි සුරක්ෂිතව ජීවත් වෙන්න[16] ලැබු-
ණෙත් ඔබේ කරුණාව නිසයි.

**10** "නමුත් දැන් අපි ආයෙත් ඔබේ
අණපනත්[17] අත්හැර ගිහින්. අපේ දෙ-
වියනි, නිදහසට කියන්න අපට කිසිම
දෙයක් නැහැ. **11** ඔබේ සේවක-
යන් වන අනාගතවක්තෘවරුන් මාර්-
ගයෙන් ඔබ අපිට දුන් මේ ආඥා
අපිට හොඳින් මතකයි. 'ඔබ හිමි කර-
ගන්න යන දේශය දූෂිත තත්වයක[18]
පවතිනවා. එහි වැසියන්ගේ පිළිකුල්-
සහගත[19] හැසිරීම[20] දේශයේ අස්-

**9 පරි.**
**1** එස්රා 10:8; එස්රා 10:14
**2** උත් 10:19; ගණන් 13:29
**3** උත් 10:15; යොෂු 1:4
**4** යොෂු 11:3; යොෂු 17:15
**5** යොෂු 18:16
**6** උත් 19:38; ද්වි 23:3
**7** උත් 19:37
**8** ලෙවී 18:3
**9** උත් 15:16; විනි 11:22
**10** නික් 33:16; එස්රා 6:21; නෙහෙ 9:2
**11** ලෙවී 20:23; ද්වි 12:30; ද්වි 18:9
**12** නික් 34:16; එස්රා 10:44
**13** නික් 19:6; නික් 22:31; ද්වි 7:6
**14** නෙහෙ 13:3; 2කොරි 6:14
**15** 1පේතෘ 5:3
**16** යොෂු 7:6; 2රාජා 22:19
**17** නෙහෙ 13:25
**18** ගීතා 143:4
**19** නික් 29:41; දානි 9:21
**20** එස්රා 10:3
**21** ගණන් 28:5
**22** ගීතා 95:6; ලූක් 22:41; ක්‍රියා 21:5; එෆී 3:14
**23** නික් 9:29; ගීතා 143:6
**24** යාකො 5:16
**25** යෝබ් 40:4; දානි 9:7
**26** එස්රා 9:2; ගීතා 38:4; ගීතා 106:6; යෙසා 1:18; යෙසා 59:12
**27** ලූක් 15:21; එළි 18:5
**28** ගණන් 32:14; 2ලේක 29:6; ක්‍රියා 7:51
**29** විලා 5:7

**2 තීරුව**
**1** 2රාජා 10:32; 1ලේක 5:22; 2ලේක 36:17
**2** 2රාජා 17:20
**3** 2රාජා 17:23; 2රාජා 25:6
**4** දානි 9:7
**5** දානි 9:8
**6** නෙහෙ 9:32
**7** නෙහෙ 9:31
**8** යෙසා 1:9
**9** ගීතා 138:7; **10** ගීතා 13:3; **11** නෙහෙ 9:36; **12** ද්වි 30:1; **13** එස්රා 1:1; **14** එස්රා 6:14; සෙක 4:9; **15** 2ලේක 36:19; **16** යෙසා 5:2; යෙසා 5:5; **17** ලෙවී 27:34; ගණන් 36:13; **18** ලෙවී 18:24; ද්වි 12:31; **19** ලෙවී 18:3; ද්වි 18:9; **20** එස 36:25; 2කොරි 7:1.

එස්රා **9:9*** හෝ, "ලැදි ප්‍රේමය."

සක් මුල්ලක් නැර[1] දැකගත හැකියි.
**12** ඒ නිසා ඔබේ දූවරුන්ව ඔවුන්-
ගේ පුතුන්ටවත්[2] ඔවුන්ගේ දූවරුන්ව
ඔබේ පුතුන්ටවත් විවාහ කර දෙන්න
එපා. ඔබ කිසිදා ඒ ජාතීන්ගේ ශුභසිද්-
ධිය[3] තකා හෝ දියුණුව තකා හෝ
වැඩ නොකළ යුතුයි. ඔබ මට කීකරු
වුණොත් ඔබ බලවත් ජාතියක්[4] බවට
පත් වෙයි. දේශයේ හොඳම දේ භුක්ති
විඳින්නත් ඔබට පුළුවන් වෙයි. එවිට
ඔබටත් ඔබේ පුත්‍රයන්ටත් සදහටම
දේශය උරුම[5] කරගන්න ලැබෙන
බව නිසැකයි.’ **13** නමුත් අපේ දෙ-
වියනි, ඔබ කී දේට අපි අකීකරු
වුණා. අපි දඬුවම් ලැබුවේ ඒ නිසයි.
නමුත් අපි කළ වැරදි[6] හා සසඳද්දී අපි
ලැබූ දඬුවම කිසිත් නැති තරම්.[7]
වහල්කමින් නිදහස් වී පැමිණෙන්න
අපිට හැකි වුණේ ඒ නිසයි.[8] **14** ඔබ
මේ සෑම දෙයක්ම අප වෙනුවෙන් කළ
පසුත් පිළිකුල්සහගත දේවල් කරන[9]
අවට ජාතීන් සමඟ විවාහ ගිවිසුම්[10]
ඇති කරගෙන නැවත ඔබේ ආඥා
කඩ කිරීම මොන තරම් අපරාධයක්ද!
දෙවියනි, අපෙන් කිසිවෙක් ඉතුරු
නොවන ලෙස[11] අපිව විනාශ කර
දමන තරමටම ඔබ උදහස්[12] වෙන
බව නිසැකයි. **15** ඊශ්‍රායෙල්හි දෙවි
වන යෙහෝවා, ඔබ ධර්මිෂ්ඨ දෙවි
කෙනෙක්.[13] ඔබ අපිව වහල්කමින්
නිදහස් කළා. අද අපි ඔබ ඉදිරියට
පැමිණ සිටින්නේ වරදකරුවන් ලෙ-
සයි.[14] අපි ඔබට විරුද්ධව ලොකු වර-
දක් කර තිබෙනවා. අපිට නිදහසට
කියන්න කිසිවක් නැහැ.”[15]

**10** එස්රා සැබෑ දෙවිගේ ගෘහය
ඉදිරියේ[16] වැඳ වැටී[17] සිය-
ලුදෙනා කළ වැරදි ගැන හඬමින්[18]
දෙවිට යාච්ඤා[19] කළ පසු, ඊශ්‍රායෙල්-
වරුන් අතරේ සිටි පුරුෂයෝ, ස්ත්‍රීහු
හා දරුවෝ ඇතුළු විශාල පිරිසක්ද
හඬමින් ඔහු ළඟට පැමිණියෝය.
**2** ඒ අවස්ථාවේදී ඒලාම්ගේ පුතුන්-
ගෙන්[20] පැවත ආ යෙහීයෙල්ගේ[21]
පුත් ෂෙකනියා එස්රාට මෙසේ පැව-
සිය. “අවට දේශවල සිටින ස්ත්‍රීන්ව
විවාහ කරගෙන අපේ දෙවිට විරුද්ධව
අපි මහත් ද්‍රෝහිකමක් කළා.[1] නමුත්
අපි බලාපොරොත්තු අත්හැරිය යුතු
නැහැ. ඊශ්‍රායෙල්වරුන් වන අපිට මේ
සම්බන්ධයෙන් යමක් කරන්න පුළු-
වන්.[2] **3** අපි යෙහෝවා දෙවිගේ මඟ
පෙන්වීම්වලට කීකරු වෙන්න කැම-
තියි. අපේ දෙවිගේ ආඥාවලට[3] ගරු
කරන[4] අයගේ උපදෙස් අපි පිළිගන්-
නවා. ඒ නිසා අපි විවාහ කරගත් ඒ
විදේශීය භාර්යාවන්ව හා ඔවුන්ගෙන්
උපන් දරුවන්ව පිටත් කර යවන[5]
බවට දෙවිට පොරොන්දු වෙන්න
කැමතියි. ඒ සඳහා අපි දෙවි සමඟ
ගිවිසුමක්[6] ඇති කරගෙන, දෙවිගේ
නීතියේ සඳහන් ආකාරයටම[7] කරමු.
**4** ඔබ මේ සම්බන්ධයෙන් මූලිකත්-
වය ගෙන කටයුතු කරන්න. අපි
ඔබට සම්පූර්ණ සහයෝගය දෙනවා.
දැන් නැඟිට, කිසි දෙයකට භය වෙන්-
නේ නැතුව අවශ්‍ය පියවර ගන්න.”
**5** එවිට එස්රා නැඟිට නායක
පූජකයන්ව, ලෙවීවරුන්ව සහ සිය-
ලුම ඊශ්‍රායෙල්වරුන්ව රැස් කරගෙන
ඒ ගිවිසුමට ඔවුන්ව කැමති කරවා-
ගත්තේය. සෑම කෙනෙක්ම අවශ්‍ය
පියවර ගන්නා බවට දිවුරුම්[8] දී පො-
රොන්දු වූහ. **6** ඉන්පසු එස්රා සැබෑ
දෙවිගේ ගෘහයේ එලියාෂිබ්ගේ පුත්
යෙහෝහානන් භාරයේ තිබූ භෝජන
ශාලාවට[9] ගියේය. එස්රා එහි ගියත්
වහල්කමින් නිදහස් වූ සෙනඟ කළ
වැරදි ගැන ශෝක වෙමින් සිටි නිසා[10]
ඔහු ආහාර ගත්තේවත්[11] වතුර බිව්-
වේවත් නැත.
**7** ඉන්පසුව යෙරුසලමේ හා යූදා
දේශයේ සිටි සියලුදෙනාටම[12] යෙරුස-
ලම් නුවරට රැස් වෙන්න කියා පණිවි-
ඩයක් යවන ලදි. **8** අධිපතීන්[13] සහ
වැඩිමහල්ලන් කී ලෙස දවස් තුනක්
ඇතුළත යෙරුසලමට නොපැමිණෙන
අයට[14] දඬුවම් කිරීමට ඔවුහු තීර-
ණය කළෝය. එවැනි අයගේ බඩු
බාහිරාදිය පවරාගැනීමටත්[15] වහල්ක-
මින් නිදහස් කළ සෙනඟ අතරින්

**9 පරි.**
**1** 2රාජා 21:16
**2** නික් 23:32
නික් 34:16
ද්වි 7:3
යොෂු 23:12
**3** ද්වි 23:6
2ලේක 19:2
**4** ද්වි 6:2
**5** උත් 18:19
ගීතා 112:2
හිතෝ 13:22
හිතෝ 20:7
**6** නෙහෙ 9:32
**7** ගීතා 103:10
විලා 3:22
විලා 3:39
**8** ගීතා 106:46
**9** එස්රා 9:1
**10** නෙහෙ 13:23
**11** ද්වි 32:26
යෙසා 1:9
එස 6:8
**12** ද්වි 9:8
රෝම 2:5
**13** නෙහෙ 9:33
ගීතා 96:13
දානි 9:7
**14** රෝම 3:19
**15** ගීතා 130:3
ගීතා 143:2

**10 පරි.**
**16** 1රාජා 8:30
2ලේක 20:9
**17** ද්වි 9:18
**18** ලෙවී 26:40
ගීතා 32:5
හිතෝ 28:13
**19** එස්රා 9:6
**20** එස්රා 2:7
නෙහෙ 10:14
**21** එස්රා 10:26

**2 තීරුව**
**1** එස්රා 9:2
**2** යෙරෙ 3:12
**3** යොෂු 23:12
යොෂු 23:13
2ලේක 34:21
**4** එස්රා 9:4
ගීතා 119:59
යෙසා 66:2
**5** යෙසා 55:7
**6** 2රාජා 11:17
2ලේක 29:10
2ලේක 34:31
**7** නෙහෙ 8:14
ක්‍රියා 7:53
**8** නෙහෙ 10:29
**9** එස්රා 8:29
**10** එස්රා 9:4
දානි 9:3
**11** ද්වි 9:18
**12** ද්වි 30:3
2ලේක 36:20
**13** එස්රා 9:1
**14** 1සාමු 11:7
**15** ලෙවී 27:28
යොෂු 6:18

ඔවුන්ව පිටමං කිරීමටත්[1] තීරණය
කරන ලදි. **9** මේ අනුව යූදා සහ
බෙන්ජමින් යන ගෝත්‍රවලට අයත්
සියලුදෙනා දවස් තුනක් ඇතුළත යෙ-
රුසලමට එක් රොක් වූහ. ඔවුන් එසේ
රැස් වුණේ නවවන මාසයේ[2] විසිව-
නදාය. සැබෑ දෙවිගේ ගෘහය අවට
එළිමහනේ හිඳගෙන සිටි ඔවුහු, ඇද
හැළුණු වර්ෂාව[3] නිසා සීතලෙන් ගැහි-
ගැහී සිටියෝය. ඒ අවස්ථාවේ බැරෑ-
රුම්කම නිසා ඔවුන්ට මහත් භයක්ද
දැනිණ.

**10** ටික වේලාවක් ගත වූ පසු පූජක
එස්රා නැඟිට, රැස් වූ සෙනඟට මෙසේ
පැවසීය. “ඔබ දෙවිට අවිශ්වාසවන්-
තව කටයුතු කර තිබෙනවා. ඔබ
විදේශ ස්ත්‍රීන්ව[4] විවාහ කරගෙන ඊශ්‍රා-
යෙල් සෙනඟගේ පාප තවත් වැඩි
කළා.[5] **11** ඒ නිසා ඔබේ මුතුන්මිත්-
තන්ගේ දෙවි වන යෙහෝවා ඉදිරියේ
ඔබේ වරද පිළිගෙන,[6] දෙවි සතුටු වන
දේ[7] කරන්න. අවට ජාතීන්ගෙන් හා
ඔබේ විදේශීය භාර්යාවන්ගෙන්[8] වෙන්
වී ඔබේ වරද හදාගන්න.” **12** ඊට
පිළිතුරු වශයෙන් රැස්ව සිටි සිය-
ලුදෙනා මහත් හඬින් මෙසේ පැව-
සූහ. “ඔබ පවසන දේ කරන්න අපි
කැමතියි. අපි ඒ දේ කළ යුතුමයි.[9]
**13** නමුත් මෙහෙ විශාල සෙනඟක්
රැස් වී සිටිනවා. දැන් වැහි කාලය
නිසා අපිට එළිමහනේ සිටින්න හරිම
අමාරුයි. ඒ විතරක් නෙවෙයි, මේ
වරද දවසකින් දෙකකින් හරිගස්සන්න
බැහැ. මොකද අපි කළ වරද සුළුපටු
එකක් නෙවෙයි. **14** ඒ නිසා අපි සෙ-
නඟගේ පහසුව වෙනුවෙන් මෙහෙම
කරමු. විදේශීය ස්ත්‍රීන්ව විවාහ කර-
ගත් සියලුදෙනා නියමිත වේලාවක්
යොදාගෙන තම තමන්ගේ නුවරවල
සිටින වැඩිමහල්ලන් සහ විනිශ්චයක-
රුවන් සමඟ මෙහි පැමිණිය යුතුයි.
ඉන්පසුව අධිපතීන්ට[10] පුළුවන් මුළු
සෙනඟව නියෝජනය කරමින් ඒ සම්-
බන්ධයෙන් පියවර ගන්න. එවිට දෙවි-
ගේ ඇවෙන උදහස නිවී යයි.”

**15** (නමුත් අසහෙල්ගේ පුත් යො-
නාතාන් හා තික්වාගේ පුත් යාෂෙයා
මෙම වැඩපිළිවෙළට විරෝධය පෑ[1]
අතර ලෙවීවරුන් වූ මෙෂුල්ලම් සහ
ෂබ්බෙතයි[2] ඔවුන්ගේ පැත්ත ගත්-
තෝය.) **16** වහල්කමින් නිදහස් වී
පැමිණි[3] සියලුදෙනා මෙම යෝජනා-
වට එකඟව ක්‍රියා කළෝය. මේ ගැන
විභාග කිරීම[4] සඳහා පූජක එස්රාද
පෙළපත් වාර්තාවල නම් වශයෙන්
සඳහන් වූ පෙළපත්වල ප්‍රධානීහුද[5]
දහවන මාසයේ[6] පළමුවන දින රැස්
වූහ. **17** පළමුවන මාසයේ පළමුවන
දිනය වන විට, විදේශීය[7] ස්ත්‍රීන්ව
විවාහ කරගත් සියලු පුරුෂයන් ගැන
තීන්දුවක් දී අවසන් කර තිබිණ.
**18** විදේශීය ස්ත්‍රීන්ව විවාහ කරගත්
අය අතර පූජකයන්ගේ පුත්‍රයන්[8] කිහි-
පදෙනෙකුත් සිටි බව හෙළි විය. ඔවුන්
අතරේ යෙහෝෂාදාක්ගේ[9] පුත් යේෂු-
වාගේ[10] පුත්‍රයෝ සහ ඔහුගේ සහෝද-
රයන් වූ මයසේයා, එලියේසර්, යාරිබ්
සහ ගෙදලියා සිටියෝය. **19** ඔවුහු
තම භාර්යාවන්ව පිටත් කර යවන
බවට අතට අත දී පොරොන්දු වූ අතර
එක් එක් කෙනා තම වරද[11] වෙනුවෙන්
බැටළුවෙකු[12] බැගින් පූජා කළෝය.

**20** මීට අමතරව ඉම්මේර්ගේ[13]
පුතුන් අතරින් හනානි සහ සෙබදියා
සිටියෝය. **21** හාරිම්ගේ[14] පුතුන්
අතරින් මයසේයා, එලියා, ෂෙමායා,
යෙහීයෙල් සහ උසියා සිටියෝය.
**22** පෂ්හූර්ගේ පුතුන්[15] අතරින් එලි-
යෝනේයයි, මයසේයා, ඉෂ්මායෙල්,
නෙතනෙල්, යෝෂාබාද් සහ එලෙ-
යාසා සිටියෝය. **23** ලෙවීවරුන්
අතරින් යෝෂාබාද්, ෂිමෙයි, කේලායා
(එනම්, කෙලීටා), පෙතහියා, යූදා සහ
එලියේසර් සිටියෝය. **24** ගායකයන්
අතරින් එලියාෂිබ් සිටියේය. දොරටු
පාලකයන් අතරින් ෂල්ලුම්, ටෙලෙම්
සහ උරී සිටියෝය.

**25** ඊශ්‍රායෙල් ජනයා අතරින්
පාරොෂ්ගේ පුතුන් වූ[16] රමියා, ඉෂ්-
ෂියා, මල්කියා, මියමින්, එලියාසර්,
මල්කියා සහ බෙනායා සිටියෝය.
**26** ඒලාම්ගේ පුතුන්[17] අතරින් මත්ත-

**10 පරි.**
1 එස්රා 7:26
2 යෙරෙ 36:22
3 දේශ 1:7
4 නෙහෙ 13:23
5 ගණන් 32:14
6 ලෙවී 26:40; යොෂු 7:19; ගීතා 32:5; හිතෝ 28:13
7 යෙසා 56:1; කොලො 1:10; හෙබ්‍රෙ 13:21
8 ද්වි 7:3; නෙහෙ 13:3; 2කොරි 6:17
9 දේශ 5:4
10 2සාමු 3:38; එස්රා 9:1; එස්රා 10:8

**2 තීරුව**
1 ක්‍රියා 5:39; ක්‍රියා 7:51
2 නෙහෙ 8:7; නෙහෙ 11:16
3 එස්රා 10:7
4 යොහ 7:51
5 එස්රා 8:1
6 එස්ත 2:16
7 එස්රා 10:11
8 එස්රා 9:2; නෙහෙ 13:28; එස 44:22; මලා 2:8
9 1ලේක 6:14
10 එස්රා 2:2; එස්රා 3:2; නෙහෙ 7:7; සෙක 6:11
11 ලෙවී 5:17; ලෙවී 6:4
12 ලෙවී 5:18; ලෙවී 6:6
13 1ලේක 24:14; එස්රා 2:37
14 1ලේක 24:8; එස්රා 2:39
15 එස්රා 2:38
16 එස්රා 2:3; නෙහෙ 3:25; නෙහෙ 10:14
17 එස්රා 2:7; එස්රා 8:7; නෙහෙ 10:14

නියා, සෙකරියා, යෙහීයෙල්,[1] අබ්දී,
යෙරෙමොත් සහ එලියා සිටියෝය.
**27** සත්තුගේ පුතුන්[2] අතරින් එලි-
යෝනේයයි, එලියාෂිබ්, මත්තනියා,
යෙරෙමොත්, සාබාද් සහ අසීසා සිටි-
යෝය. **28** බෙබායිගේ පුතුන්[3] අත-
රින් යෙහෝහානන්, හනනියා, සබ්බයි
සහ අත්ලයි සිටියෝය. **29** බානි-
ගේ පුතුන් අතරින් මෙෂුල්ලම්, මල්-
ලූක්, අදායා, යාෂුබ්, ෂෙයාල් සහ
යෙරෙමොත් සිටියෝය. **30** පාහත්-
මෝවබ්ගේ[4] පුතුන් අතරින් අද්නා,
චෙලාල්, බෙනායා, මයසේයා, මත්-
තනියා, බෙසලෙල්, බින්නුයි සහ
මනස්සේ සිටියෝය. **31** හාරිම්ගේ
පුතුන්[5] අතරින් එලියේසර්, ඉෂ්ෂියාහ්,
මල්කියා,[6] ෂෙමායා, ෂිමෙයොන්,
**32** බෙන්ජමින්, මල්ලූක් සහ ෂෙමරියා
සිටියෝය. **33** හාෂුම්ගේ පුතුන්[7]
අතරින් මත්තෙනයි, මත්තත්තා,
සාබාද්, එලිෆෙලෙත්, යෙරෙමයි,
මනස්සේ සහ ෂිමෙයි සිටියෝය.
**34** බානිගේ පුතුන් අතරින් මය-
දයි, අම්රාම්, ඌයෙල්, **35** බෙ-
නායා, බෙදේයා, කෙලූහයි,
**36** වනියා, මෙරේමොත්, එලියාෂිබ්,
**37** මත්තනියා, මත්තෙනයි සහ
යයසූ සිටියෝය. **38** බින්නුයිගේ
පුතුන් අතරින් ෂිමෙයි, **39** ෂෙලෙ-
මියා, නාතන්, අදායා, **40** මක්න-
දෙබයි, ෂාෂයි, ෂාරයි, **41** අෂරෙල්,
ෂෙලෙමියා, ෂෙමරියා, **42** ෂල්ලුම්,
අමරියා සහ යෝසෙප් සිටියෝය.
**43** නෙබෝගේ පුතුන් අතරින් යෙයී-
යෙල්, මත්තිතියා, සාබාද්, සෙබිනා,
යද්දයි, යෝවෙල් සහ බෙනායා සිටි-
යෝය. **44** විදේශීය ස්ත්‍රීන්[1] විවාහ
කරගෙන සිටි ඔවුහු සියලුදෙනා තම
භාර්යාවන්ව හා පුතුන්ව පිටත් කර
යැවූහ.

**10 පරි.**
1 එස්රා 10:2
2 එස්රා 2:8 නෙහෙ 10:14
3 එස්රා 2:11 එස්රා 8:11
4 එස්රා 2:6 නෙහෙ 3:11 නෙහෙ 10:14
5 එස්රා 2:32
6 නෙහෙ 3:11
7 එස්රා 2:19 නෙහෙ 8:4 නෙහෙ 10:18

**2 තීරුව**
1 ද්වි 7:3 එස්රා 10:17 2කොරි 6:14

# නෙහෙමියා*

**1** හකලියාගේ පුත් නෙහෙමියා[1]
ලියූ වාර්තාව මෙයයි. මම විසි-
වන[2] අවුරුද්දේ කිස්ලෙව්[3] මාස-
යේ ෂූෂන්[4] මාලිගාවේ සිටියෙමි.
**2** යූදා දේශයේ සිට පැමිණි මගේ
සහෝදරයෙක් වූ හනානි[5] තවත්
වැඩිමහල්ලන් කිහිපදෙනෙකු සමඟ
මාව හමු වීමට මාලිගාවට පැමිණි-
යේය. වහල්භාවයෙන්[6] නිදහස්[7] වී
නැවත යූදා දේශයට ගිය යුදෙව්-
වන්[8] ගැනත් යෙරුසලමෙහි පැවති
තත්වය ගැනත් මම ඔවුන්ගෙන්
විමසුවෙමි.[9] **3** ඔවුන් මට පිළිතුරු
දුන්නේ මෙසේය. "වහල්කමින් නිද-
හස් වී යූදා පළාතට[10] ගොස් පදිංචිව
සිටින අය සිටින්නේ ඉතා අසරණ
තත්වයකයි.[11] අවට සිටින සියලුදෙ-
නාගේ නින්දා අපහාසවලට[1] ලක්
වෙන්නත් ඔවුන්ට සිදු වෙලා. ඒ විත-
රක් නෙවෙයි, යෙරුසලමේ පවුරු[2]
කඩා දමා එහි දොරටුත්[3] ගින්නෙන්
පුලුස්සා තියෙනවා."
**4** ඒ වචන ඇසූ විට මා තුළ දැඩි
ශෝකයක් ඇති විය. මම ඒ ගැන
සිතමින් දවස් ගණනාවක් යන තුරු
හිඳගෙන අඬමින් සිටියෙමි. ඒ කාලය
පුරා නිරාහාරව[4] සිටි මම ස්වර්ගයේ
වෙසෙන දෙවිට යාච්ඤා කරමින්ද
සිටියෙමි.[5] **5** මා දෙවිට පැවසුවේ
මෙයයි. "ස්වර්ගයේ සිටින යෙහෝවා
දෙවියනි, ඔබ ඉතා ශ්‍රේෂ්ඨ වූ ගරුබිය
ලැබීමට වටිනා දෙවි කෙනෙක්.[6]
ඔබට ප්‍රේම කරමින් ඔබේ ආඥාවලට

නෙහෙ නම* තේරුම, "යෙහෝවා දෙවි සැනසීම ගෙන දෙයි."

**1 පරි.**
1 නෙහෙ 1:11 නෙහෙ 5:14 නෙහෙ 10:1
2 නෙහෙ 2:1
3 එස්රා 10:9 යෙරෙ 36:22
4 එස්රා 4:9 එස්ත 1:2 එස්ත 3:15 දානි 8:2
5 නෙහෙ 7:2
6 එස්රා 8:35 යෙරෙ 52:30
7 එස්රා 9:8 එස 6:9
8 එස්රා 4:12 එස්රා 6:7
9 ගීතා 137:5
10 එස්රා 5:8
11 නෙහෙ 9:37

**2 තීරුව**
1 1රාජා 9:7 ගීතා 79:4
2 2රාජා 25:10 නෙහෙ 2:17 යෙසා 5:5

**3** යෙරෙ 14:2; විලා 1:4; **4** 2ලේක 20:3; එස්රා 8:21; ගීතා 69:10; **5** එස්රා 5:11; නෙහෙ 2:4; ගීතා 115:16; **6** ද්වි 10:17; ගීතා 47:2; දානි 9:4.

කීකරු වන අයට[1] ඔබ නොඅඩුව ප්‍රේ-
මය* පෙන්වනවා.[2] ඔබ ඔවුන් සමඟ
කළ ගිවිසුම් කිසිදා කඩ කරන්-
නේ නැහැ.[3] **6** අනේ දෙවියනි, ඔබේ
දෑස් යොමා මා දෙස බලන්න. ඔබේ
සේවකයා වන මා දිවා රෑ දෙ-
කේම[4] ඔබේ සෙනඟ වන ඊශ්‍රායෙල්ව-
රුන් ගැන කරන යාච්ඤාවලට සවන්
දෙන්න.[5] ඊශ්‍රායෙල්වරුන් වන අපි
ඔබට විරුද්ධව පව් කළා.[6] මගේ පියා-
ගේ පෙළපතට අයත් සියලුදෙනා
මෙන්ම මමත් ඔබට විරුද්ධව පව්
කළා.[7] **7** අපි ඔබට විරුද්ධව කළ
දූෂිත දේවලට නිමක් නැහැ.[8] ඔබේ
සේවකයා වූ මෝසෙස්[9] මාර්ගයෙන්
ඔබ අපට කියා දුන් අණපනත්[10] සහ
නීතිරීතිවලටත්[11] ඔබගේ තීන්දුවල-
ටත්[12] අපි අකීකරු වුණා.

**8** "දෙවියනි, මා ඔබෙන් බැගෑ-
පත්ව ඉල්ලා සිටින්නේ ඔබේ සේ-
වකයා වූ මෝසෙස්ට ඔබ පැවසූ
වචන සිහි කරන්න[13] කියායි. ඔබ
ඔහුට පැවසුවේ මෙයයි. 'ඔබ මට
ද්‍රෝහී වී කටයුතු කළොත් මම ඔබව
ජාතීන් අතරට විසුරුවාහරිනවා.[14]
**9** නමුත් මාගේ සෙනඟ වන ඔබ,
මා වෙතට හැරී[15] මාගේ අණපනත්
සිහි කර ඒවා පිළිපදිනවා නම්[16]
ඔබ පොළොවේ ඈත කෙළවරක
විසිරී සිටියත් මම ඔබව නැවත
එක් රැස් කර[17] මාගේ නාමය දැරීම
සඳහා මා තෝරාගන්නා ස්ථානය
වෙතට[18] ගෙන යනවා.'[19] **10** ඊශ්‍රා-
යෙල්වරුන් ඔබේ සෙනඟ[20] වගේම
ඔබේ සේවකයන්.[21] ඔබේ අතිමහත්
බලයෙන්[22] ඔබ නිදහස් කරගෙන
ආවේ ඔවුන්වයි. **11** යෙහෝවා දෙ-
වියනි, ඔබේ සේවකයා වන මාගේ
යාච්ඤාවට සවන් දෙන්න.[23] ඔබේ
නාමයට ගරුබිය දැක්වීමෙන්[24] මහත්
ප්‍රීතියක් ලබන ඔබේ අනික් සේවක-
යන්ගේ යාච්ඤාවලටත් ඇහුම්කන්
දෙන්න. ඔබේ සෙනඟ වෙනුවෙන්
ඔබේ සේවකයා වන මා ගන්නා පියා-
වරවලට ආශීර්වාද කරන්න.[1] එසේම
රජුගෙන් කරුණාව ලබන්නත් මට
උදව් කරන්න[2] කියා මා ඔබෙන්
බැගෑපත්ව ඉල්ලා සිටිනවා."

ඒ වන විට මා සේවය කරමින් සිටි-
යේ රජ්ජුරුවන්ගේ කුසලාන දරන්නා[3]
ලෙසය.

**2** අර්තක්ෂස්තා[4] රජ්ජුරුවන්ගේ
පාලන සමයේ විසිවන[5] අවු-
රුද්දේ නීසාන්[6] මාසයේ එක්තරා
දිනයකදී, රජ්ජුරුවන්ට වයින් බීමට
ආශාවක් ඇති විය. මමද සුපුරුදු පරිදි
වයින් රැගෙන ගොස් එතුමාට පිළි-
ගැන්වූවෙමි.[7] නමුත් එදින මා ඔහු
වෙත ගියේ මහත් දුකකිනි. මින් පෙර
කිසිදාක මම එසේ ඔහු ඉදිරියට ගොස්
නැත.[8] **2** මාගේ වෙනස දුටු රජ මට
මෙසේ පැවසීය. "ඔබට අසනීපයක්
නැති බව නම් මම දන්නවා. ඒත් ඇයි
ඔබ දුකින් සිටින්නේ?[9] මොනවා හරි
ප්‍රශ්නයක්ද? නැත්නම් යම් කාරණා-
යක් නිසා ඔබ කලකිරී සිටිනවාද?"[10]
ඒ වචන ඇසූ මා තුළ ඇති වූයේ ඉම-
හත් බියකි.

**3** මම රජ්ජුරුවන්ට මෙසේ පැවසු-
වෙමි. "රජ්ජුරුවනි, ඔබ සදහටම
ජීවත් වේවා![11] මා දුකින් සිටින්නේ
මාගේ මුතුන්මිත්තන් සැතපී සිටින[12]
නුවරට[13] සිදු වී ඇති දේ නිසයි. එය
විනාශ වෙලා. එහි දොරටු ගින්-
නෙන් පිලිස්සී ගිහින්."[14] **4** රජ මට
මෙසේ පිළිතුරු දුන්නේය. "ඉතින්
ඔබට මගෙන් මොනවාද කෙරෙන්න
ඕනේ?"[15] ඒ මොහොතේම මම ස්වර්-
ගයේ සිටින දෙවිට[16] යාච්ඤා කර,[17]
**5** රජ්ජුරුවන්ට මෙසේ කීවෙමි. "අව-
සරයි රජතුමනි, මට ඔබතුමාගේ
කරුණාව ලැබේවා![18] මාගේ මුතුන්-
මිත්තන් සැතපී සිටින නුවර පිහිටා
ඇති යූදා පළාතට යන්න මට අවසර
දෙනවාද? ඔබ මට අවසර දුන්-
නොත්[19] මට පුළුවන් එහි ගොස්

**1 පරි.**
**1** 1යොහ 5:3
**2** නික් 20:6
**3** ද්වි 7:9
**4** ගීතා 88:1; ලූක් 18:7
**5** 2ලේක 6:40; 2ලේක 7:15; ගීතා 86:6; ගීතා 130:2
**6** එස්රා 9:6; විලා 3:39
**7** 2ලේක 29:6; ගීතා 32:5; හිතෝ 28:13; එෆී 2:3
**8** නෙහෙ 9:34; ගීතා 106:6; ශෙප 3:7
**9** ද්වි 4:5
**10** ලෙවී 27:34; ගණන් 36:13; ගීතා 119:4
**11** ද්වි 12:1
**12** ද්වි 4:1
**13** ගීතා 119:49; ලූක් 1:72
**14** ලෙවී 26:33; ද්වි 4:27; ද්වි 28:64
**15** ද්වි 4:29
**16** ද්වි 30:2; යෙරෙ 29:13
**17** ද්වි 30:4; ගීතා 106:47; යෙසා 11:12; යෙරෙ 12:15
**18** ද්වි 12:5; ගීතා 132:13
**19** යෙරෙ 3:14
**20** ද්වි 9:29
**21** ලෙවී 25:42
**22** ද්වි 5:15; ද්වි 7:8; ද්වි 9:26; ද්වි 15:15
**23** හිතෝ 15:8; හිතෝ 15:29; යාකො 5:16
**24** යෙසා 26:8

**2 තීරුව**
**1** එස්රා 7:6; ගීතා 118:25
**2** 1රාජා 8:50; ගීතා 106:46; හිතෝ 21:1
**3** නෙහෙ 2:1

**2 පරි.**
**4** එස්රා 7:1; නෙහෙ 13:6
**5** නෙහෙ 1:1
**6** නික් 12:2; එස්ත 3:7
**7** නෙහෙ 1:11
**8** එස්ත 4:2
**9** උත් 40:7
**10** හිතෝ 15:13

**11** 1රාජා 1:31; දානි 2:4; **12** නෙහෙ 3:16; **13** නෙහෙ 1:3; ගීතා 137:5; **14** නෙහෙ 1:3; **15** එස්ත 5:3; එස්ත 7:2; **16** එස්රා 5:11; **17** 1සාමු 1:13; හිතෝ 3:6; පිලි 4:6; **18** එස්ත 7:3; හිතෝ 3:4; **19** එස්රා 5:17; එස්ත 1:19.

නෙහෙ **1:5*** හෝ, "ළැදි ප්‍රේමය."

ඒ නුවර නැවත ගොඩනඟන්න.”[1]
6 ඒ අවස්ථාවේදී රජ්ජුරුවන් සමඟ
රැජිනද සිටියාය. රජ මාගෙන් මෙසේ
ඇසීය. “මම ඔබට අවසර දුන්නොත්
ඔබට ඒ ගමන යන්න කොතරම්
කාලයක් ගත වෙයිද? නැවත ඔබට
මෙහි පැමිණිය හැක්කේ කවදාද?” මා
ඔහුට ඒ තොරතුරු පැහැදිලි කළ විට[2]
රජ මට යන්න අවසර දුන්නේය.[3]
7 මම රජ්ජුරුවන්ට තවදුරටත්
මෙසේ පැවසුවෙමි. “රජතුමනි, මහ
ගඟෙන්*[4] එගොඩ සිටින ආණ්ඩුකාර-
යන්ට[5] පෙන්වන්න මට ලිපි[6] කිහිප-
යක් ලබා දීම නුවණට හුරු දෙයක්
කියා ඔබතුමාට පෙනේ නම් ඒ දේ
ලබා දෙන ලෙසද මම බැගෑපත්ව
ඔබෙන් ඉල්ලා සිටිනවා. එවිට ඒ ලිපි
පෙන්වා යූදා පළාතට යන්න මට
අවසර ලබාගත හැකි වෙයි. 8 ඒ
වගේම දේවමාලිගාවේ[7] බලකොටු-
වේ*[8] දොරටු සඳහාත් නුවරේ පවුරු[9]
සඳහාත් මට පදිංචි වීමට නිවසක්
තැනීම සඳහාත් යම් දැව ප්‍රමාණයක්
අවශ්‍යයි. ඔබතුමාට අයිති වනාන්ත-
රයේ භාරකරු වන ආසාෆ්ට ඒ ගැන
සඳහන් කර ලිපියක් පිළියෙල කර
දෙන මෙන්ද මම ඔබෙන් ඉල්ලා සිටි-
නවා.” මට දෙවිගේ ආශීර්වාද ලැබුණු
නිසා රජ මට මේ සියල්ල සඳහා අව-
සර දුන්නේය.[10]
9 මා සමඟ ඒ ගමන යෑම සඳහා
හමුදාපතීන් හා අසරුවන් කිහිපදෙ-
නෙකුව රජ මට ලබා දුන්නේය. දින
කිහිපයකින් පසු මම මහ ගඟෙන්
එගොඩ සිටි ආණ්ඩුකාරයන්ව[11] හමු
වී, රජ්ජුරුවන් සකස් කළ ලිපි
ඔවුන්ට ලබා දුන්නෙමි. 10 යම්
කෙනෙක් ඊශ්‍රායෙල්වරුන්ට උදව්
කරන්න පැමිණ සිටි බව හෝරොන්හි
වැසියෙකු[12] වූ සන්බලට්ට[13] සහ අම්-
මොන් ජාතික[14] නිලධාරියෙකු වූ
ටොබියාට[15] ආරංචි වූ විට ඔවුහු කල-
බල වූහ.[16]
11 කල් යත්ම යෙරුසලමට
පැමිණි මම එහි දින තුනක් ගත
කළෙමි. 12 ඉන්පසුව මම රාත්‍රියේ
නැඟිට මිනිසුන් කිහිපදෙනෙකු සමඟ
එළිමහනට ගියෙමි. එහෙත් යෙරුස-
ලම[1] වෙනුවෙන් කළ යුතු දේ ගැන
මාගේ දෙවි මට දුන් මහ පෙන්වීම් මම
කිසිවෙකුටවත් පැවසුවේ නැත.[2] ඒ
අවස්ථාවේදී මා නැඟ ගිය බූරුවාව
මිස වෙන කිසි සතෙකුව අපි රැගෙන
ගියේ නැත. 13 මම යෙරුසලමෙහි
පවුරු[3] වටා ගොස් ඒවා කැඩී බිඳී තිබූ
ස්ථානත් ගින්නෙන් විනාශ වී තිබූ
එහි දොරටුත්[4] සෝදිසි කර බැලු-
වෙමි. ඒ සඳහා මම නිම්න දොරටු-
වෙන්[5] පිටත්ව ගොස් මහ සර්ප
පොකුණත්* කසළ දොරටුවත්#[6] පසු
කරගෙන ගියෙමි. 14 මම උල්පත්
දොරටුව[7] ළඟටත් රාජකීය පොකුණ
ළඟටත් ගියෙමි. එහෙත් මා නැඟ
ගිය බූරුවාට එතැනින් එහාට යන්න
තරම් එහි ඉඩ තිබුණේ නැත. 15 ඒ
රාත්‍රියේ මම නිම්නය[8] හරහා යමින්
පවුරුද සෝදිසි කර බැලුවෙමි. ඒ
කාර්යය නිම කළායින් පසු මම
නිම්න දොරටුවෙන්[9] නැවත නුවරට
ඇතුල් වුණෙමි.
16 මා ගියේ කොතැනකටද කියා-
වත් මා කළේ කුමක්ද කියාවත් එහි
පත් කරනු ලැබූ නිලධාරීහු[10] දැන
සිටියේ නැත. යුදෙව්වන්ටවත් පූජක-
යන්ටවත් වංශවත් අයටවත් නිල-
ධාරීන්ටවත් මම ඒ ගැන කිසිවක්
පවසා තිබුණේ නැත. 17 අන්ති-
මේදී මම ඔවුන්ට මෙසේ පැවසුවෙමි.
“අප කොතරම් අසරණව සිටිනවාද
කියා ඔබ සියලුදෙනා හොඳින් දන්-
නවා. බලන්න, යෙරුසලම විනාශ
වී තිබෙන ආකාරය! එහි දොරටු
පවා ගින්නෙන් පුලුස්සලා. එය අපිට
මොන තරම් නින්දාවක්ද![11] අපි මේ
ගැන මොනවා හරි කළ යුතුයි.

---

නෙහෙ **2:7*** එස්රා 4:9හි පාදසටහන බලන්න. **8*** මෙය නැවත ගොඩනඟනු ලැබූ දේවමාලිගාවට උතුරින් පිහිටා තිබිණ.

නෙහෙ **2:13*** මෙය ඒන්-රොගෙල් කියා හැඳින්වූ දිය උල්පත විය හැකියි. **13#** සෙප්ටුඅජින්ට් සහ ලතින් වල්ගේට් පරිවර්තනවල, “ගොම දොරටුව” ලෙස සඳහන් වේ.

---

**2 පරි.**
1 දානි 9:25
2 නෙහෙ 5:14, නෙහෙ 13:6
3 නෙහෙ 1:11, යෙසා 65:24
4 යොෂු 1:4
5 එස්රා 5:3, නෙහෙ 3:7
6 එස්රා 7:21, නෙහෙ 2:9
7 1ලේක 29:1, එස්රා 1:3
8 නෙහෙ 7:2
9 නෙහෙ 1:3, නෙහෙ 2:17
10 එස්රා 7:6, හිතෝ 21:1
11 එස්රා 5:3
12 යොෂු 16:3, යොෂු 16:5
13 නෙහෙ 2:19, නෙහෙ 4:1, නෙහෙ 6:2
14 නෙහෙ 13:1
15 නෙහෙ 4:3, නෙහෙ 6:14, නෙහෙ 13:7
16 ගීතා 112:10

**2 තීරුව**
1 ගීතා 51:18, ගීතා 122:6
2 දේශ 3:7, ආමො 5:13, මතෙ 10:16
3 නෙහෙ 1:3
4 විලා 1:4, විලා 2:9
5 2ලේක 26:9, නෙහෙ 3:13
6 නෙහෙ 3:13
7 නෙහෙ 3:15, නෙහෙ 12:37
8 2සාමු 15:23, යොහ 18:1
9 නෙහෙ 2:13
10 නෙහෙ 4:14, නෙහෙ 7:5
11 නෙහෙ 1:3, යෙරෙ 24:9, එස 5:14

අපි සියලුදෙනාම එකතු වී යෙරුස-
ලමේ පවුරු නැවත ගොඩනඟමු.”
**18** ඉන්පසුව මාගේ දෙවිගේ ආශීර්වා-
දය[1] මට තිබුණු බවත්[2] මට රජ්ජුරු-
වන්ගේ අවසරය[3] තිබුණු බවත් මම
ඔවුන්ට පැහැදිලි කර දුන්නෙමි. ඒ
දේවල් ඇසූ ඔවුන් තුළ මේ වැදගත්
කාර්යය කිරීමට මහත් ධෛර්යයක්
ඇති විය.[4] එමනිසා සියලුදෙනා එක
හඬින්, “අපි එකතු වී පවුරු නැවත
ගොඩනඟමු” කියා පැවසූහ.

**19** හෝරොන්හි වැසියෙකු වූ සන්-
බලට්ටත්[5] අම්මොන්[6] ජාතික නිල-
ධාරියෙකු[7] වූ ටොබියාටත්[8] අරාබි[9]
ජාතිකයෙකු වූ ගෙෂෙම්ටත්[10] අප
කරන්න යන දේ ගැන ආරංචි වූ විට
ඔවුහු අපට නින්දා කරන්න පටන්-
ගත්තෝය.[11] එසේම, “ඔබ මොන-
වාද මේ කරන්නේ? ඔබ රජ්ජුරුවන්ට
විරුද්ධව කැරලිගසන්නද හදන්නේ”[12]
කියා ඔවුහු අපෙන් ඇසූහ. **20** නමුත්
මම ඔවුන්ට මෙසේ පිළිතුරු දුන්-
නෙමි. “ස්වර්ගයේ සිටින දෙවි[13] අපේ
උපකාරයට සිටින නිසා අපි කරන
මේ කාර්යය අනිවාර්යයෙන්ම සාර්ථක
වෙනවා.[14] ඒ ගැන අපිට සැකයක්
නැහැ. අපි මේ කාර්යය කරනවාමයි.
නමුත් මෙය මතක තබාගන්න. යෙරු-
සලමෙහි ඔබේ නම සිහි වෙන්න[15]
තරම් ඔබ කිසිම දෙයක් කරලා නැහැ.
ඔබෙන් එක් කෙනෙකුටවත් යෙරුසල-
මෙහි අයිතිවාසිකමක්වත් උරුමයක්-
වත් නැහැ.”[16]

**3** උත්තම පූජක එලියාෂිබ්ද[17]
පූජකයන් වූ ඔහුගේ සහෝද-
රයෝද බැටළු දොරටුව[18] අලුත්වැ-
ඩියා කරන්න පටන්ගත්තෝය. ඔවුහු
එම ස්ථානය ශුද්ධ ස්ථානයක් ලෙස
කැප[19] කළ පසු ඊට දොරවල්ද සවි
කළෝය. ඔවුහු මේයා[20] නම් මුරකො-
ටුව දක්වා ඉදි කිරීම් කටයුතු කර
එම ස්ථානයද කැප කළෝය. ඉන්-
පසු ඔවුහු හනානෙල්ගේ[21] මුරකොටුව
දක්වා ඉදි කිරීම් කටයුතු කළෝය.
**2** එතැන් සිට ඉදි කිරීම් කටයුතු
කළේ යෙරිකෝවේ[1] මනුෂ්‍යයෝය.
ඉම්රිගේ පුත් සක්කූර් ඊළඟ කොටස
ඉදි කළේය.

**3** හස්සෙනායාගේ පුතුන් ඉදි
කළේ මත්ස්‍ය දොරටුවයි.[2] ඔවුහු දො-
රවල් සඳහා ලී රාමුද[3] ඒවාට දො-
රවල්ද[4] දොරගුලුද[5] සවි කළෝය.
**4** ඊළඟ කොටස අලුත්වැඩියා කළේ
හක්කොෂ්ගේ පුත්‍රයෙකු වූ උරි-
යාහ්ගේ[6] පුත් මෙරේමොත්ය.[7] ඊළඟ
කොටස කළේ මෙෂෙෂබෙල්ගේ පුත්‍ර-
යෙකු වූ බෙරෙකියාගේ පුත් මෙෂුල්-
ලම්[8] හා ඔහුගේ පිරිසයි. බානාගේ
පුත් සාදොක්ගේ පිරිස ඊළඟ කො-
ටස අලුත්වැඩියා කළෝය. **5** ඊළඟ
කොටසේ අලුත්වැඩියා කටයුතු භාර
වුණේ තෙකෝවාහි[9] වැසියන්ටය.
නමුත් ඔවුන් අතරේ සිටි ප්‍රධානියෝ[10]
ඉදි කිරීම් කටයුතු භාරව සිටි අයට
යටත් වී වැඩ කරන්න අකමැති වූහ.

**6** පැරණි නුවරේ දොරටුව[11] අලුත්-
වැඩියා කළේ පාසේයාගේ පුත්
යෝයාදා හා බෙසෝදෙයාගේ පුත්
මෙෂුල්ලම්ය. ඔවුහු දොරවල් සඳහා
ලී රාමුද ඒවාට දොරවල්ද දොරගුලුද
සවි කළෝය.[12] **7** ඊළඟ කොටස
අලුත්වැඩියා කළේ ගිබියෝන්වර-
යෙකු[13] වූ මෙලෙටියා සහ මෙරො-
නොත්හි[14] වැසියෙකු වූ යාදොන්ය.
ඔවුහු මහ ගඟෙන්[15] එගොඩ පාල-
නය කළ ආණ්ඩුකාරයාගේ[16] පාල-
නය යටතේ පැවති ගිබියෝන්[17] හා
මිශ්පාහි[18] වැසියෝ වූහ. **8** ඊළඟ
කොටස අලුත්වැඩියා කළේ රන්ක-
රුවෙකු[19] වූ හර්හායාගේ පුත්
උස්සියෙල්ය. සුවඳ තෙල් සාදන[20]
අයගෙන් කෙනෙකු වූ හනනියා
ප්‍රමුඛ පිරිස ඊළඟ කොටස අලුත්-
වැඩියා කළෝය. ඔවුහු පළල්
පවුර[21] දක්වා යෙරුසලමේ මාර්ග-
වලට ගල් ඇල්ලුවෝය. **9** ඊළඟ
කොටසේ අලුත්වැඩියා කටයුතු භාර
වූයේ හූර්ගේ පුත් රෙෆායාටය. මුළු
යෙරුසලම් දිස්ත්‍රික්කයෙන් එක් කො-
ටසකට අධිපති ලෙස කටයුතු කළේ
ඔහුය. **10** ඊළඟ කොටස අලුත්-

**2 පරි.**
1 එස්රා 7:6; එස්රා 7:28
2 නෙහෙ 2:8
3 දානි 9:25
4 එස්රා 6:22; හග් 1:14
5 නෙහෙ 2:10
6 නෙහෙ 13:1
7 හිතෝ 30:22
8 නෙහෙ 6:14
9 නෙහෙ 4:7
10 නෙහෙ 6:1
11 යෝබ් 30:1; ගීතා 79:4; ගීතා 80:6
12 නෙහෙ 6:6
13 එස්රා 1:2; එස්රා 5:11; එස්රා 7:23
14 ගීතා 122:6; ගීතා 127:1
15 නික් 28:29
16 එස්රා 4:3; 2කොරි 6:14

**3 පරි.**
17 නෙහෙ 12:10; නෙහෙ 13:4; නෙහෙ 13:28
18 යොහ 5:2
19 නෙහෙ 12:30
20 නෙහෙ 12:39
21 යෙරෙ 31:38; සෙක 14:10

**2 තීරුව**
1 එස්රා 2:34
2 2ලේක 33:14; ශෙප 1:10
3 නෙහෙ 2:8
4 නෙහෙ 7:1
5 2ලේක 14:7
6 එස්රා 8:33
7 නෙහෙ 3:21
8 නෙහෙ 3:30; නෙහෙ 6:18
9 නෙහෙ 3:27; ආමො 1:1
10 විනි 5:23; ලූක් 11:23; 1තිමෝ 6:17
11 නෙහෙ 12:39
12 නෙහෙ 3:3
13 යොෂු 9:27; 2සාමු 21:2
14 1ලේක 27:30
15 උත් 15:18
16 නෙහෙ 2:9
17 යොෂු 10:2
18 යොෂු 18:26; 2ලේක 16:6; යෙරෙ 40:6
19 නෙහෙ 3:31
20 නික් 30:25; 1ලේක 9:30
21 2රාජා 14:13; නෙහෙ 12:38

වැඩියා කළේ හරුමප්ගේ පුත් යෙදා-
යාය. ඔහු අලුත්වැඩියා කළ කොටස
තිබුණේ ඔහුගේ නිවස ඉදිරිපිටය.[1]
ඊළඟ කොටසේ අලුත්වැඩියා කටයුතු
කළේ හෂබ්නෙයාගේ පුත් හට්ටුෂ්
ප්‍රමුඛ පිරිසයි.
**11** හාරිම්ගේ[2] පුත් මල්කියා සහ
පාහත්-මෝවබ්ගේ[3] පුත් හෂ්ෂුබ් පවු-
රේ තවත් කොටසක් අලුත්වැඩියා
කළෝය. ඔවුහු උදුන් මුරකොටුව[4]
අලුත්වැඩියා කළෝය. **12** ඊළඟ
කොටස හල්ලෝහෙෂ්ගේ පුත් ෂල්-
ලුම් යටතේ අලුත්වැඩියා කරන ලදි.
යෙරුසලම් දිස්ත්‍රික්කයේ අනික් කො-
ටසට අධිපති[5] ලෙස කටයුතු කළේ
ඔහුය. එම කාර්යයට ඔහුද ඔහුගේ
දියණියෝද සහභාගි වූහ.
**13** හානුන් සහ ෂානොවාහි[6] වැසි-
යන් අලුත්වැඩියා කළේ නිම්න දොර-
ටුවයි.[7] ඔවුහු එය ඉදි කර ඊට
දොරවල්ද[8] දොරගුලුද[9] සවි කර කසළ
දොරටුව[10] දක්වා පවුරෙන් රියන්*
දහසක්ද ඉදි කළෝය. **14** කසළ
දොරටුව අලුත්වැඩියා කළේ බෙත්-
හක්කෙරෙම්[11] දිස්ත්‍රික්කයේ අධිපති-
යෙකු වූ රේකාබ්ගේ පුත් මල්කියාය.
ඔහු එම දොරටුව ඉදි කර ඊට දොර-
වල් සහ දොරගුලු සවි කළේය.
**15** මිෂ්පා[12] දිස්ත්‍රික්කයේ අධිපති-
යෙකු වූ කොල්හෝසෙගේ පුත් ෂල්-
ලූන් උල්පත් දොරටුව[13] අලුත්වැඩියා
කළේය. ඔහු ඊට වහලක් සාදා දොර-
වල්[14] සහ දොරගුලුද සවි කළේය. මීට
අමතරව රජුගේ උද්‍යානය[15] අසල
තිබෙන ඇළ මාර්ග පොකුණේ[16] සිට
දාවිත්ගේ නුවර[17] මැදින් දිව යන පඩි
පෙළ[18] දක්වා තිබුණු පවුරද ඔහු
අලුත්වැඩියා කළේය.
**16** එතැන් සිට ඉදි කිරීම් කට-
යුතු කළේ බෙත්-ෂූර්[19] දිස්ත්‍රික්ක-
යෙන් එක් කොටසකට අධිපති වූ
අෂ්බුක්ගේ පුත් නෙහෙමියාය. දාවිත්
රජුගේ සොහොන් බිම[20] ඉදිරිපිට ඇති
කොටස දක්වාත් ඉදි කරනු ලැබූ
පොකුණ[1] දක්වාත් රණශූරයන්ගේ
නිවස[2] දක්වාත් ඔහු පවුර අලුත්වැ-
ඩියා කළේය.
**17** එතැන් සිට අලුත්වැඩියා කට-
යුතු කළේ ලෙවීවරුන්ය.[3] ඒ
සඳහා මූලිකත්වය ගත්තේ බානි-
ගේ[4] පුත් රෙහුම්ය. එතැන් සිට
කෙයිලා[5] දිස්ත්‍රික්කයෙන් එක් කො-
ටසකට අධිපති වූ හෂබියා තම
දිස්ත්‍රික්කය වෙනුවෙන් අලුත්වැඩියා
කටයුතු කළේය. **18** එතැන් සිට
ලෙවීවරුන්ගේ සහෝදරයෝ හෙනා-
දාද්ගේ පුත් බව්වයි යටතේ අලුත්වැ-
ඩියා කටයුතුවල නිරත වූහ. ඔහු
කෙයිලා දිස්ත්‍රික්කයේ අනික් කොට-
සේ අධිපති ලෙස කටයුතු කළේය.
**19** එතැන් සිට මනින ලද තවත්
කොටසක් මිෂ්පාහි[6] අධිපතියෙකු වූ
යේෂුවාගේ[7] පුත් එෂෙර් විසින් අලුත්-
වැඩියා කරනු ලැබීය. එම කොටස
ආධාරක බැම්ම[8] අසල පිහිටි අවි ගබ-
ඩාවට යන මහ දක්වා දිව ගියේය.
**20** එතැන් සිට මනින ලද තවත්
කොටසක් අලුත්වැඩියා කළේ සබ්-
බයිගේ[9] පුත් බාරුක්ය. ආධාරක
බැම්මේ සිට උත්තම පූජක එලියා-
ෂිබ්ගේ[10] නිවසට ඇතුල් වන ස්ථානය
දක්වා දිව ගිය එම කොටස ඔහු
අලුත්වැඩියා කළේ මහත් උනන්දුව-
කිනි.[11]
**21** එතැන් සිට මනින ලද තවත්
කොටසක් හක්කොෂ්ගේ පුත්‍රයෙකු වූ
උරියාහ්ගේ[12] පුත් මෙරේමොත් අලුත්-
වැඩියා කළේය. ඔහුට භාරව තිබුණේ
එලියාෂිබ්ගේ නිවසට ඇතුල් වන
ස්ථානයේ සිට එම නිවසේ කෙළවර
දක්වා දිවෙන කොටසයි.
**22** එතැන් සිට යොර්දාන් දිස්-
ත්‍රික්කයේ[13] විසූ පූජකයෝ අලුත්වැ-
ඩියා කටයුතු කළෝය. **23** ඊළඟ
කොටස අලුත්වැඩියා කළේ බෙන්ජ-
මින් සහ හෂ්ෂුබ්ය. ඔවුන් අලුත්වැ-
ඩියා කළ කොටස තිබුණේ ඔවුන්ගේ
නිවෙස් ඉදිරිපිටය. අනනියාගේ පුත්‍ර-
යෙකු වූ මයසේයාගේ පුත් අෂ-
රියා තම නිවස අසල තිබූ පවුර

---

නෙහෙ **3:13*** උත් 6:15හි පාදසටහන බලන්න.

**3 පරි.**
**1** නෙහෙ 3:23 නෙහෙ 3:28
**2** එස්රා 2:32
**3** එස්රා 2:6 නෙහෙ 10:14
**4** නෙහෙ 12:38
**5** 2රාජා 24:12 1ලේක 28:1
**6** යොෂු 15:34 නෙහෙ 11:30
**7** 2ලේක 26:9 නෙහෙ 2:13
**8** විනි 16:3 1ලේක 22:3
**9** 2ලේක 8:5 නෙහෙ 3:3
**10** නෙහෙ 2:13
**11** යෙරෙ 6:1
**12** යොෂු 18:26 1රාජා 15:22 යෙරෙ 40:6
**13** නෙහෙ 2:14 නෙහෙ 12:37
**14** නෙහෙ 3:3
**15** යෙරෙ 39:4
**16** යෙසා 22:9
**17** 2සාමු 5:7
**18** නෙහෙ 12:37
**19** යොෂු 15:58 2ලේක 11:7
**20** 1රාජා 2:10 2ලේක 16:14

**2 තීරුව**
**1** නෙහෙ 2:14
**2** සල 3:7
**3** 1ලේක 23:28
**4** නෙහෙ 8:7 නෙහෙ 9:5
**5** යොෂු 15:44 1සාමු 23:1 1ලේක 4:19
**6** නෙහෙ 3:15
**7** එස්රා 2:40 නෙහෙ 10:9
**8** 2ලේක 26:9 නෙහෙ 3:24
**9** එස්රා 10:28
**10** නෙහෙ 3:1 නෙහෙ 13:4
**11** දේශ 9:10 රෝම 12:11 කොලො 3:23
**12** එස්රා 8:33
**13** උත් 13:10 ද්වි 34:3 1රාජා 7:46

අලුත්වැඩියා කළේය. **24** එතැන්
සිට මනින ලද තවත් කොටසක් හෙ-
නාදාද්ගේ පුත් බින්නුයි අලුත්වැඩියා
කළේය. ඒ කොටස අෂරියාගේ නිව-
සේ සිට ආධාරක බැම්ම[1] දක්වාද පවු-
රේ කොන දක්වාද දිව ගියේය.

**25** ආධාරක බැම්ම ඉදිරියේ
තිබුණු කොටසේ සිට රජමාලිගාවට[2]
ළඟින් තිබූ මුරකරුගේ මළුවේ[3] පිහිටි
මුරකොටුව දක්වා ඌසයිගේ පුත්
පාලල් අලුත්වැඩියා කළේය. ඊළඟ
කොටස අලුත්වැඩියා කළේ පාරොෂ්-
ගේ[4] පුත් පෙදායාය.

**26** ඕෆෙල්හි[5] වාසය කරමින් සිටි
නෙතිනිම්වරු[6] නැඟෙනහිර දෙසින්
පිහිටි ජල දොරටුව[7] දක්වාත් ඉදිරි-
යට නෙරා ඇති මුරකොටුව දක්වාත්
අලුත්වැඩියා කටයුතු කළෝය.

**27** එතැන් සිට මනින ලද තවත්
කොටසක් තෙකෝවාහි[8] වැසි-
යෝ අලුත්වැඩියා කළෝය. ඉදිරි-
යට නෙරා ඇති මුරකොටුවේ සිට
ඕෆෙල්හි පවුර දක්වා එම කොටස දිව
ගියේය.

**28** පූජකයෝ අශ්ව දොරටුවට[9]
උතුරින් තිබූ තම තමන්ගේ නිවෙස්
ඉදිරියේ පිහිටි කොටස් අලුත්වැඩියා
කළෝය.

**29** ඉම්මේර්ගේ පුත් සාදොක්[10]
තමාගේ නිවස ඉදිරියේ පිහිටි කොටස
අලුත්වැඩියා කළේය.

එතැන් සිට නැඟෙනහිර දොර-
ටුවේ[11] පාලක ෂෙකනියාගේ පුත්
ෂෙමායා අලුත්වැඩියා කටයුතුවල
නිරත විය.

**30** එතැන් සිට මනින ලද තවත්
කොටසක් ෂෙලෙමියාගේ පුත් හනනි-
යාද ෂාලාෆ්ගේ හයවන පුත්‍රයා වන
හානුන්ද අලුත්වැඩියා කළෝය.

බෙරෙකියාගේ පුත් මෙෂුල්ලම්[12]
තමාගේ නිවස*[13] ඉදිරියේ පිහිටි කො-
ටස අලුත්වැඩියා කළේය.

**31** එතැන් සිට මුරදොරටුව අසල
තිබූ නෙතිනිම්වරුන්ගේ[14] හා වෙළෙ-
ඳුන්ගේ[1] නිවෙස් දක්වාත් පවුරු කො-
නේ පිහිටි උඩුමහල් කාමරය දක්වාත්
අලුත්වැඩියා කළේ රන්කරුවන්ගේ[2]
සංගමයේ සාමාජිකයෙකු වූ මල්කි-
යාය.

**32** පවුරු කොනේ පිහිටි උඩුමහල්
කාමරය හා බැටළු දොරටුව[3] අතර
කොටස අලුත්වැඩියා කරනු ලැබුවේ
රන්කරුවන් සහ වෙළෙඳුන් විසිනි.

**4** අප පවුර නැවත ගොඩනඟ-
මින් සිටි බව සන්බලට්ට[4]
ආරංචි වූ වහාම ඔහු මහත් කෝපය-
කින්[5] යුදෙව්වන්ට නින්දා[6] කරන්න
පටන්ගත්තේය. **2** ඔහු තම සග-
යන්[7] හා සමාරියේ හමුදාව ඉදිරියට
ගොස් මෙසේ කීවේය. "කිසි දෙ-
යක් කරකියාගත නොහැකි යුදෙව්වන්
මොනවාද මේ කරන්න හදන්නේ? මෙ-
තරම් විශාල කාර්යයක් තනිවම නිම
කරන්න ඔවුන්ට පුළුවන්ද? ඔවුන් ගල්
පවුර තනන්න හදන්නේ ගිනිබත් වූ
සුන්බුන්වලින්ද?[8] මේ වැඩේ දවසකින්
දෙකකින් නිම කරලා ඒ ස්ථානයේ
පුදපූජා ඔප්පු කරන්නද[9] ඔවුන්ගේ
අදහස?"

**3** ඒ අවස්ථාවේදී ඔහු සමඟ සිටි
අම්මොන් ජාතික[10] ටොබියා[11] මෙසේ
පැවසීය. "ඒකත් පවුරක්ද? ඔය පවු-
රට හිවලෙක්[12] නැග්ගත් ඒක කඩා-
ගෙන වැටෙයි."

**4** ඒ කාලයේදී මම දෙවිට මෙසේ
කන්නලව් කළෙමි. "දෙවියනි, අපේ
කන්නලව්වලට සවන් දෙන්න.[13] අප
අපේ සතුරන්ගේ නින්දා අපහාසවලට
ලක් වෙලා.[14] දෙවියනි, ඔවුන් අපට
කරන නින්දාව[15] ඔවුන් පිටටම පැමි-
ණේවා! කොල්ලකරුවන් වස්තුවක්
පැහැරගන්නාක් මෙන් ඔවුන්ව පැහැ-
රගෙන, වහල්කමට රැගෙන යෑමට
සතුරන්ට ඉඩහරින්න. **5** දෙවියනි,
ඔවුන්ගේ පව්කාර ක්‍රියා නොසලකා-
හරින්න නම් එපා.[16] ඔවුන් ඉදි කිරීමේ
කටයුතු කරන අයගේ මුහුණටම අප-
හාස කළා! ඉතින් දෙවියනි, ඔවුන්
අපිට විරුද්ධව කළ අපරාධ අමතක
කරන්න එපා."

**3 පරි.**
1 නෙහෙ 3:19
2 2සාමු 5:11
2සාමු 7:1
නෙහෙ 12:37
3 යෙරෙ 37:21
4 එස්රා 2:3
5 2ලේක 27:3
2ලේක 33:14
නෙහෙ 11:21
6 යොෂු 9:23
1ලේක 9:2
එස්රා 2:43
එස්රා 8:17
එස්රා 8:20
7 නෙහෙ 8:1
නෙහෙ 12:37
8 නෙහෙ 3:5
9 යෙරෙ 31:40
10 නෙහෙ 13:13
11 1ලේක 9:18
1ලේක 26:14
2ලේක 31:14
12 නෙහෙ 6:18
13 නෙහෙ 12:44
14 නෙහෙ 3:26

**2 තීරුව**
1 1රාජා 10:15
1රාජා 10:28
2 නෙහෙ 3:8
3 නෙහෙ 3:1
නෙහෙ 12:39
යොහ 5:2

**4 පරි.**
4 නෙහෙ 2:10
නෙහෙ 6:1
නෙහෙ 13:28
5 ගීතා 2:1
6 හෙබ්‍රෙ 11:36
7 එස්රා 4:9
8 නෙහෙ 4:10
9 නෙහෙ 12:43
10 නෙහෙ 13:1
11 නෙහෙ 2:19
නෙහෙ 6:1
12 විලා 5:18
13 ගීතා 86:6
14 ගීතා 123:3
15 ගීතා 79:12
හිතෝ 3:34
16 ගීතා 59:5
ගීතා 69:27
යෙරෙ 18:23
2තිමෝ 4:14

---

නෙහෙ **3:30*** හෝ, "නම කාමරය."

6 අපි මේ අභියෝග හමුවේ පවුරේ
ඉදි කිරීම් කටයුතු දිගටම කරගෙන
ගියෙමු. කල් යත්ම, පවුරේ කැඩී බිඳී
තිබුණු සියලුම තැන් අලුත්වැඩියා
කර එහි නියමිත උස ප්‍රමාණයෙන්
අඩක් දක්වා ගොඩනැඟීමට අපට
හැකි විය. මන්ද සියලුදෙනා මහත්
උනන්දුවෙන් එම කාර්යයට අතහිත
දුන්නෝය.[1]
7 යෙරුසලමේ පවුරු නැවත ගො-
ඩනැඟීමේ කාර්යය සාර්ථකව කෙරී-
ගෙන යන බවත් පවුරේ කැඩී බිඳී
තිබුණු තැන් අලුත්වැඩියා කරගෙන
යන බවත් සන්බලට්,[2] ටොබියා,[3]
අරාබි ජාතිකයන්,[4] අම්මොන්ව-
රුන්[5] සහ අෂ්දොද්වරුන්[6] යන අයට
ආරංචි වූ විට ඔවුහු බොහෝ සෙයින්
කෝප වූහ. 8 එහෙයින් යෙරුසල-
මට ඇවිත් අපට විරුද්ධව සටන්
කර අපගේ කාර්යයට බාධා කරන්න
ඔවුහු කුමන්ත්‍රණය කළෝය.[7] 9 ඒ
නිසා, අපි අපේ දෙවිගේ උපකාරය
ඉල්ලා යාච්ඤා කර[8] මුර කිරීම සඳහා
දිවා රෑ දෙකේදීම මිනිසුන්ව පත්
කළෙමු.
10 එහෙත් යූදාහි වැසියෝ මෙසේ
කීවෝය. "බර උසුලන අය[9] දැන්
හොඳටම හෙම්බත් වෙලයි ඉන්නේ.
තවමත් ඉවත දමා නැති සුන්බුන්[10]
බොහොමයක් තිබෙනවා. මේ පවුර
අපට තනිව ගොඩනඟන්න බැහැ."
11 මීට අමතරව, අපගේ සතුරෝ
මෙසේ සැලසුම් යොදමින් සිටියෝය.
"අපි හොර රහසේම ඔවුන් ඉන්න
තැනට යමු. අපි ළඟට යනකම්ම
ඔවුන් මොකුත් දැනගන්න එකක්
නැහැ.[11] අපි ඔවුන්ව මරා මේ වැඩේ
නතර කරලා දාමු."
12 අපේ සතුරන් අසල ජීවත් වූ
යුදෙව්වරුන් වැඩට පැමිණි විට ඔවුහු
අපට මෙසේ පැවසූහ. "හැම පැත්ත-
කින්ම අපව වට කරලා අපිට පහර
දෙන්න අපේ සතුරන් සැලසුම් කර-
නවා." එවැනි වාර්තා අපට දස
වරක්ම අසන්න ලැබිණ.

**4 පරි.**
1 එස්රා 5:8; දේශ 3:3; කොලො 3:23
2 නෙහෙ 2:10
3 නෙහෙ 4:3
4 නෙහෙ 2:19
5 ආමො 1:13
6 යොෂු 13:3; නෙහෙ 13:23
7 ගීතා 2:2
8 ගීතා 50:15; ගීතා 55:16
9 2ලේක 2:18
10 නෙහෙ 4:2
11 ගීතා 56:6

**2 තීරුව**
1 සල 3:8
2 2ලේක 26:14
3 නෙහෙ 2:16; නෙහෙ 13:17
4 නෙහෙ 7:5
5 ගණන් 14:9; ද්වි 20:3; යොෂු 1:9; ගීතා 27:1; රෝම 8:31; හෙබ්‍රෙ 13:5
6 ද්වි 10:17; 1සාමු 4:8
7 ද්වි 7:21; නෙහෙ 1:5; ගීතා 47:2; ගීතා 65:5
8 2සාමු 10:12
9 2සාමු 17:14; ගීතා 33:10
10 නෙහෙ 5:16
11 2ලේක 26:14
12 එස්රා 10:14; නෙහෙ 11:1
13 මතෙ 10:16; පිලි 1:28
14 2ලේක 23:10; 2ලේක 32:5
15 ආනි 9:25
16 2සාමු 20:8
17 ගණන් 10:9; 2ලේක 13:12; විනි 20:18
18 නෙහෙ 2:16; නෙහෙ 7:5

13 එහෙයින් ආරක්ෂාව සඳහා
පවුර පිටුපස තිබූ පහත් ඉඩම්වල
මුරකරුවන්ව තබා කඩු,[1] හෙල්ල[2]
සහ දුනුවලින් මම ඔවුන්ව සන්නද්ධ
කළෙමි. තම තමන්ගේ පවුල්වලට
අයත් කොටස ආරක්ෂා කරන පිණිස
මම ඔවුන්ව පත් කළෙමි. 14 සෙ-
නඟ බියෙන් සිටින බව තේරුම්ගත්
විගස මම වංශවත් අයටත්[3] නිලධා-
රීන්ටත්[4] පොදු ජනයාටත් මෙසේ
පැවසුවෙමි. "ඔවුන්ට භය වෙන්න
එපා.[5] නිතරම ශ්‍රේෂ්ඨ,[6] ගරුබිය උප-
දවන[7] දෙවි වන යෙහෝවාව සිහි
කරන්න. ඔබේ සහෝදරයන් වෙනු-
වෙනුත්[8] ඔබේ දූපුතුන් හා භාර්යාවන්
වෙනුවෙනුත් ඔබේ නිවෙස් වෙනුවෙ-
නුත් සටන් කරන්න."
15 ඔවුන් කරන්න අදහස් කළ දේ
අපට ආරංචි වූ බව අපේ සතුරන්ට
දැනගන්න ලැබිණ. සැබෑ දෙවි ඔවුන්-
ගේ සැලසුම් අසාර්ථක කර තිබූ
බැවින්[9] අපි සියලුදෙනා ඉදි කිරීම්
කටයුතුවලට නැවත යොමු වුණෙමු.
16 සතුරන්ගේ කුමන්ත්‍රණය හෙළි වූ
දා පටන් මා යටතේ සේවය කළ
තරුණයන්ගෙන් අඩක්[10] අලුත්වැ-
ඩියා කටයුතුවල නිරත වෙමින් සිටි-
යෝය. ඉතුරු පිරිස ආරක්ෂක යුධ
ඇඳුම්වලින් සැරසී[11] හෙල්ල, පලිස්
හා දුනු අතැතිව සුපරීක්ෂාකාරීව සිටි-
යෝය. යූදාහි සියලු වැසියන්ට අධිප-
තීන්ගේ[12] පූර්ණ සහයෝගය ලැබිණ.
17 පවුරුවල වැඩ කරමින් සිටි අය
සහ ගොඩනැඟිලි ද්‍රව්‍ය උසුලාගෙන
යන අය තමන්ගේ කාර්යය ඉටු
කළේ එක් අතකිනි. මන්ද ඔවුහු
අනික් අතේ[13] ආයුධයක්[14] තබා-
ගෙන සූදානමින් සිටියෝය. 18 ඉදි
කිරීම්[15] කටයුතු කළ සියලුදෙනා
තම ඉණේ කඩුවක්ද බැඳගෙන සිටි-
යෝය.[16] හොරණෑව පිඹීමට[17] සූදා-
නමව සිටි තැනැත්තා නිතරම මා
අසල සිටගෙන සිටියේය.
19 මම වංශවත් අයටත් නිලධා-
රීන්ටත්[18] පොදු ජනයාටත් මෙසේ
පැවසුවෙමි. "මේ අතිවිශාල පවුර

අලුත්වැඩියා කිරීමට එක් එක්
කෙනාගෙන් ගොඩක් දුරස්ව වැඩ
කරන්න සිදු වෙනවා. **20** ඒ නිසා
යම් ස්ථානයකින් ඔබට හොරණෑ හඬ
ඇසුණොත් සියලුදෙනාම ඒ ස්ථාන-
යට එක් රැස් විය යුතුයි. කිසිම සැක-
යක් නැහැ, අපේ දෙවි අපි වෙනුවෙන්
සටන් කරයි.”[1]

**21** අප අතර සිටි පිරිසෙන් අඩක්ම
හිමිදිරි උදෑසන සිට රාත්‍රිය උදා
වන තුරු අලුත්වැඩියා කටයුතු-
වල නිරත වෙමින් සිටි අතරේදී
ඉතුරු පිරිස හෙල්ල අතැතිව අපව
ආරක්ෂා කළෝය. **22** මේ අතර
මම ජනයාට මෙසේද පැවසුවෙමි.
“රාත්‍රියේදී ඔබ සියලුදෙනා ඔබේ සේ-
වකයන් සමඟ යෙරුසලමෙහි නතර
වී සිටින්න.[2] එවිට රාත්‍රියේදී මුර සේ-
වයේ යෙදෙන්නත් දිවා කාලයේදී ඉදි
කිරීම් වැඩකටයුතුවල නිරත වෙන්-
නත් ඔබට පුළුවන් වෙයි.” **23** මගේ
සහෝදරයනුත්[3] මගේ සේවකයනුත්[4]
මා සමඟ සිටි ආරක්ෂක නිලධාරී-
නුත්[5] මමත්[6] ඇඳුම් මාරු කරන්නේ-
වත් නැතුව දකුණතේ ආයුධයක්[7]
තබාගෙන රාත්‍රිය පුරාම සෝදිසියෙන්
සිටියෙමු.

**5** යුදෙව් පුරුෂයෝ සහ ඔවුන්ගේ
භාර්යාවෝ තම සහෝදර ජන-
තාව අතරේ සිටි සමහරදෙනෙකුට
විරුද්ධව[8] බරපතළ පැමිණිල්ලක්[9]
කළෝය. **2** “අපේ පණකෙන්ද රැක-
ගන්න[10] ධාන්‍ය අවශ්‍යයි. ඒත් දැන්
ධාන්‍ය ටිකක් ගන්න අපේ දූපු-
තුන්ව ඇපයට දෙන්න සිදු වෙලා”
කියා සමහරෙක් පැමිණිලි කළෝය.
**3** තවත් සමහරෙකු කියා සිටි-
යේ මෙයයි. “ආහාර හිඟය නිසා
ධාන්‍ය ටිකක් ගන්න අපේ කෙත්වතු
හා නිවෙස් ඇපයට දෙන්න අපට
සිදු වෙලා.”[11] **4** තවත් පිරිසක් මෙ-
සේද කියා සිටියෝය. “අපේ කෙත්
හා මිදිවතු[12] සඳහා රජු අය කරන
බද්ද[13] ගෙවන්න තරම් මුදලක් අපට
නැහැ. ඒ සඳහා මුදල් ණයට ගන්න
අපට සිදු වෙලා. **5** අපි හැමෝම
සහෝදරයෝ. අප අතර වෙනසක්
නැහැ.[1] අපේ පුතුනුත් අපේ සහෝද-
රයන්ගේ පුතුන් වගේමයි. නමුත්
අපේ දූපුතුන්ව දාසකමට දෙන්න සිදු
වෙලා.[2] මේ වන විටත් අපේ දූවරුන්-
ගෙන් කිහිපදෙනෙක් ඔවුන්ගේ දාසීන්
වෙලා. අපේ කෙත් හා මිදිවතු වෙනත්
අයට අයිති වී තිබෙන නිසා කිසිවක්
කරකියාගත නොහැකි තත්වයකයි
අපි ඉන්නේ.”

**6** ඔවුන්ගේ පැමිණිලිවලට සවන්
දුන් මා තුළ මහත් කෝපයක් ඇති
විය. **7** සිදු වී ඇති දේවල් ගැන මා
හොඳින් සොයා බැලූ විට ඊට වග කිව
යුත්තේ වංශවත් අය හා නිලධාරීන්
බව මම වටහාගත්තෙමි. එවිට මම
ඔවුන්ට බැණවදිමින් මෙසේ පැවසු-
වෙමි.[3] “මොනවාද ඔබ මේ කරන්-
නේ? ඔබ ඔබේම සහෝදරයන්ගෙන්
මේ විදිහට අසාධාරණව පොලී[4] අය
කරන්නේ ඇයි?”

එහෙයින් මේ ප්‍රශ්නයට විසඳුමක්
ලබා දීම සඳහා මම සියලුදෙනාව
රැස් කර,[5] **8** ඔවුන්ට මෙසේ පැවසු-
වෙමි. “වෙනත් ජාතීන්ට වහලුන්
ලෙස විකුණූ අපේ යුදෙව් සහෝදර-
යන්ව අපි නැවත මිල දී ගත්තා.[6]
අපේ හැකියාව අනුව අපි ඒ දේ
කළා. ඒත් දැන් බලන්න ඔබ කරන
දේ! ඔබ ඔබේම සහෝදරයන්ව එකි-
නෙකාට විකුණනවා.[7] දැන් ඔබටත්
මුදල් දී ඔවුන්ව නිදහස් කරන්න
කියාද ඔබ අපට කියන්නේ?” කිසි-
වෙක් වචනයකින්වත් මට පිළිතුරු
දුන්නේ නැත.[8] **9** මම තවදුරටත්
මෙසේ පැවසුවෙමි. “ඔබ කරන්නේ
යහපත් දෙයක් නම් නොවෙයි.[9] සතුරු
ජාතීන්[10] අපව නින්දාවට[11] පත් නො-
කරන ලෙස දැන් අපේ දෙවිට[12]
ගරුබිය[13] දක්වන්න. **10** මාත් මගේ
සහෝදරයනුත් මට සේවය කරන
අයත් මුදල් සහ ධාන්‍ය ණයට දීලයි
ඉන්නේ. ඒ නිසා අපි දැන් තීරණයක්
ගනිමු. පොලියට ණය දෙන එක
අපි වහාම නතර කරමු.[14] **11** මා
ඔබෙන් ඉල්ලා සිටින්නේ අදම ඔවුන්-

**4 පරි.**
1 ද්වි 1:30
යොෂු 23:10
2 නෙහෙ 4:6
3 නෙහෙ 4:14
4 නෙහෙ 5:10
නෙහෙ 13:19
5 1ලේක 11:25
6 නෙහෙ 10:1
7 2ලේක 23:9
2ලේක 23:10

**5 පරි.**
8 මීකා 2:2
9 ද්වි 15:9
හිතෝ 21:13
ලූක් 18:7
10 උත් 47:19
11 උත් 47:20
12 නෙහෙ 9:37
13 ද්වි 28:48

**2 තීරුව**
1 2සාමු 5:1
2 නික් 21:7
ද්වි 15:12
2රාජා 4:1
හිතෝ 22:7
මතෙ 18:25
3 ලෙවී 19:15
ලෙවී 19:17
2ලේක 19:6
1තිමෝ 5:20
තීත 2:15
4 නික් 22:25
ලෙවී 25:36
ද්වි 23:19
ගීතා 15:5
එස 22:12
5 හිතෝ 27:5
6 ලෙවී 25:48
7 ලෙවී 25:35
ද්වි 15:7
යෙරෙ 34:9
8 යෝබ් 29:10
යෝබ් 32:15
9 1සාමු 2:24
යෙසා 58:7
10 එස 36:20
රෝම 2:24
11 1පේතෘ 2:12
12 ද්වි 8:18
13 ලෙවී 25:36
නෙහෙ 5:15
යෝබ් 28:28
හිතෝ 8:13
දේශ 8:12
මලා 1:6
14 නෙහෙ 5:7
එස 18:8
එස 18:13

ගෙන් ගත් කෙත්වතු,[1] මිදිවතු, ඔලී-
වවතු සහ නිවෙස් ඔවුන්ට ආපසු භාර
දෙන ලෙසයි. ඔබ ඔවුන්ට ණයට දුන්
මුදල්, ධාන්‍ය, අලුත් වයින් සහ තෙල්
යනාදිය සඳහා ඔබ සියයට එකක
පොලියක් අය කරගත්තා. දැන් ඒ
මුදල් නැවත ඔවුන්ට ලබා දෙන්න.”
**12** ඔවුහු මෙසේ පිළිතුරු දුන්හ.
“ඔබ කියන විදිහටම කරන්න අපි
කැමතියි.[2] අපි කැමතියි ඔවුන්ට
අයිති දේවල් ආපසු දෙන්න.[3] අපි
ඔවුන්ගෙන් කිසි දෙයක් ඉල්ලන්නේ
නැහැ.”[4] එහෙයින් මම පූජකයන්ව
කැඳවා මේ දේ කරන බවට වරදකරු-
වන්ගෙන් පොරොන්දුවක් ගත්තෙමි.[5]
**13** මීට අමතරව, මම මාගේ වස්-
ත්‍රය* ගසා දමා ඔවුන්ට මෙසේ පැව-
සුවෙමි. “මාගේ මේ වස්ත්‍රය ගසා
දැමුවා වගේම සැබෑ දෙවිත් මේ පො-
රොන්දුවට කීකරු නොවන අයව
තමන්ගේ නිවසෙන් හා ඉඩමෙන්
පන්නා දමයි. එවැනි කෙනෙකුට
සිදු වන්නේ හිස් අතින් යන්නයි.”
ඊට රැස්ව සිටි සියලුදෙනා, “එසේම
වේවා”#[6] කියා පවසා යෙහෝවා දෙ-
විට ප්‍රශංසා කරන්න පටන්ගත්හ.[7]
සියලුදෙනාම තමන් වූ පොරොන්දු-
වට එකඟව කටයුතු කළෝය.[8]
**14** මා තවත් දෙයක්ද සඳහන්
කළ යුතුයි. අර්තක්ෂස්තා රජ[9] මාව
යූදා දේශයේ ආණ්ඩුකාරයා[10] ලෙස
පත් කළ දවසේ සිට එනම්, එතු-
මාගේ පාලනයේ විසිවන[11] අවුරුද්-
දේ සිට තිස්දෙවන[12] අවුරුද්ද දක්වා
අවුරුදු දොළහක කාලයක් පුරා
ආණ්ඩුකාරයාට ලැබිය යුතු ආහාර
දීමනාව මමවත් මාගේ සහෝදරයන්-
වත් ලබා නොගත්තෙමු.[13] **15** මට
කලින් ආණ්ඩුකාරයන් ලෙස සිටි
අය ජනතාව මත ඉමහත් බරක්
පැටවූහ. ඔවුහු ආහාර සහ වයින්
මිල දී ගැනීමට ජනතාවගෙන් දින-
පතා රිදී ෂෙකෙල්* හතළිහක් අය
කළෝය. ඔවුන් යටතේ සිටි සේවක
පිරිසත් ජනතාවට බොහෝ පීඩා ඇති
කළෝය.[1] නමුත් දෙවිට ගරුබිය දක්-
වන නිසා[2] මම එලෙස කටයුතු නො-
කළෙමි.[3]
**16** මම පවුර ගොඩනැඟීමේ කාර්-
යයටත් හවුල් වුණෙමි.[4] මා යටතේ
සිටි මුළු සේවක පිරිසත් ඒ කාර්යයට
හවුල් වූ අතර අපි වෙන කෙනෙ-
කුට අයිති එක කෙතක්වත් අයිති
කර නොගත්තෙමු.[5] **17** යුදෙව්ව-
රුන්ට හා නිලධාරීන් එකසිය පනස්-
දෙනෙකුටද අවට ජාතීන්ගෙන් අපගේ
සහයට පැමිණි අයටද ආහාර ලබා
දුන්නේ මමය.[6] **18** ඔවුන් සඳහා
මගේ වියදමින් මම දිනපතා ගව-
යෙකු, හොඳ බැටළුවන් හයදෙනෙකු
හා අවශ්‍ය තරම් කුරුල්ලන්ද සූදානම්
කළෙමි. දවස් දහයකට වරක් ඔවුන්ට
විවිධාකාර වයින්[7] වර්ගද සපයා දුන්-
නෙමි. එහෙත් ජනතාවට බොහෝ
වියදම් දැරිය නොහැකි නිසා මම
ආණ්ඩුකාරයාට ලබා දිය යුතු ආහාර
දීමනාවවත් ඔවුන්ගෙන් ඉල්ලා නො-
සිටියෙමි. **19** “මාගේ දෙවියනි, මම
මේ ජනතාව වෙනුවෙන් කර ඇති මේ
සෑම දෙයක්ම[8] අමතක නොකර මට
කරුණාව පෙන්වා[9] මාව සිහි කරන
මෙන් ඉල්ලා සිටිමි.”[10]

**6** මා පවුරේ කැඩී බිඳී ගිය සියලු
තැන් අලුත්වැඩියා කර එය
නැවත ගොඩනඟා තිබූ බව[11] සන්බ-
ලට්,[12] ටොබියා[13] සහ අරාබි ජාතික[14]
ගෙෂෙම්[15] ඇතුළු අපගේ සියලු සතු-
රන්ට ආරංචි විය. (ඒ අවස්ථාව
වන විට, පවුරේ දොරටු[16] විත-
රක් සවි කර තිබුණේ නැත.)[17]
**2** ඔවුන්ට මේ සියල්ල ආරංචි
වූ වහාම සන්බලට් සහ ගෙෂෙම්
පණිවිඩකරුවන් අතේ මට මෙසේ
දැන්වූහ. “අපි කැමතියි ඔබව හමු
වෙලා ටිකක් කතා කරන්න.[18] ඒ
සඳහා වේලාවක් තීරණය කරගෙන

**5 පරි.**
1 නෙහෙ 5:3
2 එස්රා 10:12
3 ලූක් 19:8
4 ගීතා 37:26, ගීතා 112:5, හිතෝ 19:17, හිතෝ 28:8, ලූක් 6:35
5 ද්වි 17:9, එස්රා 10:5
6 ද්වි 27:26
7 ගීතා 148:1
8 ගීතා 76:11, ගීතා 119:106, දේශ 5:5
9 එස්රා 8:1
10 නෙහෙ 10:1
11 නෙහෙ 2:1
12 නෙහෙ 13:6
13 1කොරි 9:4, 1කොරි 9:15, 2තෙස 3:8

**2 තීරුව**
1 හිතෝ 29:2
2 නෙහෙ 5:9, ගීතා 112:1, ගීතා 147:11, හිතෝ 16:6, දේශ 12:13
3 2කොරි 11:9, 2කොරි 12:14
4 1පේතෘ 5:3
5 ක්‍රියා 20:33, 2කොරි 12:17
6 2සාමු 9:7, ගීතා 37:21, යෙසා 32:8, පිලි 2:4, 1පේතෘ 4:9
7 දේශ 9:7, දේශ 10:19
8 හෙබ්‍රෙ 6:10
9 යෙසා 38:3
10 නෙහෙ 13:14, නෙහෙ 13:31, ගීතා 18:24, ගීතා 106:4, මලා 3:16

**6 පරි.**
11 නෙහෙ 4:6, ආමො 9:25
12 නෙහෙ 2:10
13 නෙහෙ 4:3
14 නෙහෙ 4:7
15 නෙහෙ 2:19
16 නෙහෙ 3:1
17 නෙහෙ 3:3
18 උත් 4:8, 2සාමු 3:27, 2සාමු 20:9, හිතෝ 26:24

නෙහෙ **5:13*** මුල් භාෂාවේ, “ළය පෙදෙසේ තිබෙන සාක්කුව” ගැන සඳහන් කෙරේ. **13#** මුල් භාෂාවට අනුව ආමෙන්!

නෙහෙ **5:15*** ෂෙකෙලයක් යනු ග්‍රෑම් 11.4කි.

ඕනෝ තැනිතලාව[1] ළඟ තිබෙන
ගමකදී හමු වෙමු.” නමුත් ඔවුන් මට
යම් හානියක්[2] කරන්න කුමන්ත්‍රණය
කරමින් සිටි බව මම දැනගෙන
සිටියෙමි. **3** එහෙයින් මම පණිවිඩ-
කරුවන් අතේ ඔවුන්ට මෙසේ දන්වා
යැව්වෙමි.[3] “මා දැන් කරමින් සිටින්-
නේ ඉතා බාරදූර කාර්යයක්.[4] මා
ඔබව හමු වෙන්න ආවොත් මේ වැඩ-
කටයුතු ප්‍රමාද වෙයි.[5] ඒ නිසා මට
ඔබව හමු වෙන්න එන්න බැහැ.”
**4** එහෙත් ඔවුහු හතර වතාවක්ම මට
පැමිණෙන්න කියා පණිවිඩ එවූහ.
මමද ඔවුන්ගේ ආරාධනාව දිගින් දිග-
ටම ප්‍රතික්ෂේප කළෙමි.

**5** එහෙත් සන්බලට්[6] පස්වන
වතාවටත් තම සේවකයෙකු අත එම
ආරාධනාව ලිපියකින් දන්වා එවීය.
එය මුද්‍රා නොකළ ලිපියකි. **6** එහි
ලියා තිබුණේ මෙයයි. “ඔබ යුදෙව්වන්
සමඟ එකතු වී යම් කැරැල්ලක් දියත්
කරන්න අදහස් කරන බව[7] අවට
ජාතීන් අතර ආරංචියක් පැතිර ඇත.
අපට ඒ ගැන ගෙෂෙම්ගෙන්ද[8] දැන-
ගන්න ලැබිණ. ඔබ පවුර ගොඩ-
නඟන්නේ ඒ හේතුව නිසා විය යුතුයි.
ඒ වගේම අපට ලැබී තිබෙන ආරංචි
අනුව, ඔබ මේ සෑම දෙයක්ම කරන්-
නේ යුදෙව්වරුන්ගේ රජු වීමේ අදහ-
සිනි.[9] **7** ‘යූදා දේශයේ දැන් රජෙක්
ඉන්නවා’ යයි ඔබ ගැන යෙරුස-
ලම පුරාම ප්‍රකාශ කරන්න කියා
මේ වන විටත් අනාගතවක්තෘවරුන්
කිහිපදෙනෙකුට ඔබ කියා තිබේ.
එවැනි දේවල් රජ්ජුරුවන්ට ආරංචි
විය හැකියි. ඒ නිසා මේ කාරණාව
ගැන අප සමඟ සාකච්ඡා කරන්න
පැමිණෙන්න කියා අපි ඔබට ආරා-
ධනා කරන්න කැමැත්තෙමු.”[10]

**8** එහෙත් මා පණිවිඩකරුවන් මාර්-
ගයෙන් ඔහුට පිළිතුරු දුන්නේ මෙ-
සේය. “ඔබ කියන ඒ දේවලට කිසිම
පදනමක් නැත.[11] ඒවා ඔබ විසින්ම
පතුරුවන ලද කටකතා විය යුතුයි.”[12]
**9** ඔවුන් සියලුදෙනා ඒ දේවල් කළේ
අපව බියගැන්වීමටයි. “අපි ඔවුන්ව
බියට පත් කළොත් ඔවුන් අධෛර්ය-
යට පත් වී[1] සියලුම වැඩකටයුතු
නතර කරයි” කියා ඔවුහු සිතූහ. “දෙවි-
යනි, මේ සියල්ලට සාර්ථකව මුහුණ
දෙන්නත් මේ කාර්යය නිම කරන්නත්
මට අවශ්‍ය ධෛර්යය දෙන්න.”[2]

**10** මේ අතර මම මෙහේටබෙල්-
ගේ පුත්‍රයෙකු වූ දෙලායාගේ පුත්
ෂෙමායාව හමු වීමට ගියෙමි. ඒ
අවස්ථාවේදී, ඔහු දොරවල් සියල්ලම
වසාගෙන තම නිවස තුළ රැඳී සිටි-
යේය.[3] ඔහුව හමු වූ විට ඔහු මට
මෙසේ පැවසීය. “ඔබේ සතුරන් අද
රෑට[4] ඇවිත් ඔබව මරන්න තීර-
ණය කර තිබෙනවා. ඉතින් අපි
සැබෑ දෙවිගේ ගෘහයේදී[5] හමු වී,[6]
දේවමාලිගාවේ දොරවල් වසාගෙන
ඇතුළට වී සිටිමු.” **11** නමුත් මම
මෙසේ පිළිතුරු දුන්නෙමි. “මම මො-
කටද පලා යන්නේ?[7] අනික, මම
වගේ කෙනෙකුට පුළුවන්ද දේව-
මාලිගාව ඇතුළට යන්න? එහෙම
කළොත් මට මරණ දඬුවම ලැබෙයි.[8]
මට නම් කොහොමටවත් එහෙම
කරන්න බැහැ!” **12** පසුව මා ඔහු
ගැන සොයා බැලූ විට, ඔහු මට පවසා
තිබුණේ[9] දෙවිගෙන් ලැබූ පණිවිඩ-
යක් නොවන බව[10] මට දැනගන්න
ලැබිණ. ඇත්තෙන්ම, ටොබියා සහ
සන්බලට්[11] මට විරුද්ධව අනාවැකි
කීමට ඔහුට යම් මුදලක් ගෙවා
තිබිණ.[12] **13** ඔවුන් එසේ කළේ,[13]
මාව බියගන්වා[14] දෙවිට විරුද්ධව
වරදක් කිරීමට මාව පොලඹවන්-
නයි.[15] මා ඒ දේ කළා නම් මට නින්දා
කර මාගේ නමට කැළැලක්[16] ඇති
කරන්න ඔවුන්ට අවස්ථාවක් උදා
වන්න ඉඩ තිබිණ.[17]

**14** “මාගේ දෙවියනි, ටොබියා[18]
සහ සන්බලට් කළ දේවල් අම-
තක කරන්න එපා.[19] අනාගතවක්තෘ-
වරියක් වන නොවදියාවත්[20] මාව
බියගැන්වීමට නිරතුරු උත්සාහයක්
දරන අනික් සියලු අනාගතවක්තෘව-
රුන්වත් අමතක නොකරන්න.”

**15** කල් යත්ම, පවුර[21] ගොඩනැඟී-

**6 පරි.**
1 1ලේක 8:12, නෙහෙ 11:35
2 ගීතා 12:2, ගීතා 37:12, ගීතා 37:32
3 හිතෝ 14:15, මතෙ 10:16
4 දේශ 9:10
5 රෝම 12:11
6 නෙහෙ 2:10
7 එස්රා 4:15
8 නෙහෙ 2:19
9 ලූක් 23:2
10 හිතෝ 26:24, ක්‍රියා 23:15
11 ක්‍රියා 24:13, ක්‍රියා 25:7
12 යෝබ් 13:4, ගීතා 36:3, ගීතා 38:12, ගීතා 52:2, මතෙ 12:34, යොහ 8:44

**2 තීරුව**
1 2ලේක 15:7, එස්රා 4:4, යෙසා 35:3, යෙරෙ 38:4
2 1සාමු 30:6, ගීතා 56:3, ගීතා 68:35, ගීතා 138:3, යෙසා 41:10
3 එස 3:24
4 යොහ 3:20
5 1රාජා 6:5, 2රාජා 11:3
6 ආමො 3:3
7 හිතෝ 28:1
8 ගණන් 1:51, ගණන් 18:7, 2ලේක 26:19
9 ගීතා 12:2, ගීතා 120:2
10 එළි 18:20, යෙරෙ 14:14
11 නෙහෙ 2:10
12 හිතෝ 11:9, එස 13:19
13 මීකා 3:11
14 යෙසා 51:12, එස 2:6
15 යාකො 4:17
16 හිතෝ 22:1, දේශ 7:1
17 ගීතා 36:11, මතෙ 22:15
18 නෙහෙ 4:3
19 නෙහෙ 4:4
20 එස 13:17
21 නෙහෙ 4:1

මේ කාර්යය අපි නිම කළෙමු. දවස්
පනස්දෙකකින් එනම්, එලූල් මාස-
යේ විසිපස්වන දින ඒ වැඩකටයුතු
සියල්ල අවසන් විය.
**16** මෙම කාර්යය නිම වූ බව දැන-
ගත් විට අපගේ සියලු සතුරන්ටත්[1]
අවට ජීවත් වූ සියලු ජාතීන්ටත්
මහත් ලැජ්ජාවක් ඇති විය. මන්ද
අප මෙම කාර්යය සාර්ථකව නිම
කළේ අපේ දෙවිගේ උපකාරය ඇතු-
වයි[2] කියා ඔවුන්ට වැටහිණ. **17** ඒ
කාලයේදී යූදා දේශයෙහි සිටි වංශ-
වත්[3] අය සහ ටොබියා[4] අතර බො-
හෝ ලිපි හුවමාරු විය. **18** එයට
හේතුව නම්, යූදා දේශයෙහි සිටි
බොහෝදෙනෙකු ටොබියාට පක්-
ෂව සිටින්න පොරොන්දු වී තිබී-
මය. මන්ද ඔහු ආරාහ්ගේ[5] පුත්
ෂෙකනියාගේ බෑනා විය. එමෙන්ම
ඔහුගේ පුත් යෙහෝහානාන්, බෙරෙකි-
යාගේ පුත් මෙෂුල්ලම්ගේ[6] දියණියව
විවාහ කරගෙන සිටියේය. **19** ඒ
නිසා ඔවුහු ටොබියා ගැන මට නිත-
රම ප්‍රශංසා මුඛයෙන් කතා කළෝය.[7]
මා පැවසූ දේවල්ද ඔවුහු ටොබියා වෙ-
තට ගොස් වාර්තා කළෝය. ටොබියා
මාව බියගැන්වීම සඳහා මට නිතරම
ලිපි එව්වේය.[8]

**7** පවුර නැවත ගොඩනඟා අවසන්
කළ වහාම[9] මම එහි දොරටුද
සවි කළෙමි.[10] දොරටු පාලකයන්වද[11]
ගායකයන්වද[12] ලෙවීවරුන්වද[13] තම
කාර්යයන් සඳහා පත් කරන ලදී.
**2** ඉන්පසුව මම යෙරුසලම පාලනය
කිරීමට මාගේ සහෝදරයෙකු වූ හනා-
නිවද[14] දේවමාලිගාවේ බලකොටුව[15]
භාරව සිටි අධිපතියෙකු වූ හනනියා-
වද පත් කළෙමි. හනනියා බොහෝ-
දෙනෙකුට වඩා සැබෑ දෙවිට ගරුබිය
දැක්වූ[16] ඉතා විශ්වාසවන්ත[17] කෙ-
නෙකි. **3** මම ඔවුන් දෙදෙනාටම
මෙසේ පැවසුවෙමි. “හිරු මුදුන් වන
වේලාව පැමිණෙන තුරු යෙරුස-
ලමෙහි දොරටු[18] විවෘත නොකළ
යුතුයි. සවස් වරුවේ මුරට පැමිණෙන
අය එම දොරවල් වසා ඒවාට අගුලු
දැමිය යුතුයි.[1] ඒ වගේම යෙරුසල-
මෙහි වැසියන් අතරින් මුරකරුවන්ව
තෝරාගන්න. ඔවුන්ගෙන් සමහරෙ-
කුට තමන්ගේම නිවෙස් මුර කිරීමට
නියම කරන්න. අනික් අයව මුරපො-
ළවලට පත් කරන්න.”[2] **4** දිගින් හා
පළලින් නුවර ඉතා විශාල වුවත් ඒ
තුළ වාසය කළේ ස්වල්පදෙනෙකි.[3]
එහි නිවෙස්ද ඉදි කර නොතිබිණ.
**5** මම වංශවත් අයවද නිලධාරීන්-
වද පොදු ජනයාවද එකතු කරගෙන
ඔවුන්ගේ නම් පෙළපත් වාර්තාවලට
ඇතුළත් කිරීමට පියවර ගත්තෙමි.[4]
එම අදහස මාගේ සිත[5] තුළ ඇති
කළේ මාගේ දෙවිය. ඉන්පසුව වහල්-
කමින් නිදහස් වී මුලින්ම පැමිණි අය-
ගේ විස්තර අඩංගු පෙළපත් වාර්තාව[6]
මා අතට පත් විය. එහි ලියා තිබුණු
විස්තර මතු දැක්වේ.
**6** බැබිලෝනියේ රජු වූ නෙබුකද්-
නෙෂර්[7] වහල්භාවයට ගෙන ගිය[8]
අයගේ පැවතෙන්නන් අතරින් බො-
හෝදෙනෙක් යෙරුසලමෙහි සහ
යූදාහි[9] පිහිටි තම තමන්ගේ නුවරව-
ලට[10] ආපසු පැමිණියෝය.[11] **7** සෙ-
රුබාබෙල්,[12] යේෂුවා,[13] නෙහෙමියා,
අෂරියා,* රයමියා,# නහමානී, මොර්-
දෙකයි,[14] බිල්ෂාන්, මිස්පෙරෙත්,△
බිග්වායි, නේහුම්⊠ සහ බානාහ් යන
අය සමඟ යූදා දේශයට පැමිණි ඔවුන්-
ගේ විස්තර මතු දැක්වේ.
ඊශ්‍රායෙල් සෙනඟ අතරේ සිටි
පුරුෂයන්ගේ සංඛ්‍යාව මෙසේය.
**8** පාරොෂ්ගේ පුත්‍රයන්ගේ[15] ගණන දෙ-
දහස් එකසිය හැත්තෑදෙකකි. **9** ෂෙ-
පටියාගේ පුත්‍රයන්ගේ[16] ගණන තුන්සිය
හැත්තෑදෙකකි. **10** ආරාහ්ගේ පුත්‍ර-
යන්ගේ[17] ගණන හයසිය පනස්දෙකකි.

**6 පරි.**
**1** නෙහෙ 2:10 නෙහෙ 4:7
**2** ගීතා 129:5
**3** නෙහෙ 5:7
**4** නෙහෙ 2:10
**5** එස්රා 2:5 නෙහෙ 7:10
**6** නෙහෙ 3:4
**7** හිතෝ 28:4 යොහ 15:19 1යොහ 4:5
**8** නෙහෙ 6:9 නෙහෙ 6:13

**7 පරි.**
**9** නෙහෙ 2:17 නෙහෙ 6:15 දානි 9:25
**10** නෙහෙ 3:1 නෙහෙ 3:6 නෙහෙ 3:13
**11** 1ලේක 26:1 1ලේක 26:12 එස්රා 2:42
**12** 1ලේක 9:33 එස්රා 2:41
**13** 1ලේක 23:28 එස්රා 3:8
**14** නෙහෙ 1:2
**15** 2ලේක 17:12 2ලේක 26:9 නෙහෙ 2:8 ක්‍රියා 23:10
**16** නික් 18:21 2සාමු 23:3 නෙහෙ 5:15 හිතෝ 8:13 යෙසා 33:6
**17** ගීතා 101:6 හිතෝ 28:20 ක්‍රියා 6:3 1කොරි 4:2
**18** නෙහෙ 2:13 නෙහෙ 12:39

**2 තීරුව**
**1** නෙහෙ 13:19
**2** ගීතා 127:1
**3** නෙහෙ 11:1
**4** 1ලේක 9:1 එස්රා 2:62
**5** එස්රා 7:27
**6** 1ලේක 4:33 1ලේක 5:1
**7** 2රාජා 25:1 දානි 3:1
**8** 2රාජා 24:14 2ලේක 36:20 යෙරෙ 39:9 යෙරෙ 52:15 යෙරෙ 52:28
**9** එස්රා 5:8 එස්ත 9:30
**10** එස්රා 2:1
**11** නෙහෙ 1:3
**12** එස්රා 1:11 එස්රා 2:2 සෙක 4:7 මතෙ 1:12

**13** එස්රා 3:8; එස්රා 5:2; හග් 1:14; සෙක 3:1; **14** එස්රා 2:2; **15** එස්රා 2:3; නෙහෙ 10:14; **16** එස්රා 2:4; **17** එස්රා 2:5; නෙහෙ 6:18.

නෙහෙ **7:7*** එස්රා 2:2හි, “සෙරායා” ලෙස හැඳින්වේ. **7#** එස්රා 2:2හි, “රෙයලායා” ලෙස හැඳින්වේ. **7△** එස්රා 2:2හි, “මිස්පාර්” ලෙස හැඳින්වේ. **7⊠** එස්රා 2:2හි, “රෙහුම්” ලෙස හැඳින්වේ.

**11** පාහත්-මෝවබ්ගේ* පෙළපතට
අයත්[1] යේෂුවාගේ සහ යෝ-
වාබ්ගේ පුත්‍රයන්ගේ[2] ගණන දෙද-
හස් අටසිය දහඅටකි. **12** ඒලාම්ගේ
පුත්‍රයන්ගේ[3] ගණන එක්දහස් දෙසිය
පනස්හතරකි. **13** සට්ටුගේ පුත්‍ර-
යන්ගේ[4] ගණන අටසිය හතළිස්-
පහකි. **14** ෂක්කායිගේ පුත්‍රයන්ගේ[5]
ගණන හත්සිය හැටකි. **15** බින්නු-
යිගේ* පුත්‍රයන්ගේ[6] ගණන හයසිය
හතළිස්අටකි. **16** බෙබායිගේ පුත්‍ර-
යන්ගේ[7] ගණන හයසිය විසිඅටකි.
**17** අස්ගාද්ගේ පුත්‍රයන්ගේ[8] ගණන දෙ-
දහස් තුන්සිය විසිදෙකකි. **18** අදො-
නිකාම්ගේ පුත්‍රයන්ගේ[9] ගණන හයසිය
හැටහතකි. **19** බිග්වායිගේ පුත්‍රයන්-
ගේ[10] ගණන දෙදහස් හැටහතකි.
**20** ආදින්ගේ පුත්‍රයන්ගේ[11] ගණන හය-
සිය පනස්පහකි. **21** හෙසකියාගේ
පවුලට අයත් ආටෙර්ගේ පුත්‍රයන්-
ගේ[12] ගණන අනූඅටකි. **22** හාෂුම්-
ගේ පුත්‍රයන්ගේ[13] ගණන තුන්සිය
විසිඅටකි. **23** බේෂායිගේ පුත්‍රයන්-
ගේ[14] ගණන තුන්සිය විසිහත-
රකි. **24** හාරිෆ්ගේ* පුත්‍රයන්ගේ[15]
ගණන එකසිය දොළහකි. **25** ගිබි-
යොන්හි*[16] පුරුෂයන්ගේ ගණන
අනූපහකි. **26** බෙත්ලෙහෙම[17] සහ
නෙටොෆාහි[18] පුරුෂයන්ගේ ගණන
එකසිය අසූඅටකි. **27** අනාතොත්හි
පුරුෂයන්ගේ[19] ගණන එකසිය විසිඅ-
ටකි. **28** බෙත්-අෂ්මාවෙත්හි පුරුෂ-
යන්ගේ[20] ගණන හතළිස්දෙකකි.
**29** කිර්යත්-යෙයාරීම්,[21] කෙෆීරා[22] සහ
බෙයේරොත්හි[23] පුරුෂයන්ගේ ගණන
හත්සිය හතළිස්තුනකි. **30** රාමා[24]
සහ ගෙබාහි[25] පුරුෂයන්ගේ ගණන
හයසිය විසිඑකකි. **31** මික්මාස්හි
පුරුෂයන්ගේ[26] ගණන එකසිය විසිදෙ-
කකි. **32** බෙතෙල්හි[27] සහ ආයිහි[28]
පුරුෂයන්ගේ ගණන එකසිය විසිතු-
නකි. **33** නෙබෝහි* පුරුෂයන්ගේ[1]
ගණන පනස්දෙකකි. **34** ඒලාම්-
ගේ* පුත්‍රයන්ගේ[2] ගණන එක්දහස්
දෙසිය පනස්හතරකි. **35** හාරිම්ගේ
පුත්‍රයන්ගේ[3] ගණන තුන්සිය විස්-
සකි. **36** යෙරිකෝවෙහි පුරුෂයන්-
ගේ[4] ගණන තුන්සිය හතළිස්පහකි.
**37** ලොද්,[5] හාදිද්[6] සහ ඕනෝගේ[7]
පුත්‍රයන්ගේ ගණන හත්සිය විසිඑකකි.
**38** සෙනායාගේ පුත්‍රයන්ගේ[8] ගණන
තුන්දහස් නවසිය තිහකි.

**39** පූජකයන්ගේ ගණන මෙසේය.
යේෂුවාගේ පවුලට අයත් යෙදා-
යාගේ පුත්‍රයන්ගේ[9] ගණන නවසිය
හැත්තෑතුනකි. **40** ඉම්මේර්ගේ පුත්‍ර-
යන්ගේ[10] ගණන එක්දහස් පනස්-
දෙකකි. **41** පෂ්හූර්ගේ පුත්‍රයන්ගේ[11]
ගණන එක්දහස් දෙසිය හතළිස්-
හතකි. **42** හාරිම්ගේ පුත්‍රයන්ගේ[12]
ගණන එක්දහස් දහහතකි.

**43** ලෙවීවරුන්ගේ ගණන මෙසේය.
හෝදෙවාගේ[13] පවුලට අයත් කද්මි-
යෙල්ගේ[14] එනම්, යේෂුවාගේ පුත්‍ර-
යන්ගේ ගණන හැත්තෑහතරකි.
**44** ගායකයන් වූ[15] ආසාෆ්ගේ පුත්‍රයන්-
ගේ[16] ගණන එකසිය හතළිස්අටකි.
**45** දොරටු පාලකයන්ගේ[17] පුත්‍රයන්
එනම්, ෂල්ලුම්,[18] ආටෙර්, ටල්මොන්,[19]
අක්කුබ්,[20] හටීටා සහ ෂෝබයි[21] යන
අයගේ පුත්‍රයන්ගේ ගණන එකසිය
තිස්අටකි.

**46** නෙතිනිම්වරුන්ගේ[22] නම් මෙ-
සේය. ශීහාගේ පුත්‍රයෝද හසුෆාගේ
පුත්‍රයෝද ටබ්බාවොත්ගේ පුත්‍රයෝද[23]
**47** කෙරොස්ගේ පුත්‍රයෝද සියාගේ*
පුත්‍රයෝද පාදොන්ගේ පුත්‍රයෝද[24]
**48** ලෙබානාගේ පුත්‍රයෝද හගාබා-
ගේ පුත්‍රයෝද[25] සල්මයිගේ පුත්‍රයෝද
**49** හානාන්ගේ පුත්‍රයෝද[26] ගිද්දෙල්-

**7 පරි.**
**1** එස්රා 2:6 එස්රා 10:30
**2** එස්රා 8:9
**3** එස්රා 2:7 එස්රා 10:26
**4** එස්රා 2:8
**5** එස්රා 2:9
**6** එස්රා 2:10 එස්රා 10:34
**7** එස්රා 2:11
**8** එස්රා 2:12
**9** එස්රා 2:13
**10** එස්රා 2:14
**11** එස්රා 2:15
**12** එස්රා 2:16
**13** එස්රා 2:19 නෙහෙ 10:18
**14** එස්රා 2:17
**15** එස්රා 2:18
**16** යොෂු 11:19 2සාමු 21:2 එස්රා 2:20 නෙහෙ 3:7
**17** උත් 35:19 1ලේක 2:51 මතෙ 2:6
**18** 1ලේක 2:54 එස්රා 2:22 යෙරෙ 40:8
**19** යොෂු 21:18 එස්රා 2:23 යෙරෙ 1:1
**20** එස්රා 2:24
**21** යොෂු 9:17 1සාමු 7:2
**22** යොෂු 18:26 එස්රා 2:25
**23** යොෂු 18:25
**24** එස්රා 2:26
**25** යොෂු 18:24 සෙක 14:10
**26** 1සාමු 13:5 එස්රා 2:27
**27** 1රාජා 12:32 එස්රා 2:28
**28** යොෂු 7:2

**2 තීරුව**
**1** එස්රා 2:29
**2** එස්රා 2:31
**3** එස්රා 2:32
**4** එස්රා 2:34
**5** නෙහෙ 11:35
**6** එස්රා 2:33
**7** නෙහෙ 6:2
**8** එස්රා 2:35
**9** එස්රා 2:36
**10** එස්රා 2:37
**11** එස්රා 10:22
**12** 1ලේක 24:8 එස්රා 2:39
**13** එස්රා 2:40
**14** එස්රා 3:9
**15** 1ලේක 25:7 එස්රා 2:41
**16** 1ලේක 6:39
**17** නෙහෙ 7:1
**18** යෙරෙ 35:4
**19** 1ලේක 9:17 නෙහෙ 11:19
**20** නෙහෙ 12:25; **21** එස්රා 2:42; **22** යොෂු 9:27; 1ලේක 9:2; එස්රා 2:58; **23** එස්රා 2:43; **24** එස්රා 2:44; **25** එස්රා 2:45; **26** එස්රා 2:46.

නෙහෙ **7:11*** එස්රා 2:6හි පාදසටහන බලන්න. **15*** එස්රා 2:10හි, “බානි” ලෙස හැඳින්වේ. **24*** එස්රා 2:18හි, “යෝරා” ලෙස හැඳින්වේ. **25*** එස්රා 2:20හි, “ගිබ්බාර්” ලෙස හැඳින්වේ.

නෙහෙ **7:33*** එනම්, නෙබෝ යන නමින් තිබූ අනිත් නුවරයි. **34*** එස්රා 2:31හි පාදසටහන බලන්න. **47*** එස්රා 2:44හි, “සියාහා” ලෙස හැඳින්වේ.

ගේ පුත්‍රයෝද ගහර්ගේ පුත්‍රයෝද
**50** රෙයායාගේ පුත්‍රයෝද[1] රෙෂීන්ගේ
පුත්‍රයෝද[2] නෙකෝදාගේ පුත්‍රයෝද
**51** ගෂ්ෂාම්ගේ පුත්‍රයෝද උස්සා-
ගේ පුත්‍රයෝද පාසේයාගේ පුත්‍රයෝද
**52** බේසයිගේ පුත්‍රයෝද[3] මෙයූනි-
වරුන්ගේ පුත්‍රයෝද නෙෆුෂෙසිම්ව-
රුන්ගේ* පුත්‍රයෝද[4] **53** බක්බුක්ගේ
පුත්‍රයෝද හකූෆාගේ පුත්‍රයෝද හර්-
හූර්ගේ පුත්‍රයෝද[5] **54** බෂ්ලීත්ගේ*
පුත්‍රයෝද මෙහිදාගේ පුත්‍රයෝද හර්ෂා-
ගේ පුත්‍රයෝද[6] **55** බාකොස්ගේ පුත්‍-
යෝද සිසෙරාගේ පුත්‍රයෝද තෙමාගේ
පුත්‍රයෝද[7] **56** නෙෂියාගේ පුත්‍රයෝද
හටීෆාගේ පුත්‍රයෝද[8] යන සියලුදෙනා
නෙතිනිම්වරුය.

**57** සලමොන්ගේ සේවකයන්[9] නම්
මොවුහුය. සෝටයිගේ පුත්‍රයන්ද සො-
ෆෙරෙත්ගේ පුත්‍රයන්ද පෙරීදාගේ*
පුත්‍රයන්ද[10] **58** යයලාගේ පුත්‍රයන්ද
දර්කොන්ගේ පුත්‍රයන්ද ගිද්දෙල්ගේ
පුත්‍රයන්ද[11] **59** ෂෙපටියාගේ පුත්‍-
යන්ද හට්ටිල්ගේ පුත්‍රයන්ද පො-
කෙරෙත්-හජ්ෂෙබායිම්ගේ පුත්‍රයන්ද
ආමොන්ගේ* පුත්‍රයන්ද[12] යන අයයි.
**60** නෙතිනිම්වරුන්ගේ[13] සහ සල-
මොන්ගේ සේවකයන්ගේ පුත්‍රයන්ගේ
මුළු ගණන තුන්සිය අනූදෙකකි.

**61** ටෙල්-මේලා, ටෙල්-හර්ෂා, කේ-
රුබ්, අද්දොන් සහ ඉම්මේර් යන නුව-
රවලින් පැමිණි අයගේ නම් මතු
දැක්වේ.[14] එහෙත් ඔවුන්ගේ පවුල්
ඊශ්‍රායෙල්ගෙන් පැවතෙන්නන් බව
ඔප්පු කර පෙන්වීමට ඔවුන්ට
නොහැකි විය. **62** දෙලායාගේ පුත්‍-
යන්ද ටොබියාගේ පුත්‍රයන්ද නෙකෝ-
දාගේ පුත්‍රයන්ද[15] යන මොවුන්ගේ
මුළු ගණන හයසිය හතළිස්දෙකකි.
**63** පූජකයන්[16] අතරේ හබායාගේ
පුත්‍රයෝද හක්කොෂ්ගේ[17] පුත්‍රයෝද
බාසිල්ලයිගේ පුත්‍රයෝද[18] සිටියෝය.
බාසිල්ලයිගේ පුත්‍රයන්ට එම නම
ලැබුණේ, ඔවුන්ගේ මුතුන්මිත්තා ගිලි-
යද්වරයෙකු වූ බාසිල්ලයිගේ[1] දිය-
ණියකව විවාහ කරගෙන ඔහුගේ
නම ලබාගත් නිසාය. **64** ඔවුන් තම
පෙළපත කුමක්ද කියා ඔප්පු කිරී-
මට පෙළපත් ලේඛනවල තමන්ගේ
නම් සෙවූ නමුත්, එය සොයාගත
නොහැකි[2] වූ නිසා ඔවුන් පූජකයන්
ලෙස සේවය කිරීමට නුසුදුසු අය බව
තීරණය කරන ලදි.[3] **65** එහෙයින්
පූජකයෙකු ඌරීම්[4] සහ තුම්මීම්*[5]
යොදාගෙන තීන්දුවක් දෙන තෙක් දෙ-
විට කැප කළ ආහාර කෑමට ඔවුන්ට
අවසර නැති බව[6] ආණ්ඩුකාරයා#[7]
පැවසුවේය.

**66** ඉහත සඳහන් වූ අයගේ මුළු
ගණන හතළිස්දෙදහස් තුන්සිය
හැටකි.[8] **67** ඊට අමතරව ඔවුන්ට
සිටි දාසදාසීන්ගේ[9] ගණන හත්ද-
හස් තුන්සිය තිස්හතකි.[10] එමෙන්ම
ගායක[11] ගායිකාවෝ[12] දෙසිය හත-
ළිස්පහක්ද ඔවුන් සමඟ සිටියෝය.
**68** ඔවුන්ට අශ්වයෝ හත්සිය තිස්-
හයක්ද කොටළුවෝ දෙසිය
හතළිස්පහක්ද[13] **69** ඔටුවෝ හාර-
සිය තිස්පහක්ද බූරුවෝ[14] හයදහස්
හත්සිය විස්සක්ද සිටියෝය.[15]

**70** පෙළපත්වල[16] ප්‍රධානීන්ගෙන්
සමහරදෙනෙක්[17] වැඩකටයුතු වෙ-
නුවෙන් යම් පරිත්‍යාග කළෝය.[18]
ආණ්ඩුකාරයාද*[19] භාණ්ඩාගාරයට
රන් ඩ්‍රැක්මා# දහසක්, බඳුන් පනහක්
හා පූජකයන්ට ඇඳිය හැකි වස්ත්‍ර
පන්සිය තිහක් පරිත්‍යාග කළේය.[20]
**71** පෙළපත්වල ප්‍රධානීන්ගෙන් සම-
හරදෙනෙක් රන් ඩ්‍රැක්මා විසිදහසක්ද
රිදී මීනා*[21] දෙදහස් දෙසියයක්ද
භාණ්ඩාගාරයට පරිත්‍යාග කළෝය.
**72** පොදු ජනයා රන් ඩ්‍රැක්මා
විසිදහසක්ද රිදී මීනා දෙදහසක්ද

**7 පරි.**
1 එස්රා 2:47
2 එස්රා 2:48
3 එස්රා 2:49
4 එස්රා 2:50
5 එස්රා 2:51
6 එස්රා 2:52
7 එස්රා 2:53
8 එස්රා 2:54
9 1රාජා 9:21 නෙහෙ 11:3
10 එස්රා 2:55
11 එස්රා 2:56
12 එස්රා 2:57
13 යොෂු 9:23 එස්රා 2:58 නෙහෙ 3:26 නෙහෙ 7:46
14 එස්රා 2:59
15 එස්රා 2:60
16 1ලේක 24:1
17 1ලේක 24:10 නෙහෙ 3:21
18 එස්රා 2:61

**2 තීරුව**
1 2සාමු 17:27 2සාමු 19:31 2සාමු 19:39 1රාජා 2:7
2 එස්රා 2:62
3 ගණන් 18:7
4 නික් 28:30 1සාමු 28:6
5 ලෙවී 8:8 ද්වි 33:8
6 ලෙවී 2:3 ගණන් 18:9
7 එස්රා 2:63 නෙහෙ 8:9 නෙහෙ 10:1
8 එස්රා 2:64
9 නික් 21:2 ලෙවී 25:44
10 එස්රා 2:65
11 නෙහෙ 7:1
12 නික් 15:21 1සාමු 18:6 2සාමු 19:35
13 එස්රා 2:66
14 1සාමු 8:16 2සාමු 16:2
15 එස්රා 2:67
16 ගණන් 17:2 1ලේක 23:11
17 ගණන් 7:2 එස්රා 1:5
18 එස්රා 2:68
19 එස්රා 2:63 නෙහෙ 7:65
20 ලෙවී 6:10 යෙසා 22:21
21 එස්රා 2:69

නෙහෙ **7:52*** එස්රා 2:50හි, "නෙෆූසිම්" යයි සඳ-හන් වේ. **54*** එස්රා 2:52හි, "බෂ්ලූත්" ලෙස හැඳින්වේ. **57*** එස්රා 2:55හි, "පෙරූදා" ලෙස හැඳින්වේ. **59*** එස්රා 2:57හි, "ආමී" ලෙස හැඳින්වේ.

නෙහෙ **7:65*** නික් 28:30හි දෙවන පාදසටහන බලන්න. **65#** මූ.අ., "තිර්ෂාතා." **70*** මූ.අ., "තිර්ෂාතා." **70#** එස්රා 2:69හි පළමුවන පා-දසටහන බලන්න. **71*** එස්රා 2:69හි දෙවන පාදසටහන බලන්න.

පූජකයන්ට ඇඳිය හැකි වස්ත්‍ර හැටහ-
තක්ද පරිත්‍යාග කළෝය.
**73** පූජකයෝද[1] ලෙවීවරුද දො-
රටු පාලකයෝද ගායකයෝද[2] යුදෙව්
ජනතාව අතරින් යම් පිරිසක්ද නෙ-
තිනිම්වරුද[3] සියලුම ඊශ්‍රායෙල්වරුද
තම තමන්ගේ නුවරවලට ගොස්
පදිංචි වූහ.[4] අවුරුද්දේ හත්වන මාසය
වන විට[5] සියලුම ඊශ්‍රායෙල්වරු තම
තමන්ගේ නුවරවල පදිංචි වී සිටි-
යෝය.[6]

**8** සියලු ජනයා එකා මෙන්[7] ජල
දොරටුව[8] ඉදිරිපිට තිබෙන
ප්‍රධාන මංසන්ධියෙහි[9] එක් රැස් වූහ.
ඉන්පසු යෙහෝවා දෙවි මෝසෙස්
මාර්ගයෙන් ඊශ්‍රායෙල් ජාතියට ලබා
දුන්[10] නීතිය[11] සඳහන් ලියවිල්ල[12]
රැගෙන එන ලෙස පිටපත්කරු වූ එස්-
රාගෙන්[13] ඔවුහු ඉල්ලා සිටියෝය.
**2** එහෙයින් පූජක[14] එස්රා පුරුෂයන්,
ස්ත්‍රීන් ඇතුළු සවන් දී තේරුම්ගැනී-
මට හැකි[15] සියලුදෙනා ඉදිරියට[16] ඒ
ලියවිල්ල ගෙනාවේය. මේ දේ සිදු
වූයේ අවුරුද්දේ හත්වන මාසයේ පළ-
මුවන දිනයේදීය.[17] **3** ඔහු අලුය-
මේ[18] සිට හිරු මුදුන් වන වේලාව
දක්වා ජල දොරටුව ඉදිරිපිට තිබෙන
ප්‍රධාන මංසන්ධියේ රැස්ව සිටි පුරුෂ-
යන්ට, ස්ත්‍රීන්ට හා තේරුම්ගැනී-
මේ හැකියාව තිබූ අන් සියලුදෙනාට
ඇසෙන සේ ලියවිල්ල කියෙව්වේය.[19]
ජනයා නීතියේ සඳහන්ව තිබූ දේව-
ලට හොඳ අවධානයක්[20] දුන්නෝය.
**4** පිටපත්කරු වන එස්රා සිටගෙන
සිටියේ ඒ අවස්ථාව සඳහා විශේෂ-
යෙන්ම තනා තිබූ ලී වේදිකාවක්
මතය.[21] මත්තිතියා, ෂෙමා, අනායා,
උරියා, හිල්කියා සහ මයසේයා යන
අය ඔහුගේ දකුණු පැත්තේ සිටගෙන
සිටියෝය. ඔහුගේ වම්පසින් සිටි-
යේ පෙදායා, මීෂායෙල්, මල්කියා,[22]
හාෂුම්,[23] හෂ්-බද්දානා, සෙකරියා සහ
මෙෂුල්ලම් යන අයයි.
**5** රැස්ව සිටි ජනයාට මදක් ඉහ-
ළින් සිටගෙන සිටි එස්රා සියලුදෙනා
ඉදිරියේ ලියවිල්ල දිගහැරියේය.[24]
ඔහු එසේ කළ විට සියලුදෙ-
නාම නැඟිට සිටියෝය.[1] **6** ඉන්ප-
සුව එස්රා එකම සැබෑ වූ ශ්‍රේෂ්ඨ දෙවි
වන යෙහෝවාට ප්‍රශංසා කළේය.[2]
එවිට සියලුදෙනාම තම අත් ඔසව-
මින්,[3] “එසේම වේවා! එසේම වේවා”*[4]
යයි පවසමින් වැඳ වැටී[5] යෙහෝවා
දෙවිට නමස්කාර කළෝය.[6] **7** ඒ
අවස්ථාවේදී, ලෙවීවරුන් වූ යේෂුවා,
බානි, ෂෙරෙබියා,[7] යාමින්, අක්කුබ්,
ෂබ්බෙතයි, හෝදියා, මයසේයා, කෙ-
ලීටා, අෂරියා, යෝෂාබාද්,[8] හානාන්
සහ පෙලායා[9] යන අය සිටගෙන
සිටි[10] ජනයාට නීතියේ සඳහන් දේවල්
පැහැදිලි කර දුන්හ.[11] **8** ඔවුහු සැබෑ
දෙවිගේ නීතිය සඳහන් ලියවිල්ල
කියවා[12] එහි සඳහන් දේවල් ජනයාට
දිගටම පහදා දෙමින් ඒ දේවල නියම
අර්ථය තේරුම්ගැනීමට ඔවුන්ට උප-
කාර කළෝය.[13]
**9** පසුව ආණ්ඩුකාරයා*[14] ලෙස
කටයුතු කළ නෙහෙමියා,[15] පිටපත්-
කරු වූ පූජක එස්රා[16] හා ජන-
යාට උගන්වමින් සිටි ලෙවීවරු රැස්ව
සිටි සියලුදෙනාට මෙසේ පැවසූහ.
“මේ දවස ඔබේ දෙවි වන යෙහෝ-
වාට ශුද්ධ වූ දවසක්.[17] ඒ නිසා
ශෝක වෙන්නවත් හඬා වැලපෙන්න-
වත් එපා.”[18] ඔවුන් එසේ පැවසුවේ
නීතියේ සඳහන් දේවල් අසා සියලු-
දෙනා හඬා වැලපෙමින් සිටි නිසාය.[19]
**10** නෙහෙමියා ඔවුන්ට මෙසේද පැව-
සීය. “ගොස් රසවත් කෑම කා මිහිරි
පාන බොන්න. කෑම බීම සූදානම් කර
නොගත් අයටත් ආහාර පංගුවක්
යවන්න.[20] මන්ද මේ දවස අපේ ස්වා-
මීන්ට ශුද්ධ දවසක්. ඒ නිසා දැන්
දුක් වෙන්න එපා. මන්ද යෙහෝවා
දෙවි දෙන ප්‍රීතිය ඔබට බලකො-
ටුවක් මෙන් වෙයි.” **11** ඉන්පසුව

**7 පරි.**
1 2ලේක 35:14
2 නෙහෙ 7:1
3 නෙහෙ 7:46
4 නෙහෙ 11:20
5 ලෙවී 23:24
1රාජා 8:2
එස්රා 3:1
6 එස්රා 2:70

**8 පරි.**
7 ක්‍රියා 2:46
8 නෙහෙ 3:26
නෙහෙ 12:37
9 යෙරෙ 5:1
10 ලෙවී 27:34
ගණන් 36:13
ද්වි 28:1
11 ද්වි 31:9
යොෂු 1:8
1රාජා 2:3
12 2ලේක 34:15
13 එස්රා 7:6
14 ද්වි 17:18
මලා 2:7
15 නෙහෙ 10:28
යෙසා 28:9
16 ද්වි 31:12
2ලේක 17:9
17 ලෙවී 23:24
ගණන් 29:1
1රාජා 8:2
18 ක්‍රියා 28:23
19 ලූක් 4:16
ක්‍රියා 13:15
ක්‍රියා 15:21
20 ද්වි 5:1
ලූක් 8:18
ක්‍රියා 16:14
ක්‍රියා 17:11
හෙබ්‍රෙ 2:1
21 2ලේක 6:13
22 නෙහෙ 12:42
23 නෙහෙ 10:18
24 ලූක් 4:17

**2 තීරුව**
1 1රාජා 8:14
2 ගීතා 72:18
එෆී 1:3
එළි 4:11
3 1රාජා 8:22
4 ද්වි 27:26
1කොරි 14:16
5 1ලේක 29:20
2ලේක 20:18
ගීතා 95:6
6 ලෙවී 9:24
මතෙ 26:39
එළි 7:11
7 නෙහෙ 9:4
8 එස්රා 8:33
නෙහෙ 11:16
9 නෙහෙ 10:10
10 1රාජා 8:14
11 ලෙවී 10:11
ද්වි 33:10
12 1තිමෝ 4:13

**13** හබ 2:2; ලූක් 24:27; ක්‍රියා 8:31; **14** නෙහෙ 7:65; **15** නෙහෙ 1:1; **16** එස්රා 7:11; **17** ලෙවී 23:24; ගණන් 29:1; **18** ද්වි 16:14; ද්වි 16:15; **19** 2රාජා 22:11; **20** එස්ත 9:19.

නෙහෙ **8:6*** ගණන් 5:22හි පාදසටහන බලන්න.
**9*** මූ.අ., “තිර්ෂාතා.”

ලෙවීවරු, "දැන් නිශ්ශබ්ද වෙන්න.
මේ දවස ශුද්ධ දවසක්. ඒ නිසා
දුකින් සිටින්න එපා" යයි සියලු-
දෙනාට පැවසූහ. **12** සියලුදෙනාම
තමන්ට පැහැදිලි කර දුන් දේවල්
හොඳින් තේරුම්ගත්[1] නිසා සතු-
ටින් සිටියෝය. එහෙයින් ඔවුහු කෑම
බීම නැති අයට ආහාර පංගු යවන්-
නත්[2] කා බී අතිශයින් ප්‍රීති වන්නත්[3]
පිටත්ව ගියෝය.

**13** පසුවදා එනම්, මාසයේ දෙව-
නදා, පෙළපත්වල ප්‍රධානීහු, පූජක-
යෝ සහ ලෙවීවරු පිටපත්කරු වූ
එස්රා වෙතට ආවෝය. ඔවුන්ගේ අර-
මුණ වූයේ නීතියේ සඳහන් දේවල්
පිළිබඳව වඩාත් ගැඹුරු අවබෝධයක්
ලබාගැනීමය.[4] **14** යෙහෝවා දෙවි
මෝසෙස්[5] මාර්ගයෙන් දුන් නීතිය
සඳහන් ලියවිල්ල පරීක්ෂා කර බැලූ
විට, හත්වන මාසයේ[6] පවත්වන
උත්සවයේදී සියලුම ඊශ්‍රායෙල්වරුන්
පැල්වල[7] වාසය කළ යුතු බව ඔවුහු
වටහාගත්තෝය. **15** මීට අමතරව
ඒ බව සඳහන් කර ප්‍රසිද්ධ නිවේදන-
යක් කළ යුතු බවත්[8] ඔවුන්ගේ සිය-
ලුම නුවරවල හා යෙරුසලමේ[9] පුරාම
නියෝගයක් නිකුත් කළ යුතු බවත්
ඔවුන්ට අවබෝධ විය. එබැවින් ඔවුහු
සෙනඟට මෙලෙස නියෝග කළෝය.
"ඔබ කඳුකරයට[10] ගොස් ඔලීව,[11]
පයින්,* මරඳ, තාල යන ගස් වර්ගව-
ලින් හා කොළ පිරුණු වෙනත් ගස්ව-
ලින් අතු කපාගෙන එන්න. ඉන්පසුව
නීතියේ ලියා තිබෙන ආකාරයට පැල්
සාදාගන්න."

**16** සෙනඟ පිටතට ගොස් අතු
කපාගෙන තමන්ගේ නිවෙස්වල
පියස්ස[12] මතත් තමන්ගේ ගෙයි මිදු-
ලෙත් සැබෑ දෙවිගේ ගෘහයේ මළුව-
ලත්[13] ජල දොරටුව[14] අසල
තිබෙන ප්‍රධාන මංසන්ධියෙත්[15] එෆ්‍රා-
යිම් දොරටුව[16] අසල පිහිටි ප්‍රධාන
මංසන්ධියෙත් පැල් සාදාගත්තෝය.
**17** මෙසේ, වහල්කමින් නිදහස් වී
පැමිණි සියලුම ජනයා පැල් සාදා-
ගෙන ඒ පැල්වලට වී සිටියෝය.
ඇත්තෙන්ම නූන්ගේ[1] පුත් යොෂුවා-
ගේ කාලයේ සිට ඒ දක්වා, ඊශ්‍රායෙල්-
වරු එයාකාරයට කර තිබුණේ නැත.
එහෙයින් ඔවුහු සියලුදෙනා මහත් සේ
ප්‍රීති වූහ.[2] **18** මීට අමතරව උත්ස-
වයේ පළමුවන දවසේ සිට අන්තිම
දවස දක්වාම එනම්, දිනපතාම[3]
සැබෑ දෙවිගේ නීතියෙන් කොටසක්
ශබ්ද නඟා කියවන ලදි. දින හතක්
පුරාම උත්සවය පැවැත්වීමෙන් අන-
තුරුව අටවන දවසේදී නීතියේ සඳ-
හන් ආකාරයට[4] විශේෂ රැස්වීමක්
පවත්වන ලදි.

**9** එම මාසයේ[5] විසිහතරවන දින-
යේදී ඊශ්‍රායෙල්වරු එක් රැස් වී
ගෝණි රෙදි ඇඳගෙන[6] තම සිරු-
රේ දූවිලි[7] තවරාගෙන නිරාහාරව[8]
සිටියෝය. **2** ඊශ්‍රායෙල්වරු සියලුම
විදේශිකයන්ගෙන්[9] වෙන් වී[10] තමන්
කළ වැරදි[11] හා තම පියවරුන් කළ
වැරදි[12] ප්‍රසිද්ධියේ පිළිගැනීමට[13] සිට-
ගත්හ. **3** ඉන්පසු ඔවුහු සිටගෙන
සිටි ස්ථානයේදීම[14] පැය තුනක්*[15]
පුරා තම දෙවි වන යෙහෝවා දුන්
නීතිය සඳහන් ලියවිල්ල ශබ්ද නඟා
කියෙව්වෝය.[16] ඔවුහු තවත් පැය
තුනක් පුරා තම වැරදි පිළිගනිමින්[17]
යෙහෝවා දෙවි ඉදිරියේ නමස්කාර
කළෝය.[18]

**4** යේෂුවාද බානිද කද්මියෙල්ද ෂෙ-
බනියාද බුන්නීද ෂෙරෙබියාද[19] බානිද
කෙනානිද ලෙවීවරුන් සඳහා තනා
තිබුණු වේදිකාවට නැඟ[20] මහත් හඬ-
කින්[21] යෙහෝවා දෙවිට කන්නලව්
කළෝය. **5** ලෙවීවරුන් වූ යේෂුවා,
කද්මියෙල්, බානි, හෂබ්නෙයා, ෂෙරෙ-
බියා, හෝදියා, ෂෙබනියා හා පෙත-
හියා මෙසේ පැවසූහ. "සියලුදෙනා
නැඟිට ඔබේ දෙවි වන යෙහෝවාට

**8 පරි.**
1 නෙහෙ 8:8; ගීතා 119:130; හිතෝ 2:10; ලූක් 24:32
2 1සාමු 1:4; ලූක් 11:41; ක්‍රියා 2:42
3 ගීතා 126:2; ගීතා 126:3
4 ගීතා 119:99; කොලො 1:9; කොලො 1:10
5 ක්‍රියා 15:21; ක්‍රියා 28:23
6 ලෙවී 23:34; ද්වි 16:16
7 ලෙවී 23:42; ද්වි 16:13; සෙක 14:16; යොහ 7:2
8 ලෙවී 23:4
9 යෙසා 33:20
10 2ලේක 27:4
11 ද්වි 8:8
12 ද්වි 22:8; ක්‍රියා 10:9
13 1රාජා 6:36; 1රාජා 7:12; 2ලේක 4:9; 2ලේක 20:5
14 නෙහෙ 3:26; නෙහෙ 8:3
15 නෙහෙ 8:1
16 2රාජා 14:13; නෙහෙ 12:39

**2 තීරුව**
1 යොෂු 1:1; හෙබ්‍රෙ 4:8
2 ද්වි 16:14
3 ද්වි 31:12
4 ලෙවී 23:36; ගණන් 29:35; යොහ 7:37

**9 පරි.**
5 1රාජා 8:2
6 එස්ත 4:3; යෝනා 3:5
7 යොෂු 7:6; 2සාමු 1:2; යෝබ් 2:12
8 එස්රා 8:21
9 යෙසා 2:6
10 එස්රා 9:2; නෙහෙ 13:3
11 ගීතා 106:6; හිතෝ 28:13
12 යෙරෙ 3:13; දානි 9:8
13 ලෙවී 26:40; එස්රා 9:6
14 නෙහෙ 8:4
15 නෙහෙ 8:3
16 නෙහෙ 8:8
17 දානි 9:20
18 නෙහෙ 8:6
19 නෙහෙ 8:7
20 නෙහෙ 8:4

21 2ලේක 20:19; ගීතා 77:1.

නෙහෙ **8:15*** 1රාජා 6:23හි පාදසටහන බලන්න.

නෙහෙ **9:3*** මූ.අ., "දිවා කාලයෙන් හතරෙන් පංගුවක්."

ප්‍රශංසා කරන්න.[1] සදාකාලයටම[2]
ඔහුට ප්‍රශංසා කරන්න.” “දෙවියනි,
සෑම ප්‍රශංසාවක්ම හා ගෞරවයක්ම
ලැබිය යුතු ඔබගේ ශ්‍රේෂ්ඨ නාමයට[3]
ප්‍රශංසාව ලැබේවා!
**6** “යෙහෝවා දෙවියනි, ඔබ පම-
ණක් දෙවිය.[4] ඔබ ස්වර්ගය[5] සහ එහි
සියලු සේනාද[6] මුළු මහත් විශ්වයත්
එහි සියලු වස්තූද පොළොව[7] සහ එහි
තිබෙන සියල්ලද[8] මහ මුහුද[9] සහ එහි
ඇති සියල්ලද[10] සාදා තිබෙනවා. ඒ
සියල්ල පවතින්නේ ඔබ නිසයි. ස්වර්-
ගයේ සේනා[11] සැමදා දණ නමන්-
නේ ඔබටයි. **7** යෙහෝවා දෙවියනි,
සැබෑ දෙවි ඔබයි. ඔබ ආබ්‍රම්ව[12]
තෝරාගෙන කල්දිවරුන්ගේ[13] දේශ-
යේ පිහිටි ඌර් නුවරින් කැඳවා
ඔහුට ආබ්‍රහම් යන නම දුන්නා.[14]
**8** ඔහු කීකරු හදවතක් ඇති විශ්වා-
සවන්ත කෙනෙක්[15] නිසා ඔබ ඔහු
සමඟ ගිවිසුමක්[16] ඇති කරගත්තා.
කානානිවරුන්, හිත්තීවරුන්, අමෝ-
රිවරුන්, පෙරිස්සිවරුන්, යෙබුසිව-
රුන් සහ ගිර්ගාෂිවරුන් විසූ දේශය
ඔහුටත් ඔහුගෙන් පැවතෙන අය-
ටත්[17] දෙන්න ඔබ පොරොන්දු වුණා.
ඔබ ධර්මිෂ්ඨ[18] දෙවි කෙනෙක් නිසා
ඔබ ඒ පොරොන්දුව ඒ ආකාරයෙන්ම
ඉටු කළා.
**9** “දෙවියනි, ඊජිප්තුවේ සිටි අපේ
මුතුන්මිත්තන්ට විඳින්න සිදු වූ හිංසා
පීඩා ඔබ දුටුවා.[19] රතු මුහුද අසලදී
ඔවුන් ඔබට මහත් හඬින් කන්නලව්
කළ විට ඔබ ඔවුන්ට සවන් දුන්නා.[20]
**10** පාරාවෝ හා ඔහුගේ සියලු සේව-
කයනුත් ඔහුගේ දේශයේ[21] විසූ මුළු
ජනතාවත් ඔබේ සෙනඟට විරුද්-
ධව ඉතා උද්දච්ච ලෙස ක්‍රියා කළ
නිසා,[22] ඔබ ඔවුන්ට විරුද්ධව බො-
හෝ විපත් ඇති කරමින් බලවත්
ක්‍රියා හා ආශ්චර්යයන් සිදු කළා. ඔබ
එසේ කර ඔබටම ශ්‍රේෂ්ඨ නාමයක්[23]
ඇති කරගත්තා. අද වන තුරුත්
ඔබ කළ ඒ ශ්‍රේෂ්ඨ ක්‍රියා කිසිවෙ-
කුට අමතක වී නැහැ. **11** දෙවි-
යනි, ඔබේ සෙනඟ ඉදිරියේම ඔබ
මුහුදේ ජලය දෙපසට කර[1] ඒ මැද
වියළි බිමක්[2] සැදුවා. ඔවුන් එම වියළි
බිම මැදින් ගමන් කළා. නමුත්
ඔවුන් පසුපස ලුහුබැඳ ගිය ඔවුන්ගේ
සතුරන්ව ඔබ විනාශ කළා. ජල පහ-
රකට[3] විසි කළ ගල් කැටයක්[4]
මෙන් ඔවුන් මුහුදු පතුලටම[5] ගිලී
ගියා. **12** දිවා කාලයේදී[6] ඔබේ සෙ-
නඟට මඟ පෙන්වූයේ ඔබ එවූ වලා
ටැඹයි. රාත්‍රියේදී[7] යා යුතු මාර්ගය
පෙන්වා දෙන්න[8] ඔවුන්ට ගිනි ජාලා-
වක්ද ඔබ ලබා දුන්නා. **13** ඉන්-
පසුව සීනයි කන්ද අසලදී[9] ඔබ
ස්වර්ගයේ සිට ඔවුන්ට කතා කර[10]
ධර්මිෂ්ඨ වූ තීන්දු,[11] නිවැරදි නීති-
රීති[12] සහ යහපත් මඟ පෙන්වීම්[13]
ලබා දුන්නා. **14** ඔබට ගෞරවය
දෙන පිණිස පැවැත්විය යුතු ශුද්ධ
සබත[14] ගැන ඔබ ඔවුන්ට දැන්වූවා.
ඔබේ සේවකයා වන මෝසෙස්[15] මාර්-
ගයෙන් ඔබේ නීතිය ගැනත් වෙනත්
අණපනත් ගැනත් ඔබ ඔවුන්ව දැනු-
වත් කළා. **15** කුසගින්න නිවන්න
අහසින් ආහාරද[16] පිපාසය සන්සිඳු-
වන්න පර්වතවලින් ජලයද[17] ඔබ
ඔවුන්ට ලබා දුන්නා. කල් යත්ම, ඔබ
දෙන බවට දිවුරා පොරොන්දු වූ[18] දේ-
ශයට ගිහින් එය හිමි කරගන්න කියා
ඔබ ඔවුන්ට පැවසුවා.[19]
**16** “නමුත් සිත් දැඩි කරගෙන[20]
සිටි අපේ මුතුන්මිත්තන් ක්‍රියා කළේ
හිතුවක්කාර[21] ලෙසයි. ඔවුන් ඔබේ
අණපනත්වලට සවන් නොදී මුරණ්ඩු
ලෙස ක්‍රියා කළා. **17** ඔවුන් ඔබට
කිසි ලෙසකින්වත් සවන් දුන්නේ
නැහැ.[22] ඔබ ඔවුන් වෙනුවෙන් කළ
පුදුම ක්‍රියා සිහි කළේවත් නැහැ.[23]
ඔවුන් නායකයෙකුව[24] පත් කරගෙන
නැවතත් ඊජිප්තුවේ මෙහෙකාරකම්
කරන්න යන්න සූදානම් වුණා. දෙ-
වියනි, ඔවුන් මෙතරම් සිත් දැඩි
කරගෙන[25] සිටියත් ඔබ ඔවුන්ව අත්-

**9 පරි.**
**1** 1ලේක 29:20; ගීතා 103:1
**2** යෙරෙ 33:11; එෆී 3:21
**3** ගීතා 72:19; ගීතා 145:1
**4** ද්වි 6:4; 2රාජා 19:19; යෙසා 37:16
**5** උත් 1:1; ගීතා 146:6; එළි 14:7
**6** උත් 2:1; ගීතා 148:2; මතෙ 26:53
**7** උත් 2:4
**8** යෙසා 45:18
**9** උත් 1:10
**10** උත් 1:20
**11** 1රාජා 22:19; ගීතා 103:21
**12** උත් 12:1
**13** උත් 11:31
**14** උත් 17:5
**15** උත් 22:12
**16** උත් 22:18
**17** උත් 15:18
**18** ද්වි 32:4
**19** නික් 2:25; නික් 3:7; ක්‍රියා 7:34
**20** ගීතා 65:2
**21** නික් 7:3; ද්වි 6:22; ගීතා 105:27; ක්‍රියා 7:36
**22** නික් 5:2; නික් 10:3; නික් 18:11
**23** නික් 9:16; රෝම 9:17

**2 තීරුව**
**1** නික් 14:21
**2** නික් 14:22; ගීතා 66:6
**3** නික් 15:10
**4** නික් 15:5
**5** නික් 15:1; ගීතා 106:11; හෙබ්‍රෙ 11:29
**6** නික් 13:21; ගණන් 14:14
**7** ගීතා 78:14; ගීතා 105:39
**8** නික් 14:20
**9** නික් 19:11; ද්වි 33:2
**10** ද්වි 4:10; ද්වි 4:36
**11** ද්වි 4:1
**12** නික් 34:6; ද්වි 6:1; ගීතා 19:9
**13** ද්වි 4:8; ද්වි 12:1
**14** නික් 16:29; නික් 20:10; ද්වි 5:12
**15** ලෙවී 27:34

**16** නික් 16:4; **17** නික් 17:6; ගීතා 78:20; **18** උත් 22:16; හෙබ්‍රෙ 6:18; **19** යොෂු 4:10; **20** ද්වි 9:6; ක්‍රියා 7:39; ක්‍රියා 7:51; **21** ගණන් 14:44; **22** ගණන් 14:11; ගණන් 14:41; **23** ගීතා 78:11; **24** ගණන් 14:4; **25** ද්වි 31:27.

හැරියේ නැහැ.[1] මන්ද ඔබ සමාව
දීමට කැමති[2] කරුණාවන්ත[3] හා
දයාන්විත[4] දෙවි කෙනෙක්. ඉමහත්[5]
ප්‍රේමයක්* පෙන්වන ඔබ කෝප වීමට
ඉක්මන් වන්නෙත් නැහැ.[6] **18** වස්-
සෙකුගේ රූපයක් සාදාගෙන,[7] ‘මේ
ඉන්නේ අපව ඊජිප්තුවෙන් නිදහස්
කළ අපේ දෙවියන්’[8] කියා පැවසූ
ඔවුන් දිගින් දිගටම ඔබව අගෞ-
රවයට පත් කරන දේවල් කළා.
**19** එහෙත් ඔබ ඔවුන්ව පාළුකර-
යේදී අතරමං කර අත්හැර දමා
ගියේ නැහැ.[9] ඒ ඔබේ අතිමහත්
දයාව නිසයි. දිවා කාලයේදී ඔවුන්ට
මඟ පෙන්වන්න තිබූ වලා ටැඹවත්[10]
රාත්‍රියේදී ඔවුන්ගේ මඟට එළිය දුන්
ගිනි ජාලාවවත්[11] ඔබ ඉවත් කළේ
නැහැ. **20** ඔබේ මහත් බලය*[12]
ඔවුන්ට ලබා දී ඔබ ඔවුන්ව නැණවත්
කළා. ඔවුන්ගේ කුසගින්නට මන්-
නාද[13] පිපාසයට වතුරද නොඅඩුව
ඔබ ලබා දුන්නා.[14] **21** පාළුකරයේදී
අවුරුදු හතළිහක්[15] පුරා ඔබ ඔවුන්ව
පෝෂණය කළා. ඔවුන්ගේ වස්ත්‍ර දිරා
ගියේවත්[16] ඔවුන්ගේ පාද ඉදිමුණේ-
වත් නැහැ.[17] ඇත්තටම ඔවුන්ට කිසි
දෙයකින් අඩුවක් තිබුණේ නැහැ.[18]
**22** “ඔබ ඔවුන්ට බොහෝ රාජ්‍ය-
වල්[19] හා ජාතීන්ව යටත් කර දී, දේ-
ශයේ ඉඩම්ද ඔවුන්ට බෙදා දුන්නා.[20]
හෙෂ්බොන්හි[21] රජු වූ සීහොන්ගේ දේ-
ශයත්[22] බාෂාන්හි[23] රජු වූ ඕග්ගේ[24]
දේශයත් අයිති කරගන්න ඔවුන්ට
හැකි වුණා. **23** ඔවුන්ගේ පුත්‍රයන්ද
අහසේ තරු මෙන්[25] වැඩි වුණේ
ඔබේ ආශීර්වාදය නිසයි. ඔබ ඔවුන්-
ගේ මුතුන්මිත්තන්ට[26] පොරොන්දු වූ
දේශයට[27] ඔවුන්ව ගෙනැවිත් එය හිමි
කර දුන්නා. **24** ඔවුන්ගේ දරුවන්[28]
දේශය හිමි කරගන්න[29] යන විට ඔබ
දේශයේ වාසය කළ කානානිවරුන්ව
ඔවුන්ට යටත්[30] කර දුන්නා. ඔබ
කානානිවරුන්වත්[31] ඔවුන්ගේ රජව-

නෙහෙ **9:17*** හෝ, “ලැදි ප්‍රේමය.” **20*** මූ.අ, “යහපත් බලය.”

**9 පරි.**
**1** 1රාජා 6:13; ගීතා 106:45
**2** ගණන් 14:18; ගීතා 86:5; දානි 9:9
**3** නික් 22:27; ගීතා 103:8
**4** ද්වි 4:31; ගීතා 78:38
**5** නික් 34:6
**6** ගීතා 145:8; යෝවෙ 2:13
**7** නික් 32:1; ද්වි 9:12
**8** නික් 32:4; ගීතා 106:19
**9** ගණන් 14:20; 1සාමු 12:22
**10** නික් 40:38
**11** ගණන් 9:15; ගණන් 14:14
**12** ගණන් 11:17; ගණන් 11:25
**13** නික් 16:15; ගණන් 11:7; යොෂු 5:12
**14** ගණන් 20:8; ද්වි 8:15; ගීතා 105:41
**15** නික් 16:35; ගණන් 14:33; ද්වි 2:7
**16** ද්වි 29:5
**17** ද්වි 8:4
**18** ගීතා 34:10
**19** යොෂු 12:1; ගීතා 105:44
**20** යොෂු 11:23
**21** ගණන් 21:26
**22** ගණන් 21:24; ද්වි 2:31
**23** ද්වි 3:13; ගීතා 136:20
**24** ගණන් 21:33
**25** උත් 15:5; උත් 22:17; 1ලේක 27:23
**26** උත් 12:7; උත් 15:18; උත් 17:8; උත් 26:3; ද්වි 9:5
**27** යොෂු 3:17
**28** ගණන් 14:31
**29** යොෂු 21:43
**30** යොෂු 18:1; 1ලේක 22:18
**31** උත් 10:19

**2 තීරුව**
**1** යොෂු 12:7
**2** ගීතා 44:2
**3** යොෂු 11:17; යොෂු 11:20; 2සාමු 8:2
**4** ද්වි 3:5; ද්වි 6:10; ද්වි 9:1
**5** ද්වි 8:7; එස 20:6

රුන්වත්[1] ඔබේ සෙනඟ අතට පත්
කර ඔවුන්ට[2] කැමති දෙයක් කරන්න
ඉඩ දුන්නා.[3] **25** ඔවුන් බලකොටු
සහිත නුවරවල්ද[4] සරුසාර බිම්ද[5]
සැප සම්පත්වලින් පිරුණු නිවෙස්ද[6]
තනන ලද පොකුණුද[7] මිදිවතුද ඔලී-
වවතුද[8] පලතුරු උයන්ද අයිති කර-
ගෙන කා බී තෘප්තිමත්[9] ජීවිතයක්
ගත කළා. දෙවියනි, ඔබේ ඒ අතිම-
හත් යහපත්කම[10] නිසා ඔවුන් බො-
හෝ සෙයින් සතුටු වුණා.[11]
**26** “නමුත් ඔවුන් ඔබට අකීකරු
වී[12] ඔබට විරුද්ධව කැරලිගැසුවා.[13]
ඔවුන් ඔබේ නීතියට පිටු පෑවා.[14]
ඔබ බොහෝ අනාගතවක්තෘවරුන්ව
ඔවුන් වෙත යවා ඔබ වෙතට නැවත
හැරී එන්න[15] කියා ඔවුන් මාර්ගයෙන්
පැවසුවත් ඔවුන් ඒ අනාගතවක්-
තෘවරුන්වත් මරා දැමුවා.[16] ඔවුන්
ඔබට අගෞරවය ගෙන දිය හැකි
සෑම දෙයක්ම කළා.[17] **27** ඒ නිසා,
ඔවුන්ගේ සතුරන් අතට ඔබ ඔවුන්ව
හසු කර දුන්නා.[18] ඒ සතුරන් නිසා
ඔවුන් බොහෝ දුක් පීඩා වින්දා.[19]
එවිට ඔවුන් හඬමින් ඔබට කන්නලව්
කළා.[20] ඔවුන්ට ඔබව සිහි වුණේ එවි-
ටයි. නමුත් ස්වර්ගයේ සිටින ඔබ
ඔවුන්ට ඇහුම්කන් නොදී සිටියේ
නැහැ.[21] ඔබ ඔවුන් වෙත ගැලවුම්ක-
රුවන්ව[22] යවා සතුරන්ගේ අතින්
ඔවුන්ව ගලවාගත්තා.[23] ඒ ඔබේ අති-
මහත් දයාව[24] නිසයි.
**28** “නමුත් ඔවුන්ට සාමකාමී
කාලයක් උදා වූ සැණින් ඒ හැම දෙ-
යක්ම ඔවුන්ට අමතක වී ගියා. ඔවුන්
නැවතත් ඔබ නපුරුයයි සලකන
දේවල් කරන්න පටන්ගත්තා.[25] ඒ
නිසා ඔබ නැවතත් ඔවුන්ගේ සතු-
රන් අතින් පීඩා විඳින්න ඔවුන්ට

**6** ද්වි 19:1; **7** ද්වි 6:11; **8** යොෂු 24:13; **9** ලෙවී 25:19; ද්වි 8:10; හොෂෙ 13:6; **10** යෙසා 63:7; **11** ද්වි 31:20; ද්වි 32:15; ගීතා 36:8; **12** විනි 2:12; **13** ගීතා 78:56; **14** 1රාජා 14:9; ගීතා 50:17; **15** 2ලේක 36:15; **16** 1රාජා 18:4; මතෙ 23:37; **17** 2රාජා 21:11; ගීතා 106:38; **18** විනි 2:14; 2ලේක 36:17; ගීතා 106:41; **19** ද්වි 31:17; **20** ද්වි 4:29; ගීතා 78:34; **21** 2ලේක 6:25; **22** විනි 2:18; විනි 3:9; විනි 3:15; 2රාජා 13:5; **23** 1සාමු 12:11; 2රාජා 14:27; **24** නික් 34:6; **25** විනි 2:19.

ඉඩහැරියා.[1] එවිට ඔවුන් නැවතත්
ඔබ වෙතට හැරී ඔබේ උපකාර ඉල්ලා
කන්නලව් කළා.[2] ඔබත් ස්වර්ගයේ
සිට ඔවුන්ට සවන් දී[3] ඔබේ අතිම-
හත් දයාවෙන් ඔවුන්ට ගැලවීම ලබා
දුන්නා. දෙවියනි, ඔබ කොතෙකුත්
වාර ගණනක් එසේ කර තිබෙන-
වාද![4] **29** නැවත ඔබ වෙතට හැරී
ඔබේ නීතියට[5] කීකරු වෙන්න කියා
ඔබ ඔවුන්ට බොහෝ වරක් අවවාද[6]
කළත් එයින් පලක් වුණේ නැහැ.
ඔවුන් හිතුවක්කාර[7] ලෙස, ජීවනය
හිමි කර දෙන[8] ඔබේ නීන්දු හා අණප-
නත්[9] කඩ කරමින් පව් කළා.[10]
ඔවුන් සිත් දැඩි කරගෙන[11] ඔබ
කී කිසි දෙයක් ගණනකට ගත්-
තේ නැහැ.[12] ඔවුන් මුරණ්ඩු, කැරලි-
කාර සෙනඟක්.[13] **30** නමුත් ඔබ
අවුරුදු ගණනාවක් තිස්සේ ඔවුන්
ගැන ඉවසමින්[14] ඔබේ බලය යොදා
ඔවුන්ට විරුද්ධව සාක්ෂි දුන්නා.[15]
ඔබේ අනාගතවක්තෘවරුන් මාර්ග-
යෙන් ඔබ ඔවුන්ට බොහෝ අවවාද
ලබා දුන්නා. එහෙත් ඔවුන් ඔබට
සවන් දුන්නේ නැහැ.[16] අන්තිමේදී ඔබ
අවට දේශවල ජනයා අතට ඔවුන්ව
පත් කළා.[17] **31** නමුත් ඔබේ අතිම-
හත් දයාව නිසා ඔවුන්ව සහමුලින්ම
විනාශ වී යන්න ඔබ ඉඩ දුන්-
නේ නැහැ.[18] ඔබ ඔවුන්ව අමතක
කර දැමුවෙත් නැහැ.[19] ඔබ මොන
තරම් කරුණාවන්ත,[20] දයාන්විත[21]
දෙවි කෙනෙක්ද!

**32** "දෙවියනි, සියලුදෙනාගේ ගරු-
බිය[22] ලබන්න වටින අපගේ ශ්‍රේෂ්ඨ,[23]
බලවත්[24] දෙවි ඔබයි. ඔබ කිසි-
විටෙක ගිවිසුම් කඩ නොකරන[25]
අතිශයින් ප්‍රේමය*[26] පෙන්වන දෙවි
කෙනෙක්. ඇසිරියාවේ රජු පාලනය
කළ කාලයේ පටන් මේ දක්වා[27]
අපේ රජවරුන්ටත්[28] අධිපතීන්ටත්[29]
පූජකයන්ටත්[30] අනාගතවක්තෘව-
රුන්ටත්[31] අපේ මුතුන්මිත්තන්ටත්[32]
සියලු සෙනඟටත් මුහුණ දෙන්න
සිදු වූ දුෂ්කරතා[1] අමතක කරන්න
එපා දෙවියනි.[2] **33** ඔබ ධර්මිෂ්-
ඨයි.[3] ඔබ අපි සමඟ විශ්වාසවන්-
තව[4] කටයුතු කළා. දුෂ්ට ලෙස
ක්‍රියා කළේ අපියි.[5] මේ සියල්ල
අපිට විඳින්න සිදු වුණේ අපේම දුෂ්-
ටකම් නිසයි. **34** අපේ රජවරුන්,
අධිපතීන්, පූජකයන් හා මුතුන්මිත්-
තන්[6] ඔබේ නීතියට කීකරු වුණේ
නැහැ.[7] ඔබේ අණපනත්වලටවත් ඔබ
ඔවුන්ට විරුද්ධව සාක්ෂි[8] දෙමින් දුන්
සිහිගැන්වීම්වලටවත් ඔවුන් සවන්
දුන්නේ නැහැ.[9] **35** ඔවුන් තමන්ගේ
රජවරුන් පාලනය කළ කාලයේදී,[10]
ඔබ ලබා දුන් යහපත් දේවල්[11] බො-
හොමයක් භුක්ති විඳිමින් ඔබ හිමි කර
දුන් සරුසාර දේශයේ ජීවත් වුණා.[12]
එහෙත් ඔවුන් ඔබට සේවය කළේ
නැහැ.[13] ඔවුන් තම නපුරු ක්‍රියාවලින්
ඉවත් වුණෙත් නැහැ.[14] **36** දෙවි-
යනි, අද මෙහි රැස්ව සිටින අප දෙස
බලන්න. ඔබ අපේ මුතුන්මිත්තන්ට
ලබා දුන් බොහෝ සැප සම්පත්වලින්
පිරුණු මේ සරුසාර දේශයේ අප ජීවත්
වන්නේ දාසයන් ලෙසයි.[15] **37** ඔබ
අපේ පව්කාර[16] ක්‍රියා නිසා අපව පාල-
නය කිරීමට විදේශීය රජවරුන්ට[17]
අවසර දී තිබෙනවා. මෙහි සැප සම්-
පත් හිමි වී තිබෙන්නේ ඔවුන්ටයි.[18]
අපත් අපේ සතුනුත් සිටින්නේ ඔවුන්-
ගේ අණසක යටතේයි. මෙතරම් දුක්
ගැහැටවලට මුහුණ දෙන්න අපට සිදු
වී තිබෙන්නේ ඒ නිසයි.[19]

**38** "අපගේ දෙවියනි, මේ සැම දෙ-
යක් නිසා අපි කැමතියි ඔබ ඉදිරියේ
පොරොන්දුවක් වෙන්න.[20] ඒ පො-
රොන්දුව කඩ නොකරන්න අප සිතින්
අදිටන් කරගෙන සිටිනවා. එය ලිය-
විල්ලක සටහන් කරන්නත් අපගේ
අධිපතීන්ගෙත් පූජකයන්ගෙත් ලෙවී-
වරුන්ගෙත්[21] මුද්‍රාවෙන් එය සහතික
කරන්නත් අපි සතුටුයි."[22]

නෙහෙ **9:32*** හෝ, "ලැදි ප්‍රේමය."

**9 පරි.**
**1** විනි 4:2 විනි 6:1
**2** විනි 6:7 ගීතා 106:44
**3** 1රාජා 8:34 1රාජා 8:39
**4** ගීතා 106:43
**5** ද්වි 28:1 ද්වි 31:26
**6** ද්වි 4:26 ද්වි 31:21 2රාජා 17:13 2ලේක 24:19
**7** ගණන් 14:44
**8** ලෙවී 18:5 රෝම 10:5
**9** ද්වි 12:1
**10** විනි 10:15
**11** යෙරෙ 7:26
**12** යෙරෙ 17:23
**13** සෙක 7:11
**14** රෝම 10:21
**15** 2රාජා 17:13
**16** 2ලේක 36:16 යෙරෙ 25:4
**17** ගීතා 106:41 යෙසා 42:24 යෙරෙ 40:3
**18** යෙරෙ 5:18 එස 14:22
**19** ද්වි 4:31 1රාජා 6:13
**20** නික් 34:6 2රාජා 13:23 ගීතා 86:15
**21** 2ලේක 30:9 ගීතා 103:8
**22** ද්වි 10:17
**23** ද්වි 7:21 ගීතා 47:2
**24** උත් 35:11 එළි 18:8
**25** ද්වි 7:9 1රාජා 8:23 හෙබ්‍රෙ 6:18
**26** දානි 9:4 මීකා 7:18
**27** 2රාජා 17:6
**28** යෙරෙ 32:32
**29** 2රාජා 24:14
**30** 2ලේක 36:14 යෙරෙ 34:19
**31** විලා 4:13
**32** 2රාජා 22:13 විලා 5:7

**2 තීරුව**
**1** යෙරෙ 2:26
**2** ගීතා 22:24
**3** ගීතා 119:137 යෙරෙ 35:17
**4** ද්වි 7:9 2සාමු 22:26
**5** දානි 9:5
**6** ගීතා 106:6
**7** 2ලේක 34:21
**8** 2රාජා 17:13
**9** යෙරෙ 29:19
**10** 2සාමු 7:13
**11** ද්වි 28:47
**12** ද්වි 8:10; **13** ද්වි 32:15; **14** යෙරෙ 8:5; **15** ද්වි 28:48; 2ලේක 12:8; එස්රා 9:9; යෙරෙ 5:19; **16** නෙහෙ 1:6; **17** එස්රා 4:13; නෙහෙ 5:4; **18** ද්වි 28:33; **19** 2ලේක 15:4; **20** 2රාජා 23:3; 2ලේක 15:12; 2ලේක 34:31; එස්රා 10:3; **21** නෙහෙ 10:29; **22** නෙහෙ 10:1.

**10** එම පොරොන්දුව සඳහන් ලියවිල්ල තම මුද්‍රාවෙන් සහතික කළ[1] අය මොවුහුය.

ආණ්ඩුකාරයා*[2] වූ හකලියාගේ පුත්[3] නෙහෙමියා,[4]

ශෙදකියා, **2** සෙරායා,[5] අෂරියා, යෙරෙමියා, **3** පෂ්හූර්, අමරියා, මල්කියා, **4** හට්ටුෂ්, ෂෙබනියා, මල්ලුක්, **5** හාරිම්,[6] මෙරේමොත්, ඔබදියා, **6** දානියෙල්,[7] ගින්නෙතොන්, බාරුක්, **7** මෙෂුල්ලම්, අබියා, මියමින්, **8** මයෂියා, බිල්ගයි සහ ෂෙමායා යන අයයි. ඔවුහු සියල්ලෝම පූජකයෝය.

**9** ලෙවීවරුන් අතරින් මුද්‍රා තැබූ අයගේ නම් මෙසේය. අසනියාගේ පුත් යේෂුවාද[8] හෙනාදාද්ගේ පුතුන්[9] අතරින් බින්නුයිද කද්මියෙල්ද **10** ඔවුන්ගේ සහෝදරයන් වන ෂෙබනියාද[10] හෝදියාද කෙලීටාද පෙලායාද හානාන්ද **11** මීකාද රෙහොබ්ද හෂබියාද **12** සක්කූර්ද ෂෙරෙබියාද[11] ෂෙබනියාද **13** හෝදියාද බානිද බෙනීනුද යන අය ඔවුන් අතරේ සිටියෝය.

**14** ජනයා අතරේ සිටි ප්‍රධානීහුද එසේ කළෝය. ඔවුන් නම් පාරොෂ්, පාහත්-මෝවබ්,[12] ඒලාම්, සට්ටු, බානි, **15** බුන්නී, අස්ගාද්, බෙබායි, **16** අදොනියා,* බිග්වායි, ආදීන්, **17** ආටෙර්, හෙසකියා, අස්සූර්, **18** හෝදියා, හාෂුම්, බේෂායි, **19** හාරිෆ්,* අනාතොත්, නේබයි, **20** මග්පියාෂ්, මෙෂුල්ලම්, හෙෂීර්, **21** මෙෂේෂබෙල්, සාදොක්, යද්දූවා, **22** පෙලතියා, හානාන්, අනායා, **23** හෝෂෙයා, හනනියා, හෂ්ෂුබ්, **24** හල්ලෝහෙෂ්, පිල්හා, ෂෝබෙක්, **25** රෙහුම්, හෂබ්නා, මයසේයා, **26** අහියා, හානාන්, අනාන්, **27** මල්ලුක් හාරිම් සහ බානාහ් යන අයයි.

නෙහෙ **10:1*** මූ.අ., “තිර්ෂාතා.” **16*** එස්රා 2:13හි, “අදොනිකාම්” ලෙස හැඳින්වේ. **19*** එස්රා 2:18හි, “යෝරා” ලෙස හැඳින්වේ.

**10 පරි.**
1 නෙහෙ 9:38; යෙරෙ 32:44
2 එස්රා 2:63; නෙහෙ 7:70
3 නෙහෙ 1:1
4 නෙහෙ 8:9
5 නෙහෙ 11:11
6 එස්රා 2:39; එස්රා 10:21; නෙහෙ 12:15
7 එස්රා 8:2
8 නෙහෙ 12:8
9 එස්රා 3:9; නෙහෙ 3:18
10 නෙහෙ 9:5
11 නෙහෙ 12:24
12 නෙහෙ 7:11

**2 තීරුව**
1 ද්වි 31:12; නෙහෙ 8:2
2 එස්රා 2:36
3 එස්රා 2:40
4 නෙහෙ 7:73
5 එස්රා 2:70
6 එස්රා 2:43
7 නෙහෙ 8:1
8 ලෙවී 20:24; එස්රා 9:1
9 නෙහෙ 3:5
10 1කොරි 1:10
11 ද්වි 33:4
12 ද්වි 5:1
13 ද්වි 4:1
14 ද්වි 6:1
15 ද්වි 27:26
16 ගීතා 119:106; දේශ 5:4
17 නික් 34:16; ද්වි 7:3
18 එස්රා 9:1
19 නික් 20:10; යෙසා 58:13
20 නික් 12:16; ගණන් 29:1; ගණන් 29:12
21 නික් 23:11; ලෙවී 25:4
22 ද්වි 15:1; ද්වි 15:2
23 නික් 30:13; හිතෝ 3:9
24 ගණන් 28:9; හෙබ්‍රෙ 10:11
25 ගණන් 28:11; ගණන් 29:6; 1ලේක 23:31; 2ලේක 8:13
26 ලෙවී 24:6; 2ලේක 2:4; මතෙ 12:4
27 ලෙවී 2:1; ලෙවී 23:37
28 ලෙවී 23:2

**28** දැනුම් තේරුම් ඇති[1] ඉතුරු අය එනම්, පූජකයෝද[2] ලෙවීවරුද[3] දොරටුපාලකයෝද[4] ගායකයෝද[5] නෙතිනිම්වරුද[6] සැබෑ දෙවිගේ නීතියට[7] කීකරු වන පිණිස අවට ජාතීන්ගෙන් වෙන් වූ සියලුදෙනාද[8] ඔවුන්ගේ භාර්යාවෝ හා දූදරුවෝද **29** තම සහෝදරයන් වූ ප්‍රධානීන්[9] ඇති කරගත් එම ගිවිසුමට එක සිතින් එකඟ වූහ.[10] ඒ ගිවිසුමට අනුව සැබෑ දෙවි තම සේවක මෝසෙස් මාර්ගයෙන්[11] දුන් නීතියට එකඟව ජීවත් වෙන්නත්[12] අපගේ ස්වාමීන් වන යෙහෝවා දෙවිගේ සියලුම අණපනත් සහ තීන්දුවලට[13] කීකරු වෙන්නත් ඔවුහු සියලුදෙනාම එකඟ වූහ.[14] එසේ නොකළොත් තමන් ශාපයකට[15] යටත් විය යුතු බව සඳහන් කරමින් ඔවුහු එම ගිවිසුම දිවුරුමකින්[16] ස්ථිර කළෝය. **30** මීට අමතරව, තමන්ගේ දූවරුන්ව අවට ජාතීන්ට අයත් පුරුෂයන්ට විවාහ කර නොදෙන බවටත් තම පුතුන් සඳහා ඔවුන්ගේ දූවරුන්ව භාර නොගන්නා බවටත් ඔවුහු පොරොන්දු වූහ.[17]

**31** ඒ වන විට අවට දේශවලින් පැමිණි වෙළෙන්දෝ,[18] සබත් දවසේදී පවා විවිධ භාණ්ඩ සහ ධාන්‍ය වර්ග විකුණමින් සිටියෝය. එමනිසා සබත් දවසේදී[19] හෝ වෙනත් ශුද්ධ දවසකදී[20] හෝ ඔවුන්ගෙන් කිසිවක් මිල දී නොගැනීමට අපි තීරණය කළෙමු. හත්වන අවුරුද්දේ බීජ වැපිරීමෙන් හා අස්වැන්න නෙළීමෙන් වැළකී සිටීමටත්[21] ණය බරින් මිරිකී සිටින අයට සහනයක් ලබා දීමටත්[22] අපි පොරොන්දු වුණෙමු.

**32** අපගේ දෙවිගේ ගෘහයේ සිදු කරන සේවාවන් සඳහා වාර්ෂිකව ෂෙකෙලයකින් තුනෙන් එකක් බැගින් සෑම කෙනෙකුගෙන්ම අය කිරීමටත් අපි තීරණය කළෙමු.[23] **33** එම මුදල් සබත් දවස්වලදී[24] හා නව සඳ පායන දවස්වලදී[25] පුදන රොටි[26] සඳහාත් දිනපතා ඔප්පු කරන ධාන්‍ය පූජා[27] හා දවන පූජා සඳහාත් නියමිත කාලවලදී පවත්වන උත්සව[28] සඳහාත් වැය

කිරීමට තීරණය කරන ලදි. ශුද්ධ[1] පූජා
සඳහාත් ඊශ්‍රායෙල්වරුන් වෙනුවෙන්
ඔප්පු කරන පාප පූජා[2] සඳහාත් අපගේ
දෙවිගේ ගෘහයේ සිදු කෙරෙන අන්
සියලු වැඩකටයුතු සඳහාත් එය වැය
කිරීමට අපි තීරණය කළෙමු.[3]

**34** මීට අමතරව, නීතියේ නියම
කර තිබෙන ලෙස[4] අපගේ දෙවි වන
යෙහෝවාගේ පූජාසනය මත වර්ෂයක්
වර්ෂයක් පාසා පූජා ඔප්පු කිරීම
සඳහා[5] අවශ්‍ය දර[6] සපයන්නේ කවු-
රුන්ද කියා අපි ආදු[7] දමා තීරණය
කළෙමු. ඒ අනුව දෙවිගේ ගෘහයට
නියමිත අවස්ථාවලදී දර ගෙනා යුතු
පූජකයන්, ලෙවීවරුන් සහ ජනයා
තම මුතුන්මිත්තන්ගේ පෙළපත් අනුව
තීරණය කරන ලදි. **35** සෑම වසර-
කදීම අපේ කෙත්වතුවලින්ද පල දරන
සෑම ගසකින්ද නෙළාගන්නා මුල්ම
පලදාව[8] යෙහෝවා දෙවිගේ ගෘහ-
යට ගෙන ඒමටත් අපි පොරොන්දු
වුණෙමු. **36** එසේම නීතියේ සඳහන්
කර ඇති ආකාරයට,[9] අපගේ කුලුඳුල්
පුතුන්වද[10] අප ඇති කරන සතුන්ට
බිහි වන කුලුඳුල් පැටවුන්වද[11] අප-
ගේ එළු බැටළු හා ගව රැළවල්වල
කුලුඳුල් සතුන්වද[12] අපගේ දෙවිගේ
ගෘහයේ සේවය කරමින් සිටි පූජක-
යන් වෙත ගෙන ඒමටත් අපි පො-
රොන්දු වුණෙමු.[13] **37** අපගේ මුල්ම
ධාන්‍ය අස්වැන්නෙන් ලබාගත් පිටිද[14]
අපගේ පරිත්‍යාගයන්ද[15] සෑම ගස-
කින්ම නෙළාගත් පලතුරුද[16] අලුත්ම
වයින්ද[17] තෙල්ද[18] අපගේ දෙවිගේ
ගෘහයේ තිබෙන භෝජන ශාලාවල[19]
සිටින පූජකයන්ට භාර දෙන්නත් අපි
එකඟ වුණෙමු. භූමියේ පලදාවෙන්
දසයෙන් කොටසක් ලෙවීවරුන්ට[20]
දෙන්නත් අපි තීරණය කළෙමු. මන්ද
වගා කටයුතු කරන සියලුම නුවරව-
ලින් ලෙවීවරුන්ට අස්වැන්නෙන් දස-
යෙන් කොටසක් දීමට නියම කර
තිබිණ.

**38** ලෙවීවරුන්ට ඒ දසයෙන් කො-
ටස ලබා දෙන විට පූජකයා ලෙස
කටයුතු කරන ආරොන්ගේ පුත්‍රයෙකු
ඔවුන් සමඟ සිටිය යුතුයි. ලෙවීව-
රුන්ද තමන්ට ලැබුණු දෙයින් දස-
යෙන් කොටසක් දෙවිගේ ගෘහයට භාර
දිය යුතුයි.[1] ඒවා භෝජන ශාලාවල[2]
තිබෙන ගබඩාවල තැන්පත් කළ
යුතුයි. **39** සියලුම ඊශ්‍රායෙල්වරුන්
හා ලෙවීවරුන් ධාන්‍ය, අලුත් වයින්,[3]
තෙල් ඇතුළු සියලු පරිත්‍යාගයන්[4]
ගෙනා යුත්තේ භෝජන ශාලාවලටය.
ශුද්ධස්ථානයේ භාවිත කරන භාජන
තැන්පත් කර තිබෙන්නේත් සේවය[5]
කරන පූජකයන්, දොරටු පාලකයන්[6]
හා ගායකයන්[7] නැවතී සිටින්නේත්
එතැනය. අපගේ දෙවිගේ ගෘහයේ
වැඩකටයුතු සම්බන්ධයෙන් නොසැ-
ලකිලිමත්ව ක්‍රියා නොකිරීමට[8] අපි
සියලුදෙනාම සිතින් අදිටන් කරගත්-
තෙමු.

**11** ජනයා අතරේ අධිපතීන්[9]
ලෙස කටයුතු කළ අය
වාසය කරමින් සිටියේ යෙරුසලමෙ-
හිය.[10] ඊට අමතරව, එම ශුද්ධ නුව-
රෙහි[11] වාසය කළ යුත්තේ වෙන
කවුරුන්ද කියා තීරණය කිරීමට
ආදු[12] දමන ලදි. ඒ අනුව සෙනඟ
අතර සිටි සෑම පවුල් දහයකින් එක්
පවුලක් බැගින් යෙරුසලමෙහි වාසය
කිරීමට පැමිණියෝය. ඉතුරු පවුල්
නවය වාසය කළේ වෙනත් නුව-
රවලය. **2** මෙසේ, යෙරුසලමෙහි
පදිංචි වීමට ඉදිරිපත් වූ සියලුදෙනා-
ටම[13] සෙනඟ ප්‍රශංසා කළෝය.[14]

**3** යූදා නම් පළාතෙහි ප්‍රධානීහු[15]
යෙරුසලමෙහි පදිංචියට පැමිණි-
යහ.[16] යූදා පළාතෙහි වෙනත් නුවර-
වලත් ඊශ්‍රායෙල්වරුද[17] පූජකයෝද[18]
ලෙවීවරුද[19] නෙතිනිම්වරුද[20] සල-
මොන්ගේ සේවකයන්ගේ පුත්‍රයෝද[21]
පදිංචි වී සිටියෝය. ඔවුන් පදිංචි වී
සිටියේ තම තමන්ගේ නුවරවල,[22]
තමන්ට හිමි ඉඩම්වලය.

**4** යූදා ගෝත්‍රයට අයත් කිහිප-
දෙනෙක්ද බෙන්ජමින්[23] ගෝත්‍රයට

**10 පරි.**
1 ලෙවී 2:10
ලෙවී 22:14
2 ලෙවී 16:15
3 2ලේක 24:5
4 ලෙවී 6:13
5 ලෙවී 6:12
6 ලෙවී 1:7
ලෙවී 3:5
7 හිතෝ 16:33
8 නික් 23:19
ලෙවී 19:23
ගණන් 18:13
ද්වි 26:2
9 නික් 13:2
ලෙවී 27:26
10 ගණන් 8:17
11 නික් 34:19
12 ගණන් 18:15
ද්වි 12:6
13 ගණන් 18:11
1කොරි 9:13
14 ගණන් 15:20
15 ගණන් 18:29
16 ලෙවී 27:30
17 ගණන් 18:12
18 ද්වි 18:4
19 1ලේක 9:26
2ලේක 31:11
20 ලෙවී 27:30
ගණන් 18:21
ගණන් 18:30

**2 තීරුව**
1 ගණන් 18:26
2 1ලේක 23:28
1ලේක 28:12
3 ද්වි 14:23
4 ද්වි 12:6
5 නික් 39:26
ගණන් 8:26
ද්වි 18:5
6 1ලේක 26:1
7 1ලේක 25:6
8 නෙහෙ 13:10
නෙහෙ 13:11

**11 පරි.**
9 1ලේක 29:6
2ලේක 32:3
එස්රා 10:14
10 නෙහෙ 7:4
11 නෙහෙ 11:18
යෙසා 48:2
මතෙ 4:5
12 නෙහෙ 10:34
හිතෝ 16:33
13 විනි 5:9
14 නික් 39:43
15 නෙහෙ 7:6
16 එස්රා 5:8
17 1ලේක 9:1
18 එස්රා 2:70
19 නෙහෙ 7:73
20 යොෂු 9:27
එස්රා 2:58
එස්රා 8:17

**21** 1රාජා 9:21; නෙහෙ 7:57; **22** 1ලේක 9:2; **23** 1ලේක 9:3.

අයත් කිහිපදෙනෙක්ද යෙරුසලමෙහි
පදිංචි වූහ. යූදා ගෝත්‍රයට අයත්
අය අතරින් අතායා එහි පදිං-
චිව සිටියේය. අතායාගේ පියා උසි-
යාය. උසියාගේ පියා සෙකරියාය.
සෙකරියාගේ පියා අමරියාය. අම-
රියාගේ පියා ෂෙපටියාය. ෂෙපටියා-
ගේ පියා පේරෙස්ගෙන්[1] පැවත ආ
මහලලෙල්ය. **5** මීට අමතරව මය-
සේයාද එහි පදිංචිව සිටියේය. මයසේ-
යාගේ පියා බාරුක්ය. බාරුක්ගේ
පියා කොල්හෝසෙය. කොල්හෝසෙ-
ගේ පියා හසායාය. හසායාගේ පියා
අදායාය. අදායාගේ පියා යෝයා-
රීබ්ය. යෝයාරීබ්ගේ පියා ෂේලා-
ගේ පෙළපතින් පැමිණි සෙකරියාය.
**6** මේ අනුව යෙරුසලමෙහි පදිංචි-
යට පැමිණි පේරෙස්ගෙන් පැවත ආ
පුරුෂයන්ගේ ගණන හාරසිය හැටඅ-
ටකි. ඔවුහු සියලුදෙනාම දක්ෂ පුරුෂ-
යෝය.

**7** බෙන්ජමින්[2] ගෝත්‍රයට අයත්
පවුල්වලින් පැමිණි අයගේ විස්තර
මෙසේය. සල්ලු ඉන් එක් අයෙකි.
ඔහුගේ පියා මෙෂුල්ලම්ය.[3] ඔහුගේ
පියා යෝවෙද්ය. ඔහුගේ පියා පෙදා-
යාය. ඔහුගේ පියා කොලායාය. ඔහු-
ගේ පියා මයසේයාය. ඔහුගේ පියා
ඉතියෙල්ය. ඔහුගේ පියා යෙෂායාය.
**8** සල්ලු සමඟ ගබ්බයි සහ සල්ලයිද
පැමිණියෝය. ඔවුන් සමඟ පැමිණි
සියලුදෙනාගේ සංඛ්‍යාව නවසිය විසි-
අටකි. **9** ඔවුන්ගේ ප්‍රධානියා ලෙස
කටයුතු කළේ ෂික්රීගේ පුත් යෝ-
වෙල්ය. නුවරෙහි දෙවනියා ලෙස
සිටියේ හස්සෙනුවාගේ පුත් යූදාය.

**10** පූජකයන් අතරින් යෝයාරීබ්-
ගේ[4] පුත්‍රයා වූ යෙදායාද යාකින්ද[5]
**11** සැබෑ දෙවිගේ ගෘහයේ අධිපති-
යෙකු වූ අහිතුබ්ගෙන් පැවත ආ
හිල්කියාගේ පුත්‍රයා වූ සෙරායාද
සිටියෝය. හිල්කියා මෙෂුල්ලම්ගේ[6]
පුත්‍රයාය. මෙෂුල්ලම් සාදොක්ගේ[7]
පුත්‍රයාය. සාදොක් මෙරායොත්-
ගේ පුත්‍රයාය. මෙරායොත් අහිතුබ්ගේ[8]
පුත්‍රයාය. **12** එම ගෘහයේ සේවය
සඳහා පැමිණි ඔවුන්ගේ සහෝදර-
යෝද එහි සිටියෝය.[1] ඒ සියලුදෙ-
නාගේ සංඛ්‍යාව අටසිය විසිදෙකකි.
යෙරොහාම්ගේ[2] පුත්‍රයා වූ අදායාද
එහි සිටියේය. යෙරොහාම් පෙලලි-
යාගේ පුත්‍රයාය. පෙලලියා අම්ෂීගේ
පුත්‍රයාය. අම්ෂී සෙකරියාගේ පුත්‍ර-
යාය. සෙකරියා පෂ්හූර්ගේ[3] පුත්‍ර-
යාය. පෂ්හූර් මල්කියාගේ[4] පුත්‍රයාය.
**13** අදායා සමඟ පෙළපත්වල ප්‍රධා-
නීන්[5] වූ ඔහුගේ සහෝදරයෝද පැමි-
ණියෝය. ඔවුන්ගේ ගණන දෙසිය
හතළිස්දෙකකි. අෂරෙල්ගේ පුත්‍ර-
යෙකු වූ අමෂ්සායිද පැමිණ සිටියේය.
අෂරෙල් ආසයිගේ පුත්‍රයාය. ආසයි
මෙෂිල්ලෙමොත්ගේ පුත්‍රයාය. මෙ-
ෂිල්ලෙමොත් ඉම්මේර්ගේ පුත්‍රයාය.
**14** එඩිතර බලසම්පන්න පුරුෂයන්[6]
වූ ඔහුගේ සහෝදරයෝද පැමිණි-
යෝය. ඔවුන්ගේ ගණන එකසිය විසි-
අටකි. ඔවුන්ගේ ප්‍රධානියා[7] ලෙස
කටයුතු කළේ සබ්දියෙල්ය. ඔහු ඉතා
වංශවත් පවුලක කෙනෙකි.

**15** ලෙවීවරුන්[8] අතුරින් බුන්නී-
ගෙන් පැවත ආ ෂෙමායාද පැමිණ
සිටියේය. ෂෙමායාගේ පියා හෂ්-
ෂුබ්ය. හෂ්ෂුබ්ගේ පියා අශ්‍රිකාම්ය.
අශ්‍රිකාම්ගේ පියා හෂබියාය.[9] හෂබි-
යාගේ පියා බුන්නීය. **16** ෂෙමායා
සමඟ ෂබ්බෙතයි[10] සහ යෝෂාබාද්ද[11]
පැමිණියෝය. ලෙවීවරුන් අතරේ
ප්‍රධානීන්ව සිටි ඔවුහු සැබෑ දෙවිගේ
ගෘහය අවට සිදු කෙරෙන වැඩකට-
යුතු භාරව සිටියෝය. **17** ආසාෆ්-
ගෙන්[12] පැවත ආ මත්තනියාද[13] එහි
පැමිණ සිටියේය. ආසාෆ්ගේ පුත්‍ර-
යෙකු වූ සබ්දීගේ පුත් මීකා මත්තනි-
යාගේ පියා විය. ප්‍රශංසා ගී ගැයීමේ[14]
කටයුත්ත මෙහෙයවූයේත් යාච්ඤා
කරන අවස්ථාවලදී ප්‍රශංසා ඔප්පු
කළේත්[15] ඔහුය. ගායකයන් අත-
රේ දෙවනියා ලෙස කටයුතු කළ
බක්බුකියාද අබ්දාද පැමිණියෝය.
යෙදූතුන්ගේ[16] පුත්‍රයෙකු වූ ගාලාල්-
ගේ[17] පුත් ෂම්මුවා අබ්දාගේ පියාය.

**11 පරි.**
1 උත් 38:29 ගණන් 26:20 රූත් 4:18 1ලේක 27:3 මතෙ 1:3
2 උත් 35:18 යොෂු 18:11 එස්ත 2:5
3 1ලේක 9:7
4 1ලේක 9:10
5 1ලේක 24:17
6 1ලේක 9:11
7 එස්රා 7:2
8 1ලේක 6:12

**2 තීරුව**
1 1ලේක 9:13
2 1ලේක 9:12
3 යෙරෙ 21:1 යෙරෙ 21:2
4 යෙරෙ 38:1
5 ගණන් 17:2 1ලේක 15:12
6 යොෂු 1:14 1ලේක 5:24
7 නෙහෙ 12:42
8 එස්රා 2:40
9 1ලේක 9:14
10 එස්රා 10:15
11 එස්රා 8:33 නෙහෙ 8:7
12 නෙහෙ 7:44
13 නෙහෙ 11:22 නෙහෙ 12:25
14 1ලේක 16:4
15 2ලේක 5:13
16 1ලේක 16:41 2ලේක 35:15
17 1ලේක 9:16

**18** ශුද්ධ නුවරෙහි[1] පදිංචි වූ ලෙවීව-
රුන්ගේ මුළු සංඛ්‍යාව දෙසිය අසූහ-
තරකි.

**19** දොරටු පාලකයන්[2] අතරින්
පැමිණියේ අක්කුබ්, ටල්මොන්[3] සහ
දොරටුවල මුර සේවය සඳහා යෙදවූ
ඔවුන්ගේ සහෝදරයන්ය.[4] ඔවුන්ගේ
ගණන එකසිය හැත්තෑදෙකකි.

**20** පූජකයෝ, ලෙවීවරු මෙන්ම
සෙසු ඊශ්‍රායෙල්වරුද යූදා දේශ-
යේ අනිකුත් නුවරවල තම තමන්ට
උරුම වූ ඉඩකඩම්වල පදිංචි වී සිටි-
යෝය.[5] **21** නෙතිනිම්වරුන්[6] පදිංචි
වූයේ ඕෆෙල්වලය.[7] ඔවුන්ගේ අධිප-
තීන් ලෙස කටයුතු කළේ ශීහා සහ
ගිෂ්පාය.

**22** යෙරුසලමෙහි විසූ ලෙවීවරුන්
සිටියේ උස්සිගේ භාරයේය. ඔහුගේ
පියා බානිය. ඔහුගේ පියා හෂබි-
යාය. ඔහුගේ පියා මත්තනියාය.[8]
ඔහුගේ පියා මීකාය.[9] ඔහු පැවත
ආවේ ගායකයන්[10] වූ ආසාෆ්ගේ[11]
පෙළපතින්ය. උස්සි සැබෑ දෙවිගේ
ගෘහයේ කරන සේවාවන් භාරව කට-
යුතු කළේය.[12] **23** ඔවුන් සම්බන්ධ-
යෙන් රජුගෙන් නියෝගයක් නිකුත් වී
තිබිණ.[13] ඒ අනුව ගායකයන්ගේ දෛ-
නික අවශ්‍යතා සැපයීමට නිශ්චිත
සැලසුමක් යොදා තිබිණ.[14] **24** පෙ-
තහියා ජනයා සම්බන්ධයෙන් මතු වූ
කාරණාවලදී රජුගේ උපදේශකයෙකු
ලෙස සේවය කළේය. පෙතහියාගේ
පියා යූදාගේ පුත් සේරාගේ පුත්‍රයෙකු
වූ මෙෂෙසබෙල්ය.

**25** කෙත්වතු අවට තිබූ ගම්මා-
නවල[15] පදිංචි වූ අයගේ විස්-
තර මතු දැක්වේ. යූදා ගෝත්‍රයට
අයත් කිහිපදෙනෙක් කිර්යත්-අර්බා[16]
සහ ඒ අවට තිබෙන කුඩා
නගරවලත් දීබොන් සහ ඒ අවට
තිබෙන කුඩා නගරවලත් යෙකබ්සෙ-
යෙල්[17] සහ ඒ අවට තිබෙන ගම්මා-
නවලත් වාසය කළෝය. **26** මීට
අමතරව, ඔවුහු යේෂුවා, මොලාදා,[18]
බෙත්-පෙලෙත්[19] යන නුවරවලත්
**27** හෂර්-ෂුවාල්,[20] බෙයර්-ෂෙබා[21] සහ
ඒ අවට තිබෙන කුඩා නගරවලත් පදිං-
චිව සිටියෝය. **28** එමෙන්ම ඔවුහු
ෂික්ලග්,[1] මෙකෝනා සහ ඒ අවට
තිබෙන කුඩා නගරවලත් **29** ඒන්-
රිම්මෝන්,[2] ෂෝරා[3] සහ යාමුත්[4] යන
නුවරවලත් **30** ෂානොවා,[5] අදුල්-
ලාම්[6] සහ ඒ අවට තිබූ ගම්මානවලත්
ලාකිෂ්[7] හා ඒ අවට පිහිටි කෙත්වතුව-
ලත් අෂේකා[8] සහ ඒ අවට පිහිටි කුඩා
නගරවලත් වාසය කළෝය. ඔවුහු
බෙයර්-ෂෙබා සහ හින්නොම් නිම්නය[9]
දක්වා ප්‍රදේශයේ කඳවුරු බැඳගත්-
තෝය.

**31** බෙන්ජමින් ගෝත්‍රයට අයත්
අය ගෙබා,[10] මික්මාෂ්,[11] අයියා,[12] බෙ-
තෙල්[13] සහ ඒ අවට කුඩා නගරවලත්
**32** අනාතොත්,[14] නොබ්,[15] අනනියා,
**33** හාෂෝර්, රාමා,[16] ගිත්තායිම්[17] යන
නුවරවලත් **34** හාදිද්, ෂෙබෝයිම්,
නෙබල්ලට්, **35** ලොද්[18] සහ කර්-
මාන්තකරුවන් වාසය කළ ඕනෝ[19]
නම් නිම්නයෙත් වාසය කළෝය.
**36** කලින් යූදා ගෝත්‍රයට හිමි ප්‍රදේශ-
යේ පදිංචි වූ ලෙවීවරුන්ගෙන් කිහිප-
දෙනෙක් බෙන්ජමින් ගෝත්‍රයට හිමි
ප්‍රදේශයට ගොස් පදිංචි වූහ.

**12** ෂෙයල්ටියල්ගේ[20] පුත් සෙරු-
බාබෙල්[21] හා යේෂුවා[22] සමඟ
පැමිණි පූජකයන්ගේ සහ ලෙවීවරුන්-
ගේ නම් මේවාය. සෙරායා, යෙරෙ-
මියා, එස්රා, **2** අමරියා,[23] මල්ලුක්,
හට්ටුෂ්, **3** ෂෙකනියා, රෙහුම්, මෙ-
රේමොත්, **4** ඉද්දෝ, ගින්නෙතොයි,
අබියා, **5** මියමින්, මයදියා, බිල්ගා,
**6** ෂෙමායා,[24] යෝයාරිබ්, යෙදායා,[25]
**7** සල්ලු, ආමොක්,[26] හිල්කියා සහ
යෙදායා[27] යන අයයි. යේෂුවා[28] සේවය
කළ කාලයේදී පූජකයන්ගේ හා ඔවුන්-
ගේ සහෝදරයන්ගේ ප්‍රධානීන් ලෙස
කටයුතු කළේ ඔවුන්ය.

**8** ලෙවීවරුන් වූයේ යේෂුවා[29] සහ
ඔහුගේ සහෝදරයන් වූ බින්නුයි,[30] කද්-

**11 පරි.**
1 1රාජා 11:13; ආනි 9:24; යෝවෙ 3:17
2 1ලේක 26:1
3 1ලේක 9:17; එස්රා 2:42; නෙහෙ 12:25
4 1ලේක 26:12
5 1ලේක 9:2
6 යොෂු 9:21; එස්රා 2:58
7 2ලේක 27:3; නෙහෙ 3:26; නෙහෙ 3:31
8 1ලේක 9:15
9 නෙහෙ 12:35
10 1ලේක 25:6; නෙහෙ 12:46
11 1ලේක 25:1
12 එස 44:11
13 එස්රා 6:9; එස්රා 7:24
14 1ලේක 9:33
15 යොෂු 13:23
16 උත් 23:2; යොෂු 14:15
17 යොෂු 15:21; 2සාමු 23:20
18 යොෂු 15:26; යොෂු 19:2
19 යොෂු 15:27
20 යොෂු 19:3; 1ලේක 4:28
21 උත් 21:31

**2 තීරුව**
1 යොෂු 15:31; යොෂු 19:5; 1සාමු 27:6
2 යොෂු 15:32
3 යොෂු 15:33; යොෂු 19:41; 2ලේක 11:10
4 යොෂු 12:11
5 යොෂු 15:34; නෙහෙ 3:13
6 යොෂු 12:15; මීකා 1:15
7 යොෂු 10:3; යොෂු 15:39; යෙසා 37:8
8 යොෂු 15:35
9 යොෂු 15:8; 2රාජා 23:10
10 යොෂු 18:24
11 1සාමු 13:11
12 උත් 12:8
13 උත් 28:19; යොෂු 18:13
14 යොෂු 21:18
15 1සාමු 21:1
16 යොෂු 18:25
17 2සාමු 4:3
18 1ලේක 8:12
19 එස්රා 2:33

**12 පරි.** **20** මතෙ 1:12; **21** එස්රා 1:11; **22** සෙක 3:1; **23** නෙහෙ 12:13; **24** නෙහෙ 12:18; **25** නෙහෙ 12:19; **26** නෙහෙ 12:20; **27** නෙහෙ 12:21; **28** නෙහෙ 7:7; **29** එස්රා 2:40; **30** එස්රා 8:33.

මියෙල්,[1] ෂෙරෙබියා, යූදා සහ මත්ත-
නියා[2] යන අයයි. ඔවුහු ස්තුති ප්‍රශංසා
ඔප්පු කිරීමේ කාර්යය භාරව සිටි-
යෝය. **9** ඔවුන් ඉදිරිපිට සේවය කළ
බක්බුකියා සහ උන්නි මුර කටයු-
තුවල යෙදී සිටියෝය. **10** යේෂුවා-
ගේ පුත්‍රයා යෝයාකීම්ය.[3] යෝයාකීම්-
ගේ පුත්‍රයා එලියාෂිබ්ය.[4] එලියාෂිබ්ගේ
පුත්‍රයා යෝයාදාය.[5] **11** යෝයාදාගේ
පුත්‍රයා යොනාතාන්ය. යොනාතාන්ගේ
පුත්‍රයා යද්දුවාය.[6]

**12** යෝයාකීම් සේවය කළ කාල-
යේදී සෑම පෙළපතකටම ප්‍රධානියෙ-
කුව[7] පත් කර තිබිණ. ඒ විස්තර
මෙසේය. සෙරායාගේ[8] පෙළපත
සඳහා මෙරායා ප්‍රධානියා විය. යෙරෙ-
මියාගේ පෙළපත සඳහා හනනියා
ප්‍රධානියා විය. **13** එස්රාගේ[9] පෙළ-
පත සඳහා මෙෂුල්ලම් ප්‍රධානියා විය.
අමරියාගේ පෙළපත සඳහා යෙහෝ-
හානන් ප්‍රධානියා විය. **14** මල්ලුකී-
ගේ පෙළපත සඳහා යොනාතාන්
ප්‍රධානියා විය. ෂෙබනියාගේ[10] පෙ-
ළපත සඳහා යෝසෙප් ප්‍රධා-
නියා විය. **15** හාරිම්ගේ[11] පෙළපත
සඳහා අද්නා ප්‍රධානියා විය. මෙරා-
යොත්ගේ පෙළපත සඳහා හෙල්-
කයි ප්‍රධානියා විය. **16** ඉද්දෝගේ
පෙළපත සඳහා සෙකරියා ප්‍රධා-
නියා විය. ගින්නෙතෝන්ගේ පෙළපත
සඳහා මෙෂුල්ලම් ප්‍රධානියා විය.
**17** අබියාගේ[12] පෙළපත සඳහා ෂික්රී
ප්‍රධානියා විය. මිනියාමින්ගේ පෙළ-
පත සඳහාද කෙනෙක් සිටියේය.
මොවදියාගේ පෙළපත සඳහා පිල්-
ටයි ප්‍රධානියා විය. **18** බිල්ගාගේ[13]
පෙළපත සඳහා ෂම්මුවා ප්‍රධානියා
විය. ෂෙමායාගේ පෙළපත සඳහා
යෙහොනාතාන් ප්‍රධානියා විය.
**19** යෝයාරිබ්ගේ පෙළපත සඳහා
මත්තෙනයි ප්‍රධානියා විය. යෙදා-
යාගේ[14] පෙළපත සඳහා උස්සි
ප්‍රධානියා විය. **20** සල්ලයිගේ පෙ-
ළපත සඳහා කල්ලයි ප්‍රධානියා විය.
ආමොක්ගේ පෙළපත සඳහා ඒබර්
ප්‍රධානියා විය. **21** හිල්කියාගේ පෙ-
ළපත සඳහා හෂබියා ප්‍රධානියා විය.
යෙදායාගේ[1] පෙළපත සඳහා නෙත-
නෙල් ප්‍රධානියා විය.

**22** එලියාෂිබ්,[2] යෝයාදා,[3] යෝ-
හානාන් සහ යද්දුවා[4] යන අයගේ
කාලයේ සිටි ලෙවීවරුන්ගේ හා පූජ-
කයන්ගේ පෙළපත්වල ප්‍රධානීන්ගේ
නම් ලේඛනගත කරනු ලැබීය. ඒ දේ
පර්සියාවේ රජු වූ දාරියුස්ගේ පාලන
සමය දක්වාම සිදු කෙරිණ.

**23** එලියාෂිබ්ගේ පුත් යෝහා-
නාන්ගේ කාලය දක්වා සිටි ලෙවීව-
රුන්ගේ පෙළපත්වල ප්‍රධානීන්ගේ[5]
නම් ඉතිහාස වාර්තාවෙහි ලේඛ-
නගත කරන ලදි. **24** ලෙවීවරුන්-
ගේ ප්‍රධානීන් ලෙස කටයුතු කළේ
හෂබියා, ෂෙරෙබියා[6] සහ කද්මි-
යෙල්ගේ[7] පුත් යේෂුවා යන අයයි.
ඔවුන් ඉදිරිපිටම සේවය කර-
මින් සිටියේ ඔවුන්ගේ සහෝදර-
යෝය. සැබෑ දෙවිගේ සේවකයෙකු
වූ දාවිත් අණ කර[8] තිබූ ආකාර-
යට එකිනෙකාට මුහුණ ලා සිටගත්
ඒ කණ්ඩායම් දෙක දෙවිට ස්තුති
ප්‍රශංසා ඔප්පු කිරීමේ කාර්යයෙහි
නිරත වූහ. **25** මත්තනියා,[9] බක්බු-
කියා, ඔබදියා, මෙෂුල්ලම්, ටල්මොන්
සහ අක්කුබ්[10] දේවමාලිගාවේ දොරටු
අසල තිබූ ගබඩා කාමර මුර කර-
මින් සිටියෝය.[11] **26** ඔවුන් සියල්-
ලෝම මෙම සේවාවන්වල නිරත
වූයේ යෝෂාදාක්ගේ[12] පුත් යෝයා-
කීම්ගේ[13] පුත්‍රයෙකු වන යේෂුවාද[14]
ආණ්ඩුකාර නෙහෙමියාද[15] පිටපත්-
කරු[16] වූ පූජක එස්රාද[17] විසූ කාල-
යේදීය.

**27** යෙරුසලමෙහි පවුරු දෙවිට
කැප[18] කළ අවස්ථාවේදී විවිධ තැන්-
වල පදිංචි වූ ලෙවීවරුන් සියලුදෙ-
නාව යෙරුසලමට රැස් කරන පිණිස
පියවර ගනු ලැබීය. ඔවුන්ව එසේ
එක් රැස් කරනු ලැබුවේ කැප කිරී-
මේ උත්සවය සඳහා දෙවිට ස්තුති
ප්‍රශංසා[19] ඔප්පු කිරීමටත් ගී ගැයීම-
ටත්[20] අත්තාළම් ගැසීමටත් වීණා හා

**12 පරි.**
**1** එස්රා 2:40
එස්රා 3:9
**2** 1ලේක 9:15
නෙහෙ 11:17
**3** නෙහෙ 12:26
**4** නෙහෙ 3:1
**5** නෙහෙ 13:28
**6** නෙහෙ 12:22
**7** 1ලේක 24:31
එස්රා 10:16
**8** නෙහෙ 11:11
**9** නෙහෙ 12:1
**10** නෙහෙ 10:4
**11** එස්රා 2:39
නෙහෙ 10:5
**12** නෙහෙ 12:4
**13** නෙහෙ 12:5
**14** නෙහෙ 12:6

---

**2 තීරුව**
**1** නෙහෙ 12:7
**2** නෙහෙ 3:1
නෙහෙ 13:28
**3** නෙහෙ 12:10
**4** නෙහෙ 12:11
**5** 1ලේක 15:12
1ලේක 23:24
**6** නෙහෙ 8:7
**7** එස්රා 2:40
නෙහෙ 12:8
**8** 1ලේක 16:4
1ලේක 23:30
**9** 1ලේක 9:15
නෙහෙ 12:8
නෙහෙ 13:13
**10** 1ලේක 9:17
එස්රා 2:42
නෙහෙ 7:45
නෙහෙ 11:19
**11** 1ලේක 9:22
1ලේක 9:27
**12** එස්රා 3:8
**13** නෙහෙ 12:10
**14** එස්රා 3:2
**15** නෙහෙ 8:9
**16** එස්රා 7:11
**17** එස්රා 7:6
**18** ද්වි 20:5
1රාජා 8:63
ගීතා 30:පෙර
**19** 2ලේක 7:6
**20** 2ලේක 5:13

කුඩා වීණා වාදනය කිරීමටත්ය.[1]
**28** යෙරුසලම අවට තිබූ සියලුම
පළාත්වලින්[2] හා නෙටෝෆාතියව-
රුන්[3] පදිංචිව සිටි ගම්මානවලින්
ගායක පෙළපතට අයත් සියලුදෙනා
එක් රැස් වූහ. **29** තවත් එවැනිම
පිරිසක් බෙත්-ගිල්ගාල්[4] සිටත් ගෙබා[5]
සහ අෂ්මාවෙත්[6] අවට තිබූ කෙත්ව-
තුවල සිටත් පැමිණියෝය. මන්ද
ගායකයෝ යෙරුසලම වටා බොහෝ
ස්ථානවල නිවෙස් සාදා පදිංචි වී සිටි-
යෝය.[7] **30** පූජකයෝ සහ ලෙවී-
වරු තමන්ගේ සේවය සඳහා පවිත්‍ර
වී,[8] රැස්ව සිටි ජනයාවත් තම අපවිත්‍ර
තත්වයෙන් පවිත්‍ර කළෝය.[9] ඉන්ප-
සුව ඔවුහු පවුර[10] හා එහි දොරටු[11] දෙ-
විට කැප කළෝය.

**31** ඉන්පසුව මම යූදාහි අධිප-
තීන්ව[12] පවුර මතට ගෙනාවෙමි.
ඊට අමතරව, මම ගායක කණ්ඩා-
යම්[13] දෙකක් සහ ඔවුන් පසුපස
ගමන් කිරීමට කණ්ඩායම්ද සංවි-
ධානය කළෙමි. එක් කණ්ඩායමක්
පවුරේ දකුණු පැත්තේ කසළ දොර-
ටුව[14] දක්වා ගමන් කළෝය. **32** ඒ
කණ්ඩායම පසුපස හෝෂායා සහ
යූදාහි අධිපතීන්ගෙන් අඩක් ගමන්
කළෝය. **33** ඔවුන් සමඟ අෂරි-
යාද එස්රාද මෙෂුල්ලම්ද **34** යූදාද
බෙන්ජමින්ද ෂෙමායාද යෙරෙමියාද
ගමන් කළෝය. **35** පූජකයන්ගේ
පුත්‍රයන්ගෙන් කිහිපදෙනෙක්ද හො-
රණෑ[15] අතැතිව ඔවුන් පිටුපස ගමන්
කළෝය. ඔවුන්ට ඉදිරියෙන් සිටි-
යේ සෙකරියාය. ඔහුගේ පියා යො-
නාතාන්ය. ඔහුගේ පියා ෂෙමායාය.
ඔහුගේ පියා මත්තනියාය. ඔහු-
ගේ පියා මීකායාය. ඔහුගේ පියා
සක්කූර්ය.[16] ඔහුගේ පියා ආසාෆ්ය.[17]
**36** සෙකරියා සමඟ ඔහුගේ සහෝදර-
යන් වූ ෂෙමායා, අෂරෙල්, මිලලයි,
ගිලලයි, මායයි, නෙතනෙල්, යූදා
සහ හනානිද සිටියෝය. සැබෑ දෙවි-
ගේ සේවකයෙකු වූ දාවිත්ගේ කාල-
යේ සෑදූ සංගීත භාණ්ඩ[18] අතැතිව
සිටි ඔවුන් සියලුදෙනාට ඉදිරියෙන්ම
ගමන් කළේ පිටපත්කරු වූ එස්රාය.[1]
**37** උල්පත් දොරටුවට[2] පැමිණි ඔවුහු
කෙළින්ම ගොස් දාවිත්ගේ නුවර[3]
මැදින් පිහිටි පඩි පෙළ[4] පසු කර-
ගෙන ගියෝය. ඔවුහු දාවිත්ගේ මාලි-
ගාව පිහිටා තිබුණු තැනට ඉහළින්
පවුර දිගේ ගොස් නැඟෙනහිර දෙසින්
පිහිටි ජල දොරටුව[5] දක්වාම ගමන්
කළෝය.

**38** ස්තුති ප්‍රශංසා ඔප්පු කළ අනික්
ගායක කණ්ඩායම[6] ඊට ප්‍රතිවිරුද්ධ
දෙසින් ගමන් කළෝය. පවුර මත සිටි
ඉතුරු පිරිසද මමද ඔවුන් පිටුප-
සින් ගමන් කර, උඳුන් මුරකොටුව[7]
පසු කරගෙන පළල් පවුර[8] වෙතට
ගියෙමු. **39** අපි එතැන් සිට එෆ්‍රා-
යිම් දොරටුව[9] පසු කරගෙන පැරණි
නුවරේ දොරටුව[10] වෙතට ආවෙමු.
ඉන්පසු අපි මත්ස්‍ය දොරටුව,[11] හනා-
නෙල්ගේ මුරකොටුව[12] සහ මේයා
මුරකොටුව[13] පසු කරගෙන බැටළු
දොරටුව[14] දක්වා ගියෙමු. අපි මුරක-
රුවන්ගේ දොරටුව අසලටද පැමිණ
එහි නැවතී සිටියෙමු.

**40** යම් වේලාවක් ගත වූ පසු
ස්තුති ප්‍රශංසා ඔප්පු කරන ගායක
කණ්ඩායම් දෙකම[15] සැබෑ දෙවි-
ගේ ගෘහයට පැමිණ එහි නැවතී
සිටියෝය.[16] ඔවුන් සමඟ නිලධා-
රීන්ගෙන් අඩක්ද මමද සිටියෙමු.[17]
**41** හොරණෑ[18] අතැතිව පූජකයන් වූ
එලියාකීම්, මයසේයා, මිනියාමින්,
මීකායා, එලියෝනේයයි, සෙකරියා
සහ හනනියාද **42** මයසේයා, ෂෙ-
මායා, එලියාසර්, උස්සි, යෙහෝහා-
නන්, මල්කියා, ඒලාම් සහ එෂෙර්
යන අයද සිටියෝය. ඉශ්රාහියාගේ
අධීක්ෂණය යටතේ සිටි ගායකයන්-
ගේ හඬ අවට ප්‍රදේශය සිසාරා පැතිරිණ.[19]

**43** ඔවුහු එදින පූජාවන් විශාල
ප්‍රමාණයක්[20] ඔප්පු කරමින් බොහෝ
සෙයින් ප්‍රීතිමත් වූහ.[21] මන්ද සැබෑ
දෙවි ඔවුන් තුළ මහත් ප්‍රීතියක් ඇති

**12 පරි.**
1 1ලේක 23:5; 2ලේක 9:11
2 උත් 13:10; 1රාජා 7:46
3 1ලේක 2:54; 1ලේක 9:16; නෙහෙ 7:26
4 යොෂු 5:9; යොෂු 15:7
5 යොෂු 21:17; 1ලේක 8:6; නෙහෙ 11:31
6 එස්රා 2:24
7 ලෙවී 25:31
8 නික් 19:10; 2ලේක 29:5
9 එස්රා 6:21
10 නෙහෙ 6:15
11 නෙහෙ 7:1
12 1ලේක 28:1; නෙහෙ 9:32
13 නෙහෙ 12:38; නෙහෙ 12:40
14 නෙහෙ 2:13; නෙහෙ 3:13
15 ගණන් 10:2; 2ලේක 5:12
16 1ලේක 25:2
17 1ලේක 6:39; 1ලේක 25:1
18 1ලේක 23:5; ආමො 6:5

**2 තීරුව**
1 නෙහෙ 8:4
2 නෙහෙ 2:14
3 2සාමු 5:7; 2සාමු 5:9
4 නෙහෙ 3:15
5 නෙහෙ 3:26; නෙහෙ 8:1
6 නෙහෙ 12:31
7 නෙහෙ 3:11
8 නෙහෙ 3:8
9 2රාජා 14:13; නෙහෙ 8:16
10 නෙහෙ 3:6
11 2ලේක 33:14; නෙහෙ 3:3; ශෙප 1:10
12 යෙරෙ 31:38; සෙක 14:10
13 නෙහෙ 3:1
14 යොහ 5:2
15 නෙහෙ 12:31
16 එස්රා 1:2; එස්රා 6:15
17 නෙහෙ 12:32; ගීතා 47:9
18 ගණන් 10:2
19 ගීතා 81:1; ගීතා 100:1; යෙසා 12:6
20 එස්රා 6:17
21 ද්වි 12:12

කර තිබිණ.[1] ඔවුන් සමඟ ස්ත්‍රීහුද[2]
දරුදැරියෝද[3] ප්‍රීතිමත් වූහ. යෙරුස-
ලමෙහි ඇසුණු ඒ ප්‍රීති ඝෝෂා හඬ
කොතරම්ද කිවහොත් එය බොහෝ
දුර ඈතට විහිදී ගියේය.[4]
**44** මීට අමතරව බඩු බාහිරාදිය,
ලැබෙන පරිත්‍යාගයන්,[5] මුල් පල-
දාව,[6] දසයෙන් කොටස්[7] යනාදිය
ගබඩා[8] කිරීමට භාවිත කළ ශාලා[9]
බලාගැනීමටත් එදින පුරුෂයන්ව
පත් කරන ලදි. ඔවුන්ගේ වගකීම
වූයේ නීතියේ සඳහන් වී තිබූ ආකාර-
යට[10] පූජකයන් සහ ලෙවීවරුන්[11]
සඳහා නියමිත කොටස කෙත්වතුව-
ලින් හා නුවරවලින් එකතු කිරීමය.
සේවය කරමින් සිටි පූජකයන් හා ලෙ-
වීවරුන්[12] දැක යුදාහි සෙනඟ ප්‍රීතිමත්
වූහ. **45** ඔවුහු එහිදී දෙවි අණ කර
තිබූ දේවල්ද[13] පවිත්‍ර වීමේ චාරිත්‍රද[14]
ඉටු කළ යුතු සියලු වගකීම්ද ඉටු
කිරීමට පටන්ගත්තෝය. මීට අමත-
රව, ගායකයෝ[15] සහ දොරටු පාල-
කයෝ[16] දාවිත් සහ ඔහුගේ පුත්
සලමොන් අණ කර තිබූ ආකාරය-
ටම තම වගකීම් ඉටු කළෝය.
**46** දාවිත් සහ ආසාෆ් ජීවත් වූ
කාලයේදී, දෙවිට ස්තුති ප්‍රශංසා[17]
ඔප්පු කරන කණ්ඩායමට ප්‍රධා-
නීන්ව[18] පත් කර තිබිණ. **47** සෙ-
රුබාබෙල්[19] ජීවත් වූ කාලයේදීත්
නෙහෙමියා[20] වන මා ජීවත් වූ කාල-
යේදීත් ගායකයන්ගේ[21] හා දොරටු
පාලකයන්ගේ[22] දෛනික අවශ්‍යතා-
වන් සැපයීමට සැලසුමක් යොදා
තිබිණ. ඊශ්‍රායෙල්හි සියලු ජනයා
තමන් සඳහා නියම කර තිබූ කොටස්
ගෙනැවිත් භාර දුන්නෝය. එයින්
කොටසක් ලෙවීවරුන්ගේ භාවිතය
සඳහා වෙන් කරන ලදි.[23] ලෙවීවරුද
ආරොන්ගේ පෙළපතට අයත් පූජක-
යන්ට කොටසක් වෙන් කර තැබු-
වෝය.

**13** එදින සියලුදෙනාටම ඇසෙන්න
මෝසෙස්ගේ ලියවිල්ල[24] ශබ්ද
නඟා කියවන ලදි.[25] ඒ ලියවිල්-
ලෙහි සඳහන් ආකාරයට අම්මොන්[1]
ජාතිකයන්ටවත් මෝවබ්[2] ජාතික-
යන්ටවත් සැබෑ දෙවි ඉදිරියේ රැස්
වන සභාව සමඟ එකතු වන්න අවසර
නැති[3] බව සියලුදෙනාටම අවබෝධ
විය. **2** එයට හේතුව වූයේ, ඔවුන්
අතීතයේදී ඊශ්‍රායෙල් සෙනඟට කෑම
බීම නොදී[4] ඔවුන්ට ශාප කරන්න[5]
බාලාම්ව[6] කුලියට ගත් නිසාය. එහෙත්
බාලාම් ඔවුන්ට ශාප කිරීමට උත්-
සාහ කරද්දී දෙවි එයට ඉඩ නොදී
ඔහු ලවාම තම සෙනඟට ආශීර්වාද
කළේය.[7] **3** නීතියේ සඳහන් දේ ඇසූ
වහාම[8] ඊශ්‍රායෙල් සෙනඟ අතරින් සිය-
ලුම විදේශිකයන්ව* වෙන්[9] කරන ලදි.
**4** ඒ කාලයේදී, පූජකයෙකු වූ එලි-
යාෂිබ්[10] අපගේ දෙවිගේ ගෘහයේ පිහිටි
එක්තරා භෝජන ශාලාවක්[11] භාරව
කටයුතු කළේය. ඔහු ටොබියාගේ[12]
නෑදෑයෙකු විය. **5** එලියාෂිබ් ටො-
බියා වෙනුවෙන්ම විශාල භෝජන
ශාලාවක්[13] වෙන් කර තිබිණ. මීට
පෙර එම භෝජන ශාලාව භාවිත
කර තිබුණේ ධාන්‍ය පූජා[14] සඳහා
ගෙනා ද්‍රව්‍ය, කට්ටකුමංජල් හා භාජන
ගබඩා කිරීමටය. ලෙවීවරුන්ට,[15]
ගායකයන්ට, දොරටු පාලකයන්ට
හා පූජකයන්ට ධාන්‍යවලින්, අලුත්
වයින්වලින්[16] හා තෙල්වලින්[17] හිමි වූ
දසයෙන් කොටස් ගබඩා කළෙත් එම
භෝජන ශාලාවේමය.
**6** මම යම් කාලයක් යෙරුසලමෙහි
නොසිටියෙමි. මන්ද බැබිලෝනියේ
රජුව සිටි අර්තක්ෂස්තාගේ[18] තිස්දෙ-
වන[19] අවුරුද්දේදී මා නැවතත් රජ්ජු-
රුවන් වෙතට ගොස් එහි සේවය
කරමින් සිටි බැවිනි. යම් කලක් ගත
වූ පසු මම රජ්ජුරුවන්ගෙන් අවසර
ලබාගෙන,[20] **7** නැවත යෙරුසලමට
පැමිණියෙමි. සැබෑ දෙවිගේ ගෘහයේ

**12 පරි.**
**1** ගීතා 9:2; ගීතා 92:4
**2** යෙරෙ 31:13
**3** ගීතා 148:12
**4** එස්රා 3:13
**5** නෙහෙ 10:39
**6** නෙහෙ 10:35; නෙහෙ 10:37
**7** නෙහෙ 10:38; නෙහෙ 13:12
**8** නෙහෙ 13:13
**9** 1ලේක 9:26; 2ලේක 31:11
**10** නික් 34:26; ගණන් 15:19; ද්වි 26:2
**11** ගණන් 18:21
**12** ගණන් 3:6; 1ලේක 23:28
**13** ගණන් 3:7
**14** නික් 30:21; ලෙවී 21:6; ලෙවී 22:2
**15** නෙහෙ 12:31
**16** 1ලේක 9:22
**17** 2ලේක 29:31
**18** 1ලේක 25:1; 1ලේක 25:6
**19** එස්රා 3:2; හග් 1:12; ලූක් 3:27
**20** නෙහෙ 1:1
**21** නෙහෙ 11:23
**22** නෙහෙ 10:39
**23** ගණන් 18:21

**13 පරි.**
**24** නෙහෙ 8:3; ලූක් 10:26; ක්‍රියා 13:15; ක්‍රියා 15:21
**25** ද්වි 31:11; නෙහෙ 8:2; ලූක් 4:16

**2 තීරුව**
**1** ද්වි 23:3
**2** උත් 19:37
**3** ද්වි 23:6
**4** ද්වි 23:4; විනි 11:17
**5** ගණන් 22:6
**6** ගණන් 22:5; යොෂු 24:9
**7** ගණන් 23:8; ගණන් 24:10; ද්වි 23:5; ගීතා 109:28; මීකා 6:5
**8** ගීතා 19:7; ගීතා 119:15; හිතෝ 6:23
**9** එස්රා 10:11; නෙහෙ 9:2; නෙහෙ 10:28
**10** නෙහෙ 3:1
**11** නෙහෙ 10:37; නෙහෙ 10:38

---

**12** නෙහෙ 2:10; **13** නෙහෙ 12:44; **14** නෙහෙ 10:33; **15** ගණන් 18:24; **16** ගණන් 18:27; ගණන් 18:30; **17** ද්වි 18:4; **18** එස්රා 7:1; නෙහෙ 2:1; **19** නෙහෙ 5:14; **20** නෙහෙ 2:5; නෙහෙ 2:6.

---

නෙහෙ **13:3*** මූ.අ., “මිශ්‍ර ජාතිකයන්ව.”

මළුවක[1] ටොබියා[2] වෙනුවෙන් ශාලා-
වක් වෙන් කර තැබීමෙන් එලියාෂිබ්[3]
කළ ලොකු වරද ගැන මට දැනගන්න
ලැබුණේ එවිටයි. **8** එය දැක මා
තුළ මහත් පිළිකුලක් ඇති විය.[4] මම
භෝජන ශාලාවට ගොස් ටොබියාගේ
සියලු ගෘහ භාණ්ඩ පිටතට විසි කර
දැමුවෙමි.[5] **9** ඉන්පසුව මාගේ අණ
පරිදි සියලුම භෝජන ශාලා[6] පවිත්‍ර
කරන ලදි.[7] මම සැබෑ දෙවිගේ ගෘහයේ
භාවිතය සඳහා තිබූ භාජනද[8] ධාන්‍ය
පූජා සඳහා ගෙනා ද්‍රව්‍යද කට්ටකුමං-
ජල්ද[9] එහි නැවත ගබඩා කිරීමට පිය-
වර ගත්තෙමි.

**10** මේ අතර ලෙවීවරුන්ට දිය
යුතු නියමිත කොටස්[10] ඔවුන්ට ලබා
නොදී තිබුණු බවත් මට දැන-
ගන්න ලැබිණ. එහි ප්‍රතිඵලය
වූයේ, ලෙවීවරුන් සහ ගායකයන්
තම තමන්ගේ අවශ්‍යතා පිරිමසාගැ-
නීම සඳහා තමන්ට පවරා තිබූ
සේවාවන් අත්හැර තම කෙත්ව-
තුවල වැඩ කිරීමට යෑමය.[11]
**11** මම මේ සම්බන්ධයෙන් නිලධා-
රීන්ට[12] දොස් කියමින්,[13] "සැබෑ දෙවි-
ගේ ගෘහයේ වැඩකටයුතු මේ විදිහට
නොසලකාහැර තිබෙන්නේ ඇයි"[14]
කියා ඇසුවෙමි. ඉන්පසුව මම සිය-
ලුම ලෙවීවරුන්ව එකතු කරගෙන
තම තමන්ට නියමිත කාර්යයන්-
වල ඔවුන්ව නැවත යෙදෙව්-
වෙමි. **12** ඉන් අනතුරුව, යූදාහි
සියලුම වැසියෝ ධාන්‍යවලින්,[15]
අලුත් වයින්වලින්[16] සහ තෙල්ව-
ලින්[17] ලබා දිය යුතු දසයෙන් කො-
ටස්[18] ගෙනැවිත් ගබඩාවල තැන්පත්
කළෝය.[19] **13** ගබඩා භාරව කට-
යුතු කිරීමට පූජක ෂෙලෙමියාව,
පිටපත්කරුවෙකු වූ සාදොක්ව සහ
ලෙවීවරයෙකු වූ පෙදායාව මම පත්
කළෙමි. ඔවුන් යටතේ මත්තනියා-
ගේ[20] පුත්‍රයෙකු වූ සක්කූර්ගේ පුත්
හානාන්ද සේවය කළේය. ඔවුන්ට
මෙම වගකීම භාර දුන්නේ ඔවුන් විශ්-
වාසවන්ත[21] පුරුෂයන් වූ නිසාය.
ඔවුන්ගේ සහෝදරයන් වන ලෙවීව-
රුන්ට හා පූජකයන්ට නියමිත කො-
ටස් ලබා දීමේ[1] වගකීම පැවරුණේ
ඔවුන්ටය.

**14** "මාගේ දෙවියනි, මා මේ කළ
කිසි දෙයක් අමතක නොකරන්න.[2]
ඔබේ ගෘහය[3] වෙනුවෙනුත් එහි විවිධ
වැඩකටයුතු බලා කියා ගැනීම වෙනු-
වෙනුත් මා විශ්වාසවන්තව* කළ
සියලුම ක්‍රියා අමතක නොකරන[4]
මෙන් මම ඔබෙන් ඉල්ලා සිටිමි."

**15** ඒ කාලයේදී යූදාහි විසූ
මනුෂ්‍යයෝ සබත් දවසේදී මිදි යන්-
ත්‍රවල මිදි මඩින ආකාරයත්[5] කපා-
ගත් ධාන්‍ය ගොඩවල් බූරුවන් පිට[6]
පටවන ආකාරයත්[7] වයින්, මිදි, අත්-
තික්කා[8] සහ වෙනත් බඩු බාහිරාදිය
යෙරුසලමට රැගෙන එන ආකාරයත්
මම දුටුවෙමි.[9] ඔවුන් ඒ සියලුම
දේවල් රැගෙන ඇවිත් සබත් දව-
සේදී විකුණන්න පටන්ගත් නිසා මම
ඔවුන්ට තරවටු කළෙමි. **16** මීට
අමතරව යෙරුසලමෙහි වාසය කළ
තීර්හි[10] වෙළෙන්දෝ විවිධ මසුන්
වර්ග හා වෙනත් බඩු බාහිරාදිය[11]
ගෙන්වාගනිමින් ඒවා යෙරුසලමෙහි
විසූ යුදෙව්වරුන්ට සබත් දවසේදී
විකුණමින් සිටියෝය. **17** එහෙයින්
යූදාහි වංශවත්[12] අයට දොස් කියමින්
මම මෙසේ ඇසුවෙමි. "ඔබ මොන-
වාද මේ කරන්නේ? ඔබ සබත් දව-
සේදී මේ දේවල් කරන්නේ ඇයි?
එය දෙවිට කරන මහත් අගෞරව-
යක් කියා ඔබට තේරෙන්නේ නැද්ද?
**18** අපේ දෙවි මීට කලින් මේ නුවර
විනාශ කර අපට බොහෝ විපත් ඇති
කළේ[13] අපේ මුතුන්මිත්තන් මෙවැ-
නිම දේවල් කළ නිසා නොවේද?[14]
නමුත් දැන් ඔබත් ඒ දේම කරනවා.
සබත් දවසට ගරු නොකරන[15] ඔබ
ඊශ්‍රායෙල් සෙනඟට විරුද්ධව දෙවිගේ
උදහස තවත් වැඩි කරනවා."

**19** සබත් දවසට පෙර දවසේදී
අඳුර වැටෙන්න කලින් යෙරුසල-
මෙහි දොරටු වසා දමන්න මම අණ

**13 පරි.**
1 මතෙ 21:13
2 නෙහෙ 2:10 නෙහෙ 4:7
3 නෙහෙ 12:10
4 හිතෝ 8:13 ආමෝ 5:15
5 මතෙ 21:12
6 නෙහෙ 10:39
7 2ලේක 29:5
8 එස්රා 1:9
9 ලෙවී 2:15 නෙහෙ 13:5
10 නෙහෙ 10:37 නෙහෙ 12:47 මලා 3:8
11 ගණන් 35:2
12 එස්රා 9:2 නෙහෙ 2:16
13 හිතෝ 28:4
14 නෙහෙ 10:39
15 ගණන් 18:27
16 ගණන් 18:12
17 ද්වි 18:4
18 ලෙවී 27:30 ගණන් 18:21
19 නෙහෙ 10:38 මලා 3:10
20 නෙහෙ 11:17 නෙහෙ 12:8
21 ගීතා 15:1 ලූක් 12:42 1කොරි 4:2

**2 තීරුව**
1 ක්‍රියා 4:35 ක්‍රියා 6:1
2 නෙහෙ 5:19
3 2ලේක 24:16 ගීතා 122:9
4 මතෙ 6:20 හෙබ්‍රෙ 6:10
5 නික් 20:10 නික් 34:21 නික් 35:2 යෙසා 58:13
6 2සාමු 16:1
7 යෙරෙ 17:21
8 ද්වි 8:8
9 යෙරෙ 17:27
10 යොෂු 19:29
11 නෙහෙ 10:31
12 නෙහෙ 4:14
13 එස්රා 9:13
14 නෙහෙ 9:16
15 නික් 20:8 නික් 31:14

නෙහෙ **13:14*** හෝ, "ඇදි ප්‍රේමය."

කළෙමි. දොරටු වහාම වසා දමනු
ලැබීය.[1] ඉන්පසු, සබත් දවස නිමා
වන තුරු දොරටු නැවත විවෘත නො-
කළ යුතු බව මම අණ කළෙමි.
එමෙන්ම මාගේ සේවකයන් කිහිපදෙ-
නෙකුවද දොරටු අසල රඳවා, සබත්
දවස අතරතුරේදී නුවර තුළට කිසිම
දෙයක් ප්‍රවාහණය කිරීමට කිසිවෙ-
කුට ඉඩ නොදෙන්න කියා ඔවුන්ට
පැවසුවෙමි.[2] **20** ඒ නිසා, වෙළෙන්-
දෝ හා නොයෙකුත් බඩු බාහිරා-
දිය අළෙවි කරන්නෝ යෙරුසලමෙන්
පිටත රාත්‍රිය ගත කළෝය. මේ දේ
දෙවරක්ම සිදු විය. **21** ඒ නිසා මම
ඔවුන්ට තරවටු කරමින්[3] මෙසේ පැව-
සුවෙමි. “ඔබ මොකටද පවුර ළඟට වී
රාත්‍රිය ගත කරන්නේ? ඔබ නැවතත්
මේ දේ කළොත් මම ඔබ සියලුදෙ-
නාව මෙතැනින් පන්නා දමනවා!”[4]
එදා පටන් ඔවුහු සබත් දවසේදී
වෙළඳ කටයුතු සඳහා නුවරට නො-
පැමිණියෝය.

**22** සබත් දවස ගෞරවනීය[5] ලෙස
පැවැත්වීම සඳහා පවිත්‍ර වී[6] නුවර දො-
රටු අසල නිතරම මුර සේවයේ යෙ-
දීමට[7] තමන් වගබලා ගත යුතු
බව මම ලෙවීවරුන්ට[8] පැවසුවෙමි.
“මාගේ දෙවියනි, මා කළ මේ දේවල්ද
අමතක නොකරන්න.[9] ඔබේ අතිම-
හත් කරුණාව*[10] පෙන්වා මට අනු-
කම්පා කරන්න.”

**23** ඒ කාලයේදී සමහර යුදෙව්-
වරුන් අෂ්දොද්,[11] අම්මොන් සහ
මෝවබ්[12] ජාතික ස්ත්‍රීන්ව විවාහ[13]
කරගෙන සිටි බවත් මගේ අවධාන-
යට ලක් විය. **24** ඔවුන්ගේ දරු-
වන්ගෙන් අඩක්ම අෂ්දොද්වරුන්ගේ
භාෂාව කතා කළත් ඉන් එක් කෙනෙ-
කුටවත් යුදෙව් භාෂාව[14] කතා කිරී-
මට නොහැකි විය. ඔවුන් කතා
කළේ වෙනත් භාෂාවන්ය. **25** මම
ඔවුන්ට දොස් කියමින් තදින්ම තර-
වටු කළෙමි.[15] මම ඔවුන්ගෙන් සමහ-
රෙකුට පහර දී[16] ඔවුන්ගේ කෙස්
උගුලා දැමුවෙමි. මින් ඉදිරියට එසේ
නොකරන බවට ඔවුන්ගෙන් පො-
රොන්දුවක්[1] ගත් පසු මෙසේ කීවෙමි.
“ඔබේ දූවරුන්ව වෙනත් ජාතිකයන්-
ගේ පුතුන්ට විවාහ කර දෙන්න
එපා. ඔබේ පුතුන්ට ඔවුන්ගේ දූවරුන්
සමඟ විවාහ වීමට ඉඩ දෙන්නත්
එපා.[2] **26** ඊශ්‍රායෙල්හි රජු වූ සල-
මොන්ට සිදු වූ දේ ඔබට මතක
නැද්ද? සියලු ජාතීන් අතරේ ඔහු හා
සමාන රජ කෙනෙක් සිටියේ නැහැ.[3]
දෙවිත් ඔහුට බොහෝ සෙයින් ප්‍රේම
කළා.[4] දෙවි ඔහුව මුළු ඊශ්‍රායෙල්
ජාතියේ රජු ලෙස පත් කළේ ඒ
නිසයි. නමුත් ඔහුත් දෙවිට විරුද්ධව
පව් කළා.[5] ඒ දේ සිදු වුණේ ඔහු-
ගේ විදේශීය භාර්යාවන්ගේ බලපෑම
නිසයි.[6] **27** මේ සෑම දෙයක්ම දැන
දැනත් ඔබ අපගේ දෙවිට ද්‍රෝහී
වී විදේශීය ස්ත්‍රීන්ව විවාහ කර-
ගෙන සිටිනවා.[7] ඔබ මේ වගේ දෙ-
යක් කරන්නේ කොහොමද කියා මට
හිතාගන්නවත් බැහැ.”

**28** උත්තම පූජක එලියාෂිබ්ගේ[8]
පුත් යෝයාදාගේ[9] එක් පුත්‍රයෙක්
හෝරොන්හි[10] වැසියෙකු වූ සන්බලට්-
ගේ[11] බෑනා විය. එහෙයින් මම ඔහුව
එළවා දැමුවෙමි.[12]

**29** “මාගේ දෙවියනි, පූජකයන්
කරන සේවයත් පූජකයන් සහ ලෙ-
වීවරුන්[13] සමඟ ඔබ කළ ගිවිසු-
මත්[14] සුළුවට ගෙන තිබෙන මේ
අයගේ වැරදි ක්‍රියා[15] අමතක නොක-
රන මෙන් මම ඉල්ලමි.”

**30** මම විදේශිකයන්ගේ සියලු
බලපෑම්වලින් සෙනඟව නිදහස් කර
ඔවුන්ව පවිත්‍ර තත්වයකට[16] ගෙනා-
වෙමි. ඉන්පසු මම පූජකයන්ට හා
ලෙවීවරුන්ට නියම වී තිබූ වගකීම්ව-
ලට නැවත ඔවුන්ව යොමු කළෙමි.[17]
**31** මේ අනුව, නියම වේලාවට දරදු[18]
මුලින්ම නෙළාගත් ඉදුණු පලතුරුද
ගෙන ඒම අරඹන ලදි.

“මාගේ දෙවියනි, මට කරුණාව
පෙන්වා[19] මාව සිහි කරන මෙන්
ඉල්ලා සිටිමි.”[20]

**13 පරි.**
**1** නෙහෙ 7:3
**2** යෙරෙ 17:21
**3** නෙහෙ 9:29
**4** එස්රා 7:26
රෝම 13:3
1පේතෘ 2:14
**5** ද්වි 5:12
**6** නෙහෙ 12:30
**7** 1ලේක 9:23
1ලේක 26:13
**8** 1ලේක 23:28
**9** නෙහෙ 5:19
නෙහෙ 13:14
නෙහෙ 13:31
**10** ගීතා 25:6
ගීතා 51:1
ගීතා 130:7
**11** යොෂු 13:3
1සාමු 5:7
**12** නික් 34:16
ද්වි 23:3
**13** එස්රා 9:2
එස්රා 10:10
2කොරි 6:14
**14** 2රාජා 18:26
**15** ද්වි 27:26
**16** ද්වි 25:2
එස්රා 7:26

**2 තීරුව**
**1** ද්වි 6:13
නෙහෙ 10:29
**2** ද්වි 7:3
**3** 1රාජා 3:13
2ලේක 1:12
2ලේක 9:22
**4** 2සාමු 12:24
**5** 1රාජා 11:1
**6** 1රාජා 11:4
1රාජා 11:5
**7** එස්රා 10:2
**8** නෙහෙ 3:1
නෙහෙ 13:4
**9** නෙහෙ 12:10
**10** යොෂු 16:3
යොෂු 16:5
**11** නෙහෙ 2:10
නෙහෙ 4:1
නෙහෙ 6:14
**12** හිතෝ 20:8
හිතෝ 20:26
**13** මලා 2:4
**14** නික් 40:15
ගණන් 25:13
**15** ලෙවී 21:15
**16** නෙහෙ 10:30
**17** 1ලේක 23:6
1ලේක 25:1
**18** නෙහෙ 10:34
**19** ගීතා 25:7
**20** නෙහෙ 5:19

---

නෙහෙ **13:22*** හෝ, “ළැදි ප්‍රේමය.”

# එස්තර්

**1** ඉන්දියාවේ සිට ඉතියෝපියාව
දක්වා පළාත් එකසිය විසිහතක
රජකම් කළ[1] අහෂ්වේරොෂ්*[2] රජු-
ගේ කාලයේදී සිදු වූ සිද්ධීන් මෙහි
වාර්තා කර ඇත. **2** එවකට අහෂ්-
වේරොෂ් රජු තම රාජධානිය පාලනය
කරමින්[3] සිටියේ ෂූෂන්[4] මාලිගා-
වේ[5] සිටය. **3** තම පාලන සමයේ
තුන්වන අවුරුද්දේදී රජ මහා භෝ-
ජන සංග්‍රහයක්[6] සූදානම් කළේය. ඒ
සඳහා ඔහු තම සියලු අධිපතීන්ටද
සේවකයන්ටද පර්සියාවේ[7] හා මේදි-
යාවේ[8] හමුදා නිලධාරීන්ටද ආරාධනා
කළේය. ඔහුගේ පාලනය යටතේ තිබූ
පළාත්වල ජීවත් වූ වංශවත් අයට[9] හා
අධිපතීන්ට ආරාධනා කිරීමටද[10] ඔහු
අමතක කළේ නැත. **4** රජ තම
තේජවත් රාජධානියේ වස්තු සම්භාර-
යද[11] තමාට මෙතරම් ගෞරවයක් හා
තේජසක්[12] ලැබීමට හේතු වූ දේ-
වල්ද දවස් එකසිය අසූවක් පුරා
ඔවුන්ට ප්‍රදර්ශනය කළේය. **5** ඒ
කාලය අවසන් වූ පසු දින හතක්
මුළුල්ලේ රජ, මහා භෝජන සංග්‍රහය
පැවැත්වීය. තම මාලිගාවේ මළුවේ
පැවැත්වූ එම භෝජන සංග්‍රහයට රජ
ෂූෂන් මාලිගාවේ උසස් මෙන්ම සුළු
තනතුරු දැරූ සෑම කෙනෙකුටම
ආරාධනා කළේය. **6** එම මළුවේ
කිරිගරුඬ කුලුනු තිබිණ. ලිනන් රෙ-
දිවලින්ද අනර්ඝ කපු රෙදිවලින්ද නිල්
පැහැති[13] රෙදිවලින්ද නිමැවූ තිර එහි
එල්ලා තිබිණ. ඒ තිර කුලුනුවල
එල්ලා තිබුණේ රිදී මුදුවලට සවි
කළ අනර්ඝ රෙදි හා රත්නිල් පැහැ-
ගැන්වූ[14] ලොම් යොදා සාදාගත් ලණු
ආධාරයෙනි. ඒ මළුවෙහි බිම කිරි-
ගරුඬවලින්ද රතු සහ කලු පැහැති
ගල්වලින්ද මුතු බෙල්ලාගේ කටුව-
ලින්ද සාදා තිබිණ. එහි රනින් සහ
රිදීයෙන් නිමැවූ යහන්[1] තබා තිබු-
ණේය.
**7** භෝජන සංග්‍රහයට සහභාගි වූ
අමුත්තන්ට වයින් බීමට දුන්නේ
රන් කුසලානවලිනි.[2] ඒ සියලු කුස-
ලාන එකිනෙකට වෙනස්ය. විශාල
වයින් ප්‍රමාණයක්[3] භෝජන සංග්‍රහ-
යට පැමිණි අමුත්තන් අතරේ
බෙදා දෙනු ලැබිණ. එතරම් විශාල
වයින් ප්‍රමාණයක් සැපයිය හැක්කේ
රජුට පමණි. **8** නමුත් නීතියේ සඳ-
හන්ව ඇති නිශ්චිත වයින් ප්‍රමාණය
බොන මෙන් කිසිවෙක් කිසිවෙකුට
බල කළේ නැත. මන්ද තමන්ගේ
කැමැත්තේ හැටියට වයින් පානය
කිරීමට අමුත්තන්ට ඉඩ දෙන ලෙස
මාලිගාවේ සේවය කළ නිලධාරීන්ට
රජ අණ කර තිබිණ.
**9** ඒ අතරතුර[4] වෂ්ටී බිසවද අහෂ්-
වේරොෂ් රජුගේ නිවසේ ස්ත්‍රීන් සඳහා
භෝජන සංග්‍රහයක් පැවැත්වූවාය.
**10** සත්වන දවසේදී වයින් බී සතු-
ටින් සිටි[5] අහෂ්වේරොෂ් රජ මෙහූ-
මාන්, බිස්තා, හර්බෝනා,[6] බිග්තා,
අබග්තා, ෂේතර් සහ කර්කස් යන
නිලධාරීන්[7] සත්දෙනාව තමා ඉදිරි-
යට කැඳවීය. **11** වෂ්ටී බිසව ඉතා
සුරූපී නිසා[8] ඇගේ ශෝභනකම
සෙනඟටත් අධිපතීන්ටත් පෙන්වන
පිණිස ඇයව රාජකීය හිස් පළඳනා-
වෙන් සරසා තමා ඉදිරියට කැඳවා-
ගෙන එන ලෙස රජ එම නිලධාරීන්ට
පැවසුවේය. **12** නමුත් වෂ්ටී බිසව
රජු තම නිලධාරීන් ලවා කළ ඉල්ලීම
එකහෙළා ප්‍රතික්ෂේප කළාය.[9] ඒ බව
දැනගත් රජුට මහත් කෝපයක්[10]
ඇති විය.
**13** එහෙයින් අහෂ්වේරොෂ් රජ,
එවකට පැවති වත්පිළිවෙත් ගැන
මනා අවබෝධයක්[11] ඇති ප්‍රඥාවන්ත
මනුෂ්‍යයන්ව[12] තමා ඉදිරියට කැඳ-
වීය. (යම් ප්‍රශ්නයක් මතු වූ විට නීතිය
හා වත්පිළිවෙත් ගැන මනා අවබෝ-

**1පරි.**
**1** එස්ත 8:9, දානි 6:1
**2** දානි 11:2
**3** එස්ත 5:1
**4** එස්රා 4:9, නෙහෙ 1:1, දානි 8:2
**5** නෙහෙ 2:8
**6** 1සාමු 25:36, එස්ත 2:18
**7** එස්රා 1:2, දානි 5:28
**8** යෙසා 21:2, යෙරෙ 51:11
**9** දානි 3:2, දානි 6:7
**10** හිතෝ 11:14, හිතෝ 15:22, හිතෝ 20:18, හිතෝ 24:6
**11** යෙසා 39:2, එස 28:5
**12** රෝම 13:7, 1පේතෘ 2:17
**13** එස්ත 8:15
**14** නික් 26:31

**2තීරුව**
**1** එස්ත 7:8
**2** 1රාජා 10:21
**3** නෙහෙ 2:1
**4** එස්ත 1:12, එස්ත 2:1, එස්ත 2:17
**5** ගීතා 104:15, දේශ 10:19, එෆී 5:18
**6** එස්ත 7:9
**7** 2රාජා 4:43, එස්ත 2:2
**8** හිතෝ 31:30
**9** 1කොරි 11:9, එෆී 5:24
**10** හිතෝ 19:12, හිතෝ 20:2
**11** 1ලේක 12:32, මතෙ 16:3
**12** දානි 2:27

**එස්ත 1:1*** සෙප්ටුඅජින්ට් පරිවර්තනයට අනුව, 'අර්තක්ෂස්තා' ලෙස හැඳින්වේ. මොහු මහ දාරියුස්ගේ පුත් වූ 1වන ෂස්තා බවද පිළිගැනේ.

ධයක් ඇති අයගෙන් ඒ ගැන විමසීම
රජුගේ සිරිත විය. **14** එසේ රජුගේ
සමීපතම උපදේශකයන් ලෙස කට-
යුතු කළේ කාෂේනා, ෂේතාර්, අද්-
මාතා, තර්ෂිෂ්, මෙරෙස්, මාසේනා
සහ මෙමූකාන් යන පර්සියාවේ සහ
මේදියාවේ අධිපතීන් සත්දෙනාය.[1]
නිතිපතා රජු ඉදිරියට ගිය[2] ඔවුන්
රාජධානියේ ඉහළ තනතුරු දැරූ
නිලධාරීන්ය.) **15** පසුව රජ ඔවුන්-
ගෙන් මෙසේ ඇසුවේය. "නිලධාරීන්
මාර්ගයෙන් දැන්වූ රජුගේ අණට අකී-
කරු වූ වෂ්ටී බිසවට නීතියට අනුව
කුමක් කළ යුතුද?"

**16** මෙමූකාන්[3] ඊට පිළිතුරු දෙ-
මින් රජු සහ අධිපතීන් ඉදිරියේ මෙසේ
පැවසුවේය. "රජතුමනි, වෂ්ටී බිසව
මේ වරද[4] කර තිබෙන්නේ ඔබට
විරුද්ධව පමණක් නෙවෙයි. ඔබ-
තුමාගේ පාලනය යටතේ තිබෙන
පළාත් සියල්ලේ වෙසෙන සියලුම
අධිපතීන්ටත් සෙනඟටත් විරුද්ධ-
වයි බිසව මේ වරද කර තිබෙන්-
නේ. **17** බිසව කළ මේ දේ,
දේශයේ වෙසෙන අනිකුත් භාර්යා-
වන්ටත් ආරංචි වෙයි. එවිට, 'අහෂ්-
වේරොෂ් රජුම තමා ඉදිරියට වෂ්ටී
බිසවව කැඳවාගෙන එන ලෙස අණ
කළත් ඇය පැමිණියේ නැහැ' කිය-
මින් ඔවුනුත් තමන්ගේ ස්වාමිපුරුෂ-
යන්ව[5] සුළු කරයි.[6] **18** එපමණක්ද
නොව බිසව කළ මේ දේ පර්සි-
යාවේ සහ මේදියාවේ අධිපතීන්ගේ
භාර්යාවන්ද දැනගත් විට ඔවුනුත්
ඔවුන්ගේ ස්වාමිපුරුෂයන්ට ඒ විදිහ-
ටම අගෞරව කරාවි. එවිට ඔවුන්ට
ඇති වන කෝපය නිසා මහා ආරවු-
ලක් ඇති වෙන්න ඉඩ තිබෙනවා.[7]
**19** රජතුමනි, ඔබ සතුටු නම්[8] වෂ්ටී
බිසව තවදුරටත් ඔබ ඉදිරියට නො-
පැමිණෙන පිණිස රාජ ආඥාවක්
නිකුත් කරන්න.[9] එය නැවත කිසි-
දාක වෙනස් නොවන පිණිස පර්සියා-
වේ සහ මේදියාවේ නීතියට ඇතුළත්
කරන්න.[10] එමෙන්ම ඔබේ කැමැත්ත
පරිදි අගබිසෝකම ඇයට වඩා සුදුසු
ස්ත්‍රියකට ලබා දෙන්න. **20** ඔබේ
මහත් රාජධානිය පුරාම ඒ නියෝගය
පතළ කරනු ලැබේවා! එවිට සියලුම
භාර්යාවන්, තම තමන්ගේ පුරුෂයන්[1]
කුමන තරාතිරමක සිටියත් ඔවුන්ට
ගෞරවයෙන් සලකාවි."[2]

**21** මෙමූකාන්ගේ යෝජනාවට
රජද අධිපතීහු සියලුදෙනාද එකඟ
වූහ.[3] එහෙයින් රජ මෙමූකාන් පැවසූ
ලෙස කළේය. **22** රජ තම පාලනය
යටතේ තිබූ සියලු පළාත්[4] වෙතට
ලියවිල්ලක් යැව්වේය.[5] ඒ එක් එක්
පළාත්වල ජීවත් වන මිනිසුන් කතා
කරන භාෂාවෙන්ද ඔවුන්ට කියවිය
හැකි අකුරුවලින්ද ඒ ලියවිල්ල ලියනු
ලැබීය. සෑම ස්වාමිපුරුෂයෙකුම තම
පවුලේ ප්‍රධානියා[6] ලෙස කටයුතු කළ
යුතු බවත් පවුලේ සාමාජිකයන් කතා
කළ යුත්තේ ඔහුගේ මව්භාෂාව බවත්
ඒ ලියවිල්ලේ සඳහන් විය.

**2** අහෂ්වේරොෂ් රජුගේ[7] කෝපය
නිවී කලක් ගත වූ පසු
ඔහුට වෂ්ටී බිසවවත්[8] ඇය කළ
දේත්[9] ඇට විරුද්ධව ගත් තීරණ-
යත් සිහි විය.[10] **2** එවිට රජුගේ
සේවකයෝ[11] රජුට මෙසේ කීවෝය.
"රජ්ජුරුවනි, රූමත්, තරුණ කන්‍යා-
වන්ව[12] සොයා ඔබ වෙතට ගෙ-
නෙන ලෙස[13] නියෝගයක් නිකුත්
කරන්න. **3** ඒ සඳහා රාජධානියේ
සෑම පළාතකටම[14] නිලධාරීන්ව පත්
කරන්න. ඔවුන් සොයාගන්නා රූමත්,
තරුණ කන්‍යාවන්ව ෂූෂන් මාලිගා-
වේ[15] හෙගයි[16] නමැති නිලධාරියා[17]
භාරයේ තිබෙන ස්ත්‍රීන්ගේ නිවසට
රැගෙන එන ලෙස අණ කරන්න.
එහිදී ඒ තරුණියන්ගේ රුව වඩවන
පිණිස තෙල් ආලේප කර සම්බාහ-
නය කරන ලෙසටත් නියම කරන්න.
**4** රජතුමනි, ඔවුන් අතරින් ඔබේ
සිත්ගන්නා තරුණියව තෝරාගෙන
වෂ්ටී බිසව වෙනුවට[18] ඇයව අගබිසව
ලෙස පත් කරන්න." ඔවුන්ගේ අදහස
ගැන සතුටු වූ රජ ඊට එකඟව ක්‍රියා
කළේය.

**1 පරි.**
1 එස්රා 7:14
2 හිතෝ 22:29
3 එස්ත 1:21
4 එස්ත 1:12
5 උත් 3:16 ද්වි 22:22 යෙරෙ 31:32 යෝවෙ 1:8 මතෙ 24:38
6 2සාමු 6:16
7 හිතෝ 27:15
8 එස්ත 3:9 එස්ත 8:5
9 දානි 6:8 දානි 6:15
10 එස්ත 8:8 දානි 6:12

**2 තීරුව**
1 එස්ත 1:17
2 එෆී 5:33 1පේතෘ 3:5
3 උත් 41:37 එස්ත 2:4
4 එස්ත 3:12 එස්ත 8:9
5 එස්ත 3:14
6 රෝම 7:2 එෆී 5:23

**2 පරි.**
7 එස්ත 1:1
8 එස්ත 1:9
9 එස්ත 1:12
10 එස්ත 1:19
11 එස්ත 1:10 එස්ත 1:14 එස්ත 6:14
12 විනි 21:12
13 1රාජා 1:3
14 එස්ත 8:9
15 නෙහෙ 2:8
16 එස්ත 2:15
17 එස්ත 2:14 එස්ත 4:4
18 එස්ත 1:11 එස්ත 1:19 එස්ත 2:17

5 ඒ කාලයේදී මොර්දෙකයි[1]
නමැති යුදෙව් ජාතිකයෙක් ෂූෂන්
මාලිගාවේ[2] සිටියේය. ඔහු යායිර්-
ගේ පුත්‍රයාය. ඔහුගේ සීයා බෙන්ජ-
මින් ජාතික[3] කිෂ්ගේ පුත් ෂිමෙයිය.
6 බැබිලෝනියේ රජු වූ නෙබුකද්නෙ-
ෂර්,[4] යූදාහි රජු වූ යෙකොනියා[5] සමඟ
යෙරුසලමේ සිට වහල්භාවයට[6]
රැගෙන ගිය සෙනඟ අතරේ ඒ පෙළප-
තට අයත් අයද සිටියේය. 7 මොර්-
දෙකයිගේ පියාගේ සහෝදරයාට[7]
හදස්සා නම් දියණියක් සිටියාය.
ඇගේ දෙමාපියන් මිය ගිය පසු මොර්-
දෙකයි තමාගේම දියණියක ලෙස
ඇයව හදා වඩා ගත්තේය.[8] එස්තර්
යන නමින්ද හඳුන්වන ඇය, ඉතා
රූමත්[9] තරුණියක් වූවාය. 8 රජු-
ගේ නියෝගය දේශය පුරා පැතිර ගිය
පසු තරුණියන් බොහෝදෙනෙකුව
ෂූෂන්[10] මාලිගාවට කැඳවාගෙන එන
ලදි. එසේ කැඳවාගෙන ආ තරුණි-
යන් අතරේ එස්තර්ද සිටියාය. ඇයව
රජුගේ නිවසට ගෙන ගොස් ස්ත්‍රීන්ගේ
නිවස භාරව සිටි හෙගයිට[11] භාර දෙන
ලදි.

9 හෙගයිට එස්තර් ගැන පැහැදී-
මක් ඇති වූ අතර ඔහු ඇයට කරුණා-
වන්තව*[12] සැලකුවේය. එහෙයින් ඔහු
ඇයට නියමිත සම්බාහන ඇතුළුව[13]
විශේෂිත ආහාර පාන ලබා දීමට ඉක්-
මනින්ම සැලසුම් කළේය. රජුගේ
නිවසේ සේවය කළ ස්ත්‍රීන් අතරින්
තෝරාගත් තරුණියන් හත්දෙනෙකු-
වද ඇගේ සහයට ලබා දුන්නේය. එප-
මණක්ද නොව ඔහු ඇයටත් ඇගේ
සහයට සිටි ඒ තරුණියන්ටත් ස්ත්‍රීන්-
ගේ නිවසේ හොඳම ස්ථානයෙහි
නවාතැන් ලබා දුන්නේය. 10 එස්-
තර් තමාගේ සෙනඟ[14] ගැනවත්
තමාගේ ඥාතීන් ගැනවත් කිසිවෙකුට
නොකීවාය. මන්ද ඒ ගැන කිසිවක්
නොකියන ලෙස මොර්දෙකයි ඇයට
අණ කර තිබුණේය.[15] 11 එස්තර්-
ගේ සැප සනීප හා ඇයට කුමක්
සිදු වේදැයි දැනගැනීමට මොර්දෙකයි
ස්ත්‍රීන්ගේ නිවසෙහි මළුව ඉදිරියෙන්
දිනපතා ගමන් කළේය.

12 රජු ඉදිරියේ පෙනී සිටීමට සූදා-
නම් වීම සඳහා තරුණියන්ට මාස
දොළහක් නියම කර තිබිණ. ඒ
කාලය තුළදී සුවඳ ලාටු තෛලය[1]
හයමාසයක්ද බෝල්සම් තෛලය[2]
හා වෙනත් ආලේපන හයමාසයක්ද
සම්බාහනය සඳහා භාවිත කරන ලදි.
මාස දොළහකින් යුත් ඒ කාලය නිම
වූ පසු තරුණියන්ට අහෂ්වේරොෂ් රජු
ඉදිරියට යෑමේ වාරය පැමිණියේය.
13 එලෙස ස්ත්‍රීන්ගේ නිවසේ සිට රජු
ඉදිරියට යෑමට පෙර තමන්ට කැමති
ඕනෑම දෙයක් ඉල්ලීමට ඒ තරුණි-
යන්ට අවසර තිබිණ. රජු ඉදිරියට
තරුණියක පැමිණියේ මෙලෙසය.[3]
14 ඇය සවස් වරුවේ රජු ඉදිරියට
ගොස් පසුවදා උදෑසන රජුගේ උප-
භාර්යාවන්ගේ රැකවලා වූ ෂයෂ්ගාස්
නම් නිලධාරියාගේ[4] භාරයේ තිබූ
ස්ත්‍රීන්ගේ නිවසට ගියාය. රජු යම්
තරුණියකට කැමති වී, ඇගේ නම
කියා ඇයව කැඳෙව්වොත් මිස[5] ඇයට
රජු වෙතට නැවත යෑමට අවස්ථාව
ලැබෙන්නේ නැත.

15 මොර්දෙකයි තමාගේම දියණි-
යක ලෙස හදා වඩා ගත්,[6] ඔහුගේ
පියාගේ සහෝදරයා වූ අබිහයිල්ගේ
දියණිය වූ එස්තර්ටද රජු වෙතට
යෑමේ වාරය පැමිණියේය. තරුණි-
යන්ව රැකබලා ගැනීමට පත් කර සිටි
හෙගයි[7] ඇයට ලබා දුන් දේ හැර
වෙන කිසිවක් ඇය ඉල්ලුවේ නැත.[8]
(ඒ කාලය අතරතුර එස්තර් සියලු-
දෙනාගේ කරුණාව දිනාගත්තාය.)[9]
16 අහෂ්වේරොෂ් රජු පාලනය කළ
හත්වන අවුරුද්දේ[10] දහවන මාසයේදී
එනම්, ටීබෙත් මාසයේදී එස්තර්ව රජු
වෙතට ගෙන යන ලදි. 17 රජ අන්
සියලු තරුණියන්ට වඩා ඇයට ආද-
රේ කළේය. ඒ නිසා අන් සියලුම
තරුණියන්ට වඩා රජුගේ ප්‍රේමයත්*

එස්ත **2:9*** හෝ, "ළැදි ප්‍රේමයකින්."

එස්ත **2:17*** හෝ, "ළැදි ප්‍රේමයත්."

**2 පරි.**
1 එස්ත 3:2, එස්ත 5:14, එස්ත 10:3
2 එස්ත 1:2
3 උත් 49:27, 1සාමු 9:21
4 යෙරෙ 24:1
5 2රාජා 24:15, 1ලේක 3:16, 2ලේක 36:10, යෙරෙ 22:28, යෙරෙ 37:1, යෙරෙ 52:31, මතෙ 1:11
6 2රාජා 24:14
7 එස්ත 2:15
8 1තිමෝ 5:8, යාකො 1:27
9 හිතෝ 31:30
10 එස්ත 1:2
11 එස්ත 2:3
12 හිතෝ 11:17, හිතෝ 14:22, හිතෝ 16:7, හිතෝ 19:22, ආනි 1:9
13 එස්ත 2:3, එස්ත 2:12
14 එස්ත 3:8, එස්ත 4:13, එස්ත 7:4, මතෙ 10:16
15 එස්ත 2:7, එස්ත 2:20, එෆී 6:1

**2 තීරුව**
1 හිතෝ 7:17, සල 3:6, ලූක් 7:37
2 උත් 43:11, 1රාජා 10:2, 2රාජා 20:13
3 එස්ත 1:9
4 එස්ත 2:3
5 එස්ත 4:11
6 එස්ත 2:7
7 එස්ත 2:8
8 1පේතෘ 3:3
9 සල 6:9
10 එස්ත 1:3

විශේෂ සැලකිල්ලත් ඇයට හිමි විය.[1]
රජ, රාජකීය හිස් පළඳනාව ඇයට
පළඳවා වෂ්ටී බිසව වෙනුවට ඇයව
තම බිසව කරගත්තේය.[2] **18** රජ,
එස්තර් බිසව වෙනුවෙන් මහා භෝ-
ජන සංග්‍රහයක් සූදානම් කර ඒ සඳහා
ඔහුගේ අධිපතීන්ටත් ඔහුගේ සේවක-
යන්ටත් ආරාධනා කළේය. රජ තමා
යටතේ තිබූ සියලු පළාත්වලට රාජ්‍ය
නිදහසක් ප්‍රකාශ කර[3] බොහෝ තෑගි-
බෝගද බෙදා දුන්නේය.

**19** දෙවන වතාවට කන්‍යාවන්ව[4]
එක් රැස් කරන අවස්ථාවේදී මොර්දෙ-
කයි, රජුගේ දොරටුව[5] අසල හිඳගෙන
සිටියේය. **20** එස්තර්, මොර්දෙක-
යිගේ[6] රැකවරණය යටතේ සිටියදී
ඔහුට කීකරු වූ ලෙසම දිගටම ඔහුට
කීකරුව සිටියාය.[7] එහෙයින් ඔහු
ඇයට අණ කළ ලෙස[8] ඇය තමාගේ
සෙනඟ ගැනවත් තමාගේ ඥාතීන්
ගැනවත් කිසිවෙකුට නොකීවාය.[9]

**21** දිනක් මොර්දෙකයි, රජුගේ
දොරටුව අසල හිඳගෙන සිටියදී දො-
රටු පාලකයන් වූ රජුගේ නිලධාරීන්
දෙදෙනෙකු වන බිග්තාන් හා තෙ-
රෙෂ්, අහෂ්වේරොෂ් රජු සමඟ කෝප
වී ඔහුව මරා දැමීමට කුමන්ත්‍රණ
කළෝය.[10] **22** ඔවුන්ගේ ඒ කුමන්-
ත්‍රණය මොර්දෙකයි දැනගත් විගස
ඔහු ඒ ගැන එස්තර් බිසවට දැන්-
වූවේය.[11] එස්තර් බිසවද ඒ ගැන
රජුට දැන්වූවාය. එමෙන්ම තමාට
එය දැනගන්න ලැබුණේ මොර්දෙකයි
මාර්ගයෙන් බව ඇය රජුට පැවසු-
වාය.[12] **23** රජු ඒ කාරණය ගැන
සොයා බැලූ විට එය සත්‍යයක් බව
හෙළි විය. එහෙයින් ඒ මනුෂ්‍යයන්
දෙදෙනාව කණුවක[13] එල්ලා මරා
දැමීය.[14] ඒ සිද්ධිය ගැන රජු ඉදිරිපිට-
දීම රජවරුන්ගේ ඉතිහාසය ඇතුළත්
ලියවිල්ලෙහි[15] සටහන් කරන ලදි.

**3** කලක් ගත වූ පසු අහෂ්වේරොෂ්
රජ, ආගග්ගෙන්[16] පැවතෙන
හම්මෙදාතාගේ පුත් හාමාන්ට[17]
විශේෂ ගෞරවයක් දී[18] අන් සියලු අධි-
පතීන්ට වඩා උසස් තනතුරක් ඔහුට
ලබා දුන්නේය.[1] **2** එහෙයින් රජුගේ
දොරටුව[2] අසල සිටි නිලධාරීහු සියලු-
දෙනා, හාමාන් ඔවුන් අසලින් යන
එන විට වැඳ වැටී ඔහුට ආචාර
කළෝය. එසේ කරන ලෙස රාජ
නියෝගයක්ද පනවා තිබිණ. නමුත්
මොර්දෙකයි ඔහු ඉදිරියේ වැඳ වැටී
ආචාර කළේ නැත.[3] **3** ඒ බව රජු-
ගේ දොරටුව අසල සිටි නිලධාරීහු
දැක, "ඔබ රාජ නියෝගය කඩ
කරන්නේ ඇයි"[4] කියා ඔහුගෙන් ඇසු-
වෝය. **4** ඔවුන් ඒ ගැන මොර්දෙ-
කයි සමඟ සෑම දිනකම කතා කළත්
ඔහු ඔවුන්ට සවන් දුන්නේ නැත.
තමා යුදෙව්වෙකු බව[5] මොර්දෙ-
කයි එම නිලධාරීන්ට පවසා තිබිණ.
නමුත් මොර්දෙකයිගේ ඒ ක්‍රියාකලා-
පය හාමාන් අනුමත කරයිද කියා
බැලීමට ඔවුහු ඒ ගැන හාමාන්ට
දැන්වූවෝය.[6]

**5** තමන් දොරටුව අසලින් යන
එන අවස්ථාවලදී මොර්දෙකයි වැඳ
වැටී තමාටද ආචාර නොකරන බව
හාමාන් දුටුවේය.[7] එහෙයින් ඔහු ඒ
ගැන කෝපයෙන් පුපුරන්නට විය.[8]
**6** මොර්දෙකයිගේ ජාතිය කුමක්ද
කියා හාමාන් දැනගෙන සිටි නිසා
ඔහුව පමණක් මරා දැමීම තමන්ගේ
තත්වයට ප්‍රමාණවත් නොවන බව
ඔහු සිතුවේය. එහෙයින් අහෂ්වේ-
රොෂ් රජුගේ රාජධානියේ සිටින සිය-
ලුම යුදෙව්වරුන්ව[9] මරා දැමීමට[10]
සුදුසු අවස්ථාවක් පැමිණෙන තෙක්
හාමාන් මාන බලමින් සිටියේය.

**7** අහෂ්වේරොෂ් රජුගේ පාලන
සමයේ දොළොස්වන අවුරුද්දේ[11]
පළමුවන මාසයේදී[12] එනම්, නීසාන්
මාසයේදී යුදෙව්වන්ව විනාශ කර
දැමීමට සුදුසු මාසය හා දවස තීර-
ණය කිරීම සඳහා හාමාන් ඉදිරියේ
දාදු*[13] දමන ලදි. දාදුව දොළොස්වන

**2 පරි.**
**1** එස්ත 4:14 ගීතා 75:7
**2** එස්ත 1:19
**3** මතෙ 27:15
**4** එස්ත 2:3
**5** එස්ත 2:21 එස්ත 3:2
**6** එස්ත 2:5 එස්ත 8:1 එස්ත 10:3
**7** එස්ත 2:7
**8** එස්ත 2:10 මතෙ 10:16
**9** එස්ත 2:6 එස්ත 3:8 එස්ත 7:4
**10** එස්ත 6:2
**11** දේශ 10:20
**12** ලෙවී 5:1 එස්ත 6:2 හිතෝ 29:24 එස 33:7
**13** ද්වි 21:22
**14** ද්වි 21:21 එස්ත 9:13
**15** එස්රා 4:15 එස්ත 6:1

**3 පරි.**
**16** ගණන් 24:7 1සාමු 15:8 1සාමු 15:32
**17** එස්ත 3:10 එස්ත 8:7 එස්ත 9:24
**18** ගීතා 12:8

**2 තීරුව**
**1** එස්ත 1:14
**2** එස්ත 2:19
**3** නික් 17:14 නික් 17:16 ද්වි 25:19 1සාමු 15:3 ගීතා 139:21
**4** ක්‍රියා 5:29
**5** නෙහෙ 1:2 එස්ත 2:5
**6** ආනි 6:13
**7** එස්ත 3:2
**8** එස්ත 5:9 හිතෝ 12:16 හිතෝ 27:3
**9** එස්ත 9:20
**10** ගීතා 73:6 ගීතා 83:4
**11** එස්ත 1:3 එස්ත 2:16
**12** නික් 12:2 නික් 34:18
**13** එස්ත 9:24 යෝවෙ 3:3 ඔබ 11 මතෙ 27:35

**එස්ත 3:7*** මූ.අ., "පූර්." පූර් යන වචනයේ බහු වචනය පූරීම්ය. යුදෙව්වරුන්ගේ උත්සවයක් පූරීම් යන නමින් හඳුන්වනු ලැබේ.

මාසයට එනම්, ආදාර් මාසයට[1]
වැටුණේය. **8** පසුව හාමාන් අහෂ්-
වේරොෂ් රජු වෙතට ගොස් රජුට
මෙසේ කීවේය. “රජතුමනි, එක්තරා
ජන කොටසක් ඔබේ රාජධානිය[2]
පුරා විසිරී සිටිනවා.[3] ඔවුන් රාජ-
ධානියේ සිටින අන් සෙනඟ හා
සම්බන්ධ නොවී වෙනම සෙනඟක්
ලෙසයි ජීවත් වෙන්නේ. ඔවුන්ගේ
නීති අන් සියලු ජන කොටස්ව-
ලට වඩා වෙනස්. ඔවුන් ඔබතුමා-
ගේ නීති පිළිපදින්නේ නැහැ.[4] එවැනි
ජන පිරිසකට ජීවත් වීමට ඉඩ-
හැරීම ඔබතුමාට එතරම් සුදුසු දෙ-
යක් නෙවෙයි. **9** රජතුමා කැමති
නම් ඔවුන්ව විනාශ කර දමන ලෙස
ලිඛිතව දන්වන්න. එසේ කළොත්
රජතුමාගේ භාණ්ඩාගාරයට ගෙනෙන
පිණිස මම රිදී තලෙන්ත දසදහසක්[5]
නිලධාරීන්ට[6] දෙන්නම්.”

**10** එවිට රජ තම මුද්ද*[7] ගලවා,
යුදෙව්වරුන්ට සතුරුකම් පෑ[8] ආගග්-
ගෙන් පැවතෙන[9] හම්මෙදාතාගේ පුත්
හාමාන්ට[10] එය දුන්නේය. **11** ඉන්-
පසු රජ හාමාන්ට මෙසේ කීවේය. “ඒ
සෙනඟව මම ඔබට භාර දෙනවා. රිදී
සියල්ලත්[11] ඔබ ගන්න. ඔබට හොඳයි
කියා සිතෙන ඕනෑම දෙයක් ඔවුන්ට
කරන්න.”[12] **12** ඉන්පසු පළමුවන
මාසයේ දහතුන්වනදා රජුගේ ලේ-
කම්වරුන්ව[13] කැඳවන ලදි. හාමාන්
අණ කළ සියල්ල ලේකම්වරුන් ලවා
ලියවා[14] විවිධ පළාත්වල සිටි රජු-
ගේ දිසාපතීන්ට හා ආණ්ඩුකාරයන්ට
යවන ලදි.[15] එමෙන්ම ඒ පළාත්වල
සිටි විවිධ ජන පිරිස්වල අධිපතීන්ටද
එය ඔවුන්ගේම භාෂාවෙන් හා ඔවුන්ට
කියවිය හැකි අකුරුවලින් ලියා යවනු
ලැබීය.[16] ඒ සියල්ල යවන ලද්දේ
අහෂ්වේරොෂ් රජුගේ නමින්[17] ලියා
ඔහුගේ මුද්දෙන් මුද්‍රා කිරීමෙන් පසු-
වය.[18]

**13** දොළොස්වන මාසයේ එනම්,
ආදාර් මාසයේ[19] දහතුන්වන දින
යුදෙව්වරුන් සියලුදෙනාව ඝාතනය
කරන ලෙස දන්වමින් රාජධානියේ
සෑම පළාතකටම පණිවිඩකරුවන්[1]
අත ඒ ලිපි යවන ලදි. යුදෙව්වරුන්-
ගේ බාල මහලු, ස්ත්‍රී පුරුෂ සියලු-
දෙනාවම එකම දවසේදී[2] ඝාතනය
කරන ලෙසද ඔවුන්ගේ දේපළ පැහැ-
රගන්නා ලෙසද එම ලිපිවල සඳහන්
කර තිබිණ.[3] **14** ලිපියේ සඳහන්
දේ සෑම පළාතකම ජීවත් වූ සෙ-
නඟට[4] දන්වනු ලැබිණ. එසේ කරන
ලද්දේ එහි සඳහන් දේ නීතියක්
ලෙස පිළිපදිමින්[5] ඒ දවසට සූදානම්
වන පිණිසය. **15** රජු අණ කළ
ලෙස පණිවිඩකරුවෝ හැකි ඉක්ම-
නින්[6] එම ලිපි බෙදා දුන්නෝය.
ෂූෂන්[7] මාලිගාවේද එම නීතිය ගැන
දැනුම් දෙන ලදි. රජු සහ හාමාන්
වයින් බොමින් විනෝද වෙමින් සිටි-
යදී[8] ෂූෂන් නුවරෙහි[9] නොසන්සුන්
වාතාවරණයක් උද්ගත වී තිබිණ.[10]

**4** සිදු වී ඇති දේ[11] මොර්දෙකයි[12]
දැනගත් විට ඔහු තම වස්ත්‍ර
ඉරාගෙන, ගෝණි රෙදි[13] ඇඳගෙන,
අළු තවරාගෙන[14] නුවර මැදට ගොස්
මහත් දුකකින් හඬා වැලපුණේය.[15]
**2** ඔහු එලෙස හඬමින් රජුගේ දොර-
ටුව[16] දක්වාම පැමිණ එහි නතර
විය. මන්ද කිසිවෙකුට ගෝණි රෙදි
ඇඳගෙන රජුගේ දොරටුවෙන් ඇතුල්
වීමට අවසර තිබුණේ නැත. **3** රජු
පැනවූ නීතිය ගැන දැනගත් විට සිය-
ලුම පළාත්වල[17] ජීවත් වූ යුදෙව්වරුද
නිරාහාරව සිට[18] හඬා වැලපුණෝය.[19]
ඔවුහු මහත් සේ ශෝක වෙමින් ගෝණි
රෙදි[20] හා අළු[21] මත වැතිර සිටි-
යෝය. **4** එස්තර් බිසවගේ සේවයට
සිටි තරුණියෝ හා නිලධාරීහු[22] ඇ
වෙතට පැමිණ ඒ සියලු විස්තර ඇයට
දැන්වූවෝය. එය අසා බිසව බෙහෙ-
වින් ශෝකයට පත් වූවාය. ඉන්පසු
ඇය මොර්දෙකයි ඇඳ සිටි ගෝණි
රෙදි වෙනුවට ඇඳගන්නා පිණිස ඔහුට
වස්ත්‍ර යැව්වාය. නමුත් ඔහු එම වස්ත්‍ර

**3 පරි.**
**1** එස්ත 9:1
**2** එස්ත 1:1
**3** ද්වි 4:27
ද්වි 30:3
නෙහෙ 1:8
යෙරෙ 50:17
සෙක 7:14
යාකො 1:1
**4** ගීතා 94:21
**5** මතෙ 18:24
**6** එස්ත 9:3
**7** උත් 41:42
එස්ත 8:2
දානි 6:17
**8** එස්ත 7:6
එස්ත 9:24
**9** ගණන් 24:7
1සාමු 15:8
**10** එස්ත 3:1
**11** එස්ත 4:7
**12** හිතෝ 29:12
යෙරෙ 40:4
**13** එස්ත 8:9
**14** ගීතා 94:20
දානි 6:8
**15** එස්ත 1:1
දානි 6:1
**16** එස්ත 1:22
**17** දානි 6:15
**18** උත් 41:42
එස්ත 8:8
දානි 6:17
**19** එස්ත 9:1

**2 තීරුව**
**1** 2ලේක 30:6
එස්ත 8:14
යෙරෙ 51:31
**2** එස්ත 8:12
**3** එස්ත 8:11
එස්ත 9:10
**4** එස්ත 1:1
**5** දානි 6:15
**6** එස්ත 8:14
**7** දානි 8:2
**8** හිතෝ 31:4
**9** එස්ත 4:16
**10** හිතෝ 29:2

**4 පරි.**
**11** එස්ත 3:8
එස්ත 3:9
**12** එස්ත 2:5
**13** 1රාජා 21:27
ගීතා 69:11
එළි 6:12
**14** එස 27:30
මතෙ 11:21
**15** එස 21:6
මීකා 1:8
**16** එස්ත 6:10
**17** එස්ත 1:1
**18** 2ලේක 20:3
එස්රා 8:21
මතෙ 4:2
**19** යෙරෙ 6:26
ආමො 5:16
**20** 2සාමු 21:10
යෙසා 58:5

එස්ත **3:10*** මූ.අ., “මුද්‍රා තබන මුද්ද.”

**21** එස 27:30; දානි 9:3; **22** එස්ත 2:3; එස්ත 2:14.

පිළිගත්තේ නැත.[1] **5** එවිට එස්තර්
බිසව තමාගේ සේවය සඳහා රජු පත්
කළ නිලධාරීන්ගෙන් කෙනෙකු වූ
හාතාක්ව[2] කැඳවා සිදු වී ඇත්තේ
කුමක්ද කියා මොර්දෙකයිගෙන් අසා
දැනගන්නා ලෙස ඔහුට අණ කළාය.

**6** හාතාක්, නුවරෙහි ප්‍රධාන
මංසන්ධියේ සිටි මොර්දෙකයි වෙතට
ගියේය. නුවරෙහි ප්‍රධාන මංසන්-
ධිය පිහිටා තිබුණේ රජුගේ දොරටුව
ඉදිරියේය. **7** මොර්දෙකයි සිදු වූ
සියල්ල[3] ගැනත් හාමාන් යුදෙව්ව-
රුන්ව විනාශ කර දැමීමට[4] රජුගේ
භාණ්ඩාගාරයට ගෙවීමට පොරොන්දු
වූ මුදල[5] ගැනත් හාතාක්ට පැව-
සුවේය. **8** එමෙන්ම එස්තර් බිස-
වට පෙන්වන පිණිස යුදෙව්වරුන්ව
විනාශ කර දැමීමට ෂූෂන්හිදී[6] දුන්
නීතියේ පිටපතක්ද[7] මොර්දෙකයි
හාතාක්ට දුන්නේය. රජු ඉදිරියට
ගොස් ඇගේ සෙනඟ[8] වෙනුවෙන්
අයැද කෙසේ හෝ රජුගේ කරුණාව
දිනාගන්නා[9] ලෙස තමන් ඇයට අණ
කරන බව[10] එස්තර් බිසවට පවසන
ලෙසද මොර්දෙකයි ඔහුට කීවේය.

**9** මොර්දෙකයි තමාට පැවසූ සෑම
දෙයක්ම හාතාක්,[11] එස්තර් බිසවට
පැවසුවේය. **10** එවිට එස්තර් බිසව
මොර්දෙකයිට මේ දේ පවසන ලෙස
හාතාක්ට අණ කළාය.[12] **11** “රජ්ජු-
රුවන් ඉදිරියට යන්න ආරාධනාවක්
දැනට තිස් දවසකින් මට ලැබී නැහැ.
යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් රජතු-
මාගේ ආරාධනාව නැතුව රජු හමු
වීමට ඇතුල් මළුවට[13] පිවිසුණොත්
නීතියට අනුව[14] එසේ ඇතුල් වන
තැනැත්තාව මරා දමන බව රජු-
ගේ සියලු සේවකයොත් රාජධානියේ
සියලු සෙනඟත් හොඳින් දන්නා කාර-
ණයක්. එම නීතිය බල නොපාන්නේ
රජ්ජුරුවන් තම රන් යෂ්ටිය එම
තැනැත්තා වෙතට දිගු කළොත් පම-
ණයි.”[15]

**12** එස්තර් බිසව පැවසූ දේ මොර්-
දෙකයිට දැන්වූ විට **13** ඔහු එස්තර්
බිසවට මෙලෙස දන්වා යැවීය. “රජු-
ගේ මාලිගාවේ සිටින නිසා යුදෙව්ව-
රුන් සියලුදෙනා විනාශ වෙද්දී ඔබ
විතරක් ගැලවෙයි කියා සිතන්න
එපා.[1] **14** මේ අවස්ථාවේදී ඔබ
කිසිවක් නොකර නිහඬව සිටියත්
මොනයම් හෝ මාර්ගයකින් යුදෙව්ව-
රුන්ට අවශ්‍ය උපකාරයත් ගැලවීමත්
ලැබෙයි.[2] නමුත් ඔබත් ඔබේ පියාගේ
පවුලේ සියලුදෙනාත් විනාශ වී යයි.
මෙවැනි අවස්ථාවකදී සෙනඟට පිහිට
වීම සඳහාම ඔබ රජුගේ බිසව වුණාද
කියා කවුද දන්නේ!”[3]

**15** එය ඇසූ එස්තර් බිසව
මොර්දෙකයිට මෙය දන්වා යැව්-
වාය. **16** “ඔබ ගොස් ෂූෂන්හි සිටින
යුදෙව්වරුන්[4] සියලුදෙනාව රැස් කර
දවස් තුනක්[5] මා වෙනුවෙන් නොකා
නොබී සිටින්න[6] කියා ඔවුන්ට පව-
සන්න. මමත් මගේ තරුණියන්[7]
සමඟ එලෙස නිරාහාරව සිටිනවා.
එසේ දවස් තුනක් නිරාහාරව සිටී-
මෙන් පසු නීතියට පටහැනි වුණත්
මම රජු ඉදිරියට යනවා. මගේ
ජීවිතය නැති වුණත් මම එසේ
කරනවා.”[8] **17** එවිට මොර්දෙකයි
එතැනින් පිටත්ව ගොස් එස්තර් බිසව
තමාට පැවසූ ලෙසම කළේය.

**5** තුන්වන දවසේදී[9] එස්තර් බිසව
රාජ වස්ත්‍රවලින් සැරසී[10] රජුගේ
නිවස ඉදිරිපිට තිබූ ඇතුල් මළුවට[11]
ගොස් එහි සිටගෙන සිටියාය. ඒ
අවස්ථාවේදී රජ, ඔහුගේ නිවසට
ඇතුල් වන දොරටුවට මුහුණ ලා
තිබූ සිංහාසනයේ වාඩි වී සිටියේය.
**2** මළුවේ සිටගෙන සිටි එස්තර් බිස-
වව දැක සතුටු වූ[12] රජ, තම රන් යෂ්-
ටිය[13] ඇය වෙතට දිගු කළේය. එවිට
ඇය රජු ළඟට පැමිණ රන් යෂ්ටියේ
ඉහළ කෙළවරට අත තැබුවාය.

**3** රජ ඇයට කතා කර, “මගේ
බිසව එස්තර්, ඔබට අවශ්‍ය කුමක්ද?[14]
ඒ දේ මට කියන්න. ඔබ මගේ
රාජධානියෙන් භාගයක් ඉල්ලුවත්[15]
මම එය ඔබට දෙනවා” කියා
කීවේය. **4** එවිට එස්තර් බිසව රජුට
මෙසේ කීවාය. “රජතුමනි, ඔබ මගේ

**4 පරි.**
1 ගීතා 77:2
2 එස්ත 4:10
3 එස්ත 3:8
4 එස්ත 3:13
5 එස්ත 3:9
6 එස්ත 3:15
7 එස්ත 3:14
8 එස්ත 7:3
9 හිතෝ 16:15, දේශ 10:4
10 එස්ත 2:20
11 එස්ත 4:5
12 එස්ත 2:5, එස්ත 2:7
13 එස්ත 5:1
14 දානි 6:15
15 එස්ත 5:2, එස්ත 8:4

**2 තීරුව**
1 හිතෝ 24:10, හිතෝ 29:25, යොහ 12:25
2 1සාමු 12:22, යෙසා 54:17, යෙරෙ 30:11, ආමො 9:8
3 ගීතා 75:7, යෙසා 14:27, යෙසා 49:23
4 එස්ත 3:15
5 එස්ත 5:1
6 2ලේක 20:3, එස්රා 8:21, මතෙ 4:2
7 එස්ත 2:9
8 ගීතා 34:15, ගීතා 55:22, ගීතා 62:8, ගීතා 115:9, හිතෝ 29:25, රෝම 16:4

**5 පරි.**
9 එස්ත 4:16
10 එස්ත 2:17, එස්ත 8:15, මතෙ 11:8
11 එස්ත 4:11, එස්ත 6:4
12 ගීතා 116:7
13 එස්ත 4:11, එස්ත 8:4
14 එස්ත 7:2, එස්ත 9:12
15 මාක් 6:23

ආරාධනාව පිළිගැනීමට කැමති නම්
මම ඔබ වෙනුවෙන් සූදානම් කර
තිබෙන භෝජන සංග්‍රහයට[1] හාමාන්[2]
සමඟ පැමිණෙන්න කියා ඉල්ලා සිටි-
නවා.” **5** එය ඇසූ පසු රජ සේවක-
යන්ට කතා කර මෙසේ කීවේය.
“සේවකයෙනි, එස්තර් බිසවගේ ඉල්-
ලීම ඉටු කිරීම සඳහා හාමාන්ව ඉක්ම-
නින් කැඳවන්න.”[3] පසුව රජ, හාමාන්
සමඟ එස්තර් බිසව සූදානම් කර තිබූ
භෝජන සංග්‍රහයට ගියේය.

**6** උත්සවයේ වයින් බොන අවස්-
ථාවේදී රජ එස්තර් බිසවගෙන් මෙසේ
ඇසුවේය. “ඔබට අවශ්‍ය කුමක්ද?[4] ඒ
ගැන මට කියන්න. මම එය ඔබට
දෙන්නම්. ඔබ මගේ රාජධානියෙන්
භාගයක් ඉල්ලුවත් මම ඔබට එය දෙ-
නවා.” **7** එවිට එස්තර් බිසව මෙසේ
පැවසුවාය. “රජතුමනි, මා ඔබෙන්
ඉල්ලා සිටින්නේ මෙයයි. **8** මගේ
ඉල්ලීම ඉටු කිරීමට තරම් මා ඔබේ
කරුණාව දිනාගෙන තිබේ නම්[5] මම
හෙට සූදානම් කරන භෝජන සංග්‍රහ-
යටත් හාමාන් සමඟ පැමිණෙන්න
කියා ඔබෙන් ඉල්ලා සිටිනවා. එහිදී
මගේ ඉල්ලීම මම ඔබතුමාට කියන්-
නම්.”[6]

**9** එදින හාමාන් ඉතා ප්‍රීතියෙන්[7]
මාලිගාවෙන් පිටත්ව ගියේය. නමුත්
රජුගේ දොරටුව අසල සිටි[8] මොර්-
දෙකයි, තමා එතැනින් යන විට
නැඟිට ආචාර කළේවත්[9] තමාට කිසි
භයක් පෙන්වූවේවත්[10] නැති බව දුටු
විගස හාමාන් තුළ මහත් කෝප-
යක් ඇති විය.[11] **10** නමුත් හාමාන්
තමාට ඇති වූ කෝපය කිසිවෙ-
කුට නොපෙන්වා තම නිවස බලා
පිටත්ව ගියේය. පසුව ඔහු තම
බිරිඳ වූ ෂෙරෙෂ්වද[12] මිත්‍රයන්වද
කැඳවා, **11** තමාගේ වත්පොහො-
සත්කම ගැනද[13] තමාට සිටින බො-
හෝ පුත්‍රයන් ගැනද[14] රජු අන් සියලු
අධිපතීන්ට හා සේවකයන්ට වඩා
උසස් තනතුරක් දී තමාව ගෞරවයට
පත් කළ ආකාරය ගැනද[15] ඔවුන්
සමඟ පුරසාරම් දෙඩීය.

**12** හාමාන් තවදුරටත් ඔවුන්ට
මෙසේ පැවසුවේය. “ඒ විතරක් නෙ-
වෙයි එස්තර් බිසව සූදානම් කළ
භෝජන සංග්‍රහයට මටත් ආරා-
ධනාවක් ලැබුණා. ඇය ඒ සඳහා
ආරාධනා කළේ රජුට හා මට විත-
රයි.[1] හෙටත් ඇය භෝජන සංග්‍රහයක්
පවත්වනවා.[2] ඒ සඳහාත් රජතුමා
සමඟ පැමිණීමට මට ආරාධනා කළා.
**13** නමුත් යුදෙව්වෙක් වන මොර්දෙ-
කයි රජුගේ දොරටුව අසල සිටින
තාක් කල් මට මේ සියල්ල ලැබුණත්
කිසි සතුටක් දැනෙන්නේ නැහැ.”
**14** එවිට ඔහුගේ බිරිඳ වූ ෂෙරෙෂ්
සහ ඔහුගේ මිත්‍රයෝ සියලුදෙනා
ඔහුට මෙසේ කීවෝය. “රියන් පන-
හක් දිග කණුවක්[3] සාදන්න කියා
ඔබේ සේවකයන්ට අණ කරන්න.
හෙට උදෑසන[4] රජු වෙතට ගොස්
මොර්දෙකයිව ඒ කණුවේ එල්ලිය යුතු
බව රජුට පවසන්න.[5] ඉන්පසු ඔබට
ප්‍රීතියෙන් රජතුමා සමඟ භෝජන
සංග්‍රහයට යන්න පුළුවන්.” ඔවුන්
පැවසූ දේට හාමාන් සතුටු වී[6] කණු-
වක් සාදන්න කියා තම සේවකයන්ට
අණ කළේය.[7]

**6** එදින රාත්‍රියේ රජුට නින්ද නො-
ගිය නිසා[8] රජවරුන්ගේ ඉතිහා-
සය වාර්තා කර ඇති ලියවිල්ල[9]
ගෙනෙන ලෙස රජ තම සේවක-
යන්ට අණ කළේය. එවිට රජුගේ
සේවකයෝ එම ලියවිල්ල ගෙනැ-
විත් රජුට ඇසෙන්න කියෙව්වෝය.
**2** ඔවුන් කියවූ කොටසේ රජුගේ දො-
රටු පාලකයන් දෙදෙනෙකු වූ[10] බිග්-
තාන් හා තෙරෙෂ්, අහෂ්වේරොෂ්
රජුව මරා දැමීමට කළ කුමන්ත්‍රණය
මොර්දෙකයි නම් තැනැත්තා හෙළි
කළ ආකාරය[11] ගැන සඳහන් වී
තිබිණ. **3** එය රජුට ඇසුණු විට,
“මොර්දෙකයි කළ ඒ යහපත් ක්‍රියා-
වට ගෞරවය පිරිනැමීමක් වශයෙන්
ඔහුට ලබා දුන්නේ කුමක්ද” කියා
සේවකයන්ගෙන් ඇසීය. එවිට සේව-
කයෝ, “ඒ වෙනුවෙන් මොර්දෙකයිට

**5 පරි.**
1 උත් 32:20 හිතෝ 17:8
2 එස්ත 3:1 එස්ත 3:8
3 එස්ත 6:14
4 එස්ත 7:2
5 එස්ත 5:3
6 හිතෝ 29:11
7 යෝබ් 20:5 ලූක් 6:25 යාකො 4:9
8 එස්ත 2:21 එස්ත 3:3 එස්ත 6:10
9 එස්ත 3:2
10 ගීතා 27:3 ගීතා 139:21 ගීතා 139:22 මතෙ 10:28
11 එස්ත 3:5 දේශ 7:9
12 එස්ත 5:14 එස්ත 6:13
13 යෝබ් 31:24 ගීතා 49:6 ගීතා 49:17 යෙරෙ 9:23 මතෙ 23:12 1තිමෝ 6:17
14 එස්ත 9:10 යෝබ් 27:14
15 එස්ත 3:1 ගීතා 37:35

**2 තීරුව**
1 එස්ත 5:5
2 එස්ත 5:8
3 ද්වි 21:22 එස්ත 2:23 එස්ත 7:9
4 හිතෝ 27:1
5 එස්ත 3:2 එස්ත 6:4
6 හිතෝ 29:12
7 ගීතා 37:14 හිතෝ 1:18 හිතෝ 21:24 හිතෝ 27:4

**6 පරි.**
8 හිතෝ 21:1 දානි 2:1 දානි 6:18
9 එස්ත 10:2
10 එස්ත 2:21
11 එස්ත 2:23 එස්ත 7:9

කිසිම දෙයක් ලබා දුන්නේ නැහැ”[1]
කියා රජුට පිළිතුරු දුන්නෝය.
**4** පසුව රජ තම සේවකයන්ට
කතා කර, “මළුවට ඇවිත් සිටින්නේ
කවුද කියා බලන්න” යයි කීවේය.
ඒ අවස්ථාවේදී හාමාන් තමන් සෑදූ
කණුවේ මොර්දෙකයිව එල්ලා දැමී-
මට රජුගෙන් අවසර ලබාගැනීම
සඳහා[2] රජුගේ නිවසේ පිටත මළුවට
පැමිණ සිටියේය.[3] **5** ඔහුව දුටු රජු-
ගේ සේවකයෝ, “රජතුමනි, පිටත
මළුවේ සිටගෙන සිටින්නේ හාමාන්”[4]
කියා රජුට කීවෝය. එවිට රජ, “ඔහුට
එන්න කියන්න” යයි කීවේය.
**6** හාමාන්, රජු ඉදිරියට පැමිණි
විට රජ ඔහුගෙන් මෙසේ ඇසීය.
“රජ්ජුරුවන් යම් කෙනෙකුට ගෞර-
වය ලබා දීමට කැමති නම් එවැනි
කෙනෙක් වෙනුවෙන් කළ යුත්තේ
කුමක්ද?”[5] එවිට හාමාන්, “රජතුමා
ඉතින් මට මිස ගෞරවයෙන් සැලකී-
මට කැමති වෙන කාටද”[6] කියා
සිතුවේය. **7** එහෙයින් හාමාන් රජුට
මෙසේ කීවේය. “රජතුමනි, ඔබ ගෞ-
රවය ලබා දීමට කැමති තැනැත්තාට
මේ දේවල් කරන්න. **8** රජ්ජුරුවන්
නැඟ යන, රාජකීය හිස පළඳනා-
වකින් සරසා සිටින අශ්වයෙකුවද[7]
රජ්ජුරුවන් අඳින රාජ වස්ත්‍රයක්ද[8]
ගෙනැවිත් **9** ගෞරවය ලබා දීමට
කැමති ඒ තැනැත්තාට එම වස්-
ත්‍රය අන්දවා ඔහුව අශ්වයා පිට
හිඳුවා නුවරෙහි[9] ප්‍රධාන මංසන්ධිය
වටා ගෙන යන්න.[10] එසේ කිරී-
මේ වගකීම රජුගේ උසස් අධිපතීන්-
ගෙන් කෙනෙකුට[11] භාර දෙන්න. එම
තැනැත්තාව අසු පිට නංවාගෙන යන
විට ඔහුට පෙරටුවෙන් යන සේවක-
යන්ට මෙසේ පැවසීමට අණ කරන්න.
‘ගෞරවය ලබා දීමට රජ්ජුරුවන්
කැමති වූ තැනැත්තාට රජු ලබා දෙන
ගෞරවය දෙස බලන්න!’[12] **10** එවිට
රජ හාමාන්ට මෙසේ කීවේය. “රාජ
වස්ත්‍රයක්ද අශ්වයෙක්ද රැගෙන රජු-
ගේ දොරටුව අසල සිටින යුදෙව්
ජාතික මොර්දෙකයි වෙතට ඉක්ම-
නින් යන්න. ඔබ පැවසූ සෑම දෙයක්ම
ඔහුට කරන්න. එයින් කිසිවක් අඩු
නොකරන්න.”[1]
**11** හාමාන් රාජ වස්ත්‍රය[2] හා අශ්ව-
යාව මොර්දෙකයි[3] වෙතට රැගෙන
ගියේය. ඔහු මොර්දෙකයිට එම වස්-
ත්‍රය අන්දවා ඔහුව අසු පිට නංවා-
ගෙන නුවරෙහි ප්‍රධාන මංසන්ධිය[4]
වටා ගෙන ගියේය. ඔහුව එලෙස
රැගෙන යන විට, “ගෞරවය ලබා
දීමට රජ්ජුරුවන් කැමති වූ තැනැත්-
තාට[5] රජු ලබා දෙන ගෞරවය
දෙස බලන්න” කියා හඬ නඟා පව-
සන ලදි.[6] **12** ඉන්පසු මොර්දෙ-
කයි නැවත රජුගේ දොරටුව අසලට
ගියේය.[7] නමුත් හාමාන් තම හිස
වසාගෙන ඉතා දුකින් නිවසට හැරී
ගියේය.[8] **13** තමන්ට සිදු වූ සියල්ල
ගැන හාමාන් තම බිරිඳ වූ ෂෙරෙෂ්-
ටද[9] තම මිත්‍රයන් සියලුදෙනාටද
පැවසුවේය. එවිට ඔහුගේ උපදේශක-
යෝද[10] ඔහුගේ බිරිඳද ඔහුට මෙසේ
කීවෝය. “ඔබේ වැටීමට හේතු වූ
මොර්දෙකයි යුදෙව්වෙක් නිසා ඔහුට
විරුද්ධව නැඟී සිටින්න ඔබට කිසි-
සේත් හැකි වන්නේ නැහැ. ඔබ අනි-
වාර්යයෙන්ම ඔහු ඉදිරියේ පරාජයට
පත් වෙනවා.”[11]
**14** ඔවුන් මේ දේවල් හාමාන්ට
පවසමින් සිටියදී රජුගේ නිලධාරීහු
පැමිණ එස්තර් බිසව සූදානම් කළ
භෝජන සංග්‍රහයට[12] හාමාන්ව ඉක්ම-
නින්ම කැඳවාගෙන ගියෝය.[13]

# 7

එස්තර් බිසව සූදානම් කළ භෝ-
ජන සංග්‍රහයට අහෂ්වේරොෂ් රජ,
හාමාන්[14] සමඟ පැමිණියේය. **2** මේ
දෙවන භෝජන සංග්‍රහයේදී ඔවුන්
වයින් බොමින් සිටියදී[15] රජ ඇගෙන්
මෙසේ ඇසුවේය. “මගේ බිසව එස්-
තර්, ඔබට අවශ්‍ය කුමක්ද?[16] ඒ
ගැන මට කියන්න. මම එය ඔබට
දෙන්නම්.[17] ඔබ මගේ රාජධානියෙන්
භාගයක් ඉල්ලුවත් මම ඔබට එය දෙ-
නවා.”[18] **3** එවිට එස්තර් බිසව රජුට
මෙසේ පිළිතුරු දුන්නාය. “රජතුමනි,
මා ඔබේ කරුණාව දිනාගෙන තිබේ

**6 පරි.**
1 හිතෝ 3:27, දේශ 9:15
2 එස්ත 5:14, එස්ත 7:9
3 එස්ත 4:11, එස්ත 5:1
4 එස්ත 3:1
5 හිතෝ 14:35, හිතෝ 16:15, හිතෝ 19:12
6 එස්ත 3:2, එස්ත 5:11, හිතෝ 16:18, හිතෝ 18:12, හිතෝ 30:13
7 1රාජා 1:38
8 එස්ත 8:15
9 එස්ත 3:15
10 එස්ත 4:6
11 එස්ත 1:3, එස්ත 1:14, එස්ත 3:1
12 උත් 41:43, 2සාමු 15:1

**2 තීරුව**
1 දානි 4:37, ලූක් 14:11
2 එස්ත 8:15
3 එස්ත 2:5
4 එස්ත 4:6
5 එස්ත 6:6
6 ලූක් 1:52
7 එස්ත 2:21, ගීතා 131:1
8 ගීතා 44:7
9 එස්ත 5:10
10 උත් 41:8
11 ද්වි 32:35, හිතෝ 28:18, හොෂෙ 14:9
12 එස්ත 5:8
13 එස්ත 5:5

**7 පරි.**
14 එස්ත 3:1, එස්ත 5:12
15 එස්ත 5:6
16 එස්ත 5:3
17 එස්ත 9:12
18 මාක් 6:23

නම් මගේ ඉල්ලීම ඉටු කර දෙන්න.
මා ඔබෙන් ඉල්ලා සිටින්නේ මගේ
ජීවිතයද[1] මගේ සෙනඟගේ ජීවිතද[2]
බේරා දෙන ලෙසයි. **4** මන්ද, මාවත්
මගේ සෙනඟවත් විකුණා තිබෙනවා.[3]
එසේ කර තිබෙන්නේ අපව සම්පූර්ණ-
යෙන්ම විනාශ කර මරා දැමීමටයි.[4]
අපිව දාසකමට විකුණුවා නම්[5] මට
නිහඬව ඉන්න තිබුණා. නමුත් මේ
මහා විපත සිදු වුණොත් ඉන් රජතු-
මාට මහත් පාඩුවක් සිදු වෙනවා. ඒ
නිසා ඊට ඉඩ නොදිය යුතුයි.”
**5** එය ඇසූ විගස අහෂ්වේරොෂ් රජ
එස්තර් බිසවගෙන් මෙසේ ඇසීය.
“එවැනි දෙයක් කරන්න තරම් එඩිතර
වූ[6] පුද්ගලයා කවුද?[7] දැන් ඔහු කො-
හේද සිටින්නේ?” **6** එවිට එස්තර්
බිසව, “ඒ සතුරා[8] වෙන කවුරුත් නෙ-
වෙයි මේ දුෂ්ට හාමාන්” යයි රජුට
පැවසුවාය.
හාමාන්, රජු සහ බිසව ඉදිරිපිට-
දීම මහත් සේ කැලඹී භීතියට පත්
විය.[9] **7** ඒ අවස්ථාවේදී රජ මහත්
සේ කෝප වී[10] භෝජන සංග්‍රහය
තිබූ ස්ථානයෙන් පිටත්ව මාලිගා-
වේ උයනට ගියේය. තමාට රජු
අනිවාර්යයෙන්ම දඬුවම් කරන බව
තේරුම්ගත්[11] හාමාන් විගස එස්තර්
බිසව ළඟට ගොස් තමාගේ ජීවි-
තය බේරා දෙන ලෙස කන්නලව්
කළේය.[12] **8** උයනේ සිට භෝජන
සංග්‍රහය[13] පැවැත්වූ ස්ථානයට රජ
නැවත පැමිණි විට, එස්තර් බිසව
හිඳගෙන සිටි යහන මත[14] හාමාන්
වැටී සිටිනවා දුටුවේය. එවිට රජ,
“ඔබ මගේම නිවස තුළ මගේ බිසවව
දූෂණය කරන්නද හදන්නේ” කියා
ඔහුගෙන් ඇසුවේය. රජු එසේ කියා
නිම වනවාත් සමඟම[15] හාමාන්ගේ
මුහුණ වසනු ලැබිණ. **9** එවිට රජු-
ගේ නිලධාරියෙකු වූ[16] හර්බොනා[17]
මෙසේ කීවේය. “රජුගේ ජීවිතය රැක
දුන්[18] මොර්දෙකයිව එල්ලා දැමීමට
හාමාන් සෑදූ රියන් පනහක් දිග කණු-
වක්[19] ඔහුගේ නිවසෙහි තිබෙනවා.”
එවිට රජ, “සේවකයෙනි, ඒ කණු-
වෙම හාමාන්ව එල්ලන්න”[1] කියා අණ
කළේය. **10** මොර්දෙකයිව එල්ලී-
මට හාමාන් සෑදූ[2] කණුව මත, රජු
අණ කළ ලෙසම ඔවුහු හාමාන්ව
එල්ලුවෝය.[3] රජුගේ කෝපය නිවී
ගියේය.

**8** එදින අහෂ්වේරොෂ් රජ, යුදෙව්-
වරුන්ට සතුරුකම් කළ[4]
හාමාන්ගේ නිවස එස්තර් බිසවට භාර
දුන්නේය.[5] මොර්දෙකයි හා තමා
අතර ඇති නෑකම එස්තර් බිසව
රජුට පැවසූ පසු, රජ මොර්දෙකයිව
තමා ඉදිරියට කැඳවීය.[6] **2** රජ තම
මුද්ද*[7] ගලවා මොර්දෙකයිට දුන්-
නේය. රජ එම මුද්ද, කලින් හාමාන්ට
දී තිබුණත් එය ආපසු ඔහුගෙන් ගෙන
තිබිණ. එස්තර් බිසව හාමාන්ගේ
නිවස මොර්දෙකයිගේ භාරයේ තැබු-
වාය.[8]
**3** පසුව ආගග්ගෙන් පැවත ආ
හාමාන්, යුදෙව්වරුන්ට නපුරක් කිරී-
මේ අටියෙන්[9] කළ කුමන්ත්‍ර-
ණය[10] නිෂ්ප්‍රභ කරන ලෙස[11] එස්තර්
බිසව රජුගේ පාමුල වැටී කන්නලව්
කළාය.[12] බිසව රජු ඉදිරියේ හඬ-
මින් රජුගේ කරුණාව අයැදුවාය.
**4** එවිට රජ තම රන් යෂ්ටිය[13] එස්තර්
බිසව වෙතට දිගු කළේය. එස්තර්
බිසව නැඟිට රජු ඉදිරියේ සිටගෙන,
**5** රජුට මෙසේ කීවාය. “රජතුමනි,
ඔබේ කරුණාව මා දිනාගෙන තිබේ
නම්,[14] මා ඔබෙන් ඉල්ලන දේ සාධා-
රණයි කියා ඔබට සිතෙනවා නම්,
එය ඉටු කර දීමට ඔබ සතුටු නම්,
මගේ මේ ඉල්ලීම ඉටු කරන්න.
ආගග්ගෙන්[15] පැවත ආ හම්මෙදාතා-
ගේ පුත් හාමාන්, රාජධානියේ සෑම
පළාතකම[16] ජීවත් වන යුදෙව්ව-
රුන්ව විනාශ කර දැමීමේ අටියෙන්[17]
කූට ලෙස නීතියක් පනවා එය ලිඛි-
තව දැනුම් දී තිබෙනවා.[18] එහෙයින්
රජතුමනි, මා ඔබෙන් ඉල්ලන්නේ ඒ

**7 පරි.**
**1** උත් 2:7 1කොරි 15:45
**2** එස්ත 2:7 එස්ත 4:8
**3** එස්ත 3:9 එස්ත 4:7 එස්ත 4:8
**4** එස්ත 3:13 එස්ත 8:11
**5** උත් 37:27 නෙහෙ 5:5 යෝවෙ 3:6
**6** ක්‍රියා 5:3
**7** හිතෝ 25:5 යෙසා 13:11
**8** 1සාමු 24:13 ගීතා 27:2 දේශ 5:8 එෆී 6:12
**9** දානි 5:6
**10** හිතෝ 14:35 හිතෝ 16:14
**11** 1සාමු 20:9 1සාමු 25:17 ගීතා 112:10 හිතෝ 19:12
**12** හිතෝ 14:19
**13** එස්ත 7:1
**14** එස්ත 1:6 මතෙ 26:20
**15** හිතෝ 16:14
**16** උත් 37:36 එස්ත 2:21
**17** එස්ත 1:10
**18** එස්ත 6:2
**19** එස්ත 5:14

**2 තීරුව**
**1** ගීතා 7:6 ගීතා 9:15 ගීතා 35:8 ගීතා 73:19 හිතෝ 11:6
**2** ගීතා 37:34 හිතෝ 21:18 2පේතෘ 2:9
**3** එස්ත 5:14

**8 පරි.**
**4** එස්ත 3:8 එස්ත 9:24
**5** එස්ත 5:11
**6** එස්ත 2:5 එස්ත 2:7
**7** උත් 41:42 එස්ත 3:10 දානි 6:17
**8** දේශ 2:18 දානි 2:48
**9** එස්ත 7:4 එස්ත 9:24
**10** එස්ත 9:25
**11** එස්ත 3:9
**12** හොෂෙ 12:4 ලූක් 11:9
**13** එස්ත 4:11
**14** එස්ත 2:17

**15** ගණන් 24:7; ද්වි 25:19; 1සාමු 15:8; එස්ත 9:24; **16** එස්ත 1:1; **17** එස්ත 3:9; **18** එස්ත 3:12; එස්ත 3:14.

එස්ත **8:2*** මූ.අ., “මුද්‍රා තබන මුද්ද.”

නීතිය අවලංගු කර දැමීමට ලිපි-
යක් යවන ලෙසයි. 6 මගේ සෙනඟ
පිටට පැමිණෙන්න යන විපත්තිය
දැක දැකත් මම එය ඉවසාගෙන ඉන්-
නේ කොහොමද? මගේ නෑදෑයන්
විනාශ වෙද්දී මම එය කොහොම දරා-
ගන්නද!”
7 එවිට අහෂ්වේරොෂ් රජ එස්තර්
බිසවට හා යුදෙව් ජාතික මොර්දෙක-
යිට මෙසේ කීවේය. “හාමාන් යුදෙව්-
වරුන්ට විරුද්ධව කුමන්ත්‍රණය කළ
නිසා ඔහුව කණුවක එල්ලා දැමීමට[1]
මම නියම කළා. ඔහුගේ නිවස
මම එස්තර් බිසවට භාර දුන්නා.[2]
8 දැන් ඔබ, යුදෙව්වරුන්ගේ යහපත
වෙනුවෙන් සුදුසුයි කියා සිතෙන දෙ-
යක් රජුගේ නමින් ලියා[3] රජුගේ
මුද්දෙන් මුද්‍රා කරන්න. මන්ද යම්
ලියවිල්ලක් රජුගේ නමින් ලියා රජු-
ගේ මුද්දෙන් මුද්‍රා කළොත් එහි සඳ-
හන් දේ කිසිම කෙනෙකුට අවලංගු
කරන්න බැහැ.”[4]
9 තුන්වන මාසයේ එනම්, සීවාන්
මාසයේ විසිතුන්වනදා රජුගේ ලේ-
කම්වරුන්ව[5] කැඳවීය. මොර්දෙකයි
අණ කළ සියල්ල ලේකම්වරුන් ලවා
ලියවිල්ලක ලියා යුදෙව්වරුන්ටත්
දිසාපතීන්ටත්[6] ආණ්ඩුකාරයන්ටත්
යවන ලදි. එමෙන්ම ඉන්දියාවේ සිට
ඉතියෝපියාව දක්වා තිබූ සියලු
පළාත්වල එනම්, පළාත් එකසිය
විසිහතක[7] වෙසෙන අධිපතීන්ටද එය
යවන ලදි. ඒ ඒ පළාත්වල ජීවත් වූ
සෙනඟගේ භාෂාවලින්[8] හා ඔවුන්ට
කියවිය හැකි අකුරුවලින් ඒවා ලියන
ලදි.[9] යුදෙව්වරුන්ට යැවූ ලියවිල්ල
ලියන ලද්දේ ඔවුන්ගේම භාෂාවෙන්
හා ඔවුන්ට කියවිය හැකි අකුරුව-
ලින්ය.[10]
10 මොර්දෙකයි ඒ ලියවිලි අහෂ්-
වේරොෂ් රජුගේ නමින් ලියා[11]
රජුගේ මුද්දෙන්[12] මුද්‍රා තබා[13] රජු-
ගේ සේවාවන් සඳහාම යොදාගත්,
ඉතා වේගවත් අශ්වයන් පිට නැඟ
යන පණිවිඩකරුවන් අතේ යැව්-
වේය.[14] 11 සෑම නුවරකම ජීවත් වූ
යුදෙව්වරුන්ට තම ජීවිත රැකගැනීම
සඳහා සංවිධානය වීමට[1] රජු අවසර
දෙන බව එම ලියවිල්ලේ සඳහන්
විය. යුදෙව්වරුන්ට දුෂ්ටකම් කරන
පිණිස නැඟී සිටින, ඕනෑම පළා-
තක වෙසෙන ජන පිරිසක්ව[2] ඔවුන්-
ගේ භාර්යාවන් හා දරුවන් සමඟ
සම්පූර්ණයෙන්ම විනාශ කර දැමීම-
ටත් ඔවුන්ගේ දේපළ පැහැරගැනීම-
ටත්[3] රජු යුදෙව්වරුන්ට අවසර දෙන
බව එම ලියවිල්ලේ සඳහන් විය.
12 අහෂ්වේරොෂ් රජු යටතේ තිබූ
සෑම පළාතක්ම එකම දවසක[4] එනම්,
දොළොස්වන මාසය වන ආදාර් මාස-
යේ[5] දහතුන්වනදා[6] එසේ කළ යුතු
බවද එහි සඳහන් විය. 13 ලියවිල්-
ලේ සඳහන් දේ සෑම පළාතකම ජීවත්
වූ සෙනඟට දන්වන ලදි.[7] මන්ද එහි
සඳහන් දේ නීතියක් ලෙස පිළිපැදිය
යුතු විය. එමෙන්ම යුදෙව්වරුන්ටද ඒ
දවසේදී තම සතුරන්ට විරුද්ධව පිය-
වර ගැනීමට සූදානම් වන පිණිස එසේ
කරන ලදි.[8] 14 රජු අණ කළ ලෙස
පණිවිඩකරුවෝ[9] එම ලිපි රැගෙන රජු-
ගේ සේවාවන් සඳහාම යොදාගත් වේ-
ගවත් අශ්වයන් පිට නැඟී පිටත්ව
ගියෝය.[10] ෂූෂන් මාලිගාවේද[11] එම
නීතිය ගැන දැනුම් දෙන ලදි.
15 මොර්දෙකයි නිල් පැහැති රෙදි-
වලින් හා ලිනන් රෙදිවලින් නිමැවූ
රාජ වස්ත්‍රයක්ද[12] රත්නිල් පැහැ-
ගැන්වූ[13] ලොම්වලින් නිමැවූ අනර්ඝ
සළුවක්ද[14] රන් ඔටුන්නක්ද පැළඳ,
රජු ඉදිරියෙන් පිටතට ගියේය. ෂූෂන්
නුවරෙහි වැසියෝ ප්‍රීති ඝෝෂා නැඟූ-
වෝය.[15] 16 මන්ද එහි සිටි යුදෙව්-
වරුන්ට මහත් බලාපොරොත්තුවක්ද
ගෞරවයක්ද ලැබිණ. ඔවුන්ගේ ප්‍රීතිය
බොහෝ සෙයින් වැඩි විය.[16] 17 රජු
පැනවූ නීතිය ගැන ප්‍රකාශ කළ සෑම
පළාතකම හා සෑම නුවරකම ජීවත් වූ
යුදෙව්වරුද එදින බොහෝ සෙයින්
ප්‍රීති වෙමින් උත්සව පැවැත්වූහ.[17]
යුදෙව්වරුන්ට භය වූ[18] ජනයාගෙන්
බොහෝදෙනෙක්[19] තමන් යුදෙව්ව-
රුන් බව කියා සිටියෝය.[20]

**8 පරි.**
1 එස්ත 7:10 ගලා 3:13
2 එස්ත 8:1 හිතෝ 13:22
3 1රාජ 21:8 එස්ත 3:12
4 දානි 6:8 දානි 6:15
5 එස්ත 3:12
6 එස්රා 8:36 එස්ත 9:3 දානි 6:1
7 එස්ත 1:1
8 දානි 4:1
9 එස්ත 1:22 එස්ත 3:12
10 1කොරි 14:9
11 දේශ 8:4
12 එස්ත 8:2
13 එස්ත 3:12
14 එස්ත 3:13

**2 තීරුව**
1 එස්ත 9:2
2 ගීතා 37:14 ගීතා 68:2
3 එස්ත 3:13 එස්ත 9:10 එස්ත 9:15 එස්ත 9:16
4 නික් 15:9
5 එස්ත 9:17 එස්ත 9:21
6 එස්ත 3:13 එස්ත 9:1
7 එස්ත 3:14
8 ගීතා 92:11 ගීතා 149:7 ලූක් 18:7
9 එස්ත 3:13
10 එස්ත 3:15
11 එස්ත 1:2 දානි 8:2
12 උත් 41:42 එස්ත 6:8 ලූක් 16:19
13 නික් 25:4 නික් 28:5
14 මතෙ 11:8
15 හිතෝ 29:2
16 එස්ත 9:17 ගීතා 18:28 ගීතා 30:5 ගීතා 97:11 හිතෝ 11:10 යෙසා 30:26 මීකා 7:8
17 නෙහෙ 8:10 එස්ත 9:19 එස්ත 9:22
18 එස්ත 9:2
19 ගීතා 18:43
20 සෙක 8:23

**9** රජුගේ නීතිය ක්‍රියාත්මක කිරී-
මට නියමිත දිනය[1] වන දො-
ළොස්වන මාසයේ එනම්, ආදාර්
මාසයේ[2] දහතුන්වන දිනය පැමිණි-
යේය. ඒ දිනයේදී යුදෙව්වරුන්ගේ
සතුරන් යුදෙව්වරුන්ව යටත් කර-
ගැනීමට බලාපොරොත්තුවෙන් සිටි
නමුත් ඔවුන් සිතූ දේ සම්පූර්ණ-
යෙන්ම වෙනත් අතකට පෙරළිණි.
අන්තිමේදී සිදු වූයේ යුදෙව්වරුන්
ඔවුන්ගේ සතුරන්ට වඩා බලවත්
වීමය.[3] **2** අහෂ්වේරොෂ් රජු[4] යට-
තේ තිබූ සෑම පළාතකම ජීවත් වූ
යුදෙව්වරු තමන්ට අනතුරක් කිරී-
මට උත්සාහ කරන සියලුදෙනාවම[5]
විනාශ කරන පිණිස තම තමන්ගේ
නුවරවල එක් රැස් වූහ.[6] නමුත් සිය-
ලුදෙනා යුදෙව්වරුන්ට බිය වූ නිසා[7]
කිසිවෙක් ඔවුන්ට විරුද්ධව පැමිණි-
යේ නැත. **3** මොර්දෙකයිට තිබූ
බිය නිසා[8] දිසාපතීහුද[9] ආණ්ඩුකාර-
යෝද[10] රජුගේ ව්‍යාපාර කටයුතුවල
නියැලුණු සියලුදෙනාද[11] සෑම පළා-
තකම සිටි අධිපතීහුද යුදෙව්වරුන්ට
උපකාර කළෝය. **4** මොර්දෙකයි
රජමාලිගාවේ ඉහළ තනතුරක් හෙ-
බවූ අතර[12] ඔහුගේ කීර්තිය[13] ගැන
සෑම පළාතකම පතළ විය. එසේ ඔහු
දවසින් දවස බලවත් විය.[14]

**5** යුදෙව්වරු තම සතුරන්ට කඩු-
වෙන් පහර දී[15] ඔවුන් සියලුදෙනාවම
මරා දැමුවෝය. තමන්ට වෛර කළ
සියලුදෙනාවම ඔවුහු රිසි සේ විනාශ
කළෝය.[16] **6** ෂූෂන්[17] මාලිගාවේදී
ඔවුහු පන්සියදෙනෙකුව මරා දැමු-
වෝය. **7** පාෂාන්දාතා, දල්ෆොන්,
අස්පාතා, **8** පෝරාතා, අදලියා,
අරිදාතා, **9** පාමෂ්තා, අරිසායි, අරි-
දායි සහ වයිසාතා **10** යන අයවත්
මරා දමන ලදි. මොවුන් හම්මෙදාතා-
ගේ පුත්‍රයාගේ එනම්, යුදෙව්වරුන්ට
සතුරුකම් කළ[18] හාමාන්ගේ[19] පුත්‍ර-
යන් දසදෙනාය.[20] නමුත් යුදෙව්-
වරු ඔවුන්ගේ දේපළ කොල්ල කෑවේ
නැත.[21]

**11** එදින ෂූෂන් මාලිගාවේදී මරා
දමනු ලැබූ අයගේ ගණන රජුට දන්-
වන ලදි.

**12** පසුව රජ, එස්තර් බිසව[1]
කැඳවා ඇයට මෙසේ පැවසුවේය.
“යුදෙව්වරු ෂූෂන් මාලිගාවේදී[2] පම-
ණක් පන්සියදෙනෙකුව හා හාමාන්-
ගේ පුත්‍රයන් දසදෙනාව මරා දමා
තිබෙනවා. එසේනම් රජ්ජුරුවන් යට-
තේ තිබෙන සෙසු පළාත්වල[3] ඔවුන්
කීදෙනෙකුව මරා දමා ඇද්ද?[4] මගේ
බිසව එස්තර්, ඔබේ ඉල්ලීම කුමක්ද?
මම එය ඔබට ඉටු කර දෙන්-
නම්.[5] ඔබට මගෙන් තව මොනවාද
කෙරෙන්න ඕනේ කියා කියන්න.[6]
එයත් මම ඔබට ඉටු කර දෙන්නම්.”
**13** එවිට එස්තර් බිසව රජුට මෙසේ
පැවසුවාය. “රජතුමනි, මගේ ඉල්ලීම
ඉටු කර දීමට ඔබ සතුටු නම්[7] අද දින
ක්‍රියාත්මක කළ නීතිය හෙට දවසේ-
දීත් ෂූෂන් මාලිගාවේ සිටින යුදෙව්ව-
රුන්ට ක්‍රියාත්මක කිරීමට අවසර
දෙන්න.[8] හාමාන්ගේ පුත්‍රයන් දසදෙ-
නාව කණුවල එල්ලා දමන ලෙසටත්
අණ කරන්න.”[9] **14** බිසවගේ ඉල්-
ලීම ඉටු කරන ලෙස රජ අණ
කළේය.[10] එහෙයින් එම නීතිය ඊළඟ
දිනයේදීද ක්‍රියාත්මක කරන ලෙස
ෂූෂන් මාලිගාවේ ප්‍රකාශයක් නිකුත්
කෙරිණ. හාමාන්ගේ පුත්‍රයන් දසදෙ-
නාවද කණුවල එල්ලන ලදි.

**15** ෂූෂන් මාලිගාවේ සිටි යුදෙව්-
වරු සංවිධානය වී ආදාර් මාසයේ
දහහතරවන දිනයේදීද[11] එහි සිටි
සතුරන් තුන්සියදෙනෙකුව මරා දැමු-
වෝය. නමුත් ඔවුන්ගේ දේපළ ඔවුහු
කොල්ල කෑවේ නැත.[12]

**16** රජුගේ පාලනය යටතේ තිබූ
සෑම පළාතකම[13] ජීවත් වූ අනික්
යුදෙව්වරුද තමන්ට දුෂ්ටකම් කරන
අයගෙන් තම ජීවිත[14] රැකගැ-
නීම සඳහා සංවිධානය වූහ. ඔවුහු
තමන්ට වෛර කරන තම සතුරන්ට
විරුද්ධව ගත් පියවරේ ප්‍රතිඵලයක්

**9 පරි.**
**1** එස්ත 3:13
**2** එස්ත 3:7
එස්ත 8:12
**3** ද්වි 32:36
2සාමු 22:41
ගීතා 30:11
**4** එස්ත 1:1
**5** ගීතා 71:13
ගීතා 71:24
**6** එස්ත 8:11
**7** ද්වි 11:25
එස්ත 8:17
**8** එස්ත 9:1
ගීතා 31:11
**9** දානි 6:1
**10** එස්ත 3:12
එස්ත 8:9
**11** එස්ත 3:9
**12** එස්ත 8:15
**13** 1සාමු 2:30
ශෙප 3:19
**14** 2ලේක 1:1
ගීතා 1:3
**15** ගීතා 18:34
ගීතා 18:47
මීකා 5:8
2තෙස 1:6
**16** 1සාමු 12:22
ගීතා 34:19
ගීතා 94:14
මීකා 5:9
**17** එස්ත 1:2
දානි 8:2
**18** එස්ත 3:8
එස්ත 7:4
**19** එස්ත 3:1
එස්ත 3:12
එස්ත 8:5
**20** නික් 17:14
නික් 17:16
ගණන් 24:7
ගීතා 21:10
ගීතා 109:13
**21** එස්ත 8:11
එස්ත 9:16

**2 තීරුව**
**1** එස්ත 2:17
**2** එස්ත 3:15
**3** එස්ත 1:1
දානි 6:1
**4** එස්ත 9:16
**5** එස්ත 5:6
**6** එස්ත 8:5
**7** එස්ත 5:8
එස්ත 7:3
**8** එස්ත 8:11
**9** ද්වි 21:22
එස්ත 2:23
එස්ත 7:10
ගලා 3:13
**10** එස්ත 9:25
**11** එස්ත 9:21
එස්ත 9:31
**12** එස්ත 9:10
**13** එස්ත 1:1
දානි 6:1

14 උත් 2:7; ලෙවී 17:11; එස්ත 7:3.

ලෙස[1] සතුරන්ගෙන් හැත්තෑපන්දහ-
සක් මරා දැමුවෝය. නමුත් ඔවුන්-
ගේ දේපළ ඔවුහු කොල්ල කෑවේ
නැත. **17** ඔවුන් එසේ කළේ ආදාර්
මාසයේ දහතුන්වනදාය. නමුත් පසු
දින එනම්, දහහතරවනදා ඔවුහු
නිවාඩු ගත්තෝය. එදින ඔවුහු බො-
හෝ සෙයින් ප්‍රීති වෙමින්[2] උත්සව
පැවැත්වූහ.[3]

**18** නමුත් ෂූෂන් මාලිගාවේ සිටි
යුදෙව්වරු ආදාර් මාසයේ දහතුන්ව-
නදා[4] සහ දහහතරවනදා යන දින-
යන් දෙකේදීම සතුරන්ට පහර දී
පහළොස්වනදා නිවාඩු ගත්තෝය.
එදින ඔවුහු බොහෝ සෙයින් ප්‍රීති වෙ-
මින් උත්සව පැවැත්වූහ.[5] **19** එය
සිහි කිරීමක් ලෙස අගනුවරින් බැහැර
ප්‍රදේශවල ජීවත් වූ යුදෙව්වරු ආදාර්
මාසයේ[6] දහහතරවන දිනය ප්‍රීතිමත්[7]
දවසක් ලෙස සලකමින්[8] උත්සව
පවත්වති. තෑගිබෝග හුවමාරු කර-
ගනිති.[9]

**20** මොර්දෙකයි[10] මේ සිදුවීම්
සියල්ල ලියවිල්ලක සඳහන් කර,
අහෂ්වේරොෂ් රජුගේ රාජධානියේ
ළඟපාත මෙන්ම දුර ඈත පිහිටි සියලු
පළාත්වල[11] ජීවත් වූ යුදෙව්වරුන්ට
එහි පිටපත් යැවීමට පියවර ගත්-
තේය. **21** සෑම අවුරුද්දකම ආදාර්
මාසයේ දහහතරවනදා සහ පහ-
ළොස්වනදා යන දිනයන් යුදෙව්ව-
රුන් උත්සව දිනයන් ලෙස සැලකිය
යුතු බව එම ලියවිල්ලේ නියෝග කර
තිබිණ.[12] **22** ඔහු එසේ නියෝග
කළේ ඒ දවස් දෙකේදී යුදෙව්වරුන්ට
සතුරන්ගෙන් නිදහස ලැබුණු බව
සිහි කිරීමටය.[13] එමෙන්ම ඒ මාස-
යේදී ඔවුන්ගේ ශෝකය ප්‍රීතියටත්
වැලපීම[14] සතුටටත් පෙරළුණු බව
සිහි කිරීමටය. ප්‍රීති වෙමින් උත්සව
පැවැත්වීමටත් කෑම බීම හුවමාරු
කරගැනීමටත්[15] දුප්පතුන්ට තෑගි-
බෝග බෙදා දීමටත්[16] ඒ දිනයන්
යොදාගත යුතු බව ඔහු දැනුම් දුන්-
නේය.

**9 පරි.**
1 ද්වි 32:35 එස්ත 8:13 ගීතා 149:7 නාහු 1:2 ලූක් 18:7
2 එස්ත 8:16 ගීතා 58:10
3 එස්ත 8:17
4 එස්ත 9:1 එස්ත 9:13 එස්ත 9:15
5 හිතෝ 11:10
6 එස්රා 6:15 එස්ත 3:7
7 ගීතා 118:15 ගීතා 145:7 යෙසා 65:14
8 ගීතා 124:2 ගීතා 124:6
9 නෙහෙ 8:10
10 එස්ත 2:5 එස්ත 8:8
11 එස්ත 1:1 ආනි 6:1
12 ගීතා 145:4
13 ගීතා 103:2 යෙසා 12:1
14 එස්ත 4:3
15 එස්ත 9:19 ලූක් 11:41
16 ගලා 2:10

**2 තීරුව**
1 එස්ත 3:10 එස්ත 9:10
2 නික් 17:16 ගණන් 24:7 1සාමු 15:8
3 එස්ත 8:5
4 එස්ත 3:1
5 එස්ත 3:9
6 එස්ත 3:7 යෝවෙ 3:3 ඔබ 11 මතෙ 27:35
7 එස්ත 8:3
8 ද්වි 19:19 ගීතා 7:16 ගීතා 37:15 ගීතා 141:10 ආනි 6:24
9 එස්ත 8:5 එස්ත 8:10 එස්ත 9:13
10 එස්ත 5:14 එස්ත 7:10 එස්ත 9:14
11 එස්ත 3:7
12 එස්ත 9:20
13 ලෙවී 19:34 ලෙවී 24:22 රූත් 1:16 1රාජා 8:43 එස්ත 8:17 ගලා 5:3
14 ගීතා 103:2
15 එස්ත 2:15

**23** යුදෙව්වරුන් විසින්ම පටන්ගත්
එම උත්සවය මොර්දෙකයි ලියා එවූ
ලෙස චාරිත්‍රයක් හැටියට නොක-
ඩවා පැවැත්වීමට යුදෙව්වරු සතුටු
වූහ. **24** යුදෙව්වරුන්ට සතුරුකම්
කළ,[1] ආගග්ගෙන්[2] පැවත ආ හම්-
මෙදාතාගේ පුත්[3] හාමාන්[4] යුදෙව්ව-
රුන්ට විරුද්ධව කුමන්ත්‍රණය කළේය.
කෝලහලයක් ඇති කර යුදෙව්ව-
රුන්ව විනාශ කර දැමීමට[5] ඔහු
ආදු* දැමුවේය.[6] **25** නමුත් එස්තර්
බිසව රජු ඉදිරියට පැමිණ ඒ ගැන
පවසා කන්නලව් කළ විට, "හාමාන්
යුදෙව්වරුන්ට විරුද්ධව කළ දුෂ්ට
කුමන්ත්‍රණය[7] ඔහු පිටටම පමුණු-
වන්න"[8] කියා රජ ලිඛිතව ආඥා-
වක්[9] නිකුත් කළේය. එහෙයින්
රජුගේ සේවකයෝ හාමාන්ව සහ ඔහු-
ගේ පුත්‍රයන්ව කණුවල එල්ලුවෝය.[10]
**26** හාමාන් යුදෙව්වරුන්ට විරුද්ධව
කුමන්ත්‍රණය කරමින් ආදු දැමූ නිසා[11]
ඔවුහු ඒ උත්සවය ආදු උත්සවය*
ලෙස හැඳින්වූහ. ලිපියෙහි[12] ලියා තිබූ
දේවල් නිසාද ඔවුන් පෞද්ගලිකව
අද්දුටු දේවල් නිසාද **27** තමන්ට
ලියා එවූ ආකාරයටම සෑම අවුරුද්ද-
කම නියමිත කාලයේදී නොවරදවාම
එම දිනයන් දෙක උත්සවාකාර-
යෙන් සැමරීමට යුදෙව්වරු එකඟ
වූහ. එම දිනයන් දෙක සැමරීමේ වග-
කීම ඔවුන්ගේ මතු පරම්පරා වෙ-
නුවෙන්ද ඔවුන්ට එකතු වන අන්
සියලුදෙනා වෙනුවෙන්ද ඔවුහු භාර-
ගත්තෝය.[13] **28** සෑම පළාතකම,
සෑම නුවරකම වෙසෙන සියලු පවුල්
එම දිනයන් දෙක සැමරිය යුතු විය.
එමෙන්ම යුදෙව්වරුන්ගේ සියලු පරම්-
පරාවන් ආදු උත්සවය සැමරීම කිසිවි-
ටක අමතක නොකළ යුතු විය.[14]

**29** ආදු උත්සවය සැමරීම ස්ථිර
කිරීම සඳහා තමන් සතු අධිකාරිය
යොදාගනිමින් අබිහයිල්ගේ දියණිය
වූ[15] එස්තර් බිසව සහ යුදෙව්වරයෙකු

එස්ත **9:24*** එස්ත 3:7හි පාදසටහන බලන්න.
**26*** පූරිම් උත්සවය ලෙසද හැඳින්වේ.

වූ මොර්දෙකයි තවත් ලිපියක් ලිව්-
වෝය. **30** මිත්‍රශීලී මෙන්ම විශ්වා-
සය දිනාගන්නා අයුරින්[1] ලියූ ලිපියක්
අහෂ්වේරොෂ් රජු[2] යටතේ තිබූ සියලු
පළාත්වල[3] එනම්, පළාත් එකසිය
විසිහතක ජීවත් වූ යුදෙව්වරුන්ට
යවන ලදි. **31** යුදෙව්වරයෙකු වූ
මොර්දෙකයි සහ එස්තර් බිසව නියම
කළ ලෙසද[4] යුදෙව්වරුන් තමන්-
ගේ සියලු පරම්පරාවලදී[5] සැමරීමට
කැමැත්තෙන්ම එකඟ වූ ලෙසද
ආදූ උත්සවය නියමිත කාලයේදී
සැමරීම එම ලිපිය මගින් අනිවාර්-
යය කරන ලදි. තමන් නිරාහා-
රව සිට[6] දෙවිගේ උපකාරය පතා
කන්නලව් කළ ආකාරය[7] සිහි කරන
පිණිස යුදෙව්වරු එම දිනයන් සැමරු-
වෝය. **32** ආදූ උත්සවයේදී[8] කළ
යුතු දේවල් එස්තර් බිසවගේ ලිපිය
මාර්ගයෙන් ස්ථිර කරනු ලැබුවේය.
පසුව ඒ සියල්ල ලියවිල්ලක සටහන්
කරන ලදි.

**9 පරි.**
**1** යෙසා 39:8
**2** එස්ත 1:1
**3** එස්ත 8:9
එස්ත 9:20
**4** එස්ත 9:21
**5** එස්ත 9:27
**6** 2ලේක 20:3
යෝවෙ 2:12
**7** එස්ත 4:1
ගීතා 65:2
ගීතා 142:1
**8** එස්ත 9:26

**2 තීරුව**

**10 පරි.**
**1** උත් 10:5
**2** යොෂු 16:10
විලා 1:1
**3** එස්ත 1:3
දානි 6:15
**4** එස්රා 4:15
එස්ත 6:1
**5** එස්ත 2:5
**6** එස්ත 8:15
ගීතා 18:35
දානි 2:48
**7** උත් 41:40
දානි 5:16

**10** අහෂ්වේරොෂ් රජ ඔහුගේ
පාලනය යටතේ තිබූ දේශව-
ලත් දූපත්වලත්[1] ජීවත් වූ වැසියන්-
ගෙන් වහල් වැඩ ගත්තේය.[2]
**2** මේදියාවේ සහ පර්සියාවේ[3] රජ-
වරුන්ගේ ඉතිහාසය වාර්තා කර
ඇති ලියවිල්ලෙහි[4] ඔහුගේ බලවත්
හා එඩිතර ක්‍රියා සියල්ල ගැනද
රජු මොර්දෙකයිට[5] උසස් තනතු-
රක් ලබා දී ඔහුව ගෞරවයට පත්
කළ ආකාරය ගැනද[6] සඳහන් කර
තිබේ. **3** යුදෙව්වෙකු වූ මොර්දෙ-
කයි දෙවෙනි වූයේ අහෂ්වේරොෂ්
රජුට පමණි.[7] ඔහු යුදෙව්වරුන් අත-
රේ ඉතා කීර්තිමත් පුද්ගලයෙකු වූ
අතර ඔවුහු ඔහුට බොහෝ සෙයින්
ආදරය කළෝය. මන්ද ඔහු තම
සෙනඟගේ යහපත උදෙසා ක්‍රියා
කළේය. මතු පරපුරටද සාමකාමී දිවි
පෙවෙතක් ගත කිරීමට හැකි වීම
සඳහා ඔහු පියවර ගත්තේය.[8]

**8** ගීතා 125:5; හිතෝ 12:20; යෙසා 26:12.

# යෝබ්

**1** ඌෂ්[1] දේශයේ දෙවිට ගරුබිය[2]
දැක්වූ නිර්දෝෂ[3] මනුෂ්‍යයෙක්
වාසය කළේය. ඔහු වැරදි දෙයින්
ඈත් වී සිටි[4] අවංක[5] මිනිසෙකි.
ඔහුගේ නම යෝබ්ය.*[6] **2** ඔහුට
පුත්‍රයෝ හත්දෙනෙක්ද දූවරු තිදෙ-
නෙක්ද සිටියෝය.[7] **3** ඔහුට හිමි
සත්ව සම්පතට,[8] බැටළුවන් හත්දහ-
සක්ද ඔටුවන් තුන්දහසක්ද ගොන්
බාන් පන්සියයක්ද කොටළුදෙනුන්
පන්සියයක්ද අයත් විය. විශාල සේ-
වක පිරිසක්ද ඔහුට සිටියෝය. ඔහු
නැඟෙනහිර දේශයේ[9] විසූ සියලුදෙ-
නාට වඩා ශ්‍රේෂ්ඨයෙක් ලෙස නම් දරා
සිටියේය.

යෝබ් **1:1*** තේරුම, "වෛරයට ලක් වූ."

**1 පරි.**
**1** යෙරෙ 25:20
විලා 4:21
**2** නෙහෙ 5:15
හිතෝ 8:13
හිතෝ 16:6
**3** උත් 6:9
2රාජා 20:3
**4** 1තෙස 5:22
1පේතෘ 3:11
**5** යෝබ් 2:3
**6** එස 14:14
එස 14:20
යාකො 5:11
**7** ගීතා 127:3
ගීතා 128:3
**8** 2ලේක 32:29
**9** උත් 29:1
1රාජා 4:30

**2 තීරුව**
**1** ගීතා 133:1
**2** නික් 19:10
1සාමු 16:5

**4** ඔහුගේ පුත්‍රයෝ තම තමන්ගේ
නිවෙස්වල තමන් සැලසුම් කරගත්
දිනවල භෝජන සංග්‍රහයන් පැවැත්-
වීමට[1] පුරුදු වී සිටියෝය. ඔවුහු
එම භෝජන සංග්‍රහයන්වලට තම
සහෝදරියන් තිදෙනාටද ආරාධනා
කළෝය. **5** එම භෝජන සංග්‍රහ-
යන් පවත්වා අවසන් වූ විට තමන්වම
පවිත්‍ර කරගන්න කියා යෝබ් තම
පුත්‍රයන්ට පණිවිඩකරුවෙකු අතේ
කියා යැව්වේය.[2] ඉන්පසු ඔහු සිරිත්
පරිදි හිමිදිරියේම නැඟිට දරුවන්ගේ
ගණනට අනුව දවන පූජා[3] ඔප්පු
කළේය. ඔහු එසේ කළේ, 'සමහරවිට
මගේ පුත්‍රයන් තම සිතින්[4] දෙවිට

**3** උත් 8:20; උත් 12:8; **4** මතෙ 15:19.

දොස් නඟා වරදක් කරන්න ඇති'[1]
කියා සිතූ නිසාය. යෝබ් සැමවිටම
ක්‍රියා කළේ එලෙසයි.[2]
**6** මේ අතරතුර සැබෑ දෙවිගේ පුත්‍ර-
යෝ*[3] නියමිත දවසේදී යෙහෝවා
දෙවි ඉදිරියෙහි පෙනී සිටියෝය.[4]
සාතන්ද#[5] එතැනට ආවේය.[6]
**7** එවිට, "ඔබ පැමිණියේ කොහේ
සිටද" කියා යෙහෝවා දෙවි ඔහුගෙන්
ඇසීය. සාතන් යෙහෝවා දෙවිට
පිළිතුරු දෙමින්, "මම පොළොවේ
සෑම තැනකම ගමන් කර මෙතැනට
පැමිණියෙමි"[7] යයි කීය. **8** එවිට
යෙහෝවා දෙවි සාතන්ට මෙසේ පැව-
සුවේය. "ඔබ මාගේ සේවක යෝබ්
ගැන සිතන්නේ කුමක්ද? ඔහු මෙන්
අවංක,[8] නිර්දෝෂව[9] හැසිරෙන, මට
ගරුබිය[10] දක්වන, වැරදි දෙයින්
ඈත් වී සිටින[11] කෙනෙක් පොළො-
වේ තවත් නැත."[12] **9** එවිට සාතන්
යෙහෝවා දෙවිට මෙසේ කීය. "ඔහු
ඔබට ගරුබිය දක්වන්නේ නිකම-
ටද?[13] **10** ඔබ ඔහුගේ නිවස හා
ඔහු සතු සියල්ල වටා ආරක්ෂක
පවුරක් දමා තිබෙනවා නොවේද?[14]
ඔහු කරන සෑම දෙයකටම ඔබ
ආශීර්වාද කර ඇත.[15] ඔහුගේ සත්ව
රැළ දේශය පුරා පැතිර තිබෙන්නේ
ඒ නිසයි. **11** එහෙත් දැන් ඔහුට
විරුද්ධව ඔබේ බලය පාවිච්චි කර
ඔහුට අයිති සියල්ල විනාශ කර
දමන්න. එවිට ඔහු ඔබේ මුහුණ-
ටම ශාප කරන්නේ නැද්ද කියා
බලන්න."[16] **12** ඒ අවස්ථාවේදී යෙ-
හෝවා දෙවි සාතන්ට කතා කර, "ඔහු
සතු සියල්ල ඔබේ අතට භාර දෙන්-
නෙමි. නමුත් ඔහුට පමණක් කිසි-
වක් නොකරන්න" යයි කීය. ඉන්පසු
සාතන් යෙහෝවා දෙවි ඉදිරියෙන්
පිටත්ව ගියේය.[17]
**13** දිනක් යෝබ්ගේ දූවරුද පුත්‍ර-
යෝද තම වැඩිමල් සහෝදරයාගේ

යෝබ් **1:6*** හෝ, "දේවදූතයෝ." **6#** හෝ, "විරුද්ධකාරයා." හෙබ්‍රෙව් භාෂාවේ සාතන් යන වචනය මෙම අවස්ථාවේදී භාවිත කර තිබෙන්නේ පුද්ගලයෙකුව විස්තර කිරීමටයි.

**1 පරි.**
**1** හිතෝ 30:9
**2** උත් 18:19
**3** උත් 6:2; ද්වි 33:2; යෝබ් 38:7; දානි 3:25
**4** ගීතා 103:20; දානි 7:13; මතෙ 18:10
**5** සෙක 3:1; මතෙ 4:3; ලූක් 22:31; යොහ 13:2; එළි 12:9
**6** 1රාජා 22:19
**7** යෝබ් 2:2; මතෙ 12:43; 1පේතෘ 5:8
**8** ගීතා 84:11; හෙබ්‍රෙ 4:13
**9** උත් 6:9; ගීතා 37:37; යොහ 1:47
**10** නෙහෙ 5:15; ගීතා 19:9; දේශ 12:13
**11** ගීතා 34:14; හිතෝ 3:7; හිතෝ 16:17
**12** ගණන් 12:3; හිතෝ 14:35
**13** එළි 12:10
**14** උත් 15:1; උත් 31:7; ද්වි 33:27; ගීතා 34:7; ගීතා 105:14; 1පේතෘ 1:5
**15** උත් 26:12; ද්වි 28:2; ගීතා 5:12; ගීතා 84:11; ගීතා 128:2; හිතෝ 10:22
**16** යෙසා 8:21
**17** යෝබ් 2:7

**2 තීරුව**
**1** යෝබ් 1:4
**2** 1සාමු 4:17
**3** 1රාජා 19:19
**4** යෝබ් 6:19
**5** 1සාමු 22:20
**6** එළි 2:2
**7** උත් 11:28; 2රාජා 24:2
**8** ගීතා 104:15; දේශ 9:7; දේශ 10:19
**9** එළි 2:2
**10** උත් 37:34; 1සාමු 4:12
**11** එස්රා 9:3; මීකා 1:16
**12** උත් 24:26; නික් 34:8; 2සාමු 12:16; නෙහෙ 9:3; යෙසා 3:26; මතෙ 26:39

නිවසෙහි කෑම කමින් වයින් බොමින්
සිටියෝය.[1] **14** පසුව පණිවිඩකාර-
යෙක්[2] යෝබ් වෙත දිව ඇවිත් මෙසේ
පැවසුවේය. "ගොනුන් කෙතේ සීසාන
විට[3] කොටළුදෙනුන් ඒ ළඟ ගොදුරු
කමින් හිටියා. **15** ඒ වෙලාවේ, සෙ-
බාවරුන්[4] එතැනට කඩාවැද සේව-
කයන්ව කඩුවෙන් මරා සතුන්වත්
රැගෙන ගියා. ඉතුරු වුණේ මම විත-
රයි. මම ඔබට ඒ ගැන දන්වන්න
එතැනින් පලා ආවා."[5]
**16** ඔහු යෝබ්ට ඒ ගැන පවසමින්
සිටියදීම තවත් සේවකයෙක් පැමිණ,
"දෙවි අහසින්[6] ගිනි එවා බැටළුවන්ව
සහ එඬේරුන්ව දවා දැමුවා. ඉතුරු
වුණේ මම විතරයි. මම එතැනින්
පලා ආවේ ඔබට ඒ ගැන දන්වන්නයි"
කියා පැවසීය.
**17** ඔහු කතා කරමින් සිටියදීම
තවත් සේවකයෙක් එතැනට පැමිණ,
"කල්දිවරුන්ගේ[7] කණ්ඩායම් තුනක්
ඇවිත් සේවකයන්ව කඩුවෙන් මරා
ඔටුවන්ව පැහැරගෙන ගියා. ඉතුරු
වුණේ මම විතරයි. මම ඔවුන් අතින්
බේරී ඔබට පණිවිඩය කියන්න ආවා"
යයි පැවසීය.
**18** ඔහු ඒ දේ පවසමින් සිටි අත-
රේදී තවත් සේවකයෙක් පැමිණ,
"ඔබේ දූපුතුන් ඔබේ වැඩිමල් පුතාගේ
නිවසේ කෑම කමින් වයින් බොමින්[8]
හිටියා. **19** ඒ වෙලාවේ පාළුකර-
යෙන් තද හුළඟක්[9] හමාගෙන ඇවිත්
නිවස බිමටම සමතලා කළා. ඔබේ
දරුවෝ සියලුදෙනාම මිය ගියා. මම
විතරයි ඉතුරු වුණේ. මම ඔබ වෙත
ආවේ ඒ ගැන දන්වන්නයි" කියා
පැවසීය.
**20** මේ පුවත් ඇසූ යෝබ් තම සළුව
ඉරාගෙන[10] හිසකෙස් කපාගෙන[11] බිම
වැටී[12] **21** මෙසේ කිවේය.

"මා මව්කුසින් ආවේ නිර්වස්ත්‍ර-
වය.[13]
මා යළි යන්නෙත් එලෙසින්-
මය.[14]

**13** යෝබ් 31:15; ගීතා 127:3; දේශ 5:15; 1තිමෝ 6:7; **14** උත් 3:19; ගීතා 49:17; දේශ 12:7.

යෙහෝවා දෙවි දුන්නේය.[1] යෙ-
හෝවා දෙවි ගත්තේය.[2]
යෙහෝවා දෙවිගේ නාමය
සැමදා ගෞරවයට පත්
වේවා!”[3]

**22** මේ සියල්ල සිදු වූ පසුත් යෝබ්
වචනයකින්වත් පව් කළේ නැත. දෙ-
විට දොස් පැවරුවේද නැත.[4]

**2** පසුව සැබෑ දෙවිගේ පුත්‍රයෝ
නැවතත් යෙහෝවා දෙවි ඉදිරි-
යෙහි, නියමිත දවසේදී පෙනී සිටි-
යෝය. සාතන්ද එතැනට ඇවිත් යෙ-
හෝවා දෙවි ඉදිරියේ පෙනී සිටියේය.[5]
**2** එවිට, “ඔබ පැමිණියේ කොහේ
සිටද” කියා යෙහෝවා දෙවි ඔහුගෙන්
ඇසීය. සාතන් යෙහෝවා දෙවිට පිළි-
තුරු දෙමින්, “මම පොළොවේ සැම
තැනකම ගමන් කර මෙතැනට පැමි-
ණියෙමි”[6] යයි කීය. **3** එවිට යෙ-
හෝවා දෙවි සාතන්ට මෙසේ පැවසු-
වේය. “ඔබ මාගේ සේවක යෝබ්
ගැන සිතන්නේ කුමක්ද?[7] ඔහු
මෙන් අවංක, නිර්දෝෂව[8] හැසිරෙන,
මට ගරුබිය දක්වන,[9] වැරදි දෙයින්
ඈත්ව සිටින[10] කෙනෙක් පොළො-
වේ තවත් නැත. කිසිම හේතුවක්
නැතුව[11] ඔහුට පීඩා කරන්න[12] ඔබ
මාගෙන් අවසර ගත්තත් ඔහු තව-
මත් මට විශ්වාසවන්තව[13] සිටියි.”
**4** එවිට සාතන්[14] යෙහෝවා දෙ-
විට මෙසේ පිළිතුරු දුන්නේය. “මිනි-
සෙකු තම ජීවිතය බේරාගන්න මො-
නවාද නොකරන්නේ? ඔහු තමා
සතු සියල්ල වුවත් ඒ වෙනුවෙන්
පරිත්‍යාග කරයි.[15] ඔහු තම ජීවිතය
රැකගන්න වෙනත් ජීවිතයක් වුණත්
දෙන්න සූදානම්.* **5** එහෙත් දැන්
ඔහුට විරුද්ධව ඔබේ බලය පාවිච්චි
කර ඔහුගේ ශරීරයට පහර දෙන්න.
එවිට ඔහු ඔබේ මුහුණටම ශාප
කරන්නේ නැද්ද කියා බලන්න.”[16]
**6** එවිට යෙහෝවා දෙවි සාතන්ට
මෙසේ පැවසුවේය. “මම ඔහුව ඔබේ
අතට භාර දෙන්නෙමි. එහෙත් ඔහුගේ
ජීවිතයට හානියක් කරන්න ඔබට
කිසිම අයිතියක් නැත.” **7** ඉන්පසු
සාතන් යෙහෝවා දෙවි ඉදිරියෙන්
පිටත්ව ගියේය.[1] ඔහු යෝබ්ගේ හිස
මුදුනේ සිට පතුල දක්වා දරුණු
කුෂ්ඨයකින්[2] ඔහුට පහර දුන්නේය.
**8** යෝබ් ඇඟ කසාගැනීමට වළං
කැබැල්ලක් ගෙන අළු ගොඩේ හිඳ-
ගත්තේය.[3]
**9** දිනක් ඔහුගේ භාර්යාව ඔහුට
කතා කරමින්, “ඔබ තවමත් දෙ-
විට විශ්වාසවන්තව සිටිනවාද?[4] ඊට
වඩා හොඳයි දෙවිට ශාප කර මිය
ගියා නම්” කියා කීවාය. **10** එහෙත්
යෝබ් ඇයට මෙසේ පිළිතුරු දුන්-
නේය. “ඔබ අඥාන[5] ස්ත්‍රියක් වගේ
කතා කරන්නේ ඇයි? අපි දෙවිගෙන්
යහපත් දේවල් භුක්ති විඳිනවා වගේම
ඔහුගෙන් ලැබෙන අයහපත් දේවලුත්
භාරගත යුතුයි.”[6] යෝබ්ට කොතරම්
පීඩා පැමිණියත් ඔහු වචනයකින්වත්
දෙවිට විරුද්ධව පව් කළේ නැත.[7]
**11** යෝබ්ට සිදු වූ විපත ඔහුගේ
මිතුරන් තිදෙනෙකු වන තේමාන්හි*[8]
එලිෆස්ට්ද ෂූහි#[9] බිල්දද්ට්ද නයමා-
තිය△[10] සෝෆර්ට්ද ආරංචි විය. ඒ
තිදෙනා තම තමන්ගේ ගම්බිම්වලින්
පිටත්ව ඇවිත් යම් ස්ථානයක හමු
වී,[11] යෝබ්ව සනසන්න[12] යෑමට තීර-
ණය කළෝය. **12** ඔවුන් ඈත තියා
යෝබ්ව දුටුවත් ඔහුව හඳුනාගැනීමට
ඔවුන්ට නොහැකි විය. ඔවුහු යෝබ්ව
හඳුනාගත් විට මහත් හඬින් වැල-
පෙන්න පටන්ගත්තෝය. ඔවුහු තම
සළු ඉරා,[13] හිස් මත දූවිලි දමාගෙන[14]
අහස දෙසටත් දූවිලි විසි කළෝය.
**13** මෙසේ, ඔවුහු රෑ සතක්ද දහවල්
සතක්ද ඔහු සමඟ බිම හිඳගෙන සිටි-
යෝය.[15] ඔහු මහත් වේදනාවකින්[16]
සිටින බව ඔවුන් දුටු නිසා ඔවුන්ගෙන්
එක් කෙනෙක්වත් ඔහුට වචනයක්-
වත් පැවසුවේ නැත.

**1 පරි.**
1 දේශ 5:19, යාකො 1:17
2 1සාමු 2:6, හිතෝ 23:5
3 ගීතා 34:1, ආනි 2:20
4 ද්වි 32:4, රෝම 9:20

**2 පරි.**
5 යෝබ් 1:6
6 යෝබ් 1:7
7 යෝබ් 1:8
8 උත් 6:9
9 නෙහෙ 5:15, හිතෝ 8:13, හිතෝ 16:6
10 ගීතා 34:14, 1තෙස 5:22
11 යෝබ් 9:17
12 යෝබ් 1:11
13 යෝබ් 27:5
14 යෝබ් 1:6
15 යෙරෙ 41:8
16 ලෙවී 24:15, යෝබ් 1:11, එළි 12:10

**2 තීරුව**
1 යෝබ් 1:12
2 නික් 9:9, ලෙවී 13:18, යෝබ් 30:30
3 යෙරෙ 6:26, එස 27:30, යෝනා 3:6, යෝනා 3:8
4 මලා 3:14
5 යෝබ් 1:11
6 යෝබ් 1:21, යාකො 5:10
7 ගීතා 39:1, හිතෝ 12:13, යාකො 5:11
8 උත් 36:34, යෙරෙ 49:7
9 උත් 25:2, 1ලේක 1:32
10 යෝබ් 42:9
11 ආමො 3:3
12 උත් 37:35
13 යෝබ් 1:20
14 නෙහෙ 9:1, විලා 2:10, එස 27:30
15 එස්රා 9:3, යෙසා 3:26
16 යෝබ් 16:6

යෝබ් **2:4*** මූ.අ., “හම වෙනුවට හම.”

යෝබ් **2:11*** ඔහු පැමිණියේ තේමාන් දේශයෙනි. **11#** ඔහු ෂූවාගෙන් පැවතෙන්නෙකි. **11△** ඔහු-
ගේ පෙළපත හෝ ඔහු පදිංචි වී සිටි ස්ථානය හෝ
විය හැකියි.

**3** මෙතෙක් නිහඬව සිටි යෝබ් තම උපන් දවසට ශාප කරමින්[1]
2 මෙසේ කීවේය.
3 “මා උපන් දවස කිසිදා සිහි නොවේවා![2]
‘දරුවෙකු පිළිසිඳගෙන ඇතැයි’ කියූ ඒ රාත්‍රියට ශාප වේවා!
4 ගන අඳුර එම දවස වෙළාගනීවා!
ස්වර්ගයේ සිටින දෙවිගේ මතකයෙන් එය පහ වේවා!
එදින හිරු උදා නොවේවා!
5 අන්ධකාරයේ හා මරණයේ සේයාවන් එම දවස වසාගනු ලැබේවා!
වැහි වලාවක් එය වෙළාගනීවා!
එදින බිය උපදවන ගන අඳුරක් ඇති වේවා![3]
6 එය ගන අඳුර පවතින රාත්‍රියක් වේවා![4]
ඒ දිනය කවදාවත් වසරේ සතුටු වන දිනයක් නොවේවා!
මාසවල දවස් අතරේ එම දිනය නොතිබේවා!
7 එය නිහඬ පාළු රාත්‍රියක් වේවා!
ප්‍රීති නාදයක් එයින් නික්ම නොඒවා![5]
8 ලෙවියාතන්ව*[6] පුබුදු කරන අය ඒ දවසට ශාප කරත්වා!
ඒ දවස ඇඩි සේ හෙළාදකිත්වා!
9 ඒ සන්ධ්‍යාවෙහි පායන තරු නොබැබළේවා!
හිරු උදා වන තුරු නෙත් අයාගෙන සිටින ඒ දවසට හිරු උදා නොවේවා!
අරුණාලෝකය දකින්න නොලැබේවා!
10 මන්ද ඒ දවස, මාව බිහි කළ කුසෙහි දොරගුලු නොවැසුවේය.[7]
මාගේ දෙනෙතින් වේදනාව දකින්න සැලැස්වූවේය.
11 මව්කුස තුළදීම මා මිය නොගියේ මන්ද?[8]
කුසින් නික්ම ආ විගසම මාගේ දිවි කෙළවර නොවූයේ මන්ද?
12 මාව මවගේ ළයට[1] ගත්තේ මන්ද?
ඇගේ උකුළේ තබා මාව නැළෙව්වේ මන්ද?
13 එසේ නොකළා නම් මේ වන විටත් මම සැනසිල්ලේ සැතපෙනු ඇත.[2]
මරණ නින්දෙහි සිටිනු ඇත.[3]
14 විනාශ වූ තැන් යළි ගොඩනැඟුවාවූ[4]
රජවරුන් හා උපදේශකයන් සමඟ මටත් සැතපෙන්න තිබිණ.[5]
15 එසේත් නැත්නම් රිදීවලින් නිවෙස් පුරවාගත් අය සමඟද
රනින් පොහොසත් වූ කුමරුන් සමඟද මට සැතපෙන්න තිබිණ.
16 මව්කුස තුළ රහසින් නැති වී ගිය කලලයක් මෙන්ද[6]
මෙලොව එළිය නොදුටු[7] බිළිඳුන් මෙන්ද මටත් මිය යන්න තිබිණ.
17 මිය ගිය පසු විඩා වූ අය විවේක සුවයෙන් සිටිති.[8]
දුෂ්ටයෝ පවා සන්සුන්ව සිටිති.[9]
18 මිනී වළ සිරකරුවන්ටද සැනසීමේ නිවහනකි.
එහිදී අණ දෙන්නන්ගේ කුරිරු හඬ ඔවුන්ට නොඇසෙයි.[10]
19 එහි ලොකු කුඩා භේදයක් නැත.[11]
වහලාද ස්වාමියාගෙන් නිදහස්ය.
20 දුක් වේදනාවලින් හෙම්බත් වී සිටින අයටත්
ජීවිතයෙන් කිසි සතුටක් නොලබන අයටත්[12] දෙවි ජීවත් වෙන්න ඉඩහරින්නේ* මන්ද?
21 නිධානයක් සේ මරණයෙන් සැනසීම සොයන අයට
එය සම්බ නොවන්නේ මන්ද?[13]

**3 පරි.**
1 යෙරෙ 20:14
2 යෝබ් 10:18 යෙරෙ 15:10 යෙරෙ 20:15
3 ආමො 8:10
4 යෝබ් 10:19
5 යෙසා 24:8
6 යෝබ් 41:1 යෝබ් 41:10 ගීතා 74:14 ගීතා 104:26
7 උත් 29:31 1සාමු 1:5 යෝබ් 10:18
8 යෙරෙ 15:10 යෙරෙ 20:17

**2 තීරුව**
1 ගීතා 22:9 ලූක් 23:29
2 දේශ 9:5 දේශ 9:10
3 යෝබ් 30:23 යොහ 11:11
4 උත් 50:26 යෙසා 22:16 එස 26:20
5 1රාජා 2:10 2ලේක 16:14
6 ගීතා 58:8 දේශ 6:3 හොෂෙ 9:14
7 ගීතා 49:19
8 ගීතා 146:4 දේශ 9:10 යෙසා 57:2
9 ගීතා 9:17
10 නික් 5:6
11 යෝබ් 30:23 ගීතා 49:10 දේශ 3:20 දේශ 8:8 දේශ 9:2
12 1සාමු 1:10 2රාජා 4:27 හිතෝ 31:6
13 ගණන් 11:15 1රාජා 19:4 යෝබ් 7:15 යෝනා 4:3 එළි 9:6

යෝබ් **3:8*** හෝ, “කිඹුලාව.”

යෝබ් **3:20*** මූ.අ., “ආලෝකය ලබා දෙන්නේ.”

22 ඔවුන්ට එය හමු වූවා නම් ඔවුහු
සතුටින් ඉපිල යති.
ප්‍රීතියෙන් උද්දාමයට පත්
වෙති.
23 කිසිවක් කරකියාගත නොහැකිව[1]
අසරණ වී සිටින මිනිසාට
ජීවත් වීමට දෙවි ඉඩහරින්-
නේ මන්ද?
හැම අතින්ම ඔහුව කොටු
කරන්නේ මන්ද?[2]
24 කෑම ඉදිරියේ මම සුසුම් හෙළමි.[3]
මාගේ විලාප හඬ ඇද හැළෙන
දිය ඇල්ලක හඬ මෙනි.[4]
25 යමකට මාගේ සිත සලිත වීද, ඒ
දේම මට සිදු වූයේය.
මා බිය වූ දේම මාව සොයා
ආවේය.[5]
26 මට මාගේ ජීවිතය කිසි කරදර-
යක් නොමැතිව සුවසේ ගත
කරන්න නොලැබුණේය.
මට කිසි සහනයක් නොලැබු-
ණේය. මා පසුපස ලුහුබැඳ
එන්නේ දුක් කරදරමය.”

**4** එවිට තේමාන් දේශයෙන් පැමිණි
එලිෆස්[6] මෙසේ කීය.
2 “යමෙකු ඔබ සමඟ කතා කිරීමට
තරම් නිර්භීත වුවහොත් ඔබ
විඩාවට පත් වෙයිද?
එහෙත් මා කතා නොකර
සිටින්නේ කොහොමද?
3 ඔබ බොහෝදෙනෙකුට දැනමුතු-
කම් දී[7]
දුර්වල අයව ශක්තිමත් කළ
ආකාරය[8] ගැන සිතා
බලන්න.
4 ඔබ වැටෙන්න ගිය අයව දිරිමත්
කර,[9]
වෙවුලන පාද සවිමත් කළෙ-
හිය.[10]
5 නමුත් දැන් ඔබත් ඒ තත්වයටම
වැටී ඇත.
ඔබ බොහෝ සෙයින් හෙම්බත්
වී සිටින්නෙහිය. දුක් පීඩා
දරාගත නොහැකිව නො-
සන්සුන්ව සිටින්නෙහිය.
6 ඔබ දෙවිට ගරුබිය දැක්වූවා නම්
ඔබ තුළ නිසැකකමක් නො-
තිබෙන්නේ මන්ද?
ඔබ දෙවිට විශ්වාසවන්තව[1]
සිටියා නම් හෙට දවස ගැන
ඔබේ සිතෙහි බලාපොරොත්-
තුවක් නොතිබෙනු ඇද්ද?
7 මේ දේ දැන් සිතට ගන්න. නිර්-
දෝෂ මිනිසෙකු කිසිවිටෙක
විනාශ වී ගිය බව ඔබ ඇසු-
වෙහිද?
ප්‍රතිපත්තිගරුක[2] ජීවිතයක්
ගත කළ කෙනෙකු නැති වී
ගිය බව ඔබ කිසිදා අසා
තිබෙනවාද?
8 මාගේ අද්දැකීමට අනුව නම්
අනුන්ට නපුරක් කිරීමට
මාන බලන,
දුෂ්ට දේ කරන අය තමන් වපු-
රන දේම කපාගන්නෝය.[3]
9 දෙවිගේ එක හුස්මකින් ඔවුහු
වැනසී යන්නෝය.
දෙවිගේ උදහසින් ඔවුන්ගේ දිවි
කෙළවර වන්නේය.
10 සිංහයා ගර්ජනා කරයි. තරුණ
සිංහයාගේ හඬ ඇසෙයි.
එහෙත් යම් දවසක තරුණ,
කේශර සිංහයාගේ දත් පවා
බිඳ දමනු ලැබේ.
11 ගොදුරු නොමැතිව සිංහයා මියැ-
දෙයි.
සිංහ ධේනුවගේ පැටව්ද
විසිර යති.
12 යමෙක් රහසින් ඇවිත් මට යමක්
පැවසුවේය.
සිහින් හඬින් පැවසූ රහසක්
මාගේ දෙසවනට වැටිණ.[4]
13 මිනිසුන් රෑ යාමේ නිදි සුව
විඳින විට
නොසන්සුන් කරවන දර්ශන-
යක් මට පෙනිණ.
14 මාගේ මුළු ගතම බියෙන් කිලි-
පොළා ගියේය.
මාගේ ඇටකටු සියල්ලද සලිත
වූයේය.
15 එවිට ස්වර්ගයෙන් පැමිණි දූත-
යෙක් මා ඉදිරියෙන් ගියේය.

**3 පරි.**
1 යෝබ් 19:8
2 යෝබ් 12:14 යෝබ් 19:8 විලා 3:9 හොෂෙ 2:6
3 ගීතා 80:5 ගීතා 102:9
4 ගීතා 22:1 ගීතා 38:8 යෙසා 59:11
5 යෝබ් 31:23

**4 පරි.**
6 යෝබ් 2:11 යෝබ් 42:9
7 ලූක් 17:3
8 ලූක් 22:32
9 හිතෝ 12:18 හිතෝ 16:23 1තෙස 5:14
10 යෙසා 35:3 හෙබ්‍රෙ 12:12

**2 තීරුව**
1 යෝබ් 1:1
2 යෝබ් 2:3 යෝබ් 42:7
3 ගලා 6:7
4 1යොහ 4:1 එළි 16:14

මාගේ සිරුරේ හිරිගඩු පිපුණේය.
16 ඔහු මා ඉදිරියේ නැවතුණේය.
එහෙත් ඔහුව හඳුනාගැනීමට මට නොහැකි විය.
මා ඉදිරියේ අඳුරු ඡායාවක් පෙනිණ.
මොහොතකට සියල්ල නිහඬ විය. ඉන්පසු මෙසේ කියන හඬක් මට ඇසිණ.
17 ‘දූවිලි බඳු මිනිසෙකුට දෙවිට වඩා ධර්මිෂ්ඨ විය හැකිද?
මිනිසෙක් තම සැදුම්කරුට වඩා ශුද්ධ වන්නේ කෙලෙසද?’
18 දෙවි තම සේවකයන්ව විශ්වාස නොකරන්නේය.
ඔහු තම දූතයන්ට* විරුද්ධව දොස් කියන්නේය.
19 එසේනම්, දූවිල්ලේ[1] අත්තිවාරම් දැමූ, මැටි ගෙවල්වල වසන්නාවූ
අය ගැන කුමක් කිව හැකිද?
කාවුන්ටත් වඩා පහසුවෙන් ඔවුන්ව පොඩි කර දැමිය හැකිය.
20 ඔවුන් උදේ සිට සවස් වන තුරුම මැරි මැරී වැටුණත්
කිසිවෙක් එය ගණනකටවත් ගන්නේ නැත. ඔවුහු සදහටම මෙලොවින් සමුගනිති.
21 කූඩාරමක ලණු බුරුල් කළ විගස එය හැකිළී යන්නාක් මෙන් ඔවුහු මිය යති.
ප්‍රඥාව නොමැති නිසා ඔවුහු තම අවසන් ගමන් යති.

**5** “ඔබට පිළිතුරු දෙන්න කිසිවෙකු සිටින්නේ නම් උපකාර පතා අයැදින්න.
දෙවිගේ ශුද්ධ දූතයන්* අතරින් ඔබ හැරෙන්නේ කා වෙතටද?
2 අඥානයාගේ කිපෙනසුලු ගතිය ඔහුගේම විනාශයට මුලපුරයි.
අන්‍යයන්ට ඊර්ෂ්‍යා කිරීමට පෙලඹෙන තැනැත්තා ඔහුගේම විනාශයට අත වනයි.
3 අඥානයා සුරක්ෂිතව ජීවත් වන හැටි මම දුටිමි.[1]
නමුත් නොසිතූ මොහොතක ඔහුගේ නිවහන පිටට ශාපයක් පැමිණියේය.
4 ඔහුගේ දරුවන්ව මුදවාගන්න කිසිවෙක් නැත.[2]
නුවර දොරටුව අසලදී ඔවුන්ව පාගා දමන ලදි. ඔවුන්ව ගලවාගන්න කිසිවෙක් නැත.
5 ඔහු වගා කරන දේ කුසගින්නෙන් පෙළෙන අය කා දමති.
වෙනත් අය ඇවිත් කෑමට ඇති ඔහුගේ මස් ටික පවා ඩැහැගනිති.
ජීවිකාව රැකුමට ඔහු සතු සියල්ල කූටයන්ගේ අතට හසු වෙයි.
6 දුක් කරදර භූමියෙන් හට නොගනියි.
විපත්ති ඉබේම මිහිතලයෙන් මතු නොවෙයි.
7 ගිනිමැළයකින් ගිනිපුපුරු නැඟෙන්නාක් මෙන්
මෙලොව එළිය දකින මිනිසාටද දුක් කරදර ඇති වීම නියතය.
8 එහෙත් මම දෙවිගෙන් පිහිට පතා මාගේ කාරණය ඔහුට භාර දෙන්නෙමි.[3]
9 දෙවිගේ විස්මිත ක්‍රියා කිසිවෙකුට සොයා තේරුම්ගත නොහැකිය.
ඔහුගේ පුදුම දනවන ක්‍රියා ගණන් කරන්නවත් බැරිය.[4]
10 පොළොව පිට වැසි වස්සවා[5]
කෙත්වතු සාරවත් කරන්නෙත් දෙවිය.[6]
11 ඔහු යටහත් අයව උසස් කරන්නේය.[7]
දුකින් සිටින්නාව ගලවාගන්නේය.

**4 පරි.**
1 උත් 3:19

**2 තිරුව**

**5 පරි.**
1 ගීතා 37:35
2 ගීතා 109:13; ගීතා 119:155
3 ලූක් 18:11
4 ගීතා 40:5; ගීතා 72:18; රෝම 11:33
5 යෝබ් 26:8; ගීතා 147:8; ක්‍රියා 14:17
6 ගීතා 65:9
7 ලූක් 1:52

**යෝබ් 4:18*** හෝ, “පණිවිඩකරුවන්ට.”
**5:1*** හෝ, “ශුද්ධ තැනැත්තන්.”

12 දෙවි කූට තැනැත්තාගේ උපායන් පෙරළා දමයි.[1]
ඔහුගේ සැලසුම් සියල්ල කඩාකප්පල් කරයි.
13 දෙවි කපටි උපා යොදන ප්‍රඥාවන්තයන්ව ඔවුන් ඇටවූ උගුලටම ඇද දමයි.[2]
ඔවුන් දුන් උපදෙස් සියල්ල කණපිට පෙරළෙයි.[3]
14 දවාල ඔවුන්ට ඝන අඳුරකි.
රෑ යාමයේදී මෙන් මධ්‍යාහ්නයේත් ඔවුහු අත පත ගාමින් ඇවිදිති.[4]
15 දෙවි පීඩා කරන්නාගේ මුඛයෙන් නික්මෙන කඩුවෙන් අසරණයාව ගලවයි.
දුප්පතාව බලවතුන්ගේ අතින් මුදාගනියි.[5]
16 අසරණයාට බලාපොරොත්තුවක් තිබෙන්නේ ඒ නිසාය.[6]
එනමුත් අධර්මිෂ්ඨයන්ගේ කට වැසී යන්නේය.[7]
17 දෙවිගෙන් අවවාද ලබන මිනිසා සන්තෝෂවත්ය.[8]
එහෙයින් සියලු බලැති තැනැත්තා දෙන හික්මවීමට පිටු නොපාන්න.
18 දෙවි තුවාල ඇති කරන්නේය. එහෙත් ඒ තුවාල බඳින්නෙත් ඔහුමය.
ඔහු සියල්ල බිඳ දමන්නේය. එහෙත් සුවය ගෙන දෙන්නෙත් ඔහුමය.
19 ඔබ හය වරක් පීඩා වින්දත් දෙවි ඔබව ගලවයි.[9]
පීඩා සතක් පැමිණියත් ඔබට කිසිදු හානියක් සිදු නොවෙයි.[10]
20 සාගත කාලයේදී දෙවි ඔබව මරණයෙන් මුදන්නේය.[11]
යුධ සමයේදී ඔහු ඔබව කඩුවෙන් බේරාගන්නේය.
21 කසයක් මෙන් පහර දෙන දුෂ්ටයන්ගේ දිව්වලින් ඔබව ආරක්ෂා කරනු ඇත.[12]
විනාශය අද්දර ඔබට බිය වන්න හේතුවක් නැත.
22 කොල්ලකරුවන් ඉදිරියේදීත් සාගත කාලයේදීත් ඔබ සිනාසෙනු ඇත.
වනයේ සැරිසරන සතුන්ට ඔබ බිය විය යුතු නැත.
23 කෙතෙහි ගල්වලින් ඔබට කිසි අනතුරක් සිදු වන්නේ නැත.
වනසතුන්ගෙන්ද ඔබට හිරිහැරයක් නැත.[1]
24 ඔබ සමාදානයෙන් ඔබේ කූඩාරමේ වසන්නෙහිය.
ඔබේ සත්ව රැළේ එකෙකුටවත් හානියක් සිදු වී නැති බව ඔබ දකින්නෙහිය.
25 ඔබේ දරු පරම්පරාව බොහෝ සෙයින් වර්ධනය වෙයි.[2]
තණකොළ මෙන් ඔබේ දරු මුනුපුරන් පොළොව පුරා පැතිර යයි.[3]
26 ධාන්‍ය කරල් නෙළාගන්නේ ඒවා පැසෙන්න කලිනි.
එසේම, ඔබ මිය යන තුරුත් ඔබේ සවිශක්තිය හීන නොවනු ඇත.[4]
27 අපි මේ සියල්ල සොයා බලා සත්‍යයක් බව අද්දුටුවෙමු.
ඔබත් එය අසා සිතට ගන්න උත්සාහ කරන්න.”

**6** එවිට යෝබ් මෙසේ කීවේය.
2 “මාගේ වේදනාව[5] කිරා,
මා මුහුණ දෙන සියලු විපත් තරාදියක දමා මැන බැලීමට හැකි නම්, ඒවා මොන තරම්ද කියා ඔබට වැටහෙනු ඇත.
3 ඒවා සාගරයේ වැලිවලටත් වඩා බරින් අධිකය.
එසේනම්, වියරු වැටුණු කෙනෙකු මෙන් මා කතා කිරීම පුදුමයක්ද?[6]
4 සියලු බලැති දෙවිගේ ඊගස් මාගේ ශරීරය පසාරු කරගෙන ගියේය.[7]
එහි විෂ මාගේ ශරීරය පුරාම දිව යයි.[8]
සිත සලිත කරවන සෑම විප-

**5 පරි.**
1 නෙහෙ 4:15
2 1කොරි 3:19
3 ගීතා 9:15
4 යෝබ් 12:25 හිතෝ 4:19
5 ගීතා 35:10
6 1සාමු 2:8
7 ගීතා 107:42
8 ගීතා 94:12
9 ගීතා 34:19
10 හිතෝ 24:16
11 උත් 45:7
12 හිතෝ 12:18 යාකො 3:8

**2 තීරුව**
1 ලෙවී 26:6
2 ගීතා 112:2
3 ගීතා 72:16
4 ද්වි 34:7

**6 පරි.**
5 ගීතා 31:9
6 යාකො 3:2
7 ගීතා 38:2
8 හිතෝ 18:14

තක්ම දෙවි මට විරුද්ධව
ගෙනාවේය.[1]
5 තණකොළ තිබෙන තැනක සිබ්‍රා-
වුන්[2] බෙරිහන් දෙයිද?
ගවයෙකු කෑම තිබියදී කෑගස-
යිද?
6 රස නැති දේ ලුණු නැතුව කයිද?
බිත්තර සුදු මදයේ කිසි රසයක්
තිබේද?
7 කිසි රසයක් නැති එවැනි කෑම
කන්න මම කොහෙත්ම
කැමති නොවුණෙමි.
ඒවා දැකීම පවා මට පිළි-
කුලකි.*
8 අනේ, මා ඉල්ලූ දේ මට ලැබු-
ණේ නම්,
දෙවි මාගේ පැතුම ඉටු කර දේ
නම්, එය මොන තරම් සහ-
නයක්ද!
9 දෙවි මාව පොඩි කර දමා,
ඔහුගේ අත ඉවතට ගෙන මාගේ
ජීවිතය නැති කර දමන්නේ
නම් එය කොතරම් හොඳද![3]
10 එය මට සැනසිල්ලක් වනු ඇත.
සිත් වේදනාවෙන් මිරිකී සිටි-
යත් මම ප්‍රීතියෙන්[4] ඉපිල
යන්නෙමි.
මන්ද ශුද්ධ තැනැත්තාණන්[5]
මට අනුකම්පා නොකළත්
මම ඔහුගේ වචනය සියල්-
ලන්ට පැවසුවෙමි. මම කිසි-
වක් සැඟෙව්වේ නැත.[6]
11 දුක දරාගෙන සිටින්න මට තවත්
ශක්තිය නැත.[7]
මට කිසි බලාපොරොත්තුවක්ද
නැත. එසේනම්, මා තවත්
ජීවත් වීමෙන් පලක් තිබේද?
12 ගල් වැනි වූ සවියක් මට තිබේද?
මාගේ ශරීරය තඹ මෙන් ශක්ති-
මත්ද?
13 මට දැන් සිතේ සවියද
කිසිවක් සාර්ථකව කරගැනීමට
හැකියාවද නැත.

යෝබ් **6:7*** සමහරවිට යෝබ් මෙහි කතා කරන්නේ තමා විඳින දුක් පීඩා ගැන හෝ තම මිතුරන්ගේ උපදෙස් ගැන හෝ විය හැකියි.

**6 පරි.**
1 ගීතා 88:16
2 යෝබ් 24:5
යෙරෙ 14:6
3 ගණන් 11:15
1රාජා 19:4
යෝබ් 3:21
යෝනා 4:3
4 යෝබ් 3:22
5 ලෙවී 19:2
හොෂෙ 11:9
1පේතෘ 1:15
6 ගීතා 40:9
ක්‍රියා 20:27
7 යෝබ් 7:7
ගීතා 103:15

**2 තීරුව**
1 හිතෝ 3:3
හිතෝ 19:22
හොෂෙ 6:6
සෙක 7:9
මතෙ 25:44
2 යෝබ් 23:16
1යොහ 3:17
3 යෝබ් 19:19
ගීතා 38:11
4 යූද් 12
5 යෝබ් 24:19
6 යෙසා 21:14
යෙරෙ 25:23
7 යෝබ් 1:15
8 යෙරෙ 14:3
9 යෝබ් 13:4
10 ගීතා 38:11
11 උත් 14:16
12 2සාමු 4:9
ගීතා 55:18
13 යෝබ් 32:11

14 යමෙකු තම සහෝදරයාට ප්‍රේම*
නොකරන්නේ නම්[1]
ඔහු සියලු බලැති දෙවිට ගරු-
බිය දක්වයිද?[2]
15 මාගේ සහෝදරයෝ මට ද්‍රෝහිව
කටයුතු කළෝය.[3]
ඔවුන්, ශීත කාලයේදී ගලා බැස
සැණෙකින් වියළී යන දිය
පහරක් වැනිය.
16 දිය වී යන මිදුණු ජලයෙන්ද හිම-
වලින්ද
දිය දහරා පිරී ඉතිරී යන්නේය.
17 ගිම්හානයේදී ඒවා නොපෙනී යන්-
නේය.[4]
ඉඩෝරයේදී වියළී යන්නේය.[5]
18 ඒවාට ස්ථිර ගමන් මඟක් නො-
මැත.
අවසානයේදී ඒවා වියළි බිමක්
කරා ගොස් අතුරුදහන්
වී යයි.
19 තේමාහි[6] තවලම්කරුවෝ එහි
වතුර සෙව්වෝය.
සෙබාහි[7] වෙළෙන්දෝ එහි
වතුර ගැන බලාපොරොත්-
තුවෙන් සිටියෝය.
20 නමුත් ඔවුහු ලැජ්ජාවට පත් වූහ.
එම ස්ථානයට පැමිණි විට
ඔවුන්ගේ බලාපොරොත්තු
සුන් විය.[8]
21 ඔබ ගැනත් කීමට ඇත්තේ ඒ දේ-
මය.[9]
මට සිදු වූ විපත දැක ඔබ
බියෙන් වෙවුලන්නහුය.[10]
22 මා ඔබෙන් කිසිවක් ඉල්ලුවාද?
ඔබේ බලය හෝ ධනය හෝ
යොදා මාව ගලවාගන්න
කියා මා ඔබෙන් ඉල්ලුවාද?
23 මාගේ සතුරාගේ අතින් මා බේරා-
ගන්න කියාවත්[11]
කුරිරු මිනිසුන් අතින් මාව මුදා-
වාගන්න කියාවත් මා ඔබට
පැවසුවාද?[12]
24 මට උගන්වන්න. මම නිහඬව
ඔබට සවන් දෙන්නෙමි.[13]

යෝබ් **6:14*** හෝ, “ළැදි ප්‍රේමය.”

මා කළ වරද කුමක්ද කියා මට
කියා දෙන්න.[1]
25 අවංක වචන හදවතට මෙතරම්
රිදුම් දෙයිද?[2]
ඔබ මට තරවටු කරන්නේ කුම-
කටද?[3]
26 බලාපොරොත්තු සුන් වූ අයෙකු-
ගේ වචන[4] සුළඟ හා සමා-
නයි[5] කියා ඔබ දන්නේ
නැද්ද?
එසේනම් මා පවසන දේ ඔබ
විවේචනයට ලක් කරන්නේ
මන්ද?
27 ඔබ ආදු දමා පියා නැත්තාව[6]
අයිති කරගන්නේ නම්
එසේම, ඔබේ මිතුරාව පවා
විකුණා කන්නේ නම් එය
මට පුදුමයක් නොවෙයි.[7]
28 මොහොතකට මට සවන් දෙන්න.
මා ඔබේ මුහුණ බලාගෙන
බොරු[8] කියයිද?
29 ඔබ කියූ දේ ගැන නැවත සිතා
බලන්න.
අයුක්තියක් සිදු නොවේවා! මා
ධර්මිෂ්ඨ කෙනෙකු බව තේ-
රුම්ගන්න.[9]
30 මා අධර්මිෂ්ඨ ලෙස කතා කරනවා
කියා ඔබ සිතනවාද?
මාගේ විපතට හේතුව තේ-
රුම්ගැනීමට මට හැකියාව
නැද්ද?

7 “මිහිපිට වෙසෙන මිනිසාට නියම
කර ඇත්තේ ඉතා කටුක
ජීවිතයකි.[10]
එය කුලීකරුවෙකුගේ ජීවිතය
මෙන් වෙහෙසකරය.[11]
2 වහලෙකු විවේක ගැනීමට සෙව-
ණක් ලැබෙන තුරු මහත්
ආශාවෙන් බලා සිටින්නාක්
මෙන්ද[12]
කුලීකරුවෙකු තම කුලිය
ලැබෙන තුරු නොඉව-
සිල්ලෙන් බලා සිටින්නාක්
මෙන්ද[13] මම බලා සිටිමි.
3 මාසයක් මාසයක් පාසා මම
කිසි පලක් නොමැතිව බලා
සිටිමි.[1]
සෑම රාත්‍රියක්ම ගෙවී යන්නේ
ශෝකයෙනි.[2]
4 යහනේ සැතපෙන විට, ‘නැඟිටින්-
නේ කොයි වෙලේද’[3] කියා
මම කල්පනා කරමි.
රාත්‍රිය දිගුය. පහන් වන තුරු
මට ඉවසුම් නැත.
5 පණුවෝ මාගේ ශරීරය වසාගෙන
සිටිති.[4] දූවිල්ල[5] මාගේ තුවා-
ලවල තැවරී ඇත.
මාගේ වණවලින් සැරව ගලයි.[6]
6 රෙදි වියන උපකරණයක වේගය
මෙන් මාගේ ජීවිතයේ දවස්ද
වේගයෙන් ගෙවී යයි.[7]
කිසි බලාපොරොත්තුවක් නො-
මැතිව[8] මාගේ ජීවිතය අව-
සන් වෙයි.
7 ‘දෙවියනි, මාගේ ජීවිතය සුළඟක්
මෙන් අවසන් වන බව සිහි
කරන්න.[9]
මාගේ ඇස්වලින් මම නැවත
කිසිදා යහපත නොදකින්-
නෙමි.
8 කිසිවෙක් නැවත කිසිදා මාව
නොදකිනු ඇත.
ඔබ මාව සෙව්වත් මාව සම්බ
වන්නේ නැත.[10]
9 වලාකුළ නැති වී නොපෙනී යයි.
එලෙසම මිනී වළට යන
තැනැත්තා නැවත පිටතට
නොඑයි.[11]
10 ඔහු තම නිවසට ආපසු හැරී එන්-
නේ නැත.
ඔහුගේ වාසස්ථානය ඔහුව
නැවත හඳුනාගන්නේද
නැත.[12]
11 මා කෙසේ කට වසාගෙන සිටින්-
නද?
මාගේ සිතේ දුකට මම කතා
කරන්නෙමි.
දරාගත නොහැකි වේදනාවෙන්
විලාප නඟන්නෙමි![13]
12 ඔබ මා රැකවල්[14] කරන්නේ
මන්ද?

6 පරි.
1 ගීතා 19:12 ගීතා 19:13 හිතෝ 19:25
2 හිතෝ 12:18 හිතෝ 25:11
3 යෝබ් 16:3 යෝබ් 21:34
4 යෝබ් 10:1
5 යෝබ් 8:2
6 යෝබ් 31:21 මලා 3:5
7 උත් 37:28
8 යෝබ් 27:4
9 යෝබ් 17:10

7 පරි.
10 යෝබ් 14:14
11 යෝබ් 14:6 ගීතා 39:4
12 යෙසා 25:5
13 ලෙවී 19:13 ද්වි 24:15

2 තීරුව
1 යෝබ් 29:2
2 ගීතා 6:6
3 යෝබ් 2:8 යෝබ් 30:17
4 යෙසා 14:11
5 යෝබ් 30:19
6 යෝබ් 30:30
7 ගීතා 102:11 ගීතා 103:15 ගීතා 144:4 යාකො 4:14
8 යෝබ් 17:15 රෝම 8:20
9 ගීතා 89:47 දේශ 2:11
10 යෝබ් 7:21 යාකො 4:14
11 යෝබ් 10:21 යෝබ් 14:12 ගීතා 78:39 දේශ 9:10
12 ගීතා 103:16 ගීතා 146:4 දේශ 9:5
13 1සාමු 1:10 යෝබ් 10:1 හිතෝ 14:10
14 යෝබ් 38:8

මා මහ මුහුදද? එසේත් නැත-
හොත් මා මුහුදේ සැරිසරන
දැවැන්තයෙක්ද?
13 "මාගේ යහන මට සැනසිල්ල ලබා
දෙයි.
මා යහනෙහි සැතපුණොත්
මාගේ ශෝකය දුරු වෙයි"
කියා මම සිතුවෙමි.
14 නමුත් ඔබ මාගේ සිත සිහිනවලින්
සලිත කළෙහිය.
රුදුරු දර්ශනවලින් මාව බිය-
ගැන්වූවෙහිය.
15 මා ජීවත් වෙනවාට වඩා හුස්ම හිර
වී මාගේ දිවි කෙළවර වෙ-
නවා නම් හොඳය.
මාගේ වැහැරුණු ශරීරය දෙස
බලා සිටිනවාට වඩා මා මිය
ගියා නම් එය මට යහප-
තකි.[1]
16 මට ජීවිතය තිත්ත වී ඇත.[2]
සැමදා ජීවත් වෙන්න මා තුළ
කිසි ආශාවක් නැත.
මට නිදහසේ ඉන්න ඉඩහ-
රින්න. මන්ද මාගේ දවස්
සුළං රොදක් මෙන් විගස
පහව යයි.[3]
17 ඔබ මිනිසාව කුඩා කාලයේ සිටම
උස් මහත් කර,
ඔහු කෙරෙහි ඔබේ අවධානය
යොමු කර සිටින්න තරම්
ඔහු කවුද?[4]
18 උදයක් උදයක් පාසා ඔබ ඔහු
දෙස නෙත් යොමා,
සැම මොහොතකම ඔහුගේ
ක්‍රියා සෝදිසි කර බලන්නේ
මන්ද?[5]
19 ඔබේ මුහුණ මාගෙන් ඉවතට
හරවා නොගන්නේ මන්ද?[6]
සුළු මොහොතකට හෝ මා-
ගෙන් ඈත්ව නොසිටින්නේ
මන්ද?
20 මිනිසා දෙස නෙත් යොමා
සිටින තැනැත්තාණෙනි,[7]
මා ඔබට විරුද්ධව වරදක්
කළත් එයින් ඔබට හානියක්
කරන්න මට හැකිද?
ඔබ මාවම ඉලක්ක කරගෙන
සිටින්නේ මන්ද? මා ඔබට
බරක් විය යුත්තේ මන්ද?
21 මම සුළු මොහොතකින් දූවිල්ලට[1]
හැරී යන්නෙමි.
ඔබ මා සෙව්වද මාව සම්බ
නොවෙයි.
ඔබ ඒ ගැනවත් සිතා මාගේ පව්-
වලට සමාව නොදෙන්නේ
මන්ද?[2]
මා කළ වැරදි අමතක නොක-
රන්නේ මන්ද?' "

8 එවිට ෂූහිය[3] බිල්දද් මෙසේ
කීවේය.
2 "ඔබ කොපමණ කල් මෙලෙස
කතා කරන්නෙහිද?[4]
ඔබේ කියුම් නිකම්ම නිකම්
සැඩ සුළඟක් වැනිය.[5]
3 දෙවි කවදා හෝ අයුක්තියක් කර
තිබේද?[6]
සියලු බලැති දෙවි අධර්මිෂ්-
ඨකමක් කළේ කවදාද?[7]
4 ඔබේ දරුවන් අතින් දෙවිට විරුද්-
ධව වරදක් සිදු වූවා නම්
ඔවුන් කළ වරදට ඔහු නිසි
දඬුවම් නොදී සිටීද?
5 ඔබ සියලු බලැති දෙවිව සොයා,[8]
ඔහුගෙන් කරුණාව අයැදින්-
නේ නම්,
6 ඔබ නිර්දෝෂ හා අවංක[9] ජීවිත-
යක් ගත කරන්නේ නම්,
මේ වන විටත් ඔබට පිහිට වීමට
දෙවි පියවර ගන්නේ නැද්ද?
ධර්මිෂ්ඨකමින් ගොඩනැඟූ
ඔබේ නිවසට ඔහු නැවත
ආශීර්වාද කරන්නේ නැද්ද?
7 පටන්ගැන්මේදී ඔබ සුළු තැනැත්-
තෙකුව සිටියත් අවසාන-
යේදී
ඔබ ශ්‍රේෂ්ඨයෙකු වනු ඇත.[10]
8 ඔබට වඩා අද්දැකීම් ඇති වැඩි-
හිටි පරම්පරාවන්ගෙන් මේ
ගැන අසන්න.[11]
ඔවුන්ගේ පියවරුන් සොයා
දැනගත් දේවල් විමසා
බලන්න.[12]

**7 පරි.**
1 යෝබ් 3:21 එළි 9:6
2 උත් 27:46 1රාජා 19:4 යෝබ් 10:1 යෝනා 4:3
3 ගීතා 62:9 ගීතා 144:4 දේශ 6:11
4 ගීතා 8:4 ගීතා 103:15 ගීතා 144:3 හෙබ්‍රෙ 2:6
5 ද්වි 13:3 යෝබ් 23:10 ගීතා 7:9
6 යෝබ් 14:6
7 යෝබ් 34:21 හිතෝ 5:21 යෙරෙ 16:17 හෙබ්‍රෙ 4:13 1පේතෘ 3:12

**2 තීරුව**
1 උත් 3:19 ගීතා 104:29 දේශ 12:7 දානි 12:2
2 යෙසා 33:24

**8 පරි.**
3 උත් 25:2 1ලේක 1:32 යෝබ් 42:9
4 යෝබ් 11:3
5 යෝබ් 6:26
6 උත් 18:25 යෝබ් 34:12
7 ද්වි 32:4 2ලේක 19:7
8 යෝබ් 5:8 යෝබ් 11:13 යෝබ් 22:23
9 යෝබ් 1:8 යෝබ් 6:24
10 යෝබ් 42:12
11 යෝබ් 11:17 ගීතා 39:5
12 යෝබ් 15:18

9 මන්ද අප අලුත උපන් බිළිඳුන්
මෙනි.[1] අප දන්නා දේ ඉතා
අල්පය.
අපේ ජීවිතයත් සෙවණැල්ලක්
මෙන් නැති වී යන්නේය.[2]
10 ඔවුහු ඔබට දැනමුතුකම් දෙන්-
නෝය.
ඔවුහු හොඳ අවබෝධයකින්
ඔබට උපදෙස් දෙන්නෝය.
11 පැපිරස් ගසක්[3] කවදා හෝ වියළි
බිමක සරුවට වැඩෙයිද?
බට පඳුරු දිය නැති තැනක
උසට වැඩෙයිද?
12 ඒවා දලු ලා වැඩෙන්නත් කලින්
මැලවී යන්නේය.
වෙනත් ගස් වැල්වලට වඩා වේ-
ගයෙන් වියළී යන්නේය.[4]
13 දෙවිව අමතක කරන තැනැත්තා-
ගේ ජීවිත ගමනත් ඒ හා
සමානය.[5]
දෙවිට ද්‍රෝහිව කටයුතු කරන
තැනැත්තාගේ බලාපො-
රොත්තුද එලෙසින්ම සුන් වී
යයි.[6]
14 ඔහු විශ්වාසය තබන්නේ නැති වී
යන දෙයක් කෙරෙහිය.
ඔහු රඳා සිටින්නේ මකුළු
දැලක්[7] මතය.
15 ඔහු ඒ මත හේත්තු වුවහොත් එය
කැඩී යන්නේය.
එය තදින් අල්ලාගෙන සිටි-
යොත් එය වැඩි කල් නොප-
වතින්නේය.
16 ඔහු හිරු එළියේ පෝෂණය ලබ-
මින් සරුවට වැඩෙන ගසක්
මෙනි.
ඔහු උයන පුරාම අතු විහිදුව-
මින් සරුවට වැඩෙන්නේය.[8]
17 එහෙත් ඔහුගේ මුල් දුවන්නේ ගල්
මතය.
ඔහුගේ නිවස ගල් ගොඩකි.
18 යමෙකු ඔහුව උදුරා දැමුවොත්[9]
ඔහු සිටි ස්ථානය කතා කොට,
'මම ඔබව හඳුනන්නේ
නැත'[10] කියා පවසනු ඇත.
19 ඔහුගේ ජීවිතයේ අවසානය එයයි.[1]
ඒ ස්ථානයෙන් වෙනත් පැළැටි
හටගනු ඇත.
20 දෙවි කිසිදා නිදොස් අයව ප්‍රතික්-
ෂේප නොකරන්නේය.
එමෙන්ම ඔහු දුෂ්ටයන්ට කිසිවි-
ටෙක අත නොදෙන්නේය.
21 දෙවි ඔබේ මුහුණ සිනහවෙන් සර-
සන්නේය.
ඔබේ දෙතොල් සතුටු ගී නාද-
යෙන් පුරවන්නේය.
22 ඔබට වෛර කරන්නෝ ලැජ්ජාවට
පත් වනු ඇත.[2]
දුෂ්ටයන්ගේ වාසස්ථාන විනාශ
වී යනු ඇත."

## 9

එවිට යෝබ් පිළිතුරු දෙමින්
මෙසේ කිවේය.
2 "ඔබ කියූ කාරණය සත්‍යය බව
මම දනිමි.
මිනිසා දෙවිට වඩා ධර්මිෂ්ඨ
වන්නේ කෙලෙසද?[3]
3 මිනිසා දෙවි සමඟ විවාදයකට
යන්නේ නම්[4]
දෙවි අසන ප්‍රශ්න දහසකින්
එකකටවත් පිළිතුරු දීමට
ඔහුට නොහැකිය.
4 මන්ද දෙවි ප්‍රඥාවන්තය. බල-
යෙන් අතිමහත්ය.[5]
ඔහුට පිටු පා සාර්ථක වූ දක්ෂයා
කවරෙකුද?[6]
5 දෙවි තම ඇවෙන කෝපයෙන්[7]
කඳු පෙරළයි.
ඔහු කඳු පහ කර දමන්නේ[8]
කිසිවෙකුට නොදැනෙන
සේය.
6 ඔහු පොළොව සොලවයි.
එහි කණු[9] දෙදරුම් කයි.
7 ඔහු, 'එළිය නොදෙන්න' කියා
හිරුට අණ කරන්නේය.
තාරකාවන් මුද්‍රාවකින් වසා
දමන්නේය.[10]
8 අහස්තලය තනිවම දිගහැරියේ
ඔහුය.[11]
මුහුදේ ඇවැන්ත රළ[12] පහර
මත පා තබන්නෙත් ඔහුය.

**8 පරි.**
1 උත් 47:9
2 1ලේක 29:15 යෝබ් 14:1 ගීතා 144:4
3 නික් 2:3 යෙසා 18:2 යෙසා 35:7
4 ගීතා 129:6
5 යෝබ් 42:7 ගීතා 9:17
6 යෝබ් 27:8
7 යෙසා 59:5
8 යෝබ් 5:3 ගීතා 37:35
9 යෝබ් 7:10
10 යෝබ් 20:9

**2 තීරුව**
1 යෝබ් 20:5
2 ගීතා 35:26

**9 පරි.**
3 ද්වි 32:4 ගීතා 143:2 රෝම 3:23
4 යෝබ් 40:2 රෝම 9:20
5 යෝබ් 36:5 ගීතා 104:24 යෙසා 40:26 ආනි 2:20
6 හිතෝ 14:16 හිතෝ 28:14 යෙසා 30:1 ආනි 5:20 සෙක 7:12 රෝම 2:5 1කොරි 10:22
7 යෙරෙ 10:10 හබ 3:6
8 යෝබ් 28:9
9 ගීතා 75:3
10 උත් 1:16 එස 32:7
11 උත් 1:1 ගීතා 33:6 යෙසා 44:24
12 යෝබ් 38:11

9 ඇෂ්, කේසිල් සහ කයිමා* යන
තාරකා මණ්ඩලද[1]
දකුණු දිග තාරකා මණ්ඩලයද#
තැනුවේ ඔහුය.
10 ඔහු කිසිවෙකුට සොයා තේරුම්-
ගත නොහැකි මවිතකර දේ
කරන්නේය.[2]
ඔහුගේ පුදුම දනවන ක්‍රියා
ගණන් කරන්නවත් බැරි
තරම්ය.[3]
11 ඔහු මා අසලින් ගියත් මාගේ දැසට
ඔහුව නොපෙනෙයි.
ඔහු මා පසු කර ගියත් මම ඔහුව
හඳුනා නොගන්නෙමි.[4]
12 ඔහු යමක් උදුරාගන්නේ නම් එය
වැළැක්විය හැක්කේ කාටද?
'ඔබ කුමක් කරන්නෙහිද' කියා
කිසිවෙකුට ඔහුගෙන් ඇසිය
හැකිද?[5]
13 දුෂ්ටයන්ව පහතට හෙළන තුරු
ඔහුගේ උදහස[6] පහ නො-
වෙයි.
පීඩා කරන්නාට[7] අතහිත දෙන
අය දෙවිගේ පාමුල වැටෙති.
14 එසේනම්, මා දෙවිට පිළිතුරු දෙන
විට මා කොතරම් පරෙස්ස-
මෙන් මාගේ වචන හැසිරවිය
යුතුද?
මම ඔහු සමඟ කතා කිරීමට
පෙර හොඳින් සිතා බලන්-
නෙමි.[8]
15 මම නිවැරදි වුවත් ඔහු ඉදිරියේ
කට නාරින්නෙමි.[9]
මට චෝදනා කරන්නාගෙන්
මම කරුණාව අයැදිමි.[10]
16 මා ඔහුට හඬගැසුවත් ඔහු මට
පිළිතුරු දෙයිද?[11]
ඔහු මාගේ හඬ අසයි කියා විශ්-
වාස කළ හැකිද?
17 දෙවි සැඩ කුණාටුවකින් මට පහර
දෙන්නේය.
ඔහු නිකරුණේ මට බොහෝ
තුවාල ඇති කරන්නේය.[1]
18 ඔහු මට හුස්ම[2] ගන්නවත් ඉඩ
නොදෙන්නේය.
මාගේ ජීවිතය එපා වන තරම-
ටම කටුක අද්දැකීම්වලට
මුහුණ දීමට ඔහු මට සැලැස්-
වූවේය.
19 දෙවිට වඩා බලවත් කෙනෙක්
සිටීද?[3]
ඔහුට වඩා යුක්තිසහගත කෙ-
නෙක් සිටීද? එසේනම්
ඔහු ඉදිරියට මාව කැඳවනු
ලැබේවා!
20 මා කිසි වරදක් නොකළද මා දුෂ්-
ටයෙකු බව මාගේම මුඛය
මට විරුද්ධව චෝදනා කරනු
ඇත.
මා නිදොස් වුවද දෙවි මා වරද-
කරුවෙකු බව ප්‍රකාශ කරනු
ඇත.
21 මා නිදොස් වුවද ජීවත් වීමෙන්
පලක් නැත.
මට ජීවිතය තිත්ත වී ඇත.
22 එක් දෙයක් නම් පැහැදිලිය.
කෙනෙකු නිදොස් වුවත් දුෂ්ට
වුවත් එහි කිසි වෙනසක්
නැත. දෙවි ඒ දෙපිරිසම
විනාශ කරන්නේය.[4]
23 නොසිතූ මොහොතක ජලගැල්-
මක් ඇති වී මිනිස් ජීවිත
උදුරාගෙන, නිදොස් අයව
අසරණ කරන්නේ නම්
දෙවි ඒ දෙස බලා සිනාසෙනු
ඇත.
24 පොළොව දුෂ්ටයාගේ අතට භාර දී
තිබේ.[5]
දෙවි විනිසුරුවන්ගේ ඇස් වසා
ඇත.
එසේ කළ හැක්කේ ඔහුට මිස
වෙන කවරෙකුටද?
25 මාගේ ජීවිතයේ දවස්, වේගයෙන්
දුවන ධාවකයෙකුටත් වඩා
ශීඝ්‍රයෙන් ගෙවී යන්නේය.[6]
කිසිදු යහපතක් නොදැක මාගේ
ජීවිතය ගෙවී යන්නේය.

**9 පරි.**
1 යෝබ් 38:31 ආමෝ 5:8
2 යෝබ් 5:9 යෙසා 40:28 රෝම 11:33
3 ගීතා 40:5
4 යෝබ් 23:8 යොහ 1:18
5 දානි 4:35 රෝම 9:20
6 ද්වි 32:22 යෙරෙ 17:4
7 යෝබ් 26:12 යෙසා 51:9
8 ගීතා 19:14
9 යෝබ් 10:15
10 මතෙ 5:25 ලූක් 12:58
11 ගීතා 102:17 හිතෝ 15:29

**2 තීරුව**
1 යෝබ් 2:3 යෝබ් 34:6
2 යෝබ් 27:3
3 යෙසා 40:28
4 දේශ 9:2
5 1යොහ 5:19
6 යෝබ් 7:6 ගීතා 90:10 යාකො 4:14

**යෝබ් 9:9*** හෙබ්‍රෙව් බසින්, ඇෂ්, කේසිල් සහ කයිමා ලෙස යොමු දැක්වූයේ මහවලසා, මුවසිරස සහ හත්දින්නත් යන තාරකා මණ්ඩලවලට විය හැකියි. **9#** මූ.අ., "දකුණේ ගබඩා කාමර."

**26** වේගයෙන් යාත්‍රා කරන පන් ඔරු-
වක් මෙන්ද
ගොදුර මතට කඩාවදින රාජා-
ලියෙකු මෙන්ද[1] මාගේ
ජීවිතයේ දවස් වේගයෙන්
ගෙවී යයි.
**27** 'මාගේ දුක් කරදර අමතක කර
දමා,[2]
ශෝක නොවී සතුටින් සිටීමට
උත්සාහ කරමි'[3] යයි මා
සිතුවත්
**28** වේදනාකාරී දේ මා පසුපස හඹා
එන නිසා මම බියෙන්
සිටිමි.[4]
මන්ද ඔබ මා නිර්දෝෂයි කියා
ප්‍රකාශ නොකරන බව මම
දනිමි.
**29** ඔබ මාව දුෂ්ටයෙකු ලෙස ගණන්
ගනු ඇත.
එසේනම් මා මෙතරම් වෙහෙ-
සෙන්නේ කුමකටද?[5]
**30** මා හිම දියෙන් නාගෙන,
සබන්[6] දමා මාගේ දෑත් සෝදා-
ගත්තද
**31** ඔබ මා මඩ වගුරක හෙළන්-
නෙහිය.
මාගේ වස්ත්‍ර පවා මාව පිළිකුල්
කරනු ඇත.
**32** දෙවි මා වැනි මිනිසෙකු නො-
වෙයි.[7]
මා කෙසේ ඔහු සමඟ විවාද
කරන්නද? කෙසේ ඔහුට
විරුද්ධව චෝදනා කරන්-
නද?
**33** දෙවිත් මාත් අතරේ මැදිහත් වී,[8]
මේ ප්‍රශ්නය විසඳිය හැකි කිසි-
වෙක් නැත.
**34** ඔහු මට ගෙනා දඬුවම ඔහුම
මාගෙන් ඉවත් කරාවා![9]
බියගන්වන දේවලින් මට තවත්
පීඩා නොකරාවා!
**35** එවිට කිසිම භයක් නොමැතිව ඔහු
සමඟ කතා කරන්නෙමි.
මන්ද ඔහුට භය වීමට මට කිසිදු
හේතුවක් නැත.

**9 පරි.**
**1** හබ 1:8
**2** යෝබ 7:13
**3** හිතෝ 15:13
**4** යෝබ 21:6
**5** ගීතා 73:13 යෙරෙ 2:35
**6** යෙරෙ 2:22 මලා 3:2
**7** ගණන් 23:19 යෙසා 45:9 යෙරෙ 49:19 රෝම 9:20
**8** 1සාමු 2:25 1තිමෝ 2:5
**9** යෝබ 13:21 ගීතා 39:10

**2 තීරුව**

**10 පරි.**
**1** ගණන් 11:15 1රාජා 19:4 යෝබ 7:16 යෝනා 4:3 රෝම 8:20
**2** උත් 18:25 ද්වි 32:4 රෝම 3:8
**3** යෝබ 14:15 ගීතා 138:8 යෙසා 64:8
**4** ගීතා 11:4
**5** 1සාමු 16:7
**6** ගීතා 90:2 යෙරෙ 10:10 හෙබ්‍රෙ 1:12
**7** යෝබ 10:14 රෝම 3:12
**8** යෝබ 1:8 ගීතා 139:1
**9** ද්වි 32:39
**10** ගීතා 119:73 ගීතා 139:13 ගීතා 139:15

# 10
"මට මාගේ ජීවිතය තිත්ත වී
ඇත.[1]
දරාගත නොහැකි වේදනාව-
කින් මම කතා කරන්-
නෙමි.
හදවතේ ඇවෙන දුක මම
නොසඟවා ප්‍රකාශ කරන්-
නෙමි.
**2** 'අනේ, මා දුෂ්ටයෙක් ලෙස ගණන්
නොගන්න' කියා මම දෙවිට
කියන්නෙමි.
'මා සමඟ වාද කරන්නේ මන්ද
කියා මට කියන්න.
**3** මට පීඩා කිරීමෙන් ඔබ සතුටක්
ලබන්නෙහිද?[2]
ඔබේම අත් දෙකෙන් නිර්මා-
ණය කළ දේ[3] ප්‍රතික්ෂේප
කරමින්,
දුෂ්ටයන්ගේ සැලසුම්වලට අනු-
බල දෙන්නේ ඇයි කියා මට
කියන්න.
**4** ඔබේ ඇස්[4] මනුෂ්‍යයන්ගේ ඇස් හා
සමානද?
ඔබ දේවල් දකින්නේ මනුෂ්‍ය-
යන් දකින ආකාරයටද?[5]
**5** ඔබේ ජීවිතයේ දවස් දූවිලි වැනි
වූ මනුෂ්‍යයන්ගේ ජීවිතයේ
දවස් හා සමානද?[6]
ඔබේ අවුරුදු මනුෂ්‍යයන්ගේ
අවුරුදු හා සමානද?
**6** ඔබ නිතරම මාගේ වැරදි සොයන්-
නේ ඒ නිසාද?
ඔබ සැමවිටම මා අතින් පාප-
යක් සිදු වී ඇද්දැයි සොයා
බලන්නේ මන්ද?[7]
**7** මා දුෂ්ටයෙකු නොවන බව ඔබ
ස්ථිර වශයෙන්ම දන්නෙ-
හිය.[8]
ඔබේ අතින් මාව ගලවාගැනී-
මට කිසිවෙකු නැති බව[9]
දැන දැනත් ඔබ එලෙස ක්‍රියා
කරන්නේ මන්ද?
**8** ඔබ කිසි අඩුවක් නොමැතිව ඔබ-
ගේම දෑතින් මාව සැදුවෙ-
හිය.[10]
එනමුත් ඔබම මාව නැති කර

දමන්න දැන් පියවර ගෙන
ඇත.
9 අනේ, ඔබ මාව සැදුවේ මැටිව-
ලින්[1] බව සිහි කරන්න.
ඔබ යළි මාව දූවිල්ලටම හර-
වන්නෙහිය.[2]
10 ඔබ මාව කිරි මෙන් වත් කර,
කේජු මෙන් වීමට සැලැස්වූවෙ-
හිය.[3]
11 ඔබ ඇට සහ නහරවලින් මාව
සකසා,
මාංසවලින්ද සමෙන්ද මාව
වැසුවෙහිය.[4]
12 ඔබ මට ජීවිතය ලබා දී කරුණා-
වෙන්* මට සැලකුවෙහිය.[5]
මාගේ හුස්ම පොද රැකුණෙත්
ඔබ නිසාමය.[6]
13 එහෙත් ඔබේ හදවතේ යමක්
සැඟවී තිබිණ.
ඔබ මා පිට මේ සියල්ල ගෙන
එන්න සිතාගෙන සිටි බව
මම දනිමි.
14 මා පව් කළා නම් එය ඔබ දකිනු
ඇත.[7]
මා වැරදිකරුවෙකු නම් ඔබ මට
සමාව නොදෙනු ඇත.[8]
15 මා වැරදිකරුවෙකු නම් මට නපු-
රක් සිදු විය යුතුය.[9]
මා තුළ වරදක් නැතත්
දුක් පීඩා හා නින්දා[10] නිසා
මාගේ හිස ඔසවන්න මට
නොහැකිය.[11]
16 මා උඩඟු[12] ලෙස මාගේ හිස ඔස-
වන්නේ නම් ඔබ සිංහයෙකු
මෙන් මා පසුපස ඇවිත්,[13]
මට විරුද්ධව ඔබේ වික්‍රමාන්-
විත බලය පෙන්වනු ඇත.
17 ඔබ මට විරුද්ධව තව තවත් සාක්-
ෂිකරුවන් කැඳවනු ඇත.
ඔබ මා සමඟ තව තවත් උද-
හස් වී,
කරදර එක පිට එක මා වෙත
පමුණුවනු ඇත.
18 ඔබ මාව මව්කුසෙන් පිටතට ගත්-
තේ මන්ද?[14]
එසේ නොකළා නම් මට කිසි-
වෙකුගේ දැසට නොපෙනී
යන්නට තිබිණ.
19 එවිට මෙලොව එළිය නොදැක
මව්කුසෙන් මිනී වළට යන්-
නට තිබිණ.
20 මා ජීවත් වන්නේ තව කෙටි කල-
කට නොවෙයිද?[1] එසේනම්
මට නිදහසේ සිටීමට ඉඩ
දෙන මෙන් ඉල්ලමි.
මා දෙස ඔබේ නෙත් යොමු
නොකරන්න. එවිට මට යම්
සහනයක් ලැබෙනු ඇත.[2]
21 මම අඳුරු දේශය වූ මිනී වළට
යෑමට මත්තෙන් මට සැන-
සීම දෙන මෙන් ඉල්ලමි.
ඝන අන්ධකාරය වෙළාගත් ඒ
දේශයෙන්[3] කිසිදාක හැරී
ඒමට මට නොහැක.[4]
22 ඒ දේශය අඳුරුය.
කිසි පිළිවෙළක් නොමැති ඒ
ස්ථානයේ ආලෝකයේ සේ-
යාවක්වත් නැත.' "

11 එවිට නයමාතිය[5] ෂෝපර්
මෙසේ කීවේය.
2 "ඔබ තොරතෝංචියක් නොමැ-
තිව පවසන දේවලට පිළි-
තුරු නොදී සිටිය හැකිද?
පුරසාරම් දොඩන්නා නිවැරදි-
යයි කිව හැකිද?
3 හිස් වචන දෙඩූ පමණින් මිනිසුන්ව
නිහඬ කළ හැකියි කියා ඔබ
සිතුවෙහිද?
ඔබ සමච්චල් කරන විට කව-
රෙකු හෝ ඔබට තරවටු
නොකළ යුතුද?[6]
4 'මා පවසන දේ[7] නිවැරදිය.
මා නිර්දෝෂය'[8] කියා ඔබ
කියන්නෙහිය.
5 එහෙත් දෙවි කතා කොට
ඔබට පිළිතුරු දෙන්නේ නම්[9]
6 ප්‍රඥාව කියන්නේ කුමක්ද කියා
ඔහු ඔබට හෙළි කරනු ඇත.
එවිට දෙවි ඔබේ සෑම වරදක්ම
සිහි නොකරන බව ඔබ තේ-
රුම්ගනු ඇත.[10]

**10 පරි.**
1 උත් 2:7
යෙසා 45:9
රෝම 9:21
2 උත් 3:19
ගීතා 104:29
දේශ 12:7
3 යෙසා 64:8
4 ගීතා 139:15
5 ගීතා 139:16
6 ගීතා 8:4
7 ගීතා 139:1
8 ගණන් 14:18
9 යෙසා 3:11
10 ගීතා 25:18
ගීතා 119:153
11 යෝබ් 9:15
ලූක් 17:10
12 2සාමු 22:28
යෝබ් 40:11
යෙසා 2:11
ලූක් 1:51
යාකො 4:6
13 යෙසා 38:13
14 යෝබ් 3:11
යෙරෙ 20:18

**2 තීරුව**
1 යෝබ් 7:6
යෝබ් 14:1
ගීතා 39:5
ගීතා 103:15
2 යෝබ් 9:27
ගීතා 39:13
3 යෝබ් 3:5
යෝබ් 38:17
ගීතා 23:4
ගීතා 88:12
දේශ 9:10
4 යෝබ් 7:9
ගීතා 115:17
යෙසා 38:11

**11 පරි.**
5 යෝබ් 42:9
6 යෝබ් 12:4
7 යෝබ් 6:10
8 යෝබ් 6:29
යෝබ් 10:7
9 යෝබ් 38:1
10 එස්රා 9:13

යෝබ් **10:12*** හෝ, "ඇදි ප්‍රේමයකින්."

සැබෑ ප්‍රඥාව ගැන අප නො-
දන්නා දේවල් බොහොමයක්
තිබේ.
7 ඔබට කවදා හෝ දෙවිගේ
ගැඹුරු කාරණා තේරුම්ගත
හැකිද?[1]
සියලු බලැති දෙවිගේ ශ්‍රේෂ්ඨත්-
වය කොතරම්ද කියා ඔබට
වටහාගත හැකිද?
8 දෙවිගේ ප්‍රඥාව අහසටත් වඩා ඉහ-
ළින් තිබේ. ඔබ එය කෙසේ
තේරුම්ගන්නද?
එය මිනී වළටත්[2] වඩා ගැඹු-
රුය. ඔබ එය කෙසේ වටහා-
ගන්නද?
9 දෙවිගේ ප්‍රඥාව පොළොවට වඩා
විශාලය.
සාගරයට වඩා මහත්ය.
10 ඔහු ඇවිත් යමෙකුව සිරභාරයට දී
නඩුවක් දමන්නේ නම්, ඔහුව
නතර කළ හැක්කේ කාටද?
11 වංක අය කවුද කියා ඔහු හොඳින්
දනියි.[3]
දුෂ්ටකම් ඉදිරියේ ඔහු ඇස් වසා-
ගෙන සිටියි කියා සිතිය
හැකිද?
12 හිලෑ නැති බූරුවෙකුගෙන් මිනි-
සෙකු බිහි කළ හැකි නම්
කිසි කමකට නැති මිනිසෙකු
තුළ යහපත් චේතනාද සො-
යාගත හැකිය.
13 ඔබේ සිත හරි මඟට යොමු කර,
දැත් ඔසවා අවංක සිතකින් දෙ-
විට යාච්ඤා කරන්න.[4]
14 ඔබේ අතින් සිදු වන වැරදි අත්-
හරින්න.
ඔබේ කූඩාරම්වල කිසි අධර්-
මිෂ්ඨ ක්‍රියාවකට ඉඩ නො-
දෙන්න.
15 එවිට ඔබට නිදොස් සිතක් ඇතුව
දෙවි දෙස බැලිය හැකිය.[5]
බිය සැක දුරු කරගෙන සුරක්-
ෂිතව ජීවත් විය හැකිය.
16 වේගයෙන් ගලන ජල ධාරාවක්
පහව යන්නාක් මෙන්
ඔබේ දුක් ගැහැට සියල්ල ඔබේ
මතකයෙන් පහ වී යන්-
නේය.
17 ඔබේ ජීවිතය[1] දවාලේ බැබළෙන
හිරුටත් වඩා දීප්තිමත් වනු
ඇත.
අන්ධකාරය අරුණාලෝකය
මෙන් වනු ඇත.[2]
18 ඔබට බලාපොරොත්තුවක්
තිබෙන බැවින් ඔබ නිසැක-
කමින් ජීවත් වන්නෙහිය.
ඔබ වට පිට බලා සැනසුම් සුසු-
මක් හෙළන්නෙහිය.[3]
19 කිසිවෙකුටවත් බිය නොවී සුවසේ
ජීවත් වන්න ඔබට හැකි
වන්නේය.
බොහෝදෙනෙක් ඔබේ කරු-
ණාව පතන්නෝය.[4]
20 එහෙත් දුෂ්ටයන්ගේ ඇස්වල දීප්-
තිය පහව යයි.[5]
ඔවුන්ට පලා යැමට ස්ථානයක්
නොමැත.[6]
ඔවුන්ට ඇති එකම බලාපො-
රොත්තුව මරණය පමණි.”[7]

**12** එවිට යෝබ් තම මිතුරන්ට
මෙසේ කීවේය.
2 “ඇත්තෙන්ම ඔබ තරම් ප්‍රඥා-
වන්ත අයව වෙන කොහෙන්
සොයන්නද?
ඔබ මිය ගියොත් ප්‍රඥාවත් මිහි-
පිටින් තුරන් වී යයි.[8]
3 මාත් ප්‍රඥාවන්ත සිතක්[9] ඇති
කෙනෙකි.
මා ඔබට වඩා පහත් කෙනෙකු
නොවෙයි.[10]
මේ දේවල් නොදන්නේ කවරෙ-
කුද?
4 අතීතයේදී මම දෙවිට කන්නලව්
කර පිළිතුරු ලැබුවෙමි.[11]
එහෙත් දැන් මාගේ අසල්වැසියා
මාව විහිළුවට ලක් කරන්-
නේය.[12]
විහිළුවට ලක් කරන්නේ ධර්-
මිෂ්ඨ, අවංක තැනැත්-
තාවය.
5 සැප පහසු ජීවිතයක් ගත කරන

**11 පරි.**
1 දේශ 3:11 රෝම 11:33
2 ගීතා 139:8
3 ගීතා 94:11 ශෙප 3:5
4 ගීතා 143:6
5 උත් 4:5

**2 තීරුව**
1 ගීතා 39:5 ගීතා 89:47
2 ගීතා 112:4 යෙසා 58:8
3 ලෙවී 26:6 ගීතා 3:5 හිතෝ 3:24
4 ගීතා 45:12
5 ලෙවී 26:16
6 යෝබ් 8:14 යෝබ් 18:14
7 එළි 9:6

**12 පරි.**
8 යෙසා 5:21
9 යෝබ් 13:2 හිතෝ 2:10
10 2කොරි 11:5
11 ගීතා 91:15 මීකා 7:7
12 යෝබ් 16:10 යෝබ් 17:2 යෝබ් 30:1 ගීතා 22:7 හෙබ්‍රෙ 11:36

අය තමන්ට කෙදිනකවත්
විපතක් සිදු නොවෙයි කියා
සිතති.[1]
එවැනි අය දුක් ගැහැට විඳිමින්
සිටින ජනයාව හෙළාදකිති.[2]
6 සොරුන්ගේ කූඩාරම් සුරක්ෂි-
තය.[3]
රූප ඉදිරියෙහි වැඳ වැටෙන අය
කිසි අනතුරක් නොමැතිව
සිටින්නාක් මෙන්[4]
දෙවිව කුපිත කරන්නෝද යහ-
තින් කල් ගෙවන්නෝය.
7 ඔබ සතුන්ගෙන් අසන්න. උන්
ඔබට උගන්වනු ඇත.[5]
පක්ෂීන්ගෙන් අසන්න. උන්ද
ඔබට කියා දෙනු ඇත.[6]
8 පොළොව වෙත ඔබේ අවධානය
යොමු කරන්න. එය ඔබට
උපදෙස් දෙනු ඇත.[7]
මුහුදේ මසුන්ද[8] ඔබට දැනමුතු-
කම් දෙනු ඇත.
9 මේ සියල්ල කර තිබෙන්නේ
යෙහෝවා දෙවි බව පිළි නො-
ගන්නේ කවුද?[9]
10 පණ ඇති සියල්ලන්[10] ජීවත් වන්-
නේ දෙවි නිසාය.
මිනිසාගේ හුස්මද ඔහුගේ අතෙ-
හිය.[11]
11 දිව*[12] කෑමවල රස තෝරන්-
නාක් මෙන්
දෙසවන වචන විමසා බලන්-
නේය.[13]
12 වයසින් මුහුකුරා ගිය අය[14] ප්‍රඥාව
අත් කරගෙන සිටිනවා නො-
වේද?
බොහෝ කල් ජීවත් වූ විට
තේරුම්ගැනීමේ හැකියාව
තියුණු වන්නේ නැද්ද?
13 නමුත් ප්‍රඥාව හා බලය තිබෙන්-
නේ දෙවිටය.[15]
නැණවත් උපදෙස් දෙන්නේ
ඔහුය. ඔහු මනා අවබෝධය-
කින් කටයුතු කරයි.[16]
14 දෙවි බිඳ දැමූ දෙයක් කිසිවෙකුට
නැවත ගොඩනැඟීමට නො-
හැකිය.[1]
ඔහු වසා දැමූ දෙයක් කිසිවෙ-
කුට නැවත විවෘත කළ
නොහැකිය.[2]
15 ඔහු වැසි වළක්වන විට ඉඩෝරය
ඇති වෙයි.[3]
ඔහු වැසි වස්සවන විට පොළො-
වේ වෙනස්කම් සිදු වෙයි.[4]
16 ශක්තියත් ප්‍රඥාවත් ඔහු සතුය.[5]
මුළා කරන්නාත් මුළාව යන්-
නාත් ඔහුගේ බලය යට-
තේය.[6]
17 දෙවි උපදේශකයන්ව හිස් අතින්
පිටත් කර යවන්නේය.[7]
විනිශ්චයකරුවන්ට උමතුවෙන්
ක්‍රියා කරන්න සලස්වන්-
නේය.
18 දෙවි රජවරුන් විසින් සිර කරනු
ලැබූ අයව නිදහස් කර,[8]
ඔවුන්ගේ ඉහටි වටා පටියක්
බඳින්නේය.
19 දෙවි පූජකයන්ට පාවහන් නොමැ-
තිව ඇවිදින්න සලස්වන්-
නේය.[9]
බලය තහවුරු කරගත් අයව
පහතට ඇද දමන්නේය.[10]
20 විශ්වාසවන්ත අයව නිහඬ කරන්-
නේය.
වයසින් මුහුකුරා ගිය අයගේ
නුවණ නැති කර දමන්-
නේය.
21 දෙවි උත්තමයන්ව නින්දාවට
ලක් කරන්නේය.[11]
බලවත් අයගේ ශක්තිය හීන
කරන්නේය.
22 අන්ධකාරයේ සැඟවී තිබෙන
ගැඹුරු දේ ඔහු හෙළි කරන්-
නේය.[12]
ඝන අන්ධකාරය මත ආලෝ-
කය හෙළන්නේය.
23 දෙවි ජාතීන්ව බලවත් කළ පසු
ඔවුන්ව විනාශ කරන්නේය.[13]
ජාතීන්ගේ දේශ සීමාවන් පුළුල්
කළ පසු ඔවුන්ව වහල්භාව-
යට රැගෙන යන්නේය.

**12 පරි.**

1 හිතෝ 13:9
2 ද්වි 32:35
3 යෝබ් 21:7
ගීතා 37:35
ගීතා 73:12
යෙරෙ 12:1
4 විනි 17:5
5 හිතෝ 6:6
යෙසා 1:3
රෝම 1:20
6 යෙරෙ 8:7
7 ගීතා 19:4
ගීතා 148:9
8 උත් 1:20
9 යෙරෙ 27:5
රෝම 11:36
10 එස 18:4
11 ගණන් 16:22
ගීතා 104:30
දේශ 12:7
දානි 5:23
12 යෝබ් 34:3
13 1කොරි 10:15
14 ලෙවී 19:32
යෝබ් 32:7
හිතෝ 16:31
හිතෝ 20:29
15 යෝබ් 9:4
යෝබ් 36:5
යෙසා 44:25
දානි 2:20
16 ගීතා 147:5
යෙසා 40:14
යෙරෙ 10:12
රෝම 11:34

**2 තීරුව**

1 යෙසා 31:2
යෙරෙ 51:64
මලා 1:4
යූද් 7
2 යෙසා 22:22
3 උත් 8:1
නික් 14:21
නාහු 1:4
4 උත් 6:17
1රාජා 8:36
ගීතා 104:8
5 යෝබ් 12:13
රෝම 1:20
6 1රාජා 22:22
7 යෙසා 29:14
යෙසා 44:25
8 දානි 2:21
9 යෙරෙ 14:18
යෙරෙ 52:24
10 ලූක් 1:52
11 ගීතා 107:40
12 දානි 2:22
මතෙ 10:26
1කොරි 4:5
13 එළි 16:14

---

යෝබ් **12:11*** මූ.අ., “උඩු තල්ල.”

24 දෙවි නායකයන්ගේ බුද්ධිය පහ
කර දමන්නේය.
පසුව ඔහු පාළු ස්ථානයක[1]
ඔවුන්ව මංමුළා කරන්නේය.
25 ඔවුහු ආලෝකය නොමැතිව අඳු-
රේ අත පත ගාමින් යන්-
නෝය.[2]
බේබද්දන් මෙන් වැනිවැනී යන්-
නෝය.[3]

13 “මේ සැම දෙයක්ම මාගේ
ඇසින් දුටුවෙමි.
මාගේ කනින් අසා තේරුම්-
ගත්තෙමි.
2 ඔබ දන්නා දේ මමත් දනිමි.
මා ඔබට වඩා පහත් කෙනෙකු
නොවෙයි.[4]
3 අනේ, සියලු බලැති දෙවි සමඟ
කතා කරන්න මට හැකි
නම්![5]
දෙවි සමඟ තර්ක කරන්න මට
ඇත්නම් එය මාගේ සිතට
මොන තරම් සැනසීමක්ද!
4 ඔබ සියල්ලෝම බොරු ගොතා[6]
මාගේ හොඳ නම කෙලසන්-
නහුය.
ඔබ කිසි කමකට නැති වෙ-
දුන්ය.[7]
5 ඔබ කතා නොකර සිටින්නේ නම්
ඔබ ප්‍රඥාවන්තයන්යයි මට
සිතන්න තිබිණ.[8]
6 මාගේ තර්කයන්ට හොඳින් සවන්
දෙන මෙන් මම ඔබෙන්
ඉල්ලා සිටිමි.[9]
මට අනුකම්පා කර මා කියන
දේට ඇහුම්කන් දෙන්න.
7 ඔබ දෙවිගේ පැත්ත ගෙන මට
විරුද්ධව දුෂ්ට දේ කියන්න-
හුද?
ඔබ දෙවි වෙනුවෙන් කතා කර-
මින් බොරු කියන්නහුද?[10]
8 ඔබ සැබෑ දෙවිගේ පැත්ත ගෙන[11]
ඔහු වෙනුවෙන් තර්ක කරන්න-
හුද?
9 ඔහු ඔබව සෝදිසි කර බැලූ විට
ඔහු ඔබ ගැන සතුටු වෙයි
කියා සිතනවාද?[12]

12 පරි.
1 ගීතා 107:4
ගීතා 107:40
2 ද්වි 28:29
1යොහ 2:11
3 ගීතා 107:27

13 පරි.
4 යෝබ් 12:3
2කොරි 11:5
5 යෝබ් 23:3
යෝබ් 29:4
යෝබ් 31:35
6 ගීතා 119:69
7 යෝබ් 6:21
යෝබ් 16:2
යෙරෙ 6:14
එස 34:4
8 හිතෝ 17:28
යාකො 1:19
9 හිතෝ 18:13
10 යෙරෙ 14:14
11 හිතෝ 24:23
12 ගීතා 139:23
යෙරෙ 17:10

2 තීරුව
1 ගීතා 82:2
යාකො 2:9
2 ගීතා 50:21
3 නෙහෙ 5:9
4 යෝබ් 4:19
5 විනි 12:3
1සාමු 19:5
ගීතා 119:109
6 යෝබ් 19:25
ගීතා 23:4
7 නික් 15:2
ගීතා 27:1
යෙසා 12:2
8 යෝබ් 8:13
යෝබ් 27:8
යෝබ් 36:13
ගීතා 24:3
යෙසා 33:14
9 හිතෝ 18:13
10 1කොරි 10:12

ඔබ උත්සාහ කරන්නේ මනුෂ්‍ය-
යන්ව රවටන්නාක් මෙන්
දෙවිවත් රවටන්නද?
10 ඔබ ඔහුගේ පැත්තට කතා කර-
මින්[1] බොරු තර්ක විතර්ක
යොදන්නේ නම්
ඔහු ස්ථිර වශයෙන්ම ඔබට තර-
වටු කරනු ඇත.[2]
11 එවිට ඔහුගේ බලමහිමය දැක ඔබ
තුළ මහත් බියක් හටගනු
ඇත.
ඔහු පැමිණි කල ඔබ තැතිගන්-
නහුය.[3]
12 ඔබ පුරාජේරුවට කියන කතා
කිසි කමකට නැති* ඔව-
දන්ය.
ඔබේ තර්ක විතර්ක මැටිවලින්[4]
තැනූ පලිස් මෙනි.
13 නිහඬව සිට මට යමක් පවසන්න
ඉඩ දෙන්න.
මට ඕනෑම දෙයක් සිදු වුණාවේ!
14 මා මාගේම ජීවිතයට හානියක්
කරගන්නේ මන්ද?
මාගේ ජීවිතය අනතුරේ හෙ-
ළන්නේ කුමකටද?[5]
15 මා මැරෙන තුරාම මම දෙවි කෙ-
රෙහි බලා සිටින්නෙමි.[6]
මම ඔහු ඉදිරියට ගොස් මා
නිදොස් බව කෙසේ හෝ
ඔප්පු කර පෙන්වන්නෙමි.
16 එවිට ඔහු මට ගැලවීම ලබා දෙනු
ඇත.[7]
මන්ද දෙවිට ද්‍රෝහිව කටයුතු
කරන කිසිවෙකුට ඔහු ඉදිරි-
යට පැමිණිය නොහැක.[8]
17 මා පවසන දේට හොඳින් සවන්
දෙන්න.[9]
ඔබේ දෙසවනට වැටෙන වචන
ගැන හොඳට සිතා බලන්න.
18 මම මාගේ පැමිණිල්ල ඉදිරිපත්
කළෙමි.[10]
මා නිවැරදි බව මට නිසැකවම
කිව හැකිය.
19 මට විරුද්ධව චෝදනාවක් එල්ල

යෝබ් **13:12*** හෝ, “අළු වැනි වූ.”

කළ හැකි කෙනෙකු සිටීද?[1]
මා දැන් නිහඬව සිටියොත් මම
මිය යනු ඇත.
20 ‘මම වෙනුවෙන් දේවල් දෙ-
කක් පමණක් කරන මෙන්
ඉල්ලමි.
එවිට ඔබ ඉදිරියෙන් මම සැඟවී
නොයන්නෙමි.[2]
21 ඔබගේ අත මාගෙන් ඉවත් කර,
ඔබේ මහත් බලය පෙන්ව-
මින් මාව බියට පත් නොක-
රන්න.[3]
22 මට හඬගසන්න. එවිට මම උත්-
තර දෙන්නෙමි.
එසේත් නැත්නම්, මා කතා
කරන විට මට උත්තර දෙන
මෙන් ඉල්ලමි.
23 මා කළ පාප හෝ මා අතින් සිදු වූ
වැරදි හෝ මට කියා දෙන්න.
මා ඔබට විරුද්ධව යමක් කර
ඇත්නම් මට එය පෙන්වා
දෙන්න.
24 ඔබේ මුහුණ මාගෙන් ඉවතට හර-
වාගන්නේ මන්ද?[4]
ඔබ මාව ඔබේ සතුරෙකු ලෙස
ගණන් ගන්නේ මන්ද?[5]
25 ඔබ සුළඟට ගසාගෙන යන කො-
ළයක් පසුපස පන්නාගෙන
යන්නෙහිද?
පිදුරු ගසක් පසුපස හඹා යන්-
නෙහිද?
26 ඔබ මට විරුද්ධව කුරිරු දේ ලියා
තබන්නෙහිය.[6]
තරුණ වියේ පටන් මා කළ
වැරදිවලට දඬුවම් කරන්-
නෙහිය.[7]
27 ඔබ මා යන එන තැන් නිතරම
බලා සිටිමින්,
මා පය තබන සීමාව සලකුණු
කර ඇත.
මාගේ පාද ඔබ දඬුකඳේ ගසා
තිබේ.[8]
28 මාගේ ජීවිතය* කුණු වූ යමක්
මෙන් දිරාපත් වෙයි.[9]

යෝබ් **13:28*** හෝ, “මේ මිනිසා.”

එය කාවෝ කෑ වස්ත්‍රයක්
මෙනි.[1]

# 14

“ ‘මව්කුසෙන්[2] නික්මෙන
මනුෂ්‍යයා ජීවත් වන්නේ
ඉතා කෙටි කාලයකටය.[3]
එයත් දුක් කම්කටොලුව-
ලින් පිරී ඇත.[4]
2 ඔහු මලක් මෙන් පිපී කඩා දමනු
ලබන්නේය.[5]
සෙවණැල්ලක් මෙන් නැති වී
යන්නේය.[6]
3 ඔබ දෑස් යොමු කර ඇත්තේ
එවැනි මිනිසෙකු දෙසය.
ඔබ මට විරුද්ධව ඇමූ නඩුව
විසඳීමට මාව කැඳවන්නෙ-
හිය.[7]
4 අපවිත්‍ර කෙනෙකුට පවිත්‍ර කෙ-
නෙකු බිහි කළ හැකිද?[8]
කවදාවත් එසේ කළ නො-
හැකිය.
5 මිනිසාගේ ආයු කාලය තීරණය
කර ඇත.[9]
ඔහු ජීවත් වන මාස ගණන ඔබ
දන්නෙහිය.
ඔබ ඔහුට සීමාවක් පනවා ඇත.
ඒ සීමාවෙන් පිට ඔහුට යා
නොහැකිය.
6 එසේනම්, ඔබ මොහොතකට හෝ
ඔහු දෙස නොබලා සිටින්නේ
නම් යහපත![10]
එවිට දවස නිමා වන විට කුලී-
කරුවෙකු සතුටු වන්නාක්
මෙන් ඔහුටද සතුටු විය
හැකිය.
7 කපා ඇමූ ගසක් කෙරෙහි වුවද
බලාපොරොත්තු තැබිය
හැක.
එය කපා ඇමුවත් යළි දලු ලා,[11]
අලුත් රිකිලි හටගනු ඇත.
8 එහි මුල් බොහෝ කලක් පො-
ළොව යට සැඟවී තිබුණත්
එහි කඳ වියළී ගියත්
9 දිය බිඳක් ලද සැණින් අතු ඉති
ලියලා,[12]
අලුත් ගසක් මෙන් එය හටගන්-
නේය.[13]

**13 පරි.**
1 යෝබ් 33:6, යෙසා 50:8
2 යෝබ් 33:7
3 යෝබ් 9:34, ගීතා 119:120, හෙබ්‍රෙ 10:31
4 ගීතා 10:1, ගීතා 13:1, ගීතා 44:24
5 විලා 2:5
6 ද්වි 32:32, රූත් 1:20, යෝබ් 16:9, යෝබ් 19:11, යෝබ් 33:10
7 ගීතා 25:7, යෙරෙ 31:19
8 යෝබ් 33:11
9 හොෂෙ 5:12

**2 තීරුව**
1 ගීතා 39:11, යෙසා 50:9, යාකො 5:2

**14 පරි.**
2 ගීතා 51:5, 1කොරි 11:12
3 ගීතා 39:5, ගීතා 90:10, යාකො 4:14
4 උත් 3:19, උත් 47:9, දේශ 2:23
5 ගීතා 103:15, යෙසා 40:6, යාකො 1:10, 1පේතෘ 1:24
6 1ලේක 29:15, ගීතා 102:11, ගීතා 144:4, දේශ 8:13
7 ගීතා 143:2
8 උත් 5:3, ගීතා 51:5, යොහ 3:6, රෝම 5:12
9 ගීතා 39:4, ලූක් 12:20
10 ගීතා 39:13
11 යෙසා 11:1, දානි 4:26, දානි 11:7
12 ගීතා 1:3
13 1කොරි 15:36

10 එහෙත් මිනිසා මිය ගිය පසු කුණු
වී යන්නේය.
ඔහුගේ හුස්ම නික්ම ගිය පසු
ඔහුව නැවත සොයාගත
හැකිද?[1]
11 සාගරයේ ජලය වාෂ්ප වී යන්නාක්
මෙන්ද
ගංගා සිඳී යන්නාක් මෙන්ද[2]
12 මිනිසාද මිය ගොස් යළි නැඟිටින්-
නේ නැත.[3]
අහස නැති වී යන තුරුම ඔවුන්
යළි නැඟිටින්නේවත්[4]
ඔවුන්ව පුබුදුවන්නේවත් නැත.[5]
13 අනේ, ඔබේ කෝපය පහ වන තුරු
මාව මිනී වළෙහි සඟවා තබා,[6]
කාලයක් නියම කර[7] නැවත
මාව සිහි කරන්නෙහි නම්[8]
කොතරම් හොඳද!
14 මිනිසෙකු මිය ගිය පසු ඔහු යළි
ජීවත් වනු ඇද්ද?[9]
මට නියම කළ කාලය අව-
සන් වී,
මාව නිදහස් කරන තුරු[10] මම
බලා සිටින්නෙමි.[11]
15 ඔබ මට අඬගසන්නෙහිය. මමද
උත්තර දෙන්නෙමි.[12]
මන්ද ඔබේ අතින් නිමැවූ දේ
දැකගන්න ඔබ මහත් ආශා-
වෙන් බලා සිටිනු ඇත.
16 එහෙත් දැන් ඔබ මාගේ සෑම පිය-
වරක්ම ගණන් කරන්නෙ-
හිය.[13]
මා පාපයක් කරන තුරු ඔබ
විමසිල්ලෙන් බලා සිටින්-
නෙහිය.[14]
17 මා කළ වැරදි ඔබ මල්ලක දමා
මුද්‍රා කර තැබුවෙහිය.[15]
මැලියම් ගා මාගේ අපරාධ මුද්‍රා
කර තබාගත්තෙහිය.
18 කන්දක් වුවද පෙරළී පොළොවට
සමතලා වනු ඇත.
පර්වතයක් එහි නියමිත ස්ථා-
නයෙන් පහ කරනු ඇත.
19 වතුරට ගල් ගෙවී යන්නේය.
දිය පහරට පොළොවේ පස් සේදී
යන්නේය.
ඔබ මිනිසාගේ බලාපොරොත්තු
නැති කරන්නෙත් එලෙසය.
20 ඔබ සදහටම ඔහුව පරාජය කරන්-
නෙහිය.
ඔහුගේ මුහුණ විකෘති කරන්-
නෙහිය. එවිට ඔහු තුරන් වී
යයි.[1]
21 ඔහුගේ පුත්‍රයන් ගෞරවයට පාත්‍ර
වුණත් ඔහු එය නොදනියි.[2]
ඔවුන් අවමානයට ලක් වුණත්
ඔහුට ඒ කිසිවක් නොපෙ-
නෙයි.
22 දිවි ඇති තුරාම ඔහුට දැනෙන්නේ
ඔහුගේ වේදනාව පමණි.
ඔහු විලාප නඟන්නේ ඔහුගේ
දුක ගැන පමණි.’ ”

15 ඉන්පසු තේමානිය එලිෆස්
යෝබ්ට මෙසේ කීවේය.
2 “ප්‍රඥාවන්ත කෙනෙකු සුළඟ වැනි
වූ හිස් වචනවලින් උත්තර
දෙයිද?[3]
ඔහු වැරදි සිතුවිලිවලින්*[4] තම
සිත පුරවාගනියිද?
3 ඔහු හරයක් නැති වචන යොදා
තර්ක කරයිද?
කිසි වටිනාකමක් නැති කතා
කියයිද?
4 එහෙත් ඔබ දෙවි කෙරෙහි ගරුබිය
දැක්වීම සැහැල්ලුවට ගෙන,
ඔහුට භක්තිය පිරිනමන අය-
ටත් බාධා ඇති කරන්-
නෙහිය.
5 ඔබ ඔබේ වචන හසුරුවන්-
නේ ඔබේ වැරදි වසාගන්නා
ආකාරයකටය.
ඔබේ මුවින් පිට වන්නේ කපටි
වචනමය.
6 ඔබ වරදකරුවෙකු බවට සාක්ෂි
දෙන්නේ ඔබේම මුවින් පිට
වන වචන මිසක මා නො-
වෙයි.

**14 පරි.**
1 උත් 49:33 දේශ 3:19 දේශ 9:10
2 යෝබ් 6:17 යෙරෙ 15:18
3 දේශ 9:5 දේශ 12:5
4 යෙසා 51:6 හෙබ්‍රෙ 1:11
5 ගීතා 13:3 යෙරෙ 51:39 යොහ 11:11 ක්‍රියා 7:60
6 උත් 44:29 1සාමු 2:6 යෙසා 57:2
7 යොහ 5:28
8 ලූක් 23:42 හෙබ්‍රෙ 11:35
9 යොහ 11:25 ක්‍රියා 26:8 1කොරි 15:12 එළි 20:13
10 යෝබ් 19:25
11 රෝම 8:20 හෙබ්‍රෙ 11:13 යාකො 5:8
12 දානි 12:13 යොහ 5:28 යොහ 11:43
13 ගීතා 139:3 යෙරෙ 32:19
14 ගීතා 130:3
15 ද්වි 32:35 හොෂෙ 13:12

**2 තීරුව**
1 යෝබ් 4:20 දේශ 8:8 යෙසා 57:16
2 1සාමු 4:20 ගීතා 39:6 දේශ 9:6 යෙසා 63:16

**15 පරි.**
3 යෝබ් 42:7
4 හොෂෙ 12:1

**යෝබ් 15:2*** හෝ, “නැඟෙනහිර සුළංවලින්.” මෙහි සඳහන් වන්නේ කාන්තාරය දෙසින් හමන හානිකර උෂ්ණාධික සුළං ගැනයි.

ඔබේම තොල් ඔබට විරුද්ධව
සාක්ෂි දෙන්නේය.[1]
7 මෙලොවට බිහි වූ පළමුවන
මිනිසා ඔබද?[2]
ඔබ මෙලොව ඉපදුණේ හෙල්[3]
බිහි වෙන්නත් කලින්ද?
8 දෙවි තම රහස් කාරණා ගැන ඔබ
ඉදිරියේ කතා කරනවාද?[4]
ඔබ හැර වෙනත් ප්‍රඥාවන්ත-
යෙකු මිහිපිට නොවෙසෙන
බව ඔබ සිතන්නෙහිද?
9 ඔබ අපට වඩා යමක් දන්නෙහිද?[5]
අප තේරුම් නොගත් දෙයක්
ඔබ අවබෝධ කරගෙන
තිබෙනවාද?
10 ඔබේ පියාට වඩා වයසින් මුහු-
කුරා ගිය
හිසකෙස් පැසුණු අය අප අතරේ
සිටිති.[6]
11 දෙවි දෙන සැනසිල්ලෙන් ඔබ
සෑහීමට පත් වන්නේ නැද්ද?
ඔබට පැවසූ කාරුණික වචනව-
ලින් ඔබේ සිත සැනසුණේ
නැද්ද?
12 ඔබේ සිත මෙතරම් එඩිතර වුණේ
කෙලෙසද?
ඔබේ දෙනෙත් කෝපයෙන්
දැවෙන්නේ මන්ද?
13 ඔබ දෙවිට විරුද්ධව උදහස් වී,
නිකරුණේ දොඩවන්නේ මන්ද?
14 මව්කුසෙන් නික්මෙන මිනිසා
කවදා හෝ නිදොස් විය
හැකිද?
දූවිලි වැනි වූ මිනිසා පවිත්‍ර විය
හැක්කේ කෙසේද?[7]
15 දෙවිට තම දූතයන්* කෙරෙහිවත්
විශ්වාසයක් නැත.[8]
ස්වර්ගයත් ඔහු සලකන්නේ
අපවිත්‍ර ස්ථානයක් ලෙසය.[9]
16 එසේනම් අධර්මිෂ්ඨකම් කිරීමට
ලොල්කමක් දක්වන්නාවූ
දූෂිත තත්වයක සිටින පිළිකුල්
මිනිසා ගැන ඔහු කුමක්
සිතන්නේද?[10]

15 පරි.
1 යෝබ් 42:8
2 උත් 4:1
3 ගීතා 90:2; හිතෝ 8:25
4 රෝම 11:34; 1කොරි 2:11
5 යෝබ් 13:2; යෝබ් 16:2
6 යෝබ් 32:6
7 2ලේක 6:36; ගීතා 51:5
8 1රාජා 22:20; හිතෝ 8:30; ආමො 3:7
9 යෝබ් 25:5; යෝබ් 42:7
10 යෝබ් 4:19

2 තීරුව
1 යෝබ් 5:27
2 යෝබ් 8:8
3 1තෙස 5:3
4 යෝබ් 18:12; යෙසා 8:22; යූද් 13
5 ගීතා 59:15; ගීතා 109:10
6 යෝබ් 18:12
7 රෝම 2:9
8 යෝබ් 16:2; යෝබ් 42:7

17 මට සවන් දෙන්න![1] මම ඔබට ඒ
ගැන පහදා දෙන්නෙමි.
මම දුටු දේ ඔබට කියා දෙන්-
නෙමි.
18 ප්‍රඥාවන්තයන් තම පියවරුන්-
ගෙන් රැස් කරගත් දැනුම[2]
සඟවා තබාගන්නේ නැත.
19 දේශය උරුම වූයේ ඔවුන්ටය.
විදේශිකයෙක් ඔවුන් අතරේ
විසුවේ නැත.
20 දුෂ්ටයෙක් ජීවිත කාලය පුරාම දුක්
විඳිනු ඇත.
කුරිරුකම් කරන තැනැත්තාද
තමාට නියම කර ඇති
කාලය පුරාම පීඩා විඳිනු
ඇත.
21 ඔහුගේ සවනට වැටෙන්නේ බිය-
කරු හඬකි.
සාමකාමී කාලයක පවා ඔහු
කොල්ලකරුවන්ගේ ප්‍රහාර-
යට ලක් වනු ඇත.[3]
22 අඳුරෙන් මිදීමට ඔහුට නොහැකි
බව ඔහු දනියි.[4]
ඔහු කඩුවෙන් මැරුම් කෑමට
නියම වී ඇත.
23 ඔහු කෑම සොයමින් ඒ මේ අත
ඇවිදියි.[5]
අඳුරු දවස[6] අත ළඟ බව ඔහු
හොඳින්ම දනියි.
24 දුක් වේදනා නිසා ඔහුගේ සිත
සලිත වෙයි.[7]
සටනට සැරසෙන රජෙකු මෙන්
විපත්ති ඔහු වට කර ප්‍රහාර
එල්ල කරයි.
25 ඔහු දෙවිට විරුද්ධව අත එසවූ
නිසාත්
සියලු බලැති දෙවිට වඩා ඉහ-
ළින් යෑමට තැත් කළ
නිසාත් ඔහුට එලෙස සිදු
වන්නේය.[8]
26 ඔහු තම ඇවැන්ත පලිහ ඔසවා
මුරණ්ඩු ලෙස දෙවිට විරුද්ධව
නැඟී සිටින්නේය.
27 ඔහු ආඩම්බරයෙන් මුහුණ පුම්බා-
ගෙන සිටින්නේය.

යෝබ් **15:15*** හෝ, "ශුද්ධ තැනැත්තන්."

ඔහුගේ බඩ තෙලෙන් තර වී
ඇත.[1]
28 ඔහු වෙසෙන්නේ විනාශයට සුදුසු
නුවරවලය.
මිනිසුන් වාසය නොකරන
නිවෙස්වලය.
ඔහු වසන ස්ථානය නටබුන්
ගොඩක් බවට පත් වන්-
නේය.
29 ඔහුගේ ධන සම්පත් කෙදිනකවත්
වැඩි වන්නේ නැත.
ඔහු රැස් කරගත් දේ සැමදා
පවතින්නේවත් දේශය පුරා
පැතිර යන්නේවත් නැත.[2]
30 ඔහුට අඳුරෙන් ගැලවී යා නො-
හැකිය.
ඔහුගේ රිකිල්ල ගිනිදැලුවලින්
පිලිස්සී යයි.
දෙවි එක හුස්මක් හෙළූ විට
ඔහුව ගසාගෙන යයි.[3]
31 ඔහු තමන්වම රවටාගනිමින් කිසි
ප්‍රයෝජනයක් නැති දේවල්
කෙරෙහි විශ්වාසය තැබු-
වොත්
ඔහුට ලැබෙන්නෙත් කිසි වටි-
නාකමක් නැති දේවල්ය.
32 මිය යෑමට පෙර ඔහුට තම ක්‍රියා-
වල ප්‍රතිඵල විඳින්න සිදු
වෙයි.
ඔහුගේ රිකිල්ල සශ්‍රීකව නොවැ-
ඩෙයි.[4]
33 මිදිවැලකින් නොඉදුණු පල
සියල්ල වැටෙන්නාක් මෙන්ද
ඔලීව ගසක මල් සියල්ල
හැළෙන්නාක් මෙන්ද ඔහු-
ටත් සිදු වනු ඇත.
34 දෙවිට ද්‍රෝහිකම් කරන්නාගේ ජීවි-
තය හිස්ය.[5]
අල්ලසට ප්‍රිය කරන අයගේ
කූඩාරම් ගින්නෙන් දැවී යනු
ඇත.[6]
35 ඔවුහු නපුරු දේ සිතෙහි පෝෂණය
කරමින් දුෂ්ටකම් කරන්-
නෝය.[7]
ඔවුන්ගේ සිත් වංචාවෙන් පිරී
ඇත.”

16 යෝබ් මෙසේ පිළිතුරු දුන්-
නේය.
2 “එවැනි කතා මා කොතෙකුත් අසා
ඇද්ද?
ඔබ සියල්ලෝම ඇවිත් සිටින්-
නේ මාව සැනසීමට නොව
මාගේ සිත බිඳ දැමීමටය.[1]
3 ඔබේ කිසි කමකට නැති කතාව-
ලට අවසානයක් නැද්ද?[2]
ඔබ මෙතරම් සිත රිදවන වචන
පවසන්නේ මන්ද?
4 ඔබත් මා සිටින තත්වයේම
සිටියා නම්
ඔබ මෙන් කතා කරන්න මටත්
තිබිණ.
සමච්චලයට හිස වනමින්[3] ඔබට
විරුද්ධව නොයෙකුත් දේ
කියන්න මට තිබිණ.[4]
එහෙත් මා එසේ කරයි කියා ඔබ
සිතන්නහුද?
5 මම සිත සනසන වචනවලින්
ඔබව ශක්තිමත් කරන්-
නෙමි.[5]
ඔබේ වේදනාව සමනය කරන්-
නෙමි.
6 මා කොතරම් කතා කළත් මාගේ
වේදනාව අඩු නොවෙයි.[6]
මා කතා නොකර සිටියත්
මාගේ වේදනාව පහව
නොයයි.
7 දෙවි මාගේ සිත ශෝකයෙන්[7]
පිරෙව්වේය.
ඔහු මාගේ සියලු ගෙවැසියන්ව
අසරණ කළේය.
8 ඔහු මාව අල්ලාගෙන සිර කර
තැබුවේය.
මාගේ සිරුර ඇට සැකිල්ලක්
වී ඇත. එය මට විරුද්ධව
සාක්ෂි[8] දෙයි.
9 දෙවි මහත් කෝපයෙන් මාව
කැබලි කොට ඉරා දැමුවේය.
ඔහුගේ උදහස මට විරුද්ධව
ඇවිළෙයි.[9]
ඔහු දත්මිටි කමින්[10]
මා දෙස කුරිරු බැල්මක් හෙ-
ළයි.[11]

15 පරි.
1 ගීතා 17:10
2 යෝබ් 20:28
3 යෝබ් 4:9
4 යෝබ් 22:16
5 යෝබ් 8:13 යෝබ් 16:2 යෝබ් 42:7
6 යෝබ් 16:3 යෝබ් 42:8
7 ගීතා 7:14 යෙසා 59:4 යාකො 1:15

2 තීරුව

16 පරි.
1 යෝබ් 13:4 යෝබ් 19:2 පිලි 1:17
2 දේශ 10:14
3 ගීතා 109:25 මතෙ 27:39
4 මතෙ 7:12 රෝම 12:15 1යොහ 3:8
5 යෝබ් 4:3 හිතෝ 27:9 ගලා 6:1
6 යෝබ් 2:13
7 යෝබ් 7:3
8 යෝබ් 16:19
9 යෝබ් 10:16
10 ක්‍රියා 7:54
11 යෝබ් 33:10

10 බොහෝදෙනා මට විරුද්ධව රැස්ව
සිටිති.[1]
ඔවුහු මාව ගිලගැනීමට මාන
බලමින් සිටිති.[2]
මාගේ කම්මුලට ගසා මට
නින්දා කරති.
11 දෙවි මාව තරුණයන්ගේ අතට
භාර දුන්නේය.
දුෂ්ටයන් ඉදිරියට මාව තල්ලු
කර දැමුවේය.[3]
12 මම නිස්කලංකව දිවි ගෙවමින්
සිටියෙමි. එහෙත් ඔහු මා
කැලඹුවේය.[4]
ඔහු මාව බෙල්ලෙන් අල්ලා-
ගෙන පොළොවේ ගැසුවේය.
ඔහු මාවම ඉලක්ක කරගෙන
සිටින්නේය.
13 ඔහු මට කිසිසේත් අනුකම්පා
නොකරන්නේය.
ඔහුගේ දුනුවායෝ[5] මා වට කර-
ගත්තෝය.
ඔවුන්ගේ ඊතල මාගේ වකුගඩු
පසාරු කරගෙන ගියේය.[6]
මාගේ පිත පවා පිටතට
ගැලුවේය.
14 දෙවි බලවන්තයෙකු මෙන් මා
පසුපස ඇවිත් පහර දෙන්-
නේය.[7]
මා යළි යළිත් ප්‍රහාරයට ලක් වූ
කැඩී බිඳී ගිය පවුරක් මෙනි.
15 මම ගෝණි රෙදි[8] මසාගෙන මාගේ
ශරීරය වසාගත්තෙමි.
මාගේ මුහුණ* දූවිල්ලෙහි[9] සඟ-
වාගතිමි.
16 හැඬූ කඳුළු නිසා මාගේ මුහුණ රතු
වී ඇත.[10]
දෙනෙත් අඳුරු වී ඇත.[11]
17 එනමුත් මම කිසිවෙකුට හානියක්
සිදු කර නැත.
මාගේ යාච්ඤාද අවංකය.[12]
18 මා භූමියට කතා කර, මාගේ රුධි-
රය[13] වසා නොගන්න කියාද
මාගේ විලාප හඬ සඟවා නො-
ගන්න කියාද කියමි.

යෝබ් 16:15* හෝ, “ගෞරවය.”

**16 පරි.**
1 ගීතා 35:15
2 ගීතා 22:13
3 ගීතා 27:12
4 යෝබ් 1:12 යෝබ් 1:17
5 යෝබ් 7:20
6 ගීතා 73:21 විලා 3:13
7 විලා 3:3
8 1රාජා 21:27 2රාජා 6:30
9 යෝබ් 30:19 ගීතා 7:5
10 ගීතා 6:6 ගීතා 31:9 විලා 1:16
11 විලා 5:17
12 හිතෝ 15:8
13 උත් 4:10 ගීතා 72:14

**2 තීරුව**
1 1සාමු 12:5 රෝම 1:9 2කොරි 11:31 1තෙස 2:10
2 යෝබ් 12:4
3 ගීතා 40:1 ගීතා 142:2 ලූක් 18:1
4 යෝබ් 31:35 දේශ 6:10 යෙසා 45:9 රෝම 9:20
5 යෝබ් 7:9 යෝබ් 14:10 දේශ 12:5

**17 පරි.**
6 යෙසා 57:15
7 ගීතා 88:4 යෙසා 38:10
8 ගීතා 35:16 හෙබ්‍රෙ 11:36
9 1සාමු 25:29 ගීතා 119:122
10 2රාජා 10:15 හිතෝ 11:21 හිතෝ 17:18
11 2සාමු 17:14 යෙසා 6:10 මතෙ 11:25 රෝම 11:8

19 බලන්න! මා වෙනුවෙන් සාක්ෂි
දෙන්නා සිටින්නේ ස්වර්ග-
යෙහිය.[1]
ඔහු ඉහළ ස්ථානයේ සිට මට
පක්ෂව කතා කරන්නේය.
20 මාගේ මිතුරෝ මට විරුද්ධව කතා
කරති.[2]
මම රාත්‍රිය පුරාම දෙවිගෙන්
උපකාරය පතමින් හඬන්-
නෙමි.[3]
21 මිනිසෙකු තවත් මිනිසෙකු සමඟ
කාරණා විසඳන්නාක් මෙන්
මිනිසාත් දෙවිත් අතරද කාර-
ණයක් විසඳීමට තිබේ.[4]
22 මට තව ඉතුරුව ඇත්තේ ස්වල්ප
දවසකි.
තව කෙටි කලකින් මම අවසන්
ගමන් යන්නෙමි. ඒ ගම-
නෙන් යළි හැරී ඒමට මට
නොහැකිය.[5]

**17** “මාගේ සිත බිඳී ගියේය.[6]
මම දැන් මරණාසන්නව
සිටිමි.
මිනී වළද මා එන තුරු බලා
සිටින්නේය.[7]
2 සමච්චල් කරන්නෝ මා වට කර
සිටිති.[8]
මාගේ දෑසට පෙනෙන්නේ
ඔවුන්ගේ කැරලිකාරකම
පමණි.
3 ‘දෙවියනි, මා වෙනුවෙන් ඇප වන
මෙන් මම ඔබෙන් ඉල්ලා
සිටිමි.[9]
ඔබ හැර මා වෙනුවෙන් ඇප
වීමට*[10] වෙන කවරෙකු
සිටීද?
4 නුවණ නොලබන පිණිස ඔබ
ඔවුන්ගේ සිත් වසා ඇත.[11]
ඔවුන් ජය නොලබන්නේ ඒ
නිසාය.
5 ඔවුහු තම මිතුරන්ට හඬගසා
තමන්ට හිමි උරුමයෙන්

යෝබ් 17:3* මුල් භාෂාවේ, ‘මට අතට අත දී ඇප වීමට’ යන අදහස ඇතුළත් කර තිබේ.

කොටසක් ගන්න කියා ආරා-
ධනා කරති.
නමුත් ඔවුන්ගේ පුත්‍රයෝ අන්ධ-
යන් බවට පත් වනු ඇත.'[1]
6 දෙවි මා උපහාසයට[2] ලක් කරන්න
මනුෂ්‍යයන්ට ඉඩහැරියේය.
ඔවුහු මාගේ මුහුණට කෙළ
ගැසුවෝය.[3]
7 ශෝකයෙන් මාගේ දෙනෙත් අඳුරු
වී ඇත.[4]
මාගේ සිරුර පහ වී යන සෙව-
ණැල්ලක් මෙනි.
8 ප්‍රතිපත්තිගරුක අය මා දෙස බලා
පුදුම වෙති.
දෙවිට ද්‍රෝහී වූ අයගේ ක්‍රියා
දැක නිර්දෝෂ අය කලබල
වන්නෝය.
9 ධර්මිෂ්ඨයා කෙදිනකවත් යහම-
ඟෙන් ඉවතට නොහැරෙයි.[5]
නිර්දෝෂ[6] තැනැත්තාගේ ශක්-
තිය දිනෙන් දින වැඩි වෙයි.[7]
10 ඔබ සියල්ලෝම දිගටම මා සමඟ
වාද කරන්න.
ඔබ කොතෙකුත් දේවල් පැවසු-
වත් ඔබ අතරේ එක්
ප්‍රඥාවන්තයෙකුවත් මට
සොයාගත නොහැකිය.[8]
11 මාගේ දිවි ගමන කෙළවර වී
ඇත.[9] මාගේ සැලසුම් සියල්-
ලම අසාර්ථක වී ඇත.[10]
මාගේ සිතේ ප්‍රාර්ථනා ඉටු
නොවීය.
12 'ආලෝකය උදා වෙන්න ආසන්-
නයි' කියමින් මාගේ මිතුරෝ
බොරු කියති.
එහෙත් දසත විහිදී ඇත්තේ
අඳුර පමණි.[11]
13 බලාපොරොත්තුවක් ඇතත් ඒ
මිනී වළ ගැන පමණය.[12]
අන්ධකාරයෙහි[13] මම සැත-
පෙන්නෙමි.
14 මම මිනී වළට,[14] 'මාගේ පියා-
ණෙනි' කියා අමතමි.
පණුවන්ට,[15] 'මාගේ මෑණි-
යෙනි' කියාද 'මාගේ නැඟ-
ණියෙනි' කියාද අමතමි.
15 එසේනම් මා බලාපොරොත්තු වූ
සියල්ලට සිදු වූයේ කුමක්ද?[1]
මට කිසිදු බලාපොරොත්තුවක්
ඇතැයි කියා කවරෙකු හෝ
සිතයිද?
16 මිනී වළට මා බැස යන විට මාගේ
සියලු බලාපොරොත්තුද මා
සමඟම නැති වී යනු ඇත.
මාගේ සියලු ප්‍රාර්ථනා සමඟම
මම දූවිල්ලට හැරී යන්-
නෙමි."[2]

**18** එවිට ෂූහිය බිල්දද් මෙසේ
කීවේය.
2 "ඔබ සියල්ලෝම* තව කොපමණ
කල් මෙලෙස කතා කරන්න
බලාපොරොත්තු වී සිටින-
වාද?
කාරණා අවබෝධ කරගන්න
වෑයම් කරන්න. පසුව අපි
කාරණා සාකච්ඡා කරමු.
3 ඔබ අපව වනසතුන්ගේ ගණයට
දමා තිබෙන්නේ මන්ද?[3]
අපව අපවිත්‍ර අය හැටියට සල-
කන්නේ මන්ද?
4 ඔබේ කෝපය නිසා ඔබ ඔබවම
විනාශ කරගන්නෙහිය.
ඔබ වෙනුවෙන් මිනිසුන් පො-
ළොව අත්හැර යයි කියා ඔබ
සිතන්නෙහිද?
ඔබ නිසා කඳු නියමිත ස්ථාන-
වලින් ඉවත් කරනු ලබයි
කියා ඔබ සිතනවාද?
5 දුෂ්ටයාගේ පහන නිවී යන්නේය.[4]
ඔහු ගින්නක් දැල්වූවත් එයින්
ආලෝකයක් නොනික්මෙයි.
6 ඔහුගේ කූඩාරමට අන්ධකාරය පිය
මනින්නේය.[5]
එහි පහනද නිවී යන්නේය.
7 ස්ථිරව පියවර තබන ඔහු යම්
දිනක කොරගසමින් යනු
ඇත.
ඔහු යෙදූ උපායන්ට ඔහුම හසු
වනු ඇත.[6]

17 පරි.
1 යෝබ් 11:20
2 යෝබ් 30:9 ගීතා 69:11
3 යෝබ් 30:10
4 යෝබ් 16:16 ගීතා 6:7 ගීතා 31:9
5 ගීතා 119:165 හිතෝ 4:11
6 උත් 20:5 ගීතා 24:4 ගීතා 26:6
7 ගීතා 84:7
8 යෝබ් 6:29 රෝම 1:22
9 යෝබ් 7:6 යෝබ් 9:25 යෙසා 38:10
10 යාකො 4:13
11 යෙසා 5:20 යොහ 3:19
12 දේශ 12:5 දේශ 12:7
13 යෝබ් 10:21 යෙසා 47:5
14 ගීතා 30:3 ගීතා 49:9 ගීතා 143:7 හිතෝ 1:12 යෙසා 14:15 යෝනා 2:6
15 යෝබ් 24:20 යෙසා 14:11 මාක් 9:48

2 තීරුව
1 යෝබ් 7:6 යෝබ් 14:19 යෝබ් 19:10
2 උත් 3:19 යෝබ් 3:19 දේශ 3:20

18 පරි.
3 ගීතා 73:22 2පේතෘ 2:12
4 හිතෝ 13:9 හිතෝ 24:20
5 යෝබ් 21:17
6 යෝබ් 5:13

**යෝබ් 18:2*** මෙය යෝබ් සහ ඔහු හා සමාන වෙනත් අයට යොමු දක්වනවා විය හැකියි.

8 ඔහු උගුලක් වෙතට පියමං කරන්-
නේය.[1]
දැලක් මත අඩිය තබන්නේය.
9 ඔහුගේ විලුඹ උගුලකට හසු
වෙයි.[2]
ගැලවිය නොහැකි සේ එය[3]
ඔහුව වෙළාගනියි.
10 ඔහු යන මඟෙහි මරුවැලක් සඟවා
ඇත.
බොරු වළක්ද කපා ඇත.
11 බියගන්වන දේවල් ඔහුව වට කර-
ගනියි.[4]
භීතිය ඔහු පසුපස ලුහුබැඳ එයි.
12 ඔහුගේ ශක්තිය හීන වී ඇත.
විපත්තිය[5] ඔහුගේ පය පැකිලවී-
මට බලා සිටියි.
13 මාරාන්තික රෝගයකින් ඔහුගේ
සම ක්ෂය වී යයි.
එය ඔහුගේ අත පය කා දමයි.
14 ඔහු සුරක්ෂිතව වාසය කළ කූඩා-
රමෙන් ඔහුව පැහැරගනු
ඇත.[6]
භීතියේ රජු වෙතට ඔහුව
රැගෙන යනු ඇත.
15 ඔහුට අයිති නැති දේ ඔහු-
ගේ කූඩාරමෙන් සොයාගනු
ඇත.
ඔහු වාසය කරන ස්ථානය
පුරාම ගෙන්දගම්[7] විසිර
තිබේ.
16 ඔහුගේ මුල් වියළී යයි.[8]
ඔහුගේ අතු මැලවී යයි.
17 ඔහුගේ නම පොළොවෙන් තුරන්
වී යන්නේය.[9]
ඔහු ගැන කිසිවෙක් මතක්
කරන්නේවත් නැත.
18 ඔහුව ආලෝකයෙන් අන්ධකාර-
යට තල්ලු කරනු ලබයි.
පොළොවෙන් ඔහුව පන්නා
දමනු ලබයි.
19 ඔහුගේ සෙනඟ අතරේ තම දරු
මුනුපුරෝ නොසිටිනු ඇත.[10]
ඔහු විදේශිකයෙකු ලෙස වාසය
කළ දේශවලවත් ඔහුගේ
නමින් කිසිවෙක් ඉතුරු
නොවනු ඇත.

18 පරි.
1 යෝබ් 22:10
2 යෙරෙ 18:22
3 යෝබ් 5:5 ගීතා 140:5
4 යෝබ් 15:21 යෝබ් 20:25
5 යෝබ් 15:23
6 යෝබ් 8:14 යෝබ් 11:20
7 ද්වි 29:23
8 යෝබ් 29:19
9 හිතෝ 10:7
10 යෝබ් 42:8

2 නිරූව

19 පරි.
1 ගීතා 55:21 හිතෝ 12:18 යාකො 3:8
2 ගීතා 42:10
3 යෝබ් 6:14 හිතෝ 18:24 මතෙ 7:12
4 රෝම 3:23
5 ගීතා 38:16
6 ගීතා 69:26
7 ගීතා 66:11 විලා 1:13
8 ගීතා 22:2 හබ 1:2
9 ලූක් 18:7
10 යෝබ් 3:23 ගීතා 88:8 විලා 3:7
11 යෙසා 50:10 යෙරෙ 13:16

20 බස්නාහිර දෙසින් ජීවත් වන වැසි-
යෝ ඔහු විනාශ වන දවසේදී
මවිතයෙන් බලා සිටිනු ඇත.
නැඟෙනහිර දෙසින් ජීවත් වන
වැසියෝ භීතියෙන් වෙවුලනු
ඇත.
21 දුෂ්ටයන් මෙලොවින් තුරන් වන්-
නේ ඒ ආකාරයටය.
දෙවිව නාඳුනන අයගේ කූඩා-
රම් විනාශ වන්නේ එලෙ-
සය.”

19 එවිට යෝබ් ඔවුන්ට මෙසේ
කීවේය.
2 “ඔබ කොපමණ කල් මට වචනව-
ලින් පහර දී දුක් දෙන්නහුද?[1]
මාගේ හදවතට මෙලෙස වේ-
දනා දෙන්නේ තව කොප-
මණ කාලයකටද?[2]
3 ඔබ මට දහ වතාවක්ම අපහාස
කළහුය.
ඔබ කුරිරු ලෙස මට සැලකු-
වත්[3] ඔබට ඒ ගැන කිසි ලැජ්-
ජාවක් නැත.
4 මා වරදක් කර ඇත්නම්[4]
එහි ප්‍රතිඵල විඳින්නේ මා නො-
වෙයිද?
5 ඔබවම උසස් කරගෙන මට
විරුද්ධව උඩඟු ලෙස කතා
කරමින්[5]
මට සිදු වූ නින්දාව සාධාරණ
බව ඔප්පු කිරීමට ඔබ මාන
බලන්නහුය.[6]
6 දෙවි මාව මංමුළා කළේය.
ඔහු මට දැලක් දමා මාව කොටු
කරගත්තේය.[7]
7 මට සිදු වූ මේ අසාධාරණය දෙස
බලා මට උදව් කරන මෙන්
මා ඉල්ලුවද කිසිවෙක් මාගේ
උපකාරයට ආවේ නැත.[8]
මා විලාප නඟා පිහිට පැතුවද
කිසිවෙක් මට යුක්තිය ඉටු
කර දුන්නේ නැත.[9]
8 ඔහු පවුරක් බැඳ මාගේ ගමන් මඟ
වසා දැමුවේය.[10]
මා පය තබන තැන් අඳුරු
කළේය.[11]

9 ඔහු මාගේ ගෞරවය නින්දාවකට
පෙරළුවේය.[1]
මාගේ හිස මත තිබූ ඔටුන්න
ඉවත් කර දැමුවේය.
10 ඔහු මට සැම අතින්ම පහර දී මාව
නැති නාස්ති කරන්නේය.
ගසක් උගුලා දමන්නාක් මෙන්
මාගේ බලාපොරොත්තු සුන්
කරන්නේය.
11 ඔහුගේ කෝපය මට විරුද්ධව
ඇවිළෙමින් තිබේ.[2]
ඔහු මාව සලකන්නේ ඔහුගේ
සතුරෙකු මෙනි.
12 ඔහුගේ මුළු හමුදාවම මාගේ කූඩා-
රම වටා කඳවුරු බැඳගෙන,
මට විරුද්ධව සටනට සැරසී
සිටිති.[3]
13 මාගේම සහෝදරයන්ව ඔහු
මාගෙන් දුරස් කර ඇත.[4]
මාව හඳුනන අය දැන් මාගෙන්
ඈත් වී සිටිති.
14 මාගේ කල්‍යාණ මිතුරෝ පවා මාව
අත්හැර දමා ඇත.[5]
මාගේ හිතමිතුරන්ට දැන් මාව
අමතක වී ඇත.
15 මාගේ නිවසේ සිටින අමුත්තන්[6]
හා සේවිකාවන් පවා මාව
සලකන්නේ පිටස්තරයෙකු
ලෙසයි.
මම දැන් පිට දේශයකින් පැමිණි
අමුත්තෙකු මෙන් වී ඇත.
16 මාගේ සේවකයාට හඬගැසුවද ඔහු
මට උත්තර දෙන්නේ නැත.
මට උපකාර කරන මෙන්
බැගෑපත්ව ඉල්ලා සිටියද
ඔහු මා ළඟට පැමිණෙන්නේ
නැත.
17 මාගේ මුඛයෙන් පිට වන හුස්ම
මාගේ භාර්යාවට[7] පිළි-
කුලකි.
එක කුසේ උපන් සහෝදර-
යන්ට පවා මාව පිළිකුලකි.
18 තරුණයෝ පවා මාව හෙළා-
දකිති.[8]
මා නැඟිටින විට ඔවුහු මට
නින්දා කරති.

**19 පරි.**
1 ගීතා 89:44
2 යෝබ් 13:24
3 යෝබ් 30:12
4 ගීතා 31:11
ගීතා 38:11
ගීතා 69:8
5 ගීතා 38:11
6 යෝබ් 31:32
7 යෝබ් 2:9
8 2රාජා 2:23

**2 තීරුව**
1 යෝබ් 17:6
ගීතා 88:8
2 ගීතා 109:5
3 යෝබ් 30:30
යෝබ් 33:21
ගීතා 102:5
විලා 4:8
4 මතෙ 5:7
1පේතෘ 3:8
5 යෝබ් 1:11
ගීතා 38:2
6 යෝබ් 2:10
ගීතා 69:26
7 යෙරෙ 17:1
8 යෝබ් 14:14
ගීතා 19:14
ගීතා 69:18
ගීතා 103:4
හිතෝ 23:11
මතෙ 20:28
9 මාක් 10:45
රෝම 3:24
1කොරි 1:30
10 ගීතා 17:15
11 ගීතා 69:26

19 මාගේ කල්‍යාණ මිතුරෝ මාව පිළි-
කුල් කරති.[1]
මා ආදරය කළ සියල්ලෝම මට
විරුද්ධව නැඟී සිටිති.[2]
20 මාගේ ඇටකටු පෑදී ඇත.[3]
මා නොමැරී සිටීමත් පුදුමයකි!*
21 අනේ මාගේ මිත්‍රයෙනි, මට අනු-
කම්පා කරන්න.[4]
මන්ද මෙය දෙවිගෙන් ලද දඬුව-
මකි.[5]
22 දෙවි මෙන් ඔබත් මට පීඩා කරන්-
නේ මන්ද?[6]
මට අපහාස කිරීමෙන් ඔබ සෑහී-
මට පත් වන්නේ නැද්ද?
23 මා පවසන සියල්ල ලියවිල්ලක
සටහන් කර තැබුවා නම්
කොතරම් යහපත්ද!
24 මාගේ වචන යකඩ පන්හිඳකින්[7]
ගලක කොටා,
කිසිදා නොමැකී යන සේ ඊයම්
දමා සුරකිව තැබිය හැකි
නම් කොතරම් අගනේද!
25 මා වෙනුවෙන් ගැලවුම්කරුවෙකු[8]
සිටින බව මම දනිමි.
මා මිය ගිය පසු ඔහු මා වෙනු-
වෙන් නැඟී සිටින බව[9] මට
ස්ථිරය.
26 මාගේ සම ගැලවී ශරීරය ක්ෂය වී
ගිය පසුත්
මාගේ දෙනෙතින් මම දෙවිව
දකින්නෙමි.
27 මා ඔහුව දකින්නේ වෙනත් අයෙකු
මාර්ගයෙන් නොවෙයි. මමම
ඔහුව දකින්නෙමි.[10]
ඔහු ගැන මට වෙනත් අයෙකු
විස්තර කළ යුතු නැත.
මාගේම ඇසින් මම ඔහුව
දකින්නෙමි.
මාගේ දැවෙන ආශාව ඉටු
නොවූ නිසා මාගේ සිත* බිඳී
ගොස් ඇත.
28 ‘අප ඔබට පීඩා කරන්නේ කෙලෙ-
සද’[11] කියා ඔබ මාගෙන්
අසන්නහුය.

---

**යෝබ් 19:20*** මූ.අ., “මා බේරී සිටින්නේ මාගේ දතේ සමකිනි.” **27*** මූ.අ., “වකුගඩු.”

වරද තිබෙන්නේ මා අතේ කියා
ඔබ සිතන්නහුය.
29 ඔබ කඩුවට[1] බියෙන් සිටිය යුතුය.
මන්ද වරදකරුවන්ට දඬුවම්
කරන පිණිස කඩුවක් එවන
ලදි.
එවිට ධර්මිෂ්ඨ විනිශ්චයකරු-
වෙකු සිටින බව ඔබ සියලු-
දෙනා දැනගනු ඇත.”[2]

20 ඉන්පසු නයමාතිය ෂෝපර්
මෙසේ පිළිතුරු දුන්නේය.
2 “ඔබට උත්තර දෙන තුරු මාගේ
සිතට ඉවසුමක් නැත.
මාගේ සිත කැලඹී ඇත.
3 ඔබේ නින්දා බස් මාගේ කනට
වැටිණ.
කිසි අවබෝධයක් නැති කෙ-
නෙකුගේ කීම්වලට පිළිතුරු
නොදී සිටින්නේ කොහො-
මද?
4 මිනිස් ඉතිහාසයේ ආරම්භයේ
පටන්[3]
දේවල් මෙයාකාරයෙන් සිදු වන
බව ඔබ දැන සිටියේ නැද්ද?
5 දුෂ්ටයා ප්‍රීති ඝෝෂා නඟන්නේ
ඉතා සුළු මොහොතකටය.[4]
දෙවිට ද්‍රෝහිකම් කරන අයගේ
සතුට තාවකාලිකය.
6 ඔහු හිස උදුම්මාගෙන අහස දක්-
වාම නැග්ගත්[5]
ඔහුගේ හිස වලාකුළු ස්පර්ශ
කළත්
7 කසළ මෙන් ඔහු සදහටම නැති
වී යන්නේය.[6]
ඔහුව හඳුනන අය, ‘ඔහු කො-
හේද’ කියා අසමින් ඔහුව
සොයනු ඇත.[7]
8 එහෙත් ඔවුන්ට ඔහුව සම්බ වන්-
නේ නැත. ඔහු සිහිනයක්
මෙන්ද
රාත්‍රියේ දකින දර්ශනයක්
මෙන්ද නොපෙනී යන්නේය.[8]
9 ඔහුව දුටු කිසිවෙක් නැවත කිසිදා
ඔහුව දකින්නේ නැත.[9]
ඔහුගේ නිවස තුළ ඔහුව යළි
කිසිදා දකින්න ලැබෙන්නේ
නැත.[1]
10 ඔහුගේ පුත්‍රයෝ දිළිඳුන්ව සතු-
ටට පත් කිරීමට පෙලඹෙනු
ඇත.
ඔහු අන් අයගෙන් ගත් වටිනා
දේ යළි ඔවුන්ටම භාර දෙනු
ඇත.[2]
11 ඔහු තරුණ ශක්තියෙන් පිරිපුන්
කෙනෙකු වුවද
දූවිල්ලට හැරී යද්දී[3] ඔහුගේ
ශක්තියද ඔහු සමඟ පහව
යන්නේය.
12 ඔහු නරක දේ මිහිරි දෙයක් සේ
සලකමින්
දිව යට තබාගෙන සිටියද
13 උඩු තල්ලේ තබාගෙන
රස විඳිමින් සිටියද
14 එය කුස තුළට ගිය පසු ඔහුට අමි-
හිරි දෙයක් වනු ඇත.
එය නාග විෂ මෙන් වනු ඇත.
15 ඔහු කෑදරකමින් යමක් ගිල දමන්-
නාක් මෙන් ධන සම්පත් රැස්
කරන නමුත් ඒ සියල්ල
ඔහුට වමාරන්න සිදු වනු
ඇත.
ඔහුගේ උදරයෙන් දෙවි ඒවා
පිටතට ඇද දමන්නේය.
16 ඔහු නාග විෂ උරා බොන්නේය.
පොළඟාගේ දළෙන් මැරුම්
කන්නේය.[4]
17 ගංගා, ඇළදොළ ඔහුගේ ඇසට
නොපෙනෙන්නේය.[5]
වෙඬරු* සහ මීපැණි ගලා යන
දිය දහරා ඔහු කිසිදා නොද-
කින්නේය.
18 ඔහු වෙහෙස මහන්සි වී උපයාගත්
දේ භුක්ති නොවිඳ ආපසු
භාර දෙන්නේය.
ඔහු ලාභ උපයන නමුත් එයින්
තෘප්තියට පත් නොවන්-
නේය.[6]
19 මන්ද ඔහු දුප්පතුන්ට හිංසා පීඩා
කර ඔවුන්ව අසරණ කර
තිබේ.

**19 පරි.**
1 ද්වි 32:41
2 ගීතා 58:11 මතෙ 7:1 රෝම 14:4 යාකො 4:12

**20 පරි.**
3 උත් 1:27 යෝබ් 8:8
4 ගීතා 37:36
5 යෙසා 14:13 ආමෝ 9:2 ඔබ 4
6 ගීතා 83:10 යෙරෙ 8:2
7 යෝබ් 14:10
8 ගීතා 73:20 ගීතා 90:5
9 ගීතා 37:36

**2 නිරුව**
1 යෝබ් 8:18 ගීතා 103:16
2 යෝබ් 20:18
3 යෝබ් 21:26
4 ද්වි 32:33
5 ගීතා 36:9 යෙරෙ 17:6
6 යෝබ් 20:10

යෝබ් **20:17*** උත් 18:8හි පාදසටහන බලන්න.

අනුන් සෑදූ නිවසක් ඔහු අයුතු-
කමින් පැහැරගෙන තිබේ.[1]
20 ඔහු මහත් ආශාවෙන් ධනය රැස්
කරගත්තද ඔහුව ගලවා-
ගන්න එයට බලයක් නැත.[2]
ඔහුගේ සිතට කිසිදා සැනසීමක්
ලැබෙන්නේ නැත.
21 ඔහුට ගිල දමන්නට තවත් කිසි-
වක් ඉතුරුව නැත.
ඔහුගේ සමෘද්ධිය දිගු කල් පව-
තින්නේ නැත.
22 මොන තරම් ධන සම්පත් තිබුණද
ඔහුගේ සිතට කිසි සැනසිල්-
ලක් නැත.[3]
සිදු විය හැකි සෑම විපතක්ම
ඔහු පිටට පැමිණෙනු ඇත.
23 දෙවි තම කෝපය ඔහු පිට වගුරු-
වනු ඇත.[4]
දෙවිගේ කෝපයෙන්
ඔහුගේ කුස පිරී ඉතිරී යනු ඇත!
24 ඔහු යකඩ ආයුධයකින් බේරීමට
පලා ගියද[5]
තඹ ඊතලයක් ඔහුගේ සිරුර
පසාරු කරගෙන යන්නේය.
25 දිලිසෙන ඊතලයක්
ඔහුගේ පිත්තාශය පසාරු කර-
ගෙන පිටතට එන්නේය.[6]
භීතිය ඔහුව වට කරගන්නේය.[7]
26 ඔහුගේ වස්තු සම්භාරය අඳුරේදී
ගිලිහී යනු ඇත.
ඉබේම හටගත් ගින්නක් ඔහුව
දවා දමනු ඇත.[8]
ඔහුගේ කූඩාරමේ ඉතුරු වන
කිසිවෙක් ගැලවෙන්නේ
නැත.
27 ස්වර්ගය ඔහු කළ වැරදි හෙළි
කරනු ඇත.[9]
පොළොව ඔහුට විරුද්ධව නැඟී
සිටිනු ඇත.
28 මහා වැස්සකට ඔහුගේ කූඩාරම
ගසාගෙන යන්නේය.
දෙවි තම උදහස ප්‍රකාශ කරන
දවසේදී මහා ජල කන්-
දරාවක් ඔහු මතට කඩා
හැළෙන්නේය.[10]
29 දෙවිට විරුද්ධව ක්‍රියා කරන අයට
ලැබෙන දඬුවම එයයි.
දුෂ්ටයන්ට දෙවිගෙන් ලැබෙන
උරුමය එයයි.”[1]

# 21

එවිට යෝබ් මෙසේ කීවේය.
2 “මා පවසන දේට හොඳින්
සවන් දෙන්න.
එවිට ඔබට සැනසීමක්
ලැබෙනු ඇත.
3 මා පවසන දේ ඉවසීමෙන් අසා
සිටින්න.
ඉන්පසු කැමති විදිහට මට අප-
හාස කරන්න.[2]
4 මාගේ සිතට දැනෙන වේදනාව
ගැන මා පවසන්නේ මනුෂ්‍ය-
යෙකුට කියා ඔබ සිතනවාද?
එසේනම් මා මෙලෙස ඉවසා-
ගෙන සිටින්නේ කොහොමද?
5 මා දෙස බලා පුදුම වී,
ඔබේ අතින් කට වසාගන්න.[3]
6 මේ දේවල් මතක් වන විට මාගේ
සිත කැලඹෙන්නේය.
මාගේ ගත කිලිපොළා යන්-
නේය.
7 දුෂ්ටයන් කිසි කරදරයක් නොමැ-
තිව ජීවත් වන්නේ මන්ද?[4]
ඔවුහු ධන සම්පත් රැස් කරගනි-
මින් බලවත් වී දිගු කලක්
ජීවත් වන්නෝය.[5]
8 ඔවුහු තමන්ගේ දරුවන්ද දරුවන්-
ගේ දරුවන්ද
දියුණු වෙමින් සුවසේ ජීවත්
වන අයුරු තම ඇස්වලින්ම
දකින්නෝය.
9 ඔවුන්ගේ නිවෙස් තුළ සාමය
රජයන්නේය. භීතිය යනු
කුමක්ද කියා ඔවුහු නොද-
නිති.[6]
දෙවිගේ දඬුවමෙන් ඔවුන් නිද-
හස්ය.
10 ඔවුන්ගේ ගවයන්ගේ ජවය මොන
තරම්ද! එහෙයින් එළදෙන්නු
නොවරදවා පැටවුන් බිහි
කරති.[7]
උන් කිසිවිටෙක ගබ්සාවක් අත්
නොදකිති.

**20 පරි.**
1 යෝබ් 35:9
2 හිතෝ 11:4 දේශ 5:13
3 දේශ 5:12
4 ගණන් 11:33 ගීතා 78:31
5 යෙසා 24:18 ආමො 9:2
6 යෝබ් 16:13
7 යෝබ් 18:11
8 ගීතා 21:9
9 ගීතා 44:21 මලා 3:5
10 ගීතා 11:6

**2 තීරුව**
1 යෝබ් 27:13 යෝබ් 31:3 හිතෝ 10:7

**21 පරි.**
2 යෝබ් 16:10 යෝබ් 16:20 යෝබ් 17:2 හෙබ්‍රෙ 11:36
3 විනි 18:19 යෝබ් 40:4 හිතෝ 30:32
4 යෙසා 55:7 එස 33:11 හබ 1:3 හබ 1:13 රෝම 9:17 රෝම 9:22
5 යෝබ් 12:6 ගීතා 37:7 ගීතා 73:3 ගීතා 73:12 යෙරෙ 12:1
6 ගීතා 73:5
7 ගීතා 144:14

11 සත්ව රැළක් මෙන් නිදහසේ දුව
පැන යන්න ඔවුහු තම දරු-
වන්ට ඉඩහරිති.
ඔවුන්ගේ දරුවෝ ප්‍රීති ප්‍රමෝද-
යෙන් කල් ගෙවති.
12 ඔවුහු රබන් ගසමින් වීණා වයමින්
ගී ගයන්නෝය.[1]
ප්‍රීති ප්‍රමෝදයෙන් නළා පිඹිමින්
නටන්නෝය.
13 ඔවුහු සතුටින් කල් ගෙවන්-
නෝය.[2]
කිසි දුකක් නොවිඳ සැණෙකින්
මිය යන්නෝය.
14 ඔවුහු සැබෑ දෙවිට කතා කොට
මෙසේ කියති. ‘අපට අපේ
පාඩුවේ ඉන්න දෙන්න![3]
ඔබෙන් මඟ පෙන්වීම් පතන්න
අපට කිසිම අවශ්‍යතාවක්
නැත.[4]
15 සියලු බලැති දෙවි කියන්නේ
කවුද? අප ඔහුට යටත්
වෙන්නේ කුමකටද?[5]
ඔහු සමඟ කතා කිරීමෙන් අපට
ඇති ප්‍රයෝජනය කුමක්ද?’[6]
16 ඔවුන් තම ජීවිත සාර්ථක කර-
ගෙන තිබුණද එය වැඩි කල්
නොපවතියි.[7]
ඔවුන්ගේ දුෂ්ට උපායන්වලින්
මම ඈත්ව සිටිමි.[8]
17 දුෂ්ටයන්ගේ පහන කී වතාවක්
නිවා දමා ඇද්ද කියාත්[9]
ඔවුන් කී වතාවක් විපතට
මුහුණ දී ඇද්ද කියාත් මට
කියන්න.
දෙවිගේ උදහස නිසා ඔවුන් කී
වතාවක් පහර ලැබ තිබෙන-
වාද?[10]
18 ඔවුන් කවදා හෝ සුළඟට ගසා-
ගෙන යන පිදුරු ගසක් මෙන්
වී තිබේද?[11]
කුණාටුවකට හසු වූ දහයියා
මෙන් විසිර ගොස් තිබේද?
19 මිනිසෙකු කරන දුෂ්ටකම් නිසා
යම් දිනක ඔහුගේ දරුවෝ
පවා දෙවිගෙන් දඬුවම් විඳිනු
ඇත.[12]
එවිට දෙවිගෙන් දඬුවම් ලබන
බව ඔහු තේරුම්ගනු ඇත.[1]
20 දුෂ්ටයා තමන් පිටට පැමිණෙන
විනාශය තම ඇසින්ම දකිනු
ඇත.
සියලු බලැති දෙවිගේ උදහස
නමැති කුසලානයෙන් ඔහුට
බීමට සිදු වන බව ස්ථිරය.[2]
21 ඔහුගේ ආයු කාලය කෙටි කරනු
ලැබුවොත්[3]
තම දරුවන් සමඟ ප්‍රීති වීමට
ඔහුට හැකි වනු ඇද්ද?
22 උත්තමයන්ව පවා විනිශ්චය
කරන දෙවිට[4]
ප්‍රඥාව ගැන කියා දෙන්න තරම්
ඔහු සමතෙක්ද?[5]
23 කිසිම දෙයකින් අඩුවක් නො-
මැතිව
නිදහසේ ජීවිතය භුක්ති විඳිමින්
සිටියදී මිය යන අයෙක්
සිටියි.[6]
24 ඔහුගේ සිරුර තරව තිබියදීත්
ඔහුගේ ඇටමිදුලු තෙත්ව තිබි-
යදීත් ඔහුගේ ජීවිතය අවසන්
වනු ඇත.
25 තවත් අයෙක් කිසිදු යහපත් දෙ-
යක් භුක්ති නොවිඳ
ජීවිත කාලය පුරාම දුක් ගැහැට
විඳිමින් මිය යනු ඇත.[7]
26 ඔවුහු දෙදෙනාම එක හා සමානව
දූවිල්ලෙහි සැතපෙනු ඇත.[8]
ඔවුන් දෙදෙනාගේම මළ සිරුරු
පණුවන්ගෙන් වැසී යනු
ඇත.[9]
27 ඔබ සියලුදෙනාගේ සිතේ තිබෙන
දේ මම හොඳින් දනිමි.
මට විරුද්ධව දුෂ්ට දේ කුමන්-
ත්‍රණය කරන බවත් මම
දනිමි.[10]
28 ‘වංශවත් තැනැත්තාගේ නිවසට
සිදු වූයේ කුමක්ද?
දුෂ්ටයාගේ කූඩාරම කොහේද’[11]
කියා ඔබ අසන්නහුය.
29 රටේ තොටේ ගමන් කර අද්දැකීම්
ලැබූ අයගෙන් මා කියූ දේ
ගැන ඔබ ඇසුවහුද?

21 පරි.
1 යෙසා 5:12 යෙසා 22:13 ආමො 6:5
2 මතෙ 24:38 ලූක් 12:20 ලූක් 17:28 1කොරි 15:32
3 යෝබ් 22:17 ගීතා 10:11 ගීතා 73:11
4 යොහ 3:19 රෝම 1:28
5 නික් 5:2 ගීතා 10:4 හොෂෙ 13:6
6 යෝබ් 34:9 යෝබ් 35:3 මලා 3:14
7 ගීතා 49:7 දේශ 8:8
8 යෝබ් 22:18 ගීතා 1:1
9 හිතෝ 20:20 හිතෝ 24:20
10 ගීතා 73:19 ලූක් 12:46
11 නික් 15:7 ගීතා 1:4 ගීතා 35:5 යෙසා 17:13 හොෂෙ 13:3 මතෙ 3:12
12 නික් 20:5

2 තීරුව
1 ගීතා 11:6 යෙසා 26:11
2 ගීතා 75:8 යෙසා 51:17 යෙරෙ 25:15 එළි 14:10
3 ගීතා 55:23
4 යෙසා 40:23 2පේතෘ 2:4 යූද් 9
5 යෙසා 40:14 රෝම 11:34 1කොරි 2:16
6 ගීතා 49:17 ලූක් 12:20
7 1රාජා 17:12 හිතෝ 13:21
8 යෝබ් 3:19 දේශ 3:20 දේශ 9:2
9 යෝබ් 24:20 යෙසා 14:11
10 ගීතා 59:3
11 යෝබ් 20:7

ඔවුන් ඉදිරිපත් කරන සාක්ෂි
ඔබ සලකා බැලුවහුද?
30 උදහස් දවසේදී අන් සියලුදෙනා
විපතට හසු වන විට
දුෂ්ටයා බේරෙනු ඇත.[1]
31 දුෂ්ටයාගේ මාර්ගය වැරදි බව ඔහු-
ගේ මුහුණටම පවසන්නේ
කවරෙකුද?[2]
ඔහු කළ ක්‍රියාවලට ප්‍රතිඵල
දෙන්නේ කවරෙකුද?[3]
32 ඔහුව සොහොන් බිමට ගෙන යනු
ලැබූ පසු[4]
ඔහුගේ සොහොන රැකවල්
කරනු ඇත.
33 නිම්නයේ පස් පිඩැලි ඔහුව ස්පර්ශ
කළ විට එය ඔහුට සැප-
තකි.[5]
සියලුම ජනයා ඔහු පිටුපස
ගමන් කරති.[6]
ඔහුට ඉදිරියෙන් මහත් ජනකා-
යක් ගමන් කළෝය.
34 මාගේ මිත්‍රවරුනි, ඔබ මාව සැන-
සීමට දරන උත්සාහය කො-
තරම් නිෂ්ඵලද?[7]
ඔබ පවසන දේවල් කිසිසේත්
විශ්වාස කළ නොහැක.”

**22** එවිට තේමානිය එලිෆස්
මෙසේ පිළිතුරු දුන්නේය.
2 “මිනිසෙකුගෙන් දෙවිට කිසිදු
ප්‍රයෝජනයක් තිබේද?[8]
වටහාගැනීමේ ශක්තිය තිබෙන
කෙනෙකුගෙන් වුවද ඔහුට
කිසි ප්‍රයෝජනයක් තිබේද?
3 ඔබ නිර්දෝෂ ජීවිතයක් ගත කිරී-
මට වෑයම් කරන,[9]
ධර්මිෂ්ඨ[10] කෙනෙකු වුණත්
සියලු බලැති දෙවිව ඔබට
සතුටු කළ හැකියි කියා ඔබ
සිතුවාද?
4 ඔහු ඔබව හික්මවන්නේ ඔබ දේ-
වගරුබිය ඇතුව කටයුතු
කරන නිසාද?
ඔහු ඔබට විරුද්ධව නඩුවක්
දමා ඇත්තේ ඒ නිසාද?[11]
5 ඔබ දැනටමත් බොහෝ දුෂ්ටකම්
කර ඇත.[12]
ඔබේ වැරදි ක්‍රියා ඔබ අත්හැර
දමන්නේ කවදාද?
6 ඔබ අයුතු ලෙස ඔබේ සහෝදර-
යන්ගෙන් ඇපයක් ඉල්ලා-
ගත්තෙහිය.[1]
ඔබ දුප්පතාට තිබෙන එකම
වස්ත්‍රය ඔහුගෙන් පැහැර-
ගත්තෙහිය.
7 ඔබ පිපාසයෙන් පෙළුණු අයට
වතුර බිඳක්වත්
කුසගින්නේ සිටි අයට රොටි
කැබැල්ලක්වත් දුන්නේ
නැත.[2]
8 ඔබේ බලය නිසාත් අන්‍යයන්-
ගෙන් ලැබූ අනිසි අනුග්‍රහය
නිසාත්
ඔබ දේශය හිමි කරගෙන සිටි-
යෙහිය.[3]
9 ඔබ වැන්දඹුවන්ව හිස් අතින්
යන්ට හැරියෙහිය.
පියා නැති දරුවන්ව ඔබ අස-
රණ කළෙහිය.[4]
10 ඔබ වටේටම උගුල් අටවා
තිබෙන්නෙත්[5]
භීතිය ඔබව වට කරගෙන
තිබෙන්නෙත් ඒ නිසාය.
11 ඔබ අඳුරෙහි අත පත ගාමින්
යන්නෙත්
ජලගැල්මට හසු වන්නෙත් ඒ
නිසාය.
12 දෙවි සිටින්නේ ස්වර්ගයේ නොවෙ-
යිද?[6]
තාරකා[7] තිබෙන්නේ කොතරම්
ඉහළින්ද කියා බලන්න.
13 එහෙත් ඔබ මෙසේ කීවේය. ‘දෙවි
දන්නේ කුමක්ද?
ගන අඳුර මැදින් ඔහුට දේවල්
පැහැදිලිව දැකගත හැකිද?
14 ඔහු අහස්තලයෙහි ඒ මේ අත ඇවි-
දින්නේය.
වලාකුළුවලින් වට වී සිටින
නිසා ඔහුට කිසිවක් නොපෙ-
නෙයි.’
15 කාලාන්තරයක් පුරා දුෂ්ටයන්
ගමන් ගත් මඟෙහි
ඔබත් දිගටම ගමන් කරන්නෙ-
හිද?

**21 පරි.**
1 හිතෝ 16:4, 2පේතෘ 2:9
2 ගලා 2:11
3 යෙසා 59:18, රෝම 12:19
4 යෝබ් 17:16
5 යෝබ් 3:17
6 රෝම 5:12
7 යෝබ් 16:2

**22 පරි.**
8 තික් 3:10, යෝබ් 42:8, 2කොරි 5:20
9 යෝබ් 2:3, හිතෝ 11:20, හිතෝ 27:11
10 හිතෝ 15:8, යෙරෙ 9:24
11 ගීතා 7:9
12 යෝබ් 1:8, යෝබ් 4:7

**2 තීරුව**
1 යෝබ් 31:19, යෝබ් 42:7
2 යෝබ් 31:17, යෝබ් 42:8
3 යෝබ් 31:25
4 යෝබ් 42:7, හිතෝ 29:12, හිතෝ 31:21
5 යෝබ් 18:9
6 ගීතා 115:3
7 ගීතා 147:4

16 ඔවුන්ගේ ආයු කාලය කෙටි කරනු
ලැබීය.[1]
වේගයෙන් ගලා බසින ගංගාවක්
මෙන් ඔවුන්ගේ අත්තිවා-
රම්ද[2] ගසාගෙන ගියේය.
17 ‘අපෙන් ඈත්ව යන්න’[3] කියා ඔවුහු
සැබෑ දෙවිට කියති.
‘අපට විරුද්ධව ක්‍රියා කරන්න
සියලු බලැති දෙවිට පුළු-
වන්ද’ කියා අසති.
18 එහෙත් ඔවුන්ගේ නිවෙස් හොඳ
දෙයින් පුරවා තිබෙන්නේ
දෙවිම නොවෙයිද?[4]
මම නම් දුෂ්ටයන්ගේ උපායන්-
වලින් ඈත්ව සිටින්නෙමි.[5]
19 ධර්මිෂ්ඨයා දුෂ්ටයාගේ විනාශය
දැක සතුටු වනු ඇත.[6]
නිර්දෝෂ අය ඔවුන්ට සමච්චල්
කරමින් මෙසේ කියති.
20 ‘අපේ සතුරෝ විනාශ වී ඇත.
ඔවුන්ගෙන් ඉතුරුව සිටින
සියල්ලන්ද ගින්නෙන් විනාශ
කරනු ඇත.’
21 දෙවිව හොඳින් දැන හඳුනා ගෙන
ඔහු සමඟ හොඳ සබඳතාවක්
පවත්වාගන්න.
එවිට ඔබ ආශීර්වාද රැසක් අද්ද-
කිනු ඇත.
22 ඔහුගෙන් දැනමුතුකම් ලබාගෙන
ඔහුගේ නීතිය ඔබේ සිතට
ගන්න.[7]
23 ඔබ අධර්මිෂ්ඨකම ඔබේ කූඩාර-
මෙන් පහ කර,
සියලු බලැති දෙවි වෙත හැරී
ආවොත්[8] ඔහු ඔබව නැවත
උසස් කරනු ඇත.
24 ඔබ වටිනා ලෝහ දූවිල්ලට විසි
කර දමන්න.
ඕෆීර්[9] දේශයෙන් ලබාගත් රන්ද
නිම්නයේ ගල් අතරට විසි
කර දමන්න.
25 එවිට සියලු බලැති දෙවි ඔබේ
ජීවිතයේ වටිනාම වස්තුව
මෙන්ද
අනර්ඝතම රිදී මෙන්ද වනු
ඇත.[10]

**22 පරි.**
1 ගීතා 55:23
2 යෝබ් 4:19
3 යෙසා 30:11
4 ගීතා 17:14
මතෙ 5:45
ක්‍රියා 14:17
5 යෝබ් 21:16
6 ගීතා 107:42
7 යෝබ් 11:13
8 යෝබ් 8:5
9 1රාජා 9:28
යෝබ් 28:16
ගීතා 45:9
යෙසා 13:12
10 යෙසා 33:6

**2 තීරුව**
1 ගීතා 37:4
2 යෝබ් 27:10
3 ගීතා 65:2
4 ගීතා 116:14
දේශ 5:4
5 හිතෝ 4:18
6 හිතෝ 16:18
හිතෝ 29:23
යාකො 4:6
1පේතෘ 5:5
7 ගීතා 138:6
යෙසා 66:2
ලූක් 18:13
8 උත් 19:16
2පේතෘ 2:9
9 ගීතා 24:4

**23 පරි.**
10 යෝබ් 10:1
11 යෝබ් 13:3
යෝබ් 16:21
12 යෝබ් 31:37
13 ගීතා 49:3

26 සියලු බලැති දෙවි නිසා ඔබ මහත්
ප්‍රීතියක් අද්දකින්නෙහිය.[1]
ඔබ ඔහු දෙස ඇස් අයාගෙන
බලා සිටින්නෙහිය.[2]
27 ඔබ උපකාර පතා ඔහුට හඬගසන
විට ඔහු ඔබට සවන් දෙනු
ඇත.[3]
ඔබද දෙවිට දුන් පොරොන්දු ඉටු
කරනු ඇත.[4]
28 ඔබ ගන්නා තීරණ සාර්ථක වනු
ඇත.
ඔබ යන මඟ ආලෝකයෙන්
දීප්තිමත් වනු ඇත.[5]
29 ඔබ උඩඟු[6] ලෙස කතා කළොත්
ලැජ්ජාවට පත් වනු ඇත.
නමුත් දෙවි යටහත්පහත්
තැනැත්තාව ගලවාගන්-
නේය.[7]
30 ඔහු නිර්දෝෂ තැනැත්තාවද බේ-
රාගනු ඇත.[8]
ඔබ පවිත්‍ර ජීවිතයක් ගත කරන්-
නෙහි නම් ඔබවද නිසැකවම
ගලවාගනු ඇත.”[9]

**23** එවිට යෝබ් මෙසේ කීවේය.
2 “මට මේ සියල්ල සිදු වී
ඇත්තේ මාගේ වැරදි
නිසයි කියා මම කො-
හෙත්ම පිළි නොගන්-
නෙමි.
මාගේ දුක් ගැනවිලි කො-
තරම්ද කිවහොත් දැන්
මාගේ ශක්තිය හීන වී
ඇත.[10]
3 දෙවිව සොයාගත හැක්කේ කො-
තැනින්ද කියා මා දැන
සිටියා නම්[11]
මම නොපමාව ඔහුගේ වාසස්-
ථානය වෙතට යන්නෙමි.[12]
4 මාගේ නඩුව ඔහු ඉදිරියට ගෙන
ගොස්
මම නිදොස් බව ඔප්පු කිරීමට
තර්ක ඉදිරිපත් කරන්නෙමි.
5 ඔහු මට දෙන පිළිතුරු මම සිතට
ගන්නෙමි.
ඔහු පවසන දේ තේරුම්ගැනීමට
මම උත්සාහ කරන්නෙමි.[13]

6 ඔහු මා සමඟ වාද කිරීමට තම මහත් බලය යොදාගනීවිද?
නැත. ඔහු මා පවසන දේට සවන් යොමු කරනු ඇත.[1]
7 එහිදී නිර්දෝෂ තැනැත්තා ඔහු සමඟ කතා කර කාරණා නිවැරදි කරගන්නේය.
මාගේ විනිශ්චයකරු සදහටම මාව දඬුවමින් නිදහස් කරන බව නිසැකය.
8 මා නැඟෙනහිර දෙසට ගොස් බැලුවත් ඔහුව සොයාගත නොහැකි විය.
මා සිටි තැනටම නැවත හැරී ආවත් ඔහුව දකින්න ලැබුණේ නැත.[2]
9 ඔහු වැඩ කරමින් සිටින උතුරු දිශාවට මම හැරී බැලුවත් ඔහුව දැකගැනීමට ලැබුණේ නැත.
ඔහු දකුණට හැරුණු විටත් මම ඔහුව දුටුවේ නැත.
10 මා ගන්නා පියවර ඔහු හොඳින් දන්නේය.[3]
ඔහු මාව සෝදිසි කර බැලූ පසු මම පවිත්‍ර රන් මෙන් වන්නෙමි.[4]
11 මා පය තැබුවේ ඔහු යන ගමන් මඟෙහිය.
මම ඒ මාර්ගයෙන් ඉවත් නොවී දිගටම ගමන් කරන්නෙමි.[5]
12 ඔහු දුන් ආඥාවලට මම පිටු පාන්නේ නැත.[6]
ඔහු බලාපොරොත්තු වූවාටත් වඩා වැඩියෙන් මම ඔහුගේ ආඥා නිධානයක් මෙන් රැකගතිමි.[7]
13 ඔහු යමක් තීරණය කළ විට එය වෙනස් කළ හැක්කේ කාටද?[8]
ඔහු සිතූ දේ එලෙසින්ම ඉටු කරන්නේය.[9]
14 එසේනම්, ඔහු මා වෙනුවෙන් තීරණය කළ දෙයද එලෙසින්ම ඉටු කරනු ඇත.[10]
ඔහු එවන් දේවල් බොහොමයක් සැලසුම් කර ඇත.
15 මා මෙතරම් කැලඹී සිටින්නේ ඒ නිසාය.
ඔහු ගැන සිතන විට මා තුළ මහත් භීතියක් හටගන්නේය.[1]
16 දෙවි මාගේ සිතේ සවිය නැති කර දැමුවේය.[2]
සියලු බලැති තැනැත්තා මාව කැලඹුවේය.[3]
17 එහෙත් අන්ධකාරය අවට පැතිර තිබියදීත්
ගන අඳුර මාව වට කරගෙන තිබියදීත් මම නිහඬව නොසිටියෙමි.

24 "සියලු බලැති දෙවි විනිශ්චය කිරීම සඳහා දවසක් නියම නොකරන්නේ මන්ද?[4]
ඔහුව දැන හඳුනා ගෙන සිටින අයට එවැනි දවසක් දකින්න නොලැබෙන්නේ මන්ද?[5]
2 ඇතමෙක් තම වාසිය සඳහා තම අසල්වැසියාගේ ඉඩමේ මායිම් වෙනස් කරති.[6]
අනුන්ගේ සත්ව රැළ සොරාගෙන තමාගේ රැළ මෙන් රැකබලා ගනිති.
3 පියා නැති දරුවාගේ බූරුවාව පවා සොරාගනිති.
වැන්දඹුවගේ ගවයාව ඇපයක් ලෙස පැහැරගනිති.[7]
4 ඔවුහු දුප්පතුන්ව තමා වෙතින් පන්නා දමන්නෝය.[8]
අසරණ වූ සියල්ලෝම ඔවුන්ට බියෙන් සැඟවී සිටින්නෝය.
5 දිළින්දෝ පාළුකරයේ ගැවසෙන සීබ්‍රාවෙකු[9] මෙන්
කෑම සොයා යති.
ඔවුන් තම දූපුතුන්ට කෑම සොයාගන්නේ පාළුකරයෙනි.
6 අනුන්ගේ කෙත්වල ඉතුරු ඇති දේ ඔවුහු අහුලාගන්නෝය.

23 පරි.
1 ගීතා 22:24 යෙසා 57:16
2 යෝබ් 9:11
3 යෝබ් 1:8 ගීතා 1:6 ගීතා 139:1
4 යෝබ් 31:6 ගීතා 17:3 1පේතෘ 1:7
5 ගීතා 18:21 ගීතා 44:18
6 1යොහ 5:3
7 ගීතා 119:11 ගීතා 119:127 යෙරෙ 15:16
8 ගණන් 23:19 ගණන් 23:20 රෝම 9:19
9 ගීතා 135:6 යෙසා 14:24 යෙසා 46:10
10 1තෙස 3:3

2 තීරුව
1 ගීතා 111:10 ගීතා 119:120 හිතෝ 16:6
2 ගීතා 22:14
3 රූත් 1:20

24 පරි.
4 ක්‍රියා 1:7
5 යෙසා 26:10
6 ද්වි 19:14 ද්වි 27:17 හිතෝ 23:10 හොෂෙ 5:10
7 ද්වි 24:17
8 ගීතා 109:16 හිතෝ 22:16 යෙසා 10:2 ආමො 8:4 යාකො 5:4
9 ගීතා 104:11 යෙසා 32:14 යෙරෙ 14:6

දුෂ්ටයන්ගේ මිදිවතුවල ඉතු-
රුව තිබෙන පල නෙළාගන්-
නෝය.
7 රාත්‍රියේ උණුසුම් වීමට ඔවුන්ට
වස්ත්‍රයක්වත් නැත.[1]
පොරවාගැනීමට වස්ත්‍රයක්
නොමැතිව ඔවුහු සීතලෙන්
ගැහිගැහී සිටින්නෝය.[2]
8 ඔවුහු කඳුකරයෙන් පැමිණෙන
වැස්සට හසු වී,
පර්වතයක් වෙත දුව ගොස්
මුවා වෙන්නෝය.[3]
9 දුෂ්ටයා පියා නැති දරුවාව පවා
මව් තුරුලෙන් උදුරාගනියි.[4]
දිලින්දා ඇඳගෙන සිටින වස්ත්‍ර-
යද ඇපයක් ලෙස පැහැරග-
නියි.[5]
10 දිලින්දාට තම නිර්වස්ත්‍රකම වසා-
ගැනීමට ඇඳුමක් නැත.
කුසට ආහාරයක් නොමැතිව
ඔහු කෙනේ ධාන්‍ය මිටි උසු-
ලාගෙන යන්නේය.[6]
11 ඔවුහු දහවල් කාලයේදීත් නො-
නවත්වා වගාබිම්වල බැමි
අසල වැඩ කරන්නෝය.
ඔවුන් මිදි යන්ත්‍රවල වැඩ කළත්
ඔවුන්ගේ පිපාසය සන්සිඳුවී-
මට ඔවුන්ට කිසිවක් නො-
ලැබෙයි.[7]
12 මරණාසන්නව සිටින අයගේ
කෙඳිරිලි හඬ නගරයෙන්
ඇසෙයි.
තුවාල ලැබූ අය උපකාරය පතා
මොරගසති.[8]
නමුත් මේ කිසිවක් ගැන දෙවිට
තැකීමක් නැත.[9]
13 දුෂ්ටයෝ ආලෝකය හෙළාදකින්-
නෝය.[10]
ආලෝකයේ මඟ ඔවුහු හඳුනන්-
නේ නැත.
ඒ මාර්ගයෙන් ඔවුහු ඉවතට
හැරෙන්නෝය.
14 මිනී මරුවා හිමිදිරියේ නැඟිට
අසරණයාව මරා දමයි.[11]
රාත්‍රියේ ඔහු සොරකමේ යයි.[12]

**24 පරි.**
1 නික් 22:27 ද්වි 24:13
2 2කොරි 11:27
3 විලා 4:5
4 2රාජා 4:1
5 නික් 22:26 ද්වි 24:13 එස 18:12
6 1තිමෝ 5:18
7 යෙරෙ 22:13 යාකො 5:4
8 දේශ 4:1
9 දේශ 8:13 2පේතෘ 3:15
10 යොහ 3:19
11 ගීතා 10:8
12 මතෙ 24:43 1තෙස 5:2

**2 තීරුව**
1 2පේතෘ 2:14
2 හිතෝ 7:9
3 2සාමු 12:12 ගීතා 94:7 හිතෝ 30:20
4 යොහ 3:20
5 යෝබ් 10:21 යෝබ් 38:17
6 ද්වි 28:16 යෝබ් 21:17 හිතෝ 3:33
7 ගීතා 49:14 ගීතා 55:15 ලූක් 12:20
8 යෝබ් 17:14 යෙසා 14:11
9 හිතෝ 10:7 දේශ 8:10 දේශ 9:5
10 මතෙ 3:10
11 නික් 22:22 සෙක 7:10

15 අනාචාරයට ලොල් වූවෝ*[1] අඳුර
වැටෙන තුරු නොඉවසිල්-
ලෙන් බලා සිටිති.[2]
ඔවුහු තම මුහුණු වැස්මකින්
වසාගෙන,
‘කිසිවෙක් මාව දකින්නේ
නැත’[3] යයි කියති.
16 සොරු රාත්‍රියේදී ගෙවල් බිඳිති.
දහවල් කාලයේදී ඔවුහු සැඟවී
සිටිති.
ඔවුහු ආලෝකයට කැමති
නැත.[4]
17 ගන අඳුරෙහි සිදු වන අන්තරාවන්
ගැන හොඳින් දන්නා ඔවුන්,
හිමිදිරිය දකින්නේ ගන අඳු-
රෙන් වෙළාගත් බිහිසුණු
රාත්‍රියක් මෙනි.[5]
18 දුෂ්ටයාගේ ජීවිතය වතුරට ගසා-
ගෙන යන කොළයක් මෙන්
සැණෙකින් පහව යයි.
ඔවුන් සතු දේපළ නැති නාස්ති
වී යයි.[6]
ඔවුන්ට නැවත කිසිදා තම මිදි-
වතු දකින්න නොලැබෙයි.
19 අව් රශ්මියට හිම දිය වී යන්-
නාක් මෙන්
දුෂ්ටයාගේ ජීවිතයත් නැති වී
යන්නේය.[7]
20 පණුවන්ට ඔහු රජ බොජුනක් වනු
ඇත.[8] ඔහුගේ මවට පවා
ඔහුව අමතක වී යන්නේය.
ඔහු ගැන මතකය සදහටම
මැකී යන්නේය.[9]
ගසක් වැටෙන්නාක් මෙන් ඔහු-
ගේ දුෂ්ටකමද අවසන් වන්-
නේය.[10]
21 ඔහු වඳ ස්ත්‍රියටත් අයුතු ලෙස
සලකන්නේය.
වැන්දඹුවට[11] කිසි අනුකම්පා-
වක් නොදක්වන්නේය.
22 දෙවි තම මහත් බලය යොදා බල-
වන්තයන්ව ඉවත් කරන්-
නේය.

**යෝබ් 24:15*** මූ.අ., “පරදාර සේවනයේ යෙදෙන අය.”

දුෂ්ටයා සාර්ථකත්වයක් ලැබුවද ඔහුගේ ජීවිතය ස්ථිර නැත.
23 දුෂ්ටයා සුරක්ෂිතව ජීවත් වෙමින් තමන්වම උසස් කරගන්නේය.[1] දෙවිද එයට ඉඩහරින්නේය.
නමුත් ඔහුගේ සියලු ක්‍රියා දෙස දෙවි බලා සිටින්නේය.[2]
24 දුෂ්ටයා කෙටි කලකට සාර්ථකත්වය අද්දකින නමුත් ඔහු සුළු මොහොතකින් නැති වී යන්නේය.[3]
ඔහුව පහතට හෙළනු ඇත.[4] අන් මිනිසුන් මෙන් ඔහුවද පැළෑටියක් මෙන් උදුරා දමනු ඇත.
ධාන්‍ය කරලක් මෙන් කපා දමනු ඇත.
25 මා පැවසූ දේ අසත්‍යයක් කියා කිව හැකිද?
එහි කිසි තේරුමක් නැහැ කියා කියන්න පුළුවන් කාටද?”

# 25

ෂූහිය බිල්දද්[5] යෝබ්ට මෙසේ උත්තර දුන්නේය.
2 “පාලනය අයිති දෙවිටය. ඔහු බිය උපදවන්නේය.[6]
ස්වර්ගයෙහි සාමය රජයන්න සලස්වන්නේය.
3 ඔහුගේ සේනා ගණන් කළ හැක්කේ කාටද?
ඔහු දෙන ආලෝකයෙන් එළිය නොලබන්නේ කවරෙකුද?
4 දූවිලි වැනි වූ මිනිසෙකු දෙවි ඉදිරියෙහි ධර්මිෂ්ඨයෙකු වන්නේ කෙසේද?[7]
ස්ත්‍රියගෙන් උපන් මිනිසා පවිත්‍ර වන්නේ කෙසේද?[8]
5 දෙවි ඉදිරියෙහි සඳ පවා අඳුරුය.
තරු වුවද දීප්තිය නොදෙයි.*
6 එසේනම්, පයට පෑගෙන පණුවෙකු වැනි වූ මිනිසා ගැන කුමක් කිව හැකිද?
ඉහදපණුවෙකු වැනි මිනිසාව[9] දෙවි පවිත්‍රයයි සලකනු ඇද්ද?”

# 26

එවිට යෝබ් මෙසේ කීවේය.
2 “ඔබ කලකිරුණු තැනැත්තාව කොතරම් ශක්තිමත් කළහුද!
දුර්වල තැනැත්තාට අත දුන් ආකාරය කොතරම් අගනේද![1]
3 ඔබ ප්‍රඥාව නැත්තාට මොන තරම් වටිනා උපදෙස් දුන්නහුද![2]
ප්‍රඥාවන්තව හැසිරෙන්න ඔබ කීදෙනෙකුට ඉගැන්වුවහුද!
4 ඔබ මෙතරම් උපදෙස් දෙන්නේ කාටද?
මෙපමණ දේවල් කතා කිරීමට ඔබව පෙලඹුවේ කවුද?
5 මිය ගිය අය කැලඹෙනු ඇත.
සාගරය සහ එහි ජීවීන්ට පහළින් සිටින සියල්ලෝම වෙවුලනු ඇත.[3]
6 මිනී වළෙහි ඇති සියල්ල දෙවිට පෙනෙයි.[4]
සියල්ල දිරාපත් වන ස්ථානය ඔහුගෙන් සැඟවී නැත.
7 ඔහු උතුරු අහස්තලය හිස් අවකාශයේ දිගහැරියේය.[5]
පොළොවද හිස් අවකාශයේ එල්ලා තැබුවේය.
8 ඔහු ජල ධාරා වලාකුළුවලින් ඔතා තබන්නේය.[6]
ඒවා කොතරම් බර වුවද කිසි දිනක බිඳී නොයන්නේය.
9 ඔහු තම සිංහාසනය
වලාකුළුවලින් සඟවා තැබුවේය.[7]
10 ඔහු ජල කඳේ ඈත කෙළවරෙහි ක්ෂිතිජය* නියම කරමින්[8]
එළියටත් අඳුරටත් සීමාවක් තැබුවේය.
11 ඔහුගේ කෝපය නිසා
අහසේ කුලුනු පවා දෙදරුම් කන්නේය.

**24 පරි.**
1 දේශ 8:11 යෙසා 56:12 ලූක් 12:19
2 ගීතා 11:4 හිතෝ 5:21 හිතෝ 15:3
3 ගීතා 37:10 ගීතා 92:7 දේශ 8:12 යාකො 1:11
4 දේශ 8:13

**25 පරි.**
5 යෝබ් 8:1 යෝබ් 18:1
6 දානි 4:3
7 යෝබ් 4:17
8 යෝබ් 15:14
9 ගීතා 22:6

**2 තීරුව**

**26 පරි.**
1 යෝබ් 16:2
2 යෝබ් 12:2 යෝබ් 15:8 යෝබ් 17:10
3 ගීතා 104:25
4 ගීතා 139:8 හෙබ්‍රෙ 4:13
5 යෝබ් 9:8 ගීතා 104:2 යෙසා 42:5
6 හිතෝ 30:4 දේශ 11:3
7 නික් 34:5 ගීතා 97:2
8 හිතෝ 8:27 යෙසා 40:22 යෙරෙ 5:22

යෝබ් **25:5*** මූ.අ., “පවිත්‍ර නැත.”

යෝබ් **26:10*** හෝ, “නිම් වළල්ල.”

12 ඔහු තම බලයෙන් සාගරය
කැලඹුවේය.[1]
තම නුවණින් පීඩා කරන්-
නාව*[2] සුනුවිසුනු කළේය.[3]
13 ඔහුගේ හුස්මෙන් අහස කාන්ති-
මත් වෙයි.[4]
ඔහු තම බලවත් හස්ත-
යෙන් ශීඝ්‍ර සර්පයාට තුවාල
කළේය.[5]
14 එහෙත් අප මේ දකින්නේ දෙවිගේ
බලවත් ක්‍රියාවලින් අල්ප-
මාත්‍රයක් පමණි.[6]
ඔහුගේ මහත් හඬෙන් අපේ සව-
නට වැටෙන්නේ සිහින් නාද-
යක් පමණි.
එසේනම් ඔහුගේ ඒ මහත් ගිගු-
රුම් හඬ තේරුම්ගත හැක්-
කේ කාටද?"[7]

**27** යෝබ් නැවත කාව්‍යමය ස්ව-
රූපයෙන් තම තර්කය ඉදිරි-
පත් කළේය.[8]
2 "මට යුක්තිය ඉටු කිරීමට අපො-
හොසත් වූ,[9]
මාගේ ජීවිතය මෙතරම් දුක්
ගැහැටවලින් පිරෙව්වාවූ[10]
සියලු බලැති ජීවමාන දෙවි-
ගේ නාමයෙන් දිවුරා[11] මම
මේ දේ පවසන්නෙමි.
3 මා ජීවත්ව සිටින තාක් කල්,
දෙවිගේ හුස්ම මා තුළ පවතින
තාක් කල්,[12]
4 මාගේ මුඛයෙන් දුෂ්ට වචන-
යක්වත්
වංචනික දෙයක්වත් පිට නො-
වෙයි.
5 ඔබ වැනි මනුෂ්‍යයන් ධර්මිෂ්ඨ-
යන්[13] කියා මා පවසන්නේ
කෙසේද? එවැනි දෙයක් ගැන
මට සිතාගන්නවත් නො-
හැකිය.
මා අවසන් හුස්ම හෙළන තුරු
මම දෙවිට විශ්වාසවන්තව
සිටිමි.[14]

**යෝබ් 26:12*** මුහුදේ සැරිසරන දැවැන්ත සතෙකු විය හැකියි.

**26 පරි.**
1 ගීතා 74:13
යෙසා 51:15
2 යෝබ් 9:13
3 ගීතා 72:4
යෙසා 2:12
දානි 2:35
4 ගීතා 33:6
ගීතා 104:30
5 ගීතා 74:13
යෙසා 27:1
යෙසා 51:9
6 ගීතා 65:4
ගීතා 92:5
දේශ 3:11
යෙසා 55:9
7 යෝබ් 37:5

**27 පරි.**
8 ගීතා 49:4
ගීතා 78:2
9 යෝබ් 34:5
10 රූත් 1:20
2රාජා 4:27
11 ද්වි 6:13
ද්වි 10:20
යෙරෙ 12:16
හෙබ්‍රෙ 6:16
12 උත් 2:7
යෙසා 42:5
ක්‍රියා 17:25
13 ද්වි 25:1
යෝබ් 40:8
හිතෝ 17:15
14 යෝබ් 22:1
යෝබ් 22:5
හිතෝ 27:11
මතෙ 24:9
එළි 2:10
එළි 6:11

**2 තීරුව**
1 යෝබ් 2:3
2 ක්‍රියා 24:16
3 1සාමු 25:26
4 යෝබ් 13:16
යෝබ් 36:13
හෙබ්‍රෙ 6:6
5 ලූක් 12:20
6 යෝබ් 35:12
ගීතා 18:41
හිතෝ 28:9
යෙරෙ 11:11
යාකො 4:3
7 ක්‍රියා 20:20
8 යෙරෙ 23:16
9 ගීතා 11:6
දේශ 8:13
මලා 3:5
10 එස්ත 9:10
හොෂෙ 9:13

6 මම ධර්මිෂ්ඨ ජීවිතයක් ගත
කරමි. මම කිසිදා ඒ මඟෙන්
ඉවතට නොයන්නෙමි.[1]
මේ දක්වා මා ගත කළ ජීවිතය
ගැන මාගේ සිත මට දොස්
නොතබයි.[2]
7 මට විරුද්ධවන්නා වරදකරුවෙකු
වේවා!
මාගේ සතුරා දුෂ්ටයෙකු වේවා![3]
8 දෙවි තමාට ද්‍රෝහි වූ කෙනෙකුගේ
ආයු කාලය කෙටි කර,[4]
ඔහුගේ ජීවිතය නැති කර දමන්-
නේ නම්[5] ඔහුට ඇති බලා-
පොරොත්තුව කුමක්ද?
9 ඔහු විපතට හසු වී,
උපකාරය පතා හඬන විට දෙවි
ඔහුට සවන් දෙයිද?[6]
10 ඔහු සැමවිටම දෙවිට අයැදිනු
ඇද්ද?
සියලු බලැති දෙවිට ළංව සිටී-
මෙන් ඔහු මහත් ප්‍රීතියක් අද්-
දකිනු ඇද්ද?
11 මම දෙවිගේ උපකාරය ඇතුව
ඔබට දැනමුතුකම් ලබා
දෙන්නෙමි.
සියලු බලැති දෙවිගේ අරමුණු
ගැන මම දන්නා දේ නො-
සඟවා ප්‍රකාශ කරන්නෙමි.[7]
12 ඔබ සියල්ලෝම දර්ශන දුටුවහුය.
එසේනම් ඔබ කිසි පලක්
නැති හිස් වචන දොඩන්නේ
මන්ද?[8]
13 කුරිරු ලෙස අන්‍යයන්ට හිංසා පීඩා
කරන දුෂ්ටයෙකුට
සියලු බලැති දෙවිගෙන්
ලැබෙන උරුමය මෙයයි.[9]
14 ඔහුට කොතරම් දරුවන් සිටියත්
ඔවුහු කඩුවෙන් මැරුම් කනු
ඇත.[10]
ඔහුගෙන් පැවතෙන්නන්ට කුස-
ගින්න නිවාගැනීමට ප්‍රමා-
ණවත් ආහාර නොලැබෙනු
ඇත.
15 ඔහුගේ පෙළපතේ ඉතුරුව සිටින
අය දරුණු වසංගතයකින්
මිය යනු ඇත.

එනමුත් ඔවුන්ගේ වැන්දඹුවෝ
කඳුළු නොසලනු ඇත.[1]
16 ඔහු වැලි ගොඩගසන්නාක් මෙන්
රිදී ගොඩගසනු ඇත.
මැටි එකතු කරන්නාක් මෙන්
විශාල ඇඳුම් ප්‍රමාණයක්
එකතු කරගනු ඇත.
17 එහෙත් ඔහු ගොඩගැසූ රිදී සියල්ල
උරුම වන්නේ නිර්දෝෂ-
යන්ටය.
ඔහු එකතු කරගත් වස්ත්‍ර හිමි
වන්නේ ධර්මිෂ්ඨයන්ටය.[2]
18 ඔහු ගොඩනැඟූ නිවස, කාවෙකු-
ගේ ගුලක් මෙන්ද
මුරකරුවෙකු විසින් සාදන ලද
මඩුවක් මෙන්ද වන්නේය.[3]
19 ඔහු ධනවතෙකු මෙන් සැතපුණත්
අවදි වන විට ඔහුට අස්වැන්-
නෙන් කිසිවක් උපයාගැනී-
මට නොහැකි වෙයි.
ඔහුට කිසිවක් ඉතුරු නො-
වෙයි.[4]
20 නොසිතූ මොහොතක ඇති වන
ජලගැල්මක් මෙන් භීතිය
ඔහුව හසු කරගනියි.[5]
රාත්‍රියේ හමන කුණාටුවකට
ඔහුව ගසාගෙන යයි.
21 නැඟෙනහිර දෙසින් හමා එන
සුළඟකට ඔහුව හසු වී[6]
තම නිවසෙන් ඈතට ගසාගෙන
යයි.[7]
22 ඔහු එම කුණාටුවෙන් බේරීමට
තම මුළු වැර යොදා දුවන්-
නේය.[8]
එහෙත් එය කිසිදු අනුකම්පා-
වක් නොපෙන්වා ඔහු පසුපස
පන්නාගෙන එන්නේය.[9]
23 ඔහුට සිදු වන දේ දැක මනුෂ්‍යයෝ
ඔහුගේම නිවසේ සිට
අත්පොළසන් දෙමින්[10] කවට-
කම් කරති.[11]

28 “රිදී සොයාගැනීමට නියමිත
ස්ථානයක් ඇත.
පවිත්‍ර[12] කළ යුතු රන් සො-
යාගැනීමටද ස්ථානයක්
තිබේ.
2 මිනිසා පොළොව හාරා යකඩ
සොයාගනිති.[1]
ගල් උණු කර තඹ ලබාගනිති.
3 ඝන අන්ධකාරය මිනිසාට බාධා-
වක් නොවෙයි.
ඔවුහු පොළොවේ ගැඹුරටම
කිඳා බැස වටිනා දේ සො-
යති.[2]
අඳුරු ආකරවලට ගොස් අස්සක්
මුල්ලක් නැර ඒවා සොයා
බලති.
4 ඔවුහු මිනිස් වාසයක් නැති පාළු
තැන්වල පතල් හාරති.[3]
පතල්වල වැඩ කරන පිණිස
කඹවල එල්ලී පහළට
බැස යති.
ඔවුන් වැඩ කරන තැන් අසල
කිසිවෙක් ගමන් කරන්නේ
නැත.
5 පොළොව මතුපිට වගා කටයුතු
කරන ලදී.[4]
නමුත් පොළෝගැබෙහි මහත්
කැලඹීමක් සිදු වේ. එය ගින්-
නට හසු වී තිබෙන ස්ථාන-
යක් මෙනි.
6 එහි පර්වත අතරේ නීල
මාණික්‍යද[5]
රත්තරන්ද සැඟවී ඇත.
7 ගොදුරු අල්ලා කන පක්ෂීන්ට-
වත්[6] ඔවුන් යන එන මඟ
නොපෙනෙයි.
කලු උකුස්සාගෙන්[7] පවා ඒ මඟ
සැඟවී ඇත.
8 දරුණු වනසත්තු ඒ මඟෙහි කිසිදා
ගමන් කර නැත.
තරුණ, කේශර සිංහයෙක් වුවද
එහි ගැවසෙන්නේ නැත.
9 ඔවුහු පර්වත දෙබෑ කරති.
කඳු පෙරළා දමති.
10 ඔවුහු පර්වත තුළට දිය පහරවල්
හරවා,[8]
නානාවිධ වටිනා වස්තු සොයා-
ගනිති.
11 දිය ගලන තැන් වසා දමා,[9]
සැඟවුණු වස්තු සොයාගනිති.

27 පරි.
1 ගීතා 78:64
2 හිතෝ 13:22 හිතෝ 28:8 දේශ 2:26
3 යෙසා 1:8 විලා 2:6
4 යෝබ් 14:10
5 ගීතා 73:19
6 යෙරෙ 18:17
7 මනෙ 7:27
8 යෙසා 10:3 ආමො 2:14
9 ගීතා 83:15 යෙරෙ 13:14
10 ගණන් 24:10 විලා 2:15 නාහු 3:19
11 1රාජා 9:8 ශෙප 2:15

28 පරි.
12 හිතෝ 17:3 මලා 3:3

2 තීරුව
1 ද්වි 8:9
2 උත් 11:6 ලූක් 1:51
3 ආමො 9:2
4 උත් 1:11 ගීතා 104:14
5 යෝබ් 28:16
6 එස 39:4
7 ලෙවී 11:14 ද්වි 14:13
8 2රාජා 20:20 2ලේක 32:30
9 යෙසා 44:27 යෙසා 45:1 යෙරෙ 50:38 යෙරෙ 51:32

12 නමුත් ප්‍රඥාව සොයාගත හැක්කේ
කොතැනින්ද?[1]
අවබෝධය සැඟවී ඇත්තේ
කොතැනද?
13 මිනිසා එහි වටිනාකම වටහාගෙන
නැත.[2]
එය මිහිපිට කොතැනකවත්
සොයාගත නොහැකිය.
14 ‘එය මා තුළ සොයාගත නොහැක’
කියා ගැඹුරු දිය උල්පත්
කියයි.
මහ මුහුදද, ‘එය මා ළඟ නැත’
කියා පවසයි.[3]
15 රන් දී එය ලබාගත නොහැකිය.[4]
එහි වටිනාකම රිදීයෙන් මැනිය
නොහැකිය.
16 ඕෆීර්හි රන්[5] දුන්නත්
දුර්ලභ ඕනික්ස් ගල් සහ නීල
මාණික්‍ය දුන්නත් එය ලබා-
ගත නොහැකිය.
17 එය රන්වලටත් අනර්ඝ වීදුරුවල-
ටත් වඩා වටින්නේය.
පිරිසිදු රනින් තැනූ බඳුනක් දී
එය ලබාගත නොහැකිය.
18 කොරල්[6] සහ පළිඟු ඊට සම කළ
නොහැකිය.
ප්‍රඥාව අගනා මුතුවලටත් වඩා
වටින්නේය.[7]
19 කූෂ් දේශයෙන් සොයාගත් පඩියන්
ගල්[8] වුණත් ඊට සම කළ
නොහැකිය.
පිරිසිදු රන් දී එය ලබාගත නො-
හැකිය.
20 ප්‍රඥාවේ උල්පත කොතැනද?[9]
අවබෝධය ලබාගත හැක්කේ
කොතැනින්ද?
21 මෙලොව ජීවත් වන සියල්ලන්-
ගෙන් එය සඟවා තිබේ.[10]
පක්ෂීන්ගෙන් පවා එය සඟවා
තිබේ.
22 මරණයද සියල්ල දිරාපත් වන
ස්ථානයද
‘ප්‍රඥාව ගැන අප අසා ඇත්-
තේ කටකතා පමණි’ කියා
පවසති.
23 ප්‍රඥාව යනු කුමක්ද කියා දන්නේ
දෙවි පමණි.[11]
එය සොයාගත හැක්කේ කො-
තැනින්ද කියා දන්නෙත් ඔහු
පමණි.
24 පොළොවේ කෙළවර දක්වා ඔහු-
ගේ ඇස් දිව යන්නේය.[1]
අහස යට ඇති සියල්ල ඔහු
දකින්නේය.
25 සුළඟෙහි බලය නියම කරන්-
නෙත්[2]
ජල ධාරා කිරා, ඒවායෙහි සීමා
මායිම් නියම කරන්නෙත්
ඔහුය.[3]
26 වර්ෂාවට නියමිත කාලයන්ද[4]
වැහි වලාකුළු යා යුතු මාර්ගයද
ඔහු නියම කළේය.
27 දෙවි ඒ සියල්ල තුළින් දිස් වූ ප්‍රඥාව
දැක ඒ ගැන ප්‍රකාශ කළේය.
ඔහු එය නිර්මාණය කළ පසු ඒ
ගැන හොඳින් සොයා බැලු-
වේය.
28 පසුව ඔහු මිනිසාට මෙසේ කීවේය.
‘ප්‍රඥාව යනු යෙහෝවා දෙවි
වන මට ගරුබිය දැක්වීමය.[5]
අවබෝධය යනු නපුරෙන්
වැළකී සිටීමය.’ ”[6]

29 යෝබ් නැවත කාව්‍යමය ස්ව-
රූපයෙන් කතා කරමින්
මෙසේ කීවේය.
2 “මට පසුගිය මාසවලට නැවත
හැරී යා හැකි නම් කොතරම්
යහපත්ද![7]
ඒ කාලයේදී මට දෙවිගේ රැකව-
රණය තිබිණ.[8]
3 ඔහුගේ පහන මාගේ හිසට ඉහළින්
දැල්විණ.
ඔහු දෙන ආලෝකය නිසා මම
අඳුර මැදින් ගමන් කළෙමි.[9]
4 මාගේ ජීවිතයේ හොඳම කාලයට
මට නැවත හැරී යා හැකි
නම් කොතරම් හොඳද![10]
ඒ කාලයේදී දෙවි සමීප මිතු-
රෙකු සේ මාගේ කූඩාරමේ
සිටියේය.[11]
5 සියලු බලැති දෙවි මා ළඟින්ම
සිටියේය.
මාගේ සේවකයෝද මාව වට

**28 පරි.**
1 යෝබ් 28:28 හිතෝ 2:6 යාකො 1:5
2 ගීතා 49:7 හිතෝ 3:15
3 රෝම 11:34
4 හිතෝ 3:14
5 යෙසා 13:12
6 හිතෝ 8:11 හිතෝ 20:15
7 හිතෝ 16:16
8 නික් 28:17
9 යෝබ් 28:12 යාකො 1:5
10 දේශ 8:17 1කොරි 2:8
11 හිතෝ 30:4 රෝම 1:20

**2 තීරුව**
1 හිතෝ 15:3 සෙක 4:10 1පේතෘ 3:12
2 ගීතා 135:7 ගීතා 148:8 දේශ 1:6
3 යෝබ් 5:10 යෝබ් 26:8 යෝබ් 37:10 හිතෝ 30:4 යෙසා 40:12
4 යෝබ් 38:25 සෙක 10:1
5 ද්වි 4:6 ගීතා 111:10 හිතෝ 9:10 දේශ 12:13 රෝම 1:20
6 හිතෝ 3:7 1පේතෘ 3:11

**29 පරි.**
7 යෝබ් 3:6
8 යෝබ් 1:10
9 ගීතා 18:28 ගීතා 119:105
10 දේශ 11:10
11 ගීතා 25:14 හිතෝ 3:32

කරගෙන සිටියෝය.
6 මා පය තැබූ තැන් වෙඬරුවලින් නැහැවී තිබිණ.
පර්වතවලින් තෙල් ගංගා ගලා ආවේය.[1]
7 ඒ දවස්වලදී මම නගරයේ දොරටුව අසලට ගොස්,[2]
ප්‍රධාන මංසන්ධියේ මාගේ ආසනය සූදානම් කළෙමි.[3]
8 තරුණයෝ මා දැක සැඟවුණෝය.
වැඩිහිටියෝ පවා මා දැක තම අසුන්වලින් නැඟිට්ටෝය.[4]
9 අධිපතියෝ කිසිවක් නොකියා
දැතින් තම කට වසාගත්තෝය.[5]
10 නායකයෝද මා ඉදිරියේ කිසිවක් නොකීවෝය.
දිව උඩු තල්ලට ඇලී තිබෙන්නාක් මෙන් ඔවුහු නිහඬව සිටියෝය.[6]
11 මා ගැන ඇසූ දුටු අය මා ආශීර්වාද ලත් කෙනෙකුයයි පැවසුවෝය.
ඔවුන් ඉදිරියේ මම හොඳ නමක් දිනාගෙන සිටියෙමි.
12 මන්ද මාගෙන් උපකාර පැතූ දුප්පතුන්ට මම පිහිට වුණෙමි.[7]
පියා නැති දරුවන්ටද අසරණ වූ සියල්ලන්ටද මම අතහිත දුන්නෙමි.[8]
13 අන්ත අසරණ තත්වයක සිටි ඔවුන්ගේ ආශීර්වාදය[9] මට ලැබිණ.
මම වැන්දඹුවන්ගේ සිත් සැනසුවෙමි.[10]
14 මම ධර්මිෂ්ඨකම වස්ත්‍රයක් මෙන් පැළඳගෙන සිටියෙමි.[11]
යුක්තිය සළුවක් මෙන්ද හිස් පළඳනාවක් මෙන්ද පැළඳගත්තෙමි.
15 අන්ධයන්ට මම දෙනෙත් මෙන්ද[12]
කොරාට දෙපා මෙන්ද වුණෙමි.
16 දිළිඳාට පියෙකු මෙන් සැලකුවෙමි.[13]
නාඳුනන කෙනෙකුගේ නඩුව පවා මම සාධාරණව විනිශ්චය කළෙමි.[1]
17 වැරදිකරුවන්ගේ හකු මම බිඳ දැමුවෙමි.[2]
ඔවුන් ගොදුරු කරගෙන සිටි අහිංසකයන්ව ඔවුන්ගේ කටින් ගලවාගත්තෙමි.
18 ඒ කාලයේදී මම මෙසේ සිතාගත්තෙමි. 'මාගේ ජීවිතයේ දවස් වැලි කැට මෙන් වෙයි. මම දිගු ආයු කාලයක් භුක්ති විඳ[3]
මාගේම කැදැල්ලේ මිය යන්නෙමි.[4]
19 මා දිය උල්පත් දක්වා මුල් බැස ගිය,[5]
රෑ පින්නෙන් නැහැවී ගිය අතු තිබෙන ගසක් හා සමානය.
20 මාගේ ගෞරවය සැමදා පවතියි.
මාගේ දුන්න මම කිසිවිටෙක පහතට නොගන්නෙමි.'
21 ජනයා මා දෙන උපදෙස්වලට ආශාවෙන් සවන් දුන්නෝය.
මා අවවාද දුන් විට ඔවුහු නිහඬව අසාගෙන සිටියෝය.[6]
22 මා යමක් කියූ විට ඊට විරෝධය නොපෑවෝය.
මාගේ වචන ඔවුන්ගේ සිතට වැහි බිඳු මෙන් කාන්දු විය.[7]
23 වර්ෂාව වැටෙන තුරු බලා සිටින්නන් මෙන්ද[8]
වසන්ත කාලයේ වැසි වැටෙන තුරු ආශාවෙන් බලා සිටින්නන් මෙන්ද[9] ඔවුහු මා එන තුරු බලා සිටියෝය.
24 මා ඔවුන් සමඟ සිනාසුණු විට ඔවුහු පුදුමයෙන් බලා සිටියෝය.
ඔවුන් මාගේ ප්‍රීතිය[10] පහ කර දැමුවේ නැත.
25 මම මූලිකත්වය ගෙන ඔවුන්ට යා යුතු මඟ පෙන්වා දුනිමි.
යුධ සේනාවක් අතරේ රජෙකු මෙන් මම සිටියෙමි.[11]
වැලපෙන අයට සනසන්නෙකුව සිටියෙමි.[12]

**29 පරි.**
1 ද්වි 32:4 ද්වි 32:13 ද්වි 33:24
2 ද්වි 16:18 රූත් 4:1
3 නෙහෙ 8:1
4 ලෙවී 19:32
5 යෝබ් 21:5
6 ගීතා 137:6
7 ගීතා 72:12 හිතෝ 21:13 හිතෝ 24:11
8 ද්වි 10:18 යාකො 1:27
9 ද්වි 24:13
10 ද්වි 10:18
11 ද්වි 24:13 ගීතා 132:9 යෙසා 61:10 එෆී 6:14
12 ගණන් 10:31
13 ලූක් 14:13 යාකො 1:27

**2 තීරුව**
1 හිතෝ 29:7
2 ගීතා 58:6 හිතෝ 30:14
3 ගීතා 30:6
4 උත් 25:8 2රාජා 22:20 යෝබ් 42:17
5 ගීතා 1:3 යෙරෙ 17:8
6 යෝබ් 29:9
7 එස 21:2
8 ගීතා 72:6
9 හිතෝ 16:15
10 යෝබ් 30:26
11 යෝබ් 1:3
12 දේශ 7:2 1තෙස 5:11

**30** “නමුත් දැන් මට වඩා වය-
සින් බාල අය[1] මට සිනා-
සෙති.[2]
මා ඔවුන්ගේ පියවරුන්ව
සැලකුවේ,
මාගේ සත්ව රැළ රැකවල් කරන
බල්ලන් සමඟ සිටින්නවත්
නොවටිනා අය ලෙසයි.
2 ඔවුන්ගේ ශක්තිය පිරිහී තිබිණ.[3]
එමනිසා ඔවුන්ගේ උපකාර-
යෙන් මට කිසි ප්‍රයෝජනයක්
ලැබුණේ නැත.
3 ඔවුහු නැති බැරිකම හා බඩගින්න
නිසා මලානිකව සිටියෝය.
කෑම සොයමින් වතුර නැති
නිසරුබිම් පුරා ඇවිද්දෝය.[4]
ඔවුහු කුණාටුවෙන් විනාශ වී
පාළුවට ගිය දේශයක කෑම
සොයා ගියෝය.
4 ඔවුහු පඳුරු අතරේ තිබෙන ලවණ
පැළෑටි උදුරා කෑවෝය.
ගස්වල* මුල් ඔවුන්ගේ
කෑම විය.
5 ඔවුන්ව මිනිස් ඇසුරෙන් පන්නා
දමනු ලැබීය.[5]
සොරෙකුව එළවා දමන්නාක්
මෙන් ඔවුන්වද එළවා දමනු
ලැබීය.
6 ඔවුන්ට නිම්නවලත්
ගුල්වල සහ ගල් ගුහාවලත්
වාසය කිරීමට සිදු විය.
7 ඔවුහු පඳුරු අතරේ වැටී විලාප
නැඟුවෝය.
කටු ගස් අතරේ එක පොදියට
ගුළි ගැසී සිටියෝය.
8 ඔවුහු දේශයෙන් පන්නා දමනු ලැබූ
කිසිකමකට නැති,[6] පහත් අය-
ගේ පුත්‍රයෝය.
9 නමුත් දැන් මම ඔවුන්ගේ සරදමට
ලක් වී සිටිමි.[7]
ඔවුහු මට කවටකම් කරති.[8]
10 මාව පිළිකුල් කොට මාගෙන් ඈත්
වී සිටිති.[9]
කිසි හයක් නොමැතිව මාගේ
මුහුණට කෙළ ගසති.[1]
11 දෙවි මාගේ දුන්නෙහි ලණුව ලිහා,
මාව ලැජ්ජාවට පත් කළේය.
ඒ නිසා ඔවුහු කිසි බියක්
නොමැතිව මට සතුරුකම්
පෑවෝය.
12 ඔවුහු සියලුදෙනාම ආමරිකයන්
මෙන් මාගේ දකුණු පැත්-
තෙහි මට විරුද්ධව නැඟී
සිටියෝය.
ඔවුන් මාව පන්නා දැමුවත්
මාගේ මාර්ගය අවහිර කොට
තිබුණු නිසා මට ගැලවී
යෑමට නොහැකි විය.[2]
13 ඔවුහු මාගේ ගමන් මඟ විනාශ කර
තව තවත් මාව අසරණ කරන්-
නෝය.[3]
එසේ කිරීමට කිසිවෙකුගේ උදව්
උපකාර ඔවුන්ට අවශ්‍ය
නැත.
14 බිඳ දැමූ පවුරක් මැදින් නුවරකට
කඩාවදින සෙනඟක් මෙන්
ඔවුහු කුණාටුවක් බඳු පීඩාව-
ලින් මිරිකී සිටින මාගේ
ඇඟට කඩාපනිති.
15 භීතිය මාව වෙළාගත්තේය.
මාගේ ගෞරවය සුළඟට ගසා-
ගෙන යන්නාක් මෙන්ද
මාගේ බලාපොරොත්තු වලාකු-
ළක් මෙන්ද පහව ගියේය.
16 දුක් පීඩා එක පිට එක පැමිණෙන්-
නේය.[4]
මාගේ ජීවිතය කෙමෙන් කෙ-
මෙන් පහව යන්නේය.[5]
17 රාත්‍රියේදී මාගේ ඇටකටු[6] කැඩී
බිඳී ගොස් ඇත්තාක් මෙන්
මට අධික වේදනාවක්
දැනෙයි.
මාගේ වේදනාවට නිමක්
නැත.[7]
18 මාගේ රෝගය කොතරම් දරුණුද
කියනවා නම් මාගේ වස්-
ත්‍රය* පවා වෙනස් වී ඇත.

**යෝබ් 30:4*** හෙබ්‍රෙව් බසින්, රොතෙම්. වියළි පළාත්වල වැඩෙන පඳුරකි.

**යෝබ් 30:18*** මෙහි, “වස්ත්‍රය” ලෙස සඳහන් වන්නේ යෝබ්ගේ සම ගැන විය හැකියි.

**30 පරි.**
1 1පේතෘ 5:5
2 යෝබ් 12:4
3 යෙසා 1:31
4 යෙරෙ 17:6
5 උත් 4:12 ගීතා 109:10 ආනි 4:25
6 1සාමු 25:25 යෙසා 32:6
7 ගීතා 69:12 විලා 3:14
8 යෝබ් 17:6
9 යෝබ් 19:13

**2 තීරුව**
1 ගණන් 12:14 ද්වි 25:9 යෙසා 50:6 මතෙ 27:30
2 යෝබ් 19:12
3 යෝබ් 16:2 ගීතා 69:26
4 යෝබ් 10:15
5 ගීතා 22:14
6 ගීතා 6:2
7 යෝබ් 2:8 යෝබ් 2:13 යෝබ් 7:4

මාගේ සළුවේ කර පටිය සේ
මාගේ වස්ත්‍රයද මා වටා එතී
ඇත.
19 දෙවි මාව මඩ ගොඩකට හෙළා
දැමුවේය.
මම දැන් දූවිලි හා අළු මෙන් වී
සිටිමි.
20 ‘මා උපකාරය පතා මොරගැසුවද
ඔබ මට පිළිතුරු දුන්නේ
නැත.[1]
මම සිටගත්තෙමි. එහෙත් ඔබ
මා දෙස බැලුවේ නැත.
21 ඔබ වෙනස් වී ඇත. මට කුරිරු
ලෙස සැලකුවෙහිය.[2]
ඔබ මා සමඟ උදහස් වී ඔබේ
මුළු වැර යොදා මට පහර
දුන්නෙහිය.
22 ඔබ මාව සුළඟට ගසාගෙන යන්න
සලස්වා
කුණාටුවෙන් මාව විනාශ
කළෙහිය.
23 ඔබ මාව මරණයට පමුණුවන බව
මම හොඳින් දනිමි.[3]
මිනිසාගේ අවසන් නවාතැන්-
පොළට ඔබ මාව ගෙන යන්-
නෙහිය.’
24 නටබුන් ගොඩක් මෙන් වී සිටින
මිනිසෙකුට කිසිවෙක් පහර
දෙන්නේ නැත.[4]
එවැනි කෙනෙකුගේ පිහිටට
කිසිවෙක් පැමිණෙන්නේද
නැත.
25 නමුත් යමෙකු දුකින් පෙළුණු විට
මම හඬා වැලපුණෙමි.[5]
දුප්පතුන් වෙනුවෙන් ශෝක
වුණෙමි.[6]
26 යහපත පැමිණෙන තුරු බලා සිටි-
යද නපුර මා පසුපස ලුහු-
බැන්දේය.[7]
එළිය ලැබෙන තුරු බලා සිටි-
යද අඳුර මාව වට කරගත්-
තේය.
27 මාගේ හදවත වේදනාවෙන්
දැවෙන්නේය.
විපත්ති කාලය මා පිටට පැමි-
ණියේය.
28 හිරු එළිය නොමැතිව මම දුකින්
ඇවිද්දෙමි.[1]
මම සමූහයන් මැද නැඟිට උප-
කාරය පතා හැඬුවෙමි.
29 මා දැන් හිවලුන්ගේ සහෝදරයෙකු
මෙන්ද
පැස්බරුන්ගේ මිතුරෙකු මෙන්ද
වී ඇත.[2]
30 මාගේ සම කලු වී ගැලවී යන්-
නේය.[3]
මාගේ ඇටකටු ගින්නකින් දැවී
යන්නාක් මෙන් වියළී ගොස්
ඇත.
31 මාගේ වීණාවෙන් විලාප හඬක්ද
මාගේ නළාවෙන් ශෝක ගී
රාවයක්ද නික්මෙන්නේය.

# 31

“මාගේ දෑස් සමඟ මම ගිවිසු-
මක් ඇති කළෙමි.[4]
එසේනම් මා වැරදි චේතනා-
වකින් තරුණියක දෙස
බලන්නේ කෙසේද?[5]
2 ස්වර්ගයේ වසන සියලු බලැති දෙ-
විගෙන්
මිනිසාට ලැබෙන උරුමය
කුමක්ද?[6]
3 වැරදිකරුවන් පිටට විපත්ති පැමි-
ණෙනු ඇත.[7]
නපුරු දේ කරන්නන්ට විනාශය
අත් වනු ඇත.
4 දෙවි මා ජීවත් වන ආකාරය දෙස
බලා,
මා තබන සෑම පියවරක් දෙ-
සම විමසිල්ලෙන් බලන්නේ
නැද්ද?[8]
5 මා වංක මිනිසුන් සමඟ ඇසුරු
කරමින්[9]
වංචනික දේ කිරීමට මාන
බලන්නේ නම්[10] ඔහු එය
දකින්නේ නැද්ද?
6 ඔහු මාව නිවැරදි තරාදියක තබා
කිරා මැන බලා,[11]
මාගේ විශ්වාසවන්තකම දැන-
ගනු ඇත.[12]
7 මා නිවැරදි මඟෙන් ඉවත් වී,[13]
මාගේ ඇසට ප්‍රිය දේ පසුපස
ගොස්,[14]

**30 පරි.**
1 යෝබ් 19:7 ගීතා 22:2 විලා 3:8
2 යෝබ් 7:20 යෝබ් 19:6
3 උත් 3:19
4 යෝබ් 13:25
5 ගීතා 35:13 රෝම 12:15
6 හිතෝ 14:21 හිතෝ 14:31 හිතෝ 19:17
7 යෙරෙ 8:15 යෙරෙ 14:19

**2 තීරුව**
1 ගීතා 38:6 ගීතා 42:9 ගීතා 43:2
2 මීකා 1:8
3 යෝබ් 7:5 ගීතා 119:83 විලා 4:8

**31 පරි.**
4 හිතෝ 6:25 මතෙ 5:28
5 යෝබ් 31:9 1කොරි 7:1
6 යෝබ් 20:29
7 ගීතා 73:18 හිතෝ 10:29
8 උත් 16:13 2ලේක 16:9 ගීතා 139:3 හිතෝ 5:21 යෙරෙ 32:19
9 ගීතා 26:5
10 හිතෝ 6:18
11 1සාමු 2:3 ආනි 5:27
12 යෝබ් 2:3 යෝබ් 27:5 ගීතා 7:8
13 ද්වි 11:16 යෙරෙ 10:23
14 ගණන් 15:39 දේශ 11:9 එස 6:9 මතෙ 5:29 1යොහ 2:16

මාගේ අත් දූෂිත දෙයින් පුරවා
ඇත්නම්[1]
8 මා වපුරන දේ අන් අය භුක්ති
විඳිය යුතුයි.[2]
මාගේ දරු පරම්පරාව නැති
නාස්ති විය යුතුයි.
9 මා වෙනත් ස්ත්‍රියක දෙස කාමා-
ශාවකින් බලන්නේ නම්[3]
මාගේ අසල්වැසියාගේ දොරකඩ
ළඟ සැඟවී ඔහුගේ භාර්-
යාව එන තුරු රැක සිටින්-
නේ නම්[4]
10 මාගේ භාර්යාව වෙනත් පුරුෂ-
යෙකු වෙනුවෙන් ධාන්‍ය අඹ-
රනු ලැබේවා!
ඇය වෙනත් පුරුෂයන් සමඟ
සයනය කරාවා![5]
11 මන්ද මා එලෙස හැසිරුණා නම්
මා ක්‍රියා කර ඇත්තේ ඉතා
නින්දිත ලෙසය.
මා සිදු කර තිබෙන්නේ විනිශ්ච-
යකරුවන් ඉදිරියට ගෙන යා
යුතු වරදකි.[6]
12 එවැනි වැරදි ආශාවක් මුළුමනින්ම
විනාශයට පත් කරන ගින්-
නක් මෙනි.[7]
එය මා රැස් කරගත් සියල්ල
සහමුලින්ම නැති නාස්ති
කරනු ඇත.
13 මාගේ දාසයා හෝ දාසිය හෝ
මට විරුද්ධව පැමිණිල්ලක්
ගෙනා විට
මා ඔවුන්ට යුක්තිය ඉටු නොක-
ළේ නම්
14 දෙවි ඔවුන් වෙනුවෙන් නැඟී සිටින
දවසේදී මා කුමක් කරන්-
නද?
දෙවි ඉදිරියේ ගණන් දෙන විට
මාගේ නිර්දෝෂකම ඔප්පු
කරන්නේ කෙසේද?[8]
15 ඔවුන්ව නිර්මාණය කළෙත් මාව
මව්කුසේ නිර්මාණය කළ
තැනැත්තාම නොවේද?[9]
අප සියල්ලන්ව මව්කුසේ
වැඩෙන්න සැලැස්වූයේ ඒ
තැනැත්තාම නොවේද?
16 මා දිළිඳුන්ගේ ආශාවන් ඉටු කර
නොදී[1]
වැන්දඹුවගේ දුකේදී ඉවත
බලාගත්තා නම්[2]
17 මම පියා නැති දරුවන්ගේ කුස-
ගින්න නොතකා
මාගේ කුස විතරක් පුරවා-
ගත්තා නම් දෙවි එය දකින්-
නේ නැද්ද?[3]
18 (මාගේ තරුණ වියේ පටන් මම
පියා නැත්තාට පියෙක්
වුණෙමි.
ඇනුම් තේරුම් ඇති වයසේ
පටන් වැන්දඹුවන්ට උපකාර
කළෙමි.)
19 ඇඟට ඇඳුමක් නොමැතිව[4]
හෝ පොරවාගැනීමට වස්ත්‍රයක්
නොමැතිව හෝ පීඩා විඳින
දුගියෙකු දුටු විට,
20 මාගේ බැටළුවන්ගේ ලොම්වලින්[5]
ඔහුව උණුසුම් නොකළා නම්
ඔහුට පිහිට නොවූ නිසා ඔහු-
ගෙන් ආශීර්වාදයක් නො-
ලැබුවා නම්[6] දෙවි එය
දකින්නේ නැද්ද?
21 නුවර දොරටුව අසලදී[7] පියා නැති
දරුවන්ට උපකාර කරනවා
වෙනුවට
අත මිටමොළවා ඔවුන්ට තර්ජ-
නය කළා නම්[8]
22 මාගේ උරහිසෙන්
අත ගැලවී වැටේවා!
23 බලයෙන් උසස් වූ[9] ශ්‍රේෂ්ඨ දෙවිට
විරුද්ධව මට කිසිවක් කළ
නොහැකිය.
ඔහු ගෙනෙන විපත්තිවලට
මුහුණ දීමට මම භය වෙමි.
24 මා රනට කතා කොට, ‘ඔබ මාගේ
විශ්වාසය’[10] යයි කියමින්
එය කෙරෙහි බලාපොරොත්තු
තැබුවාද?
25 එසේත් නැත්නම් මට බොහෝ[11]
ධන සම්පත් හා දේපළ
තිබුණු හෙයින්[12] ප්‍රීතියෙන්
ඉපිල ගියාද?

**31 පරි.**
1 යෙසා 33:15
2 ලෙවී 26:16
3 යෝබ් 31:1 මතෙ 5:28
4 යෝබ් 24:15
5 2සාමු 12:11 යෙරෙ 8:10
6 උත් 38:24 ලෙවී 20:10 ද්වි 22:22
7 හිතෝ 6:27 හිතෝ 7:27
8 ගීතා 82:3 හිතෝ 22:23 යෙසා 10:3
9 යෝබ් 34:19 ගීතා 139:16 හිතෝ 14:31 හිතෝ 22:2 මලා 2:10

**2 තීරුව**
1 ද්වි 15:7
2 ද්වි 10:18 හිතෝ 28:27
3 එස 18:7 යාකො 1:27 1යොහ 3:17
4 යෙසා 58:7 මතෙ 25:36 ලූක් 3:11 යාකො 2:15
5 ද්වි 18:4
6 ද්වි 24:13
7 ද්වි 16:18
8 හිතෝ 14:21
9 යෝබ් 13:11
10 ගීතා 49:6 හිතෝ 11:28 1තිමෝ 6:17
11 එස්ත 5:11 ගීතා 62:10 හිතෝ 11:28
12 ද්වි 8:17

26 දීප්තියෙන් බැබළෙන හිරු දෙස හෝ
ආලෝකය විහිදුවමින් ගමන් කරන සඳු දෙස හෝ බලා,[1]
27 මා මුළාව ගොස්[2]
ඒවාට ආචාර කිරීමට* පෙලඹුණා නම්
28 එය සැබෑ දෙවිට විරුද්ධව කරන ද්‍රෝහිකමකි.
එයත් විනිශ්චයකරුවන් ඉදිරියට ගෙන යා යුතු වරදකි.
29 මට වෛර කරන කෙනෙකුගේ විනාශය දැක මා සතුටු වුණා නම්[3]
ඔහුගේ විපතේදී මා උදම් ඇනුවා නම් දෙවි මට දඬුවම් කළ යුතුයි.
30 එහෙත් මම එවැනි කෙනෙකුට විරුද්ධව පව් කර,
ඔහුට ශාප කිරීමට තරම් එඩිතර වූයේ නැත.[4]
31 'ඔහුගෙන් ආහාර වේලක් කා තෘප්තියට පත් නොවූ කෙනෙක් නැත'[5] කියා මාගේ ගෙයි වැසියන් මා ගැන පවසන්නේ නැත්නම්
ඔවුන්ගේ අවශ්‍යතා නොසලකාහැරීම ගැන මා වග කිව යුතු නැද්ද?
32 එහෙත් මම කිසිදා අමුත්තෙකුට එළිමහනේ රාත්‍රිය ගත කරන්න ඉඩ දුන්නේ නැත.[6]
ආගන්තුකයන් වෙනුවෙන් මාගේ නිවසේ දොරටුව සැමදා විවෘතව තිබිණ.
33 සාමාන්‍ය මිනිසෙකු මෙන් මා කළ වැරදි සිතෙහි සඟවා,[7]
ඒවා හෙළි නොකර සිටියා නම් දෙවි එය දන්නේ නැද්ද?
34 එහෙත් මා සමූහයට භය වී සිටි නිසා හෝ
මාගේ පවුලේ අය මාව පිළිකුල් කරයි යන බිය නිසා හෝ
මාගේ නිවසට වී මම කළ පාප සඟවා සිටියේ නැත.
35 අනේ, මා පවසන දේට කවරෙකු හෝ සවන් දෙනවා නම් කොතරම් යහපත්ද![1]
මා මුද්‍රාවෙන් සහතික කළ මාගේ පැමිණිල්ලට සියලු බලැති දෙවි සවන් දී පිළිතුරු දෙන තෙක් මම බලා සිටිමි.[2]
මාගේ විරුද්ධකරු මට විරුද්ධව ගෙන එන චෝදනා ලියවිල්ලක සටහන් කරනවා නම් මම කැමැත්තෙමි.
36 මම ඒවා මාගේ උරහිස මත තබාගෙන යන්නෙමි.
අගනා ඔටුන්නක් මෙන් එය පළඳින්නෙමි.
37 මම කිසිවක් නොසඟවා මා ගත් සියලු පියවර ගැන ඔහුට පවසන්නෙමි.[3]
මම නායකයෙකු මෙන් එඩිතරව ඔහු ඉදිරියට යන්නෙමි.
38 මාගේම වගාබිම් මා නිසා හඬා වැලපෙනවා නම්
මාගේ කෙත්වල සීසාන ලද පොළොව කඳුළුවලින් තෙමී ඇත්නම් දෙවි එය දකිනු ඇත.
39 මා කිසිවක් නොගෙවා කෙත්වතුවල පලදාව භුක්ති වින්දා නම්[4]
නියම අයිතිකරුවන්ගෙන් එම කෙත්වතු පැහැරගන්න වෑයම් කළා නම්[5]
40 මාගේ කෙත්වල තිරිඟු වෙනුවට කටු ගස්ද[6]
බාර්ලි වෙනුවට වල් පැළෑටිද හටගනු ලැබේවා!"

මෙයින් යෝබ්ගේ කතාව අවසන් විය.

**32** යෝබ් තමා ධර්මිෂ්ඨයෙකුයි සිතූ බැවින්[7] ඔහුගේ මිතුරෝ තිදෙනා ඔහු සමඟ තවදුරටත් වාද කිරීමෙන් වැළකී සිටියෝය. 2 ඒ අවස්ථාවේදී බූෂ්ගේ[8] පෙළපතට අයත් රාම්ගෙන් පැව-

31 පරි.
1 ද්වි 4:19
2 ද්වි 11:16
3 හිතෝ 17:5
හිතෝ 24:17
4 මතෙ 5:44
රෝම 12:14
5 උත් 18:5
රෝම 12:13
6 උත් 19:3
විනි 19:21
මතෙ 25:35
හෙබ්‍රෙ 13:2
1පේතෘ 4:9
7 උත් 3:8
හිතෝ 28:13
ක්‍රියා 5:8

2 තීරුව
1 යෝබ් 19:7
2 යෝබ් 13:22
3 යෝබ් 29:6
4 යාකො 5:4
5 1රාජා 21:15
6 උත් 3:18

32 පරි.
7 යෝබ් 6:29
යෝබ් 27:6
හිතෝ 3:7
8 උත් 22:21

යෝබ් **31:27*** මුල් භාෂාවේ, "අත සිඹ ආචාර කිරීම" යන අදහස ඇතුළත් කර තිබේ.

තෙන බාරකෙල්ගේ පුත් එලිහුගේ
කෝපය යෝබ්ට විරුද්ධව ඇවුළු-
ණේය. මන්ද යෝබ් දෙවිගේ ධර්මිෂ්-
ඨකම ගැන කතා කරනවා වෙනුවට
තමාගේ ධර්මිෂ්ඨකම ඔප්පු කිරීමට
වැයම් කළේය.[1] **3** යෝබ්ගේ මිතු-
රන් තිදෙනා ඔහුට නිවැරදි පිළිතුරක්
දීමට නොහැකිව දෙවි දුෂ්ටයෙකු-
යයි[2] ප්‍රකාශ කළ නිසා එලිහු ඔවුන්
සමඟද උදහස් විය. **4** එලිහු එහි
සිටි සියල්ලන්ට වඩා වයසින් බාල
වූ නිසා[3] සියලුදෙනා කතා කර
අවසන් වන තුරු යෝබ්ට කිසි-
වක් නොකීවේය. **5** යෝබ්ගේ මිතු-
රන් තිදෙනාට තවදුරටත් පිළිතුරු
දීමට නොහැකි බව දුටු විට[4] ඔහුගේ
කෝපය තව තවත් වැඩි වුණේය.
**6** පසුව බූෂ්ගේ පෙළපතට අයත්
බාරකෙල්ගේ පුත් එලිහු කතා කිරීමට
පටන්ගත්තේය.

“මා වයසින් බාලය.
ඔබ සියලුදෙනා මට වඩා වැඩි-
මල්ය.[5]
මා දන්නා දේ ඔබ සමඟ කතා
කිරීමට තරම්
එඩිතර නොවුණේ ඒ නිසාය.
**7** ‘වයසින් මුහුකුරා ගිය අය කතා
කළ යුතුයි.
ප්‍රඥාව ගැන කියා දිය යුත්තේ
වයසින් වැඩි අයයි’ කියා මම
සිතුවෙමි.[6]
**8** මිනිසාට අවබෝධය ලැබෙන්නේ
ඔවුන් තුළ සියලු බලැති දෙවි-
ගේ බලය ක්‍රියාත්මක වන
විටයි.[7]
**9** යමෙකු වයසින් මුහුකුරා ගිය පම-
ණින් ඔහු ප්‍රඥාවන්තයෙකු
වන්නේ නැත.[8]
නිවැරදි විනිශ්චයක් කිරීමට
හැකියාව තිබෙන්නේ මහල්-
ලන්ට පමණක් නොවෙයි.[9]
**10** එමනිසා මම දන්නා දේ පව-
සන විට
මට සවන් දෙන මෙන් ඉල්ලමි.
**11** ඔබ සියලුදෙනා කියූ දේට මම
සවන් දුන්නෙමි.
ඔබේ තර්ක විතර්කවලටද මම
හොඳින් සවන් දුන්නෙමි.[1]
පිළිතුරු දෙන්නේ කෙසේද කියා
ඔබ කල්පනා කළ විටත් මම
නිහඬව සිටියෙමි.
**12** ඔබ කියූ සෑම දෙයකටම මම
හොඳින් අවධානය දුන්-
නෙමි.
එහෙත් යෝබ්ව නිවැරදි කළ
හැකි කිසිවෙක් නැත.
ඔහුට නිවැරදි පිළිතුරක් දීමට
සමත් කෙනෙක් ඔබ අතරේ
නැත.
**13** එසේනම්, ‘ප්‍රඥාව අප සතුයි’ කියා
පැවසීමටවත්[2]
‘යෝබ්ට දඬුවම් දෙන්නේ දෙවි
මිසක මිනිසෙකු නොවෙයි’
කියා පැවසීමටවත් ඔබට
අයිතියක් නැත.
**14** ඔහු වාද කළේ ඔබ සමඟ මිස මා
සමඟ නොවෙයි.
එමනිසා මා ඔහුට පිළිතුරු
දෙන්නේ ඔබ පිළිතුරු දුන්
ආකාරයට නොවෙයි.
**15** ඔබ තිගැස්සී නිහඬව සිටින්නහුය.
ඔබට තව කීමට දෙයක් ඉතුරු
වී නැත.
**16** ඔබට කීමට තවත් කිසිවක් ඇද්-
දැයි මම බලා සිටියෙමි.
ඔබ කිසිවක් නොකියා ගල්ගැසී
බලා සිටින්නහුය.
**17** දැන් මාගේ වාරය පැමිණ තිබේ.
මම අවබෝධ කරගත් දේ ඔබට
පවසන්නෙමි.
**18** මට කීමට බොහෝ දේ ඇත.
දෙවිගේ බලය මා තුළ ක්‍රියා
කරන බැවින් මට නිහඬව
සිටීමට නොහැකිය.[3]
**19** මා සිදුරක් නැති බඳුනක පැස වන
වයින් මෙනි.
අලුත් සම් භාජනයක් මෙන්
මාත් දැන් පිපිරීමට ආසන්-
නය.[4]
**20** මට කතා කිරීමට දැන් අවසර
දෙන්න.
මාගේ සිත තුළ සිර කරගෙන

**32 පරි.**
1 යෝබ් 10:3
2 නික් 20:7; යෝබ් 4:18; යෝබ් 22:3; යෝබ් 25:5; යෝබ් 42:8
3 ලෙවී 19:32
4 ගීතා 78:36; 2කොරි 13:1; තීත 1:11
5 යෝබ් 15:10; 1තිමෝ 5:1; 1පේතෘ 5:5
6 1රාජා 12:6; යෝබ් 12:12
7 1රාජා 3:12; 1රාජා 4:29; යෝබ් 35:11; හිතෝ 2:6; දේශ 2:26; දානි 1:17; මතෙ 11:25; යාකො 1:5
8 ගීතා 119:100; 1කොරි 1:26
9 දේශ 4:13

**2 තීරුව**
1 යාකො 1:19
2 යෙරෙ 9:23; 1කොරි 1:29
3 ගීතා 39:3; යෙරෙ 20:9; ක්‍රියා 18:25
4 මතෙ 9:17

තිබෙන අදහස් මම පිට
කරන්නෙමි.[1]
21 මම කිසි මිනිසෙකුගේ පැත්ත
නොගනිමි.[2]
කිසිවෙකුටවත් විශේෂ ගෞරව
නාමයක් නොදෙන්නෙමි.[3]
22 මා යමෙකුගේ අනුග්‍රහය දිනාගැනී-
මට එවැනි දෙයක් කරන්නේ
කෙසේද?
මා එසේ කළොත් මාගේ සැදුම්-
කරු[4] මාව විගස විනාශ
කරනු ඇත.

33 "යෝබ්, දැන් මම කියන දේට
ඇහුම්කන් දෙන මෙන්
ඉල්ලමි.
මා පවසන සියල්ලට හො-
දින් අවධානය දෙන්න.
2 මට තවත් කතා නොකර සිටිය
නොහැක.
මාගේ දිව අග තිබෙන වචන මා
පිට කළ යුතුය.[5]
3 මාගේ සිතෙහි ධර්මිෂ්ඨකමට
අනුව මම කතා කරන්-
නෙමි.[6]
මා දන්නා දේ මම අවංකව
ප්‍රකාශ කරන්නෙමි.[7]
4 දෙවි තම බලය මාර්ගයෙන් මාව
නිර්මාණය කළේය.[8]
සියලු බලැති දෙවි තම හුස්-
මෙන් මාව ජීවත් කෙරෙව්-
වේය.[9]
5 ඔබට හැකි නම් මට පිළිතුරු
දෙන්න.
මා පවසන දේට විරුද්ධව තර්ක
කිරීමට සූදානම් වෙන්න.
6 සැබෑ දෙවි ඉදිරියේ ඔබත් මාත්
එක හා සමානය.[10]
ඔබව මෙන්ම මාවද සාදා
තිබෙන්නේ මැටිවලිනි.[11]
7 මට බිය වන්න කිසිදු හේතුවක්
නැත.
මම ඔබේ සිත බිඳ දමන්න කිසි-
වක් පවසන්නේද[12] නැත.
8 එහෙත් ඔබ කියූ දේ මට ඇසු-
ණේය.
ඔබ නැවත නැවත මෙසේ
කීවෙහිය.
9 'මා නිර්දෝෂය.[1]
මම කිසි වරදක් කර නැත. මා
පවිත්‍රය.[2]
10 එහෙත් දෙවි මාව තමාගේ සතු-
රෙකු[3] ලෙස සලකමින්
මට විරුද්ධව කාරණා සොයන්-
නේය.
11 ඔහු මාගේ පාද දඬුකඳේ ගසා[4]
මා යන එන තැන් දෙස නිතරම
බලා සිටින්නේය.'[5]
12 එහෙත් ඔබ දෙවි ගැන කී ඒ එක්
දෙයක්වත් සත්‍යය නො-
වෙයි.[6]
දෙවි මනුෂ්‍යයාට වඩා බොහෝ
සෙයින් උසස්ය.[7]
13 එසේනම් ඔබ දෙවි සමඟ වාද
කරන්නේ මන්ද?[8]
ඔබ එසේ කරන්නේ ඔහු ඔබට
පිළිතුරු නොදෙන බව
සිතන නිසාද?[9]
14 ඇත්තෙන්ම, දෙවි නැවත නැවත
කතා කරන්නේය.[10]
එහෙත් මිනිසා ඔහු කතා කරන
විට අවධානය යොමු නොක-
රන්නේය.
15 මිනිසා රාත්‍රියේ යහන මත
අඩ නින්දේ සිටින විටද තද
නින්දේ සිටින විටද[11]
දර්ශන[12] මගින් දෙවි ඔහුට
කතා කරන්නේය.
16 එවැනි අවස්ථාවල දෙවි ඔහුට
කාරණා හෙළි කරන්නේය.[13]
ඔහු දෙන අවවාද තවත් ස්ථිර
කරන්නේය.
17 ඔහු එසේ කරන්නේ, මනුෂ්‍යයාව
වැරදි මඟෙන් ඉවතට ගැනීම
සඳහාය.[14]
ඔහු තුළ තිබෙන උඩඟුකම පහ
කිරීම උදෙසාය.[15]
18 මෙසේ දෙවි ඔහුගේ ජීවිතය මිනී
වළෙන් බේරාගනු ඇත.[16]
මාරාන්තික ඊතලයකින් ඔහු-
ගේ ජීවිතය අහිමි වීම වළක්-
වනු ඇත.[17]

**32 පරි.**
1 හිතෝ 15:28 1පේතෘ 3:15
2 ලෙවී 19:15 හිතෝ 24:23 යාකො 3:17
3 මතෙ 23:8 ලූක් 18:19
4 යෝබ් 27:8 යෝබ් 35:10 ගීතා 95:6

**33 පරි.**
5 යෝබ් 6:30 ගීතා 137:6
6 මතෙ 12:34 ලූක් 6:45
7 හිතෝ 15:2 හිතෝ 20:15
8 ගීතා 119:73
9 උත් 2:7 යෝබ් 32:8 දේශ 12:7 ක්‍රියා 17:25
10 ක්‍රියා 14:15
11 උත් 2:7 යෝබ් 10:9 1කොරි 15:47 2කොරි 4:7
12 විනි 16:16 ලූක් 24:29

**2 තීරුව**
1 යෝබ් 10:7 යෝබ් 16:17 යෝබ් 23:11
2 යෝබ් 29:14 හිතෝ 21:2
3 යෝබ් 13:24 යෝබ් 16:9 යෝබ් 19:11
4 යෝබ් 13:27 යෙරෙ 20:2 ක්‍රියා 16:24
5 යෝබ් 14:16 යෝබ් 31:4
6 හිතෝ 9:8 ගලා 2:11
7 යෝබ් 12:13 ගීතා 8:4 යෙසා 40:25 යෙසා 55:9
8 යෙසා 45:9 රෝම 9:20 1කොරි 10:22
9 යෝබ් 13:24
10 යෝබ් 40:5 ගීතා 62:11
11 දානි 4:5
12 ගණන් 12:6 දානි 4:5
13 යෝබ් 36:10
14 උත් 20:6 මතෙ 2:12 මතෙ 27:19
15 දානි 4:25
16 උත් 31:24
17 2ලේක 32:5 එෆී 6:16

19 ඔහු මිනිසාට තම යහන මත වේද-
නාවෙන් වැතිර සිටීමට ඉඩ-
හැර ඔහුව හික්මවන්නේය.
නොනවත්වාම ඔහුගේ ඇටකටු
රිදුම් දෙන්නේය.
20 කෑම සඳහා ඔහුට කිසි ප්‍රියක්
නැත.[1]
ප්‍රණීත ආහාර පවා ඔහුට
අප්‍රිය වේ.
21 ඔහුගේ ශරීරය ක්ෂය වී යන්නේය.
පිරිපුන්ව සිටි ඔහු දැන් ඇට
සැකිල්ලක් වී ඇත.
22 මිනී වළට යෑමට ඔහුට ඇත්තේ
තව කෙටි කලකි.[2]
මිනී මරුවන් අතට ඔහුගේ ජීවි-
තය හසු වී ඇත.
23 එහෙත් නිවැරදි දේ කුමක්ද කියා
ඔහුට කියා දීමට පණිවිඩක-
රුවෙකු සිටින්නේ නම්
එසේය, දහසක් අතරින්
ඔහුව නියෝජනය කිරීමට
තැනැත්තෙකු පැමිණේ නම්
24 ඒ තැනැත්තා ඔහුට අනුකම්පා
කොට මෙසේ කියනු ඇත.
‘මිනී වළෙන් ඔහුව බේරා-
ගන්න.[3]
මන්ද ඔහු වෙනුවෙන් මම වන්-
දියක් ගෙවා ඇත.[4]
25 ඔහුගේ සම දරුවෙකුගේ සමට
වඩා මෘදු වන්නේය.[5]
ඔහු නැවත තරුණ වියට පැමි-
ණෙන්නේය.’[6]
26 එවිට එම පණිවිඩකරු ඔහුට අනු-
මැතිය ලබා දෙන මෙන් දෙ-
විගෙන් අයැදින්නේය.[7]
ඒ නිසා ඔහු දෙවි ඉදිරියේ ප්‍රීති
ඝෝෂා නඟනු ඇත.
දෙවිද ඔහුව නැවත ධර්මිෂ්ඨ
තත්වයකට ගෙනෙනු ඇත.
27 ඔහු මිනිසුන් ඉදිරියේ ගී ගයමින්
මෙසේ කියනු ඇත.
‘මම පව් කර ඇත.[8] මම නිවැ-
රදි මඟෙන් ඉවතට හැරු-
ණෙමි.
මා ක්‍රියා කළේ නුසුදුසු ආකාර-
යටයි.
28 ඔහු මාව මරණයෙන් ගලවාගත්
බැවින්[1]
මාගේ ජීවිතයට ආලෝකය
උදා වන්නේය.’
29 දෙවි නැවත නැවත
මිනිසා වෙනුවෙන් මේ සියලු දේ
කරන්නේය.
30 ඔහු මිනී වළෙන් ඔහුව ගලවාගන්-
නේ,[2] ජීවනය
නමැති ආලෝකය ඔහුට ලබා
දෙන පිණිසය.[3]
31 යෝබ්, මා කියන දේ අසන්න. මට
තවත් කීමට යමක් ඇත.
නිහඬව ඒ දේට අවධානය
දෙන්න.
32 ඔබට යමක් කීමට ඇත්නම් මට
පවසන්න.
මන්ද ඔබ ගත කළ ධර්මිෂ්ඨ
ජීවිතය ගැන මම සතුටු
වෙමි.
33 ඔබට කීමට දෙයක් නැත්නම් මා
පවසන දේට නිහඬව සවන්
දෙන්න.[4]
මම ඔබට ප්‍රඥාව යනු කුමක්ද
කියා උගන්වන්නෙමි.”

**34** එලිහු තවදුරටත් මෙසේ
පැවසුවේය.
2 “ප්‍රඥාවන්තයෙනි, මට සවන්
දෙන්න.
දැනුම් තේරුම් ඇත්තෙනි, මට
ඇහුම්කන් දෙන්න.
3 දිව* කෑමවල රස තෝරන්නාක්
මෙන්[5]
දෙසවන් වචන විමසා බලන්-
නේය.[6]
4 අපි හරි දේ කුමක්දැයි සොයා
බලමු.
යහපත කුමක්දැයි විමසා
බලමු.
5 මන්ද යෝබ් මෙසේ කියා ඇත.
‘මා ධර්මිෂ්ඨය.[7]
නමුත් දෙවි මට යුක්තිය ඉටු
නොකළේය.[8]

**33 පරි.**
1 ගීතා 107:18
2 ගීතා 89:48
3 යෝබ් 14:13
4 යෝබ් 19:25 ගීතා 49:7 මතෙ 20:28
5 2රාජා 5:14
6 ද්වි 34:7 යෝබ් 42:16 ගීතා 103:5
7 ගීතා 30:8
8 2සාමු 12:13 ගීතා 32:5 හිතෝ 28:13 ලූක් 15:21 1යොහ 1:9

**2 තීරුව**
1 ගීතා 19:14 යෙසා 38:17
2 යෝබ් 33:24
3 ගීතා 56:13
4 ගීතා 34:11

**34 පරි.**
5 යෝබ් 6:30
6 යෝබ් 12:11 ක්‍රියා 17:11 එළි 2:7
7 යෝබ් 29:14 යෝබ් 33:9
8 යෝබ් 27:2

**යෝබ් 34:3*** මූ.අ., “උඩු තල්ල.”

6 මට ලැබිය යුතු විනිශ්චය ගැන මා
පවසන්නේ බොරුවක්ද?
මම කිසි වරදක් නොකළෙමි.
එහෙත් මාගේ තුවාලය දරුණුය.'[1]
7 නින්දා අපහාසවලට ලොල්කමක්
දක්වන්නාවූ[2]
යෝබ් වැනි තවත් මිනිසෙකු
සිටීද?[3]
8 ඔහු වැඩි කල් යන්න මත්තෙන් නපුරුකම් කරන අයගේ ඇසුරට වැටෙන්නේය.
දුෂ්ටයන්ගේ මාවත් වෙතට
පියමං කරන්නේය.[4]
9 මන්ද, 'දෙවිව සතුටට පත් කරන
ජීවිතයක් ගත කිරීමෙන්
මිනිසෙකුට කිසි ප්‍රයෝජනයක්
නැහැ'[5] කියා ඔහු පවසන්නේය.
10 තේරුම්ගැනීමේ හැකියාව ඇති
තැනැත්තෙනි,[6] දැන් මා
කියන දේට ඇහුම්කන්
දෙන්න.
සැබෑ දෙවි කවදා හෝ දුෂ්ට
ලෙස ක්‍රියා කරයිද?[7]
සියලු බලැති දෙවි අයුක්තියක්
කරයි කියා සිතිය හැකිද?[8]
එවැනි සිතුවිල්ලක්වත් ඔහුගේ සිතට පහළ වන්නේ
නැත.
11 දෙවි මිනිසෙකුට ප්‍රතිඵල දෙන්නේ
ඔහුගේ ක්‍රියාවලට අනුවය.[9]
මිනිසෙකු හැසිරෙන ආකාරය
අනුව ඔහුට ප්‍රතිඵල විඳින්න
දෙවි ඉඩහරින්නේය.
12 සියලු බලැති දෙවි කිසි දිනක දුෂ්ට
ලෙස හැසිරෙන්නේවත්[10]
අසාධාරණයක් සිදු කරන්නේවත් නැති බව ස්ථිරය.[11]
13 මුළු මහත් පොළොව රැකබලා
ගැනීමට දෙවිව පත් කළේ
කවුද?
කවරෙකු හෝ මේ පොළොව
දෙවිගේ භාරයේ තැබුවාද?
14 අවශ්‍ය නම් මිනිසාව ජීවත් කරවන
බලයත්
හුස්මත් ඉවත් කිරීමට දෙවිට
හැක.[1]
15 එවිට සෑම ජීවියෙක්ම නසිනු ඇත.
මිනිසාද නැවත දූවිල්ලට හැරී
යනු ඇත.[2]
16 ඔබ දැනුම් තේරුම් ඇති අය නම්
මට ඇහුම්කන් දෙන්න.
මා පවසන දේ සිතට ගන්න.
17 යුක්තියට ප්‍රිය නොකරන කෙනෙකුට පාලනය කළ හැකිද?[3]
ධර්මිෂ්ඨ ලෙස ක්‍රියා කරන බලවන්තයෙකු දුෂ්ටයි කියා ඔබ
පවසයිද?[4]
18 යමෙකු රජෙකුව අමතා, 'ඔබ කිසි
කමකට නැති කෙනෙක්'
කියා හෝ
උත්තමයෙකුට, 'ඔබ දුෂ්ටයෙක්' කියා හෝ පවසයිද?[5]
19 එහෙත් අධිපතියෙකුට වුවද
විශේෂ සැලකිල්ලක් නොදක්වන කෙනෙක් සිටියි.
ඔහු දිළින්දන්ටත් උත්තමයන්ටත් සලකන්නේ එක හා
සමානවය.[6]
මන්ද ඒ සෑම කෙනෙකුටම ජීවිතය දුන්නේ ඔහුය.[7]
20 ඒ සියලුදෙනාම රෑ යාමයේදී[8]
සැණෙකින් මිය යන්නෝය.[9]
ඔවුහු විපත්තිය දැක කැලඹී,
අවසන් හුස්ම හෙළන්නෝය.
බලවන්තයෝ පවා මිනිසෙකුගේ මැදිහත් වීමකින් තොරව
නැති වී යන්නෝය.[10]
21 මන්ද දෙවිගේ ඇස් මිනිසා කෙරෙහි යොමු වී තිබේ.[11]
ඔවුන් ගන්නා සෑම පියවරක්ම
ඔහු දකින්නේය.
22 එබැවින් දුෂ්ටකම් කරන අයට
සැඟවීමට ස්ථානයක් නැත.
ඝන අඳුරෙන් වට වූ ස්ථානවල
පවා ඔවුන්ට සැඟවිය නොහැක.[12]

**34 පරි.**
1 යෝබ් 9:17
2 යෝබ් 15:16 මතෙ 5:39
3 යෝබ් 2:3 එස 14:20 යාකො 5:11
4 හිතෝ 1:15 හිතෝ 4:14
5 යෝබ් 9:22 යෝබ් 35:3 මලා 3:14
6 යෝබ් 34:34
7 උත් 18:25 2ලේක 19:7 ගීතා 92:15
8 ද්වි 32:4 රෝම 9:14 හෙබ්‍රෙ 6:10
9 1ලේක 28:9 ගීතා 62:12 හිතෝ 24:12 යෙරෙ 32:19 එස 33:20 මතෙ 16:27 රෝම 2:6 2කොරි 5:10 ගලා 6:7 1පේතෘ 1:17 එළි 22:12
10 යෝබ් 8:3 යාකො 1:13
11 ගීතා 89:14 ගීතා 97:2 ගීතා 99:4 රෝම 2:11

**2 තීරුව**
1 යෝබ් 27:3 ගීතා 104:29 දේශ 12:7 යෙසා 42:5 ක්‍රියා 17:25
2 උත් 3:19 ගීතා 146:4 දේශ 3:20
3 2සාමු 23:3
4 උත් 18:25
5 නික් 22:28 හිතෝ 17:26 දේශ 8:4 දේශ 10:20
6 ද්වි 10:17 2ලේක 19:7 ක්‍රියා 10:34 රෝම 2:11 ගලා 2:6 එෆී 6:9
7 යෝබ් 31:15 හිතෝ 22:2
8 නික් 12:29 ආනි 5:30 ලූක් 12:20
9 ගීතා 73:19 ක්‍රියා 12:23
10 1සාමු 25:38 ආනි 2:34

**11** උත් 6:5; 2ලේක 16:9; යෝබ් 31:4; හිතෝ 5:21; හිතෝ 15:3; යෙරෙ 16:17; යෙරෙ 32:19; 1පේතෘ 3:12;
**12** ගීතා 139:12; යෙසා 29:15; යෙරෙ 23:24; ආමො 9:3; හෙබ්‍රෙ 4:13.

23 මිනිසුන්ව විනිශ්චය කිරීමට දෙවි
විශේෂ දවසක් නියම කර
නැත.
ඔහුට ඕනෑම අවස්ථාවක එසේ
කළ හැක.
24 ඒ නිසා ඔහු බලවතුන්ව විනිශ්-
චයට නොකැඳවා, ඔවුන්ව
බලයෙන් පහ කර දමන්-
නේය.[1]
ඉන්පසු ඔහු ඔවුන් වෙනුවට වෙ-
නත් අයව පත් කරන්නේය.[2]
25 ඔහු ඔවුන්ගේ සියලු ක්‍රියා දන්නා
නිසා[3]
එක රැයකින් ඔවුන්ව යටත්
කරගෙන විනාශයට පමුණු-
වන්නේය.[4]
26 ඔහු ඔවුන්ව දුෂ්ටයන් ලෙස සලකා
සියල්ලන් ඉදිරියේ ඔවුන්ට පහර
දෙන්නේය.[5]
27 මන්ද ඔවුහු දෙවිගේ මඟ පෙන්වීම්
ප්‍රතික්ෂේප කර,[6]
ඔහුගේ ආඥා ගැන කිසිදු තැකී-
මක් නොකරන්නෝය.[7]
28 අසරණ අය කඳුළු සලමින් දෙවිට
කන්නලව් කරන්නෙත්
පීඩිතයන් ඔහුගෙන් පිහිට
පතන්නෙත් ඔවුන් නිසාය.[8]
29 දෙවි සාමකාමී කාලයක් උදා
කළොත් කිසිවෙකුට ඒ ගැන
දොස් කිව හැකිද?
ඔහු තම මුහුණ ඉවතට හර-
වාගත්තොත්[9] කිසිවෙකුට
ඔහුව දැකිය හැකිද?
ඔහු ඉවතට හැරෙන්නේ යම්
පුද්ගලයෙකු වෙතින් හෝ
වේවා යම් ජාතියක් වෙතින්
හෝ වේවා[10] සිදු වන්නේ
එකම දෙයයි.
30 තමාට ද්‍රෝහිව කටයුතු කරන
කෙනෙකු, පාලනය සියතට
ගෙන[11]
ජනයාව මුළා නොකරන
පිණිස[12] දෙවි එසේ කරන්-
නේය.
31 යමෙකු දෙවිට කතා කොට මෙසේ
කියයිද?
‘මම දුෂ්ටකම්[1] නොකළත් දුක්
විඳින්නෙමි.
32 මා වරදක් කර ඇත්නම් එය මට
පෙන්වා දෙන්න.
මා යම් අධර්මිෂ්ඨ ක්‍රියාවක් කර
ඇත්නම් මම යළි එය නො-
කරන්නෙමි.’[2]
33 දෙවිගේ තීරණය ප්‍රතික්ෂේප කිරී-
මට ඔබ තෝරාගත් නිසා
ඔබ බලාපොරොත්තු වන ආකා-
රයට දෙවි ඔබේ ප්‍රශ්නය
විසඳයි කියා ඔබ සිතනවාද?
මේ තීරණය ගත යුත්තේ මා
නොව ඔබය. ඒ නිසා දැන්
ඔබ දන්නා දේ කියන්න.
34 එවිට අවබෝධයෙන් කටයුතු
කරන මිනිසුන්ද[3]
මට සවන් දී සිටින ප්‍රඥාවන්ත-
යන්ද මට මෙසේ කියනු
ඇත.
35 ‘යෝබ් කතා කරන්නේ දැනුම්
තේරුම් ඇති කෙනෙකු
මෙන් නොවෙයි.[4]
ඔහු පවසන දෙයින් කියාපාන්-
නේ ඔහුට කිසි අවබෝධයක්
නැති බවය.’
36 මාගේ පියාණෙනි, යෝබ් මේ
නපුරු මිනිසුන්ට පැවසූ
දේවල් නිසා
ඔහුව සම්පූර්ණ සෝදිසියකට
ලක් කරන්න.[5]
37 ඔහු අප ඉදිරියේ තම දෑත්වලට
ගසාගනිමින් සැබෑ දෙවිට
විරුද්ධව බොහෝ දේ කියන්-
නේය.[6]
ඒ නිසා ඔහු පව්කාරයෙකු විත-
රක් නොව කැරලිකරුවෙකු
බවටද පත් වී ඇත.”[7]

**35** එලිහු තවදුරටත් පිළිතුරු
දෙමින් මෙසේ කීවේය.
2 “ඔබ කතා කරන ආකාරය සාධා-
රණයි කියා ඔබ සිතනවාද?
‘මම දෙවිට වඩා ධර්මිෂ්ඨයි’
කියා ඔබ කීවෙහිය.[8]
3 ‘මා ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කළා

34 පරි.
1 ආනි 2:21
2 එස 21:27 ආනි 4:25
3 හොෂෙ 7:2 2කොරි 11:15 තීත 1:16
4 1සාමු 4:17 ආනි 5:30
5 ගණන් 12:10
6 නික් 32:8 1සාමු 15:11
7 ගීතා 28:5 යෙසා 5:12
8 නික් 22:23 යෝබ් 35:9 යාකො 5:4
9 ගීතා 27:9 ගීතා 30:7
10 හොෂෙ 4:6
11 යෝබ් 13:16 යෝබ් 27:8
12 1රාජා 12:28 2රාජා 21:9

2 තීරුව
1 ආනි 9:7 රෝම 3:23
2 හිතෝ 28:13
3 යෝබ් 34:10
4 යෝබ් 35:16 යෝබ් 38:2 යෝබ් 42:3
5 යාකො 5:11 1පේත්‍ර 1:7
6 යෝබ් 35:2
7 යෝබ් 10:1 යෝබ් 19:6

35 පරි.
8 යෝබ් 10:7 යෝබ් 16:17 යෝබ් 34:5

කියා එයින් කිසි ප්‍රයෝජන-
යක් තිබේද?[1]
මා පාපයෙන් වැළකී සිටි-
යත් එයින් ඇති වාසිය
කුමක්ද? මා ගත කරන්-
නේ පව්කාරයන්ට වඩා හොඳ
ජීවිතයක්ද' කියාත් ඔබ ඇසු-
වෙහිය.[2]
4 ඔබටත් ඔබේ මිතුරන්ටත්[3]
මේ කාරණය සම්බන්ධයෙන්
මම උත්තර දෙන්නෙමි.
5 අහස දෙස බලන්න.[4]
වලාකුළු ඔබට වඩා කොපමණ
ඉහළින් තිබෙනවාද කියා
බලන්න.[5]
6 ඔබ පව් කළොත් එයින් දෙවිට යම්
හානියක් සිදු වෙනවාද?[6]
ඔබ දිගින් දිගටම දෙවිට විරුද්-
ධව කැරලිගැසුවත් එයින්
දෙවිට යම් අවාසියක් සිදු
වෙනවාද?
7 යහපත් ජීවිතයක් ගත කිරීම දෙ-
විට කරන උදව්වක් කියා
ඔබ සිතුවාද?
දෙවි කවදාවත් ඔබෙන් උදව්-
වක් ඉල්ලා තිබෙනවාද?[7]
8 දුෂ්ටකම් කර, ඔබ හා සමාන වෙ-
නත් මිනිසෙකුට හානියක්
කළ හැකිය.[8]
ධර්මිෂ්ඨ ක්‍රියාවක් කර, වෙනත්
මිනිසෙකුට ප්‍රයෝජන අත්
කර දීමටත් ඔබට හැකිය.[9]
9 මිනිසා දුක් පීඩාවලින් හෙම්බත් වූ
විට උපකාර ඉල්ලති.[10]
බලහත්කාරකම් කරන අය-
ගේ අතින් ගලවාගන්න
කියා හඬා වැලපෙමින් පිහිට
පතති.[11]
10 එහෙත්, 'රාත්‍රියේදී ප්‍රශංසා ගී ගැයී-
මට සලස්වන්නාවූ,[12]
මාව නිර්මාණය කළ ශ්‍රේෂ්ඨ
දෙවි[13] කොහේද' කියා එක්
කෙනෙක්වත් අසන්නේ
නැත.
11 සතුන්ට[14] ලබාගත නොහැකි
ඇනුම මිනිසාට ලබා දෙන්-
නේ ඔහුයි.[1]
අහසේ පියාසර කරන පක්ෂීන්ට
වඩා ප්‍රඥාවන්තව ක්‍රියා කිරී-
මට අපට හැකියාව ලබා
දෙන්නෙත් ඔහුයි.
12 මිනිසුන් උපකාරය පතා මොරගැ-
සුවද
දුෂ්ටයන්ගේ අහංකාරකම[2]
නිසා දෙවි උත්තර දෙන්නේ
නැත.[3]
13 වංක සිතින් කතා කරන අයගේ
කන්නලව්වලට දෙවි සවන්
දෙන්නේ නැත.[4]
සියලු බලැති දෙවි ඔවුන්ව ගණ-
නකටවත් ගන්නේ නැත.[5]
14 එසේනම් ඔහුව දැකගන්න බැහැ
කියා පවසන ඔබට ඔහු
සවන් දෙයිද?[6]
නමුත් ඔබේ නඩුව ඔහුට භාර දී
ඇත. ඔහු තීන්දුව දෙන
තෙක් බලා සිටින්න.[7]
15 දෙවි ඔබ සමඟ උදහස් වී ඔබ කියූ
දේවලට දඬුවමක් නියම කර
නැත.[8]
ඔබ සිතා බලන්නේ නැතුව
පැවසූ වචන ඔහු තම සිතෙහි
තබාගන්නේ නැත.[9]
16 යෝබ් කිසි තේරුමක් නැති වචන
දොඩන්නේය.
ඔහු කිසි අවබෝධයක් නැතුව
බොහෝ දේ පවසන්නේය."[10]

**36** එලිහු තවදුරටත් කතා කර-
මින් මෙසේ කීවේය.
2 "තව ටික වේලාවක් මට කතා
කරන්න ඉඩ දෙන්න.
දෙවි වෙනුවෙන් කතා කිරීමට
මට තවත් කාරණා ඇත.
3 මා දුර බැහැර දේශවලින් දැනුම
රැස් කරගෙන,
මාව සෑදූ තැනැත්තා ධර්-
මිෂ්ඨ බව මම ප්‍රකාශ කරන්-
නෙමි.[11]
4 මා පවසන්නේ සත්‍යය කාරණා
මිසක බොරු නොවෙයි.

35 පරි.
1 යෝබ් 21:15 යෝබ් 34:9
2 යෝබ් 9:22 ගීතා 73:13 මලා 3:14
3 යෝබ් 2:11
4 යෝබ් 22:12
5 ගීතා 68:34
6 හිතෝ 8:36 හිතෝ 9:12 යෙරෙ 7:19
7 ගීතා 16:2 රෝම 11:35
8 හිතෝ 19:3 ගලා 6:7
9 එස 33:16
10 නික් 2:23 යෝබ් 34:28 හිතෝ 29:2
11 ගීතා 10:15
12 ගීතා 42:8 ගීතා 77:6 ගීතා 149:5 ක්‍රියා 16:25
13 යෙසා 51:13 1පේත්‍ර 4:19 එළි 4:11
14 උත් 1:26 හිතෝ 30:24

2 තීරුව
1 ගීතා 94:12 යෙසා 48:17
2 1පේත්‍ර 5:5
3 ගීතා 18:41 හිතෝ 1:28
4 හිතෝ 15:29 යෙසා 1:15 යෙරෙ 11:11
5 හබ 1:13
6 යෝබ් 9:11
7 ගීතා 37:5
8 ගීතා 89:32
9 ගීතා 103:12
10 යෝබ් 34:35 යෝබ් 38:2

36 පරි.
11 ද්වි 32:4 ගීතා 11:7 ගීතා 139:14 ගීතා 139:16 ආනි 9:14 එළි 15:3

දැනුම අතින් කිසි අඩුවක් නැති
තැනැත්තා[1] ඔබ ඉදිරියේ
සිටියි.
5 දෙවි බලවත්ය.[2] නමුත් ඔහු මිනි-
සාව ප්‍රතික්ෂේප කරන්නේ
නැත.
ඔහුට ගැඹුරු අවබෝධයක්
ඇත.
6 ඔහු දුෂ්ටයන්ගේ ජීවිත ආරක්ෂා
නොකරන්නේය.[3]
පීඩාවට පත් වූ අයට යුක්තිය
ඉටු කර දෙන්නේය.[4]
7 ඔහු ධර්මිෂ්ඨයා දෙස සැමදා ඇස්
යොමා සිටින්නේය.[5]
ඔහු රජවරුන්ව සිංහාසනයේ
හිඳුවන්නේය.[6]
ඔවුන්ව සදහටම ගෞරවයට
පත් කරන්නේය.
8 මිනිසුන් විලංගුවලින් බැඳ,[7]
දුක් පීඩාවලින් වට වී
සිටින විට,
9 ඔවුන් උඩඟු වී නොමඟ ගොස් කළ
වැරදි ක්‍රියා ගැන
ඔහු ඔවුන්ට කියා දෙන්නේය.
10 ඔහු ඔවුන් ගිය වැරදි මාර්ගය
පෙන්වා දී[8]
එයින් ඉවත් වීමට නිසි උපදෙස්
ලබා දෙන්නේය.[9]
11 ඔවුන් කීකරු වී ඔහුට සේවය
කරන්නේ නම්
ඔවුන්ගේ ජීවිතය සතුටින් ගෙවී
යනු ඇත.
යහපත් දේ ඔවුහු භුක්ති විඳිනු
ඇත.[10]
12 එහෙත් ඔවුන් කීකරු නොවන්-
නේ නම් ඊපහර වැදී[11] ඔවුහු
විනාශ වී යනු ඇත.[12]
නිවැරදි අවබෝධයක් නො-
මැතිව ජීවිතයෙන් සමුගනු
ඇත.
13 දෙවිට ද්‍රෝහිකම් කරන අය අනා-
ගතය සඳහා රුස් කරන්නේ
දෙවිගේ උදහස පමණි.[13]
දෙවි ඔවුන්ව යදම්වලින් බඳිනු
ලැබුවත් ඔවුහු උපකාරය
පතමින් හඬන්නේ නැත.
14 ඔවුහු තරුණ වියේදීම මිය යනු
ඇත.[1]
දේවාලවල මුදලට සමලිංගික
සේවනයේ යෙදෙන පිරිමින්
සමඟ ඔවුහු මිය යනු ඇත.[2]
15 ඔහු, පීඩාවලින් හෙම්බත් වී සිටින
අයට ඔහුගේ හඬ ඇසෙන්න
සලස්වා
ඔවුන්ව ගලවාගන්නේය.
16 ඔහු ප්‍රශ්නවලින් කොටු වී සිටින
ඔබව මුදා[3]
නිදහස් තැනකට[4] ගෙන යනු
ඇත.
තෙලින් පිරුණු රසවත්
කෑමෙන් ඔබව තෘප්තිමත්
කර සනසනු ඇත.[5]
17 දුෂ්ටයාට නිසි දඬුවම් ලැබෙන විට
ඔබ එය දකිනු ඇත.[6]
නිසැකවම යුක්තිය හා සාධාර-
ණය රජයනු ඇත.
18 එහෙත් ඔබේ සිතෙහි ඇති කෝ-
පය වෛරයට පෙරළී, අපහා-
සාත්මක ලෙස ක්‍රියා කිරී-
මට* ඉඩ ඇත.[7] ඒ නිසා එසේ
නොවීමට වගබලා ගන්න.
මුළාව ගොස් අල්ලසක්# නො-
ගැනීමටද වගබලා ගන්න.[8]
19 ඔබ එලෙස ක්‍රියා කරනවා නම්
විපත්තියෙන් ගැලවීමට ඔබ
දරන වෑයම් සාර්ථක වෙ-
යිද?[9]
ඔබ උපකාරය පතා මොරගැසු-
වත් එයින් පලක් තිබේද?[10]
20 ඔබ රාත්‍රිය එන තුරු බලා නොසි-
ටින්න.
මිනිසුන් තම යහනට ගොස්
සැතපෙන තුරු බලා නොසි-
ටින්න.
21 ඔබ අද්දකින දුක් පීඩා නිහඬව
දරාගන්නවා වෙනුවට[11]
මුළාව ගොස් නපුරු දේ කිරීමට
ඔබට පෙලඹීමක් ඇති විය
හැක.[12]

**36 පරි.**
1 1සාමු 2:3; යෝබ් 37:16
2 ගීතා 24:8; ගීතා 99:4; යෙරෙ 32:18
3 ගීතා 9:17; ගීතා 68:2; 2පේත෍ 2:9
4 ගීතා 10:14; ගීතා 140:12; හිතෝ 22:23
5 ගීතා 33:18; ගීතා 34:15
6 ගීතා 78:70; ගීතා 113:8; යෙසා 9:7
7 ගීතා 107:10
8 ගීතා 33:16
9 එස 18:30
10 යෙසා 1:19; යෙරෙ 26:13
11 යෝබ් 33:18
12 යෙසා 1:20; රෝම 2:8
13 යෝබ් 13:16; රෝම 2:5

**2 තීරුව**
1 ගීතා 55:23
2 1රාජා 14:24
3 යෙසා 30:21
4 ගීතා 18:19; ගීතා 31:8; ගීතා 118:5
5 යෙසා 25:6; යෙසා 55:2
6 හිතෝ 2:22; යෙරෙ 25:31
7 හිතෝ 19:19; හිතෝ 29:22
8 ගීතා 49:7
9 යෝබ් 34:20; ගීතා 33:16; හිතෝ 11:4
10 එස 8:18
11 හෙබ්‍රෙ 11:25
12 ගීතා 66:18

**යෝබ් 36:18*** මූ.අ., අපහාසාත්මක ලෙස, “අත්ලට ගසාගැනීමට.” **18#** මූ.අ., “විශාල වන්දි මුදලක්.”

22 දෙවි තම බලය ඉතා විශිෂ්ට ලෙස
විදහාපෙන්වන්නේය.
දෙවි තරම් ශ්‍රේෂ්ඨ ගුරුවරයෙකු
තවත් සිටියිද?
23 ඔහු කරන දේ හරිද වැරදිද කියා
ප්‍රශ්න කළ හැක්කේ කාටද?[1]
‘ඔබ දුෂ්ට ලෙස ක්‍රියා කර ඇත’
කියා ඔහුට චෝදනා කළ
හැකි කෙනෙකු සිටියිද?[2]
24 මනුෂ්‍යයන් ප්‍රශංසා ගීයෙන් වර්-
ණනා කළ[3] දෙවිගේ ක්‍රියා
ඔබ විසිනුත් වර්ණනා කළ යුතු
බව අමතක නොකරන්න.[4]
25 සියලු මනුෂ්‍යයෝ දෙවිගේ ක්‍රියා
දකින්නෝය.
දුර ඈත සිට ඔහුගේ ක්‍රියා දෙස
බලා සිටින්නෝය.[5]
26 දෙවිගේ ශ්‍රේෂ්ඨත්වය කොතරම්ද
කියා අපට කිසිදා තේරුම්-
ගත නොහැකිය.[6]
ඔහුගේ පැවැත්ම අවුරුදුවලින්
ගණන් කළ නොහැකිය.[7]
27 ඔහු දිය බිඳු පොළොවෙන් ඉහළට
ඇදගත් පසු[8]
පොළොවට වැසි වස්සවා පින්-
නද වැටෙන්න සලස්වන්-
නේය.
28 වලාකුළුවලින් වැහි බිඳු වැටෙන්-
නේය.[9]
වර්ෂාව නොඅඩුව පොළොවට
ඇද හැළෙන්නේය.
29 වලාකුළු අහසේ අතුරා තිබෙන
ආකාරයත්
ඔහුගේ වාසස්ථානයෙන්[10] ගිගු-
රුම් හඬ නැඟෙන ආකාරයත්
තේරුම්ගත හැක්කේ කාටද?
30 වලාකුළුවලට ඉහළින් ඔහු
ආලෝකය විහිදුවන්නේය.[11]
නමුත් මුහුදු පතුල ඔහු වසා
තබන්නේය.
31 ඔහු පොළොවේ වැසියන්ට යුක්-
තිය ඉටු කර දෙන පිණිස ඒ
සියල්ල ප්‍රයෝජනයට ගන්-
නේය.[12]
ඔහු ඇති තරම් ආහාර සපයන්-
නේය.[13]

32 දෙවි අකුණු තම අතට ගෙන
යම් ඉලක්කයක් කරා යෑමට
ඊට අණ කරන්නේය.[1]
33 මහා ගිගුරුම් හඬ මැද ඔහු පැමි-
ණෙනු ඇත.[2]
ගව රැළ පවා ඒ හඬ හඳුනාගෙන
ඔහු එන බවට ඇනුම් දෙනු
ඇත.

**37** “මාගේ හදවත සලිත වී
බියෙන් ගැහෙන්න පටන්-
ගත්තේය.[3]
2 ඔබ සියලුදෙනා දෙවිගේ ගිගුරම්
හඬටත්[4]
ඔහුගේ ගර්ජනාවටත් හොඳින්
සවන් දෙන්න.
3 ඔහු තම හඬ මුළු අහස්තලය පුරා
ඇසෙන්න සලස්වන්නේය.
අකුණු සැර[5] පොළොවේ සීමා
දක්වා යවන්නේය.
4 ඔහුගේ ගිගුරුම් හඬට[6] පොළොව
දෙදරුම් කයි.
ඔහුගේ තේජාන්විත හඬ පො-
ළොව සිසාරා යයි.[7]
ඔහුගේ හඬ ඇසෙන විට අකුණු
සැර දිගින් දිගටම නික්-
මෙයි.[8]
5 දෙවිගේ මුවින් නික්මෙන ගිගුරුම්
හඬ පුදුමාකාරය.[9]
අපට සිතාගැනීමටවත් නො-
හැකි පුදුමාකාර දේවල් ඔහු
සිදු කරන්නේය.[10]
6 ඔහු හිමට කතා කර, ‘පො-
ළොව සිපගන්න’ කියා පව-
සන්නේය.[11]
ඔහු අණ දෙන විට වර්ෂා-
වද ධාරානිපාත වර්ෂාද
පොළොවට ඇද හැළෙන්-
නේය.[12]
7 මෙසේ, ඔහු පොළොවේ සියලු
වැසියන්ගේ වැඩ නවතා
දමන්නේය.
ඔහු එසේ කරන්නේ ඔහුගේ
සියලු ක්‍රියා ඔවුන් දකින
පිණිසය.
8 වනසත්තු පවා ගුහාවලට
ගොස් සැඟවෙති.[13]

**36 පරි.**
1 යෙසා 40:14
2 යෝබ් 34:10 රෝම 9:14
3 නික් 15:1 එළි 15:3
4 ගීතා 92:5 ගීතා 104:24
5 නික් 20:18
6 ගීතා 145:3 ගීතා 148:13 එළි 10:6 එළි 15:3
7 ගීතා 90:2 ගීතා 102:27 1තිමෝ 1:17 හෙබ්‍රෙ 1:12
8 උත් 2:6 ආමො 5:8
9 ද්වි 32:2 හිතෝ 3:20 යෙසා 55:10 යෙරෙ 14:22
10 2සාමු 22:12
11 යෝබ් 37:3 මතෙ 24:27
12 නික් 9:23 යොෂු 10:11 යෝබ් 37:13 යෝබ් 38:23
13 ක්‍රියා 14:17

**2 තීරුව**
1 2සාමු 22:15 ගීතා 18:14 ගීතා 144:6
2 1රාජා 18:41

**37 පරි.**
3 1සාමු 28:5
4 යෝබ් 38:1
5 යෝබ් 37:11 ගීතා 97:4 ලූක් 17:24
6 යෝබ් 40:9 ගීතා 29:3
7 ගීතා 148:13
8 ගීතා 68:33
9 2සාමු 22:14
10 දේශ 3:11 එළි 15:3
11 ගීතා 147:16 යෙසා 55:10
12 ආමො 9:6
13 ගීතා 104:22

9 කුණාටුව එහි නියමිත ස්ථාන-
යෙන්[1] නික්ම එයි.
උතුරු දිශාවෙන් සීත සුළං
පිටත්ව එයි.[2]
10 දෙවි තම හුස්ම පිට කරන විට
පොළොවේ ගලා යන ජල ධාරා[3]
මිදී අයිස් කැට සෑදෙයි.[4]
11 ඔහු ගන වලාකුළු සාදා
ඔහුගේ අකුණු සැරෙන්[5] ඒවා
විසුරුවාහරින්නේය.
12 දෙවි තමන් කැමති දිශාවකට වැහි
වලාකුළු හරවන්නේය.
ඔහුගේ අණ පරිදි[6] ඒවා පො-
ළොවට ඉහළින් ගමන් කර,
ඔහු කැමති දේ සිදු කරන්-
නේය.
13 දඬුවම් කිරීමට[7] හෝ පොළොව
සාරවත් කිරීමට[8] හෝ
කරුණාව* පෙන්වීමට[9] හෝ
ඔහු ඒවා පිටත් කර යවන්-
නේය.
14 යෝබ්, මා කියන දේට සවන්
දෙන්න.
දෙවිගේ විස්මිත ක්‍රියා[10] වෙත
ඔබේ සිත යොමු කරන්න.
15 දෙවි වලාකුළුවලින් ඉටු විය යුතු
කාර්යය නියම කළෙත්[11]
ඒවා අතරින් විදුලි සැර යැවී-
මට තීරණය කළෙත් කවදාද
කියා ඔබ දන්නවාද?
16 වලාකුළු අහසේ පාවෙන්නේ කො-
හොමද කියා ඔබ දන්න-
වාද?[12]
එය දැනුමෙන් පූර්ණ වූ
තැනැත්තාගේ විශිෂ්ට නිර්-
මාණයකි.[13]
17 අවට පරිසරයම නිහඬ කරවමින්
දකුණෙන් සුළං හමද්දී
ඔබේ ඇඟට රස්නය දැනෙන්-
නේ මන්ද කියා ඔබ දන්න-
වාද?[14]
18 දෙවි සමඟ එකතු වී සවිමත් ලෝ-
හමය කැඩපතක් මෙන්
අහස්තලය දිගහරින්න ඔබට
හැකිද?[1]
19 දෙවිට කිව යුතු දේ ඔබ අපට කියා
දෙන්න.
අප සිටින්නේ අඳුරේය. පැවසිය
යුත්තේ කුමක්දැයි අපි නො-
දන්නෙමු.
20 දෙවි සමඟ කතා කිරීමට මා ඉදිරි-
පත් වන බව ඔහුට පවසන්-
නද?
ඔහු සමඟ කතා කිරීමට තරම්
එඩිතර වූ කිසිවෙකු සිටීද?[2]
21 සුළඟ හමා වලාකුළු විසුරුවාහැර
අහස පැහැදිලි වන තුරු
එහි බැබළෙන ආලෝකය මිනි-
සුන්ට නොපෙනෙයි.
22 උතුරු දෙසින් රන්වන් කාන්තිය
නික්මෙයි.
දෙවිගේ තේජස[3] බිය උපදවයි.
23 සියලු බලැති දෙවිව අපට තේරුම්-
ගත නොහැකිය.[4]
ඔහු බලයෙන් ඉතා උසස්ය.[5]
ඔහු කිසිදා යුක්තිය[6] හා ධර්මිෂ්-
ඨකම[7] සුළු කොට තකන්-
නේ නැත.[8]
24 එබැවින් සියලු ජනයා දෙවිට ගරු-
බිය පෙන්විය යුතුය.[9]
තමා ප්‍රඥාවන්තයෙකුයයි
සිතන කිසිවෙකුව දෙවි ගණ-
නකට නොගන්නේය.”[10]

38 යෙහෝවා දෙවි සැඩ සුළඟ
මැදින් කතා කර[11] යෝබ්ට
මෙසේ පිළිතුරු දුන්නේය.
2 “කිසි අවබෝධයක් නොමැතිව[12]
කතා කරමින්,
මා ගත් තීරණ විවේචනයට
ලක් කරන* මේ තැනැත්තා
කවුද?
3 දැන් ශක්තිමත් මිනිසෙකු මෙන්
නැඟිට,
මා අසන ප්‍රශ්නවලට පිළිතුරු
දීමට සූදානම් වෙන්න.[13]
4 මා පොළොවේ අත්තිවාරම් දැමූ
විට ඔබ සිටියේ කොහේද?[14]

37 පරි.
1 ගීතා 104:3
2 හිතෝ 25:23
3 යෝබ් 26:8
යෝබ් 28:25
යෝබ් 38:30
4 යෝබ් 38:29
ගීතා 147:16
5 යෝබ් 37:3
6 ගීතා 148:8
7 නික් 9:23
1සාමු 12:18
යෝබ් 36:31
8 යෝබ් 38:27
9 1රාජා 18:45
යාකො 5:18
10 ගීතා 111:2
ගීතා 145:5
11 යෝබ් 38:4
12 යෝබ් 36:29
13 යෝබ් 36:4
ගීතා 18:30
ගීතා 104:24
14 ලූක් 12:55

2 තීරුව
1 යෙසා 44:24
2 රෝම 11:34
3 1ලේක 16:27
1ලේක 29:11
ගීතා 8:1
4 ගීතා 145:3
දේශ 3:11
රෝම 11:33
5 1ලේක 29:11
යෝබ් 36:22
යෙසා 40:26
6 ද්වි 32:4
ගීතා 33:5
ගීතා 37:28
7 ගීතා 11:7
ගීතා 71:19
8 ක්‍රියා 10:35
9 ගීතා 33:8
හිතෝ 1:7
මතෙ 10:28
10 හිතෝ 3:7
මතෙ 11:25
රෝම 11:20
රෝම 12:16
1කොරි 1:26

38 පරි.
11 නික් 19:16
1රාජා 19:11
12 යෝබ් 42:3
1තිමෝ 1:7
13 යෝබ් 40:7
14 උත් 1:1
නෙහෙ 9:6
ගීතා 104:5
ගීතා 136:6
හිතෝ 8:29
හෙබ්‍රෙ 1:10

**යෝබ් 37:13*** හෝ, “ළැදි ප්‍රේමය.”

**යෝබ් 38:2*** මූ.අ., “අඳුරු කරන.”

ඔබ දැනුම් තේරුම් ඇති කෙ-
නෙකු නම් මට කියන්න.
5 පොළොවේ දිග පළල නියම කළේ
කවුද?
ඒ හරහා මනින ලණුවක් ගෙන
ගියේ කවුද? ඔබ දන්නවා
නම් කියන්න.
6 එහි අත්තිවාරම් සවිමත්ව රඳා
තිබෙන්නේ කුමක් මතද?[1]
එහි ප්‍රධාන ගල තැබුවේ කවුද?
7 ඒ අවස්ථාවේදී පහන් තාරකා[2]
එක්ව ප්‍රීතියෙන් ගී ගැයූ
ආකාරයත්
දෙවිගේ සියලු පුත්‍රයෝ[3] සතුටු
සිතින් ප්‍රශංසා කළ ආකාර-
යත් ඔබ දුටුවාද?
8 මහ මුහුද පොළෝගැබ කඩාගෙන
පිටතට ආ විට
ඊට අගුලු දමා එහි සීමා නියම
කළේ කවුද?[4]
9 මම එය වලාකුළුවලින් වැසුවෙමි.
බිලිඳෙකුව රෙදිකඩකින්
ඔතන්නාක් මෙන් මම එය
ඝන අන්ධකාරයෙන් වෙළු-
වෙමි.
10 මම එයට නියෝගයක් පනවමින්
දොරගුලු දමා,[5]
11 මෙසේ කීවෙමි. 'ඔබට මේ සීමා-
වෙන් එහාට පැමිණිය නො-
හැක.[6]
ඔබේ චණ්ඩ රළ මෙතැනින්
නතර විය යුතුය.'[7]
12 ඔබ උපන් ආ සිට මේ වන තුරු
අලුත් දිනක් උදා වෙන්න
කියා අණ දී තිබෙනවාද?[8]
අලුයමට කාලයක් නියම කළේ
ඔබද?
13 අලුයම් ආලෝකය පොළොවේ
සතර කොනෙන්
විහිදී දුෂ්ටයන්ව එයින් පන්නා
දමන්නේය.[9]
14 එවිට පොළොවත් මුද්‍රාවක් යට
තිබෙන මැටි වෙනස් වන්-
නාක් මෙන් වෙනස් වන්-
නේය.[10]
ඒ මත තිබෙන සියල්ල අලං-
කාර වස්ත්‍රයක් පැළඳ සිටින්-
නාක් මෙන් දිස් වන්නේය.
15 දුෂ්ටයාට ආලෝකයක් මෙන්
තිබූ අන්ධකාරය පහව යන්-
නේය.[1]
දුෂ්ටයාගේ බලය බිඳී යන්-
නේය.[2]
16 ඔබ මුහුදේ උල්පත් ළඟට ගොස්
තිබෙනවාද?
ඔබ මුහුදු පත්ලේ ඇවිදිමින්[3]
එහි තිබෙන දේවල් ගැන
සොයා බැලුවාද?[4]
17 මිනී වළේ දොරටු[5] ඔබ සොයාගත්-
තෙහිද?
ගන අඳුරෙන් වට වූ ස්ථානයට
විවර වන දොරටු[6] ඔබ දැක
තිබෙනවාද?
18 පොළොව කොතරම් විශාලද කියා
ඔබ වටහාගෙන ඇද්ද?[7]
මේ සියල්ල ගැන ඔබ දන්නෙහි
නම් මට කියන්න.
19 ආලෝකයේ නිවහනට යන මඟ
ඔබ දන්නවාද?[8]
අන්ධකාරය වසන්නේ කොතැ-
නද කියා ඔබට කිව හැකිද?
20 එසේනම් එහි නිවහන වෙතට
ගොස්
එහි සීමාව වෙතට එය රැගෙන
යන්න.
21 ඔබ උපත ලැබුවේ මේ සියල්ල සිදු
වූ කාලයේදීද?[9]
ඔබ අප්‍රමාණ කාලයක් ජීවත් වී
තිබෙනවාද? ඔබ මේ සියල්ල
ගැන දන්නේ ඒ නිසාද?
22 ඔබ හිම කැට ගබඩා කළ ස්ථාන
ඇතුළට ගොස් තිබෙන-
වාද?[10]
එසේත් නැත්නම්, හිම කැට
ගබඩා කළ තැන් ඔබ දුටු-
වාද?[11]
23 මා ඒ සියල්ල ගබඩා කර තිබෙන්-
නේ විපත්ති දවස උදෙසාය.
යුද්ධ සහ කෝලහල ඇති වන
දවස සඳහාය.[12]
24 ආලෝකය පොළොව පුරා විහිදී
යන්නෙත්

**38 පරි.**
1 ගීතා 104:5
2 එළි 22:16
3 උත් 6:2; 1රාජා 22:19; යෝබ් 1:6; යෝබ් 2:1; ගීතා 89:6; ගීතා 104:4
4 ගීතා 33:7; හිතෝ 8:29; ක්‍රියා 4:24
5 උත් 1:9; යෙරෙ 5:22
6 හිතෝ 8:29
7 ගීතා 89:9
8 උත් 1:5; ගීතා 74:16; ගීතා 148:5
9 යෝබ් 24:15; 1තෙස 5:7
10 යෙරෙ 18:6

**2 තීරුව**
1 නික් 10:21; යෝබ් 33:30
2 ගීතා 10:15; යෙරෙ 48:25; එස 30:22
3 ගීතා 77:19
4 උත් 1:2
5 ගීතා 9:13; ගීතා 107:18; මතෙ 16:18; එළි 1:18
6 යෝබ් 10:21
7 ගීතා 74:17; ගීතා 89:11
8 යෙසා 45:7
9 යෝබ් 38:12
10 යෝබ් 6:16; යෝබ් 37:6
11 යොෂු 10:11; යෙසා 30:30
12 නික් 9:24; එස 13:13

නැඟෙනහිරෙන් හමා එන සුළඟ[1] පොළොව පුරා පැතිර යන්නෙත් කොහොමද කියා ඔබ දන්නවාද?
25 වර්ෂාවට අගලක් කපා දුන්නේ කවුද?
අකුණු සහිත වැසිවලට මාර්ගයක් සාදා දී[2]
26 මිනිස් වාසයක් නොමැති දේශ පිටත්
පාළුකරය පිටත් වැසි ඇද හැළෙන්න සලස්වන්නේ කවුද?[3]
27 වැසි වස්සවා කුණාටුවට හසු වූ පාළු දේශ තෘප්තියට පත් කර
පොළොවෙන් තණකොළ හටගන්න සලස්වන්නේ කවුද?[4]
28 වර්ෂාවට පියෙක් සිටිනවාද?[5]
පිනි බිඳු බිහි කළේ කවුද?[6]
29 අයිස් කැට නික්මෙන්නේ කාගේ කුසෙන්ද?
තුෂර බිඳු ජනිත කරන්නේ කවුද?[7]
30 ගලක් යට සඟවා තැබුවාක් මෙන් ජලය සුරක්ෂිතව තිබේ.
මතුපිට ජලය මිදී ගලක් මෙන් ඝන වෙයි.[8]
31 කයිමා තාරකා මණ්ඩලයේ කඹ සවිමත්ව බැඳ තබන්න ඔබට හැකිද?
එසේත් නැත්නම්, කේසිල් තාරකා මණ්ඩලයේ[9] කඹ ලිහා දමන්න ඔබට හැකිද?
32 නියමිත කාලයේදී මස්සරොත් තාරකා මණ්ඩලය පිටතට කැඳවන්න ඔබට පුළුවන්ද?
ඈෂ් තාරකා මණ්ඩලයටත් එහි පුතුන්ටත් මඟ පෙන්වන්න ඔබට පුළුවන්ද?
33 විශ්වය පාලනය කරන නීති ඔබ දන්නවාද?[10]
ඒ නීතිවලින් පොළොව පාලනය කරන්න ඔබට පුළුවන්ද?
34 ඔබව වැසි දියෙන් නහවන්න කියා වලාකුළුවලට අණ කළ හැකිද?[1]
35 ඔබ කැමති තැනකට අකුණු සැර යවන්න පුළුවන්ද?
අකුණු ඔබ වෙත පැමිණ, 'අපි ආවෙමු' කියා ඔබට පවසනු ඇද්ද?
36 වලාකුළුවලට ප්‍රඥාව දුන්නේ කවුද?[2]
විස්මිත ක්‍රියා සිදු වෙන අහස්තලයට නුවණ ලබා දුන්නේ කවුද?[3]
37 කොතරම් වලාකුළු ප්‍රමාණයක් තිබෙනවාද කියා ගණන් කළ හැකි කෙනෙකු සිටිනවාද?
අහස්තලයේ වතුර භාජන පෙරළිය හැක්කේ කාටද?[4]
38 දූවිලි මඩ බවට පත් කර උණු කළ ලෝහ මෙන් ගලා යන්න සලස්වා,
පස් පිඩැලි එකිනෙකට බැඳ තබන්නේ කවුද?
39 සිංහයෙකුට ගොදුරු අල්ලා දීමට ඔබට හැකිද?
සිංහ පැටවුන්ගේ ඇවෙන කුසගින්න නිවාලීමට ඔබට හැකිද?[5]
40 උන් සැඟවී කුරුමානම් අල්ලන විටද[6]
ගල් ගුහාවල මාන බලමින් සිටින විටද උන්ව තෘප්තියට පත් කරන්න ඔබට හැකිද?
41 කපුටන් ආහාර නොමැතිව ඒ මේ අත පියාසර කරන විටද
උන්ගේ පැටවුන් උපකාරය පතා මොරගසන විටද
උන්ට ආහාර දෙන්නේ කවුද?[7]

**39** "පර්වතවල වෙසෙන කඳු එළුදෙනුන්ට පැටව් බිහි වන කාලය ඔබ දන්නවාද?[8]
මුවදෙන වේදනාවෙන් පැටවුන් බිහි කරන ආකාරය ඔබ දැක තිබෙනවාද?[9]

**38 පරි.**
1 ගීතා 78:26 ගීතා 135:7
2 යෝබ් 28:26
3 ගීතා 104:13 ගීතා 107:35
4 2සාමු 23:4 ගීතා 147:8 හෙබ්‍රෙ 6:7
5 1සාමු 12:18 යෙසා 30:23 යෙරෙ 5:24
6 උත් 27:28
7 ගීතා 147:16
8 යෝබ් 37:10
9 ආමො 5:8
10 හිතෝ 3:19 යෙරෙ 31:35 යෙරෙ 33:25

**2 තීරුව**
1 සෙක 10:1
2 යෙරෙ 10:12
3 ගීතා 136:5 හිතෝ 3:20
4 යෙරෙ 10:13
5 ගීතා 104:21 ගීතා 145:15 නාහු 2:12
6 විලා 3:10
7 ගීතා 104:27 ගීතා 147:9 මතෙ 6:26 ලූක් 12:24

**39 පරි.**
8 ගීතා 104:18
9 ගීතා 29:9

2 උන් කොතරම් කාලයක් ගැබ්බ-
රව සිටිනවාද කියා ඔබ දන්-
නවාද?
උන් පැටවුන් බිහි කරන නිශ්-
චිත දවස ඔබට කිව හැකිද?
3 උන් බිම වැතිර පැටවුන් බිහි කර
ප්‍රසව වේදනාවෙන් නිදහස්
වෙති.
4 උන්ගේ පැටව් වනළැහැබේ වැඩී
ශක්තිමත් වෙති.
පසුව උන් තම දෙමාපියන්ව
අත්හැර යති.
5 සීබ්‍රාවුන්ට[1] නිදැල්ලේ දුවන්න ඉඩ
දුන්නේ කවුද?
කැලෑ බූරුවන්ගේ බැඳුම් ලිහා
ඇමුවේ කවුද?
6 මම පාළුකරය උන්ගේ නිවහන
ලෙසත්
ලුණු සහිත ප්‍රදේශය උන්ගේ
වාසස්ථානය ලෙසත් දුනිමි.[2]
7 කැලෑ බූරුවා ඝෝෂාකාරී නගර
ගණනකටවත් ගන්නේ
නැත.
ඌ පසුපස එළවාගෙන එන්-
නාගේ ශබ්දයවත් ඌට
ඇසෙන්නේ නැත.[3]
8 කඳුකරය ඌගේ ගොදුරුබිමය.[4]
ඌ නානාවිධ පලා ජාති සොයා
ඒ මේ අත සැරිසරයි.[5]
9 කුළු හරකා ඔබට යටත් වනු
ඇද්ද?[6]
රාත්‍රියේ ඌ ඔබේ සත්ව ගාලේ
ලගිනු ඇද්ද?
10 කුළු හරකාව ලණුවකින් බැඳ,
කෙතේ වැඩ සඳහා යොදා-
ගැනීමට ඔබට පුළුවන්ද?
ඌ ඔබේ වගාබිම්වල පස් පෙ-
රළා දෙනු ඇද්ද?[7]
11 ඌ සතු මහත් ශක්තිය ප්‍රයෝජන-
යට ගෙන
ඌ ලවා ඔබේ බර වැඩ කරවා-
ගත හැකිද?
12 ඌ ඔබේ අස්වැන්න එකතු කර,
එය කමතට රැගෙන යයි කියා
ඔබට බලාපොරොත්තු විය
හැකිද?
13 පැස්බරා ප්‍රීතියෙන් තටු සලා
පියාඹනවාද?
ඌට මානකොකා[1] මෙන්
පියාඹන්න හැකියාව තිබෙ-
නවාද?
14 පැස්බරධේනුව වැලි මත බිත්තර
දමා
ඒවා උණුසුම් වීමට වැලිවල
තබා යන්නීය.
15 නමුත් ඒවා මිනිසෙකුගේ හෝ
වනසතෙකුගේ හෝ පයට
පෑගිය හැකි බව ඇයට සිහි
නොවෙයි.
16 ඇය කිසි මව් සෙනෙහසක් නො-
මැතිව ඉතා නපුරු ලෙස
පැටවුන්ට සලකන්නීය.[2]
ඇය උන්ගේ ආරක්ෂාව ගැන
සැලකිලිමත් නොවන නිසා
ඇගේ මහන්සිය වතුරේ යයි.
17 ඇය එසේ කටයුතු කරන්නේ
දෙවි ඇයට ප්‍රඥාව නොදුන්
නිසාය.
සිහිනුවණින් ක්‍රියා කිරීමට
ඇයට හැකියාවක් නැත.[3]
18 ඇය අශ්වයා හා අසරුවා දෙස
බලා සිනාසී
පියාපත් විදහා දුවන්නීය.
19 අශ්වයාට ශක්තිය ලබා දුන්නෙත්[4]
ලෙළ දෙන කේශරවලින් උගේ
ගෙල සැරසුවෙත් ඔබද?
20 පළඟැටියෙකු මෙන් ඌට පනින්න
සැලැස්වූයේ ඔබද?
උගේ මුවින් නික්මෙන හඬ බිය
උපදවන්නේය.[5]
21 ඌ නොඉවසිල්ලෙන් තැනිතලා-
වේ දූවිලි අවුස්සමින්[6] තම
ශක්තිය ප්‍රදර්ශනය කළ පසු
සතුරු සේනාව වෙතට වේග-
යෙන් දිව යයි.[7]
22 ඌ භීතිය හමුවේ සිනාසෙයි. කිසි-
විටෙක තැති නොගනියි.[8]
කඩුව දැක පලා නොයයි.
23 ඌ දිව යද්දී අසරුවාගේ ඊකොපු-
වෙන්ද
හෙල්ලයෙන්ද කුඩා හෙල්ල-
යෙන්ද හඬ නික්මෙයි.

**39 පරි.**
1 යෝබ් 24:5, ගීතා 104:11
2 ද්වි 29:23, යෙරෙ 17:6
3 යෝබ් 3:18
4 යෝබ් 40:20
5 උත් 1:30, යෝබ් 40:15
6 ගණන් 23:22, ද්වි 33:17, ගීතා 29:6
7 යෙසා 28:24

**2 තීරුව**
1 ගීතා 104:17, සෙක 5:9
2 විලා 4:3
3 යෝබ් 35:11
4 ගීතා 147:10, යෙසා 31:1
5 යෙරෙ 8:16
6 විනි 5:22, ගීතා 32:9, යෙරෙ 47:3, හබ 1:8
7 හිකෝ 21:31, යෙරෙ 46:9
8 යෙසා 5:28, යෙරෙ 8:6

24 ඌ හොරණෑවේ හඬ ඇසෙන තුරු
මහත් ආශාවෙන් බලා සිටියි.
එය ඇසූ සැණින් ඌ වියරුවෙන්
මෙන් එක පිම්මේ දිව යයි.
25 හොරණෑවේ හඬ ඇසෙද්දී ඌ
මහත් ප්‍රීතියකින් හඬ නඟයි.
යුධ ඝෝෂාවත් සෙන්පතීන්ගේ
අණ දෙන හඬත් දුර තියාම
ඌට ඇසෙයි.[1]
26 පියාපත් විදහාගෙන, දකුණු දිශා-
වෙන් හමා එන සුළං රැල්ලත්
සමඟ ඉහළට
නඟින්නේ කොහොමද කියා
කුරුලුගොයාට කියා දුන්නේ
ඔබද?
27 රාජාලියාට[2] ඉහළට පියඹා යන්න
කියාත්
උස් තැන්වල කැදලි තනන්න
කියාත්[3] අණ දුන්නේ ඔබද?
28 ඌ මහා පර්වතවල ලැගුම් ගනියි.
කිසිවෙකුට ළඟා විය නොහැකි
ඒ පර්වත මුදුනටම ගොස්
වාසය කරයි.
29 ඌ ඒ ස්ථානයේ සිටම ගොදුරු
සොයයි.[4]
දුර ඇත තියාම ඌ ගොදුර
දකියි.
30 මළ කඳන් කොතැනද ඌත් එතැ-
නය.[5]
උගේ පැටව් ඒවායේ ලේ උරා
බොති.”

# 40

යෙහෝවා දෙවි තවදුරටත් යෝබ්ට මෙසේ පැවසුවේය.
2 “සියලු බලැති දෙවි සමඟ වාද
කරමින් ඔහුට චෝදනා
කරන්න මිනිසෙකුට අයිති-
යක් තිබෙනවාද?[6]
ඔබ මට විරුද්ධව චෝදනා කළා
නම් දැන් පිළිතුරු දෙන්න.”[7]
3 එවිට යෝබ් යෙහෝවා දෙවිට
මෙසේ කීය.
4 “මා ඔබ ඉදිරියේ කිසි වැදගැම්ම-
කට නැති කෙනෙකි.[8]
මා ඔබට පිළිතුරු දෙන්නේ කෙ-
සේද?
මම අතින් මාගේ කට වසාගන්-
නෙමි.[1]
5 මම වරක් දෙවරක් කතා කළෙමි.
මම තවත් කිසිවක් නො-
කියමි.
මම දැන් නිහඬ වන්නෙමි.”
6 එවිට යෙහෝවා දෙවි සැඩ සුළඟ
මැදින්[2] යෝබ්ට මෙසේ කීවේය.
7 “දැන් ශක්තිමත් මිනිසෙකු මෙන්
නැඟිට[3]
මා අසන ප්‍රශ්නවලට පිළිතුරු
දීමට සූදානම් වෙන්න.[4]
8 ඔබ නිර්දෝෂයි කියා ඔප්පු කිරී-
මට මා දුෂ්ටයෙකු බව ඔබ
පවසන්නෙහිද?[5]
මා ගන්නා තීරණ සාධාරණ
නැහැයි කියා ඔබ සිතනවාද?
9 මට හා සමාන බලයක් ඔබට
තිබෙනවාද?[6]
මට මෙන් ඔබටත් මහත් ගර්-
ජනා හඬක් නඟන්න පුළු-
වන්ද?[7]
10 එසේනම් ශ්‍රේෂ්ඨත්වය[8] වස්ත්‍රයක්
මෙන් පැළඳගන්න.
ගෞරවයෙන්[9] හා තේජසින්[10]
සැරසී සිටින්න.
11 ඔබ උඩඟු අය දෙස බලා,
ඔබේ ඇවෙන කෝපයෙන්[11]
ඔවුන්ට පහර දී
ඔවුන්ගේ අහංකාරකම නැති
කර දමන්න.
12 උඩඟුකමෙන් ක්‍රියා කරන සියලු-
දෙනාව පහත් කරන්න.[12]
දුෂ්ටයන්ව පාගා දමන්න.
13 ඔවුන් සියල්ලන්ව වළලා
දමන්න.[13]
අඳුරු ස්ථානයේ ඔවුන්ව බැඳ
තබන්න.
14 ඔබ එසේ කර ඔබවම ගලවාගන්-
නෙහි නම්
මම ඔබට ප්‍රශංසා කරන්නෙමි.
15 බෙහෙමොත්* දෙස බලන්න. ඌව
නිර්මාණය කළෙත් ඔබව
නිර්මාණය කළ මමය.

---

යෝබ් **40:15*** හෝ, “හිපපොටේමස්.”

**39 පරි.**
1 යෙරෙ 46:4, ආමො 1:14
2 හිතෝ 23:5, යෙසා 40:31
3 යෙරෙ 49:16, ඔබ 4
4 යෝබ් 9:26, යෙරෙ 49:22
5 මතෙ 24:28

**40 පරි.**
6 යෝබ් 21:15, යෝබ් 33:13, යෙසා 45:9, එළි 4:8
7 යෝබ් 13:3, යෝබ් 23:4, යෝබ් 31:35, රෝම 9:19
8 එස්රා 9:6, යෝබ් 42:6, ගීතා 51:4

**2 තීරුව**
1 විනි 18:19, යෝබ් 29:9, ගීතා 39:9, හිතෝ 30:32
2 යෝබ් 38:1
3 යෝබ් 38:3
4 යෝබ් 42:4
5 ගීතා 51:4, රෝම 3:4
6 නික් 15:6, ගීතා 89:13, 1කොරි 10:22
7 යෝබ් 37:4, ගීතා 29:3
8 ගීතා 83:18, යෙසා 2:10, යෙසා 24:14
9 1ලේක 16:27, ගීතා 8:1
10 ගීතා 104:1
11 ගීතා 78:49, ගීතා 90:11, යෙරෙ 30:23
12 2සාමු 22:28, ගීතා 18:27, හිතෝ 15:25, යෙසා 2:11, දානි 4:37
13 ගීතා 49:14, ගීතා 55:15

ඌ ගොනෙකු මෙන් තණකොළ
ආහාරයට ගනියි.[1]
16 උගේ බලය තිබෙන්නේ උගේ
තුනටියේය.
උගේ උදරයේ මස් ගොබවල
ඇති ශක්තිය[2] අසීමිතය.
17 ඌ තම වලිගය දේවදාර ගසක්
මෙන් සොලවයි.
උගේ කළවා පෙදෙසේ නහර
එකිනෙකට ගොතා තිබේ.
18 උගේ අස්ථි තඹ නළ මෙනි.
උගේ ශක්තිමත් අස්ථි යකඩ
දණ්ඩක් මෙනි.
19 ඌ මාගේ මුල්ම නිර්මාණයන්
අතරින් එකකි.
මට හැර[3] වෙන කිසිවෙකුට
ඌට කඩුවෙන් පහර දිය
නොහැකිය.
20 මුළු කඳුකරයේම පලදාව ඌ වෙ-
නුවෙන් වෙන් කර ඇත.[4]
ඌ ආහාර බුදින විට අනික් වන-
සත්තු ඒ අසල ක්‍රීඩා කරති.
21 ඌ නෙළුම් පැළ යටද
වගුරුබිම්වල[5] බට ගස්[6] අතරේද
විවේක ගනියි.
22 නෙළුම් පත් සෙවණේද විලෝ ගස්
සෙවණේද
ඌ සැඟවී සිටියි.
23 ගඟේ දිය කඳ වේගයෙන් ගලා
ගියත් ඌ කලබල නොවෙයි.
යොර්දාන්[7] ගඟ පිටාර ගැලුවත්
ඌ බිය නොවෙයි.
24 කිසිවෙකුට ඌ ඉදිරියට ගොස්
ඌව ඇල්ලිය හැකිද?
කිසිවෙකුට උගේ නාසයට
කොක්කක් දමා ඇදගෙන යා
හැකිද?

41 "බිලි කොක්කක් දමා ලෙ-
වියාතන්ව*[8] එළියට
අදින්න හෝ
කඹයකින් උගේ දිව බඳින්න
හෝ ඔබට හැකිද?
2 උගේ නාසයට[9] වැල් පොටක්
දමන්නවත්
කටුවකින් උගේ හකු සිදුරු
කරන්නවත් ඔබට පුළුවන්ද?
3 ඌට අනුකම්පා කරන මෙන් ඌ
ඔබෙන් බැගෑපත්ව ඉල්ල-
යිද?
එසේත් නැත්නම්, ඌ ඔබට
මිහිරි වචන පවසයි කියා ඔබ
සිතනවාද?
4 හැමදාටම ඔබේ සේවකයා
වන බවට
ඌ ඔබ සමඟ ගිවිසුමක් ඇති
කරගනියිද?
5 සුරතලයට ඇති කරන කුරුල්-
ලෙකු සමඟ විනෝද වෙන්-
නාක් මෙන් ඔබ ඌ සමඟ
විනෝද වෙයිද?
ඔබ ඌව ගැටගසා සෙල්ලම්
කිරීම සඳහා ඔබේ කුඩා ඇරි-
යන්ගේ අතට දෙයිද?
6 වෙළඳපොළේදී ඌව දී වෙනත්
භාණ්ඩයක් ලබාගත හැකිද?
මිනිසුන් ඌව අල්ලා, කොටස්-
වලට කපා තම තමන් අත-
රේ බෙදාගනියිද?
7 උගේ හිසට හෝ හමට හෝ
හෙල්ලයකින්[1] අනින්න ඔබට
පුළුවන්ද?
8 ඌ මත අත තැබුවොත් ඌ සමඟ
පොර බදින්න සිදු වන බව
ස්ථිරය.
ඔබ යළි කිසි දිනක ඌට අත
නොතබන බවත් ස්ථිරය.
9 ඌව මෙල්ල කිරීමට උත්සාහ
කළොත් ඔබ අසාර්ථක වන
බව නිසැකය.
මන්ද ඌ දෙස බැලූ පමණින්
ඔබ බියෙන් සලිත වනු ඇත.
10 ඌව ඇවිස්සීමට තරම් නිර්භීත-
යෙක් නැත.
එසේනම් මට විරුද්ධව නැඟී
සිටිය හැක්කේ කාටද?[2]
11 අහස්තලය යට ඇති සියල්ල
අයිති මටය.[3]
එසේනම්, මා කාගෙන් හෝ
යමක් ලබාගෙන ඔහුට ණය-

**40 පරි.**
1 උත් 1:30; ගීතා 104:14
2 යෙසා 40:26
3 ගීතා 104:24
4 ගීතා 104:14
5 යෝබ් 8:11
6 ගීතා 68:30; යෙසා 19:6
7 යොෂු 3:15

**41 පරි.**
8 යෝබ් 3:8; ගීතා 104:26
9 යෙසා 37:29

**2 තීරුව**
1 යෝබ් 41:26
2 2ලේක 20:6; දානි 4:35; ක්‍රියා 11:17; රෝම 9:19
3 නික් 19:5; ද්වි 10:14; ගීතා 24:1; ගීතා 50:12; 1කොරි 10:26

යෝබ් **41:1*** හෝ, "කිඹුලා."

ගැනිව සිටිනවා කියා පැව-
සිය හැකිද?[1]
12 උගේ සිරුරේ හැඩය ගැනත්
උගේ සවි ශක්තිය ගැනත් එක්
එක් අංග ලක්ෂණ ගැනත් මා
කතා කළ යුතුය.
13 උගේ පිට වස්ත්‍රය ගැලවිය හැක්-
කේ කාටද?
උගේ කට ළඟට යන්න තරම්
එඩිතර වන්නේ කවුද?
14 උගේ විශාල හකු විවර කළ කෙ-
නෙකු සිටීද?
භයංකර දත් පෙළක් ඌ සතුය.
15 උගේ අහංකාරකමට හේතු වන්-
නේ උගේ විශාල කොර-
පොතුය.
ඒවා මුද්‍රාවකින් වසා තැබුවාක්
මෙන් උගේ ඇඟටම ඇලී
තිබේ.
16 උගේ කොරපොතු අතරින් සුළඟ-
ටවත් ගමන් කළ නො-
හැකිය.
මන්ද ඒවා එකිනෙකට ඉතා
ළංව පිහිටා තිබේ.
17 ඒවා වෙන් කිරීමට නොහැකි
වන සේ
එකිනෙකට යා වී තිබේ.
18 ඌ කිවිසුම් හරින විට එළියක් දිස්
වෙයි.
උගේ ඇස් හිමිදිරි ආලෝකය
මෙන් බැබළෙයි.
19 උගේ මුඛයෙන්
ගිනිදලුද ගිනිපුපුරුද නික්මෙයි.
20 උදුනක පිදුරු ඇවිළෙන්-
නාක් මෙන්
උගේ නාසයෙන් දුම් පිට වෙයි.
21 උගේ හුස්මට ගිනිඅඟුරු ඇවිළෙයි.
කටින් ගිනි නික්මෙයි.
22 උගේ ගෙල ඉතා ශක්තිමත්ය.
ඌ ඉදිරියෙහි සියල්ලෝ අස-
රණ වෙති.
23 උගේ උදරයේ මස් පිඩු ඉතා තදය.
ඒවා කිසි ලෙසකින්වත් නො-
සෙල්වෙයි.
24 උගේ හදවත ගලක් මෙන් ඇඩිය.
එය ඇඹරුම් ගලක් මෙනි.
25 ඌ ඉහළට මතු වන විට නිර්භීත
අය පවා බියට පත් වෙති.[1]
බියෙන් වියවුල් වෙති.
26 කඩුවෙන්වත් හෙල්ලයෙන්වත්
පිහියෙන්වත් ඊතලයෙන්වත්
ඌව මෙල්ල කළ නොහැකිය.[2]
27 ඌ ඉදිරියෙහි යකඩ,[3] පිදුරු මෙනි.
තඹ, දිරා ගිය ලී මෙනි.
28 ඊතලයකින් ඌව පන්නා ඇමිය
නොහැකිය.
ගල්පටියකින්[4] විදින ගල්, ඌට
පිදුරු ගහක් ඇඟේ වදින්-
නාක් මෙන් දැනෙයි.
29 මුගුරක්,[5] ඌට පිදුරු ගසක් මෙනි.
හෙල්ලයේ හඬ ඇසෙන විට ඌ
සිනාසෙයි.
30 උගේ උදරයේ හම තියුණු වළං
කැබලි මෙනි.
ඌ මඩින යන්ත්‍රයක්[6] මෙන් මඩ
හාරාගෙන යයි.
31 ඌ ජලය තුළට කිඳා බසින විට
ජල කඳ කැලතෙයි.
එය වතුර නටන කල්දේරමක්
මෙන්ද රත් වෙන තෙල් බඳු-
නක් මෙන්ද වෙයි.
32 ඌ ඇවිද ගිය මඟ දිලිසෙයි.
එය හරියට පැසුණු කෙස් රො-
දක් මෙන් දිස් වෙයි.
33 භීතිය කුමක්දැයි නොහඳුනන
ඌ හා
සමාන සතෙක් මිහිපිට නැත.
34 ඌ සද්දන්තයන් ඉදිරියේ වුවද
නොසැලෙයි.
ඉතා තේජාන්විත සතුන් අතරේ
වුවද ඌ රජෙකු ලෙස වැජ-
ඹෙයි.”

**42** යෝබ් යෙහෝවා දෙවිට
මෙසේ පිළිතුරු දුන්නේය.
2 “ඔබට කළ නොහැකි දෙයක් නැති
බව මම තේරුම්ගනිමි.[7]
ඔබ අරමුණු කළ ඕනෑම දෙයක්
ඔබට ඉටු කළ හැකි බව මම
දනිමි.[8]
3 ‘කිසි අවබෝධයක් නොමැතිව
මා ගත් තීරණ විවේචනයට

41 පරි.
1 රෝම 11:35
2 තීරුව
1 යෝබ් 41:9
2 යෝබ් 41:7
3 යොෂු 17:16
4 විනි 20:16
2ලේක 26:14
5 හිතෝ 25:18
එස 9:2
6 යෙසා 41:15
42 පරි.
7 උත් 18:14
යෙසා 43:13
යෙරෙ 32:17
මාක් 10:27
ලූක් 18:27
8 ගීතා 135:6
යෙසා 55:11

ලක් කරන මේ තැනැත්තා
කවුද'[1] කියා ඔබ ඇසු-
වෙහිය.
ඇත්තෙන්ම, මා කතා කළේ
කිසි අවබෝධයක් නැතුවය.
මට සිතාගත නොහැකි පුදුමස-
හගත දේවල් ගැන හරි දැනු-
මක් නොමැතිව මම කතා
කළෙමි.[2]
4 'මා දැන් පවසන දේට ඇහුම්කන්
දෙන්න.
මා අසන ප්‍රශ්නවලට දැන් පිළි-
තුරු දෙන්න'[3] කියාත් ඔබ
මට කීවෙහිය.
5 මම කලින් ඔබ ගැන අසා
තිබුණත්
දැන් මාගේ ඇස් දෙකෙන්ම
ඔබව දකින්නෙමි.
6 මම කලින් පැවසූ සියල්ල ගැන
පසුතැවෙමි.
මම දූවිලි හා අළු මත හිඳ මාගේ
වරද ගැන දුක් වෙමි."[4]

7 යෙහෝවා දෙවි යෝබ්ට කතා
කළ පසු තේමාන්හි එලිෆස්ට කතා
කළේය. යෙහෝවා දෙවි ඔහුට මෙසේ
කිවේය.
"ඔබත් ඔබේ මිතුරන් දෙදෙනාත්[5]
මාගේ සේවක යෝබ් මෙන් නො-
වෙයි. ඔබ මා ගැන සත්‍යය නොර-
තුරු පැවසුවේ නැති නිසා[6] මම
ඔබ තිදෙනා සමඟ මහත් උදහ-
සින් සිටිමි. 8 ඔබ කළ පාපය වෙ-
නුවෙන් දවන පූජාවක් ඔප්පු
කිරීම සඳහා ගොනුන් සත්දෙ-
නෙකු සහ බැටළුවන් සත්දෙනෙකු[7]
රැගෙන මාගේ සේවක යෝබ් වෙත
යන්න.[8] ඔහු ඔබ වෙනුවෙන් යාච්ඤා
කරයි.[9] මා ඔබේ අඥාන කතාවලට
සමාව දෙන්නේ, ඔහු ඔබ වෙනුවෙන්
කන්නලව් කළොත් පමණයි. නැත්-
නම් මම ඔබට දඬුවම් කර, ඔබව
නින්දාවට පත් කරන්නෙමි. මන්ද
මාගේ සේවක යෝබ් මෙන් ඔබ
මා ගැන සත්‍යය නොරතුරු කීවේ
නැත."[10]

**42 පරි.**
1 යෝබ් 38:2
2 ගීතා 40:5; ගීතා 131:1; ගීතා 139:6
3 යෝබ් 38:3; යෝබ් 40:7
4 එස්රා 9:6; යෝබ් 40:4; ගීතා 51:17
5 යෝබ් 2:11
6 යෝබ් 11:6; යෝබ් 15:15; යෝබ් 22:2
7 ගණන් 23:1
8 මතෙ 5:24
9 උත් 20:17; යාකො 5:15
10 යෝබ් 42:7; හිතෝ 6:17

**2 තීරුව**
1 මතෙ 6:14
2 යෝබ් 2:6; යාකො 5:11
3 උත් 32:10; 1සාමු 2:7; 2ලේක 25:9; හිතෝ 22:4; යෙසා 61:7
4 යෝබ් 19:13
5 හිතෝ 24:29; රෝම 12:15
6 යෝබ් 1:3; දේශ 7:8
7 හිතෝ 3:33; හිතෝ 10:22; හෙබ්‍රෙ 11:6; යාකො 5:11
8 යෝබ් 1:2
9 යොෂු 15:19
10 හිතෝ 3:16
11 ගීතා 128:6
12 උත් 25:8

9 තේමාන්හි එලිෆස්, ෂූහි බිල්-
දද් සහ නයමාතිය ෂෝපර් යෙ-
හෝවා දෙවි ඔවුන්ට කී ලෙසම
කළෝය. එවිට යෝබ් ඔවුන් වෙනු-
වෙන් කළ කන්නලව්වලට යෙහෝවා
දෙවි ඇහුම්කන් දුන්නේය.
10 යෝබ් තම මිත්‍රයන් තිදෙනා
වෙනුවෙන් යාච්ඤා කළ පසු[1] ඔහු
අද්දකිමින් සිටි සියලු දුක් පීඩාව-
ලින් යෙහෝවා දෙවි ඔහුව නිදහස්
කළේය.[2] යෝබ්ට අහිමි වී තිබූ සියලු
ධන සම්පත්වලට වඩා දෙගුණය-
කින් දෙවි ඔහුට ආශීර්වාද කළේය.[3]
11 ඔහුගේ සහෝදර සහෝදරියෝද
ඔහුව හඳුනන සියලුදෙනාද[4] ඔහුගේ
නිවසට පැමිණ ඔහු සමඟ එකට කෑම
කෑවෝය.[5] යෙහෝවා දෙවි ඔහුට
අත්විඳීමට ඉඩහැරිය පීඩා ගැන ඔවුහු
ඔහු සමඟ දුක් වී ඔහුව සැනසුවෝය.
පසුව ඔවුහු සියලුදෙනා රිදී කුට්ටියක්
හා රන් මුද්දක් බැගින් ඔහුට තෑගි
කළෝය.
12 යෙහෝවා දෙවි යෝබ්ට
මුලින්[6] ආශීර්වාද කළාටත් වඩා
බොහෝ සෙයින් ආශීර්වාද කළේය.[7]
ඔහුට බැටළුවෝ දහහතර දහ-
සක්ද ඔටුවෝ හයදහසක්ද ගොන්
බාන් දහසක්ද බූරුදෙන්නු දහසක්ද
සිටියෝය. 13 ඔහුට දාව පුත්‍රයෝ
හත්දෙනෙක්ද දූවරු තිදෙනෙක්ද
උපන්නෝය.[8] 14 ඔහු තම පළමු
දියණියට යෙමීමා කියාද දෙවන දිය-
ණියට කෙෂීයා කියාද තුන්වන දිය-
ණියට කෙරෙන්-හප්පූක් කියාද නම්
තැබුවේය. 15 එම දේශයේ යෝබ්-
ගේ දියණියන් තරම් රූමත් කාන්තා-
වෝ තවත් සිටියේ නැත. යෝබ් තම
පුත්‍රයන්ට මෙන් ඔවුන්ටත් උරුමයක්
ලබා දුන්නේය.[9]
16 ඉන්පසු යෝබ් අවුරුදු එකසිය
හතළිහක් ජීවත් වී[10] හතරවන පරම්-
පරාව දක්වා තම දූපුතුන්ගේ දරු-
දැරියන්වද දුටුවේය.[11] 17 යෝබ්
තෘප්තිමත් ජීවිතයක් ගත කර මහලු
වියේදී මිය ගියේය.[12]

# ගීතාවලිය

## පළමුවෙනි කාණ්ඩය
(ගීතාවලිය 1 – 41)

**1** දුෂ්ටයන්ගේ අවවාද නොපිළිගත්-
නාවූ,[1]
පව්කාරයන් යන මඟෙහි නො-
ගියාවූ,[2]
සමච්චල් කරන්නන් සමඟ
ඇසුරු නොකළාවූ[3] මනු-
ෂ්‍යයා සන්තෝෂවත්ය.[4]
**2** යෙහෝවා දෙවිගේ නීතිය කියවී-
මෙන් ඔහු මහත් ප්‍රීතියක්
ලබන්නේය.[5]
ඔහු දිවා රෑ දෙවිගේ නීතිය
කියවා ඒ ගැන ගැඹුරින් කල්-
පනා කරන්නේය.[6]
**3** ඔහු දිය දහරා අසල සිටෙව්වාවූ,[7]
නියම වාරයට පල හටගන්-
නාවූ,[8]
කොළ මැලවී නොයන්නාවූ ගසක්
මෙන් වන්නේය.[9]
ඔහු කරන සෑම දෙයක්ම සාර්-
ථක වන්නේය.[10]
**4** නමුත් දුෂ්ටයෝ ඔහු හා සමාන
නොවෙති.
ඔවුන් සුළඟින් ගසාගෙන යන
දහයියා මෙනි.[11]
**5** විනිශ්චයේදී දුෂ්ටයන්ට අනුමැ-
තිය ලැබෙන්නේ නැත.[12]
පව්කාරයන්ට ධර්මිෂ්ඨයන්
අතරේ ස්ථානයක්ද නැත.[13]
**6** යෙහෝවා දෙවි ධර්මිෂ්ඨයන් යන
මාර්ගය හොඳින් දන්නේය.[14]
නමුත් දුෂ්ටයාගේ මාර්ගය
විනාශ වන්නේය.[15]

**2** සියලු ජාතීන් කැලඹී සිටින්නේ
මන්ද?[16]
පලක් නැති දේවල් ජනයා යෝ-
ජනා කරන්නේ මන්ද?[17]
**2** යෙහෝවා දෙවිටත්[18] ඔහුගේ අභි-
ෂේක ලත් තැනැත්තාටත්
විරුද්ධව[19]
පොළොවේ රජවරු නැඟී
සිටිති.[20]
පාලකයෝද එකට රැස්ව
සිටිති.[1]
**3** "ඔවුන් දමා ඇති මේ පටි අපි කඩා
දමමු.[2]
අපිට දමා ඇති මේ දම්වැල්
ගලවා වීසි කරමු"[3] කියා
ඔවුහු කියති.
**4** ස්වර්ගයේ[4] තම සිංහාසනයේ
සිටින තැනැත්තාණෝ එය
අසා සිනාසෙන්නේය.
යෙහෝවා දෙවි ඉදිරියේ ඔවුහු
විහිළුවකට ලක් වන්නෝය.[5]
**5** එකල ඔහු කෝපයෙන් ඔවුන්ට
කතා කරන්නේය.[6]
ඔහුගේ දැඩි උදහසට ඔවුහු
කලබල වන්නෝය.[7]
**6** "මාගේ ශුද්ධ කන්ද[8] වන සියොන්-
හිදී[9]
මා තෝරාගත් තැනැත්තාව
මම රජකමට පත් කළෙමි"[10]
කියා දෙවි කියන්නේය.
**7** යෙහෝවා දෙවි කළ ගිවිසුම මම
සඳහන් කරන්නෙමි.
ඔහු මට මෙසේ කීවේය. "ඔබ
මාගේ පුත්‍රයාය.[11]
අද සිට මම ඔබේ පියා වන්-
නෙමි.[12]
**8** මාගෙන් ඉල්ලන්න.[13] එවිට මම
සියලු ජාතීන්ව ඔබට උරුම-
යක් ලෙස දෙන්නෙමි.[14]
පොළොවේ කෙළවර දක්වා
තිබෙන සෑම දෙයක්ම ඔබට
ලබා දෙන්නෙමි.[15]

**1 ගීතාවලිය**
**1** 2ලේක 22:3
යෝබ් 21:16
ගීතා 64:2
මතෙ 26:4
ක්‍රියා 9:23
**2** හිතෝ 4:14
**3** ගීතා 26:4
ගීතා 69:12
හිතෝ 22:10
2පේතෘ 3:3
**4** ගීතා 112:1
මතෙ 5:3
**5** ගීතා 19:7
ගීතා 40:8
රෝම 7:22
යාකො 1:25
**6** යොෂු 1:8
ගීතා 35:28
ගීතා 119:97
1තිමෝ 4:15
**7** යෙසා 44:4
යෙසා 61:3
යෙරෙ 17:8
**8** මතෙ 21:43
පිලි 4:17
එළි 22:2
**9** යෙසා 27:11
**10** උත් 39:3
1ලේක 22:13
**11** යෝබ් 21:18
ගීතා 35:5
යෙසා 17:13
මතෙ 3:12
**12** ගීතා 5:5
යූද් 15
**13** මලා 3:18
මතෙ 13:49
මතෙ 25:41
**14** යෝබ් 23:10
ගීතා 37:18
යෙරෙ 12:3
2තිමෝ 2:19
1පේතෘ 3:12
**15** හිතෝ 14:12

**2 ගීතාවලිය**
**16** ගීතා 46:6
මතෙ 24:7
ක්‍රියා 4:25
**17** ගීතා 33:10
යෙසා 40:15
යෙසා 60:2
**18** ගීතා 83:5
යොහ 5:23
යොහ 15:24
**19** ගීතා 45:7
ගීතා 89:20
යෙසා 61:1
ක්‍රියා 4:27

---

**20** ගීතා 48:4; ලූක් 13:31; ලූක් 23:11; එළි 19:19; **2 තීරුව** **1** මතෙ 27:1; මාක් 3:6; **2** ලූක් 19:14; **3** යෙරෙ 5:5; **4** ගීතා 11:4; ගීතා 68:33; **5** ගීතා 37:13; ගීතා 59:8; **6** ගීතා 90:11; යෙරෙ 25:31; නාහු 1:6; **7** හෙබ්‍රෙ 3:16; **8** යෙසා 27:13; **9** 2සාමු 5:7; හෙබ්‍රෙ 12:22; එළි 14:1; **10** ගීතා 45:6; එස 17:22; එස 21:27; දානි 7:14; යොහ 1:49; එළි 19:16; **11** 2සාමු 7:14; මතෙ 3:17; රෝම 1:4; හෙබ්‍රෙ 1:5; හෙබ්‍රෙ 5:5; **12** ගීතා 89:27; මාක් 1:11; යොහ 1:14; ක්‍රියා 13:33; **13** මතෙ 28:18; **14** ගීතා 22:27; ගීතා 110:2; මතෙ 25:32; **15** ගීතා 72:8; හෙබ්‍රෙ 1:2; එළි 11:15.

9 ඔබ ඔවුන්ව යකඩ යෂ්ටියකින් විනාශ කරන්නෙහිය.[1]
මැටි බඳුනක් කැබලි කරන්නාක් මෙන් ඔවුන්ව කැබලි කරන්නෙහිය."[2]
10 එබැවින් රජවරුනි, අවබෝධයෙන් යුතුව කටයුතු කරන්න.
පොළොවේ විනිශ්චයකරුවෙනි, මෙයින් පාඩමක් ඉගෙනගන්න.[3]
11 ගරුබිය ඇතුව යෙහෝවා දෙවිට සේවය කරන්න.[4]
ඔහුට ගැඹුරු ගෞරවය දක්වීමෙන් ප්‍රීතිය ලබන්න.[5]
12 දෙවිව කෝප නොකරන පිණිසද
ඔබ විනාශ නොවන පිණිසද[6]
ඔහුගේ පුත්‍රයාව පිළිගන්න.*[7]
මන්ද ඔහුගේ උදහස වහා ඇවිළෙන්නේය.[8]
ඔහුගේ රැකවරණය සොයා එය ලබාගන්නෝ සන්තෝෂවත්ය.[9]

දාවිත් තම පුත් අබ්සලොම් වෙතින් පලා යන විට රචනා කළ ගීතයකි.[10]

**3** යෙහෝවා දෙවියනි, බොහෝදෙනෙක් මට විරුද්ධව ක්‍රියා කරන්නේ මන්ද?[11]
මෙපමණදෙනෙක් මට විරුද්ධව නැඟී සිටින්නේ මන්ද?[12]
2 "දෙවි ඔහුව ගලවාගන්නේ නැහැ"[13]
කියා බොහෝදෙනෙක් මා ගැන පවසති. සේලාහ්.*
3 එහෙත් යෙහෝවා දෙවියනි, ඔබ මට පලිහක් මෙනි.[14]
මාගේ ගෞරවය ඔබය.[15] මා උසස් කරන තැනැත්තාණන් ඔබය.[16]
4 මම හඬ නඟා යෙහෝවා දෙවිට කතා කරන්නෙමි.
ඔහු තම ශුද්ධ කන්දේ සිට මට පිළිතුරු දෙන්නේය.[17] සේලාහ්.

**ගීතා 2:12*** මූ.අ., "පුත්‍රයාව සිපගන්න." **3:2*** 'සේලාහ්' යනු සංගීත වාදනයේදී හෝ ගීතිකා ගැයීමේදී යොදාගත් හෙබ්‍රෙව් යෙදුමකි. එහි නියම අර්ථය පැහැදිලිව කිව නොහැක.

**2 ගීතාවලිය**
**1** එළි 2:27, එළි 12:5, එළි 19:15
**2** දානි 2:44
**3** ගීතා 72:1, ගීතා 82:2
**4** ගීතා 19:9, හිතෝ 28:14, පිලි 2:12, හෙබ්‍රෙ 12:28
**5** ගීතා 95:1, ගීතා 99:1, ගීතා 119:120
**6** ගීතා 1:6, යොහ 3:36, යොහ 14:6
**7** උත් 49:10, ලූක් 7:45, පිලි 2:10
**8** 2තෙස 1:9, එළි 6:16
**9** යෙසා 11:10, යෙසා 32:2, රෝම 9:33

**3 ගීතාවලිය**
**10** 2සාමු 15:14
**11** 2සාමු 15:12, 2සාමු 16:15
**12** 2සාමු 12:11
**13** 2සාමු 16:8, ගීතා 22:7, මතෙ 27:43
**14** උත් 15:1, ද්වි 33:29
**15** යෙසා 45:25, යොහ 1:14
**16** උත් 40:13, ගීතා 27:6
**17** 2සාමු 15:25, 1රාජා 8:30, 1රාජා 8:45, ගීතා 2:6, යෙසා 2:3

**2 තීරුව**
**1** ගීතා 4:8, ගීතා 127:2, හිතෝ 3:24
**2** 2රාජා 6:15, ගීතා 27:3, ගීතා 121:7, රෝම 8:31
**3** ගීතා 10:12, යෙසා 51:9
**4** ගීතා 35:23, යොහ 20:17
**5** ගීතා 109:26, මතෙ 27:43, 1තිමෝ 4:10
**6** යෝබ් 16:10, යෝබ් 29:17
**7** ගීතා 58:6, 2තෙස 1:6
**8** ගීතා 37:39, හිතෝ 21:31, යෙසා 43:11, හොෂෙ 13:4, යෝනා 2:9, එළි 19:1

5 මම සුවෙන් නිදාගන්නෙමි.
නිසැකවම මම නැවත අවදි වන්නෙමි. මන්ද යෙහෝවා දෙවි මාව රැකබලා ගන්නේය.[1]
6 මාගේ විරුද්ධකාරයන් දසදහසක් මා වටලුවත්
මම බිය නොවන්නෙමි.[2]
7 යෙහෝවා දෙවියනි, මා වෙනුවෙන් නැඟී සිටින්න![3] මාගේ දෙවියනි,[4] මාව බේරාගන්න![5]
මාගේ සියලු සතුරන්ගේ කම්මුලට පහර දෙන්න.[6]
දුෂ්ටයන්ගේ දත් බිඳ දමන්න.[7]
8 ගැලවීම ලැබෙන්නේ යෙහෝවා දෙවිගෙන්ය.[8]
ඔබේ සෙනඟට ඔබ ආශීර්වාද කරන්නෙහිය.[9] සේලාහ්.

සංගීත අධ්‍යක්ෂක වෙතය. තත් භාණ්ඩ[10] වාදනය කරමින් ගායනා කිරීම සඳහාය. දාවිත් රචනා කළ ගීතයකි.

**4** මාගේ ධර්මිෂ්ඨ දෙවියනි,[11] මා ඔබට හඬගසන විට මට පිළිතුරු දෙන්න.
විපතින් ගැලවෙන මාර්ගය මට පෙන්වා දෙන්න.
මට කරුණාව පෙන්වා[12] මාගේ යාච්ඤාවට සවන් දෙන්න.
2 මනුෂ්‍යයෙනි, ඔබ කොපමණ කාලයක් මට අගෞරව කරන්නහුද?[13]
කොපමණ කාලයක් නිෂ්ඵල දේවලට ප්‍රිය වන්නහුද?
ඔබ කොපමණ කාලයක් බොරුව පසුපස හඹා යන්නහුද? සේලාහ්.
3 මෙය දැනගන්න. යෙහෝවා දෙවි තමාට පක්ෂපාත තැනැත්තාට විශේෂ සැලකිල්ලක් දක්වන්නේය.[14]
මා යෙහෝවා දෙවිට හඬගසන විට ඔහු සවන් දෙන්නේය.[15]

**9** ගීතා 29:11; එෆි 1:3; හෙබ්‍රෙ 6:14; **4 ගීතාවලිය** **10** 1ලේක 25:1; **11** ගීතා 11:7; යෙසා 45:24; යෙරෙ 23:6; **12** ගීතා 9:13; **13** ගීතා 3:3; **14** 1සාමු 2:9; හිතෝ 2:8; **15** ගීතා 34:15; ගීතා 55:16.

4 ඔබේ සිත කැලඹුණත් පව් නොක-
රන්න.[1]
කීමට ඇති දේ ඔබේ සිතේම
තබාගන්න. ඔබ තනිව
යහන මත සිටින විට ඒවා
ඔබටම කියාගන්න.[2] සීලාහ්.
5 ධර්මිෂ්ඨකමින් පූජා ඔප්පු
කරන්න.[3]
යෙහෝවා දෙවි ගැන විශ්වාස-
යෙන් සිටින්න.[4]
6 "අපට යහපතක් කරන්නේ
කවුද" කියා බොහෝදෙ-
නෙක් අසති.
යෙහෝවා දෙවියනි, ඔබේ අනු-
මැතිය අපට ලබා දෙන්න.[5]
7 පලදාව වැඩි වන විටත් අලුත්
වයින් පිරී ඉතිරී යන විටත්
ඔවුහු ප්‍රීතියෙන් ඉපිල යති.[6]
ඊටත් වඩා ප්‍රීතියක් ඔබ මාගේ
සිතට ලබා දෙන්නෙහිය.[7]
8 මම සුවෙන් නිදාගන්නෙමි.[8]
යෙහෝවා දෙවියනි, ඔබ මට
කිසිදු බියක් නොමැතිව
සැනසීමෙන් ජීවත් වීමට
සලස්වන්නෙහිය.[9]

සංගීත අධ්‍යක්ෂක වෙතය. නිහියලොත්*
ඇතුව ගායනා කිරීම සඳහාය.
දාවිත් රචනා කළ ගීතයකි.

5 යෙහෝවා දෙවියනි, මට සවන්
දෙන්න.[10]
මා සුසුම්ලමින් හඬන විට මාව
තේරුම්ගන්න.
2 මාගේ රජ්ජුරුවනි,[11] මාගේ දෙවි-
යනි, මා යාච්ඤා කරන්නේ
ඔබටය.[12]
උපකාරය පතා මා කරන මො-
රගැසීමට සවන් දෙන්න.[13]
3 යෙහෝවා දෙවියනි, උදෑසනින්ම
ඔබට මාගේ හඬ ඇසෙනු
ඇත.[14]
එසේ ඔබ අමතන මම, ඔබ-
ගෙන් පිළිතුරක් ලැබෙන
තෙක් බලා සිටින්නෙමි.[1]
4 ඔබ දුෂ්ටකමට ප්‍රිය කරන දෙවි
කෙනෙක් නොවෙයි.[2]
දුෂ්ටයෙකුට එක මොහොතක්-
වත් ඔබ සමඟ සිටීමට අව-
සර නොලැබෙයි.[3]
5 පුරසාරම් දොඩන කිසිවෙකුට
ඔබේ අනුමැතිය නොලැ-
බෙන්නේය.[4]
නපුරු දේ කරන්නන්ට ඔබ
ද්වේෂ කරන්නෙහිය.[5]
6 බොරු කියන්නන්ව ඔබ විනාශ
කරන්නෙහිය.[6]
ලේ වගුරුවන,[7] රැවටිලිකාර
අය[8] යෙහෝවා දෙවි වන
ඔබට පිළිකුලකි.
7 ඔබේ මහත් ප්‍රේමය*[9] නිසා
මම ඔබේ ගෘහයට එන්නෙමි.[10]
ඔබ කෙරෙහි ගරුබියෙන් යුතුව
ඔබේ ශුද්ධ මාලිගාව දෙසට
හැරී වැඳ වැටෙන්නෙමි.[11]
8 යෙහෝවා දෙවියනි, ඔබේ ධර්-
මිෂ්ඨ මාර්ගයේ මාව ගෙන
යමින්[12] සතුරන්ගෙන් මාව
ආරක්ෂා කරන්න.[13]
ඔබේ මාර්ගයේ දිගටම ගමන්
කිරීමට මට උපකාර
කරන්න.[14]
9 මන්ද ඔවුන් කියන කිසිවක් විශ්-
වාස කළ නොහැක.[15]
ඔවුහු වාටු බස් දොඩති.[16]
ඔවුන්ගේ සිත්* නපුරුකමින් පිරී
තිබේ.[17]
ඔවුන්ගේ උගුර විවර වී තිබෙන
සොහොනකි.[18]

**4 ගීතාවලිය**
1 එෆී 4:26
2 ගීතා 63:6
3 ද්වි 33:19
ගීතා 51:19
4 ගීතා 37:3
ගීතා 62:8
හිතෝ 3:5
1පේතෘ 4:19
5 ගණන් 6:26
ගීතා 80:7
ගීතා 89:15
ගීතා 119:135
හිතෝ 16:15
1පේතෘ 3:12
6 යෙරෙ 48:33
7 නෙහෙ 12:43
යෙසා 9:3
8 ගීතා 3:5
හිතෝ 3:24
9 ලෙවී 25:18
ද්වි 12:10
එස 34:25

**5 ගීතාවලිය**
10 ගීතා 55:1
ගීතා 65:2
1පේතෘ 3:12
11 ගීතා 44:4
ගීතා 74:12
ගීතා 145:1
යෙසා 33:22
12 ගීතා 65:2
මතෙ 6:9
13 ගීතා 3:4
14 ගීතා 55:17
ගීතා 88:13

**2 තීරුව**
1 මාක් 1:35
2 ගීතා 89:14
හිතෝ 6:16
හබ 1:13
යාකො 1:13
3 ගීතා 15:1
ගීතා 140:13
හිතෝ 12:19
එළි 21:3
4 ගීතා 1:5
1කොරි 1:29
5 හිතෝ 16:6
හොෂෙ 9:15
මලා 2:16
රෝම 12:9
හෙබ්‍රෙ 1:9
6 හිතෝ 6:19
හිතෝ 20:19
යොහ 8:44
කොලො 3:9
1තිමෝ 3:11
එළි 21:8
එළි 22:15
7 උත් 4:10
උත් 9:6
ගීතා 55:23
යෙසා 26:21

**8** ගීතා 119:163; හිතෝ 6:17; හිතෝ 12:19; හොෂෙ 4:2; 1පේතෘ 3:10; **9** ගීතා 51:1; ගීතා 69:13; යෝනා 4:2; **10** 1සාමු 3:3; 1ලේක 16:1; ගීතා 84:10; **11** 1රාජා 8:29; ගීතා 28:2; ගීතා 138:2; **12** ගීතා 23:3; ගීතා 25:5; **13** 1සාමු 18:14; ගීතා 27:11; ගීතා 59:10; **14** ගීතා 25:4; **15** ගීතා 12:2; ගීතා 52:2; **16** හිතෝ 29:5; 1තෙස 2:5; යාකො 3:5; **17** ගීතා 58:2; මීකා 6:12; **18** ගීතා 140:3; රෝම 3:13.

**ගීතා 5:පෙර*** මෙම හෙබ්‍රෙව් වචනයෙහි අර්ථය නිශ්චිතව පැවසිය නොහැක. එය නලා වර්ගයක් හෝ එක්තරා තාලයක් විස්තර කිරීමට භාවිත කරන වචනයක් විය හැක.

**ගීතා 5:7*** හෝ, "ළැදි ප්‍රේමය." **9*** හෝ, "ඇතුළාන්තය."

10 ඔවුන් වරදකරුවන් බව ඔබ දන්නෙහිය.[1]
ඔවුන්ගේ කූට උපායන්වලට ඔවුහුම හසු වන්නෝය.[2]
ඔවුන් ඔබට විරුද්ධව කැරලිගසා තිබේ.[3]
බොහෝ වැරදි කළ ඔවුන්ව පන්නා දමන්න.[4]
11 ඔබේ රැකවරණය සොයා එය ලබාගන්නෝ සන්තෝෂවත්ය.[5]
සදහටම ඔවුහු සතුටින් ප්‍රීති ඝෝෂා නඟති.[6]
ඔවුන්ට අනතුරක් කිරීමට ඔබ කිසිවෙකුට ඉඩ නොදෙන්නෙහිය.
ඔබේ නාමයට ප්‍රේම කරන්නෝ සතුටින් ඉපිල යන්නෝය.[7]
12 යෙහෝවා දෙවියනි, ඔබ ධර්මිෂ්ඨයන්ට ආශීර්වාද කරන්නෙහිය.[8]
ඔබේ අනුමැතිය ඔවුන්ට ලබා දෙන්නෙහිය. විශාල පලිහක් මෙන්[9] ඔබ ඔවුන්ව ආරක්ෂා කරන්නෙහිය.[10]

සංගීත අධ්‍යක්ෂක වෙතය. තත් භාණ්ඩ වාදනය කරමින් පහළ ස්වරයෙන් ගායනා කිරීම සඳහාය.[11] දාවිත් රචනා කළ ගීතයකි.

**6** යෙහෝවා දෙවියනි, කෝපයෙන් මට තරවටු නොකරන්න.[12]
කේන්තියෙන් මට දඬුවම් නොකරන්න.[13]
2 යෙහෝවා දෙවියනි, මම විඩාබරව සිටින්නෙමි. එබැවින් මට කරුණාව පෙන්වන්න.[14]
යෙහෝවා දෙවියනි, බියෙන් සිටින මාගේ ඇටකටු පවා වෙවුලන්නේය. එබැවින් මට සුවයක් ලබා දෙන්න.[15]
3 මම බොහෝ සෙයින් කැළඹී සිටින්නෙමි.[16]
යෙහෝවා දෙවියනි, මා තව කොපමණ කාලයක් මෙසේ දුක් විඳින්නද?[17]
4 යෙහෝවා දෙවියනි, නැවත මා ළඟට පැමිණ[18] මාගේ ජීවිතය ගලවාගන්න.[19]
ඔබ මහත් ප්‍රේමයකින්* පිරි දෙවි කෙනෙක් නිසා මාව බේරාගන්න.[1]
5 මිය ගිය අයට ඔබ ගැන කතා කළ හැකිද?[2]
මිනී වළේ සිටින කිසිවෙකුට ඔබට ප්‍රශංසා කළ හැකිද?[3]
6 හඬා වැලපී මම හෙම්බත්ව සිටිමි.[4]
මාගේ කඳුළුවලින් යහන තෙත් වී ඇත.[5]
රාත්‍රිය පුරා මා හෙළන කඳුළෙන් මාගේ යහන පෙඟී ඇත.[6]
7 ශෝකය නිසා මාගේ ඇස් මලානික වී ඇත.[7]
හිරිහැර කරන්නන් නිසා මාගේ ඇස් අඳුරු වී ඇත.[8]
8 දුෂ්ටකම් කරන සියල්ලෙනි, මාගෙන් ඉවත් වන්න.[9]
යෙහෝවා දෙවි මාගේ හැඬීමට නිසැකවම සවන් දෙනු ඇත.[10]
9 කරුණාව පෙන්වන්න කියා මා කරන ඉල්ලීමට යෙහෝවා දෙවි නිසැකවම සවන් දෙනු ඇත.[11]
යෙහෝවා දෙවි මා කරන යාච්ඤාව පිළිගනු ඇත.[12]
10 මාගේ සියලු සතුරෝ ක්ෂණයකින් ලැජ්ජාවට පත් වනු ඇත.[13] ඔවුහු බොහෝ සෙයින් කැලඹෙනු ඇත.
ලැජ්ජාවට පත් වූ ඔවුන්ට ආපසු හැරී යෑමට සිදු වනු ඇත.[14]

බෙන්ජමින් ගෝත්‍රයට අයත් කූෂ් කී දේ නිසා දාවිත් යෙහෝවා දෙවිට ගැයූ විලාප ගීතයකි.

**7** යෙහෝවා, මාගේ දෙවියනි,[15] මම ආරක්ෂාව පතන්නේ ඔබගෙනුයි.[16]
මට පීඩා කරන සියල්ලන්ගෙන්

**5 ගීතාවලිය**
**1** රෝම 3:19
**2** 2සාමු 17:23; ගීතා 7:15
**3** 1සාමු 12:15; 1සාමු 15:23; යෙසා 1:20; යෙසා 63:10; එස 20:21
**4** 2සාමු 15:31; 2තෙස 1:6
**5** ගීතා 40:16
**6** ගීතා 35:27
**7** ගීතා 34:3; ගීතා 69:36
**8** ගීතා 115:13; හිතෝ 10:6
**9** උත් 15:1; ගීතා 3:3; ගීතා 84:11
**10** ගීතා 32:10

**6 ගීතාවලිය**
**11** 1ලේක 15:21; ගීතා 12:පෙර
**12** ගීතා 38:1
**13** යෙරෙ 10:24; යෙරෙ 46:28
**14** ගීතා 38:7; ගීතා 41:4; 1පේත 1:24
**15** ගීතා 103:3; යෙරෙ 17:14; හොෂෙ 6:1
**16** ගීතා 31:9; මතෙ 26:38
**17** ගීතා 13:1
**18** ගීතා 90:13
**19** ගීතා 17:13; ගීතා 50:15

**2 තීරුව**
**1** ගීතා 119:88; විලා 3:22
**2** උත් 3:19; ගීතා 30:9; ගීතා 88:10; ගීතා 115:17; දේශ 9:5
**3** දේශ 9:10; යෙසා 38:18; යොහ 11:13
**4** ගීතා 69:3
**5** 2සාමු 13:36; විලා 1:16; ක්‍රියා 21:13; 2කොරි 2:7
**6** ගීතා 39:12
**7** යෝබ් 17:7; ගීතා 31:9
**8** ගීතා 88:9
**9** ගීතා 119:115; මතෙ 7:23
**10** ගීතා 3:4; ගීතා 145:18; යෙසා 30:19; හෙබ්‍රෙ 5:7
**11** ගීතා 31:22; ගීතා 40:1; යෝනා 2:2
**12** ගීතා 116:1

**13** ගීතා 40:14; ගීතා 109:29; යෙරෙ 20:11; **14** හිතෝ 29:1; **7 ගීතාවලිය** **15** ගීතා 3:7; ගීතා 35:23; **16** ගීතා 18:2; හිතෝ 18:10.

**ගීතා 6:4*** හෝ, “ළැදි ප්‍රේමයකින්.”

මාව ආරක්ෂා කර මාව ගලවාගන්න.[1]
2 මාව ගලවාගැනීමට කිසිවෙකු නොසිටියොත් ඔවුහු මාව පැහැරගෙන ගොස්,[2]
සිංහයෙකු මෙන් කැබලිවලට ඉරා දමනු ඇත.[3]
3 යෙහෝවා, මාගේ දෙවියනි, මා වරදක් කර තිබෙනවා නම්,[4]
මා අතින් අයුක්තියක් සිදු වී තිබෙනවා නම්,[5]
4 මට හොඳක් කළ තැනැත්තාට මා නපුරක් කළේ නම්,[6]
මට නපුරක් කිරීමට උත්සාහ කළ කෙනෙකුගේ දේපළ මා විනාශ කළේ නම්,[7]
5 මාගේ සතුරාට මාව ලුහුබැඳීමට ඉඩහරින්න.[8]
මාව අල්ලා පාගා දැමීමට ඔහුට ඉඩහරින්න.
මාගේ ගෞරවය පයට පෑගෙන දූවිල්ලක් මෙන් වීමට ඉඩහරින්න. සීලාහ්.
6 යෙහෝවා දෙවියනි, මා වෙනුවෙන් නැඟී සිටින්න.[9]
කෝපයෙන් මට හිරිහැර කරන්නන්ට විරුද්ධව ඔබේ උදහස ප්‍රකාශ කරන්න.[10]
යුක්තිය ඉටු කිරීමට නියෝග කළ ඔබ,[11] මා වෙනුවෙන් ක්‍රියා කරන්න.[12]
7 සියලු ජාතීන්ට ඔබ වටා එක් රොක් වීමට ඉඩහරින්න.
ඔබේ සිංහාසනයේ සිට ඔවුන්ට විරුද්ධව ක්‍රියා කරන්න.
8 යෙහෝවා දෙවි ජනයාට හිමි තීන්දුව දෙන්නේය.[13]
යෙහෝවා දෙවියනි, මාව විනිශ්චය කරන විට මා ධර්මිෂ්ඨව[14] හා
ඔබට විශ්වාසවන්තව ජීවත් වූ බව[15] සිහි කරන්න.
9 දුෂ්ටයන්ගේ නපුරු ක්‍රියා අවසන් කරන්න.[16]
නමුත් ධර්මිෂ්ඨයාව තව තවත් ශක්තිමත් කරන්න.[17]

**7 ගීතාවලිය**
**1** ගීතා 31:15 යෙරෙ 15:15 රෝම 8:37 2කොරි 4:9 2පේතෘ 2:9
**2** විනි 18:28 ගීතා 50:22
**3** ගීතා 10:9 ගීතා 17:12 1පේතෘ 5:8
**4** යොෂු 22:22 2සාමු 16:8
**5** 1සාමු 24:11
**6** 1සාමු 24:17 හිතෝ 17:13
**7** 1සාමු 19:4 1සාමු 24:7 1සාමු 26:9
**8** ක්‍රියා 25:11
**9** ගීතා 3:7 ගීතා 68:1 ගීතා 90:11
**10** ගීතා 35:1 ගීතා 94:2 යෙසා 33:10
**11** ගීතා 76:9 ගීතා 103:6
**12** ගීතා 44:23 ගීතා 73:20 යෙසා 51:9
**13** උත් 18:25 ගීතා 9:8
**14** ගීතා 18:20 ගීතා 35:24
**15** යෝබ් 27:5 ගීතා 26:11 ගීතා 41:12 ගීතා 78:72 හිතෝ 19:1
**16** ගීතා 9:5 හිතෝ 11:19 යෙරෙ 11:20
**17** ගීතා 37:25 හිතෝ 2:21

**2 තීරුව**
**1** ද්වි 32:4 1ලේක 28:9 යොහ 17:25 එළි 15:3
**2** 1සාමු 16:7
**3** යෙරෙ 11:20 යෙරෙ 17:10 යෙරෙ 20:12 එළි 2:23
**4** උත් 15:1 හිතෝ 30:5
**5** ගීතා 125:4 හිතෝ 2:21
**6** උත් 18:25 ගීතා 9:4 ගීතා 33:5 ගීතා 98:9
**7** ගීතා 85:4 යෙසා 55:7 මලා 4:6 ලූක් 1:16
**8** ද්වි 32:41 එස 21:9
**9** ද්වි 32:23
**10** හබ 3:5

ධර්මිෂ්ඨ වූ දෙවි,[1] මිනිසාගේ සිත් සෝදිසි කර[2] ඇතුළාන්ත හැඟීම්* විමසා බලන්නේය.[3]
10 දෙවි මාගේ පලිහය.[4] ප්‍රතිපත්තිගරුක ජීවිතයක් ගත කරන අයගේ ගැලවුම්කරුය.[5]
11 දෙවි ධර්මිෂ්ඨ විනිශ්චයකරුවෙක්ය.[6]
ඔහු සැමදා දුෂ්ටයන්ට තරවටු කරන්නේය.
12 යමෙක් නපුරු මාර්ගයෙන් හැරී නාවොත්[7] දෙවි තම කඩුව මුවහත් කරන්නේය.[8]
ඔහු තම දුන්නෙන් විදීමට සූදානමින් සිටින්නේය.[9]
13 ඔහු මාරක ආයුධ සූදානම් කරන්නේය.[10]
ඊතල, ගිනිමය ඊතල කරන්නේය.[11]
14 බලන්න! නපුරු දේවල් තම සිතේ පෝෂණය කරන තැනැත්තෙක් සිටින්නේය.[12]
ඔහුගේ සිත තුළ නපුර පිළිසිඳගෙන බොරුව උපදවන්නේය.[13]
15 ඔහු වළක් හාරා එය තව තවත් ගැඹුරට හාරන්නේය.[14]
නමුත් ඔහු කැපූ වළේ ඔහුම වැටෙන්නේය.[15]
16 ඔහු කළ නපුර ආපසු ඔහු පිටටම පැමිණෙන්නේය.[16]
ඔහුගේ සැහැසික ක්‍රියාවල ප්‍රතිඵල ඔහුටම විඳින්න සිදු වන්නේය.[17]
17 යෙහෝවා දෙවි ධර්මිෂ්ඨ නිසා මම ඔහුට ප්‍රශංසා කරන්නෙමි.[18]
මහෝත්තම තැනැත්තාණන් වන යෙහෝවා දෙවිගේ[19]

---

**11** ද්වි 32:42; ගීතා 45:5; ගීතා 64:7; **12** යෙසා 33:11; **13** යෙසා 59:4; යාකො 1:15; **14** ගීතා 35:7; ගීතා 40:2; ගීතා 57:6; යෙරෙ 18:20; **15** එස්ත 7:10; ගීතා 10:2; හිතෝ 26:27; **16** 1රාජා 2:32; එස්ත 9:25; ගලා 6:7; **17** මතෙ 26:52; **18** ගීතා 35:28; ගීතා 51:14; ගීතා 71:15; ගීතා 98:2; ගීතා 145:7; **19** උත් 14:22; ගීතා 83:18; ගීතා 92:8; දානි 4:17; එළි 15:4.

---

**ගීතා 7:9*** මූ.අ., "වකුගඩු."

නාමයට මම ප්‍රශංසා ගී ගයන්නෙමි.[1]

සංගීත අධ්‍යක්ෂක වෙතය.
ගිටිත් * ඇතුව ගායනා කිරීම සඳහාය.[2]
දාවිත් රචනා කළ ගීතයකි.

**8** අපේ ස්වාමීන් වන යෙහෝවා දෙවියනි, ඔබේ නාමය මොන තරම් ශ්‍රේෂ්ඨද කියා මුළු පොළෝතලයෙන් පැහැදිලිව දිස් වෙයි.[3]
ඔබේ බලමහිමය මොන තරම්ද කියා මුළු අහස්තලය නැවත නැවත ප්‍රකාශ කරයි.[4]
2 ඔබට විරුද්ධ වන අයට,[5]
බිලිඳුන්ගේද කිරි බොන ළදරුවන්ගේද මුවින් ඔබ ඔබේ බලය පෙන්වූවෙහිය.[6]
සතුරාගේ හා පළිගන්නාගේ ක්‍රියා නතර කිරීමට ඔබ එසේ කළෙහිය.[7]
3 ඔබේ දැත්වලින් නිම කළ අහස්තලය දෙසද[8]
ඔබ සෑදූ සඳ හා තාරකා දෙසද මා බලන විට[9]
4 ඔබ මිනිසාව[10] සිහි කිරීමට තරම් ඔහු කවුද?[11]
ඔබේ රැකවරණය ලැබීමට තරම් මිනිසුන් වටින්නේද?[12]
5 ඔබ ඔහුව දේවදූතයන්ට* වඩා මදක් පහත් කළෙහිය.[13]
ඉන්පසු ඔබ ගෞරවය[14] සහ තේජස නමැති ඔටුන්න ඔහුට පැළඳෙව්වෙහිය.[15]
6 ඔබ නිර්මාණය කළ සියල්ල ඔබ ඔහු යටතේ තැබුවෙහිය.[16]
ඔහුගේ පාදවලට සියල්ල යටත් කළෙහිය.[17]
7 එළුවන්, බැටළුවන් හා ගවයන් යන සියල්ලන්වද[18]
වනසතුන්වද[19]
8 අහසේ පියාසර කරන කුරුල්ලන්වද මුහුදේ මත්ස්‍යයන්වද[20]
මුහුදේ සැරිසරන වෙනත් ජීවීන්වද එසේ ඔබ යටත් කළෙහිය.[1]
9 අපේ ස්වාමීන් වන යෙහෝවා දෙවියනි, ඔබේ නාමය මොන තරම් ශ්‍රේෂ්ඨද කියා මුළු පොළෝතලයෙන් පැහැදිලිව දිස් වෙයි.[2]

සංගීත අධ්‍යක්ෂක වෙතය. මත්ලාබන්.*
දාවිත් රචනා කළ ගීතයකි.

א [ආලෙෆ්]

**9** යෙහෝවා දෙවියනි, මම මාගේ මුළු හදවතින්ම ඔබට ප්‍රශංසා කරන්නෙමි.[3]
ඔබේ සියලු පුදුමාකාර ක්‍රියා ගැන ප්‍රකාශ කරන්නෙමි.[4]
2 මම ඔබ ගැන සන්තෝෂයෙන් සිටිමි. සතුටින් ඉපිල යමි.[5]
මහෝත්තමයාණෙනි, මම ඔබේ නාමයට ප්‍රශංසා ගී ගයන්නෙමි.[6]

ב [බේත්]

3 මාගේ සතුරන්ට පසුබැසීමට සිදු වන විට[7]
ඔවුහු ඔබ ඉදිරියේ වැටී විනාශ වී යන්නෝය.[8]
4 මන්ද ඔබ මාගේ නඩුව අසා මට යුක්තිය ඉටු කර දුන්නෙහිය.[9]
ඔබ සිංහාසනයේ හිඳ ධර්මිෂ්ඨකමින් විනිශ්චය කරන්නෙහිය.[10]

ג [ගීමෙල්]

5 ඔබ ජාතීන්ට තරවටු කළෙහිය.[11]
දුෂ්ටයාව විනාශ කළෙහිය.[12]
ඔබ ඔවුන්ගේ නාමය සදහටම මකා දැමුවෙහිය.[13]
6 සතුරා විනාශ වී සදහටම තුරන් වී යන්නේය.[14]

**7 ගීතාවලිය**
1 ගීතා 9:2; යෙසා 25:1; හෙබ්‍රෙ 13:15

**8 ගීතාවලිය**
2 ගීතා 84:පෙර
3 ද්වි 28:58; ගීතා 148:13; මතෙ 6:9; යොහ 17:26
4 1රාජා 8:27; 1ලේක 16:27; යෝබ් 37:22; ගීතා 104:1; ගීතා 148:13; යෙසා 33:21; හෙබ්‍රෙ 1:3
5 ක්‍රියා 4:14; ක්‍රියා 6:10
6 මතෙ 21:16; ලූක් 10:21; ක්‍රියා 4:13; 1කොරි 1:27
7 ගීතා 44:16
8 උත් 1:1; ගීතා 19:1; ගීතා 102:25; රෝම 1:20
9 ගීතා 104:19; යෙසා 40:26; මතෙ 5:45
10 යෙසා 51:12; 1කොරි 15:47
11 යෝබ් 7:17; ගීතා 144:3; හෙබ්‍රෙ 2:6
12 උත් 1:29; උත් 9:3; මතෙ 6:25; මතෙ 6:30; ලූක් 12:28; යොහ 3:16; ක්‍රියා 14:17
13 හෙබ්‍රෙ 2:7
14 යෙසා 40:5; 1කොරි 11:7
15 ගීතා 21:5; හිතෝ 5:9
16 උත් 1:26; උත් 9:2
17 හෙබ්‍රෙ 2:8
18 උත් 1:28; උත් 9:3
19 උත් 2:20
20 උත් 1:20; යොහ 21:6

**2 තීරුව**
1 උත් 1:21; යෝබ් 41:1
2 ගීතා 8:1; හෙබ්‍රෙ 8:1

**9 ගීතාවලිය**
3 ගීතා 86:12; ගීතා 111:1
4 1ලේක 16:12; 1ලේක 29:11; එළි 4:11

**ගීතා 8:පෙර*** මෙම හෙබ්‍රෙව් වචනයෙහි අර්ථය නිශ්චිතව පැවසිය නොහැක. **5*** හෝ, “දෙවිට සමාන අයට.”

**5** ගීතා 5:11; ගීතා 28:7; **6** ගීතා 83:18; ගීතා 97:9; එළි 15:3; **7** ගීතා 56:9; **8** ගීතා 80:16; **9** ගීතා 140:12; **10** ගීතා 89:14; ගීතා 98:9; 1පේතෘ 2:23; **11** ද්වි 9:4; **12** ගීතා 106:11; **13** ද්වි 9:14; මතෙ 25:46; **14** නික් 14:13; ගීතා 34:16.

**ගීතා 9:පෙර*** මෙම හෙබ්‍රෙව් වචනයෙහි අර්ථය නිශ්චිතව පැවසිය නොහැක. සමහර පරිවර්තකයන්, ‘පුත්‍රයාගේ මරණය සම්බන්ධවය’ කියා එම වචනය පරිවර්තනය කර ඇත.

ඔබ විනාශ කළ නුවරවල්ද පාළු
වී යන්නේය.[1]
ඔබේ සතුරන් ගැන නැවත
කිසිදා අසන්නවත් ලැබෙන්-
නේ නැත.[2]

ה [හේ]

7 යෙහෝවා දෙවි සදහටම රජකම්
කරන්නේය.[3]
ඔහු විනිශ්චය කිරීම සඳහා තම
සිංහාසනය ස්ථිරව පිහිටෙව්-
වේය.[4]
8 පොළෝතලයේ වෙසෙන වැසි-
යන්ව ඔහු ධර්මිෂ්ඨකමින්
විනිශ්චය කරන්නේය.[5]
ජාතීන්ව ඔහු සාධාරණව විනිශ්-
චය කරන්නේය.[6]

ו [වාව්]

9 යෙහෝවා දෙවි තැළී පොඩි වී
සිටින සියල්ලන්ට ආරක්ෂාව
ලබා දෙන උස් බලකො-
ටුවකි.[7]
විපතකට මුහුණ දෙන විටද ඔහු
උස් බලකොටුවකි.[8]
10 ඔබේ නාමය හඳුනන්නෝ ඔබ
ගැන විශ්වාසයෙන් සිටිති.[9]
යෙහෝවා දෙවියනි, ඔබේ මඟ
පෙන්වීම් පතන අයව ඔබ
කිසිසේත් අත්නාරින්නෙ-
හිය.[10]

ז [ෂායින්]

11 ජනයෙනි, සියොන්හි වාසය කරන
යෙහෝවා දෙවිට ප්‍රශංසා ගී
ගයන්න.[11]
සෙනඟ අතරේ ඔහුගේ ක්‍රියා
ගැන පවසන්න.[12]
12 ලේ වගුරුවන අයව ඔහු සොයන
විට[13] පීඩිත අයව සිහියේ
තබාගනු ඇත.[14]
පීඩිත අයගේ මොරගැසීම ඔහු
කිසිසේත් අමතක නොකා-
රනු ඇත.[15]

ח [චේත්]

13 යෙහෝවා දෙවියනි, මට කරු-
ණාව පෙන්වන්න. මට වෛර
කරන්නන් මට කරන හිංසා
දෙස බලන්න.[16]

**9 ගීතාවලිය**
1 1සාමු 31:7
2 ද්වි 25:19; යෙසා 14:22
3 ගීතා 90:2; ගීතා 102:12; 1තිමෝ 1:17
4 ගීතා 89:14; රෝම 14:10; එළි 20:11
5 උත් 18:25; ගීතා 85:11; ගීතා 96:13; යෙසා 26:9
6 ගීතා 98:9; ක්‍රියා 17:31
7 ගීතා 32:7; ගීතා 46:1; ගීතා 91:2; එළි 7:10
8 ගීතා 54:7
9 ගීතා 91:14; හිතෝ 18:10; යෙරෙ 16:21
10 2ලේක 20:12; ගීතා 25:15; 2කොරි 1:10
11 ගීතා 74:2; ගීතා 132:13; ගීතා 135:21
12 ගීතා 66:5; ගීතා 96:10; ගීතා 105:1; ගීතා 107:22; යෙසා 12:4
13 උත් 4:10; 2රාජා 9:26
14 උත් 9:5; ද්වි 32:43; 2රාජා 24:4; යෙසා 26:21; ලූක් 11:50
15 නික් 3:7; ගීතා 72:14; ලූක් 18:7
16 ගීතා 25:19

**2 තීරුව**
1 2සාමු 22:5; යෝබ් 38:17; ගීතා 30:3; ගීතා 107:18; ගීතා 116:3; යෙසා 38:10; එළි 1:18
2 යෙසා 37:22
3 යෙරෙ 17:19
4 ගීතා 66:16
5 ගීතා 13:5; ගීතා 20:5; හබ 3:18
6 ගීතා 7:15
7 ගීතා 35:7; ගීතා 57:6; ගීතා 141:10
8 ද්වි 32:35; ගීතා 35:8; හිතෝ 5:22
9 නික් 14:4; යොෂු 2:10; 1සාමු 6:20; 2රාජා 19:19

මරණය අබියස සිටින මාව
බේරාගන්න.[1]
14 සියොන් දියණියගේ[2] දොරටු අස-
ළදී[3]
ඔබේ සියලු ප්‍රශංසනීය ක්‍රියා
ගැන මා පවසන පිණිසත්[4]
ඔබ දෙන ගැලවීම ගැන මා ප්‍රීති
වන පිණිසත් එසේ කරන්න.[5]

ט [ටේත්]

15 ජාතීහු තමුන් කැපූ වළේම වැටී
සිටිති.[6]
ඔවුන් එළූ දැලටම[7] ඔවුන්ගේ
පය පැටලී ඇත.[8]
16 යෙහෝවා දෙවි යුක්තිය ඉටු කරන
ආකාරයෙන් තමන් කවුද
කියා ප්‍රකාශ කර ඇත.[9]
දුෂ්ටයෝ තමන්ගේම ක්‍රියාව-
ලට හසු වෙති.[10]
හිගෙයියන්.* *සේලාහ්.*

י [යෝද්]

17 දුෂ්ටයෝ[11] එනම්, දෙවිව අමතක
කරන සියලු ජාතීහු[12]
මිනී වළට යති.[13]
18 දිළිඳුන්ව සදහටම අමතක කරනු
නොලැබේ.[14]
නිහතමානී අයගේ බලාපො-
රොත්තුව කවදා හෝ ඉටු
වෙයි.[15]

כ [කෆ්]

19 යෙහෝවා දෙවියනි, නැඟී
සිටින්න! දූවිලි වැනි මිනි-
සුන්ට ඔබට වඩා බලවත්
වීමට ඉඩ නොදෙන්න.[16]
ජාතීන්ව ඔබ ඉදිරියේ විනිශ්චය
කරන්න.[17]
20 යෙහෝවා දෙවියනි, තමන් දූවිලි
හා සමාන බව ජාතීන් දැන-
ගන්නා පිණිස[18]

---

**10** හිතෝ 6:2; හිතෝ 26:27; යෙසා 3:11; **11** ගීතා 49:14; **12** ගීතා 50:22; යෙසා 34:2; යෙරෙ 10:25; **13** ගණන් 16:30; යෙසා 5:14; **14** ගීතා 12:5; ගීතා 72:4; **15** ගීතා 10:17; ගීතා 37:34; හිතෝ 24:14; මතෙ 5:5; **16** 1සාමු 2:9; අනි 5:21; **17** උත් 18:25; ගීතා 82:8; ක්‍රියා 17:31; **18** යෝබ් 40:12; යෙසා 31:3; එස 28:2; ක්‍රියා 12:23.

---

**ගීතා 9:16*** මෙම හෙබ්‍රෙව් යෙදුමේ අර්ථය නිශ්චිතව පැවසිය නොහැක.

ඔවුන්ව භයෙන් වෙළී යෑමට සලස්වන්න.[1] සීලාහ්.

ל [ලාමෙද්]

10 යෙහෝවා දෙවියනි, ඔබ මාගෙන් ඈත්ව සිටින්නේ මන්ද?[2]
මාගේ දුකේදී මාගේ පිහිටට ඔබ නොඑන්නේ මන්ද?[3]
2 දුෂ්ටයා උඩඟු ලෙස පීඩිත
තැනැත්තාට පහර දීමට ඔහු පසුපස ලුහුබැඳ යන්නේය.[4]
පීඩාවලින් හෙම්බත් වී සිටින ඔහු දුෂ්ටයාගේ උපායන්වලට හසු වන්නේය.[5]
3 දුෂ්ටයා තමාගේ තෘෂ්ණාවන් ගැන
ආඩම්බරෙන් කතා කරන්නේය.[6]
වංක ලෙස ලාභ ලබන්නා[7] තමාට වාසි වන අයුරින් දේවල් සකසාගන්නේය.

נ [නුන්]

ඔහු යෙහෝවා දෙවිට අගෞරව කරන්නේය.[8]
4 දුෂ්ටයාගේ උඩඟුකම නිසා ඔහු
දෙවිට ළං වීමට උත්සාහ නොකරන්නේය.[9]
"දෙවි කෙනෙක් නැහැ" කියා ඔහු සැමවිටම සිතන්නේය.[10]
5 ඔහු සැමදා යස ඉසුරෙන් වැජ-
ඹෙන්නේය.[11]
නමුත් දෙවිගේ උසස් විනිශ්චයන් ඔහුට කිසිසේත් තේරුම්ගැනීමට නොහැකි වන්නේය.[12]
යමෙක් ඔහුට විරුද්ධව නැඟී සිටියත් ඔහු එය ගණනකටවත් නොගන්නේය.[13]
6 "මම නම් කවදාවත් වැටෙන්නේ
නැහැ.[14]
පරම්පරා ගාණක් ගත වුණත් මට කිසිම හානියක් සිදු වෙන්නේ නැහැ" කියා ඔහු සිතන්නේය.[15]

פ [පේ]

7 ඔහුගේ මුඛයෙන් නිතරම පිට වන්-
නේ ශාපයෙන්, වංචාවෙන් හා හිංසාවෙන් පිරුණු වදන්ය.[1]
ඔහුගේ දිවග ඇත්තේ හානිකර හා රිදුම් දෙන වදන්ය.[2]
8 ඔහු ගොදුරක් ලැබෙන තෙක් මිනි-
සුන් ගැවසෙන තැන්වල රැක සිටින්නේය.
ඔහු සැඟවී සිට අහිංසකයෙකුව මරා දමන්නේය.[3]

ע [ආයින්]

අසරණයෙකුව අල්ලාගැනීමට ඔහු මාන බලන්නේය.[4]
9 සිංහයෙකු රැක සිටින්නාක් මෙන්
ඔහු නොපෙනෙන තැනක සැඟවී බලා සිටින්නේය.[5]
අසරණ වූ කෙනෙකුව ඔහුගේ දැලෙහි දමාගෙන,[6]
ඇදගෙන යෑමේ අටියෙන් ඔහු රැක සිටින්නේය.[7]
10 අසරණයා මුළුමනින්ම තැළී පොඩි
වී යන්නේය. ඔහු ශෝකයෙන් ඇද වැටෙන්නේය.
පීඩිත වූ සියල්ලෝ දුෂ්ටයාගේ දැඩි ග්‍රහණයට හසු වන්නෝය.[8]
11 "සිදු වී තිබෙන මේ දේවල් දෙවිට
අමතක වෙලා![9]
ඔහු ඉන්නේ අහක බලාගෙන![10]
ඔහුට මේ දේවල් පේන්නේ නැහැ"[11] කියා දුෂ්ටයා සිතන්නේය.[12]

ק [කෝෆ්]

12 යෙහෝවා දෙවියනි, නැඟී
සිටින්න.[13] ඔබගේ මහත් බලය පෙන්වන්න.[14]
දෙවියනි, අසරණයන්ව අමතක නොකරන්න.[15]
13 දුෂ්ටයා දෙවිට අගෞරව කරන්නේ
මොන හේතුවක් නිසාද?[16]
"මම කිසිවෙකුට ගණන් දීමට අවශ්‍ය නැහැ" කියා ඔහු සිතන නිසාය.[17]

**9 ගීතාවලිය**
**1** නික් 15:16 නික් 23:27 ද්වි 2:25

**10 ගීතාවලිය**
**2** ගීතා 22:1 යෙරෙ 14:8
**3** ගීතා 13:1 ගීතා 44:24
**4** නික් 14:17 ගීතා 37:14
**5** උත් 11:4 ගීතා 7:16 ගීතා 21:11 ගීතා 37:7 හිතෝ 5:22 හිතෝ 26:27 එළි 17:13
**6** නික් 15:9 ගීතා 94:4 ගීතා 106:14 හොෂෙ 12:8
**7** හිතෝ 11:18 යාකො 5:4
**8** යෙසා 57:17 මාක් 12:9 ලූක් 20:15
**9** යෝබ් 35:10 ගීතා 14:2 යෙරෙ 2:6
**10** ගීතා 14:1 ගීතා 53:1 ශෙප 1:12
**11** ගීතා 37:35
**12** හිතෝ 24:1 යෙසා 26:11 හොෂෙ 14:9
**13** ගීතා 12:5
**14** හිතෝ 14:16
**15** දේශ 8:11 යෙසා 56:12 එළි 18:7

**2 තීරුව**
**1** ගීතා 5:6 ගීතා 59:12 රෝම 3:14 1පේතෘ 3:10
**2** ගීතා 7:14 ගීතා 12:2 ගීතා 55:21 හිතෝ 10:31 හිතෝ 17:4
**3** හිතෝ 1:11 හබ 3:14
**4** ගීතා 17:11 යෙරෙ 22:17
**5** ගීතා 17:12 ගීතා 59:3 මීකා 7:2 ක්‍රියා 23:21
**6** යෝබ් 18:8 ගීතා 140:5 යෙරෙ 5:26 හබ 1:15 යොහ 10:12
**7** යෝබ් 38:40 විලා 3:10
**8** 2සාමු 15:5
**9** ගීතා 64:5 දේශ 8:11

---

**10** ගීතා 51:9; ගීතා 73:11; **11** ගීතා 94:7; එස 8:12; එස 9:9; **12** ගීතා 10:6; මාක් 2:6; **13** ගීතා 3:7; **14** ගීතා 94:2; මීකා 5:9; **15** ගීතා 9:12; ගීතා 35:10; **16** ද්වි 31:20; ගීතා 74:10; **17** හෙබ්‍රෙ 4:13.

ר [රේෂ්]

14 ඔබ දුක් කරදර සියල්ල දැක ඇත.
ඒවාට සහනයක් ගෙන දීමට
ඔබ බලා සිටින්නෙහිය.[1]
අසරණ තැනැත්තාද[2] පියා නැති
දරුවාද ඔබේ පිහිට පතන්-
නෝය.
ඔවුන්ට උපකාර කරන්නේ
ඔබයි.[3]

ש [ෂින්]

15 දුෂ්ට හා නපුරු තැනැත්තා සතු
බලය බිඳ දමන්න.[4]
ඔහුගේ සියලු දුෂ්ටකම්වලට
ඔබ ඔහුට දඬුවම් කරන්න.[5]
16 යෙහෝවා දෙවි සදාකාලයෙන්
සදාකාලයටම රජුය.[6]
වෙනත් ජාතීහු ඔහුගේ දේශ-
යෙන් තුරන් වී ඇත.[7]

ת [ටාව්]

17 යෙහෝවා දෙවියනි, ඔබ නිහත-
මානී අයගේ කන්නලව්වට
සවන් දෙන්නෙහිය.[8]
ඔබ ඔවුන්ගේ සිත් යහමඟට
ගෙනෙන්නෙහිය.[9]
ඔබ ඔවුන් දෙස බලා ඔවුන්ට
කන් දෙන්නෙහිය.[10]
18 පියා නැති දරුවා හා පීඩිත
වූ තැනැත්තා වෙනුවෙන්
යුක්තිය ඉටු කිරීම සඳහා
ඔබ ඔවුන් වෙතට අවධානය
යොමු කරන්නෙහිය.[11]
එවිට මිහිපිට සිටින කිසිවෙක්
බියෙන් නොසිටිනු ඇත.[12]

සංගීත අධ්‍යක්ෂක වෙතය.
දාවිත් රචනා කළ ගීතයකි.

**11** මාගේ රක්ෂස්ථානය යෙ-
හෝවා දෙවිය.[13]
එසේනම් මනුෂ්‍යයෙනි,
“කුරුල්ලෙකු මෙන් ඔබේ
කන්දට ඉක්මනින් පලා
යන්න”
කියා ඔබ මට පවසන්නේ
මන්ද?[14]
2 “බලන්න! දුෂ්ටයෝ ඔවුන්ගේ
දුන්න අතට ගනිති.[15]
ඊතල සූදානම් කරගනිති.
අඳුරු තැනක සැඟවී සිට ප්‍රති-
පත්තිගරුක අයට පහර
දීමට ඔවුහු සූදානමින්
සිටිති.[1]
3 යුක්තිය නමැති අත්තිවාරම බිඳ
වැටී තිබෙන විට[2]
ධර්මිෂ්ඨයාට කිරීමට ඉතුරුව
ඇත්තේ තව කුමක්ද?”
4 යෙහෝවා දෙවි ඔහුගේ ශුද්ධ මාලි-
გාවේ සිටින්නේය.[3]
යෙහෝවා දෙවිගේ සිංහාසනය
ස්වර්ගයේය.[4]
ඔහුගේ දෙනෙත් මනුෂ්‍යයන්
දෙසට යොමු වී තිබෙන්-
නේය. ඔහු ඔවුන්ව සෝදිසි
කර බලන්නේය.[5]
5 යෙහෝවා දෙවි ධර්මිෂ්ඨයාව
මෙන්ම දුෂ්ටයාවද සෝදිසි
කර බලන්නේය.[6]
සැහැසියාවට කැමැත්තක් දක්-
වන අයට ඔහු ද්වේෂ කරන්-
නේය.[7]
6 ඔහු උගුල්ද ගින්දරද ගෙන්දගම්ද
වර්ෂාව මෙන් දුෂ්ටයන් පිටට
වැටෙන්න සලස්වන්නේය.[8]
ඔවුන්ට ලැබෙන උරුමය ගිනි-
මය සුළඟකි.[9]
7 යෙහෝවා දෙවි ධර්මිෂ්ඨය.[10] ඔහු
ධර්මිෂ්ඨ ක්‍රියාවලට ප්‍රිය
කරන්නේය.[11]
දෙවිගේ මුහුණ දකින්න
ලැබෙන්නේ ඔහුගේ ප්‍රති-
පත්ති රකින අයටය.[12]

සංගීත අධ්‍යක්ෂක වෙතය.
පහළ ස්වරයෙන් ගායනා කිරීම සඳහාය.[13]
දාවිත් රචනා කළ ගීතයකි.

**12** යෙහෝවා දෙවියනි, මාව ගල-
වාගන්න.[14] මන්ද පක්ෂ-
පාත කිසිවෙක් ඉතුරු වී
නැත.[15]
මනුෂ්‍යයන් අතරේ විශ්වාස-
වන්ත අයද නැත.

**10 ගීතාවලිය**
1 2රාජා 9:26; 2ලේක 6:23
2 2තිමෝ 1:12; 1පේතෘ 4:19
3 ද්වි 10:18; ගීතා 146:9; යෙරෙ 49:11; හොෂෙ 14:3; හෙබ්‍රෙ 13:6
4 යෝබ් 34:30; යෝබ් 38:15; ගීතා 37:17; එස 30:21; සෙක 11:17
5 2රාජා 21:13; ගීතා 4:5; 1තෙස 5:22
6 ගීතා 29:10; ගීතා 145:13; යෙරෙ 10:10; දානි 4:34; 1තිමෝ 1:17
7 ගීතා 9:5; ගීතා 44:2
8 ගීතා 9:18; ගීතා 147:6
9 1ලේක 29:18; 2ලේක 30:12
10 1සාමු 8:21; ගීතා 6:9; ගීතා 9:18; ගීතා 102:17; හිතෝ 15:8; 1පේතෘ 3:12; 1යොහ 3:22
11 ගීතා 72:4; ගීතා 82:3
12 යෙසා 51:12

**11 ගීතාවලිය**
13 2ලේක 14:11; ගීතා 7:1; ගීතා 56:11
14 හිතෝ 27:8
15 ගීතා 37:14

**2 තීරුව**
1 ක්‍රියා 23:15
2 ගීතා 82:5
3 යෙසා 6:1; මීකා 1:2; හබ 2:20; එළි 7:15
4 2ලේක 20:6; ගීතා 103:19; මතෙ 23:22; ක්‍රියා 7:49; එළි 4:2
5 2ලේක 16:9; ගීතා 33:13; ගීතා 66:7; හිතෝ 15:3; සෙක 4:10; හෙබ්‍රෙ 4:13
6 උත් 6:5; උත් 7:1; උත් 22:1
7 හිතෝ 3:31; හිතෝ 6:17
8 උත් 19:24; එස 38:22

**9** ගීතා 75:8; යෙසා 51:17; යෙරෙ 25:15; හබ 2:16; එළි 16:19; එළි 18:6; **10** ද්වි 32:4; **11** ගීතා 45:7; ගීතා 146:8; **12** යෝබ් 36:7; ගීතා 34:15; 1පේතෘ 3:12; **12 ගීතාවලිය** **13** ගීතා 6:පෙර; **14** ගීතා 3:7; **15** මීකා 7:2.

2 ඔවුහු එකිනෙකාට බොරු කියාගනිති.[1]
දෙසින් ඇතුව[2] චාටු බස් දොඩති.[3]
3 යෙහෝවා දෙවි චාටු බස් දොඩන්නන්ගේ දිව්ද
උඩඟු දේවල් පවසන්නන්ගේ දිව්ද කපා දමන්නේය.[4]
4 "කතාවෙන් අපිට පුළුවන් ජය ගන්න.[5]
අපි කැමති ඕනෑම දෙයක් කියන්න අපිට අයිතිය තියෙනවා. අපිව පාලනය කරන්න කාටවත් බැහැ" කියා පවසන අයව ඔහු විනාශ කර දමන්නේය.
5 "පීඩිත අයගේ දේපළ උදුරාගත් හැටි මම දුටුවෙමි. දුප්පතුන්ගේ සුසුම්ලෑම මම ඇසුවෙමි.[6]
එබැවින් දැන් මම නැඟී සිටිමි.[7]
ඔවුන්ව හෙළාදකින සියල්ලන්ගෙන් මම ඔවුන්ව ආරක්ෂා කරමි" කියා යෙහෝවා දෙවි කියන්නේය.[8]
6 යෙහෝවා දෙවිගේ වදන්, බොහෝ සෙයින් රත් වූ උදුනක දමා සත් වරක් පිරිසිදු කළ
රිදී මෙන් පවිත්‍රය.[9]
7 යෙහෝවා දෙවියනි, ඔබ ඔවුන්ව ආරක්ෂා කරන්නෙහිය.[10]
ඔවුන් සියලුදෙනාවම මේ දුෂ්ට පරම්පරාවෙන් සදහටම බේරාගන්නෙහිය.
8 මනුෂ්‍යයන් අතරේ දුෂ්ටකම රජයන බැවින්
දුෂ්ටයෝ සෑම තැනකම සිටිති.[11]

සංගීත අධ්‍යක්ෂක වෙතය. දාවිත් රචනා කළ ගීතයකි.

**13** යෙහෝවා දෙවියනි, ඔබ කොපමණ කාලයකට මාව අමතක කරන්නෙහිද?[12] සදහටම ඔබ එසේ කරන්නෙහිද?[13]
ඔබ කොපමණ කාලයක් මා වෙතින් ඔබේ මුහුණ ඉවතට හරවාගෙන සිටින්නෙහිද?[1]
2 කොපමණ කල් මා තනිව ගැටලු සමඟ පොරබදන්නද?
දවස මුළුල්ලෙහි ශෝකයෙන් සිටින මා තව කොපමණ කාලයක් මේ දුක ඉවසන්නද?
තව කොපමණ කාලයක් මාගේ සතුරා මාව යටපත් කරගෙන සිටීවිද?[2]
3 මාගේ දෙවි යෙහෝවා, මා දෙස බලන්න. මට පිළිතුරු දෙන්න.
මා මරණ නින්දට නොයන පිණිස[3] මාගේ විඩාබර දෙනෙත් නැවත ප්‍රාණවත් කරන්න.[4]
4 "මම ඔහුව පරාජය කළා" කියා මාගේ සතුරා නොකියන පිණිසත්
මාගේ වැටීම දැක මාගේ විරුද්ධකරුවන් ප්‍රීති නොවන පිණිසත් එසේ කරන්න.[5]
5 ඔබේ මහත් ප්‍රේමය* ගැන මම විශ්වාස කළෙමි.[6]
ඔබ දෙන ගැලවීම ගැන මාගේ සිත ප්‍රීති වෙයි.[7]
6 යෙහෝවා දෙවියනි, ඔබ මට බොහෝ සෙයින් ආශීර්වාද කර තිබෙන නිසා මම ඔබට ප්‍රශංසා ගී ගයන්නෙමි.[8]

සංගීත අධ්‍යක්ෂක වෙතය. දාවිත් රචනා කළ ගීතයකි.

**14** ප්‍රතිපත්තිවලට ගරු නොකරන පුද්ගලයෙක් තම සිතින් යෙහෝවා දෙවිව ප්‍රතික්ෂේප කරන්නේය.[9]
ඔහුගේ ක්‍රියා දුෂ්ටය.[10] පිළිකුල්සහගතය.
යහපත කරන කිසිවෙක් නැත.[11]
2 යෙහෝවා දෙවි ස්වර්ගයේ සිට

**12 ගීතාවලිය**
1 ගීතා 10:7
ගීතා 41:6
2 1ලේක 12:33
3 ගීතා 5:9
ගීතා 28:3
ගීතා 62:4
යෙරෙ 9:8
රෝම 16:18
4 නික් 15:9
1සාමු 2:3
ගීතා 17:10
එස 28:2
2පේත‍්‍ර 2:18
5 යෙරෙ 18:18
6 නික් 3:7
ගීතා 10:12
7 යෙසා 33:10
8 ගීතා 10:5
9 2සාමු 22:31
ගීතා 18:30
ගීතා 19:8
ගීතා 119:140
හිතෝ 30:5
10 1සාමු 2:9
ගීතා 145:20
11 දේශ 8:11

**13 ගීතාවලිය**
12 ගීතා 6:3
ගීතා 88:14
යෙසා 59:2
13 විලා 5:20

**2 තීරුව**
1 ද්වි 31:17
යෝබ 13:24
ගීතා 22:2
යෙසා 59:2
2 ගීතා 22:7
3 යෙරෙ 51:39
යොහ 11:11
4 එස්රා 9:8
5 ගීතා 25:2
ගීතා 35:19
ගීතා 38:16
විලා 1:16
6 ගීතා 52:8
ගීතා 147:11
1පේත‍්‍ර 5:7
7 1සාමු 2:1
ලූක් 1:47
8 ගීතා 116:7
ගීතා 119:17

**14 ගීතාවලිය**
9 ගීතා 10:4
ගීතා 53:1
යෙසා 29:16
10 උත් 6:12
11 රෝම 3:10

**ගීතා 13:5*** හෝ, "ළැදි ප්‍රේමය."

මනුෂ්‍යයන් දෙස බලන්-
නේය.[1]
දෙවිගේ මහ පෙන්වීම් තම ජීවි-
තයට අවශ්‍යයි කියා තේ-
රුම්ගන්නා කෙනෙකු සිටීද
කියා යෙහෝවා දෙවි සොයා
බලන්නේය.[2]
3 බොහෝදෙනෙක් යහපත කිරීම
අත්හැර[3] වංක ක්‍රියාවල
නියැලෙති.[4]
යහපත කරන කිසිවෙක් නැත.[5]
එක් කෙනෙක්වත් නැත.[6]
4 ඔවුහු රොටි කන්නාක් මෙන්
මාගේ සෙනඟව කා දමති.[7]
හානි පමුණුවන ඔවුන්ගෙන් එක්
කෙනෙකුටවත් කිසි දැනු-
මක් නැද්ද?[8]
ඔවුහු යෙහෝවා දෙවිගෙන්
අයැදුවේ නැත.[9]
5 එවිට මහත් බියක් ඔවුන්ව වෙළා-
ගත්තේය.[10]
මන්ද යෙහෝවා දෙවි ධර්මිෂ්ඨ-
යන්* සමඟය.[11]
6 පීඩිතයාගේ රක්ෂස්ථානය යෙ-
හෝවා දෙවිය.[12]
එබැවින් ඔවුහු පීඩිතයාගේ
අනාගත සැලසුම්වලට
නින්දා කරන්නෝය.
7 ඊශ්‍රායෙල්හි ගැලවීම සියොන් වෙ-
තින් පැමිණියා නම් කොත-
රම් අගනේද![13]
වහල්ව සිටි තම සෙනඟව යෙ-
හෝවා දෙවි නැවත එක් රැස්
කරන විට[14]
යාකොබ් ප්‍රීති වන්න. ඊශ්‍රායෙල්
ප්‍රීතිමත් වන්න.[15]

දාවිත් රචනා කළ ගීතයකි.

**15** යෙහෝවා දෙවියනි, ඔබේ
ශුද්ධ කූඩාරමට ඇතුල්
විය හැක්කේ කාටද?[16]
ඔබේ ශුද්ධ කන්දේ වාසය
කිරීමට අවස්ථාව ලැ-
බෙන්නේ කාටද?[17]

ගීතා 14:5* මූ.අ., "ධර්මිෂ්ඨ පරම්පරාව."

**14 ගීතාවලිය**
1 උත් 11:5
ගීතා 33:13
ගීතා 102:19
2 2ලේක 16:9
හෙබ්‍රෙ 11:6
3 දේශ 7:29
4 යෙසා 64:6
5 රෝම 3:11
6 රෝම 3:10
7 යෙරෙ 10:25
ආමො 8:4
මීකා 3:3
8 ගීතා 94:8
9 ගීතා 79:6
යෙසා 64:7
10 නික් 15:16
ගීතා 53:5
11 ගීතා 24:6
12 ගීතා 9:9
ගීතා 142:5
හෙබ්‍රෙ 6:18
13 රෝම 11:26
14 ගීතා 53:6
ගීතා 85:1
ගීතා 126:4
15 නෙහෙ 12:43
ගීතා 126:1

**15 ගීතාවලිය**
16 එළි 21:3
17 ගීතා 2:6
ගීතා 3:4
ගීතා 24:3
යෙසා 2:3

**2 තීරුව**
1 ගීතා 50:23
යෙසා 33:15
ක්‍රියා 10:35
2 ගීතා 1:1
3 හිතෝ 3:32
හිතෝ 12:19
සෙක 8:16
එෆී 4:25
කොලො 3:9
4 ලෙවී 19:16
ගීතා 34:13
ගීතා 101:5
හිතෝ 11:13
හිතෝ 20:19
හිතෝ 30:10
5 1සාමු 24:11
හිතෝ 14:21
රෝම 12:17
6 නික් 23:1
7 එස්ත 3:2
8 ගීතා 101:6
9 යොෂු 9:18
විනි 11:35
ගීතා 50:14
මතෙ 5:33
10 නික් 22:25
ලෙවී 25:36
ද්වි 23:19
එස 18:17
11 නික් 23:8
ද්වි 16:19
12 ගීතා 16:8
ගීතා 55:22
හිතෝ 12:3
2පේතෘ 1:10

2 ධර්මිෂ්ඨකම් කරමින්[1] නිර්දෝෂ
ජීවිතයක් ගත කරන,[2]
සිතින් සත්‍යය පවසන තැනැත්-
තාටය.[3]
3 ඔහු කේලම් කියන්නේ නැත.[4]
තමාගේ අසල්වැසියාට කිසි අය-
හපතක් කරන්නේ නැත.[5]
තමාගේ හිතවත් මිතුරා ගැන
කටකතා පතුරුවන්නේද
නැත.[6]
4 ඔහු පිළිකුල් ක්‍රියාවල යෙදෙන්-
නන්ව මුළුමනින්ම ප්‍රතික්-
ෂේප කරයි.[7]
නමුත් යෙහෝවා දෙවි කෙරෙහි
ගරුබිය ඇති අයට ඔහු ගරු
කරයි.[8]
ඔහුට පාඩුවක් සිදු වුණත් ඔහු
දුන් පොරොන්දු එලෙසම ඉටු
කරයි.[9]
5 ඔහු ණයකරුවන්ගෙන් පොලී අය
නොකරයි.[10]
අහිංසක කෙනෙකුට විරුද්ධව
අසාධාරණයක් සිදු කිරීමට
ඔහු කිසිවිටෙක අල්ලසක්
නොගනියි.[11]
මෙසේ ක්‍රියා කරන තැනැත්තා
කිසිදා නොසෙල් වෙයි.[12]

දාවිත් රචනා කළ මික්ටැම්.*

**16** දෙවියනි, මා ඔබේ රැකවර-
ණය පතන නිසා මාව
ආරක්ෂා කරන්න.[13]
2 මම යෙහෝවා දෙවිට මෙසේ
කීවෙමි. "ඔබ යෙහෝවා දෙ-
විය. මා ගත කරන යහපත්
ජීවිතයෙන් ඔබට ප්‍රයෝජන-
යක් තිබේද?[14]
3 මාගේ යහපත්කමින් ප්‍රයෝජන
ලබන්නේ පොළොවේ සිටින
ශුද්ධ තැනැත්තන්ය.
උතුම් අය වන ඔවුන් මාගේ
සතුටය."[15]

**16 ගීතාවලිය** 13 ගීතා 25:20; ගීතා 91:2; 14 යෝබ් 35:7; රෝම 11:35; 15 ගීතා 119:63.

ගීතා 16:පෙර* මෙම හෙබ්‍රෙව් යෙදුමේ අර්ථය නිශ්චිතව පැවසිය නොහැක.

4 වෙනත් දෙවිවරුන්ව පිළිගන්නා
අය බොහෝ වේදනා අද්ද-
කිති.[1]
ඔවුන් පාන පූජා ලෙස ලේ ඔප්පු
කරන විට මම ඊට සහභාගි
නොවන්නෙමි.[2]
ඒ දෙවිවරුන්ගේ නම්වත් මාගේ
මුවින් සඳහන් නොකරන්-
නෙමි.[3]
5 යෙහෝවා දෙවිට මා කරන සේවය
මාගේ උරුමයයි.[4] ප්‍රීතියෙන්
පිරුණු මාගේ කුසලානයත්
ඔහුයි.[5]
දෙවියනි, මාගේ උරුමය රක්ෂා
කරන්නේද ඔබයි.
6 මට උරුම වූ කොටස ගැන මම
සතුටු වෙමි.[6]
ඇත්තෙන්ම ඒ ගැන මම බො-
හෝ සෙයින් ප්‍රීති වෙමි.
7 මට මඟ පෙන්වූ යෙහෝවා දෙවිට
මම ප්‍රශංසා කරමි.[7]
මාගේ ඇතුළාන්තයටම කාවැ-
දුණු ඒ මඟ පෙන්වීම්
රාත්‍රී කාලයේදී මාව නිවැරදි
කළේය.[8]
8 යෙහෝවා දෙවි සැමවිටම මා ඉදි-
රියේ සිටිනවා කියා මම විශ්-
වාස කරමි.[9]
ඔහු මාගේ දකුණු පැත්තේ
සිටින නිසා මම නොසැලී
සිටිමි.[10]
9 මාගේ පවිත්‍ර හදවත ප්‍රීතියෙන්
ඉපිල යන්නේය. මම ප්‍රීති-
යෙන් ඉපිල යන්නෙමි.[11]
මාගේ ජීවිතය ගැන මා තුළ
කිසි බියක් නැත.[12]
10 මන්ද ඔබ මාව මිනී වළෙහි දිගටම
තබන්නේ නැත.[13]
ඔබට පක්ෂපාත නැනැත්තාට
මිනී වළෙහි කුණු වීමට ඔබ
ඉඩහරින්නේ නැත.[14]
11 ජීවනයට යන මාර්ගය මට පෙන්-
වන්න.[15]
මා ඔබ ඉදිරියේ සිටින විට සැබෑ
ප්‍රීතිය ඇත්තේය.[16]
ඔබේ දකුණු පැත්තේ සිටී-
මෙන් මට සැමදාටම සතුට
ලැබෙන්නේය.[1]

දාවිත්ගේ යාච්ඤාවකි.

17 යෙහෝවා දෙවියනි, මාගේ
සාධාරණ ඉල්ලීමට සවන්
දෙන්න. මාගේ කන්-
නලව්වට ඇහුම්කන්
දෙන්න.[2]
අවංකව මා කරන මේ යාච්-
ඤාවට කන් දෙන්න.[3]
2 මාගේ මේ කාරණයට තීන්දුව ඔබ-
ගෙන් ලැබේවා![4]
ඔබ එයට සාධාරණ විනිශ්චයක්
ලබා දේවා![5]
3 ඔබ මාගේ සිත විමසා බලා රාත්‍රි-
යේදී මාව සෝදිසි කළෙ-
හිය.[6]
ඔබ මා පවිත්‍ර කළෙහිය. මා
කුමන්ත්‍රණ නොකළ කෙ-
නෙකු බව ඔබ දකින්නෙ-
හිය.[7]
මම කිසි වැරදි දෙයක් නොකී-
මට තීරණය කළෙමි.[8]
4 මිනිසුන් කෙසේ ක්‍රියා කළත් ඔබ
පවසා ඇති දේට එකඟව
කටයුතු කිරීමට මම අදිටන්
කරගතිමි.
සොරා යන මාර්ගයේ නොයෑ-
මට මම වගබලා ගතිමි.[9]
5 ඔබ පෙන්වන මාර්ගයේ මම දිග-
ටම ගමන් කරමි.[10]
එවිට මාගේ පය කිසිදා පැට-
ලෙන්නේ නැත.[11]
6 දෙවියනි, ඔබ මට පිළිතුරු දෙන
නිසා මම ඔබේ නාමයෙන්
අයැදිමි.[12]
අනේ, මට කන් දෙන්න. මා
කියන දේට ඇහුම්කන්
දෙන්න.[13]
7 ගැලවුම්කරුවෙනි, ඔබේ රැකව-
රණය පතන අයට ඔබේ
මහත් ප්‍රේමය* විශිෂ්ට අන්ද-
මින් පෙන්වන්න.[14]

**16 ගීතාවලිය**
1 ද්වි 8:19, ගීතා 97:7, යෝනා 2:8
2 යෙරෙ 7:18
3 නික් 23:13, යොෂු 23:7, හොෂෙ 2:17
4 ගණන් 18:20, ගීතා 73:26, විලා 3:24
5 ගීතා 23:5
6 ගීතා 78:55
7 යෙසා 48:17
8 ගීතා 17:3, ගීතා 26:2
9 ගීතා 139:18, ක්‍රියා 2:25
10 ගීතා 73:23, ගීතා 121:5
11 ගීතා 30:12, ගීතා 57:8
12 යෝබ් 14:14, යෙසා 26:19
13 ගීතා 49:15, හිතෝ 15:11, ක්‍රියා 2:31, ක්‍රියා 3:15, එළි 1:18
14 යෝබ් 14:13, යෝබ් 17:14, යෙසා 38:17, ක්‍රියා 13:35
15 ගීතා 21:4, හිතෝ 12:28
16 ගීතා 21:6, මතෙ 5:8, ක්‍රියා 2:28, 1තිමෝ 1:11

**2 තීරුව**
1 ගීතා 36:10

**17 ගීතාවලිය**
2 ගීතා 5:2
3 ගීතා 145:18
4 යෝබ් 1:8
5 ගීතා 37:6
6 ගීතා 11:5, ගීතා 16:7, 1කොරි 4:4
7 යෝබ් 23:10, ගීතා 26:2, ගීතා 66:10, යෙරෙ 9:7, සෙක 13:9, මලා 3:3, 1පේතෘ 1:7
8 ගීතා 39:1
9 ගීතා 119:9
10 1සාමු 2:9, ගීතා 119:133
11 ගීතා 18:36, ගීතා 94:18, ගීතා 121:3
12 ගීතා 55:16, ගීතා 66:19
13 ගීතා 116:2, යෙසා 37:17

14 ගීතා 31:21; විලා 3:22.

ගීතා **17:7*** හෝ, “ළැදි ප්‍රේමය.”

ඔබේ බලවත් හස්තයට*
විරුද්ධ වන අයගෙන්
ඔවුන්ව ආරක්ෂා කරන්න.[1]
8 ඇසේ කලු ඉංගිරියාව මෙන් මාව
රැකගන්න.[2]
ඔබේ පියාපත් සෙවණෙහි මාව
සඟවාගන්න.[3]
9 මන්ද දුෂ්ටයෝ මට විරුද්ධව ක්‍රියා
කරති.
මාගේ ජීවිතය විනාශ කර දැමී-
මට දැනටමත් සතුරෝ මා
වටා රැස්ව සිටිති.[4]
10 ඔවුහු තමන්ගේ සිත් දැඩි කර-
ගෙන සිටිති.*[5]
අහංකාර ලෙස කතා කරති.[6]
11 අප යන යන තැන ඔවුහු අපව වට
කරති.[7]
අපව බිම හෙළන්නේ කොයි
මොහොතේද කියා බලා
සිටිති.[8]
12 ඔවුන් එක් එක් කෙනා ගොදුර
ඉරා දමන තෙක් නොඉව-
සිල්ලෙන් සිටින සිංහයන්
මෙනි.[9]
මඟ රැක සිටින තරුණ සිංහ-
යන්ට ඔවුන් සමානය.
13 යෙහෝවා දෙවියනි, ඔවුන්ට
විරුද්ධව නැඟී සිටින්න.[10]
ඔවුන්ව පහතට ඇද දමන්න.
ඔබේ කඩුව ගෙන දුෂ්ටයා-
ගෙන් මාව ගලවාගන්න.[11]
14 යෙහෝවා දෙවියනි, ඔබේ බල-
වත් හස්තය දිගු කර[12] මේ
ලෝකයේ මනුෂ්‍යයන්ගෙන්[13]
මාව ගලවාගන්න.
දැන් ගත කරන ජීවිතය ගැන
පමණක් සිතන මනුෂ්‍යයන්-
ගෙන්[14] මාව බේරාගන්න.
ඔබ රැස් කර තිබෙන යහපත්
දෙයින් ඔවුහු තමන්ගේ බඩ
පුරවාගනිති.[15]
ඔවුහු දරුපල ලබා තෘප්තිමත්
ජීවිතයක් ගත කරති.[16]
ඔවුන්ට පසුව ඔවුන්ගේ දරු-
වෝද ඔවුන් රැස් කළ සම්පත්
භුක්ති විඳිති.[1]
15 නමුත් මාගේ ධර්මිෂ්ඨකම නිසා
මම ඔබේ මුහුණ දකින්-
නෙමි.[2]
මම අවදි වන විට ඔබව දැකී-
මෙන් සතුටු වන්නෙමි.[3]

සංගීත අධ්‍යක්ෂක වෙතය. යෙහෝවා දෙවිගේ සේවකයෙකු වූ දාවිත් රචනා කළ ගීතයකි. යෙහෝවා දෙවි දාවිත්ව ඔහුගේ සියලු සතුරන් අතින්ද සාවුල් අතින්ද ගැලවූ දවසේදී ඔහු යෙහෝවා දෙවිට මේ ගීතය ගැයුවේය.[4]

18 මාගේ ශක්තිය වන යෙ-
හෝවා දෙවියනි, මම
ඔබට ප්‍රේම කරමි.[5]
2 යෙහෝවා දෙවි වූ ඔබ මාගේ පර්-
වතයය. මාගේ බලකොටු-
වය. මට ගැලවීම ලබා දෙන
තැනැත්තාණන්ය.[6]
මාගේ දෙවි මාගේ පර්වත-
යය. මම ඔහුගේ ආරක්ෂාව
පතමි.[7]
ඔහු මාගේ පලිහය. මාගේ ගැල-
වීමේ අඟය. මට සුරක්ෂිත-
බවක් ලබා දෙන උස්
බලකොටුව ඔහුය.[8]
3 ප්‍රශංසාව ලැබීමට වටින තැනැත්-
තාණන් වන යෙහෝවා දෙ-
විට මම හඬගසන්නෙමි.[9]
එවිට ඔහු මාගේ සතුරන්ගේ
අතින් මාව බේරාගනු ඇත.[10]
4 මරණයේ රැහැන් මා වටා එතු-
ණේය.[11]
සැඩ පහරක් මෙන් කිසි කමකට
නැති මිනිස්සු නොසිතූ මො-
හොතක මා වෙතට පැමිණ
මා බිය ගැන්වූහ.[12]
5 මිනී වළෙහි බැමි මා වට කළේය.[13]
මරණයේ උගුල් මට තර්ජනය
කළේය.[14]
6 මාගේ විපතේදී මම දිගටම යෙ-
හෝවා දෙවිට හඬගැසුවෙමි.
උපකාරය පතා මාගේ දෙ-
විට මම හඬමින් දිගටම
කන්නලව් කළෙමි.[15]

ගීතා 17:7* මූ.අ., “දකුණු හස්තයට.” 10* මූ.අ., “ඔවුහු තෙලින් තර වී සිටිති.”

**17 ගීතාවලිය**
1 නික් 15:6
2 ද්වි 32:10, සෙක 2:8
3 රූත් 2:12, ගීතා 36:7, ගීතා 57:1, ගීතා 63:7
4 1සාමු 24:11, ගීතා 35:4
5 ද්වි 32:15, ගීතා 119:70, එස 16:49
6 1සාමු 2:3, ගීතා 31:18, ගීතා 73:9
7 1සාමු 23:26
8 ගීතා 10:8
9 ගීතා 7:2
10 ගීතා 7:6
11 ගීතා 7:12
12 ගීතා 108:6
13 ගීතා 49:1, 1තිමෝ 6:17
14 ගීතා 73:12, යාකො 5:5
15 යෝබ් 22:18, ගීතා 144:13, මතෙ 5:45
16 ගීතා 144:12

**2 තීරුව**
1 ගීතා 39:6
2 යෝබ් 19:26
3 ගීතා 65:4

**18 ගීතාවලිය**
4 2සාමු 22:1
5 ගීතා 18:32, ගීතා 118:14, යෙසා 12:2
6 ගීතා 3:3, ගීතා 37:40, ගීතා 40:17, ගීතා 70:5, ගීතා 144:2
7 2සාමු 23:3, ගීතා 46:1
8 උත් 15:1, ද්වි 32:4, 2සාමු 22:3, හිතෝ 2:7, ලූක් 1:69
9 2සාමු 22:4, ගීතා 69:34, 2කොරි 11:31
10 ගීතා 50:15, ලූක් 1:71
11 1සාමු 20:3, ගීතා 116:3, මතෙ 26:66
12 2සාමු 20:1, 2සාමු 22:5, ගීතා 22:16
13 2සාමු 22:6, ගීතා 88:3
14 දේශ 9:12
15 ගීතා 50:15, ගීතා 130:1

තම මාලිගාවේ සිටි ඔහුට මාගේ
හඬ ඇසිණ.[1]
මා කළ මොරගැසීම ඔහුගේ දෙ-
සවනට වැටිණ.[2]
7 ඔහුගේ කෝපය නිසා පොළොව
සෙලවී කම්පනය විය.[3]
කඳුවල අත්තිවාරම් පවා සෙල-
විය.[4]
ඒවා තදින් දෙදරුම් කන්නට
විය.[5]
8 ඔහුගේ නාසයෙන් දුම් නැග්ගේය.
ඔහුගේ මුවින් පිට වූ ගින්-
නෙන් අවට දැවී ගියේය.[6]
ඇවිළෙන ගින්නක් ඔහු වෙතින්
නික්මුණේය.
9 ඔහු අහස නමා පහතට බැස
ආවේය.[7]
අඳුරු වලාකුළු ඔහුගේ පාද යට
තිබුණේය.
10 ඔහු කෙරුබ්වරයෙකු පිට නැඟී
පියාසර කරමින් ආවේය.[8]
දේවදූතයෙකුගේ පියාපත්* පිට
නැඟී වේගයෙන් ආවේය.[9]
11 ඔහු අන්ධකාරයේ සැඟවුණේය.[10]
අඳුරු වැහි වලාවන් ඔහුගේ
කූඩාරම වූවේය.[11]
12 ඔහු ඉදිරියෙන් නික්මුණු දීප්තිය
ඔහු වටා තිබූ වලාකුළු අත-
රින් විහිදී ගියේය.[12]
හිම කැට සහ ගිනි අඟුරු වර්ෂා-
වක්ද ඇද හැළුණේය.[13]
13 අහස ගිගුරුම් දෙන්නට යෙහෝවා
දෙවි සැලැස්වූවේය.[14]
මහෝත්තමයාණන්ගේ හඬ
දසත පැතිරුණේය.[15]
එවිට හිම කැට සහ ගිනි අඟුරු
වර්ෂාවක් ඇද හැළුණේය.
14 ඔහු ඔවුන්ව විසුරුවාහැරීමට
ඊතල වි‍ද්දේය.[16]
ඔවුන්ව වියවුල් කිරීමට අකුණු-
වලින් පහර දුන්නේය.[17]
15 යෙහෝවා දෙවියනි, ඔබේ තරව-
ටුව නිසාද ඔබේ නාසයෙන්
හුස්ම පිට වූ විට ඇති වූ
පිපිරීම නිසාද[1]
ගංගාවල පතුල මතු විය.[2]
පොළොවේ අත්තිවාරම් පවා
පෙනුණේය.[3]
16 ඉහළ සිට ඔහු තම හස්තය දිගු
කොට මා අල්ලාගත්තේය.[4]
ගැඹුරු ජලයෙන් ඔහු මාව ඉහ-
ළට ඇදගත්තේය.[5]
17 මට වෛර කරන මාගේ බලවත්
සතුරන් අතින් ඔහු මාව
ගැලෙව්වේය.[6]
එසේ කළේ ඔවුන් මට වඩා
ශක්තිමත් වූ බැවිනි.[7]
18 මා විපත්තිවලට මුහුණ දුන් විට
ඔවුහු දිගටම මට තර්ජනය
කළෝය.[8]
නමුත් යෙහෝවා දෙවි මාගේ
උපකාරයට පැමිණියේය.[9]
19 ඔහු මාව ආරක්ෂිත ස්ථානයකට
ගෙනාවේය.[10]
ඔහු මා ගැන සතුටු වූ නිසා මාව
බේරාගත්තේය.[11]
20 මාගේ ධර්මිෂ්ඨ ක්‍රියාවලට අනුව
යෙහෝවා දෙවි මට ආශීර්-
වාද කරන්නේය.[12]
මා පවිත්‍ර ජීවිතයක් ගත කරන
නිසා ඔහු මට ආශීර්වාද
කරන්නේය.[13]
21 මම යෙහෝවා දෙවිගේ මාර්ගයේ
ගමන් කළෙමි.[14]
දුෂ්ට ලෙස ක්‍රියා කර, මාගේ දෙ-
විව අත්හැර නොගියෙමි.[15]
22 ඔහු දුන් සියලු තීන්දු මාගේ සිතේ
තබාගත්තෙමි.[16]
ඔහුගේ පනත්වලින් මම ඉවත්ව
නොගියෙමි.[17]
23 මම නිර්දෝෂ බව ඔහුට ඔප්පු කර
පෙන්වන්නෙමි.[18]
වැරදි කිරීමෙන් වැළකී සිටින්-
නෙමි.[19]
24 එවිට මාගේ ධර්මිෂ්ඨ ක්‍රියාවලට
අනුවද[20]
ඔහු ඉදිරියේ මා ගත කරන

**18 ගීතාවලිය**
**1** 1සාමු 3:3; 2සාමු 22:7; 1ලේක 16:1; ගීතා 11:4; යෝනා 2:7
**2** නික් 3:7; ගීතා 10:17; ගීතා 34:15; 1පේතෘ 3:12
**3** විනි 5:4; එස 38:19; හග් 2:6
**4** 2සාමු 22:8
**5** ගීතා 77:18; ගීතා 97:4; එළි 16:18
**6** 2සාමු 22:9; යෙසා 30:27
**7** 2සාමු 22:10; ගීතා 144:5; යෙසා 64:1
**8** ගීතා 99:1
**9** ගීතා 104:3; හෙබ්‍රෙ 1:7
**10** ගීතා 97:2
**11** යෝබ් 36:29
**12** 2සාමු 22:13
**13** ගීතා 97:3
**14** 1සාමු 2:10; 1සාමු 7:10
**15** 2සාමු 22:14; ගීතා 29:3
**16** යොෂු 10:10; යෙසා 30:30
**17** 2සාමු 22:15; යෝබ් 36:32; ගීතා 144:6

**2 තීරුව**
**1** නික් 15:8
**2** ගීතා 74:15; ගීතා 106:9; ගීතා 114:3
**3** 2සාමු 22:16; ගීතා 9:8
**4** 2සාමු 22:17; ගීතා 57:3
**5** ගීතා 32:6; ගීතා 124:4
**6** 2සාමු 22:18; ගීතා 3:7
**7** ගීතා 35:10
**8** 1සාමු 19:11; 1සාමු 23:26
**9** යෙසා 50:10
**10** ගීතා 31:8; ගීතා 118:5
**11** ගීතා 149:4
**12** 1සාමු 26:23; 1රාජා 8:32; හිතෝ 11:18
**13** 1සාමු 24:11; ගීතා 24:4
**14** 2සාමු 22:22
**15** ගීතා 119:102
**16** 2සාමු 22:23
**17** ද්වි 8:11
**18** උත් 6:9; 2සාමු 22:24; ගීතා 84:11
**19** හිතෝ 14:16
**20** යෙසා 3:10; හෙබ්‍රෙ 11:6.

**ගීතා 18:10*** හෝ, "සුළඟේ පියාපත්."

පවිත්‍ර ජීවිතයට අනුවද[1] යෙහෝවා දෙවි මට ආශීර්වාද කරන්නේය.
25 ඔබව අත් නොහරින කෙනෙකුව ඔබත් කිසිදාක අත් නොහරින්නෙහිය.[2]
නිර්දෝෂ තැනැත්තාව කිසි කලෙක ඔබ අත් නොහරින්නෙහිය.[3]
26 පවිත්‍ර සිතක් ඇති තැනැත්තාට ඔබ ආශීර්වාද කරන්නෙහිය.[4]
වංක තැනැත්තාට ඔහුගේ ක්‍රියාවලට අනුව ප්‍රතිඵල දෙන්නෙහිය.[5]
27 පීඩිත වූ අයව ඔබ ගලවාගන්නෙහිය.[6]
නමුත් උඩඟු අයව ඔබ පහත් කරන්නෙහිය.[7]
28 යෙහෝවා දෙවියනි, මාගේ පහන දල්වන්නේ ඔබයි.[8]
මාගේ දෙවියනි, මාගේ අන්ධකාරය ආලෝකයට හරවන්නේ ඔබයි.[9]
29 ඔබේ උපකාරය ඇතුව මට සේනාවකට විරුද්ධව වුවත් නැඟී සිටිය හැක.[10]
මාගේ දෙවිගේ උපකාරය ඇතුව මට මහා පවුරකට වුවත් නැඟිය හැක.[11]
30 සැබෑ දෙවිගේ මාර්ගය පරිපූර්ණය.[12]
යෙහෝවා දෙවිගේ වචනය පවිත්‍රය.[13]
ඔහුගේ රැකවරණය සොයන සියල්ලන්ට ඔහු පලිහක්ය.[14]
31 යෙහෝවා දෙවි හැර වෙන දෙවි කෙනෙක් සිටීද?[15]
අපේ දෙවි පර්වතයකි. ඔහුට සමාන තවත් කෙනෙක් සිටීද?[16]
32 සැබෑ දෙවි මාගේ ඉහටිය, ශක්තිය නමැති පටියෙන් බඳින්නේය.[17]
ඔහු මාගේ මාවත සමතලා කරන්නේය.[18]
33 මුවදෙනෙකු මෙන් දිවීමට ඔහු මට උපකාර කරන්නේය.[1]
මට තනිව යා නොහැකි උස් තැන්වලට ඔහු මාව ගෙන යන්නේය.[2]
34 ඔහු මට සටන් කිරීමට උගන්වන්නේය.[3]
ඔහුගේ උපකාරය ඇතුව මාගේ දෑතින් මම තඹ දුන්නක් වුවත් නමන්නෙමි.[4]
35 ඔබේ ගැලවීම නමැති පලිහ ඔබ මට දෙන්නෙහිය.[5]
ඔබේ දකුණතින් මාව සුරකින්නෙහිය.[6]
ඔබ යටහත්පහත් කෙනෙක් නිසා මාව උසස් තත්වයකට ගෙනෙන්නෙහිය.[7]
36 ඔබ මා ගමන් කරන මඟෙහි අවහිර තැන් සකසන්නෙහිය.[8]
එබැවින් මාගේ පාද කිසිසේත් නොලිස්සන්නේය.[9]
37 මම මාගේ සතුරන් පසුපස ලුහුබැඳ ගොස් ඔවුන්ව අල්ලාගන්නෙමි.
ඔවුන්ව මුළුමනින්ම විනාශ කරන තුරු ආපසු හැරී නොඑන්නෙමි.[10]
38 ඔවුන්ට නැවත හිස එසවිය නොහැකි වන සේ මම ඔවුන්ව කැබලි කරන්නෙමි.[11]
ඔවුන්ව පාගා දමන්නෙමි.[12]
39 ඔබ මාගේ ඉහටිය, ශක්තිය නමැති පටියෙන් බැඳ මාව සටනට සූදානම් කරන්නෙහිය.
මට විරුද්ධව නැඟී සිටින අයව ඔබ මා ඉදිරියේම වැටෙන්න සලස්වන්නෙහිය.[13]
40 ඔබ මාගේ සතුරන්ව මට යටත් කර දෙන බැවින්[14] ඔවුහු මා වෙතින් පලා දුවන්නෝය.
මට ඇඩි සේ වෛර කරන අයව මම විනාශ කරන්නෙමි.[15]
41 ඔවුන් උපකාර පතා මොරගැසුවත්

15 2සාමු 22:41; ගීතා 21:8; ගීතා 34:21.

**18 ගීතාවලිය**
1 2සාමු 22:25 හිතෝ 5:21
2 ගීතා 97:10 යෙරෙ 3:12
3 යෝබ් 34:11 යෙරෙ 32:19
4 දානි 12:10 මතෙ 5:8
5 2සාමු 22:27 ගීතා 125:5
6 යෝබ් 34:28
7 යෝබ් 10:16 යෝබ් 40:11 හිතෝ 6:17 යෙසා 2:11 ලූක් 18:14
8 2සාමු 22:29 ගීතා 132:17
9 ගීතා 97:11 යෙසා 42:16
10 2සාමු 5:19 පිලි 4:13 හෙබ්‍රෙ 11:34
11 2සාමු 22:30
12 ද්වි 32:4 2සාමු 22:31 දානි 4:37 එළි 15:3
13 ගීතා 12:6 ගීතා 19:8 ගීතා 119:140
14 ගීතා 18:2 ගීතා 84:11 හිතෝ 30:5
15 1සාමු 2:2 2සාමු 22:32 ගීතා 86:8 යෙසා 45:5
16 ද්වි 32:31
17 ගීතා 28:7 ගීතා 84:7
18 2සාමු 22:33 යෙසා 26:7

**2 තීරුව**
1 හබ 3:19
2 ද්වි 32:13 2සාමු 22:34
3 ගීතා 144:1
4 2සාමු 22:35
5 උත් 15:1 ද්වි 33:29 ගීතා 28:7
6 ගීතා 17:7
7 2සාමු 22:36 ගීතා 113:6
8 ගීතා 4:1
9 2සාමු 22:37 ගීතා 17:5
10 2සාමු 22:38
11 ගීතා 2:9 ගීතා 110:5
12 2සාමු 22:39 ගීතා 110:6
13 2සාමු 22:40 ගීතා 44:5 ගීතා 144:2
14 උත් 49:8 නික් 23:27 යොෂු 10:24

ඔවුන්ව ගලවාගන්න කිසිවෙක් පැමිණියේ නැත.[1]
ඔවුන් යෙහෝවා දෙවිට මොරගැසුවත් ඔහු ඔවුන්ට පිළිතුරු දෙන්නේ නැත.[2]
**42** මම ඔවුන්ව පොඩි කර, සුළඟට ගසාගෙන යන දූවිලි මෙන් වීමට සලස්වන්නෙමි.[3]
පාරේ තිබෙන මඩ මෙන් මම ඔවුන්ව විසුරුවාහරින්නෙමි.[4]
**43** සෙනඟ මට කරන චෝදනාවලින් ඔබ මාව නිදහස් කරන්නෙහිය.[5]
ජාතීන් කෙරෙහි නායකයා ලෙස ඔබ මාව පත් කරන්නෙහිය.[6]
මා කලින් නොදත් සෙනඟක් මට සේවය කරනු ඇත.[7]
**44** මා ගැන අසන්න ලැබුණු වහාම ඔවුහු මට කීකරු වනු ඇත.[8]
විදේශිකයෝ පවා භයෙන් වෙවුලමින් මා වෙතට පැමිණ මට යටත් වනු ඇත.[9]
**45** විදේශිකයෝ පසුබසිති.
ඔවුහු භයෙන් ගැහිගැහී තමන්ගේ බලකොටුවලින් එළියට පැමිණෙති.[10]
**46** යෙහෝවා දෙවි ජීවමානය.[11]
මාගේ පර්වතය වන දෙවිට[12] ප්‍රශංසාව ලැබේවා!
මට ගැලවීම ලබා දෙන දෙවි සියල්ලන්ගේ පැසසුමට ලක් වේවා![13]
**47** සැබෑ දෙවි මා වෙනුවෙන් යුක්තිය ඉටු කරන්නේය.[14]
ජාතීන්ව මට යටත් කර දෙන්නේය.[15]
**48** කෝපයෙන් වියරු වැටුණු මාගේ සතුරන්ගෙන් ඔහු මාව බේරාගන්නේය.[16]
මට විරුද්ධව නැඟී සිටින අයට හසු නොවන සේ ඔබ මාව ඉහළින් තබන්නෙහිය.[17]
ආමරිකයාගේ අතින් ඔබ මාව මුදාගන්නෙහිය.[18]
**49** එබැවින් යෙහෝවා දෙවියනි, ජාතීන් ඉදිරියේ මම ඔබට ප්‍රශංසා කරන්නෙමි.[1]
ඔබේ නාමයට ප්‍රශංසා ගී ගයන්නෙමි.[2]
**50** තමා පත් කළ රජුව ගලවාගැනීමට දෙවි මහත් ක්‍රියා කරන්නේය.[3]
ඔහුගේ අභිෂේක ලත් තැනැත්තාට ඔහු ප්‍රේමය* පෙන්වන්නේය.[4]
දෙවි, දාවිත්ටත් ඔහුගෙන් පැවතෙන්නන්ටත් සදහටම එසේ කරන්නේය.[5]

සංගීත අධ්‍යක්ෂක වෙතය.
දාවිත් රචනා කළ ගීතයකි.

**19** අහස, දෙවිගේ බලමහිමය ප්‍රකාශ කරයි.[6]
ගුවන්තලය, ඔහු තම දෑතින් නිර්මාණය කළ දේට සාක්ෂි දෙයි.[7]
**2** සෑම දහවලක්ම දෙවිගේ තේජස කියාපායි.[8]
සෑම රාත්‍රියක්ම නිමක් නෙරක් නැති ඔහුගේ දැනුම විදහාපායි.[9]
**3** ඒවා කතා නොකරයි. වචනයක්වත් පිට නොකරයි.
කිසිදු හඬක් නොඇසෙයි.[10]
**4** නමුත් ඒවායින් දෙන සාක්ෂිය මුළු පොළෝතලය පුරා පැතිරී යන්නේය.[11]
ඒවායින් කියාපාන දේ පොළොවේ කෙළවර දක්වාම පැතිරී යන්නේය.[12]
දෙවි සූර්යයාට කූඩාරමක් එහි සාදා ඇත.[13]
**5** හිරු කුමරු, විවාහ යහනෙන් නික්මෙන මනාලයෙකු වැනිය.[14]
තමාගේ ගමන දිවීමට ප්‍රීති-

**18 ගීතාවලිය**
**1** 2සාමු 22:42
**2** යෝබ් 35:12; හිතෝ 1:28; යෙසා 1:15; යෙරෙ 11:11; යෙරෙ 14:12; මීකා 3:4; සෙක 7:13
**3** 2සාමු 22:43
**4** යෙසා 10:6; සෙක 10:5; මලා 4:3
**5** 1සාමු 30:6; 2සාමු 22:44
**6** 2සාමු 8:3; ගීතා 2:8; 1තිමෝ 6:15; එළි 19:16
**7** යෙසා 55:5; යෙසා 65:1; ක්‍රියා 15:14
**8** 2සාමු 22:45
**9** ද්වි 33:29
**10** 2සාමු 22:46; මීකා 7:17
**11** 2සාමු 22:47; යෙරෙ 10:10; 1තිමෝ 4:10
**12** ද්වි 32:4
**13** නික් 15:2
**14** ද්වි 32:35; 2සාමු 22:48; ගීතා 94:1; නාහු 1:2; රෝම 12:19
**15** ගීතා 47:3; 1කොරි 15:25
**16** ගීතා 59:1
**17** 2සාමු 7:9
**18** 2සාමු 22:49; ගීතා 140:1

**2 තීරුව**
**1** ද්වි 32:43; ගීතා 117:1; යෙසා 11:10; රෝම 15:9
**2** 1ලේක 16:9; ගීතා 108:3
**3** 1සාමු 2:10; ගීතා 2:6; ගීතා 144:10
**4** 2සාමු 7:15; 1රාජා 3:6; ගීතා 89:20
**5** ගීතා 89:36; යෙසා 9:7; ලූක් 1:33; එළි 5:5

**19 ගීතාවලිය**
**6** ගීතා 8:3; ගීතා 69:34; ගීතා 115:15; ගීතා 148:3; යෙසා 40:22; රෝම 1:20; 1කොරි 15:40
**7** උත් 1:6; ගීතා 150:1; එළි 4:11; **8** ගීතා 65:8; ගීතා 74:16; **9** උත් 1:5; උත් 1:14; උත් 8:22; ගීතා 136:9; **10** යෝබ් 31:26; **11** යෝබ් 38:5; **12** යෙසා 49:6; රෝම 10:18; **13** යෝබ් 22:14; දේශ 1:5; **14** යෙසා 61:10.

**ගීතා 18:50*** හෝ, “ළැදි ප්‍රේමය.”

යෙන් සූදානමින් සිටින ශක්-
තිමත් මිනිසෙකු වැනිය.[1]
6 එය අහසේ එක් කෙළවරකින්
නික්ම ඇවිත්
අනික් කෙළවරින් තම ගමන
අවසන් කරයි.[2]
එහි රස්නය නොදැනෙන කිසි-
වක් නැත.[3]
7 යෙහෝවා දෙවිගේ නීතිය[4] පරිපූර්-
ණය.[5] එය කෙනෙකුව හරි
මාර්ගයට ගෙනෙන්නේය.[6]
යෙහෝවා දෙවිගේ සිහිගැන්-
වීම්[7] විශ්වාසවන්තය.[8] ඒවා
අද්දැකීම් අඩු තැනැත්තාට
ප්‍රඥාව ලබා දෙන්නේය.[9]
8 යෙහෝවා දෙවිගේ නියෝග[10]
සාධාරණය.[11] ඒවා සිතට
සතුටක් ගෙන දෙන්නේය.[12]
යෙහෝවා දෙවිගේ ආඥා[13] පවි-
ත්‍රය.[14] ඒවා ඇස් දීප්තිමත්
කරන්නේය.[15]
9 යෙහෝවා දෙවි කෙරෙහි ඇති
ගරුබිය[16] කෙනෙකුව පවිත්‍ර
කරන්නේය. එය සදහටම
පවතින්නේය.
යෙහෝවා දෙවිගේ තීන්දු[17]
නිවැරදිය.[18] ඒවා මුළුමු-
නින්ම යුක්තිසහගතය.[19]
10 රන්වලට වඩා එසේය, පවිත්‍ර රන්
රාශියකට වඩා ඒවාට ආශා
විය යුතුය.[20]
ඒවා මීපැණිවලට[21] එසේය, මීව-
දයෙන් වෑස්සෙන පවිත්‍ර
මීපැණිවලට වඩා මිහිරිය.[22]
11 ඒවායින් ඔබේ සේවකයාට අන-
තුරු ඇඟවීම් ලැබෙන්-
නේය.[23]
ඒවා පිළිපැදීමෙන් බොහෝ
ආශීර්වාද ලැබෙන්නේය.[24]
12 තමා කළ වැරදි සියල්ල දැනගත
හැක්කේ කාටද?[25]
මා නොදැනුවත්ව කළ පාපව-
ලට* මට සමාව දෙන්න.[26]

ගීතා 19:12* හෝ, “රහසින් කළ පව්වලට.”

19 ගීතාවලිය
1 යෙරෙ 33:20
2 ගීතා 104:19
3 උත් 31:40
යෙසා 49:10
මතෙ 20:12
4 ද්වි 33:4
ගීතා 1:2
ගීතා 78:1
5 ගීතා 119:72
මතෙ 5:17
ලූක් 2:22
රෝම 2:13
රෝම 7:14
රෝම 7:22
රෝම 9:31
6 2සාමු 16:12
1රාජා 8:47
ගීතා 23:3
එස 18:27
එස 33:15
රෝම 10:5
7 ගීතා 119:111
ගීතා 119:129
ගීතා 132:12
2පේතෘ 3:1
8 2රාජා 17:15
ගීතා 93:5
9 හිතෝ 1:5
2තිමෝ 3:15
10 ද්වි 1:26
1සාමු 12:14
ගීතා 111:7
11 ගීතා 33:4
12 2ලේක 24:10
ගීතා 40:8
ගීතා 119:7
13 ද්වි 6:1
හිතෝ 4:4
මතෙ 15:3
14 නෙහෙ 9:13
15 ගීතා 13:3
හිතෝ 6:23
මතෙ 6:22
16 ද්වි 10:12
හිතෝ 1:7
මලා 3:16
17 නික් 21:1
ගණන් 15:35
නෙහෙ 9:13
ගීතා 119:137
18 ගීතා 119:160
එළි 16:7
19 ද්වි 4:8
20 ගීතා 119:127
හිතෝ 8:10
21 ගීතා 119:103
හිතෝ 16:24
22 1සාමු 14:27
23 2ලේක 19:10
ගීතා 119:11
24 ගීතා 119:165
හිතෝ 11:18
25 ගීතා 40:12
1කොරි 4:4
26 ලෙවී 4:2
ගීතා 90:8

13 හිතුවක්කාර ලෙස ක්‍රියා කිරීමට
ඔබේ සේවකයාට ඉඩ නො-
දෙන්න.[1]
එවැනි ක්‍රියාවලට වහල් වීමට
මට ඉඩ නොදෙන්න.[2]
එවිට නිර්දෝෂ ජීවිතයක් ගත
කිරීමට මට හැකියාව
ලැබෙන්නේය.[3]
මා අතින් සිදු වන වැරදිද අල්ප
වන්නේය.
14 මාගේ පර්වතයද[4] මාගේ ගැලවුම්-
කරුද වන යෙහෝවා දෙවි-
යනි,[5]
මාගේ මුවින් පිට වන වචනද
මාගේ සිතේ සිතුවිලිද[6] සැම-
විටම ඔබ ඉදිරියේ ප්‍රසන්නව
තිබේවා!

සංගීත අධ්‍යක්ෂක වෙතය.
දාවිත් රචනා කළ ගීතයකි.

20 ඔබේ විපත්ති කාලයේදී යෙ-
හෝවා දෙවිගෙන් ඔබට
පිළිතුරු ලැබේවා![7]
යාකොබ්ගේ දෙවිගේ නාමය
ඔබට ආරක්ෂාවක් වේවා![8]
2 ශුද්ධස්ථානයේ සිට ඔහුගෙන්
ඔබට උපකාර ලැබේවා![9]
සියොන්හි සිට ඔබව ශක්තිමත්
කරනු ලැබේවා![10]
3 ඔබ ඔප්පු කළ තෑගි පූජා සියල්ල
ඔහු සිහි කරනු ලැබේවා![11]
ඔබේ දවන පූජා ඔහු පිළිගනු
ලැබේවා![12] සේලාහ්.
4 ඔබේ සිතේ ආශාව ඔහු ඉටු කරනු
ලැබේවා![13]
ඔබේ සියලු සැලසුම් ඔහු සාර්-
ථක කරනු ලැබේවා![14]
5 ඔබට ලැබුණු ගැලවීම නිසා අපි
ප්‍රීති ඝෝෂා නඟන්නෙමු.[15]

**2 තීරුව** **1** උත් 20:6; ද්වි 17:12; 1සාමු 15:23; 2සාමු 6:7; 2ලේක 26:16; **2** ගීතා 119:133; **3** යෙසා 38:3; **4** ගීතා 18:2; **5** යෝබ් 19:25; හිතෝ 23:11; යෙසා 43:14; යෙසා 44:6; **6** ගීතා 49:3; ගීතා 51:15; ගීතා 77:12; ගීතා 143:5; පිලි 4:8; **20 ගීතාවලිය** **7** උත් 35:3; 2සාමු 4:9; **8** ගීතා 9:10; හිතෝ 18:10; **9** 2ලේක 20:8; **10** 2සාමු 5:7; ගීතා 50:2; ගීතා 134:3; යෙසා 12:6; **11** ක්‍රියා 10:4; **12** ලෙවී 9:24; 1ලේක 21:26; 2ලේක 7:1; **13** ගීතා 21:2; **14** හිතෝ 20:5; **15** ගීතා 35:9; ගීතා 51:14; ගීතා 59:16; ලූක් 1:47.

අපේ දෙවිගේ නාමය අපි ගෞර-
වයට පත් කරන්නෙමු.[1]
ඔබේ සියලු ඉල්ලීම් යෙ-
හෝවා දෙවි ඉටු කර දෙනු
ලැබේවා![2]
6 යෙහෝවා දෙවි තම අභිෂේක
ලත් තැනැත්තාව අනිවාර්-
යයෙන්ම ගලවන බව දැන්
මම දනිමි.[3]
දෙවිගේ ශුද්ධ වාසස්ථානය වන
ස්වර්ගයේ සිට දෙවි ඔහුට
පිළිතුරු දෙන්නේය.[4]
දෙවි තම හස්තයෙන් බලවත්
ක්‍රියා කර ඔහුට ගැලවීම
ලබා දෙන්නේය.[5]
7 සමහරු තමන් සතු අශ්ව රථ
ගැනද තවත් සමහරු අශ්ව-
යන් ගැනද ආඩම්බරයෙන්
කතා කළෝය.[6]
නමුත් අපි අපේ දෙවිගේ නාමය
ගැන එනම්, යෙහෝවා යන
ඔහුගේ නාමය ගැන එකි-
නෙකා සමඟ කතා කළෙමු.[7]
8 ඔවුහු පරාජය වී වැටුණෝය.[8]
නමුත් අපි ස්ථිරව නැඟිට සිටි-
යෙමු.[9]
9 අනේ යෙහෝවා දෙවියනි, රජුව
බේරාගන්න![10]
අප හඬගසන දවසේදී දෙවි
අපට පිළිතුරු දෙන්නේය.[11]

සංගීත අධ්‍යක්ෂක වෙතය.
දාවිත් රචනා කළ ගීතයකි.

21 යෙහෝවා දෙවියනි, ඔබ ලබා
දෙන ශක්තිය නිසා රජු
ප්‍රීති වන්නේය.[12]
ඔබ දෙන ගැලවීම නිසා ඔහු
නිරන්තරයෙන් ප්‍රීති වන්-
නේය.[13]
2 ඔහුගේ සිතේ ආශාව ඔබ ඉටු
කළෙහිය.[14]
ඔහුගේ මුවින් ඉල්ලූ දේ
ඔබ නොදී නොසිටියෙහිය.[15]
සේලාහ්.
3 ඔබ ඔහුට ආශීර්වාද කර යහ-
පත් දේවල් බහුලව සැපයු-
වෙහිය.[16]
පිරිසිදු රනින් නිමැවූ ඔටුන්නක්
ඔහුගේ හිසේ තැබුවෙහිය.[1]
4 ඔහු ඔබෙන් දීර්ඝායුෂ ඉල්ලුවේය.
ඔබ ඔහුට එය දුන්නෙහිය.[2]
නිමක් නැති ජීවිතයක් ලබා
දීමෙන් ඔබ ඔහුගේ ආයුෂ
වැඩි කළෙහිය.[3]
5 ඔබ දෙන ගැලවීම නිසා ඔහුට
මහත් තේජසක් ලැබෙන්-
නේය.[4]
ඔබ ඔහුව ගෞරවයෙන්ද තේජ-
සින්ද පළඳවන්නෙහිය.[5]
6 ඔබ ඔහුට සදහටම බොහෝ සෙ-
යින් ආශීර්වාද කරන්නෙ-
හිය.[6]
ඔබ සමඟ සිටීමෙන් ලැබෙන
ප්‍රීතිය අද්දැකීමට ඔබ ඔහුට
සලස්වන්නෙහිය.[7]
7 මන්ද රජුගේ විශ්වාසය යෙහෝවා
දෙවි කෙරෙහිය.[8]
ඔහු මහෝත්තමයාණන්ගේ
මහත් ප්‍රේමය* කෙරෙහි විශ්-
වාසය තබන්නේය. ඒ නිසා
ඔහු කිසිදාක නොසෙල්වෙන්-
නේය.[9]
8 ඔබේ සියලු සතුරෝ ඔබේ අතට
හසු වෙති.[10]
ඔබට වෛර කරන අය ඔබේ
දකුණතට හසු වෙති.
9 නියමිත කාලයේදී ඔබ ඔවුන්ට
විරුද්ධව පැමිණෙන විට ගිනි
උදුනකට දැමූ අය මෙන්
ඔවුහු දැවී යන්නෝය.[11]
යෙහෝවා දෙවි කෝපයෙන්
ඔවුන්ව ගිල දමන්නේය.
ගින්නෙන් ඔවුහු දැවී යන්-
නෝය.[12]
10 ඔබ ඔවුන්ගෙන් පැවතෙන්නන්
පොළොවෙන් තුරන් කරන්-
නෙහිය.[13]
ඔවුන්ගේ පෙළපත මනුෂ්‍යයන්
අතරෙන් නැති කර දමන්-
නෙහිය.[14]
11 මන්ද ඔවුහු ඔබට විරුද්ධව

20 ගීතාවලිය
1 1සාමු 17:45
2 මතෙ 7:7
3 ගීතා 2:2
ගීතා 105:15
ලූක් 18:7
4 1රාජා 8:30
ගීතා 18:9
5 ගීතා 17:7
6 ගීතා 33:17
හිතෝ 21:31
යෙසා 31:1
හොෂෙ 1:7
7 2ලේක 14:11
2ලේක 20:12
2ලේක 32:8
8 විනි 5:31
9 ගීතා 125:1
10 ගීතා 18:50
11 ගීතා 44:4

21 ගීතාවලිය
12 ගීතා 63:11
13 ගීතා 28:7
14 ගීතා 2:8
15 ගීතා 20:4
16 2ලේක 6:41
ගීතා 31:19

2 තීරුව
1 2සාමු 12:30
2 ගීතා 13:3
ගීතා 61:6
3 ගීතා 89:29
ගීතා 91:16
4 2සාමු 7:9
හෙබ්‍රෙ 8:1
5 දානි 7:14
6 ගීතා 72:17
7 ගීතා 16:11
ගීතා 45:7
ක්‍රියා 2:28
8 1සාමු 30:6
මතෙ 27:43
හෙබ්‍රෙ 2:13
9 ගීතා 16:8
10 ගීතා 2:9
11 දේශ 3:8
මලා 4:1
2තෙස 1:8
12 ද්වි 32:22
ගීතා 110:5
13 1රාජා 13:34
ගීතා 9:5
ගීතා 37:28
මතෙ 25:46
14 ගීතා 109:13
යෙසා 14:20

ගීතා 21:7* හෝ, "ලැදි ප්‍රේමය."

නපුරු දේ කිරීමට උත්සාහ කළෝය.[1]
ඔවුහු තමන්ට ක්‍රියාත්මක කළ නොහැකි දේවල් සැලසුම් කළෝය.[2]
12 ඔබ ඔවුන්ට පලා දුවන්න සලස්වන්නෙහිය.[3]
ඔවුන්ගේ මුහුණට දුන්නෙන් විදීමට ඔබ සූදානමින් සිටින්නෙහිය.[4]
13 යෙහෝවා දෙවියනි, ඔබේ බලය විදහා ඔබ බලවත් දෙවි කෙනෙක් බව පෙන්වන්න.[5]
අපි ඔබේ මහත් බලය ගැන ගී ගයමින් ඔබට ප්‍රශංසා කරන්නෙමු.[6]

සංගීත අධ්‍යක්ෂක වෙතය. අලුයම් මුවදෙන නම් වූ රිද්මය ඇතුව ගායනා කිරීම සඳහාය. දාවිත් රචනා කළ ගීතයකි.

**22** මාගේ දෙවියනි, මාගේ දෙවියනි, ඔබ මා අත්හැරියේ මන්ද?[7]
ඔබ මා ගලවා නොගන්නේ මන්ද?[8]
මාගේ කෙඳිරීමේ හඬට සවන් නොදෙන්නේ මන්ද?[9]
2 මාගේ දෙවියනි, මම දිවා කාලයේදී ඔබට නොකඩවා හඬගසමි. නමුත් ඔබ මට පිළිතුරු නොදෙන්නෙහිය.[10]
රාත්‍රියේද මම නිහඬව නොසිට ඔබට හඬගසමි.[11]
3 ඔබ ශුද්ධය.[12]
ඊශ්‍රායෙලයෙන් නැඟෙන ප්‍රශංසාවලින් ඔබ වට වී සිටින්නෙහිය.[13]
4 අපේ පියවරුන් විශ්වාසය තැබුවේ ඔබ කෙරෙහිය.[14]
එබැවින් ඔබ ඔවුන්ට ගැලවීම අත් කර දුන්නෙහිය.[15]
5 ඔවුන් ඔබට හඬගැසූ නිසා[16] ඔබගේ ආරක්ෂාව ඔවුන්ට ලැබුණේය.[17]
ඔවුන් ඔබ කෙරෙහි විශ්වාසය තැබූ නිසා කිසිදා ලැජ්ජාවට පත් නොවුණේය.[18]
6 මම මිනිසෙකු නොව නිකම්ම නිකම් පණුවෙකි.[1]
මිනිසුන්ට නින්දාවකි. ජනයාට පිළිකුලකි.[2]
7 මාව දකින සියල්ලෝ මට අවමන් කරති.[3]
ඔවුහු හිස වනමින් සමච්චලේට මෙන් මෙසේ කියති.[4]
8 “ඔහු යෙහෝවා දෙවිට භාර වුණා.[5] ඒ නිසා දෙවිම ඇවිත් ඔහුව බේරාගනියි.[6]
දෙවිට ඔහුව ප්‍රසන්න නම් දෙවි ඔහුව ගලවාගනියි.”[7]
9 මට මව්කුසින් මෙලොව එළිය දකින්න සැලැස්වුවේ ඔබයි.[8]
මවගේ ළයෙහි සිටියදී මට සුරක්ෂිතබවක් දැනෙන්න සැලැස්වුවේ ඔබයි.[9]
10 මව්කුසේ සිට මා සිටියේ ඔබේ රැකවරණය යටතේය.[10]
මව්කුසේ පටන් ඔබ මාගේ දෙවිය.[11]
11 මා අසලටම විපත්ති පැමිණ තිබෙන නිසා මාගෙන් ඈත්ව නොයන්න.[12]
මන්ද ඔබ හැර වෙන පිළිසරණක් මට නැත.[13]
12 ගව රැළක් මා වට කර සිටිති.[14]
බාෂාන්හි ශක්තිමත් ගවයෝ මා වටා සිටිති.[15]
13 සිංහයෙකු ගොරවමින් ගොදුර ඉරා දමන්නාක් මෙන්[16]
ඔවුහු මට විරුද්ධව කට ඇරියෝය.[17]
14 වතුර බිමට හැළෙන්නාක් මෙන් මාගේ ශක්තිය මාගෙන් පහව ගියේය.[18]
මාගේ ඇටකටු සියල්ල සන්ධිවලින් වෙන් වී ඇත.[19]
මාගේ හදවත ඉටි මෙන් උණු වී[20]

**21 ගීතාවලිය**
**1** ගීතා 5:10 ගීතා 34:16
**2** ගීතා 2:1 ගීතා 83:4
**3** ගීතා 9:3 ගීතා 56:9
**4** ගීතා 7:13 ගීතා 64:7
**5** ගීතා 46:10
**6** එළි 11:17 එළි 15:3 එළි 18:20

**22 ගීතාවලිය**
**7** ගීතා 22:16 ගීතා 31:14 මතෙ 27:46 මාක් 15:34
**8** ගීතා 26:9 හෙබ්‍රෙ 5:7
**9** යෝබ් 3:24 ගීතා 38:8
**10** ගීතා 42:3 ගීතා 88:1
**11** ලූක් 18:7
**12** යෙසා 6:3 යොහ 17:11 1පේතෘ 1:15
**13** ද්වි 10:21 ගීතා 65:1
**14** උත් 15:6 හෙබ්‍රෙ 11:33
**15** නික් 14:13
**16** ගීතා 99:6 ගීතා 106:44
**17** 1කොරි 10:13
**18** ගීතා 25:2 යෙසා 49:23 රෝම 10:11

**2 තීරුව**
**1** යෝබ් 25:6 යෙසා 41:14
**2** ගීතා 31:11 යෙසා 53:3 යොහ 7:15
**3** ගීතා 35:16 මතෙ 5:11 මතෙ 9:24 ලූක් 16:14
**4** යෝබ් 16:4 ගීතා 44:14 ගීතා 109:25 මතෙ 27:39
**5** ගීතා 37:5
**6** මතෙ 27:43 ලූක් 23:35
**7** ගීතා 18:19 ගීතා 91:14
**8** ගීතා 71:6 ගීතා 139:16
**9** ලූක් 11:27
**10** යෙසා 46:3
**11** යෙසා 49:1 ලූක් 1:42 ගලා 1:15

---

**12** ගීතා 10:1; හෙබ්‍රෙ 5:7; **13** ගීතා 72:12; ලූක් 23:46; **14** ගීතා 68:30; **15** යෙසා 53:7; එස 39:18; ආමො 4:1; මතෙ 27:1; **16** ගීතා 57:4; 1පේතෘ 5:8; **17** යෝබ් 16:10; ගීතා 35:21; විලා 2:16; මතෙ 26:4; **18** යොෂු 7:5; **19** දානි 5:6; ලූක් 22:44; **20** යෝබ් 23:16; යොහ 12:27.

ඇතුළාන්තයටම ගලා ගොස් ඇත.[1]
15 මාගේ ශක්තිය පහව ගොස් ඇත. මා දැන් බිඳී ගිය වළඳක් මෙනි.[2]
මාගේ දිව උඩුතල්ලේ ඇලී ඇත.[3]
මිනී වළට ඔබ මා නියම කළෙහිය.[4]
16 බල්ලෝ මා වට කරගෙන සිටිති.[5]
අපරාධකරුවෝ එකතු වී මාව කොටු කරගෙන සිටිති.[6]
සිංහයෙකු මෙන් ඔවුහු මාගේ අත් පා හපා කති.[7]
17 මාගේ ඇටකටු සියල්ල ගණන් කළ හැක.[8]
ඔවුහු මා දෙස බලා සිටින්නෝය.[9]
18 ඔවුහු මාගේ පිට වස්ත්‍ර තමන් අතරේ බෙදාගත්තෝය.[10]
මාගේ ඇඳුම් සඳහා ආදු දැමුවෝය.[11]
19 අනේ යෙහෝවා දෙවියනි, මාගෙන් ඈත්ව නොයන්න.[12]
මාගේ ශක්තිය වන ඔබ,[13] ඉක්මනින්ම මාගේ උපකාරයට පැමිණෙන්න.[14]
20 මාගේ ජීවිතය කඩුවෙන් බේරාගන්න.[15]
බල්ලාගේ ග්‍රහණයෙන් මාගේ වටිනා ජීවිතය බේරාගන්න.[16]
21 සිංහ කටින් මාව ගලවාගන්න.[17]
මට ඇහුම්කන් දී වල්හරකුන්ගේ අංවලින් මාව බේරාගන්න.[18]
22 මාගේ සහෝදරයන්ට[19] මම ඔබේ නාමය ප්‍රකාශ කරන්නෙමි.[20]
සභාව මැදදී ඔබට ප්‍රශංසා කරන්නෙමි.[21]
23 යෙහෝවා දෙවි කෙරෙහි ගරුබිය ඇත්තෙනි, ඔහුට ප්‍රශංසා කරන්න![22]
යාකොබ්ගෙන් පැවතෙන්නෙනි, දෙවිව ගෞරවයට පත් කරන්න![23]
ඊශ්‍රායෙල්ගෙන් පැවතෙන්නෙනි, දෙවිට ගරුබිය දක්වන්න.[1]
24 ඔහු පීඩිතයාව හෙළාදැක්කේවත්[2] ඔහුව පිළිකුලක් ලෙස සැලකුවේවත් නැත.[3]
ඔහු ඒ පීඩිතයාගෙන් තම මුහුණ ඉවතට හරවාගත්තේ නැත.[4]
උපකාර ඉල්ලා මොරගැසූ විට ඔහු ඔහුට ඇහුම්කන් දුන්නේය.[5]
25 ඔබ කර ඇති සියලු දේ නිසා මහත් සෙනඟක් අතරේ මම ඔබට ප්‍රශංසා කරමි.[6]
මා දුන් පොරොන්දු ඔබට ගරුබියක් ඇති අය ඉදිරියේ ඉටු කරමි.[7]
26 යටහත්පහත් අය කා බී තෘප්තිමත් වන්නෝය.[8]
යෙහෝවා දෙවිගේ මඟ පෙන්වීම් පතන අය ඔහුට ප්‍රශංසා කරන්නෝය.[9]
ඔබේ සිත් සදහටම ප්‍රාණවත්ව තිබේවා![10]
27 පොළොවේ සතර දිගින් ජනයා යෙහෝවා දෙවිව සිහි කර ඔහු වෙතට හැරී එන්නෝය.[11]
ජාතීන් අතරේ සිටින සියලු ගෝත්‍ර ඔබ ඉදිරියේ වැඳ වැටෙන්නෝය.[12]
28 මන්ද රජකම අයිති යෙහෝවා දෙවි වන ඔබටය.[13]
ඔබ ජාතීන්ව පාලනය කරන්නෙහිය.[14]
29 කා බී තෘප්තියෙන් සිටින පොළොවේ ධනවන්තයෝ ඔබ ඉදිරියේ වැඳ වැටෙති.[15]
දූවිල්ලට හැරී යන සියල්ලෝද ඔබ ඉදිරියේ වැඳ වැටෙති.[16]
මන්ද ඔවුන්ගෙන් කිසිවෙකුට තම ජීවිතය රැකගත නොහැක.[17]

**22 ගීතාවලිය**
**1** ද්වි 20:8; මතෙ 26:38; මාක් 14:33
**2** හිතෝ 17:22
**3** විලා 4:4; යොහ 19:28
**4** උත් 3:19; ගීතා 30:9; යෙසා 53:12; 1කොරි 15:4
**5** ගීතා 59:6; ලූක් 22:63; පිලි 3:2; එළි 22:15
**6** ගීතා 86:14; ලූක් 11:53
**7** යෙසා 53:7; මතෙ 27:35; යොහ 20:25
**8** ගීතා 34:20; යොහ 19:36
**9** මතෙ 27:36; ලූක් 23:35
**10** යොහ 19:24
**11** මාක් 15:24
**12** ගීතා 10:1
**13** ගීතා 18:1
**14** ගීතා 40:13
**15** ගීතා 17:13; ගීතා 37:17
**16** ගීතා 22:16
**17** ගීතා 35:17; 2තිමෝ 4:17
**18** ද්වි 33:17; යොහ 8:59; ක්‍රියා 4:27
**19** මතෙ 12:49; යොහ 20:17; රෝම 8:29; හෙබ්‍රෙ 2:11; හෙබ්‍රෙ 2:17
**20** යොහ 17:6; හෙබ්‍රෙ 2:12
**21** ගීතා 40:9; හෙබ්‍රෙ 2:12
**22** ගීතා 135:20; ලූක් 1:50; ක්‍රියා 4:24
**23** ගීතා 50:15; ගීතා 50:23; ලූක් 2:20; 1කොරි 6:20; එළි 15:4

**2 තීරුව**
**1** ද්වි 6:13
**2** ගීතා 69:33
**3** ගීතා 34:6
**4** ගණන් 6:25
**5** හෙබ්‍රෙ 5:7
**6** ගීතා 35:18; ගීතා 40:10; ගීතා 107:32; ගීතා 111:1
**7** දේශ 5:4
**8** ගීතා 37:11; යෙසා 65:13
**9** ශෙප 2:3
**10** යොහ 4:14
**11** යෙසා 66:20

---

**12** උත් 22:18; එළි 7:9; එළි 15:4; **13** 1ලේක 29:11; ඔබ 21; එළි 11:17; **14** ගීතා 47:7; සෙක 14:9; **15** ගීතා 45:12; **16** යෙසා 26:19; පිලි 2:10; **17** ගීතා 49:7.

30 එක් පරම්පරාවක් ඔබට සේවය
කරනු ඇත.[1]
ඔවුහු යෙහෝවා දෙවි වන ඔබ
ගැන මතු පරම්පරාවටත්
පවසනු ඇත.[2]
31 ඔබ කර ඇති මේ දේවල් ගැන
ඔවුහු පවසන්නෝය.
ඔවුහු ඔබේ ධර්මිෂ්ඨකම ගැන[3]
මතු උපදින්නන්ටත් පව-
සන්නෝය.[4]

දාවිත් රචනා කළ ගීතයකි.

23 යෙහෝවා දෙවි මාගේ එඬේ-
රාය.[5]
මට කිසි හිඟයක් නොවන්-
නේය.[6]
2 ඔහු සරු තණබිම්වල මා සතප-
වන්නේය.[7]
සිසිල් දිය ගලා බසින නිසංසල
තැන්වලට මා ගෙන යන්-
නේය.[8]
3 ඔහු මා ප්‍රාණවත් කරන්නේය.[9]
තම නාමය උදෙසා ඔහු ධර්-
මිෂ්ඨ මාවත්වල මා ගෙන
යන්නේය.[10]
4 මම අඳුරු තැනිතලාවක ගමන්
කළත්[11]
කිසිවකට භය නොවන්නෙමි.[12]
මන්ද ඔබ මා සමඟය.[13]
ඔබේ කෙවිටද සැරයටියද මට
සැනසීමකි.[14]
5 මට හිරිහැර කරන අය ඉදිරියේ
ඔබ මට කෑම මේසයක් පිළි-
යෙල කරන්නෙහිය.[15]
ඔබ මාගේ හිස තෙලින් ආලේප
කළෙහිය.[16]
මාගේ කුසලානය පිරී තිබේ.[17]
6 මාගේ ජීවිතයේ සෑම දවසකම
ඔබේ යහපත හා ප්‍රේමය* මා
අද්දකින්නේය.[18]
යෙහෝවා දෙවි වන ඔබේ ගෘහ-
යේ මම සැමදා සිටින්-
නෙමි.[19]

**ගීතා 23:6*** හෝ, “ළැදි ප්‍රේමය.”

**22 ගීතාවලිය**
**1** යෙසා 53:10
**2** 1පේතෘ 2:9
**3** රෝම 1:17
රෝම 3:22
**4** ගීතා 78:6
ගීතා 102:18

**23 ගීතාවලිය**
**5** ගීතා 80:1
යෙරෙ 23:3
එස 34:12
1පේතෘ 2:25
**6** ගීතා 34:9
ගීතා 84:11
මතෙ 6:33
පිලි 4:19
හෙබ්‍රෙ 13:5
**7** එස 34:14
මතෙ 4:4
**8** යෝබ් 34:29
එස 34:13
**9** ගීතා 19:7
ගීතා 51:12
**10** ගීතා 5:8
ගීතා 31:3
හිතෝ 8:20
**11** යෝබ් 10:21
යෝබ් 38:17
ගීතා 44:19
මතෙ 4:16
ලූක් 1:79
**12** ගීතා 3:6
ගීතා 27:1
යෙසා 41:10
**13** යෙසා 43:2
රෝම 8:31
**14** මීකා 7:14
**15** ගීතා 22:26
ගීතා 31:19
**16** ගීතා 92:10
ලූක් 7:46
යාකො 5:14
**17** ගීතා 16:5
**18** ගීතා 103:17
එෆී 5:9
**19** ගීතා 15:1
ගීතා 27:4
ගීතා 65:4
ගීතා 84:4
ගීතා 122:1
ලූක් 2:37
එළි 21:3

**2 තීරුව**

**24 ගීතාවලිය**
**1** නික් 9:29
නික් 19:5
ද්වි 10:14
1ලේක 29:11
යෝබ් 41:11
1කොරි 10:26
**2** ගීතා 89:11
ගීතා 98:7
**3** උත් 1:9
ගීතා 136:6
**4** යෝබ් 38:11
ගීතා 96:10
ගීතා 104:5
යෙරෙ 5:22

දාවිත් රචනා කළ ගීතයකි.

24 පොළොව හා එහි ඇති
සියල්ල[1]
එසේය, භූමිය හා එහි සියලු
ජීවීන් යෙහෝවා දෙවිට
අයිතිය.[2]
2 ඔහු භූමිය මුහුදට ඉහළින් පිහි-
ටෙව්වේය.[3]
ගංගාවන්ට ඉහළින් එය ස්ථිරව
තැබුවේය.[4]
3 යෙහෝවා දෙවිගේ කන්දට නැඟිය
හැක්කේ කාටද?[5]
ඔහුගේ ශුද්ධස්ථානයට ඇතුල්
විය හැක්කේ කාටද?[6]
4 පිරිසිදු සිතක් ඇති, නිර්දෝෂ ජීවි-
තයක් ගත කරන තැනැත්-
තාටය.[7]
මාගේ නාමයට අගෞරවයක්
ගෙන නොදුන්,[8]
වංක ලෙස දිවුරුම් නොදුන්
තැනැත්තාටය.[9]
5 ඔහුට යෙහෝවා දෙවිගෙන් ආශීර්-
වාද ලැබෙන්නේය.[10]
ගැලවීම සලසා දෙන ඔහුගේ
දෙවි ඔහු ධර්මිෂ්ඨයෙකුයයි
ප්‍රකාශ කරන්නේය.[11]
6 දෙවිගේ මඟ පෙන්වීම් පතන්නේ
එවැනි අයය.
යාකොබ්ගේ දෙවිගෙන් උප-
කාර ඉල්ලන්නේ ඔවුන්ය.[12]
සේලාහ්.
7 “දොරටුවෙනි,[13] තේජවත් රජුට
ඇතුල් වීමට හැකි වන සේ
ඔබේ හිස් ඔසවන්න![14]
පුරාණ දොරටුවෙනි, නැඟිට ඉඩ
සලසා දෙන්න!”[15]
8 “මේ තේජවත් රජු කවුද?”[16]
“ඒ වෙන කිසිවෙකු නොව ශක්-
තියෙන් හා බලයෙන් උසස්
යෙහෝවා දෙවිය.[17]

**5** ගීතා 15:1; යෙසා 2:2; **6** රෝම 11:35; **7** 2සාමු 22:21; ගීතා 37:3; යෙසා 33:15; මතෙ 5:8; **8** උත් 50:20; රෝම 8:29; **9** ගීතා 34:13; මලා 3:5; **10** ගීතා 128:5; මලා 3:10; **11** ගීතා 68:19; යෙසා 12:2; තීත 2:10; **12** ගීතා 27:8; ගීතා 105:4; **13** යෙසා 26:2; **14** 2සාමු 6:15; ගීතා 48:2; ගීතා 97:6; **15** ගීතා 118:19; **16** ගීතා 99:1; **17** ගීතා 93:1; යෙසා 42:13; 1තිමෝ 1:17.

යුද්ධයට දක්ෂ යෙහෝවා දෙ-
වියය."[1]
9 "දොරටුවෙනි, තේජවත් රජුට
ඇතුල් වීමට හැකි වන සේ
ඔබේ හිස් ඔසවන්න![2]
පුරාණ දොරටුවෙනි, නැගිට ඉඩ
සලසා දෙන්න!"[3]
10 "මේ තේජවත් රජු කවුද?"
"ඔහු වෙන කිසිවෙකු නොව
ස්වර්ගයේ සේනාවල අධිප-
තියාණන් වන යෙහෝවා
දෙවිය."[4] සීලාහ්.

දාවිත් රචනා කළ ගීතයකි.

א [ආලෙෆ්]

25 යෙහෝවා දෙවියනි, මාගේ
සියලු සිතුවිලි මම ඔබට
දන්වන්නෙමි.[5]

ב [බේත්]

2 මාගේ දෙවියනි, මා විශ්වාසය
තබන්නේ ඔබ කෙරෙහිය.[6]
එබැවින් මාව ලැජ්ජාවට පත්
වීමට ඉඩ නොදෙන්න.
මාගේ දුකේදී මාගේ සතුරන්ට
සතුටු වීමට ඉඩ නො-
දෙන්න.[7]

ג [ගීමෙල්]

3 ඔබ කෙරෙහි බලාපොරොත්තු
තබන කිසිවෙක් ලැජ්ජාවට
පත් නොවන්නේය.[8]
ලැජ්ජාවට පත් වන්නේ මට
ද්‍රෝහිකම් කිරීමට උත්සාහ
කරන අයය.[9]

ד [දාලෙත්]

4 යෙහෝවා දෙවියනි, ඔබේ මාර්ග
දැනගැනීමට මට උපකාර
කරන්න.[10]
ඔබේ මාවතේ ගමන් කිරීමට
මට උගන්වන්න.[11]

ה [හේ]

5 සත්‍යය නමැති ඔබේ මාවතේ
මාව ගෙන යමින් මට උගන්-
වන්න.[12]
මන්ද ඔබ මට ගැලවීම සලසා
දෙන දෙවිය.[13]

ו [වාව්]

දවස පුරා මා බලාපොරොත්තු
තබන්නේ ඔබ කෙරෙහිය.[1]

ז [ෂායින්]

6 යෙහෝවා දෙවියනි, ඔබ මහත්
ප්‍රේමයකින්* පිරි[2] දයාවන්ත
දෙවි කෙනෙක් බව අමතක
නොකරන්න.[3]
අතීතයේ සිටම ඔබ එම
ගුණාංග විදහාපෙන්වා ඇත.[4]

ח [චේත්]

7 තරුණ වියේදී මා කළ පාපද
මාගේ වැරදිද සිහි නොක-
රන්න.[5]
යෙහෝවා දෙවියනි, ඔබේ
මහත් ප්‍රේමයත්*[6]
යහපත්කමත් මට පෙන්-
වන්න.[7]

ט [ටේත්]

8 යෙහෝවා දෙවි යහපත්ය. අවං-
කය.[8]
ඔහු පව්කාරයන්ට හරි මඟ කියා
දෙන්නේය.[9]

י [යෝද්]

9 ඔහු යටහත්පහත් අයට ඔහු-
ගේ නීති පිළිපැදීමට උපකාර
කරන්නේය.[10]
ඔවුන්ට ඔහුගේ මාර්ගය ගැන
උගන්වන්නේය.[11]

כ [කෆ්]

10 යෙහෝවා දෙවිගේ ගිවිසුම
රකින,[12] ඔහුගේ සිහිගැන්-
වීම්වලට කීකරු වන අයට[13]
ඔහුගේ සියලු මාවත්වල ප්‍රේ-
මය* හා සැබෑකම සම්බ
වන්නේය.

ל [ලාමෙද්]

11 යෙහෝවා දෙවියනි, මම බරපතළ
වැරදි කර ඇත.
ඔබේ නාමය වෙනුවෙන්[14] මාගේ
වැරදිවලට සමාව දෙන්න.[15]

**24 ගීතාවලිය**
1 නික් 15:3; 1සාමු 17:47; 2ලේක 20:15; යෙසා 59:17
2 ගීතා 68:16
3 ගීතා 118:19; ගීතා 122:2
4 1ලේක 29:11; ගීතා 145:1; යෙසා 6:5; එළි 1:8

**25 ගීතාවලිය**
5 ගීතා 86:4; ගීතා 143:8
6 යෙසා 26:3; රෝම 10:11
7 ගීතා 13:4; ගීතා 35:19; ගීතා 41:11
8 ගීතා 69:6
9 ගීතා 31:17; ගීතා 71:13
10 නික් 33:13; ගීතා 5:8; ගීතා 86:11; ගීතා 143:8
11 ගීතා 27:11
12 ගීතා 43:3
13 ගීතා 24:5; ගීතා 88:1

**2 තීරුව**
1 ගීතා 22:2
2 නික් 34:6; ගීතා 69:16; යෙසා 55:3; යෙරෙ 33:11
3 2ලේක 6:42; ගීතා 98:3; ගීතා 103:17; යෙසා 63:15
4 ගීතා 136:1; ලූක් 1:50
5 යෝබ් 13:26; යෙරෙ 3:25
6 ගීතා 6:4; ගීතා 51:1
7 නික් 33:19; ගීතා 27:13
8 ගීතා 92:15; ගීතා 119:68; ගීතා 145:9; නාහු 1:7; සෙක 9:17; ක්‍රියා 14:17
9 ගීතා 119:33; යෙසා 30:20; මීකා 4:2
10 ශෙප 2:3
11 ගීතා 32:8
12 ද්වි 29:1
13 ගීතා 19:7

14 ගීතා 31:3; ගීතා 79:9; ගීතා 109:21; ගීතා 143:11; එස 36:22; දානි 9:19; මතෙ 6:9; 15 ගීතා 103:3.

**ගීතා 25:6*** හෝ, "ලැදි ප්‍රේමයකින්." **7*** හෝ, "ලැදි ප්‍රේමයත්." **10*** හෝ, "ලැදි ප්‍රේමය."

מ [මෙම්]

12 යෙහෝවා දෙවි කෙරෙහි ගරුබියක්
ඇති තැනැත්තා කවුද?[1]
ඔහු තෝරාගත යුතු මාර්ගය
කුමක්ද කියා දෙවි ඔහුට
කියා දෙන්නේය.[2]

נ [නුන්]

13 දෙවිගේ යහපත්කම ජීවිත කාලය
පුරාම ඔහු අද්දකින්නේය.[3]
ඔහුගේ දරුවෝද පොළොව
උරුම කරගන්නෝය.[4]

ס [සාමෙක්]

14 යෙහෝවා දෙවිට සමීප විය හැක්-
කේ ඔහු කෙරෙහි ගරුබියක්
ඇති අයටය.[5]
තම ගිවිසුම ගැන දෙවි ඔවුන්ට
උගන්වන්නේය.[6]

ע [ආයින්]

15 මාගේ ඇස් යෙහෝවා දෙවි දෙස-
ටම යොමු කර ඇත.[7]
මන්ද එළා තිබෙන දැලෙන්
මාගේ දෙපා මුදාගන්නේ
ඔහුය.[8]

פ [පේ]

16 මා දෙස බලා මට කරුණාව පෙන්-
වන්න.[9]
මන්ද මම තනි වී සිටිමි. පීඩාව-
ලින් වේදනා විඳිමි.[10]

צ [ට්සාඩේ]

17 මාගේ සිතේ දුක් වේදනා බො-
හෝය.[11]
එබැවින් මා විඳින මේ පීඩාව-
ලින් මාව ගලවාගන්න.[12]

ר [රේෂ්]

18 මාගේ දුක් කරදර දෙස බලා[13]
මා කළ සියලු පාපවලට මට
සමාව දෙන්න.[14]

19 බලන්න, මාගේ සතුරෝ බො-
හෝය.[15]
ඔවුහු මා සමඟ මහත් වෛරය-
කින් සිටිති. මට හිරිහැර
කරන්න ඔවුහු නිතරම උත්-
සාහ කරති.[16]

שׁ [ෂින්]

20 මාගේ ජීවිතය රැක දෙන්න. මාව
බේරාගන්න.[17]
මා ඔබගෙන් රැකවරණය පතන
බැවින් මාව ලැජ්ජාවට පත්
වීමට ඉඩ නොදෙන්න.[1]

ת [ටාව්]

21 මා විශ්වාසවන්තව කටයුතු කළ
නිසාත් ප්‍රතිපත්තිගරුකව
ක්‍රියා කළ නිසාත් එය මට
ආරක්ෂාවක් වේවා![2]
මන්ද මම ඔබ කෙරෙහි බලා-
පොරොත්තු තබමි.[3]

22 දෙවියනි, ඊශ්‍රායෙල්වරුන්ගේ සියලු
විපත්තිවලින් ඔවුන්ව බේරා-
ගන්න.[4]

දාවිත් රචනා කළ ගීතයකි.

26 යෙහෝවා දෙවියනි, මා ඔබට
විශ්වාසවන්තව සිටින
බැවින්[5] මට යුක්තිය ඉටු
කර දෙන්න.[6]
නොසෙල්වී ස්ථිරව සිටින
පිණිස මම යෙහෝවා දෙවි
වන ඔබ කෙරෙහි විශ්වා-
සය තැබුවෙමි.[7]

2 යෙහෝවා දෙවියනි, මාව සෝ-
දිසි කරන්න. මා කෙබඳු
කෙනෙක්දැයි සෝදිසි කර
බලන්න.[8]
මාගේ ඇතුළාන්ත හැඟීම් සහ
සිතුවිලි* තව තවත් පවිත්‍ර
කරන්න.[9]

3 ඔබේ ප්‍රේමය* නිතරම මා ඉදිරියේ
තිබේ.
සත්‍යය නමැති ඔබේ මාර්ගයේ
මම ගමන් කරන්නෙමි.[10]

4 වංක මිනිස්සුන් සමඟ හිඳ නො-
ගත්තෙමි.[11]
තමන් කවුදැයි සඟවන අය
සමඟ ඇසුරු නොකළෙමි.[12]

5 නපුරු මනුෂ්‍යයන්ගේ ආශ්‍රයට මම
ද්වේෂ කළෙමි.[13]
දුෂ්ටයන් සමඟ හිඳ නොගන්-
නෙමි.[14]

6 මාගේ නිදොස් බව පෙන්වීමට
මම මාගේ දෑත් සෝදාගන්-
නෙමි.[15]

**25 ගීතාවලිය**
**1** ගීතා 111:10
ක්‍රියා 10:2
**2** ගීතා 37:23
**3** ගීතා 31:19
සෙක 9:17
**4** ගීතා 37:11
**5** උත් 18:17
හිතෝ 3:32
ආමො 3:7
යොහ 15:15
**6** උත් 22:17
**7** ගීතා 121:1
ගීතා 123:1
ගීතා 141:8
**8** ගීතා 31:4
ගීතා 91:3
ගීතා 124:7
2තිමෝ 2:26
**9** ගීතා 69:16
ගීතා 86:16
**10** ගීතා 143:4
**11** ගීතා 73:21
**12** ගීතා 107:28
**13** 2සාමු 16:12
ගීතා 119:153
**14** ගීතා 32:5
ගීතා 51:9
**15** ගීතා 38:19
**16** ගීතා 37:12
**17** ගීතා 17:8
ගීතා 121:7

**2 තීරුව**
**1** ගීතා 71:1
**2** ගීතා 41:12
**3** ගීතා 37:34
රෝම 15:13
**4** ගීතා 130:8

**26 ගීතාවලිය**
**5** 2රාජා 20:3
හිතෝ 20:7
**6** ගීතා 7:8
**7** ගීතා 21:7
ගීතා 37:31
හිතෝ 3:6
හිතෝ 29:25
**8** උත් 22:1
ගීතා 7:9
**9** ගීතා 17:3
ගීතා 66:10
සෙක 13:9
**10** 2රාජා 20:3
ගීතා 43:3
ගීතා 86:11
**11** හිතෝ 13:20
යෙරෙ 15:17
**12** හිතෝ 12:11
1කොරි 15:33
**13** ගීතා 31:6
ගීතා 139:21
**14** ගීතා 1:1
**15** ගීතා 51:2
ගීතා 73:13
යෙසා 1:16
මතෙ 27:24

---

**ගීතා 26:2*** මූ.අ., “සිත සහ වකුගඩු.” **3*** හෝ, “ළැදි ප්‍රේමය.”

යෙහෝවා දෙවියනි, මම ඔබේ
පූජාසනය වටා ඇවිදින්-
නෙමි.[1]
7 මාගේ ස්තුති ප්‍රශංසා සියල්ලන්ට
ඇසෙන පිණිසත්[2]
ඔබේ සියලු පුදුම ක්‍රියා ප්‍රකාශ
කරන පිණිසත් එසේ කරන්-
නෙමි.[3]
8 යෙහෝවා දෙවියනි, ඔබ වාසය
කරන ඔබේ ගෘහයටද[4]
ඔබේ තේජස තිබෙන ස්ථානය-
ටද මම බොහෝ සෙයින්
ඇලුම් කරමි.[5]
9 පව්කාරයන් සමඟ මාගේ ජීවිතය
විනාශ නොකරන්න.[6]
ලේ වැගිරවූ අය සමඟ මාගේ
ජීවිතය නැති නොකරන්න.[7]
10 ඔවුන්ගේ දෑත්වල දුෂ්ටකම*
ඇත.[8]
ඔවුන්ගේ දකුණත අල්ලස්වලින්
පිරී ඇත.[9]
11 නමුත් මම ඔබට විශ්වාසවන්තව
ජීවත් වුණෙමි.[10]
අනේ, මට කරුණාව පෙන්වා[11]
මාව මුදවාගන්න.[12]
12 එවිට සමතලා බිමක ගමන් කිරී-
මට මට හැකි වනු ඇත.[13]
රැස්ව සිටින සෙනඟ සමඟ මමද
යෙහෝවා දෙවි වන ඔබට
ප්‍රශංසා කරන්නෙමි.[14]

දාවිත් රචනා කළ ගීතයකි.

27 යෙහෝවා දෙවි මාගේ ආලෝ-
කයය.[15] මාගේ ගැලවී-
මය.[16]
මම කිසිවෙකුටවත් භය
නැත.[17]
යෙහෝවා දෙවි මාගේ බලකො-
ටුවය.[18]
මම කිසිවෙකුටවත් බිය වන්-
නේ නැත.[19]
2 දුෂ්ටයෝ මාගේ මාංසය කා
දමන පිණිස
මට විරුද්ධව ආවෝය.[20]
නමුත් අවසානයේදී මාගේ
විරුද්ධකාරයන්ද මාගේ
සතුරන්ද[1] වන ඔවුහු වැටී
ගියෝය.[2]
3 සේනාවක් මට විරුද්ධව පැමිණ
කඳවුරු බැඳගත්තත්[3]
මාගේ සිතට බියක් දැනෙන්නේ
නැත.[4]
මට විරුද්ධව යුද්ධ කිරීමට පැමි-
ණියත්[5]
මාගේ විශ්වාසය බිඳෙන්නේ
නැත.[6]
4 මා යෙහෝවා දෙවිගෙන් ඉල්ලන්-
නේ එකම එක දෙයයි.[7]
ඒ දේ ලබාගැනීමට මම මහත්
ආශාවකින් සිටින්නෙමි.[8]
ඒ මාගේ ජීවිතයේ සියලු දවස්ව-
ලදී යෙහෝවා දෙවිගේ ගෘහ-
යේ සිටින්න ලැබීමය.[9]
එවිට මම යෙහෝවා දෙවිගේ යහ-
පත දිනෙන් දින දකින්-
නෙමි.[10]
ඔහුගේ මාලිගාව දෙස මහත්
අගයකින් බලන්නෙමි.[11]
5 විපත්ති දවසේදී ඔහු තම රැකවර-
ණය යටතේ මාව තබාගන්-
නේය.[12]
ඔහුගේ කූඩාරමේ රහස් තැනක
මාව සඟවා තබාගන්නේය.[13]
උස් පර්වතයක් මුදුනේ මාව
තබන්නේය.[14]
6 එවිට මා වටලා සිටින මාගේ
සතුරන්ට වඩා මම ඉහළින්
සිටින්නෙමි.[15]
ප්‍රීති ඝෝෂා නඟමින් ඔහුගේ
ශුද්ධ කූඩාරමේදී පූජා ඔප්පු
කරන්නෙමි.[16]
මම ගී ගයමින් යෙහෝවා දෙවිට
ප්‍රශංසා කරන්නෙමි.[17]
7 යෙහෝවා දෙවියනි, මා ඔබට
හඬගසන විට මට ඇහුම්කන්
දෙන්න.[18]

---

ගීතා 26:10* මූ.අ., "නින්දිත ක්‍රියා."

**26 ගීතාවලිය**
1 ගීතා 43:4
2 ගීතා 50:23 ගීතා 95:2
3 ගීතා 107:22
4 1සාමු 3:3 1ලේක 16:1 ගීතා 27:4 ගීතා 84:10
5 2ලේක 5:14 ගීතා 63:2
6 1සාමු 25:29
7 ගීතා 51:14
8 ගලා 5:19 2පේතෘ 2:7
9 ද්වි 16:19 1සාමු 8:3 යෙසා 1:23 එස 22:12 ආමො 5:12
10 ලූක් 1:6
11 නෙහෙ 13:14 ගීතා 40:2
12 ගීතා 69:18
13 1සාමු 2:9 හිතෝ 10:9
14 ගීතා 68:26 ගීතා 107:32 ගීතා 111:1

**27 ගීතාවලිය**
15 යෝබ් 29:3 ගීතා 36:9 ගීතා 43:3 ගීතා 119:105
16 නික් 15:2 ගීතා 68:19
17 ගීතා 23:4
18 ගීතා 62:6 යෙසා 12:2 පිලි 4:13
19 ගීතා 36:1 රෝම 8:31 හෙබ්‍රෙ 13:6
20 ගීතා 14:4 ගීතා 22:16

**2 තීරුව**
1 ගීතා 18:40
2 ගීතා 18:38
3 ගීතා 3:6
4 2ලේක 20:15
5 2ලේක 32:7
6 ගීතා 84:12
7 ලූක් 10:42
8 යෙරෙ 29:13 දානි 9:3 මතෙ 7:7
9 ගීතා 15:1 ගීතා 23:6 ගීතා 65:4 ලූක් 2:37
10 ගීතා 16:11 ගීතා 50:2 ගීතා 63:2 ගීතා 90:17
11 1සාමු 3:3 1ලේක 16:1 ගීතා 26:8 හෙබ්‍රෙ 12:16

12 ගීතා 31:20; ගීතා 32:7; ගීතා 57:1; ශෙප 2:3; 13 ගීතා 61:4; ගීතා 119:114; 14 ගීතා 40:2; 15 2සාමු 7:9; ගීතා 3:3; 16 ගීතා 107:22; හෙබ්‍රෙ 13:15; 17 එෆි 5:19; 18 ගීතා 4:1; ගීතා 130:2.

මට කරුණාව පෙන්වා මාගේ
කන්නලව්වට පිළිතුරු
දෙන්න.[1]
8 “සෙනහෙනි, මාගේ කරුණාව
ලැබීමට මට ළං වෙන්න”[2]
කියා ඔබ දුන් අණ ගැන
මාගේ සිත කතා කරයි.
යෙහෝවා දෙවියනි, ඔබට ළං වී
ඔබේ කරුණාව ලබන්න මම
උත්සාහ කරන්නෙමි.[3]
9 මා වෙතින් ඔබේ මුහුණ ඉවතට
හරවා නොගන්න.[4]
කෝප වී ඔබේ සේවකයාව අත්
නොහරින්න.[5]
මාගේ උපකාරයට පැමිණෙන්න.[6]
මට ගැලවීම සලසා දෙන දෙ-
වියනි, මාව ප්‍රතික්ෂේප
නොකරන්න. මාව අත් නො-
හරින්න.[7]
10 මාගේ පියා හෝ මව හෝ මාව
අත්හැරියත්[8]
යෙහෝවා දෙවි වන ඔබ මාව
භාරගනු ඇත.[9]
11 යෙහෝවා දෙවියනි, ඔබේ මාර්ගය
ගැන මට උගන්වන්න.[10]
මාගේ සතුරන්ගෙන් මා
ආරක්ෂා කර ධර්මිෂ්ඨ මාව-
තේ මා ගෙන යන්න.
12 මාගේ සතුරන් අතට මා හසු වීමට
ඉඩ නොදෙන්න.[11]
මන්ද බොරු සාක්ෂිකරුවෝද[12]
තර්ජන කරන්නෝද මට විරුද්-
ධව නැඟී සිටිති.[13]
13 මෙතෙක් මා ගත කළ ජීවිතය
දෙස බලද්දී යෙහෝවා දෙවි-
ගේ යහපත්කම දැකගැනී-
මට මට හැකියි යන විශ්-
වාසය නොතිබුණේ නම්,
අද මාගේ තත්වය කුමක්
වේද?[14]
14 යෙහෝවා දෙවි කෙරෙහි බලාපො-
රොත්තු තබන්න.[15] ධෛර්-
යයෙන් සිටින්න. ශක්තිමත්
වන්න.[16]
යෙහෝවා දෙවි කෙරෙහි බලා-
පොරොත්තු තබන්න.[17]

**27 ගීතාවලිය**
**1** ගීතා 5:2
ගීතා 119:58
**2** ගීතා 24:6
ගීතා 105:4
ශෙප 2:3
**3** ගීතා 63:1
**4** ගීතා 69:17
ගීතා 143:7
යෙසා 59:2
**5** යෙසා 50:1
**6** 1සාමු 7:12
ගීතා 46:1
**7** ගීතා 38:21
ගීතා 88:1
**8** ගීතා 69:8
මතෙ 10:21
**9** යෙසා 40:11
යෙසා 49:15
**10** 1රාජා 8:36
ගීතා 25:4
ගීතා 86:11
යෙසා 30:20
යෙසා 54:13
**11** ගීතා 31:8
ගීතා 35:25
ගීතා 41:2
ගීතා 41:11
**12** ගීතා 35:11
මතෙ 26:59
ක්‍රියා 6:11
**13** ක්‍රියා 9:1
**14** යෝබ් 33:30
යෙරෙ 11:19
එස 26:20
**15** ගීතා 25:3
**16** ගීතා 31:24
යෙසා 40:31
**17** ගීතා 62:5
ගීතා 130:5
රෝම 15:13

**2 තීරුව**

**28 ගීතාවලිය**
**1** ගීතා 18:3
**2** ද්වි 32:4
ගීතා 42:9
යෙසා 26:4
**3** ගීතා 35:22
ගීතා 83:1
**4** යෝබ් 33:28
ගීතා 30:9
ගීතා 69:15
යෙසා 38:18
**5** ගීතා 5:7
**6** 2ලේක 6:13
**7** ගණන් 16:26
ගීතා 26:9
**8** ගීතා 7:14
ගීතා 36:4
හිතෝ 26:25
**9** ගීතා 62:4
යෙරෙ 9:8
**10** ගීතා 59:12
යෙරෙ 18:22
2තිමෝ 4:14
**11** ගීතා 21:10
**12** ගීතා 62:12
මතෙ 25:45
එළි 22:12

දාවිත් රචනා කළ ගීතයකි.

# 28

යෙහෝවා දෙවියනි, මම ඔබට
දිගටම හඬගසමි.[1]
මාගේ පර්වතය, මා කිවූ
දේ නොඇසුණාක් මෙන්
නොසිටින්න.[2]
නිහඬව සිට[3]
මාව මිනී වළට නියම නො-
කරන්න.[4]
2 ඔබේ උපකාරය පතා මා
කරන කන්නලව්වලට සවන්
දෙන්න.
ඔබේ ශුද්ධස්ථානයේ ඇතුල්
කාමරය දෙසට හැරී[5] යාච්-
ඤාවෙන් මා දෑත් ඔසවන
කල[6] මට ඇහුම්කන් දෙන්න.
3 දුෂ්ටයන් හා නපුරු ක්‍රියා කරන්-
නන් සමඟ මාව විනාශ නො-
කරන්න.[7]
ඔවුහු සිතේ නපුරු චේ-
තනා තබාගෙන[8] අසල්වා-
සීන් සමඟ හොඳින් කතා
කරති.[9]
4 ඔවුන්ගේ ක්‍රියාවලට අනුවද[10]
ඔවුන්ගේ නපුරුකම්වලට අනු-
වද ඔවුන්ට ප්‍රතිඵල
දෙන්න.[11]
ඔවුන් කරන දේට ඔවුන්ට දඬුවම්
කරන්න.[12]
ඔවුන්ගේ ක්‍රියාවලට අනුව
ඔවුන්ට ප්‍රතිඵල දෙන්න.[13]
5 මන්ද ඔවුහු යෙහෝවා දෙවිගේ
ක්‍රියාද[14]
දෙවිගේ දෑතින් කළ නිර්මාණද
කිසි ගණනකට නොගත්-
තෝය.[15]
දෙවි ඔවුන්ව සදහටම බිඳ
දමන්නේය.
6 යෙහෝවා දෙවිට ප්‍රශංසා වේවා!
මන්ද ඔහු මාගේ කන්නලව්-
වට ඇහුම්කන් දුන්නේය.[16]
7 යෙහෝවා දෙවි මාගේ ශක්ති-
යය.[17] මාගේ පලිහය.[18]

**13** 2තෙස 1:6; **14** යෝබ් 34:27; යෙසා 5:12; **15** ගීතා 8:3; ගීතා 19:1; යෙසා 40:26; **16** ගීතා 66:20; **17** යෙසා 12:2; එෆි 6:10; **18** උත් 15:1; 2සාමු 22:3; ගීතා 3:3; ගීතා 84:11.

මම මුළු සිතින්ම ඔහු කෙරෙහි
විශ්වාසය තබමි.[1]
ඔහු මට උපකාර කළේය. එබැවින්
මාගේ සිත ප්‍රීතියෙන් පිනා
යයි.[2]
ගී ගයමින් මම ඔහුට ප්‍රශංසා
කරමි.[3]
8 යෙහෝවා දෙවි ඔහුගේ සෙනඟට
ශක්තියකි.[4]
ඔහුගේ අභිෂේක ලත් තැනැත්-
තාට අතිවිශිෂ්ට ගැලවීමක්
සලසා දෙන බලකොටුවකි.[5]
9 ඔබේ සෙනඟව ගලවාගන්න.
ඔබේ උරුමය වන ඔවුන්ට
ආශීර්වාද කරන්න.[6]
එඬේරෙකු මෙන් ඔවුන්ව රැක-
බලා ගනිමින් සදහටම
ඔවුන්ව උසුලාගෙන යන්න.[7]

දාවිත් රචනා කළ ගීතයකි.

**29** බලවතුන්ගේ පුත්‍රයෙනි, යෙ-
හෝවා දෙවිට ප්‍රශංසා
කරන්න.
යෙහෝවා දෙවිගේ තේජස
හා ශක්තිය ගැන පස-
සන්න.[8]
2 යෙහෝවා දෙවිගේ නාමයට දිය
යුතු ගෞරවය දෙන්න.[9]
ශුද්ධ වස්ත්‍රවලින් සැරසී යෙ-
හෝවා දෙවිට නමස්කාර
කරන්න.[10]
3 යෙහෝවා දෙවිගේ හඬ ජලය*
කෙරෙහි බලපවත්වයි.[11]
තේජවත් දෙවිගේ[12] හඬ ගිගුරුම්
දෙයි.[13]
යෙහෝවා දෙවි ජල කන්දරා-
වන් කෙරෙහි බලපවත්වයි.[14]
4 යෙහෝවා දෙවිගේ හඬ බලග-
තුයි.[15]
යෙහෝවා දෙවිගේ හඬ ගරුබිය
ඇති කරවයි.[16]
5 යෙහෝවා දෙවිගේ හඬ දේවදාර
ගස් දෙපළු කරයි.
යෙහෝවා දෙවි ලෙබනොන්හි
දේවදාර ගස් සුනුවිසුනු
කරයි.[1]
6 ඔහු ඒවාට වසු පැටවෙකු මෙන් දුව
පැන යන්න සලස්වයි.[2]
ඔහු ලෙබනොන් හා සිරියොන්[3]
වසු පැටවුන් මෙන් පැන
දුවන්න සලස්වයි.
7 යෙහෝවා දෙවිගේ හඬ ගිනි ජාලා-
වක් සේ පහර දෙයි.[4]
8 යෙහෝවා දෙවිගේ හඬට පාළුක-
රය දෙදරුම් කයි.[5]
යෙහෝවා දෙවි කාදෙෂ්හි පාළු-
කරය[6] දෙදරවයි.
9 යෙහෝවා දෙවිගේ හඬට මුව
දෙන්නු පැටවුන් බිහි කරති.[7]
වනාන්තර පාළු වී යයි.[8]
දේවමාලිගාවෙහි සියල්ලෝ,
“දෙවිට ගෞරවය ලැබේවා”
යයි පවසති.[9]
10 යෙහෝවා දෙවි තම සිංහාසනය
මහා ජල කන්දරාවට ඉහ-
ළින් පිහිටෙව්වේය.[10]
යෙහෝවා දෙවි තම සිංහාසන-
යෙහි හිඳ සදහටම පාලනය
කරන්නේය.[11]
11 යෙහෝවා දෙවි තම සෙනඟට
ශක්තිය ලබා දෙන්නේය.[12]
තම සෙනඟ අතරේ සාමය
පැවතීමට ඉඩහැරීමෙන් යෙ-
හෝවා දෙවි ඔවුන්ට ආශීර්-
වාද කරන්නේය.[13]

ගෘහය කැප කිරීමේදී[14] ගැයූ,
දාවිත් රචනා කළ ගීතයකි.

**30** යෙහෝවා දෙවියනි, මම
ඔබට ප්‍රශංසා කරන්-
නෙමි.
මන්ද ඔබ මා විපතින් බේරා-
ගෙන[15] මාගේ සතුරන්ට
සතුටු වීමට ඉඩ නොදුන්-
නෙහිය.[16]
2 යෙහෝවා මාගේ දෙවියනි, මා
ඔබේ පිහිට පතා මොරගැසූ
විට ඔබ මට සහනයක් දුන්-
නෙහිය.[17]

**28 ගීතාවලිය**
1 ගීතා 13:5
ගීතා 56:4
2 යෙසා 61:10
3 නික් 15:1
4 1සාමු 16:13
2සාමු 22:3
5 ගීතා 20:6
හෙබ්‍රෙ 5:7
6 ගණන් 23:20
ද්වි 9:29
7 ද්වි 32:11
ගීතා 78:71
යෙසා 40:11

**29 ගීතාවලිය**
8 1ලේක 16:28
ගීතා 96:7
හබ 3:3
9 ගීතා 96:8
10 2ලේක 20:21
11 ගීතා 18:13
12 ක්‍රියා 7:2
13 1සාමු 7:10
යෝබ් 37:5
14 ගීතා 93:4
ගීතා 104:3
15 යෝබ් 26:11
එස 10:5
16 යෝබ් 40:9

**2 තීරුව**
1 යෙසා 2:13
2 ගීතා 114:4
යෙරෙ 4:24
3 ද්වි 3:9
4 නික් 19:18
ගීතා 77:18
ගීතා 144:5
හෙබ්‍රෙ 12:18
5 යෙසා 13:13
හෙබ්‍රෙ 12:26
6 ගණන් 13:26
7 යෝබ් 39:1
8 යෙසා 10:18
එස 20:47
9 ගීතා 48:9
ගීතා 63:2
ගීතා 134:1
ගීතා 135:2
10 උත් 6:17
යෝබ් 38:25
11 ගීතා 10:16
1තිමෝ 1:17
12 ගීතා 28:9
යෙසා 40:29
13 ගණන් 6:26
ගීතා 72:7
ගීතා 147:14
රෝම 15:33
1කොරි 1:3

**30 ගීතාවලිය**
14 2සාමු 5:11
15 ගීතා 28:9
16 ගීතා 25:2
ගීතා 41:11

**ගීතා 29:3*** මෙය යොමු දක්වන්නේ වැහි කුණා-
ටුවලටය.

17 උත් 20:17; නික් 15:26; 2රාජා 20:5; ගීතා 6:2; ගීතා 103:3.

3 යෙහෝවා දෙවියනි, ඔබ මා මිනීවළෙන් ගොඩගත්තෙහිය.[1]
මා මරණය නොදකින පිණිස* ඔබ මාගේ දිවි රැක දුන්නෙහිය.[2]
4 යෙහෝවා දෙවිට විශ්වාසවන්තව සිටින සියල්ලෙනි, ඔහුට ගී ගයන්න.[3]
සදා නොමැකෙන ඔහුගේ ශුද්ධ නාමයට ප්‍රශංසා කරන්න.[4]
5 ඔහුගේ කෝපය සුළු මොහොතකට පමණය.[5]
නමුත් ඔහුගේ කරුණාව ජීවිතාන්තය දක්වාය.[6]
රාත්‍රියේදී හැඬීම පැවතුණත්[7] උදෑසන ප්‍රීතිය උදා වෙයි.[8]
6 සැප සේ මම දිවි ගෙවන විට මෙසේ සිතුවෙමි.[9] "කෙදිනකවත් මම නොසෙල්වෙනු ඇත."[10]
7 යෙහෝවා දෙවියනි, ඔබ මට කරුණාව පෙන්වා මාගේ කන්ද ශක්තිමත්ව පිහිටෙව්වෙහිය.[11]
ඔබ මා වෙතින් ඔබේ මුහුණ ඉවතට හරවාගත්තෙහිය. මම කැලඹුණෙමි.[12]
8 යෙහෝවා දෙවියනි, මම ඔබට නොකඩවා හඬගැසුවෙමි.[13]
යෙහෝවා දෙවියනි, කරුණාව ඉල්ලා මම ඔබට දිගින් දිගටම ආයාචනා කළෙමි.[14]
9 මා මිය ගියොත් එයින් ඔබට ඇති ප්‍රයෝජනය කුමක්ද?[15]
දූවිල්ල ඔබට ප්‍රශංසා කරනු ඇද්ද?[16] ඔබේ විශ්වාසවන්තභාවය ගැන පවසනු ඇද්ද?[17]
10 යෙහෝවා දෙවියනි, සවන් දී මට කරුණාව පෙන්වන්න.[18]
යෙහෝවා දෙවියනි, මාගේ උපකාරකයා ඔබ බව ඔප්පු කර පෙන්වන්න.[19]
11 වැලපෙමින් සිටි මට නටන්න සැලැස්වුවේ ඔබය.[20]
මා ඇඳ සිටි ගෝණි රෙදි ගලවා ප්‍රීතිය නමැති සළු මට පැළඳුවේ ඔබය.[1]
12 ඔබ එසේ කළේ නිහඬව නොසිට මාගේ මුළු හදවතින්ම* ඔබට ගී ගයන පිණිසය.[2]
යෙහෝවා මාගේ දෙවියනි, මම ඔබට සදහටම ප්‍රශංසා කරන්නෙමි.[3]

සංගීත අධ්‍යක්ෂක වෙතය. දාවිත් රචනා කළ ගීතයකි.

31 යෙහෝවා දෙවියනි, මා රැකවරණය පැතුවේ ඔබගෙන්ය.[4]
එබැවින් මාව කිසිදාක ලැජ්ජාවට පත් වීමට ඉඩ නොදෙන්න.[5]
ඔබ ධර්මිෂ්ඨ දෙවි කෙනෙක් නිසා මට ගැලවීම සලසා දෙන්න.[6]
2 ඔබේ සවන් මා දෙසට යොමු කරන්න.[7]
ඉක්මනින්ම මා ගලවාගන්න.[8]
ඔබ මට පර්වතයක් බඳු බලකොටුවක් වන්න.[9]
මාව බේරාගැනීමට ආරක්ෂක ගෘහයක් වන්න.[10]
3 මන්ද මාගේ පර්වතයත් මාගේ බලකොටුවත් ඔබය.[11]
ඔබේ නාමය වෙනුවෙන්[12] මට මඟ පෙන්වීම් ලබා දී ඔබ මා හරි මාර්ගයේ ගෙන යන්නෙහිය.[13]
4 ඔවුන් රහසින් මට ඇමූ දැලින් ඔබ මා බේරාගන්නෙහිය.[14]
මන්ද ඔබ මාගේ රක්ෂස්ථානයය.[15]
5 මම මාගේ ජීවිතය ඔබේ අතට භාර දෙමි.[16]
සත්‍යතාවේ දෙවි වන යෙහෝවා,[17] ඔබ මා මුදාගත්තෙහිය.[18]

**30 ගීතාවලිය**
1 ගීතා 16:10; ගීතා 86:13; ක්‍රියා 2:31
2 ගීතා 28:1; යෙසා 38:17; යෝනා 2:6
3 1ලේක 16:4; ගීතා 32:11; ගීතා 145:10
4 නික් 3:15; ගීතා 97:12
5 යෙසා 12:1; යෙසා 54:8; 2කොරි 4:17
6 ගීතා 63:3
7 ගීතා 6:6
8 ගීතා 126:5
9 යෝබ් 29:18
10 ගීතා 15:5; ගීතා 16:8
11 2සාමු 5:12; ගීතා 89:17
12 යෝබ් 34:29; ගීතා 10:1; ගීතා 143:7
13 ගීතා 34:6; ගීතා 77:1
14 පිලි 4:6
15 ගීතා 28:1
16 ගීතා 6:5; ගීතා 88:11; ගීතා 115:17; දේශ 9:10
17 යෙසා 38:18
18 ගීතා 143:1
19 ගීතා 28:7; ගීතා 54:4
20 2සාමු 6:14; දේශ 3:4; යෙරෙ 31:4

**2 තීරුව**
1 යෙසා 61:3
2 ගීතා 16:9; ගීතා 57:8
3 ගීතා 9:1

**31 ගීතාවලිය**
4 ගීතා 18:2
5 ගීතා 22:5; යෙසා 49:23; රෝම 5:5; රෝම 10:11
6 ගීතා 143:1
7 ගීතා 71:2; ගීතා 130:2
8 ගීතා 40:17; ගීතා 70:1; ලූක් 18:8
9 2සාමු 22:3; ගීතා 18:2; ගීතා 94:22
10 ගීතා 71:3
11 2සාමු 22:2
12 ගීතා 25:11; යෙරෙ 14:7
13 ගීතා 23:3
14 ගීතා 25:15; ගීතා 91:3; මතෙ 6:13
15 හිතෝ 18:10; 16 ලූක් 23:46; ක්‍රියා 7:59; 17 ද්වි 32:4; හෙබ්‍රෙ 6:18; 18 ගීතා 71:23.

ගීතා 30:3* මූ.අ., "වළට නොයන ලෙස."

ගීතා 30:12* මූ.අ., "මාගේ තේජසින්."

**6** කිසි වටිනාකමක් නැති දේවතා රූපවලට නමස්කාර කරන අයට මම ද්වේෂ කරමි.[1]
නමුත් මා විශ්වාසය තබා තිබෙන්නේ යෙහෝවා දෙවි වන ඔබ කෙරෙහිය.[2]
**7** මම ප්‍රීති වෙමි. ඔබ මට පෙන්වන මහත් ප්‍රේමය* ගැන මම ප්‍රීතියෙන් ඉපිල යන්නෙමි.[3]
මන්ද මා විඳින දුක ඔබ දුටුවෙහිය.[4]
මා මේ ජීවිතය තුළ මුහුණ දෙන සියලු කරදර ඔබ දන්නෙහිය.[5]
**8** ඔබ මා සතුරාගේ අතට හසු කර නොදුන්නෙහිය.[6]
ආරක්ෂිත ස්ථානයකට මා ගෙන ගියෙහිය.[7]
**9** අනේ යෙහෝවා දෙවියනි, මට කරුණාව පෙන්වන්න. මන්ද මාගේ දුක මට දරාගත නොහැකිය.[8]
ශෝකය නිසා මාගේ ගතත් සිතත්[9] දෙනෙතත් දුර්වල වී ඇත.[10]
**10** සෝ දුකින් මාගේ ජීවිතය අවසානයට පැමිණ ඇත.[11]
සුසුම්ලෑමෙන්ම මාගේ ජීවිතය ගෙවී ගොස් ඇත.[12]
මා කළ වරද නිසා මාගේ ශක්තිය හීන වී[13]
මාගේ ඇටකටු දුර්වල වී ඇත.[14]
**11** මට විරුද්ධ වන සියල්ලන් ඉදිරියේ[15] මම නින්දාවට ලක්ව සිටිමි.[16]
මාගේ අසල්වැසියන් ඉදිරියේ මම අපහාසයට ලක්ව සිටිමි.[17]
මාගේ මිත්‍රයෝ මා නිසා භයෙන් සිටිති.[18]
මා එළිමහනේ සිටිනවා දැක ඔවුහු මා අත්හැර පලා දිව්වෝය.[19]

**12** අන් අයගේ මතකයෙන් ගිලිහුණු මිය ගිය තැනැත්තෙකු මෙන් මාවද අමතක වී ගියේය.[1]
මම බිඳුණු භාජනයක් මෙන් වුණෙමි.[2]
**13** බොහෝදෙනෙකු මා ගැන නරක දේවල් පවසනවා මට අසන්න ලැබිණ.[3]
භීතිය හාත්පස පැතිර ඇත.[4]
ඔවුන් සියලුදෙනා එකතු වී[5]
මට විරුද්ධව කුමන්ත්‍රණය කරන්නේ මාගේ ජීවිතය නැති කර දැමීමටය.[6]
**14** නමුත් යෙහෝවා දෙවියනි, මාගේ විශ්වාසය ඔබ කෙරෙහිය.[7]
එබැවින්, "ඔබ මාගේ දෙවි" යයි මම පැවසුවෙමි.[8]
**15** මාගේ ජීවිතය ඔබ අතේය.[9]
මාගේ සතුරන් අතින්ද මා පසුපස ලුහුබඳින්නන් අතින්ද මාව ගලවාගන්න.[10]
**16** ඔබේ සේවකයාට කරුණාව පෙන්වන්න.[11]
ඔබ මහත් ප්‍රේමයකින්* පිරි දෙවි කෙනෙක් නිසා මාව බේරාගන්න.[12]
**17** යෙහෝවා දෙවියනි, මා ඔබට කන්නලව් කළ නිසා මාව ලැජ්ජාවට පත් වීමට ඉඩ නොදෙන්න.[13]
දුෂ්ටයෝ ලැජ්ජාවට පත් වෙත්වා![14]
ඔවුහු මිනී වළෙහි නිහඬව සිටිත්වා![15]
**18** ධර්මිෂ්ඨ තැනැත්තාට විරුද්ධව දිගින් දිගටම බොරු කියමින්[16]
උඩඟු හා අපහාසාත්මක ලෙස කතා කරන්නන්ව[17] නිහඬ කරනු ලැබේවා![18]

**31 ගීතාවලිය**
**1** යෙරෙ 10:8; යෝනා 2:8; 1කොරි 8:4
**2** ගීතා 25:2
**3** ගීතා 13:5
**4** ගීතා 9:13
**5** ගීතා 142:3; 1කොරි 8:3; ගලා 4:9
**6** ද්වි 32:30; 1සාමු 17:46
**7** ගීතා 4:1; ගීතා 18:19
**8** හිතෝ 14:10
**9** ගීතා 6:2; ගීතා 22:14
**10** යෝබ් 17:7; ගීතා 6:7; ගීතා 88:9
**11** ගීතා 88:15; හිතෝ 15:13
**12** ගීතා 71:9
**13** ගීතා 106:43
**14** ගීතා 32:3; ගීතා 102:3
**15** ගීතා 6:7; මතෙ 10:22; මතෙ 24:9; ලූක් 21:17
**16** ගීතා 22:6; ගීතා 42:10; ගීතා 102:8; යෙසා 53:4; රෝම 15:3; 1පේතෘ 4:14
**17** යෝබ් 19:13; ගීතා 38:11
**18** ගීතා 88:8
**19** මතෙ 26:56; 2තිමෝ 4:16

**2 තීරුව**
**1** ගීතා 88:5
**2** රෝම 9:22
**3** යෙරෙ 20:10; ලූක් 23:2
**4** ගීතා 57:4; යෙරෙ 6:25
**5** ලූක් 22:2; ලූක් 23:1
**6** මතෙ 27:1
**7** ගීතා 56:4
**8** ගීතා 16:2; ගීතා 43:5; යොහ 20:17
**9** 2සාමු 7:12
**10** ගීතා 142:6
**11** ගණන් 6:25; ගීතා 67:1; ගීතා 80:3; රෝම 9:15
**12** ගීතා 6:4
**13** ගීතා 25:2; ගීතා 69:6; යෙසා 50:7; මතෙ 27:46
**14** නෙහෙ 4:4; නෙහෙ 6:16; ගීතා 6:10; යෙසා 41:11; යෙරෙ 20:11

**15** 1සාමු 2:9; ගීතා 115:17; දේශ 9:5; **16** 2ලේක 32:16; මතෙ 10:25; ක්‍රියා 25:7; **17** ගීතා 94:4; **18** ගීතා 12:3; ගීතා 63:11.

**ගීතා 31:7*** හෝ, "ලැදි ප්‍රේමය."

**ගීතා 31:16*** හෝ, "ලැදි ප්‍රේමයකින්."

19 ඔබ කෙරෙහි ගරුබියක් ඇති අයට ආශීර්වාද කිරීම සඳහා වස්තුවක් මෙන් සුරැකිව තබා තිබෙන[1] ඔබේ යහපත්කම මොන තරම්ද![2]
ඔබේ රැකවරණය පතන අයට ඔබ සියල්ලන් ඉදිරියේ ඔබේ යහපත්කම පෙන්වන්නෙහිය.[3]
20 මිනිසුන් එකතු වී ඔවුන්ට විරුද්ධව කුමන්ත්‍රණ කරන විට[4]
ඔබ ඔබේ රහසිගත ස්ථානයේ ඔවුන්ව සුරක්ෂිතව තබාගන්නෙහිය.[5]
මිනිසුන් ඔවුන්ට බැණවදින විට[6] ඔබ ඔවුන්ව ඔබේ කූඩාරමේ සඟවා තබාගන්නෙහිය.
21 වටලා තිබූ නගරයක සිටි මට[7] පුදුමාකාර ලෙස ඔබ ඔබේ මහත් ප්‍රේමය* පෙන්වූ බැවින්[8]
යෙහෝවා දෙවි වන ඔබට ප්‍රශංසා වේවා![9]
22 සතුරන් නිසා මා කලබලයට පත් වූ විට,[10]
“අනිවාර්යයෙන්ම ඔවුන් මාව මරා දමයි” කියා මම සිතුවෙමි.[11]
නමුත් ඔබේ උපකාරය පතා මා ඔබට කන්නලව් කළ විට ඔබ මාගේ හඬට ඇහුම්කන් දුන්නෙහිය.[12]
23 යෙහෝවා දෙවිට පක්ෂපාත සියල්ලෙනි, ඔහුට ප්‍රේම කරන්න.[13]
විශ්වාසවන්තව සිටින අයව යෙහෝවා දෙවි ආරක්ෂා කරන්නේය.[14]
නමුත් උඩඟු අයට සුදුසු දඬුවම ඔහු ලබා දෙන්නේය.[15]
24 යෙහෝවා දෙවි කෙරෙහි බලාපොරොත්තු තබා සිටින සියල්ලෙනි,[16]
ධෛර්යවත්ව සිටින්න. කිසි දෙයකට භය නොවන්න.[1]

දාවිත් රචනා කළ ගීතයකි. මස්කිල්.*

**32** වරදට සමාව ලැබූ තැනැත්තා සන්තෝෂවත්ය. ඔහු කළ පාපය දෙවි මකා දැමූ විට ඔහු සන්තෝෂවත්ය.[2]
2 යමෙකු කළ වරදක් යෙහෝවා දෙවි සිහියේ තබා නොගන්නේ නම් ඔහු සන්තෝෂවත්ය.[3]
යමෙකුගේ සිතේ කිසි වංචාවක් නැත්නම් ඔහු සන්තෝෂවත්ය.[4]
3 මාගේ වරද ගැන මා නිහඬව සිටි කාලයේදී දවස පුරා මට දැනුණු වේදනාව නිසා මාගේ ඇටකටු දිරා ගියේය.[5]
4 ඔබේ අප්‍රසාදයට මා ලක් වූ නිසා එය දිවා රෑ දෙකේම මාගේ සිතට මහත් බරක් විය.[6]
ගිම්හානයේදී තද රශ්මියට තෙතමනය වියළී යන්නාක් මෙන් මාගේ ශක්තිය හීන වී ගියේය.[7] *සීලාහ්.*
5 අවසානයේදී මම මාගේ පාපය ඔබ ඉදිරියේ ප්‍රකාශ කළෙමි. මාගේ වරද තවදුරටත් නොසැඟුවෙමි.[8]
“මා කළ වැරදි යෙහෝවා දෙවි ඉදිරියේ පිළිගන්නෙමි”[9] කියා කීවෙමි.
එවිට ඔබ මාගේ පාප කමා කළෙහිය.[10] *සීලාහ්.*
6 මෙය දකින පක්ෂපාත සියල්ලෝ ඔබේ අනුමැතිය දිනාගැනීමට ප්‍රස්තාව තිබෙන කාලයේදී[11] නොපමාව ඔබට යාච්ඤා කරනු ඇත.[12]

**31 ගීතාවලිය**
**1** යෙසා 64:4 1කොරි 2:9
**2** ගීතා 73:1 යෙසා 63:7
**3** ගීතා 126:2 යෙසා 26:12
**4** ගීතා 86:14
**5** ගීතා 27:5 ගීතා 32:7 ක්‍රියා 3:19
**6** ගීතා 64:3
**7** 1සාමු 23:7
**8** ගීතා 17:7
**9** රූත් 4:14 1සාමු 25:39 ගීතා 68:19 ලූක් 1:68
**10** 1සාමු 23:26
**11** ගීතා 88:16 විලා 3:54 යෝනා 2:4
**12** 2ලේක 33:13 ගීතා 6:9 හිතෝ 15:29 හෙබ්‍රෙ 5:7
**13** ද්වි 10:12 ද්වි 30:20 ගීතා 34:9
**14** 1සාමු 2:9 ගීතා 145:20
**15** 2සාමු 22:28 යෝබ් 40:11 ගීතා 94:2 යෙසා 2:11 යාකො 4:6 1පේතෘ 5:5
**16** උත් 49:18 ගීතා 62:1 ගීතා 71:14 විලා 3:21 මීකා 7:7 තීත 2:13

**2 තීරුව**
**1** ගීතා 27:14 යෙසා 35:4

**32 ගීතාවලිය**
**2** ගීතා 85:2 යෙසා 1:18 ක්‍රියා 3:19 රෝම 4:7
**3** ලෙවී 17:4 රෝම 5:13 2කොරි 5:19
**4** යොහ 1:47
**5** හිතෝ 28:13
**6** ගීතා 38:2
**7** යෝබ් 30:30 ගීතා 63:1 ගීතා 102:3
**8** ගීතා 38:18 ගීතා 51:4 1යොහ 1:9
**9** ලෙවී 5:5 2සාමු 12:13 2ලේක 30:22 ගීතා 38:18 ගීතා 41:4 මතෙ 3:6

**10** ගීතා 86:5; ගීතා 103:3; යෙසා 44:22; හොෂෙ 14:2; ලූක් 7:47; **11** ගීතා 69:13; යෙසා 55:6; **12** ගීතා 65:2; 2කොරි 1:3.

**ගීතා 31:21*** හෝ, “ඇදි ප්‍රේමය.”

**ගීතා 32:පෙර*** මෙම හෙබ්‍රෙව් යෙදුමෙහි ගැඹුරින් කල්පනා කරමින් තැනූ ගීතිකාව යන අර්ථය තිබිය හැක.

මහා ජල කන්දරාවක් ඔවුන් පිටට පැමිණියත් ඔවුන්ට කිසි හානියක් සිදු නොවනු ඇත.[1]
7 ආරක්ෂාව පතා මා සැඟවෙන්නේ ඔබ ළඟය. විපත්තිවලින් ඔබ මා ආරක්ෂා කරන්නෙහිය.[2]
ඔබ මට ගැලවීම ලබා දෙන නිසා මම නිතරම ප්‍රීති ඝෝෂා මැද සිටින්නෙමි.[3] *සීලාහ්.*
8 ඔබ මෙසේ කීවෙහිය. "ඔබ යා යුතු මාර්ගය ගැන මම ඔබට කියා දෙන්නෙමි. වටහාගැනීමේ හැකියාවද මම ඔබට ලබා දෙන්නෙමි.[4]
මම ඔබ දෙස හොඳින් බලා ඔබට අවවාද කරන්නෙමි.[5]
9 දැනුම් තේරුම් නැති අශ්වයෙකු හෝ කොටළුවෙකු ඔබට කීකරු කරගත හැක්කේ[6]
කටකලියාවක් හෝ පටියක් හෝ දැමීමෙනි.[7]
මෙල්ල කළ නොහැකි එවැනි සතුන් මෙන් ඔබ ක්‍රියා නොකරන්න."[8]
10 දුෂ්ටයා බොහෝ වේදනා විඳින්නේය.[9]
නමුත් යෙහෝවා දෙවි කෙරෙහි විශ්වාසය තබන්නා දෙවිගේ මහත් ප්‍රේමය* අද්දකින්නේය.[10]
11 ධර්මිෂ්ඨ තැනැත්තෙනි, යෙහෝවා දෙවි නිසා ප්‍රීතියෙන් පිනා යන්න.[11]
අවංක සිත් ඇති සියල්ලෙනි, ප්‍රීති ඝෝෂා නඟන්න.[12]

**33** ධර්මිෂ්ඨ තැනැත්තෙනි, යෙහෝවා දෙවි නිසා ප්‍රීති ඝෝෂා නඟන්න.[13]
අවංක තැනැත්තෙනි, ඔබ ඔහුට ප්‍රශංසා කිරීම සුදුසුය.[14]
2 වීණාව වයමින් යෙහෝවා දෙවිට ස්තුති කරන්න.[1]
තත් දසයේ සංගීත භාණ්ඩ වයමින් ඔහුට ප්‍රශංසා ගී ගයන්න.[2]
3 අලුත් ගීයක් ඔහුට ගායනා කරන්න.[3]
මුළු හදවතින්ම ප්‍රීති ඝෝෂා නඟමින් සංගීත භාණ්ඩ වාදනය කරන්න.[4]
4 මන්ද යෙහෝවා දෙවිගේ වදන් සාධාරණය.[5]
ඔහුගේ සියලු ක්‍රියා විශ්වාසවන්තය.[6]
5 ඔහු ධර්මිෂ්ඨකමටත් යුක්තියටත් ප්‍රිය කෙනෙකි.[7]
යෙහෝවා දෙවිගේ මහත් ප්‍රේමයෙන්* පොළොව පිරී ඇත.[8]
6 යෙහෝවා දෙවිගේ අණ පරිදි අහස නිර්මාණය කර ඇත.[9]
ඔහුගේ හුස්මෙන් එහි ඇති සියල්ල* සෑදුවේය.[10]
7 වෙල්ලක් බඳින්නාක් මෙන් ඔහු මුහුදු ජලය එක් තැනකට සීමා කර තැබුවේය.[11]
ඔහු විශාල ජල ස්කන්ධය රැස් කර තැබුවේය.
8 පොළොවේ සිටින සියල්ලෙනි, යෙහෝවා දෙවිට ගරුබිය දක්වන්න.[12]
සියලු වැසියෙනි, ඔහු ඉදිරියේ ගරුබිය ඇතුව සිටින්න.[13]
9 මන්ද ඔහු යමක් පැවසුවේද එසැණින් එය ඉටු විය.[14]
ඔහු යමක් අණ කළේද විගස එය සිදු විය.[15]
10 යෙහෝවා දෙවි ජාතීන්ගේ සැලසුම් බිඳ දැමුවේය.[16]
ඔහු ජනයාගේ සිතුවිලි අසාර්ථක කළේය.[17]

**32 ගීතාවලිය**
1 ගීතා 124:4; එළි 12:16
2 ගීතා 9:9; ගීතා 27:5; ගීතා 119:114
3 නික් 15:1; විනි 5:1; 2සාමු 22:1
4 ගීතා 27:11; ගීතා 86:11; යෙරෙ 7:23
5 හිතෝ 3:6
6 යෝබ් 35:11
7 යෙරෙ 31:18; යාකො 3:3
8 යෝබ් 35:11; හිතෝ 26:3; යෙරෙ 8:6
9 හිතෝ 13:21; රෝම 2:9
10 ගීතා 34:8; හිතෝ 16:20; යෙරෙ 17:7
11 ගීතා 68:3; පිලි 4:4
12 ගීතා 64:10

**33 ගීතාවලිය**
13 ගීතා 32:11; ගීතා 97:12; පිලි 4:4
14 ගීතා 147:1

**2 තීරුව**
1 ගීතා 81:2
2 ගීතා 92:3; ගීතා 144:9
3 ගීතා 40:3; ගීතා 98:1; ගීතා 149:1; යෙසා 42:10; එළි 5:9
4 1ලේක 13:8; එෆී 5:19
5 ගීතා 12:6; හිතෝ 30:5
6 ගීතා 111:7
7 යෝබ් 37:23; ගීතා 11:7; ගීතා 45:7
8 ගීතා 145:16; ක්‍රියා 14:17
9 හෙබ්‍රෙ 11:3; 2පේතෘ 3:5
10 උත් 2:1; ගීතා 104:30
11 උත් 1:9; යෝබ් 26:10; යෝබ් 38:8; හිතෝ 8:29; යෙරෙ 5:22
12 එළි 14:7
13 ගීතා 76:7
14 උත් 1:3; ගීතා 148:5
15 ගීතා 119:90

**16** යෙසා 8:10; යෙසා 19:3; **17** ගීතා 21:11; ගීතා 140:8.

**ගීතා 32:10*** හෝ, "ළැදි ප්‍රේමය."

**ගීතා 33:5*** හෝ, "ළැදි ප්‍රේමයෙන්." **6*** මූ.අ., "සේනාවන්."

**11** යෙහෝවා දෙවිගේ අරමුණ සදහටම පවතින්නේය.[1]
පරම්පරා ගණනාවක් ගත වුවත් ඔහුගේ කැමැත්ත එලෙසම පවතින්නේය.[2]
**12** යෙහෝවා දෙවිව තමන්ගේ දෙවි ලෙස පිළිගෙන සිටින ජාතියද[3]
දෙවි තම උරුමය ලෙස තෝරාගත් සෙනඟද සන්තෝෂවත්ය.[4]
**13** යෙහෝවා දෙවි ස්වර්ගයේ සිට බැලූ විට[5]
සියලු මනුෂ්‍යයන් ඔහුගේ නෙත ගැටිණ.[6]
**14** ඔහුගේ ස්ථිර වාසස්ථානයේ සිට[7]
ඔහු පොළොවේ ජීවත් වන සියල්ලන් දෙස බැලුවේය.
**15** ඔහු ඔවුන්ගේ හදවත් නිසි ලෙස සකසන්නේය.[8]
ඔවුන්ගේ සියලු ක්‍රියාවන් සෝදිසි කර බලන්නේය.[9]
**16** යුධ සේනාවක් විශාල වූ පමණින් රජෙකුට ආරක්ෂාවක් නොලැබෙන්නේය.[10]
බොහෝ බලය තමන් සතුව තිබූ පමණින් මිනිසෙක් නොගැලවෙන්නේය.[11]
**17** තමන්ට අශ්වයන් සිටි පමණින් ගැලවීම ලැබේයයි සිතීම මෝඩකමකි.[12]
උන්ට බොහෝ ශක්තිය තිබුණත් ඉන් කිසිවෙකු ගලවාගත නොහැක.[13]
**18** යෙහෝවා දෙවිගේ ඇස් ඔහුට ගරුබිය ඇත්තාවූ[14]
ඔහුගේ මහත් ප්‍රේමය* ලැබීමට ආශාවෙන් සිටින්නාවූ අය දෙසට යොමු වී තිබේ.[15]
**19** ඔවුන්ව මරණයෙන් ගලවාගන්නා පිණිසත්[16]
සාගතයෙන් මිය යැමට නොදී ආරක්ෂා කරගන්නා පිණිසත් ඔහු එසේ කර තිබේ.[17]

**ගීතා 33:18*** හෝ, “ළැදි ප්‍රේමය.”

**33 ගීතාවලිය**
**1** යෝබ් 23:13 හිතෝ 19:21 යෙසා 46:10
**2** ගීතා 92:5 යෙසා 55:8 යෙරෙ 29:11
**3** ද්වි 33:29 ගීතා 144:15
**4** ගීතා 65:4 ගීතා 135:4 1පේතෘ 2:9
**5** ගීතා 11:4 ගීතා 14:2 හිතෝ 15:3
**6** හෙබ්‍රෙ 4:13
**7** 1රාජා 8:30 ගීතා 115:3
**8** 1ලේක 28:9 ගීතා 105:25
**9** යෝබ් 34:21 හිතෝ 24:12
**10** යොෂු 11:6 2ලේක 32:21
**11** ගීතා 44:5 යෙරෙ 9:23
**12** ද්වි 17:16 2රාජා 7:7 ගීතා 20:7 හිතෝ 21:31 යෙසා 31:1 හොෂෙ 14:3
**13** ගීතා 147:10
**14** යෝබ් 36:7 ගීතා 34:15 1පේතෘ 3:12
**15** ගීතා 147:11
**16** ගීතා 56:13
**17** ගීතා 37:19 යෙසා 33:16

**2 තීරුව**
**1** ගීතා 62:1 ගීතා 130:6
**2** උත් 15:1 ද්වි 33:29 ගීතා 18:2 ගීතා 115:9
**3** 1ලේක 16:10 ගීතා 28:7 හිතෝ 18:10
**4** ගීතා 13:5 සෙක 10:7
**5** ගීතා 32:10 ගීතා 119:76
**6** ගීතා 31:24 මීකා 7:7

**34 ගීතාවලිය**
**7** 1සාමු 21:13
**8** ක්‍රියා 16:25 එෆී 5:20
**9** ගීතා 44:8 ගීතා 71:8
**10** යෙසා 45:25 යෙරෙ 9:24 1කොරි 1:31

**20** අපි යෙහෝවා දෙවි කෙරෙහි බලාපොරොත්තුවෙන් සිටින්නෙමු.[1]
ඔහු අපේ උපකාරකයාය. අපේ පලිහය.[2]
**21** ඔහුගේ ශුද්ධ නාමය කෙරෙහි අපි විශ්වාසය තැබූ නිසා[3]
අපේ සිත් සතුටෙන් පිරී ඉතිරී යන්නේය.[4]
**22** යෙහෝවා දෙවියනි, ඔබේ ප්‍රේමය* අපට පෙන්වන්න.[5]
මන්ද අපි බලාපොරොත්තු තබා තිබෙන්නේ ඔබ කෙරෙහිය.[6]

දාවිත් සිහිවිකල් වූ කෙනෙකු ලෙස අබිමෙලෙක් ඉදිරියේ හැසිරුණු විට[7] ඔහු දාවිත්ව එතැනින් පලවාහැරියේය. ඒ ගැන දාවිත් රචනා කළ ගීතයකි.

א [ආලෙෆ්]

**34** මම සැමවිටම යෙහෝවා දෙවිට ප්‍රශංසා කරමි.[8]
ඔහුට කරන ප්‍රශංසාව නිතරම මාගේ මුවේ තිබේ.[9]

ב [බේත්]

**2** මම යෙහෝවා දෙවි ගැන ආඩම්බරයෙන් කතා කරමි.[10]
නිහතමානී අය එය අසා ප්‍රීතිමත් වන්නෝය.[11]

ג [ගීමෙල්]

**3** ජනයෙනි, මා සමඟ එක්ව යෙහෝවා දෙවිට ප්‍රශංසා කරන්න.[12]
අපි එක්ව ඔහුගේ නාමය ගෞරවයට පත් කරමු.[13]

ד [දාලෙත්]

**4** මම යෙහෝවා දෙවිගෙන් උපකාර ඉල්ලුවෙමි. ඔහු මට සවන් දී[14]
මා තුළ තිබූ බිය මාගෙන් ඉවත් කළේය.[15]

**11** ගීතා 119:74; **12** ගීතා 35:27; ගීතා 69:30; ලූක් 1:46; **13** ගීතා 148:13; **14** ලූක් 11:9; හෙබ්‍රෙ 5:7; **15** ගීතා 18:48; ගීතා 144:10.

**ගීතා 33:22*** හෝ, “ළැදි ප්‍රේමය.”

ה [හේ]
5 ඔහුගේ මහ පෙන්වීම් පැතූ අය
ආලෝකය ලැබුවෝය.[1]
ඔවුහු කිසිදා ලැජ්ජාවට පත්
නොවන්නෝය.[2]
ו [ෂායින්]
6 පීඩිතව සිටින මම දෙවිට හඬගැසු-
වෙමි. එවිට යෙහෝවා දෙවි
මට සවන් දුන්නේය.[3]
මාගේ සියලු කරදරවලින් ඔහු
මාව ගලවාගත්තේය.[4]
ח [චේත්]
7 යෙහෝවා දෙවිගේ දූතයා දෙවි
කෙරෙහි ගරුබිය ඇති අය
වටා කඳවුරු බැඳ[5]
ඔවුන්ව ගලවාගන්නේය.[6]
ט [ටේත්]
8 ජනයෙනි, යෙහෝවා දෙවි යහපත්
බව රස බලා දැනගන්න.[7]
ඔහුගේ රැකවරණය පතන්නා
සන්තෝෂවත්ය.[8]
י [යෝද්]
9 යෙහෝවා දෙවිගේ ශුද්ධ තැනැත්-
තෙනි, ඔහු කෙරෙහි ගරුබිය
ඇතුව සිටින්න.[9]
මන්ද ඔහු කෙරෙහි ගරුබිය
ඇති අයට කිසිවකින් හිඟ-
යක් නොවන්නේය.[10]
כ [කෆ්]
10 තරුණ, කේශර සිංහයෝ පවා
හාමතේ සිටිති.[11]
නමුත් යෙහෝවා දෙවිගේ මහ
පෙන්වීම් පතන්නන්ට යහ-
පත් දෙයකින් කිසිම අඩුවක්
නොවන්නේය.[12]
ל [ලාමෙද්]
11 මාගේ පුත්‍රයෙනි, ඇවිත් මට
ඇහුම්කන් දෙන්න.[13]
යෙහෝවා දෙවිට ගරුබිය ඇතුව
සිටීම යනු කුමක්ද කියා මම
ඔබට උගන්වන්නෙමි.[14]
מ [මෙම්]
12 ජීවිතයට ආදරයක් ඇති,[15]
දීර්ඝ ආයුෂ ලබමින් යහපත්
දේ භුක්ති විඳීමට කැමති
තැනැත්තා කවුද?[16]

נ [නූන්]
13 ඔබේ දිව නපුරු කතාවෙන්ද[1]
ඔබේ තොල් වංචා දේ පැවසී-
මෙන්ද වළක්වාගන්න.[2]
ס [සාමෙක්]
14 නපුරට පිටු පා යහපත කරන්න.[3]
සමාදානය සොයා, එය ලුහු-
බඳින්න.[4]
ע [ආයින්]
15 යෙහෝවා දෙවිගේ ඇස් ධර්මිෂ්ඨ-
යන් දෙසටත්[5]
ඔහුගේ කන් ඔවුන්ගේ අයැදීම්
වෙතටත් යොමු වී තිබේ.[6]
פ [පේ]
16 නමුත් නපුරු දේවල් කරන්නන්ව
යෙහෝවා දෙවි ප්‍රතික්ෂේප
කරයි.[7]
නැවත කිසිදාක ඔවුන් ගැන
අසන්නවත් නොලැබෙයි.[8]
צ [ට්සාධේ]
17 ධර්මිෂ්ඨයන් හඬගැසූ විට යෙ-
හෝවා දෙවිට ඔවුන්ගේ හඬ
ඇසුණේය.[9]
ඔවුන් අද්දකින සියලු පීඩාව-
ලින් ඔහු ඔවුන්ව ගලවාගත්-
තේය.[10]
ק [කෝෆ්]
18 යෙහෝවා දෙවි බිඳුණු සිත් ඇති
අයට සමීපව සිටියි.[11]
තැළුණු හදවත් ඇති අයව ඔහු
බේරාගනියි.[12]
ר [රේෂ්]
19 ධර්මිෂ්ඨයාට දුක් කරදර බො-
හෝය.[13]
නමුත් ඒ සියල්ලෙන්ම යෙ-
හෝවා දෙවි ඔහුව ගලවා-
ගන්නේය.[14]
ש [ෂින්]
20 ඔහු ධර්මිෂ්ඨයාගේ සෑම ඇටකටු-
වක්ම ආරක්ෂා කරයි.
එයින් එකක්වත් නොබිඳෙයි.[15]

**34 ගීතාවලිය**
**1** 2කොරි 3:18
**2** ගීතා 37:19
**3** ගීතා 3:4
ගීතා 10:17
**4** 2සාමු 22:1
**5** 2රාජා 6:17
ගීතා 91:11
මතෙ 18:10
ක්‍රියා 5:19
ක්‍රියා 12:11
හෙබ්‍රෙ 1:14
**6** 2රාජා 19:35
දානි 6:22
**7** යෙරෙ 31:14
1පේතෘ 2:3
**8** ගීතා 84:12
ගීතා 94:22
**9** උත් 22:12
ගීතා 19:9
හොෂෙ 3:5
**10** ගීතා 23:1
පිලි 4:19
**11** යෝබ් 4:11
**12** ගීතා 23:6
ගීතා 84:11
ලූක් 1:53
**13** හිතෝ 4:1
**14** යෝබ් 28:28
ගීතා 111:10
හිතෝ 1:7
හිතෝ 8:13
**15** ද්වි 6:2
ද්වි 30:20
ගීතා 21:4
ගීතා 91:16
මතෙ 7:14
1පේතෘ 3:10
**16** ගීතා 4:6
දේශ 2:3

**2 තීරුව**
**1** ගීතා 39:1
හිතෝ 15:4
යාකො 1:26
යාකො 3:8
**2** හිතෝ 12:19
හිතෝ 12:22
කොලො 3:9
1පේතෘ 2:1
**3** ගීතා 37:27
ගීතා 97:10
හිතෝ 3:7
යෙසා 1:16
ආමො 5:15
රෝම 12:9
**4** මතෙ 5:9
රෝම 12:18
හෙබ්‍රෙ 12:14
1පේතෘ 3:11
**5** යෝබ් 36:7
ගීතා 33:18
1පේතෘ 3:12
**6** ගීතා 10:17
ගීතා 18:6
ගීතා 94:9
යෙසා 59:1
**7** ලෙවී 17:10
යෙරෙ 44:11
එස 14:8
ආමො 9:4

**8** ගීතා 10:16; ගීතා 37:10; හිතෝ 10:7; යෙසා 26:14; **9** ගීතා 30:2; ගීතා 91:15; ගීතා 145:18; **10** 2ලේක 32:22; ගීතා 91:15; ක්‍රියා 12:11; **11** ගීතා 147:3; යෙසා 61:1; **12** ගීතා 51:17; යෙසා 57:15; යෙසා 66:2; ලූක් 4:18; **13** හිතෝ 24:16; ක්‍රියා 14:22; 2තිමෝ 3:12; **14** දානි 6:22; 1කොරි 10:13; **15** යොහ 19:36.

ת [ටාව්]

21 ධර්මිෂ්ඨයාට වෛර කරන්නන්ව වරදකරුවන් ලෙස ප්‍රකාශ කරනු ලබන්නේය.[1]
දුෂ්ටයා විපත්ති නිසා මරණයට පත් වන්නේය.[2]
22 යෙහෝවා දෙවි තම සේවකයන්ගේ ජීවිත බේරාගන්නේය.[3]
ඔහුගේ රැකවරණය පතන කිසිවෙක් දඬුවම් නොලබන්නේය.[4]

දාවිත් රචනා කළ ගීතයකි.

35 යෙහෝවා දෙවියනි, මාගේ සතුරන් මට විරුද්ධව එල්ල කරන චෝදනා දෙස බලා මට සාධාරණය ඉටු කරන්න.[5]
මට විරුද්ධව සටන් කරන අයට එරෙහිව සටන් කරන්න.[6]
2 කුඩා පලිහත් මහා පලිහත් රැගෙන[7]
මාගේ උපකාරයට එන්න.[8]
3 මා පසුපස ලුහුබඳින්නන්ට විරුද්ධව හෙල්ලයද පොරවද අතැතිව පැමිණෙන්න.[9]
ඔබ මට ගැලවීම සලසා දෙන බව මට පවසන්න.[10]
4 මාගේ ජීවිතය නැති කිරීමට සොයන අය ලැජ්ජාවටත් අවමානයටත් පත් වෙත්වා![11]
මට විරුද්ධව කුමන්ත්‍රණය කරන අයව වියවුල් කර පලවාහරිනු ලබත්වා![12]
5 ඔවුහු සුළඟට ගසාගෙන යන දහයියා මෙන් වෙත්වා![13]
යෙහෝවා දෙවිගේ දූතයා ඔවුන්ව පලවාහරිනු ලැබේවා![14]
6 ඔවුන්ගේ මාර්ගය ලිස්සනසුලු අඳුරු තැනක් වේවා![15]
යෙහෝවා දෙවිගේ දූතයා ඔවුන් පසුපස ලුහුබඳීවා!
7 මන්ද කිසිම හේතුවක් නොමැතිව ඔවුහු මාව හසු කරගැනීමට දැල් එළුවෝය.[16]
නිස්කාරණයේ මාගේ ජීවිතය නැති කර දැමීමට ඔවුහු උගුල් ඇටෙව්වෝය.[1]
8 හදිස්සියේම ඔවුන් පිටට විනාශය පැමිණේවා![2]
ඔවුන් එළූ දැලට ඔවුහුම හසු වෙත්වා![3]
ඔවුන් ඇටවූ උගුලට ඔවුහුම හසු වී විනාශ වෙත්වා![4]
9 නමුත් මම යෙහෝවා දෙවි කෙරෙහි ප්‍රීති වෙමි.[5]
ඔහු සලසා දෙන ගැලවීම ගැන ප්‍රීතියෙන් පිනා යන්නෙමි.[6]
10 "යෙහෝවා දෙවියනි, ඔබ පීඩිතයාව බලවතා අතින්ද[7]
පීඩා විඳින දුප්පතාව සොරුන් අතින්ද ගලවාගන්නෙහිය.[8]
එසේ ක්‍රියා කරන කෙනෙක් තවත් සිටීද"[9]
කියා මාගේ මුළු හදවතින්ම පැවසීමට මා තුළ පෙලඹීමක් ඇති වේවා![10]
11 බොරු සාක්ෂිකරුවෝ ඉදිරිපත් වී[11]
මා නොදන්නා දේ මාගෙන් අසති.[12]
12 යහපත කළ මට ඔවුහු අයහපත කරති.[13]
මාගේ ජීවිතයට දුක් දෙති.[14]
13 නමුත් ඔවුන් රෝගාතුරව සිටියදී මම ගෝණි රෙදි ඇඳගෙන,[15]
නිරාහාරව සිට ඔවුන් වෙනුවෙන් වැලපුණෙමි.[16]
මා කළ යාච්ඤාව නැවත මා වෙතට හිස්ව හැරී ආවේය.[17]
14 මාගේ මිතුරන් ලෙසද මාගේම සහෝදරයන් ලෙසද මම ඔවුන්ව සැලකුවෙමි.[18]
මට ඔවුන් ගැන මහත් වේදනාවක් දැනිණ.
මවක් අහිමි වූ කෙනෙකු මෙන්

**34 ගීතාවලිය**
**1** ගීතා 89:23; යොහ 7:7
**2** ගීතා 94:23; යෙසා 3:11
**3** 1රාජා 1:29; ගීතා 71:23; ගීතා 103:4; විලා 3:58
**4** ගීතා 9:10; ගීතා 84:11

**35 ගීතාවලිය**
**5** 1සාමු 24:15; ගීතා 43:1; ගීතා 119:154
**6** නික් 14:25; යොෂු 10:42; ගීතා 3:7
**7** නික් 15:3
**8** ගීතා 33:20; යෙසා 42:13
**9** 1සාමු 23:26
**10** ගීතා 62:7; යෙසා 12:2
**11** ගීතා 40:14; ගීතා 70:2; යෙරෙ 17:18
**12** ගීතා 35:26
**13** ගීතා 1:4; යෙසා 17:13; හොෂෙ 13:3; මතෙ 3:12
**14** නික් 14:19; යෙසා 37:36; ක්‍රියා 12:23
**15** ගීතා 73:18; හිතෝ 4:19; යෙරෙ 23:12
**16** ගීතා 140:5

**2 තීරුව**
**1** ගීතා 119:85
**2** හිතෝ 29:1
**3** ගීතා 7:15; ගීතා 9:15; ගීතා 57:6; ගීතා 141:10
**4** එස්ත 7:10; ගීතා 69:22; රෝම 11:9
**5** 1සාමු 2:1; හබ 3:18
**6** ගීතා 13:5; ගීතා 21:1
**7** ගීතා 18:17; ගීතා 37:40
**8** ගීතා 40:17; හිතෝ 22:23
**9** නික් 15:11; ගීතා 71:19
**10** ගීතා 22:14
**11** ගීතා 27:12; මතෙ 26:59
**12** ක්‍රියා 6:13

**13** 1සාමු 19:5; ගීතා 38:20; ගීතා 109:5; යෙරෙ 18:20; යොහ 10:32; යොහ 18:23; **14** 1සාමු 20:33; **15** යෝබ් 30:25; ගීතා 69:11; **16** ලෙවී 16:31; 1රාජා 21:27; යෙසා 58:3; **17** ලූක් 10:6; **18** 2සාමු 1:17.

මම ඔවුන් නිසා ශෝකයෙන් සිටියෙමි.[1]
15 නමුත් මාගේ පය ලිස්සූ විට ඔවුහු එක්ව ප්‍රීති වූහ.[2]
මට විරුද්ධව ක්‍රියා කිරීමට ඔවුහු රැස් වූහ.[3]
සැඟවී සිට ඔවුහු මට පහර දුන්හ.[4]
දිගින් දිගටම මාගේ චරිතය ඝාතනය කළහ.[5]
16 දෙවිට ද්‍රෝහිව කටයුතු කරන ඔවුහු, කෑම ටිකක් ලබාගන්නා අටියෙන් මාව සමච්චලයට ලක් කරති.[6]
මට විරුද්ධව කෝපයෙන් දත්මිටි කති.[7]
17 යෙහෝවා දෙවියනි, ඔබ කොපමණ කාලයක් මේ දෙස බලා සිටින්නෙහිද?[8]
ඔවුන් ගෙනෙන දරුණු පීඩාවලින් මාගේ ජීවිතය බේරාගන්න.[9]
තරුණ, කේශර සිංහයන්ගෙන් මාගේ වටිනා ජීවිතය ගලවාගන්න.[10]
18 රැස්ව සිටින සමූහය මැදදී මම ඔබව පසසන්නෙමි.[11]
බොහෝ සෙනඟ අතරේ මම ඔබට ප්‍රශංසා කරන්නෙමි.[12]
19 කිසිදු හේතුවක් නොමැතිව මට සතුරුකම් කරන අයට මාගේ දුකේදී සතුටු වීමට ඉඩ නොදෙන්න.[13]
නිස්කාරණයේ මට වෛර කරන අයට මාව සමච්චලයට ලක් කිරීමට ඉඩ නොදෙන්න.[14]
20 ඔවුහු සමාදානය ඇති කරන අන්දමින් කතා කරනවා වෙනුවට[15]
කිසිවෙකුට හිංසාවක් නොකර අහිංසකව ජීවත් වන අයට
විරුද්ධව බොරු චෝදනා එල්ල කරති.[16]
21 ඔවුහු කෑගසා මට අපහාස කරති.[17]
"අපි සිතූ විදිහටම දේවල් සිදු වුණා" කියා ඔවුහු මහත් සතුටින් කියති.[1]
22 යෙහෝවා දෙවියනි, මේ හැම දෙයක්ම ඔබට පෙනෙන නිසා[2] නිහඬව නොසිටින්න.[3]
අනේ යෙහෝවා දෙවියනි, මාගෙන් ඈත්වී නොසිටින්න.[4]
23 යෙහෝවා මාගේ දෙවියනි, මා වෙනුවෙන් නැඟී සිටින්න.[5]
මා වෙනුවෙන් ඉදිරිපත් වී මට යුක්තිය ඉටු කර දෙන්න.[6]
24 යෙහෝවා මාගේ දෙවියනි, ඔබේ ධර්මිෂ්ඨ ප්‍රමිතිවලට අනුව මාව විනිශ්චය කරන්න.[7]
මාගේ දුකේදී ඔවුන්ට සතුටු වීමට ඉඩ නොදෙන්න.[8]
25 "අපේ කුමන්ත්‍රණය සාර්ථකයි" කියා සිතන්න ඔවුන්ට ඉඩ නොදෙන්න.[9]
"අපි ඔහුව නැති කර දැම්මා" කියා පැවසීමට ඔවුන්ට ඉඩ නොදෙන්න.[10]
26 මාගේ දුක් කරදර ගැන සතුටු වන සියල්ලෝ[11]
ලැජ්ජාවටත් අවමානයටත් පත් වෙත්වා![12]
මාව සුළු කොට මහත් ආඩම්බරයකින් කතා කළ අයට[13] ලැජ්ජාව හා නින්දාව උරුම වේවා![14]
27 මාගේ ධර්මිෂ්ඨකම ගැන සතුටු වන්නෝ ප්‍රීති ඝෝෂා නඟමින්[15] සැමදා මෙසේ කියනු ලබත්වා![16]
"තම සේවකයා හොඳින් ජීවත් වනවා දැකීමෙන් සතුටට පත් වන යෙහෝවා දෙවිට ගෞරවය ලැබේවා!"[17]
28 මම ඔබේ ධර්මිෂ්ඨකම ගැන ප්‍රකාශ කරන්නෙමි.[18]
දවස පුරා ඔබට ප්‍රශංසා කරන්නෙමි.[19]

**35 ගීතාවලිය**
1 උත් 24:67
2 හිතෝ 17:5
3 ගීතා 71:10
4 මතෙ 27:30
5 මතෙ 27:29
6 යොහ 18:28
7 යෝබ් 16:9, ගීතා 37:12, ක්‍රියා 7:54
8 හබ 1:13
9 ගීතා 69:14, ගීතා 142:6
10 ගීතා 22:20, ගීතා 57:4
11 ගීතා 22:22, ගීතා 40:9, ගීතා 111:1, හෙබ්‍රෙ 2:12
12 රෝම 15:9
13 ගීතා 25:2
14 ගීතා 69:4, හිතෝ 6:13, යොහ 15:25
15 මතෙ 26:4
16 ගීතා 31:13, යෙරෙ 11:19, මතෙ 12:24, 1පේතෘ 2:22
17 ගීතා 22:13

**2 තීරුව**
1 ගීතා 70:3
2 නික් 3:7, ක්‍රියා 7:34
3 ගීතා 28:1, ගීතා 50:21, ගීතා 83:1
4 ගීතා 10:1, ගීතා 71:12
5 ගීතා 44:23
6 ගීතා 119:154
7 ගීතා 7:8, ගීතා 26:1, ගීතා 96:13, යෙසා 11:4
8 ගීතා 13:4
9 ගීතා 70:3
10 ගීතා 27:12, ගීතා 41:2, ගීතා 56:1
11 යොහ 16:20
12 ගීතා 40:14
13 ගීතා 38:16
14 ගීතා 132:18
15 රෝම 12:15, 1කොරි 12:26
16 ගීතා 70:4
17 ගීතා 84:11, ගීතා 149:4
18 ගීතා 51:14
19 ගීතා 71:24, ගීතා 145:2

සංගීත අධ්‍යක්ෂක වෙතය.
යෙහෝවා දෙවිගේ සේවකයෙකු වූ දාවිත් රචනා කළ ගීතයකි.

**36** පව්කාර සිතුවිලි දුෂ්ටයාගේ හදවත තුළින්ම උපදින්නේය.[1]
දෙවි කෙරෙහි ඔහුට කිසි ගරුබියක් නැත.[2]
2 ඔහු තමා ගැන ඕනෑවට වඩා සිතීමෙන් තමාවම රවටාගනියි.[3]
තමා වරදක් කරන බව ඔහුට නොතේරෙයි. එබැවින් වරදට ද්වේෂ කිරීමට ඔහුට නොහැක.[4]
3 ඔහු පවසන වචන වේදනාකාරීය. මුළාකරවනසුලුය.[5]
යහපත කිරීමට ඔහු තුළ කිසි පෙලඹීමක් නැත.[6]
4 ඔහු යහනේ සිටින විටදී පවා යමෙකුට හානියක් කිරීමට සිතින් සැලසුම් යොදයි.[7]
ඔහු නරක මාර්ගයේ දිගටම ගමන් කරයි.[8]
නපුර කිසිවිටක ප්‍රතික්ෂේප නොකරයි.[9]
5 යෙහෝවා දෙවියනි, ඔබ පෙන්වන මහත් ප්‍රේමය* ස්වර්ගය දක්වාම නැඟ තිබේ.[10]
ඔබේ විශ්වාසවන්තකම අහසේ වලාකුළු දක්වාම විහිදී තිබේ.[11]
6 ඔබේ ධර්මිෂ්ඨකම ඔබ සෑදූ උස් කඳු මෙනි.[12]
ඔබේ විනිශ්චයන් ගැඹුරු ජලය මෙනි.[13]
යෙහෝවා දෙවියනි, ඔබ මිනිසුන්ව හා සතුන්ව ආරක්ෂා කරන්නෙහිය.[14]
7 දෙවියනි, ඔබ පෙන්වන ප්‍රේමය* මොන තරම් අනර්ඝද![15]
ඔබේ පියාපත් සෙවණේ සිටිමින් මනුෂ්‍යයෝ රැකවරණය ලබන්නෝය.[16]
8 තෘප්තියට පැමිණෙන තෙක්ම ඔබේ ගෘහයේ ඇති අනර්ඝ දේවලින් ඔවුහු පානය කරති.[1]
ඔවුන් වෙතට ගලා බසින ප්‍රීතිය නමැති ඔබේ ගංගාවෙන් ඔවුහු පානය කරති.[2]
9 ජීවිතයේ උල්පත ඔබය.[3]
ඔබෙන් ලැබෙන ආලෝකය නිසා ආලෝකය යනු කුමක්ද කියා අපි හඳුනාගන්නෙමු.[4]
10 ඔබව හඳුනාගත් අයට ඔබේ නොමියන ප්‍රේමය* සැමදා පෙන්වන්න.[5]
අවංක සිත් ඇත්තන්ට ඔබේ ධර්මිෂ්ඨකම පෙන්වන්න.[6]
11 උඩඟු අයට මාව පාගා දැමීමට ඉඩ නොදෙන්න.[7]
දුෂ්ටයන්ට මාව පන්නා දැමීමට ඉඩ නොදෙන්න.[8]
12 බලන්න! අනුන්ට හානි පමුණුවන්නෝ වැටී සිටිති.[9]
ආපසු නැඟිටීමට නොහැකි වන සේ ඔවුන්ව බිමට හෙළා ඇත.[10]

දාවිත් රචනා කළ ගීතයකි.

א [ආලෙෆ්]

**37** දුෂ්ටයන්ගේ ක්‍රියාවන් නිසා කේන්ති නොගන්න.[11]
අධර්මිෂ්ඨකම් කරන අයට ඊර්ෂ්‍යා නොකරන්න.[12]
2 මන්ද තණකොළ කෙටි කාලයකින් වියළී යන්නාක් මෙන් ඔවුහුද වියළී යන්නෝය.[13]
නිල් පලා මැලවී යන්නාක් මෙන් ඔවුහු පහව යන්නෝය.[14]

ב [බේත්]

3 යෙහෝවා දෙවි කෙරෙහි විශ්වාසය තබා යහපත කරන්න.[15]

**36 ගීතාවලිය**
1 හිතෝ 6:18
2 උත් 20:11 රෝම 3:18
3 ද්වි 29:19 ගීතා 10:3
4 ගීතා 97:10 ආමො 5:15
5 ගීතා 5:9 ගීතා 12:2
6 යෙරෙ 4:22
7 හිතෝ 4:16 මීකා 2:1
8 යෙසා 65:2
9 රෝම 1:32
10 ගීතා 57:10 ගීතා 103:11
11 ගීතා 89:2 ගීතා 108:4
12 ගීතා 71:19
13 රෝම 11:33
14 ගීතා 145:9 ගීතා 147:9 1තිමෝ 4:10
15 ගීතා 31:19 මීකා 7:18
16 රූත් 2:12 ගීතා 17:8 ගීතා 91:4

**2 තීරුව**
1 ගීතා 65:4 යෙරෙ 31:14 සෙක 9:17
2 ගීතා 16:11
3 යෝබ් 33:4 යෙරෙ 2:13 ක්‍රියා 17:28 එළි 4:11
4 යෝබ් 29:3 ගීතා 27:1 ගීතා 43:3 යෙසා 2:5 2කොරි 4:6 යාකො 1:17 1පේතෘ 2:9
5 ගීතා 103:17 යෙරෙ 22:16
6 ගීතා 7:10 ගීතා 94:15 ගීතා 97:11
7 ගීතා 10:2
8 ගීතා 16:8
9 ගීතා 58:10 2තෙස 1:8
10 ගීතා 1:5 යෙරෙ 51:64

**37 ගීතාවලිය**
11 ගීතා 37:7 හිතෝ 24:19
12 ගීතා 73:3 හිතෝ 3:31 හිතෝ 23:17
13 ගීතා 73:19 ගීතා 90:6 ගීතා 129:6
14 යාකො 1:10 1පේතෘ 1:24

15 ගීතා 4:5; යෙසා 1:17; යෙසා 50:10; හෙබ්‍රෙ 13:16.

**ගීතා 36:5*** හෝ, "ලැදි ප්‍රේමය." **7*** හෝ, "ලැදි ප්‍රේමය."

**ගීතා 36:10*** හෝ, "ලැදි ප්‍රේමය."

ජීවිත කාලය පුරාම විශ්වාස-
වන්තව කටයුතු කරන්න.[1]
4 යෙහෝවා දෙවිව ඔබේ ජීවිතයේ
සතුට කරගන්න.[2]
එවිට ඔබේ සිතේ ආශාවන් ඔහු
ඉටු කරනු ඇත.[3]

ג [ගීමෙල්]

5 ඔබේ ජීවිතය යෙහෝවා දෙවිට
භාර දෙන්න.[4]
ඔහු මත රඳා සිටින්න.[5] එවිට
ඔහු ඔබ වෙනුවෙන් නිසි පිය-
වර ගනියි.[6]
6 ඔහු ඔබේ ධර්මිෂ්ඨකම ආලෝකය
මෙන්ද[7]
ඔබේ යුක්තිය දහවල් ආලෝ-
කය මෙන්ද පැහැදිලිව පෙ-
නෙන්න සලස්වයි.[8]

ד [ආලෙත්]

7 යෙහෝවා දෙවි ක්‍රියා කරන
තෙක් නිහඬව,[9] ඉවසිලිවන්-
තව බලා සිටින්න.[10]
කෙනෙකු හිතුමතේට ක්‍රියා කර[11]
ජීවිතය සාර්ථක කරගත්තත් ඒ
ගැන කෝප නොවන්න.[12]

ה [හේ]

8 කෝප වීමෙන් වළකින්න. උදහස්
වීම අත්හරින්න.[13]
මන්ද කෝපය නපුරකට මඟ
පාදන්නේය.[14]
9 දුෂ්ටයන්ව විනාශ කරනු ලබන්-
නේය.[15]
නමුත් යෙහෝවා දෙවි කෙරෙහි
බලාපොරොත්තු තබන්නෝ
පොළොව උරුම කරගන්-
නෝය.[16]

ו [වාව්]

10 තව කෙටි කලකින් දුෂ්ටයා නැති
වී යන්නේය.[17]
ඔබ ඔහුව සෙව්වත් ඔහුව සො-
යාගැනීමට නොහැකි වන්-
නෙහිය.[18]
11 නමුත් නිහතමානී අය පොළොව
උරුම කරගන්නෝය.[19]
දසත පැතිරී තිබෙන සාමය
නිසා ඔවුහු මහත් සේ ප්‍රීති
වන්නෝය.[20]

**37 ගීතාවලිය**
**1** හිතෝ 28:20
**2** යෙසා 58:14
**3** ගීතා 21:2
**4** ගීතා 55:22
හිතෝ 16:3
**5** මතෙ 6:33
පිලි 4:6
1පේතෘ 5:7
**6** දේශ 9:1
විලා 3:37
යාකො 4:15
**7** මීකා 7:9
**8** මලා 3:18
මතෙ 7:2
**9** ගීතා 62:1
විලා 3:26
**10** ගීතා 27:14
**11** හිතෝ 19:21
යෙසා 10:13
**12** යෝබ් 21:7
ගීතා 73:3
යෙරෙ 12:1
**13** හිතෝ 14:29
හිතෝ 16:32
එෆී 4:26
**14** ලූක් 9:54
**15** යෝබ් 27:14
ගීතා 55:23
2පේතෘ 2:9
**16** ගීතා 25:13
ගීතා 37:29
යෙසා 57:13
යෙසා 58:14
මතෙ 5:5
**17** යෝබ් 24:24
හෙබ්‍රෙ 10:37
1පේතෘ 4:7
**18** 1සාමු 25:39
යෝබ් 7:10
ගීතා 52:5
**19** යෙසා 45:18
මතෙ 5:5
එළි 21:3
**20** ගීතා 72:7
ගීතා 119:165
යෙසා 26:3
යෙසා 48:18
පිලි 4:7

**2 තීරුව**
**1** ගීතා 35:16
**2** 1සාමු 18:21
මතෙ 26:4
**3** ගීතා 2:4
**4** 1සාමු 26:10
යෙරෙ 50:27
එස 21:25
**5** හබ 1:13
**6** ක්‍රියා 7:52
ක්‍රියා 12:2
1යොහ 3:12
**7** ගීතා 64:3
**8** 2සාමු 17:23
එස්ත 7:10
ගීතා 7:15
ගීතා 35:8
**9** ගීතා 46:9
ගීතා 76:3

ז [ෂායින්]

12 දුෂ්ටයා තරහෙන්, දත්මිටි කමින්[1]
ධර්මිෂ්ඨයාට විරුද්ධව කුමන්-
ත්‍රණය කරන්නේය.[2]
13 නමුත් යෙහෝවා දෙවි ඔහු දෙස
බලා සිනාසෙන්නේය.[3]
මන්ද දුෂ්ටයා විනාශය අද්දකින
දවස පැමිණෙන බව ඔහු
ස්ථිරෙන්ම දන්නේය.[4]

ח [චේත්]

14 පීඩිතයාව සහ දුප්පතාව තව
තවත් පාගා දමන පිණිසත්[5]
අවංකව ජීවත් වන අයව මරා
දමන පිණිසත්[6]
දුෂ්ටයෝ කඩුව පිටතට ඇද,
දුන්න සූදානම් කරගත්-
තෝය.[7]
15 නමුත් ඔවුන්ගේම කඩු ඔවුන්ගේ
හදවත් පසාරු කරන්නේය.[8]
ඔවුන්ගේ දුනු කැඩී යන්නේය.[9]

ט [ටේත්]

16 දුෂ්ටයන් සතු බොහෝ දේට
වඩා[10]
ධර්මිෂ්ඨයා සතු ස්වල්පය
හොඳය.[11]
17 මන්ද දුෂ්ටයන්ගේ බලය බිඳ දමනු
ලබන්නේය.[12]
නමුත් ධර්මිෂ්ඨයන්ට යෙ-
හෝවා දෙවිගේ උපකාරය
ඇත.[13]

י [යෝද්]

18 නිර්දෝෂ අයගේ ක්‍රියාවන් යෙ-
හෝවා දෙවි හොඳින් දන්-
නේය.[14]
ඔවුන්ගේ උරුමය සදාකාල-
යෙන් සදාකාලයටම පව-
තින්නේය.[15]
19 විපත්ති දවසේදී ඔවුහු ලැජ්ජාවට
පත් නොවන්නෝය.[16]
සාගත කාලයේදීද ඔවුහු කා බී
තෘප්තිමත්ව සිටින්නෝය.[17]

---

**10** හිතෝ 15:16; දේශ 2:26; **11** හිතෝ 16:8; හිතෝ 30:9; 1තිමෝ 6:6; **12** යෝබ් 38:15; ගීතා 10:15; **13** ගීතා 41:12; යූද් 24; **14** ගීතා 1:6; 2තිමෝ 2:19; **15** ගීතා 16:11; 1යොහ 2:25; **16** දේශ 9:12; ආමො 5:13; **17** ගීතා 33:19.

כ [කෆ්]

20 නමුත් දුෂ්ටයෝ විනාශ වී යන්නෝය.[1]
යෙහෝවා දෙවිගේ සතුරන් සරුවට වැඩුණු තණබිම් මෙන් සිටියත්
අවසානයේදී ඔවුහු විනාශ වී යන්නෝය.[2] ඔවුහු දුමක් මෙන් අතුරුදහන් වී යන්නෝය.[3]

ל [ලාමෙද්]

21 දුෂ්ටයා ණයට ගත් දේ පවා නොගෙවන්නේය.[4]
නමුත් ධර්මිෂ්ඨයා ත්‍යාගශීලීව බොහෝ තෑගිබෝග දෙන්නේය.[5]
22 දෙවිගෙන් ආශීර්වාද ලබන අය පොළොව උරුම කරගන්නෝය.[6]
නමුත් ඔහුගෙන් දඬුවම් ලබන අය විනාශ වී යන්නෝය.[7]

מ [මෙම්]

23 යෙහෝවා දෙවි මනුෂ්‍යයා යා යුතු මඟ පෙන්වා දෙන්නේය.[8]
යමෙකු එම මාර්ගයේ ගමන් කරන විට ඔහු ගැන දෙවි සතුටු වන්නේය.[9]
24 ඔහුගේ පය පැටලුණත් ඔහු සම්පූර්ණයෙන්ම ඇද වැටෙන්නේ නැත.[10]
මන්ද යෙහෝවා දෙවි ඔහුගේ අත අල්ලාගෙන සිටින්නේය.[11]

נ [නුන්]

25 දැන් මම මහලු වයසේ සිටිමි.[12] මාගේ තරුණ කාලයේ සිට මේ වන තෙක්
ධර්මිෂ්ඨයෙකුව කිසිසේත් අත්හැර දැමූ අවස්ථාවක් මම දැක නැත.[13]
ඔහුගේ දරුවන් කෑම හිඟනවාවත් මම දැක නැත.[14]
26 සෑම දිනකම ඔහු කරුණාව පෙන්වමින් ණයට දෙන්නේය.[15]
එබැවින් ඔහුගේ දරුවන්ට ආශීර්වාද ලැබෙන්නේය.[16]

ס [සාමෙක්]

27 නපුරෙන් ඈත් වී යහපත කරන්න.[1]
එවිට ඔබ සදහටම ජීවත් වනු ඇත.[2]
28 මන්ද යෙහෝවා දෙවි යුක්තියට ප්‍රිය කෙනෙකි.[3]
තමාව කිසි ලෙසකින්වත් අත් නොහරින අයව ඔහුත් අත් නොහරින්නේය.[4]

ע [ආයින්]

ඔවුන්ව සදාකාලයටම ආරක්ෂා කරනු ලබන්නේය.[5]
නමුත් දුෂ්ටයන්ගේ දරුවෝ විනාශ වී යන්නෝය.[6]
29 ධර්මිෂ්ඨයෝ පොළොව උරුම කරගන්නෝය.[7]
ඔවුහු එහි සදාකල් ජීවත් වන්නෝය.[8]

פ [පේ]

30 ධර්මිෂ්ඨයාගේ මුඛයෙන් ප්‍රඥාව පිට වන්නේය.[9]
ඔහුගේ දිව සාධාරණ ලෙස කතා කරන්නේය.[10]
31 දෙවිගේ නීතිය නිතරම ඔහුගේ හදවතේ තිබේ.[11]
එබැවින් ඔහුගේ පාද කිසිවිටක නොලිස්සන්නේය.[12]

צ [ට්සාධේ]

32 දුෂ්ටයා නිතරම ධර්මිෂ්ඨයාව හසු කරගැනීමට බලා සිටින්නේය.[13]
ඔහුව මරා දැමීමට දුෂ්ටයා මාන බලන්නේය.[14]
33 නමුත් යෙහෝවා දෙවි ඔහුව දුෂ්ටයාගේ අතට හසු වීමට ඉඩ නොදෙන්නේය.[15]
ඔහුව විනිශ්චය කරන විට වරදකරුවෙකු ලෙස දෙවි තීන්දු නොකරන්නේය.[16]

ק [කෝෆ්]

34 යෙහෝවා දෙවි කෙරෙහි

**37 ගීතාවලිය**
**1** ගීතා 92:9 හිතෝ 10:7 2පේතෘ 2:12
**2** උත් 19:29
**3** ගීතා 102:3
**4** ද්වි 28:12 හිතෝ 22:7
**5** ද්වි 15:11 යෝබ් 31:16 ගීතා 112:9 හිතෝ 14:21 හිතෝ 19:17 දේශ 11:2 2තිමෝ 1:16
**6** ගීතා 37:9
**7** ගීතා 119:21 සෙක 5:4
**8** 1සාමු 2:9 හිතෝ 16:9
**9** හිතෝ 11:20 යෙරෙ 9:24
**10** ගීතා 34:19 ගීතා 145:14 හිතෝ 24:16
**11** ගීතා 91:12
**12** යෝබ් 32:6 ගීතා 71:18
**13** යොෂු 1:5 ගීතා 94:14 මතෙ 6:33 හෙබ්‍රෙ 13:5
**14** ද්වි 24:19 ගීතා 25:13 ගීතා 112:2 ගීතා 145:15 හිතෝ 10:3 හිතෝ 13:22
**15** ද්වි 15:8 ගීතා 112:5
**16** හිතෝ 20:7

**2 තීරුව**
**1** ගීතා 34:14 යෙසා 1:17 1පේතෘ 3:11
**2** හිතෝ 16:17
**3** යෝබ් 37:23 ගීතා 11:7 ගීතා 33:5 යෙරෙ 9:24
**4** 1සාමු 2:9 2සාමු 22:26 හිතෝ 2:8
**5** ගීතා 97:10
**6** යෝබ් 27:14 ගීතා 21:10 හිතෝ 2:22
**7** ද්වි 30:20 ගීතා 37:9 හිතෝ 2:21 මතෙ 5:5
**8** යෙසා 66:22 මතෙ 25:46 එළි 21:3
**9** යොෂු 1:8 ගීතා 1:2

---

**10** මතෙ 12:35; එෆී 4:29; කොලො 4:6; **11** ද්වි 6:6; ගීතා 40:8; හෙබ්‍රෙ 8:10; **12** ගීතා 121:3; **13** යෙරෙ 20:10; ලූක් 6:7; **14** ගීතා 10:8; ලූක් 19:47; ක්‍රියා 9:24; **15** ගීතා 31:8; 2තිමෝ 4:17; 2පේතෘ 2:9; **16** ගීතා 109:31.

බලාපොරොත්තු තබා ඔහු-
ගේ මාවතේ දිගටම ගමන්
කරන්න.[1]
එවිට ඔහු ඔබව උසස් කර ඔබට
පොළොව උරුම කර දෙන්-
නේය.[2]
දුෂ්ටයන්ව විනාශ කරන විට
ඔබ එය දකින්නෙහිය.[3]

ר [රේෂ්]

35 දුෂ්ටයාගේ කුරිරු පාලනය මම
දුටුවෙමි.[4]
සිටෙවූ පසෙහිම අතු පතර විහිදී
යමින් සරුසාරව වැඩෙන
ගසක් මෙන් ඔහු සාර්ථක
වෙනවාද මම දුටුවෙමි.[5]
36 නමුත් ඔහු දැන් එතැන නැත. ඔහු
විනාශ වී ගියේය.[6]
මා ඔහුව සෙව්වත් ඔහුව සොයා-
ගැනීමට නොහැකි විය.[7]

ש [ෂින්]

37 නිර්දෝෂව හා අවංකව කට-
යුතු කරන තැනැත්තා දෙස
බලන්න.[8]
සාමය පිරුණු අනාගතයක්
ඔහුට ඇත.[9]
38 නමුත් වැරදි කරන සියලුදෙනා-
වම විනාශ කරනු ලබන්-
නේය.[10]
දුෂ්ටයෝ වැඩි කල් පවතින්නේ
නැත.[11]

ת [ටාව්]

39 ධර්මිෂ්ඨයන්ට ගැලවීම ලැබෙන්-
නේ යෙහෝවා දෙවිගෙන්ය.[12]
දුක් කරදර ඇති කාලයේදී
ඔවුන්ගේ රක්ෂස්ථානය
ඔහුය.[13]
40 යෙහෝවා දෙවි ඔවුන්ට උපකාර
කර ඔවුන්ට ගැලවීම සලසා
දෙන්නේය.[14]
ඔවුන් දෙවිගේ රැකවරණය
පතන නිසා ඔහු
දුෂ්ටයන්ගේ අතින් ඔවුන්ව ගල-
වාගන්නේය.[15] ඔහු ඔවුන්ව
ආරක්ෂා කරන්නේය.[16]

නැවත මතක් කිරීමක් ලෙස
දාවිත් රචනා කළ ගීතයකි.

38 යෙහෝවා දෙවියනි, කෝප-
යෙන් මට තරවටු නොක-
රන්න.[1]
කේන්තියෙන් මට දඬුවම්
නොකරන්න.[2]
2 ඔබේ ඊතල මාගේ ශරීරය පසාරු
කරමින් ඇතුළටම ගොස්
ඇත.[3]
ඔබ දුන් දඬුවමේ වේදනාව මට
දැනිණ.[4]
3 ඔබ දුන් තරවටුව නිසා මාගේ මුළු
ගතම රිදුම් දෙයි.[5]
මා කළ පාපය නිසා මා තුළ
කිසි සැනසීමක් නැත.[6]
4 මා කළ වැරදි මාගේ හිසටත් ඉහ-
ළින් තිබේ.[7]
විශාල බරක් මෙන් ඒවා මා පිට
තිබේ. මට එය දරාගත නො-
හැක.[8]
5 මා කළ මෝඩකම් නිසා
මාගේ තුවාල පැසවා දුගඳක්
හමයි.[9]
6 මාගේ වේදනාව මට දරාගත නො-
හැකි නිසා මම බිම වැතිර
සිටිමි.[10]
දවස මුළුල්ලේ මම දුකින් ඇවිද්-
දෙමි.[11]
7 මාගේ තුනටිය වේදනාවෙන්
කකියයි.
මාගේ මුළු ගතම වේදනාවෙන්
දැවෙයි.[12]
8 මාගේ මුළු ඇඟම හිරිවැටී ඇත.
මම තැළී පොඩි වී සිටිමි.
සිතේ වේදනාවෙන් මම කෙඳිරි-
ගෑවෙමි.[13]
9 යෙහෝවා දෙවියනි, මාගේ සෑම
ආශාවක්ම ඔබ දන්නෙහිය.
මාගේ සෑම සුසුම්ලෑමක්ම
ඔබෙන් සැඟවී නොතිබු-
ණේය.[14]

**11** යෝබ් 30:28; ගීතා 42:9; **12** ගීතා 38:3; **13** යෝබ් 3:24; ගීතා 22:1; යෙසා 59:11; **14** රෝම 8:23.

**37 ගීතාවලිය**
**1** ගීතා 27:14 හිතෝ 4:26 හිතෝ 20:22
**2** ගීතා 37:22
**3** ගීතා 52:6 ගීතා 91:8
**4** එස්ත 5:11
**5** යෝබ් 21:7
**6** නික් 15:10 ක්‍රියා 12:23
**7** ගීතා 37:10
**8** යෝබ් 1:1
**9** යෝබ් 42:12 යෝබ් 42:16 හිතෝ 28:10 යෙසා 32:18
**10** ගීතා 1:4 ගීතා 9:17 ගීතා 52:5 හිතෝ 10:7
**11** 2පේතෘ 2:9
**12** ගීතා 3:8 යෙසා 12:2 යෝනා 2:9
**13** ගීතා 9:9 ගීතා 46:1 ගීතා 91:15 යෙසා 33:2
**14** යෙසා 31:5 යෙසා 46:4 1කොරි 10:13
**15** ගීතා 17:13 ගීතා 40:17
**16** 1ලේක 5:20 ගීතා 22:4 දානි 3:17 දානි 6:23

**2 තීරුව**

**38 ගීතාවලිය**
**1** ගීතා 6:1 හෙබ්‍රෙ 12:6
**2** ද්වි 9:19 යෙරෙ 10:24
**3** යෝබ් 6:4 විලා 3:12
**4** රූත් 1:13 ගීතා 32:4
**5** ගීතා 102:10 යෙසා 1:6
**6** ගීතා 6:2 ගීතා 31:10 ගීතා 41:4 ගීතා 51:8
**7** එස්රා 9:6 ගීතා 40:12
**8** මතෙ 11:28
**9** හිතෝ 20:30
**10** ගීතා 35:14

10 මාගේ හදවත වේගයෙන් ගැහෙන්-
නේය. මාගේ ශක්තිය හීන වී
ගොසින්ය.
මාගේ ඇස් අඳුරු වී ඇත.[1]
11 මට ආදරය කළ අයද මාගේ මිත්‍ර-
යෝද මාගේ විපත දැක
මාගෙන් ඈත්ව සිටිති.[2]
මාගේ කල්‍යාණ මිත්‍රයෝ පවා
මාගෙන් දුරස්ව සිටිති.[3]
12 මාව මරන්න සොයන අය මාව
අල්ලාගැනීමට උගුල් අට-
වති.[4]
මට හානියක් කිරීමට උත්සාහ
කරන අය මා ගැන නින්දිත
දේ පවසති.[5]
දවස මුළුල්ලේම ඔවුහු මට
විරුද්ධව උපායන් යොදති.[6]
13 නමුත් බිහිරෙකු සේ මම නොඇසු-
ණාක් මෙන් සිටිමි.[7]
ගොළුවෙකු සේ මම කතා නො-
කර සිටිමි.[8]
14 නැසෙන කෙනෙකු ලෙස මම
සිටියෙමි.
මම එකට එක කතා නොක-
ළෙමි.
15 මන්ද මම යෙහෝවා දෙවි වන
ඔබ කෙරෙහි බලාපොරොත්-
තුවෙන් සිටියෙමි.[9]
යෙහෝවා මාගේ දෙවියනි, ඔබ
මට පිළිතුරු දුන්නෙහිය.[10]
16 “ඔබ මට පිළිතුරු නොදුන්නොත්
මාගේ විපත දැක ඔවුහු ප්‍රීති
වෙති.[11]
මාගේ පය පැටලුණු විට[12] ඔවුහු
මට සිනාසී මහත් ආඩම්-
බරයකින් කතා කරති” කියා
මම කීවෙමි.[13]
17 මාගේ වේදනාව නිතරම මට
දැනිණ.[14]
සුළු මොහොතකින් මා වැටී
යන්නත් ඉඩ තිබිණ.[15]
18 මා කළ වරද ගැන ප්‍රකාශ
කළෙමි.[16]
මාගේ පාපය නිසා මම දුක්
වුණෙමි.[17]

**38 ගීතාවලිය**
**1** ගීතා 6:7
ගීතා 88:9
**2** යෝබ් 19:13
ගීතා 31:11
**3** ලූක් 23:49
**4** ගීතා 64:5
ගීතා 119:110
ලූක් 20:20
**5** 2සාමු 16:7
ගීතා 62:4
**6** ගීතා 35:20
හිතෝ 24:2
**7** 2සාමු 16:11
**8** ගීතා 39:2
ගීතා 39:9
ආමො 5:13
1පේත්‍රු 2:23
**9** 2සාමු 16:12
ගීතා 39:7
ගීතා 123:2
**10** ගීතා 138:3
**11** ගීතා 13:4
ගීතා 35:24
**12** ගීතා 94:18
**13** ගීතා 35:26
**14** ගීතා 77:2
**15** ගීතා 35:15
යෙරෙ 20:10
**16** ගීතා 32:5
**17** ගීතා 51:3

---

**2 තීරුව**
**1** ගීතා 25:19
**2** ගීතා 35:19
ගීතා 69:4
**3** 1සාමු 25:21
ගීතා 35:12
යෙරෙ 18:20
**4** 1පේත්‍රු 3:13
1යොහ 3:12
**5** ගීතා 22:11
ගීතා 35:22
**6** ගීතා 27:1
ගීතා 62:2
යෙසා 12:2
**7** ගීතා 40:13

---

**39 ගීතාවලිය**
**8** 1ලේක 16:41
1ලේක 25:1
**9** යෝබ් 2:10
ගීතා 12:4
හිතෝ 18:21
යාකො 3:5
**10** 1රාජා 2:4
ගීතා 34:13
ගීතා 119:9
හෙබ්‍රෙ 2:1
1පේත්‍රු 2:23
**11** කොලො 4:5
**12** ගීතා 141:3
යාකො 1:26
යාකො 3:2
**13** ගීතා 38:13
මතෙ 27:12

19 මාගේ සතුරෝ ශක්තිමත් වී තව
තවත් බලවත් වූහ.[1]
කිසිදු හේතුවක් නැතුව මට
වෛර කරන්නෝ වැඩි වූහ.[2]
20 යහපත කළ මට ඔවුහු අයහපත
කළෝය.[3]
මා යහපත කරන්න කොතරම්
උත්සාහ කළත් ඔවුහු ඊට
ඉඩ දුන්නේ නැත.[4]
21 අනේ යෙහෝවා දෙවියනි, මාව
අත් නොහරින්න.
මාගේ දෙවියනි, මාගෙන් ඈත්ව
නොසිටින්න.[5]
22 යෙහෝවා දෙවියනි, මාගේ ගැල-
වුම්කරු වන ඔබ[6]
මාගේ උපකාරයට ඉක්මනින්
පැමිණෙන්න.[7]

යෙදුතුන්*[8] සංගීත අධ්‍යක්ෂක වෙනය.
දාවිත් රචනා කළ ගීතයකි.

**39** “එක වචනයකින්වත් පව්
නොකිරීමට[9]
මම වගබලා ගන්නෙමි.[10]
දුෂ්ටයෙකු මා ඉදිරියේ සිටින
තාක් කල්[11]
මාගේ කට නොඅරින
පිණිස මම කටකලියා-
වක් දමාගන්නෙමි” කියා
කීවෙමි.[12]
2 මම කතා නොකර නිහඬව සිටි-
යෙමි.[13]
කිසිම යහපත් දෙයක්වත් නො-
කීවෙමි.[14]
මාගේ වේදනාව ගැනද කිසිවක්
නොකීවෙමි.
3 මාගේ හදවත මා තුළ දැවෙන්නට
විය.[15]
මා සුසුම්ලන විට ඒ ගින්න තව
තවත් ඇවිළුණේය.
එබැවින් මම මෙසේ කීවෙමි.
4 “යෙහෝවා දෙවියනි, මාගේ

---

**14** මතෙ 7:6; **15** යෙරෙ 20:9.

---

**ගීතා 39:පෙර*** මෙම හෙබ්‍රෙව් යෙදුමේ අර්ථය නිශ්චිතව පැවසිය නොහැක.

ජීවිතය කොතරම් ඉක්ම-
නින් අවසන් වෙයිද කියාත්[1]
මට හිමි වී ඇති දින ගණන
කොතරම් ස්වල්පද කියාත්
දැනගැනීමට මට උපකාර
කරන්න.[2]
එවිට මාගේ ජීවිත කාලය කො-
තරම් කෙටිද කියා මට වට-
හාගත හැක.[3]
5 බලන්න! මා ජීවත් වන්නේ ස්වල්ප
දවසකි.[4]
මාගේ ආයු කාලය ඔබට නො-
දැනෙන තරම්ය.[5]
මිනිසා කොතරම් ශක්තිමත්ව
සිටියත් පලක් නැත. මන්ද
ඔහු ගසාගෙන යන සුළඟක්
මෙනි.[6] සීලාහ්.
6 මිනිසා වෙනස් වන සෙවණැල්ලක්
මෙනි.[7]
ඔවුහු නිකරුණේ කලබලෙන්
ක්‍රියා කරති.[8]
තමන් රැස් කරන දේවල් කාට
උරුම වෙයිද කියාත් ඔවුහු
නොදනිති.[9]
7 යෙහෝවා දෙවියනි, දැන් මා
කුමක් අපේක්ෂාවෙන් සිටින්-
නද?
මාගේ බලාපොරොත්තුව
ඔබය.[10]
8 මා කළ සියලු වැරදිවලින් මාව
ගලවාගන්න.[11]
මට නින්දා කිරීමට අඥානයාට
ඉඩ නොදෙන්න.[12]
9 ඔබ මේ සියල්ල සිදු වීමට අවසර
දී තිබෙන නිසා[13]
මම නිහඬව සිටියෙමි.[14] කිසි
වචනයක්වත් නොකියා මම
කට පියාගෙන සිටියෙමි.[15]
10 ඔබ මට විදීමට ඉඩහැරිය පීඩා
මාගෙන් ඉවත් කරන්න.[16]
මන්ද ඔබ මට විරුද්ධව ක්‍රියා
කරන නිසා මාගේ අවසානය
ළං වී ඇත.[17]
11 මිනිසෙකු වරදක් කළ විට ඔහුව
නිවැරදි කිරීමට ඔබ ඔහුට
දඬුවම් කරන්නෙහිය.[18]
ඔහු ආශාවෙන් රැකගත් දේ ඔබ
කාවෙකු මෙන් කා දමන්නෙ-
හිය.[1]
සෑම මිනිසෙකුම ගසාගෙන යන
සුළඟක් මෙනි.[2] සීලාහ්.
12 යෙහෝවා දෙවියනි, මාගේ යාච්-
ඤාවට ඇහුම්කන් දෙන්න.
මා උපකාරය ඉල්ලා කන්නලව්
කරන විට මට සවන්
දෙන්න.[3]
මා කඳුළු සලන විට නිහඬව
නොසිටින්න.[4]
මන්ද මා ඔබ ඉදිරියේ මාගේ
මුතුන්මිත්තන් මෙන්[5]
තාවකාලිකව පදිංචි වී සිටින
විදේශිකයෙකු මෙනි.[6]
13 මා දෙස උදහසින් නොබලන්න.
එවිට මා මිය යෑමට පෙරවත්[7]
මට සතුටක් ලැබෙයි.”[8]

සංගීත අධ්‍යක්ෂක වෙතය.
දාවිත් රචනා කළ ගීතයකි.

40 මම යෙහෝවා දෙවි කෙ-
රෙහි පමණක් බලාපො-
රොත්තු තැබුවෙමි.[9]
ඔහු මා වෙතට කන් යොමා,
උපකාරය පතා මා කළ
මොරගැසීමට සවන් දුන්-
නේය.[10]
2 ඔහු මාව ගැඹුරු වතුර වළකින්ද[11]
මඩ වගුරකින්ද ගොඩට ගෙන[12]
පර්වතයක් මත තැබුවේය.[13]
ඔහු මාව ස්ථිර ලෙස පිහිටෙව්-
වේය.[14]
3 අපේ දෙවිට ප්‍රශංසා කිරීම සඳහා
අලුත් ගීතිකාවක් ඔහු මාගේ
දෙතොලේ තැබුවේය.[15]
බොහෝ අය එය දැක, යෙහෝවා
දෙවිට ගරුබිය දක්වමින්[16]
ඔහු කෙරෙහි විශ්වාසය තබන්-
නෝය.[17]
4 යෙහෝවා දෙවි කෙරෙහි විශ්වා-
සය තබන තැනැත්තා සන්-
තෝෂවත්ය.[18]

**39 ගීතාවලිය**
1 යෝබ් 14:13
2 ගීතා 89:47 ගීතා 90:12 ගීතා 119:84
3 යෝබ් 14:1
4 ගීතා 90:9 යාකො 4:14
5 ගීතා 90:4 2පේත 3:8
6 ගීතා 62:9 ගීතා 144:4
7 රෝම 8:20
8 ලූක් 12:19
9 යෝබ් 27:17 ගීතා 49:10 හිතෝ 13:22 දේශ 2:19 දේශ 4:8 ලූක් 12:20
10 ගීතා 38:15
11 ගීතා 25:11 මීකා 7:19
12 ගීතා 44:13 යෝවෙ 2:17
13 2සාමු 16:10 ආනි 4:35
14 ලෙවී 10:3 යෝබ් 40:4
15 ගීතා 38:13
16 යෝබ් 9:34 යෝබ් 13:21
17 ගීතා 90:7
18 ගීතා 90:8

**2 තීරුව**
1 යෝබ් 13:28 යෙසා 50:9 යෙසා 51:8 හොෂෙ 5:12
2 ගීතා 39:5 ගීතා 102:11
3 ගීතා 28:1
4 යෝබ් 16:20
5 උත් 47:9 හෙබ්‍රෙ 11:13
6 ලෙවී 25:23 1ලේක 29:15 ගීතා 119:19 1පේත 1:17 1පේත 2:11
7 යෝබ් 14:10
8 යෝබ් 10:20 යෝබ් 14:6

**40 ගීතාවලිය**
9 ගීතා 27:14 ගීතා 37:7
10 ගීතා 34:15 ගීතා 116:2
11 ගීතා 18:16
12 ගීතා 69:2
13 ගීතා 27:5
14 ගීතා 37:23
15 ගීතා 33:3 ගීතා 98:1 ගීතා 113:1
16 ගීතා 52:6; ගීතා 64:9; 17 ක්‍රියා 4:4; 18 ගීතා 34:8; යෙරෙ 17:7.

මුරණ්ඩු ලෙස ක්‍රියා කරන්නන්ව
ඇසුරු නොකරන්නාවූ
බොරුකාරයන්ගේ මාර්ගයේ
නොයන්නාවූ තැනැත්තා
සන්තෝෂවත්ය.[1]
5 යෙහෝවා මාගේ දෙවියනි, ඔබ
පුදුමාකාර දේවල් බොහොම-
යක් අප වෙනුවෙන් කළෙ-
හිය.[2]
ඔබ බොහෝ දේවල් අප වෙනු-
වෙන් සැලසුම් කළෙහිය.[3]
කිසිවෙකුව ඔබට සමාන කළ
නොහැක.[4]
ඔබ කළ දේවල් ගැන මම කතා
කිරීමට උත්සාහ කළෙමි.
නමුත් ඒවා ගණන් කිරීමට බැරි
තරම් බොහෝය.[5]
6 පූජාවලටත් යාගවලටත් ඔබ
ප්‍රසන්න වූයේ නැත.[6]
ඔබ මාගේ දෙසවන් පෑදූ නිසා
ඔබේ වදන් දැන් මට පැහැදි-
ලිව ඇසේ.[7]
දවන පූජා හා පාප පූජා ඔබ ඉල්-
ලුවේ නැත.[8]
7 එබැවින් මම මෙසේ කීවෙමි.
"මෙන්න, මම ඇවිත් සිටිමි.[9]
අකුළන ලද ලියවිල්ලේ මා
ගැන ලියා තිබේ.[10]
8 මාගේ දෙවියනි, ඔබේ කැමැත්ත
කිරීමට මම බොහෝ සේ
ආශා වෙමි.[11]
ඔබේ නීතිය මාගේ සිතෙහි ලියා
ඇත.[12]
9 ඔබේ ධර්මිෂ්ඨකම පිළිබඳ ශුභාරං-
චිය මම විශාල සමූහයක්
මැදදී ප්‍රකාශ කළෙමි.[13]
මාගේ තොල් එය පැවසීමෙන්
වළක්වා නොගත්තෙමි.[14]
යෙහෝවා දෙවියනි, ඔබ ඒ
බව හොඳින් දන්නෙහිය.[15]
10 ඔබ ධර්මිෂ්ඨ බව මම නොසඟවා
ප්‍රකාශ කළෙමි.[16]
ඔබේ විශ්වාසවන්තකම ගැනත්
ඔබ ලබා දෙන ගැලවීම
ගැනත් මම දැන්වූවෙමි.[17]
ඔබ සැබෑ කෙනෙක් බවත්
ඔබ පෙන්වන මහත් ප්‍රේමය*
ගැනත් මම විශාල සමූහයක්
අතරේ නොසඟවා පැවසු-
වෙමි."[1]
11 යෙහෝවා දෙවියනි, ඔබේ අනු-
කම්පාව මට පෙන්වන්න.[2]
ප්‍රේමයෙන්* පිරුණු සැබෑ දෙවි
ඔබයි. එබැවින් නිරතුරුවම
මාව ආරක්ෂා කරන්න.[3]
12 ගණන් කිරීමට නොහැකි තරම්
දුක් කරදර මා වට කරගත්-
තේය.[4]
හිස එසවීමට බැරි තරම් මා කළ
වැරදි මා පිට පැමිණියේය.[5]
ඒවා මාගේ හිසේ කෙස්වලටත්
වඩා වැඩිය.[6]
මම බොහෝ සෙයින් අධෛර්ය-
යට පත් වුණෙමි.[7]
13 අනේ යෙහෝවා දෙවියනි,
මාව ගලවාගන්න.[8] ඔබේ
සිතේ කැමැත්තෙන්ම එසේ
කරන්න.
යෙහෝවා දෙවියනි, ඉක්ම-
නින්ම මාගේ උපකාරයට
පැමිණෙන්න.[9]
14 මාගේ ජීවිතය නැති කර දැමීමට
මාන බලන සියල්ලන්ව[10]
වියවුල් කර
ලැජ්ජාවට පත් කරන්න.[11]
මාගේ දුකේදී සතුටු වන්නන්ව
අවමානයට ලක් කරන්න.
ඔවුන්ව පලවාහරින්න.[12]
15 මට සිනාසෙමින් සරදම් කරන
අයව ලැජ්ජාවට පත්
කරන්න.[13]
තමන් අද්දකින ලැජ්ජාව
නිසා ඔවුහු පුදුමයට පත්
වෙත්වා![14]
16 ඔබේ මඟ පෙන්වීම් පතන සියල්-
ලෝ[15] ප්‍රීති වෙත්වා![16]
ඔබ දෙන ගැලවීම අගය කරන්-
නෝ,[17]

**40 ගීතාවලිය**
1 ගීතා 101:3, යෙසා 28:15
2 නික් 15:11, ගීතා 136:4
3 ගීතා 92:5, එළි 15:3
4 ගීතා 89:6, යෙසා 55:8
5 ගීතා 71:15, ගීතා 139:18
6 1සාමු 15:22, ගීතා 51:16, යෙසා 1:11, හොෂෙ 6:6, මතෙ 12:7, හෙබ්‍රෙ 10:5
7 යෙසා 50:5
8 හෙබ්‍රෙ 10:6
9 හෙබ්‍රෙ 10:7
10 උත් 3:15, ද්වි 18:15, ලූක් 24:44, ක්‍රියා 10:43, 1කොරි 15:3
11 ගීතා 112:1, යොහ 4:34, රෝම 7:22, හෙබ්‍රෙ 10:9
12 ගීතා 37:31, හිතෝ 3:1, යෙරෙ 31:33, 2කොරි 3:3
13 ගීතා 22:22, ගීතා 35:18
14 ගීතා 119:13, හෙබ්‍රෙ 13:15
15 ගීතා 139:2
16 ක්‍රියා 20:27
17 හෙබ්‍රෙ 2:13

**2 තීරුව**
1 හෙබ්‍රෙ 2:12
2 ගීතා 69:16
3 ගීතා 43:3, ගීතා 57:3, ගීතා 61:7
4 ගීතා 71:20
5 ගීතා 38:4
6 ගීතා 69:4
7 ගීතා 73:26
8 ගීතා 25:17
9 ගීතා 38:22, ගීතා 50:15, ගීතා 70:1
10 මතෙ 21:38
11 ගීතා 31:17, ගීතා 35:4, ගීතා 70:2, ගීතා 71:13
12 ගීතා 9:3
13 ගීතා 35:25
14 ගීතා 70:3, ගීතා 73:19
15 ද්වි 4:29, ගීතා 70:4
16 ගීතා 13:5, ගීතා 68:3
17 ගීතා 3:8, ගීතා 85:9

**ගීතා 40:10*** හෝ, "ඇදි ප්‍රේමය." **11*** හෝ, "ඇදි ප්‍රේමයෙන්."

"යෙහෝවා දෙවිට ගෞරවය ලැබේවා"[1] කියා නිරතුරුවම කියත්වා!
17 මම අසරණ දිළින්දෙක්ව සිටිමි.[2]
නමුත් යෙහෝවා දෙවි වන ඔබ මා ගැන සලකන්නෙහිය.[3]
මාගේ උපකාරයට සිටින්නේ ඔබය. ඔබ මට ගැලවීම සලසා දෙන්නෙහිය.[4]
අනේ මාගේ දෙවියනි, පමා නොවී මට උපකාර කරන්න.[5]

සංගීත අධ්‍යක්ෂක වෙතය.
දාවිත් රචනා කළ ගීතයකි.

41 අසරණයා ගැන සැලකිලිමත් වන තැනැත්තා සන්තෝෂවත්ය.[6]
මන්ද ඔහු දුක් කරදරවලට මුහුණ දෙන විටදී යෙහෝවා දෙවි ඔහුට ගැලවීමට මාර්ගයක් සලසා දෙන්නේය.[7]
2 යෙහෝවා දෙවි ඔහුව ආරක්ෂා කර ඔහුගේ ජීවිතය රැක දෙන්නේය.[8]
ඔහු සන්තෝෂවත් තැනැත්තෙකුයයි ප්‍රකාශ කරනු ලබන්නේය.[9]
ඔහුව සතුරන් අතට හසු කර දීමට කිසිවෙකුට නොහැක.[10]
3 ඔහු අසනීපව යහනේ සිටින විට[11] යෙහෝවා දෙවි ඔහුට පිළිසරණක් වනු ඇත.[12]
දෙවි ඔහුව රැකබලා ගනු ඇත.
4 "අනේ යෙහෝවා දෙවියනි, මට කරුණාව පෙන්වන්න.[13]
මට සුවයක් ලබා දෙන්න. මන්ද මම ඔබට විරුද්ධව පව් කළෙමි" යයි මම කීවෙමි.[14]
5 මාගේ සතුරන්ගේ ආශාව මට නපුරක් සිදු වෙනවා දැකීමය.[15]
"ඔහු කවදා මැරෙයිද? ඔහුගේ නම පොළොවෙන් මැකී යන්නේ කවදාද" කියා ඔවුහු කියති.
6 යමෙකු මාගේ සුව දුක් විමසීමට පැමිණියත් ඔහුගේ සිතේ කිසි අවංකකමක් නැත.[1]
ඔහු මාව රිදවීමේ අරමුණින් කාරණා රැස් කරගෙන,
පිටතට ගොස් ඒ ගැන කතා කරයි.[2]
7 මට වෛර කරන සියල්ලෝ එකට එකතු වී මා ගැන රහසින් කතා කරති.[3]
ඔවුහු මට විරුද්ධව කුමන්ත්‍රණ කරති.[4]
8 "ඔහුගේ අසනීප තත්වය ඔහුගේ මුළු සිරුරම වෙළාගෙන ඇත.
ඔත්පළව සිටින ඔහු නැවත හිස ඔසවන්නේ නැත."[5]
9 මා සමඟ හිඳ මගේම කෑම කෑ,[6] මා විශ්වාස කළ මගේම මිත්‍රයා[7]
මට ද්‍රෝහි වී ක්‍රියා කළේය.*[8]
10 අනේ යෙහෝවා දෙවියනි, මට කරුණාව පෙන්වා මාව නැඟිටුවන්න.[9]
එවිට ඔවුන්ගේ ක්‍රියාවලට නිසි දඬුවම් දීමට මට හැකි වනු ඇත.[10]
11 මාගේ සතුරන් ජය නාද නඟන්නේ නැති බව මම දනිමි.
ඔබ මා ගැන ප්‍රසන්නව සිටින බව එයින් මම ස්ථිර ලෙස දැනගත්තෙමි.[11]
12 මා ඔබට විශ්වාසවන්තව සිටින නිසා ඔබ මාව උසුලාගන්නෙහිය.[12]
සදහටම ඔබේ කරුණාව ලැබීමට සුදුස්සෙකු ලෙස ඔබ මාව සලකන්නෙහිය.[13]
13 ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝවාට සදාකාලයෙන් සදාකාලයටම[14]
ප්‍රශංසාව ලැබේවා![15]
ආමෙන්, ආමෙන්.*[16]

**15** 1ලේක 29:10; ලූක් 1:68; **16** ගීතා 72:19; 1කොරි 14:16.

**ගීතා 41:9*** මූ.අ., "මට විරුද්ධව විලුඹ එසෙව්වේය." **13*** එනම්, එසේම වේවා!

**40 ගීතාවලිය**
**1** ගීතා 35:27; ලූක් 1:46
**2** ගීතා 70:5
**3** 1පේත 5:7
**4** ගීතා 54:4; යෙසා 50:7; හෙබ්‍රෙ 13:6
**5** ගීතා 143:7

**41 ගීතාවලිය**
**6** ද්වි 15:7; ගීතා 112:9; හිතෝ 14:21; හිතෝ 22:9
**7** ගීතා 37:39
**8** ගීතා 145:20; යෙරෙ 45:5
**9** ගීතා 128:1; මතෙ 5:7; ලූක් 1:48
**10** ගීතා 27:12; 2පේත 2:9
**11** 2රාජා 20:5; ගීතා 103:3
**12** පිලි 2:27
**13** ගීතා 32:5; ගීතා 51:1
**14** ගීතා 6:2; ගීතා 38:3; ගීතා 147:3; හිතෝ 28:13
**15** ගීතා 102:8

**2 තීරුව**
**1** ගීතා 12:2; හිතෝ 26:24
**2** මතෙ 26:61
**3** හිතෝ 16:28; රෝම 1:29; 2කොරි 12:20
**4** ගීතා 31:13; ගීතා 56:5
**5** ගීතා 3:2; ගීතා 71:11
**6** ඔබ 7
**7** 2සාමු 15:12; යෝබ් 19:19; ගීතා 55:13
**8** මාක් 14:18; යොහ 13:18; යොහ 13:26
**9** ගීතා 57:1
**10** ගීතා 18:37
**11** ගීතා 31:8; ගීතා 124:6; යෙරෙ 20:13
**12** යෝබ් 1:1; ගීතා 25:21; හිතෝ 2:7; හිතෝ 10:29
**13** ගීතා 34:15; ගීතා 140:13
**14** 1ලේක 16:36; එළි 7:12

## දෙවෙනි කාණ්ඩය
(ගීතාවලිය 42 – 72)

සංගීත අධ්‍යක්ෂක වෙතය.
කෝරාගේ පුත්‍රයන්[1] සඳහා මස්කිල්.*

**42** ගලා යන දිය පහරක් වෙත
පැමිණීමට මුවදෙනක්
බොහෝ සෙයින් ආශා
වන්නා සේ
දෙවියනි, මමද ඔබ වෙ-
නට පැමිණීමට අතිශයින්
ආශාවෙන් සිටිමි.[2]
2 ජීවමාන දෙවි වන ඔබට[3] ළං වීමට
මා තුළ තිබෙන්නේ දැඩි
ආශාවකි.[4] එය මට දැනෙන්-
නේ මහත් පිපාසයකින් මා
සිටින්නාක් මෙනි.
මා ඔබ ඉදිරියට එන්නේ කව-
දාද?[5]
3 මාගේ කුස පිරුණේ දිවා රෑ දෙ-
කෙහි මා හෙළන කඳුළුව-
ලිනි.[6]
“ඔබේ දෙවි කොහේද” කියා
ඔවුහු දවස මුළුල්ලේ
මාගෙන් අසති.[7]
4 දරාගත නොහැකි වේදනාවක්
මාගේ හදවතට දැනේ.[8]
මන්ද මා සෙනඟ සමඟ දෙවිගේ
ගෘහයට ගිය ආකාරයත්[9]
එහිදී උත්සවය සැමරීමට ඒ
සෙනඟ[10]
ප්‍රීති ඝෝෂා නඟමින්, දෙවිට
ස්තුති ප්‍රශංසා කරමින්[11]
මා පසුපස පැමිණි ආකාරයත්
මට මතක් වේ.
5 නමුත් මා තවදුරටත් හදවතින්
වේදනා විඳින්නේ මන්ද?[12]
මා තවදුරටත් නොසන්සුන්ව
සිටින්නේ මන්ද?[13]
දෙවි ක්‍රියා කරන තෙක් මම ඉවසී-
මෙන් බලා සිටින්නෙමි.[14]
ඉදිරියේදී ඔහු මට ගැලවීම
සලසා දෙයි. එබැවින් මාගේ
ශ්‍රේෂ්ඨ ගැලවුම්කරු වූ ඔහුට
මම ප්‍රශංසා කරන්නෙමි.[1]
6 අනේ මාගේ දෙවියනි, මාගේ
හදවත මහත් වේදනාවකින්
දැවෙයි.[2]
ඒ නිසා යොර්දාන් දේශයේ සිටද
හෙර්මොන් කඳු මුදුන්වල සිටද[3]
කුඩා කන්දේ සිටද[4] මට ඔබව
සිහි වේ.[5]
7 ඔබේ හඬට කීකරු වී මහා ජල
කන්දරාවක් වේගයෙන් ඇද
හැළෙයි.
එයින් හටගන්නා විශාල රළ
පහර[6]
මාව යටපත් කරගෙන වේග-
යෙන් ඇදී යයි.[7]
8 යෙහෝවා දෙවි තම ප්‍රේමය* දවස
පුරාම මට ලැබීමට සලස්-
වයි.[8]
රාත්‍රියේදී මම ඔහුට ප්‍රශංසා ගී
ගයන්නෙමි.[9]
මට ජීවිතය දුන් දෙවිට මම
යාච්ඤා කරන්නෙමි.[10]
9 මාගේ පර්වතය වන දෙවිට මම
මෙසේ කියමි.[11]
“ඔබ මාව අමතක කළේ
මන්ද?[12]
මට හිරිහැර කරන සතුරා නිසා
මා දුකින් කල් ගෙවිය යුත්-
තේ මන්ද?”[13]
10 මට හිරිහැර කරන්නන් මට කො-
තරම් නින්දා කරනවාද කිව-
හොත් මාගේ ඇටකටු බිඳී
යන්නා සේ මට දැනේ.[14]
“ඔබේ දෙවි කොහේද” කියා
ඔවුහු දවස මුළුල්ලේ
මාගෙන් අසති.[15]
11 මා තවදුරටත් හදවතින් වේදනා
විඳින්නේ මන්ද?[16]
මා තවදුරටත් නොසන්සුන්ව
සිටින්නේ මන්ද?[17]

---

**ගීතා 42:පෙර*** මෙම හෙබ්‍රෙව් යෙදුමේ අර්ථය නිශ්චිතව පැවසිය නොහැක. ගීතා 32:0හි පාදසටහන බලන්න.

**ගීතා 42:8*** හෝ, “ළැදි ප්‍රේමය.”

---

**42 ගීතාවලිය**
1 1ලේක 6:37
2 යෙසා 26:8
3 ද්වි 32:40
යොෂු 3:10
යෙරෙ 10:10
මතෙ 16:16
1තෙස 1:9
4 ගීතා 63:1
5 ගීතා 27:4
ගීතා 84:2
6 ගීතා 80:5
ගීතා 102:9
7 ගීතා 3:2
ගීතා 79:10
8 යෝබ් 30:16
ගීතා 62:8
9 1ලේක 16:1
10 ද්වි 16:16
2ලේක 30:23
11 ද්වි 16:14
එෆී 5:19
කොලො 3:16
12 ගීතා 55:4
මාක් 14:34
13 ගීතා 43:5
14 ගීතා 37:7
ගීතා 71:14
විලා 3:24
මීකා 7:7

**2 තීරුව**
1 ගීතා 43:5
2 ගීතා 22:1
ගීතා 43:5
හිතෝ 12:25
යොහ 12:27
3 ද්වි 3:8
4 ගීතා 48:2
ගීතා 68:16
ගීතා 132:13
5 යෝනා 2:7
6 ගීතා 88:7
7 යෝනා 2:3
8 ද්වි 28:8
9 යෝබ් 35:10
ගීතා 32:7
ගීතා 63:6
10 ගීතා 27:1
11 2සාමු 22:2
12 ගීතා 13:1
13 ගීතා 38:6
ගීතා 43:2
දේශ 4:1
14 ගීතා 31:11
ගීතා 102:8
15 ගීතා 3:2
ගීතා 79:10
යෝවෙ 2:17
මීකා 7:10
16 ගීතා 42:5
17 ගීතා 43:5

දෙවි ක්‍රියා කරන තෙක් මම ඉවසී-
මෙන් බලා සිටින්නෙමි.[1]
ඉදිරියේදී ඔහු මට ගැලවීම
සලසා දෙයි. එබැවින් මාගේ
ශ්‍රේෂ්ඨ ගැලවුම්කරුද මාගේ
දෙවිද වන ඔහුට මම ප්‍රශංසා
කරන්නෙමි.[2]

43 දෙවියනි, මට යුක්තිය ඉටු
කර දෙන්න.[3]
අවිශ්වාසවන්තව ක්‍රියා
කරන ජාතියකට විරුද්-
ධව තිබෙන මේ නඩුවේදී
මට සාධාරණය ඉටු කර
දෙන්න.[4]
වංචාකාරී, අධර්මිෂ්ඨ මිනි-
සුන්ගෙන් මාව බේරා-
ගන්න.[5]
2 මන්ද ඔබ මාගේ දෙවිය, මාගේ
රක්ෂස්ථානයය.[6]
ඔබ මා අත්හැරියේ මන්ද?
මට හිරිහැර කරන සතුරා නිසා
මා දුකින් කල් ගෙවිය යුත්-
තේ මන්ද?[7]
3 ඔබේ ආලෝකය මට ලබා
දෙන්න. ඔබේ සත්‍ය මඟ මට
පෙන්වන්න.[8]
ඒවා මට මඟ පෙන්වනු
ලැබේවා![9]
ඔබේ ශුද්ධ කන්ද වෙතටත්
ඔබේ තේජවත් කූඩාරම වෙ-
තටත් ඒවා මාව ගෙන යනු
ලැබේවා![10]
4 මම දෙවිගේ පූජාසනය වෙතට
එන්නෙමි.[11]
මාගේ ප්‍රීතිය වන දෙවි වෙතට
එන්නෙමි.[12]
දෙවියනි, මාගේ දෙවියනි,
වීණාව වයමින් මම ඔබට
ප්‍රශංසා කරන්නෙමි.[13]
5 මම තවදුරටත් හදවතින් වේදනා
විඳින්නේ මන්ද?[14]
මම තවදුරටත් නොසන්සුන්ව
සිටින්නේ මන්ද?
දෙවි ක්‍රියා කරන තෙක් මම ඉවසී-
මෙන් බලා සිටින්නෙමි.[15]
ඉදිරියේදී ඔහු මට ගැලවීම
සලසා දෙනු ඇත. එබැවින්
මාගේ ශ්‍රේෂ්ඨ ගැලවුම්කරුද
මාගේ දෙවිද වන ඔහුට මම
ප්‍රශංසා කරන්නෙමි.[1]

සංගීත අධ්‍යක්ෂක වෙනය.
කෝරාගේ පුත්‍රයන්[2] රචනා කළ ගීතයකි.
මස්කිල්.

44 දෙවියනි, ඔබේ ක්‍රියා ගැන අපි
අසා ඇත්තෙමු.
ඈත අතීතයේදී[3]
එනම්, අපේ මුතුන්මිත්තන්-
ගේ කාලයේදී ඔබ කළ
දේවල්[4]
අපේ පියවරු අපට පැවසු-
වෝය.[5]
2 සතුරු ජාතීන්ව ඔබේ බලයෙන්
ඔබ එළවා දැමුවෙහිය.[6]
ඔවුන් වෙනුවට ඔබේ සෙනඟව
ඔබ එහි පදිංචි කෙරෙව්වෙ-
හිය.[7]
ඔබ විවිධ ජාතීන්ව පරාජය
කර ඔවුන්ව විසුරුවාහැරියෙ-
හිය.[8]
3 ඔබේ සෙනඟ ඒ දේශය හිමි
කරගත්තේ ඔවුන්ගේම කඩු-
වෙන් නොවේ.[9]
ඔවුන්ට ගැලවීම ලැබුණේ
ඔවුන්ගේම බලයෙන් නො-
වේ.[10]
ඔබේ දකුණතින්ය. එසේය, ඔබේ
බලයෙන්ය.[11] ඔබේ ආශීර්වා-
දයෙන්ය.
මන්ද ඔබ ඔවුන්ට ප්‍රේම කළෙ-
හිය.[12]
4 දෙවියනි, ඔබ මාගේ රජුය.[13]
එබැවින් යාකොබ්ට විශිෂ්ට
ජයග්‍රහණයක් අත් කර
දෙන්න.[14]
5 ඔබේ උපකාරයෙන් අපි අපේ සතු-
රන්ව පලවාහරින්නෙමු.[15]
ඔබේ නාමය කෙරෙහි විශ්වාසය
තබා අපට විරුද්ධව නැඟී
සිටින්නන්ව අපි පාගා දමන්-
නෙමු.[16]
6 මාගේ දුන්න කෙරෙහි මම විශ්වා-
සය නොතැබුවෙමි.[17]

42 ගීතාවලිය
1 ගීතා 37:7
ගීතා 71:14
2 ගීතා 42:5

43 ගීතාවලිය
3 ගීතා 7:8
ගීතා 26:1
ගීතා 35:24
4 1සාමු 24:15
ගීතා 35:1
හිතෝ 22:23
5 ගීතා 71:4
6 ගීතා 28:7
ගීතා 140:7
7 ගීතා 42:9
8 යෝබ් 29:3
ගීතා 40:11
හිතෝ 6:23
9 ගීතා 5:8
ගීතා 27:11
ගීතා 143:10
10 1ලේක 16:1
ගීතා 3:4
ගීතා 78:68
11 ගීතා 84:3
හෙබ්‍රෙ 13:10
12 යෙසා 61:10
13 2සාමු 6:5
ගීතා 81:2
14 ගීතා 42:5
15 ගීතා 37:7
ගීතා 71:14

2 තීරුව
1 ගීතා 42:11

44 ගීතාවලිය
2 1ලේක 6:37
3 ගණන් 21:14
4 යෙසා 38:19
5 නික් 13:14
විනි 6:13
ගීතා 78:3
6 ද්වි 7:1
ගීතා 78:55
ගීතා 105:44
7 නික් 15:17
ගීතා 80:8
8 යොෂු 10:11
යොෂු 24:12
ගීතා 135:10
ගීතා 136:17
9 ද්වි 4:38
ද්වි 8:17
10 1සාමු 12:22
11 යෙසා 63:12
12 ද්වි 7:8
13 ගීතා 24:10
ගීතා 74:12
යෙසා 33:22
14 ගීතා 53:6
15 ගීතා 18:39
පිලි 4:13
16 ගීතා 60:12
17 ගීතා 20:7
ගීතා 33:16

මාගේ කඩුව මාගේ ගැලවීම නොවිණ.[1]
7 නමුත් අපේ සතුරන්ගෙන් අපව බේරාගත්තේ ඔබය.[2]
අපට බොහෝ සෙයින් වෛර කළ අයව ලැජ්ජාවට පත් කළේ ඔබය.[3]
8 දවස පුරා අපේ දෙවි වන ඔබට අපි ප්‍රශංසා කරන්නෙමු.[4]
සදහටම අපි ඔබේ නාමය පසසන්නෙමු.[5] සේලාහ්.
9 නමුත් දැන් ඔබ අපව අත්හැර ඇත. අපව නින්දාවට පත් වීමට ඔබ ඉඩහැර ඇත.[6]
ඔබ අපේ හමුදාවන්ට උපකාර කරන්නේද නැත.[7]
10 අපේ සතුරන් වෙතින් අපට පලා දුවන්න ඔබ සලස්වා ඇත.[8]
අපට බොහෝ සෙයින් වෛර කළ අයට, අපිට අයිති දේවල් කොල්ල කෑමට ඔබ ඉඩහැර ඇත.[9]
11 බැටළුවන් මෙන් සිටින අපව ආහාරයක් ලෙස ඔබ ඔවුන්ට දී ඇත.[10]
ජාතීන් අතරේ ඔබ අපව විසුරුවාහැර ඇත.[11]
12 ඔබ ඔබේ සෙනඟව ඉතා සුළු මුදලකට විකුණුවෙහිය.[12]
එයින් කිසි ලාභයක් ඔබට නොලැබුණේය.
13 ඔබ අපව අපේ අසල්වාසීන් ඉදිරියේ නින්දාවට පත් කළෙහිය.[13]
ඔවුන් ඉදිරියේ අප විහිළුවක්ද සමච්චලයක්ද වීමට ඔබ සැලැස්වුවෙහිය.[14]
14 අපව ජාතීන් අතරේ නින්දාවට පත් වීමට ඔබ ඉඩ දුන්නෙහිය.[15]
අපට සමච්චල් කරමින් හිස වැනීමට ඔබ ඔවුන්ට ඉඩහැරියෙහිය.[16]
15 මා අද්දුටු නින්දාව දවස මුළුල්ලේම මට සිහි වන්නේය.
ලැජ්ජාව නිසා මම මාගේ මුහුණ වසාගත්තෙමි.[1]
16 නින්දා කරන්නාගේ හා අපහාස කරන්නාගේ කතා ඇසීමෙන් මම ලැජ්ජාවට පත් වුණෙමි.
සතුරන් හා පළිගන්නන් නිසාත් මම ලැජ්ජාවෙන් පසු වුණෙමි.[2]
17 මේ සියල්ලට අපි මුහුණ දුන්නත් අපි ඔබව අමතක නොකළෙමු.[3]
ඔබ අප සමඟ ඇති කරගත් ගිවිසුමට අපි ද්‍රෝහී නොවුණෙමු.[4]
18 අපි අවිශ්වාසවන්තව ක්‍රියා නොකළෙමු.[5]
ඔබේ මාවතෙන් අපේ පාද ඉවතට නොගත්තෙමු.[6]
19 හිවලුන් වසන ස්ථානයේදී ඔබ අපට පහර දුන්නත්[7]
ඝන අන්ධකාරයෙන් අපව වසා දැම්මත් අපි ඔබ ඉදිරියේ විශ්වාසවන්තව ක්‍රියා කළෙමු.[8]
20 අපට ඔබේ නාමය අමතක වුණා නම්,
නාඳුනන දෙවි කෙනෙකුට අපේ දෑත් දිගු කළේ නම්,[9]
21 දෙවි වූ ඔබ එය දැනගන්නේ නැද්ද?[10]
මන්ද සිතේ ඇති රහස් ඔබ දන්නෙහිය.[11]
22 ඔබට විශ්වාසවන්තව සිටින නිසා අපේ ජීවිතය සෑම දවසකම අවදානමක පවතී.
අපව මරණයට නියම කළ බැටළුවන් මෙන් ගණන් ගනු ලැබේ.[12]
23 යෙහෝවා දෙවියනි, නැඟී සිටින්න. ඔබ නිදා සිටින්නේ මන්ද?[13]
අවදි වන්න. අපව සදහටම අත් නොහරින්න.[14]
24 ඔබේ මුහුණ අප වෙතින් ඉවතට හරවාගෙන සිටින්නේ මන්ද?
අප විඳින දුක් කරදර හා පීඩා

**44 ගීතාවලිය**
1 1සාමු 17:45 හොෂෙ 1:7
2 යොෂු 24:8
3 ගීතා 40:14 ගීතා 132:18
4 ගීතා 34:2
5 ගීතා 115:1
6 ගීතා 43:2 ගීතා 74:1
7 ගීතා 60:10
8 ද්වි 28:25 යොෂු 7:8 1සාමු 31:1
9 ගීතා 89:41 යෙරෙ 15:13
10 ගීතා 119:176 රෝම 8:36
11 ද්වි 28:64
12 ද්වි 32:30 යෙසා 52:3
13 ගීතා 79:4 ගීතා 80:6
14 ගීතා 123:4
15 ද්වි 28:37 2ලේක 7:20 යෙරෙ 24:9
16 විලා 2:15

**2 තීරුව**
1 යෙරෙ 51:51
2 ගීතා 8:2
3 ද්වි 6:12
4 නික් 34:10
5 හෙබ්‍රෙ 3:12
6 යෝබ 23:11 ගීතා 119:157
7 යෙසා 34:13 යෙසා 35:7
8 ගීතා 23:4
9 නික් 20:3
10 ගීතා 139:1 යෙරෙ 17:10
11 දේශ 12:14
12 ගීතා 79:2 රෝම 8:36
13 ගීතා 7:6 ගීතා 78:65
14 යෝබ 13:24 ගීතා 13:1 ගීතා 88:14

ඔබ අමතක කර දමන්නේ
මන්ද?[1]
25 අපි සම්පූර්ණයෙන්ම පහත වැටී
සිටින්නෙමු.[2]
අපට පොළොවේ බඩ ගා යැමට
සිදු වී ඇත.
26 නැඟී සිට අපට උපකාර කරන්න.[3]
ඔබ ප්‍රේමණීය* දෙවි කෙනෙකු
නිසා අපව ගලවාගන්න.[4]

සංගීත අධ්‍යක්ෂක වෙතය. ලිලී මල් නම් වූ රිද්මයට අනුව ගායනා කිරීම සඳහාය. කෝරාගේ පුත්‍රයන් රචනා කළ ගීතයකි. මස්කිල්. ප්‍රේමවන්ත ස්ත්‍රීන් පිළිබඳව ලියැවුණු ගීතයකි.

**45** හොඳ ආරංචියකින් මාගේ
සිත පිරී ඇත.[5]
මා පවසන වදන් රජ කෙ-
නෙකු ගැනය.[6]
මාගේ දිව දක්ෂ පිටපත්කරු-
වෙකුගේ[7] පන්හිඳ මෙන්
වේවා![8]
2 රජ්ජුරුවනි, ඔබ අන් සියලු
මනුෂ්‍යයන්ට වඩා ප්‍රසන්න,
කඩවසම් කෙනෙකි.[9]
ඔබේ වදන් කොතරම් මිහිරිද![10]
ඔබට දෙවිගේ ආශීර්වාදය සඳ-
හටම ලැබෙන්නේය.[11]
3 බලවත් තැනැත්තාණෙනි,[12] ඔබේ
කඩුව[13] ඉණේ බැඳගෙන,
ගෞරවය සහ තේජස පැළඳ-
ගන්න.[14]
4 තේජශ්‍රීයෙන් ජයග්‍රහණය කරා
යන්න.[15]
නිහතමානී අය වෙනුවෙන්ද
ධර්මිෂ්ඨකම සහ සත්‍යය
වෙනුවෙන්ද අසු පිට නැඟී
ගොස් සටන් කරන්න.[16]
ඔබේ දකුණත බිය උපදවන
දේවල් කරන්නේය.*[17]
5 ඔබේ ඊතල තියුණුය. ඒවා ඔබේ
සතුරන්ගේ හදවත් පසාරු
කරගෙන යන්නේය.[18]
ජනයා ඔබේ පාමුල ඇද
වැටෙන්නෝය.[1]
6 ඔබට සිංහාසනය සදහටම හිමි
කර දෙන්නේ ඔබේ දෙවිය.[2]
යුක්තිය නමැති රාජ යෂ්ටිය
අතැතිව ඔබ රජකම් කරන්-
නෙහිය.[3]
7 ඔබ ධර්මිෂ්ඨකමට ප්‍රිය කර[4] දුෂ්ට-
කමට වෛර කළෙහිය.[5]
එබැවින් ඔබේ දෙවි,[6] ප්‍රීතිය
නමැති තෛලයෙන්[7] ඔබව
අභිෂේක කළේය.[8] ඔබේ
හවුල්කරුවන්ට වඩා වැඩි
ප්‍රීතියක් ඔබට අත් කර දුන්-
නේය.[9]
8 සුවඳ ලාටු, අගිල් සහ පැඟිරි
කුරුඳුවලින් සුගන්ධවත් වූ
වස්ත්‍ර ඔබ පැළඳ සිටියි.[10]
ඇත්දළවලින් අලංකාර වූ[11]
මාලිගාවෙන් ඇසෙන සංගී-
තයෙන් ඔබ සතුටු වන්-
නෙහිය.
9 ඔබ බොහෝ සෙයින් ආදරය
කරන ස්ත්‍රීන් අතරේ රජව-
රුන්ගේ දියණියන්ද සිටියි.[12]
ඕෆීර් දේශයෙන් ගෙනා රන්[13]
ආභරණින් සැරසුණු රැජිණ[14]
ඔබේ දකුණු පැත්තේ
සිටින්නීය.
10 දියණිය, ඇහුම්කන් දෙන්න. මේ
දෙස බලන්න. ඔබේ සවන්
යොමු කරන්න.
ඔබේ පියාගේ නිවසද ඔබේ
සෙනඟවද අමතක කර
දමන්න.[15]
11 රජ ඔබේ රූපශ්‍රීයට ආශා වන්-
නේය.[16]
ඔහු ඔබේ ස්වාමියාය.[17]
එබැවින් ඔහු ඉදිරියේ හිස
නමන්න.[18]
12 තීර් දියණියද තෑග්ගක් රැගෙන
පැමිණ සිටින්නීය.[19]
සෙනඟ අතරේ සිටින ධන-
වන්තයෝ ඔබේ අනුමැ-
තිය දිනාගැනීමට උත්සාහ
කරති.[20]

**44 ගීතාවලිය**
1 යෙසා 40:27
2 ගීතා 119:25; යෙසා 51:23
3 ගීතා 33:20
4 ගීතා 26:11; ගීතා 130:7

**45 ගීතාවලිය**
5 ගීතා 49:3
6 ගීතා 2:6; 1පේතෘ 1:11
7 එස්රා 7:6
8 2සාමු 23:2; යෙසා 8:1; යෙරෙ 8:8
9 සල 5:10
10 යොහ 7:46
11 ගීතා 72:17
12 යෙසා 9:6
13 එළි 1:16; එළි 19:15
14 හෙබ්‍රෙ 1:3
15 එළි 6:2
16 එළි 19:11
17 එළි 6:15
18 එළි 17:14; එළි 19:19

**2 තීරුව**
1 ගීතා 2:9; 2තෙස 1:8
2 ගීතා 89:29; ගීතා 89:36
3 යෙසා 11:4; යෙරෙ 33:15; හෙබ්‍රෙ 1:8
4 මතෙ 3:15; හෙබ්‍රෙ 7:26
5 මතෙ 7:23; හෙබ්‍රෙ 1:9
6 යොහ 20:17
7 ගීතා 21:6
8 යෙසා 61:1; ක්‍රියා 4:27; ක්‍රියා 10:38
9 1ලේක 29:23; 2ලේක 13:5; 2ලේක 13:8; මතෙ 1:6
10 සල 1:3; සල 4:14
11 1රාජා 22:39
12 යෙසා 60:4
13 යෙසා 13:12
14 එළි 19:7
15 සල 2:10; එළි 14:4
16 සල 1:8; සල 2:2
17 එෆී 5:23; යූද් 4
18 1රාජා 1:16; පිලි 2:10
19 2සාමු 5:11
20 ගීතා 72:10; යෙසා 49:23

**ගීතා 44:26*** හෝ, “ළැදි ප්‍රේමයකින් යුත්.” **45:4*** හෝ, “බිය උපදවන දේ කිරීමට ඔබට උගන්වන්නේය.”

13 මාලිගාවේ සිටින රජුගේ දියණිය
තේජශ්‍රීයෙන් වැජඹෙයි.[1]
ඇගේ වස්ත්‍ර රන් නූල්වලින් වැඩ
දමා ඇත.
14 අනර්ඝ වස්ත්‍රවලින් සැරසී සිටින
ඇයව රජු ඉදිරියට ගෙන එනු
ලබන්නේය.[2]
ඇය සමඟ පැමිණි ඇගේ යෙහෙ-
ළියන්වද* රජු ඉදිරියට ගෙන
එනු ලබන්නේය.[3]
15 සැවොම ප්‍රීති ඝෝෂා නඟමින්
මහත් සේ ප්‍රීති වන්නෝය.
ඔවුහු රජුගේ මාලිගාවට පිවි-
සෙන්නෝය.
16 රජ්ජුරුවනි, ඔබ ඔබේ මුතුන්-
මිත්තන්[4] වෙනුවට ඔබේ
පුත්‍රයන්ව[5]
අධිපතීන් ලෙස පොළොව
පුරාම පත් කරනු ලබන්නෙ-
හිය.[6]
17 මතු පැමිණෙන පරම්පරාවන්ට
මම ඔබේ නාමය ප්‍රකාශ
කරන්නෙමි.[7]
එවිට සදාකාලයෙන් සදාකාල-
යට ජනයා ඔබට ප්‍රශංසා
කරන්නෝය.

සංගීත අධ්‍යක්ෂක වෙතය. තරුණියන් විසින් ගායනා කිරීම සඳහාය. කෝරාගේ පුත්‍රයන්[8] රචනා කළ ගීතයකි.

**46** දෙවි අපේ රැකවරණයය. අපේ
ශක්තියය.[9]
දුක් කරදරවලදී අපිට පිහිට
වීමට ඔහු සූදානමින්
සිටින්නේය.[10]
2 පොළොව කම්පා වුණත්[11]
කඳු දෙදරුම් කා මහ මුහුදට
කඩා වැටුණත් අපි බිය නොව-
න්නෙමු.[12]
3 මුහුදේ ජලය කැලඹී වේගයෙන්
රළ ගැසුවත්[13]
ඒ මහා රළ පහරින් කඳු දෙදරුම්
කැවත් අපි බිය නොවන්-
නෙමු.[14] සීලාහ්.

4 එක් ගංගාවක් ඇත. එයින් ගලා
බසින අතු ගංගා දෙවිගේ
නුවරේ වැසියන්ව සතුටට
පත් කරයි.[1]
ඒ නුවර, මහෝත්තමයාණන්-
ගේ තේජවත් අතිශුද්ධ කූඩා-
රමයි.[2]
5 දෙවි ඒ නුවරේ වාසය කරයි.[3] එය
කවදාවත් බිඳ වැටෙන්නේ
නැත.[4]
අලුයම උදා වන මොහොතේ
සිට දෙවි එයට උපකාර
කරයි.[5]
6 ජාතීහු කැලඹුණෝය.[6] රාජ්‍යයන්
බිඳ වැටිණ.
ඔහුගේ හඬට පොළොව දිය වී
ගියේය.[7]
7 ස්වර්ගයේ සේනාවල අධිපතියා-
ණන් වන යෙහෝවා දෙවි
අප සමඟය.[8]
යාකොබ්ගේ දෙවි අපට සුරක්ෂි-
තබවක් ලබා දෙන උස් බල-
කොටුවකි.[9] සීලාහ්.
8 ජනයෙනි, පැමිණ යෙහෝවා දෙවි-
ගේ ක්‍රියා දෙස බලන්න.[10]
ඔහු පොළොවේ කර තිබෙන පුදු-
මාකාර දේවල් දෙසට ඔබේ
නෙත් යොමු කරන්න.[11]
9 පොළොවේ සිදු වන සියලු යුද්ධ
ඔහු නවත්වා දමන්නේය.[12]
දුන්න බිඳ හෙල්ලය කැබලිව-
ලට කඩා දමන්නේය.[13]
යුධ රථ ගිනිබත් කරන්නේය.[14]
10 "ජනයෙනි, යටත් වන්න. මම දෙවි
බව දැනගන්න.[15]
ජාතීන් අතරේ මම උසස් වන්-
නෙමි.[16]
මුළු පොළොවෙහිම ගෞරවය
මට ලැබෙන්නේය."[17]
11 ස්වර්ගයේ සේනාවල අධිපතියා-
ණන් වන යෙහෝවා දෙවි
අප සමඟය.[18]
යාකොබ්ගේ දෙවි අපට සුරක්ෂි-
තබවක් ලබා දෙන උස් බල-
කොටුවකි.[19] සීලාහ්.

**45 ගීතාවලිය**
1 එළි 19:7
2 එළි 19:8
එළි 21:2
3 සල 2:7
සල 5:9
සල 6:1
4 මතෙ 1:1
5 යෙසා 9:6
6 යෙසා 32:1
7 ගීතා 72:17

**46 ගීතාවලිය**
8 1ලේක 6:37
9 ගීතා 62:7
හිතෝ 14:26
යෙසා 25:4
10 ද්වි 4:7
ගීතා 145:18
නාහු 1:7
11 2පේතෘ 3:10
12 යෙසා 54:10
13 ගීතා 93:4
යෙරෙ 5:22
14 විනි 5:5
මීකා 1:4
නාහු 1:5

**2 තීරුව**
1 2ලේක 6:6
ගීතා 48:1
යෙසා 60:14
2 ගීතා 43:3
3 ද්වි 23:14
ගීතා 132:13
යෙසා 12:6
හොෂෙ 11:9
4 හෙබ්‍රෙ 12:28
5 නික් 14:24
ගීතා 30:5
ගීතා 143:8
6 ගීතා 2:1
7 යොෂු 2:24
ආමෝ 9:5
8 යොෂු 1:9
යෙරෙ 1:19
රෝම 8:31
9 ගීතා 9:9
10 ගීතා 66:5
11 යෙසා 34:2
12 යෙසා 11:9
මීකා 4:3
13 එස 39:9
14 මීකා 5:10
15 හබ 2:20
16 යෙසා 2:11
17 1ලේක 29:11
ගීතා 57:5
යෙරෙ 16:19
18 2ලේක 20:17
19 ගීතා 48:3
ගීතා 125:2

ගීතා 45:14* මු.අ., "කන්‍යා තරුණියන්ව."

සංගීත අධ්‍යක්ෂක වෙනය.
කෝරාගේ පුත්‍රයන් රචනා කළ ගීතයකි.

**47** සියලු ජනයෙනි, අත්පොළසන් දෙන්න.[1]
ප්‍රීතියෙන් දෙවිට ජය නාද නගන්න.[2]
**2** මන්ද මහෝත්තමයාණන් වන යෙහෝවා දෙවි ගරුබිය උපදවන දෙවි කෙනෙකි.[3]
මුළු පොළොවෙහිම ශ්‍රේෂ්ඨ රජ ඔහුය.[4]
**3** දෙවි ජනයාව අපට යටත් කර දෙන්නේය.[5]
ජාතීන්ව අපේ පාමුල තබන්නේය.[6]
**4** අපේ උරුමය දෙවි අපට ලබා දෙන්නේය.[7]
එය දෙවි ප්‍රේම කළ යාකොබ් සතු වටිනාම සම්පතයි.[8] *සේලාහ්.*
**5** ප්‍රීති ඝෝෂා හා හොරණෑ හඬ මැද[9]
යෙහෝවා දෙවි නැඟී ගියේය.[10]
**6** දෙවිට ගී ගයන්න. ප්‍රශංසා ගී ගයන්න.[11]
අපේ රජුට ගී ගයන්න. ප්‍රශංසා ගී ගයන්න.
**7** මන්ද මුළු පොළොවෙහිම රජ ඔහුය.[12]
අවබෝධයෙන් යුතුව ක්‍රියා කරමින් ඔහුට ප්‍රශංසා ගී ගයන්න.[13]
**8** දෙවි තම අතිශුද්ධ සිංහාසනයේ හිඳගත්තේය.[14]
ඔහු ජාතීන් කෙරෙහි රජකම් කරන්නේය.[15]
**9** ආබ්‍රහම්ගේ දෙවිගේ සෙනඟ සමඟ[16]
අධිපතීහුද රැස් වී ඇත.[17]
මන්ද පොළොවේ පලිස් මෙන් සිටින අය* දෙවිට අයිතිය.[18]
දෙවි සිටින්නේ ඉතා උස් තැනකය.[19]

**ගීතා 47:9*** බොහෝදුරට මෙයින් අදහස් කරන්නේ පාලකයන්ව හෝ සෙනඟව රැකබලා ගන්නා අයව විය යුතුයි.

**47 ගීතාවලිය**
1 2රාජා 11:12; ගීතා 98:4; යෙසා 55:12
2 එස්රා 3:11; ගීතා 33:3
3 ද්වි 7:21; නෙහෙ 1:5; ගීතා 76:12
4 ගීතා 22:28; මලා 1:14
5 ගීතා 18:47
6 ද්වි 33:29
7 ද්වි 9:5
8 ද්වි 7:6; මලා 1:2
9 1ලේක 15:24
10 ගීතා 68:24
11 1ලේක 16:9; ගීතා 68:32
12 යෙරෙ 10:7; සෙක 14:9
13 1කොරි 14:15
14 එළි 4:2
15 1ලේක 16:31; ගීතා 96:10; ගීතා 97:1; එළි 19:6
16 රෝම 4:12; ගලා 3:29
17 ගීතා 110:3
18 ගීතා 89:18
19 ගීතා 97:9

2 තීරුව

**48 ගීතාවලිය**
1 ගීතා 42:පෙර
2 ගීතා 46:4; ගීතා 87:3
3 සෙක 8:3
4 නෙහෙ 9:5; ගීතා 89:1; ගීතා 145:3; ගීතා 147:5
5 ගීතා 47:8; ගීතා 135:21; මතෙ 5:35
6 යෙසා 14:13
7 ගීතා 50:2; විලා 2:15
8 ගීතා 125:1; සෙක 2:5
9 2සාමු 10:6; 2සාමු 10:19
10 එළි 19:19
11 නික් 14:25
12 නික් 15:15; යෙසා 13:8; ආනි 5:6
13 යෙරෙ 30:6; හොෂෙ 13:13
14 1රාජා 22:48; යෙසා 2:16; යෙරෙ 18:17; එස 27:26
15 ගීතා 48:1; හෙබ්‍රෙ 12:22
16 ගීතා 44:1

කෝරාගේ පුත්‍රයන් රචනා කළ ගීතයකි.[1]

**48** යෙහෝවා දෙවි අතිඋතුම්ය.
අපේ දෙවිගේ නුවරේදී[2] එනම්, ඔහුගේ ශුද්ධ කන්දේදී[3]
ඔහු බොහෝ ප්‍රශංසාව ලබන්න වටින්නේය.[4]
**2** ශ්‍රේෂ්ඨ රජුගේ නුවර[5] වන උතුරු කෙළවරේ ඇති සියොන් කන්ද[6]
ඉතා උස්ව අලංකාරව තිබේ. මුළු ලොවෙහිම සතුටට හේතුව එයයි.[7]
**3** ඒ නුවරේ බලකොටු ආරක්ෂා කරන්නා ලෙස දෙවි ප්‍රසිද්ධ වී ඇත.[8]
**4** බලන්න! නියම කරගත් ලෙස රජවරු එකට රැස් වූහ.[9]
ඔවුහු එක්ව ඉදිරියට ගියත් කිසිවක් නොකර පිටත්ව ගියෝය.[10]
**5** ඔවුහු තමන් දුටු දේ ගැන පුදුමයට පත් වූහ.
ඔවුහු කැලඹී, භයෙන් පලා දිව්වෝය.[11]
**6** භීතිය ඔවුන්ව වෙළාගත්තේය. මහත් වේදනාවකින් ඔවුහු පීඩා වින්දෝය.[12]
ඔවුන්ට දැනුණු වේදනාව ස්ත්‍රියක අද්දකින ප්‍රසව වේදනාව මෙනි.[13]
**7** නැඟෙනහිරෙන් හමා ආ කුණාටුවෙන් තර්ෂිෂ්හි නැව් මුහුදුබත් වීමට ඔබ සැලැස්වුවෙහිය.[14]
**8** යෙහෝවා දෙවිගේ ක්‍රියා ගැන අපට අසන්න ලැබුණු දේ, ස්වර්ගයේ සේනාවල අධිපතියාණන් වන ඔහුගේ නුවරේදී
එනම්, අපේ දෙවිගේ නුවරේදී[15] දැන් අපට අපේම ඇස්වලින් දැකගැනීමට හැකි වී තිබේ.[16]
දෙවි තම නුවර ස්ථිර ලෙස පිහිටුවන්නේය. සදහටම

එය එලෙස පවතින්නේය.[1]
සීලාහ්.
9 දෙවියනි, අපි ඔබේ මාලිගාවට ගොස්[2]
ඔබ පෙන්වන මහත් ප්‍රේමය* ගැන ගැඹුරින් කල්පනා කළෙමු.[3]
10 දෙවියනි, ඔබේ නාමයද[4] ඔබට දෙන ප්‍රශංසාවද
පොළොවේ සියලු සීමා දක්වා පැතිර යන්නේය.
ඔබේ දකුණත ධර්මිෂ්ඨකමින් පිරී ඇත.[5]
11 ඔබ දුන් තීන්දු දැක,[6]
සියොන් කන්ද[7] ප්‍රීති වේවා! යූදා අවට පිහිටි කුඩා නගරද ප්‍රීති වේවා![8]
12 ජනයෙනි, සියොන් කන්ද වටා ගමන් කරමින්[9]
එහි බලකොටු ගණන් කරන්න.[10]
13 එහි තිබෙන ආරක්ෂිත පවුර හොඳින් නිරීක්ෂණය කරන්න.[11]
එහි බලකොටු සෝදිසි කරන්න.
මතු පරම්පරාවට ඒ ගැන පැවසීමට හැකි වන පිණිස එසේ කරන්න.[12]
14 දෙවි සදාකාලයෙන් සදාකාලයටම අපේ දෙවියය.[13]
මුළු ජීවිත කාලය පුරාම අපට මඟ පෙන්වන්නේ ඔහුය.[14]

සංගීත අධ්‍යක්ෂක වෙතය.
කෝරාගේ පුත්‍රයන්[15] රචනා කළ ගීතයකි.

# 49

සියලු ජනයෙනි, මෙයට ඇහුම්කන් දෙන්න.
ලෝවැසියෙනි, සවන් දෙන්න.[16]
2 මනුෂ්‍යයෙනි,
දුප්පත් පොහොසත් සියල්ලෙනි, සවන් දෙන්න.[17]
3 මාගේ මුඛය ප්‍රඥාවන්ත දේවල් කතා කරන්නේය.[18]
මාගේ සිත ගැඹුරු දේවල් කල්පනා කරන්නේය.[1]
4 දෙවිගේ වදන්වලට මම සවන් දෙන්නෙමි.[2]
වීණා වයමින් ගැඹුරු කාරණා තේරුම් කර දෙන්නෙමි.[3]
5 මට පීඩා කිරීමට උත්සාහ කරන අයගෙන් මම වට වී සිටිමි.[4]
ඔවුන් නිසා මා අනතුරුවලට මුහුණ දුන්නත් මම බිය නොවෙමි.[5]
6 ඔවුහු තම ධනය කෙරෙහි විශ්වාසය තබති.[6]
තමන් සතු වස්තුව ගැන පුරසාරම් දොඩති.[7]
7 නමුත් ඔවුන්ගෙන් කිසිවෙකුට තම සහෝදරයෙකුව මුදවාගැනීමටවත්[8]
ඒ වෙනුවෙන් දෙවිට යම් වන්දියක් ගෙවීමටවත් හැකියාවක් නැත.
8 (මන්ද මනුෂ්‍ය ජීවිතයක් සඳහා දිය යුතු වන්දිය
කිසිදා ගෙවා නිම කළ නොහැකි තරම් ඉතා ඉහළය.)[9]
9 එසේ ගෙවීමට හැකියාවක් තිබුණා නම් ඔහු මිනී වළට නොගොස් සදහටම ජීවත් වනු ඇත.[10]
10 ප්‍රඥාවන්තයන් පවා මිය යන බවත්[11]
මෝඩයා සහ නුගතා නැසී යන බවත් ඔහු දකියි.[12]
තමන් රැස් කරගත් ධනය අනුන්ට අයිති වීමට ඉඩහැර ඔවුන්ට මිය යන්න සිදු වන බවත් ඔහු දකියි.[13]
11 තම ගෙවල් දොරවල් සදාකාලයටම තබාගැනීම ඔවුන්ගේ පැතුමය.[14]
තම කූඩාරම් පරම්පරාවෙන් පරම්පරාවට තබාගැනීමත් ඔවුන්ගේ ආශාවය.[15]

ගීතා 48:9* හෝ, “ඇදි ප්‍රේමය.”

**48 ගීතාවලිය**
**1** ගීතා 87:5 යෙසා 2:2 මීකා 4:1
**2** 1සාමු 3:3 2සාමු 7:2 1ලේක 16:1 ගීතා 63:2
**3** ගීතා 26:3 ගීතා 40:10 ගීතා 63:3
**4** ද්වි 28:58 ගීතා 113:3
**5** විනි 5:11 ගීතා 17:7 ගීතා 60:5 ගීතා 98:2
**6** 2ලේක 20:27 ගීතා 137:8 එළි 15:4
**7** ගීතා 78:68 යෝවෙ 2:32
**8** ගීතා 97:8
**9** නෙහෙ 12:31
**10** නෙහෙ 12:39 යෙසා 33:18
**11** යෙසා 26:1
**12** ද්වි 11:19
**13** ගීතා 31:14
**14** යෙසා 58:11

**49 ගීතාවලිය**
**15** 1ලේක 6:37
**16** ගීතා 17:14 හෙබ්‍රෙ 1:2
**17** ගීතා 62:9
**18** හිතෝ 16:23 දේශ 10:12

**2 තීරුව**
**1** ගීතා 143:5 හිතෝ 14:33 මතෙ 12:35 පිලි 4:8
**2** ගීතා 78:2 මතෙ 13:35
**3** හිතෝ 1:6
**4** 2සාමු 15:12
**5** ගීතා 27:1 එෆී 5:16
**6** ද්වි 8:17 ගීතා 52:7 හිතෝ 10:15 හිතෝ 18:11 1තිමෝ 6:17 1යොහ 2:16
**7** එස්ත 5:11 යෙරෙ 9:23 ලූක් 12:19
**8** හිතෝ 11:4 මතෙ 16:26
**9** යෝබ් 36:18
**10** ගීතා 89:48
**11** දේශ 2:16 රෝම 5:12
**12** දේශ 3:19
**13** ගීතා 39:6; හිතෝ 11:4; හිතෝ 23:4; දේශ 2:18; යෙරෙ 17:11; ලූක් 12:20; **14** යෝබ් 21:9; ගීතා 17:14; **15** දේශ 1:4.

එබැවින් ඔවුහු තම ඉඩකඩම්ව-
ලට තමන්ගේම නම් තබා
ඇත.[1]
**12** මනුෂ්‍යයාට කොතරම් ගෞරව-
යක් හිමි වුවත් ඔහුට සදහ-
ටම ජීවත් වීමට නොහැක.[2]
නැසී යන සතුන් හා ඔහු අතර
කිසි වෙනසක් නැත.[3]
**13** අඥාන ලෙස ක්‍රියා කරන්-
නන්ට[4] හා
ඔවුන්ගේ වදන් පිළිපදින්නන්ට
සිදු වන්නේ ඒ දේය. සේලාහ්.
**14** එඬේරෙකු තම බැටළුවන්ව නිය-
මිත ස්ථානයට නොවරද-
වාම ගෙන යන්නාක් මෙන්
ඔවුන්ට නියම වූ ස්ථානය වන
මිනී වළට[5] මරණය ඔවුන්ව
ගෙන යයි.[6]
දවස ආරම්භයේදීම නිර්දෝෂ
අය ඔවුන්ව යටත් කරග-
නිති.[7]
ඔවුන්ගේ ශරීර වැහැරී යයි.[8]
ඔවුහු සියල්ලෝ විශාල මන්දිර-
වල නොව මිනී වළේ සැත-
පෙති.[9]
**15** නමුත් දෙවි මාව පිළිගන්නා නිසා
මිනී වළෙන් ඔහු මාව මුදවා-
ගන්නේය.[10] සේලාහ්.
**16** යමෙකු ධනය රැස් කරමින් තව
තවත් පොහොසත් වුණත්[11]
ඔහුගේ නිවස දිනෙන් දින යස
ඉසුරෙන් පිරුණත්[12] අධෛර්-
යයට පත් නොවන්න.
**17** ඔහු මිය යන විට ඔහුට ඉන්
කිසිවක් ගෙන යෑමට නො-
හැක.[13]
ඔහුගේ කීර්තිය ඔහු සමඟ මිනී
වළට නොයන්නේය.[14]
**18** ඔහු ජීවිත කාලය පුරාම තමන්වම
වර්ණනා කරගන්නේය.[15]
(යමෙකු බොහෝ වස්තු රැස්
කරමින් දිනෙන් දින දියුණු
වන විට මිනිස්සුද ඔහුව
පැසසුමට ලක් කරති.)[16]
**19** නමුත් අවසානයේදී ඔහුගේ
මුතුන්මිත්තන් ගිය තැනටම
ඔහුට යන්න සිදු වෙයි.[1]
නැවත කිසිදාක ඔවුහු ආලෝ-
කය නොදකිති.[2]
**20** මනුෂ්‍යයාට කොතරම් ගෞරවයක්
හිමිව තිබුණත් ඔහුට නිසි
අවබෝධයක් නැත්නම්[3]
නැසී යන සතුන් හා ඔහු අතර
කිසි වෙනසක් නැත.[4]

ආසාෆ් රචනා කළ ගීතයකි.[5]

**50** බලවත්[6] දෙවි වූ යෙහෝවා[7]
කතා කළේය.[8]
නැඟෙනහිර සිට බස්නාහිර
දක්වා[9]
පොළොවේ සිටින සියල්-
ලන්ව ඔහු කැඳෙව්වේය.[10]
**2** සුන්දරත්වයෙන් පිරිපුන් සියොන්
කන්දේ සිට[11] දෙවිගේ
ආලෝකය දසත පැතිරී
ගියේය.[12]
**3** අපේ දෙවි පැමිණෙන්නේය. ඔහු
නිහඬව නොසිටින්නේය.[13]
ඔහු ඉදිරියේ විශාල ගින්නක්
ඇවිළෙමින් තිබුණේය.[14]
දරුණු කුණාටුවක් ඔහු වටා
හැමුවේය.[15]
**4** තම සෙනඟව විනිශ්චය කිරීමට
සූදානම් වූ[16]
ඔහු අහසද පොළොවද සාක්-
ෂිකරුවන් ලෙස කැඳවන්-
නේය.[17]
**5** "පූජාවක් මාර්ගයෙන් මා සමඟ
ගිවිසුමක් ඇති කරගත්,[18]
මාගේ විශ්වාසවන්ත සේවක-
යන්ව මා වෙතට ගෙ-
නෙන්න."[19]
**6** දෙවි විනිශ්චයකරුය.[20]
අහස ඔහුගේ ධර්මිෂ්ඨකම ගැන
ප්‍රකාශ කරයි.[21] සේලාහ්.
**7** "මාගේ සෙනඟෙනි, මම දැන්
ඔබට කතා කරන්නෙමි. මට
සවන් දෙන්න.[22]

**49 ගීතාවලිය**
**1** උත් 4:17
1සාමු 15:12
2සාමු 18:18
**2** ගීතා 39:5
යාකො 1:11
**3** දේශ 3:20
**4** ලූක් 12:20
**5** යෝබ් 21:13
**6** යෝබ් 24:19
රෝම 5:14
එළි 6:8
**7** ගීතා 30:5
මලා 4:3
**8** ගීතා 39:11
**9** 1සාමු 2:6
යෝබ් 7:9
**10** යෝබ් 33:28
ගීතා 16:10
ගීතා 30:3
ගීතා 56:13
ගීතා 86:13
**11** එස්ත 3:1
**12** එස්ත 5:11
**13** යෝබ් 1:21
දේශ 5:15
ලූක් 12:20
1තිමෝ 6:17
**14** යෙසා 10:3
**15** ද්වි 29:19
ලූක් 12:19
**16** හිතෝ 14:20

**2 තීරුව**
**1** උත් 15:15
**2** යෝබ් 33:30
ගීතා 56:13
**3** යෝබ් 4:21
ගීතා 49:12
හිතෝ 16:16
**4** දේශ 3:19
2පේතෘ 2:12

**50 ගීතාවලිය**
**5** 1ලේක 15:17
**6** යොෂු 22:22
යෙසා 46:9
යෙරෙ 32:18
**7** ගීතා 95:3
**8** ආමො 3:8
**9** යෙසා 45:6
**10** යෙසා 1:2
**11** ගීතා 48:2
විලා 2:15
**12** ද්වි 33:2
ගීතා 80:1
**13** ගීතා 83:1
යෙසා 42:13
යෙසා 65:6
**14** නික් 19:18
ගීතා 97:3
ආගි 7:10
හෙබ්‍රෙ 12:29
**15** ගීතා 97:4
**16** මීකා 6:2
හෙබ්‍රෙ 10:30
**17** ද්වි 4:36
ද්වි 30:19
ද්වි 32:1
යෙසා 1:2

**18** නික් 24:8; ලූක් 22:20; යොහ 11:52; **19** ද්වි 33:3; 2ලේක 29:20; ගීතා 14:7; හිතෝ 2:8; යෙසා 13:3; **20** ගීතා 7:11; ගීතා 75:7; හෙබ්‍රෙ 12:23; එළි 20:12; **21** ගීතා 97:6; **22** ගීතා 81:8.

මම දෙවිය. මම ඔබේ දෙවිය.[1]
ඊශ්‍රායෙල්, මම ඔබට විරුද්ධව සාක්ෂි දෙන්නෙමි.[2]
8 නමුත් මා ඔබට තරවටු කරන්නේ,[3]
ඔබ නිරතුරුවම ඔප්පු කරන පූජා ගැනවත් දවන පූජා ගැනවත් නොවෙයි.[4]
9 ඔබේ ගවපට්ටිවලින් ගවයන්වත්[5]
ඔබේ ගාල්වලින් එළුවන්වත් මට අවශ්‍ය නැත.
10 මන්ද වනයේ සිටින සියලු සත්වයන්ද[6]
දහස් ගණන් කඳුවල වෙසෙන සත්වයන්ද මට අයිතිය.[7]
11 තණබිම්වල සැරිසරන සත්ව රංචුද සිටින්නේ මා යටතේය.[8]
කඳුවල ලගින සියලු පක්ෂීන් ගැනද මම හොඳින් දනිමි.[9]
12 මට කුසගින්නක් දැනුණත් ඒ ගැන ඔබට කියන්න අවශ්‍ය නැත.
මන්ද මුළු සරුසාර දේශයද[10]
එහි ඇති සියල්ලද මාගේය.[11]
13 තර ගොනුන්ගේ මස් කෑම[12] හෝ එළුවන්ගේ ලේ පානය කිරීම මට අවශ්‍යද?[13]
14 ඔබේ පූජාව ලෙස දෙවිට ස්තුති ප්‍රශංසා ඔප්පු කරන්න.[14]
මහෝත්තමයාණන්ට ඔබ දුන් පොරොන්දු එලෙසම ඉටු කරන්න.[15]
15 දුක් කරදරවලට ඔබ මුහුණ දෙන විට මට හඬගසන්න.[16]
මම ඔබව ගලවාගන්නෙමි.
එවිට ඔබ මට ප්‍රශංසා කරනු ඇත."[17]
16 එහෙත් දුෂ්ටයාට දෙවි මෙසේ කියන්නේය.[18]
"මාගේ නියෝග ගැන කතා කිරීමට ඔබට අයිතිය දුන්නේ කවුද?[19]
මාගේ ගිවිසුම ගැන කතා කරන්න ඔබට ඇති අයිතිය කුමක්ද?[20]
17 ඔබ හික්මවීම් ප්‍රතික්ෂේප කළෙහිය.[1]
මාගේ වදන් ගණනකටවත් නොගන්නෙහිය.[2]
18 ඔබට සොරෙකුව හමු වූ විට ඔබ ඔහුව හිතවතෙක් කරගන්නෙහිය.[3]
ඔබ දුරාචාරයේ යෙදෙන්නන් සමඟ ඇසුරු කළෙහිය.[4]
19 ඔබේ මුඛය දිගින් දිගටම නපුරු දේ ගැන කතා කරයි.[5]
ඔබේ දිවේ නිරතුරුවම ඇත්තේ වංචාවය.[6]
20 ඔබ ඔබේම සහෝදරයාට විරුද්ධව අන් අය සමඟ කතා කරන්නෙහිය.[7]
ඔබේම මවගේ පුත්‍රයාගේ වැරදි ප්‍රසිද්ධ කරන්නෙහිය.[8]
21 ඔබ මේ දේවල් කළත් මම නිහඬව සිටියෙමි.[9]
එබැවින් මාත් ඔබට සමාන වෙයි කියා ඔබ සිතුවෙහිය.[10]
නමුත් දැන් මම ඔබගේ වැරදි පෙන්වා දී[11] ඔබට තරවටු කරන්නෙමි.[12]
22 දෙවිව අමතක කරන්නෙනි, මා කියන දේ තේරුම්ගන්න.[13]
නැත්නම් මම ඔබව විනාශ කර දමන්නෙමි. එවිට කිසිවෙකුට ඔබව බේරාගැනීමට නොහැකි වන්නේය.[14]
23 තම පූජාව ලෙස ස්තුති ප්‍රශංසා ඔප්පු කරන තැනැත්තා සැබවින්ම මාව ගෞරවයට පත් කරන්නේය.[15]
අරමුණක් ඇතුව ගමන් කරන්නා දෙවි දෙන ගැලවීම අද්දකින්නේය."[16]

**50 ගීතාවලිය**
**1** නික් 20:2
**2** නෙහෙ 9:30
**3** ගීතා 40:6; යෙසා 1:11; යෙරෙ 7:22
**4** 1සාමු 15:22; හොෂෙ 6:6
**5** මීකා 6:7
**6** උත් 1:24; 1ලේක 29:14; යෝබ් 40:15
**7** ක්‍රියා 17:24
**8** ගීතා 80:13
**9** උත් 1:20; යෝබ් 38:41; ගීතා 104:12; මතෙ 10:29
**10** 1සාමු 2:8; ගීතා 24:1; ගීතා 89:11
**11** නික් 19:5; ද්වි 10:14; යෝබ් 41:11; ගීතා 104:24; 1කොරි 10:26
**12** හොෂෙ 14:2
**13** මීකා 6:6
**14** ගීතා 69:30; ගීතා 107:22; හිතෝ 21:3; හොෂෙ 6:6; හෙබ්‍රෙ 13:15
**15** ද්වි 23:21; ගීතා 15:4; ගීතා 76:11; දේශ 5:4; යෝනා 2:9; මතෙ 5:33
**16** 2ලේක 33:12; ගීතා 77:2; ගීතා 91:15; ලූක් 22:44
**17** ගීතා 22:23; ගීතා 50:23
**18** යෙසා 48:1; එස 18:27
**19** යෙරෙ 7:4; මතෙ 7:23; රෝම 2:21
**20** ද්වි 29:21; ද්වි 31:20; හෙබ්‍රෙ 8:9

**2 තීරුව**
**1** හිතෝ 1:7; හිතෝ 5:12; හෙබ්‍රෙ 12:6
**2** නෙහෙ 9:26; යෙසා 5:24; යෙරෙ 8:9

**3** යෙසා 5:23; රෝම 1:32; රෝම 2:21; **4** යාකො 4:4; 2යොහ 11; **5** ගීතා 52:3; යෙරෙ 9:5; **6** ගීතා 52:2; යාකො 3:5; **7** ලෙවී 19:16; ගීතා 31:18; ලූක් 22:65; **8** මතෙ 10:21; **9** දේශ 8:11; රෝම 2:4; 2පේතෘ 3:9; **10** ගණන් 23:19; ගීතා 73:11; ගීතා 94:7; දේශ 8:12; **11** ගීතා 50:4; දේශ 12:14; **12** හිතෝ 29:1; **13** ගීතා 9:17; යෙසා 51:13; යෙරෙ 2:32; හොෂෙ 4:6; **14** ගීතා 7:2; **15** ගීතා 22:23; ගීතා 27:6; රෝම 12:1; එෆී 5:20; 1තෙස 5:18; හෙබ්‍රෙ 13:15; **16** ගීතා 91:16; මීකා 6:8; ලූක් 2:30.

සංගීත අධ්‍යක්ෂක වෙතය. බැත්-ෂෙබා සමඟ දුරාචාරයේ යෙදුණු දාවිත්ව හමු වීමට අනාගතවක්තෘ වූ නාතන් පැමිණියේය. එම සිද්ධියෙන් පසුව දාවිත් විසින් රචනා කළ ගීතයකි.[1]

51 අනේ දෙවියනි, ඔබේ අතිමහත් ප්‍රේමය* මට පෙන්වන්න. මට අනුකම්පා කරන්න.[2]
ඔබේ දයාව මට පෙන්වා මාගේ වැරදි මකා දමන්න.[3]
2 මාව මුළුමනින්ම සෝදා මාගේ වරද ඉවත් කරන්න.[4]
මා කළ පාපය පහ කර මාව පවිත්‍ර කරන්න.[5]
3 මා කළ වැරදි මම හොඳින් දනිමි.[6]
මා කළ පාපය නිතරම මා ඉදිරියේ තිබේ.[7]
4 මා පව් කළේ ඔබට විරුද්ධවය.[8]
දුෂ්ටයි කියා ඔබ සලකන දේ මම කළෙමි.[9]
ඒ නිසා ඔබ පවසන දේ ධර්මිෂ්ඨය.[10]
ඔබේ විනිශ්චයත් නිවැරදිය.[11]
5 මාගේ මව මහත් වේදනාවකින් මාව බිහි කළේ මට පාපය උරුම කර දෙමිනි.[12]
ඇත්තෙන්ම, මව්කුස තුළ මාව පිළිසිඳගත් මොහොතේ සිටම මා තුළ පාපය තිබිණ.[13]
6 ඔබ සතුටු වන්නේ මුළු හදවතින්ම, අවංකව කටයුතු කරන අය ගැනයි.[14]
එබැවින් සැබෑ ප්‍රඥාව මාගේ හදවතට ළං කරගැනීමට මට උපකාර කරන්න.[15]
7 හිසොප්වලින් මාව පවිත්‍ර කර මාගේ පාපය පහ කරන්න.[16]
මාව සෝදන්න. එවිට මා හිමවලටත් වඩා සුදු වන්නේය.[17]
8 ඔබ බිඳ දැමූ ඇටකටුවලට සුවයක්* ලැබෙන පිණිස[18]
මාගේ දෙසවනට ප්‍රීති ඝෝෂා හඬ ඇසෙන්න සලස්වන්න.[1]
9 මා අතින් සිදු වූ පාප වෙතින් ඔබේ මුහුණ ඉවතට හරවාගන්න.[2]
මාගේ සියලු වැරදි මකා දමන්න.[3]
10 අනේ දෙවියනි, මට පිරිසිදු හදවතක් ලබා දෙන්න.[4]
නොසැලී ස්ථිරව සිටීමට හැකි වන පිණිස මා සිතන ආකාරය නිවැරදි කර, අලුත් සිතක් මට ලබා දෙන්න.[5]
11 ඔබ ඉදිරියෙන් මාව ඉවතට නොදමන්න.[6]
ඔබේ බලය මට දිගටම ලබා දෙන්න. එය මාගෙන් ඉවත් නොකරන්න.[7]
12 ඔබ දෙන ගැලවීම නිසා ප්‍රීතිය අද්දැකීමට මට සලස්වන්න.[8]
දිගටම ඔබේ කැමැත්ත කිරීමට මා තුළ ආශාවක් ඇති කරගැනීමට මට උපකාර කරන්න.[9]
13 පව්කාරයන් නැවත ඔබ වෙතට හැරී එන පිණිස[10]
වැරදි කරන්නන්ට ඔබේ මාර්ග ගැන මම උගන්වන්නෙමි.[11]
14 මට ගැලවීම ලබා දෙන දෙවියනි,[12] ලේ වැගිරවීමෙන් මා කළ වරද මාගෙන් ඉවත් කරන්න.[13]
එවිට ඔබේ ධර්මිෂ්ඨකම ගැන ප්‍රීතියෙන් කතා කිරීමට මට හැකි වන්නේය.[14]
15 අනේ යෙහෝවා දෙවියනි, ඔබට ප්‍රශංසා කිරීමට මට හැකි වන පිණිස[15]
මාගේ මුඛය විවෘත කරන්න.[16]
16 ඔබ පූජාවලට ප්‍රසන්න නොවන බව මම දනිමි. නමුත්

ගීතා 51:1* හෝ, "ළැදි ප්‍රේමය." 8* මූ.අ., "ප්‍රීතියක්."

51 ගීතාවලිය
1 2සාමු 11:3
2 ගණන් 14:18 ගීතා 25:7 ගීතා 32:10 ගීතා 41:4 ගීතා 90:14 ගීතා 103:11
3 ගීතා 39:8 ගීතා 103:13 හිතෝ 28:13 යෙසා 43:25 යෙසා 44:22
4 යෙසා 1:18 1කොරි 6:11
5 හෙබ්‍රෙ 9:14 1යොහ 1:7
6 ගීතා 32:5
7 ගීතා 40:12
8 උත් 20:6 උත් 39:9 ලෙවී 5:19 2සාමු 12:13 ලූක් 15:21
9 2සාමු 12:9 ගීතා 38:18
10 ගීතා 50:6 රෝම 3:4
11 ලූක් 7:29 එළි 19:2
12 උත් 3:16 යෝබ් 14:4 රෝම 5:12
13 රෝම 3:23 එෆී 2:3
14 2රාජා 20:3 1ලේක 29:17
15 1සාමු 16:7 1පේතෘ 3:4
16 ලෙවී 14:4 ගණන් 19:18 හෙබ්‍රෙ 9:14
17 යෙසා 1:18
18 ගීතා 6:2 ගීතා 38:3 යෙසා 57:15

2 තීරුව
1 ගීතා 30:11
2 ගීතා 103:12 යෙසා 38:17 යෙරෙ 16:17
3 මීකා 7:19
4 යෙරෙ 32:39 ක්‍රියා 15:9 එෆී 2:10
5 එස 11:19 එෆී 4:23
6 උත් 4:14 2රාජා 13:23 ගීතා 102:10
7 ලූක් 11:13 රෝම 8:9 එෆී 4:30
8 ගීතා 21:1 ලූක් 1:47
9 ගීතා 110:3 මතෙ 26:41

10 ක්‍රියා 3:19; 11 ක්‍රියා 2:38; 12 ගීතා 38:22; ගීතා 88:1; යෙසා 12:2; එළි 7:10; 13 උත් 9:6; 1සාමු 25:34; ගීතා 26:9; එස 33:8; ක්‍රියා 18:6; ක්‍රියා 20:26; 14 නෙහෙ 9:33; ගීතා 20:5; ගීතා 35:28; ගීතා 59:16; දානි 9:7; රෝම 10:3; 15 ගීතා 34:1; ගීතා 71:8; ගීතා 109:30; ගීතා 145:21; හෙබ්‍රෙ 13:15; 16 එස 3:27.

ඔබ ඒවාට කැමති නම් මම අනිවාර්යයෙන්ම ඔබට පූජා ඔප්පු කරන්නෙමි.[1]
දවන පූජාවලින්ද ඔබට සතුටක් නැත.[2]
17 දෙවියනි, ඔබට ප්‍රසන්න පූජාව නම් බිඳුණු සිතකි.[3]
තැළුණාවූ බිඳුණාවූ හදවතක් ඔබ හෙළා නොදකින්නෙහිය.[4]
18 ඔබේ කරුණාව පෙන්වමින් සියොන් නුවරට යහපත කරන්න.[5]
යෙරුසලමේ පවුරු නැවත ගොඩනඟන්න.[6]
19 එවිට ධර්මිෂ්ඨකමින් ඔප්පු කරන පූජා ගැනද[7]
දවන පූජා ගැනද ඔබ සතුටට පත් වනු ඇත.[8]
ඔබේ පූජාසනය මත ගොනුන්වද ඔප්පු කරනු ඇත.[9]

සංගීත අධ්‍යක්ෂක වෙනය. මස්කිල්. දාවිත් අහිමෙලෙක්ගේ නිවසට ආ බව ඒදොම්වරයෙකු වූ දොවෙග් සාවුල්ට දැන්වීය. ඒ සිද්ධිය ගැන දාවිත් රචනා කළ ගීතයකි.[10]

# 52

බලවත් මනුෂ්‍යය, දෙවිගේ ප්‍රේමය* සැමදා පවතින බව ඔබ දැන සිටියේ නැද්ද?[11]
එසේනම් ඔබ කරන නපුරු දේවල් ගැන පුරසාරම් දොඩන්නේ මන්ද?[12]
2 ඔබේ දිව ඇලි පිහියක් මෙන් මුවහත්ය.[13] එය නිතරම යමෙකුව වේදනාවට පත් කිරීම සඳහා සැලසුම් යොදයි.
රැවටිලිකාරකමින් එය පිරී ඇත.[14]
3 යහපතට වඩා අයහපතටද[15]
ඇත්ත කීමට වඩා බොරු කීමටද ඔබ කැමති විය.[16]
සීලාහ්.
4 වංචාකාරී දිවක් සතු ඔබ,[1]
සියලු හානිකර වදන්වලට ප්‍රිය විය.[2]
5 එබැවින් නැවත කිසිදා නැඟී සිටීමට නොහැකි වන සේ දෙවි ඔබව බිමට හෙළන්නේය.[3]
ඔබේ කූඩාරමෙන් ඔබව ඇද දමන්නේය.[4]
ඔහු ඔබව ජීවතුන් අතරින් උදුරා දමන්නේය.[5] සීලාහ්.
6 එය දකින ධර්මිෂ්ඨයන් තුළ දෙවි කෙරෙහි ගරුබියක් ඇති වන්නේය.[6]
ඔබට සිදු වූ දේ දැක ඔවුහු සිනාසෙන්නෝය.[7]
7 “මෙවැනි මනුෂ්‍යයෝ දෙවිව තම රක්ෂස්ථානය කර නොගෙන[8]
තමාගේ වස්තුව කෙරෙහි පමණක් විශ්වාසය තබති.[9]
ඔවුහු අනුන්ව අමාරුවේ දැමීමෙන් ශක්තියක් ලබති.”[10]
8 නමුත් මම දෙවිගේ ගෘහයේ සරුසාරව වැඩුණු ඔලීව ගසක් මෙන් සිටින්නෙමි.[11]
සදාකාලයෙන් සදාකාලයටම දෙවිගේ මහත් ප්‍රේමය* කෙරෙහි මම විශ්වාසය තබන්නෙමි.[12]
9 දෙවි කර තිබෙන දේවල් නිසා මම සදහටම දෙවිව පසසන්නෙමි.[13] මන්ද ඔහුගේ ක්‍රියා යහපත්ය.
මම දෙවිගේ නාමය කෙරෙහි බලාපොරොත්තු තබන්නෙමි. ඔහුගේ විශ්වාසවන්ත තැනැත්තන් ඉදිරියේ එසේ කරන්නෙමි.[14]

**51 ගීතාවලිය**
**1** 1සාමු 15:22; හිතෝ 21:3; හොෂෙ 6:6
**2** ගීතා 40:6; ගීතා 50:8; යෙසා 1:11; යෙරෙ 7:22; ආමො 5:22
**3** 2රාජා 22:19; ගීතා 34:18; යෙසා 57:15; ලූක් 18:13
**4** 2ලේක 33:13; ගීතා 22:24; ගීතා 119:58; හිතෝ 28:13; ලූක් 15:22
**5** ගීතා 102:16; යෙසා 62:1
**6** දානි 9:25; මීකා 7:11
**7** මලා 3:3
**8** ගීතා 4:5; රෝම 12:1
**9** හොෂෙ 14:2

**52 ගීතාවලිය**
**10** 1සාමු 22:9
**11** ගීතා 103:17
**12** උත් 10:8; 1සාමු 21:7; ගීතා 94:4
**13** ගීතා 50:19; ගීතා 57:4; ගීතා 59:7; ගීතා 64:3
**14** ගීතා 109:2; 2කොරි 11:13
**15** යෙරෙ 4:22; මීකා 3:2
**16** ගීතා 62:4; යෙරෙ 9:3; යොහ 8:44

**2 තීරුව**
**1** හිතෝ 14:25; යාකො 3:6; 1පේතෘ 3:10
**2** 1සාමු 22:18
**3** ගීතා 55:23; හිතෝ 12:19; හිතෝ 15:25; හිතෝ 19:9
**4** ගීතා 28:5; ගීතා 37:9
**5** හිතෝ 2:22
**6** ගීතා 37:34; ගීතා 40:3; ගීතා 119:120; මලා 1:5; එළි 19:2
**7** ගීතා 58:10; යෙසා 37:22; එළි 18:20; **8** ගීතා 146:3; යෙරෙ 17:5; **9** ගීතා 49:6; හිතෝ 11:28; හිතෝ 23:5; 1තිමෝ 6:17; **10** දේශ 8:8; **11** යෙරෙ 11:16; හොෂෙ 14:6; **12** ගීතා 13:5; ගීතා 147:11; **13** ගීතා 50:15; **14** ගීතා 27:14; ගීතා 54:6; ගීතා 123:2; හිතෝ 18:10.

**ගීතා 52:1*** හෝ, “ළැදි ප්‍රේමය.”

**ගීතා 52:8*** හෝ, “ළැදි ප්‍රේමය.”

මහලත්* සංගීත අධ්‍යක්ෂක වෙතය.[1] මස්කිල්. දාවිත් රචනා කළ ගීතයකි.

**53** ප්‍රතිපත්තිගරුක නොවන පුද්ගලයෙක් තම සිතින් යෙහෝවා දෙවිව ප්‍රතික්ෂේප කරන්නේය.[2]
එවැනි අයගේ ක්‍රියා දූෂ්ටය. පිළිකුල්සහගතය. ඔවුන්ගේ සෑම ක්‍රියාවක්ම අධර්මිෂ්ඨය.[3]
යහපත කරන කිසිවෙක් නැත.[4]

2 දෙවි ස්වර්ගයේ සිට මනුෂ්‍යයන් දෙස බලන්නේය.[5]
දෙවිගේ මඟ පෙන්වීම් තම ජීවිතයට අවශ්‍යයි කියා තේරුම්ගන්නා කෙනෙකු සිටීද කියා යෙහෝවා දෙවි සොයා බලන්නේය.[6]

3 බොහෝදෙනෙක් යහපත කිරීම අත්හැර වංක ක්‍රියාවල නියැලෙති.[7]
යහපත කරන කිසිවෙක් නැත.[8]
එක් කෙනෙක්වත් නැත.

4 ඔවුහු රොටි කන්නාක් මෙන් මාගේ සෙනඟව කා දමති.[9]
හානි පමුණුවන ඔවුන්ගෙන් එක් කෙනෙකුටවත් කිසි දැනුමක් නැද්ද?[10]
ඔවුහු යෙහෝවා දෙවිගෙන් අයැදුවේ නැත.[11]

5 කිසිදු බියක් සැකක් නොමැතිව ජීවත් වූ ස්ථානවලම[12]
ඔවුහු දැන් මහත් බියකින් ජීවත් වන්නෝය.[13]
මන්ද දෙවි තම සෙනඟට පීඩා කරන අයගේ ඇටකටු වීසි කර දමන්නේය.[14]
යෙහෝවා දෙවි ඔවුන්ව ප්‍රතික්ෂේප කර තිබෙන නිසා ඊශ්‍රායෙල් සෙනඟ අතින් ඔවුහු ලැජ්ජාවට පත් වන්නෝය.[15]

6 ඊශ්‍රායෙල්හි මහත් ගැලවීම සියොන් වෙතින් පැමිණියා නම් එය කොතරම් අගනේද![1]
වහල්ව සිටි තම සෙනඟව යෙහෝවා දෙවි නැවත එක් රැස් කරන විට[2]
යාකොබ් ප්‍රීති වන්න. ඊශ්‍රායෙල් ප්‍රීතිමත් වන්න.[3]

සංගීත අධ්‍යක්ෂක වෙතය. තත් භාණ්ඩ ඇතුව ගායනා කිරීම සඳහාය. මස්කිල්. ෂිප්හි වැසියෝ පැමිණ, “අප සිටින ස්ථානයට නුදුරින් දාවිත් සැඟවී සිටින බව ඔබ දන්නේ නැද්ද” කියා සාවුල්ගෙන් ඇසීය. ඒ ගැන දාවිත් රචනා කළ ගීතයකි.[4]

**54** අනේ දෙවියනි, ඔබේ නාමය නිසා මාව ගලවාගන්න.[5]
ඔබේ බලය විදහා මට යුක්තිය ඉටු කර දෙන්න.[6]

2 දෙවියනි, මාගේ යාච්ඤාවට ඇහුම්කන් දෙන්න.[7]
මාගේ වදන්වලට සවන් දෙන්න.[8]

3 මන්ද මාගේ සතුරෝ* මට විරුද්ධව නැඟී සිටිති.
කුරිරු පාලකයෝද මාව මරන්න සොයති.[9]
ඔවුහු කිසිවිටෙක දෙවිව ගණන් නොගනිති.[10] සීලාහ්.

4 දෙවි මාගේ උපකාරකයාය.[11]
මට සහය දෙන්නන්ටද යෙහෝවා දෙවිගේ උපකාරය ලැබෙන්නේය.

5 මාගේ සතුරන්ගේ නපුරු ක්‍රියාවලට ඔහු දඬුවම් දෙන්නේය.[12]
දෙවියනි, ඔබ විශ්වාසවන්ත කෙනෙක් නිසා මාගේ සතුරන්ව නිහඬ කරන්න.[13]

**53 ගීතාවලිය**
1 ගීතා 88:පෙර
2 ගීතා 10:4
ගීතා 14:1
ගීතා 92:6
රෝම 1:21
3 උත් 6:11
ලෙවී 18:30
ද්වි 32:5
4 ගීතා 14:3
රෝම 3:10
5 ගීතා 8:4
ගීතා 11:4
ගීතා 33:14
ගීතා 102:19
යෙරෙ 16:17
යෙරෙ 23:24
6 1ලේක 28:9
2ලේක 15:2
2ලේක 19:3
යෝබ් 28:28
යෙසා 55:6
1පේතෘ 3:12
7 උත් 6:5
යෙසා 53:6
යෙරෙ 8:6
ශෙප 1:6
8 උත් 6:12
ගීතා 12:1
ගීතා 14:3
දේශ 7:20
රෝම 3:12
9 ගීතා 27:2
යෙරෙ 10:25
10 හිතෝ 1:29
යෙරෙ 4:22
හොෂෙ 4:1
11 යෝබ් 21:14
ගීතා 14:4
12 ලෙවී 26:17
ලෙවී 26:36
හිතෝ 28:1
13 1සාමු 14:15
2රාජා 7:6
ගීතා 14:5
14 එස 6:5
15 2රාජා 17:20
ගීතා 35:4
යෙරෙ 6:30

**2 තීරුව**
1 ගීතා 20:2
යෙසා 12:6
2 ගීතා 85:1
ගීතා 126:1
යෙරෙ 30:18
යෝවෙ 3:1
ආමො 9:14
3 එස්රා 3:11
නෙහෙ 12:43

**54 ගීතාවලිය**
4 1සාමු 23:19
1සාමු 26:1
5 ගීතා 20:1
ගීතා 79:9
හිතෝ 18:10

**6** ගීතා 43:1; ගීතා 99:4; හිතෝ 23:11; යෙරෙ 50:34; **7** ගීතා 13:3; ගීතා 65:2; ගීතා 84:8; හිතෝ 15:29; **8** ගීතා 130:2; **9** ගීතා 22:16; ගීතා 59:3; ගීතා 86:14; **10** ගීතා 36:1; ගීතා 53:4; යොහ 16:3; **11** 1ලේක 12:18; ගීතා 118:6; රෝම 8:31; හෙබ්‍රෙ 13:6; **12** රෝම 12:19; 2තිමෝ 4:14; **13** ගීතා 143:12.

**ගීතා 53:පෙර*** මෙය සංගීත වාදනයේදී භාවිත කළ යෙදුමක් විය හැක. ඇතැම් අය පවසන්නේ එය දුක්බර තනුවක් විස්තර කිරීමට භාවිත කළ බවය.

**ගීතා 54:3*** මූ.අ., “නාඳුනන අය.”

6 මම කැමැත්තෙන්ම ඔබට පූජා
ඔප්පු කරන්නෙමි.[1]
යෙහෝවා දෙවියනි, මම ඔබේ
නාමය පසසන්නෙමි. මන්ද
එය යහපත්ය.[2]
7 මාගේ සතුරන්ගේ වැටීම මාගේ
ඇස් දෙකෙන්ම මම දුටු-
වෙමි.[3]
සෑම විපතකින්ම ඔබ මාව ගල-
වාගත්තෙහිය.[4]

සංගීත අධ්‍යක්ෂක වෙතය. තත් භාණ්ඩ
ඇතුව ගායනා කිරීම සඳහාය. මස්කිල්.
දාවිත් රචනා කළ ගීතයකි.

55 අනේ දෙවියනි, මාගේ යාච්-
ඤාවට සවන් දෙන්න.[5]
මට කරුණාව පෙන්වන්න
කියා මා ඔබට කන්නලව්
කරන විට එය නොඇ-
සුණා සේ නොසිටින්න.[6]
2 මට සවන් දී මාගේ ඉල්ලීම ඉටු
කරන්න.[7]
ප්‍රශ්න ගැටලු නිසා මා කැලඹී
සිටින්නෙමි.[8]
නොසන්සුන්කමක් හැර වෙන
කිසිවක් මාගේ සිතට නො-
දැනේ.
3 මා නොසන්සුන්ව සිටින්නේ දුෂ්-
ටයා ගෙනෙන පීඩා නිසාත්
සතුරා පවසන දේවල්
නිසාත්ය.[9]
ඔවුහු දිගින් දිගටම මාගේ සිතට
වේදනා දෙති.[10]
කෝපයෙන් මට විරුද්ධව ක්‍රියා
කරති.[11]
4 මාගේ හදවත වේදනාවෙන්
දැවෙයි.[12]
මරණ බිය මාව වෙළාගෙන
සිටියි.[13]
5 භීතිය මා තුළ ලැගුම් ගෙන
සිටියි.[14]
තැතිගැන්ම මාගේ ජීවිතේ
කොටසක් වී තිබේ.
6 මම මෙසේ කියමි. "අනේ, මට
පරෙවියෙකුට මෙන් පියාපත්
තිබුණා නම්![15]
මම ඉගිලී ගොස් වෙන තැනක
ලැගුම් ගන්නෙමි.[1]
7 දුර ඈතට ඉගිලී යන්නෙමි.[2]
පාළුකරයට ගොස් එහි වාසය
කරන්නෙමි.[3]—සේලාහ්—
8 සැඩ සුළඟින්ද කුණාටුවෙන්ද මිදී
ඉක්මනින්ම ආරක්ෂිත ස්ථාන-
යකට යන්නෙමි.[4]
9 යෙහෝවා දෙවියනි, ඔවුන්ව විය-
වුලට පත් කරන්න. ඔවුන්-
ගේම කතාවෙන් ඔවුන් අතර
භේද ඇති කරන්න.[5]
මන්ද ඔවුන්ගේ සැහැසික ක්‍රියාද
ආරවුල්ද නගරය පුරාම
දකින්න තිබේ.[6]
10 ඔවුහු දිවා රෑ දෙකෙහිම නගරයේ
පවුරු මත සැරිසරති.[7]
නගරය පුරාම කෝලාහල හා
ගැටුම් පවතී.[8]
11 නගරයේ සෑම තැනක්ම කරදර-
වලින් පිරී තිබේ.
වංචාවන්ද හිංසාවන්ද එහි
ප්‍රධාන මංසන්ධියේ දකින්න
තිබේ.[9]
12 මට නින්දා කරන්නේ මාගේ සතු-
රෙකු නම්[10]
මේ දුක මට ඉවසීමට පුළුවන.
මට විරුද්ධව උදම් ඇණුවේ මා
සමඟ මහත් වෛරයෙන්
සිටින කෙනෙක් නම්[11]
ඔහුගෙන් සැඟවී සිටීමට මට
පුළුවන.[12]
13 එහෙත් එසේ කළේ මා හා
සමාන,[13]
මාව හොඳින් දැන හඳුනන,
මාගේ කිට්ටු මිත්‍රයෙකු වූ
ඔබය.[14]
14 කලින් අපි සමීප මිතුරන් ලෙස
සිටියෙමු.[15]
සෙනඟ සමඟ දෙවිගේ ගෘහයට
නොයෙක් වර ගියෙමු.[16]
15 දුෂ්ටකම මාගේ සතුරන්ගේ සිත්
තුළ මුල් ඇද තිබේ.[17]

---

14 ලූක් 22:21; ලූක් 22:48; 15 හිතෝ 3:32; 16 ගීතා 42:4;
17 ගීතා 9:17; යොහ 12:6.

**54 ගීතාවලිය**
1 ගීතා 50:14
ගීතා 107:22
ගීතා 116:17
හෙබ්‍රෙ 13:15
2 ගීතා 7:17
ගීතා 52:9
3 ගීතා 37:34
ගීතා 59:10
ගීතා 91:8
ගීතා 92:11
4 2සාමු 4:9
ගීතා 34:19
ගීතා 37:39
2තිමෝ 4:18

**55 ගීතාවලිය**
5 ගීතා 5:1
ගීතා 80:1
ගීතා 84:8
1පේතෘ 3:12
6 ගීතා 28:2
ගීතා 143:7
7 ගීතා 17:1
8 යෙසා 38:14
9 ගීතා 54:3
10 2සාමු 15:3
11 2සාමු 16:7
හොෂෙ 9:7
12 ගීතා 69:29
13 ගීතා 18:4
ගීතා 116:3
යෙසා 38:10
14 ගීතා 119:120
15 ගීතා 11:1

**2 තීරුව**
1 ගීතා 139:9
එළි 12:14
2 2සාමු 15:14
3 1සාමු 23:14
යෙරෙ 9:2
4 යෙසා 17:13
5 උත් 11:9
2සාමු 15:31
2සාමු 17:7
6 යෙසා 1:21
යෙරෙ 5:1
යෙරෙ 6:7
7 1සාමු 19:11
2සාමු 17:1
යොහ 18:3
යොහ 18:28
ක්‍රියා 9:24
8 එස 9:4
ශෙප 3:3
9 ගීතා 109:2
යෙරෙ 9:5
ආමො 5:10
10 ගීතා 41:9
11 ගීතා 35:26
ගීතා 38:16
මතෙ 26:21
12 යොහ 13:18
13 2සාමු 15:12
2සාමු 16:23
යෙරෙ 9:4

එබැවින් විනාශය ඔවුන් පිටට පැමිණේවා![1]
ඔවුන්ට පණපිටින්ම මිනී වළට යැමට සිදු වේවා![2]
16 නමුත් මම හඬගසන්නේ යෙහෝවා දෙවිටය.[3]
එවිට ඔහු මාව ගලවාගන්නේය.[4]
17 දිවා රෑ දෙකෙහිම මාගේ දුක දෙවිට කියමින් මම හඬා වැලපුණෙමි.[5]
දෙවි මාගේ හඬට සවන් දෙන්නේය.[6]
18 ඔවුන් මට විරුද්ධව කරන සටනින් දෙවි මාව බේරාගන්නේය. මාගේ සිතට සහනයක් දෙන්නේය.[7]
මන්ද මහත් හමුදාවක් මෙන් ඔවුහු මට විරුද්ධව නැඟී සිටිති.[8]
19 අතීතයේ පටන් සිංහාසනයේ හිඳගෙන සිටින[9]
දෙවි, මාගේ හඬ අසා ඔවුන්ට දඬුවම් කරන්නේය.[10] —සීලාහ්—
මන්ද ඔවුහු තම ජීවිත මාර්ගය වෙනස් කර නොගනිති.[11]
දෙවි කෙරෙහි කිසිදු ගරුබියක්ද ඔවුන් තුළ නැත.[12]
20 ඔහු* තමාගේ මිතුරන්ට විරුද්ධව අත එසෙව්වේය.[13]
ඔහු තම පොරොන්දුව කඩ කළේය.[14]
21 ඔහුගේ වදන් වෙඬරු මෙන් සුමුදුය.[15]
නමුත් ඔහුගේ සිත වෛරයෙන් පිරී තිබේ.[16]
ඔහුගේ මුවින් පිට වන වදන් මිහිරිය.*[17]
නමුත් ඒවා තියුණු කඩු මෙනි.[18]
22 ඔබේ සියලු බර යෙහෝවා දෙවිට භාර දෙන්න.[19]
එවිට ඔහු ඔබව ශක්තිමත් කරන්නේය.[1]
ඔහු කිසිදාක ධර්මිෂ්ඨයාට වැටෙන්න ඉඩ නොදෙන්නේය.[2]
23 දෙවියනි, ඔබ ලේ වගුරුවන, වංචාකාරී අයව ගැඹුරු වළකට හෙළන්නෙහිය.[3]
ඔවුහු දිගු කල් ජීවත් නොවන්නෝය.[4]
නමුත් මාගේ විශ්වාසය ඔබ කෙරෙහිය.[5]

සංගීත අධ්‍යක්ෂක වෙතය. දුර ඈතක සිටින පරෙවියා යන නමින් හඳුන්වන රිද්මයට අනුව ගායනා කිරීම සඳහාය. මික්ටැම්. පිලිස්තිවරු දාවිත්ව ගාත්හිදී අල්ලාගත්තෝය. ඒ ගැන දාවිත් රචනා කළ ගීතයකි.[6]

56 අනේ දෙවියනි, මට කරුණාව පෙන්වන්න. මන්ද මිනිස්සු මාව ගිලගන්න උත්සාහ කරන්නෝය.[7]
ඔවුහු දවස මුළුල්ලේම මට විරුද්ධව යුද්ධ කරමින් මට පීඩා කරන්නෝය.[8]
2 මාගේ සතුරෝ මාව ගිලගැනීමට දවස පුරාම උත්සාහ කරති.[9]
බොහෝ අය මට විරුද්ධව යුද්ධ කරමින් උඩඟු ලෙස ක්‍රියා කරති.[10]
3 මට භයක් දැනෙන ඕනෑම අවස්ථාවක මාගේ විශ්වාසය ඔබය.[11]
4 දෙවි කෙරෙහි මා විශ්වාසය තබා තිබෙන නිසා ඔහුගේ වදන් මම ප්‍රශංසාවට ලක් කරන්නෙමි.[12]
මාගේ විශ්වාසය දෙවි කෙරෙහිය. එබැවින් මම භය නොවෙමි.[13]
දූවිලි වැනි මිනිසාට මට විරුද්ධව කළ හැක්කේ කුමක්ද?[14]

ගීතා 55:20* “ඔහු” ලෙස යොමු දක්වන්නේ 12-14 දක්වා පදවල සඳහන් කළ ගීතිකාකරුගේ මිතුරෙකුව සිටි තැනැත්තාටය. 21* මූ.අ., “තෙල්වලට වඩා සුමුදුය.”

55 ගීතාවලිය
1 ගීතා 9:6; ගීතා 59:13; ගීතා 69:25; ගීතා 109:15
2 ගණන් 16:30; 2සාමු 17:23; 2සාමු 18:14; මතෙ 27:5; ක්‍රියා 1:18
3 ගීතා 73:28
4 ගීතා 50:15; ගීතා 91:15
5 ගීතා 88:1; ගීතා 119:147; දානි 6:10; මාක් 1:35; 1තෙස 5:17
6 ගීතා 5:3
7 2සාමු 4:9
8 2ලේක 32:7; ගීතා 3:6; ගීතා 118:12; මතෙ 26:47
9 ද්වි 33:27; ගීතා 90:2; යෙරෙ 10:10
10 ගීතා 69:33; ගීතා 143:12
11 දේශ 8:11; යෙරෙ 48:11
12 ගීතා 36:1; ශෙප 1:12
13 2සාමු 15:14; ගීතා 7:4; ක්‍රියා 12:1
14 2සාමු 5:3; දේශ 8:2
15 2සාමු 16:23; ගීතා 28:3; ගීතා 57:4; ගීතා 59:7; ගීතා 62:4; මතෙ 26:25
16 යොහ 13:2
17 හිතෝ 5:3
18 ගීතා 59:7; හිතෝ 12:18
19 ගීතා 37:5; ගීතා 43:5; යෙසා 50:10; පිලි 4:6; 1පේතෘ 5:7

2 තීරුව
1 1සාමු 2:9; ගීතා 68:19; 1පේතෘ 1:5
2 ගීතා 16:8; ගීතා 37:24; ගීතා 62:2; ගීතා 121:3
3 ගීතා 55:15
4 ගීතා 5:6; හිතෝ 10:27; දේශ 7:17; මතෙ 27:5
5 ගීතා 56:11; ගීතා 115:11

56 ගීතාවලිය 6 1සාමු 21:10; 7 ගීතා 57:3; ගීතා 124:2; 8 ගීතා 27:2; ගීතා 124:3; 9 එස 36:3; 10 ගීතා 3:1; ගීතා 54:5; ක්‍රියා 4:27; 11 1සාමු 21:12; ගීතා 18:2; 12 ගීතා 56:10; ගීතා 119:160; 13 ගීතා 27:1; ගීතා 56:11; රෝම 8:31; හෙබ්‍රෙ 13:6; 14 2ලේක 32:8; ගීතා 118:6.

5 දවස පුරාම ඔවුහු මට හිංසා කරති.
ඔවුන්ගේ එකම අරමුණ මට
අයහපතක් කිරීමය.[1]
6 ඔවුහු මට පහර දී සැඟවී සිටිති.[2]
මාගේ ජීවිතය විනාශ කිරීමට
මාන බලති.[3]
මා ගන්නා සෑම පියවරක්
ගැනම සෝදිසියෙන් සිටිති.[4]
7 දෙවියනි, ඔවුන්ගේ දුෂ්ට අර-
මුණු නිසා ඔවුන්ව ප්‍රතික්-
ෂේප කරන්න.[5]
ඔබේ උදහසින් මේ සෙනඟව
සහමුලින්ම විනාශ කර
දමන්න.[6]
8 මා උවදුරුවලින් පලායන්නෙකු
බව ඔබ දකින්නෙහිය.[7]
දෙවියනි, මාගේ කඳුළු ඔබේ
සම් භාජනයේ තබාගන්න.[8]
ඒවා ගැන ඔබේ ලියවිල්ලෙහි
සටහන් කරගන්න.[9]
9 මා ඔබට හඬගසන දවසේදී මාගේ
සතුරෝ මා වෙතින් පලා
දුවන්නෝය.[10]
ඔබ මාගේ පැත්තේ සිටින බව
මම ස්ථිරෙන්ම දනිමි.[11]
10 දෙවි කෙරෙහි මා විශ්වාසය තබා
තිබෙන නිසා[12] ඔහුගේ වදන්
මම ප්‍රශංසාවට ලක් කරන්-
නෙමි.
යෙහෝවා දෙවි කෙරෙහි මම
විශ්වාසය තබන්නෙමි. එබැ-
වින් ඔහුගේ වචන මම පැස-
සුමට ලක් කරන්නෙමි.[13]
11 මාගේ විශ්වාසය දෙවි කෙරෙහිය.
එබැවින් මම භය නොවන්-
නෙමි.[14]
දූවිලි වැනි මිනිසාට මට විරුද්-
ධව කළ හැක්කේ කුමක්ද?[15]
12 දෙවියනි, මා දුන් පොරොන්දු ඉටු
කිරීමට මම බැඳී සිටිමි.[16]
මම ඔබට ස්තුති පූජා ඔප්පු
කරන්නෙමි.[17]
13 මන්ද ඔබ මාගේ ජීවිතය මරණ-
යෙන් ගලවාගත්තෙහිය.[18]
මාගේ පය පැටලීමට ඔබ ඉඩ
නොදුන්නෙහිය.[19]
ඔබ එසේ කළේ මා ජීවන-
යේ ආලෝකය අතර සිටිමින්
ඔබට සේවය කරන පිණි-
සය.[1]

සංගීත අධ්‍යක්ෂක වෙතය. මික්ටැම්. "මාව විනාශ නොකරන්න" යන තේමා-වෙන් ලියවුණු ගීතයකි. සාවුල්ගෙන් බේරෙන්න ගල් ගුහාවකට පලා ගිය අවස්-ථාව ගැන දාවිත් විසින් රචනා කළ ගීත-යකි.[2]

# 57

අනේ දෙවියනි, මට කරුණාව
පෙන්වන්න. මට කරු-
ණාව පෙන්වන්න.[3]
මන්ද මා රැකවරණය පතන්-
නේ ඔබගෙන්ය.[4]
මේ විපත්ති පහ වන
තුරු මම ඔබේ පියා-
පත් සෙවණෙහි රැකවර-
ණය පතමි.[5]
2 මාගේ විපත්තිවලට අවසානයක්
ගෙනෙන සැබෑ දෙවිට මම
හඬගසන්නෙමි. එසේය, මා
වෙනුවෙන් ඉදිරිපත් වී ක්‍රියා
කරන මහෝත්තම දෙවිට
මම හඬගසන්නෙමි.[6]
3 ඔහු ස්වර්ගයේ සිට උපකාර සපය-
මින් මාව ගලවාගන්නේය.[7]
මාව ගිල දැමීමට උත්සාහ
කරන තැනැත්තාව ඔහු
වියවුලට පත් කරන්නේය.[8]
සීලාහ්.
ඔහුගේ මහත් ප්‍රේමය* හා විශ්-
වාසවන්තභාවය මම අද්ද-
කින්නෙමි.[9]
4 සිංහයෝ මා වට කර සිටිති.[10]
මා සැතපෙන්නේ කවරෙකු
හෝ ගිල දැමීමට මාන
බලන මිනිසුන් අතරේය.
ඔවුන්ගේ දත්, හෙල්ල හා ඊතල
මෙනි.[11]
ඔවුන්ගේ දිව, මුවහත් කඩු
මෙනි.[12]
5 දෙවියනි, ඔබට ලැබෙන ගෞර-
වය ස්වර්ගයටත් ඉහළින්
පැතිරේවා![13]

**56 ගීතාවලිය**
1 යෙරෙ 18:18
2 ගීතා 10:8; ගීතා 140:2
3 ගීතා 59:3; ගීතා 71:10
4 ගීතා 37:32; ලූක් 20:20
5 ගීතා 92:7
6 ගීතා 55:15; යෙරෙ 18:23
7 1සාමු 27:1
8 ගීතා 39:12; ගීතා 126:5
9 ගීතා 139:16; මලා 3:16
10 ගීතා 18:40; ගීතා 27:2
11 යෙසා 8:10; රෝම 8:31
12 යෙසා 45:14; යෙරෙ 12:3; යොහ 10:38; යොහ 17:21
13 ගීතා 56:4
14 ගීතා 27:1; යෙසා 51:7
15 යෙසා 51:12
16 ගණන් 30:2; දේශ 5:4
17 ගීතා 50:23
18 ගීතා 116:8; 2කොරි 1:10
19 ගීතා 17:5; ගීතා 94:18

**2 තීරුව**
1 යෝබ් 3:20; යෝබ් 33:30; ගීතා 116:9

**57 ගීතාවලිය**
2 1සාමු 22:1; 1සාමු 24:3; ගීතා142:පෙර
3 ගීතා 119:77
4 ගීතා 18:2
5 රූත් 2:12; ගීතා 17:8; ගීතා 63:7
6 යොෂු 23:5; ගීතා 138:8
7 ගීතා 144:7; ක්‍රියා 12:11
8 ගීතා 56:2; එස 36:3
9 ගීතා 40:11; ගීතා 61:7; යොහ 1:17
10 ගීතා 22:13; ගීතා 35:17
11 ගීතා 58:6; හිතෝ 30:14
12 ගීතා 52:2; ගීතා 55:21; ගීතා 64:3; හිතෝ 25:18
13 ගීතා 108:5; ගීතා 113:4

**ගීතා 57:3*** හෝ, "ළැදි ප්‍රේමය."

ඔබේ තේජස පොළොව පුරා
පැතිරේවා![1]
6 මා පය තබන තැන්වල ඔවුහු දැල් එළුවෝය.[2]
එබැවින් මම කලකිරුණෙමි.[3]
නමුත් මට කැපූ වළේම
ඔවුහු වැටුණෝය.[4] සේලාහ්.
7 දෙවියනි, මාගේ සිත වෙනස් වී නැත.[5]
එසේය, මාගේ සිත ස්ථිරව තිබේ.
මම ගී ගයමින් ඔබට ප්‍රශංසා කරන්නෙමි.[6]
8 මා තුළ තිබෙන පවිත්‍ර සිතුවිලි, අවදි වන්න.[7]
තත් භාණ්ඩත් වීණාත්, අවදි වන්න.[8]
මමද හිමිදිරියේ පිබිදෙන්නෙමි.
9 යෙහෝවා දෙවියනි, මම සෙනඟ අතරේ ඔබට ප්‍රශංසා කරන්නෙමි.[9]
ජාතීන් අතරේ ඔබට ප්‍රශංසා ගී ගයන්නෙමි.[10]
10 මන්ද ඔබ පෙන්වන මහත් ප්‍රේමය* ස්වර්ගය දක්වාම නැඟ තිබේ.[11]
ඔබේ විශ්වාසවන්තකම අහසේ වලාකුළු දක්වාම විහිදී තිබේ.[12]
11 දෙවියනි, ඔබට ලැබෙන ගෞරවය ස්වර්ගයටත් ඉහළින් පැතිරේවා![13]
ඔබේ තේජස පොළොව පුරාම පැතිරේවා!

සංගීත අධ්‍යක්ෂක වෙතය. "මාව විනාශ නොකරන්න" යන තේමාවෙන් ලියවුණු ගීතයකි. මික්ටාම්. දාවිත් රචනා කළ ගීතයකි.

58 නිහඬව සිටින ඔබ ධර්මිෂ්ඨ දේවල් ගැන කතා කරන්නේ කෙසේද?[14]
මනුෂ්‍යයෙනි, ඔබට යුක්තිසහගත ලෙස විනිශ්චය කළ හැකිද?[15]
2 ඔබේ සිත ඔබව පොළඹවන්නේ දේශය පුරාම අධර්මිෂ්ඨකම් කිරීමට මිස වෙන කිසිවකට නොවේ.[1]
ඔබ සැහැසික ක්‍රියාවලට මාර්ගය විවෘත කරන්නහුය.[2]
3 මව්කුසෙන් බිහි වූ දා සිට දුෂ්ටයෝ නොමඟ ගොස් ඇත.[3]
ඉපදුණු මොහොතේ සිට ඔවුහු යහමඟින් ඉවත්ව සිටිති.
ඔවුන් පවසන්නේ බොරුමය.[4]
4 ඔවුන්ගේ වදන් විසකුරු සර්ප විෂ මෙනි.[5]
කන් වසාගෙන සිටින නාගයා මෙන් ඔවුන් බිහිරිය.[6]
5 මතුරන්නන් කොතරම් දක්ෂ ලෙස මැතුරුවත් නාගයා ඊට ඇදී නොයයි.[7]
නයි නටවන්නන්ගේ හඬට ඌ කන් නොදෙයි.[8]
6 යෙහෝවා දෙවියනි, දුෂ්ටයන්ගේ දත් බිඳ දමන්න.[9]
තරුණ, කේශර සිංහයන්ගේ හකු කඩා දමන්න.
7 ගලා යන ජලය මෙන් ඔවුහු පහව යත්වා![10]
ඔවුන් දුර්වල වී වැටී යන විට දෙවි ඔවුන්ට විරුද්ධව දුන්න අතට ගනීවා![11]
8 ගොළුබෙල්ලෙකු දිය වී යන්නාක් මෙන් ඔවුහුද දිය වී පහව යන්නෝය.
ගබ්සා වූ දරුවෙකු මෙන් ඔවුහුද කෙදිනකවත් එළිය නොදකින්නෝය.[12]
9 වළඳට හීන් දර කෝටුවල රස්නය දැනෙන්නත් කලින්[13]
දෙවි කුණාටුවක් මෙන් පැමිණ අමු දරත් ඇවිළෙන දරත් විසුරුවාහරින්නේය.[14]
10 දුෂ්ටයන් දඬුවම් විඳින ආකාරය දකින ධර්මිෂ්ඨයා ප්‍රීති වන්නේය.[15]
දුෂ්ටයාගේ ලෙයින් ඔහු තම පාද සෝදාගන්නේය.[16]

ගීතා 57:10* හෝ, "ලැදි ප්‍රේමය."

57 ගීතාවලිය
1 ගණන් 14:21 ගීතා 72:19
2 ගීතා 7:15 ගීතා 35:7 ගීතා 140:5 හිතෝ 29:5
3 ගීතා 42:6
4 1සාමු 24:4 ගීතා 9:15 ගීතා 141:10 හිතෝ 26:27 හිතෝ 28:10
5 ගීතා 112:7
6 1ලේක 16:23 ගීතා 33:3
7 ගීතා 16:9 ගීතා 30:12
8 ගීතා 108:2
9 ගීතා 9:11 ගීතා 138:1 ගීතා 145:12
10 ගීතා 96:3 රෝම 15:9
11 ගීතා 36:5 ගීතා 89:1 ගීතා 103:11
12 ගීතා 108:4
13 ගීතා 8:1 ගීතා 57:5

58 ගීතාවලිය
14 2සාමු 23:3 2ලේක 19:6
15 ගීතා 82:2 දේශ 5:8

2 තීරුව
1 දේශ 3:16 යෙරෙ 22:17 මීකා 3:9
2 ගීතා 94:20 යෙසා 10:1
3 ගීතා 51:5 යෙසා 48:8
4 ගීතා 5:6 යොහ 8:44
5 ගීතා 140:3 රෝම 3:13 යාකො 3:8
6 යෙසා 43:8
7 ද්වි 18:11
8 යෙසා 19:3
9 ගීතා 3:7
10 2සාමු 14:14 ගීතා 112:10
11 ගීතා 64:7
12 යෝබ් 3:16
13 ගීතා 118:12
14 හිතෝ 10:25 යෙරෙ 23:19
15 ගීතා 52:6 ගීතා 64:10 ගීතා 107:42 එස 25:17 එළි 18:20
16 ගීතා 68:23 හිතෝ 21:18 එළි 14:20

11 “සැබවින්ම ධර්මිෂ්ඨයාට ආශීර්-
වාද ලැබෙන්නේය.[1]
පොළොවේ වැසියන්ව විනිශ්චය
කරන දෙවි කෙනෙක් සැබ-
වින්ම සිටියි”[2] කියා මිනිස්සු
කියනු ඇත.[3]

සංගීත අධ්‍යක්ෂක වෙතය. “මාව විනාශ නොකරන්න” යන තේමාවෙන් ලියවුණු ගීතයකි. මික්ටැම්. සාවුල්ගේ පිරිස දාවිත්ව මරා දමන පිණිස ඔහුගේ නිවස අසල රැක සිටියෝය. ඒ ගැන දාවිත් රචනා කළ ගීතයකි.[4]

59 අනේ දෙවියනි, මාගේ සතු-
රන්ගෙන් මාව බේරා-
ගන්න.[5]
මට විරුද්ධව නැඟී සිටින්-
නන්ගෙන් මාව ආරක්ෂා
කරන්න.[6]
2 දුෂ්ටයන්ගෙන් මාව බේරාගන්න.[7]
ලේ වගුරුවන අයගෙන් මාව
ගලවාගන්න.
3 මන්ද ඔවුහු මාව මරා දමන පිණිස
රැක සිටිති.[8]
බලවන්තයෝ මට පහර දීමට
සැරසී සිටිති.[9]
නමුත් යෙහෝවා දෙවියනි, ඒ
මාගේ වරදක් නිසාවත් මා
කළ පාපයක් නිසාවත් නො-
වෙයි.[10]
4 මා වරදක් නොකළත් ඔවුහු මට
විරුද්ධව ක්‍රියා කිරීමට ඉක්-
මන් වෙති.[11]
එබැවින් මා ඔබට හඬගසන විට
නැඟී සිටින්න. ඔබේ නෙත්
මා දෙස යොමු කරන්න.[12]
5 ස්වර්ගයේ සේනාවල අධිපතියා-
ණන් වන යෙහෝවා දෙවි-
යනි, ඔබ ඊශ්‍රායෙල්හි දෙ-
විය.[13]
නැඟී සිට සියලු ජාතීන්ව[14]
සෝදිසි කර බලන්න.
එක ද්‍රෝහියෙකුටවත් ඔබේ
කරුණාව නොපෙන්වන්න.[15]
සීලාහ්.
6 ඔවුහු සෑම සවසකම පැමිණෙති.[16]
බල්ලන් මෙන් බුරමින්[17] නුවර
පුරාම යති.[18]
7 තියුණු කඩු වැනි දුෂ්ට වදන්[1]
ඔවුන්ගේ මුවින් නික්මෙයි.[2]
“අපි පවසන දේවල් කවුරු දැන-
ගන්නද”
කියා ඔවුහු පවසති.[3]
8 නමුත් යෙහෝවා දෙවියනි, ඔබ
ඔවුන්ට සිනාසෙන්නෙහිය.[4]
ජාතීහු ඔබ ඉදිරියේ විහිළුවකට
ලක් වන්නෝය.[5]
9 මාගේ ශක්තිය වන ඔබ දෙස මම
බලා සිටිමි.[6]
මන්ද ඔබ මට සුරක්ෂිතබවක්
ලබා දෙන උස් බලකොටු-
වකි.[7]
10 මහත් ප්‍රේමයකින්* පිරුණු දෙවි
මාගේ උපකාරයට පැමි-
ණෙන්නේය.[8]
දෙවි මාගේ සතුරන්ගේ පරාජය
මට දැකගැනීමට සලස්වන්-
නේය.[9]
11 දෙවියනි, ඔවුන්ව මරණයට පත්
නොකරන්න. එවිට ඔබේ
ක්‍රියාවන් මාගේ සෙනඟට
අමතක නොවනු ඇත.[10]
නමුත් ඔවුන්ට ඉබාගාතේ
යෑමට සලස්වා ඔබේ ශක්-
තිය ඔවුන්ට පෙන්වන්න.[11]
අපේ පලිහ වන යෙහෝවා දෙවි-
යනි, ඔවුන්ව බිමට හෙළාද-
මන්න.[12]
12 මන්ද ඔවුන්ගේ තොල්වලින් නික්-
මෙන්නේ දුෂ්ට වදන්ය.[13]
ඔවුහු දිගින් දිගටම ශාප කර-
මින්ද රවටමින්ද සිටිති.
ඔවුන්ගේ මේ උඩඟුකම ඔවුන්-
ගේ විනාශයට මුල් වේවා![14]
13 ඔබේ උදහසින් ඔවුන්ව විනාශ කර
දමන්න.[15]
එක් කෙනෙකුවත් ඉතුරු නො-
වන පිණිස ඔවුන්ව සහමු-
ලින්ම නැති කර දමන්න.
එවිට යාකොබ් කෙරෙහිත් මුළු

**58 ගීතාවලිය**
1 යෙසා 3:10
2 ගීතා 9:16
ගීතා 98:9
හෙබ්‍රෙ 10:30
3 ගීතා 92:15

**59 ගීතාවලිය**
4 1සාමු 19:11
5 1සාමු 19:12
ගීතා 7:1
ගීතා 18:48
ගීතා 71:4
6 ගීතා 12:5
ගීතා 91:14
7 ගීතා 28:3
2තෙස 3:2
8 1සාමු 19:1
ගීතා 10:9
ගීතා 37:32
ගීතා 38:12
ගීතා 56:6
ගීතා 71:10
යොහ 7:1
ක්‍රියා 23:21
9 ගීතා 2:2
ක්‍රියා 4:26
10 1සාමු 24:11
1සාමු 26:18
ගීතා 35:19
ගීතා 69:4
11 හිතෝ 1:16
ක්‍රියා 23:15
12 ගීතා 35:23
13 ද්වි 33:29
14 ගීතා 9:15
15 හිතෝ 2:22
හිතෝ 13:2
16 1සාමු 19:11
17 ගීතා 22:16
18 ගීතා 59:14

**2 තීරුව**
1 ගීතා 57:4
ගීතා 64:3
හිතෝ 12:18
2 මතෙ 12:34
3 ගීතා 10:11
ගීතා 73:11
එස 9:9
4 ගීතා 2:4
ගීතා 37:13
හිතෝ 1:26
5 ගීතා 33:10
6 ගීතා 18:1
ගීතා 27:1
ගීතා 46:1
7 ගීතා 9:9
ගීතා 62:2
8 ගීතා 6:4
ගීතා 119:88
9 ගීතා 54:7
ගීතා 92:11
10 විනි 1:6
දේශ 9:5
11 උත් 4:12
එස 12:15
12 උත් 15:1
ද්වි 33:29
යෝබ් 40:12
ගීතා 3:3

**13** ගීතා 64:8; හිතෝ 12:13; හිතෝ 18:7; **14** හිතෝ 8:13; හිතෝ 16:18; **15** ගීතා 7:9; යෙසා 63:3.

**ගීතා 59:10*** හෝ, “ලැදි ප්‍රේමයකින්.”

පොළොව කෙරෙහිත් රජකම් කරමින් සිටින්නේ දෙවි
වන ඔබ බව සියලුදෙනාම
දැනගන්නෝය.[1] සීලාහ්.

14 ඔවුන් සෑම සවසකම පැමිණ
බල්ලන් මෙන් බුරමින් නුවර
පුරාම ඇවිද ගියත් මම එය
ගණන් නොගනිමි.[2]

15 කෑමට යමක් සොයමින් ඒ මේ අත
ඇවිදීමට ඔවුන්ට සිදු වේවා![3]
කෑමක් ලැබුණත් එයින් තෘප්තියට පත් නොවේවා! රාත්‍රිය
ගත කිරීමට ස්ථානයක්වත්
ඔවුන්ට නොලැබේවා![4]

16 නමුත් මම ඔබේ ශක්තිය ගැන ගී
ගයන්නෙමි.[5]
උදෑසනින්ම ඔබේ මහත් ප්‍රේමය* ගැන ප්‍රීතියෙන් කතා
කරන්නෙමි.[6]
මන්ද ඔබ මට සුරක්ෂිතබවක්
ලබා දෙන උස් බලකොටුවකි.[7]
විපත්ති කාලවලදී ආරක්ෂාව
ලැබිය හැකි ස්ථානයකි.[8]

17 මාගේ ශක්තිය වන ඔබට මම
ප්‍රශංසා ගී ගයන්නෙමි.[9]
මන්ද ඔබ මට සුරක්ෂිතබවක්
ලබා දෙන උස් බලකොටුවකි. මහත් ප්‍රේමයක්* පෙන්වන දෙවි කෙනෙකි.[10]

සංගීත අධ්‍යක්ෂක වෙනය. මතකයට නඟමින් ලිලී මල නම් වූ රිද්මයට අනුව ගායනා කිරීම සඳහාය. මික්ටැම්. ජනයාට ඉගැන්වීම සඳහා මෙය රචනා කරන ලදි.[11] දාවිත් ආරම්-නහරායිම් සහ ආරම්-ෂෝබා නම් දේශයන්හි වැසියන්ට විරුද්ධව සටනක යෙදී සිටියදී යෝවාබ් ආපසු ලුණු නිම්නයට ගොස් ඒදොම්වරුන් දොළොස්දහසකට පහර දුන්නේය. ඒ ගැන දාවිත් රචනා කළ ගීතයකි.[12]

60 දෙවියනි, ඔබ උදහස් වූවෙහිය. ඔබ අපව බිඳ දැමුවෙහිය.[13]
අපව අත්හැරියෙහිය. අනේ
දෙවියනි, දැන් අපව
නැවත පිළිගන්න.[1]

2 ඔබ පොළොව දෙදරුම් කෑමට
සැලැස්වුවෙහිය. ඔබ එය
දෙබෑ කළෙහිය.[2]
අනේ දෙවියනි, එයට කඩා
වැටීමට ඉඩ නොදෙන්න.
එය නැවත ගොඩනඟන්න.[3]

3 ඔබේ සෙනඟට දුක් විඳීමට ඔබ
ඉඩහැරියෙහිය.[4]
ඔබ අපට වයින් පොවා මත්
වීමට සැලැස්වුවෙහිය.[5]

4 ඔබට ගරුබිය දක්වන අයට
සතුරන්ගේ ඊතල පහරින් බේරී
පලා යා හැකි ස්ථානයක්
ඔබ පෙන්වා දුන්නෙහිය.[6]
සීලාහ්.

5 දෙවියනි, අපේ කන්නලව්වට
සවන් දී ඔබේ දකුණතින්
අපව ගලවාගන්න.[7]
ඔබට ප්‍රේම කරන අයව බේරාගන්න.[8]

6 ශුද්ධ දෙවි මෙසේ කීවේය.[9]
"මම කැමති කෙනෙකුට
ෂීකෙම් නුවර උරුමයක්
ලෙස දෙන්නෙමි.[10]
මහත් ප්‍රීතියකින් සුක්කොත්
තැනිතලාව බෙදා වෙන් කර
දෙන්නෙමි.[11]

7 මනස්සේ හා ගිලියද් මට අයිතිය.[12]
එෆ්‍රායිම් මා පත් කළ ප්‍රධානියාගේ බලකොටුවය.
යූදා මාගේ රාජ යෂ්ටියය.*[13]

8 මා අත් පා සෝදාගන්නා භාජනය
මෝවබ්ය.[14]
මම ඒදොම් වෙතට මාගේ
පාවහන් ගලවා වීසි කරන්නෙමි.[15]
පිලිස්තියාව පරදවා මම ජය
නාද නඟන්නෙමි."[16]

9 වටලා තිබෙන නුවරට මාව ගෙන
යන්නේ කවුද?[17]

---

ගීතා 59:16* හෝ, "ලැදි ප්‍රේමය." 17* හෝ, "ලැදි ප්‍රේමයක්."

ගීතා 60:7* මූ.අ., "පාලකයාගේ සැරයටිය." පාලකයෙකුට යම් නියෝග දීමට ඇති අයිතිය ඉන් නියෝජනය කරයි.

---

59 ගීතාවලිය
1 1සාමු 17:46
ගීතා 9:16
ගීතා 83:18
2 ගීතා 59:6
3 ගීතා 109:10
4 යෙසා 56:11
5 යෝබ් 37:23
ගීතා 21:13
ගීතා 106:8
ගීතා 145:11
6 ගීතා 89:1
ගීතා 101:1
එෆී 1:6
7 1සාමු 17:37
ගීතා 61:3
8 හිතෝ 18:10
9 ගීතා 18:1
යෙසා 12:2
10 ගීතා 59:10

60 ගීතාවලිය
11 ද්වි 31:19
2සාමු 1:18
12 2සාමු 8:13
1ලේක 18:3
13 ගීතා 44:9
ගීතා 89:38

2 තීරුව
1 ගීතා 85:4
ගීතා 90:13
2 හග් 2:7
3 යෙරෙ 30:17
හොෂෙ 6:1
4 නෙහෙ 9:32
ගීතා 71:20
දානි 9:12
5 යෙසා 51:17
යෙරෙ 25:15
හබ 2:16
6 ගීතා 20:5
7 ගීතා 18:35
ගීතා 21:8
ගීතා 118:15
යෙසා 41:10
8 ගීතා 108:6
9 ගීතා 89:35
ගීතා 108:7
10 උත් 12:6
යොෂු 1:6
11 යොෂු 13:27
12 ද්වි 33:17
ගීතා 108:8
13 උත් 49:10
14 ගණන් 24:17
2සාමු 8:2
ගීතා 108:9
15 ගණන් 24:18
2සාමු 8:14
16 2සාමු 8:1
17 2සාමු 11:1
2සාමු 12:29
1ලේක 11:16

ඒදොම් වෙතට යෑමට මට මඟ පෙන්වන්නේ කවුද?[1]
**10** දෙවියනි, එසේ කරන්නේ ඔබ නොවේද? නමුත් දෙවියනි, තවමත් ඔබ අපව අත්හැර දමා ඇත.[2]
ඔබ අපේ හමුදාවේ උපකාරයට පැමිණියේ නැත.[3]
**11** අනේ දෙවියනි, අපේ විපත්තියේදී අපට උපකාර කරන්න.[4]
මන්ද ගැලවීම ලබාගැනීමට මිනිසා මත විශ්වාසය තැබීම නිෂ්ඵලය.[5]
**12** අපිට අවශ්‍ය ශක්තිය අපි ඔබෙන් ලබන්නෙමු.[6]
ඔබ අපේ සතුරන්ව පාගා දමන බව නියතය.[7]

සංගීත අධ්‍යක්ෂක වෙතය. තත් භාණ්ඩ ඇතුව ගායනා කිරීම සඳහාය. දාවිත් රචනා කළ ගීතයකි.

**61** අනේ දෙවියනි, මාගේ කන්නලව්වට සවන් දෙන්න.[8]
මාගේ යාච්ඤාවට ඇහුම්කන් දෙන්න.[9]
**2** මාගේ හදවත වේදනාවෙන් පිරී තිබෙන විට මම දුර ඈතක සිටියත් ඔබට හඬගසන්නෙමි.[10]
දෙවියනි, උස් පර්වතයකට මාව ගෙන යන්න.[11]
**3** මන්ද ඔබ මාගේ රැකවරණයය.[12]
සතුරු ප්‍රහාර හමුවේ ශක්තිමත් බලකොටුවය.[13]
**4** සදහටම මම ඔබේ කූඩාරමේ ආගන්තුකයෙකු ලෙස සිටින්නෙමි.[14]
ඔබේ පියාපත් සෙවණේ සැඟවී මම රැකවරණය ලබන්නෙමි.[15] සීලාහ්.
**5** දෙවියනි, මා දුන් පොරොන්දුවලට ඔබ ඇහුම්කන් දුන්නෙහිය.[16]
ඔබේ නාමයට ගරුබිය දක්වන අයට ඔබ දෙන උරුමය ඔබ මටද දුන්නෙහිය.[17]
**6** ඔබ රජුගේ ආයු කාලය වැඩි කරන්නෙහිය.[18]
පරම්පරා ගණනාවක් පහව ගියත් ඔහු ජීවත් වන්නේය.[1]
**7** ඔහු සදහටම දෙවි ඉදිරියේ වාසය කරන්නේය.[2]
ප්‍රේමය* හා විශ්වාසවන්තකම ඔබ ඔහුට පෙන්වා ඔහුව ආරක්ෂා කරන්නෙහිය.[3]
**8** මා දුන් පොරොන්දු කිසි දිනක කඩ නොවන පිණිස[4]
මම සදහටම ඔබේ නාමයට ප්‍රශංසා ගී ගයන්නෙමි.[5]

යෙදූතුන් සංගීත අධ්‍යක්ෂක වෙතය. දාවිත් රචනා කළ ගීතයකි.

**62** මම නිහඬව දෙවි කෙරෙහි බලාපොරොත්තුවෙන් සිටින්නෙමි.[6]
මට ගැලවීම ලැබෙන්නේ ඔහුගෙන්ය.[7]
**2** දෙවි මාගේ පර්වතයය. මාගේ ගැලවීමය. මට සුරක්ෂිතබවක් ලබා දෙන උස් බලකොටුවය.[8]
මම කිසි දිනක සම්පූර්ණයෙන්ම වැටෙන්නේ නැත.[9]
**3** ඔබ වෛර කරන තැනැත්තාව මරා දැමීමට තව කොපමණ කල් මාන බලමින් සිටින්නහුද?[10]
ඔබ සියල්ලෝම ගරාවැටුණු පවුරක් මෙනි. එය දැන් කඩා වැටීමට ආසන්නය.[11]
**4** ඔවුන් ලබා දෙන උපදෙස් පිළිපැදීමෙන් කෙනෙකු සතු ආත්ම ගරුත්වය නැති වන්නේය.[12]
බොරු කීමෙන් ඔවුහු ආස්වාදයක් ලබති.[13]
ඔවුහු මුවින් ප්‍රශංසා කළත් සිතින් ශාප කරති.[14] සීලාහ්.
**5** මම නිහඬව දෙවි කෙරෙහි බලා සිටින්නෙමි.[15]

**60 ගීතාවලිය**
**1** 2සාමු 8:14
**2** ගීතා 44:9; ගීතා 108:11; යෙසා 8:17; යෙසා 12:1
**3** ද්වි 1:42; ද්වි 20:4; යොෂු 7:12
**4** ගීතා 25:22; ගීතා 108:12
**5** ගීතා 62:9; ගීතා 118:8; ගීතා 146:3
**6** 2සාමු 10:12; ගීතා 18:32; ගීතා 108:13
**7** ගීතා 44:5; යෙසා 63:3

**61 ගීතාවලිය**
**8** ගීතා 5:2; ගීතා 28:2; ගීතා 102:1; ගීතා 130:2
**9** ගීතා 17:1; ගීතා 55:1; පිලි 4:6
**10** 1රාජා 8:48; යෝනා 2:2
**11** ගීතා 27:5; ගීතා 40:2
**12** ගීතා 25:20
**13** 1සාමු 17:45; ගීතා 18:2; හිතෝ 18:10
**14** ගීතා 23:6; ගීතා 27:4
**15** ගීතා 17:8; ගීතා 57:1; ගීතා 63:7; ගීතා 91:4
**16** ගීතා 65:1
**17** ගීතා 115:13; මලා 3:16
**18** ගීතා 18:50; ගීතා 21:4; ගීතා 72:17

**2 තීරුව**
**1** ගීතා 89:4
**2** 2සාමු 7:16; ගීතා 41:12
**3** ගීතා 40:11; ගීතා 57:3; ගීතා 143:12; හිතෝ 20:28; මීකා 7:20
**4** ගීතා 65:1; ගීතා 66:13; දේශ 5:4
**5** ගීතා 30:12; ගීතා 145:1; ගීතා 146:2

**62 ගීතාවලිය**
**6** ගීතා 33:20
**7** ගීතා 3:8; ගීතා 37:39; ගීතා 68:19; යෙසා 12:2

**8** ගීතා 18:2; ගීතා 46:7; ගීතා 62:6; **9** ගීතා 37:24; මීකා 7:8; 2කොරි 4:9; **10** 1සාමු 24:11; ගීතා 38:12; **11** යෙසා 30:13; **12** මතෙ 2:8; **13** ගීතා 52:3; හිතෝ 6:17; යොහ 8:44; **14** ගීතා 5:9; ගීතා 28:3; ගීතා 55:21; **15** ගීතා 43:5; ගීතා 62:1; මීකා 7:7.

**ගීතා 61:7*** හෝ, “ළැදි ප්‍රේමය.”

මන්ද ඔහු මා තුළ බලාපො-
රොත්තුවක් ඇති කළේය.[1]
6 ඔහු මාගේ පර්වතයය. මාගේ
ගැලවීමය. මට සුරක්ෂිතබ-
වක් ලබා දෙන උස් බලකො-
ටුවය.[2]
මම කිසිදා නොවැටෙන්නෙමි.[3]
7 මාගේ ගැලවීමත් ගෞරවයත් දෙ-
විය.[4]
ඔහු මාගේ ශක්තිමත් පර්වත-
යය. මට රැකවරණය ලබා
දෙන්නෙත් ඔහුය.[5]
8 ජනයෙනි, සැමවිටම දෙවි කෙ-
රෙහි විශ්වාසය තබන්න.[6]
ඔබේ හදවතේ ඇති සියල්ල දෙ-
විට පවසන්න.[7]
මන්ද අපට රැකවරණය ලබා
දෙන්නේ ඔහුය.[8] සේලාහ්.
9 මනුෂ්‍යයන් මොහොතකට පව-
තින සුළඟක් මෙනි.[9]
ඔවුන්ව තරාදියක දමා මැන
බැලුවොත් ඔවුන්ගේ බර
කිසිත් නැති තරම්ය. ඔවුන්
සුළං පොදකටත් වඩා බරින්
අඩුය.[10]
ඔවුන්ගෙන් ලැබෙන රැකවර-
ණය නිෂ්ඵලය.[11]
10 වංචනික ක්‍රියා කර දියුණු-
වක් ලැබිය හැකියයි නො-
සිතන්න.[12]
සොරකම වැනි නිෂ්ඵල දෙයින්
සාර්ථක විය හැකියයි නො-
සිතන්න.[13]
ඔබට ධනය බොහෝ සෙයින්
ලැබුණත් ඒ මත විශ්වාසය
නොතබන්න.[14]
11 දෙවි මට දෙවරක් කතා කළේය.[15]
සියලු ශක්තියේ උල්පත දෙවි
බව මට දන්වන ලදි.[16]
12 යෙහෝවා දෙවියනි, ප්‍රේමයේ*
උල්පත ඔබය.[17]
එකිනෙකාගේ ක්‍රියාවලට අනුව
ප්‍රතිඵල දෙන්නෙත් ඔබය.[18]

ගීතා 62:12* හෝ, “ලැදි ප්‍රේමයේ.”

62 ගීතාවලිය
1 ගීතා 71:5 රෝම 15:13 තීත 1:2
2 ගීතා 18:31
3 ගීතා 16:8 ගීතා 112:6 හිතෝ 10:30
4 ගීතා 3:3 යෙරෙ 3:23
5 ගීතා 95:1 යෙසා 26:4
6 යෙසා 50:10
7 1සාමු 1:15
8 ගීතා 46:11 හිතෝ 14:26
9 ගීතා 39:5 ගීතා 144:4
10 යෙසා 40:15
11 2සාමු 15:31 ගීතා 60:11 රෝම 3:4
12 හිතෝ 14:31 යෙසා 30:12
13 යෙසා 61:8
14 ද්වි 6:12 යෝබ් 31:24 ගීතා 52:7 හිතෝ 11:4 හිතෝ 11:28 හිතෝ 23:5 මතෙ 6:19 මතෙ 6:24 මාක් 8:36 ලූක් 12:15 1තිමෝ 6:17 1යොහ 2:16
15 යෝබ් 33:14
16 යෝබ් 9:4 ගීතා 63:2 ගීතා 77:14 නාහු 1:3 එළි 19:1
17 ගීතා 36:7 ගීතා 86:15 මීකා 7:18
18 1සාමු 16:7 යෝබ් 34:11 හිතෝ 24:12 යෙරෙ 32:19 එස 7:27 රෝම 2:6 2කොරි 5:10 ගලා 6:7 කොලො 3:25 2තිමෝ 4:14 1පේත 1:17 එළි 20:12 එළි 22:12

2 තීරුව

63 ගීතාවලිය
1 1සාමු 22:5 1සාමු 23:14
2 නික් 15:2 යෙසා 26:9
3 ගීතා 63:පෙර
4 ගීතා 42:2 ගීතා 143:6

දාවිත් යූදාහි පාළුකරයේ සිටියදී රචනා කළ ගීතයකි.[1]

63 දෙවියනි, ඔබ මාගේ දෙවිය.
මම නිතරම ඔබේ මහ
පෙන්වීම් පතන්නෙමි.[2]
ඉරි තැළී ගිය වියළි භූමියක
සිටින කෙනෙකු වතුර
පොදක් තම දෙතොල්
මතට වැටෙන තෙක්
මහත් ආශාවකින් බලා
සිටින්නාක් මෙන්,[3]
ඔබට ළං වීමට මමත් මහත්
ආශාවෙන් සිටිමි.[4]
2 මම ඔබේ ශක්තිය හා ඔබේ තේ-
ජස දෙස මහත් ආශාවකින්
බලා සිටියෙමි.[5]
එවිට ශුද්ධස්ථානයේ සිටින
ඔබව දුටුවාක් මෙන් මට
හැඟිණ.[6]
3 ඔබ පෙන්වන මහත් ප්‍රේමය*
ලැබීමම මට අගනේය. එය
මාගේ ජීවිතයටත් වඩා මට
වටින්නේය.[7]
එබැවින් මම ඔබට ප්‍රශංසා
කරන්නෙමි.[8]
4 දිවි ඇති තුරා මම ඔබට ප්‍රශංසා
කරන්නෙමි.[9]
මම දෑත් ඔසවා ඔබේ නාම-
යෙන් අයැදින්නෙමි.[10]
5 කෙනෙකුට ජීවිතේ ලැබිය හැකි
හොඳම දේවලින්* මම තෘප්-
තිමත්ව සිටිමි.[11]
එබැවින් ප්‍රීති ඝෝෂා නඟමින්
මම ඔබට ප්‍රශංසා කරමි.[12]
6 මම යහනේ සිටින විට ඔබව සිහි
කළෙමි.[13]
මැදියම් රැයේ* මම ඔබ ගැන
ගැඹුරින් කල්පනා කළෙමි.[14]

**5** 1ලේක 16:28; ගීතා 29:1; ගීතා 96:6; **6** ගීතා 77:13; **7** ගීතා 30:5; ගීතා 100:5; **8** ගීතා 66:17; හොෂෙ 14:2; හෙබ්‍රෙ 13:15; **9** ගීතා 145:2; **10** 1රාජා 8:22; ගීතා 134:2; **11** ලෙවි 7:25; ගීතා 36:8; යෙරෙ 31:14; **12** ගීතා 43:4; ගීතා 71:23; ගීතා 135:3; **13** ගීතා 149:5; **14** ගීතා 119:55; ගීතා 119:148.

ගීතා 63:3* හෝ, “ලැදි ප්‍රේමය.” 5* මූ.අ., “හොඳම කොටස වන තෙලින්.” 6* මූ.අ., “රැකවල් යාමේ.”

7 ඔබ මා වෙනුවෙන් මොන තරම් දේවල් කර තිබේද![1]
ඔබේ පියාපත් සෙවණේ සිටිමින් මම සතුටින් ඔබට ප්‍රශංසා ගී ගයන්නෙමි.[2]
8 මම ඔබට ඉතා සමීපව සිටිමි.[3]
දකුණතින් ඔබ මාව අල්ලාගෙන සිටින්නෙහිය.[4]
9 මාගේ ජීවිතය විනාශ කර දැමීමට උත්සාහ කරන අය[5]
පොළොවේ ගැඹුරුම ස්ථානවලට කිඳා බසින්නෝය.[6]
10 ඔවුහු කඩු මුවහතින් පහර කන්නෝය.[7]
හිවලුන්ගේ ගොදුරක් බවට පත් වන්නෝය.[8]
11 නමුත් රජ දෙවි කෙරෙහි ප්‍රීතිමත් වන්නේය.[9]
දෙවිගේ නාමයෙන් දිවුරන සියල්ලෝද ප්‍රීතිමත් වන්නෝය.[10]
මන්ද බොරුකාරයන්ව නිහඬ කරනු ලැබේ.[11]

සංගීත අධ්‍යක්ෂක වෙතය.
දාවිත් රචනා කළ ගීතයකි.

64 දෙවියනි, මාගේ දුක කියා මා ඔබට කන්නලව් කරන විට මට සවන් දෙන්න.[12]
සතුරන්ගෙන් එල්ල වන ප්‍රහාරවලින් මාගේ ජීවිතය ආරක්ෂා කර දෙන්න.[13]
2 මට විරුද්ධව සිටින කලහකාරී සෙනඟගෙන්ද[14]
අපරාධකරුවන්ගේ කුමන්ත්‍රණවලින්ද මාව ආරක්ෂා කරන්න.[15]
3 ඔවුන්ගේ දිව් මුවහත් කඩු මෙනි.[16]
ඔවුන්ගේ මුවින් නික්මෙන වදන් ඊතල මෙනි. ඒවා සිත් පසාරු කරගෙන යන්නේය.[17]
4 ඔවුහු නිර්දෝෂ තැනැත්තාට ඊතලවලින් පහර දීමට සැඟවී බලා සිටිති.[18]
ඔවුහු එකවරම කිසිම බියක් සැකක් නැතුව ඔහුට පහර දෙති.[1]
5 ඔවුන් සැමවිටම කතා කරන්නේ දුෂ්ට දේවල් ගැනය.[2]
ඔවුන් සැමවිටම සැලසුම් කරන්නේ යමෙකුව හසු කරගැනීමට හැකි මඟක් ගැනය.[3]
"අපි කරන දේ කවුරු දකින්නද" කියා ඔවුහු කියති.[4]
6 ඔවුහු අධර්මිෂ්ඨ දේවල් සඳහා සැලසුම් යොදති.[5]
සූක්ෂ්ම ලෙස සැලසුම් කළ උගුල් යමෙකුට විරුද්ධව අටවති.[6]
ඔවුන්ගේ සිතේ ඇති දේ කිසිවෙකුට තේරුම්ගත නොහැක.[7]
7 නමුත් නොසිතන මොහොතකදී දෙවි ඊතලවලින් ඔවුන්ට පහර දෙන්නේය.[8]
එයට ගොදුරු වන ඔවුහු දැඩි ලෙස තුවාල ලබති.[9]
8 ඔවුහු අනුන්ගේ පය පටලවා ඔවුන්ව වැටීමට සලස්වති.[10]
නමුත් ඔවුන්ගේ කතා නිසා ඔවුහුම විනාශය අද්දකිති.[11]
ඔවුන්ට සිදු වන දේ දකින සියල්ලෝ පුදුමයෙන් හිස වනති.[12]
9 සියලු මිනිස්සු බියට පත් වී[13]
දෙවි කළ දේ ගැන කතා කරති.[14]
ඔවුහු ඔහුගේ ක්‍රියා හොඳින් තේරුම්ගනිති.[15]
10 ධර්මිෂ්ඨ තැනැත්තා යෙහෝවා දෙවිගේ ක්‍රියා ගැන ප්‍රීති වී ඔහුගේ රැකවරණය පතන්නේය.[16]
නිර්දෝෂ සිතක් ඇති සියල්ලෝ ඔහු ගැන ආඩම්බරෙන් කතා කරන්නෝය.[17]

**63 ගීතාවලිය**
1 1සාමු 17:37 ගීතා 46:1 ගීතා 54:4
2 ගීතා 5:11 ගීතා 32:11 ගීතා 36:7 ගීතා 57:1 ගීතා 61:4
3 ගීතා 73:25 ගීතා 143:6
4 යෙසා 41:10
5 ගීතා 35:4 ගීතා 40:14
6 ගණන් 16:30 1සාමු 25:29
7 1සාමු 26:10 යෙරෙ 18:21 යෙරෙ 25:31
8 එස 39:4
9 ගීතා 21:1
10 ද්වි 6:13 යෙසා 45:23
11 ගීතා 31:18

**64 ගීතාවලිය**
12 ගීතා 55:1
13 ගීතා 31:15
14 ලූක් 23:18
15 ගීතා 56:6 ගීතා 109:2
16 හිතෝ 12:18 හිතෝ 30:14
17 ගීතා 11:2 ගීතා 58:7 යෙරෙ 9:8
18 ගීතා 10:8

**2 තීරුව**
1 1සාමු 18:11 2සාමු 15:14
2 ගණන් 22:6
3 හිතෝ 1:11 මතෙ 26:4
4 ගීතා 10:11 ගීතා 59:7 ගීතා 94:7 එස 8:12
5 ගීතා 35:11 දානි 6:4
6 ගීතා 140:5 මතෙ 26:59
7 ගීතා 5:9 යෙරෙ 17:9
8 ද්වි 32:23 ගීතා 7:12
9 1රාජා 22:34 1ලේක 10:3
10 හිතෝ 12:13 මලා 2:8 රෝම 14:21
11 හිතෝ 18:7 ලූක් 19:22
12 යෙරෙ 18:16 එළි 18:10
13 ගණන් 16:34
14 ගීතා 145:6 යෙරෙ 50:28 යෙරෙ 51:10

**15** 1සාමු 5:12; ගීතා 107:43; හොෂෙ 14:9; **16** ගීතා 32:11; ගීතා 58:10; ගීතා 68:3; පිලි 4:4; **17** 1කොරි 1:31.

සංගීත අධ්‍යාක්ෂක වෙතය.
දාවිත් රචනා කළ ගීතයකි.

**65** දෙවියනි, සියොන්හිදී ඔබට
ප්‍රශංසාව ලැබෙන්නේය.[1]
ඔබ ඉදිරියේ නිහඬතා-
වක්ද පවතින්නේය.
අපි ඔබට දුන් පොරොන්දු
ඉටු කරන්නෙමු.[2]
2 යාච්ඤා අසන තැනැත්තාණෙනි,
සැම ජාතියකටම අයත්
මිනිස්සු ඔබ ඉදිරියට පැමි-
ණෙනු ඇත.[3]
3 මා කළ වැරදි මට දරාගත නො-
හැකි තරම්ය.[4]
නමුත් ඔබ අපේ වැරදිවලට
සමාව දෙන්නෙහිය.[5]
4 ඔබේ මාලිගාවේ මළුවෙහි වාසය
කිරීමට
ඔබ තෝරාගත්,[6] ඔබ ළඟට
පැමිණීමට ආරාධනා ලබන
තැනැත්තා සන්තෝෂ-
වත්ය.[7]
ඔබේ ශුද්ධ මාලිගාවෙන්[8]
ලැබෙන යහපත් දෙයින් අපි
තෘප්තිමත් වන්නෙමු.[9]
5 ඔබ ගරුබිය උපදවන ක්‍රියා කර
අපට පිළිතුරු දෙන්නෙහිය.
ඔබ සිදු කරන ඒ සියලු ක්‍රියා
ධර්මිෂ්ඨය.[10]
අපට ගැලවීම ලබා දෙන දෙවි-
යනි,[11]
මිහිතලයේද මහ සයුරේද වෙ-
සෙන සියල්ලන්ගේ විශ්වා-
සය ඔබය.[12]
6 ඔහු බලය නමැති වස්ත්‍රයෙන්
සැරසී සිටින්නේය.[13]
තමන් සතු බලයෙන් කඳු ස්ථිර
ලෙස පිහිටුවන්නේය.[14]
7 ඔහු මුහුද නිශ්චල කරන්නේය.[15]
රළ පහරේ හඬද සෙනඟගේ
ඝෝෂාවද නිහඬ කරන්-
නේය.[16]
8 ඔබ පෙන්වන ලකුණු දැක පො-
ළොවේ ඈත සීමාවන්වල
වෙසෙන ජනයා පවා බිය
වන්නෝය.[17]
හිරු නැඟ එන විටද හිරු බැස
යන විටද ඔබ ප්‍රීති ඝෝෂා
හඬ ඇසීමට සලස්වන්නෙ-
හිය.[1]
9 පොළොවේ පලදාව බොහෝ සෙ-
යින් වැඩි වීම සඳහා ඔබ
එයට ආශීර්වාද කර ඇත.[2]
ඔබ එය සාරවත් කර ඇත.
ගංගාවන් දිය දහරාවලින් පිරී
යෑමට ඔබ සලස්වා ඇත.[3]
කෙත්වතු කරලින් බර වීමටද ඔබ
සලස්වා ඇත.[4]
ඔබ භූමිය සූදානම් කළේ එලෙ-
සය.[5]
10 කෙත්වල පස ජලයෙන් තෙමා
සකස් කර ඇත.[6]
ඔබ බොහෝ වැසි වස්සවා පස
බුරුල් කර භෝග සරුසාරව
වැඩීමට සලස්වා ඇත.[7]
11 වසර පුරාවටම ඔබ දී ඇති ආශීර්-
වාද මොන තරම්ද! ඒ සියල්-
ලම ඔබ කළේ ඔබේ යහපත්-
කම නිසාය.[8]
ඔබේ මාර්ගවලින් යහපත් දේ
බහුලව ගලා එන්නේය.[9]
12 පාළුකරයේ තණබිම් තෙත්බරිත
වී ඇත.[10]
කඳු ප්‍රීතියෙන් ලෙළ දෙන්-
නේය.[11]
13 තණබිම් සත්ව රැළවලින් ගහන වී
ඇත.[12]
තැනිතලා ධාන්‍යයෙන් පිරී
ඇත.[13]
ඒවා ජය නාද දෙති. ඒවා සතු-
ටින් ගී ගයති.[14]

සංගීත අධ්‍යාක්ෂක වෙතය. ගීතයකි.

**66** පොළොවේ සියලු වැසියෙනි,
ප්‍රීතියෙන් දෙවිට ජය නාද
නඟන්න.[15]
2 ඔහුගේ නාමයට හිමි ගෞරවය
ගැන ගී ගයන්න.[16]
ඔහුට ගෞරවයත් ප්‍රශංසාවත්
ලබා දෙන්න.[17]

**65 ගීතාවලිය**
1 ගීතා 76:2
2 ගීතා 56:12; ගීතා 76:11; ගීතා 116:18; දේශ 5:4
3 ගීතා 145:18; යෙසා 66:23; ක්‍රියා 10:31; ක්‍රියා 15:17; 1යොහ 5:14
4 ගීතා 40:12; රෝම 7:23; ගලා 5:17
5 ගීතා 51:2; ගීතා 78:38; ගීතා 79:9; යෙසා 1:18; යොහ 1:29; හෙබ්‍රෙ 9:14; 1යොහ 1:7
6 ගීතා 27:4; ගීතා 84:4; ගීතා 84:10
7 ගීතා 15:1; ගීතා 135:4
8 1සාමු 3:3; 1ලේක 16:1
9 ගීතා 36:8; ගීතා 63:5
10 ද්වි 10:21; ගීතා 47:2; එළි 15:3
11 ගීතා 3:8; ගීතා 68:19
12 ගීතා 22:27; යෙසා 45:22
13 ගීතා 93:1
14 ගීතා 119:90
15 ගීතා 89:9; ගීතා 107:29
16 ගීතා 2:1; යෙසා 17:12; යෙසා 57:20
17 ගීතා 48:5; ගීතා 66:3

**2 තිරුව**
1 ගීතා 19:5; ගීතා 148:3
2 ද්වි 11:12; ගීතා 104:14; ගීතා 147:8; ක්‍රියා 14:17
3 ගීතා 46:4
4 ගීතා 104:15; ගීතා 107:37
5 උත් 26:12
6 යෝබ් 21:33; යෝබ් 38:38
7 ගීතා 147:8
8 උත් 27:28; ද්වි 33:16
9 මලා 3:10
10 යෙසා 30:23
11 යෙසා 55:12
12 යෙරෙ 6:3
13 සෙක 9:17
14 ගීතා 96:11; යෙසා 35:1; ක්‍රියා 14:17

**66 ගීතාවලිය** **15** ගීතා 33:1; ගීතා 98:4; **16** යෙසා 12:5; එළි 4:11; **17** නෙහෙ 9:5; ගීතා 72:19; ගීතා 96:8.

3 දෙවිට මෙසේ කියන්න. “ඔබේ
ක්‍රියා කොතරම් ගරුබිය දන-
වනසුලුද![1]
ඔබ සතු මහත් ශක්තිය දැක
ඔබේ සතුරෝ වෙවුලමින්
ඔබ වෙතට පැමිණ ඔබට
යටත් වෙති.[2]
4 පොළොවේ සියලු ජනයා ඔබ ඉදි-
රියේ වැඳ වැටෙති.[3]
ඔවුහු ඔබට ප්‍රශංසා ගී ගයති.
ඔබේ නාමයට ප්‍රශංසා ගී
ගයති.”[4] *සීලාහ්.*
5 ජනයෙනි, පැමිණ දෙවිගේ ක්‍රියා
දෙස බලන්න.[5]
ඔහු මනුෂ්‍යයන් සමඟ කටයුතු
කළ ආකාරය ඇත්තෙන්ම
ගරුබිය දනවනසුලුය.[6]
6 ඔහු මුහුද වියළි බිමක් බවට පත්
කළේය.[7]
පයින් ගමන් කරමින් ගඟෙන්
එගොඩ වීමට සෙනඟට හැකි
වූයේය.[8]
ඔහු කළ මේ දේවල් නිසා අපි
ප්‍රීති සෝෂා නැඟුවෙමු.[9]
7 ඔහු තම බලය විදහාපෙන්වමින්
සදහටම පාලනය කරන්-
නේය.[10]
ජාතීන්ගේ ක්‍රියා දෙස ඔහු බලා
සිටින්නේය.[11]
මුරණ්ඩු සිත් ඇති අයට උඩඟු
ලෙස කතා කිරීමට ඉඩ නො-
දේවා![12] *සීලාහ්.*
8 ජනයෙනි, අපේ දෙවිට ප්‍රශංසා
කරන්න.[13]
මහත් හඬින් ඔහුට ප්‍රශංසා
කරන්න.[14]
9 ඔහු අපේ ජීවිතය රැක දෙන්-
නේය.[15]
අපේ පය ලිස්සීමට ඔහු ඉඩ
නොදුන්නේය.[16]
10 දෙවියනි, ඔබ අපව සෝදිසි කර
බැලුවෙහිය.[17]
රිදී පවිත්‍ර කරන්නාක් මෙන් ඔබ
අපව පවිත්‍ර කළෙහිය.[18]
11 ඔබ අපව උගුලකට හසු කළෙ-
හිය.[19]

66 ගීතාවලිය
1 නික් 15:16 ගීතා 76:12 යෙසා 2:19 යෙරෙ 10:10
2 ගීතා 81:15
3 ගීතා 22:27 මලා 1:11
4 යෙසා 42:10 එළි 15:4
5 ගීතා 46:8
6 ගීතා 66:3 ශෙප 2:11
7 නික් 14:22 ගීතා 78:13 ගීතා 106:9
8 යොෂු 3:16
9 නික් 15:1
10 දානි 4:34 1තිමෝ 1:17
11 2ලේක 16:9 ගීතා 11:4 ගීතා 33:13 හිතෝ 15:3 හෙබ්‍රෙ 4:13
12 ද්වි 17:20 ගීතා 75:4 යෙසා 37:29
13 ද්වි 32:43 රෝම 15:10
14 යෙරෙ 33:11
15 1සාමු 25:29 ක්‍රියා 17:28
16 1සාමු 2:9 ගීතා 62:6 ගීතා 94:18 ගීතා 121:3
17 ද්වි 8:2 ගීතා 17:3
18 යෙසා 48:10 සෙක 13:9 මලා 3:3 1පේතෘ 1:7
19 යෝබ් 19:6 හොෂෙ 7:12

2 තීරුව
1 ගීතා 129:3 යෙසා 51:23
2 1තෙස 3:3
3 යෙසා 43:2 ක්‍රියා 14:22
4 ගණන් 15:3 ගීතා 100:4
5 ගීතා 22:25 ගීතා 56:12 ගීතා 116:14 දේශ 5:4
6 2සාමු 22:7
7 ගණන් 30:2 විනි 11:35
8 1ලේක 16:1
9 2සාමු 6:13
10 ගීතා 22:24
11 ගීතා 34:11 මලා 3:16
12 ගීතා 30:8 ගීතා 34:3

බොහෝ කරදර අප පිට
පැටෙව්වෙහිය.
12 අපව පාගා දැමීමට අසරුවන්ට
ඉඩහැරියෙහිය.[1]
අපි ගිනි ජාලා මැදින්ද ජල ධාරා
මැදින්ද ආවෙමු.[2]
එවිට ඔබ අපට සහනය ලබා
දුන්නෙහිය.[3]
13 මම දවන පූජා රැගෙන ඔබේ ගෘහ-
යට පැමිණෙන්නෙමි.[4]
ඔබට දුන් පොරොන්දු ඉටු
කරන්නෙමි.[5]
14 දුක් කරදරවලට මුහුණ දුන් කාල-
යේදී[6]
මා දුන් පොරොන්දු මම ඉටු
කරන්නෙමි.[7]
15 මම තර සතුන්ව දවන පූජා ලෙස
ඔබට ඔප්පු කරන්නෙමි.[8]
ප්‍රසන්න සුවඳක් ගෙනෙන
පිණිස බැටළුවන්ව මම ඔබට
ඔප්පු කරන්නෙමි.
ගොනුන්වද එළුවන්වද මම
ඔබට ඔප්පු කරන්නෙමි.[9]
*සීලාහ්.*
16 දෙවි කෙරෙහි ගරුබියක් ඇති
සියල්ලෙනි, ඇවිත් මට
ඇහුම්කන් දෙන්න.
දෙවි මා වෙනුවෙන් කර ඇති
සියල්ල[10] මම ඔබට කියන්-
නෙමි.[11]
17 උපකාර පතා මා හඬගැසුවේ
ඔහුටය.[12]
මා ප්‍රශංසා කළේද ඔහුටය.[13]
18 දුෂ්ට දේ කිරීමට මා තුළ ආශාවක්
තිබුණා නම්
යෙහෝවා දෙවි මට ඇහුම්කන්
නොදෙනු ඇත.[14]
19 නමුත් දෙවි මට සවන් දුන්නේය.[15]
මාගේ යාච්ඤාවට ඔහු කන්
දුන්නේය.[16]
20 දෙවිට ප්‍රශංසා වේවා! මන්ද ඔහු

**13** ගීතා 51:14; ගීතා 126:2; **14** යෝබ් 27:9; හිතෝ 15:29; හිතෝ 28:9; යෙසා 1:15; යොහ 9:31; යාකො 4:3; **15** ගීතා 6:9; ගීතා 34:6; ගීතා 65:2; ගීතා 116:1; විලා 3:56; 1යොහ 3:22; **16** හෙබ්‍රෙ 5:7.

මාගේ යාච්ඤාව නොවටිනා දෙයක් ලෙස සලකා ඉවත නොදැමුවේය.
ඔහු තම ප්‍රේමය* මාගෙන් ඉවත් නොකළේය.[1]

සංගීත අධ්‍යක්ෂක වෙතය.
තත් භාණ්ඩ වාදනය කරමින්
ගායනා කිරීම සඳහාය.

**67** දෙවි අපට කරුණාව පෙන්වා ආශීර්වාද කරන්නේය.[2]
ඔහු තම අනුමැතිය අපට ලබා දෙන්නේය.[3] —සීලාහ්—
**2** දෙවියනි, ඔබ ක්‍රියා කරන ආකාරය ගැන පොළොවේ වෙසෙන සියල්ලෝ දැනගනු ඇත.[4]
සියලු ජාතීහු ඔබ සලසා දෙන ගැලවීම ගැන අසනු ඇත.[5]
**3** ජනයා ඔබට ප්‍රශංසා කරනු ලබත්වා![6]
එසේය, සියලු ජනයා ඔබට ප්‍රශංසා කරත්වා![7]
**4** ඔබ ධර්මිෂ්ඨකමින් සියල්ලන්ව විනිශ්චය කරන්නෙහිය.[8]
පොළොවේ සියලු ජාතීන්ට ඔබ මඟ පෙන්වන්නෙහිය.
එබැවින් සියලු ජාතීන්ට අයත් සෙනඟ ප්‍රීති සෝෂා නඟන්නෝය.[9] සීලාහ්.
**5** දෙවියනි, ජනයා ඔබට ප්‍රශංසා කරනු ලබත්වා![10]
එසේය, සියලු ජනයා ඔබට ප්‍රශංසා කරත්වා![11]
**6** අපේ දෙවි අපට ආශීර්වාද කරන්නේය.[12]
එබැවින් භූමිය බොහෝ පල දරනු ඇත.[13]
**7** දෙවි අපට ආශීර්වාද කරන්නේය.[14]
පොළොවේ සතරදිග සිටින සියලුදෙනා ඔහු කෙරෙහි ගරුබිය ඇතුව සිටින්නෝය.[15]

ගීතා **66:20*** හෝ, "ළැදි ප්‍රේමය."

**66 ගීතාවලිය**
**1** 2සාමු 7:15; ගීතා 86:13

**67 ගීතාවලිය**
**2** ගීතා 28:9; 2කොරි 13:14; එෆී 1:3
**3** ගණන් 6:25; ගීතා 4:6; ගීතා 31:16; ගීතා 119:135; හිතෝ 16:15
**4** එස්ත 8:17; ගීතා 98:2; රෝම 10:18; කොලො 1:23
**5** ගීතා 66:1; ගීතා 98:2; යෙසා 49:6; ලූක් 2:30; ක්‍රියා 28:28; තීත 2:11
**6** ගීතා 138:4; ගීතා 142:7
**7** ගීතා 44:8
**8** ගීතා 9:8; ගීතා 96:10; ගීතා 98:9; රෝම 2:5
**9** ද්වි 32:43; යෙසා 42:10; රෝම 15:10
**10** ගීතා 45:17
**11** ගීතා 108:3; යෙසා 38:19
**12** උත් 17:7; ගීතා 48:14; යෙරෙ 31:1
**13** ලෙවී 26:4; ගීතා 85:12; යෙසා 30:23; එස 34:27
**14** හිතෝ 10:22
**15** ගීතා 22:27; එළි 15:4

**2 තීරුව**

**68 ගීතාවලිය**
**1** ගණන් 10:35; ගීතා 44:26
**2** ගීතා 59:11; යෙසා 33:3
**3** ද්වි 7:10; ගීතා 21:8
**4** යෙසා 9:18; හොෂෙ 13:3
**5** ගීතා 97:5; මීකා 1:4
**6** නාහු 1:6; 2තෙස 1:9
**7** ද්වි 12:12; ගීතා 32:11; ගීතා 33:1; පිලි 4:4
**8** හිතෝ 11:10
**9** ගීතා 43:4
**10** ගීතා 67:4; යෙසා 12:4

සංගීත අධ්‍යක්ෂක වෙතය.
දාවිත් රචනා කළ ගීතයකි.

**68** දෙවියනි, නැඟී සිට[1] ඔබේ සතුරන්ව විසුරුවාහරින්න.[2]
ඔබට වෛර කරන්නෝ පරාජයට පත් වී පලා යත්වා![3]
**2** සුළඟට ගසාගෙන යන දුමක් සේ ඔවුන්ව පලවාහරින්න.[4]
ගිනිදැල්ලට දිය වී යන ඉටි කැබැල්ලක් සේ[5]
දුෂ්ටයෝ දෙවි ඉදිරියේ විනාශ වෙත්වා![6]
**3** නමුත් ධර්මිෂ්ඨයෙනි, ප්‍රීතිමත් වන්න.[7]
දෙවි ඉදිරියේ ප්‍රීති සෝෂා නඟන්න.[8]
ප්‍රීතියෙන් පිනා යන්න.[9]
**4** දෙවිට ගී ගයන්න. ඔහුගේ නාමයට ප්‍රශංසා ගී ගයන්න.[10]
පාළුකරය මැදින් ගමන් කරන තැනැත්තාට ගී ගයන්න.[11]
ඔහුගේ නාමය යෙහෝවාය.[12]
ඔහු ඉදිරියේ බොහෝ සෙයින් සතුටු වන්න.
**5** ශුද්ධ වාසස්ථානයේ සිටින දෙවි,[13]
පියා නැති දරුවන්ගේ පියාය.
වැන්දඹුවන්ට යුක්තිය ඉටු කර දෙන විනිශ්චයකරුය.[14]
**6** තනි වූ අයට සුරක්ෂිත නිවහනක් ඔහු සපයා දෙන්නේය.[15]
සිරකරුවන්ව නිදහස් කර ඔවුන්ව සමෘද්ධිමත් තත්වයකට ගෙනෙන්නේය.[16]
එහෙත් මුරණ්ඩු අයට වියළි දේශයේ වාසය කිරීමට සිදු වන්නේය.[17]
**7** දෙවියනි, ඔබේ සෙනඟට පෙරටුවෙන් ඔබ ගමන් කළ විට[18]
පාළුකරය මැදින් ඔබ පියමන් කළ විට[19] —සීලාහ්—

**11** ද්වි 33:26; ගීතා 18:10; ගීතා 104:3; යෙසා 19:1; **12** නික් 6:3; **13** යෙසා 57:15; ක්‍රියා 7:48; **14** නික් 22:22; ද්වි 10:18; ගීතා 10:14; ගීතා 146:9; **15** 1සාමු 2:5; ගීතා 113:9; **16** යෙසා 61:1; **17** ද්වි 28:23; ගීතා 107:34; **18** නික් 13:21; **19** විනි 5:5.

8 පොළොව දෙදරා ගියේය.[1]
අහසින් වර්ෂාවක් ඇදහැළු-
ණේය.[2]
ඊශ්‍රායෙල්හි දෙවියනි,[3] ඔබ ඉදි-
රියේ සීනයි කන්ද දෙදරුම්
කෑවේය.[4]
9 ධාරානිපාත වැසි ඇදහැළීමට ඔබ
සැලැස්වුවෙහිය.[5]
ඔබේ සෙනඟ විඩාවට පත්
වුවත් ඔබ ඔවුන්ව ප්‍රාණවත්
කළෙහිය.[6]
10 ඔවුහු කූඩාරම්වල[7] වාසය
කළෝය.[8]
දෙවියනි, ඔබේ යහපත්කම
නිසා පීඩාවට ලක් වූ
තැනැත්තාටද එහි වාසය
කිරීමට ඔබ සැලැස්වුවෙ-
හිය.[9]
11 යෙහෝවා දෙවි අණක් නිකුත්
කරන්නේය.[10]
එබැවින් ශුභාරංචිය ප්‍රකාශ
කරන ස්ත්‍රීහු විශාල හමුදා-
වක් මෙන් පිටත්ව එති.[11]
12 මහත් සේනාවන් සතු රජවරු පවා
පලා දුවති.[12]
නිවසේ නැවතී සිටින ස්ත්‍රියටද
කොල්ල කා ගත් දෙයින්
කොටසක් ලැබෙයි.[13]
13 පුරුෂයන්ට කඳවුරේ අළු ගොඩ-
වල් අතරේ වැතිර සිටීමට
සිදු වුවත්
රිදී තැවරුණු පිහාටුද රන්*
අත්තටුද ඇති පරෙවි-
යෙකු මෙන් ඔවුහු පියඹා එනු
ඇත.[14]
14 සියලු බලැති තැනැත්තාණන් දේ-
ශයේ රජවරුන්ව විසුරුවා-
හරින විට[15]
ෂල්මොන්, හිමෙන් වැසී
ගියේය.[16]
15 බාෂාන් කඳුකරය[17] දෙවිගේ නිර්-
මාණයකි.[18]
එහි කඳු ඉතා උස්ව පිහිටා
තිබෙන්නේය.[19]

16 කඳු මුදුන් සියල්ලෙනි,
දෙවි තම වාසය සඳහා තෝරා-
ගත් කන්ද දෙස ඊර්ෂ්‍යාවෙන්
බලන්නේ මන්ද?[1]
යෙහෝවා දෙවි එහි සදහටම
වාසය කරනු ඇත.[2]
17 දෙවිගේ යුධ රථ දසදහස් ගණන්ය.
ඒවා ගණන් කළ නොහැ-
කිය.[3]
යෙහෝවා දෙවි සීනයි කන්දේ
සිට ශුද්ධස්ථානයට පැමිණි-
යේය.[4]
18 ඔබ ඉහළට නැඟ ගියෙහිය.[5]
ඔබ වහලුන්වද රැගෙන ගියෙ-
හිය.[6]
පුරුෂයන්ව තෑගි වශයෙන් ගත්-
තෙහිය.[7]
යෙහෝවා* දෙවියනි, ඔබ
මුරණ්ඩු අයවද[8] තෑගි වශ-
යෙන් ගත්තෙහිය. ඔවුන්
අතරේ වාසය කරන පිණිස
ඔබ එසේ කළෙහිය.[9]
19 දිනපතා අපේ බර උසුලාගෙන
යන යෙහෝවා දෙවිට ප්‍රශංසා
වේවා![10]
අපට ගැලවීම ලබා දෙන සැබෑ
දෙවි ඔහුය.[11] *සේලාහ්.*
20 සැබෑ දෙවි වන ඔහු අපේ ගැලවුම්-
කරුය.[12]
විශ්වයේ පාලකයාණන්[13] වන
යෙහෝවා දෙවි අපව මරණ-
යෙන් මුදවාගන්නේය.[14]
21 දෙවි තම සතුරන්ගේද
දිගින් දිගටම වැරදි කරන අය-
ගේද[15] හිස් කැබලි කරන්-
නේය.[16]
22 යෙහෝවා දෙවි මෙසේ කියා
තිබේ. "ඔවුන් බාෂාන්හි සිටි-
යත් මම ඔවුන්ව නැවත ගෙ-
නෙන්නෙමි.[17]

**68 ගීතාවලිය**
**1** ගීතා 114:4; ගීතා 114:7; හෙබ්‍රෙ 12:26
**2** විනි 5:4
**3** යෙසා 45:3
**4** නික් 19:18; ද්වි 5:24
**5** ගීතා 65:9; එස 34:26
**6** ද්වි 11:12
**7** ගණන් 10:34
**8** ගීතා 15:1
**9** ද්වි 26:5; ලූක් 1:53
**10** ගීතා 40:3
**11** නික් 15:20; විනි 5:1; විනි 11:34; 1සාමු 18:6; යෙසා 40:9; ක්‍රියා 8:12
**12** ගණන් 31:8; යොෂු 10:16; යොෂු 12:7; විනි 5:19
**13** ගණන් 31:27; 1සාමු 30:24
**14** ගීතා 105:37
**15** ගණන් 21:3; යොෂු 10:10; යෙරෙ 2:3; යෝවෙ 1:15
**16** විනි 9:48
**17** ගණන් 21:33; මීකා 7:14
**18** මතෙ 17:1; මාක් 9:2; 2පේතෘ 1:18
**19** ද්වි 3:8; ද්වි 3:10; ගීතා 42:6

**2 තීරුව**
**1** 1ලේක 11:5; ගීතා 48:2; ගීතා 132:13
**2** ද්වි 12:5; 1රාජා 9:3; හෙබ්‍රෙ 12:22
**3** ද්වි 33:2; 2රාජා 6:17; දානි 7:10; මතෙ 26:53; එළි 5:11
**4** නික් 19:23
**5** ගීතා 47:5
**6** 2සාමු 5:7; එෆී 4:8
**7** 2සාමු 24:16; 1ලේක 21:15; එෆී 4:11
**8** ද්වි 2:36; ද්වි 7:22; මතෙ 9:13; 1තිමෝ 1:13
**9** ගීතා 15:1; 2කොරි 6:16
**10** ගීතා 55:22; 1පේතෘ 5:7
**11** ගීතා 95:1
**12** යෙසා 12:2; යෙසා 45:17; හොෂෙ 1:7; **13** දානි 4:35; ක්‍රියා 4:24; **14** ද්වි 32:39; **15** ගීතා 55:23; එස 18:26; ලූක් 13:5; **16** හබ 3:13; **17** ගණන් 21:33.

**ගීතා 68:13*** හෝ, "කොළ පාටට හුරු රන්."

**ගීතා 68:18*** මූ.අ., "යාහ්."

මුහුදු පත්ලෙන් වුවත් මම
ඔවුන්ව රැගෙන එන්නෙමි.[1]
23 ඔබේ පාද ලෙයින් සෝදාගන්නා
පිණිසත්[2]
ඔබේ බල්ලන්ට සතුරන්ගේ ලේ
ලෙව කෑමට හැකි වන පිණි-
සත් මම එසේ කරමි.”[3]
24 දෙවියනි, මාගේ දෙවි වන ඔබ
වෙත පැමිණෙන ජයග්‍රාහී
පෙරහැර ඔවුහු දැක ඇත.[4]
එසේය, මාගේ රජු සිටින ශුද්-
ධස්ථානය වෙතට පැමි-
ණෙන ජයග්‍රාහී පෙරහැර
ඔවුහු දුටුවෝය.[5]
25 ගායකයෝ ඉදිරියෙන්ම ගියෝය.
තත් භාණ්ඩ වාදනය
කරන කණ්ඩායම පසුපසින්
ගියෝය.[6]
ඒ දෙපිරිස අතරේ කන්‍යාවෝද
රබන් ගසමින් ගියෝය.[7]
26 ඊශ්‍රායෙල් ජාතිය බිහි කළ
තැනැත්තාණන්ගෙන්* ජීව-
නය ලැබූ සියල්ලෙනි,[8]
එක්ව යෙහෝවා දෙවිට ප්‍රශංසා
කරන්න.[9]
27 සෙනඟව පාලනය කරන කුඩා
බෙන්ජමින්ද ඔවුන් සමඟ
ගියේය.[10]
සෙනඟව යටත් කරගත්
සෙබුලූන්හි හා නප්තලීහි
පාලකයෝද[11]
යූදාහි පාලකයෝද ප්‍රීති ඝෝෂා
නඟන යූදා සෙනඟ සමඟ
ගියෝය.
28 අපට ශක්තිය ලබා දෙන
ලෙස දෙවි අණක් නිකුත්
කළේය.[12]
අප වෙනුවෙන් මහත් දේ කළ
දෙවියනි, ඔබේ බලය පෙන්-
වන්න.[13]
29 යෙරුසලමේ ඇති ඔබේ මාලිගාව
ගැන අසා[14]
රජවරු ඔබට තෑගි ගෙනෙන්-
නෝය.[15]

ගීතා 68:26* මූ.අ., “ඊශ්‍රායෙල්හි උල්පතින්.”

**68 ගීතාවලිය**
1 නික් 14:22; යෙසා 51:10
2 ගීතා 58:10; යෙසා 63:3
3 1රාජා 21:19; 1රාජා 22:38; 2රාජා 9:33
4 ගීතා 24:7
5 1ලේක 13:8
6 1ලේක 15:16; ගීතා 87:7; ගීතා 150:3
7 නික් 15:20; විනි 11:34; 1සාමු 18:6; ගීතා 148:12
8 ගීතා 95:6; යෙසා 44:2; යෙරෙ 2:13
9 ගීතා 26:12; ගීතා 107:32
10 උත් 49:27; 1සාමු 9:21
11 1ලේක 12:34
12 ගීතා 42:8; ගීතා 71:3; යෙසා 40:31
13 ගීතා 138:8; එෆී 3:20
14 1සාමු 3:3; 1රාජා 6:1; 1ලේක 16:1; එස්රා 5:14
15 1රාජා 10:10; 2ලේක 32:23; ගීතා 72:10

**2 තීරුව**
1 2සාමු 8:5; ගීතා 22:12; එස 39:18
2 යෝබ් 40:21
3 2සාමු 8:2
4 ගීතා 120:7
5 ගීතා 72:9; යෙසා 45:14; යෙසා 60:5
6 ශෙප 3:10; ක්‍රියා 8:27
7 ද්වි 32:43
8 ගීතා 18:10; ගීතා 104:3
9 එස 10:5
10 ගීතා 29:1; ගීතා 96:7
11 ගීතා 93:1
12 ගීතා 43:3; ගීතා 47:2; ගීතා 66:5; ගීතා 73:17
13 ගීතා 29:11; යෙසා 40:31; සෙක 10:12
14 ගීතා 72:18

**69 ගීතාවලිය**
15 ගීතා 45:පෙර

30 ගව රැළටද[1] පන් ගස් අතරේ සිටින
වනමෘගයාටද[2]
වසු පැටවුන්ටද තරවටු
කරන්න. ඔවුහු සියල්ලෝ
උඩඟු ලෙස රිදී පාගා දමති.[3]
දබරයට සැරසී සිටින අයව ඔහු
විසුරුවාහැරියේය.[4]
31 ලෝකඩවලින් නිමැවූ දේ ඊජිප්තු-
වෙන් පැමිණෙයි.[5]
කූෂ් දේශය තෑගි අතැතිව දෙ-
විට දෑත් දිගු කරන්නේය.[6]
32 පොළොවේ රාජ්‍යයෙනි, දෙවිට ගී
ගයන්න.[7]
යෙහෝවා දෙවිට ප්‍රශංසා ගී
ගයන්න. —සේලාහ්—
33 පුරාණයේ සිට ස්වර්ගයේ ඉහළම
ස්ථානයන්හි ගමන් කරන
තැනැත්තාණන්ට[8] ප්‍රශංසා
ගී ගයන්න.
ඔහු මහත් ශබ්දයකින් හඬ
නඟන්නේය.[9]
34 දෙවිගේ මහත් ශක්තිය ගැන කතා
කරන්න.[10]
ඔහුගේ ශ්‍රේෂ්ඨ පාලනය ඊශ්‍රා-
යෙල් කෙරෙහිය. ඔහුගේ
ශක්තිය මුළු අහස්තලය
සිසාරා පැතිර තිබේ.[11]
35 දෙවියනි, ඔබ ශුද්ධස්ථානයේ සිට
පැමිණෙන විට ඔබ කෙරෙහි
අපි තුළ ගරුබියක් ඇති
වන්නේය.[12]
සෙනඟගේ ශක්තියද බලයද
වන ඔබ ඊශ්‍රායෙල්හි දෙ-
විය.[13]
දෙවියනි, ඔබට ප්‍රශංසා වේවා![14]

සංගීත අධ්‍යක්ෂක වෙතය. ලිලී මල් නම්
වූ රිද්මයට අනුව ගායනා කිරීම සඳහාය.[15]
දාවිත් රචනා කළ ගීතයකි.

# 69

දෙවියනි, මාව ගලවාගන්න.
මා ගිලෙන තරමටම
වතුර මට්ටම ඉහළට
නැඟ ඇත.[16]
2 මම ගැඹුරු මඩ වගුරක එරී සිටිමි.
මාගේ පය ගසා නැඟිට

16 ගීතා 144:7; විලා 3:54; යෝනා 2:5; එළි 12:15.

සිටින්නවත් මට තැනක්
නැත.[1]
මම ගැඹුරු දියට වැටී සිටිමි.
සැඩ පහරින් මාව ගසාගෙන
ගියේය.[2]
3 හෙම්බත් වන තරමටම මම උප-
කාරය පතා හඬගැසුවෙමි.[3]
මාගේ උගුර වියළී ඇත.
මාගේ දෙවිගෙන් උපකාර
ලැබෙන තෙක් බලා සිටී-
මෙන් මාගේ දෙනෙත් විඩා-
බර වී ඇත.[4]
4 කිසිදු හේතුවක් නොමැතිව
මට සතුරුකම් පාන අය
මාගේ හිසකෙස්වලටත් වඩා
වැඩිය.[5]
නිස්කාරණයේ මට වෛර කර-
මින් මාව මරා දැමීමට උත්-
සාහ කරන අය ගණන් කළ
නොහැකි තරම්ය.[6]
මා ඔවුන්ගෙන් කිසිවක් සොර-
කම් නොකළත් මා සතු දේ
ඔවුන්ට දීමට මට සිදු විය.
5 දෙවියනි, මා කළ අඥාන ක්‍රියා
ගැන ඔබ දන්නෙහිය.
මා කළ වැරදි ඔබගෙන් සැඟවී
නැත.[7]
6 විශ්වයේ පාලකයාණන්ද ස්වර්ග-
යේ සේනාවල අධිපතියා-
ණන්ද වන යෙහෝවා දෙවි-
යනි,[8]
ඔබ කෙරෙහි බලාපොරොත්තු-
වෙන් සිටින අයට මා නිසා
ලැජ්ජාවට පත් වීමට ඉඩ
නොදෙන්න.[9]
ඊශ්‍රායෙල්හි දෙවියනි,[10]
ඔබේ මඟ පෙන්වීම් පතන අයට
මා නිසා නින්දාවට පත්
වීමට ඉඩ නොදෙන්න.[11]
7 ඔබ නිසා මට විඳීමට සිදු වූ අප-
හාස මම දරාගත්තෙමි.[12]
නින්දාවලින් මාගේ මුහුණ වැසී
ගියේය.[13]
8 මාගේ සහෝදරයන්ට මම ආගන්-
තුකයෙක් වී සිටිමි.[14]
මාගේ මවගේ පුත්‍රයන්ට මම
විදේශිකයෙක් වී සිටිමි.[1]
9 ඔබේ ගෘහය කෙරෙහි මට තිබෙන
ලැදියාව මොන තරම්ද! එය
මා තුළ ඇවිළෙන ගින්නක්
මෙනි.[2]
ඔබට නින්දා කරන්නන්ගේ
නින්දා අපහාස මා පිටට
පැමිණියේය.[3]
10 මම නිරාහාරව සිට වැලපුණෙමි.[4]
එයින්ද මට අත් වූයේ නින්දා-
වක් පමණි.[5]
11 මා ගෝණි රෙදි ඇඳගත් විට
මාව ඔවුන්ට විහිළුවක් විය.[6]
12 දොරටුව අසල හිඳගන්නන්-
ගේ කතාබහට මම ලක්
වුණෙමි.[7]
බේබද්දන්ගේ සරදමටද මම
හසු වුණෙමි.[8]
13 නමුත් යෙහෝවා දෙවියනි, මම
යාච්ඤා කළේ ඔබටය.[9]
දෙවියනි, ඔබේ අනුමැතිය දිනා-
ගැනීමට ප්‍රස්තාව තිබෙන
කාලයේදී[10] මම ඔබට
යාච්ඤා කළෙමි.
ඔබේ මහත් ප්‍රේමය* පෙන්වා
මට පිළිතුරු දෙන්න. මන්ද
සැබෑ ගැලවුම්කරු ඔබය.[11]
14 මඩ වගුරේ ගැඹුරටම එරීමට ඉඩ
නොදී මාව බේරාගන්න.[12]
මට වෛර කරන්නන්ගෙන්[13]
මාව ගලවාගන්න. ගැඹුරු
දියේ ගිලීමට ඉඩ නොදී මාව
බේරාගන්න.[14]
15 සැඩ පහරින් මාව ගසාගෙන
යෑමට ඉඩ නොදෙන්න.[15]
ගැඹුරු ජලයෙන් මාව යට වී
යෑමට ඉඩ නොදෙන්න.
මිනී වළට මාව ගිලගැනීමට
ඉඩ නොදෙන්න.[16]
16 යෙහෝවා දෙවියනි, ඔබ මහත්
ප්‍රේමයෙන්* පිරුණු දෙවි

**69 ගීතාවලිය**
1 ගීතා 40:2
ගීතා 88:6
යෙරෙ 38:6
2 ගීතා 32:6
යෝනා 2:3
3 ගීතා 6:6
ගීතා 22:2
4 ගීතා 25:21
ගීතා 119:82
ගීතා 119:123
යෙසා 38:14
5 ගීතා 35:19
ලූක් 23:22
යොහ 15:25
6 ගීතා 35:12
ගීතා 109:3
7 යෙරෙ 16:17
8 ගීතා 24:10
9 ගීතා 25:3
ගීතා 35:26
10 ගීතා 72:18
ක්‍රියා 13:17
11 යෙසා 49:23
12 ගීතා 22:6
ගීතා 44:22
යෙරෙ 15:15
මතෙ 5:11
13 යෙසා 50:6
යෙසා 53:3
මතෙ 26:67
මතෙ 27:29
14 යෝබ් 19:13
ගීතා 31:11
මතෙ 26:56
යොහ 1:11
යොහ 7:5

**2 තීරුව**
1 1සාමු 17:28
මීකා 7:6
2 1රාජා 19:10
ගීතා 119:139
මතෙ 21:12
මාක් 11:15
යොහ 2:17
3 හිතෝ 27:11
රෝම 15:3
4 ගීතා 35:13
ගීතා 109:24
5 ගීතා 102:8
6 1රාජා 9:7
ගීතා 44:14
යෙරෙ 24:9
7 ලූක් 23:2
8 යෝබ් 30:9
මාක් 15:19
9 හෙබ්‍රෙ 5:7
10 යෙසා 49:8
යෙසා 55:6
2කොරි 6:2
11 ගීතා 68:20
12 ගීතා 69:2
විලා 3:55
13 ගීතා 25:19
ගීතා 35:19
14 ගීතා 144:7
15 යෙසා 43:2
16 ගණන් 16:33
ගීතා 16:10

**ගීතා 69:13*** හෝ, "ලැදි ප්‍රේමය." **16*** හෝ, "ලැදි ප්‍රේමයෙන්."

කෙනෙක් නිසා මට පිළිතුරු දෙන්න.[1]
ඔබ දයාන්විත නිසා මා වෙතට හැරී මට කරුණාව පෙන්වන්න.[2]
17 ඔබේ සේවකයා වෙතින් ඔබේ මුහුණ ඉවතට හරවා නොගන්න.[3]
මා පීඩාවලින් හෙම්බත් වී සිටින නිසා ප්‍රමාද නොවී මට පිළිතුරු දෙන්න.[4]
18 මට ළං වී මාගේ ජීවිතය බේරා දෙන්න.[5]
මාගේ සතුරන්ගෙන් මාව ගලවාගන්න.[6]
19 මා විඳින නින්දා අපහාසද මා අද්දකින ලැජ්ජාවද ඔබ දන්නෙහිය.[7]
මට හිරිහැර කරන සියල්ලන්ව ඔබට පෙනෙන්නෙහිය.[8]
20 මට කරන නින්දාවන් නිසා මාගේ හදවත පැළෙන තරම් වේදනාවක් මට දැනේ. ඒ තුවාලය සුව කළ නොහැකි තරම් මහත්ය.[9]
කවරෙකු හෝ මට අනුකම්පා කරන තෙක් මම බලා සිටියෙමි. නමුත් කිසිවෙක් එසේ කළේ නැත.[10]
මාව සනසවන්නද කිසිවෙක් සිටියේ නැත.[11]
21 ඔවුන් මට කන්න දුන්නේ විෂ පලා ජාතියකි.[12]
මා පිපාසයෙන් සිටි විට ඔවුන් මට පොවන්න උත්සාහ කළේ ඇඹුල් වයින්ය.[13]
22 ඔවුන් පිළියෙල කරගත් මේසය ඔවුන්ටම උගුලක් වේවා![14]
ඔවුන්ගේ ප්‍රයෝජනයට රැස් කරගත් දේ ඔවුන්ටම මර උගුලක් වේවා![15]
23 කිසිවක් දැකගැනීමට නොහැකි වන සේ ඔවුන්ගේ ඇස් අඳුරු කරන්න.[16]
ඔවුන්ගේ තුනටියේ ශක්තිය හීන වී යෑමට සලස්වන්න.[17]
24 ඔබේ උදහස ඔවුන් පිට වගුරුවන්න.[1]
ඔබේ දැවෙන කෝපයෙන් ඔවුන්ව දවා දමන්න.[2]
25 ඔවුන් ඉදි කළ කඳවුර පාළු වේවා![3]
කිසි වැසියෙක් ඔවුන්ගේ කූඩාරම්වල නොසිටීවා![4]
26 මන්ද ඔබ පහර දුන් තැනැත්තා පසුපස ඔවුහු ලුහුබැඳ ගියෝය.[5]
ඔබ තුවාල කළ අයගේ වේදනාව ගැන ඔවුහු කතා කරති.
27 ඔවුන් කළ අපරාධ එක පිට එක ගොඩගසන්න.[6]
ඔවුන්ව ධර්මිෂ්ඨයන් ලෙස ගණන් නොගන්න.[7]
28 ජීවනය ලැබීමට සුදුසු අයගේ නම් ඇතුළත් ලියවිල්ලෙන් ඔවුන්ගේ නම් මකා දමන්න.[8]
ධර්මිෂ්ඨයන්ගේ නම් සමඟ ඔවුන්ගේ නම් ඇතුළත් නොකරන්න.[9]
29 බොහෝ පීඩාවන් නිසා මම වේදනාවෙන් සිටිමි.[10]
දෙවියනි, මට ගැලවීම සලසා දී මාව ආරක්ෂා කරන්න.[11]
30 මම දෙවිගේ නාමයට ප්‍රශංසා ගී ගයමි.[12]
ඔහුට ස්තුති දෙමින් ඔහුව ගෞරවයට පත් කරමි.[13]
31 ගවයෙකුව පූජාවක් ලෙස ඔප්පු කරනවාට වඩා එය යෙහෝවා දෙවිට ප්‍රසන්නය.[14]
අං සහ කුර ඇති වස්සෙකුව ඔප්පු කරනවාට වඩා එයට දෙවි සතුටු වන්නේය.[15]
32 නිහතමානී අය එය දැක ප්‍රීති වන්නෝය.[16]
දෙවිගේ මඟ පෙන්වීම් පතන සියල්ලෙනි, ඔබේ සිත් ප්‍රාණවත්ව තිබේවා![17]
33 යෙහෝවා දෙවි දුගී දුප්පත් අයට ඇහුම්කන් දෙන්නේය.[18]

18 ගීතා 10:17; ගීතා 102:17; යෙසා 66:2; ලූක් 4:18.

**69 ගීතාවලිය**
1 ගීතා 36:7 ගීතා 63:3 ගීතා 109:21
2 ගීතා 25:16 ගීතා 86:16
3 ගීතා 27:9 ගීතා 102:2
4 ගීතා 31:9 ගීතා 40:13 ගීතා 70:1
5 යෝබ් 6:23
6 යොෂු 7:9
7 ගීතා 22:6 යෙසා 53:3 හෙබ්‍රෙ 12:2
8 යොහ 8:49
9 ගීතා 42:10
10 ගීතා 142:4 2තිමෝ 4:16
11 යෝබ් 19:14
12 මතෙ 27:34 මාක් 15:23
13 මතෙ 27:48 මාක් 15:36 ලූක් 23:36 යොහ 19:29
14 රෝම 11:9
15 1පේතෘ 2:8
16 යෙසා 6:9 යොහ 12:40 ක්‍රියා 28:26 2කොරි 3:14
17 ද්වි 28:65 එස 29:7 රෝම 11:10

**2 තීරුව**
1 මතෙ 23:35 1තෙස 2:16 එළි 16:1
2 ගීතා 21:9
3 1රාජා 9:8 යෙරෙ 7:12 මතෙ 23:38 මතෙ 24:2
4 ක්‍රියා 1:20
5 2ලේක 28:9 ගීතා 109:16 යෙසා 53:4 සෙක 1:15
6 ගීතා 109:17 යෙසා 13:11 2තිමෝ 4:14
7 යෙසා 26:10
8 නික් 32:33 එළි 22:19
9 එස 13:9 පිලි 4:3 එළි 3:5 එළි 13:8
10 ගීතා 109:22
11 ගීතා 18:3
12 ගීතා 28:7
13 ගීතා 34:3 ගීතා 50:23
14 ගීතා 50:13
15 හොෂෙ 14:2
16 ගීතා 34:2
17 ගීතා 22:26

වහලුන් ලෙස සිටින තම
සෙනඟව ඔහු කිසිදා හෙළා
නොදකින්නේය.[1]
34 අහසත් පොළොවත් ඔහුට ප්‍රශංසා
ගී ගයන්න.[2]
මුහුදත් එහි ඇති සියලු ජීවීනුත්
ඔහුට ප්‍රශංසා කරන්න.[3]
35 මන්ද දෙවි සියොන් බේරාගන්-
නේය.[4]
ඔහු යූදාහි නුවරවල් නැවත
ගොඩනඟන්නේය.[5]
සෙනඟ දේශයේ වාසය කරමින්
එය උරුම කරගන්නෝය.[6]
36 ඔහුගේ සේවකයන්ගෙන් පැව-
තෙන්නෝ එය උරුම කර-
ගන්නෝය.[7]
ඔහුගේ නාමයට ප්‍රේම කරන්-
නෝ එහි වාසය කරන්-
නෝය.[8]

සංගීත අධ්‍යක්ෂක වෙනය. නැවත මතක්
කිරීමක් ලෙස දාවිත් රචනා කළ ගීතයකි.[9]

# 70

අනේ දෙවියනි, මාව ගලවා-
ගන්න.[10]
යෙහෝවා දෙවියනි, ඉක්ම-
නින්ම මාගේ උපකාරයට
පැමිණෙන්න.[11]
2 මාගේ ජීවිතය නැති කර දැමීමට
මාන බලන සියල්ලන්ව විය-
වුල් කර ලැජ්ජාවට පත්
කරන්න.[12]
මාගේ දුකේදී සතුටු වන්නන්ව
අවමානයට ලක් කරන්න.
ඔවුන්ව පලවාහරින්න.[13]
3 මට සිනාසෙමින් සරදම් කරන
අයව ලැජ්ජාවට පත්
කරන්න.[14] ඔවුන්ට පලා
යෑමට සලස්වන්න.
4 ඔබේ මහ පෙන්වීම් පතන සියල්-
ලෝ ප්‍රීති වෙත්වා![15]
ඔබ දෙන ගැලවීම අගය කරන්-
නෝ, "දෙවිට ගෞරවය
ලැබේවා" කියා නිරතුරුවම
කියත්වා![16]
5 දෙවියනි, මම අසරණ දිලින්-
දෙක්ව සිටිමි.[17]
එබැවින් පමා නොවී මා වෙනු-
වෙන් ක්‍රියා කරන්න.[1]
මාගේ උපකාරයට සිටින්නේ
ඔබය. ඔබ මට ගැලවීම
සලසා දෙන්නෙහිය.[2]
අනේ යෙහෝවා දෙවියනි,
පමා නොවී මට උපකාර
කරන්න.[3]

# 71

යෙහෝවා දෙවියනි, මා රැක-
වරණය පැතුවේ ඔබ-
ගෙන්ය.[4]
එබැවින් කිසිදාක ලැජ්ජාවට
පත් වීමට මට ඉඩ නො-
දෙන්න.[5]
2 ඔබ ධර්මිෂ්ඨ දෙවි කෙනෙක් නිසා
මාව බේරාගන්න.[6] මට ගැල-
වීම සලසා දෙන්න.
අනේ, මට සවන් දී මාව ගලවා-
ගන්න.[7]
3 ඕනෑම මොහොතක ආරක්ෂාව
ලැබිය හැකි බලකොටුවක්
වන්න.[8]
මාව ගලවාගන්නා ලෙස අණ
දෙන්න.[9]
මන්ද මාගේ පර්වතයත් මාගේ
බලකොටුවත් ඔබය.[10]
4 අනේ මාගේ දෙවියනි, දුෂ්ටයාගේ
අතින් මාව ගලවාගන්න.[11]
අයුක්තිසහගතව හා කුරිරු
ලෙස ක්‍රියා කරන්නාගේ
අතින් මාව බේරාගන්න.[12]
5 විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවියනි, මා
බලාපොරොත්තු තබා
තිබෙන්නේ ඔබ කෙරෙ-
හිය.[13] යොවුන් වියේ සිට
මාගේ විශ්වාසය ඔබය.[14]
6 මව්කුසෙන් මාව පිටතට ගත්තේ
ඔබය.[15]
උපන් මොහොතේ සිටම මම
ඔබ මත රඳා සිටියෙමි.[16]
මම නිතරම ප්‍රශංසා කරන්නේ
ඔබ ගැනය.[17]

**69 ගීතාවලිය**
1 ගීතා 107:10, ගීතා 146:7, යෙසා 61:1, සෙක 9:11, ක්‍රියා 5:19, ක්‍රියා 12:7
2 ගීතා 19:1, ගීතා 96:11, ගීතා 148:1, යෙසා 44:23, යෙසා 49:13
3 ගීතා 148:7
4 ගීතා 51:18, යෙසා 14:32, යෙසා 44:26
5 යෙරෙ 33:10, එස 36:35
6 යෙරෙ 33:11
7 ගීතා 102:28, යෙසා 61:9, යෙසා 66:22
8 ගීතා 91:14, යාකො 1:12

**70 ගීතාවලිය**
9 ගීතා 38:පෙර
10 ගීතා 40:13
11 ගීතා 71:12
12 2සාමු 17:2, ගීතා 6:10, ගීතා 35:26, ගීතා 71:13
13 ගීතා 35:4
14 ගීතා 35:21, ගීතා 40:15
15 ගීතා 5:11, විලා 3:25
16 ගීතා 35:27, ලූක් 1:46
17 ගීතා 40:17, ගීතා 69:29, ගීතා 109:22

**2 තීරුව**
1 ගීතා 141:1
2 ගීතා 18:2, ගීතා 40:17
3 ගීතා 13:3

**71 ගීතාවලිය**
4 ගීතා 25:2, ගීතා 31:1
5 යෙසා 45:17, යෙරෙ 17:18
6 ගීතා 144:2, 1කොරි 10:13
7 ගීතා 17:6, ගීතා 34:15
8 හිතෝ 18:10
9 ගීතා 44:4
10 2සාමු 22:2, ගීතා 18:2, ගීතා 144:2
11 2සාමු 17:12, ගීතා 3:7, ගීතා 17:9, ගීතා 59:1, ගීතා 140:4, මතෙ 6:13
12 2සාමු 19:9

---

**13** ගීතා 39:7; **14** 1සාමු 17:45; යෙරෙ 17:7; ලූක් 2:40; 2තිමෝ 3:15; **15** ගීතා 22:9; යෙසා 46:3; **16** ගීතා 139:16; **17** ගීතා 34:1.

7 බොහෝ මනුෂ්‍යයෝ මා දෙස පුදුමයෙන් බලති.[1]
නමුත් මාගේ ශක්තිමත් බලකොටුව ඔබය.[2]
8 සැමවිටම මාගේ මුවින් පිට වන්නේ ඔබට කරන ප්‍රශංසාවයි.[3]
දවස පුරා මා කතා කරන්නේ ඔබේ තේජස ගැනයි.[4]
9 මා මහලු වූ විට මාව අහක නොදමන්න.[5]
මා දුර්වල වූ විට මාගෙන් ඈත්ව නොයන්න.[6]
10 මාගේ සතුරෝ මා ගැන මෙසේ පවසති.[7]
මාගේ ජීවිතය නැති කර දැමීමට මාන බලන අය කුමන්ත්‍රණය කරමින් මෙසේ පවසති.[8]
11 “දෙවි ඔහුව අත්හැර දමා ඇති නිසා[9]
ඔහුව බේරාගැනීමට කිසිවෙක් නැත. එබැවින් ඔහුව ලුහුබැඳ ගොස් අල්ලාගන්න.”[10]
12 අනේ මාගේ දෙවියනි, මාගෙන් ඈත්ව නොසිටින්න.[11]
ඉක්මනින්ම මාගේ උපකාරයට පැමිණෙන්න.[12]
13 මට විරුද්ධව ක්‍රියා කරන්නන්ව ලැජ්ජාවට පත් කරන්න. ඔවුන්ව විනාශ කර දමන්න.[13]
මට දුක් කරදර ගෙනෙන්න උත්සාහ කරන අයට නින්දා අපහාස විඳීමට සලස්වන්න.[14]
14 මා නිතරම බලා සිටින්නේ ඔබ දෙසය.[15]
මම තව තවත් වැඩියෙන් ඔබට ප්‍රශංසා කරමි.
15 මම දවස පුරාම ඔබේ ධර්මිෂ්ඨකම ගැන කතා කරමි.[16]
ඔබ ලබා දුන් ගැලවීම ගැන ප්‍රකාශ කරමි.[17]
ඔබ කොතරම් වාර ගණනක් එසේ කර තිබෙනවාද කියා කිවහොත් ඒවා ගණන් කිරීමටවත් නොහැකි තරමය.[1]
16 විශ්වයේ පාලකයාණන්[2] වන යෙහෝවා දෙවියනි, මම පැමිණ ඔබේ මහත් බලය ගැන කතා කරමි.[3]
ඔබේ ධර්මිෂ්ඨකම ගැන පමණක් පවසමි.[4]
17 දෙවියනි, බාල වයසේ පටන් ඔබ මාගේ ගුරුවරයාය.[5]
ඔබ කර ඇති පුදුමාකාර දේවල් ගැන මම අද වන තුරුත් කතා කරමි.[6]
18 අනේ දෙවියනි, මාගේ හිසකෙස් පැසී මා මහලු වයසේ පසු වන විටදීද මාගෙන් ඈත්ව නොයන්න.[7]
එවිට ඔබ කර ඇති දේවල් මතු පරම්පරාවට පැවසීමට මට හැකි වනු ඇත.[8]
ඔබේ බලය ගැන සියලු පරම්පරාවන්ට කීමට මට හැකි වනු ඇත.[9]
19 දෙවියනි, ඔබේ ධර්මිෂ්ඨකම ඉතා උසස්ය.[10]
ඔබ කර තිබෙන මහත් දේවල් මොන තරම්ද![11]
දෙවියනි, ඔබට සමාන තවත් කෙනෙක් සිටීද?[12]
20 බොහෝ දුක් කරදර අද්දැකීමට ඔබ මට ඉඩහැරියත්[13]
මාව ප්‍රාණවත් කර මට නව ජීවයක් ලබා දෙන්න.[14]
පොළොවේ ගැඹුරුම තැනකට වැටී සිටින මාව ගොඩගන්න.[15]
21 මාගේ ගෞරවය වැඩි කරන්න.[16]
සෑම පැත්තකින්ම මාව ආරක්ෂා කර මට සැනසීම ලබා දෙන්න.[17]
22 මාගේ දෙවියනි, මම තත් භාණ්ඩයක් වාදනය කරමින්[18]

**13** 2සාමු 12:11; ගීතා 60:3; ගීතා 66:12; ගීතා 88:6; **14** ගීතා 80:18; **15** ගීතා 40:2; ගීතා 86:13; **16** 2සාමු 3:1; ගීතා 72:11; යෙසා 9:7; **17** 2කොරි 1:4; **18** ගීතා 92:3; ගීතා 150:3.

**71 ගීතාවලිය**
**1** යෙසා 8:18 සෙක 3:8 ලූක් 2:34 ක්‍රියා 4:13 1කොරි 4:9
**2** ගීතා 62:7 ගීතා 142:5 යෙරෙ 16:19
**3** ගීතා 51:15 ගීතා 145:21 හෙබ්‍රෙ 13:15
**4** ගීතා 35:28 ගීතා 145:2
**5** ගීතා 92:14
**6** ගීතා 73:26 දේශ 12:3
**7** 2සාමු 17:1
**8** ගීතා 83:3 මතෙ 26:4 මතෙ 27:1
**9** ගීතා 3:2 ගීතා 42:10 මතෙ 27:43
**10** 2ලේක 32:13 ගීතා 7:2 මතෙ 27:42
**11** ගීතා 35:22 ගීතා 38:21
**12** ගීතා 22:11 ගීතා 70:1
**13** 2සාමු 17:23 මතෙ 27:5
**14** 2සාමු 18:9 ගීතා 109:29
**15** ගීතා 43:5
**16** ගීතා 35:28 ගීතා 40:9
**17** ගීතා 95:1 එළි 7:10

**2 තීරුව**
**1** ගීතා 40:5 ගීතා 139:17 රෝම 11:33
**2** ගීතා 68:20
**3** යෙසා 40:31
**4** එළි 15:3
**5** ගීතා 71:5
**6** 2සාමු 22:1 1ලේක 16:4 ගීතා 9:1 ගීතා 66:16
**7** 1සාමු 4:15 ගීතා 37:25 ගීතා 71:9
**8** ගීතා 78:4
**9** නික් 13:8 1ලේක 29:11
**10** ගීතා 36:6 ගීතා 57:10 ගීතා 89:14
**11** ගීතා 86:8 ගීතා 89:7
**12** නික් 15:11 ගීතා 72:18 ගීතා 86:8 ගීතා 89:6 යෙසා 40:18 යෙරෙ 10:7

ඔබේ විශ්වාසවන්තකම ගැන
ඔබට ප්‍රශංසා කරන්නෙමි.[1]
ඊශ්‍රායෙල්හි ශුද්ධ තැනැත්තා-
ණෙනි,[2] වීණාව වාදනය
කරමින් මම ඔබට ප්‍රශංසා ගී
ගයන්නෙමි.
23 මම මහත් ප්‍රීතියකින් ඔබට ප්‍රශංසා
ගී ගයන්නෙමි.[3]
මුළු හදවතින්ම ඔබට ප්‍රීති
ඝෝෂා නඟන්නෙමි. මන්ද
මාව ගලවාගත්තේ ඔබය.[4]
24 මම ඔබේ ධර්මිෂ්ඨකම ගැන දවස
පුරාම කතා කරන්නෙමි.[5]
මන්ද මට දුක් කරදර ගෙ-
නෙන්න උත්සාහ කළ අය
ලැජ්ජාවටත් අවමානයටත්
පත් වූහ.[6]

සලමොන් ගැනය.

# 72

දෙවියනි, ඔබේ නියෝග ගැන
රජුට උගන්වන්න.[7]
ඔබේ ධර්මිෂ්ඨකම ගැන
රජුගේ පුත්‍රයාට කියා
දෙන්න.[8]
2 ඔහු ඔබේ සෙනඟ වෙනුවෙන් ධර්-
මිෂ්ඨකමින් ක්‍රියා කරයි.[9]
පීඩාවට ලක් වූ ඔබේ ජනයාට
යුක්තිය ඉටු කර දෙයි.[10]
3 ධර්මිෂ්ඨකම නිසා ඇති වන සමා-
දානය
කඳු සහ හෙල් අතරින් ජනතාව
අතරට ගලා බසියි.[11]
4 සෙනඟ අතරේ සිටින පීඩිතවූ-
වන්ට ඔහු යුක්තිය ඉටු කර
දෙයි.[12]
දුගී දුප්පත් අයව බේරාගනියි.
වංචනිකයන්ව පාගා පොඩි කර
දමයි.
5 දෙවියනි, ඉර සඳ පවතින තෙක්[13]
ඔවුහු ඔබ කෙරෙහි ගරුබිය
ඇතුව සිටින්නෝය.
පරම්පරාවක් පාසා පරම්පරා-
වක් ඔවුහු ඔබට ගරුබිය
පෙන්වන්නෝය.[14]
6 ඔහුගේ පාලනය කැපූ තණ පිටි-
යක් මතට ඇද හැළෙන වර්-
ෂාව මෙනි.[15]
පොළොව තෙත් කරන වැසි
මෙනි.[1]
7 ඔහුගේ පාලන සමයේදී ධර්මිෂ්-
ඨයා සාර්ථක වන්නේය.[2]
සඳ පවතින තෙක් බොහෝ
සමාදානය තිබෙන්නේය.[3]
8 මුහුදෙන් මුහුදටද[4]
මහ ගංගාවේ* සිට[5] පොළොවේ
සියලු සීමා දක්වාද ඔහුගේ
පාලනය විහිදී යන්නේය.[6]
9 කාන්තාරවල වැසියෝ ඔහු ඉදිරි-
යේ වැඳ වැටෙන්නෝය.[7]
ඔහුගේ සතුරෝද දූවිලි කන්-
නෝය.[8]
10 තර්ෂිෂ්හි රජවරුද දූපත්වල රජව-
රුද[9]
තෑගි ගෙනෙන්නෝය.[10]
ෂෙබාහි රජවරුද සෙබාහි රජව-
රුද ඔහුට
තෑගි බෝග දෙන්නෝය.[11]
11 ඔහු ඉදිරියේ සියලු රජවරු වැඳ
වැටෙන්නෝය.[12]
සියලු ජාතීහු ඔහුට සේවය
කරන්නෝය.[13]
12 මන්ද උපකාරය පතා හඬ නඟන
දුප්පතාව ඔහු ගලවාගන්-
නේය.[14]
පීඩිතයාවද උපකාරයක් නො-
මැතිව අන්ත අසරණ වී
සිටින්නන්වද ඔහු බේරාගන්-
නේය.[15]
13 අසරණයාටද දිළින්දාටද ඔහු අනු-
කම්පා කරන්නේය.[16]
දුප්පතුන්ගේ දිවි රැක දෙන්-
නේය.[17]
14 පීඩාවලින්ද සැහැසික ක්‍රියාවලින්ද
ඔහු ඔවුන්ව මුදවාගන්නේය.
ඔවුන්ගේ ජීවිත* ඔහුට බොහෝ
සේ වටින්නේය.[18]
15 රජ දිගු කල් ජීවත් වේවා![19] ෂෙ-
බාහි රන්වලින් කොටසක්

**71 ගීතාවලිය**
**1** ගීතා 25:10
ගීතා 108:4
ගීතා 138:2
ගීතා 146:6
එළි 15:3
**2** 2රාජා 19:22
යෙසා 60:9
**3** ගීතා 63:5
ගීතා 104:33
**4** උත් 48:16
2සාමු 4:9
ගීතා 103:4
**5** ද්වි 11:19
ගීතා 71:8
හිතෝ 10:20
**6** ගීතා 35:26
ගීතා 40:14
ගීතා 71:13

**72 ගීතාවලිය**
**7** 1ලේක 22:12
1ලේක 29:19
**8** යෙරෙ 23:5
**9** 1රාජා 3:9
යෙසා 11:4
යෙසා 32:1
**10** 1රාජා 3:28
**11** ගීතා 85:10
යෙසා 32:17
යෙසා 52:7
**12** යෙසා 11:4
**13** ගීතා 89:36
**14** ගීතා 89:37
ලූක් 1:33
එළි 11:15
**15** හිතෝ 19:12

**2 තීරුව**
**1** 2සාමු 23:4
හිතෝ 16:15
යෙසා 58:11
එස 34:26
හොෂෙ 6:3
**2** යෙසා 61:11
**3** 1රාජා 4:25
1ලේක 22:9
යෙසා 2:4
යෙසා 9:6
**4** නික් 23:31
1රාජා 4:21
ගීතා 2:8
ගීතා 89:25
සෙක 9:10
**5** ද්වි 11:24
**6** ගීතා 22:27
දානි 2:35
**7** 1රාජා 9:18
ගීතා 74:14
**8** ගීතා 2:9
ගීතා 110:1
යෙසා 49:23
මීකා 7:17
**9** ගීතා 45:12
යෙසා 49:7
යෙසා 60:9
**10** 1රාජා 4:21
**11** 1රාජා 10:10
**12** යෙසා 49:23
**13** යෙසා 11:9
**14** ගීතා 10:17

**15** යෝබ් 29:12; **16** ගීතා 109:31; **17** යාකො 2:5; **18** ගීතා 116:15; **19** ගීතා 21:4; යොහ 14:19; 1යොහ 1:2; එළි 1:18.

**ගීතා 72:8*** එනම්, යුප්‍රටීස් ගඟේ. **14*** මූ.අ., “රුධිරය.”

ඔහුට දෙනු ලැබේවා![1]
නිරතුරුවම ඔහු වෙනුවෙන් අයැදිනු ලැබේවා!
දවස මුළුල්ලේම ඔහුට ප්‍රශංසාව ලැබේවා![2]
16 පොළොව ධාන්‍යවලින් පිරී ඉතිරී යයි.[3]
කඳු මුදුන් ධාන්‍යවලින් වැසී යයි.[4]
සරුසාරව තිබෙන ලෙබනොන් වනාන්තරය මෙන් ඔහු ලබන අස්වැන්නද සරු වන්නේය.[5]
නුවරේ වැසියෝ පොළොවේ තණකොළ මෙන් බහුල වන්නෝය.[6]
17 රජගේ නාමය සදහටම පවතීවා![7]
සූර්යයා පවතින තාක් කල් ඔහුගේ නාමය වැජඹේවා!
ඔහු මාර්ගයෙන් සෙනඟ ආශීර්වාද ලබාගන්නෝය.[1]
සියලු ජාතීහු ඔහු සන්තෝෂවත්යයි ප්‍රකාශ කරන්නෝය.[2]
18 පුදුමසහගත ක්‍රියා කරන එකම තැනැත්තා[3] වන
ඊශ්‍රායෙල්වරුන්ගේ දෙවි වන යෙහෝවාට ප්‍රශංසා වේවා![4]
19 ඔහුගේ තේජවත් නාමය සදාකාලයෙන් සදාකාලයටම ගෞරවයට පත් වේවා![5]
ඔහුගේ තේජසින් මුළු පොළොවම පිරී යනු ලැබේවා![6]
ආමෙන්, ආමෙන්.
20 යෙස්සේගේ පුත්[7] දාවිත්ගේ යාච්ඤාවල අවසානය මෙයයි.

**72 ගීතාවලිය**
1 1රාජා 10:10 යෙසා 60:6
2 2පේතෘ 3:18
3 යෙසා 30:23
4 යෙසා 29:17 යෙසා 35:2
5 යෙසා 29:17
6 1රාජා 4:20 එළි 7:16
7 ගීතා 45:17 ගීතා 89:36

**2 තීරුව**
1 උත් 22:18 ගලා 3:14
2 1තිමෝ 1:11
3 නික් 15:11 ගීතා 77:14 ගීතා 136:4
4 1ලේක 29:10 ගීතා 41:13 ලූක් 1:68
5 එළි 5:13
6 ගණන් 14:21 හබ 2:14

7 1සාමු 17:58; ක්‍රියා 13:22.

## තුන්වෙනි කාණ්ඩය
(ගීතාවලිය 73 – 89)

ආසාෆ් රචනා කළ ගීතයකි.[1]

**73** දෙවි ඊශ්‍රායෙල් ජාතිය වෙනුවෙන් මොන තරම් යහපත් දේ කර තිබේද! එසේය, නිර්මල සිත් ඇත්තන්ට ඔහු කර තිබෙන යහපත් දේවල් මොන තරම්ද![2]
2 මාගේ පය ලිස්සීමට ආසන්නව තිබිණ.[3]
තව කෙටි කලක් ගත වූවා නම් මා නොමඟ යෑමට ඉඩ තිබිණ.[4]
3 මන්ද පුරසාරම් දොඩන අය ගැන මා තුළ ඊර්ෂ්‍යාවක් ඇති විය.[5]
දුෂ්ටයන් කිසි කරදරයක් නැතුව සිටිනවා දකින විට මම ඔවුන්ට ඊර්ෂ්‍යා කළෙමි.[6]
4 මැරෙන මොහොතේදී පවා ඔවුහු වේදනාවක් අත් නොදකිති.[7]
ඔවුන්ගේ බඩ තර වී ඇත.[8]
5 ඔවුහු සාමාන්‍ය මිනිසුන් මෙන් දුක් ගැහැට නොවිඳිති.[1]
අන් අය මෙන් දුක් පීඩා අත් නොදකිති.[2]
6 එබැවින් ඔවුහු අහංකාරකම ආභරණයක් මෙන් ගෙලෙහි පැළඳ සිටිති.[3]
සැහැසියාව නමැති වස්ත්‍රයෙන් ඔවුහු සැරසී සිටිති.[4]
7 තරකමින් ඔවුන්ගේ දෙනෙත් නෙරා ඇත.[5]
ඔවුන් ආශා කළ දේවල් ඔවුන්ට ඕනෑවටත් වඩා ලැබී ඇත.[6]
8 ඔවුහු අන් අයට අපහාස කරමින් නපුරු දේ ගැනම පවසති.[7]
වංචනික ක්‍රියා ගැන උජාරුවෙන් කතා කරති.[8]
9 තමන් ස්වර්ගයේ සිටිනවායයි සිතාගෙන ඔවුහු කතා කරති.[9]
ඔවුහු පොළොව පුරා ඇවිදිමින්

**73 ගීතාවලිය**
1 2ලේක 35:15
2 ගීතා 84:11 මතෙ 5:8 යාකො 4:8
3 ගීතා 38:16 ගීතා 94:18
4 ලූක් 24:38 යූද් 22
5 හිතෝ 23:17 හිතෝ 24:1 හිතෝ 24:19
6 යෝබ් 21:7 ගීතා 37:1 ගීතා 37:7 යෙරෙ 12:1
7 දේශ 7:15
8 ගීතා 17:10

**2 තීරුව**
1 යෝබ් 12:6 යෝබ් 21:9
2 යෙරෙ 12:1 හෙබ්‍රෙ 12:8
3 යෝබ් 21:14
4 ගීතා 109:18 හිතෝ 3:31 යාකො 5:6
5 යෙරෙ 5:28
6 ලූක් 16:8
7 ගීතා 53:1 2පේතෘ 2:18

8 1රාජා 21:7; යූද් 16; 9 නික් 5:2; එළි 13:6.

තමන්ට රිසි පරිදි දේවල් පව-
සති.[1]
10 දෙවිගේ සෙනඟද ඔවුන්ගේ තත්ව-
යටම ඇද වැටෙති.
ජලය පිරුණු බඳුන්වලින්
ඔවුන්ට බීමට සිදු වී ඇත.
11 "දෙවි මේ දේවල් කොහොම දැන-
ගන්නද?[2]
මහෝත්තමයාණන්ට මේ
දේවල් ගැන කිසි අවබෝධ-
යක් තිබේද" කියා ඔවුහු
අසති.[3]
12 දුෂ්ටයන්ගේ ජීවිත එලෙසය. ඔවුහු
කිසි කරදරයක් අත් නොද-
කිති.[4]
ධන සම්පත් වැඩි වැඩියෙන් රැස්
කරගනිති.[5]
13 නිර්මල සිතක් ඇතුව ජීවත් වීමට
මා දැරූ උත්සාහය නිෂ්ඵ-
ලය.[6]
මගේ දෑත් සෝදාගෙන මා
නිදොස් බව හෙළි කළත්
එයින්ද කිසිදු පලක් නො-
වීය.[7]
14 මම දවස පුරාම බොහෝ වේදනා-
වෙන් සිටියෙමි.[8]
නමුත් සෑම උදෑසනකම ඔබ
මාව නිවැරදි කළෙහිය.[9]
15 එලෙස දිගින් දිගටම කතා කිරීමට
මා තීරණය කළා නම්,
එය ඔබේ සියලු පුත්‍රයන්ට
මා කරන ද්‍රෝහිකමකි.[10]
16 එබැවින් මම ඒ කාරණය තේරුම්-
ගැනීමට උත්සාහ කළෙමි.[11]
නමුත් එය මට බොහෝ දුෂ්-
කර විය.
17 ඉදිරියේදී ඔවුන්ට සිදු වන්නේ
කුමක්ද කියා දැනගැනීමට
මට අවශ්‍ය විය.[12]
එබැවින් මම දෙවිගේ ශුද්ධස්ථා-
නය වෙතට ගියෙමි.[13]
18 ඔබ දුෂ්ටයන්ට සිටගැනීමට
සැලැස්වූවේ ලිස්සනසුලු
තැන්වලය.[14]
ඔබ ඔවුන්ව විනාශ වී යෑමට
සැලැස්වුවෙහිය.[15]

73 ගීතාවලිය
1 ගීතා 52:4
යාකො 3:6
2 යෝබ් 22:13
ගීතා 10:11
ගීතා 94:7
එස 8:12
ශෙප 1:12
3 ගීතා 44:21
4 ගීතා 37:35
5 ගීතා 17:14
ගීතා 144:13
6 යෝබ් 34:9
යෝබ් 35:3
මලා 3:14
7 ගීතා 26:6
8 ගීතා 34:19
9 යෝබ් 7:18
ගීතා 94:12
හෙබ්‍රෙ 12:5
10 මතෙ 18:6
11 දේශ 8:17
12 ගීතා 37:38
දේශ 8:13
13 ගීතා 77:13
14 ගීතා 35:6
ගීතා 37:20
යෙරෙ 23:12
15 ගීතා 37:10
ගීතා 55:23
හිතෝ 3:33

2 තීරුව
1 යෝබ් 21:23
ගීතා 37:2
යෙසා 30:13
2 යෝබ් 20:8
ගීතා 90:5
යෙසා 29:8
3 1සාමු 2:30
4 ගීතා 37:1
ගීතා 73:3
5 විලා 3:13
6 ගීතා 92:6
හිතෝ 30:2
7 ගීතා 32:9
8 ගීතා 16:8
හෙබ්‍රෙ 13:5
9 ගීතා 37:17
ගීතා 63:8
යෙසා 41:10
10 ගීතා 25:9
ගීතා 32:8
ගීතා 37:23
ගීතා 143:10
හිතෝ 3:6
යෙසා 58:8
11 ගීතා 37:34
12 ගීතා 16:5
පිලි 3:8
13 ගීතා 42:2
ගීතා 84:2
යෙසා 26:9
14 ගීතා 63:1
ගීතා 119:81
15 ගීතා 16:5
ගීතා 119:57
ගීතා 142:5
විලා 3:24
16 ගීතා 119:155
හෙබ්‍රෙ 10:39

19 සුළු මොහොතක් ඇතුළතදී
ඔවුන් අද්දුටු විනාශය දෙස
බලන්න.[1]
එක් නිමේෂයකින් ඔවුන් මොන
තරම් භීතියකට පත් වුණාද
කියා බලන්න. මෙසේ ඔවුන්-
ගේ දිවි කෙළවර විය.
20 යෙහෝවා දෙවියනි, ඔවුන්ගේ
ජීවිත විගසින් අමතක වී
යන සිහිනයක් මෙනි.[2]
මන්ද ඔබ නැඟී සිටින විට ඔබ
ඔවුන්ව අවමානයට පත් කර
අහක දමන්නෙහිය.[3]
21 මාගේ සිතෙහි තරහක් ඇති විය.[4]
මාගේ ඇතුළාන්තය වේදනා-
වෙන් පිරී තිබිණ.[5]
22 මාගේ කල්පනා ශක්තිය බොඳ වී
ගියේය. මට කිසිවක් තේ-
රුම්ගැනීමට නොහැකි විය.[6]
මම ඔබ ඉදිරියේ වනමෘගයෙකු
මෙන් හැසිරුණෙමි.[7]
23 එහෙත් මම නිතරම ඔබ සමඟ
සිටිමි.[8]
ඔබ මාගේ දකුණතින් අල්ලා-
ගෙන සිටින්නෙහිය.[9]
24 ඔබ උපදෙස් දෙමින් මට මඟ
පෙන්වන්නෙහිය.[10]
පසුව ඔබ ඔබේ අනුමැතිය මට
ලබා දෙන්නෙහිය.[11]
25 මට පිහිට වීමට ස්වර්ගයේ සිටින
ඔබ හැර වෙන කිසිවෙක්
නැත.[12]
මට සතුටු වීමටද පොළොවේ
කිසි දෙයක් නැත. මාගේ
සතුට ඔබය.[13]
26 මාගේ සිතද මාගේ අවයවයන්ද
අඩපණ වී ඇත.[14]
නමුත් දෙවි මාගේ සිත ශක්ති-
මත් කරන්නේය. ඔහු මාගේ
පර්වතයය. සදහටම මට
හිමි උරුමයය.[15]
27 දෙවිගෙන් ඈත් වී සිටින සිය-
ලුදෙනා විනාශ වී යන්-
නෝය.[16]
ඔහුට ද්‍රෝහි වී ඔහුගෙන් ඈත්

වන සියලුදෙනාව ඔහු පහ
කර දමන්නේය.[1]
28 දෙවිට ළං වී සිටීම මට යහපතකි.[2]
ඔහු මාගේ රක්ෂස්ථානයය.[3]
විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවිගේ සියලු
ක්‍රියා මම ප්‍රකාශ කරමි.[4]

මස්කිල්. ආසාෆ් රචනා කළ ගීතයකි.[5]

74 දෙවියනි, ඔබ සදහටම අපව
අත්හැර දැමුවේ මන්ද?[6]
ඔබේ තණබිම්මේ සිටි බැටළු
රැළ සමහ උදහසින්
සිටින්නේ මන්ද?[7]
2 බොහෝ කලකට පෙර ඔබ අයිති
කරගත් ඔබේ සෙනඟව සිහි
කරන්න.[8]
ඔබේ උරුමය ලෙස ඔබ බේරා-
ගත් ගෝත්‍රය සිහි කරන්න.[9]
ඔබ වාසය කළ මේ සියොන්
කන්ද සිහි කරන්න.[10]
3 කාලයක් පුරා නටබුන්ව තිබූ
තැන්වලට ඔබේ දෙපා
තබන්න.[11]
ශුද්ධස්ථානයේ තිබූ සියලු
දේ සතුරා නැති නාස්ති
කළේය.[12]
4 ඔබට නමස්කාර කරන ස්ථානයේ
සිට ඔබේ විරුද්ධවාදීහු ගර්-
ජනා කළෝය.[13]
ඔවුහු තම හමුදාවන්ට වෙන් වූ
ලාංඡන එසෙව්වෝය.[14]
5 පොරෝ යොදාගෙන ගන කැලෑ
එළි කරන්නන් ලෙස ඔවුහු
ප්‍රසිද්ධය.
6 ඔවුහු පොරෝවලින් සහ යකඩ
ආයුධවලින් ශුද්ධස්ථානයේ
ඇති කැටයම් මුළුමනින්ම
කඩා දැමුවෝය.[15]
7 ඔබේ ශුද්ධස්ථානය ගිනිබත්
කළෝය.[16]
ඔබේ නාමය දරන ශුද්ධ කූඩා-
රම බිම හෙළා කෙලෙසා
දැමුවෝය.[17]
8 ඔවුහුද ඔවුන්ගේ දරුවෝද මෙසේ
කීවෝය.
"දෙවිට නමස්කාර කරන
ස්ථාන සියල්ල අප ගිනිබත්
කර ඒවා දේශයෙන් ඉවත්
කළ යුතුය."[1]
9 අපේ ලකුණු අපි නොදුටුවෙමු.
තවදුරටත් අනාගතවක්තෘ
කෙනෙක් දේශයේ නැත.[2]
තව කොතරම් කාලයක් මේ
තත්වය පවතීද කියා අපෙන්
කිසිවෙක් දන්නේ නැත.
10 අනේ දෙවියනි, තව කොපමණ
කාලයක් ඔබේ විරුද්ධකරු
ඔබට මෙසේ නින්දා කරනු
ඇද්ද?[3]
ඔබේ නාමයට අගෞරව කිරීමට
ඔබ සදහටම සතුරාට ඉඩ-
හරින්නෙහිද?[4]
11 ඔබ ඔබේ දකුණත දිගු කර කිසි-
වක් නොකරන්නේ මන්ද?[5]
ඔබ ඔබේ හස්තය දිගු නො-
කර සිටියොත් අපි සම්පූර්ණ-
යෙන්ම විනාශ වී යනු ඇත.
12 පුරාණයේ සිටම මාගේ රජු දෙ-
විය.[6]
ශ්‍රේෂ්ඨ ගැලවීමක් සලසා දෙන
එකම තැනැත්තා ඔහුය.[7]
13 දෙවියනි, ඔබේ ශක්තියෙන් ඔබ
මුහුද කැලඹුවෙහිය.[8]
මුහුදේ සැරිසරන දැවැන්තයන්-
ගේ හිස් පොඩි කර දැමුවෙ-
හිය.[9]
14 ලෙවියාතන්ගේ හිස* ඔබ කැබලි
කළෙහිය.[10]
ඔබ ඒවා කාන්තාරවල වැසි-
යන්ට ආහාර ලෙස දුන්නෙ-
හිය.[11]
15 පර්වත දෙබෑ කර දිය උල්පත් මතු
කළේ ඔබය.[12]
ගලා යන ගංගා සිඳී යෑමට
සැලැස්වූවේද ඔබය.[13]
16 දිවා කාලයේද රාත්‍රියේද අයිතිය
ඔබටය.[14]

**73 ගීතාවලිය**
**1** නික් 34:15 ගණන් 15:39 යාකො 4:4
**2** ගීතා 65:4 හෙබ්‍රෙ 10:22 යාකො 4:8
**3** ගීතා 46:1 ගීතා 71:5
**4** ගීතා 107:22 ගීතා 118:17

**74 ගීතාවලිය**
**5** 1ලේක 25:1 2ලේක 35:15
**6** ගීතා 10:1 ගීතා 44:23 විලා 5:20
**7** ද්වි 29:20 ගීතා 95:7 ගීතා 100:3
**8** ද්වි 9:29
**9** ද්වි 4:20 ද්වි 32:9 ගීතා 33:12 යෙරෙ 10:16 මීකා 7:14
**10** ගීතා 48:2 ගීතා 78:68 ගීතා 132:13
**11** දානි 9:17 මීකා 1:3
**12** ගීතා 79:1
**13** විලා 2:7
**14** මතෙ 24:24 මාක් 13:22
**15** 1රාජා 6:18 1රාජා 6:35
**16** 2රාජා 25:9 යෙසා 64:11
**17** ගීතා 89:39

**2 තීරුව**
**1** ගීතා 83:4
**2** 1සාමු 3:1 ආමො 8:11
**3** ගීතා 13:2 ගීතා 79:4
**4** එස 36:23
**5** ගීතා 44:23 යෙසා 64:12 විලා 2:3
**6** යෙසා 33:22
**7** නික් 15:2 හබ 3:13
**8** නික් 14:21 නෙහෙ 9:11 ගීතා 78:13 ගීතා 106:9
**9** නික් 14:28 ගීතා 136:15 යෙසා 51:9 එස 29:3 එස 32:2
**10** යෝබ් 3:8 යෝබ් 41:1 ගීතා 104:26
**11** නික් 14:30 ගණන් 14:9
**12** යොෂු 3:13 යෙසා 48:21

**13** එළි 16:12; **14** උත් 1:3; උත් 1:5; ගීතා 136:7.

**ගීතා 74:14*** මූ.අ., "හිස්."

ආලෝක වස්තුවක් වන සූර්-
යයා සැදුවේ ඔබය.[1]
17 පොළොවේ සීමා නියම කළේ
ඔබය.[2]
ගිම්හාන කාලයද ශීත කාලයද
ඇති කළේ ඔබය.[3]
18 යෙහෝවා දෙවියනි, සතුරා ඔබට
නින්දා කළ බව අමතක
නොකරන්න.[4]
අඥාන සෙනඟක් ඔබේ නාමය
කෙලෙසූ බවද අමතක නො-
කරන්න.[5]
19 ඔබේ කොබෙයියාගේ ජීවිතය
වනමෘගයෙකුගේ ගොදුරක්
වීමට ඉඩ නොදෙන්න.[6]
පීඩා විඳින ඔබේ සෙනඟගේ
ජීවිත සදහටම අමතක කර
නොදමන්න.[7]
20 අප සමඟ ඇති කරගත් ගිවිසුම
සිහි කරන්න.[8]
පොළොවේ අඳුරු තැන් සැහැ-
සික ක්‍රියාවලින් පිරී ඇත.[9]
21 පීඩිතයා සදහටම ලැජ්ජාවට පත්
නොවේවා![10]
අසරණයාද දිළින්දාද ඔබේ
නාමයට ප්‍රශංසා කරනු
ලැබේවා![11]
22 දෙවියනි, අඥානයා දවස පුරා
ඔබට කරන නින්දාව සිහි
කරන්න.[12]
දැන් නැඟී සිට ඔබ වෙනුවෙන්
කතා කරන්න.[13]
23 ඔබට විරුද්ධව නැඟී සිටින්-
නන්ගේ හඬ අහස දක්වාම
නඟින්නේය.[14]
ඔබේ විරුද්ධවාදීන් ඔබට විරුද්-
ධව දිගින් දිගටම නඟන හඬ
මතකයේ තබාගන්න.[15]

සංගීත අධ්‍යක්ෂක වෙතය.
"මාව විනාශ නොකරන්න" යන තේමාවෙන්
ලියවුණු, ආසාෆ්[16] රචනා කළ ගීතයකි.

# 75

දෙවියනි, අපි ඔබට ස්තුති
කරමු. ඔබට ස්තුතිය පුද
කරමු.[17]
ඔබ අප සමඟය.[18]
ඔබේ පුදුම ක්‍රියා ගැන
මනුෂ්‍යයෝ ප්‍රකාශ කරන්-
නෝය.[1]
2 දෙවි මෙසේ කියන්නේය.* "නියම
කළ කාලය පැමිණි විට[2]
මම යුක්තිසහගත ලෙස විනිශ්-
චය කිරීමට පටන්ගත්-
තෙමි.[3]
3 පොළොවත් එහි වැසියොත් භීතිය
නිසා දිය වී යෑමට පටන්-
ගත්තෝය.[4]
මම එහි කණු නැවත සකස්
කළෙමි."[5] සේලාහ්.
4 "අඥාන ලෙස ක්‍රියා නොක-
රන්න" කියා මම අඥාන-
යන්ට කීවෙමි.[6]
දුෂ්ටයන්ට මම මෙසේ කීවෙමි.
"ඔබේ බලය* ගැන පුරසාරම්
දෙඩීම අත්හරින්න.[7]
5 ඔබේ බලය ගැන පුරසාරම් දෙඩී-
මෙන් වළකින්න.
උඩඟු ලෙස කතා නොක-
රන්න.[8]
6 නැඟෙනහිරෙන්වත්
බස්නාහිරෙන්වත් දකුණෙන්-
වත් උසස්කම නොලැබෙයි.
7 කෙනෙකුව පහත් කරන්නෙත්
තවත් කෙනෙකුව උසස්
කරන්නෙත් දෙවිය.[9]
මන්ද විනිශ්චයකරු ඔහුය.[10]
8 යෙහෝවා දෙවිගේ අතේ කුසලා-
නයක් තිබේ.[11]
එය පෙණ දමන, සැර අධික
වයින්වලින් පිරී තිබේ.
ඔහු මණ්ඩිවත් ඉතුරු නොකර,
එම වයින් සියල්ලම වත්
කරන්නේය.
පොළොවේ සිටින සියලු දුෂ්ට-
යෝ එයින් බිඳක්වත් ඉතුරු
නොවන සේ එය සම්පූර්-
ණයෙන්ම බොන්නෝය."[12]
9 මම ඒ ගැන සැමදා පවසන්නෙමි.
යාකොබ්ගේ දෙවිට ප්‍රශංසා ගී
ගයන්නෙමි.[13]

74 ගීතාවලිය
1 උත් 1:14
ගීතා 136:8
මතෙ 5:45
2 ක්‍රියා 17:26
3 උත් 8:22
4 ගීතා 74:10
යෙසා 52:5
5 නික් 5:2
2ලේක 32:14
යෙසා 37:23
6 සල 2:14
7 ගීතා 68:10
8 උත් 17:7
ලෙවී 26:45
ගීතා 105:9
ගීතා 106:45
යෙරෙ 33:21
9 රෝම 1:27
10 ගීතා 12:5
11 එස්රා 3:11
12 ගීතා 89:51
යෙසා 52:5
13 ගීතා 9:19
14 යෙසා 37:29
15 ගීතා 2:2
ගීතා 8:2
ගීතා 10:5

75 ගීතාවලිය
16 2ලේක 35:15
17 ගීතා 50:14
ගීතා 116:17
18 ගීතා 138:2
යෙසා 30:27

2 තීරුව
1 ගීතා 145:12
එළි 15:3
2 දේශ 3:17
ක්‍රියා 17:31
3 යෙසා 11:4
4 ගීතා 60:2
2පේත්‍ර 3:10
5 යෝබ් 9:6
6 ගීතා 94:8
හිතෝ 29:9
7 ආමො 6:13
සෙක 1:21
8 නික් 32:9
2ලේක 30:8
හිතෝ 29:1
ක්‍රියා 7:51
යූද් 16
9 1සාමු 2:7
2සාමු 6:21
දානි 2:21
දානි 4:17
ලූක් 1:52
10 ගීතා 50:6
ගීතා 58:11
11 ගීතා 60:3
යෙසා 51:17
යෙරෙ 49:12
එළි 14:10
එළි 16:19
එළි 18:6
12 යෝබ් 21:20
ගීතා 11:6
යෙරෙ 25:15
යෙරෙ 25:28
13 ගීතා 104:33

**ගීතා 75:2*** මෙම කොටස මුල් භාෂාවේ නැත. **4*** මූ.අ., "ඔබේ අඟ."

10 දෙවි මෙසේ කියන්නේය.* “දුෂ්ටයන්ගේ බලය මම නැති කර දමන්නෙමි.”[1]
නමුත් ඔහු ධර්මිෂ්ඨයන්ට ශක්තිය දී ඔවුන්ව උසස් කරනු ලබන්නේය.[2]

සංගීත අධ්‍යක්ෂක වෙතය.
තත් භාණ්ඩ වාදනය කරමින් ගායනා කිරීම සඳහාය. ආසාෆ්[3] රචනා කළ ගීතයකි.

**76** යූදාහි වැසියෝ දෙවිව හඳුනති.[4]
ඔහුගේ නාමය ඊශ්‍රායෙල්හි ප්‍රසිද්ධ වී ඇත.[5]
2 ඔහුගේ ගෘහය සාලම්හි තිබේ.[6]
ඔහුගේ වාසස්ථානය සියොන්හි තිබේ.[7]
3 එහිදී ඔහු ගිනිමය ඊතලද[8]
පලිහද කඩුවද අනිකුත් යුද්ධායුධද කඩා දැමුවේය.[9] සීලාහ්.
4 දෙවියනි, ඔබ ආලෝකයෙන් වට වී සිටින්නෙහිය. රුදුරු වනමෘගයන් සැරිසරන කඳුවලටත් වඩා ඔබ තේජාන්විතය.[10]
5 බලවන්තයන්ව පවා කොල්ල කනු ලැබුවෝය.[11]
ඔවුහු නිදිකිරා වැටුණෝය.[12]
එරෙහි වී නැඟී සිටීමට තරම් ශක්තියක් එඩිතර කිසිවෙකුට නොවීය.[13]
6 යාකොබ්ගේ දෙවියනි, ඔබ දුන් දඬුවම නිසා අශ්වයාද අශ්ව රථ පදවන්නාද තද නින්දකට වැටුණෝය.[14]
7 ඔබ ගරුබිය දනවන දෙවි කෙනෙකි.[15]
ඔබේ ඇවෙන උදහසට විරුද්ධව නැඟී සිටිය හැක්කේ කාටද?[16]
8 ඔබ දුන් තීන්දුව ස්වර්ගයේ සිට ඇසීමට සැලැස්වුවෙහිය.[17]
පොළොව බිය වී නිහඬ වුණේය.[18]

---

ගීතා **75:10*** ගීතා 75:2හි පාදසටහන බලන්න.

9 පොළොවේ සිටින නිහතමානී සියල්ලන්ව බේරාගන්නා පිණිස[1]
ඔබ නැඟී සිටියෙහිය.[2] සීලාහ්.
10 මිනිසුන් කොතරම් උදහසකින් කටයුතු කළත් අවසානයේදී එයින් ඔබට ප්‍රශංසාව ලැබෙන්නේය.[3]
ඔවුන් කෝපය පිට කරන අවසන් මොහොත පවා ඔබ ඔබේ ගෞරවයට හරවාගන්නෙහිය.
11 යෙහෝවා දෙවි වටා සිටින සියල්ලෙනි, ඔහුට දුන් පොරොන්දු ඉටු කරන්න.[4]
ගරුබියෙන් යුතුව ඔහු වෙතට තෑගි ගෙනෙන්න.[5]
12 ඔහු නායකයන්ගේ අහංකාරකම නිවා දමන්නේය.[6]
පොළොවේ රජවරුන්ට ඔහු කෙරෙහි මහත් බියක් ඇති වන්නේය.[7]

යෙදූතුන් සංගීත අධ්‍යක්ෂක වෙතය.
ආසාෆ්[8] රචනා කළ ගීතයකි.

**77** මම ශබ්ද නඟා දෙවිට හඬගසන්නෙමි.[9]
ඔහු මට සවන් දෙන්නේය.[10]
2 මම දුක් කරදරවලට මුහුණ දෙන විට යෙහෝවා දෙවිගේ මඟ පෙන්වීම් පැතුවෙමි.[11]
මුළු රාත්‍රිය පුරාම මාගේ දෑත් දෙවි වෙතට දිගු කළෙමි.
නමුත් මා තුළ කිසි සැනසිල්ලක් නැත.[12]
3 මම දෙවිව සිහි කරමි. මාගේ හදවත වේදනාවෙන් කෑ මොර ගසයි.[13]
විඩාවට පත් වන තරමටම මම කල්පනා කරමි.[14] සීලාහ්.
4 ඔබ මාගෙන් නින්ද වැළැක්වූවෙහිය.[15]
කතා කිරීමටවත් නොහැකි තරමට මම කැලඹී සිටිමි.[16]

**75 ගීතාවලිය**
**1** ගීතා 101:8; හිතෝ 2:22; යෙරෙ 48:25; සෙක 1:21
**2** ගීතා 89:17; ගීතා 92:10; ගීතා 148:14

**76 ගීතාවලිය**
**3** 2ලේක 35:15
**4** ගීතා 48:3
**5** ද්වි 4:7; 2ලේක 2:5
**6** උත් 14:18; හෙබ්‍රෙ 7:1
**7** ගීතා 74:2; ගීතා 78:68; ගීතා 132:13; ගීතා 135:21; යෙසා 12:6
**8** 2ලේක 32:21
**9** ගීතා 46:9
**10** ගීතා 104:2
**11** යෙසා 46:12; ලූක් 1:51
**12** ගීතා 13:3; යෙසා 37:36; යෙරෙ 51:39
**13** යෙසා 31:8
**14** නික් 14:28; නික් 15:21; යෙසා 43:17; නාහු 2:13; සෙක 12:4
**15** නික් 14:31; ගීතා 89:7
**16** ගීතා 90:11; යෙරෙ 10:10; නාහු 1:6; 1කොරි 10:22
**17** 1රාජා 8:49; ගීතා 2:4
**18** 2ලේක 20:29; සෙක 2:13

**2 තීරුව**
**1** ගීතා 147:6; හිතෝ 3:34; ශෙප 2:3
**2** ගීතා 82:8
**3** හිතෝ 16:4; දානි 3:19; දානි 3:28; රෝම 3:5
**4** ගණන් 30:2; ගීතා 50:14; දේශ 5:4
**5** 2ලේක 32:23; ගීතා 68:29; ගීතා 89:7
**6** යෙසා 5:15; යෙරෙ 13:18
**7** යෙසා 24:21; එළි 6:15

**77 ගීතාවලිය**
**8** 2ලේක 35:15
**9** ගීතා 3:4
**10** ගීතා 34:6; ගීතා 116:2; හිතෝ 15:29; **11** ගීතා 18:6; ගීතා 50:15; යෙසා 26:16; **12** යෙරෙ 31:15; **13** ගීතා 42:5; **14** ගීතා 142:3; ගීතා 143:4; **15** එස්ත 6:1; **16** ගීතා 4:4.

5 අතීත දවස් ගැන මම කල්පනා
කරමි.[1]
ඈත අතීතය ගැන සිහි කරමි.
6 රාත්‍රියේදී මම තත් භාණ්ඩ වාද-
නය කළ හැටි සිහි කරමි.[2]
මම ගැඹුරින් කල්පනා කරමි.[3]
මේ දේවල් ගැන හොඳින් සිතා
බලමි.
7 යෙහෝවා දෙවි සදහටම අපව
අත්හැර දමයිද?[4]
නැවත ඔහුව සතුටු කිරීමට
අපට හැකි වෙයිද?[5]
8 ඔහු නැවත කිසිදාක අපට ඔහුගේ
මහත් ප්‍රේමය* පෙන්වන්නේ
නැද්ද?[6]
ඔහුගේ පොරොන්දු සදහටම
නිෂ්ඵල වී යයිද?[7]
9 කරුණාව දක්වන්න දෙවිට අම-
තක වී ඇද්ද?[8]
ඔහු උදහස් වී දයාව නොපෙන්වා
සිටින්නේද?[9] සීලාහ්.
10 මම මෙසේ කීවෙමි. "මහෝත්තම
දෙවි අපට තවදුරටත් උප-
කාර නොකරන නිසා[10]
මට දරාගත නොහැකි මහත්
වේදනාවක් දැනෙන්නේය."[11]
11 මම යෙහෝවා දෙවිගේ ක්‍රියා සිහි
කරමි.[12]
පුරාණයේ සිට ඔහු කළ පුදුමා-
කාර ක්‍රියා මතක් කරමි.[13]
12 දෙවියනි, ඔබේ සියලු ක්‍රියා ගැන
මම ගැඹුරින් කල්පනා
කරමි.[14]
ඔබ කළ දේවල් ගැන සිතා
බලමි.[15]
13 ඔබ ක්‍රියා කරන ආකාරය ගැන
දැනගත හැක්කේ ශුද්ධස්ථා-
නයේදීය.[16]
දෙවියනි, ඔබට වඩා ශ්‍රේෂ්ඨ
දෙවි කෙනෙක් තවත්
සිටීද![17]
14 පුදුම දනවන දේ කරන සැබෑ දෙවි
ඔබය.[18]
ඔබේ ශක්තිය ජනයා අතරේ
ඔබ පෙන්වා ඇත.[1]
15 ඔබේ සෙනඟ වූ යාකොබ්ගේ පුත්‍ර-
යන්වද යෝසෙප්ගේ පුත්‍ර-
යන්වද
ඔබ ඔබේ හස්තයෙන් මුදවා-
ගත්තෙහිය.[2] සීලාහ්.
16 දෙවියනි, ජල ධාරාවෝ ඔබව දැක
මහත් වේදනාවට පත් වූවෝය.[3]
ගැඹුරු ජලයද කැලඹුණේය.[4]
17 ගිගුරුම් දෙමින් වලාකුළුවලින්
ජලය ඇද හැළුණේය.[5]
වලාකුළින් බර වූ අහස ශබ්ද
නැඟුවේය.
අහසින් නික්මුණු අකුණු සැර
ඊතල* මෙන් විහිදී ගියේය.[6]
18 ඔබේ ගිගුරුම් හඬ යුධ රථවල හඬ
මෙනි.[7]
විදුලි කෙටීම් නිසා මුළු පො-
ළොවම ආලෝකවත් විය.[8]
පොළොව කැලඹී දෙදරුම්
කෑවේය.[9]
19 ඔබ මුහුද හරහා ගමන් කළෙ-
හිය.[10]
ජල ධාරාවන් හරහා ඔබේ ගමන්
මඟ වැටී තිබිණ.
ඔබේ පා සටහන් කිසිවෙකුට
සොයාගත නොහැකි විය.
20 බැටළු රැළකට මඟ පෙන්වන්නාක්
මෙන්[11]
ඔබ මෝසෙස් සහ ආරොන්
මාර්ගයෙන් ඔබේ සෙනඟට
මඟ පෙන්වූවෙහිය.[12]

මස්කිල්. ආසාෆ් රචනා කළ ගීතයකි.[13]

# 78

මාගේ ජනයෙනි, මාගේ නීති-
යට ඇහුම්කන් දෙන්න.[14]
මා පවසන දේට සවන්
දෙන්න.[15]
2 ඔබ හොඳින් දන්නා දෙයක් මම
ඔබට කියන්නෙමි.[16]
අතීතයේ සිට අපැහැදිලිව තිබූ

77 ගීතාවලිය
1 ද්වි 32:7
ගීතා 143:5
යෙසා 51:9
යෙසා 63:9
2 ගීතා 42:8
3 ගීතා 77:12
4 ගීතා 74:1
5 ගීතා 79:5
ගීතා 85:1
රෝම 11:1
6 ගීතා 136:1
විලා 3:22
7 ගණන් 23:19
රෝම 9:6
8 යෙසා 49:14
යෙසා 63:15
යෙරෙ 50:5
9 රෝම 11:32
10 රෝම 3:5
11 ගීතා 31:22
12 ගීතා 111:4
13 1ලේක 16:12
14 ගීතා 19:14
ගීතා 143:5
පිලි 4:8
15 1ලේක 16:9
ගීතා 105:2
16 ගීතා 73:17
17 නික් 15:11
ගීතා 89:8
18 ගීතා 72:18
එළි 15:3

2 තීරුව
1 නික් 9:16
යෙසා 52:10
දානි 3:29
දානි 6:27
2 නික් 6:6
ද්වි 9:29
3 නික් 14:21
යොෂු 3:16
ගීතා 114:3
හබ 3:8
4 ගීතා 104:7
5 ගීතා 68:8
6 2සාමු 22:15
යෝබ 36:32
ගීතා 18:14
ගීතා 144:6
හබ 3:11
සෙක 9:14
7 නික් 9:16
ගීතා 29:3
8 ගීතා 97:4
හබ 3:4
9 නික් 19:18
2සාමු 22:8
10 නෙහෙ 9:11
හබ 3:15
11 නික් 13:21
ගීතා 78:52
හොෂෙ 12:13
12 යෙසා 63:11
ක්‍රියා 7:36

78 ගීතාවලිය
13 ගීතා 74:පෙර
14 යෙසා 51:4
15 ගීතා 49:3
16 ගීතා 49:4; මතෙ 13:35.

ගීතා 77:8* හෝ, "ළැදි ප්‍රේමය."

ගීතා 77:17* මූ.අ., "ඔබේ ඊතල."

ගැඹුරු කාරණා මම එළිදරව්
කරන්නෙමි.[1]
3 ඒවා අප අසා ඇති, හොඳින් දන්නා
කාරණාය.[2]
අපේ පියවරුන් ඒවා අපට පවසා
තිබේ.[3]
4 අපි ඒවා අපේ පුත්‍රයන්ගෙන්ද
නොසඟවා,[4]
මතු පරම්පරාවට කියා දෙන්-
නෙමු.[5]
යෙහෝවා දෙවිගේ ශ්‍රේෂ්ඨ ක්‍රියා
ගැනත් ඔහුගේ ශක්තිය
ගැනත්[6]
ඔහු කර ඇති පුදුමාකාර දේවල්
ගැනත් අපි ඔවුන්ට පවසන්-
නෙමු.[7]
5 ඔහු යාකොබ්ට සිහිගැන්වීම් ලබා
දුන්නේය.[8]
ඊශ්‍රායෙල්ට නීතිය ලබා දුන්-
නේය.[9]
ඒවා තමන්ගේ පුත්‍රයන්ට දන්වන
ලෙස[10]
ඔහු අපේ මුතුන්මිත්තන්ට අණ
කළේය.[11]
6 එසේ කළේ, මතු පරම්පරාව ඒවා
දැනගෙන[12]
ඔවුන්ද ඔවුන්ගේ දරුවන්ට ඒවා
කියා දෙන පිණිසය.[13]
7 ඔවුහු දෙවි කෙරෙහි විශ්වාසය
තබන පිණිසය.[14]
දෙවිගේ ක්‍රියා අමතක නො-
කර[15] ඔහුගේ ආඥා පිළිපදින
පිණිසය.[16]
8 ඔවුහු තමන්ගේ මුතුන්මිත්තන්
මෙන් ක්‍රියා නොකරන පිණි-
සය.[17]
ඔවුන්ගේ මුතුන්මිත්තන්
මුරණ්ඩු, කැරලිකාර පරම්ප-
රාවකි.[18]
මුළු සිතින්ම දෙවිට විශ්වාසවන්-
තව සිටීමට[19]
අදිටන් කර නොගත් පරම්පරා-
වකි.[20]
9 එප්‍රායිම්ගේ පුත්‍රයෝ දුනු ඊතල
ඇතුව සිටියත්[21]
සටන් කරන දවසේදී පසුබැස්-
සෝය.[1]
10 ඔවුහු දෙවිගේ ගිවිසුම රක්ෂා නො-
කළෝය.[2]
ඔහුගේ නීතියට අනුව ජීවත්
නොවුණෝය.[3]
11 දෙවි ක්‍රියා කළ ආකාරයද
ඔවුන්ගේ දෙනෙත් ඉදිරිපිටම
දෙවි කළ පුදුමාකාර ක්‍රියාද[4]
ඔවුහු අමතක කළෝය.[5]
12 ඊජිප්තු දේශයේදී[6] එනම්, ෂෝවන්
භූමියේදී[7]
ඔවුන්ගේ මුතුන්මිත්තන් ඉදිරි-
පිටම ඔහු පුදුම දනවන දේ
කළේය.[8]
13 ඔවුන්ට මුහුද මැදින් ගමන් කිරීමට
හැකි වන පිණිස මුහුද දෙබෑ
කළේය.[9]
මහා ජල කඳ පවුරක් මෙන් නො-
සෙල්වී සිටින්නට සැලැස්වූ-
වේය.[10]
14 ඔහු දහවල් කාලයේදී වලාකුළක්
මාර්ගයෙන්ද[11]
රාත්‍රි කාලයේදී ගිනි ජාලාවක්
මාර්ගයෙන්ද ඔවුන්ට මඟ
පෙන්වූවේය.[12]
15 ඔහු පාළුකරයේ පර්වත දෙබෑ කර
මහා ජල කන්දරාවක් එයින්
ගලා ඒමට සැලැස්වූවේය.[13]
ඔවුන්ට ඇති තරම් බීමට අවශ්‍ය
ජලය ලබා දුන්නේය.[14]
16 ගලා එන ඇළ පාරක් සේ ඔහු පර්-
වතයකින් ජලය ගලා ඒමට
සැලැස්වූවේය.[15]
ගංගාවක දිය ගලා එන්නා සේ
එයින් ජලය නික්මෙන්න
සැලැස්වූවේය.[16]
17 මහෝත්තම දෙවි ඒ සියල්ල
කළත් ඔවුහු පාළුකරයේදී
ඔහුට විරුද්ධව කැරලිගසා[17]
තව තවත් පව් කළෝය.[18]

78 ගීතාවලිය
1 ගීතා 119:171
හිතෝ 1:6
හිතෝ 18:4
එස 17:2
2 ගීතා 44:1
3 නික් 13:8
4 ද්වි 4:9
ද්වි 6:7
ද්වි 6:21
ගීතා 145:4
යෝවෙ 1:3
5 ද්වි 11:19
යොෂු 4:6
ගීතා 71:18
6 යෙසා 63:7
7 ගීතා 98:1
8 ද්වි 4:45
9 ද්වි 4:8
ද්වි 27:3
ගීතා 147:19
10 උත් 18:19
ද්වි 6:7
එෆී 6:4
11 රෝම 3:2
12 ගීතා 71:18
ගීතා 102:18
13 ද්වි 4:10
14 ගීතා 40:4
යෙරෙ 17:7
15 ද්වි 4:9
ගීතා 103:2
16 ද්වි 5:29
17 2රාජා 17:14
එස 20:18
ක්‍රියා 7:51
18 නික් 32:9
ද්වි 1:43
ද්වි 9:6
ද්වි 31:27
යෙසා 65:2
19 උත් 6:5
20 2ලේක 12:14
ගීතා 81:12
යෙරෙ 5:23
යෙරෙ 7:24
21 උත් 49:24

2 තීරුව
1 විනි 12:4
2 ද්වි 31:16
2ලේක 13:4
2ලේක 13:11
යෙරෙ 31:32
3 2රාජා 17:14
2ලේක 13:9
නෙහෙ 9:26
4 ගීතා 106:13
ගීතා 106:22
5 ද්වි 32:18
2ලේක 13:8
2ලේක 13:12
යෙරෙ 2:32
6 ගීතා 105:27
ගීතා 135:9
7 ගණන් 13:22
යෙසා 19:11
8 ද්වි 4:34
නෙහෙ 9:10
ගීතා 105:29

**9** නික් 14:21; ගීතා 66:6; ගීතා 136:13; යෙසා 63:13; 1කොරි 10:1; **10** නික් 15:8; ගීතා 33:7; **11** නික් 13:21; නෙහෙ 9:12; **12** නික් 14:20; නික් 14:24; ගීතා 105:39; **13** නික් 17:6; ගණන් 20:11; **14** ගීතා 105:41; යෙසා 48:21; 1කොරි 10:4; **15** ද්වි 8:15; නෙහෙ 9:15; **16** යෙසා 41:18; **17** ද්වි 9:22; ගීතා 95:8; හෙබ්‍රෙ 3:16; **18** ද්වි 9:21.

18 ඔවුහු කැදර ලෙස කෑම ඉල්ලමින්,[1]
දෙවි ඔවුන් වෙනුවෙන් මැදිහත් වී ක්‍රියා කරයිද නැද්ද කියා පරීක්ෂා කළෝය.[2]
19 ඔවුහු දෙවිට විරුද්ධව කතා කළෝය.[3]
“මේ පාළුකරයේ අපට අවශ්‍ය කරන කෑම ලබා දෙන්න දෙවිට පුළුවන්ද” කියා ඇසුවෝය.[4]
20 නමුත් බලන්න! ඔහු පර්වතයකට ගැසුවේය.[5]
එවිට වතුර ගලා ආවේය. මහා ජල කඳක් පිටතට ආවේය.[6]
නමුත් ඔවුහු මෙසේ ඇසුවෝය. “අපට අවශ්‍ය කෑම ලබා දෙන්නවත්[7]
ඔහුගේ සෙනඟව පෝෂණය කරන්නවත් ඔහුට පුළුවන්ද?”[8]
21 එය අසා යෙහෝවා දෙවි බොහෝ සෙයින් උදහස් වුණේය.[9]
යාකොබ්ට විරුද්ධව ගිනිදැල් ඇවුළුණේය.[10]
ඊශ්‍රායෙල්ට විරුද්ධව ඔහුගේ උදහස වැගුරුවේය.[11]
22 මන්ද ඔවුහු ඔහු කෙරෙහි විශ්වාසය තැබුවේ නැත.[12]
ඔහු ගැලවීම ලබා දෙන බව විශ්වාස කළේ නැත.[13]
23 වලාකුළින් පිරුණු අහසට ඔහු අණ කළේය.
එවිට අහසේ කවුළු ඇරුණේය.[14]
24 කෑම පිණිස මන්නා වර්ෂාවක් ඇද හැලීමට සැලැස්වූවේය.[15]
ස්වර්ගයෙන් ධාන්‍ය සපයා දුන්නේය.[16]
25 ඔවුහු බලවන්තයන්ගේ*[17] කෑම කෑවෝය.
ඇති තරම් ආහාර ඔහු ඔවුන්ට සපයා දුන්නේය.[18]

26 ඔහු පෙරදිගින් තද සුළඟක් හමා ඒමට සැලැස්වූවේය.[1]
තමා සතු බලයෙන් දකුණු දෙසින් හැමූ සුළඟද මෙහෙයවූවේය.[2]
27 වර්ෂාවක් සේ අහසින් කෑම වැටීමට සැලැස්වූවේය. ඒවා වැලි කැට මෙන් බහුලව තිබුණේය.[3]
කුරුල්ලන් විශාල ප්‍රමාණයක්ද ඔවුන්ට ආහාර ලෙස දුන්නේය. උන් මුහුදේ වැලි මෙන් බහුලව සිටියෝය.[4]
28 ඔහු තම කූඩාරම[5] අවට
එනම්, තම සෙනඟගේ කඳවුර දෙසට උන්ව ගසාගෙන ඒමට සැලැස්වූවේය.[6]
29 දෙවි ඔවුන්ගේ ආශාවන් පිනෙව්වේය.[7]
ඔවුහු කැදර ලෙස බඩ කට පුරවාගත්තෝය.[8]
30 නමුත් කෑමට තිබූ ඔවුන්ගේ ලොල්කම තව තවත් වැඩි වුණේය.
ඔවුන්ගේ මුවේ කෑම තිබියදීම[9]
31 දෙවි ඔවුන් සමඟ උදහස් වී ඔවුන්ට පහර දුන්නේය.[10]
ඊශ්‍රායෙල් සෙනඟ අතරේ සිටි ශක්තිසම්පන්න අයව මරා දැමුවේය.[11]
තරුණයෝද මැරී වැටුණෝය.
32 මේ සෑම දෙයක්ම දැක දැකත් ඔවුහු දිගින් දිගටම පව් කළෝය.[12]
ඔහු කළ පුදුමාකාර දේවල් කෙරෙහි ඔවුහු විශ්වාසය තැබුවේ නැත.[13]
33 එබැවින් ගසාගෙන යන සුළඟක් මෙන් ඔවුන්ගේ ජීවිත අවසන් වී යෑමට ඔහු සැලැස්වූවේය.[14]
ඔවුන්ගේ දිවි බියෙන් ගෙවී ගියේය.
34 ඔහු ඔවුන්ට පහර දුන් සෑම අවස්ථාවකදීම ඔවුහු ඔහුගේ උපකාර පැතුවෝය.[15]

78 ගීතාවලිය
1 නික් 16:8
2 ගීතා 106:14
3 ගණන් 21:5
4 ගණන් 11:4
5 නික් 17:6
6 ගණන් 20:11
7 නික් 16:3
8 ගණන් 11:21
9 ගණන් 11:10 1කොරි 10:5
10 ද්වි 32:22 හෙබ්‍රෙ 12:29
11 ගණන් 11:1
12 ගීතා 106:24 හෙබ්‍රෙ 3:10 යූද් 5
13 ද්වි 32:15
14 උත් 7:11 මලා 3:10
15 නික් 16:14 නික් 16:35 ගණන් 11:7 ද්වි 8:3 නෙහෙ 9:15 යොහ 6:31 1කොරි 10:3
16 නික් 16:31
17 ගීතා 103:20
18 නික් 16:12

2 තීරුව
1 ගණන් 11:31
2 ගීතා 135:7
3 ගණන් 11:19
4 නික් 16:13 ගණන් 11:32
5 නික් 40:29 නික් 40:34
6 ගණන් 11:31
7 ගණන් 11:20
8 ගීතා 106:15
9 ගණන් 11:33
10 ගණන් 11:10
11 ගණන් 11:34
12 ගණන් 14:4 ගණන් 25:3 1කොරි 10:8 1කොරි 10:9 1කොරි 10:10
13 නික් 16:15 ද්වි 8:15
14 ගණන් 14:29 ගණන් 14:35 ද්වි 2:14
15 ගණන් 21:7 විනි 4:3

ගීතා 78:25* හෝ, “දේවදූතයන්ගේ.”

දෙවි වෙතට හැරී ඔහුගේ මඟ
පෙන්වීම් පැතුවෝය.[1]
35 මහෝත්තම දෙවි ඔවුන්ගේ පර්ව-
තය බව ඔවුන්ට සිහි විය.[2]
ගැලවීම සලසා දෙන
තැනැත්තා ඔහු බව ඔවුන්ට
මතක් විය.[3]
36 නමුත් ඔවුහු තම වදන්වලින්
ඔහුව රැවටීමට උත්සාහ
කළෝය.[4]
ඔහුට බොරු කීවෝය.[5]
37 ඔවුහු මුළු හදවතින්ම ඔහුට විශ්-
වාසවන්තව සිටියේ නැත.[6]
ඔහු සමඟ කළ ගිවිසුම ඔවුහු
කඩ කළෝය.[7]
38 නමුත් ඔහු ඔවුන්ට දයාව පෙන්-
වූවේය.[8] ඔවුන්ගේ වරදට
සමාව දී[9] ඔවුන්ව විනාශ
නොකළේය.[10]
බොහෝ අවස්ථාවලදී ඔහු
ඔවුන්ට විරුද්ධව තම උද-
හස ප්‍රකාශ නොකළේය.[11]
ඔහු තමා තුළ ඇති වූ මහත්
උදහස මැඩපවත්වාගත්-
තේය.
39 මන්ද ඔවුන් දූවිලි බවද[12]
අවසන් හුස්ම හෙළූ පසු ඔවුන්ට
කිසිවක් කරකියාගත නො-
හැකි බවද ඔහු සිහි කළේය.[13]
40 නමුත් ඔවුන් පාළුකරයේදී කොප-
මණ වාර ගණනක් ඔහුට
විරුද්ධව කැරලිගැසුවාද![14]
කාන්තාරයේදී කොපමණ සැර-
යක් ඔහුගේ සිත රිදෙව්-
වාද![15]
41 ඔවුහු දිගින් දිගටම දෙවිගේ ඉවසීම
පරීක්ෂාවට ලක් කළෝය.[16]
ඊශ්‍රායෙල්හි ශුද්ධ තැනැත්තා-
ණන්ගේ සිතට වේදනා ඇති
කළෝය.[17]
42 ඔහු ඔවුන්ව සතුරාගෙන් ගලවා-
ගත් ආකාරය ඔවුන්ට සිහි
නොවීය.[18]
ඔවුන් වෙනුවෙන් ඔහු තම
බලය යොදාගෙන ක්‍රියා
කළ හැටි ඔවුහු අමතක
කළෝය.[1]
43 ඔහු ඊජිප්තු දේශයේ කළ බලවත්
ක්‍රියා[2]
එනම්, ෂෝවන් භූමියේ කළ
ආශ්චර්යයන් ඔවුන්ගේ මත-
කයෙන් මැකී ගියේය.[3]
44 ඔහු නයිල් ගඟේ සියලු අතු
ගංගා ලේ දහරා බවට පත්
කරමින්[4]
ඊජිප්තු වැසියන්ව පිපාසයෙන්
තැබුවේය.[5]
45 ලේ උරා බොන ගඩු මැස්-
සන්ව එවා ඔවුන්ට හිරිහැර
කළේය.[6]
මැඩි වසංගතයකින් ඔවුන්ව
නැති නාස්ති කළේය.[7]
46 කැරපොත්තන් එවා ඔවුන්ගේ
පලදාව විනාශ කළේය.
ඔවුන් වෙහෙස මහන්සියෙන්
සකසාගත් වගාබිම් පළහැටි-
යන්ට භාර කළේය.[8]
47 ඔහු හිම කැට වර්ෂාවක් එවා[9]
ඔවුන්ගේ මිදිවැල්ද
සිකමෝර් ගස්ද විනාශ කර දැමු-
වේය.[10]
48 එම හිම කැට වර්ෂාවෙන් ඔවුන්ගේ
සතුන්වද විනාශ කර දැමු-
වේය.[11]
ඔවුන්ගේ එළු බැටළු රැළ-
වල් වසංගතයකට ගොදුරු
කළේය.
49 ඔහු දැවෙන උදහසකින් ඔවුන්ට
පහර දුන්නේය.[12]
ඔහුගේ කෝපය ඔවුන් පිට වගු-
රුවමින් ඔවුන්ව ප්‍රතික්ෂේප
කළේය.[13]
දේවදූත සේනාවන් එවා ඔවුන්
පිටට විපත්ති ගෙනාවේය.[14]
50 ඔහු තම කෝපය ඔවුන් පිටට වත්
කිරීමට පියවර ගත්තේය.[15]
ඔවුන්ව වසංගතයකට ගොදුරු
කළේය.
ඔවුන්ව මරණයෙන් මුදා නො-
ගත්තේය.[16]

**78 ගීතාවලිය**
1 ද්වි 30:2
2 ද්වි 32:4
3 නික් 6:6 නික් 13:15
4 එස 33:31
5 හොෂෙ 7:13
6 නෙහෙ 9:26 ගීතා 95:10 හෙබ්‍රෙ 3:12
7 ද්වි 31:20 යෙරෙ 31:32
8 නික් 34:6 ගණන් 14:18 නෙහෙ 9:31
9 ගීතා 65:3 ගීතා 79:9
10 ගණන් 14:20 යෙරෙ 30:11 විලා 3:22
11 නෙහෙ 9:27 යෙසා 48:9 එස 20:9
12 ගීතා 103:14
13 දේශ 12:7
14 ගණන් 14:11 ගීතා 78:17
15 යෙසා 63:10 එෆී 4:30 හෙබ්‍රෙ 3:16
16 ගණන් 14:22 ද්වි 6:16 ගීතා 95:9
17 2රාජා 19:22
18 නික් 14:30

**2 තීරුව**
1 ද්වි 9:26 ගීතා 78:11
2 ද්වි 4:34 නෙහෙ 9:10 ගීතා 105:27
3 ගීතා 78:12
4 නික් 7:19
5 ගීතා 105:29
6 නික් 8:24 ගීතා 105:31
7 නික් 8:6 ගීතා 105:30
8 නික් 10:15 ගීතා 105:34 ආමො 7:1
9 නික් 9:23 ගීතා 105:32
10 ගීතා 105:33
11 නික් 9:25
12 විලා 4:11
13 ගීතා 11:6 යෙසා 42:25
14 2රාජා 6:17 මතෙ 26:53
15 ගණන් 25:4
16 නික් 9:6

51 අවසානයේදී ඔහු ඊජිප්තුවේ සියලු
කුලුඳුලන්ට පහර දුන්නේය.[1]
හාම් දේශයේ කූඩාරම්වල සිටි
කුලුඳුලන්ව විනාශ කළේය.[2]
52 ඔහු තම සෙනඟව බැටළු රැළක්
මෙන් පිටතට ගෙනාවේය.[3]
පාළුකරයේදී බැටළු රැළකට
මඟ පෙන්වන්නාක් මෙන්
ඔවුන්ට මඟ පෙන්වූවේය.[4]
53 ඔහු ඔවුන්ව සුරක්ෂිතව ගෙන
ගියේය. ඔවුන්ට කිසි භීති-
යක් නොදැනුණේය.[5]
මහ මුහුද ඔවුන්ගේ සතුරන්ව
ගිලගත්තේය.[6]
54 ඔහු ඔවුන්ව තම ශුද්ධ දේශයට[7]
එනම්, තම දකුණතින් අත්
කරගත් මේ කඳුකර දේශයට
ගෙනාවේය.[8]
55 ඔවුන්ගේ ඇස් පනාපිටම දේශයේ
විසූ ජනයාව ඔහු ක්‍රමක්‍රම-
යෙන් ඉවත් කළේය.[9]
ඔහු ඉඩම් මැන ඔවුන්ට උරුම-
යක් වශයෙන් ඒවා බෙදා
දුන්නේය.[10]
ඔහු සෑම ඊශ්‍රායෙල් ගෝත්‍රයක-
ටම ඉඩමක් බැගින් දුන්-
නේය.[11]
56 නමුත් ඔවුහු මහෝත්තම දෙවිගේ
ඉවසීම නැවතත් පරීක්ෂාවට
ලක් කරමින් ඔහුට විරුද්ධව
කැරලිගැසුවෝය.[12]
ඔහුගේ සිහිගැන්වීම්වලට කීකරු
නොවුණෝය.[13]
57 ඔවුහු නැවත නැවතත් දෙවිව
අත්හැර ඔවුන්ගේ මුතුන්-
මිත්තන් මෙන් ඔහුට ද්‍රෝහී
වුණෝය.[14]
ඔවුහු, ලණුව ලිහිල් වූ දුන්නක්
මෙන් කිසිම විශ්වාසයක්
තැබිය නොහැකි සෙනඟක්
බවට පත් වූවෝය.[15]
58 ඔවුහු පූජනීය ස්ථාන ගොඩ-
නඟා ඔහුව උදහසට පත්
කළෝය.[16]
නමස්කාරය සඳහා පිළිම සාදා
ඔහුව කුපිත කළෝය.[17]

78 ගීතාවලිය
1 නික් 12:29
නික් 13:15
ගීතා 105:36
ගීතා 135:8
ගීතා 136:10
2 ගීතා 106:22
3 ගීතා 77:20
ගීතා 105:37
ගීතා 136:11
4 ගීතා 136:16
5 නික් 14:20
හෙබ්‍රෙ 11:29
6 නික් 14:27
නික් 15:10
ගීතා 136:15
7 නික් 15:17
දානි 9:16
8 ගීතා 44:3
9 යොෂු 24:12
නෙහෙ 9:24
ගීතා 44:2
ගීතා 105:44
ගීතා 136:18
10 ද්වි 32:8
යොෂු 13:7
ගීතා 136:21
11 නෙහෙ 9:25
12 ද්වි 31:16
ද්වි 32:15
විනි 2:11
2සාමු 20:1
නෙහෙ 9:26
13 2රාජා 17:15
යෙරෙ 44:23
14 ද්වි 9:7
විනි 3:6
එස 20:27
15 හොෂෙ 7:16
16 ද්වි 12:2
විනි 2:2
1රාජා 14:23
එස 20:28
17 ද්වි 32:16
විනි 2:12
1සාමු 7:3
1රාජා 11:7
1රාජා 12:28
2රාජා 21:7

2 තීරුව
1 ගීතා 94:9
2 විනි 2:20
3 ගීතා 106:40
4 1සාමු 14:3
යෙරෙ 7:12
5 යොෂු 18:1
1සාමු 4:11
යෙරෙ 26:6
6 1සාමු 4:21
7 1සාමු 5:1
8 1සාමු 4:2
1සාමු 4:10
යෙරෙ 7:34
9 ගීතා 89:38
10 2ලේක 36:17
11 1සාමු 2:33
1සාමු 4:11
1සාමු 22:18

59 ඒවා දුටු දෙවි[1] උදහස් වී[2]
මුළු ඊශ්‍රායෙල් ජාතියම හෙළා-
දැක්කේය.[3]
60 අවසානයේදී ඔහු, මනුෂ්‍යයන්
අතරේ වාසය කරන පිණිස[4]
ෂීලෝහි පිහිටෙවූ ශුද්ධ කූඩාර-
මද අත්හැරියේය.[5]
61 තම ශක්තිය හා අලංකාරය
නියෝජනය කළ[6] ගිවිසුම්
පෙට්ටිය පැහැරගෙන යෑමට
ඔහු සතුරන්ට ඉඩහැරියේය.[7]
62 තම සෙනඟට කඩුවෙන් පහර
කෑමට ඉඩහැරියේය.[8]
තම උරුමය ලෙස සැලකූ සෙ-
නඟ සමඟ උදහස් වුණේය.[9]
63 තරුණයෝ ගින්නෙන් විනාශ වී
ගියෝය.
තරුණියන්ට තම විවාහ ගී
ඇසීමට නොලැබුණේය.[10]
64 පූජකයෝ පවා කඩුවෙන් පහර
කෑවෝය.[11]
නමුත් ඔවුන්ගේ වැන්දඹුවෝ
කඳුළු සැලුවේ නැත.[12]
65 යෙහෝවා දෙවි, නින්දකින් අවදි
වන්නාක් මෙන් පිබිදු-
ණේය.[13]
වයින්වලින් මත් වූ බලවන්ත-
යෙක් නැවත පියවි සිහියට
පැමිණෙන්නාක් මෙන් ඔහු
අවදි වුණේය.[14]
66 ඔහු තම සතුරන් පසුපස හඹා
ගොස් ඔවුන්ට පහර දුන්-
නේය.[15]
ඔවුන්ව සදහටම ලැජ්ජාවට
පත් කළේය.[16]
67 ඔහු යෝසෙප්ගෙන් පැවතෙන්-
නන්ව ප්‍රතික්ෂේප කළේය.[17]
එෆ්‍රායිම් ගෝත්‍රය තෝරා නො-
ගත්තේය.[18]
68 නමුත් ඔහු යූදා ගෝත්‍රය තෝරා-
ගත්තේය.[19]
තමා මහත් සේ ප්‍රිය කළ

---

12 1සාමු 4:19; යෝබ් 27:15; 13 ගීතා 44:23; 14 යෙසා 42:13; 15 1සාමු 5:6; 16 යෙරෙ 23:40; 17 ආමො 5:6; 18 ගීතා 78:9; 19 උත් 49:10.

සියොන් කන්ද තෝරාගත්-
තේය.[1]
69 ඔහු උස් ස්ථානයක තම ශුද්ධස්-
ථානය පිහිටෙව්වේය.[2]
සදහටම පවතින ලෙස තමා
සෑදූ පොළොව මෙන් එයද
ගොඩනැඟුවේය.[3]
70 ඔහු තම සේවක දාවිත්ව තෝරා-
ගත්තේය.[4]
බැටළු රැළ බලාගනිමින් සිටි
ඔහුව කැඳවාගත්තේය.[5]
71 යාකොබ්ව රැකබලා ගැනීමට[6]
එසේය, තම උරුමය වූ ඊශ්‍රා-
යෙල්ට උපකාර කිරීමට[7]
කිරි දෙන බැටළුදෙනුන් බලා-
ගත් ඔහුව කැඳවාගත්-
තේය.[8]
72 ඔහු අවංක හදවතින් ඔවුන්ව රැක-
බලා ගත්තේය.[9]
ප්‍රඥාවන්තව ඔවුන්ට මඟ පෙන්-
වූවේය.[10]

ආසාෆ් රචනා කළ ගීතයකි.

79 දෙවියනි, ජාතීහු ඔබේ උරු-
මය පැහැරගත්තෝය.[11]
ඔබේ ශුද්ධ මාලිගාව කෙ-
ලෙසා,[12]
යෙරුසලම නටබුන් ගොඩක්
කළෝය.[13]
2 ඔවුහු ඔබේ සේවකයන්ගේ මළ
කඳන් අහසේ කුරුල්ලන්-
ටද[14]
ඔබට පක්ෂපාතී අයගේ මාංස
වනසතුන්ටද බොජුනක්
ලෙස දුන්නෝය.[15]
3 වතුර වත් කරන්නාක් මෙන් ඔවුහු
යෙරුසලම පුරා ඔවුන්ගේ
ලේ වැගුරුවෝය.
ඔවුන්ව වළලා දැමීමට කිසි-
වෙක් නොසිටියේය.[16]
4 අපේ අසල්වාසීන් ඉදිරියේ අපි
නින්දාවට පත් වුණෙමු.[17]
අන් අය ඉදිරියේ අපි විහි-
ළුවටද සමච්චලයටද ලක්
වුණෙමු.[18]
5 යෙහෝවා දෙවියනි, ඔබ සදහටම
අප සමඟ උදහස්ව සිටින්-
නෙහිද?[1]
තව කොපමණ කාලයක් ඔබේ
කෝපය ගින්නක් සේ අපට
විරුද්ධව ඇවිළෙයිද?[2]
6 ඔබව හඳුනාගැනීමට අකමැති වූ
ජාතීන් කෙරෙහිද[3]
ඔබේ නාමය කියා කන්නලව්
නොකළ රාජ්‍යයන් කෙරෙ-
හිද ඔබේ උදහස වගුරු-
වන්න.[4]
7 ඔවුහු යාකොබ්ව ගිල දැමුවෝය.[5]
ඔහුගේ වාසස්ථානය පාළු කර
දැමුවෝය.[6]
8 දෙවියනි, අපේ මුතුන්මිත්තන්
කළ වැරදිවලට අපට දඬුවම්
නොකරන්න.[7]
විගස අපට දයාව පෙන්වන්න.[8]
මන්ද අපි හෙම්බත්ව සිටින්-
නෙමු.[9]
9 අපට ගැලවීම ලබා දෙන දෙවි-
යනි,[10]
ඔබේ නාමය ගෞරවයට පත්
වන පිණිස අපට උපකාර
කරන්න.[11]
ඔබේ නාමය වෙනුවෙන් අපව
ගලවාගන්න. අපේ පව්වලට
සමාව දෙන්න.[12]
10 "ඔවුන්ගේ දෙවියන් කොහේද"
කියා අසන්න ඔබ ජාතීන්ට
ඉඩ දෙන්නේ ඇයි?[13]
ඔබේ සේවකයන්ගේ ලේ වෙ-
නුවෙන් ඔබ යුක්තිය ඉටු
කරන බව[14]
අප ඉදිරිපිටම ජාතීන්ට දැනගැ-
නීමට සලස්වන්න.[15]
11 සිරකරුවාගේ කෙඳිරීම් හඬට
සවන් දෙන්න.[16]
මරණයට නියම වූ අයව ඔබේ
මහත් බලයෙන් ගලවා-
ගන්න.[17]

**78 ගීතාවලිය**
1 ගීතා 87:2
ගීතා 132:13
ගීතා 135:21
2 2ලේක 2:9
ගීතා 76:2
හෙබ්‍රෙ 12:22
3 ගීතා 104:5
ගීතා 119:90
දේශ 1:4
4 1සාමු 16:12
5 1සාමු 17:15
6 ගණන් 27:17
2සාමු 7:8
7 2සාමු 6:21
8 උත් 33:13
9 2සාමු 8:15
1රාජා 3:6
1රාජා 9:4
1රාජා 15:5
10 1සාමු 18:14

**79 ගීතාවලිය**
11 නික් 15:17
ගීතා 74:3
12 2රාජා 24:13
2ලේක 36:18
ගීතා 74:7
විලා 1:10
13 2රාජා 25:9
2ලේක 36:19
යෙරෙ 52:13
මීකා 3:12
14 යෙරෙ 7:33
යෙරෙ 15:3
15 යෙරෙ 34:20
16 ගීතා 141:7
යෙරෙ 14:16
යෙරෙ 16:4
17 ද්වි 28:37
එස 36:4
18 ගීතා 44:13
ගීතා 80:6

**2 තීරුව**
1 ගීතා 74:1
ගීතා 85:5
යෙසා 64:9
2 ගීතා 89:46
යෙසා 30:27
ශෙප 1:18
2තෙස 1:8
3 යෙරෙ 10:25
4 ගීතා 14:4
5 ගීතා 53:4
6 2ලේක 36:21
7 නික් 32:34
නෙහෙ 9:34
8 නික් 34:6
ගීතා 69:17
විලා 3:22
9 ද්වි 28:43
ගීතා 142:6
10 1ලේක 16:35
11 2ලේක 14:11
ගීතා 115:1

**12** යොෂු 7:9; 1සාමු 12:22; ගීතා 65:3; ගීතා 78:38; යෙසා 48:9; යෙරෙ 14:7; **13** ගීතා 42:3; ගීතා 115:2; යෝවෙ 2:17; **14** යෙරෙ 51:35; රෝම 12:19; එළි 18:20; **15** එස 36:23; **16** නික් 2:23; ගීතා 69:33; යෙසා 42:7; **17** ගීතා 102:20; යෙසා 33:2.

12 යෙහෝවා දෙවියනි, අපේ අසල්වාසීන් ඔබට කළ නින්දාව[1]
හත් ගුණයකින් වැඩි කර එය ඔවුන් පිටටම* ගෙනෙන්න.[2]
13 ඔබේ සෙනඟද ඔබේ තණබිමේ බැටළු රැළද වන අපි,[3]
සදාකාලයටම ඔබට ස්තුති කරන්නෙමු.
පරම්පරාවෙන් පරම්පරාවට ඔබට ප්‍රශංසා කරන්නෙමු.[4]

සංගීත අධ්‍යක්ෂක වෙතය.
මතකයට නඟමින් ලිලී මල් නම් වූ
රිද්මයට අනුව ගායනා කිරීම සඳහාය.[5]
ආසාෆ් රචනා කළ ගීතයකි.[6]

**80** ඊශ්‍රායෙල්හි එඬේරාණෙනි, බැටළු රැළකට මඟ පෙන්වන්නාක් මෙන් යෝසෙප්ට මඟ පෙන්වන තැනැත්තාණෙනි,[7] මේ දේට සවන් දෙන්න.[8]
කෙරුබ්වරුන් පිට හිඳගෙන සිටින තැනැත්තාණෙනි,[9] ඔබේ ආලෝකය විහිදුවන්න.[10]
2 එප්‍රායිම්, බෙන්ජමින් සහ මනස්සේ වෙනුවෙන් නැඟී සිට ඔබේ බලය පෙන්වන්න.[11]
අපට ගැලවීම ලබා දෙන්න.[12]
3 දෙවියනි, අපට ඔබේ අනුමැතිය නැවත ලබා දෙන්න.[13]
අපට කරුණාව පෙන්වා* අපව ගලවාගන්න.[14]
4 ස්වර්ගයේ සේනාවල අධිපතියාණන් වන යෙහෝවා දෙවියනි, ඔබේ සෙනඟ කරන යාච්ඤාවලට සවන් නොදී තව කොපමණ කාලයක් ඔබ ඔවුන් සමඟ උදහසින් සිටින්නෙහිද?[15]
5 කඳුළුවලින් ඔවුන්ගේ කුස පුරවාගැනීමට ඔබ සැලැස්වුවෙහිය.[16]
කඳුළු ගංගාවක් පානය කිරීමටද සැලැස්වුවෙහිය.[17]

6 අප සතු දේ කොල්ල කෑමට අපේ අසල්වැසියෝ, එකිනෙකා අතරේ දබර කරගන්නෝය.[1]
අපේ සතුරෝ කිසිදු භයක් නොමැතිව අපට සමච්චල් කරන්නෝය.[2]
7 ස්වර්ගයේ සේනාවල අධිපතියාණන් වන දෙවියනි, අපට ඔබේ අනුමැතිය නැවත ලබා දෙන්න.[3]
අපට කරුණාව පෙන්වා* අපව ගලවාගන්න.[4]
8 ඔබ මිදිවැලක් ඊජිප්තුවෙන් ගෙනාවෙහිය.[5]
එම මිදිවැල පැළ කිරීමට ඔබ අනිකුත් ජාතීන්ව පන්නා දැමුවෙහිය.[6]
9 අවට එළි පෙහෙළි කරමින් භූමිය සකස් කළෙහිය.[7] එය හොඳින් මුල් ඇද දේශය පුරා පැතිර යන පිණිස ඔබ එසේ කළෙහිය.[8]
10 ඔබ සතු දේවදාර ගස් පවා එම වැලෙන් වැසී ගියේය.[9]
එහි සෙවණැල්ල කඳුවලටද වැටුණේය.
11 එම වැල මුහුද දක්වාද[10]
එහි රිකිලි මහ ගංගාව* දක්වාද විහිදී ගියේය.[11]
12 එය වට කර තිබූ තාප්ප ඔබ බිඳ දැම්මේ මන්ද?[12]
එය පසු කර යන සියල්ලන්ට එහි පල කඩාගැනීමට ඔබ ඉඩහැරියේ මන්ද?[13]
13 වනාන්තරයෙන් ආ වල් ඌරා එය විනාශ කර දමන්නේය.[14]
එළිමහනේ ගැවසෙන සත්තුද එය කා දමන්නෝය.[15]

---

**ගීතා 79:12*** මූ.අ., “ඔවුන්ගේ ළයටම.”
**80:3*** මූ.අ., “ඔබේ මුහුණ බබළවා.”

**ගීතා 80:7*** ගීතා 80:3හි පාදසටහන බලන්න.
**11*** එනම්, යුප්‍රටීස් ගඟ.

**79 ගීතාවලිය**
**1** ගීතා 74:18; රෝම 15:3
**2** උත් 4:15; යෙසා 65:6; යෙරෙ 12:14; යෙරෙ 32:18; ලූක් 6:38
**3** ගීතා 74:1; ගීතා 95:7; ගීතා 100:3; එස 34:31
**4** ගීතා 45:17; ගීතා 145:4; යෙසා 43:21

**80 ගීතාවලිය**
**5** ගීතා 45:පෙර; ගීතා 60:පෙර
**6** ගීතා 74:පෙර
**7** ගීතා 77:20; යෙසා 40:11; යෙරෙ 31:10; එස 34:12; 1පේතෘ 2:25
**8** ගීතා 55:1
**9** නික් 25:20; 1සාමු 4:4; 2සාමු 6:2; 2රාජා 19:15; ගීතා 99:1
**10** ද්වි 33:2; ගීතා 50:2; ගීතා 94:1
**11** ගණන් 2:18; ගීතා 35:23; යෙසා 42:13
**12** යෙසා 25:9; යෙසා 33:22
**13** ගීතා 85:4; විලා 5:21
**14** ගණන් 6:25; ගීතා 4:6; ගීතා 67:1
**15** ගීතා 74:1; ගීතා 85:5; විලා 3:44
**16** ගීතා 42:3
**17** ගීතා 102:9; යෙසා 30:20

**2 තීරුව**
**1** ගීතා 44:13
**2** විනි 16:25; ගීතා 79:4
**3** ගීතා 80:3
**4** ගීතා 4:6
**5** යෙසා 5:7; යෙරෙ 2:21; එස 19:10
**6** ගීතා 44:2; ගීතා 78:55
**7** නික් 23:28; යොෂු 24:12; නෙහෙ 9:22; ගීතා 105:44
**8** 1රාජා 4:25
**9** ගීතා 104:16
**10** නික් 23:31; ගීතා 72:8
**11** උත් 15:18; 1රාජා 4:21
**12** ගීතා 89:40; යෙසා 5:5; **13** ගීතා 89:41; නාහු 2:2; **14** 2රාජා 18:9; 2ලේක 32:1; **15** 2රාජා 24:1; 2රාජා 25:1; යෙරෙ 39:1.

14 ස්වර්ගයේ සේනාවල අධිපතියා-
ණන් වන දෙවියනි, නැව-
තත් අප දෙස බලන්න.[1]
ස්වර්ගයේ සිට බලා මේ මිදිවැල
රැකගන්න.[2]
15 ඔබේ දකුණතින් සිටෙවූ මේ වැල*
හොඳින් රැකබලා ගන්න.[3]
ඔබට ගෞරවයක් ගෙනෙන
පිණිස ඔබ ශක්තිමත් කළ
මේ වැල ආරක්ෂා කරන්න.[4]
16 එය කපා දමන ලදි. ගින්නෙන්
දවා දමන ලදි.[5]
ඔබේ තරවටුව නිසා එය විනාශ
වී යන්නේය.[6]
17 ඔබේ දකුණු පැත්තේ සිටින
තැනැත්තාට ඔබේ උපකා-
රය* ලබා දෙන්න.[7]
ඔබට ගෞරවයක් ගෙනෙන
පිණිස ඔබ ශක්තිමත් කළ
පුත්‍රයාව ආරක්ෂා කරන්න.[8]
18 අපි ඔබ වෙතින් නැවත කිසිදාක
ඈත් නොවන්නෙමු.[9]
දෙවියනි, ඔබේ නාමයෙන් අයැ-
දින පිණිස අපේ ජීවිත රැක
දෙන්න.[10]
19 ස්වර්ගයේ සේනාවල අධිපතියා-
ණන් වන යෙහෝවා දෙවි-
යනි, අපට ඔබේ අනුමැතිය
නැවත ලබා දෙන්න.[11]
අපට කරුණාව පෙන්වා අපව
ගලවාගන්න.[12]

සංගීත අධ්‍යක්ෂක වෙතය.
ගිටිත් ඇතුව ගායනා කිරීම සඳහාය.[13]
ආසාෆ් රචනා කළ ගීතයකි.

81 ජනයෙනි, අපේ ශක්තිය වන
දෙවි ඉදිරියේ ප්‍රීති ඝෝෂා
නඟන්න.[14]
යාකොබ්ගේ දෙවිට ජය නාද
නඟන්න.[15]
2 රබානත්[16] තත් භාණ්ඩයත් මිහිරි
නාදයක් නික්මෙන වීණා-
වත්[17] අතට ගෙන
ප්‍රශංසා ගීයක් වයන්න.[18]
3 නව සඳ පායන දවසේදීද
අපේ උත්සවය පවත්වන පුර
සඳ පායන දවසේදීද[1] හො-
රණෑ පිඹින්න.[2]
4 එය ඊශ්‍රායෙල්ට පනවන ලද
නියෝගයකි.[3]
යාකොබ්ගේ දෙවි විසින් දෙන
ලද පනතකි.
5 දෙවි ඊජිප්තු දේශය මැදින්
ගිය බව[4]
සිහිගැන්වීම සඳහා ඔහු යෝ-
සෙප්ට එම පනත දුන්නේය.[5]
අප නොදන්නා භාෂාවකින්
කතා කරනවා අපට
ඇසිණ.[6]
6 “ඔවුන්ගේ උරහිස මත තිබූ බර
මම ඉවත් කළෙමි.[7]
බර කූඩ ඉසිලූ ඔවුන්ගේ දෑත්ව-
ලට නිදහස දුන්නෙමි.[8]
7 දුක් කරදරවලට මුහුණ දෙන විට
ඔබ මට හඬගැසුවෙහිය. මම
ඔබව බේරාගත්තෙමි.[9]
ගිගුරුම් හඬ මැදින් මම ඔබට
පිළිතුරු දුන්නෙමි.[10]
මෙරිබාහි දිය පහර අසලදී
ඔබව සෝදිසි කර බැලු-
වෙමි.[11] සීලාහ්.
8 මාගේ ජනයෙනි, ඔබට විරුද්ධව
මට පැවසීමට යමක් තිබේ.
ඊට ඇහුම්කන් දෙන්න.[12]
ඊශ්‍රායෙල්, ඔබ මාගේ වදන්ව-
ලට සවන් දෙනවා නම් එය
කොපමණ යහපත්ද![13]
9 එවිට ඔබ අතරේ වෙන දෙවි කෙ-
නෙක් නොසිටිනු ඇත.[14]
ඔබ වෙනත් දෙවි කෙනෙ-
කුට නමස්කාර නොකරනු
ඇත.[15]
10 යෙහෝවා වන මම ඔබේ දෙවිය.[16]
ඔබව ඊජිප්තු දේශයෙන් පිටතට
ගෙන ආවේ මමය.[17]
ඔබේ කට හැකි තරම් අරින්න.
මම කෑමවලින් එය පුරවන්-
නෙමි.[18]
11 නමුත් මාගේ සෙනඟ මට ඇහුම්-
කන් දුන්නේ නැත.[19]
ඊශ්‍රායෙල් මට කීකරු වීමට

**80 ගීතාවලිය**
1 යෙසා 63:17
මලා 3:7
2 යෙසා 63:15
3 යෙසා 5:2
යෙරෙ 2:21
මාක් 12:1
4 නික් 4:22
යෙසා 49:5
5 ගීතා 79:5
යෙරෙ 52:13
6 ගීතා 39:11
7 ගීතා 89:21
ගීතා 110:1
8 ආනි 7:13
9 හෙබ්‍රෙ 10:39
10 ක්‍රියා 15:17
11 ගීතා 80:7
12 ගීතා 89:15

**81 ගීතාවලිය**
13 ගීතා 8:පෙර
14 ගීතා 28:8
පිලි 4:13
15 ගීතා 33:3
මතෙ 22:32
16 ගීතා 149:3
17 ගීතා 92:3
එෆි 5:19
18 ගීතා 33:2

**2 තීරුව**
1 නික් 23:16
2 ගණන් 10:10
ගණන් 29:1
3 ලෙවී 23:24
4 නික් 12:12
5 නික් 12:14
6 ගීතා 114:1
7 නික් 6:6
යෙසා 9:4
යෙසා 10:27
8 නික් 1:14
නික් 5:4
9 නික් 2:23
නික් 14:10
ගීතා 50:15
ගීතා 91:15
10 නික් 19:16
නික් 19:19
හෙබ්‍රෙ 12:19
11 නික් 17:6
ද්වි 33:8
12 ද්වි 32:36
ගීතා 50:7
13 නික් 15:26
14 නික් 20:3
ද්වි 6:14
15 නික් 20:5
16 ද්වි 5:6
17 නික් 20:2
යෙරෙ 11:4
18 ද්වි 32:13
ගීතා 37:25
එළි 21:6
19 සෙක 7:11

---

ගීතා **80:15*** මූ.අ., “රිකිල්ල.” **17*** මූ.අ., “ඔබේ හස්තය ඔහු මත තබන්න.”

කිසි කැමැත්තක් දැක්වූයේ නැත.[1]
12 එබැවින් මුරණ්ඩු ලෙස දිගටම ක්‍රියා කිරීමට මම ඔවුන්ට ඉඩහැරියෙමි.[2]
ඔවුහු ඔවුන්ට රිසි පරිදි ජීවත් වුණෝය.[3]
13 මාගේ සෙනඟ මට ඇහුම්කන් දුන්නා නම්,[4]
ඊශ්‍රායෙල් මාගේ මාර්ගවල ගමන් කළා නම් කොතරම් යහපත්ද![5]
14 ඔවුන් එසේ කළා නම් මම ඔවුන්ගේ සතුරන්ව පහසුවෙන්ම ඔවුන්ට යටත් කර දෙන්නෙමි.[6]
ඔවුන්ගේ විරුද්ධවාදීන්ට එරෙහිව මම මාගේ අත ඔසවන්නෙමි.[7]
15 දැඩි ලෙස යෙහෝවා දෙවිට වෛර කරන අය බියෙන් වෙවුලමින් ඔහු වෙතට පැමිණෙනු ඇත.[8]
ඔවුහු සදහටම විනාශ වී යනු ඇත.
16 හොඳම ධාන්‍යයෙන් දෙවි ඊශ්‍රායෙල්ව පෝෂණය කරන්නේය.[9]
පර්වතයෙන් ගලා එන පැණිවලින් ඔහුව තෘප්තියට පමුණුවන්නේය."[10]

ආසාෆ් රචනා කළ ගීතයකි.

**82** දෙවි[11] තම සභාවේ සිටගෙන[12]
දෙවිවරුන් මැද විනිශ්චය කරන්නේය.[13]
2 "ඔබ තව කොපමණ කාලයක් අසාධාරණ ලෙස විනිශ්චය කරන්නහුද?[14]
දුෂ්ටයන්ගේ පැත්ත ගෙන කටයුතු කරන්නහුද?[15] සීලාහ්.
3 අසරණයා හා පියා නැති දරුවා වෙනුවෙන්ද[16]
පීඩිතයා හා දුප්පතා වෙනුවෙන්ද යුක්තිය ඉටු කරන්න.[17]
4 අසරණයාව හා දුප්පතාව බේරාගන්න.[1]
දුෂ්ටයන්ගේ අතින් ඔවුන්ව ගලවාගන්න."[2]
5 නමුත් ඔවුහු කිසිවක් නොදනිති. කිසිවක් තේරුම් නොගනිති.[3]
ඔවුහු අන්ධකාරයේ ඒ මේ අත ඇවිදිති.[4]
පොළොවේ අත්තිවාරම සොලවනු ලැබේ.[5]
6 "මම මෙසේ කීවෙමි. 'ඔබ දෙවිවරුය.[6]
ඔබ සියල්ලෝම මහෝත්තමයාණන්ගේ පුත්‍රයෝය.[7]
7 නමුත් සාමාන්‍ය මිනිසුන් මෙන් ඔබත් මිය යනු ඇත.[8]
අන් පාලකයන් මෙන් ඔබත් වැටී යනු ඇත.' "[9]
8 දෙවියනි, පොළොව විනිශ්චය කිරීමට නැඟී සිටින්න.[10]
මන්ද සියලු ජාතීන් අයිති ඔබටය.[11]

ආසාෆ් රචනා කළ ගීතයකි.[12]

**83** අනේ දෙවියනි, නිහඬව නොසිටින්න.[13]
බලවත් තැනැත්තාණෙනි, පිළිතුරු නොදී නොසිටින්න.[14]
2 මන්ද ඔබේ සතුරෝ ඔබට විරුද්ධව නැඟී සිටිති.[15]
දැඩි ලෙස ඔබට වෛර කරන අය හිස ඔසවති.[16]
3 ඔබේ සෙනඟට විරුද්ධව ඔවුහු කුමන්ත්‍රණ කරති.[17]
ඔබේ රැකවරණයේ සිටින අයට[18] විරුද්ධව කූට උපා යොදති.
4 ඔවුහු මෙසේ කීවෝය. "අපි ඒ ජාතිය නැත්තටම නැති කර දමමු.[19]
එවිට ඊශ්‍රායෙල් යන නාමය

**81 ගීතාවලිය**
**1** නික් 32:1 ද්වි 32:15
**2** යෙරෙ 11:8 යෙරෙ 18:12 ක්‍රියා 7:51 රෝම 1:24
**3** යෙරෙ 7:24 මීකා 6:16
**4** ද්වි 32:29 යෙසා 48:18
**5** ද්වි 5:29
**6** ගණන් 14:9
**7** ආමො 1:8
**8** ගීතා 18:45 ගීතා 66:3
**9** ද්වි 32:14 ගීතා 147:14 යෝවෙ 2:24
**10** ද්වි 32:13

**82 ගීතාවලිය**
**11** ගීතා 118:27
**12** නික් 18:21 2ලේක 19:6
**13** නික් 18:22 ගීතා 82:6 යොහ 10:35
**14** ලෙවී 19:15 දේශ 5:8 මීකා 3:2
**15** ද්වි 1:17 2ලේක 19:7 හිතෝ 18:5
**16** ද්වි 24:17 සෙක 7:10
**17** යෙරෙ 5:28 යෙරෙ 7:6 යෙරෙ 22:3

**2 තීරුව**
**1** යෝබ් 29:12 හිතෝ 24:11
**2** නෙහෙ 5:8
**3** ගීතා 53:4 මීකා 3:1
**4** හිතෝ 4:19 1යොහ 2:11
**5** ගීතා 11:3 ගීතා 75:3 හිතෝ 29:4
**6** යොහ 10:34 1කොරි 8:5
**7** යොහ 10:35
**8** යෝබ් 21:32 ගීතා 49:12 එස 31:14
**9** ගීතා 146:3
**10** ගීතා 76:9 ගීතා 96:13
**11** ගීතා 2:8 එළි 11:15

**83 ගීතාවලිය**
**12** 2ලේක 20:14 ගීතා 74:පෙර
**13** ගීතා 28:1 ගීතා 35:22 ගීතා 109:1
**14** ගීතා 50:1

**15** 2රාජා 19:28; ගීතා 2:1; ගීතා 74:4; ක්‍රියා 4:25; **16** විනි 8:28; යෙසා 37:23; **17** ගීතා 64:2; **18** ගීතා 27:5; **19** නික් 1:10; 2ලේක 20:1; එස්ත 3:6.

සියල්ලන්ගේ මතකයෙන් ගිලිහී යනු ඇත.”[1]
5 ඔවුහු තම සිතේ ඇති ආශාව ඉටු කරගැනීමට එක්ව සාකච්ඡා කළෝය.[2]
ඔබට විරුද්ධව ගිවිසුමක් ඇති කරගත්තෝය.[3]
6 ඔවුන් නම් ඒදොම්වරු,[4] ඉෂ්මායෙල්වරු,* මෝවබ්වරු[5] සහ හග්රියවරුය.[6]
7 ගෙබල්වරු, අම්මොන්වරු,[7] අමලෙක්වරු,
පිලිස්තිවරු[8] සහ තීර්හි වැසියෝද[9] ඔවුන් අතර සිටියෝය.
8 ඇසිරියානුවෝද ඔවුන්ට එක්ව සිටිති.[10]
ඔවුහු ලොත්ගේ පුත්‍රයන්ට[11] සහයෝගය දෙමින් ඔවුන්ට ශක්තියක් වුණෝය. සේලාහ්.
9 ඔබ මිදියන්වරුන්ව[12] පරාජය කළ ලෙස ඔවුන්වත් පරාජය කරන්න.
කීෂෝන් නිම්නයේදී[13] සිසෙරාටත්[14] යාබින්ටත්[15] කළ දේ ඔවුන්ටත් කරන්න.
10 ඔවුන්ව එන්-දෝර්හිදී සම්පූර්ණයෙන්ම විනාශ කරනු ලැබුවේය.[16]
ඔවුහු කුණු වී පසට පොහොර වී ගියෝය.[17]
11 ඔරෙබ්ට හා ශීබ්ට කළ දේම ඔවුන්ගේ අධිපතීන්ටත් කරන්න.[18]
සෙබාහ්ට සහ ශල්මුන්නාට කළ දේ ඔවුන්ගේ පාලකයන්ටත් කරන්න.[19]
12 ඔවුහුද, “අපි දෙවිගේ ශුද්ධ වාසස්ථානය අත් කරගනිමු” කියා කීවෝය.[20]
13 අනේ මාගේ දෙවියනි, ඔවුන්ව සුළඟට ගසාගෙන යන වියළි තණකොළ මෙන් වීමට සලස්වන්න.[21]
පිදුරු මෙන් ඔවුන්ව ගසාගෙන යෑමට සලස්වන්න.[1]
14 ලැව් ගින්නකින් වනාන්තරයක් දවා දමන්නාක් මෙන්ද[2]
විශාල ගින්නකින් කඳුකරයක් විනාශ කර දමන්නාක් මෙන්ද[3]
15 ඔවුන් පසුපස හඹා ගොස් ඔබේ කුණාටුවෙන් ඔවුන්ව විනාශ කර දමන්න.[4]
චණ්ඩ මාරුතයෙන් ඔවුන්ව කලඹන්න.[5]
16 යෙහෝවා දෙවියනි, ඔවුන්ගේ මුහුණු ලැජ්ජාවෙන් වැසී යෑමට සලස්වන්න.[6]
එවිට ජනයා ඔබේ නාමයෙන් මඟ පෙන්වීම් පතනු ඇත.[7]
17 ඔවුන්ව සදහටම අවමානයට ලක් කර වියවුලට පත් කරන්න.[8]
ඔවුන්ව ලැජ්ජාවට පත් කර විනාශ කර දමන්න.[9]
18 යෙහෝවා නම් වූ ඔබ පමණක්[10]
මුළු පොළොවටම[11] මහෝත්තම දෙවි බව[12] සියල්ලන්ට දැනගැනීමට සලස්වන්න.[13]

සංගීත අධ්‍යක්ෂක වෙතය.
ගිටිත් ඇතුව ගායනා කිරීම සඳහාය.[14]
කෝරාගේ පුත්‍රයන් රචනා කළ ගීතයකි.

**84** ස්වර්ගයේ සේනාවල අධිපතියාණන් වන යෙහෝවා දෙවියනි,[15]
ඔබේ තේජවත් ශුද්ධ කූඩාරම මොන තරම් අලංකාරද![16]
2 යෙහෝවා දෙවිගේ කූඩාරමේ මළුව වෙතට පැමිණීමට මම මහත් ආශාවකින් සිටින්නෙමි.[17]
මාගේ ගතත් සිතත් ජීවමාන දෙවිට ප්‍රීති ඝෝෂා නඟයි.[18]
3 මාගේ රජුද මාගේ දෙවිද වන ස්වර්ගයේ සේනාවල අධිපතියාණන් වන යෙහෝවා දෙවියනි,
ඔබේ ශ්‍රේෂ්ඨ පූජාසනය අසල

**ගීතා 83:6*** මූ.අ., “ඒදොම්වරුන්ගේ සහ ඉෂ්මායෙල්වරුන්ගේ කූඩාරම්.”

**83 ගීතාවලිය**
**1** යෙරෙ 11:19, යෙරෙ 31:36
**2** ගීතා 2:2, යෙසා 7:5
**3** 2සාමු 10:6, යෙසා 7:2
**4** 2ලේක 20:10
**5** 2ලේක 20:1
**6** 1ලේක 5:10
**7** උත් 19:38, යෙරෙ 49:2
**8** නික් 15:14, ගීතා 60:8
**9** ආමො 1:9
**10** 2රාජ 17:5
**11** උත් 19:37, ද්වි 2:9
**12** ගණන් 31:7, විනි 8:10, යෙසා 9:4, යෙසා 10:26
**13** විනි 4:7
**14** විනි 4:15
**15** විනි 4:2
**16** යොෂු 17:11
**17** 2රාජ 9:37, ශෙප 1:17
**18** විනි 7:25
**19** විනි 8:21
**20** 2ලේක 20:11
**21** යෙසා 17:13

**2 තීරුව**
**1** ගීතා 35:5, යෙසා 40:24, මතෙ 3:12
**2** යෙරෙ 46:23, මලා 4:1
**3** ද්වි 32:22, ගීතා 104:32, ගීතා 144:5, නාහු 1:6
**4** ගීතා 50:3, යෙසා 30:30
**5** ගීතා 11:6
**6** ගීතා 6:10, ගීතා 35:26
**7** ශෙප 2:3
**8** ගීතා 109:29
**9** ගීතා 35:26
**10** නික් 6:3, ගීතා 68:4, යෙසා 42:8, යෙසා 54:5
**11** ආනි 4:25, සෙක 4:14
**12** ගීතා 92:8, ආනි 4:17
**13** ගීතා 59:13, එස 5:13

**84 ගීතාවලිය**
**14** ගීතා 81:පෙර
**15** ගීතා 27:4
**16** ගීතා 43:3, ගීතා 46:4
**17** ගීතා 42:1, ගීතා 63:1
**18** ගීතා 9:1, 1තිමෝ 4:10

කිරිල්ලියට නිවහනක්ද
වැහිළිහිණියට ඇගේ පැටවුන් තැබීමට කැදැල්ලක්ද ඇත.
4 ඔබේ ගෘහයේ වාසය කරන්නෝ සන්තෝෂවත්ය.[1]
ඔවුහු සැමදා ඔබට ප්‍රශංසා කරන්නෝය.[2] සීලාහ්.
5 ඔබේ ශක්තිය මත රඳා සිටින්නෝ සන්තෝෂවත්ය.[3]
ඔබේ ගෘහයට යන මඟෙහි ගමන් කිරීමට මහත් ආශාවකින් බලා සිටින්නෝ සන්තෝෂවත්ය.[4]
6 බේකා පඳුරු[5] ඇති වියළි තැනිතලාව හරහා ඔවුන් ගමන් කළත්
එය දිය දහරා ගලා බසින මාවතක් සේ ඔවුහු සලකති.
ඔවුන් කරන ප්‍රශංසාවලින් ඔවුන්ගේ උපදේශකයා වටව සිටින්නේය.[6]
7 ඔවුහු දිගු ගමනක යෙදුණත් විඩාවට පත් නොවී තව තවත් ශක්තිමත් වෙති.[7]
මන්ද සියොන්හිදී ඔවුන්ට දෙවි ඉදිරියේ පෙනී සිටීමට හැකි බව ඔවුහු දනිති.[8]
8 ස්වර්ගයේ සේනාවල අධිපතියාණන් වන යෙහෝවා දෙවියනි, මාගේ යාච්ඤාව අසන්න.[9]
යාකොබ්ගේ දෙවියනි, මට සවන් දෙන්න.[10] සීලාහ්.
9 අපේ පලිහ වන දෙවියනි,[11]
ඔබේ අභිෂේක ලත් තැනැත්තා දෙස බලා ඔහුට ඔබේ කරුණාව පෙන්වන්න.[12]
10 වෙනත් තැනක දවස් දහසක් ගත කරනවාට වඩා ඔබේ කූඩාරමේ මළුවෙහි එක දවසක් ගත කිරීමට ලැබීම මට අගනේය.[13]
දුෂ්ටයන්ගේ කූඩාරම්වල ගැවසෙනවා වෙනුවට[14]
මාගේ දෙවිගේ ගෘහයේ දොර-

84 ගීතාවලිය
1 ගීතා 23:6; ගීතා 65:4
2 1ලේක 25:7; ගීතා 150:1
3 ගීතා 28:7
4 ගීතා 40:8; යෙරෙ 31:33
5 2සාමු 5:24
6 යෙසා 30:20
7 1සාමු 2:4; 2සාමු 22:40; ගීතා 18:32; යෙසා 40:29; හබ 3:19
8 ද්වි 16:16; යෙරෙ 31:6; සෙක 14:16
9 ගීතා 4:1
10 ගීතා 17:1
11 උත් 15:1
12 1සාමු 2:10
13 ගීතා 27:4; ගීතා 43:4; ලූක් 2:46
14 ගීතා 141:4

2 තීරුව
1 ගීතා 26:8
2 ගීතා 27:1; යෙසා 60:19
3 උත් 15:1; ද්වි 33:29; 2සාමු 22:3; ගීතා 3:3; ගීතා 84:9; ගීතා 115:9; ගීතා 119:114; ගීතා 144:2; හිතෝ 2:7
4 යෝබ් 1:1; ගීතා 34:9; ගීතා 37:18; යාකො 1:5
5 2කොරි 3:18
6 ගීතා 146:5; යෙරෙ 17:7

85 ගීතාවලිය
7 ලෙවී 26:42; ගීතා 77:7; යෝවෙ 2:18
8 එස්රා 2:1; ගීතා 14:7; ගීතා 53:6; යෙරෙ 30:18; යෙරෙ 31:23; එස 39:25; යෝවෙ 3:1
9 ගීතා 32:1; යෙරෙ 50:20; මීකා 7:18
10 ක්‍රියා 13:39; රෝම 4:7; කොලො 2:13
11 නික් 32:14
12 ද්වි 13:17; යෙසා 12:1

කඩ ළඟ සිටීමට මම තෝරාගත්තෙමි.[1]
11 මන්ද යෙහෝවා දෙවි සූර්යයා මෙනි.[2] ඔහු පලිහක් මෙනි.[3]
ඔහු නිර්දෝෂ අයට සැම යහපත් දෙයක්ම ලබා දෙන්නේය.[4]
යෙහෝවා දෙවි ඔවුන්ට තම අනුමැතිය ලබා දී ඔවුන්ව ගෞරවයට පත් කරන්නේය.[5]
12 ස්වර්ගයේ සේනාවල අධිපතියාණන් වන යෙහෝවා දෙවියනි, ඔබ කෙරෙහි විශ්වාසය තබන තැනැත්තා සන්තෝෂවත්ය.[6]

සංගීත අධ්‍යක්ෂක වෙතය.
කෝරාගේ පුත්‍රයන් රචනා කළ ගීතයකි.

85 යෙහෝවා දෙවියනි, ඔබේ දේශයට ඔබ කරුණාව පෙන්වුවෙහිය.[7]
වහලුන් ලෙස ගෙන ගිය යාකොබ්ගේ දරුවන්ව ඔබ නැවත දේශයට ගෙනාවෙහිය.[8]
2 ඔබේ සෙනඟ කළ වැරදිවලට ඔබ සමාව දුන්නෙහිය.[9]
ඔවුන්ගේ සියලු පාප ඔබ අමතක කර දැමුවෙහිය.[10] සීලාහ්.
3 ඔබේ උදහස සම්පූර්ණයෙන්ම ඔවුන් පිට වැගිරීමෙන් ඔබ වැළකුණෙහිය.[11]
ඔබේ ඇවෙන කෝපය ඔබ මැඩපවත්වා ගත්තෙහිය.[12]
4 අපට ගැලවීම සලසා දෙන දෙවියනි,[13] අපව නැවත ශක්තිමත් කරන්න.
අප කෙරෙහි වූ ඔබේ උදහස නිවා දමන්න.[14]
5 ඔබ සදහටම අප සමඟ උදහස්ව සිටින්නෙහිද?[15]

**13** ගීතා 27:1; ගීතා 80:3; **14** ගීතා 78:38; **15** ගීතා 74:1; ගීතා 79:5; ගීතා 80:4.

පරම්පරාවක් පරම්පරාවක්
පාසා ඔබේ කෝපය අපට
විරුද්ධව ඇවිළී තිබෙනු
ඇද්ද?[1]
6 ඔබ නිසා සතුටු වීමට[2]
ඔබේ සෙනඟ වන අපව ඔබ
ප්‍රාණවත් කරන්නේ නැද්ද?[3]
7 යෙහෝවා දෙවියනි, ඔබේ අතිම-
හත් ප්‍රේමය* අපට පෙන්-
වන්න.[4]
අපට ගැලවීම ලබා දෙන්න.[5]
8 සැබෑ දෙවි වූ යෙහෝවා පවසන
දේට මම ඇහුම්කන් දෙන්-
නෙමි.[6]
ඔහු තම සෙනඟටත් තමාට
පක්ෂපාතව සිටින අයටත්
සාමය ගැන පවසනු ඇත.[7]
නමුත් ඔවුන් තමන් කෙරෙහිම
විශ්වාසය නොතැබීමට වග-
බලා ගත යුතුය.[8]
9 ඔහු කෙරෙහි ගරුබියක් ඇති අයට
ඔහු ගැලවීම ලබා දෙනු
ඇත.[9]
එබැවින් අපේ දේශය ඔහුගේ
තේජසින් පිරී යනු ඇත.[10]
10 ප්‍රේමය* හා විශ්වාසවන්තකම
අත්වැල් බැඳගනු ඇත.[11]
ධර්මිෂ්ඨකම හා සමාදානය
වැලඳගනු ඇත.[12]
11 විශ්වාසවන්තකම භූමියෙන් දලු-
ලනු ඇත.[13]
ධර්මිෂ්ඨකම ස්වර්ගයේ සිට
බලා සිටිනු ඇත.[14]
12 යෙහෝවා දෙවි යහපත් දෙයින්
ආශීර්වාද කරනු ඇත.[15]
එබැවින් අපේ දේශයද එහි
නියම පලදාව ලබා දෙනු
ඇත.[16]
13 ධර්මිෂ්ඨකම ඔහු ඉදිරියෙන් ගමන්
කරන්නේය.[17]
ධර්මිෂ්ඨකමේ පිය සටහන් ඔහු-
ගේ ගමන් මඟෙහි දක්නට
ලැබෙන්නේය.[18]

**ගීතා 85:7*** හෝ, “ළැදි ප්‍රේමය.” **10*** හෝ, “ළැදි ප්‍රේමය.”

**85 ගීතාවලිය**
1 ගීතා 103:9
2 එස්රා 3:11
යෙරෙ 33:11
3 යෙසා 57:15
හබ 3:2
4 ගීතා 109:26
විලා 3:22
5 ගීතා 50:23
ගීතා 119:41
6 හබ 2:1
සෙක 9:10
හෙබ්‍රෙ 12:25
7 ගීතා 29:11
යෙසා 57:19
ක්‍රියා 10:36
8 ද්වි 8:17
ගීතා 78:7
හිතෝ 30:9
9 ගීතා 119:155
යෙසා 46:13
ක්‍රියා 10:2
10 සෙක 2:5
11 ගීතා 100:5
මීකා 7:20
12 ගීතා 72:3
යෙසා 32:17
13 ගීතා 57:10
14 යෙසා 26:9
යෙසා 45:8
15 ගීතා 84:11
යාකො 1:17
16 ලෙවී 26:4
ද්වි 28:8
ගීතා 67:6
යෙසා 25:6
යෙසා 30:23
17 ගීතා 89:14
යෙසා 58:8
18 ගීතා 119:35

**2 නිරූව**

**86 ගීතාවලිය**
1 හිතෝ 15:29
2 ගීතා 34:6
යෙසා 66:2
3 1සාමු 2:9
ගීතා 4:3
ගීතා 37:28
4 2ලේක 16:9
යෙසා 26:3
5 ගීතා 56:1
ගීතා 57:1
6 ගීතා 25:5
ගීතා 88:9
7 ගීතා 51:12
8 ගීතා 62:8
ගීතා 143:8
9 නෙහෙ 9:17
යෙසා 55:7
දානි 9:9
යෝවෙ 2:13
මීකා 7:18
10 ගීතා 25:8
ගීතා 145:9
ලූක් 18:19
11 ගීතා 130:7
රෝම 10:13
12 ගීතා 17:1
13 ගීතා 130:2

දාවිත්ගේ යාච්ඤාවකි.

**86** අනේ යෙහෝවා දෙවියනි,
මට සවන් දී මාගේ යාච්-
ඤාවට පිළිතුරු දෙන්න.[1]
බොහෝ පීඩාවන් නිසා මම
අන්ත අසරණ තත්වය-
කට පත්ව සිටිමි.[2]
2 මාව ආරක්ෂා කරන්න. මන්ද
මම ඔබට විශ්වාසවන්තව
සිටිමි.[3]
ඔබ මාගේ දෙවිය. ඔබ කෙරෙහි
විශ්වාසය තබා සිටින ඔබේ
සේවකයාව ගලවාගන්න.[4]
3 අනේ යෙහෝවා දෙවියනි, මට
කරුණාවෙන් සලකන්න.[5]
මන්ද දවස මුළුල්ලේම මා
මොරගසන්නේ ඔබටය.[6]
4 යෙහෝවා දෙවියනි, ඔබේ සේවක-
යාව සතුටට පත් කරන්න.[7]
මන්ද මාගේ මුළු ජීවිතයම මම
ඔබ වෙනුවෙන් දෙන්නෙමි.[8]
5 යෙහෝවා දෙවියනි, ඔබ සමාව
දීමට කැමති,[9] යහපත් දෙවි
කෙනෙක්ය.[10]
ඔබේ නාමයෙන් අයැදින සියල්-
ලන්ට ඔබ පෙන්වන ප්‍රේමය*
අතිමහත්ය.[11]
6 අනේ යෙහෝවා දෙවියනි, මාගේ
යාච්ඤාවට සවන් දෙන්න.[12]
මාගේ කන්නලව්වලට ඔබේ
සවන් යොමු කරන්න.[13]
7 විපතේදී මම ඔබට හඬගසන්-
නෙමි.[14]
ඔබ නිසැකවම මට පිළිතුරු
දෙන්නෙහිය.[15]
8 යෙහෝවා දෙවියනි, ඔබට සමාන
වෙන කිසි දෙවි කෙනෙක්
නැත.[16]
ඔබේ ක්‍රියාවන්ට සම කළ හැකි
වෙන කිසිවක්ද නැත.[17]

**14** ගීතා 18:6; ගීතා 50:15; **15** ගීතා 66:19; ගීතා 116:1; **16** නික් 15:11; ගීතා 89:6; ගීතා 96:5; යෙසා 40:25; යෙරෙ 10:6; දානි 3:29; 1කොරි 8:5; **17** ද්වි 3:24; ගීතා 33:4; ගීතා 104:24; ගීතා 111:7.

**ගීතා 86:5*** හෝ, “ළැදි ප්‍රේමය.”

9 යෙහෝවා දෙවියනි, ඔබ ජීවිතය
දුන් සියලු ජාතීහු ඇවිත්[1]
ඔබ ඉදිරියේ වැඳ වැටෙනු
ඇත.[2]
ඔවුහු ඔබේ නාමය ගෞරවයට
පත් කරනු ඇත.[3]
10 මන්ද ඔබ ශ්‍රේෂ්ඨය. ඔබේ ක්‍රියා
පුදුමාකාරය.[4]
ඔබ හැර වෙන දෙවි කෙනෙක්
නැත.[5]
11 යෙහෝවා දෙවියනි, ඔබේ මාර්ගය
ගැන මට උගන්වන්න.[6]
මම ඔබේ සත්‍ය මාර්ගයෙහි
ගමන් කරන්නෙමි.[7]
මාගේ මුළු සිතින්ම ඔබේ
නාමය කෙරෙහි ගරුබියක්
ඇතුව සිටීමට මට උපකාර
කරන්න.[8]
12 යෙහෝවා, මාගේ දෙවියනි, මාගේ
මුළු සිතින්ම මම ඔබට
ප්‍රශංසා කරන්නෙමි.[9]
සැමදා ඔබේ නාමය ගෞරවයට
පත් කරන්නෙමි.
13 ඔබ මට පෙන්වන ප්‍රේමය* මොන
තරම්ද![10]
ඔබ මාව මිනී වළෙන් ගලවා-
ගත්තෙහිය.[11]
14 දෙවියනි, උඩඟු අය මට විරුද්ධව
නැඟී සිටිති.[12]
කුරිරු පාලකයෝ එක්ව මාව
මරා දැමීමට සොයති.[13]
ඔවුහු කිසිවිටක ඔබව ගණන්
නොගනිති.[14]
15 නමුත් යෙහෝවා දෙවියනි, ඔබ
දයාන්විතය. කරුණාවන්-
තය.[15]
ඔබ කෝප වීමට ඉක්මන්
නොවන්නෙහිය.[16] සැමවිටම
විශ්වාසවන්තව ක්‍රියා කරන්-
නෙහිය. ඔබ පෙන්වන ප්‍රේ-
මය* අතිමහත්ය.[17]
16 දෙවියනි, මා දෙස බලා මට කරු-
ණාව පෙන්වන්න.[18]
ඔබේ සේවකයාට ඔබේ ශක්තිය
ලබා දෙන්න.[1]
ඔබේ දාසියගේ පුත්‍රයාව ගලවා-
ගන්න.[2]
17 ඔබ මා වෙනුවෙන් කරන යහපත්
දේ අන් අයට දැකීමට සලස්-
වන්න.
මට වෛර කරන්නෝ එය දැක
ලැජ්ජාවට පත් වනු ඇත.[3]
යෙහෝවා දෙවියනි, ඔබ මට
උපකාර කළෙහිය. ඔබ මාව
සැනසුවෙහිය.[4]

කෝරාගේ පුත්‍රයන් රචනා කළ ගීතයකි.

87 ඔහුගේ අත්තිවාරම ශුද්ධ
කඳුවල පිහිටා තිබේ.[5]
2 යෙහෝවා දෙවි යාකොබ්ගේ අන්
සියලු වාසස්ථානවලට වඩා[6]
සියොන් කන්දට* ප්‍රිය කරන්-
නේය.[7]
3 බොහෝදෙනෙක් සැබෑ දෙවිගේ
නුවර ගැන මහත් ගෞරව-
යෙන් කතා කරති.[8] සේලාහ්.
4 "මාව හඳුනන අය අතරෙහි
රාහබ්ද*[9] බැබිලෝනියද[10]
සිටින බව මම දන්වන්නෙමි.
පිලිස්තියාව,[11] තීර් හා කූෂ් දෙ-
සද බලන්න.
'මොවුන් සියල්ලන්ව සියොන්හි
උපන් අය ලෙස ගණන් ගනු
ඇත.' "[12]
5 සියොන් ගැන මෙසේ කියනු ලැබේ.
"ඒ සියලු ජාතීන්ට අයත් සෙ-
නඟ උපත ලැබුවේ මෙහි-
දීය."[13]
මහෝත්තම දෙවි[14] ඒ නුවර
කිසිදා නොවැටෙන සේ ශක්-
තිමත්ව පිහිටුවන්නේය.[15]
6 යෙහෝවා දෙවි ජනයාගේ නම්
ලේඛනගත කරන විට,[16]

**86 ගීතාවලිය**
1 ගීතා 22:31; යෙසා 2:2; යෙසා 43:7; එළි 15:4
2 සෙක 14:9; එළි 7:10
3 රෝම 15:9
4 නික් 15:11; ගීතා 72:18; ගීතා 77:14; දානි 6:27
5 ද්වි 6:4; ද්වි 32:39; ගීතා 83:18; යෙසා 37:16; යෙසා 44:6; මාක් 12:29; 1කොරි 8:4; එෆි 4:6
6 1රාජා 8:36; ගීතා 27:11; ගීතා 119:33; ගීතා 143:8; යෙසා 54:13
7 යොෂු 24:14; 1සාමු 12:24; ගීතා 43:3; යෙසා 38:3; මලා 2:6; යොහ 8:32; 2යොහ 4
8 දේශ 12:13; යෙරෙ 32:39
9 මතෙ 22:37
10 ලූක් 1:58
11 යෝබ් 33:28; ගීතා 56:13; ගීතා 116:8
12 2සාමු 15:12; ගීතා 54:3
13 2සාමු 16:20; මතෙ 26:4
14 ගීතා 10:4; එස 8:12
15 නික් 34:6; ගණන් 14:18; යෝවෙ 2:13; යෝනා 4:2
16 නෙහෙ 9:17; ගීතා 103:8; නාහු 1:3
17 ගීතා 31:5; ගීතා 130:7; ගීතා 145:8; යෝවෙ 2:13
18 ගීතා 25:16; ගීතා 69:16

**2 තීරුව**
1 ගීතා 28:7
2 ගීතා 116:16
3 ගීතා 71:13; යෙසා 41:11
4 ගීතා 40:1; ගීතා 71:21

**87 ගීතාවලිය**
5 ගීතා 48:1
6 ගණන් 24:5
7 ගීතා 78:68; ගීතා 132:13

8 ගීතා 48:2; යෙසා 60:14; 9 ගීතා 89:10; යෙසා 30:7; යෙසා 51:9; 10 යෙසා 13:1; 11 ගීතා 83:7; 12 2සාමු 12:24; ගලා 4:31; 13 යෙසා 54:1; යෙසා 54:13; 14 ගීතා 83:18; 15 රෝම 8:31; 16 ගීතා 22:30; ලූක් 10:20.

**ගීතා 86:13*** හෝ, "ලැදි ප්‍රේමය." **15*** හෝ, "ලැදි ප්‍රේමය."

**ගීතා 87:2*** මූ.අ., "දොරටුවලට." **4*** මෙය බොහෝදුරට යොමු දක්වන්නේ ඊජිප්තුවට විය හැකියි.

"මොවුන් ඉපදුණේ මෙහිය"
කියා ඒ ජාතීන් ගැන ප්‍රකාශ
කරන්නේය.[1] සේලාහ්.
7 ගායකයෝද නැට්ටුවෝද ඒ නුව-
රේ වසන්නෝය.[2]
ඒ නුවර ගැන මෙසේ කියනු
ලැබේ. "මා වෙනට ආශීර්වාද
ගලා එන උල්පත් සියල්ලම
ඔබ සතුය."[3]

කෝරාගේ පුත්‍රයන් රචනා කළ ගීතයකි.
මහලත් සංගීත අධ්‍යක්ෂකගෙන් පිළිතුරක්
ලබාගැනීම සඳහාය. සේරාගෙන් පැවතෙන්-
නෙකු වූ හේමාන්[4] විසින් රචනා
කරනු ලැබූ මස්කිල්.

**88** මට ගැලවීම සලසා දෙන යෙ-
හෝවා දෙවියනි,[5]
දිවා රෑ දෙකෙහිම[6]
මම ඔබ ඉදිරියේ හඬා වැලපු-
ණෙමි.[7]
2 මම ඔබට යාච්ඤා කරන්නෙමි.[8]
මාගේ කන්නලව්වට ඔබේ
සවන් යොමු කරන්න.[9]
3 මන්ද ජීවිතය එපා වන තරමටම
මම දුක් කරදර අද්දැක්-
කෙමි.[10]
මාගේ ජීවිතය මිනී වළ අද්දර-
ටම පැමිණ තිබේ.[11]
4 මරණය අබියස සිටින්නෙකු ලෙස
මාව ගණන් ගෙන තිබේ.[12]
මම කිසිම සවිශක්තියක් නැති
අයෙකු මෙන් සිටිමි.[13]
5 මිය ගිය කෙනෙකු මෙන් මමද
නිදහස ලැබුවෙමි.[14]
මා සොහොන් ගෙයක තැන්පත්
කළ අයෙකු මෙනි.[15]
ඔබ මාව අමතක කර දැමුවෙහිය.
ඔබේ උපකාරය ලබන්නන්
අතරින් මාව ඉවත් කළෙ-
හිය.[16]
6 ඔබ මාව ගැඹුරු වළකට දැමු-
වෙහිය.
ඝන අන්ධකාරයෙන් වැසී ගිය
අගාධයකට හෙළුවෙහිය.[17]
7 ඔබේ උදහස මා පිට වගුරුවා,[18]
ඔබේ කෝපය නමැති සැඩ පහ-
රින් මාව ගසාගෙන යෑමට
සැලැස්වුවෙහිය.[1] සේලාහ්.
8 මාගේ මිතුරන්ව ඔබ මාගෙන් ඈත්
කළෙහිය.[2]
ඔවුන්ට මාව පිළිකුලක් වීමට
සැලැස්වුවෙහිය.[3]
කිසි තැනකට යෑමට නොහැකි
වන තරමට මම සිර වී
සිටිමි.[4]
9 මා අද්දකින පීඩා නිසා මාගේ දෙ-
නෙත් දුර්වල වී ඇත.[5]
යෙහෝවා දෙවියනි, දවස
මුළුල්ලේම මම ඔබට හඬගැ-
සුවෙමි.[6]
යාච්ඤා කරමින් ඔබ වෙනට
මාගේ දෑත් දිගු කළෙමි.[7]
10 මරණ නින්දේ සැතපී සිටින්නන්
ඉදිරියේ ඔබ පුදුමසහගත දේ
කරන්නෙහිද?[8]
මිය ගිය අය නැඟිට[9]
ඔබට ප්‍රශංසා කරයිද?[10] සේලාහ්.
11 ඔබ පෙන්වූ ප්‍රේමය* ගැන මිනී
වළේදී වර්ණනා කරයිද?
සියල්ල දිරාපත් වන ස්ථාන-
යේදී ඔබේ විශ්වාසවන්ත-
කම ගැන කතා කරයිද?[11]
12 ඝන අන්ධකාරයේ සිටින අයට,
ඔබේ පුදුමාකාර ක්‍රියාවන්
ගැන දැනගැනීමට ලැබෙ-
යිද?[12]
මතකයෙන් ගිලිහී ගිය අය
සිටින ස්ථානයට ඔබේ ධර්-
මිෂ්ඨකම ගැන ආරංචි වෙ-
යිද?[13]
13 යෙහෝවා දෙවියනි, උපකාරය
පතා මම දිගින් දිගටම ඔබට
හඬගැසුවෙමි.[14]
සෑම උදෑසනකම මාගේ යාච්-
ඤාව ඔබට ඇසෙන්නෙ-
හිය.[15]
14 එහෙත් යෙහෝවා දෙවියනි,
ඔබ මාව අත්හැර දැමුවේ
මන්ද?[16]

**87 ගීතාවලිය**
1 ගීතා 87:4, ගලා 4:29
2 1ලේක 15:16, ගීතා 68:25, ගීතා 150:4
3 ගීතා 46:4

**88 ගීතාවලිය**
4 1රාජා 4:31, 1ලේක 2:6
5 උත් 49:18, ගීතා 27:9, ගීතා 51:14, ගීතා 68:19, යෙසා 12:2, ලූක් 1:47
6 ගීතා 22:2
7 ගීතා 86:3
8 1රාජා 8:30, ගීතා 79:11
9 ගීතා 141:1
10 ගීතා 71:20
11 ගීතා 107:18, යෙසා 38:10
12 යෝබ් 33:22, ගීතා 143:7
13 ගීතා 31:12
14 යෙසා 14:9
15 එස 32:18
16 ගීතා 10:11
17 ගීතා 143:3
18 ගීතා 90:7, ගීතා 102:10

**2 තීරුව**
1 ගීතා 42:7
2 යෝබ් 19:13, යෝබ් 19:19, ගීතා 31:11, ගීතා 142:4, ලූක් 23:49
3 මතෙ 27:22, යොහ 15:23
4 විලා 3:7
5 යෝබ් 17:7, ගීතා 38:10, ගීතා 42:3, විලා 3:49
6 ගීතා 55:17, ගීතා 86:3
7 1රාජා 8:54, 2ලේක 6:13, ගීතා 143:6
8 ගීතා 6:5
9 යෝබ් 14:14
10 ගීතා 30:9, ගීතා 115:17, යෙසා 38:18
11 යෝබ් 26:6, දේශ 3:20
12 යෝබ් 10:21, ගීතා 143:3
13 ගීතා 31:12, දේශ 2:16, දේශ 8:10, දේශ 9:5
14 ගීතා 5:3, ගීතා 46:1
15 ගීතා 55:17, ගීතා 119:147

**16** ගීතා 43:2.

ගීතා **88:11*** හෝ, "ළැදි ප්‍රේමය."

ඔබේ මුහුණ මා වෙතින් ඉවතට
හරවාගත්තේ මන්ද?[1]
15 තරුණ වයසේ පටන් මම බොහෝ
පීඩාවන් අද්දැක්කෙමි. දැන්
මම මරණයේ අබියසටම
පැමිණ සිටිමි.[2]
ඔබ ගෙන ආ භයානක දේවල්
රැසකට මම මුහුණ දුන්-
නෙමි.[3]
16 ඔබේ උදහසේ ගිනිදලු මා අස-
ලින්ම ගියේය.[4]
ඔබ ගෙන ආ භයානක දේවලින්
මම විනාශ වී ගියෙමි.[5]
17 ඒවා මහා ජල කඳක් මෙන් මා වට
කරගෙන සිටියේය.[6]
ඒ සියල්ල එකවරම මා වෙතට
ගසාගෙන ආවේය.
18 මාගේ හිතමිතුරන්ගෙන්ද අසල්-
වැසියන්ගෙන්ද ඔබ මාව
ඈත් කළෙහිය.[7]
දැන් මාගේ එකම මිතුරා ඝන
අන්ධකාරයය.[8]

සේරාගෙන් පැවතෙන්නෙකු වූ
ඒතන්[9] රචනා කළ මස්කිල්.

# 89

යෙහෝවා දෙවි පෙන්වූ ප්‍රේ-
මය* ගැන මම සැමදා ගී
ගයන්නෙමි.[10]
පරම්පරාවක් පරම්පරාවක්
පාසා මම ඔහුගේ විශ්වාස-
වන්තකම ගැන ප්‍රකාශ
කරන්නෙමි.[11]
2 "ඔබේ අතිමහත් ප්‍රේමය* සදහටම
පවතින්නේය.[12]
ඔබේ විශ්වාසවන්තකම ස්වර්-
ගයේ ස්ථිර ලෙස පිහි-
ටුවා තිබෙන්නේය" කියා මම
කීවෙමි.[13]
3 දෙවි මෙසේ කීවේය. "මා තෝරා-
ගත් තැනැත්තා සමඟ මම
ගිවිසුමක් ඇති කරගත්-
නෙමි.[14]
මාගේ සේවක දාවිත්ට මම
මෙසේ පොරොන්දු වුණෙමි.[15]
4 'මම ඔබේ පෙළපත කිසිදා නැති
නොවන ලෙස ස්ථිරව පිහිටු-
වන්නෙමි.[1]
ඔබේ සිංහාසනය පරම්පරාවෙන්
පරම්පරාවට පවතින ලෙස
සුරකින්නෙමි.' "[2] සේලාහ්.
5 යෙහෝවා දෙවියනි, ඔබේ පුදුමා-
කාර ක්‍රියාවන් ගැන ස්වර්ගය
පවා ඔබට ප්‍රශංසා කරන්-
නේය.[3]
එසේය, රැස්ව සිටින ශුද්ධ
තැනැත්තෝ පවා ඔබේ විශ්-
වාසවන්තකම ගැන ඔබට
ප්‍රශංසා කරන්නෝය.
6 යෙහෝවා දෙවිට සමාන තවත්
කෙනෙක් ස්වර්ගයේ සිටීද?[4]
දෙවිගේ පුත්‍රයන්* අතරේ යෙ-
හෝවා දෙවිට සමාන කිසි-
වෙක් සිටීද?[5]
7 ශුද්ධ තැනැත්තන්ට දෙවි කෙරෙහි
ගරුබියක් තිබිය යුතුය.[6]
ඔහු වටා සිටින සියල්ලන්ට
වඩා ඔහු අතිශ්‍රේෂ්ඨය.[7] ගරු-
බියක් උපදවන තැනැත්තාද
ඔහුය.
8 ස්වර්ගයේ සේනාවල අධිපතියා-
ණන් වන යෙහෝවා දෙවි-
යනි,[8]
ඔබ මෙන් ශක්තිමත් කෙනෙක්
තවත් සිටීද?[9]
යෙහෝවා දෙවියනි, ඔබ සැමවි-
ටම විශ්වාසවන්තය.[10]
9 ඔබ මුහුදේ සැඩ පහර පාලනය
කරන්නෙහිය.[11]
රළ නඟින විට ඔබ ඒවා සන්-
සුන් කරන්නෙහිය.[12]
10 ඔබ රාහබ්ව පරාජය කළෙහිය.[13]
ඇය දැන් මැරුම් කෑ කෙ-
නෙකු මෙනි.[14]
ඔබේ ශක්තිමත් හස්තයෙන්
ඔබ සතුරන්ව විසුරුවාහැරි-
යෙහිය.[15]

**88 ගීතාවලිය**
1 යෝබ් 13:24, ගීතා 13:1
2 යෝබ් 17:1
3 යෝබ් 6:4
4 ගීතා 102:10
5 යෙසා 53:8
6 ගීතා 22:16, ගීතා 69:2
7 යෝබ් 19:13, ගීතා 31:11, ගීතා 38:11, ගීතා 88:8
8 ගීතා 142:4

**89 ගීතාවලිය**
9 1රාජා 4:31, 1ලේක 2:6
10 ගීතා 86:12, ගීතා 106:1
11 ගීතා 119:90
12 1ලේක 16:41, නෙහෙ 1:5, යෙසා 54:10
13 ගීතා 119:89, හෙබ්‍රෙ 6:18
14 2සාමු 7:8, 1රාජා 8:16, යෙසා 42:1, ලූක් 1:32
15 ගීතා 132:11, යෙරෙ 30:9, එස 34:23, හොෂෙ 3:5, යොහ 7:42, ක්‍රියා 2:30

**2 තීරුව**
1 2සාමු 7:12, 1ලේක 17:11, එළි 22:16
2 2සාමු 7:13, ලූක් 1:33, හෙබ්‍රෙ 1:8
3 ගීතා 19:1, ගීතා 50:6, ගීතා 97:6
4 නික් 15:11, ගීතා 40:5, ගීතා 71:19, ගීතා 86:8, ගීතා 113:5
5 යෝබ් 38:7, ගීතා 29:1
6 ගීතා 76:7, යෙසා 6:2
7 එස 1:23, දානි 7:10
8 1සාමු 2:2, ගීතා 84:12
9 ගීතා 24:8, යෙසා 40:26, යෙරෙ 32:17
10 ද්වි 32:4
11 යෝබ් 38:8, ගීතා 107:29, යෙරෙ 31:35, නාහු 1:4
12 ගීතා 65:7, ගීතා 107:29
13 නික් 14:26; ගීතා 87:4; යෙසා 30:7; යෙසා 51:9; 14 නික් 15:4; 15 නික් 3:20; ද්වි 4:34; ලූක් 1:51.

**ගීතා 89:1*** හෝ, "ලැදි ප්‍රේමය." **2*** හෝ, "ලැදි ප්‍රේමය."

**ගීතා 89:6*** හෝ, "දේවදූතයන්."

11 අහසෙත්[1] පොළොවෙත් අයිතිය
ඔබටය.[2]
භූමියත් එහි ඇති සියල්ලත්
ඔබගේය.[3] මන්ද ඒ සියල්ලේ
සැදුම්කරු ඔබය.[4]
12 උතුරෙත් දකුණෙත් ඇති දේවල්
නිර්මාණය කළේ ඔබය.[5]
තාබෝර්[6] සහ හෙර්මොන්[7]
ඔබේ නාමයට ප්‍රශංසා කර-
මින් ප්‍රීති ඝෝෂා නඟන්-
නෝය.[8]
13 ඔබේ හස්තය බලවත්ය.[9]
ඔබේ දෑත් ශක්තිමත්ය.[10]
ඔබේ දකුණත ශ්‍රේෂ්ඨය.[11]
14 ඔබේ සිංහාසනය පිහිටුවා ඇත්-
තේ ධර්මිෂ්ඨකම හා යුක්-
තිය මතය.[12]
ප්‍රේමය* හා විශ්වාසවන්තකම
ඔබ ඉදිරියෙන් ගමන් කරන්-
නේය.[13]
15 ප්‍රීති ඝෝෂාවන්ට හවුල් වන්නෝ
සන්තෝෂවත්ය.[14]
යෙහෝවා දෙවියනි, ඔබේ
මුහුණෙන් විහිදෙන ආලෝ-
කයෙන් ඔවුහු ගමන් කරන්-
නෝය.[15]
16 ඔබේ නාමය නිසා ඔවුහු දවස
මුළුල්ලේම ප්‍රීතියෙන් සිටින්-
නෝය.[16]
ඔබේ ධර්මිෂ්ඨකම නිසා ඔබ
ඔවුන්ව උසස් කරනු ලබන්-
නෙහිය.[17]
17 ඔවුන්ගේ ශක්තිය තව තවත් ඔප්-
නංවන්නේ ඔබය.[18]
ඔබේ කරුණාව නිසා අපේ සවිය
තව තවත් වැඩි වන්නේය.[19]
18 අපේ පලිහ යෙහෝවා දෙවි-
ගෙන්ය.[20]
අපේ රජු ඊශ්‍රායෙල්හි ශුද්ධ
තැනැත්තාගෙන්ය.[21]
19 යම් කලකට ඉහතදී දර්ශනයක්
මාර්ගයෙන් ඔබට පක්ෂපාත
අයට ඔබ මෙසේ කීවෙහිය.[22]
“බලවන්තයෙකු මාර්ගයෙන් මම
උපකාර කරමි.[1]
ජනයා අතරින් තෝරාගත් කෙ-
නෙකුව උසස් කළෙමි.[2]
20 මාගේ සේවක දාවිත්ව මම
තෝරාගත්තෙමි.[3]
මාගේ ශුද්ධ තෛලයෙන් මම
ඔහුව අභිෂේක කළෙමි.[4]
21 මාගේ හස්තය සැමවිටම ඔහු
සමඟ වන්නේය.[5]
මම ඔහුව ශක්තිමත් කරන්-
නෙමි.[6]
22 කිසිම සතුරෙක් ඔහුට පීඩා කරනු
නොලබන්නේය.[7]
කිසිම දුෂ්ටයෙක් ඔහුට හිරිහැර
නොකරන්නේය.[8]
23 මම ඔහුගේ සතුරන්ව සුනුවිසුනු
කර දැමුවෙමි.[9]
ඔහුට ඇඩි ලෙස වෛර කරන්-
නන්ට දිගටම පහර දුන්-
නෙමි.[10]
24 මම ඔහුට ප්‍රේමය* පෙන්වමින් ඔහු
සමඟ විශ්වාසවන්තව කට-
යුතු කරමි.[11]
මාගේ නාමය නිසා ඔහුගේ
සවිය වැඩි වන්නේය.[12]
25 මම ඔහුගේ අත මුහුද මත තැබු-
වෙමි.[13]
ගංගා මත ඔහුගේ දකුණත
තැබුවෙමි.[14]
26 ‘ඔබ මාගේ පියාය,[15]
මාගේ දෙවිය,[16] මට ගැලවීම
සලසා දෙන පර්වතය’ කියා
ඔහු මට කියන්නේය.[17]
27 මම ඔහුට කුලුඳුල්කම දෙන්-
නෙමි.[18]
මම ඔහුව පොළොවේ රජව-
රුන් අතරින් ශ්‍රේෂ්ඨතම රජ
කරන්නෙමි.[19]

---

**11** 2සාමු 7:15; 1ලේක 17:13; ගීතා 61:7; ක්‍රියා 13:34; **12** 1සාමු 2:1; යොහ 17:6; **13** ගීතා 72:8; **14** 1රාජා 4:21; ගීතා 80:11; **15** 1ලේක 22:10; මතෙ 26:39; **16** යොහ 20:17; **17** 2සාමු 22:47; ගීතා 18:2; ලූක් 23:46; **18** 1සාමු 10:1; ගීතා 2:7; කොලො 1:18; හෙබ්‍රෙ 1:5; **19** ගණන් 24:7; 1තිමෝ 6:15; එළි 1:5; එළි 19:16.

---

**ගීතා 89:14*** හෝ, “ළැදි ප්‍රේමය.”

**ගීතා 89:24*** හෝ, “ළැදි ප්‍රේමය.”

---

**89 ගීතාවලිය**
**1** 1ලේක 29:11
**2** 1කොරි 10:26
**3** ගීතා 24:1
ගීතා 50:12
**4** උත් 1:1
**5** යෝබ් 26:7
**6** යොෂු 19:22
විනි 4:6
**7** ද්වි 3:8
යොෂු 12:1
**8** ගීතා 65:12
**9** නික් 6:6
ද්වි 4:34
**10** නික් 13:3
ද්වි 6:21
1පේතෘ 5:6
**11** ගීතා 44:3
**12** ද්වි 32:4
ගීතා 5:4
ගීතා 71:19
ගීතා 97:2
ගීතා 145:17
හිතෝ 16:12
එළි 15:3
**13** නික් 34:6
නෙහෙ 9:17
යෙරෙ 9:24
**14** ගණන් 10:10
ගණන් 23:21
ගීතා 98:6
**15** යෙසා 2:5
**16** ගීතා 33:21
ගීතා 44:8
**17** ගීතා 71:15
**18** ගීතා 28:7
**19** 1සාමු 2:10
ගීතා 75:10
ගීතා 92:10
ගීතා 132:17
**20** ගීතා 47:9
**21** 2රාජා 19:22
ගීතා 2:6
**22** ගණන් 12:6
2සාමු 7:4

**2 තීරුව**
**1** 1සාමු 18:14
යෙසා 9:6
**2** 2සාමු 7:8
1රාජා 11:34
හෙබ්‍රෙ 2:17
**3** 1ලේක 17:7
ක්‍රියා 13:22
**4** 1සාමු 16:13
යෙසා 61:1
ක්‍රියා 10:38
**5** 2සාමු 7:9
ගීතා 80:17
යෙසා 42:1
**6** ගීතා 18:32
**7** 2සාමු 7:13
1ලේක 17:9
මතෙ 4:11
**8** 2සාමු 17:10
**9** 2සාමු 3:1
2සාමු 7:9
2සාමු 22:41
**10** ගීතා 21:8
ගීතා 110:1
ලූක් 19:27
යොහ 15:24

28 මම සදහටම ඔහුට ප්‍රේමය* පෙන්වන්නෙමි.[1]
ඔහු සමඟ මා කළ ගිවිසුම කිසිදා කඩ නොවන්නේය.[2]
29 මම ඔහුගේ පෙළපත කිසිදා නැති නොවන ලෙස ස්ථිරව පිහිටුවන්නෙමි.[3]
අහස පවතින තාක් කල් ඔහුගේ සිංහාසනය පවතින්නේය.[4]
30 නමුත් ඔහුගේ පුත්‍රයෝ මාගේ නීතිය කඩ කරමින්[5]
මාගේ අණපනත්වලට එකඟව ක්‍රියා නොකරන්නේ නම්,[6]
31 මාගේ නියෝග කඩ කරමින්
මාගේ ආඥා නොසලකාහරින්නේ නම්,
32 මට ගණන් දීමට ඔවුන්ට සිදු වනු ඇත. මම වේවැලෙන් ඔවුන්ගේ වරදට දඬුවම් කරන්නෙමි.[7]
ඔවුන්ව හික්මවන්නෙමි.[8]
33 නමුත් ඔහුට මාගේ ප්‍රේමය* පෙන්වීමට මම පසුබට නොවන්නෙමි.[9]
මම සැමදා ඔහුට විශ්වාසවන්තව සිටින්නෙමි.[10]
34 මා ඔහු සමඟ ඇති කරගත් ගිවිසුම කඩ කරන්නේවත්[11]
මා පැවසූ දේ වෙනස් කරන්නේවත් නැත.[12]
35 මාගේ ශුද්ධකමේ නාමයෙන් මම දෙයක් පොරොන්දු වුණෙමි.[13]
මම දාවිත්ට බොරු නොකියන්නෙමි.[14]
36 ඔහුගේ පෙළපත කිසිදා පහ නොවන්නේය.[15]
මා ඉදිරියේ තිබෙන සූර්යයා මෙන් ඔහුගේ සිංහාසනය සැමදා පවතින්නේය.[16]
37 විශ්වාසවන්ත සාක්ෂිකරුවෙකු සේ අහසේ පෙනී සිටින සඳ මෙන්
එය සැමදා ස්ථිරව පවතින්නේය.” සේලාහ්.
38 නමුත් ඔබ, ඔබේ අභිෂේක ලත් තැනැත්තා සමඟ උදහස් වී[1]
ඔහුව ප්‍රතික්ෂේප කළෙහිය.[2]
ඔහුව හෙළාදුටුවෙහිය.
39 ඔබේ සේවකයා සමඟ කළ ගිවිසුම ඔබ අත්හැරියෙහිය.
ඔහුගේ ඔටුන්න බිම හෙළා ඔහුව නින්දාවට පත් කළෙහිය.[3]
40 ඔබ ඔහුගේ සත්ව ගාල් බිඳ දමා,[4]
ඔහුගේ බලකොටු සුනුවිසුනු කර දැමුවෙහිය.[5]
41 මඟ යන එන සියල්ලෝ ඔහු සතු දේවල් කොල්ල කෑවෝය.[6]
ඔහුගේ අසල්වැසියන් ඉදිරියේ ඔහු නින්දාවට පත් වුණේය.[7]
42 ඔහුගේ විරුද්ධකරුවන්ගේ දකුණත ඔබ ශක්තිමත් කළෙහිය.[8]
ඔහුගේ සියලු සතුරන්ට සතුටු වීමට ඉඩහැරියෙහිය.[9]
43 ඔබ ඔහුගේ කඩුව සතුරෙකුගේ කඩුවක් ලෙස සැලකුවෙහිය.[10]
යුද්ධයෙන් ජය ගැනීමට ඔබ ඔහුට ඉඩ නොදුන්නෙහිය.[11]
44 ඔබ ඔහුගේ තේජස නැති කර දමා,[12]
ඔහුගේ සිංහාසනය බිම හෙළුවෙහිය.[13]
45 ඔහුගේ යෞවන කාලය කෙටි කළෙහිය.
ලැජ්ජාවෙන් ඔහුව වැසී යෑමට සැලැස්වුවෙහිය.[14] සේලාහ්.
46 යෙහෝවා දෙවියනි, ඔබ කොපමණ කාලයකට අපෙන් ඈත්ව සිටින්නෙහිද? සදහටම ඔබ එසේ සිටින්නෙහිද?[15]
ඔබේ උදහස ගින්නක් සේ අපට විරුද්ධව සැමදා ඇවිළෙයිද?[16]

**89 ගීතාවලිය**
1 ක්‍රියා 13:34
2 2සාමු 23:5; ගීතා 89:34; ලූක් 22:29
3 යෙසා 9:7; යෙරෙ 33:17
4 හෙබ්‍රෙ 1:8
5 2සාමු 7:14; ගීතා 119:53; යෙරෙ 9:13
6 යෙසා 33:22
7 2සාමු 7:14; 1රාජා 11:31; හිතෝ 13:24
8 නික් 32:34; 1රාජා 11:14; හෙබ්‍රෙ 12:6
9 2සාමු 7:15; 1රාජා 11:32; 1රාජා 11:36
10 1සාමු 15:29; හෙබ්‍රෙ 6:18
11 ලෙවී 26:44; යෙරෙ 14:21; යෙරෙ 33:21
12 මලා 3:6; යාකො 1:17
13 ගීතා 110:4; ආමො 4:2; හෙබ්‍රෙ 6:17
14 ගණන් 23:19; 1සාමු 15:29; ගීතා 132:11; තීත 1:2
15 2සාමු 7:16; ගීතා 72:17; යෙසා 11:1; යෙරෙ 23:5; සෙක 6:13; යොහ 12:34; එළි 22:16
16 යෙරෙ 33:21; දානි 7:14; ලූක් 1:33

**2 තීරුව**
1 2සාමු 24:12; සෙක 13:7
2 1ලේක 28:9; ගීතා 44:9; ගීතා 60:1
3 ගීතා 74:7; විලා 5:16; එස 21:26
4 ගීතා 80:12
5 2ලේක 12:4; යෙරෙ 52:14; විලා 2:2
6 ගීතා 44:10; යෙරෙ 50:17
7 ද්වි 28:37; නෙහෙ 5:9
8 ද්වි 28:25
9 විලා 1:7; විලා 2:17; යොහ 16:20
10 2ලේක 25:8
11 යොෂු 7:4
12 1රාජා 12:16; විලා 4:2
13 එස 21:26
14 ගීතා 44:15; යෙසා 53:3; එස 21:25; 15 ගීතා 13:1; 16 ගීතා 78:63; ගීතා 79:5; යෙසා 30:27; යෙරෙ 23:29.

ගීතා 89:28* හෝ, “ලැදි ප්‍රේමය.” 33* හෝ, “ලැදි ප්‍රේමය.”

47 මාගේ ආයු කාලය කොතරම්
කෙටිදැයි සිහි කරන්න.[1]
ඔබ මනුෂ්‍යයන්ව සෑදුවේ කිසිම
අරමුණක් නොමැතිවද?[2]
48 මරණය අත් නොදකින කිසි මිනි-
සෙක් සිටීද?[3]
කිසිවෙකුට මිනී වළෙන්
තමන්ව බේරාගත හැකිද?[4]
සේලාහ්.
49 යෙහෝවා දෙවියනි, ඔබ කලින්
පෙන්වූ ප්‍රේමය* දැන් අපට
නොපෙන්වන්නේ මන්ද?
විශ්වාසවන්ත කෙනෙකු වූ ඔබ
ප්‍රේමය පෙන්වන බවට
දාවිත්ට පොරොන්දු වූවා
නොවේද?[5]
50 යෙහෝවා දෙවියනි, ඔබේ සේවක-
යන් අද්දකින නින්දාව සිහි
කරන්න.[1]
බොහෝදෙනෙකු කරන නින්-
දාවන් මම මාගේ ළයෙහි
දරාගෙන සිටිමි.[2]
51 යෙහෝවා දෙවියනි, ඔබේ සතුරන්
කළ නින්දා අපහාස අමතක
නොකරන්න.[3]
ඔබේ අභිෂේක ලත් තැනැත්තා
කළ සෑම දෙයකටම ඔවුහු
නින්දා කළෝය.[4]
52 සදාකාලයෙන් සදාකාලයටම යෙ-
හෝවා දෙවිට ප්‍රශංසා වේවා!
ආමෙන්, ආමෙන්.[5]

ගීතා 89:49* හෝ, "ළැදි ප්‍රේමය."

**89 ගීතාවලිය**
1 යෝබ් 7:7
ගීතා 39:5
ගීතා 119:84
2 යෝබ් 14:1
ගීතා 144:4
දේශ 11:8
3 යෝබ් 30:23
ගීතා 49:9
දේශ 3:19
දේශ 9:5
හෙබ්‍රෙ 11:5
4 ගීතා 49:15
ක්‍රියා 2:27
5 2සාමු 7:15
ගීතා 132:11
යෙසා 55:3
ක්‍රියා 2:30

**2 තීරුව**
1 ගීතා 44:13
ගීතා 74:22
හෙබ්‍රෙ 11:26
2 රෝම 15:3
3 ගීතා 79:10
4 2සාමු 16:7; මතෙ 12:24; මතෙ 26:65; යොහ 8:48;
5 නෙහෙ 9:5; ගීතා 41:13; ගීතා 72:18.

## හතරවෙනි කාණ්ඩය
(ගීතාවලිය 90 – 106)

සැබෑ දෙවිගේ සේවකයෙකු වූ
මෝසෙස්ගේ යාච්ඤාවකි.[1]

**90** යෙහෝවා දෙවියනි, ඔබ
පරම්පරාවක් පරම්පරා-
වක් පාසා[2]
අපට වාසස්ථානයක් වී
ඇත.[3]
2 පටන්ගැන්මක්වත් අවසානයක්-
වත් ඔබට නැත.[4]
කඳු බිහි වන්නත්[5] පොළොව[6]
හා එහි ඇති සියල්ල[7]
සාදන්නත්* කලින් ඔබ සිටි-
යෙහිය.
3 ඔබ මිනිසාව නැවත දූවිල්ලට හර-
වන්නෙහිය.[8]
"මනුෂ්‍යයෙනි, නැවත දූවිල්ලට
හැරී යන්න" කියා ඔබ පව-
සන්නෙහිය.[9]
4 අවුරුදු දහසක් ගත වුවත් ඔබට
එය ගෙවී ගිය එක දවසක්
මෙනි.[10]
එය ඔබට ගෙවී ගිය එක රැකවල්
යාමයක්* මෙනි.[1]
5 එක මොහොතකින් ඔබ ඔවුන්
පිටට විනාශය ගෙනෙන්නෙ-
හිය.[2] ඔවුහු සිහිනයක් මෙන්
පහ වී යන්නෝය.[3]
ඔවුන් උදෑසන පිබිදෙන තණ-
කොළ මෙනි.[4]
6 හිරු නැඟ එන විට ඒවා දලු ලා
හොඳින් වැඩෙන්නේය.[5]
නමුත් සවස් වන විට ඒවා පර වී
වියළී යන්නේය.[6]
7 ඔබේ කෝපය නිසා අප පිටට
විනාශය පැමිණියේය.[7]
ඔබේ උදහස නිසා අප කැලඹු-
ණෝය.[8]

ගීතා 90:2* මූ.අ., "ප්‍රසව වේදනාවක් ඇතුව බිහි කිරීමටත්."

ගීතා 90:4* බොහෝදුරට එක රැකවල් යාමයක් යනු හිරු බැස යෑමේ සිට හිරු නැඟීම දක්වා ඇති කාලයෙන් තුනෙන් කොටසකි.

**90 ගීතාවලිය**
1 ද්වි 33:1
2 ගීතා 89:1
3 ද්වි 33:27
ගීතා 91:1
එළි 21:3
4 ගීතා 93:2
යෙසා 40:28
යෙසා 45:22
යෙරෙ 10:10
හබ 1:12
1තිමෝ 1:17
එළි 1:8
එළි 15:3
5 හිතෝ 8:26
6 උත් 1:1
ගීතා 146:6
7 1සාමු 2:8
1ලේක 16:30
ගීතා 89:11
යෙරෙ 10:12
8 දේශ 3:20
9 උත් 3:19
ගීතා 104:29
ගීතා 146:4
දේශ 12:7
10 2පේතෘ 3:8

**2 තීරුව**
1 ලූක් 12:38
2 යෝබ් 9:25
යෝබ් 27:21
3 යොහ 11:11; ක්‍රියා 7:60; 1කොරි 15:20; 2පේතෘ 3:4;
4 ගීතා 103:15; යෙසා 40:6; යෙසා 51:12; 1පේතෘ 1:24;
5 යෝබ් 14:2; 6 ගීතා 92:7; යාකො 1:11; 7 ගණන් 17:12; ද්වි 32:22; 8 රෝම 2:8.

8 ඔබ අපේ වැරදි ඔබ ඉදිරියේම
තබාගන්නෙහිය.[1]
අප රහසින් කළ දේ* මතට
ඔබේ මුහුණේ දීප්තිය වැටී-
මට ඔබ සැලැස්වුවෙහිය.[2]
9 ඔබේ උදහසට හසු වී අපේ
ජීවිතයේ සියලු දවස් ගෙවී
ගියේය.[3]
හෙළන සුසුමක් මෙන් අපේ ආයු
කාලය අවසන් වුණේය.[4]
10 සාමාන්‍යයෙන් අප ජීවත් වන්නේ
අවුරුදු සැත්තෑවකි.[5]
ශක්තිය ඇත්නම් අවුරුදු අසූ-
වකි.[6]
එයද කරදර සහ දුක් ගැහැටවලින්
පිරී ඇත.[7]
ජීවිතය වේගයෙන් ගෙවී යයි.
අපද සැණෙකින් පහව යයි.[8]
11 ඔබේ කෝපය කොතරම් බලග-
තුද කියා දැනගත හැක්කේ
කාටද?[9]
ඔබේ උදහස කොතරම් ප්‍රබ-
ලද කියා කාට තේරුම්ගත
හැකිද? ඔබ කෙරෙහි අපට
තිබිය යුතු ගරුබිය තරම් එය
ඉමහත්ය.[10]
12 නැණවත් සිතක් අත් කරගැනීමට
අපට හැකි වන පිණිස[11]
අපේ ජීවිතයේ සෑම දවසක්ම
අර්ථවත් ලෙස ගත කිරීමට*
අපට උගන්වන්න.[12]
13 අපව අත්හැර ගිය ඔබ නැවත අප
වෙතට පැමිණෙන්න[13] තව
කොපමණ කලක් ගත වෙ-
යිද?[14]
අනේ යෙහෝවා දෙවියනි, ඔබේ
සේවකයන්ට අනුකම්පා
කරන්න.[15]
14 ප්‍රීති ඝෝෂා නගමින් අපේ මුළු
ජීවිත කාලයම සතුටින් ගත
කිරීමට හැකි වන පිණිස[16]
උදෑසනින්ම ඔබේ ප්‍රේමය* අපට
පෙන්වන්න.[17]

ගීතා 90:8* හෝ, "නොදැන කළ වැරදි." 12* මූ.අ., "දවස් ගණින්න." 14* හෝ, "ලැදි ප්‍රේ-මය."

**90 ගීතාවලිය**
1 ලෙවී 26:39 ගීතා 50:21 යෙරෙ 16:17
2 ගීතා 19:12 හිතෝ 24:12 හෙබ්‍රෙ 4:13
3 ගීතා 78:33
4 ගීතා 39:5
5 2සාමු 5:4
6 2සාමු 19:35 ලූක් 2:37
7 දේශ 12:3
8 යෝබ් 14:10 ගීතා 78:39 ලූක් 12:20 යාකො 4:14
9 ද්වි 29:23 හබ 3:12
10 යෙසා 33:14 ලූක් 12:5
11 ගීතා 51:6
12 ද්වි 32:29 ගීතා 39:4
13 ගීතා 6:4
14 ගීතා 89:46
15 නික් 32:14 ද්වි 13:17 ද්වි 32:36 ගීතා 135:14 ආමෝ 7:3
16 ගීතා 86:4 ගීතා 149:2 පිලි 4:4
17 ගීතා 36:7 ගීතා 51:1 ගීතා 63:3 ගීතා 85:7

**2 තීරුව**
1 ගීතා 30:5 ගීතා 126:5 මතෙ 5:4 යොහ 16:20
2 ද්වි 2:14
3 ගීතා 44:1
4 ගණන් 14:31 යොෂු 23:14
5 ගීතා 27:4
6 ගීතා 68:28 ගීතා 118:25 යෙසා 26:12
7 ගීතා 127:1 හිතෝ 16:3 1කොරි 3:7

**91 ගීතාවලිය**
8 ගීතා 32:7 ගීතා 83:18
9 ගීතා 18:11 ගීතා 27:5 ගීතා 31:20
10 ගීතා 36:7 ගීතා 57:1
11 ද්වි 32:30 ගීතා 18:2 හිතෝ 18:10
12 ගීතා 62:8 හිතෝ 3:5
13 යෝබ් 22:10 ගීතා 124:7

15 ඔබ අපට විඳීමට ඉඩහැරිය දුක්
පීඩාවල ප්‍රමාණයටම දැන්
අපව සතුටට පත් කරන්න.[1]
දුක් ගැහැට අද්දුටු අවුරුදු ගණ-
නට සරිලන සේ[2] අපව ප්‍රීති-
යට පත් කරන්න.
16 ඔබේ ක්‍රියාවන් ඔබේ සේවකයන්ට
දැකීමට සලස්වන්න.[3]
ඔබේ තේජස ඔවුන්ගේ දරු-
වන්ටද දැකගැනීමට සලස්-
වන්න.[4]
17 යෙහෝවා දෙවි වූ ඔබේ කරුණාව*
අපට අද්දැකීමට ලැබේවා![5]
අපේ දෑතේ වැඩවලට ඔබේ
ආශීර්වාදය ලැබේවා![6]
එසේය, අපේ දෑතේ වැඩවලට
ඔබේ ආශීර්වාදය ලැබේවා![7]

# 91
මහෝත්තම දෙවිගේ[8] රහස්
ස්ථානයේ සිටින්නාට[9]
සියලු බලැති තැනැත්-
තාණන්ගේ සෙවණෙහි
වාසය කිරීමට හැකි වන්-
නේය.[10]
2 මම යෙහෝවා දෙවිට මෙසේ
කියන්නෙමි. "ඔබ මාගේ
රැකවරණයය. මාගේ බල-
කොටුවය.[11]
මා විශ්වාසය තබන මාගේ දෙ-
විය."[12]
3 ඔහු කුරුලු දඩයක්කරුගේ උගු-
ලෙන් ඔබව ගලවාගන්-
නේය.[13]
විනාශකාරී වසංගතයෙන් ඔබව
මුදවාගන්නේය.[14]
4 ඔබට ළං වීමට කිසිවෙකුට ඉඩ
නොදී ඔහුගේ පියාපත්වලින්
ඔබව වසාගන්නේය.[15]
ඔහුගේ පියාපත් සෙවණෙහි ඔබ
රැකවරණය ලබන්නෙහිය.[16]
ඔහුගේ විශ්වාසවන්තකම[17]
ඔබට විශාල පලිහක්[18]

**14** 2සාමු 24:15; **15** ගීතා 5:11; **16** නික් 19:4; ද්වි 32:11; රූත් 2:12; ගීතා 17:8; ගීතා 57:1; ගීතා 61:4; **17** ගීතා 40:11; ගීතා 57:3; ගීතා 61:7; ගීතා 86:15; හිතෝ 20:28; **18** උත් 15:1; ගීතා 84:11.

ගීතා 90:17* හෝ, "යහපත."

මෙන්ද පවුරක් මෙන්ද වන්-
නේය.
**5** රාත්‍රියේ සිදු වන කිසිම භයානක
දෙයකට ඔබ භය නොවන්-
නෙහිය.[1]
දවාලේ විදින ඊගස[2] නිසා ඔබ
තැති නොගන්නෙහිය.
**6** අඳුරේ පැතිරී යන වසංගතය
නිසාවත්[3]
දවල් කාලයේදී සියල්ල නැති
නාස්ති කර දමන විනාශය
නිසාවත් ඔබට බියක් නොදැ-
නේ.[4]
**7** දහසක් ඔබ අසලම ඇද වැටුණත්
දසදහසක් ඔබේ දකුණු පැත්තේ
ඇද වැටුණත්
ඔබට නම් එවැනි දෙයක් සිදු
නොවන්නේය.[5]
**8** දුෂ්ටයන්ට ලැබෙන දඬුවම[6]
ඔබේම ඇස් දෙකෙන් ඔබට
දැකගැනීමට හැකි වන්නෙ-
හිය.[7]
**9** ඔබ, “යෙහෝවා දෙවි මාගේ රැකව-
රණයය”[8] කියා පවසමින්
මහෝත්තම දෙවිව ඔබේ
වාසස්ථානය කරගත්තෙ-
හිය.[9]
**10** එබැවින් කිසි විපතක් ඔබ පිටට
නොපැමිණෙන්නේය.[10]
කිසි පීඩාවක් ඔබේ කූඩාරමට
ළඟා නොවන්නේය.[11]
**11** ඔහු තම දූතයන්ට ඔබව ආරක්ෂා
කිරීමට අණ දෙන්නේය.[12]
එසේය, ඔබ ගන්නා සෑම පියව-
රකදීම ඔබව ආරක්ෂා කරන
ලෙස අණ දෙන්නේය.[13]
**12** ඔබේ පය කිසිවිටකත් ගලක නො-
වදින පිණිස[14]
ඔවුහු සිය අත්වලින් ඔබව උසු-
ලන්නෝය.[15]
**13** තරුණ, කේශර සිංහයාවද නාග-
යාවද ඔබ පාගා දමන්නෙ-
හිය.[16]
කේශර සිංහයන්වත් විශාල සර්-
පයන්වත් ඔබ පාගා දමන්-
නෙහිය.[17]

**91 ගීතාවලිය**
**1** ගීතා 121:4 ගීතා 121:6 හිතෝ 3:23 යෙසා 43:2 යෙසා 60:2
**2** ගීතා 64:3 යෙසා 54:17
**3** මලා 4:2
**4** යෝබ් 11:17 යෙරෙ 6:4 යෙරෙ 15:8 යෙරෙ 20:16
**5** නික් 12:13 ගීතා 103:3
**6** යෙසා 3:11 මලා 3:18
**7** ගීතා 37:34 මලා 1:5
**8** ගීතා 142:5
**9** ගීතා 71:3 ගීතා 90:1
**10** ගීතා 121:7 හිතෝ 12:21
**11** දානි 7:15 හෙබ්‍රෙ 11:9
**12** 2රාජා 6:17 ගීතා 34:7 මතෙ 18:10 ලූක් 4:10
**13** නික් 23:20 නික් 32:34 හෙබ්‍රෙ 1:14
**14** ගීතා 37:24 මතෙ 4:6 1පේතෘ 2:8
**15** යෙසා 63:9
**16** උත් 49:17 ලූක් 10:19
**17** යෙරෙ 51:34 එළි 12:9

**2 තීරුව**
**1** දානි 6:5 මාක් 12:30 1යොහ 4:19
**2** ගීතා 18:2
**3** ගීතා 9:10 හිතෝ 18:10 යෙරෙ 16:21 යොහ 17:3
**4** ගීතා 10:17 ගීතා 50:15 රෝම 10:13 හෙබ්‍රෙ 5:7
**5** ගීතා 138:7 යෙසා 43:2
**6** 1සාමු 2:30 1පේතෘ 1:21
**7** ගීතා 21:4 ගීතා 36:9 හිතෝ 3:2
**8** හිතෝ 21:31 යෙසා 45:17 ලූක් 2:30

**14** දෙවි මෙසේ කීවේය. “ඔහු මට ප්‍රේම
කරන නිසා[1]
මම ඔහුව ගලවාගන්නෙමි.[2]
ඔහු මාගේ නාමය ගැන දැනගත්
බැවින් මම ඔහුව ආරක්ෂා
කරන්නෙමි.[3]
**15** ඔහු මට කන්නලව් කරන්නේය.
එවිට මම ඔහුට උත්තර
දෙන්නෙමි.[4]
විපත්ති කාලයේදී මම ඔහු
සමඟ සිටින්නෙමි.[5]
ඔහුව බේරාගෙන ඔහුව ගෞරව-
යට පත් කරන්නෙමි.[6]
**16** ඔහුගේ ජීවිත කාලය වැඩි කර
ඔහුව තෘප්තිමත් කරන්-
නෙමි.[7]
මම ලබා දෙන ගැලවීම ඔහුට
දැකීමට සලස්වන්නෙමි.”[8]

සබත් දවස සඳහා ගීතිකාවකි.

**92** ස්තුති ප්‍රශංසා ලැබීමට යෙ-
හෝවා දෙවි වටින්නේය.[9]
මහෝත්තම දෙවියනි, ඔබේ
නාමයට ප්‍රශංසා ගී ගැයීම
කොතරම් අගනේද![10]
**2** උදෑසනින්ම ඔබේ ප්‍රේමය*
ගැනද[11]
සෑම රාත්‍රියකම ඔබේ විශ්වාස-
වන්තකම ගැනද කතා කිරීම
ඉතා යෝග්‍යය.[12]
**3** තත් දසයේ සංගීත භාණ්ඩද[13]
කුඩා වීණාද
මහා වීණාද වයමින් අපි එසේ
ඔබව පසසන්නෙමු.[14]
**4** යෙහෝවා දෙවියනි, ඔබේ ක්‍රියා
දැක මම සතුටට පත්
වුණෙමි.
ඔබේ මහත් බලයෙන් ඔබ කළ
ක්‍රියා නිසා මම ප්‍රීති ඝෝෂා
නඟමි.[15]

**92 ගීතාවලිය** **9** ගීතා 33:2; ගීතා 50:23; එෆී 5:20; **10** ගීතා 9:2; **11** ගීතා 89:1; යෙසා 63:7; **12** ක්‍රියා 16:25; **13** 1ලේක 25:6; ගීතා 33:2; **14** 1ලේක 15:16; 2ලේක 29:25; ගීතා 81:2; **15** ගීතා 126:3.

**ගීතා 92:2*** හෝ, “ළැදි ප්‍රේමය.”

5 යෙහෝවා දෙවියනි, ඔබේ ක්‍රියා
මොන තරම් ශ්‍රේෂ්ඨද![1]
ඔබේ සිතුවිලි කොතරම් ගැඹු-
රුද![2]
6 අඥානයෙකුට කිසිදාක ඒවා දැන-
ගත නොහැකිය.[3]
අනුවණ කිසිවෙකුට ඒවා තේ-
රුම්ගත නොහැකිය.[4]
7 දුෂ්ටයෝ තණකොළ මෙන්
වැඩෙන්නෝය.[5]
නපුරු ක්‍රියා කරන්නෝ සශ්‍රීක
වන්නෝය.
නමුත් අන්තිමේදී ඔවුහු සදහ-
ටම විනාශ වී යන්නෝය.[6]
8 යෙහෝවා දෙවියනි, ඔබ අන්
සියල්ලන්ට වඩා සදහටම
උසස්ව සිටින්නෙහිය.[7]
9 යෙහෝවා දෙවියනි, ඔබේ සතුරන්
දෙස බලන්න.[8]
ඔවුහු විනාශ වී යන්නෝය.[9]
නපුරු ක්‍රියා කරන්නෝ සීසීකඩ
විසුරුවාහරින්නේය.[10]
10 නමුත් ඔබ මාව කුළු ගොනෙකු
මෙන් ශක්තිමත් කරන්නෙ-
හිය.[11]
මම නැවුම් තෛලයකින් මාවම
ආලේප කරගන්නෙමි.[12]
11 මාගේ සතුරන් වැටී යන අයුරු මට
දකින්න ලැබෙන්නේය.[13]
මට විරුද්ධව නැඟී සිටින දුෂ්ට-
යන්ගේ පරාජය ගැන මට
අසන්න ලැබෙන්නේය.
12 ධර්මිෂ්ඨයා තාල වර්ගයේ ගසක්
මෙන් සශ්‍රීක වන්නේය.[14]
ලෙබනොන්හි දේවදාර ගසක්
මෙන් වැඩෙන්නේය.[15]
13 යෙහෝවා දෙවිගේ ගෘහයේ එනම්,
අපේ දෙවිගේ මළුවේ[16]
සිටවනු ලැබූ අය[17] සශ්‍රීකව
වැඩෙන්නෝය.
14 මහලු වයසේදීද ඔවුහු සාරවත් ගස්
මෙන් පල දරන්නෝය.[18]
ඔවුහු සැමදා සරුසාරව, ප්‍රාණ-
වත්ව සිටින්නෝය.[19]
15 ඔවුන්ට යෙහෝවා දෙවිගේ අවංක-
කම ගැන කතා කිරීමට හැකි
වනු ඇත.[1]
දෙවි මාගේ පර්වතයය.[2] ඔහු
තුළ කිසි අධර්මිෂ්ඨකමක්
නැත කියා කීමටද හැකි වනු
ඇත.[3]

93 යෙහෝවා දෙවි රජ වී ඇත![4]
ඔහු තේජශ්‍රීයෙන් සැරසී
සිටියි.[5]
යෙහෝවා දෙවි බලය නමැති
සළුව පැළඳගෙන සිටියි.[6]
පොළොවද නොසෙල්වන
ලෙස ස්ථිරව පිහිටුවා
ඇත.[7]
2 ඔබේ සිංහාසනය පුරාණයේ සිට
ස්ථිරව පිහිටුවා ඇත.[8]
අනාදිමත් කාලයක සිට පැව-
තෙන ඔබ සදාතනිකය.[9]
3 යෙහෝවා දෙවියනි, ගංගාවෝ
මහත් හඬක් නැඟුවෝය.
දිගින් දිගටම ඝෝෂා කළෝය.[10]
එසේය, මහත් හඬකින් ඝෝෂා
නැඟුවෝය.[11]
4 විශාල ජල දහරාවන්ගෙන්
නැඟෙන ශබ්දයටත් සයුරේ
මහා රැළිවලටත් වඩා[12]
යෙහෝවා දෙවි තේජවත්ය.[13]
එසේය, ඔහු ඒ සියල්ලට වඩා
බලවත්ය.
5 යෙහෝවා දෙවියනි, ඔබේ සිහි-
ගැන්වීම් විශ්වාසවන්තය.[14]
සදහටම[15] ඔබේ ගෘහය ශුද්ධව
තිබීම සුදුසුය.[16]

94 දුෂ්ටයන්ට දඬුවම් දීමට අයි-
තිය ඇති යෙහෝවා දෙවි-
යනි,[17]
යුක්තිය ඉටු කරන දෙවියනි,
ඔබේ ආලෝකය විහිදු-
වන්න.[18]
2 පොළොව විනිශ්චය කරන

**92 ගීතාවලිය**
1 ගීතා 40:5; ගීතා 66:3; ගීතා 104:24; ගීතා 145:4; ගීතා 150:2; දේශ 3:11; එළි 15:3
2 යෝබ් 26:14; ගීතා 139:17; යෙසා 28:29; රෝම 11:33
3 ගීතා 73:22; ගීතා 94:8; දානි 12:10
4 ගීතා 14:1; 1කොරි 2:14
5 යෝබ් 12:6; ගීතා 37:35; යෙරෙ 12:1; මලා 3:15
6 1සාමු 25:37; ගීතා 37:38
7 ගීතා 83:18
8 විනි 5:31
9 ගීතා 68:1; ගීතා 89:10
10 ද්වි 28:7
11 ද්වි 33:17; 1සාමු 2:1; ගීතා 89:24; ගීතා 112:9
12 ගීතා 23:5
13 ගීතා 37:34; ගීතා 91:8; ගීතා 112:8
14 ගීතා 52:8; යෙසා 65:22; හොෂෙ 14:6
15 යෙසා 61:3
16 ගීතා 100:4; ගීතා 135:2
17 යෙසා 60:21
18 ගීතා 71:18; හිතෝ 16:31; යෙසා 40:31; යෙසා 46:4
19 යෙරෙ 17:8

**2 තීරුව**
1 ගීතා 138:5; එළි 15:3
2 ද්වි 32:4; ගීතා 18:2
3 රෝම 9:14

**93 ගීතාවලිය**
4 ගීතා 96:10; ගීතා 97:1; යෙසා 52:7; එළි 11:17; එළි 19:6
5 ගීතා 68:34; ගීතා 104:1; යෙසා 26:10
6 ගීතා 65:6
7 ගීතා 18:15; ගීතා 96:10
8 ගීතා 97:2; ගීතා 145:13

**9** ගීතා 90:2; **10** ගීතා 98:8; **11** ගීතා 148:7; **12** ගීතා 65:7; ගීතා 89:9; **13** ගීතා 8:1; ගීතා 76:4; යෙසා 33:21; හෙබ්‍රෙ 1:3; හෙබ්‍රෙ 8:1; **14** ගීතා 19:7; ගීතා 119:111; **15** ගීතා 52:8; **16** ගීතා 11:4; එස 43:12; මාක් 11:15; 1පේතෘ 1:16; **94 ගීතාවලිය** **17** ද්වි 32:35; යෙසා 35:4; යෙරෙ 50:28; නාහු 1:2; රෝම 12:19; 1තෙස 4:6; 2තෙස 1:6; හෙබ්‍රෙ 10:30; **18** ගීතා 80:1.

තැනැත්තාණෙනි, නැඟී
සිටා[1]
උඩඟු අයට දඬුවම් කරන්න.[2]
3 යෙහෝවා දෙවියනි, තව කොප-
මණ කාලයක් දුෂ්ටයන් සතු-
ටින් සිටිනු ඇද්ද?[3]
අනේ දෙවියනි, තව කොපමණ
කල් ඔවුන් මෙසේ සතුටු වනු
ඇද්ද?[4]
4 ඔවුහු දිගින් දිගටම කතා කරති.
තොරතෝංචියක් නැතුව
දොඩවති.[5]
නපුරු ක්‍රියා කරන්නෝ තමන්
ගැනම උජාරුවෙන් කතා
කරති.[6]
5 යෙහෝවා දෙවියනි, ඔබේ සෙ-
නඟව ඔවුහු පොඩි කර
දමති.[7]
ඔබේ උරුමය වන ඔවුන්ට දිගින්
දිගටම හිරිහැර කරති.[8]
6 වැන්දඹුවන්වද විදේශිකයන්වද
මරා දමති.[9]
පියා නැති දරුවන්වද මරණයට
පත් කරති.[10]
7 "යෙහෝවා දෙවිට මේ දේවල් පෙ-
නෙන්නේ නැහැ.[11]
යාකොබ්ගේ දෙවි මේ දේවල්
ගැන දන්නේ නැහැ" කියා
ඔවුහු පවසති.[12]
8 මාගේ සෙනඟ අතරේ සිටින අඥා-
නයෙනි, තේරුම්ගන්න.[13]
අනුවණයෙනි, කවදා ඔබ මේ
දේ වටහාගනු ඇද්ද?[14]
9 කන් සෑදූ තැනැත්තාට මේ දේවල්
ඇසෙන්නේ නැද්ද?[15]
දැස් සෑදූ තැනැත්තාට මේ
දේවල් පෙනෙන්නේ නැද්ද?[16]
10 ජාතීන්ව හික්මවන,[17] මිනි-
සුන්ට දැනුම ලබා දෙන
තැනැත්තාට
ඔවුන්ව නිවැරදි කළ නොහැ-
කිද?[18]
11 මිනිසුන්ගේ සිතුවිලි යෙහෝවා
දෙවි දන්නේය. ඒවා කොත-
රම් නිරර්ථකද කියාත් ඔහු
දන්නේය.[19]

12 යෙහෝවා දෙවියනි, ඔබෙන් හික්-
මවීම් ලබන තැනැත්තා
සන්තෝෂවත්ය.[1]
ඔබේ නීතිය ගැන ඔබ උගන්-
වන තැනැත්තා සන්තෝෂ-
වත්ය.[2]
13 ඔබ දුෂ්ටයන්ව ඇද දැමීමට වළක්
හාරන තෙක්,[3]
පැමිණෙන විපත්තිවලට සන්-
සුන්ව මුහුණ දීමට ඔහුට
හැකි වන පිණිස ඔබ එසේ
කරන්නෙහිය.[4]
14 යෙහෝවා දෙවි ඔහුගේ සෙනඟව
අත් නොහරින්නේය.[5]
තම උරුමය වූ ඔවුන්ව ඉවත
නොදමන්නේය.[6]
15 ධර්මිෂ්ඨ ලෙස තීන්දු දෙන කාල-
යක් නැවත පැමිණෙන්-
නේය.[7]
අවංක සිත් ඇති සියල්ලෝ ඒවා
පිළිගන්නෝය.
16 මා වෙනුවෙන් අපරාධකරුවන්ට
විරුද්ධව නැඟී සිටින්නේ
කවුද?[8]
නපුරු ක්‍රියා කරන්නන්ට
විරුද්ධ වීමට මාගේ පැත්තේ
සිටින්නේ කවුද?[9]
17 යෙහෝවා දෙවි මට උපකාර නො-
කළේ නම්[10]
මේ වන විටත් මා සදහටම
නිහඬ වී හමාරය.[11]
18 "මාගේ පය ලිස්සන්න ආසන්නයි"
කියා මා සිතුවත්[12]
යෙහෝවා දෙවියනි, ඔබේ ඉම-
හත් ප්‍රේමය* නිසා ඔබ මට
වැටෙන්න ඉඩ නොදුන්නෙ-
හිය.[13]
19 මාගේ සිත නොසන්සුන් වූ විට[14]
ඔබේ ඉමහත් ප්‍රේමය මට සැන-
සීමක් විය.[15]

**94 ගීතාවලිය**
1 උත් 18:25; ගීතා 7:6; ගීතා 50:6; ක්‍රියා 17:31; රෝම 14:4
2 යෝබ් 40:11; ගීතා 31:23; 1පේත්‍ර 5:5
3 ගීතා 74:10
4 ගීතා 73:3
5 ගීතා 59:7
6 ගීතා 31:18; ගීතා 73:9; ගීතා 144:15
7 ගීතා 14:4
8 යෙරෙ 10:21; යෙරෙ 50:11
9 යෙසා 1:23; යෙසා 10:2
10 යෙරෙ 7:6
11 ගීතා 10:11; ගීතා 59:7; එස 8:12
12 ගීතා 73:11; යෙසා 29:15
13 ගීතා 49:10; ගීතා 73:22; ගීතා 92:6; හිතෝ 12:1
14 හිතෝ 1:22
15 උත් 21:17; නික් 4:11; ගීතා 55:19; ගීතා 69:33
16 ගීතා 34:15; හිතෝ 20:12
17 ගීතා 9:5; යෙසා 10:12
18 යෝබ් 35:11; ගීතා 25:8; යෙසා 28:26; යොහ 6:45
19 1කොරි 1:19; 1කොරි 3:20

**2 තීරුව**
1 ගීතා 119:71; හිතෝ 3:11; 1කොරි 11:32; හෙබ්‍රෙ 12:6
2 ගීතා 19:8; හිතෝ 2:6; යෙසා 54:13
3 ගීතා 55:23; 2පේත්‍ර 2:9
4 යෙසා 26:20; හබ 3:16
5 1සාමු 12:22; ගීතා 37:28; රෝම 11:1; හෙබ්‍රෙ 13:5
6 ද්වි 32:9
7 ගීතා 19:9
8 2රාජා 10:15
9 නෙහෙ 5:7; යොහ 7:51

**10** ගීතා 118:13; ගීතා 124:2; 2කොරි 1:10; **11** ගීතා 13:3; දේශ 9:5; **12** ගීතා 38:16; ගීතා 121:3; **13** 1සාමු 2:9; ගීතා 37:24; ගීතා 117:2; විලා 3:22; **14** යෙරෙ 20:12; පිලි 4:6; **15** ගීතා 71:21; ගීතා 86:17.

**ගීතා 94:18*** හෝ, "ළැදි ප්‍රේමය."

**20** දුෂ්ට අරමුණක් ඇතුව නීති
පනවන[1]
දූෂිත පාලකයන්ට ඔබ සමඟ
මිත්‍රත්වයක් ඇති කරගත
හැකිද?[2]
**21** ඔවුහු ධර්මිෂ්ඨයාට දරුණු ලෙස
පහර දෙන්නෝය.[3]
නිර්දෝෂ තැනැත්තෙකුගේ ලේ
වැගිරවීමේ අරමුණ ඇතුව
ඔහුව දුෂ්ටයෙකු ලෙස තීන්දු
කරන්නෝය.[4]
**22** නමුත් මාගේ දෙවි වූ යෙහෝවා
මට උස් බලකොටුවක්
මෙනි.[5]
ආරක්ෂාව සලසා දෙන පර්වත-
යක් මෙනි.[6]
**23** ඔවුන් කළ නපුරු දේවල් දෙවි
ආපසු ඔවුන් පිටටම පමුණු-
වන්නේය.[7]
ඔවුන් අන් අයට ගෙනා
විපත්ති ඔවුන්ටම අද්ද-
කින්න සලස්වා දෙවි ඔවුන්ව
නිහඬ කරන්නේය.[8]
එසේය, අපේ දෙවි යෙහෝවා
ඔවුන්ව නිහඬ කරන්නේය.[9]

**95** එන්න, අපි යෙහෝවා දෙවි
ඉදිරියේ ප්‍රීති සෝෂා
නඟමු.[10]
අපට ගැලවීම සලසා දෙන
පර්වතයට ජය නාද
නඟමු.[11]
**2** ස්තුති ප්‍රශංසා සමඟ අපි ඔහු ඉදිරි-
යට පැමිණෙමු.[12]
ගීතිකා ගයමින් ඔහුට ජය නාද
නඟමු.[13]
**3** මන්ද යෙහෝවා දෙවි උතුම් දෙවි
කෙනෙකි.[14]
අන් සියලු දෙවිවරුන්ට වඩා
ශ්‍රේෂ්ඨ රජෙකි.[15]
**4** පොළොවේ ගැඹුරුතම ස්ථාන
ඔහුගේ අතේය.[16]
කඳු මුදුන්වල අයිතිය ඔහුටය.[17]
**5** ඔහු සාගරයේ සැදූම්කරු නිසා එහි
අයිතියද ඔහු සතුය.[18]
ඔහුගේම දෑතින් ඔහු භූමියද
සෑදුවේය.[19]
**6** එන්න, අපි වැඳ වැටී ඔහුට නමස්-
කාර කරමු.[1]
අපේ නිර්මාතෘ වන යෙහෝවා
දෙවි[2] ඉදිරියේ දණ නමමු.[3]
**7** මන්ද ඔහු අපේ දෙවිය. අපි ඔහුගේ
සෙනඟය. තණබිමේ සිටින
බැටළුවන් මෙන් ඔහු අපිව
රැකබලා ගන්නේය.[4]
අද ඔබ සැම ඔහුගේ හඬට සවන්
දිය යුතුය.[5]
**8** එබැවින් ඔබේ මුතුන්මිත්තන් මෙ-
රිබාහිදී කළාක් මෙන් ඔබේ
සිත් දැඩි කර නොගන්න.[6]
එදා පාළුකරයේ මස්සාහ් නම්
ස්ථානයේ ඔවුන් කළ දේ
නොකරන්න.[7]
**9** ඔවුන් මාගේ ක්‍රියා දැක තිබුණත්[8]
එහිදී මා ඔවුන් වෙනුවෙන් මැදි-
හත් වෙයිද නැද්ද කියා ඔවුහු
පරීක්ෂා කර බැලුවෝය.[9]
**10** අවුරුදු හතළිහක් පුරාම ඒ පරම්-
පරාව මට පිළිකුලක් විය.[10]
"ඔවුහු මුළාව ගිය සෙනඟකි.[11]
ඔවුහු මට පිටු පා මා පැවසූ දේව-
ලට කීකරු වූයේ නැත"[12]
කියා මම කීවෙමි.
**11** මම උදහසින් ඔවුන් ගැන දිවුරා
මෙසේ කීවෙමි.[13]
"මා මෙන් විවේක ගැනීමට
අවස්ථාවක් ඔවුන්ට නොලැ-
බෙන්නේය."[14]

**96** යෙහෝවා දෙවිට අලුත් ගීයක්
ගයන්න.[15]
පොළොවේ සියලු ජනයෙනි,
යෙහෝවා දෙවිට ගී
ගයන්න.[16]
**2** යෙහෝවා දෙවිට ගී ගයන්න.

**94 ගීතාවලිය**
**1** 1රාජා 21:10
ගීතා 58:2
යෙසා 10:1
ආනි 3:5
ආනි 6:7
ක්‍රියා 5:28
**2** දේශ 5:8
**3** ගීතා 59:3
**4** නික් 23:7
1රාජා 21:19
හිතෝ 17:15
ක්‍රියා 7:58
**5** ගීතා 59:9
**6** ගීතා 18:2
ගීතා 62:7
**7** එස්ත 7:10
ගීතා 7:16
හිතෝ 2:22
හිතෝ 5:22
2තෙස 1:6
**8** 1සාමු 26:10
ගීතා 7:15
හිතෝ 26:27
**9** ගීතා 12:3

**95 ගීතාවලිය**
**10** නික් 15:1
ගීතා 66:2
**11** ද්වි 32:15
2සාමු 22:47
ගීතා 98:4
**12** ගීතා 50:23
ගීතා 100:4
**13** ගීතා 105:2
**14** ගීතා 47:2
ගීතා 96:4
යෙරෙ 10:10
තීත 2:13
**15** නික් 18:11
ගීතා 97:9
ගීතා 135:5
යෙසා 44:8
මලා 1:14
1කොරි 8:6
**16** ආමො 9:3
**17** ගීතා 65:6
ආමො 4:13
**18** උත් 1:10
යෝබ් 38:11
හිතෝ 8:29
යෙරෙ 5:22
**19** උත් 1:9
හිතෝ 8:26

**2 තීරුව**
**1** යෙසා 45:23
මතෙ 4:10
රෝම 14:11
එළි 14:7
එළි 22:9
**2** උත් 2:7
යෝබ් 35:10
ගීතා 100:3
මතෙ 19:4
**3** 1රාජා 8:54
එස්රා 9:5
එෆී 3:14

**4** ගීතා 23:1; ගීතා 48:14; ගීතා 79:13; ගීතා 80:1; යෙසා 40:11; එස 34:31; **5** හෙබ්‍රෙ 3:7; හෙබ්‍රෙ 4:7; **6** ද්වි 32:51; ගීතා 105:41; 1කොරි 10:4; හෙබ්‍රෙ 3:15; **7** නික් 17:7; ද්වි 6:16; ද්වි 9:22; ද්වි 33:8; හෙබ්‍රෙ 3:8; **8** ගීතා 78:18; 1කොරි 10:9; හෙබ්‍රෙ 3:9; **9** ගණන් 14:22; **10** හෙබ්‍රෙ 3:9; **11** හෙබ්‍රෙ 3:10; **12** හිතෝ 1:7; රෝම 1:28; **13** ගණන් 14:23; හෙබ්‍රෙ 4:3; **14** උත් 2:3; හෙබ්‍රෙ 3:11; **96 ගීතාවලිය** **15** 1ලේක 16:23; ගීතා 33:3; ගීතා 40:3; ගීතා 98:1; ගීතා 149:1; යෙසා 42:10; **16** ගීතා 66:4.

ඔහුගේ නාමයට ප්‍රශංසා කරන්න.[1]
ඔහු ලබා දෙන ගැලවීම පිළිබඳ ශුභාරංචිය සෑම දිනකම කතා කරන්න.[2]
3 ඔහුගේ තේජස ගැන ජාතීන් අතරේද[3]
ඔහු කළ පුදුමාකාර ක්‍රියා ගැන සියලු ජනයා අතරේද ප්‍රකාශ කරන්න.[4]
4 මන්ද යෙහෝවා දෙවි ශ්‍රේෂ්ඨය.[5]
ඔහු බොහෝ සෙයින් ප්‍රශංසාව ලැබීමට වටින්නේය.
අන් සියලු දෙවිවරුන්ට වඩා ඔහු කෙරෙහි ගරුබියක් ඇති වන්නේය.[6]
5 මිනිසුන් නමස්කාර කරන අන් සියලු දෙවිවරුන්ට කිසිවක් කළ නොහැකිය.[7]
නමුත් යෙහෝවා දෙවි මුළු අහස්තලයම නිර්මාණය කළේය.[8]
6 ගෞරවයත් තේජශ්‍රීයත් ඔහු ඉදිරියෙහිය.[9]
ශක්තියත් අලංකාරයත් ඔහුගේ ශුද්ධස්ථානයෙහි ඇත.[10]
7 පොළොවේ සියලු ගෝත්‍රයෙනි, යෙහෝවා දෙවිට ප්‍රශංසා කරන්න.[11]
යෙහෝවා දෙවිගේ තේජස හා බලය ගැන පසසන්න.[12]
8 යෙහෝවා දෙවිගේ නාමයට දිය යුතු ගෞරවය දෙන්න.[13]
සතුටු සිතින් යමක් රැගෙන ඔහුගේ ගෘහයේ මළුවට පැමිණෙන්න.[14]
9 ශුද්ධ වස්ත්‍රවලින් සැරසී යෙහෝවා දෙවි ඉදිරියේ වැඳ වැටෙන්න.[15]
පොළොවේ සියලු ජනයෙනි, ඔහු කෙරෙහි ගරුබිය ඇතුව* සිටින්න.[16]
10 “යෙහෝවා දෙවි රජ වී ඇත.[17]
පොළොවද නොසෙල්වෙන ලෙස ස්ථිරව පිහිටුවා ඇත.[18]
ඔහු ජනයා වෙනුවෙන් යුක්තිය ඉටු කරනු ඇත”[1]
කියා ජාතීන් අතරේ ප්‍රකාශ කරන්න.
11 ස්වර්ගය ප්‍රීති වේවා! පොළොව ප්‍රීති ඝෝෂා නඟාවා![2]
මුහුදත් එහි ඇති සියල්ලත් ඝෝෂා නඟත්වා![3]
12 කෙත්වතුත් එහි ඇති සියල්ලත් සතුටු වේවා![4]
වනයේ සියලු ගස්ද යෙහෝවා දෙවි ඉදිරියේ ප්‍රීති ඝෝෂා නඟාවා![5]
13 මන්ද ඔහු පැමිණියේය.[6]
එසේය, ඔහු පොළොව විනිශ්චය කිරීම සඳහා පැමිණියේය.[7]
ඔහු ධර්මිෂ්ඨකමින් ලෝකයද[8]
අවංකකමින් ජනයාවද විනිශ්චය කරන්නේය.[9]

**97** යෙහෝවා දෙවි රජ වී ඇත.[10]
පොළොව ප්‍රීති වේවා![11]
දූපත් සියල්ල සතුටු වේවා![12]
2 ඔහු වටා වලාකුළුද ඝන අන්ධකාරයද ඇත.[13]
ධර්මිෂ්ඨකම හා යුක්තිය මත ඔහුගේ සිංහාසනය පිහිටුවා ඇත.[14]
3 ඔහු ඉදිරියෙන් ගින්නක් නික්මුණේය.[15]
එයින් ඔහුගේ සතුරෝ සියල්ලෝම දැවී යන්නෝය.[16]
4 ඔහුගෙන් නික්මෙන විදුලි කෙටීම් නිසා දේශය ආලෝකවත් වුණේය.[17]
පොළොව එය දැක මහත් වේදනාවට පත් වුණේය.[18]
5 මුළු පොළොවටම ස්වාමීන් වන යෙහෝවා දෙවි ඉදිරියේ[19]
කඳු, ඉටි මෙන් දිය වී ගියේය.[20]

**ගීතා 96:9*** මූ.අ., “භයෙන් වෙවුලමින්.”

**96 ගීතාවලිය**
දෙවියනි, ඔබේ නියෝග මට
උගන්වන්න.[11]
125 මම ඔබේ සේවකයාය.[12] ඔබේ
සිහිගැන්වීම්[13] තේරුම්-
ගැනීමට
මට උපකාර කරන්න.[14]
126 යෙහෝවා දෙවියනි, කාලය
පැමිණ තිබෙන බැවින්
නැඟී සිටින්න.[15]
මන්ද ඔවුහු ඔබේ නීතිය කඩ
කළෝය.[16]
127 ඔබේ ආඥා රන්වලටත් වඩා
එසේය, පවිත්‍ර රන්වලටත්
වඩා වටින නිසා[17]

ගීතා 119:124* හෝ, "ලැදි ප්‍රේමය."

119 ගීතාවලිය
1 ගීතා 93:5
ගීතා 119:2
2 2සාමු 6:9
ගීතා 2:11
හබ 3:16
3 ලෙවී 20:22
නෙහෙ 10:29
4 1සාමු 24:11
2සාමු 8:15
මීකා 6:8
2කොරි 1:12
5 ගීතා 37:33
2පේතෘ 2:9
6 උත් 44:32
යෝබ් 17:3
යෙසා 38:14
ෆිලෙ 19
7 ගීතා 36:11
ගීතා 119:78
හොෂෙ 12:7
8 ගීතා 119:81
9 ගීතා 69:3
ගීතා 143:7
10 ගීතා 69:16
ගීතා 103:11
ලූක් 18:13
11 ගීතා 119:135
ගීතා 143:10
12 ගීතා 116:16
රෝම 6:22
13 ගීතා 19:7
14 2ලේක 1:10
ගීතා 119:34
2තිමෝ 2:7
යාකො 1:5
15 ගීතා 9:19
ගීතා 102:13
යෙසා 28:21
යෙරෙ 18:23
16 ගණන් 15:31
යෙසා 24:5
යෙසා 33:8
මතෙ 24:12
1තිමෝ 1:9
17 ගීතා 19:10
ගීතා 119:72
හිතෝ 3:14
හිතෝ 8:11
හිතෝ 16:16

2 තිරුව
1 ගීතා 119:47
2 ගීතා 19:8
ගීතා 119:40
හිතෝ 30:5
3 ගීතා 119:104
4 ගීතා 93:5
5 ගීතා 25:10
ගීතා 119:2
6 ගීතා 119:105
හිතෝ 6:23
2කොරි 4:6
2පේතෘ 1:19
7 ගීතා 19:7
හිතෝ 1:4
2තිමෝ 3:15
8 1පේතෘ 2:2
9 ගීතා 42:1
ගීතා 119:48

මම ඒවාට බොහෝ සෙයින්
ඇලුම් කරමි.[1]
128 සෑම දෙයක් ගැනම ඔබ දී තිබෙන
අණපනත් යහපත් බව මම
පිළිගනිමි.[2]
මම සියලු වැරදි මාර්ගවලට
ද්වේෂ කරන්නෙමි.[3]

פ [පේ]

129 ඔබ දෙන සිහිගැන්වීම් කොතරම්
ශ්‍රේෂ්ඨද![4]
එබැවින් මම ඒවා පිළිපදිමි.[5]
130 ඔබේ වදන්වල අර්ථය එළිද-
රව් වන විට ආලෝකය
ලැබෙයි.[6]
අද්දැකීම් අඩු අයට එයින් අව-
බෝධය ලැබෙයි.[7]
131 ඔබේ ආඥාවන් ලැබෙන තෙක්[8]
මම මහත් ආශාවකින් බලා
සිටිමි.[9]
132 මා වෙත හැරී මට කරුණාව
පෙන්වන්න.[10]
ඔබේ නාමයට ඇලුම් කරන්-
නන්ට ඔබ යුක්තිය ඉටු කර
දෙන අයුරින්ම මටද යුක්-
තිය ඉටු කර දෙන්න.[11]
133 මා ගන්නා සෑම පියවරක්ම
ඔබේ වදන්වලට එකඟව
ගැනීමට මට උපකාර
කරන්න.[12]
කිසිම දුෂ්ට දෙයකට මාව
පාලනය කිරීමට ඉඩ නො-
දෙන්න.[13]
134 වංචනිකයන්ගෙන් මාව බේරා-
ගන්න.[14]
මම ඔබේ අණපනත් පිළිපදින්-
නෙමි.[15]
135 ඔබේ සේවකයාට කරුණාව
පෙන්වන්න.[16]
දෙවියනි, ඔබේ නියෝග මට
උගන්වන්න.[17]
136 ඔවුන් ඔබේ නීතිය කඩ කළ
නිසා[18]

**10** නික් 4:31; 1සාමු 1:11; 2සාමු 16:12; යෙසා 38:20; යෙසා 63:9; **11** ගීතා 72:19; ගීතා 106:4; ක්‍රියා 15:14; හෙබ්‍රෙ 6:10; **12** ගීතා 18:30; ගීතා 119:67; **13** ගීතා 19:13; රෝම 6:12; **14** එස 22:7; **15** ගීතා 119:4; **16** ගණන් 6:25; ගීතා 4:6; **17** ද්වි 4:1; **18** ගීතා 119:53; එස 9:4; එස 22:26; හොෂෙ 4:6; ආමො 2:4.

මාගේ ඇස්වලින් කඳුළු ගංගා-
වක් ගලා ගියේය.[1]

צ [ට්සාඩේ]

137 යෙහෝවා දෙවියනි, ඔබ ධර්මිෂ්-
ඨය.[2]
ඔබ දෙන තීන්දුද යුක්තිසහග-
තය.[3]
138 ඔබේ සිහිගැන්වීම්වලට[4] කීකරු
වන ලෙස ඔබ අපට අණ
කළෙහිය.
මන්ද ඔබ ධර්මිෂ්ඨය. විශ්වාස-
වන්තය.[5]
139 මා තුළ තිබෙන උද්‍යෝගය ඇවි-
ළෙන ගින්නක් මෙන් මාව
දවා දැමුවේය.[6]
මන්ද මාගේ සතුරන්ට ඔබේ
වදන් අමතක වී ඇත.[7]
140 ඔබේ වදන් ඉතා පවිත්‍රය.[8]
ඔබේ සේවකයා ඊට අතිශයින්
ප්‍රිය කරන්නේය.[9]
141 කිසි වැදගැම්මකට නැති, පහත්
තැනැත්තෙකු ලෙස ඔවුන්
මාව සැලකුවත්[10]
ඔබේ අණපනත් මම අමතක
නොකරන්නෙමි.[11]
142 ඔබේ ධර්මිෂ්ඨකම සදාකල් පව-
තින්නේය.[12]
ඔබේ නීතිය සැමවිටම විශ්වා-
සවන්තය.[13]
143 දුක් වේදනා හා දුෂ්කරතා බො-
හොමයක් මා අද්දැක්කත්[14]
ඔබේ ආඥාවලට මම ඇලුම්
කරමි.[15]
144 ඔබේ සිහිගැන්වීම් කොතරම්
ධර්මිෂ්ඨද! ඒවා සදහටම
එලෙසම පවතින්නේය.[16]
මාගේ දිවි රැකෙන පිණිස මට
ඒවා තේරුම්ගැනීමට උප-
කාර කරන්න.[17]

ק [කෝෆ්]

145 මාගේ මුළු හදින්ම මම ඔබට
කන්නලව් කළෙමි.[18] යෙ-
හෝවා දෙවියනි, මට පිළි-
තුරු දෙන්න.[19]
ඔබේ නියෝග මම පිළිපදින්-
නෙමි.[20]
146 මම ඔබට හඬගැසුවෙමි. අනේ,
මාව බේරාගන්න.[1]
ඔබේ සිහිගැන්වීම්වලට මම
කීකරු වන්නෙමි.[2]
147 ඔබේ උපකාර පැතීමට[3] මම හිමි-
දිරි උදයේ[4] අවදි වුණෙමි.
ඔබ මට පිළිතුරු දෙන තෙක්
මම බලා සිටියෙමි.[5]
148 ඔබේ වදන් ගැන ගැඹුරින් කල්-
පනා කිරීමට[6]
මම මැදියම් රැයේ අවදි
වුණෙමි.[7]
149 අනේ යෙහෝවා දෙවියනි, ඔබේ
ඉමහත් ප්‍රේමය* පෙන්වමින්
මාගේ කන්නලව්වට සවන්
දෙන්න.[8]
ඔබ තීන්දු කළ ලෙස මාගේ දිවි
රැක දෙන්න.[9]
150 නින්දිත ක්‍රියාවල නියැලෙන්-
නෝ[10] මා අසලටම පැමිණ
සිටිති.
ඔවුහු ඔබේ නීතියෙන් ඈත්ව
සිටිති.[11]
151 යෙහෝවා දෙවියනි, ඔබ මාගේ
සමීපයේ සිටින්නෙහිය.[12]
ඔබේ සියලු ආඥා විශ්වාසවන්-
තය.[13]
152 බොහෝ කාලයක සිට ඔබේ සිහි-
ගැන්වීම්[14] සමහරක් මම
දැන සිටියෙමි.
සදහටම පවතින ලෙස ඔබ
ඒවා පිහිටුවා ඇත.[15]

ר [රේෂ්]

153 දෙවියනි, මා විඳින දුක් ගැහැට
දෙස බලා මාව බේරා-
ගන්න.[16]

**119 ගීතාවලිය**

**1** 1සාමු 15:11
යෙරෙ 9:18
විලා 3:48
2පේතෘ 2:8
**2** ද්වි 32:4
එස්රා 9:15
නෙහෙ 9:33
යෙරෙ 12:1
දානි 9:7
**3** ද්වි 4:8
නෙහෙ 9:13
ගීතා 119:7
එළි 16:5
එළි 16:7
එළි 19:2
**4** ගීතා 119:144
**5** ගීතා 119:90
**6** 2රාජා 10:16
ගීතා 69:9
යොහ 2:17
**7** යෙසා 17:10
යෙරෙ 3:21
**8** 2සාමු 22:31
ගීතා 12:6
ගීතා 18:30
ගීතා 119:160
හිතෝ 30:5
යොහ 17:17
**9** ගීතා 119:97
ගීතා 119:163
**10** ගීතා 22:6
ලූක් 17:10
ලූක් 18:13
1පේතෘ 5:6
**11** ගීතා 119:93
**12** ගීතා 36:6
යෙසා 51:6
දානි 9:24
**13** නික් 34:6
නෙහෙ 9:13
ගීතා 19:9
ගීතා 119:151
ගීතා 119:160
යොහ 17:17
**14** ගීතා 18:4
ගීතා 88:3
මාක් 14:34
**15** ගීතා 112:1
ගීතා 119:47
**16** ගීතා 93:5
යෙරෙ 44:23
**17** ගීතා 119:34
ගීතා 119:116
හිතෝ 10:21
දානි 12:10
**18** විලා 3:41
මතෙ 22:37
**19** ගීතා 61:1
**20** නික් 15:26
ලෙවී 26:46
ගීතා 119:8

**2 තීරුව**

**1** ගීතා 3:7
මාක් 11:9
එළි 7:10
**2** ගීතා 93:5
ගීතා 119:22
**3** ගීතා 5:3
ගීතා 88:13
මාක් 1:35
**4** යෝබ් 3:9

**5** ගීතා 130:5; **6** ගීතා 119:11; **7** ගීතා 63:6; ලූක් 6:12; **8** ගීතා 51:1; ගීතා 65:2; යෙසා 63:7; **9** ගීතා 25:9; ගීතා 119:156; **10** ලෙවී 18:17; විනි 20:6; ගීතා 26:10; හිතෝ 10:23; හිතෝ 21:27; ගලා 5:19; 2පේතෘ 2:2; යූද් 4; **11** ලෙවී 20:14; හිතෝ 24:9; යෙරෙ 9:13; රෝම 1:32; **12** ද්වි 4:7; ගීතා 46:1; ගීතා 145:18; **13** නෙහෙ 9:13; ගීතා 19:9; ගීතා 119:142; යොහ 17:17; 1පේතෘ 1:22; **14** ගීතා 93:5; **15** ගීතා 119:144; දේශ 3:14; **16** ගීතා 6:4; ගීතා 9:13; ගීතා 140:1.

**ගීතා 119:149*** හෝ, “ළැදි ප්‍රේමය.”

මන්ද ඔබේ නීතිය මම අමතක නොකළෙමි.[1]
154 මා වෙනුවෙන් පෙනී සිට මාව බේරාගන්න.[2]
ඔබ පොරොන්දු වූ ලෙස මාගේ දිවි රැක දෙන්න.[3]
155 ගැලවීම දුෂ්ටයන්ගෙන් ඉතා ඈත්ව තිබේ.[4]
මන්ද ඔවුහු ඔබේ නියෝග පිළිපැදීමට උත්සාහ නොකරති.[5]
156 යෙහෝවා දෙවියනි, ඔබ පෙන්වන දයාව අතිමහත්ය.[6]
ඔබ තීන්දු කළ ලෙස මාගේ දිවි රැක දෙන්න.[7]
157 මට පීඩා කරන්නෝ බොහෝය. මාගේ සතුරෝ ගණනින් අධිකය.[8]
නමුත් මම ඔබේ සිහිගැන්වීම් අමතක නොකළෙමි.[9]
158 ද්‍රෝහිකම් කරන්නන්ව මම දුටුවෙමි.[10]
ඔවුන් ඔබේ වදන්වලට කීකරු නොවන නිසා ඔවුන් මට පිළිකුලකි.[11]
159 ඔබේ අණපනත්වලට මා අතිශයින් ප්‍රිය කරන බව අමතක නොකරන්න.[12]
යෙහෝවා දෙවියනි, ඔබ ප්‍රේමණීය* දෙවි කෙනෙක් නිසා මාගේ දිවි රැක දෙන්න.[13]
160 ඔබේ වදන් සත්‍යය.[14]
ඔබ දෙන සෑම ධර්මිෂ්ඨ තීන්දුවක්ම සදාකල් පවතින්නේය.[15]

ש [සින්] හෝ [ෂින්]

161 කිසිම හේතුවක් නොමැතිව අධිපතීහු මට පීඩා කළෝය.[16]
නමුත් මම ඔබේ වදන් කෙරෙහි පමණක් ගරුබියක් පෙන්වූවෙමි.[17]
162 වටිනා වස්තුවක් ලබාගත් තැනැත්තෙකු මෙන්[18]
ඔබේ වදන් ගැන මම සතුටු වෙමි.[1]
163 මම වංචාවට ද්වේෂ කරමි.[2]
සැමදා එයට පිළිකුල් කරමි.[3]
නමුත් ඔබේ නීතියට මම අතිශයින් ප්‍රිය කරමි.[4]
164 ඔබේ තීන්දු ධර්මිෂ්ඨ නිසා[5]
දවසට සත් වතාවක්ම මම ඔබට ප්‍රශංසා කළෙමි.[6]
165 ඔබේ නීතියට ප්‍රිය කරන අය මහත් සමාදානයක්* අද්දකිනු ඇත.[7]
පය පැටලී ඔවුහු කිසිවිටක වැටෙන්නේ නැත.[8]
166 යෙහෝවා දෙවියනි, ඔබ ගැලවීම දෙන තෙක් මම බලා සිටින්නෙමි.[9]
ඔබේ ආඥා මම පිළිපදිමි.[10]
167 ඔබේ සිහිගැන්වීම්වලට මම කීකරු වෙමි.[11]
ඒවාට අතිශයින් ප්‍රිය කරමි.[12]
168 ඔබේ අණපනත් හා සිහිගැන්වීම්වලට මම කීකරු වෙමි.[13]
ඔබ මාගේ සියලු ක්‍රියා දකින්නෙහිය.[14]

ת [ටාව්]

169 යෙහෝවා දෙවියනි, මාගේ කන්නලව්වට සවන් දෙන්න.[15]
ඔබ පොරොන්දු වූ ලෙස තේරුම්ගැනීමේ හැකියාව මට ලබා දෙන්න.[16]
170 කරුණාව පතා මා ඔබට කරන ඉල්ලීමට ඇහුම්කන් දෙන්න.[17]

**119 ගීතාවලිය**
1 ගීතා 119:109; හොෂෙ 4:6
2 විනි 6:31; 1සාමු 24:15; ගීතා 35:1; ගීතා 43:1; හිතෝ 22:23; හිතෝ 23:11; යෙරෙ 50:34; විලා 3:59; මීකා 7:9
3 හෙබ්‍රෙ 10:39
4 ගීතා 73:27; හිතෝ 15:29
5 1රාජා 8:58; 2රාජා 17:15
6 1ලේක 21:13; ගීතා 86:15; යෙසා 55:7; 2කොරි 1:3; යාකො 5:11
7 ගීතා 119:149
8 ගීතා 3:1; ගීතා 25:19; ගීතා 56:2; මතෙ 24:9
9 ගීතා 19:7; ගීතා 44:18; ගීතා 119:51; 1කොරි 15:58
10 නික් 21:8; හිතෝ 2:22; හිතෝ 11:6; ශෙප 3:4
11 ගීතා 139:21; එස 9:4
12 ගීතා 119:40; ගීතා 119:69
13 ගීතා 6:4; ගීතා 119:88; විලා 3:22
14 2සාමු 7:28; 1රාජා 17:24; ගීතා 12:6; ගීතා 119:140; හිතෝ 30:5; යොහ 17:17
15 ගීතා 119:75
16 1සාමු 24:11; 1සාමු 26:18; ගීතා 119:23; යොහ 15:25
17 නික් 9:20; 2රාජා 22:19; යෙසා 66:2
18 1සාමු 30:16; යෙසා 9:3

**2 තීරුව**
1 ගීතා 40:16; යෙසා 61:10; යෙරෙ 15:16
2 ගීතා 119:104; හිතෝ 6:19; ආමො 5:15; රෝම 12:9
3 ගීතා 101:7; ගීතා 119:29; එෆී 4:25; 4 ගීතා 1:2; 5 ගීතා 97:8; එළි 19:2; 6 ගීතා 55:17; ගීතා 119:62; 7 ගීතා 1:3; හිතෝ 3:1; යෙසා 32:17; යෙසා 48:18; 1කොරි 14:33; 8 යෙසා 57:14; මතෙ 13:21; රෝම 14:13; 1පේතෘ 2:6; 9 උත් 49:18; ගීතා 130:7; 10 ද්වි 4:2; ගීතා 19:8; 11 ගීතා 19:7; ගීතා 25:10; ගීතා 99:7; 12 ගීතා 1:2; ගීතා 40:8; රෝම 7:22; 13 ගීතා 119:8; ගීතා 119:93; 14 ගීතා 11:5; ගීතා 139:3; හිතෝ 5:21; හිතෝ 15:11; හෙබ්‍රෙ 4:13; 15 ගීතා 18:6; 16 1ලේක 22:12; 2ලේක 1:10; හිතෝ 2:3; යාකො 1:5; 17 ගීතා 55:1.

ගීතා **119:159*** හෝ, “ළැදි ප්‍රේමයකින් යුත්.”

ගීතා **119:165*** හෝ, “සැනසීමක්.”

ඔබ පොරොන්දු වූ ලෙස මාව බේරාගන්න.[1]
171 මාගේ දෙතොල් නිරතුරුවම ඔබට ප්‍රශංසා කරනු ලැබේවා![2]
මන්ද ඔබේ නියෝග ඔබ මට උගන්වන්නෙහිය.[3]
172 මම ඔබේ වදන් ගැන ගී ගයන්නෙමි.[4]
මන්ද ඔබේ සියලු ආඥා ධර්මිෂ්ඨය.[5]
173 ඔබේ හස්තයෙන් මට උපකාර කරන්න.[6]
මන්ද ඔබේ අණපනත්වලට කීකරු වීමට මම තීරණය කළෙමි.[7]
174 යෙහෝවා දෙවියනි, ඔබ ගැලවීම ලබා දෙන තෙක් මම මහත් ආශාවෙන් බලා සිටිමි.[8]
ඔබේ නීතියට මම ඇලුම් කරමි.[9]
175 ඔබට හැමදාටම ප්‍රශංසා කිරීමට මට හැකි වන පිණිස මාගේ දිවි රැක දෙන්න.[10]
ඔබේ තීන්දුවලින් මට උපකාර ලැබේවා![11]
176 අතරමං වූ බැටළුවෙකු මෙන් මම මංමුළා වුණෙමි.[12]
ඔබේ සේවකයාව[13] සොයා, නැවත රැගෙන යන්න.
මන්ද ඔබේ සේවකයා වන මට ඔබේ ආඥා අමතක වී නැත.[14]

කන්ද නඟින විට ගැයූ ගීතයකි.

**120** මාගේ විපතේදී මම යෙහෝවා දෙවිට කන්නලව් කළෙමි.[15]
ඔහු මට පිළිතුරු දුන්නේය.[16]
2 යෙහෝවා දෙවියනි, බොරු කියන අයගෙන්ද[17]
රැවටිලිකාරයන්ගෙන්ද[18] මාගේ දිවි රැක දෙන්න.
3 රැවටිලිකාරයෙනි, ඔබට කුමක් ලැබෙයිද?
ඔබට කුමක් අත් වෙයිද?[1]
4 බලවන්තයෙකුගේ තියුණු ඊතල ප්‍රහාරවලට ඔබ ලක් වනු ඇත.[2]
අධික රස්නයකින් දැවෙන ගිනි අඟුරු ඔබ පිටට පැමිණෙනු ඇත.[3]
5 මට දුක් වේ! මන්ද මම මෙෂෙක්හි[4] විදේශිකයෙකු මෙන් වාසය කළෙමි.
කේදාර්හි[5] කූඩාරම් ගසාගත් අය සමඟ මට ජීවත් වීමට සිදු විය.
6 සමාදානයට අකමැති අය සමඟ[6] බොහෝ කාලයක් වාසය කිරීමට මට සිදු විය.[7]
7 ඔවුන් සමඟ සමාදානයෙන් කටයුතු කිරීමට මම කොතරම් උත්සාහ දැරුවත්[8]
ඔවුහු මා සමඟ සටනට එති.[9]

කන්ද නඟින විට ගැයූ ගීතයකි.

**121** උපකාරය පතමින් මම කඳු දෙසට දෙනෙත් යොමු කළෙමි.[10]
මට උපකාර ලැබෙන්නේ කාගෙන්ද කියා මම කල්පනා කළෙමි.[11]
2 මට උපකාර ලැබෙන්නේ
අහසත් පොළොවත් සෑදූ[12] යෙහෝවා දෙවිගෙන්ය.[13]
3 ඔබේ පය පැටලී වැටෙන්න ඔහු ඉඩ නොදෙන්නේය.[14]
ඔබව ආරක්ෂා කරන තැනැත්තා කිසිවිටක නින්දට නොයන්නේය.[15]
4 ඊශ්‍රායෙල් සෙනඟව ආරක්ෂා කරන තැනැත්තා[16]
නිදිකිරා වැටෙන්නේ නැත. ඔහු

**119 ගීතාවලිය**
**1** 2සාමු 7:28 ගීතා 119:41
**2** ගීතා 63:5 ගීතා 71:17 ගීතා 145:7 යොහ 4:14
**3** ද්වි 6:1
**4** ගීතා 40:9 ගීතා 119:11
**5** ගීතා 119:86
**6** ගීතා 60:5
**7** ද්වි 30:19 යොෂු 24:15 යොෂු 24:22 ගීතා 119:15 හිතෝ 1:29 ලූක් 10:42
**8** උත් 49:18 2සාමු 23:5 ගීතා 119:81 එළි 7:10
**9** ගීතා 1:2 ගීතා 119:16
**10** ගීතා 9:14 යෙසා 38:19
**11** ද්වි 4:1 ගීතා 119:75
**12** ගීතා 95:7 යෙසා 53:6 එස 34:6 මතෙ 10:6 ලූක් 15:4 1පේතෘ 2:25
**13** 2ලේක 32:16
**14** ලෙවී 27:34 ගීතා 119:60 දේශ 12:13 හොෂෙ 4:6

**120 ගීතාවලිය**
**15** ගීතා 18:6 ගීතා 116:4
**16** ගීතා 50:15 ගීතා 107:13 යෝනා 2:2
**17** ගීතා 35:11 ගීතා 109:2 මතෙ 26:59 එෆී 4:29
**18** ගීතා 52:2 ගීතා 119:118 එෆී 4:14

**2 තීරුව**
**1** ගීතා 52:4 හිතෝ 12:22 යාකො 3:6
**2** ගීතා 7:13 ගීතා 59:7 ගීතා 64:3 හිතෝ 12:18
**3** ගීතා 140:10 හිතෝ 16:27
**4** උත් 10:2 එස 27:13
**5** සල 1:5 යෙරෙ 49:28

**6** ගීතා 57:4; එස 2:6; මතෙ 10:16; **7** හෙබ්‍රෙ 11:9; **8** ගීතා 34:14; මතෙ 5:9; හෙබ්‍රෙ 12:14; 1පේතෘ 3:11; **9** 1සාමු 24:11; 1සාමු 26:2; ගීතා 35:20; **121 ගීතාවලිය** **10** ගීතා 125:2; **11** ගීතා 124:8; ගීතා 146:5; හොෂෙ 13:9; **12** උත් 1:1; ගීතා 8:3; ගීතා 115:15; ගීතා 124:8; යෙසා 40:26; ක්‍රියා 17:24; එළි 4:11; **13** 1රාජා 8:45; ගීතා 3:4; ගීතා 46:1; යෙසා 41:13; යෙරෙ 20:11; දානි 6:10; හෙබ්‍රෙ 13:6; **14** 1සාමු 2:9; ගීතා 91:12; හිතෝ 3:26; ලූක් 1:79; **15** හිතෝ 2:8; 1පේතෘ 1:5; **16** ගීතා 127:1.

සෑමවිටම අවදිව සිටින්-
නේය.[1]
5 යෙහෝවා දෙවි ඔබව ආරක්ෂා
කරන්නේය.[2]
යෙහෝවා දෙවි ඔබේ දකුණු-
පසට[3] රැකවරණය දෙන්-
නේය.[4]
6 දහවල් කාලයේදී අධික හිරු රශ්මි-
යෙන්වත්[5]
රාත්‍රි කාලයේදී සඳ එළියෙන්-
වත්[6] ඔබට කිසිදු හානියක්
නොවන්නේය.
7 යෙහෝවා දෙවි සියලු විපත්තිව-
ලින් ඔබව ආරක්ෂා කරන්-
නේය.[7]
ඔහු ඔබේ දිවි රැක දෙන්නේය.[8]
8 අදත් හෙටත් සදාකාලයටත්[9]
ඔබ යන එන සෑම තැනක-
දීම යෙහෝවා දෙවි ඔබව
ආරක්ෂා කරන්නේය.[10]

දාවිත් රචනා කළ ගීතයකි. කන්ද
නඟින විට ගැයූ ගීතයකි.

# 122

“යෙහෝවා දෙවිගේ ගෘහ-
යට[11] අපි යමු”[12] කියා
ඔවුන් මට කී විට
මම සතුටින් ඉපිල
ගියෙමි.[13]
2 යෙරුසලම් නුවර,[14]
අපි ඔබේ දොරටුවලින් ඇතුල්
වුණෙමු.[15]
3 යෙරුසලම මනාව ගොඩනැඟූ,[16]
ඉතා අලංකාර නුවරකි.[17]
4 සියලු ගෝත්‍රවලට අයත් සෙනඟ
එතැනට එක් රැස් වී ඇත.[18]
යෙහෝවා දෙවි තම සෙනඟට[19]
දුන් සිහිගැන්වීමට කීකරු
වෙමින්[20]
ඊශ්‍රායෙල් ගෝත්‍ර සියල්ලම
යෙහෝවා දෙවිගේ නාමයට
ප්‍රශංසා කිරීමට එහි එක් රැස්
වී ඇත.[21]
5 විනිශ්චය කරන්නන්ගේ සිංහාසන
එහි ඇත.[22]
එසේය, දාවිත්ගේ පෙළපතට
අයත් සිංහාසන එහි ඇත.[23]
6 ජනයෙනි, යෙරුසලමට සාමය
පතා යාච්ඤා කරන්න.[1]
තේජවත් නුවර, ඔබට ඇලුම්
කරන්නෝ කිසිදු දුකක්,
කනස්සල්ලක් අත් නො-
දකිති.[2]
7 පවුරෙන් වට වී සිටින ඔබ තුළ
සැමදා සමාදානය තිබේවා![3]
ඔබේ බලකොටු තුළ සැනසිල්-
ලේ කාලය ගත කිරීමට හැකි
වේවා![4]
8 මාගේ සහෝදරයන්ද මාගේ මිත්‍ර-
යන්ද වෙනුවෙන් මම මේ දේ
කියන්නෙමි.[5]
“ඔබ තුළ සැමදා සමාදානය
තිබේවා!”[6]
9 අපේ දෙවි යෙහෝවාගේ ගෘහය
වෙනුවෙන්[7]
ඔබට යහපත පතා මම යාච්ඤා
කරන්නෙමි.[8]

කන්ද නඟින විට ගැයූ ගීතයකි.

# 123

ස්වර්ගයේ වාසය කරන
තැනැත්තාණෙනි,[9]
මාගේ දෙනෙත් මම
ඔබ වෙතට යොමු
කළෙමි.[10]
2 සේවකයන් තම ස්වාමියා දෙසද[11]
සේවිකාවන් තම ස්වාමිදුව දෙ-
සද[12] බලා සිටින්නාක් මෙන්
අපි අපේ දෙවි වන ඔබ දෙස
දෙනෙත් අයා බලා සිටින්-
නෙමු.[13]
එසේය, යෙහෝවා දෙවි වන
ඔබ අපට කරුණාව පෙන්වන
තෙක් අපි ඔබ දෙස බලා
සිටින්නෙමු.[14]
3 යෙහෝවා දෙවියනි, ඔබේ කරු-
ණාව අපට පෙන්වන්න.
අපට කරුණාවෙන් සල-
කන්න.[15]

**121 ගීතාවලිය**
1 යෙසා 27:3
යෙසා 40:28
2 නික් 15:2
ගණන් 23:21
3 ගීතා 16:8
ගීතා 73:23
ගීතා 109:31
4 ගීතා 91:1
යෙසා 4:5
යෙසා 25:4
5 ගීතා 91:6
යෙසා 49:10
එළි 7:16
6 යෝබ් 31:26
ගීතා 91:5
7 ගීතා 91:10
හිතෝ 12:21
8 ගීතා 34:22
ගීතා 41:2
ගීතා 97:10
ගීතා 145:20
9 ගීතා 113:2
ගීතා 115:18
10 ද්වි 28:6
2සාමු 5:2

**122 ගීතාවලිය**
11 ගීතා 27:4
12 2සාමු 6:15
ගීතා 84:10
මීකා 4:2
13 ගීතා 42:4
ගීතා 55:14
ගීතා 106:5
14 2ලේක 6:6
ගීතා 87:2
ගීතා 100:4
15 ගීතා 84:7
16 2සාමු 5:9
ගීතා 132:13
17 ගීතා 48:2
18 නික් 23:17
ගීතා 78:68
යෙසා 2:3
19 ද්වි 12:5
20 නික් 16:34
ගීතා 19:7
21 ගීතා 107:1
22 ද්වි 17:8
2ලේක 19:8
23 2සාමු 7:16
2සාමු 8:18
1රාජා 10:18
1ලේක 29:23
මතෙ 19:28

**2 තීරුව**
1 2සාමු 19:30
ගීතා 51:18
2 උත් 12:3
ගණන් 24:9
3 ගීතා 48:13
4 ගීතා 48:12
5 ගීතා 16:3
6 1ලේක 12:18
ගීතා 122:6
7 1රාජා 8:6
1ලේක 29:3
ගීතා 26:8
ගීතා 69:9

8 ගීතා 102:14; ගීතා 137:5; **123 ගීතාවලිය** 9 ගීතා 2:4; ගීතා 11:4; ගීතා 115:3; මතෙ 6:9; 10 ගීතා 25:15; ගීතා 121:1; ගීතා 141:8; ලූක් 18:13; 11 නෙහෙ 2:3; 12 උත් 16:3; 13 උත් 49:18; ගීතා 119:82; ගීතා 119:123; ගීතා 130:6; 14 විලා 3:25; මීකා 7:7; 15 ගීතා 56:1; ගීතා 57:1; ගීතා 69:16.

මන්ද අපි බොහෝ නින්දා අප-
හාසවලට ලක් වී සිටින්-
නෙමු.[1]
4 සැප පහසු දිවියක් ගත කරන අය-
ගේ සමච්චලයට අපි මැදි වී
සිටින්නෙමු.[2]
අහංකාර අය අපව ඉතා පහත්
කොට සලකන්නෝය.[3]

දාවිත් රචනා කළ ගීතයකි. කන්ද
නඟින විට ගැයූ ගීතයකි.

124 ඊශ්‍රායෙල්, දැන් මෙසේ
කියන්න.[4]
“යෙහෝවා දෙවි අපට
උපකාර නොකළා
නම්,[5]
2 මනුෂ්‍යයන් අපට විරුද්ධව නැඟී
සිටියදී[6]
යෙහෝවා දෙවි අප සමඟ නො-
සිටියේ නම්,[7]
3 ඔවුන්ගේ කෝපය අපට විරුද්ධව
ඇවුළුණු විට[8]
ඔවුන් අපව පණපිටින්ම ගිල
දැමීමට ඉඩ තිබිණ.[9]
4 විශාල දිය පහරකින් අපව ගසා-
ගෙන යෑමටද[10]
ජල ධාරාවකින් අපව යට වී
යෑමටද[11] ඉඩ තිබිණ.
5 රෞද්‍ර ජල පහරකට හසු වී
ගිලෙන්නද ඉඩ තිබිණ.[12]
6 අපව ඔවුන්ගේ ගොදුරක් වීමට ඉඩ
නොදුන්[13]
යෙහෝවා දෙවිට ප්‍රශංසා
වේවා![14]
7 අප උගුල් අටවන්නන්ගේ දැලෙන්[15]
බේරී ගිය කුරුල්ලන් මෙනි.[16]
දැල කැඩී ගියේය.[17]
අපි බේරී ඉගිලී ගියෙමු.[18]
8 අපට උපකාරය ලැබෙන්නේ
අහසත් පොළොවත් සෑදූ[19] යෙ-
හෝවා නම් වූ දෙවිගෙන්ය.”[20]

කන්ද නඟින විට ගැයූ ගීතයකි.

125 යෙහෝවා දෙවි කෙරෙහි
විශ්වාසය තබන අය[21]
කිසිදා නොසෙල්වෙන
සියොන් කන්ද හා
සමානය.[1] එසේය, සදා-
හටම පවතින සියොන්
කන්ද හා සමානය.[2]
2 යෙරුසලම කඳුවලින් වට වී
තිබෙන්නාක් මෙන්[3]
යෙහෝවා දෙවි තම සෙනඟව
සැම පැත්තෙන්ම ආරක්ෂා
කරන්නේය.[4]
එසේය, අදත් හෙටත් සැමදාට-
මත් දෙවි ඔවුන්ව ආරක්ෂා
කරන්නේය.[5]
3 දුෂ්ටයන්ගේ රාජ යෂ්ටිය ධර්මිෂ්ඨ-
යන්ට උරුම වූ දේශය කෙ-
රෙහි සැමදාටම බලපවත්-
වන්නේ නැත.[6]
එසේ වන්නේ ධර්මිෂ්ඨයන්
අතින් වරදක් සිදු නොවන
පිණිසය.[7]
4 ප්‍රතිපත්තිගරුකව ක්‍රියා කරන,[8]
යහපත් අයට යෙහෝවා දෙවි
ආශීර්වාද කරන්නේය.[9]
5 දුෂ්ටකම් කරන්නන්ට[10] මෙන්
යහපත් මාර්ගය අත්හැර වංක
මාවත්වල ගමන් කරන්නන්-
ටද[11] යෙහෝවා දෙවි දඬුවම්
කරන්නේය.
ඊශ්‍රායෙල්ට සමාදානය
ලැබේවා![12]

කන්ද නඟින විට ගැයූ ගීතයකි.

126 වහල්භාවයේ සිටි සියොන්හි
වැසියන්ව යෙහෝවා
දෙවි නැවත ඔවුන්ගේ
දේශයට ගෙනා විට[13]
එය අපට සිහිනයක්
මෙන් විය.[14]
2 එකල අපි නිතරම සිනාමුසු මුහු-
ණෙන්ද[15]
ප්‍රීති ඝෝෂා නඟමින්ද[16] සිටි-
යෙමු.

**123 ගීතාවලිය**
1 නෙහෙ 4:4
ගීතා 44:13
ගීතා 89:51
2 ගීතා 73:12
ගීතා 119:51
යෙරෙ 48:11
3 ගීතා 73:6
යෙරෙ 48:29
1කොරි 4:13

**124 ගීතාවලිය**
4 ගීතා 129:1
5 ගීතා 46:7
රෝම 8:31
හෙබ්‍රෙ 13:6
6 ගීතා 3:1
ගීතා 22:16
ගීතා 37:32
7 ගීතා 54:4
ගීතා 118:6
8 ගීතා 56:1
ගීතා 76:10
හිතෝ 1:12
9 2ලේක 20:2
එස්ත 3:6
ගීතා 27:2
යෙරෙ 51:34
10 ගීතා 18:4
එළි 17:15
11 ගීතා 42:7
12 හිතෝ 21:24
13 නික් 15:9
විනි 5:30
14 1සාමු 26:20
ගීතා 118:13
15 හිතෝ 6:5
යෙරෙ 5:26
16 1සාමු 23:26
2සාමු 17:22
17 ගීතා 25:15
18 ගීතා 91:3
19 උත් 1:1
ගීතා 121:2
ගීතා 134:3
ක්‍රියා 4:24
20 හිතෝ 18:10

**125 ගීතාවලිය**
21 1ලේක 5:20
ගීතා 33:21
ගීතා 118:8
හිතෝ 3:5
යෙරෙ 17:7

**2 තීරුව**
1 ගීතා 48:2
ගීතා 132:14
මීකා 4:2
එළි 14:1
2 1රාජා 8:13
3 1රාජා 11:7
ක්‍රියා 1:12
4 ද්වි 33:27
ගීතා 34:7
ගීතා 46:11
යෙසා 4:5
යෙසා 31:5
සෙක 2:5
5 එස්රා 3:11

**6** හිතෝ 22:8; යෙසා 10:5; යෙසා 14:5; **7** දේශ 7:7; **8** ගීතා 32:11; ගීතා 36:10; ගීතා 97:11; යොහ 1:47; **9** යෝබ් 34:11; ගීතා 51:18; ගීතා 73:1; හෙබ්‍රෙ 6:10; **10** ගීතා 53:5; **11** 1ලේක 10:13; ගීතා 40:4; ගීතා 101:3; හිතෝ 2:15; යෙසා 59:8; **12** ගීතා 128:6; එස 37:26; ගලා 6:16; **126 ගීතාවලිය** **13** එස්රා 1:3; ගීතා 53:6; ගීතා 85:1; හොෂෙ 6:11; **14** යෝබ් 9:16; ක්‍රියා 12:9; **15** ගීතා 14:7; යෙසා 49:13; යෙරෙ 31:12; **16** එස්රා 3:11; ගීතා 106:47; යෙරෙ 33:11.

වෙනත් ජාතීන්ට අයත් සෙනඟද
මෙසේ පැවසුවෝය.[1]
“යෙහෝවා දෙවි තම සෙනඟ
වෙනුවෙන් කළ දේ මොන
තරම් ශ්‍රේෂ්ඨද!”[2]
3 යෙහෝවා දෙවි අප වෙනුවෙන් පුදු-
මාකාර දේවල් කර තිබේ.[3]
එබැවින් අපි මහත් ප්‍රීතියකින්
සිටින්නෙමු.[4]
4 යෙහෝවා දෙවියනි, නෙගෙබ්
පාළුකරයෙහි සිඳී ගොස්
තිබෙන දිය පාරවල් නැවත
ජලයෙන් පිරී යන්නාක්
මෙන්[5]
වහලුන්ව සිටින අපව නැවත
එක් රැස් කරන්න.[6]
5 කඳුළු සලමින් වපුරන්නෝ[7]
ප්‍රීති ඝෝෂා නඟමින් නෙළාගන්-
නෝය.[8]
6 බීජ මල්ලක් රැගෙන[9] කඳුළු සල-
මින් පිටත්ව ගියත්[10]
ගොයම් මිටි උසුලාගෙන[11] ප්‍රීති
ඝෝෂා නඟමින් නැවත පැමි-
ණෙන්නෝය.[12]

සලමොන් රචනා කළ ගීතයකි. කන්ද
නඟින විට ගැයූ ගීතයකි.

# 127

යෙහෝවා දෙවි ගෘහය
ගොඩනඟන්නේ නැත්-
නම්[13]
ගොඩනඟන්නන්ගේ වෙ-
හෙස නිෂ්ඵල වනු
ඇත.[14]
යෙහෝවා දෙවි නුවර
ආරක්ෂා කරන්නේ
නැත්නම්[15]
මුරකරුවන් අවදිව සිටී-
මෙන් කිසිදු පලක්
නැත.[16]
2 දෙවිගේ ආශීර්වාදය නැත්නම්
කුසගිනි නිවාගැනීමට උදෑස-
නින්ම අවදි වී[17]
රෑ වන තුරුම[18] වෙහෙස මහන්සි වී
වැඩ කළත් ඉන් කිසි පලක්
නැත.[19]
නමුත් දෙවිගේ ආශීර්වාදය
ඇති, ඔහුගේ ප්‍රේමය දිනාගත්
තැනැත්තාගේ නින්ද සැප-
වත්ය.[1]
3 දරුවෝ යෙහෝවා දෙවිගෙන්
ලැබෙන උරුමයකි.[2]
කුසේ පලය ඔහුගෙන් ලැබෙන
තෑග්ගකි.[3]
4 තරුණ වියේදී වැදූ දරුවන්[4]
බලවත් මිනිසෙකුගේ අතේ ඇති
ඊතල මෙනි.[5]
5 එවැනි ඊතලවලින් පිරුණු ඊකො-
පුවක් ඇති මනුෂ්‍යයා සන්-
තෝෂවත්ය.[6]
ඔහු ලැජ්ජාවට පත් නොවන්-
නේය.[7]
මන්ද ඔහුගේ දරුවෝ දො-
රටු අසලදී ඔහුගේ සතුරන්ට
විරුද්ධව කතා කරනු ඇත.

කන්ද නඟින විට ගැයූ ගීතයකි.

# 128

යෙහෝවා දෙවි කෙරෙහි
ගරුබියක් ඇත්තාවූ[8]
ඔහුගේ මාර්ගවල ගමන්
කරන්නාවූ සියල්ලෝ[9]
සන්තෝෂවත්ය.
2 මන්ද ඔබ ඔබේම දෑතින් උපයා-
ගත් දේ භුක්ති විඳිනු ඇත.[10]
ඔබ සන්තෝෂයෙන් ජීවත් වනු
ඇත. ඔබ යහපත අද්දකිනු
ඇත.[11]
3 ඔබේම නිවසෙහි සිටින
ඔබේ බිරිඳ හොඳින් පල දරන
මිදිවැලක් මෙනි.[12]
ඔබේ මේසය වටා සිටින ඔබේ
දරුවෝ ඔලීව ගසක රිකිලි
මෙනි.[13]
4 යෙහෝවා දෙවි කෙරෙහි ගරුබියක්
ඇති තැනැත්තාට[14]
එසේ ආශීර්වාද ලැබෙන්නේය.[15]
5 සියොන්හි සිට යෙහෝවා දෙවි

**126 ගීතාවලිය**
**1** රෝම 15:10
එළි 15:4
**2** ගණන් 23:23
යොෂු 2:9
නෙහෙ 6:16
**3** එස්රා 7:28
ගීතා 18:50
ගීතා 68:7
යෙසා 11:11
යෙසා 61:6
සෙක 8:23
මතෙ 24:31
එළි 11:11
**4** ගීතා 14:7
**5** යෙසා 41:18
**6** ගීතා 85:4
**7** ගීතා 137:1
යෙරෙ 31:9
**8** මතෙ 5:4
යොහ 16:20
**9** ගලා 6:7
**10** යෙරෙ 50:4
**11** යෙසා 9:3
**12** ගීතා 30:5
යෙසා 61:3

**127 ගීතාවලිය**
**13** 2සාමු 7:11
හිතෝ 3:6
මතෙ 6:10
හෙබ්‍රෙ 3:2
යාකො 4:15
**14** හිතෝ 10:22
1කොරි 3:9
**15** විනි 5:8
ගීතා 121:5
යෙසා 27:3
සෙක 2:5
**16** හිතෝ 16:3
යෙසා 62:6
යෙරෙ 51:12
එස 33:2
**17** ගීතා 39:6
**18** රූත් 2:7
**19** උත් 3:17

**2 තීරුව**
**1** ගීතා 3:5
ගීතා 4:8
දේශ 5:12
යෙරෙ 31:26
**2** උත් 33:5
උත් 48:4
1සාමු 2:21
1ලේක 28:5
**3** උත් 30:2
උත් 41:52
ලෙවී 26:9
ද්වි 28:4
යොෂු 24:3
යොෂු 24:4
ගීතා 128:3
යෙසා 8:18
**4** හිතෝ 17:6
හිතෝ 31:28
**5** යෙරෙ 50:9
**6** උත් 50:23
යෝබ් 1:2
යෝබ් 42:13

**7** හිතෝ 27:11; **128 ගීතාවලිය** **8** ගීතා 103:17; ගීතා 112:1; ගීතා 115:13; ගීතා 147:11; ලූක් 1:48; හෙබ්‍රෙ 5:7; **9** උත් 6:9; ගීතා 81:13; ගීතා 119:1; මීකා 6:8; ලූක් 1:6; ක්‍රියා 9:31; 1තෙස 4:1; **10** උත් 3:19; ද්වි 28:4; යෙසා 3:10; **11** දේශ 5:18; යෙසා 65:22; **12** නික් 23:26; ගීතා 127:3; **13** ගීතා 52:8; ගීතා 144:12; හොෂෙ 14:6; රෝම 11:24; **14** ගීතා 15:4; ගීතා 115:13; දේශ 8:12; **15** ගීතා 40:4; ගීතා 127:5.

ඔබට ආශීර්වාද කරන්නේය.[1]
ඔබේ මුළු ජීවිත කාලය පුරාම යෙරුසලමේ සිදු වන සෑම යහපත් දෙයක්ම අද්දකින්න.[2]
6 ඔබේ දරුවන්ගේ දරුවන්වත් ඔබට දැකගැනීමට හැකි වන්නෙහිය.[3]
ඊශ්‍රායෙල්ට සමාදානය ලැබේවා![4]

කන්ද නඟින විට ගැයූ ගීතයකි.

**129** ඊශ්‍රායෙල් මෙසේ කියන්න.[5]
"මාගේ යොවුන් වියේ සිට ඔවුහු මට බොහෝ විරුද්ධවාදිකම් කළෝය.[6]
2 බොහෝ කාලයක් පුරා ඔවුහු මට විරුද්ධව ක්‍රියා කළෝය.[7]
නමුත් ඔවුන්ට මාව පාගා දැමීමට හැකි වූයේ නැත.[8]
3 කුඹුරක් කොටන්නාක් මෙන් ඔවුහු මට හිරිහැර කළෝය.[9]
නඟුලෙන් එහි පස පෙරළන්නාක් මෙන් ඔවුහු දිගින් දිගටම මාව තළා පෙළා දැමුවෝය."
4 යෙහෝවා දෙවි ධර්මිෂ්ඨය.[10]
දුෂ්ටයන් අපව බැඳ දමා තිබූ කඹ ඔහු කැබලිවලට කඩා දැමුවේය.[11]
5 සියොන්ට වෛර කරන සියල්ලෝ[12]
ලැජ්ජාවට පත්ව ආපසු හැරී යන්නෝය.[13]
6 ඔවුහු, උගුල්ලන්නත් කලින් වියළී යන[14]
පියස්ස මත වැවෙන තණකොළ මෙන් වන්නෝය.[15]
7 අස්වනු නෙළන්නා එවැනි තණකොළවලින් එක් මිටියක්වත් කපාගන්නේ නැත.[16]
ගොයම් මිටි බඳින්නා ඒවා තමන් ළඟටවත් ගන්නේ නැත.
8 ඔවුන්ව හමු වන කිසිවෙක්,
"යෙහෝවා දෙවිගේ ආශීර්වාදය ඔබට ලැබේවා![1]
යෙහෝවා දෙවිගේ නාමයෙන් අපි ඔබට ආශීර්වාද කරමු"[2]
කියා කිසිවිටක නොකියනු ඇත.

කන්ද නඟින විට ගැයූ ගීතයකි.

**130** යෙහෝවා දෙවියනි, දුක් සාගරයක ගිලී සිටියදී මම ඔබට කන්නලව් කළෙමි.[3]
2 අනේ යෙහෝවා දෙවියනි, මාගේ හඬට ඇහුම්කන් දෙන්න.[4]
මාගේ කන්නලව්වලට ඔබේ දෙසවන් යොමු කරන්න.[5]
3 යෙහෝවා දෙවියනි, ඔබ අපේ වැරදි දෙසම බලා සිටිනවා නම්,[6]
අනේ යෙහෝවා දෙවියනි, ඔබ ඉදිරියේ සිටිය හැක්කේ කාටද?[7]
4 සැබවින්ම සමාව දිය හැක්කේ ඔබටය.[8]
එබැවින් ඔබ කෙරෙහි අපට ගරුබියක් ඇති වන්නේය.[9]
5 මම ඔබේ උපකාරය බලාපොරොත්තුවෙන් සිටිමි. යෙහෝවා දෙවියනි, ඔබ මට උපකාර කරයි කියා මම බලාපොරොත්තුවෙන් සිටිමි.[10]
ඔබ පැවසූ දේ ඉටු වන තෙක් මම බලාපොරොත්තුවෙන් සිටිමි.[11]
6 එළිය වැටෙන තෙක් මුරකරුවන් නොඉවසිල්ලෙන් බලා සිටියි.[12]
ඊටත් වඩා මහත් ආශාවකින්[13] යෙහෝවා දෙවි වන ඔබ දෙස මම බලා සිටිමි.[14]

**128 ගීතාවලිය**
1 ගීතා 20:2
ගීතා 134:3
මීකා 4:2
2 ගීතා 122:6
යෙසා 33:20
3 උත් 50:23
යෝබ් 42:16
4 ගීතා 125:5
යෙසා 66:12
ගලා 6:16

**129 ගීතාවලිය**
5 ගීතා 124:1
6 නික් 5:9
1සාමු 13:19
7 විලා 1:3
එස 23:3
හොෂෙ 11:1
8 ගීතා 118:13
ගීතා 125:3
යොහ 16:33
9 ගීතා 66:12
ගීතා 141:7
යෙසා 51:23
10 එස්රා 9:15
නෙහෙ 9:33
විලා 1:18
දානි 9:7
11 ගීතා 124:7
ගීතා 140:5
12 ගීතා 83:4
ගීතා 137:7
13 නෙහෙ 6:16
එස්ත 6:13
එස්ත 9:5
යෙසා 37:29
සෙක 12:3
14 මතෙ 13:6
15 2රාජා 19:26
නෙහෙ 4:4
ගීතා 37:2
ගීතා 92:7
යෙසා 37:27
යෙරෙ 17:6
16 යෙසා 17:11
හොෂෙ 8:7
ගලා 6:8

**2 තීරුව**
1 රූත් 2:4
2 ගීතා 118:26

**130 ගීතාවලිය**
3 ගීතා 18:5
ගීතා 25:17
ගීතා 40:2
ගීතා 71:20
විලා 3:55
යෝනා 2:2
හෙබ්‍රෙ 5:7
4 ගීතා 4:1
ගීතා 65:2
5 2ලේක 6:40
ගීතා 17:1
ගීතා 18:6
ගීතා 34:15

**6** එස්රා 9:6; නෙහෙ 9:2; ගීතා 38:4; ගීතා 41:4; ගීතා 51:4; රෝම 3:23; **7** යෝබ් 9:2; යෝබ් 10:14; ගීතා 103:14; ගීතා 143:2; යෙසා 55:7; දානි 9:18; රෝම 3:20; තීත 3:5; යාකො 3:2; **8** නික් 34:7; ගීතා 25:11; රෝම 4:7; **9** 1රාජා 8:40; ගීතා 2:11; යෙරෙ 33:9; ක්‍රියා 9:31; **10** රෝම 8:24; හෙබ්‍රෙ 6:18; **11** උත් 49:18; ගීතා 27:14; ගීතා 33:20; ගීතා 40:1; යෙසා 8:17; යෙසා 26:8; ලූක් 2:25; **12** ගීතා 134:1; **13** ගීතා 119:147; යෙසා 21:8; **14** ගීතා 63:6; මීකා 7:7.

7 ඊශ්‍රායෙල් ජනයෙනි, යෙහෝවා
දෙවි කෙරෙහි බලා සිටින්න.[1]
මන්ද යෙහෝවා දෙවි ප්‍රේම-
යෙන්* පිරුණු දෙවි කෙ-
නෙකි.[2]
ගැලවීම සලසා දීමට ඔහු මහත්
ආශාවෙන් සිටින්නේය.[3]
8 ඊශ්‍රායෙල් ජනයාගේ සියලු වැරදිව-
ලින් දෙවි ඔවුන්ව මුදවාගන්-
නේය.[4]

දාවිත් රචනා කළ ගීතයකි. කන්ද
නඟින විට ගැයූ ගීතයකි.

# 131

යෙහෝවා දෙවියනි, මම
අහංකාර නැත.[5]
උඩඟු ලෙස බැලුවේ
නැත.[6]
මට අත් කරගත නො-
හැකි[7] මහත් දේවල්
පසුපස
මම හඹා ගියේද නැත.[8]
2 මාගේ සිත මම සන්සුන් කර නිහඬ
කරගත්තෙමි.[9]
කිරි වැරූ දරුවෙකු මව් තුරුලේ
සිටින්නා සේ[10]
මමද සන්සුන්ව සිටිමි.[11]
3 ඊශ්‍රායෙල්, අදත් හෙටත් සැම-
දාටත්[12]
යෙහෝවා දෙවි කෙරෙහි බලා
සිටින්න.[13]

කන්ද නඟින විට ගැයූ ගීතයකි.

# 132

යෙහෝවා දෙවියනි,
දාවිත්ව සිහි කරන්න.[14]
ඔහු අද්දුටු පීඩා අමතක
නොකරන්න.[15]
2 ඔහු යෙහෝවා දෙවි වන ඔබට
එසේය, යාකොබ්ගේ[16] බලවත්
දෙවි[17] වන ඔබට දිවුරා
මෙසේ පොරොන්දු වූ හැටි[18]
අමතක නොකරන්න.
3 “මාගේ නිවසට මම ඇතුල් නො-
වන්නෙමි.[19]
මාගේ යහන වෙතට මම නො-
යන්නෙමි.[20]

ගීතා 130:7* හෝ, “ලැදි ප්‍රේමයකින් යුත්.”

**130 ගීතාවලිය**
**1** ගීතා 115:9 ගීතා 131:3
**2** ගීතා 86:5 රෝම 5:20
**3** එෆී 1:7 1තිමෝ 4:10
**4** ගීතා 103:4 තීත 2:14

**131 ගීතාවලිය**
**5** ද්වි 17:20 යෙසා 9:9 දානි 5:20 1පේත්‍රු 5:5
**6** 1සාමු 18:23 ගීතා 138:6 හිතෝ 6:17
**7** යෝබ් 42:3 ගීතා 139:6
**8** ගීතා 78:70 යෙරෙ 45:5 ආමො 7:14 රෝම 12:16
**9** 1සාමු 30:6 ගීතා 42:5 ගීතා 62:1 යෙසා 30:15 විලා 3:26
**10** මතෙ 23:37
**11** මතෙ 18:3 1කොරි 14:20
**12** ගීතා 115:18 යෙසා 26:4
**13** ගීතා 115:9 ගීතා 130:7 යෙරෙ 17:7 මීකා 7:7

**132 ගීතාවලිය**
**14** ගීතා 78:70 ගීතා 89:3
**15** 1සාමු 20:1 ගීතා 66:12 යෙසා 57:15
**16** 2සාමු 7:3 ගීතා 22:25 ගීතා 46:11 ගීතා 61:8 ගීතා 146:5
**17** උත් 49:24
**18** ගීතා 56:12 ගීතා 65:1
**19** 2සාමු 5:11 2සාමු 20:3
**20** ගීතා 6:6

**2 තීරුව**
**1** රූත් 3:18
**2** හිතෝ 6:4
**3** 2සාමු 7:2 1ලේක 15:3 1ලේක 15:12 ක්‍රියා 7:46
**4** 1රාජා 8:17
**5** 1සාමු 17:12
**6** 1සාමු 7:1 1ලේක 13:6

4 මාගේ දෑස් පියා නොගන්නෙමි.[1]
මාගේ දෙනෙත්වලින් නින්ද පහ
කරන්නෙමි.[2]
5 යෙහෝවා දෙවිගේ ගිවිසුම් පෙට්-
ටිය තැබීමට ස්ථානයක්
වෙන් කරන තුරු[3]
එසේය, යාකොබ්ගේ බලවත්
දෙවිගේ තේජවත් කූඩා-
රම සඳහා ස්ථානයක් වෙන්
කරන තුරු මම එසේ සිටින්-
නෙමි.”[4]
6 අපට ගිවිසුම් පෙට්ටිය* ගැන එෆ්‍රා-
තාහිදී අසන්න ලැබිණ.[5]
තුරුලියෙන් වට වූ ප්‍රදේශයකදී
එය අපට සම්බ වුණේය.[6]
7 අපි දෙවිගේ තේජවත් කූඩාරමට
ඇතුල් වෙමු.[7]
ඔහුගේ පා පුටුව ඉදිරියේ වැඳ
වැටෙමු.[8]
8 යෙහෝවා දෙවියනි,
ඔබේ තේජවත්[9] ගිවිසුම් පෙට්-
ටිය[10] රැගෙන එන විට ඒ
සමඟ ඔබත් ඔබේ වාසස්ථා-
නයට පැමිණෙන්න.[11]
9 දෙවියනි, ඔබේ පූජකයෝ ධර්මිෂ්-
ඨකම නමැති වස්ත්‍රයෙන්
සැරසී සිටිත්වා![12]
ඔබේ විශ්වාසවන්ත සේවකයෝ
ප්‍රීති ඝෝෂා නඟත්වා![13]
10 ඔබේ සේවක දාවිත්ට දුන් පො-
රොන්දුව නිසා[14]
ඔබේ අභිෂේක ලත් තැනැත්-
තාව ප්‍රතික්ෂේප නොක-
රන්න.[15]
11 යෙහෝවා දෙවි දාවිත්ට දිවුරා
පොරොන්දුවක් වුණේය.[16]
ඔහු ඒ පොරොන්දුව කිසිදා කඩ

**7** ගීතා 43:3; ගීතා 84:1; **8** 1ලේක 28:2; ගීතා 5:7; ගීතා 95:6; ගීතා 99:5; විලා 2:1; **9** 2ලේක 6:41; **10** යෙරෙ 3:16; **11** ගණන් 10:35; 2සාමු 6:17; **12** යෝබ් 29:14; යෙසා 61:10; සෙක 3:5; **13** ගීතා 32:11; ගීතා 149:5; **14** 1රාජා 11:12; 1රාජා 15:4; 2රාජා 19:34; **15** 2ලේක 6:42; ගීතා 89:38; හෙබ්‍රෙ 1:9; **16** 2සාමු 3:9; ගීතා 89:3; හෙබ්‍රෙ 7:21.

ගීතා 132:6* හෝ, “ශුද්ධ කූඩාරම.”

නොකරන්නේය.[1] ඒ පොරොන්දුව මෙසේය.
"ඔබෙන් පැවතෙන්නෙකුව[2]
ඔබේ සිංහාසනයේ හිඳුවන්නෙමි.[3]
12 ඔබේ පුත්‍රයන් මාගේ ගිවිසුම රක්ෂා කර[4]
මා ඔවුන්ට ලබා දෙන සිහිගැන්වීම්වලට කීකරු වන්නේ නම්,[5]
ඔවුන්ගේ පුත්‍රයෝද සදහටම[6]
ඔබේ සිංහාසනයේ හිඳගනු ඇත."[7]
13 යෙහෝවා දෙවි තම වාසස්ථානය ලෙස සියොන් තෝරාගත්තේය.[8]
ඔහු ඊට බොහෝ සෙයින් ආශා කළේය.[9]
14 "එය සදහටම මාගේ වාසස්ථානය වන්නේය.[10]
එයට බොහෝ සෙයින් මා ආශා කළ බැවින් මම එහි වාසය කරන්නෙමි.[11]
15 මාගේ ආශීර්වාදය එයට ලැබෙන බැවින් එහි ගබඩා ආහාරවලින් පිරී යන්නේය.[12]
මම එහි වෙසෙන දිළිඳුන්ට ආහාර සපයා දී ඔවුන්ව තෘප්තිමත් කරන්නෙමි.[13]
16 එහි පූජකයන්ට ගැලවීම නමැති වස්ත්‍රය පළඳවන්නෙමි.[14]
එහි වෙසෙන මාගේ විශ්වාසවන්ත සේවකයෝ නිසැකවම ප්‍රීති ඝෝෂා නඟනු ඇත.
17 දාවිත් සතු ශක්තිය* තව තවත් වැඩි වීමට සලස්වන්නෙමි.[15]
මාගේ අභිෂේක ලත් තැනැත්තාගේ පෙළපත සුරැකීමට
මම පියවර ගත්තෙමි.#[16]
18 ඔහුගේ සතුරන්ට ලැජ්ජාව නමැති වස්ත්‍රය පළඳවන්නෙමි.[17]
නමුත් ඔහුගේ පාලනය*[18] සපල වනු ඇත."[19]

---

**ගීතා 132:17*** මූ.අ., "අභ." **17#** හෝ, "මාගේ අභිෂේක ලත් තැනැත්තා වෙනුවෙන් මම පහනක් සූදානම් කළෙමි." **18*** මූ.අ., "ඔටුන්න."

**132 ගීතාවලිය**
**1** 1සාමු 15:29 ගීතා 110:4 යෙසා 45:23 යෙසා 55:11 යෙරෙ 33:21
**2** 2සාමු 7:12 1ලේක 17:11 ලූක් 1:69 ක්‍රියා 13:23
**3** 1රාජා 8:25 1ලේක 17:14 2ලේක 6:16 ගීතා 89:36 යෙසා 9:7 මතෙ 9:27 ක්‍රියා 2:30 රෝම 1:3 රෝම 15:12
**4** ගීතා 89:30
**5** 1ලේක 29:19 ගීතා 25:10
**6** ගීතා 102:28
**7** 2සාමු 7:16 1ලේක 17:12 ගීතා 89:29
**8** ගීතා 9:11 ගීතා 48:3 ගීතා 74:2 ගීතා 76:2 ගීතා 78:68 ගීතා 135:21 හෙබ්‍රෙ 12:22
**9** ගීතා 87:2
**10** ගීතා 46:5 ගීතා 68:16 යෙසා 24:23 යෝවෙ 3:21 සෙක 2:10
**11** 1රාජා 8:27 ගීතා 135:21
**12** ද්වි 28:2 ගීතා 147:14
**13** ගීතා 22:26 ගීතා 37:19
**14** 2ලේක 6:41 ගීතා 132:9 ගීතා 149:4 යෙසා 61:10
**15** ගීතා 148:14 එස 29:21 ලූක් 1:69
**16** 1සාමු 16:1 1රාජා 11:36 1රාජා 15:4 2ලේක 21:7
**17** ගීතා 35:26 ගීතා 109:29
**18** 2සාමු 1:10 2රාජා 11:12 2ලේක 23:11
**19** ගීතා 2:6 ගීතා 72:8 යෙසා 9:6 එළි 11:15

දාවිත් රචනා කළ ගීතයකි. කන්ද නඟින විට ගැයූ ගීතයකි.

# 133 සහෝදරයන් එකමුතුව ජීවත් වීම

කොතරම් යහපත්ද!
කොතරම් ප්‍රසන්නද![1]
2 එය ආරොන්ගේ හිස මත වත් කළ අනර්ඝ තෙලය මෙනි.[2]
එසේය, ඔහුගේ රැවුල දිගේ ගලා ගොස්[3]
කරපටිය මත වැටුණු අගනා තෙලය මෙනි.[4]
3 එය සියොන්හි කඳු[5] මතට වැටෙන හෙර්මොන් කන්දෙහි[6] පිනි බිඳු මෙනි.[7]
මන්ද යෙහෝවා දෙවි සදාකල් ජීවනය[8] නමැති ආශීර්වාදය
සියොන් මතට වගුරුවා ඇත.[9]

කන්ද නඟින විට ගැයූ ගීතයකි.

# 134 යෙහෝවා දෙවිගේ සියලු සේවකයෙනි,[10]

රාත්‍රි කාලයේදී යෙහෝවා දෙවිගේ ගෘහයේ සේවය කරන සියල්ලෙනි,[11]
යෙහෝවා දෙවිට ප්‍රශංසා කරන්න.[12]
2 දැත් දිගු කර දෙවිට අයැදින විට පවිත්‍රකමින් සැරසී සිටින්න.[13]
යෙහෝවා දෙවිට ප්‍රශංසා කරන්න.[14]
3 අහසත් පොළොවත් සැදූ[15] යෙහෝවා දෙවි
සියොන්හි සිට ඔබට ආශීර්වාද කරනු ලැබේවා![16]

---

**2 තීරුව 133 ගීතාවලිය 1** උත් 13:8; උත් 45:24; යොහ 13:35; යොහ 17:21; කොලො 3:14; හෙබ්‍රෙ 13:1; **2** නික් 29:7; නික් 30:25; ලෙවී 21:10; ගීතා 141:5; හිතෝ 27:9; **3** නික් 30:30; **4** ලෙවී 8:12; **5** ගීතා 125:2; **6** ද්වි 3:9; ද්වි 4:48; 1ලේක 5:23; **7** ද්වි 32:2; හිතෝ 19:12; **8** ගීතා 21:4; **9** ලෙවී 25:21; ද්වි 28:8; **134 ගීතාවලිය 10** එළි 19:5; **11** ලෙවී 8:35; 1ලේක 9:33; ගීතා 130:6; ලූක් 2:37; එළි 7:15; **12** 1ලේක 23:30; ගීතා 103:21; ගීතා 135:19; ලූක් 1:68; යාකො 3:9; **13** ගීතා 28:2; ගීතා 141:2; විලා 3:41; 2කොරි 1:12; 1තිමෝ 2:8; **14** ගීතා 103:2; 2කොරි 1:3; 1පේත්‍රෘ 1:3; **15** උත් 1:1; ගීතා 124:8; යෙසා 45:18; එළි 10:6; **16** ගීතා 14:7; ගීතා 20:2; ගීතා 50:2; ගීතා 128:5; රෝම 11:26.

**135** ජනයෙනි, යෙහෝවා දෙ-
විට ප්‍රශංසා කරන්න.[1]
යෙහෝවා දෙවිගේ නාම-
යට ප්‍රශංසා කරන්න.[2]
යෙහෝවා දෙවිගේ සේව-
කයෙනි, ඔහුට ප්‍රශංසා
කරන්න.[3]
**2** යෙහෝවා දෙවිගේ ගෘහයේ සිටින
සියල්ලෙනි, ඔහුට ප්‍රශංසා
කරන්න.[4]
අපේ දෙවිගේ ගෘහයේ මළුවෙහි
සිටින සියල්ලෙනි, ඔහුට
ප්‍රශංසා කරන්න.[5]
**3** යෙහෝවා දෙවිට ප්‍රශංසා කරන්න.
මන්ද යෙහෝවා දෙවි යහ-
පත්ය.[6]
ඔහුගේ නාමයට ප්‍රශංසා ගී
ගයන්න. එසේ කිරීම ඉතා
අගනේය.[7]
**4** යෙහෝවා දෙවි යාකොබ්ව
තෝරාගත්තේය.[8]
ඊශ්‍රායෙල්, ඔහු සතු අනර්ඝතම
වස්තුවය.[9]
**5** යෙහෝවා දෙවි ඉතා ශ්‍රේෂ්ඨ දෙවි
කෙනෙක් බව මම හොඳින්
දනිමි.[10]
අන් සියලු දෙවිවරුන්ට වඩා
අපේ ස්වාමීන් අතිඋතුම්ය.[11]
**6** අහසෙත් පොළොවෙත් සයුරෙත්
ගැඹුරු තැන්හිත්[12]
තම කැමැත්ත පරිදි යෙහෝවා
දෙවි බොහෝ දේවල් කර
ඇත.[13]
**7** ඔහු පොළොවේ සතර දිගින් ජලය
වාෂ්ප වී ඉහළට නැඟීමට
සලස්වන්නේය.[14]
වර්ෂාව ලබා දීමට ඔහු අහසේ
කවුළු සැදුවේය.[15]
තම ගබඩාවලින් සුළං හමා
ඒමට ඔහු සලස්වන්නේය.[16]
**8** ඊජිප්තුවරුන්ගේ කුලුඳුල් දරු-
වන්ට[17] හා
කුලුඳුල් සතුන්ට[18] පහර දුන්නේ
ඔහුය.
**9** ඔහු ඊජිප්තු දේශයේදී ආශ්චර්යයන්
සිදු කළේය. බොහෝ ලකු-
ණුද පෙන්වූවේය.[1]
එසේය, පාරාවෝටත් ඔහු-
ගේ සියලු සේවකයන්ටත් ඒ
සියල්ල අද්දැකීමට සැලැස්-
වූවේ ඔහුය.[2]
**10** බොහෝ ජාතීන්ට පහර දුන්නේද[3]
බලවත් රජවරුන්ව විනාශ කර
දැමුවේද[4] ඔහුය.
**11** අමෝරිවරුන්ගේ සීහොන් රජුවද[5]
බාෂාන්හි ඕග් රජුවද[6]
කානාන්හි සියලු රාජ්‍යයන්ද[7]
විනාශ කර දැමුවේ ඔහුය.
**12** ඔවුන් සතුව තිබූ දේශය උරුමයක්
ලෙස[8] තම සෙනඟ වූ
ඊශ්‍රායෙල්වරුන්ට[9] දුන්නේ
ඔහුය.
**13** යෙහෝවා දෙවියනි, ඔබේ නාමය
සදාකල් පවතින්නේය.[10]
යෙහෝවා දෙවියනි, සදා නො-
මැකෙන ඔබේ නාමය
පරම්පරාවෙන් පරම්පරාවට
පවතින්නේය.[11]
**14** යෙහෝවා දෙවි තම සෙනඟ වෙනු-
වෙන් යුක්තිය ඉටු කරන්-
නේය.[12]
තම සේවකයන්ට ඔහු අනු-
කම්පා කරන්නේය.[13]
**15** ජාතීන් නමස්කාර කරන දේවතා
රූප සාදා ඇත්තේ රන් හා
රිදීවලින්ය.[14]
ඒවා සාදන්නේ මනුෂ්‍යයන්
විසින්ය.[15]
**16** ඒවාට කටවල් ඇත. නමුත් කතා
කිරීමට නොහැකිය.[16]
ඇස් ඇත. නමුත් කිසිවක් පෙ-
නෙන්නේ නැත.[17]
**17** ඒවාට කන් ඇත. නමුත් කිසිවක්
ඇසෙන්නේ නැත.[18]

**135 ගීතාවලිය**
**1** ගීතා 113:1
එළි 19:5
**2** ගීතා 29:2
ගීතා 148:13
**3** ගීතා 134:1
**4** 1ලේක 23:30
ලූක් 2:37
**5** 1රාජා 6:36
ගීතා 84:10
ගීතා 92:13
ගීතා 96:8
ගීතා 116:19
**6** ගීතා 106:1
ගීතා 119:68
මතෙ 19:17
**7** ගීතා 92:1
ගීතා 147:1
**8** ද්වි 32:9
ගීතා 33:12
**9** නික් 19:5
ද්වි 7:6
1රාජා 8:53
1පේතෘ 2:9
**10** ගීතා 48:1
ගීතා 95:3
ගීතා 97:9
**11** ද්වි 10:17
**12** ගීතා 33:6
**13** ගීතා 115:3
යෙසා 46:10
හෙබ්‍රෙ 3:4
**14** උත් 2:6
යෙරෙ 10:13
යෙරෙ 51:16
**15** යෝබ් 38:25
ගීතා 147:8
සෙක 10:1
**16** නික් 14:21
ගණන් 11:31
ගීතා 78:26
ගීතා 107:25
ගීතා 147:18
යෝනා 1:4
**17** නික් 12:12
ගීතා 78:51
ගීතා 136:10
**18** නික් 12:29
නික් 13:15

**2 තීරුව**
**1** නික් 7:20
නික් 8:6
නික් 8:17
නික් 9:6
නික් 9:10
නික් 9:23
නික් 10:12
නික් 10:21
ද්වි 4:34
නෙහෙ 9:10
ගීතා 105:27
ක්‍රියා 7:36
**2** ගීතා 136:15
**3** ගීතා 44:2
**4** ගීතා 136:17

**5** ගණන් 21:24; ද්වි 2:30; ද්වි 31:4; විනි 11:21; ගීතා 136:19; **6** නෙහෙ 9:22; **7** යොෂු 12:7; **8** ගණන් 33:53; ගීතා 44:3; ගීතා 78:55; ගීතා 136:21; **9** යොෂු 11:23; **10** ගීතා 8:9; ගීතා 72:17; **11** නික් 3:15; ගීතා 102:12; හොෂෙ 12:5; **12** නික් 14:31; ගීතා 7:8; **13** ද්වි 32:36; 1ලේක 21:15; **14** ද්වි 4:28; ගීතා 115:4; **15** යෙසා 46:6; ක්‍රියා 17:29; **16** හබ 2:19; **17** ගීතා 115:5; **18** 1කොරි 10:19.

නාසයෙන් හුස්ම ගන්නේද නැත.[1]
18 ඒවා සාදන්නෝත්[2]
ඒවා කෙරෙහි විශ්වාසය තබන්නෝත්[3] එම රූප හා සමාන වන්නෝය.
19 ඊශ්‍රායෙල්ගෙන් පැවතෙන්නෙනි, යෙහෝවා දෙවිට ප්‍රශංසා කරන්න.[4]
ආරොන්ගෙන් පැවතෙන්නෙනි, යෙහෝවා දෙවිට ප්‍රශංසා කරන්න.[5]
20 ලෙවීගෙන් පැවතෙන්නෙනි, යෙහෝවා දෙවිට ප්‍රශංසා කරන්න.[6]
යෙහෝවා දෙවි කෙරෙහි ගරුබියක් ඇති සියල්ලෙනි, යෙහෝවා දෙවිට ප්‍රශංසා කරන්න.[7]
21 සියොන්හි වැසියෙනි, යෙරුසලමෙහි වාසය කරන[8]
යෙහෝවා දෙවිට ප්‍රශංසා කරන්න.[9]
ජනයෙනි, යෙහෝවා දෙවිට ප්‍රශංසා කරන්න.[10]

# 136

ජනයෙනි, යෙහෝවා දෙවිට ස්තුති කරන්න. මන්ද ඔහු යහපත්ය.[11]
ඔහුගේ ප්‍රේමය* සදාකල් පවතින්නේය.[12]
2 දෙවිවරුන්ගෙත් දෙවිට ස්තුති කරන්න.[13]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්නේය.[14]
3 ස්වාමිවරුන්ගෙත් ස්වාමීන්ට ස්තුති කරන්න.[15]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්නේය.[16]
4 කිසිවෙකුගේ උපකාරයක් නොමැතිව පුදුමසහගත ක්‍රියා කරන තැනැත්තාණන්ට ස්තුති කරන්න.[17]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්නේය.[18]
5 තම ප්‍රඥාවෙන් අහස්තලය සෑදූ තැනැත්තාණන්ට ස්තුති කරන්න.[1]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්නේය.[2]
6 මුහුදට වඩා උස්ව භූමිය පිහිටෙවූ තැනැත්තාණන්ට ස්තුති කරන්න.[3]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්නේය.[4]
7 මහත් ආලෝක වස්තූන් සෑදූ තැනැත්තාණන්ට ස්තුති කරන්න.[5]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්නේය.[6]
8 දවාලට එළිය ලබා දෙන පිණිස* සූර්යයා සෑදූ තැනැත්තාණන්ට ස්තුති කරන්න.[7]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්නේය.[8]
9 රාත්‍රියට එළිය ලබා දෙන පිණිස* සඳද තරුද සෑදූ තැනැත්තාණන්ට ස්තුති කරන්න.[9]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්නේය.[10]
10 ඊජිප්තුවේ කුලුඳුලන්ට පහර දුන් තැනැත්තාණන්ට ස්තුති කරන්න.[11]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්නේය.[12]
11 ඊශ්‍රායෙල් සෙනඟව ඊජිප්තු දේශයෙන් පිටතට ගෙනා තැනැත්තාණන්ට ස්තුති කරන්න.[13]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්නේය.[14]
12 තමා සතු මහත් බලය අප වෙනුවෙන් යොදාගත් තැනැත්තාණන්ට ස්තුති කරන්න.[15]

**135 ගීතාවලිය**
1 ගීතා 115:7 යෙරෙ 10:14 යෙරෙ 51:17
2 ගීතා 115:8 යෙසා 44:9
3 2රාජා 21:21 ගීතා 97:7
4 2රාජා 18:22 1ලේක 5:20 රෝම 9:5 1පේත්‍ර 1:3
5 ගීතා 115:10
6 ද්වි 10:8
7 ගීතා 115:11
8 ගීතා 48:1 යෙරෙ 3:17
9 ගීතා 76:2 ගීතා 78:68 ගීතා 132:13 ගීතා 134:3
10 ගීතා 112:1 එළි 19:6

**136 ගීතාවලිය**
11 ගීතා 106:1 ගීතා 107:1 ලූක් 18:19
12 2ලේක 7:3
13 නික් 18:11 2ලේක 2:5 ගීතා 97:9 දානි 2:47
14 1ලේක 16:34
15 ද්වි 10:17 යෙසා 3:1
16 1ලේක 16:41
17 නික් 15:11 1සාමු 2:7 ගීතා 72:18 ගීතා 86:10 දානි 4:35 එළි 15:3
18 ගීතා 103:17

**2 තීරුව**
1 උත් 1:1 යෝබ 38:36 හිතෝ 3:19 යෙරෙ 10:12 යෙරෙ 51:15
2 2ලේක 20:21
3 උත් 1:9 ගීතා 24:2
4 ලූක් 1:50
5 උත් 1:14 ගීතා 74:16
6 2ලේක 5:13
7 උත් 1:16 ගීතා 148:3 යෙරෙ 31:35
8 2ලේක 7:6
9 උත් 1:18 යෝබ 31:26 ගීතා 8:3
10 එස්රා 3:11
11 නික් 11:5; නික් 12:29; ගීතා 78:51; ගීතා 105:36; ගීතා 135:8; හෙබ්‍රෙ 11:28; 12 ගීතා 25:6; 13 නික් 12:51; 1සාමු 12:6; ගීතා 78:52; 14 ගීතා 89:2; 15 නික් 13:14; යෙරෙ 32:21.

ගීතා 136:1* හෝ, "ළැදි ප්‍රේමය."

ගීතා 136:8* මූ.අ., "පාලනය කරන පිණිස."
9* ගීතා 136:8හි පාදසටහන බලන්න.

ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්-
නේය.
13 රතු මුහුද දෙබෑ කළ තැනැත්තා-
ණන්ට ස්තුති කරන්න.[1]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්-
නේය.[2]
14 ඊශ්‍රායෙල් ජාතියට ඒ දෙබෑ කළ
මුහුද මැදින් ගමන් කිරීමට
සැලැස්වූ තැනැත්තාණන්ට
ස්තුති කරන්න.[3]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්-
නේය.[4]
15 පාරාවෝද ඔහුගේ හමුදාවද ඒ මහ
මුහුදේ ජල පහරට ගසාගෙන
යෑමට සැලැස්වූ තැනැත්තා-
ණන්ට ස්තුති කරන්න.[5]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්-
නේය.[6]
16 පාළුකරයේදී තම සෙනඟට මඟ
පෙන්වූ තැනැත්තාණන්ට
ස්තුති කරන්න.[7]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්-
නේය.[8]
17 බලවත් රජවරුන්ට පහර දුන්
තැනැත්තාණන්ට ස්තුති
කරන්න.[9]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්-
නේය.[10]
18 තේජශ්‍රීයෙන් වැජඹුණු රජවරුන්ව
විනාශ කර දැමූ තැනැත්තා-
ණන්ට ස්තුති කරන්න.[11]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්-
නේය.[12]
19 අමෝරිවරුන්ගේ සීහොන් රජුව
ඔහු විනාශ කර දැමුවේය.[13]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්-
නේය.[14]
20 බාෂාන්හි ඕග් රජුවද ඔහු විනාශ
කර දැමුවේය.[15]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්-
නේය.[16]
21 ඔවුන්ට අයිතිව තිබූ දේශය ඔහු
තම සෙනඟට උරුමයක්
ලෙස දුන්නේය.[17]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්-
නේය.[18]
22 තම සේවක ඊශ්‍රායෙල්ට ඔහු ඒ දේ-
ශය උරුම කර දුන්නේය.[1]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්-
නේය.[2]
23 අපි ලැජ්ජාවට පත්ව සිටි අවස්ථා-
වලදී ඔහු අපව අමතක නො-
කළේය.[3]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්-
නේය.[4]
24 කිහිප වතාවක්ම අපේ සතුරන්ගේ
අතින් ඔහු අපව ගලවාගත්-
තේය.[5]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්-
නේය.[6]
25 සියල්ලන්ට ආහාර සපයා දෙන
තැනැත්තාණන්ට ස්තුති
කරන්න.[7]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්-
නේය.[8]
26 ස්වර්ගයේ දෙවිට ස්තුති කරන්න.[9]
ඔහුගේ ප්‍රේමය සදාකල් පවතින්-
නේය.[10]

**137** බැබිලෝනියේ ගං ඉවුරු-
වල[11] වාඩි වී[12]
අපි සියොන් සිහි කරමින්
හඬා වැලපුණෙමු.[13]
2 එහි තිබූ විලෝ ගස්වල[14]
අපේ වීණා එල්ලා තැබුවෙමු.[15]
3 අපව වහලුන් කරගත් අය,
“සියොන්හි ගයන ගීයක්
ගයන්න”[16] කියා අපට පැවසු-
වෝය.[17]
අපට සමච්චල් කරන්නෝ,
ගීයක් ගයා ඔවුන්ව සතුටු
කරන්න යයි කීවෝය.[18]
4 යෙහෝවා දෙවිට ගයන ගීතය වෙ-
නත් දේශයක සිට[19]
අපි කෙසේ ගයන්නද![20]
5 යෙරුසලම, මට ඔබව අමතක
වුණොත්[21]

**136 ගීතාවලිය**
**1** නික් 14:21
යොෂු 2:10
නෙහෙ 9:11
ගීතා 78:13
ගීතා 106:9
**2** නික් 20:6
**3** නික් 14:29
**4** ගීතා 107:1
**5** නික් 14:27
ද්වි 11:4
නෙහෙ 9:11
ගීතා 78:53
**6** ගීතා 118:1
**7** නික් 13:18
නික් 15:22
ද්වි 8:2
ද්වි 8:15
නෙහෙ 9:12
**8** ගීතා 118:2
**9** යොෂු 12:7
ගීතා 135:10
**10** ගීතා 118:3
**11** යොෂු 12:24
විනි 1:7
**12** ගීතා 118:4
**13** ගණන් 21:21
ද්වි 1:4
ද්වි 29:7
යොෂු 2:10
විනි 11:21
ගීතා 135:11
**14** ගීතා 118:29
**15** ගණන් 21:33
ද්වි 31:4
ගීතා 135:11
**16** ගීතා 40:11
**17** ගණන් 32:33
ද්වි 3:12
යොෂු 12:1
නෙහෙ 9:22
ගීතා 44:2
ගීතා 78:55
ගීතා 105:44
**18** යෙරෙ 33:11

**2 තීරුව**
**1** ගීතා 47:4
ගීතා 135:12
**2** නෙහෙ 1:5
**3** උත් 8:1
ද්වි 32:36
ගීතා 113:7
ලූක් 1:48
**4** නෙහෙ 9:32
**5** විනි 3:9
විනි 6:9
ලූක් 1:71
**6** ගීතා 21:7
**7** ගීතා 104:27
ගීතා 145:15
ගීතා 147:9
මතෙ 5:45
**8** ගීතා 118:29
**9** ගීතා 115:3
ගීතා 123:1
**10** ගීතා 57:10

**137 ගීතාවලිය** **11** යෙසා 44:27; යෙරෙ 50:38; යෙරෙ 51:13; යෙරෙ 51:32; එස 1:1; දානි 10:4; **12** එස 3:15; **13** යෙරෙ 13:17; විලා 1:16; දානි 9:3; **14** ලෙවී 23:40; **15** ගීතා 33:2; යෙසා 24:8; **16** 1ලේක 16:7; ගීතා 28:7; ගීතා 69:30; යෙසා 35:10; **17** ගීතා 123:4; විලා 2:16; **18** නෙහෙ 4:2; විලා 2:15; **19** යෙසා 49:21; **20** නික් 15:1; විනි 5:3; **21** නෙහෙ 2:3; ගීතා 84:2; ගීතා 102:14; යෙසා 62:1; යෙරෙ 51:50.

මාගේ දකුණතින් කිසිවක් කර-
ගැනීමට මට නොහැකි
වේවා!
6 යෙරුසලම, මට ඔබව සිහි නො-
වන්නේ නම්,[1]
මා වඩාත්ම සතුටු වන්නේ
ඔබ ගැන නොවේ නම්,[2]
මාගේ දිව උඩු තල්ලට ඇලී
තිබේවා![3]
7 යෙහෝවා දෙවියනි, යෙරුසලම
විපතට පත් වූ දවසේදී[4]
ඒදොම්හි පුත්‍රයන්[5] මෙසේ කී
බව අමතක නොකරන්න.[6]
"එය සමතලා කරන්න! එය
පොළොවටම සමතලා
කරන්න!"[7]
8 විනාශ වීමට නියමිත බැබිලෝනීය
දියණියනි,[8]
ඔබ අපට සැලකූ අයුරින් ඔබ-
ටත් සලකන[9]
තැනැත්තා සන්තෝෂවන්ය.[10]
9 ඔබේ දරුවන්ව පැහැරගෙන
ඔවුන්ව ගලේ ගසා මරා
දමන තැනැත්තා සන්තෝ-
ෂවන්ය.[11]

දාවිත් රචනා කළ ගීතයකි.

## 138

මාගේ මුළු හදින්ම මම
ඔබට ප්‍රශංසා කරන්-
නෙමි.[12]
වෙනත් දෙවිවරුන් ඉදිරි-
යේ මම ඔබට ප්‍රශංසා
ගී ගයන්නෙමි.[13]
2 ඔබ පෙන්වන ඉමහත් ප්‍රේමය*
නිසාත්[14] ඔබේ විශ්වාසවන්-
තකම නිසාත්[15]
මම ඔබේ නාමයට ප්‍රශංසා
කරන්නෙමි.[16]
ඔබේ ශුද්ධ මාලිගාව දෙසට හැරී
වැඳ වැටෙන්නෙමි.[17]
ඔබේ නාමයෙන් ඔබ දෙන පො-
රොන්දු මොන තරම්
ශ්‍රේෂ්ඨද![18] නමුත් ඒ පො-
රොන්දුවල ඉටු වීම ඊටත්
වඩා ශ්‍රේෂ්ඨය.[1] එබැවින් මම
ඔබට ප්‍රශංසා කරන්නෙමි.
3 මා ඔබට කන්නලව් කළ දවසේම
ඔබ මට පිළිතුරු දුන්නෙ-
හිය.[2]
නිර්භීතව ක්‍රියා කිරීමට ඔබ මට
ශක්තිය දුන්නෙහිය.[3]
4 යෙහෝවා දෙවියනි, පොළොවේ
සියලු රජවරු ඔබට ප්‍රශංසා
කරනු ඇත.[4]
මන්ද ඔබේ වදන් ඔවුන්ට
අසන්න ලැබෙන්නේය.
5 ඔවුහු යෙහෝවා දෙවිගේ මාර්ග
ගැන ගී ගයන්නෝය.[5]
මන්ද යෙහෝවා දෙවිගේ තේජස
අතිමහත්ය.[6]
6 යෙහෝවා දෙවි කොතරම්
උසස් වුවත් යටහත්පහත්
තැනැත්තා ගැන ඔහු සැල-
කිලිමත් වන්නේය.[7]
එහෙත් උඩඟු තැනැත්තා සමඟ
ඔහුට කිසි මිත්‍රත්වයක්
නැත.[8]
7 විපත්ති මැදින් මට ගමන් කිරීමට
සිදු වුවත් ඔබ මාගේ දිවි රැක
දෙන්නෙහිය.[9]
කෝපයෙන් දැවෙන මාගේ
සතුරන්ට විරුද්ධව ඔබ ඔබේ
හස්තය දිගු කරන්නෙහිය.[10]
ඔබේ දකුණතින් ඔබ මාව ගල-
වාගන්නෙහිය.[11]
8 යෙහෝවා දෙවියනි, මා සම්බන්ධ-
යෙන් ඔබ අරමුණු කළ දේ
ඔබ ඉටු කරන්නෙහිය.[12]
ඔබ පෙන්වන ප්‍රේමය* සදාකල්
පවතින්නේය.[13]
යෙහෝවා දෙවියනි, ඔබේම
දෑතින් සෑදූ දේ අත් නොහ-
රින්න.[14]

**137 ගීතාවලිය**
**1** ගීතා 103:2
**2** ගීතා 122:1
**3** ගීතා 22:15; එස 3:26
**4** ඔබ 13
**5** යෙරෙ 49:7; විලා 4:22; එස 25:12
**6** ගීතා 74:18
**7** ඔබ 10; ඔබ 12; මීකා 4:11
**8** යෙසා 13:1; යෙසා 47:1; යෙරෙ 25:12; යෙරෙ 50:2; එළි 18:2
**9** යෙරෙ 50:29; එළි 18:6
**10** යෙසා 13:5
**11** යෙසා 13:16

**138 ගීතාවලිය**
**12** ගීතා 9:1; ගීතා 86:12
**13** ගීතා 82:1; ගීතා 119:46; යොහ 10:34; 1කොරි 8:5
**14** ගීතා 66:20; ගීතා 115:1; ගීතා 136:1
**15** ගීතා 71:22
**16** ගීතා 44:8; ගීතා 54:6; ගීතා 115:1; යොහ 17:6
**17** 1සාමු 3:3; 1ලේක 16:1; ගීතා 5:7; ගීතා 28:2; දානි 6:10
**18** යෙසා 40:8; 1පේතෘ 1:25

**2 තීරුව**
**1** ගීතා 56:10; යෙසා 42:21; හෙබ්‍රෙ 6:17
**2** ගීතා 18:6; ගීතා 77:1
**3** ගීතා 29:11; යෙසා 12:2; යෙසා 41:10; සෙක 10:12; 1පේතෘ 5:10
**4** ගීතා 102:15; යෙසා 49:23
**5** යෙසා 60:3
**6** 1රාජා 8:11; ගීතා 57:5; ගීතා 104:31

**7** 1සාමු 2:8; ගීතා 113:6; හිතෝ 3:34; ලූක් 1:52; 1පේතෘ 5:5; **8** යෝබ් 40:11; යෙසා 2:11; යෙසා 57:15; යාකො 4:6; **9** ගීතා 71:20; **10** ගීතා 64:7; **11** ගීතා 60:5; **12** ගීතා 57:2; පිලි 1:6; **13** ගීතා 100:5; ගීතා 103:17; **14** යෝබ් 10:8; යෝබ් 14:15; ගීතා 71:18; 1පේතෘ 4:19.

**ගීතා 138:2*** හෝ, "ලැදි ප්‍රේමය."

**ගීතා 138:8*** හෝ, "ලැදි ප්‍රේමය."

සංගීත අධ්‍යක්ෂක වෙතය.
දාවිත් රචනා කළ ගීතයකි.

**139** යෙහෝවා දෙවියනි, ඔබ
මාව සෝදිසි කර බලා
මාව හොඳින් හඳුනා-
ගත්තෙහිය.[1]
**2** මා ඉඳගත්තත් සිටගත්තත් ඔබ
එය දන්නෙහිය.[2]
ඉතා දුරක සිටියත් මා සිතන දේ
ඔබ දන්නෙහිය.[3]
**3** මා ගමනක් ගියත් විවේක ගත්තත්
ඔබ ඒ ගැන අවධානයෙන්
සිටින්නෙහිය.[4]
මා කරන සෑම දෙයක් ගැනම
ඔබ හොඳින් දන්නෙහිය.[5]
**4** යෙහෝවා දෙවියනි, මාගේ මුඛ-
යෙන් වචනයක් පිට වෙන්-
නත් කලින්[6]
මා පැවසීමට යන දේ ඔබ දන්-
නෙහිය.[7]
**5** මාගේ ඉදිරිපසින්ද පිටුපසින්ද සිට
ඔබ මාව ආරක්ෂා කරන්-
නෙහිය.
ඔබ ඔබේ හස්තය මා පිට තැබු-
වෙහිය.
**6** ඔබට මා ගැන තිබෙන අවබෝ-
ධය මට සිතාගන්නවත් බැරි
තරම්ය.[8]
එය මට තේරුම්ගැනීමට නො-
හැකි තරම් ගැඹුරුය.[9]
**7** ඔබේ බලයට ළඟා විය නොහැකි,
මට සැඟවී සිටිය හැකි
තැනක් තිබේද?[10]
ඔබේ අවධානයට හසු නොවී
මා කොතැනකට පලා යන්-
නද?[11]
**8** මා ස්වර්ගයට නැඟ ගියත් ඔබ
එහිය.[12]
මා මිනී වළෙහි සැතපී සිටියත්
එතැනදීද ඔබට මාව පෙ-
නෙයි.[13]
**9** අරුණාලෝකයේ පියාපත් ඇතුව[14]
මා ඈත සාගරයෙන් එහාට
පියාඹා ගියත්[15]
**10** ඔබේ හස්තය එහිදීත් මට මඟ
පෙන්වනු ඇත.[16]
ඔබේ දකුණතින් ඔබ මාව ශක්-
තිමත්ව අල්ලාගනු ඇත.[1]
**11** "නිසැකවම සනාන්ධකාරය මාව
වසාගනියි" කියා මම
කීවෙමි.[2]
නමුත් රාත්‍රිය පවා ආලෝකයට
සමානය.[3]
**12** අඳුර ඇත්තටම ඔබට අඳුරක්
නොවේ.[4]
රාත්‍රි කාලයද දිවා කාලය මෙන්
ඔබට ආලෝකවත්ය.[5]
අඳුරත් ආලෝකයත් ඔබට එක
හා සමානය.[6]
**13** ඔබ මාව මව්කුසෙහි සඟවා තැබු-
වෙහිය.[7]
මාගේ වකුගඩුද සැදුවේ ඔබය.[8]
**14** ඔබ මාව කොතරම් පුදුමාකාර
ලෙස සාදා ඇද්ද! එබැවින්
ඔබ කෙරෙහි මහත් ගරුබි-
යක් මා තුළ ඇති වන්නේය.[9]
මම ඔබට ප්‍රශංසා කරමි.
ඔබේ ක්‍රියා ඇත්තෙන්ම පුදුමා-
කාරය.[10] ඒ බව මම හොඳින්
දනිමි.[11]
**15** කිසිවෙකුට නොපෙනෙන සේ රහ-
සින් මා වැඩුණත්[12] ඔබට
මාව පෙනුණේය.
මව්කුස තුළ මා ටිකෙන් ටික
වැඩෙන විට[13]
මාගේ ඇටකටු පවා ඔබෙන්
සැඟවී නොතිබුණේය.[14]
**16** මා කලලයක්ව සිටියදී ඔබට මාව
පෙනුණේය.[15]
මාගේ අවයව සෑදෙන්නත්
කලින්
ඒ සියල්ල ගැන තොරතුරු
ඔබේ ලියවිල්ලෙහි සටහන් කර
තිබිණ.[16]
**17** දෙවියනි, ඔබේ අදහස් මට කොත-
රම් වටින්නේද![17]
ඒ වටිනා අදහස් ගණන් කළ
නොහැකි තරම්ය![18]

**139 ගීතාවලිය**
**1** 1සාමු 16:7
1රාජා 8:39
1ලේක 28:9
ගීතා 17:3
ගීතා 44:21
ගීතා 139:23
යෙරෙ 12:3
යෙරෙ 20:12
හෙබ්‍රෙ 4:13
**2** උත් 16:13
2රාජා 19:27
යෙසා 37:28
**3** ගීතා 33:13
ගීතා 94:11
එස 38:10
මතෙ 9:4
**4** උත් 28:15
2සාමු 8:14
යෝබ් 31:4
ගීතා 121:8
**5** ගීතා 33:15
හිතෝ 5:21
යෙසා 29:15
ක්‍රියා 5:3
**6** ගීතා 19:14
**7** ගීතා 50:21
හෙබ්‍රෙ 4:12
**8** යෝබ් 42:3
ගීතා 40:5
ගීතා 131:1
රෝම 11:33
**9** යෝබ් 26:14
හිතෝ 30:3
**10** ක්‍රියා 5:9
**11** යෙරෙ 23:24
යෝනා 1:3
**12** ආමො 9:2
ඔබ 4
**13** යෝබ් 26:6
හිතෝ 15:11
**14** ගීතා 18:10
**15** ගීතා 65:5
යෙසා 11:11
යෙසා 24:14
**16** ගීතා 63:8

**2 තීරුව**
**1** ගීතා 73:23
යෙසා 41:13
**2** ගීතා 94:7
යෙසා 29:15
යෙරෙ 23:24
**3** යෝබ් 12:22
**4** නික් 20:21
**5** යෝබ් 34:22
දානි 2:22
**6** හෙබ්‍රෙ 4:13
**7** යෝබ් 10:8
යෝබ් 31:15
ගීතා 22:10
යෙසා 46:3
යොහ 3:4
**8** යෝබ් 10:9
**9** උත් 1:26
ගීතා 22:9
ගීතා 71:6
ගීතා 100:3
යෙසා 44:2
යෙරෙ 1:5

---

**10** ගීතා 19:1; ගීතා 92:5; ගීතා 104:24; ගීතා 111:2; **11** එළි 15:3; **12** යෝබ් 10:9; **13** එෆි 4:9; **14** යෝබ් 10:11; දේශ 11:5; **15** යෝබ් 1:21; යෝබ් 10:18; ගීතා 127:3; **16** යෝබ් 31:15; **17** යෙසා 55:9; **18** රෝම 11:33.

18 මා ඒවා එකින් එක ගණන් කළොත් ඒවා වැලි කැටවලටත් වඩා වැඩිය.[1]
උදෑසන අවදි වන විටත් මම තවමත් ඒවා ගැන කල්පනා කරනු ඇත.[2]
19 දෙවියනි, ඔබ දුෂ්ටයන්ව විනාශ කර දැම්මොත්[3]
මා වටා රොක් වී සිටින මිනීමරුවෝ[4] මාගෙන් ඈත්ව යනු ඇත.
20 ඔවුහු තමන්ට රිසි පරිදි ඔබට විරුද්ධව කතා කරති.[5]
සතුරෝ[6] ඔබේ නාමයට අගෞරවයක් වන අයුරින් ඔබේ නාමය යොදාගනිති.[7]
21 යෙහෝවා දෙවියනි, ඔබට බොහෝ සෙයින් ද්වේෂ කරන අයට මම කොතරම් ද්වේෂ කරනවාද![8]
ඔබට විරුද්ධව කැරලිගසන අය මට කොතරම් පිළිකුලක්ද![9]
22 මම සහමුලින්ම ඔවුන්ව එපා කර ඔවුන්ට ද්වේෂ කරමි.[10]
ඔවුන්ව මාගේ සතුරන් ලෙස සලකමි.[11]
23 අනේ දෙවියනි, මාව විමසා බලා මාගේ හදවතේ තිබෙන දේ දැනගන්න.[12]
මාව සෝදිසි කර බලා මාගේ සිතට වධ දෙන දේ දැනගන්න.[13]
24 මාව නොමඟට යවන දෙයක් මා තුළ තිබේද කියා සොයා බලා[14]
මට සදහටම මඟ පෙන්වන්න.[15]

සංගීත අධ්‍යක්ෂක වෙතය.
දාවිත් රචනා කළ ගීතයකි.

**140** යෙහෝවා දෙවියනි, දුෂ්ටයන්ගෙන් මාව බේරාගන්න.[16]
දාමරිකයන්ගෙන් මාව ආරක්ෂා කරන්න.[17]
2 ඔවුහු සිතින් මට විරුද්ධව කූට සැලසුම් යොදති.[18]
යුද්ධ කරන්නාක් මෙන් ඔවුහු දවස මුළුල්ලේම මට පහර දෙති.[1]
3 ඔවුන්ගේ දිව සර්ප දිවක් මෙන් තියුණුය.[2]
ඔවුන්ගේ මුවින් පිට වන වචන පොළොං විෂ මෙන් මාරාන්තිකය.[3] සීලාහ්.
4 යෙහෝවා දෙවියනි, දුෂ්ටයාගේ අතින් මාව බේරාගන්න.[4]
දාමරිකයන්ගෙන් මාව ආරක්ෂා කරන්න.[5]
මාව බිම හෙළා දැමීමට ඔවුහු කුමන්ත්‍රණය කරති.[6]
5 උඩඟු මිනිස්සු මට උගුලක් ඇටෙව්වෝය.[7]
මා යන එන පාරේ දැලක් එළා තැබුවෝය.[8]
මාව හසු කරගැනීමට ඔවුහු උගුල් අටවා තැබුවෝය.[9] සීලාහ්.
6 “යෙහෝවා දෙවියනි,
මාගේ දෙවි ඔබයි.[10]
එබැවින් මාගේ කන්නලව්වලට සවන් දෙන්න”[11] කියා මම යෙහෝවා දෙවි වන ඔබට හඬගැසුවෙමි.
7 විශ්වයේ පාලකයාණන් වන යෙහෝවා දෙවියනි,[12] මට ගැලවීම සලසා දෙන බලවත් තැනැත්තා ඔබයි.[13]
යුධ පිටියේදී ඔබ මාගේ හිස, වැස්මකින් ආරක්ෂා කළෙහිය.[14]
8 යෙහෝවා දෙවියනි, දුෂ්ටයන්ගේ ආශාවන් ඉටු කරගැනීමට ඉඩ නොදෙන්න.[15]
ඔවුන් තව තවත් උඩඟු නොවන පිණිස ඔවුන්ගේ උපායන් සාර්ථක වීමට ඉඩ නොදෙන්න.[16] සීලාහ්.

**139 ගීතාවලිය**
1 ගීතා 40:5
2 ගීතා 3:5 ගීතා 17:15 ගීතා 63:6
3 ගීතා 5:6 ගීතා 9:17 ගීතා 94:23
4 1රාජා 2:5
5 යෝබ් 21:14 ගීතා 21:11 ගීතා 73:8 හිතෝ 24:8
6 යෙසා 64:2
7 නික් 20:7 යූද් 15
8 2ලේක 19:2 ගීතා 21:8 ගීතා 81:15 2කොරි 6:14
9 ගීතා 119:158
10 ගීතා 101:3
11 ගීතා 37:12 ගීතා 37:32
12 යෙරෙ 20:12
13 ගීතා 94:19
14 ගීතා 7:3 ගීතා 17:3
15 ගීතා 5:8 ගීතා 143:8 ගීතා 143:10

**140 ගීතාවලිය**
16 ගීතා 59:1
17 ගීතා 18:48 ගීතා 71:4
18 ගීතා 36:4 ගීතා 64:6 හිතෝ 6:18 සෙක 7:10 මතෙ 5:28

**2 තීරුව**
1 ගීතා 56:6 ගීතා 120:7
2 ගීතා 52:2 ගීතා 58:4
3 මතෙ 12:34 රෝම 3:13 යාකො 3:8
4 ගීතා 17:8 ගීතා 36:11 ගීතා 37:33
5 ගීතා 31:4 ගීතා 71:4
6 ගීතා 25:15
7 ගීතා 119:110 ගීතා 141:9
8 ගීතා 10:9 ගීතා 35:7 ගීතා 57:6
9 යෙරෙ 18:22 ලූක් 11:54 ලූක් 20:20
10 ගීතා 31:14 ගීතා 91:2 යොහ 20:17

**11** ගීතා 27:7; ගීතා 28:2; ගීතා 55:1; **12** ක්‍රියා 4:24; **13** ද්වි 33:27; ගීතා 27:1; ගීතා 28:8; **14** 1සාමු 17:37; ගීතා 144:10; **15** 2සාමු 15:31; ගීතා 27:12; **16** ද්වි 32:27.

9 මාව වට කරගෙන සිටින අයගේ[1]
කූට සැලසුම්වලට
ඔවුන්ම හසු වේවා![2]
10 ගිනි අඟුරු ඔවුන් පිට වැටේවා![3]
නැවත ගොඩ ඒමට නොහැකි වන සේ ඔවුහු ගිනි ගොඩකට ඇද වැටෙත්වා![4] ගැඹුරු වතුර වළකට වැටෙත්වා![5]
11 උදම් අනන බොරුකාරයන්ට හැමදාටම පොළොවේ රැඳී සිටීමට නොහැකි වේවා![6]
දුක් කරදර දාමරිකයන් පසුපස ලුහුබඳීවා![7]
12 යෙහෝවා දෙවි පීඩිතයාටත් දිළින්දාටත්[8]
යුක්තිය ඉටු කර දෙන බව මට විශ්වාසයි.[9]
13 ධර්මිෂ්ඨයෝ ඔබේ නාමයට ප්‍රශංසා කරන්නෝය.[10]
අවංක අය ඔබ ඉදිරියේ ජීවත් වන්නෝය.[11]

දාවිත් රචනා කළ ගීතයකි.

# 141

යෙහෝවා දෙවියනි, මම ඔබට කන්නලව් කළෙමි.[12]
පමා නොවී මාගේ උපකාරයට පැමිණෙන්න.[13]
මා ඔබට හඬගසන විට මට සවන් දෙන්න.[14]
2 ඔබ ඉදිරියේ ඔප්පු කිරීම සඳහා පිළියෙල කළ සුවඳ ද්‍රව්‍ය[15] ඔබ පිළිගන්නාක් මෙන් මා කරන යාච්ඤාවත් පිළිගන්න.[16]
සන්ධ්‍යාවේ ඔප්පු කරන ධාන්‍ය පූජාව පිළිගන්නාක් මෙන් දෑත් ඔසවා මා කරන කන්නලව්වත් පිළිගන්න.[17]
3 යෙහෝවා දෙවියනි, මාගේ මුඛයට රැකවලෙකු පත් කරන්න.[18]
මාගේ දෙතොලින් පිට වන වදන් ගැන විමසිලිමත්ව සිටීමට උපකාර කරන්න.[19]
4 මාගේ හදවත කිසි නපුරු දෙයකට යොමු වීමට ඉඩ නොදෙන්න.[20]
නපුරු දේ කරන්නන් සමඟ එකතු වී[1]
දුෂ්ට ක්‍රියාවල නියැළීමට මට ඉඩ නොහරින්න.[2]
ඔවුන්ගේ රසවත් බොජුන් භුක්ති විඳීමට මා තුළ ආශාවක් ඇති වීමට ඉඩ නොදෙන්න.[3]
5 ධර්මිෂ්ඨයා මට පහර දුන්නත් එය ප්‍රේමණීය* ක්‍රියාවකි.[4]
ඔහු මට අවවාද කළත් එය මාගේ හිස පිට වත් කරන තෛලයක් මෙනි.[5]
මම එය ප්‍රතික්ෂේප නොකරන්නෙමි.[6]
ඔවුන් විපත්තිවලට මුහුණ දෙන විටදී මම ඔවුන් වෙනුවෙන් යාච්ඤා කරන්නෙමි.[7]
6 සෙනඟගේ විනිශ්චයකරුවන්ව පර්වතයෙන් පහතට හෙළන ලදී.[8]
නමුත් සෙනඟ මාගේ වදන් අසා ඒවා යහපත් බව වටහාගන්නෝය.[9]
7 දර පැළූ විට කුඩා ලී පතුරු සීසීකඩ වැටී තිබෙන්නාක් මෙන්
අපේ ඇටකටු මිනී වළ අද්දර සීසීකඩ වැටී තිබේ.[10]
8 නමුත් විශ්වයේ පාලකයාණන් වන යෙහෝවා දෙවියනි,[11] මාගේ දෙනෙත් මම ඔබ වෙතට යොමු කළෙමි.[12]
මා රැකවරණය පැතුවේ ඔබගෙන්ය.[13]
මාගේ ජීවිතය අවසන් වී යෑමට ඉඩ නොදෙන්න.[14]
9 ඔවුන් මට ඇටෙවූ උගුලෙන්ද[15]
නපුරු ක්‍රියා කරන්නන් හෑරූ

**7** 1සාමු 12:23; මතෙ 5:44; **8** 1සාමු 31:1; 2සාමු 1:19; 1ලේක 10:1; **9** 2සාමු 2:5; 2සාමු 23:1; ලූක් 4:22; **10** රෝම 8:36; 2කොරි 1:9; හෙබ්‍රෙ 11:37; **11** ක්‍රියා 4:24; **12** 2ලේක 20:12; ගීතා 25:15; ගීතා 123:1; **13** ගීතා 5:11; ගීතා 11:1; ගීතා 71:1; **14** යෙසා 53:12; **15** ගීතා 119:110; ගීතා 124:7.

**ගීතා 141:5*** හෝ, “ලැදි ප්‍රේමයකින් යුත්.”

**140 ගීතාවලිය**
**1** ගීතා 7:16
**2** එස්ත 7:10, ගීතා 94:23, හිතෝ 12:13, හිතෝ 18:7
**3** උත් 19:24, ගීතා 11:6, ගීතා 21:9
**4** මතෙ 13:42
**5** ගීතා 55:23, හිතෝ 28:10
**6** ගීතා 12:3
**7** ගීතා 34:21, යෙසා 3:11, ගලා 6:7
**8** ගීතා 9:4, ගීතා 10:18, ගීතා 22:24, ගීතා 72:4
**9** 1රාජා 8:45
**10** ගීතා 32:11, ගීතා 33:1
**11** ගීතා 23:6, එළි 7:15

**141 ගීතාවලිය**
**12** ගීතා 31:17, ගීතා 88:9
**13** ගීතා 40:13, ගීතා 70:5, ගීතා 71:12
**14** ගීතා 39:12, 1පේතෘ 3:12
**15** නික් 30:35
**16** ලූක් 1:9, එළි 5:8, එළි 8:3
**17** නික් 29:39, ගීතා 28:2, ගීතා 63:4, ගීතා 134:2, 1තිමෝ 2:8
**18** හිතෝ 13:3, හිතෝ 21:23
**19** යාකො 1:26, යාකො 3:2
**20** 1රාජා 8:58, ගීතා 119:36, හිතෝ 21:1

**2 තීරුව**
**1** 1කොරි 15:33
**2** ආනි 11:27
**3** හිතෝ 23:6
**4** 2සාමු 12:7, 2ලේක 16:7, හිතෝ 17:10, ගලා 2:11, ගලා 6:1
**5** ගීතා 23:5, හිතෝ 6:23, හිතෝ 19:25, යාකො 5:14
**6** හිතෝ 9:8, හිතෝ 19:25, හිතෝ 25:12

බොරු වළවල්වලින්ද[1] මාව ආරක්ෂා කරන්න.
10 දුෂ්ටයෝ සියලුදෙනාම තමුන් එළූ දැලටම අසු වන්නෝය.[2]
නමුත් මම ඒ සියල්ලෙන් බේරී යන්නෙමි.

මස්කිල්. යාච්ඤාවකි. ගුහාවක සැඟවී සිටි කාලය ගැන ආවිත් රචනා කළ ගීතයකි.[3]

142 උපකාරය පතා මම යෙහෝවා දෙවිට කන්නලව් කළෙමි.[4]
මට කරුණාව පෙන්වන ලෙස යෙහෝවා දෙවිට මොරගැසුවෙමි.[5]
2 මාගේ කනස්සල්ල ගැන නොනවත්වා ඔහුට පැවසුවෙමි.[6]
මාගේ දුක ගැන දිගින් දිගටම ඔහුට කීවෙමි.[7]
3 මාගේ ශක්තිය[8] හීන වී මා මලානික වූ විට
මා යා යුතු මඟ ඔබ මට පෙන්වූවෙහිය.[9]
මා යන මාවතෙහි[10]
ඔවුහු මට උගුලක් ඇටෙව්වෝය.[11]
4 දකුණු පැත්තට හැරී බලන්න.
මාව හඳුනන කිසිවෙක් එහි නැත.[12]
පලා යා හැකි තැනක් මට නැත.[13]
කිසිවෙක් මා ගැන සොයා බලන්නේද නැත.[14]
5 යෙහෝවා දෙවියනි, උපකාරය පතා මම ඔබට කන්නලව් කළෙමි.[15]
“මාගේ රැකවරණය ඔබය.[16]
මිහිපිට[17] මට ඇති උරුමය ඔබය”[18] කියා මම පැවසුවෙමි.
6 දෙවියනි, මාගේ කන්නලව්වට සවන් දෙන්න.[19]
මන්ද මම හෙම්බත්ව සිටිමි.[20]
පීඩා කරන්නන්ගෙන් මාව බේරාගන්න.[21]
මන්ද ඔවුහු මට වඩා බලවත්ය.[22]

**141 ගීතාවලිය**
1 ගීතා 140:5, ගීතා 142:3, යෙරෙ 18:22, ලූක් 11:54, ලූක් 20:20
2 එස්ත 7:10, ගීතා 7:15, ගීතා 9:15, ගීතා 35:8, ගීතා 37:15, ගීතා 57:6

**142 ගීතාවලිය**
3 1සාමු 22:1, 1සාමු 24:3, හෙබ්‍රෙ 11:38
4 ගීතා 28:2, ගීතා 50:15, ගීතා 107:13
5 ගීතා 30:8, ගීතා 77:1, ගීතා 141:1
6 1සාමු 1:16, යෙසා 26:16, මතෙ 26:39
7 ගීතා 18:6, යෝනා 2:7, මාක් 15:34, හෙබ්‍රෙ 5:7
8 යොෂු 5:1, ගීතා 143:4
9 යෝබ් 23:10, ගීතා 1:6, ගීතා 119:105
10 ගීතා 139:3
11 ගීතා 140:5, යෙරෙ 18:22, මතෙ 22:15
12 ගීතා 31:11, ගීතා 69:20, ගීතා 88:8
13 1සාමු 23:11
14 යොහ 16:32
15 ගීතා 107:19
16 ගීතා 34:8, ගීතා 46:1, ගීතා 91:2, හිතෝ 18:10
17 ගීතා 27:13, යෙරෙ 11:19
18 ගීතා 16:5, ගීතා 73:26, ගීතා 119:57, විලා 3:24
19 ගීතා 143:11
20 ගීතා 116:6
21 1සාමු 20:33, 1සාමු 23:26, 1සාමු 25:29, ගීතා 3:1
22 ගීතා 38:19

**2 තීරුව**
1 ගීතා 54:6
2 යෙසා 24:22, යෙසා 42:7, යෙරෙ 38:13

7 ඔබේ නාමයට ප්‍රශංසා කිරීමට මට හැකි වන පිණිස[1]
මාව මේ අඳුරු සිරකුටියෙන් පිටතට ගන්න.[2]
ඔබ මට යහපත කරන නිසා[3]
මා වටා ධර්මිෂ්ඨයෝ රැස් වෙත්වා![4]

දාවිත් රචනා කළ ගීතයකි.

143 යෙහෝවා දෙවියනි, මාගේ යාච්ඤාවට සවන් දෙන්න.[5]
මාගේ කන්නලව්වට ඔබේ දෙසවන් යොමු කරන්න.[6]
ඔබ විශ්වාසවන්ත නිසාත් ධර්මිෂ්ඨ නිසාත් මට පිළිතුරු දෙන්න.[7]
2 විනිශ්චයකරුවෙකු ඉදිරියට කැඳවන්නාක් මෙන් ඔබේ සේවකයාව ඔබ ඉදිරියට නොකැඳවන්න.[8]
මන්ද කිසිවෙකුට ඔබ ඉදිරියේ ධර්මිෂ්ඨයෙකු විය නොහැකිය.[9]
3 මාගේ ජීවිතය විනාශ කිරීමේ අටියෙන් සතුරා මා පසුපස ලුහුබැඳ ආවේය.[10]
ඔහු මාව බිම හෙළා පාගා දැමුවේය.[11]
අඳුරු තැන්වල ජීවත් වීමට ඔහු මට සැලැස්වූවේය. මා දැන් සිටින්නේ බොහෝ කාලයකට ඉහතදී මිය ගිය කෙනෙකු මෙනි.[12]
4 මාගේ ශක්තිය[13] හීන වී මම මලානික වී ඇත.
මාගේ සිත දුකින් වෙළී ඇත.[14]
5 අතීතය ගැන මම සිහි කළෙමි.[15]

3 ගීතා 13:6; ගීතා 116:7; ගීතා 119:17; යාකො 5:11; 4 ගීතා 34:2; **143 ගීතාවලිය** 5 ගීතා 65:2; 6 ගීතා 28:2; 7 2සාමු 7:25; ගීතා 31:1; ගීතා 71:2; 8 යෝබ් 14:3; රෝම 3:20; ගලා 2:16; 9 2ලේක 6:36; යෝබ් 9:2; ගීතා 51:5; ගීතා 130:3; දේශ 7:20; රෝම 3:10; 1යොහ 1:10; 10 ගීතා 7:1; ගීතා 35:4; 11 ගීතා 7:5; 12 ගීතා 88:5; 13 ගීතා 77:3; ගීතා 142:3; 14 ගීතා 102:4; 15 ගීතා 77:5.

ඔබේ සියලු ක්‍රියා ගැන ගැඹුරින් කල්පනා කළෙමි.[1]
ඔබේ මහත් බලය විදහා ඔබ කළ දේවල් ගැන මහත් ආශාවකින් කල්පනා කළෙමි.[2]
6 මම දැන් ඔසවා ඔබට යාච්ඤා කළෙමි.[3]
වියළි දේශයක් දිය පොදක් වැටෙන තෙක් බලා සිටින්නාක් මෙන් ඔබ දෙස බලා සිටිමි.[4] සේලාහ්.
7 යෙහෝවා දෙවියනි, පමා නොවී මාගේ උපකාරයට පැමිණෙන්න.[5]
මන්ද මාගේ ජීවිතය නැති වී යැමට ආසන්නය.[6]
දෙවියනි, මා වෙතින් ඔබේ මුහුණ ඉවතට හරවා නොගන්න.[7]
මන්ද ඔබ එසේ කළොත් මිය යැමට ආසන්න කෙනෙකුගේ තත්වයට මම පත් වනු ඇත.[8]
8 ඔබ පෙන්වන ඉමහත් ප්‍රේමය* ගැන උදෑසනින්ම මට ඇසීමට සලස්වන්න.[9]
මන්ද මා විශ්වාසය තැබුවේ ඔබ කෙරෙහිය.[10]
දෙවියනි, මා යා යුතු මාර්ගය මට පෙන්වන්න.[11]
මන්ද මාගේ මුළු ජීවිතයම මම ඔබ වෙනුවෙන් දෙන්නෙමි.[12]
9 යෙහෝවා දෙවියනි, මාගේ සතුරන්ගෙන් මාව බේරාගන්න.[13]
මන්ද මා රැකවරණය පතා පැමිණියේ ඔබ වෙතටය.[14]
10 ඔබේ කැමැත්ත කිරීමට මට උගන්වන්න.[15]
මන්ද ඔබ මාගේ දෙවියා.[16]
ඔබේ මහත් බලය ඉතා අගනේය.[17]
අවංකකමේ දේශයේ දිගටම ගමන් කිරීමට එයින් මට මඟ පෙන්වීම ලැබේවා![18]
11 යෙහෝවා දෙවියනි, ඔබේ නාමය වෙනුවෙන්[1] මාගේ දිවි රැක දෙන්න.[2]
ඔබ ධර්මිෂ්ඨ දෙවි කෙනෙකු නිසා[3] මාව මේ විපතින් ගලවාගන්න.[4]
12 ඔබ ප්‍රේමණීය* දෙවි කෙනෙකු නිසා මාගේ සතුරන්ව විනාශ කර දමන්න.[5]
මට හිරිහැර කරන සියල්ලන්ව විනාශ කර දමන්න.[6]
මන්ද මම ඔබේ සේවකයාය.[7]

දාවිත් රචනා කළ ගීතයකි.

**144** මාගේ පර්වතය වන යෙහෝවා දෙවිට ප්‍රශංසා වේවා![8]
ඔහු මට සටන් කිරීමට උගන්වන්නේය.[9]
යුද්ධ කිරීමට මාව සූදානම් කරන්නේය.
2 මාගේ බලකොටුව ඔහුය.[10] මට ප්‍රේමණීයව* සලකන්නෙත් ඔහුය.
මට ආරක්ෂාව ලබා දෙන උස් බලකොටුවද මට ගැලවීම ලබා දෙන තැනැත්තාද ඔහුය.[11]
මාගේ පලිහ ඔහුය.[12] මා ආරක්ෂාව පතන්නේ ඔහුගෙන්ය.[13]
සෙනඟව මට යටත් කර දෙන්නෙත් ඔහුය.[14]
3 යෙහෝවා දෙවියනි, ඔබ මිනිසාව සිහි කිරීමට තරම් ඔහු කවුද?[15]
ඔබේ අවධානයට ලක් වීමට තරම් මිනිසුන් වටින්නේද?[16]
4 මිනිසා ගසාගෙන යන සුළඟක් මෙනි.[17]

---

**143 ගීතාවලිය**
1 ද්වි 32:4, ගීතා 19:14, ගීතා 64:9, ගීතා 77:12, ගීතා 90:16, ගීතා 111:3, පිලි 4:8
2 ගීතා 92:4
3 ගීතා 88:9
4 ගීතා 63:1
5 ගීතා 13:3, ගීතා 40:13, ගීතා 70:5
6 ගීතා 142:3
7 ගීතා 27:9, ගීතා 104:29
8 ගීතා 28:1, ගීතා 88:4, යෙසා 38:18
9 ගීතා 42:8, ගීතා 46:5, ගීතා 59:16
10 හිතෝ 3:5, හිතෝ 16:20, යෙසා 26:3, යෙරෙ 17:7
11 ගීතා 5:8, හිතෝ 3:6
12 ගීතා 25:1, ගීතා 86:4
13 ගීතා 59:1
14 ගීතා 61:4, ගීතා 91:1
15 ගීතා 25:4, මීකා 4:2
16 ගීතා 31:14, යොහ 20:17
17 නෙහෙ 9:20, යොහ 14:26
18 ගීතා 27:11, යෙසා 26:10

**2 තීරුව**
1 ගීතා 25:11
2 ගීතා 119:25
3 ගීතා 9:8, ගීතා 31:1
4 ගීතා 34:19
5 1සාමු 25:29, 1සාමු 26:10, ගීතා 54:5
6 1සාමු 24:12
7 ගීතා 89:20, ගීතා 116:16, ක්‍රියා 3:13, ක්‍රියා 4:25

**144 ගීතාවලිය**
8 ද්වි 32:4, 2සාමු 23:3, ගීතා 18:2, ගීතා 95:1
9 2සාමු 22:35, ගීතා 18:34
10 2සාමු 22:2, යෙරෙ 16:19

**11** 2සාමු 22:3; ගීතා 18:2; ගීතා 40:17; **12** උත් 15:1; හිතෝ 30:5; **13** ගීතා 141:8; **14** ගීතා 18:47; **15** යෝබ් 7:17; ගීතා 8:4; හෙබ්‍රෙ 2:6; **16** ගීතා 10:18; ගීතා 104:15; **17** ගීතා 39:5; ගීතා 62:9.

---

**ගීතා 143:8*** හෝ, “ලැදි ප්‍රේමය.”

**ගීතා 143:12*** හෝ, “ලැදි ප්‍රේමයකින් යුත්.” **144:2*** හෝ, “ලැදි ප්‍රේමයකින්.”

ඔහුගේ ආයු කාලය මොහොතකින් නොපෙනී යන සෙවණැල්ලක් මෙනි.[1]
5 යෙහෝවා දෙවියනි, අහස නමා පහතට බැස එන්න.[2]
කඳු ස්පර්ශ කරන්න. එවිට ඒවායින් දුම් නඟිනු ඇත.[3]
6 අකුණුවලින් පහර දී මාගේ සතුරන්ව විසුරුවාහරින්න.[4]
ඊතල විද ඔවුන්ව වියවුලට පත් කරන්න.[5]
7 ඉහළ සිට ඔබේ හස්තය දිගු කර[6]
ගැඹුරු ජලයෙන් මාව පිටතට අදින්න.[7]
විදේශිකයන්ගේ අතින් මාව බේරාගන්න.[8]
8 ඔවුන්ගේ මුවින් නිතරම පිට වන්නේ බොරු වදන්ය.[9]
ඔවුහු දකුණත ඔසවා බොරු දිවුරුම් දෙන්නෝය.[10]
9 දෙවියනි, මම ඔබට අලුත් ගීයක් ගායනා කරමි.[11]
තත් දසයේ සංගීත භාණ්ඩයක් වයමින් ඔබට ප්‍රශංසා ගී ගයමි.[12]
10 රජවරුන්ට ජයග්‍රහණය අත් කර දෙන්නේ ඔබය.[13]
තම සේවක දාවිත්ව කුරිරු කඩුවෙන් බේරාගන්නෙත් ඔබය.[14]
11 දෙවියනි, විදේශිකයන්ගේ අතින් මාව බේරාගන්න.[15]
ඔවුන්ගේ මුවින් නික්මෙන්නේ බොරු වදන්ය.[16]
ඔවුහු දකුණත ඔසවා බොරු දිවුරුම් දෙන්නෝය.[17]
12 ඔවුහු මෙසේ පවසන්නෝය.
“තරුණ වියේ සිටින අපේ පුත්‍රයෝ හොඳින් වැඩුණු ගස් මෙනි.[18]
අපේ දූවරු රජමාලිගාවේ ඇති කැටයම් කළ මනහර කණු මෙනි.
13 විවිධ ආහාර පානවලින් අපේ ගබඩා පිරී ඇත.[19]
අපේ වතුපිටිවල සිටින එළු බැටළු රැළවල් දහස් ගණනින්ද දසදහස් ගණනින්ද වර්ධනය වෙති.
14 ගැබ්බරව සිටින අපේ එළදෙනුන්ට ගබ්සා වීමක්වත් කිසි අනතුරක්වත් සිදු නොවන්නේය.[1]
අපේ මංසන්ධිවල වැලපීමේ හඬක් කිසිවිටක අසන්න නොලැබේ.[2]
15 ජීවිතය මෙලෙස භුක්ති විඳින සෙනඟ සන්තෝෂවත්ය.”
නමුත් ඇත්තටම සන්තෝෂවත් සෙනඟ වන්නේ යෙහෝවා දෙවිව තමන්ගේ දෙවි ලෙස පිළිගෙන සිටින සෙනඟය.[3]

දාවිත් රචනා කළ ප්‍රශංසා ගීතයකි.

א [ආලෙෆ්]

145 රජ්ජුරුවනි, මාගේ දෙවියනි, මම ඔබට ප්‍රශංසා කරන්නෙමි.[4]
ඔබේ නාමයට සදාකාලයෙන් සදාකාලයට ප්‍රශංසා කරන්නෙමි.[5]

ב [බේත්]

2 දවස මුළුල්ලේම ඔබට ප්‍රශංසා කරන්නෙමි.[6]
සදාකාලයෙන් සදාකාලයට ඔබේ නාමයට ප්‍රශංසා කරන්නෙමි.[7]

ג [ගීමෙල්]

3 යෙහෝවා දෙවි වන ඔබ ඉතා ශ්‍රේෂ්ඨය. ඔබ බොහෝ සෙයින් ප්‍රශංසාව ලැබීමට වටින්නෙහිය.[8]
ඔබේ ශ්‍රේෂ්ඨත්වය කොතරම්ද කියා දැනගත හැක්කේ කාටද![9]

**144 ගීතාවලිය**
1 1ලේක 29:15
යෝබ් 8:9
යෝබ් 14:2
ගීතා 102:11
දේශ 8:13
2 ගීතා 18:9
යෙසා 64:1
3 නික් 19:18
ගීතා 104:32
4 2සාමු 22:15
යෝබ් 36:32
ගීතා 18:14
ගීතා 77:18
ගීතා 97:4
සෙක 9:14
5 ද්වි 32:42
ගීතා 21:12
ගීතා 45:5
6 2සාමු 22:17
ගීතා 18:16
7 ගීතා 69:1
එළි 12:15
8 නෙහෙ 9:2
ගීතා 54:3
9 ගීතා 10:7
ගීතා 12:2
ගීතා 109:2
10 යෙසා 44:20
11 ගීතා 33:3
ගීතා 40:3
ගීතා 96:1
යෙසා 42:10
එළි 5:9
එළි 14:3
12 1ලේක 25:1
ගීතා 33:2
ගීතා 92:3
13 2සාමු 5:19
ගීතා 18:50
14 1සාමු 17:46
2සාමු 21:17
15 2සාමු 10:6
16 2සාමු 10:3
ගීතා 73:9
17 ගීතා 7:14
ගීතා 73:8
ගීතා 119:118
18 ගීතා 37:35
19 ගීතා 73:12

**2 තීරුව**
1 ගීතා 73:5
2 ගීතා 73:3
3 ගීතා 33:12
ගීතා 37:9
ගීතා 37:37
ගීතා 89:15
ගීතා 146:5
ලූක් 11:28
යාකො 1:25

**145 ගීතාවලිය** **4** ගීතා 44:4; යෙසා 33:22; දානි 2:47; එළි 11:17; **5** 1ලේක 29:10; **6** ගීතා 119:164; **7** ගීතා 113:2; ගීතා 146:2; **8** ගීතා 48:1; ගීතා 96:4; ගීතා 147:5; ගීතා 150:2; රෝම 1:20; එළි 15:3; **9** යෝබ් 9:10; යෝබ් 26:14; යෝබ් 36:26; ගීතා 92:5; ගීතා 139:6; රෝම 11:33.

ד [දාලෙත්]

4 පරම්පරාවක් පරම්පරාවක් පාසා
ඔබේ ක්‍රියා ගැන ඔබට
ප්‍රශංසා කරනු ඇත.[1]
ඔබේ බලවත් ක්‍රියා ගැන ප්‍රකාශ
කරනු ඇත.[2]

ה [හේ]

5 ඔබ තේජශ්‍රීයෙන් කොතරම්
උසස්ද කියාත්[3]
ඔබ කර ඇති පුදුමාකාර ක්‍රියා
ගැනත් මම ගැඹුරින් කල්-
පනා කරමි.[4]

ו [වාව්]

6 බිය උපදවන දේවල් කර ඔබ විද-
හාපෙන්වූ ඔබේ මහත් බලය
ගැන ඔවුහු කතා කරනු
ඇත.[5]
ඔබේ ශ්‍රේෂ්ඨත්වය ගැන මම
ප්‍රකාශ කරන්නෙමි.[6]

ז [ෂායින්]

7 ඔබේ යහපත්කම මොන තරම්ද
කියා ඔවුහු සැමදා කතා
කරනු ඇත.[7]
ඔබේ ධර්මිෂ්ඨකම ගැන ඔවුහු
ප්‍රීති ඝෝෂා නගනු ඇත.[8]

ח [චේත්]

8 යෙහෝවා දෙවි කරුණාවන්තය.
දයාන්විතය.[9]
ඔහු කෝප වීමට ඉක්මන් නො-
වන්නේය. ඔහු පෙන්වන ප්‍රේ-
මය* අතිමහත්ය.[10]

ט [ටේත්]

9 යෙහෝවා දෙවි සියල්ලන්ට යහ-
පත කරන්නේය.[11]
තම හස්තයෙන් නිර්මාණය
කළ සියල්ලන්ට ඔහු දයාව
පෙන්වන්නේය.[12]

י [යෝද්]

10 යෙහෝවා දෙවියනි, ඔබ සෑදූ
සියල්ල ඔබව පසසන්-
නේය.[13]
ඔබේ විශ්වාසවන්ත සේවක-
යෝ ඔබට ප්‍රශංසා කරන්-
නෝය.[1]

כ [කෆ්]

11 ඔබේ රාජ්‍යයේ තේජස ගැන ඔවුහු
වර්ණනා කරන්නෝය.[2]
ඔබේ මහත් බලය ගැන කතා
කරන්නෝය.[3]

ל [ලාමෙද්]

12 එසේ කරන්නේ ඔබේ බලවත් ක්‍රියා
ගැනත්[4]
ඔබේ රාජ්‍යයේ තේජස ගැනත්[5]
සියලු මනුෂ්‍යයන්ට දන්වන
පිණිසය.

מ [මෙම්]

13 ඔබේ රජකම සදහටම පවතින්-
නේය.[6]
ඔබේ පාලනය පරම්පරාවෙන්
පරම්පරාවට පවතින්නේය.[7]

ס [සාමෙක්]

14 වැටී සිටින සියල්ලන්ට නැඟී සිටී-
මට යෙහෝවා දෙවි උපකාර
කරන්නේය.[8]
හෙම්බත්ව නැමී සිටින සියල්-
ලන්ට කෙළින් සිටගැනීමට
ඔහු උදව් කරන්නේය.[9]

ע [ආයින්]

15 බලාපොරොත්තු ඇතුව සියල්-
ලෝම ඔබ දෙස බලා
සිටිති.[10]
නිසි වේලාවට ඔබ ඔවුන්ට කෑම
සපයන්නෙහිය.[11]

פ [පේ]

16 ඔබේ හස්තය විදහා[12]
ඔබ ජීවමාන සියල්ලන්ගේ
ආශාව තෘප්තිමත් කරන්-
නෙහිය.[13]

צ [ට්සාඩේ]

17 යෙහෝවා දෙවිගේ සියලු මාර්ග
ධර්මිෂ්ඨය.[14]
ඔහු කරන සෑම දෙයකින්ම ඔහු-

ගීතා 145:8* හෝ, "ලැදි ප්‍රේමය."

145 ගීතාවලිය
1 යොෂු 4:21 ගීතා 71:18 යෙසා 38:19
2 නික් 12:27
3 ගීතා 8:1 ගීතා 104:1 ගීතා 111:3 ගීතා 148:13
4 ගීතා 72:18
5 යොෂු 2:9 නෙහෙ 1:5
6 ගීතා 107:21 ක්‍රියා 4:24
7 1රාජා 8:66 ගීතා 13:6 ගීතා 31:19 යෙසා 63:7 යෙරෙ 31:12
8 ගීතා 51:14 යෙසා 45:24 එළි 15:3
9 2ලේක 30:9 ගීතා 86:15 ගීතා 111:4 එෆී 2:4
10 නික් 34:6 ගණන් 14:18 නෙහෙ 9:17 ගීතා 103:8
11 ගීතා 25:8 ගීතා 100:5 ගීතා 104:28 නාහූ 1:7 මතෙ 5:45 ක්‍රියා 14:17 යාකො 1:17
12 එෆී 2:4
13 ගීතා 19:1 ගීතා 103:22 ගීතා 104:24

2 තිරුව
1 1සාමු 2:9 ගීතා 30:4 ගීතා 132:9 ගීතා 149:5 හෙබ්‍රෙ 13:15 1පේතෘ 2:5
2 1ලේක 29:11 මතෙ 4:23 ලූක් 10:9
3 ද්වි 3:24 එළි 15:3
4 ගීතා 98:1 ගීතා 136:4
5 ගීතා 103:19 ගීතා 111:3
6 ගීතා 146:10 යෙරෙ 10:7 1තිමෝ 1:17
7 දානි 6:26
8 ගීතා 37:24 ගීතා 94:18
9 ගීතා 38:6; ගීතා 146:8; 10 ගීතා 104:21; 11 උත් 1:30; ගීතා 104:27; ගීතා 136:25; මතෙ 24:45; 12 ගීතා 104:28; 13 ගීතා 107:9; ගීතා 132:15; 14 උත් 18:25; ද්වි 32:4; රෝම 3:5; එළි 15:3; එළි 16:5.

ගේ විශ්වාසවන්තකම දකින්-
නට ලැබෙන්නේය.[1]

ק [කෝෆ්]

18 යෙහෝවා දෙවි තමාට හඬගසන
සියල්ලන්ට සමීපව සිටියි.[2]
අවංකකමින් ඔහුට හඬගසන
සියල්ලන්ට ඔහු ළංව සිටියි.[3]

ר [රේෂ්]

19 ඔහුට ගරුබිය දක්වන අයගේ
ආශාව ඔහු ඉෂ්ට කරන්-
නේය.[4]
උපකාරය ඉල්ලා ඔවුන්
කන්නලව් කරන විට ඔහු
ඔවුන්ට සවන් දී ඔවුන්ව
බේරාගන්නේය.[5]

ש [ෂින්]

20 යෙහෝවා දෙවි තමාට ප්‍රේම කරන
සියල්ලන්ව ආරක්ෂා කරන්-
නේය.[6]
නමුත් සියලු දුෂ්ටයන්ව ඔහු
සහමුලින්ම විනාශ කර
දමන්නේය.[7]

ת [ටාව්]

21 මාගේ මුවින් මම යෙහෝවා දෙවිට
ප්‍රශංසා කරන්නෙමි.[8]
සියලුදෙනාම ඔහුගේ ශුද්ධ
නාමයට සදාකාලයෙන් සදා-
කාලයට ප්‍රශංසා කරනු
ලබත්වා![9]

# 146

ජනයෙනි, යෙහෝවා දෙ-
විට ප්‍රශංසා කරන්න.[10]
මාගේ මුළු සිතින්ම
මම යෙහෝවා දෙවිට
ප්‍රශංසා කරන්නෙමි.[11]

2 දිවි ඇති තුරා යෙහෝවා දෙවිට
ප්‍රශංසා කරන්නෙමි.[12]
ජීවත්ව සිටින තාක් කල් මාගේ
දෙවිට ප්‍රශංසා ගී ගයන්-
නෙමි.[13]

3 වංශවත් අය කෙරෙහිවත්[14]
ගැලවීම ලබා දිය නොහැකි
මිනිසුන් කෙරෙහිවත්[15] විශ්-
වාසය නොතබන්න.

4 ඔවුහු අවසන් හුස්ම හෙළූ* පසු[1]
නැවත දූවිල්ලට හැරී යන්-
නෝය.[2]
ඒ මොහොතේම ඔවුන්ගේ කල්-
පනාව නැති වී යන්නේය.[3]

5 උපකාරය සඳහා යාකොබ්ගේ
දෙවි තමා සමඟ සිටින
තැනැත්තා සන්තෝෂ-
වත්ය.[4]
තම දෙවි වූ යෙහෝවා කෙ-
රෙහි බලාපොරොත්තු තබන
තැනැත්තා සන්තෝෂවත්ය.[5]

6 අහසත් පොළොවත්[6]
මුහුදත් ඒවායේ තිබෙන සියල්-
ලත්[7] සෑදුවේ ඔහුය.
සදහටම විශ්වාසවන්තව ක්‍රියා
කරන්නෙත් ඔහුය.[8]

7 අසාධාරණකම්වලට මුහුණ දුන්
අයට යුක්තිය ඉටු කර දෙන්-
නේ ඔහුය.[9]
කුසගින්නෙන් පෙළෙන්නන්ට
ආහාර සපයා දෙන්නේ
ඔහුය.[10]
සිරකරුවන්ට නිදහස දෙන්නේද
යෙහෝවා දෙවි වන ඔහුය.[11]

8 යෙහෝවා දෙවි අන්ධ අයට පෙ-
නීම දෙන්නේය.[12]
හෙම්බත්ව නැමී සිටින අයට
කෙළින් සිටගැනීමට යෙ-
හෝවා දෙවි උපකාර
කරන්නේය.[13]
ධර්මිෂ්ඨ අයට යෙහෝවා දෙවි
ප්‍රේම කරන්නේය.[14]

9 යෙහෝවා දෙවි විදේශිකයන්ව
ආරක්ෂා කරන්නේය.[15]
පියා නැති දරුවාටද වැන්දඹු-
වටද ඔහු උපකාර කරන්-
නේය.[16]

**145 ගීතාවලිය**
1 ගීතා 18:25; එළි 15:4
2 ද්වි 4:7; 1රාජා 18:36; ගීතා 34:18; යාකො 4:8; යූද් 24
3 ගීතා 17:1
4 ගීතා 34:9; ලූක් 1:53
5 ගීතා 37:40; ගීතා 50:15; ගීතා 91:15
6 ගීතා 31:23; ගීතා 37:28; ගීතා 97:10
7 ගීතා 1:6; හිතෝ 2:22
8 ගීතා 34:1; ගීතා 51:15; ගීතා 71:8; ගීතා 89:1
9 ගීතා 117:1; ගීතා 150:6

**146 ගීතාවලිය**
10 නික් 15:2; ගීතා 149:9; එළි 19:6
11 ගීතා 103:1; ගීතා 104:35
12 ගීතා 63:4
13 ගීතා 145:2
14 ගීතා 62:9; ගීතා 118:9
15 ගීතා 118:8; යෙසා 2:22; යෙරෙ 17:5

**2 තීරුව**
1 යෝබ් 12:10; ගීතා 104:29; දේශ 8:8; මතෙ 27:50; ක්‍රියා 7:59
2 උත් 3:19; ගීතා 90:3; දේශ 3:20; දේශ 12:7
3 යෝබ් 14:10; යෝබ් 17:11; දේශ 9:5; දේශ 9:10; යෙසා 38:18
4 ගීතා 33:12; ගීතා 46:7; ගීතා 144:15; යෙරෙ 17:7
5 ගීතා 71:5

**6** උත් 1:1; නෙහෙ 9:6; යෙරෙ 10:12; ක්‍රියා 4:24; එළි 4:11; එළි 14:7; **7** නික් 20:11; **8** ද්වි 7:9; ගීතා 71:22; **9** ගීතා 103:6; **10** ගීතා 107:9; ගීතා 145:16; **11** ගීතා 107:14; ගීතා 142:7; **12** යෙසා 29:18; යෙසා 35:5; **13** ගීතා 145:14; ගීතා 147:6; ලූක් 13:13; 2කොරි 7:6; **14** ගීතා 11:7; **15** ද්වි 10:18; **16** ගීතා 68:5.

**ගීතා 146:4*** එනම්, ජීව බලය පිට වූ.

නමුත් දුෂ්ටයන්ගේ මාර්ග[1] ඔහු
අවුල් කරන්නේය.[2]
10 යෙහෝවා දෙවි සදහටම රජකම්
කරන්නේය.[3]
සියොන්, ඔබේ දෙවි පරම්පරා-
වක් පරම්පරාවක් පාසා රජ-
කම් කරන්නේය.[4]
ජනයෙනි, යෙහෝවා දෙවිට
ප්‍රශංසා කරන්න.[5]

**147** ජනයෙනි, යෙහෝවා දෙ-
විට ප්‍රශංසා කරන්න.[6]
අපේ දෙවිට ප්‍රශංසා ගී
ගැයීම කොතරම් අග-
නේද![7]
ඔහුට ගී ගැයීම කො-
තරම් ප්‍රීතියක්ද! ඔහු
ඇත්තෙන්ම ප්‍රශංසාව
ලැබීමට වටින්නේය.[8]
2 යෙහෝවා දෙවි යෙරුසලම් නුවර
නැවත ගොඩනඟන්නේය.[9]
විසිරී සිටින ඊශ්‍රායෙල්වරුන්ව
ඔහු නැවත එක් රැස් කරන්-
නේය.[10]
3 බිඳුණු සිත් ඇත්තන්ට[11] ඔහු සහ-
නය දෙන්නේය.[12]
ඔවුන්ගේ වේදනාකාරී තුවාල
ඔහු සුව කරන්නේය.[13]
4 ඔහු තාරකා සියල්ල ගණන් කරන්-
නේය.[14]
ඒ එක් එක් තාරකාවන් ඔහු,
නම් වශයෙන් හඳුන්වන්-
නේය.[15]
5 අපේ ස්වාමීන් ශ්‍රේෂ්ඨය. ඉතා බල-
වන්තය.[16]
ඔහු කොතරම් ප්‍රඥාවන්තද
කියා කිසිවෙකුට තේරුම්ගත
නොහැකිය.[17]
6 නිහතමානී අයට යෙහෝවා දෙවි
සහනය දෙමින් ඔවුන්ව නඟා
සිටුවන්නේය.[18]
ඔහු දුෂ්ටයන්ව පහතට හෙළා
පාගා දමන්නේය.[19]
7 ජනයෙනි, යෙහෝවා දෙවිට ස්තුති
කරමින් ගී ගයන්න.[20]
වීණා වයමින් ඔහුට ප්‍රශංසා ගී
ගයන්න.[21]

8 අහස වලාකුළුවලින් අතුරා[1]
පොළොවට වර්ෂාව ලබා දෙන්-
නේ ඔහුය.[2]
කඳු මුදුන් නිල් තණකොළව-
ලින් වැසී යැමට සලස්වන්-
නෙත් ඔහුය.[3]
9 ඔහු සතුන්ටත්[4]
කෑම ඉල්ලා හඬන කපුටු පැට-
වුන්ටත්[5] ආහාර සපයා දෙන්-
නේය.
10 අශ්වයෙකු සතු ශක්තිය ගැනවත්[6]
මිනිසෙකුට වේගයෙන් දිවීමට
ඇති හැකියාව ගැනවත්[7]
ඔහු සතුටට පත් නොවන්-
නේය.
11 නමුත් යෙහෝවා දෙවි කෙරෙහි
ගරුබියක් ඇති,[8]
ඔහු ප්‍රේමය* පෙන්වන තෙක්
ආශාවෙන් බලා සිටින අය
ගැන[9] ඔහු සතුටු වන්නේය.
12 යෙරුසලම, යෙහෝවා දෙවිට
ප්‍රශංසා කරන්න.[10]
සියොන්, ඔබේ දෙවිට ප්‍රශංසා
කරන්න.[11]
13 මන්ද ඔහු ඔබේ දොරටුවල අගුල්
ශක්තිමත් කළේය.
ඔබේ පුත්‍රයන්ට ඔහු ආශීර්වාද
කළේය.[12]
14 ඔබේ දේශ සීමාව තුළ ඔහු සමාදා-
නය ඇති කළේය.[13]
අනර්ඝතම තිරිඟුවලින් ඔහු
ඔබව සැමදා තෘප්තිමත්
කරන්නේය.[14]
15 ඔහු පොළොවට ආඥාවක් නිකුත්
කරන්නේය.[15]
ඔහුගේ වදන් පොළොව පුරාම
වේගයෙන් ඉටු වන්නේය.
16 ඔහු ලොම් මෙන් වූ හිම වස්සවන්-
නේය.[16]

**146 ගීතාවලිය**
**1** හිතෝ 1:15
**2** ගීතා 145:20
**3** නික් 15:18 ගීතා 10:16 ගීතා 145:13 දානි 6:26 එළි 11:15
**4** ගීතා 147:12 යෝවෙ 3:17
**5** ගීතා 117:2 එළි 19:3

**147 ගීතාවලිය**
**6** ගීතා 135:1 එළි 19:1
**7** ගීතා 92:1 ගීතා 135:3
**8** ගීතා 33:1 එළි 19:5
**9** ගීතා 102:16
**10** ද්වි 30:3 එස 36:24 එස 37:21
**11** ගීතා 51:17
**12** යෙසා 6:10
**13** ලූක් 4:18
**14** උත් 15:5
**15** යෙසා 40:26
**16** 1ලේක 16:25 ගීතා 48:1 ගීතා 96:4 ගීතා 145:3 නාහූ 1:3
**17** යෙසා 40:28 රෝම 11:33
**18** ගණන් 12:3 ගීතා 37:11 ගීතා 146:8
**19** ගීතා 55:23
**20** ගීතා 95:2
**21** ගීතා 33:2 ගීතා 92:1

**2 තීරුව**
**1** 1රාජා 18:45
**2** යෝබ් 38:26 යෙරෙ 14:22 මතෙ 5:45
**3** යෝබ් 38:27 ගීතා 104:14 යෙසා 30:23 සෙක 10:1
**4** ගීතා 104:27 ගීතා 136:25 ගීතා 145:15
**5** යෝබ් 38:41 ලූක් 12:24
**6** යෝබ් 39:19 ගීතා 33:16 යෙසා 31:1 හොෂෙ 1:7
**7** 1සාමු 16:7
**8** මලා 3:16
**9** ගීතා 33:18
**10** ගීතා 63:3 ගීතා 117:1

**11** ගීතා 135:21; යෙසා 12:6; **12** ගීතා 128:3; **13** ලෙවී 26:6; ගීතා 29:11; ගීතා 122:6; යෙසා 45:7; යෙසා 60:17; රෝම 15:33; **14** ද්වි 8:8; ද්වි 32:14; ගීතා 81:16; ගීතා 132:15; **15** ගීතා 33:9; ගීතා 68:11; ගීතා 107:20; **16** යෝබ් 37:6; ගීතා 148:8.

**ගීතා 147:11*** හෝ, "ළැදි ප්‍රේමය."

පිනි කැට අළු මෙන් ඉසින්-
නේය.[1]
17 හිම කැට සීසීකඩ විසුරුවන්-
නේය.[2]
ඔහු ගෙනෙන සීතල දරාගත
හැක්කේ කාටද?[3]
18 ඔහු අණ දෙන විට[4] ඒවා දිය වී
යන්නේය.
ඔහු සුළං හැමීමට සලස්වන්-
නේය.[5]
ඒ සුළඟින් ජලය ගලා බසින්-
නේය.
19 තම වදන් ඔහු යාකොබ්ට ප්‍රකාශ
කරන්නේය.[6]
තම නියෝග[7] සහ තීන්දු[8] ඔහු
ඊශ්‍රායෙල් ජනයාට කියා
දෙන්නේය.
20 වෙන කිසි ජාතියකට ඔහු එසේ
නොකළේය.[9]
ඔහුගේ තීන්දු ගැන වෙනත්
කිසිම ජාතියක් දැනුවත් වී
නොසිටියේය.[10]
ජනයෙනි, යෙහෝවා දෙවිට
ප්‍රශංසා කරන්න.[11]

# 148

ජනයෙනි, යෙහෝවා දෙ-
විට ප්‍රශංසා කරන්න.[12]
ස්වර්ගයේ සිට යෙ-
හෝවා දෙවිට ප්‍රශංසා
කරන්න.[13]
උස් තැන්හි සිට ඔහුට
ප්‍රශංසා කරන්න.[14]
2 ඔහුගේ සියලු දූතයෙනි, ඔහුට
ප්‍රශංසා කරන්න.[15]
ඔහුගේ මුළු සේනාවෙනි, ඔහුට
ප්‍රශංසා කරන්න.[16]
3 ආලෝකය විහිදුවන සියලු තාර-
කාවෙනි, ඔහුට ප්‍රශංසා
කරන්න.[17]
ඉරත් සඳත්, ඔහුට ප්‍රශංසා
කරන්න.[18]
4 මුළු මහත් ස්වර්ගය, ඔහුට ප්‍රශංසා
කරන්න.[19]
ජලයෙන් පිරුණු වලාවෙනි,
ඔහුට ප්‍රශංසා කරන්න.[20]
5 යෙහෝවා දෙවිගේ නාමයට ඒ

**147 ගීතාවලිය**
**1** යෝබ් 38:29
**2** යොෂු 10:11
**3** යෝබ් 37:10
**4** ක්‍රියා 10:36
**5** ගීතා 148:8
**6** නික් 20:1
ද්වි 33:3
ගීතා 78:5
ගීතා 103:7
රෝම 9:4
**7** ද්වි 4:8
ද්වි 5:31
මලා 4:4
**8** ද්වි 4:5
ද්වි 6:1
**9** නික් 19:5
නික් 31:17
ද්වි 4:32
ද්වි 7:6
රෝම 3:2
**10** 1ලේක 17:21
**11** ගීතා 116:19
එළි 19:6

**148 ගීතාවලිය**
**12** ගීතා 113:1
**13** ගීතා 89:5
යෙසා 49:13
**14** ලූක් 2:14
**15** ගීතා 103:20
ලූක් 2:13
එළි 5:13
**16** උත් 2:1
යෙරෙ 32:18
යූද් 14
**17** ගීතා 136:9
**18** උත් 1:16
ගීතා 19:1
ගීතා 136:8
**19** ද්වි 10:14
නෙහෙ 9:6
2කොරි 12:2
**20** උත් 1:7
2පේතෘ 3:5

**2 තීරුව**
**1** එළි 19:6
**2** උත් 1:1
උත් 1:6
ගීතා 33:6
**3** ගීතා 89:37
හිතෝ 8:27
**4** ගීතා 119:91
යෙරෙ 31:36
යෙරෙ 33:25
**5** උත් 1:21
ගීතා 74:13
ගීතා 104:25
යෝනා 1:17
**6** ගීතා 69:34
**7** නික් 9:23
ගණන් 16:35
ගීතා 147:17
යෙසා 30:30
**8** ගීතා 107:25

සියල්ල ප්‍රශංසා ගෙනෙනු
ලැබේවා![1]
මන්ද ඔහු අණ දුන් විට ඒවා
සාදන ලදි.[2]
6 ඔහු ඒවා සදහටම පැවතීමට
සලස්වන්නේය.[3]
ඔහු ඒවාට දුන් නියමයන් කිසිදා
පහ නොවන්නේය.[4]
7 මුහුදු දැවැන්තයෙනි, ජල ධාරා-
වෙනි,[5]
පොළොවේ සිට යෙහෝවා දෙ-
විට ප්‍රශංසා කරන්න.[6]
8 ගිනි සහ හිම කැට වර්ෂාවෙනි, හිම
සහ ගන වලාවෙනි,[7]
ඔහුගේ අණ ඉටු කරන චණ්ඩ
මාරුතයෙනි,[8] ඔහුට ප්‍රශංසා
කරන්න.
9 කඳු, හෙල් සියල්ලෙනි,[9]
දේවදාර වෘක්ෂයෙනි, පලින් බර
වූ ගස් සියල්ලෙනි,[10] ඔහුට
ප්‍රශංසා කරන්න.
10 වනසතුන් සහ හීලෑ සත්වයෙනි,[11]
බඩ ගා යන සතුන් සහ අහ-
සේ පියාසර කරන පක්ෂීනි,[12]
ඔහුට ප්‍රශංසා කරන්න.
11 පොළොවේ රජවරුනි,[13] සියලු
ජාතීන්ට අයත් සෙනඟෙනි,
අධිපතීන්[14] සහ පොළොවේ
විනිශ්චයකරුවෙනි,[15] ඔහුට
ප්‍රශංසා කරන්න.
12 තරුණ[16] තරුණියෙනි,[17]
බාල[18] මහලු[19] සියල්ලෙනි,
ඔහුට ප්‍රශංසා කරන්න.
13 ඔවුහු යෙහෝවා දෙවිගේ නාමයට
ප්‍රශංසා කරත්වා![20]
අන් සියලුම දේවලට වඩා ඔහු-
ගේ නාමය අතිඋසස්ය.[21]
ඔහුට හිමි ගෞරවය අහසත් පො-
ළොවත් අභිභවා යන්නේය.[22]

---

**9** ගීතා 65:12; ගීතා 98:8; යෙසා 44:23; යෙසා 49:13; **10** 1ලේක 16:33; ගීතා 96:12; යෙසා 44:23; යෙසා 55:12; **11** ගීතා 50:10; යෙසා 43:20; **12** උත් 7:14; **13** ගීතා 2:10; යෙසා 49:23; **14** ගීතා 45:16; **15** ගීතා 2:10; ගීතා 82:1; **16** ගීතා 110:3; **17** ගීතා 45:14; ක්‍රියා 21:9; **18** මතෙ 21:15; **19** යෙරෙ 31:13; **20** ගීතා 99:3; **21** ගීතා 8:1; යෙසා 12:4; **22** 1රාජා 8:27; 1ලේක 29:11; ගීතා 113:4.

14 ඔහු තම සෙනඟගේ ශක්තිය වැඩි කරන්නේය.[1]
ඔහුට විශ්වාසවන්තව සිටින සියල්ලන්ට,[2]
එසේය, ඔහුට ළංව සිටින ඊශ්‍රායෙල් සෙනඟට ලැබිය යුතු ප්‍රශංසාව ඔහු වැඩි කරන්නේය.[3]
ජනයෙනි, යෙහෝවා දෙවිට ප්‍රශංසා කරන්න.[4]

# 149

ජනයෙනි, යෙහෝවා දෙවිට ප්‍රශංසා කරන්න.[5]
යෙහෝවා දෙවිට අලුත් ගීයක් ගායනා කරන්න.[6]
රැස්ව සිටින ඔහුගේ විශ්වාසවන්ත සේවකයන් මැදදී ඔහුට ප්‍රශංසා ගී ගයන්න.[7]
2 ඊශ්‍රායෙල් ජනයෙනි, ඔබේ ශ්‍රේෂ්ඨ සැදුම්කරු ගැන ප්‍රීති වන්න.[8]
සියොන් පුත්‍රයෙනි, ඔබේ රජු ගැන ප්‍රීති වන්න.[9]
3 නටමින් ඔහුගේ නාමයට ප්‍රශංසා කරන්න.[10]
රබන් ගසමින්ද වීණා වයමින්ද ඔහුට ප්‍රශංසා ගී ගයන්න.[11]
4 මන්ද යෙහෝවා දෙවි තම සෙනඟ ගැන සතුටු වන්නේය.[12]
ඔහු නිහතමානී අයව ගැලවීම නමැති වස්ත්‍රයෙන් සරසවන්නේය.[13]
5 ගෞරවයට පත්ව සිටින විශ්වාසවන්ත සෙනඟෙනි, ප්‍රීතියෙන් ඉපිල යන්න.
තම යහනේ සිට ප්‍රීතියෙන් ගී ගයන්න.[14]
6 දෙවිට ගයන ප්‍රශංසා ගී ඔබේ මුවගේ සැමදා රැඳේවා![15]
දෙමුවහත් කඩුවක් ඔබේ හස්තයේ තිබේවා![16]
7 එයින් ජාතීන්ට දඬුවම් කරන්න.[17]
ඔවුන්ට තරවටු කරන්න.[18]
8 රජවරුන්ට විලංගු දමා[19]
ඔවුන්ගේ ප්‍රභූවරුන්ව යදම්වලින් බඳින්න.
9 ලියා තිබෙන තීන්දුව ඔවුන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන්න.[1]
එසේ කිරීමේ ගෞරවය දෙවිට විශ්වාසවන්තව සිටින සියල්ලන්ට හිමි වන්නේය.[2]
ජනයෙනි, යෙහෝවා දෙවිට ප්‍රශංසා කරන්න.[3]

# 150

ජනයෙනි, යෙහෝවා දෙවිට ප්‍රශංසා කරන්න.[4]
ඔහුගේ ශුද්ධ මාලිගාවේදී ඔහුට ප්‍රශංසා කරන්න.[5]
ඔහුගේ බලය කියාපාන ගුවන්තලය සිසාරා ඔහුට කරන ප්‍රශංසාව පැතිර යෑමට සලස්වන්න.[6]
2 ඔහුගේ බලවත් ක්‍රියා ගැන ඔහුට ප්‍රශංසා කරන්න.[7]
ඔහුගේ ශ්‍රේෂ්ඨත්වය අතිමහත් නිසා ඔහුට බොහෝ සෙයින් ප්‍රශංසා කරන්න.[8]
3 හොරණෑ පිඹිමින් ඔහුට ප්‍රශංසා කරන්න.[9]
තත් භාණ්ඩ වාදනය කරමින්ද වීණා වයමින්ද ඔහුට ප්‍රශංසා කරන්න.[10]
4 රබන් ගසමින්[11] හා නටමින්[12] ඔහුට ප්‍රශංසා කරන්න.
තත් භාණ්ඩ වාදනය කරමින්ද[13] නළා පිඹිමින්ද[14] ඔහුට ප්‍රශංසා කරන්න.
5 මිහිරි හඬකින්, අත්තාළම් ගසමින් ඔහුට ප්‍රශංසා කරන්න.[15]
මහත් හඬකින්, අත්තාළම් ගසමින් ඔහුට ප්‍රශංසා කරන්න.[16]
6 පණ ඇති සියල්ලෙනි, යෙහෝවා දෙවිට ප්‍රශංසා කරන්න.[17]
ජනයෙනි, යෙහෝවා දෙවිට ප්‍රශංසා කරන්න.[18]

---

**9** 1ලේක 15:28; ගීතා 81:3; ගීතා 98:6; **10** ගීතා 33:2; ගීතා 108:2; **11** නික් 15:20; 1සාමු 10:5; යෙසා 5:12; **12** ගීතා 149:3; **13** ගීතා 92:3; ගීතා 144:9; යෙසා 38:20; **14** යෝබ් 21:12; යෝබ් 30:31; **15** 1ලේක 15:19; 1ලේක 16:5; **16** 2සාමු 6:5; 1ලේක 25:1; **17** එළි 5:13; **18** ගීතා 112:1; ගීතා 148:14; එළි 19:3.

**148 ගීතාවලිය**
**1** නික් 15:16 ගීතා 75:10 ගීතා 89:17 ගීතා 135:4
**2** ගීතා 145:10 ගීතා 149:9
**3** නික් 19:5 එෆී 2:17
**4** ගීතා 113:9 ගීතා 117:2

**149 ගීතාවලිය**
**5** ගීතා 113:1
**6** ගීතා 33:3 ගීතා 96:1 යෙසා 42:10 එළි 5:9
**7** ගීතා 22:22 හෙබ්‍රෙ 2:12
**8** ද්වි 12:7 1සාමු 12:22 ගීතා 100:3 යෙසා 54:5
**9** ගීතා 47:7
**10** නික් 15:20 විනි 11:34 ගීතා 150:4 යෙරෙ 31:13
**11** ගීතා 81:2 ගීතා 144:9 ගීතා 150:4
**12** ගීතා 35:27 ගීතා 84:11
**13** ගීතා 132:16 යෙසා 61:10
**14** ගීතා 63:6
**15** නෙහෙ 9:5
**16** හෙබ්‍රෙ 4:12 එළි 1:16
**17** ගණන් 31:2 ගීතා 79:6 ගීතා 110:6
**18** ගීතා 44:2
**19** යොෂු 10:24 යොෂු 12:7

**2 තීරුව**
**1** ද්වි 7:1
**2** ගීතා 148:14 1කොරි 6:2 එළි 20:4
**3** ගීතා 111:1

**150 ගීතාවලිය**
**4** එළි 19:6
**5** 2ලේක 20:8 ගීතා 29:9 ගීතා 116:19 ගීතා 134:2
**6** උත් 1:6 ගීතා 19:1 දානි 12:3
**7** ගීතා 92:5 ගීතා 107:15 ගීතා 145:6 එළි 15:3
**8** ද්වි 3:24 ගීතා 96:4 ගීතා 145:3 යෙරෙ 32:18

# හිතෝපදේශ*

**1** ඊශ්‍රායෙල්හි රජු වූ[1] දාවිත්ගේ පුත්[2] සලමොන්[3] ලියූ හිතෝපදේශ[4] මේවාය. **2** ඒවා ලියා තිබෙන්නේ යමෙකුට ප්‍රඥාව[5] හා උපදෙස් ලබාගැනීමටත්[6] ගැඹුරු කාරණා වටහාගැනීමටත්[7] හැකි වන පිණිසය. **3** එහි උපදෙස් පිළිපැදීමෙන්[8] වටහාගැනීමේ ශක්තිය[9] හා හොඳ තීරණ ගැනීමේ හැකියාව[10] දියුණු කරගත හැකියි. ධර්මිෂ්ඨ,[11] ප්‍රතිපත්තිගරුක[12] ජීවිතයක් ගත කිරීමටද එයින් හැකියාව ලැබෙයි. **4** එමෙන්ම අද්දැකීම් අඩු කෙනෙකුට බුද්ධියද[13] තරුණයෙකුට දැනුම[14] සහ හොඳින් සිතීමේ හැකියාවද[15] ලැබෙයි.

**5** ප්‍රඥාවන්ත කෙනෙක් උපදෙස්වලට සවන් දී තව තවත් ඉගෙනගනියි.[16] හොඳ අවබෝධයකින් කටයුතු කරන තැනැත්තා සෑමවිටම නිසි මඟ පෙන්වීම් ලබාගනියි.[17] **6** එවැනි කෙනෙක් හිතෝපදේශ, සංකීර්ණ කාරණා,[18] ප්‍රඥාවන්තයන්ගේ වදන්[19] හා ගැඹුරු කියමන්[20] තේරුම්ගැනීමට උත්සාහ කරයි.

**7** දැනුම ලබාගැනීමට මුල්ම පියවර වන්නේ යෙහෝවා දෙවිට ගරුබිය දැක්වීමයි.[21] එහෙත් අඥානයෝ* ප්‍රඥාව සහ හික්මවීම සුළු කරති.[22]

**8** මාගේ පුත්‍රය, ඔබේ පියාගෙන් ලැබෙන මඟ පෙන්වීම් හා හික්මවීම් පිළිගන්න.[23] ඔබේ මවගේ උපදෙස්වලට පිටු නොපාන්න.[24] **9** ඒවා ඔබේ හිසට අලංකාර ඔටුන්නක් මෙන්ද[25] ඔබේ ගෙල පළඳනා අනර්ඝ මාලයක් මෙන්ද[26] වන්නේය.

**10** මාගේ පුත්‍රය, පව්කාරයන් ඔබව නොමඟ යවන්න උත්සාහ කළහොත් ඔවුන්ට හසු නොවන්න.[1] **11** සමහරවිට ඔවුන් ඔබට මෙසේ කීමට ඉඩ තිබේ. "අප සමඟ එන්න. අපි මඟ රැක සිට කවරෙකු හෝ මරා දමමු.[2] සැඟවී සිට අහිංසකයෙකුව අල්ලාගමු. එයට හේතුවක් අවශ්‍ය නැත.[3] **12** මිනී වළ[4] මිනිසෙකුව ගිල දමන්නාක් මෙන් අපි ඔහුව පණපිටින්ම අල්ලාගෙන නැති කරමු.[5] **13** අපි නානාවිධ වස්තු රැස් කරගමු.[6] කොල්ල කෑ දේවලින් අපේ ගෙවල් පුරවාගමු.[7] **14** එන්න, අපේ මිතුරු කැලට එකතු වන්න. අපි සියලුදෙනාම එකම මල්ල බෙදාගමු."[8] **15** මාගේ පුත්‍රය, ඔවුන් යන මාර්ගයේ නම් නොයන්න.[9] ඔවුන්ගෙන් ඈත් වන්න.[10] **16** ඔවුන් දුවන්නේ දුෂ්ටකම් කරන්නමය.[11] ඔවුහු ලේ වගුරුවන්න ඉක්මන් වෙති.[12] **17** කුරුල්ලෙකු බලා සිටියදී දැලක් එළීමෙන් කිසි පලක් නොමැත.[13] **18** එමනිසා උන්ව* මරා දමන්න ඔවුහු සැඟවී සිටිති.[14] උන්ගේ ලේ වගුරුවන්න ඔවුහු මාන බලති.[15] **19** අයුතු ලෙස වස්තු රැස් කරන අය ක්‍රියා කරන්නේද එලෙසමය.[16] නමුත් අවසානයේදී එය ඔවුන්ගේම විනාශයට මඟ පාදයි.[17]

**20** සැබෑ ප්‍රඥාව[18] සියල්ලන්ට ඇසෙන පරිදි වීථිවලද[19] ප්‍රධාන මංසන්ධිවලද ශබ්ද නඟා කතා

**1 පරි.**
**1** 1රාජා 2:12
**2** 2සාමු 12:24
**3** හිතෝ 10:1; හිතෝ 25:1; මතෙ 12:42
**4** 1රාජා 4:32; දේශ 12:9
**5** හිතෝ 8:11; ලූක් 2:52
**6** හිතෝ 2:20; 2තිමෝ 3:16; හෙබ්‍රෙ 12:7
**7** ද්වි 4:6
**8** හිතෝ 3:11; හෙබ්‍රෙ 12:5; 1පේතෘ 5:10
**9** හිතෝ 10:5
**10** 1රාජා 3:28
**11** හෙබ්‍රෙ 12:11
**12** ගීතා 37:37; හිතෝ 2:9
**13** යොෂු 9:4; 1සාමු 23:22; හිතෝ 15:5; මතෙ 10:16
**14** යොහ 17:3
**15** හිතෝ 2:11; හිතෝ 3:21; හිතෝ 8:12; හිතෝ 14:17
**16** හිතෝ 9:9; හිතෝ 15:31; 1කොරි 10:15
**17** 1සාමු 25:33; හිතෝ 24:6
**18** ගීතා 49:4
**19** දේශ 12:11
**20** විනි 14:14; දානි 5:12
**21** යෝබ් 28:28; ගීතා 111:10; හිතෝ 9:10
**22** හිතෝ 5:12; හිතෝ 12:15; හිතෝ 18:2; රෝම 1:28
**23** ද්වි 6:7; හිතෝ 4:1; හිතෝ 6:20; එෆී 6:4; හෙබ්‍රෙ 12:9
**24** ලෙවී 19:3; හිතෝ 31:26; 2තිමෝ 1:5; 2තිමෝ 3:15
**25** හිතෝ 4:9
**26** හිතෝ 3:22; යොහ 7:46; කොලො 4:6

**2 තීරුව**
**1** උත් 39:7; නික් 23:2; ද්වි 13:6; රෝම 16:18
**2** යෙරෙ 5:26

**3** ගීතා 10:8; ගීතා 17:12; ගීතා 56:6; මතෙ 26:4; ක්‍රියා 23:15; **4** ගණන් 16:30; ගණන් 26:10; යෝබ් 33:22; ගීතා 30:3; එස 31:16; **5** ගීතා 35:25; **6** විනි 18:18; **7** විනි 5:30; **8** 1සාමු 30:16; **9** හිතෝ 4:14; හිතෝ 13:20; 2කොරි 6:17; **10** ගීතා 119:101; හිතෝ 4:27; 1කොරි 15:33; **11** හිතෝ 4:16; හිතෝ 6:18; හිතෝ 19:2; **12** හිතෝ 6:17; යෙසා 59:7; රෝම 3:15; **13** ගීතා 91:3; **14** හිතෝ 28:17; **15** ගීතා 55:23; **16** 2රාජා 5:20; හිතෝ 15:27; මීකා 3:11; **17** ද්වි 24:6; යෝබ් 31:39; **18** රෝම 11:33; රෝම 16:27; 1කොරි 1:20; 1කොරි 2:5; එෆී 3:10; යාකො 3:17; **19** මතෙ 10:27; මතෙ 11:19; ක්‍රියා 5:42.

**හිතෝ නම*** එනම්, ප්‍රඥාවන්ත කියමන්. මෙම පොතේ නම රැගෙන තිබෙන්නේ, එහි ආරම්භක වදන්වලිනි. **1:7*** බයිබලයේ, "අඥානයා," "අනුවණයා" සහ "මෝඩයා" යන වචන භාවිත කර තිබෙන්නේ, යෙහෝවා දෙවිගේ ප්‍රමිතිවලට මුරණ්ඩු ලෙස පිටු පාන කෙනෙකුව විස්තර කිරීමටය.

**හිතෝ 1:18*** මෙහි අහිංසක මිනිසුන්ව කුරුල්ලන්ට සමාන කර ඇත.

කරන්නීය.[1] **21** ඇය සෙනඟ ගැව-
සෙන ස්ථානවල හඬ නඟන්නීය.[2]
නුවර දොරටු අසල සිට මෙසේ හඬග-
සන්නීය.[3]
**22** “අනුවණයෙනි, ඔබ කොපමණ
කල් අනුවණකමට ආශා කරන්න-
හුද?[4] සමච්චල් කරන්නෙනි, ඔබ
තව කොපමණ කල් සමච්චල් කිරී-
මෙන් ප්‍රීතියක් ලබන්නහුද?[5] අඥාන-
යෙනි, ඔබ කොපමණ කල් දැනුම
එපා කරන්නහුද?[6] **23** මාගේ අවවා-
දය සිතට ගන්න.[7] එවිට මම
ඔබට ප්‍රඥාව* නොඅඩුව ලබා දෙන්-
නෙමි.[8] මාගේ වචන ඔබට දන්-
වන්නෙමි.[9] **24** මා හඬගැසුවත් ඔබ
මට සවන් දෙන්නේ නැත.[10] මා
අත දුන්නත් කිසිවෙක් එය පිළිගන්-
නේ නැත.[11] **25** මා දෙන උපදෙස්
ඔබ ගණනකටවත් ගන්නේ නැත.[12]
මාගේ අවවාදත් ඔබ පිළිගන්නේ
නැත.[13] **26** එහෙයින් ඔබේ විපතේදී
මම සිනාසෙන්නෙමි.[14] විනාශය ඔබ
පිටට පැමිණෙද්දී මම ඔබට සරදම්
කරන්නෙමි.[15] **27** විනාශය කුණාටු-
වක් මෙන්ද විපත්තිය සුළිසුළඟක්
මෙන්ද ඔබ පිටට පැමිණ,[16] ඔබ
බොහෝ දුක් පීඩා හා අසීරුතාවලට
මුහුණ දෙන විට[17] මම ඔබට සමච්චල්
කරන්නෙමි. **28** එවිට ඔබ දිවා රෑ
දෙකෙහිම මට හඬගසන නමුත් මම
පිළිතුරු නොදෙන්නෙමි.[18] ඔබ සෑම
තැනකම මාව සෙව්වද සම්බ නො-
වන්නේය.[19] **29** මන්ද ඔබ දැනුම
එපා කළහුය.[20] යෙහෝවා දෙවිට ගරු-
බිය දක්වන්න ඔබ කැමැත්තක් දැක්-
වූයේ නැත.[21] **30** කිසිදාක මාගේ
දැනමුතුකම් පිළිගත්තේ නැත.[22] ඔබ
මාගේ සෑම අවවාදයක්ම හෙළාදුටු-
වහුය.[23] **31** එමනිසා ඔබේ ක්‍රියාවල
ප්‍රතිඵල විඳින්න ඔබට සිදු වෙයි.[24] ඔබ
යෙදූ උපායන්වල ප්‍රතිඵල ඔබටම අත්
විඳින්න සිදු වෙයි.[25] **32** අඥානයන්-
ගේ කැරලිකාරකම නිසා[26] ඔවුන්ට
මරණය අත් වෙයි.[27] ඔවුන්ගේ විනාශ-
යට මුල් වන්නේ කාරණා සැහැල්ලු-
වට ගැනීමය.[1] **33** නමුත් මට සවන්
දෙන තැනැත්තා කිසි විපතකට භය
නොවී[2] සුරක්ෂිතව ජීවත් වන්නේය.”[3]

**2** මාගේ පුත්‍රය, මාගේ වචන පිළි-
ගෙන[4] මාගේ ආඥා නිධාන-
යක් මෙන් රැකගන්න.[5] **2** ප්‍රඥාවට
ඔබේ සවන් යොමු කර[6] වටහා-
ගැනීමේ හැකියාව දියුණු කරගැනීමට
අදිටන් කරගන්න.[7] **3** අවබෝධය
ලබා දෙන මෙන් හඬ නඟා අයැ-
දින්න.[8] වටහාගැනීමේ හැකියාවද
නිරතුරුවම ඉල්ලන්න.[9] **4** රිදී සො-
යන්නාක් මෙන්ද[10] සැඟවුණු නිධාන
සොයන්නාක් මෙන්ද දිගටම ඒ දේවල්
සොයන්න.[11] **5** එසේ කරනවා නම්
ඔබ යෙහෝවා දෙවිට ගරුබිය දැක්-
වීමට ඉගෙනගෙන[12] දෙවිව දැන
හඳුනා ගනු ඇත.[13] **6** මන්ද ප්‍රඥාව
යෙහෝවා දෙවිගෙන් ලැබෙන දීම-
නාවකි.[14] දැනුම සහ වටහාගැනීමේ
හැකියාව ලැබෙන්නේ ඔහුගෙන්ය.[15]
**7** ප්‍රතිපත්තිගරුක ජීවිතයක් ගත
කරන අයට දෙන පිණිස දෙවි
තම වස්තු ගබඩාවේ ප්‍රඥාව* සුර-
කිව තබාගන්නේය.[16] විශ්වාසවන්-
තව කටයුතු කරන අයට ඔහු පලිහක්
මෙන් වන්නේය.[17] **8** දෙවි යුක්ති-
යේ මාවත් රක්ෂා කරන්නේය.[18] ඔහු
තමන්ට පක්ෂපාතව සිටින අයගේ
ගමන් මඟ සුරකින්නේය.[19] **9** ඔබ
එලෙස හැසිරෙන්නේ නම් යහපත්
ජීවිතයක් ගත කිරීමට ඇතුළත් වන
සියල්ල එනම්, ධර්මිෂ්ඨකම, යුක්තිය
සහ අවංකකම ගැන ඔබට හොඳ අව-
බෝධයක් ලැබෙනු ඇත.[20]

**1 පරි.**
**1** හිතෝ 8:2, හිතෝ 9:3
**2** මතෙ 10:27, ක්‍රියා 20:20
**3** හිතෝ 8:3, යොහ 18:20
**4** ගීතා 94:8, ලූක් 19:42
**5** හිතෝ 14:6
**6** 2ලේක 24:19, හිතෝ 5:12, යොහ 3:20
**7** ගීතා 141:5, එළි 3:19
**8** හිතෝ 18:4, ක්‍රියා 2:18
**9** යෙසා 54:13, මතෙ 10:20, යොහ 6:45
**10** යෙසා 65:12, මතෙ 22:5
**11** යෙසා 65:2, යෙරෙ 7:13
**12** 2ලේක 36:16, ගීතා 107:11
**13** ගීතා 81:11
**14** ගීතා 37:13, රෝම 2:5
**15** විනි 10:14, 2ලේක 7:20
**16** නාහු 1:3
**17** මතෙ 24:21, ලූක් 21:23, රෝම 2:9
**18** ගීතා 18:41, ලූක් 13:25, යාකො 4:3
**19** විලා 3:44
**20** ගීතා 50:17, හොෂෙ 4:6, ක්‍රියා 7:51
**21** විනි 5:8, මීකා 3:2, 2පේතෘ 2:15
**22** ගීතා 81:11, යෙරෙ 8:9
**23** නික් 33:5, 2ලේක 29:6, යෙරෙ 5:12
**24** යෙසා 3:11, යෙරෙ 6:19, එස 24:14, ගලා 6:7
**25** යෙසා 8:10
**26** යෙරෙ 3:14
**27** රෝම 6:23

**2 තීරුව**
**1** යෙරෙ 48:11, එළි 2:5
**2** 2රාජා 6:16, යෙසා 26:3, ලූක් 21:28, 2පේතෘ 2:9
**3** ගීතා 25:13, යෙසා 48:18, එළි 3:10

**2 පරි.** **4** හිතෝ 4:1; 1පේතෘ 1:25; **5** ද්වි 6:6; යෝබ් 23:12; **6** හිතෝ 1:5; **7** හිතෝ 17:27; එෆී 5:17; හෙබ්‍රෙ 5:14; **8** 1රාජා 3:11; හිතෝ 9:10; හිතෝ 18:15; **9** පිලි 1:9; 2තිමෝ 2:7; **10** ගීතා 19:10; **11** යෝබ් 28:18; **12** යෝබ් 28:28; හිතෝ 8:13; යෙරෙ 32:40; එළි 14:7; **13** යෙරෙ 9:24; 2තිමෝ 3:15; 1යොහ 5:20; **14** නික් 31:3; 1රාජා 4:29; යාකො 3:17; **15** 2තිමෝ 3:16; **16** හිතෝ 3:21; හිතෝ 8:14; ලූක් 1:17; ලූක් 16:8; **17** යෝබ් 1:10; ගීතා 41:12; හිතෝ 28:18; **18** හිතෝ 8:20; **19** ගීතා 37:28; ගීතා 97:10; **20** දේශ 12:13; මීකා 6:8; ලූක් 10:27.

හිතෝ **1:23*** මූ.අ., “බලය.”

හිතෝ **2:7*** මූ.අ., “ස්ථානෝචිත ප්‍රඥාව.”

10 ඔබ ප්‍රඥාව සිතට ගෙන[1] දැනු-
මෙන් ප්‍රීතියක් ලබන්නේ නම්[2]
11 සිතීමේ හැකියාව ඔබව සුර-
කිනු ඇත.[3] වටහාගැනීමේ හැකියා-
වද ඔබට ආරක්ෂාවක් වනු
ඇත.[4] 12 එවිට සියලු දුෂ්ට මාර්ග-
වලින්ද[5] වංචනික දේ කතා කරන
තැනැත්තාගෙන්ද ඔබ ගැලවෙනු
ඇත.[6] 13 අඳුරු මාවත්වල[7] ගමන්
කරන පිණිස ධර්මිෂ්ඨ මාවත් අත්-
හැර යන අයට ඔබ හසු වන්-
නේද නැත. 14 දුෂ්ටකම් කිරීමෙන්
ප්‍රීතියක් ලබන අයගෙන්ද[8] පහත්
දේවලින් සතුටක් ලබන අයගෙන්ද[9]
15 වංක මාවත්වල ගමන් කරන අය-
ගෙන්ද වංචනික ලෙස හැසිරෙන අය-
ගෙන්ද ඔබ ආරක්ෂා වනු ඇත.[10]
16 මිහිරි බස් පවසන[11] දුරාචාරයේ
යෙදෙන* ස්ත්‍රියගෙන්ද ඔබ ආරක්ෂා
වන්නහුය.[12] 17 තරුණ කාලයේදී
විවාහ කරගත් තම පුරුෂයාට* ද්‍රෝහි
වෙමින්[13] දෙවිට වූ ගිවිසුම කඩ
කරන්නාවූ[14] ස්ත්‍රියට ඔබ හසු නො-
වන්නහුය. 18 ඇගේ නිවස බැස
යන්නේ මිනී වළටයි. ඇය පියමං
කරන්නේ මිය ගිය අය වෙතටයි.[15]
19 ඇය සමඟ අනාචාරයේ යෙදෙන
කිසිවෙකුට ආපසු හැරී ඒමට නුපුළු-
වන. ජීවතුන්ගේ මාවත් යළි සො-
යාගැනීමට ඔවුන්ට නොහැකි වනු
ඇත.[16]

20 ඔබට මේ උපදෙස් දී තිබෙන්-
නේ යහපතුන්ගේ අඩිපාරේ ඇවිදී-
මට[17] හා ධර්මිෂ්ඨයන්ගේ මාවත්වල
ගමන් කිරීමට ඔබට උපකාර කිරී-
මටයි.[18] 21 මන්ද ප්‍රතිපත්තිගරුක
ජීවිතයක් ගත කරන අය දිගු කල්
ජීවත් වන්නෝය.[19] පොළොව මත
බේරී ජීවත් වන්නේ නිර්දෝෂ අයයි.[20]
22 නමුත් දුෂ්ටයන්ව පොළොවෙන්
තුරන් කරනු ලබන්නේය.[21] ද්‍රෝහිකම්
කරන්නන්වද පොළොවෙන් උදුරා
දමනු ලබන්නේය.[22]

හිතෝ **2:16*** මු.අ., "නාඳුනන." **17*** මු.අ., "හිතවත් මිතුරාට."

**2 පරි.**

**1** ගීතා 119:111
**2** ක්‍රියා 17:11
කොලො 3:16
**3** දේශ 7:12
දේශ 9:15
එෆී 5:15
**4** දේශ 10:10
මතෙ 10:16
**5** ගීතා 141:4
**6** හිතෝ 8:13
ක්‍රියා 20:30
**7** යොහ 3:19
යොහ 12:35
1යොහ 2:19
**8** 1කොරි 13:6
**9** ගීතා 50:18
හොෂෙ 7:3
ලූක් 22:5
රෝම 1:32
**10** ද්වි 32:5
පිලි 2:15
**11** හිතෝ 6:24
හිතෝ 7:21
**12** උත් 39:12
හිතෝ 7:5
හිතෝ 22:14
හිතෝ 23:27
1කොරි 6:9
1කොරි 6:18
**13** උත් 2:24
හිතෝ 5:18
යෙරෙ 3:4
**14** මලා 2:14
**15** හිතෝ 5:5
හිතෝ 5:23
හිතෝ 9:18
එෆී 5:5
**16** දේශ 7:26
එළි 22:15
**17** ගීතා 119:63
1කොරි 11:1
යාකො 1:27
**18** හිතෝ 13:20
**19** ගීතා 7:9
ගීතා 37:11
**20** ගීතා 37:29
**21** ගීතා 37:20
ගීතා 104:35
හිතෝ 10:7
මතෙ 25:46
**22** ද්වි 28:63
ගීතා 7:8

**2 තීරුව**

**3 පරි.**

**1** ද්වි 4:23
හොෂෙ 4:6
**2** ද්වි 4:6
ගීතා 119:34
**3** ගීතා 21:4
හිතෝ 10:27
**4** යෙසා 54:13
**5** 2සාමු 15:20
හොෂෙ 12:6
**6** ද්වි 6:8
**7** 2කොරි 3:3
හෙබ්‍රෙ 10:16

**3** මාගේ පුත්‍රය, මාගේ ඔවදන්
අමතක නොකරන්න.[1] මාගේ
ආඥා මුළු හදවතින්ම පිළිපදින්න.[2]
2 එවිට ඔබ බොහෝ කල්[3] සමාදා-
නයෙන් ජීවත් වනු ඇත.[4] 3 ප්‍රේම-
යද* විශ්වාසවන්තකමද ඔබෙන් ඈත්
නොවේවා![5] ඒවා ඔබේ ගෙල වටා
බැඳගන්න.[6] ඔබේ සිත නමැති පුවරු-
වේ ලියාගන්න.[7] 4 එසේ කළොත්
ඔබේ වටහාගැනීමේ හැකියාව දියුණු
කරගෙන දෙවි සහ මිනිසුන් ඉදිරි-
යේ හොඳ නමක් දිනාගැනීමට ඔබට
හැකි වනු ඇත.[8] 5 ඔබේම නුව-
ණෙහි රඳා නොසිට[9] මුළු හදව-
තින්ම යෙහෝවා දෙවිව විශ්වාස
කරන්න.[10] 6 ඔබේ ජීවන ගමනේදී
ඔබ තබන සෑම පියවරකදීම දෙවිව
සිහි කරන්න.[11] එවිට ඔහු ඔබ යා යුතු
හරි මඟ පෙන්වා දී ඔබේ දිවිය සාර්-
ථක කර දෙනු ඇත.[12]

7 ඔබ ප්‍රඥාවන්තයෙකුයයි නො-
සිතන්න.[13] යෙහෝවා දෙවිට ගරු-
බිය දක්වා දුෂ්ටකමෙන් ඉවත්ව
සිටින්න.[14] 8 එවිට ඔබේ ගතට*
සුවයක්ද[15] ඔබේ ඇටවලට ප්‍රාණවත්-
බවක්ද[16] ලැබෙනු ඇත.

9 ඔබ සතු වටිනා දේවල්ද[17] ඔබේ
අස්වැන්නේ මුල්ම පලදාවද[18] යෙ-
හෝවා දෙවිට ලබා දී ඔහුව ගෞරව-
යට පත් කරන්න. 10 එවිට ඔබේ
ගබඩා පිරී ඉතිරී යනු ඇත.[19] වයින්
සාදන ඔබේ යන්ත්‍රද අලුත් වයින්ව-
ලින් ඉතිරී යනු ඇත.[20]

11 මාගේ පුත්‍රය, යෙහෝවා දෙවි
දෙන හික්මවීම ප්‍රතික්ෂේප නොක-
රන්න.[21] ඔහු දෙන අවවාදවලට ද්වේෂ

**8** ලූක් 2:52; 2කොරි 8:21; **9** හිතෝ 28:26; යෙරෙ 9:23; යෙරෙ 10:23; 1කොරි 3:18; **10** ගීතා 62:8; යෙසා 26:4; යෙරෙ 17:7; **11** 1සාමු 23:2; 1සාමු 23:4; 1ලේක 28:9; නෙහෙ 1:11; පිලි 4:6; කොලො 3:17; **12** යොෂු 1:7; ගීතා 25:9; යාකො 1:5; **13** හිතෝ 26:12; යෙසා 5:21; රෝම 12:16; **14** නෙහෙ 5:15; හිතෝ 14:27; හිතෝ 16:6; **15** ගීතා 103:3; **16** මතෙ 11:29; **17** ගණන් 31:50; ද්වි 16:16; ලූක් 16:9; 1තිමෝ 6:18; **18** නික් 23:19; ද්වි 26:2; **19** ද්වි 28:8; 2ලේක 31:10; මලා 3:10; **20** යෝවෙ 2:24; **21** හිතෝ 15:32; හෙබ්‍රෙ 12:5.

හිතෝ **3:3*** හෝ, "ලැදි ප්‍රේමය." **8*** මු.අ., "නාභියට."

නොකරන්න.[1] **12** මන්ද පියෙකු
තම ආදරණීය පුතුට අවවාද කරන්-
නාක් මෙන්[2] යෙහෝවා දෙවි තමා
ප්‍රේම කරන තැනැත්තාට අවවාද
කරයි.[3]

**13** ප්‍රඥාව සොයාගෙන[4] වටහා-
ගැනීමේ හැකියාව දියුණු කර-
ගන්න[5] තැනැත්තා සන්තෝෂවත්ය.
**14** මන්ද ප්‍රඥාවෙන් ලැබෙන ප්‍රයෝ-
ජන රන් රිදීවලටත් වඩා අගනේය.[6]
**15** එය කොරල්වලටත්[7] ඔබ ආශා
කරන අන් සියලු දේවලටත් වඩා
වටින්නේය. ඊට සම කළ හැකි
දෙයක් නොමැත. **16** එහි දකුණ-
තේ දීර්ඝායුෂද[8] එහි වමතේ
වස්තුවද ගෞරවයද[9] තිබෙන්නේය.
**17** ප්‍රඥාවේ මාවත් ප්‍රසන්නය. එහි
ගමන් කරන සැමට සමාදානය අත්
වනු ඇත.[10] **18** ප්‍රඥාව ජීවන වෘක්-
ෂයකි.[11] එය අත් කරගෙන තදින් අල්-
ලාගෙන සිටියොත්[12] එයින් ජීවනයද
සන්තෝෂයද ලැබෙනු ඇත.[13]

**19** යෙහෝවා දෙවි ප්‍රඥාවෙන් පො-
ළොවේ අත්තිවාරම් දැමුවේය.[14] ඔහු
මනා අවබෝධයකින් යුතුව අහස
ස්ථිර ලෙස පිහිටෙව්වේය.[15] **20** ඔහු
තම දැනුම යොදා මහා ජල
කඳන් බෙදුවේය.[16] වලාකුළුවලින්
වැහි බිඳු වැටෙන්න සැලැස්වූවේය.[17]
**21** මාගේ පුත්‍රය, මේ දේවල් දෙ-
සම ඔබේ නෙත් යොමා සිටින්න.[18]
ප්‍රඥාවද* ඔබේ සිතීමේ හැකියාවද
රැකගන්න.[19] **22** ඒවා ඔබේ ගෙල
පළඳනා අලංකාර මාලයක්[20] මෙන්
වන්නේය. එමගින් ඔබට ජීවනයද
අත් වන්නේය.[21] **23** ඔබ කිසි අන-
තුරකට භය නොවී සුරක්ෂිතව
ගමන් කරනු ඇත.[22] ඔබේ පාද කිසි-
වක පැටලෙන්නේද නැත.[23] **24** ඔබ
විවේකයෙන් සිටින කල කිසි බියක්
නොදැනෙනු ඇත.[24] ඔබට සුව නින්-
දක්ද ලැබෙනු ඇත.[25] **25** හදිස්සි-
යෙන් පැමිණෙන විපතකටවත්[26]
දුෂ්ටයන් පිටට පැමිණෙන කුණා-
ටුවකටවත් බිය වීමට ඔබට අවශ්‍ය
වන්නේ නැත.[1] **26** මන්ද ඔබ යෙ-
හෝවා දෙවි කෙරෙහි විශ්වාසය තබා
ඇත.[2] ඔහුද ඔබේ දෙපා කිසි උගුල-
කට හසු වීමට ඉඩ නොදෙනු ඇත.[3]

**27** අගහිඟකම් තිබෙන අයට[4]
යහපතක් කිරීමට ඔබට හැකි-
යාව තිබියදී[5] එසේ කිරීමට පසු-
බට නොවන්න. **28** දීමට යමක්
ඔබ ළඟ තිබියදීත්, "ගිහින් හෙට
එන්න. මම හෙට ඔබට යමක් දෙන්-
නම්" කියා ඔබේ අසල්වැසියාට නො-
කියන්න.[6] **29** ඔබව විශ්වාස කර
ඔබ සමඟ සුහද ඇසුරක් පවත්වන[7]
ඔබේ අසල්වැසියාට විරුද්ධව නපුරක්
කිරීමට කුමන්ත්‍රණය නොකරන්න.[8]
**30** යමෙක් ඔබට නපුරක් කර නැත්-
නම්[9] නිකරුණේ ඔහු සමඟ ආරවුලක්
ඇති කර නොගන්න.[10]

**31** දාමරිකයන්ට ඊර්ෂ්‍යා නොක-
රන්න.[11] ඔවුන්ගේ මාර්ගවල ගමන්
නොකරන්න.[12] **32** මන්ද වංක
තැනැත්තා[13] යෙහෝවා දෙවිට පිළිකු-
ලක්ය.[14] නමුත් අවංක අයට ඔහු ළංව
සිටින්නේය.[15] **33** යෙහෝවා දෙවි
දුෂ්ටයාගේ නිවස පිටට දඬුවම් පමු-
ණුවන්නේය.[16] නමුත් ධර්මිෂ්ඨ අය-
ගේ වාසස්ථානවලට ඔහු ආශීර්වාද
කරන්නේය.[17] **34** සමච්චල් කරන්-
නන්ට[18] ඔහු සරදම් කරන්නේය.[19]
නමුත් නිහතමානී අයට ඔහු කරු-
ණාව දක්වන්නේය.[20] **35** ප්‍රඥාවන්-
තයන්ට ගෞරවය ලැබෙනු ඇත.[21]
නමුත් මෝඩයන් උසස් කොට සල-
කන්නේ අගෞරවයට පත් කරවන
දේවල්මය.[22]

**3 පරි.**
**1** ගීතා 94:12
**2** ද්වි 8:5; හිතෝ 23:15; හෙබ්‍රෙ 12:7; හෙබ්‍රෙ 12:9
**3** 1කොරි 11:32; හෙබ්‍රෙ 12:6; එළි 3:19
**4** දේශ 7:12
**5** හිතෝ 2:3; හිතෝ 10:23
**6** යෝබ් 28:15; හිතෝ 8:10; හිතෝ 16:16
**7** යෝබ් 28:18; හිතෝ 8:11
**8** 1තිමෝ 4:8
**9** 2කොරි 6:10
**10** ලූක් 1:79; පිලි 4:9
**11** හිතෝ 11:30
**12** පිලි 2:16
**13** ගීතා 1:1; හිතෝ 2:10
**14** ගීතා 104:24; යෙරෙ 10:12; 1කොරි 8:6
**15** හිතෝ 8:27; යෙරෙ 51:15
**16** උත් 1:9; ගීතා 104:9; ගීතා 136:6; 2පේතෘ 3:5
**17** ලෙවී 26:4; යෝබ් 36:27; යෝබ් 38:37; යෙරෙ 10:13
**18** ද්වි 6:8; එෆී 1:18
**19** හිතෝ 1:4; හිතෝ 5:2
**20** හිතෝ 1:9
**21** හිතෝ 4:22
**22** හිතෝ 10:9
**23** ගීතා 91:12; ගීතා 121:3; හිතෝ 4:12; යෙසා 26:7
**24** ගීතා 3:5; ගීතා 4:8; හිතෝ 6:22
**25** ගීතා 127:2; දේශ 5:12; යෙරෙ 31:26
**26** ගීතා 27:1; දානි 3:17; ලූක් 1:74; යොහ 14:1; පිලි 1:14

**2 තීරුව**
**1** ගීතා 73:19; මතෙ 24:21; 1තෙස 5:2
**2** ගීතා 91:9; හිතෝ 10:29; හිතෝ 14:26; හිතෝ 28:1
**3** 1සාමු 2:9; ගීතා 91:14
**4** රෝම 13:7; ගලා 6:6; තීත 3:1; යාකො 2:16; යාකො 5:4; **5** නෙහෙ 5:8; හිතෝ 28:27; **6** ලෙවී 19:13; ද්වි 24:13; **7** ගීතා 35:20; ගීතා 55:20; **8** හිතෝ 6:18; **9** රෝම 12:18; 1පේතෘ 3:11; **10** හිතෝ 18:6; හිතෝ 20:3; හිතෝ 25:8; **11** ගීතා 37:1; හිතෝ 23:17; හිතෝ 24:1; හිතෝ 24:19; **12** හිතෝ 1:15; **13** හිතෝ 6:12; හිතෝ 14:2; මීකා 3:11; **14** හිතෝ 6:16; හිතෝ 6:17; හිතෝ 11:20; ලූක් 16:15; **15** ගීතා 15:2; ගීතා 24:4; ගීතා 25:14; **16** ද්වි 28:15; යොෂු 7:24; එස්ත 9:25; සෙක 5:4; රෝම 2:5; කොලො 3:6; **17** ද්වි 28:2; යෝබ් 42:12; ගීතා 37:25; **18** 2රාජා 2:23; හිතෝ 1:22; **19** ගීතා 138:6; හිතෝ 19:29; **20** ගීතා 37:11; ගීතා 149:4; යෙසා 57:15; යාකො 4:6; **21** හිතෝ 12:8; **22** එස්ත 6:12; ගීතා 132:18; හිතෝ 26:3.

හිතෝ **3:21*** මූ.අ., "ස්ථානෝචිත ප්‍රඥාව."

**4** මාගේ පුත්‍රයෙනි, ඔබේ පියා-
ගෙන් ලැබෙන උපදෙස් සහ
හික්මවීම් පිළිගෙන[1] ඔබේ තේරුම්ගැ-
නීමේ හැකියාව දියුණු කරගන්න.[2]
**2** මන්ද මා ඔබට දෙන්නේ හොඳ
උපදෙස්ය.[3] මාගේ නීතිවලට පිටු
නොපාන්න.[4] **3** මම මාගේ මව-
ගෙන් බොහෝ ආදරය ලද* සුර-
තල් පුතෙක් වුණෙමි.[5] මාගේ
පියාට කීකරු පුතෙක් වුණෙමි.[6]
**4** ඔහු මට මෙසේ උපදෙස් දුන්-
නේය.[7] “මාගේ වචන ඔබේ සිතේ[8]
සුරකිව තබාගන්න.[9] මාගේ ආඥා
පවත්වා බොහෝ කල් ජීවත් වන්න.[10]
**5** ප්‍රඥාව ලබාගෙන[11] තේරුම්ගැනී-
මේ හැකියාවද[12] දියුණු කරගන්න.
මාගේ කියමන් අමතක නොකරන්න.
මා ඔබට කියා දුන් මාර්ගයෙන්
ඉවත්ව නොයන්න.[13] **6** ප්‍රඥාව අත්
නොහරින්න. එවිට එය ඔබව
ආරක්ෂා කරනු ඇත. ප්‍රඥාවට ඇලුම්
වන්න. එයින් ඔබ රැකෙනු ඇත.
**7** වැදගත්ම දේ නම් ප්‍රඥාවය.[14] එබැ-
වින් ප්‍රඥාව ලබාගැනීමට උත්සාහ
කරන්න. තේරුම්ගැනීමේ හැකියාවද
අත් කරගැනීමට අමතක නොක-
රන්න.[15] මන්ද ඔබ අත් කරගන්නා
අන් සෑම දෙයකටම වඩා වටින්නේ
එයයි. **8** ප්‍රඥාව ඉතා උසස් කොට
සලකන්න. එවිට එය ඔබව උසස්
කරනු ඇත.[16] ඔබ ඉතා ආශාවෙන්
එය වැළඳගත්තොත් ඔබ ගෞරවයට
පත් වනු ඇත.[17] **9** එය ඔබේ හිසට
මනහර කිරුළක්ද[18] අලංකාර ඔටුන්-
නක්ද වන්නේය.”[19]

**10** මාගේ පුත්‍රය, මාගේ වදන්-
වලට සවන් දී ඒවා පිළිගන්න.[20]
එවිට ඔබට දීර්ඝායුෂ ලැබෙන්නේය.[21]
**11** මම ඔබට ප්‍රඥාවේ මාවත්වල
ගමන් කිරීමට උගන්වා[22] ප්‍රතිපත්-
තිගරුක ජීවිතයක් ගත කරන්නේ
කෙසේද කියා උපදෙස් දෙන්නෙමි.[23]
**12** එවිට ඇවිදින කල ඔබේ
ගමන අවහිර වන්නේවත්[24] දුවන කල
ඔබේ පය පැටලෙන්නේවත් නැත.[1]
**13** එබැවින් ඔබට ලැබෙන උපදෙස්
හා හික්මවීම් හදවතින්ම පිළිගෙන[2]
කිසිදා ඒවා අත් නොහරින්න.[3] ඒවා
ඉතා උසස් කොට සලකන්න. මන්ද
එමගින් ඔබට ජීවනය අත් වෙයි.[4]

**14** දුෂ්ටයන්ගේ මාර්ගවලට ඇතුල්
නොවන්න.[5] දැන දැනම නපුරු අයගේ
මාවත් වෙතට පියමං නොකරන්න.[6]
**15** ඒ ළඟින්වත් නොයා[7] අහකට හැරී
යන්න.[8] **16** මන්ද නපුරක් නොක-
ළොත් දුෂ්ටයන්ට නින්ද නොයන්-
නේය.[9] යමෙකුට හිරිහැරයක් කරන
තුරු ඔවුහු නිදා නොගන්නෝය.[10]
**17** ඔවුන් කෑම කන්නෙත් වයින්
බොන්නෙත් දුෂ්ටකම් හා දරුණු අප-
රාධ සිදු කරමින් උපයාගන්නා මුදල්-
වලිනි.[11] **18** නමුත් ධර්මිෂ්ඨයන්ගේ
මාවත්, අලුයම සිට මධ්‍යාහ්නය
දක්වා ක්‍රමක්‍රමයෙන් වැඩි වන දීප්-
තිමත් ආලෝකය මෙනි.[12] **19** දුෂ්-
ටයන්ගේ මාර්ග ඝනාන්ධකාරයෙන්
වැසී තිබෙන්නේය.[13] ඔවුහු තම පය
පැටලෙන්නේ කුමකද කියාවත් නො-
දනිති.[14]

**20** මාගේ පුත්‍රය, මාගේ වචන පිළි-
ගන්න.[15] මාගේ වදන්වලට සවන්
යොමු කරන්න.[16] **21** ඒවා ඔබේ
දෙනෙතින් ඈත් නොවේවා![17] ඒවා
ඔබේ සිතෙහි සුරකිව තබාගන්න.[18]
**22** මන්ද මාගේ වචන පිළිගන්නා
අය බොහෝ කල් ජීවත් වන්-
නෝය.[19] ඒවා ඔවුන්ගේ මුළු ශරී-
රයටම සුවයක් ලබා දෙන්නේය.[20]
**23** සියලු දේටම වඩා ඔබේ සිත
ආරක්ෂා කරගන්න.[21] මන්ද ජීවනය

4 පරි.
**1** ද්වි 6:7 ගීතා 34:11 හිතෝ 1:8 හිතෝ 19:20 එෆී 6:1
**2** හිතෝ 23:23
**3** ද්වි 31:13 ද්වි 32:2 1තිමෝ 4:6 තිත 1:9
**4** ද්වි 13:4 1ලේක 28:9
**5** 2සාමු 12:24 1රාජා 1:21
**6** 1රාජා 2:2 1රාජා 2:12
**7** හිතෝ 22:6
**8** හිතෝ 4:23
**9** ද්වි 4:9
**10** ලෙවී 18:5 යොහ 12:50
**11** යාකො 3:17
**12** නෙහෙ 8:8 ගීතා 49:3 හිතෝ 9:10
**13** 2ලේක 34:2 ගීතා 44:17 හිතෝ 3:1
**14** හිතෝ 9:10 දේශ 7:12 දේශ 8:1 කොලො 2:3
**15** හිතෝ 8:14 හිතෝ 15:14 මතෙ 13:23 හෙබ්‍රෙ 5:14
**16** හිතෝ 9:9 හිතෝ 22:29 ආනි 1:20
**17** නික් 35:31 1රාජා 4:29 1රාජා 7:14
**18** හිතෝ 1:9
**19** හිතෝ 16:31 ලූක් 10:42
**20** 1තෙස 2:13
**21** ද්වි 5:16 හිතෝ 3:2
**22** 1සාමු 12:24 1රාජා 4:29
**23** යෝබ් 1:1 ගීතා 23:3 යෙසා 26:7 මලා 2:6
**24** 2සාමු 22:37

**2 තීරුව**
**1** හිතෝ 3:23 යෙසා 40:31 යොහ 11:9
**2** හිතෝ 8:10 හිතෝ 8:33 හිතෝ 23:23 හෙබ්‍රෙ 12:6
**3** ක්‍රියා 14:22 හෙබ්‍රෙ 2:1 හෙබ්‍රෙ 12:5 හෙබ්‍රෙ 12:11
**4** ද්වි 32:47 හිතෝ 3:22

**හිතෝ 4:3*** මූ.අ., “මගේ මවගේ එකම පුතා.”

**5** ගීතා 1:1; 1කොරි 15:33; **6** හිතෝ 1:15; හිතෝ 3:32; **7** හිතෝ 5:8; ආමො 5:15; 2කොරි 6:14; එෆී 5:11; 1තෙස 5:22; **8** යෙසා 33:15; **9** ගීතා 36:4; යෙසා 57:20; **10** 2පේත්‍රු 2:14; යූද් 12; එළි 2:14; **11** මීකා 2:1; මීකා 6:12; මතෙ 23:28; එළි 17:6; **12** 2සාමු 23:4; ගීතා 97:11; ගීතා 119:105; ආනි 12:4; මතෙ 5:14; 1කොරි 13:12; 2කොරි 4:6; 2පේත්‍රු 1:19; **13** යෙසා 59:9; යොහ 12:35; **14** යෝබ් 12:25; යෙසා 8:14; මතෙ 15:14; **15** හිතෝ 5:1; හෙබ්‍රෙ 2:1; **16** ගීතා 78:1; යෙසා 55:3; **17** හිතෝ 3:21; **18** ගීතා 40:8; හිතෝ 2:1; **19** හිතෝ 4:4; 1තිමෝ 4:8; **20** ද්වි 7:15; ගීතා 103:3; හිතෝ 14:30; ක්‍රියා 15:29; **21** ද්වි 4:9; යෙරෙ 17:9; මාක් 7:21; රෝම 8:6; එෆී 6:14; පිලි 4:8; කොලො 3:8.

නික්මෙන්නේ එයින්ය.[1] **24** රවටි-
ලිකාර කතාවලින් වළකින්න.[2] වංක
තොල් ඔබෙන් අහක් කරගන්න.[3]
**25** ඔබේ දෙනෙත් ඔබේ ගමන් මඟ
දෙසම යොමු කර තබන්න.[4] වට-
පිට නොබලා ඔබේ දීප්තිමත් දෙ-
නෙත්වලින් ඉදිරියම බලා සිටින්න.[5]
**26** ඔබ යන මාවත සකසාගන්න.[6]
ඔබේ සියලු මාර්ග ස්ථිරව පිහිටුවා-
ගන්න.[7] **27** දකුණටවත් වමටවත්
නොහැරෙන්න.[8] ඔබේ පය නපුරෙන්
ඉවත් කරගන්න.[9]

**5** මාගේ පුත්‍රය, මා උගන්වන
දේට සවන් යොමු කර මා
දෙන ප්‍රඥාව ලබාගන්න.[10] මට සවන්
දී වටහාගැනීමේ හැකියාවද දියුණු
කරගන්න.[11] **2** එවිට ඔබේ සිතීමේ
හැකියාව ආරක්ෂා වනු ඇත.[12] ඔබ
කතා කරන විට සත්‍ය කාරණා හැර
වෙන කිසිවක් කතා නොකිරීමට වග-
බලා ගන්න.*[13]
**3** දූරාචාර* ස්ත්‍රියකගේ තොල්
මීවදයකින් වෑස්සෙන මිහිරි පැණි
මෙනි.[14] ඇගේ මුඛයෙන් පිට
වන වචන වශී කරවනසුලුය.#[15]
**4** එහෙත් ඇගේ ඇසුරට යන
තැනැත්තාට අවසානයේදී අත් වන්-
නේ ඉතා තිත්ත ප්‍රතිඵලය.[16] දෙමුව-
හත් කඩුවකින් ඇනගන්නාක් මෙන්
ඔහු බොහෝ වේදනා විඳින්නේය.[17]
**5** ඇගේ දෙපා මරණයට පියමං
කරයි.[18] ඇය පියවර තබන්නේ මිනී
වළ වෙතටයි.[19] **6** ඇය ජීවනයේ
මාවත සොයන්නේ නැත.[20] ඇය
මංමුළා වී ඒ මේ අත ඇවිදින්-
නීය. ඇය යන මඟ ඇයවත් දන්නේ
නැත.[21] **7** ඉතින් මාගේ පුත්‍ර-
යෙනි, මට ඇහුම්කන් දෙන්න.[22]
මාගේ වදන්වලට පිටු නොපාන්න.[23]
**8** ඇගෙන් ඈත්ව සිටින්න. ඇගේ
දොරකඩ ළඟටවත් නොයන්න.[24]
**9** ඔබ ඇගෙන් ඈත් නොවුණොත්
ඔබ නින්දාවට පත් වන්නහුය.[1] ජීවිත
කාලය පුරාවටම ඉතා කටුක අද්දැ-
කීම්වලට මුහුණ දෙන්න ඔබට සිදු
වන්නේය.[2] **10** අන් අය ඔබේ සව්-
ශක්තිය සූරා කමින් තෘප්තියට පැමි-
ණෙනු ඇත.[3] ඔබ වෙහෙස මහන්සි
වී උපයාගත් දේ නාඳුනන කෙනෙ-
කුගේ නිවසකට උරුම වන්නේය.[4]
**11** බොහෝ වේදනා විඳිමින් කෙඳි-
රිගාමින්[5] ඔබ අකල් මරණයකට
ගොදුරු වන්නහුය.[6] **12** එවිට ඔබට
මෙසේ කීමට සිදු වෙයි. “අනේ, මා
හික්මවීමට කොතරම් ද්වේෂ කළාද?[7]
අවවාදය කොතරම් සුළු කළාද?[8]
**13** මාගේ උපදේශකයන්ගේ හඬට මා
සවන් දුන්නේ නැත.[9] මාගේ ගුරුව-
රුන් කියූ දේ ගණනකටවත් ගත්-
තේ නැත.[10] **14** මා සෑම වැරදි
ක්‍රියාවකටම පැටලී[11] රැස්ව සිටින
මුළු සභාව ඉදිරියේම නින්දාවට පත්
වුණේ ඒ නිසාය.”[12]
**15** ඔබේම පොකුණෙන්ද ඔබේම
ළිඳෙන්ද වතුර බොන්න.[13]
**16** ඔබේ දිය උල්පත් ඔබේ නිව-
සින් පිටට[14] හෝ ඔබේ දිය දහරා
මංසන්ධිවලට හෝ ගලා යෑමට ඉඩ
දෙන්නේ කුමකටද? **17** ඒවා ඔබට
පමණක්ම වේවා! ඔබ වෙනත්
අය සමඟ ඒවා බෙදා නො-
ගන්න.[15] **18** ඔබේ දිය උල්පතට
ආශීර්වාද ලැබේවා![16] ඔබ යොවුන්
වියේදී විවාහ කරගත් බිරිඳ සමඟ ප්‍රීති
වන්න.[17] **19** ඇය ආදරණීය මුව-
දෙනක මෙනි. ප්‍රියකරු මුව පැට-
වෙකු* මෙනි.[18] ඇගේ පියයුරුවලින්
තෘප්තිමත් වන්න.[19] ඇගේ ප්‍රේමයෙන්
සැමදා ප්‍රීති ප්‍රමෝදයට පත් වන්න.[20]
**20** ඉතින් මාගේ පුත්‍රය, දූරාචාර ස්ත්‍රි-

---

**4 පරි.**
**1** මතෙ 12:35
**2** හිතෝ 8:8; 1පේතෘ 2:1
**3** එස 18:31; එෆී 4:22; යාකො 1:21
**4** යෝබ් 31:1; හිතෝ 23:5
**5** මතෙ 6:22
**6** එෆී 5:15; හෙබ්‍රෙ 12:1
**7** ගීතා 40:2; 2තෙස 3:3; 1පේතෘ 5:10
**8** ද්වි 12:32; යොෂු 1:7
**9** යෙසා 1:16; රෝම 12:9

**5 පරි.**
**10** හිතෝ 2:2; යාකො 1:19
**11** 1රාජා 4:29; එළි 2:11
**12** හිතෝ 1:4; හිතෝ 8:12
**13** හිතෝ 15:7; මලා 2:7
**14** හිතෝ 2:16; හිතෝ 7:21
**15** හිතෝ 9:17
**16** දේශ 7:26
**17** ගණන් 25:8; හිතෝ 6:32
**18** හිතෝ 2:19; හිතෝ 9:18
**19** හිතෝ 7:27
**20** හිතෝ 11:19; හිතෝ 11:27
**21** හිතෝ 7:11
**22** හිතෝ 22:17; හෙබ්‍රෙ 12:25
**23** හිතෝ 2:1
**24** හිතෝ 4:15; හිතෝ 6:27; හිතෝ 9:14

**2 තීරුව**
**1** 1ලේක 5:1; හිතෝ 6:33; හිතෝ 29:3
**2** හිතෝ 6:34; හිතෝ 7:23
**3** හිතෝ 31:3; ලූක් 15:30
**4** උත් 34:27
**5** ද්වි 32:29; 2සාමු 12:10; රෝම 6:21; හෙබ්‍රෙ 13:4
**6** 1කොරි 5:5; එළි 21:8
**7** ගීතා 50:17; සෙක 7:11; යොහ 3:20
**8** උත් 19:9; එස 33:8
**9** ලූක් 15:18
**10** 1තෙස 4:8

**11** ගණන් 25:2; 1කොරි 10:6; යූද් 8; **12** 1කොරි 10:11; යූද් 4; **13** සල 4:15; 1කොරි 7:3; හෙබ්‍රෙ 13:4; **14** හිතෝ 5:20; **15** උත් 2:24; උත් 20:3; මතෙ 14:4; **16** 1කොරි 7:2; 1කොරි 7:5; **17** ද්වි 24:5; දේශ 9:9; මලා 2:15; **18** සල 2:9; **19** සල 4:5; **20** උත් 26:8; උත් 29:20; සල 8:6; එෆී 5:25.

---

**හිතෝ 5:2*** මූ.අ., “ඔබේ තොල්වලින් දැනුම රැකගන්න.” **3*** මූ.අ., “නාඳුනන.” **3#** මූ.අ., “ඇගේ මුඛය තෙලටත් වඩා සුමුදුය.”

**හිතෝ 5:19*** මූ.අ., “කඳු එළුවා.”

යකගෙන් ඔබේ ආශාවන් පිනවාගන්-
නේ කුමටද? එවැනි ස්ත්‍රියකගේ ළය
වැළඳගන්නේ මන්ද?[1] **21** මිනිසා-
ගේ සෑම ක්‍රියාවක්ම යෙහෝවා දෙවි
දකින්නේය.[2] ඔහු ඒ සියල්ල ගැන
විමසිල්ලෙන් සිටින්නේය.[3] **22** දුෂ්-
ටයා කරන වැරදි ඔහුටම උගුලක්
වේ.[4] පාපය නමැති උගුලට හසු වී
සිටින ඔහුට එයින් මිදී යෑමට කිසි
මඟක් නොමැත.[5] **23** ඔහු තමාගේ
අධික මෝඩකම නිසා නොමඟ යනු
ඇත.[6] හික්මවීම නොපිළිගත් බැවින්
ඔහු මරණයට පත් වනු ඇත.[7]

**6** මාගේ පුත්‍රය, ඔබේ සහෝදරයා
වෙනුවෙන් ඇපකරුවෙකු වීමට
පොරොන්දු වී[8] නාඳුනන කෙනෙකුට
අතට අත දෙමින් ගිවිසුමක් ඇති කර-
ගෙන තිබෙනවා නම්[9] **2** ඔබ දුන්
වචනය නිසා ඔබ ලොකු කරදර-
යකට වැටෙන්න ඉඩ තිබේ.[10] ඔබ
දුන් පොරොන්දුව ඉටු කිරීමට නොහැ-
කිව, **3** ඔබේ සහෝදරයාගේ අතට
හසු වී සිටිනවා නම් ඔහුගෙන් මිදීමට
ඔබ පියවර ගත යුතුයි.[11] ඔබ යට-
හත්පහත් ලෙස ඔහු ළඟට ගොස්
ඔබේ පොරොන්දුවෙන් නිදහස් කරන
මෙන් ඔහුගෙන් ඉල්ලා සිටිය යුතුයි.[12]
**4** ඔබ ඔහුගේ අතින් නිදහස් වන
තුරු නිදා නොගන්න. ඔබේ දෙනෙත්-
වලින් නින්ද පහ කරන්න.[13] **5** දඩ-
යක්කරුවෙකු අතින් ගැලවී යන
මුවෙකු* මෙන්ද කුරුලු දඩයක්ක-
රුගේ අතින් බේරී යන කුරුල්-
ලෙකු මෙන්ද ඔබත් ඔහුගෙන් ගැලවී
යන්න.[14]

**6** අලසය,[15] කුහුඹුවා[16] ළඟට
ගොස් උෟ වැඩ කරන ආකාරය දෙස
බලා ප්‍රඥාවන්ත වන්න. **7** උෟට
අණ දෙන්නෙක්වත් වැඩ බලන්-
නෙක්වත් පාලකයෙක්වත් නැත.
**8** එහෙත් ගිම්හාන කාලයේදී උෟ
කෑම එකතු කරගනියි.[17] අස්වැන්න
නෙළන කාලයේදී ආහාර රැස් කර-
ගනියි. **9** අලසය, තව කොපමණ
වේලාවක් ඔබ නිදාගෙන සිටිනවාද?[1]
ඔබ නින්දෙන් අවදි වන්නේ කොයි
වේලාවේද?[2] **10** එසේනම් තව
ටිකක් නිදාගන්න. තව ටිකක් හාන්සි
වී සිටින්න. අත් දෙක බැඳගෙන
හොඳට නිදාගන්න.[3] **11** එවිට දුප්-
පත්කම මංකොල්ල කන්නෙකු
මෙන්ද[4] අඟහිඟකම් අවි ගත් මිනි-
සෙකු මෙන්ද[5] හදිස්සියෙන් ඔබ පිටට
පැමිණෙනු ඇත.

**12** කිසි කමකට නැති,[6] දුෂ්ට
මිනිසෙක් රැවටිලිකාර කතා කියමින්
ඇවිදින්නේය.[7] **13** ඔහු තම ඇස්ව-
ලින් ඉඟි කරයි.[8] අත් පාවලින් සංඥා
කරයි.[9] **14** ඔහුගේ සිත දූෂිත අද-
හස්වලින් පිරී තිබේ.[10] සැමවිටම දුෂ්ට
දේ කරන්න කුමන්ත්‍රණය[11] කරන ඔහු
නිතරම බලන්නේ එකිනෙකා අත-
රේ භේද පතුරවන්නයි.[12] **15** එහෙ-
යින් හදිස්සියෙන්ම ඔහු පිටට විපතක්
පැමිණ[13] එක මොහොතකින් ඔහු
විනාශ වී යයි. ඔහුට කිසිසේත් එයින්
ගැලවී යෑමට නොහැක.[14]

**16** යෙහෝවා දෙවි ද්වේෂ කරන
දේවල් හයක් තිබේ.[15] එසේය, ඔහු
පිළිකුල් කරන දේවල් හතක් ඇත.[16]
**17** උඩඟු ඇස්,[17] බොරු කියන දිව,[18]
අහිංසකයන්ගේ ලේ වගුරුවන අත්,[19]
**18** දුෂ්ට ලෙස කුමන්ත්‍රණය කරන
සිත[20] සහ වැරදි කිරීමට ඉක්මන් වන
පාද ඔහුට පිළිකුලකි.[21] **19** බොරු
සාක්ෂි දෙන්නාවූ තැනැත්තාට[22]
මෙන්ම සහෝදරයන් අතර භේද පතු-
රුවන[23] තැනැත්තාටද ඔහු ද්වේෂ
කරන්නේය.

**20** මාගේ පුත්‍රය, ඔබේ පියාගේ
ආඥාව පවත්වන්න.[24] ඔබේ මවගේ

**5 පරි.**
1 හිතෝ 2:16; හිතෝ 7:22; හිතෝ 22:14; හිතෝ 23:27
2 2ලේක 16:9; යෝබ් 34:21; ගීතා 11:4; යෙරෙ 17:10; යෙරෙ 23:24; යෙරෙ 32:19
3 ගීතා 17:3; යෙරෙ 16:17; හෙබ්‍රෙ 4:13
4 ගීතා 7:16; ගලා 6:7
5 හිතෝ 11:21; එපී 5:6; හෙබ්‍රෙ 13:4
6 ගීතා 81:12; හිතෝ 19:3; 2පේතෘ 2:15
7 හිතෝ 10:17

**6 පරි.**
8 උත් 43:9; හිතෝ 17:18; හිතෝ 22:26
9 හිතෝ 11:15; හිතෝ 20:16
10 හිතෝ 18:7
11 2සාමු 24:14
12 මතෙ 5:25
13 ගීතා 132:4
14 ගීතා 124:7
15 හිතෝ 10:26; හිතෝ 26:13
16 යෝබ් 12:7
17 හිතෝ 30:25

**2 තීරුව**
1 හිතෝ 10:5; හිතෝ 24:33
2 හිතෝ 19:15
3 හිතෝ 20:13; හිතෝ 24:33; හිතෝ 26:15; දේශ 4:5
4 හිතෝ 24:34
5 හිතෝ 10:4; හිතෝ 13:4; හිතෝ 18:9; හිතෝ 20:4
6 1සාමු 25:25; හිතෝ 16:27
7 ගීතා 10:7; මතෙ 12:34; ක්‍රියා 20:30; යාකො 3:6
8 ගීතා 35:19; හිතෝ 10:10; හිතෝ 16:30
9 යෙසා 58:9
10 උත් 8:21; හිතෝ 10:32
11 ගීතා 35:20; ගීතා 36:4; හිතෝ 6:18; යෙසා 32:7; මීකා 2:1

**12** හිතෝ 16:28; රෝම 16:17; ගලා 5:20; **13** ගීතා 73:18; හිතෝ 1:27; යෙසා 30:13; 1තෙස 5:3; **14** 2ලේක 36:16; ගීතා 50:22; **15** ගීතා 11:5; හිතෝ 8:13; යෙසා 61:8; **16** ද්වි 12:31; ගීතා 11:5; හිතෝ 11:20; **17** 2සාමු 15:1; 1රාජා 1:5; ගීතා 101:5; හිතෝ 16:5; ගලා 6:3; **18** හිතෝ 12:22; 1තිමෝ 1:10; එළි 21:8; **19** උත් 4:10; උත් 9:6; ගණන් 35:31; ද්වි 27:25; **20** උත් 6:5; සෙක 8:17; මලා 2:16; **21** යෙසා 59:7; රෝම 3:15; **22** නික් 23:1; 1රාජා 21:13; මතෙ 26:59; **23** ලෙවී 19:16; ගලා 5:20; යාකො 3:14; 3යොහ 10; **24** හිතෝ 1:8.

**හිතෝ 6:5*** මූ.අ., “ගසෙල් මුවෙකු.”

උපදෙස්වලට පිටු නොපාන්න.[1]
**21** ඒවා ඔබේ ගෙල වටා බැඳගන්න.[2]
නිතරම ඔබේ සිත තුළම තබා-
ගන්න.[3] **22** එවිට ඔබ ඇවිදින කල
ඒවා ඔබට මඟ පෙන්වනු ඇත.[4] ඔබ
විවේක සුවයෙන් සිටින කල ඒවා
ඔබව ආරක්ෂා කරනු ඇත.[5] ඔබ අවදි
වන කල ඔබට ඒවා සිහි වනු ඇත.
**23** මන්ද ආඥාව ඔබට පහනකි.[6]
නීතිය ඔබට ආලෝකයකි.[7] නිවැරදි
මඟ ගෙන යන්නාවූ අවවාදය ඔබට
ජීවනය අත් කර දෙයි.[8] **24** එම-
ගින් නරක ස්ත්‍රියගෙන්ද[9] දුරාචාරයේ
යෙදෙන* ස්ත්‍රියගේ චාටු බස්වලින්ද
ඔබ ආරක්ෂා වනු ඇත.[10] **25** ඇගේ
රූපශ්‍රීයට ඔබේ සිත ඇදී යන්න
ඉඩ නොදෙන්න.[11] ඇගේ වශී කර-
වනසුලු බැල්මට හසු නොවන්න.[12]
**26** මන්ද ගණිකාවක ඇසුරු කරන
තැනැත්තාට අවසානයේදී ඉතුරු
වන්නේ රොටි කැබැල්ලක් පමණි.[13]
එහෙත් ද්‍රෝහි ලෙස කටයුතු කරන
බිරිඳක උත්සාහ කරන්නේ වටිනා
ජීවිතයක් බිලිගන්නයි.[14] **27** මිනි-
සෙකු ගින්දර තම ළයට ගත්තොත්
ඔහුගේ ඇඳුම් නොපිළිස්සේද?[15]
**28** මිනිසෙකු ගිනි අඟුරු මත
ඇවිද්දොත් ඔහුගේ දෙපා නොදැ-
වෙයිද? **29** අන් කෙනෙකුගේ බිරිඳ
සමඟ අනාචාරයේ යෙදෙන තැනැත්-
තාට සිදු වන්නේද එලෙසමය.[16]
ඇය සමඟ සම්බන්ධකම් පවත්වන
ඕනෑම කෙනෙක් අනිවාර්යයෙන්ම
දඬුවම් විඳින්නේය.[17] **30** සොරෙකු
තම කුසගින්න නිවාගැනීමට සො-
රකම් කළාට ඔහුව හෙළාදකින්නේ
නැත. **31** ඒ කෙසේනමුත් ඔහුව
හසු වුණොත් ඒ සඳහා හත් ගුණ-
යකින් වන්දි ගෙවීමට ඔහුට සිදු
වෙයි. ඔහුගේ නිවසේ වටිනා යමක්
ඇත්නම් ඒ සියල්ල වුවද ඔහුට
දීමට සිදු වෙයි.[18] **32** වෙනත් පුරු-
ෂයෙකුගේ බිරිඳ සමඟ අනාචාරයේ
යෙදෙන තැනැත්තා අඥානයෙකි.*[1]
ඒ තැනැත්තා තමාගේම ජීවිතය
නාස්ති කරගනියි.[2] **33** ඔහු බො-
හෝ දුක් පීඩා විඳ නින්දාවට පත්
වෙයි.[3] ඔහුට විඳින්න සිදු වන්-
නේ කිසිදා මැකී නොයන[4]
නින්දාවකි. **34** මන්ද පුරුෂයෙකු-
ගේ සිතෙහි වෛරයක්* හටගත්-
තොත්[5] ඔහු මහත් කෝපයකින්
කටයුතු කරයි. ඔහු පළිගන්නා දව-
සේදී කිසි අනුකම්පාවක් නොපෙන්-
වයි.[6] **35** ඔහුට වන්දියක් ගෙව්වත්
ඔහුට ඉතා වටිනා තෑගිබෝග දුන්-
නත් ඔහුගේ කෝපය නිවා ඇමිය
නොහැක.

**7** මාගේ පුත්‍රය, මා පවසන
දේ සිතේ තබාගන්න.[7] මාගේ
ආඥා නිධානයක් සේ රැකගන්න.[8]
**2** මාගේ ආඥා පවත්වා දිගු කල් ජීවත්
වන්න.[9] ඔබේ ඇසේ කළු ඉංගිරියාව
මෙන් මාගේ නීතිය රක්ෂා කරන්න.[10]
**3** ඒවා ඔබේ ඇඟිලිවල බැඳගෙන[11]
ඔබේ සිත නමැති පුවරුවේ ලියා-
ගන්න.[12] **4** ප්‍රඥාවට,[13] "ඔබ මාගේ
සහෝදරිය" යයි කියන්න. තේරුම්ගැ-
නීමේ හැකියාවට, "ඔබ මාගේ නෑදෑ-
යෙකි" යයි කියන්න. **5** එවිට ඔබ
අනාචාරයේ යෙදෙන* ස්ත්‍රීන්ගේ චාටු
බස්වලට[14] නොරැවටී ආරක්ෂා[15] වනු
ඇත. **6** මම මාගේ ගෙයි ජනේල-
යෙන්[16] වීථිය දෙස බැලූ විට, **7** ජීවි-
තයේ අද්දැකීම් අඩු තරුණයෙකු
දුටුවෙමි.[17] තරුණයන් අතරින් අඥා-
නයෙකුව*[18] සිටි ඔහුට සිදු වන දේ
තේරුම්ගැනීමට මම උනන්දු වුණෙමි.
**8** ඔහු වීථිය දිගේ ගොස් ඇය සිටින
පාරට හැරී, ඇගේ නිවස දෙසට

**6 පරි.**

**1** ද්වි 21:18
එෆී 6:1
**2** හිතෝ 3:3
**3** ද්වි 6:6
**4** ගීතා 43:3
**5** ගීතා 119:9
**6** ගීතා 119:105
2පේත්‍ර 1:19
**7** යෙසා 30:21
යෙසා 51:4
**8** හිතෝ 4:13
හෙබ්‍රෙ 12:11
**9** හිතෝ 5:3
දේශ 7:26
**10** හිතෝ 2:16
හිතෝ 7:5
**11** හිතෝ 11:22
මතෙ 5:28
යාකො 1:15
**12** යෙසා 3:16
**13** හිතෝ 29:3
ලූක් 15:16
ලූක් 15:30
**14** එස 13:18
**15** ගලා 6:7
**16** උත් 20:3
2සාමු 11:4
යෙරෙ 5:8
එස 22:11
**17** 2සාමු 12:10
හිතෝ 6:35
හෙබ්‍රෙ 13:4
**18** නික් 22:1
නික් 22:4
ලූක් 19:8

**2 තීරුව**

**1** හිතෝ 7:7
**2** හිතෝ 2:18
හිතෝ 5:23
මලා 3:5
1කොරි 6:9
හෙබ්‍රෙ 13:4
**3** හිතෝ 5:9
**4** 1රාජා 15:5
1ලේක 5:1
මතෙ 1:6
**5** ගණන් 5:14
හිතෝ 27:4
**6** උත් 39:19
විනි 20:5
විනි 20:13
සල 8:6

**7 පරි.**

**7** හිතෝ 2:1
හිතෝ 4:1
හිතෝ 5:1
ලූක් 8:15
**8** ද්වි 11:18
හිතෝ 10:14
**9** ලෙවී 18:5
යෙසා 55:3
යොහ 12:50
**10** ගීතා 17:8
**11** ද්වි 6:8
**12** හිතෝ 2:10
2කොරි 3:3

**13** හිතෝ 2:2; **14** හිතෝ 5:3; හිතෝ 6:24; **15** හිතෝ 2:16; හිතෝ 23:27; **16** සල 2:9; **17** හිතෝ 9:6; **18** හිතෝ 6:32; හිතෝ 9:16.

---

හිතෝ **6:24*** මූ.අ., "නාදුනන."

හිතෝ **6:32*** මූ.අ., "සිතෙහි අඩුවක් ඇති කෙනෙකි." මෙම යෙදුමෙන් යහපත් චේතනා නොමැති, හොඳ විනිශ්චයක් කිරීමට නොහැකි පුද්ගලයෙකුව විස්තර කෙරේ. **34*** හෝ, "ඊර්ෂ්‍යාවක්." **7:5*** මූ.අ., "නාදුනන." **7*** හිතෝ 6:32හි පාදසටහන බලන්න.

ඇවිදගෙන යයි.[1] **9** ඔහු ඒ දෙසට
යන්නේ සවස් වරුවේ අඳුර වැටී-
ගෙන එන වේලාවේදීය.[2] ඔහු පියමං
කරන්නේ රාත්‍රියේ ගන අඳුර දසත
පැතිරෙන විටයි. **10** බලන්න! ඔහුව
හමු වන්න ස්ත්‍රියක් පැමිණ සිටියි.
ගණිකාවකගේ ඇඳුමෙන් සැරසී[3]
සිටින ඇය කපටි සිතක් ඇති ස්ත්‍රි-
යකි. **11** ඇය කටකාරය, හිතුවක්-
කාරය.[4] කොයි වේලෙත් නිවසේ
රැඳී නොසිටියි.[5] **12** විටක ඇය එළි-
මහනේ සිටියි. විටක ඇය ප්‍රධාන
මංසන්ධිවල ගැවසෙමින් සිටියි.[6] සෑම
පාරකම මුල්ලකට වී ඇය මඟ බලා-
ගෙන සිටියි.[7] **13** ඇය ඒ තරුණයා
දෙසට දුව ගොස් ඔහුව සිප වැළඳග-
නියි.[8] ඇය කිසි භයක් සැකක් නොමැ-
තිව ඔහුට මෙසේ කියයි.

**14** “මම අද හවුල් පූජා ඔප්පු
කළෙමි.[9] මගේ භාර ඉටු කළෙමි.[10]
**15** ඒ නිසයි මා ඔබව හමු වීමට
ආවේ. මම ඔබව සොයා ආවෙමි.
**16** ඊජිප්තුවෙන් ගෙනා[11] පාට පාට
ලිනන් ඇතිරිලිවලින් මාගේ ඇඳ
සැරසුවෙමි. **17** මාගේ යහන සුවඳ
ලාටු, අගිල්* සහ කුරුඳුවලින් සුවඳ-
වත් කළෙමි.[12] **18** එන්න, උදෑසන
වන තුරු අපි පෙම් බස් දොඩමින් ආද-
රයෙන් මත් වී සිටිමු.[13] **19** මගේ
ස්වාමිපුරුෂයා ගෙදර නැත. ඔහු
දුර ගමනක් ගොස් ඇත.[14] **20** මුදල්
මල්ලක්ද ඔහු රැගෙන ගියේය. ඔහු
නැවත ගෙදර එන්නේ පුන්සඳ දකින
දවසේදීය.”

**21** ඇය බොහෝ මායම්වලින්
ඔහුව රවටාගෙන ඇත.[15] චාටු බස්-
වලින් ඔහුව වශී කරගෙන ඇත.[16]
**22** විගස, ඔහු ඇය පසුපස යන්-
නේය.[17] මරන්න ගෙන යන ගො-
නෙකු මෙන්ද විලංගු දමා දඬුවම්
කිරීමට ගෙන යන මෝඩයෙකු
මෙන්ද ඔහු ඇය පසුපස යන්නේය.
**23** ඔහු හදිස්සියේම උගුලකට හසු
වන කුරුල්ලෙකු මෙනි.[18] ඔහුගේ ජීවි-
තය අනතුරේ ඇති බව ඔහු නොදනී.[1]
ඊතලයක් ඔහුගේ අක්මාව පසාරු
කරගෙන යන තුරු ඔහු කිසිවක්
නොදනී.[2]

**24** ඉතින් මාගේ පුත්‍රයෙනි, මට
සවන් දී මාගේ වදන් පිළිගන්න.[3]
**25** ඇගේ මාර්ග වෙතට ඔබේ සිත
ඇදී යන්න ඉඩ නොදෙන්න. මංමුළා
වී ඇගේ මාවත්වලට හැරී නො-
යන්න.[4] **26** මන්ද ඇය නිසා බො-
හෝදෙනෙකුට තම ජීවිත අහිමි වී
ඇත.[5] ඇගෙන් මැරුම් කෑ අය අප්‍රමා-
ණය.[6] **27** ඇගේ නිවස බැස යන්-
නේ මිනී වළටයි.[7] මිනී වළේ ගැඹුරුම
තැන් වෙතට එය බැස යයි.[8]

**8** ප්‍රඥාව ශබ්ද නඟා හඬගසන්නේ
නැද්ද?[9] වටහාගැනීමේ ශක්තිය
හඬ නඟන්නේ නැද්ද?[10] **2** ප්‍රඥාව
උස් තැන්වලද[11] මඟ අසලද මංසන්-
ධිවලද රැඳී සිටියි. **3** නුවර දොරටුව
අසලද ඒ අවට ස්ථානවලද[12] එය හඬ
නඟා මෙසේ කියයි.[13]

**4** “මනුෂ්‍යයෙනි, මා කතා කරන්-
නේ ඔබටයි. මනුෂ්‍ය පුත්‍රයෙනි,
මා මේ වචන පවසන්නේ ඔබ-
ටයි.[14] **5** අද්දැකීම් අඩු තැනැත්-
තෙනි, සිහිබුද්ධියෙන් කටයුතු
කරන්නේ කෙසේද කියා ඉගෙන-
ගන්න.[15] අඥානයෙනි, නැණවත්ව
සිතන්න ඉගෙනගන්න.[16] **6** මට
ඇහුම්කන් දෙන්න. මන්ද මා කතා
කරන්නේ ඉතා වැදගත් කාරණා
ගැනය.[17] මාගේ මුවින් නික්මෙන්නේ
නිවැරදි වචන පමණයි.[18] **7** මන්ද
මම සත්‍යය කතා කරන්නෙමි.[19]
අසත්‍ය කතා මගේ තොල්වලට පිළි-
කුලක්ය.[20] **8** මා පවසන සියලු දේ
ධර්මිෂ්ඨය.[21] වංක වූ දූෂිත අදහස්
මාගේ මුවින් පිට වන්නේ නැත.[22]
**9** වටහාගැනීමේ හැකියාව සතු අය
මා පවසන සියල්ල නිවැරදි බව පිළි-
ගනිති. දැනුම අත් කරගෙන සිටින
අයට ඒ සෑම කියමනක්ම සාධා-
රණය.[23] **10** රිදීවලට වඩා වටිනා
මගේ උපදෙස් පිළිගන්න. පවිත්‍ර

හිතෝ **7:17*** සුවඳ පතුරුවන ගස් වර්ගයක්.

**7 පරි.**
1 හිතෝ 5:8
2 යෝබ් 24:15 රෝම 13:12 එෆී 5:11
3 උත් 38:14 යෙරෙ 4:30
4 හිතෝ 9:13
5 1තිමෝ 5:13 තිත 2:5
6 හිතෝ 9:14
7 හිතෝ 23:28 යෙරෙ 3:2
8 උත් 39:12 එළි 2:20
9 ලෙවී 19:5 හිතෝ 15:8 හිතෝ 21:27 යෙසා 1:11
10 2සාමු 15:8
11 එස 27:7
12 සල 3:6 සල 4:14
13 සල 1:4
14 මාක් 13:34
15 හිතෝ 5:3 හිතෝ 7:5
16 එළි 2:20
17 1කොරි 6:18
18 දේශ 9:12

**2 තීරුව**
1 හිතෝ 9:18
2 හිතෝ 5:9 හිතෝ 5:11
3 හිතෝ 1:1
4 හිතෝ 5:8 1පේතෘ 2:11
5 දේශ 7:26
6 1කොරි 10:8
7 හිතෝ 5:5 හිතෝ 9:18
8 හිතෝ 2:18 දේශ 7:17

**8 පරි.**
9 හිතෝ 1:20
10 හිතෝ 2:3 හිතෝ 2:11
11 මතෙ 10:27
12 හිතෝ 1:21
13 ක්‍රියා 20:20
14 මතෙ 11:15
15 ගීතා 19:7 හිතෝ 1:4
16 යෙරෙ 17:9
17 1කොරි 2:6
18 හිතෝ 2:9
19 යොහ 4:24 යොහ 17:17
20 හිතෝ 12:22 හිතෝ 29:27
21 ගීතා 12:6 යෙසා 45:23
22 2තිමෝ 3:16
23 ගීතා 25:12 හිතෝ 21:11

රනටත් වඩා වටිනා දැනුම මාගෙන්
ලබාගන්න.[1] **11** මන්ද ප්‍රඥාව කො-
රල්වලට වඩා වටින්නේය.[2] මිනිසුන්
ආශා කරන අන් සියලු දේවලටත්
වඩා එය වටින්නේය. ඊට සම කළ
හැකි කිසි දෙයක් නැත.[3]
**12** “ප්‍රඥාව වන මම, සිහිකල්ප-
නාව සමඟ අත්වැල් බැඳගෙන
සිටින්නෙමි.[4] දැනුමද හොඳින් සිතී-
මේ හැකියාවද මා සතුය.[5] **13** යෙ-
හෝවා දෙවි කෙරෙහි ගරුබිය
ඇතුව සිටීම යනුවෙන් අදහස් කරන්-
නේ නපුරට ද්වේෂ කිරීමයි.[6] තමා-
වම උසස් කරගැනීමද උඩඟුකමද[7]
නපුරු මාර්ගයද වංචනික මෙන්ම
දූෂිත කතාද[8] යන මේ සියල්ලට
මම ද්වේෂ කරමි. **14** හොඳ උප-
දෙස්ද[9] බුද්ධියද*[10] මගෙන් ලබාගත
හැකියි. මනා අවබෝධයකින් කට-
යුතු කරන්නද[11] ශක්තිමත්ව සිටින්-
නද[12] මගෙන් ඉගෙනගත හැකියි.
**15** රජවරුන් සාර්ථකව රජකම්
කරන්නේ මාගේ උපකාරයෙනි.
උසස් නිලධාරීන් ධර්මිෂ්ඨ නියෝග
පනවන්නේ මා නිසාය.[13] **16** අධිප-
තීන් පාලනය කරන්නේද[14] ධර්-
මිෂ්ඨ ලෙස විනිශ්චය කරන්නේද[15]
මගේ උපකාරයෙනි. **17** මට ප්‍රේම
කරන අයට මම ප්‍රේම කරමි.[16] මාව
සොයන අයට මාව සම්බ වේ.[17]
**18** වස්තුවද ගෞරවයද[18] ධර්මිෂ්ඨ-
කමද මා සතුය. හොඳ සාරධර්ම
මට උරුම වී තිබේ.[19] **19** මාගෙන්
ලැබෙන දේ රනටත් වඩා අනර්-
ඝය. එසේය, පිරිසිදු රනටත් වඩා
අනර්ඝය. මාගෙන් නෙළාගන්නා
දේ ඉස්තරම් රිදීවලටත් වඩා අග-
නේය.[20] **20** මා ගමන් කරන්නේ
ධර්මිෂ්ඨ මාර්ගයේය.[21] යුක්තියේ
මාවත් මැදින්ම මම ගමන් කරන්-
නෙමි.[22] **21** මන්ද මට ප්‍රේම කරන
අයට වටිනා දේ හිමි කර දෙන්නත්[23]
නිරතුරුවම ඔවුන්ගේ ගබඩා පුරවා
තබන්නත්[24] මම ආශාවෙන් සිටිමි.

**22** “යෙහෝවා දෙවිගේ මුල්ම නිර්-
මාණය මමයි.[1] ඈත අතීතයේ අන්
සියල්ල සෑදීමට පෙර ඔහු බිහි කළේ
මාවයි.[2] **23** ඔහු මට හිමි තැන ලබා
දුන්නේ බොහෝ කලකට පෙරයි.[3]
මුල පටන්ම මට ඒ තැන හිමි විය.
මට එය හිමි වුණේ පොළොව නිර්මා-
ණය කිරීමටත් කලිනුයි.[4] **24** මාව
බිහි කළේ මහා ජල කඳන් පවතින්-
නත් කලිනුයි.[5] ඒ කාලයේදී ගැඹුරු
දිය උල්පත් තිබුණේ නැත. **25** කඳු
හෙල් පිහිටුවන්නත් කලින් මාව බිහි
කළේය.[6] **26** ඒ වන විට පෘථිවි-
යවත්[7] වෙල් යායවල්වත් තණබිම්-
වත් සරුසාර කෙත්වතුවත් භූමියේ
එක පස් පිඩැල්ලක්වත් සාදා තිබුණේ
නැත.[8] **27** ඔහු අහස පිහිටෙවූ කලද
මහා ජල කඳේ ඈත කෙළවරේ ක්ෂිති-
ජය* නියම කළ කලද[9] මම සිටි-
යෙමි.[10] **28** ඔහු ඉහළ අහසේ වලා
පටලයන් සෑදූ විටද[11] මහා ජල කඳේ
දිය උල්පත් ස්ථිර ලෙස පිහිටෙවූ විටද
මම සිටියෙමි.[12] **29** මුහුදේ සීමාවන්
ඉක්මවා නොයන ලෙස මුහුදු ජලයට
අණ කළ විටද[13] පොළොවේ අත්තිවා-
රම් නියම කළ විටද මම සිටියෙමි.[14]
**30** එවිට මම ඔහු ළඟින්ම සිට ඔහු-
ගේ ප්‍රධාන සේවකයා ලෙස කටයුතු
කළෙමි.[15] මම නිතරම ඔහු ඉදිරියේ
සතුටින් සිටියෙමි.[16] දිනපතාම ඔහු
විශේෂයෙන්ම මා ගැන ප්‍රීති වුණේය.[17]
**31** ඔහු නිර්මාණය කළ සරුසාර පො-
ළොව දැක මම සතුටු වුණෙමි.[18] මා
බොහෝ සෙයින් ප්‍රිය කළේ මනුෂ්‍ය
පුත්‍රයන්ටයි.[19]
**32** “මාගේ පුත්‍රයෙනි, මට ඇහුම්-
කන් දෙන්න. මාගේ මාර්ග
රක්ෂා කරන අය සන්තෝෂවත්ය.[20]
**33** හික්මවීම පිළිගෙන ප්‍රඥාවන්ත

**8 පරි.**

**1** ගීතා 19:10; ගීතා 119:72; ගීතා 119:127; හිතෝ 3:14; හිතෝ 16:16; හිතෝ 20:15
**2** හිතෝ 3:15
**3** ගීතා 19:10; ගීතා 119:127
**4** හිතෝ 1:4
**5** හිතෝ 2:11; හිතෝ 5:2
**6** ගීතා 97:10; ගීතා 101:3; හිතෝ 13:5; හිතෝ 16:6; රෝම 12:9
**7** 1සාමු 2:3; ගීතා 101:5; හිතෝ 11:2; 1පේතෘ 5:5
**8** හිතෝ 4:24
**9** යෙසා 9:6; යොහ 7:16
**10** හිතෝ 2:7; ලූක් 1:17
**11** හිතෝ 4:7
**12** හිතෝ 24:5
**13** ගීතා 72:1
**14** යෙසා 32:1
**15** හිතෝ 29:2
**16** ගීතා 91:14; යොහ 14:21
**17** හිතෝ 2:5
**18** මාක් 10:30
**19** 1රාජා 3:6
**20** හිතෝ 3:14
**21** ගීතා 85:13; හිතෝ 11:5
**22** ගීතා 72:2; යෙසා 11:4; යෙසා 42:1
**23** ගීතා 37:11; මතෙ 25:34
**24** මලා 3:10

**2 තීරුව**

**1** යොහ 1:1; යොහ 1:14
**2** කොලො 1:15
**3** මීකා 5:2
**4** යොහ 1:3; යොහ 8:58; යොහ 17:5; කොලො 1:16
**5** උත් 1:2
**6** උත් 1:10; ගීතා 90:2
**7** උත් 1:1
**8** ගීතා 89:11; ගීතා 90:2
**9** උත් 1:6; යෝබ් 26:10
**10** ගීතා 33:6; යෙරෙ 10:12; කොලො 1:17
**11** උත් 1:7; යෝබ් 38:9

**12** උත් 2:6; උත් 7:11; උත් 8:2; ගීතා 104:6; **13** උත් 1:9; යෝබ් 38:11; ගීතා 33:7; ගීතා 104:9; යෙරෙ 5:22; **14** උත් 1:9; **15** උත් 1:26; යොහ 1:3; යොහ 17:5; කොලො 1:16; **16** යෝබ් 38:7; **17** යෙසා 42:1; මතෙ 3:17; **18** ගීතා 9:8; ගීතා 98:7; **19** යොහ 3:16; යොහ 13:1; **20** 1යොහ 2:17.

හිතෝ **8:14*** මූ.අ., “ස්ථානෝචිත ප්‍රඥාව.”

හිතෝ **8:27*** හෝ, “නිම් වළල්ල.”

වන්න.[1] එය ප්‍රතික්ෂේප නොක-
රන්න.[2] **34** දිනපතාම මාගේ ගෙයි
දොරටුව අසල බලා සිටිමින් මාගේ
දොරකඩ අසල අවදිව සිට මට සවන්
දෙන තැනැත්තා සන්තෝෂවත්ය.[3]
**35** මාව සොයාගන්නා තැනැත්තාට
අනිවාර්යයෙන්ම ජීවනය ලැබෙන්-
නේය.[4] ඔහුට යෙහෝවා දෙවිගේ අනු-
මැතියද ලැබෙන්නේය.[5] **36** එහෙත්
මාව සොයාගැනීමට අසමත් වන
තැනැත්තා තමාගේම ජීවිතයට හානි
පමුණුවාගනියි.[6] මට වෛර කරන
සියල්ලෝ මරණයට අත වනති.”[7]

**9** සැබෑ ප්‍රඥාව[8] කුලුනු සතකින්
යුත් නිවසක් තනා ඇත.[9]
**2** ඇය කෑම සඳහා සතුන් මැරී-
මට සැලසුම් කර වයින් මිශ්‍රණයක්ද
සාදා ඇත. එපමණක්ද නොව ඇය
කෑම මේසයද පිළියෙල කර ඇත.[10]
**3** ප්‍රඥාව තම සේවිකාවන්ව නුවරෙහි
උස් තැන් වෙත යවන්නීය. ඇය
ඔවුන් ලවා හඬ නඟා මෙසේ ආරාධනා
කරන්නීය. **4** “අද්දැකීම් අඩු සියල්-
ලෙනි, මා වෙතට එන්න.”[11] අඥාන*[12]
වූ සියල්ලන්ට ප්‍රඥාව මෙසේ කියන්-
නීය. **5** “එන්න, මාගේ රොටිවලින්
පෝෂණය වී මාගේ වයින් මිශ්‍රණය
පානය කරන්න.[13] **6** අද්දැකීම් අඩු
අයගේ ආශ්‍රය අත්හැර ජීවනය අත්
කරගන්න.[14] තේරුම්ගැනීම නමැති
මාවතේ ඉදිරියටම ගමන් කරන්න.”[15]

**7** සමච්චල් කරන්නාට දැනමු-
තුකම් දීමට උත්සාහ කරන
තැනැත්තා තමාවම අගෞරව-
යට පත් කරගනියි.[16] දුෂ්ටයෙකුට
අවවාද දෙන තැනැත්තා තමාගේ
හොඳ නමට කැළැලක් ඇති
කරගනියි.[17] **8** සමච්චල් කරන්නෙ-
කුට අවවාද නොකරන්න. මන්ද ඔබ
එසේ කළොත් ඔහු ඔබට වෛර
කරන්නේය.[18] ප්‍රඥාවන්තයෙකුට අව-
වාද කරන්න. එවිට ඔහු ඔබට ප්‍රේම
කරන්නේය.[19] **9** ප්‍රඥාවන්තයෙකුට
උපදෙස් දෙන්න. එවිට ඔහු තවත්
ප්‍රඥාවන්ත වන්නේය.[1] ධර්මිෂ්ඨයෙ-
කුට උගන්වන්න. එවිට ඔහු දැනුම
තවත් වැඩි කරගන්නේය.

**10** ප්‍රඥාව ලබාගැනීමට මුල්ම පිය-
වර වන්නේ යෙහෝවා දෙවිට ගරුබිය
දැක්වීමයි.[2] අවබෝධය යනු අතිශුද්ධ
තැනැත්තාණන්ව දැන හඳුනා ගැනී-
මයි.[3] **11** මාගේ ආශීර්වාදයෙන් ඔබ
බොහෝ කල් ජීවත් වන්නහුය.[4] මා
නිසා ඔබේ ආයු කාලය වැඩි වනු
ඇත.[5] **12** ඔබ ප්‍රඥාවන්ත වන්නේ
නම් එයින් ප්‍රයෝජන ලබන්නේ ඔබ-
මයි.[6] එහෙත් ඔබ සමච්චල් කරන්-
නෙකු ලෙස කටයුතු කරන්නේ නම්
එහි ප්‍රතිඵල විඳින්නේද ඔබමයි.[7]

**13** මෝඩ ස්ත්‍රියක් කටකාරය.[8]
ඇය කිසිවක් නොදන්නා බොළඳ
තැනැත්තියකි.[9] **14** නුවරේ කන්-
දක් උඩ පිහිටි ඇගේ නිවසේ දොර-
කඩ ළඟ ඇය හිඳගෙන සිටින්නීය.[10]
**15** ඇය එසේ සිටින්නේ එතැනින්
යන එන අයට හඬගැසීමටයි. නො-
නැවතී කෙළින් ගමන් කරන අයට
ඇය මෙසේ කියන්නීය.[11] **16** “අද්-
දැකීම් අඩු සියල්ලෙනි, මා ළඟට
එන්න.”[12] අඥාන[13] සියල්ලන්ටද ඇය
මෙසේ කියන්නීය. **17** “හොර රහ-
සේ ගත් වතුර මිහිරිය.[14] රහසින්
කන රොටි රසවත්ය.”[15] **18** එහෙත්
ඇගේ නිවස මිය ගිය අයගෙන් පිරී
ඇති බවත් ඇගේ ආරාධනාව පිළිගත්
අය මිනී වළේ ගැඹුරුම ස්ථානවල
සිටින බවත් ඔවුහු නොදනිති.[16]

**10** සලමොන්ගේ හිතෝපදේ-
ශයන්ය.[17]

ප්‍රඥාවන්ත පුතෙක් තම පියාව
ප්‍රීතියට පත් කරයි.[18] නමුත් අඥාන
පුතෙකු තම මවට ශෝකයකි.[19]
**2** දුෂ්ටයාගේ වස්තුවෙන් කිසි ප්‍රයෝ-
ජනයක් නැත.[20] මරණයෙන් ගලවනු

---

හිතෝ **9:4*** හිතෝ 6:32හි පාදසටහන බලන්න.

**8** හිතෝ 7:11; හිතෝ 21:9; **9** යෝබ් 2:10; **10** හිතෝ 7:12; හිතෝ 23:28; **11** හිතෝ 7:8; හිතෝ 7:26; හිතෝ 23:27; **12** හිතෝ 9:4; **13** හිතෝ 6:32; **14** හිතෝ 20:17; **15** හිතෝ 7:18; එෆී 5:12; **16** හිතෝ 2:18; හිතෝ 7:23; **10 පරි.** **17** හිතෝ 1:1; **18** හිතෝ 13:1; හිතෝ 23:24; හිතෝ 27:11; හිතෝ 29:3; **19** හිතෝ 15:20; හිතෝ 17:21; හිතෝ 17:25; **20** හිතෝ 11:4; ශෙප 1:18.

**8 පරි.**
**1** හිතෝ 3:11, හිතෝ 4:13, හෙබ්‍රෙ 12:7
**2** හිතෝ 28:14, හෙබ්‍රෙ 12:25
**3** මතෙ 5:3, 1තෙස 5:6
**4** හිතෝ 13:14, යොහ 3:36, යොහ 14:6, යොහ 17:3
**5** හිතෝ 12:2, එෆී 1:6
**6** යොහ 3:19, ක්‍රියා 13:46
**7** හිතෝ 5:23, මතෙ 25:46

**9 පරි.**
**8** හිතෝ 1:20, 1කොරි 2:7
**9** ගීතා 127:1
**10** ලූක් 14:17
**11** ගීතා 119:130, හිතෝ 1:22
**12** හිතෝ 7:7
**13** ගීතා 22:26, යෙරෙ 31:12, යොහ 6:27, එළි 22:17
**14** ගීතා 26:4, ක්‍රියා 2:40, 2කොරි 6:17, එළි 18:4
**15** හිතෝ 4:5, හිතෝ 13:20, හිතෝ 22:17, දේශ 7:5, මතෙ 7:13, ලූක් 13:24
**16** 1රාජා 18:17, හිතෝ 15:12
**17** 1රාජා 21:20, 2ලේක 25:16
**18** 1රාජා 22:8, හිතෝ 15:12, හිතෝ 23:9, මතෙ 7:6
**19** ගීතා 141:5, හිතෝ 27:6, හිතෝ 28:23

**2 තීරුව**
**1** හිතෝ 1:5, හිතෝ 15:31, හිතෝ 17:10, හිතෝ 25:12, මතෙ 13:12
**2** ගීතා 34:11, ගීතා 111:10, හිතෝ 1:7
**3** 1ලේක 28:9, මතෙ 11:27, යොහ 17:3
**4** ද්වි 6:2, හිතෝ 8:35, හිතෝ 10:27
**5** හිතෝ 3:2
**6** හිතෝ 16:26
**7** යෙසා 28:22

ලබන්නේ ධර්මිෂ්ඨ ලෙස හැසිරෙන
පුද්ගලයාවයි.[1] **3** යෙහෝවා දෙවි
ධර්මිෂ්ඨ තැනැත්තාව කුසගින්-
නේ නොතබයි.[2] නමුත් දුෂ්ටයන්ගේ
ආශාවන් ඔහු ඉෂ්ට නොකරයි.[3]
**4** අලසකමින් වැඩ කරන්නා
දිළිඳුකමට වැටෙයි.[4] නමුත් උත්සාහ-
වන්තයා පොහොසත් වෙයි.[5]
**5** අස්වැන්න නෙළන කාලයේදී
බර නින්දක පසු වන පුත්‍රයා
තම දෙමාපියන්ට ලැජ්ජාවකි.[6] නමුත්
බුද්ධිමත්ව කටයුතු කරන පුත්‍රයා ගිම්-
හානයේ අස්වැන්න රැස් කරගනියි.
**6** ආශීර්වාද ලැබෙන්නේ ධර්මිෂ්ඨ-
යාටය.[7] එහෙත් දුෂ්ටයා තම වච-
නවලින් දරුණු චේතනා සඟවයි.[8]
**7** ධර්මිෂ්ඨයාගේ හොඳ නම සැමදා
සිහි වෙයි.[9] නමුත් දුෂ්ටයාගේ නම
ඇසීමත් පිළිකුලකි.[10]
**8** ප්‍රඥාවන්තව සිතන තැනැත්තා
අණ පිළිපැදීමට කැමැත්තක් දක්-
වයි.[11] එහෙත් අඥානව කතා කරන
තැනැත්තාව පාගා දමනු ලැබේ.[12]
**9** දෙවිට විශ්වාසවන්තව සිටින
තැනැත්තා සුරක්ෂිතව ගමන් කරයි.[13]
එහෙත් වංකකමින් කටයුතු කරන්නා-
ගේ ක්‍රියා හෙළි වෙයි.[14]
**10** රැවටිලිකාර ලෙස ඇස්වලින්
ඉඟි කරන්නා වේදනාව ඇති කරයි.[15]
අඥානව කතා කරන තැනැත්තාව
පාගා දමනු ලැබේ.[16] **11** ධර්මිෂ්ඨ-
යාගේ වචන ජීවනය ගෙන දෙයි.[17]
එහෙත් දුෂ්ටයා තම වචනවලින්
දරුණු චේතනා සඟවයි.[18]
**12** වෛරයෙන් දබර හටගනියි.[19]
නමුත් ප්‍රේමය සියලු වැරදි අමතක
කර දමයි.[20]
**13** හොඳ අවබෝධයකින් කට-
යුතු කරන තැනැත්තා ප්‍රඥාවන්තව
කතා කරයි.[21] එහෙත් වේවැල සාදා
තිබෙන්නේ අඥානයාට තළන්නයි.[22]
**14** ප්‍රඥාවන්තයා දැනුම වස්තුවක්
සේ රැකගනී.[23] එහෙත් අඥානයාගේ
මුඛය ඉක්මනින්ම ඔහුව විනාශයට
පමුණුවයි.[24]
**15** ධනවතෙකුගේ වටිනා දේවල්
ඔහුට බලකොටුවකි.[1] දිළිඳුන්ගේ
නාස්තියට හේතු වන්නේ ඔවුන්ගේ
දිළිඳුකමයි.[2]
**16** ධර්මිෂ්ඨයාගේ ක්‍රියාකලාපය
හේතුවෙන් ඔහුට ජීවනය අත් වෙයි.[3]
එහෙත් දුෂ්ටයා තමා උපයාගත් දේ
නිසා පාපයට පෙලඹෙයි.[4]
**17** හික්මවීමට ප්‍රිය කරන්නා අන්
අයව ජීවනයට මඟ පෙන්වයි.[5] නමුත්
අවවාදයට පිටු පාන්නා අනුන්ව නො-
මඟ යවයි.[6]
**18** බොරු වචනවලින් කෙනෙකු
තම වෛරය සඟවයි.[7] අනුන් ගැන
අපහාසාත්මක කතා පතුරුවන්නා
අඥානයෙකි.[8]
**19** කතාබහ වැඩි වූ විට වරදකට
හසු වීමේ ඉඩකඩද වැඩිය.[9] එහෙත්
බුද්ධිමත් තැනැත්තා තම වචන කල්-
පනාකාරීව හසුරුවයි.[10]
**20** ධර්මිෂ්ඨයාගේ වචන පවිත්‍ර රිදී
මෙනි.[11] එහෙත් දුෂ්ටයාගේ සිත කිසි
වටිනාකමක් නැති තරම්ය.[12]
**21** ධර්මිෂ්ඨයා තම කතාවෙන්
බොහෝදෙනෙකුව ආරක්ෂා කරයි.[13]
එහෙත් මෝඩයෝ තම අඥානකම්*
නිසා මිය යති.[14]
**22** යෙහෝවා දෙවිගේ ආශීර්වාදය
සැබෑ වස්තුවකි.[15] ඔහු ඊට කිසි වේද-
නාවක් එක් නොකරයි.[16]
**23** අඥානයා නින්දිතව හැසිරෙන්-
නේ විනෝදයටයි.[17] එහෙත් වටහා-
ගැනීමේ හැකියාව ඇති මිනිසා ප්‍රඥාව
සොයා යයි.[18]
**24** දුෂ්ටයා යම් දෙයකට හයින්

**10 පරි.**

**1** හිතෝ 11:4 හිතෝ 12:28 දානි 4:27
**2** ගීතා 33:19 ගීතා 37:25 මතෙ 6:33 හෙබ්‍රෙ 13:5
**3** හිතෝ 14:32
**4** හිතෝ 20:4 දේශ 10:18
**5** හිතෝ 12:24 හිතෝ 13:4 හිතෝ 21:5
**6** හිතෝ 6:6 හිතෝ 6:9 හිතෝ 17:2
**7** නික් 23:25 ද්වි 28:2 හිතෝ 11:26 හිතෝ 28:20 මලා 3:10
**8** ද්වි 28:15
**9** 2රාජා 19:34 ගීතා 112:6 හිතෝ 22:1 දේශ 7:1
**10** ගීතා 9:5 ගීතා 109:15
**11** ද්වි 4:6 යෝබ් 23:12 ගීතා 19:7 ගීතා 107:43 ගීතා 119:34 ගීතා 119:100 2තිමෝ 3:15
**12** හිතෝ 17:20 හිතෝ 18:6 දේශ 10:12
**13** ගීතා 25:21 හිතෝ 28:18
**14** මතෙ 10:26 ලූක් 12:2 1කොරි 4:5 1තිමෝ 5:24
**15** ගීතා 35:19 හිතෝ 6:13
**16** හිතෝ 18:21 3යොහ 10
**17** ගීතා 37:30 හිතෝ 11:30 මතෙ 12:35 යාකො 5:20
**18** දේශ 10:13 මතෙ 12:34 යාකො 3:5
**19** හිතෝ 15:18 යාකො 4:1
**20** හිතෝ 17:9 1කොරි 13:4 1පේතෘ 4:8
**21** හිතෝ 15:7 යෙසා 50:4 ලූක් 4:22
**22** ගීතා 32:9 හිතෝ 19:29 හිතෝ 26:3 1කොරි 4:21
**23** හිතෝ 9:9 හිතෝ 18:15 මතෙ 12:35
**24** හිතෝ 13:3 හිතෝ 18:7 හිතෝ 21:23

---

**2 තීරුව** **1** යෝබ් 31:24; දේශ 7:12; ලූක් 12:19; **2** හිතෝ 19:7; **3** හිතෝ 11:30; හබ 2:4; ගලා 6:8; **4** මතෙ 7:17; **5** හිතෝ 12:1; හෙබ්‍රෙ 2:1; හෙබ්‍රෙ 13:7; **6** හිතෝ 5:12; හිතෝ 15:10; 2තිමෝ 4:4; හෙබ්‍රෙ 12:25; **7** 1සාමු 18:21; 2සාමු 3:27; ලූක් 20:20; 1යොහ 3:15; **8** ගීතා 50:20; ගීතා 101:5; **9** දේශ 5:2; දේශ 10:14; යාකො 3:2; **10** ගීතා 39:1; හිතෝ 17:27; හිතෝ 21:23; යාකො 1:19; **11** හිතෝ 12:18; හිතෝ 16:13; මතෙ 12:35; **12** උත් 6:5; යෙරෙ 17:9; මතෙ 12:34; **13** යෙරෙ 3:15; 1පේතෘ 5:2; **14** හිතෝ 5:12; හොෂෙ 4:6; රෝම 1:28; **15** ද්වි 8:18; 1සාමු 2:7; ගීතා 37:22; ගීතා 107:38; **16** 1තිමෝ 6:6; **17** හිතෝ 14:9; හිතෝ 26:19; **18** හිතෝ 1:2; හිතෝ 2:10; හිතෝ 15:21.

---

**හිතෝ 10:21*** හිතෝ 6:32හි පාදසටහන බලන්න.

සිටින්නේද ඔහු පිටට පැමිණෙන්නෙත්
ඒ දේමය.[1] නමුත් ධර්මිෂ්ඨයන්ගේ
ආශා ඉටු කරනු ලැබේ.[2] **25** සුළිසු-
ළඟක් හමා අවසන් වන්නාක් මෙන්
දුෂ්ටයා පහ වී යයි.[3] එහෙත් ධර්මිෂ්-
ඨයා සදහටම පවතින අත්තිවාරමක්
මෙනි.[4]

**26** විනාකිරිවලට දත් හිරිවැටෙන්-
නාක් මෙන්ද දුමෙන් ඇස් දැවිල්ල
ගන්නාක් මෙන්ද අලසයෙකුව සේව-
යට බඳවාගන්න තැනැත්තාද වේ-
දනා විඳින්නේය.[5]

**27** යෙහෝවා දෙවි කෙරෙහි ගරු-
බිය ඇතුව සිටීමෙන් දිගු කල් ජීවත්
විය හැකියි.[6] නමුත් දුෂ්ටයන්ගේ ජීවි-
තය කෙටි කරනු ලැබේ.[7]

**28** ධර්මිෂ්ඨයන්ට ඇත්තේ ප්‍රීති-
මත් අපේක්ෂාවකි.[8] නමුත් දුෂ්ටයන්-
ගේ බලාපොරොත්තු සුන් වෙයි.[9]

**29** යෙහෝවා දෙවිගේ මාර්ගය
නිර්දෝෂ අයට ආරක්ෂාවකි.[10] නමුත්
නපුරු දේ කරන අයට අත් වන්නේ
විනාශයයි.[11]

**30** ධර්මිෂ්ඨයාව සොලවන්න කිසි-
වෙකුට නොහැක.[12] එහෙත් දුෂ්ට-
යන්ට සැමදාමත් පොළොවේ ජීවත්
වීමට ඉඩ නොලැබේ.[13]

**31** ධර්මිෂ්ඨයාගේ මුවින් නික්-
මෙන්නේ ප්‍රඥාවන්ත වචනය.*[14]
එහෙත් වංක ලෙස කතා කරන අයව
සදහටම නිහඬ කරනු ලැබේ.[15]

**32** ධර්මිෂ්ඨයාගේ මුවින් සිත්-
ගන්නා වචන පිට වෙයි.[16] නමුත්
දුෂ්ටයන්ගේ මුඛයෙන් නික්මෙන්නේ
දූෂිත අදහස්ය.[17]

**11** හොර තරාදිය යෙහෝවා දෙ-
විට පිළිකුලක්ය.[18] නමුත්
නිවැරදි මිනුම් පඩිය* ඔහුට
ප්‍රසන්නය.

**2** යමෙකු අහංකාරකමින්* ඉදිමී
ඇද්ද, ඔහු අගෞරවයට පත් වනු
ඇත.[1] එහෙත් නිහතමානී අය ප්‍රඥා-
වන්තය.[2]

**3** ප්‍රතිපත්තිගරුක අයට මඟ
පෙන්වන්නේ ඔවුන්ගේම අවංකක-
මය.[3] එහෙත් ද්‍රෝහිව කටයුතු කරන
අයගේ වංකකම ඔවුන්ගේම විනාශ-
යට මඟ පාදයි.[4]

**4** දෙවිගේ උදහස ප්‍රකාශ කරන
දවසේදී වස්තුවෙන් කිසිදු ප්‍රයෝ-
ජනයක් නැත.[5] මරණයෙන් ගැල-
වෙන්නේ ධර්මිෂ්ඨ ලෙස හැසිරෙන
පුද්ගලයායි.[6]

**5** නිර්දෝෂ තැනැත්තා තම
මාර්ග සමතලා කරගන්නේ තම ධර්-
මිෂ්ඨකම නිසාය.[7] නමුත් දුෂ්ටයා
තමාගේම දුෂ්ටකම නිසා වැටෙන්-
නේය.[8] **6** ප්‍රතිපත්තිගරුක ජීවිත-
යක් ගත කරන අය ගැලවෙන්නේ
ඔවුන්ගේ ධර්මිෂ්ඨකම නිසාය.[9]
නමුත් ද්‍රෝහිව කටයුතු කරන අය-
ගේ වැරදි ආශාවන් ඔවුන්ටම උගුලක්
වේ.[10]

**7** දුෂ්ට මිනිසා තමා සතු බලය
කෙරෙහි කොතරම් විශ්වාසය තැබු-
වත්[11] ඔහු මිය යන කල ඔහුගේ සියලු
ප්‍රාර්ථනාවන් සුන් වී යයි.[12]

**8** දුක් පීඩාවලින් ධර්මිෂ්ඨයාව
බේරාගනු ලැබෙයි.[13] නමුත් ඒ සියලු
දුක් පීඩා දුෂ්ටයා පිටට පැමිණෙයි.[14]

**9** දෙවිට ද්‍රෝහිව කටයුතු කරන
තැනැත්තා තම වචනවලින් අසල්වැ-
සියාව විනාශයට පත් කරයි.[15] එහෙත්
දැනුම් තේරුම් ඇතුව කටයුතු කරන
නිසා ධර්මිෂ්ඨයා ගැලවෙයි.[16]

**10 පරි.**

**1** හෙබ්‍රෙ 10:27
**2** ගීතා 21:2, ගීතා 37:4, යොහ 16:24, 1යොහ 5:14
**3** ගීතා 37:10, ගීතා 58:9, යෙසා 40:24
**4** ගීතා 15:5, මතෙ 7:24, 1තිමෝ 6:19
**5** මතෙ 25:26
**6** ගීතා 21:4, ගීතා 91:16
**7** ගීතා 55:23, දේශ 7:17
**8** ගීතා 16:9, රෝම 5:2, රෝම 12:12
**9** ගීතා 112:10, හිතෝ 11:7, මතෙ 25:46, 2තෙස 1:9
**10** ගීතා 41:11, ගීතා 84:7, හිතෝ 18:10, යෙසා 40:31, පිලි 4:13
**11** යෝබ් 31:3, ගීතා 1:6, ලූක් 13:27, රෝම 2:8
**12** ගීතා 16:8, ගීතා 125:1
**13** ගීතා 37:9, මතෙ 21:41
**14** ගීතා 37:30, හිතෝ 10:11
**15** ගීතා 63:11
**16** ගීතා 30:5, හිතෝ 11:27
**17** හිතෝ 15:2

**11 පරි.**

**18** ලෙවී 19:36, ද්වි 25:15, හිතෝ 20:10, එස 45:10, ආමො 8:5, මීකා 6:10

**2 තීරුව**

**1** හිතෝ 16:18, හිතෝ 18:12, ලූක් 14:8
**2** හිතෝ 15:33, මීකා 6:8, 1පේතෘ 5:5
**3** ගීතා 25:21, ගීතා 26:1, හිතෝ 13:6
**4** හිතෝ 21:7, හිතෝ 28:18, යෙසා 1:28
**5** හිතෝ 10:2, හිතෝ 18:11, එස 7:19, ශෙප 1:18, මතෙ 16:26

**6** උත් 7:1; හිතෝ 12:28; හිතෝ 14:32; **7** ගීතා 26:3; හිතෝ 10:2; හිතෝ 13:6; **8** 2සාමු 17:23; එස්ත 7:10; ගීතා 9:15; හිතෝ 5:22; **9** උත් 31:7; යෙරෙ 39:18; යෙරෙ 40:4; **10** ගීතා 7:16; හිතෝ 1:32; දේශ 9:3; දේශ 10:8; **11** නික් 15:9; ගීතා 146:4; දේශ 9:5; ලූක් 12:20; **12** හිතෝ 10:28; හිතෝ 14:32; 2තෙස 1:9; **13** එස්ත 8:11; හිතෝ 10:28; දානි 3:27; දානි 6:23; **14** එස්ත 7:9; හිතෝ 21:18; දානි 6:24; **15** ක්‍රියා 20:30; 2කොරි 11:13; 2තිමෝ 2:18; 2පේතෘ 2:1; **16** හිතෝ 2:10; හිතෝ 9:10.

---

**හිතෝ 10:31*** මූ.අ., "ප්‍රඥාවේ පල." **11:1*** මෙහි සඳහන් කරන මිනුම් පඩි ගල්වලින් සාදන ලදි. වෙළෙන්දෝ තමන් විකුණන හා මිල දී ගන්නා භාණ්ඩ මනින පිණිස මෙම මිනුම් පඩි මල්ලක රැගෙන ගියෝය.

**හිතෝ 11:2*** 1සාමු 15:23හි පාදසටහන බලන්න.

**10** ධර්මිෂ්ඨයන්ගේ යහපත්කම නිසා නුවරේ වැසියෝ ප්‍රීතියට පත් වෙති.[1] දුෂ්ටයා විනාශ වන විටත් ඔවුහු ප්‍රීති ඝෝෂා නඟති.[2]

**11** ප්‍රතිපත්තිගරුකව ජීවත් වන අය ආශීර්වාද ලබන* විට නුවරක් කීර්තියට පත් වෙයි.[3] නමුත් දුෂ්ටයන්ගේ මුවින් පිට වන වචන නිසා එය බිඳ වැටෙයි.[4]

**12** අඥානයා* තම අසල්වැසියාව හෙළාදකියි.[5] නමුත් කාරණා හොඳින් අවබෝධ කරගත හැකි තැනැත්තා නිහඬව සිටියි.[6]

**13** නින්දා කරන්නා[7] රහස් හෙළි කරයි.[8] නමුත් විශ්වාසවන්ත තැනැත්තා රහසිගත කාරණා රකියි.[9]

**14** නැණවත් උපදෙස් නැති තැන ජනයා දුකට පත් වෙති.[10] නමුත් උපදේශකයන් රාශියක් සිටින තැන ගැලවීම තිබේ.[11]

**15** නාඳුනන කෙනෙකු වෙනුවෙන් ඇප දීමට පොරොන්දු වන තැනැත්තා ලොකු කරදරයක වැටෙයි.[12] නමුත් එසේ අතට අත දී ගිවිසුමක් ඇති කර නොගන්න තැනැත්තා අනවශ්‍ය ගැටලුවලින් නිදහස් වෙයි.

**16** ගුණවත් ස්ත්‍රියක් සියල්ලන්ගේ ගෞරවය දිනාගන්නීය.[13] එහෙත් බලහත්කාරකම් කරන අය රැස් කරගන්නේ වස්තුව පමණයි.

**17** ප්‍රේමණීයව* කටයුතු කරන තැනැත්තා බොහෝ ආශීර්වාද ලබයි.[14] එහෙත් කෲර තැනැත්තා තමා පිටට බොහෝ දුක් කරදර ගෙනෙයි.[15]

**18** දුෂ්ටයා උපයාගන්නේ වංචකමිනි.[16] නමුත් ධර්මිෂ්ඨකමින් වපුරන තැනැත්තා අවංකකමින් උපයාගන්නේය.[17]

**19** ධර්මිෂ්ඨ ප්‍රතිපත්ති තුළ ස්ථිර වී රැඳී සිටින අයට ජීවනය ලැබෙනවා නියතයි.[1] නමුත් වැරදි දේ පසුපස හඹා යන තැනැත්තාට අත් වන්නේ මරණයයි.[2]

**20** වංක සිත් ඇත්තන් යෙහෝවා දෙවිට පිළිකුලක්ය.[3] නමුත් නිර්දෝෂව ක්‍රියා කරන අය ඔහුට ප්‍රසන්නය.[4]

**21** දුෂ්ටයන් අතට අත දී එකිනෙකාට උදව් කළත් ඔවුන්ට දඬුවමින් නම් නිදහස් විය නොහැක.[5] එහෙත් ධර්මිෂ්ඨයන්ගේ දරුවෝ ගැලවෙන්නෝය.[6]

**22** සිහිබුද්ධියෙන් වැඩ නොකරන ස්ත්‍රියකගේ රූමත්කම ඌරෙකුගේ නාසයට දැමූ රන් ආභරණයකට සමානය.[7]

**23** ධර්මිෂ්ඨයන්ගේ සියලු ආශා යහපත්ය.[8] එහෙත් තම බලාපොරොත්තු ඉටු කරගන්න යන දුෂ්ටයන් උදහසට ලක් වේ.[9]

**24** අන්‍යයන්ට බොහෝ සේ බෙදා දෙන අයට තව තවත් ලැබෙයි.[10] දිය යුතු දේ නොදී සිටින තැනැත්තාට අඟහිඟකම් ඇති වෙයි.[11]

**25** ත්‍යාගශීලී තැනැත්තා තෘප්තියට පත් වෙයි.[12] අන්‍යයන්ව නොමසුරුව පෝෂණය කරන* තැනැත්තාවද නොඅඩුව පෝෂණය කරනු ලැබේ.[13]

**26** ධාන්‍ය සඟවා තබන වෙළෙන්දාව ජනයා හෙළාදකිති. නමුත් එය විකුණන තැනැත්තාට ආශීර්වාද ලැබේ.[14]

**27** නිතරම යහපත් දේ කිරීමට උනන්දුවෙන් සිටින තැනැත්තා ආශීර්වාද ලබයි.[15] එහෙත් වැරදි දේ කිරීමට උනන්දු වන අයට සිදු වන්නේ නපුරු දේමය.[16]

**28** තම වස්තුව කෙරෙහි විශ්වා-

**11 පරි.**
**1** එස්ත 8:16 හිතෝ 28:12
**2** නික් 15:21 විනි 5:31 එස්ත 9:22
**3** හිතෝ 14:34 හිතෝ 29:8
**4** එස්ත 9:1 යාකො 3:6
**5** 2සාමු 19:27 ගීතා 123:4 හිතෝ 18:8 2කොරි 12:20
**6** හිතෝ 17:27 1පේත්‍ර 2:23
**7** ලෙවී 19:16 ගීතා 101:5
**8** හිතෝ 20:19 හිතෝ 25:9 හිතෝ 26:22
**9** යොෂු 2:14 යොෂු 2:20 යෙරෙ 38:27 මතෙ 1:19
**10** 1රාජා 12:14 යෙසා 19:13
**11** හිතෝ 15:22 හිතෝ 20:18 හිතෝ 24:6
**12** හිතෝ 6:1 හිතෝ 17:18 හිතෝ 20:16 හිතෝ 22:26
**13** 1සාමු 25:39 හිතෝ 31:30 1තිමෝ 2:9 1පේත්‍ර 3:4
**14** හිතෝ 19:22 දානි 4:27 ලූක් 6:38 2කොරි 9:6
**15** යාකො 5:3
**16** යෝබ් 27:13 ගලා 6:7
**17** ගීතා 126:5 ගලා 6:8 යාකො 3:18

**2 තීරුව**
**1** හිතෝ 10:16 හිතෝ 12:28 හබ 2:4 ක්‍රියා 10:35 එළි 2:10
**2** හිතෝ 7:23 හිතෝ 8:36 රෝම 6:23
**3** ගීතා 18:26 හිතෝ 3:32 හිතෝ 6:15
**4** ගීතා 11:7 ගීතා 51:6 හිතෝ 15:8
**5** දේශ 8:13 එස 18:4
**6** උත් 22:12 1සාමු 30:19
**7** හිතෝ 9:13

**8** ගීතා 10:17; ගීතා 37:4; යෙසා 26:9; මතෙ 5:6; **9** හිතෝ 10:28; 2තෙස 1:9; හෙබ්‍රෙ 10:27; **10** ද්වි 15:10; ගීතා 112:9; හිතෝ 19:17; දේශ 11:1; **11** හග් 1:6; **12** යෝබ් 29:13; යෙසා 32:8; ක්‍රියා 20:35; 2කොරි 9:6; **13** හිතෝ 28:27; ලූක් 6:38; **14** උත් 41:56; යෝබ් 29:13; **15** හිතෝ 8:35; හිතෝ 12:2; ලූක් 2:14; **16** එස්ත 7:10; ගීතා 7:15; ගීතා 10:2; හිතෝ 17:11.

**හිතෝ 11:11*** හෝ, “අන් අයට ආශීර්වාද කරන.” **12*** හිතෝ 6:32හි පාදසටහන බලන්න. **17*** හෝ, “ලැදි ප්‍රේමය.”

**හිතෝ 11:25*** මූ.අ., “දිය බෙදාහරින.”

සය තබන්නාට අත් වන්නේ විනා-
ශයයි.[1] එහෙත් ධර්මිෂ්ඨයා සරුවට
වැඩෙන ගස් වැල් මෙන් වෙයි.[2]
**29** තමාගේ ගෙයි වැසියන් පිටට
ශාපයක් ගෙනෙන තැනැත්තා[3] කිසි
දෙයක් අත් කරගැනීමට සමත් වන්-
නේ නැත.*[4] අඥානයා ප්‍රඥාවන්තව
කටයුතු කරන තැනැත්තාට මෙහෙ-
කාරකම් කරයි.
**30** ධර්මිෂ්ඨයාගේ ක්‍රියා ජීවන
වෘක්ෂයකි.[5] අනුන්ගේ ජීවිත ගලවන
තැනැත්තා ප්‍රඥාවන්තයෙකි.[6]
**31** ධර්මිෂ්ඨයාට තම ක්‍රියාවලට
අනුව ප්‍රතිඵල දෙනු ලැබේ.[7] එසේ-
නම්, දුෂ්ටයාටත් පව්කාරයාටත් තම
ක්‍රියාවලට අනුව ඊට වඩා කොපමණ
ප්‍රතිඵල විඳින්න සිදු වෙයිද?[8]

**12** හික්මවීමට ප්‍රිය කරන
තැනැත්තා දැනුමට ප්‍රිය
කරන්නේය.[9] එහෙත් අවවාදයට
ද්වේෂ කරන්නාට කල්පනා ශක්තිය
නැත.[10]
**2** යහපත් කෙනෙකුට යෙහෝවා
දෙවිගේ අනුමැතිය ලැබේ.[11] නමුත්
කූට අදහස් ඇති අයව දෙවි දුෂ්ටයන්
ලෙස විනිශ්චය කරයි.[12]
**3** දුෂ්ට දේ කර කිසිවෙකුට ස්ථි-
රව සිටීමට නොහැක.[13] එහෙත් ධර්-
මිෂ්ඨයා ගැඹුරට මුල් බැස ඇති
ශක්තිමත් ගසක් මෙන් කිසිදා නො-
සෙල්වෙන්නේය.[14]
**4** හොඳ බිරිඳක් ඇගේ ස්වාමිපුරු-
ෂයාට ඔටුන්නකි.[15] නමුත් නින්දිතව
හැසිරෙන තැනැත්තියකගේ පුරුෂයා
ඇටකටු දිරා යන්නාක් මෙන් වේදනා
විඳින්නේය.[16]
**5** ධර්මිෂ්ඨ අයගේ සිතුවිලි යුක්ති-
සහගතය.[17] එහෙත් දුෂ්ටයන්ගේ මඟ
පෙන්වීම් රැවටිලිකාරය.[18]
**6** දුෂ්ටයා තම වචන හසුරුවන්-
නේ නිදොස් අයගේ ලේ වගුරුවන්-
නයි.[19] එහෙත් අවංක තැනැත්තා
පවසන වචනවලින් ගැලවීම අත්
වෙයි.[20]
**7** දුෂ්ටයාව පාගා දමා නැති කර
දමයි.[1] එහෙත් ධර්මිෂ්ඨයාගේ පෙළ-
පත සැමදා පවතින්නේය.[2]
**8** නැණවත් ලෙස වචන හසුරුවන
මිනිසා ප්‍රශංසාව ලබයි.[3] නමුත් කපටි
සිතක් ඇති තැනැත්තාව හෙළාදකිනු
ලබයි.[4]
**9** කුසට අහරක්වත් නැති විටදී
පවා තමා ගැනම පුරසාරම් දොඩන
තැනැත්තෙකුට වඩා එක් සේවකයෙ-
කුවත් සිටින නිහතමානී කෙනෙකු
හොඳය.[5]
**10** ධර්මිෂ්ඨයා, තමා ඇති කරන
සතා ගැන පවා සැලකිලිමත් වෙයි.[6]
එහෙත් දුෂ්ටයාගේ කරුණාවන්තම
ක්‍රියාව පවා කෲරයි.[7]
**11** තම ඉඩමේ වගා කරන
තැනැත්තා කෑම කා තෘප්තියට පත්
වෙයි.[8] එහෙත් වැදගැම්මකට නැති
දේවල් ලුහුබඳින තැනැත්තා අඥාන-
යෙකි.*[9]
**12** දුෂ්ටයා නපුරු අයගේ දැලට
හසු වූ දේට ආශා කරයි.[10] එහෙත් ධර්-
මිෂ්ඨයාගේ මුල සවිමත් වෙයි.[11]
**13** නපුරු තැනැත්තාගේ දුෂ්ට
කතා ඔහුවම හසු කරගනී.[12] එහෙත්
ධර්මිෂ්ඨයා දුක් වේදනාවලින් ගැල-
වෙයි.[13]
**14** මිනිසෙකු තම මුවින් පිට
කරන වචන නිසා සතුටක් ලබයි.[14]
ඔහුගේ ක්‍රියාවලට අනුව ඔහුට ප්‍රති-
ඵල ලැබෙන්නේය.[15]
**15** අඥානයා තමා කරන දේ හරි-
යයි සිතයි.[16] නමුත් උපදෙස්වලට
සවන් දෙන්නා ප්‍රඥාවන්තයෙකි.[17]

**11 පරි.**
**1** යෝබ් 31:24, ගීතා 52:7, ගීතා 62:10
**2** ගීතා 1:3, ගීතා 52:8, යෙසා 60:21, යෙරෙ 17:8
**3** උත් 34:30, 1සාමු 25:3
**4** හොෂෙ 8:7
**5** හිතෝ 15:4, 2කොරි 3:3
**6** හිතෝ 14:25, දානි 12:3, මතෙ 4:19, රෝම 10:14, 1කොරි 9:20, යාකො 5:20
**7** හිතෝ 4:13, යෙරෙ 39:18
**8** එස 18:24, එස 33:9, 2තෙස 1:6, 1පේතෘ 4:18

**12 පරි.**
**9** හිතෝ 3:11, හිතෝ 4:13, හිතෝ 23:12
**10** ගීතා 32:9, යෙසා 1:3
**11** ගීතා 112:6, හිතෝ 15:9
**12** ද්වි 25:1, 1රාජා 8:32, යෙසා 32:5
**13** ගීතා 37:10, ගීතා 37:38
**14** එෆී 3:17, කොලො 2:7
**15** හිතෝ 18:22, හිතෝ 19:14, 1කොරි 11:7
**16** උත් 39:10, 1රාජා 21:25
**17** පිලි 4:8
**18** ගීතා 140:2, හිතෝ 6:18, හිතෝ 11:23, යෙරෙ 4:14, මතෙ 26:4
**19** 2සාමු 17:1, ගීතා 10:9, මීකා 7:2, ක්‍රියා 23:12
**20** එස්ත 4:16, එස්ත 7:4, හිතෝ 14:3, හිතෝ 15:2

**2 තීරුව**
**1** එස්ත 9:10, ගීතා 37:10, හිතෝ 14:11
**2** ගණන් 25:13, 2සාමු 7:16, හිතෝ 24:3, මතෙ 7:24

**3** උත් 41:39; 1සාමු 16:18; ලූක් 16:8; යොහ 7:46; **4** 1සාමු 25:17; මතෙ 27:4; ක්‍රියා 12:23; **5** හිතෝ 13:7; ලූක් 14:11; **6** උත් 33:13; නික් 23:12; ද්වි 22:4; ද්වි 22:10; ද්වි 25:4; යෝනා 4:11; **7** උත් 49:6; විනි 1:7; 1සාමු 11:2; **8** ගීතා 128:2; හිතෝ 28:19; එෆී 4:28; **9** හිතෝ 6:32; මතෙ 16:26; **10** යෙරෙ 5:26; මීකා 7:2; **11** මතෙ 5:39; මතෙ 5:41; **12** 1රාජා 2:23; ගීතා 5:6; දේශ 5:6; දානි 6:24; **13** 2සාමු 4:9; මතෙ 12:37; 2පේතෘ 2:9; **14** හිතෝ 18:20; **15** යෙසා 3:11; මතෙ 16:27; **16** හිතෝ 3:7; හිතෝ 26:12; ගලා 6:3; **17** හිතෝ 1:5; දේශ 4:13.

**හිතෝ 11:29*** මූ.අ., "අත් කරගන්නේ සුළං."

**හිතෝ 12:11*** හිතෝ 6:32හි පාදසටහන බලන්න.

16 අඥානයා තමාට ගැටලුවක් සිදු වූ දවසේම කෝපය පිට කරයි.[1] එහෙත් බුද්ධිමත්ව කටයුතු කරන තැනැත්තාට අගෞරව කළත් ඔහු නිහඬව සිටියි.[2]

17 විශ්වාසවන්ත සාක්ෂිකරුවෙක් සත්‍යය පවසයි.[3] නමුත් බොරු සාක්ෂිකරුවෙකුගේ මුවින් නික්මෙන්නේ රැවටිලිකාර වදන්මය.[4]

18 නොසැලකිලිමත් ලෙස කතා කරන තැනැත්තා කඩුවෙන් අනින්නාක් මෙන් වචන පිට කරයි.[5] නමුත් ප්‍රඥාවන්තයාගේ වචන සුවය ගෙන දෙයි.[6]

19 සත්‍යය කතා කරන[7] තැනැත්තා සදහටම පවතියි.[8] නමුත් බොරු කියන දිව සැණෙකින් නිහඬ කරනු ලබයි.[9]

20 උගුල් අටවන්නාගේ සිත වංචාවෙන් පිරී ඇත.[10] එහෙත් සමාදානයට ප්‍රිය කරන තැනැත්තාගේ සිත ප්‍රීතියෙන් පිනා යයි.[11]

21 ධර්මිෂ්ඨයාට කිසි අනතුරක් සිදු වන්නේ නැත.[12] නමුත් දුෂ්ටයා බොහෝ විපත්තිවලට මුහුණ දෙයි.[13]

22 බොරු කියන දිව යෙහෝවා දෙවිට පිළිකුලක්ය.[14] නමුත් විශ්වාසවන්තව ක්‍රියා කරන අය ඔහුට ප්‍රසන්නය.[15]

23 සිහිබුද්ධියෙන් කටයුතු කරන අය තම දැනුම ප්‍රදර්ශනය නොකරයි.[16] නමුත් අඥානයා තම මෝඩකම ප්‍රසිද්ධියේ කියයි.[17]

24 උත්සාහයෙන් වැඩ කරන තැනැත්තා හොඳ පාලකයෙක් වන්නේය.[18] එහෙත් අලසයන්ට සිදු වන්නේ වහලුන් මෙන් වැඩ කරන්නයි.[19]

25 මිනිසෙකු තම සිතේ ඇති කනස්සල්ල නිසා මානසිකව වැටෙයි.[20] නමුත් දිරිගන්වනසුලු වචනයකින් ඔහුගේ සිත ප්‍රීතිමත් වෙයි.[21]

26 ධර්මිෂ්ඨයා තම වටපිටාව ගැන සුපරීක්ෂාකාරීව සිටියි. නමුත් දුෂ්ටයෝ තමන් යන ගමන නිසා මංමුළා වී සිටිති.[22]

27 අලසයාට දඩමස් කන්න ලැබෙන්නේ නැත.[1] එහෙත් උත්සාහවන්තකම මිනිසෙකුගේ වස්තුවයි.

28 ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීමෙන් ජීවනය අත් වෙයි.[2] ඒ මඟෙහි ගමන් කරන්නාට කිසිදා මරණය අත් නොවෙයි.[3]

13 පියාගෙන් හික්මවීම් ලබන පුත්‍රයෙකු ප්‍රඥාවන්තය.[4] නමුත් සමච්චල් කරන්නෙක් කිසිදා තරවටුවක් පිළිගන්නේ නැත.[5]

2 මිනිසෙකු තම මුවින් පිට කරන වචන නිසා හොඳ ප්‍රතිඵල අද්දකියි.[6] නමුත් ද්‍රෝහීව කටයුතු කරන අයගේ එකම ආශාව වන්නේ අන් අයට හානි පමුණුවීමයි.[7]

3 තම දිව පාලනය කරගන්නා තම ජීවිතය ආරක්ෂා කරගනියි.[8] නමුත් පාලනයකින් තොරව කතා කරන තැනැත්තාට අත් වන්නේ විනාශයයි.[9]

4 අලසයාට දහසකුත් ආශාවන් තිබුණත් ඔහුට ඒ කිසිවක් ලැබෙන්නේ නැත.[10] නමුත් උත්සාහවන්තයාගේ ආශාවන් ඉෂ්ට වෙයි.[11]

5 ධර්මිෂ්ඨයා බොරුව හෙළාදකියි.[12] එහෙත් දුෂ්ටයා නින්දාසහගතව හැසිර ලැජ්ජාවට පත් වෙයි.[13]

6 නිර්දෝෂ තැනැත්තාගේ ධර්මිෂ්ඨ හැසිරීම ඔහුට ආරක්ෂාවකි.[14] නමුත් පව්කාරයාගේ දුෂ්ටකම් ඔහුව විනාශයට පමුණුවයි.[15]

7 කිසිවක් නැති නමුත් තමන් පොහොසත්යයි පෙන්වන අය සිටිති.[16] බොහෝ වටිනා දේ තිබුණත් තමන්ට අගහිඟකම් ඇති බව පෙන්වන අයද සිටිති.

8 ධනවතාට තම ජීවිතය ගලවාගැනීමට තම වස්තුව භාර දෙන්න සිදු

**12 පරි.**

1 හිතෝ 29:11
2 හිතෝ 11:13
3 1සාමු 22:14
4 හිතෝ 6:19, හිතෝ 14:5, මතෙ 26:59
5 එෆී 6:4
6 හිතෝ 10:21, හිතෝ 16:24
7 එෆී 4:25
8 1පේතෘ 3:10
9 හිතෝ 19:9, ක්‍රියා 5:3
10 හිතෝ 26:24, ආනි 6:5, මාක් 7:23
11 මතෙ 5:9, මතෙ 18:15
12 ගීතා 91:10, හිතෝ 1:33, හිතෝ 13:6
13 හිතෝ 1:31, යෙසා 48:22, හබ 2:16
14 ගීතා 5:6, හිතෝ 6:16, හිතෝ 6:17, එළි 21:8
15 හිතෝ 15:8
16 හිතෝ 10:19
17 හිතෝ 13:16, හිතෝ 15:2
18 උත් 39:4, 1රාජා 11:28, හිතෝ 17:2, හෙබ්‍රෙ 6:11
19 හිතෝ 19:15
20 නෙහෙ 2:2, ගීතා 38:6, හිතෝ 15:13, මතෙ 6:25
21 හිතෝ 13:12, හිතෝ 16:24, යෙසා 50:4, සෙක 1:13
22 හිතෝ 11:18

**2 තීරුව**

1 හිතෝ 13:4, හිතෝ 26:15
2 ගීතා 37:27, හිතෝ 10:2, හිතෝ 10:7, හබ 2:4, රෝම 5:21, 1පේතෘ 3:10
3 හිතෝ 10:16, හිතෝ 11:19

**13 පරි.**

4 හිතෝ 15:5, හෙබ්‍රෙ 12:7
5 1සාමු 2:25, හිතෝ 9:7
6 හිතෝ 12:14, හිතෝ 18:20

---

**7** ගීතා 140:11; හිතෝ 4:17; හබ 2:8; එළි 16:6; **8** ගීතා 39:1; ගීතා 141:3; හිතෝ 21:23; **9** හිතෝ 10:19; හිතෝ 12:13; හිතෝ 18:7; මතෙ 12:36; යාකො 1:26; යාකො 3:9; යූද් 16; **10** හිතෝ 12:24; හිතෝ 26:13; **11** හිතෝ 10:4; හිතෝ 11:25; **12** ගීතා 119:163; හිතෝ 8:13; හිතෝ 30:8; එෆී 4:25; **13** 2පේතෘ 3:3; **14** ගීතා 25:21; හිතෝ 12:21; හිතෝ 12:28; **15** 2ලේක 28:23; ගීතා 140:11; **16** හිතෝ 12:9; එළි 3:17.

වෙයි.[1] එහෙත් අගහිඟකම් ඇති කෙනෙකුට විරුද්ධව කිසිවෙක් සැරපරුෂ වචනයක්වත් නොපවසයි.[2]

**9** ධර්මිෂ්ඨයාගේ පහනෙන් ලැබෙන එළිය නිසා ඔහු සතුටක් අද්දකියි.[3] නමුත් දුෂ්ටයන්ගේ පහන නිවා දමනු ලැබේ.[4]

**10** අහංකාරකම දබරවලට මුල පුරයි.[5] නමුත් එකිනෙකාගෙන් අදහස් විමසන විට ප්‍රඥාවන්තව කටයුතු කළ හැක.[6]

**11** වෙහෙස මහන්සියක් නොමැතිව උපයාගන්න තැනැත්තාගේ වස්තුව අඩු වී යන්නේය.[7] නමුත් දැතේ වීර්යයෙන් උපයාගන්නාගේ වස්තුව තව තවත් වැඩි වන්නේය.[8]

**12** බලාපොරොත්තු වන දේ ප්‍රමාද වූ විට සිත කලකිරෙන්නේය.[9] නමුත් ආශා වන දේ ලැබෙන විට එය ජීවන වෘක්ෂයකි.[10]

**13** ණයකරුවෙකු නීතියට එකඟව කටයුතු නොකළොත්[11] තමන් ඇප වූ දේ පවා පැහැරගනු ලැබේ. එහෙත් දෙවිගේ ආඥාවට ගරු කරන අය ආශීර්වාද ලබනු ඇත.[12]

**14** ප්‍රඥාවන්තයාගේ නීතිය ජීවනයේ උල්පතකි.[13] එය මාරාන්තික උගුල්වලින් ආරක්ෂාව ලබා දෙයි.[14]

**15** වටහාගැනීමේ ශක්තිය වැඩි කරගන්නා සිත් දිනාගනියි.[15] එහෙත් ද්‍රෝහිකම් කරන අයගේ මඟ කටුකයි.[16]

**16** සිහිකල්පනාව ඇති සියලුදෙනා දැනුම් තේරුම් ඇතුව කටයුතු කරති.[17] නමුත් අඥානයා සෑම තැනම මෝඩකම පතුරුවයි.[18]

**17** දුෂ්ට පණිවිඩකරුවෙක් හානිකර දේ පවසයි.[19] නමුත් විශ්වාසවන්ත පණිවිඩකරුවෙක් සුවදායක වචන පවසයි.[20]

**18** හික්මවීමට පිටු පාන්නා දිළිඳුකමටත් අගෞරවයටත් පත් වෙයි.[21] නමුත් අවවාදය පිළිගන්නාට ගෞරවය හිමි වෙයි.[22]

**19** යමෙක් තම ආශාව ඉෂ්ට කරගත් විට තෘප්තියට පැමිණෙයි.[1] නපුරු මාර්ගයෙන් ඉවත් වීම අඥානයාට පිළිකුලකි.[2]

**20** ප්‍රඥාවන්ත අය සමඟ ඇසුරු කරන්න. එවිට ඔබත් ප්‍රඥාවන්ත වන්නෙහිය.[3] නමුත් අඥානයන්ව ඇසුරු කරන්නා විපතට පත් වෙයි.[4]

**21** විපත පව්කාරයන්ව ලුහුබැඳ එයි.[5] නමුත් ධර්මිෂ්ඨයන්ට බොහෝ ආශීර්වාද ලැබෙන්නේය.[6]

**22** යහපත් තැනැත්තා තම දරුවන්ගේ දරුවන්ටත් උරුමයක් තබා යයි. පව්කාරයන්ගේ වස්තුව හිමි වන්නේ ධර්මිෂ්ඨයන්ටයි.[7]

**23** අගහිඟකම් තිබුණත් මහන්සි වී ගොවිතැන් කිරීමෙන් බොහෝ පලදාව ලැබෙයි.[8] එහෙත් අසාධාරණව කටයුතු කරන අය විනාශයට පත් වන්නෝය.[9]

**24** වේවැල* පාවිච්චි නොකරන්නා තම දරුවාට වෛර කරයි.[10] එහෙත් තම දරුවාට ප්‍රේම කරන්නා අවශ්‍ය හික්මවීම් දීමට මැළි නොවෙයි.[11]

**25** ධර්මිෂ්ඨයා කා බී තෘප්තිමත් වෙයි.[12] නමුත් දුෂ්ටයා කුසගින්නෙන් පෙළෙයි.[13]

**14** ප්‍රඥාවන්ත ස්ත්‍රියක් ඇගේ පවුල ගොඩනඟා ගන්නීය.[14] නමුත් අඥාන තැනැත්තිය තම දෑතින්ම එය බිඳ දමන්නීය.[15]

**2** ප්‍රතිපත්තිගරුක ජීවිතයක් ගත කරන අයට යෙහෝවා දෙවි කෙරෙහි ගරුබියක් ඇත.[16] නමුත් වංක තැනැත්තා දෙවිව සුළු කොට තකන්නේය.[17]

**3** අඥානයා උද්ධච්ච ලෙස කතා කරමින් අනුන්ට පහර දෙන පිණිස

**13 පරි.**
**1** නික් 21:30; යෙරෙ 41:8
**2** 2රාජා 24:14; යෙරෙ 39:10
**3** ගීතා 97:11
**4** යෝබ් 21:17; හිතෝ 20:20; හිතෝ 24:20
**5** විනි 8:1; විනි 12:1; හිතෝ 11:2; හිතෝ 21:24
**6** හිතෝ 24:6; ක්‍රියා 15:6
**7** හිතෝ 28:8; දේශ 5:14; යෙරෙ 17:11
**8** ගීතා 128:2
**9** ගීතා 69:3; ගීතා 143:7
**10** උත් 21:7; ලූක් 2:30; පිලි 1:23
**11** 2ලේක 36:16; හිතෝ 13:18
**12** ගීතා 19:11; 2යොහ 8
**13** හිතෝ 8:35; හිතෝ 16:22; හිතෝ 24:14
**14** හිතෝ 14:27
**15** 1සාමු 18:14; ලූක් 2:52
**16** හිතෝ 4:19; රෝම 6:21
**17** හිතෝ 14:8; හිතෝ 14:15; හිතෝ 14:18; මතෙ 10:16
**18** 1සාමු 25:25
**19** 2සාමු 4:10
**20** හිතෝ 25:25; 2කොරි 5:20; 2තිමෝ 2:2
**21** හිතෝ 15:32; හෙබ්‍රෙ 12:25
**22** ගීතා 141:5; හෙබ්‍රෙ 12:11

**2 තීරුව**
**1** 1රාජා 1:48
**2** හිතෝ 29:27; ආමො 5:10
**3** හිතෝ 22:17; ක්‍රියා 4:13; හෙබ්‍රෙ 10:24
**4** උත් 34:2
**5** උත් 4:7; ද්වි 28:20
**6** යෙසා 3:10; රෝම 2:10
**7** ද්වි 6:11; යෝබ් 27:17; යෙසා 61:6
**8** හිතෝ 12:11; හිතෝ 27:18; 2කොරි 9:6
**9** හිතෝ 28:19
**10** 1සාමු 3:13; 1රාජා 1:6; හිතෝ 29:15

**11** ද්වි 6:7; හිතෝ 3:12; හිතෝ 19:18; හිතෝ 22:15; හිතෝ 23:14; එෆී 6:4; හෙබ්‍රෙ 12:6; **12** ගීතා 34:10; ගීතා 37:25; හෙබ්‍රෙ 13:5; **13** ද්වි 28:48; යෙසා 65:13; **14 පරි.** **14** රූත් 4:11; හිතෝ 24:3; හිතෝ 31:10; හිතෝ 31:26; **15** හිතෝ 9:13; **16** යෝබ් 1:1; ක්‍රියා 10:35; **17** ද්වි 32:15; ලූක් 10:16.

**හිතෝ 13:24*** යම් දඬුවමක් හෝ නිවැරදි කිරීමක් සංකේතවත් කරයි.

තම මුඛය වේවැලක් සේ යොදාගනී.[1]
එහෙත් ප්‍රඥාවන්තයා තම මුවින් ජීවි-
තය ආරක්ෂා කරගනියි.[2]
**4** ගවයන් නැති තැන ගවම-
ඩුව පිරිසිදුය. එහෙත් සරු අස්-
වැන්නක් ලැබෙන්නේ ගවයෙකුගේ
ශක්තියෙනි.
**5** විශ්වාසවන්ත සාක්ෂිකරුවෙක්
බොරු නොකියයි.[3] නමුත් බොරු
සාක්ෂිකරුවෙකුගේ මුවින් පිට වන්-
නේ බොරුමය.[4]
**6** සමච්චල් කරන්නා ප්‍රඥාව සෙව්-
වත් ඔහුට එය සම්බ නොවේ. නමුත්
කාරණා හොඳින් තේරුම්ගන්න
තැනැත්තාට දැනුම ලබාගැනීම පහ-
සුය.[5]
**7** අඥානයාගෙන් ඈත් වන්න.[6]
මන්ද ඔහුගේ මුවින් ඔබට දැනුම
ලබාගත නොහැක.[7]
**8** සිහිබුද්ධිය ඇති තැනැත්තාට
තමන් යන මඟ ගැන හොඳ වැටහී-
මක් තිබේ.[8] නමුත් අඥානයා තම
මෝඩකම නිසා මුළාව ගොස් අන්‍ය-
යන්වත් මුළා කරයි.[9]
**9** අඥානයෝ තමුන් කරන වැරදි
සැහැල්ලුවට ගනිති.[10] එහෙත් ප්‍රති-
පත්තිගරුක අය අතරේ සාමකාමී
සබඳතා පවතී.[11]
**10** යමෙකුගේ සිතේ තිබෙන වේද-
නාව දන්නේ ඔහු පමණි.[12] ඔහුගේ
සිතට දැනෙන සතුට පවා වෙනත්
කෙනෙකුට විස්තර කළ නොහැකි
තරම්ය.
**11** දුෂ්ටයන්ගේ නිවස විනාශ
කරනු ලැබේ.[13] නමුත් ප්‍රතිපත්ති-
ගරුක අයගේ නිවස දියුණු වෙයි.[14]
**12** මිනිසාට නිවැරදියයි පෙනෙන
මඟක් ඇත.[15] එහෙත් එය අවසන්
වන්නේ මරණයෙනි.[16]
**13** යමෙකු සිනාසුණත් ඔහුගේ
සිතේ ලොකු වේදනාවක් තිබිය
හැක.[17] විනෝද වීම ශෝකයෙන් කෙ-
ළවර විය හැක.[18]
**14** අවිශ්වාසවන්ත තැනැත්තා
තමා කරන දේට අනුව ප්‍රතිඵල
ලබන්නේය.[1] යහපත් තැනැත්තාද
තමා කරන දේට අනුව ප්‍රතිඵල
නෙළාගන්නේය.[2]
**15** අද්දැකීම් අඩු තැනැත්තා
අනුන් පවසන සෑම දෙයක්ම විශ්වාස
කරයි.[3] නමුත් සිහිබුද්ධිය ඇති අය
තමන් ගත යුතු පියවර ගැන හොඳින්
කල්පනා කරයි.[4]
**16** ප්‍රඥාවන්තයා දෙවි කෙරෙහි
ගරුබියක් ඇති නිසා නපුරෙන් ඈත්
වෙයි.[5] එහෙත් අඥානයා උදහස් වී
තම මතයේම එල්බගෙන සිටියි.[6]
**17** කෝප වීමට ඉක්මන් වන
තැනැත්තා මෝඩයෙකු ලෙස
හැසිරෙයි.[7] හොඳ කල්පනා ශක්තියක්
තිබෙන මිනිසා අනුන්ගේ වෛරයට
ලක් වෙයි.[8]
**18** අද්දැකීම් අඩු අය හැසිරෙන්නේ
මෝඩයන් ලෙසයි.[9] එහෙත් සිහිබුද්-
ධිය ඇති තැනැත්තා දැනුම ඔටුන්-
නක් මෙන් පළඳින්නේය.[10]
**19** දුෂ්ටයා යහපත් මිනිසා ඉදිරි-
යේ දණ නමන්නේය.[11] ඔහුට ධර්මිෂ්-
ඨයාගේ දොරටු ඉදිරියේ දණ නමන්න
සිදු වෙයි.
**20** දිළින්දාගේ අසල්වැසියෝ පවා
ඔහුව හෙළාදකින්නෝය.[12] නමුත්
පොහොසතා මිතුරන්ගෙන් වට වී
සිටින්නේය.[13]
**21** තම අසල්වැසියාව සුළු කොට
තකන තැනැත්තා වරදකරුවෙකි.[14]
අගහිඟකම් තිබෙන කෙනෙකුට කරු-
ණාව දක්වන තැනැත්තා සන්තෝෂ-
වන්තය.[15]
**22** නපුරක් කිරීමට මාන බලන
තැනැත්තා මුළාව යන්නේය.[16]
එහෙත් යහපත කිරීමට උත්සාහ
කරන්නා සියල්ලන්ගේ ප්‍රේමය* සහ
විශ්වාසය දිනාගන්නේය.[17]
**23** වෙහෙස මහන්සි වී කරන සෑම
වැඩකින්ම ප්‍රයෝජන අත් වෙයි.[18]

**14 පරි.**
**1** 1සාමු 2:3; 2පේතෘ 2:18
**2** හිතෝ 12:6; රෝම 10:10
**3** හිතෝ 12:17; 2කොරි 6:7
**4** නික් 20:16; හිතෝ 6:19; හිතෝ 19:5
**5** හිතෝ 18:15
**6** හිතෝ 13:20
**7** හිතෝ 1:29
**8** ගීතා 111:10; එෆී 5:17
**9** හිතෝ 11:18; හිතෝ 14:12; ලූක් 12:19; 1කොරි 1:20
**10** හිතෝ 10:23; හිතෝ 30:20; යෙරෙ 6:15; යූද් 18
**11** 1කොරි 1:10
**12** 1සාමු 1:10; 2රාජා 4:27; හිතෝ 15:13
**13** හිතෝ 3:33; හිතෝ 12:7; හිතෝ 21:12
**14** ගීතා 112:3; හිතෝ 13:22
**15** හිතෝ 30:12
**16** හිතෝ 16:25; රෝම 6:21
**17** දේශ 2:2
**18** දේශ 7:2; දේශ 7:4

**2 තීරුව**
**1** හිතෝ 1:31; හිතෝ 1:32; මතෙ 6:16; 2පේතෘ 2:13
**2** 2කොරි 1:12; ගලා 6:4; ගලා 6:8
**3** හිතෝ 27:12; රෝම 16:18
**4** නෙහෙ 6:2; ආමො 5:13
**5** උත් 39:12; 1තෙස 5:22
**6** 1සාමු 25:11; 1රාජා 19:2
**7** හිතෝ 12:16; හිතෝ 16:32
**8** යොහ 15:19
**9** හිතෝ 3:35; යෙරෙ 16:19; යෙරෙ 44:17
**10** ගීතා 141:5; හිතෝ 3:22; හිතෝ 4:9
**11** උත් 42:6; යෙසා 60:14
**12** යෝබ් 30:10; හිතෝ 19:7
**13** එස්ත 5:10; හිතෝ 19:4
**14** හිතෝ 11:12

**15** ගීතා 41:1; හිතෝ 19:17; හිතෝ 28:27; යෙසා 58:7; එස 18:7; **16** උත් 4:12; යෙරෙ 43:7; **17** උත් 24:27; යෝබ් 42:10; ගීතා 25:10; **18** හිතෝ 12:24; හිතෝ 28:19.

**හිතෝ 14:22*** හෝ, "ළැදි ප්‍රේමය."

එහෙත් කතාවටම වැටුණොත් අත් වන්නේ අගහිඟකම් පමණි.

**24** ප්‍රඥාවන්තයාගේ වස්තුව ඔහුට ඔටුන්නක් මෙන් වෙයි. එහෙත් මෝඩයාගේ ක්‍රියාවන් තව තවත් මෝඩකම්වලට මඟ පාදයි.[1]

**25** සැබෑ සාක්ෂිකරුවෙක් ජීවිත බේරාගනී.[2] එහෙත් බොරු සාක්ෂිකරුවෙකු පවසන්නේ බොරුමය.[3]

**26** යෙහෝවා දෙවි කෙරෙහි ගරුබිය ඇති අයට මහත් නිසැකකමක් ඇත.[4] ඔහුගේ පුත්‍රයන්ටද ආරක්ෂාවක් ලැබෙනු ඇත.[5]

**27** යෙහෝවා දෙවි කෙරෙහි ගරුබිය දැක්වීමෙන් ජීවනය අත් වෙයි.*[6] මාරාන්තික උගුල්වලින් ආරක්ෂා වීමටද එය මඟ සලසා දෙයි.[7]

**28** රජෙකු යටතේ බොහෝ පුරවැසියන් සිටින්නේ නම් ඔහුට මහත් ගෞරවයක් හිමි වෙයි.[8] එහෙත් යටත්වැසියන් අඩු වූ විට පාලකයෙකුගේ බලය බිඳ වැටෙයි.[9]

**29** ඉක්මනින් කෝප නොවන්නා හොඳ වටහාගැනීමේ හැකියාවක් ඇති කෙනෙකි.[10] එහෙත් ඉවසීම නැති තැනැත්තා තම මෝඩකම ප්‍රදර්ශනය කරයි.[11]

**30** සන්සුන් මනසක් ගතට සුවයකි.[12] නමුත් ඊර්ෂ්‍යාසහගත සිතුවිලි නිසා ඇටකටු දිරා යයි.[13]

**31** අසරණයාට වංචා කරන්නා තමාට ජීවිතය දුන් තැනැත්තාට නින්දා කරන්නේය.[14] නමුත් දිළින්දාට කරුණාව දක්වන්නා ඔහුව ප්‍රශංසාවට පත් කරන්නේය.[15]

**32** දුෂ්ටයාගේ නපුරු ක්‍රියාවන් නිසා ඔහුව පහත් කරනු ලැබේ.[16] එහෙත් ධර්මිෂ්ඨයාගේ විශ්වාසවන්තකම ඔහුට ආරක්ෂාවකි.[17]

**33** තේරුම්ගැනීමේ හැකියාව ඇති තැනැත්තාගේ ප්‍රඥාව තිබෙන්නේ තම සිත තුළය.[18] එහෙත් අඥානයා තමා ප්‍රඥාවන්තයෙකුයයි සෑම තැනම ප්‍රකාශ කරයි.

**34** ධර්මිෂ්ඨකම නිසා ජාතියක් ගෞරවයට පත් වෙයි.[1] නමුත් පාපතර ක්‍රියා නිසා ජන සමූහයක්ම නින්දාවට ලක් වෙයි.[2]

**35** හොඳ අවබෝධයකින් වැඩ කරන සේවකයෙකු රජුට ගෙන දෙන්නේ මහත් සතුටකි.[3] එහෙත් ලැජ්ජාසහගතව හැසිරෙන තැනැත්තා ඔහුගේ උදහසට ලක් වෙයි.[4]

**15** මෘදු පිළිතුරකින් කෝපය නිවී යයි.[5] නමුත් සිත රිදවන වචනයකින් තරහ උපදවයි.[6]

**2** ප්‍රඥාවන්තයන්ගේ දිව දැනුම පතුරවන්නේ ප්‍රයෝජනදායක ලෙසය.[7] එහෙත් අඥානයන්ගේ මුවින් පිට වන්නේ මෝඩ කතාමය.[8]

**3** යෙහෝවා දෙවි සෑම දෙයක්ම දකින්නේය.[9] ඔහු යහපත් අය දෙසද අයහපත් අය දෙසද නෙත් යොමා සිටින්නේය.[10]

**4** සන්සුන්ව දිව හසුරුවන තැනැත්තා දිවි රැක දෙයි.*[11] එහෙත් හානිකර ලෙස දිව හසුරුවන තැනැත්තා සිත් බිඳ දමයි.[12]

**5** අඥාන තැනැත්තා තම පියාගේ හික්මවීම් සුළු කොට තකන්නේය.[13] එහෙත් අවවාදය පිළිගන්නා සිහිබුද්ධිය ඇති තැනැත්තෙකි.[14]

**6** ධර්මිෂ්ඨයාගේ ගබඩාවේ කිසි හිඟයක් නැත.[15] එහෙත් දුෂ්ටයා නෙළන පලදාවෙන් අත් වන්නේ විනාශයයි.[16]

**7** ප්‍රඥාවන්තයාගේ දිව දැනුම දසත පතුරුවයි.[17] එහෙත් අඥානයාගේ සිත දැනුමට ප්‍රිය නොකරන්නේය.[18]

**14 පරි.**
**1** 1සාමු 25:25, හිතෝ 27:22
**2** හිතෝ 11:30, ක්‍රියා 20:21, ක්‍රියා 26:20, යාකො 5:20
**3** හිතෝ 14:5, 1තිමෝ 4:2, 2තිමෝ 2:18
**4** ගීතා 34:9, මලා 3:16, ක්‍රියා 9:31
**5** හිතෝ 18:10, යෙසා 26:20, යෙරෙ 15:11, රෝම 8:31
**6** හිතෝ 19:23, යෙසා 33:6
**7** හිතෝ 22:5, දේශ 7:26
**8** 1රාජා 4:21, පිලි 2:10
**9** 2රාජා 13:7
**10** හිතෝ 17:27, හිතෝ 29:11, යාකො 1:19
**11** හිතෝ 25:28, දේශ 7:9
**12** හිතෝ 4:23
**13** උත් 37:4, 1සාමු 18:8
**14** ද්වි 24:15, ගීතා 12:5, හිතෝ 17:5, දේශ 5:8, රෝම 15:3
**15** මතෙ 19:21, ලූක් 18:43
**16** යෝබ් 27:13, යෝබ් 27:20, ගීතා 37:20, 1තෙස 5:3
**17** හිතෝ 2:7, හිතෝ 10:9
**18** ගීතා 49:3, හිතෝ 15:28

**2 තීරුව**
**1** ද්වි 4:6
**2** ද්වි 9:5, යෙසා 1:21
**3** 2සාමු 15:34, හිතෝ 22:29, මතෙ 24:45
**4** 1රාජා 2:44, එස්ත 7:7

**15 පරි.**
**5** විනි 8:2, 1සාමු 25:33, හිතෝ 25:15
**6** 1රාජා 12:14, 1රාජා 12:16, හිතෝ 29:22
**7** ගීතා 45:1; හිතෝ 16:23; දේශ 10:12; යෙසා 50:4; යොහ 7:46; **8** ගීතා 59:7; යාකො 3:10; **9** යෝබ් 34:21; ගීතා 11:4; ගීතා 66:7; හිතෝ 5:21; යෙරෙ 16:17; යෙරෙ 23:24; හෙබ්‍රෙ 4:13; **10** 2ලේක 16:9; **11** හිතෝ 12:18; හිතෝ 16:24; හිතෝ 17:27; **12** ගීතා 52:2; හිතෝ 18:7; **13** 1සාමු 2:25; හිතෝ 13:1; **14** ගීතා 141:5; හිතෝ 6:23; හෙබ්‍රෙ 12:11; **15** ගීතා 112:3; **16** හිතෝ 16:8; යාකො 5:3; **17** ගීතා 37:30; මතෙ 10:27; රෝම 10:10; 2තිමෝ 2:2; **18** මතෙ 12:34.

**හිතෝ 14:27*** මූ.අ., “ජීවන උල්පතකි.”

**හිතෝ 15:4*** මූ.අ., “ජීවන වෘක්ෂයකි.”

**8** දුෂ්ටයන් ඔප්පු කරන පූජා යෙහෝවා දෙවිට පිළිකුලකි.[1] නමුත් ප්‍රතිපත්තිගරුක අයගේ යාච්ඤා ඔහුට ප්‍රසන්නය.[2]

**9** දුෂ්ටයන්ගේ මාර්ග යෙහෝවා දෙවිට පිළිකුලකි.[3] නමුත් ධර්මිෂ්ඨ මාර්ගය අත් නොහරින තැනැත්තාට ඔහු ප්‍රේම කරයි.[4]

**10** නිවැරදි මාර්ගය අත්හැර යන්නා හික්මවීම හෙළාදකියි.[5] අවවාදයට ද්වේෂ කරන්නා මිය යන්නේය.[6]

**11** යෙහෝවා දෙවි මිනී වළ දකින්නේය. සියල්ල දිරාපත් වන ස්ථානය[7] ඔහුගෙන් සැඟවී නැත.[8] එසේනම්, මනුෂ්‍යයන්ගේ සිතෙහි තිබෙන දේ ඔහු දකින්නේ නැද්ද?[9]

**12** සමච්චල් කරන්නා තමාට අවවාද කරන තැනැත්තාට ප්‍රේම නොකරයි.[10] ඔහු ප්‍රඥාවන්තයන් ළඟට යන්න අකමැතිය.[11]

**13** ප්‍රීතිමත් සිතක් මුහුණ පැහැපත් කරයි.[12] නමුත් සිතේ වේදනාව නිසා මලානික පෙනුමක් ඇති වෙයි.[13]

**14** කාරණා හොඳින් වටහාගන්න තැනැත්තා දැනුම සොයා යයි.[14] නමුත් අඥානයන්ගේ මුඛය මෝඩකමට ආශා කරයි.[15]

**15** නිතරම සිත්තැවුලෙන් සිටින්නාට සෑම දවසක්ම නරකය.[16] එහෙත් සතුටු සිතින් සිටින්නාට සෑම දවසක්ම උත්සව දවසක් මෙනි.[17]

**16** බොහෝ වස්තු රැස් කරගෙන නොසන්සුන් මනසක් ඇතුව සිටිනවාට වඩා[18] ස්වල්පයකින් සෑහීමට පත් වී යෙහෝවා දෙවිට ගරුබිය දැක්වීම හොඳය.[19]

**17** වෛරයෙන් යුතුව ගව මස්* කනවාට වඩා[20] ප්‍රේමය ඇතුව එළවළු ටිකක් කෑම හොඳය.[21]

**18** කෝපාවිෂ්ට මිනිසෙක් රණ්ඩු දබර ඇති කරයි.[22] නමුත් ඉක්මනින් කේන්ති නොගන්නා සණ්ඩුසරුවල් නතර කරයි.[1]

**19** අලසයාගේ මාර්ගය කටු පඳුරු ඇති මහක් මෙනි.[2] නමුත් ප්‍රතිපත්තිගරුක අයගේ මාර්ගය කම්කටොලු නැති සමතලා මාවතකි.[3]

**20** ප්‍රඥාවන්ත පුතෙක් තම පියාගේ සිත සතුටු කරයි.[4] නමුත් අඥාන තැනැත්තා තම මවට හෙළාදකියි.[5]

**21** අඥානයා* තමාගේ මෝඩ හැසිරීමෙන් ප්‍රීතියක් ලබයි.[6] එහෙත් වටහාගැනීමේ හැකියාව ඇති මිනිසා හරි මඟෙන් ඉවත්ව නොයයි.[7]

**22** සිතේ තිබෙන දේ හෙළි නොකරන විට සැලසුම් අසාර්ථක වෙයි.[8] නමුත් උපදේශකයන් බොහෝදෙනෙකු සිටින විට සැලසුම් සාර්ථක වෙයි.[9]

**23** මිනිසෙක් තම මුවින් පිට කරන අදහස් නිසා ප්‍රීතියට පත් වෙයි.[10] සුදුසු අවස්ථාවේදී පවසන හොඳ වචන කොතරම් වටින්නේද![11]

**24** වටහාගැනීමේ ශක්තිය ඇති තැනැත්තා මිනී වළට යන මඟ අත්හැර[12] ජීවනයට යන මාර්ගයෙහි ගමන් කරන්නේය.[13]

**25** යෙහෝවා දෙවි තමන්වම උසස් කරගන්න අයගේ නිවස කඩා දමයි.[14] නමුත් ඔහු වැන්දඹුවගේ ඉඩමේ මායිම ආරක්ෂා සහිතව තබයි.[15]

**26** දුෂ්ටයන්ගේ කූට උපායන් යෙහෝවා දෙවිට පිළිකුලකි.[16] එහෙත් ප්‍රසන්න වචන පවිත්‍රය.[17]

**27** අයුතු ලෙස ලාභ උපයන තැනැත්තා තමාගේම ගෙයි වැසි-

**15 පරි.**
**1** හිතෝ 21:27, යෙසා 1:11, යෙසා 66:3, යෙරෙ 6:20, මතෙ 23:23
**2** ගීතා 10:17, හෙබ්‍රෙ 5:7, යාකො 5:16, 1පේතෘ 3:12, 1යොහ 3:22
**3** ගීතා 1:6, ගීතා 146:9, මතෙ 7:13
**4** හිතෝ 21:21, යෙසා 26:7, යොහ 3:35
**5** 1රාජා 18:17
**6** ලෙවී 26:21, හිතෝ 1:32, හිතෝ 5:12, හිතෝ 10:17
**7** ගීතා 88:11, හිතෝ 27:20
**8** යෝබ් 26:6, ගීතා 139:8
**9** 2ලේක 6:30, ගීතා 7:9, ගීතා 44:21, යෙරෙ 17:10, ක්‍රියා 1:24, හෙබ්‍රෙ 4:13
**10** හිතෝ 9:7, ආමො 5:10, යොහ 3:20, යොහ 7:7
**11** 2ලේක 18:7, යෝබ් 21:14
**12** හිතෝ 4:23, හිතෝ 17:22
**13** නෙහෙ 2:2, ගීතා 143:4, හිතෝ 12:25
**14** 1රාජා 3:12, ගීතා 119:97, ක්‍රියා 17:11
**15** හිතෝ 12:23, යෙසා 30:10, හොෂෙ 12:1
**16** ද්වි 28:67, යෝබ් 3:11
**17** ක්‍රියා 16:25, 1පේතෘ 4:13
**18** හිතෝ 15:17
**19** ගීතා 37:16
**20** හිතෝ 26:26, ලූක් 7:36
**21** ගීතා 133:1, හිතෝ 17:1, 1කොරි 13:4
**22** හිතෝ 10:12, හිතෝ 29:22

**2 තීරුව**
**1** උත් 13:8, 1සාමු 25:24, හිතෝ 25:15, කොලෝ 3:8, යාකො 1:19

**2** හිතෝ 10:26; හිතෝ 26:13; **3** යෙසා 30:21; යෙසා 57:14; මලා 3:18; **4** 1රාජා 1:48; හිතෝ 23:15; හිතෝ 27:11; **5** හිතෝ 10:1; හිතෝ 23:22; හිතෝ 30:17; **6** හිතෝ 10:23; හිතෝ 26:19; දේශ 7:4; **7** හිතෝ 4:26; හිතෝ 11:5; එෆී 5:15; යාකො 3:13; **8** දේශ 4:13; **9** හිතෝ 11:14; හිතෝ 20:18; **10** හිතෝ 12:14; හිතෝ 16:13; එෆී 4:29; **11** 1සාමු 25:33; හිතෝ 25:11; **12** හිතෝ 8:36; හිතෝ 23:14; **13** මතෙ 7:14; **14** ගීතා 52:5; ලූක් 18:14; **15** ද්වි 10:18; ගීතා 146:9; **16** හිතෝ 6:18; මතෙ 15:19; **17** ගීතා 19:14.

**හිතෝ 15:17*** මුල් භාෂාවේ, 'තර කළ ගවයෙකුගේ මස්' යන අදහසද ඇතුළත් වේ.

**හිතෝ 15:21*** හිතෝ 6:32හි පාදසටහන බලන්න.

යන්ව විනාශයට පමුණුවයි.[1] නමුත් අල්ලසට පිළිකුල් කරන තැනැත්තා තම ජීවිතය රැකගනියි.[2]

**28** ධර්මිෂ්ඨයා පිළිතුරක් දීමට පෙර හොඳින් සිතා බලයි.[3] එහෙත් දුෂ්ටයාගේ මුඛය නපුරේ උල්පතකි.[4]

**29** යෙහෝවා දෙවි දුෂ්ටයන්ගෙන් ඈත්ව සිටියි.[5] නමුත් ඔහු ධර්මිෂ්ඨයන්ගේ යාච්ඤාවලට සවන් දෙයි.[6]

**30** යහපත් පුවතක්[7] ශරීරයට සුවයක් ගෙන දෙයි.*[8] ඇස්[9] දීප්තිමත් වූ විට සිත ප්‍රීතියෙන් පිනා යයි.[10]

**31** ජීවනය ගෙන දෙන අවවාදවලට කැමැත්තක් දක්වන අය[11] ප්‍රඥාවන්තයන්ගේ ඇසුර සොයා යති.[12]

**32** හික්මවීම ප්‍රතික්ෂේප කරන තැනැත්තා[13] තමාගේම ජීවිතය සුළු කොට තකන්නේය. එහෙත් අවවාදය පිළිගන්න තැනැත්තාගේ සිත ප්‍රඥාවන්ත වන්නේය.[14]

**33** යෙහෝවා දෙවි කෙරෙහි ගරුබියක් ඇති තැනැත්තා ප්‍රඥාවන්තව හැසිරීමට තමාවම හික්මවාගනී.[15] යටහත්පහත්ව කටයුතු කළොත් මිසක ගෞරවයක් හිමි නොවන්නේය.[16]

**16** මිනිසෙකුගේ සිතුම් පැතුම් පාලනය කරන්නේ ඔහුමය.[17] එහෙත් මුවින් ලැබෙන පිළිතුර යෙහෝවා දෙවිගෙන්ය.[18]

**2** මිනිසෙකුට තමාගේ සියලුම ක්‍රියා හරියයි පෙනේ.[19] නමුත් යෙහෝවා දෙවි ඔහුගේ සිතුම් පැතුම් සෝදිසි කර බලයි.[20]

**3** ඔබේ සියලු වැඩ යෙහෝවා දෙවිට භාර දෙන්න.[21] එවිට ඔබේ සැලසුම් සාර්ථකව ඉටු කරගැනීමට ඔබට හැකි වෙයි.[22]

**4** යෙහෝවා දෙවි තම අරමුණ ඉටු කරගැනීම සඳහා සියල්ල සාදා ඇත.[23] ඔහු දුෂ්ටයාව පවා විපත්ති දවසට නියම කර ඇත.[24]

**5** උඩඟු සිත් ඇති සියල්ලෝ යෙහෝවා දෙවිට පිළිකුලකි.[1] ඔවුහු අතට අත දී එකිනෙකාට උදව් කළත් දඬුවමෙන් නම් නිදහස් නොවන්නෝය.[2]

**6** ප්‍රේමය* සහ විශ්වාසවන්තකම හේතුවෙන් වරදට සමාව ලැබෙයි.[3] එහෙත් යෙහෝවා දෙවි කෙරෙහි ගරුබිය ඇති තැනැත්තා වැරදි දෙයින් වැළකී සිටියි.[4]

**7** මිනිසෙකුගේ හැසිරීම ගැන යෙහෝවා දෙවි සතුටු වූ විට[5] ඒ තැනැත්තාගේ සතුරෝ පවා ඔහු සමඟ සමාදානයෙන් සිටින්නෝය.[6]

**8** අසාධාරණයෙන් බොහෝ දේ රැස් කරගන්නවාට වඩා[7] ධර්මිෂ්ඨකමෙන් ස්වල්පයක් උපයාගැනීම යහපත්ය.[8]

**9** මිනිසෙකු තමන් යන මඟ තීරණය කළත්[9] ඔහුගේ පියවර හසුරුවන්නේ යෙහෝවා දෙවිය.[10]

**10** රජෙකු ප්‍රකාශ කළ යුත්තේ දෙවිගෙන් ලැබෙන තීන්දුවයි.[11] ඔහුගේ මුවින් අසාධාරණ තීන්දුවක් පිට නොවිය යුතුයි.[12]

**11** නිවැරදි මිනුම හා තරාදිය අයිති යෙහෝවා දෙවිටය.[13] මල්ලේ රැගෙන යන මිනුම් පඩි* ලබා දෙන්නේද ඔහුය.[14]

**12** රජවරු සියලුම දුෂ්ටකම් හෙළාදකිති.[15] ධර්මිෂ්ඨකම නිසා සිංහාසනයක් ස්ථිර වන්නේය.[16]

**13** ධර්මිෂ්ඨ ලෙස කතා කරන

**15 පරි.**
**1** ද්වි 16:19
1සාමු 8:3
හිතෝ 1:19
දේශ 7:7
යෙසා 1:23
**2** නික් 23:8
යෙසා 33:15
**3** හිතෝ 16:23
**4** හිතෝ 24:2
තීත 1:10
2පේතෘ 2:18
**5** ගීතා 34:16
ගීතා 138:6
1පේතෘ 3:12
**6** ගීතා 34:15
ගීතා 145:19
යෙසා 58:9
යොහ 9:31
**7** හිතෝ 25:25
**8** හිතෝ 16:24
යෙසා 58:11
**9** ගීතා 25:15
**10** ගීතා 16:9
ගීතා 19:8
**11** ගීතා 39:11
හිතෝ 6:23
හිතෝ 13:18
**12** හිතෝ 9:8
හිතෝ 19:20
**13** ගීතා 50:17
හිතෝ 5:12
හිතෝ 13:18
හෙබ්‍රෙ 12:25
**14** හිතෝ 19:8
මතෙ 7:24
හෙබ්‍රෙ 12:10
**15** යෝබ් 28:28
ගීතා 111:10
හිතෝ 1:7
**16** හිතෝ 18:12
හිතෝ 29:23
ලූක් 14:11
යාකො 4:10

**16 පරි.**
**17** ගීතා 21:11
හිතෝ 16:9
හිතෝ 19:21
හිතෝ 20:24
1කොරි 7:37
**18** නික් 4:11
යෙරෙ 1:9
මතෙ 10:20
ලූක් 12:12
ලූක් 21:15
**19** 1සාමු 15:13
ගීතා 36:2
හිතෝ 21:2
හිතෝ 30:12
යෙරෙ 17:9
ලූක් 18:11
**20** 1සාමු 2:3
1සාමු 16:7
හිතෝ 24:12
ලූක් 16:15

**21** ගීතා 37:5; ගීතා 55:22; මතෙ 6:33; පිලි 4:6; 1පේතෘ 5:7; **22** 2සාමු 7:5; 2සාමු 7:13; **23** යෙසා 43:21; එළි 4:11; **24** නික් 14:4; රෝම 9:21; 2පේතෘ 2:9; **2 තීරුව** **1** යෝබ් 40:12; හිතෝ 6:17; හිතෝ 8:13; හිතෝ 21:4; **2** හිතෝ 15:25; යෙසා 3:11; රෝම 2:8; **3** 2ලේක 19:3; ක්‍රියා 3:19; **4** උත් 20:11; නෙහෙ 5:9; හිතෝ 8:13; හිතෝ 14:26; 2කොරි 7:1; **5** කොලො 1:10; 1පේතෘ 3:9; 1යොහ 3:22; **6** උත් 31:24; නික් 34:24; යෙරෙ 15:11; රෝම 8:31; **7** හිතෝ 21:6; යෙරෙ 17:11; මීකා 6:10; **8** ගීතා 37:16; හිතෝ 15:16; 1තිමෝ 6:6; **9** හිතෝ 16:1; හිතෝ 19:21; **10** ගීතා 51:10; හිතෝ 16:3; හිතෝ 20:24; යෙරෙ 10:23; **11** ද්වි 17:18; 2සාමු 23:2; 1රාජා 3:28; ගීතා 72:1; **12** ගීතා 72:14; හිතෝ 29:4; **13** ලෙවී 19:36; හිතෝ 11:1; එස 45:10; **14** ද්වි 25:13; හිතෝ 20:10; මීකා 6:11; **15** හිතෝ 14:35; හිතෝ 20:26; ලූක් 12:48; **16** හිතෝ 25:5; හිතෝ 29:14; එළි 19:11.

හිතෝ **15:30*** මූ.අ., “ඇටකටු පුෂ්ටිමත් කරයි.”

හිතෝ **16:6*** හෝ, “ලැදි ප්‍රේමය.” **11*** හිතෝ 11:1හි පාදසටහන බලන්න.

කෙනෙකු රජුගේ හද සතුටු කරයි.[1]
යහපත් දේ කතා කරන අයට ඔහු
ප්‍රේම කරයි.[2]
**14** රජෙකුගේ කෝපය මරණ පණි-
විඩ ගෙනෙන දූතයෙකු මෙනි.[3]
එහෙත් ප්‍රඥාවන්තයා රජෙකුගේ උද-
හස නිවා දමන්නේය.[4]
**15** රජෙකුගේ සිත දිනාගැනීමෙන්
ජීවිතය රැකෙයි.[5] ඔහුගේ අනුමැතිය
ලබාගැනීම වසන්ත කාලයේ දක්නට
ලැබෙන වැහි වලාකුළු මෙනි.[6]
**16** ප්‍රඥාව රනටත් වඩා වටින්-
නේය.[7] රිදී සොයාගැනීමටත් වඩා
වටින්නේ හොඳ අවබෝධයක් ලබා-
ගැනීමය.[8]
**17** ප්‍රතිපත්තිගරුක අය වැරදි
මාර්ගවලින් ඈත් වෙයි.[9] තමන්ගේ
ගමන් මඟ ගැන සෝදිසියෙන් සිටින
තැනැත්තා තම ජීවිතය රැකගනී.[10]
**18** විනාශයට මුල උඩඟුකමය.[11]
වැටීමට හේතුව අහංකාර සිතකි.[12]
**19** තමන්වම උසස් කරගන්න අය
සමඟ ලාභ බෙදාගන්නවාට වඩා[13]
නිහතමානී අය සමඟ යටහත්පහත්
මනසක් ඇතුව සිටීම යහපත්ය.[14]
**20** යම් කාරණයකදී තම වට-
හාගැනීමේ හැකියාව යොදාගන්න
තැනැත්තා තම ජීවිතය සාර්ථක
කරගනියි.[15] යෙහෝවා දෙවි කෙරෙහි
විශ්වාසය තබන මිනිසා සන්තෝෂ-
වත්ය.[16]
**21** ප්‍රඥාවන්තව සිතන අයට
හොඳ අවබෝධයක් ඇතැයි පිළිගැ-
නේ.[17] ප්‍රසන්න අයුරින් වචන හසුරු-
වන්නා අන් අයගේ සිත් දිනාගනී.[18]
**22** වටහාගැනීමේ ශක්තිය ජීවි-
තය රැක දෙයි.*[19] අඥානයා තම
මෝඩකම් නිසා විහින් දඬුවම් විඳින්-
නේය.#[20]
**23** ප්‍රඥාවන්තයා තම වචන හසු-
රුවන්නේ වටහාගැනීමේ හැකියාව
යොදාගෙනයි.[21] අන් අයගේ සිත් දිනා-
ගැනීමටද එය උපකාරවත් වෙයි.[22]

**හිතෝ 16:22*** මූ.අ., "ජීවන උල්පතකි."
**22#** මූ.අ., "හික්මවීම් ලබන්නේය."

**16 පරි.**
**1** ගීතා 101:6
**2** හිතෝ 22:11
**3** 1සාමු 22:18, 1රාජා 2:29, හිතෝ 19:12, හිතෝ 20:2, ආනි 3:13
**4** දේශ 9:15, දේශ 10:4
**5** යෝබ් 29:24, ක්‍රියා 2:28
**6** යෝබ් 29:23, ගීතා 72:6, හිතෝ 19:12, හොෂෙ 6:3
**7** ගීතා 119:127, හිතෝ 8:10, දේශ 7:12
**8** හිතෝ 3:14, හිතෝ 4:7
**9** හිතෝ 4:27
**10** හිතෝ 10:9, ක්‍රියා 10:35, හෙබ්‍රෙ 10:39
**11** හිතෝ 11:2, හිතෝ 17:19, හිතෝ 18:12, ආනි 4:30, ආනි 5:22
**12** එස්ත 3:5, එස්ත 5:11, ආනි 4:31
**13** 1සාමු 30:16
**14** දේශ 7:8, යෙසා 57:15, යෙරෙ 9:24
**15** උත් 41:39, හිතෝ 13:15
**16** 1ලේක 5:20, ගීතා 34:8, ගීතා 146:5, 1තිමෝ 4:10
**17** 1රාජා 3:12, හිතෝ 4:7, රෝම 16:19
**18** දේශ 12:10, ලූක් 4:22, 2කොරි 5:11, කොලො 4:6
**19** හිතෝ 14:27, හිතෝ 15:24, යොහ 4:14
**20** හිතෝ 1:7, හිතෝ 15:28
**21** ගීතා 37:30, හිතෝ 22:17, හිතෝ 22:18, මතෙ 12:35
**22** යොහ 6:68, ක්‍රියා 19:26, කොලො 3:16

**2 තීරුව**
**1** ගීතා 19:10, ගීතා 119:103
**2** හිතෝ 3:8, හිතෝ 4:22, හිතෝ 12:18, හිතෝ 17:22

**24** ප්‍රිය වදන් මීවදයක් මෙන් මිහි-
රිය.[1] එය ගතටත් සිතටත්* සුවයක්
ගෙන දෙයි.[2]
**25** මිනිසාට නිවැරදියයි පෙනෙන
මඟක් ඇත.[3] එහෙත් එය අවසන්
වන්නේ මරණයෙනි.[4]
**26** වෙහෙස මහන්සි වී වැඩ
කරන්නා තමාගේ කුසගින්න නිවා-
ගැනීමට වැඩ කරයි.[5] ඔහුව පොලඹ-
වන්නේ ඔහුගේම කුසගින්නයි.[6]
**27** කිසි වැදගැම්මකට නැති
මිනිසා නපුරු දේ හාරා අවුස්සයි.[7]
ඔහුගේ තොල් දැවෙන ගින්නක් හා
සමානය.[8]
**28** කූට උපක්‍රම යොදන
තැනැත්තා භේද පතුරවයි.[9] කේලම්
කියන්නා මිත්‍රයන්ව වෙන් කරයි.[10]
**29** දරුණු මිනිසෙක් තම අසල්වැ-
සියාව රවටා[11] ඔහුව වැරදි මඟක
ගෙන යයි.[12] **30** ඔහු ඇස්වලින් ඉඟි
කර කූට උපක්‍රම යොදයි.[13] ඔහු කපටි
සිනාවක් පාමින් තම උගුල අටවයි.
**31** ධර්මිෂ්ඨ[14] මිනිසෙකුගේ පැසුණු
හිසකෙස් අලංකාර ඔටුන්නක් මෙනි.[15]
**32** ඉක්මනින් කේන්ති නොගන්න
තැනැත්තා බලවන්තයෙකුට වඩා
ශක්තිමත්ය.[16] තමාවම පාලනය
කරගන්න තැනැත්තා නුවරක් අල්-
ලාගන්නා කෙනෙකුටත් වඩා බල-
වත්ය.[17]
**33** දාදු දමන්නේ* තීරණයක්
ගැනීමටය.[18] එහෙත් ගත යුතු තීර-
ණය පෙන්වා දෙන්නේ යෙහෝවා
දෙවිය.[19]

**3** මතෙ 7:22; යොහ 9:41; යොහ 16:2; ක්‍රියා 26:9; **4** හිතෝ 5:4; හිතෝ 14:12; **5** දේශ 6:7; එෆී 4:28; 1තෙස 4:11; **6** හිතෝ 18:20; දේශ 6:7; **7** හිතෝ 6:14; ආනි 6:4; **8** ගීතා 52:4; යාකො 3:6; **9** හිතෝ 6:14; ගලා 5:20; යාකො 3:16; **10** උත් 3:1; 1සාමු 24:9; හිතෝ 18:8; රෝම 16:17; 2කොරි 12:20; **11** හිතෝ 1:10; 2පේත්‍ර 3:17; **12** 1සාමු 19:17; නෙහෙ 6:13; **13** ගීතා 35:19; හිතෝ 6:13; **14** 1සාමු 12:2; ගීතා 71:18; ගීතා 92:14; යෙසා 46:4; **15** ලෙවී 19:32; යෝබ් 32:7; හිතෝ 20:29; **16** හිතෝ 14:29; ගලා 5:22; යාකො 1:19; **17** හිතෝ 25:28; රෝම 12:21; **18** ගණන් 26:55; යොෂු 18:10; හිතෝ 18:18; ක්‍රියා 1:26; **19** 1සාමු 14:41; ක්‍රියා 1:24.

**හිතෝ 16:24*** මූ.අ., "ඇටකටුවලටත්."
**33*** මූ.අ., "ඔඩොක්කුවට දාදු දමන්නේ."

**17** රණ්ඩු දබර ඇති නිවසක
සිට බොහෝ පුදපූජා ඔප්පු
කරනවාට වඩා[1] සමාදානයෙන් වියළි
රොටි කැබැල්ලක් කෑම හොඳය.[2]
**2** ගැඹුරු අවබෝධයකින් යුතුව
වැඩ කරන දාසයෙක් නින්දිතව
හැසිරෙන පුත්‍රයෙකුව පාලනය
කරයි.[3] ඒ නිසා ඔහුටද තම ස්වාමි-
යාගේ පුතුන්ට ලැබෙන උරුමයෙන්
කොටසක් හිමි වෙයි.[4]
**3** රිදී පවිත්‍ර කිරීම සඳහා භාජන-
යක්ද රන් පවිත්‍ර කිරීම සඳහා උදු-
නක්ද තිබේ.[5] එහෙත් සිත් සෝදිසි
කරන්නේ යෙහෝවා දෙවිය.[6]
**4** දුෂ්ටයා හානිකර කතා පවසන
අයට ඇහුම්කන් දෙයි.[7] බොරුකා-
රයෙක් අන්‍යයන්ට හානියක් ගෙන
දෙන කතාවලට සවන් දෙයි.[8]
**5** අගහිඟකම් ඇති තැනැත්තාව
සරදමට ලක් කරන්නා තමාගේ නිර්-
මාතෘට නින්දා කරන්නේය.[9] අනුන්-
ගේ විපතේදී ප්‍රීති වන්නා දඬුවමින්
නිදහස් නොවන්නේය.[10]
**6** මහල්ලන්ට ඔවුන්ගේ මුනුපුරෝ
ඔටුන්නක් මෙන් වන්නෝය.[11] පිය-
වරු පුත්‍රයන්ට ගෞරවයකි.[12]
**7** නිවැරදි අදහස් ප්‍රකාශ කිරීම
අඥානයෙකුගේ චරිතයට කොහෙත්ම
නොගැළපේ.[13] එසේනම්, අධිපතියෙ-
කුගේ මුවින් වංචනික අදහස් පිට වීම
කොතරම් නුසුදුසුද?[14]
**8** මිනිසෙකු තමා දෙන තෑග්-
ගක් සලකන්නේ සිත් ඇදගන්නා-
සුලු මැණිකක් මෙනි.[15] ඔහු යන යන
තැන තම අරමුණ ඉටු කරගනී.[16]
**9** වරදක් අමතක කර දමන
තැනැත්තා ප්‍රේමණීය අයෙකි.[17]
නමුත් වරදක් ගැන හැම තැනම
කතා කරන්නා කිට්ටු මිත්‍රයන්ව වෙන්
කරයි.[18]
**10** අඥානයෙකුට සිය වරක් පහර
දෙනවාට වඩා[19] හොඳ අවබෝධය-
කින් වැඩ කරන කෙනෙකුට එක් තර-
වටුවක් දීම ප්‍රයෝජනවත්ය.[20]
**11** දුෂ්ටයාගේ එකම ආශාව වන්-
නේ කැරලිගැසීමයි.[1] ඔහුට විරුද්ධව
යවන ලද දූතයා කිසිදු අනුකම්පාවක්
නොපෙන්වයි.[2]
**12** මෝඩ ලෙස හැසිරෙන අඥාන-
යෙකුව[3] මුණගැසීමට වඩා පැටවුන්
නැති වූ වැලහින්නියකව හමු වීම
යහපත්ය.[4]
**13** තමාට හොඳක් කළ අයෙකුට
නපුරක් කරන තැනැත්තාගේ[5] නිව-
සට කිසිදා යහපතක් නම් සිදු නො-
වෙයි.[6]
**14** රණ්ඩු දබර ඇති වන්නේ වේල්-
ලකින් වතුර බිඳී යන්නාක් මෙනි.[7]
එහෙයින් රණ්ඩුවක් හටගැනීමට පෙර
එතැනින් අහක්ව යන්න.[8]
**15** දුෂ්ටයා ධර්මිෂ්ඨයෙකුයයි
කියන තැනැත්තා[9] සහ ධර්මිෂ්ඨයා
දුෂ්ටයෙකුයයි කියන තැනැත්තා[10]
යන දෙදෙනාම යෙහෝවා දෙවිට
පිළිකුලකි.[11]
**16** අඥානයාට සැබෑ ප්‍රඥාව ලබා-
ගැනීමට හැකියාව තිබුණද[12] ඔහු-
ගේ චේතනා පිරිසිදු නැත්නම්[13] එයින්
ඇති ප්‍රයෝජනය කුමක්ද?
**17** සැබෑ මිතුරෙකු සෑම වෙලේම
ප්‍රේමණීයයි.[14] ඔහු විපතකදී උපකාර
කරන්න ඉපදුණු සහෝදරයෙකි.[15]
**18** අඥානයා* අතට අත දී[16] තම
මිතුරා වෙනුවෙන් ඇප වීමට පො-
රොන්දු වෙයි.[17]
**19** වැරදි දේට ආශා කරන
තැනැත්තා දබරයට ප්‍රිය කරයි.[18]
තමාගේ දොරකඩ උසට තනාගන්නා
විනාශයට අත වනයි.[19]
**20** වංක සිත් ඇත්තන්ට කිසි

**17 පරි.**
**1** හිතෝ 21:9
හිතෝ 21:19
**2** ගීතා 37:16
හිතෝ 15:16
හිතෝ 15:17
**3** හිතෝ 10:5
හිතෝ 14:35
**4** උත් 15:2
**5** හිතෝ 27:21
මලා 3:3
**6** ගීතා 26:2
ගීතා 66:10
හිතෝ 21:2
හිතෝ 24:12
යෙසා 48:10
**7** හිතෝ 1:11
2තිමෝ 4:4
**8** යෙසා 30:10
යෙරෙ 5:31
2තිමෝ 4:3
1යොහ 4:5
**9** හිතෝ 14:31
**10** යෝබ් 31:29
හිතෝ 24:17
ඔබ 12
රෝම 12:15
**11** උත් 50:23
යෝබ් 42:16
**12** 1රාජා 15:4
හිතෝ 13:22
යොහ 8:39
**13** හිතෝ 26:7
**14** හිතෝ 16:10
හිතෝ 29:12
**15** උත් 32:20
2සාමු 16:1
හිතෝ 18:16
හිතෝ 19:6
**16** 1සාමු 25:35
**17** හිතෝ 10:12
1පේත්‍ර 4:8
**18** හිතෝ 16:28
**19** හිතෝ 27:22
**20** ගීතා 141:5
හිතෝ 9:8

**2 තීරුව**
**1** ගණන් 16:3
2සාමු 20:1
**2** 2සාමු 18:15
2සාමු 20:22
1රාජා 2:24
එස්ත 7:9
මතෙ 21:41
**3** හිතෝ 27:3
**4** 2සාමු 17:8
2රාජා 2:24
හොෂෙ 13:8
**5** 1සාමු 24:17
ගීතා 38:20
යෙරෙ 18:20
**6** 2සාමු 12:10
2සාමු 21:1
මතෙ 27:5
**7** හිතෝ 26:21

**8** උත් 13:9; හිතෝ 25:8; මතෙ 5:39; රෝම 12:18; **9** නික් 23:7; ද්වි 25:1; 1රාජා 8:32; යෙසා 5:23; **10** 1රාජා 21:13; ලූක් 23:18; යාකො 5:6; **11** හිතෝ 12:22; **12** හිතෝ 1:22; රෝම 1:20; රෝම 1:21; **13** හිතෝ 9:4; දේශ 10:3; **14** 1සාමු 18:3; 2සාමු 1:26; හිතෝ 18:24; යොහ 15:13; **15** රූත් 1:17; 1සාමු 19:2; 2සාමු 17:28; **16** යෝබ් 17:3; හිතෝ 6:1; හිතෝ 11:15; හිතෝ 22:26; **17** හිතෝ 20:16; හිතෝ 22:27; **18** යාකො 3:16; යාකො 3:17; **19** 2සාමු 15:1.

**හිතෝ 17:18*** හිතෝ 6:32හි පාදසටහන බලන්න.

යහපතක් සිදු නොවෙයි.[1] වංචනික
කතා පවසන තැනැත්තා විපතට
පත් වෙයි.[2]
**21** මෝඩ දරුවෙක් තම පියාට
ශෝකය ගෙන දෙයි.[3] අඥාන දරුවෙ-
කුගේ පියාට ප්‍රීති වීමට කිසිදු හේතු-
වක් නැත.[4]
**22** ප්‍රීතිමත් සිතක් හොඳ ඖෂධ-
යකි.[5] නමුත් බිඳුණු සිතක් ඇට විය-
ළවයි.[6]
**23** දුෂ්ටයා යුක්තිය පෙරළන
පිණිස[7] රහසින් දෙන අල්ලසක් වුවද
පිළිගනියි.[8]
**24** කාරණා හොඳින් තේරුම්-
ගන්න තැනැත්තා ප්‍රඥාව දෙසම ඇස්
යොමා සිටියි.[9] එහෙත් අඥානයාගේ
මනස* එහෙ මෙහෙ දුවන්නේය.[10]
**25** අඥාන පුතෙකු තම පියාට
ගෙනෙන්නේ මහත් වේදනාවකි.[11]
ඔහු තම මවට ශෝකයකි.[12]
**26** ධර්මිෂ්ඨ තැනැත්තාට දඬු-
වම් කිරීම නුසුදුසුය.[13] අධිපතියෙකුට
පහර දීමද සුදුසු ක්‍රියාවක් නොවෙයි.[14]
**27** දිව පාලනය කරගන්න
තැනැත්තා දැනුම් තේරුම් ඇතුව
කටයුතු කරන්නේය.[15] වටහාගැනීමේ
ශක්තිය ඇති මිනිසා කලබල නො-
වන්නේය.[16]
**28** නිශ්ශබ්දව සිටින විට මෝ-
ඩයෙකු පවා ප්‍රඥාවන්තයෙකු මෙන්
පෙනේ.[17] ඔහු කිසිවක් කතා නොක-
රන විට දැනුම් තේරුම් ඇති පුද්ගල-
යෙකු මෙන් පෙනේ.

**18** නිතරම අන් අයගෙන් වෙන්ව
සිටින තැනැත්තා තම ආත්-
මාර්ථකාමී ආශාවන් පසුපස ලුහුබැඳ
යයි.[18] ඔහු සැබෑ ප්‍රඥාව මුළුමනින්ම
ප්‍රතික්ෂේප කරයි.[19]
**2** අඥානයා තම සිතේ අදහස්
හෙළි කිරීමට කැමැත්තක් දක්ව-
නවා[20] මිසක වටහාගැනීමේ හැකියාව
දියුණු කරගැනීමට කිසි උනන්දුවක්
නොදක්වයි.[21]

**3** දුෂ්ටයෙකු පැමිණෙන විට ඔහු
අන්‍යයන්ගේ අවමානයට ලක්
වේ.[1] අගෞරවය[2] සමඟ නින්දාවද
පැමිණේ.
**4** මිනිසෙකු පවසන වචන ගැඹුරු
උල්පතකින් නික්මෙන ජලය මෙනි.[3]
ප්‍රඥාව දිය උනන උල්පතකි.[4]
**5** දුෂ්ටයාගේ පැත්ත ගැනීමත්[5]
ධර්මිෂ්ඨයාට යුක්තිය ඉටු නොකිරී-
මත් නුසුදුසුය.[6]
**6** මෝඩයා නිතරම රණ්ඩු දබරව-
ලට පැටලෙයි.[7] ඔහු පහර ලබන්නේ
ඔහුගේම මෝඩ කතා නිසාය.[8]
**7** මෝඩයාගේ මුඛය ඔහුගේම
විනාශයට පාර කපයි.[9] ඔහුගේ දිව
ඔහුටම උගුලක් වේ.[10]
**8** කේලාම් කියන්නාගේ වචන
කැදරකමින් ගිල දමන රසවත්
කෑමක් මෙනි.[11] එය ගිලගත් පසු
ඇඟට හොඳින් උරාගනී.[12]
**9** වැඩ කිරීමට කම්මැලි
තැනැත්තා[13] සොරකම් කරන්නෙකු-
ගේ සහෝදරයාය.[14]
**10** යෙහෝවා දෙවිගේ නාමය
ශක්තිමත් බලකොටුවකි.[15] ධර්මිෂ්-
ඨයා ඒ වෙත දුව ගොස් ආරක්ෂාව
ලබයි.[16]
**11** ධනවතාගේ වස්තුව ඔහුට
බලවත් නුවරක් මෙනි.[17] ඔහු එය
ආරක්ෂක පවුරක් සේ සලකයි.[18]
**12** මිනිසෙකුගේ විනාශයට මුල
ඔහුගේ උඩඟු සිතය.[19] යටහත්-
පහත්ව කටයුතු කළොත් මිසක
ගෞරවයක් හිමි නොවන්නේය.[20]
**13** කාරණයකට හොඳින් සවන්
දීමට කලින් කතා කිරීම මෝඩක-
මකි.[21] එයින් අත් වන්නේ ලැජ්ජා-
වකි.[22]
**14** දරුණු රෝගයක් පවා දරාගැ-

**17 පරි.**
**1** ගීතා 18:26 හිතෝ 3:32 හිතෝ 6:15
**2** හිතෝ 10:31 හිතෝ 18:6 දේශ 10:12 යාකො 3:8
**3** 1සාමු 2:25 1සාමු 8:3 2සාමු 15:14 හිතෝ 10:1
**4** හිතෝ 19:13
**5** හිතෝ 12:25 හිතෝ 15:13
**6** ගීතා 22:15 හිතෝ 18:14 2කොරි 7:10
**7** නික් 23:8 ද්වි 16:19 හිතෝ 29:4 යෙසා 1:23
**8** 1සාමු 8:3
**9** දේශ 2:14 දේශ 8:1
**10** දේශ 2:14
**11** හිතෝ 19:13
**12** හිතෝ 10:1 හිතෝ 15:20
**13** හිතෝ 18:5
**14** 2සාමු 16:7 යෝබ් 34:18
**15** හිතෝ 10:19 දේශ 10:14 යාකො 1:19
**16** හිතෝ 15:4 දේශ 9:17 යාකො 3:13
**17** යෝබ් 13:5

**18 පරි.**
**18** නික් 33:16 රෝම 14:7 හෙබ්‍රෙ 10:25
**19** හිතෝ 15:22
**20** හිතෝ 10:19
**21** හිතෝ 1:7 හිතෝ 1:29 හිතෝ 28:16

**2 තීරුව**
**1** 1සාමු 20:30 ගීතා 123:4
**2** හිතෝ 11:2
**3** හිතෝ 10:11 හිතෝ 20:5
**4** ගීතා 78:2
**5** ලෙවී 19:15 ද්වි 1:17 හිතෝ 24:23
**6** 1රාජා 21:9 යෙසා 5:23
**7** හිතෝ 13:10
**8** හිතෝ 19:19
**9** හිතෝ 10:8; හිතෝ 10:14; හිතෝ 13:3; දේශ 10:12; **10** හිතෝ 6:2; **11** ලෙවී 19:16; **12** හිතෝ 26:22; **13** හිතෝ 10:4; රෝම 12:11; **14** හිතෝ 28:24; **15** 1සාමු 17:46; ගීතා 20:1; ගීතා 33:21; **16** ගීතා 18:2; ගීතා 71:3; ගීතා 91:14; **17** ගීතා 49:6; හිතෝ 10:15; හිතෝ 11:4; යෙරෙ 9:23; **18** ලූක් 12:21; **19** හිතෝ 11:2; දානි 5:23; ක්‍රියා 12:23; **20** හිතෝ 15:33; හිතෝ 22:4; හිතෝ 29:23; ලූක් 14:11; 1පේතෘ 5:5; **21** ද්වි 17:4; **22** හිතෝ 25:8.

හිතෝ **17:24*** මූ.අ., “ඇස්.”

නීමට මිනිසෙකුට සිතේ සවිය තිබු-
ණත්[1] බිඳුණු සිතක් දරාගත හැක්කේ
කාටද?[2]
**15** කාරණා හොඳින් තේරුම්-
ගන්න තැනැත්තා දැනුමට ප්‍රිය
කරයි.[3] ප්‍රඥාවන්තයාගේ කන දැනු-
මට යොමු කර තිබේ.[4]
**16** මිනිසෙකු තෑග්ගක් දෙන විට
ඔහුට මහඟු ප්‍රස්තාවන් විවෘත වෙයි.[5]
උත්තමයන් ඉදිරියේ පෙනී සිටීමටද
එය ඉඩ සලසා දෙයි.[6]
**17** නඩුවකදී පළමුවෙන් පෙනී
සිටින්නා නිවැරදියයි පෙනේ.[7] එහෙත්
ඉන්පසුව එතැනට පැමිණ සාක්ෂි
දෙන තැනැත්තා සැබෑ තත්වය හෙළි
කර දෙයි.[8]
**18** ආදු දැමීමෙන් වාද සමනයකට
පත් වෙයි.[9] ඉන් බලවතුන් අතර පවා
සමාදානයක් ඇති වෙයි.[10]
**19** සහෝදරයෙකුට විරුද්ධව වර-
දක් කළ පසු ඔහුව දිනාගැනීම ශක්-
තිමත් නුවරක් අල්ලාගැනීමට වඩා
අසීරුය.[11] එකිනෙකා අතරේ ඇති
වන වාදවිවාද බලකොටුවක සවිමත්
දොරගුළු මෙනි.[12]
**20** මිනිසෙක් තම මුවින් පිට
කරන වචනවලට අනුව නිසි ප්‍රතිඵල
අද්දකියි.[13] ඔහු පවසන දෙයින් තෘප්-
තියට පත් වෙයි.[14]
**21** ඔබේ දිව කොතරම් බලවත්ද
කිවහොත් ඔබ පවසන දෙයින් යමෙ-
කුව මරා දමන්න හෝ ජීවත් කර-
වන්න හෝ එයට බලය තිබේ.[15] එක්
එක් කෙනා තමා ප්‍රිය කරන වචනව-
ලට අනුව ප්‍රතිඵල විඳින්නෝය.[16]
**22** යමෙකුට හොඳ බිරිඳක් සො-
යාගත හැකි නම්[17] ඇය ඔහුට වටිනා
සම්පතකි.[18] එය ඔහුට යෙහෝවා දෙ-
විගෙන් ලැබෙන ආශීර්වාදයකි.[19]
**23** අගහිඟකම් ඇති තැනැත්තා
බැගෑපත් ලෙස කතා කරයි.[20] එහෙත්
පොහොසතා සැරෙන් පිළිතුරු දෙයි.[21]
**24** ද්‍රෝහිව කටයුතු කරන මිතු-
රෝ සිටිති.[22] නමුත් සහෝදරයෙ-
කුටත් වඩා විශ්වාසවන්තව සිටින
මිතුරෙක්ද සිටියි.[23]

**18 පරි.**
**1** යෝබ් 1:21
2කොරි 4:16
2කොරි 12:10
**2** හිතෝ 17:22
**3** 1රාජා 3:9
හිතෝ 9:9
හිතෝ 15:14
**4** හිතෝ 2:10
හිතෝ 8:10
**5** උත් 32:20
උත් 43:11
හිතෝ 17:8
**6** හිතෝ 19:6
**7** 2සාමු 16:3
**8** ද්වි 13:14
2සාමු 19:26
හිතෝ 25:8
**9** යොෂු 14:2
1සාමු 10:21
නෙහෙ 11:1
හිතෝ 16:33
**10** 1සාමු 14:42
**11** උත් 27:41
2සාමු 13:22
1රාජා 2:23
**12** 2සාමු 14:28
ක්‍රියා 15:39
**13** හිතෝ 12:14
හිතෝ 16:20
හිතෝ 16:26
**14** හිතෝ 22:18
**15** හිතෝ 10:31
හිතෝ 11:30
මතෙ 15:18
එෆී 4:29
යාකො 3:6
**16** හිතෝ 16:1
දේශ 10:12
යෙසා 57:19
හෙබ්‍රෙ 13:15
**17** උත් 24:67
හිතෝ 12:4
හිතෝ 31:10
දේශ 9:9
1කොරි 7:2
**18** උත් 29:20
හිතෝ 19:14
**19** රූත් 4:11
**20** රූත් 2:7
2රාජා 4:1
යාකො 5:4
**21** උත් 42:7
1සාමු 25:10
ආමො 8:4
**22** 2සාමු 15:31
මතෙ 26:49
**23** 1සාමු 19:4
2සාමු 1:26
2සාමු 9:1
හිතෝ 17:17
හිතෝ 27:9

**2 තීරුව**

**19 පරි.**
**1** 1සාමු 25:17
හිතෝ 28:6
මතෙ 12:37

**19** වංචනික මුඛයක් ඇති
තැනැත්තෙකුටත් මෝඩ-
යෙකුටත් වඩා[1] දෙවිට විශ්වාසවන්-
තව සිටින දුප්පතෙකු හොඳය.[2]
**2** යමෙකු දැනුම ලබා නොගන්-
නේ නම් එය හොඳ දෙයක් නො-
වේ.[3] හදිස්සියෙන් කටයුතු කරන
තැනැත්තා පාපයට වැටෙයි.[4]
**3** මිනිසෙකු තමාගේම මෝඩකම
නිසා ජීවිතය අවුල් කරගනී.[5] නමුත්
ඔහු සිතින් දොස් කියන්නේ යෙ-
හෝවා දෙවිටය.[6]
**4** ධනය නිසා මිතුරන් බොහෝ
සෙයින් වැඩි වෙයි.[7] එහෙත් දුප්ප-
තාගේ මිතුරෝ පවා ඔහුගෙන් ඈත්
වෙති.[8]
**5** බොරු සාක්ෂිකරුවෙක් දඬුව-
මින් නිදහස් නොවන්නේය.[9] බොරු-
කාරයෙකුට කිසි ගැලවීමක් නැත.[10]
**6** උත්තමයෙකුගේ හොඳ හිත
දිනාගැනීමට බොහෝදෙනෙක් උත්-
සාහ කරති.[11] තෑගිබෝග දෙන
තැනැත්තා සෑම කෙනෙකුගේම මිතු-
රෙකි.[12]
**7** දුප්පතාගේ සහෝදරයෝ පවා
ඔහුව හෙළාදකිති.[13] එසේනම්, ඔහුගේ
මිත්‍රයන් ඔහුගෙන් ඈත්ව සිටීම පුදුම-
යක්ද?[14] ඔහු උපකාර පැතුවත් කිසි-
වෙක් ඔහුට පිහිට වන්නේ නැත.[15]
**8** යමෙකු තම සිත පවිත්‍ර කරගන්-
නේ නම්[16] ඔහු තම ජීවිතයට ඇලුම්
කරයි. වටහාගැනීමේ හැකියාව රක්ෂා
කරගන්නා යහපත් දේ සොයාගනියි.[17]
**9** බොරු සාක්ෂිකරුවෙක් දඬුව-
මින් නිදහස් නොවන්නේය.[18] බොරු-
කාරයෙකුට අත් වන්නේ විනාශයයි.[19]
**10** සැප පහසු ජීවිතයක් ගත

---

**2** හිතෝ 15:16; හිතෝ 16:8; යාකො 2:5; **3** හොෂෙ 4:6; යොහ 16:3; රෝම 10:2; **4** හිතෝ 1:16; හිතෝ 6:18; **5** 1සාමු 13:13; 1රාජා 20:42; හිතෝ 5:23; ක්‍රියා 13:45; **6** ගණන් 16:30; එළි 16:9; **7** හිතෝ 14:20; **8** යෝබ් 19:13; **9** නික් 23:1; ද්වි 19:19; හිතෝ 25:18; **10** 1රාජා 2:9; හිතෝ 21:28; **11** උත් 43:11; හිතෝ 16:15; **12** හිතෝ 17:8; හිතෝ 18:16; **13** යෝබ් 30:10; හිතෝ 14:20; යාකො 2:6; **14** ගීතා 38:11; ගීතා 88:8; දේශ 9:15; යාකො 2:3; **15** හිතෝ 18:23; යාකො 2:16; 1යොහ 3:17; **16** හිතෝ 15:32; **17** හිතෝ 2:2; හිතෝ 3:21; හිතෝ 11:12; දානි 1:4; මතෙ 24:15; **18** හිතෝ 19:5; **19** එස 13:22; 2පේත්‍රු 2:3; එළි 21:8.

කිරීම මෝඩයෙකුට වටින්නේ නැත.[1]
එසේනම්, අධිපතියෙකුව පාලනය
කිරීම දාසයෙකුට කොහෙත්ම වටින-
වාද?[2]
**11** වටහාගැනීමේ ශක්තිය ඇති
මිනිසෙකුට ඉක්මනින් කේන්ති නො-
යයි.[3] වරද අමතක කර දැමීම ඔහු
සතු අලංකාර ගුණාංගයකි.[4]
**12** රජෙකුගේ කෝපය කේශර
සිංහයෙකුගේ ගර්ජනාව මෙනි.[5]
නමුත් ඔහු දක්වන කරුණාව තණ-
බිම මත වැටෙන පිනි බිඳු මෙනි.[6]
**13** මෝඩ පුතෙක් තම පියාට කර-
දර ගෙන දෙයි.[7] බිරිඳකගේ අඬද-
බර කැඩුණු වහලකින් නොනැවතී
වැටෙන වැහි බිඳු මෙනි.[8]
**14** නිවස හා වස්තුව පියෙකුගෙන්
ලැබෙන උරුමයකි.[9] එහෙත් බුද්ධි-
මත් බිරිඳක් ලැබෙන්නේ යෙහෝවා
දෙවිගෙන්ය.[10]
**15** යමෙක් අලසකම නිසා බර
නින්දකට වැටෙයි.[11] කම්මැළි
තැනැත්තා බඩගින්නෙන් පෙළෙන්-
නේය.[12]
**16** ආඥාව පිළිපදින්නා තම ජීවි-
තය රැකගනී.[13] එහෙත් තම හැසිරීම
ගැන නොසැලකිලිමත් වන්නාට මර-
ණය අත් වන්නේය.[14]
**17** දුප්පතාට කාරුණිකව සලකන
තැනැත්තා යෙහෝවා දෙවිට ණයට
දෙයි.[15] ඔහු දක්වන සැලකිල්ලට දෙවි
හොඳ ප්‍රතිඵල දෙයි.[16]
**18** ඔබේ පුත්‍රයාව යහමඟට ගැනී-
මට හැකියාව තිබෙන තාක් කල්
ඔහුව හික්මවන්න.[17] ඔහුට මරණ
දඬුවම ලැබෙන තුරු බලා නොසි-
ටින්න.[18]
**19** කෝපාවිෂ්ට තැනැත්තාට දඬු-
වමක් විඳින්න සිදු වෙයි.[19] එක් වරක්
ඔහුව දඬුවමින් නිදහස් කළොත්
ඔබට නැවත නැවත එසේ කිරීමට
සිදු වෙයි.[20]
**20** උපදෙස්වලට සවන් දී හික්-
මවීම පිළිගන්න.[21] එවිට ඔබ
අනාගතයේදී ප්‍රඥාවන්ත කෙනෙකු
වන්නෙහිය.[22]

**19 පරි.**
**1** 1සාමු 25:36
හිතෝ 30:22
**2** 2සාමු 3:24
2සාමු 3:39
දේශ 10:7
යෙසා 3:5
**3** හිතෝ 14:29
හිතෝ 15:18
හිතෝ 16:32
යාකො 1:19
**4** උත් 50:21
මතෙ 18:22
එෆි 4:32
**5** එස්ත 7:8
හිතෝ 16:14
හිතෝ 20:2
ආනි 2:12
මතෙ 25:41
**6** ගීතා 72:6
හොෂෙ 14:5
**7** 2සාමු 16:22
හිතෝ 10:1
හිතෝ 17:21
**8** හිතෝ 21:9
හිතෝ 25:24
හිතෝ 27:15
**9** ද්වි 21:16
2කොරි 12:14
**10** උත් 24:14
උත් 28:2
හිතෝ 18:22
හිතෝ 31:10
**11** හිතෝ 6:9
හිතෝ 20:13
හිතෝ 24:33
**12** හිතෝ 10:4
හිතෝ 23:21
හිතෝ 27:7
2තෙස 3:10
**13** හිතෝ 16:17
ලූක් 10:28
**14** හිතෝ 13:13
හිතෝ 15:32
**15** ලෙවී 25:35
ද්වි 15:7
ගීතා 37:26
ගීතා 112:5
2තිමෝ 1:16
හෙබ්‍රෙ 13:16
**16** හිතෝ 11:24
හිතෝ 21:13
හිතෝ 28:27
මතෙ 5:7
මතෙ 10:41
හෙබ්‍රෙ 6:10
යාකො 2:13
**17** 1සාමු 3:13
හිතෝ 13:24
හිතෝ 22:6
හිතෝ 22:15
හිතෝ 23:13
හිතෝ 29:15
හෙබ්‍රෙ 12:7
**18** ද්වි 21:20
**19** 2සාමු 16:5
එස්ත 5:9

**21** මිනිසෙකු බොහෝ දේ සැලසුම්
කළත්[1] ඉටු වන්නේ යෙහෝවා දෙවි-
ගේ කැමැත්තයි.[2]
**22** ප්‍රේමය* මිනිසෙකු තුළ
තිබෙන ඉතා වටිනා ගුණාංගයකි.[3]
බොරුකාරයෙකු වෙනවාට වඩා දුප්-
පතෙකු වීම හොඳය.[4]
**23** යෙහෝවා දෙවි කෙරෙහි ඇති
ගරුබිය යමෙකුව ජීවනයට මඟ
පෙන්වයි.[5] එවැනි අයෙකු රාත්‍රිය ගෙ-
වන්නේ සතුටිනි.[6] ඔහුට කිසි නපුරක්
සිදු නොවෙයි.[7]
**24** අලසයා කෑම බඳුනට තම අත
දැමුවද[8] එය කට ළඟට ගැනීමට
ඔහුට කම්මැළිය.[9]
**25** සමච්චල් කරන්නාට පහර
දෙන්න.[10] අද්දැකීම් අඩු තැනැත්තා
එය දැක බුද්ධිමත් වන්නේය.[11]
කාරණා හොඳින් තේරුම්ගන්නාට
අවවාද කරන්න. එවිට ඔහු දැනුම
ලබාගන්නේය.[12]
**26** පියාට කෲර ලෙස සලකන්-
නාවූ මවව එළවා දමන්නාවූ පුත්‍ර-
යෙකු[13] ලැජ්ජාසහගතව හැසිරෙන
නින්දිත තැනැත්තෙකි.[14]
**27** මාගේ පුත්‍රය, ඔබ හික්මවීම
ප්‍රතික්ෂේප කරන්නේ නම් නැණ-
වත් වදන්වලින් ඔබ ඉවතට හැරෙනු
ඇත.[15]
**28** කිසි කමකට නැති සාක්ෂික-
රුවෙක් යුක්තිය සුළු කොට තකයි.[16]

---

**20** 1සාමු 24:17; 1සාමු 26:21; **21** හිතෝ 1:8; හිතෝ 4:13; හිතෝ 8:10; ශෙප 3:7; හෙබ්‍රෙ 12:7; **22** ද්වි 8:16; ද්වි 32:29; ගීතා 90:12; හෙබ්‍රෙ 12:11; **2 තීරුව** **1** උත් 11:6; එස්ත 9:25; ගීතා 21:11; හිතෝ 16:9; දේශ 7:29; එළි 17:13; **2** උත් 11:7; උත් 50:20; යොෂු 23:14; හිතෝ 21:30; දානි 4:35; ක්‍රියා 5:39; හෙබ්‍රෙ 6:17; **3** 1ලේක 29:17; හිතෝ 11:17; මීකා 6:8; **4** මාක් 12:41; 2කොරි 8:2; **5** ගීතා 85:9; හිතෝ 1:7; හිතෝ 14:27; මලා 3:16; ක්‍රියා 9:31; **6** හිතෝ 3:24; දේශ 5:12; මතෙ 5:6; **7** හිතෝ 12:21; 2තිමෝ 4:18; **8** හිතෝ 6:9; හිතෝ 15:19; **9** හිතෝ 24:30; හිතෝ 26:14; **10** ද්වි 25:2; හිතෝ 21:11; හිතෝ 22:10; **11** හිතෝ 10:13; හිතෝ 15:5; **12** යෝබ් 6:24; හිතෝ 9:9; එළි 3:19; **13** ලෙවී 20:9; ද්වි 27:16; හිතෝ 17:25; හිතෝ 20:20; හිතෝ 23:22; හිතෝ 30:11; හිතෝ 30:17; මීකා 7:6; 2තිමෝ 3:2; **14** නික් 20:12; හිතෝ 10:5; හිතෝ 17:2; **15** හිතෝ 4:5; හිතෝ 18:1; ලූක් 8:18; **16** 1රාජා 21:10; හිතෝ 14:5; මීකා 7:3; ක්‍රියා 6:11.

---

**හිතෝ 19:22*** හෝ, “ළැදි ප්‍රේමය.”

දුෂ්ටයෝ නපුරු දේ කිරීමෙන් ආස්වාදයක් ලබති.[1]

**29** සමච්චල් කරන්නන්ට දඬුවම් කිරීමටද[2] මෝඩයන්ට පහර දීමටද නියම කර ඇත.[3]

**20** වයින් සමච්චල් කරන්නෙකි.[4] මත්පැන් කෝලහල ඇති කරන්නෙකි.[5] එයින් මුළාව යන්නෝ අඥානයෝය.[6]

**2** රජෙකු කෝපය පිට කරන විට එය කේශර සිංහයෙකුගේ ගර්ජනාව මෙනි.[7] ඔහුව කෝපයට පත් කරන තැනැත්තා තමාගේම ජීවිතය අනතුරට ලක් කරගනියි.[8]

**3** විවාද කිරීමෙන් වැළකී සිටීම මිනිසෙකු සතු උතුම් ගතිලක්ෂණයකි.[9] නමුත් අඥාන සියල්ලෝ බැණවැදීමට ඉක්මන් වෙති.[10]

**4** ශීත කාලයේදී අලසයා බීජ වපුරන්නේ නැත.[11] අස්වැන්න නෙළන කාලයේදී ඔහු සිඟමනේ ගියත් ඔහුට කිසිවක් ලැබෙන්නේ නැත.[12]

**5** මිනිසෙකුගේ සිතේ කල්පනාව ගැඹුරු ජලය මෙනි.[13] එහෙත් වටහාගැනීමේ හැකියාව ඇති මිනිසා එය ඇදගනියි.[14]

**6** බොහෝ අය තමන්ගේම කරුණාවන්තකම* ගැන කතා කරති.[15] එහෙත් විශ්වාසවන්තව කටයුතු කරන මිනිසෙකුව සොයාගත හැක්කේ කාටද?[16]

**7** ධර්මිෂ්ඨයා දෙවිට විශ්වාසවන්තව සිටියි.[17] එහෙයින් ඔහුගේ පුත්‍රයන්ද සන්තෝෂය ලබයි.[18]

**8** රජතුමා විනිශ්චයාසනයේ හිඳගෙන[19] සියල්ල විමසා බලා සෑම නපුරු ක්‍රියාවක්ම දුරු කරයි.[20]

**9** "මාගේ සිත මම පවිත්‍ර කරගත්තෙමි.[21] මට කිසි පාපයක් නැත"[22] යයි කිව හැක්කේ කාටද?

**10** මිනුම් පඩි දෙවර්ගයක් හා ඒපා මිනුම්* දෙවර්ගයක්[23] තබාගැනීම යෙහෝවා දෙවිට පිළිකුලක්ය.[24]

**11** දරුවෙකුගේ ක්‍රියාවලින් ඔහු නිර්මල, ප්‍රතිපත්තිගරුක කෙනෙකුදැයි පෙනී යන්නේය.[1]

**12** ඇසීමට කනද දැකීමට ඇසද සෑදුවේ යෙහෝවා දෙවිය.[2]

**13** නින්දට අධික ආශාවක් ඇති කරගන්න තැනැත්තා දිළිඳුකමට වැටෙයි.[3] ඒ නිසා නින්දට ආශා නොකර අවදිව සිටින්න. එවිට කෑම කා තෘප්තියට පත් වෙන්න ඔබට පුළුවන.[4]

**14** "මෙය වටින්නේ නැත, වටින්නේ නැත" යයි කියමින් යමෙක් භාණ්ඩයක් මිල දී ගනී.[5] පසුව ඔහු එතැනින් ගොස් තමා කළ දේ ගැන පුරසාරම් දොඩයි.[6]

**15** රන් ඇත. බොහෝ කොරල්ද තිබේ. එහෙත් දැනුම පතුරුවන තොල් අගනා ආභරණ වැනිය.[7]

**16** නාඳුනන කෙනෙකු වෙනුවෙන් ඇප වී සිටින තැනැත්තාගේ වස්ත්‍රය පැහැරගන්න.[8] දුරාචාරයේ යෙදෙන ස්ත්‍රියක සමඟ එක් වී සිටින තැනැත්තාගෙන් ඇපයක් ගත යුතුයි.[9]

**17** වංචාවෙන් උපයාගත් කෑම මිනිසෙකුට රසවත් වුවද[10] පසු කලෙක ඔහුට ගල්කැට කන්න සිදු වෙයි.[11]

**18** උපදෙස් ලබාගෙන කරන සැලසුම් සාර්ථක වෙයි.[12] යුද්ධ කරන විට අන් අයගෙන් නැණවත් උපදෙස් පතන්න.[13]

**19** තැනින් තැන ගොස් නින්දා බස් දොඩන්නා අන් අයගේ රහස් හෙළි කරයි.[14] පමණට වඩා කතා කරන තැනැත්තාව ඇසුරු නොකරන්න.[15]

---

**19 පරි.**

**1** හිතෝ 4:16, හිතෝ 4:17, හොෂෙ 4:8
**2** හිතෝ 3:34, හිතෝ 9:12, ක්‍රියා 13:41, 2පේතෘ 3:3
**3** හිතෝ 10:13, හිතෝ 26:3

**20 පරි.**

**4** උත් 9:21, ගීතා 107:27, හිතෝ 23:31, යෙසා 19:14
**5** යෙසා 28:7
**6** 1සාමු 25:36, හිතෝ 23:32, 1කොරි 6:10, ගලා 5:21, එෆී 5:18
**7** හිතෝ 19:12, දේශ 10:4
**8** 1රාජා 2:23, එස්ත 7:7
**9** හිතෝ 14:29, එෆී 4:32, 2තිමෝ 2:23
**10** හිතෝ 14:17, හිතෝ 18:6, දේශ 7:9, යාකො 4:1
**11** හිතෝ 19:15
**12** හිතෝ 6:11, හිතෝ 24:34, 2තෙස 3:10
**13** හිතෝ 18:4
**14** හිතෝ 2:3
**15** හිතෝ 27:2, මතෙ 6:2, ලූක් 18:11
**16** ගීතා 12:1, දේශ 7:28, යෙරෙ 5:1, මීකා 7:2, ලූක් 18:8
**17** යෝබ් 1:1, ගීතා 26:1, හිතෝ 14:2, මතෙ 11:11, ලූක් 1:6
**18** උත් 12:3, ගීතා 37:26, ක්‍රියා 2:39
**19** 2සාමු 23:3, 1රාජා 2:12, 1රාජා 7:7, මතෙ 19:28
**20** 1රාජා 3:28, ගීතා 72:4, හිතෝ 16:12
**21** යෝබ් 14:4, රෝම 3:10
**22** 1රාජා 8:46, ගීතා 51:5, දේශ 7:20, යාකො 3:2

---

හිතෝ **20:6*** හෝ, "ළැදි ප්‍රේමය." **10*** නික් 16:36හි පාදසටහන බලන්න.

**23** හිතෝ 16:11; ආමො 8:5; මීකා 6:11; **24** හිතෝ 11:1; **2 තීරුව** **1** ගීතා 58:3; හිතෝ 22:15; මතෙ 7:17; ලූක් 1:15; **2** නික් 4:11; ගීතා 94:9; ක්‍රියා 26:18; එෆී 1:18; **3** හිතෝ 10:4; **4** හිතෝ 12:11; **5** හිතෝ 14:31; හිතෝ 21:6; හොෂෙ 12:7; **6** ලෙවී 19:13; **7** හිතෝ 3:15; හිතෝ 8:10; දේශ 12:9; එෆී 4:29; **8** නික් 22:26; හිතෝ 11:15; **9** උත් 38:18; හිතෝ 2:16; හිතෝ 5:3; **10** හිතෝ 4:17; හිතෝ 9:17; **11** හිතෝ 6:31; දේශ 11:9; විලා 3:16; **12** හිතෝ 15:22; **13** විනි 1:1; 1සාමු 18:14; හිතෝ 24:6; ලූක් 14:31; **14** ලෙවී 19:16; හිතෝ 11:13; හිතෝ 25:9; හිතෝ 25:23; **15** හිතෝ 16:29; රෝම 16:18.

**20** පියාට හෝ මවට හෝ ශාප කරන[1] කෙනාගේ පහන අඳුර වැටීගෙන එද්දී නිවී යයි.[2]

**21** කෑදරකමින් උරුමයක් ලබාගත්තත්[3] අනාගතයේදී එයින් කිසිදු ආශීර්වාදයක් ලැබෙන්නේ නැත.[4]

**22** ඔබට නපුරක් සිදු වූ විට, "මම පළිගන්නෙමි" යයි නොකියන්න.[5] යෙහෝවා දෙවි කෙරෙහි බලාපොරොත්තු තබන්න.[6] ඔහු ඔබව ගලවනු ඇත.[7]

**23** මිනුම් පඩි දෙවර්ගයක් තබාගැනීම යෙහෝවා දෙවිට පිළිකුලක්ය.[8] හොර තරාදියක් තබාගැනීමද සුදුසු නැත.[9]

**24** මිනිසා ගත යුතු පියවර යෙහෝවා දෙවි පෙන්වා දෙයි.[10] තමා යා යුතු මඟ කුමක්ද කියා මිනිසාට තනිවම වටහාගත හැකිද?[11]

**25** යමෙකු දුර දිග නොබලා, "මෙය කැප කරන්නෙමි"[12] යයි කියමින් භාරයක් වුණොත්[13] එය ඔහුටම උගුලක් වේ. ඔහු එහි බැරෑරුම්කම ගැන සිතා බලන්නේ භාරය වූ පසුවයි.[14]

**26** ප්‍රඥාවන්ත රජෙකු දුෂ්ටයන්ව මඩින්නේය.[15] ඔහු ඔවුන් පිට ධාන්‍ය මඩින රෝදයක් කරකවයි.[16]

**27** මිනිසෙකුගේ මුවින් පිට කරන දේ*[17] යෙහෝවා දෙවි දැල්වූ පහනක් මෙනි. එමගින් ඔහුගේ ඇතුළාන්තය මුළුමනින්ම සෝදිසි කරනු ලැබේ.[18]

**28** කරුණාව* හා විශ්වාසවන්තකම රජුව ආරක්ෂා කරයි.[19] කරුණාවන්තකම මගින් ඔහු තම පාලනය ස්ථිර කරගනී.[20]

**29** තරුණයන්ගේ අලංකාරය වන්නේ ඔවුන්ගේ ශක්තියයි.[21] මහලු අයව ගෞරවයට පත් කරන්නේ ඔවුන්ගේ පැසුණු හිසකෙස්ය.[22]

**30** වරදකරුවෙකු නපුරෙන් ඉවත් වන පිණිස ඔහුට තළන්න.[23] එසේ දෙන හික්මවීම ඔහුගේ සිතට හොඳින් කාවදියි.[24]

# 21

**21** රජෙකුගේ සිත යෙහෝවා දෙවිගේ අතේ තිබෙන දිය පහරක් මෙනි.[1] ඔහු කැමති කැමති අතට එය හරවන්නේය.[2]

**2** මිනිසෙකුට තමාගේ සියලු ක්‍රියා හරියයි පෙනේ.[3] නමුත් යෙහෝවා දෙවි මිනිසාගේ සිතුම් පැතුම් සෝදිසි කර බලයි.[4]

**3** පූජාවට වඩා යෙහෝවා දෙවිට වටින්නේ ධර්මිෂ්ඨකම හා යුක්තියයි.[5]

**4** උඩඟු ඇස් හා අහංකාර සිතක්[6] තිබීම පාපයකි. ඒවා දුෂ්ටයන්ට පහනක් මෙනි.[7]

**5** උත්සාහවන්තයාගේ සැලසුම් සාර්ථක වෙයි.[8] එහෙත් දුර දිග නොබලා ක්‍රියා කරන්නා දිළිඳෙකු බවට පත් වෙයි.[9]

**6** බොරු ගොතමින් වංචා කරමින් රැස් කරගත් වස්තුව සුසුමක් මෙන් විගස අතුරුදහන් වී යයි.[10] එසේ වස්තු රැස් කරගන්නා මරණයට අත වනයි.[11]

**7** දුෂ්ටයෝ යුක්තිය එපා කරන්නෝය.[12] අනුන්ට කරන අපරාධ ඔවුන්ටම සිදු වී ඔවුන් විනාශ වී යයි.[13]

**8** දෙවිව නාඳුනන කෙනෙකුගේ ක්‍රියා වංකය.[14] නමුත් නිර්දෝෂ තැනැත්තාගේ ක්‍රියා අවංකය.[15]

**9** අඬදබර කරන බිරිඳක සමඟ එක ගෙයි වාසය කරනවාට වඩා[16] වහල උඩ වාසය කිරීම හොඳය.[17]

**10** දුෂ්ටයා නපුරු දේ කිරීමට බොහෝ සෙයින් ආශා කරයි.[18] ඔහු

---

**හිතෝ 20:27*** මූ.අ., "හුස්ම." **28*** හෝ, "ලැදි ප්‍රේමය."

**20 පරි.**

**1** නික් 20:12; නික් 21:17; ලෙවී 20:9; ද්වි 27:16; හිතෝ 19:26; 2තිමෝ 3:2
**2** යෝබ් 18:5; හිතෝ 13:9
**3** 1රාජා 21:15; හිතෝ 23:10; හිතෝ 28:20
**4** හිතෝ 28:8; හබ 2:6; 1තිමෝ 6:9
**5** ද්වි 32:35; හිතෝ 24:29; මතෙ 5:38; රෝම 12:17; 1තෙස 5:15; 1පේතෘ 3:9
**6** ගීතා 27:14; ගීතා 37:34; රෝම 15:13
**7** 2සාමු 16:12; ගීතා 34:7; 1පේතෘ 4:19
**8** එස 45:10
**9** හිතෝ 20:10
**10** ගීතා 37:23; යෙරෙ 10:23
**11** ගීතා 25:12; හිතෝ 14:8; හිතෝ 16:9
**12** ලෙවී 27:9
**13** දේශ 5:4; මලා 3:8; මාක් 7:11
**14** ගණන් 30:2; දේශ 5:6; මතෙ 5:33
**15** 2සාමු 4:10; ගීතා 101:8; හිතෝ 20:8
**16** ගීතා 94:23; යෙසා 28:27
**17** උත් 2:7; උත් 7:22; යෙසා 42:5; ක්‍රියා 17:25
**18** ගීතා 7:9; හිතෝ 16:2; හෙබ්‍රෙ 4:12
**19** ගීතා 61:7; හිතෝ 16:6
**20** ගීතා 21:7; යෙසා 16:5
**21** 1තිමෝ 4:8
**22** ලෙවී 19:32; හිතෝ 16:31
**23** ගීතා 119:71; හිතෝ 22:15
**24** හෙබ්‍රෙ 12:10

**2 තීරුව**

**21 පරි.**

**1** නික් 14:4; එස්රා 7:27; ගීතා 106:46
**2** නෙහෙ 2:8; යෙසා 44:28; එළි 17:17; **3** ගීතා 36:2; හිතෝ 16:2; හිතෝ 30:12; **4** 1සාමු 16:7; හිතෝ 24:12; යෙරෙ 17:10; **5** 1සාමු 15:22; ගීතා 50:14; හොෂෙ 6:6; මීකා 6:7; මතෙ 12:7; මාක් 12:33; **6** 2සාමු 22:28; ගීතා 10:4; ගීතා 18:27; ගීතා 101:5; හිතෝ 6:17; හිතෝ 14:3; යෙසා 2:11; ලූක් 18:14; 1පේතෘ 5:5; **7** උත් 6:5; රෝම 6:12; **8** හිතෝ 13:4; 1තෙස 4:11; **9** හිතෝ 14:29; **10** හිතෝ 10:2; හිතෝ 20:21; **11** හිතෝ 1:19; රෝම 6:23; **12** ගීතා 7:16; එස 18:24; **13** යෙසා 1:23; එස 18:18; මීකා 3:11; **14** දේශ 8:13; දේශ 9:3; එෆී 2:2; **15** ගීතා 37:37; හිතෝ 16:17; දානි 12:10; 1පේතෘ 1:22; **16** හිතෝ 17:1; හිතෝ 19:13; හිතෝ 27:15; **17** හිතෝ 25:24; **18** උත් 6:5; ගීතා 36:4; 1කොරි 10:6; ගලා 6:7; යාකො 4:5; 1යොහ 2:16.

තමාව ඇසුරු කරන අයට කිසි අනුකම්පාවක් නොපෙන්වයි.[1]

**11** සමච්චල් කරන්නාට දඬුවම් කරන්න. අද්දැකීම් අඩු තැනැත්තා එය දැක ප්‍රඥාවන්ත වෙයි.[2] ප්‍රඥාවන්ත තැනැත්තෙකුට කාරණා හොඳින් අවබෝධ කර දෙන්න. එවිට ඔහු දැනුම් තේරුම් ඇතුව ක්‍රියා කරයි.[3]

**12** ධර්මිෂ්ඨ තැනැත්තාණන්* දුෂ්ටයාගේ නිවස ගැන සෝදිසියෙන් සිටියි.[4] ඔහු දුෂ්ටයන්ව පාගා දමා විනාශයට පමුණුවයි.[5]

**13** අසරණයා පිහිට පතන විට යමෙකු කන් වසාගෙන සිටින්නේ නම්[6] ඔහු කරන කන්නලව්වලටත් පිළිතුරු නොලැබෙන්නේය.[7]

**14** රහසින් දෙන තෑග්ගක් නිසා කෝපය පහ වී යයි.[8] අල්ලසකින්[9] උදහස පවා නිවා දැමිය හැක.

**15** යුක්තිය ඉටු කිරීම ධර්මිෂ්ඨයාට ප්‍රීතියකි.[10] එහෙත් නපුරු දේ කරන අයට අත් වන්නේ භයානක විනාශයකි.[11]

**16** සිහිබුද්ධිය අත්හරින්නා[12] මිනීවළට යන්නේය.[13]

**17** විනෝදකාමී ජීවිතයකට ඇලුම් වන්නා දුගීකමට පත් වෙයි.[14] වයින්වලටත් තෙල්වලටත් අධික ආශාවක් ඇති කරගන්නා කිසිදා පොහොසත් නොවෙයි.[15]

**18** ධර්මිෂ්ඨයාව බේරාගැනීමට දුෂ්ටයාව භාර දෙනු ලැබේ.[16] ප්‍රතිපත්තිගරුක අයගේ ජීවිත ගලවාගැනීමට ද්‍රෝහිකම් කරන අයව දෙනු ලැබේ.[17]

**19** අඬදබර කරන බිරිඳක සමඟ ජීවත් වීමට වඩා කාන්තාරයක තනිව විසීම හොඳය.[18]

**20** ප්‍රඥාවන්තයාගේ නිවසේ අගනා වස්තුවලින්ද තෙල්වලින්ද අඩුවක් නැත.[19] නමුත් අඥානයා ඒවා නැති නාස්ති කර දමයි.[20]

**21** ධර්මිෂ්ඨකමටත් කරුණාවටත්* ප්‍රිය කරන තැනැත්තාට[1] ජීවනයද යුක්තියද ගෞරවයද ලැබෙයි.[2]

**22** ප්‍රඥාවන්තයෙක් බලවත් නුවරක පවුරට නැඟ එහි වැසියන්ගේ විශ්වාසයට හේතු වූ බලකොටු පවා බිඳ දමයි.[3]

**23** තම වචන කල්පනාකාරීව හසුරුවන තැනැත්තා දුක් කරදරවලින් තම ජීවිතය ආරක්ෂා කරගනියි.[4]

**24** හිස උදුම්මාගෙන විගස කෝපය පිට කරන තැනැත්තාව හඳුන්වන්නේ උද්ධච්ච, පුරසාරම් දොඩන්නෙකු ලෙසය.[5]

**25** අලසයා වැඩ නොකරයි.[6] ඒ නිසා ඔහුගේ ආශාවන් ඔහුව මරණයට ළඟා කරයි. **26** දවස පුරාම ඔහුගේ ආශාවන් ඔහු තුළම ඇවෙයි. එහෙත් ධර්මිෂ්ඨයා නොමසුරුව දෙන්නේය.[7]

**27** දුෂ්ටයන් ඔප්පු කරන පූජා පිළිකුලකි.[8] එසේනම්, නින්දිතව හැසිරීමෙන් අනතුරුව ඔප්පු කරන පූජාවක් ඊට වඩා කොපමණ පිළිකුලක් වේද![9]

**28** බොරු සාක්ෂිකරුවෙක් විනාශ වී යයි.[10] එහෙත් හොඳ අවධානයකින් සවන් දෙන තැනැත්තා සැමදා ජීවත් වෙයි.[11]

**29** දුෂ්ටයා කිසි භයක් නැතුව ක්‍රියා කරයි.[12] එහෙත් සාර්ථක වන්නේ ප්‍රතිපත්තිගරුක තැනැත්තාය.[13]

**30** යෙහෝවා දෙවිට විරුද්ධව යොදාගත හැකි ප්‍රඥාවක්වත් උපායක්වත් උපදේශයක්වත් නැත.[14]

**31** යුධ දවස සඳහා අශ්වයාව

**21 පරි.**
**1** 1සාමු 25:8; යාකො 2:13
**2** හිතෝ 19:25
**3** හිතෝ 9:9; දේශ 7:25
**4** ද්වි 16:20; යෝබ් 21:28; ගීතා 37:10; ගීතා 91:8; ගීතා 101:8
**5** උත් 19:29; ගීතා 37:20; හිතෝ 13:6; හිතෝ 14:32; 2පේතෘ 2:4; 2පේතෘ 3:6
**6** ද්වි 15:9; හිතෝ 19:17; හිතෝ 28:27; යාකො 5:4
**7** ගීතා 18:41; හිතෝ 1:28; විලා 3:44
**8** හිතෝ 18:16
**9** හිතෝ 17:23
**10** යෝබ් 29:13; ගීතා 106:3
**11** හිතෝ 10:29; ලූක් 13:27; එළි 22:15
**12** ගීතා 125:5; හෙබ්‍රෙ 6:4; 2පේතෘ 2:21
**13** හිතෝ 2:19; හිතෝ 9:18; යාකො 1:15
**14** දේශ 7:4; ලූක් 15:13; 2තිමෝ 3:4
**15** හිතෝ 23:21
**16** හිතෝ 11:8; යෙසා 43:4
**17** එස්ත 7:10; හිතෝ 13:22
**18** හිතෝ 17:1; හිතෝ 27:15
**19** ගීතා 112:3; හිතෝ 15:6; දේශ 5:19
**20** ලූක් 15:14

**2 තීරුව**
**1** හිතෝ 15:9; මතෙ 5:6; හෙබ්‍රෙ 12:14
**2** හිතෝ 22:4; රෝම 2:7
**3** දේශ 7:19; දේශ 9:16; 2කොරි 10:4
**4** ගීතා 141:3; හිතෝ 10:19; හිතෝ 12:13; හිතෝ 13:3; දේශ 10:20
**5** ගණන් 14:44; එස්ත 6:4; හිතෝ 16:18; යාකො 4:16; **6** හිතෝ 6:6; හිතෝ 13:4; හිතෝ 19:24; **7** ගීතා 37:26; ගීතා 112:9; ලූක් 6:30; 2කොරි 8:9; **8** 1සාමු 15:22; හිතෝ 15:8; යෙසා 1:11; යෙරෙ 6:20; **9** ලෙවී 18:17; ද්වි 23:18; විනි 20:6; 1සාමු 13:12; **10** නික් 23:1; ද්වි 19:18; හිතෝ 6:19; හිතෝ 19:5; **11** හිතෝ 12:19; මතෙ 7:24; **12** හිතෝ 28:14; හිතෝ 29:1; යෙරෙ 3:3; **13** හිතෝ 11:5; 1තෙස 3:11; **14** ගණන් 23:8; හිතෝ 19:21; ක්‍රියා 5:39; රෝම 8:31.

**හිතෝ 21:12*** මෙහි සඳහන් කරන්නේ, යෙහෝවා දෙවි ගැනයි.

**හිතෝ 21:21*** හෝ, "ලැදි ප්‍රේමය."

සූදානම් කර ඇත.[1] නමුත් ගැලවීම
ලබා දෙන්නේ යෙහෝවා දෙවිය.[2]

**22** වස්තු සම්භාරයක් තිබීමට
වඩා වටින්නේ හොඳ නමක්
ඇතුව සිටීමයි.[3] හොඳ නමක් දිනාගැ-
නීම රන් රිදීවලටත් වඩා වටින්නේය.[4]
**2** ධනවතාද දුප්පතාද එක සමා-
නය.[5] මන්ද ඔවුන් දෙදෙනාටම ජීවි-
තය දුන්නේ යෙහෝවා දෙවිය.[6]
**3** බුද්ධිමත් අය අවදානම දුර
තියාම හඳුනාගෙන එයින් ඉවත්
වෙති.[7] නමුත් අද්දැකීම් අඩු අය ඒ
දෙසටම ගමන් කර ප්‍රතිඵල විඳිති.[8]
**4** යෙහෝවා දෙවි කෙරෙහි ගරු-
බිය ඇතුව යටහත්පහත්ව සිටීමෙන්
වස්තුවද ගෞරවයද ජීවනයද ලැබේ.[9]
**5** වංක තැනැත්තාගේ ගමන්
මඟෙහි කටු ගස්ද උගුල්ද ඇත.[10]
එහෙත් තම ජීවිතය රැකගන්නා ඒවා-
යින් ආරක්ෂා වෙයි.[11]
**6** දරුවෙකුට හරි මඟෙහි යෑමට
අවශ්‍ය පුහුණුව ලබා දෙන්න.[12] එවිට
ඔහු වයසට ගිය පසුත් එයින් අහක්ව
යන්නේ නැත.[13]
**7** ධනවතා දුප්පතුන්ව පාලනය
කරයි.[14] ණයගැතියා ණයහිමියාගේ
සේවකයෙකි.[15]
**8** අධර්මිෂ්ඨකම වපුරන්නා නරක
අස්වැන්නක් නෙළාගනී.[16] ඔහුගේ
කෲර ආධිපත්‍යය* වැඩි කල් පවතින්-
නේ නැත.[17]
**9** කරුණාවන්ත තැනැත්තාට
ආශීර්වාද කරනු ලැබේ. මන්ද ඔහු
තම කෑම පංගුවෙන් දුප්පතාට කන්න
දී ඇත.[18]
**10** සමච්චල් කරන්නාව එළවා
දමන්න. එවිට රණ්ඩු දබරද පැමිණි-
ලිද නින්දාවද පහව යයි.[19]
**11** සිත පවිත්‍රව තබාගැනීමට
කැමැත්තක් දක්වන්නාවූ,[20] ප්‍රිය වදන්
කතා කරන තැනැත්තා රජුගේ මිත්‍ර-
රෙක් වෙයි.[21]

**12** යෙහෝවා දෙවි දැනුම ඇති
අය දෙස බලා ඔවුන්ව ආරක්ෂා
කරයි.[1] නමුත් ද්‍රෝහිව කටයුතු කරන
අයගේ වචන ඔහු නිෂ්ඵල කරයි.[2]
**13** "මංසන්ධියේ සිංහයෙක් සිටියි.[3]
මම එළියට ගියොත් ඌ මාව මරා
දමයි" කියා අලසයා පවසයි.[4]
**14** අනාචාරයේ යෙදෙන ස්ත්‍රියක-
ගේ මුඛය ගැඹුරු වළක් මෙනි.[5] යෙ-
හෝවා දෙවිගේ උදහසට ලක් වන
තැනැත්තා එම වළට වැටෙයි.[6]
**15** මෝඩකම දරුවෙකුගේ
සිතෙහි පැළපදියම් වී ඇත.[7] හික්ම-
වීම නමැති වේවැල* මඟින් එය දුරු
කළ හැකිය.[8]
**16** බොහෝ වස්තු රැස් කරගන්නා
පිණිස දුප්පතාට වංචා කරන්නාටද[9]
පොහොසතාට තෑගි දෙන්නාටද අග-
හිඟකම් ඇති වෙයි.[10]
**17** ප්‍රඥාවන්තයාගේ වදන් දෙසට
ඔබේ කන් යොමු කර[11] මා දෙන
දැනුම සිතට ගන්න.[12] **18** මන්ද ඒ
කාරණා ඔබේ සිත තුළම තබා-
ගෙන[13] නිතරම ඒ ගැන කතා
කරන්නෙහි නම් ඔබ ප්‍රීතියක් ලබන්-
නෙහිය.[14]
**19** ඔබ යෙහෝවා දෙවි කෙරෙහි
විශ්වාසය තබන පිණිස[15] මම අද
ඔබව දැනුවත් කළෙමි.
**20** මම ඔබට උපදෙස් හා දැන-
මුතුකම් ලියා දුන්නෙමි.[16] **21** එසේ
කළේ මේ සැබෑ කියමන් කෙරෙහි
ඔබේ විශ්වාසය ගොඩනංවන පිණි-
සය. දැන් නැවත ඔබව එවූ
තැනැත්තා වෙතට ගොස් මේ සත්‍ය-
යන් ඔහු සමඟ බෙදාගන්න.[17]
**22** දුප්පතාගේ අසරණකම වාසි-
යට ගෙන ඔහුගෙන් සොරකම් නො-

**21 පරි.**
1 ගීතා 20:7, යෙසා 31:1, යෙරෙ 46:4, එළි 19:11
2 2ලේක 20:17, ගීතා 3:8, ගීතා 33:17, ගීතා 68:20, එළි 7:10

**22 පරි.**
3 දේශ 7:1
4 හෙබ්‍රෙ 11:26
5 ගීතා 49:2, හිතෝ 29:13
6 යෝබ් 31:15, යෝබ් 34:19, ක්‍රියා 17:26
7 නික් 9:20, හිතෝ 27:12
8 හිතෝ 29:1
9 ගීතා 34:9, හිතෝ 18:12, යාකො 4:10
10 යොෂු 23:12, යොෂු 23:13, ගීතා 11:6
11 හිතෝ 1:15, හිතෝ 4:15, 1යොහ 5:18
12 උත් 18:19, ද්වි 6:7, එෆී 6:4
13 2තිමෝ 3:15
14 යාකො 2:6
15 2රාජා 4:1, නෙහෙ 5:4, මතෙ 18:25
16 හොෂෙ 8:7, ගලා 6:7
17 ගීතා 125:3, යෙසා 9:4
18 ද්වි 15:7, ගීතා 41:1, හිතෝ 11:25, ලූක් 6:35, හෙබ්‍රෙ 6:10
19 උත් 21:10
20 මතෙ 5:8
21 ගීතා 45:2, හිතෝ 16:13

**2 තීරුව**
1 යෙසා 11:9
2 ක්‍රියා 13:10, 2තෙස 2:8
3 හිතෝ 26:13
4 හිතෝ 15:19
5 හිතෝ 5:3, හිතෝ 23:27, දේශ 7:26
6 එළි 2:20
7 උත් 8:21
8 හිතෝ 13:24, හිතෝ 19:18, හිතෝ 23:14, හිතෝ 29:15, හෙබ්‍රෙ 12:10

**9** ගීතා 12:5; හිතෝ 14:31; මීකා 2:2; **10** ලූක් 14:12; **11** හිතෝ 5:1; හිතෝ 13:20; යෙසා 55:3; මතෙ 17:5; **12** හිතෝ 15:14; හිතෝ 23:12; **13** ගීතා 119:103; හිතෝ 2:10; හිතෝ 24:14; **14** හිතෝ 15:7; **15** ගීතා 62:8; හිතෝ 3:5; යෙසා 12:2; 1පේතෘ 1:21; **16** හිතෝ 8:6; 2තිමෝ 3:15; **17** 2තිමෝ 2:2.

**හිතෝ 22:8*** මු.අ., "කෝපය නමැති ඔහුගේ වේවැල."

**හිතෝ 22:15*** හිතෝ 13:24හි පාදසටහන බලන්න.

කරන්න.[1] නුවර දොරටුව අසලදී
පීඩිත වූවන්ට හිරිහැර නොකරන්න.[2]
**23** මන්ද යෙහෝවා දෙවිම ඔවුන් වෙ-
නුවෙන් පෙනී සිට ඔවුන්ට සාධාර-
ණය ඉටු කර දෙන්නේය.[3] ඔවුන්ගෙන්
සොරකම් කරන අයගේ ජීවිත පැහැ-
රගන්නේය.[4]
**24** ඉක්මනින් කෝප වන
තැනැත්තෙකු සමඟ මිත්‍ර නො-
වන්න.[5] හදිසි කෝපයෙන් ක්‍රියා
කරන්නෙකු සමඟ ඇසුරු නොක-
රන්න. **25** ඔහුව ඇසුරු කළොත්
ඔබ ඔහුගේ මාර්ගවලට හුරු වී උගු-
ලකට හසු වනු ඇත.[6]
**26** යමෙකුට අතට අත දී ගිවිසු-
මක් ඇති කරගෙන[7] ණයකට
ඇප නොවන්න.[8] **27** ඇපය ගෙවී-
මට ඔබට හැකියාවක් නැත්නම් ඔහු
ඔබේ නිදන ඇඳ රැගෙන යයි. ඔබ ඒ
තත්වයට පත් විය යුත්තේ මන්ද?
**28** පුරාණයේදී ඔබේ මුතුන්-
මිත්තන්ට උරුම වූ ඉඩම්වල මායිම්
වෙනස් නොකරන්න.[9]
**29** මිනිසෙක් තමා කරන වැඩය
දක්ෂ ලෙස කරන්නෙහි නම් ඔහු
රජවරුන් ඉදිරියට යන්නේය.[10] ඔහු
සාමාන්‍ය අය අතරේ නොසිටිනු ඇත.

**23** ඔබ රජෙකු සමඟ එක
මේසයේ හිඳගෙන කෑම
කන්නෙහි නම් ඔබ සිටින්නේ කො-
තැනද කියා අමතක නොක-
රන්න.[11] **2** ඔබ කෑමට බීමට ලොල්
වූ කෙනෙකු නම් ඔබවම පාලනය
කරගැනීම හොඳය.*[12] **3** රස නහර
පිනවන ඔහුගේ කෑමවලට අධික
ආශාවක් ඇති කර නොගන්න. මන්ද
ඔහු එය දෙන්නේ අවංක සිතකින්
නොවෙයි.[13]
**4** පොහොසත් වීමට වෙහෙස
නොවන්න.[14] ඔබේම නුවණෙහි රඳා
නොසිටින්න.[15] **5** සුළු මොහොත-
කින් නැති වී යන වස්තුව කෙරෙහි
ඔබේ සිත ඇදී ගොස් ඇද්ද?[16] ඔබ
බලා සිටියදීම එය රාජාලියෙකු මෙන්
තටු විහිදා ඇතින් ඇතට පියඹා යයි.[1]
**6** මසුරු කෙනෙකු දෙන කෑම
නොකන්න.[2] ඔහුගේ රසවත් කෑම-
වලට ආශා නොකරන්න.[3] **7** මන්ද
ඔහු කපටි ලෙස කුමන්ත්‍රණය කරන්-
නෙකි.[4] "කන්න, බොන්න" කියා ඔහු
ඔබට කියන නමුත් ඔහු එසේ කියන්-
නේ යටි අදහසකිනි.[5] **8** පසුව ඔහු
දුන් කෑම ඔබට වමාරන්න සිදු වෙයි.
ඔබ පැවසූ ප්‍රියමනාප වදන්වලින් කිසි
පලක් නොවනු ඇත.[6]
**9** මෝඩයෙකු සමඟ කතා නොක-
රන්න.[7] මන්ද ඔහු ඔබේ බුද්ධිමත්
වදන් හෙළාදකිනු ඇත.[8]
**10** පුරාණයේදී වෙන් කරනු ලැබූ
ඉඩම්වල මායිම් වෙනස් නො-
කරන්න.[9] පියා නැති දරුවන්ගේ
ඉඩම්වලට බලහත්කාරයෙන් ඇතුල්
නොවන්න.[10] **11** මන්ද ඔවුන්ගේ
මිදුම්කරු ශක්තිමත්ය. ඔහු ඔවුන්
වෙනුවෙන් පෙනී සිට ඔබට විරුද්ධව
පියවර ගනු ඇත.[11]
**12** උපදෙස්වලට ඔබේ සිත යොමු
කරන්න. දැනුමට ඔබේ කන් යොමු
කරන්න.[12]
**13** දරුවෙකුට හික්මවීම අවශ්‍ය වූ
විට එය දීමෙන් නොවළකින්න.[13] වේ-
වැලකින්* ඔහුට පහරක් ගැසූ පම-
ණින් ඔහු මැරෙන්නේ නැත.
**14** ඔහුව මරණයෙන් බේරාගන්නා
පිණිස වේවැල පාවිච්චි කරන්න.[14]
**15** මාගේ පුත්‍රය, ඔබ ප්‍රඥාවන්-
තව සිතන්නේ නම්[15] මාගේ සිත
ප්‍රීති වන්නේය.[16] **16** ඔබ ඔබේ
වචන නිවැරදිව හසුරුවන්නේ නම්[17]
මම මුළු හදවතින්ම සතුටු වන්නෙමි.
**17** පව්කාරයන්ට ඊර්ෂ්‍යා නොක-
රන්න.[18] දවස මුළුල්ලේම යෙහෝවා

**22 පරි.**
**1** හිතෝ 23:10
එස 22:29
**2** නික් 23:6
යෝබ් 29:12
ආමො 5:12
සෙක 7:10
**3** 1සාමු 24:12
ගීතා 12:5
හිතෝ 23:11
යෙරෙ 50:34
මීකා 7:9
**4** යෙසා 33:1
**5** 2කොරි 6:14
**6** හිතෝ 13:20
1කොරි 5:6
**7** හිතෝ 6:1
හිතෝ 17:18
1කොරි 15:33
**8** හිතෝ 11:15
හිතෝ 17:18
**9** ද්වි 19:14
ද්වි 27:17
යෝබ් 24:2
හොෂෙ 5:10
**10** 1සාමු 16:18
2සාමු 16:23
1රාජා 7:14
ආනි 1:19

**23 පරි.**
**11** උත් 43:32
**12** ගලා 5:23
**13** ගීතා 141:4
**14** හිතෝ 28:20
යොහ 6:27
1තිමෝ 6:10
**15** හිතෝ 3:5
හිතෝ 26:12
යෙසා 5:21
**16** පිලි 3:8
1යොහ 2:17

**2 තීරුව**
**1** හිතෝ 27:24
දේශ 12:8
**2** ද්වි 15:9
**3** ගීතා 141:4
**4** ලූක් 6:45
**5** 2සාමු 13:26
ගීතා 12:2
ගීතා 28:3
**6** 2සාමු 13:28
**7** හිතෝ 9:7
හිතෝ 26:4
යෙසා 36:21
ක්‍රියා 13:46
**8** මතෙ 7:6
**9** ද්වි 19:14
**10** යෝබ් 6:27
ගීතා 94:6
යෙරෙ 7:6
**11** නික් 22:23
ද්වි 27:19
ගීතා 10:14
ගීතා 68:5
**12** හිතෝ 2:2
හිතෝ 5:1
හිතෝ 22:17

හිතෝ **23:2*** මූ.අ., "උගුරට පිහියක් තබාගන්න."

**13** හිතෝ 13:24; හිතෝ 19:18; හිතෝ 29:15; හිතෝ 29:17; එෆී 6:4; **14** හිතෝ 19:18; **15** හිතෝ 4:1; **16** හිතෝ 10:1; හිතෝ 27:11; 3යොහ 4; **17** කොලො 4:4; **18** ගීතා 37:1; හිතෝ 3:31; හිතෝ 24:1.

හිතෝ **23:13*** හිතෝ 13:24හි පාදසටහන බලන්න.

දෙවි කෙරෙහි ගරුබිය ඇතුව
සිටින්න.[1] **18** එවිට ඔබට හොඳ
අනාගතයක් තිබෙනු ඇත.[2] ඔබේ
බලාපොරොත්තු කඩ නොවන්නේය.[3]

**19** මාගේ පුත්‍රය, උපදෙස්වලට
ඇහුම්කන් දී ප්‍රඥාවන්ත වන්න. ඔබේ
සිත නිවැරදි මඟට යොමු කරන්න.[4]

**20** වයින්වලට ලොල් වූ[5] අය
සමඟවත් මස්වලට කෑදර වූ
අය සමඟවත් එකතු නොවන්න.[6]
**21** මන්ද බේබද්දෝද කෑදරයෝද
දිළිඳුකමට පැමිණෙන්නෝය.[7] මත්ව
සිටින්නන්ට අඳින්න ඉතුරු වන්නේ
වැරහැලි පමණි.[8]

**22** ඔබව ජාතක කළ ඔබේ පියාට
ඇහුම්කන් දෙන්න.[9] ඔබේ මව මහ-
ලුව සිටින නිසාම ඇයව සුළු කොට
නොතකන්න.[10] **23** සත්‍යය මිල දී
ගන්න.[11] එය ලබාගත් පසු නොවිකු-
ණන්න. ප්‍රඥාවද හික්මවීමද අවබෝ-
ධයද මිල දී ගන්න.[12] **24** ධර්මිෂ්ඨ
තැනැත්තෙකුගේ පියා නිසැකවම ප්‍රීති
වෙයි.[13] ප්‍රඥාවන්තයෙකුගේ පියාද ඔහු
ගැන බොහෝ සෙයින් සතුටු වෙයි.[14]
**25** ඔබ එවැනි කෙනෙක් වන්නෙහි
නම් ඔබේ පියාද මවද ප්‍රීති වෙති.
ඔබව බිහි කළ තැනැත්තිය මහත් සේ
ප්‍රීති වන්නීය.[15]

**26** මාගේ පුත්‍රය, ඔබේ සිත මා
වෙතට යොමු කරන්න. මා ඔබට
පෙන්වන මාර්ගය දෙසටම ඔබේ
ඇස් යොමු කරන්න.[16] **27** ගණිකා-
වක ගැඹුරු වළක් මෙනි.[17] දුරාචාරයේ
යෙදෙන ස්ත්‍රියක පටු ළිඳක් මෙනි.
**28** කොල්ලකරුවෙකු මෙන් ඇය මඟ
රැක සිටින්නීය.[18] ඇය බොහෝ පුරුෂ-
යන්ව ද්‍රෝහිකමට පොලඹවයි.[19]

**29** රතු ඇස් ඇත්තේ කාටද? දුක
ඇත්තේ කාටද? සිත්තැවුල් ඇත්-
තේ කාටද? ගැටලු ඇත්තේ කාටද?
අඬදබර කරන්නේ කවුද?[20] නිකරු-
ණේ තුවාල ලබන්නේ කවුද?
**30** මේ සියල්ල සිදු වන්නේ බො-
හෝ වයින් බොන අයටය.[21] සැර
වැඩි කළ වයින්[22] සොයා යන අය-
ටය. **31** වයින් රතට රතේ දිස්
වන විටත් එය කුසලානේ දිලිසෙන
විටත් එයින් ආස්වාදයක් ලැබෙන
විටත් ඊට වශී නොවන්න. **32** අව-
සානයේදී එය සර්පයෙකු මෙන් දෂ්ට
කරයි.[1] පොළඟෙකු මෙන් විෂ පිට
කරයි.[2] **33** ඔබේ ඇස් අමුතු දර්-
ශන දකින්නේය. ඔබේ සිතුවිලි විකෘති
වන්නේය.[3] **34** ඔබ මුහුදු පත්ලටම
ගිලී යන කෙනෙකු මෙන්ද කුඹගසක්
උඩ සිටින කෙනෙකු මෙන්ද වන්-
නෙහිය.[4] **35** "ඔවුහු මට ගැසුවෝය.
නමුත් මට රිදුණේ නැත. ඔවුහු මට
තදින් පහර දුන්නෝය. නමුත් මට
දැනුණේවත් නැත. මම අවදි වන විට[5]
තව තවත් එය සොයා යන්නෙමි"[6] යයි
ඔබ කියන්නෙහිය.

**24** නපුරු මිනිසුන්ට ඊර්ෂ්‍යා
නොකරන්න.[7] ඔවුන්ගේ ඇසු-
රට ප්‍රිය නොකරන්න.[8] **2** මන්ද
ඔවුන්ගේ නිරන්තර සිතුවිල්ල උගුල්
ඇටවීමයි. ඔවුන් කතා කරන්නේ අන්
අයට හානි පමුණුවන දේවල් ගැන-
මය.[9]

**3** ප්‍රඥාවෙන් නිවසක්* ගොඩනැ-
ඟෙයි.[10] වටහාගැනීමේ හැකියා-
වෙන් එය ස්ථිරව පිහිටුවනු ලැබේ.[11]
**4** දැනගැන්ම නිසා එහි කාමර ඉතා
අනර්ඝ මෙන්ම ප්‍රසන්න වූ සෑම දෙය-
කින්ම පිරී තිබේ.[12]

**5** ප්‍රඥාවන්තව තම බලය යොදා-
ගන්න මිනිසා සැබවින්ම ශක්ති-
මත්ය.[13] දැනමුතුකම් ලබාගන්න
මිනිසා තම බලය වැඩි කරගනියි.[14]
**6** යුද්ධ කරන විට අන් අයගෙන්
නැණවත් උපදෙස් පතන්න.[15] උපදේ-
ශකයන් රාශියක් සිටින තැන ගැල-
වීම ඇත.[16]

**23 පරි.**

**1** ගීතා 111:10 හිතෝ 15:16 ක්‍රියා 9:31 2කොරි 7:1 1පේත්‍ර 1:17
**2** ගීතා 37:37 යෙරෙ 29:11 රෝම 6:22
**3** පිලි 1:20
**4** හිතෝ 4:21
**5** හිතෝ 20:1 යෙසා 5:11 රෝම 13:13 1කොරි 10:31 1පේත්‍ර 4:3
**6** හිතෝ 28:7 තීත 1:12
**7** ද්වි 21:20 හිතෝ 21:17 දේශ 10:17 ගලා 5:21
**8** හිතෝ 19:15 හිතෝ 24:34
**9** නික් 20:12 ලෙවී 19:3 හිතෝ 1:8 එෆී 6:1
**10** නික් 21:17 ද්වි 27:16 හිතෝ 30:11 මතෙ 15:5
**11** යොහ 8:32 පිලි 3:7
**12** හිතෝ 4:5 හිතෝ 16:16 එළි 3:18
**13** 1රාජා 1:48 හිතෝ 10:1
**14** හිතෝ 15:20
**15** ලූක් 11:27
**16** ගීතා 107:43
**17** හිතෝ 22:14
**18** හිතෝ 7:12 දේශ 7:26
**19** ගණන් 25:1 1කොරි 10:8
**20** හිතෝ 20:1 එෆී 5:18
**21** යෙසා 5:11
**22** යෙසා 65:11

**2 තීරුව**

**1** ගණන් 21:9 යෙරෙ 8:17
**2** ගීතා 140:3 ක්‍රියා 28:6
**3** හොෂෙ 4:11 හොෂෙ 7:5
**4** 1රාජා 16:9
**5** උත් 19:33
**6** හිතෝ 26:11 1කොරි 15:32

**24 පරි.**

**7** හිතෝ 23:17
**8** ගීතා 26:5 ගීතා 28:3 හිතෝ 1:10

**9** 1සාමු 23:9; ගීතා 38:12; හිතෝ 1:11; හිතෝ 15:28; මතෙ 26:4; **10** ගීතා 104:24; හිතෝ 9:1; හිතෝ 14:1; **11** හිතෝ 3:19; **12** 1රාජා 10:23; යෝබ් 42:12; හිතෝ 15:6; **13** හිතෝ 8:14; හිතෝ 21:22; දේශ 7:19; **14** යෙසා 40:31; එෆී 6:10; කොලො 1:11; **15** හිතෝ 20:18; ලූක් 14:31; **16** හිතෝ 11:14; හිතෝ 13:10; හිතෝ 15:22; ක්‍රියා 15:6.

**හිතෝ 24:3*** හෝ, "පවුලක්."

**7** මෝඩයාට සැබෑ ප්‍රඥාව අත්
කරගත නොහැකිය.[1] ඔහු කිසිවිටක
නුවර දොරටුව අසලදී තම මුඛය
නාරින්නේය.
**8** නපුරුකම් කිරීමට කුමන්ත්‍රණය
කරන තැනැත්තා දුෂ්ට උපා යෙදීමට
අතිදක්ෂයෙකුයයි පවසනු ලැබේ.[2]
**9** මෝඩකම හේතුවෙන් නින්දිත
හැසිරීමට වැටුණොත් එය පාපයකි.[3]
සමච්චල් කරන්නාව ජනයා හෙළා-
දකිති.[4]
**10** දුක් කරදර පැමිණෙන විට ඔබ
අධෛර්යයට[5] පත් වන්නේ නම් ඔබේ
ශක්තිය හීන වන්නේය.
**11** මරණයට ගෙන යනු ලබන
අයව ගලවාගන්න. මරණයට නියම
කළ අයව බේරාගන්න.[6] **12** “අපි
මේ ගැන දැන සිටියේ නැත”[7] යයි ඔබ
කීවොත් ඔබේ සිතුම් පැතුම් සෝදිසි
කර බලන තැනැත්තා ඒ ගැන සොයා
බලන්නේ නැද්ද?[8] ඔබ ගැන හොඳ
සෝදිසියකින් සිටින තැනැත්තා එය
දැනගන්නේ නැද්ද?[9] ඔහු එක් එක්
කෙනාට තම තමාගේ ක්‍රියාවලට
අනුව ප්‍රතිඵල දෙන්නේ නැද්ද?[10]
**13** මාගේ පුත්‍රය, මීපැණි කන්න.
එය ඔබට ගුණය. මීවදයෙන් වෑස්-
සෙන මිහිරි පැණිවලින් ඔබේ දිව පිනා-
වන්න.[11] **14** ඒ ආකාරයෙන්ම ඔබ
ප්‍රඥාව සොයාගන්නෙහි[12] නම් ඔබට
හොඳ අනාගතයක් තිබෙනු ඇත.
ඔබේ බලාපොරොත්තු කඩ නොවන්-
නේය.[13]
**15** ධර්මිෂ්ඨයාගේ නිවස කොල්ල
කන පිණිස දුෂ්ටයෙකු මෙන් රැක
නොසිටින්න.[14] ඔහුගේ නිවස විනාශ
නොකරන්න.[15] **16** ධර්මිෂ්ඨයා සත්
වතාවක් වැටුණත් ඔහු නැඟිටින්-
නේය.[16] එහෙත් දුෂ්ටයෝ විපතට
හසු වී විනාශ වී යන්නෝය.[17]
**17** ඔබට සතුරුකම් පාන කෙ-
නෙකු විපතට වැටුණොත් ප්‍රීති නො-
වන්න. ඔහුගේ පය පැටලුණොත්
සිතින් සතුටු නොවන්න.[18] **18** ඔබ
ඒ ගැන සතුටු වුවහොත් යෙහෝවා
දෙවි එය දැක ඔබ ගැන අසතුටු
වන්නේය. ඒ තැනැත්තාට විරුද්ධව
දෙවිට ඇති වූ කෝපයද පහව යන්-
නේය.[1]
**19** අපරාධකරුවන් නිසා කේන්ති
නොගන්න. දුෂ්ටයන්ට ඊර්ෂ්‍යා නො-
කරන්න.[2] **20** මන්ද නපුරු අයට
කිසි අනාගතයක් නැත.[3] දුෂ්ටයන්-
ගේ පහන නිවා දමනු ලැබේ.[4]
**21** මාගේ පුත්‍රය, යෙහෝවා දෙවි
කෙරෙහිත් රජු කෙරෙහිත් ගරුබි-
යක් ඇතුව සිටින්න.[5] කැරලිකරු-
වන්ගේ කල්ලියට එකතු නොවන්න.[6]
**22** මන්ද කැරලිකරුවන්ගේ විනාශය
කොතරම් ක්ෂණිකව[7] පැමිණෙනවාද
කිවහොත් එය පැමිණ අවසන් වන
තෙක්ම කිසිවෙක් ඒ ගැන දැනගන්-
නේ නැත.[8]
**23** මෙම කියමන්ද ප්‍රඥාවන්ත අය
සඳහාය.[9] විනිශ්චය කරද්දී පැති
ගැනීම සුදුසු නැත.[10]
**24** යමෙකු, “ඔබ ධර්මිෂ්ඨයි” කියා
දුෂ්ටයෙකුට පවසන්නේ නම්[11] ජනයා
ඔහුව පිළිකුල් කරනු ඇත. ජාතීහු
ඔහුව හෙළාදකිනු ඇත. **25** එහෙත්
දුෂ්ටයෙකුට අවවාද කරන්නාට[12] අත්
වන්නේ යහපත් ප්‍රතිඵලය. ඔහුට
මහඟු ආශීර්වාද අත් වේ.[13] **26** කිසි-
වක් නොසඟවා අවංකවම කාරණා
පහදා දෙන තැනැත්තාව ආදරයෙන්
සිපගනු ලැබේ.[14]
**27** නිවසින් පිටත ඔබට ඇති
වැඩකටයුතු සැලසුම් කර ඔබේ
කෙත සකසන්න.[15] ඉන්පසුව ඔබේ
පවුල ගොඩනැඟීමටත් සැලසුම් යො-
දන්න.
**28** කාරණා හරිහැටි නොදැන
මෝඩ ලෙස කතා කර[16] ඔබේ
අසල්වැසියාට විරුද්ධව සාක්ෂි

**24 පරි.**
**1** හිතෝ 14:6; 1කොරි 2:14
**2** ගීතා 21:11; හිතෝ 6:14; හිතෝ 12:2; රෝම 1:30
**3** හිතෝ 10:23; ගලා 5:19
**4** හිතෝ 22:10; 2පේතෘ 3:3
**5** හෙබ්‍රෙ 12:3
**6** ගීතා 82:4
**7** මතෙ 25:44
**8** 1සාමු 16:7; හිතෝ 5:21; හිතෝ 17:3; හිතෝ 21:2
**9** දානි 5:23
**10** ගීතා 62:12; මතෙ 16:27; රෝම 2:6; 2කොරි 5:10
**11** හිතෝ 25:16; සල 5:1; මතෙ 3:4
**12** ගීතා 19:10; ගීතා 119:103; හිතෝ 22:18
**13** හිතෝ 13:14; හිතෝ 23:18; යොහ 17:3
**14** 1සාමු 19:11; ගීතා 10:8; ගීතා 37:32; ගීතා 56:6; හිතෝ 1:11; මතෙ 26:4
**15** යෙසා 32:18
**16** ගීතා 34:19; 2කොරි 1:10
**17** 1සාමු 26:10; 1සාමු 31:4; එස්ත 7:10
**18** විනි 16:25; 2සාමු 16:5; යෝබ් 31:29; හිතෝ 17:5; හිතෝ 25:21

**2 තීරුව**
**1** එස 26:2; සෙක 1:15
**2** හිතෝ 23:17
**3** ගීතා 9:17; ගීතා 73:18; හිතෝ 10:7; යෙසා 3:11
**4** යෝබ් 21:17; ගීතා 73:27; හිතෝ 13:9; හිතෝ 20:20; මතෙ 8:12; යූද් 13
**5** 1සාමු 24:6; හිතෝ 8:13; 1පේතෘ 2:17

**6** ගණන් 16:2; 2සාමු 15:12; **7** ගණන් 16:31; ක්‍රියා 5:36; **8** ගීතා 90:11; හිතෝ 20:2; 1තෙස 5:2; **9** 1රාජා 3:28; එස්රා 7:25; ගීතා 107:43; **10** ලෙවී 19:15; ද්වි 1:17; ද්වි 16:19; 2ලේක 19:7; 1තිමෝ 5:21; යාකො 2:4; 1පේතෘ 1:17; **11** නික් 23:6; හිතෝ 17:15; **12** ලෙවී 19:17; 1තිමෝ 5:20; **13** හිතෝ 28:23; **14** හිතෝ 27:5; හිතෝ 27:6; **15** 1රාජා 6:7; ලූක් 14:28; **16** එෆී 4:25; කොලො 3:9.

නොදෙන්න.[1] **29** “ඔහු මට විරුද්-
ධව යමක් කළොත් මමත් ඔහුට ඒ
දේම කරමි.[2] අනුන් මට කරන ලෙසම
මමත් ඔවුන්ට කරන්නෙමි”[3] යයි නො-
කියන්න.

**30** අලසයාගේ[4] කෙත ළඟින්ද
අඥානයාගේ*[5] මිදිවත්ත ළඟින්ද
මම ගියෙමි. **31** ඔවුන්ගේ කෙත්වතු
පුරාම වල් පැළෑටි හටගෙන තිබිණ.[6]
කටු ගස්වලින් ඒවා වැසී තාප්පද බිඳ
වැටී තිබිණ.[7]

**32** මම ඒ දෙස බලා පාඩමක්
ඉගෙනගත්තෙමි.[8] මම මේ දේ සිතට
ගත්තෙමි.[9] **33** තව ටිකක් නිදා-
ගත්තොත් තව ටිකක් හාන්සි වී සිටි-
යොත් අත් දෙක බැඳගෙන හොඳට
නිදාගත්තොත්[10] **34** දුප්පත්කම මං-
කොල්ල කන්නෙකු මෙන්ද අග-
හිඟකම් අවි ගත් මිනිසෙකු මෙන්ද
හදිස්සියෙන්ම පැමිණෙනු ඇත.[11]

**25** මෙම උපදේශයන්ද රචනා
කරන ලද්දේ සලමොන් රජු
විසිනි.[12] යූදාහි රජු වූ හෙසකියා-
ගේ[13] සේවකයන් විසින් මේවා පිටපත්
කරන ලදි.

**2** දෙවි ගෞරවයට පත් වන්නේ
යම් කාරණා රහසිගතව තබාගැනීම
නිසාය.[14] එහෙත් රජවරුන් ගෞරව-
යට පත් වන්නේ කාරණා හොඳින්
සෝදිසි කර බැලීම නිසාය.[15]

**3** අහසේ උසද[16] පොළොවේ ගැඹු-
රද[17] සොයාගත නොහැකි සේම
රජවරුන්ගේ සිතෙහි තිබෙන දේද
සොයාගත නොහැකිය.[18]

**4** රිදීවලින් බොර ඉවත් කරන්න.
එවිට එය මුළුමනින්ම පවිත්‍ර වනු
ඇත.[19]

**5** රජු ඉදිරියෙන් දුෂ්ටයාව පන්නා
දමන්න.[20] එවිට ධර්මිෂ්ඨකම නිසා
ඔහුගේ සිංහාසනය ස්ථිර වෙයි.[21]

**6** රජු ඉදිරියේ තමාවම උසස් කර
නොගන්න.[22] උත්තමයන් අතරට

**24 පරි.**
1 නික් 20:16
මතෙ 26:59
2 හිතෝ 20:22
රෝම 12:17
1තෙස 5:15
3 රෝම 12:19
4 හිතෝ 6:6
හිතෝ 22:13
5 හිතෝ 12:11
6 හෙබ්‍රෙ 6:8
7 හිතෝ 20:4
දේශ 10:18
8 හිතෝ 19:8
9 හිතෝ 1:3
හිතෝ 4:13
හිතෝ 12:1
10 හිතෝ 6:10
11 හිතෝ 10:4
හිතෝ 13:4
හිතෝ 23:21

**25 පරි.**
12 1රාජා 4:32
හිතෝ 1:1
හිතෝ 10:1
දේශ 12:9
13 2ලේක 29:1
මතෙ 1:10
14 ද්වි 29:29
රෝම 11:33
15 එස්රා 5:17
එස්රා 6:1
යෝබ් 29:16
16 ගීතා 103:11
යෙසා 55:9
17 ගීතා 107:24
18 රෝම 11:33
19 හිතෝ 17:3
මලා 3:3
20 1රාජා 2:46
එස්ත 7:10
හිතෝ 20:8
21 හිතෝ 16:12
හිතෝ 20:28
හිතෝ 29:14
යෙසා 16:5
22 හිතෝ 27:2

**2 තීරුව**
1 ගීතා 131:1
2 ලූක් 14:9
ලූක් 18:14
1පේත 5:5
3 ලූක් 14:10
4 හිතෝ 18:17
මතෙ 5:25
5 මතෙ 18:15
6 හිතෝ 11:13
හිතෝ 20:19
7 හිතෝ 15:23
හිතෝ 24:26
දේශ 12:10
යෙසා 50:4
8 ගීතා 141:5
හිතෝ 1:9
හිතෝ 9:8

නොයන්න.[1] **7** මන්ද ඔබ හඳුනන
උත්තමයෙකු ඉදිරියේ ඔබව පහත්
කරනු ලබනවාට වඩා,[2] “මෙතැනට
එන්න”[3] කියා ඔහුම ඔබට ආරාධනා
කිරීම හොඳය.

**8** ඔබ හඳුනන කෙනෙකුට විරුද්-
ධව නඩුවක් දමන්න ඉක්මන් නො-
වන්න. මන්ද අන්තිමේදී ඔහු ඔබව
ලැජ්ජාවට පත් කළහොත් ඔබ කුමක්
කරන්නෙහිද?[4] **9** යමෙකු සමඟ
ප්‍රශ්නයක් ඇති වූ විට එය ඔහු සමඟ
පමණක් කතා කර විසඳගන්න.[5] අන්
අයගේ රහස් හෙළි නොකරන්න.[6]
**10** ඔබ එසේ කළොත් ඊට ඇහුම්කන්
දෙන තැනැත්තා ඔබව ලැජ්ජාවට
පත් කරනු ඇත. තවද ඔබ හෙළි කළ
දෙයින් සිදු වූ හානිය මකා දැමීමට
නොහැක.

**11** නිසි කලට කියන වදන් කැට-
යම් කළ රිදී බඳුන්වල තැබූ රන්
ඇපල් මෙනි.[7]

**12** ප්‍රඥාවන්තයා දෙන අවවාදව-
ලට සවන් දෙන කෙනෙකුට එම අව-
වාද රන් කරාබුවක් මෙන්ද අනර්ඝ
රන් ආභරණයක් මෙන්ද වන්නේය.[8]

**13** විශ්වාසවන්ත පණිවිඩකරු-
වෙකු අස්වැන්න නෙළන කාලයේදී
සිසිලස ගෙනෙන හිම[9] මෙනි. මන්ද
ඔහු තම ස්වාමීන්ව ප්‍රාණවත් කරයි.[10]

**14** තෑග්ගක් දෙන බවට බොරු-
වට පුරසාරම් දොඩන තැනැත්තා[11]
වැසි නොගෙනෙන වලාකුළු හා සුළං
මෙනි.

**15** ඉවසීමෙන් හමුදාපතියෙකුගේ
සිත පවා දිනාගත හැක. මෘදු වූ වදන්-
වලින් ඇටකටු පවා බිඳිය හැක.[12]

**16** ඔබට මීපැණි ලැබුණේ නම්[13]
සුදුසු ප්‍රමාණයට වඩා නොකන්න.
මන්ද ප්‍රමාණය ඉක්මවා කෑවොත්
ඔබට එය වමාරන්න සිදු වෙයි.[14]

**17** ඔබේ අසල්වැසියාගේ ගෙට
නිතර නිතර නොයන්න. ඔබ එසේ

---

**හිතෝ 24:30*** හිතෝ 6:32හි පාදසටහන බලන්න.

**9** හිතෝ 26:1; **10** හිතෝ 13:17; පිලි 2:25; **11** මතෙ 5:37; යාකො 5:12; **12** උත් 32:4; හිතෝ 15:1; **13** විනි 14:8; හිතෝ 24:13; **14** හිතෝ 25:27.

ගියොත් ඔහුට ඔබව එපා වී ඔබට
වෛර කරන්න පටන්ගනී.
18 හඳුනන කෙනෙකුට විරුද්-
ධව බොරු සාක්ෂි දෙන මිනිසෙකු
මුගුරක්ද කඩුවක්ද තියුණු ඊයක්ද
මෙනි.[1]
19 විපත්ති දවසේදී ද්‍රෝහිව කට-
යුතු කරන්නා කෙරෙහි විශ්වා-
සය තැබීම නිෂ්ඵලය.[2] එය කැඩුණු
දතක්ද කොර වූ පාදයක්ද මෙනි.
20 ශීත දවසක යමෙකු වස්ත්‍රය
ඉවතලීම ලුණු දියට* විනාකිරි දමන්-
නාක් මෙන්ද දුකින් සිටින කෙනෙකුට
ගී ගයන්නාක් මෙන්ද වෙයි.[3]
21 ඔබට වෛර කරන කෙනා
බඩගින්නේ සිටී නම් ඔහුට කන්න
දෙන්න. ඔහු පිපාසයෙන් සිටිනවා
නම් ඔහුට වතුර ටිකක් බොන්න
දෙන්න.[4] 22 එසේ කිරීමෙන් ඔබ
ඔහුගේ හිස පිට ගිනි අඟුරු ගොඩගස-
නවා ඇත.[5] තවද යෙහෝවා දෙවි
ඔබට ආශීර්වාද කරන්නේය.[6]
23 උතුරු දිගින් හමන සුළඟ තද
වර්ෂාව ගෙන දෙයි.[7] රහසක් හෙළි
කරන්නාව හෙළාදකිනු ඇත.[8]
24 අඬදබර කරන බිරිඳක සමඟ
එක ගෙයි වාසය කරනවාට වඩා
වහල උඩ වාසය කිරීම හොඳය.[9]
25 දුර පළාතකින් ලැබෙන හොඳ
පුවතක්[10] විඩාවට පත් වූ කෙනෙකුට
ලැබෙන සිසිල් පැන් පොදක් මෙනි.[11]
26 දුෂ්ටයා ඉදිරියේ ස්ථිරව නො-
සිටින ධර්මිෂ්ඨයෙකු බොර දිය
නඟන උල්පතක් හා අපිරිසිදු ළිඳක්
මෙනි.[12]
27 අධික ලෙස මීපැණි කෑම සුදුසු
නැත.[13] මිනිසෙකු තමාටම ගෞර-
වය සොයාගන්නේ නම් ඔහුට හිමි
වන්නේ සැබෑ ගෞරවයක්යයි පැව-
සිය හැකිද?[14]
28 මිනිසෙකු තමාවම පාලනය
කර නොගන්නේ නම්[15] ඔහු පවුර
කඩා බිඳ දැමූ නුවරක් මෙනි.

හිතෝ 25:20* සෝඩියම් බයිකාබනේට්වලින් සාදාගත් පිරිසිදු කරන ද්‍රව්‍යයකි.

**26** මෝඩයෙකුව ගෞරවයට පත්
කිරීම කොහෙත්ම නුසුදුසුය.[1]
එය ගිම්හානයේදී හිම වැටෙන්නාක්
මෙන්ද අස්වැන්න නෙළන කාලයේදී
වැසි වසින්නාක් මෙන්ද වන්නේය.[2]
2 කුරුල්ලෙකු ඉගිලී යන්නෙත්
වැහිළිහිණියෙකු පියඹා යන්නෙත්
යම් හේතුවක් ඇතුවය. එසේම, හේ-
තුවක් නොමැතිව යමෙකු පිටට ශාප-
යක් නොපැමිණෙන්නේය.[3]
3 අශ්වයන් සඳහා කසයක්ද[4] බූරු-
වන් සඳහා නාස් ලණුවක්ද[5]
තිබෙන්නා සේම මෝඩයන්ව හික්ම-
වීමට වේවැල තිබේ.[6]
4 මෝඩයෙකු සමඟ කතා කරන
විට ඔහුගේ කතා විලාසය අනුගමනය
නොකරන්න. එසේ කළොත් ඔබත්
ඔහුගේම තත්වයට පත් වනු ඇත.[7]
5 මෝඩයෙකු තමා ප්‍රඥාවන්ත-
යෙකුයයි නොසිතන පිණිස ඔහුගේ
මෝඩකම ඉස්මතු වන ලෙසින් ඔහුට
පිළිතුරු දෙන්න.[8]
6 මෝඩයෙකුගේ අතට කාරණා
භාර දෙන කෙනා තම දෙපා කපා-
ගන්න කෙනෙකු මෙන්ද තමාටම
හානියක් කරගන්න කෙනෙකු මෙන්ද
වන්නේය.[9]
7 කොරගසන කෙනෙකුට පුළු-
වන්ද වතුර අදින්න? එසේනම්,
මෝඩයෙකුටත් පුළුවන් වෙයි හිතෝ-
පදේශ කියන්න.[10]
8 මෝඩයෙකුට ගෞරවය පිරිනැ-
මීම[11] ගල් ගොඩක ගලක් වළලා
දමන්නාක් මෙනි.
9 මෝඩයෙකු විසින් පවසන
හිතෝපදේශයක් බේබද්දෙකුගේ අතේ
තිබෙන කටු අත්තක් මෙනි.[12]
10 මඟ යන එන අයව හෝ මෝ-
ඩයෙකුව හෝ කුලියට ගන්න කෙ-
නෙකු හැම තැනටම ඊතල විදින
දුනුවායෙකු මෙනි.[13]
11 මෝඩයෙකු එකම මෝඩකම
නැවත නැවත කිරීම බල්ලෙකු උගේ
වමනය ලෙව කන්නාක් මෙනි.[14]

14 නික් 8:15; මතෙ 12:45; 2පේතෘ 2:22.

**25 පරි.**
1 නික් 20:16, ගීතා 52:2, ගීතා 57:4, ගීතා 120:3, ගීතා 140:3, යෙරෙ 9:3, යාකො 3:6
2 2සාමු 15:31
3 ගීතා 137:3, දේශ 3:4
4 නික් 23:5, 2රාජ 6:22, හිතෝ 24:17, මතෙ 5:44
5 1සාමු 24:11, 1සාමු 25:34, රෝම 12:20
6 1සාමු 24:12
7 යෝබ් 37:9
8 ගීතා 101:5
9 හිතෝ 19:13, හිතෝ 21:19, හිතෝ 27:15
10 හිතෝ 15:30, යෙසා 52:7, ලූක් 2:10
11 රූත් 2:9, 2සාමු 23:15, මතෙ 10:42
12 1සාමු 22:17, 2ලේක 24:22, ක්‍රියා 7:52
13 හිතෝ 25:16
14 හිතෝ 27:2, යොහ 5:44, පිලි 2:3
15 1සාමු 20:33, හිතෝ 16:32, හිතෝ 22:24, හිතෝ 29:11

**2 තීරුව**

**26 පරි.**
1 එස්ත 3:1, හිතෝ 30:22, දේශ 10:7
2 1සාමු 12:17
3 ගලා 6:7
4 ගීතා 32:9
නාහු 3:2
5 යාකො 3:3
6 හිතෝ 10:13, හිතෝ 17:10, හිතෝ 27:22, 1කොරි 4:21, 2කොරි 10:6
7 1පේතෘ 3:9
8 මතෙ 21:24, යොහ 9:27
9 ගණන් 13:31
10 හිතෝ 17:7
11 හිතෝ 19:10, හිතෝ 26:1
12 හිතෝ 23:35
13 හිතෝ 1:32

**12** තමා ප්‍රඥාවන්තයෙකුයයි
සිතන මිනිසෙකුව ඔබ දන්නෙහිද?[1]
ඔහුට වඩා මෝඩයෙකු යහමඟට
හැරෙයි කියා බලාපොරොත්තු තැබිය
හැක.[2]
**13** "පාරේ සිංහ පැටවෙක් සිටියි.
මංසන්ධියේ සිංහයෙක් සිටී" යයි අල-
සයා කියයි.[3]
**14** දොරක් නිතරම ඇරෙනවා
වැහෙනවා හා සමානව අලසයාද තම
යහන මත ඒ මේ අත පෙරළෙයි.[4]
**15** අලසයා කෑම බඳුනට තම අත
දැමුවද එය කට ළඟට ගැනීම පවා
ඔහුට වෙහෙසකරයි.[5]
**16** අලසයා සිතන්නේ නැණවත්ව
පිළිතුරු දෙන සත්දෙනෙකුටත් වඩා
තමා ප්‍රඥාවන්තයි කියාය.[6]
**17** මඟ දිගේ යන විට අනුන්ගේ
අඬදබරවලට මැදිහත් වී කෝප වන
අයෙකු[7] බල්ලෙකුගේ කන් දෙක අල්-
ලාගන්නෙකු මෙනි.
**18** යමෙකු මාරාන්තික ගිනිමය
ඊතල[8] විදින වියරු වැටුණු කෙනෙකු
මෙන් හැසිර **19** තම මිතුරාව රව-
ටන්නේය. ඉන්පසු, "මම එය විහිළු-
වට කළෙමි"[9] යයි ඔහු කියන්නේය.
**20** දර නැති විට ගින්න නිවී
යන්නා සේම නින්දා කරන්නෙකු
නැති විට විවාදයද නතර වෙයි.[10]
**21** නිතරම රණ්ඩුවට ඇදී යන
මිනිසෙක් ගින්නට දමන දර මෙන්ද
ලිපට දමන අඟුරු මෙන්ද වන්නේය.[11]
**22** කේලාම් කියන්නාගේ වචන
කෑදරකමින් ගිල දමන රසවත්
කෑමක් මෙනි. එය ගිලගත් පසු ඇඟට
හොඳින් උරාගනී.[12]
**23** පණ වුණත් දෙන බවට බොරු
මවාපෑමක් කරන කෙනා රිදී ආලේප
කළ මැටි භාජනයක් මෙනි.[13]
**24** යමෙක් තමා කතා කරන
ආකාරයෙන් සිතේ ඇති වෛරය සඟ-
වාගනී. ඔහුට සැබවින්ම හැඟෙන
විදිහ ඔහු හෙළි නොකරයි.[14]
**25** ඔහු මිහිරි බස් පැවසුවත්[15] ඔහුව
විශ්වාස නොකරන්න.[16] මන්ද ඔහු-
ගේ සිතේ ද්වේෂසහගත සිතුවිලි
සතක් තිබේ.[1] **26** යමෙක් කපටික-
මින් තම සිතේ වෛරය සඟවාගෙන
සිටියත් ඔහුගේ දුෂ්ටකම සියල්ලන්
ඉදිරියේ හෙළි වනු ඇත.[2]
**27** අනුන්ට වළ කපන්නා තමන්
කැපූ වළේම වැටෙයි.[3] යමෙකු ගලක්
පෙරළුවොත් ඒ ගල නැවත ඔහු දෙස-
ටම පෙරළී එයි.[4]
**28** යමෙකු බොරු කියා අනුන්ව
රිදවන්නේ ඔහුගේ සිතෙහි තිබෙන
වෛරය නිසාය.[5] චාටු බස් දොඩන්නා
හානි පමුණුවයි.[6]

**27** හෙට දවස ගැන පුරසාරම්
දෙඩීමෙන් වළකින්න.[7] මන්ද
දවසක් ඇතුළත කුමක් සිදු වෙයිද
කියා ඔබ දන්නේ නැත.[8]
**2** ඔබ ඔබටම ප්‍රශංසා කරගන්න-
වාට වඩා වෙනත් කෙනෙකු ඔබට
ප්‍රශංසා කිරීම හොඳය. අන් අය
ඔබ ගැන ප්‍රශංසා මුඛයෙන් කතා
කරත්වා! නමුත් ප්‍රශංසා මුඛයෙන්
ඔබ ගැනම කතා නොකරන්න.[9]
**3** විශාල ගලක් බරය. වැලි මල්-
ලක්ද බරය.[10] එහෙත් මෝඩයෙකු
විසින් ඇති කරන දුක් කරදර උසු-
ලන්න බැරි තරම් බරය.[11]
**4** කෝපය දරුණුය. උදහස ජල-
ගැල්මක් මෙනි.[12] එහෙත් ඊර්ෂ්‍යාව
දරාගත හැක්කේ කාටද?[13]
**5** සැඟවුණු ප්‍රේමයකට වඩා අවංක
සිතකින් දෙන අවවාදයක් හොඳය.[14]
**6** ඔබට ප්‍රේම කරන කෙනෙකු
ඔබේ සිත රිදෙව්වත් ඔහු එසේ කරන්-
නේ විශ්වාසවන්තකමින්ය.[15] එහෙත්
ඔබට වෛර කරන්නෙකුගෙන් බැගෑ-
පත්ව ඉල්ලුවොත් මිසක ඔහු ඔබව
සිඹින්නේ නැත.[16]
**7** තෘප්තියට පැමිණි තැනැත්තා
මීවදයක් පවා පාගා දමයි. එහෙත්
බඩගිනිව සිටින කෙනෙකුට සියලු
තිත්ත දේ පවා මිහිරිය.[17]
**8** තම ගෙදරින් පලා යන මිනි-

**26 පරි.**
**1** හිතෝ 12:15
රෝම 12:16
1කොරි 3:18
1කොරි 8:2
**2** හිතෝ 29:20
**3** හිතෝ 22:13
**4** හිතෝ 6:9
හිතෝ 19:15
හිතෝ 24:33
**5** හිතෝ 19:24
**6** හිතෝ 12:15
**7** ලූක් 12:14
1තෙස 4:11
1පේත 4:15
**8** එෆී 6:16
**9** හිතෝ 10:23
හිතෝ 15:21
**10** හිතෝ 16:28
හිතෝ 22:10
යාකො 3:6
**11** හිතෝ 3:30
හිතෝ 17:14
**12** හිතෝ 18:8
**13** 2සාමු 20:9
මතෙ 12:34
ලූක් 22:47
**14** 2සාමු 13:22
හිතෝ 10:18
**15** 2සාමු 13:26
ගීතා 12:2
ගීතා 28:3
**16** යෙරෙ 12:6

**2 තීරුව**
**1** හිතෝ 6:16
**2** 1කොරි 4:5
1තිමෝ 5:24
**3** ගීතා 7:15
ගීතා 57:6
හිතෝ 28:10
**4** එස්ත 7:10
ගීතා 9:15
දේශ 10:8
**5** උත් 37:32
**6** හිතෝ 7:21
හිතෝ 29:5

**27 පරි.**
**7** යෙසා 56:12
ලූක් 12:19
යාකො 4:13
**8** යාකො 4:14
**9** හිතෝ 25:27
යෙරෙ 9:23
2කොරි 10:12
2කොරි 10:18
2කොරි 12:11
**10** යෝබ් 6:3
**11** 1සාමු 25:25
**12** යාකො 1:20
**13** උත් 37:11
හිතෝ 14:30
ක්‍රියා 17:5
යාකො 3:14
**14** ලෙවී 19:17
මතෙ 18:15
**15** 2සාමු 12:7
ගීතා 141:5
එළි 3:19

**16** උත් 33:4; **17** ලූක් 15:16.

සෙකු[1] කැදැල්ල අත්හැර යන කුරුල්-
ලෙකු මෙනි.[2]
**9** තෙලින්ද සුවඳ දුම්වලින්ද[3] සිත
සතුටු වෙයි. එලෙසම ආදරයෙන්
උපදෙස් දෙන මිතුරෙකුගේ ඇසුරත්
ඉතා ප්‍රසන්නය.[4]
**10** ඔබේ මිතුරාවද ඔබේ පියාගේ
මිතුරාවද අත් නොහරින්න. විපත්ති
දවසකදී ඔබේ සහෝදරයාගේ නිව-
සට නොයන්න. මන්ද ඈතින් සිටින
සහෝදරයෙකුට වඩා ළඟින් සිටින
අසල්වැසියෙකු හොඳය.[5]
**11** මාගේ පුත්‍රය, මට නින්දා
කරන්නාට මා උත්තර දෙන පිණිස[6]
ඔබ ප්‍රඥාවන්තව ක්‍රියා කර මාගේ
සිත සතුටු කරන්න.[7]
**12** බුද්ධිමත් තැනැත්තා අවදානම
දුර තියාම හඳුනාගෙන එයින් ඉවත්
වෙයි.[8] එහෙත් අද්දැකීම් අඩු අය ඒ
දෙසටම ගමන් කර ප්‍රතිඵල විඳිති.[9]
**13** නාඳුනන කෙනෙකු වෙනුවෙන්
ඇප වී සිටින තැනැත්තාගේ වස්ත්‍රය
පැහැරගන්න.[10] දුරාචාරයේ යෙදෙන
ස්ත්‍රියක සමඟ එක් වී සිටින තැනැත්-
තාගෙන් ඇපයක් ගත යුතුයි.[11]
**14** යමෙකු උදේ පාන්දරින්ම
නැඟිට මහා හඬින් තම අසල්වැසි-
යාට ආශීර්වාද කරන්නේ නම් එය
ශාපයක් ලෙස සලකනු ඇත.[12]
**15** කැඩුණු වහලකින් නොනැ-
වතී වැටෙන වැහි බිඳු නිසා නිවස
එපා වන්නාක් මෙන් අඬදබර කරන
බිරිඳක නිසාද නිවස අත්හැර යෑමට
සිතෙයි.[13] **16** ඇගේ නියම චරිතය
සඟවන්න වෑයම් කිරීම නිෂ්ඵලය. එය
හරියට සුළඟ නවත්වාගැනීමට හෝ
අතේ තෙල් පුරවාගැනීමට වෑයම්
කරනවා හා සමානය.
**17** යකඩින් යකඩ මුවහත් වෙයි.
එසේම, මිනිසෙකුට දියුණු වීමට
තවත් මිනිසෙකුට උපකාර කළ
හැක.*[14]
**18** අත්තික්කා ගස රැකබලා
ගන්නා එහි පල කන්නේය.[1] තම
ස්වාමියාව රැකබලා ගන්නාට ගෞර-
වය ලැබේ.[2]
**19** මිනිසෙකුට වතුරෙන් තම
මුහුණ බලාගත හැකි වන්නාක් මෙන්
වෙනත් කෙනෙකුගේ සිතේ තිබෙන
දේ දැනගැනීමෙන් තමන්ගේම සිතත්
තේරුම්ගත හැක.
**20** මිනී වළ හා සියල්ල දිරාපත්
වන ස්ථානය[3] සෑහීමට පත් වන්නේ
නැත.[4] එලෙසම මිනිසෙකුගේ ඇස්ද
සෑහීමට පත් නොවන්නේය.[5]
**21** රිදී පවිත්‍ර කිරීම සඳහා භාජන-
යක්ද[6] රන් පවිත්‍ර කිරීම සඳහා උදු-
නක්ද තිබේ.[7] එසේම, අන්‍යයන්ගෙන්
ලබන ප්‍රශංසාව මගින් මිනිසෙකු කෙ-
බඳු පුද්ගලයෙකුදැයි හෙළි වනු ඇත.[8]
**22** මෝඩයෙකුව ධාන්‍ය ඇති
වංගෙඩියක දමා කෙටුවත් ඔහුගේ
මෝඩකම ඉවත් කිරීමට නොහැක.[9]
**23** ඔබේ රැළේ තත්වය කෙබඳු-
දැයි ඔබ හොඳින් දැනගත යුතුය.
ඔබේ රැළ ගැන හොඳ අවධානයකින්
සිටින්න.[10] **24** මන්ද වස්තුව සදහ-
ටම පවතින්නේ නැත.[11] ඔටුන්නද
සියලු පරම්පරා දක්වාම පවතින්නේ
නැත.
**25** තණකොළ වියළී ගියත් අලුත්
තණකොළ හටගනී. කඳුවල වැවෙන
තණකොළ රැස් කරගනු ලැබේ.[12]
**26** බැටළු පැටවුන්ගේ ලොම්වලින්
ඔබට ඇඳුම් සාදාගත හැක.[13] තණබි-
මක් ලබාගැනීමට එළුවන්ව දිය හැක.
**27** ඔබටත් ඔබේ ගෙයි වැසියන්ටත්
ඔබේ සේවිකාවන්ටත් එළුකිරිවලින්
කිසි අඩුවක්ද නොතිබෙනු ඇත.[14]

# 28
දුෂ්ටයා තමා පසුපස කිසි-
වෙකු ලුහුබැඳ නාවත් බියෙන්
පලා දුවයි.[15] එහෙත් ධර්මිෂ්ඨයා එඩි-
තර තරුණ සිංහයෙකු මෙනි.[16]
**2** දේශයක අපරාධ වැඩි වූ විට
පාලකයන්ව කලින් කලට වෙනස්

**27 පරි.**
1 උත් 4:16, නික් 2:15, 1සාමු 27:1, 1රාජා 19:8
2 යෙසා 16:2
3 ගීතා 45:8, සල 3:6, සල 4:10, යොහ 12:3
4 1සාමු 23:16, හිතෝ 15:23, හිතෝ 16:24, ක්‍රියා 28:15
5 හිතෝ 17:17, හිතෝ 18:24, මතෙ 12:49
6 යෝබ් 1:8, යෝබ් 1:9, ගීතා 127:5
7 හිතෝ 10:1, හිතෝ 15:20, හිතෝ 23:15, ශෙප 3:17, 2යොහ 4
8 නික් 9:20, ගීතා 57:1, හිතෝ 18:10, යෙසා 26:20, හෙබ්‍රෙ 6:18, හෙබ්‍රෙ 11:7
9 හිතෝ 22:3, 2පේතෘ 3:7
10 හිතෝ 20:16
11 උත් 38:18, දේශ 7:26
12 1තෙස 2:5
13 හිතෝ 19:13, හිතෝ 21:9
14 1සාමු 23:16, හිතෝ 5:1, හෙබ්‍රෙ 10:24, හෙබ්‍රෙ 12:12

**2 තීරුව**
1 හිතෝ 13:4, 1කොරි 9:7
2 උත් 39:2, 2සාමු 23:23, හිතෝ 17:2
3 ගීතා 88:11, හබ 2:5
4 හිතෝ 30:16
5 දේශ 1:8
6 ගීතා 12:6, ගීතා 66:10
7 හිතෝ 17:3
8 1සාමු 16:18, 1සාමු 18:7
9 හිතෝ 23:35
10 උත් 39:3, හිතෝ 10:4, හිතෝ 12:27, කොලො 3:23
11 හිතෝ 23:5, 1තිමෝ 6:17, යාකො 1:10
12 ගීතා 72:16, ගීතා 104:14
13 යෝබ් 31:20
14 ගීතා 62:10

**හිතෝ 27:17*** මූ.අ., "එක් මිනිසෙක් තවත් මිනිසෙකුව මුවහත් කරයි."

**28 පරි.** **15** ලෙවී 26:17; 2රාජා 7:6; ගීතා 53:5; **16** නික් 11:8; 1ලේක 12:8; ආනි 3:16; ක්‍රියා 4:13; ක්‍රියා 14:3; 1තෙස 2:2.

කරන්න සිදු වෙයි.[1] නමුත් හරි
වැරැද්ද ගැන හොඳ අවබෝධයක්
ඇති බුද්ධිමත් කෙනෙකුගේ උපකා-
රයෙන් පාලකයෙක් බොහෝ කල්
පාලනය කරයි.[2]
**3** අඟහිඟකම් ඇති ජනයාට වංචා
කරන[3] දුප්පත් මනුෂ්‍යයෙකු, මුළු දේ-
ශයම පාළු කරමින් කෑම හිඟයක්
ඇති කරවන තද වර්ෂාවක් මෙනි.
**4** නීතිය කඩ කරන්නෝ දුෂ්ටයාට
ප්‍රශංසා කරති.[4] නමුත් නීතිය රකින්-
නෝ ඔවුන්ට විරුද්ධව නැඟී සිටිති.[5]
**5** නපුර කිරීමට ආශා කරන අයට
යුක්තිය කුමක්දැයි වටහාගත නො-
හැක. එහෙත් යෙහෝවා දෙවිව සො-
යන අයට සියල්ල වටහාගත හැක.[6]
**6** වැඩි වත්කමක් නොතිබුණත්
දෙවිට විශ්වාසවන්ත ජීවිතයක් ගත
කරන මිනිසා වංචනික ජීවිතයක්
ගත කරන පොහොසතෙකුට වඩා
හොඳය.[7]
**7** තේරුම්ගැනීමේ හැකියාව ඇති
පුත්‍රයෙක් නීතිය පිළිපදියි.[8] එහෙත්
කෑදරයන් සමඟ ඇසුරු කරන
පුත්‍රයෙක් තම පියාව ලැජ්ජාවට පත්
කරයි.[9]
**8** අයුතු පොලී අය කර පොහො-
සත් වන්නෙකු සිටී.[10] නමුත් අවසාන-
යේදී ඔහු රැස් කරගත් දේ හිමි වන්නේ
දුප්පතුන්ට කරුණාව දක්වන අය-
ටය.[11]
**9** නීතියට සවන් නොදෙන[12] අය-
ගේ යාච්ඤාව පවා දෙවිට පිළිකු-
ලකි.[13]
**10** ප්‍රතිපත්තිගරුක ජීවිතයක් ගත
කරන අයව නොමඟ යවන්නා[14] තමා
කැපූ වළේම වැටෙයි.[15] එහෙත් නිර්-
දෝෂ අයට ආශීර්වාද කරනු ලැබේ.[16]
**11** පොහොසතා සිතන්නේ තමා
ප්‍රඥාවන්තයෙකු කියාය.[17] නමුත්
වටහාගැනීමේ හැකියාව ඇති දුප්පතා
ඔහු සැබවින්ම කෙබඳු කෙනෙකුදැයි
හෙළි කර දෙයි.[18]
**12** ධර්මිෂ්ඨයන් ප්‍රීති වන විට[19]
එය දැකීමට ප්‍රිය දසුනකි. නමුත් දුෂ්-
ටයන් බලයට පත් වන විට ජනයා
සැඟවෙති.[1]
**13** තමාගේ වැරදි සඟවන
තැනැත්තා සාර්ථක වන්නේ නැත.[2]
නමුත් ඒවා හෙළි කර ඒවායින් ඈත්
වන්නාට දයාව පෙන්වනු ලැබේ.[3]
**14** නිතරම දෙවි කෙරෙහි ගරු-
බියක් ඇතුව සිටින්නා සන්තෝ-
ෂවත්ය.[4] එහෙත් තම සිත දැඩි
කරගන්නා විපතට පත් වෙයි.[5]
**15** දුප්පතුන්ව පාගා දමන දුෂ්ට
පාලකයෙකු ගොරවන සිංහයෙකු හා
ඇඟට කඩාපනින වලසෙකු මෙනි.[6]
**16** සැබෑ වටහාගැනීමේ හැකියා-
වක් නොමැති නායකයෙක් බොහෝ
වංචනික ක්‍රියාවල නියැලෙයි.[7] එහෙත්
අයුතු ලෙස ලාභ ඉපයීම හෙළාදකින[8]
කෙනා බොහෝ කල් ජීවත් වෙයි.
**17** ලේ වැගිරීමේ වරදට හසු වූ
තැනැත්තාට මිනී වළට යන තෙක්ම
පලා යන්න සිදු වෙයි.[9] කිසිවෙකු
ඔහුව බේරාගැනීමට උත්සාහ නො-
කළ යුතුයි.
**18** නිර්දෝෂ තැනැත්තාව ගල-
වනු ලැබේ.[10] නමුත් වංචනිකව
හැසිරෙන තැනැත්තා ක්ෂණිකව
වැටෙනු ඇත.[11]
**19** තමාගේ කෙත්වතුවල වගා
කරන මිනිසාට කෑමෙන් කිසි හිඟයක්
නැත.[12] එහෙත් නිෂ්ඵල දේ පසුපස
හඹා යන්නා අන්ත දුගීකමට පත් වනු
ඇත.[13]
**20** විශ්වාසවන්තව ක්‍රියා කරන
කෙනාට බොහෝ ආශීර්වාද ලැබේ.[14]
නමුත් පොහොසත් වීමට ඉක්මන්
වන්නා වැඩි කල් නිර්දෝෂව සිටින්-
නේ නැත.[15]

**28 පරි.**

**1** 1රාජා 15:25 1රාජා 16:8 1රාජා 16:15 1රාජා 16:22 2ලේක 36:2 හොෂෙ 13:11
**2** ආනි 4:27
**3** හිතෝ 14:31
**4** මලා 3:15
**5** ලෙවී 5:1 ගණන් 25:8 1සාමු 15:23 එෆී 5:11
**6** ගීතා 25:14 මාක් 4:11 යාකො 1:5
**7** හිතෝ 16:8 හිතෝ 19:1
**8** හිතෝ 2:1 හිතෝ 3:1
**9** හිතෝ 23:20 1කොරි 15:33
**10** ලෙවී 25:36 ද්වි 23:19 එස 18:13
**11** යෝබ් 27:17 හිතෝ 13:22 හිතෝ 19:17
**12** සෙක 7:11 2තිමෝ 4:4
**13** ගීතා 66:18 ගීතා 109:7 හිතෝ 15:29 යෙසා 1:15
**14** ගණන් 31:16 1සාමු 26:19 රෝම 16:17
**15** ගීතා 7:15 හිතෝ 26:27 දේශ 10:8 ගලා 6:7
**16** ද්වි 7:12 ගීතා 37:11 ගීතා 37:18 ගීතා 37:37 ගීතා 84:11 හිතෝ 15:6
**17** හිතෝ 18:11 යෙසා 5:21 රෝම 12:16
**18** මාක් 10:21
**19** 1ලේක 15:25 හිතෝ 11:10

**2 තීරුව**

**1** 1රාජා 17:3 හිතෝ 29:2
**2** උත් 3:8 1සාමු 15:15 ගීතා 32:3
**3** 2සාමු 12:13 2ලේක 33:12 ගීතා 32:5 ගීතා 51:1

**4** ගීතා 2:11; හිතෝ 8:13; හිතෝ 23:17; යෙරෙ 32:40; පිලි 2:12; **5** නික් 7:22; නෙහෙ 9:29; යෝබ් 9:4; හිතෝ 29:1; යෙසා 30:1; යෙරෙ 16:12; **6** 1සාමු 22:17; හිතෝ 29:2; ශෙප 3:3; මතෙ 2:16; **7** නෙහෙ 5:15; දේශ 4:1; ආමො 4:1; **8** නික් 18:21; යෙසා 33:15; **9** උත් 9:6; 1රාජා 21:19; මතෙ 27:5; **10** ගීතා 25:21; ගීතා 26:1; මතෙ 24:13; **11** ගීතා 73:18; 1තෙස 5:3; එළි 3:3; **12** හිතෝ 12:11; **13** හිතෝ 23:21; ලූක් 15:14; **14** 1සාමු 18:5; නෙහෙ 7:2; ගීතා 101:6; **15** 2රාජා 5:22; හිතෝ 20:21; යෙරෙ 17:11; 1තිමෝ 6:9.

**21** පැති ගැනීම සුදුසු නැත.[1] පුරුෂයෙකු රොටි කැබැල්ලක් වෙනුවෙන් වරදට වැටීමද සුදුසු නැත.

**22** ඊර්ෂ්‍යා කරන තැනැත්තා වස්තුව ලබාගන්න වෙහෙසෙයි.[2] එහෙත් පසුව ඔහුට අගහිඟකම් විඳින්න සිදු වන බව ඔහු නොදනියි.

**23** චාටු බස් දොඩන තැනැත්තාට වඩා අවවාදයක් දෙන තැනැත්තා[3] අන්‍යයන්ගේ ගෞරවය දිනාගනී.

**24** තම පියාගෙන්ද මවගෙන්ද සොරකම් කර,[4] "එය වරදක් නොවේ"[5] යයි කියන තැනැත්තා සොරුන් සමඟ මිත්‍රකම් පවත්වන්නෙකි.

**25** අහංකාර තැනැත්තා අඬදබර ඇති කරයි.[6] නමුත් යෙහෝවා දෙවි කෙරෙහි රඳා පවතින තැනැත්තා සාර්ථක වෙයි.[7]

**26** තමාගේම සිත කෙරෙහි විශ්වාසය තබන්නා අඥානයෙකි.[8] එහෙත් ප්‍රඥාවන්තව හැසිරෙන්නා අනතුරෙන් ගැලවෙන්නේය.[9]

**27** දුප්පතාට දෙන තැනැත්තා අගහිඟකම්වලට මුහුණ දෙන්නේ නැත.[10] එහෙත් දුප්පතාව දැක අහක බලාගන්න තැනැත්තා බොහෝ විපත්වලට මුහුණ දෙනු ඇත.[11]

**28** දුෂ්ටයන් නැඟී සිටින විට ජනයා සැඟවෙති.[12] එහෙත් ඔවුන් විනාශ වන විට ධර්මිෂ්ඨයෝ වැඩි වෙති.[13]

**29** නිතරම ලැබෙන අවවාද[14] මුරණ්ඩු ලෙස ප්‍රතික්ෂේප කරන මිනිසා[15] හදිස්සියෙන්ම විනාශ වී යයි. ඔහුට ඒ විනාශයෙන් කිසිසේත් ගැලවී යා නොහැක.[16]

**2** ධර්මිෂ්ඨයන් වැඩි වූ කල ජනයා ප්‍රීති වෙති.[17] නමුත් පාලනය දුෂ්ටයෙකුගේ අතට පත් වූ විට ජනයා සුසුම්ලති.[18]

**3** ප්‍රඥාවට ප්‍රිය කරන්නා තම පියාව සතුටට පත් කරයි.[19] එහෙත් ගණිකාවන් සමඟ සම්බන්ධකම් පවත්වන්නා සියලු වටිනා දේ නැති කරගනී.[20]

**4** රජෙකු යුක්තිය ඉටු කරන විට දේශය දියුණුවක් අද්දකියි.[1] එහෙත් අල්ලස් දූෂණය නිසා දේශයක් පරිහානියට ලක් වෙයි.[2]

**5** චාටු බස් දොඩන මිනිසා[3] තම මිතුරා ඉදිරියේ දැලක් එළයි.[4]

**6** දුෂ්ටයෙකු කරන වැරදි ක්‍රියා ඔහුටම උගුලක් වේ.[5] එහෙත් ධර්මිෂ්ඨයා සතුටු සිතින් ප්‍රීති ඝෝෂා නඟයි.[6]

**7** ධර්මිෂ්ඨයා දුප්පතාගේ අයිතිවාසිකම් සුරැකීමට උනන්දු වෙයි.[7] නමුත් දුෂ්ටයා ඒ ගැන කිසි සැලකිල්ලක් නොදක්වයි.[8]

**8** පුරසාරම් දොඩන අය ගින්නක් අවුළන්නාක් මෙන් නුවරේ වැසියන්ව උසිගන්වන්නෝය.[9] එහෙත් ඥානවන්තයෝ කෝපය නිවා දමන්නෝය.[10]

**9** ඥානවන්තයෙකු මෝඩයෙකු සමඟ නඩුවකට පැටලුණොත් මෝඩයා කෑගසමින් සිනාසෙයි. ඔහු නිසා ඥානවන්තයාට කිසි සැනසිල්ලක් නොලැබෙයි.[11]

**10** ලේ පිපාසිත මිනිසා නිර්දෝෂ අයට ද්වේෂ කරයි.[12] නමුත් ප්‍රතිපත්තිගරුක අය ඔවුන්ගේ ජීවිත සුරැකීමට උත්සාහ කරති.[13]

**11** මෝඩයා තම කෝපය මුළුමනින්ම පිට කරයි. නමුත් ඥානවන්තයා අවසානය දක්වාම සන්සුන්ව සිටියි.[14]

**12** බොරු කතාවලට සවන් දෙන පාලකයෙකුගේ සියලු සේවකයෝ දුෂ්ටයෝය.[15]

**13** දුප්පතා හා පීඩා කරන්නා අතරේ සමානකමක් තිබේ.[16] මන්ද ඔවුන් දෙදෙනාටම ජීවිතය දුන්නේ යෙහෝවා දෙවිය.[17]

**28 පරි.**

**1** ලෙවී 19:15
ද්වි 16:19
හිතෝ 18:5
යාකො 2:1
**2** ද්වි 15:9
මතෙ 6:23
මතෙ 20:12
මාක් 7:22
2පේතෘ 2:14
**3** 2සාමු 12:7
ගීතා 141:5
හිතෝ 27:6
ගලා 2:11
**4** හිතෝ 19:26
මාක් 7:11
**5** මලා 1:8
**6** හිතෝ 10:12
1තිමෝ 6:4
**7** 1රාජා 3:13
ගීතා 84:12
**8** හිතෝ 3:5
යෙරෙ 17:9
**9** යෝබ් 28:28
යාකො 3:13
**10** ද්වි 15:7
ගීතා 41:1
හිතෝ 14:21
හිතෝ 19:17
හිතෝ 22:9
යෙසා 58:7
2කොරි 9:6
හෙබ්‍රෙ 13:16
**11** හිතෝ 11:26
**12** යෝබ් 24:4
හිතෝ 28:12
**13** එස්ත 8:17

**29 පරි.**

**14** 1සාමු 2:25
2ලේක 36:16
යෙරෙ 25:3
**15** නික් 11:10
2ලේක 36:13
ගීතා 75:5
යෙරෙ 17:23
**16** හිතෝ 6:15
**17** 1රාජා 4:20
**18** එස්ත 3:15
හිතෝ 28:15
**19** හිතෝ 10:1
හිතෝ 15:20
හිතෝ 27:11
ලූක් 1:14
**20** හිතෝ 5:9
හිතෝ 6:26
ලූක් 15:13

**2 තීරුව**

**1** 2සාමු 8:15
ගීතා 89:14
යෙසා 9:7
**2** හිතෝ 17:23
**3** එෆී 4:25
1තෙස 2:5
**4** හිතෝ 26:28
රෝම 16:18

**5** හිතෝ 5:22; 2තිමෝ 2:26; **6** ගීතා 97:11; 1පේතෘ 1:8; **7** ගීතා 41:1; **8** යෙරෙ 5:28; **9** හිතෝ 11:11; ක්‍රියා 19:29; යාකො 3:6; **10** නික් 32:11; ක්‍රියා 19:35; **11** හිතෝ 26:4; **12** උත් 27:41; 1සාමු 20:31; 1යොහ 3:12; **13** යෙරෙ 38:12; මාක් 10:45; **14** හිතෝ 14:29; හිතෝ 25:28; ආමො 5:13; **15** 1රාජා 21:11; යෙරෙ 38:5; **16** හිතෝ 22:2; **17** මතෙ 5:45.

**14** දුප්පතුන්ට සාධාරණ විනිශ්චයක් දෙන රජෙකුගේ[1] සිංහාසනය සදහටම ස්ථිර වෙයි.[2]

**15** වේවැල* භාවිත කිරීමෙන්ද අවවාද දීමෙන්ද ප්‍රඥාව ලබා දිය හැක.[3] නමුත් දරුවෙකුට හිතුමතේට ක්‍රියා කරන්න ඉඩහැරියොත් ඔහු තම මවට ලැජ්ජාවට පත් කරයි.[4]

**16** දුෂ්ටයන් වැඩි වූ විට අපරාධ දසත පැතිරෙයි. එහෙත් ධර්මිෂ්ඨයෝ දුෂ්ටයන්ගේ වැටීම ඇස් දෙකෙන්ම දකිති.[5]

**17** ඔබේ පුත්‍රයාව හික්මවන්න. එවිට ඔහු ඔබේ ජීවිතයට සතුටක් හා සැනසීමක් ගෙන දෙයි.[6]

**18** දෙවිගෙන් මඟ පෙන්වීම් නොලබන විට ජනයා නොහික්මුණු අයුරින් හැසිරෙති.[7] එහෙත් නීතිය රකින අය සන්තෝෂවත්ය.[8]

**19** සේවකයෙකුට අවවාදයක් දුන් විට ඔහු එය සිතට නොගන්නේ නම්[9] ඔබ කියන දේ තේරුම්ගත්තත් ඔහු එයින් පාඩමක් ඉගෙනගන්නේ නැත.[10]

**20** කතා කිරීමට ඉක්මන් වන මිනිසෙකුව ඔබ දන්නෙහිද?[11] ඔහුට වඩා මෝඩයෙකු යහමඟට හැරෙයි කියා බලාපොරොත්තු තැබිය හැක.[12]

**21** සේවකයෙකුට ඔහුගේ බාල කාලයේ සිටම පමණට වඩා සැලකිල්ල දැක්වුවහොත් පසු කලකදී ඔහු අගය නොපෙන්වන කෙනෙකු බවට පත් වෙයි.

**22** කෝපාවිෂ්ට මිනිසෙක් රණ්ඩු දබර ඇති කරයි.[13] හදිසි කෝපයෙන් ක්‍රියා කරන්නාගේ අතින් බොහෝ වැරදි සිදු වෙයි.[14]

**23** උඩඟු මිනිසාව පහත් කරනු ලැබේ.[15] නමුත් යටහත්පහත් මනසක් ඇති මිනිසා ගෞරවය හිමි කරගනියි.[16]

**24** සොරෙකු සමඟ මිතුරු වන්නා තමාගේම ජීවිතය අනතුරේ හෙළයි.[1] වරදක් ගැන සාක්ෂි දෙන ලෙස ඔහුට දැන්වූ* පසුත් ඔහු එසේ නොකරයි.[2]

**25** මනුෂ්‍යයන්ට භය වීම උගුලකි.[3] නමුත් යෙහෝවා දෙවිව විශ්වාස කරන්නාව ආරක්ෂා කරනු ලැබේ.[4]

**26** පාලකයෙකුගෙන් උදව් උපකාර ලබාගැනීමට බොහෝදෙනා වෙහෙසෙති.[5] එහෙත් මිනිසාට යුක්තිය ඉටු කර දෙන්නේ යෙහෝවා දෙවිය.[6]

**27** ධර්මිෂ්ඨයා යුක්තිය ඉටු නොකරන මිනිසාව හෙළාදකියි.[7] නමුත් දුෂ්ටයා හෙළාදකින්නේ යුක්තියට ප්‍රිය කරන තැනැත්තාවයි.[8]

# 30

මෙය යාකේගේ පුත් ආගුර් විසින් පවසන ලද බැරෑරුම් පණිවිඩයකි.[9] ඔහු මෙම වදන් පැවසුවේ ඉතියෙල්ට සහ ඌකාල්ටය.

**2** මා අන් සියලුදෙනාටම වඩා අඥානයෙකි.[10] සාමාන්‍ය මිනිසුන්ට තිබෙන නුවණවත් මට නැත.[11]
**3** මා ප්‍රඥාව අත් කරගෙන නැත.[12] අතිශුද්ධ තැනැත්තාණන් සතු දැනුම මා ලබාගෙන නැත.[13]

**4** ස්වර්ගයට ගොස් නැවත පොළොවට පැමිණියේ කවුද?[14] එවැනි කෙනෙකුව ඔබ හඳුනන්නෙහිද? තම දෑතින් සුළඟ[15] අල්ලාගත්තේ කවුද? තම සළුවෙන් ජල ධාරා රැස් කරගත්තේ කවුද?[16] පොළොවේ සීමා නියම කළේ කවුද?[17] ඔබ එවැනි කෙනෙකුව දන්නවා නම් ඔහුගේ නම[18] මට කියන්න. ඔහුගේ පුත්‍රයාගේ නමත් මට කියන්න.[19]

---

**29 පරි.**
1 ගීතා 72:2; හිතෝ 20:28; දානි 4:27
2 හිතෝ 16:12; හිතෝ 25:5; යෙසා 9:7; හෙබ්‍රෙ 1:8
3 හිතෝ 22:6; හිතෝ 22:15; හිතෝ 23:13; එෆී 6:4
4 උත් 27:46; හිතෝ 10:1; හිතෝ 17:25
5 ගීතා 37:34; ගීතා 58:10; ගීතා 91:8; එළි 18:20
6 හිතෝ 13:24; හිතෝ 19:18; හෙබ්‍රෙ 12:11
7 හොෂෙ 4:6
8 හිතෝ 19:16; යොහ 13:17; යාකො 1:25
9 හිතෝ 26:3
10 යෝබ් 19:16
11 දේශ 5:2; යාකො 1:19
12 හිතෝ 14:29; හිතෝ 21:5
13 හිතෝ 10:12; හිතෝ 15:18
14 1සාමු 22:18; හිතෝ 22:24; යාකො 3:16
15 එස්ත 6:6; හිතෝ 18:12; ලූක් 18:14; යාකො 4:6
16 හිතෝ 15:33; හිතෝ 18:12; යෙසා 57:15; මතෙ 18:4; පිලි 2:9

**2 තීරුව**
1 හිතෝ 1:11
2 ලෙවී 5:1; හිතෝ 28:4
3 යෙරෙ 38:19; මතෙ 10:28; මතෙ 26:75
4 1ලේක 5:20; 2ලේක 14:11; ගීතා 69:29; හිතෝ 18:10
5 1සාමු 8:5; 1රාජා 4:34
6 2රාජා 6:27; නෙහෙ 1:11; ගීතා 62:12
7 ගීතා 119:115; ගීතා 139:21
8 යොහ 7:7; 1යොහ 3:13

**30 පරි.** **9** 2තිමෝ 3:16; 2පේත්‍ර 1:21; **10** යෝබ් 42:3; ගීතා 73:22; 1කොරි 3:18; **11** ගීතා 92:6; **12** යාකො 1:5; **13** හිතෝ 2:6; හිතෝ 8:1; **14** ගීතා 115:16; යොහ 3:13; එෆී 4:9; **15** දේශ 1:6; **16** යෙසා 40:12; **17** යෝබ් 38:4; **18** නික් 3:15; නික් 6:3; ගීතා 83:18; **19** ගීතා 2:7; මතෙ 1:21; යොහ 5:22; ක්‍රියා 4:12; පිලි 2:6; 1තිමෝ 2:5; හෙබ්‍රෙ 6:20; එළි 19:16.

හිතෝ **29:15*** හිතෝ 13:24හි පාදසටහන බලන්න.

හිතෝ **29:24*** ලෙවී 5:1හි පාදසටහන බලන්න.

**5** දෙවිගේ සියලු වදන් පවිත්‍රය.[1]
ඔහුගේ රැකවරණය පතන අයට
ඔහු පලිහකි.[2] **6** ඔහුගේ වදන්වලට
කිසිවක් එකතු නොකරන්න.[3] මන්ද
එසේ කළොත් ඔබ බොරුකාරයෙක්
වන්නෙහිය.[4] එවිට දෙවි ඔබට තරවටු
කරනු ඇත.

**7** දෙවියනි, මම ඔබෙන් දේවල්
දෙකක් ඉල්ලා සිටිමි.[5] මා මිය යන
තුරු වෙන කිසිවක් ඔබෙන් ඉල්ලන්-
නේ නැත.[6] **8** බොරුවත් වංචාවත්
මාගෙන් ඉවත් කරන්න.[7] මට දුප්පත්
වීමටවත් පොහොසත් වීමටවත් ඉඩ
නොදී,[8] එදිනෙදා අවශ්‍ය ආහාර පාන
විතරක් ලබා දෙන්න.[9] **9** නැත්නම්
මා ඕනෑවට වඩා තෘප්තියට පත් වී,[10]
"යෙහෝවා දෙවි කවුද? මා ඔහුව හඳු-
නන්නේ නැහැ"[11] යයි කියමින් ඔබව
ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ. එසේත්
නැත්නම්, මා දිළිඳුකමට වැටී සොර-
කමට පුරුදු වී ඔබගේ නමට නින්දා
කිරීමට පෙලඹෙයි.[12]

**10** සේවකයෙකු ගැන ඔහුගේ
ස්වාමියාට කේලාම් නොකියන්න.[13]
එසේ කළහොත් ඔහු ඔබට ශාප
කරයි. ඔබ කළ වරද ගැන ඔබට
ගණන් දෙන්න සිදු වෙයි.[14]

**11** තම පියාට ශාප කරන, මවට
කිසි ගෞරවයක් නොදක්වන පරම්ප-
රාවක් ඇත.[15]

**12** තමන් පවිත්‍රයයි සිතන පරම්-
පරාවක්ද ඇත.[16] එහෙත් ඔවුහු
තමුන්ගේ අපවිත්‍රකම් සෝදා ඉවත්
කරගෙන නැත.[17]

**13** ඉතා අහංකාර ලෙස කටයුතු
කරන පරම්පරාවක් ඇත. ඔවුන්ගේ
ඇස් උඩඟුය.[18]

**14** කඩු වැනි තියුණු දත් ඇති,
මන්න පිහි වැනි ශක්තිමත් හකු ඇති
පරම්පරාවක් ඇත.[19] ඔවුහු පීඩාවට
පත් වූ ජනයාවද දුප්පතුන්වද කා
දමන්නෝය.[20]

**15** කූඩැල්ලාට දූවරු දෙදෙනෙක්
සිටිති. ඒ දූවරු, "දෙන්න! දෙන්න"
යයි කියමින් නිතරම කෑගසති.
කිසිදා සෑහීමට පත් නොවන දේවල්
තුනක් තිබේ. ඒ තුනට අමතරව,
"මට ඇති" යයි නොකියන තවත් දෙ-
යක්ද තිබේ. **16** මිනී වළද[1] දරුපල
නැති ගැබද[2] නියඟයෙන් වියළී ගිය
දේශයක්ද[3] කිසිදා සෑහීමට පත් නො-
වේ. ගින්නද[4] කිසිදා, "මට ඇති" යයි
නොකියන්නේය.[5]

**17** පියාව සුළු කොට තක-
මින් මවගේ උපදෙස්ද හෙළාද-
කින තැනැත්තෙක් සිටියි.[6] නිම්නයේ
ලගින කපුටෝ ඇවිත් ඔහුගේ ඇස්
උගුලා දමනු ඇත. රාජාලි පැටවුන්
ඔහුව කා දමනු ඇත.

**18** මම පුදුමාකාර දේවල් තුනක්
දුටිමි. ඒ තුනට අමතරව, මට වටහා-
ගැනීමට නොහැකි වූ තවත් දෙයක්ද
දුටුවෙමි. **19** අහසේ පියාසර කරන
රාජාලියෙකුගේ ගමන් මඟවත් පර්ව-
තයක් මත ඇදී යන සර්පයෙකුගේ
ගමන් මඟවත් ගැඹුරු මුහුදේ යාත්‍රා
කරන[7] නැවක ගමන් මඟවත් සොයා-
ගත නොහැක. එසේම, තරුණියක
වෙතට ඇදී යන පුරුෂයෙකුගේ ක්‍රියා-
කලාපයද වටහාගත නොහැක.[8]

**20** අනාචාරයේ යෙදෙන ස්ත්‍රියක
හැසිරෙන්නේ මෙසේය. ඇය කෑම කා
කට පිස දමා, "මා කිසි වරදක් කර
නැත" යයි කියන්නීය.[9]

**21** පොළොවේ වැසියන්ව කැලඹී-
මට පත් කරන දේවල් තුනක් ඇත.
ඒ තුනට අමතරව, ඔවුන්ට දරා-
ගත නොහැකි තවත් දෙයක්ද
තිබේ. **22** රජකමට පත් වූ දාස-
යෙකුගේ අණසක යටතේ සිටීමත්[10]
කා බී තෘප්තියට[11] පැමිණි මෝ-
ඩයෙකු ඉදිරියේ සිටීමත් **23** එපා
කළ ස්ත්‍රියකව විවාහ කරගෙන සිටී-
මත්[12] දාසියක ඇගේ ස්වාමිදුවට හිමි
තැන පැහැරගැනීමත් දරාගත නො-
හැකිය.[13]

**30 පරි.**
**1** 2සාමු 22:31
ගීතා 12:6
ගීතා 18:30
ගීතා 119:140
**2** උත් 15:1
ගීතා 84:11
**3** ද්වි 4:2
එළි 22:18
**4** රෝම 3:4
**5** ගීතා 27:4
ලූක් 10:42
1යොහ 3:22
1යොහ 5:14
**6** ගීතා 21:2
**7** හිතෝ 12:22
හිතෝ 21:6
**8** හිතෝ 23:5
**9** මතෙ 6:11
1තිමෝ 6:8
**10** ද්වි 6:12
ද්වි 8:11
**11** නික් 5:2
**12** නික් 20:7
ද්වි 5:11
හිතෝ 6:30
**13** ද්වි 23:15
**14** දානි 6:24
මාක් 7:5
**15** ලෙවී 20:9
ද්වි 27:16
හිතෝ 19:26
හිතෝ 20:20
මාක් 7:11
2තිමෝ 3:2
**16** ගීතා 36:2
යෙසා 65:5
ලූක් 16:15
2තිමෝ 3:4
1යොහ 1:8
**17** මතෙ 23:27
ලූක් 11:39
**18** ගීතා 101:5
හිතෝ 6:17
හිතෝ 21:4
යෙසා 2:11
2තෙස 2:4
**19** ගීතා 3:7
ගීතා 57:4
**20** ගීතා 14:4
හිතෝ 22:16
යෙසා 32:7
මීකා 3:3
හබ 3:14
මාක් 12:40
යාකො 5:4

**2 තීරුව**
**1** හිතෝ 27:20
හබ 2:5
**2** උත් 20:18
උත් 30:22
1සාමු 1:5
**3** ද්වි 8:15
ගීතා 107:33
**4** යාකො 3:5
**5** හිතෝ 27:20

**6** ලෙවී 20:9; ද්වි 21:21; 2සාමු 17:1; හිතෝ 20:20; හිතෝ 23:22; රෝම 1:30; 2තිමෝ 3:2; **7** ගීතා 77:19; **8** ගණන් 5:13; **9** හිතෝ 7:11; යෙරෙ 6:15; **10** හිතෝ 19:10; දේශ 10:7; යෙසා 3:4; **11** ද්වි 8:12; 1සාමු 25:36; **12** හිතෝ 21:19; හිතෝ 27:15; **13** උත් 16:5.

**24** පොළොවේ කුඩාම සතුන් අත-
රින් සතරදෙනෙක් සිටිති. උන් කුඩා
වුණත් සහජයෙන්ම ප්‍රඥාවන්තය.[1]
**25** කුහුඹුවන් සවිශක්තිය අතින් දුර්-
වලය.[2] එහෙත් ගිම්හානයේ උන් කෑම
රැස් කරගනිති.[3] **26** බෙන්හාවුන්[4]
බලවත් සතුන් නොවෙයි. එහෙත්
උන් තම වාසස්ථාන තනාගන්-
නේ පර්වතයක් මතයි.[5] **27** පළඟැ-
ටියන්ට[6] රජෙක් නැත. එහෙත්
උන් සියල්ලෝ කණ්ඩායම් වශයෙන්
බෙදී පිළිවෙළකට ගමන් කරති.[7]
**28** හූනා[8] තම පාදවලින් එල්ලීගෙන
සිටියි. රජමාලිගාවල පවා ඌව දක්-
නට ලැබේ.

**29** ආඩම්බර ලීලාවෙන් ගමන්
කරන තුන්දෙනෙක් සිටිති. තේජාන්-
විතව ගමන් කරන තවත් අයෙක්ද
සිටියි. **30** වනසතුන් අතරින් බල-
වතා සිංහයාය. ඌ කිසිවෙකුට
භයෙන් හැරී එන්නේ නැත.[9] **31** දඩ-
බල්ලා හා එළුවා ගමන් කරන්නෙත්
ආඩම්බර ලීලාවෙනි. රජෙකු තම සේ-
නාව ඉදිරියේ ගමන් කරන්නේද එලෙ-
සමය.[10]

**32** ඔබ ඔබවම උසස් කරගනි-
මින් අඥානව කටයුතු කර ඇත්-
නම්[11] එසේත් නැත්නම්, එසේ
කිරීමට කල්පනා කරමින් සිටින්-
නේ නම් කට පියාගෙන නිහඬ
විය යුතුයි.[12] **33** කිරි කලතන විට
වෙඬරු* සෑදෙයි. නාසය තදින් මිරි-
කන විට ලේ ගලයි. කෝපය පිට කිරී-
මෙන් ආරවුල් ඇති වෙයි.[13]

**31** මෙය ලෙමුවෙල් රජු විසින්
ලියන ලද බැරෑරුම් උපදේශ-
යකි.[14] ඔහුගේ මව ඔහුට අවවාද කර-
මින් පැවසූ එම උපදෙස් මේවාය.[15]
**2** මාගේ පුත්‍රය, දෙවිට භාර වෙමින්
මා කන්නලව් කළේ ඔබ ගැනයි.[16]
මගේම කුසෙන් බිහි වූ පුත්‍රය,[17] මා
පවසන දේට සවන් දෙන්න.
**3** ඔබේ පුරුෂ ශක්තිය ස්ත්‍රීන්ට
නොදෙන්න.[1] නොහොබිනා ජීවන
රටාවක් අනුගමනය නොකරන්න.
මන්ද එලෙස හැසිරෙන රජවරුන්ට
අත් වන්නේ විනාශය පමණි.[2]
**4** මාගේ පුත්‍ර ලෙමුවෙල්, වයින්
බීම රජෙකුට නුසුදුසුය. නිතරම මත්-
පැන් සොයා යෑම නිලධාරියෙකුට
සුදුසු නැත.[3] **5** මන්ද වයින් බී මත්
වූ පසු නීතිය අමතක කර අසරණ-
යන්ට යුක්තිය ඉටු කර දීමට අස-
මත් විය හැකියි.[4] **6** මරණාසන්නව
සිටින කෙනෙකුට[5] හෝ කලකිරුණු
කෙනෙකුට හෝ මත්පැන් දෙන්න.[6]
**7** යමෙක් මත්පැන් බීමෙන් පසු තම
දුප්පත්කම අමතක කර දමයි. ඔහුට
තම දුක් කරදර තවත් සිහි නොවෙයි.

**8** තමන් වෙනුවෙන් කතා කළ
නොහැකි[7] අන්ත අසරණ තත්ව-
යක සිටින ජනයා වෙනුවෙන් ඔබේ
මුඛය හැර කතා කරන්න.[8] **9** ඔබේ
මුඛය හැර ධර්මිෂ්ඨකමින් විනිශ්-
චය කරන්න. පීඩිත අය වෙනුවෙන්ද
දුප්පත් අය වෙනුවෙන්ද කතා කර
ඔවුන්ට යුක්තිය ඉටු කර දෙන්න.[9]

א [ආලෙෆ්]

**10** ගුණවත් බිරිඳක් සොයාගත
හැක්කේ කාටද?[10] ඇය අනර්ඝ
මැණික්වලටත්* වඩා අගනේය.

ב [බේත්]

**11** ඇගේ ස්වාමිපුරුෂයා මුළු හද-
වතින්ම ඇයව විශ්වාස කරයි. ඔහුට
කිසිම දෙයකින් අඩුවක් නැත.[11]

ג [ගීමෙල්]

**12** ඇගේ මුළු ජීවිත කාලය පුරාම
ඇය ඔහුට යහපතක් මිස අයහපතක්
නම් සිදු නොකරන්නීය.[12]

ד [දාලෙත්]

**13** ලොම්ද ලිනන් රෙදිද සොයා
යන ඇය කැමැත්තෙන්ම ඇගේ දෑත්-
වලින් වැඩ කරන්නීය.[13]

**30 පරි.**
1 යෝබ් 12:7; යෝබ් 35:11
2 හිතෝ 6:6
3 හිතෝ 6:8
4 ලෙවී 11:5
5 ගීතා 104:18
6 නික් 10:14; ගීතා 105:34; යෝවෙ 1:4
7 යෝවෙ 2:7
8 ලෙවී 11:30
9 ගණන් 23:24; විනි 14:5; විනි 14:18; යෙසා 31:4
10 2සාමු 10:18
11 2සාමු 15:4; එස්ත 5:11; හිතෝ 26:12; රෝම 12:16
12 යෝබ් 21:5; හිතෝ 27:2
13 හිතෝ 26:21; හිතෝ 28:25

**31 පරි.**
14 හිතෝ 30:1; 2තිමෝ 3:16
15 හිතෝ 1:8; හිතෝ 6:20; 2තිමෝ 1:5; 2තිමෝ 3:15
16 1සාමු 1:11; 1සාමු 1:28
17 ගීතා 71:6; යෙසා 49:15

**2 තීරුව**
1 හොෂෙ 4:11
2 ද්වි 17:17; 1රාජා 11:3; නෙහෙ 13:26
3 ලෙවී 10:9; එස්ත 3:15; දේශ 10:17; යෙසා 28:7; ආනි 5:4; හොෂෙ 4:11
4 හබ 2:5
5 ගීතා 104:15; මතෙ 27:34
6 යෙරෙ 16:7
7 ගීතා 79:11
8 1සාමු 19:4; 1සාමු 22:14; එස්ත 4:14; එස්ත 7:3; ගීතා 82:4
9 ද්වි 1:17; 2සාමු 8:15; ගීතා 58:11; ගීතා 72:2; යෙසා 11:4; යෙරෙ 22:3; යොහ 7:24; හෙබ්‍රෙ 1:9; එළි 19:11

**10** රූත් 3:11; හිතෝ 12:4; හිතෝ 19:14; **11** 1පේතෘ 3:7; **12** 1පේතෘ 3:6; **13** 1සාමු 2:19; ක්‍රියා 9:39; තීත 2:5.

හිතෝ **30:33*** උන් 18:8හි පාදසටහන බලන්න.

හිතෝ **31:10*** මු.අ., “කොරල්වලටත් වඩා.”

ח [හේ]

**14** ඇය වෙළඳ නැවක්[1] මෙන් දුර ඈත ගමන් කර ආහාර මිල දී ගන්නීය.

ו [වාව්]

**15** ඇය පාන්දරින්ම නැඟිට[2] ඇගේ ගෙයි වැසියන්ට ආහාර පිළියෙල කරන්නීය. ඇගේ සේවිකාවන්ටද ඇය කොටසක් වෙන් කර තබන්නීය.[3]

ז [ෂායින්]

**16** ඇය ඉඩමක් ගැන හොඳින් සොයා බලා එය මිල දී ගනී.[4] වෙහෙස මහන්සි වී උපයාගත් දෙයින් මිදිවත්තක් වවන්නීය.[5]

ח [චේත්]

**17** ඇය තම දෑත් සවිමත් කරගනිමින් වෙහෙස මහන්සි වී වැඩ කරන්නීය.[6]

ט [ටේත්]

**18** ඇගේ වෙළඳ කටයුතු සාර්ථක බව ඇයට පෙනී යයි. රාත්‍රියේදී ඇගේ පහන කිසිවිටකත් නිවී යන්නේ නැත.[7]

י [යෝද්]

**19** ඇය නූල් ඔතන යන්ත්‍රය එක අතකින්ද නූල් ගොතන යන්ත්‍රය අනික් අතින්ද අල්ලාගනී.[8]

כ [කෆ්]

**20** ඇය දුප්පතුන්ටද අසරණයන්ටද අතහිත දෙන්නීය.[9]

ל [ලාමෙද්]

**21** ඇගේ සියලු ගෙයි වැසියන්ට ඇය වස්ත්‍ර දෙක බැගින් සාදා තිබේ.[10] හිම වැටෙන කාලයේදී ඇය භය නොවන්නේ ඒ නිසාය.

מ [මෙම්]

**22** ඇය ඇඳ ඇතිරිලි[11] සාදාගනී. ඇගේ ඇඳුම් ලිනන් රෙදිවලින්ද රත්නිල් පැහැගැන්වූ ලොම්වලින්ද නිමවා ඇත.[12]

נ [නූන්]

**23** නුවර දොරටුව අසල[13] වැඩිමහල්ලන් සමඟ අසුන්ගන්නා ඇගේ ස්වාමිපුරුෂයා[1] ජනයාගේ ගෞරවය දිනාගෙන සිටියි.

ס [සාමෙක්]

**24** ඇය ඇතුල් වස්ත්‍ර සාදා[2] ඒවා විකුණන්නීය. බඳපටි සාදා වෙළෙඳුන්ට දෙන්නීය.

ע [ආයින්]

**25** ඇය ශක්තියෙන්ද අලංකාරයෙන්ද සැරසී සිටින්නීය.[3] අනාගතය ගැන කිසිදු බියක් සැකක් නොමැතිව ඇය සිනාසෙන්නීය.[4]

פ [පේ]

**26** ඇය ඥානවන්තව කතා කරන්නීය.[5] ප්‍රේමය* නමැති නීතිය රකිමින් ඇය වචන හසුරුවන්නීය.[6]

צ [ට්සාධේ]

**27** ඇගේ ගෙයි වැසියන්ගේ ඕනෑ එපාකම් ගැන ඇය සෝදිසියෙන් සිටින්නීය. ඇය අලසකමින් කටයුතු කර කෑම කන්නේ නැත.[7]

ק [කෝෆ්]

**28** ඇගේ පුත්‍රයෝ නැඟිට ඇයට ප්‍රශංසා කරති.[8] ඇගේ ස්වාමිපුරුෂයාද නැඟිට ඇයට ප්‍රශංසා කරයි.[9]

ר [රේෂ්]

**29** දක්ෂ කාන්තාවන් බොහෝදෙනෙකු[10] සිටින බව ඇත්තයි. එහෙත් ඔබ ඒ සියල්ලන්ටම වඩා බොහෝ සෙයින් වටින්නෙහිය.[11]

ש [ෂින්]

**30** රූමත්බව නිෂ්ඵලය.[12] ප්‍රියමනාප පෙනුම රැවටෙනසුලුය.[13] එහෙත් ප්‍රශංසාව ලබාගන්නේ යෙහෝවා දෙවිට ගරුබිය දක්වන කාන්තාවයි.[14]

ת [ටාව්]

**31** ඇගේ දෑතේ උත්සාහයට සුදුසු ප්‍රතිඵල ලබා දෙන්න.[15] ඇය කළ වැඩ වෙනුවෙන් නුවර දොරටුව අසලදී ඇයට ප්‍රශංසා කරනු ලැබේවා![16]

---

**16** මාක් 14:9; ක්‍රියා 9:39; රෝම 16:2.

---

හිතෝ **31:26*** හෝ, “ළැදි ප්‍රේමය.”

**31 පරි.**
**1** 2ලේක 9:21; ගීතා 107:23
**2** යොහ 20:1
**3** 1තිමෝ 5:10
**4** යොෂු 15:19
**5** හිතෝ 10:4; හිතෝ 13:4; හිතෝ 21:5
**6** උත් 18:6; උත් 24:20
**7** මතෙ 25:4
**8** නික් 35:25
**9** 1සාමු 25:18; හිතෝ 19:17; හිතෝ 22:9; ක්‍රියා 9:36; එෆී 4:28; 1තිමෝ 2:10; හෙබ්‍රෙ 13:16
**10** 1තිමෝ 5:8
**11** හිතෝ 7:16
**12** නික් 39:29; එස්ත 8:15; ක්‍රියා 16:14
**13** ද්වි 16:18; රූත් 4:1; යෝබ් 29:7

**2 තීරුව**
**1** උත් 20:3; ද්වි 22:22; 2සාමු 11:26; 1කොරි 11:9
**2** ක්‍රියා 9:39
**3** උත් 24:20; විනි 5:24; යෝබ් 40:10
**4** මතෙ 6:34
**5** විනි 13:23; 1සාමු 25:31; 2සාමු 20:16; එස්ත 5:8; ගීතා 68:11; හිතෝ 31:1; ක්‍රියා 18:26; තීත 2:3
**6** උත් 24:18; යොෂු 2:6; 2රාජා 4:10; ක්‍රියා 16:15
**7** හිතෝ 14:1; 1තිමෝ 5:10; තීත 2:5
**8** රූත් 4:11; 1රාජා 2:19; 2තිමෝ 1:5
**9** යෙසා 62:4
**10** උත් 30:13
**11** සල 6:9; ලූක් 1:42
**12** හිතෝ 11:16
**13** 2රාජා 9:30; එස්ත 1:11; හිතෝ 6:25; 1පේත 1:24
**14** උත් 24:60; විනි 5:7; රෝම 2:29; 1පේත 3:4
**15** රූත් 3:11; ගීතා 128:2

# දේශනාකාරයා

**1** දාවිත්ගේ පුත්‍ර වූ යෙරුසලමෙහි
රජකම් කළ[1] උපදේශකයාගේ*
වදන් මේවාය.[2] **2** "සියල්ල නිෂ්ඵ-
ලය![3] සියල්ල නිෂ්ඵලය! පල ප්‍රයෝජ-
නයක් ඇති කිසිම දෙයක් නැත"[4]
යයි උපදේශකයා පවසයි. **3** වෙ-
හෙස මහන්සි වී ඉර යට[5] කරන
කිසිම වැඩකින් මිනිසාට ප්‍රයෝජන-
යක් තිබේද?[6] **4** පරම්පරාවක් පහව
යයි.[7] තවත් පරම්පරාවක් බිහි වෙයි.[8]
එහෙත් පොළොව සදහටම පවතියි.[9]
**5** හිරු උදා වෙයි. හිරු බැස යයි.[10]
යළි උදා වන පිණිස නියමිත ස්ථානය
කරා වේගයෙන් එය ගමන් කරයි.[11]

**6** සුළඟ දකුණු දෙසට හමා නැවත
උතුරු දෙසට හැරී යයි.[12] එලෙස
සුළඟ පොළොව පුරාම කැරකී නො-
නැවතී එම ගමනෙහි යෙදෙයි.[13]

**7** සියලු ගංගා[14] ගලා බසින්නේ
මුහුදටය.[15] එහෙත් මුහුද පිරී
ඉතිරී යන්නේ නැත.[16] මුහුදේ ජලය
නැවතත් ගංගාවලට එකතු වෙයි.[17]
**8** ඇස දකින දෙයින් තෘප්තියට පත්
වන්නේ නැත.[18] කනට ඇසෙන දෙ-
යින් එයද සෑහීමට පත් වන්නේ
නැත.[19] සියල්ල වෙහෙසකරය.[20] ඒ
ගැන විස්තර කිරීමට වචන නැති
තරම්ය. **9** ඉර යට අලුතින් සිදු
වන කිසිවක් නැත.[21] දැන් සිදු වන්-
නේ පෙර සිටම සිදු වූ දේමය.[22] මතු
සිදු වන්නෙත් ඒ දේමය. **10** යම් දෙ-
යක් පෙන්වා, "මේ බලන්න. මෙය
අලුත් දෙයක්" යයි පැවසීමට කිසිවෙ-
කුට හැකිද? එසේ පැවසීමට කිසිවෙ-
කුට නොහැක. මන්ද සෑම දෙයක්ම
අතීතයේ සිටම පවතින්නේය.[23] අප
මෙලොවට බිහි වෙන්නත් කලින්ම
ඒ දේවල් පැවතුණි.[24] **11** අතීතයේ
විසූ අයව දැන් අමතක වී ඇත. අනා-
ගතයේ ජීවත් වන අයට සිදු වන්නෙත්
ඒ දේමය.[1] ඔවුන්ගෙන් පසුව පැමි-
ණෙන පරම්පරාවට ඔවුන්වද අමතක
වී යන්නේය.[2]

**12** උපදේශකයා වන මම, යෙරු-
සලමේ සිට පාලනය කරන ඊශ්‍රායෙල්
දේශයේ රජුද වෙමි.[3] **13** පොළොවේ
සිදු කෙරෙන සෑම කාර්යයක් ගැනම
හොඳින් සොයා බලා ප්‍රඥාව ගැන
මනා අවබෝධයක් ලබාගැනීමට මම
උත්සාහ කළෙමි.[4] දෙවි මිනිසාට
ගත කිරීමට දුන් ජීවිතය විපත්තිව-
ලින් පිරුණු ඉතා දුෂ්කර එකක් බව
මට වැටහුණි.[5] **14** මම ඉර යට සිදු
කෙරෙන සෑම වැඩක් දෙසම බැලු-
වෙමි.[6] ඒ සියල්ල සුළඟ පසුපස හඹා
යන්නාක් මෙන් විය. එය නිෂ්ඵල
උත්සාහයක් පමණි.[7]

**15** ඇද දෙයක් කෙළින් කරන්න-
වත්[8] නැති දෙයක් ගණන් කරන්-
නවත් නොහැක. **16** "යෙරුසලමේ
ජීවත් වූ වෙන කිසිම කෙනෙකුට වඩා
මම ප්‍රඥාව අත් කරගෙන සිටිමි.[9]
මාගේ සිත තුළ ප්‍රඥාවද දැනුමද
නොඅඩුව තිබේ"[10] යයි මම මටම
කියාගතිමි.[11] **17** මම ප්‍රඥාව ගැන
පමණක් නොව මෝඩකම ගැනත්[12]
සිහිවිකල්ව හැසිරෙන[13] කෙනෙකුගේ
ජීවන රටාව ගැනත් තේරුම්ගැනීමට
උත්සාහ කළෙමි. එයද සුළඟ පසුපස
හඹා යන්නාක් මෙන් නිෂ්ඵල විය.[14]
**18** මන්ද බොහෝ ප්‍රඥාව අත් කරගැ-
නීමට යෑමෙන් ජීවිතයට බොහෝ දුක්
කරදර එකතු වෙයි.[15] දැනුම වැඩි
කරගන්න තැනැත්තා වේදනාවද වැඩි
කරගනියි.[16]

---

**දේශ 1:1*** මූ.අ., "එක් රැස් කරන්නා." 'සෙනඟව රැස් කරන හෝ කැඳවනු ලබන තැනැත්තා' යන අදහස මුල් භාෂාවේ ඇතුළත් වේ.

**1 පරි.**

**1** 1රාජා 2:12 2ලේක 9:30
**2** 1රාජා 8:1 1රාජා 8:22 2ලේක 5:2 දේශ 12:10
**3** දේශ 12:8
**4** ගීතා 39:5 ගීතා 144:4 රෝම 8:20
**5** දේශ 6:12
**6** දේශ 2:11 යෙසා 55:2 මතෙ 16:26 යොහ 6:27
**7** නික් 1:6 ගීතා 89:47 ගීතා 90:10 දේශ 12:7 සෙක 1:5
**8** එෆී 3:21
**9** ගීතා 78:69 ගීතා 104:5 ගීතා 119:90
**10** ගීතා 104:19
**11** උත් 8:22 ගීතා 19:6
**12** ගීතා 78:26 ගීතා 107:25 ලූක් 12:55
**13** යෙසා 40:22 යොහ 3:8
**14** යෝබ් 6:15
**15** ගීතා 104:25 ක්‍රියා 27:4
**16** යෝබ් 38:10
**17** යෝබ් 36:27 යෙසා 55:10 ආමෝ 5:8
**18** හිතෝ 27:20 දේශ 4:8
**19** ක්‍රියා 17:21
**20** දේශ 12:12
**21** උත් 8:22 දේශ 1:4
**22** දේශ 3:15
**23** ගීතා 77:5
**24** උත් 2:7

**2 තීරුව**

**1** දේශ 2:16 යෙසා 40:6
**2** දේශ 9:5
**3** 1රාජා 11:31 1රාජා 11:42 දේශ 1:1
**4** 1රාජා 4:30 හිතෝ 2:2 දේශ 7:25 දේශ 8:16
**5** දේශ 3:10 දේශ 4:4
**6** ගීතා 39:6 දේශ 2:18 දේශ 8:9 දේශ 9:3

**7** ගීතා 39:5; දේශ 2:11; දේශ 2:26; දේශ 6:9; ලූක් 12:15; **8** උත් 8:21; 1රාජා 22:43; දේශ 4:1; දානි 2:44; රෝම 8:20; **9** උත් 14:18; 2ලේක 1:12; දේශ 2:9; **10** 1රාජා 3:28; 1රාජා 4:29; 2ලේක 1:10; හිතෝ 2:6; හිතෝ 8:10; **11** ගීතා 15:2; ගීතා 77:6; හිතෝ 2:10; හිතෝ 15:28; මතෙ 12:35; **12** දේශ 2:12; දේශ 9:3; **13** දේශ 2:3; දේශ 7:25; දේශ 10:1; **14** දේශ 2:11; දේශ 2:26; **15** දේශ 2:15; දේශ 7:16; 1කොරි 3:20; **16** දේශ 12:12.

**2** පසුව මම මටම මෙසේ කියා-
ගතිමි.[1] “විනෝදබර ජීවිතයක්
ගත කර[2] මට සතුට ලබාගත හැකි-
දැයි සොයා බලන්නෙමි.”[3] නමුත්
එයත් ඉතා නිෂ්ඵල දෙයක් බව
මට වැටහුණි. **2** මම සිනාවට කතා
කර, “මෙය මහා මෝඩකමකි”[4] කියා
පැවසුවෙමි. විනෝදයට[5] කතා කර,
“මෙයින් ඇති ප්‍රයෝජනය කුමක්ද”
කියා ඇසුවෙමි.

**3** විනෝදබර සැහැල්ලු ජීවිතයක්
ගත කිරීමෙන් අත් වන ප්‍රයෝජන
තේරුම්ගැනීමට මම වයින් පානය
කරමින් ජීවිතය සතුටින් ගත
කළෙමි.[6] එසේ කළත් මම ප්‍රඥාවන්ත
මාර්ගයෙන් ඉවත් නොවුණෙමි.[7] මෙ-
ලෙස, මිනිසා තම ජීවිතය ගත කළ
යුත්තේ කෙසේදැයි මම තේරුම්ග-
තිමි.[8] **4** මම නොයෙකුත් වැඩවල
යෙදුණෙමි.[9] මම මටම කියා ගෙ-
වල් ගොඩනඟා ගත්තෙමි.[10] මිදිවතු
වවාගත්තෙමි.[11] **5** වතුද උයන්ද
සාදා[12] නානාවිධ පලතුරු ගස් වැවු-
වෙමි. **6** වනාන්තරයේ ගස් වැල්-
වලට වතුර සැපයීම සඳහා[13]
පොකුණුද සාදාගත්තෙමි.[14] **7** මට
බොහෝ සේවක සේවිකාවෝ සිටි-
යෝය.[15] මගේම ගෙයි උපන් සේ-
වකයෝද සිටියෝය.[16] යෙරුසලමේ
ජීවත් වූ වෙන කිසිම කෙනෙකුට
වඩා විශාල ගව රැළවල්ද එළු බැටළු
රැළවල්ද මට සිටියෝය.[17] **8** මම
බොහෝ රන්ද රිදීද රැස් කරග-
තිමි.[18] රජවරුන්ට අයිති ඉඩම්ද විවිධ
පළාත්වල තිබූ වටිනා ඉඩම්ද මම
හිමි කරගතිමි.[19] ගායක ගායිකා-
වෝද[20] පිරිමින්ගේ සිත්ගත්[21] බො-
හෝ කාන්තාවෝද මට සිටියෝය.[22]
**9** මට කලින් යෙරුසලමේ ජීවත් වූ
අන් සියලුදෙනාටම වඩා මම ඉතා
ශ්‍රේෂ්ඨ, බලවත් කෙනෙක් වුණෙමි.[23]
මට තරම් වත්කමක් වෙන කිසිවෙ-
කුට තිබුණේ නැත. මම සැමවිටම
ප්‍රඥාවන්තව ක්‍රියා කළෙමි.[24]

**10** මාගේ ඇස්වලට ප්‍රිය කළ සැම
දෙයක්ම මම ලබාගතිමි.[25] මම හිතේ
හැටියට සතුටු වුණෙමි. මන්ද වෙ-
හෙස මහන්සි වී කළ සැම වැඩකින්ම
මම තෘප්තියක් ලැබුවෙමි.[1] මගේ
දැතේ උත්සාහයෙන් කළ සියලු වැඩ-
වලින් මට ලැබුණු ප්‍රතිඵලය එයයි.[2]
**11** එහෙත් මා ඉටු කළ සැම දෙයක්
දෙසද මගේ දැතේ උත්සාහයෙන් කළ
සැම වැඩක් දෙසද ආපසු හැරී බලද්දී[3]
ඒ සියල්ලත් නිෂ්ඵල බව මට පෙ-
නුණි. එය සුළඟ පසුපස හඹා යන්-
නාක් මෙන් විය.[4] ඉර යට කෙරෙන
කිසි වැඩකින් ප්‍රයෝජනයක් නැති බව
මට පෙනී ගියේය.[5]

**12** එවිට මම ප්‍රඥාව ගැනත්[6] මෝ-
ඩකම ගැනත් සිහිවිකල්ව[7] කට-
යුතු කරන කෙනෙකුගේ ජීවන රටාව
ගැනත් කල්පනා කළෙමි. සාමාන්‍ය
මිනිසෙකු රජුගේ තැනට පත්
වුණොත් ඔහුට කළ හැක්කේ
කුමක්ද? මේ දක්වාම මිනිසා කර
තිබෙන දේවල්ම නොවේද? **13** අඳු-
රට වඩා ආලෝකයෙන් ප්‍රයෝජන-
යක් තිබෙන්නා සේම[8] මෝඩකමට
වඩා ප්‍රඥාව ප්‍රයෝජනවත් වන බව
මම වටහාගතිමි.[9]

**14** ප්‍රඥාවන්තයා තමන් යන මඟ
හොඳින් දකියි.[10] එහෙත් මෝඩයා
ඇවිදින්නේ අන්ධකාරයේය.[11] කෙසේ-
නමුත්, ඒ සියලුදෙනාටම අවසාන-
යේදී සිදු වන්නේ එකම දේ බව මම
තේරුම්ගත්තෙමි.[12] **15** එවිට මම
මටම මෙසේ කියාගතිමි.[13] “අවසාන-
යේදී මට සිදු වන්නෙත්[14] මෝඩයාට
සිදු වන දේමයි.”[15] එසේනම්, මෙත-
රම් ප්‍රඥාවක් ඇතුව සිටීමෙන් මට
ඇති ප්‍රයෝජනය කුමක්ද?[16] “එයින්ද
කිසි පලක් නැත” යයි මම සිතුවෙමි.
**16** කල් යත්ම, මෝඩයාව වගේම
ප්‍රඥාවන්තයාවද මිනිසුන්ගේ මතක-
යෙන් පහ වනු ඇත.[17] පසු කලෙකදී

**2 පරි.**
**1** දේශ 3:17, ලූක් 12:19
**2** නික් 32:6, 1කොරි 10:7
**3** දේශ 7:4
**4** හිතෝ 14:13, දේශ 7:6
**5** යෙසා 22:13
**6** ගීතා 104:15, දේශ 10:19
**7** හිතෝ 31:4, දේශ 1:17, එෆි 5:18
**8** උත් 47:9, යෝබ් 14:1, ගීතා 90:10
**9** 1රාජා 7:8, 1රාජා 9:17, 2ලේක 9:15
**10** ද්වි 8:12, 1රාජා 7:1, ගීතා 49:11
**11** 1රාජා 4:25, සල 8:11
**12** සල 4:6, යෙරෙ 39:4
**13** ගීතා 1:3, යෙරෙ 17:8
**14** නෙහෙ 2:14, සල 7:4
**15** 1සාමු 8:13, 1රාජා 9:22
**16** උත් 14:14, උත් 15:3, උත් 17:12, එස්රා 2:58
**17** 1රාජා 4:23
**18** 1රාජා 9:14, 1රාජා 9:28, 1රාජා 10:10, 2ලේක 1:15, 2ලේක 9:13
**19** 1රාජා 9:19, 1රාජා 10:15
**20** 2සාමු 19:35
**21** සල 7:6
**22** 1රාජා 11:3, සල 6:8
**23** 1රාජා 3:13, 1රාජා 10:23
**24** දේශ 2:3
**25** හිතෝ 23:5, හිතෝ 27:20, දේශ 11:9, 1යොහ 2:16

**2 තීරුව**
**1** ගීතා 128:2, දේශ 5:18
**2** දේශ 3:22, දේශ 9:9
**3** 1රාජා 7:1, දේශ 1:14
**4** ගීතා 49:10, දේශ 2:16
**5** දේශ 1:3, දේශ 2:17, මතෙ 16:26, 1තිමෝ 6:7
**6** 1කොරි 3:19

**7** දේශ 1:17; දේශ 7:25; **8** යෙසා 5:20; **9** හිතෝ 4:7; දේශ 7:12; **10** හිතෝ 4:25; හිතෝ 14:8; හිතෝ 23:26; **11** හිතෝ 17:24; යොහ 3:19; 1යොහ 2:11; **12** දේශ 3:19; දේශ 9:2; දේශ 9:11; **13** ගීතා 15:2; දේශ 1:16; දේශ 3:17; **14** 1රාජා 11:43; ගීතා 49:10; **15** හිතෝ 10:23; හිතෝ 23:9; **16** 1රාජා 3:12; දේශ 1:18; ලූක් 11:31; **17** නික් 1:8; ගීතා 103:16; දේශ 1:11.

සියලුදෙනාවම මතකයෙන් බොඳ වී
යන්නේය. ප්‍රඥාවන්තයෙකු මිය යන්-
නේ කෙසේද? මෝඩයෙකු මිය යන
ආකාරයටමය.[1]
**17** මට ජීවිතය එපා විය.[2] මන්ද
ඉර යට කරන සෑම දෙයකින්ම අත්
වන්නේ දුක් කරදර පමණි.[3] ඒ සියල්ල
නිෂ්ඵලය. සුළඟ පසුපස හඹා යන්-
නාක් මෙනි.[4] **18** ඉර යට මා වෙ-
හෙස මහන්සි වී කළ සියලු වැඩ ගැන[5]
මම බොහෝ සෙයින් පසුතැවුණෙමි.
මන්ද මගෙන් පසුව වෙනත් මිනි-
සෙකු ඇවිත් ඒ සියල්ල භුක්ති විඳියි.[6]
**19** එහෙත් ඔහු ප්‍රඥාවන්තයෙකු වේ-
විද නැතහොත් මෝඩයෙකු වේවිද
කියා පැවසිය හැක්කේ කාටද?[7] ඔහු
කෙබඳු කෙනෙකු වුවද මගේ දැනේ
උත්සාහයෙන් හා ප්‍රඥාවෙන් ලබාගත්
සියල්ල හිමි වන්නේ ඔහුටයි.[8] මෙ-
යද මහා නිෂ්ඵලකමකි. **20** එබැවින්
මම වෙහෙස මහන්සි වී ඉර යට
කළ සියලු වැඩ ගැන සිතා කලකි-
රුණෙමි.[9] **21** මන්ද මිනිසෙකු තම
ප්‍රඥාවද දැනුමද දක්ෂතාද යොදාගනි-
මින් වෙහෙස මහන්සි වී වැඩක නිරත
වුණත්[10] එයින් ප්‍රතිඵල භුක්ති විඳින්-
නේ ඒ වෙනුවෙන් කිසි උත්සාහයක්
නොදැරූ අයෙකි.[11] මෙයද මහා නිෂ්-
ඵලකමක් මෙන්ම දුකකි.[12]
**22** මිනිසෙකු ඉර යට වෙහෙස
මහන්සි වී කරන සියලු වැඩවලටත්
ඔහුගේ අවංක උත්සාහයටත් ඔහුට
ලැබෙන්නේ කුමක්ද?[13] **23** ඔහුගේ
ජීවිත කාලය පුරාවටම ඔහු කරන
සියලු වැඩවලින් ඔහුට ලැබෙන්නේ
දුක් කරදර පමණි.[14] රාත්‍රියේවත් ඔහු-
ගේ සිතට කිසි විවේකයක් ලැබෙන්-
නේ නැත.[15] මෙයද නිෂ්ඵලකමකි.
**24** මිනිසෙකු තමන් වෙහෙස
මහන්සි වී උපයාගත් දේ භුක්ති විඳ,
කා බී සතුටින් සිටීම තරම් සැහීම
ගෙන දෙන දෙයක් මා දැක නැත.[16]
එය සැබෑ දෙවිගෙන් ලද ආශීර්-
වාදයකි.[17] මමද එය අද්දුටුවෙමි.
**25** මන්ද මට වඩා හොඳ කෑම[18] බීම
ඇත්තේ වෙන කාටද?[19]

**2 පරි.**
**1** දේශ 6:8 රෝම 5:12 හෙබ්‍රෙ 9:27
**2** ගණන් 11:15 1රාජා 19:4 යෝබ් 7:6 යෙරෙ 20:18 යෝනා 4:3 රෝම 8:20
**3** දේශ 1:14 දේශ 2:21
**4** දේශ 5:16
**5** දේශ 2:4 දේශ 5:18 දේශ 9:9
**6** 1රාජා 11:43 ගීතා 17:14 ගීතා 39:6 ලූක් 12:20
**7** 1රාජා 12:8 2ලේක 10:13 2ලේක 12:9
**8** 1රාජා 7:2
**9** 1සාමු 27:1
**10** 1රාජා 4:30 2ලේක 1:12
**11** 2ලේක 9:31 දේශ 2:18 දේශ 5:15
**12** දේශ 5:16
**13** ගීතා 127:2 දේශ 1:3 දේශ 3:9 දේශ 4:8
**14** උත් 47:9 යෝබ් 14:1
**15** උත් 31:40 දානි 6:18 ලූක් 12:29
**16** ද්වි 12:18 ද්වි 20:6 දේශ 3:22 දේශ 5:18 දේශ 8:15 ක්‍රියා 14:17
**17** ගීතා 145:16 දේශ 3:13 දේශ 5:19
**18** 1රාජා 4:7 1රාජා 4:22
**19** 1රාජා 10:5 1රාජා 10:21

**2 තීරුව**
**1** උත් 7:1 1සාමු 18:14 2ලේක 31:20 හිතෝ 3:32 යෙසා 3:10 ලූක් 1:6
**2** හිතෝ 2:6
**3** ද්වි 6:11 යෝබ් 27:17 හිතෝ 13:22 හිතෝ 28:8
**4** දේශ 2:11

**26** දෙවි තමා ඉදිරියේ යහපත්ව
හැසිරෙන[1] මිනිසාට ප්‍රඥාවද දැන-
ගැන්මද ප්‍රීතියද ලබා දෙයි.[2] එහෙත්
පව්කාරයා වෙහෙස මහන්සි වී වැඩ
කළත් අවසානයේදී ඔහුට සිදු වන්-
නේ, තමා රැස් කරගත් දේ සැබෑ දෙවි
ඉදිරියේ යහපත්ව හැසිරෙන තැනැත්-
තාට දීමටයි.[3] මෙයද සුළඟ පසුපස
හඹා යන්නාක් මෙන් වූ නිෂ්ඵල වැය-
මකි.[4]

**3** අහස යට සිදු වන සෑම දෙය-
කටම නියමිත කාලයක්
ඇත.[5] **2** ඉපදීමට කාලයක්ද[6] මිය
යෑමට කාලයක්ද[7] සිටුවන්න කාල-
යක්ද උදුරා දමන්න කාලයක්ද,[8]
**3** මරන්න කාලයක්ද[9] සුව කරන්න
කාලයක්ද[10] කඩා දමන්න කාලයක්ද
ගොඩනඟන්න කාලයක්ද ඇත.[11]
**4** අඬන්න කාලයක්ද[12] සිනාසෙන්න
කාලයක්ද[13] වැලපීමට කාලයක්ද[14]
නටන්න කාලයක්ද,[15] **5** ගල් විසි
කරන්න කාලයක්ද[16] ගල් එකතු
කරන්න කාලයක්ද[17] වැළඳගැනී-
මට කාලයක්ද[18] වැළඳ නොගැනීමට
කාලයක්ද තිබේ.[19] **6** සොයන්න
කාලයක්ද[20] සෙවීම අත්හැර දැමීමට
කාලයක්ද යමක් සුරකිව තබාගැනී-
මට කාලයක්ද ඉවත දැමීමට කාල-
යක්ද,[21] **7** ඉරා දමන්න කාලයක්ද[22]
මහන්න කාලයක්ද[23] නිහඬව සිටීමට
කාලයක්ද[24] කතා කිරීමට කාලයක්ද
ඇත.[25] **8** ප්‍රේම කිරීමට කාලයක්ද
වෛර කිරීමට කාලයක්ද[26] යුද්ධ-
යට කාලයක්ද[27] සමාදානයට කාල-
යක්ද ඇත.[28] **9** එසේනම්, වෙහෙස

---

**3 පරි.** **5** 2රාජා 5:26; හිතෝ 15:23; දේශ 3:17; **6** උත් 1:28; **7** ද්වි 34:5; යෝබ් 14:5; යොහ 7:8; **8** යෙරෙ 1:10; **9** ගණන් 31:2; යෙරෙ 48:10; එස 9:6; **10** යෙරෙ 33:6; හොෂෙ 6:1; එළි 22:2; **11** යෙසා 44:28; යෙසා 65:21; යෙරෙ 31:28; දානි 9:25; **12** යොහ 16:20; රෝම 12:15; 2කොරි 7:11; යාකො 4:9; **13** ගීතා 126:2; **14** උත් 23:2; යෙරෙ 25:34; **15** නික් 15:20; 2සාමු 6:16; **16** 2රාජා 3:25; මතෙ 24:2; **17** යොෂු 10:27; 1රාජා 6:7; **18** උත් 29:13; උත් 33:4; උත් 48:10; 2රාජා 4:16; **19** නික් 19:15; හිතෝ 5:20; ලූක් 10:4; **20** නික් 12:35; ලූක් 15:8; **21** යෙසා 2:20; යෝනා 1:5; **22** 2සාමු 3:31; 2සාමු 13:19; **23** නික් 26:1; නික් 35:35; **24** ගීතා 39:1; හිතෝ 9:8; යෙසා 53:7; **25** 1සාමු 19:4; 1සාමු 25:24; එස්ත 4:14; ගීතා 145:11; **26** ගීතා 139:21; රෝම 12:9; **27** යෝවෙ 3:9; **28** 1රාජා 4:24; ගීතා 37:11; යෙසා 2:4.

මහන්සි වී වැඩ කරන්නාගේ උත්සාහ-
යෙන් ලැබෙන ප්‍රයෝජනය කුමක්ද?[1]
**10** දෙවි මිනිසාට දුන් ජීවිතය ගැන
මම හොඳ අවබෝධයක් ලබාගතිමි.[2]
**11** ඔහු සෑම දෙයක්ම නියමිත කාල-
යට, පිළිවෙළට සකස් කරයි.[3] ඔහු
සදාකල් ජීවත් වීමේ ආශාව මිනිසාගේ
සිතෙහි තබා ඇත.[4] එහෙත් සැබෑ
දෙවි කළ සෑම ක්‍රියාවක්ම තේරුම්ගැ-
නීමට මිනිසා කිසිදා සමත් වන්නේ
නැත.[5] **12** ජීවිත කාලය පුරාම යහ-
පත කර සතුටු සිතින් සිටීම තරම්
හොඳ දෙයක් නැති බව මම තේරුම්-
ගත්තෙමි.[6] **13** මිනිසා තමන් වෙ-
හෙස මහන්සි වී උපයාගත් දේ භුක්ති
විඳ, කා බී සතුටින් සිටීමත් ඉතා
යහපත් දෙයකි.[7] එය දෙවිගෙන් ලද
ආශීර්වාදයකි.[8]

**14** සැබෑ දෙවි සෑදූ සෑම දෙ-
යක්ම සදහටම පවතිනු ඇත.[9] ඒවාට
කිසිවක් එකතු කරන්නවත් ඒවායින්
කිසිවක් අඩු කරන්නවත් නොහැක.[10]
සැබෑ දෙවි ඒ සියල්ල සෑදුවේ[11] මිනි-
සාට ඔහු කෙරෙහි ගරුබියක් ඇති වන
පිණිසය.[12]

**15** දැන් සිදු වන දේ කලිනුත් සිදු
වී තිබේ. මින් ඉදිරියට සිදු වන්නෙත්
සැමදා සිදු වන දේමය.[13] එහෙත් සැබෑ
දෙවි[14] පීඩා විඳින අයට යහපත කිරී-
මට බලා සිටින්නේය.[15]

**16** ඉර යට සිදු වන තවත් දෙ-
යක් මම දුටුවෙමි. යුක්තිය ඉටු විය
යුතු තැන දුෂ්ටකම් සිදු වන බවත්
ධර්මිෂ්ඨකම් වෙනුවට අධර්මිෂ්ඨ-
කම් සිදු වන බවත් මට පෙනුණි.[16]
**17** "සෑම කාරණයක් සඳහාද සෑම
ක්‍රියාවක් සඳහාද නියමිත කාලයක්
ඇත.[17] එමනිසා, සැබෑ දෙවි නියමිත
කාලයේදී ධර්මිෂ්ඨයාවත් දුෂ්ටයාවත්
විනිශ්චය කරනු ඇත"[18] යයි මම සිතු-
වෙමි.[19]

**18** සැබෑ දෙවි මනුෂ්‍යයන්ව සෝ-
දිසි කර බලයි. ඒ නිසා, අවසානයේදී
සතුන් හා තමන් අතර කිසි වෙනසක්
නැති බව ඔවුහු තේරුම්ගනු ඇත.[20]
**19** මන්ද අවසානයේදී මනුෂ්‍යයන්-
ටත් සිදු වන්නේ සතුන්ට සිදු වන දේ-
මය.[1] මිනිසා මිය යන්නේ සතුන් මිය
යන ආකාරයටමය.[2] ඒ දෙපිරිසවම
ජීවත් කරවන්නේ එකම බලයෙන්[3]
වන නිසා සතුන් හා මිනිසා අතර
වෙනසක් නැත. සියල්ල නිෂ්ඵලය.
**20** සියල්ලෝම යන්නේ එකම තැන-
ටය.[4] සියල්ලෝ දූවිල්ලෙන්ය.[5] සියල්-
ලෝ දූවිල්ලටම හැරී යන්නෝය.[6]
**21** මනුෂ්‍යයන්ව ජීවත් කරවන බලය
ඉහළට යනවාද කියාවත් සතුන්ව
ජීවත් කරවන බලය පොළොව දෙ-
සට යනවාද කියාවත් දන්නේ කවුද?[7]
**22** මිනිසා තමා කරන සෑම වැඩ-
කින්ම තෘප්තියට පත් වීම තරම්
හොඳ දෙයක් නැත. එය තමාගේ
උත්සාහයට ලැබෙන ආශීර්වාදයකි.[8]
මන්ද ඔහු මිය ගිය පසු සිදු වූ දේවල්
පෙන්වීමට ඔහුව නැවත ජීවත් කර-
වන්න පුළුවන් කාටද?[9]

**4** ඉර යට සිදු වන සියලු අසා-
ධාරණකම් ගැන මම නැවත
කල්පනා කර බැලුවෙමි.[10] පීඩාවට
ලක්වූවන්ගේ කඳුළු දුටිමි.[11] එහෙත්
ඔවුන්ව සනසන්න කිසිවෙක් සිටියේ
නැත.[12] ඔවුන්ට පීඩා කළ අය ඔවුන්ට
වඩා බලවත් වූහ. එබැවින් ඔවුන්ව
සනසන්න කිසිවෙක් සිටියේ නැත.
**2** මිය ගිය අය ගැන මම සතුටු
වුණෙමි. මන්ද ජීවත් වීමට වඩා මිය
යෑම හොඳයයි මට සිතුණි.[13] **3** මෙ-
ලොවට ඉපදී ඉර යට සිදු වන සියලු
දුක් කරදර[14] ඇස් දෙකෙන් දකිනවාට
වඩා ඉපදුණේ නැත්නම් හොඳය.[15]

**4** මිනිසා තුළ ඇති තරඟකාරී ස්ව-
භාවය[16] නිසා ඔහු වෙහෙස මහන්සි
වී වැඩ කරන ආකාරයත්[17] ඔවුන්ගේ
දක්ෂතා වැඩි දියුණු කරගන්නා ආකා-
රයත් මම දුටිමි. මෙයද සුළඟ පසුපස

**3 පරි.**
**1** දේශ 1:3; දේශ 5:16
**2** දේශ 2:26
**3** උත් 1:31; දේශ 7:29; මාක් 7:37; රෝම 1:20
**4** 2පේතෘ 3:18; යූද් 25
**5** උත් 1:1; යෝබ් 11:7
**6** ගීතා 37:3; යෙසා 64:5; 1තෙස 5:15; 1තිමෝ 6:18
**7** ද්වි 20:6; ගීතා 128:2; දේශ 5:18; යෙසා 65:22
**8** දේශ 5:19
**9** ගීතා 119:90; එෆී 3:11
**10** හිතෝ 30:6; එළි 22:18
**11** ද්වි 32:4
**12** ගීතා 64:9; යෙසා 59:19; යෙරෙ 10:7; එළි 15:4
**13** දේශ 1:9
**14** ගීතා 83:18
**15** ගීතා 141:9; ගීතා 142:6; රෝම 8:28
**16** 1රාජා 21:10; ගීතා 82:2; ගීතා 94:21; යෙසා 59:14; මීකා 7:3; මතෙ 26:59
**17** එළි 11:18; එළි 20:3
**18** දේශ 12:14; මතෙ 25:32; යොහ 5:29; ක්‍රියා 17:31; රෝම 2:6; 2කොරි 5:10
**19** දේශ 1:16
**20** උත් 3:19; යෝබ් 14:1; ගීතා 49:20; ගීතා 73:22; 2පේතෘ 2:12

**2 තීරුව**
**1** යෝබ් 14:10; ගීතා 39:5; ගීතා 49:12
**2** ගීතා 89:48
**3** උත් 7:22; ගණන් 27:16; ගීතා 104:29; දේශ 12:7
**4** දේශ 9:10
**5** උත් 2:7

---

**6** උත් 3:19; යෝබ් 10:9; යෝබ් 34:15; ගීතා 104:29; දේශ 12:7; ආනි 12:2; **7** ගීතා 146:4; දේශ 3:19; දේශ 9:10; **8** ද්වි 12:7; දේශ 5:18; **9** යෝබ් 14:21; දේශ 6:12; දේශ 10:14; **4 පරි.** **10** යෝබ් 35:9; ආමො 4:1; මීකා 2:2; **11** ගීතා 42:9; ගීතා 102:9; යාකො 5:4; **12** ගීතා 69:20; ගීතා 142:4; 2තිමෝ 4:16; **13** යෝබ් 3:17; දේශ 2:17; **14** ගීතා 55:9; දේශ 1:14; යෙරෙ 9:3; හොෂෙ 4:2; **15** යෙරෙ 20:18; ලූක් 23:29; **16** උත් 4:5; මතෙ 27:18; ගලා 5:26; යාකො 4:5; 1යොහ 3:12; **17** දේශ 2:21.

හඹා යන්නාක් මෙන් වූ නිෂ්ඵල
වැයමකි.
**5** මෝඩයා නිකරුණේ අත් දෙක
බැඳගෙන[1] සිටින නිසා ඔහු තමාගේම
ජීවිතයට හානි කරගනියි.[2]
**6** වෙහෙස මහන්සි වී බොහෝ වේ-
ලාවක් වැඩ කරමින් සුළඟ පසුපස
හඹා යනවාට වඩා සුළු විවේකයක්
ගැනීම හොඳය.[3]
**7** ඉර යට කෙරෙන සියලුම නිෂ්-
ඵල දේවල් ගැන මම නැවතත්
කල්පනා කළෙමි. **8** එක මිත්‍රයෙ-
කුවත් නොමැති මිනිසෙක් සිටියි.[4]
ඔහුට පුත්‍රයෙකුවත් සහෝදරයෙකු-
වත් නැති[5] නමුත් ඔහු වෙහෙස
මහන්සි වී කරන වැඩවලින් නම්
නිමක් නැත. ඔහු වස්තු සම්භාරයක්
රැස් කරගෙන සිටියත් එයින් සෑහීමට
පත් නොවෙයි.[6] “මා වෙහෙස මහන්සි
වී වැඩ කරන්නේ කා වෙනුවෙන්ද? මා
ජීවිතයේ හොඳ දේවල් අහිමි කර-
ගන්නේ කුමක් නිසාද”[7] කියා ඔහු
කල්පනා කරයි. ඔහු දරන වැයම
කලකිරෙනසුලුය. එය නිෂ්ඵලය.[8]
**9** එක් කෙනෙකුට වඩා දෙදෙ-
නෙකු හොඳය.[9] මන්ද ඔවුන් දෙ-
දෙනා වෙහෙස මහන්සි වී එකට
වැඩ කරන විට ඉන් හොඳ ප්‍රතිඵල
ලැබේ.[10] **10** ඔවුන්ගෙන් එක් කෙ-
නෙකු වැටුණොත් අනික් තැනැත්තා
ඔහුව නැඟිටුවයි.[11] එහෙත් තනිව
සිටින කෙනෙකු වැටුණොත් ඔහුට
කුමක් සිදු වෙයිද?[12]
**11** එමෙන්ම දෙදෙනෙකු එකට
සැතපුණොත් ඔවුන්ට උණුසුම
ලැබේ. එහෙත් තනිව සිටින කෙ-
නෙකු උණුසුම ලබන්නේ කෙසේද?[13]
**12** තනිව සිටින කෙනෙකුව පැරදවීම
සතුරෙකුට අපහසු දෙයක් නොවේ.
එහෙත් ඔහුට විරුද්ධව නැඟී සිටී-
මට දෙදෙනෙකුට පුළුවන.[14] එමෙන්ම
තුන්පට ලණුවක් පහසුවෙන් දෙකට
කැඩිය නොහැක.
**13** උපදෙස් පිළි නොගන්නාවූ[15]
මෝඩ මහලු රජෙකුට වඩා[16] බුද්-
ධිමත් දිළිඳු තරුණයෙකු හොඳය.[17]
**14** මන්ද ඒ රජුගේ පාලන සමයේදී
දුප්පතෙකු ලෙස ඉපදුණත් එම තරු-
ණයා දියුණු වෙයි.[1] සිරගතව සිටියත්
ඔහු නිදහස් වී රජකමට පත් වනු
ඇත.[2] **15** ඉර යට ජීවත් වන සිය-
ලුදෙනාට මෙන්ම අලුතින් රජකමට
පත් වන එවැනි තරුණයෙකුට සිදු
වන දේද මම දුටිමි.[3] **16** බොහෝ-
දෙනෙකු ඔහුගේ පැත්ත ගෙන සිටි-
යත්[4] පසු කලෙක ඔහුගේ පාලනය
ගැන ඔවුහු සෑහීමට පත් නොවෙති.[5]
මෙයද ඉතා නිෂ්ඵල දෙයකි. එය
සුළඟ පසුපස හඹා යන්නාක් මෙන්
වන්නේය.[6]

**5** ඔබ සැබෑ දෙවිගේ ගෘහයට
යන විට කල්පනාකාරීව
හැසිරෙන්න.[7] එතැනට ගොස් අඥාන-
යෙකු මෙන් පූජා ඔප්පු කරනවා වෙ-
නුවට[8] උපදෙස්වලට හොඳින් සවන්
දෙන්න.[9] මන්ද අඥානයෙක් තමා
දුෂ්ට මාර්ගයක ගමන් කරන බව
වටහා නොගෙන පූජා ඔප්පු කරයි.[10]
**2** කතා කිරීමට ඉක්මන් නො-
වන්න. සැබෑ දෙවි සමඟ කතා කිරීමට
පෙර[11] හොඳින් සිතා බලන්න.[12] සැබෑ
දෙවි සිටින්නේ ස්වර්ගයේ[13] කියාත්
ඔබ සිටින්නේ පොළොවේ කියාත්
අමතක නොකරන්න. ඔබ පමණට
වඩා කතා නොකළ යුත්තේ ඒ
නිසාය.[14] **3** වුවමනාවට වඩා යමක්
ගැන සිතීම නිසා සිහින පවා පෙ-
නිය හැක.[15] එලෙසම, නොර-
තෝංචියක් නැතුව කතා කරන විට
මෝඩ වචන පිට විය හැකිය.[16]
**4** ඔබ දෙවිට පොරොන්දුවක් දුන්
විට එය ඉටු කිරීමට ප්‍රමාද නො-
විය යුතුය.[17] මන්ද අඥාන කෙනෙකුට
කිසිවෙක් කැමති නැත.[18] එබැවින්
ඔබ යමක් පොරොන්දු වුවහොත් එය
ඉටු කරන්න.[19] **5** ඔබ පොරොන්දු-
වක්[20] දී එය ඉටු නොකරනවාට වඩා

**15** මතෙ 6:25; මතෙ 6:34; ලූක් 12:18; **16** හිතෝ 10:19; හිතෝ 15:2; දේශ 10:14; **17** ද්වි 23:21; ගීතා 50:14; ගීතා 76:11; යෙසා 19:21; මතෙ 5:33; **18** දේශ 10:12; **19** ගණන් 30:2; ගීතා 66:13; ගීතා 116:18; යෝනා 2:9; **20** ද්වි 23:22.

**4 පරි.**
**1** හිතෝ 6:10 හිතෝ 20:4 හිතෝ 24:33 එෆී 4:28
**2** හිතෝ 6:11
**3** ගීතා 37:16 හිතෝ 15:16 හිතෝ 16:8 හිතෝ 17:1
**4** උත් 2:18
**5** උත් 15:2 ගණන් 27:10
**6** හිතෝ 27:20 දේශ 5:10
**7** ගීතා 39:6 ලූක් 12:19
**8** දේශ 2:23
**9** උත් 2:18 1සාමු 23:16 හිතෝ 27:17 ක්‍රියා 13:2
**10** යොහ 4:36
**11** යෝබ් 4:4 ගලා 6:1
**12** 1සාමු 23:16
**13** 1රාජා 1:2
**14** 1සාමු 14:7
**15** 1රාජා 22:8 2ලේක 25:16
**16** හිතෝ 28:16
**17** හිතෝ 19:1 හිතෝ 28:6 දේශ 9:15

**2 තීරුව**
**1** 2සාමු 7:8 යෝබ් 5:11 ගීතා 113:8
**2** උත් 41:14 උත් 41:40
**3** 1රාජා 3:7 2රාජා 21:24
**4** 1රාජා 1:40
**5** 2සාමු 20:1 1රාජා 12:4
**6** දේශ 2:11

**5 පරි.**
**7** ගීතා 15:2
**8** 1සාමු 13:12 1සාමු 15:22 හිතෝ 21:27 යෙසා 1:13 හොෂෙ 6:6
**9** ද්වි 31:12 ක්‍රියා 17:11 යාකො 1:19
**10** හිතෝ 30:20 යෙරෙ 6:15
**11** ගණන් 30:2 ගණන් 30:5 1සාමු 14:24
**12** හිතෝ 10:13
**13** 2ලේක 16:9 ගීතා 11:4 මතෙ 6:9
**14** හිතෝ 10:19 දේශ 3:7 මතෙ 6:7

පොරොන්දු නොවී සිටීම හොඳය.[1]
**6** ඔබව පාපයට හසු කිරීමට ඔබේ
දිවට ඉඩ නොදෙන්න.[2] එය වැරදීම-
කින් දුන් පොරොන්දුවක්යයි[3] දේවදූ-
තයා ඉදිරියේ නොකියන්න.[4] මන්ද
ඔබ එසේ පැවසුවොත් සැබෑ දෙවි
ඔබ සමඟ උදහස් වන අතර ඔබ
කළ සියලු වැඩ අසාර්ථක වනු ඇත.[5]
**7** මන්ද වුවමනාවට වඩා යමක් ගැන
සිතීම නිසා සිහින දකින්නාක් මෙන්[6]
පමණට වඩා කතා කිරීමෙන් නිෂ්ඵල
වචන පිට වෙයි. එබැවින් සැබෑ දෙවි
කෙරෙහි ගරුබියක් ඇතුව සිටින්න.[7]

**8** යම් දේශයක සිටින නිලධා-
රීන් දුප්පතුන්ට පීඩා කරන බව හෝ
ඔවුන් බලහත්කාරයෙන් යුක්තිය පෙ-
රළා අධර්මිෂ්ඨකම් කරන බව[8] හෝ
ඔබ දකින්නෙහි නම් ඒ ගැන පුදුම
නොවන්න.[9] ඔවුන්ටත්[10] වඩා බලවත්
අධිපතීන් සිටින බවත් ඒ සියලුදෙනා-
ටම වඩා බලවත් තැනැත්තෙකු බලා
සිටින[11] බවත් මතක තබාගන්න.

**9** භූමියේ පලදාව සියලුදෙනාගේම
ප්‍රයෝජනය සඳහාය.[12] රජෙකුට පවා
අවශ්‍ය දේ ලබාගැනීමට නම් ඔහුගේ
කෙත්වතුවල වගා කළ යුතුය.[13]

**10** රිදීවලට ඇලුම් වන්නාට රිදී
ලැබුණත් ඔහු එයින් සෑහීමට පත්
නොවෙයි. ධනයට ඇලුම් වන්නාද
තමා කොපමණ ආදායමක් ලැබුවත්
එයින් සෑහීමට පත් නොවෙයි.[14] මෙ-
යද මහා නිෂ්ඵලකමකි.[15]

**11** වස්තුව බහුලව තිබෙන තැන
ඒවා භුක්ති විඳින අයද බොහෝය.[16]
ඒ වස්තුව හිමි තැනැත්තාට ඒ දෙස
බලා සිටිනවා හැර එයින් ඇති ප්‍රයෝ-
ජනය කුමක්ද?[17]

**12** සේවකයෙකුට ස්වල්පයක්
කන්න තිබුණත් බොහොමයක්
කන්න තිබුණත් ඔහුගේ නින්ද මිහි-
රිය.[18] එහෙත් තමා සතු වස්තු සම්භා-
රය නිසා ධනවතාට නින්ද නොයයි.

**13** ධනවතෙකු ලෝභකමින් තම
වස්තුව රැස් කර තබාගනිමින් තමා-
ටම හානි පමුණුවාගත් ආකාරය මම
දුටුවෙමි.[1] එය ඉර යට සිදු වන
මහත් විපතකි. **14** මන්ද යම් හානි-
කර කටයුත්තක් නිසා ඔහු රැස් කර-
ගත් සියල්ල මොහොතකින් විනාශ වී
ගියේය.[2] පසු කලෙක ඔහුට පුතෙකු
ලැබුණත් ඔහුට උරුමයක් ලෙස දීමට
කිසිවක් ඉතුරුව නොතිබිණ.[3]

**15** යමෙක් මිනී වළට යන්නේ
මව්කුසෙන් නික්ම ආ ලෙසින්මය.[4]
ඔහු වෙහෙස මහන්සි වී කොයි තරම්
දේවල් උපයාගත්තද මිය යන විට
ඒ කිසිවක් ගෙන යැමට ඔහුට නො-
හැක.[5]

**16** ඔහු මව්කුසෙන් නික්ම ආ ලෙ-
සම මිය යන්නේය. එසේනම්, සුළං
රොදක් පසුපස හඹා යමින් මහත්
සේ වෙහෙසීමෙන් ඇති ප්‍රයෝජනය
කුමක්ද?[6] මෙයද මහත් විපතකි.
**17** ඔහුගේ ජීවිත කාලය පුරාම ඔහු
අඳුරේ සිට අකමැත්තෙන් කෑම කන්-
නේය.[7] ඔහු අසනීප වී මහත් සේ
කෝපයෙන් සිටියි.

**18** මිනිසෙකු තමන් වෙහෙස
මහන්සි වී උපයාගත් දේ භුක්ති විඳ,
කා බී සතුටින් සිටීම තරම් සෑහීම
ගෙන දෙන දෙයක් මම දැක නැත.[8]
සැබෑ දෙවි ඔහුට ජීවත් වීමට දුන්
කාලය පුරාම ඔහු දැරූ උත්සාහයට
ලැබෙන ප්‍රතිඵලය එයයි. **19** මිනි-
සෙකුට සැබෑ දෙවිගේ ආශීර්වාදයෙන්
තමාට ලැබී තිබෙන ධනය හා දේ-
පළ ගැනද[9] තමා වෙහෙස මහන්සි වී
කරන වැඩ ගැනද තමාට හිමි කො-
ටස ගැනද සෑහීමට පත් වී,[10] කා බී
සතුටින් සිටිය හැකි නම්[11] එයද දෙවි-
ගෙන් ලද ආශීර්වාදයකි.[12] **20** ඔහු
ජීවත් වන කෙටි කාලය පුරා ඔහු අද්-
දකින අසීරුතා ගැන කල්පනා කරන්-
නේ කලාතුරකිනි. මන්ද සැබෑ දෙවි
ඔහුට සතුටු සිතින් ජීවත් වීමට ඉඩ
සලසා ඇත.[13]

**5 පරි.**
**1** හිතෝ 20:25
**2** විනි 11:35
යාකො 1:26
**3** ලෙවී 5:4
**4** මතෙ 18:10
ලූක් 1:18
**5** ගීතා 127:1
හග් 1:11
2යොහ 8
**6** දේශ 5:3
**7** ගීතා 33:8
හිතෝ 23:17
දේශ 7:18
දේශ 12:13
යෙසා 50:10
**8** හිතෝ 17:23
හිතෝ 31:5
දේශ 3:16
යාකො 5:4
**9** 1රාජා 21:19
මලා 3:5
**10** නික් 18:25
1සාමු 22:7
ආනි 3:2
**11** උත් 41:40
එස්ත 5:11
ආනි 5:16
**12** උත් 1:29
ගීතා 104:14
හිතෝ 28:19
**13** 1සාමු 8:12
1රාජා 4:7
1රාජා 21:2
2ලේක 26:10
සල 8:12
**14** දේශ 4:8
මතෙ 6:24
ලූක් 12:15
1තිමෝ 6:10
**15** දේශ 2:11
**16** 1රාජා 4:22
නෙහෙ 5:17
නෙහෙ 5:18
එස්ත 1:5
**17** යොෂු 7:21
එස්ත 5:11
හිතෝ 23:5
1යොහ 2:16
**18** ගීතා 4:8
හිතෝ 3:24
යෙරෙ 31:26
මතෙ 6:25

**2 තීරුව**
**1** හිතෝ 1:19
හිතෝ 11:24
හිතෝ 11:28
ලූක් 12:21
යාකො 5:3
**2** 1රාජා 14:26
යෝබ් 27:17
ගීතා 39:6
හිතෝ 23:5
මතෙ 6:19
**3** ගීතා 109:10
**4** යෝබ් 1:21
**5** ගීතා 49:17
ලූක් 12:20
1තිමෝ 6:7

**6** හොෂෙ 8:7; මතෙ 16:26; මාක් 8:36; යොහ 6:27; **7** එෆී 5:5; 1තිමෝ 6:10; **8** 1රාජා 4:20; දේශ 2:24; දේශ 3:13; දේශ 3:22; යෙසා 65:22; **9** උත් 31:9; ද්වි 6:11; 1රාජා 3:13; යෝබ් 42:12; 1තිමෝ 6:17; **10** යොහ 4:36; **11** ද්වි 8:10; දේශ 2:24; **12** දේශ 3:13; යාකො 1:17; **13** ද්වි 28:8; ගීතා 4:7; යෙසා 65:22.

**6** ඉර යට සිදු වන තවත් විපතක්
මම දුටිමි. එය මිනිසා අතරේ
නිතර නිතර දක්නට ලැබෙන දෙයකි.
**2** සැබෑ දෙව් මිනිසෙකුට වස්තුවද දේ-
පළද ගෞරවයද[1] තමා ආශා කරන
සියල්ලද ලබාගැනීමට ඉඩ සලසා
තිබුණත්[2] ඒ කිසිවක් භුක්ති විඳී-
මට තරම් සැබෑ දෙවිගෙන් ආශීර්වාද
ඔහුට ලැබී නැත.[3] ඔහු හරියට දරුණු
රෝගයක් ඇති කෙනෙකු මෙනි. ඔහු
සතු දේ භුක්ති විඳින්නේ වෙනත් මිනි-
සෙකි.[4] මෙයද මහා නිෂ්ඵලකමකි.
**3** මිනිසෙකු බොහෝ කල් ජීවත් වී[5]
දරුදැරියන් සියදෙනෙකුව හදා වඩා
ගත්තද,[6] තෘප්තිමත් ජීවිතයක් ගත
කිරීමට නොහැකිව[7] ඔහු මැරෙන මො-
හොත එන තුරු බලා සිටින්නේ නම්*[8]
එයින් පලක් තිබේද? මෙලොව එළිය
දැකීමට නොලැබුණු බිළිඳෙකු ඔහුට
වඩා ආශීර්වාද ලද්දෙකි.[9] **4** මන්ද
ඔහු මව්කුසෙන් පිටතට ආවත් කිසි-
වක් නොදැක, කිසිවක් නොදැන අඳු-
රේම නික්ම යයි. කිසිවෙකු ඔහුව
හඳුනන්නේද නැත.[10] **5** ඔහු හිරු
එළිය දැක නැත. ඒ ගැන දන්නේවත්
නැත.[11] එහෙත් ජීවිතයේ කරදරවලින්
ඔහුට සහනයක් ලැබී ඇත.*[12] මහලු
තැනැත්තාට නම් සහනයක් නැත.
**6** මන්ද ඔහු අවුරුදු දෙදහසක් ජීවත්
වුවත් ඔහු ජීවිතය භුක්ති විඳින්නේ
නැත.[13] සියලුදෙනාම යන්නේ එකම
තැනට නොවේද?[14]

**7** මිනිසා වෙහෙස මහන්සි වී සෑම
දෙයක්ම කරන්නේ තමාගේම කුස
පුරවාගැනීමටය.[15] එහෙත් ඔවුහු
කිසිදා සෑහීමට පත් වන්නේ නැත.
**8** මෝඩයාට වඩා ප්‍රඥාවන්තයාට
ඇති වාසිය කුමක්ද?[16] පීඩාවට පත්වූ-
වන් අන් අය ඉදිරියේ හොඳ හැසිරීමක්
පැවැත්වූවත් එයින් ඇති ප්‍රයෝජනය
කුමක්ද? **9** ඉටු කරගත නොහැකි
ආශාවන් පසුපස හඹා යනවාට වඩා
තමා සතු දෙයින් සෑහීමට පත් වීම
හොඳය.[1] මන්ද එයත් සුළඟ පසුපස
හඹා යන්නාක් මෙන් වූ නිෂ්ඵල වැය-
මකි.[2]

**10** දැන් පවතින සෑම දෙයකටම
මුල සිටම නමක් දී ඇත. තවද මිනි-
සාගේ ස්වභාවය කුමක්ද කියා හෙළි වී
ඇත.[3] තමාට වඩා බලවත් තැනැත්-
තෙකු ඉදිරියේ තමා නිදොස් බව ඔප්පු
කර පෙන්වීමට මිනිසාට නොහැක.[4]

**11** නිෂ්ඵල වූ වැයම් බොහොමයක්
ඇත.[5] ඒ කිසිවකින් මිනිසාට ප්‍රයෝජ-
නයක් ඇද්ද? **12** මිනිසෙකුට තම
ජීවිත කාලය තුළ කළ හැකි හොඳම
දෙය කුමක්ද කියා කිව හැක්කේ
කාටද?[6] සෙවණැල්ලක් වැනි වූ ඔහු-
ගේ නිෂ්ඵල ජීවිතය අවසන් වෙයි.[7]
ඉන්පසුව ඉර යට කුමක් සිදු වේද
කියා පැවසිය හැක්කේ කාටද?[8]

**7** හොඳ නමක් අනර්ඝ තෙල්වලට
වඩා වටින්නේය.[9] උපන් දව-
සට වඩා මිය යන දවස හොඳය.[10]
**2** උත්සව ගෙදරට යෑමට වඩා මරණ
ගෙදරට යෑම හොඳය.[11] මන්ද අවසා-
නයේදී සෑම මිනිසෙකුම මිය යන බව
ජීවත්ව සිටින අය හොඳින් සිතට ගත
යුතුය. **3** සිනාසීමට වඩා දුකින්
සිටීම හොඳය.[12] මන්ද දුකක් දැනෙන
විට සිත ශක්තිමත් වෙයි.[13] **4** ප්‍රඥා-
වන්තයා මරණ ගෙදරට ගිය පසු ජීවි-
තය ගැන ගැඹුරින් කල්පනා කරයි.[14]
එහෙත් මෝඩයා නිතරම සිතන්නේ
විනෝද වීම ගැනයි.[15]

**5** මෝඩයෙකුගේ ගීතයකට
ඇහුම්කන් දෙනවාට වඩා[16] ප්‍රඥා-
වන්තයෙකුගේ තරවටුවට ඇහුම්කන්
දීම හොඳය.[17] **6** මන්ද මෝඩයාගේ
සිනහව ලිපේ දැවෙමින් තිබෙන කටු
දර පුපුරන ශබ්දය මෙනි.[18] එයද
ඉතා නිෂ්ඵල දෙයකි. **7** දුක් කරදර-
වලින් මිරිකී සිටින ප්‍රඥාවන්තයෙකු
පවා මෝඩයෙකු සේ හැසිරීමට ඉඩ

**6 පරි.**
1 2ලේක 2:11
2 ගීතා 17:14 ලූක් 12:19
3 2සාමු 19:35
4 හොෂෙ 7:9
5 ගීතා 73:4
6 2රාජා 10:1 2ලේක 11:21
7 ලූක් 12:21
8 2රාජා 9:35
9 යෝබ් 3:16 දේශ 4:3
10 ගීතා 109:13
11 යෝබ් 3:11 ගීතා 58:8
12 යෝබ් 3:13 යෝබ් 14:1
13 යෙරෙ 17:6
14 යෝබ් 30:23 දේශ 3:20 එස 18:4 රෝම 5:12
15 උත් 3:19 හිතෝ 16:26
16 ගීතා 49:10 දේශ 2:15

**2 තීරුව**
1 ගණන් 11:4 යාකො 4:2
2 දේශ 4:4
3 උත් 2:7 ගීතා 49:10
4 යෝබ් 9:2 යෝබ් 9:32 යෙසා 45:9 රෝම 9:20
5 දේශ 2:11 දේශ 4:4
6 ගීතා 4:6
7 1ලේක 29:15 යෝබ් 8:9 යෝබ් 14:2 ගීතා 102:11 ගීතා 144:4
8 යෝබ් 14:21 හිතෝ 27:1 දේශ 8:7 යාකො 4:14

**7 පරි.**
9 හිතෝ 10:7 හිතෝ 22:1 යෙසා 56:5 එස 36:23 මතෙ 6:9 ලූක් 10:20
10 දේශ 7:8 2කොරි 5:1 එළි 2:10
11 හිතෝ 14:13 යෙසා 5:12 මතෙ 5:4 යාකො 4:9 1පේතෘ 4:3
12 ගීතා 119:71 ලූක් 6:21

දේශ **6:3*** හෝ, "ඔහු තවමත් මිනී වළට ගොස් නැත්නම්." **5*** මූ.අ., "විවේකයක් ලැබී ඇත."

**13** රෝම 5:3; 2කොරි 4:17; 2කොරි 7:10; හෙබ්‍රෙ 12:11; **14** නෙහෙ 9:1; දානි 9:3; **15** 1සාමු 25:36; හිතෝ 21:17; දානි 5:1; හොෂෙ 7:5; මාක් 6:21; **16** ගීතා 69:12; **17** ගීතා 141:5; හිතෝ 15:31; එළි 3:19; **18** දේශ 2:2.

තිබේ.[1] අල්ලසකින්[2] කෙනෙකුගේ
සිත දූෂ්‍ය විය හැක.[3]
**8** පටන්ගැන්මට වඩා අවසානය
හොඳය.[4] උඩඟු ලෙස හැසිරෙන කෙ-
නෙකුට වඩා ඉවසිලිවන්ත කෙනෙකු
හොඳය.[5] **9** අමනාප වීමට ඉක්-
මන් නොවන්න.[6] මන්ද සිත තුළ
අමනාපයක් ඇති කරගන්නේ මෝඩ-
යන්ය.[7]
**10** "අතීතයේ මම මීට වඩා සතු-
ටින් සිටියෙමි"[8] යයි නොකියන්න.
මන්ද එලෙස කල්පනා කිරීම ප්‍රඥා-
වන්ත දෙයක් නොවේ.[9]
**11** ප්‍රඥාවන්තයෙකුට උරුමයක්
ලැබීම ආශීර්වාදයකි. ජීවත්ව සිටින
අන් අයටද* එයින් ප්‍රයෝජන
අත් වෙයි.[10] **12** මුදල ආරක්ෂාවක්[11]
වන්නා සේම ප්‍රඥාවද ආරක්ෂාවකි.[12]
නමුත් දැනුම සමඟ ප්‍රඥාව අත් කර-
ගැනීම මුදලට වඩා වටින්නේය. මන්ද
ප්‍රඥාව නිසා කෙනෙකුගේ ජීවිතය
රැකෙයි.[13]
**13** සැබෑ දෙවිගේ ක්‍රියා දෙස
බලන්න.[14] ඔහු ඇද කළ දෙ-
යක් කෙළින් කළ හැක්කේ කාටද?[15]
**14** කරදර නැති දවසක සතුටින්
සිටින්න.[16] එහෙත් කරදර ඇති වූ
විට, සතුට මෙන්ම දුක් කරදර ඇති
වීමට ඉඩහැර තිබෙන්නේ සැබෑ දෙවි
බව සිතට ගන්න.[17] ඔහු එසේ කරන්-
නේ අනාගතය ගැන මිනිසාට නිශ්-
චිතව දැනගැනීමට නොහැකි වන
පිණිසය.[18]
**15** මාගේ මේ නිෂ්ඵල ජීවිතයේදී
මම තවත් දෙයක් දුටුවෙමි.[19] ධර්-
මිෂ්ඨ ලෙස හැසිරෙන යහපත් මිනිසා
විනාශ වී යන[20] නමුත් නපුරු දේ
කරන දුෂ්ටයා බොහෝ කල් ජීවත්
වන්නේය.[21]
**16** පමණට වඩා ධර්මිෂ්ඨ වීමට[22]
හෝ පමණට වඩා ප්‍රඥාවන්ත වීමට
හෝ වෑයම් නොකරන්න.[23] ඔබ එසේ
කර ඔබටම හානි කරගන්නේ මන්ද?[24]
**17** පමණට වඩා සැහැල්ලුවට සිතා
දුෂ්ටයෙකු ලෙසවත්[1] මෝඩයෙකු ලෙ-
සවත් නොහැසිරෙන්න.[2] ඔබ එලෙස
හැසිර අකලට මිය යන්නේ මන්ද?[3]
**18** ඉහත කී මුල් අවවාදය සිතට
ගන්න. දෙවන අවවාදයත් සිතට
ගන්න.[4] මන්ද දෙවිට ගරුබිය දක්-
වන අය මේ කාරණා සම්බන්ධයෙන්
අන්තයට යන්නේ නැත.[5]
**19** නුවරක සිටින බලවතුන් දස-
දෙනෙකුට වඩා මිනිසෙකු සතු ප්‍රඥාව
බලවත්ය.[6] **20** කිසි පාපයක් නො-
කර සැමවිටම යහපත්කම් කරන ධර්-
මිෂ්ඨයෙකු මෙලොවෙහි සොයාගත
නොහැක.[7]
**21** මිනිසුන් කියන සෑම දෙයක්ම
සිතට නොගන්න.[8] ඔබ එසේ
කළොත් ඔබේ සේවකයා ඔබ ගැන
නපුරු දේ කියන බවත් ඔබට අසන්න
ලැබේවි.[9] **22** මන්ද ඔබම අන් අය
ගැන නපුරු දේ කී වතාවක් කියා ඇද්-
දැයි ඔබ හොඳින් දන්නෙහිය.[10]
**23** මම මේ සියල්ල මා සතු ප්‍රඥා-
වෙන් සෝදිසි කර බැලුවෙමි. "මම
ප්‍රඥාවන්තයෙකු වන්නෙමි" යයි සිතු-
වත් මට එය අත් කරගැනීමට නො-
හැකි විය.[11] **24** මුල පටන් සිදු වූ
සෑම දෙයක්ම තේරුම්ගත නොහැ-
කිය. මන්ද ඒ කාරණා ඉතා ගැඹුරුය.
ඒ සියලු කාරණා අවබෝධ කරගත
හැකි කෙනෙකු සිටීද?[12] **25** මමත්
මේ කාරණා සම්බන්ධයෙන් තේ-
රුම්ගැනීමට උත්සාහ කළෙමි.[13] මම
ප්‍රඥාව ගැනත්[14] යම් දේවල් සිදු
වීමට හේතුව ගැනත් සොයා බැලු-
වෙමි.[15] මෝඩකමට හේතුව දුෂ්ට-
කම බවත් සිහිකල්පනාව නොමැතිව
හැසිරීමට හේතුව අඥානකම බවත්

දේශ **7:11*** මූ.අ., "හිරු දකින අයට."

**7 පරි.**
1 ද්වි 28:34
2 ද්වි 16:19
හිතෝ 15:27
3 නික් 23:8
1සාමු 8:3
හිතෝ 17:23
4 උත් 50:20
ගීතා 126:6
දේශ 7:1
යොහ 12:24
යාකො 5:11
5 ගීතා 138:6
හිතෝ 13:10
ගලා 6:3
යාකො 5:10
1පේතෘ 5:5
6 හිතෝ 14:17
හිතෝ 16:32
හිතෝ 29:11
යාකො 1:19
7 උත් 4:5
එස්ත 5:9
හිතෝ 14:29
8 විනි 6:13
9 ලූක් 9:62
පිලි 3:13
10 1රාජා 3:7
11 හිතෝ 10:15
ලූක් 16:9
12 හිතෝ 2:11
හිතෝ 4:6
13 හිතෝ 3:18
හිතෝ 8:35
හිතෝ 9:11
14 ගීතා 107:43
15 යෝබ් 9:12
යෙසා 14:27
යෙසා 46:10
16 ගීතා 30:11
ගලා 5:22
යාකො 5:13
17 ද්වි 8:3
යෝබ් 2:10
යෙසා 45:7
රෝම 11:22
18 හිතෝ 27:1
දේශ 9:11
යාකො 4:14
19 ගීතා 39:5
දේශ 4:4
20 උත් 4:8
1සාමු 22:18
මතෙ 23:34
යොහ 16:2
1පේතෘ 4:12
1පේතෘ 5:10
21 යෝබ් 21:7
ගීතා 73:12
යෙරෙ 12:1
22 යෙසා 65:5
මතෙ 6:1
මතෙ 12:2
මතෙ 23:23
ලූක් 18:9
රෝම 10:3
රෝම 14:10
කොලො 2:23
23 හිතෝ 3:7
යොහ 12:5
රෝම 12:3
1කොරි 3:18

**24** 2සාමු 6:7; හිතෝ 16:18; **2 තීරුව** **1** යොෂු 7:21; එස 8:17; එස 16:20; 2තිමෝ 4:14; යාකො 1:21; 2පේතෘ 2:14; **2** ගීතා 14:1; ගීතා 75:4; හිතෝ 14:9; **3** 1සාමු 25:38; ගීතා 55:23; හිතෝ 10:27; **4** මතෙ 11:19; මතෙ 12:1; පිලි 4:5; **5** ලූක් 16:9; **6** 2සාමු 20:16; හිතෝ 21:22; හිතෝ 24:5; දේශ 9:16; **7** 2ලේක 6:36; ගීතා 51:5; ගීතා 130:3; ගීතා 143:2; හිතෝ 20:9; රෝම 3:23; යාකො 3:2; 1යොහ 1:8; **8** 1සාමු 24:9; **9** 2සාමු 16:10; **10** ලූක් 9:54; යාකො 3:2; යාකො 3:9; **11** ද්වි 29:29; යෝබ් 28:12; ගීතා 119:114; **12** යෝබ් 11:7; ගීතා 36:6; ගීතා 139:6; යෙසා 55:9; රෝම 11:33; **13** දේශ 1:13; දේශ 2:3; **14** ගීතා 51:6; හිතෝ 2:4; දේශ 1:17; **15** යෝබ් 38:3; යෝබ් 42:2.

මම තේරුම්ගත්තෙමි.[1] **26** මම මේ
කාරණයත් වටහාගත්තෙමි. ගො-
දුරක් හසු කරගැනීමට එළන දැලක්
හා සමාන වූ ස්ත්‍රියක මම දුටිමි.
ඇගේ සිත මාදැලක් මෙනි. ඇගේ
දෑත් විලංගු මෙනි.[2] ඇයට හසු වීම
මිය යෑමටත් වඩා වේදනාකාරී අද්-
දැකීමකි.[3] යමෙකු ඇගෙන් ගැලවු-
ණොත් ඔහුට සැබෑ දෙවිගේ අනුමැතිය
ලැබෙයි. එහෙත් ඇයට හසු වන අය
පාපයට වැටෙනු ඇත.[4]

**27** උපදේශකයා මෙසේද කීවේය.[5]
“මම සෑම කාරණයක්ම හොඳින්
සොයා බලා යමක් තේරුම්ගත්-
තෙමි.[6] **28** මට එක් දෙයක් සො-
යාගැනීමට නොහැකි විය. පුරුෂයන්
දහසක් අතරින් එක් ධර්මිෂ්ඨ පුරු-
ෂයෙකු සොයාගත්[7] නමුත් ස්ත්‍රීන්
අතරින් එක් ධර්මිෂ්ඨ ස්ත්‍රියකවත්
මට සොයාගැනීමට නොහැකි විය.[8]
**29** සැබෑ දෙවි මිනිසාව කිසි දෝෂයක්
නැතුව සෑදූ[9] නමුත් මිනිසා විවිධාකාර
සැලසුම් යොදා වෙනත් මඟක ගමන්
කිරීමට තෝරාගෙන ඇත.”[10]

**8** ප්‍රඥාවන්තයාට සම කළ හැකි
කෙනෙකු සිටීද?[11] යම් කාර-
ණයක අර්ථය වටහාගත හැක්කේ
කාටද?[12] ප්‍රඥාව අත් කරගැනීමෙන්
මිනිසෙකුගේ සිත සතුටින් පිනා යයි.
ඔහුගේ මුහුණේ තිබුණු සැරපරුෂ ස්ව-
භාවයද නැති වී යයි.[13]

**2** මා ඔබට දෙන උපදේශය
මෙයයි. “ඔබ දෙවිට දුන් පොරොන්-
දුවට විශ්වාසවන්ත වෙමින්[14] රජු-
ගේ නියෝගය පවත්වන්න.[15] **3** ඔහු
වෙතින් ඉවත්ව යෑමට ඉක්මන් නො-
වන්න.[16] වැරදි ක්‍රියාවකට සම්බන්ධ
නොවන්න.[17] මන්ද රජු යම් දෙයක්
සිතුවොත් ඔහු අනිවාර්යයෙන්ම එය
ඉටු කරගනී.[18] **4** මන්ද රජුගේ වච-
නයට ඉහළින් යන්න කාටවත් නො-
හැක.[19] ‘ඔබ කුමක්ද මේ කරන්නේ’
කියා ඔහුගෙන් කිසිවෙකුට ඇසිය
නොහැක.”

**5** නීතිගරුක පුද්ගලයෙකුට කිසි
අනතුරක් සිදු නොවෙයි.[20] එමෙන්ම
යම් කාරණයක් සම්බන්ධයෙන් පිය-
වර ගැනීමට නිසි වේලාවක් හා
නිසි ක්‍රමයක් තිබෙන බව ප්‍රඥාවන්-
තව සිතන කෙනෙක් දනී.[1] **6** මන්ද
සෑම කාරණයක්ම හැසිරවීමට නිසි
වේලාවක් හා නිසි ක්‍රමයක් තිබේ.[2]
තවද මිනිසාට දරාගන්න බැරි තර-
මටම බොහෝ දුක් කරදර තිබේ.[3]
**7** අනාගතයේ කුමක් සිදු වෙයිද කියා
කිසිවෙක් නොදනියි.[4] එසේනම්, ඉදි-
රියේදී කුමක් වෙයිද කියා පැවසිය
හැක්කේ කාටද?

**8** මිය යන මොහොතේදී තම
හුස්ම පිට වී යෑම වැළැක්වීමටවත්[5]
මැරෙන දවස කල් දැමීමටවත් මිනි-
සෙකුට බලය නැත.[6] යුද්ධයට ගිය
කෙනෙකුට සටනින් ඉවත්ව යා නො-
හැක.[7] එසේම, දුෂ්ටයෙකුට තම දුෂ්ට
උපායන් මඟින් ගැලවීමක් ලබාගත
නොහැක.[8]

**9** මේ සෑම දෙයක්ම මම ඇස්
දෙකෙන්ම දුටුවෙමි. ඉර යට සිදු
කෙරෙන සෑම කාර්යයක් දෙසම මම
සිත යොමු කළෙමි. ඒ මුළු කාලය
පුරාම මිනිසා අන් අයට හානියක් වන
ලෙසින් තම බලය ක්‍රියාත්මක කර
ඇත.[9] **10** ඒ කෙසේනමුත්, දුෂ්ට-
යන් ශුද්ධ නුවරට[10] ඇතුල් වූ ආකාර-
යත් එතැනින් පිටත්ව යන ආකාරයත්
ඔවුන්ව තැන්පත්[11] කරනු ලැබූ ආකා-
රයත් මම දුටුවෙමි. ඔවුන් ඒ නුවරේ
දුෂ්ට ලෙස හැසිරුණත් එහි වැසියන්ට
ඔවුන්ව අමතක වී ගිය බවත් මම දුටු-
වෙමි.[12] මෙයද ඉතා නිෂ්ඵල දෙයකි.

**11** වරදකට නිසි දඬුවම වහාම
නොදෙන විට[13] ජනයා කිසි බියක්
සැකක් නොමැතිව දුෂ්ටකම් කිරීමට
පෙලඹෙති.[14] **12** පව්කාරයෙකු සිය
වරක් දුෂ්ටකම් කර[15] බොහෝ කල්
සතුටින් ජීවත් වුණත් අවසානයේදී

**7 පරි.**

1 ද්වි 32:6
හිතෝ 11:29
දේශ 2:12
දේශ 9:3
2 විනි 16:21
හිතෝ 7:22
3 1සාමු 15:32
ගීතා 55:4
4 හිතෝ 5:14
හිතෝ 7:23
හිතෝ 7:26
හිතෝ 22:14
5 දේශ 1:1
දේශ 1:12
6 දේශ 7:25
7 නෙහෙ 7:2
යෝබ් 33:23
ගීතා 12:1
පිලි 2:20
2පේත්‍රු 2:8
8 හිතෝ 18:22
හිතෝ 31:10
9 උත් 1:26
උත් 1:31
ද්වි 32:4
10 උත් 3:6
උත් 6:12
උත් 11:4
ද්වි 32:5
යෙරෙ 2:13
මාක් 7:9
යාකො 1:14

**8 පරි.**

11 හිතෝ 1:5
හිතෝ 3:35
හිතෝ 15:7
හිතෝ 15:31
12 උත් 40:8
2පේත්‍රු 1:20
13 හිතෝ 4:8
14 2සාමු 5:3
15 හිතෝ 24:21
රෝම 13:1
තීත 3:1
1පේත්‍රු 2:13
16 දේශ 10:4
17 1රාජා 1:49
හිතෝ 20:2
18 දානි 5:19
19 උත් 41:44
1රාජා 2:25
එස්රා 7:26
දානි 3:15
රෝම 13:1
20 ගීතා 119:6
රෝම 13:3
රෝම 13:5
1පේත්‍රු 3:13

**2 තීරුව**

1 1සාමු 24:13
1සාමු 26:10
1ලේක 12:32
ගීතා 37:7
හිතෝ 17:24
2 දේශ 3:17
3 ලූක් 17:27
ලූක් 17:29
4 මතෙ 24:44

**5** යෝබ් 34:14; දේශ 12:7; **6** ගීතා 89:48; ගීතා 104:29; ගීතා 146:4; **7** රෝම 5:12; රෝම 5:14; **8** ගීතා 9:17; ගීතා 52:5; හිතෝ 14:32; යෙසා 28:18; **9** උත් 3:16; නික් 1:14; 2රාජා 25:7; මීකා 7:3; **10** මතෙ 24:15; **11** 2රාජා 9:34; 2ලේක 28:27; **12** හිතෝ 10:7; දේශ 9:5; හෙබ්‍රෙ 10:38; **13** නික් 8:15; 1සාමු 2:23; ගීතා 10:6; යෙසා 26:10; මතෙ 24:48; **14** නික් 9:16; යෙරෙ 44:17; 2පේත්‍රු 3:9; **15** 1රාජා 21:25; හිතෝ 13:21; රෝම 9:22.

සැබෑ දෙවි කෙරෙහි ගරුබියක් ඇති
අයට යහපතක් සිදු වන බව මට විශ්-
වාසය.[1] ඔවුන්ට හොඳ ප්‍රතිඵල අත්
වන්නේ දෙවි කෙරෙහි ඔවුන්ට ගරුබි-
යක් ඇති නිසාය.[2] **13** එහෙත් දුෂ්ට-
යාට දෙවි කෙරෙහි ගරුබියක් නැති
නිසා[3] ඔහුට කිසි යහපතක් සිදු වන්-
නේ නැත.[4] ඔහු සෙවණැල්ලක් මෙන්
ඉක්මනින්ම නැති වී යන්නේය.[5]

**14** පොළොවේ සිදු වන තවත්
නිෂ්ඵල දෙයක් මම දුටුවෙමි. දුෂ්ට-
යන් විඳිය යුතු දේ ධර්මිෂ්ඨයන්ට විඳී-
මට සිදු වෙයි.[6] එමෙන්ම ධර්මිෂ්ඨයන්
භුක්ති විඳිය යුතු දේ දුෂ්ටයෝ භුක්ති
විඳින්නෝය.[7] මෙයද ඉතා නිෂ්ඵල
දෙයකි.

**15** සන්තෝෂ වීම මම අනුමත
කරමි.[8] මන්ද මිනිසෙකු කා බී සතු-
ටින් සිටීම තරම් හොඳ දෙයක් ඉර
යට නැත. එමෙන්ම සැබෑ දෙවි ඔහුට
ඉර යට[9] ජීවත් වීමට දුන් කාලය
පුරාම වෙහෙස මහන්සි වී කරන සියලු
වැඩවලින්ද ඔහු තෘප්තියක් ලබාගත
යුතුයි.[10] **16** ප්‍රඥාව ගැන හොඳ අව-
බෝධයක් ලබාගැනීමටත් මනුෂ්‍ය-
යන් කරන සෑම කාර්යයක් ගැනම
සොයා බැලීමටත්[11] මම උත්සාහ
කළෙමි.[12] එහෙත් ඒ සියලු කාර්යයන්
නිසා ඔවුන්ට දිවා රාත්‍රී දෙකෙහිම
නින්දක් නොලැබෙයි.[13]

**17** සැබෑ දෙවි ඉර යට සිදු කරන
සියලු දේ[14] තේරුම්ගැනීමට මිනිසාට
නොහැකි බව මම දුටුවෙමි.[15] මිනිසා
ඒවා තේරුම්ගැනීමට කොතරම් වෙ-
හෙසුණත් ඔවුන්ට එය කළ නො-
හැක.[16] එවැනි දේ තේරුම්ගැනීමට
තරම් තමුන් ප්‍රඥාවන්තයයි පැවසු-
වත්[17] ඔවුන්ට එසේ කිරීමට හැකියා-
වක් නැත.[18]

**9** මම මේ කාරණා ගැනත් හොඳින්
සොයා බලා ඒවා තේරුම්ගැනී-
මට උත්සාහ කළෙමි.[19] ධර්මිෂ්ඨයන්
හා ප්‍රඥාවන්තයන් සිටින්නේ සැබෑ
දෙවිගේ අතේය. ඔවුන් කරන සියල්-
ලත් ඔහුගේ අතේය.[20] තවද තමන්
ඉපදීමට කලින් තිබූ ප්‍රේමය ගැන-
වත් වෛරය ගැනවත් මිනිසා දන්-
නේ නැත.[1] **2** සියලුදෙනාටම සිදු
වන්නේ එකම දෙයයි.[2] ධර්මිෂ්ඨයාට[3]
මෙන්ම දුෂ්ටයාටත්[4] පවිත්‍ර ජීවිතයක්
ගත කරන තැනැත්තාට මෙන්ම අප-
වි‍ත්‍ර ජීවිතයක් ගත කරන තැනැත්-
තාටත් පූජා ඔප්පු කරන හා ඔප්පු
නොකරන තැනැත්තාටත් අවසාන-
යේදී සිදු වන්නේ එකම දෙයයි.[5] යහ-
පත් තැනැත්තා හා පව්කාර ජීවිතයක්
ගත කරන තැනැත්තා අතර වෙ-
නසක් නැත.[6] දිවුරුම් දෙන්නා සහ
දිවුරුම් දීමට භය වන්නා අතරත් වෙ-
නසක් නැත.[7] **3** ඉර යට සිදු වන
ඉතා කනගාටුදායක දෙයක් ඇත.
අවසානයේදී සියලුදෙනාටම එකම දේ
සිදු වන නිසා[8] මනුෂ්‍යයන්ගේ සිත
නපුරටම යොමු වී තිබේ.[9] ඔවුන්-
ගේ ජීවිත කාලය පුරාම ඔවුහු වියරු-
වෙන්[10] මෙන් ක්‍රියා කරති. පසුව ඔවුහු
මිනී වළට යන්නෝය.[11]

**4** ජීවත් වන අයට බලාපොරොත්-
තුවක් ඇත. මළ සිංහයෙකුට වඩා[12]
පණපිටින් සිටින බල්ලෙකු හොඳය.[13]
**5** ජීවත්ව සිටින අය තමන් කවදා
හෝ මිය යන බව දනිති.[14]
නමුත් මිය ගිය අය කිසිවක් දන්නේ
නැත.[15] ඔවුන්ට තවදුරටත් ආශීර්වාද
හෝ දඬුවම් හෝ ලැබෙන්නේ නැත.
ඔවුන්ව සම්පූර්ණයෙන්ම අමතක වී
ඇත.[16] **6** ඔවුන්ගේ ප්‍රේමයද වෛර-
යද ඊර්ෂ්‍යාවද නැති වී ඇත.[17] ඔවුන්ට
නැවත කවදාවත් ඉර යට කෙරෙන
කිසිම දෙයකට සහභාගි වීමට නො-
හැක.[18]

**7** දැන් ගොස් ප්‍රීතියෙන් කෑම
කන්න. සතුටින් වයින් බොන්න.[19]
මන්ද සැබෑ දෙවි දැනටමත් ඔබ කළ

**8 පරි.**

**1** ගීතා 37:11, ගීතා 37:18, ගීතා 112:1, ගීතා 115:13, යෙසා 3:10, යෙසා 65:13, මතෙ 25:34, 2පේතෘ 2:9
**2** ගීතා 25:14, ගීතා 34:9, ගීතා 103:13, හිතෝ 23:17
**3** ගීතා 14:1, ගීතා 36:1
**4** ගණන් 32:23, යෝබ් 18:5, ගීතා 11:5, ගීතා 37:10, යෙසා 57:21, මතෙ 25:46, 2පේතෘ 2:12
**5** යෝබ් 24:24, දේශ 6:12, ලූක් 12:20, යාකො 1:11, 2පේතෘ 2:3
**6** දේශ 7:15, මතෙ 27:22
**7** ගීතා 37:7, ගීතා 73:12, මලා 3:15
**8** ගීතා 100:2, දේශ 3:12, මතෙ 5:12, පිලි 4:4
**9** දේශ 1:3
**10** දේශ 2:24, 1තිමෝ 6:17
**11** දේශ 1:13
**12** හිතෝ 14:33, හිතෝ 22:17, දේශ 7:25
**13** දේශ 2:23
**14** උත් 1:1, ගීතා 40:5, ගීතා 104:24, ගීතා 146:6, යෙසා 40:28
**15** යෝබ් 11:7, දේශ 3:11, දේශ 11:5, රෝම 11:33
**16** යෝබ් 28:12
**17** හිතෝ 3:7, හිතෝ 26:5
**18** දේශ 7:24, දේශ 11:5, ආනි 12:9

**9 පරි.**

**19** දේශ 1:17, දේශ 7:25, දේශ 8:16
**20** ද්වි 33:3, 1සාමු 2:9, ගීතා 37:5

**2 තීරුව**

**1** දේශ 9:6

**2** මතෙ 5:45; ක්‍රියා 14:17; **3** උත් 25:8; **4** යෝබ් 21:7; යෝබ් 21:23; දේශ 8:10; **5** දේශ 5:15; **6** රෝම 5:12; **7** 1සාමු 14:26; **8** යෝබ් 3:19; යෝබ් 14:10; දේශ 2:15; **9** උත් 8:21; **10** දේශ 7:25; **11** 1කොරි 15:32; **12** 2ලේක 35:24; හිතෝ 30:30; **13** යෙසා 38:19; මතෙ 15:27; **14** උත් 3:19; උත් 47:30; රෝම 5:12; **15** ගීතා 88:10; ගීතා 115:17; ගීතා 146:4; යෙසා 38:18; යොහ 11:11; **16** යෝබ් 7:10; ගීතා 109:15; දේශ 2:16; යෙසා 26:14; **17** ගීතා 1:6; දේශ 9:1; **18** දේශ 9:10; **19** ද්වි 12:7; 1රාජා 8:66; ගීතා 104:15; දේශ 2:24.

වැඩ ගැන සතුටින් සිටින්නේය.[1] **8** සැමවිටම ප්‍රියමනාප* ඇඳුම්වලින් සැරසී සිටින්න.[2] ඔබේ හිසෙහි නිතරම තෙල් ආලේප කරන්න.[3] **9** ඔබේ නිෂ්ඵල ජීවිත කාලය පුරාම ඔබ ආදරය කරන ඔබේ බිරිඳ සමඟ සතුටින් කල් ගෙවන්න.[4] දෙවි ඔබට ඉර යට ජීවත් වීමට දෙන කාලය පුරාම එසේ කරන්න. මන්ද ඔබ ඉර යට වෙහෙස මහන්සි වී කරන සියලු වැඩවලට ලැබෙන ආශීර්වාදය එයයි.[5] **10** ඔබට කළ හැකි සෑම දෙයක්ම ඔබේ මුළු උත්සාහයෙන්ම කරන්න.[6] මන්ද ඔබ යන[7] මිනී වළේදී[8] කිසි වැඩක් කරන්නවත් කිසි දෙයක් ගැන කල්පනා කරන්නවත් ඔබට නොහැක.[9] එහි දැනුමද ප්‍රඥාවද නැත.[10]

**11** ඉර යට සිදු වන සියල්ල ගැන මම නැවත කල්පනා කළෙමි. වේගවත්ම අය තරඟයෙන් ජය නොගනිති.[11] බලවතුන්ද යුද්ධයෙන් ජය ගන්නේ නැත.[12] ප්‍රඥාවන්තයන්ට කෑම සොයාගැනීමට නොහැකි වෙයි.[13] බුද්ධිමතුන්ට වස්තුව නොලැබෙයි.[14] මනා අවබෝධයකින් කටයුතු කරන අයට නිසි පිළිගැනීමක්ද නොලැබෙයි.[15] මන්ද නොසිතන මොහොතක බලාපොරොත්තු නොවූ දේවල් ඒ සියලුදෙනාටම සිදු විය හැක.[16] **12** මිනිසා[17] තමා මිය යන්නේ කවදාද කියා නොදනී.[18] දැලකට හසු වන මත්ස්‍යයන් මෙන්ද[19] උගුලකට හසු වන කුරුල්ලන් මෙන්ද[20] ඔවුහු බලාපොරොත්තු නොවන මොහොතක[21] විපතට හසු වී මිය යන්නෝය.[22]

**13** පොළොවේ වැසියන් අතරේ ඉතා උසස් ප්‍රඥාවක් මම දුටුවෙමි. **14** කුඩා නුවරක් තිබිණ. එහි සිටියේ ස්වල්පදෙනෙකි. ශ්‍රේෂ්ඨ රජෙක් ඒ නුවරට පැමිණ එය වටලා ඊට විරුද්ධව මහා බලකොටු ගොඩනැඟීය.[23] **15** ඒ නුවරේ දුප්පත් මනුෂ්‍යයෙක් සිටියේය. ඔහු දුප්පතෙකු වුවද ඉතා ප්‍රඥාවන්තය. ඔහු තම ප්‍රඥාව යොදා ඒ නුවර විපතෙන් ගැලෙව්වේය.[1] එහෙත් පසුව ඒ දුප්පත් මිනිසාව සියලුදෙනාම අමතක කළෝය.[2] **16** ඒ නිසා මම මෙසේ කීවෙමි. "ප්‍රඥාව බලයට වඩා වටින්නේය.[3] එහෙත් දුප්පතාගේ ප්‍රඥාව සුළු කොට තකනු ලැබේ. ඔහුගේ උපදෙස්වලට කිසිවෙකු සවන් නොදෙයි."[4]

**17** අඥානයන් ඉදිරියේ කෑගසන පාලකයෙකුගේ වචනවලට වඩා[5] සන්සුන්ව කතා කරන ප්‍රඥාවන්තයෙකුගේ වචන ප්‍රබලය.[6]

**18** යුද්ධායුධවලට වඩා ප්‍රඥාව බලවත්ය. නමුත් වැරදි මඟෙහි යන එක් කෙනෙකු නිසා වටිනා බොහෝ දේවල් විනාශ වී යා හැකියි.[7]

**10** මළ මැස්සන් නිසා අනර්ඝ තෛලයක්[8] වුවද නාස්ති වී දුඟඳ හමන්න පටන්ගනියි. එලෙසම, අන්‍යයන්ගේ ගෞරවය දිනාගෙන සිටින ප්‍රඥාවන්තයෙකු කරන එක් මෝඩ ක්‍රියාවකින් ඔහුගේ හොඳ නම පලුදු වෙයි.[9]

**2** ප්‍රඥාවන්තයාගේ සිත හරි මඟට යොමු වෙයි.[10] නමුත් අඥානයාගේ සිත යොමු වන්නේ නරක දේටය.[11] **3** මෝඩයා කුමන දෙයක් කළත් ඔහුගේ අඥානකම* හොඳින් පැහැදිලි වේ.[12] ඔහු තම මෝඩකම සියල්ලන් ඉදිරියේ ප්‍රදර්ශනය කරයි.[13]

**4** පාලකයෙකු ඔබට විරුද්ධව උදහස් වුණොත් ඔබේ තැන අත්හැර නොයන්න.[14] මන්ද සන්සුන්ව සිටීමෙන් සිදු වීමට තිබෙන ලොකු වරදක් වුණත් වැළැක්විය හැක.[15]

**5** ඉර යට සිදු වන තවත් විපතක් මම දුටුවෙමි. එය නම් පාලකයෙකු[16] අතින් සිදු වන වරදකි.[17] **6** උසස්

**9 පරි.**

**1** ද්වි 16:15; ක්‍රියා 10:31; ක්‍රියා 10:35; ක්‍රියා 14:17
**2** එළි 3:5; එළි 7:14; එළි 19:8
**3** දානි 10:3; මතෙ 6:17; ලූක් 7:46
**4** හිතෝ 5:18
**5** දේශ 5:18
**6** 2ලේක 31:21
**7** ගීතා 115:17
**8** උත් 37:35; 1රාජා 2:6; යෙසා 5:14
**9** යෙසා 38:18
**10** ගීතා 146:4
**11** යෙරෙ 46:6; ආමො 2:14
**12** 1සාමු 17:50; ගීතා 33:16
**13** දේශ 9:15
**14** දේශ 2:15
**15** 2සාමු 17:23
**16** උත් 42:4; 1සාමු 6:9; 1රාජා 22:34
**17** යෝබ් 14:1; ගීතා 8:4
**18** දේශ 8:8; යාකො 4:14
**19** හබ 1:15
**20** හිතෝ 7:23
**21** ලූක් 21:34
**22** ලූක් 21:35
**23** 2සාමු 20:15

**2 තීරුව**

**1** 2සාමු 20:22; දේශ 7:12
**2** උත් 40:23; ගීතා 31:12; දේශ 9:11
**3** හිතෝ 21:22; හිතෝ 24:5; දේශ 7:19; දේශ 9:18
**4** හිතෝ 10:15; මාක් 6:3; යොහ 7:48; 1කොරි 1:27; 1කොරි 2:8
**5** 1සාමු 7:3
**6** උත් 41:39; හිතෝ 22:17; දානි 12:3
**7** යොෂු 22:20; 1කොරි 5:6; ගලා 5:9; තීත 1:11; හෙබ්‍රෙ 12:15; 3යොහ 10

**10 පරි.**

**8** නික් 30:35
**9** ගණන් 20:12; 2සාමු 12:12
**10** හිතෝ 14:8; මතෙ 25:33; ලූක් 14:28; **11** හිතෝ 17:16; දේශ 10:14; මතෙ 25:41; **12** හිතෝ 10:23; හිතෝ 18:6; 1පේතෘ 4:4; **13** හිතෝ 13:16; හිතෝ 18:7; හිතෝ 29:11; දේශ 5:3; **14** 1රාජා 2:36; දේශ 8:3; තීත 3:2; **15** 1සාමු 25:24; හිතෝ 25:15; **16** 1සාමු 26:21; යෙසා 3:12; **17** 1රාජා 12:10.

දේශ **9:8*** මූ.අ., "සුදු."

දේශ **10:3*** හිතෝ 6:32හි පාදසටහන බලන්න.

තනතුරු බොහොමයකට පත් කර තිබෙන්නේ මෝඩයන්වය.[1] එහෙත් සුදුසුකම් ලත් අය සිටින්නේ පහත් තනතුරුවලය.

**7** සේවකයන් අශ්වයන් පිට නැඟ යන ආකාරයත් අධිපතීන් පයින් යන ආකාරයත් මම දුටුවෙමි.[2]

**8** වළක් කපන්නා ඒ වළටම වැටිය හැකියි.[3] ගල් පවුරක් බිඳ දමන්නාට සර්පයෙකු දෂ්ට කළ හැකියි.[4]

**9** ගල් කඩන්නාට ඒ ගල්වලින් හානියක් විය හැක. දර පළන්නාද පරෙස්සම් විය යුතුය.[5]

**10** යකඩ ආයුධයක් මොට්ට වූ විට එය මුවහත් නොකර[6] භාවිත කරන්නේ නම් ශක්තිය නිකරුණේ වැය කිරීමට සිදු වෙයි. එලෙසම, ප්‍රඥාව නිසි ලෙස යොදා නොගන්නේ නම් එයින් ප්‍රයෝජනයක් ලබාගත නොහැකිය.[7]

**11** නයාව නටවන්නත් කලින් ඌ දෂ්ට කරයි[8] නම් නයි නටවන්නා පසුව කරන කිසිම දෙයකින් ප්‍රයෝජනයක් නැත.

**12** ප්‍රඥාවන්තයාගේ මුඛයෙන් නික්මෙන්නේ ප්‍රිය වචනයි.[9] එහෙත් අඥානයාගේ වචන ඔහුගේම විනාශයට හේතු වෙයි.[10] **13** අඥානයා තම කතාව බොළඳ ලෙස ආරම්භ කළත්[11] එහි අවසානය විනාශකාරීය. **14** මෝඩයා පාලනයකින් තොරව බොහෝ වචන පිට කරයි.[12]

අනාගතයේ කුමක් සිදු වේදැයි මිනිසෙකුට කිව නොහැකිය. ඔහු මිය ගිය පසු කුමක් සිදු වේදැයි කිව හැක්කේ කාටද?[13]

**15** අඥානයෝ නිකරුණේ වෙහෙස මහන්සි වෙති.[14] නුවරට ඇතුල් වන දොරටුවවත් ඔවුන්ට සොයාගත නොහැක.[15]

**16** දේශයේ වැසියෙනි, ඔබේ රජු කුඩා දරුවෙකු නම් කුමක් සිදු වේවිද?[16] ඔබේ අධිපතීන් උදෑසන සිටම කමින් බොමින් සිටින්නේ නම් ඔබේ තත්වය කුමක්ද? **17** එහෙත් ඔබේ රජු වංශවත් තැනැත්තෙකු නම් ඔබ සන්තෝෂවත්ය. ඔබේ අධිපතීන් බේබදුකමට නොවැටී,[1] සවිශක්තිය ලබාගන්නා පිණිස නිසි වේලාවට කෑම ගන්නේ නම් ඔබ ආශීර්වාද ලත් සෙනඟකි.

**18** අලසයාගේ වහලේ පරාල කැඩී යයි. ඔහු අත් දෙක බැඳගෙන නිදාගෙන සිටින නිසා ඔහුගේ නිවස වැස්සට තෙමෙයි.[2]

**19** සේවකයෝ කෑම කා ප්‍රීති වෙති. වයින් බීමෙන් ජීවිතයට සතුටක් එක් කළ හැකියි.[3] නමුත් ජීවිතේ මොන දේ කරන්නත් මුදල් අවශ්‍යයි.[4]

**20** ඔබේ නිදන කාමරයේදීවත් රජුට විරුද්ධව කතා නොකරන්න.[5] ඔබ, ගේ ඇතුළේ විවේක ගනිමින් සිටියදී පවා ධනවතෙකු ගැන කිසි වරදක් නොකියන්න.[6] මන්ද අහසේ පියාසර කරන කුරුල්ලෙක් ඔබ කියූ දේ අසා ඒ ගැන දන්වයි. පක්ෂියෙක් ඔබ කියූ දේ ගැන ඔවුන්ට දැනුම් දෙයි.[7]

**11** ඔබ කෑම[8] ජලයෙහි පා කර යවන්නේ නම්[9] දවස් ගණනාවකට පසු එය නැවතත් ඔබට ලැබෙන්නේය.[10] **2** සත්දෙනෙකු හෝ අටදෙනෙකු හෝ සමඟ ඔබ සතු දේ බෙදාගන්න.[11] මන්ද ඉදිරියේදී කුමනාකාරයේ විපතක් සිදු වේදැයි පැවසිය නොහැක.[12]

**3** අහසේ වැහි වලාකුළු තිබේ නම් වැස්ස කඩා හැලෙයි.[13] ගසක් දකුණු දෙසට හෝ උතුරු දෙසට හෝ වැටෙනවා නම්[14] එය වැළැක්විය නොහැක.

**4** සුළඟ හමයිද කියා කල්පනා කරන තැනැත්තා කිසිවිටෙක වපුරන්නේ නැත. වැස්ස වහීද කියා කල්පනා කරන තැනැත්තා අස්වැන්න නෙළාගන්නේ නැත.[15]

**10 පරි.**
**1** 1රාජා 12:14 එස්ත 3:1 හිතෝ 28:12 දේශ 4:13
**2** 2සාමු 3:39 හිතෝ 19:10 හිතෝ 30:22 යෙසා 3:5
**3** 2සාමු 17:23 එස්ත 7:10 ගීතා 7:15 ගීතා 9:15 හිතෝ 26:27
**4** ආමො 5:19 ආමො 9:3
**5** ද්වි 19:5
**6** 1සාමු 13:20
**7** නික් 31:3 2ලේක 2:14 දේශ 9:10
**8** ගීතා 58:5 යෙරෙ 8:17
**9** 1රාජා 10:8 යෝබ් 4:4 ගීතා 37:30 හිතෝ 10:21 ලූක් 4:22 එෆී 4:29
**10** ගීතා 64:8 හිතෝ 10:14 හිතෝ 14:3
**11** 1සාමු 20:31 1සාමු 25:10 2රාජා 6:31 ලූක් 6:11
**12** හිතෝ 10:19 හිතෝ 15:2
**13** හිතෝ 27:1 දේශ 6:12 දේශ 8:7 යාකො 4:14
**14** හබ 2:13
**15** ගීතා 107:4
**16** 2ලේක 13:7 2ලේක 36:9 යෙසා 3:4

**2 තීරුව**
**1** හිතෝ 31:4 යෙසා 28:7 හොෂෙ 7:5
**2** හිතෝ 21:25 හිතෝ 24:33 හෙබ්‍රෙ 6:12
**3** ගීතා 104:15 දේශ 9:7
**4** දේශ 7:12 ලූක් 16:9
**5** නික් 22:28 යෙසා 8:21 1පේතෘ 2:13
**6** දේශ 7:12
**7** ලූක් 12:2

**11 පරි.**
**8** නෙහෙ 8:10 එස්ත 9:19
**9** ද්වි 15:11 හිතෝ 22:9 යෙසා 32:20

**10** ද්වි 15:10; ගීතා 41:1; හිතෝ 19:17; ලූක් 14:14; හෙබ්‍රෙ 6:10; **11** ගීතා 37:21; ලූක් 6:38; ක්‍රියා 4:32; 2කොරි 9:7; 1තිමෝ 6:18; **12** දානි 4:27; **13** 1රාජා 18:45; යෙසා 55:10; **14** යෝබ් 14:7; **15** හිතෝ 20:4; හිතෝ 24:34.

**5** මව්කුසෙහි වැඩෙන බිලිඳෙකුගේ
ඇටකටු සෑදෙන ආකාරය* ඔබ නො-
දන්නා සේම,[1] සියල්ල සෑදූ සැබෑ දෙ-
විගේ ක්‍රියාද ඔබට තේරුම්ගත
නොහැකිය.[2]

**6** උදෑසන ඔබේ බීජ වපුරන්න.
කිසි විවේකයක් නොගෙන සවස් වන
තුරුම එසේ කරන්න.[3] මන්ද ඒ කුමන
බීජ පැළ වෙයිද කියා ඔබ දන්නේ
නැත.[4] සමහරවිට ඉන් එකක් හෝ
දෙකක් හෝ ඒ සියල්ල වුවද පැළ
වීමට ඉඩ තිබේ.

**7** අලුත් දවසක හිරු එළිය දැකීම
මොන තරම් සතුටක්ද![5] එය ඇස්ව-
ලට සුවයක්ද ගෙන දෙයි. **8** මිනි-
සෙකු කොතරම් කාලයක් ජීවත්
වුණත් ඒ සෑම දවසකදීම ඔහු ප්‍රීති-
යෙන් සිටීමට වෑයම් කළ යුතුයි.[6] ඉදි-
රියේදී අඳුරු දවස් පැමිණෙන බවත්
ඔහු මතක තබාගත යුතුයි.[7] මන්ද
ඉදිරියේදී පැමිණෙන ඒ දවස් නිෂ්ඵ-
ලය.[8]

**9** තරුණය, ඔබේ යෞවන කාලය
සතුටින් ගත කරන්න.[9] යොවුන්
වියේදී ප්‍රීති වන්න. ඔබේ සිතේ ආශා-
වන් ඉටු කරගන්න. ඔබේ ඇස්වලට
ප්‍රිය කරන දේ ලබාගන්න.[10] එහෙත්
ඔබ කරන සෑම දෙයක් ගැනම සැබෑ
දෙවිට ගණන් දිය යුතු බව අමතක
නොකරන්න.[11] **10** ඔබේ ජීවිතයට
අනවශ්‍ය ලෙස දුක් කරදර හා සිත්තැ-
වුල් ඇති වීමට ඉඩ නොදෙන්න.[12]
මන්ද යෞවන කාලය එනම්, ජීවිත-
යේ හොඳම කාලය වුවද නිෂ්ඵලය.[13]

**12** යෞවනයෙනි, ඔබට ජීවි-
තය දුන් ශ්‍රේෂ්ඨ සැදුම්-
කරුව[14] ඔබේ යොවුන් වියේදීම සිහි
කරන්න.[15] එසේ නොකළොත් ජීවිත-
යේ දුෂ්කර දවස් පැමිණි පසු,[16] “මට
ජීවිතයෙන් කිසි සතුටක් ලැබෙන්-
නේ නැහැ”[17] කියා ඔබ පවසනු ඇත.
**2** ඒ නිසා ඉර, හඳ හා තාරකා
අඳුරු වීමට කලින්ද[1] අහස අඳු-
රෙන් වැසී ගොස් නොනැවතීම වැසි
ඇද හැළීමට කලින්ද ඔහුව සිහි
කරන්න. **3** මන්ද ඒ කාලයේදී නිව-
සේ[2] මුරකරුවෝ වෙවුලති. ශක්ති-
මත් පුරුෂයෝ කෙළින් සිටගන්න
බැරි තරමටම දුර්වල වෙති.[3] අඹ-
රන ස්ත්‍රීන්ගේ[4] ගණන අඩු වී ඇති
නිසා වැඩ නවතිනු ඇත. ජනේල-
යෙන්[5] එබිකම් කරන කාන්තාවන්ගේ
පෙනීමද දුර්වල වෙයි. **4** මාවතට
පිවිසෙන දොරවල් වැසෙන අතර[6]
ඇඹරුම් ගලේ ශබ්දයද හීන වී යයි.[7]
ඒ කාලයේදී යමෙක් කුරුල්ලෙකු-
ගේ හඬට පවා අවදි වෙයි. ගායි-
කාවන්ගේ හඬ නොඇසෙන තරම්ය.[8]
**5** උස් තැන් දකින විටත් මාර්-
ගයේ ගමන් කරන විටත් මහත්
බියක් දැනෙනු ඇත. ආමන්ඩ්
ගසේ මල් පිපෙන අතර[9] තණකොළ
පෙත්තා ගාටමින් ඇවිදිනු ඇත.
කෑම රුචිය පවා නැති වන්නේය.*
මන්ද මිනිසා තම විශ්‍රාම ස්ථානයට#
ගමන් කරන්නේය.[10] විලාප කියන්-
නෝද මහ දිගේ ඇවිදගෙන යති.[11]
**6** රිදී ලණුව දෙකට කැඩෙන්නත් රන්
බඳුන පොඩි වෙන්නත්[12] දිය උල්පත
ළඟ ඇති පැන් කළය බිඳෙන්නත්
ළිඳේ බොලොක්කය කැඩෙන්නත්
කලින් ඔබේ දෙවිව සිහි කරන්න.
**7** මන්ද පොළොවෙන් ගන්නා ලද
දූවිල්ල නැවත පොළොවටම එකතු
වන්නේය.[13] ජීව බලය[14] එය දුන් සැබෑ
දෙවි[15] වෙතටම හැරී යන්නේය.[16]

**8** උපදේශකයාගේ නිගමනය මෙ-
යයි.[17] “සියල්ල නිෂ්ඵලය! කිසිම දෙ-
යකින් ප්‍රයෝජනයක් නැත.”[18]

**11 පරි.**
1 යෝබ් 10:11 ගීතා 139:13 ගීතා 139:15 යෙරෙ 1:5
2 යෝබ් 11:7 යෝබ් 26:14 ගීතා 40:5 දේශ 8:17 රෝම 11:33
3 දේශ 9:10 හොෂෙ 10:12 යොහ 9:4 2කොරි 9:6 කොලො 3:23
4 හිතෝ 27:1 යාකො 4:14
5 යෝබ් 33:28 හිතෝ 29:13 දේශ 7:11
6 දේශ 5:18 දේශ 8:15
7 උත් 48:10 දේශ 12:2 යොහ 21:18
8 දේශ 2:11 දේශ 4:8
9 ද්වි 16:11 ගීතා 5:11
10 යෝබ් 31:7
11 දේශ 3:17 දේශ 12:14 රෝම 2:6 රෝම 14:12 2කොරි 5:10
12 යෝබ් 13:26 ගීතා 25:7
13 දේශ 12:8 2තිමෝ 2:22

**12 පරි.**
14 උත් 1:1 උත් 1:27
15 ගීතා 71:17 ගීතා 110:3 ගීතා 148:12 ලූක් 2:49 2තිමෝ 3:15
16 ගීතා 90:10
17 2සාමු 19:35

**2 තීරුව**
1 උත් 27:1 1සාමු 4:15
2 යෝබ් 4:19 මතෙ 12:44 2කොරි 5:1 2පේත 1:13
3 2සාමු 21:15 ගීතා 22:15 ගීතා 90:9 ගීතා 102:23
4 යෝබ් 31:10 යෙසා 47:2 මතෙ 24:41
5 උත් 48:10 යෙසා 59:10 මතෙ 9:29
6 යෝබ් 41:14
7 ගීතා 58:6
8 2සාමු 19:35

9 යෝබ් 15:10; හිතෝ 16:31; 10 යෝබ් 17:13; යෝබ් 30:23; ගීතා 49:14; දේශ 9:10; 11 උත් 50:10; මාක් 5:38; 12 විනි 9:53; 13 උත් 3:19; යෝබ් 34:15; ගීතා 146:4; දේශ 3:20; 14 යෝබ් 34:14; ගීතා 104:29; දේශ 3:21; 15 1කොරි 8:4; 16 උත් 2:7; යෝබ් 27:3; යෙසා 42:5; සෙක 12:1; 17 1රාජ 8:1; 18 දේශ 1:2; දේශ 1:14.

**දේශ 11:5*** මුල් භාෂාවේ, දෙවිගේ බලය නූපන් දරුවෙකුගේ ඇටකටු තුළ ක්‍රියාත්මක වන ආකාරය ගැන සඳහන් වේ.

**දේශ 12:5*** මූ.අ., “කේප ගෙඩිවලින් පලක් නැත.” කෑම රුචිය වැඩි කිරීමට කන කුඩා ගෙඩි වර්ගයකි. **5#** මුල් භාෂාවේ, ‘බොහෝ කල් විශ්‍රාම ගන්නා ස්ථානය’ යන අදහස ඇතුළත්ය.

**9** උපදේශකයා ප්‍රඥාව වැඩි දියුණු
කරගෙන[1] තමන් ඉගෙනගත් දේ ජන-
යාට නිතරම කියා දුන්නේය.[2] ඊට
අමතරව, ඔහු සෑම කාරණයක් ගැනම
හොඳින් සොයා බලා ගැඹුරින් කල්-
පනා කර බැලුවේය.[3] ඔහු එසේ කළේ
හිතෝපදේශයන් ගණනාවක් පිළි-
යෙල කිරීමේ අරමුණින්ය.[4] **10** උප-
දේශකයා ප්‍රිය වදන්[5] සෙවීමටත් සත්‍ය
වචන නිසි ලෙස ලියා තැබීමටත්
උත්සාහ කළේය.[6]

**11** ප්‍රඥාවන්තයන්ගේ වචන කෙවි-
ටක් හා සමානය.[7] එඬේරෙකුගෙන්[8]
ලැබෙන එම වදන් එකතු කර තබා-
ගන්නා අය හොඳට සවි කළ ඇණ
මෙනි.[9] **12** මාගේ පුත්‍රය, මා දැන්
පවසන දේ සිතට ගන්න. මේ වදන්ව-
ලට අමතරව ලියන ලද දේ ගැන මා
දෙන අනතුරු ඇඟවීම මෙයයි. පොත්
පත් ලිවීමෙහි කෙළවරක් නැත. ඒවා
අධ්‍යයනය කිරීමට දරන උත්සාහයද
ඉතා වෙහෙසකරය.[1]

**13** සියල්ල සලකා බැලූ පසු මගේ
අවසන් නිගමනය මෙයයි. සැබෑ
දෙවිට ගරුබිය දක්වමින්[2] ඔහුගේ
ආඥා පිළිපදින්න.[3] මිනිසාගේ යුතු-
කම එයයි. **14** මන්ද සැබෑ දෙවි
මිනිසාගේ සියලු ක්‍රියා ගැනත් සියලු
රහස් කාරණා ගැනත් සොයා බලා
ඒවා යහපත්ද නැද්ද කියා විනිශ්චය
කරනු ඇත.[4]

**12 පරි.**
**1** 1රාජා 3:12
1රාජා 10:23
**2** 1රාජා 10:3
1රාජා 10:8
**3** හිතෝ 25:2
ලූක් 1:3
**4** 1රාජා 4:32
හිතෝ 1:1
**5** හිතෝ 15:23
හිතෝ 16:21
හිතෝ 16:24
හිතෝ 25:11
**6** ලූක් 1:4
යොහ 17:17
**7** ක්‍රියා 2:37
2කොරි 10:4
තීත 2:4
හෙබ්‍රෙ 4:12
**8** ගීතා 23:1
ගීතා 80:1
1පේතෘ 5:4
**9** ගීතා 112:8
1කොරි 15:58
එෆී 6:14

**2 තීරුව** **1** දේශ 1:18; ක්‍රියා 19:19; කොලො 2:8; **2** ද්වි 10:12; යෝබ් 28:28; ගීතා 111:10; හිතෝ 1:7; හිතෝ 8:13; හිතෝ 9:10; **3** ද්වි 6:2; ගීතා 119:35; 1පේතෘ 2:17; 1යොහ 5:3; **4** ගීතා 62:12; දේශ 11:9; මතෙ 12:36; ලූක් 12:2; ක්‍රියා 17:31; 1කොරි 4:5; 2කොරි 5:10; 1තිමෝ 5:24.

# සලමොන්ගේ ගීතිකාව

**1** ගීතිකා අතරින් අලංකාරවත්ම
ගීතිකාව මෙයයි.[1] මෙය ලියනු
ලැබුවේ සලමොන් රජු විසින්ය.[2]
**2** “ඔබ ඇවිත් මාව සිපගන්න.[3] ඔබේ
ආදරය වයින්වලටත් වඩා අගනේය.[4]
**3** ඔබේ ඇඟ ගැල්වූ තෛලය සුගන්-
ධවත්ය.[5] ඔබේ නාමය මට සුව-
යක් ගෙන දෙයි.[6] එය හිස මත වත්
කරන තෙල් මෙනි. ළඳුන් ඔබට ආද-
රය කරන්නේ ඒ නිසාය. **4** රජ මාව
ඔහුගේ මන්දිරයට ගෙනැවිත් ඇත.[7]
අනේ, ඇවිත් මාව මෙතැනින් රැගෙන
යන්න.[8] අපි පලා යමු. අපි දෙදෙනා
එකට ප්‍රීති වෙමු. ඔබට මා කෙරෙහි
ඇති ආදරය ගැන කතා කරමු. ඔබේ
ආදරය මට වයින්වලටත් වඩා අග-
නේය.[9] ළඳුන් ඔබට ආදරය කිරීම
පුදුමයක්ද![10]

**5** “යෙරුසලමේ ළඳුනේ,[11] මම
කේදාර්හි කූඩාරම්[12] මෙන් කළු වුණත්
සලමොන් රජුගේ කූඩාරම[1] මෙන් ප්‍රිය-
කරුය. **6** හිරු රශ්මිය වැදී මගේ
සම කළු වී ඇති හෙයින් මාව හෙළා
නොදකින්න. මගේම සහෝදරයෝ මා
සමඟ උරණ වී මිදිවතු බලාගැනීමට
මට අණ කළෝය. එහෙයින් මගේ මිදි-
වත්ත[2] බලාගැනීමට මට කාලයක්
නොලැබුණේය.

**7** “මාගේ ආදරය දිනාගත් පෙම්-
වත,[3] ඔබ බැටළුවන්ව ගෙන යන්නේ
කොතැනටද කියා මට කියන්න.[4]
දහවලේ උන් වැතිර සිටින්නේ කො-
තැනද කියා මට කියන්න. එවිට සො-
වින් නැවෙන ළඳක් මෙන් බැටළු
රැළවල් අතරේ ඔබව සොයමින් ඒ මේ
අත යෑමට මට සිදු වන්නේ නැත.”

**8** “තරුණියන් අතරේ රුවැත්තිය,[5]
ඔහු සිටින තැන ඔබ නොදන්නේ

**1 පරි.**
**1** නික් 15:1
ද්වි 31:19
විනි 5:1
2සාමු 22:1
ගීතා 18:පෙර
යෙසා 5:1
එළි 15:3
**2** 1රාජා 4:32
**3** සල 8:1
**4** සල 4:10
**5** හිතෝ 27:9
දේශ 9:8
සල 5:5
ලූක් 23:56
**6** දේශ 7:1
**7** 1රාජා 7:1
**8** යොහ 6:44
**9** යොහ 15:13
**10** මතෙ 10:37
**11** ගීතා 45:9
**12** ගීතා 120:5
එස 27:21

**2 තීරුව**
**1** නික් 36:14
**2** සල 8:12
**3** 1සාමු 18:20
යෙසා 5:1

**4** සල 6:3; යොහ 10:11; එළි 7:17; **5** ගීතා 45:9; එෆී 5:27.

නම් බැටළුවන් ගිය මහ දිගේ ගොස්
එඬේරුන්ගේ කූඩාරම් අසල ඔබේ එළු
පැටවුන්ට තණ කවන්න.”
**9** “මාගේ සොඳුරිය,[1] ඔබ පාරා-
වෝගේ රථවල බැඳ සිටින අශ්ව
ධේනුවක් මෙන් ශෝභමානය.[2]
**10** කඩා හැළෙන කෙස් කලඹ ඔබේ
දෙකොපුල් හැඩ කරයි. ඔබ පැළඳි
මුතු මාලය ඔබේ ගෙල සරසවයි.[3]
**11** හිසේ පැළඳීමට රන් පළඳනා-
වක්ද[4] රිදී ආභරණද ඔබට සාදා දෙන්-
නම්.”
**12** “මා රජු සමඟ හිඳගෙන සිටි-
යත් මගේ සුවඳ විලවුන්වල[5] සුවඳ
විහිදී ගියේ[6] මගේ පෙම්වතා වෙත-
ටය. **13** මගේ පෙම්වතා මුළු රාත්‍රි-
යේම මගේ ළයට[7] තුරුලු වී සිටිනු
ඇත. ඔහු මට සුවඳ ලාටු[8] පිරුණු
බඳුනක් මෙනි. **14** මගේ පෙම්-
වතා ඒන්-ගෙදී ප්‍රදේශයේ[9] මිදිවතුවල
වැවෙන මනරම් පඳුරක්* මෙනි.”[10]
**15** “මාගේ පෙම්වතිය,[11] ඔබ
මොන තරම් ප්‍රියකරුද! ඔබ කොත-
රම් රූමත් ළඳක්ද! ඔබේ දෙනුවන්
පරෙවියෙකුගේ දෙනෙත් මෙන් කාන්-
තිමත්ය.”[12]
**16** “මාගේ හද දිනාගත් පෙම්-
වත, ඔබත් මොන තරම් කඩව-
සම්ද![13] කොතරම් ප්‍රසන්නද! අපේ
යහන[14] තණතිල්ලකි. **17** අපේ
මැඳුරේ වහල දේවදාර ගස්ය.[15] එහි
පරාල ජුනිපර් ගස්ය.

**2** “මම ශාරොන්හි*[16] වැවෙන
මලකි.#[17] තැනිතලාවේ වැවෙන
ලිලී මලකි.”[18]
**2** “මගේ පෙම්වතිය යුවතියන්
අතරේ සිටින විට ඇය කටු ගස් අත-
රේ පිපී ලෙළ දෙන ලස්සන ලිලී
මලක් වැනිය.”[19]
**3** “මගේ පෙම්වතා තරුණයන්
අතරේ සිටින විට ඔහු වනයේ ගස්
අතුරින් කැපීපෙනෙන[20] ඇපල් ගසක්

සල **1:14*** මූ.අ., “හෙනා.” **2:1*** මූ.අ., “වෙර-ළාසන්න තැනිතලාවක්.” **1#** මූ.අ., “කුංකුම (සැෆ්රන්) මලකි.”

**1 පරි.**
1 සල 6:4
2 1රාජා 10:28
3 එස 16:11
4 2සාමු 1:24; යෙරෙ 4:30
5 සල 4:13
6 යොහ 12:3
7 සල 4:5
8 නික් 30:23; එස්ත 2:12; ගීතා 45:8; සල 4:6; සල 5:13; යොහ 19:39
9 යොෂු 15:62
10 සල 4:13
11 ගීතා 45:11; සල 4:7
12 උත් 29:17; සල 4:1; සල 5:2
13 ගීතා 45:2; සල 5:10; යොහ 1:14; හෙබ්‍රෙ 11:23
14 යෝබ් 7:13; ගීතා 132:3
15 ගීතා 92:12; යෙසා 9:10

**2 පරි.**
16 1ලේක 27:29
17 යෙසා 35:1
18 සල 2:16
19 සල 1:15; පිලි 2:15; 1පේතෘ 2:12
20 ගීතා 45:2; සල 5:9

**2 තීරුව**
1 සල 8:5
2 යෙසා 25:6
3 උත් 29:18; උත් 29:20
4 සල 6:4
5 1සාමු 30:12; 2සාමු 6:19
6 1සාමු 18:20; සල 5:8
7 සල 8:3
8 සල 8:4
9 2සාමු 2:18; 1ලේක 12:8; හිතෝ 5:19; සල 3:5
10 ද්වි 6:13
11 එළි 22:20
12 සල 5:2; යොහ 10:27; එළි 3:20
13 සල 2:17; සල 8:14
14 විනි 5:28
15 සල 4:7
16 ගීතා 45:10; යොහ 14:3
17 සෙක 10:1

වැනිය.[1] ඒ තුරු සෙවණේ පහස
ලබන්න මම බොහෝ සෙයින් ආශා
වෙමි. එහි පල මගේ මුවට මිහිරක්
ගෙන දෙයි. **4** ඔහු මාව භෝජන
සංග්‍රහයකට කැඳවාගෙන ගියේය.[2]
ඔහුට මා කෙරෙහි ඇති ආදරය[3]
එහිදී සියල්ලන්ට දිස් විය.[4] **5** වියළි
මිදිවලින් මාව ප්‍රාණවත් කරන්න.[5]
ඇපල්වලින් මාව ශක්තිමත් කරන්න.
මන්ද ආදරය නිසා මගේ සවිය
හීන වී ගොස් ඇත.[6] **6** ඔහුගේ වම-
තෙහි මම මගේ හිස හොවාගනිමි.
ඔහු තම දකුණතින් මාව වැලඳ-
ගනු ඇත.[7] **7** යෙරුසලමේ ළඳුනේ,
මා තුළ ආදර හැඟීම් අවදි කිරී-
මට වෑයම් නොකරන්න.[8] ඔබ එසේ
නොකරන බවට මුවදෙනුන්ගේ නාම-
යෙන්[9] දිවුරා මට පොරොන්දු වන්න.[10]
**8** “කඳු හෙල් අතරින් වේගයෙන්
පියමනිමින් පැමිණෙන[11] මගේ පෙම්-
වතාගේ කටහඬ මට ඇසෙන්නේය.[12]
**9** මගේ පෙම්වතා නාඹර මුවෙකු
මෙනි.[13] ඔහු අපේ නිවසේ බිත්-
තිය අසලට වී කවුළුවෙන් එබිකම්
කරන්නේය. කවුළුවේ පොලු අත-
රෙන් දෑස් අයා බලා සිටින්නේය.[14]
**10** මගේ පෙම්වතා මට කතා කර
මෙසේ කියන්නේය. ‘මාගේ පෙම්ව-
තිය, මාගේ රුවැත්තිය,[15] මා සමඟ
එන්න.[16] **11** ශීත කාලය අවසන් වී
ඇත. වැසි සමය[17] දැන් නිමා වී ඇත.
**12** දැන් උදා වී ඇත්තේ මල් පිදෙන
වසන්තයයි.[18] මිදිවැලේ දලු ලියලන
කාලයයි.[19] කොබෙයියන්ගේ සුමි-
හිරි නාදය[20] දසතින් ඇසෙන්නේය.
**13** මුල් වාරයේ හටගන්නා[21] පලව-
ලින් බර වී තිබෙන අත්තික්කා ගස්[22]
මොන තරම් අලංකාරද! ඒවායේ පල
දැන් හොඳින් ඉදී ඇත. මිදිවැලේ මල්
පිපී සුවඳ දසත විහිදුවන්නේය. මාගේ
පෙම්වතිය,[23] මාගේ රුවැත්තිය, මා
සමඟ එන්න. **14** ගිරි ශිඛරවල, කඳු

**18** සල 6:11; යෙසා 55:10; **19** යෙසා 18:5; යොහ 15:2; **20** යෙරෙ 8:7; **21** යෙසා 28:4; නාහු 3:12; **22** මීකා 4:4; **23** සල 1:15.

විවරවල, ලැගුම් ගෙන සිටින මාගේ
පරෙවිදෙන,[1] පිටතට එන්න. ඔබේ
ලස්සන බලන්නත්[2] ඔබේ සුමිහිරි හඬ
අසන්නත් මට ඉඩ දෙන්න. මන්ද ඔබ
ඉතා ශෝභමානය.' "[3]

**15** "ඉක්මනින් ගොස් අපේ මිදි-
වත්ත විනාශ කිරීමට පැමිණි හිව-
ලුන්ව[4] අල්ලාගන්න. මන්ද අපේ
මිදිවැල්වල මල් පිපී ඇත."[5]

**16** "මගේ පෙම්වතාගේ හිමිකා-
රිය මමයි. මගේ හිමිකාරයා ඔහුයි.[6]
ඔහු ලිලී මල් පිපුණු තණබිම්මක[7]
තම බැටළුවන්ට තණ කවන්නේය.[8]
**17** මාගේ පෙම්වත, මද සුළඟ හමා
අවසන් වීමට මත්තෙන්, සෙවණැලි
පහව යෑමට මත්තෙන් මා වෙ-
තට හැරී එන්න. අප දෙදෙනා අත-
රේ පිහිටි කඳුවල වෙසෙන තරුණ
මුවෙකු මෙන්ද[9] මුව පැටවෙකු මෙන්ද
මා වෙතට දිව එන්න.

# 3

"රාත්‍රියේ මගේ යහනේදී, මා හද
දිනාගත් තරුණයාව මම සෙවි-
වෙමි.[10] නමුත් මට ඔහුව සම්බ
නොවීය. **2** මා දැන් නැඟිට
නගරයට ගොස්[11] වීථි දිගේත් මං-
සන්ධිවලත්[12] මගේ පෙම්වතාව සො-
යන්නෙමි. මා ඔහුව සොයා ගියත්
මට ඔහුව සම්බ නොවීය. **3** 'මගේ
පෙම්වතාව ඔබ දුටුවාද' කියා නගර-
යේ සක්මන් කරමින් සිටි මුරකරු-
වන්ගෙන්[13] මම විමසුවෙමි. **4** එසේ
විමසා මම ඔවුන්ගෙන් සමුගෙන යන-
වාත් සමඟම මට මගේ පෙම්වතාව
හමු විය. මම ඔහුව වැළඳගත්තෙමි.
ඔහුගේ දෑත අල්ලාගෙන මාව බිහි
කළ තැනැත්තියගේ නිවසට* මම
ඔහුව ගෙන ගියෙමි. **5** යෙරුසල-
මේ ළඳුනේ, මා තුළ ආදර හැඟීම්
අවදි කිරීමට වෑයම් නොකරන්න.[14]
ඔබ එසේ නොකරන බවට මුවදෙනුන්-
ගේ නාමයෙන්[15] දිවුරා මට පොරොන්දු
වන්න."[16]

**6** "පාළුකරයේ සිට පැමිණෙන මේ
දේ කුමක්ද? එය ඈතට දිස් වන්නේ
දුම් කණු මෙනි. ඒවායින් සුවඳ ලාටු,
කට්ටකුමංජල්[1] සහ අනර්ඝ සුවඳ
ද්‍රව්‍යවල සුවඳ නික්මෙන්නේය."[2]

**7** "ඒ සලමොන් රජුගේ දෝලාවයි!
ඊශ්‍රායෙල්හි එඩිතර සෙබළු[3] හැට-
දෙනෙක් එය පිරිවරාගෙන සිටිති.
**8** ඔවුහු සියල්ලෝම කඩුවෙන් සටන්
කිරීමට දක්ෂයෝය. රාත්‍රියේදී උවදු-
රුවලට මුහුණ දීමට සිදු වන නිසා
ඔවුහු තම තමන්ගේ ඉණේ කඩුවක්
ගසාගෙන සිටිති."[4]

**9** "ඒ, ලෙබනොන්හි ලීවලින්[5]
නිමවා තිබෙන සලමොන් රජුගේ දෝ-
ලාවයි! **10** එහි කණු රිදීය. ආධාරක
කොටස් රන්ය. එහි ආසනය රත්-
නිල් පැහැගැන්වූ ලොම්වලින් නිමවා
තිබුණි. එහි ඇතුළත අලංකාරවත්
කළේ යෙරුසලමේ ළඳුන් විසින්ය."

**11** "සියොන්හි ළඳුනේ, එන්න.
සිය මව්[6] සෑදූ කිරුළ[7] දරා සිටින සල-
මොන් රජුව ඇවිත් බලන්න. ප්‍රීතිය
උතුරා ගිය ඔහුගේ මංගල දිනයේදී[8]
එය ඔහුට පළඳවන ලදි."

# 4

"මාගේ පෙම්වතිය, ඔබ මොන
තරම් ප්‍රියකරුද![9] ඔබ කොත-
රම් රූමත්ද! මුහුණු වැස්ම අත-
රින් එබිකම් කරන[10] ඔබේ දෙනුවන්
පරෙවියෙකුගේ දෙනෙත් මෙන් කාන්-
තිමත්ය.[11] ඔබේ වරලස ගිලියද් කඳු-
කරයෙන්[12] බැස එන එළු රංචුවක්
මෙනි.[13] **2** ඔබේ දත් දෙපළ ලොම්
කපා නහවන ලද සුදෝ සුදු බැට-
ළුදෙනුන් මෙනි.[14] එයින් එකක්වත්
අඩු නොවී සියල්ල පිළිවෙළට, ලස්-
සනට පිහිටා ඇත. **3** ඔබේ දෙ-
තොල් රත් පැහැති නූල් දෙපොටක්
මෙනි. ඔබේ වදන් මගේ හදවතට
සතුටක් ගෙන දෙන්නේය.[15] මුහුණු
වැස්ම අතරින් දිස් වන ඔබේ නළල්
දෙකෙළවර දෙළුම් පළු මෙන් දිලි-
සෙන්නේය.[16] **4** ඔබේ ගෙල[17] බල-
වතුන්ගේ පලිස්[18] දහසක් එල්ලා
තිබෙන, ගලින් නිමැවූ දාවිත් රජුගේ
කොත මෙනි.[19] **5** ඔබේ පියයුරු[20]
ලිලී මල් පිපී තිබෙන තණබිම්මක තණ

සල **3:4*** හෝ, "ඇතුල් කාමරයට."

**2 පරි.**
1 සල 5:2, යෙරෙ 48:28, මතෙ 10:16
2 ගීතා 45:11
3 සල 1:5, සල 6:10
4 විනි 15:4, විලා 5:18
5 සල 7:12
6 සල 6:3, සල 7:10
7 සල 2:1
8 සල 1:7
9 2සාමු 2:18, සල 2:9, සල 8:14

**3 පරි.**
10 1සාමු 18:20, සල 1:7
11 2ලේක 9:30
12 නෙහෙ 8:16, විලා 4:18
13 ගීතා 130:6, සල 5:7
14 සල 8:4
15 සල 2:7
16 1රාජා 22:16

**2 තීරුව**
1 යෙරෙ 2:2
2 නික් 30:23, නික් 30:34
3 1රාජා 9:22
4 නෙහෙ 4:22, දේශ 5:12
5 1රාජා 5:9
6 2සාමු 12:24, හිතෝ 4:3
7 හිතෝ 4:9
8 යෙසා 62:5

**4 පරි.**
9 ගීතා 45:11
10 උත් 24:65
11 සල 1:15
12 ගණන් 32:1, ද්වි 3:12
13 සල 6:5
14 සල 6:6
15 ගීතා 37:30, ගීතා 45:2
16 සල 6:7
17 සල 1:10
18 2සාමු 8:7, 2රාජා 11:10, එස 27:11
19 නෙහෙ 3:25, සල 7:4
20 සල 7:3

කමින් සිටින[1] නිවුන් මුව පැටවුන්
මෙනි.”
6 “මද සුළඟ හමා අවසන් වීමට
මත්තෙන්,[2] සෙවණැලි පහව යෑමට
මත්තෙන් මම සුවඳ ලාටු සහ කට්ට-
කුමංජල් සුවඳින් පිරුණු කන්දට යන්-
නෙමි.”[3]
7 “මාගේ පෙම්වතිය, ඔබ නිකැ-
ළැල්,[4] රූමත් ළඳකි.[5] 8 මාගේ
මනාලිය,[6] ලෙබනොන් සිට මා සමඟ
එන්න.[7] අමානා, සෙනීර්[8] සහ
හෙර්මොන් කඳු මුදුනේ[9] සිට පැමි-
ණෙන්න. සිංහයන් ලගින ගුහාවලි-
නුත් දිවියන් වෙසෙන කඳුවලිනුත්
බැස එන්න. 9 මාගේ සොහොයු-
රිය,[10] මාගේ මනාලිය,[11] ඔබේ එක
බැල්මකින් මගේ හද සලිත විය.[12]
ඔබේ ගෙල පැළඳි මාලය දුටු පම-
ණින් මගේ හද ගැස්ම වැඩි විය.
10 මාගේ සොහොයුරිය, මාගේ මනා-
ලිය, ඔබේ ආදරයට සම කළ හැකි
තවත් දෙයක් නැති තරම්ය![13] ඔබේ
ආදරය වයින්වලටත් වඩා අගනේය.
ඔබේ ඇඟ ගැල්වූ තෛලයේ සුවඳ
මෙලොවේ ඇති සෑම සුවඳක්ම පර-
දවන්නේය.[14] 11 මාගේ මනාලිය,
ඔබ තෙපලන වදන් මීවදයකින් වෑස්-
සෙන මීපැණි මෙන්ය.[15] ඔබේ දිව-
ගේ ඇත්තේ කිරි සහ මීපැණිය.[16]
ඔබ පැළඳි වස්ත්‍රවල සුවඳ, ලෙබ-
නොන්හි සුවඳ මෙන්ය.[17] 12 මාගේ
සොහොයුරිය, මාගේ මනාලිය, ඔබ
වැටකින් වට කළ උයනකි.[18] මට
පමණක් විවෘත වූ දිය උල්පතකි.
13 ඔබේ සම හොඳම දෙළුම්වලින්ද[19]
මනරම් පඳුරු* සහ සුවඳැති ගස්-
වලින්ද[20] පිරුණු උයනක් බඳුය.
14 සුවඳැති ගස්,[21] කුරුඳු,[22] කට්ට-
කුමංජල්, සුවඳ ලාටු, අගිල්[23] සහ
ආකර්ෂණීය සුවඳින්[24] පිරුණු උය-
නකට සමානය. 15 එය උයනක
තිබෙන දිය උල්පතක් මෙනි. නැවුම්
ජලයෙන් පිරුණු ළිඳක් මෙනි.[25] ලෙ-
බනොන් සිට ගලා බසින දිය දහ-

සල 4:13* මූ.අ., “හෙනා.”

4 පරි.
1 සල 2:16
2 සල 2:17
3 දේශ 2:5
4 2කොරි 11:2
එෆී 1:4
2පේතෘ 3:14
5 සල 4:1
6 යොහ 3:29
එළි 21:9
7 ද්වි 3:25
8 ද්වි 3:9
9 ගීතා 133:3
10 සල 5:1
11 ගීතා 45:14
එළි 19:7
12 හිතෝ 5:19
13 සල 1:2
සල 7:12
14 එස්ත 2:12
සල 1:3
සල 1:12
15 හිතෝ 16:24
16 හිතෝ 24:13
සල 5:1
17 ගීතා 45:8
18 සල 6:2
19 සල 7:13
20 සල 1:12
21 නික් 30:23
සල 2:1
යෙසා 43:24
යොහ 12:3
22 හිතෝ 7:17
එළි 18:13
23 ගණන් 24:6
ගීතා 45:8
24 නික් 30:34
එස 27:22
2කොරි 2:14
25 උත් 26:19

2 තීරුව
1 යෙරෙ 18:14
2 දේශ 1:6
3 සල 5:1

5 පරි.
4 සල 4:9
1තිමෝ 5:2
5 සල 4:8
යොහ 3:29
එළි 21:9
6 සල 4:16
සල 6:2
7 සල 4:14
8 ද්වි 26:9
සල 4:11
යෙසා 7:15
9 සල 1:2
සල 1:4
10 සල 3:1
11 එළි 3:20
12 2කොරි 7:1
2කොරි 11:2
එෆී 5:27
2පේතෘ 3:14
එළි 14:4

රාවක් මෙනි.[1] 16 උතුරු සුළඟ,
අවදි වන්න. දකුණු සුළඟ,[2] හමා
එන්න. ඇවිත් මගේ උයන සිපගෙන[3]
එහි සුවඳ දසත විහිදුවන්න.”
“මාගේ පෙම්වත, ඔබට හිමි උය-
නට ඇවිත් එහි පල භුක්ති විඳින්න!”

**5** “මාගේ සොහොයුරිය,[4] මාගේ
මනාලිය,[5] මම මගේ උයනට
ඇවිත්[6] එහි ඇති සුවඳ ලාටුද[7] සුවඳ
පැළෑටිද නෙළාගතිමි. මීපැණිත්
සමඟ මීවදය කෑවෙමි.[8] කිරිත් සමඟ
වයින් බීවෙමි.”
“පෙම්වතුනි, කා බී ප්‍රේමයෙන් මත්
වන්න.”[9]
2 “මම යහනේ සැතපී සිටියෙමි.
නමුත් මගේ හදවත අවදි වී තිබිණ.[10]
මගේ පෙම්වතා දොරට තට්ටු කරන
හඬ මට ඇසිණ.”[11]
“මාගේ සොහොයුරිය, මාගේ නිකැ-
ළැල්* පෙම්වතිය,[12] මාගේ පරෙ-
විදෙන, දොර අරින්න.[13] මගේ හිස
පින්නෙන් තෙමී ඇත. මගේ කෙස්ව-
ලින් පිනි බිඳු බේරෙන්නේය.”[14]
3 “‘මා ගලවා තැබූ සළුව නැවත
ඇඳගන්නද? සේදූ පාද මා නැවත
කිලිටි කරගන්නද?’ 4 මගේ පෙම්-
වතා දොර සිදුරෙන් අත දැමූ විට
මගේ හදවත[15] වේගයෙන් ගැහෙන්-
නට විය. 5 මගේ පෙම්වතාට දොර
විවර කිරීමට මම යහනෙන් නැඟිට-
ටෙමි. සුවඳ ලාටු තෛලය මාගේ
දෑත් දිගේ ගලා ගොස් දොරගුල මත
පතිත විය. 6 මම මගේ පෙම්වතාට
දොර විවර කළෙමි. එහෙත් ඔහු මා
අබියස සිටියේ නැත. ඔහු කතා කළ
විට මගේ හද ගැස්ම මොහොතකට
නතර විය. මම ඔහුව සොයා ගියෙමි.
නමුත් මට ඔහුව සම්බ නොවීය.[16]
මම ඔහුට හඬගැසීමි. නමුත් ඔහු මට
පිළිතුරු නොදුන්නේය. 7 නගරයේ

13 ලූක් 12:36; 14 ලූක් 2:8; 15 උත් 43:30; 1රාජා 3:26; 16 සල 3:1.

සල 5:2* මෙයින් පෙනුමේ කිසිම අඩුවක් නොමැති බවද අදහස් කළා විය හැකියි.

සක්මන් කරමින් සිටි මුරකරුවෝ[1]
මාව දැක මට තුවාල වන තුරු තැළු-
වෝය. පවුරේ රැකවල්ලු[2] මගේ සළුව
පැහැරගත්තෝය.
8 “යෙරුසලමේ ළඳුනේ,[3] ඔබට
මගේ පෙම්වතාව හමු වුණොත්[4] ආද-
රය නිසා මගේ සවිය හීන වී ඇති බව
ඔහුට කියන්න.[5] ඔබ නොවරදවාම
ඔහුට එසේ පවසන බවට මට දිවුරා
පොරොන්දු වන්න.”[6]
9 “තරුණියන් අතරේ රුවැත්-
තිය,[7] එවැනි පොරොන්දුවක් අපෙන්
ගන්න තරම්[8] අනික් තරුණයන්ට
වඩා ඔබේ පෙම්වතාගේ ඇති විශේ-
ෂත්වය කුමක්ද?”[9]
10 “මගේ පෙම්වතාට ඇත්තේ
දිදුලන සමකි. ඔහු ඉතා කඩව-
සම්ය. දසදහසක් අතරේ සිටියත්
ඔහු කැපීපෙනෙන්නේය.[10] 11 ඔහු-
ගේ හිස පවිත්‍ර රන් මෙන් අගනේය.
කැරලිගැසුණු ඔහුගේ හිසකෙස් ඉඳි-
පොකුරු මෙනි. ඒවා කපුටු පිහාටු
මෙන් කලුය. 12 ඔහුගේ දෙනෙත්
දිය පාරක් අසල සිටින පරෙවියන්
මෙනි. උන් කිරෙන් නාමින් සිටිති.
13 ඔහුගේ දෙකොපුල්, සුවඳ මල්
පිරුණු පාත්තියකි.[11] සුවඳ පැළව-
ලින් පිරුණු කොතකි. ඔහුගේ දෙ-
තොල් ලිලී මල් මෙනි. ඒවායින්
සුවඳ තෛලයක්* වෑස්සෙන්නේය.[12]
14 ඔහුගේ ඇඟිලි රන්වන්ය. ක්‍රිසො-
ලයිට් ගල් ඔබ්බවා තිබෙන්නා සේ
ඒවා දිලිසෙන්නේය. ඔහුගේ උදරය
නීල මාණික්‍ය ඇල්ලූ, ඇත්දළවලින්
නිමැවූ පලිහක් මෙනි. 15 ඔහුගේ
දෙපා, පවිත්‍ර රනින් සෑදූ පැතිලි ආධා-
රක මත සිටෙවූ කිරිගරුඬ කණු
දෙකක් මෙනි. ඔහුගේ පෙනුම ලෙබ-
නොන් මෙන් තේජාන්විතය. වෙන
කිසිවකට සම කළ නොහැකි දේවදාර
ගසක් මෙනි.[13] 16 ඔහුගේ මුව ඉතා
මිහිරිය. ඔහු සෑම අතින්ම ආකර්ෂණී-
යය.[14] යෙරුසලමේ ළඳුනේ, මගේ හද
දිනූ පෙම්වතා ඔහුය.”

සල **5:13*** මූ.අ., “සුවඳ ලාටු.”

**5 පරි.**
1 සල 3:3
2 යෙසා 62:6
3 සල 3:10
4 ගීතා 45:2
5 සල 2:5
6 ද්වි 6:13
ද්වි 10:20
7 සල 6:1
8 සල 5:8
9 ගීතා 45:7
10 ලූක් 2:52
11 සල 6:2
12 සල 1:13
13 ගීතා 92:12
14 ගීතා 45:2
සල 2:3

**2 තීරුව**

**6 පරි.**
1 ගීතා 45:11
සල 1:8
සල 5:9
එළි 19:8
2 සල 5:13
3 සල 5:1
4 සල 1:7
සල 2:16
5 සල 7:10
2කොරි 11:2
6 යෙසා 40:11
යොහ 10:14
හෙබ්‍රෙ 13:20
7 සල 1:9
8 1රාජා 14:17
9 ගීතා 48:2
එළි 21:10
10 ගීතා 20:5
11 සල 6:10
12 සල 1:15
සල 4:9
සල 7:4
13 සල 4:1
14 සල 4:2
15 සල 4:3
16 1රාජා 11:1
17 සල 2:14
18 සල 5:2
19 ගීතා 45:9
යෙසා 49:23
20 2සාමු 23:4
යෙසා 58:8
21 සල 8:5
එළි 21:10
22 යෙසා 24:23
23 මතෙ 13:43
24 සල 6:4

**6** “තරුණියන් අතරේ රුවැත්තිය,[1]
ඔබේ පෙම්වතා ගියේ කොතැන-
ටද? ඔහු ගිය තැන අපිට කියන්න.
ඔහුව සොයා යෑමට අපිත් ඔබ සමඟ
එන්නම්.”
2 “මගේ පෙම්වතා සුවඳ මල්ව-
ලින් පිරුණු[2] ඔහුගේ උයනට ගොස්
ඇත.[3] බැටළුවන්ට තණ කවන්-
නත්[4] ලිලී මල් නෙළන්නත් ඔහු එහි
ගියේය. 3 මගේ පෙම්වතාගේ හිමි-
කාරිය මමයි. මගේ හිමිකාරයා ඔහුයි.[5]
ඔහු ලිලී මල් පිපුණු තණබිමක තම
බැටළුවන්ට තණ කවන්නේය.”[6]
4 “මාගේ පෙම්වතිය,[7] ඔබ තිර්ෂා
නගරය මෙන් ඉතා ප්‍රියකරුය.[8] යෙ-
රුසලම මෙන් මනහරය.[9] කොඩි
අතැති[10] යුධ සේනාවක් මෙන් ඔබ
තේජාන්විතය.[11] 5 ඔබේ දෙනෙත්
මා සසල කරවන්නේය. එහෙයින්
මා දෙස නොබලන්න.[12] ඔබේ වර-
ලස ගිලියද් කඳුකරයෙන් බැස එන
එළු රංචුවක් මෙනි.[13] 6 ඔබේ ලස්-
සන දත් දෙපළ නැහැවූ සුදෝ සුදු
බැටළුදෙනුන් මෙනි. එයින් එකක්වත්
අඩු නොවී[14] සියල්ල පිළිවෙළට, ලස්-
සනට පිහිටා ඇත. 7 මුහුණු වැස්ම
අතරින් දිස් වන ඔබේ නළල් දෙ-
කෙළවර දෙළුම් පළු මෙන් දිලි-
සෙන්නේය.[15] 8 මට බිසෝවරු
හැටදෙනෙක් සිටියත් උපභාර්යා-
වෝ අසූදෙනෙක් සිටියත් කන්‍යා-
වෝ අනන්ත අප්‍රමාණ සංඛ්‍යාවක්
සිටියත්[16] 9 මගේ හද දිනූ පරෙවි-
දෙනත්[17] නිකැළැල්* ළඳත්[18] ඔබය.
ඔබේ මව්ගේ ප්‍රියතම දැරියත් ඇගේ
ආඩම්බරයත් ඔබය. තරුණියෝද
බිසෝවරුද උපභාර්යාවෝද ඔබව
දැක ඔබේ ගුණ වර්ණනා කළෝය.[19]
10 ‘අරුණාලෝකය මෙන්[20] තේජ-
වත්ව පැමිණෙන මේ යුවතිය කවුද?[21]
ඇය පුර සඳ මෙන් ශෝභමානය.[22]
හිරු කිරණ මෙන් දීප්තිමත්ය.[23]
කොඩි අතැති යුධ සේනාවක් මෙන්
උදාරය.’ ”[24]

සල **6:9*** සල 5:2හි පාදසටහන බලන්න.

11 “මම කජු ගස්* උයනට
ගියෙමි.[1] නිම්නයේ ඇති ගස්වල මල්
පොහොට්ටු පිපී ඇද්දැයි බැලීමටත්[2]
මිදිවැල දලු ලා, දෙළුම් ගස්වල මල්
පිදී ඇද්දැයි බැලීමටත්[3] මම ගියෙමි.
12 මම උයනේ සැරිසරමින් සිටියදී
නොදැනුවත්වම රජුගේ පිරිවර වෙ-
නට* ආවෙමි.”
13 “ෂූලම්මීය ළඳේ, හැරී එන්න.
අපිට ඔබව හොඳින් දැක බලා ගැනී-
මට[4] හැරී එන්න.”
“මා ෂූලම්මීය ළඳකි. මා දෙස
බැලීමට තරම් මගේ ඇති විශේෂත්-
වය කුමක්ද?”[5]
“ඔබ, මහනායිම්හි* පවත්වන රංග-
නය තරම් අතිසුන්දරය.”

7 “නොසැලෙන ළඳේ,[6] වහන්
පැළඳ සිටින ඔබේ දෙපා
කොතරම් අලංකාරද![7] ඔබේ උකුළ
දක්ෂ ශිල්පියෙකු විසින් සැදූ ආභර-
ණයක් මෙන් ඉතා ලස්සනය.[8]
2 ඔබේ නාභිය වටකුරු කුඩා බඳු-
නක් මෙනි. එය සැමවිටම වයින්-
වලින්[9] පිරී තිබේවා! ඔබේ උදරය
ලිලී මල්වලින් වට වූ[10] තිරිඟු මෙනි.
3 ඔබේ පියයුරු නිවුන් මුව පැටවුන්
මෙනි.[11] 4 ඔබේ ගෙල[12] ඇත්දළින්
නිමැවූ කුලුනක් මෙනි. ඔබේ දෙනු-
වන්[13] හෙෂ්බොන් නගරයේ[14] බාත්-
රබ්බිම් දොරටුව අසල පිහිටි පොකුණු
මෙනි. ඔබේ නාසය දමස්කය දෙසට
මුහුණ ලා තිබෙන ලෙබනොන්හි ටැඹ
මෙනි. 5 ඔබේ හිස කර්මෙල් කන්ද
මෙනි.[15] ඔබේ කෙස් කලඹ[16] රත්-
නිල් පැහැගැන්වූ ලොම් මෙනි.[17] කඩා
හැළෙන ඔබේ වරලසට රජුගේ සිත
ඇදී යන්නේය.[18] 6 මාගේ සොඳුරිය,
ඔබ මොන තරම් ප්‍රියකරුද! මොන
තරම් රුමත්ද! මිහිපිට ඇති කිසිවක්
ඔබට සම කළ නොහැකිය.[19] 7 ඔබ
අලංකාර ඉඳි ගසක් මෙනි.[20] ඔබේ පිය-
යුරු[1] ඉඳිපොකුරු මෙනි. 8 ‘මම ඉඳි
ගසට නැඟ එහි පල නෙළන්නෙමි’[2]
යයි කීවෙමි. ඔබේ පියයුරු මිදිපොකුරු
මෙන්ද ඔබ හෙළන සුසුම් ඇපල් සුවඳ
මෙන්ද වේවා! 9 ඔබේ මුව අගනා
වයින් මෙන් සුමුදු වේවා!”[3] “ඒ සුමුදු
වයින්[4] මගේ පෙම්වතාගේ දෙතොල
තෙමාලන පිණිස ගලා යන්නේය.
10 “මගේ හිමිකාරයා මගේ පෙම්-
වතාය.[5] ඔහුගේ එකම පැතුම මමය.[6]
11 මාගේ පෙම්වත, එන්න. අපි කෙ-
තට යමු.[7] මනරම් පඳුරු* අතරේ[8]
කල් ගෙවමු. 12 අපි හිමිදිරි උදෑ-
සන නැඟිට, මිදිවතු බලන්න යමු.
මිදිවැල් දලු ලා[9] මල් පිපී[10] ඇද්-
දැයි බැලීමටත් දෙළුම් ගස්වල මල්
පිදී[11] ඇද්දැයි බැලීමටත් අපි එහි
යමු. එහිදී මම ආදර වදන් පවසමින්
මගේ ආදරය ඔබට පෙන්වන්නෙමි.[12]
13 මැන්ඩ්‍රේක්* පලවලින්[13] හමන
සුවඳ දසත විහිදෙන්නේය. මාගේ
පෙම්වත, කලින් රැස් කළ පලතුරුව-
ලින්ද අලුත් පලතුරුවලින්ද සෑම වර්-
ගයකම හොඳම පලතුරු[14] මම ඔබ
වෙනුවෙන් අපේ දොරටු අසල රැස්
කරගෙන සිටින්නෙමි.

8 “අනේ, මගේම මව්ගෙන් කිරි බී
වැඩුණු[15] මගේම සහෝදරයෙකු-
ගේ හැඩරුව ඔබට තිබුණා නම්![16]
එවිට මා ඔබව සිපගත්තත්[17] කිසි-
වෙක් මට අවමන් නොකරනු ඇත.
2 මට හොඳ නරක කියා දුන් මගේම
මව්ගේ නිවසටද බියක් සැකක් නැතුව
මට ඔබව රැගෙන යා හැක.[18] එහිදී
නැවුම් දෙළුම් පානයක්ද අනර්ඝ
වයින්ද[19] මම ඔබට පිළිගන්වන්නෙමි.
3 ඔබේ වමතෙහි මගේ හිස හොවා-
ගන්නෙමි. ඔබේ දකුණතින් ඔබ මාව
වැළඳගනු ඇත.[20]
4 “යෙරුසලමේ ළඳුනේ, මා තුළ
ආදර හැඟීම් අවදි කිරීමට වෑයම්
නොකරන්න.[21] ඔබ එසේ නොකරන
බවට මට දිවුරා පොරොන්දු වන්න.”

6 පරි.
1 දේශ 2:5
සල 6:2
2 ද්වි 8:7
3 සල 7:12
4 සල 1:10
5 සල 1:6
එළි 19:7

7 පරි.
6 ගීතා 110:3
7 යෙසා 52:7
රෝම 10:15
8 ගීතා 45:13
9 හිතෝ 9:2
සල 8:2
10 සල 2:2
11 සල 4:5
12 සල 1:10
සල 4:4
13 සල 4:1
14 ගණන් 21:25
යොෂු 21:39
15 යෙසා 35:2
16 සල 6:5
17 එස්ත 8:15
සල 3:10
18 සල 1:4
19 සල 4:7
20 ගීතා 92:12

2 තීරුව
1 සල 7:3
සල 8:10
2 මතෙ 5:28
1තිමෝ 5:2
3 ගීතා 104:15
4 හිතෝ 23:31
5 සල 2:16
සල 6:3
6 සල 2:14
7 සල 8:1
8 සල 1:14
සල 4:13
9 සල 6:11
10 සල 2:13
11 ද්වි 8:8
සල 6:11
12 සල 1:4
සල 4:10
13 උත් 30:14
14 සල 4:16

8 පරි.
15 ගලා 4:26
16 සල 1:6
17 ගීතා 2:12
සල 1:2
18 සල 3:4
19 හිතෝ 9:2
සල 5:1
20 සල 2:6
21 සල 2:7
සල 3:5

සල 6:11* මෙහි සඳහන් වන්නේ, ඊශ්‍රායෙල් දේශයේ හැදුණු කජුවලට සමාන පල දරන ගස් වර්ගයක් ගැනය. 12* හෝ, “මාගේ සෙනඟගේ අශ්ව රථ වෙතට.” 13* හෝ, “කඳවුරු දෙකේ රංගනය.”

සල 7:11* මූ.අ., “හෙනා.” 13* මැන්ඩ්‍රේක් යනු ඖෂධීය පැළෑටියකි.

**5** "තම පෙම්වතාට තුරුලු වී[1]
පාළුකරයේ සිට පැමිණෙන[2] මේ යුව-
තිය කවුද?"[3]

"ඇපල් ගස් සෙවණේ සැතපී සිටි
ඔබව මම අවදි කළෙමි. ඔබේ මව
මහත් වේදනාවකින් ඔබව බිහි කළේ
එහිදීය.[4]

**6** "මා හැර වෙන කිසිවෙකුට ඔබේ
හදවත විවර නොකරන්න.[5] මා හැර
වෙන කිසිවෙකුව ඔබේ දෑතින් වැලඳ
නොගන්න. ප්‍රේමය මරණය තරම්ම
ප්‍රබලය.[6] පෙම්වතුන් එකිනෙකාගෙන්
අයැද සිටින විශ්වාසන්තකම,[7] මිය
ගිය අයව ඉල්ලා සිටින මිනී වළ
තරම්ම බලවත්ය. ප්‍රේමය ගිනිදලු
මෙන් ඇවිළෙන්නේය. ඒ ගින්න යෙ-
හෝවා දෙවිගෙන්ය.[8] **7** මහා ජල
කඳකින්වත් ප්‍රේමය නමැති ඒ ගින්න
නිවාලිය නොහැක.[9] මහා ගංවතුර-
කින්වත් එය නිවාලිය නොහැක.[10]
මිනිසෙකු තමා සතු වස්තු සම්භාර-
යම දුන්නත් ඔහුට ප්‍රේමය මිල දී ගත
නොහැක."

**8** "අපේ පුංචි නැඟණියගේ[11] පිය-
යුරු තවමත් වැඩී නැත. අනාග-
තයේදී ඇයට විවාහ යෝජනාවක්
ලැබුණොත් අපි ඇය වෙනුවෙන්
කුමක් කරමුද?"

**9** "ඇය පවුරක් මෙන් ස්ථිරව සිටි-
යොත්[1] අපි ඇයව රිදීවලින් සරසා
තවත් අලංකාර කරන්නෙමු. නමුත්
ඇය නිතර ඇරෙන වැහෙන දොරක්
මෙන් අස්ථිරව සිටියොත්[2] අපි දේව-
දාර ලී ගසා ඒ දොර වසා දමමු."

**10** "මම පවුරක් බව ඔප්පු කළෙමි.
මගේ පියයුරු බලකොටු මෙනි.[3]
එහෙයින් මගේ සිත නිශ්චල බව මගේ
පෙම්වතා වටහාගනු ඇත.

**11** "බාල්-හාමොන්හි සලමොන්
රජුට අයිති මිදිවත්තක් තිබුණේය.[4]
ඔහු ඒ මිදිවත්ත රැකවලුන්ට භාර දුන්-
නේය.[5] එයින් ලැබෙන පලදාව වෙනු-
වෙන් ඔවුන් එක් එක් කෙනා රජුට රිදී
ෂෙකෙල් දහසක් ගෙව්වෝය.

**12** "සලමොන් රජුනි, මගේ මිදි-
වත්ත සැමදා මා සතුවම තිබෙනු
ඇත. නමුත් ඔබට අයිති දහස ඔබ-
ටම ලැබේවා! මිදිවත්තෙහි රැකව-
ලුන්ට අයිති දෙසීය ඔවුන්ට ලැබේවා!"

**13** "උයනේ සක්මන් කරමින්
සිටින තැනැත්තිය,[6] මිතුරෝ ඔබේ
හඬ ඇසෙන තුරු බලා සිටිති.
ඔබේ සුමිහිරි කටහඬ මට අසන්න
ලැබේවා!"[7]

**14** "මාගේ පෙම්වත, සුවඳ පැළෑ-
ටිවලින් පිරුණු කඳුවල වෙසෙන
තරුණ මුවෙකු මෙන්ද මුව පැටවෙකු
මෙන්ද මා වෙතට දිව එන්න."[8]

**8 පරි.**
1 සල 7:11
2 ගීතා 45:10
3 සල 6:13; සල 7:10
4 උත් 3:16
5 හග් 2:23
6 යොහ 15:13; රෝම 16:4; එෆී 5:25; එළි 12:11
7 නික් 20:5; යොෂු 24:19
8 ගීතා 89:8; ගීතා 118:17; යෙසා 12:2; 1යොහ 4:8
9 1කොරි 13:8; 1කොරි 13:13
10 රෝම 8:39
11 සල 1:6

**2 තීරුව**
1 2කොරි 7:1; ගලා 5:23; 1පේතෘ 3:2
2 හිතෝ 7:11; හොෂෙ 2:7; 1කොරි 7:9
3 1කොරි 7:34; කොලො 3:5; 1පේතෘ 2:12
4 දේශ 2:4; සල 7:12
5 ලූක් 20:9
6 සල 1:6; සල 6:11
7 සල 2:14
8 සල 2:17

# යෙසායා

**1** ආමොෂ්ගේ පුත් යෙසායාට[1] යූදා
සෙනඟ ගැනත් යෙරුසලමේ
වැසියන් ගැනත් ලැබුණු දර්ශනය[2]
මෙයයි. ඔහුට මෙම දර්ශනය ලැබු-
ණේ යූදාහි රජවරුන්[3] වන උසියා,[4]
යෝතම්,[5] ආහස්[6] සහ හෙසකියාගේ[7]
පාලන සමයේදීය.

**2** ස්වර්ගයෙන් පොළොවෙන් ජීවත්
වන සියල්ලෙනි, දැන් යෙහෝවා දෙවි
පවසන මේ දේට සවන් දෙන්න.[1] "මා
හදා වඩා ගත්[2] මගේම පුත්‍රයෝ මට
ද්‍රෝහි වුණෝය.[3] **3** ගවයෙක් උගේ
අයිතිකරුවද බූරුවෙක් උගේ ගාලද
හොඳින් හඳුනාගෙන සිටින්නේය.
එහෙත් ඊශ්‍රායෙල්වරු මාව හඳුනා-
ගෙන නැත.[4] මගේම සෙනඟ දැනුම්

**1 පරි.**
1 2ලේක 32:32
2 ගණන් 12:6; යෝබ් 33:15; ආමො 3:7
3 මතෙ 1:9
4 2ලේක 26:22; යෙසා 6:1
5 2ලේක 27:1
6 2ලේක 28:1
7 2රාජා 19:2; 2ලේක 29:1; 2ලේක 32:20

**2 තීරුව** **1** ගීතා 50:4; **2** ද්වි 1:31; එස 16:13; **3** ද්වි 4:25; යෙසා 30:9; එස 20:8; **4** හොෂෙ 4:6.

තේරුම් ඇතුව කටයුතු කරන්නේ
නැත.”[1]
4 මොවුහු පව්කාර ජාතියකි.[2] බර-
පතළ වැරදි කරන දුෂ්ට සෙනඟකි.[3]
යෙහෝවා දෙවිව අත්හැර[4] ගිය
මේ සෙනඟ දරුණු ලෙස හැසිරෙන
පුත්‍රයෝය.[5] ඔවුහු ඊශ්‍රායෙල්හි ශුද්ධ
තැනැත්තාණන්ට පිටු පාමින්[6] ඔහුට
අගෞරව කළෝය.[7] ඒ නිසා ඔවුන්ට
අත් වන්නේ දුක පමණි! 5 ඔබ
දිගින් දිගටම දෙවිට විරුද්ධව කැරලි-
ගසමින්[8] තව තවත් දඬුවම් විඳින්-
නේ[9] මන්ද? ඔබේ හිස තුවාල වී
ඇත. සිත හොඳටම දුර්වල වී ඇත.[10]
6 ඔබේ හිස මුදුනේ සිට පතුල දක්-
වාම කැපුම්ද තැළුම්ද දරුණු තුවාලද
පෙනෙන්න තිබේ.[11] ඔබේ තුවාලව-
ලින් සැරව ගලන්නේය. ඒවා පිරිසිදු
කර බෙහෙත් තෙල් දමා බැඳ නැත.[12]
7 ඔබේ දේශය පාළුවට ගොස්[13] ඔබේ
නගර ගිනිබත් වී ඇත.[14] විදේශික-
යෝ[15] ඔබේ ඇස් පනාපිටම ඔබේ දේ-
ශය නැති නාස්ති කළෝය.[16] එය
සතුරු ආක්‍රමණයට හසු වී පාළුවට
ගිය දේශයක් මෙනි.[17] 8 සියොන්[18]
දියණියව අත්හැර ගොස් ඇත. ඇය
මිදිවත්තක මඩුවක් මෙන්ද පිපිඤ්ඤා
වත්තක පැල්පතක් මෙන්ද වැටලූ
නගරයක් මෙන්ද පාළුවට ගොස්
ඇත.[19] 9 ස්වර්ගයේ සේනාවල අධි-
පති වන යෙහෝවා දෙවිගේ කරුණාව
නිසා අපෙන් අතළොස්සක් ඉතුරු වී
සිටිති.[20] එසේ නොවුණා නම් අප සො-
දොම් සහ ගොමෝරාව මෙන් නැත්ත-
ටම නැති වී යනු ඇත.[21]
10 සොදොම්හි[22] කෲර පාලක-
යෙනි,[23] යෙහෝවා දෙවිගේ වදන්වලට
ඇහුම්කන් දෙන්න.[24] ගොමෝරාවේ
ජනයෙනි, අපේ දෙවිගේ නීතියට
සවන් යොමු කරන්න. 11 යෙහෝවා
දෙවි ඔබට මෙසේ පවසයි. “ඔබ
මට අනන්ත අප්‍රමාණ පුදපූජා ඔප්පු
කළත් මට ඒවායින් කිසි ප්‍රයෝජ-
නයක් තිබේද? දවන ලද[25] බැටළු[26]
පූජා හා තර කළ සතුන්ගේ තෙල[27]
දැකීම පවා මට දැන් පිළිකුලකි.
වසු පැටවුන්ගේද බැටළු පැටවුන්ගේද
එළුවන්ගේද[1] ලෙයින්[2] මම කිසි සතු-
ටක් නොලබමි.[3] 12 මගේ මාලිගා-
වට පැමිණ මා ඉදිරියේ පෙනී සිටින්න
කියා ඔබට පැවසුවේ කවුද?[4] ඔබ මෙ-
තැනට පැමිණ මගේ මාලිගාවේ මළුව
පාගා දමන්නේ මන්ද?[5] 13 ඔබ මා
ඉදිරියට තවත් ධාන්‍ය පූජා රැගෙන
නොඑන්න.[6] ඒවායින් මට කිසි පලක්
නැත. ඔබ මා ඉදිරියේ ඔප්පු කරන
සුවඳ දුම්ද මට පිළිකුලක්ය.[7] ඔබ
නව සඳ පායන දවස්ද[8] සබත් දවස්ද[9]
සමරන්නහුය. විශේෂ රැස්වීම්ද පවත්-
වන්නහුය.[10] එහෙත් ඔබ මන්තර ගුරු-
කම්වලින්[11] ඒ ශුද්ධ දවස් දූෂ්‍ය කර
තිබේ. ඒ නිසා මම ඒ සියල්ල හෙළාද-
කින්නෙමි. 14 ඔබ නව සඳ පායන
දවස් හා වෙනත් උත්සව සමරන
විට එය මට මහත් පිළිකුලකි.[12] එය
මා පිට පැටවූ විශාල බරක් මෙනි.[13]
එය උසුලාගෙන යෑමත් මට දැන්
වෙහෙසකරය.[14] 15 ඔබ අත් දෙක
ඔසවා[15] මට කන්නලව් කළත් මම
අහක බලාගන්නෙමි.[16] ඔබ මොන
තරම් යාච්ඤා කළත්[17] මම සවන්
නොදෙන්නෙමි.[18] මන්ද ඔබේ දෑත්ව-
ලින් ඔබ බොහෝ ලේ වගුරුවා
ඇත.[19] 16 දැන් නාගෙන[20] පවිත්‍ර
වෙන්න.[21] තවත් මා ඉදිරියේ දුෂ්ට-
කම් නොකරන්න.[22] නපුරු දේ අත්-
හරින්න.[23] 17 යහපත් දේ කරන්න
ඉගෙනගන්න.[24] යුක්තිය කුමක්ද කියා
සොයා බලන්න.[25] පීඩා කරන්නාට
තරවටු කර ඔහුව හරි මඟට ගන්න.[26]
පියා නැති දරුවාට සාධාරණ විනිශ්ච-
යක් දෙන්න.[27] වැන්දඹුව වෙනුවෙන්

**1 පරි.**
**1** ද්වි 32:28 ගීතා 32:9 රෝම 1:28
**2** දානි 9:11 ක්‍රියා 7:51
**3** ගණන් 32:14 විනි 2:19
**4** ද්වි 31:16 හෙබ්‍රෙ 3:10
**5** මීකා 7:2
**6** ගීතා 58:3 යෙරෙ 2:5 යෙරෙ 15:6 රෝම 8:7
**7** ද්වි 32:19 යෙරෙ 7:19 යෙරෙ 50:29 1කොරි 10:22
**8** යෙරෙ 9:3
**9** යෙරෙ 2:30 යෙරෙ 5:3
**10** නෙහෙ 9:34 දානි 9:8
**11** ගීතා 38:3
**12** ලූක් 10:34
**13** ද්වි 28:63 යෙරෙ 44:2
**14** යෙසා 34:9 යෙරෙ 2:15
**15** 2රාජා 10:32
**16** ද්වි 28:33
**17** 2රාජා 18:11 විලා 5:2
**18** යෙසා 8:18 සෙක 9:9
**19** 2රාජා 18:14 යෙසා 5:2 යෙසා 8:8 යෙරෙ 4:17 ලූක් 19:43
**20** 2රාජා 25:11 විලා 3:22 රෝම 9:27
**21** උත් 19:24 ද්වි 29:23 ආමො 4:11 රෝම 9:29
**22** උත් 13:13 ද්වි 32:32 යෙසා 3:9 විලා 4:6 යූද් 7
**23** යෙසා 3:6
**24** ආමො 3:1
**25** හොෂෙ 6:6
**26** නික් 29:38 ගණන් 29:39 මීකා 6:7
**27** ලෙවී 3:16

**2 තීරුව**
**1** ලෙවී 16:5
**2** ලෙවී 4:18 ලෙවී 17:11
**3** 1සාමු 15:22 ගීතා 40:6 ගීතා 51:16 හිතෝ 15:8 මතෙ 9:13
**4** නික් 23:17 ද්වි 16:16

**5** දේශ 5:1; මලා 1:8; **6** මලා 2:12; ලූක් 11:42; **7** හිතෝ 15:9; හිතෝ 21:27; එස 8:11; **8** ගණන් 28:11; **9** නික් 31:13; **10** ලෙවී 23:2; ගීතා 81:3; **11** ලෙවී 19:26; 1සාමු 15:23; **12** ආමො 5:21; ආමො 8:5; **13** යෙසා 43:24; **14** මලා 2:17; **15** 1රාජා 8:22; එස්රා 9:5; **16** හිතෝ 15:29; **17** මතෙ 6:7; **18** හිතෝ 28:9; යෙසා 59:2; විලා 3:44; මීකා 3:4; **19** යෙසා 59:3; යෙරෙ 7:9; මීකා 3:2; **20** ගීතා 26:6; යෙරෙ 4:14; ක්‍රියා 22:16; එළි 7:14; **21** 1කොරි 5:8; 2කොරි 7:1; **22** යෙසා 55:7; එස 18:30; 1පේත්‍ර 2:1; **23** ගීතා 34:14; 1පේත්‍ර 3:11; **24** ආමො 5:15; මීකා 6:8; **25** ගීතා 82:3; ගීතා 112:5; **26** හිතෝ 31:9; **27** යෙරෙ 22:3.

කතා කර ඇයට යුක්තිය ඉටු කර
දෙන්න.”[1]
**18** යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ පවසයි. “ජනයෙනි, එන්න. අපි
සාකච්ඡා කර මෙම ප්‍රශ්නය නිරාකර-
ණය කරගනිමු.[2] නැවතත් මා සමඟ
හොඳ සබඳතාවක් ඇති කරගන්නා
ආකාරය මම ඔබට කියා දෙන්නෙමි.
ඔබේ පාප රතට රතේ තිබුණත් මම
ඒවා හිම මෙන් සුදු වෙන්න සලස්වන්-
නෙමි.[3] තද රතු සායම් යෙදූ වස්ත්‍ර-
යක් මෙන් තිබුණත් ඒවා සුදු ලොම්
මෙන් වීමට සලස්වන්නෙමි. **19** ඔබ
මා පවසන දේට සවන් දී කීකරු වෙ-
නවා නම් දේශයේ හොඳම පලදාව
ඔබ භුක්ති විඳිනු ඇත.[4] **20** නමුත්
මට සවන් නොදී දිගටම මුරණ්ඩු ලෙස
කටයුතු කළොත්[5] ඔබ කඩුවෙන්
මැරුම් කන්නහුය. මේ සියල්ල පව-
සන්නේ යෙහෝවා දෙවි වන මමය.”[6]
**21** අනේ, විශ්වාසවන්තව සිටි
නුවරට[7] කුමක් සිදු වී ඇද්ද? ඇය
දැන් ගණිකාවක් මෙනි![8] යුක්තියත්[9]
ධර්මිෂ්ඨකමත් රකිමින් සිටි නුවර[10]
දැන් මිනී මරුවන්ගේ වාසස්ථානයක්
බවට පත් වී ඇත.[11] **22** ඔබේ රිදී
දැන් කිසි වටිනාකමක් නැති බොර
මෙනි.[12] ඔබේ බීරවලට වතුර දමා
බාල කර ඇත.[13] **23** ඔබේ පාල-
කයෝ මුරණ්ඩුය. ඔවුන් මිතුරු-
කම් පවත්වන්නේ සොරුන් සමඟය.[14]
ඔවුහු අල්ලසට ආශා කරති.[15] තෑග්-
ගක්[16] ලබාගැනීමට බොහෝ සෙ-
යින් වෙහෙසෙති. පියා නැති දරුවාට
සාධාරණ විනිශ්චයක් නොදෙන ඔවුහු
වැන්දඹුවගේ පැමිණිල්ලවත් ගණනා-
කට ගන්නේ නැත.[17]
**24** එබැවින් සැබෑ ස්වාමීන්ද ස්වර්-
ගයේ සේනාවල අධිපතිද ඊශ්‍රායෙල්හි
බලවත් තැනැත්තාද[18] වන යෙහෝවා
දෙවි මෙසේ පවසයි. “මගේ සතුරන්ට[19]
මම නිසි දඬුවම්[20] ලබා දෙන්නෙමි.
මට විරුද්ධව නැඟී සිටින සියල්ලන්ව
මම නැත්තටම නැති කරන්නෙමි.
**25** බොර වැනි වූ ඔබේ සියලු අපවිත්‍ර-
කම් මම මගේම අතින් ඉවත් කරන්-
නෙමි.* ඔබේ සියලු කිලුටුකම්ද ඉවත්
කර[1] ඔබව පිරිසිදු තත්වයකට ගෙ-
නෙන්නෙමි. **26** මම පෙර මෙන් ඔබ
වෙනුවෙන් ධර්මිෂ්ඨ විනිශ්චයකරු-
වන්ව හා උපදේශකයන්ව පත් කරන්-
නෙමි.[2] එවිට ඔබව ධර්මිෂ්ඨ නුවරක්
ලෙසත් විශ්වාසවන්ත නගරයක්[3] ලෙ-
සත් හඳුන්වනු ඇත. **27** සාධාරණ
විනිශ්චයකින් සියොන්ව මුදවාගනු
ඇත.[4] මා ධර්මිෂ්ඨකමින් පියවර
ගන්නා නිසා ඇගේ සෙනඟ නැව-
තත් ඇය වෙතට පැමිණෙන්නෝය.[5]
**28** නමුත් ඒ කාලයේදී යෙහෝවා
දෙවි වන මාව අත්හැර යන කැර-
ලිකාරයන්ටත් පව්කාරයන්ටත් අත්
වන්නේ විනාශයයි.[6] ඒ සියල්-
ලෝම එක්ව විනාශ වී යන්නෝය.[7]
**29** ඔවුහු තමන් ආශා කළ විශාල
ගස් නිසා ලැජ්ජාවට පත් වෙති.[8]
තමන් තෝරාගත් උයන් නිසා නින්-
දාවට පත් වනු ඇත.[9] **30** ඔවුහු
මැලවී ඇති විශාල ගසක් මෙන්ද[10]
වතුර නොමැතිව වියළී ගිය උයනක්
මෙන්ද වන්නෝය. **31** බලවන්තයා
හණ කෙන්දක් මෙන්ද[11] ඔහුගේ ක්‍රියා
ගිනිපුපුරක් මෙන්ද වන්නේය. ඔහුත්
ඔහුගේ ක්‍රියාත් ගින්නෙන් දැවී විනාශ
වී යනු ඇත. ඒ ගින්න නිවා දමන්න
කිසිවෙකු සමත් නොවෙයි.”[12]

**2** ආමොෂ්ගේ පුත් යෙසායාට යූදා
සහ යෙරුසලම ගැන ලැබුණු දර්-
ශනය මෙයයි.[13] **2** අවසාන කාල-
යේදී,[14] යෙහෝවා දෙවිගේ ගෘහය[15]
පිහිටි කන්ද නොසෙල්වන ලෙස
ස්ථිරව පිහිටුවනු ලබන්නේය. එය

**1 පරි.**
1 ද්වි 10:18
2 යෙරෙ 2:5, හොෂෙ 14:1, මීකා 6:2, යාකො 4:8
3 ගීතා 51:7, යෙසා 44:22, විලා 4:7, මීකා 7:19
4 ද්වි 28:2, යෝවෙ 2:26
5 1සාමු 12:25, හිතෝ 29:1, ආනි 9:5, හොෂෙ 13:16
6 ලෙවී 26:33, ද්වි 28:15, ද්වි 30:19, 1සාමු 15:29, 2පේතෘ 3:9
7 ගීතා 48:2, සෙක 8:3
8 යෙරෙ 2:20, යෙරෙ 3:6, එස 16:22
9 2සාමු 8:15, 1රාජා 3:28
10 2ලේක 19:9, 2ලේක 19:10
11 මීකා 3:3, ලූක් 13:34, ක්‍රියා 7:52
12 විලා 4:1, එස 22:18
13 හොෂෙ 4:18
14 යෙසා 3:14, මීකා 3:9
15 නික් 23:8, හිතෝ 17:23
16 හිතෝ 21:14, දේශ 7:7
17 නික් 22:22, යෙරෙ 5:28, මලා 3:5, ලූක් 18:3
18 යෙසා 60:16
19 ද්වි 32:43, යෙසා 59:18, එස 5:13
20 එස 25:14, හොෂෙ 8:3, රෝම 12:19

**2 තීරුව**
1 යෙරෙ 6:29, යෙරෙ 9:7, මලා 3:3
2 ගණන් 12:3, 1සාමු 12:3, යෙසා 32:1, එස 34:23
3 යෙසා 62:1, සෙක 8:8
4 ද්වි 24:18, යෙරෙ 31:11
5 1කොරි 1:30, 2කොරි 5:21

**6** ගීතා 1:6; ගීතා 37:38; ගීතා 104:35; හිතෝ 29:1; එස 20:38; 2පේතෘ 3:7; **7** 1සාමු 12:25; 1රාජා 9:6; 2තෙස 1:9; **8** යෙරෙ 2:20; යෙරෙ 3:6; එස 6:13; හොෂෙ 4:13; රෝම 6:21; **9** යෙසා 65:3; යෙසා 66:17; **10** යෙරෙ 17:6; එස 17:9; මතෙ 21:19; **11** එස 32:21; **12** ගීතා 73:27; යෙසා 34:10; එස 20:47; මලා 4:1; **2 පරි.** **13** යෙසා 1:1; මීකා 1:1; හබ 1:1; **14** යෙරෙ 23:20; යෙරෙ 30:24; එස 38:16; ආනි 12:9; ක්‍රියා 2:17; 2තිමෝ 3:1; එළි 12:12; **15** ක්‍රියා 10:35; 1පේතෘ 2:5.

යෙසා **1:25*** මුල් භාෂාවේ, සබන් දමා බොර ඉවත් කරනවා යන අදහස ඇතුළත්ය. ඒ සඳහා සෝඩියම් කාබනේට්වලින් සාදාගත් පිරිසිදු කරන ද්‍රව්‍යයක් භාවිත කෙරිණ.

සියලුම කඳුවලටත්[1] හෙල්වලටත්[2]
වඩා ඉහළින් පිහිටුවනු ලබන්නේය. ඒ
කාලයේදී සියලු ජාතීහු වැල නො-
කැඩී ඒ කන්ද වෙතට ඇදී එන්-
නෝය.[3] 3 එතැනට යන බොහෝ
ජනයා මෙසේ කියන්නෝය. “ජන-
යෙනි, එන්න.[4] අපි යෙහෝවා දෙවි-
ගේ කන්දට නඟිමු. යාකොබ්ගේ
දෙවිගේ ගෘහයට යමු. එහිදී දෙවි
අපට ඔහුගේ මාර්ග ගැන උගන්වයි.
අපිද ඔහුගේ මඟ පෙන්වීමට අනුව
ජීවත් වෙමු.”[5] මන්ද දෙවිගේ නීතිය
සියොන් කන්දේ සිට ප්‍රකාශ කරනු
ලැබේ. යෙරුසලමේ සිට යෙහෝවා
දෙවි තම වචනය දැනුම් දෙන්නේය.[6]
4 ඔහු බොහෝ ජාතීන් අතරේ තමා-
ගේ තීන්දු ප්‍රකාශ කරන්නේය.[7] ඔහු
බොහෝ ජනයන්ගේ[8] ගැටලු විසඳා
ඔවුන්ව නිවැරදි කරන්නේය.[9] ජාතීහු
තමුන්ගේ කඩුවලින් නගුල්ද හෙල්-
ලවලින් දැකැතිද සාදාගන්නෝය.[10]
ඔවුහු තවදුරටත් එකිනෙකාට විරුද්-
ධව කඩු ඔසවන්නේවත් යුද්ධයට
පුහුණු වන්නේවත් නැත.[11]

5 යාකොබ්ගේ ගෘහයට අයත් ජන-
යෙනි, එන්න. අපි යෙහෝවා දෙවි
දෙන ආලෝකයෙන් ගමන් කරමු.[12]

6 දෙවියනි, ඔබ ඔබේ සෙනඟ වන
යාකොබ්ගෙන් පැවතෙන්නන්ව අත්-
හැරියෙහිය.[13] මන්ද නැඟෙනහිර දෙ-
සින් ජීවත් වන ජාතීන් කරන දේවල්ම
දැන් ඔවුන්ගේ දේශයේ සෑම තැනකම
දක්නට තිබේ.[14] ඔවුහු පිලිස්තිවරුන්
මෙන් මන්ත්‍ර ගුරුකම්වල[15] නියැ-
ලෙති. වෙනත් දෙවිවරුන්ට නමස්-
කාර කරන අය ඔවුන්ගේ දේශය පුරාම
විසිරී සිටිති.[16] 7 ඔවුන්ගේ දේශය
රන් රිදීවලින්ද වටිනා වස්තුවලින්ද
පිරී තිබේ.[17] අශ්වයන්ගෙන්ද අශ්ව
රථවලින්ද ඔවුන්ට අඩුවක් නැත.[18]
8 දේශයේ අස්සක් මුල්ලක් නැර කිසි
කමකට නැති දේවතා රූප තිබේ.[19]
ඔවුන් නමස්කාර කරන්නේ ඔවුන්-
ගේම අතින් සෑදූ ඒ රූපවලටය.[20]
9 මෙසේ, ඔවුහු තමන්වම නින්දාවට
පත් කරගනිති. ඔවුන්ව පහත් කරනු
ලබන්නේය. ඔවුන්ට කිසිසේත් සමාව
දෙන්න ඔබට නොහැකියි.[1]

10 යෙහෝවා දෙවිගේ බලමහි-
මය නිසාත් ඔහු උදහස් වී සිටින
නිසාත් ගල් ගුහාවලට ගොස් බිංගෙ-
වල් සාදා ඒවාහි සැඟවී සිටින්න.[2]
11 එහෙත් උඩඟු අයව පහතට හෙ-
ළනු ලැබේ. අහංකාර අයව නින්දාවට
පත් කරනු ඇත.[3] ඒ දවසේදී ගෞරව-
යට පත් වන්නේ යෙහෝවා දෙවි පම-
ණයි.[4] 12 මන්ද එම දවස ස්වර්ගයේ
සේනාවල අධිපති වන යෙහෝවා දෙවි
තම විනිශ්චය ප්‍රකාශ කරන දවසය.[5]
තමන්වම උසස් කරගන්නා අයද අහං-
කාර අයද උස් පහත් භේදයකින් තො-
රව සියලුම තරාතිරම්වල ජනයාද ඒ
දවසට මුහුණ දිය යුතුයි.[6] 13 ලෙබ-
නොන්හි තේජවත් දේවදාර ගස්[7] හා
බාෂාන්හි[8] දැවැන්ත ගස් සියල්ලටවත්
14 උස් වූ කඳු හා හෙල් සියල්ලටවත්
ඒ දවසෙන් ගැලවී යා නොහැකිය.[9]
15 උසට ගොඩනැඟූ සියලුම මුරකො-
ටුද දැවැන්ත පවුරුද[10] 16 තර්ෂිෂ්
නැව්[11] ඇතුළු අනිකුත් විශාල නැව්ද ඒ
දවසට මුහුණ දිය යුතුයි. 17 ඒ දව-
සේදී උඩඟු වූ සියලුම මිනිසුන්ව පහත්
කරනු ලැබේ. අහංකාර වූ සියලුදෙ-
නාව නින්දාවට පත් කරනු ඇත.[12]
යෙහෝවා දෙවිට පමණක් ගෞරවයද
ප්‍රශංසාවද ලැබෙන්නේය.[13]

18 බොරු දෙවිවරුන්ගේ රූප
සියල්ලම දේශයෙන් තුරන් කරනු
ලබයි.[14] 19 යෙහෝවා දෙවි පැමි-
ණෙද්දී මුළු පොළොවම දෙදරුම්
කයි.[15] ඔහුගේ බලමහිමය[16] නිසාත්
ඔහුගේ උදහස නිසාත් ජනයා ගල්
ගුහාවලටත් බිංගෙවල්වලටත් දුව

**2 පරි.**

**1** දානි 2:35
සෙක 8:3
හෙබ්‍රෙ 12:22
එළි 21:10
**2** මීකා 4:1
**3** ගීතා 2:8
ගීතා 72:8
ගීතා 86:9
හග් 2:7
මලා 3:12
එළි 11:15
**4** යෙරෙ 31:6
සෙක 8:23
එළි 22:17
**5** ගීතා 25:8
යෙසා 54:13
මීකා 4:2
යොහ 7:16
ක්‍රියා 10:33
1තෙස 4:9
**6** ගීතා 110:2
යෙසා 51:4
රෝම 10:18
එළි 21:24
**7** 1සාමු 2:10
ගීතා 82:8
ගීතා 96:13
ගීතා 110:6
ක්‍රියා 17:31
**8** යෙසා 1:18
එෆී 2:1
කොලො 2:13
**9** හිතෝ 11:5
මතෙ 3:3
ලූක් 3:5
යොහ 1:23
2තිමෝ 3:16
හෙබ්‍රෙ 9:10
**10** ගීතා 46:9
හොෂෙ 2:18
සෙක 9:10
**11** ගීතා 72:7
යෙසා 60:18
මීකා 4:3
මතෙ 5:44
මතෙ 26:52
**12** ගීතා 89:15
යෙසා 60:19
1යොහ 1:7
එළි 21:23
**13** ද්වි 31:17
2ලේක 24:20
**14** එළි 17:5
**15** ලෙවී 19:31
ද්වි 18:10
ගීතා 106:35
**16** එස්රා 9:2
නෙහෙ 13:24
**17** 1රාජා 10:21
**18** ද්වි 17:16
1රාජා 4:26
**19** 2ලේක 28:2
2ලේක 33:7
යෙරෙ 2:28
**20** ද්වි 4:28
ගීතා 115:4
හොෂෙ 13:2
එළි 9:20

---

**2 තීරුව** **1** නික් 20:7; යොෂු 24:19; යෙරෙ 18:23; මාක් 3:29; **2** නික් 20:18; 1ලේක 29:11; ගීතා 119:120; **3** යෙරෙ 50:32; මලා 4:1; ලූක් 18:14; යාකො 4:6; 1පේතෘ 5:5; **4** යෙසා 24:23; මීකා 4:7; ශෙප 2:11; **5** යෙසා 13:6; යෙරෙ 46:10; එස 13:5; ආමො 5:18; 1තෙස 5:2; **6** යෙසා 66:16; යෙරෙ 25:31; **7** යෙසා 10:33; එස 31:3; සෙක 11:2; **8** ආමො 4:1; **9** ගීතා 110:5; **10** ශෙප 1:16; **11** 1රාජා 10:22; එස 27:25; **12** යෙසා 13:11; යෙරෙ 48:29; එස 28:5; **13** යෙසා 2:11; **14** යෙසා 27:9; එස 36:25; එස 37:23; හොෂෙ 14:8; සෙක 13:2; **15** ගීතා 7:6; මීකා 1:3; හෙබ්‍රෙ 12:26; 2පේතෘ 3:10; එළි 16:18; **16** ගීතා 76:7; යෙසා 2:10; ලූක් 23:30; 2තෙස 1:9; එළි 6:15.

ගොස් සැඟවෙන්න උත්සාහ කරති.
**20** ඒ දවසේදී, මිනිස්සු තමන් රන්
රිදීවලින් සාදාගත් කිසි කමකට
නැති දේවතා රූප මීයන් හා වවු-
ලන් සිටින ස්ථානවලට විසි කර
දමති.[1] **21** ඔවුහු යෙහෝවා දෙවිගේ
බලමහිමය[2] නිසාත් ඔහුගේ උදහස
නිසාත් භය වී ගල් ගුහා දෙසටත්
පර්වත දෙසටත් දුව ගොස් සැඟ-
වෙනු ඇත. මන්ද ඔහු පැමිණෙද්දී
මුළු පොළොවම දෙදරුම් කන්නේය.
**22** එබැවින් මිනිසා කෙරෙහි විශ්වා-
සය නොතබන්න. ක්ෂණයකින් හුස්ම
නික්ම වී යන[3] මිනිසා කෙරෙහි විශ්වා-
සය තැබීමෙන් පලක් තිබේද?[4]

**3** සැබෑ ස්වාමීන්ද[5] ස්වර්ගයේ සේ-
නාවල අධිපතිද වන යෙහෝවා
දෙවි, යෙරුසලමේ සහ යූදා දේශ-
යේ වැසියන්ගේ පැවැත්මට අවශ්‍ය වූ
සියල්ලද ඔවුන් විශ්වාසය තැබූ සියල්-
ලද ඉවත් කරන්නේය.[6] ඔවුන්ට ආහාර
පාන නොලැබෙන්නේය.[7] **2** ඔවුන්-
ගේ බලවන්තයන්ව, යුධ දක්ෂයන්ව,
විනිශ්චයකරුවන්ව, අනාගතවක්තෘ-
වරුන්ව,[8] මන්තර ගුරුකම් කරන
අයව හා වැඩිමහල්ලන්වද දෙවි නැති
කර දමන්නේය.[9] **3** හමුදාවේ නිල-
ධාරීන්වද*[10] උත්තමයන්වද උපදේ-
ශකවරුන්වද මායාකරුවන්වද දක්ෂ
මතුරන්නන්වද[11] දෙවි දේශයෙන්
ඉවත් කරන්නේය. **4** දෙවි දරුවන්ව
පාලකයන් ලෙස පත් කරන්නේය.
හිතුමතේට පාලනය කරන අය බල-
යට පත් වෙති.[12] **5** ජනයා එකිනෙ-
කාට පීඩා කරන්නෝය. එක් එක්
කෙනා තම තමාගේ අසල්වැසියාට
කුරිරුකම් කරන්නෝය.[13] දරුවෝ
වැඩිහිටියන්ට විරුද්ධවත්[14] සාමාන්‍ය
මිනිස්සු ගරු කළ යුතු අයට විරුද්-
ධවත් නැඟී සිට ඔවුන්ට අපහාස
කරති.[15] **6** ඒ කාලයේදී එක් එක්
කෙනා තම තමාගේ පවුලේ කෙ-
නෙකුට කතා කර මෙසේ කියනු
ඇත. "ඔබට අඳින්න එක වස්ත්‍රයක්-
වත් තියෙන නිසා ඔබ අපේ නායකයා[1]
වෙන්න. අසරණ තත්වයකට වැටී
සිටින මේ සෙනඟව රැකබලා ගන්න."
**7** එහෙත් එදිනම ඔහු ඒ ඉල්ලීම
ප්‍රතික්ෂේප කරමින් මෙසේ කියයි.
"මාව නායකයෙක් ලෙස පත් කරන්න
එපා. මගේ පවුලේ අයට කන්නවත්
අඳින්නවත් නැතුව මම කොහොමද
වෙනත් අයගේ ගැටලු විසඳන්නේ?"

**8** යෙරුසලමේ සහ යූදාහි වැසි-
යන් තමන් කරන කියන සෑම දෙ-
යකින්ම යෙහෝවා දෙවිව අසතුටට
පත් කර ඇත.[2] ඔවුහු තේජාන්-
විත තැනැත්තාණන්ට විරුද්ධව කැර-
ලිගැසූහ.[3] ඔවුන්ගේ වැටීමට හේතුව
එයයි.[4] **9** ඔවුන්ගේ මුහුණ බැලූ පම-
ණින්ම ඔවුන්ගේ දුෂ්ටකම පෙනෙයි.
ඔවුහු එළිපිටම වැරදි කරන්නෝය.[5]
ඔවුන්ගේ පාප සොදොම්හි ජනයාගේ
පාප තරම් දරුණුය.[6] ඔවුන්ට විඳින්න
සිදු වන්නේ මොන තරම් දුකක්ද!
ඔවුන්ගේ විනාශයට වග කිව යුත්තේ
ඔවුන්මය.[7]

**10** ධර්මිෂ්ඨයන්ට හොඳ අනාග-
තයක් ඇත.[8] මන්ද ඔවුහු තමුන්-
ගේ යහපත් හැසිරීමට අනුව ප්‍රතිඵල
ලබන්නෝය.[9] **11** නමුත් දුෂ්ටයාට
උරුම වන්නේ දුක පමණි. ඔහු කළ
නපුරුකම්වලට අනුව ඔහුට ප්‍රතිඵල
විඳින්න සිදු වෙයි.[10] **12** "මගේ සෙ-
නඟගෙන් වැඩ ගන්නා අය ඔවුන්ට
දරුණු ලෙස සලකති. දේශයේ පාල-
නය දැන් ස්ත්‍රීන්ගේ අතට පත් වී
ඇත.[11] මගේ ජනයෙනි, ඔබට මඟ
පෙන්වන්නෝ ඔබව මංමුළා කරති.[12]
ඔබ යා යුතු මඟ ඔබට නොපෙනී
ගොස් ඇත්තේ ඒ නිසාය."[13]

**13** යෙහෝවා දෙවි විනිශ්චය
කිරීමට පැමිණ අඩුවම නියම කරන්-
නේය.[14] **14** යෙහෝවා දෙවි තම සෙ-
නඟ අතරේ සිටින වැඩිමහල්ලන්ටද

---

**යෙසා 3:3*** මූ.අ., "පනස්දෙනෙකු භාරව සිටින ප්‍රධානීන්."

**2 පරි.**

**1** යෙසා 2:8
යෙසා 30:22
යෙසා 31:7
**2** 1ලේක 29:11
ගීතා 96:6
ගීතා 119:120
**3** උත් 2:7
යෝබ් 27:3
**4** යෝබ් 7:17
ගීතා 8:4

**3 පරි.**

**5** යෙසා 37:20
යෙසා 44:6
යෙරෙ 10:10
**6** 2රාජා 23:27
2ලේක 36:19
**7** ලෙවී 26:26
ද්වි 28:51
යෙරෙ 37:21
එස 4:16
**8** එස 13:9
**9** 2රාජා 24:14
ගීතා 74:9
විලා 5:12
**10** නික් 18:21
ද්වි 1:15
1සාමු 8:12
**11** ද්වි 18:10
ගීතා 58:5
යෙසා 8:19
**12** විනි 21:25
දේශ 10:16
**13** යෙසා 9:19
යෙරෙ 9:5
මීකා 3:3
මලා 3:5
**14** යෝබ් 30:1
**15** ලෙවී 19:32
2සාමු 16:5
හිතෝ 16:31
දේශ 10:7
මාක් 14:65

**2 තීරුව**

**1** යෙසා 1:10
යෙසා 22:3
යොහ 6:15
**2** ගීතා 73:8
එස 9:9
මලා 3:13
මතෙ 12:36
යූද් 15
**3** 2ලේක 33:6
හබ 1:13
මලා 2:2
1කොරි 10:22
**4** 2ලේක 28:5
2ලේක 28:18
2ලේක 33:11
යෙරෙ 26:18
මීකා 3:12
**5** ගීතා 73:6
හිතෝ 30:13
1තිමෝ 5:24
**6** උත් 18:20
යෙසා 1:10
යූද් 7
**7** විලා 3:64
හොෂෙ 13:9

---

**8** ගීතා 18:24; ගීතා 128:1; දේශ 8:12; ශෙප 2:3; රෝම 2:10; **9** ගීතා 128:2; ගලා 6:7; හෙබ්‍රෙ 6:10; **10** ගීතා 28:4; ගීතා 62:12; 2කොරි 5:10; 2තිමෝ 4:14; යාකො 2:13; **11** 2රාජා 11:1; නාහු 3:13; 1තිමෝ 2:12; **12** යෙසා 9:16; **13** යෙරෙ 5:31; හබ 1:4; මතෙ 15:14; මතෙ 23:15; **14** ගීතා 12:5; හිතෝ 22:23; හොෂෙ 4:1; මීකා 6:2.

පාලකයන්ටද විරුද්ධව තීන්දුව ප්‍රකාශ
කරන්නේ මෙලෙසය.[1]
“ඔබ මිදිවත්ත දවා දැමුවහුය.
ඔබ අසරණයන්ගෙන් සොරාගත් දේ
ඔබේ ගෙවල්වලට ගෙන ගියහුය.[2]
**15** ඔබ මගේ සෙනඟට මෙතරම් පීඩා
කරන්නේ මන්ද? ඇඹරුම් ගලේ දමා
අඹරන්නාක් මෙන් අසරණයන්ට හිරි-
හැර කරන්නේ මන්ද?”[3] එසේ පව-
සන්නේ ස්වර්ගයේ සේනාවල අධිපති
හා විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවිය.
**16** යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ පවසයි. “සියොන්හි දියණි-
යන්ගේ අහංකාරකම මොන තරම්ද!
අහක බලාගෙන ආඩම්බර ලීලාවෙන්
ගමන් කරන ඔවුන් ඇස් කරකව-
මින් ඒ මේ අත පැද්දෙමින් යන්නේ
පාද සළංවල හඬ නඟමිනි.[4] **17** යෙ-
හෝවා දෙවි වන මම සියොන්හි
දියණියන්ගේ හිස පුරාම තුවාල හට-
ගන්න සලස්වන්නෙමි.[5] යෙහෝවා
දෙවි වන මම ඔවුන්ගේ හිස මුඩු
කරන්නෙමි.[6] **18** ඒ දවසේදී යෙ-
හෝවා දෙවි වන මම ඔවුන්ගේ අලං-
කාරය පහ කර දමන්නෙමි. ඔවුන්ගේ
වළලුද නළල්පටිද අඩසඳ හැඩයෙන්
යුත් ආභරණද[7] මම ඉවත් කරන්-
නෙමි. **19** ඔවුන්ගේ කරාබුද වළලුද
මුහුණු වැස්මද[8] **20** හිස්වැස්මද පාද
සළංද ළයවැස්මද[9] සුවඳ විලවුන් ඇමූ
බඳුන්ද සුරද මම ඉවතට ගන්නෙමි.[10]
**21** ඔවුන්ගේ මුදුද නාස් ආභරණද[11]
**22** උත්සව ඇඳුම්ද පිට වස්ත්‍රද පො-
රෝනාද පසුම්බිද **23** අත් කැඩ-
පත්ද[12] ඇතුල් වස්ත්‍රද හිස්පළඳනාද[13]
සළුද[14] මම ඉවත් කරන්නෙමි.
**24** “බෝල්සම් තෛලයේ[15] සුවඳ
වෙනුවට පුස් ගඳක් නික්මෙන්-
නේය. ඉඟපටිය වෙනුවට ලණු-
වක්ද කොණ්ඩා මෝස්තර වෙනුවට
මුඩු හිසක්ද[16] වටිනා වස්ත්‍ර වෙනුවට
ගෝණි රෙදිද[17] රූපශ්‍රීය වෙනුවට ලැප්-
ජාවද*[18] ඔවුන්ට හිමි වෙයි. **25** ඒ
නගරයේ පුරුෂයෝ කඩුවෙන් මැරුම්
කන්නෝය. බලවන්තයෝ යුධ පිටි-
යේදී වැටෙන්නෝය.[1] **26** සියොන්
නුවර බිම හිඳගෙන[2] වැලපෙන ස්ත්‍රි-
යක මෙනි. ඇය පාළුවට ගොස් ඇත.
ඇගේ දොරටු අසල ඇසෙන්නේ විලාප
හඬ පමණි.”[3]

**4** ඒ දවසේදී ස්ත්‍රීන් සත්දෙනෙක්
එක් පුරුෂයෙකුව අල්ලාගෙන,[4]
“අපේ නින්දාව පහ කිරීමට[5] ඔබ අපේ
ස්වාමිපුරුෂයා කියා කියන්න විතරක්
අපට ඉඩ දෙන්න. අපේ කෑම බීම
ගැනවත් ඇඳුම් පැළඳුම් ගැනවත් ඔබ
කරදර විය යුතු නැහැ” යයි කියන්-
නෝය.
**2** ඒ දවසේදී, යෙහෝවා දෙවි හට-
ගන්න සලස්වන අංකුරය[6] හොඳින්
වැඩී දේශය අලංකාරවත් කර ගෞර-
වයට පත් කරන්නේය.[7] දේශයෙන්
ලැබෙන පලදාව ඊශ්‍රායෙල් සෙනඟ
අතරින් ඉතුරු වූ අයට ඉතා අලං-
කාර දසුනක් වනු ඇත.[8] ඔවුහු
ඒ ගැන බොහෝ සෙයින් ආඩම්-
බර වන්නෝය.[9] **3** ඒ කාලයේදී
දෙවි සියොන් සහ යෙරුසලමෙහි
ඉතුරු වී සිටින අයව සලකන්නේ
ශුද්ධ සෙනඟක් ලෙසයි.[10] ඒ සියලුදෙ-
නාම යෙරුසලමේ ජීවත් වීමට සුදුසු
බව සඳහන් කරමින් ඔවුන්ගේ නම්
ලේඛනයක සටහන් කරනු ඇත.[11]
**4** යෙහෝවා දෙවි සියොන්හි වැසි-
යන්ව විනිශ්චය කරනු ඇත. ඔහු
තම දැවෙන කෝපය ඔවුන් පිටට
වගුරුවන්නේය.[12] මෙසේ, අසූචි මෙන්
වූ ඔවුන්ගේ සියලු අපවිත්‍රකම් ඔහු
සෝදා ඉවත් කරන්නේය.[13] යෙරුස-
ලම පුරාම තැවරී ඇති ලේ පැල්ලම්[14]
ඔහු මකා දමන්නේය.[15] **5** යෙ-
හෝවා දෙවි මුළු සියොන් කන්දට[16]
හා ජනයා රැස් වන ස්ථානයට ඉහළින්
දවාලේදී වලාකුළක් සහ දුමක්ද රාත්‍රි-

**3 පරි.**
**1** යෙරෙ 12:10; ලූක් 12:48; යාකො 3:1
**2** යෙසා 1:23; යෙරෙ 5:27; ආමො 4:1; මීකා 2:2; මීකා 6:10
**3** යෙසා 58:4; ආමො 2:6; ආමො 8:4; මීකා 3:2
**4** ද්වි 8:14; යෙසා 32:9; එස 16:49
**5** ද්වි 28:27
**6** යෙසා 3:24; 1කොරි 11:6
**7** විනි 8:26
**8** උත් 24:22; නික් 32:2; එස 16:11; හොෂෙ 2:13
**9** යෙරෙ 2:32
**10** නික් 35:22; ගණන් 31:50
**11** උත් 24:22
**12** නික් 38:8
**13** ලෙවි 16:4
**14** උත් 38:14; යෙසා 47:2
**15** එස්ත 2:12
**16** යෙසා 22:12; එස 7:18; මීකා 1:16
**17** යෙරෙ 4:8; විලා 2:10; යෝවෙ 1:8; ආමො 8:10
**18** ගලා 6:17

**2 තීරුව**
**1** 2ලේක 29:9; යෙරෙ 11:22; විලා 2:21; ආමො 9:10
**2** යෝබ් 2:13; යෙසා 47:1; විලා 2:10
**3** යෙරෙ 14:2; විලා 1:4

**4 පරි.**
**4** යෙසා 3:25
**5** උත් 30:23; යෙසා 54:4; ලූක් 1:25
**6** යෙසා 27:6; යෙසා 60:21; යෝවෙ 2:18
**7** සෙක 9:17
**8** යෙසා 10:20; යෙසා 66:19; යෙරෙ 44:14; එස 7:16
**9** යෙසා 30:23; යෝවෙ 3:18
**10** යෙසා 60:21; සෙක 14:5; මතෙ 23:35

**11** නික් 32:32; එළි 3:5; එළි 20:15; **12** එස 22:20; මලා 3:2; මතෙ 3:12; **13** එස 22:15; එස 36:25; **14** එස 24:7; **15** එස 16:9; **16** ගීතා 87:2; යෙසා 32:18; යෙසා 33:20; යෙසා 37:35.

යෙසා **3:24*** මූ.අ., “හංවඩු ලකුණක්.”

යේදී[1] දීප්තිමත් ගිනි ජාලාවක්ද[2] පිහි-
ටුවන්නේය. සියොන්හි තේජස එයින්
ආරක්ෂා වන්නේය.[3] 6 දවාලේ තද
අව් රශ්මියෙන් විවේක ගැනීමටත්[4]
වැස්සෙන් හා කුණාටුවෙන් ආරක්ෂා
වීමටත් ඔවුන්ට ස්ථානයක් තිබෙනු
ඇත.[5]

5 මා ප්‍රේම කරන තැනැත්තාට
ඔහුගේ මිදිවත්ත[6] ගැන මම දැන්
ගීයක් ගයන්නෙමි. මා ප්‍රේම කරන
තැනැත්තා සශ්‍රීක කඳු බෑවුමක මිදි-
වත්තක් වගා කළේය. 2 ඔහු එහි
බිම කොටා ගල් ඉවත් කරමින් පස
හොඳින් සූදානම් කළේය. ඉන්පසුව
ඔහු ඉස්තරම් රතු මිදි වර්ගයක් වගා
කර එහි වයින් සාදන යන්ත්‍රයක්ද
සෑදුවේය.[7] ඔහු මිදිවත්ත මැද ටැඹක්
ඉදි කළේය.[8] ඒ මිදිවැලෙන් හොඳ
පලදාවක්[9] ලැබෙයි කියා ඔහු බලා-
පොරොත්තු වුණත් එහි හටගත්තේ
වල් මිදිය.[10]
3 "යෙරුසලමේ වැසියෙනි, යූදාහි
ජනයෙනි, දැන් මා දෙසත් මගේ
මිදිවත්ත දෙසත් බලා විනිශ්චය
කරන්න.[11] 4 මගේ මිදිවත්ත වෙනු-
වෙන් මට කළ හැකි හැම දෙ-
යක්ම මම කළෙමි. ඒ වෙනුවෙන්
කරන්න තව කිසි දෙයක් ඉතුරු වී
නැත.[12] මම බලාපොරොත්තු වුණේ
එයින් හොඳ පලදාවක් නොවෙයිද?
එසේනම්, එයින් වල් මිදි හටගත්-
තේ කොහොමද? 5 මගේ මිදිවත්-
තට මම කරන්න යන දේ දැන්
ඔබට දන්වමි. මම වත්ත වටේට
සෑදූ වැට ඉවත් කර[13] පුළුස්සා දමන්-
නෙමි.[14] ගල්වලින් සෑදූ එහි තාප්පයද
මම කඩා දමන්නෙමි. ඉන්පසු වත්ත
පාගා දමනු ඇත.[15] 6 මම එය පාළු-
වට යන්න ඉඩහරින්නෙමි.[16] එහි මිදි-
වැල් කප්පාදු කරන්නවත් පස් බුරුල්
කරන්නවත්[17] කිසිවෙකු නොමැති
නිසා, එය කටු පඳුරු හා වල් පැළෑටිව-
ලින් වැසී යනු ඇත.[18] වැසි නොවසින
ලෙස මම වලාකුළුවලට අණ දෙන්-
නෙමි.[19] 7 මේ මිදිවත්තේ[20] අයිති-
කරු ස්වර්ගයේ සේනාවල අධිපති වූ
යෙහෝවා දෙවි වන මමය. මිදිවත්-
තෙන් සංකේතවත් කරන්නේ ඊශ්‍රා-
යෙල් ජාතියවයි. මා ප්‍රිය කළ මිදිවැල
නම් යූදා ගෝත්‍රයයි.[1] ඔවුන් යුක්-
තිය ඉටු කරයි[2] කියා මා බලාපො-
රොත්තු වූ නමුත් ඔවුහු නීතියට ගරු
නොකළෝය. ඔවුන් ධර්මිෂ්ඨ ලෙස
ක්‍රියා කරයි කියා මා බලාපොරොත්තු
වුණත් මට ඇසුණේ පීඩිතවූවන්ගේ
විලාප හඬ පමණි."[3]
8 අනුන්ට කිසිවක් ඉතුරු නො-
කර අවට තිබෙන නිවෙස්[4] හා වතු-
පිටි සියල්ල අයිති කරගෙන[5] දේශයේ
තනිව ජීවත් වන අයට දුක් වෙන්න
සිදු වෙයි. 9 මේ විශාල මන්දිර
කොතරම් අලංකාරව තිබුණත් ඒවා
ගරාවැටී පාළුවට යන ආකාරය දැක
මිනිස්සු පුදුමයට පත් වන්නෝය. ඒ
නිවෙස්වල එක් වැසියෙකුවත් ඉතුරු
නොවන බවට ස්වර්ගයේ සේනාවල
අධිපති වන යෙහෝවා දෙවි මට දිවුරා
පොරොන්දු විය.[6] 10 අක්කර[7] දහ-
යක මිදිවත්තකින් ලැබෙන්නේ වයින්
බාත් මිනුමක්*[8] පමණි. බීජ හෝමර-
යක්# වැපුරුවත් ලැබෙන්නේ ධාන්‍ය
ඒපාවක්△ පමණි.[9]
11 හිමිදිරි පාන්දරින්ම නැඟිට
මත්පැන්[10] සොයා ගොස් රෑ යාමය
දක්වාම බොමින් වෙරිමත් වී සිටින
අයට අත් වන්නේ දුක පමණි.[11]
12 වීණාවේ, කුඩා වීණාවේ, බට
නළාවේ සහ රබානේ මිහිරි හඬ
ඔවුන්ගේ උත්සවවලදී ඇසෙයි. ඔවුහු
වයින් බොමින් ප්‍රීති වෙති.[12] එහෙත්
යෙහෝවා දෙවිගේ ක්‍රියා ඔවුහු ගණන-
කටවත් ගන්නේ නැත. ඒවා ගැන
සොයා බලන්න ඔවුන්ට කිසිම වුවම-
නාවක් නැත.[13]

**4 පරි.**
1 නික් 40:38
2 නික් 13:21 ගණන් 9:15 සෙක 2:5
3 ගීතා 85:9
4 ගීතා 91:1 ගීතා 121:5
5 යෙසා 25:4 යෙසා 32:2

**5 පරි.**
6 ගීතා 80:8 යෙසා 5:7 යෙරෙ 2:21 ලූක් 20:9
7 මතෙ 21:33
8 මාක් 12:1
9 හොෂෙ 9:10 1කොරි 9:7
10 යෙසා 5:7 යෙරෙ 2:21 හොෂෙ 10:1
11 යෙරෙ 2:5 මීකා 6:2
12 2ලේක 36:15 එස 24:13 ක්‍රියා 7:51
13 යෝබ් 1:10
14 ලෙවී 26:31 ද්වි 28:63 නෙහෙ 2:3 ගීතා 79:1 විලා 2:7
15 යෙසා 26:6 විලා 1:15
16 ලෙවී 26:33 යෙරෙ 25:11
17 ද්වි 29:23 යෙරෙ 45:4
18 යෙසා 7:23 යෙසා 32:13 හෙබ්‍රෙ 6:8
19 ද්වි 11:17 ද්වි 28:23 ආමො 4:7
20 ගීතා 80:8 යෙරෙ 12:10 ලූක් 20:9

**2 තීරුව**
1 නික් 15:17 ගීතා 147:11 ගීතා 149:4
2 යෙරෙ 22:15 මීකා 6:8 සෙක 7:9
3 උත් 19:13 ද්වි 15:9 යෝබ් 34:28 ලූක් 18:7
4 යෙරෙ 22:17 මීකා 2:2 හබ 2:9
5 1රාජා 21:16
6 2ලේක 36:21 යෙසා 27:10 ආමො 5:11
7 1සාමු 14:14
8 එස 45:11

9 ද්වි 28:17; යෝවෙ 1:17; හග් 1:11; 10 ලූක් 21:34; රෝම 13:13; ගලා 5:21; 11 හිතෝ 20:1; හිතෝ 23:30; හොෂෙ 4:11; 12 1සාමු 25:36; 13 යෝබ් 34:27; ගීතා 19:1; ගීතා 28:5; ගීතා 92:6.

යෙසා **5:10*** එනම්, ලීටර් 22කි. **10#** එනම්, ලීටර් 220කි. **10△** එනම්, ලීටර් 22කි.

**13** මගේ සෙනඟ දැනගැන්මට අනුව ක්‍රියා නොකරන[1] නිසා ඔවුන්ව වහල්භාවයට රැගෙන යනු ඇත. ඔවුන්ගේ උත්තමයෝ හාමතෙන්ද[2] පොදු ජනයා පිපාසයෙන්ද පෙළෙනු ඇත.[3] **14** මිනී වළද එහි කට අප්‍රමාණ ලෙස ඇරගෙන ඔවුන්ව ගිලගන්න මහත් ආශාවෙන් බලාගෙන සිටියි.[4] නගරයේ උත්තමයන්වද පොදු ජනයාවද ඝෝෂා කරන්නන්වද ප්‍රීති ප්‍රමෝදයට පත් වන්නන්වද එය ගිලගනියි.[5] **15** සැමදෙනාවම නින්දාවට පත් කරනු ලබයි. උත්තමයන්වත් පහත් කරනු ලබයි.[6] **16** ස්වර්ගයේ සේනාවල අධිපති වන යෙහෝවා දෙවි යුක්තිය ඉටු කරන නිසා ඔහු මහත් සේ ගෞරවයට පත් වන්නේය.[7] ශුද්ධ තැනැත්තාණන්[8] වන සැබෑ දෙවි ධර්මිෂ්ඨව කටයුතු කරමින්[9] තමන්ගේ ශුද්ධකම එළිදරව් කරන්නේය. **17** දේශයේ නටබුන් අතරේ බැටළුවෝ තණ කන්නෝය. ඔවුන්ගේ සතුන්ගේ ගොදුරුබිම් දැන් විදේශිකයන්ගේ ගොදුරුබිම් වී ඇත.[10]

**18** සතෙකු කඹයකින් ගැලක් ඇදගෙන යන්නාක් මෙන් වංකව කටයුතු කර පාපය ඇදගන්නා අයට අත් වන්නේ දුක පමණි.[11] **19** ඔවුහු මෙසේ කියති. “දෙවිට කැමති දෙයක් කරන්න කියන්න. අපේ ඇස් දෙකට දකින පිණිස පමා නොවී එසේ කරන්න කියන්න. ඊශ්‍රායෙල්හි ශුද්ධ තැනැත්තාණන් ඔහුගේ අරමුණ ඉටු කරන ආකාරය බලන්න අපිත් ආසයි.”[12]

**20** යහපතට නපුර කියාද නපුරට යහපත කියාද[13] අඳුරට ආලෝකය කියාද ආලෝකයට අඳුර කියාද තිත්ත දේට මිහිරි කියාද මිහිරි දේට තිත්ත කියාද පවසන සියලුදෙනාටම දුක් වෙන්න සිදු වෙයි.[14]

**21** තමන් ප්‍රඥාවන්තයයි සිතන අයටත් තමන්ට නුවණ තිබෙනවායයි සිතන අයටත් දුක් වෙන්න සිදු වෙයි.[15]

**22** බොහෝ වයින් බීමටත් සැර මත්පැන් සෑදීමටත් දක්ෂ වූ අයට අත් වන්නේද දුක පමණි.[1] **23** අල්ලසක් ගෙන වරදකරුවෙකු නිදොස් බව ප්‍රකාශ කරන අයත්[2] ධර්මිෂ්ඨයෙකු වරදකරුවෙකු බව ප්‍රකාශ කරන අයත් දුකට පත් වේ.[3]

**24** ඔවුහු ස්වර්ගයේ සේනාවල අධිපති වන යෙහෝවා දෙවිගේ නීතිය ප්‍රතික්ෂේප කළෝය.[4] ඊශ්‍රායෙල්හි ශුද්ධ තැනැත්තාණන්ගේ වචනයට ඔවුහු අගෞරව කර ඇත.[5] ඒ නිසා, ගිනිදැල්ලට පිදුරු දැවී යන්නාක් මෙන්ද[6] වියළී ගිය තණකොළ පොළොවටම අළු වී යන්නාක් මෙන්ද ඔවුහු විනාශ වෙති. ඔවුන්ගේ මුල දිරාපත් වී ගඳගසයි.[7] ඔවුන්ගේ මල් වියළී දූවිලි මෙන් සුළඟට ගසාගෙන යයි. **25** යෙහෝවා දෙවිගේ කෝපය ඔවුන්ට විරුද්ධව ඇවිළී තිබෙන්නේ හොඳ හේතු ඇතුවයි. ඔහු අත දිගහැර ඔවුන්ට පහර දෙයි.[8] එකල කඳු දෙදරුම් කයි.[9] බැලූ බැලූ තැන ඔවුන්ගේ මළ මිනී කුණු කසළ මෙන් වීථිවල ගොඩගසා තිබෙයි.[10]

ඔවුන්ගේ දුෂ්ටකම හේතුවෙන් දෙවිගේ කෝපය තවමත් නිවී නැත. ඔහුගේ හස්තය ඔවුන්ට විරුද්ධව දිගු කර තිබේ. **26** දෙවි කොඩියක් සිටුවා දුර ඈත සිටින බලවත් ජාතියකට සංඥාවක් දෙන්නේය.[11] පොළොවේ ඈත කෙළවර සිටින ඒ ජනයාව කැඳවන්නේය.[12] ඔහුගේ හඬ ඇසුණු විගස ඔවුහු වේගයෙන් පැමිණෙන්නෝය.[13] **27** ඔවුන් අතරේ විඩාවට පත්වූවෙක්වත් දුර්වලයෙක්වත් නැත. කිසිවෙක් විවේක ගන්නේවත් නිදාගන්නේවත් නැත. ඔවුන්ගේ ඉඟපටි නොලිහෙන්නේය. වහන්පටිද නොකැඩෙන්නේය. **28** ඔවුහු තම ඊතල තියුණු කර දුන්න සූදානම් කරගෙන සිටිති.[14] ඔවුන්ගේ අශ්වයන්-

**5 පරි.**

**1** යෙසා 27:11 යෙරෙ 8:7 හොෂෙ 4:6 ලූක් 19:44
**2** යෙරෙ 14:18 විලා 4:9
**3** යෙරෙ 14:3
**4** ද්වි 28:63 හිතෝ 27:20 හබ 2:5
**5** එස 32:18
**6** යෙසා 2:11 යෙසා 13:11 දානි 4:37 1පේත්‍රු 5:5
**7** ගීතා 9:16 රෝම 2:5 එළි 19:2
**8** යෙසා 6:3 යෙසා 8:13 යෙසා 57:15 එළි 4:8
**9** ද්වි 32:4 2ලේක 19:7 ගීතා 98:2
**10** ද්වි 28:33 නෙහෙ 9:37 යෙසා 1:7 විලා 5:2 හොෂෙ 8:7
**11** ගීතා 10:3 ගීතා 14:1 ගීතා 36:3 හිතෝ 6:18
**12** හිතෝ 24:9 යෙරෙ 5:12 යෙරෙ 17:15 එස 12:22 ආමො 5:18
**13** හිතෝ 17:15 මලා 2:17
**14** මතෙ 15:6 2පේත්‍රු 2:3
**15** හිතෝ 3:7 හිතෝ 15:12 යොහ 9:41 රෝම 1:22 රෝම 12:16

**2 තීරුව**

**1** හිතෝ 23:20 හිතෝ 31:5 යෙසා 5:11
**2** ද්වි 16:19 හිතෝ 17:23 යෙසා 1:23 මීකා 3:11 යාකො 2:9
**3** 1රාජා 21:13 ගීතා 94:21 හිතෝ 17:15 මතෙ 23:35 යාකො 5:6
**4** 1සාමු 15:23 2රාජා 17:14 නෙහෙ 9:26 ගීතා 50:17 හෙබ්‍රෙ 10:28
**5** ද්වි 31:20 යෙසා 1:4

**6** නික් 15:7; යෝවෙ 2:5; නාහු 1:10; මලා 4:1; **7** යෝබ් 18:16; හොෂෙ 9:16; ආමො 2:9; **8** ද්වි 31:17; 2ලේක 36:16; විලා 2:2; **9** නාහු 1:5; **10** 2රාජා 9:37; ගීතා 83:10; යෙරෙ 8:2; **11** යෙරෙ 52:4; **12** ද්වි 28:49; යෙරෙ 5:15; **13** යෙරෙ 4:13; විලා 4:19; **14** ගීතා 120:4.

ගේ කුර කලු ගල් මෙනි.[1] ඔවුන්ගේ
අශ්ව රථවල රෝද සුළිසුළඟක් මෙන්
කැරකෙන්නේය.[2] **29** ඔවුන්ගේ හඬ
ගොරවන සිංහයෙකුගේ මෙනි. තරුණ
කේශර සිංහයන්[3] මෙන් ඔවුහු ගර්-
ජනා කරති. ඔවුහු ගොදුර ඩැහැ-
ගෙන කැමති තැනකට ඇදගෙන
යති. ඔවුන්ව නතර කරන්න කිසි-
වෙකුට නොහැක.[4] **30** ඔවුහු ගර්-
ජනා කරමින් ගොදුර ළඟින්ම සිටිති.
ඔවුන්ගේ ගර්ජනා හඬ මුහුදේ ඝෝෂාව
මෙන් වන්නේය.[5] දේශය දෙස බලන
ඕනෑම කෙනෙකු දකින්නේ බිය උපද-
වන ඝන අන්ධකාරයකි.[6] මුළු අහසම
වැහි වලාකුළුවලින් වැසී ඇත.

**6** උසියා රජු මිය ගිය අවුරුද්දේදී,[7]
මම දර්ශනයක් දුටිමි. යෙහෝවා
දෙවි[8] උත්කෘෂ්ට සිංහාසනයක හිඳ-
ගෙන[9] සිටි අතර ඔහුගේ වස්ත්‍ර-
වලින් දේවමාලිගාව වැසී තිබිණ.[10]
**2** ඔහු අවට සෙරාෆ්වරු සිටියෝය.[11]
ඔවුන් එක් එක් කෙනාට පියාපත්
හය බැගින් තිබිණ. පියාපත් දෙක-
කින් ඔවුහු තම මුහුණද[12] තවත් පියා-
පත් දෙකකින් තම පාදද වසාගෙන
සිටියෝය. අනික් පියාපත් දෙකෙන්
ඔවුහු පියාසර කළෝය. **3** සෙරාෆ්-
වරු එකිනෙකාට මෙසේ කියාගත්-
තෝය. "ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි ශුද්ධය, ශුද්ධය,
ශුද්ධය.[13] පොළොවේ ඇති සෑම දෙය-
කින්ම ඔහුගේ තේජස දැකගත හැකි
වෙයි." **4** ඔවුන්ගේ හඬට දේවමාලි-
ගාවේ උළුවහු[14] සෙලවුණේය. මුළු දේ-
වමාලිගාවම දුමෙන් පිරී ගියේය.[15]
**5** එය දැක මම මෙසේ කීවෙමි.
"අනේ, මම අපවිත්‍ර තොල් ඇති
මනුෂ්‍යයෙක්.[16] මම ජීවත් වෙන්-
නෙත් අපවිත්‍ර තොල් ඇති සෙනඟක්
අතරෙයි.[17] එහෙත් ස්වර්ගයේ සේනා-
වල අධිපතිද රජුද වන යෙහෝවා දෙ-
විව මම දැක්කා![18] අපවිත්‍ර කෙනෙකුට
දෙවිව දැක ජීවත් වෙන්න පුළුවන්ද?"
**6** මා එසේ කී පසු, සෙරාෆ්ව-
රුන්ගෙන් එක් කෙනෙක්, පූජාසනය[19]
මත තිබුණු ගිනි අඟුරක්[20] අඬුවකින්
රැගෙන මා වෙතට ආවේය. **7** ඔහු
ඇවිත් එයින් මගේ කට ස්පර්ශ කර[1]
මෙසේ කීවේය. "මේ ගිනි අඟුර ඔබේ
තොල ස්පර්ශ කළ නිසා ඔබේ පව්ව-
ලට සමාව ලැබී ඇත. ඔබේ වරද
ගණන් ගනු නොලැබේ."[2]
**8** එවිට යෙහෝවා දෙවි මෙසේ
පවසනවා මට ඇසුණේය. "මා යවන්-
නේ කාවද? අප[3] වෙනුවෙන් ඉදිරිපත්
වෙන්නේ කවුද?" එය අසා, මම මෙසේ
කීවෙමි. "මම යන්න කැමතියි. මාව
යවන්න."[4] **9** ඉන්පසු දෙවි මෙසේ
කීවේය. "එසේනම්, මගේ සෙනඟ වෙ-
තට ගොස් මෙසේ කියන්න. 'ජන-
යෙනි, ඔබ හැමදාම අසාගෙන සිටියත්
කිසිවිටෙක තේරුම්ගන්නේ නැත.
ඔබ දුටුවත් දකින දේ වටහාගන්නේ
නැත.'[5] **10** මේ ජනයා තමන්ගේ
සිත් මුරණ්ඩු කරගනිති.[6] ඔවුන්-
ගේ කන් වසාගෙන සිටිති.[7] ඔවුන්-
ගේ ඇස්ද පියාගනිති. එසේ කිරීමට
ඔවුන්ට ඉඩහරින්න. මෙසේ, ඔවුහු
තම ඇස්වලින් කිසිවක් නොදකින්-
නෝය. ඔවුන්ට කිසිවක් නොඇසෙයි.
ඔවුන්ගේ සිත්වලින් ඒ කිසිම දෙ-
යක නියම අර්ථය වටහාගන්නේද
නැත. ඒ නිසා, ඔවුහු සුවයක් ලබන
පිණිස නැවත මා වෙතට හැරී එන්නේ
නැත."[8]
**11** එවිට මම, "අනේ යෙහෝවා
දෙවියනි, මේ තත්වය තව කොපමණ
කාලයක් පවතීද"[9] කියා ඇසුවෙමි.
එවිට ඔහු මෙසේ කීවේය. "නුවර-
වල් නටබුන් වී යන තුරුත් පදිංචි-
යට කාත් කවුරුත් නැතුව නිවෙස්
පාළු වී යන තුරුත් මුළු දේශයම
නාස්ති වී යන තුරුත් මේ තත්වය
පවතියි.[10] **12** යෙහෝවා දෙවි වන
මම මේ වැසියන්ව ඈත දේශයකට
පන්නා දමා මුළු දේශයම පාළු වී
යන්න සලස්වන්නෙමි.[11] **13** නමුත්
ඔවුන්ගෙන් දසයෙන් කොටසක් එහි
ඉතුරු වෙයි.[12] ඇවැන්ත ගසක් කපා[13]

**5 පරි.**

**1** හිතෝ 21:31; එස 3:9
**2** හබ 1:8
**3** යෙරෙ 50:17
**4** ගීතා 50:22; යෙසා 42:22
**5** යෙරෙ 6:23
**6** යෙසා 8:22; යෙරෙ 4:23; යෝවෙ 2:10; ආමො 8:9

**6 පරි.**

**7** 2ලේක 26:23
**8** නික් 33:20; ද්වි 4:12; ද්වි 4:15; යොහ 1:18; යොහ 4:24
**9** 1රාජ 22:19
**10** දානි 7:9
**11** යෙසා 6:6
**12** නික් 3:6
**13** නික් 15:11; හබ 1:13; එළි 4:8
**14** හිතෝ 26:14
**15** එළි 15:8
**16** යෝබ් 14:4
**17** යෙසා 29:13; යාකො 3:2
**18** උත් 32:30; නික් 33:20; විනි 6:22; විනි 13:22; යොහ 1:18; යොහ 4:24
**19** එළි 8:5
**20** එස 10:2

**2 තීරුව**

**1** යෙරෙ 1:9; දානි 10:16
**2** ගීතා 51:2; මීකා 7:18; සෙක 3:4
**3** උත් 1:26; උත් 3:22; යොහ 1:2
**4** 1සාමු 3:8; ගීතා 110:3; මතෙ 4:20
**5** යෙසා 44:18; යෙරෙ 5:21; මතෙ 13:14; ලූක් 8:10; ක්‍රියා 28:26
**6** නික් 7:3; 1සාමු 6:6; එස 3:7; 2කොරි 2:16
**7** යෙරෙ 6:10; සෙක 7:11; යොහ 3:20; ක්‍රියා 28:27
**8** 1සාමු 2:25; මතෙ 13:15
**9** ගීතා 74:10; ගීතා 94:3

**10** 2ලේක 36:21; යෙසා 1:7; යෙසා 3:26; යෙසා 24:1; **11** 2රාජ 25:11; යෙරෙ 52:28; **12** යෙසා 10:20; රෝම 9:27; **13** මතෙ 3:10.

දැමූ පසු කඳ කොටස[1] ඉතුරු වන්-
නාක් මෙන් ශුද්ධ කොටසක් ඉතුරු
වෙයි.[2] එහෙත් ඔවුන්ද ගින්නට හසු
වනු ඇත.”

**7** උසියාගේ පුත්‍රයා වූ යෝතම්-
ගේ පුත් ආහස්[3] යූදාහි රජකම්
කළ කාලයේදී, සිරියාවේ රජු වූ රෙ-
ෂීන්ද[4] ඊශ්‍රායෙල්හි රජු වූ රෙමලියාගේ
පුත් පේකාද[5] යෙරුසලමට විරුද්ධව
යුද්ධ කිරීමට පැමිණියෝය. නමුත්
ඔවුන්ට එය යටත් කරගැනීමට නො-
හැකි විය.[6] **2** ඒ කාලයේදී, දාවිත්-
ගේ රජ පෙළපතට අයත් යූදාහි රජුට
මෙසේ ආරංචි විය. “එප්‍රායිම්වරුන්[7]
සමඟ සිරියානුවන් එකතු වෙලා!”

මෙය ඇසූ විට ආහස් රජද යූදා සෙ-
නඟද මහත් සේ භය වී තද සුළඟට
සෙලවෙන වනයේ ගස් මෙන් වෙවු-
ලන්න පටන්ගත්හ.[8]

**3** එවිට යෙහෝවා දෙවි යෙසායාට
මෙසේ කීවේය. “ඔබේ පුත් ෂෙයර්-
යාෂුබ්*[9] සමඟ ගොස් ආහස් රජුව හමු
වන්න කියා මම ඔබෙන් ඉල්ලමි.
රෙදි සෝදන්නන්ගේ පිට්ටනියට යන
මාර්ගයෙහි[10] පිහිටි ඉහළ පොකුණේ
දිය අගල[11] ළඟදී ඔබට ඔහුව හමු
වෙයි. **4** ඔහුට මෙසේ කියන්න.
‘ඔබ කලබල නොවී ස්ථිරව සිටිය
යුතුයි.[12] සිරියාවේ රජු වන රෙෂීන් හා
රෙමලියාගේ පුත්‍රයා[13] මහත් කෝප-
යෙන් සිටින බව ඇත්තයි. නමුත්
ඔවුන්ට භය නොවන්න. අධෛර්ය-
යට පත් නොවන්න.[14] මන්ද ඒ රජුන්
දෙදෙනා හරියට නිවීගෙන යන දර
කැබලි දෙකක් මෙනි. **5** එප්‍රායිම්ව-
රුන් සමඟ එකතු වී සිටින සිරියා-
නුවන්ද රෙමලියාගේ පුත්‍රයාද ඔබට
නපුරක් කරන්න සැලසුම් කරමින්
මෙසේ කීවෝය. **6** “අපි යූදා දේශ-
යේ පවුරු බිඳ දමා එය නාස්තියට
පමුණුවා යටත් කරගනිමු. ඉන්පසු
ටාබෙයෙල්ගේ පුත්‍රයාව ඒ දේශයේ
රජු හැටියට පත් කරමු.”[15]

**6 පරි.**
1 රෝම 11:7
2 උත් 22:18
රෝම 11:5
ගලා 3:16
ගලා 3:29

**7 පරි.**
3 2රාජා 16:1
2ලේක 28:1
4 2රාජා 16:5
5 2රාජා 15:37
2ලේක 28:6
6 2රාජා 16:5
7 2ලේක 25:7
යෙසා 11:13
එස 37:16
8 ලෙවී 26:36
හිතෝ 28:1
9 යෙසා 8:18
10 යෙසා 36:2
11 2රාජා 18:17
2රාජා 20:20
12 විලා 3:26
මතෙ 10:28
13 2රාජා 15:30
යෙසා 8:6
14 ද්වි 20:3
15 2රාජා 16:5

**2 තීරුව**
1 ගීතා 2:4
ගීතා 33:11
හිතෝ 21:30
2 2රාජා 17:6
හොෂෙ 1:6
3 1රාජා 16:24
4 2රාජා 15:27
5 2ලේක 20:20
නෙහෙ 9:35
හෙබ්‍රෙ 11:6
6 විනි 6:36
යෙසා 37:30
යෙසා 38:7
මතෙ 12:38
7 2ලේක 36:16
මලා 2:17
ක්‍රියා 7:51
8 ලූක් 1:34
9 මතෙ 1:23
ලූක් 1:35
10 යෙසා 9:6
යොහ 1:14
1තිමෝ 3:16
11 හිතෝ 8:13
ලූක් 2:40
රෝම 12:9
12 ද්වි 1:39
13 2රාජා 15:29
2රාජා 16:9
යෙසා 8:4
යෙසා 17:1

**7** “ ‘එහෙත් විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි මෙසේ පවසා
තිබේ. “ඔවුන්ගේ සැලසුම් කිසිසේත්
සාර්ථක වන්නේ නැත.[1] **8** සිරියාවේ
ප්‍රධාන නගරය දමස්කයයි. දමස්කය
පාලනය කරන්නේ රෙෂීන් රජුයි. තව
අවුරුදු හැටපහකින් එප්‍රායිම්වරු ජාති-
යක් හැටියට පොළොවෙන් තුරන් වනු
ඇත.[2] **9** එප්‍රායිම් දේශයේ ප්‍රධාන
නගරය සමාරියයි.[3] සමාරිය පාලනය
කරන්නේ රෙමලියාගේ පුත්‍රයාය.[4] ඔබ
සියලුදෙනාම මා කෙරෙහි ස්ථිර විශ්-
වාසයකින් සිටිය යුතුයි. එසේ නොක-
ළොත් ඔබට වැඩි කල් පැවතීමට ඉඩ
නොලැබෙයි.” ’ ”[5]

**10** යෙහෝවා දෙවි ආහස් රජුට
මෙසේද කීවේය. **11** “මේ කාරණා
සත්‍යයද කියා සහතික කරගැනීමට
යෙහෝවා දෙවි වන මාගෙන් ඕනෑම
ලකුණක් ඉල්ලන්න.[6] පොළොවේ
ගැඹුරුම ස්ථානයක තිබෙන දෙයක්
වුණත් ඉහළ අහසේ තිබෙන දෙ-
යක් වුණත් ඉල්ලන්න.” **12** නමුත්
ආහස් මෙසේ ඇසුවේය. “මම මොක-
ටද යෙහෝවා දෙවිගෙන් ලකුණක්
ඉල්ලා ඔහු ඒ දේ කරයිද කියා පරීක්ෂා
කර බලන්නේ?”

**13** එවිට අනාගතවක්තෘ ඔහුට
මෙසේ කීවේය. “දාවිත්ගේ පුත්‍රය, මා
කියන දේට දැන් සවන් දෙන්න. ඔබ
මිනිසුන්ව වෙහෙසට පත් කළා මදිවට
දැන් මගේ දෙවිවත් වෙහෙසට පත්
කරන්න හදනවාද?[7] **14** යෙහෝවා
දෙවි ඔබට දෙන ලකුණ මෙයයි. තරු-
ණිය[8] ගැබ්ගෙන[9] පුතෙකු බිහි කරන්-
නීය.[10] ඇය ඔහුට එම්මානුවෙල්* යන
නම තබනු ඇත. **15** හරි වැරද්ද
අතර වෙනස තේරුම්ගත[11] හැකි වය-
සට පැමිණෙන විට ඔහු වෙඬරු* හා
මීපැණි කමින් සිටියි. **16** දරුවා ඒ
වයසට පැමිණෙන්නත් කලින්[12] ඔබව
මහත් සේ බියට පත් කළ මේ රජුන්
දෙදෙනාගේම දේශයන් පාළුවට යන්-
නේය.[13] **17** නමුත් යෙහෝවා දෙවි,

---

යෙසා **7:3*** තේරුම, “නැවත පැමිණෙන්නේ ඉතුරුව සිටින කුඩා පිරිසක් පමණි.”

යෙසා **7:14*** තේරුම, “දෙවි අප සමඟය.”
**15*** උත් 18:8හි පාදසටහන බලන්න.

ඔබට[1] හා ඔබේ පියාගේ පෙළපතට
විරුද්ධවත් ඔබේ සෙනඟට විරුද්ධ-
වත් ඇසිරියාවේ රජුව[2] එවන්නේය.
එෆ්‍රායිම්වරුන් යූදාහි[3] වැසියන්ගෙන්
වෙන් වූ කාලයේ පටන් මේ දක්වා
නොතිබුණු ඉතා දුක්ඛිත කාලයකට
ඔබට මුහුණ දෙන්න සිදු වෙයි.
**18** “ඒ දවසේදී යෙහෝවා දෙවි
ඊජිප්තුවේ නයිල් ගඟෙන් නික්මෙන
සියලුම දිය පහරවල් අසල සිටින
මැස්සන්ටත් ඇසිරියාවේ[4] සිටින
මීමැස්සන්ටත්[5] හඬගසයි. **19** ඔහු-
ගේ හඬ අසා පැමිණෙන උන් කඳු
බෑවුම් හා පර්වත මෙන්ම සියලුම කටු
පඳුරු හා තණබිම්ද වසාගනු ඇත.[6]
**20** “ඒ දවසේදී යෙහෝවා දෙවි,
තමන්ගේ කැමැත්ත ඉටු කිරීම සඳහා
මහ ගඟ*[7] අවට තිබෙන ප්‍රදේශයෙන්
දැලිපිහියක් ගෙන්වාගනියි. දෙවි දැලි-
පිහියක් වැනි වූ ඇසිරියාවේ රජු[8] මාර්-
ගයෙන් දේශයේ වැසියන්ගේ හිසකෙස්
හා රැවුල පමණක් නොව ඇඟ පුරාම
තිබෙන රෝම පවා කපා ඉවත් කරන්-
නේය.[9]
**21** “ඒ කාලයේදී යමෙක් තරුණ
එළදෙනකව හා බැටළුවන් දෙදෙනෙ-
කුව බේරා උන්ව රැකබලා ගනියි.[10]
**22** උන්ගෙන් වුවමනාවටත් වඩා කිරි
ලැබෙන නිසා ඔහුට වෙඬරු කන්න
සිදු වෙයි. දේශයේ ඉතුරු වී සිටින
සියලුදෙනාටම වෙඬරු හා මීපැණි[11]
හැර වෙන කිසිම දෙයක් කන්න
ඉතුරු නොවෙයි.
**23** “රිදී ෂෙකෙල් දහසක්[12] වටිනා
මිදිවැල් දහසක් තිබුණු වතුවල
දකින්න ලැබෙන්නේ කටු පඳුරු
හා වල් පැළ පමණි.[13] **24** දේශයට
ඇතුල් වන අයට ඊතල හා දුනු
රැගෙන යන්න සිදු වෙයි.[14] මන්ද මුළු
දේශයම කටු පඳුරු සහ වල් පැළෑටිව-
ලින් වැසී ගිය කැලෑවක් සේ පව-
තිනු ඇත. **25** කලින් එළි පෙහෙළි
කර තිබුණු කඳු බෑවුම් නැවතත් කටු
පඳුරු හා වල් පැළෑටිවලින් ගහනව
තිබෙනු ඇත. මිනිස්සු ගොනුන්ට සහ
බැටළුවන්ට ඒ ස්ථානවල ඉබාගාතේ
යන්න හරිනි. නමුත් එහි කිසි මිනි-
සෙක් ගමන් කරන්නේ නැත.”[1]

**8** යෙහෝවා දෙවි මට මෙසේ පැව-
සුවේය. “විශාල අකුරු ලියන
ලෑල්ලක්[2] ගෙන, ‘මහෙර්-ශාලල්-හෂ්-
බස්’* කියා පැහැදිලිව ලියන්න.#
**2** පූජක ඌරියාවද[3] යෙබෙරෙකියා-
ගේ පුත් සෙකරියාවද විශ්වාසවන්ත
සාක්ෂිකරුවන්[4] ලෙස කැඳවා මා කී
දේ ස්ථිර කරන්න[5] කියා ඔවුන්ට
කියන්න.”
**3** මම අනාගතවක්තෘවරිය සමඟ
සයනය කළෙමි. ඇය ගැබ්ගෙන
පුතෙකු බිහි කළාය.[6] ඒ අවස්ථාවේදී
යෙහෝවා දෙවි මට මෙසේ පැවසු-
වේය. “ඔහුට මහෙර්-ශාලල්-හෂ්-බස්
යන නම තබන්න. **4** මන්ද දරුවා,
‘අම්මා, තාත්තා’ කියා කියන්නත්
කලින්[7] මිනිස්සු දමස්කයේ වස්තු හා
සමාරියේ වටිනා දේ කොල්ල කා ඇසි-
රියාවේ රජු ඉදිරියට ගෙන එනු ඇත.”[8]
**5** යෙහෝවා දෙවි මට මෙසේද
පැවසුවේය. **6** “මේ ජනයා, ෂිලෝවා
ඇළ මාර්ගයේ හෙමිහිට ගලා යන
ජලය[9] ප්‍රතික්ෂේප කර[10] රෙෂින් රජු හා
රෙමලියාගේ පුත්‍රයා[11] ගැන බලාපො-
රොත්තු තබමින් ප්‍රීති වෙති.[12] **7** ඒ
නිසා යෙහෝවා දෙවි වන මම මහ
ගඟෙහි[13] ජල සමූහය ඔවුන්ට විරුද්ධව
ගෙනෙන්නෙමි.[14] ඇසිරියාවේ රජ[15]
මුළු මහත් තේජස[16] සමඟින් පැමිණ
සැඩ ජල පහරක් සේ දේශය සම්පූර්ණ-
යෙන්ම යටපත් කරයි. **8** සැඩ ජල
පහර යූදා දේශය දක්වාද ගලා යයි.
එය මුළු දේශයම යටපත් කරමින්[17]
ගෙල* දක්වාම ගලා එයි.[18] එම්මානු-
වෙල්,[19] ඒ තැනැත්තා තම පියාපත්[20]
විහිදුවා ඔබේ මුළු දේශයම වසාගනු
ඇත!”

යෙසා **7:20*** එනම්, යුප්‍රටීස් ගඟ.

යෙසා **8:1*** තේරුම, “කොල්ලය, ඉක්මන් කරන්න!” හෝ, “ඉක්මනින් ගොස් කොල්ල කන්න.” **1#** මූ.අ., “මිනිසා පොදුවේ භාවිත කරන පන්හිඳකින් ලියන්න.” **8*** එනම්, යෙරුසලම.

**7 පරි.**
**1** 2ලේක 28:19
නෙහෙ 9:32
**2** 2රාජා 18:14
**3** 1රාජා 12:20
**4** 2රාජා 18:13
2රාජා 19:4
**5** ද්වි 1:44
ගීතා 118:12
**6** 2රාජා 18:17
2ලේක 33:11
**7** උත් 15:18
2රාජා 23:29
**8** 2රාජා 16:7
2ලේක 28:20
**9** යෙසා 9:14
යෙසා 15:2
යෙසා 24:3
**10** යෙරෙ 39:10
**11** 2සාමු 17:29
**12** සල 8:11
**13** යෙසා 5:6
යෙසා 32:13
යෙරෙ 4:26
හෙබ්‍රෙ 6:8
**14** එස 39:9

**2 තීරුව**
**1** යෙසා 34:13

**8 පරි.**
**2** යෙසා 30:8
හබ 2:2
**3** 2රාජා 16:10
**4** 2කොරි 13:1
**5** රූත් 4:7
යෙසා 8:16
**6** යෙසා 8:18
**7** යෙසා 7:16
**8** 2රාජා 15:29
2රාජා 16:9
2රාජා 17:6
යෙසා 17:1
**9** ගීතා 36:9
යෙරෙ 17:13
යොහ 9:7
**10** 2රාජා 17:16
**11** යෙසා 7:1
**12** හිතෝ 17:5
හිතෝ 24:17
**13** 1ලේක 18:3
යෙසා 7:20
**14** ද්වි 28:49
**15** 2රාජා 17:5
2රාජා 18:9
යෙසා 7:17
**16** එස 31:3
**17** 2ලේක 28:20
යෙසා 10:28
**18** යෙසා 30:28
**19** යෙසා 7:14
මතෙ 1:23
**20** එස 17:3

9 ජනයෙනි, සටනට සැරසෙන්න!
පොළොවේ ඈත සීමාවන්හි වෙ-
සෙන සියල්ලෙනි,[1] ඔවුන්ව විනාශ-
යට පත් කරන්න. කුමන දේ කළත්
ඔබ සුනුවිසුනු වී යනු ඇත![2] එසේ-
නම්, සටනට සූදානම් වෙන්න![3]
10 කුමන්ත්‍රණය කරන්න. නමුත් ඔබ
කරන කිසිවක් සාර්ථක නොවෙයි.[4]
කැමති දෙයක් කියන්න. එයින් පලක්
නොවෙයි. මන්ද දෙවි අප සමඟය![5]
11 යෙහෝවා දෙවි තම මහත් බල-
යෙන් මට මඟ පෙන්වමින් මා සමඟ
කතා කළේය. මේ ජනයාව අනුකර-
ණය නොකරන ලෙස මට අනතුරු
අඟවමින් ඔහු මට මෙසේ කීවේය.
12 "මේ ජනයාගේ කූට කුමන්ත්‍රණ-
වලට[6] අතහිත නොදෙන්න. ඔවුන්
භය වන දෙයට ඔබ භය වෙන්න-
වත් තැතිගන්නවත් එපා.[7] 13 ඔබ
භය විය යුත්තේ යෙහෝවා දෙවි වන
මටයි.[8] ඔබ තැතිගත යුත්තේ මා ඉදි-
රියේ පමණයි.[9] ශුද්ධ දෙවි[10] කෙනෙ-
කුට සිටින්නේ ස්වර්ගයේ සේනාවල
අධිපති වන මා පමණක් බව අමතක
නොකරන්න."

14 දෙවි ශුද්ධස්ථානයක් මෙන්
වනු ඇත.[11] එහෙත් ඔහු ඊශ්‍රායෙල්
පෙළපත් දෙකටම පය වදින ගලක්
මෙන්ද පය පැටලී වැටීමට හේතු
වන පර්වතයක් මෙන්ද වන්නේය.[12]
ඔහු යෙරුසලමේ වැසියන්ට උගු-
ලක් මෙන් වනු ඇත.[13] 15 ඔවුන්-
ගෙන් බොහෝදෙනෙක් පය පැටලී
වැටී සුනුවිසුනු වී යන්නෝය. ඔවුහු
උගුලට හසු වන්නෝය.[14]

16 සාක්ෂිය සටහන් වූ ලියවිල්ල
අකුළන්න.[15] නීතිය සඳහන් ලියවිල්-
ලට මුද්‍රාවක් තබා එය මගේ ගෝලයන්
අතට පත් කරන්න.[16] 17 මම යෙ-
හෝවා දෙවි කෙරෙහි බලාපොරොත්තු
තබන්නෙමි.[17] ඔහු යාකොබ්ගේ පෙළ-
පත වෙතින් තම මුහුණ සඟවාගෙන
සිටියත්[18] මම ඔහු කෙරෙහි බලාපො-
රොත්තු අත් නොහරින්නෙමි.[19]

18 මාත් යෙහෝවා දෙවි මට දුන්
දරුවනුත්[20] ඊශ්‍රායෙල් දේශයේ වැසි-
යන් ඉදිරියේ සිදු කෙරෙන ලකුණු[1]
හා ආශ්චර්යයන් හා සමානයි. අපව
එලෙස යොදාගන්නේ සියොන් කන්-
දේ වාසය කරන ස්වර්ගයේ සේනාවල
අධිපති වන යෙහෝවා දෙවිය.[2]

19 "පක්ෂීන් මෙන් හඬ නඟන,
හීන් හඬින්[3] මතුරන මායාකාරයන්-
ගෙන්[4] හෝ ශාස්ත්‍ර කියන්නන්ගෙන්
විමසන්න" කියා ජනයා ඔබට කියති.
එහෙත් ජනයා කාරණා විමසිය යුත්-
තේ තමන් නමස්කාර කරන දෙවි-
ගෙන් නොවෙයිද?[5] ජීවතුන් උදෙසා
මිය ගිය අයගෙන් විමසිය යුතුද?[6]
20 නීතිය හා සාක්ෂිය[7] සටහන් වූ
ලියවිල්ල විමසා බලන්න!

ඔවුන් එහි සඳහන් වචන පැව-
සුවත්[8] ඔවුන්ට කිසි ආලෝකයක්
ලැබෙන්නේ නැත.[9] 21 ඔවුහු පීඩා-
වට පත් වී කුසගින්නෙන්[10] පෙළී අස-
රණව දේශයේ ඒ මේ අත ගමන්
කරති. කුසගින්නෙන් පෙළෙන විට
ඔවුහු උදහස් වී රජුටත් දෙවිටත් දොස්
තබති.[11] ඔවුන් අහස දෙස බැලුවත්
22 පොළොව දෙස බැලුවත් ඔවුන්
දකින්නේ දසත පැතිරී ඇති වේදනාව
හා අඳුර පමණි.[12] බලාපොරොත්තුවේ
ලකුණක්වත් ඔවුන්ට දකින්න නො-
ලැබෙයි.[13]

**9** දේශය පුරාම අඳුරු කාලයක් උදා
වෙයි. එහෙත් සෙබුලුන් සහ
නප්තලී[14] යන පළාත් නින්දාවට පත්
කළ අවස්ථාවේදී පැවති අඳුරු කාලය
තරම් එය දරුණු වන්නේ නැත.
යොර්දාන් පළාතට අයත් මුහුද අස-
ලින් දිව යන මාර්ගයේ පිහිටි, බොහෝ
ජාතීන් වාසය කරන ගලීල දේශය[15]
පසු කලෙකදී ගෞරවයට පත් කරනු
ලබයි.[16] 2 අඳුරේ සිටි ජනයා මහත්
ආලෝකයක් දුටුවෝය.[17] සනාන්ධ-

**8 පරි.**
1 මීකා 4:11 සෙක 14:2
2 2ලේක 32:21 යෙසා 37:36
3 1රාජා 20:11
4 ගීතා 2:9 ගීතා 33:10 හිතෝ 21:30
5 ද්වි 20:1 ගීතා 44:3 රෝම 8:31 1යොහ 4:4
6 2රාජා 16:5 යෙසා 7:2
7 ද්වි 32:21 ගීතා 96:5 යෙසා 44:8 යෙරෙ 16:20 1කොරි 8:4 1පේතෘ 3:14
8 හිතෝ 8:13 දේශ 12:13 මතෙ 10:28 ලූක් 12:5 එළි 15:4
9 ගීතා 2:11 ගීතා 76:7 යෙසා 66:2 මලා 2:5 පිලි 2:12
10 ලෙවි 10:3 ලෙවි 22:32 යෙසා 29:23
11 යොහ 14:6 පිලි 2:9 කොලො 3:17
12 හිතෝ 4:19 යෙසා 28:16 මතෙ 13:57 ලූක් 20:18 රෝම 9:32 රෝම 9:33 1පේතෘ 2:8
13 මතෙ 13:57
14 මතෙ 11:6 මතෙ 21:44 1කොරි 1:23
15 රූත් 4:7 යෙසා 8:2 දානි 12:4 එළි 5:1
16 යෙසා 29:11 දානි 12:9
17 ගීතා 33:20 ගීතා 39:7 හෙබ්‍රෙ 6:12 2පේතෘ 3:9
18 ද්වි 31:17 ද්වි 32:20 එස 39:23 මීකා 3:4
19 ගීතා 37:34 ගීතා 40:1 ගීතා 146:5
20 යෙසා 7:16 යෙසා 8:3 හෙබ්‍රෙ 2:13

**2 තීරුව**
1 යෙසා 7:14 1කොරි 4:9

**2** ගීතා 9:11; යෙසා 12:6; යෙසා 24:23; **3** යෙසා 29:4; **4** ලෙවි 20:6; ද්වි 18:11; **5** නික් 19:5; 2රාජා 1:3; ගීතා 135:4; **6** ගීතා 146:4; දේශ 9:5; **7** යෙසා 8:2; **8** යෙසා 8:19; **9** හිතෝ 4:19; **10** ද්වි 28:48; 2රාජා 25:3; යෙරෙ 52:6; විලා 4:4; **11** නික් 22:28; හිතෝ 19:3; **12** හිතෝ 4:19; ශෙප 1:15; මතෙ 8:12; **13** 2ලේක 15:5; යෙරෙ 23:12; යෝවෙ 2:31; **9 පරි.** **14** 2රාජා 15:29; **15** මතෙ 4:15; **16** උත් 49:21; මතෙ 4:13; **17** මතෙ 4:16; ලූක් 1:79; ලූක් 2:32; යොහ 1:9; යොහ 8:12.

කාරයෙන්[1] වැසී ගිය දේශයේ වැසි-
යන්ට ආලෝකය උදා විය.[2] **3** ඔබ
ඒ සෙනඟව මහත් ජාතියක් වීමට
සලස්වා[3] ඔවුන්ට මහත් ප්‍රීතියක්[4]
ගෙන දුන්නෙහිය. අස්වැන්න නෙළන
කාලවලදී[5] හා කොල්ල කා ගත් දේ
බෙදාගන්නා අවස්ථාවලදී ප්‍රීති වන්-
නාක් මෙන් ඔවුහු ඔබ ඉදිරියේ ප්‍රීති
වෙති.[6]

**4** මිදියන්වරුන්ව පරාජයට පත්
කළ දවසේදී[7] කළාක් මෙන් සතුරන්
ඔවුන් පිට පැටවූ වියගහද[8] ඔවුන්ට
දඬුවම් කිරීමට භාවිත කළ දණ්-
ඩද සැරයටියද[9] ඔබ කඩා ඇමුවෙ-
හිය. **5** රණශූරයන්ගේ[10] වහන්ද ලේ
තැවරුණු වස්ත්‍රද ගින්නට දමන දර
මෙන් වී ඇත.[11] **6** මන්ද අපට ළද-
රුවෙක් උපන්නේය.[12] අපට පුත්‍රයෙකු
දෙන ලද්දේය.[13] රාජ්‍ය බලය ඔහුට
භාර දෙනු ලබන්නේය.[14] ඔහුව උතුම්
උපදේශකයාණන්,[15] බලවත් දෙවි,[16]
සදාකාල පියාණන්[17] සහ සමාදාන-
යේ කුමාරයා[18] ලෙස හඳුන්වනු ඇත.
**7** ඔහු දාවිත්ගේ සිංහාසනය[19] මත
හිඳ රාජ්‍ය පාලනය භාරගනියි.[20]
ඔහු මෙතැන් පටන් ධර්මිෂ්ඨකමින්ද[21]
යුක්තියෙන්ද[22] රජකම් කරමින් සද-
හටම තම බලය පිහිටුවනු ඇත.[23]
ඔහුගේ රාජ්‍ය බලයට සීමාවක් නො-
තිබෙයි. සමාදානය සදහටම පවතිනු
ඇත.[24] ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මහත් ආශාවකින්
මේ දේ ඉටු කරන්නේය.[25]

**8** යෙහෝවා දෙවි යාකොබ්ට
විරුද්ධව තීන්දුවක් ප්‍රකාශ කළේය.
ඔහු තීන්දු කළ දඬුවම ඊශ්‍රායෙල්ව-
රුන් පිටට පැමිණුණේය.[26] **9** එෆ්‍රා-
යිම්වරුන් හා සමාරියේ[27] ජනයාද
එයින් නිදහස් නොවෙයි.[28] මන්ද ඔවුහු
අහංකාරකමින් මෙසේ උදම් අනති.[29]
**10** "ගඩොලින් තැනූ ගොඩනැඟිලි
කඩා ඇමුවත් අපි ඒ වෙනුවට සුවිසල්
ගල්වලින්[30] ගොඩනැඟිලි තනාගනිමු.
සිකමෝර්[31] ගස් කපා ඇමුවත් අපි
ඒ වෙනුවට දේවදාර ගස් සිටවමු."
**11** යෙහෝවා දෙවි එෆ්‍රායිම්වරුන්ව

**9 පරි.**

**1** ආමො 5:8
**2** මතෙ 4:16
**3** සෙක 2:11
සෙක 8:23
**4** ක්‍රියා 8:8
පිලි 4:4
1පේත 1:8
**5** ගීතා 4:7
ගීතා 126:6
**6** 1සාමු 30:16
2ලේක 20:27
**7** විනි 8:12
විනි 8:28
යෙසා 10:26
**8** ද්වි 28:48
යෙසා 10:27
යෙරෙ 30:8
එස 34:27
නාහු 1:13
**9** යෙසා 14:5
**10** යෙසා 14:4
**11** යෙසා 9:19
**12** යෙසා 7:14
ලූක් 1:35
ලූක් 2:11
**13** යොහ 1:14
යොහ 3:16
හෙබ්‍රෙ 1:2
**14** උත් 49:10
ගීතා 2:6
ලූක් 22:29
එළි 19:16
**15** යෙසා 11:2
සෙක 6:13
මතෙ 7:28
මතෙ 12:42
**16** ගීතා 45:3
යොහ 1:18
**17** 1කොරි 15:22
හෙබ්‍රෙ 9:12
එළි 1:18
**18** යෙසා 32:18
යොහ 14:27
**19** ලූක් 1:32
එළි 3:7
**20** දානි 2:35
**21** ගීතා 45:6
යෙසා 16:5
යෙසා 32:1
යොහ 5:30
හෙබ්‍රෙ 1:8
**22** යෙසා 42:1
යෙරෙ 23:5
මතෙ 12:18
**23** 2සාමු 7:16
එළි 11:15
**24** ගීතා 72:7
දානි 2:44
**25** 2රාජ 19:31
යෙසා 37:32
එස 36:22
**26** යෙසා 7:8
**27** 2රාජ 17:6
යෙසා 7:9
**28** යෝබ් 21:19
එස 33:33
**29** හිතෝ 16:18
මලා 3:15
**30** 1රාජ 7:9
ආමො 5:11
**31** 1රාජ 10:27

රෙෂීන් රජුගේ සතුරන්ගේ අතට හසු
කර දෙයි. දෙවි එෆ්‍රායිම්වරුන්ගේ
සතුරන්ව ඔවුන්ට විරුද්ධව සටන්
කිරීමට පොලඹවයි.[1] **12** නැඟෙන-
හිරෙන් පැමිණෙන සිරියානුවන්ද[2]
බස්නාහිරෙන් පැමිණෙන පිලිස්තිව-
රුන්ද[3] ඊශ්‍රායෙල්වරුන්ව එක කටින්
ගිල දමනු ඇත.[4] ඔවුන්ගේ දුෂ්ටකම
හේතුවෙන් දෙවිගේ කෝපය තවමත්
නිවී නැත. ඔහුගේ හස්තය ඔවුන්ට
විරුද්ධව දිගු කර තිබේ.[5]

**13** එහෙත් සෙනඟ පසුතැවී
තමන්ව හික්මවූ තැනැත්තාණන් වෙ-
තට හැරී ආවේ නැත.[6] ඔවුහු ස්වර්ග-
යේ සේනාවල අධිපති වන යෙහෝවා
දෙවිගෙන් මඟ පෙන්වීම් පැතුවේ
නැත.[7] **14** ඒ නිසා යෙහෝවා දෙවි
එක දවසකින්[8] ඊශ්‍රායෙල්හි හිස[9] සහ
වල්ගයද[10] අතු සහ පන්ගස්ද කපා
දමන්නේය. **15** හිස නම් වැඩිහිටි
අය සහ ජනයාගේ ගෞරවය දිනාගත්
අයය.[11] වල්ගය නම් ජනයාව නො-
මඟ යවන බොරු අනාගතවක්තෘව-
රුන්ය.[12] **16** ජනයාට මඟ පෙන්වන
අය ඔවුන්ව මංමුළා කරති.[13] ඔවුන්
පසුපස යන අය වියවුලට පත් වෙති.[14]
**17** යෙහෝවා දෙවි ඔවුන්ගේ තරු-
ණයන් තුළ කිසි යහපතක් නොද-
කින්නේය.[15] පියා නැති දරුවාටවත්
වැන්දඹුවන්ටවත් ඔහු දයාව නො-
පෙන්වන්නේය. මන්ද ඒ සියලුදෙනාම
දෙවිට ද්‍රෝහිව කටයුතු කරන්-
නෝය.[16] සියල්ලෝම දුෂ්ටයෝය.
ඔවුන්ගේ මුවින් පිට වන්නේ නිෂ්ඵල
කතාමය. ඔවුන්ගේ දුෂ්ටකම හේතු-
වෙන් දෙවිගේ කෝපය තවමත් නිවී
නැත. ඔහුගේ හස්තය ඔවුන්ට විරුද්-
ධව දිගු කර තිබේ.[17]

**18** ඔවුන්ගේ දුෂ්ටකම බුරාබුරා
නඟින ගින්නක් මෙනි.[18] එය කටු

---

**2 තීරුව** **1** 2රාජ 16:9; **2** 2රාජ 16:6; **3** 2ලේක 28:18; **4** ද්වි 31:17; ගීතා 79:7; යෙරෙ 10:25; **5** යෙසා 5:25; යෙසා 10:4; **6** හොෂෙ 7:2; හොෂෙ 7:10; **7** 2රාජ 17:14; ආමො 4:6; ආමො 5:6; **8** යෙසා 10:17; හොෂෙ 10:15; **9** යෙසා 5:13; **10** ද්වි 13:5; 2රාජ 17:6; **11** යාකො 3:1; **12** ද්වි 13:1; යෙරෙ 5:31; මතෙ 7:15; **13** යෙසා 3:12; **14** මතෙ 15:14; **15** ගීතා 5:4; ගීතා 147:10; **16** ද්වි 4:25; **17** යෙසා 5:25; එස 20:33; **18** යෝබ් 31:12; නාහු 1:6.

පඳුරුද වල් පැළෑටිද දවා දමයි.[1] ඝන
වනාන්තර නැති නාස්ති කරයි.[2] අව-
සානයේදී ඉතුරු වන්නේ දුම් වලාවක්
පමණි.[3] **19** දේශය මෙසේ දැවෙන්-
නේ ස්වර්ගයේ සේනාවල අධිපති වන
යෙහෝවා දෙවිගේ ඇවිළෙන කෝ-
පය නිසයි. දේශයේ වැසියෝ ඒ ගින්-
නට දමන දර වැනිය.[4] කිසිවෙක් තම
සහෝදරයාටවත් අනුකම්පාව පෙන්-
වන්නේ නැත.[5] **20** යමෙක් දකුණු
පැත්තෙන් මස් කපාගෙන කෑවත් වම්
පැත්තෙන් මස් කපාගෙන කෑවත්
ඔහුගේ කුස පිරෙන්නේ නැත.[6] ඒ
එක් එක් කෙනා තම තමාගේම අත්
කපාගෙන කන්නෝය.[7] **21** මනස්-
සේ එෆ්‍රායිම්වද එෆ්‍රායිම් මනස්සේ-
වද කා දමන්නේය. එහෙත් යූදාට
විරුද්ධව යුද්ධ කිරීමට ඔවුහු එකතු
වන්නෝය.[8] ඔවුන්ගේ දුෂ්ටකම හේ-
තුවෙන් දෙවිගේ කෝපය තවමත් නිවී
නැත. ඔහුගේ හස්තය ඔවුන්ට විරුද්-
ධව දිගු කර තිබේ.[9]

**10** දුෂ්ට දේ නියෝග කරන අය-
ටද අසාධාරණ නීති පන-
වන අයටද බොහෝ දුක් පැමිණෙයි.[10]
**2** ඔවුහු දුප්පතුන්ගේ පැමිණිලි ගණ-
නකට නොගනිති. අසරණ වූ පීඩිත
ජනයාට යුක්තිය ඉටු කරන්නේද
නැත.[11] ඔවුහු වැන්දඹුවන්ගෙන්ද පියා
නැති දරුවන්ගෙන්ද සූරා කති.[12]
**3** ජනයෙනි, ඔබව සෝදිසි කරනු
ලබන දවස පැමිණෙන විට ඔබ කරන්-
නේ කුමක්ද?[13] ඈත දේශයකින් ඔබව
විනාශ කිරීමට පැමිණෙන ජනයා ඉදි-
රියේ ඔබ කුමක් කරාවිද?[14] ඔබ උප-
කාරය පතා දුවන්නේ කා ළඟටද?[15]
ඔබේ කීර්තියට සිදු වන්නේ කුමක්ද?[16]
**4** ඒ දවසේදී ඔබට සිදු වන්නේ සිරක-
රුවන් අතරේ බියෙන් නැමී සිටින්-
නයි. එසේත් නැත්නම් සතුරන් අතින්
මැරුම් කන්නයි. ඔබ මළ සිරුරුවලින්
වැසී යනු ඇත.[17] ඔබේ දුෂ්ටකම හේ-
තුවෙන් දෙවිගේ කෝපය තවමත් නිවී
නැත. ඔහුගේ හස්තය ඔබට විරුද්ධව
දිගු කර තිබේ.[18]

**5** “මගේ කෝපය ප්‍රකාශ කිරීමට
භාවිත කරන වේවැල[1] නම් ඇසිරි-
යානු[2] රජයි! ඔහුගේ අතේ තිබෙන්නේ
මගේ උදහස ප්‍රකාශ කිරීමට භාවිත
කරන සැරයටියයි. **6** මට ද්‍රෝහී වූ[3]
මේ සෙනඟට දඬුවම් කරන්න මම
ඔහුව එවන්නෙමි. මගේ උදහසට ලක්
වූ සෙනඟට විරුද්ධව ගොස් බොහෝ
වස්තු කොල්ල කන්නත් වීථියේ පාගා
දමන මඩ මෙන් ඔවුන්ගේ දේශය
පාගා දමන්නත්[4] මම ඔහුට අණ
කරන්නෙමි.[5] **7** ඔහුගේ සිතේ එවැනි
අදහසක් නොතිබුණත් ඔහු එසේ කිරී-
මට පෙලඹෙයි. ඔහු එසේ කිරීමට
නොසිතුවත් සැලසුම් යොදයි. මන්ද
ඔහුගේ එකම ආශාව[6] වන්නේ බො-
හෝ ජාතීන්ව සහමුලින්ම විනාශ කර
දමන්නයි.[7] **8** ඇසිරියානු රජ මෙසේ
උදම් අනයි. ‘මා යටතේ දැන් අධිප-
තීන් ලෙස සේවය කරන්නේ රජවරුන්
නොවෙයිද?[8] **9** කල්නො[9] නගරයට
සිදු වූයේ කර්කෙමිෂ්[10] දේශයට සිදු වූ
දේම නොවෙයිද? අර්පාද්[11] නගරය හා
හමාත්[12] නගරය අතර කිසි වෙනසක්
තිබෙනවාද? එසේනම්, දමස්කය[13]
හා සමාරිය[14] අතර තිබෙන වෙනස
කුමක්ද? **10** යෙරුසලමටත් සමාරි-
යටත් වඩා බොහෝ දේවතා රූපවලට
වැඳුම්පිදුම් කරන ජාතීන්ට විරුද්ධව
මම සටන් කළ විට මගේ අතින්
බේරාගන්න ඒ ජාතීන්ගේ දෙවිවරුන්
සමත් වුණාද?[15] **11** ඒ ජාතීන්ට කළ
ලෙසම මට සමාරියටත් එහි දෙවිව-
රුන්ටත් කරන්න බැරිද?[16] මම යෙ-
රුසලමටත් එහි දේවතා රූපවලටත්
කරන්නේ ඒ දේම නොවෙයිද?’[17]

**12** “යෙහෝවා දෙවි වන මම
සියොන් කන්දටත් යෙරුසලමටත්
නියම කළ දේ ඉටු කළ පසු, ඇසිරි-
යාවේ රජුගේ අහංකාරකමටත් ඔහු
උද්ධච්චකමින් කළ සියලු දේවලටත්
නිසි දඬුවම් දෙන්නෙමි.[18] **13** මන්ද
ඔහු මෙසේ කියා තිබේ. ‘මම හැම
දෙයක්ම කරන්නේ මගේම ශක්-

**18** 2රාජා 18:19; 2රාජා 18:35; ගීතා 18:27.

**9 පරි.**
**1** මලා 4:1; හෙබ්‍රෙ 6:8
**2** එස 20:47
**3** ගීතා 37:20; හොෂෙ 13:3
**4** යෙසා 10:17; යෙරෙ 9:12; ශෙප 1:18
**5** මීකා 7:6
**6** ලෙවී 26:26; ද්වි 28:51
**7** ලෙවී 26:29; ද්වි 28:55
**8** 2ලේක 28:6
**9** යෙසා 5:25

**10 පරි.**
**10** ලෙවී 19:15; ද්වි 1:17
**11** යෙසා 29:21; විලා 3:36; ආමො 2:7
**12** ද්වි 27:19; යෙසා 1:23; යාකො 1:27
**13** හොෂෙ 9:7
**14** ද්වි 28:49; යෙසා 5:26
**15** හොෂෙ 5:13
**16** ගීතා 49:17
**17** ද්වි 32:30
**18** යෙසා 5:25

**2 තීරුව**
**1** 2රාජා 17:3; යෙසා 8:4; යෙසා 10:24
**2** උත් 10:11
**3** ගීතා 73:27; යෙසා 24:5; යෙසා 33:14; යෙරෙ 3:8
**4** ද්වි 28:63; 2රාජා 17:23
**5** 2රාජා 17:6
**6** විලා 2:16; මීකා 4:11
**7** 2රාජා 18:34; යෙසා 37:12
**8** 2රාජා 18:24
**9** ආමො 6:2
**10** 2ලේක 35:20; යෙරෙ 46:2
**11** 2රාජා 19:13; යෙරෙ 49:23
**12** 2සාමු 8:9; 2රාජා 17:24
**13** 2රාජා 16:9
**14** 2රාජා 17:5; 2රාජා 18:10
**15** 2රාජා 18:34; 2රාජා 19:18; 2ලේක 32:19
**16** යෙසා 36:19; යෙසා 37:12; යෙරෙ 16:20; 1කොරි 8:4
**17** 2රාජා 21:11

තියෙන්[1] හා මගේම බුද්ධියෙන්. මම
ජාතීන්ගේ දේශ සීමාවන් පවා වෙ-
නස් කර[2] ඔවුන්ගේ වස්තු කොල්ල
කනවා.[3] බලවන්තයෙකු මෙන්
ඔවුන්ගේ වැසියන්වත් යටත් කරගන්-
නවා.[4] 14 යමෙකු කුරුලු කූඩුවකට
අත දමා[5] බිත්තර එකතු කරන්නාක්
මෙන් මම ජාතීන්ගේ වස්තු කොල්ල
කා[6] මුළු පොළොවම අල්ලාගන්නවා.
කිසි කුරුල්ලෙක් කූඩුව ළඟට ඇවිත්
තටු ගසන්නේවත් හොට ඇර කෑග-
සන්නේවත් නැහැ.’ ”

15 දර පළන්නාට වඩා පොරව
උසස් වෙන්න වෑයම් කරනවාද?
කියතෙන් කපන තැනැත්තාට වඩා
එය උතුම් කියා කියතට කිව
හැකිද? සැරයටියකට හෝ දණ්ඩකට
හෝ පුළුවන්ද එය අල්ලගෙන සිටින
තැනැත්තාව පාලනය කරන්න?[7]
16 සැබෑ ස්වාමීන්ද ස්වර්ගයේ සේනා-
වල අධිපතිද වන යෙහෝවා දෙවි ඒ
රජුගේ ශක්තිමත් පුරුෂයන්ගේ සවිය
නැති කර දැමීමට දරුණු රෝග-
යක් එවයි.[8] ඔහුගේ තේජස දවා දැමී-
මට ගින්නක් පත්තු කරනු ඇත.[9]
17 ඊශ්‍රායෙල්වරුන්ගේ ආලෝකයද[10]
ඔවුන්ගේ ශුද්ධ තැනැත්තාද වන දෙවි
ගින්නක්[11] මෙන් පැමිණ ඔහුගේ වල්
පැළෑටි සහ කටු පඳුරු[12] එක දවසකින්
දවා දමයි. 18 ඔහුගේ වනළැහැබේද
පලතුරු උයනේද අලංකාරය පහව
යයි.[13] දරුණු රෝගයකින් පෙළෙන
කෙනෙකු වැහැරී යන්නාක් මෙන් ඒවා
විනාශ වී යයි.[14] 19 ඔහුගේ වනළැ-
හැබේ ඉතුරු වන ගස් ළාබාල දරු-
වෙකුට වුවත් ගණන් කිරීමට හැකි
වෙයි.[15]

20 ඒ කාලයේදී ඊශ්‍රායෙල් දේශයේ
ඉතුරු වන අයද[16] යාකොබ්ගේ ගෘහ-
යේ බේරී ජීවත් වන අයද නැවත
කිසිදා තමන්ට පහර දුන් තැනැත්-
තාගෙන් උපකාර පතන්නේ නැත.[17]
ඔවුහු ඊශ්‍රායෙල්හි ශුද්ධ තැනැත්තා[18]
වන යෙහෝවා දෙවිව මුළු හදින්ම
විශ්වාස කර[19] ඔහුගෙන් උපකාර
පතන්නෝය. 21 බලවත් දෙවි වෙ-
තට නැවත හැරී එන්නේ යාකොබ්ගේ
පෙළපතට අයත් වන කුඩා පිරි-
සක් පමණි.*[1] 22 ඊශ්‍රායෙල්වරුනි,
ඔබ දැන් මුහුදේ වැලි මෙන් වූ විශාල
සෙනඟක් වුවද[2] ඔබෙන් නැවත හැරී
එන්නේ කුඩා පිරිසක් පමණි.[3] ඔබ පිට
පැමිණීමට නියම කර තිබෙන විනා-
ශය[4] සැඩ දිය පහරක් මෙන් පැමි-
ණෙයි. එය සාධාරණ විනාශයකි.[5]
23 විශ්වයේ පාලකයාද ස්වර්ගයේ
සේනාවල අධිපතිද වන යෙහෝවා
දෙවි නියම කර තිබෙන එම විනාශය[6]
මුළු දේශයටම බලපායි.[7]

24 විශ්වයේ පාලකයාද[8] ස්වර්ගයේ
සේනාවල අධිපතිද වන යෙහෝවා
දෙවි මෙසේ පවසයි. “සියොන්හි වාසය
කරන මාගේ සෙනඟෙනි,[9] ඊජිප්තුව-
රුන් ඔබට කළාක් මෙන්[10] සැරය-
ටියෙන්[11] හා දණ්ඩෙන් ඔබට පහර
දුන් ඇසිරියානු රජුට බිය නොවන්න.
25 මන්ද තව කෙටි කාලයකින්
මාගේ උදහස[12] පහ වෙයි. මම ඔවුන්
පිටට මගේ උදහස ප්‍රකාශ කර ඔවුන්ව
විනාශ කර දමන්නෙමි.[13] 26 ස්වර්-
ගයේ සේනාවල අධිපති වූ යෙහෝවා
දෙවි වන මම ඔරෙබ්[14] පර්වතය ළඟ
මිදියන්වරුන්ව පරාජය කළාක් මෙන්
ඔහුට කසයකින් පහර දෙන්නෙමි.[15]
ඊජිප්තුවේදී කළාක් මෙන්[16] මම මුහුද
දෙසට සැරයටිය දිගු කරන්නෙමි.[17]

27 “ඒ දවසේදී ඔහු ඔබ පිට පැටවූ
බරෙන් ඔබ නිදහස් වන්නහුය.[18] ඔහු
ඔබ පිට තැබූ වියගහද අහකට ගනු
ඇත.[19] තෛලය* නිසා වියගහ මුළුම-
නින්ම කැඩී යයි.”[20]

**10 පරි.**

**1** ද්වි 8:17; එස 25:3; එස 29:3
**2** 2රාජා 15:29; 2රාජා 17:6; 2රාජා 18:11; 1ලේක 5:26
**3** 2රාජා 16:8; 2රාජා 18:16
**4** 2රාජා 18:25
**5** යෝබ් 31:25; හබ 2:5
**6** උත් 34:29; යෙසා 8:4
**7** යෙසා 10:5
**8** 2ලේක 32:21
**9** යෙසා 30:30; යෙසා 30:31
**10** ගීතා 27:1; ගීතා 84:11; යෙසා 31:9; යෙසා 60:19; එළි 22:5
**11** ද්වි 4:24; ගීතා 18:8; සල 8:6; යෙසා 30:27; හෙබ්‍රෙ 12:29
**12** 2රාජා 14:9; ගීතා 97:3; යෙසා 9:5; නාහු 1:6
**13** 2ලේක 32:21
**14** යෙරෙ 21:14
**15** යෙසා 37:36
**16** එස්රා 6:16; යෙසා 1:9; එස 37:21; රෝම 9:27
**17** 2ලේක 28:20; හොෂෙ 5:13; හොෂෙ 14:3
**18** ලෙවී 19:2; 1සාමු 2:2
**19** එස්රා 1:3; නෙහෙ 1:9; යෙසා 17:7; යෙසා 54:13

**2 තීරුව**

**1** යෙසා 65:9; හොෂෙ 1:10; හොෂෙ 6:1; රෝම 9:29
**2** 1රාජා 4:20
**3** රෝම 9:27; රෝම 11:5
**4** යෙසා 28:22
**5** ද්වි 32:4; ගීතා 145:17
**6** යෙසා 1:9
**7** ද්වි 28:63; ආමො 4:13; රෝම 9:28
**8** ක්‍රියා 4:24; හෙබ්‍රෙ 12:23
**9** යෙසා 4:3; යෙසා 12:6
**10** නික් 14:3; නික් 14:9

---

**11** 2රාජා 18:13; යෙසා 10:5; යෙසා 37:37; **12** 2රාජා 19:35; **13** මීකා 7:9; **14** විනි 7:25; විනි 8:21; ගීතා 83:11; **15** 2ලේක 32:21; යෙසා 30:32; යෙසා 37:36; මීකා 7:10; නාහු 3:7; **16** නික් 14:27; නෙහෙ 9:11; ගීතා 106:11; **17** නික් 14:21; හබ 3:15; **18** යෙසා 9:4; නාහු 1:13; **19** යෙසා 14:25; **20** 2රාජා 19:35; යෙසා 37:35; යෙසා 37:36.

---

යෙසා **10:21*** යෙසා 7:3හි සඳහන්, “ෂෙයර්-යාෂුබ්” යන හෙබ්‍රෙව් නමෙහි අර්ථයට සමාන අර්ථයකි. **27*** මෙය ඇවීම සඳහා හෝ රජවරුන්ව අභිෂේක කිරීම සඳහා භාවිත වූ තෙල් විය හැකියි.

**28** අයියත්[1] නම් නගරයට ඔහු
ඇතුල් විය. මිග්‍රොන් නගරය
මැදින්ද ගොස් මික්මාෂ්හි[2] තමන්ගේ
බඩු තැන්පත් කළේය. **29** ඔහු කඳු
මාවත පසු කර ගොස් ගෙබා[3] නගර-
යේ රාත්‍රිය ගත කළේය. ඔහුගේ සේ-
නාව නිසා රාමාහි[4] වැසියෝ බිය වී
ඇත. සාවුල් රජ වාසය කළ ගිබෙයා[5]
නගරයේ වැසියෝ පලා ගොස් ඇත.
**30** ගල්ලිම්[6] නගරයේ වැසියෙනි, හඬ
නඟන්න. ලායිෂා නගරයේ වැසි-
යෙනි, සූදානමින් සිටින්න. අනා-
තොත්හි[7] අසරණ වැසියෙනි, ඔබත්
සූදානමින් සිටින්න! **31** මද්මේනාහි
වැසියෝ පලා ගොස් ඇත. ගෙබිම්හි
වැසියෝ ආරක්ෂිත තැන් සොයා යති.
**32** දිවා කාලයේදී ඇසිරියානු ජාතික-
යෝ නොබ්[8] නගරයේ නතර වෙති.
ඔවුහු යෙරුසලමේ කන්ද[9] එනම්,
සියොන් නුවර පිහිටි කන්දට විරුද්ධව
තම අත් අමෝරාගෙන සිටිති.

**33** නමුත් සැබෑ ස්වාමීන්ද ස්වර්-
ගයේ සේනාවල අධිපතිද වන යෙ-
හෝවා දෙවි ගස්වල අතු කපා
දමන්නේය.[10] දැවැන්ත ගස්ද පො-
ළොවට හෙළනු ඇත. උත්තමයන්ව
පහත් කරනු ලබයි.[11] **34** දෙවි
යකඩ ආයුධයකින් වනළැහැබේ ගස්
කපා දමයි. බලවත් තැනැත්තෙකු
නිසා ලෙබනොන්හි ගස් පොළොවට
කඩා වැටෙයි.[12]

# 11

යෙස්සේගේ[13] කඳෙන් අංකුර-
යක්[14] හටගන්නේය. ඔහුගේ
මුල්වලින් පැළෑටියක්[15] හටගෙන පල
දරන්නේය.[16] **2** ඔහුට යෙහෝවා
දෙවිගේ බලය නොඅඩුව ලැබෙයි.[17]
එමගින් ඔහුට ප්‍රඥාවද[18] දැනුමද[19]
තේරුම්ගැනීමේ හැකියාවද[20] නැණ-
වත් උපදෙස් දීමේ හැකියාවද ශක්ති-
යද[21] ලැබෙන්නේය. ඔහු යෙහෝවා
දෙවිට ගරුබිය ඇතුව ජීවත් වෙයි.[22]
**3** යෙහෝවා දෙවිට ගරුබිය[23] දැක්වී-
මෙන් ඔහු මහත් ප්‍රීතියක් ලබයි.

ඔහු මතුපිටින් දකින දේ අනුව
විනිශ්චය නොකරයි. ඔහුට යමක්
ඇසුණු පමණින්ද ඔහු දඬුවම් නොක-
රයි.[1] **4** ඔහු දිළිඳු අයව ධර්මිෂ්ඨක-
මින් විනිශ්චය කරයි.[2] ඔහු සාධාරණව
කටයුතු කර යටහත්පහත් අයගේ
ප්‍රයෝජනය සඳහා අවවාද දෙයි. ඔහු-
ගේ මුඛයෙන් දණ්ඩක් නික්මෙන
අතර ඔහු එමගින් පොළොවට පහර
දෙන්නේය.[3] තම මුඛයෙන් නික්මෙන
දෙයින්* ඔහු දුෂ්ටයාව මරණයට පත්
කරන්නේය.[4] **5** ධර්මිෂ්ඨකම ඔහු-
ගේ ඉඟපටියද[5] විශ්වාසවන්තකම
ඔහුගේ බඳපටියද වෙයි.[6]

**6** ඒ කාලයේදී බැටළුවා වෘකයා
සමඟත්[7] එළු පැටවා දිවියා සමඟත්
බියක් නොමැතිව ජීවත් වන්නේය.
වසු පැටවාද තරුණ කේශර සිංහයාද[8]
තර වස්සාද එකට ලගින්නෝය.[9]
කුඩා දරුවෙක් උන් සියල්ලන්ව බලා-
ගන්නේය. **7** එළදෙනත් වැලහින්-
නත් එකට තණ කන්නෝය. උන්ගේ
පැටවුද එකට ලගින්නෝය. සිංහ-
යාද ගොනා මෙන් පිදුරු කන්නේය.[10]
**8** කිරි බොන දරුවා නයාගේ තුඹස
පිට සෙල්ලම් කරන්නේය.[11] කිරි වැරූ
දරුවා විෂ සර්පයෙකුගේ ගුල තුළට
අත දමන්නේය. **9** මගේ ශුද්ධ කන්-
දේ[12] කොතැනකදීවත් කිසිවෙක්
හානියක් වන අයුරින් කටයුතු කරන්-
නේවත්[13] විනාශයක් සිදු කරන්නේ-
වත් නැත. මන්ද ජලයෙන් මුහුද පිරී
තිබෙන්නාක් මෙන් යෙහෝවා දෙවි
වන මා පිළිබඳ දැනුමෙන් පොළොව
පිරී තිබෙන්නේය.[14]

**10** ඒ දවසේදී[15] යෙස්සේගේ පෙළ-
පතින් මුලක්[16] හටගනු ඇත. සියලු
ජනයාට ලකුණක් පිණිස ඔහුව කො-
ඩියක් සේ සිටවනු ලබන්නේය.[17]

**10 පරි.**

**1** යොෂු 7:2
**2** 1සාමු 13:2
1සාමු 14:31
**3** යොෂු 18:24
යොෂු 21:17
2ලේක 16:6
**4** හොෂෙ 5:8
**5** විනි 20:13
හොෂෙ 9:9
හොෂෙ 10:9
**6** 1සාමු 25:44
**7** යොෂු 21:18
1රාජා 2:26
යෙරෙ 1:1
**8** 1සාමු 22:19
නෙහෙ 11:32
**9** 2රාජා 19:21
ගීතා 132:13
යෙසා 10:24
**10** 2ලේක 32:21
යෙසා 37:36
**11** යෝබ් 40:11
යෙසා 2:11
දානි 4:37
ලූක් 14:11
**12** නාහු 1:4

**11 පරි.**

**13** රූත් 4:17
1සාමු 17:58
මතෙ 1:6
ලූක් 3:32
ක්‍රියා 13:22
රෝම 15:12
**14** යෙසා 53:2
සෙක 6:12
එළි 5:5
එළි 22:16
**15** යෙරෙ 23:5
යෙරෙ 33:15
සෙක 3:8
සෙක 6:12
ක්‍රියා 13:23
**16** 2සාමු 7:16
**17** යෙසා 42:1
යොහ 1:32
ක්‍රියා 10:38
**18** ලූක් 2:52
1කොරි 1:30
**19** 1කොරි 12:8
එෆි 1:17
**20** යොහ 14:17
යොහ 16:13
**21** යෙසා 9:6
**22** යූද් 9
**23** හිතෝ 2:5
හිතෝ 8:13
හෙබ්‍රෙ 5:7

**2 තීරුව**

**1** 1රාජා 3:28
යොහ 7:24
යොහ 8:16
**2** ගීතා 45:7
හිතෝ 31:9
**3** ගීතා 2:9
ගීතා 110:2
එළි 19:15
**4** 2තෙස 2:8
එළි 2:16

**5** එෆි 6:14; එළි 1:13; **6** හෙබ්‍රෙ 2:17; හෙබ්‍රෙ 3:6; එළි 3:14; **7** යෙසා 65:25; **8** ගීතා 148:10; **9** එස 34:25; **10** හොෂෙ 2:18; **11** ද්වි 32:33; ගීතා 58:4; **12** යෙසා 51:3; යෙසා 56:7; යෙසා 57:13; යෙසා 65:25; එස 20:40; **13** යෙසා 2:4; යෙසා 35:9; යෙසා 60:18; මීකා 4:4; එෆි 4:23; **14** ගීතා 22:27; හබ 2:14; **15** යෙසා 2:2; **16** ගීතා 132:11; රෝම 15:12; එළි 22:16; **17** උත් 49:10; මතෙ 25:31; එළි 14:1.

**යෙසා 11:4*** මූ.අ., “මුඛයේ බලයෙන්.”

විවිධ ජාතීහු ඔහුගෙන් මඟ පෙන්වීම
පතන්නෝය.[1] ඔහුගේ වාසස්ථානය
තේජසින් පිරී යන්නේය.[2]

**11** ඒ කාලයේදී යෙහෝවා දෙවි
දෙවන වරටත්[3] අත දී ඉතුරු වී සිටින
තම සෙනඟව බේරාගන්නේය. ඇසි-
රියාව,[4] ඊජිප්තුව,[5] පත්‍රොස්,[6] කූෂ්,[7]
ඒලාම්[8] සහ ෂීනාර්[9] යන දේශවලද
හමාත් නගරයේද දූපත්වලද සිටින
සියලුදෙනාවම ඔහු එක් රැස් කරගන්-
නේය.[10] **12** දෙවි සියලු ජනයාට
ලකුණක් පිණිස කොඩියක් සිටුවා
විසිර සිටින ඊශ්‍රායෙල්වරුන්ව එකතු
කරගන්නේය.[11] ඔහු පොළොව පුරාම
විසිරී සිටින යුදෙව්වරුන්ව නැවත
එක් රැස් කරන්නේය.[12]

**13** ඒ කාලයේදී එෆ්‍රායිම්ගේ
ඊර්ෂ්‍යාව පහ වී යයි.[13] යූදාට සතු-
රුකම් කළ සියලුදෙනා විනාශ වී
යන්නෝය. එෆ්‍රායිම් යූදාට ඊර්ෂ්‍යා
කරන්නේවත් යූදා එෆ්‍රායිම්ට තවත්
සතුරුකම් කරන්නේවත් නැත.[14]
**14** ඔවුහු බස්නාහිර දෙසින් පිහිටි
පිලිස්තිවරුන්ගේ කඳු බෑවුම මතට
කඩාවදින්නෝය.[15] ඔවුහු එකතු වී
නැඟෙනහිර දෙසින් ජීවත් වන ජන-
යාට[16] පහර දී ඔවුන්ගෙන් කොල්ල
කන්නෝය. ඔවුහු ඒදොම්වරුන්වද
මෝවබ්වරුන්වද[17] අම්මොන්වරුන්-
වද යටත් කරගන්නෝය.[18] **15** යෙ-
හෝවා දෙවි, ඊජිප්තු මුහුදු බොක්කේ
ජලය වියළී යෑමට සලස්වන්නේය.[19]
ඔහු තම අත දිගු කොට ගිනි-
මය සුළඟකින් මහ ගඟත්*[20] එහි
අතු ගංගා සතටත් පහර දෙන්නේය.
එවිට ජනයා තමන්ගේ පාවහන් ගල-
වන්නේවත් නැතුව ගොඩබිමේ ඇවිද-
ගෙන යන ආකාරයට ගඟෙන් එගොඩ
වන්නෝය.[21] **16** ඊජිප්තු දේශයෙන්
පිටතට ඒමට ඊශ්‍රායෙල්වරුන්ට මඟ
සලසා දුන් ආකාරයටම දෙවිගේ සෙ-
නඟ අතරින් ඉතුරු වී සිටින අයට[22]
ඇසිරියාවෙන් පිටතට ඒම සඳහා
මාර්ගයක්[23] සකස් කර තිබෙයි.

---

යෙසා **11:15*** එනම්, යුප්‍රටීස් ගඟ.

**11 පරි.**
**1** ලූක් 2:32 ක්‍රියා 11:18 ක්‍රියා 28:28 රෝම 15:9
**2** යෙසා 56:7 හග් 2:7 පිලි 2:10 එළි 7:15
**3** ලෙවී 26:42 ද්වි 4:31 යෙසා 11:16 යෙරෙ 23:8 එස 11:17
**4** යෙසා 27:13 මීකා 7:12
**5** යෙසා 19:23 යෙරෙ 44:28
**6** යෙරෙ 44:15
**7** ශෙප 3:10
**8** දානි 8:2
**9** සෙක 5:11
**10** යෙසා 66:19
**11** එස්රා 1:3 යෙසා 49:22 යෙසා 62:10
**12** ගීතා 147:2 යෙසා 66:20 ඔබ 20 සෙක 2:7 මතෙ 24:31
**13** 2ලේක 30:10 යෙරෙ 31:6
**14** යෙරෙ 3:18 එස 37:16 එස 37:19 හොෂෙ 1:11
**15** සෙක 9:5
**16** යෙසා 9:12
**17** යෙසා 25:10 ආමෝ 9:12 ඔබ 18
**18** යෙසා 60:14 යෙරෙ 49:2
**19** නික් 10:19 නික් 14:22 යෙසා 50:2
**20** උත් 15:18
**21** එළි 16:12
**22** එස්රා 1:3 යෙසා 27:13 යෙසා 35:8 යෙසා 48:20 යෙසා 49:12 යෙරෙ 31:21
**23** යෙසා 19:23 යෙසා 40:3 යෙසා 57:14 යෙසා 62:10

**12** ඒ දවසේදී[1] ඔබ මෙසේ කියනු
ඇත. "යෙහෝවා දෙවියනි,
ඔබ මා සමඟ කොතරම් උදහස් වී
සිටියත් ඒ උදහස දැන් පහව ගිහින්.[2]
ඔබ මාව සැනසුවා.[3] ඒ ගැන මා
හද පත්ලෙන්ම ඔබට ස්තුතිවන්ත
වෙනවා. **2** දෙවියනි, මට ගැලවීම
ලබා දෙන්නේ ඔබයි.[4] මගේ විශ්වා-
සය ඔබයි. ඒ නිසා මා කිසි දෙයකට
බිය වන්නේ නැහැ.[5] යාහ් යෙහෝවා
දෙවියනි, මට ගැලවීම ලබා දුන්නේ
ඔබයි.[6] මට ශක්තියත්[7] ආරක්ෂාවත්[8]
ලැබෙන්නේ ඔබගෙන්."

**3** ඔබ ගැලවීම නමැති ළිංවලින්
ප්‍රීතියෙන් දිය ඇදගන්නහුය.[9] **4** ඒ
දවසේදී ඔබ මෙසේ කියනු ඇත.
"ජනයෙනි, යෙහෝවා දෙවිට ස්තුති
කරන්න![10] ඔහුගේ නම කියා අයැ-
දින්න.[11] ඔහු කළ දේවල් ගැන ජන-
යාට දන්වන්න.[12] ඔහුගේ නාමය
මොන තරම් ශ්‍රේෂ්ඨද කියා ජන-
යාට පවසන්න.[13] **5** යෙහෝවා දෙ-
විට ප්‍රශංසා ගී ගයන්න.[14] මන්ද ඔහු
අරුමපුදුම දේවල් කළේය.[15] ඔහුගේ
පුදුම ක්‍රියා මුළු ලෝකය පුරාම පතළ
වී තිබේ.

**6** "සියොන්හි වැසියෙනි, ප්‍රීතියෙන්
හඬ නඟන්න! මන්ද ඔබ සමඟ සිටින
ඊශ්‍රායෙල්හි ශුද්ධ තැනැත්තාණන්[16]
ඉතා උසස්ය."

**13** බැබිලෝනියට විරුද්ධව දුන්
තීන්දුව[17] ගැන ආමොෂ්ගේ[18]
පුත් යෙසායාට ලැබුණු දර්ශනය මෙ-
යයි. **2** "ජනයෙනි, පාළු පර්වතයක්
මත කොඩියක් සිටුවන්න.[19] අතින්
සංඥා කර[20] ඔවුන්ව කැඳවන්න.

---

**2 තීරුව 12 පරි.** **1** යෙසා 10:20; යෙසා 44:28; යෙසා 52:6; **2** ගීතා 126:1; යෙසා 40:2; **3** ද්වි 30:3; ගීතා 30:5; ගීතා 85:1; යෙසා 66:13; හොෂෙ 6:1; **4** ගීතා 126:4; යෙසා 45:17; යෝනා 2:9; එළි 7:10; **5** යෙසා 26:4; **6** හොෂෙ 1:7; **7** පිලි 4:13; 1පේතෘ 4:11; **8** ගීතා 91:1; ගීතා 118:14; **9** ගීතා 36:8; යෙසා 49:10; යෙරෙ 2:13; සෙක 13:1; එළි 7:17; එළි 22:17; **10** ගීතා 30:4; ගීතා 118:1; ගීතා 138:2; **11** 1ලේක 16:8; ගීතා 105:1; රෝම 10:13; **12** ගීතා 9:11; ගීතා 40:5; ගීතා 105:2; ගීතා 145:4; **13** නික් 15:2; **14** ගීතා 47:6; ගීතා 149:3; **15** ගීතා 72:18; ගීතා 98:1; **16** යෙසා 10:20; **13 පරි.** **17** යෙසා 14:4; යෙරෙ 25:12; යෙරෙ 50:1; එළි 18:2; **18** යෙසා 1:1; **19** යෙරෙ 50:2; යෙරෙ 51:12; යෙරෙ 51:27; **20** යෙසා 10:32.

ඔවුන්ට හඬගසා උත්තමයන්ගේ දො-
රකඩින් ඇතුල් වෙන්න කියා
පවසන්න.[1] **3** මගේ උදහස ප්‍රකාශ
කරන පිණිස මම මගේ බලවන්ත-
යන්ව කැඳවාගතිමි.[2] මා තෝරාගත්
සටන්කරුවන්ට* නියෝගය දුන්-
නෙමි.[3] ඔවුහු ප්‍රීතියෙන් ඉපිල යති.
**4** සවන් දෙන්න! කඳුකරය දෙසින්
සමූහයකගේ හඬ ඇසෙයි. ඔවුන්-
ගේ හඬ මහත් සමූහයක් නඟන හඬ
මෙනි.[4] සවන් දෙන්න! එකට එක් රැස්
කරනු ලැබූ ජාතීහුද රාජ්‍යයන්ද එක්ව
හඬ නඟති![5] ස්වර්ගයේ සේනාවල අධි-
පති වන යෙහෝවා නම් වූ මම සේ-
නාව සටනට සූදානම් කරමි.[6] **5** ඒ
සේනාව දුර බැහැර දේශයකින් පැමි-
ණෙන්නෝය.[7] ක්ෂිතිජය පෙනෙන
දිශාවෙන් ඔවුහු එන්නෝය. මගේ උද-
හස ප්‍රකාශ කිරීමට ආයුධයක් මෙන්
යොදාගන්නා ඒ සෙනඟ සමඟ යෙ-
හෝවා දෙවි වන මම පැමිණ මුළු දේ-
ශයටම පහර දෙන්නෙමි.[8]

**6** “ජනයෙනි, විලාප නඟන්න.[9]
මන්ද යෙහෝවා දෙවි වන මාගේ දවස
ළඟය![10] සියලු බලැති තැනැත්තා වන
මා මහත් විනාශයක් සිදු කරන එම
දවස නිසැකවම පැමිණෙන්නේය.[11]
**7** එදාට සියල්ලෝම කිසිවක් කරකි-
යාගත නොහැකිව භයෙන් වෙවුලන්-
නෝය.[12] **8** ජනයා කැලඹීමට පත්
වන්නෝය.[13] ඔවුහු මහත් වේදනාද
සිත්තැවුල්ද අද්දකින්නෝය. ස්ත්‍රිය-
කට ඇති වන ප්‍රසව වේදනාව මෙන්
දරුණු වේදනා විඳින්නෝය.[14] එකි-
නෙකා දෙස භයෙනුත් පුදුමයෙනුත්
බලා සිටින ඔවුන්ගේ මුහුණු සුදුමැලි වී
ඇත.[15]

**9** “යෙහෝවා දෙවි වන මාගේ
දවස පැමිණෙන්නේය. මාගේ දැවෙන
උදහස වගුරුවන එම දවස ඉතා භයා-
නකය. මම දේශයේ පව්කාරයන්ව
සහමුලින්ම නැති කර දමන්නෙමි.[16]
දේශයට සිදු වන විනාශය මොන
තරම්ද කිවහොත් මිනිස්සු කට ඇර
පුදුමයෙන් ඒ දෙස බලා සිටිති.[1]
**10** ඒ දවසේදී අහසේ තාරකාවත් එහි
තාරකා මණ්ඩලවත්*[2] බැබළෙන්නේ
නැත. ඉර පායද්දීම එය අඳුරු වෙයි.
සඳද එළිය නොදෙයි. **11** දේශයේ
වැසියන් කළ දුෂ්ටකම්වලට මම නිසි
දඬුවම් දෙමි.[3] දුෂ්ටයෝ තමන් කළ
වැරදිවලට දඬුවම් විඳිනු ඇත. අහං-
කාර අයගේ උඩඟුකමත් කුරිරු පාල-
කයන්ගේ උඩඟුකමත් මම පහ කර
දමමි.[4] **12** ඒ කාලයේදී මිනිසුන්ව
සොයාගැනීම, ඕෆීර් දේශයේ අනර්ඝ
රන්[5] සොයාගැනීමටත් වඩා දුෂ්-
කර වෙයි.[6] **13** ස්වර්ගයේ සේනා-
වල අධිපති වූ යෙහෝවා දෙවි වන
මාගේ දැවෙන කෝපය ප්‍රකාශ කරන
දවසේදී[7] අහස පවා කම්පා වෙයි.[8]
මාගේ උදහස නිසා පොළොවද සෙ-
ලවී යන්නේය.[9] **14** එවිට, පන්නා
දැමූ මුවදෙනක මෙන්ද විසිරී ගිය
බැටළු රැළක් මෙන්ද[10] ඔවුහු එක්
එක් කෙනා තම තමන්ගේ දේශය-
ටත් තම තමන්ගේ සෙනඟ වෙතටත්
හැරී යනු ඇත.[11] **15** දේශයේ ඉතු-
රුව සිටින අයද දේශයෙන් පලා යන
අයද යන දෙපිරිසම කඩුවෙන් මැරුම්
කන්නෝය.[12] **16** ඔවුන් බලා සිටිය-
දීම සතුරෝ ඔවුන්ගේ දරුවන්ව පො-
ළොවේ ගසා මරා දමති.[13] ඔවුන්ගේ
ගෙවල් කොල්ල කා ඔවුන්ගේ භාර්යා-
වන්ව දූෂණය කරති.[14]

**17** “ඔවුන්ට විරුද්ධව නැඟී සිටී-
මට මම මේදිය ජාතිකයන්ව
පොලඹවන්නෙමි.[15] ඔවුහු රිදීවලට-
වත් රන්වලටවත් ආශා නොකරති.
**18** ඔවුන් විදින ඊතල නිසා තරු-
ණයෝ මැරී වැටෙති.[16] දරුවන්ට-
වත් බිළිඳුන්ටවත් ඔවුහු අනුකම්පා
නොකරති.[17] **19** අන් සියලු රාජ්‍ය-
යන්ට වඩා අලංකාර වූ,[18] කල්දි-
වරුන්ගේ මහත් ආඩම්බරයට හේතු
වූ[19] ඔවුන්ගේ තේජස වන බැබි-
ලෝනියට සිදු වන්නේ මා සොදොම්

**13 පරි.**
**1** යෙසා 45:1
**2** ගීතා 149:7
යෝවෙ 3:11
**3** යෙරෙ 51:28
**4** යෙරෙ 51:11
යෙරෙ 51:27
**5** යෙරෙ 50:3
යෙරෙ 51:11
දානි 5:28
**6** යෙරෙ 50:15
යෙරෙ 51:3
**7** යෙරෙ 50:9
යෙරෙ 51:28
**8** යෙරෙ 51:11
යෙරෙ 51:20
**9** යෝවෙ 3:14
**10** ශෙප 1:14
**11** යෙසා 13:18
යෙරෙ 50:13
**12** යෙරෙ 50:43
**13** දානි 5:6
**14** යෙරෙ 50:43
**15** යෝවෙ 2:6
නාහු 2:10
**16** යෙරෙ 50:42

**2 තීරුව**
**1** හිතෝ 13:21
**2** යෝබ් 9:9
යෝබ් 38:31
ආමෝ 5:8
**3** ගීතා 137:8
යෙසා 24:6
යෙරෙ 51:37
එළි 18:2
**4** යෙරෙ 50:29
දානි 5:23
**5** 1රාජා 10:11
1ලේක 29:4
ගීතා 45:9
**6** යෙරෙ 50:30
යෙරෙ 51:3
**7** ගීතා 110:5
යෙසා 13:6
**8** හග් 2:6
හග් 2:21
**9** යෙරෙ 51:29
2පේතෘ 3:10
**10** යෙසා 47:15
**11** යෙරෙ 50:16
**12** යෙසා 14:19
යෙරෙ 50:27
යෙරෙ 51:3
**13** ගීතා 137:9
**14** ගීතා 137:8
**15** යෙසා 21:2
යෙරෙ 50:9
යෙරෙ 51:11
දානි 5:31
**16** යෙසා 21:15
යෙරෙ 50:14
යෙරෙ 50:42
**17** 2රාජා 8:12
යෙසා 13:16
**18** යෙසා 47:5; යෙරෙ 51:13; දානි 4:30; **19** යෙසා 47:1.

---

**යෙසා 13:3*** මූ.අ., “මාගේ ශුද්ධ තැනැත්තන්ට.”

**යෙසා 13:10*** හෝ, “කේසිල් තරු මණ්ඩල.”

සහ ගොමෝරාව[1] යන නුවරවලට
සිදු කළ දේමයි. **20** නැවත කෙදින-
කවත් කිසි කෙනෙකුට බැබිලෝනි-
යේ ජීවත් වෙන්න ලැබෙන්නේ නැත.[2]
ඇයට නැවත කිසිදා ස්ථානයක් හිමි
වන්නේද නැත.[3] අරාබි ජාතිකයන්
එහි තමන්ගේ කූඩාරම් ගසාගන්-
නේවත් එඬේරුන් තමන්ගේ බැටළු
රැළවල් එතැනට ගෙන යන්නේවත්
නැත. **21** වතුර නැති පාළු තැන්-
වල වෙසෙන වනසත්තු එහි වෙසෙති.
එහි පාළුවට ගිය නිවෙස්වල ලගින්-
නේ බකමූණන් පමණි.[4] පැස්බරුද
භූතයෝද* එහි සැරිසරති.[5] **22** එහි
බලකොටුවල හිවල්ලු උඩු බුරති.[6]
ඔවුන්ගේ සුඛෝපභෝගී මන්දිර විශාල
නාගයින්ට තෝතැන්නක් වනු ඇත.
ඇයට දඬුවම් ලැබෙන කාලය අත
ළඟය. එය ප්‍රමාද නොවෙයි. ඇයට
ඉතුරුව ඇත්තේ තව ස්වල්ප කාල-
යක් පමණි."[7]

**14** එහෙත් යෙහෝවා දෙවි
යාකොබ්ට දයාව පෙන්වා[8]
ඊශ්‍රායෙල්වරුන්ව නැවතත් තම සෙ-
නඟ ලෙස තෝරාගනු ඇත.[9] ඔවුන්ට
තමන්ගේ දේශයේ සුවසේ ජීවත් වීමට
ඔහු ඉඩ සලසා දෙයි.[10] විදේශි-
කයෝද යාකොබ්ගේ සෙනඟ වෙ-
තට පැමිණ ඔවුන් සමඟ එකමුතුව
වාසය කරති.[11] **2** ඊශ්‍රායෙල්වරුන්ව
තමන්ගේම දේශය වෙතට ගෙන යන්-
නේ වෙනත් ජාතීන්ට අයත් ජනයායි.
යෙහෝවා දෙවිගේ දේශයට පැමිණි
පසු ඊශ්‍රායෙල් ජනයා එම ජාතීන්ව
තමන්ගේ සේවක සේවිකාවන් ලෙස
අයිති කරගනිති.[12] ඔවුහු තමන්ව
යටත් කරගෙන සිටි අයවද තමන්-
ගෙන් වැඩ ගත් අයවද යටත් කරගන්-
නෝය.[13]

**3** ඔබ වින්ද වේදනාවලින්ද පීඩාව-
ලින්ද වහලුන්ව සිටියදී කළ බර වැඩ-
වලින්ද යෙහෝවා දෙවි ඔබව නිදහස්
කරන දවසේදී,[1] **4** බැබිලෝනියේ
රජුට විරුද්ධව මේ උපහාස වදන්
පැවසිය යුතුයි.

"අනුන්ට හිංසා පීඩා කර බල-
හත්කාරයෙන් වැඩ ගත් රජුට
සිදු වූ දේ බලන්න![2] **5** යෙහෝවා
දෙවි දුෂ්ටයන්ගේ දණ්ඩද පාලක-
යන්ගේ සැරයටියද බිඳ දැමුවේය.[3]
**6** නොනවත්වාම අනුන්ට පහර දෙ-
මින් තම කෝපය පිට කළ තැනැත්-
තාව ඔහු විනාශ කළේය.[4] මහත්
උදහසෙන් ජාතීන්ව යටත් කරගෙන,
ඉවක් බවක් නොමැතිව ඔවුන්ට පීඩා
කළ එම තැනැත්තාව ඔහු පහ
කර දැමුවේය.[5] **7** මුළු දේශයම දැන්
නිස්කලංක වී ඇත.[6] සතුරු උවදුරුව-
ලින් නිදහස් වී ඇත. එහි වැසියෝ
ප්‍රීතියෙන් ගී ගයන්නෝය.[7] **8** ජුනි-
පර් ගස්[8] පවා ඔහුට සිදු වූ දේ
දැක ප්‍රීති වෙයි. ලෙබනොන්හි දේව-
දාර ගස්ද, 'ඔබ මිය ගිය නිසා දැන්
අපිව කපා දමන්න කවුරුත් එන්නේ
නැහැ'[9] කියා පවසමින් සතුටු වෙයි.

**9** "මිනී වළ[10] පවා ඔබ එන බව
දැක පුදුම වී ඇත! එය ඔබව පිළි-
ගැනීමට මිය ගිය අයව නැඟිටුවන්-
නේය.[11] එළුවන් ලෙස ක්‍රියා කළ කෲර
පාලකයෝ[12] නැඟිට ඔබව පිළිගැ-
නීමට සූදානමින් සිටිති. ජාතීන්ගේ
රජවරුද සිංහාසනවලින් නැඟිට ඔබ
එන තුරු බලා සිටිති.[13] **10** ඒ සිය-
ලුදෙනා ඔබට මෙසේ කියනු ඇත.
'ඔබත් අපි වගේම කිසිවක් කර-
කියාගත නොහැකි තත්වයකට පත්
වුණාද?[14] ඔබත් අපි සිටින ස්ථානය-
ටම ආවාද?[15] **11** ඔබේ මුළු මහත්
තේජස දැන් මිනී වළට ඇද වැටී ඇත.
ඔබේ මියුරු ගී නාදත් පහව ගොස්
ඇත.[16] ඔබට වැතිරෙන්න සිදු වී ඇත්-
තේ පණුවන් මතය. ඔබේ පොරෝ-
නය වී ඇත්තේද පණුවන්ය.'[17]

යෙසා **13:21*** හෝ, "එළුවන්ගේ හැඩයෙන් යුත් භූතයන්." මෙහි සඳහන් වන්නේ භූතයන්ට හෝ භූතයන්ව මතකයට නඟන සත්තු ජාතියකට හෝ විය හැකියි.

**13 පරි.**

**1** උත් 19:24
ද්වි 29:23
යෙරෙ 49:18
යෙරෙ 50:40
ශෙප 2:9
**2** යෙරෙ 51:37
**3** යෙසා 14:22
යෙරෙ 50:3
යෙරෙ 50:13
යෙරෙ 51:29
එළි 18:21
**4** යෙසා 34:11
**5** ලෙවී 17:7
2ලේක 11:15
යෙසා 34:14
එළි 18:2
**6** යෙසා 34:13
මීකා 1:8
**7** ද්වි 32:35
දේශ 3:1
යෙරෙ 51:33
2පේතෘ 2:3

**14 පරි.**

**8** ලෙවී 26:42
ද්වි 4:31
ගීතා 98:3
**9** සෙක 1:17
රෝම 11:7
**10** ද්වි 30:3
යෙසා 66:20
යෙරෙ 24:6
එස 36:24
**11** එස්රා 2:58
නෙහෙ 11:21
එස්ත 8:17
යෙසා 56:6
යෙසා 60:3
සෙක 8:22
සෙක 8:23
**12** එස්රා 2:65
යෙසා 60:7
යෙසා 61:5
සෙක 2:9
**13** එස්ත 8:1
එස්ත 9:3
එස්ත 10:3
යෙසා 60:14
දානි 5:29
දානි 6:3

**2 තීරුව**

**1** එස්රා 3:1
එස්රා 9:8
යෙසා 12:1
යෙසා 32:18
යෙරෙ 30:10
එස 28:24
**2** යෙරෙ 50:23
යෙරෙ 51:36
**3** ගීතා 125:3
**4** 2ලේක 36:17
යෙසා 33:1
යෙරෙ 25:12
යෙරෙ 50:17
යාකො 2:13
**5** හබ 1:6
සෙක 1:15
**6** යෙසා 49:13
යෙරෙ 27:11

**7** ගීතා 98:4; ගීතා 126:2; හිතෝ 11:10; යෙසා 49:13; යෙරෙ 51:48; එළි 18:20; **8** යෙසා 55:13; යෙසා 60:13; **9** යෙරෙ 46:23; **10** දේශ 9:10; **11** හිතෝ 2:18; දේශ 3:20; යෙසා 26:14; එස 32:21; **12** මතෙ 25:33; එළි 20:12; **13** එස 28:17; **14** ගීතා 137:8; **15** ගීතා 82:7; **16** එළි 18:22; **17** යෝබ් 17:14; යෝබ් 24:20.

**12** “දීප්තියෙන් බැබළෙන තාරකා-
වක් හා අලුයමේ පුත්‍රයෙකුව සිටි ඔබ
අහසින් කඩා වැටුණු හැටි බලන්න![1]
අනේ, ජාතීන්ව බෙලහීන කළ[2] ඔබව
පොළොවට ඇද දැමූ හැටි![3] **13** ඔබ
සිතාගෙන සිටියේ මෙලෙසයි. ‘මම
අහසට නඟින්නෙමි.[4] දෙවිගේ තාර-
කාවලටත්[5] වඩා ඉහළට නැඟ මගේ
සිංහාසනය පිහිටුවන්නෙමි.[6] දේශයේ
උතුරු කෙළවරට[7] ගොස් සෙනඟ රැස්
වෙන කන්දේ හිඳගෙන මම පාල-
නය කරන්නෙමි.[8] **14** මම වලාකු-
ළුත් පසු කරගෙන ඉහළටම නැඟ[9]
මහෝත්තම දෙවිට සමාන වන්-
නෙමි.’[10]

**15** “නමුත් ඔබව මිනී වළට හෙළා
දමනු ඇත.[11] ඔබ පොළෝගැ-
බේ පාළුම තැන්වලට යන්නෙහිය.[12]
**16** ඔබව දකින අය ඇස් ලොකු කර-
ගෙන ඔබ දෙස බලා මෙසේ පව-
සති. ‘පොළොවත් එහි රාජ්‍යයනුත්
සෙලවූ තැනැත්තා මොහු නොවේද?[13]
**17** සරුසාර පොළොව පාළු කාන්-
තාරයක් බවට පත් කර එහි නුවර-
වල් යටත් කරගත්තේත්[14] වහලුන්ව
කිසිදා නිදහස් නොකළේත් මොහු
නොවේද?’[15] **18** අන් සියලු රජව-
රුන්ගේ මළ සිරුරු ගෞරවනීය ලෙස
තම සොහොන් ගෙවල්වල තැන්-
පත් කර ඇත.[16] **19** නමුත් ඔබව
තැන්පත් කිරීමට ස්ථානයක් නැත.
ගසකින් කපා ඉවත දමන අනවශ්‍ය
අත්තක් මෙන් ඔබේ මළ සිරුරද
පැත්තකට විසි කර දමා ඇත.[17] ඔබ
පයට පෑගී ගිය මළ සිරුරක් මෙන්
වන්නෙහිය.[18] ඔබ කඩුවෙන් මැරුම්
කා, වළකට විසි කර දැමූ, මළ කඳන්-
වලට යට වී ගිය සෙබළෙකු මෙනි.[19]
**20** ඔබ ඔබේම දේශය විනාශ කර
ඔබේම සෙනඟව මරණයට පත් කළ
නිසා රජවරුන් සමඟ ඔබව තැන්පත්
කරන්නේ නැත. දුෂ්ටයන්ගෙන් පැව-
තෙන දරුදැරියන්ගේ නම් යළි කිසිදා
සඳහන් නොකරනු ඇත.[20]

**21** “ජනයෙනි, ඔහුගේ පුත්‍රයන්ව
මරා දැමීමට සූදානම් වෙන්න. මන්ද
ඔවුන්ගේ මුතුන්මිත්තන් කළ වැරදි
නිසා ඔවුන්ව මරා දැමිය යුතුයි.[1]
එසේ නොකළොත් ඔවුහු නැවත නැඟී
සිට මුළු පොළොවම යටත් කරගෙන
එහි සෑම තැනකම ඔවුන්ගේ නුවරවල්
ගොඩනඟා ගනු ඇත.”[2]

**22** “මම ඔවුන්ට විරුද්ධව සටන්
කරන්නෙමි”[3] කියා ස්වර්ගයේ සේනා-
වල අධිපති වන යෙහෝවා දෙවි පව-
සන්නේය.

“බැබිලෝනිවරුන්ගෙන් කිසිවෙක්
බේරී ජීවත් වන්නේ නැත.[4] ඔවුන්ගේ
දරු මුනුපුරන්වත් බැබිලෝනිය යන
නාමයවත් මම ඉතුරු නොකරන්-
නෙමි”[5] කියාද යෙහෝවා දෙවි පව-
සන්නේය.

**23** “මම ඒ දේශය මුළුමනින්ම අතු
ගා දමන්නෙමි. එය ඉත්තෑවුන් ලඟින
තැනක් බවටද වගුරුබිමක් බවටද
පත් කරන්නෙමි.”[6] එසේ පවසන්නේ
ස්වර්ගයේ සේනාවල අධිපති වන යෙ-
හෝවා දෙවිය.

**24** ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවිගේ පොරොන්දුව[7]
මෙයයි. “මා තීරණය කළ දේ අනි-
වාර්යයෙන්ම ඉටු වනු ඇත. මා අර-
මුණු කළ දේ එලෙසම සිදු වනු ඇත.[8]
**25** මම ඇසිරියානු රජුව මගේ දේ-
ශයේදීම යටත් කරන්නෙමි.[9] මගේ
කන්දේ සිට ඔහුව පාගා දමා[10] මගේ
සෙනඟ මත ඔහු තැබූ වියගහද ඔවුන්
මත පැටවූ බරද අහක් කර දමන්-
නෙමි.”[11]

**26** මුළු පොළොවට විරුද්ධව දෙවි
ගත් තීරණය එයයි. සියලු ජාතීන්ට
විරුද්ධව දෙවි තම බලය පෙන්වන්-
නේ එලෙසයි. **27** ස්වර්ගයේ සේ-
නාවල අධිපති වන යෙහෝවා දෙවි
අරමුණු කළ දේ[12] නිෂ්ඵල කළ හැක්-
කේ කාටද?[13] ඔහුගේ බලවත් හස්ත-
යට විරුද්ධව නැඟී සිටිය හැක්කේ
කාටද?[14]

**28** මේ තීන්දුව ප්‍රකාශ කරන ලද්-

**14 පරි.**
**1** යෙසා 34:4
**2** 2ලේක 36:17 යෙරෙ 51:7 එස 29:19 දානි 5:19
**3** එස 28:17
**4** යෙසා 47:7 දානි 4:30
**5** ගණන් 24:17
**6** දානි 2:38 දානි 5:23
**7** ගීතා 48:2
**8** යෙසා 2:2 යෙසා 24:23 යෝවෙ 3:17
**9** 2තෙස 2:4
**10** එස 28:2
**11** ලූක් 10:15 ලූක් 14:11
**12** එස 28:8 එස 32:23
**13** යෙරෙ 50:23 යෙරෙ 51:25
**14** 2රාජා 25:21 යෙසා 64:10
**15** 2රාජා 24:14 2රාජා 25:11 යෙසා 43:14
**16** එස 32:18
**17** 2රාජා 9:35 යෙරෙ 22:19
**18** 2රාජා 9:33
**19** එස 32:23
**20** යෝබ් 18:16 ගීතා 21:10 ගීතා 37:28 ගීතා 109:13 ගීතා 137:8

**2 තීරුව**
**1** නික් 20:5 ලෙවී 26:39
**2** නාහු 1:9
**3** යෙසා 43:14 යෙරෙ 50:25 යෙරෙ 51:56
**4** යෙරෙ 51:62
**5** ගීතා 9:5 ගීතා 109:13 හිතෝ 10:7
**6** යෙසා 13:21 යෙරෙ 50:39 යෙරෙ 51:25 යෙරෙ 51:62 එළි 18:2
**7** යෙසා 55:11 හෙබ්‍රෙ 6:13
**8** ගීතා 33:9 හිතෝ 19:21 යෙසා 46:10
**9** යෙසා 30:31 යෙසා 31:8 යෙසා 37:37 එස 31:3 එස 32:22
**10** 2රාජා 19:35 2ලේක 32:21 යෙසා 37:36
**11** යෙසා 10:24 නාහු 1:13

---

**12** හිතෝ 21:30; යෙසා 23:9; යෙසා 25:1; **13** යෝබ් 40:8; ගීතා 33:11; හිතෝ 19:21; යෙසා 46:11; **14** 2ලේක 20:6; යෝබ් 9:12; යෙසා 43:13.

දේ ආහස් රජු මිය ගියා[1] අවුරුද්-
දේදීය. **29** "පිලිස්තිවරුනි,[2] ඔබට
පහර දුන් තැනැත්තාගේ සැරය-
ටිය බිඳුණු නිසා[3] ප්‍රීති නොවන්න.[4]
මන්ද ඒ සර්පයා වෙතින්[5] විෂ සර්-
පයෙක් නික්මෙන්නේය.[6] ඒ සර්පයා
පොළඟෙකු මෙන් පැන පැන පහර
දෙනු ඇත.[7] **30** නමුත් යටහත්ප-
හත් ජනයාගේ කුලුඳුලන්ද දුප්පතුන්ද
හොඳින් කා බී කිසි බියක් සැකක්
නැතුව සුව සේ වාසය කරනු ඇත.[8]
එහෙත් ඔබේ දරුවන්ට සිදු වන්නේ
සාගින්නෙන් මැරෙන්නයි. ඔබෙන්
ඉතුරු වන සෙනඟ මැරුම් කනු
ඇත.[9] **31** නුවර දොරටුව අසල සිට
විලාප නඟන්න! නගරයේ වැසියෙනි,
මොරගසන්න! පිලිස්තිවරුනි, තැති
ගන්න! මන්ද උතුරෙන් දුමක් නඟින්-
නේය. සතුරු හමුදාව එකට එකතු වී
ඔබ වෙතට පැමිණෙනු ඇත."[10]

**32** ජාතීන් ඔබ වෙතට එවන පණි-
විඩකරුවන්ට පිළිතුරු දෙන්නේ කෙ-
සේද?[11] යෙහෝවා දෙවි සියොන්
නුවරේ අත්තිවාරම දමා තිබෙන
බවත්[12] ඔහුගේ සෙනඟ අතරේ පීඩා
විඳින අය රැකවරණය ලබාගන්නා
පිණිස එතැනට යන බවත් ඔවුන්ට
කියන්න.

**15** මෝවබ් දේශයට විරුද්ධව
දුන් තීන්දුව මෙයයි.[13] මෝ-
වබ් දේශයේ ආර්[14] නගරයද කිර්[15]
නගරයද එක රැයකින් විනාශ කර
දමනු ඇත. **2** එහි වැසියෝ දේශ-
යේ දේවස්ථානය වෙතටත් දීබොන්[16]
නගරය අසල පිහිටි දේවස්ථාන වෙත-
ටත් ගොස් වැලපෙති. නෙබෝ[17] හා
මේදෙබා[18] නගර ගැනද මෝවබ්-
වරු වැලපෙති. එහි සියලු වැසි-
යෝ හිස මුඩු කරගෙන රැවුල්
කපාගෙන සිටිති.[19] **3** ඔවුහු ගෝණි
රෙදි ඇඳගෙන[20] වීථිවල සැරිසරති.
ජනයා පියස්ස මතත්[21] මංසන්ධිවලත්
හිඳගෙන බොහෝ සෙයින් හඬා වැල-
පෙති.[22] **4** හෙෂ්බොන් සහ එලෙයා-
ලෙ[23] නගරවල වැසියන් වැලපෙන හඬ
යහෂ්[24] නගරය දක්වාම ඇසෙයි. මෝ-
වබ් දේශයේ සෙබළු පවා කෑගසති.
මුළු මහත් සෙනඟම බියෙන් වෙවුලති.

**5** මෝවබ්වරුන් ගැන මගේ සිතත්
කම්පා වෙයි.[1] නගරයේ වැසියෝ ෂෝ-
වර්[2] සහ එග්ලත්-ෂෙලිෂියා[3] දක්වාම
පලා යති. ජනයා හඬහඬා ලූහිත්[4] වෙ-
නට නැඟ යති. ඔවුහු තමන්ට සිදු
වූ විපත ගැන හෝරනායිම්ට[5] යන
මඟ දිගේ විලාප නඟති. **6** මන්ද
නිම්රිම්[6] ඔයේ ජලය මුළුමනින්ම
සිඳී ගොස් ඇත. තණ ගස් වියළී
ගොස් ඇති අතර සියල්ල කාන්-
තාරයක් මෙන් වී ඇත.[7] **7** ඔවුහු
තමුන්ගේ දේපළවලින් ගෙන යා හැකි
දේ රැගෙන විලෝ ගස් වැවී ඇති
ඔය හරහා පලා යති. **8** මුළු මෝ-
වබ්[8] දේශය පුරාම එනම්, එග්ලයිම්
සිට බෙයර්-එලීම් දක්වාම ඇසෙන්නේ
මොරගැසීමේ හඬ පමණි. **9** මන්ද
දීමෝන් අසල ඇති දිය පහරවල් ලෙ-
යින් පිරී ඇත. එපමණක්ද නොව,
මෝවබ් දේශයෙන් පලා යන අයවත්
දේශයේ ඉතුරුව සිටින සෙනඟවත්
ගොදුරු කරගන්න මම දීමෝන් නග-
රයට සිංහයන්ව එවන්නෙමි.[9]

**16** මෝවබ් දේශයේ වැසියෙනි,
සේලා සිට පාළුකරය හරහා
ගොස් සියොන් කන්දේ[10] පිහිටි නග-
රයේ වෙසෙන පාලකයා අතට බැටළු-
වෙකුව භාර දෙන්න.[11]

**2** මෝවබ් වැසියෝ කැදැල්ලෙන්
පන්නා දමන ලද කුරුල්ලන් මෙන්[12]
ආනොන්[13] ඔයේ තොටුපළ අසල අස-
රණව සිටිති.

**3** "ජනයෙනි, යෝජනාවක් ඉදිරි-
පත් කරන්න. යම් තීරණයක් ගන්න.[14]

"ඉර මුදුන් වන වේලාවේදී රාත්‍රිය
තරම් අඳුරු වූ සෙවණැල්ලකින්
ආරක්ෂාව ලබා දෙන්න.[15] පලා යන
අයව සඟවාගන්න.[16] ඔවුන්ව පාවා
නොදෙන්න.[17] **4** මෝවබ්[18] දේශයේ

**14 පරි.**
**1** 2රාජා 16:20; 2ලේක 28:27
**2** යොෂු 13:3
**3** 2ලේක 28:18
**4** ඔබ 12
**5** 2ලේක 26:6
**6** 2රාජා 18:8
**7** යෙසා 30:6
**8** යෙසා 30:23; යෙසා 65:13
**9** යෙරෙ 47:1; එස 25:16; යෝවෙ 3:4; ආමෝ 1:6; ශෙප 2:4; සෙක 9:5
**10** යෙරෙ 1:14; යෙරෙ 25:9
**11** 2රාජා 20:12
**12** ගීතා 48:1; ගීතා 87:1; ගීතා 102:16; ගීතා 132:13; යෙසා 28:16

**15 පරි.**
**13** යෙරෙ 9:25; එස 25:11
**14** ගණන් 21:28; ද්වි 2:9
**15** 2රාජා 3:25; යෙරෙ 48:31
**16** යොෂු 13:17; යෙරෙ 48:18
**17** යෙරෙ 48:1
**18** ගණන් 21:30; යොෂු 13:16
**19** ද්වි 14:1; යෙසා 3:24; යෙරෙ 48:37
**20** 2සාමු 3:31; 2රාජා 6:30; යෙසා 24:11; මතෙ 11:21
**21** යෙරෙ 19:13
**22** යෙරෙ 48:38
**23** ගණන් 32:37; යෙසා 16:9
**24** විනි 11:20

**2 තීරුව**
**1** යෙරෙ 48:31
**2** උත් 13:10; උත් 19:22
**3** යෙරෙ 48:34
**4** යෙරෙ 48:5
**5** යෙරෙ 48:3
**6** යෙරෙ 48:34
**7** යෙසා 16:9; හබ 3:17
**8** යෙරෙ 48:20
**9** ලෙවී 26:22; 2රාජා 17:25; යෙරෙ 15:3; ආමෝ 5:19

**16 පරි.** **10** යෙසා 10:32; මීකා 4:8; **11** එස්රා 7:17; **12** හිතෝ 27:8; යෙසා 13:14; යෙරෙ 48:19; **13** ගණන් 21:13; **14** ගීතා 82:3; යෙසා 1:17; යෙරෙ 21:12; දානි 4:27; සෙක 7:9; **15** ද්වි 28:29; **16** යෙසා 32:2; **17** ඔබ 14; **18** 1සාමු 22:3.

වැසියෙනි, මගේ දේශයෙන් පලා
ගිය අයට ඔබේ දේශයේ රැකවරු-
ණය දෙන්න. ඔවුන්ව විනාශ කරන්න
එන අයගෙන් ඔවුන්ව ආරක්ෂා කර-
ගන්න.[1] මන්ද තව කෙටි කලකින්
ඔවුන්ට පීඩා කරන්නා විනාශ වී යනු
ඇත. ඔවුන් අද්දකින පීඩාද නිමා
වෙයි. අනුන්ව පාගා දමන අයව පො-
ළොවෙන් තුරන් කරනු ඇත.[2]

**5** “ප්‍රේමය* මගින් සිංහාසනයක්
ස්ථිරව පිහිටවනු ඇත.[3] දාවිත්ගේ
කූඩාරමෙන් පැමිණෙන රජෙක්[4] ඒ
මත හිඳ විශ්වාසවන්තකමින් පාල-
නය කරයි. ඔහු යුක්තිය ඉටු කිරී-
මට සොයමින් විනිශ්චය කරන්නේය.
ඔහු හරි දේ කිරීමටද ප්‍රමාද නොවන්-
නේය.”[5]

**6** මෝවබ්වරුන්ගේ උඩඟුකම
ගැන අප අසා ඇත. ඔවුන් ඉතා
අහංකාරය.[6] ඔවුන්ගේ උද්ධච්චක-
මද කෝපයද පහ වී යයි.[7] ඔවුන්
පුරසාරම් දොඩමින් පවසන දේවල්
නිකම්ම හිස් වචන පමණි.[8] **7** මෝ-
වබ් දේශයේ සෑම වැසියෙක්ම ඔවුන්ට
සිදු වූ විපත ගැන හඬා වැලපෙති.[9]
කිර්-හරෙසෙත්[10] නගරයේ වියළි මිදි
ගැන සිතා ඔවුහු දුක් වෙති. **8** හෙෂ්-
බොන්[11] නගරයේ කෙත් මැලවී ගොස්
ඇත. ජාතීන්ගේ පාලකයෝ ඇවිත්
සිබ්මා[12] නගරයේ පලවලින් බර වූ මිදි-
වැල් කපා දමා ඇත. එම මිදිවැල්
යාසෙර්[13] නගරයද පාළුකරයද මුහුද
දක්වාද විහිදී ඉතා සරුසාරව වැඩු-
ණත් දැන් ඒ සියල්ල විනාශ වී ඇත.

**9** මම යාසෙර් නගරය ගැන හඬා
වැලපෙන ලෙසම සිබ්මා නගරයේ
මිදි වගාව ගැනද හඬා වැලපෙමි.[14]
හෙෂ්බොන්[15] හා එලෙයාලෙ[16] නුව-
රේ වැසියෙනි, මගේ දෙනෙතින් කඩා
හැළෙන කඳුළුවලින් ඔබේ නුවර
තෙමී යයි. මන්ද ගිම්හාන කාලයේ-
දීත් අස්වැන්න නෙළන කාලයේදීත්
ප්‍රීති නාද වෙනුවට දැන් ඇසෙන්නේ
කෑගසන ශබ්දය පමණි.[17] **10** පල-
තුරු උයන්වලින්ද මිදිවතුවලින්ද
දැන් ප්‍රීති නාද ඇසෙන්නේ නැත.[1] මිදි
යන්ත්‍රවලින් මිදියුෂ පෙරන්නේවත්[2]
ඒ අසල ප්‍රීති ඝෝෂා නඟන්නේවත්
නැත.[3]

**11** වීණාවක තත් දෙදරන්නාක්
මෙන් මෝවබ් දේශය නිසාත්[4] කිර්-
හරෙසෙත් නගරය නිසාත් මගේ හද
කම්පා වෙයි.[5]

**12** මෝවබ්වරු දේවස්ථානයට[6]
ගොස් යාච්ඤා කර වෙහෙසට පත්
වී ඇත. ඔවුන් ශුද්ධස්ථානයට ගොස්
යාච්ඤා කළත්[7] එයින් කිසි පලක්
වුණේ නැත.[8]

**13** යෙහෝවා දෙවි මෝවබ් දේ-
ශයට විරුද්ධව කලින් දුන් තීන්-
දුව එයයි. **14** යෙහෝවා දෙවි දැන්
මෙසේ පවසයි. “කුලීකරුවෙකුගේ
සේවා කාලය නිම වන දවස නිශ්චිත
වන්නාක් මෙන්[9] තව අවුරුදු තුන-
කින් මෝවබ්වරුන්ගේ කීර්තිය[10] පහ
වී යෑමට නියමිතයි. ඔවුන්ව නින්දා-
වට පත් කරන අතර දේශයේ මහත්
කෝලාහලයක් ඇති වෙයි. ඔවුන්ගෙන්
ඉතුරු වන්නේ ඉතා දුර්වල වූ අත-
ළොස්සක් පමණි.”[11]

**17** දමස්කයට විරුද්ධව දුන්
තීන්දුව මෙයයි.[12] “දමස්කය
කියා නුවරක් තවත් ඉතුරු නො-
වන්නේය. ඉතුරු වන්නේ නටබුන්
ගොඩක් පමණි![13] **2** අරෝයේර්[14]
නගරවල සියලු වැසියන් පලා යනු
ඇත. ඒ ස්ථානවල සත්තු ලගින්-
නෝය. උන්ව බියගන්වන්න කිසිවෙකු
එහි නොසිටින නිසා උන් නිදැල්ලේ
සැරිසරන්නෝය.[15] **3** එෆ්‍රායිම් දේශ-
යේ සුරක්ෂිත නුවරවල් විනාශ වනු
ඇත.[16] දමස්කයේ රාජ්‍යයද පහව යන්-
නේය.[17] ඊශ්‍රායෙල්වරුන්ගේ තේජස
පහ වී ගිය ලෙසම සිරියාවේ ඉතුරුව
සිටින අයගේ තේජසද පහ වී යනු
ඇත.” එය ස්වර්ගයේ සේනාවල අධි-

**16 පරි.**
**1** යෙරෙ 48:8
යෙරෙ 48:42
**2** යෙසා 33:1
**3** ගීතා 45:6
ගීතා 89:14
හිතෝ 20:28
**4** 2සාමු 7:16
යෙසා 9:7
යෙරෙ 23:5
දානි 7:14
**5** ගීතා 72:2
යෙසා 32:1
**6** යෙරෙ 48:26
යෙරෙ 48:29
ශෙප 2:10
**7** ආමො 2:1
**8** යෙරෙ 48:7
**9** යෙසා 15:2
යෙරෙ 48:20
**10** 2රාජා 3:25
**11** යොෂු 13:17
**12** ගණන් 32:38
යොෂු 13:19
**13** ගණන් 32:3
යොෂු 13:25
යෙරෙ 48:32
**14** යෙරෙ 48:32
**15** යෙසා 15:4
**16** යෙරෙ 48:34
**17** විනි 9:27

**2 තීරුව**
**1** යෙසා 24:8
යෙරෙ 25:30
යෙරෙ 48:33
**2** හබ 3:17
**3** ශෙප 2:9
**4** යෙසා 15:5
යෙරෙ 48:36
**5** යෙසා 15:1
**6** ගණන් 22:41
ගණන් 23:1
යෙරෙ 48:35
**7** 1රාජා 11:7
2රාජා 3:27
යෙරෙ 48:7
**8** 2රාජා 19:18
ගීතා 115:4
යෙරෙ 10:5
යෙරෙ 16:20
1කොරි 8:4
**9** යෙසා 21:16
**10** යෙසා 23:9
යෙරෙ 9:23
යෙරෙ 48:46
**11** යෙසා 25:10
යෙරෙ 48:47
ශෙප 2:9

**17 පරි.**
**12** 1ලේක 18:5
යෙරෙ 49:23
ආමො 1:5
**13** 2රාජා 16:9
යෙසා 8:4
සෙක 9:1

**14** ගණන් 32:34; යොෂු 13:16; 2රාජා 10:33; යෙරෙ 48:19; **15** ශෙප 2:7; **16** 2රාජා 17:6; යෙසා 7:8; හොෂෙ 5:14; හොෂෙ 9:13; **17** 2රාජා 16:9.

යෙසා **16:5*** හෝ, “ළැදි ප්‍රේමය.”

පති වන යෙහෝවා දෙවි දුන් තීන්-
දුවයි.[1]
4 “ඒ කාලයේදී යාකොබ්ගේ තේජ-
සද නැති වී යයි.[2] ඔහුගේ පුෂ්ටිමත්
සිරුර වැහැරී යයි.[3] 5 අස්වැන්න
කපන්නා කෙතේ අස්වැන්න නෙළා-
ගෙන තම අතින්ම කරල් කඩාගන්නා
විට[4] ඔහු හරියට රෙෆායිම් තැනිතලා-
වේ[5] අත්හැරුණු ධාන්‍ය කරල් ඇහිඳින
කෙනෙකු මෙන් වෙයි. 6 ඔලීව ගස්-
වල අතු සොලවා* ගෙඩි ඇහිඳ-
ගත් පසු ඉහළ අතුවල ඉදුණු ගෙඩි
දෙක තුනක් ඉතුරු වෙයි. අනිකුත්
අතුවල ඉතුරු වන්නේ ගෙඩි හත-
රක් හෝ පහක් හෝ පමණයි. ඒ හා
සමානව යාකොබ්ගේ සෙනඟ අත-
රින්ද සුළු පිරිසක් ඉතුරු වන්නෝය.”
එසේ පවසන්නේ ඊශ්‍රායෙල්වරුන්ගේ
දෙවි වන යෙහෝවාය.[6]
7 ඒ කාලයේදී අසරණ වූ මිනිසා
තමන්ට ජීවිතය දුන් තැනැත්තා-
ණන්ගෙන් උපකාර පතයි. ඔහු ඊශ්‍රා-
යෙල්හි ශුද්ධ තැනැත්තාණන් දෙස
මහත් විශ්වාසයකින් බලයි.[7] 8 ඔහු
උපකාරය සඳහා තම අතින් සෑදූ[8]
පූජාසන[9] දෙසවත් දේවතා රූප දෙස-
වත් නමස්කාරය සඳහා සෑදූ කුලුනු
හා සුවඳ දුම් පූජාසන[10] දෙසවත්
තවත් බලන්නේ නැත. 9 ඒ කාල-
යේදී ඔහුගේ සුරක්ෂිත නුවරවල් අත්-
හැර ගිය පාළු ස්ථානයක් මෙන්ද
විසි කර දැමූ අත්තක් මෙන්ද වන්-
නේය. ඊශ්‍රායෙල්වරුන්ගේ ක්‍රියාකලා-
පය නිසා දේශය මුළුමනින්ම විනාශ
වෙයි.[11] 10 මන්ද ඔබට ගැලවීම
ලබා දෙන ඔබේ දෙවිව[12] ඔබට අම-
තක වී ඇත.[13] ඔබට සවියක්ව සිටි
ඔබේ පර්වතය[14] ඔබට දැන් සිහි වන්-
නේ නැත. ඔබ වෙනත් දේශවලින්
පැළෑටි ගෙනැවිත් ලස්සනට වතු වගා
කරන්නේ ඒ නිසාය. 11 ඔබ ඒ වතු
වටේට ආරක්ෂිත වැටක් බැඳ හිමි-
දිරි උදෑසනින්ම නැඟිට පැළෑටිවලට
සාත්තු කළත් ඔබ දරුණු ලෙස රෝ-
ගාතුර වී වේදනා විඳින කාලයේදී අස්-
වැන්න විනාශ වී යන්නේය.[1]
12 ඝෝෂා කරන අර මහත් සෙනඟ
දෙස බලන්න! මහ සයුරේ රළ මෙන්
ඔවුහු කැලඹී ඇත. මහා ජල ධාරා-
වක් මෙන් ඔවුහු හඬ නඟති.[2] නමුත්
ඔවුන්ට අත් වන්නේ දුක පමණි!
13 ජාතීන්[3] වේගයෙන් ගලා යන ජල
ධාරා මෙන් කෑ මොර ගසන නමුත්
දෙවි ඔවුන්ට තරවටු කරයි.[4] ඔවුහු
හැරී විගස පලා යන්නෝය. කඳු බෑවුම්
අසල සුළඟට ගසාගෙන යන දහ-
යියා මෙන්ද සුළිසුළඟට හසු වූ වියළී
ගිය පැළෑටියක් මෙන්ද ඔවුහු ගසා-
ගෙන යන්නෝය.[5] 14 රාත්‍රිය උදා වූ
විගසම මහත් භීතයක් ඇති වෙයි.
නමුත් පසුවදා නිස්කලංක දවසක්
උදා වෙයි.[6] අපෙන් වස්තුව පැහැර-
ගන්නා අයද අපෙන් කොල්ල කන
අයද එලෙසම නිහඬ වෙති.[7]

18 ඉතියෝපියාවේ[8] ගංගා අසල
පිහිටි පළඟැටියන්ගෙන්* පිරි
දේශය පිටටත් මහත් විපතක් පැමි-
ණෙයි! 2 එහි වැසියෝ මුහුද මාර්ග-
යෙන් පණිවිඩකරුවන්ව[9] යවති. ඔවුහු
එම පණිවිඩකරුවන්ව පැපිරස් බටව-
ලින් සෑදූ බෝට්ටුවලින් පිටත් කර
යවා මෙසේ කියති. “වේගවත් පණිවි-
ඩකරුවෙනි, ගංවතුරට සේදී ගිය දේ-
ශයක වෙසෙන සිනිඳු අත් පා හා
උස් වූ ශක්ති සම්පන්න ශරීර ඇති
සෙනඟක් වෙතට යන්න. අන්‍යයන්ව
පාගා දමා සියලු ජාතීන් තුළ බිය
උපදවන ඒ සෙනඟට මේ පණිවිඩය
කියන්න.”[10]
3 දේශයේ සියලු වැසියෙනි,[11] පො-
ළොවේ ජනයෙනි, කඳු මුදුනක සිටෙවූ
කොඩියක් පැහැදිලිව දකින්නා සේ
ඔබට ලකුණක් දකින්න ලැබෙයි.[12]

**17 පරි.**
1 යෙසා 28:2 හොෂෙ 9:11
2 යෙසා 9:9 යෙසා 10:4
3 ද්වි 32:15 යෙසා 10:16
4 ද්වි 23:25 යෙරෙ 9:22 හොෂෙ 6:11 යෝවෙ 3:13
5 යොෂු 15:8 යොෂු 18:16 2සාමු 5:18
6 ද්වි 4:27 ද්වි 24:20 විනි 8:2 යෙසා 24:13 රෝම 9:27
7 යෙසා 10:20 යෙසා 29:19 මීකා 7:7
8 යෙසා 2:8 හොෂෙ 8:6 මීකා 5:13
9 2ලේක 31:1 2ලේක 34:7 යෙරෙ 17:2 එස 36:25 හොෂෙ 8:11 හොෂෙ 14:8 සෙක 13:2
10 2ලේක 34:4
11 යෙසා 6:11 හොෂෙ 10:14 ආමො 3:11 මීකා 5:11 මීකා 7:13
12 1ලේක 16:35 ගීතා 65:5 ගීතා 79:9 හබ 3:18 එළි 7:10
13 ද්වි 6:12 ගීතා 50:22 යෙසා 1:3 යෙරෙ 2:32 හොෂෙ 8:14
14 ද්වි 32:4 2සාමු 22:32 ගීතා 18:2 යෙසා 26:4

**2 තීරුව**
1 ද්වි 28:30 යෙරෙ 12:13 හොෂෙ 8:7 ශෙප 1:13
2 ගීතා 29:3 ගීතා 65:7 එළි 16:3 එළි 17:1
3 ගීතා 2:1 ගීතා 67:4 යෙසා 13:4
4 ගීතා 9:5 යෙසා 33:3
5 ගීතා 35:5 ගීතා 83:13 යෙසා 29:5 දානි 2:35 හොෂෙ 13:3

**6** 2රාජ 19:35; ගීතා 37:36; **7** හිතෝ 22:23; යෙසා 33:1; එස 39:10; ශෙප 2:9; **18 පරි.** **8** යෙසා 20:3; එස 30:4; ශෙප 3:10; **9** යෙසා 30:4; එස 30:9; **10** 2ලේක 12:3; 2ලේක 14:9; 2ලේක 16:8; **11** ගීතා 33:8; ගීතා 96:13; හිතෝ 8:31; යෙසා 26:18; විලා 4:12; **12** යෙසා 5:26; යෙසා 13:2.

යෙසා **17:6*** ද්වි 24:20හි පාදසටහන බලන්න.

යෙසා **18:1*** මූ.අ., “ගුමු හඬ නඟන කෘමීන්.”

හොරණෑවක්[1] පිඹින්නා සේ හඬක්
ඔබට ඇසෙයි. **4** අස්වැන්න නෙළන
කාලය එන තුරු වගාබිම් හිරු රැස්ව-
ලින්[2] හා පිනි බිඳුවලින්[3] පෝෂණය
වීමට ඉඩ දෙන්නා සේ මාගේ තෝරා-
ගත් ස්ථානය දෙස මම නිහඬව බලා
සිටින්නෙමි.[4] **5** නමුත් අස්වැන්න
නෙළීමට පෙර එනම්, මිදි මල් පිපී
පල දැරූ පසු යමෙක් පැමිණ දැකැත්-
තකින් මිදිවැල කප්පාදු කරන්නා
සේ මම එතැනට පැමිණ පියවර
ගන්නෙමි.[5] **6** ඒ සියල්ල කඳුවල
වෙසෙන පක්ෂීන්ටත් පොළොවේ සැරි-
සරන වනමෘගයන්ටත් ගොදුරක් වනු
ඇත.[6] අස්වැන්න නෙළන ගිම්හාන
කාලය පුරාම පක්ෂීහුද වනමෘගයෝද
එයින් පෝෂණය වෙති.[7]

**7** "ඒ කාලයේදී, ගංවතුරට සේදී
ගිය දේශයක වෙසෙන සිනිඳු අත් පා
හා උස් වූ[8] ශක්ති සම්පන්න ශරීර ඇති
සෙනඟක් ස්වර්ගයේ සේනාවල අධි-
පති වන යෙහෝවා දෙවිට තෑග්ගක්
රැගෙන එන්නෝය.[9] අන්‍යයන්ව පාගා
දමා සියලු ජාතීන් තුළ බිය උපදවන
ඒ සෙනඟ එම තෑග්ග රැගෙන එන්නේ
ස්වර්ගයේ සේනාවල අධිපති වන යෙ-
හෝවා දෙවිගේ නාමය දරන සියොන්
කන්ද වෙතටයි."[10]

**19** ඊජිප්තුවට විරුද්ධව දුන්
තීන්දුව මෙයයි.[11] යෙහෝවා
දෙවි වේගයෙන් ගමන් කරන වලා-
කුළක නැඟ[12] ඊජිප්තුවට එන්නේය.
ඊජිප්තුවේ කිසි කමකට නැති දෙවි-
වරු ඔහු ඉදිරියේ වෙව්ලන්නෝය.[13]
ඊජිප්තුවරුද බියෙන් වෙව්ලති.[14]

**2** "එක් එක් කෙනා සමඟ ඇන-
කොටා ගැනීමට මම ඊජිප්තුවරුන්ව
පොලඹවන්නෙමි. ඔවුහු තම තමාගේ
සහෝදරයන්ටත් මිතුරන්ටත් විරුද්-
ධව නැඟී සිටිනු ඇත. නුවරක් නුවර-
කට විරුද්ධවත් රාජ්‍යයක් රාජ්‍යයකට
විරුද්ධවත් යුද්ධයට සැරසෙයි.[15]
**3** ඊජිප්තුවරු වියවුල් වෙති.[16]
මම ඔවුන්ගේ සැලසුම් අවුල් කරන්-
නෙමි.[17] එවිට වැදගැම්මකට නැති
ඔවුන්ගේ දෙවිවරුන්ගෙන්ද[1] මතු-
රන්නන්ගෙන්ද මායාකාරයන්ගෙන්ද
ශාස්ත්‍ර කියන්නන්ගෙන්ද ඔවුහු උප-
කාර පතන්නෝය.[2] **4** මම ඊජිප්තු-
වරුන්ව කෲර ස්වාමියෙකුගේ අතට
හසු කර දෙන්නෙමි. දරුණු රජෙක්
ඔවුන්ව පාලනය කරයි."[3] එසේ පව-
සන්නේ සැබෑ ස්වාමීන්ද ස්වර්ගයේ
සේනාවල අධිපතිද වන යෙහෝවා
දෙවිය.

**5** ගංගාවෙහි ජලය සිඳී යයි. ගං
පතුලද වියළී යයි.[4] **6** ගං පතු-
ලෙන් දුගඳක් හමයි. ඊජිප්තුවේ නයිල්
ගඟෙන් නික්මෙන ඇළදොළවල්වල
වතුරද සිඳී යයි.[5] බට ගස්ද[6] පන් ගස්ද
මැලවී යයි. **7** නයිල් ගඟ දෙපසත්
එහි මෝයකට අසලත් තිබෙන තණ-
බිම්ද කෙත්වතුද සියල්ල වියළී යයි.[7]
ඒ අසල වැඩෙන සියලු පැළෑටි වියළී
ගොස් සුළඟට ගසාගෙන යනු ඇත.
**8** මසුන් මරන්නෝ වැලපෙන්නෝය.
නයිල් ගඟේ බිලී බාන්නෝද දැල් හෙ-
ළන්නෝද ළත වන්නෝය.[8] **9** පිරි-
සිදු කළ හණ[9] නූල්වලින් වියන්නෝද
සුදු රෙදි වියන්නෝද කලකිරෙන්-
නෝය. **10** ඊජිප්තුවේ වියන්නෝ[10]
දුක් වෙති. වැටුපට වැඩ කරන සියල්-
ලෝ සුසුම්ලති.

**11** ෂෝවන්[11] නගරයේ පාලකයෝ
මෝඩයෝය. පාරාවෝගේ උපදේශක-
යන් අතරේ සිටින බුද්ධිමත්ම අයද
මෝඩ උපදෙස් දෙති.[12] එසේනම්
පාරාවෝ ඉදිරියට ගොස්, "මගේ පිය-
වරුන් බුද්ධිමත් අය" කියාද, "මම
පුරාණයේ සිට පැවත ආ රජව-
රුන්ගේ පුත්‍රයෙක්" කියාද ඔබ
කියන්නේ කෙසේද? **12** ඔබේ බුද්ධි-
මතුන් කොහේද? ඔවුන්ට එන්න
කියන්න.[13] ස්වර්ගයේ සේනාවල අධි-
පති වන යෙහෝවා දෙවි ඊජිප්තුව
ගැන තීන්දු කළ දේ කුමක්ද කියා,
ඔවුන් දන්නවා නම් එය ඔබට දන්-

**18 පරි.**
**1** යෝවෙ 2:1 ආමො 3:6 සෙක 9:14
**2** 2සාමු 23:4
**3** හිතෝ 25:13
**4** ගීතා 132:13 හොෂෙ 5:15
**5** යෙසා 5:7 යෙසා 17:11 ලූක් 8:14
**6** යෙසා 14:19 එස 29:5
**7** යෙසා 34:3 යෙරෙ 15:3 එස 32:4 එළි 19:17
**8** යෙසා 60:4 සෙක 14:16
**9** 2ලේක 32:23 යෙසා 2:2 මලා 1:11
**10** යෙසා 8:18 යෙසා 24:23 යෝවෙ 3:17 මීකා 4:13

**19 පරි.**
**11** යෙරෙ 25:19 එස 29:2 යෝවෙ 3:19
**12** ද්වි 33:26 ගීතා 68:33
**13** නික් 12:12 යෙරෙ 43:12 යෙරෙ 46:25 එස 30:13
**14** ගීතා 76:12
**15** මතෙ 12:25
**16** ද්වි 7:20 යොෂු 2:11
**17** හිතෝ 19:21 හිතෝ 21:30 යෙසා 19:11 1කොරි 3:20

**2 තීරුව**
**1** යෙරෙ 16:20 1කොරි 8:4
**2** යෙසා 8:19 යෙසා 44:25 ක්‍රියා 16:16 එළි 18:23
**3** යෙරෙ 46:2 යෙරෙ 46:26 එස 29:19
**4** එස 30:12 සෙක 10:11
**5** 2රාජා 19:24 යෙසා 37:25
**6** නික් 2:3 යෝබ් 40:21
**7** ද්වි 11:10 එස 29:10
**8** ගණන් 11:5
**9** නික් 9:31 හිතෝ 7:16
**10** නික් 35:35

**11** ගණන් 13:22; ගීතා 78:12; යෙසා 30:4; එස 30:14; **12** යෙසා 44:25; 1කොරි 3:19; **13** උත් 41:8; 1රාජා 4:30; දේශ 7:23; ක්‍රියා 7:22.

වන්න කියන්න.[1] **13** ශෝවන් නග-
රයේ පාලකයෝ හැසිර තිබෙන්නේ
මෝඩයන් ලෙසයි.[2] නොෆ්[3] නග-
රයේ පාලකයෝ රැවටුණෝය. එහි
ගෝත්‍රවල නායකයෝ[4] ජනයාව අත-
රමං කර ඇත. **14** යෙහෝවා දෙවි
ඊජිප්තුවේ වැසියන්ව වියවුලට පත්
කළේය.[5] නායකයන් නිසා ඔවුහු
මංමුළා වී ඇත. බේබද්දෙකු වමනය
දැමූ පසු වැනිවැනී ඒ මතම ඇවිදින්-
නේය.[6] ඊජිප්තුවේ වැසියන්ද නිතරම
කටයුතු කරන්නේ ඒ හා සමානවය.
**15** ඊජිප්තුවේ හිස හෝ වල්ගය ලෙ-
සත් අතු හෝ පන් ගස් ලෙසත් සිටින
පුද්ගලයන් කරන කිසි දෙයක් සාර්-
ථක නොවෙයි.[7]

**16** ඒ දවසේදී ඊජිප්තුවරු ස්ත්‍රීන්
මෙන් බියෙන් වෙවුලති.[8] මන්ද ස්වර්-
ගයේ සේනාවල අධිපති වන
යෙහෝවා දෙවි ඔවුන්ට දඬුවම් කිරී-
මට සූදානමින් සිටියි.[9] **17** ස්වර්ග-
යේ සේනාවල අධිපති වන යෙහෝවා
දෙවි ඊජිප්තුවරුන්ට විරුද්ධව තීන්දු
කර ඇති දේ නිසා ඔවුහු තැතිගෙන
සිටිති.[10] යූදා දේශය ගැන සඳහන්
කළ පමණින් ඔවුහු භයෙන් වෙවු-
ලති.[11]

**18** ඒ කාලයේදී ඊජිප්තු දේශ-
යේ නගර පහක වැසියෝ[12] කානාන්
දේශයේ කතා කරන භාෂාව කතා
කරනු ඇත.[13] ඔවුහු ස්වර්ගයේ සේනා-
වල අධිපති වන යෙහෝවා දෙවිට
කැප වන බවට දිවුරා පොරොන්දු[14]
වෙති. ඉන් එක් නගරයක්, "විනාශයට
පමුණුවන නගරය" ලෙස හඳුන්වනු
ලබන්නේය.

**19** ඒ කාලයේදී, ඊජිප්තු දේශයේ
මැද[15] යෙහෝවා දෙවිට නමස්කාර
කිරීම සඳහා පූජාසනයක්ද ඒ දේශ-
යේ මායිම අසල යෙහෝවා දෙවිව
සිහි කරන පිණිස කණුවක්ද තිබෙනු
ඇත. **20** ඊජිප්තු දේශය පුරාම
ස්වර්ගයේ සේනාවල අධිපති වන
යෙහෝවා දෙවි කළ දේවලට සාක්-
ෂියක් පිණිසද සිහිවටනයක් ලෙසද
ඒවා පිහිටවනු ලදි.[16] ඔවුහු තමන්ට
පීඩා කරන අය නිසා යෙහෝවා දෙවිට
හැඬූ කඳුළින් කන්නලව් කරන විට[1]
ඔහු උතුම් ගැලවුම්කරුවෙකුව ඔවුන්
වෙත එවන්නේය. ඔහු නිසැකවම
ඔවුන්ව ගලවාගනු ඇත.[2] **21** ඊජිප්-
තුවරු යෙහෝවා දෙවිව දැන හඳුනා
ගනිති.[3] ඔවුහු යෙහෝවා දෙවි කවු-
රුන්ද කියා තේරුම්ගෙන ඔහුට පූජාද
තෑගිද ඔප්පු කරති.[4] ඔවුහු යෙහෝවා
දෙවිට පොරොන්දු දී ඒ පොරොන්දු ඉටු
කරති.[5] **22** යෙහෝවා දෙවි ඊජිප්තු-
වරුන්ට පහර දෙනු ඇත.[6] එහෙත්
පහර දුන් පසු ඔහු ඔවුන්ව සුව කරයි.[7]
එවිට ඔවුන් නැවත යෙහෝවා දෙවි
වෙතට හැරී එන අතර[8] ඔහු ඔවුන්ගේ
කන්නලව්වලට සවන් දී ඔවුන්ට සුවය
ලබා දෙයි.[9]

**23** ඒ කාලයේදී ඊජිප්තුවත් ඇසිරි-
යාවත් අතර මාර්ගයක්[10] සකස් කරනු
ඇත. එවිට ඇසිරියානු ජාතිකයෝ
ඊජිප්තු දේශයටත් ඊජිප්තු ජාතික-
යෝ ඇසිරියාවටත් යන්නෝය. ඔවුහු
එක්ව දෙවිට සේවය කරති. **24** ඒ
කාලයේදී ඊශ්‍රායෙල්වරුද ඔවුන් සමඟ
එකතු වන්නෝය. ඒ ජාතීන් තුන
එක්ව සේවය කරන අතර[11] ඊශ්‍රා-
යෙල්වරුන් මාර්ගයෙන් පොළොවේ
සියලු වැසියෝ ආශීර්වාද ලබාගන්-
නෝය.[12] **25** මන්ද ස්වර්ගයේ සේ-
නාවල අධිපති වන යෙහෝවා දෙවි
ඔවුන්ට ආශීර්වාද කර[13] මෙසේ පව-
සයි. "මගේ සෙනඟ වන ඊජිප්තු-
වරුන්ටත් මා නිර්මාණය කළ
ඇසිරියානු ජාතිකයන්ටත්[14] මගේ
උරුමය වන ඊශ්‍රායෙල්වරුන්ටත්
ආශීර්වාද ලැබේවා!"[15]

**20** තර්තාන්,*[16] ඇසිරියාවේ රජු
වන සර්ගොන්ගේ අණ පරිදි[17]
අෂ්දොද්[18] නගරයට විරුද්ධව ගොස්
යුද්ධ කර එය අල්ලාගත්තේය.[19]

**19 පරි.**
**1** යෝබ් 11:7
රෝම 11:33
**2** රෝම 1:22
**3** යෙරෙ 46:14
එස 30:13
හොෂෙ 9:6
**4** විනි 20:2
1සාමු 14:38
**5** යෝබ් 12:20
යෝබ් 12:24
යෙසා 19:3
2තෙස 2:11
**6** ගීතා 107:27
හිතෝ 20:1
යෙසා 28:7
යෙරෙ 48:26
**7** යෙසා 9:15
**8** ගීතා 48:6
යෙරෙ 30:6
**9** යෙසා 10:32
යෙසා 11:15
සෙක 2:9
**10** යෙසා 14:24
යෙසා 20:3
දානි 4:35
**11** යෙරෙ 25:26
යෙරෙ 43:11
එස 29:6
**12** යෙරෙ 43:7
යෙරෙ 44:1
එස 30:14
**13** 2රාජා 18:28
**14** ද්වි 10:20
යෙරෙ 4:2
යෙරෙ 12:16
**15** යෙරෙ 43:7
යොහ 17:15
එළි 11:8
**16** යෙරෙ 32:20

**2 තීරුව**
**1** ගීතා 50:15
**2** ලූක් 2:11
**3** ගීතා 83:18
ගීතා 98:2
හබ 2:14
**4** ශෙප 3:10
මලා 1:11
**5** දේශ 5:4
**6** යෙසා 19:1
යෙරෙ 46:13
**7** ද්වි 32:39
යෙසා 57:18
යෙරෙ 33:6
හොෂෙ 6:1
**8** යෙසා 19:18
යෙරෙ 44:1
**9** 1රාජා 8:43
යෙරෙ 50:19
සෙක 8:22
**10** යෙසා 11:16
යෙසා 35:8
යෙසා 40:3
**11** ද්වි 32:43
ගීතා 117:1
සෙක 2:11
**12** උත් 12:3
එස 34:26
සෙක 8:13
ගලා 3:14

**13** ගීතා 67:6; ගීතා 115:12; යෙසා 61:9; යෙසා 65:8; **14** හොෂෙ 2:23; රෝම 3:29; **15** ද්වි 32:9; ආමො 3:2; මලා 3:17; 1පේතෘ 2:9; **20 පරි.** **16** 2රාජා 18:17; **17** 2ලේක 32:9; **18** යොෂු 11:22; යොෂු 13:3; **19** ආමො 1:8.

යෙසා **20:1*** හෝ, "හමුදාපති."

තර්තාන් අෂ්දොද් නගරයට පැමිණි
අවුරුද්දේදී, **2** යෙහෝවා දෙවි
ආමොෂ්ගේ[1] පුත් යෙසායාට මෙසේ
පැවසුවේය. "ඔබේ පාවහන්ද[2] ඉඟ
වටා ඇති ගෝණි රෙද්ද ගලවා
දමන්න."[3] යෙසායාද දෙවි පැවසූ ලෙ-
සම ඇඳුම් සහ පාවහන් නොමැතිව
ඇවිද්දේය.[4]

**3** පසුව යෙහෝවා දෙවි මෙසේ
පැවසුවේය. "අවුරුදු තුනක් පුරා මගේ
සේවක යෙසායා ඇඳුම් සහ පාව-
හන් නොමැතිව ඇවිද්දේය. ඔහු කළ
ඒ දේ ඊජිප්තුවට[5] සහ ඉතියෝපි-
යාවට[6] සිදු වීමට නියමිත දේ පිළි-
බඳව ලකුණක් විය.[7] **4** ඇසිරියාවේ
රජ පැමිණ ඊජිප්තුවෙන්ද[8] ඉතියෝපි-
යාවෙන්ද බාල මහලු සැම කෙනෙ-
කුගේම ඇඳුම් සහ පාවහන් ගලවා
ඔවුන්ව වහලුන් හැටියට රැගෙන යයි.
තට්ටම පෙනෙන තරමටම ඊජිප්තුව-
රුන්ව නිර්වස්ත්‍ර කර ලැජ්ජාවට පත්
කරනු ඇත.[9] **5** එවිට, ඉතියෝපි-
යාව මත විශ්වාසය තැබූ අයද[10] ඊජිප්-
තුවේ කීර්තිය ගැන මහ ඉහළින්
කතා කළ අයද[11] ලැජ්ජාවට පත් වී
බියෙන් තැතිගනිති. **6** එවිට වෙර-
ළබඩ තීරයේ වෙසෙන ජනයා මෙසේ
කියන බවට නිසැකයි. 'අපි උප-
කාරය පතා දිව්වේ මොවුන් වෙ-
නට නොවේද? අපි සිතුවේ ඔවුන්
ඇසිරියාවේ රජුගේ අතින් අපිව ගල-
වාගනියි කියායි![12] දැන් අපිව බේරා-
ගන්නේ කවුද?'"

**21** මුහුද අසල පිහිටි පාළුක-
රයට* විරුද්ධව දුන් තීන්-
දුව මෙයයි.[13] දකුණු දිශාවෙන් හමා
එන බිහිසුණු කුණාටුවක්[14] වැනි වූ
විපතක් පැමිණෙයි. පාළුකරයේ සිට
බිය උපදවන ජාතියක් එන්නේය.[15]
**2** දරුණු සිද්ධීන් ඇතුළත් මේ දර්ශ-
නය[16] මා ඉදිරියේ දිගහැරිණ. වංචනික
ලෙස කටයුතු කරන්නා තව තවත්
වංචා කරන්නේය. කොල්ලකරුවා
තව තවත් කොල්ල කන්නේය.[1]
ඒලාම් දේශයේ වැසියෙනි, දැන් ඒ දේ-
ශයට විරුද්ධව ගොස් යුද්ධ කරන්න!
මේදිය[2] වැසියෙනි, දේශය වටලන්න!
මන්ද ඔවුන් අනුන්ට ඇති කරන දුක්
පීඩා මම නවත්වන්නෙමි.[3] **3** මෙය
දුටු පසු මගේ ශරීරය පුරාම දරුණු
වේදනාවක් දිව ගියේය.[4] දරු ප්‍රසූති-
යේදී ස්ත්‍රියකට ඇති වන වේදනාව
මෙන් දැඩි වේදනාවක් මට දැනිණ.[5]
කිසිම දෙයක් නොඇසෙන තරම-
ටම මගේ සිත අවුල් වුණේය. කිසිම
දෙයක් නොපෙනෙන තරමටම මගේ
සිත කැලඹුණේය. **4** මගේ හදවත
ගැහෙයි. මම භයෙන් වෙවුලමි. මා
නිසංසල සන්ධ්‍යා වරුවට ප්‍රිය කළ
නමුත් දැන් සවස් වී ගෙන එද්දී මගේ
සිතට මහත් භයක් දැනෙයි.[6]

**5** භෝජන සංග්‍රහයට මේසය සූදා-
නම් කරන්න. අසුන් සූදානම් කරන්න.
ඇති තරම් කන්න, බොන්න![7] පාලක-
යෙනි,[8] දැන් නැඟිට පලිහට තෙල්
ආලේප කරන්න.[9] **6** මන්ද යෙ-
හෝවා දෙවි මට මෙසේ පැවසුවේය.

"ඔබ දැන් මුරකරුවෙකුව පත් කර
දකින දේ වාර්තා කරන්න කියා ඔහුට
පවසන්න."[10]

**7** මුරකරු අශ්වයන් දෙදෙනෙකු
බැඳ සිටි යුධ රථයක්ද බූරුවන් බැඳ
සිටි රථයක්ද ඔටුවන් බැඳ සිටි රථ-
යක්ද දුටුවේය. ඒ දෙස සුපරීක්ෂාකා-
රීව බැලූ ඔහු, **8** සිංහයෙකු ගර්ජනා
කරන්නාක් මෙන් හඬ නඟා[11] මෙසේ
පැවසුවේය. "යෙහෝවා දෙවියනි, මම
මුරටැඹට වී රෑ දාවල් බලා සිටින්-
නෙමි.[12] **9** දැන් මිනිසුන් කිහිපදෙ-
නෙකු අශ්ව රථයක එනවා මට
පෙනේ!"[13]

ඉන්පසු මුරකරු මෙසේ කීවේය.
"ඇය වැටුණාය! බැබිලෝනිය වැටු-
ණාය.[14] දෙවි ඇගේ දේවතා රූප

---

යෙසා **21:1*** මෙය, පුරාණ බැබිලෝනියේ දකුණු ප්‍රදේශය විස්තර කිරීමට භාවිත කළ යෙදුමක් බව පෙනී යයි. යුප්‍රටීස් සහ ටයිග්‍රීස් ගංගා දෙක අවුරුද්දකට වරක් පිටාර ගලා එම ප්‍රදේශය යටපත් කළේය.

**14** යෙසා 13:19; යෙසා 14:4; යෙසා 45:1; යෙරෙ 50:3; යෙරෙ 51:8; දානි 5:28; එළි 14:8; එළි 18:2.

---

**20 පරි.**
1 යෙසා 1:1
2 2සාමු 15:30
3 යෙරෙ 13:1
යෙරෙ 19:1
යෝනා 3:8
එළි 11:3
4 1සාමු 19:24
මීකා 1:8
හෙබ්‍රෙ 11:37
5 යෙසා 19:1
6 යෙසා 18:1
7 යෙසා 8:18
8 යෙසා 19:4
යෙරෙ 46:26
එස 30:19
9 යෙරෙ 13:22
මීකා 1:11
10 ගීතා 146:3
11 2රාජා 18:21
යෙසා 30:3
යෙසා 36:6
යෙරෙ 17:5
එස 29:6
12 යෙසා 30:2
යෙසා 31:1

**21 පරි.**
13 යෙසා 13:1
යෙසා 13:20
යෙරෙ 51:42
14 සෙක 9:14
15 යෙසා 13:4
යෙසා 13:18
16 යෙසා 13:9
එළි 18:2

**2 තීරුව**
1 යෙසා 33:1
යෙරෙ 51:48
යෙරෙ 51:53
2 යෙරෙ 51:11
යෙරෙ 51:28
දානි 5:28
දානි 8:20
3 ගීතා 137:1
යෙසා 14:7
යෙසා 35:10
යෙරෙ 31:12
4 හබ 3:16
5 යෙරෙ 50:43
1තෙස 5:3
6 ද්වි 28:67
7 යෙසා 22:13
දානි 5:1
8 යෙරෙ 50:35
යෙරෙ 51:57
9 2සාමු 1:21
10 2රාජා 9:17
යෙසා 62:6
යෙරෙ 51:12
එස 3:17
එස 33:3
හබ 2:1
මතෙ 24:45
11 යෙසා 5:29
12 හබ 2:1
13 යෙරෙ 50:3
යෙරෙ 50:9
යෙරෙ 51:27

සියල්ල විනාශ කර පොළොවට සම-
තලා කර දැමුවේය!”[1]
10 කමතේ ධාන්‍ය මෙන් මඩිනු
ලැබූ මගේ සෙනඟෙනි,[2] මා ඔබට
දැනුම් දුන්නේ ස්වර්ගයේ සේනාවල
අධිපති හා ඊශ්‍රායෙල්හි දෙවි වන යෙ-
හෝවා මට පැවසූ දේය.
11 දූමා දේශයට* විරුද්ධව දුන්
තීන්දුව මෙයයි. සේයිර්[3] දේශයේ
සිට යමෙක් හඬගසා මගෙන් මෙසේ
ඇසීය. “මුරකරුව, එළි වෙන්න තව
කොපමණ වෙලා තියෙනවාද? තව
කොපමණ වෙලා තියෙනවාද කියා
මට කියන්න.”[4] 12 එවිට මුරකරු
මෙසේ පිළිතුරු දුන්නේය. “එළිය
වැටෙයි. ආපසු රාත්‍රියත් උදා වෙයි.
ඔබ කැමති නම් ඇවිත් විමසන්න.
යළිත් එන්න!”
13 පාළුකරයට* විරුද්ධව දුන්
තීන්දුව මෙයයි. දෙදාන් ගෝත්‍රයට
අයත් තවලම්කරුවෙනි,[5] පාළුකර-
යේ පිහිටි වනයක ඔබට රාත්‍රිය
ගත කරන්න සිදු වෙයි. 14 තේමා[6]
දේශයේ වැසියෙනි, පිපාසිතයන්ට
බොන්න වතුර දෙන්න. පලා යන
අයව මුණගැසී ඔවුන්ට කෑමට යමක්
දෙන්න. 15 මන්ද සතුරෝ ඔවුන්ට
විරුද්ධව යුද්ධයට සැරසී ඇත. කඩු-
වෙන්ද දුන්නෙන්ද මැරුම් නොකන
පිණිස ඔවුහු පලා යන්නෝය.
16 යෙහෝවා දෙවි මට මෙසේ
කියා තිබේ. “කුලීකරුවෙකුගේ සේවා
කාලය නිම වන දවස නිශ්චිත
වන්නාක්[7] මෙන් තව අවුරුද්දකින්
කේදාර්[8] ගෝත්‍රිකයන්ගේ තේජස මුළු-
මනින්ම පහ වී යයි. 17 ඔවුන් අත-
රේ සිටින බලවත් දුනුවායන්ගෙන්
ඉතුරු වන්නේ අතළොස්සක් පමණි.[9]
ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝවා යමක්
පැවසුවොත් එය එලෙසම සිදු වනු
ඇත.”[10]

---

**යෙසා 21:11*** ඒදොම් දේශයට දුන් නමකි. **13*** හෝ, “පාළු සමභූමිය.” සිරියැක් පෙෂිටා හා ලතින් වල්ගේට් පිටපත්වල ‘අරාබිය’ යනුවෙන් සඳහන් වේ.

**21 පරි.**
1 යෙරෙ 50:2
යෙරෙ 51:44
යෙරෙ 51:52
2 1රාජා 8:46
2රාජා 13:7
යෙසා 1:25
මතෙ 3:12
හෙබ්‍රෙ 12:6
3 උත් 32:3
ද්වි 2:8
ගීතා 137:7
4 එළි 16:15
5 එස 27:15
6 යෝබ් 6:19
යෙරෙ 25:23
7 යෝබ් 7:1
යෙසා 16:14
8 උත් 25:13
ගීතා 120:5
සල 1:5
යෙසා 42:11
එස 27:21
9 යෙරෙ 49:28
10 ගණන් 23:19
යෙසා 46:10
යෙසා 55:11

**2 තීරුව**

**22 පරි.**
1 යෙසා 1:1
යෙසා 13:1
යෙසා 22:5
යෙරෙ 6:6
2 යෙසා 15:3
යෙරෙ 48:38
3 යෙසා 32:13
ආමො 6:6
4 යෙසා 3:1
යෙරෙ 14:18
යෙරෙ 38:2
විලා 4:9
5 යෙසා 1:10
6 2රාජා 25:4
යෙරෙ 39:4
යෙරෙ 52:7
7 යෙරෙ 52:24
8 යෙසා 33:7
යෙරෙ 4:19
යෙරෙ 6:26
යෙරෙ 9:1
මීකා 1:8
9 යෙරෙ 8:18
යෙරෙ 31:15
10 යෙරෙ 30:5
ආමො 5:18
මීකා 7:4
11 යෙසා 5:5
යෙසා 10:6
12 2රාජා 25:10
නෙහෙ 1:3
විලා 2:2
13 හොෂෙ 10:8
ලූක් 23:30
එළි 6:16
14 උත් 10:22
යෙසා 21:2
15 2රාජා 16:9
ආමො 1:5

## 22

බොහෝ එළිදරව් කිරීම්
කරනු ලැබූ නිම්නයට*
විරුද්ධව දුන් තීන්දුව මෙයයි.[1] ඔබට
කුමක් සිදු වී ඇද්ද? ඔබේ සියලු
වැසියන් තම නිවෙස්වල පියස්සට වී
සිටින්නේ මන්ද?[2] 2 ඔබේ නගරය
කැලඹී ඝෝෂාවෙන් පිරී තිබේ. ප්‍රීති
ඝෝෂාද ඇසෙයි.[3] ඔබේ වැසියන් මිය
ගොස් ඇත්තේ කඩුවෙන්වත් යුද්ධ-
යෙන්වත් නොවෙයි.[4] 3 ඔබේ කෲර
පාලකයෝ[5] සියලුදෙනාම පලා ගොස්
ඇත.[6] ඊතලයක්වත් නොවිදි ඔවුන්ව
අල්ලාගෙන තිබේ. දුර ඈත පලාත්ව-
ලට පලා ගිය අයවත් සිරකරුවන්
ලෙස රැගෙන ගොස් ඇත.[7]
4 ඒ නිසා මම මෙසේ කීවෙමි.
“මම හඬා වැලපෙද්දී මා දිහා බලන්න
එපා. මට අඬන්න ඉඩ දෙන්න.[8]
මගේ ජනයා විනාශ වෙද්දී මාව
සනසන්න වෑයම් කරන්න එපා.[9]
5 මන්ද ස්වර්ගයේ සේනාවල අධිප-
තිද විශ්වයේ පාලකයාණන්ද වන යෙ-
හෝවා දෙවි බොහෝ එළිදරව් කිරීම්
කරනු ලැබූ නිම්නය මත ව්‍යවුලක්[10]
ඇති කිරීමටද එය පාගා දමා[11] විනාශ
කිරීමටද දවසක් නියම කර තිබේ.
සතුරා ඇවිත් එහි පවුරු බිඳ දමන්-
නේය.[12] කඳුවල විලාප හඬ දෝංකාර
දෙයි.[13] 6 ඒලාම්[14] දේශයේ වැසියෝ
ඊතොපුව පුරවාගෙන යුද්ධ කරන
පිණිස අශ්ව රථවල නැඟ එන්නෝය.
කිර්හි[15] වැසියෝද තම පලිස් සූදා-
නම් කරගන්නෝය.* 7 ඔබේ සරු-
සාර තැනිතලා පවා යුධ රථවලින් පිරී
තිබෙයි. සතුරාගේ අශ්වයෝ නුවර
දොරටුව අසල සැරසී සිටින්නෝය.
8 ඒ දවසේදී, යූදා දේශයට රැකවර-
ණය ලබා දුන් ව්‍යන ඉවත් කරනු
ලබයි. ඒ නිසා ලෙබනොන් වනාන්ත-
රය ලෙස හඳුන්වන ගෘහයේ[16] ආයුධ
ගබඩා[17] වෙතට ඔබ දුවන්නහුය.

---

**16** 1රාජා 7:2; **17** නෙහෙ 3:19.

---

**යෙසා 22:1*** මෙහි බොහෝවිට කතා කරන්නේ යෙරුසලම ගැනයි. **6*** මූ.අ., “පලිහේ වැස්ම ඉවත් කළෝය.”

**9** දාවිත්ගේ නුවරේ පවුර සෑම තැනම
කැඩී බිඳී ගොස් ඇති ආකාරය දැක,[1]
ඔබ පහළ පොකුණේ වතුර රැස් කර-
ගනු ඇත.[2] **10** පවුර[3] නැවත ගො-
ඩනැඟීම සඳහා යෙරුසලමේ කුමන
නිවෙස් කඩා දැමිය හැකිදැයි ඔබ
සොයා බලන්නහුය. **11** පරණ පො-
කුණේ[4] ජලය රැස් කරගන්න ඔබ
පවුරු දෙක අතරේ තටාකයක් සාදා-
ගනු ඇත. නමුත් බොහෝ කලකට
පෙර එය සෑදූ උදාර තැනැත්තාණන්-
ගෙන් ඔබ උපකාර පතන්නේ නැත.

**12** "ඒ දවසේදී ස්වර්ගයේ සේ-
නාවල අධිපතිද විශ්වයේ පාලකයා-
ණන්ද[5] වන යෙහෝවා දෙවි ඔබට
හඬා වැලපෙන්න කියාද[6] හිස මුඩු
කරගන්න කියාද ගෝණි රෙදි ඇඳ-
ගන්න කියාද නියම කරන්නේය.[7]
**13** එහෙත් ඔබ එය ගණනකට නො-
ගෙන ගොනුන්වද බැටළුවන්වද මරා
මස් කමින්, වයින් බොමින්,[8] 'අපි
හෙට මැරෙන නිසා අද කමු, බොමු'
කියමින් ප්‍රීති වන්නහුය."[9]

**14** ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා මට මේ දේ හෙළි
කළේය.[10] " 'ඔබ සියල්ලෝ මැරෙන
තුරු[11] ඔබේ වරදට සමාව ලැබෙන්නේ
නැත.'[12] එසේ පැවසුවේ ස්වර්ගයේ
සේනාවල අධිපතිද විශ්වයේ පාලක-
යාණන්ද වන යෙහෝවා දෙවිය."

**15** ස්වර්ගයේ සේනාවල අධිපතිද
විශ්වයේ පාලකයාණන්ද වන යෙ-
හෝවා දෙවි මෙසේද පැවසුවේය.
"මාළිගාව භාරව සිටින සේව-
කයා[13] වන ෂෙබ්නා[14] වෙතට ගොස්
කතා කරන්න. **16** මන්ද ඔහු උස්
ස්ථානයක එනම්, පර්වතයක් මුදු-
නේ තමාටම කියා සොහොන් ගෙ-
යක් ගොඩනඟමින් සිටියි. ඒ නිසා
ඔහුට මෙසේ කියන්න. 'ඔබටම කියා
මෙහි සොහොන් ගෙයක් තනන්න
ඔබට තිබෙන අයිතිය කුමක්ද? ඔබ-
ටම කියා කිසි දෙයක් මෙහි තිබේද?
ඔබගේම කියා කිසි කෙනෙක් මෙහි
සිටිනවාද? **17** බලවත් තැනැත්ත,
වැඩි කල් යන්න පෙර යෙහෝවා
දෙවි ඔබව පොළොවට හෙළන්නේය.
**18** බෝලයක් විසි කර දමන්නාක්
මෙන් දෙවි ඔබව තම අතෙහි ගුළි
කර ඈත දේශයකට පන්නා දමන්-
නේය. එහිදී ඔබ මිය යනු ඇත. ඔබේ
ස්වාමියාගේ නිවසට නින්දාවක් ගෙ-
නෙන ඔබේ අලංකාර අශ්ව රථ පම-
ණක් එහි ඉතුරු වනු ඇත. **19** දෙවි
ඔබේ තනතුරෙන්ද ඔබේ වගකීම්ව-
ලින්ද ඔබව ඉවත් කර දමයි.[1]

**20** " 'දෙවි හිල්කියාගේ[2] පුත්‍රයා වූ
තම සේවක[3] එලියාකීම්ව[4] තෝරා-
ගනු ඇත. **21** දෙවි ඔබේ නිලවස්ත්‍ර-
යද බඳපටියද ඔහුට පළඳවා[5] ඔබට
තිබුණු අධිකාරියද ඔහුට දෙන්නේය.
ඔහු යෙරුසලමේ වැසියන්ටත් යූදා
සෙනඟටත් පියෙකු මෙන් වන්නේය.[6]
**22** දාවිත්ගේ නිවසෙහි යතුර[7] දෙවි
ඔහුට භාර දෙන්නේය.* ඔහු යමක්
ඇරියොත් කිසිවෙකුට එය වැසිය
නොහැක. ඔහු යමක් වැසුවොත්
කිසිවෙකුට එය ඇරිය නොහැක.[8]
**23** ඇණයක් සෙලවිය නොහැකි
තැනක සවි කරන්නාක් මෙන්[9] දෙවි
ඔහුට කිසිදා අහිමි නොවන ස්ථිර
ස්ථානයක් ලබා දෙන්නේය. ඔහු තම
පියාගේ නිවස අලංකාර කරන සිංහා-
සනයක් මෙන් වනු ඇත.[10] **24** ඔහු-
ගේ පියාගේ නිවසේ මුළු ගෞරවය
ඔහු මත රඳා පවතියි. ඔහුගේ පියා-
ගෙන් පැවතෙන අයද රිකිල්ලක් සේ
සිටින සියල්ලන්ද එනම්, එම නිව-
සෙහි ලොකු කුඩා සියලු භාජනද ඔහු
මත රඳා පවතිනු ඇත.'

**25** "ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මෙසේද පව-
සයි. 'ස්ථිර ලෙස සවි කර තිබූ
ඇණය[11] ගලවා ඉවත් කරනු ලබයි.[12]
ඒ සමඟම ඒ මත එල්ලා තිබෙන
සියල්ලද ගැලවී වැටෙයි. යෙහෝවා
දෙවි වන මා යමක් පැවසුවොත් එය
ස්ථිර වශයෙන්ම සිදු වෙයි.' "[13]

**22 පරි.**
1 2රාජා 25:10 යෙරෙ 52:7
2 2රාජා 20:20 2ලේක 32:30 නෙහෙ 3:15 යොහ 9:7
3 නෙහෙ 1:3
4 2රාජා 18:17 යෙසා 7:3 යෙසා 36:2
5 ක්‍රියා 4:24
6 නෙහෙ 8:9 යෙසා 15:3 යෝවෙ 2:17
7 යෝබ් 1:20 ආමො 8:10 මීකා 1:16
8 යෙසා 5:12 යෙසා 56:12 ආමො 6:4 ලූක් 17:27
9 යෙසා 21:5 1කොරි 15:32 යාකො 5:5
10 යෙසා 5:9 ආමො 3:7
11 ලෙවී 26:31
12 යෙසා 1:11 යෙරෙ 15:1 එස 24:13 හෙබ්‍රෙ 10:26
13 2රාජා 10:5
14 2රාජා 18:37 2රාජා 19:2 යෙසා 36:3 යෙසා 37:2

**2 තීරුව**
1 යෝබ් 40:11 ගීතා 75:7 ලූක් 1:52
2 2රාජා 18:26
3 මතෙ 24:45 1කොරි 4:2
4 2රාජා 18:18 2රාජා 18:37 යෙසා 36:3
5 උත් 41:42 1සාමු 18:4 එස්ත 8:15
6 උත් 45:8
7 1ලේක 9:27 එළි 3:7
8 මතෙ 18:18
9 එස්රා 9:8
10 උත් 45:9 1සාමු 2:8 ලූක් 22:30 එළි 3:21
11 යෙසා 22:15
12 යෙසා 22:17
13 යෙසා 46:11 යෙරෙ 4:28

යෙසා **22:22*** මූ.අ., "ඔහුගේ කර පිට තබන්නේය."

**23** තීර්[1] දේශයට විරුද්ධව දුන්
තීන්දුව මෙයයි. තර්ෂිෂ්හි[2]
නාවිකයෙනි, හඬා වැලපෙන්න! මන්ද
ඔබේ වරාය[3] විනාශ වී ඇති බව
කිත්තිම්[4] දේශයේදී ඔබට ආරංචි වනු
ඇත. **2** වෙරළබඩ තීරයේ වැසි-
යෙනි, නිහඬ වන්න. මුහුද තරණය
කර ඔබ වෙතට පැමිණි සීදොන්[5]
දේශයේ වෙළෙන්දෝ ඔබව ධන-
වත් කළෝය. **3** ෂිහොර්[6] ප්‍රදේශ-
යෙන් ලබාගත් ධාන්‍යද නයිල් ගඟ
අවට පෙදෙස්වලින් ලබාගත් අස්වැන්-
නද මහා ජල කඳන් හරහා ප්‍රවාහණය
කිරීම ඔබේ ජීවනෝපාය විය. ජාතීහු
ඔබ නිසා ලාභ ලැබුවෝය.[7]
**4** සීදොන් දේශයේ වැසියෙනි,[8]
ලැජ්ජා වන්න! මුහුදේ සුරක්ෂිත ස්ථා-
නයේ වෙසෙන්නෙනි, ඔබත් ලැජ්ජා
වන්න. මන්ද මුහුද මෙසේ කීවේය.
“මම ප්‍රසව වේදනා වින්දේවත් දරුවන්
වැදුවේවත් නැත. මම තරුණ තරු-
ණියන්ව උස් මහත් කළේද නැත.”[9]
**5** ඊජිප්තුවට අත් වූ විපත ගැන
ආරංචි වූ විට[10] සිදු වුණාක් මෙන් තීර්
දේශය ගැන අසන විටත් ජනයාට
දරාගත නොහැකි වේදනාවක් ඇති
වෙයි.[11] **6** වෙරළබඩ තීරයේ වැසි-
යෙනි, තර්ෂිෂ් දේශයට පලා ගොස්
හඬා වැලපෙන්න. **7** අතීතයේ සිට
ප්‍රීතිමත් නුවරක්ව සිටි ඔබට සිදු
වුණේ කුමක්ද? ඔබේ සෙනඟ ඈත
රටවලට ගමන් කර එහි පදිංචි වූහ.
**8** රජවරුන්ට කිරුළ පැළඳූ තීර්
දේශයට විරුද්ධව මේ තීන්දුව දුන්-
නේ කවුද?[12] වෙළෙඳුන්ව අධිපතීන්
හා නම්බුකාර අය මෙන් සැලකූ ඒ
දේශයට විරුද්ධව මේ තීන්දුව දුන්නේ
කවුද?[13]
**9** මේ තීන්දුව දුන්නේ ස්වර්ගයේ
සේනාවල අධිපති වන යෙහෝවා දෙ-
විය.[14] උඩඟුකමට හේතු වන සෑම
අලංකාර දෙයක්ම නැති කර දමන
පිණිසත්[15] මෙලොවෙහි වැසියන්ගේ
ගෞරවයට පාත්‍ර වූ සියල්ලන්ව පහත්
කරන පිණිසත් ඔහු ඒ දේ නියම කර
තිබේ.[16]

**10** තර්ෂිෂ්හි දියණිය,[1] නයිල් ගඟ
පිටාර ගලන්නාක් මෙන් ඔබත් දේශය
පුරා විසිර යන්න. මන්ද ඔබටම කියා
වරායක් දැන් නැත.[2] **11** දෙවි තම
හස්තය මුහුද හරහා දිගු කර රාජ්‍ය-
යන් කැලඹුවේය.[3] යෙහෝවා දෙවි
ෆිනීෂිය දේශයේ බලකොටු බිඳ දැමී-
මට අණ කළේය.[4] **12** ඔහු මෙසේ
පවසන්නේය. “පීඩා විඳින සීදොන්[5]
කන්‍යා දියණිය, ඔබ යළි කිසිදා ප්‍රීති
වන්නේ නැත.[6] ඔබ කිත්තිම්[7] දෙසට
යන්න. එහෙත් එහි ගිය පසුත් ඔබට
සහනයක් ලැබෙන්නේ නැත.”
**13** තීර් දේශය වනසතුන්ගේ නිජ-
බිමක් බවට පත් කරන්නේ[8]
ඇසිරියානු[9] ජාතිකයන් නොව කල්දි-
වරුන්ය.[10] ඔවුහු දේශය වටලාගෙන
එයට පහර දෙන පිණිස බැම්මක් ගො-
ඩනඟන්නෝය.[11] එහි රාජකීය බල-
කොටු නැති නාස්ති කර[12] දේශය
නටබුන් ගොඩක් බවට පත් කරන්-
නෝය.[13]
**14** තර්ෂිෂ්හි නාවිකයෙනි, විලාප
නඟන්න! මන්ද ඔබේ බලකොටුව
විනාශ වනු ඇත.[14]
**15** එක් රජෙකුගේ පාලන සමයේදී
එනම්, අවුරුදු හැත්තෑවක් තුළදී තීර්
දේශය මිනිසුන්ගේ මතකයෙන් ගිලිහී
යනු ඇත.[15] අවුරුදු හැත්තෑව අවසා-
නයේදී, මෙම ගීයේ සඳහන් ගණිකාව-
ගේ තත්වයට තීර් දේශය පත් වනු
ඇත. **16** “මතකයෙන් ගිලිහී ගිය
ගණිකාව,[16] වීණාවක් රැගෙන නුවර
වටේ ඇවිදින්න. මිහිරි නාදයට වීණාව
වයමින් ඔබ කවුද කියා ඔවුන්ට සිහි
වන තුරු ගී ගයන්න.”
**17** එහෙත් අවුරුදු හැත්තෑව අව-
සානයේදී යෙහෝවා දෙවි නැවතත්
තීර් දේශය වෙතට තම අවධානය
යොමු කරයි. ඇය නැවතත් ගණිකා-
වක මෙන් හැසිර පොළොවේ සියලු
රජවරුන්ගෙන්[17] කුලී ලබාගන්නීය.[18]
**18** නමුත් ඇයට ගෙවන කුලියත්
ඇය උපයන ලාභයත්[19] යෙහෝවා

**23 පරි.**
1 යෙරෙ 25:22
යෙරෙ 47:4
එස 26:3
එස 27:2
යෝවේ 3:4
ආමො 1:9
සෙක 9:4
2 2ලේක 9:21
ගීතා 48:7
යෙසා 2:16
එස 27:25
3 එස 27:3
4 උත් 10:4
යෙරෙ 2:10
එස 27:6
දානි 11:30
5 එස 27:8
6 යෙරෙ 2:18
7 එස 27:33
එස 28:4
යෝවේ 3:5
8 උත් 10:15
එස 27:8
9 යෙරෙ 47:4
10 යෙසා 19:1
යෙසා 19:16
11 එස 26:15
එස 27:35
එස 28:19
12 ද්වි 29:24
ගීතා 94:2
13 එස 28:2
14 යෙසා 14:24
යෙසා 46:10
15 දානි 4:37
යාකො 4:6
16 යෝබ් 12:21
ගීතා 107:40

**2 තීරුව**
1 යෙසා 23:1
2 එස 26:14
එස 26:17
3 ගීතා 46:6
එස 27:34
4 එස 26:5
එස 26:15
5 උත් 10:15
6 එස 26:13
7 එස 27:6
දානි 11:30
8 යෙසා 13:21
9 2රාජ 17:24
යෙසා 10:12
යෙසා 30:31
නාහු 3:18
ශෙප 2:13
10 උත් 11:31
යෙසා 13:19
යෙසා 47:1
හබ 1:6
11 එස 26:8
12 එස 26:9
13 එස 26:12
14 යෙසා 23:1
15 යෙරෙ 25:11
යෙරෙ 27:3
යෙරෙ 27:6
16 හිතෝ 7:10
යෙරෙ 30:14
17 නාහු 3:4

**18** මීකා 1:7; **19** ද්වි 23:18.

දෙවිට කැප වූ දෙයක් බවට පත් වන්-
නේය. ඒ කිසිවක් රැස් කර තබා-
ගන්න ඇයට නොහැකි වෙයි. මන්ද
ඒ සියල්ල යෙහෝවා දෙවිගේ සේව-
කයන්ගේ ප්‍රයෝජනය පිණිස වෙන්
කරනු ලබන්නේය.[1] ඔවුහු ඒවායින්
කා බී වටිනා සළුපිළි මිල දී ගෙන
තෘප්තියට පත් වන්නෝය.[2]

**24** යෙහෝවා දෙවි දේශයේ කිසි
වැසියෙකු ඉතුරු නොකර
එය පාළුවට යන්න හරින්නේය.[3]
ඔහු දේශය නාස්තියට පමුණුවා[4]
එහි වැසියන්ව විසුරුවාහරින්නේය.[5]
**2** සාමාන්‍ය ජනයාට හා පූජකයන්-
ටත් සේවකයාට හා ස්වාමියාටත්
සේවිකාවට හා ස්වාමිදූවටත් වෙ-
ළෙන්දාට හා ඔහුගෙන් බඩු මිල
දී ගන්නාටත් ණයට දෙන්නාට හා
ණයට ගන්නාටත් පොලී අය කරන්-
නාට හා පොලී ගෙවන්නාටත් සිදු
වන්නේ එකම දෙයයි.[6] **3** සතුරු
හමුදා ඇවිත් දේශය හිස් වන තුරුම
සෑම දෙයක්ම කොල්ල කන්නෝය.[7]
ස්ථිර වශයෙන්ම ඒ දේ සිදු වන්-
නේය. මන්ද ඒ දේ තීන්දු කර
ඇත්තේ යෙහෝවා දෙවිය.[8] **4** දේ-
ශය වැලපෙයි.[9] එහි ගස් කොළන්
වියළී, කෙත්වතු පාළුවට ගොස් ඇත.
එහි උත්තමයෝ පහ වී යන්-
නෝය.[10] **5** දේශයේ වැසියෝ දෙ-
විගේ නීති නොසලකාහරින්නෝය.[11]
ඔවුන් තමන්ටම නීති සාදාගෙන[12]
පරම්පරාවෙන් පරම්පරාවට පවතින
ගිවිසුම කඩ කරමින්[13] දේශය දූෂ්‍ය
කර තිබේ.[14] **6** ඒ නිසා දේශය පිටට
ශාපයක් පැමිණ[15] එහි වැසියෝ දඬුවම්
විඳින්නෝය. ඔවුන්ගෙන් දැන් ඉතුරු
වී ඇත්තේ ස්වල්පදෙනෙකු පමණි.[16]
**7** මිදිවැල් වියළී ගොස් ඇති නිසා
දේශයේ හොඳ වයින් සොයාගත නො-
හැක.[17] ප්‍රීතියෙන් කල් ගෙවූ සිය-
ලුදෙනා දැන් සුසුම්ලති.[18] **8** වීණා
වයමින් රබන් ගසමින් විනෝද වූ අය-
ගේ ප්‍රීති නාද දැන් අසන්න ලැබෙන්-
නේ නැත.[19] **9** සතුටු ගී ගයමින්
වයින් බොන කිසිවෙක් නැත. මත්-
පැන් පවා ඔවුන්ට තිත්ත වී ඇත.
**10** අත්හැර ගිය නගරයේ ගෙවල් දො-
රවල් සියල්ල වසා දමා ඇත. එහි ගො-
ඩනැඟිලි ගරාවැටී ඇත.[1] **11** වයින්
හිඟය නිසා වීථිවල මහත් කලබලයක්
ඇති වී තිබේ. ප්‍රීති ඝෝෂා කොතැන-
කවත් අසන්න ලැබෙන්නේ නැත. ප්‍රීති
ප්‍රමෝදයෙන් සිටි දේශය දැන් වැල-
පෙයි.[2] **12** නුවර දොරටුව කඩා බිඳ
දමා එහි කැබලි ගොඩගසා ඇත. නුවර
අඳහාගන්න බැරි තත්වයකට පත් වී
තිබේ.[3]

**13** එහෙත් ඔලීව ගසේ පලදාව
රැස් කරගන්නා විට* ගෙඩි කිහිපයක්
ඉතුරු කර යන්නාක් මෙන්ද[4] මිදි අස්-
වැන්න නෙළාගන්නා විට පල කිහි-
පයක් ඉතුරු කර යන්නාක් මෙන්ද
දේශයේ ඉතා සුළු පිරිසක් ඉතුරු වනු
ඇත.[5] **14** ඔවුහු ප්‍රීති ප්‍රමෝදයෙන්
හඬ නඟන්නෝය. මුහුදෙන් එතෙර
දේශවල සිට ඔවුහු යෙහෝවා දෙවිගේ
ශ්‍රේෂ්ඨත්වය පැසසුමට ලක් කරති.[6]
**15** නැඟෙනහිර දෙසින්[7] පිහිටි දේ-
ශවල වැසියෝද යෙහෝවා දෙවිව
ගෞරවයට පත් කරති.[8] දූපත්වල වෙ-
සෙන වැසියෝද ඊශ්‍රායෙල්හි දෙවි වන
යෙහෝවාගේ නමට ප්‍රශංසා කරති.[9]
**16** පොළොවේ දුර ඈත ප්‍රදේශවල
සිට,[10] “ධර්මිෂ්ඨ තැනැත්තාණන්ට
ගෞරවය දෙන්න”[11] කියා ගායනා
කරන හඬක් ඇසෙනු ඇත.

නමුත් දැන් මම මෙසේ කියමි.
“මගේ ශක්තිය හීන වී ඇත.[12] මට
දරාගත නොහැකි වේදනාවක් ඇනේ.
වංචනික ලෙස කටයුතු කරන අය
තව තවත් වංචා කරන්නෝය.[13] ඔවුහු
ද්‍රෝහිව කටයුතු කරන්නෝය.”[14]

**23 පරි.**
**1** යෝබ් 27:17 දේශ 2:26
**2** යෙසා 60:5 යෙසා 61:6

**24 පරි.**
**3** ද්වි 28:63 යෙසා 1:7 යෙසා 5:5 යෙරෙ 4:6 එස 6:6
**4** 2රාජා 21:13
**5** ද්වි 28:64 නෙහෙ 1:8 යෙරෙ 9:16
**6** යෙසා 3:2 යෙසා 9:14 එස 7:12 හොෂෙ 4:9
**7** ලෙවී 26:31 ද්වි 29:28
**8** යෙසා 46:10
**9** යෙසා 3:26 යෙසා 33:9 යෙරෙ 4:28 විලා 1:4 හොෂෙ 4:3
**10** යෙසා 2:11
**11** 2රාජා 17:7 2රාජා 22:13 එස 20:13 දානි 9:5
**12** මීකා 3:11
**13** නික් 19:5 නික් 24:7 යෙරෙ 31:32 යෙරෙ 34:18
**14** ලෙවී 18:24 ගණන් 35:33 2ලේක 33:9 යෙරෙ 3:1 යෙරෙ 23:11 විලා 4:13
**15** ලෙවී 26:16 ද්වි 28:15 යොෂු 23:15
**16** ලෙවී 26:22 ද්වි 4:27 ද්වි 28:62 යෙසා 10:22
**17** යෙරෙ 8:13 යෝවෙ 1:10
**18** යෙසා 16:10 යෙසා 32:12 ආමො 5:17
**19** ගීතා 81:2 යෙරෙ 7:34 යෙරෙ 16:9 හොෂෙ 2:11

**2 තීරුව**
**1** 2රාජා 25:10
**2** යෙසා 8:22 විලා 5:15
**3** යෙසා 32:14 යෙරෙ 9:11 විලා 1:4 විලා 2:9 මීකා 1:9

**4** ද්වි 24:20; යෙසා 17:6; **5** යෙසා 1:9; යෙසා 17:5; යෙරෙ 6:9; එස 6:8; මීකා 7:1; **6** යෙසා 12:1; යෙසා 40:9; යෙරෙ 31:12; යෙරෙ 33:11; සෙක 2:10; **7** නික් 27:13; ගීතා 97:11; යෙසා 30:26; යෙසා 43:5; යෙසා 49:6; මීකා 7:9; **8** සෙක 13:9; මලා 1:11; **9** යෙසා 11:11; යෙසා 60:9; ශෙප 2:11; **10** ගීතා 22:27; ගීතා 98:3; මාක් 13:27; **11** නික් 15:11; එස්රා 9:15; ගීතා 145:7; එළි 15:3; එළි 19:2; **12** යෙසා 10:16; යෙසා 17:4; **13** යෙසා 21:2; යෙසා 33:1; විලා 1:2; **14** යෙරෙ 9:2; හොෂෙ 10:13.

**යෙසා 24:13*** ද්වි 24:20හි පාදසටහන බලන්න.

17 දේශයේ වැසියෙනි, විපතක්
ඔබ පසුපස ලුහුබැඳ එන්නේය. ඔබ
වළකට හෝ උගුලකට හෝ හසු වී
වැටෙන්නහුය.[1] 18 විපතෙන් බේරී-
මට පලා යන තැනැත්තා වළ-
කට වැටෙයි. වළෙන් ගොඩ එන
තැනැත්තා උගුලකට හසු වෙයි.[2]
මන්ද ඒ දවසේදී අහසේ කවුළු අරිනු
ලබන්නේය.[3] පොළොවේ අත්තිවා-
රම් පවා සෙලවෙන්නේය.[4] 19 පො-
ළොව දෙදරුම් කා භූමිය පැලී
යන්නේය. මුළු පොළොවම සෙල-
වෙන්නේය.[5] 20 දේශය වෙරිමත් වී
වැනිවැනී සිටින මිනිසෙකු මෙන්ද
සුළඟට හසු වූ පැල්පතක් මෙන්ද ඒ
මේ අත සෙලවෙයි.[6] දේශය නැවත
ගොඩගන්න බැරි වන තරමටම[7] එහි
වැසියන් පිරිහෙනු ඇත.[8]

21 ඒ කාලයේදී ඉහළ ස්ථාන-
වල සිටින සේනාවටත් පොළොවේ
රජවරුන්ටත් යෙහෝවා දෙවි දඬු-
වම් කරයි.[9] 22 ඔවුන්ව සිරකරු-
වන් මෙන් ගැඹුරු වළකට දමා සිර
කරනු ඇත.[10] ඔවුන්ව සිරකුටියේ වසා
දමා[11] බොහෝ කාලයකට පසු සෝ-
දිසි කරනු ලබයි.[12] 23 ඒ දවසේදී
පුන් සඳත් බැබළෙන හිරුත් ලැජ්ජා-
වට පත් වනු ඇත.[13] මන්ද ස්වර්ග-
යේ සේනාවල අධිපති වන යෙහෝවා
දෙවි සියොන් කන්දේ[14] සිට තේජශ්‍රී-
යෙන් රජකම් කරන්නේය.[15] ඔහු යෙ-
රුසලමේ සිට පාලනය කරද්දී ඔහුගේ
සෙනඟ අතරේ සිටින මහලු අය පවා
ඔහුගේ තේජස දකින්නෝය.[16]

**25** යෙහෝවා දෙවියනි, ඔබ
මාගේ දෙවිය.[17] මම ඔබට
ප්‍රශංසා කර[18] ඔබේ නාමය ගෞරව-
යට පත් කරමි.[19] මන්ද ඔබේ ක්‍රියා
විස්මිතය.[20] අතීතයේ සිට අරමුණු
කළ දේ[21] එලෙසින්ම ඉටු කරන ඔබ
සැමවිටම විශ්වාසවන්තය.[22] 2 ඔබ
නගරයක් නටබුන් ගොඩක් බවට
පත් කළෙහිය. පවුරුවලින් වට වූ
සුරක්ෂිත නුවරක් පොළොවටම සම-
තලා කළෙහිය. විදේශිකයන්ගේ බල-
කොටු යළි ගොඩනඟන්න බැරි වන
තරමටම බිඳ දැමුවෙහිය.[1] 3 බල-
වත් සෙනඟක් ඔබව ගෞරවයට
පත් කරන්නේ ඒ නිසාය. කෲර
ජාතීහු ඔබ ගැන බියට පත් වන්-
නෝය.[2] 4 මන්ද ඔබ අසරණයන්ට
බලකොටුවක්ය. දුප්පතාගේ දුක් කර-
දරවලදී ඔහුට පිහිට වන්නෙහිය.[3]
ඔබ කුණාටුවෙන් ඔවුන්ව ආරක්ෂා
කරමින් අව් රශ්මියෙන් සෙවණක්ද[4]
ලබා දෙන්නෙහිය. පවුරක් බිඳී යන
තරමටම දරුණු ලෙස ඇද හැළෙන
වැස්සක් මෙන් පහර දෙන කෲරයන්-
ගෙන් ඔබ ඔවුන්ව ආරක්ෂා කරන්-
නෙහිය. 5 වියළි දේශයක උණුසුම
නිවා දමන්නාක් මෙන් ඔබ විදේශික-
යන්ව නිහඬ කරන්නෙහිය. වලාකු-
ළක් අව් රශ්මියෙන් සෙවණක් ලබා
දෙන්නාක් මෙන්[5] ඔබ කෲරයන්ගේ
ප්‍රීති ඝෝෂා නිහඬ කරන්නෙහිය.[6]

6 ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි තම කන්-
දේදී[7] සියලු ජනයා සඳහා[8] ප්‍රණීත
ආහාර,[9] හොඳින් පෙරූ[10] ඉස්තරම්
වයින්[11] සහ දිව[12] පිනවන රසවත්
කෑම සහිත විශාල භෝජන සංග්‍රහයක්
සූදානම් කරන්නේය. 7 ඒ කන්-
දේ සිට දෙවි සියලු ජාතීන්ව වෙ-
ළාගත් අඳුරු වලාවද[13] ඔවුන් වටා
එතී තිබෙන දැලද ඉවත් කරනු ඇත.
8 විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි මරණය සදහටම ගිල
දමා[14] සියලුදෙනාගේ ඇස්වලින් කඳුළු
පිස දමන්නේය.[15] ඔහු පොළොව
පුරාම සිටින තම සෙනඟගේ නින්දාව
පහ කරන්නේය.[16] යෙහෝවා දෙවි
එසේ කරන බවට පොරොන්දු වී ඇත.

24 පරි.
1 ලෙවී 26:22 යෙරෙ 8:3 එස 14:21 ආමෝ 5:19
2 ද්වි 32:23 1රාජා 20:30
3 උත් 7:11 හිතෝ 27:4
4 ද්වි 32:22 ගීතා 18:7 ගීතා 18:15
5 යෙරෙ 4:24 නාහූ 1:5 හබ 3:6
6 ගීතා 107:27 යෙසා 19:14 යෙසා 29:9
7 ආමෝ 8:14
8 2රාජා 21:16 2ලේක 36:16 යෙරෙ 14:20 හොෂෙ 4:2
9 ගීතා 76:12 හග් 2:22
10 උත් 41:14
11 යෙසා 42:7
12 සෙක 9:11
13 එළි 21:23
14 ගීතා 132:13 යෙසා 8:18 යෙසා 18:7 යෝවෙ 3:17 හෙබ්‍රෙ 12:22
15 ගීතා 97:1 එළි 11:17
16 1රාජා 8:11 ගීතා 46:5 යෙසා 12:6 මීකා 4:7 සෙක 2:10

25 පරි.
17 ද්වි 32:3 1ලේක 29:10 ගීතා 25:12 යෙසා 61:10
18 ගීතා 7:17 ගීතා 99:5 ගීතා 145:1 හෙබ්‍රෙ 13:15
19 ගීතා 30:4 ගීතා 150:6 එළි 15:4
20 ගීතා 40:5 ගීතා 98:1 ගීතා 107:8 ගීතා 145:4
21 ගීතා 33:11 යෙසා 28:29 හෙබ්‍රෙ 6:17
22 උත් 24:27 ගණන් 23:19 ද්වි 32:4 නෙහෙ 9:33 ගීතා 89:5

2 තීරුව
1 ද්වි 13:16 යෙසා 6:11

**2** ගීතා 46:10; ගීතා 66:3; ගීතා 83:16; එස 38:23; **3** ගීතා 46:1; ගීතා 121:7; නාහූ 1:7; ශෙප 3:12; **4** ගීතා 91:1; ගීතා 121:5; ගීතා 121:6; එළි 7:16; **5** යෝබ් 7:2; යෙසා 49:10; **6** ගීතා 58:10; යෙසා 24:8; එළි 18:22; **7** ගීතා 72:3; යෙසා 11:9; යෙසා 65:25; දානි 2:35; **8** යෙසා 49:10; දානි 7:14; මතෙ 8:11; **9** ගීතා 72:16; ගීතා 85:11; ගීතා 85:12; ගීතා 104:15; යෙරෙ 31:12; **10** යෙරෙ 48:11; ලූක් 5:39; **11** දේශ 10:19; යෙසා 55:1; **12** යෝබ් 21:24; **13** යෙසා 60:2; ලූක් 2:32; ක්‍රියා 17:30; 2කොරි 3:13; 2කොරි 4:4; එෆි 5:8; **14** හොෂෙ 13:14; 1කොරි 15:54; 2තිමෝ 1:10; හෙබ්‍රෙ 2:15; එළි 20:14; **15** යෙසා 35:10; එළි 7:17; එළි 21:4; **16** ගීතා 69:9; ගීතා 89:51.

**9** ඒ දවසේදී ජනයා මෙසේ කියනු
ඇත. “මේ අපේ දෙවිය.[1] අප ඔහු කෙ-
රෙහි බලාපොරොත්තු තබන නිසා[2]
ඔහු අපව ගලවාගන්නේය.[3] මේ යෙ-
හෝවා දෙවිය.[4] අප බලාපොරොත්තු
තැබුවේ ඔහු මතය. ඔහු අපට ගැලවීම
ලබා දුන් නිසා අපි බොහෝ සෙයින්
ප්‍රීති වෙමු.”[5]

**10** යෙහෝවා දෙවි තම අතින් මේ
කන්ද[6] ආරක්ෂා කරන්නේය. නමුත්
ගොම ගොඩේ[7] පිදුරු දමා පාගන්-
නාක් මෙන් මෝවබ් දේශය මඩිනු
ලබනු ඇත.[8] **11** පිහිනුම්කරුවෙකු
තම අත්වලින් වතුරට ගසන්නාක්
මෙන් දෙවි ඔවුන්ට තදින් පහර දී
ඔවුන්ගේ උඩඟුකම[9] නැති කර දමන්-
නේය. **12** දැවැන්ත පවුරුවලින් වට
වූ ඔවුන්ගේ සුරක්ෂිත නගරය ඔහු
පොළොවටම සමතලා කරනු ඇත.[10]

**26** ඒ දවසේදී[11] යූදා දේශ-
යේ[12] මෙම ගීය ගයනු
ලබන්නේය.[13] “අපේ නුවර දැන් ශක්-
තිමත්ය.[14] දෙවි පවුරක් සහ බල-
කොටුවක් මෙන් අපට ආරක්ෂාව
සපයයි.[15] **2** ජනයෙනි, නුවරේ දො-
රටුව විවෘත කර[16] විශ්වාසවන්තව
කටයුතු කරන ධර්මිෂ්ඨ සෙනඟට
ඇතුල් වෙන්න ඉඩ දෙන්න.[17] **3** දෙ-
වියනි, කිසිදා සැක නොකර මුළු
හදින්ම ඔබව විශ්වාස කරන තැනැත්-
තාට ඔබ සමාදානය දෙන්නෙහිය.[18]
ඔබ කෙරෙහි විශ්වාසය තබන නිසා
ඔහු හැමදාමත් සමාදානයෙන් සිටි-
යේය.[19] **4** ජනයෙනි, හැමදාම යෙ-
හෝවා දෙවිව විශ්වාස කරන්න.[20]
මන්ද යාහ් යෙහෝවා දෙවි සදාකාල-
යටම පර්වතයකි.[21]

**5** “දෙවි උස් තැන්වල වෙසෙන
ජනයාව පහත් කළේය.[22] ඔහු ඔවුන්-
ගේ නුවර[23] බිමටම සමතලා
කළේය.[24] **6** පීඩාවට පත් වූ අසරණ
අය විසින් ඔවුන්ගේ නුවර පාගා දමනු
ලබන්නේය.”[25]

**7** ධර්මිෂ්ඨ අය ප්‍රතිපත්තිගරුක
ජීවිතයක් ගත කරන්නෝය.[26] දෙවි-
යනි, ඔබ සාධාරණය. ඒ නිසා ඔබ
ධර්මිෂ්ඨයාගේ මාර්ගය සකසා දෙන්-
නෙහිය.[1] **8** යෙහෝවා දෙවියනි,
යුක්තියේ මාවත්වල ගමන් කරන්න
ඔබ අපට උගන්වයි කියා අපි බලා-
පොරොත්තු වන්නෙමු.[2] අපේ එකම
ආශාව[3] වන්නේ ඔබවත් ඔබගේ නාම-
යත් සිහි කිරීමයි.[4] **9** මම රාත්‍රි-
යේදී නොනිදා මුළු හදින්ම ඔබ ගැන
කල්පනා කරමි.[5] මම දැවෙන ආශා-
වකින් ඔබේ මඟ පෙන්වීම් පතමි.[6]
මන්ද පොළොවේ වැසියන්ව විනිශ්චය
කිරීමට ඔබ පැමිණෙන විට[7] ඔවුහු
ධර්මිෂ්ඨකම[8] කුමක්ද කියා තේ-
රුම්ගන්නෝය.[9] **10** නමුත් දුෂ්ට-
යාට කොතරම් කරුණාව දැක්වුවත්
ඔහු කිසිදා ධර්මිෂ්ඨකම ඉගෙනගන්-
නේ නැත.[10] ප්‍රතිපත්තිගරුක අය වෙ-
සෙන දේශයේදී පවා ඔහු අයුතු ලෙස
කටයුතු කරන නිසා[11] යෙහෝවා දෙ-
විගේ ශ්‍රේෂ්ඨත්වය දකින්න ඔහුට
නොහැකිය.[12]

**11** යෙහෝවා දෙවියනි, ඔබ අත
ඔසවා ඔබේ සතුරන්ට පහර දුන්-
නෙහිය.[13] නමුත් ඔවුහු එය තේරුම්-
ගත්තේ නැත.[14] ඔබ මහත් උදහසින්
ඔබේ සෙනඟ වෙනුවෙන් නැඟී සිටින
විට ඔවුහු ලැජ්ජාවට පත් වෙති.[15]
ඔබේ දැවෙන උදහස[16] නිසා ඔවුන්
සියලුදෙනා විනාශ වී යන්නෝය.
**12** යෙහෝවා දෙවියනි, ඔබ යුක්තිය
ඉටු කර අපට සමාදානය දුන්නෙ-
හිය.[17] අපේ සෑම ක්‍රියාවක්ම සාර්ථක
වන්නේ ඔබ නිසාය.[18] **13** යෙ-
හෝවා, අපේ දෙවියනි, අප වෙ-
නත් ස්වාමිවරුන් යටතේ සේවය
කර තිබුණත්[19] අප ප්‍රශංසා කරන්නේ

**25 පරි.**

**1** ද්වි 32:3; යෙසා 25:1; එළි 19:1
**2** ගීතා 27:14; ගීතා 37:34; ගීතා 146:5
**3** උත් 49:18; හිතෝ 20:22; ලූක් 2:30
**4** නික් 6:2; ගීතා 97:5; ශෙප 3:12
**5** ගීතා 20:5; ගීතා 21:1; ගීතා 62:1; ගීතා 95:1; මීකා 7:7; ශෙප 3:14
**6** ගීතා 132:13; යෙසා 12:6
**7** ගීතා 83:10; ලූක් 13:8
**8** ගීතා 110:6; යෙසා 15:1; ශෙප 2:9
**9** යෙරෙ 48:29; ආනි 4:37; යාකො 4:6
**10** යෙසා 26:5

**26 පරි.**

**11** යෙසා 4:2; යෙසා 26:19; යොහ 11:24
**12** යෙරෙ 33:10; යෙරෙ 33:11
**13** නික් 15:1; 2සාමු 22:1; ගීතා 146:2; ගීතා 150:5; යෙසා 12:5
**14** ගීතා 48:2; ගීතා 48:12; ගීතා 127:1
**15** යෙසා 60:18; සෙක 2:5
**16** ගීතා 118:19; ගීතා 118:20; යෙසා 60:11; යෙසා 62:10; මතෙ 7:14; එළි 22:14
**17** නික් 19:6; ද්වි 4:8; මලා 3:17; ක්‍රියා 2:47; 1පේතෘ 2:9
**18** ගීතා 119:165; යෙසා 54:13; යොහ 14:27; රෝම 15:33; පිලි 4:7; 2පේතෘ 1:2
**19** ගීතා 9:10; යෙරෙ 17:7
**20** 2ලේක 20:20; ගීතා 62:8; හිතෝ 3:5
**21** ද්වි 32:4; ද්වි 32:31; 1සාමු 2:2

**22** යෝබ් 40:11; යෙසා 2:11; **23** යෙසා 15:1; යෙසා 25:10; **24** යෙසා 25:12; යෙරෙ 48:9; **25** ශෙප 3:12; මලා 4:3; **26** 1ලේක 29:17; යෝබ් 1:1; ගීතා 18:24; හිතෝ 20:7; **2 තීරුව** **1** ගීතා 5:8; **2** ගීතා 119:7; එෆී 5:17; **3** මීකා 7:7; **4** නික් 3:15; ගීතා 135:13; හොෂෙ 12:5; **5** ගීතා 63:6; ගීතා 119:62; ලූක් 6:12; **6** ගීතා 63:1; ගීතා 77:6; **7** ගීතා 9:8; ගීතා 58:11; **8** ගීතා 96:13; ගීතා 97:2; **9** ගීතා 85:11; යෙසා 61:11; **10** නික් 8:15; ගීතා 106:43; හිතෝ 1:32; **11** ගීතා 78:57; යෙරෙ 2:7; **12** ගීතා 28:5; යෙසා 5:12; හොෂෙ 11:7; **13** ගීතා 10:12; මීකා 5:9; **14** යෙසා 6:9; **15** ගීතා 86:17; 1පේතෘ 3:16; එළි 3:9; **16** හෙබ්‍රෙ 10:27; **17** ගීතා 29:11; යෙසා 57:19; යෙරෙ 33:6; යොහ 14:27; **18** ක්‍රියා 5:38; ක්‍රියා 5:39; **19** 2ලේක 12:8.

ඔබේ නාමයට පමණයි.[1] **14** එම
ස්වාමිවරුන් දැන් නැත.[2] දැන් මිනී
වළෙහි[3] සිටින ඔවුන්ට යළි නැඟිටීමට
නොහැක.[4] මන්ද ඔබ ඔවුන්ට විරුද්-
ධව තීන්දුව ප්‍රකාශ කරමින් සදහ-
ටම මතකයෙන් ගිලිහී යන ලෙසින්
ඔවුන්ව විනාශ කළෙහිය.[5]

**15** යෙහෝවා දෙවියනි, ඔබ ඔබේ
ජනයාව මහත් ජාතියක් බවට පත්
කර[6] ඔවුන්ගේ දේශ සීමා පුළුල් කළෙ-
හිය.[7] එසේ කිරීමෙන් ඔබ මහත්
ගෞරවයට පත් වුණෙහිය.[8] **16** යෙ-
හෝවා දෙවියනි, ඔවුන්ගේ විපතේදී
ඔවුන් උපකාරය පැතුවේ ඔබගෙන්ය.[9]
ඔබෙන් හික්මවීම්[10] ලැබූ විට තම
සිතේ තිබෙන දේ ඔබට පැවසුවත්
ඔවුන් යාච්ඤා කරන ශබ්දයවත් නො-
ඇසුණේය. **17** යෙහෝවා දෙවියනි,
ඔබ අපව ප්‍රසව වේදනාවෙන් කෑගසන
ගැබිනි ස්ත්‍රියක මෙන් වීමට සැලැස්-
වූවෙහිය.[11] **18** අපි ගැබ්ගෙන ප්‍රසව
වේදනා වින්දත්[12] බිහි නොකළෙමු.*
අපේ දේශයට ගැලවීම අත් කර
දෙන්න අපට නොහැකි විය.[13] දේශයේ
කිසිවෙකුට දරුවන් බිහි කිරීමට හැකි
වූයේ නැත.[14]

**19** "ජනයෙනි, මරණ නින්දෙහි
සැතපී සිටින ඔබේ සෙනඟ යළි
නැඟිටින්නෝය.[15] මාගේ දේශයේ මිය
ගිය අය නැවත ජීවත් වනු ඇත.[16]
දූවිල්ලෙහි සැතපී සිටින ජනයෙනි,
අවදි වී ප්‍රීති සෝෂා නඟන්න![17] මන්ද
ගස් වැල් මත පිනි බිඳු වැටෙන්-
නාක් මෙන්[18] ඔබත් පින්නෙන් නැහැවී
යන්නහුය.[19] දරුවන් බිහි කරන්නාක්
මෙන් පොළොව එහි මිය ගිය අයව
පිටතට දමනු ඇත.[20]

**20** "මගේ සෙනඟෙනි, ඔබේ නිවස
ඇතුළේ තිබෙන ආරක්ෂිත කාමරව-
ලට ගොස් දොර වසාගන්න.[21] උද-
හස පහ වන තුරු මොහොතකට
සැඟවී සිටින්න.[22] **21** මන්ද දේශයේ
වැසියන් ඔහුට විරුද්ධව කළ වැරදිව-
ලට නිසි දඬුවම් දීමට යෙහෝවා දෙවි
වන මම මාගේ වාසස්ථානයේ සිට
පැමිණෙමි.[1] එවිට පොළොව නිරපරා-
දේ ලේ වැගිරෙවූ අයව තවත් සඟවා
තබන්නේ නැත.[2] මරා දැමූ අයගේ
ලේ ගැන තවත් නිහඬව නොසිටිනු
ඇත."[3]

**27** ඒ දවසේදී යෙහෝවා දෙවි[4]
තම භයංකර වූ තියුණු කඩු-
වෙන්[5] ලෙවියාතන්[6] නමින් හැඳින්-
වෙන වේගවත් මුහුදු සර්පයාට[7] පහර
දෙන්නේය. මුහුදේ සැරිසරන මහා
සර්පයාව[8] දෙවි මරා දමනු ඇත.

**2** ජනයෙනි, ඒ දවසේදී ඔබ ඒ
නුවරේ වැසියන්ට මෙසේ ගායනා
කරන්න.[9] "ඔබ අනර්ඝ වයින්
නිපදවන මිදිවත්තකි![10] **3** ඔබව
ආරක්ෂා කරන්නේ යෙහෝවා දෙ-
වියි.[11] ඔහු නිතරම ඔබට අවශ්‍ය වතුර
සපයන්නේය.[12] ඔහු රෑ දාවල් ඔබව
ආරක්ෂා කර ඔබට හානියක් කරන්න
කිසිවෙකුට ඉඩ නොදෙන්නේය.[13]
**4** ඔහුගේ කෝපය දැන් නිවී ඇත.[14]
එහෙත් යමෙක් දෙවි ඉදිරියේ කටු
පඳුරු[15] හෝ වල් පැළෑටි හෝ හට-
ගන්න සැලැස්වූවොත් ඔහු සටනට
සැරසෙන්නේය. ඔහු එක මොහොත-
කින් ඒවා පාගා දමා ගින්නෙන් විනාශ
කර දමන්නේය.[16] **5** ඒ නිසා දැන්
ඔහුගේ බලකොටුව වෙතට දුව ගොස්
ඔහු සමඟ සමාදාන වීමට පියවර
ගන්න. ඔහු සමඟ සමාදානයෙන් සිට
ආරක්ෂාව ලබාගන්න."[17]

**6** මතු දවස්වලදී යාකොබ් ගසක්
මෙන් මුල් ඇද ශක්තිමත් වෙයි. ඊශ්‍රා-
යෙල්,[18] හොඳින් වැඩුණු, මලින් බර වූ
ගසක් මෙන් වන්නේය. ඔවුහු පො-
ළොව පුරාම පල දරන්නෝය."[19]

---

යෙසා **26:18*** මූ.අ., "සුළඟ බිහි කළෙමු."

**26 පරි.**
1 යොෂු 23:7; 2තිමෝ 2:19
2 ගීතා 22:15
3 හිතෝ 2:18; දේශ 9:5; දේශ 9:10; යෙසා 38:18
4 යෝබ් 14:14; දේශ 9:6; යෙරෙ 51:39; මතෙ 25:46
5 ගීතා 9:5; ගීතා 109:13; හිතෝ 10:7
6 උත් 12:2; ද්වි 10:22; යෙසා 9:3; යෙසා 51:2
7 1රාජා 4:21
8 ගීතා 72:18; යෙසා 60:21
9 විනි 10:10; ගීතා 77:2; ගීතා 78:34; හොෂෙ 5:15
10 විනි 3:8; හෙබ්‍රෙ 12:5; හෙබ්‍රෙ 12:6
11 යෙසා 13:8; යෙරෙ 4:31; යෙරෙ 6:24
12 2රාජා 19:3
13 යොෂු 7:9
14 යෙසා 37:3
15 හොෂෙ 13:14; යොහ 5:29; ක්‍රියා 24:15; 1කොරි 15:22; එළි 20:12
16 යෙසා 25:8; මාක් 12:26; යොහ 11:24; යොහ 11:25; 1කොරි 15:21; 1තෙස 4:14
17 උත් 3:19; දානි 12:2
18 2රාජා 4:39
19 එස 37:2
20 එළි 20:13
21 උත් 7:16; නික් 12:22; ගීතා 32:7; ගීතා 91:4; හිතෝ 18:10
22 ගීතා 27:5; ගීතා 57:1; ගීතා 91:4

**2 තීරුව**
1 ගීතා 37:20; හොෂෙ 5:14; මීකා 1:3; මතෙ 24:21; 2තෙස 1:8; 2පේතෘ 3:7

**2** උත් 4:10; ගීතා 9:12; එස 24:7; ලූක් 11:50; එළි 16:6; එළි 18:24; **3** මලා 4:1; **27 පරි.** **4** නික් 15:3; **5** ද්වි 32:41; යෙරෙ 47:6; **6** යෝබ් 41:1; **7** යෝබ් 26:13; **8** උත් 1:21; ගීතා 74:13; යෙසා 51:9; එස 29:3; එස 32:2; **9** යෙසා 5:1; **10** ගීතා 80:8; යෙරෙ 2:21; මතෙ 21:33; **11** ද්වි 33:29; 1සාමු 2:9; **12** යෙසා 35:6; යෙසා 41:18; යෙසා 58:11; **13** ගීතා 121:4; යෙසා 46:4; **14** ගීතා 85:3; ගීතා 103:9; යෙසා 12:1; **15** ලූක් 6:44; **16** 2සාමු 23:6; යෙසා 10:17; හෙබ්‍රෙ 6:8; **17** යෙසා 57:19; එස 34:25; හොෂෙ 2:18; රෝම 5:1; 2කොරි 5:19; **18** එස 39:25; **19** ගීතා 92:13; යෙසා 37:31; යෙසා 60:22; යෙරෙ 30:19; හොෂෙ 14:5.

7 එහෙත් ඔවුන්ට සතුරන් අතින්
දරුණු ලෙස පහර ලැබ මැරුම් කෑමට
සිදු වූයේ මන්ද?[1] 8 දෙවියනි, ඔබ
ඔවුන්ට විරුද්ධව සටන් කර ඔවුන්ව
දේශයෙන් පිටමං කරන්නෙහිය. ඔබ
භයංකර හඬක් නඟමින් නැඟෙනහිර
දෙසින් හමා එන තද සුළඟක් මෙන් වූ
ඔබේ එක හුස්මකින් ඔවුන්ව දේශ-
යෙන් පන්නා දමන්නෙහිය.[2] 9 ඔබ
ඔවුන්ගේ පූජාසනය හුණුගල් මෙන්
කුඩු කර දමන්නෙහිය. ඔවුන් නමස්-
කාරය සඳහා සෑදූ කුලුනු[3] සහ සුවඳ
දුම් පූජාසන යළි කෙදිනකවත් ගොඩ-
නඟන්නේ නැත.[4] මෙසේ, නිසි දඬු-
වම් ලැබීමෙන් අනතුරුව යාකොබ්ට
සමාව දෙනු ඇත.[5] ඔහුගේ පාප මකා
දැමූ පසු ඔහු හොඳ පල දරන්නේය.[6]
10 සුරක්ෂිතව තිබූ නුවරේ එක වැසි-
යෙක්වත් ඉතුරු වන්නේ නැත. එය
අත්හැර දමා ගිය පාළු කාන්තාරයක්
මෙන් වන්නේය.[7] වස්සා එහි ලගින්-
නේය. එහි අතු දවා දමනු ඇත.[8]
11 ස්ත්‍රීහු පැමිණ එහි වියළී ගිය
අතු දරට කඩාගෙන යති.[9] මන්ද
ඔවුන් දැනුම් තේරුම් ඇතුව කටයුතු
කරන සෙනඟක් නොවෙයි.[10] ඔවුන්ට
ජීවිතය දානය කළ තැනැත්තාණන්
ඔවුන්ට කිසි අනුකම්පාවක් නො-
පෙන්වන්නේ ඒ නිසාය. ඔහු ඔවුන්ට
කරුණාව දක්වන්නේ නැත.[11]

12 ඊශ්‍රායෙල් සෙනඟෙනි, ගසකින්
ගෙඩි කඩා* එකින් එක එකතු කර-
ගන්නා සේම,[12] මහ ගඟ#[13] අසල සිට
ඊජිප්තු නිම්නය[14] දක්වා විසිරී සිටින
ඔබව යෙහෝවා දෙවි එකතු කරගන්-
නේය.[15] 13 ඒ දවසේදී, ඔබ අතරින්
ඊජිප්තුවේ[16] විසිරී සිටින සියල්-
ලන්වද ඇසිරියාවේ[17] මරණාසන්නව
සිටින සියල්ලන්වද නැවත කැඳවීම
සඳහා මහ හොරණෑවක් පිඹිනු ලබන්-
නේය.[18] එවිට ඔබ යෙරුසලමේ ශුද්ධ
කන්දට[19] ඇවිත් යෙහෝවා දෙවිට
නමස්කාර කරනු ඇත.[20]

**යෙසා 27:12*** ද්වි 24:20හි පාදසටහන බලන්න.
**12#** එනම්, යුප්‍රටීස් ගඟ.

**27 පරි.**
**1** යෙසා 10:20
යෙරෙ 50:33
**2** යෙරෙ 4:11
එස 13:13
**3** යෙසා 17:8
මීකා 5:13
**4** 2ලේක 34:4
**5** යෙසා 4:4
යෙසා 48:10
එස 24:13
**6** රෝම 11:26
**7** යෙසා 6:11
යෙසා 17:9
යෙරෙ 26:18
විලා 2:5
එස 36:4
**8** යෙසා 7:25
යෙසා 17:2
යෙසා 32:14
**9** ගීතා 80:16
යෙසා 6:13
එස 15:6
මතෙ 3:10
යොහ 15:6
**10** ද්වි 32:28
යෙසා 1:3
යෙරෙ 4:22
හොෂෙ 4:6
**11** 2ලේක 36:16
එස 9:10
2තෙස 1:8
**12** යෙසා 11:11
යෙසා 24:13
**13** යොෂු 24:2
**14** ගණන් 34:5
1රාජා 8:65
**15** ද්වි 30:3
නෙහෙ 1:9
යෙරෙ 3:14
ආමො 9:14
ලූක් 15:4
**16** යෙරෙ 43:7
හොෂෙ 8:13
සෙක 10:10
**17** 2රාජා 17:6
යෙසා 11:16
හොෂෙ 9:3
**18** යෙසා 11:12
යෙසා 49:22
යෙසා 62:10
**19** ගීතා 122:4
යෙසා 2:3
යෙසා 25:6
යෙසා 52:1
යෙරෙ 3:17
**20** ගීතා 95:6
සෙක 14:16

**2 තීරුව**

**28 පරි.**
**1** යෙසා 7:2
හොෂෙ 7:11
**2** යෙසා 7:17
යෙසා 7:20
**3** යෝබ් 38:22
යෙසා 28:17
එස 13:11

# 28
එෆ්‍රායිම්හි[1] බේබද්දන්ගේ තේ-
ජවත් ඔටුන්න පහ වී යන්-
නේය. වයින්වලින් වෙරි වී සිටින අය
වෙසෙන සරුසාර නිම්නයට ඉහළින්
පිහිටි නුවරේ අලංකාරය පරවී යන මල්
මාලාවක් මෙනි! 2 යෙහෝවා දෙවි
ඔවුන්ට විරුද්ධව බලවත් තැනැත්-
තෙකුව එවන්නේය.[2] ඔහු දරුණු අයිස්
කැට වැස්සක්[3] මෙන්ද චණ්ඩ මාරුත-
යක් මෙන්ද මහා ජලගැල්මක්[4] මෙන්ද
ඇවිත් ඔවුන්ගේ ඔටුන්න පොළො-
වට හෙළා දමන්නේය. 3 එෆ්‍රායිම්හි
බේබද්දන්ගේ තේජවත් ඔටුන්න පාගා
දමනු ඇත.[5] 4 සරුසාර නිම්නයට
ඉහළින් පිහිටි අලංකාර නුවර පරවී
යන මලක් මෙන්[6] පහව යන්නේය.
යමෙකු ගිම්හානයට කලින් හටගත්
අත්තික්කා ගෙඩියක්[7] දුටු විගස එය
කඩාගෙන ගිල දමන්නාක් මෙන් එම
නුවරද සතුරා අතට පත් වන්නේය.

5 ඒ කාලයේදී ස්වර්ගයේ සේනා-
වල අධිපති වන යෙහෝවා දෙවි තම
සෙනඟ අතරින් ඉතුරු වන අයට[8]
අලංකාර ඔටුන්නක් මෙන්ද[9] ලස්සන
මල් පළඳනාවක් මෙන්ද[10] වන්නේය.
6 ඔහු විනිශ්චයකරුවන්ට යුක්ති-
යෙන් විනිශ්චය කිරීමට පොළඹවන්-
නේය.[11] නුවර දොරටුව ඉදිරියෙන්
සතුරන්ව පන්නා දමන තැනැත්තාව
ඔහු ශක්තිමත් කරන්නේය.[12]

7 මොවුහු වයින් සහ මත්පැන්
නිසා මංමුළා වී ඇත. පූජකයාද
අනාගතවක්තෘවරයාද[13] මත්පැන් හා
වයින් නිසා වියවුල් වී ඒ මේ අත
ඇවිදිති.[14] දර්ශන තේරුම්ගැනීමට
හා නිවැරදි තීරණ ගැනීමට නො-
හැකි වන තරමටම ඔවුහු මත් වී
සිටිති. 8 ඔවුන්ගේ මේස පුරාම වම-
නය[15] දැකගත හැක. පිරිසිදු තැනක්
සොයාගත නොහැකි තරම්ය.

**4** යෙසා 29:6; නාහු 1:8; **5** යෙසා 25:10; විලා 1:15; **6** යාකො 1:10; **7** යෙරෙ 24:2; නාහු 3:12; එළි 6:13; **8** යෙසා 11:16; රෝම 11:5; **9** යෙසා 24:15; යෙසා 24:23; යෙසා 62:3; **10** යෙසා 35:2; **11** ගණන් 11:17; 1රාජා 3:28; ගීතා 72:1; යෙසා 11:2; **12** ගීතා 18:34; ගීතා 68:35; පිලි 4:13; **13** යෙරෙ 5:31; යෙරෙ 23:13; **14** 2රාජා 16:10; **15** යෙරෙ 48:26.

**9** ඔවුහු මෙසේ කියති. "ඔහු උගන්-
වන්න හදන්නේ කාටද?[1] ඔහුට
ලැබුණු පණිවිඩය තේරුම් කර දෙන්න
හදන්නේ කාටද?[2] අපි අම්මාගේ තුරු-
ලේ ඉඳගෙන ඊයේ පෙරේදා කිරි
වැරූ ළදරුවන් කියාද ඔහු හිතාගෙන
ඉන්නේ?[3] **10** 'මේ අණ පිළිපදින්න.
අර අණ පිළිපදින්න. හරි මිම්ම මෙ-
යයි. මේකයි හරි මිම්ම. මේ විදිහට
කරන්න. අර විදිහට කරන්න' කියා
අපට කියන්න ඔහු කවුද?"*[4] **11** ඒ
නිසා, නොතේරෙන භාෂාවක් කතා
කරන ගොතගසන[5] සෙනඟක් ලවා
දෙවි මේ ජනයාට කතා කරනු ඇත.[6]
**12** "විවේක ගන්න ස්ථානය මෙ-
යයි. විඩා වූ අයට විවේකය දෙන්න.
ඔවුන්ට මෙතැනට ඇවිත් විවේක
ගන්න දෙන්න" යයි දෙවි ඔවුන්ට පැව-
සුවත් ඔවුහු සවන් දුන්නේ නැත.[7]
**13** ඒ නිසා යෙහෝවා දෙවි ඔවුන්ට
පැවසූ මෙම වදන් සත්‍යය බව ඔවුහු
තේරුම්ගනු ඇත. "මේ අණ පිළිප-
දින්න. අර අණ පිළිපදින්න. හරි මිම්ම
මෙයයි. මේකයි හරි මිම්ම.[8] මේ විදිහට
කරන්න. අර විදිහට කරන්න." ඔවුහුද
වැටී තුවාල වී, උගුලට හසු වන්-
නෝය.[9]

**14** පුරසාරම් දොඩන යෙරුසල-
මේ පාලකයෙනි,[10] යෙහෝවා දෙවි-
ගේ පණිවිඩයට දැන් සවන් දෙන්න.
**15** ඔබ මෙසේ කියා තිබේ. "අපි මර-
ණය සමඟ ගිවිසුමක් ඇති කළා.[11]
මිනී වළ සමඟ අත්වැල් බැඳගත් පසු
අපි දර්ශනයක් දුටුවා.[12] මහා ජල-
ගැල්මක් ආවත් අපිට හානියක් වෙන්-
නේ නැහැ. මන්ද අපි බොරුව අපේ
රක්ෂස්ථානය කරගෙන[13] එහි සැඟවී
සිටිනවා."[14] **16** ඒ නිසා විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවි
මෙසේ කියන්නේය. "මම සියොන්හි[15]
අත්තිවාරම තබන පිණිස සෝදිසියට
ලක් කළ[16] අනර්ඝ ගලක්[17] තෝ-
රාගන්නෙමි. එය ස්ථිර අත්තිවාර-
මක[1] ප්‍රධාන ගල[2] ලෙස තබන්නෙමි.
එය කෙරෙහි විශ්වාසය තබන කිසි-
වෙක් බිය වන්නේ නැත.[3] **17** මම
යුක්තිය මගේ මිනුම් ලණුව[4] ලෙසද
ධර්මිෂ්ඨකම[5] මගේ මට්ටම් ලීය ලෙ-
සද යොදාගන්නෙමි. බොරුව නමැති
ඔබේ රක්ෂස්ථානය[6] හිම කැට වර්-
ෂාවට[7] ගසාගෙන යයි. ඔබ සැඟවී
සිටින ස්ථානය ජලගැල්මට යට වී
යයි.[8] **18** ඔබ මරණය සමඟ කළ
ගිවිසුම අහෝසි වෙයි.[9] මිනී වළ සමඟ
අත්වැල් බැඳගැනීමෙන් පසු ඔබ දුටු
දර්ශනය ඉටු වෙන්නේ නැත.[10] ජල-
ගැල්ම පැමිණෙන විට[11] ඔබත් ඊට හසු
වී ගසාගෙන යන්නහුය.[12] **19** ජල-
ගැල්ම පැමිණෙන සෑම අවස්ථාවක-
දීම ඔබ එයින් පහර කන්නහුය.[13]
උදයක් උදයක් පාසා එය පැමිණෙයි.
රෑ දාවලේ ඔබ එයින් පහර කන්න-
හුය. ඒ ගැන ආරංචි වන සියලුදෙනා
බියෙන් තැතිගනිති."[14]

**20** ඔවුන්ගේ යහන ඔවුන්ට දිගා
වෙන්නවත් ඔවුන්ගේ පොරෝන
ඔවුන්ට ඇඟ වසාගන්නවත් ප්‍රමාණ-
වත් නැත. **21** පෙරාෂිම්[15] කන්දේදී
හා ගිබියොන්[16] නගරය අසල පිහිටි
තැනිතලාවේදී යෙහෝවා දෙවි කෝ-
පයෙන් නැඟී සිටි ආකාරයටම ඔහු
නැවත වරක් නැඟී සිට තමා අරමුණු
කළ පුදුම දනවන ක්‍රියාව සිදු කරන්-
නේය. ඔහු කිරීමට අදහස් කරන
දේ විස්මිතය.[17] **22** ස්වර්ගයේ සේ-
නාවල අධිපතිද විශ්වයේ පාලකයා-
ණන්ද[18] වන යෙහෝවා දෙවි මේ මුළු
දේශයම[19] විනාශ කිරීමට තීරණය
කර ඇති බව මට දන්වා තිබේ. ඒ
නිසා, දැන් සමච්චල්[20] නොකරන්න.
මන්ද එසේ කළොත් ඔබට දමන
විලංගු තව තවත් තද කරනු ලබයි.

**23** ජනයෙනි, මා පවසන දේට
සවන් දෙන්න. මා කියන දේට හොඳ
අවධානයක් දෙන්න. **24** ගොවියෙකු

**28 පරි.**

**1** හෙබ්‍රෙ 5:14
**2** යෙසා 6:10
**3** හොෂෙ 4:6 මතෙ 15:8 මතෙ 15:9
**4** 2රාජා 21:13 යෙසා 28:17 විලා 2:8
**5** ද්වි 28:49 යෙරෙ 5:15 ආනි 1:4
**6** 1කොරි 14:21
**7** ගීතා 81:11 යෙරෙ 44:16
**8** 2රාජා 21:13 යෙසා 28:17 විලා 2:8
**9** 2ලේක 36:16 යෙසා 8:15
**10** හබ 1:10
**11** යෙසා 28:18
**12** එස 13:16
**13** යෙසා 31:1 යෙසා 31:3
**14** යෙසා 30:10
**15** හෙබ්‍රෙ 12:22 එළි 14:1
**16** හෙබ්‍රෙ 2:10 හෙබ්‍රෙ 5:9
**17** ගීතා 118:22 රෝම 9:33 1පේතෘ 2:6

**2 තීරුව**

**1** යෙසා 51:16 මතෙ 16:18 1කොරි 3:11 එෆී 2:20
**2** මතෙ 21:42 මාක් 12:10 ලූක් 20:17 ක්‍රියා 4:11
**3** රෝම 9:33 රෝම 10:11 1පේතෘ 2:6
**4** 2රාජා 21:13
**5** ගීතා 9:8 ගීතා 35:24 යෙරෙ 11:20
**6** 2රාජා 18:21 යෙසා 31:1 යෙසා 31:3 යෙරෙ 43:11
**7** යෙසා 28:2
**8** යෙරෙ 42:14 යෙරෙ 43:7 එස 17:15
**9** රෝම 5:14
**10** යෙසා 28:15
**11** යෙසා 8:8 යෙරෙ 47:2
**12** 2රාජා 18:13
**13** යෙසා 24:1
**14** 2රාජා 21:12 යෙරෙ 19:3 හබ 3:16
**15** 2සාමු 5:20 1ලේක 14:11
**16** යොෂු 10:10 1ලේක 14:16

---

**යෙසා 28:10*** හෙබ්‍රෙව් බසින් මෙය ලියා ඇත්තේ එකම දේ නැවත නැවත කියන, කුඩා දරුවන්ට කියන කවියක් ලෙසිනි.

**17** විලා 2:15; හබ 1:5; **18** යෙසා 10:23; **19** යෙසා 24:1; **20** 2ලේක 30:10; 2ලේක 36:16; යෙරෙ 20:7.

බීජ නොවපුරා දවස පුරාම[1] කෙත
සූදානම් කරමින් සිටිනවාද?[2]
**25** කෙත හොඳින් සකස් කළ පසු ඔහු
කලුදුරුද සූදුරුද[3] වපුරා තිරිඟුද මෙ-
නේරිද[4] බාර්ලිද නිසි තැන්වල[5] පැළ
කරන්නේය. ඉන්පසු ඉඩමේ මායි-
මේ[6] ඔහු තණ හාල්*[7] සිටුවන්නේය.
**26** දෙවි යමෙකුව හික්මවන්නේ නිසි
ආකාරයටයි.[8] දෙවි ඔහුට දැනමුතු-
කම් දෙන්නේය.[9] **27** යමෙකු කලු-
දුරු සුද්ද කිරීමට මඩින යන්ත්‍රයක්[10]
භාවිත කරනවාද? සූදුරු උඩින්
කරත්ත රෝදයක් යවනවාද? කලු-
දුරු තැළීමට භාවිත කරන්නේ
පොල්ලකි.[11] සූදුරු තැළීමට භාවිත
කරන්නේ කෝටුවකි. **28** යමෙකු
ධාන්‍ය කුඩු වී යන තෙක්ම එය පාගා
දමනවාද? එසේත් නැත්නම් එය නො-
නවත්වාම[12] මඩිනු ලබනවාද?[13] අශ්-
වයන් විසින් ඇදගෙන යන මඩින
යන්ත්‍රයක් ඊට උඩින් ගෙන ගියත්
ඔහු එය පොඩි නොකිරීමට වගබලා
ගනියි.[14] **29** මේ දැනමුතුකම් ලැබී
තිබෙන්නේ ස්වර්ගයේ සේනාවල අධි-
පති වන යෙහෝවා දෙවිගෙන්ය.[15] ඔහු
සෑම දෙයක්ම සාර්ථකව ඉටු කරන
දෙවි කෙනෙකි. ඔහුගේ අරමුණු විස්-
මිතය.[16]

**29** "දාවිත් කඳවුරු බැඳගත්[17]
ස්ථානය වන අරියෙල්[18]
නුවර* පිටට මහත් විපතක් පැමි-
ණෙනු ඇත! අරියෙල් නුවරේ ජන-
යෙනි, වසරක් වසරක් පාසා ඔබේ
සියලු උත්සව[19] පවත්වන්න.
**2** එහෙත් මම අනිවාර්යයෙන්ම අරි-
යෙල් නුවර පිටට දුක් පීඩා ගෙ-
නෙන්නෙමි.[20] එදින විලාප හඬ[21] නුවර
සිසාරා යයි. මම අරියෙල් නුවර ගිනි-
මය පූජාසනයක් බවට පත් කරන්-
නෙමි.[22] **3** මම ඔබේ නුවර වටේටම
කඳවුරු බැඳගෙන එය වටා උල් කණු
සහිත වැටක්ද බඳින්නෙමි. ඔබට පහර
දෙන පිණිස නුවර වටේට බැම්මක්
ගොඩනඟන්නෙමි.[1] **4** ඔබ මොන
තරම් පහත් තත්වයකට වැටෙනවාද
කිවහොත් ඔබ කතා කරන විට පිට
වන්නේ හීන් ශබ්දයක් පමණි.[2] දූවිලි
ගොඩෙන් නැඟෙන ඔබේ කෙඳිරිලි
හඬ මතුරන්නෙකුගේ හීන් හඬ මෙන්
ඇසෙන්නේය.[3] **5** එහෙත් ඔබේ සතු-
රෝ ක්ෂණිකවම[4] පහ වී යන්නෝය.
ඔබට පහර දෙන ඒ කෲර[5] හමුදාව
දූවිල්ල මෙන්ද[6] දහයියා මෙන්ද ගසා-
ගෙන යන්නෝය.[7] **6** මන්ද ස්වර්ග-
යේ සේනාවල අධිපති වූ යෙහෝවා
දෙවි වන මම ඔබව ගලවාගැනීමට
පියවර ගන්නෙමි. මම ගිගුරුම් හඬ,
භූමිකම්පා හා දෙදරන ශබ්දයක් මැද
පැමිණ සුළිසුළඟෙන්ද කුණාටුවෙන්ද
ඇවිළෙන ගින්නෙන්ද ඔබව ගලවා-
ගන්නෙමි."[8]

**7** අරියෙල් නුවරට විරුද්ධව සටන්
කරන ජන සමූහයන්ට රාත්‍රියේ සිහි-
නයක් දකින්නාක් මෙන් සිදු වනු
ඇත.[9] ඇය වටා බැම්මක් ගොඩනඟා
ගෙන ඇයට හිරිහැර කරන සියලු-
දෙනාටම සිදු වන්නේ ඒ දේමය.[10]
**8** කුසගින්නේ සිටින කෙනෙකු සිහි-
නෙන් තම කුස පුරවාගත්තද අවදි
වන විට ඔහුට දැනෙන්නේ නිවා-
ලිය නොහැකි කුසගින්නකි.[11] වතුර
පිපාසයෙන් සිටින කෙනෙකු සිහි-
නෙන් තම පිපාසය සන්සිඳුවා ගත්තද
ඔහු විඩාවට පත් වී මහත් පිපාසය-
කින් අවදි වන්නේය. සියොන් කන්දට
විරුද්ධව පැමිණෙන ජන සමූහයන්ට
සිදු වන්නෙත් එලෙසමයි.[12]

**9** ජනයෙනි, පුදුමයෙන් බලා
සිටින්න.[13] ඔබේ දෑස් වසාගෙන අන්-
ධයන් මෙන් සිටින්න.[14] ඔබ මත්
වී[15] වැනිවැනී සිටින්නහුය. එහෙත්
ඔබ මත්ව සිටින්නේ වයින් නිසා හෝ
මත්පැන් නිසා හෝ නොවෙයි.[16]

**10** යෙහෝවා දෙවි ඔබව තද නින්-
දකට[17] වැටෙන්න සලස්වා ඇත.

---

**යෙසා 28:25*** නික් 9:32හි පාදසටහන බලන්න. **29:1*** මෙම නමෙහි අර්ථය, "දෙවිගේ ගිනිමය පූජාසනය" විය හැක. එය යෙරුසලමට යෙදූ නමකි.

**28 පරි.**
**1** ගීතා 30:5 ගීතා 103:9 මීකා 7:18
**2** යෙරෙ 4:3
**3** මතෙ 23:23
**4** එස 4:9
**5** ලෙවී 19:19
**6** ලෙවී 19:9 ලෙවී 19:10 ලෙවී 23:22
**7** නික් 9:32 එස 4:9
**8** යෙරෙ 10:24 හෙබ්‍රෙ 12:6 හෙබ්‍රෙ 12:11
**9** ගීතා 119:71
**10** යෙසා 41:15 ආමො 1:3
**11** යෙසා 10:5
**12** ගීතා 103:9 මීකා 7:18
**13** යෙසා 21:10 1කොරි 9:9
**14** ලෙවී 26:44 යෙසා 10:20
**15** හෙබ්‍රෙ 12:9
**16** ගීතා 40:5 යෙරෙ 32:19 රෝම 11:33

**29 පරි.**
**17** 2සාමු 5:9
**18** යෙසා 29:7
**19** ලෙවී 23:2 2ලේක 8:13
**20** ද්වි 28:53 ද්වි 28:55
**21** යෙසා 51:19 විලා 1:4
**22** යෙසා 9:19 යෙරෙ 15:14 යෙරෙ 17:4 ශෙප 1:7

**2 තීරුව**
**1** 2රාජා 24:11 2රාජා 25:1 යෙරෙ 39:1 එස 4:2 එස 21:22
**2** ගීතා 44:25 යෙසා 51:23
**3** යෙසා 8:19
**4** යෙසා 47:9 යෙසා 48:3
**5** යෙසා 13:11
**6** යෙසා 13:19 යෙසා 14:22 යෙසා 21:9
**7** යෝබ් 21:18 ගීතා 1:4 ගීතා 35:5 යෙසා 17:13
**8** 1සාමු 2:10 යෙරෙ 50:25 නාහු 1:3
**9** යෙරෙ 25:14 සෙක 14:2
**10** යෙසා 29:2
**11** ගීතා 73:20; **12** යෙසා 10:12; යෙරෙ 51:24; **13** හබ 1:5; **14** යෙසා 6:9; **15** යෙරෙ 51:7; **16** යෙරෙ 25:27; **17** ගීතා 69:23; යෙසා 6:10; ක්‍රියා 28:27; රෝම 11:8.

ඔබේ ඇස් මෙන් සිටි අනාගතවක්තෘ-
වරුන්ව[1] ඔහු අන්ධ කළේය. ඔබේ හිස
මෙන්[2] සිටි දිවැසිවරුන්ගේ[3] මුහුණ
වසා දැමුවේය. **11** ඒ නිසා මේ මුළු
දර්ශනයම ඔබට මුද්‍රා කළ ලියවිල්-
ලක්[4] මෙන් වන්නේය. ඔබ අකුරු
දන්නා කෙනෙකුට එම ලියවිල්ල දී,
“මෙහි ලියා ඇති දේ අපිට ඇහෙන්න
කියවන්න” යයි කියන්නහුය. එහෙත්
ඔහු, “මේ ලියවිල්ල මුද්‍රා කර තිබෙ-
නවා. ඒ නිසා මට එය කියවන්න
බැහැ”[5] යයි කියන්නේය. **12** ඔබ
අකුරු නොදන්න කෙනෙකුට එය දුන්
විට, “මට කියවන්න දන්නේ නැහැ”
කියා ඔහු කියයි.

**13** යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. “මේ ජනයා මා වෙතට ළං වන්-
නේ තමන්ගේ තොල්වලින් පමණි.[6]
ඔවුන් තමන්ගේ මුඛයෙන් මට ප්‍රශංසා
කළත් ඔවුන්ගේ සිත් මා වෙතින්
බොහෝ ඈත් වී තිබේ.[7] මිනිසුන්
විසින් සාදාගත් ආඥා ඉගෙනගත්
පමණින් මට ගරුබිය දක්වනවා-
යයි ඔවුහු සිතති.[8] **14** ඒ නිසා, මම
නැවත වරක් මේ ජනයාට පුදුම දන-
වන දෙයක් කරන්නෙමි.[9] ඔවුන්ගේ
ප්‍රඥාවන්තයන්ගේ ප්‍රඥාව නැති කර
දමන්නෙමි. ඔවුන්ගේ නැණවතුන්ගේ
නුවණ පහ කර දමන්නෙමි.”[10]

**15** තමන් සැලසුම් කරන දේ යෙ-
හෝවා දෙවිගෙන් සඟවාගන්න මහත්
වෑයමක් දරන අයට සිදු වන්නේ
දුක පමණි.[11] ඔවුහු කාටවත් නොපෙ-
නෙන අඳුරු තැන්වල[12] වැරදි කර-
මින්, “අපි කරන දේවල් දකින්නේ
කවුද”[13] යයි අසන්නෝය. **16** ඔබේ
සිත් මොන තරම් දූෂ්‍ය වී ඇද්ද! මැටි
පිඩ කුඹල්කරු හා සමානයි කියා පැව-
සිය හැකිද?[14] මැටි භාජනය එය සෑදූ
තැනැත්තාට, “මාව සෑදුවේ ඔබ නෙ-
මෙයි”[15] කියා හෝ, “ඔබ කිසි දෙ-
යක් දන්නේ නැහැ”[16] කියා හෝ කිව
හැකිද?

**17** තව කෙටි කලකින් ලෙබ-
නොන් දේශය පලතුරු උයනක් බවට
පත් වෙයි.[17] පලතුරු උයන සශ්‍රීකව
වැඩෙන කැලෑවක් මෙන් පෙනෙයි.[1]
**18** ඒ දවසේදී බිහිරි අයට ලියවිල්ලේ
සඳහන් වචන ඇසෙනු ඇත.[2] සනාන්-
ධකාරයේ සිටින අන්ධයන්ට පවා
පෙනීම ලැබෙනු ඇත.[3] **19** නිහත-
මානී[4] අය යෙහෝවා දෙවි නිසා
බොහෝ සෙයින් ප්‍රීති වන්නෝය. අග-
හිඟකම් ඇති අය පවා ඊශ්‍රායෙල්හි
ශුද්ධ තැනැත්තාණන් නිසා සන්තෝ-
ෂයෙන් සිටින්නෝය.[5] **20** මන්ද
කෲර ලෙස අධිපතිකම් කරන්නාද[6]
පුරසාරම් දොඩන්නාද එකට විනාශ වී
යන්නෝය.[7] අනුන්ට හානියක් කිරී-
මට සොයන අයද[8] පහව යන්නෝය.
**21** මොවුහු නිර්දෝෂ අයගේ වචන
පෙරළමින් ඔවුන්ව වරදකට හසු කර-
ගනිති.[9] නුවර දොරටුව අසල අව-
වාද දෙන තැනැත්තාට[10] පවා ඔවුහු
උගුලක් අටවන්නෝය. ඔවුන් බොරු
චෝදනා ඉදිරිපත් කරන නිසා ධර්මිෂ්-
ඨයාට යුක්තිය ඉටු නොවෙයි.[11]

**22** ආබ්‍රහම්ව[12] ගලවාගත් යෙ-
හෝවා දෙවි දැන් යාකොබ්ගේ ගෘහය
ගැන මෙසේ පවසන්නේය. “යාකොබ්
තවදුරටත් ලැජ්ජාවට පත් වන්නේ-
වත් ඔහුගේ මුහුණ තවත් මලානිකව
තිබෙන්නේවත් නැත.[13] **23** මන්ද
මාගේ නිර්මාණයක් වූ යාකොබ්-
ගේ දරුවන් ඔහු සමඟ සිටින විට[14]
ඔවුහු සියල්ලෝ එක්ව මගේ නාමය
ගෞරවයට පත් කරති.[15] යාකොබ්ගේ
ශුද්ධ තැනැත්තාද[16] ඊශ්‍රායෙල්හි දෙවිද
වන මාව ඔවුහු ශුද්ධ දෙවි කෙනෙකු
ලෙස සලකමින් මට ගරුබිය දක්-
වති.[17] **24** වැරදි ආකල්ප තිබෙන
අය නිවැරදි අවබෝධයක් ලබාගනු
ඇත. මැසිවිලි නඟන්නෝද දැනමුතු-
කම් ලබාගන්නෝය.”[18]

**30** යෙහෝවා දෙවි මෙසේ පව-
සයි. “මාගේ මුරණ්ඩු පුත්‍රයෝ
මහත් විපතකට මුහුණ දෙනු ඇත.[19]

**29 පරි.**

**1** 1සාමු 9:9 යෙරෙ 14:14 යෙරෙ 27:15
**2** යෙසා 9:16
**3** මීකා 3:7
**4** යෙසා 8:16 දානි 12:4 එළි 5:1
**5** දානි 12:9 මතෙ 11:25 මතෙ 13:11
**6** යෙසා 48:1 යෙරෙ 3:10 යෙරෙ 5:2 මාක් 7:6
**7** මතෙ 15:8
**8** මතෙ 15:9 මාක් 7:8 කොලො 2:22
**9** යෙසා 28:21 හබ 1:5
**10** යෙරෙ 8:9 යොහ 9:39 ක්‍රියා 28:26 රෝම 1:28 1කොරි 1:19
**11** යෙසා 30:1
**12** යෝබ් 24:15 එස 8:12 යොහ 3:20 1කොරි 4:5
**13** ගීතා 73:11 ගීතා 94:7
**14** යෙසා 45:9 යෙසා 64:8 රෝම 9:21
**15** යෙරෙ 18:6
**16** ගීතා 94:9 යෙසා 45:9 රෝම 9:20
**17** යෙසා 35:1 යෙසා 41:19

**2 තීරුව**

**1** යෙසා 32:15
**2** යෙසා 35:5
**3** යෙසා 42:16 ලූක් 4:18 ක්‍රියා 26:18 එළි 3:18
**4** ගීතා 37:11 ශෙප 2:3 මතෙ 5:5
**5** යෙසා 41:16
**6** යෙසා 29:5
**7** යෙසා 28:14 යෙරෙ 9:23
**8** යෙරෙ 18:18 මීකා 2:1 ලූක් 6:7 ලූක් 20:20
**9** මතෙ 22:15 ලූක් 11:54
**10** ආමො 5:10
**11** එස 13:19 මලා 3:5
**12** නෙහෙ 9:7 මීකා 7:20
**13** යෝවෙ 2:27

**14** යෙසා 43:21; යෙසා 45:11; **15** ලෙවී 10:3; ලෙවී 22:32; මතෙ 6:9; **16** යෙසා 5:16; **17** යෙසා 8:13; හොෂෙ 3:5; එළි 15:4; එළි 19:5; **18** ගීතා 94:10; හිතෝ 4:2; **30 පරි.** **19** යෙසා 1:2; යෙසා 63:10; යෙසා 65:2; ක්‍රියා 7:51.

මන්ද ඔවුහු මාගේ කැමැත්තට*
විරුද්ධව[1] උපායන් යොදති. මට
පිළිකුල් වූ පාන පූජා ඔප්පු කර-
මින් තමන්ගේ පාප තව තවත් වැඩි
කරගනිති.#[2] **2** ඔවුහු මාගේ අවස-
රය නොමැතිව[3] ඊජිප්තුවට ගියෝය.[4]
ඔවුහු ඊජිප්තුව තම සෙවණ කර-
ගනිමින් පාරාවෝගෙන් රැකවරණය
පතන්නෝය.[5] **3** නමුත් පාරාවෝ-
ගෙන් රැකවරණය පැතීමෙන් ඔවුන්ට
අත් වන්නේ ලැජ්ජාව පමණි.[6] ඊජිප්-
තුව ඔවුන්ගේ සෙවණ කරගැනීමෙන්
ඔවුහු නින්දාවට පත් වනු ඇත.[7]
**4** ඔවුන්ගේ පාලකයෝ ෂොවන්[8] නග-
රයට පැමිණ සිටිති. ඔවුන්ගේ පණිවි-
ඩකරුවෝ හනේස් ප්‍රදේශය දක්වාම
ගොස් ඇත. **5** ඔවුහු සියලුදෙනාම
ලැජ්ජාවට පත් වෙති. මන්ද ඔවුන්
විශ්වාසය තබා ඇත්තේ තමන්ට
පිහිට විය නොහැකි සෙනඟක් මතයි.
ඔවුන් කෙරෙහි බලාපොරොත්තු
තැබීමෙන් නින්දාවක් අත් වෙනවා
මිසක ඔවුන්ට කිසි ප්‍රයෝජනයක්
නොලැබෙයි."[9]

**6** දකුණු දේශයේ සිටින සතුන්ට
විරුද්ධව දෙන තීන්දුව මෙයයි.[10] ඔවුහු
බූරුවන් හා ඔටුවන් පිට[11] වටිනා තෑගි-
බෝග පටවා ගොරවන සිංහයන් හා
දිවියන්ගෙන්ද විෂකුරු සර්පයන්[12] හා
පොළොඟුන්ගෙන්ද ගහන වූ දුෂ්කර
දේශයක්[13] මැදින් ගමන් කරති. නමුත්
ඔවුන්ට එයින් කිසි පලක් වන්නේ
නැත. **7** ඊජිප්තුවරුන්ගෙන් උපකා-
රය පැතුවත් එයින් කිසි ප්‍රයෝජනයක්
නැත.[14] මා ඊජිප්තුවරුන්ව, "පැත්ත-
කට වී බලා සිටින රාහබ්"[15] ලෙස
හඳුන්වන්නේ ඒ නිසාය.

**8** "දැන් ලියන ලෑල්ලක් මතද
ලියවිල්ලක්[16] මතද මේ සියල්ල ලියා
තබන්න. මතු කාලයට ප්‍රයෝජනවත්
වන පිණිසත් හැමදාටම[17] සාක්ෂියක්
වන පිණිසත් එය යුදා වැසියන් ඉදිරි-
යේ ලියා තබන්න. **9** මන්ද මොවුහු
කැරලිකාර පුත්‍රයෝය.[1] යෙහෝවා
දෙවි වන මාගේ නීතියට අකීකරු
වන[2] අවිශ්වාසවන්ත දරුවෝය.[3]
**10** ඔවුහු දර්ශන දකින්නන්ට, 'දර්-
ශන දකින්න එපා' කියා පවසති.
අනාගතවක්තෘවරුන්ට ඔවුහු මෙසේ
කියති. 'අපිට ඇත්ත කියන්න එපා.[4]
අපි අහන්න කැමති දේවල් විතරක්
කියන්න. අපි කියන විදිහට අනා-
වැකි කියන්න.[5] **11** අපි කැමති දේ
කරන්න බැරි නම් මෙතැනින් යන්න.[6]
අපි ඉදිරියට ආයෙත් එන්න එපා. ඊශ්‍රා-
යෙල්හි ශුද්ධ තැනැත්තාණන් පවසන
දේවල් අපිට තවත් නොකියන්න.' "[7]

**12** ඒ නිසා ඊශ්‍රායෙල්හි ශුද්ධ
තැනැත්තාණෝ මෙසේ පවසයි. "ඔබ
මාගේ වචන ප්‍රතික්ෂේප කර[8] බො-
රුව සහ වංචාව කෙරෙහි විශ්වාසය
තබන්නහුය.[9] **13** ඔබේ කැරලිකාර-
කම නිසා පුපුරා ගිය උස් බිත්-
තියක්[10] මෙන් ඔබ හදිස්සියෙන්ම[11]
කඩා වැටෙනු ඇත. **14** ඔබ කඩා
බිඳ දැමූ මැටි භාජනයක් මෙන් වනු
ඇත.[12] ලිපකින් ගිනි අඟුරක් ගන්න-
වත් පොකුණකින් දිය පොදක් ගන්න-
වත් ප්‍රමාණවත් කැබැල්ලක් ඉතුරු
නොවන ලෙසින් කුඩු කර දැමූ භාජන-
යක් මෙන් ඔබ සුනුවිසුනු වී යන්න-
හුය."[13]

**15** විශ්වයේ පාලකයාණන්ද ඊශ්‍රා-
යෙල්හි ශුද්ධ තැනැත්තාණන්ද[14] වන
යෙහෝවා දෙවි ඔබට මෙසේ
කියා තිබිණ. "මා වෙතට හැරී සන්-
සුන්ව සිටින්න. එවිට ඔබට ගැල-
වීම අත් වෙයි. කලබල නොවී මා
කෙරෙහි විශ්වාසය තබන්න.[15] එවිට
ඔබ ශක්තිමත් වන්නහුය." එහෙත්
ඔබ එසේ කිරීමට කැමති වූයේ
නැත.[16] **16** ඔබ දෙවි කී දේ ප්‍රතික්-
ෂේප කර, "නැහැ, අපි අශ්වයන්
පිට පලා යමු"[17] යයි කීවහුය. ඒ
නිසා, ඔබට ඇත්තෙන්ම පලා යන්න

**30 පරි.**
1 යෙසා 29:15 හොෂෙ 4:10 1තෙස 4:8
2 ගණන් 32:14 හොෂෙ 13:2
3 ගණන් 27:21 1රාජා 22:7
4 2රාජා 17:4 යෙසා 31:1 එස 29:6 හොෂෙ 7:11
5 යෙසා 36:6
6 යෙසා 20:5 යෙරෙ 37:7
7 යෙරෙ 17:5
8 ගණන් 13:22 යෙසා 19:11 එස 30:14
9 යෙසා 31:3 යෙරෙ 2:36 හොෂෙ 5:13
10 2ලේක 12:3 යෙසා 20:3
11 2ලේක 9:1
12 ගණන් 21:6 ද්වි 8:15 යෙරෙ 2:6
13 නික් 1:14 ද්වි 4:20 යෙරෙ 11:4
14 ගීතා 118:8 යෙසා 31:1 යෙරෙ 37:7
15 ගීතා 87:4 ගීතා 89:10
16 යෝබ් 19:23 යෙසා 8:1 යෙරෙ 36:2
17 රෝම 15:4

**2 තීරුව**
1 ද්වි 31:27 යෙසා 1:4 යෙරෙ 44:3 ක්‍රියා 7:51
2 2ලේක 33:10 2ලේක 36:15 නෙහෙ 9:29 හිතෝ 28:9 යෙරෙ 7:13 ආමො 5:10
3 යෙසා 59:3 යෙරෙ 9:3 හොෂෙ 4:2
4 2ලේක 16:10 2ලේක 18:7 2ලේක 24:19 යෙරෙ 11:21 යෙරෙ 26:11 ක්‍රියා 4:17
5 යෙරෙ 23:17 එස 13:7 මීකා 2:11 2තිමෝ 4:3
6 ආමො 7:16
7 ආමො 7:13
8 යෙසා 5:24 ආමො 2:4
9 යෙරෙ 13:25 මීකා 3:11

**10** ගීතා 62:3; ලූක් 6:49; **11** ගීතා 73:19; **12** යෙරෙ 19:11; **13** යෙරෙ 13:14; **14** යෙසා 30:11; **15** 1ලේක 5:20; 2ලේක 16:8; යෙසා 26:3; **16** යෙරෙ 44:16; මතෙ 23:37; ක්‍රියා 7:51; **17** යෙසා 31:1; යෙසා 31:3.

යෙසා **30:1*** මූ.අ., "මාගේ බලයට." **1#** මෙයින් අදහස් කරන්නේ, ගිවිසුමක් ඇති කරගන්නා පිණිස පාන පූජා වත් කිරීමයි.

සිදු වෙයි. “අපි වේගවත් අශ්වයන්
පිට නැඟ යන්නෙමු”[1] යයි කී බැවින්
ඔබ පසුපස හඹා එන ඔබේ සතු-
රෝ ඔබට වඩා වේගවත් වන්නෝය.[2]
**17** ඔවුන්ගෙන් එක් කෙනෙකු තර්ජ-
නය කළ විට ඔබෙන් දහස්දෙනෙක්
බියෙන් වෙවුලති.[3] පස්දෙනෙකුගේ
තර්ජනයට ඔබ සියලුදෙනාම පලා
දුවන්නහුය. අන්තිමේදී ඔබෙන් ඉතුරු
වන අය කඳු මුදුනක සිටුවා ඇති තනි
කොඩියක් මෙන් වෙති.[4]

**18** එහෙත් යෙහෝවා දෙවි ඔබට
කරුණාව පෙන්වන්න[5] මහත් ආශා-
වකින් බලා සිටියි. ඔහු ඔබ වෙ-
නුවෙන් පියවර ගෙන ඔබට දයාව
පෙන්වයි.[6] මන්ද යෙහෝවා දෙවි යුක්-
තිය ඉටු කරන දෙවි කෙනෙකි.[7]
ඔහු කෙරෙහි බලාපොරොත්තු තබන
සෑම කෙනෙකුම[8] සන්තෝෂවත්ය.[9]
**19** යෙරුසලමේ[10] වාසය කරන
සියොන්හි[11] ජනයෙනි, ඔබ තවදුර-
ටත් හඬා වැලපෙන්නේ නැත.[12] ඔබ
හඬ නඟා දෙවිට කන්නලව් කරන
විට ඔහු ඔබට කරුණාවෙන් සවන්
දෙන්නේය. ඔබ හඬගසන මොහො-
තේදීම ඔහු ඔබට පිළිතුරු දෙන්-
නේය.[13] **20** යෙහෝවා දෙවි ඔබට
දුක් කරදර නමැති කෑම කන්නත්
පීඩා නමැති වතුර බොන්නත් ඉඩ-
හරින්නේය.[14] එහෙත් ඔබේ උදාර
උපදේශකයාණන් තවදුරටත් ඔබෙන්
සැඟවී සිටින්නේ නැත. ඔබ සැබ-
වින්ම ඔහුව දකින්නහුය.[15] **21** එවිට
ඔබට පිටුපසින් මෙසේ කියන හඬක්
ඇසෙයි. “ජනයෙනි, යා යුතු හරි මඟ[16]
මම ඔබට පෙන්වන්නෙමි. ඒ මාර්ග-
යේ ගමන් කරන්න.” ඔබ දකුණට
හෝ වමට හෝ හැරී නිවැරදි මඟෙන්
ඉවත්ව ගියොත් දෙවි පෙන්වන මඟට
නැවත හැරී එන්න.[17]

**22** ඒ කාලයේදී, ඔබ රිදී හා රන්[18]
ආලේප කළ ඔබේ දේවතා රූප[19] පිළි-
කුල් දෙයක් ලෙස සලකා ඉවතලනු
ඇත.[20] ස්ත්‍රියක් තම ඔසප් දවස්වලදී
අපවිත්‍ර වූ රෙදිකඩක් ඉවත දමන්-
නාක් මෙන් ඔබත්, “මෙය මහ පිළිකු-
ලක්”[1] යයි කියමින් ඒ රූප ඉවත්
කරන්නහුය.[2] **23** දෙවි බීජ වපුරන
කාලයේදී ඔබට වර්ෂාව දී හොඳ පල-
දාවක් ලබා දෙන්නේය.[3] ඔබ ප්‍රණීත
වූ හොඳම කෑම කන්නහුය.[4] ඔබේ
සතුන්ට ලගින්න ඇති තරම් තණබිම්
තිබෙයි.[5] **24** ගොවිතැනේ යොදවන
ගවයන්ගේ හා බූරුවන්ගේ කෑමවලට
හොඳ ධාන්‍යත්[6] එක් කරනු ලබයි.*
**25** ඔබේ සතුරන්ගේ බලකොටු බිඳ
වැටී[7] විශාල සෙනඟක් මැරුම් කන්-
නෝය. ඒ දවසේදී සෑම පර්වතය-
කින්ද කඳු මුදුනකින්ද දිය ඇළි හා දිය
පහරවල් ගලාගෙන එයි.[8] **26** යෙ-
හෝවා දෙවි තම සෙනඟට දඬුවම්
කළ නිසා ඔවුන්ට දරුණු තුවාල ඇති
විය. එහෙත් දෙවිම ඔවුන්ගේ තුවාල
බැඳ[9] සුව කර[10] ඔවුන්ව විපතෙන්
ගලවාගන්නේය. ඒ දවසේදී, පුන් සඳ
බැබළෙන හිරු මෙන් දීප්තිමත් වන්-
නේය. බැබළෙන හිරුගේ ආලෝකය
සත්ගුණයකින් වැඩි වී[11] සත් දවසක
එළිය මෙන් කාන්තිමත් වන්නේය.

**27** යෙහෝවා දෙවි* දුර ඈත
සිට පැමිණෙන්නේය. ඝන වලාකුළු
පිට නැඟ මහත් කෝපයෙන්[12] පැමි-
ණෙන ඔහුගේ මුඛය දවාලන ගින්නක්
වැනිය.[13] **28** ඔහුගේ බලය වේග-
යෙන් ගලා යන ජල ධාරාවක් මෙනි.
එය ගෙල දක්වාම නඟින්නේය.[14] ඔහු
ජාතීන්ව පොළා[15] කිසි කමකට නැති
දහයියා මෙන් ඉවතලන්නේය. ඔහු
ඔවුන්ගේ හකුවලට කටකලියාවක්[16]
දමා ඔවුන්ව විනාශය කරා ඇදගෙන
යන්නේය.[17] **29** නමුත් ශුද්ධ උත්-
සවයක්[18] පවත්වන රාත්‍රියක මෙන්
ඔබ ප්‍රීතියෙන් ගී ගයන්නහුය.[19] ඊශ්‍රා-
යෙල්හි පර්වතය[20] වන යෙහෝවා

**30 පරි.**

**1** ගීතා 33:17; ආමෝ 2:14
**2** ද්වි 28:49; යෙරෙ 4:13; විලා 4:19; හබ 1:8
**3** ලෙවී 26:36; ද්වි 32:30
**4** යෙසා 66:19; එස 12:16
**5** නික් 34:6; එස 36:9
**6** ගීතා 102:13; රෝම 9:15
**7** ගීතා 99:4; යෙරෙ 10:24; රෝම 2:2
**8** යෙරෙ 17:7
**9** ගීතා 112:1; හිතෝ 16:20
**10** නෙහෙ 11:1; යෙසා 44:28
**11** ගීතා 87:5; යෙසා 62:1; යෙරෙ 31:6; සෙක 1:17
**12** නෙහෙ 12:27; යෙසා 61:3
**13** ගීතා 50:15; යෙරෙ 29:12
**14** ලෙවී 26:26; ගීතා 80:5
**15** යෝබ් 36:22; ගීතා 32:8; ගීතා 71:17; ගීතා 119:102
**16** ගීතා 25:8
**17** ද්වි 5:32; යොෂු 1:7; හිතෝ 4:27
**18** ද්වි 7:25
**19** නික් 32:4; විනි 17:3
**20** 2රාජා 23:4; 2ලේක 34:4; සෙක 13:2

**2 තීරුව**

**1** හොෂෙ 14:8
**2** ද්වි 7:5
**3** ද්වි 11:11; ගීතා 65:9; ගීතා 104:13; සෙක 10:1
**4** හොෂෙ 2:22
**5** යෙසා 65:10
**6** මතෙ 3:12
**7** යෙසා 2:15; යෙසා 32:14
**8** යෙසා 41:18; යෙසා 44:3
**9** විලා 2:13
**10** ද්වි 32:39; යෙරෙ 33:6; හොෂෙ 6:1; ආමෝ 9:11
**11** යෙසා 60:20; හබ 3:4; හබ 3:11; එළි 21:23; එළි 22:5

**12** ද්වි 32:22; ගීතා 79:5; යෙසා 10:17; නාහු 1:6; ශෙප 3:8; **13** ගීතා 18:8; යෙරෙ 23:29; හෙබ්‍රෙ 12:29; **14** යෙසා 8:8; **15** ආමෝ 9:9; **16** 2රාජා 19:28; ගීතා 32:9; **17** යෙසා 19:3; **18** ද්වි 16:14; ගීතා 42:4; ගීතා 81:2; මතෙ 26:30; **19** නික් 15:1; 2ලේක 20:28; යෙරෙ 33:11; **20** ද්වි 32:4; ගීතා 18:31; ගීතා 95:1; යෙසා 26:4.

යෙසා **30:24*** මූ.අ., “කුල්ලෙන්ද මුල්ලුවෙන්ද පෙළූ ධාන්‍ය.” **27*** මූ.අ., “යෙහෝවා දෙවිගේ නාමය.”

දෙවිගේ කන්දට[1] නළා පිඹිමින්[2] යන
ජනයා මෙන් ඔබේ සිත ප්‍රීතියෙන්
ඉපිල යන්නේය.

**30** යෙහෝවා දෙවි තම සතු-
රන්ට විරුද්ධව බිය උපදවන හඬක්[3]
නික්මවමින් තම බලවත් හස්ත-
යෙන්[4] ඔවුන්ට පහර දෙන්නේය.
ඔහු ගිනි ජාලාවක්[5] මගින්ද කුණාටු-
වක්[6] මගින්ද හිම කැට වර්ෂාවක්[7]
මගින්ද තම දැවෙන කෝපය[8] පිට
කරන්නේය. **31** යෙහෝවා දෙවිගේ
හඬ ඇසෙන විට ඇසිරියානු ජාති-
කයෝ බියෙන් තැතිගනිති.[9] ඔහු
ඔවුන්ට යෂ්ටියකින් පහර දෙන්-
නේය.[10] **32** යෙහෝවා දෙවි තම
දණ්ඩ අතට ගෙන ඇසිරියානුවන්ට
පහර දෙන සෑම වතාවකදීම ඔහුගේ
සෙනඟ රබන් ගසමින්ද වීණා වය-
මින්ද ප්‍රීති වෙති.[11] ඔහු තම මහත්
බලය පෙන්වමින් ඔවුන්ට විරුද්ධව
සටන් කරන්නේය.[12] **33** ඇසිරියා-
නුවන්වද ඔවුන්ගේ රජුවද[13] පුලුස්සා
දැමීමට දෙවි දැනටමත් තෝෆෙත්හි[14]
වළක් සූදානම් කරගෙන එහි දර ගො-
ඩගසා ඇත. එම වළෙන් ගිනිදැල් බුර-
බුරා නඟියි. දැවෙන ගෙන්දගම් වැනි
වූ යෙහෝවා දෙවිගේ හුස්ම එහි ගිනි-
දළු අවුළුවයි.[15]

# 31

ඊජිප්තුවෙන් උපකාර පතන
අය පිටට බොහෝ දුක් පීඩා
පැමිණෙයි![16] ඔවුන් විශ්වාසය තබන්-
නේ අසංඛ්‍යාත යුධ රථ[17] හා බල-
වත් අශ්වයන් කෙරෙහිය.[18] ඔවුහු
ඊශ්‍රායෙල්හි ශුද්ධ තැනැත්තා වන
යෙහෝවා දෙවිගෙන් උපකාර පතන්-
නේවත් මඟ පෙන්වීම් ඉල්ලන්නේවත්
නැත.[19] **2** නමුත් දෙවි ඔවුන්ට වඩා
ප්‍රඥාවන්තය.[20] ඔහුට ඕනෑම දෙයක්
විනාශ කළ හැකි බවත්[21] යම් දෙ-
යක් පැවසුවොත් එය එලෙසින්ම ඉටු
කරන බවත්[22] මතක තබාගන්න. ඔහු
දුෂ්ටකම් කරන අයට විරුද්ධවත්[23]
අනුන්ට හිරිහැර කරන අයට විරුද්ධ-
වත් නැඟී සිටින්නේය.[24]

**3** ඊජිප්තුවරුන් නිකම්ම නිකම්
මනුෂ්‍යයන් පමණයි.[25] ඔවුන්ව දෙ-
විට සමාන කළ නොහැකියි. ඔවුන්ගේ
අශ්වයන් ස්වර්ගයෙන් බැස ආ දූත-
යන් නොව ඇට මස් සහිත සතුන් පම-
ණයි.[1] යෙහෝවා දෙවි තම අත දිගු
කර පහර දෙන්නේය. එවිට උපකාර
දෙන තැනැත්තාද උපකාර පතන
තැනැත්තාද එකට වැටී විනාශ වී
යන්නෝය.[2]

**4** යෙහෝවා දෙවි මට මෙසේ පැව-
සුවේය. "තරුණ කේශර සිංහයෙක්[3]
ගොදුරක් අල්ලාගත් පසු ගර්ජනා කර-
මින් එය රැකගන්නේය. එඬේරුන්
බොහෝදෙනෙකු ඌ ළඟට ගොස්
මොන තරම් කලබල කර කෑගැ-
සුවත් ඌ ඔවුන්ට භය නොවෙයි.
ස්වර්ගයේ සේනාවල අධිපති හා යෙ-
හෝවා දෙවි වන මමත් සියොන්
කන්ද වෙනුවෙන්ද එහි නුවර වෙනු-
වෙන්ද සටන් කරන්නේ ඒ ආකාරයට-
මය.[4] **5** කුරුල්ලෙකු තම පැටවුන්
ළඟ පියාසර කරමින් උන්ව ආරක්ෂා
කරන්නාක් මෙන් ස්වර්ගයේ සේනා-
වල අධිපතිද යෙහෝවා දෙවිද වන
මම යෙරුසලම ආරක්ෂා කරන්-
නෙමි.[5] මම එහි වැසියන්ව ආරක්ෂා
කර ඔවුන්ව ගලවාගන්නෙමි."[6]

**6** "ඊශ්‍රායෙල්වරුනි, ඔබ මට විරුද්-
ධව බරපතළ ලෙස පව් කළහුය.[7]
දැන් පසුතැවී මා වෙතට හැරී එන්න.[8]
**7** එකල මට විරුද්ධව පව් කරමින්[9]
රන් රිදීවලින් සාදාගත් කිසි කම-
කට නැති දේවතා රූප ඔබ ඉවත
දමන්නහුය.[10] **8** ඇසිරියානු හමුදාව
කඩුවෙන් මැරුම් කන්නෝය. නමුත්
ඔවුන් මැරුම් කන්නේ මනුෂ්‍යයෙකු-
ගේ කඩුවක් නිසා නොවෙයි.[11] ඔවුහු
ඒ කඩුව දැක බියෙන් පලා යති.
ඔවුන්ගේ තරුණයන්වද වහලුන් ලෙස
ඇදගෙන යනු ඇත. **9** ඔවුන් පර්ව-
තයක් සේ සැලකූ තැනැත්තා තැති-
ගෙන පහව යයි. ඔවුන්ගේ පාලකයෝ
කොඩිය[12] දැක බියෙන් වෙවුලති."

**30 පරි.**
1 යෙසා 2:3
2 1ලේක 13:8; ගීතා 150:4
3 ගීතා 29:3; එස 10:5; එළි 1:15
4 නික් 15:16; ගීතා 98:1; යෙසා 53:1; ලූක් 1:51
5 ගීතා 18:13; ගීතා 50:3
6 විනි 5:4
7 යොෂු 10:11
8 ගණන් 11:1; යෙසා 5:25; නාහු 1:2
9 යෙසා 9:4; යෙසා 37:36
10 යෙසා 10:12
11 නික් 15:20; විනි 11:34
12 යෙසා 10:26
13 යෙසා 37:38; එස 32:22
14 2රාජා 23:10; යෙරෙ 7:32; යෙරෙ 19:6
15 උත් 19:24; යෙසා 34:9

**31 පරි.**
16 යෙසා 30:2; එස 17:15
17 යෙසා 36:9
18 ද්වි 17:16; ගීතා 33:17; හිතෝ 21:31
19 යෙසා 9:13; යෙසා 64:7; දානි 9:13; හොෂෙ 7:7; ආමො 5:4
20 රෝම 16:27
21 යොෂු 23:15; යෙසා 45:7
22 ගණන් 23:19; යෙසා 55:11; යෙරෙ 44:29
23 ගීතා 68:1; ශෙප 3:8
24 යෙසා 30:3; යෙරෙ 44:30; එස 29:6
25 ගීතා 9:20; ගීතා 146:3

**2 තීරුව**
1 ගීතා 33:17
2 යෙසා 9:17; යෙරෙ 15:6
3 හොෂෙ 11:10; ආමො 3:8
4 ගීතා 125:1; යෙසා 42:13; සෙක 12:8
5 නික් 19:4; ද්වි 32:11; ගීතා 91:4

**6** ගීතා 37:40; **7** 2ලේක 33:9; 2ලේක 36:14; යෙරෙ 5:23; හොෂෙ 9:9; **8** යෙසා 55:7; හොෂෙ 14:1; යෝවෙ 2:12; ක්‍රියා 3:19; **9** 1රාජා 12:28; හොෂෙ 8:11; **10** එස 36:25; හොෂෙ 14:8; **11** 2රාජා 19:35; 2ලේක 32:21; යෙසා 37:36; **12** යෙසා 18:3.

එසේ පවසන්නේ, සියොන්හි ආලෝ-
කය විහිදුවන, යෙරුසලමෙහි ගිනිඋදු-
නක්[1] ඇවුළු යෙහෝවා දෙවිය.

**32** ඒ කාලයේදී, ධර්මිෂ්ඨකමින්[2]
පාලනය කිරීමට රජෙකුවද[3]
යුක්තිය ඉටු කිරීමට පාලකයන්වද[4]
පත් කරනු ලබයි. **2** ඒ සෑම කෙ-
නෙක්ම සුළඟින් මුවා වීමට ස්ථාන-
යක් මෙන්ද කුණාටුවෙන් සැඟවීමට
රක්ෂස්ථානයක් මෙන්ද වන්නෝය.[5]
ඔවුහු වියළි දේශයක ගලා බසින දිය
පහරවල් මෙන්ද[6] කාන්තාර ප්‍රදේශ-
යක මහා පර්වතයකින් ලැබෙන සෙ-
වණක් මෙන්ද[7] වන්නෝය.

**3** ඒ කාලයේදී ඇස් පෙනෙන අය-
ගේ පෙනීම දුර්වල නොවෙයි. කන්
ඇසෙන අය හොඳ අවධානයකින්
සවන් දෙනු ඇත.[8] **4** ඉක්මන් වී
කටයුතු කරන තැනැත්තා පවා අව-
බෝධයෙන් යුතුව ක්‍රියා කරයි.[9] ගො-
තගසන අය පැහැදිලිව හා චතුර
ලෙස කතා කරති.[10] **5** දුෂ්ටයාව
තවදුරටත් න්‍යායශීලී කෙනෙකු
ලෙස ගණන් ගනු නොලබයි. නීච
ලෙස හැසිරෙන තැනැත්තාව තවත්
උසස් කරනු නොලබයි.[11] **6** දුෂ්ටයා
කතා කරන්නේ දුෂ්ට දේමය.[12] ඔහු
තම සිතින් නපුරු දේ කුමන්ත්‍රණය
කරයි.[13] ඔහු යෙහෝවා දෙවිට ද්‍රෝහිව
කටයුතු කර[14] දෙවි ගැන නින්දාසහ-
ගත දේ කතා කරන්නේය. ඔහු කුස-
ගින්නෙන් පෙළෙන අයට කෑමවත්
පිපාසයෙන් සිටින අයට දිය බිඳක්-
වත් නොදෙන්නේය.[15] **7** නින්දිතව
හැසිරෙන තැනැත්තා මොන යම්
ක්‍රමයකින් හෝ තම අරමුණු ඉටු
කරගනියි.[16] ඔහු නපුරු දේ කිරීමට
අනුන්වද පොලඹවයි.[17] ඔහු පීඩාවට
පත් වූ තැනැත්තාට හානියක් කිරීමේ
අදහසින් බොරු කියයි.[18] සාධාරණ
පැමිණිල්ලක් කරන දුප්පතාගේ අයි-
තිවාසිකම් පවා පැහැරගනියි.

**8** ත්‍යාගශීලී තැනැත්තා ත්‍යාග-
ශීලී වීමට අන් අයවත් දිරිගන්වයි. ඔහු
නොමසුරුව අනායයන් සමඟ දේවල්
බෙදාගනියි.[19]

**31 පරි.**
1 එස 22:20
සෙක 2:5
මලා 4:1

**32 පරි.**
2 ගීතා 72:1
යෙසා 9:7
යෙසා 11:5
යෙරෙ 23:5
සෙක 9:9
හෙබ්‍රෙ 1:9
එළි 19:11
3 උත් 49:10
ගීතා 2:6
ගීතා 45:6
ලූක් 1:32
යොහ 1:49
4 ගීතා 45:16
5 යෙසා 4:6
6 යෙසා 35:6
එළි 22:1
7 ගීතා 31:2
ගීතා 63:1
8 මතෙ 13:11
9 යෙසා 29:24
10 යෙසා 35:6
ලූක් 21:15
ක්‍රියා 4:13
11 යෙසා 5:20
මලා 3:18
12 1සාමු 25:25
මතෙ 12:34
13 1සාමු 24:13
ගීතා 58:2
මීකා 2:1
14 ගීතා 35:16
යෙසා 10:6
15 යාකො 2:16
1යොහ 3:17
16 යෙරෙ 5:26
මීකා 7:3
17 ගීතා 10:7
2පේතෘ 2:2
18 1රාජා 21:10
ක්‍රියා 6:11
19 ගීතා 112:9
හිතෝ 11:24
ක්‍රියා 9:39

**2 තීරුව**
1 ද්වි 28:56
යෙසා 3:16
2 යෙසා 3:17
යෙරෙ 25:10
3 යෙසා 7:23
යෙරෙ 8:13
විලා 2:12
හොෂෙ 2:12
ශෙප 1:13
4 යෙසා 3:24
5 ද්වි 8:7
එස 20:6
6 යෙරෙ 4:8
7 ගීතා 107:34
යෙසා 5:6
8 යෙසා 22:2
විලා 2:15
9 2රාජා 25:9
යෙසා 27:10

**9** "සැප පහසු ජීවිතයක් ගත
කරන කාන්තාවෙනි, මා කියන
දේට හොඳින් සවන් දෙන්න.[1] වගකී-
මකින් තොරව කටයුතු කරන තරු-
ණියෙනි, මට ඇහුම්කන් දෙන්න.
**10** තව අවුරුද්දකින් පමණ ඔබට
ඉතා කටුක ජීවිතයක් ගත කරන්න
සිදු වෙයි.[2] මිදි අස්වැන්න නෙළන
කාලය අවසන් වුවත් මිදිගෙඩියක්-
වත් ඔබට නොලැබෙයි.[3] **11** සැප
පහසු ජීවිත ගත කරන කාන්තා-
වෙනි, භයෙන් වෙවුලන්න! වග-
කීමකින් තොරව කටයුතු කරන
තරුණියෙනි, ශෝක වන්න! ඔබ
ඇඳගෙන සිටින වස්ත්‍ර ඉවතලා
ගෝණි රෙදි ඇඳගන්න.[4] **12** සාර-
වත්ව තිබුණු කෙත්වතු[5] දෙසත් මිදි-
වැල් දෙසත් බලා පපුවට ගසාගෙන
වැලපෙන්න.[6] **13** මාගේ සෙනඟගේ
ප්‍රීතිමත් නුවර දැන් පාළුවට ගිය
ස්ථානයකි. ඔවුන්ගේ ඉඩම් පුරාම
කටු පඳුරු හටගෙන තිබේ.[7] ඔවුන්
විනෝදයෙන් කල් ගෙවූ ගෙවල් පවා
කටුවැල්වලින් වැසී ගොස් ඇත.[8]
**14** ඔවුන්ගේ බලකොටුව අත්හැර
ගොස්[9] ඇති අතර ජනාකීර්ණ නුවර
පවා නිහඬව පවතියි. ඕෆෙල්[10] නම්
ප්‍රදේශයත් මුරකොටුවත් සදහටම
පාළුවට ගොස් ඇත. ඒ ස්ථාන-
වල සීබ්‍රාවුන්, ගවයන් හා බැටළුවන්
වැනි සත්තු නිදැල්ලේ ගැවසෙති.
**15** එහෙත් දෙවි නැවතත් තම බලය
ලබා දෙමින් අපට ආශීර්වාද කරන්-
නේය.[11] එවිට පාළුවට ගිය දේශය
සරුසාර උයනක් බවට පත් වෙයි.
උයන සශ්‍රීකව වැඩෙන වනාන්තර-
යක් බවට පත් වෙයි.[12]

**16** "පාළුකරයේ යුක්තිය රජයයි.
සරුසාර උයන ධර්මිෂ්ඨ ජනයා-
ගෙන් පිරී ඉතිරෙයි.[13] **17** ධර්මිෂ්-
ඨකම රජයන නිසා සාමය උදා

**10** 2ලේක 27:3; නෙහෙ 3:26; **11** ගීතා 104:30; හිතෝ 1:23; යෙසා 44:3; **12** යෙසා 29:17; යෙසා 35:2; **13** ගීතා 94:15; යෙසා 42:4; යෙසා 60:21; තීත 2:12; 2පේතෘ 3:13.

වෙයි.[1] ධර්මිෂ්ඨ සමාජයක් බිහි වන
නිසා ජනයා සදහටම කිසි කරදරයක්
නොමැතිව සුරක්ෂිතව කල් ගෙ-
වනු ඇත.[2] **18** මාගේ සෙනඟ තම
නිවහන්වල සාමකාමීව කල් ගෙවන්-
නෝය. ඔවුහු කිසි බියක් සැකක්
නොමැතිව සුවසේ ජීවත් වන්නෝය.[3]
**19** නමුත් හිම කැට වර්ෂාවකින් ගන
කැලෑවද නුවරද පොළොවටම සම-
තලා වී යයි.[4]

**20** “දිය පහරවල් අසල බීජ වපුර-
මින්[5] කෙතට ගවයන්ව හා බූරුවන්ව
රැගෙන යන[6] ජනයා සන්තෝෂ-
වත්ය.”

**33** කිසිවෙකු ඔබේ වස්තුව
පැහැර නොගත්තත් ඔබ අන්
අයගේ වස්තුව පැහැරගෙන ඔවුන්-
ගේ දේශ නැති නාස්ති කරන්නෙහිය.
කිසිවෙකු ඔබට ද්‍රෝහිකම් නොක-
ළත් ඔබ අන් අයට ද්‍රෝහිකම් කරන්-
නෙහිය.[7] ඒ සියල්ල කළ පසු ඔබ
අනිවාර්යයෙන්ම දඬුවම් විඳිනු ඇත.[8]
ඔබ අන් අයව විනාශයට ඇද දැමූ
නිසා ඔබවත් විනාශයට ඇද දමනු
ලබන්නේය. ඔබ ද්‍රෝහිකම් කළ නිසා
අන් අය ඔබ සමඟත් ද්‍රෝහිව කටයුතු
කරන්නෝය.[9]

**2** යෙහෝවා දෙවියනි, අපේ බලා-
පොරොත්තුව ඔබයි.[10] ඒ නිසා, අප
දෙස බලා අපට අනුකම්පා කරන්න.[11]
සෑම උදෑසනකම[12] අපව ශක්ති-
මත් කරන්න.[13] විපත්ති කාලයේදී
අපට පිහිට වී අපව ගලවාගන්න.[14]
**3** ඔබේ ගර්ජනාව ඇසෙද්දී සතු-
රෝ පලා යති.[15] ඔබ නැඟී සිටින
විට ජාතීහු කලබල වී ඒ මේ අත
දුවති.[16] **4** කැරපොත්තන් කැමක්
උඩ වැහෙන ලෙසින්ද මහත් පළඟැටි
රංචුවක් යමෙකුව වට කරගන්නා ලෙ-
සින්ද[17] සතුරෝ ඇවිත් ඔබේ වස්-
තුව[18] පැහැරගෙන යන්නෝය.
**5** ස්වර්ගයේ වෙසෙන[19] යෙහෝවා
දෙවිව මහත් සේ ගෞරවයට පත් වනු
ඇත.[20] ඔහු සියොන් කන්ද පුරාම
යුක්තියත් ධර්මිෂ්ඨකමත් පතුරවන්-
නේය.[1] **6** ඒ කාලයේදී,* විශ්වාස-
වන්තව සිටීමෙන් මහත් ගැලවීමක්
අත් වෙයි.[2] එමෙන්ම ප්‍රඥාව, දැනුම[3]
හා යෙහෝවා දෙවි කෙරෙහි දක්වන
ගරුබිය[4] වටිනා වස්තුවකි.

**7** ඔවුන්ගේ රණශූරයෝ පවා වීථි-
වල කෑගසති. ඔවුන්ගේ සාම දූත-
යෝද[5] හඬා වැලපෙති. **8** මංමාවත්
පාළුවට ගොස් ඇත.[6] ඒවායෙහි කිසි-
වෙක් ගමන් නොකරති.[7] සතුරා ගිවි-
සුම කඩ කළේය.[8] ඔහු කිසි
මිනිසෙකු ගැනවත් තැකීමක් නො-
කරයි.[9] ඔහු නුවරවල් පාගා දමන්-
නේය.[10] **9** කෙත්වතු පාළුවට ගොස්
ඇත. දේශය වැලපෙයි.[11] ලෙබනොන්
දේශය නාස්තියට ගොස් ලැජ්ජාවට
පත් වී ඇත.[12] ෂාරොන් තැනිත-
ලාව[13] දැන් කාන්තාරයකි. බාෂාන් හා
කර්මෙල් දේශයන්හි ගස්වල කොළ
හැළෙයි.[14]

**10** යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. “මම දැන් පියවර ගන්-
නෙමි.[15] මම මගේ තේජස සියල්ලන්ට
දකින්න සලස්වා[16] මට හිමි ගෞර-
වය ලබාගන්නෙමි.[17] **11** ඔබ වියළි
තණකොළ[18] වැනි වූ අදහස් සිතෙහි
පෝෂණය කර පිදුරු වැනි වූ උපා-
යන් යොදන්නෙහිය. ගින්නක් මෙන්
වූ ඔබේ දුෂ්ට සිතුවිලි ඔබ තුළම
දැවී පවතියි.[19] **12** සියලුදෙනා හුණු-
ගල් මෙන්ද කපා ඉවත දැමූ කටු
පඳුරු මෙන්ද පිලිස්සී යන්නෝය.[20]
**13** දුර ඈත වෙසෙන ජනයෙනි, මා
කරන්න යන දේ මම ඔබට දන්වන්-
නෙමි.[21] ළඟ සිටින ජනයෙනි, මම
ඔබටත් මගේ බලය පෙන්වන්නෙමි.[22]
**14** සියොන්හි වෙසෙන පව්කාරයෝ
තැතිගෙන සිටිති.[23] දෙවිව අත්හැර
ගිය ද්‍රෝහියෝ භයෙන් වෙවුලමින්[24]

**11** යෙසා 24:1; යෙසා 24:4; **12** යෙසා 37:24; **13** යෙසා 35:2; **14** නාහු 1:4; **15** ගීතා 12:5; **16** ගීතා 46:10; **17** ගීතා 7:6; **18** ගීතා 7:14; යෙසා 17:13; මලා 4:1; **19** යෙසා 5:24; නාහු 1:10; **20** 2සාමු 23:7; යෙසා 9:18; **21** ගීතා 46:6; ගීතා 98:2; **22** ගීතා 99:2; **23** ද්වි 28:66; ද්වි 28:67; ගීතා 53:5; **24** යෙසා 9:17; යෙසා 10:6; යෙසා 32:6.

**යෙසා 33:6*** මූ.අ., “ඔහුගේ කාලයේදී.”

**32 පරි.**

**1** ගීතා 72:3
ගීතා 119:165
යෙසා 55:12
රෝම 14:17
**2** එස 37:26
මීකා 4:3
**3** යෙසා 60:18
යෙසා 65:22
යෙරෙ 23:6
එස 34:25
හොෂෙ 2:18
**4** යෙසා 26:5
එස 13:11
**5** දේශ 11:1
යෙසා 30:23
**6** යෙසා 30:24

**33 පරි.**

**7** 2රාජා 18:13
2ලේක 28:21
යෙසා 10:5
**8** නාහු 3:7
**9** යෙසා 10:12
මතෙ 7:2
**10** ගීතා 25:3
ගීතා 27:14
යෙසා 25:9
**11** ගීතා 123:2
**12** ගීතා 143:8
විලා 3:23
**13** ගීතා 44:3
ගීතා 89:10
යෙසා 52:10
**14** ගීතා 37:39
ගීතා 46:1
නාහු 1:7
**15** ගීතා 46:6
ගීතා 68:1
යෙසා 17:13
**16** ගීතා 110:6
**17** යෝවෙ 2:9
යෝවෙ 2:25
**18** 2රාජා 7:16
2ලේක 14:13
2ලේක 20:25
**19** ගීතා 113:5
ගීතා 123:1
යෙසා 66:1
**20** ගීතා 97:9
දානි 4:37

**2 තීරුව**

**1** යෙසා 62:1
**2** ගීතා 27:1
ගීතා 28:8
ගීතා 140:7
**3** දේශ 7:12
**4** යෝබ් 28:28
හිතෝ 19:23
**5** යොෂු 9:6
ලූක් 14:32
**6** විනි 5:6
**7** විලා 1:4
**8** 2රාජා 18:14
**9** 2රාජා 18:20
ගීතා 10:5
**10** 2රාජා 18:13
යෙසා 36:1

මෙසේ කියති. 'දැවෙන ගින්නක්
ළඟින් සිටිය හැක්කේ කාටද?[1] බුර-
බුරා නඟින ගිනිදලු ළඟ බො-
හෝ වේලා නැවතී සිටිය හැක්කේ
කාටද?'[2]

15 "නිරතුරුවම ධර්මිෂ්ඨ මඟෙහි
ගමන් කරන තැනැත්තෙක් සිටියි.[3]
ඔහුගේ මුවින් පිට වන්නේ අවංක
වචනය.[4] ඔහු වංචාවෙන් ලාභ ඉප-
යීම හෙළාදකියි.[5] අල්ලස් ගැනීමේ
සිතුවිල්ලක්වත් ඔහුගේ සිතට පහළ
නොවෙයි.[6] ඔහු දුෂ්ට දේ දෙස බලන්-
නවත්[7] මිනී මැරීමක් ගැන අසන්න-
වත් කැමති නැත. 16 ඔහු වාසය
කරන්නේ උස් කන්දක් මතය.[8] ඔහු
කිසිවෙකුට ළඟා විය නොහැකි සුරක්-
ෂිත පර්වතයක් මත වසන්නේය.[9]
ඔහු කිසිදා කුසගින්නෙන්වත්[10] පිපාස-
යෙන්වත් සිටින්නේ නැත."[11]

17 තේජශ්‍රීයෙන් පාලනය කරන
රජෙකුව ඔබ දකින්නහුය.[12] දුර
ඈත පිහිටි දේශයක්ද ඔබේ නෙත
ගැටෙයි.[13] 18 එවිට ඔබ භීතියෙන්
කල් ගෙවූ කාලය ගැන මතක් කරග-
නිමින්,[14] "ලේකම් කෝ? කප්-
පම් ගෙවන තැනැත්තාට සිදු වුණේ
කුමක්ද?[15] මුරකොටු භාරව සිටින
තැනැත්තා කෝ"[16] යයි සිතන්නහුය.
19 ගොතගසමින් නොතේරෙන
භාෂාවක් කතා කරන[17] ඒ අහංකාර
සෙනඟව ඔබ යළි දකින්නේ නැත.
20 අප ප්‍රීති ප්‍රමෝදයෙන් උත්සව
පැවැත්වූ නුවර[18] වන සියොන්[19] දෙස
බලන්න! යෙරුසලම සුවසේ වාසය
කළ හැකි ස්ථානයක් බව ඔබට
පෙනෙයි. එය කිසිවෙකුට අකුළා
දැමිය නොහැකි කූඩාරමකි.[20] එහි
කූඤ්ඤ ගලවා දමන්නවත් එහි ලණු
කඩන්නවත් කිසිවෙකුට නොහැ-
කිය.[21] 21 උදාර තැනැත්තාණන්[22]
වන යෙහෝවා දෙවි ඒ ස්ථානයේ සිට
ගංගාවක්[23] මෙන්ද මහ ඇළක් මෙන්ද
අප වට කර ආරක්ෂාව දෙන්නේය.
එහි සතුරු නැව්වලටවත් ඔරුවකට-
වත් යාත්‍රා කළ නොහැක. 22 මන්ද
යෙහෝවා දෙවි අපගේ විනිශ්චයක-
රුය.[1] යෙහෝවා දෙවි අපේ නීති-
දායකයාය.[2] අපේ රජුද යෙහෝවා
දෙවිය.[3] ඔහු ස්ථිර වශයෙන්ම අපව
ගලවාගන්නේය.[4]

23 සතුරාගේ නැවෙහි රුවල දිග-
හැර නැත. එහි ලණු බුරුල් වී එල්ලෙ-
මින් තිබේ. එහි කුඹගස ඒ මේ අත
සෙලවෙයි.

ඒ කාලයේදී, සතුරාගෙන් බොහෝ
දේ කොල්ල කා එකිනෙකා අතරේ
බෙදාගනු ඇත. කොර අය පවා එතැ-
නට ගොස් ඇති තරම් වස්තු පැහැර-
ගනිති.[5] 24 දේශයේ වාසය කරන
සියල්ලන්ගේ වරදට සමාව දෙනු
ලබයි.[6] කිසිවෙකුවත්, "මා ලෙඩින්"[7]
යයි පවසන්නේ නැත.

# 34
විවිධ ජාතීන්ට අයත් සෙ-
නඟෙනි,[8] මා ළඟට එන්න.
ජනයෙනි, මා පවසන දේට හොඳින්
අවධානය යොමු කරන්න.[9] පො-
ළොවත් එහි සියලු වැසියනුත්[10] මේ
දේ සිතට ගත යුතුයි.[11] 2 සියලු
ජාතීන්ට විරුද්ධව යෙහෝවා දෙවි-
ගේ උදහස ඇවිළී ඇත.[12] ඔවුන්ගේ
සියලු සේනාවන් පිටට ඔහු තම කෝ-
පය පිට කරන්නේය.[13] ඔවුන් සියල්-
ලෝම විනාශ කිරීමට නියම කර
ඇත. ඔවුහු සියල්ලෝම ඔහුගේ අතින්
මැරුම් කන්නෝය.[14] 3 ඔවුන්ගේ
මළ කඳන් පිටතට විසි කර දමනු
ඇත. කුණු වී යන මළ කඳන්වල දුගඳ
දසත පැතිර යයි.[15] ඔවුන්ගේ ලෙයින්
නැහැවුණු කඳු දිය වී යයි.[16] 4 මුළු
අහස් සේනාවම පහව යනු ඇත.[17]
අහස ලියවිල්ලක් මෙන් අකුළා දමන්-
නේය.[18] මිදිවැලක කොළ හැකිළී
යන්නාක් මෙන්ද අත්තික්කා ගෙ-
ඩියක් කුණු වී බිමට වැටෙන්නාක්
මෙන්ද[19] මුළු අහස් සේනාවම වැටී
යන්නෝය.

**33 පරි.**
1 ද්වි 32:22
ගීතා 21:9
නාහු 1:6
හෙබ්‍රෙ 12:29
2 යෙසා 66:24
3 ගීතා 106:3
එස 18:17
මලා 2:6
4 1ලේක 29:17
5 නික් 23:8
6 ද්වි 16:19
1සාමු 12:3
7 ගීතා 119:37
8 ගීතා 15:1
හිතෝ 1:33
9 ගීතා 18:33
10 ගීතා 34:10
ගීතා 37:25
ගීතා 111:5
ලූක් 12:31
11 යෙසා 65:13
12 ගීතා 45:2
13 හෙබ්‍රෙ 11:13
14 ගීතා 71:24
15 2රාජා 15:19
16 2ලේක 26:9
17 ද්වි 28:49
2රාජා 18:26
යෙසා 28:11
යෙරෙ 5:15
18 ද්වි 12:5
ගීතා 78:68
19 ගීතා 132:13
20 ගීතා 46:5
ගීතා 125:1
21 යෙසා 54:2
යෙරෙ 10:20
22 ගීතා 8:9
ගීතා 93:4
ලූක් 9:43
හෙබ්‍රෙ 8:1
23 ගීතා 46:4

**2 තීරුව**
1 උත් 18:25
ගීතා 50:6
ගීතා 75:7
ගීතා 98:9
2 ලෙවී 26:3
ද්වි 28:15
ගීතා 119:16
යාකො 4:12
3 ගීතා 44:4
ගීතා 74:12
ගීතා 97:1
එළි 11:17
එළි 19:6
4 යෙසා 12:2
ශෙප 3:17
5 2රාජා 7:8
යෙසා 33:4
6 යෙරෙ 50:20
මීකා 7:18
රෝම 4:8
7 ද්වි 7:15
එළි 21:4
එළි 22:2

---

**34 පරි.** **8** යෙසා 49:1; **9** ගීතා 49:1; ගීතා 50:1; **10** ගීතා 24:1; 1කොරි 10:26; **11** ද්වි 32:1; යෙරෙ 22:29; **12** යෙරෙ 25:15; යෝවෙ 3:12; ශෙප 3:8; සෙක 14:3; රෝම 1:18; **13** යෙසා 30:27; නාහු 1:2; **14** එළි 14:15; එළි 19:15; **15** යෙරෙ 16:4; යෙරෙ 25:33; එස 32:5; යෝවෙ 2:20; **16** එස 39:4; එළි 14:20; **17** යෙසා 13:10; ඔබ 4; ඔබ 8; **18** යෙසා 51:6; **19** යෙරෙ 8:13.

5 “ඉහළ අහසේ තිබෙන මාගේ
කඩුව[1] දෙස බලන්න! මාගේ
කඩුවෙන් ඒදොම්වරුන්ව මුළුමනින්ම
විනාශ කර දැමීමට[2] මම යුක්ති-
සහගත ලෙස තීන්දු කළෙමි.[3] ඒ
නිසා, මාගේ කඩුව ඒදොම්වරුන්ගේ
ලෙයින් නැහැවී යන්නේය. 6 යෙ-
හෝවා දෙවි වන මා එල්ල කරන
ඒ කඩුව බැටළු පැටවුන්ගේද එළු-
වන්ගේද ලෙයින් තෙමී යනු ඇත.[4]
බැටළුවන්ගේ වකුගඩු පසාරු කරගෙන
යන මාගේ කඩුව පුරාම තෙල්[5] තැවරී
තිබෙයි. මන්ද යෙහෝවා දෙවි වන
මම බොෂ්රා නුවරෙහි පූජාවක් ඔප්පු
කරන්නෙමි. ඒදොම්හි[6] මහත් ඝාතන-
යක් සිදු කරන්නෙමි. 7 මම කුළු
හරකුන්වද[7] ඝාතනය කිරීමට ගෙන
යන්නෙමි. වස්සන්ද ශක්තිමත් හර-
කුන්ද[8] යන ඒ සියල්ලෝම එකට
විනාශ වී යන්නෝය. උන්ගේ තෙ-
ලින්[9] පොළොව පෙඟී යන්නේය. දේ-
ශය ලේ විලක් බවට පත් වන්නේය.”

8 සියොන්හි වැසියන්ට සිදු කළ
අසාධාරණය වෙනුවෙන් නිසි පියවර
ගැනීමට යෙහෝවා දෙවි දවසක් වෙන්
කර තිබේ.[10] ඔවුන්ගේ සතුරන්ට දඬු-
වම් කිරීමට ඔහු අවුරුද්දක් නියම කර
ඇත.[11]

9 එහි* ගංගා තාර බවටද භූමිය
ගෙන්දගම් බවටද පත් වෙයි. මුළු
දේශයම ගිනිවිලක් මෙන් පෙනෙයි.[12]
10 ගින්න නොනිවෙයි. දුම්වලා සදහ-
ටම ඉහළට නඟියි.[13] දේශය කිසිවෙකු
නොගැවසෙන වියළී ගිය කාන්තාර-
යක් බවට පත් වන්නේය.[14] එය සද-
හටම ඒ තත්වයේ පවතින්නේය.[15]
11 දේශය පැස්තුඩුවන්ටද ඉත්තෑ-
වන්ටද නිවහනක් වනු ඇත. බක-
මූණන්ද කපුටන්ද එහි කූඩු තනනු
ඇත.[16] දෙවි මනින ලණුවෙන්ද[17]
ලඹයෙන්ද දේශය මැන බලා එය
හිස්කමට අත්හරින්නේය. 12 දේ-
ශයේ උත්තමයෙකුවත් පාලකයෙ-

යෙසා **34:9*** එනම්, ඒදොම්හි අගනුවර වන බොෂ්රා නගරය.

**34 පරි.**
1 ද්වි 32:41, ගීතා 17:13, යෙරෙ 46:10, එස 21:3, ශෙප 2:12
2 ගීතා 137:7, යෙරෙ 49:7, යෙරෙ 49:22
3 ද්වි 7:10
4 යෙසා 63:3
5 ලෙවී 3:16
6 යෙසා 63:1, ඔබ 8
7 ගණන් 23:22, ද්වි 33:17, යෝබ් 39:9, ගීතා 92:10
8 ගීතා 68:30
9 යෙරෙ 46:21
10 ද්වි 32:35, ද්වි 32:41, ගීතා 94:1, රෝම 12:19
11 යෙසා 35:4, 2තෙස 1:6
12 ගීතා 11:6, ලූක් 17:29
13 යෙරෙ 7:20, එස 20:47, එළි 19:3
14 යෙසා 13:20
15 එස 29:11, මලා 1:4
16 යෙසා 13:21, යෙසා 14:23, ශෙප 2:14
17 2සාමු 8:2, 2රාජා 21:13, යෙසා 28:13, විලා 2:8

**2 තීරුව**
1 යෙසා 40:23
2 යෙසා 32:13, හොෂෙ 9:6, ශෙප 2:9
3 යෙසා 13:21, මලා 1:3
4 ලෙවී 17:7, 2ලේක 11:15
5 එළි 18:2
6 ද්වි 14:13
7 යෙසා 55:11, ආමො 3:7
8 යෙසා 34:11
9 ගීතා 33:9
10 උත් 6:19
11 ගීතා 78:55, ක්‍රියා 17:26

**35 පරි.**
12 යෙසා 29:17, යෙසා 32:15, යෙසා 35:6, යෙසා 51:3, එස 36:35

කුවත් ඉතුරු නොවෙයි. ඒ නිසා රජ
කිරුළ පළඳවන්න කිසිවෙක් නො-
සිටියි.[1] 13 එහි මාලිගා වැසී යන
තරමටම කටු පඳුරු හටගනියි. බල-
කොටුවල පවා වල් පැළෑටිද කටු
ගස්ද බිහි වෙයි.[2] එය හිවලුන්ගේද
පැස්බරුන්ගේද වාසස්ථානයක් බවට
පත් වෙයි.[3] 14 කාන්තාරවල ගැව-
සෙන සතුන්ද හිවලුන්ද භූතයන්ද*[4]
යන සියල්ලෝම එහි සැරිසරන්-
නෝය. නිශාචර පක්ෂීහුද කිසි
භයක් නොමැතිව එහි ලගින්නෝය.[5]
15 එහි බෙන සාදා බිත්තර දමන
සැපින්නද* ඇගේ පැටවුන්ව වෙ-
ළාගනිමින් උන්ව රැකබලා ගන්-
නීය. උකුස්සෝ[6] උන්ගේ සහකාරියන්
සමඟ එකතු වී එහි ලගින්නෝය.

16 යෙහෝවා දෙවිගේ ලියවිල්-
ලෙහි ඒ ගැන සඳහන් වන්නේ නැද්ද
කියා සොයා බලන්න.[7] එහි සඳ-
හන් දේ ශබ්ද නඟා කියවන්න. ඒ
එක් සතෙක්වත් නැති වී යන්නේ
නැත.[8] උන් සියල්ලන්ටම සහකාරි-
යක බැගින් සිටිනු ඇත. මන්ද එසේ
සිදු වීමට නියම කර තිබෙන්නේ යෙ-
හෝවා දෙවිය.[9] ඔහු තම බලය යොදා
උන්ව එක තැනකට රැස් කරන්-
නේය.[10] 17 දේශය මැන උන්ට
කොටසක් වෙන් කර දුන්නේ ඔහුය.[11]
ඒ නිසා, උන් සදහටම ඒ දේශය උන්-
ගේ වාසභූමිය කරගන්නෝය.

**35** වැලි කතරද වියළි දේ-
ශයද සතුටෙන් පිනා යන්-
නේය.[12] පාළුකරය කෙතේ මලක්*
මෙන් පිබිදී ප්‍රීතියෙන් ඉපිල යන්-
නෝය.[13] 2 දේශය පුරාම මල් හටග-
නියි.[14] ප්‍රීති ඝෝෂා හා සතුටු ගී නද
රැව් පිළිරැව් දෙයි.[15] මුළු දේශයම ලෙ-
බනොන් දේශය මෙන් සශ්‍රීක වන්-

**13** යෙසා 4:2; යෙසා 27:6; යෙසා 55:12; **14** හොෂෙ 14:5; **15** සෙක 10:7.

යෙසා **34:14*** යෙසා 13:21හි පාදසටහන බලන්න. **15*** මූ.අ., “ඊතල සර්පයා.” **35:1*** මුල් භාෂාවේ කතා කරන්නේ කුංකුම (සැෆ්රන්) පුෂ්පය ගැනය.

නේය.[1] එහි සුන්දරත්වය කර්මෙල්[2]
කන්ද මෙන්ද ෂාරොන් තැනිතලාව[3]
මෙන්ද වන්නේය. එහි වැසියෝ යෙ-
හෝවා දෙවිගේ තේජස දකින්නෝය.[4]
අපේ දෙවිගේ අලංකාරය සියලුදෙනාම
දැකගනු ඇත.[5]
**3** ජනයෙනි, දුර්වල වූ දෑත්ද වෙවු-
ලන පාදද සවිමත් කරන්න.[6]
**4** කනස්සල්ලෙන්[7] සිටින අයව දිරි-
මත් කරමින් මෙසේ කියන්න. "භය
නොවන්න.[8] ධෛර්යවත් වන්න![9]
මන්ද ඔබේ දෙවි පැමිණ ඔබට පීඩා
කරන අයට නිසි දඬුවම් දී[10] ඔබව
ගලවාගන්නේය."[11]
**5** ඒ කාලයේදී අන්ධ අයගේ
ඇස් පැහැදෙන්නේය.[12] බිහිරි අය-
ගේ කන් ඇරෙන්නේය.[13] **6** කොර
අය මුවෙකු මෙන් පැන යන්නෝය.[14]
ගොළු අය ප්‍රීතියෙන් ගී ගයන්නෝය.[15]
මන්ද කාන්තාරයේ දිය උල්පත් බිඳී
යයි. පාළුකරයේ ඇළදොළ, ගංගා
ගලා බසියි. **7** වියළි දේශය දිය
පොකුණක් මෙන් වන්නේය. ඉරි තැළී
ගිය භූමියෙන් පවා දිය උනන්නේය.[16]
හිවලුන් ලැග සිටි ස්ථානය[17] නිල්
තණබිමක් බවට පත් වෙයි. එහි බට
ගස්ද පැපිරස්[18] ගස්ද වැඩෙයි.
**8** ඒ දේශයෙහි මාර්ගයක්[19] ඉදි
කරනු ලබයි. එය ශුද්ධ මඟ ලෙස
හඳුන්වනු ඇත.[20] අපවිත්‍ර වූ කිසි-
වෙක් එහි ගමන් නොකරයි. අඥා-
නයා ඒ මාර්ගයේ ගමන් කරන්නේ
නැත.[21] එහි ගමන් කරන්නේ අවසර
ලැබූ අය පමණි. **9** එහි සිංහයන්-
වද දරුණු වනසතුන්වද හමු වන්නේ
නැත.[22] එහි ගමන් කරන්නේ මුද-
වාගනු ලැබූ අය පමණි.[23] **10** යෙ-
හෝවා දෙවි ගලවාගත් අය ඉමහත්
ප්‍රීතියෙන්[24] නැවත සියොන් වෙතට
පැමිණෙන්නෝය.[25] යළි කෙදිනක-
වත් ඔවුන්ට දුකක්වත් ශෝකයක්වත්
දැනෙන්නේ නැත.[26] ඔවුන්ගේ සතුට
සදහටම පවතින්නේය.[27]

**36** හෙසකියා රජුගේ පාලන සම-
යේ දහහතරවන අවුරුද්දේදී
ඇසිරියාවේ රජු වූ[28] සෙනකෙරිබ්,[29]
යූදා දේශයේ පවුරුවලින් වට වී
තිබෙන සුරක්ෂිත නුවරවලට විරුද්-
ධව යුද්ධ කර ඒවා යටත් කරගත්-
තේය.[1] **2** පසුව ඇසිරියාවේ රජ,
රබ්ෂාකේව*[2] මහත් හමුදාවක් සමඟ
යෙරුසලමේ[3] විසූ හෙසකියා රජු
වෙත යැව්වේය. රබ්ෂාකේ ලාකිෂ්[4]
නගරයේ සිට යෙරුසලමට පැමිණ,
රෙදි සෝදන්නන්ගේ පිට්ටනියට[5] යන
මාර්ගයෙහි පිහිටි ඉහළ පොකුණේ[6]
දිය අගල[7] ළඟ නැවතුණේය. **3** ඔහු
පැමිණ සිටි බව දැනගත් විට, රජමා-
ළිගාවේ වැඩකටයුතු භාරව සිටි හිල්-
කියාගේ පුත් එලියාකීම්ද[8] ලේකම් වූ
ෂෙබ්නාද[9] වාර්තාකරු[10] වූ ආසාෆ්-
ගේ[11] පුත් යෝවාද[12] ඔහුව හමු වීමට
පැමිණියෝය.
**4** එවිට රබ්ෂාකේ ඔවුන්ට මෙසේ
කීවේය. "ඇසිරියාවේ රජු[13] වන මහ
රජ්ජුරුවෝ[14] හෙසකියාට එවූ මේ
පණිවිඩය ගොස් ඔහුට කියන්න.
'ඔබ දැන් විශ්වාසය තබාගෙන
ඉන්නේ කවුරුන් මතද?[15] **5** යුද්-
ධය මෙහෙයවීමට අවශ්‍ය උපදේශ-
කයන් සිටින බව හා හමුදා
බලය[16] ඔබට තිබෙන බව ඔබ පැව-
සුවත් ඒවා නිකම්ම නිකම් වචන
විතරයි. ඔබ මට විරුද්ධව කැර-
ළිගසන්න තරම් ධෛර්යයක් උප-
දවාගත්තේ කාගේ ශක්තියෙන්ද?[17]
**6** තැළුණු බට දණ්ඩක් වගේ ඉන්න
ඊජිප්තුවෙන්ද[18] ඔබ පිහිට පතන්-
නේ?[19] තැළුණු බට දණ්ඩක් ඇල්-
ලුවොත් සිදු වන්නේ තමාගේම අත
තුවාල වෙන එක විතරයි. ඊජිප්තුවේ
රජු වන පාරාවෝ[20] කෙරෙහි විශ්වාසය
තැබූ හැමෝටම වෙලා තියෙන්නෙත්

**35 පරි.**
**1** ගීතා 72:16 යෙසා 60:13 යෙසා 61:3 හොෂෙ 14:6
**2** යෙරෙ 50:19
**3** යෙසා 65:10
**4** නික් 33:18 ගීතා 97:6 යෙසා 12:4
**5** 1ලේක 16:27 ගීතා 29:4 ගීතා 104:1 ගීතා 145:5
**6** යෝබ් 4:4 ලූක් 22:32 හෙබ්‍රෙ 12:12
**7** හිතෝ 12:25
**8** ගීතා 56:3 ශෙප 3:16 මතෙ 10:28 හෙබ්‍රෙ 10:38
**9** දානි 10:19 හග් 2:4 එෆී 6:10
**10** ද්වි 32:35 යෙරෙ 51:56 රෝම 12:19 2තෙස 1:6 එළි 6:10
**11** යෙසා 25:9 හොෂෙ 1:7 මතෙ 1:21
**12** ගීතා 146:8 යෙසා 42:16 මතෙ 9:30
**13** යෙසා 29:18 යෙරෙ 6:10 මාක් 7:35 ලූක් 7:22
**14** මතෙ 11:5 මතෙ 21:14 ක්‍රියා 8:7 ක්‍රියා 14:10
**15** මතෙ 15:30
**16** යෙසා 44:3 යොහ 4:14
**17** යෙසා 34:13 යෙරෙ 9:11
**18** යෙසා 18:2
**19** යෙසා 11:16 යෙසා 49:11 යෙසා 62:10 යෙරෙ 31:21
**20** එස්රා 1:3
**21** යෙසා 52:1
**22** ලෙවී 26:6 යෙසා 11:6 යෙසා 65:25 එස 34:25 හොෂෙ 2:18
**23** ගීතා 107:2 යෙසා 62:12 ගලා 3:13 තීත 2:14 1පේතෘ 1:18
**24** යෙරෙ 31:12
**25** ද්වි 30:4 යෙසා 51:11 මතෙ 20:28 1තිමෝ 2:6
**26** යෙරෙ 33:11
**27** යෙසා 30:19 යෙසා 65:19

**36 පරි.** **28** යෙසා 8:7; යෙසා 10:5; **29** 2ලේක 32:1; **2 තීරුව** **1** 2රාජා 18:13; යෙසා 10:28; යෙසා 33:8; **2** 2රාජා 18:17; **3** 2ලේක 32:9; **4** 2රාජා 19:8; **5** යෙසා 7:3; **6** යෙසා 22:9; **7** 2රාජා 20:20; **8** යෙසා 22:20; **9** 2රාජා 19:2; **10** 2රාජා 18:37; **11** 2රාජා 18:18; **12** 2රාජා 18:26; **13** 2රාජා 18:19; **14** යෙසා 10:8; **15** 2රාජා 19:10; ගීතා 4:2; යෙසා 37:10; **16** 2රාජා 18:20; **17** 2රාජා 18:7; **18** 2රාජා 17:4; යෙසා 30:2; යෙසා 31:1; **19** එස 29:6; **20** එස 29:7.

**යෙසා 36:2*** හෝ, "කුසලාන දරන්නන්ගේ ප්‍රධානියා."

ඒ දේමයි.[1] **7** එහෙමත් නැත්නම් ඔබ
මට කියන්න හදන්නේ ඔබේ දෙවි
වන යෙහෝවා මත ඔබ විශ්වාසය
තබනවා කියාද? ඒ දෙවියන්ගේ ශුද්-
ධස්ථාන[2] හා පූජාසන නෙවෙයිද හෙස-
කියා කඩා දැමුවේ?[3] ඔහු ඒවා කඩා
දමා, “යෙරුසලමේ තිබෙන පූජාසනය
ඉදිරියේ නමස්කාර කරන්න”[4] කියා
යූදා සහ යෙරුසලමේ වැසියන්ට පැව-
සුවේ නැද්ද? **8** “මගේ ස්වාමීන් වන
ඇසිරියාවේ රජු[5] ඔබට දැන් අශ්ව-
යන් දෙදහක් දුන්නොත් අඩුම තරමින්
ඒ අශ්වයන් ගණනට අසරුවන් සොය-
යාගන්නවත්[6] ඔබට පුළුවන් වෙයිද?[7]
**9** ඊජිප්තුවෙන් අශ්ව රථ සහ අසරු-
වන් ලැබෙයි කියා බලාපොරොත්තු-
වෙන් ඉන්න ඔබට,[8] මගේ ස්වාමියාට
සේවය කරන සුළුම නිලධාරියෙ-
කුටවත් පහර දෙන්න පුළුවන්ද?”[9]
**10** මම මේ නගරය විනාශ කරන්න
ආවේ යෙහෝවා දෙවිගේ අනුමැතිය
නැතුව කියාද ඔබ සිතන්නේ? “ඒ දේ-
ශයට විරුද්ධව යුද්ධ කර එය විනාශ
කරන්න”[10] කියා මට කිව්වේ යෙ-
හෝවා දෙවිමයි.’ ”[11]

**11** එවිට එලියාකීම්ද[12] ෂෙබ්-
නාද[13] යෝවාද[14] රබ්ෂාකේට[15] මෙසේ
කීවෝය. “ඔබේ සේවකයන් වන
අපට සිරියානු භාෂාව[16] තේරෙනවා.
ඒ නිසා අපට සිරියානු භාෂාවෙන්
කතා කරන්න. යුදෙව් භාෂාවෙන්[17]
කතා කළොත් පවුර උඩ සිටින
අයටත් ඔබ කියන දේ තේරෙයි.”[18]
**12** එහෙත් රබ්ෂාකේ ඔවුන්ට මෙසේ
කීවේය. “මගේ ස්වාමියා මාව එව්වේ
ඔබට හා ඔබේ ස්වාමියාට පමණක්
මේ පණිවිඩය දෙන්න නෙවෙයි. පවු-
රේ ඉන්න අයත් මේ පණිවිඩය ඇසිය
යුතුයි. මන්ද තව කෙටි කාලයකින්
ඒ සියලුදෙනාටම ඔවුන්ගේම අසූචි
කන්නත් ඔවුන්ගේම මුත්‍රා බොන්නත්
සිදු වෙනවා. ඔබට සිදු වෙන්නෙත් ඒ
දේමයි.”[19]

**13** එසේ පැවසූ රබ්ෂාකේ,[20] තවදු-
රටත් යුදෙව් භාෂාවෙන්ම හඬ නඟා
මෙසේ කීවේය.[21] “ඇසිරියාවේ රජු
වන මහ රජ්ජුරුවන්ගේ පණිවිඩ-
යට ඇහුම්කන් දෙන්න.[1] **14** ‘ජන-
යෙනි, හෙසකියා කියන දේට ඔබ
රැවටෙන්න එපා.[2] ඔබව ගලවාගන්න
ඔහුට බැහැ.[3] **15** හෙසකියා ඔබට
මෙහෙම කියයි. “යෙහෝවා දෙවි
අපව ගලවන බවට කිසිම සැකයක්
නැහැ.[4] මේ නගරය ඇසිරියාවේ රජු-
ගේ අතට පත් වෙන්න දෙවි කිසි-
දාක ඉඩ දෙන්නේ නැහැ.”[5] එහෙම
කියා යෙහෝවා දෙවි කෙරෙහි ඔබ
තුළ විශ්වාසයක් ඇති කරන්න ඔහු
උත්සාහ දරයි. එහෙත් ඔහුව විශ්-
වාස කරන්න එපා.[6] **16** ඔහු කියන
දේට ඇහුම්කන් දෙන්න එපා. ඇසිරි-
යාවේ රජුට ඇහුම්කන් දෙන්න. ඔහු
පැවසුවේ මෙයයි. “දැන් මා ඉදිරි-
යට ඇවිත් මට යටත් වෙන්න.[7]
එවිට ඔබේම මිදිවැලේ හා අත්-
තික්කා ගසේ පල කන්න ඔබට
පුළුවන් වෙයි.[8] ඔබේම පොකුණෙන්
වතුර බොන්නත් පුළුවන්.[9] **17** මම
ඔබේ දේශය හා සමාන හොඳ දේශය-
කට ඔබව ගෙන යන්නම්.[10] ධාන්‍ය-
යෙන් සහ අලුත් වයින්වලින්ද රොටි
සහ මිදිවතුවලින්ද පිරුණු දේශයක
ඔබට ජීවත් වෙන්න පුළුවන් වෙයි.
**18** ‘යෙහෝවා දෙවි අපිව ගලවාග-
නියි’ කියා හෙසකියා ඔබට පැවසුවත්
ඔහුට රැවටෙන්න එපා.[11] ඇසිරියාවේ
රජු වන මම යටත් කරගත් දේශවල
වැසියන් නමස්කාර කළ එක දෙවි-
යෙකුටවත් පුළුවන් වුණාද තමාගේ
දේශය ගලවාගන්න?[12] **19** හමාත්[13]
සහ අර්පාද්[14] නගරවල දෙවිවරුන්ට
මොනවද වුණේ? සෙෆාවායිම්[15] නග-
රයේ දෙවිවරුන්ට මොනවද වුණේ?
මගේ අතින් සමාරිය ගලවාගන්න
ඔවුන්ට පුළුවන් වුණාද?[16] **20** මම
යටත් කරගත් දේශවල සිටි එක දෙවි-
යෙකුටවත් තමන්ගේ දේශය බේරා-
ගන්න බැරි වුණා නම්[17] යෙහෝවා
දෙවිට පුළුවන් වෙයිද මගේ අතින් යෙ-
රුසලම ගලවාගන්න?” ’ ”[18]

**36 පරි.**
**1** 2රාජා 18:21; යෙසා 30:7; යෙරෙ 37:7
**2** 2රාජා 18:4; 2ලේක 31:1
**3** 2රාජා 18:22; 2ලේක 32:12
**4** ද්වි 12:11; 2ලේක 7:12; 2ලේක 32:12
**5** 2රාජා 18:13
**6** ගීතා 123:4; යෙසා 10:13
**7** 2රාජා 18:23
**8** ද්වි 17:16; හිතෝ 21:31; යෙසා 31:1
**9** 2රාජා 18:24; යෙසා 10:8
**10** 2රාජා 18:25
**11** 2රාජා 19:6; 2රාජා 19:22
**12** 2රාජා 18:18
**13** යෙසා 22:15
**14** 2රාජා 18:26
**15** 2රාජා 18:17
**16** එස්රා 4:7; දානි 2:4
**17** නෙහෙ 13:24
**18** 2රාජා 18:26
**19** 2රාජා 18:27
**20** 1සාමු 17:8
**21** 2ලේක 32:18

**2 තීරුව**
**1** 2රාජා 18:28
**2** 2ලේක 32:11; යෙසා 37:10
**3** 2රාජා 18:29; 2ලේක 32:15; දානි 3:15; දානි 6:20
**4** ගීතා 71:12; ගීතා 125:1
**5** 2රාජා 18:30
**6** 2රාජා 19:10; 2රාජා 19:22; ගීතා 11:1; ගීතා 22:8
**7** 2රාජා 18:31
**8** 1රාජා 4:20; මීකා 4:4; සෙක 3:10
**9** 2රාජා 18:31
**10** 2රාජා 17:6; 2රාජා 17:23
**11** 2රාජා 18:32
**12** 2රාජා 19:12; 2ලේක 32:14; යෙසා 10:11; යෙසා 37:12
**13** 2සාමු 8:9; 2රාජා 19:13
**14** යෙරෙ 49:23
**15** 2රාජා 17:24
**16** 2රාජා 17:6; 2රාජා 17:23; 2රාජා 18:34; යෙසා 10:11

---

**17** 2රාජා 18:35; 2රාජා 19:17; **18** 2ලේක 32:15; ගීතා 2:2; යෙසා 37:23; දානි 3:15.

**21** එහෙත් ජනයා ඔහුට පිළිතුරු
නොදී නිශ්ශබ්දව සිටියෝය.[1] මන්ද,
“ඔහුට පිළිතුරු දෙන්න එපා”[2] කියා
රජතුමා ඔවුන්ට අණ කර තිබිණ.
**22** පසුව, රජමාලිගාව භාරව සිටි[3]
හිල්කියාගේ පුත් එලියාකීම්ද[4] ලේකම්
වූ ෂෙබ්නාද[5] වාර්තාකරු වූ ආසාෆ්ගේ
පුත් යෝවාද[6] තම වස්ත්‍ර ඉරාගෙන[7]
හෙසකියා ළඟට ඇවිත් රබ්ෂාකේ[8]
පැවසූ දේ ඔහුට දැන්වූහ.

**37** එය ඇසූ විගස හෙසකියා රජ
තම වස්ත්‍ර ඉරා ගෝණි රෙදි
ඇඳගෙන[9] යෙහෝවා දෙවිගේ ගෘහ-
යට[10] ගියේය. **2** ඔහු රජමාලිගාවේ
වැඩකටයුතු භාරව සිටි එලියාකීම්-
ටද[11] ලේකම් වූ ෂෙබ්නාටද[12] පූජ-
කයන්ගේ ප්‍රධානීන්ටද[13] කතා කර
ගෝණි රෙදි ඇඳ, ආමොෂ්ගේ
පුත් අනාගතවක්තෘ[14] යෙසායා[15] වෙ-
නට යන ලෙස පැවසුවේය. **3** ඔවුහු
ගොස් යෙසායාව හමු වී මෙසේ
කීවෝය. “හෙසකියා රජු මෙසේ පැව-
සුවා. ‘අද ඉතා දුක්බර දවසක්.[16] අපි
දැඩි විවේචනයටත් බොහෝ නින්දා
අපහාසවලටත් ලක් වුණා.[17] අපි, දරු-
වෙක් බිහි කරන්න ළංව සිටියත්
දරුවාව බිහි කරන්න තරම් ශක්ති-
යක් නැති ස්ත්‍රියක් හා සමානයි.[18]
**4** රබ්ෂාකේගේ[19] ස්වාමියා වන ඇසිරි-
යාවේ රජු ඔහුව එව්වේ ජීවමාන දෙවිට
සරදම්[20] කරන්නයි. සමහරවිට යෙ-
හෝවා දෙවි රබ්ෂාකේ පැවසූ දේවල්
සැලකිල්ලට ගෙන ඔහුට නිසි දඬු-
වම් දෙයි.[21] ඔහු පැවසූ දේවල් ගැන
අනිවාර්යයෙන්ම යෙහෝවා දෙවිට
ගණන් දෙන්න ඔහුට සිදු වෙයි. නමුත්
දැන් මා ඔබෙන් ඉල්ලා සිටින්නේ
ඉතුරුව සිටින මේ සෙනඟ වෙනු-
වෙන්[22] යාච්ඤා කරන්න[23] කියායි.’”

**5** හෙසකියා රජුගේ සේවකයෝ
යෙසායාට මෙම පණිවිඩය දුන් පසු[24]
**6** යෙසායා ඔවුන්ට මෙසේ කීවේය.
“ගිහින් ඔබේ ස්වාමියාට මෙසේ
කියන්න. ‘යෙහෝවා දෙවිගේ පිළිතුර
මෙයයි.[25] “ඇසිරියාවේ රජුගේ සේ-
වකයෝ[26] මට අපහාස කරමින් කී
දේවල්වලට භය නොවන්න.[1] **7** මම
ඔහුගේ අදහස වෙනස් කරන්නෙමි.[2]
ඔහුට ආරංචියක් ලැබී[3] ඔහු නැවත
තමාගේ රටට හැරී යනු ඇත. පසුව
ඔහුගේ රටේදීම ඔහු කඩුවෙන් මැරුම්
කන්නේය.”’”[4]

**8** පසුව ඇසිරියාවේ රජු ලාකිෂ්
නගරයෙන්[5] පිටත්ව ගිය බව රබ්ෂා-
කේට[6] ආරංචි වී රජුව හමු වීමට ඔහු
ගියේය. ඒ අවස්ථාවේදී රජ ලිබ්නා
නගරයට[7] විරුද්ධව යුද්ධ කරමින්
සිටියේය. **9** ඉතියෝපියාවේ රජු වන
තිර්හාකා[8] තමාට විරුද්ධව යුද්ධයට
එන බව ඇසිරියාවේ රජුට ආරංචි විය.
ඒ ගැන ඇසූ ගමන්ම ඔහු හෙසකියා රජු
වෙත පණිවිඩකරුවන්[9] යවමින් මෙසේ
කීවේය. **10** “යූදාහි රජු වන හෙසකි-
යාව හමු වී මෙසේ කියන්න. ‘“යෙරු-
සලම ඇසිරියාවේ රජුගේ අතට පත්
වෙන්නේ නැහැ”[10] කියා ඔබ විශ්වාස
කරන ඔබේ දෙවියන් ඔබට කියයි.
නමුත් ඔබ ඊට රැවටෙන්න එපා.[11]
**11** ඇසිරියාවේ රජවරු අනික් දේශ-
යන් විනාශ කළ හැටි ඔබ අසා
නැද්ද?[12] එසේනම් ඔබට පමණක්
බේරෙන්න ලැබෙයි කියා ඔබ හිතන්-
නේ කොහොමද?[13] **12** මගේ මුතුන්-
මිත්තන් විනාශ කළ දේශවල ජීවත් වූ
වැසියන් නමස්කාර කළ එක දෙවි-
යෙකුටවත්[14] පුළුවන් වුණාද ඔවුන්ගේ
සෙනඟ බේරාගන්න?[15] ගෝසාන්,[16]
හාරාන්,[17] රෙෂෙප් හා ටෙල්-අසර් දේ-
ශයේ සිටි ඒදන්හි[18] වැසියන්ටවත්
බේරෙන්න බැරි වුණා. **13** හමාත්,[19]
අර්පාද්,[20] සෙෆාර්වායිම්,[21] හේනා සහ
ඉව්වා[22] යන නගරවල රජවරුන් දැන්
කොහේද?’”

**14** හෙසකියා එම පණිවිඩකරුවන්
තමාට දුන් ලිපිය ගෙන කියෙව්-
වේය.[23] ඉන්පසු හෙසකියා යෙහෝවා
දෙවිගේ ගෘහයට ගොස් එම ලිපිය

**36 පරි.**
1 ගීතා 38:13; ගීතා 38:14; ගීතා 39:1; හිතෝ 9:7; හිතෝ 26:4; මතෙ 7:6
2 2රාජා 18:36
3 2රාජා 18:37
4 2රාජා 18:18
5 යෙසා 22:15
6 යෙසා 36:3
7 උත් 37:29; 2රාජා 22:11
8 2රාජා 18:17

**37 පරි.**
9 2රාජා 19:1; මතෙ 11:21
10 2ලේක 7:16
11 යෙසා 36:3
12 2රාජා 18:18
13 2රාජා 19:2
14 2ලේක 26:22; ලූක් 3:4
15 යෙසා 1:1
16 ගීතා 50:15; ගීතා 91:15
17 2රාජා 18:32; 2ලේක 32:17; යෙසා 10:12; යෙසා 36:18
18 2රාජා 19:3; යෙසා 26:17
19 2රාජා 18:28
20 1සාමු 17:45; 2රාජා 18:35; යෙසා 36:20
21 2රාජා 19:4
22 2රාජා 17:18; රෝම 9:27
23 2ලේක 32:20; ගීතා 50:15; යෝවෙ 2:17
24 2රාජා 19:5
25 2රාජා 19:6
26 2රාජා 18:17

**2 තීරුව**
1 ද්වි 20:1; රෝම 8:31
2 2රාජා 19:7
3 හිතෝ 21:1; ඔබ 1
4 2ලේක 32:21; යෙසා 37:38
5 2රාජා 18:14; මීකා 1:13
6 2රාජා 18:17; 2රාජා 19:8
7 යොෂු 10:29; 2රාජා 8:22
8 2රාජා 19:9
9 2රාජා 18:17
10 2රාජා 19:10
11 2රාජා 18:5; 2ලේක 32:15; ගීතා 22:8; යෙසා 36:4

**12** 2රාජා 17:5; 2ලේක 32:13; යෙසා 10:11; යෙසා 36:18; **13** 2රාජා 19:11; **14** 2සාමු 5:21; 1කොරි 8:4; **15** යෙසා 36:19; **16** 2රාජා 19:12; **17** උත් 11:31; උත් 29:4; **18** එස 27:23; **19** 2සාමු 8:9; යෙසා 36:19; **20** 2රාජා 18:34; **21** 2රාජා 17:24; **22** 2රාජා 19:13; **23** 2රාජා 19:14.

යෙහෝවා දෙවි ඉදිරියේ තැබු-
වේය.[1] **15** ඔහු යෙහෝවා දෙවි ඉදි-
රියේ යාච්ඤා කරමින්[2] මෙසේ
කීවේය. **16** "අනේ යෙහෝවා දෙවි-
යනි, පොළොවේ සියලු රාජ්‍යයන්ට
වඩා උසස්ව සිටින එකම සැබෑ වූ
දෙවි[3] හා ස්වර්ගයේ සේනාවල අධිපති
ඔබයි. කෙරුබ්වරුන් පිට හිඳගෙන
සිටින ඊශ්‍රායෙල්හි දෙවියනි,[4] අහසත්
පොළොවත් නිර්මාණය කළේ ඔබයි.[5]
**17** යෙහෝවා දෙවියනි, අපේ කන්-
නලව්වලට ඇහුම්කන් දෙන්න.[6]
අනේ යෙහෝවා දෙවියනි, අප දෙස
බලන්න.[7] ජීවමාන දෙවි වන ඔබට
අපහාස[8] කිරීම සඳහා සෙනකෙ-
රිබ්[9] ලියා තිබෙන මේ දේවල්ව-
ලට ඔබේ අවධානය යොමු කරන්න.
**18** යෙහෝවා දෙවියනි, ඇසිරියාවේ
රජවරුන් විවිධ ජාතීන්වත් ඔවුන්-
ගේ දේශයනුත් විනාශ කළ බව
ඇත්තයි.[10] **19** ඒ ජාතීන් නමස්කාර
කළ දෙවිවරුන්වත් ඔවුන් පුලුස්සා
දැමුවා.[11] නමුත් ඔවුන් සැබෑ දෙ-
විවරුන් නෙමෙයි,[12] ලී සහ ගල්-
වලින් සාදාගත් රූප පමණයි.[13] ඒ
නිසයි ඔවුන්ට ඒ දෙවිවරුන්ව විනාශ
කරන්න පුළුවන් වුණේ.[14] **20** අනේ
යෙහෝවා දෙවියනි,[15] ඇසිරියාවේ
රජුගේ අතින් අපව බේරාගන්න.[16]
එවිට යෙහෝවා නම් වූ ඔබ පමණක්
සැබෑ දෙවි බව පොළොවේ සියලු රජ-
වරුන් දැනගනීවි."[17]

**21** පසුව ආමොෂ්ගේ පුත් යෙසායා
හෙසකියාට මෙසේ කියා යැව්වේය.
"ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝවා
මෙසේ පැවසුවා. 'ඇසිරියාවේ රජු වන
සෙනකෙරිබ් ගැන ඔබ මට යාච්ඤා
කළ නිසා[18] **22** යෙහෝවා දෙවි වන
මම සෙනකෙරිබ්ට විරුද්ධව මේ දේ
ප්‍රකාශ කරමි.

"සියොන් කන්‍යා දියණිය ඔබව හෙ-
ළාදකින්නීය. ඔබව සමච්-
චලයට ලක් කරන්නීය.[19]
යෙරුසලම් දියණිය ඔබව විහි-
ළුවට ලක් කරමින් සිනා-
සෙන්නීය.[20]

**23** ඔබ අපහාස[1] කරමින් සමච්චල-
යට[2] ලක් කළේ කාවද?
ඔබ අහංකාරකමින් කතා
කළේ[3] කාට විරුද්ධවද?
උඩඟු ලෙස බැලුවේ[4] කා දෙසද?
ඒ සැම දෙයක්ම ඔබ කළේ
ඊශ්‍රායෙල්හි ශුද්ධ තැනැත්තා
වන මට විරුද්ධවයි![5]

**24** ඔබේ සේවකයන් ලවා ඔබ යෙ-
හෝවා දෙවි වන මට
අභියෝග කරමින් මෙසේ
කීවේය.[6]
'මාගේ යුධ රථ සේනාවත්
සමඟ[7]
මම කඳුකරයේ ඉහළටම නඟිමි.[8]
ලෙබනොන් දේශයේ ඈත කෙ-
ළවරටම ගොස්,[9]
එහි ඇවැන්ත දේවදාර ගස්ද
හොඳම ජුනිපර් ගස්ද කපා
දමමි.[10]
එහි පලතුරු උයන් කෙළවරටම
වුවද මම යමි.[11]

**25** මම බිම හාරා වතුර බොන්නෙමි.
ඊජිප්තුවේ නයිල් ගඟේ[12] සියලු
අතු ගංගා[13] පිට ඇවිද ඒවා
සිඳවන්නෙමි.'

**26** බොහෝ කාලයක සිට මා කිරීමට
තීරණය කළ දේ[14] ඔබට
ආරංචි වුණේ නැද්ද?[15]
මුල සිටම මම එය සැලසුම්
කළෙමි.[16] දැන් මම එය ඉටු
කරන්නෙමි.[17]
සුරක්ෂිත නුවරවල් විනාශ කර
පාළු නටබුන් ගොඩක් බවට
පත් කරන්න මම ඔබව යො-
දාගනිමි.[18]

**27** එම නුවරවල වැසියෝ කිසි-
වක් කරකියාගත නොහැ-
කිව අසරණ වනු ඇත.[19]
ඔවුහු භය වී ලැජ්ජාවට පත්
වන්නෝය.[20]

**37 පරි.**
**1** 1රාජා 8:30
2ලේක 6:20
2ලේක 20:9
**2** එස්රා 9:5
ගීතා 123:1
දානි 9:3
**3** ගීතා 86:10
යෙසා 6:3
**4** 2සාමු 7:26
1රාජා 8:23
ගීතා 46:7
යෙසා 8:13
**5** උත් 1:1
2රාජා 19:15
ගීතා 146:6
යෙරෙ 10:12
**6** 2ලේක 6:40
ගීතා 17:6
ගීතා 65:2
ගීතා 71:2
ගීතා 130:2
**7** 2ලේක 16:9
යෝබ් 36:7
1පේතෘ 3:12
**8** ගීතා 74:10
ගීතා 79:12
යෙසා 37:4
**9** 2රාජා 19:16
**10** 2රාජා 15:29
2රාජා 16:9
1ලේක 5:26
**11** යෙසා 10:11
**12** ගීතා 115:4
යෙරෙ 10:2
1කොරි 8:4
**13** යෙසා 40:19
යෙසා 41:7
හොෂෙ 8:6
ක්‍රියා 17:29
**14** 2රාජා 19:18
**15** ද්වි 32:31
ගීතා 91:2
**16** 1සාමු 14:6
2රාජා 19:19
**17** ද්වි 32:39
ගීතා 83:18
ගීතා 96:5
**18** 2රාජා 19:20
**19** 2රාජා 19:21
**20** යෝබ් 16:4
ගීතා 22:7
ගීතා 109:25

**2 තීරුව**
**1** 2රාජා 19:4
2රාජා 19:16
**2** 2රාජා 18:30
**3** 2රාජා 18:35
යෙසා 10:13
**4** හිතෝ 6:17
හිතෝ 30:13
**5** නික් 15:11
ගීතා 71:22
යෙසා 5:24
යෙසා 10:20
යෙරෙ 51:5
එස 39:7
**6** 2රාජා 19:4
2රාජා 19:22
2ලේක 32:17
**7** ගීතා 20:7

**8** යෙසා 10:12; යෙසා 14:13; **9** යෙසා 10:34; එස 31:3; **10** එස 31:8; **11** 2රාජා 19:23; **12** නික් 7:19; **13** 2රාජා 19:24; යෙසා 19:6; **14** උත් 12:3; **15** නික් 9:14; යොෂු 9:9; **16** 2රාජා 19:25; ගීතා 33:11; යෙසා 46:11; **17** ගීතා 17:13; යෙසා 55:11; **18** ලෙවී 26:33; 2රාජා 19:25; යෙසා 17:9; **19** ගීතා 48:6; ගීතා 127:1; **20** ද්වි 28:66; 2රාජා 19:26; ගීතා 48:5.

ඔවුහු කෙතේ මැලවී යන පැළෑටි
මෙන්ද[1]
නැඟෙනහිර දෙසින් හමන
සුළඟට[2] වියළී යන පියස්සේ[3]
හා කෙතේ දලු ලන තණ-
කොළ මෙන්ද වනු ඇත.
**28** ඔබ හිඳගෙන සිටින විටත් පිට වී
යන විටත්[4] නැවත ගෙට
එන විටත් ඔබ කරන හැම
දෙයක්ම මම දනිමි.[5]
මට විරුද්ධව ඔබ කෝපයෙන්
ක්‍රියා කරන හැටිත් මම
දනිමි.[6]
**29** ඔබ මහත් කෝපයෙන් මට විරුද්-
ධව[7] කළ චෝදනා මගේ
කනට වැටී ඇත.[8]
මම ඔබේ නාසයට කොක්කක්ද
කටට කටකලියාවක්ද දමා[9]
ඔබ ආ පාරෙන්ම නැවත ඔබව
ඇදගෙන යන්නෙමි.”[10]

**30** “‘මෙය ඔබට ලකුණක් වනු
ඇත. පසුගිය අස්වැන්නේදී කෙතේ
වැටුණු බීජවලින් හටගන්නා පලදා-
වෙන් ඔබට මේ අවුරුද්දේ කන්න
පුළුවන.[11] දෙවන අවුරුද්දේදී, ඉබේම
පලදාවක් හටගනියි. ඔබට ඒ
පලදාවෙන් දෙවන අවුරුද්දේදී කන්න
ලැබෙයි. නමුත් තුන්වන අවුරුද්දේදී,
ඔබම බීජ වපුරා අස්වැන්න නෙ-
ළාගන්න. මිදිවතු වවා ඒවායේ පල
කන්න.[12] **31** යූදා පෙළපතේ බේරී
ජීවත් වන අය[13] ගැඹුරට මුල් බැස
ඇති ගසක් මෙන් පල දරනවා ඇත.[14]
**32** මන්ද කුඩා සෙනඟක් යෙරුස-
ලමෙන් නික්ම එනු ඇත.[15] බේරී
ජීවත් වන අය සියොන් කන්ද වෙතින්
නික්ම එන්නෝය.[16] ස්වර්ගයේ සේ-
නාවල අධිපති වූ යෙහෝවා දෙවි වන
මම මහත් ආශාවකින් මේ දේ ඉටු
කරන්නෙමි.[17]

**33** “‘එබැවින් යෙහෝවා දෙවි වන
මම ඇසිරියාවේ රජු[18] ගැන මෙසේ
පැවසුවෙමි. “ඔහුට මේ නුවරට ඇතුල්
වෙන්නවත්[19] ඒ දෙසට ඊතලයක්
විදින්නවත් පලිහ අතට ගෙන ඊට
විරුද්ධව යුද්ධ කරන්නවත් එය වටා
බැම්මක් ගොඩනඟා නුවර වටලන්න-
වත් ලැබෙන්නේ නැත.”’[1]

**34** “‘ඔහු ආ පාරෙන්ම නැවත හැරී
යයි. ඔහුට මේ නුවරට කිසි ලෙ-
සකින්වත් ඇතුල් වෙන්න ලැබෙන්-
නේ නැති බව යෙහෝවා දෙවි වන
මම පවසමි.[2] **35** මාගේ නාමය වෙ-
නුවෙනුත්[3] මාගේ සේවක දාවිත් වෙ-
නුවෙනුත්[4] මම මේ නගරය ආරක්ෂා
කර[5] බේරාගන්නෙමි.’”

**36** යෙහෝවා දෙවිගේ දූතයා[6]
ඇසිරියානු කඳවුරේ හටයන් එක්-
ලක්ෂ අසූපන්දහසක් මරා දැමුවේය.[7]
උදෑසනින්ම අවදි වූ සෙසු හටයින්
අවට බැලූ විට ඔවුන්ට දකින්න
ලැබුණේ සෑම තැනම තිබුණු මළ
සිරුරු පමණි.[8] **37** මේ සිද්ධියෙන්
පසු ඇසිරියාවේ රජු වූ සෙනකෙරිබ්[9]
ආපසු නිනිවය නගරයට[10] ගොස් එහි
වාසය කළේය.[11] **38** දිනක් ඔහු තම
දෙවි වූ[12] නිස්රොක්ගේ[13] දේවාලයේ
නමස්කාර කරමින් සිටිද්දී, ඔහුගේම
පුත්‍රයෝ වූ අද්‍රම්මෙලෙක් සහ ෂරෙ-
ෂෙර් ඔහුට කඩුවෙන් පහර දී මරා
දැමුවෝය.[14] ඉන්පසු ඔවුහු දෙදෙනා
අරරත්[15] දේශයට පලා ගියෝය. සෙ-
නකෙරිබ් රජුට පසු ඔහුගේ පුත් ඒසර්-
හද්දොන්[16] රජකමට පත් විය.

**38** ඒ කාලයේදී හෙසකියා අස-
නීප වී මරණාසන්නව සිටි-
යේය.[17] දවසක් අනාගතවක්තෘ වූ
ආමොෂ්ගේ පුත් යෙසායා[18] ඔහු ළඟට
ඇවිත් මෙසේ කීවේය. “යෙහෝවා දෙවි
ඔබට මෙසේ පැවසුවා. ‘ඔබ සුවය
ලබන්නේ නැත. ඔබ මිය යන්-
නෙහිය.[19] එහෙයින් දැන් ඔබේ ගෙයි
වැසියන්ව කැඳවා පවුලේ කාරණා
සැලසුම් කරන්න.’”[20] **2** එවිට ඔහු
බිත්තිය දෙසට හැරී[21] යෙහෝවා දෙ-
විට යාච්ඤා කරමින්[22] මෙසේ
කීවේය. **3** “යෙහෝවා දෙවියනි, මම

**37 පරි.**
**1** ගීතා 37:2
ගීතා 92:7
ගීතා 103:15
යෙසා 40:7
යාකො 1:10
**2** 2රාජා 19:26
**3** ගීතා 129:6
**4** ද්වි 28:6
**5** හිතෝ 5:21
හිතෝ 15:3
යෙරෙ 23:24
හෙබ්‍රෙ 4:13
**6** 2රාජා 19:27
**7** ගීතා 2:2
ගීතා 10:13
ගීතා 46:6
යෙසා 10:15
යෙසා 37:23
**8** 2රාජා 18:35
යෙසා 36:4
යෙසා 36:20
නාහු 1:9
**9** ගීතා 32:9
යෙසා 30:28
එස 38:4
ආමො 4:2
**10** 2රාජා 19:28
2රාජා 19:33
**11** ලෙවී 25:5
**12** 2රාජා 19:29
**13** යෙසා 1:9
යෙසා 10:21
රෝම 9:27
රෝම 11:5
**14** 2රාජා 19:30
**15** 2රාජා 19:4
**16** 2රාජා 19:31
**17** යෙසා 9:7
යෙසා 59:17
එස 5:13
යෝවෙ 2:18
සෙක 1:14
**18** යෙසා 10:24
**19** 2ලේක 32:22
යෙසා 10:32
යෙසා 33:20

**2 තීරුව**
**1** 2රාජා 19:32
**2** 2රාජා 19:33
හිතෝ 21:30
**3** ද්වි 32:27
1සාමු 12:22
එස 36:22
**4** 1රාජා 15:4
2රාජා 19:34
යෙරෙ 30:9
එස 37:24
**5** 2රාජා 20:6
යෙසා 31:5
යෙසා 38:6
**6** 2සාමු 24:16
ගීතා 35:5
**7** 2රාජා 19:35
2ලේක 32:21
**8** ගීතා 76:6
**9** 2රාජා 19:7
2රාජා 19:28

**10** උත් 10:11; යෝනා 1:2; නාහු 1:1; ශෙප 2:13; **11** 2රාජා 19:36; **12** 1කොරි 8:4; **13** 2රාජා 19:37; **14** 2ලේක 32:21; **15** උත් 8:4; යෙරෙ 51:27; **16** එස්රා 4:2; **38 පරි.** **17** 2ලේක 32:24; **18** 2රාජා 19:20; යෙසා 1:1; **19** 2රාජා 20:1; **20** 2සාමු 17:23; **21** 1රාජා 8:30; 2රාජා 20:2; මතෙ 6:6; **22** ගීතා 50:15; ගීතා 91:15.

විශ්වාසවන්තව,[1] මුළු හදවතින්ම[2]
ඔබට සේවය කළ හැටිත්[3] ඔබ යහ-
පත්යයි සලකන දේ කළ හැටිත් සිහි
කරන මෙන් ඔබෙන් බැගෑපත්ව අයැ-
දිමි."[4] එසේ කියමින් හෙසකියා බො-
හෝ සෙයින් හැඬුවේය.[5]
**4** පසුව යෙහෝවා දෙවි යෙසායාට
කතා කර මෙසේ කීවේය.[6] **5** "හෙ-
සකියා වෙතට ගොස් මෙසේ කියන්න.
'ඔබේ මුතුන්මිත්තා වූ දාවිත්ගේ[7] දෙවි
වන යෙහෝවා ඔබට මෙසේ පැවසුවා.
"මම ඔබ හෙළූ කඳුළු දුටුවෙමි.[8] ඔබේ
යාච්ඤාවටද මම සවන් දුන්නෙමි.[9] ඒ
නිසා මම ඔබට තව අවුරුදු පහළවක්
ජීවත් වෙන්න ඉඩහරිමි.[10] **6** ඇසිරි-
යාවේ රජුගේ අතින් ඔබව ගලවාගන්-
නෙමි. මේ නගරයත් ගලවාගෙන එය
ආරක්ෂා කරන්නෙමි.[11] **7** මා කී දේ
ඉටු කරන බව සහතික කිරීමට යෙ-
හෝවා දෙවි වන මම ඔබට ලකුණක්
දෙන්නෙමි. යෙහෝවා දෙවි වන මා
දෙන ලකුණ මෙයයි.[12] **8** ආහස්ගේ
පඩි පෙළ කියා හඳුන්වන පඩි පෙළ
දිගේ වැටෙන සෙවණැල්ල[13] පඩි දහ-
යක් ආපස්සට යන්න මම සලස්වන්-
නෙමි."'"[14] දෙවි කී ලෙසම පඩි පෙළ
මත වැටී තිබුණු සෙවණැල්ල පඩි දහ-
යක් ආපස්සට ගියේය.[15]
**9** යුදාහි රජු වූ හෙසකියා සුවය
ලැබූ පසු[16] ලියූ වචන[17] මෙයයි.

**10** "මගේ ජීවිතයේ හොඳම කාල-
යේදී මට මිනී වළට යන්න
වෙයි.[18]
මගේ ජීවිතය කෙටි කර ඇත"[19]
කියා මම සිතුවෙමි.
**11** මම මෙසේද සිතුවෙමි. "අනේ,
මට නැවත යෙහෝවා දෙ-
විගේ යහපත්කම දකින්න
ලැබෙන්නේ නැත.[20] මිහිපිට
ජීවත් වෙන්නවත් යෙහෝවා
දෙවිගේ යහපත්කම දැක-
ගන්නවත් මට අවස්ථාවක්
නොලැබෙයි.
මිනී වළට ගිය පසු මට
කිසි මිනිසෙකුවත් දකින්න
ලැබෙන්නේ නැත.
**12** එඬේරෙකු තම කූඩාරම අකුළා
දමන්නාක් මෙන් මගේ ජීවි-
තයද අවසන් වෙයි.[1]
රෙදි වියන්නෙකු විසින් වියනු
ලැබූ රෙද්දක් යන්ත්‍රයෙන්
කපා ඉවත් කරන්නාක්
මෙන්,[2]
මගේ ජීවිතයද කපා ඉවත් කරනු
ලබයි.
උදේ සිට රෑ යාමය දක්වා පීඩා-
වලින් හෙම්බත් වීමට ඔහු
මට ඉඩහැරියේය.[3]
**13** රාත්‍රිය පුරාම මාගේ සිත සන-
සාගන්න මම උත්සාහ
කළෙමි.[4]
නමුත් ඔහු සිංහයෙකු මෙන්
මගේ ඇටකටු සියල්ල බිඳ
දැමුවේය.[5]
ඔහු උදේ සිට රෑ යාමය දක්වා
පීඩාවලින් හෙම්බත් වීමට
මට ඉඩහැරියේය.[6]
**14** තුරිතයෙකු හා කොණ්ඩ කුරුල්-
ලෙකු මෙන් මම කෑගසන්-
නෙමි.[7]
පරෙවියෙකු මෙන් හඬන්නෙමි.[8]
මා ඇස් අයාගෙන අහස දෙස බල-
මින්,[9]
'යෙහෝවා දෙවියෙනි, මා අස-
රණය. ඔබේ උපකාරය
ලැබෙන තුරු මම බලා
සිටිමි'[10] කියා ඔහුට කන්-
නලව් කළෙමි.
**15** ඔහු මට පිළිතුරු දුන්නේය.[11] ඔහු
මට පිහිට වුණේය.[12]
මම ඔහුගෙන් වෙන කිසිවක්
ඉල්ලන්නේ නැත.
මෙම කටුක අද්දැකීම සිහි කර-
මින්[13] මගේ ජීවිත කාලය
පුරාම නිහතමානීව සිටීමට
මම තීරණය කළෙමි.
**16** 'යෙහෝවා දෙවියනි, සියලුදෙනා
ජීවත් වන්නේ ඔබ නිසයි. මා
ජීවත් වන්නේ* ඔබේ පිහි-
ටෙනි.[14]

**38 පරි.**
**1** ගීතා 51:6; ගීතා 145:18
**2** 2ලේක 31:21
**3** උත් 5:22; 1රාජා 2:4; 2ලේක 31:20
**4** නෙහෙ 13:22; ගීතා 20:3; 1කොරි 15:58; හෙබ්‍රෙ 6:10
**5** 2රාජා 20:3
**6** 2රාජා 20:4
**7** 2ලේක 34:2
**8** 2රාජා 20:5; ගීතා 39:12; ගීතා 56:8
**9** 2රාජා 19:20; හිතෝ 15:29; 1යොහ 5:14
**10** 2රාජා 20:6; ගීතා 91:16
**11** 2රාජා 19:34; 2ලේක 32:22
**12** 2රාජා 20:8
**13** යොෂු 10:12
**14** 2රාජා 20:9; 2ලේක 32:24
**15** 2රාජා 20:11
**16** ද්වි 32:39; 1සාමු 2:6
**17** 2රාජා 20:1
**18** යෝබ් 38:17; ගීතා 9:13; ගීතා 107:18
**19** ගීතා 90:10; දේශ 3:2; දේශ 7:17
**20** ගීතා 6:5; දේශ 9:5

**2 තීරුව**
**1** ගීතා 146:4; දේශ 8:8
**2** යෝබ් 14:2
**3** යෝබ් 17:1
**4** ගීතා 130:6; ගීතා 131:2
**5** දානි 6:24; හොෂෙ 5:14
**6** ගීතා 39:10
**7** ගීතා 102:7; යෙරෙ 8:7
**8** යෙසා 59:11; එස 7:16; නාහු 2:7
**9** ගීතා 39:7; ගීතා 119:82
**10** ගීතා 119:123
**11** ගීතා 39:12
**12** 1පේතෘ 5:7
**13** 2රාජා 4:27; යෝබ් 7:11; යෝබ් 21:25; ලූක් 22:62
**14** යෝබ් 33:28; ගීතා 71:20

යෙසා **38:16*** මූ.අ., "මගේ හුස්ම පවතින්නේ."

මට සුවය ලබා දෙන්නෙත්
මගේ ජීවිතය රැක දෙන්-
නෙත් ඔබයි.[1]
17 සමාදානය වෙනුවට මා අද්දුටුවේ
ශෝකය පමණි.[2]
නමුත් මා කෙරෙහි තිබෙන
ගැඹුරු ප්‍රේමය නිසා ඔබ මිනී
වළෙන් මාව ගලවාගත්තෙ-
හිය.[3]
ඔබ මගේ පාප අමතක කර දමා
ඒ දෙස නැවත හැරී නොබැ-
ලුවෙහිය.[4]
18 මිනී වළෙහි සිට ඔබට ප්‍රශංසා කළ
හැක්කේ කාටද?[5] මිය ගිය
අයට ඔබේ ගුණ වර්ණනා
කළ හැකිද?[6]
මිය ගිය කෙනෙකුට ඔබේ විශ්-
වාසවන්තකම සිහි කරමින්
ඔබ කෙරෙහි බලාපො-
රොත්තු තැබිය හැකිද?[7]
19 ජීවතුන් අතර සිටියොත් මිසක
කිසිවෙකුට ඔබට ප්‍රශංසා
කළ නොහැක.[8]
මා අද ඔබට ප්‍රශංසා කරන්නේ
ඒ නිසාය.[9]
පියෙකු තම දරුවන්ට ඔබ-
ගේ විශ්වාසවන්තකම ගැන
උගන්වන්නේද[10] ඒ නිසාය.
20 අනේ යෙහෝවා දෙවියනි, ගැල-
වීම ලබා දෙන්න.[11]
එවිට දිවි ඇති තුරාම යෙහෝවා
දෙවිගේ ගෘහයේ[12] අපි වීණා
වයන්නෙමු.’ ”[13]

21 යෙසායා සේවකයන්ට කතා
කර මෙසේ කීවේය. “වේළාගත් අත්-
තික්කා කුට්ටියක් ගෙන රජතුමාගේ
තුවාලය[14] මත තබන්න. ඔහුට සුවය
ලැබෙයි.”[15] 22 පසුව හෙසකියා රජ
මෙසේ ඇසුවේය. “මට යෙහෝවා දෙ-
විගේ ගෘහයට නැවත යන්න ලැබෙන
බවට දෙන ලකුණ කුමක්ද?”[16]

# 39

39 හෙසකියාගේ අසනීප තත්-
වය සුව වූ බව[17] බැබි-
ලෝනියේ[18] රජු වූ බලදාන්ගේ පුත්
මෙරොදක්-බලදාන්ට[19] ආරංචි වී ඔහු
හෙසකියාට ලිපි ලියා ඒ සමඟ තෑග්-
ගක්ද[1] එව්වේය. 2 හෙසකියා ඒ
පණිවිඩයද තෑග්ගද නිසා බොහෝ
සෙයින් සතුටු විය.[2] ඉන්පසු ඔහු
තම වස්තු ගබඩාවේ තිබුණු සියල්ල
ඔවුන්ට පෙන්වූවේය.[3] ඔහු එහි තිබූ
රන් රිදීද බෝල්සම් තෙල්ද[4] අනර්ඝ
තෙල්ද යුද්ධායුධ[5] ගබඩාවද ඔහු-
ගේ අනිකුත් වස්තු සියල්ලද ඔවුන්ට
පෙන්වූවේය. හෙසකියා තම මාලි-
ගාවෙත්[6] මුළු රාජධානියෙත්[7] තිබූ
සෑම දෙයක්ම ඔවුන්ට පෙන්වූවේය.
3 ඉන්පසු අනාගතවක්තෘ යෙ-
සායා, හෙසකියා රජු හමු වීමට
පැමිණ,[8] “රජතුමනි, අර මිනිස්සු
ආවේ කොහෙන්ද? ඔවුන් මොන-
වද කිව්වේ” කියා ඇසුවේය. හෙස-
කියා මෙසේ කීවේය. “ඔවුන් ආවේ
දුර ඈත පිහිටි බැබිලෝනියේ සිටයි.”[9]
4 එවිට යෙසායා, “ඔවුන් ඔබේ මාලි-
ගාවේ මොනවද බැලුවේ”[10] කියා
ඇසුවේය. හෙසකියා මෙසේ කීවේය.
“මගේ මාලිගාවේ තිබෙන හැම දෙ-
යක්ම ඔවුන් බැලුවා. මගේ ගබඩාවේ
තිබෙන හැම වස්තුවක්ම මම ඔවුන්ට
පෙන්නුවා.” 5 එවිට යෙසායා, හෙ-
සකියාට[11] මෙසේ කීවේය. “ස්වර්ග-
යේ සේනාවල අධිපති වන යෙහෝවා
දෙවි කියන මේ දේට ඇහුම්කන්
දෙන්න. 6 ‘බලන්න! ඔබේ මාලි-
ගාවේ තිබෙන සියල්ලත් මේ දක්වා
ඔබේ මුතුන්මිත්තන් රැස් කර තිබෙන
සියල්ලත් බැබිලෝනියට ගෙන යන
දවස් පැමිණෙන්නේය.[12] මෙහි කිසි-
වක් ඉතුරු නොවන්නේය’[13] කියා
යෙහෝවා දෙවි පැවසුවා. 7 ‘ඔබේම
පුත්‍රයන්ගෙන් සමහරෙකුව ඔවුහු
ගෙන යන්නෝය.[14] ඔවුහු බැබිලෝනි-
යේ රජුගේ මාලිගාවේ[15] නිලධාරීන්[16]
ලෙස සේවය කරනු ඇත.’ ”
8 එය අසා හෙසකියා, යෙසායාට
මෙසේ කීවේය. “ඔබ මාර්ගයෙන් යෙ-
හෝවා දෙවි කී දේ මම සතුටින් භාර-
ගන්නවා.[17] මගේ ජීවිත කාලයේදී[18]

**38 පරි.**

1 1සාමු 2:6
ගීතා 86:13
2 ගීතා 30:5
3 ගීතා 28:1
ගීතා 30:3
ගීතා 86:13
ගීතා 88:5
යෝනා 2:6
4 යෙසා 43:25
මීකා 7:18
රෝම 4:8
5 ගීතා 30:9
ගීතා 88:10
ගීතා 146:4
6 ගීතා 6:5
ගීතා 115:17
දේශ 9:10
7 දේශ 9:5
යෙසා 38:11
8 ගීතා 63:4
ගීතා 146:2
9 යොහ 9:4
10 උත් 18:19
ද්වි 4:9
යොෂු 4:21
ගීතා 78:3
11 ගීතා 27:5
12 2රාජා 20:5
ගීතා 84:2
13 ගීතා 30:12
ගීතා 150:4
14 යෝබ් 2:7
15 2රාජා 20:7
16 2රාජා 20:8

**39 පරි.**

17 2රාජා 20:5
18 උත් 10:10
යෙසා 13:19
19 2රාජා 20:12

**2 තීරුව**

1 2ලේක 32:23
2 යෝබ් 31:25
හිතෝ 23:5
3 2රාජා 20:13
2ලේක 32:27
4 1රාජා 10:25
5 නෙහෙ 3:19
යෙසා 22:8
6 යෙරෙ 9:23
7 2රාජා 20:13
8 යෙසා 38:1
9 ද්වි 28:49
2රාජා 20:14
10 2රාජා 20:15
11 2රාජා 20:16
12 2රාජා 24:13
2රාජා 25:13
2ලේක 36:18
යෙරෙ 52:17
13 2රාජා 20:17
දානි 1:2
14 2රාජා 24:12
2රාජා 25:6
2ලේක 33:11
එස 17:12
15 2රාජා 20:18

---

**16** දානි 2:49; දානි 5:29; **17** ලෙවී 10:3; ගීතා 39:9; 1පේත෍ 5:6; **18** 2රාජා 20:19.

සමාදානයෙන් හා සුරක්ෂිතභාව-
යෙන්*[1] ජීවත් වෙන්න ලැබෙනවා නම්
ඒ ඇති."

**40** "සනසන්න. මාගේ සෙනඟට
සැනසිලිදායක වදන් පව-
සන්න" යයි දෙවි ඔබෙන් ඉල්ලා
සිටින්නේය.[2] **2** "යෙරුසලමට සිත
සනසවන අයුරින් කතා කරන්න.[3]
ඇය දුක් පීඩා වින්ද කාලය අව-
සන් බවත්[4] ඇගේ වැරදිවලට සම්පූර්-
ණයෙන්ම වන්දි ගෙවා ඇති බවත්[5]
ඇයට පවසන්න. යෙහෝවා දෙවි-
ගෙන් ඇය තවදුරටත් දඬුවම් නොල-
බන්නීය."[6]

**3** සවන් දෙන්න! පාළුකරයේ සිට
යමෙකු හඬ නඟනවා ඔබට ඇසෙන-
වාද?[7] "ජනයෙනි, යෙහෝවා දෙවිගේ
මාර්ගය එළි පෙහෙළි කර සූදානම්
කරන්න.[8] කාන්තාරය හරහා දිව යන
අපේ දෙවිගේ ගමන් මඟ සමතලා
කරන්න.[9] **4** සියලුම හෙල්ද කඳුද
සමතලා කර,[10] නිම්නද ඒ මට්ටමට
ගෙනෙන්න.[11] සමතලා නැති තැන්
සකස් කර රළුබිම් සුමට කරන්න.[12]
**5** එවිට සියලුදෙනාම[13] යෙහෝවා
දෙවිගේ තේජස දැකගනු ඇත.[14] යෙ-
හෝවා දෙවි එය පැවසූ බැවින් එය
එසේම සිදු වන්නේය."[15]

**6** සවන් දෙන්න! "හඬ නඟා කතා
කරන්න"[16] කියා පවසන හඬක්
ඇසෙයි. "මා කිව යුත්තේ කුමක්ද"
කියා අසන තවත් හඬක් ඇසෙයි.

"මිනිසා තණකොළ මෙනි. ඔහු-
ගේ කරුණාව* කෙතෙහි හටගන්නා
මලක් මෙනි.[17] **7** තණකොළ විය-
ළෙයි. මල පරවී යයි.[18] යෙහෝවා
දෙවි තම හුස්ම හෙළූ විට ඒ සියල්ල
පහව යයි.[19] සැබවින්ම මිනිසා වියළී
යන තණකොළ මෙනි.[20] **8** තණ-
කොළ වියළී යයි. මල පරවී යයි.[21]
නමුත් අපේ දෙවිගේ වචනය සදහටම
පවතියි."[22]

**9** සියොන් වෙත ශුභාරංචි ගෙ-
නෙන කාන්තාව,[1] උස් කන්දකට[2]
නැඟ පුවත පතළ කරන්න. යෙරුස-
ලමට සුබ පුවත් ගෙනෙන තැනැත්-
තිය,[3] භය නොවන්න.[4] ශබ්ද නඟා
පුවත කියන්න. යූදාහි සියලු නුවරව-
ලට, "ඔබේ දෙවි ඇවිත් සිටිනවා"[5]
යයි හඬ නඟා කියන්න. **10** විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවි බලවන්තයෙකු මෙන් පැමි-
ණෙන්නේය. ඔහු තම හස්ත බල-
යෙන් සියල්ල යටත් කරගන්නේය.[6]
ඔහු ඔබ වෙත පැමිණෙන්නේ ආශීර්-
වාද රැසක් සමඟිනි.[7] ඔහු එක් එක්
කෙනාගේ ක්‍රියාවලට අනුව ඔවුන්ට
ආශීර්වාද කිරීමට බලා සිටියි.[8]
**11** එඬේරෙකු තම රැළ බලාගන්-
නාක් මෙන් දෙවි තම සෙනඟව රැක-
බලා ගන්නේය.[9] ඔහු බැටළු පැටවුන්ව
වඩාගෙන[10] තම තුරුලට ගන්නේය.[11]
කිරි දෙන බැටළුදෙනුන්ව මහත් සැල-
කිල්ලකින් දක්කගෙන යන්නේය.[12]

**12** ජල ධාරා සියල්ලම තම අල්-
ලට ගෙන මැන බැලුවෙත්[13] තම
වියතෙන් මුළු අහස්තලයම මැන
බැලුවෙත් කවුද?[14] එක් මිටකට* පො-
ළොවේ සියලු වැලි කැට රැස් කර-
ගත්තේ[15] කවුද කියාත් කඳු හෙල්
සියල්ල තරාදියක දමා කිරා බැලු-
වේ කවුද කියාත් ඔබ දන්නෙහිද?
**13** යෙහෝවා දෙවිගේ බලය* මැනිය
හැක්කේ කාටද? දෙවිට උපදෙස්
දෙන්නවත් ඔහුට යමක් උගන්වන්න-
වත් කිසිවෙකුට හැකිද?[16] **14** දෙවි
කාගෙන්වත් උපදෙස් පතා තිබෙන-
වාද? ඔහුට කාරණා පහදා දෙන්න
කිසිවෙකුට හැකිද? යුක්තිය කුමක්ද
කියා ඔහුට කියා දිය යුතුද? ඔහුට
දැනුම ලබා දීමට[17] හෝ කාරණා තේ-

**39 පරි.**
**1** යෙරෙ 33:6

**40 පරි.**
**2** යෙසා 35:3; යෙසා 49:13; යෙසා 51:3; සෙක 1:13; 2කොරි 1:3
**3** 2ලේක 30:22; හොෂෙ 2:14
**4** ගීතා 79:8; ගීතා 103:13
**5** ගීතා 32:1; යෙරෙ 31:34; යෙරෙ 33:8
**6** යෙරෙ 16:18; දානි 9:12
**7** මතෙ 3:3; මාක් 1:3; ලූක් 3:4; යොහ 1:23
**8** යෙසා 35:8; යෙසා 57:14; මලා 3:1
**9** යෙසා 11:16
**10** යෙසා 2:12
**11** යෙසා 42:16; ලූක් 3:5
**12** ගීතා 26:12
**13** යෙසා 49:6; යෙසා 52:10
**14** ගීතා 50:15; ගීතා 72:19; යෙසා 24:15
**15** යෙසා 55:11; තීත 1:2
**16** යෙරෙ 2:2
**17** යෝබ් 14:2; ගීතා 90:6
**18** යාකො 1:11; 1පේතෘ 1:24
**19** ගීතා 90:5; ගීතා 103:16; ගීතා 104:29
**20** ගීතා 103:15
**21** ගීතා 37:2
**22** ගීතා 119:89; යෙසා 46:10; මතෙ 5:18; 1පේතෘ 1:25

**2 තීරුව**
**1** යෙසා 52:7; රෝම 10:18
**2** 1සාමු 26:13; මතෙ 5:14
**3** ලූක් 24:47; රෝම 10:15
**4** යෙසා 51:7; යොහ 12:15; පිලි 1:28; 1පේතෘ 3:14
**5** යෙසා 12:2; යෙසා 25:9; රෝම 8:31
**6** ගීතා 2:6; ගීතා 110:2; යෙසා 9:6; යොහ 12:38

**7** යෙසා 62:11; එළි 22:12; **8** යෙසා 49:4; **9** උත් 49:24; යෙසා 49:10; හෙබ්‍රෙ 13:20; 1පේතෘ 2:25; **10** එස 34:16; **11** යොහ 21:15; **12** උත් 33:13; යොහ 10:14; යොහ 10:16; 1පේතෘ 5:2; **13** හිතෝ 30:4; **14** ගීතා 104:2; හෙබ්‍රෙ 1:10; **15** යෝබ් 38:5; හිතෝ 8:26; **16** යෝබ් 21:22; යෝබ් 36:23; රෝම 11:34; **17** 1කොරි 2:16.

යෙසා **39:8*** මූ.අ., "සත්‍යයෙන්." **40:6*** හෝ, "ළැදි ප්‍රේමය."

යෙසා **40:12*** මූ.අ., "මිනුම් භාජනයකින්." **13*** හෝ, "ඔහුගේ මනස."

රුම් කර දීමට[1] හෝ කිසිවෙකුට
හැකිද?
15 දෙවිට සියලු ජාතීන් කළයකින්
වැටෙන දිය බිඳක් මෙනි. ඔවුන් තරා-
දියක තිබෙන දූවිල්ල මෙනි.[2] දෙවි
දූවිල්ල එකතු කරන්නාක් මෙන් සිය-
ලුම දූපත් තම අතට ගන්නේය.[3]
16 ලෙබනොන් දේශයේ සියලු ගස්
දර සඳහා කැපුවත් එහි සෑම සතෙ-
කුවම[4] දෙවි වෙත ගෙනාවත් ඔහුට
සුදුසු දවන පූජාවක් ඔප්පු කිරීමට
එය ප්‍රමාණවත් නොවෙයි.[5] 17 දෙවි
සමඟ සසඳන කල සියලු ජාතීන් කිසි
වටිනාකමක් නැති තරම්ය.[6] ඔවුන්ව
කිසිසේත් දෙවිට සම කළ නො-
හැක. ඔවුන් සියල්ලෝම වැදගැම්ම-
කට නැති අය මෙනි.[7]
18 දෙවිට සමාන කළ හැකි කිසි-
වෙකු සිටියිද?[8] ඔහුගේ සමානත්වයට
කිසිවක් සැදිය හැකිද?[9] 19 රන්-
කරුවෙක් දේවතා රූපයකට[10] රන්
ආලේප කර[11] රිදී මාලවලින්
එය සරසයි.[12] 20 යමෙක් රූපයක්
සාදාගැනීමට හොඳ ගසකින් ලී කපා-
ගන්නේය.[13] දිගු කල් පවතින ශක්-
තිමත් රූපයක්[14] සාදාගැනීමට ඔහු
දක්ෂ කර්මාන්තකරුවෙකුව සොයා-
ගන්නේය.[15]
21 ඔබ ඇත්තටම මේ ගැන දන්-
නේ නැද්ද? ඔබ කවදාවත් මේ ගැන
අසා නැද්ද? බොහෝ කාලයකට
පෙර ඔබට ඒ ගැන කියා දුන්නේ
නැද්ද? පොළොවේ අත්තිවාරම් තැබූ
දා පටන් මේ දක්වා පවතින සාක්ෂි
ඔබ තවමත් වටහාගෙන නැද්ද?[16]
22 පෘථිවි ගෝලයට ඉහළින් වාසය
කරන තැනැත්තෙක් සිටියි.[17] පො-
ළොවේ සියලු වැසියන් ඔහු ඉදිරි-
යේ තණකොළ පෙත්තන් මෙනි.
ඔහු අහස්තලය ඇතිරිල්ලක් මෙන්
දිගහැර කූඩාරමක් මෙන් එය පිහි-
ටුවන්නේය.[18] 23 දෙවි පාලකයන්ව
පහත් කරන්නේය. විනිශ්චයකරු-
වන්ව බලයෙන් පහ කර දමන්නේය.[19]
24 පැළ සිටුවන්නවත් බීජ වපුරන්-
නවත් පැළෑටි හටගෙන මුල් අදින්න-
වත් අවස්ථාවක් නොලැබෙයි.[1]
හුස්මක් හෙළූ සැණින් ඒ සියල්ල
වියළී යන්නේය.[2] කුණාටුවට පිදුරු
ගසාගෙන යන්නාක් මෙන් ඔවුන්ද
ගසාගෙන යනු ඇත.[3]
25 “මට සමාන කළ හැකි කිසි-
වෙකු සිටියිද” කියා ශුද්ධ තැනැත්තා-
ණෝ අසන්නේය.[4] 26 “අහස දෙස
බලන්න. මේ සියල්ල නිර්මාණය
කළේ කවුද?[5] තාරකා සේනා-
වක් මෙන් කැඳවන්නාවූ තැනැත්තා-
ණන්ය. ඔහු ඒ සියල්ල ගණන් කර
නම් වශයෙන් හඳුන්වන්නේය.[6] ඔහු
සතු අතිමහත් බලය[7] හා ශක්තිය
නිසා ඉන් එකක්වත් නැති නොවෙයි.
27 “යාකොබ්ගේ පුත්‍රයෙනි, ‘යෙ-
හෝවා දෙවිට මගේ තත්වය පෙ-
නෙන්නේ නැත.[8] මට යුක්තිය ඉටු
කර දීමට මගේ දෙවිට අම-
තක වී ඇත’[9] කියා ඔබ පවසන්-
නහුය. ඊශ්‍රායෙල්වරුනි, ඔබ එසේ
පැමිණිලි කරන්නේ මන්ද? 28 මුළු
මහත් පොළොවම නිර්මාණය කළ
යෙහෝවා දෙවි සදාකාලයෙන් සදා-
කාලයටම පවතින දෙවි කෙනෙකු[10]
කියා ඔබ දන්නේ නැද්ද? ඔබ ඒ ගැන
අසා නැද්ද?[11] ඔහු කිසිවිටෙක විඩාවට
පත් වන්නේ නැත. ඔහුට වෙහෙසක්
නොදැනෙයි.[12] ඔහුගේ ප්‍රඥාව කිසිවෙ-
කුට තේරුම්ගත හැකිද?[13] 29 දෙවි
විඩාවට පත් වූ අයට සවිය දෙයි.[14]
හෙම්බත් වූ අයව බොහෝ සෙ-
යින් ශක්තිමත්[15] කරයි. 30 තරු-
ණයෝ වෙහෙසට පත් වන්නෝය.
පුරුෂයෝ පවා ක්ලාන්ත වී වැටෙන්-
නෝය. 31 එහෙත් යෙහෝවා දෙවි
කෙරෙහි බලාපොරොත්තු තබන
අය[16] යළි නැඟිටින්නෝය.[17] ඔවුහු
තම සවිය වැඩි කරගෙන රාජාලීන්

**40 පරි.**

**1** යෝබ් 32:8; ගීතා 147:5
**2** ගීතා 62:9
**3** යෙසා 41:5
**4** ගීතා 50:10
**5** මීකා 6:7
**6** ගීතා 39:5; ගීතා 62:9; දානි 4:35
**7** ගීතා 39:11; ගීතා 144:4; යෙසා 41:11
**8** නික් 8:10; 1සාමු 2:2; ගීතා 86:8; ගීතා 89:6; ගීතා 113:5; යෙරෙ 10:6; මීකා 7:18
**9** නික් 20:4; ද්වි 4:15; ද්වි 4:16; ක්‍රියා 17:29
**10** යෙසා 44:10; යෙරෙ 16:20; හබ 2:18
**11** ගීතා 115:4; ගීතා 135:15; යෙසා 37:19; යෙසා 41:7; හොෂෙ 8:6
**12** විනි 17:4; යෙරෙ 10:4
**13** යෙසා 44:14; යෙරෙ 10:3
**14** යෙසා 41:7
**15** ගීතා 115:8; යෙසා 2:8; යෙසා 46:7; හබ 2:18
**16** ගීතා 19:1; ක්‍රියා 14:17; රෝම 1:20
**17** ගීතා 2:4; ගීතා 29:10; ගීතා 68:33; යෙසා 66:1
**18** යෝබ් 9:8; යෝබ් 38:9; යෙසා 42:5; යෙසා 44:24; යෙරෙ 10:12; සෙක 12:1
**19** ගීතා 76:12; ලූක් 1:52

**2 තීරුව**

**1** 1රාජා 21:21; 2රාජා 10:11; යෙරෙ 22:30
**2** යෙසා 11:4
**3** ගීතා 58:9; හිතෝ 1:27; යෙසා 17:13
**4** යෙසා 40:18
**5** ගීතා 8:3; ගීතා 102:25
**6** ගීතා 147:4
**7** ගීතා 89:13; යෙරෙ 32:17; **8** ගීතා 77:7; යෙසා 49:14; යෙසා 60:15; එස 37:11; රෝම 11:1; **9** යෝබ් 27:2; යෝබ් 34:5; ලූක් 18:7; **10** උත් 21:33; ද්වි 33:27; ගීතා 90:2; යෙසා 57:15; යෙරෙ 10:10; රෝම 16:26; 1තිමෝ 1:17; **11** යෙසා 40:21; **12** ගීතා 121:4; යෙසා 27:3; **13** ගීතා 139:6; ගීතා 147:5; යෙසා 55:9; රෝම 11:33; 1කොරි 2:16; **14** ගීතා 29:11; පිලි 4:13; හෙබ්‍රෙ 11:34; **15** යෙසා 40:26; හොෂෙ 12:3; **16** ගීතා 25:3; **17** ගීතා 103:5; ගීතා 138:3.

මෙන් ඉහළටම පියාඹන්නෝය.[1]
ඔවුහු දුවන්නෝය. නමුත් වෙහෙසට
පත් නොවෙති. ඔවුහු ඇවිදින්නෝය.
නමුත් විඩාවට පත් නොවෙති.”[2]

**41** “දූපත්වල වැසියෙනි, නිහඬව
සිට මා පවසන දේට සවන්
දෙන්න.[3] විවිධ ජාතීන්ට අයත් ජන-
යෙනි,[4] ශක්තිය උපදවාගෙන මා ඉදි-
රියට පැමිණෙන්න.[5] මා ළඟට පැමිණ
කතා කරන්න. මා දෙන තීන්දුවට
සවන් දෙන්න.[6]
**2** “නැඟෙනහිර දෙසින් බලවන්-
තයෙකුව කැඳෙව්වේ කවුද?[7] ධර්-
මිෂ්ඨ අරමුණක් ඉටු කරගැනීම සඳහා
ඔහුව කැඳවා, ජාතීන්වත් රජ-
වරුන්වත් ඔහුට යටත් කර දුන්නේ
කවුද?[8] ඔහු තම කඩුවෙන් පහර
දී දූවිලි මෙන් ඔවුන්ව විසුරුවාහැරි-
යේය. ඔහු තම දුන්නෙන් විද ඔවුන්ව
පිදුරු මෙන් ගසාගෙන යන්න සැලැස්-
වූවේය.[9] ඒ සඳහා ඔහුට අවසර ලැබු-
ණේ කාගෙන්ද? **3** ඔහු තමන් පය
නොතැබූ මාර්ගයක් දිගේ කිසි අනතු-
රක් නොමැතිව ඔවුන් පසුපස ලුහු-
බැඳ ගියේය. **4** ඒ සියල්ල ඉටු කළ
තැනැත්තා කවුද?[10] මූලාරම්භයේ
පටන් තම කැමැත්තට එකඟව පරම්-
පරා බිහි කළ තැනැත්තා කවුද?[11]
“ඒ, යෙහෝවා දෙවි වන මමය. මා
පළමුවැනියාය.[12] අවසාන පරම්පරාව
දක්වාම මම වෙනස් නොවෙමි.”[13]
**5** දූපත්වල[14] වැසියෝ එය දැක
බියෙන් සලිත වූහ. පොළොවේ ඈත
සීමාවල සිටින ජනයා බියෙන් වෙවු-
ලන්න පටන්ගත්තෝය.[15] ඔවුහු සිය-
ලුදෙනාම එකතු වී ඉදිරියට ආවෝය.
**6** ඔවුහු එකිනෙකාට සහය වෙමින්,
“ශක්තිමත් වෙන්න”[16] කියා තමන්-
ගේ සහෝදරයන්ව දිරිගැන්වූහ.
**7** වඩුවා කම්මල්කරුව[17] ශක්තිමත්
කළේය. මිටියෙන් දේවතා රූපය මට්-
ටම් කරන තැනැත්තා, “ඔබ හොඳට
පාස්සනවා” කියමින් ලෝහ පාස්සන
තැනැත්තාව දිරිමත් කළේය. අවසා-
නයේදී, රූපය නොවැටෙන සේ ඇණ
ගසා සවි කළේය.[18]

**40 පරි.**
1 නික් 19:4
2 1රාජා 18:46
ගීතා 84:7

**41 පරි.**
3 යෙසා 49:1
4 ගීතා 108:3
5 යෙසා 41:21
6 මීකා 6:1
7 යෙසා 44:28
යෙසා 46:11
එළි 16:12
8 ගීතා 110:6
යෙසා 45:1
9 යෙසා 40:24
10 ගීතා 90:16
ගීතා 111:3
යොහ 5:17
11 ද්වි 32:8
ක්‍රියා 17:26
12 යෙසා 43:10
යෙසා 44:6
යෙසා 48:12
එළි 1:8
13 යෙසා 46:4
මලා 3:6
යාකො 1:17
14 උත් 10:5
15 ගීතා 65:8
ගීතා 66:3
ගීතා 67:7
16 1සාමු 4:9
යෝවෙ 3:10
17 යෙසා 44:12
යෙසා 46:6
18 යෙසා 40:20

**2 තීරුව**
1 නික් 19:5
ලෙවී 25:42
2 ද්වි 7:6
ගීතා 33:12
3 2ලේක 20:7
යාකො 2:23
4 මතෙ 3:9
හෙබ්‍රෙ 2:16
5 ගීතා 107:3
මතෙ 24:31
6 ගීතා 94:14
යෙරෙ 33:26
රෝම 11:2
රෝම 11:26
7 යෙසා 43:10
8 1සාමු 12:22
9 ද්වි 20:1
යොෂු 1:9
ගීතා 46:1
රෝම 8:31
10 ගීතා 147:12
යෙසා 60:19
හෙබ්‍රෙ 8:10
11 ද්වි 33:27
ගීතා 29:11
සෙක 10:12
12 ගීතා 37:40
ගීතා 115:9
ගීතා 121:2
13 ගීතා 65:5
ගීතා 89:14

**8** “ඊශ්‍රායෙල්, ඔබ මාගේ සේව-
කයාය.[1] යාකොබ්, මා තෝරාගත්
තැනැත්තා ඔබය.[2] ඔබ මාගේ මිතුරා[3]
වන ආබ්‍රහම්ගේ පුත්‍රයාය.*[4] **9** මම
ඔබගේ අතින් අල්ලාගෙන පොළොවේ
ඈත කෙළවරේ සිට ඔබව ගෙනා-
වෙමි.[5] මම ඔබව කැඳවාගෙන මෙසේ
කීවෙමි. ‘මම ඔබව ප්‍රතික්ෂේප නො-
කළෙමි.[6] ඔබව මාගේ සේවකයා[7]
ලෙස තෝරාගත්තෙමි.[8] **10** භය
නොවන්න. මන්ද මම ඔබ සමඟ
සිටින්නෙමි.[9] කලබල නොවන්න.
මන්ද ඔබේ දෙවි මමය.[10] මම ඔබව
ශක්තිමත් කරන්නෙමි.[11] ඔබට පිහිට
වන්නෙමි.[12] ධර්මිෂ්ඨකම[13] නමැති
මාගේ දකුණතින්[14] ඔබව තදින් අල්-
ලාගන්නෙමි.’
**11** “ඔබට වෛර කරන සියලුදෙ-
නාම නින්දාවට පත් වන්නෝය.[15]
ඔබට විරුද්ධව නැඟී සිටින අය විනාශ
වී යන්නෝය.[16] **12** ඔබ ඔවුන්ව
සෙව්වත් ඔවුන්ව සොයාගත නො-
හැකි වෙයි. ඔබට විරුද්ධව සටන්
කරන[17] ඒ සියලුදෙනාම නැත්තටම
නැති වී යන්නෝය.[18] **13** මන්ද යෙ-
හෝවා දෙවි වන මම ඔබේ දකුණතින්
අල්ලාගෙන සිටින්නෙමි.[19] ‘භය නො-
වන්න,[20] මම ඔබේ උපකාරයට සිටින්-
නෙමි’[21] කියා ඔබට පැවසුවේ මමය.”
**14** ඔබේ මිදුම්කරුද[22] ඊශ්‍රායෙල්හි
ශුද්ධ තැනැත්තාද වන යෙහෝවා
දෙවි මෙසේද පවසයි. “යාකොබ්, භය
නොවන්න! ඊශ්‍රායෙල් ජනයෙනි,[23]
පණුවෙකු[24] මෙන් සිටින ඔබට මම
උපකාර කරන්නෙමි. **15** මම ඔබව
මඩින යන්ත්‍රයක්[25] මෙන් යොදාගන්-
නෙමි. ඔබ මුවහත් ඇති ඇති අලුත්
මඩින යන්ත්‍රයක් මෙන් ක්‍රියා කරනු
ඇත. ඔබ කඳු පාගා දමා ඒවා පස්

**14** ගීතා 63:8; **15** නික් 11:8; ගීතා 86:17; යෙසා 45:24; එළි 3:9; **16** යෙසා 40:17; යෙසා 60:12; **17** යෙසා 54:17; **18** ගීතා 37:10; ගීතා 37:36; **19** ගීතා 73:23; ගීතා 109:31; යෙසා 42:6; යෙසා 45:1; **20** යෙසා 41:10; **21** ද්වි 33:29; **22** ගීතා 19:14; යෙසා 43:14; යෙසා 47:4; **23** ද්වි 7:7; **24** යෝබ් 25:6; ගීතා 22:6; **25** මීකා 4:13; හබ 3:12.

යෙසා **41:8*** උත් 3:15හි පාදසටහන බලන්න.

ගොඩක් බවට පත් කරන්නෙහිය.
හෙල්ද දහයියා මෙන් වීමට සලස්වන්-
නෙහිය.[1] **16** ඔබ ඒ සියල්ල
ධාන්‍ය මෙන් පොළන්නෙහිය.[2] ඒවා
සුළඟට ගසාගෙන යයි.[3] කුණාටුවක්
හමා ඒ සියල්ල ඒ මේ අත විසුරුවාහ-
රියි.[4] එහෙත් යෙහෝවා දෙවි වන මා
නිසා ඔබ බොහෝ සෙයින් සතුටට
පත් වන්නෙහිය.[5] ඊශ්‍රායෙල්හි ශුද්ධ
තැනැත්තා වන මා ගැන ඔබ ආඩම්-
බරයෙන් කතා කරන්නෙහිය."[6]

**17** "පීඩා විඳින දුප්පතුන් වතුර
සොයමින් ඇවිදින්නෝය.[7] දිය බිඳක්-
වත් සොයාගත නොහැකි[8] ඔවුන්ගේ
තොල් කට වේළී ඇත.[9] යෙහෝවා
දෙවි වන මම ඔවුන්ට පිහිට වන්-
නෙමි.[10] ඊශ්‍රායෙල්හි දෙවි වන මම
ඔවුන්ව අත් නොහරිමි.[11] **18** මම
පාළු කඳු දිගේ ගංගා ගලා බසින්න
සලස්වන්නෙමි. තැනිතලා මැද දිය
උල්පත් උනන්න සලස්වන්නෙමි.[12]
පාළුකරය දිය පොකුණක් මෙන් වෙයි.
කාන්තාරයද දිය පහරවලින් ගහන
වෙයි.[13] **19** මම පාළුකරයේ දේව-
දාර, ෂිට්ටිම්, මරඳ සහ පයින් ගස්
වැවෙන්න සලස්වන්නෙමි.[14] කාන්තා-
රයේ ජුනිපර් ගස්ද හල් ගස්ද සයි-
ප්‍රස් ගස්ද වැවෙන්න සලස්වන්නෙමි.[15]
**20** මේ සියල්ල දකින විට ජනයා මා
කළ දේ ගැන ගැඹුරින් සිතා බලා
තමන්ගේ අවබෝධය වැඩි කරගනිති.
මේ සියල්ල ඉටු කළේ ඊශ්‍රායෙල්හි
ශුද්ධ තැනැත්තා වූ යෙහෝවා දෙවි
වන මා බව ඔවුහු වටහාගනු ඇත."[16]

**21** යාකොබ්ගේ රජු[17] වන යෙ-
හෝවා දෙවි ඔබට මෙසේ ආරාධනා
කරයි. "ඉදිරියට පැමිණ ඔබේ සාක්ෂි
ඉදිරිපත් කරන්න.[18] ඔබේ නිදහසට
කරුණු ඉදිරිපත් කරන්න.[19] **22** ඉදි-
රියේදී සිදු වීමට නියමිත දේවල් ගැන
ඔබ දන්නවා නම් කියන්න. මූලා-
රම්භයේ සිට සිදු වූ දේවල් ගැනත්
කියන්න. එවිට අපි ඒවා ගැන හොඳින්
සිතා බලා අවසානයේදී සිදු වීමට
යන දේ වටහාගන්නෙමු. එසේත්
නැත්නම්, ඔබම ඒ දේවල් ගැන
අපිට කියා දෙන්න.[1] **23** අනාගතය
ගැන නිවැරදිව අපිට කියා දුන්-
නොත් ඔබ දෙවිවරුන් කියා අපි
පිළිගන්නෙමු.[2] යහපත් ක්‍රියාවක් හෝ
නපුරු ක්‍රියාවක් හෝ සිදු කර ඔබේ
බලය ඔප්පු කර අපව පුදුමයට පත්
කරන්න.[3] **24** ඔබ කිසි වටිනාක-
මක් නැති බොරු දෙවිවරුන්ය. ඔබට
කිසිවක් ඉටු කළ නොහැකිය.[4] ඔබට
නමස්කාර කරන අය පිළිකුලකි.[5]

**25** "මම බලවන්තයෙකුව කැඳෙව්-
වෙමි. නැඟෙනහිර දිශාවේ[6] සිටින ඔහු
මාගේ නාමයට අයැදින්නේය. උතුරු
දෙසින් පැමිණෙන ඔහු,[7] කුඹල්කරු-
වෙකු අමු මැටි පිඩක් පාගන්නාක්
මෙන් පාලකයන්ව පාගා දමන්නේය.[8]

**26** "අනාගතයේදී සිදු වීමට යන
මේ දේවල් ගැන කිසිවෙකු පවසා
ඇද්ද? අතීතයේ සිටම මේ දේවල්
ගැන පැවසූ කෙනෙකු සිටියිද? එවැනි
කෙනෙකු සිටී නම් 'ඔහු කී දේ එලෙ-
සම ඉටු වුණා'[9] කියා අපට කිව
හැකිය. එහෙත් එවැනි ප්‍රකාශයක්
කළ හැකි එක් කෙනෙකුවත් ඔබ අත-
රේ නැත. ඔබේ මුවින් එක වචනයක්-
වත් පිට කළ නොහැකිය."[10]

**27** පළමුවැනියා මමය. මම
සියොන් නුවරට, "අර බලන්න! ඔවුන්
දැනටමත් ඇවිත් සිටිනවා"[11] යයි
කියන්නෙමි. මම යෙරුසලම වෙනට
ශුභාරංචි රැගෙන යන තැනැත්තෙකුව
යවන්නෙමි.[12]

**28** මම ඔවුන්ව සෝදිසි කර බැලු-
වෙමි. නමුත් මඟ පෙන්වීම් දිය
හැකි කිසිවෙක් ඔවුන් අතරේ සිටි-
යේ නැත.[13] මම ඔවුන්ගෙන් ප්‍රශ්න
ඇසුවෙමි. එහෙත් උත්තරයක් නො-
ලැබුණි. **29** ඔවුහු කිසි වටිනාකමක්
නැති බොරු දෙවිවරුය. ඔවුන්ට කිසි-
වක් කළ නොහැකිය. ඔවුන්ගේ දේ-
වතා රූප සුළඟ මෙනි. ඒවායින් කිසි
පලක් නැත.[14]

**41 පරි.**
**1** ගීතා 18:42
**2** මතෙ 3:12
**3** ගීතා 1:4
**4** යෙසා 17:13
**5** එස්ත 9:22 යෙසා 25:9
**6** යෙසා 12:6 යෙරෙ 9:24
**7** ගීතා 63:1 යෙසා 55:1 ආමො 8:11 එළි 22:17
**8** ද්වි 28:48 ගීතා 22:15 විලා 4:4
**9** ලූක් 16:24
**10** ගීතා 34:6 යෙසා 30:19
**11** උත් 28:15 ගීතා 94:14 යෙසා 42:16 හෙබ්‍රෙ 13:5
**12** ගීතා 46:4 යෙසා 30:25 යෝවෙ 3:18
**13** ගීතා 107:35
**14** යෙසා 32:15 යෙසා 55:13 යෙසා 60:21
**15** යෙසා 51:3
**16** ගීතා 109:27 එස 39:28
**17** ද්වි 33:5 යෙසා 49:26 යෙසා 60:16
**18** යෝබ් 23:4 යෙසා 43:9
**19** යෝබ් 38:3 යෙසා 50:8 මීකා 6:2

**2 තීරුව**
**1** යෙසා 42:9 යෙසා 46:10 යෙසා 48:5
**2** යෙසා 44:6 යෙසා 46:9 යෙරෙ 16:20
**3** යෙසා 46:7 යෙරෙ 10:5
**4** ගීතා 115:8 යෙසා 44:10 යෙරෙ 10:14 යෙරෙ 51:18 1කොරි 8:4
**5** ද්වි 7:26 ද්වි 27:15
**6** යෙසා 46:11 එළි 16:12
**7** යෙසා 44:28 යෙසා 45:1 යෙරෙ 51:28
**8** 2සාමු 22:43 යෙසා 10:6 මීකා 7:10 සෙක 10:5
**9** යෙසා 43:9 යෙසා 44:7 යෙසා 45:21
**10** ගීතා 115:6 හබ 2:18

**11** යෙසා 43:10; යෙසා 44:7; **12** එස්රා 1:1; යෙසා 40:9; නාහු 1:15; රෝම 10:15; **13** යෙසා 63:5; යෙරෙ 5:13; ආනි 2:10; **14** ගීතා 115:4; යෙසා 44:9; යෙරෙ 10:5; හබ 2:18; 1කොරි 8:4.

**42** මෙන්න, මාගේ අනුමැතිය
ඇති[1] මාගේ සේවකයා![2] මා
තෝරාගත්[3] සේවකයා මොහුය. මම
සෑම අතින්ම ඔහුට සහය වෙමි.[4]
මාගේ බලය ඔහුට නොඅඩුව දෙන්-
නෙමි.[5] සියලු ජාතීන්ට ඔහු යුක්තිය
ඉටු කර දෙන්නේය.[6] **2** ඔහු කෑග-
සන්නේවත් ප්‍රධාන වීථිවල ශබ්ද නඟා
කතා කරන්නේවත් නැත.[7] **3** ඔහු
තැළුණු බට ගසක් පොඩි කරන්නේ-
වත්[8] නිවී යන පහන් තිරයක් නිවා
දමන්නේවත් නැත. ඔහු විශ්වාසවන්ව
ක්‍රියා කර යුක්තිය ඉටු කර දෙයි.[9]
**4** පොළොව පුරාම යුක්තිය ඉටු කිරී-
මට ඔහු අදිටන් කරගෙන සිටියි.[10] ඔහු
දුර්වල වී තම වෑයම අත්හරින්නේ
නැත. ඔහුව නවතා දැමීමට කිසිවෙක්
සමත් වන්නේද නැත. ඔහුගේ නීති
ක්‍රියාත්මක වන තුරු දූපත්වල වැසි-
යෝ ආශාවෙන් බලා සිටින්නෝය.[11]
**5** අහස්තලය සාදා[12] එය දිගහැ-
රියාවූ,[13] පොළොවත්[14] එහි සියල්-
ලත් සෑදුවාවූ,[15] ලෝවැසියන්ට[16]
ජීවිතයද[17] හුස්මද[18] දෙන්නාවූ උදාර
තැනැත්තාද සැබෑ දෙවිද වන යෙ-
හෝවා මෙසේ කියන්නේය. **6** "යෙ-
හෝවා දෙවි වන මම ධර්මිෂ්ඨ
අරමුණක් ඉටු කිරීම සඳහා ඔබව
කැඳෙව්වෙමි.[19] මම ඔබේ අතින් අල්-
ලාගතිමි.[20] මම ඔබව ආරක්ෂා කර
සියලු ජනයාට සහතිකයක්* ලබා
දෙන පිණිසත්[21] ජාතීන්ට ආලෝකය
දෙන පිණිසත්[22] ඔබව යවන්නෙමි.
**7** අන්ධ අයට පෙනීම ලබා දෙන්-
නත්[23] සිරකරුවන්ව නිදහස් කරන්-
නත්[24] අඳුරු සිරකුටිවල හිඳගෙන
සිටින අයව එළියට කැඳවන්නත්[25]
මම ඔබව පත් කළෙමි.
**8** "මාගේ නාමය යෙහෝවාය.[26]
මට හිමි ගෞරවය වෙන කිසිවෙකු
සමඟ මම බෙදා නොගන්නෙමි.[27] මට
ලැබිය යුතු ප්‍රශංසාව[28] දේවතා රූපය-
කට දීමට ඉඩ නොදෙන්නෙමි.[29]
**9** "මා පෙර කී අනාවැකි ඉටු වී
තිබේ.[1] දැන් මම අලුත් යමක් ගැන
ඔබට පවසන්නෙමි. එය ඉටු වීමට
පෙර මම ඔබට ඒ ගැන දන්වන්-
නෙමි."[2]
**10** නාවිකයෙනි, ධීවරයෙනි,[3] පො-
ළොවේ ඈත කෙළවරේ සිට[4] යෙ-
හෝවා දෙවිට අලුත් ප්‍රශංසා ගීයක්[5]
ගයන්න. දූපත්වල වැසියෙනි,[6] ඔබත්
ඔහුට ප්‍රශංසා ගී ගයන්න. **11** පාළු-
කරයේද[7] ඒ අවට පිහිටි නුවරවලද
කේදාර්වරුන්ගේ[8] ගම්මානවලද පර්-
වත මතද ජීවත් වන සියල්ලෙනි,[9]
ඔබේ හඬ නඟන්න. කඳු මුදුන්ව-
ලට ගොස් ප්‍රීති ඝෝෂා නඟන්න.
**12** ඔවුහු සියල්ලෝම යෙහෝවා දෙ-
විට ගෞරවය දෙත්වා![10] දූපත්වල
වැසියෝද දෙවිට ප්‍රශංසා කරත්වා![11]
**13** යෙහෝවා දෙවි බලවන්ත-
යෙකු මෙන්ද[12] රණශූරයෙකු මෙන්ද
එඩිතර ලීලාවෙන් පැමිණෙයි.[13] දෙවි
යුද්ධයට සැරසෙයි. ඔහු හඬ නඟා[14]
තම සතුරන් ඉදිරියට ගොස් ඔවුන්ව
අන්ත පරාජයට පත් කරයි.[15]
**14** "මම බොහෝ කල් පියවර
නොගෙන[16] නිහඬව බලා සිටිමි.[17]
මම මාවම පාලනය කරගත්තෙමි.[18]
එහෙත් දැන් මම දරුවෙකු බිහි කරන
ස්ත්‍රියක මෙන් කෑගසමි. මම හති
දමා හයියෙන් හුස්ම ගන්නෙමි.[19]
**15** මම කඳුද හෙල්ද විනාශ කර
ඒවායෙහි ගස් වැල් දවා දමන්-
නෙමි.[20] මම ගංගා, වැව් හා පො-
කුණු වියළි බිම් බවට හරවන්නෙමි.[21]
**16** මම අන්ධ අයට තමන් කිසිදා
නොගිය මඟක ඇවිදින්න සලස්වන්-
නෙමි.[22] ඔවුන් නොදන්නා මාර්ගයක
ඔවුන්ව ගෙන යන්නෙමි.[23] අඳුරු තැන්

**42 පරි.**
**1** මතෙ 3:17
යොහ 6:27
2පේත්‍රු 1:17
**2** යෙසා 52:13
මතෙ 12:18
යොහ 4:34
යොහ 6:38
**3** ගීතා 89:19
ලූක් 9:35
1පේත්‍රු 2:4
**4** යෙසා 49:7
යොහ 16:32
**5** යෙසා 61:1
මතෙ 3:16
ක්‍රියා 10:38
**6** මතෙ 12:18
රෝම 15:9
**7** සෙක 9:9
මතෙ 12:16
මතෙ 12:19
**8** යෙසා 40:11
මතෙ 11:28
හෙබ්‍රෙ 2:17
**9** ගීතා 72:2
යෙසා 11:3
මතෙ 12:20
යොහ 5:30
එළි 19:11
**10** යෙසා 9:7
යෙසා 49:8
**11** උත් 12:3
උත් 49:10
ගීතා 22:27
මතෙ 12:21
**12** ගීතා 102:25
යෙසා 40:26
**13** ගීතා 104:2
යෙසා 40:22
**14** උත් 1:1
ගීතා 136:6
**15** යෙරෙ 10:12
**16** උත් 2:7
ක්‍රියා 17:25
**17** උත් 7:22
**18** යෝබ් 12:10
දේශ 12:7
**19** ගීතා 45:6
යෙසා 32:1
**20** යෙසා 41:13
**21** යෙසා 49:8
මතෙ 26:28
හෙබ්‍රෙ 8:6
**22** යෙසා 49:6
ලූක් 2:32
යොහ 8:12
**23** යෙසා 35:5
**24** යෙසා 61:1
**25** හෙබ්‍රෙ 2:15
1පේත්‍රු 2:9
**26** ගීතා 83:18
**27** යෙසා 48:11
**28** නික් 15:11
යෙසා 12:4
**29** නික් 32:8
නික් 34:14

**2 තීරුව**
**1** උත් 12:2
උත් 15:14
යොෂු 21:45
1රාජා 8:15

**2** යෙසා 41:23; යෙසා 43:19; ආමො 3:7; 2පේත්‍රු 1:21; **3** ගීතා 107:23; **4** යෙසා 44:23; හබ 3:3; **5** ගීතා 96:1; ගීතා 98:1; එළි 14:3; **6** ගීතා 97:1; යෙසා 51:5; **7** යෙසා 32:16; යෙසා 35:1; **8** උත් 25:13; ගීතා 120:5; යෙසා 60:7; **9** යෙරෙ 48:28; යෙරෙ 49:16; **10** ගීතා 22:27; යෙසා 24:15; රෝම 15:9; **11** යෙසා 66:19; **12** ගීතා 78:66; යෙසා 59:17; යෙරෙ 25:30; **13** නික් 15:3; නාහු 1:2; **14** හොෂෙ 11:10; යෝවෙ 3:16; **15** ද්වි 32:39; 1සාමු 2:10; **16** යෙරෙ 44:22; **17** ගීතා 50:3; ගීතා 83:1; **18** 2පේත්‍රු 3:9; **19** උත් 3:16; **20** ගීතා 18:7; යෙරෙ 4:24; ශෙප 1:15; **21** ගීතා 107:33; යෙසා 37:25; යෙසා 44:27; යෙසා 50:2; **22** යෙසා 29:18; යෙසා 35:5; යෙරෙ 31:8; **23** යෙසා 30:21.

යෙසා **42:6*** මූ.අ., "ගිවිසුමක්."

මම ආලෝකවත් කර[1] රළුබිම් සම-
තලා කරමි.[2] මම ඔවුන්ව කිසිදා අත්
නොහරිමි."[3]

17 දේවතා රූප කෙරෙහි විශ්වා-
සය තබන සියල්ලෝම පලා දුවන්-
නෝය.[4] දේවතා රූපයකට, "ඔබයි
අපේ දෙවි"[5] කියා පවසන ඒ සියලුදෙ-
නාම ලැජ්ජාවට පත් වනු ඇත.

18 බිහිරිව සිටින සියල්ලෙනි,
සවන් දෙන්න. අන්ධව සිටින සියල්-
ලෙනි, ඔබේ ඇස් ඇර බලන්න.[6]
19 මාගේ සේවකයා තරම් අන්ධ වූ
කෙනෙක් සිටියිද? මාගේ පණිවිඩ-
කරුවා තරම් බිහිරි අයෙක් තවත්
සිටියිද? ආශීර්වාද ලැබූ තැනැත්තා
තරම් හෝ යෙහෝවා දෙවිගේ සේව-
කයා තරම් හෝ අන්ධව සිටින
කෙනෙක් සිටියිද?[7] 20 ඔබ බො-
හෝ දේ දුටුවත් ඒ කිසිවකට ඔබ
අවධානය දුන්නේ නැත.[8] ඔබ අසා-
ගෙන සිටියත් ඒ කිසිවක් සිතට ගත්-
තේ නැත.[9] 21 යෙහෝවා දෙවි තම
ධර්මිෂ්ඨකම සියල්ලන්ට පෙනෙන
සේ[10] තම නීතිය මොන තරම් ශ්‍රේෂ්-
ඨද[11] කියා පෙන්වා දී තිබේ. ඔහු
මහත් ආශාවකින් තම නීතිය උසස්
බව ප්‍රකාශ කරන්නේය. 22 එහෙත්
මේ සෙනඟ තම සතුරන්ගේ ගොදුරක්
බවට පත් වී ඇත. කොල්ලකරුවන්
ඇවිත් ඔවුන්ගේ සියලු වස්තු පැහැර-
ගෙන ගොස් තිබේ.[12] ඔවුහු වළක වැටී
ඉන් ගොඩ ඒමට නොහැකිව සිටිති.
ඔවුන්ව සිරකුටිවල සිර කර තබා
ඇත.[13] ඔවුන්ව ගලවාගැනීමට හෝ,
"ඔවුන්ව පිටතට ගන්න" කියා පැවසී-
මට හෝ කිසිවෙක් නැත.[14]

23 ඔබ අතරින් මේ දේට ඇහුම්-
කන් දෙන්නේ කවුද? පසු කලෙක
ප්‍රයෝජන ලබාගන්නා පිණිස
හොඳින් අවධානය දෙන්නේ කවුද?[15]
24 යාකොබ්ව සතුරන් අතට පත්
වීමට ඉඩහැරියේ කවුද? ඊශ්‍රායෙල්ව-
රුන්ව කොල්ලකරුවන් අතට භාර
දුන්නේ කවුද? ඒ, යෙහෝවා දෙ-
වියි. අපි ඔහුට විරුද්ධව පව් කළෙමු.
අපි දෙවිගේ මාර්ගවල ගමන් කිරීමට
කැමැත්තක් නොදැක්වූවෙමු. ඔහුගේ
නීති ගණනකටවත් ගත්තේ නැත.[1]
25 එබැවින් ඔහු තම දැවෙන කෝපය
පිට කළේය. යුද්ධයෙන් දරුණු ලෙස
පීඩා විඳින්න අපට ඉඩහැරියේය.[2] යුද්-
ධය ගිනිදලු මෙන් අප වටා ඇවිළු-
ණේය.[3] එහෙත් අපි එයින් පාඩමක්
ඉගෙනගත්තේ නැත.[4] ගිනිදලු අපව
දවා දැමුවේය. එහෙත් අපි එය ගණන-
කටවත් ගත්තේ නැත.[5]

43 යාකොබ්, ඔබේ සැදුම්කරු[6]
වන යෙහෝවා දෙවි කියන
දේට සවන් දෙන්න. ඊශ්‍රායෙල්, ඔබව
බිහි කළ තැනැත්තා[7] මෙසේ කියන්-
නේය. "භය නොවන්න. මන්ද මම
ඔබව මුදවාගත්තෙමි.[8] මම ඔබේ
නමින් ඔබට හඬගැසුවෙමි.[9] ඔබ
මට අයිති සෙනඟකි.[10] 2 ඔබ ජල
ධාරා මැදින් ගියත්[11] මම ඔබ සමඟ
සිටිමි.[12] ඔබ ගංගා මැදින් ගියත් ඔබට
ගිලෙන්න ඉඩ නොදෙමි.[13] ඔබ ගිනි
ජාලා මැදින් ගමන් කළත් මම ඔබට
කිසි හානියක් වීමට ඉඩ නොදෙමි.[14]
3 මන්ද මා ඔබේ දෙවි වන යෙ-
හෝවාය. ඔබේ ගැලවුම්කරු[15] වන
ඊශ්‍රායෙල්හි ශුද්ධ තැනැත්තාය. මම
ඔබව මුදවාගැනීම සඳහා ඊජිප්තුව
සතුරා අතට භාර දුනිමි.[16] ඔබ වෙනු-
වට ඉතියෝපියාවද[17] සෙබාවද දුන්-
නෙමි. 4 මන්ද ඔබ මට ඉතා අගනා
වස්තුවකි.[18] මම ඔබට බොහෝ සෙ-
යින් ප්‍රේම කර[19] ඉතා ගෞරවයෙන්
සලකමි. ඒ නිසා ඔබව මුදවාගන්නා
පිණිස මම මනුෂ්‍යයන්වද ජාතීන්වද
භාර දෙමි.[20]

5 "භය නොවන්න. මම ඔබ සමඟ
සිටිමි.[21] නැඟෙනහිර දෙසින්ද බස්-
නාහිර දෙසින්ද මම ඔබේ දරු-
වන්ව එකතු කර එක තැනකට
ගෙනෙන්නෙමි.[22] 6 මම උතුරට[23]

**42 පරි.**
1 යෙසා 60:1; යෙසා 60:20
2 යෙසා 40:4; ලූක් 3:5
3 ගීතා 94:14; හෙබ්‍රෙ 13:5
4 ගීතා 97:7; යෙසා 1:29; යෙසා 44:11; යෙසා 45:16; යෙරෙ 2:26
5 නික් 32:4; යෙසා 44:17
6 යෙසා 6:10; යෙසා 29:18; යෙසා 43:8
7 යෙසා 6:9; යෙසා 56:10; යෙසා 61:1; යෙරෙ 4:22; එස 12:2; ලූක් 4:18; 2කොරි 4:4
8 ද්වි 4:9; ද්වි 29:4; ගීතා 106:7
9 එස 33:31
10 ගීතා 71:16; රෝම 3:25
11 ගීතා 19:7; හෙබ්‍රෙ 8:10
12 ද්වි 28:33; යෙසා 1:7; යෙරෙ 50:17
13 ගීතා 102:20
14 ද්වි 28:29; ද්වි 28:52; යෙසා 51:23
15 ලෙවී 26:16; ද්වි 4:30; ද්වි 32:29

**2 තීරුව**
1 විනි 2:14; 2ලේක 15:6; ගීතා 106:41
2 ද්වි 32:22; නාහු 1:6
3 2රාජා 10:32; 2රාජා 25:9
4 යෙසා 9:13; යෙරෙ 5:3; හොෂෙ 7:9
5 යෙසා 57:11; මලා 2:2

**43 පරි.**
6 ගීතා 100:3; යෙසා 43:15; එෆී 2:10
7 යෙසා 44:2; යෙසා 44:21
8 යෙසා 35:9; යෙසා 44:23; යෙරෙ 50:34
9 යෙසා 45:4
10 ද්වි 32:9; ගීතා 135:4

**11** නික් 14:29; යොෂු 3:15; ගීතා 66:12; හෙබ්‍රෙ 11:29; **12** ගීතා 23:4; **13** 2රාජා 2:8; **14** දානි 3:25; සෙක 13:9; **15** යෙසා 60:16; තීත 2:10; තීත 3:4; **16** 2රාජා 24:7; එස 29:19; **17** යෙසා 45:14; **18** නික් 19:5; **19** ද්වි 7:8; යෙරෙ 31:3; **20** හිතෝ 21:18; **21** යෙසා 41:10; යෙසා 44:2; යෙරෙ 30:10; **22** ද්වි 30:3; ගීතා 106:47; යෙසා 66:20; එස 36:24; මීකා 2:12; සෙක 8:7; රෝම 11:26; **23** යෙරෙ 3:18.

කතා කර, 'ඔවුන්ව මුදාහරින්න' කියා පවසමි. මම දකුණට කතා කර, 'ඔවුන්ට යන්න දෙන්න. පොළොවේ ඈත කෙළවරේ සිට[1] මාගේ පුතුන්වද දූවරුන්වද නිදහස් කරන්න. **7** මට ගෞරවය ගෙනෙන පිණිස මා බිහි කළ,[2] මාගේ නාමයෙන් හඳුන්වන ඒ සියලුදෙනාව[3] මුදාහරින්න' කියාද පවසමි.

**8** "ඇස් තිබුණත් කිසිවක් නොපෙනෙන, කන් තිබුණත් කිසිවක් නෑසෙන[4] ඒ සෙනඟව ඉදිරියට කැඳවන්න. **9** විවිධ ජාතීන්ව එක් තැනකට රැස් කරන්න. සියලු ජනයාව එක් රැස් කරන්න.[5] ඉදිරියේදී සිදු වන දේවල් ගැන කියන්න පුළුවන් කාටද?[6] ඊළඟට සිදු වෙන්න යන්නේ කුමක්ද කියා කිසිවෙකුට පැවසිය හැකිද?[7] ඔවුන්ගේ නිර්දෝෂ බව ඔප්පු කිරීමට සාක්ෂිකරුවන්ව කැඳවන්න කියා ඔවුන්ට කියන්න.[8] එවිට ඔවුන් නිවැරදිව යමක් පවසා ඇත්නම්, 'එය සැබෑවක්'[9] බව ඔවුන්ගේ සාක්ෂිකරුවන්ට ප්‍රකාශ කළ හැකිය."

**10** යෙහෝවා දෙවි මෙසේ පවසන්නේය. "ඔබ මාගේ සාක්ෂිකරුවෝය.[10] මාගේ සේවකයා වශයෙන්ද මම ඔබව තෝරාගතිමි.[11] ඔබ මාව දැන හඳුනා ගෙන[12] මා කෙරෙහි විශ්වාසය තබන පිණිසත්[13] මා කිසිදා නොවෙනස් වන දෙවි කෙනෙකු බව තේරුම්ගන්නා පිණිසත්[14] මම ඔබව තෝරාගතිමි. මට පෙර කිසි දෙවි කෙනෙක් සිටියේ නැත.[15] මින් මතු කිසිදාක මා හැර වෙන කිසි දෙවි කෙනෙක් සිටින්නේද නැත.[16] **11** යෙහෝවා දෙවි මමය.[17] මා හැර වෙනත් මිදුම්කරුවෙක් නැත."[18]

**12** යෙහෝවා දෙවි මෙසේද පවසන්නේය. "ඔබ අතරේ වෙනත් දෙවිවරුන් නොසිටියදී[19] මම ඔබට කාරණා හෙළි කර දුනිමි. මම ඔබව ගලවා, සිදු වීමට යන දේ කලින්ම ඔබට ප්‍රකාශ කළෙමි.[20] ඒ නිසා, ඔබ මාගේ සාක්ෂිකරුවෝය.[21] සැබෑ දෙවි මමය.[22] **13** මම කිසිදා වෙනස් නොවෙමි.[1] මගේ අතින් ගැලවිය හැකි කිසිවෙක් නැත.[2] මා කරන දේ[3] වළක්වන්න කිසිවෙකුට නොහැක."[4]

**14** ඔබේ මිදුම්කරුද[5] ඊශ්‍රායෙල්හි ශුද්ධ තැනැත්තාද[6] වන යෙහෝවා දෙවි මෙසේ පවසන්නේය. "මම ඔබ වෙනුවෙන් ඔවුන්ව බැබිලෝනියට යවා සිර මැදිරිවල අගුල් කඩා දමන්නෙමි.[7] කල්දිවරුන්ගේ නාවිකයන්වද පරදවා ඔවුන්ට විලාප නඟන්න සලස්වමි.[8] **15** යෙහෝවා වන මා ඔබේ ශුද්ධ දෙවිය.[9] ඔබේ රජුය.[10] ඊශ්‍රායෙල්වරුන්ගේ සැදුම්කරු මමය."[11]

**16** යෙහෝවා දෙවි මුහුද මැදින්ද සැඩ ජල පහරවල් හරහාද මාර්ගයක් සකසන්නේය.[12] **17** ඔහු යුධ රථද අශ්වයන්ද යුද සේනාවද පිටතට ගෙන එන්නේය. ඔහු පිටතට ගෙන එන අය අතරේ යුද්ධයට දක්ෂ අයද සිටිති.[13] "ඔවුහු යළි කිසිදා හිස ඔසවන්න බැරි ලෙස[14] බිම වැටෙන්නෝය.[15] පහන් තිරයක් නිවා දමන්නාක් මෙන්[16] ඔවුන්වද නැති කර දමනු ඇත"[17] කියා දෙවි පවසන්නේය.

**18** "අතීතයේ දේවල් සිහි නොකරන්න. දැන් ඒ දේවල් ගැන කල්පනා නොකරන්න. **19** මන්ද මම අලුත් දෙයක් කරමි.[18] එය සිදු වෙන්න පටන්ගන්නා විට ඔබ එය දැක තේරුම්ගනු ඇත.[19] පාළුකරය හරහා මම මාර්ගයක් තනමි.[20] කාන්තාරය මැදින් ගංගාවන් ගලා බසින්න සලස්වමි.[21] **20** මම පාළුකරයේ ඇළදොළ, ගංගා ගලා බසින්න සලස්වා[22] මාගේ තෝරාගත් සෙනඟගේ[23] පිපාසය සන්සිඳුවන්නෙමි. එය දැක හිවලුන් හා පැස්බරුන්[24] වැනි වනසත්තු පවා මට ප්‍රශංසා කරති.[25] **21** ඔවුන් මාගේ සෙනඟය. මා ඔවුන්ව බිහි

**43 පරි.**

**1** යෙරෙ 31:8
**2** නික් 19:6; ගීතා 50:23; ගීතා 95:6; ගීතා 100:3; යෙසා 29:23; 1පේත්‍රු 2:9
**3** යෙරෙ 33:16
**4** යෙසා 6:9; යෙසා 42:18
**5** යෙසා 41:1
**6** යෙසා 44:7; යෙසා 46:10
**7** යෙසා 48:5
**8** යෙසා 41:21
**9** 1රාජා 18:24
**10** යෙසා 43:12; යෙසා 44:8; යොහ 15:27; ක්‍රියා 1:8; 1කොරි 15:15; එළි 1:5
**11** ද්වි 4:37; ද්වි 10:15; ගීතා 78:68; මතෙ 24:45; එෆී 1:4; 2තෙස 2:13
**12** යෙසා 41:20; යෙරෙ 31:34
**13** යොහ 20:31; රෝම 11:20
**14** යෙසා 41:4
**15** යෙසා 44:6; යෙසා 45:6; 1කොරි 8:4
**16** යෙසා 44:8
**17** ද්වි 6:4
**18** යෙසා 12:2; හොෂෙ 13:4; 1තිමෝ 2:3; යූද් 25
**19** ද්වි 32:12; ගීතා 81:9
**20** යෙසා 46:10
**21** යෙසා 43:10
**22** යෙසා 37:20; යෙසා 46:9

**2 තීරුව**

**1** යෙසා 41:4; එළි 1:8
**2** ද්වි 32:39; ගීතා 50:22; හොෂෙ 2:10
**3** ද්වි 32:4; ගීතා 64:9; යෙසා 41:4; දානි 4:35
**4** යෝබ් 9:12; යෙසා 14:27
**5** ගීතා 19:14; යෙසා 44:6; යෙසා 63:16
**6** යෙසා 54:5
**7** යෙසා 14:17; යෙසා 45:2
**8** යෙරෙ 50:10; එළි 18:11
**9** ගීතා 89:18; යෙරෙ 51:5

**10** ද්වි 33:5; ගීතා 74:12; යෙසා 33:22; එළි 11:17; **11** යෙසා 43:1; **12** නික් 14:16; යොෂු 3:13; **13** නික් 15:4; **14** යෙසා 14:20; යෙරෙ 51:39; **15** ගීතා 76:6; **16** යෙසා 1:31; යෙසා 42:3; **17** එළි 19:20; **18** යෙසා 42:9; **19** යෙසා 40:5; ලූක් 3:6; **20** යෙසා 11:16; යෙසා 40:3; **21** ද්වි 8:15; ගීතා 78:16; යෙසා 41:18; **22** යෙසා 41:17; යෙරෙ 31:9; එළි 22:17; **23** ගීතා 33:12; යෙසා 41:8; යෙසා 44:1; 1පේත්‍රු 2:9; **24** යෙසා 34:13; **25** ගීතා 148:10.

කළේ ඔවුන් මාර්ගයෙන් මට ප්‍රශංසා-
වද ගෞරවයද ලැබෙන පිණිසයි.[1]
**22** "එහෙත් යාකොබ්, ඔබ මට
හඬගැසුවේ නැත.[2] අනේ ඊශ්‍රායෙල්,
ඔබ මාව එපා කළේ මන්ද?[3] **23** ඔබ
දවන පූජා ලෙස ඔබේ බැටළුවන්ව මා
ඉදිරියට ගෙනාවේ නැත. ඔබ මට
ඔප්පු කරන පූජාවලින් මාව ගෞරව-
යට පත් කළේ නැත.[4] මට තෑගිබෝග
ගෙනැවිත් දෙන්න කියා මම ඔබට
බල කළේවත් කට්ටකුමංජල් ගෙනැ-
විත් දෙන්න කියා ඔබට කරදර කළේ-
වත් නැත.[5] **24** ඔබ මට පූජා කිරීම
සඳහා සුවඳැති පැළෑටි[6] මිල දී ගෙනා-
වේවත් ඔබේ පූජාවල තෙලින් මාව
සතුටට පත් කළේවත් නැත.[7] ඔබ
කරන වැරදි නිසා මම කලකිරී සිටිමි.[8]
ඔබේ පව්කාර ක්‍රියා නිසා මට දැන්
ඔබට සේවය කරන්න සිදු වී තිබේ.

**25** "එහෙත් ඔබ කළ වැරදි[9] මගේ
සිතින් මකා දමමි.[10] ඔබ කළ අප-
රාධ මම නැවත මතක් කරගන්නේද
නැත.[11] මා එසේ කරන්නේ මාගේ
නාමය වෙනුවෙනි.[12] **26** එන්න, අපි
කතා කර මේ ප්‍රශ්නය විසඳගනිමු.[13]
මට යමක් අමතක වී ඇත්නම් මට
මතක් කර දෙන්න. ඔබේ නිර්දෝෂී
බව ඔප්පු කිරීමට කරුණු ඉදිරි-
පත් කරන්න.[14] **27** ඔබේ මුල් පියා
පව් කළේය.[15] ඔබට මඟ පෙන්වන
අය පවා මට විරුද්ධව කැරලිගැසු-
වෝය.[16] **28** ඒ නිසා මම ශුද්ධස්-
ථානයේ සිටින ප්‍රධානීන්ව පහත්
කරන්නෙමි. යාකොබ්ව විනාශ කිරී-
මට ඉඩහරින්නෙමි. ඊශ්‍රායෙල් නින්දා-
වට ලක් වනු ඇත.[17]

**44** "මාගේ සේවක යාකොබ්,[18]
මා තෝරාගත් තැනැත්තා[19]
වන ඊශ්‍රායෙල්, මේ දේ සිතට ගන්න.
**2** ඔබ මව්කුසේ සිටි කාලයේ
පටන්[20] මේ දක්වාම ඔබට පිහිට වූ,
ඔබේ සැදූම්කරුද[21] ඔබව බිහි කළ[22]
තැනැත්තාද වන යෙහෝවා දෙවි
ඔබට මෙසේ කියයි. "මාගේ සේවක
යාකොබ්, මා තෝරාගත් තැනැත්තා
වන යෙෂුරූන්,*[1] භය නොවන්න.[2]
**3** මන්ද මම පිපාසිත අයට නො-
අඩුව වතුර දෙන්නෙමි.[3] වියළී ගිය
දේශය පුරාම ඇළදොළවල් දකින්න
ලැබෙයි.[4] මම මාගේ අත දිගහැර
ඔබෙන් පැවත එන්නන්ට මාගේ
බලය දී[5] බොහෝ සෙයින් ආශීර්වාද
කරන්නෙමි. **4** ඔවුහු නිල් තණ-
කොළ මෙන්ද දිය අගල් ළඟ වැඩෙන
විලෝ ගස් මෙන්ද සරුවට වැඩෙති.[6]
**5** ඔවුන්ගෙන් යමෙක්, 'මම අයිති
යෙහෝවා දෙවිටයි'[7] කියා පවසයි.
තවත් කෙනෙක් තමාට යාකොබ් යන
නමින් කතා කරන්න කියා ඉල්ලා
සිටියි.[8] වෙනත් අයෙක්, 'මා යෙ-
හෝවා දෙවිට අයිතිය' යන වචන
පෙළ තම අතේ ලියාගනියි. තවත්
කෙනෙක් තමාව ඊශ්‍රායෙල් යන
නමින් හඳුන්වා දෙයි."[9]

**6** "ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි ඊශ්‍රායෙල්හි
මිදුම්කරුය.[10] ඊශ්‍රායෙල්හි රජු[11] වන
යෙහෝවා දෙවි මෙසේ පවසයි. 'පළ-
මුවැනියා මමය. අන්තිමයාද මමය.[12]
මා හැර වෙන කිසි දෙවි කෙනෙක්
නැත.[13] **7** මට සමාන කළ හැකි
කිසිවෙක් සිටියිද?[14] එවැනි කෙනෙකු
සිටිනවා නම් ඉදිරිපත් වෙන්න කියා
මම ඔහුට ආරාධනා කරමි.[15] මා
ඈත අතීතයේ සෙනඟක් බිහි කළ දා
පටන් මේ දක්වා කළාක් මෙන් ඔහු-
ටත් කළ හැකිද?[16] ළඟදී සිදු වීමට
නියමිත දේවල් ගැනද තව බොහෝ
කාලයකින් සිදු වීමට නියමිත දේවල්
ගැනද ඔහුට නිවැරදිව කිව හැකිද?
**8** මාගේ සෙනඟෙනි, භය නොවන්න.
කලබල නොවන්න.[17] අතීතයේ සිටම
සිදු වීමට නියමිත දේවල් ගැන මා

**43 පරි.**
1 ගීතා 102:18; යෙසා 42:12; යෙසා 60:21; හෙබ්‍රෙ 13:15
2 යෙසා 64:7
3 යෙරෙ 2:5; හොෂෙ 7:10; මීකා 6:3
4 යෙසා 1:13; ආමෝ 5:25; මලා 1:13; මලා 3:8
5 යෙසා 66:3; ආමෝ 5:22
6 යෙරෙ 6:20
7 ලෙවී 3:16
8 ගීතා 95:10; යෙසා 1:14; මලා 2:13
9 යෙසා 1:18; යෙරෙ 50:20
10 ගීතා 51:9
11 ගීතා 79:8; යෙරෙ 31:34; හෙබ්‍රෙ 10:17
12 ගීතා 25:7; ගීතා 79:9; එස 20:9
13 යෝබ් 23:4; යෙරෙ 2:29
14 යෝබ් 40:7; ලූක් 10:29
15 උත් 3:17; ගීතා 78:8; රෝම 5:12
16 යෙසා 28:7; යෙරෙ 5:31
17 ද්වි 28:15; ගීතා 79:4; ගීතා 137:3; ලූක් 21:24

**44 පරි.**
18 යෙසා 41:8; යෙරෙ 30:10
19 උත් 17:7; උත් 35:11; ගීතා 105:6; රෝම 11:7
20 ගීතා 71:6; යෙසා 49:1; යෙරෙ 1:5
21 යෙසා 43:1; යෙසා 43:21; යෙසා 44:21; යෙසා 64:8
22 යෙසා 43:7

**2 තීරුව**
1 ද්වි 32:15; ද්වි 33:5; ද්වි 33:26
2 යෙසා 41:10
3 යෙසා 41:17
4 යෙසා 32:2
5 යෙසා 32:15; ක්‍රියා 2:17

**6** ගීතා 92:13; ගීතා 137:2; යෙසා 61:11; ක්‍රියා 2:41; **7** සෙක 13:9; **8** එස්ත 8:17; **9** ගලා 6:16; **10** නික් 6:6; යෙසා 48:17; යෙරෙ 50:34; **11** ද්වි 33:5; යෙසා 33:22; **12** යෙසා 41:4; යෙසා 48:12; එළි 22:13; **13** ද්වි 4:35; යෙසා 43:10; යෙසා 44:24; යෙරෙ 16:20; **14** යෙසා 40:18; යෙසා 46:9; **15** යෙසා 43:9; යෙසා 45:21; **16** උත් 17:8; ද්වි 32:8; යෙසා 41:4; ක්‍රියා 17:26; **17** හිතෝ 3:25; යෙසා 41:10.

යෙසා **44:2*** ද්වි 32:15හි පාදසටහන බලන්න.

ඔබට දැනුම් දුන්නේ නැද්ද?[1] ඔබ මාගේ සාක්ෂිකරුවෝය.[2] මා හැර වෙන කිසි දෙවි කෙනෙක් සිටීද?[3] මට සමාන වූ කිසිවෙක් නැත. එකම පර්වතය[4] මමය.’ ”

**9** දේවතා රූප සාදන්නෝ කිසි වටිනාකමක් නැති අය වෙති.[5] ඔවුන් භක්ත්‍යාදරයෙන් සලකන රූපවලින් කිසි ප්‍රයෝජනයක් නැත.[6] රූප සාදන්නෝ කිසිවක් නොදකින, කිසිවක් නොදන්න[7] සාක්ෂිකරුවෝය. ඔවුහු ලැජ්ජාවට පත් වනු ඇත.[8] **10** යමෙකු දේවතා රූපයක් සාදා ඇද්ද?[9] ඔහුට එයින් කිසි ප්‍රයෝජනයක් නොලැබෙයි.[10] **11** ඔහුද ඔහුගේ සහයකයෝද ලැජ්ජාවට පත් වෙති.[11] දේවතා රූප සාදන්නෝ නිකම්ම නිකම් මිනිස්සු පමණි. ඔවුහු සියලුදෙනාම එකතු වී ඉදිරියට පැමිණෙති.[12] ඔවුහු නිහඬව සිටිති. භයෙන් වෙවුලති. එක් කෙනෙක්වත් නැර සියලුදෙනාම ලැජ්ජාවට පත් වනු ඇත.[13]

**12** කම්මල්කරු තම උපකරණ අතට ගන්නේය. ඔහු ගල් අඟුරුවලින් යකඩ රත් කර තම ශක්තිමත් දෑතින් එය තළා රූපයක් සාදාගන්නේය.[14] ඔහු බඩගින්න නොතකයි. ඒ නිසා ඔහු දුබල වන්නේය. පිපාසිතව සිටින නමුත් ඔහු වතුර බොන්නේ නැත. ඒ නිසා ඔහු විඩාවට පත් වන්නේය.

**13** වඩුවා ලීය මනියි. ඉන්පසු රතු පැහැති හුණු කැබැල්ලකින් ලීය ලකුණු කරයි. ඔහු ආයුධයකින් ලීය කපා කව කටුවකින් තවත් ලකුණක් දමයි. මිනිසෙකුගේ හැඩරුව ඇති ලස්සන රූපයක් ඔහු සාදාගනියි.[15] ඉන්පසු ඔහු එම රූපය තම නිවසේ තබාගනියි.[16]

**14** තවත් අයෙක් දේවදාර ගස් කපයි. ඔහු වනයේ ගස් අතරින් විශාලව වැඩෙන ගසක් තෝරාගෙන එය ශක්තිමත්ව වැඩෙන සේ හොඳින් සාත්තු කරයි.[17] ඔහු ලෝරෙල් ගසක්ද පැළ කර ඇත. ඇද හැළෙන වර්ෂාව නිසා එය ශක්තිමත්ව වැඩෙන්නේය. **15** එය දරට ගැනීම සඳහා සිටුවන ලද ගසකි. ගිනි තපින්න ඔහු ගසෙන් දර ලබාගන්නේය. ඔහු ගින්නක් අවුළුවා එයින් රොටිද පුලුස්සන්නේය. ඉතුරු වන ලීවලින් ඔහු දෙවි කෙනෙකුගේ රූපයක් සාදාගන්නේය.[1] ඉන්පසු ඔහු ඒ රූපය ඉදිරියේ වැඳ වැටෙන්නේය.[2] **16** ඔහු ගසෙන් කොටසක් දර හැටියට භාවිත කරන්නේය. ඔහු එයින් මස් උයාගෙන කා, තෘප්තියට පත් වන්නේය. ඔහු ඒ ගින්නෙන්ම උණුසුම් වී, “මේ ගින්න නිසා මට උණුසුමක් දැනේ” යයි කියන්නේය. **17** එහෙත් ගසේ ඉතුරු කොටසෙන් ඔහු දෙවි කෙනෙකුව සාදාගනියි. ඔහු දේවතා රූපයක් සාදාගෙන එය ඉදිරියේ වැඳ වැටී මෙසේ යාච්ඤා කරන්නේය. “මගේ දෙවි ඔබයි.[3] මට පිහිට වන්න.”

**18** ඔවුන්ගේ ඇස් පෑදී නැත.[4] කල්පනා ශක්තියද මොට වී ඇත.[5] ඒ නිසා ඔවුහු කිසිවක් දන්නේ නැත.[6] ඔවුහු කිසිවක් අවබෝධ කරගන්නේද නැත.[7] **19** ඔවුන් කරන දේ ගැන ඔවුන්ට කිසි අවබෝධයක් නැත.[8] ඔවුන්ගෙන් කිසිවෙක් මෙසේ කල්පනා කර නැත.[9] “මම ගසෙන් කොටසක් දරට පාවිච්චි කළා. මම ගින්නක් අවුළුවා එයින් රොටි පුලුස්සා මසුත් උයාගත්තා. ඉතුරු කොටසෙන් මම පිළිකුල් රූපයක් සාදාගන්නද?[10] ගසක වියළී ගිය ලී කැබැල්ලකට නමස්කාර කිරීමෙන් කිසි පලක් තියෙනවාද?” **20** ඔහු කරන දේ නිෂ්ඵලයි.*[11] ඔහුගේ සිත මුළා වී ඇත.[12] ඔහුගේ ජීවිතය පවා අනතුරේ තිබේ. එහෙත් ඔහු, “මම මේ විශ්වාසය තබාගෙන සිටින්නේ බොරුවක් කෙරෙහි නොවෙයිද”[13] කියා කල්පනා කර ඒ තත්වයෙන් මිදෙන්න උත්සාහ කරන්නේ නැත.

**44 පරි.**
**1** උත් 15:13, ද්වි 28:15, යෙසා 48:5
**2** යෙසා 43:10
**3** ද්වි 4:39, 1සාමු 2:2
**4** ද්වි 32:4, 2සාමු 22:32
**5** 1සාමු 12:21, ගීතා 97:7, යෙසා 41:29
**6** විනි 10:14, 1රාජා 18:26, 1කොරි 8:4
**7** ගීතා 115:5, ගීතා 135:17
**8** ගීතා 97:7, යෙරෙ 51:17
**9** නික් 32:4, 1රාජා 12:28
**10** යෙරෙ 10:5, ක්‍රියා 19:26
**11** 1සාමු 5:3, 1සාමු 5:7, යෙසා 1:29
**12** යෙසා 41:6
**13** දානි 3:29
**14** යෙසා 40:19, යෙසා 41:7, යෙසා 46:6
**15** නික් 20:4, ද්වි 4:16, ද්වි 4:28, ක්‍රියා 17:29, රෝම 1:23
**16** උත් 31:19, උත් 35:2, ද්වි 27:15, විනි 17:4
**17** යෙසා 40:20, යෙරෙ 10:3

**2 තීරුව**
**1** ලෙවී 26:1, විනි 17:3, විනි 18:30, 2රාජා 21:7, නාහු 1:14, හබ 2:18
**2** නික් 20:5, ද්වි 5:9, විනි 2:19, 2ලේක 25:14, හබ 2:19, එළි 9:20
**3** යෙසා 36:19, යෙසා 37:38, යෙසා 45:20, යෙසා 46:7
**4** යෙරෙ 5:21
**5** යෙරෙ 10:8, රෝම 1:21
**6** යෙරෙ 10:14
**7** ගීතා 81:12, යෙසා 6:10, මතෙ 13:15, රෝම 1:28
**8** හිතෝ 1:4, හිතෝ 2:9

**9** ද්වි 32:46; එස 40:4; හොෂෙ 7:11; **10** ද්වි 7:26; ද්වි 27:15; 1රාජා 11:5; **11** ගීතා 102:9; **12** යෙරෙ 17:9; රෝම 1:28; යාකො 1:14; **13** යෙරෙ 16:19; හබ 2:18.

යෙසා **44:20*** මූ.අ., “ඔහු අළු කන්නේය.”

21 "යාකොබ්, ඔබ මේ දේවල් සිතට
ගත යුතුයි.[1] ඊශ්‍රායෙල්, ඔබ මා පව-
සන දේවල් මතක තබාගත යුතුයි.
මන්ද ඔබ මාගේ සේවකයාය.[2] ඔබව
බිහි කළේ මමය.[3] ඒ නිසා ඔබ, මට
අයිතිය. ඔබ මාගේ සේවකයාය. මම
කවදාවත් ඔබව අමතක නොකරමි.[4]
22 ඔබ කර තිබෙන සෑම වැරදි ක්‍රියා-
වක්ම මට නැවතත් නොපෙනෙන සේ
වලාකුළකින් වැසී යන්න සලස්වමි.[5]
ඔබ කළ පාප මම ඝන වලාකුළකින්
වැසුවෙමි. මා වෙතට හැරී එන්න.[6]
එවිට මා ඔබව මුදවාගන්නෙමි.[7]
23 "ස්වර්ගයේ වැසියෙනි, ප්‍රීති
ඝෝෂා නඟන්න![8] මන්ද යෙහෝවා
දෙවි පියවර ගෙන ඇත.[9] පහත් බිම්-
වල වැසියෙනි,[10] ජය ඝෝෂා
නඟන්න![11] කඳුද[12] වනාන්තරද සියලු
ගස්ද ප්‍රීති වේවා! මන්ද යෙහෝවා
දෙවි යාකොබ්ව මුදවාගෙන ඇත.
ඊශ්‍රායෙල් සෙනඟ ලවා ඔහුගේ අලං-
කාරය සියල්ලන්ට දකින්න සලස්-
වයි."[13]
24 ඔබේ මිදුම්කරුද[14] මව්කුසේ
ඔබව වැඩෙන්න සැලැස්වූ තැනැත්-
තාද වන යෙහෝවා දෙවි කියන
මේ දෙයට සවන් දෙන්න. "යෙ-
හෝවා දෙවි වන මම සියල්ල සාදන්-
නෙමි. අහස්තලය දිගහැරියේ මමය.[15]
ඒ සඳහා මට කිසිවෙකුගේ උපකා-
රය අවශ්‍ය වුණේ නැත. පොළොව
සෑදුවෙත් මමය.[16] ඒ අවස්ථාවේදී
මා සමඟ සිටියේ කවුද? 25 හිස්
වචන දොඩන අය දෙන ලකුණු
මම නිෂ්ඵල වීමට සලස්වමි. ශාස්ත්‍ර
කියන්නෝ මා නිසා උමතුවෙන් හැසි-
රෙති.[17] බුද්ධිමතුන්ව වියවුලට පත්
කරන්නෙත් ඔවුන්ගේ දැනුම මෝඩ-
කමක් බව හෙළි කරන්නෙත් මමය.[18]
26 එහෙත් මාගේ සේවකයාගේ වචන
සැබෑ බව මම ඔප්පු කර පෙන්-
වන්නෙමි. මගේ පණිවිඩකරුවන්-
ගේ සැලසුම් සියල්ල මම සාර්ථක
වීමට සලස්වන්නෙමි.[19] මම යෙරු-
සලම ගැන, 'එය නැවත ජනාවාස
නුවරක් බවට පත් වෙයි'[20] කියාත්
යූදා දේශයේ නුවරවල් ගැන, 'ඒ
සියල්ල නැවත ගොඩනඟනු ඇත.[1]
එහි පාළු තැන් මම නැවත ගොඩ-
නඟන්නෙමි'[2] කියාත් පවසන්නෙමි.
27 'වියළී යන්න. මම ඔබේ සෑම අතු
ගංගාවක්ම වියළී යන්න සලස්වමි'[3]
කියා මහා ජල කඳට අණ කරන්-
නෙත් මමය. 28 සයිරස්[4] ගැන සඳ-
හන් කරමින්, 'ඔහු මා පත් කළ
එඬේරාය. මා කැමති සියල්ල ඔහු
ඉටු කරන්නේය'[5] කියා පැවසුවේද
මමය. 'යෙරුසලම යළි ගොඩනඟනු
ඇත' කියාද 'දේවමාලිගාවේ අත්ති-
වාරම දමනු ඇත'[6] කියාද මා දුන්
පොරොන්දුවත් ඔහු මාර්ගයෙන් ඉටු
වනු ඇත."

45 යෙහෝවා දෙවි තම අභි-
ෂේක ලත් තැනැත්තා[7] වන
සයිරස්ගේ දකුණතින් අල්ලාගෙන[8]
ජාතීන්ව ඔහුට යටත් කර දුන්නේය.[9]
දෙවි රජවරුන්ගේ තුනටියට පහර දී
ඔවුන්ගේ බලය නැති කර දැමුවේය.
නුවර දොරටු* පවා ඔහුට විවෘත කර
දුන්නේය. දෙවි ඔහුට මෙසේ පැවසු-
වේය. 2 "මම ඔබ ඉදිරියෙන් ගොස්[10]
ඔබ යන මාර්ගයේ තිබෙන සියලු
බාධක ඉවත් කරමි.[11] මම තඹ දොර-
ටුද එහි යකඩ අගුල්ද කඩා බිඳ
දමමි.[12] 3 ඔබේ නමින්[13] ඔබට හඬ-
ගසන මම ඊශ්‍රායෙල්හි දෙවි වන යෙ-
හෝවා බව දැනගන්නා පිණිස අඳුරු
ස්ථානවල සඟවා තිබෙන වස්තුද
ඔබට ලබා දෙන්නෙමි.[14] 4 ඔබ මාව
දැන හඳුනා ගෙන නොසිටියත්[15] මම
ඔබට කීර්ති නාමයක් ලැබීමට සලස්-
වන්නෙමි. මම ඔබේ නමින් ඔබට
කතා කර ඔබව කැඳවන්නෙමි. මා
ඒ සියල්ල කරන්නේ මාගේ තෝරා-
ගත් සේවකයා වන යාකොබ් හෙවත්

44 පරි.
1 එළි 4:9
2 යෙසා 44:1
3 යෙසා 43:1
4 යෙසා 49:15
5 ගීතා 51:1 ගීතා 103:12 යෙසා 1:18 යෙසා 43:25 යෙරෙ 33:8 ක්‍රියා 3:19
6 යෙරෙ 3:12 හොෂෙ 14:1 ක්‍රියා 2:38 යාකො 4:8
7 යෙසා 1:27 යෙසා 48:20 යෙසා 59:20 1කොරි 6:20
8 ගීතා 69:34 ගීතා 96:11
9 යෙසා 43:13
10 ගීතා 98:4 යෙසා 41:9 යෙසා 42:10
11 ගීතා 100:1 යෙසා 49:13
12 යෙසා 55:12
13 යෙසා 60:21
14 යෙසා 44:6
15 යෝබ් 26:7 ගීතා 104:2 යෙසා 40:22 යෙසා 45:12 යෙසා 51:13
16 උත් 1:1 යෙසා 42:5 යෙසා 48:13 එළි 10:6
17 යෝබ් 12:17 හොෂෙ 9:7
18 2සාමු 15:31 යෙසා 29:14 1කොරි 1:19
19 යොෂු 21:45 යොෂු 23:14 යෙසා 55:11 සෙක 1:6
20 ගීතා 147:2

2 තීරුව
1 යෙසා 60:10
2 යෙසා 61:4
3 ගීතා 74:15 යෙසා 42:15 යෙරෙ 50:38 එළි 16:12
4 එස්රා 1:1 යෙසා 41:25 යෙසා 45:1 යෙසා 46:11 දානි 10:1
5 2ලේක 36:22 යෙසා 48:14
6 2ලේක 36:23 එස්රා 1:2 එස්රා 6:3 යෙසා 45:13

45 පරි. 7 1රාජා 19:16; යෙසා 44:28; 8 එස්රා 1:1; ගීතා 73:23; යෙසා 45:4; 9 යෙසා 13:17; යෙසා 41:25; යෙරෙ 51:20; 10 යෙසා 13:4; 11 යෙසා 40:4; 12 ගීතා 107:16; 13 එස්රා 1:2; යෙසා 44:28; 14 යෙරෙ 50:37; 15 ගලා 4:8.

යෙසා 45:1* "අකුළන පියන් සහිත දොරටු" යන අදහස මුල් භාෂාවේ ඇතුළත් කර තිබේ.

ඊශ්‍රායෙල් වෙනුවෙනි.[1] 5 මා යෙ-
හෝවා දෙවිය. මට සමාන කළ
හැකි කිසිවෙක් නැත.[2] එකම සැබෑ
දෙවි මමය.[3] ඔබ මා කවුරුන්ද කියා
නොදැන සිටියත් මම ඔබව ශක්ති-
මත් කරන්නෙමි. 6 නැඟෙනහිර සිට
බස්නාහිර දක්වා විසිර සිටින සිය-
ලුම ජනයා මා හැර අන් දෙවි කෙ-
නෙකු නැති බව[4] තේරුම්ගන්නා
පිණිස මම එසේ කරන්නෙමි. මා යෙ-
හෝවා දෙවිය. මට සමාන වූ කිසිවෙක්
නැත.[5] 7 ආලෝකයෙත්[6] අන්ධකා-
රයෙත්[7] උල්පත මමය. මම සමා-
දානය ඇති කරන්නෙමි.[8] විනාශයට
පමුණුවන්නෙමි.[9] යෙහෝවා දෙවි වන
මට ඒ සෑම දෙයක්ම කළ හැකිය.[10]

8 "ස්වර්ගයේ වැසියෙනි, අහසෙන්
වැසි වස්සවන්න.[11] ධර්මිෂ්ඨකම
නමැති වැහි බිඳුවලින් මුළු පොළො-
වම තෙමන්න.[12] පොළොව පිබිදේවා!
ඒ පුරාම ධර්මිෂ්ඨකම හා ගැල-
වීම නමැති බීජ හටගනීවා![13] ධර්මිෂ්-
ඨකම හා ගැලවීම පොළොව පුරාම
පැතිරේවා! යෙහෝවා දෙවි වන මම
එය ඉටු වීමට සලස්වන්නෙමි. "[14]

9 තමන්ගේ සෑදුම්කරු සමඟ වාද
කරන තැනැත්තාට අත් වන්නේ දුක
පමණි.[15] ඔහු බිම විසි කර දැමූ වළං
කැබැල්ලක් මෙනි. "ඔබ සාදන්නේ
කුමක්ද" කියා කුඹල්කරුවෙකුගෙන්
අසන්න මැටි පිඩකට[16] පුළුවන්ද?
"මාව සෑදූ තැනැත්තාට අත් නැත"
කියා මැටි බඳුනකට පැවසිය හැකිද?
10 දරුවෙකු තම පියාගෙන්, "ඔබ
මාව ජනිත කළේ මන්ද" කියාත් තම
මවගෙන්, "ඔබ මාව වැදුවේ කුමක-
ටද"[17] කියාත් අසනවා නම් ඔහුට අත්
වන්නේ දුක පමණි.

11 ඊශ්‍රායෙල් ජාතිය බිහි කළ[18]
ශුද්ධ තැනැත්තා[19] වන යෙහෝවා
දෙවි මෙසේ පවසන්නේය. "ඉදිරියේදී
සිදු වීමට යන දේවල්[20] ගැනත් මාගේ
පුත්‍රයන් ගැනත්[21] ඔබ මාගෙන් ප්‍රශ්න
කරන්න. මා කළ[22] යුත්තේ කුමක්ද
කියා මට කියා දෙන්න. 12 පො-
ළොවද[23] එහි වැසියන්වද සෑදුවේ
මමය.[1] අහස දිගහැරියේ මාගේ දෑත්-
වලිනි.[2] ස්වර්ගයේ සේනා සිටින්නේ
මාගේ අණසක යටතේය."[3]

13 "මාගේ ධර්මිෂ්ඨ අරමුණ ඉටු
කිරීමට මම යමෙකුව පත් කළෙමි.[4]
ඔහු ඉදිරියේ තිබෙන සියලු බාධක
ඉවත් කරමි.[5] මාගේ නුවර ගොඩ-
නඟන්නේ ඔහුය.[6] වහල්භාවයේ සිටින
මගේ ජනයාව ඔහු නිදහස් කරන්-
නේය.[7] ඔහු එසේ කරන්නේ මුදලට-
වත්[8] අල්ලසකටවත් නොවෙයි." ඒ දේ
නියම කර තිබෙන්නේ ස්වර්ගයේ සේ-
නාවල අධිපති වන යෙහෝවා දෙවිය.

14 යෙහෝවා දෙවි මෙසේද පව-
සන්නේය. "ඊජිප්තුවේ[9] කුලී නොලබා
වැඩ කරන සේවකයෝද ඉති-
යෝපියාවේ වෙළෙන්දෝද උස මහත
මිනිසුන්[10] වන සෙබාවරුද[11] ඔබ-
ගේ අණසකට යටත් වෙති.[12] ඔවුහු
විලංගු[13] දමාගෙන ඔබ වෙත පැමිණ
හිස නමා[14] මෙසේ කියති. 'සැබවින්ම
දෙවි ඔබ සමඟ සිටියි.[15] ඔහුට සමාන
දෙවි කෙනෙක් නැත. එකම සැබෑ
දෙවි ඔහුයි.' "[16]

15 දෙවියනි, ඔබ ක්‍රියා කරන
ආකාරය කිසිවෙකුට තේරුම්ගත
නොහැක.[17] ඔබ ඊශ්‍රායෙල්වරුන්ගේ
දෙවි හා ගැලවුම්කරුය.[18] 16 දේ-
වතා රූප සාදන සියල්ලෝම
නින්දාවට පත් වන්නෝය. ඔවුහු සිය-
ලුදෙනාම ලැජ්ජාවට පත් වී[19] හැරී
යන්නෝය. 17 එහෙත් යෙහෝවා
දෙවි සමඟ තිබෙන බැඳීම නිසා[20]
ඊශ්‍රායෙල් ජනයාව සදහටම ගලවා-
ගනු ඇත.[21] ඔබ කිසිදා ලැජ්ජාවට
පත් වන්නේ නැත.[22] මින් මතු කවදා-
වත් කිසිවෙක් ඔබව නින්දාවට පත්
කරන්නේ නැත.[23]

**45 පරි.**

**1** නික් 19:5; යෙසා 41:8
**2** ද්වි 4:35; 1රාජා 8:60; යෙසා 44:8; යෝවෙ 2:27
**3** ද්වි 4:39; ද්වි 32:39; 1කොරි 8:4
**4** 1සාමු 17:46; ගීතා 102:15; යෙසා 37:20; මලා 1:11
**5** ගීතා 83:18
**6** උත් 1:3; ගීතා 8:3; යෙරෙ 31:35; යාකො 1:17
**7** නික් 10:21; ගීතා 104:20; ආමො 4:13
**8** ගීතා 29:11; යෙසා 26:12; 2කොරි 1:2
**9** දේශ 7:14; යෙසා 10:6; යෙරෙ 18:7; ආමො 3:6
**10** 1සාමු 2:7
**11** ගීතා 72:6; එස 34:26
**12** හොෂෙ 10:12; 2පේතෘ 3:13
**13** යෙසා 61:11; 1කොරි 3:6
**14** යෙසා 65:17; එළි 21:1
**15** ගීතා 2:9; 1කොරි 10:22
**16** යෙසා 29:16; යෙරෙ 18:6; රෝම 9:20
**17** මලා 1:6
**18** යෙසා 43:7; යෙසා 43:21
**19** යෙසා 43:3
**20** යෙසා 46:10; යෙරෙ 33:3
**21** යෙසා 29:23; යෙසා 60:21; යෙරෙ 3:19; හොෂෙ 1:10; ගලා 3:29
**22** ගීතා 111:3
**23** උත් 1:1; උත් 14:19; ගීතා 102:25; යෙසා 40:28; එළි 10:6

**2 තීරුව**

**1** උත් 1:27; උත් 2:7; උත් 5:2; ද්වි 4:32; ගීතා 139:14; යෙරෙ 27:5
**2** යෙසා 44:24; යෙරෙ 32:17; සෙක 12:1

**3** උත් 2:1; නෙහෙ 9:6; **4** යෙසා 42:6; **5** හෙබ්‍රෙ 1:8; **6** 2ලේක 36:23; එස්රා 1:2; යෙසා 44:28; **7** එස්රා 1:3; යෙසා 14:17; යෙසා 43:14; යෙසා 49:25; **8** යෙසා 13:17; **9** යෙසා 19:23; **10** යෙසා 18:7; **11** ගීතා 72:10; **12** යෙසා 49:23; යෙසා 61:5; **13** ගීතා 149:8; **14** එස්ත 8:17; යෙසා 14:2; යෙසා 60:14; **15** සෙක 8:23; **16** යෙසා 44:8; **17** ගීතා 44:24; **18** යෙසා 43:11; යෙසා 60:16; තීත 1:3; **19** ගීතා 97:7; යෙසා 44:9; **20** හොෂෙ 1:7; **21** යෙසා 26:4; යෙසා 51:6; **22** ගීතා 25:3; යෙසා 29:22; යෝවෙ 2:26; **23** යෙසා 54:4; ශෙප 3:11.

**18** අහස නිර්මාණය කළ[1] යෙ-
හෝවා දෙවි, සැබෑ දෙවිය.[2] ඔහු පො-
ළොවද නිර්මාණය කර[3] එය ස්ථිර
ලෙස පිහිටෙව්වේය.[4] ඔහු පොළොව
සෑදුවේ හිස්, පාළු ස්ථානයක් වීමට
නොව, මිනිසුන්ගේ වාසය සඳහාය.[5]
ඔහු ඔබට මෙසේ පවසයි. "මා යෙ-
හෝවා දෙවිය. මට සමාන කිසි-
වෙක් නැත.[6] **19** මා ඔබට කතා
කළේ අඳුරු ස්ථානයක සිට නො-
වෙයි. මම ඔබෙන් සැඟවී සිට කතා
කළේද නැත.[7] 'මාගේ මඟ පෙන්වීම්
පතන්න'[8] කියා මා යාකොබ්ගේ වංශ-
යට පැවසුවේ නිකමට නොවෙයි. මා
යෙහෝවා දෙවිය. මා කතා කරන්නේ
ධර්මිෂ්ඨ හා අවංක දේ පමණි.[9]
**20** "සියලු ජාතීන් අතරින් ගැල-
වීම ලැබූ ජනයෙනි,[10] ඔබ සියලුදෙනා
මා වෙතට රැස් වෙන්න.[11] ලීව-
ලින් සෑදූ දේවතා රූප රැගෙන යන
අයට කිසි අවබෝධයක් නැත. ඔවුන්
යාච්ඤා කරන්නේ ගලවාගන්න බැරි
දෙවිවරුන්ටයි.[12] **21** ඔබේ නිදහසට
කරුණු ඉදිරිපත් කරන්න.[13] එක් එක්
කෙනාගෙන් තොරතුරු විමසා බලා
කරුණු රැස් කරගන්න. අනාගත-
යේ සිදු වන දේවල් ගැන පුරාණ-
යේ සිටම පැවසුවේ කවුද?[14] අතීතයේ
සිටම ඒ දේවල් වාර්තා කළේ කවුද?[15]
යෙහෝවා දෙවි වන මා නොවෙයිද?
මා හැර වෙන කිසි දෙවි කෙනෙක්
නැත.[16] මා ධර්මිෂ්ඨ දෙවි කෙනෙකි.
ගැලවුම්කරුවෙකි.[17] මට සමාන වෙන
කිසිවෙක් නැත.[18]
**22** "පොළොවේ සතර දිශාවේ
සිටින සියල්ලෙනි, මා වෙතට
පැමිණ ගැලවීම ලබාගන්න.[19] මන්ද
මා හැර අන් දෙවි කෙනෙක් නැත.[20]
**23** සියලු ජනයා මා ඉදිරියෙහි දණ
නමනු ඇත.[21] සියලු ජනයා මට
විශ්වාසවන්තව සිටීමට දිවුරා පො-
රොන්දු වෙති.[22] එසේ සිදු වන බවට
මම මගේම නාමයෙන් ඔබට දිවුරා
පොරොන්දු වෙමි.[23] මාගේ වචනය
විශ්වාසවන්තය.[24] එය කිසිවිටෙකත්
නිෂ්ඵල වන්නේ නැත.[25] **24** එසේ
පොරොන්දු වන ජනයා මෙසේද
කියති. 'යෙහෝවා දෙවි සෑම අතින්ම
ධර්මිෂ්ඨයි. ශක්තිය තිබෙන්නේ ඔහුට
පමණයි.[1] දෙවි සමඟ උදහස් වන සිය-
ලුදෙනා ඔහු ඉදිරියට පැමිණ ලැජ්ජා-
වට පත් වනු ඇත.[2] **25** යෙහෝවා
දෙවිගෙන් ලද උපකාරය නිසා ඊශ්‍රා-
යෙල්ගෙන් පැවතෙන සියලුදෙනාම[3]
නිදොස් බව ඔප්පු වනු ඇත.[4] දෙවි
ඔවුන් වෙනුවෙන් කළ දේ ගැන ඔවුහු
ආඩම්බරයෙන් කතා කරති.' "[5]

**46** බෙල්*[6] පහතට නැමී ඇත.[7]
නෙබෝ# මුණින් අතට වැටී
ඇත. ඔවුන්ගේ රූප[8] සතුන් පිට පට-
වාගෙන යයි. සතුන්ටද ඒ බර දරාගත
නොහැක. **2** උන් පහතට නැමෙති.
මුණින් අතට වැටෙති. ඒ දෙවිවරුන්ට
තමන්ගේම රූප ගලවාගැනීමටවත්
බලය නැත.[9] ඔවුන්ව වහල්කමට
ඇදගෙන යනු ඇත.[10]
**3** "යාකොබ්ගේ පුත්‍රයෙනි, ඊශ්‍රා-
යෙල් සෙනඟ අතරින් බේරී ජීවත් වන
සියල්ලෙනි,[11] මා කියන දේ සිතට
ගන්න. මව්කුසෙන් බිහි වූ දා පටන්
ඔබව උසුලාගෙන යන තැනැත්තා
මමය.[12] **4** ඔබ වයසට ගිය පසුත්
මම වෙනස් නොවෙමි.[13] ඔබ මහලු වී
හිසකෙස් පැසුණු පසුත් මම දිගටම
ඔබව උසුලාගෙන යන්නෙමි.[14] මම
ඔබ වෙනුවෙන් පියවර ගන්නෙමි.[15]
ඔබව උසුලාගෙන ඔබව ගලවාගන්-
නෙමි.[16]
**5** "මට සමාන කළ හැකි කෙ-
නෙක් සිටියිද?[17] මාව සන්සන්දනය
කරන්නේ කා සමඟද?[18] **6** ඔවුහු
තම පසුම්බි දිගහැර ලෝහ නැතුව

**45 පරි.**
1 යෙසා 42:5 යෙරෙ 10:12
2 2සාමු 22:31 1කොරි 8:5
3 උත් 14:19 ගීතා 102:25 එළි 10:6
4 යෝබ් 38:4 ගීතා 78:69 ගීතා 104:5 ගීතා 119:90 හිතෝ 3:19
5 උත් 1:28 උත් 9:1 ගීතා 37:29 ගීතා 115:16
6 1රාජා 8:60 යෙසා 46:9
7 ද්වි 30:11 හිතෝ 8:1 යෙසා 48:16
8 ගණන් 23:20 1ලේක 28:8 1තිමෝ 4:8
9 ගීතා 111:8 ගීතා 119:137 හිතෝ 8:6
10 යෙසා 4:3 යෙසා 66:20 යෙරෙ 50:28
11 යෙසා 41:5 එළි 22:17
12 1රාජා 18:26 යෙසා 42:17 යෙරෙ 50:2
13 යෙසා 41:21
14 යෙසා 41:22
15 යෙසා 43:9
16 යෙසා 44:8 මාක් 12:32
17 යෙසා 43:3
18 ද්වි 4:39 යෝවෙ 2:27
19 ගීතා 65:5 මීකා 7:7 යොහ 3:16
20 ද්වි 4:35 1රාජා 8:60 යෙසා 45:5
21 රෝම 14:11
22 ද්වි 6:13 යෙරෙ 4:2 යෙරෙ 12:16
23 උත් 22:16 ආමෝ 6:8 හෙබ්‍රෙ 6:13
24 ගණන් 23:19 තීත 1:2
25 යෙසා 55:11

**2 තීරුව**
1 ගීතා 29:1
2 එළි 11:18
3 ගලා 3:29
4 යෙසා 61:9
5 ගීතා 64:10 2කොරි 10:17

**46 පරි.** **6** යෙරෙ 50:2; යෙරෙ 51:44; **7** 1සාමු 5:3; **8** යෙසා 2:20; යෙසා 45:20; යෙරෙ 10:5; **9** යෙසා 37:12; **10** යෙරෙ 43:12; **11** යෙසා 1:9; **12** නික් 19:4; ද්වි 1:31; යෙසා 44:2; **13** යෙසා 41:4; යෙසා 43:10; **14** ගීතා 71:18; ගීතා 92:14; **15** යෙසා 43:13; **16** ගීතා 41:1; ගීතා 116:4; **17** නික් 8:10; නික් 15:11; ගීතා 113:5; යෙසා 40:25; යෙරෙ 10:6; **18** ගීතා 89:6; මීකා 7:18; ක්‍රියා 17:29.

යෙසා **46:1*** බැබිලෝනිවරුන් ඇදහූ දෙවි කෙනෙකි. **1#** බැබිලෝනිවරුන් ඇදහූ දෙවි කෙනෙකි.

රන්ද රිදීද පිටතට ගෙන තරාදි-
යේ දමා කිරති. ඒවා රන්කරුවෙ-
කුට දී රූපයක් සාදාගත්[1] පසු ඔවුහු
එය ඉදිරියේ වැඳ වැටෙති.[2] **7** ඔවුහු
එම රූපය තම කර පිට තබාගෙන[3]
ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයට
ගෙන යති. එය නොසෙල්වී එම ස්ථා-
නයේම රැඳී පවතියි.[4] යමෙකු ඒ ඉදිරි-
යට ගොස් හඬ නඟා අයැද සිටියත්
එයින් කිසි පලක් නැත. ඔහුට පිළිතු-
රක් ලැබෙන්නේ නැත. ඔහුව දුකින්
මුදවාගන්න ඒ රූපයට නොහැක.[5]
**8** “පව්කාරයෙනි,[6] මේ දේ සිතට
ගෙන[7] ධෛර්යය උපදවාගන්න. අතී-
තය සිහි කරන්න. **9** ඈත අතීතයේ
සිදු වූ දේවල් මතකයට නඟන්න.[8]
එකම දෙවි මමය.[9] මට සමාන
කළ හැකි එක් කෙනෙක්වත් නැත.[10]
මා හැර වෙන කිසි දෙවි කෙනෙක්
නැත.[11] **10** අවසානයේදී සිදු වීමට
නියමිත දේ දැනුම් දෙන තැනැත්තා
මමය. මම මුල පටන්ම ඒ ගැන
දැනුම් දුනිමි.[12] මේ වන තුරුත් සිදු
නොවූ දේවල් ගැනද මම බොහෝ
කලකට පෙර දැන්වූවෙමි.[13] ‘මා
අරමුණු කළ දේ ඉටු වන්නේය.[14]
මම කැමති සියල්ල එලෙසින්ම ඉටු
කරමි’[15] කියා පවසන තැනැත්තා
මමය. **11** මාගේ අරමුණ ඉටු කිරීම
සඳහා[16] මම නැගෙනහිර දෙසින්
ගිජු පක්ෂියෙකු[17] වැනි මනුෂ්‍යයෙ-
කුට හඬගසන්නෙමි. ඔහු ඈත එපිට
තිබෙන දේශයකින් පැමිණෙන්නේය.
මා කියූ දේ මම ඒ අයුරින්ම ඉටු
කරන්නෙමි.[18] මම අරමුණු කළ ලෙ-
සම කරමි.[19]
**12** “මුරණ්ඩු සිත් ඇත්තෙනි,[20]
ධර්මිෂ්ඨකමෙන් ඈත්ව සිටින ඔබ[21]
මට සවන් දෙන්න. **13** මගේ ධර්-
මිෂ්ඨකම[22] හෙළි කිරීමට කාලය අත
ළඟයි. තව කෙටි කාලයකින් ඔබ
එය දකිනු ඇත.[23] මම පමා නොවී
සියොන්හි වැසියන්ට ගැලවීම අත්
කර දෙන්නෙමි.[24] ඊශ්‍රායෙල් දේශය
පුරාම මාගේ අලංකාරය දකින්න
සලස්වන්නෙමි.”[25]

**46 පරි.**
**1** නික් 32:4
යෙසා 40:19
යෙරෙ 10:9
හබ 2:18
**2** යෙසා 2:8
යෙසා 44:17
දානි 3:5
**3** යෙරෙ 10:5
**4** 1සාමු 5:3
දානි 3:1
**5** 1රාජා 18:26
යෙසා 37:38
යෙරෙ 2:28
යෝනා 1:5
**6** එස 18:28
**7** ද්වි 32:29
හිතෝ 2:1
යෙසා 44:18
හග් 1:5
**8** ද්වි 32:7
යෙසා 42:9
**9** ගීතා 50:1
ගීතා 118:27
රෝම 1:20
**10** ද්වි 33:26
යෙසා 40:18
**11** යෙසා 45:14
**12** යෙසා 42:9
**13** යෙසා 41:22
යෙසා 45:21
**14** ගීතා 33:11
**15** ගීතා 135:6
යෙසා 55:11
හෙබ්‍රෙ 6:17
**16** එස්රා 1:2
යෙසා 44:28
යෙසා 48:14
**17** යෙසා 41:2
යෙසා 45:1
**18** ගණන් 23:19
**19** යෝබ් 23:13
**20** ගීතා 76:5
යෙසා 48:4
ක්‍රියා 7:51
**21** ගීතා 119:150
යෙරෙ 2:5
**22** ගීතා 97:2
ගීතා 145:17
යෙසා 51:5
**23** ගීතා 46:1
යෙසා 12:2
**24** යෙසා 62:11
**25** යෙසා 44:23
යෙසා 60:21

**2 තීරුව**

**47 පරි.**
**1** ගීතා 137:8
යෙරෙ 50:42
සෙක 2:7
**2** 1සාමු 2:7
යෙසා 26:5
**3** යෙසා 47:5
**4** ගීතා 89:44
යෙරෙ 51:33
දානි 5:30
**5** එළි 18:7

**47** බැබිලෝනියේ කන්‍යා දිය-
ණිය,[1] බිමට බැස දූවිලි
ගොඩේ හිඳගන්න.[2] කල්දිවරුන්-
ගේ දියණිය,[3] ඔබට දැන් හිඳගැ-
නීමට සිංහාසනයක් නැත.[4] ඔබට
යළි කිසිදා සියුමැලි, සුකොමල ළඳ
කියා නොකියන්නේය.[5] **2** ඇඹ-
රුම් ගලක්[6] ගෙන පිටි අඹරන්න.
ඔබේ මුහුණු වැස්ම[7] ඉවත් කරන්න.
ඔබේ දිග වස්ත්‍රය[8] ඉහළටම ඔසවා-
ගෙන[9] ගංගා හරහා ගමන් කරන්න.
**3** ඔබේ නින්දාව සියල්ලන්ටම හෙළි
වන සේ නිර්වස්ත්‍රව සිටින්න.[10] ඔබට
ලැබිය යුතු දඬුවම මම අනිවාර්ය-
යෙන්ම ඔබ පිටට ගෙනෙන්නෙමි.[11]
මට විරුද්ධව නැඟී සිටින කිසිවෙකුට
සාර්ථක වීමට මම ඉඩ නොදෙන්-
නෙමි.
**4** “ඊශ්‍රායෙල්හි ශුද්ධ තැනැත්තාද[12]
ස්වර්ගයේ සේනාවල අධිපතිද වන
යෙහෝවා දෙවි[13] අපව මුදවාගන්-
නේය.”[14]
**5** කල්දිවරුන්ගේ දියණිය,[15] නිහ-
ඬව අඳුරෙහි[16] හිඳගෙන සිටින්න.[17]
යළි කිසිදා ඔබව සියලු රාජ්‍යයන්වල[18]
රැජින ලෙස හඳුන්වන්නේ නැත.[19]
**6** මම මාගේ සෙනඟ සමඟ උදහස් වී[20]
ඔවුන්ව නින්දාවට පත් වීමට ඉඩහැරි-
යෙමි.[21] මම ඔවුන්ව ඔබේ අතට හසු
කර දුන්නෙමි.[22] එහෙත් ඔබ ඔවුන්ට
කිසි අනුකම්පාවක් පෙන්වූයේ නැත.[23]
ඔබ මහල්ලා පිටත් ඉසිලිය නො-
හැකි බරක් පැටෙව්වෙහිය.[24] **7** “මම
හැමදාමත් රැජිනක්ව සිටිමි”[25] කියා
ඔබ සිතුවෙහිය. ඔබ කරන දේවල්
ගැන කල්පනා කළේවත් අවසාන-
යේදී කුමක් වෙයිද කියා සිතුවේවත්
නැත.[26]

---

**6** නික් 11:5; මතෙ 24:41; **7** යෙසා 3:19; **8** යෙරෙ 13:22; නාහු 3:5; **9** යෙසා 20:4; **10** යෙරෙ 13:26; එස 16:37; **11** ද්වි 32:35; ගීතා 94:1; රෝම 12:19; **12** යෙසා 43:3; **13** යෙසා 44:6; **14** යෙසා 41:14; **15** යෙසා 47:1; **16** 1සාමු 2:9; **17** ගීතා 94:23; **18** යෙසා 13:19; යෙසා 14:4; එළි 17:5; **19** එළි 18:7; **20** 2ලේක 28:9; 2ලේක 36:16; යෙසා 42:25; සෙක 1:15; **21** ද්වි 28:63; යෙසා 10:6; එස 24:21; **22** 2රාජා 25:21; යෙරෙ 52:14; **23** ගීතා 137:8; මතෙ 7:12; එළි 18:5; **24** ද්වි 28:50; **25** දානි 4:30; එළි 18:7; **26** ද්වි 32:29.

**8** සැප ජීවිකාවට ප්‍රිය කරන
නැනැත්තිය, ඔබ සුරක්ෂිතව හිඳ-
ගෙන[1] මෙසේ කියන්නෙහිය. “මා
තරම් වැදගත් කෙනෙක් තවත්
නැහැ.[2] මම කවදාවත් වැන්දඹු-
වක් වෙන්නේ නැහැ. මගේ දරු-
වන් මට අහිමි වෙන්නෙත් නැහැ.”[3]
**9** එහෙත් ඔබ නොසිතන මොහො-
තක ඒ දේම සිදු වන්නේය. එකම
දවසේදී[4] ඔබේ දරුවන් අහිමි වී ඔබ
වැන්දඹුවක් බවටද පත් වනු ඇත.
මම ඔබට ඒ ශෝකය හොඳින්ම
දැනෙන්න සලස්වමි.[5] මන්ද ඔබ සීමා-
වක් නොමැතිව මන්තර ගුරුකම්-
වල නියැලෙමින් අනුන්ට විරුද්ධව
ඔබේ මායා බලය යොදාගත්තෙහිය.[6]
**10** “මාව කවුරුවත් දකින්නේ නැහැ”[7]
යයි කියමින් ඔබ දුෂ්ටකමේ ඇලීගැලී
සිටියෙහිය.[8] “මා තරම් වැදගත් කෙ-
නෙක් තවත් නැහැ” යයි ඔබ නිතරම
සිතන්නෙහිය. ඔබ මුළා වූයේ ඔබේ
ප්‍රඥාව හා දැනුම නිසාය.[9] **11** ඒ
නිසා ඔබ පිටට මහත් විපතක් පැමි-
ණෙනු ඇත. ඔබ කොතරම් මැතුරු-
වත් කොතරම් මන්තර ගුරුකම්
කළත් ඒ විපතෙන් ගැලවීමට ඔබට
නොහැකි වෙයි.[10] හදිස්සියෙන්ම[11] ඔබ
පිටට පැමිණෙන ඒ විපත නිසා කිසිදා
අද්දැක නැති දුක් පීඩාවලට මුහුණ
දීමට ඔබට සිදු වෙයි.

**12** ඔබ තරුණ කාලයේ පටන්
මහත් වෙහෙසක් දරා ප්‍රගුණ කරගත්
යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් දැන් භාවිත
කරන්න.[12] ඒ මාර්ගයෙන්වත් ඔබට
ගැලවිය හැකිදැයි බලන්න. සමහ-
රවිට ඔබේ සතුරන්ව බියගැන්වීමට
ඔබට පුළුවන් වෙයි. **13** ඔබට උප-
දෙස් දීමට අනන්ත අප්‍රමාණ පිරි-
සක් සිටිති. එහෙත් ඔවුන්ගේ උපදෙස්
නිසා ඔබ කලකිරෙන්නෙහිය. ඔබේ
ජ්‍යෝතිඃ ශාස්ත්‍රඥයන්ටද තාරකා
බලන්නන්ටද[13] අමාවක දවස් බලන්-
නන්ටද ඇවිත් ඔබට සිදු වීමට
නියමිත විපතෙන් ඔබව ගලවා-
ගන්න කියන්න. **14** ඔවුහු පිදුරු
මෙන් වන්නෝය.[14] ඔවුහු ගින්නට හසු
වන්නෝය.[1] ඒ ගින්නෙන් ඔවුන්ට[2]
කිසිසේත් ගැලවිය නොහැක. එය
උණුසුම ලබා දෙන ගිනිමැලයක්
නොව ගිනි ජාලාවකි.[3] **15** ඔබේ
තරුණ වයසේ පටන් ඔබ සමඟ
වෙහෙසී එකට වැඩ කළ මන්තර-
කරුවන්ගෙන්[4] ඔබට කිසිදු ප්‍රයෝජ-
නයක් නැත. ඔවුහු එක් එක් කෙනා
මංමුළා වී තම තමන්ගේ ස්ථානවලට
හැරී යති. ඔබේ උපකාරයට කිසිවෙක්
පැමිණෙන්නේ නැත.[5]

**48** යාකොබ්ගේ පුත්‍රයෙනි, ඊශ්‍රා-
යෙල්වරුන් කියා තමන්ව
හඳුන්වා දෙන සෙනඟෙනි,[6] මට සවන්
දෙන්න. යූදාගෙන් පැවතෙන*[7] ඔබ
ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝවාගේ
නමින් දිවුරා[8] ඔබේ මුවින් ඔහුව පස-
සන්නහුය.[9] නමුත් ඔබ එසේ කරන්-
නේ අවංක සිතකින් නොවෙයි. ඔබ
සැබවින්ම අධර්මිෂ්ඨය.[10] **2** ඔබ
ශුද්ධ නුවරේ[11] වැසියන්යයි කියාග-
නිමින් ස්වර්ගයේ සේනාවල අධිපති
ලෙස හඳුන්වන[12] ඊශ්‍රායෙල්හි දෙවි
වන යෙහෝවාගෙන් උපකාර පතන්-
නහුය.[13]

**3** “මම මුලින් සිදු කළ දේවල් ගැන
ඔබට කලින්ම දැනුම් දුන්නෙමි. ඒවා
මා දැනුම් දුන්නේ ඈත අතීතයේදීය.
මාගේම මුවින් නියම කළ ඒ සියල්ල
මම ජනයාට ඇසෙන්න සැලැස්වූ-
වෙමි.[14] පසුව නොසිතූ මොහොතක
මම ඒ දේ ඉටු කළෙමි.[15] **4** ඔබ
දැඩි සිත් ඇති මුරණ්ඩු සෙනඟක් බව
මම හොඳින් දනිමි.[16] ඔබේ බෙල්ල
යකඩ මෙන්ද[17] ඔබේ හිස තඹ මෙන්ද
දැඩිය.[18] **5** මම සිදු වීමට නියමිත
දේවල් කලින්ම ඔබට දැනුම් දුනිමි.[19]
‘මේ හැම දෙයක්ම නියම කළේ
මගේ දෙවියන්. ඒ සියල්ල ඉටු කළේ
මගේ දේවතා රූපවල බලයෙනුයි’[20]
කියා ඔබ නොකියන පිණිස මම

**47 පරි.**
1 දානි 5:1 දානි 5:23 එළි 18:3
2 යෙරෙ 51:53
3 ගීතා 10:6 එළි 18:7
4 ගීතා 73:19 එළි 18:10
5 යෙරෙ 51:29
6 එස 21:21 දානි 2:2 දානි 5:7 එළි 18:23
7 යෙරෙ 23:24 හෙබ්‍රෙ 4:13
8 ගීතා 52:7
9 යෙසා 5:21 රෝම 1:22
10 යෙරෙ 51:39
11 එළි 18:10
12 දානි 2:2
13 දානි 5:7 මතෙ 2:1
14 නික් 15:7 යෙසා 40:24

**2 තීරුව**
1 ද්වි 4:24 මලා 4:1
2 උත් 2:7
3 මතෙ 16:26
4 දානි 2:2 එළි 21:8
5 යෙරෙ 51:6

**48 පරි.**
6 උත් 32:28 උත් 35:10 2රාජා 17:34 රෝම 9:6
7 උත් 49:8 1ලේක 5:2 1ලේක 28:4
8 ද්වි 6:13 යෙරෙ 4:2 ශෙප 1:5
9 නික් 23:13 යෙසා 26:13
10 ලෙවී 19:12 යෙරෙ 4:2 මලා 3:7
11 නෙහෙ 11:1 ගීතා 48:1 යෙසා 52:1
12 යෙරෙ 10:16
13 විනි 17:13 යෙරෙ 21:2 රෝම 2:17
14 ද්වි 28:15 යෙසා 41:22 යෙසා 42:9
15 යොෂු 21:45 යොෂු 23:14 යෙසා 55:11

**16** 2ලේක 36:16; ගීතා 78:8; යෙසා 46:12; සෙක 7:11; **17** නික් 32:9; ද්වි 10:16; 2රාජා 17:14; **18** යෙරෙ 44:16; එස 3:7; **19** ලූක් 1:70; හෙබ්‍රෙ 1:1; **20** යෙරෙ 44:17.

යෙසා **48:1*** මූ.අ., “යූදාගේ උල්පතෙන් පැමිණි.”

එසේ කළෙමි. **6** ඔබ මේ ඇසූ[1] දුටු
සියල්ල[2] ගැන අන්‍යයන්ට නොපව-
සන්නේ මන්ද?[3] මම මීට කලින් හෙළි
නොකළ අලුත් දේවල් ගැන දැන්
ඔබට පවසමි.[4] **7** ඒවා ඇත අතීත-
යේදී මා නියම කළ දේවල් නොවෙයි.
‘මම මේ දේවල් කලින් දැනගෙන
හිටියා’ කියා ඔබ නොකියන පිණිස
අද වන තුරු මම ඔබට ඒ දේවල් ගැන
නොකීවෙමි.[5]

**8** “නමුත් ඔබට කොපමණ කීවත්
ඔබ ඇසුවේ නැත.[6] ඔබ මේ කිසි-
වක් තේරුම්ගත්තේ නැත. ඔබේ කන්
ඔබ වසාගෙන සිටින්නහුය. අතීත-
යේ සිටම ඔබ ක්‍රියා කළේ එලෙසයි.
ඔබ අද වන තුරුම ද්‍රෝහිව කටයුතු
කර තිබේ.[7] ඔබ ‘මව්කුසේ පටන්ම
කැරලිගසන්නෙක්’ යයි කියනු ලබන්-
නේ ඒ නිසාය.[8] **9** නමුත් මාගේ
නාමය අගෞරවයට පත් නොවන
පිණිස මම මාගේ උදහස පාල-
නය කරගන්නෙමි.[9] මාගේ නාමයට
ප්‍රශංසාව ලැබෙන පිණිස මම මාවම
පාලනය කරගන්නෙමි. මා එසේ නො-
කරන්නේ නම් ඔබ සම්පූර්ණයෙන්ම
විනාශ වී යනු ඇත.[10] **10** මම ඔබව
පවිත්‍ර කළෙමි. නමුත් රිදී පවිත්‍ර කරන
ආකාරයට නොවෙයි.[11] ඔබ දුක් පීඩා
නමැති ගිනි උදුනේ සිටියදී මම ඔබව
තෝරාගතිමි.[12] **11** මාගේ නාමය
වෙනුවෙන් මම පියවර ගන්නෙමි.[13]
මාගේ නාමයට කැළැලක් ඇති වීමට
ඉඩ දෙන්නේ කොහොමද?[14] මට හිමි
ගෞරවය මා වෙන කිසිවෙකුට දෙන්-
නේ නැත.[15]

**12** “යාකොබ්ගේ පුත්‍රයෙනි, මා
විසින් තෝරාගත් ඊශ්‍රායෙල් ජන-
යෙනි, සවන් දෙන්න. මම කිසිදා වෙ-
නස් නොවෙමි.[16] පළමුවැනියා මමය.[17]
අන්තිමයාද මමය.[18] **13** පොළොවේ
අත්තිවාරම තැබුවේ මමය.[19] අහස
දිගහැරියේ මාගේ දකුණතින්ය.[20] ඒ
සියල්ල මාගේ හඬට කීකරු වෙයි.[21]

**14** “ඔබ සියලුදෙනා එක් තැනකට
රැස් වී මා කියන දේට සවන් දෙන්න.[22]
යෙහෝවා දෙවි වන මා ප්‍රේම කරන
තැනැත්තා පැමිණෙනු ඇත.[1] ඔහු
බැබිලෝනියට විරුද්ධව මා නියම
කළ සෑම දෙයක්ම ඉටු කරයි.[2] ඔහු
කල්දිවරුන්ට විරුද්ධව පියවර ගන්-
නේය.[3] ඒ දේවල් ගැන ප්‍රකාශ කරන්න
කිසිවෙකුට හැකි වුණාද? **15** මේ
සියල්ල ප්‍රකාශ කළේ මමයි. ඔහුව
කැඳෙව්වෙත් මමයි.[4] මම ඔහුට මඟ
පෙන්වා ඔහු කරන සෑම දෙයක්ම
සාර්ථක වීමට සලස්වමි.[5]

**16** “ජනයෙනි, මා ළඟට පැමි-
ණෙන්න. මම මුල පටන්ම මේ
සියල්ල ඔබට ප්‍රකාශ කළෙමි. මා මේ
දේවල් පැවසුවේ රහසින් නොව ප්‍රසිද්-
ධියේමයි.[6] ඒ සියල්ල ඉටු වන ආකාර-
යද මම බලා සිටින්නෙමි.”

විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි තම බලයෙන් මාව
ශක්තිමත් කර එව්වේය.[7] **17** ඔබේ
මිදුම්කරු[8] වූ ඊශ්‍රායෙල්හි ශුද්ධ
තැනැත්තා[9] වන යෙහෝවා දෙවි
මෙසේ පවසන්නේය. “මා ඔබේ දෙවි
වන යෙහෝවාය. ඔබේම ප්‍රයෝජනය
සඳහා ඔබට උගන්වන්නෙත්[10] ඔබ යා
යුතු හරි මඟ ඔබට කියා දෙන්නෙත්
මමය.[11] **18** අනේ, ඔබ මාගේ ආඥා-
වලට ඇහුම්කන් දුන්නා නම්[12] ඔබේ
සමාදානය ගංගාවක් මෙන්ද[13] ඔබේ
ධර්මිෂ්ඨකම මුහුදේ රැළි මෙන්ද වන්-
නේය.[14] **19** එමෙන්ම, වැලි මෙන්
විශාල දරු පරම්පරාවක් ඔබෙන් පැව-
තෙන්නේය.[15] මම ඊශ්‍රායෙල් යන
නාමය මාගේ මතකයෙන් පහ නොක-
රන්නෙමි. එම නාමය මැකී යන්නත්
මම ඉඩ නොදෙන්නෙමි.”[16]

**20** ජනයෙනි, බැබිලෝනියේ
තවත් රැඳී නොසිටින්න![17] කල්දිව-
රුන්ගේ දේශයෙන් පලා දුවන්න![18]
ප්‍රීති ඝෝෂා නඟමින් පොළොවේ
සතර දිශාවටම[19] මේ දේ දන්වන්න.[20]
“යෙහෝවා දෙවි තම සේවකයා
වන යාකොබ්ව ගලවාගත්තේය.[21]

**48 පරි.**

**1** යෙසා 21:10 යෙසා 43:12 මීකා 6:9
**2** ගීතා 107:43 යෙසා 41:20
**3** ගීතා 40:9 යෙසා 43:10
**4** යෙසා 42:9 2පේතෘ 1:21
**5** යෙසා 46:10 යෙසා 65:17
**6** යෙසා 29:10
**7** යෙරෙ 5:11 යෙරෙ 9:2 මලා 2:11
**8** ද්වි 9:7 ගීතා 58:3 ගීතා 95:10
**9** 1සාමු 12:22 ගීතා 25:11 ගීතා 79:9 යෙරෙ 14:7
**10** නෙහෙ 9:31 ගීතා 78:38
**11** යෝබ් 23:10 හිතෝ 17:3 මලා 3:3 හෙබ්‍රෙ 12:11
**12** යෙසා 1:25 යෙරෙ 9:7
**13** යෙසා 48:9
**14** එස 20:9 රෝම 2:24
**15** යෙසා 42:8
**16** යෙසා 43:13 යෙසා 46:4
**17** යෙසා 44:6 එළි 1:8
**18** එළි 22:13
**19** යෝබ් 38:4 ගීතා 102:25 යෙසා 42:5
**20** යෙසා 40:22
**21** ගීතා 147:4
**22** යෙසා 48:20

**2 තීරුව**

**1** යෙසා 45:1
**2** යෙසා 44:28
**3** යෙසා 13:19 යෙරෙ 50:13
**4** යෙසා 41:2 යෙරෙ 51:20
**5** යෙසා 45:5
**6** යෙසා 45:19
**7** යෙසා 61:1
**8** යෙසා 43:14 යෙසා 44:6
**9** යෙසා 54:5
**10** 1රාජා 8:36 ගීතා 25:8 යෙසා 30:20 යෙසා 54:13 මීකා 4:2
**11** ගීතා 32:8 යෙසා 30:21 යෙසා 49:10
**12** ද්වි 5:29 ගීතා 81:13

---

**13** ගීතා 119:165; යෙසා 32:18; යෙසා 66:12; **14** ආමො 5:24; **15** උත් 22:17; යෙරෙ 33:22; හොෂෙ 1:10; **16** රූත් 4:10; හිතෝ 10:7; **17** යෙරෙ 50:8; එළි 18:4; **18** යෙරෙ 51:54; **19** යෙරෙ 50:2; **20** හිතෝ 10:28; යෙසා 49:13; එළි 18:20; **21** යෙරෙ 31:10.

**21** දෙවි ඔවුන්ව කාන්තාර මැදින්
රැගෙන යන විට[1] ඔවුන්ට පිපාස-
යක් දැනුණේ නැත.[2] දෙවි පර්වත
දෙබෑ කර වතුර ගලා එන්න සලස්වා
ඔවුන්ට බොන්න දුන්නේය."[3]

**22** එහෙත්, "දුෂ්ටයන්ට නම් සමා-
දානයක් නැත"[4] යයි යෙහෝවා දෙවි
කියන්නේය.

**49** දූපත්වල වැසියෙනි,[5] දුර ඈත
දේශවල වෙසෙන ජනයෙනි,[6]
මා කියන දෙයට සවන් දෙන්න. මා
මව්කුසේ සිටියදීම[7] යෙහෝවා දෙවි
මට හඬගැසුවේය.[8] මා උපදින්නත්
කලින් ඔහු මාගේ නම සඳහන්
කළේය.[9] **2** ඔහු මාගේ මුඛය කඩු-
වක් මෙන් තියුණු කළේය.[10] ඔහුගේ
හස්තයේ සෙවණෙහි[11] මට රැකවර-
ණය ලැබුණි.[12] ඔහු මාව උල් කළ
ඊතලයක් මෙන් වීමට සලස්වා තමා-
ගේ ඊකොපුවේ මාව සැඟෙව්වේය.
**3** ඔහු මට මෙසේ කීවේය. "ඊශ්‍රායෙල්,
ඔබ මාගේ සේවකයාය.[13] මම ඔබ
මාර්ගයෙන් මාගේ අලංකාරය සියල්-
ලන්ටම දකින්න සලස්වමි."[14]

**4** එහෙත් මම මෙසේ සිතුවෙමි.
"මාගේ වෙහෙස මහන්සියෙන් කිසි
පලක් නැත.[15] මා මාගේ ශක්තිය
වැය කළේ නිකමටයි. එය නිෂ්-
ඵල වැයමකි.[16] නමුත් මාව
විනිශ්චය කරන්නේ යෙහෝවා දෙ-
වියි.[17] මට ආශීර්වාද ලැබෙන්නේ
මාගේ දෙවිගෙන්ය."[18] **5** මව්කුසේ
මට වැඩෙන්න සැලැස්වූ දා සිටම මාව
තම සේවකයා ලෙස තෝරාගත්[19]
යෙහෝවා දෙවි මට වැඩක් පවරා
තිබේ. යාකොබ්ව නැවත තමා වෙ-
තට ගෙනෙන්න[20] කියාද ඊශ්‍රා-
යෙල් සෙනඟ තමා වෙතට එක් රැස්
කරන්න[21] කියාද ඔහු මට පැවසුවේය.
යෙහෝවා දෙවි මාව ගෞරවයට පත්
කරන්නේය. මාගේ දෙවි මාගේ සවිය
වන්නේය. **6** දෙවි මට මෙසේ පැව-
සුවේය. "මාගේ සේවකයා ලෙස ඔබට
පැවරී තිබෙන කාර්යය සුළුපටු එකක්
නොවෙයි. යාකොබ්ගේ පුත්‍රයන්ගෙන්

**48 පරි.**
1 යෙසා 43:19
2 නික් 15:25
නික් 17:6
ද්වි 8:15
3 ගණන් 20:11
නෙහෙ 9:15
ගීතා 78:15
4 යෙසා 57:20
යෙසා 57:21
රෝම 3:17

**49 පරි.**
5 යෙසා 41:1
යෙසා 42:4
යෙසා 51:5
යෙසා 60:9
6 යෙසා 43:9
යෙසා 55:4
7 ගීතා 71:6
යෙසා 44:2
යෙසා 46:3
8 යෙසා 1:1
9 ගීතා 139:16
10 2ලේක 36:15
රෝම 9:27
රෝම 10:20
11 ගීතා 17:8
ගීතා 36:7
ගීතා 57:1
12 ගීතා 63:8
ගීතා 91:1
යෙසා 51:16
13 යෙසා 43:10
මතෙ 24:45
14 යෙසා 44:23
15 2ලේක 36:16
යෙසා 65:12
16 හිතෝ 9:7
17 ගීතා 35:23
ගීතා 140:12
18 යෙසා 40:10
19 යෙසා 49:1
20 මතෙ 15:24
ක්‍රියා 10:36
21 යෙසා 56:8
මතෙ 23:37

**2 තීරුව**
1 රෝම 11:26
රෝම 15:8
2 යෙසා 42:6
මතෙ 12:18
ලූක් 2:32
ක්‍රියා 13:47
3 ගීතා 98:2
යෙසා 2:2
යෙසා 11:10
යෙසා 52:10
4 ගීතා 69:7
යෙසා 53:3
ලූක් 23:18
5 මතෙ 26:67
6 යෙසා 43:14
7 මාක් 10:45
ලූක් 22:27
8 යෙසා 42:1
1පේතෘ 2:4
9 ගීතා 2:12
යෙසා 52:15
යෙසා 60:3

පැවතෙන ගෝත්‍ර නැවත ගොඩ-
නඟන්නත් රැකවරණය ලැබූ ඊශ්‍රා-
යෙල්වරුන්ව නැවත මා වෙතට ගෙන
එන්නත් මම ඔබට පැවරුවෙමි.[1]
එමෙන්ම, ජාතීන්ට ආලෝකය දෙන
පිණිස මම ඔබව පත් කළෙමි.[2] මා
එසේ කළේ පොළොවේ ඈත කෙළවර
දක්වාම වෙසෙන ජනයාට මා දෙන
ගැලවීම අත් කර දෙන පිණිසය."[3]

**7** මිනිසුන් විසින් සුළු කරනු
ලබන,[4] ජාතීන්ගේ වෛරයට පාත්‍ර
වූ තැනැත්තෙනි,[5] ඊශ්‍රායෙල්හි මිදුම්-
කරු[6] පවසන දේට සවන් දෙන්න.
පාලකයන්ට මෙහෙකාරකම් කරන
ඔබට,[7] ඊශ්‍රායෙල්හි ශුද්ධ තැනැත්තා
වන යෙහෝවා දෙවි මෙසේ පව-
සයි. "ඔබව තෝරාගත් ඊශ්‍රායෙල්හි
ශුද්ධ තැනැත්තා[8] වන මා නිසා අධිප-
තිහු ඔබ ඉදිරියේ දණ නමන්නෝය.
රජවරු වුවද තමන් දකින දේ නිසා
නැඟිට ගෞරවය පිරිනමන්නෝය.[9]
යෙහෝවා දෙවි වන මා විශ්වාස-
වන්තය."[10]

**8** යෙහෝවා දෙවි මෙසේද පව-
සයි. "මගේ අනුමැතිය ලබාගත හැකි
කාලයේදී මම ඔබට පිළිතුරු දුන්-
නෙමි.[11] ගැලවීම ලබා දෙන දිනයේදී
මම ඔබට පිහිට වුණෙමි.[12] මම ඔබව
ආරක්ෂා කර සියලු ජනයාට සහති-
කයක්* ලබා දෙන පිණිසත්[13] දේ-
ශය යළි ගොඩනඟා[14] පාළුවට ගිය
ඉඩම් නැවත උරුම කර දෙන පිණි-
සත් ඔබව යැව්වෙමි.[15] **9** සිරකරු-
වන්ට,[16] 'පිටතට එන්න'[17] කියාද
අන්ධකාරයේ සිටින අයට,[18] 'තවත්
අඳුරේ නොසිටින්න'[19] කියාද ඔබ
පවසනු ඇත. මඟ දෙපස තිබෙන
තණබිම්වලින් ඔවුහු කන්නෝය.
වියළි පාරවල් අසලද ඔවුන්ට

**10** ද්වි 7:9; 1කොරි 1:9; 1තෙස 5:24; 1පේතෘ 4:19; **11** ගීතා 69:13; 2කොරි 6:2; **12** ලූක් 1:69; ලූක් 22:43; හෙබ්‍රෙ 5:7; **13** යෙසා 42:6; **14** යෙසා 51:16; **15** ගීතා 2:8; යෙසා 54:3; **16** ගීතා 102:20; යෙසා 42:7; **17** 2කොරි 6:17; එළි 18:4; **18** ගීතා 112:4; යෙසා 9:2; ලූක් 1:79; **19** ගීතා 110:3.

යෙසා **49:8*** මූ.අ., "ගිවිසුමක්."

කැම සම්බ වෙයි.[1] **10** ඔවුන්ට බඩ-
ගිනි වන්නේවත්[2] පිපාස වන්නේවත්
නැත.[3] තද අව් රශ්මිය හෝ දැඩි උෂ්-
ණත්වය හෝ ඔවුන්ට නොදැනෙයි.[4]
මන්ද ඔවුන් කෙරෙහි අනුකම්පාව දක්-
වන මම ඔවුන්ට මඟ පෙන්වා[5] ඔවුන්ව
දිය පහරවල් අසලට ගෙන යන්-
නෙමි.[6] **11** මාගේ සියලු කඳු හරහා
මම පාරවල් සකස් කරමි. මාගේ
මාර්ග මම උස් කරමි.[7] **12** ඔවුහු දුර
ඈත පළාත්වල සිට පැමිණෙති.[8] උතු-
රෙන්ද[9] බස්නාහිරෙන්ද[10] සීනිම් දේශ-
යෙන්ද ඔවුහු පැමිණෙති.”

**13** ස්වර්ගයේ වැසියෙනි, ප්‍රීති
ඝෝෂා නඟන්න![11] පොළොවේ වැසි-
යෙනි, සතුටින් ගී ගයන්න![12] කඳුද
ප්‍රීතියෙන් ඉපිල යනු ලැබේවා![13] මන්ද
යෙහෝවා දෙවි තම සෙනඟව සැනසූ-
වේය.[14] පීඩා වින්ද තම සෙනඟට ඔහු
අනුකම්පා කළේය.[15]

**14** එහෙත් සියොන් දියණිය, “යෙ-
හෝවා දෙවි මාව අත්හැරියේය.[16] යෙ-
හෝවා දෙවිට මාව අමතක වී ඇත”[17]
යයි පවසන්නීය. **15** “මවකට තම
කිරි බොන දරුවාව අමතක කළ
හැකිද? තම කුසේ දරා මෙලොවට
බිහි කළ පුතාට ඇය අනුකම්පා නො-
කර සිටියිද?[18] මවක තම දරුවාව
අමතක කළත්[19] මම කිසිදා ඔබව
අමතක නොකරන්නෙමි.[20] **16** මේ
බලන්න, ඔබේ නම මාගේ අල්ලේ
කොටා තිබේ![21] ඔබේ පවුරු නිතරම
මා ඉදිරියේ ඇත.[22] **17** ඔබේ දරු-
වෝ ඔබ වෙත දිව එන්නෝය. ඔබව
නාස්තියට පැමිණවූ අය දැන් ඔබ වෙ-
තින් ඉවත්ව යන්නෝය. **18** ඔබේ
ඇස් ඇර වටපිට බලන්න. ඔවුහු සිය-
ලුදෙනාම එක් රැස් වී[23] ඔබ වෙත
පැමිණෙන්නෝය. යෙහෝවා දෙවි
වන මා ජීවමානය. ඒ නිසා මා
කියන මේ දේ ස්ථිර වශයෙන්ම සිදු
වන්නේය.[24] ‘ඒ සියලුදෙනාම ඔබව
අලංකාර කරන ආභරණ මෙන් වන්-
නෝය. ඔබව වට කරගෙන සිටින
ඔවුන් නිසා ඔබ ආභරණ පැළඳ-
ගත් මනාලියක් මෙන් වන්නෙහිය.’[25]

**19** ඔබ මහත් විනාශයකට හසු වී
පාළු නටබුන් ගොඩක් බවට පත් වී
ඇත.[1] එහෙත් දැන් ඔබේ වැසියන්ට
ජීවත් වීමට දේශයේ ඉඩ මදිය. ඔබව
විනාශ කළ අයත් දුර ඈත පළාතකට
ගොස් සිටිති.[2] **20** ඔබ ශෝකයෙන්
සිටි කාලයේදී ඔබට බිහි වූ දරුවෝ,[3]
‘මෙහි ජීවත් වන්න අපට ඉඩ මදියි.[4]
අපට ඉඩකඩ සලසා දෙන්න’[5] යයි
කියති. **21** ඒ කාලයේදී ඔබ නිසැ-
කවම මෙසේ කියන්නෙහිය. ‘මාගේ
දරුවන් මට අහිමි විය. මා දැන් වඳ
ස්ත්‍රියකි. වහලියකව සිටින මම දැන්
තනි වී සිටිමි.[6] තනි වූ මට[7] මේ දරු-
වන් ලැබුණේ කොහෙන්ද?[8] ඔවුන්ගේ
පියා කවුද? මේ දරුවන් මා ළඟට ගෙ-
නාවේ කවුද?’ ”[9]

**22** විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේ පවසන්නේය.
“මම අත ඔසවා ජාතීන්ට සංඥා
කරන්නෙමි.[10] සියලු ජනයාට පෙ-
නෙන සේ මම කොඩියක් සිටුවන්-
නෙමි.[11] එවිට ඔවුහු ඔබේ පුත්‍රයන්ව
වඩාගෙන ඔබ වෙතට රැගෙන එති.
ඔබේ දූවරුන්වද කර පිට උසුලා-
ගෙන එති.[12] **23** රජවරු ඔබව
රැකබලා ගනිති.[13] ඔවුන්ගේ කුමාරි-
කාවෝ ඔබේ කිරි මව්වරු ලෙස සේ-
වය කරති. ඔවුහු ඔබේ පාමුල වැටී[14]
පාදවල තිබෙන දූවිල්ල පවා ලෙව
කති.[15] ඒ දවසේදී, මා යෙහෝවා දෙවි
බවත් මා කෙරෙහි බලාපොරොත්තු
තබන අය කවදාවත් ලැජ්ජාවට පත්
වන්නේ නැති බවත් ඔබ නිසැකවම
තේරුම්ගනු ඇත.”[16]

**24** බලවන්තයෙකු අල්ලාගෙන
ගිය අයව කාටවත් නිදහස් කළ
හැකිද?[17] කුරිරු පාලකයෙකු යටතේ
සිටින වහලුන්ට ඔහුගේ අතින් බේරී
යා හැකිද?[18] **25** යෙහෝවා දෙවි
මෙසේ පොරොන්දු වී ඇත. “බලවන්-
තයා අල්ලාගෙන ගිය සිරකරුවන්ව

**49 පරි.**

**1** එළි 7:17
**2** යෙසා 65:13 එළි 7:16
**3** යෙසා 55:1
**4** යෙසා 32:2
**5** එස 34:23
**6** ගීතා 23:2 යෙරෙ 31:9
**7** ගීතා 107:7 යෙසා 11:16 යෙසා 40:3
**8** ද්වි 30:4 ගීතා 22:27
**9** යෙසා 43:6
**10** මතෙ 8:11
**11** ගීතා 96:11 යෙසා 44:23
**12** ගීතා 98:4 යෙසා 42:10
**13** යෙසා 55:12
**14** යෙසා 12:1 යෙසා 40:1 යෙසා 66:13
**15** යෙසා 61:3 යෙරෙ 31:13 2තෙස 2:16
**16** යෙසා 54:7
**17** ගීතා 13:1 විලා 5:20
**18** 1රාජා 3:26 ගීතා 103:13
**19** ලෙවී 26:29 ද්වි 28:56 2රාජා 6:28
**20** යෙසා 44:21 යෙරෙ 31:20 රෝම 11:1
**21** සල 8:6
**22** යෙසා 26:1 යෙසා 60:18
**23** යෙසා 43:5 යෙසා 60:4 මතෙ 24:31
**24** උත් 22:16 හෙබ්‍රෙ 6:13
**25** යෙරෙ 2:32

**2 තීරුව**

**1** යෙසා 51:3 යෙරෙ 30:18
**2** යෙරෙ 30:16 යෙරෙ 51:34
**3** එස 6:9
**4** යොෂු 17:15 2රාජා 6:1 යෙසා 54:1
**5** යෙසා 54:2
**6** විලා 1:13
**7** විලා 1:1
**8** යෙසා 62:4
**9** යෙසා 43:5 යෙරෙ 31:17 මතෙ 24:31
**10** යෙසා 11:12
**11** එස්රා 1:3 යෙසා 11:10 යෙසා 62:10
**12** යෙසා 60:4 යෙසා 66:20

---

**13** ගණන් 11:12; යෙසා 52:15; යෙසා 60:10; යෙසා 60:16; **14** ගීතා 72:9; යෙසා 60:14; **15** මීකා 7:17; **16** ගීතා 25:3; යෙසා 25:9; යෙසා 64:4; **17** මතෙ 12:29; ලූක් 11:21; **18** එස්රා 9:9; නෙහෙ 9:37.

මම නිදහස් කරමි.[1] කුරිරු පාලකයා
යටතේ සිටින වහලුන් ඔහුගේ අතින්
බේරී එනු ඇත.[2] ඔබට විරුද්ධව
සටන් කරන සියල්ලන්ට විරුද්ධව
මම සටන් කරමි.[3] ඔබේ දරුවන්-
වද මම බේරාගන්නෙමි.[4] **26** ඔබට
වධ හිංසා කරන අයට තමන්ගේම
මාංසය කන්න සිදු වෙයි. අලුත්
වයින් බොන අය මෙන් ඔවුහු තමන්-
**8** යෙසා 56:7; හෙබ්‍රෙ 13:10; **9** හග් 2:9; **10** එළි 7:9; **11** යෙසා 51:5; රෝම 15:12; **12** 1රාජා 10:22; **13** යෙසා 60:4; යෙසා 66:20; **14** සෙක 14:14; **15** යෙසා 48:17; **16** 1රාජා 8:41; ගීතා 72:19; **17** ගීතා 149:4; යෙසා 52:1; යෙසා 55:5; ලූක් 2:32; **18** නෙහෙ 3:26; **19** එස්රා 7:27; නෙහෙ 2:7; යෙසා 49:23; එළි 21:24; **20** යෙසා 57:17; **21** ද්වි 30:3; 1රාජා 11:39; ගීතා 30:5; යෙසා 12:1; යෙසා 54:7; **22** එළි 21:25; **23** යෙසා 60:5.

පෙරටුවෙන් ගමන් කරන්නේ ඔවුන්-
ගේ රජවරුන්ය.[1] **12** ඔබට සේවය
නොකරන මොනයම් ජාතියක් හෝ
රාජ්‍යයක් හෝ පවතින්නේ නැත.
ඒවා නිසැකවම විනාශ වී යන්නේය.[2]
**13** "'මාගේ ශුද්ධස්ථානය අලංකා-
රවත් කරන පිණිසත්[3] මා පය තබන
ස්ථානය ගෞරවයට පත් කරන පිණි-
සත්[4] ලෙබනොන් දේශයේ තේජස
වන ජුනිපර්, හල් හා සයිප්‍රස් ගස් ඔබ
වෙතට රැගෙන එනු ඇත.'[5]
**14** "ඔබට පීඩා කරන අයගේ දරු-
වෝ ඔබ ඉදිරියෙහි දණ නමති.[6]
ඔබට අගෞරව කළ අය ඔබේ පාමුල
වැටෙති.[7] ඔවුහු ඔබව ඊශ්‍රායෙල්හි
ශුද්ධ දෙවි වූ යෙහෝවාගේ නුවර වන
සියොන්[8] කියා හඳුන්වනු ඇත.
**15** "'ඔබේ දේශය මැදින් කිසි-
වෙක් ගමන් කළේ නැත. ඒ තරමටම
ඔබව එපා කර අත්හැර දමා තිබිණ.[9]
එහෙත් මින් ඉදිරියට මම සදහ-
ටම ඔබව ගෞරවයට පත් කරන්-
නෙමි. මතු පැමිණෙන සියලු පරම්පරා
ඔබ නිසා මහත් ප්‍රීතියක් අද්දකිනු
ඇත.[10] **16** ඔබ ජාතීන්ගේද රජව-
රුන්ගේද කිරි උරා බොන්නෙහිය.[11]
ඒ කාලයේදී, යෙහෝවා දෙවි වන
මා[12] ඔබේ ගැලවුම්කරු බව ඔබ[13]
දැනගන්නවා ඇත. යාකොබ්ගේ බල-
වත් තැනැත්තා[14] ඔබේ මිදුම්කරු[15]
බව ඔබ තේරුම්ගනු ඇත. **17** මම
තඹ වෙනුවට රන්ද[16] යකඩ වෙනුවට
රිදීද ලී වෙනුවට තඹද ගල් වෙනු-
වට යකඩද ගෙනෙන්නෙමි. මම ඔබව
බලාගැනීමට සමාදානයෙන් හා ධර්-
මිෂ්ඨකමින් කටයුතු කරන රැකබලා
ගන්නන්වද වැඩ පවරන්නන්වද පත්
කරන්නෙමි.'[17]
**18** "ඔබේ දේශ සීමා තුළ බලහත්-
කාරකම්, කොල්ල කෑම් හා විපත් යළි
කෙදිනකවත් සිදු වන්නේ නැත.[18]
ඔබේ පවුරු, ගැලවීම[19] යන නමින්ද
ඔබේ දොරටු, ප්‍රශංසාව යන නමින්ද
හඳුන්වනු ලබයි. **19** ඔබට ආලෝ-
කයත් දීප්තියත් සපයන්නේ හිරු සඳු
නොව, ඔබේ සදාකාලික ආලෝක-
යත්[1] තේජසත්[2] වන යෙහෝවා දෙ-
වියි. **20** ඔබේ හිරුගේ ආලෝකය
කිසිදා බැස යන්නේ නැත. ඔබේ
සඳුද සදහටම පවතියි. මන්ද යෙ-
හෝවා දෙවි ඔබේ සදාකාලික ආලෝ-
කය වෙයි.[3] ඔබේ වැලපීමේ දවස්
අවසන් වනු ඇත.[4] **21** 'ඔබේ සියලු
දරුවෝ ධර්මිෂ්ඨයෝ[5] හැසිරෙන්-
නෝය. ඔවුහු සදාකාලයටම දේශය
උරුම කරගනිති.[6] ඔවුහු මට අලං-
කාරය ගෙන දෙන පිණිස[7] මගේම
අත් දෙකෙන්[8] සිටෙවූ පැළෑටියකි.[9]
**22** කුඩා තැනැත්තා දහසක් බව-
ටත් සුළු තැනැත්තා බලවත් ජාතියක්
බවටත් පත් වෙයි.[10] යෙහෝවා දෙවි
වන මම නියම කාලයට එය වේග-
යෙන් සිදු වෙන්න සලස්වමි.'"[11]

**61** විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවිගේ බලය මට
ලැබී ඇත.[12] මන්ද යෙහෝවා දෙවි
මෘදු ගුණැති අයට ශුභාරංචි ප්‍රකාශ
කරන පිණිස[13] මාව අභිෂේක
කළේය.[14] දෙවි මාව එවා තිබෙන්-
නේ බිඳුණු සිත් ඇත්තන්ව සුව
කරන පිණිසත්[15] වහලුන්ට නිද-
හස ප්‍රකාශ කරන පිණිසත්[16] සිර-
කරුවන්ගේ ඇස් පාදන පිණිසත්ය.[17]
**2** යෙහෝවා දෙවි කරුණාව දක්-
වන අවුරුද්ද ගැන ප්‍රකාශ කරන්-
නත්[18] ඔහු තම සතුරන්ට දඬුවම්
කිරීමට නියම කර ඇති දවස ගැන
ප්‍රකාශ කරන්නත්[19] වැලපෙන සියල්-
ලන්ව සනසන්නත් ඔහු මාව එව්-
වේය.[20] **3** සියොන් ගැන වැලපෙන
සියල්ලන්ට අළු වෙනුවට අලංකාර
හිස්පළඳනාවක්ද[21] වැලපීම වෙනු-
වට ප්‍රීතිය නමැති තෙලයද[22] දුක්-
මුසු ස්වභාවය වෙනුවට ස්තුති ප්‍රශංසා

**60 පරි.**
1 යෙසා 60:3
2 ගීතා 2:12; යෙසා 41:11; දානි 2:44; ලූක් 19:27; එළි 2:27
3 ගීතා 96:6
4 ගීතා 99:5; ගීතා 132:7
5 යෙසා 35:2; යෙසා 41:19; යෙසා 55:13
6 යෙසා 14:2; යෙසා 45:14; යෙරෙ 16:19
7 එළි 3:9
8 ගීතා 48:2; ගීතා 87:3; යෙසා 62:12; හෙබ්‍රෙ 12:22
9 2ලේක 36:17; යෙසා 49:14; යෙරෙ 30:17; යෙරෙ 33:10; විලා 1:4; ගලා 4:27
10 යෙසා 35:10; යෙසා 61:7; යෙරෙ 33:11
11 යෙසා 49:23; යෙසා 61:6; යෙසා 66:11
12 එස 34:30
13 යෙසා 43:3
14 ගීතා 46:11; ගීතා 132:2; යෙසා 30:29; යෙසා 49:26
15 යෙසා 41:14
16 1රාජා 10:21; එළි 21:18
17 යෙසා 1:26; යෙසා 32:1; 1පේතෘ 5:2
18 යෙසා 2:4; යෙසා 11:9; යෙසා 54:14; සෙක 9:8
19 යෙසා 26:1; 1කොරි 3:17; එළි 19:1

**2 තීරුව**
1 ගීතා 36:9; යෙසා 60:1; එළි 21:23; එළි 22:5
2 ගීතා 62:7; ගීතා 71:8; සෙක 2:5; ලූක් 2:32
3 ගීතා 27:1; ගීතා 84:11; යාකො 1:17
4 යෙසා 25:8; යෙසා 30:19; යෙසා 35:10; එළි 21:4
5 යෙසා 32:16; 2පේතෘ 3:13

**6** ගීතා 37:11; ගීතා 37:29; මතෙ 5:5; එළි 21:7; **7** යෙසා 43:21; යෙසා 44:23; **8** යෙසා 29:23; යෙසා 43:7; එෆී 2:10; **9** ගීතා 92:13; මතෙ 15:13; **10** දානි 2:35; එළි 7:9; **11** යෙසා 5:19; හබ 2:3; **61 පරි.** **12** යෙසා 42:1; මතෙ 3:16; ලූක් 4:18; **13** ගීතා 22:26; ගීතා 34:2; මතෙ 11:5; **14** ගීතා 2:2; ක්‍රියා 10:38; **15** ගීතා 147:3; 2කොරි 7:6; **16** ගීතා 102:20; යෙරෙ 34:8; රෝම 8:21; ගලා 4:25; හෙබ්‍රෙ 2:15; **17** ලූක් 4:18; ලූක් 7:22; ක්‍රියා 26:18; **18** ලෙවී 25:10; ලූක් 4:19; 2කොරි 6:2; **19** යෙසා 34:8; ක්‍රියා 17:31; **20** යෙසා 25:8; මතෙ 5:4; ලූක් 6:21; **21** එස්ත 9:22; ගීතා 30:11; **22** ගීතා 45:7.

නමැති වස්ත්‍රයද[1] ලබා දෙන පිණිස
මාව එවා තිබේ. ඔවුන්ව ධර්මිෂ්ඨකම
නමැති විශාල ගස් ලෙස හඳුන්වනු
ලබයි.[2] ඒවා යෙහෝවා දෙවි තමාට
අලංකාරයක් ගෙන දෙන පිණිස[3]
සිටෙවූ ගස්ය.[4] **4** බොහෝ කාල-
යක් පුරා නටබුන් වූ තැන් ඔවුහු
යළි ගොඩනඟන්නෝය.[5] ඈත අතී-
තයේ විනාශ වූ තැන් නැවත සක-
සන්නෝය.[6] පරම්පරා ගණනාවකට
පාළුවට ගොස් තිබූ නුවරවල්ද ඔවුහු
මුළුමනින්ම අලුත් කරන්නෝය.[7]

**5** “ඔබේ බැටළු රැළ බලාගැනී-
මට විදේශිකයෝ පැමිණෙති.[8] ඔබේ
කෙත්වතු හා මිදිවතු වවන්නේ වෙ-
නත් ජාතීන්ට[9] අයත් සෙනඟකි.[10]
**6** එහෙත් ඔබව හඳුන්වනු ලබන්-
නේ යෙහෝවා දෙවිගේ පූජකයන්
ලෙසයි.[11] ඔබ අපේ දෙවිගේ සේ-
වකයෝය.[12] ඔබ ජාතීන්ගේ සම්-
පත් භුක්ති විඳින්නහුය.[13] එමගින්
ඔබට හිමි වන ගෞරවය ගැන ඔබ
මහත් ප්‍රීතියෙන් කතා කරන්නහුය.[14]
**7** ඔබ වින්ද ලැජ්ජාව වෙනුවට දෙගු-
ණයක් ආශීර්වාද ලබන්නහුය.[15] ඔබ
නින්දාවට පත් වෙනවා වෙනුවට
ඔබට ලැබෙන උරුමය නිසා ඔබ
ප්‍රීතියෙන් ඉපිල යන්නහුය.[16] ඔබ
ජීවත් වන දේශයේදී, එක් කොටසක්
නොව කොටස් දෙකක්ම ඔබට හිමි
වනු ඇත.[17] ඔබ සදහටම සතුටින්
කල් ගෙවන්නහුය.[18] **8** ‘මන්ද යෙ-
හෝවා දෙවි වන මම යුක්තියට ප්‍රිය
කරමි.[19] අධර්මිෂ්ඨකමත් සොරකමත්
මම හෙළාදකිමි.[20] මම විශ්වාසවන්ත
ලෙස ඔවුන්ගේ ක්‍රියාවලට සුදුසු ප්‍රති-
ඵල දී[21] ඔවුන් සමඟ සදහටම පව-
තින ගිවිසුමක් ඇති කරගන්නෙමි.’[22]
**9** ඔබගේ දරුදැරියන්ව හා ඔබෙන්
පැවතෙන්නන්ව ජාතීන් පවා දැන
හඳුනා ගනු ඇත.[23] ඔබ යෙහෝවා දෙ-
විගෙන් ආශීර්වාද ලැබූ සෙනඟක්[24]
බව ඔබව දකින සියලුදෙනාම තේ-
රුම්ගනු ඇත.”[25]

**10** මාගේ දෙවි වන යෙහෝවා
නිසා මම බොහෝ සෙයින් සතුටු වන්-
නෙමි.[1] මන්ද ඔහු ගැලවීම නමැති
වස්ත්‍රයද[2] ධර්මිෂ්ඨකම නමැති සළුවද
මට ඇන්දුවේය.[3] පූජකයෙකු මෙන්
හිස්වැස්මක්[4] පළඳින මනාලයෙකු
සේද අලංකාර ආභරණ පළඳින මනා-
ලියක[5] සේද ඔහු මාව සැරසුවේය.
**11** භූමියෙන් පැළෑටි හටගන්නාක්
මෙන්ද උයනේ වපුරා තිබෙන බීජ දලු
ලන්නාක් මෙන්ද[6] විශ්වයේ පාලක-
යාණන් වන යෙහෝවා දෙවි සියලු
ජාතීන් ඉදිරියේ ධර්මිෂ්ඨකම[7] හා ප්‍රීති
ප්‍රශංසා හටගන්න සලස්වන්නේය.[8]

**62** සියොන්හි ධර්මිෂ්ඨකම දීප්-
තිමත්ව බැබළෙන තුරු[9] මම
නිහඬ නොවෙමි.[10] යෙරුසලමෙහි[11]
ගැලවීම දැල්වෙන පහනක් මෙන් දිස්
වන තුරු[12] මම නිශ්චල නොවෙමි.

**2** “ස්ත්‍රිය,[13] ජාතීන් ඔබේ ධර්මිෂ්ඨ-
කමද[14] රජවරු ඔබේ තේජසද දකිනු
ඇත.[15] යෙහෝවා දෙවිම ඔබට පව-
රන අලුත් නමකින් ඔබව හඳුන්වනු
ලබයි.[16] **3** ඔබ යෙහෝවා දෙවිගේ
අතේ තිබෙන අලංකාර ඔටුන්නක්
මෙන්ද[17] ඔබේ දෙවිගේ අතේ තිබෙන
රාජකීය හිස්පළඳනාවක් මෙන්ද වන්-
නෙහිය. **4** යළි කෙදිනකවත් ඔබ
අත්හරිනු ලැබූ තැනැත්තියක්යයි
නොකියන්නේය.[18] ඔබේ දේශය පාළු-
වට ගිය ස්ථානයක් කියාද කිසිවෙක්
නොකියන්නේය.[19] ඒ වෙනුවට ඔබව,
‘මාගේ ප්‍රීතිය’[20] ලෙසද ඔබේ දේ-
ශය, ‘මාගේ භාර්යාව’ ලෙසද හඳුන්-
වනු ඇත. මන්ද යෙහෝවා දෙවි ඔබ
ගැන ප්‍රීති වෙයි. ඔබේ දේශයද භාර්යා-
වක් ලෙස භාරගනු ඇත.[21] **5** තරු-
ණයෙකු කන්‍යාවක තම භාර්යාව
ලෙස භාරගන්නා සේම ඔබේ පුත්‍රයෝද
ඔබව භාර්යාවක සේ භාරගන්නෝය.[22]

**61 පරි.**
1 සෙක 3:4
2 ගීතා 92:12; මතෙ 7:17
3 යොහ 15:8; 1කොරි 6:20
4 යෙසා 60:21
5 යෙසා 49:8; යෙසා 51:3; එළි 11:2
6 යෙසා 44:26; යෙසා 58:12
7 එස 36:33
8 යෙසා 14:1
9 යෙසා 60:10
10 මතෙ 25:34; එළි 7:15
11 නික් 19:6; 1පේත්‍ර 2:9; එළි 20:6
12 මතෙ 24:45; ක්‍රියා 13:2; 2කොරි 6:4; හෙබ්‍රෙ 10:11
13 යෙසා 23:18; යෙසා 60:5; යෙසා 60:7
14 හග් 2:7
15 ද්වි 21:17; 2රාජා 2:9
16 යෝබ් 42:10
17 සෙක 9:12
18 ගීතා 16:11; යෙසා 35:10
19 ද්වි 32:4; ගීතා 33:5; ගීතා 37:28
20 හිතෝ 6:16; යෙරෙ 7:9; සෙක 8:17; මලා 3:8
21 රූත් 2:12; ගීතා 117:2; සෙක 8:8
22 2සාමු 23:5; යෙසා 55:3; යෙරෙ 32:40; හෙබ්‍රෙ 13:20
23 උත් 22:18; සෙක 8:13
24 ගීතා 115:15; යෙසා 65:23
25 යෙසා 60:4

**2 තීරුව**
1 1සාමු 2:1; යෙසා 25:9; යෙසා 65:13; ලූක් 1:46; රෝම 5:11
2 ගීතා 132:16; යෙසා 52:1; එළි 21:2
3 යෝබ් 29:14; ගීතා 132:9
4 නික් 28:39; යෙසා 61:3
5 ගීතා 45:13; යෙසා 49:18; එළි 19:7
6 යෙසා 55:10; යෙසා 58:11

**7** ගීතා 85:11; යෙසා 45:8; යෙසා 62:1; **8** යෙසා 60:18; යෙසා 62:7; 1පේත්‍ර 2:9; **62 පරි.** **9** හිතෝ 4:18; යෙසා 1:26; **10** ගීතා 102:13; යෙසා 43:13; **11** ගීතා 137:6; සෙක 2:12; **12** ගීතා 98:2; යෙසා 51:5; **13** යෙසා 54:1; යෙසා 60:1; **14** යෙසා 48:14; යෙසා 54:14; යොහ 16:8; **15** ගීතා 72:10; යෙසා 49:23; යෙසා 60:11; **16** යෙසා 65:15; යෙරෙ 33:16; **17** ගීතා 48:2; ගීතා 50:2; සෙක 9:16; 1තෙස 2:19; **18** යෙසා 54:6; **19** යෙසා 32:14; යෙසා 49:14; **20** ගීතා 149:4; යෙරෙ 32:41; ශෙප 3:17; **21** යෙරෙ 3:14; හොෂේ 2:19; **22** යෙරෙ 3:14.

මනාලයෙකු තම මනාලිය ගැන ප්‍රීති
වන්නා සේම[1] ඔබේ දෙවිද ඔබ ගැන
බොහෝ සෙයින් ප්‍රීති වෙයි.[2] **6** ‘යෙ-
රුසලම, මම ඔබේ පවුරු පිට මුර-
කරුවන් තැබුවෙමි.[3] ඔවුන් දිවා රෑ
දෙකෙහිම ක්‍රියාශීලීව සිටිය යුතුයි.’[4]

“යෙහෝවා දෙවි ගැන කතා කරන
සියල්ලෙනි,[5] නිහඬ නොවන්න.[6]
**7** දෙවි යෙරුසලම ස්ථිර ලෙස පිහිටු-
වන තුරු ඔබ නිහඬ නොවිය යුතුයි.
යෙරුසලම පොළොවේ සියලු වැසි-
යන්ගෙන් ප්‍රශංසාව ලැබෙන තත්ව-
යට ගෙනෙන තුරු[7] ඔබ දෙවි ඉදිරියේ
නිහඬ නොවන්න.”

**8** යෙහෝවා දෙවි තම බලවත්
දකුණත[8] ඔසවා මෙසේ පොරොන්දු
වෙයි.[9] “මම නැවත කිසිදා ඔබේ
ධාන්‍ය සතුරන්ට කන්න නොදෙන්-
නෙමි.[10] ඔබ වෙහෙස මහන්සියෙන්
පෙරූ අලුත් වයින්ද මම විදේශික-
යන්ට තවත් බොන්න නොදෙමි.[11]
**9** ධාන්‍ය රැස් කරගත් අයම එය
භුක්ති විඳ යෙහෝවා දෙවි වන මට
ස්තුති ප්‍රශංසා කරනු ඇත. මිදිපල රැස්
කරගත් අයම මාගේ ශුද්ධස්ථානයේ
මළුවල වයින් පානය කරනු ඇත.”[12]

**10** ජනයෙනි, පිටත්ව යන්න.
නුවර දොරටුවෙන් පිටත්ව යන්න.
මාර්ගය එළි පෙහෙළි කර එය සක-
සන්න.[13] එහි ගල්, බොරලු ඉවත්
කර[14] ජනයාට පෙනෙන සේ කොඩි-
යක් සිටුවන්න.[15]

**11** යෙහෝවා දෙවි පොළොවේ
සතර දිශාවටම ඇසෙන සේ
මෙසේ ප්‍රකාශ කරන්නේය.[16] “ජන-
යෙනි, ‘ඔබේ ගැලවීම අත ළඟය![17]
දෙවි ඔබේ ක්‍රියා දැක ඔබට ආශීර්වාද
කිරීමට බලා සිටියි.[18] ඔහු ආශීර්වාද
රැසක් සමඟින් ඔබ වෙත පැමිණෙයි’[19]
කියා සියොන් දියණියට කියන්න.”[20]

**12** ඔවුන්ව යෙහෝවා දෙවි මුදවා-
ගත්[21] ශුද්ධ සෙනඟ වශයෙන් හඳුන්-
වනු ලබයි.[22] ඔබව, ‘සොයා ගිය
තැනැත්තිය’ ලෙසත් ‘අත් නැරිය
නුවර’[23] ලෙසත් හඳුන්වනු ලබයි.

**63** ඒදොම්හි[1] බොෂ්රා[2] නගරයේ
සිට දීප්තිමත් වර්ණවලින්
යුත් තේජාන්විත සළුපිළි පැළඳගෙන
මහත් බලයෙන් යුතුව පැමිණෙන මේ
තැනැත්තා කවුද?

“ඒ වෙන කිසිවෙකු නොව ධර්-
මිෂ්ඨ ලෙස කතා කරන,[3] ගලවාගැනී-
මට සියලු බලැති තැනැත්තා වන
මමය.”[4]

**2** මිදි පාගන[5] කෙනෙකුගේ වස්ත්‍ර
මෙන් ඔබේ වස්ත්‍ර රතු පාටට තිබෙන්-
නේ මන්ද?

**3** “මම තනිවම මිදි පෑගුවෙමි.[6]
කිසි මිනිසෙක් මාගේ උදව්වට සිටියේ
නැත. මම මහත් කෝපයෙන් ඔවුන්ව
පාගා පොඩි කර දැමුවෙමි.[7] ඔවුන්ගේ
ලේ මගේ ඇඳුම්වල විසි වූ නිසා[8]
මාගේ ඇඳුම් අපවිත්‍ර විය. **4** මාගේ
සතුරන්ව විනාශ කරන දවස මට සිහි
විය.[9] මාගේ සෙනඟව මුදවාගන්නා
කාලය ළං වී තිබේ. **5** මට උපකාර
පිරිනමන්න කිසිවෙකු සිටීදැයි මම
බැලුවෙමි. එහෙත් මට උපකාර කිරී-
මට කිසිවෙක් ඉදිරිපත් වුණේ නැත.[10]
ඒ ගැන මම පුදුමයට පත් වුණෙමි. ඒ
නිසා ගැලවීම ලබා දෙන පිණිස මමම
ඉදිරිපත් වුණෙමි.[11] මාව සවිමත්
කළේ මාගේ දැවෙන කෝපයයි.[12]
**6** මම මහත් උදහසින් මිනිසුන්ව
පාගා දැමුවෙමි. මාගේ කෝපයෙන්
ඔවුන්ව මත් කරවා[13] ඔවුන්ගේ ලේ
පොළොවට වත් කළෙමි.”[14]

**7** යෙහෝවා දෙවිගේ කාරුණාව*
ගැන මම ප්‍රකාශ කරන්නෙමි.[15] යෙ-
හෝවා දෙවි අප වෙනුවෙන් කළ සෑම
දෙයක් ගැනම මම ඔහුව පසසන්-
නෙමි.[16] යෙහෝවා දෙවි තම අසීමිත
කරුණාවෙන් හා දයාවෙන්[17] පෙ-
ළඹී ඊශ්‍රායෙල් ජාතිය වෙනුවෙන් කළ
සියලු යහපත්කම්[18] ගැන කියමින්,

**62 පරි.**
**1** සල 3:11
**2** යෙසා 65:19; යෙරෙ 32:41
**3** 2ලේක 8:14; යෙසා 52:8; 1කොරි 12:28; එෆී 4:11
**4** ගීතා 134:1
**5** ගීතා 134:2; ක්‍රියා 10:4
**6** 1තෙස 5:17
**7** යෙසා 61:11; යෙරෙ 33:9; ශෙප 3:19
**8** යෙසා 40:10
**9** ද්වි 32:40; එස 20:5
**10** ද්වි 28:33
**11** ද්වි 28:51; යෙරෙ 5:17
**12** ද්වි 14:23; යෙසා 65:21
**13** යෙසා 40:3; යෙසා 48:20
**14** යෙසා 57:14
**15** එස්රා 1:3; යෙසා 11:12; යෙසා 18:3; යෙසා 49:22
**16** ගීතා 98:2
**17** සෙක 9:9; මතෙ 21:5; යොහ 12:15
**18** යෙසා 40:10; යෙසා 49:4
**19** 1කොරි 15:58; එළි 22:12
**20** යෙසා 40:9
**21** ගීතා 107:2; යෙසා 35:9
**22** ද්වි 26:19; 1පේතෘ 1:15
**23** 1රාජා 11:39; යෙසා 54:7

**2 තීරුව**

**63 පරි.**
**1** ගීතා 137:7; යෙසා 34:5
**2** ආමො 1:12
**3** යෙසා 45:19; යෙසා 45:24
**4** යෙසා 25:9; යෙසා 49:26
**5** යෝවෙ 3:13; එළි 14:20; එළි 19:15
**6** විලා 1:15
**7** 1සාමු 2:10; යෙසා 34:2; මීකා 7:10; එළි 14:19
**8** 2රාජා 9:33
**9** යෙසා 34:8; යෙසා 35:4; යෙසා 61:2
**10** යෙසා 59:16

**11** ගීතා 44:3; ගීතා 98:1; යෙසා 51:9; යෙසා 52:10; **12** ගීතා 59:13; යෙසා 59:18; **13** ගීතා 75:8; යෙරෙ 25:16; එළි 14:10; **14** යෙසා 26:5; **15** නික් 20:6; ගීතා 63:3; ගීතා 107:8; ගීතා 136:1; **16** ගීතා 78:12; ගීතා 105:5; **17** ගීතා 51:1; යෙසා 55:7; **18** 1රාජා 8:66; ගීතා 31:19.

යෙසා **63:7*** හෝ, “ළැදි ප්‍රේමය.”

මම ඔහුට ප්‍රශංසා කරමි. **8** දෙවි මෙසේ පවසන්නේය. “ඔවුහු මාගේ සෙනඟය.[1] මාගේ විශ්වාසය කඩ නොකරන මාගේ දරුවෝය.”[2] ඒ නිසා දෙවි ඔවුන්ගේ ගැලවුම්කරු ලෙස කටයුතු කළේය.[3] **9** ඔවුන් වින්ද සෑම දුකක්ම ඔහුටත් දැනුණි.[4] ඒ නිසා ඔහු තමාගේම දූතයා එවා ඔවුන්ව ගලවාගත්තේය.[5] දෙවි ඔවුන් කෙරෙහි දැක්වූ ප්‍රේමය නිසා ඔහුට අනුකම්පා කර ඔවුන්ව මුදවාගත්තේය.[6] දෙවි ඈත අතීතයේදී ඔවුන්ව උසුලාගෙන ගියේය.[7]

**10** නමුත් ඔවුහු දෙවිට විරුද්ධව කැරලිගැසුවෝය.[8] ඔවුහු දෙවිගේ බලයට විරුද්ධව ක්‍රියා කරමින් ඔහුට දුක් දුන්නෝය.[9] එමනිසා දෙවි ඔවුන්ගේ සතුරෙකු ලෙස ක්‍රියා කරමින්[10] ඔවුන්ට විරුද්ධව සටන් කළේය.[11] **11** එවිට ඔවුහු පුරාණයේ විසූ දෙවිගේ සේවකයා වූ මෝසෙස්ගේ දවස් සිහි කරමින් මෙසේ කීවෝය. “තම රැළේ එඬේරුන්[12] සමඟ ඔවුන්ව මුහුද මැදින් ගෙනා තැනැත්තාණන් දැන් කොහේද?[13] මෝසෙස්ට* බලය[14] දුන් තැනැත්තාණන් කොහේද? **12** ඔහු තම තේජවත් හස්තයෙන්[15] මෝසෙස්ගේ දකුණත අල්ලා ඔහුට උපකාර කළේය. සෙනඟ බලා සිටියදීම ඔහු මුහුද දෙබෑ කළේ[16] ඔහුගේ නාමය සදහටම ගෞරවයට පත් වන පිණිසය.[17] **13** පාළුකරයේ නිදැල්ලේ දුවන අශ්වයෙකු මෙන් ඔහු තම සෙනඟව කිසි කරදරයක් නොමැතිව මහා ජල කඳ මැදින් ගෙන ගියේය.[18] **14** තැනිතලාවට බැස යන සතෙකු සුවසේ සිටින්නාක් මෙන් යෙහෝවා දෙවි තම බලය මාර්ගයෙන් ඔවුන්ට සැනසීම ලබා දුන්නේය.”[19]

මෙසේ, ඔබේ සෙනඟට ඔබ මඟ පෙන්වූයේ ඔබේ නාමය තේජසට පත් වන පිණිසය.[20]

**15** ඉහළින් පිහිටි ඔබගේ තේජසින් පිරි ශුද්ධ වාසස්ථානය[21] වන ස්වර්ගයේ සිට අප දෙස බලන්න.[1] ඔබ පෙර දවස්වලදී මෙන් මහත් උද්‍යෝගයෙන්[2] පියවර ගෙන ඔබේ මහත් බලය නොපෙන්වන්නේ මන්ද? ඔබේ ගැඹුරු සෙනෙහසත් අනුකම්පාවත්[3] ඔබේ දයාවත්[4] ඔබ දැන් නොපෙන්වන්නේ මන්ද? ඔබ ඒ සියල්ල මාගෙන් සඟවා තබන්නෙහිය.[5] **16** යෙහෝවා දෙවියනි, ඔබ අපගේ පියාණන්ය.[6] ආබ්‍රහම් සහ ඊශ්‍රායෙල් අපව භාරගත්තේ නැතත් ඔබ අපව ඔබේ දරුවන් ලෙස භාරගන්නෙහිය. පුරාණයේ සිටම ඔබ අපේ මිදුම්කරු ලෙස කටයුතු කර තිබේ.[7] **17** යෙහෝවා දෙවියනි, ඔබගේ මාර්ගවලින් මුළාව යන්න ඔබ අපට ඉඩ දෙන්නේ මන්ද? ඔබට ගරුබියක් නොපෙන්වා සිත් දැඩි කරගෙන සිටීමට අපට ඉඩ දෙන්නේ මන්ද?[8] ඔබේ සේවකයන් වන අපේ පිහිටට ඇවිත් ඔබට අයිති ගෝත්‍ර[9] ගලවාගන්න කියා අපි ඔබෙන් ඉල්ලා සිටින්නෙමු. **18** කෙටි කලකට ඔබේ ශුද්ධ ජාතිය[10] දේශය උරුම කරගෙන සිටියේය. එහෙත් ඔබේ සතුරෝ ඇවිත් ඔබේ ශුද්ධස්ථානය පාගා දැමුවෝය.[11] **19** අපි කිසිවිටෙකත් ඔබගේ පාලනය යටතේ නොසිටි ඔබගේ නමින් නොහැඳින්වූ සෙනඟක්[12] මෙන් වන්නෙමු. අපි දැන් බොහෝ කාලයක් පුරා මේ තත්වයේ සිටින්නෙමු.

**64** ඔබ අහස දෙබෑ කරමින් පොළොවට පැමිණියා නම්[13] කඳු ඔබ නිසා දෙදරුම් කයි.[14] **2** වනළැහැබ වනසා දමන, වතුර උතුරුවන ගින්නක් මෙන් පැමිණ ඔබේ සතුරන්ට ඔබේ නාමය දැනගන්න සලස්වන්න.[15] එවිට ජාතීහු ඔබ නිසා කැලඹෙන්නෝය.[16] **3** පෙර කාලවලදී, ඔබ පැමිණ අප බලාපොරොත්තු නොවූ බිය උපදවන දේවල්[17] කළෙහිය. කඳු ඔබ නිසා දෙදරුම් කෑවේය.[18] **4** පුරාණයේ සිට මේ

**63 පරි.**
1 උත් 17:7
2 නික් 24:7
3 නික් 14:30; ගීතා 106:21
4 නික් 3:7; විනි 10:16
5 නික් 14:19; නික් 23:20
6 ද්වි 7:8; ගීතා 106:10
7 නික් 19:4; ද්වි 1:31
8 ද්වි 9:7
9 ගීතා 78:40; ක්‍රියා 7:51; එෆී 4:30
10 ලෙවී 26:17; ද්වි 28:63; යෙරෙ 30:14
11 යෙරෙ 21:5
12 ගීතා 77:20
13 නික් 14:30; යෙසා 51:10
14 ගණන් 11:17; හග් 2:5; සෙක 4:6
15 නික් 6:6; නික් 15:16
16 නික් 14:21; ගීතා 78:13
17 නික් 9:16; නික් 14:17; රෝම 9:17
18 ගීතා 106:9
19 යොෂු 22:4
20 2සාමු 7:23; නෙහෙ 9:10
21 2ලේක 30:27; යෙසා 57:15

**2 තීරුව**
1 ද්වි 26:15; ගීතා 80:14
2 2රාජ 19:31; සෙක 8:2
3 යෙරෙ 31:20
4 ද්වි 4:31; නෙහෙ 9:17
5 ද්වි 31:17
6 නික් 4:22; ද්වි 32:6; යෙරෙ 3:19
7 යෙසා 41:14; යෙසා 44:6; යෙසා 54:5
8 ද්වි 2:30; යොෂු 11:20; යෙසා 6:10; රෝම 9:18
9 ගීතා 74:2; ගීතා 80:14; ගීතා 135:4
10 නික් 19:6; ද්වි 7:6
11 2ලේක 36:19; යෙසා 64:11; විලා 1:10
12 ද්වි 28:10; 2ලේක 7:14

**64 පරි.** **13** නික් 19:11; මීකා 1:3; **14** ගීතා 18:7; ගීතා 68:8; **15** ගීතා 46:10; එස 36:23; මතෙ 6:9; **16** ගීතා 99:1; **17** නික් 34:10; ගීතා 66:3; **18** හබ 3:6.

යෙසා **63:11*** මු.අ., “ඔහුට.”

දක්වාම කිසිවෙකු ඔබ හා සමාන දෙවි
කෙනෙකු ගැන ඇසුවේවත්[1] එවැනි
දෙවි කෙනෙකුව දුටුවේවත් නැත. ඔබ
හැර වෙන කිසි දෙවි කෙනෙකු[2] තමන්
කෙරෙහි බලාපොරොත්තු තබන අය-
ගේ පිහිටට පැමිණෙන්නේ[3] නැත.
**5** ඔබව සිහි කරමින් ඔබ කියන
ආකාරයට[4] ජීවත් වන, ධර්මිෂ්ඨකම්
කිරීමෙන්[5] සතුටක් ලබන අයගේ උප-
කාරයට ඔබ පැමිණෙන්නෙහිය.

ඔබ අප සමඟ උදහස් වුණේ[6] අප
කළ පව් නිසාය.[7] අපි බොහෝ කාල-
යක් පුරා වැරදි ක්‍රියාවල ඇලීගැලී
සිටියෙමු. එසේනම්, ඔබ අපව ගලවා-
ගනියි කියා අපට බලාපොරොත්තු
විය හැකිද?[8] **6** අප හැමෝම අප-
විත්‍රය. අපගේ ධර්මිෂ්ඨ ක්‍රියා ඔසප්
කාලයේදී අපවිත්‍ර වන වස්ත්‍රයක්
මෙනි.[9] අපි ගසක කොළයක් මෙන්
මැලවී යන්නෙමු.[10] අපේ පව් නිසා අපි
සියල්ලෝම සුළඟට ගසාගෙන යන්-
නෙමු.[11] **7** ඔබේ නාමයට කිසිවෙ-
කුවත් අයැදින්නේ නැත.[12] ඔබ සමඟ
බැඳීමක් ඇති කරගැනීමට ඔවුන්ට
කිසි වුවමනාවක් නැත. ඔබ අපෙන්
ඔබේ මුහුණ සඟවා[13] අපගේ වැරදි
ක්‍රියාවල ප්‍රතිඵල විඳ පීඩාවට පත්
වෙන්න අපට ඉඩහැරියෙහිය.[14]

**8** එහෙත් යෙහෝවා දෙවියනි,
අපේ පියාණන් ඔබය.[15] අප නිකම්ම
නිකම් මැටි පිඩක් වැනිය.[16] ඔබ
අපේ කුඹල්කරුය.[17] අප සියල්ලන්ම
ඔබේ අතින් නිමැවුණු භාණ්ඩ මෙනි.[18]
**9** යෙහෝවා දෙවියනි, අප සමඟ උද-
හස් නොවන්න.[19] අපගේ වැරදි ක්‍රියා
සැමදා සිතේ තබා නොගන්න.[20] අපි
ඔබේ සෙනඟ බව සිහි කරන මෙන්
ඔබෙන් ඉල්ලා සිටිමු.[21] **10** ඔබේ
ශුද්ධ නුවරවල්[22] පාළුවට ගොස් ඇත.
සියොන්[23] නුවර වියළි කාන්තාරයක්
මෙනි. යෙරුසලම පාළු නටබුන් ගො-
ඩකි.[24] **11** අපගේ පියවරුන් ඔබට
ප්‍රශංසා කළ ස්ථානය[25] වන අපේ අලං-
කාර වූ ශුද්ධ ගෘහය[26] ගිනිබත් වී
ඇත.[27] අපගේ එක් වටිනා දෙයක්-
වත්[28] ඉතුරු වී නැත. **12** යෙහෝවා
දෙවියනි, ඔබ මේ දේවල් දැක දැකත්
නිහඬව බලා සිටින්නෙහිද?[1] අප මෙ-
තරම් දුක් විඳිද්දී ඔබ කිසිවක් නොකර
බලා සිටින්නෙහිද?[2]

**65** “මාව හඳුනාගැනීමට නො-
වෙහෙසුණු අයට[3] මාව හඳු-
නාගැනීමට හැකි විය.[4] මාගෙන් මඟ
පෙන්වීම් නොපැතූ අය මට ළං වූහ.[5]
මාගේ නාමයට නොඅයැදූ ජාතිය-
කට,[6] ‘මම ඔබ ළඟ සිටිමි’[7] කියා
පැවසුවෙමි.

**2** “වැරදි මාර්ගයක[8] ගමන් කරමින්
හිතුමනාපෙට[9] හැසිරෙන සෙනඟක්[10]
ඉදිරියේ මම දවස මුළුල්ලේම අත් විහි-
දුවා ඉවසිලිවන්තව බලා සිටියෙමි.
**3** ඔවුහු මාගේ මුහුණටම අපහාස කර-
මින්[11] සෑම වෙලේම උයන්වල පුද-
පූජා ඔප්පු කරති.[12] ගඩොල් මත සුවඳ
දුම්[13] ඔප්පු කරති. **4** ඔවුහු සො-
හොන් ගෙවල් අසල හිඳගෙන සිටිති.[14]
රාත්‍රිය පුරාම මුරපොළවල්වල ගැව-
සෙමින් ඌරු මස් කති.[15] ඔවුන්ගේ
කෑම භාජනවල තිබෙන්නේ පිළිකුල්-
සහගත දේවලින් සාදාගත් කෑමයි.[16]
**5** ඔවුහු තම සහෝදරයන්ට මෙසේ
කියති. ‘මට ළං වෙන්නවත් එපා.
මන්ද මම ඔබට වඩා ශුද්ධයි.’[17]
එහෙත් ඔවුන් මාගේ නාසයට නඟින
දුමක් මෙනි.[18] දවස පුරාම දැවෙන
ගින්නකින්[19] නඟින දුමක් මෙනි.

**6** “ඒ සෑම දෙයක්ම මා ඉදිරි-
යේ සටහන් වී තිබේ.[20] මම කිසි-
වක් නොකර නිහඬව බලා සිටින්නේ
නැත.[21] ඔවුන්ට ලැබිය යුතු දේ මම
අනිවාර්යයෙන්ම ඔවුන්ට ලබා දෙන්-
නෙමි.[22] ඔවුන්ට ලැබිය යුතු දඬු-

**64 පරි.**
**1** 1කොරි 2:9
**2** යෙරෙ 16:20; 1කොරි 8:4
**3** ගීතා 130:7; යෙසා 25:9; මීකා 7:7
**4** ගීතා 25:4; ගීතා 25:9; හොෂෙ 14:9
**5** එස 33:16; ශෙප 2:3; ක්‍රියා 10:35
**6** ගීතා 90:7; යෙසා 63:10
**7** යෙසා 1:21
**8** යෙසා 1:15; මලා 3:7
**9** ලෙවී 12:2; ලෙවී 15:20
**10** ගීතා 90:6; යාකො 1:10
**11** ගීතා 1:4; යෙසා 57:13
**12** ගීතා 14:4; හොෂෙ 7:7
**13** ද්වි 31:17; යෙසා 57:17
**14** එස 22:20
**15** යෙසා 63:16
**16** යෝබ් 10:9; යෙසා 29:16; යෙරෙ 18:6
**17** යෙසා 45:9; රෝම 9:20
**18** යෝබ් 10:8; ගීතා 100:3
**19** ගීතා 74:1; ගීතා 79:5
**20** යෙරෙ 3:12
**21** ද්වි 7:6; ගීතා 79:13
**22** යෙසා 1:7
**23** විලා 5:18; මීකා 3:12
**24** ගීතා 79:1; විලා 1:4
**25** 2ලේක 29:25
**26** 2රාජා 25:9
**27** 2ලේක 36:19; යෙරෙ 52:13
**28** විලා 1:10

**2 තීරුව**
**1** ගීතා 74:10; ගීතා 83:1; යෙසා 14:1
**2** ගීතා 10:1; ගීතා 74:11; සෙක 1:12

**65 පරි.**
**3** හොෂෙ 2:23
**4** ගීතා 105:4; යෙසා 55:6
**5** රෝම 9:30; රෝම 10:20; එෆි 2:12

**6** හොෂෙ 1:10; සෙක 2:11; 1පේතෘ 2:10; **7** යෙසා 45:22; **8** ගීතා 36:4; යෙරෙ 5:31; යෙරෙ 35:15; **9** යෙසා 55:7; යෙසා 59:7; යෙරෙ 18:12; මතෙ 15:19; යාකො 1:14; **10** ද්වි 31:27; නෙහෙ 9:29; යෙසා 1:2; යෙරෙ 5:23; යෙරෙ 6:28; සෙක 7:11; ක්‍රියා 7:51; **11** ද්වි 32:16; 2රාජා 17:17; 2රාජා 22:17; යෙරෙ 32:29; යෙරෙ 32:30; **12** ලෙවී 17:5; යෙසා 1:29; යෙසා 66:17; **13** 2ලේක 34:25; යෙරෙ 44:3; **14** ගණන් 19:16; ද්වි 18:11; **15** ලෙවී 11:7; ද්වි 14:8; යෙසා 66:17; **16** ලෙවී 11:4; ද්වි 14:3; **17** ලූක් 18:9; ලූක් 18:11; **18** ගීතා 101:5; හිතෝ 16:5; ලූක් 18:14; **19** ද්වි 29:20; **20** ගීතා 56:8; මලා 3:16; **21** ගීතා 50:3; යෙසා 43:13; යෙරෙ 5:9; **22** ගීතා 50:21; යෙරෙ 16:18; එස 11:21; යෝවෙ 3:4.

වම ඔවුන් පිටටම ගෙනෙන්නෙමි.*[1]
**7** ඔවුන් කළ වැරදිවලටත් ඔවුන්ගේ
පියවරුන්ගේ වැරදිවලටත් මම දඬුවම්
කරන්නෙමි.[2] මන්ද ඔවුහු කඳු මුදුන්-
වලත් හෙල්වලත් සුවඳ දුම් හා පුද-
පූජා ඔප්පු කර[3] මට නින්දා කළෝය.[4]
මම වෙන කිසිවක් කරන්න කලින්
ඔවුන්ට ලැබිය යුතු දඬුවම ඔවුන්
පිටට ගෙනෙන්නෙමි.”[5] එසේ පවසන්-
නේ යෙහෝවා දෙවිය.

**8** යෙහෝවා දෙවි මෙසේද පවසන්-
නේය. “මිදිපොකුරක හොඳ ගෙඩි කිහි-
පයක්[6] ඉතුරු වී ඇති බව දුටු විට
යමෙක් මෙසේ කියයි. ‘ඒ මිදිපොකුර
විනාශ කරන්න එපා.[7] එහි ගෙඩි කිහි-
පයක් ප්‍රයෝජනයට ගත හැකියි. අපට
එයින් ආශීර්වාද ලැබෙන්නත් ඉඩ
තිබෙනවා.’[8] එලෙසම, මමත් මාගේ
සේවකයන් වෙනුවෙන් මුළු ජාති-
යම විනාශ නොකරන්නෙමි.[9] **9** මම
යාකොබ්ගේ පෙළපතෙන් පරම්පරා-
වක් බිහි වීමට සලස්වමි.[10] යූදා-
ගේ පෙළපතෙන් පැමිණෙන මාගේ
තෝරාගත් සේවකයෝ මාගේ කඳු
උරුම කරගෙන[11] එහි වාසය
කරන්නෝය.[12] **10** මම ෂාරොන්[13]
තැනිතලාව බැටළුවන්ගේ තණබි-
මක්[14] බවටත් ආකොර් තැනිතලාව[15]
ගවයන් ලගින ස්ථානයක් බවටත් පත්
කරන්නෙමි. මා ඒ දේ කරන්නේ මාගේ
මඟ පෙන්වීම් පතන[16] මාගේ සෙනඟ
වෙනුවෙනි.

**11** “නමුත් ඔබ යෙහෝවා දෙවි
වන මාව එපා කළ සෙනඟකි.[17]
ඔබ මාගේ ශුද්ධ කන්ද අමතක කර
දමා[18] වාසනාවේ දෙවියන්ට[19] මේස-
යක් සූදානම් කළහුය. ඔබ සැර වැඩි
කළ වයින් ඉරණමේ දෙවියන්ට ඔප්පු
කළහුය.[20] **12** මම ඔබට කතා කළ
විට[21] ඔබ මට ඇහුම්කන් දුන්නේවත්
උත්තර දුන්නේවත් නැත.[22] මා පිළි-
කුල් කරන දේවල් ඔබ දිගටම කළ-
හුය.[23] ඔබ තෝරාගත්තේ මා කැමති

**යෙසා 65:6*** මූ.අ., “ඔවුන්ගේ ළයට ලබා දෙන්-
නෙමි.”

**65 පරි.**

**1** ගීතා 79:12
**2** නික් 20:5
ලෙවී 26:39
මතෙ 23:35
**3** 1රාජා 22:43
2රාජා 12:3
**4** එස 20:28
**5** ගීතා 79:12
1තෙස 2:16
**6** විනි 9:13
**7** යෙරෙ 30:11
මතෙ 24:22
**8** උත් 18:18
යෝවෙ 2:14
**9** ආමෝ 9:8
රෝම 9:27
**10** එස 37:21
රෝම 11:5
**11** උත් 35:12
යෙසා 60:21
යෙසා 61:7
එස 36:8
ඔබ 17
**12** ශෙප 3:20
**13** යෙසා 33:9
**14** ද්වි 28:2
යෙසා 35:2
**15** යොෂු 7:24
හොෂෙ 2:15
**16** ගීතා 24:6
යෙසා 55:6
**17** ද්වි 29:25
1ලේක 28:9
යෙසා 1:4
**18** 2ලේක 28:24
2ලේක 34:25
**19** ද්වි 32:17
1කොරි 10:20
**20** නික් 20:3
**21** 2ලේක 36:15
හිතෝ 1:24
යෙසා 50:2
යෙසා 66:4
**22** 2ලේක 36:16
යෙරෙ 7:13
සෙක 7:11
මතෙ 22:3
**23** 2ලේක 36:12
යෙසා 1:16
යෙරෙ 16:17

**2 තීරුව**

**1** හිතෝ 1:29
යෙසා 66:3
**2** ලෙවී 26:25
ද්වි 28:22
එස 6:13
**3** ද්වි 28:63
එස 9:6
**4** ගීතා 34:10
ගීතා 37:25
මලා 3:18
ලූක් 16:25
**5** ගීතා 37:19
ආමෝ 8:11
**6** යෙසා 49:10
**7** ලූක් 16:24
**8** යෙසා 61:7
යෙසා 66:14
**9** යෙසා 66:5

නැති දේමය.[1] ඒ නිසා මම ඔබව මර-
ණයට නියම කරන්නෙමි.[2] ඔබ සිය-
ලුදෙනාම ඔබේ ඝාතකයන් ඉදිරියේ
වැටී කඩුවෙන් මැරුම් කන්නහුය.”[3]

**13** විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේ පවසන්නේය.
“මාගේ සේවකයන් කෑම කා[4] තෘප්-
තිමත් වන නමුත් ඔබ කුසගින්නේ
සිටින්නහුය.[5] මාගේ සේවකයන්ට
බොන්න තිබුණත්[6] ඔබ පිපාසයෙන්
සිටින්නහුය.[7] මාගේ සේවකයන් ප්‍රීති-
යෙන් ඉපිල යන නමුත්[8] ඔබට අත්
වන්නේ ලැජ්ජාව පමණි.[9] **14** මාගේ
සේවකයන් සතුටු සිතින් ප්‍රීති ඝෝෂා
නඟන නමුත්[10] ඔබ හදවතේ වේදනා-
වෙන් හා සිත්තැවුලෙන් කෑ මොර
ගසන්නහුය.[11] **15** ‘විශ්වයේ පාල-
කයාණන් වූ යෙහෝවා දෙවි ඔබ
සියලුදෙනාවම නැති කර දමන්-
නේය.[12] දෙවිගේ සෙනඟ අනුන්ට
ශාප කිරීම සඳහා ඔබගේ නාමය
භාවිත කරති. නමුත් දෙවි ඔහු-
ගේ සේවකයන්ව හඳුන්වන්නේ වෙ-
නත් නමකිනි.[13] **16** මිහිපිට ජීවත්
වන කවරෙකු වුවද, “මට ආශීර්වාද
කරන්න” කියා අයැදින්නේ විශ්වාස-
වන්ත දෙවිගෙන් පමණයි.[14] දිවුරුමක්
දෙන කවරෙකු වුවද එසේ දිවුරන්නේ
විශ්වාසවන්ත දෙවිගේ නමින් පම-
ණයි.[15] මන්ද පෙර කාලවලදී අද්දුටු
සියලු දුක් පීඩා යළි කිසිදා මතකයට
නැඟෙන්නේ නැත.’ යළි කෙදිනක-
වත් මා ඉදිරියේ එවැනි දේවල් සිදු
වන්නේ නැත.[16]

**17** “මම අලුත් අහසක්ද[17] අලුත්
පොළොවක්ද[18] සාදන්නෙමි. පෙර
කාලවලදී සිදු වූ දේවල් නැවත කිසි
දිනක මතකයට නැඟෙන්නේ නැත.[19]
**18** දැන් මා කරන්න යන දේ ගැන

**10** යෙසා 24:14; යෙරෙ 31:12; **11** මතෙ 8:12; මතෙ 24:51; ලූක් 13:28; **12** යෙසා 66:16; මතෙ 25:41; **13** යෙසා 62:2; යෙරෙ 33:16; රෝම 9:26; **14** උත් 22:18; ගීතා 72:17; යෙරෙ 4:2; **15** ද්වි 6:13; යෙරෙ 4:2; යෙරෙ 12:16; **16** යෙසා 12:1; යෙරෙ 31:12; ශෙප 3:15; **17** එස්රා 4:3; එස්රා 5:2; යෙසා 32:1; යෙසා 51:16; ලූක් 12:32; රෝම 8:20; එළි 14:1; **18** උත් 12:3; ගීතා 37:29; යෙසා 49:8; මතෙ 25:34; යොහ 10:16; 2පේතෘ 3:13; එළි 7:9; **19** ගීතා 37:10; එළි 21:4.

සිතා හද පත්ලෙන්ම සතුටු වන්න.[1] ඒ
සතුට සඳහටම ඔබේ සිතෙහි රඳවා-
ගන්න.[2] මන්ද මා යෙරුසලම හා එහි
වැසියන් වෙනුවෙන් කරන දේ ඇත්-
තෙන්ම සතුටට කාරණයකි. ඒ නිසා
සියලු ජනයා සතුටින් ඉපිල යන්-
නෝය.[3] **19** මම යෙරුසලම සහ
ඇගේ සෙනඟ ගැන අතිශයින් ප්‍රීති
වෙමි.[4] යළි කිසිදා ඇගෙන් වැලපෙන
හඬක්වත් වේදනාවෙන් කෑ මොර
දෙන හඬක්වත් ඇසෙන්නේ නැත."[5]

**20** "ඒ කාලයේදී ස්වල්ප දවසක්
ජීවත් වූ ළදරුවෙක්වත්[6] ආයු
කාලය සම්පූර්ණයෙන් භුක්ති නො-
වින්ද මහල්ලෙක්වත් මිය යන්නේ
නැත.[7] වයස අවුරුදු සියයක් ජීවත්
වී මිය යන පුද්ගලයා පවා
කුඩා දරුවෙකු මෙන් වෙයි. අවු-
රුදු සියයක් ජීවත් වූ කෙනෙකු
පවා පව් කළොත් ඔහු පිටට ශාප
පැමිණෙනු ඇත.[8] **21** ඔවුහු ගෙ-
වල් ගොඩනඟා එහි ජීවත් වන්-
නෝය.[9] මිදිවතු වවා එහි පලදාව
භුක්ති විඳින්නෝය.[10] **22** ඔවුන්
ගොඩනඟන නිවෙස්වල වෙනත් අය
ජීවත් වන්නේ නැත. ඔවුන් වගා
කරන කෙත්වතුවල පලදාව වෙනත්
අය භුක්ති විඳින්නේ නැත. මාගේ සෙ-
නඟ වෘක්ෂයක් මෙන් බොහෝ කල්
ජීවත් වන්නෝය.[11] මාගේ තෝරාගත්
අය තමන් කරන වැඩවලින් නියම
සතුටක් ලබන්නෝය.[12] **23** ඔවුන්-
ගේ වෙහෙස මහන්සිය කිසිවිටෙක
අපතේ යන්නේවත්[13] ඔවුන් බිහි කරන
දරුවෝ කිසිවිටෙක විපතකට හසු
වන්නේවත් නැත.[14] මන්ද ඔවුහු යෙ-
හෝවා දෙවි වන මාගෙන් ආශීර්වාද
ලැබූ අයගේ දරුවෝය.[15] ඔවුන් සමඟ
ඔවුන්ගෙන් පැවතෙන සියලුදෙනාද
ආශීර්වාද ලබන්නෝය.[16] **24** ඔවුන්
මට හඬගැසූ විට මම ඇහුම්කන්
දෙමි.[17] ඔවුන් හඬගසන්න කලින්ම
මම ඔවුන්ට උත්තර දෙමි.[18]

**25** "වෘකයා[19] බැටළු පැටවා සමඟ
එකට තණ කන්නේය.[20] සිංහයා
හරකා මෙන් පිදුරු කන්නේය.[21] සර්-
පයා ආහාරයට ගන්නේ දූවිලිය.[1]
මාගේ ශුද්ධ කන්දේදී[2] උන්, කිසි-
වෙකුටවත් අනතුරක් සිදු කරන්නේ
නැත."[3] එසේ පවසන්නේ යෙහෝවා
දෙවිය.

**66** යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. "ස්වර්ගය මාගේ
සිංහාසනයය.[4] පොළොව මාගේ පා
පුටුවය.[5] එසේනම්, ඔබ මට ගෘහයක්
සාදන්නේ කොතැනද?[6] මට වාසස්-
ථානයක් සූදානම් කළ හැකි ස්ථාන-
යක් තිබේද?"[7]

**2** "ඒ සෑම දෙයක්ම සෑදුවේ මාගේ
දෑත්වලින් නොවෙයිද? ඒ සියල්ල පව-
තින්නේ මා නිසාය"[8] කියා යෙහෝවා
දෙවි පවසන්නේය. "මම මාගේ වචන-
යට ගරුබිය දක්වන,[9] බිඳුණු සිත්
ඇති යටහත්පහත් අය[10] වෙත මාගේ
නෙත් යොමු කරන්නෙමි.

**3** "නමුත් ඔවුහු පිළිකුල්සහගත දේ
කිරීමෙන් මහත් තෘප්තියක් ලබන,
හිතුමනාපෙට හැසිරෙන සෙනඟකි.[11]
ඔවුන් ගොනෙකු මරා මට පූජා
කළත් මා එය සලකන්නේ මිනී
මැරුමක් ලෙසය.[12] ඔවුන් මට බැට-
ළුවෙකු පූජා කළත් මා එය සල-
කන්නේ බල්ලෙකුව පූජා කරන්නාක්
මෙනි.[13] ඔවුන්ගේ යාග පූජා ඌරෙකු-
ගේ රුධිරය තරම්ම මට පිළිකුලකි.[14]
සිහිගැන්වීමක් ලෙස පූජාසනයේ කට-
ටකුමංජල්[15] ඔප්පු කරන තැනැත්-
තාව මා සලකන්නේ මන්තරයක් ජප
කර ආශීර්වාද දෙන තැනැත්තෙකු
මෙනි.[16] **4** ඒ නිසා, මම ඔවුන් පිටට
දඬුවම් ගෙන ඒමට තීරණය කළෙමි.[17]
ඔවුන්ව භීතියට පත් කරන දේවල්ම
ඔවුන්ට අද්දැකීමට සිදු වෙයි.[18] මන්ද
මා ඔවුන්ට හඬගැසූ විට කිසිවෙක්
මට සවන් දුන්නේවත් පිළිතුරු දුන්-
නේවත් නැත.[19] ඔවුහු දිගින් දිගටම
මා හෙළාදකින දුෂ්ට දේවල් කරන්-

**65 පරි.**

**1** ගීතා 67:3
**2** ගීතා 96:10; ගීතා 98:1
**3** යෙසා 51:11
**4** යෙසා 62:4; යෙරෙ 32:41
**5** යෙසා 25:8; යෙරෙ 31:12
**6** 2රාජා 8:12; විලා 2:21; හොෂෙ 13:16
**7** යෙරෙ 6:11; විලා 5:14
**8** දේශ 8:12; යෙසා 3:11
**9** යෙරෙ 31:4; ආමො 9:14
**10** යෙසා 62:8
**11** ගීතා 92:12; ගීතා 92:14; එළි 21:4
**12** 1කොරි 15:58
**13** ලෙවී 26:4; ද්වි 28:4; යෙසා 55:1; යෙසා 55:2
**14** නික් 23:26; යෙසා 33:24; යෙසා 54:13
**15** යෙසා 61:9; සෙක 10:9
**16** යෙසා 59:21; යෙසා 66:22; යෙරෙ 32:39
**17** යෙසා 58:9; ලූක් 12:30; රෝම 8:26
**18** ගීතා 91:15
**19** හොෂෙ 2:18
**20** යෙසා 11:6
**21** යෙසා 35:9

**2 තීරුව**

**1** උත් 3:14; රෝම 16:20
**2** මීකා 4:2; සෙක 8:3
**3** යෙසා 2:4; යෙසා 11:9

**66 පරි.**

**4** ගීතා 11:4; ගීතා 113:6; ගීතා 148:13
**5** මතෙ 5:35; ක්‍රියා 7:49
**6** 2ලේක 6:18; ක්‍රියා 17:24
**7** 1ලේක 28:2; ක්‍රියා 7:48
**8** උත් 1:1; යෙසා 40:26; ක්‍රියා 7:50
**9** එස්රා 9:4; ගීතා 119:161; ක්‍රියා 16:29

**10** 2රාජා 22:19; ගීතා 34:18; මතෙ 5:11; ලූක් 18:14; **11** විනි 5:8; ගීතා 81:12; යෙරෙ 14:10; **12** හිතෝ 15:8; යෙසා 1:11; **13** ලෙවී 11:27; **14** ද්වි 14:8; යෙසා 65:4; යෙසා 66:17; **15** ලෙවී 2:2; **16** 1සාමු 15:23; යෙසා 1:13; **17** ද්වි 28:15; හිතෝ 1:31; 2තෙස 2:11; **18** හිතෝ 10:24; **19** හිතෝ 1:24; යෙසා 50:2; යෙරෙ 7:13.

නෝය. ඔවුන් තෝරාගන්නේ මා පිළි-
කුල් කරන දේවල්මය."[1]
5 යෙහෝවා දෙවිගේ වචනයට
ගරුබිය දක්වන තැනැත්තෙනි,[2] ඔහු
පවසන දේට දැන් සවන් දෙන්න.
"මාගේ නාමය නිසා[3] ඔබට වෛර කර-
මින් ඔබව කොන් කරන ඔබේ සහෝ-
දරයෝ,[4] 'යෙහෝවා දෙවිට ප්‍රශංසා
වේවා'[5] යයි කියති. එහෙත් ලැජ්ජාවට
පත් වන්නේ ඔවුන්මය.[6] මම ඔබ ගැන
බොහෝ සෙයින් සතුටු වෙමි."[7]
6 නුවරෙහි ඝෝෂා හඬක් ඇසෙයි.
දේවමාලිගාවෙන්ද හඬක් ඇසෙයි![8]
එය නම් යෙහෝවා දෙවි තම
සතුරන්ට දඬුවම් කිරීමේදී නැඟෙන
හඬයි.[9]
7 ඇය ප්‍රසව වේදනා විඳින්න
කලින් දරුවෙකු බිහි කළාය.[10] ඇය
කිසි වේදනාවක් විඳින්නේ නැතුව
පිරිමි දරුවෙකු වැදුවාය.[11] 8 එවැනි
දෙයක් ගැන ඇසුවේ කවුද?[12] එවැනි
දෙයක් දුටුවේ කවුද?[13] දේශයක්[14] එක
දවසකින්[15] බිහි වෙයිද?* නැතහොත්
ජාතියක්[16] එක මොහොතකින් බිහි
වෙයිද?[17] සියොන් දියණිය ප්‍රසව වේ-
දනා විඳි සැණින්ම ඇගේ පුත්‍රයන්ව
බිහි කළාය.
9 "මා යමක් පටන්ගත් පසු එය
අතරමඟ නතර කරනවාද?[18] මවක
දරුවෙකු බිහි කරද්දී මා එය වළක්ව-
නවාද" කියා ඔබේ දෙවි වන යෙ-
හෝවා අසන්නේය.
10 යෙරුසලමට ප්‍රේම කරන
සියල්ලෙනි,[19] ඇයත් සමඟ සතුටු
වෙන්න.[20] ඇය ගැන වැලපෙන සියල්-
ලෙනි,[21] ප්‍රීතියෙන් ඉපිල යන්න.
11 මන්ද දරුවෙකු තම මවගෙන් කිරි
උරා බොන විට තෘප්තියට පත් වී
සැනසෙන්නාක් මෙන් ඔබද ඇයට
හිමි වන ගෞරවය නිසා මහත් ප්‍රීති-
යක්ද සැනසීමක්ද අද්දකින්නහුය.[22]
12 යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. "මම සමාදානය ගංගාවක්
මෙන්[1] ඇය වෙතට ගලා එන්න
සලස්වමි. ගලා යන දිය පහරක්
මෙන් ජාතීන්ගේ වටිනා වස්තු ඇය
වෙතට පැමිණෙන්න සලස්වා ඇයව
තේජසට පත් කරන්නෙමි.[2] ඔබ
කිරි බොන දරුවෙකු මෙන් ඒ තේ-
ජස ඇගෙන් උරා බොන්නහුය.[3] ඇය
ඔබව උකුළේ තබාගෙන යන්නීය.
ඔබව ඔඩොක්කුවේ තබාගෙන නළ-
වන්නීය.[4] 13 මවක ඇගේ දරුවා
සනසන්නාක් මෙන් මමද ඔබව සන-
සන්නෙමි.[5] යෙරුසලම නිසා ඔබ
සැනසීම අද්දකිනු ඇත.[6] 14 ඔබ
වටපිට බැලූ විට ඔබේ සිත ප්‍රීතියෙන්
ඉපිල යයි.[7] අලුත පිබිදෙන තණ-
කොළ මෙන් ඔබේ ඇට[8] ප්‍රාණවත්
වෙයි.[9] යෙහෝවා දෙවි වන මම මාගේ
සේවකයන්ට මාගේ බලය දකින්න
සලස්වමි.[10] නමුත් මාගේ සතුරන්ව
මම හෙළාදකින්නෙමි."[11]
15 "යෙහෝවා දෙවි වන මම ගින්-
නක් මෙන්[12] ඔබ වෙත එන්නෙමි.
මාගේ රථ සුළිසුළඟක් මෙනි.[13] මා
ඇවිත් ගිනිදලුවලින් ඔවුන්ට තර-
වටු කර මහත් කෝපයෙන් යුතුව
ඔවුන් පිටට දඬුවම් ගෙනෙන්නෙමි.[14]
16 යෙහෝවා දෙවි වන මම ගින්නක්
මෙන් පැමිණ විනිශ්චය ප්‍රකාශ කර
සියලු මනුෂ්‍යයන්ට විරුද්ධව මාගේ
කඩුව එල්ල කරමි.[15] යෙහෝවා දෙවි
වන මාගේ අතින් මැරුම් කන අයගේ
සංඛ්‍යාව ඉතා මහත්ය.[16] 17 උයන්[17]
මැද තිබෙන දේවතා රූප ඉදිරියෙහි
නමස්කාර කරන පිණිස තමන්වම
පවිත්‍ර කරගන්නාවූ, ඌරු මස්[18] හා
මීයන්[19] වැනි පිළිකුල් සතුන් කන්නාවූ
සියලුදෙනාවම මම විනාශ කරමි."
එසේ පවසන්නේ යෙහෝවා දෙවිය.
18 "මම ඔවුන්ගේ සියලු ක්‍රියා[20] හා
සිතුවිලි[21] දන්නෙමි. ඒ නිසා මම

යෙසා **66:8*** හෝ, "ප්‍රසව වේදනා නොවිඳ එක දවසකින් බිහි කළ හැකිද?"

**66 පරි.**

**1** 2රාජා 21:9 යෙසා 65:3 රෝම 1:28 හෙබ්‍රෙ 4:11
**2** එස්රා 10:3 යෙසා 66:2 යෙරෙ 36:16 හබ 3:16
**3** යොහ 17:11 යාකො 2:7
**4** යොහ 16:2 ගලා 2:4 2තෙස 2:3
**5** යෙසා 5:19 යෙසා 29:13
**6** යෙසා 65:13 යෙරෙ 17:13 යෙරෙ 17:18
**7** යෙසා 60:14 යෙසා 65:14
**8** මලා 3:1 1පේතෘ 4:17
**9** ද්වි 32:35 යෙසා 59:18
**10** යෙසා 54:1 ගලා 4:26
**11** ගීතා 33:12
**12** යෙසා 64:4
**13** 1කොරි 2:9
**14** යෙසා 27:6 යෙසා 65:9
**15** යෙසා 54:7 යෙරෙ 30:20
**16** යෙසා 10:20 යෙරෙ 23:8 සෙක 8:12 රෝම 11:26 1පේතෘ 2:9
**17** මතෙ 24:31
**18** උත් 18:14 යෙසා 37:3
**19** ගීතා 26:8 ගීතා 84:2 ගීතා 122:6 ගීතා 137:6
**20** ද්වි 32:43 යෙසා 44:23 රෝම 15:10
**21** එස 9:4
**22** ගීතා 36:8 යෙරෙ 3:15 යෝවෙ 3:18

**2 තීරුව**

**1** ගීතා 72:3 යෙසා 9:7 යෙසා 48:18
**2** යෙසා 54:3 යෙසා 60:3 හග් 2:7
**3** යෙසා 60:16
**4** යෙසා 60:4
**5** යෙසා 51:3
**6** යෙසා 44:28 යෙසා 65:18
**7** සෙක 10:7
**8** හිතෝ 3:8 හිතෝ 17:22
**9** යෙසා 26:19 හොෂෙ 14:5

**10** යෙසා 65:13; මලා 3:18; **11** යෙසා 59:18; යෙසා 65:12; **12** ද්වි 4:24; ගීතා 11:6; ගීතා 21:9; ගීතා 97:3; **13** ගීතා 50:3; යෙරෙ 25:32; **14** ගණන් 16:35; 2තෙස 1:8; **15** යෙරෙ 15:2; **16** යෙසා 34:5; යෙරෙ 25:33; එස 38:21; යෝවෙ 3:14; එළි 19:18; **17** යෙසා 1:29; යෙසා 65:3; **18** ලෙවී 11:7; ද්වි 14:8; යෙසා 65:4; **19** ලෙවී 11:29; **20** යෙසා 37:28; යෙසා 59:6; ආමො 5:12; **21** ද්වි 31:21; යෙසා 55:7; මීකා 2:1.

ජාතියක්, භාෂාවක් නොබලා සියලු
ජනයාව එකතු කර[1] ඔවුන්ට මගේ
තේජස දකින්න සලස්වමි."[2]
**19** "මම ඔවුන් ඉදිරියේ ලකුණක්
දිස් වීමට සලස්වා[3] බේරාගනු ලැබූ
සමහර අයව ජාතීන් අතරට යවන්-
නෙමි.[4] දක්ෂ දුනුවායන් සිටින තර්-
ෂිෂ්,[5] පූල් හා ලූද්[6] යන දේශ වෙනටත්
තූබල් හා යාවාන්[7] යන දේශ වෙන-
ටත් දුර ඈත පිහිටි දූපත්[8] වෙන-
ටත් මම ඔවුන්ව යවමි. මා ගැන
අසා නැති, මාගේ තේජස දැක
නැති[9] ඒ ජාතීන් අතරේ ඔවුහු මා
ගැන ප්‍රකාශ කරමින් මාව ගෞර-
වයට පත් කරති.[10] **20** ඊශ්‍රායෙල්-
වරුන් යෙහෝවා දෙවි වන මාගේ
ගෘහයට පවිත්‍ර භාජනයක තෑග්-
ගක් රැගෙන එන්නාක් මෙන්[11] ඔවුහු
සියලු ජාතීන් අතරේ සිටින ඔබේ
සහෝදරයන්ව[12] යෙහෝවා දෙවි වන
මා වෙනට රැගෙන එන්නෝය.[13]
ඔවුන්ව අශ්වයන් පිටද අශ්ව රථ
පිටද කරත්ත පිටද කොටළුවන් පිටද
වේගයෙන් දුවන ඔටුදෙනුන්[14] පිටද
තබාගෙන මාගේ ශුද්ධ කන්ද[15] වන
යෙරුසලමට ගෙනෙනු ලබයි." එසේ
පවසන්නේ යෙහෝවා දෙවිය.
**21** "පූජකයන් හා ලෙවීවරුන්
ලෙස කටයුතු කිරීම සඳහා ඔවුන්-
ගෙන් කිහිපදෙනෙකුව තෝරාගන්-
නෙමි" කියා යෙහෝවා දෙවි පවසයි.
**22** "මා සාදන අලුත් අහසත්[1]
අලුත් පොළොවත්[2] ස්ථිර ලෙස පිහි-
ටුවා තිබෙන්නාක් මෙන්[3] ඔබෙන්
පැවතෙන්නන්ද[4] ඔබේ නාමයද සදහ-
ටම පවතිනු ඇත."[5] එසේ පවසන්නේ
යෙහෝවා දෙවිය.
**23** "ඒ කාලයේදී, මාසයක් මාස-
යක්* පාසාද සබතක් සබතක්
පාසාද මට නමස්කාර කිරීම සඳහා
සියලු ජනයා මා ඉදිරියට පැමිණෙන්-
නෝය"[6] කියා යෙහෝවා දෙවි පව-
සන්නේය. **24** "ඔවුහු පිටතට ගොස්
මට විරුද්ධව කැරලිගැසූ සියලුදෙනා-
ගේ මළ සිරුරු දෙස බලන්නෝය.[7]
ඔවුන්ගේ මළ සිරුරු කා දමන පණු-
වෝ කිසිදා නොනසින්නෝය. ඒවා
දවාලන ගින්නද කිසිදා නොනිවෙන්-
නේය.[8] ඔවුහු සියලු ජනයාට මහත්
පිළිකුලක් වෙති."[9]

**66 පරි.**
**1** ගීතා 86:9 යෙසා 2:2 මතෙ 25:32 එළි 7:9
**2** එස 39:21
**3** එස්රා 1:3
**4** යෙසා 4:2 මතෙ 24:31
**5** උත් 10:4 ගීතා 72:10
**6** උත් 10:13
**7** උත් 10:2 එස 27:13
**8** යෙසා 49:1
**9** මලා 1:11
**10** යෙසා 60:3 රෝම 15:12 එළි 7:9
**11** ගණන් 7:13
**12** ද්වි 30:3 යෙසා 11:16 යෙසා 43:6 යෙසා 54:3 යෙසා 60:4 මතෙ 24:31
**13** යෙසා 60:9 රෝම 12:1 1පේතෘ 2:5
**14** යෙසා 60:6
**15** යෙසා 11:9 සෙක 1:17 එළි 14:1

**2 තීරුව**
**1** එස්රා 3:2 එස්රා 5:2 යෙසා 65:17 2පේතෘ 3:13
**2** එස්රා 1:3 එස්රා 2:64 එළි 21:1
**3** යෙසා 65:18

**4** යෙසා 65:23; **5** ගීතා 94:14; යෙරෙ 31:36; **6** ගීතා 86:9; සෙක 14:16; මලා 1:11; **7** ගීතා 58:10; එස 39:12; **8** යෙසා 14:11; යෙසා 34:10; මතෙ 3:12; මතෙ 25:41; මාක් 9:48; 2තෙස 1:9; **9** ගීතා 139:21.

යෙසා **66:23*** මූ.අ., "එක් නව සඳ දවසක සිට ඊළඟ නව සඳ දවස දක්වා."

# යෙරෙමියා

**1** මෙහි සඳහන් වන්නේ බෙන්ජ-
මින් දේශයේ[1] අනාතොත් නගර-
යේ[2] පූජකයෙකු වූ හිල්කියාගේ
පුත් යෙරෙමියා පැවසූ දේවල්ය.[3]
**2** ආමොන්ගේ පුත්‍රයා වූ[4] යුදාහි රජු
වන යොෂියාගේ පාලන සමයේ[5] දහ-
තුන්වන අවුරුද්දේදී[6] යෙහෝවා දෙවි
තම පණිවිඩය යෙරෙමියාට දැන්-
වීය. **3** යොෂියාගේ පුත් යෙහෝයා-
කිම්[7] යුදාහි රජව සිටි කාලය තුළදීද
යෙරුසලමේ වැසියන්ව වහලුන් ලෙස
ගෙන යනු ලැබූ මාසය දක්වාද එනම්,
යුදා දේශය පාලනය කළ යොෂියාගේ
පුත් ශෙදකියාගේ පාලනයේ එකො-
ළොස්වන අවුරුද්දේ[1] පස්වන මාසය
දක්වාද[2] ඒ පණිවිඩ යෙරෙමියාට දන්-
වන ලදි.
**4** යෙහෝවා දෙවි මට මෙසේ
පැවසුවේය. **5** "ඔබ මව්කුසේ පිළි-
සිඳගැනීමටත් කලින්[3] මම ඔබව

**1 පරි.**
**1** යොෂු 18:11
**2** යොෂු 21:18 1රාජා 2:26 1ලේක 6:60 යෙරෙ 29:27
**3** එස්රා 1:1 ආනි 9:2 මතෙ 2:17
**4** 2රාජා 21:19
**5** 2රාජා 22:1
**6** 2ලේක 34:1 යෙරෙ 25:3
**7** 2රාජා 24:1 2ලේක 36:4 යෙරෙ 25:1

**2 තීරුව** **1** 2රාජා 24:18; 2ලේක 36:11; යෙරෙ 21:1; යෙරෙ 39:2; **2** 2රාජා 25:8; යෙරෙ 52:12; **3** ගීතා 139:16.

තෝරාගත්තෙමි.[1] ඔබ ඉපදෙන්නත්
කලින් මම ඔබව ශුද්ධ සේවයක්
සඳහා තෝරාගත්තෙමි.[2] ජාතීන්ට
අනාවැකි කීමට මම ඔබව පත්
කළෙමි.”
**6** නමුත් මම දෙවිට මෙසේ
කීවෙමි. “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවියනි, මම තවම තරු-
ණයෙක්.[3] අනික මම කතාවට දක්ෂ
කෙනෙක් නෙවෙයි.”[4]
**7** එවිට යෙහෝවා දෙවි මට මෙසේ
කීවේය. “‘මම තවම තරුණයෙක්’
කියා නොකියන්න. මා ඔබව යවන
සෑම තැනකටම ඔබ යා යුතුයි. මා
ඔබට කීමට අණ කරන සෑම දෙයක්ම
ඔබ පැවසිය යුතුයි.[5] **8** ඔවුන්ට භය
නොවන්න.[6] ඔබව ගලවාගැනීමට මම
ඔබ සමඟ සිටිමි.[7] මේ දේවල් ඔබට
පවසන මා යෙහෝවා දෙවිය.”
**9** ඉන්පසු යෙහෝවා දෙවි ඔහුගේ
අතින් මගේ මුඛය ස්පර්ශ කළේය.[8]
යෙහෝවා දෙවි මට තවදුරටත් මෙසේ
පැවසුවේය. “ඔබ පැවසිය යුතු දේ දැන්
මම ඔබට දැන්වූවෙමි.[9] **10** මෙතැන්
සිට මම ඔබව ජාතීන් හා රාජ්‍ය-
යන් කඩා බිඳ දමන්නත් උදුරා
දමන්නත් විනාශ කර දමන්නත්[10]
ගොඩනඟන්නත් සිටුවන්නත්[11] පත්
කරන්නෙමි.”[12]
**11** ඉන්පසු යෙහෝවා දෙවි
මාගෙන් මෙසේ ඇසුවේය. “යෙරෙ-
මියා, ඔබට පෙනෙන්නේ කුමක්ද?”
මමද, “ආමන්ඩ්* ගසක රිකිල්ලක්
මට පෙනේ” කියා පිළිතුරු දුන්නෙමි.
**12** එවිට යෙහෝවා දෙවි මට
මෙසේ කීවේය. “ඔබ දුටු දේ හරිය.
මාගේ වදන් ඉටු වන තුරු දිවා රෑ දෙ-
කෙහි මම අවදිව බලා සිටින්නෙමි.”[13]
**13** දෙවන වතාවටත් යෙහෝවා
දෙවි, “ඔබට පෙනෙන්නේ කුමක්ද”
කියා මගෙන් ඇසුවේය.
මමද, “විශාල හැළියක් මට පෙනේ.
උතුරු දෙසට නොව දකුණු දෙසට
ඇල වී ඇති ඒ හැළියට යටින් ගිනිදලු
නඟිනවාත් මට පෙනේ” කියා කීවෙමි.
**14** එවිට යෙහෝවා දෙවි මට
මෙසේ කීවේය. “මේ දේශයේ වැසි-
යන්ව විනාශ කර දමන ප්‍රහාරය
දියත් වෙන්නේ උතුරු දෙසින්ය.[1]
**15** උතුරු දිශාවේ තිබෙන රාජ්‍ය-
යන්වලට අයත් සියලු ගෝත්‍ර මම
කැඳවන්නෙමි. ඔවුන්ගේ පාලකයෝ
පැමිණ යෙරුසලමේ දොරටු අස-
ලද[2] එහි පවුරු අවටද යූදා දේශයේ
සෙසු නගර තුළද[3] තම බලය තහ-
වුරු කරගනු ඇත. මේ දේ පවසන
මා යෙහෝවා දෙවිය.[4] **16** යූදා දේ-
ශයේ සහ යෙරුසලමේ වැසියෝ මා
අත්හැර[5] වෙනත් දෙවිවරුන්ට සුවඳ
දුම් ඔප්පු කළෝය.[6] ඔවුන් විසින්ම
සාදාගත් දෙවිවරුන්ට ඔවුහු නමස්-
කාර කළෝය.[7] එබැවින් මම ඔවුන්ට
විරුද්ධව මාගේ විනිශ්චයන් ප්‍රකාශ
කරන්නෙමි.[8]
**17** “දැන් සූදානම් වෙන්න.[9] මම
ඔබට කීමට අණ කරන දේ, ගොස්
ඔවුන්ට ප්‍රකාශ කරන්න. ඔවුන්ට
භය නොවන්න.[10] ඔබ ඔවුන්ට භය
වුණොත් ඔවුන් ඉදිරියේම මම ඔබව
ලැජ්ජාවට පත් කරන්නෙමි. **18** අද
මම ඔබව යූදා දේශයේ රජවරුන්,
පාලකයන්, පූජකයන් සහ දේශ-
යේ වැසියන් ඉදිරියේ[11] බලකොටුවක්
මෙන්ද යකඩ කුලුනක් මෙන්ද තඹ
පවුරක් මෙන්ද[12] ශක්තිමත් කරන්-
නෙමි.[13] **19** ඔවුන් ඔබට විරුද්ධව
සටන් කළත් ඔබව පරාජය කිරීමට
ඔවුන්ට හැකි වන්නේ නැත.[14] මන්ද
ඔබව ගලවාගැනීමට[15] මම ඔබ සමඟ
සිටිමි.[16] මේ දේවල් පවසන මා යෙ-
හෝවා දෙවිය.”

# 2

යෙහෝවා දෙවි මට මෙසේ
කීවේය.[17] **2** “ගොස් යෙරුසල-
මේ වැසියන්ට මෙසේ කියන්න. ‘යෙ-
හෝවා දෙවි පවසන්නේ මෙයයි.[18]

**1 පරි.**
1 විනි 13:5; යෙසා 45:1; රෝම 9:11
2 ලූක් 1:15
3 1රාජා 3:7; 1තිමෝ 4:12
4 නික් 4:10
5 නික් 7:2; ගණන් 22:20; 2ලේක 18:13; යෙරෙ 11:2; එස 3:4
6 එස 2:6; එස 3:8
7 නික් 3:12; ද්වි 31:6; යොෂු 1:5; යෙරෙ 15:20; ක්‍රියා 18:10; ක්‍රියා 26:17; 2කොරි 1:10; හෙබ්‍රෙ 13:6
8 යෙසා 6:7
9 නික් 4:15; යෙසා 51:16; එස 33:7
10 යෙරෙ 18:7; එස 32:18
11 යෙසා 44:26; යෙරෙ 18:9; යෙරෙ 24:6
12 එළි 10:11
13 ද්වි 32:35

**2 තීරුව**
1 යෙරෙ 6:1; යෙරෙ 10:22; යෙරෙ 47:2; යෙරෙ 50:9
2 යෙරෙ 39:3
3 ද්වි 28:52; යෙරෙ 4:16; යෙරෙ 9:11; යෙරෙ 33:10; යෙරෙ 34:22; යෙරෙ 44:6
4 යෙරෙ 5:15; යෙරෙ 6:22; යෙරෙ 25:9
5 යොෂු 24:20; 2රාජා 22:17; 2ලේක 7:19; යෙරෙ 17:13
6 එස 8:11; හොෂෙ 11:2
7 යෙසා 2:8; ක්‍රියා 7:41
8 ද්වි 28:20; යෙරෙ 4:12
9 1රාජා 18:46; 2රාජා 4:29; 2රාජා 9:1; යෝබ් 38:3; ලූක් 12:37; 1පේත්‍ර 1:13
10 යොෂු 1:9; එස 2:6
11 යෙරෙ 26:12; ආනි 9:6
12 යෙරෙ 15:20

---

යෙරෙ **1:11*** “ආමන්ඩ් ගස.” හෙබ්‍රෙව් බසින්, ෂාකෙඩ්. එහි අර්ථය, “අවදිව සිටින්නා.” මෙම ගස, වසන්ත සමයේදී මුලින්ම දලු ලන ගස්වලින් එකකි.

**13** යෙරෙ 20:11; එස 3:8; මීකා 3:8; **14** ගීතා 129:2; **15** යෙරෙ 15:20; රෝම 8:31; **16** උත් 28:15; නික් 3:12; යොෂු 1:5; **2 පරි.** **17** හෙබ්‍රෙ 1:1; **18** යෙසා 37:33.

“ඔබ තරුණ වියේදී මට ඇලුම්ව* සිටි
ආකාරය මට අමතක වී නැත.[1] විවාහ
ගිවිසගෙන සිටි කාලයේදී ඔබට මා
ගැන තිබූ ආදරය[2] නිසා ගස් කොළන්
නැති, දුෂ්කර දේශයක් වූ පාළුකර-
යේදී පවා ඔබ මා පසුපස ආ හැටිත්[3]
මට හොඳින් මතකය. **3** යෙහෝවා
දෙවි වන මා ඊශ්‍රායෙල් සෙනඟව සැල-
කුවේ ශුද්ධ ජාතියක් ලෙසයි.[4] ඔවුන්
මට අස්වැන්නේ ප්‍රථම ඵල මෙනි.”[5] ඒ
සෙනඟට නපුරක් කිරීමට තැත් කළ
කිසිවෙක් මාගේ දඬුවමින් බේරුණේ
නැත.[6] මේ දේ පවසන මා යෙහෝවා
දෙවිය.’ ”[7]

**4** යාකොබ්ගෙන් පැවතෙන්-
නෙනි,[8] ඊශ්‍රායෙල්ගෙන් පැවතෙන
සියලු ගෝත්‍රයෙනි,[9] යෙහෝවා දෙවි
පවසන දේට සවන් දෙන්න. **5** යෙ-
හෝවා දෙවි පවසන්නේ මෙයයි.
“ඔබේ පියවරුන් මාගෙන් ඈත්ව
ගොස්[10] දේවතා රූපවලට නමස්කාර
කර,[11] ඒ රූප හා සමාන නිෂ්ඵල තත්-
වයකට පත් වූයේ[12] මා කළ කුමන
වරදක් නිසාද?[13] **6** ‘අපව ඊජිප්තු-
වෙන් ගලවාගෙන[14] මර උගුල් ඇති,
දිය පොදක් නැති,[15] සනාන්ධකාර-
යෙන් වැසුණු,[16] කිසිදු මිනිසෙකු පා
නොතැබූ දේශයක්[17] මැදින් අපව
සුරක්ෂිතව ගෙනා යෙහෝවා දෙවිගේ
මහ පෙන්වීම් අපට අවශ්‍යයි’* කියා
ඔවුහු නොකීවෝය.

**7** “පලතුරු වතුවලින් පිරුණු
දේශයකට මම ඔබව ගෙනා-
වෙමි.[18] නමුත් ඔබ මාගේ දේශය
දූෂ්‍ය කළහුය. මාගේ උරුමය ඔබ
නැති නාස්ති කළහුය.[19] **8** ‘යෙ-
හෝවා දෙවිගේ මහ පෙන්වීම් අපට
අවශ්‍යයි’ කියා පූජකයොවත් පැවසු-
වේ නැත.[20] නීතිය උගන්වන අයවත්
මාව හරි හැටි හඳුනාගෙන සිටියේ
නැත.[21] සෙනඟව රැකබලා ගන්නා
අය පවා මට විරුද්ධව පව් කළෝය.[22]
අනාගතවක්තෘවරු බාල් දෙවියාගේ
නමින් අනාවැකි කියමින්[1] කිසිම පිහි-
ටක් ලබා දිය නොහැකි දෙවිවරුන්ගේ
සරණ පැතුවෝය.[2]

**9** “ඒ නිසා යෙහෝවා දෙවි වන
මට ඔබට විරුද්ධවත් ඔබේ දරුවන්-
ගේ දරුවන්ට විරුද්ධවත්[3] පැමිණිල්-
ලක් තිබේ.[4]

**10** “කිත්තිම්වරුන්ගේ වෙරළා-
සන්න දේශයේ[5] සිට කේදාර් දේශය[6]
දක්වා ගොස් මෙවැනි දෙයක් එහි
කවදා හෝ සිදු වී තිබේදැයි හොඳින්
විපරම් කර බලන්න.[7] **11** ඒ දේශ-
වල වෙසෙන එක් ජාතියක්වත් තමන්
නමස්කාර කරන දෙවිවරුන්ව අත්-
හැර දමා,[8] දැන දැනම බොරු දෙවිව-
රුන් පසුපස ගොස් ඔවුන්ගේ සරණ
පතා තිබෙනවාද?[9] නමුත් මාගේම
සෙනඟ ඔවුන්ගේ තේජාන්විත දෙවි
වන මාව අත්හැර, පිහිට විය නොහැකි
බොරු දෙවිවරුන්ගේ සරණ පැතු-
වෝය.[10] **12** යෙහෝවා දෙවි වන
මම මෙසේ කීවෙමි.[11] ‘අහස්තලය,
මේවා දැක පුදුම වන්න. මහත් බිය-
කින් වෙවුලන්න.’ **13** මන්ද මාගේ
සෙනඟ කළ ක්‍රියාවන් දෙකක් නිසා
ඔවුහු මට විරුද්ධව පව් කළෝය.
ඔවුහු ජීවනදායක දිය උල්පත[12] වන
මා අත්හැර[13] වතුර නොරැඳෙන, දිය
කාන්දු වන පොකුණු සාදාගත්තෝය.

**14** “ඊශ්‍රායෙල්වරුනි, ඔබ සේවක-
යෙක්වත්[14] ගෙයි උපන් දාසයෙක්වත්
නොවේ. එසේනම් ඔබව ගොදුරු කර-
ගැනීමට ඔබේ සතුරන්ට හැකි වුණේ
කෙසේද? **15** තරුණ, කේශර සිංහ-
යෝ ඔබට විරුද්ධව ගර්ජනා කරති.[15]
ඔබේ දේශයට සිදු වී ඇති දේ ගැන
අන් අය පුදුමයට පත් වෙති. ඔබේ
නගර සියල්ල ගින්නෙන් දැවී ගොස්
ඇත. කිසි වැසියෙක් එහි ජීවත් වන්-
නේ නැත.[16] **16** නොෆ්[17] සහ තාහ්-
පනේස්[18] නගරවල වැසියෝ ඔබේ

---

යෙරෙ **2:2*** හෝ, “ළැදි ප්‍රේමයකින්.” **6*** මූ.අ., “යෙහෝවා දෙවි කොහේද?”

**11** යෙසා 1:2; යෙරෙ 6:19; **12** ගීතා 36:9; යෙරෙ 17:13; යොහ 17:3; එළි 22:1; **13** විනි 10:13; 1සාමු 12:10; **14** නික් 4:22; යෙසා 41:8; **15** යෙසා 5:29; **16** යෙරෙ 4:7; යෙරෙ 9:11; එස 5:14; ශෙප 3:6; **17** යෙසා 19:13; යෙරෙ 44:1; යෙරෙ 46:19; එස 30:13; **18** යෙරෙ 43:7; යෙරෙ 46:14; එස 30:18.

**2 පරි.**
**1** එස 16:8; හොෂෙ 2:15
**2** නික් 24:3
**3** ද්වි 2:7; නෙහෙ 9:12
**4** නික් 19:6; ද්වි 7:6
**5** යාකො 1:18; එළි 14:4
**6** යෙසා 41:11; සෙක 1:15
**7** නික් 17:13
**8** යෙරෙ 5:20
**9** හොෂෙ 4:1
**10** යෙරෙ 12:2
**11** ද්වි 32:21; 1රාජා 16:26; 2රාජා 17:15; ක්‍රියා 14:15
**12** ගීතා 115:8
**13** යෙසා 5:4; මීකා 6:3
**14** නික් 14:30; විනි 6:13; යෙසා 63:11; හොෂෙ 13:4
**15** ද්වි 8:15; නෙහෙ 9:20
**16** ගීතා 23:4
**17** ද්වි 1:1; ද්වි 32:10
**18** ගණන් 13:27; ද්වි 6:11; ද්වි 8:7; නෙහෙ 9:25
**19** ලෙවී 18:24; ගණන් 35:33; ද්වි 21:23; ගීතා 78:58; ගීතා 106:38; යෙරෙ 16:18; එස 36:17
**20** 1සාමු 2:12; විලා 4:13
**21** ලූක් 11:52; යොහ 8:55
**22** එස 34:8

**2 තීරුව**
**1** 1රාජා 18:19; යෙරෙ 23:13
**2** 1සාමු 12:21; හබ 2:18
**3** නික් 20:5
**4** එස 20:35; මීකා 6:2
**5** උත් 10:4; ගණන් 24:24
**6** උත් 25:13; ගීතා 120:5; යෙරෙ 49:28
**7** යෙරෙ 18:13
**8** මීකා 4:5
**9** ගීතා 115:4; යෙසා 37:19; යෙරෙ 16:20; 1කොරි 8:4
**10** ගීතා 106:20; හොෂෙ 4:7; රෝම 1:23

දේශය කොල්ල කා එය නැති නාස්ති
කර දමති.*[1] **17** ඔබේ දෙවි වන
යෙහෝවා ඔබව නිසි මඟේ ගෙන
ගියත්[2] ඔබ ඔහුව සිය කැමැත්-
තෙන්ම අත්හැර ගියහුය. එබැවින් මේ
විපත ඔබ පිටට පමුණුවාගත්තේ ඔබ-
මය.[3] **18** ඔබ ඊජිප්තුවට යන්නේ
මොන අරමුණකින්ද?[4] ෂීහෝර් ගඟෙන්
වතුර බොන්නද?[5] ඔබ ඇසිරියා-
වට යන්නේ මොන අරමුණකින්ද?[6] මහ
ගඟෙන්* වතුර බොන්නද? **19** ඔබ
කළ නපුරු ක්‍රියාවලින් ඔබ පාඩ-
මක් ඉගෙනගත යුතුයි.[7] ඔබ කළ
ද්‍රෝහිකම්වලට ඔබ තරවටු ලැබිය
යුතුයි.[8] ඔබේ දෙවි යෙහෝවා වන
මාව අත්හැර යෑම ඔබ කළ දුෂ්ට
ක්‍රියාවක් බව දැනගන්න.[9] මා කෙ-
රෙහි කිසි ගරුබියක් ඔබ තුළ නැත.[10]
මේ දේවල් පවසන මා විශ්වයේ පාල-
කයාද[11] ස්වර්ගයේ සේනාවල අධිප-
තිද වන යෙහෝවා දෙවිය.

**20** "කාලයකට ඉහතදී ඔබ දරා-
ගෙන සිටි වියගහ මම බිඳ දමා[12] එහි
බැමි කඩා දැමුවෙමි. නමුත්, "මම දෙ-
විට සේවය කරන්නේ නැහැ" කියා
පැවසූ ඔබ, කඳු මුදුන්වලත් සරුසාරව
වැඩුණු ගස් යටත්[13] වැතිර[14] වේශ්‍යා-
වන් මෙන් ක්‍රියා කළහුය.[15] **21** මා
සිටෙව්වේ ඉතා අනර්ඝ රතු මිදිවැ-
ලක්ය.[16] මා එයින් බලාපොරොත්තු
වුණේ හොඳ මිදිපල පමණි. නමුත්
එතරම් අනර්ඝ මිදිවැලක්ව සිටි ඔබ,
කිසි වැඩකට නැති වල් මිදි දරන
වැලක් බවට පත් වුණේ කෙසේද?[17]

**22** "ඔබ ඇඟ පුරාම සබන් ගෑවත්
ඔබේ ශරීරය ලුණු දියෙන්* සෝදා-
ගත්තත්[18] ඔබේ වැරදි නිසා ඇති
වූ කැළැල මකා දැමිය නොහැක.[19]
මෙසේ පවසන මා විශ්වයේ පාලකයා
වන යෙහෝවා දෙවිය. **23** 'මම අප-
විත්‍ර වුණේ නැහැ.[20] මම බාල් දෙවි-
යන් පසුපස ගියේ නැහැ'[21] කියා ඔබ
කියන්නේ කොහොමද? තැනිතලා-
වල ඔබ කරන දේවල් ගැන කල්පනා
කර බලන්න.[1] ඔබ හරියට ඒ මේ අත
දුවන ඔටුදෙනක වගෙයි. **24** පිරිමි
සතෙකු සොයාගැනීමට ඉව අල්ල-
මින්[2] පාළුකරයේ සැරිසරන සීබ්‍රාදෙ-
නක වගෙයි.[3] ඇගේ ආශාව මැඩලිය
හැක්කේ කාටද? ඇයව සොයා එන
පිරිමි සතුන්ට ඒ කාලයේදී ඇයව සො-
යාගැනීම අපහසු කාර්යයක් නොවේ.
**25** ඊශ්‍රායෙල්වරුනි, නිෂ්ඵල දේවල්
පසුපස නොයන්න. එසේ කළොත්
ඔබේ දෙපා විඩාවට පත් වනු ඇත.
පිපාසයෙන් ඔබේ උගුර වියළී යනු
ඇත.[4] නමුත් ඔබ, 'මට ආපසු හැරී
එන්න බැහැ.[5] මගේ හිත ඇදී ගිහින්
තියෙන්නේ වෙනත් අය වෙතටයි.[6]
ඔවුන් යන මාර්ගයේ මමත් යනවා'[7]
කියා පවසා ඇත.

**26** "සොරෙක් හසු වූ විට අන් අය
ඉදිරියේ ඔහු ලැජ්ජාවට පත් වන්නා
සේ ඊශ්‍රායෙල් ජාතියත්[8] ඔවුන්ගේ
රජවරුත් පාලකයොත් පූජකයොත්
අනාගතවක්තෘවරුත්[9] ලැජ්ජාවට
පත් වෙති. **27** ඔවුහු ගසකට, 'පියා-
ණෙනි' කියාද[10] ගලකට, 'අපිට ජීවි-
තය දුන්නේ ඔබයි' කියාද පවසති.
නමුත් මාව ඔවුහු ප්‍රතික්ෂේප කරති.[11]
විපත්තියකට මුහුණ දෙන විට, 'අනේ
අපිව බේරගන්න' කියා ඔවුහු මට
පවසති.[12]

**28** "යූදා වැසියෙනි, ඔබට අයිති
නුවරවල ගණනටම ඔබට දෙවිවරු
සිටිති.[13] එසේනම් ඔබ සාදාගත් ඒ
දෙවිවරුන් ඔබේ පිහිටට නොඑන්-
නේ මන්ද?[14] ඔබ විපත්තියකට මුහුණ
දෙන විට ඔවුන්ට ඔබව බේරාගත
හැකි නම් ඇවිත් ඔබව බේරාගන්න
කියා ඔවුන්ට පවසන්න.[15]

**29** "ජනයෙනි, ඔබ මට චෝදනා
කරන්නේ ඇයි?[16] ඔබ සියලුදෙනාම
මට විරුද්ධව පව් කරන්නේ ඇයි?[17]
ඔබෙන් එසේ අසන්නේ යෙහෝවා

**2 පරි.**
**1** යෙසා 1:7
**2** ද්වි 32:10; ගීතා 77:20; ගීතා 78:54; ගීතා 136:16; යෙසා 63:13
**3** 1ලේක 28:9; 2ලේක 7:19
**4** යෙසා 30:2; යෙසා 31:1; විලා 5:6; එස 16:26; එස 17:15; එස 23:3; 2කොරි 6:14
**5** යොෂු 13:3; යෙසා 23:3
**6** 2රාජා 16:7; හොෂෙ 5:13
**7** යෙසා 3:9; හොෂෙ 5:5
**8** හොෂෙ 11:7
**9** යෙරෙ 4:18; ආමො 8:10
**10** යෙරෙ 5:22
**11** ක්‍රියා 4:24
**12** ලෙවී 26:13; ද්වි 4:20; යෙසා 9:4; නාහු 1:13
**13** 1රාජා 14:23; එස 6:13; හොෂෙ 4:13
**14** යෙසා 57:5; යෙරෙ 3:6; යෙරෙ 17:2
**15** නික් 34:15; එස 16:15; හොෂෙ 6:10
**16** නික් 15:17; ගීතා 44:2; ගීතා 80:8; යෙසා 5:1
**17** යෙසා 1:21; යෙසා 5:4
**18** යෝබ් 9:30
**19** ද්වි 32:34; යෝබ් 14:17; ගීතා 90:8; යෙරෙ 16:17; හොෂෙ 13:12; ආමො 8:7
**20** හිතෝ 28:13; හිතෝ 30:12
**21** හිතෝ 30:20

**2 තීරුව**
**1** යෙරෙ 7:31
**2** යෙරෙ 14:6
**3** හොෂෙ 8:9
**4** හොෂෙ 2:3
**5** යෙරෙ 18:12
**6** යෙසා 2:6; යෙරෙ 3:13
**7** යෙරෙ 44:17
**8** නික් 22:7
**9** එස්රා 9:7; දානි 9:6
**10** යෙසා 44:13; හබ 2:18
**11** 2ලේක 29:6; යෙරෙ 32:33; **12** විනි 10:15; 2ලේක 20:9; ගීතා 78:34; ගීතා 106:47; යෙසා 26:16; හොෂෙ 5:15; **13** යෙරෙ 11:13; **14** ද්වි 32:37; විනි 10:13; යෙසා 45:20; **15** විනි 10:14; යෙසා 46:7; **16** 1සාමු 2:10; **17** යෙරෙ 5:1; යෙරෙ 9:2; දානි 9:11; හොෂෙ 7:13.

යෙරෙ **2:16*** මු.අ., "ඔබේ හිස මුඩු කරන්නෝය."
**18*** එනම්, යුප්‍රටීස් ගඟෙන්. **22*** සෝඩියම් බයි-
කාබනේට්වලින් සාදාගත් පිරිසිදු කරන ද්‍රව්‍යයක්.

දෙවි වන මමයි. **30** මා ඔබේ දරු-
වන්ට දඬුවම් කළත් ඔවුහු එයින් කිසි
පාඩමක් ඉගෙනගෙන නැත.[1] සිංහ-
යෙකු ගොදුරක් කැබලිවලට ඉරා
දමන්නාක් මෙන් ඔබේ කඩුවෙන් ඔබ
ඔබේ අනාගතවක්තෘවරුන්ව මරා
දමා ඇත.[2] **31** ඊශ්‍රායෙල් ජනයෙනි,
යෙහෝවා දෙවි කියන මේ දෙයට
සවන් දෙන්න.[3]

"මා කෙදිනකවත් ඔබට නිකම්ම
නිකම් කාන්තාරයක්[4] හෝ ඝනාන්ධ-
කාරයෙන් වැසී ගිය දේශයක් මෙන්
වීද? එසේනම්, 'අපි දැන් නිදහසේ
සැරිසරනවා. ආයෙත් නම් අපට ඔබ
ළඟට එන්න බැහැ' කියා මාගේම සෙ-
නඟ වන ඔබ මට පවසන්නේ ඇයි?[5]
**32** තරුණියකට ඇගේ ආභරණවත්
මනාලියකට ඇගේ මංගල ඇඳුමවත්
අමතක කළ හැකිද? නමුත් මාගේම
සෙනඟට දැන් මාව අමතක වී අවුරුදු
ගණනාවක්ම ගෙවී ගොස් හමාරය.[6]

**33** "ඔබ* ආදරය දිනාගැනීමට
කූට ලෙස සැලසුම් යොදන්නේ ඇයි?
ඒ අරමුණ ඉටු කරගැනීමට ඔබ
කරන්නෙම දුෂ්ට දේවල්ය.[7] **34** එප-
මණක්ද නොව අහිංසක දුප්පතුන්-
ගේ[8] ලේ ඔබේ වස්ත්‍ර පුරාම තැවරී
ඇත.[9] ඔබ ඔවුන්ව මරා දැමුවේ ඔවුන්
ඔබේ නිවෙස්වලට කඩාවැද එහි ඇති
දේවල් සොරකම් කිරීමට තැත් කළ
නිසා නොවේ.[10]

**35** "නමුත් ඔබ, 'අපි කිසි වරදක්
කළේ නැහැ. අපි හරි අහිංසකයි. දෙවි-
ගේ උදහස දැන් අප වෙතින් පහව
ගිහින්'[11] කියා පවසන්නහුය.

"'මම පව් කළේ නැහැ'[12] කියා
ඔබ පැවසූ නිසා ඔබට විරුද්ධව මට
චෝදනාවක් ඇත. **36** දුර දිග නො-
බලා ඔබ හිතුමතේට වෙනස් වන්නේ
ඇයි?[13] ඇසිරියාව මත තැබූ ඔබේ
බලාපොරොත්තු සුන් වූ ලෙසම[14]
ඊජිප්තුව මත තබන ඔබේ බලා-
පොරොත්තු සියල්ලත් සුන් වී ඔබ
ලැජ්ජාවට පත් වනු ඇත.[1] **37** ඔබ
විශ්වාසය තැබූ ජාතීන්ව යෙහෝවා
දෙවි වන මා ප්‍රතික්ෂේප කර ඇති
නිසා ඔබ කිසිසේත් සාර්ථක වන්-
නේ නැත. ඔබේ අත් දෙක හිස මත
තබාගෙන ඔබට ලැජ්ජාවෙන් යෑමට
සිදු වේ."[2]

**3** "මිනිසෙකු තම බිරිඳව දික්කසාද
කළ පසු ඇය වෙන පුරුෂයෙකු
සමඟ විවාහ වුණොත් කලින් පුරුෂ-
යාට ඇයව නැවත විවාහ කරගැනී-
මට අයිතියක් නැත" කියා කියමනක්
තිබේ.[3]

එවැනි දෙයක් සිදු වුණොත් මුළු
දේශයම අපවිත්‍ර වන්නේය. මේ දේශ-
යට සිදු වී ඇත්තෙත් එය නොවේද?[4]

"ඔබ* බොහෝ පෙම්වතුන් සමඟ
වේශ්‍යාකම් කර ඇත.[5] එසේ ක්‍රියා
කළ ඔබට දැන් මා වෙතට හැරී එන්න
පුළුවන්ද"[6] කියා යෙහෝවා දෙවි
අසන්නේය. **2** "ඔබ පාර අයිනට වී
ඔබේ පෙම්වතුන් එන තෙක් බලා
සිටින්නේ පාළුකරයේ හිඳගෙන බලා
සිටින අරාබි ජාතිකයෙකු මෙනි.[7] ඔබ
වේශ්‍යාකම් නොකළ තැනක්[8] ඇද්-
දැයි ඇස් ඇර බලන්න.[9] ඔබ කළ
වේශ්‍යාකම් නිසාත් ඔබේ දුෂ්ට ක්‍රියා
නිසාත් මුළු දේශයම දූෂ්‍ය වී ඇත.[10]
**3** ඒ හේතුවෙන් දේශයට වැසි වසින්-
නේ නැත.[11] වසන්ත කාලයේවත් දේ-
ශයට වර්ෂාව ලැබෙන්නේ නැත.[12]
ඔබ හැසිරෙන්නේ කිසිම ලැජ්ජා-
වක් නැතුව[13] වේශ්‍යාකම් කරන භාර්-
යාවක මෙනි.* **4** නමුත් ඔබ දැන්
මට මෙසේ කියන්නහුය. 'මාගේ පියා-
ණෙනි,[14] කුඩා කාලයේ සිටම මගේ
හොඳම මිතුරා ඔබයි.[15] **5** ඔබ හැම-
දාටම අප සමඟ අමනාපයෙන් සිටින්-
නෙහිද? අප කළ වැරදි ඔබ හැමදාම
මතකයේ තබාගන්නෙහිද?'[16] ඔබ

**2 පරි.**
**1** 2ලේක 28:22; යෙසා 1:5; යෙසා 9:13; යෙරෙ 5:3; ශෙප 3:2
**2** 2ලේක 36:16; නෙහෙ 9:26; මතෙ 21:35; මතෙ 23:34; ක්‍රියා 7:52; 1තෙස 2:15
**3** මීකා 6:9
**4** 2ලේක 31:10; නෙහෙ 9:25
**5** ද්වි 32:15
**6** ගීතා 106:21; යෙසා 17:10; යෙරෙ 13:25; යෙරෙ 18:15; හොෂෙ 8:14
**7** 2ලේක 33:9
**8** 2රාජා 21:16; 2රාජා 24:4; ගීතා 106:38; යෙසා 10:2; යෙසා 59:7; යෙරෙ 19:4; මතෙ 23:35
**9** උත් 9:5
**10** නික් 22:2
**11** හිතෝ 28:13
**12** 1යොහ 1:8
**13** හොෂෙ 12:2
**14** 2ලේක 28:20

**2 තීරුව**
**1** යෙසා 30:3; යෙරෙ 37:7
**2** 2සාමු 13:19

**3 පරි.**
**3** ද්වි 24:4
**4** යෙසා 24:5; යෙරෙ 2:7
**5** යෙරෙ 2:20; එස 16:28
**6** යෙරෙ 4:1; සෙක 1:3
**7** උත් 38:16; හිතෝ 23:28
**8** එස 16:16; එස 20:28
**9** යෙරෙ 2:23
**10** යෙරෙ 2:7
**11** ලෙවී 26:19; ද්වි 28:23; යෙසා 5:6; යෙරෙ 9:12; යෙරෙ 14:4; ආමො 4:7; හග් 1:11
**12** යෙරෙ 5:24
**13** යෙරෙ 6:15; ශෙප 3:5
**14** යෙරෙ 3:19; යෙරෙ 31:9
**15** ගීතා 71:5; හිතෝ 2:17; යෙරෙ 2:2; හොෂෙ 2:15;
**16** ගීතා 77:7; ගීතා 103:9; යෙසා 57:16; යෙසා 64:9.

යෙරෙ **2:33*** හෙබ්‍රෙව් බසින්, "ඔබ" යන්න භාවිත කර ඇත්තේ ස්ත්‍රියකටයි. එයින් යෙරුසලම අදහස් විය හැකියි.

යෙරෙ **3:1*** යෙරෙ 2:33හි පාදසටහන බලන්න.
**3*** මූ.අ., "ඔබේ හිස වේශ්‍යාකම් කරන භාර්යාවකගේ හිසක් මෙන් දැඩි වී ඇත."

එසේ පවසමින් දිගින් දිගටම කරන්-
නේ දුෂ්ට දේවල්මය."[1]
6 යොෂියා රජුගේ පාලන සමයේදී[2]
යෙහෝවා දෙවි මට මෙසේ කීවේය.
"ඊශ්‍රායෙල් මට ද්‍රෝහී වී ක්‍රියා කරන
ආකාරය ඔබට පෙනෙනවාද?[3] ඇය
කඳු මුදුන්වලත්[4] සරුසාරව වැඩුණු
ගස් යටත්[5] වේශ්‍යාකම් කරන්නීය.[6]
7 ඇය ඒ විදිහට හැසිරුණත් මා වෙ-
තට හැරී එන්න කියා මම ඇයට
නැවත නැවතත් පැවසුවෙමි. නමුත්
ඇය මා වෙතට හැරී ආවේ නැත.[7]
තම ද්‍රෝහිකාර සොහොයුරියගේ ක්‍රියා
දෙස බලා සිටි යූදාද ඇයව ආදර්ශ-
යට ගත්තාය.[8] 8 ඊශ්‍රායෙල් අනාචා-
රයේ* යෙදෙමින් මට ද්‍රෝහී වූ නිසා
මම අත්හැරීමේ පත්‍රයක් දී ඇයව
දික්කසාද කළෙමි.[9] ඇගේ ද්‍රෝහිකාර
සොහොයුරිය වන යූදා ඒ දේ දැක
දැකත් කිසි භයක් සැකක් නැතුව
ඒ දේම කළාය.[10] 9 ඇය වේශ්‍යා-
වක් බවට පත් වුණේ ඇය වේශ්‍යාකම
සැහැල්ලුවට ගත් නිසාය. ඇය මුළු
දේශයම අපවිත්‍ර කළාය.[11] ගස් ගල්ව-
ලට වන්දනාමාන කරමින් අනාචා-
රයේ යෙදුණාය.[12] 10 මේ සියල්ල
දැක දැකත් ඇගේ ද්‍රෝහිකාර සො-
හොයුරිය වන යූදා මුළු හදවතින්ම මා
වෙතට හැරී ආවේ නැත.[13] ඇය කළේ
මවාපෑමක් පමණි.[14] මේ දේ පවසන
මා යෙහෝවා දෙවිය."
11 යෙහෝවා දෙවි මට තවදුරටත්
මෙසේ කීවේය. "ඊශ්‍රායෙල් විශ්වාස-
වන්තව ක්‍රියා නොකළත් ද්‍රෝහිකාර
යූදා තරම්ම ඇය අධර්මිෂ්ඨ නැත.[15]
12 ඔබ දැන් ගොස් මේ පණිවිඩය
උතුරේ වෙසෙන්නන්ට කියන්න.[16]
'යෙහෝවා දෙවි පවසන්නේ මෙ-
යයි. "කැරලිකාර ඊශ්‍රායෙල් සෙන-
ඟෙනි, හැරී මා වෙතට එන්න.[17] මම
විශ්වාසවන්ත කෙනෙක්[18] වන බැවින්
ඔබ සමඟ සදහටම උදහසින් නො-
සිටින්නෙමි.[19] එසේ පවසන්නේ යෙ-
හෝවා දෙවි වන මමය. මම සදහටම
ඔබ සමඟ අමනාපයෙන් නොසිටින්-
නෙමි.[1] 13 ඔබ මාගේ හඬට අකීකරු
වී සරුසාරව වැඩුණු සෑම ගසක් යටම[2]
වෙනත් දෙවිවරුන්ට දිගින් දිගටම
නමස්කාර කළහුය.[3] එබැවින් ඔබේ
දෙවි වන යෙහෝවාට විරුද්ධව ඔබ
කළ වැරදි කොතරම් බරපතළද කියා
තේරුම්ගන්න.[4] මේ බව ඔබට පවසන්-
නේ යෙහෝවා දෙවි වන මමය."
14 " 'යෙහෝවා දෙවි තවදුරටත්
පවසන්නේ මෙයයි. "කැරලිකාර ජන-
යෙනි, හැරී මා වෙතට එන්න.[5]
මම ඔබේ ස්වාමිපුරුෂයා වන්නෙමි.[6]
ඔබේ සෑම නුවරකින්ම එක් කෙනා
බැගින්ද සෑම ගෝත්‍රයකින්ම දෙදෙනා
බැගින්ද තෝරාගෙන ඔවුන්ව සියොන්
වෙතට ගෙන යන්නෙමි.[7] 15 ඔබව
රැකබලා ගැනීම සඳහා මාගේ සිතට
ප්‍රීතියක් ගෙන දෙන අයුරින් කටයුතු
කරන පුරුෂයන්ව මම පත් කරන්-
නෙමි.[8] ඔවුහු තමන් සතු මනා දැනුම
හා ගැඹුරු අවබෝධය භාවිත කර-
මින් ඔබව පෝෂණය කරනු ඇත.[9]
16 ඒ කාලයේදී ඔබේ සෙනඟ ගණ-
නින් වැඩි වී මහත් ජාතියක් බවට පත්
වනු ඇත. මේ දේ පවසන මා යෙ-
හෝවා දෙවිය.[10] ඒ කාලයේදී යෙ-
හෝවා දෙවිගේ ගිවිසුම් පෙට්ටිය ගැන
ඔවුහු සඳහන් කරන්නේවත්[11] මතක-
යට නඟන්නේවත්[12] නැත. එය නැති
පාඩුව ඔවුන්ට නොදැනේ. නැවත
කිසිදාක ඔවුහු ගිවිසුම් පෙට්ටියක්
සාදන්නේ නැත. 17 ඒ දවස්වලදී
ඔවුහු යෙරුසලමට යෙහෝවා දෙවි-
ගේ සිංහාසනය කියා පවසන්නෝය.[13]
යෙහෝවා දෙවිගේ නාමයට ප්‍රශංසා
කිරීම සඳහා[14] සියලු ජාතීහු යෙරුසල-
මට රැස් වනු ඇත.[15] ඔවුහු තවදුරටත්
මුරණ්ඩු ලෙස ක්‍රියා කරන්නේවත් දුෂ්-
ටකම් කරන්නේවත් නැත." ' "[16]
18 "ඒ කාලයේදී යූදා සෙනඟ ඊශ්‍රා-
යෙල් සෙනඟ සමඟ[17] එක්සත්ව[18]

යෙරෙ 3:8* මූ.අ., "පරදාර සේවනයේ."

**3 පරි.**
1 මීකා 2:1
මීකා 7:3
ශෙප 3:3
2 2රාජා 22:1
3 යෙරෙ 7:24
4 යෙසා 57:7
යෙරෙ 2:20
එස 6:3
5 1රාජා 14:23
යෙරෙ 17:2
6 එස 20:28
හොෂෙ 4:13
7 2රාජා 17:13
2ලේක 30:6
හොෂෙ 14:1
8 එස 16:46
එස 23:2
9 ද්වි 24:1
යෙසා 1:21
යෙසා 50:1
එස 23:9
හොෂෙ 2:2
හොෂෙ 9:15
10 2රාජා 17:19
එස 23:11
11 යෙරෙ 2:7
12 යෙසා 57:6
යෙරෙ 2:27
13 ගීතා 78:37
හොෂෙ 7:14
14 හිතෝ 11:20
15 එස 16:51
එස 23:11
16 2රාජා 17:6
යෙරෙ 23:8
යෙරෙ 31:8
17 යෙරෙ 4:1
එස 33:11
හොෂෙ 6:1
හොෂෙ 14:1
18 2සාමු 22:26
ගීතා 18:25
ගීතා 86:5
එළි 15:4
19 හොෂෙ 11:8

**2 තීරුව**
1 ගීතා 79:5
2 ද්වි 12:2
3 යෙරෙ 2:25
එස 16:15
4 ලෙවී 26:40
හිතෝ 28:13
හොෂෙ 7:13
5 යෙසා 57:17
යෙරෙ 4:22
6 යෙසා 54:5
යෙරෙ 2:2
යෙරෙ 31:32
හොෂෙ 2:19
7 යෙරෙ 23:3
රෝම 11:5
8 යෙරෙ 23:4
එස 34:23
එෆි 4:11
9 යොහ 21:15
ක්‍රියා 20:28
10 යෙසා 61:4
හොෂෙ 1:10
11 1සාමු 4:5
12 යෙසා 65:17

13 ගීතා 87:3; යෙරෙ 14:21; එස 43:7; 14 යෙසා 26:8; යෙසා 56:6; සෙක 8:22; 15 යෙසා 2:2; යෙසා 60:3; මීකා 4:2; සෙක 2:11; සෙක 8:23; එළි 7:9; 16 ගීතා 78:8; 17 යෙරෙ 50:4; හොෂෙ 1:11; 18 2ලේක 36:23; එස්රා 1:3; එස 37:19.

උතුරු දේශයෙන් පිටත්ව ඇවිත්,
මා ඔවුන්ගේ මුතුන්මිත්තන්ට උරුම-
යක් ලෙස දුන් දේශයේ වාසය කරනු
ඇත.[1] **19** මා ඔබව පුත්‍රයන් ලෙස
පිළිගෙන, සියලු ජාතීන් ඉතා වටිනා
දෙයක් ලෙස සැලකූ ඒ අලංකාර දේ-
ශය උරුමයක් හැටියට ඔබට දුන්-
නේ මොන තරම් කැමැත්තෙන්ද![2]
ඔබ මට, “මාගේ පියාණෙනි”[3] කියා
අමතමින් දිගටම මාගේ මාර්ගයෙහි
ගමන් කරයි කියා මම සිතුවෙමි.
**20** නමුත් ඊශ්‍රායෙල් ජනයෙනි, තම
ස්වාමිපුරුෂයාව අත්හැර යන අවිශ්-
වාසවන්ත භාර්යාවක මෙන්[4] ඔබ මට
ද්‍රෝහි වී ඇත.[5] මෙසේ පවසන්නේ
යෙහෝවා දෙවි වන මමය.”

**21** මාර්ගවලින් හඬක් ඇසෙයි. ඒ
ඇසෙන්නේ ඊශ්‍රායෙල් සෙනඟ තම
දෙවි වන යෙහෝවාව අමතක කර[6]
වැරදි මාර්ගවල ගමන් කළ[7] නිසා
ඔවුන් නඟන විලාපයේ හා කන්නලව්-
වේ හඬයි.

**22** “කැරලිකාර පුත්‍රයෙනි! මා වෙ-
තට හැරී එන්න.[8] මම ඔබේ කැරලි-
කාර ගතිපැවතුම් වෙනස් කර ඔබව
යහමඟට ගන්නෙමි.”[9]

“යෙහෝවා දෙවියනි, ඔබයි අපේ
දෙවි! අපි ඔබ වෙතට නැවත හැරී
ආවෙමු.[10] **23** පූජනීය ස්ථානවලින්
කිසිම ප්‍රයෝජනයක් නැත. කඳු
මුදුන්වල පැවැත්වූ උත්සවයන්ද[11]
නිෂ්ඵලයි.[12] ඊශ්‍රායෙල් දේශයට ගැල-
වීම ලැබෙන්නේ අපේ දෙවි යෙහෝවා
වන ඔබෙන් පමණයි.[13] **24** අපේ
තරුණ කාලයේ සිට අපේ මුතුන්-
මිත්තන්ට අයිතිව තිබුණු එළු බැටළු
රැළවල්ද ඔවුන්ගේ දරුදැරියන්ද ඔවුන්
වෙහෙස මහන්සි වී උපයාගත් සියලු
දේද නින්දිත දෙවියා*[14] නිසා නැති
නාස්ති වී ගියේය. **25** අපේ තරුණ
කාලයේ සිට මේ දක්වාම අපිද අපේ
පියවරුද[15] යෙහෝවා දෙවි වන ඔබට
විරුද්ධව පව් කළෙමු.[16] යෙහෝවා
දෙවියනි, අපි ඔබේ හඬට කීකරු නො-

යෙරෙ **3:24*** එනම්, බාල් දෙවියා.

**3 පරි.**
**1** යෙරෙ 23:8 ආමො 9:15
**2** ගීතා 106:24 එස 20:6
**3** යෙසා 63:16 යෙසා 64:8 මතෙ 6:8 1පේත 1:17
**4** හොෂෙ 3:1
**5** යෙසා 48:8 යෙරෙ 5:11 හොෂෙ 5:7 හොෂෙ 6:7 මලා 2:11
**6** යෙසා 17:10 එස 23:35 හොෂෙ 8:14 හොෂෙ 13:6
**7** හිතෝ 10:9 මීකා 3:9
**8** හොෂෙ 6:1 හොෂෙ 14:1
**9** යෙරෙ 33:6 හොෂෙ 14:4
**10** යෙරෙ 31:18 හොෂෙ 3:5 සෙක 13:9
**11** යෙසා 65:7
**12** යෙරෙ 10:14 යෝනා 2:8
**13** ගීතා 3:8 ගීතා 37:39 යෙසා 12:2 යොහ 4:22
**14** යෙරෙ 11:13 හොෂෙ 9:10
**15** එස්රා 9:7 ගීතා 106:7
**16** ගීතා 51:4 යෙරෙ 2:19 එස 36:31

**2 තීරුව**
**1** විනි 2:2 යෙසා 48:8 යෙරෙ 22:21 දානි 9:10 1කොරි 10:8
**2** එස්රා 9:6 යෙරෙ 2:26 දානි 9:7
**3** එස 7:18

**4 පරි.**
**4** ද්වි 30:2 යෙසා 31:6 යෙරෙ 3:22 හොෂෙ 14:1 යෝවෙ 2:12
**5** 2ලේක 15:8
**6** යෙසා 48:1
**7** ගීතා 99:4
**8** ද්වි 10:20 යෙසා 65:16
**9** යෙසා 45:25 යෙරෙ 9:24 1කොරි 1:31
**10** හොෂෙ 10:12

වුණෙමු.[1] අප ලැජ්ජාවට පත් වුණේ[2]
ඒ නිසාය. අප මෙතරම් මහත් නින්දා-
වකට ලක් වුණේත්[3] ඒ නිසාය.”

**4** යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. “ඊශ්‍රායෙල් ජනයෙනි,
මා වෙතට හැරී එන්න.[4] මා පිළි-
කුල් කරන දේවල් ඔබ වෙතින්
ඉවත් කරන්න. ඔබ එසේ කළොත්[5]
ඔබ කිසිදාක අන් දේශයක අස-
රණ වන්නේ නැත. **2** ‘යෙහෝවා
දෙවි ජීවමාන, සත්‍යවාදී,[6] යුක්තිග-
රුක, ධර්මිෂ්ඨ[7] දෙවි කෙනෙක්’ බව
ඔබ දිවුරා පිළිගන්න.[8] එවිට අන්
සියලු ජාතීහුද දෙවි දෙන ආශීර්වාද
ලබාගනු ඇත. දෙවිගෙන් ලැබෙන ඒ
ආශීර්වාද ගැන ඔවුහු ආඩම්බරයෙන්
කතා කරනු ඇත.”[9]

**3** යෙහෝවා දෙවි යූදාහි වැසියන්-
ටත් යෙරුසලමේ වැසියන්ටත් මෙසේ
පවසන්නේය. “කටු ගස් අතරේ බීජ
නොවපුරා පස හොඳට සකස් කළ
බිමෙහි බීජ වපුරන්න.[10] **4** යූදාහි
වැසියෙනි, යෙරුසලමේ ජනයෙනි,
යෙහෝවා දෙවි වන මා ඉදිරියේ
ඔබේ සිත් පවිත්‍ර කරගන්න.*[11] ඔබ
එසේ නොකළොත් ඔබේ දුෂ්ට ක්‍රියා
නිසා මාගේ උදහස කිසිවෙකුට නිවිය
නොහැකි ගින්නක් මෙන් ඇවිළෙනු
ඇත.”[12]

**5** මේ ගැන යූදා දේශයේ වැසි-
යන්ට ප්‍රකාශ කරන්න. යෙරුසලමේ
වෙසෙන්නන්ටත් දන්වන්න.[13] දේශය
පුරා හොරණෑ පිඹිමින්[14] මේ පණි-
විඩය ප්‍රකාශ කරන්න. ශබ්ද නඟා
මෙසේ පවසන්න. “ඔබ සියලුදෙනාම
ආරක්ෂාව තර කර ඇති නුවර-
වලට එකතු වෙන්න.[15] **6** සියොන්
දෙසට මඟ පෙන්වන පිණිස සංඥා-
වක් තබන්න. සුරක්ෂිතව සිටීමට
ස්ථානයක් සූදානම් කරගන්න. මේ

**11** ද්වි 10:16; ද්වි 30:6; යෙරෙ 9:26; ක්‍රියා 7:51; රෝම 2:29; කොලො 2:11; **12** ලෙවී 26:28; විලා 4:11; **13** යෙරෙ 5:20; යෙරෙ 11:2; **14** යෙරෙ 6:1; එස 33:3; හොෂෙ 8:1; ආමො 3:6; **15** යෙරෙ 8:14; යෙරෙ 35:11.

යෙරෙ **4:4*** මූ.අ., “ඔබේ හදවත් චර්මච්ඡේදනය කරගන්න.”

මහ පෙන්වීම් නොසලකා නොහ-
රින්න.” මන්ද දෙවි මෙසේ පවසන්-
නේය. “මම උතුරු දෙසින්[1] විපතක්ද
මහත් විනාශයක්ද ගෙනෙන්නෙමි.
**7** ජාතීන් වනසා දමන තැනැත්තා,[2]
වනයෙන් නික්ම එන රෞද්‍ර සිංහ-
යෙකු මෙන් පැමිණෙන්නේය.[3] ඔබේ
දේශය විනාශ කර දමන පිණිස ඔහු
නික්ම එන්නේය. ඒ විනාශය දැක
සියලුදෙනා මවිතයට පත් වන්නෝය.
කිසිවෙකු ඉතුරු නොවන සේ ඔබේ
නුවරවල් සියල්ල ඔහු නටබුන් කරන්-
නේය.”[4] **8** අපට විරුද්ධව ඇවුළුණු
යෙහෝවා දෙවිගේ උදහස පහව නො-
ගිය නිසා[5] ජනයෙනි, ගෝණි රෙදි
ඇඳගන්න.[6] පපුවට ගසාගනිමින් කෑ
මොර ගසන්න.[7]

**9** යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. “ඒ දවසේදී රජද[8] පාලක-
යෝද අධෛර්යයට පත් වන්නෝය.
පූජකයෝ භයෙන් වෙවුලන්නෝය.
ඒ විනාශය දැක අනාගතවක්තෘවරුද
පුදුමයට පත් වන්නෝය.”[9]

**10** එවිට මම මෙසේ කීවෙමි. “විශ්-
වයේ පාලකයා වන යෙහෝවා දෙවි-
යනි, කඩුව නිසා ඔබේ සෙනඟගේ
ජීවිතය තිබෙන්නේ අනතුරේ! නමුත්
යූදා හා යෙරුසලමෙහි වැසියන්
සිතන්නේ තම දේශයට සමාදානය
ලැබෙයි කියාය.[10] දෙවියනි, ඔවුන්ට
එසේ නොමඟ යැමට ඔබ ඉඩ දුන්නේ
මන්ද?”[11]

**11** ඒ කාලයේදී යූදා හා යෙ-
රුසලමේ වැසියන්ට මෙසේ කියනු
ලැබේ. “මාගේ සෙනඟ වෙතට[12] පාළු-
කරය හරහා වියළි සුළඟක් හමා එන්-
නේය.[13] ධාන්‍ය පොළන්නවත් ඒවා
පවිත්‍ර කරන්නවත් බැරි තරම් වේග-
යෙන් ඒ සුළඟ හමා එන්නේය.
**12** ඒ වේගවත් සුළඟ හමා එන්නේ
මාගේ අණ පරිදිය. ඔබට විරුද්ධව
ක්‍රියාත්මක කිරීමට යන මාගේ විනිශ්-
චයන් දැන් මම ප්‍රකාශ කරන්නෙමි.[14]
**13** බලන්න ඔබට සිදු වන දේ! සතුරු
හමුදා වැහි වලාවක් මෙන් ඔබව වසා-
ගන්නෝය. ඔවුන්ගේ යුධ රථ, කුණා-

**4 පරි.**
**1** යෙරෙ 1:14
යෙරෙ 6:1
යෙරෙ 21:7
යෙරෙ 25:9
**2** එස 26:7
**3** 2රාජා 24:1
2රාජා 25:1
යෙරෙ 5:6
යෙරෙ 50:17
**4** යෙසා 1:7
යෙසා 5:9
යෙසා 6:11
යෙරෙ 2:15
යෙරෙ 9:11
**5** යෙසා 9:17
යෙසා 10:4
**6** යෙරෙ 6:26
යෝවෙ 2:12
ආමො 8:10
**7** එස 21:12
**8** 2රාජා 25:5
**9** යෙසා 29:9
ක්‍රියා 13:41
**10** යෙරෙ 5:12
යෙරෙ 6:14
යෙරෙ 14:13
යෙරෙ 23:17
1තෙස 5:3
**11** එස 14:9
2තෙස 2:11
**12** යෙසා 22:4
**13** එස 17:10
හොෂෙ 13:15
**14** යෙරෙ 1:16

**2 තීරුව**
**1** යෙසා 5:28
**2** ද්වි 28:49
විලා 4:19
හොෂෙ 8:1
හබ 1:8
**3** හිතෝ 1:22
**4** යෙසා 1:16
එස 18:31
**5** විනි 18:29
විනි 20:1
යෙරෙ 8:16
**6** යොෂු 17:15
යොෂු 20:7
**7** ද්වි 28:49
යෙසා 39:3
**8** නෙහෙ 9:26
යෙසා 1:20
යෙසා 30:9
යෙසා 63:10
එස 2:3
එස 20:21
**9** 2රාජා 25:2
යෙසා 1:8
**10** ගීතා 107:17
හිතෝ 1:31
හිතෝ 5:22
යෙසා 50:1
යෙරෙ 2:17
**11** යෙසා 15:5
යෙසා 21:3
**12** ගීතා 42:5
යෙසා 16:11
**13** ශෙප 1:16
**14** ගීතා 42:7
ගීතා 137:8

ටුවක් මෙන් ඔබ වෙතට වේගයෙන්
පැමිණෙන්නේය.[1] ඔවුන්ගේ අශ්වයන්
රාජාලීන්ටත් වඩා වේගවත්ය.[2] ‘අනේ
අපට අත් වූ විනාශයක මහත’ කියා
ඔබ පවසනු ඇත. **14** යෙරුසල-
මේ වැසියනි, තව කොපමණ කාල-
යක් ඔබ දුෂ්ට සිතුවිලි ඇතුව ජීවත්
වෙනවාද?[3] මේ විපතෙන් ගැලවීමට
නම් ඔබ තුළ තිබෙන දුෂ්ට සිතුවිලි
සම්පූර්ණයෙන්ම සෝදා ඉවත් කර-
ගන්න.[4] **15** විපතක් ගැන ප්‍රකාශ
කරන හඬක් දාන් නුවරේ සිටද[5]
එෆ්‍රායිම් කඳුකරයේ සිටද[6] නික්මෙයි.
**16** ජනයෙනි, ඒ විපත ගැන ජාතීන්ට
පවසන්න. ඒ ගැන යෙරුසලමේ සිටින
අයටත් ප්‍රකාශ කරන්න.”

“ඈත එපිට දේශයකින් සතුරු
හමුදා පැමිණ[7] යූදාහි නගරවලට
විරුද්ධව යුධ ඝෝෂා නඟනු ඇත.
**17** යෙරුසලමේ වැසියන් මට විරුද්-
ධව කැරලිගැසූ නිසා[8] කෙතක් මුර
කරන රැකවලුන් මෙන් සතුරු හමුදා
සෑම පැත්තකින්ම ඇයව වටලන්-
නෝය”[9] කියා යෙහෝවා දෙවි පවසන්-
නේය. **18** “ඔබ ක්‍රියා කරන ආකාරය
ගැන ඔබට ගණන් දීමට සිදු වෙයි.[10]
එය ඔබට අමිහිරි අද්දැකීමක් වන බව
නිසැකය. කැරලිකාරකම ඔබේ සිත
තුළ පැළපදියම් වී ඇති නිසා ඔබට ඒ
විපත අත් වන්නේය.”

**19** අනේ, මට* දැනෙන මේ වේද-
නාව කොතරම්ද! මගේ හදවත වේ-
දනාවෙන් පිරී ඇත.[11] මගේ සිත
බොහෝ සෙයින් කැලඹී ඇත.[12] මට
දසත ඇසෙන්නේ යුද්ධය ගැන අන-
තුරු අඟවන හොරණෑ හඬ පමණි.[13]
ඒ නිසා මට මේ විපත ගැන ප්‍රකාශ
නොකර සිටිය නොහැක. **20** හැම
පැත්තෙන්ම ආරංචි වන්නේ සිදු වන
විනාශය ගැනය. මුළු දේශයම විනාශ
වී ගොසිනි.[14] මගේ කූඩාරම එක මො-
හොතින් කැඩී වැටුණේය.[15] එහි තිර

**15** යෙරෙ 6:26; යෙරෙ 10:20.

යෙරෙ **4:19*** මූ.අ., “මගේ බඩවැල්වල.”

ඉරී ගියේය. **21** යුද්ධය ගැන අන-
තුරු අඟවන සංඥාව මට තව කොප-
මණ කාලයක් දකින්න සිදු වෙයිද?
හොරණෑවේ හඬ මට තව කො-
පමණ කාලයක් අසාගෙන සිටින්න
සිදු වෙයිද?[1] **22** මගේ සෙනඟ ක්‍රියා
කරන්නේ අඥාන ලෙසයි.[2] ඔවුහු
මා කියන දේ කිසි ගණනකටවත්
ගන්නේ නැත.[3] ඔවුන්ගේ ක්‍රියාවල
බරපතළකම ඔවුන්ට වැටහෙන්නේ
නැත.[4] දුෂ්ට දේ කිරීමට නම් ඔවුහු
අතිදක්ෂයෝය. නමුත් යහපත කිරී-
මට ඔවුහු අපොහොසත් වෙති.[5]
**23** මා දේශය දෙස බැලූ විට එය
හිස්ව, පාළුවට ගොස් තිබිණ.[6] අහ-
සින් කිසිම එළියක් නික්මුණේ නැත.[7]
**24** කඳු දෙස බලන්න! ඒවා සෙ-
ලවෙන්නේය. හෙල්ද දෙදරුම්
කන්නේය.[8] **25** දේශයේ එක මිනි-
සෙක්වත් අහසේ එක පක්ෂියෙක්වත්
සිටියේ නැත.[9] **26** පලතුරු වතු
දෙස බලන්න! ඒවා පාළුවට ගොසිනි.
දේශයේ සෑම නගරයක්ම සුන්බුන් වී
ඇත.[10] මේ සියල්ල සිදු වුණේ යෙ-
හෝවා දෙවිගේ උදහස අපට විරුද්ධව
ඇවුළුණු නිසාය.
**27** යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. "මා මේ දේශය සම්පූර්-
ණයෙන්ම විනාශ කරන නිසා[11] එය
මුළුමනින්ම පාළු වී යනු ඇත.[12]
**28** ඒ නිසා මුළු දේශයම වැලපෙයි.[13]
අහසද අඳුරු වෙයි.[14] ඒ විනාශය ගැන
ප්‍රකාශ කළෙත් එය ඉටු කිරීමට තීර-
ණය කළෙත් මමයි. මම ඒ ගැන
කනගාටු නොවෙමි. මගේ තීරණය
කිසිසේත් වෙනස් නොකරන්නෙමි.[15]
**29** අසරුවන්ගේද දුනුවායන්ගේද
ශබ්දය ඇසී මුළු නගරයේම වැසියෝ
පලා යන්නෝය.[16] ඔවුන්ට කැලෑව-
ලත් පර්වතවලත් සැඟවී සිටීමට සිදු
වෙයි.[17] කිසිම නගරයක මිනිස් පුලු-
ටක්වත් දකින්න නොලැබෙයි."
**30** ඔබ රත් පැහැති වස්ත්‍ර ඇඳ-
ගෙන, රන් ආභරණ පැළඳගෙන,
ඇස්වලට කලු අඳුන් ආලේප කර-
ගෙන[18] කලක් අලංකාරව වැජඹුණත්
ඒ දේවලින් දැන් කිසිදු පලක් නැත.[1]
ඔබ දැන් පාළුවට ගොසින්ය. ඔබේ
ආලවන්තයෝ ඔබව ප්‍රතික්ෂේප කර,
ඔබව නැති නාස්ති කර දමන්න මං
සොයති.[2] **31** රෝගාතුරව කෙඳිරි-
ගාන ස්ත්‍රියකගේ හඬක් මට ඇසේ. ඒ
හඬ තම කුලුඳුල් දරුවාව බිහි කරන
ස්ත්‍රියක වේදනාවෙන් නඟන හඬට
සමානය.[3] ඒ හඬ සියොන් දියණිය
තම පණකෙන්ද රැකගන්න අමාරු-
වෙන් හුස්ම ගන්නා හඬයි. ඇය තම
දැත් දිගු කරමින්,[4] "අනේ මට සිදු වුණ
දේ බලන්න! මාව මරා දමන්න සො-
යන අයගෙන් මට කිසි ගැලවීමක්
නැහැ"[5] කියා කියන්නීය.

**5** යුක්තිගරුක,[6] විශ්වාසවන්ත[7]
එක් මනුෂ්‍යයෙකු හෝ සිටින-
වාද කියා යෙරුසලමේ මාවත්වල හා
මංසන්ධිවල ඇවිද බලන්න.[8] එවැනි
එක් මනුෂ්‍යයෙකු හෝ සිටිනවා නම්
මම මුළු නගරයටම සමාව දෙන්-
නෙමි. **2** ජීවමාන යෙහෝවා දෙ-
විගේ නාමයෙන් ඔවුන් දිවුරා කතා
කළත් ඔවුන් පවසන දේ සත්‍යයක්
නොවේ.[9]
**3** යෙහෝවා දෙවියනි, ඔබ මහත්
ආශාවෙන් බලා සිටින්නේ මිනිසුන්
විශ්වාසවන්තව ක්‍රියා කරනවා දැකී-
මට නොවේද?[10] ඔබ ඔවුන්ට පහර
දුන්නත්[11] ඔවුන්ට කිසි වේදනාවක්
දැනුණේ නැත.[12] ඔබ ඔවුන්ට මහත්
විනාශයක් අද්දැකීමට ඉඩහැරියත්[13]
ඔවුහු එයින් කිසි පාඩමක් ඉගෙ-
නගත්තේ නැත.[14] ඔවුන්ගේ සිත්*
පර්වතයකටත් වඩා දැඩිය.[15] තමන්
ගමන් කරන වැරදි මාර්ගවලින් ඉවත්
වීමට ඔවුහු කැමති වුණේ නැත.[16]
**4** නමුත් මට මෙසේ සිතිණ. "ඔවුන්
සමාජයේ සිටින නූගත් පිරිසක්. ඔවුන්
මෝඩ ලෙස හැසිරෙන්නේ ඒ නිසයි.

**4 පරි.**
**1** යෙරෙ 6:1
**2** ද්වි 32:6; යෙසා 6:9; යෙරෙ 5:21
**3** හොෂෙ 5:4
**4** හොෂෙ 4:14
**5** මීකා 2:1
**6** යෙසා 24:19; යෙරෙ 9:10
**7** යෙසා 5:30; යෙසා 13:10; එස 32:8; යෝවෙ 2:31; මතෙ 24:29
**8** යෙසා 5:25; එස 38:20; නාහු 1:5; හබ 3:6
**9** යෙරෙ 9:10; හොෂෙ 4:3; ශෙප 1:3
**10** ද්වි 29:23
**11** ලෙවී 26:32; යෙරෙ 10:22; යෙරෙ 12:11; එස 11:13
**12** 2ලේක 36:21; යෙසා 6:11; යෙරෙ 12:11; එස 33:28
**13** යෙසා 24:4; හොෂෙ 4:3; යෝවෙ 1:10
**14** යෙසා 5:30; යෙසා 50:3; යෝවෙ 2:2; යෝවෙ 2:30
**15** ගණන් 23:19; 2රාජා 23:26; යෙසා 43:13; යෙසා 46:10; එස 24:14
**16** 2රාජා 25:4
**17** යෙසා 2:19; එළි 6:15
**18** 2රාජා 9:30; එස 23:40; එළි 17:4

**2 තීරුව**
**1** එස 23:26
**2** යෙරෙ 22:20; විලා 1:2; එළි 17:16
**3** යෙරෙ 6:24; 1තෙස 5:3
**4** යෙසා 1:15; විලා 1:17
**5** යෙරෙ 45:3; එස 23:47

**5 පරි.**
**6** උත් 18:32; ගීතා 12:1; ගීතා 14:3; එස 22:29; ආමො 5:7; මීකා 7:2
**7** යෙසා 59:4
**8** එස 22:30

**9** යෙසා 48:1; යෙරෙ 7:9; **10** 2ලේක 16:9; ගීතා 101:6; **11** 2ලේක 28:22; **12** යෙසා 1:5; යෙසා 9:13; යෙරෙ 2:30; **13** ද්වි 28:21; **14** ගීතා 50:17; යෙසා 1:5; යෙසා 42:25; යෙරෙ 7:28; ශෙප 3:2; **15** හිතෝ 21:29; සෙක 7:11; **16** එස 3:7.

යෙරෙ **5:3*** මූ.අ., "මුහුණු."

ඔවුන් යෙහෝවා දෙවිගේ මඟ පෙන්-
වීම් නොසලකා හරිනවා. දෙවි ඔවුන්-
ගෙන් බලාපොරොත්තු වන දේ ඔවුන්
තේරුම්ගන්නේ නැහැ.[1] **5** නමුත්
මා දැන් ගොස් උත්තමයන් සමඟ
කතා කළ යුතුයි.[2] ඔවුන් නම් යෙ-
හෝවා දෙවිගේ මඟ පෙන්වීම්වලට
කීකරු වෙමින්, දෙවි ඔවුන්ගෙන්
බලාපොරොත්තු වන ලෙස ජීවත් වෙ-
නවා ඇති.”[3] නමුත් මා සිතුවා වැර-
දියි. ඔවුන් සියලුදෙනාත් කීකරුකම
නමැති වියගහට යටත් වෙනවා වෙ-
නුවට එහි බැමි කඩා දමා තිබිණ.[4]

**6** කැලෑවෙන් ආ සිංහයෙකුට
ඔවුන් ගොදුරු වුණෙත් පාළුක-
රයෙන් ආ වෘකයෙකුගෙන් ඔවුන්
පහර කෑවෙත් ඒ නිසාය.[5] දිවියෙකු
ඔවුන්ගේ නගරවල් අසල කුරුමානම්
අල්ලමින් සිටින්නේද ඒ නිසාය.[6] නග-
රවලින් පිටතට යන සියලුදෙනාව
උන් කැබලිවලට ඉරා දැමුවෝය.
මන්ද ඔවුහු බොහෝ වැරදි කළෝය.
ඔවුහු අනේක වාරයක් දෙවිට ද්‍රෝහි
වෙමින් ක්‍රියා කළෝය.[7]

**7** ඔබ කළ මේ දේවලට මා සමාව
දෙන්නේ කෙසේද? ඔබේ පුත්‍රයෝ
මාව අත්හැර බොරු දෙවිවරුන්ගේ
නාමයෙන්[8] දිවුරති.[9] මා ඔවුන්ට කො-
තරම් යහපත් දේ කළත්[10] ඔවුහු අනා-
චාරයේ යෙදීම නම් නතර කළේ
නැත.[11] ඔවුන් ගණිකාවන්ගේ නිවෙස්-
වලට ඇතුල් වන්නේ රංචු පිටින්ය.
**8** ඔවුහු මෘගයන්* මෙන් කාමාශා-
වෙන් උමතු වී තම අසල්වැසියාගේ
භාර්යාව සොයා යති.[12]

**9** “ඔවුන් කරන මේ අපරාධවලට
ඔවුන් අනිවාර්යයෙන්ම මට ගණන්
දිය යුතුයි. එයින් මා ඔවුන්ව නිද-
හස් කරන්නේ කෙසේද?[13] මෙලෙස
හැසිරෙන ජාතියකට මා දඬුවම් නො-
කර සිටින්නේ කෙසේද” කියා යෙ-
හෝවා දෙවි අසන්නේය.[14]

**10** “එන්න, දේශයේ මිදිවතු පාළු
කර දමන්න.[15] පලවලින් බර වූ
අතු යෙහෝවා දෙවි වන මට අයිති
නැති බැවින් ඒවා සියල්ල කපා ඉවත්
කරන්න.[1] නමුත් සම්පූර්ණ විනා-
ශයක් සිදු නොකරන්න.[2] **11** ඊශ්‍රා-
යෙල් හා යූදා සෙනඟ මට විරුද්ධව
බොහෝ ද්‍රෝහිකම් කළෝය” කියා
යෙහෝවා දෙවි පවසන්නේය.[3]
**12** “ඔවුහු යෙහෝවා දෙවි වන මාව
ප්‍රතික්ෂේප කරමින් මෙසේ කියති.
‘ඒ වගේ දෙවි කෙනෙක් කොහේද
ඉන්නේ![4] අපිට නම් කිසි කරදරයක්
වෙන්නේ නැහැ. යුද්ධවලටවත් සාග-
තවලටවත් මුහුණ පාන්න අපිට සිදු
වෙන්නේ නැහැ.’[5] **13** අනාගතවක්-
තෘවරුන් පවසන දේවල් සුළං රොදක්
මෙන් හිස්ය. මන්ද දෙවිගේ වචනය
ඔවුන් තුළ නැත.[6] ඔවුන්ගේ වදන්
මෙන් ඔවුහුද කිසිත් නැති තත්වය-
කට පත් වනු ඇත.”

**14** ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. “ඔවුන් එවැනි දේවල් පවසන
නිසා ඔබේ මුඛයෙන් පිට වන මාගේ
වචන ගින්නක් මෙන් වීමට සලස්වන්-
නෙමි.[7] දර මිටියක් පිළිස්සී යන්නාක්
මෙන් ඔවුහුද ඒ ගින්නෙන් පිළිස්සී
යනු ඇත.”[8]

**15** යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. “ඊශ්‍රායෙල් සෙනඟෙනි, දුර
ඈත සිටින ජාතියක් මම ඔබට විරුද්-
ධව එවන්නෙමි.[9] ඔවුහු පුරාණයේ සිට
පැවත එන ජාතියකි.[10] ඔවුන් කතා
කරන්නේ ඔබ නොදන්නා භාෂාවකි.
ඔවුන් කියන දේවල් ඔබට තේරුම්ගත
නොහැකිය. **16** ඊතලවලින් පිරුණු
ඔවුන්ගේ ඊකොපු, විවර වී තිබෙන
මිනී වළක් මෙන් මාරාන්තිකය.
ඔවුන්ගේ හමුදාව ඉතා බලවත්ය.[11]
**17** ඔවුහු ඔබේ අස්වැන්නත් ඔබේ
ආහාර සියල්ලත් කා දමනු ඇත.[12]
ඔබේ දූපුතුන්වද එළු බැටළු හා ගව
රැළවල්ද ඔවුහු විනාශ කර දමනු ඇත.
ඔවුහු ඔබේ මිදිවතුද අත්තික්කා ගස්ද
පාළු කර දමන්නෝය.[13] ඔබ විශ්වාසය
තැබූ ඔබේ සුරක්ෂිත නුවරවල් ඔවුහු
කඩු පහරින් සුනුවිසුනු කරන්නෝය.”

**5 පරි.**
**1** යෙසා 27:11
යෙරෙ 7:8
හොෂෙ 4:6
**2** මලා 2:7
**3** මීකා 3:1
**4** ගීතා 2:3
**5** ගීතා 104:20
ශෙප 3:3
**6** හොෂෙ 13:7
**7** එස්රා 9:6
යෙසා 59:12
එස 23:19
**8** ද්වි 32:21
යෙරෙ 2:11
1කොරි 8:4
ගලා 4:8
**9** යොෂු 23:7
යෙරෙ 12:16
ආමො 8:14
ශෙප 1:5
**10** එස 16:49
හොෂෙ 13:6
**11** එස 22:11
**12** යෙරෙ 13:27
**13** යෙරෙ 9:9
**14** ලෙවී 26:25
යෙරෙ 44:22
නාහු 1:2
**15** 2ලේක 36:17
යෙරෙ 39:8

**2 තීරුව**
**1** ගීතා 78:61
**2** ලෙවී 26:44
යෙරෙ 46:28
ආමො 9:8
**3** යෙසා 48:8
යෙරෙ 3:20
හොෂෙ 5:7
හොෂෙ 6:7
**4** 2ලේක 36:16
යෙසා 28:15
**5** ගීතා 10:6
යෙරෙ 4:10
යෙරෙ 23:17
**6** යෙසා 41:29
හොෂෙ 9:7
**7** යෙරෙ 1:9
**8** යෙරෙ 23:29
හොෂෙ 6:5
එළි 11:5
**9** ද්වි 28:49
යෙරෙ 1:15
යෙරෙ 4:16
යෙරෙ 25:9
එස 7:24
**10** හබ 1:6
**11** ද්වි 28:50
**12** ලෙවී 26:16
ද්වි 28:51
**13** යෙරෙ 8:13

යෙරෙ **5:8*** මූ.අ., “අශ්වයන්.”

18 “ඒ කාලයේදී පවා ඔබේ ජාතිය
මම සම්පූර්ණයෙන්ම නැති කර නො-
දමන්නෙමි”[1] කියා යෙහෝවා දෙවි
පවසන්නේය. 19 “ ‘අපේ යෙහෝවා
දෙවි අපට මේ වගේ දෙයක් වෙන්න
ඉඩහැරියේ ඇයි’ කියා ඒ කාල-
යේදී සෙනඟ අසනු ඇත.[2] එවිට ඔබ
ඔවුන්ට මෙසේ කියන්න. ‘ඔබ දෙ-
විව අත්හැර, ඔබේ දේශයේදීම වෙනත්
දෙවිවරුන්ට සේවය කළාක් මෙන්
ඔබට අයිති නැති දේශයකදී වෙනත්
ජාතියකට සේවය කිරීමට ඔබට සිදු
වන්නේය.’ ”[3]

20 යාකොබ්ගෙන් පැවතෙන්නන්ට
මේ ගැන කියන්න. යූදා දේශය පුරා
මෙසේ ප්‍රකාශ කරන්න. 21 “ඇස්
තිබුණත් නොදකින,[4] කන් තිබුණත්
නොඇසෙන,[5] මෝඩ, අඥාන*[6] වැසි-
යෙනි, ඇහුම්කන් දෙන්න. 22 යෙ-
හෝවා දෙවි මෙසේ අසන්නේය. ‘ඔබ
මට ගරුබිය පෙන්විය යුතු නැද්ද?[7]
මුහුදු රැල්ල වෙරළ පසු කර නො-
යන ලෙස සාගරයට මායිමක් තැබුවේ
මමය. මුහුද කැලඹී රැලි නංවමින් වෙ-
රළෙහි කොතරම් වැදුණත් ඒ
මායිම පසු කර යෑමට මුහුදු රැල්-
ලට නොහැක.[8] මේ සෑම දෙයක්ම
සෑදූ මා ඉදිරියේ ඔබ භයෙන් වෙවුලිය
යුතු නැද්ද?[9] 23 නමුත් ඔබ ඉතා
මුරණ්ඩු කැරලිකාර සෙනඟකි. ඔබ
මාගෙන් ඈත් වී ඔබේ හිතේ හැටි-
යට හැසිරෙන්නහුය.[10] 24 “වසන්ත
කාලයේදී හා සරත් කාලයේදී වර්-
ෂාව ලබා දෙන,[11] අස්වැන්න නෙළන
කාලයේදී අපේ වගාව ආරක්ෂා කර
දෙන[12] අපේ යෙහෝවා දෙවිට අපි
ගරුබිය පෙන්වමු”[13] කියා ඔබට නික-
මටවත් සිතුණේ නැත. 25 ඔබේම
වැරදි නිසා ඒ ආශීර්වාද සියල්ල ඔබ
නැති කරගත්තහුය. ඔබේම පව්කාර
ක්‍රියා නිසා යහපත් දේවල් රාශියක්
ඔබ අහිමි කරගත්තහුය.[14]

26 “ ‘මාගේ සෙනඟ අතරේම දුෂ්ට
මනුෂ්‍යයෝ සිටිති.[1] ඔවුහු සැඟවී
සිටින කුරුලු දඩයක්කරුවන් මෙන්
මිනිසුන්ව හසු කරගැනීමට මාන
බලති.[2] ඔවුන් අටවන උගුල් මාරාන්-
තිකය. 27 කුරුලු කූඩුවක් කුරුල්-
ලන්ගෙන් පිරී තිබෙන්නාක් මෙන්
වංචාවෙන් ඔවුන්ගේ නිවෙස් පිරී
ඇත.[3] ධනයෙනුත් බලයෙනුත් කිසිම
අඩුවක් ඔවුන්ට නැත්තේ ඒ නිසාය.[4]
28 ඔවුහු තරව[5] පැහැපත්ව සිටිති.
ඔවුන් කරන වැරදිවලට කිසිම සීමා-
වක් නැත. ඔවුහු නඩු විභාග කරන
විට සාධාරණ ලෙස කටයුතු නොක-
රති.[6] පියා නැති දරුවෙකුටවත් ඔවුහු
සාධාරණය ඉටු නොකරති.[7] දුප්ප-
තාගේ නඩුව ඔවුහු නොසලකාහරිති.
ඔවුන් මේ සෑම දෙයක්ම කරන්නේ
තමන්ගේම වාසිය තකාය.’ ”[8]

29 යෙහෝවා දෙවි මෙසේ අසන්-
නේය. “ඔවුන් කරන මේ අපරාධ-
වලට ඔවුන් අනිවාර්යයෙන්ම මට
ගණන් දිය යුතුයි. එයින් මා ඔවුන්ව
නිදහස් කරන්නේ කෙසේද? මෙ-
ලෙස හැසිරෙන ජාතියකට මා දඬු-
වම් නොකර සිටින්නේ කෙසේද?[9]
30 සියල්ලන්ව පුදුමයට පත්
කරන පිළිකුල්සහගත දෙයක් දේශ-
යේ සිදු වන්නේය.[10] 31 අනාගත-
වක්තෘවරු බොරු අනාවැකි ප්‍රකාශ
කරති.[11] පූජකයෝ හිතුමතේට තම
බලය යොදාගනිමින් මිනිසුන්ව පාගා
දමති.[12] නමුත් මාගේ සෙනඟ මේ
සෑම දෙයක්ම භාරගන්නේ කැමැත්-
තෙනි.[13] ජනයෙනි, මේ සියල්ලේම
අවසාන ප්‍රතිඵලවලට මුහුණ දීමට
ඔබට සිදු වෙයි. එවිට ඔබ කරන්නේ
කුමක්ද?”[14]

**6** බෙන්ජමින් පුත්‍රයෙනි, උතුරු
දෙසින් මහත් විපතක්ද විනා-
ශයක්ද පැමිණෙන නිසා[15] යෙරුස-
ලමෙන් පලා දුවන්න. තෙකෝවාහි
සිට[16] හොරණෑව පිඹින්න.[17] බෙන්-

**5 පරි.**
1 යෙරෙ 4:27
2 ද්වි 29:25; 1රාජා 9:9; යෙරෙ 2:35; යෙරෙ 13:22; යෙරෙ 16:10
3 ද්වි 4:27; ද්වි 28:48; 2ලේක 7:22
4 යෙසා 59:10
5 යෙසා 6:9; එස 12:2; හොෂෙ 7:11; මතෙ 13:13; මාක් 8:18; ක්‍රියා 28:26
6 ද්වි 29:4; යෙරෙ 4:22
7 ද්වි 28:58; ගීතා 119:120; එළි 15:4
8 යෝබ් 26:10; යෝබ් 38:11; ගීතා 33:7; ගීතා 104:9; හිතෝ 8:29
9 ගීතා 99:1
10 ගීතා 78:8; ගීතා 81:12; ගීතා 95:10; යෙසා 1:23; යෙසා 65:2; යෙරෙ 3:17; යෙරෙ 11:8; යෙරෙ 18:12; හොෂෙ 11:7; ක්‍රියා 7:51
11 ද්වි 11:14; ගීතා 147:8; යෝවෙ 2:23; යාකො 5:7
12 උත් 8:22
13 ගීතා 33:18
14 ද්වි 28:23; ගීතා 107:17; යෙරෙ 3:3

**2 තීරුව**
1 එස 22:6
2 ගීතා 10:9; හිතෝ 1:17; හබ 1:15
3 හොෂෙ 12:7; ආමො 8:5; මීකා 6:11
4 යෙරෙ 17:11
5 ද්වි 32:15; යාකො 5:5
6 ගීතා 82:2
7 යෙසා 1:23; සෙක 7:10
8 යෝබ් 12:6; ගීතා 73:12; යෙරෙ 12:1
9 යෙරෙ 9:9
10 යෙරෙ 2:12; යෙරෙ 23:14; හොෂෙ 6:10
11 යෙරෙ 14:14; විලා 2:14; එස 13:6
12 යෙරෙ 32:32; මතෙ 27:20; 13 යෙසා 30:10; යොහ 3:19; 2තෙස 2:12; 2තිමෝ 4:3; 14 ද්වි 28:29; යෙසා 10:3; **6 පරි.** 15 යෙරෙ 1:14; යෙරෙ 4:6; යෙරෙ 10:22; 16 2සාමු 14:2; 2ලේක 11:6; ආමො 1:1; 17 යෙරෙ 4:5.

යෙරෙ **5:21*** මූ.අ., “හදවතක් නැති” නැත-
හොත්, “පිරිසිදු චේතනාවක් නැති.”

හක්කෙරෙම්හි[1] ගින්නක් අවුළුවා
සංඥාවක් දෙන්න. **2** සියොන් දිය-
ණිය සියුමැලිව ඇතිදැඩි වූ ප්‍රියකරු
ළඳක මෙනි.[2] **3** එඬේරු තම රැළ-
වල් රැගෙන ඇය වෙතට පැමිණ ඇය
වටා කඳවුරු බැඳගත්තෝය.[3] ඔවුහු
රිසි සේ තම රැළට තණ කැව්වෝය.[4]
**4** නමුත් ඇයට විරුද්ධව යුධ ප්‍රකාශ
කළ ඔවුහු[5] මෙසේ පැවසූහ. “එන්න,
ඉර මුදුන් වන වේලාවේදී අපි ඔවුන්ට
පහර දෙමු.”[6]

“බලන්න! දවාල ගෙවී ගොසිනි.
සැඳෑ අඳුර කෙමෙන් කෙමෙන් ළඟා
වෙයි.”

**5** “නැඟිටින්න. අපි රාත්‍රියේම
ගොස් ඇගේ බලකොටු සුනුවිසුනු
කරමු.”[7]

**6** ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. “ගස් කපා[8] යෙරුසලම වටා
බැම්මක් ඉදි කරන්න.[9] ඇය දුෂ්-
ටකමින් පිරී තිබෙන නුවරකි.[10]
ඒ නිසා මා ඉදිරියේ ගණන් දීමට
ඇයට සිදු වෙයි.[11] **7** පොකුණක
වතුර නැවුම්ව හා සුරැකිව තිබෙන්-
නාක් මෙන් ඇයත් තම පව් සියල්ල
වටිනා යමක් සේ සුරැකිව තබාගන්-
නීය. සැහැසියාව හා කොල්ල කෑම
ඒ නගරය පුරා බහුලව සිදු වෙයි.[12]
එහි මා නිතරම දකින්නේ ලෙඩ
රෝග හා වසංගතයි. **8** යෙරුසල-
මේ වැසියෙනි, වැරදි මාර්ගවලින්
ඉවත් වෙන්න.[13] ඔබ ගැන පිළිකු-
ලක් ඇති වී ඔබෙන් ඈත් වීමට මට
හේතුවක් නොදෙන්න.[14] ඔබේ දේශය
කිසි වැසියෙකු වාසය නොකරන පාළු
බිමක් බවට පත් කිරීමට මට හේතු-
වක් ලබා නොදෙන්න.”[15]

**9** ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. “පලදාව රැස් කළ පසු ඉතුරු
වන මිදිපල එකතු කරගන්නාක් මෙන්
ඔවුහු ඊශ්‍රායෙල්හි ඉතුරු වන සියලු-
දෙනාව රැස් කරගන්නෝය.[16] මිදිවැ-
ලේ අතු පතර සූරා ඉතුරුව ඇති
පල සියල්ලද රැස් කරගන්නාක් මෙන්
ඔවුහු කිසිවෙකුව ඉතුරු නොකරන්-
නෝය.”

**10** “මේ ගැන මා අනතුරු අඟ-
වන්නේ කාටද? මට සවන් දෙන්නේ
කවරෙක්ද? සවන් දීමට ඔවුන්ට කිසි
ආශාවක් නැති* නිසා ඔවුහු මට සවන්
නොදෙති.[1] ඔවුන් යෙහෝවා දෙවිගේ
වදන් සලකන්නේ තමන්ට නින්දා-
වක් ගෙන දෙන්නක් ලෙසයි.[2] ඔවුහු
එයින් කිසි සතුටක් ලබන්නේ නැත.[3]
**11** ඔවුන්ට විරුද්ධව යෙහෝවා දෙ-
විට ඇති වූ උදහසට සමාන උදහසක්
මා තුළද ඇති විය. ඒ නිසා මට තවත්
නිහඬව සිටිය නොහැක.”[4]

“වීථිවල සැරිසරන දරුවන් පිට-
ටත්[5] රංචු ගැසී සිටින තරුණයන්
පිටටත් මාගේ කෝපය වගුරු-
වන්න. පුරුෂයා සහ භාර්යාව පිට-
ටත් මහල්ලා සහ ඉතා වයස්ගත
තැනැත්තා පිටටත්[6] මාගේ උද-
හස වගුරුවන්න. කිසිවෙකුට ගැලවී-
මට ලැබෙන්නේ නැත. **12** දේශයේ
වැසියන්ට විරුද්ධව මාගේ අත දිගු
කරන නිසා[7] ඔවුන්ගේ ගේදොර, ඉඩ-
කඩම් හා භාර්යාවෝ අන් අයට අයිති
වනු ඇත”[8] කියා යෙහෝවා දෙවි පව-
සන්නේය.

**13** “ඔවුන් අතරේ සිටින ලොකු
කුඩා සෑම කෙනෙක්ම අයුතු ලෙස
වාසි ප්‍රයෝජන ලබාගනිති.[9] අනාග-
තවක්තෘවරු සහ පූජකයෝ පවා සෙ-
නඟව රවටති.[10] **14** තුවාලයකට
මතුපිටින් පමණක් බෙහෙත් දමන්-
නාක් මෙන් ඔවුහුද සාමය නැති විටදී
පවා, ‘දැන් සාමය පැමිණ ඇත! සාමය
පැමිණ ඇත!’[11] කියා මාගේ සෙ-
නඟව බොරුවට සැනසවීමට උත්-
සාහ කරති.[12] **15** ඔවුන් කරන මේ
පිළිකුල්සහගත ක්‍රියා ගැන ඔවුන්ට
කිසි ලැජ්ජාවක් ඇති වීද?[13] ඔවුන්ට ඒ
ගැන කිසිම ලැජ්ජාවක් නැත. ලැජ්-
ජාව කියන්නේ කුමක්ද කියාවත්
ඔවුහු නොදනිති.[14] ඒ නිසා වැටී යන

---

යෙරෙ **6:10*** මූ.අ., “ඔවුන්ට තිබෙන්නේ අචර්-
මච්ඡේදිත කන්ය.”

**6 පරි.**
**1** නෙහෙ 3:14
**2** යෙසා 3:16
**3** 2රාජා 25:1
**4** යෙරෙ 4:17
**5** යෝවෙ 3:9
**6** යෙරෙ 15:8
**7** 2ලේක 36:19 ආමො 2:5
**8** ද්වි 20:20
**9** එස 21:22 ලූක් 19:43
**10** 2රාජා 21:16 එස 7:23
**11** යෙරෙ 5:9
**12** ගීතා 55:9 යෙරෙ 20:8 එස 7:11 මීකා 2:2
**13** හිතෝ 4:13 ශෙප 3:7
**14** එස 23:18 හොෂෙ 9:12
**15** ලෙවී 26:34 යෙරෙ 2:15 යෙරෙ 9:11
**16** යෙසා 24:13 යෙරෙ 49:9

**2 තීරුව**
**1** යෙසා 6:10 යෙරෙ 7:26 ක්‍රියා 7:51
**2** 2ලේක 36:16 යෙරෙ 20:8
**3** 2තිමෝ 4:3
**4** යෙරෙ 20:9
**5** යෙරෙ 9:21 යෙරෙ 18:21
**6** එස 9:6
**7** යෙසා 5:25
**8** ද්වි 28:30 යෙරෙ 8:10 විලා 5:11 ශෙප 1:13
**9** යෙරෙ 8:10 එස 22:12 එස 33:31 ලූක් 16:14
**10** යෙරෙ 2:8 යෙරෙ 14:18 යෙරෙ 23:11 මීකා 3:5 මීකා 3:11 ශෙප 3:4
**11** යෙරෙ 14:13 යෙරෙ 23:17 එස 13:10 1තෙස 5:3
**12** යෙරෙ 8:11
**13** යෙරෙ 8:12 ශෙප 3:5
**14** යෙරෙ 3:3

අය අතරේ ඔවුහුද සිටිනු ඇත.[1] ඔවුන්
කළ දේවලට මා දඬුවම් කරන දව-
සේදී ඔවුන්ගේ වැටීමද සිදු වනු ඇත”
කියා යෙහෝවා දෙවි පවසන්නේය.

**16** යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ පවසන්නේය. “ඔබ දැන් ගමන්
කරන මාර්ගයේ යැම නතර කර, ඔබේ
මුතුන්මිත්තන් ගමන් කළ යහපත්
මාර්ගය* සොයා[2] එහි ගමන් කරන්න.[3]
එවිට ඔබට සහනයක් ලැබෙයි.”[4]
නමුත් ඔබ, “අපි ඒ මාර්ගයේ යන්නේ
නැහැ” කියා නැවත නැවතත් පැවසුව-
හුය.[5] **17** “ ‘හොරණෑවේ හඬට සවන්
දෙන්න’[6] කියා පැවසීමට මම ඔබ
අතරට මුරකරුවන් එව්වෙමි.”[7] නමුත්
ඔබ, “අපි සවන් දෙන්නේ නැහැ”
කියා නැවත නැවතත් පැවසුවහුය.[8]
**18** “ජනයෙනි, ඇහුම්කන් දෙන්න.
සෙනඟෙනි, ඔවුන්ට සිදු වන දේ දැන-
ගන්න. **19** පොළොවේ වැසියෙනි,
මේ අසන්න! දුෂ්ට සිතුවිලි ඇති මේ
සෙනඟ[9] මට අකීකරු වී මාගේ නීතිය
කඩ කළ නිසා[10] මම ඔවුන් පිටට
විපත්තියක් ගෙනෙන්නෙමි.”[11]

**20** “ඔබ ෂෙබාහි සිට කට්ටකු-
මංජල්ද[12] ඈත එපිට සිට සුවඳැති
පැළෑටිද රැගෙන මා ඉදිරියට පැමිණි-
යත් මට ඉන් කිසි පලක් තිබේද?
ඔබ ඔප්පු කරන දවන පූජාවලින් මට
කිසි සතුටක් ලැබෙන්නේ නැත.[13] ඔබ
ඔප්පු කරන පූජා ගැන මට කිසි-
සේත් සැහීමට පත් විය නොහැක.”[14]
**21** එබැවින් යෙහෝවා දෙවි මෙසේ
පවසන්නේය. “මේ සෙනඟ වැටී යන
ලෙස මම ඔවුන් ඉදිරියේ බාධක
තබන්නෙමි.[15] ඒ බාධක නිසා පිය-
වරුද පුත්‍රයෝද අසල්වැසියෝ හා
ඔවුන්ගේ මිත්‍රයෝද එකට වැටී විනාශ
වී යනු ඇත.”[16]

**22** යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. “බලන්න, උතුරු දෙසින්
ජාතියක් පැමිණෙයි. මහත් ජාතියක්
පොළොවේ ඈත කෙළවරින් ඔබට
විරුද්ධව පැමිණෙයි.[17] **23** දුනු හා
හෙල්ල අතැතිව[1] එන ඒ ජාතිය කිසි
අනුකම්පාවක් නොපෙන්වන ඉතා
කෲර ජාතියකි. අශ්වයන් පිට නැඟී
එන[2] ඔවුන්ගේ ඝෝෂාව මහ මුහුදේ
ඝෝෂාවට සමානය.[3] සියොන් දියණි-
යනි, ඔවුන් එක්සත්ව මෙසේ යුද්ධයට
සැරසී සිටින්නේ ඔබට විරුද්ධවය.”[4]

**24** ඒ ගැන ආරංචි වූ විට අපි
බොහෝ සෙයින් අධෛර්යයට පත්
වූයෙමු.[5] දරුවෙකු බිහි කරන මවකට
දැනෙන වේදනාවට සමාන වේදනා-
වක් අපට දැනිණ.[6] එමෙන්ම අපට
මහත් භීතියක්ද දැනිණ. **25** සතු-
රන් සෑම තැනකම කඩු අතැතිව
සිටින නිසා සියලුදෙනාම සිටින්නේ
මහත් බියකිනි.[7] ඒ නිසා එළිමහනේත්
වීථිවලත් සැරිසැරීමෙන් වළකින්න.
**26** මාගේ සෙනඟෙනි, ගෝණි රෙදි
ඇඳගෙන[8] අළු මත වැතිරෙන්න.[9]
සතුරු ප්‍රහාර ඔබ වෙතට හදිසියේම
එල්ල වන නිසා[10] තම එකම පුතු
මිය ගිය විට හඬා වැලපෙන කෙ-
නෙකු මෙන් ඔබත් ශෝකයෙන් වැල-
පෙන්න.[11]

**27** “මාගේ සෙනඟ යන මාර්ගය
ගැන විමසිලිමත්ව සිට ඔවුන්ගේ ක්‍රියා
හොඳින් සෝදිසි කර බලන පිණිස
මම ඔබව ලෝහ පරීක්ෂකයෙකු සේ
පත් කළෙමි.[12] **28** ඔවුහු සියලුදෙ-
නාම තඹ හා යකඩ මෙන් දැඩි
සිත් ඇති, මුරණ්ඩු සෙනඟකි.[13] ඔවුන්
නිතරම කරන්නේ අනුන්ට අපහාස
කිරීමයි.[14] ඔවුහු දූෂිත සෙනඟකි.[15]
**29** ඒ ලෝහ පවිත්‍ර කිරීමට කො-
තරම් උත්සාහ දැරුවත් ඉන් පලක්
වූයේ නැත. ගිනි අවුළන මයිනහ-
මත් පිලිස්සී ගියේය.[16] ඉතුරු වූයේ
ඊයම් පමණි.[17] දුෂ්ටයන්ව ඉවත් කිරී-
මට කිසිසේත් හැකි වූයේ නැත.[18]
**30** යෙහෝවා දෙවි ඔවුන්ව ප්‍රතික්-
ෂේප කළ නිසා[19] ජනයා ඔවුන්ව
වටිනාකමක් නැති රිදී හා සමානව
සලකති.”[20]

**6 පරි.**
**1** යෙරෙ 23:12
**2** යෙරෙ 18:15
මලා 4:4
**3** යෙසා 2:3
යෙසා 2:5
යෙසා 30:21
**4** ගීතා 23:3
**5** ගීතා 78:10
යෙසා 42:24
යෙරෙ 44:16
**6** යෙසා 58:1
**7** යෙසා 21:11
යෙරෙ 25:4
එස 3:17
හබ 2:1
**8** සෙක 7:11
**9** හිතෝ 1:31
යෙසා 59:7
**10** හිතෝ 28:9
**11** ද්වි 4:26
යෙසා 1:2
ආනි 9:12
**12** 1රාජා 10:1
යෙසා 60:6
**13** යෙරෙ 7:21
**14** යෙසා 1:11
යෙසා 66:3
ආමො 5:21
**15** යෙසා 8:14
**16** 2ලේක 36:17
යෙසා 9:14
විලා 2:21
**17** යෙරෙ 1:14
යෙරෙ 25:9

**2 තීරුව**
**1** යෙරෙ 5:16
යෙරෙ 50:42
**2** හබ 1:8
**3** යෙරෙ 10:22
**4** යෙරෙ 4:11
ලූක් 21:20
**5** එස 21:7
**6** යෙරෙ 4:31
යෙරෙ 30:6
යෙරෙ 49:24
**7** යෙරෙ 4:10
යෙරෙ 20:3
**8** යෙරෙ 4:8
**9** එස්ත 4:3
යෙරෙ 25:34
එස 27:30
මීකා 1:10
**10** යෙරෙ 15:8
යෙරෙ 48:8
**11** විලා 1:2
විලා 1:16
ආමො 5:16
ලූක් 7:12
**12** එස 22:2
මලා 3:2
**13** යෙසා 30:1
යෙසා 48:4
යෙරෙ 5:23
යෙරෙ 13:10
**14** 2සාමු 19:27
හිතෝ 20:19
යෙරෙ 9:4

**15** යෙසා 1:4; **16** එස 22:20; **17** යෙරෙ 9:7; **18** එස 24:13; **19** යෙරෙ 14:19; විලා 5:22; හොෂෙ 9:17; **20** යෙසා 1:22.

යෙරෙ **6:16*** මූ.අ., “පුරාණ ගමන් මාර්ග.”

**7** යෙහෝවා දෙවි යෙරෙමියාට
මෙසේ පැවසීය. **2** “යෙහෝවා
දෙවි වන මාගේ ගෘහයේ දොරටුව
අසල සිට ඔබ මේ පණිවිඩය ප්‍රකාශ
කරන්න.[1] ‘යෙහෝවා දෙවිට නමස්-
කාර කිරීමට මේ දොරටුවලින් ඇතුල්
වන යූදා වැසියෙනි, යෙහෝවා දෙවි
පවසන දේට සවන් දෙන්න. **3** ස්වර්-
ගයේ සේනාවල අධිපතිද ඊශ්‍රායෙල්හි
දෙවිද වන යෙහෝවා මෙසේ පව-
සන්නේය. “ඔබේ ගතිපැවතුම්ද හැසි-
රීම් රටාවද වෙනස් කරගන්න. එවිට
මම ඔබට මේ දේශයේ දිගටම ජීවත්
වීමට ඉඩහරින්නෙමි.[2] **4** නමුත්,
‘යෙහෝවා දෙවිගේ මාලිගාව අපට
ආරක්ෂාවක්! යෙහෝවා දෙවිගේ මාලි-
ගාව අපට ආරක්ෂාවක්! යෙහෝවා
දෙවිගේ මාලිගාව අපට ආරක්ෂාවක්’
කියා පැවසුවද ඒ වදන් කෙරෙහි
විශ්වාසය නොතබන්න. ඒ සියල්ල
රැවටිලිකාර අදහස්ය.[3] **5** ඔබේ ගති-
පැවතුම් හා හැසිරීම් රටාව නිවැ-
රදි කරගන්න. දෙදෙනෙකු අතර ඇති
නඩුවක් විභාග කරන විට සාධාරණය
ඉටු කරන්න.[4] **6** විදේශිකයාටවත්
පියා නැති දරුවාටවත් වැන්දඹුවට-
වත් පීඩා නොකරන්න.[5] මේ දේශයේ
සිටින අහිංසකයන්ගේ ලේ වැගිරවී-
මෙන් වළකින්න.[6] ඔබ පිටට විපත්ති
නොපැමිණෙන පිණිස වෙනත් දෙ-
විවරුන්ට නමස්කාර නොකරන්න.[7]
**7** ඔබ එලෙස ක්‍රියා කළොත් ඔබට මේ
දේශයේ දිගටම ජීවත් වීමට හැකි වන්-
නේය. එසේය, ඔබේ මුතුන්මිත්තන්ට
මා දුන් මේ දේශයේ ඔබ සදහටම
ජීවත් වනු ඇත.” ’ ”[8]

**8** “රැවටිලිකාර වදන් කෙරෙහි ඔබ
විශ්වාසය තබා ඇතත් ඉන් කිසි
ප්‍රයෝජනයක් ඔබට ලැබෙන්නේ
නැත.[9] **9** ඔබ සොරකම් කරමින්,[10]
මිනී මරමින්,[11] අනාචාරයේ යෙදෙ-
මින්[12] සිටින්නහුය. දිවුරුම් දී ඔබ පව-
සන්නේ බොරුය.[13] ඔබ බාල් දෙවියාට
සුවඳ දුම් ඔප්පු කරමින්[14] කලින් නො-
දැන සිටි දෙවිවරුන්ට පවා නමස්-
කාර කරන්නහුය.[15] **10** ඔබ එවැනි
පිළිකුල්සහගත දේවල් කරන අතර-
තුර මාගේ නාමය දරන මේ ගෘහයට
පැමිණ,[1] ‘අපිට ආරක්ෂාව ලැබෙනවා’
කියා මා ඉදිරියේ පවසන්නේ කෙසේද?
**11** මාගේ නාමය දරන මේ ගෘහය[2]
ඔබ සලකන්නේ කොල්ලකාරයන්ගේ
ගුහාවක් ලෙසද?[3] ඔබ කරන සෑම දෙ-
යක්ම මට හොඳින් පෙනේ” කියා යෙ-
හෝවා දෙවි පවසන්නේය.[4]

**12** “ ‘මාගේ නාමය දැරීමට ෂීලෝ
නගරයේ[5] මා මුලින්ම තෝරාගත්
ස්ථානයට[6] යන්න. මාගේ සෙනඟ
වන ඊශ්‍රායෙල් ජාතිය කළ දුෂ්ට-
කම් නිසා මා ඒ ස්ථානයට කළ
දේ ගොස් බලන්න.[7] **13** ඔබ දිගින්
දිගටම කරන දුෂ්ට ක්‍රියා නිසා මම
නැවත නැවතත් ඔබට ඒ ගැන
කතා කළෙමි. හිමිදිරි උදෑසන සිට
ඔබට ඒ ගැන පැවසුවෙමි.[8] නමුත්
ඔබ මට ඇහුම්කන් දුන්නේ නැත.[9]
මම ඔබට දිගින් දිගටම හඬගැසු-
වෙමි. නමුත් ඔබ මට සවන් දුන්නේ
නැත.[10] මේ දේ පවසන මා යෙහෝවා
දෙවිය. **14** මම ෂීලෝ නුවරට කළ
දේම මාගේ නාමය දරන මේ ගෘහය-
ටත් කරන්නෙමි.[11] මේ ගෘහය ඔබට
ආරක්ෂාවක් වෙයි කියා ඔබ සිතුවද[12]
ෂීලෝ නුවරට සිදු වූ දේ අනිවාර්-
යයෙන්ම මෙයටත් සිදු වන්නේය.[13]
ඔබටත් ඔබේ මුතුන්මිත්තන්ටත් මා
දුන් ඒ ස්ථානය විනාශ වී යන්නේය.
**15** මම එෆ්‍රායිම්ගේ මුළු පෙළපත[14]
එසේය, ඔබේ සහෝදරයන් වූ ඔවුන්ව
පන්නා ඇමුවාක් මෙන් ඔබවද මා ඉදි-
රියෙන් පන්නා දමන්නෙමි.’[15]

**16** “ඔබ මේ සෙනඟ වෙනුවෙන්
යාච්ඤා කරන්නවත් කන්නලව්
කරන්නවත් ඔවුන් වෙනුවෙන් මැදි-
හත් වෙන්නවත් එපා.[16] ඔබ එසේ
කළත් මම ඔබට ඇහුම්කන් නො-
දෙන්නෙමි.[17] **17** යූදාහි නගරවලත්
යෙරුසලමේ මාවත්වලත් සෙනඟ
කරන දේවල් ඔබට පෙනෙන්නේ

**7 පරි.**

**1** යෙරෙ 26:2
**2** යෙරෙ 18:11 යෙරෙ 26:13
**3** මීකා 3:11
**4** යෙරෙ 21:12 යෙරෙ 22:3
**5** ද්වි 24:17 ගීතා 82:3 සෙක 7:10 මලා 3:5 යාකො 1:27
**6** ගීතා 106:38
**7** ද්වි 6:14 ද්වි 8:19 ද්වි 11:28 යෙරෙ 13:10
**8** ද්වි 4:40 යෙරෙ 3:18
**9** යෙසා 30:10 යෙරෙ 5:31 යෙරෙ 14:14
**10** යෙසා 3:14 එස 22:29 හොෂෙ 4:2 මීකා 2:2
**11** එස 33:25
**12** යෙරෙ 9:2 මලා 3:5
**13** යෙරෙ 5:2
**14** 1රාජා 18:21 2රාජා 23:5 යෙරෙ 11:13
**15** නික් 20:3 ද්වි 32:17 විනි 5:8

**2 තීරුව**

**1** 2රාජා 21:4 2ලේක 33:7 යෙරෙ 34:15 එස 20:39
**2** යෙසා 56:7
**3** මතෙ 21:13 මාක් 11:17 ලූක් 19:46
**4** යෙරෙ 23:24 හෙබ්‍රෙ 4:13
**5** යොෂු 18:1 විනි 18:31 1සාමු 1:3
**6** ද්වි 12:5 ද්වි 12:11
**7** 1සාමු 4:11 ගීතා 78:60 යෙරෙ 26:6 යෙරෙ 26:9
**8** යෙරෙ 25:4
**9** 2ලේක 36:16 නෙහෙ 9:29 යෙරෙ 11:8 යෙරෙ 25:3 සෙක 1:4
**10** යෙසා 65:12 යෙසා 66:4 සෙක 7:13
**11** 2රාජා 25:9
**12** යෙරෙ 7:4
**13** 1සාමු 4:10 ගීතා 78:60 යෙරෙ 26:6 විලා 2:7

**14** 2ලේක 25:7; ගීතා 78:67; **15** 2රාජා 17:23; **16** නික් 32:10; යෙරෙ 11:14; යෙරෙ 14:11; **17** යෙසා 1:15; යෙරෙ 15:1; මීකා 3:4.

නැද්ද?[1] **18** 'අහස් දේවතාවියට'[2]
පූජා ඔප්පු කිරීම සඳහා රොටි සෑදී-
මට මව්වරු පිටි අනති. පුත්‍රයෝ
දර අහුලති. පියවරු ගිනි අවුළති.
මාගේ සිතට වේදනාවක් ඇති කරන
බව දැන දැනත්[3] ඔවුහු වෙනත් දෙ-
විවරුන්ට පාන පූජා ඔප්පු කරති.[4]
**19** නමුත් ඇත්තටම එයින් හානියක්
සිදු වන්නේ මටද?[5] නැත. එහි ප්‍රති-
ඵල අද්දකින්නේ ඔවුන්මය. අන්තිමට
ලැජ්ජාවට පත් වන්නෙත් ඔවුන්මය.[6]
මේ දේවල් පවසන මා යෙහෝවා දෙ-
විය. **20** එබැවින් මාගේ උදහස මේ
ස්ථානය පිට වගුරුවන්නෙමි.[7] එහි
මිනිසුන්, සතුන්, ගස් කොළං[8] සහ එහි
පලදාව පිට මාගේ උදහස වගුරුවන්-
නෙමි. එය නිවා දැමීමට කිසිවෙකුට
හැකි වන්නේ නැත.[9] මේ දේ පවසන
මා විශ්වයේ පාලකයා වන යෙහෝවා
දෙවිය.

**21** "ඊශ්‍රායෙල්හි දෙවිද ස්වර්ගයේ
සේනාවල අධිපතිද වන යෙහෝවා
දෙවි වන මම මෙසේ පවසන්නෙමි.
'ඔබේ දවන පූජා සමඟ අනිකුත්
පූජාද ඔප්පු කර ඒවායේ මස් අනුභව
කරන්න.[10] **22** මම ඔබේ මුතුන්-
මිත්තන්ව ඊජිප්තු දේශයෙන් නිද-
හස් කරගෙන ආ දවසේදී දවන
පූජා හා අනිකුත් පූජා සම්බන්-
ධව කිසිවක් ඔවුන්ට අණ කළේ
නැත.[11] ඒ ගැන මම කතා කළේ-
වත් නැත. **23** නමුත් මම ඔවුන්ට
මෙම ආඥාව දුන්නෙමි. "මාගේ හඬට
කීකරු වන්න.[12] ඔබ එසේ කළොත්
මම ඔබේ දෙවි වන්නෙමි.[13] ඔබව
මාගේ සෙනඟ ලෙස පිළිගන්නෙමි.
මම ඔබට දෙන සියලු ආඥා පිළි-
පදින්න.[14] ඔබ එසේ කළොත්
ඔබේ ජීවිතය සාර්ථක වන්නේය."'[15]
**24** නමුත් ඔවුහු මා පැවසූ දේ ගණන-
කටවත් ගත්තේ නැත. මට සවන්
දුන්නේ නැත.[16] ඒ වෙනුවට ඔවුන්
ක්‍රියා කළේ ඔවුන්ගේ දුෂ්ට සිතු-
විලිවලට අනුවය. ඔවුහු මුරණ්ඩු
ලෙස හැසිරුණෝය.[17] එබැවින් ඔවුහු
ක්‍රමක්‍රමයෙන් පිරිහීමට පටන්ගත්-
තෝය.[1] **25** ඔබේ මුතුන්මිත්තන්
ඊජිප්තු දේශයෙන් පිටත්ව ආ දව-
සේ සිට අද දක්වාම සිදු වුණේ
එයයි.[2] එබැවින් හිමිදිරි උදෑසනින්ම
මාගේ සේවකයන් වන අනාගතවක්-
තෘවරුන්ව මම ඔබ වෙතට සැමදා
එව්වෙමි.[3] **26** නමුත් කිසි කෙනෙක්
මා පැවසූ දේ සැලකිල්ලට ගත්තේ
නැත. මට සවන් දුන්නේ නැත.[4]
ඔවුහු දිගින් දිගටම ඔවුන්ගේ සිත් දැඩි
කරගත්තෝය.[5] ඔවුහු තම මුතුන්-
මිත්තන්ටත් වඩා මුරණ්ඩු ලෙස හැසි-
රුණෝය.[6]

**27** "ඔබ මේ සියල්ල ඔවුන්ට පව-
සන්න.[7] නමුත් ඔවුහු ඔබට සවන්
දෙන්නේ නැත. ඔවුන්ට හඬගසන්න.
නමුත් ඔවුන්ගෙන් ඔබට පිළිතුරක්
ලැබෙන්නේ නැත.[8] **28** එවිට ඔබ
ඔවුන්ට මෙසේ පවසන්න. 'මේ දේශ-
යේ සෙනඟ ඔවුන්ගේ දෙවි වූ යෙහෝ-
වාගේ හඬට අකීකරු වුණෝය.[9] ඔහු
ඔවුන්ව නිවැරදි කළ විට ඔවුහු එය
පිළි නොගත්තෝය.[10] විශ්වාසවන්ත
කිසිවෙක් දේශයේ නැත. කිසිවෙක්
විශ්වාසවන්තකම ගැන කතා කරන්-
නේවත් නැත.'"[11]

**29** "යෙහෝවා දෙවි මේ පරම්-
පරාව ප්‍රතික්ෂේප කර ඇත.[12] ඔහු
ඔවුන් සමඟ උදහස් වී ඔවුන්ව අත්-
හැර දැමුවේය.[13] එබැවින් දිගට වවා
තිබෙන ඔබේ හිසකෙස් කපා ඉවත්
කරන්න.[14] පාළු හෙල් මත සිට
විලාප ගීයක් ගයන්න.[15] **30** යෙ-
හෝවා දෙවි මෙසේ පවසන්නේය.
'යූදා සෙනඟ මට විරුද්ධව දුෂ්ට-
කම් කර තිබේ. ඔවුහු මාගේ නාමය
දරන මේ ගෘහය තුළ පිළිකුල්ස-
හගත රූප තබා එය අපවිත්‍ර කර
ඇත.[16] **31** තම දූදරුවන්ව ගින්-
නෙන් දැවීම සඳහා[17] ඔවුහු බෙන්හින්-

**7 පරි.**

**1** එස 8:6
**2** ද්වි 4:19; ද්වි 17:3; යෙරෙ 44:17; ක්‍රියා 7:42
**3** යෙසා 3:8; යෙසා 65:3; යෙරෙ 25:7
**4** යෙසා 57:6; යෙරෙ 19:13; එස 20:28
**5** ද්වි 32:16; එස 8:17; 1කොරි 10:22
**6** යෙසා 45:16; යෙරෙ 20:11; දානි 9:7
**7** විලා 2:3
**8** එස 20:47
**9** 2රාජා 22:17; යෙරෙ 17:27
**10** යෙසා 1:11; යෙරෙ 6:20; හොෂෙ 8:13; ආමො 5:21
**11** 1සාමු 15:22; ගීතා 51:16; හොෂෙ 6:6
**12** නික් 15:26; ලෙවී 26:3; ද්වි 6:3; යෙරෙ 11:4
**13** නික් 19:5; ලෙවී 26:12
**14** විනි 2:22
**15** ද්වි 5:29
**16** නික් 32:8; නෙහෙ 9:16; ගීතා 81:11; යෙරෙ 11:8; එස 20:8
**17** ද්වි 29:19; යෙරෙ 5:23; යෙරෙ 23:17; එස 3:7; හොෂෙ 4:16; සෙක 7:12

**2 තීරුව**

**1** නෙහෙ 9:26; යෙසා 1:4; යෙරෙ 32:33
**2** ද්වි 9:7; 1සාමු 8:8; එස්රා 9:7
**3** 2රාජා 17:13; 2ලේක 36:15; නෙහෙ 9:30; යෙරෙ 25:4
**4** 2ලේක 33:10; යෙරෙ 11:8; යෙරෙ 17:23; යෙරෙ 25:3
**5** 2රාජා 17:14; නෙහෙ 9:17; හිතෝ 29:1; යෙරෙ 19:15; රෝම 2:5; රෝම 10:21
**6** යෙරෙ 16:12

**7** යෙරෙ 26:2; එස 2:7; ක්‍රියා 20:27; **8** සෙක 7:13; **9** යෙසා 1:4; යෙරෙ 5:4; ශෙප 3:2; **10** ගීතා 50:17; හිතෝ 1:7; ශෙප 3:7; **11** යෙරෙ 5:1; හොෂෙ 4:1; මීකා 7:2; **12** 2රාජා 17:20; **13** ද්වි 28:15; ද්වි 32:20; **14** යෝබ් 1:20; යෙරෙ 16:6; මීකා 1:16; **15** එස 19:1; **16** 2රාජා 21:4; 2ලේක 33:4; යෙරෙ 23:11; යෙරෙ 32:34; **17** ද්වි 12:31; 2රාජා 17:17; ගීතා 106:37; ගීතා 106:38; යෙසා 57:5; එස 16:20; එස 20:31.

නොම්* නිම්නයේ[1] පිහිටි තෝෆෙත්
නම් ස්ථානයේ පූජාසන ගොඩනැඟු-
වෝය.[2] එවැනි දෙයක් කරන ලෙස
මම ඔවුන්ට අණ කළේ නැත. එවැනි
දෙයක් කිරීමේ අදහසක්වත් මාගේ
සිතට පහළ වුණේ නැත.’[3]
**32** “එබැවින් යෙහෝවා දෙවි තව-
දුරටත් මෙසේ පවසන්නේය. ‘ඒ
ස්ථානය තෝෆෙත් කියාවත් බෙන්-
හින්නොම් නිම්නය කියාවත් හඳුන්-
වන්නේ නැති කාලයක් ඉදිරියේදී
පැමිණෙනු ඇත. ඒ වෙනුවට ඒ කාල-
යේදී එය හඳුන්වන්නේ මිනී මරන
නිම්නය කියායි.[4] තැන්පත් කිරීමට
ඉඩ නැති වන තරමටම තෝෆෙත්හි
මළ මිනී ගොඩගසනු ලබන්නේය.[5]
**33** සෙනඟගේ මළ කඳන් පක්ෂීන්ගේ
හා වනසතුන්ගේ ආහාර වන්නේය.
උන්ව බියගැන්වීමට කිසිවෙක් එහි
ඉතුරු වන්නේ නැත.[6] **34** යූදාහි
නගරවලින් හා යෙරුසලමේ වීථිවලින්
ප්‍රීති ඝෝෂාවද මනාලයාගේ හා මනා-
ලියගේ හඬද තවදුරටත් නොඇසෙනු
ඇත.[7] ඒ දේ සිදු වීමට සලස්වන්-
නේ මමය. ඒ දේශය මුළුමනින්ම පාළු
තැනක් බවට පත් වනු ඇත.’ ”[8]

**8** යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. “ඒ කාලයේදී ජනයා,
යූදාහි රජවරුන්ගේද අධිපතීන්ගේද
පූජකයන්ගේද අනාගතවක්තෘවරුන්-
ගේද යෙරුසලමේ වැසියන්ගේද ඇට-
කටු ඔවුන්ගේ සොහොන් ගෙවල්වලින්
එළියට ඇද දමන්නෝය.[9] **2** ඔවුහු
ඒ ඇටකටු යෙරුසලමේ වැසියන් ප්‍රිය
කළ, නමස්කාර කළ, පිහිට පැතූ,
වැඳ වැටුණු,[10] ඉර හා සඳ ඇතුළු
සියලු ආකාශ වස්තූන් ඉදිරියේ අතුරා
තබන්නෝය.[11] කිසිවෙක් ඒවා එකතු
කරන්නේවත් නැවත ඒවා තැන්පත්
කරන්නේවත් නැත. ඒවා පොළොව
මතුපිටම කුණු වී පොහොර වී යන්-
නේය.”[12]
**3** ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. “මේ නපුරු පරම්පරාවෙන්
ඉතුරු වන අයව මම සීසීකඩ විසුරු-
වාහරින්නෙමි.[1] එසේ විසිරී සිටින අය
ජීවත් වීමට වඩා මරණයට ඇලුම්
කරනු ඇත.”[2]
**4** “ඔබ ඔවුන්ට මේ දේද කියන්න.
‘යෙහෝවා දෙවි මෙසේ පවසන්නේය.
“යමෙක් වැටුණොත් ඔහු නැඟිටින්නේ
නැද්ද?[3] වැරදි මඟේ ගිය කෙනෙක්
හැරී යහමඟෙහි ගියොත් තවත් කෙ-
නෙකු තමන් කිරීමට අදහස් කළ දේ
වෙනස් කරන්නේ නැද්ද?[4] **5** නමුත්
යෙරුසලමේ සෙනඟ දිගටම මට
විරුද්ධව කැරලිගසන්නෝය. මා ඉදි-
රියේ වංචාසහගතව ක්‍රියා කරන්-
නෝය.[5] තම වැරදි ක්‍රියා අත්හැරීමට
ඔවුහු කිසිසේත් කැමති නැත.[6]
**6** මම ඔවුන්ට හොඳින් ඇහුම්කන්
දුනිමි.[7] ඔවුන් කියන දේ අසාගෙන
සිටියෙමි.[8] ඔවුන් දිගින් දිගටම කතා
කළේ නපුරු දේමය. ‘මම මොන-
වාද මේ කළේ’ කියා පවසමින් තමන්
කළ වැරදි ගැන කිසිවෙක් පසුතැ-
විලි වුණේ නැත.[9] යුද්ධයකට වේග-
යෙන් දිව යන අශ්වයන් මෙන් ඔවුහුද
වැඩිදෙනා ගමන් කරන මඟට ඇදී
යන්නෝය.[10] **7** තමන් සංක්‍රමණය
කළ යුත්තේ කුමන කාලයේද කියා
මානකොකා හරියටම දනී.[11] කො-
බෙයියා,[12] තුරිතයා හා කොණ්ඩයාට
පවා ඒ කාලය ගැන හොඳ අවබෝධ-
යක් තිබේ. නමුත් යෙහෝවා දෙවි
වන මා ළඟදීම විනිශ්චයක් ගෙනෙන
බව මාගේ සෙනඟ තවම තේරුම්-
ගෙන නැත.” ’ ”[13]
**8** “ ‘ “අපි ඥානවන්ත සෙනඟක්.
යෙහෝවා දෙවිගේ නීතිය තිබෙන්නේ
අප ළඟයි” කියා ඔබ කියන්නේ කෙ-
සේද?[14] ලියන්නන්ගේ පන්හිඳෙන්[15]
ලියවුණු බොරු නිසා සෙනඟ මුළාව
ගොසින්ය. **9** ඥානවන්තයෝ ලැජ්-
ජාවට පත් වී[16] බියෙන් වෙවුලති.
ඔවුහු උගුලකට හසු වන්නාක් මෙන්
තමන් කළ දේවල ප්‍රතිඵල නියත

**7 පරි.**
**1** යොෂු 15:8
2ලේක 28:3
යෙරෙ 19:2
**2** 2රාජා 23:10
2ලේක 33:6
යෙරෙ 19:6
**3** ලෙවී 18:21
ලෙවී 20:3
ද්වි 17:3
යෙරෙ 19:5
යෙරෙ 32:35
**4** යෙරෙ 19:6
**5** 2රාජා 23:10
යෙරෙ 19:11
එස 6:5
**6** ද්වි 28:26
ගීතා 79:2
යෙරෙ 12:9
යෙරෙ 16:4
යෙරෙ 34:20
**7** යෙසා 24:8
යෙරෙ 16:9
යෙරෙ 25:10
එස 26:13
හොෂෙ 2:11
**8** ලෙවී 26:33
යෙසා 1:7
යෙසා 3:26
යෙසා 6:11

**8 පරි.**
**9** 2රාජා 23:16
2ලේක 34:5
එස 6:5
**10** 2රාජා 23:5
2ලේක 33:3
එස 8:16
ක්‍රියා 7:42
**11** ද්වි 4:19
ද්වි 17:3
2රාජා 17:16
2රාජා 21:3
යෙරෙ 7:9
යෙරෙ 19:13
ශෙප 1:5
**12** 2රාජා 9:37
ගීතා 83:10
යෙරෙ 9:22
යෙරෙ 16:4
යෙරෙ 25:33

**2 තීරුව**
**1** ද්වි 30:1
යෙරෙ 29:14
දානි 9:7
**2** යෝබ් 3:21
එළි 9:6
**3** හිතෝ 24:16
මීකා 7:8
**4** හොෂෙ 6:1
**5** ගීතා 119:118
යෙරෙ 9:6
**6** යෙසා 1:20
යෙරෙ 5:3
**7** නෙහෙ 9:28
**8** ගීතා 14:2
මලා 3:16
**9** යෙරෙ 5:1
2පේතෘ 3:9
**10** 2රාජා 17:15

**11** යෙසා 1:3; **12** සල 2:12; **13** යෙරෙ 5:4; **14** හොෂෙ 8:12; රෝම 2:17; **15** යෙසා 8:1; **16** යෙසා 29:14.

යෙරෙ **7:31*** එනම්, හින්නොම් පුත්‍රයාගේ.

වශයෙන්ම අද්දකිනු ඇත. ඔවුහු යෙ-
හෝවා දෙවිගේ මඟ පෙන්වීම්
නොසලකාහැරියෝය. එබැවින් ඔවුන්
තුළ කිසි ප්‍රඥාවක් තිබිය හැකිද?[1]
**10** මම ඔවුන්ගේ භාර්යාවන්ව වෙනත්
මිනිසුන් අතට භාර දෙන්නෙමි. ඔවුන්-
ගේ ඉඩකඩම් අන් අයට අයිති කර
දෙන්නෙමි.[2] මා එසේ කරන්නේ ඔවුන්
අතරේ සිටින ලොකු කුඩා සැම කෙ-
නෙක්ම අයුතු ලෙස වාසි ප්‍රයෝජන
ලබාගන්නා නිසාය.[3] අනාගතවක්තෘ-
වරුන් හා පූජකයන් පවා සෙනඟව
නොමඟ යවන නිසාය.[4] **11** තුවාල-
යකට මතුපිටින් පමණක් බෙහෙත්
දමන්නාක් මෙන් සාමය නැති විටදී
පවා, 'දැන් සාමය පැමිණ ඇත! සාමය
පැමිණ ඇත'[5] කියා මාගේ සෙනඟව
බොරුවට සැනසවීමට ඔවුහු උත්සාහ
කරති.[6] **12** ඔවුන් කරන මේ පිළි-
කුල්සහගත ක්‍රියා ගැන ඔවුන්ට කිසි
ලැජ්ජාවක් ඇති වීද?[7] නැත. ඔවුන්ට
ඒ ගැන කිසිම ලැජ්ජාවක් නොදැ-
නෙයි. ලැජ්ජාව කියන්නේ කුමක්ද
කියාවත් ඔවුහු නොදනිති.[8]

" 'එබැවින් මැරී වැටෙන අය අතරේ
ඔවුහුද සිටිනු ඇත. ඔවුන් කළ දේව-
ලට මා දඬුවම් කරන දවසේදී[9] ඔවුන්-
ගේ වැටීම සිදු වන බව යෙහෝවා
දෙවි වන මම පවසන්නෙමි.' "[10]

**13** "යෙහෝවා දෙවි මෙසේද පව-
සන්නේය. 'අස්වැන්න නෙළන කාල-
යේදී මම ඔවුන්ව විනාශ කර
දමන්නෙමි.[11] ඒ කාලයේදී මිදිවැලේ
පලදාවවත්[12] අත්තික්කා ගසේ අත්-
තික්කා ගෙඩිවත් නොතිබෙයි. අතු
ඉති සියල්ල වියළී යයි. මා ඔවුන්ට
දුන් සියල්ල ඔවුන්ට අහිමි වෙයි.' "

**14** "අපි මෙතැනට වී නිකඬව වාඩි
වී සිටින්නේ කුමකටද? අපි එකට
එකතු වී ආරක්ෂාව තර කර තිබෙන
නුවරවලට ඇතුල් වී[13] එහිදී මිය
යමු. අපි යෙහෝවා දෙවිට විරුද්-
ධව පව් කළ නිසා ඔහු අපට විෂ
මිශ්‍ර වතුර බීමට දුන්නේය.[14] අපේ
දෙවි යෙහෝවා අප පිටට විනාශ-
යක් ගෙනෙන්න තීරණය කර ඇත.[15]

**8 පරි.**
**1** ද්වි 4:6
ගීතා 19:7
2තිමෝ 3:15
**2** ද්වි 28:30
යෙරෙ 6:12
ආමො 5:11
ශෙප 1:13
**3** යෙසා 56:11
යෙරෙ 6:13
එස 33:31
මීකා 3:11
තීත 1:11
**4** යෙරෙ 5:31
යෙරෙ 27:9
විලා 2:14
විලා 4:13
එස 22:28
**5** යෙරෙ 23:17
එස 13:10
**6** යෝබ් 13:4
යෙරෙ 6:14
**7** යෙරෙ 6:15
**8** යෙරෙ 3:3
පිලි 3:19
**9** යෙසා 10:3
යෙරෙ 23:12
**10** ද්වි 32:35
**11** එස 22:20
**12** යෙසා 24:7
යෝවෙ 1:7
**13** යෙරෙ 4:5
**14** යෙරෙ 9:15
යෙරෙ 23:15
විලා 3:19
**15** විලා 3:28

**2 තීරුව**
**1** යෙරෙ 4:10
යෙරෙ 14:19
මීකා 1:12
**2** යෙරෙ 4:15
**3** විනි 18:29
1රාජා 15:20
**4** විනි 5:22
යෙරෙ 47:3
**5** ගීතා 58:5
දේශ 10:11
**6** ද්වි 32:24
**7** යෙරෙ 10:19
**8** ගීතා 135:21
යෙසා 12:6
**9** ගීතා 146:10
ගීතා 149:2
යෙසා 33:22
**10** යෙසා 39:3
**11** ද්වි 32:21
**12** යෙසා 30:15
යෙරෙ 4:14
**13** යෙසා 1:5
යෙරෙ 6:14
යෙරෙ 30:15
විලා 3:47
**14** යෙරෙ 4:19
යෙරෙ 14:17
**15** යෝවෙ 2:6
නාහු 2:10
**16** උත් 37:25
උත් 43:11
යෙරෙ 46:11
**17** යෙරෙ 30:13

**15** සාමය ඇති වෙයි කියා අප බලා-
පොරොත්තුවෙන් සිටියත් එයින් කිසි
පලක් වූයේ නැත.[1] අප සහනයක්
ලැබීමට ආශාවෙන් සිටියත් සිදු වූයේ
ඉතා භයානක දෙයකි.[2] **16** ඔහුගේ
අශ්වයන්ගේ ශබ්දය දාන් දෙසින්[3]
ඇසෙන්නේය. උන්ගේ හේෂාව නිසා
මුළු දේශයම දෙදරුම් කන්නේය.[4]
සතුරෝ ඇවිත් මුළු දේශයම විනාශ
කරන්නෝය. නගරයත් එහි වැසියන්-
වත් විනාශ කර දමන්නෝය."

**17** යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. "කිසිම ආකාරයකින් මෙල්ල
කළ නොහැකි[5] විෂඝෝර සර්පයන්ව
මම ඔබ අතරට එවන්නෙමි.[6] උන්
ඔබට දෂ්ට කරනු ඇත."

**18** සනසන්න බැරි තරමටම[7]
මාගේ සිත ශෝකයෙන් පිරී ඇත.
**19** "යෙහෝවා දෙවි සියොන් නගරය
අත්හැර ගොස් ඇද්ද?[8] ඇගේ රජ්ජුරු-
වෝ දැන් එහි නැද්ද"[9] කියා පවසමින්
මාගේ සෙනඟ ඈත දේශයක සිට උප-
කාරය ඉල්ලා මොරගසන හඬ මට
ඇසෙයි.[10]

"රූපවලටත් කිසි කමකට නැති
වෙනත් දෙවිවරුන්ටත් නමස්කාර
කර ඔවුන් මාව උදහස් කළේ ඇයි?"[11]

**20** "අස්වැන්න නෙළන කාලය
ගෙවී ගොස් ඇත. ගිම්හානයද අවසන්
වී ගියේය. නමුත් අපට තවමත් ගැල-
වීම ලැබී නැත."[12]

**21** මාගේ සෙනඟගේ වැටීම[13] දුටු
විට මට මහත් වේදනාවක් ඇතිණ.[14]
මම බොහෝ සෙයින් ශෝක වුණෙමි.
එමෙන්ම මම පුදුමයට පත් වුණෙමි.[15]
**22** ගිලියද් දේශයේ බෝල්සම් නෙ-
ලය නැද්ද?[16] එහි සුව කරන කිසිවෙකු
නැද්ද?[17] එසේනම් මාගේ සෙනඟ
තවමත් සුවයක්[18] ලබා නැත්තේ
ඇයි?[19]

**9** මගේ ඇස් දෙක කඳුළු උල්පතක්
වී නම්[20] මගේ හිස දිය පොකු-
ණක් වී නම් මැරුම් කෑ මාගේ සෙනඟ

---

**18** යෙසා 58:8; යෙරෙ 30:17; යෙරෙ 33:6; **19** යෙරෙ 30:12; **9 පරි.** **20** යෙසා 22:4; යෙරෙ 13:17; විලා 2:11.

වෙනුවෙන් දිවා රෑ දෙකේ මට හඬා
වැලපීමට තිබිණ.[1]
**2** අනේ, මට පාළුකරයේ නවා-
තැනක් තිබුණා නම්![2] අනාචාරයේ*
යෙදෙන,[3] ද්‍රෝහිකම් කරන[4] මගේ සෙ-
නඟව අත්හැර මට එතැනට දිව යෑමට
තිබිණ. **3** බොරු කීමට ඔවුහු තම
දිව දුන්නක් මෙන් නවාගනිති.[5] ඔවුහු
විශ්වාසවන්ත අය ලෙස දේශයේ හොඳ
නමක් දිනාගෙන නැත.

යෙහෝවා දෙවි මෙසේ පවසයි.
“ඔවුහු නපුරුකමේ අඩියටම බැස
සිටිති. ඔවුහු මා ගැනවත් කිසිදු තැකී-
මක් කළේ නැත.”[6]

**4** “ඔබේ මිතුරාගෙන් පරෙස්සම්
වෙන්න.[7] ඔබේ සහෝදරයාවවත් විශ්-
වාස නොකරන්න.[8] ඔබේම සහෝදර-
යෝ පවා ඔබට හිමි දේ ලබාගැනීමට
ඔබව මුළා කරති.[9] ඔබේ මිතුරෝ
ඔබට අපහාස කරමින් සෑම තැනම
ඇවිදිති.[10] **5** ඔවුහු එකිනෙකා තම
තමාගේ මිතුරාව රවටති.[11] ඔවුන්-
ගේ කටින් එක සත්‍ය වචනයක්වත්
පිට නොවෙයි. ඔවුන්ගේ දිව පුරුදු වී
තිබෙන්නේ බොරු කීමටමය.[12] ඔවුන්
හෙම්බත් වන තුරුම කරන්නේ නපුරු
දේවල්මය.[13]

**6** යෙහෝවා දෙවි මෙසේ පව-
සයි. “ඔබ ජීවත් වන්නේ වංචාකරු-
වන් අතරෙයි.[14] ඔවුන්ගේ කපටිකම
නිසා මාව දැන හඳුනා ගැනීමට ඔවුහු
කැමති නැත.”[15]

**7** එබැවින් ස්වර්ගයේ සේනාවල
අධිපති වන යෙහෝවා දෙවි තවදු-
රටත් මෙසේ කීවේය. “මම ඔවුන්ව
ලෝහ මෙන් උණු කර ඔවුන්ගේ තත්-
වය පරීක්ෂා කර බලන්නෙමි.[16] එසේ
නොකර මාගේ සෙනඟට මා වෙන
මොනවා කරන්නද?[17] **8** ඔවුන්ගේ
දිව මාරාන්තික ඊතල මෙනි.[18] ඔවුන්
කතා කරන්නේ වංචනික දේවල්මය.
ඔවුහු තම මිත්‍රයා සමඟ සමාදාන-
යෙන් කතා කළත් රහසින් ඔහුට
උගුල් අටවති.”[19]

**9 පරි.**
**1** යෙරෙ 6:26
**2** ගීතා 55:7
**3** යෙරෙ 5:7; යෙරෙ 23:10; හොෂෙ 7:4
**4** යෙරෙ 12:1; හොෂෙ 5:7; හොෂෙ 6:7; මලා 2:11
**5** ගීතා 64:3; යෙසා 59:3; රෝම 3:13
**6** යෙරෙ 4:22; රෝම 1:28
**7** යෙරෙ 12:6; මීකා 7:2
**8** මීකා 7:5
**9** උත් 27:36
**10** ලෙවී 19:16; 2සාමු 19:27; ගීතා 15:3; හිතෝ 20:19; යෙරෙ 6:28; එස 22:9
**11** උත් 31:7; යෝබ් 11:3
**12** ගීතා 50:19; මීකා 6:12
**13** එස 24:12
**14** යෙරෙ 18:18
**15** හිතෝ 1:24; හොෂෙ 4:6; රෝම 1:28; 1කොරි 15:34
**16** ගීතා 66:10; යෙසා 1:25; යෙසා 48:10; මලා 3:3
**17** 2ලේක 36:15
**18** ගීතා 12:2; ගීතා 120:3
**19** 2සාමු 3:27; 2සාමු 20:10; ගීතා 28:3

**2 තීරුව**
**1** යෙරෙ 5:9
**2** යෙරෙ 7:29
**3** යෙරෙ 12:4; යෙරෙ 23:10
**4** එස 14:15
**5** යෙරෙ 4:25; හොෂෙ 4:3; ශෙප 1:3
**6** ගීතා 79:1; යෙසා 25:2; යෙරෙ 26:18
**7** යෙසා 13:22; යෙරෙ 10:22
**8** යෙරෙ 4:27; යෙරෙ 25:11; යෙරෙ 32:43
**9** යෙසා 42:23; හොෂෙ 14:9
**10** ද්වි 29:24
**11** ගීතා 89:30
**12** යෙරෙ 3:17; යෙරෙ 7:24
**13** යෙරෙ 44:17

**9** යෙහෝවා දෙවි මෙසේ පව-
සයි. “ඔවුන් කරන මේ අපරාධ-
වලට ඔවුන් අනිවාර්යයෙන්ම මට
ගණන් දිය යුතුයි. එයින් මා ඔවුන්ව
නිදහස් කරන්නේ කෙසේද? මෙලෙස
හැසිරෙන ජාතියකට මා දඬුවම් නො-
කර සිටින්නේ කෙසේද?[1] **10** මම
කඳු ගැන හඬා වැලපෙන්නෙමි.[2]
පාළුකරයක් බවට පත් වන තණ-
බිම් ගැනත් විලාප ගීයක් ගයන්-
නෙමි. දේශය ගින්නෙන් දැවී
පාළුවට යන බැවින්[3] කිසි මනුෂ්‍ය-
යෙකු ඒ හරහා යන්නේවත් එළුවන්ගේ
හෝ බැටළුවන්ගේ හඬක් ඒ දෙ-
සින් ඇසෙන්නේවත් නැත.[4] කුරුල්-
ලෝද වනසත්වයෝද දේශය අත්හැර
පලා යන්නෝය.[5] **11** මම යෙරුස-
ලම නටබුන් ගොඩක් බවටද[6] හිව-
ලුන් ලගින තැනක් බවටද[7] පත්
කරන්නෙමි. මම යූදාහි නගර සියල්ල
කිසි මිනිසෙකු වාසය නොකරන පාළු
තැනක් බවට පත් කරන්නෙමි.[8]

**12** “මේ දේවල් තේරුම්ගැනීමට
තරම් ප්‍රඥාවක් තිබෙන කෙනෙක්
සිටීද? අන් අයට පවසන පිණිස යෙ-
හෝවා දෙවි මේ දේවල් ප්‍රකාශ කළේ
කාටද?[9] මේ දේශය විනාශ විය යුත්-
තේ ඇයි? කිසිවෙකු ගමන් නොකරන,
පාළුකරයක් මෙන් මේ දේශය ගින්-
නෙන් දැවී පාළුවට යා යුත්තේ ඇයි?”[10]

**13** යෙහෝවා දෙවි මෙසේ පවසයි.
“මා ඔවුන්ට දුන් නීතිය ඔවුහු පිළි-
පැද්දේ නැත. මාගේ හඬට ඇහුම්-
කන් දී මා පෙන්වූ මාර්ගයේ ගමන්
කරනවා වෙනුවට[11] **14** තම තමන්
කැමති මාර්ගයේ ගමන් කරමින් ඔවුහු
මුරණ්ඩු ලෙස ක්‍රියා කළෝය.[12] ඔවුන්-
ගේ මුතුන්මිත්තන් ඉගැන්වූ ලෙස[13]
ඔවුහු බාල් දෙවිවරුන්ට නමස්කාර
කළෝය.[14] **15** එබැවින් ස්වර්ගයේ
සේනාවල අධිපතිද ඊශ්‍රායෙල්හි දෙ-
විඳ වන යෙහෝවා වන මම මෙසේ
පවසමි. ‘මම මේ සෙනඟට තිත්ත
දේ කන්න දෙමි.[15] බීමට විෂ මිශ්‍ර

යෙරෙ **9:2*** මූ.අ., “පරදාර සේවනයේ.”

**14** විනි 3:7; 1සාමු 12:10; හොෂෙ 11:2; **15** යෙරෙ 23:15; විලා 3:15.

වතුර දෙමි.[1] 16 ඔවුන්වත් ඔවුන්-
ගේ මුතුන්මිත්තන්වත් නොදැන සිටි
ජාතීන් අතරට මම ඔවුන්ව විසුරුවා-
හරින්නෙමි.[2] ඔවුන් සම්පූර්ණයෙන්ම
විනාශ වී යන තුරු ඔවුන්ට කඩුවෙන්
පහර කෑමට මම ඉඩහරින්නෙමි.'[3]
17 "මේ දේවල් තේරුම්ගෙන,
විලාප ගී ගයන ස්ත්‍රීන්වද[4] කුලි-
යට හඬන අයවද[5] කැඳවන ලෙස
ස්වර්ගයේ සේනාවල අධිපති වන
යෙහෝවා දෙවි අපට අණ කළේය.
18 අප වෙනුවෙන් විලාප නැඟීමට
ඔවුන්ට ඉක්මනින් එන්න කියන්න.
අපේ ඇස්වලින් කඳුළු ගංගා ගලා
ඒවා![6] 19 "අපි විනාශ වී ගිය හැටි
බලන්න![7] අප මොන තරම් ලැජ්ජා-
වට පත් වුණාද! උන්හිටි තැන්
අපට අහිමි වී ඇත. අපේ දේශයෙන්
අපට යන්න සිදු වී ඇත"[8] කියා විලාප
නඟන හඬක් සියොන් නුවරින් නික්-
මුණේය.[9] 20 ස්ත්‍රියෙනි, යෙහෝවා
දෙවිගේ වදන්වලට හොඳින් ඇහුම්-
කන් දෙන්න. ඔබේ දූවරුන්ට විලාප
ගීයක් උගන්වන්න.[10] සෑම ස්ත්‍රියක්ම
ඇගේ මිතුරියට දුක්මුසු කවියක් කියා
දෙන්න.[11] 21 මරණය අපේ කවුළුව-
ලින් එබිකම් කරයි. වීථිවල සිටින
ළමුන්වද මංසන්ධිවල සිටින තරුණ-
යන්වද විනාශ කර දමන පිණිස එය
අපේ බලකොටු තුළට ඇවිත් සිටියි."[12]
22 "මේ ගැන දන්වන්න. 'යෙ-
හෝවා දෙවි වන මා පවසන්නේ මෙ-
යයි. "මිනිසුන්ගේ මළ කඳන් භූමිය
මතුපිට කසළ මෙන්ද අස්වැන්න නෙ-
ළාගන්නා බිම දිගේ අතුරා තබන
ධාන්‍ය මිටි මෙන්ද විසුරුවා තිබෙනවා
දක්නට ලැබෙයි. ඒවා එකතු කිරීමට
කිසිවෙක් නොසිටිනු ඇත." ' "[13]
23 යෙහෝවා දෙවි මෙසේ පවසයි.
"ප්‍රඥාවන්තයා තම ප්‍රඥාව ගැන පුර-
සාරම් දෙඩීමෙන් වැළකිය යුතුයි.[14]
බලවන්තයාද තමාගේ බලවත්කම
ගැන පුරසාරම් දෙඩීම නතර කළ
යුතුයි.[15] ධනවතාත් තමාගේ ධන
සම්පත් ගැන පුරසාරම් දෙඩීමෙන්
වැළකී සිටිය යුතුයි."[16]

**9 පරි.**
1 යෙරෙ 8:14; විලා 3:19
2 ලෙවී 26:33; ද්වි 28:64; නෙහෙ 1:8; ගීතා 106:27; සෙක 7:14
3 යෙරෙ 29:17; එස 5:2
4 2ලේක 35:25
5 දේශ 12:5; ආමො 5:16
6 යෙරෙ 6:26; යෙරෙ 14:17
7 ද්වි 28:29; යෙරෙ 4:13
8 ලෙවී 18:28; ලෙවී 20:22; විලා 4:15; මීකා 2:10
9 යෙරෙ 4:31; එස 7:16; මීකා 1:8
10 1සාමු 7:2; යෙසා 29:2; මීකා 2:4
11 2සාමු 1:17; යෙරෙ 7:29
12 2ලේක 36:17; යෙරෙ 6:11
13 ගීතා 83:10; යෙසා 5:25; යෙරෙ 8:2; යෙරෙ 16:4
14 ගීතා 49:10; හිතෝ 3:5; දේශ 9:11; යෙසා 5:21
15 ද්වි 8:17; ගීතා 33:16; ආනි 4:30; 1කොරි 3:21
16 ද්වි 8:14; ගීතා 49:6; හිතෝ 11:4; හිතෝ 18:11; ලූක් 12:15; 1තිමෝ 6:17

**2 තීරුව**
1 ගීතා 91:14; යොහ 17:3; 1කොරි 1:31
2 2කොරි 10:17
3 ගීතා 99:4; හොෂෙ 6:6; මීකා 6:8; මීකා 7:18
4 නික් 34:6; නෙහෙ 1:5; නෙහෙ 9:17; ගීතා 51:1; ගීතා 89:14
5 ආමො 3:2; ක්‍රියා 7:51; රෝම 2:25
6 යෙසා 19:1; එස 29:2
7 යෙසා 1:1

24 යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. "කෙනෙක් මහත් සතුටකින්
කතා කළ යුත්තේ තමා කොතරම්
හොඳින් යෙහෝවා දෙවි වන මාව
දැන හඳුනා ගෙන සිටිනවාද යන්න[1]
ගැනයි. මා ගැන තමාට තිබෙන
ගැඹුරු අවබෝධය ගැනත්[2] ඔහුට
කතා කළ හැක. පොළොවේ ජීවත්
වන වැසියන්ට ප්‍රේමය* පෙන්වීමෙන්ද
යුක්තිය ඉටු කිරීමෙන් හා ධර්මිෂ්ඨ-
කම පැවැත්වීමෙන්ද මා ඉමහත් සතු-
ටක් ලබන[3] දෙවි කෙනෙක් බව ඔහු
දැන සිටීම ගැනත්[4] ඔහුට ආඩම්බර-
යෙන් කතා කළ හැක."
25 යෙහෝවා දෙවි මෙසේද පව-
සන්නේය. "චර්මච්ඡේදනය වූ නමුත්
අචර්මච්ඡේදිතයන් ලෙස හැසිරෙන
අයව මම විනිශ්චය කරන කාලය
ළඟදීම පැමිණෙන බව දැනගන්න.[5]
26 ඊජිප්තුවේ වැසියන්ව,[6] යූදා වැසි-
යන්ව,[7] ඒදොම් වැසියන්ව,[8] මෝවබ්
වැසියන්ව[9] හා අම්මොන්වරුන්ව[10]
මම විනිශ්චය කරමි. පාළුකරයේ වෙ-
සෙන, කම්මුල් දෙපස පිහිටි කෙස්
කපා ඇති අයවත්[11] මම විනිශ්චය
කරමි. මා මෙසේ විනිශ්චය කරන්නේ
චර්මච්ඡේදනය නොවූ සියලු ජාතීන්ව
සහ තම සිත් පවිත්‍ර කර නොගත්*[12]
මුළු ඊශ්‍රායෙල් සෙනඟවය."

**10** ඊශ්‍රායෙල් ජනයෙනි, යෙ-
හෝවා දෙවි ඔබට විරුද්-
ධව පවසන මේ දේට සවන් දෙන්න.
2 යෙහෝවා දෙවි මෙසේ පවසයි.
"වෙනත් ජාතීන් ක්‍රියා කරන ආකාරය
ඔබ අනුගමනය නොකරන්න.[13] අහ-
සේ ලකුණු දැක ඔවුන් කැලඹුණත්[14]
ඔබ ඒවා දැක නොකැලඹෙන්න.
3 ජාතීන්ගේ සිරිත් විරිත්වල[15] කිසිම
හරයක් නැත. කැටයම්කරුවෙක්

**8** යෙරෙ 27:3; එස 32:29; ඔබ 1; **9** යෙසා 15:1; යෙරෙ 48:1; **10** යෙරෙ 49:1; එස 25:2; **11** යෙරෙ 25:23; යෙරෙ 49:32; **12** ලෙවී 26:41; ද්වි 30:6; යෙරෙ 4:4; රෝම 2:29; **10 පරි.** **13** ලෙවී 18:3; ලෙවී 20:23; ද්වි 12:30; **14** යෙසා 47:13; **15** ලෙවී 18:30.

යෙරෙ **9:24*** හෝ, "ලැදි ප්‍රේමය." **26*** මූ.අ., "සිත් චර්මච්ඡේදනය කර නොගත්."

වනාන්තරයෙන් ගසක් කපාගෙන[1]
එයින් රූප නෙළයි.[2] **4** ඒ රූපවලට
රන් හා රිදී ආලේප කර ඒවා අලංකාර
කරයි.[3] ඉන්පසු මිටියෙන් ඇණ ගසා
ඒවා නොසෙල්වෙන සේ සවි කරයි.[4]
**5** ඒ රූප, පිපිඤ්ඤා වත්තක සිටුවා
තිබෙන කතා කිරීමට බැරි පඹ-
යන් මෙනි.[5] ඒවාට ඇවිදීමට නොහැකි
නිසා ඒවා උසුලාගෙන යා යුතුයි.[6]
ඒවාට භය නොවන්න. මන්ද ඔබට
අනතුරක් කිරීමට ඒවාට නොහැක.
ඔබට යහපතක් කිරීමටවත් ඒවාට
හැකියාවක් නැත."[7]

**6** යෙහෝවා දෙවියනි, ඔබට
සමාන කිසිවෙක් නැත.[8] බලවත්ම
දෙවි ඔබය. ඔබේ නාමය ඉතා ශ්‍රේෂ්-
ඨය.[9] **7** සියලු ජාතීන්ගේ රජ්ජුරු-
වනි,[10] ඔබට ගරුබිය නොදක්වන්නේ
කවුද?[11] සෑම කෙනෙකුම ඔබට ගරු-
බිය දැක්වීම සුදුසුය. මන්ද ජාතීන්
අතරේ ප්‍රඥාවන්තයන් සිටියත් රජ-
වරුන් සිටියත් ඒ කිසිවෙකු කිසි
ලෙසකින් ඔබට සම කළ නො-
හැක.[12] **8** ඔවුහු සියලුදෙනා අඥා-
නයෝය. මෝඩයෝය.[13] ඔවුන්ගේ ලී
රූප නිසා ඔවුහු නිෂ්ඵල දේ කිරීමට
පෙලඹෙන්නෝය.[14] **9** තර්ෂිෂ්හි සිට
ගෙනා රිදී තහඩුවලින්ද[15] උෆාස්හි
සිට ගෙනා රන්වලින්ද[16] ලෝහකරු-
වෝ සහ කැටයම්කරුවෝ ඒ රූප
සාදති. ඉන්පසු ඒවාට නිල් පැහැති
නූල් හා රත්නිල් පැහැගැන්වූ ලොම්ව-
ලින් සාදාගත් ඇඳුම් පළඳවති. මෙසේ
දක්ෂ ශිල්පීහු ඒ රූප සාදති.[17]

**10** නමුත් එකම සැබෑ දෙවි යෙ-
හෝවාය.[18] ජීවමාන දෙවිත් ඔහුය.[19]
සදාකාලයෙන් සදාකාලයටම රජුද
ඔහුය.[20] ඔහු උදහස් වූ විට මුළු පො-
ළොවම දෙදරුම් කන්නේය.[21] ඔහු
තම උදහස වගුරුවන විට කිසි ජාති-
යකට එය දරාගැනීමට නොහැකි වන්-
නේය.[22] **11** සෙනඟෙනි, ඒ ජාතීන්ට
මෙසේ පවසන්න. "අහසත් පොළො-
වත් නොසෑදූ දෙවිවරු[23] මේ පොළො-
වෙන් තුරන් වී යනු ඇත.[24] එසේය,
අහස්තලය යටින් ඔවුහු සම්පූර්ණ-
යෙන්ම තුරන් වී යනු ඇත." **12** දෙවි
තම බලයෙන් මේ පොළොව සෑදු-
වේය.[1] තම ප්‍රඥාවෙන් එය ස්ථිර
ලෙස පිහිටෙව්වේය.[2] ඔහු තම නුව-
ණින් අහස්තලය ඇතිරිල්ලක් මෙන්
දිගහැරියේය.[3] **13** ඔහුගේ හඬට අහ-
සේ ජලය ගිගුරුම් දෙයි.[4] ඔහු පො-
ළොවේ සතර දිගින් ජලය වාෂ්ප වී
ඉහළට නැඟීමට සැලැස්වූවේය.[5] වැසි
වස්සවන පිණිස ඔහු අහසේ කවුළු
සෑදුවේය.[6] ඔහු තම ගබඩාවෙන් සුළං
පිටතට ගෙනෙන්නේය.[7]

**14** නමුත් මේවා තේරුම්ගැනීමට
බැරි තරමටම මනුෂ්‍යයන් අඥාන
ලෙස කටයුතු කර තිබේ.[8] තමන්
සෑදූ රූප නිසා ලෝහකරුවන් සිය-
ලුදෙනාම ලැජ්ජාවට පත් වන බව
නියතයි.[9] ඔවුන් සාදාගෙන තිබෙන
රූපවලට කිසිම ජීවයක් නැත.[10]
ඒ සියල්ල පුහු දේවල්ය.[11] **15** ඒවා
නිෂ්ඵලය. ඒවා නිසා අත් වන්නේ
නින්දාව පමණි.[12] නියමිත කාලය
පැමිණි විට ඒවා සියල්ල විනාශ කරනු
ලැබේ.[13]

**16** නමුත් යාකොබ්ගේ දෙවි[14] ඒ
රූපවලට වඩා බොහෝ සෙයින් වෙ-
නස්ය. සෑම දෙයක්ම සෑදුවේ ඔහුය.[15]
ඔහුගේ උරුමයේ වටිනාම කොටස
ඊශ්‍රායෙල් සෙනඟය.[16] ස්වර්ගයේ සේ-
නාවල අධිපති වන යෙහෝවා යන
නාමයෙන් ඔහුව හඳුන්වයි.[17]

**17** විපත්තියකට හසු වී සිටින
තැනැත්තිය,[18] ඔබේ බඩු මල්ල
රැගෙන සූදානම් වන්න.[19] **18** යෙ-
හෝවා දෙවි මෙසේ පවසයි. "මම

**10 පරි.**

**1** යෙසා 40:20
**2** යෙසා 44:14 යෙසා 45:20 හබ 2:18
**3** ගීතා 115:4 ගීතා 135:15 යෙසා 40:19 හොෂෙ 13:2
**4** යෙසා 41:7 යෙසා 46:7
**5** ගීතා 115:5 ගීතා 135:16 යෙසා 46:7 හබ 2:19 1කොරි 12:2
**6** ගීතා 115:7 යෙසා 46:1 යෙසා 46:7
**7** යෙසා 41:23 යෙසා 44:9 යෙසා 45:20 1කොරි 8:4
**8** නික් 15:11 2සාමු 7:22 ගීතා 86:8
**9** නෙහෙ 4:14 නෙහෙ 9:32 ගීතා 48:1 ගීතා 145:3 යෙරෙ 32:18
**10** ගීතා 22:28 ගීතා 93:1 එළි 11:17
**11** යෝබ් 37:24 ලූක් 12:5 එළි 15:4
**12** ගීතා 89:6 දානි 4:35
**13** ගීතා 115:8 යෙසා 41:29 යෙරෙ 51:17 හබ 2:18 සෙක 10:2 රෝම 1:22
**14** යෙසා 44:19
**15** 1රාජා 10:22 2ලේක 9:21
**16** දානි 10:5
**17** ගීතා 115:4
**18** ගීතා 31:5
**19** යොෂු 3:10 දානි 6:26 යොහ 6:57 2කොරි 6:16 1තෙස 1:9
**20** ගීතා 10:16 දානි 4:3 හබ 1:12 එළි 15:3
**21** නාහු 1:5
**22** ගීතා 76:7 ගීතා 90:11 යෝවෙ 2:11
**23** ගීතා 96:5
**24** යෙසා 2:18 යෙරෙ 51:18 ශෙප 2:11 සෙක 13:2

---

**2 තීරුව** **1** උත් 1:1; යෝබ් 38:4; ගීතා 89:11; යෙසා 40:28; යෙරෙ 51:15; ක්‍රියා 14:15; එළි 4:11; **2** ගීතා 24:2; ගීතා 93:1; හිතෝ 3:19; යෙසා 45:18; **3** යෝබ් 9:8; ගීතා 104:2; ගීතා 136:5; යෙසා 40:22; යෙසා 42:5; යෙසා 45:12; සෙක 12:1; **4** යෝබ් 37:2; යෝබ් 38:34; යෝබ් 38:36; ගීතා 18:13; ගීතා 68:33; **5** යෝබ් 36:27; ගීතා 135:7; **6** යෝබ් 38:25; යෙසා 45:8; යෙරෙ 51:16; සෙක 10:1; **7** උත් 8:1; නික් 14:21; ගණන් 11:31; ගීතා 107:25; ගීතා 147:18; යෝනා 1:4; **8** ගීතා 92:6; **9** ගීතා 97:7; යෙසා 42:17; යෙසා 44:11; **10** ගීතා 135:17; යෙරෙ 51:17; **11** හබ 2:18; 1කොරි 8:4; **12** යෙසා 41:29; **13** යෙරෙ 51:18; **14** ගීතා 16:5; ගීතා 73:26; ගීතා 119:57; ගීතා 142:5; **15** යෙසා 45:7; **16** ද්වි 32:9; ගීතා 74:2; ගීතා 135:4; **17** යෙසා 47:4; යෙරෙ 51:19; **18** මීකා 2:10; **19** එස 12:3.

දේශයේ වැසියන්ව පන්නා දමන්-
නෙමි.[1] ඔවුන් තේරුම්ගන්නා පිණිස
මම ඔවුන් පිටට විපත්ති ගෙනෙන්-
නෙමි."[2]

**19** මට සිදු වූ විපතක මහත![3]
මගේ තුවාලය සුව කිරීමට බැරි තරම්
දරුණුය. මම මෙසේ කියාගත්තෙමි.
"මෙය මගේ පීඩාවයි. මෙය දරාගැනී-
මට සිදු වන්නේ මටමයි.[4] **20** මගේ
කූඩාරම නැති නාස්ති කර ඇත. එහි
ලණු සියල්ල දෙකට කඩා දමා ඇත.[5]
මගේ කූඩාරම දිගහැර එහි රෙදි අතු-
රන්නවත් කිසිවෙක් නැත. මගේ පුත්‍ර-
යන්ට මාව අත්හැර යෑමට සිදු විය.
මට නැවත ඔවුන්ව දකින්න ලැබෙන්-
නේ නැත.[6] **21** එඬේරුන් කටයුතු
කළේ අඥාන ලෙසය.[7] ඔවුහු යෙ-
හෝවා දෙවිගේ මඟ පෙන්වීම් පැතුවේ
නැත.[8] මනා අවබෝධයකින් ක්‍රියා
කිරීමට ඔවුන්ට නොහැකි වුණේ ඒ
නිසාය. ඔවුන්ගේ මුළු රැළ සෑම තැන-
කටම විසුරුවාහැර ඇත."[9]

**22** මේ පුවතට කන් දෙන්න.
මහත් ඝෝෂාවක් උතුරු දෙසින් නික්-
මෙයි.[10] එයින් යූදාහි නගරවල් හිව-
ලුන් ලගින පාළු ප්‍රදේශයක් බවට පත්
වෙයි.[11]

**23** යෙහෝවා දෙවියනි, මිනිසෙ-
කුට තමන් යා යුතු මාර්ගය කුමක්ද
කියා තනිව තීරණය කිරීමට අයිති-
යක් නැති බව මම හොඳින් දනිමි.
තම ජීවන ගමනේ පියවර තැබිය
යුත්තේ කෙසේද කියා තනිව තීර-
ණය කිරීමට ඔහුට හැකියාවක්ද
නැත.[12] **24** යෙහෝවා දෙවියනි,
ඔබේ ධර්මිෂ්ඨ ප්‍රමිතිවලට අනුව
මාව නිවැරදි කරන්න.[13] නමුත් ඔබේ
උදහසින්[14] මාව විනාශ කර නො-
දමන්න.[15] **25** ඔබව නොසලකාහැ-
රිය[16] ජාතීන් පිටටත්[17] ඔබේ නාමය
කියා කන්නලව් නොකළ ගෝත්‍ර
පිටටත්[18] ඔබේ උදහස වගුරුවන්න.
ඔවුහු යාකොබ්ගේ පෙළපත සම්පූර්-
ණයෙන්ම නැති නාස්ති කළෝය.[19]
ඔහුව විනාශ කර දැමුවෝය.[20] ඔහුගේ
වාසස්ථානය පාළු කර දැමුවෝය.[21]

## 11

යෙහෝවා දෙවිගෙන් යෙ-
රෙමියාට ලැබුණු පණිවිඩය
මෙයයි. **2** "සියලුදෙනාම මා ඇති
කරගත් ගිවිසුමේ සඳහන් දේට සවන්
දෙන්න.

"යූදා වැසියන්ටත් යෙරුසලමේ
වැසියන්ටත් ඔබ මේ පණිවිඩය පැව-
සිය යුතුයි.[1] **3** ඔබ ඔවුන්ට මෙසේ
කියන්න. 'ඊශ්‍රායෙල්හි දෙවි වන යෙ-
හෝවා මෙසේ පවසන්නේය. "ඒ ගිවි-
සුමේ සඳහන් නියමයන්ට සවන්
නොදෙන මනුෂ්‍යයා ශාප ලද්දෙක්
වන්නේය.[2] **4** මම ඔබේ මුතුන්-
මිත්තන්ව යකඩ ගිනි උදුනක් මෙන්
වූ[3] ඊජිප්තුවෙන් පිටතට ගෙනා කාල-
යේදී ඔවුන් සමඟ ගිවිසුමක් ඇති කර-
ගනිමින්[4] ඔවුන්ට මෙසේ අණ කළෙමි.
'මාගේ හඬට කීකරු වෙන්න. මම
ඔබට දෙන සියලු ආඥා පිළිපදින්න.[5]
ඔබ එසේ කළොත් මම ඔබව මාගේ
සෙනඟ ලෙස පිළිගන්නෙමි. මම
ඔබේ දෙවි වන්නෙමි.[6] **5** මම එවැනි
ආඥාවක් ඔවුන්ට දුන්නේ, ඔබ දැන්
ජීවත් වන කිරියෙන් හා පැණියෙන්
ඉතිරෙන මේ දේශය[7] ඔබේ මුතුන්-
මිත්තන්ට උරුම කර දෙන බවට
මා දුන් පොරොන්දුව ඉටු කිරීම සඳ-
හාය.' " ' "[8]

එවිට මම, "යෙහෝවා දෙවියනි,
එසේම වේවා"* කියා කීවෙමි.

**6** යෙහෝවා දෙවි තවදුරටත් මට
මෙසේ පැවසුවේය. "යූදාහි නගරවෙ-
ලත් යෙරුසලමේ වීථිවලත් මේ සියලු
වචන ප්‍රකාශ කරන්න.[9] 'ජනයෙනි,
මා ඇති කරගත් ගිවිසුමේ සඳහන්
නියමයන්ට ඇහුම්කන් දී ඒවා පිළි-
පදින්න.[10] **7** ඔබේ මුතුන්මිත්තන්ව
ඊජිප්තු දේශයෙන් පිටතට ගෙනා දව-
සේ සිට අද දක්වා, "මාගේ හඬට
කීකරු වන්න" කියා මම ඔවුන්ට අව-
වාද කළෙමි.[11] මම හිමිදිරි උදැසන

**10 පරි.**

**1** ද්වි 28:63; 1සාමු 25:29; යෙරෙ 16:13
**2** යෙරෙ 23:20; එස 6:10
**3** යෙරෙ 4:19; යෙරෙ 8:21; විලා 2:11
**4** මීකා 7:9
**5** යෙරෙ 4:20; විලා 2:4
**6** යෙරෙ 31:15
**7** ගීතා 94:8; යෙරෙ 5:31; යෙරෙ 12:10
**8** යෙරෙ 2:8; යෙරෙ 8:9
**9** යෙරෙ 23:1; එස 34:5
**10** යෙරෙ 1:15; යෙරෙ 4:6; යෙරෙ 6:22; හබ 1:6
**11** යෙරෙ 9:11
**12** ගීතා 17:5; ගීතා 37:23; හිතෝ 16:3; හිතෝ 20:24; යෙරෙ 17:9
**13** ගීතා 6:1; යෙරෙ 30:11
**14** ගීතා 38:1
**15** යෙසා 40:23
**16** යෝබ් 18:21; 1තෙස 4:5; 2තෙස 1:8; එළි 16:1
**17** ගීතා 9:17; ගීතා 79:6; යෙසා 34:2
**18** ශෙප 1:6
**19** ගීතා 79:7; යෙරෙ 51:34
**20** යෙසා 10:22
**21** යෙරෙ 8:16; විලා 2:22

**2 තීරුව**

**11 පරි.**

**1** යෙරෙ 1:7
**2** ද්වි 27:26; ද්වි 28:15; ගලා 3:10; හෙබ්‍රෙ 8:9
**3** නික් 13:3; ද්වි 4:20; 1රාජා 8:51
**4** නික් 24:3; එස 20:6
**5** ලෙවී 26:3; 1සාමු 15:22; යෙරෙ 7:23
**6** උත් 17:8; ලෙවී 26:12; එස 11:20; 2කොරි 6:16

**7** නික් 3:8; ලෙවී 20:24; ද්වි 6:3; යොෂු 5:6; එස 20:6; **8** උත් 15:18; ද්වි 7:12; ගීතා 105:9; **9** යෙසා 58:1; **10** ද්වි 6:3; යොහ 13:17; රෝම 2:13; යාකො 1:22; **11** නික් 15:26.

යෙරෙ **11:5*** හෙබ්‍රෙව් බසින්, ආමෙන්.

සිට නොනවත්වා ඔවුන්ට එසේ අවවාද කළෙමි.[1] **8** නමුත් ඔවුහු මාගේ හඬට සවන් දුන්නේවත් මා පැවසූ දේ ගණනකට ගත්තේවත් නැත.[2] ඔවුහු දිගටම මුරණ්ඩු ලෙස හැසිරෙමින් ඔවුන්ගේ දුෂ්ට සිතුවිලිවලට අනුව ක්‍රියා කළෝය.[3] නමුත් ගිවිසුම කඩ කළොත් අද්දැකීමට සිදු වෙයි කියා මා කලින් පැවසූ දඬුවම් ඔවුන් පිටට මම ගෙනාවෙමි.’”

**9** යෙහෝවා දෙවි තවදුරටත් මට මෙසේ කීවේය. “යූදා සහ යෙරුසලමේ වැසියන් එකතු වී මට විරුද්ධව කුමන්ත්‍රණයක් දියත් කර තිබේ.[4] **10** මාගේ වදන්වලට කිසිසේත් ඇහුම්කන් නොදී වෙනත් දෙවිවරුන්ට නමස්කාර කළ[5] ඔවුන්ගේ මුතුන්මිත්තන් ගිය වැරදි මාර්ගයටම ඔවුහුද හැරී ගියෝය.[6] මුතුන්මිත්තන් සමඟ මා ඇති කරගත් ගිවිසුම ඊශ්‍රායෙල් හා යූදා සෙනඟ කඩ කළෝය.[7] **11** එබැවින් මම ඔවුන් පිටට විපත්ති ගෙනෙන්නෙමි.[8] ඉන් ගැලවී යෑමට ඔවුන්ට කිසිසේත් නොහැකි වන්නේය.[9] එදාට ඔවුහු මාගෙන් පිහිට පතන්නෝය. නමුත් මම ඔවුන්ට ඇහුම්කන් නොදෙමි.[10] එසේ පවසන්නේ යෙහෝවා දෙවි වන මමය. **12** යූදා නුවරවල හා යෙරුසලමේ වැසියන්ට ඔවුන් සුවඳ දුම් ඔප්පු කරන දෙවිවරුන්ගේ පිහිට පැතීමට සිදු වෙයි.[11] නමුත් ඔවුන් අද්දකින විපතෙන් ඔවුන්ව ගලවාගැනීමට ඒ දෙවිවරුන්ට කිසිසේත් හැකි වෙන්නේ නැත.[12] **13** යූදා වැසියෙනි, ඔබට හිමි නගරවල් ප්‍රමාණයටම ඔබට දෙවිවරු ඇත.[13] යෙරුසලමේ තිබෙන වීථි ප්‍රමාණයටම පිළිකුල්සහගත බාල් දෙවියාට[14] සුවඳ දුම් ඔප්පු කිරීම සඳහා තැනූ පූජාසන ඇත.[15]

**14** “ඔබ මේ සෙනඟ වෙනුවෙන් යාච්ඤා කරන්නවත් ඔවුන් වෙනුවෙන් කන්නලව් කරන්නවත් එපා.[16] මන්ද විපතේදී ඔවුන් මට කන්නලව් කළත් මම ඔවුන්ට ඇහුම්කන් නොදෙමි.[17]

**15** “මාගේ ප්‍රේමණීය ජනයෙනි, දුෂ්ට දේවල් කරමින්[1] සිටින ඔබෙන් බොහෝදෙනෙකුට[2] මාගේ ගෘහයට පැමිණීමට අයිතියක් තිබෙනවාද?[3] ඔබ පිටට එන විපතෙන් ඔබව ගලවාගැනීමට මාගේ පූජාසනය මත ඔප්පු කරන සත්ව පූජාවලට හැකියි කියා ඔබ සිතන්නහුද?[4] එසේ සිතමින් ඔබ සතුටු වන්නහුද?[5] **16** යෙහෝවා දෙවි වන මා ඔබව හැඳින්වූයේ, ‘පලවලින් බර වුණු, සරුසාරවත්, අලංකාර ඔලීව ගසක්’ ලෙසයි.[6] මහා ඝෝෂාවක් ඇසිණ. ඒ ගස දවා දැමීමට මම ගින්නක් ඇවුළුවෙමි. සතුරෝ එහි අතු සියල්ල විනාශ කර දැමුවෝය.[7]

**17** “ඊශ්‍රායෙල් හා යූදා සෙනඟව පැළ කළේ ස්වර්ගයේ සේනාවල අධිපති වන යෙහෝවා දෙවි වන මමය.[8] නමුත් ඔවුන් කළ දුෂ්ටකම් නිසා ඔවුන් පිටට විපත්ති ගෙනෙන බව මම ප්‍රකාශ කළෙමි.[9] ඔවුහු බාල් දෙවියාට සුවඳ දුම් ඔප්පු කිරීමෙන් මාව උදහස් කළෝය.”[10]

**18** යෙහෝවා දෙවි යම් දේවල් ගැන මට දැනුම් දුන්නේය. ජනයා යොදන සැලසුම් ඔහු මට දැනගැනීමට සැලැස්වූවේය.[11] **19** මම මරන්න ගෙන යන හීලෑ බැටළු පැටවෙකුට සමානව සිටියෙමි.[12] “ගස එහි පලත් සමඟම විනාශ කර දමමු. ඔහුගේ නම තවත් සිහි නොවන පිණිස සම්පූර්ණයෙන්ම ඔහුව පොළොවෙන් තුරන් කර දමමු”[13] යයි කියමින් ඔවුන් මට විරුද්ධව කුමන්ත්‍රණය කරන බව මම දැන සිටියේ නැත.[14] **20** ස්වර්ගයේ සේනාවල අධිපති වන යෙහෝවා දෙවි ධර්මිෂ්ඨකමින් විනිශ්චය කරන්නේය.[15] ඔහු මිනිසාගේ සිතද ඇතුළාන්ත හැඟීම්ද* සෝදිසි කර

**11 පරි.**
**1** යෙරෙ 7:13; යෙරෙ 25:4; යෙරෙ 35:15
**2** නෙහෙ 9:16; යෙරෙ 6:16; යෙරෙ 7:26; එස 20:8; සෙක 7:11
**3** ගීතා 78:8; ගීතා 81:12; යෙසා 65:2; යෙරෙ 3:17; යෙරෙ 7:24; යෙරෙ 9:14; සෙක 7:12; රෝම 10:21
**4** යෙරෙ 5:31; එස 22:25
**5** විනි 2:17; 1සාමු 8:8; 2රාජා 22:17; 2ලේක 28:23
**6** විනි 2:11; ගීතා 78:8; එස 20:18; ක්‍රියා 7:51
**7** ද්වි 31:16; 2රාජා 17:7; එස 16:59; හොෂෙ 6:7; හෙබ්‍රෙ 8:9
**8** 2රාජා 22:16; 2ලේක 34:24; යෙරෙ 6:19; එස 7:5
**9** හිතෝ 29:1; ආමෝ 2:14
**10** ගීතා 18:41; හිතෝ 1:28; යෙසා 1:15; යෙරෙ 14:12; එස 8:18; මීකා 3:4; සෙක 7:13
**11** ද්වි 32:37; යෙසා 45:20
**12** යෙරෙ 2:28
**13** ද්වි 32:17
**14** හොෂෙ 9:10
**15** යෙරෙ 7:9
**16** යෙරෙ 7:16; යෙරෙ 14:11; 1යොහ 5:16
**17** ගීතා 66:18; හොෂෙ 5:6

**2 තීරුව**
**1** එස 16:25
**2** යෙරෙ 3:8
**3** යෙරෙ 2:3
**4** හග් 2:12
**5** යාකො 4:16
**6** ගීතා 52:8; රෝම 11:17
**7** මතෙ 3:10
**8** ගීතා 44:2; යෙසා 5:2; යෙරෙ 2:21
**9** යෙරෙ 19:15
**10** 2රාජා 23:5; යෙරෙ 7:9; යෙරෙ 19:5; **11** එස 8:6; **12** යෙසා 53:7; **13** ගීතා 116:9; ගීතා 142:5; **14** ගීතා 37:32; යෙරෙ 18:18; **15** උත් 18:25; ගීතා 98:9; ක්‍රියා 17:31.

යෙරෙ **11:20*** මූ.අ., “වකුගඩු.”

බලන්නේය.[1] දෙවියනි, ඔබ ඔවුන්ට
දඬුවම් කරන අයුරු මට දකින්න
සලස්වන්න. මන්ද මගේ නඩුව මා
භාර දුන්නේ ඔබටය.[2]
**21** මගේ ජීවිතය නැති කර දැමී-
මට සොයමින්, "යෙහෝවා දෙවිගේ
නාමයෙන් අනාවැකි කියන්න එපා.[3]
එසේ කළොත් ඔබට අපේ අතින්
මැරුම් කන්න සිදු වෙනවා" කියා
මට පවසන අනාතොත්හි වැසියන්ට
විරුද්ධව යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය.[4] **22** "මම ඔවුන්ට දඬුවම්
කරන්නෙමි. තරුණයෝ කඩුවෙන්
මැරුම් කන්නෝය.[5] ඔවුන්ගේ පුත්‍ර-
යෝද දූවරුද සාගතයෙන් මිය
යන්නෝය."[6] ස්වර්ගයේ සේනාවල
අධිපති වන යෙහෝවා දෙවි තව-
දුරටත් මෙසේ පවසයි. **23** "අනා-
තොත්හි වැසියන්ට[7] මම දඬුවම්
කරන කාලයේදී[8] ඔවුන් පිටට මා ගෙ-
නෙන විපත්ති නිසා ඔවුන්ගේ පෙළප-
තින් කිසිවෙක් ඉතුරු නොවන්නේය."

**12** යෙහෝවා දෙවියනි, ඔබ ධර්-
මිෂ්ඨ දෙවි කෙනෙකි.[9] මා
ඔබට පැමිණිල්ලක් ඉදිරිපත් කරන
විටදීද ඔබ දුන් තීන්දු ගැන කතා
කරන විටදීද ඔබ සාධාරණ ලෙස
කටයුතු කරන්නෙහිය. නමුත් දුෂ්ට-
යන් මෙතරම් සාර්ථකත්වයක් අත්
කරගෙන සිටින්නේ ඇයි?[10] ද්‍රෝහිකම්
කරන්නන් කිසි කනස්සල්ලක් නැතුව
සැපෙන් කල් ගෙවන්නේ කෙසේද?
**2** පැළයක් මෙන් ඔබ මේ සෙනඟව
සිටෙව්වෙහිය. ඔවුහු හොඳින් මුල් ඇද
පල දරා ඇත. ඔවුහු තම මුවින්
ඔබ ගැන බොහෝ දේ කතා කළත්
සිතින්* නම් ඔබෙන් බොහෝ දුරස්ව
සිටිති.[11] **3** යෙහෝවා දෙවියනි, ඔබ
මා ගැන හොඳින් දන්නෙහිය.[12] ඔබට
මාව පෙනෙන්නෙහිය. ඔබට ළැදි
සිතක් මා තුළ තිබේද කියා ඔබ
සෝදිසි කර බැලුවෙහිය.[13] මරන්න
ගෙන යන බැටළුවන්ව වෙන් කර
තබන්නාක් මෙන් ඔවුන්වද[1] විනාශ-
යේ දවස සඳහා වෙන් කර තබන්න.
**4** තව කොපමණ කාලයක් දේශය
මලානිකව තිබේවිද?[2] එහි ගහ කොළ
තව කොපමණ කාලයක් වියළී තිබේ-
විද?[3] දේශයේ වැසියන්ගේ දුෂ්ටකම්
නිසා මෘගයෝද පක්ෂීහුද දේශයෙන්
තුරන්ව ගොස් ඇත.[4] "අපට වෙන්න
යන දේ දෙවිට පෙනෙන්නේ නැහැ"
කියා සෙනඟ පැවසුවෝය.
**5** මිනිසුන් සමඟ දිවීමට ගොස් ඔබ
වෙහෙසට පත් වෙනවා නම් අශ්ව-
යන් සමඟ ඔබ දුවන්නේ කෙසේද?[5]
දැන් දේශයේ සමාදානයක් තිබෙ-
නවා කියා සිතා[6] ඔබ විමසිල්ලෙන්
සිටින්නේ නැත්නම් යොර්දාන් ගඟේ
අවදානම් සහිත වනළැහැබ අස-
ළදී ඔබ ක්‍රියා කරන්නේ කෙසේද?[7]
**6** ඔබේම සහෝදරයෝ හා ඔබේ පියා-
ගේ ගෙයි වැසියෝ පවා ඔබට ද්‍රෝහි-
කම් කළෝය.[8] ඔවුහු ඔබට විරුද්ධව
ප්‍රසිද්ධියේ දොස් නඟා ඇත. ඔබ සමඟ
ඔවුන් සුහදව කතා කළත් ඔවුන්ව
විශ්වාස නොකරන්න.[9]
**7** "මගේ ගෘහය මම අත්හැරි-
යෙමි.[10] මගේ උරුමය වූ සෙනඟව
තනි කර දැමුවෙමි.[11] මගේ ප්‍රේ-
මණීය තැනැත්තියව ඇගේ සතු-
රාගේ අතට භාර දුනිමි.[12] **8** මගේ
උරුමය වන ඇය වනයේ සැරිස-
රන සිංහයෙකු මෙන් මට ගර්ජනා
කළාය. මා ඇයට ද්වේෂ කළේ
ඒ නිසාය.[13] **9** මගේ උරුමය[14] වන
ඇය මස් කන, වර්ණවත් පක්ෂි-
යෙකු මෙනි. මස් කන අනික් පක්ෂීහු
ඇයව වට කරගෙන සිටිති.[15] වනමෘ-
ගයෙනි, සියලුදෙනාම පැමිණ ගොදුර
ඩැහැගන්න.[16] **10** එඬේරු බොහෝ-
දෙනෙක්[17] පැමිණ මගේ මිදිවත්ත
වනසා දැමුවෝය.[18] ඔවුහු මගේ උරු-
මය පාගා දැමුවෝය.[19] මා අතිශයින්
ආශා කළ ඒ උරුමය[20] ඔවුහු පාළු
කාන්තාරයක් බවට පත් කළෝය.

යෙරෙ **12:2*** මූ.අ., "වකුගඩු." ගැඹුරු සිතුවිලි ඉන් අදහස් කෙරේ.

**16** යෙසා 56:9; යෙරෙ 7:33; එස 39:17; එළි 19:18; **17** යෙරෙ 6:3; **18** ගීතා 80:8; යෙසා 5:1; **19** යෙසා 63:18; **20** යෙරෙ 3:19.

**11 පරි.**
**1** 1සාමු 16:7
1ලේක 28:9
ගීතා 7:9
හිතෝ 11:20
යෙරෙ 17:10
යෙරෙ 20:12
එළි 2:23
**2** 1සාමු 24:15
**3** යෙසා 30:10
ආමෝ 2:12
ආමෝ 7:16
**4** යෙරෙ 1:1
**5** 2ලේක 36:17
විලා 2:21
**6** යෙරෙ 18:21
**7** යොෂු 21:18
1ලේක 6:60
**8** යෙරෙ 23:12
යෙරෙ 46:21
මීකා 7:4
ලූක් 19:44

**12 පරි.**
**9** උත් 18:25
ගීතා 51:4
ගීතා 145:17
ශෙප 3:5
**10** යෝබ් 12:6
යෝබ් 21:7
ගීතා 37:1
ගීතා 73:3
යෙරෙ 5:28
මලා 3:15
**11** යෙසා 29:13
මතෙ 15:8
මාක් 7:6
**12** ගීතා 139:2
**13** 2රාජා 20:3
1ලේක 29:17
ගීතා 17:3
ගීතා 44:21
යෙරෙ 11:20

**2 තීරුව**
**1** ගීතා 44:22
**2** යෙරෙ 23:10
**3** ගීතා 107:34
යෙරෙ 14:6
**4** යෙරෙ 4:25
හොෂෙ 4:3
ශෙප 1:3
**5** යෙරෙ 4:13
**6** යෙරෙ 14:13
**7** යෙරෙ 49:19
යෙරෙ 50:44
සෙක 11:3
**8** යෙරෙ 9:4
**9** හිතෝ 26:25
යෙරෙ 23:17
**10** ගීතා 78:60
හොෂෙ 9:15
ලූක් 13:35
**11** නික් 19:5
යෙසා 47:6
**12** විලා 2:1
**13** හොෂෙ 9:15
ආමෝ 6:8
**14** ගීතා 78:71
**15** 2රාජා 24:2
එස 16:37

**11** එය සම්පූර්ණයෙන්ම මැලවී නැති
නාස්ති වී ඇත.[1] දේශයට සිදු වූ
දේ කිසිවෙකු ගණනකටවත් නොගත්
නිසා[2] එය මා ඉදිරියේ සහමුලින්ම
පාළුවට ගොසින්ය.[3] **12** පාළුකරය
හරහා තිබෙන සෑම අඩි පාරකින්ම
කොල්ලකරුවෝ පැමිණ සිටිති. යෙ-
හෝවා දෙවිගේ කඩුව දේශයේ
එක් කෙළවරක සිට අනික් කෙළවර
දක්වා සිටි සෙනඟව විනාශ කර දැමු-
වේය.[4] කිසිවෙකුට සාමයෙන් ජීවත්
වීමට නොහැක. **13** ඔවුන් තිරිඟු
වැපුරුවත් නෙළාගත්තේ කටුය.[5]
ඔවුන් හෙම්බත් වන තුරුම වෙහෙසී
වැඩ කළත් ඉන් කිසි ප්‍රයෝජන-
යක් ඔවුන්ට ලැබෙන්නේ නැත.[6] යෙ-
හෝවා දෙවිගේ උදහස නිසා තමන්ට
ලැබෙන අස්වැන්න ගැන ඔවුහු ලැජ්-
ජාවට පත් වනු ඇත.”

**14** යෙහෝවා දෙවි මෙසේ පව-
සයි. “මාගේ සෙනඟ වන ඊශ්‍රායෙල්ට
මා උරුම කර දුන් දේශයට අත
තැබූ[7] මාගේ නපුරු අසල්වාසීන්ව[8]
ඔවුන්ගේ දේශවලින් මම උදුරා දමන්-
නෙමි.[9] මම යූදා සෙනඟවත් දේශ-
යෙන් උදුරා දමන්නෙමි.[10] **15** මම
යූදා සෙනඟව දේශයෙන් උදුරා දැමු-
වත් පසුව ඔවුන්ට දයාව පෙන්වන්-
නෙමි.[11] ඔවුන්ව ආපසු රැගෙන ඇවිත්
ඔවුන්ට උරුම වූ දේශයේ එකිනෙකාට
හිමි කොටස ලබා දෙන්නෙමි.”[12]

**16** “මාගේ සෙනඟට බාල් දෙවි-
යාගේ නමින් දිවුරන්න ඉගැන්වූ ඒ
ජාතීන්,[13] ජීවමාන යෙහෝවා දෙවි
වන මාගේ නාමයෙන් දිවුරමින්
මාගේ සෙනඟගේ මාර්ග ඉගෙනගත්-
තොත්[14] ඔවුන්ටද මාගේ සෙනඟ අත-
රේ වාසය කිරීමට අවස්ථාව ලැබේ.[15]
**17** නමුත් ඒ ජාතීන් මට කීකරු
නොවුණොත් මම ඔවුන්ව දේශයෙන්
උදුරා, විනාශ කර දමන්නෙමි”[16] කියා
යෙහෝවා දෙවි පවසයි.

**13** යෙහෝවා දෙවි මට මෙසේ
පැවසුවේය. “ගොස් ලිනන්
රෙදිවලින් සාදාගත් පටියක් ගෙන
ඔබේ ඉණ වටා බැඳගන්න. ඊට වතුර
වැදීමට ඉඩ නොදෙන්න.” **2** එබැ-
වින් මම යෙහෝවා දෙවි පැවසූ
ලෙස පටියක් ගෙන මගේ ඉණ
වටා බැඳගත්තෙමි. **3** යෙහෝවා
දෙවි නැවත වරක් මට කතා කර
මෙසේ කීවේය. **4** “ඔබ ඉණ වටා
බැඳගෙන සිටින පටිය රැගෙන යුප්‍රටීස්
ගඟ[1] ළඟට ගොස් ඒ අසල ඇති පර්-
වත විවරයක එය සඟවා තබන්න.”
**5** එබැවින් මම යෙහෝවා දෙවි අණ
කළ ලෙස යුප්‍රටීස් ගඟ ළඟට ගොස් ඒ
පටිය සඟවා තැබුවෙමි.

**6** නමුත් කලක් ගත වූ පසු යෙ-
හෝවා දෙවි මට මෙසේ පැවසු-
වේය. “යුප්‍රටීස් ගඟ ළඟට ගොස්
සඟවා තබන්න කියා මා ඔබට අණ
කළ පටිය නැවත ගන්න.” **7** එබැ-
වින් මම යුප්‍රටීස් ගඟ ළඟට ගොස්
පටිය සඟවා තැබූ තැන හාරා එය පිට-
තට ගත්තෙමි. නමුත් සිදු වී තිබූ දේ
බලන්න! ඒ පටියෙන් කිසි ප්‍රයෝජන-
යක් ගත නොහැකි වන ලෙස එය දිරා
ගොස් තිබිණ.

**8** එවිට යෙහෝවා දෙවි මට මෙසේ
පැවසුවේය. **9** “යෙහෝවා දෙවි වන
මම මේ දේ පවසමි. ‘යූදාහි උඩඟු-
කමත්[2] යෙරුසලමේ උද්ධච්චකමත්
මා නැති කර දමන්නේ එලෙසය.
**10** මාගේ හඬට කීකරු වීමට අක-
මැති මේ දුෂ්ට සෙනඟ,[3] මුරණ්ඩු
ලෙස තමන්ට රිසි සේ ක්‍රියා කරති.[4]
ඔවුහු වෙනත් දෙවිවරුන්ගේ පිහිට
පතමින් ඒවා ඉදිරියේ වැඳ වැටෙමින්
ඒවාට නමස්කාර කරති.[5] එසේ කරන
මේ දුෂ්ට සෙනඟට සිදු වන්නෙත්
මේ පටියට සිදු වූ දේමය. එනම්,
කිසිම ප්‍රයෝජනයක් නැති තත්වය-
කට පත් වීමය.’ **11** ‘මිනිසෙකුගේ
ඉණ වටා බැඳි පටිය ඔහුගේ සිරුරට
ඇලී තිබෙන්නාක් මෙන් මම මුළු ඊශ්‍රා-
යෙල් හා යූදා සෙනඟව මා ළඟට ගෙ-
නැවිත් මට සමීපව තබාගත්තෙමි.[6]
මා එසේ කළේ ඔවුන් මාගේ සෙ-
නඟ වී[7] මට ගෞරවයක්ද[8] ප්‍රශංසා-
වක්ද තේජසක්ද ගෙන දෙන පිණිසය.

**12 පරි.**
1 යෙරෙ 9:11
2 යෙසා 42:25
මලා 2:2
3 යෙරෙ 10:22
යෙරෙ 14:2
4 ලෙවී 26:33
යෙරෙ 15:2
එස 14:17
5 ලෙවී 26:16
මීකා 6:15
හග් 1:6
6 ගීතා 127:1
7 යෙරෙ 2:3
සෙක 1:15
සෙක 2:8
8 ගීතා 79:4
යෙරෙ 48:26
එස 25:3
ශෙප 2:8
9 යෙරෙ 48:2
යෙරෙ 49:2
10 2ලේක 7:20
11 ද්වි 30:3
එස 28:25
12 ද්වි 3:20
යෙරෙ 32:37
හොෂෙ 1:11
ආමො 9:14
ශෙප 3:20
13 යොෂු 23:7
ශෙප 1:5
14 උත් 14:22
ද්වි 6:13
ද්වි 10:20
විනි 21:7
යෙසා 65:16
යෙරෙ 4:2
15 1පේතෘ 2:5
16 යෙසා 60:12

**2 තීරුව**

**13 පරි.**
1 උත් 2:14
2 ලෙවී 26:19
හිතෝ 16:18
ශෙප 3:11
ලූක් 18:14
යාකො 4:6
1පේතෘ 5:5
3 2ලේක 36:16
4 යෙරෙ 6:28
යෙරෙ 9:14
යෙරෙ 11:8
යෙරෙ 16:12
ක්‍රියා 7:51
5 විනි 2:12
1සාමු 8:8
2ලේක 7:19
6 ද්වි 26:18
7 නික් 19:5
ගීතා 135:4
8 යෙරෙ 33:9

නමුත් ඔවුහු මට කීකරු වූයේ නැත.'[1]
මෙසේ පවසන මා යෙහෝවා දෙවිය.
**12** "ඔබ මේ දේ සෙනඟට කියන්න.
'ඊශ්‍රායෙල්හි දෙවි යෙහෝවා මෙසේ
පවසනවා. "විශාල මැටි බඳුන්
තිබෙන්නේ වයින් පුරවා තබන්-
නයි."'[2] එවිට සෙනඟ ඔබට මෙසේ
පවසනු ඇත. 'සෑම මැටි බඳුනකම
වයින් පුරවා තබන බව අපි දන්-
නවා.' **13** එවිට ඔබ ඔවුන්ට මෙසේ
කියන්න. 'යෙහෝවා දෙවි පවසන්-
නේ මෙයයි. "මේ දේශයේ සිටින සියලු
වැසියන්ටද පූජකයන්ටද අනාගත-
වක්තෘවරුන්ටද දාවිත්ගේ පෙළපතින්
පැමිණෙන සියලු රජවරුන්ටද[3] යෙරු-
සලමේ වැසියන්ටද මත් වන තුරුම
මම වයින් පොවන්නෙමි.[4] **14** ඔවුන්-
ගේ පියවරුන් හා පුත්‍රයන් අතර ගැටු-
මක් ඇති වීමට සලස්වන්නෙමි.[5] එසේ
නොකර සිටීමට තරම් අනුකම්පාවක්
මට ඔවුන් ගැන ඇති වන්නේ නැත.
මට ඔවුන් ගැන කිසි දුකක් දැනෙන්-
නේද නැත. මම ඔවුන්ට දයාව නො-
පෙන්වන්නෙමි."[6] මේ දේවල් පවසන
මා යෙහෝවා දෙවිය.'
**15** "ජනයෙනි, උඩඟු නොවී
ඇහුම්කන් දෙන්න.[7] මන්ද මේ
දේවල් පැවසුවේ යෙහෝවා දෙවිය.[8]
**16** දෙවි අන්ධකාරය ගෙනෙන්න පෙ-
රත්[9] අඩ අඳුරේ කඳු මත දුවන ඔබ,
පැටලී වැටීමට පෙරත්[10] ඔබේ දෙවි
වන යෙහෝවාට ගෞරවය දෙන්න.[11]
ඔබ එසේ නොකළොත් ඔහු භයං-
කර ඝනාන්ධකාරයක් ඔබ පිටට
පමුණුවයි.[12] ඔබ ආලෝකය ලැබෙන
තෙක් බලා සිටියත්[13] එය ඔබට
නොලැබෙනු ඇත.[14] **17** උඩඟුකම
නිසා ඔබ දෙවිට ඇහුම්කන් නො-
දුන්නොත්[15] මම තනිව කඳුළු
සලන්නෙමි. යෙහෝවා දෙවිගේ රැළ
මෙන් වූ මේ සෙනඟ[16] වහල්කමට
ගෙන යන නිසා මම කඳුළු සලමින්
හඬා වැලපෙන්නෙමි.[17]
**18** "රජුටත් මව් බිසවටත් මෙසේ
පවසන්න.[18] 'හිසේ පැළඳ සිටින ඔබේ
අලංකාර ඔටුනු ගලවා දමන නිසා[19]
සිහසුනෙන් බැස පහළ අසුනකට
එන්න.'[1] **19** දකුණු දිශාවේ පිහිටි
නුවරවල දොරටු වසා තිබේ. ඒවා
විවෘත කිරීමට කිසිවෙක් එහි නැත.
යූදා දේශයේ වැසියන් සියලුදෙනාවම
වහලුන් ලෙස රැගෙන ගොස් ඇත.[2]
**20** "උතුරෙන් පැමිණෙන අය දෙස
හොඳින් බලන්න.[3] ඔබට භාර දුන්
අනර්ඝ රැළක් මෙන් සිටි සෙනඟ දැන්
කොහේද?[4] **21** ඔබ කලින් හොඳම
මිතුරන් ලෙස පිළිගත් අය[5] ඔබට
විරුද්ධව නැඟී සිටින විට ඔබ කුමක්
කියයිද?[6] දරුවෙකු බිහි කරන ස්ත්‍රී-
යකට දැනෙන වේදනාවකට සමාන
වේදනාවක් ඒ අවස්ථාවේදී ඔබටත්
දැනෙනු ඇත.[7] **22** 'මට මේ දේවල්
සිදු වුණේ ඇයි'[8] කියා ඔබ සිතනු
ඇත.[9] එවිට ඔබේ වස්ත්‍ර ගලවා
දමා තිබෙන්නෙත්[10] ඔබේ යටිපතුල්
තුවාල වී තිබෙන්නෙත් ඔබ කළ
මහත් දුෂ්ටකම් නිසා බව තේරුම්-
ගන්න.
**23** "කූෂ් ජාතිකයෙකුට[11] තමාගේ
සමේ වර්ණයවත් දිවියෙකුට උගේ
ඇඟේ තිබෙන පුල්ලිවත් වෙනස්
කරගත හැකිද?[12] එසේනම් නපුරු
දේ කිරීමට පමණක් පුරුදුව සිටින
ඔබට යහපත් දේ කිරීමට හැකි වෙ-
යිද?[13] **24** පාළුකරයෙන් හමා එන
සුළඟට ගසාගෙන යන පිදුරු
මෙන්[14] මම ඔවුන්ව සීසීකඩ විසුරු-
වාහරින්නෙමි.[15] **25** ඔබට මම මැන
දෙන කොටස එයයි"[16] කියා යෙ-
හෝවා දෙවි පවසන්නේය. "ඔබට
එසේ වන්නේ ඔබ මා අමතක
කර[17] බොරු දේවල් මත විශ්වා-
සය තැබූ නිසාය.[18] **26** මම ඔබේ
වස්ත්‍ර ගලවා දමා සියල්ලන් ඉදිරියේ
ඔබව ලැජ්ජාවට පත් කරන්නෙමි.[19]
**27** එවිට ඔබ අනාචාරයේ* යෙදුණු

**13 පරි.**
**1** ගීතා 81:11
යෙරෙ 6:17
**2** 1සාමු 10:3
1සාමු 25:18
2සාමු 16:1
**3** යෙරෙ 29:16
**4** ගීතා 75:8
යෙසා 29:9
යෙසා 51:17
යෙසා 63:6
යෙරෙ 25:27
**5** යෙරෙ 6:21
එස 5:10
මතෙ 10:21
**6** යෙසා 13:9
යෙසා 27:11
එස 7:4
එස 24:14
රෝම 2:5
**7** හිතෝ 18:12
යාකො 4:10
**8** යෙරෙ 26:15
**9** යෙසා 5:30
යෙසා 8:22
ආමො 8:9
**10** හිතෝ 4:19
**11** යොෂු 7:19
ගීතා 96:7
**12** ගීතා 44:19
**13** යෙසා 59:9
**14** යෙසා 60:2
**15** යෙරෙ 22:5
මලා 2:2
**16** ගීතා 80:1
ගීතා 100:3
**17** යෙරෙ 9:1
විලා 1:2
විලා 2:18
**18** 2රාජා 10:13
2රාජා 24:12
යෙරෙ 22:26
**19** එස 21:26

**2 තීරුව**
**1** හිතෝ 25:7
ලූක් 14:8
**2** ද්වි 28:64
2රාජා 25:21
යෙරෙ 39:9
**3** යෙරෙ 6:22
**4** එස 34:8
ක්‍රියා 20:29
**5** යෙසා 39:2
**6** යෙසා 10:3
**7** යෙසා 13:8
යෙරෙ 6:24
මීකා 4:9
1තෙස 5:3
**8** යෙරෙ 5:19
යෙරෙ 16:10
**9** ශෙප 1:12
**10** යෙසා 20:4
එස 16:37
හොෂෙ 2:3
**11** 1ලේක 1:10
**12** හිතෝ 27:22
මතෙ 19:24
**13** යෙරෙ 9:5
**14** ගීතා 1:4
යෙරෙ 4:11
හොෂෙ 13:3

**15** ලෙවි 26:33; ද්වි 28:64; ලූක් 21:24; **16** ගීතා 11:6; මතෙ 24:51; **17** ද්වි 32:18; ගීතා 106:21; යෙරෙ 2:32; **18** ද්වි 32:38; යෙසා 28:15; යෙරෙ 10:14; හබ 2:18; **19** විලා 1:8; එස 16:37; එස 23:29; හොෂෙ 2:10.

යෙරෙ **13:27*** මූ.අ., "පරදාර සේවනයේ."

හැටිත්[1] කාම ආශාවෙන් උමතු වී
මෘගයන් මෙන් හැසුරුණු හැටිත්[2]
ගණිකාවක මෙන් නින්දිතව ක්‍රියා
කළ හැටිත් සියල්ලෝම දැනගනු
ඇත. කඳු මුදුන්වලත් කෙත්වලත්
ඔබ කළ පිළිකුල්සහගත දේවල් මම
දුටුවෙමි.[3] යෙරුසලමේ වැසියෙනි,
ඔබට අද්දැකීමට සිදු වන විපත කො-
තරම්ද! තව කොපමණ කාලයක්[4]
ඔබ මෙලෙස අපවිත්‍රව සිටිනු ඇද්ද?”[5]

**14** නියං කාලය ගැන යෙ-
හෝවා දෙවිගෙන් යෙරෙමි-
යාට ලැබුණු පණිවිඩය මෙසේය.[6]
**2** යූදා දේශය හඬා වැලපෙන්නේය.[7]
එහි දොරටු දිරාපත් වී[8] පොළො-
වටම පහත් වී ඇත.[9] වැලපී-
මේ හඬක් යෙරුසලමෙන් මට
ඇසුණේය.[10] **3** උත්තමයෝ වතුර
ගෙන ඒමට තරාතිරමෙන් අඩු
අයව පිටත් කර යැව්වෝය.[11] ඔවුහු
භාජන රැගෙන වතුර වළවල් ළඟට
ගියත් එහි වතුර නැති නිසා[12] ආපසු
හැරී ආවෝය. බලාපොරොත්තු සුන්
වීමෙන් ලැජ්ජාවට පත් වූ ඔවුහු[13]
තම හිස් වසාගත්තෝය.[14] **4** දේ-
ශයට වර්ෂාව නොලැබුණු බැවින්
පොළොව ඉරි තැළී ඇත.[15] ගො-
වියෝ ලැජ්ජාවෙන් තම හිස් වසා-
ගෙන සිටිති.[16] **5** තණබිම්වල ළපටි
තණකොළ නැති නිසා මුවදෙන පවා
උගේ අලුත උපන් පැටවාව අත්-
හැර ගියාය. **6** සීබ්‍රාවෝ[17] පාළුවට
ගිය හෙල් මත හිවලුන් මෙන් පිපාසි-
තව හති දමති. කෑමට තණකොළ
නැති නිසා උන්ගේ ඇස් අඳුරු වී
ඇත.[18] එබැවින් උන් ගල් ගැසී බලා
සිටිති. **7** යෙහෝවා දෙවියනි, අපි
අනේක වාරයක් ඔබට ද්‍රෝහිව ක්‍රියා
කළෙමු.[19] ඔබට විරුද්ධව අපි පව්
කළෙමු.[20] අපේ වැරදි අපට විරුද්ධව
සාක්ෂි දෙයි. නමුත් ඔබේ නාමය නිසා
අපට පිහිට වෙන්න.[21]

**8** ඊශ්‍රායෙල් සෙනඟගේ බලාපො-
රොත්තුව ඔබයි.[22] විපත්තියේදී[23]
ඔවුන්ව ගලවන්නෙත් ඔබයි.[24] එසේ-
වුවත් දැන් ඔබ මේ දේශයට
විදේශිකයෙකු ලෙසද රාත්‍රියක් ගත
කිරීමට පැමිණි සංචාරකයෙකු ලෙ-
සද සිටින්නේ මන්ද?[1] **9** ඔබ වියවුල්
වූ මිනිසෙකු මෙන්ද තම සෙනඟව
ගලවාගත නොහැකි බලවන්තයෙකු
මෙන්ද සිටින්නේ මන්ද?[2] නමුත් යෙ-
හෝවා දෙවියනි, ඔබ සිටින්නේ අප
සමඟය.[3] අප ඔබේ නාමය දරන සෙ-
නඟයි.[4] අනේ, අපව අත් නොහරින්න.

**10** යෙහෝවා දෙවි සෙනඟ ගැන
මෙසේ පැවසුවේය. “ඔවුහු තමන් යන
ගමන ගැන සොයා බලන්නේ නැතුව[5]
මහත් ආශාවෙන් ඒ මේ අත සැරි-
සැරුවෝය.[6] යෙහෝවා දෙවි වන
මම ඔවුන් ගැන කොහෙත්ම ප්‍රසන්න
නැත.[7] එබැවින් මම දැන් ඔවුන් කළ
වැරදි සිහි කර ඔවුන්ට දඬුවම් කරමි.”[8]

**11** යෙහෝවා දෙවි මට මෙසේ
පැවසුවේය. “මේ සෙනඟට යහපතක්
වෙන්න කියා ඔබ ඔවුන් වෙනුවෙන්
යාච්ඤා නොකරන්න.[9] **12** ඔවුන්
නිරාහාරව සිට මට කන්නලව් කළත්
මම ඔවුන්ට ඇහුම්කන් නොදෙමි.[10]
ඔවුන් දවන පූජා හා ධාන්‍ය පූජා
ඔප්පු කළත් මට ඉන් කිසි සතුටක්
නොලැබේ.[11] මම ඔවුන්ට කඩුවෙන්ද
සාගතයෙන්ද වසංගතවලින්ද පහර දී
ඔවුන්ව විනාශ කර දමන්නෙමි.”[12]

**13** එවිට මම මෙසේ කීවෙමි. “විශ්-
වයේ පාලකයා වන යෙහෝවා දෙ-
වියනි, අනාගතවක්තෘවරු සෙනඟට
මෙසේ කියති. ‘ඔබට විරුද්ධව කඩු
ඔසවනු ලබන්නේ නැත. ඔබට සාග-
තවලට මුහුණ දීමට සිදු වෙන්නේ
නැත. දෙවි ඔබට මේ දේශය තුළ
සමාදානය ලබා දෙන්නේය.’ ”[13]

**14** යෙහෝවා දෙවි මට තවදුරටත්
මෙසේ පැවසුවේය. “අනාගතවක්තෘ-
වරු මාගේ නාමයෙන් බොරු අනා-
වැකි පවසති.[14] මම ඔවුන්ව එව්වේවත්

**13 පරි.**
1 යෙරෙ 2:20; යෙරෙ 3:2; එස 16:15
2 යෙරෙ 5:8
3 යෙසා 65:7; එස 6:13
4 හොෂෙ 8:5
5 එස 24:13

**14 පරි.**
6 ද්වි 28:24
7 යෙරෙ 4:28; විලා 1:4; හොෂෙ 4:3; යෝවෙ 1:10
8 යෙසා 3:26; යෙසා 24:4
9 විලා 2:9
10 1සාමු 5:12
11 1රාජා 18:5
12 1රාජා 17:7
13 ගීතා 40:14; ගීතා 109:29; යෙසා 45:16
14 2සාමු 15:30; එස්ත 6:12
15 ලෙවී 26:20; ද්වි 28:23
16 2සාමු 19:4
17 යෝබ් 6:5
18 ද්වි 29:23; යෙසා 42:15; යෙරෙ 12:4; යෝවෙ 1:18
19 එස්රා 9:6; නෙහෙ 9:33; යෙරෙ 5:6; දානි 9:5
20 දානි 9:8
21 යොෂු 7:9; ගීතා 25:11; ගීතා 115:1
22 යෙරෙ 17:13; යෙරෙ 50:7
23 ගීතා 46:1
24 ගීතා 106:8; ගීතා 106:21; යෙසා 45:15; නිත 1:3

**2 තීරුව**
1 විනි 19:7
2 ගීතා 44:23; යෙසා 59:1
3 නික් 29:45; ලෙවී 26:11; ද්වි 23:14; ගීතා 46:5; යෙසා 12:6; 2කොරි 6:16
4 යෙරෙ 15:16; දානි 9:19
5 ගීතා 119:101; යෙරෙ 2:25
6 යෙරෙ 2:23
7 යෙරෙ 6:20; ආමො 5:22

**8** ගීතා 109:14; හොෂෙ 8:13; හොෂෙ 9:9; **9** යෙරෙ 7:16; යෙරෙ 11:14; **10** හිතෝ 1:28; යෙසා 1:15; යෙසා 58:3; යෙරෙ 11:11; එස 8:18; සෙක 7:13; **11** හිතෝ 15:8; යෙසා 1:11; යෙරෙ 7:22; **12** යෙරෙ 9:16; එස 5:12; එස 14:21; **13** යෙරෙ 4:10; යෙරෙ 5:31; යෙරෙ 6:14; යෙරෙ 23:17; යෙරෙ 27:9; එස 13:10; මීකා 3:11; **14** යෙසා 9:15; යෙරෙ 23:25; යෙරෙ 27:10; යෙරෙ 29:8; යෙරෙ 29:21.

ඔවුන්ට එවැනි දේවල් කිරීමට අණ
කළේවත් ඔවුන් සමඟ කතා කළේවත්
නැත.[1] ඔවුන් ඔබට ප්‍රකාශ කරන්-
නේ බොරු දර්ශනය.[2] ඔවුහු පේන
කියති. තම වංචනික සිතුවිලිවලට
අනුව කිසි කමකට නැති අනා-
වැකි ඔබට ප්‍රකාශ කරති.[3] **15** අනා-
වැකි කීමට මම ඔවුන්ව එව්වේ නැත.
නමුත් මාගේ නාමයෙන් අනාවැකි
කියමින්, කඩුවෙන් පහර කන්නේවත්
දේශයට සාගතයක් පැමිණෙන්නේවත්
නැත කියා පැවසූ ඒ අනාගතවක්තෘව-
රුන් සම්බන්ධයෙන් යෙහෝවා දෙවි
වන මම මෙසේ පවසමි. ‘ඔවුහු කඩු-
වෙන් සහ සාගතයෙන් පහර කන්-
නෝය.[4] **16** ඔවුන්ගේ අනාවැකි ඇසූ
සෙනඟද කඩුවෙන් සහ සාගතයෙන්
පහර කා, යෙරුසලමේ වීථිවල වැටී
සිටින්නෝය. ඔවුන්වද ඔවුන්ගේ භාර්-
යාවන්වද ඔවුන්ගේ දූපුතුන්වද තැන්-
පත් කිරීමට කිසිවෙක් එහි නොසිටිනු
ඇත.[5] ඔවුන් කළ දුෂ්ටකම් නිසා
ලැබිය යුතු නිසි දඬුවම මම ඔවුන්ට
දෙන්නෙමි.’[6]

**17** “ඔබ ඔවුන්ට මේ දේත් ප්‍රකාශ
කරන්න. ‘මාගේ දෑසින් රෑ දහ-
වල් දෙකේම, නොනවත්වා කඳුළු
ගලා ඒවා![7] මන්ද අවිවාහක තරු-
ණියක මෙන් වූ මාගේ සෙනඟට
බරපතළ පහරක් වැදී[8] සුව කළ
නොහැකි ලෙස තුවාල වී සිටියි.[9]
**18** බලන්න! මා කෙතට ගියොත්
මට දකින්න ලැබෙන්නේ කඩුවෙන්
මැරුම් කා වැටී සිටින අයවයි.[10]
මා නුවරට ඇතුල් වුණොත් මට
පෙනෙන්නේ සාගතය නිසා රෝගීව
සිටින අයවයි.[11] අනාගතවක්තෘවරු
සහ පූජකයෝ ඔවුන් නොදන්නා දේ-
ශයක ඒ මේ අත සැරිසරති.’ ”[12]

**19** ඔබ යූදා වැසියන්ව සම්පූර්-
ණයෙන්ම අත්හැරියෙහිද?[13] සියොන්
නුවරත් ඔබට පිළිකුලක් වීද?[14] අපට
සුවයක් නොලැබෙන තරමටම ඔබ
අපට පහර දුන්නේ ඇයි?[15] අපි සාමය
ඇති වෙයි කියා බලාපොරොත්තු-
වෙන් සිටියෙමු. නමුත් ඉන් කිසිදු

**14 පරි.**
**1** යෙරෙ 23:21
යෙරෙ 27:15
**2** විලා 2:14
එස 12:24
සෙක 10:2
**3** යෙරෙ 23:26
**4** යෙරෙ 5:13
යෙරෙ 23:15
එස 13:9
**5** ගීතා 79:3
යෙරෙ 9:22
**6** හිතෝ 1:31
යෙරෙ 4:18
**7** යෙරෙ 8:18
යෙරෙ 9:1
විලා 1:16
විලා 2:18
**8** යෙරෙ 8:21
විලා 1:15
**9** යෙරෙ 30:12
**10** එස 7:15
**11** විලා 5:10
**12** ද්වි 28:36
**13** ගීතා 89:38
විලා 5:22
**14** යෙරෙ 12:8
**15** 2ලේක 36:16
යෙරෙ 8:22
යෙරෙ 15:18
විලා 2:13

**2 තීරුව**
**1** යෙරෙ 8:15
**2** ලෙවී 26:40
එස්රා 9:7
නෙහෙ 9:2
ගීතා 106:6
**3** 2සාමු 12:13
ගීතා 51:4
දානි 9:5
දානි 9:8
1යොහ 1:9
**4** එස 36:22
දානි 9:15
**5** යෙරෙ 17:12
**6** නික් 32:13
ලෙවී 26:42
ගීතා 106:45
ලූක් 1:72
**7** ද්වි 32:21
**8** සෙක 10:1
**9** ද්වි 28:12
ගීතා 135:7
ගීතා 147:8
යෙසා 30:23
යෝවෙ 2:23
**10** ගීතා 25:3
ගීතා 130:5

**15 පරි.**
**11** නික් 32:11
**12** 1සාමු 7:9
ගීතා 99:6
**13** ගීතා 106:23
**14** 2රාජා 17:20
යෙරෙ 7:15
**15** යෙරෙ 14:12
එස 5:2
සෙක 11:9

පලක් නොවීය. අපි සුවය ලැබීමට
ආශාවෙන් සිටියෙමු. නමුත් සිදු වූයේ
ඉතා භයානක දෙයකි.[1] **20** යෙ-
හෝවා දෙවියනි, අප කළ දුෂ්ටකම්ද
අපේ මුතුන්මිත්තන් කළ වැරදිද අපි
පිළිගනිමු.[2] අපි සියලුදෙනාම ඔබට
විරුද්ධව බොහෝ පව් කළෙමු.[3]
**21** දෙවියනි, අපව නොවටිනා අය
ලෙස සලකා අපව අහක නොදමන්න.
ඔබේ නාමය වෙනුවෙන් එසේ නොක-
රන්න.[4] ඔබේ තේජවත් සිංහාසනය
හෙළා නොදකින්න.[5] දෙවියනි, මේ
සියල්ල සිහි කර ඔබ අප සමඟ ඇති
කරගත් ගිවිසුම කඩ නොකරන්න.[6]
**22** ජාතීන් නමස්කාර කරන බොරු
දෙවිවරුන් අතරේ[7] වර්ෂාව ගෙන
ඒමට හැකි කෙනෙකු සිටිනවාද?
නැත්නම් මහා වර්ෂාවක් ගෙන ඒමට
අහසට පුළුවන්ද?[8] යෙහෝවා දෙවි-
යනි, මේ සියල්ල කළ හැකි එකම
තැනැත්තා ඔබයි.[9] ඔබට මේ සියල්ල
කළ හැකි නිසා අපි ඔබ කෙරෙහි
බලාපොරොත්තුවෙන් සිටින්නෙමු.[10]

**15** යෙහෝවා දෙවි මට මෙසේ
පැවසුවේය. “මෝසෙස්[11] සහ
සාමුවෙල්[12] මේ සෙනඟ වෙනුවෙන්
මැදිහත් වුණත් මම ඔවුන්ට අනු-
කම්පා නොකරමි.[13] මම මේ සෙනඟව
මා ඉදිරියෙන් පන්නා දමන්නෙමි.[14]
**2** ‘අපි කොහේ යන්නද’ කියා ඔවුන්
ඔබෙන් ඇසුවොත් ඔබ ඔවුන්ට මෙසේ
කියන්න. ‘යෙහෝවා දෙවි පවසන්නේ
මෙයයි. “වසංගතවල ගොදුරක් වීමට
නියම වූ අය ඊට ගොදුරු වුණාවේ.
කඩුවට නියම වූ අය කඩුවෙන් පහර
කෑවාවේ. සාගතයට නියම වූ අය
සාගතයට ගොදුරු වුණාවේ.[15] වහල්-
භාවයට නියම වූ අය වහලුන් ලෙස
ගෙන ගියාවේ.” ’[16]

**3** “යෙහෝවා දෙවි වන මම
මෙසේ පවසමි. ‘මම ඔවුන්ට පහර
දීමට විපත්ති හතරක් නියම කරමි.[17]
ඔවුන්ව මරා දැමීමට කඩුවද ඔවුන්ව
ඇදගෙන යෑමට බල්ලන්වද ඔවුන්ව

**16** යෙරෙ 43:11; එස 12:11; **17** ලෙවී 26:16; එස 14:21.

කා විනාශ කර දැමීමට අහසේ පියාසර
කරන පක්ෂීන්වද[1] පොළොවේ සැරිස-
රන මෘගයන්වද මම ඔවුන් අතරට
එවන්නෙමි. **4** යූදාහි රජු වූ හෙසකි-
යාගේ පුත් මනස්සේ යෙරුසලමේදී
කළ දේවල් නිසා[2] මම මේ සෙනඟ
පිටට විපත්ති ගෙනෙන්නෙමි. ඔවුන්ට
සිදු වන දේ දැක පොළොවේ සියලු
රාජ්‍යයන් බියෙන් වෙවුලනු ඇත.[3]
**5** යෙරුසලමේ වැසියෙනි, ඒ කාල-
යේදී ඔබට කරුණාව පෙන්වන්නේ
කවුද? ඔබට අනුකම්පා කිරීමට කිසි-
වෙක් සිටීවිද?[4] කිසිවෙක් ඔබ අසල
නතර වී ඔබේ දුක සැප විමසයිද?’
**6** “යෙහෝවා දෙවි වන මම තවදු-
රටත් මෙසේ පවසමි. ‘මට පිටු පා[5]
මාව අත්හැර ගියේ ඔවුන්මය.[6] එබැ-
වින් මාගේ හස්තය ඔවුන්ට විරුද්-
ධව දිගු කර මම ඔවුන්ව විනාශ කර
දමන්නෙමි.[7] ඔවුන් ගැන තවදුරටත්
මම කනගාටු නොවෙමි. මාගේ සීමාව
ඉක්මවා ගොස් ඇත.[8] **7** ධාන්‍ය
පොළන්නාක් මෙන් දේශයේ දොරටු
අසලදී මම ඔවුන්ව පොළන්නෙමි.[9]
ඔවුන්ගේ දරුවන්ව ඔවුන්ගෙන් උදුරා-
ගන්නෙමි.[10] මාගේ සෙනඟ වූ ඔවුන්
තමන්ගේ වැරදි මාර්ගයන් වෙනස්
නොකළ නිසා[11] මම ඔවුන්ව විනාශ
කර දමන්නෙමි. **8** ඔවුන්ගේ වැන්-
දඹුවන්ගේ ගණන මාගේ ඇස් ඉදිරියේ
මුහුදේ වැලිවලටත් වඩා වැඩිය. මව-
ටත් තරුණයාටත් පහර දීමට මම
දහවල් කාලයේදී කොල්ලකරුවෙකුව
එවන්නෙමි.[12] ඔවුන් නොසිතන මො-
හොතක ඔවුන් පිටට භීතියත් කම්ප-
නයත් පැමිණීමට සලස්වන්නෙමි.[13]
**9** දරුවන් හත්දෙනෙකු වැදූ ස්ත්‍රිය
මලානිකව සිටින්නීය. ඇය හුස්ම
ගැනීමට වෙර දරන්නීය.[14] ඇගේ
ආලෝකය දහවල් කාලයේදීම අඳුරට
හැරී ඇත.[15] එබැවින් ලැජ්ජාවක් හා
නින්දාවක් ඇයට උරුම විය. ඇගේ
ඉතුරු වූ දරුවන්වත් මම සතුරාගේ
අතට භාර දී කඩුවෙන් විනාශ කර
දමන්නෙමි.[16] මේ දේවල් පවසන මා
යෙහෝවා දෙවිය.’ ”

**10** මගේ මව්නි, මට දුක් වේ.[1]
මන්ද ඔබ වැදුවේ පොළොවේ වැසි-
යන්ගේ ආරවුල්වලටද විවාදවලටද
හේතුවක් වූ පුත්‍රයෙකුවය.[2] මම කිසි-
වෙකුගෙන් ණයට ගත්තේවත් කිසි-
වෙකුට ණයට දුන්නේවත් නැත.
නමුත් සියලුදෙනාම මට ශාප කරති.[3]
**11** යෙහෝවා දෙවි මෙසේ පැවසු-
වේය. “මම අනිවාර්යයෙන්ම ඔබට
උපකාර කරමි.[4] විපත්ති කාලයේදී
මම ඔබ වෙනුවෙන් මැදිහත් වී[5]
ඔබව සතුරාගේ අතින් බේරාගන්-
නෙමි.[6] **12** උතුරෙන් ගෙනා යකඩ,
කැලි කැලිවලට කඩන්න පුළුවන්
කාටද? තඹ, කැබලිවලට කැඩිය
හැක්කේ කාටද? **13** සෙනඟ දේ-
ශය පුරා කළ පව් නිසා ඔවුන්ගේ
ධන සම්පත් සියල්ල පහසුවෙන්ම[7]
පැහැරගෙන යෑමට මම කොල්ල-
කරුවන්ට ඉඩහරින්නෙමි.[8] **14** ඒවා
ඔවුන් නොදන්නා දේශයකට ගෙන
යෑමට ඔවුන්ගේ සතුරන්ට මම ඉඩ
දෙමි.[9] මන්ද මාගේ උදහස ගින්-
නක් මෙන් ඇවිළී තිබේ.[10] එය ඇවිළී
තිබෙන්නේ ඔවුන්ට විරුද්ධවය.”
**15** යෙහෝවා දෙවියනි, මා සිටින
තත්වය ඔබ හොඳින් දන්නෙහිය.[11]
එබැවින් ඔබේ මතකයෙන් මාව ඈත්
නොකරන්න.[12] දෙවියනි, මට පීඩා
කරන්නන්ට දඬුවම් කරන්න.[13] ඔබ
බොහෝ සෙයින් ඉවසමින් ඔවුන් කෙ-
රෙහි පෙන්වන අනුකම්පාව නිසා මාව
විනාශ වී යෑමට ඉඩ නොහරින්න.[14]
ඔබේ සේවකයෙකු ලෙස මා විඳින
නින්දා අපහාස ඔබ නිසා මා දරාගෙන
සිටින බවද අමතක නොකරන්න.[15]
**16** ඔබේ වදන් මට අසන්න ලැබුණු
විට මම එය හොඳින් සිතට ගත්-
තෙමි.*[16] ඉන් මම ඉමහත් සතු-
ටක් ලැබුවෙමි.[17] මන්ද ස්වර්ගයේ
සේනාවල අධිපති වන යෙහෝවා

**15 පරි.**
**1** ද්වි 28:26; යෙරෙ 7:33
**2** 2රාජා 21:11; 2රාජා 23:26; 2රාජා 24:3
**3** ද්වි 28:25; යෙරෙ 24:9; එස 23:46
**4** ගීතා 69:20; යෙසා 51:19; විලා 1:12
**5** යෙසා 1:4; යෙරෙ 7:24
**6** යෙරෙ 1:16; යෙරෙ 2:13
**7** එස 25:7; ශෙප 1:4
**8** යෙරෙ 23:20; එස 24:14; හොෂෙ 13:14
**9** ගීතා 1:4; යෙසා 30:24
**10** ද්වි 28:18; යෙරෙ 9:21; එස 24:21; හොෂෙ 9:12
**11** යෙසා 9:13; යෙරෙ 5:3; ආමො 4:10; සෙක 1:4
**12** යෙරෙ 6:4
**13** ලූක් 21:35
**14** 1සාමු 2:5
**15** ආමො 8:9; මීකා 3:6
**16** යෙරෙ 44:27; එස 5:12

**2 තීරුව**
**1** යෝබ් 3:1; යෙරෙ 20:14
**2** ලූක් 21:17
**3** ගීතා 109:28; හිතෝ 26:2
**4** රෝම 8:28
**5** යෙරෙ 39:12
**6** 2ලේක 20:17
**7** ගීතා 44:12; යෙසා 52:3
**8** යෙරෙ 20:5
**9** ලෙවී 26:38; යෙරෙ 16:13; යෙරෙ 17:4; ආමො 5:27
**10** ද්වි 32:22; යෙසා 42:25; හෙබ්‍රෙ 12:29
**11** යෝබ් 10:7; ගීතා 17:3; යෙරෙ 12:3
**12** නෙහෙ 5:19
**13** යෙරෙ 11:20; යෙරෙ 17:18; යෙරෙ 20:11; යෙරෙ 37:15
**14** ගීතා 102:24
**15** ගීතා 69:7; මතෙ 10:22; රෝම 15:3

**16** එස 3:1; එළි 10:10; **17** යෝබ් 23:12; ගීතා 119:111.

යෙරෙ **15:16*** මූ.අ., “ඔබේ වදන් මට සම්බ වූ විට මම එය කෑවෙමි.”

දෙවියනි,[1] මම ඔබේ නාමය දරමි.[2]
17 විහිළුතහළු කරමින්[3] විනෝදකාමී
ජීවිතයක් ගත කරන අය සමඟ
මම ඇසුරු නොකළෙමි.[4] ඔබගේ මඟ
පෙන්වීම්වලට අනුව ක්‍රියා කරන මම
දැන් තනි වී ඇත.[5] මන්ද සෙ-
නඟ කෙරෙහි ඔබට දැනෙන උදහස
ප්‍රකාශ කිරීමේ වගකීම ඔබ මට භාර
දුන්නෙහිය.[6] 18 මට ඇති වූ වේද-
නාව මගෙන් පහව නොයන්නේ ඇයි?[7]
මගේ තුවාලය සුව නොවන්නේ ඇයි?[8]
මන්ද ඔබ ඉක්මනින් හිඳී යන රැවටි-
ලිකාර දිය උල්පතක් මෙන් විය.[9]
19 එබැවින් යෙහෝවා දෙවි මෙසේ
පැවසුවේය. “ඔබේ ආකල්ප ඔබ වෙ-
නස් කරගත්තොත් නැවතත් මාගේ
කරුණාව ලබා[10] මා ඉදිරියේ සේ-
වය කිරීමට මම ඔබට ඉඩ දෙමි.[11]
ඔබ නිෂ්ඵල දෙයින් අනර්ඝ දේ වෙන්
කළොත් මම ඔබව මාගේ පණිවි-
ඩකරු* ලෙස නැවත යොදාගනිමි.
එවිට සෙනඟගෙන් සමහරෙක් ඔබ
වෙතට එනු ඇත. නමුත් ඔබ ඔවුන්-
ගේ මාර්ගයේ නොයන්න.”
20 “මම ඔබව මේ සෙනඟ ඉදිරියේ
ශක්තිමත් තඹ පවුරක් මෙන් වීමට
සලස්වන්නෙමි.[12] ඔවුන් ඔබට විරුද්-
ධව සටන් කළත් ඔබව පරාජය කිරී-
මට ඔවුන්ට කිසිසේත් නොහැකිය.[13]
මන්ද ඔබව ආරක්ෂා කරන්නත් ඔබව
ගලවාගන්නත් මම ඔබ සමඟ සැමදා
සිටිමි”[14] කියා යෙහෝවා දෙවි පැව-
සුවේය. 21 “මම ඔබව දුෂ්ටයන්ගේ
අතින් ගලවාගන්නෙමි.[15] භයානක
සතුරන්ගේ අතින්ද මම ඔබව මුදවා-
ගන්නෙමි.”

**16** යෙහෝවා දෙවි මට මෙසේද
පැවසුවේය. 2 “ඔබ මේ දේ-
ශයේදී විවාහ නොවන්න. දරුදැරියන්
හදා වඩා නොගන්න.[16] 3 මේ දේශ-
යේ උපදින දරුදැරියන් ගැනද ඔවුන්ව
බිහි කරන මව්වරුන් ගැනද ඔවුන්ව
ජනිත කරන පියවරුන් ගැනද යෙ-
හෝවා දෙවි වන මම මෙසේ පවසමි.[17]

යෙරෙ **15:19*** මූ.අ., “මුඛය.”

**15 පරි.**
1 1සාමු 17:45
2 යෙරෙ 14:9
3 හිතෝ 26:19
4 ගීතා 1:1
5 යෙරෙ 13:17
විලා 3:28
6 යෙරෙ 20:8
7 යෙරෙ 14:19
8 යෙරෙ 30:15
9 යෝබ් 6:15
යෙරෙ 20:7
10 යාකො 4:8
11 1රාජා 17:1
සෙක 3:7
12 යෙරෙ 1:18
එස 3:9
13 යෙරෙ 20:11
රෝම 8:31
14 යෙසා 41:10
ක්‍රියා 18:10
15 යෙසා 25:4
2කොරි 1:10

**16 පරි.**
16 මතෙ 24:19
17 ලූක් 21:23
ලූක් 23:29

**2 තීරුව**
1 යෙරෙ 15:2
2 යෙරෙ 22:18
යෙරෙ 25:33
3 ගීතා 79:3
යෙරෙ 7:33
යෙරෙ 36:30
4 ගීතා 83:10
යෙසා 5:25
යෙරෙ 8:2
යෙරෙ 9:22
5 යෙරෙ 14:15
යෙරෙ 34:17
එස 5:12
6 යෙරෙ 34:20
එස 39:17
එළි 19:17
7 එස 24:16
8 ද්වි 31:17
2ලේක 15:6
යෙසා 27:11
යෙසා 63:10
සෙක 8:10
9 යෙරෙ 16:4
10 ලෙවී 19:28
ද්වි 14:1
යෙරෙ 41:5
11 යෙසා 22:12
12 එස 24:17
හොෂෙ 9:4
13 හිතෝ 31:6
14 දේශ 7:2
15 යෙසා 24:7
යෙරෙ 7:34
යෙරෙ 25:10
එස 26:13
හොෂෙ 2:11
එළි 18:23

4 ‘ඔවුහු මාරාන්තික රෝගවලින් මිය
යන්නෝය.[1] කිසිවෙක් ඔවුන් ගැන
වැලපෙන්නේවත්[2] ඔවුන්ව තැන්පත්
කරන්නේවත්[3] නැත. ඔවුන්ගේ මළ
කඳන් පොළොව මතුපිටම කුණු වී
පොහොර වී යනු ඇත.[4] ඔවුහු කඩුව-
ටද සාගතයටද ගොදුරු වී මිය යනු
ඇත.[5] ඔවුන්ගේ මළ කඳන් ආකාශ-
යේ පක්ෂීන්ටද පොළොවේ මෘගයන්-
ටද ආහාරයක් වන්නේය.’[6]
5 “‘ඔබ මළ ගෙවල්වලට ගොස්
එහි සංග්‍රහයන් භුක්ති නොවිඳින්න.
ඔවුන් ගැන හඬා වැලපෙමින් ශෝක
නොවන්න.’[7] මේ වදන් පවසන්නේ
යෙහෝවා දෙවි වන මමය.
“යෙහෝවා දෙවි වන මම මෙ-
සේද පවසමි. ‘මම තවදුරටත්
ඔවුන්ට සමාදානයෙන් ජීවත් වීමට
ඉඩ දෙන්නේ නැත. ඔවුන්ට ප්‍රේ-
මයෙන්* හා දයාවෙන් සලකන්නේද
නැත.[8] 6 ඔවුන්ගේ ලොකු කුඩා
සැම කෙනෙක්ම මේ දේශයේදී නිසැ-
කවම මරණයට පත් වනු ඇත.
ජනයා ඔවුන්ව තැන්පත් කරන්නේ-
වත්[9] ඔවුන් වෙනුවෙන් පපුවට ගසාග-
නිමින් හඬා වැලපෙන්නේවත් ශරීර
කපාගන්නේවත්[10] හිස් බූ ගාගන්නේ-
වත්[11] නැත. 7 මිය ගිය අය වෙනු-
වෙන් වැලපෙන කෙනෙකුව සනසවන
පිණිස කිසිවෙක් ආහාර වේලක්වත්
නොදෙනු ඇත.[12] තම පියා හෝ මව
හෝ මිය ගිය නිසා වැලපෙන කෙනෙ-
කුව සැනසීමට පානයක්වත් දෙන්නේ
නැත.[13] 8 භෝජන සංග්‍රහයක් දෙන
නිවසකට ගොස් ඔබ ඔවුන් සමඟ
කෑමට හිඳ නොගන්න.’[14]
9 “‘මේ දේශයෙන් ප්‍රීති ඝෝෂා-
වද මනාලයාගේ හා මනාලියගේ හඬද
ඔබේ ජීවිත කාලයේදී තවදුරටත්
ඔබට නොඇසීමට මම සලස්වමි.’[15]
මේ දේවල් පවසන මා ස්වර්ගයේ සේ-
නාවල අධිපතිද ඊශ්‍රායෙල්හි දෙවිද
වන යෙහෝවාය.
10 “මම ඔබට පැවසූ මේ සැම දෙ-

යෙරෙ **16:5*** හෝ, “ඇදි ප්‍රේමයෙන්.”

යක්ම ඔබ සෙනඟට පවසන විට ඔවුහු
ඔබෙන් මෙසේ අසනු ඇත. 'මෙවැනි
මහත් විපතක් යෙහෝවා දෙවි අපට
විරුද්ධව ගෙනෙන බව ඔබ පවසන්නේ
ඇයි? අප කළ වරද කුමක්ද? අපේ
දෙවි වන යෙහෝවාට විරුද්ධව අප
කළ පාපය කුමක්ද?'[1] **11** එවිට ඔබ
ඔවුන්ට මෙසේ කියන්න. 'යෙහෝවා
දෙවි මෙසේ පවසන්නේය. "ඔබේ
මුතුන්මිත්තෝ මාව අත්හැර[2] වෙනත්
දෙවිවරුන්ට නමස්කාර කරමින් ඔවුන්
ඉදිරියේ වැඳ වැටුණෝය.[3] ඔවුහු මාගේ
නීති රීති පිළිපැද්දේ නැත. ඔවුහු මාව
අත්හැර ගියෝය.[4] **12** ඔබේ මුතුන්-
මිත්තන්ටත් වඩා අන්ත ලෙස ඔබ
ක්‍රියා කරන්නහුය.[5] ඔබ මට අකී-
කරු වී[6] ඔබේ දුෂ්ට සිතුවිලිවලට
අනුව මුරණ්ඩු ලෙස ක්‍රියා කරන්-
නහුය.[7] **13** එබැවින් ඔබවත් ඔබේ
මුතුන්මිත්තන්වත් නොදැන සිටි දේශ-
යකට[8] මම ඔබව පන්නා දමන්නෙමි.[9]
මා ඔබට කිසි කරුණාවක් නොපෙන්-
වන නිසා එහිදී ඔබට රෑ දාවල් දෙකේම
වෙනත් දෙවිවරුන්ට දාසකම් කිරීමට
සිදු වනු ඇත."'[10]

**14** "යෙහෝවා දෙවි වන මම
මෙසේ පවසමි. 'මතු දවස්වලදී[11] ඊශ්‍රා-
යෙල් සෙනඟ ජීවමාන යෙහෝවා
දෙවි වන මාගේ නමින් දිවුරන විට
මම ඊජිප්තු දේශයෙන් සෙනඟව පිට-
තට ගෙනා ආකාරය සිහි නොකරනු
ඇත.[12] **15** නමුත් උතුරු දේශයට
හා වෙනත් දේශවලට මා විසුරුවාහැ-
රිය සෙනඟව මා නැවත ඔවුන්ගේ දේ-
ශයට ගෙනා ආකාරය සිහි කරමින්
ඔවුහු ජීවමාන යෙහෝවා දෙවි වන
මාගේ නමින් දිවුරනු ඇත. මන්ද මම
නිසැකවම ඔවුන්ගේ මුතුන්මිත්තන්ට
දුන් දේශයට ඔවුන්ව නැවත ගෙ-
නෙන්නෙමි.'[13]

**16** "යෙහෝවා දෙවි වන මම මෙ-
සේද පවසමි. 'මම ඔවුන් අතරට
ධීවරයන්ව යවන්නෙමි. ඔවුහු මසුන්
අල්ලන්නාක් මෙන් ඔවුන් වාසය
කරන තැන් සොයා ගොස් ඔවුන්ව
එකතු කරගන්නෝය. ඔවුන්ව
සෙවීම සඳහා මම බොහෝ අයව*
යවන්නෙමි.[1] ඔවුහු සියලු කඳුවල-
ටද හෙල්වලටද පර්වත විවරවලටද
ගොස් සෙනඟව සොයාගන්නෝය.[2]
**17** සෙනඟ කරන සෑම දෙයක්ම
මට පෙනෙන්නේය. ඔවුන්ට මාගෙන්
සැඟවී සිටිය නොහැකිය. තමන්-
ගේ වැරදි මට නොපෙනෙන ලෙස
සඟවා තබන්නවත් ඔවුන්ට නො-
හැක.[3] **18** ඔවුන් මාගේ දේශය දූෂ්‍ය
කරමින්[4] කළ පව්වලටත් ඔවුන්ගේ
දුෂ්ට ක්‍රියාවලටත් ඔවුන් ලැබිය යුතු
නිසි දඬුවම මම ඔවුන්ට දෙමි.[5] මාගේ
උරුමය වන මේ දේශය, මළ කඳන්
හා සමාන වූ ඔවුන්ගේ පිළිකුල්සහගත
රූපවලින් ඔවුහු පිරෙව්වෝය.' "[6]

**19** යෙහෝවා දෙවියනි, මගේ ශක්-
තියත් මගේ බලකොටුවත් ඔබයි.
විපත්ති කාලයේදී මට පලා
ගොස් සැඟවී සිටිය හැක්කේ ඔබ
ළඟයි.[7] පොළොවේ ඈත කෙළව-
රේ සිට ජාතීහු ඔබ වෙතට පැමිණ[8]
මෙසේ පවසනු ඇත. "අපේ මුතුන්-
මිත්තන්ගේ උරුමය වූයේ කිසිම
වැඩකට නැති,[9] නිෂ්ඵල, බොරු
දෙවිවරුන්ට කළ නමස්කාරයයි."[10]
**20** පිහිට ලබාගැනීම සඳහා දෙවි-
වරුන්ව සාදාගැනීමට මනුෂ්‍යයන්ට
පුළුවන්ද? ඔවුන් දෙවිවරුන් සාදාගත්-
තද ඒ දෙවිවරුන් සැබෑ දෙවිවරුන්
නොවේ.[11]

**21** "එක් අවස්ථාවකදී මාගේ
මහත් බලය හා ශක්තිය ගැන
මම ඔවුන්ට දැනගැනීමට සලස්වන්-
නෙමි.[12] එවිට මාගේ නාමය යෙ-
හෝවා බව ඔවුන්ට අනිවාර්යයෙන්ම
දැනගැනීමට සිදු වනු ඇත."[13]

# 17

"යූදා වැසියන්ගේ පාපය
යකඩ පන්හිඳකින් ලියා
තිබේ.[14] ඒවා දියමන්ති තුඩ-
කින් ඔවුන්ගේ සිත්වලද[15] ඔවුන්ගේ

---

**12** නික් 9:16; රෝම 9:17; **13** නික් 15:3; ගීතා 83:18; යෙරෙ 33:2; **17 පරි.** **14** යෝබ් 19:24; **15** හිතෝ 3:3; 2කොරි 3:3.

---

යෙරෙ **16:16*** මූ.අ., "දඩයක්කරුවන්ව."

**16 පරි.**
**1** ද්වි 29:24 යෙරෙ 5:19 යෙරෙ 13:22 යෙරෙ 22:8
**2** ද්වි 29:25 විනි 2:12 නෙහෙ 9:26 යෙරෙ 2:8 යෙරෙ 5:7 යෙරෙ 22:9
**3** යෙරෙ 8:2 යෙරෙ 13:10
**4** දානි 9:11 ආමො 2:4
**5** නෙහෙ 9:16 යෙරෙ 7:26
**6** 1සාමු 15:23
**7** ද්වි 29:19 විනි 2:19 නෙහෙ 9:29 යෙරෙ 6:28 යෙරෙ 7:24 යෙරෙ 9:14
**8** යෙරෙ 15:14 යෙරෙ 17:4
**9** ද්වි 28:36 2ලේක 7:20
**10** ද්වි 4:28
**11** යෙරෙ 23:7
**12** නික් 20:2 ද්වි 15:15 මීකා 6:4
**13** ද්වි 30:3 යෙරෙ 3:18 යෙරෙ 24:6 යෙරෙ 30:3 යෙරෙ 32:37 ආමො 9:14

**2 තීරුව**
**1** විලා 4:18
**2** ආමො 9:1
**3** යෝබ් 34:21 ගීතා 90:8 හිතෝ 5:21 හිතෝ 15:3 යෙරෙ 32:19 හෙබ්‍රෙ 4:13
**4** ගණන් 35:33 ගීතා 106:38
**5** යෙසා 40:2 යෙරෙ 17:18
**6** ලෙවී 26:30
**7** ගීතා 18:2 හිතෝ 18:10 යෙසා 25:4 යෙරෙ 17:17 නාහු 1:7
**8** යෙසා 2:2 සෙක 2:11
**9** යෙරෙ 10:14
**10** යෙසා 44:10 යෙරෙ 10:5
**11** ගීතා 115:4 යෙසා 37:19 යෙරෙ 2:11 ක්‍රියා 19:26 1කොරි 8:4 ගලා 4:8

පූජාසනවල අං මතද[1] කොටා තිබේ.
**2** ඔවුන් තැනූ පූජාසනද නමස්කා-
රය සඳහා සෑදූ කුලුනුද ඔවුන්-
ගේ පුත්‍රයන්ට පවා මතකය. ඔවුහු
ඒවා සරුසාරව වැඩුණු ගස් අසලද
හෙල් මතද[2] **3** කඳු මුදුන්වලද ඉදි
කළෝය. ඔබ දේශය පුරා කළ පව්
නිසා නමස්කාරය සඳහා ඔබ ඉදි කළ
සියලු පූජනීය ස්ථාන කොල්ල කෑමට
මම ඉඩහරින්නෙමි.[3] ඔබේ ධන සම්-
පත් සියල්ලද පහසුවෙන් පැහැරගෙන
යෑමට මම කොල්ලකරුවන්ට ඉඩහ-
රින්නෙමි.[4] **4** මම ඔබට දුන් උරු-
මය[5] ඔබ අත්හැර දැමුවහුය. එබැවින්
ඔබ නොදන්නා දේශයකදී ඔබේ සතු-
රන්ට මෙහෙකාරකම් කිරීමට ඔබට
සිදු වනු ඇත.[6] ඔබ නිසා මාගේ උද-
හස ගින්නක් මෙන් ඇවිළී තිබේ.[7] එය
කිසිදා නිවී නොයයි.”

**5** යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. “යෙහෝවා දෙවි වන මාගෙන්
ඈත් වී[8] මනුෂ්‍යයන් කෙරෙහි විශ්වා-
සය තබා[9] ඔවුන්ගේ ශක්තිය මත
රඳා සිටින[10] තැනැත්තා ශාප ලද්-
දෙක් වන්නේය. **6** ඔහු පාළුකරයේ
හුදෙකලාවේ වැවී තිබෙන ගසකට
සමාන වනු ඇත. එම ගස මෙන්
ඔහුද කිසි දිනක හොඳ කාලයක්
අද්දකින්නේ නැත.[11] ඔහු පාළුකර-
යේ වියළි තැනක, මිනිසුන් නොව-
සන ලුණු බිමක වාසය කරනු ඇත.[12]
**7** නමුත් යෙහෝවා දෙවිව විශ්වාස
කරමින් යෙහෝවා දෙවි මත රඳා
සිටින තැනැත්තා ආශීර්වාද ලද්-
දෙක් වන්නේය.[13] **8** ඔහු දිය පාර-
වල් අසල සිටෙවූ, දිය උල්පත් වෙතට
මුල් ඇද ඇති ගසකට සමාන වනු
ඇත. ඔහු අතු පතර සරුවට වැඩී
ඇති ගසක් මෙන් වන්නේය.[14] දැඩි
හිරු රශ්මියෙන් කිසිදු හානියක් නො-
වන, නියඟයකට පවා[15] හොඳින්
ඔරොත්තු දෙන, දිගටම පල දරන
ගසකට ඔහු සමාන වන්නේය.

**9** “සියල්ලටම වඩා මිනිසාගේ සිත
රැවටිලිකාරය. එබැවින් ඔහු උත්සාහ
කරන්නේ කෙසේ හෝ තම ආශාව
ඉටු කරගැනීමටය.[1] ඒ රැවටිලිකාර
සිත තේරුම්ගත හැක්කේ කාටද?
**10** යෙහෝවා දෙවි වන මම මනුෂ්‍ය-
යන්ගේ සිත් සෝදිසි කර[2] ඔවුන්ගේ
ඇතුළාන්ත හැඟීම් විමසා බලන්-
නෙමි.[3] මා එසේ කරන්නේ ඔවුන් එකි-
නෙකා ගත කරන ජීවිතයට අනුව
ඔවුන්ට නිසි ප්‍රතිඵල ලබා දීමටය.[4]
**11** අසාධාරණ ලෙස ධන සම්පත් රැස්
කරන තැනැත්තා වටුවෙකුට සමා-
නය.[5] මන්ද ඌ තමා නොදැමූ බිත්-
තර පවා රැස් කරගනිති. නමුත්
කලක් ගත වූ පසු එම තැනැත්තාගේ
ධන සම්පත් සියල්ල ඔහුව අත්හැර
යයි.[6] අවසානයේදී ඔහුගේ අඥානකම
පැහැදිලිව දිස් වෙයි.”[7]

**12** දෙවිගේ තේජවත් සිංහාසන-
යට මුල සිටම ගෞරවය හිමි වී
ඇත.[8] එය අපගේ ශුද්ධස්ථානයයි.[9]
**13** යෙහෝවා දෙවියනි, ඊශ්‍රායෙල්හි
බලාපොරොත්තුව ඔබයි.[10] නමුත්
ඔබව අත්හැර යන සියලුදෙනාම
ලැජ්ජාවට පත් වන්නෝය.[11] ඔවුන්
ජීවනදායක දිය උල්පත වන යෙ-
හෝවා දෙවි[12] වන ඔබව අත්හැර
යන බැවින්[13] ඔවුන්ගේ නම් ලියනු
ලබන්නේ පොළොවේ දූවිලි මතය.
**14** යෙහෝවා දෙවියනි, මාව සුව
කරන්න. ඔබ එසේ කළොත් මට
සුවය ලැබේ.[14] දෙවියනි, මාව බේර-
ගන්න. ඔබ එසේ කළොත් මට ගැල-
වීම ලැබෙයි.[15] මන්ද මා ප්‍රශංසා
කරන්නේ ඔබට පමණය.[16]

**15** බලන්න! සෙනඟ මගෙන්
මෙසේ අසති. “යෙහෝවා දෙවි පැවසූ
දේ තවම ඉටු නොවුණේ ඇයි?”[17]
**16** ඔවුන් එසේ ඇසුවත් එඬේරෙකු
ලෙස මට ලැබුණු වගකීම මම අත්-
හැර ගියේ නැත. මම ඔබට කරමින්
සිටි සේවය නතර නොකළෙමි. විනා-
ශයේ දවස එන තෙක් මම ආශා-

**17 පරි.**
**1** ආමො 3:14
**2** විනි 3:7; 1රාජා 14:23; 2රාජා 16:4; 2ලේක 24:18; 2ලේක 33:3; ගීතා 78:58; යෙසා 1:29; යෙරෙ 2:20; එස 6:13; එස 20:28
**3** ලෙවී 26:30; එස 6:3
**4** 2රාජා 24:13; යෙරෙ 15:13
**5** යෙසා 49:8; විලා 5:2
**6** ද්වි 28:48; නෙහෙ 9:28; යෙරෙ 16:13
**7** ද්වි 29:27; යෙසා 5:25; යෙරෙ 15:14; නාහු 1:6
**8** 2රාජා 16:7; එස 6:9
**9** යෙසා 30:2; යෙසා 31:1
**10** 2ලේක 32:8; යෙසා 31:3
**11** 2රාජා 7:2
**12** ද්වි 29:23; යෝබ් 39:6; ශෙප 2:9
**13** ගීතා 34:8; ගීතා 125:1; ගීතා 146:5; හිතෝ 16:20; යෙසා 26:3; යෙසා 30:18
**14** ගීතා 1:3; ගීතා 92:12
**15** යෙරෙ 14:1

**2 තීරුව**
**1** උත් 6:5; උත් 8:21; හිතෝ 28:26; යෙසා 44:20; යෙසා 59:13; යාකො 1:14; යාකො 1:26
**2** 1සාමු 16:7; 1ලේක 28:9; ගීතා 139:23; හිතෝ 17:3; හිතෝ 21:2; රෝම 8:27
**3** ගීතා 7:9
**4** ගීතා 62:12; යෙසා 3:10; යෙරෙ 32:19; මීකා 7:13; රෝම 2:6; රෝම 6:21; ගලා 6:7; එළි 2:23; එළි 22:12
**5** හිතෝ 28:20; යෙසා 1:23; යෙරෙ 5:27; යාකො 5:4

**6** ගීතා 55:23; **7** ලූක් 12:20; **8** යෙරෙ 14:21; **9** 2ලේක 2:5; යෙසා 6:1; **10** ගීතා 22:4; යෙරෙ 14:8; යෙරෙ 50:7; **11** ගීතා 97:7; **12** ගීතා 36:9; යෙරෙ 2:13; එළි 22:1; **13** ගීතා 73:27; යෙසා 1:28; **14** ද්වි 32:39; ගීතා 6:2; **15** ගීතා 60:5; යෙරෙ 15:20; **16** ද්වි 10:21; ගීතා 109:1; **17** යෙසා 5:19; 2පේතෘ 3:4.

වෙන් බලා නොසිටියෙමි. මා පැවසූ
සැම දෙයක්ම ඔබ හොඳින් දන්නෙ-
හිය. ඒ කිසිවක් මම ඔබෙන් සැඟවූ-
යේ නැත. **17** දෙවියනි, මාව අත්
නොහරින්න. මන්ද විපත්ති කාලයේදී
මගේ රැකවරණය ඔබය.[1] ඔබ මාව
අත්හැරියොත් භීතිය මාව වෙළාගනු
ඇත.[2] **18** දෙවියනි, මාව ලැජ්ජාවට
පත් වීමට ඉඩ නොදෙන්න.[3] මා පිටට
භීතිය පැමිණීමට ඉඩ නොදෙන්න.
නමුත් මට පීඩා කරන්නෝ ලැජ්-
ජාවට පත් වෙත්වා![4] ඔවුහු භයෙන්
තැතිගනිත්වා! විපත්ති දවස ඔවුන්
පිටට පමුණුවන්න.[5] ඔවුන්ව සහමු-
ලින්ම විනාශ කර දමන්න.[6]

**19** යෙහෝවා දෙවි මට මෙසේ
පැවසුවේය. "ඔබ ගොස් යූදාහි රජ-
වරුන් යන එන ප්‍රධාන දොරටුව*
අසලද යෙරුසලමේ අනිකුත් දො-
රටු අසලද සිටගෙන,[7] **20** සෙනඟට
මෙසේ කියන්න. 'මේ දොරටුවලින්
ඇතුල් වන යූදාහි රජවරුනි, යූදාහි
වැසියෙනි, යෙරුසලමේ ජනයෙනි,
යෙහෝවා දෙවි පවසන දේට ඇහුම්-
කන් දෙන්න.[8] **21** යෙහෝවා දෙවි
මෙසේ පවසන්නේය. "ජීවිතය රැකගැ-
නීමට ඔබ කැමති නම්[9] සබත් දවස
තුළ කිසිම බරක් උසුලාගෙන යෙ-
රුසලමේ දොරටුවලින් ඇතුල් නො-
වන්න.[10] **22** සබත් දවසේදී ඔබේ
නිවසින් පිටතට කිසි බරක් උසුලා-
ගෙන නොයන්න. ඔබ එදින කිසිම
වැඩක් නොකළ යුතුයි.[11] මා ඔබේ
මුතුන්මිත්තන්ට අණ කළ ලෙස
ඔබ සබත් දවස ශුද්ධ දවසක් ලෙස
සැලකිය යුතුයි.[12] **23** නමුත් ඔබේ
මුතුන්මිත්තෝ මා දුන් අණ පිළි-
පැද්දේ නැත.[13] තම සිත් දැඩි
කරගත් ඔවුහු[14] මට සවන් නොදුන්-
නෝය. මාගේ හික්මවීම් පිළි නො-
ගත්තෝය." '[15]

**24** " 'යෙහෝවා දෙවි මෙසේද
පැවසුවේය. "සබත් දවසේදී කිසි-
වක් උසුලාගෙන මේ නගරයේ දො-
රටුවලින් ඇතුල් නොවන්න.[1] එදින
කිසි වැඩක් නොකර එය ශුද්ධ දවසක්
ලෙස සලකන්න.[2] එසේ කරමින් ඔබ
මා පැවසූ සියලු දේට කීකරු වන්-
නේ නම්[3] **25** දාවිත් රජුගේ පෙළප-
තින් පැමිණෙන[4] රජවරුද ඔවුන්ගේ
අධිපතීහුද මේ දොරටුවලින් නිසැක-
වම ඇතුල් වනු ඇත.[5] ඒ රජවරුද
ඔවුන්ගේ අධිපතීහුද අශ්ව රථ පිට
නැඟී යූදාහි හා යෙරුසලමේ වැසියන්
සමඟ මේ දොරටුවලින් ඇතුල් වනු
ඇත. මේ නගරය සැමදා ජනාවාසව
තිබෙනු ඇත. **26** යූදාහි නගරව-
ලින්ද යෙරුසලම අවට ප්‍රදේශවලින්ද
බෙන්ජමින් ගෝත්‍රයට අයත් දේශ-
යෙන්ද[6] පහත් බිම්වලින්ද[7] කඳුකර
පළාතෙන්ද[8] නෙගෙබ් ප්‍රදේශයෙන්ද[9]
යෙහෝවා දෙවිගේ ගෘහයට සෙනඟ
පැමිණෙනු ඇත. ඔවුහු දවන පූජාත්[10]
ධාන්‍ය පූජාත්[11] ස්තුති පූජාත්[12] වෙ-
නත් පූජාත්[13] කට්ටකුමංජලුත්[14]
රැගෙන පැමිණෙනු ඇත.

**27** " ' "නමුත් සබත් දවස ශුද්ධ දව-
සක් ලෙස සලකමින් එදින බර උසු-
ලාගෙන යෙරුසලමේ දොරටුවලින්
ඇතුල් නොවන්න කියා මා දුන් ආඥා-
වට ඔබ කීකරු නොවුණොත්[15] යෙ-
රුසලමේ දොරටු සියල්ල දැවී යන
ලෙස මම ගින්නක් අවුළුවන්නෙමි.[16]
එහි බලකොටු සියල්ල ඒ ගින්නෙන්
පිලිස්සී යනු ඇත.[17] එය නිවා දැමී-
මට කිසිවෙකුටවත් නොහැකි වන්-
නේය." ' "[18]

# 18

**18** යෙහෝවා දෙවිගෙන් යෙරෙ-
මියාට ලැබුණු පණිවිඩය මෙ-
යයි. **2** "ඔබ කුඹල්කරුගේ නිවසට
යන්න.[19] එහිදී මාගේ පණිවිඩය ඔබට
කියන්නෙමි."

**3** එබැවින් මම කුඹල්කරුගේ නිව-
සට ගියෙමි. මා එහි ගිය විට ඔහු සක-
පෝරුවෙන් වැඩ කරමින් සිටියේය.
**4** ඔහු සාදමින් සිටි මැටි බඳුන ඔහු
සිතූ ආකාරයටම නොසැදුණු නිසා
ඔහු ඒ මැටිම භාවිත කර තමන්
කැමති ආකාරයේ වෙනත් බඳුනක්
තැනුවේය.[20]

**17 පරි.**
1 ගීතා 59:16
2 ගීතා 88:15
3 ගීතා 25:2
4 ගීතා 35:4
යෙරෙ 15:15
යෙරෙ 20:11
5 යෙරෙ 18:23
6 යෙරෙ 16:18
7 නෙහෙ 8:3
යෙරෙ 7:2
8 ගීතා 49:1
හිතෝ 1:21
යෙරෙ 19:3
යෙරෙ 22:2
9 ද්වි 4:9
10 ගණන් 15:32
නෙහෙ 13:19
11 නික් 20:10
නික් 23:12
ලෙවී 23:3
12 නික් 31:13
එස 20:12
13 යෙරෙ 7:24
යෙරෙ 11:10
එස 20:13
14 හිතෝ 29:1
යෙසා 48:4
15 හිතෝ 1:3
හිතෝ 5:12
ශෙප 3:7

**2 තීරුව**
1 යෙරෙ 17:21
2 නික් 34:21
ද්වි 5:12
3 ද්වි 11:13
4 ගීතා 132:11
5 යෙරෙ 22:4
6 යෙරෙ 32:44
7 යෙරෙ 33:13
8 ද්වි 1:7
9 සෙක 7:7
10 ලෙවී 1:3
11 ලෙවී 2:1
12 ගීතා 50:23
ගීතා 107:22
ගීතා 116:17
යෙරෙ 33:11
හෙබ්‍රෙ 13:15
13 එස්රා 3:3
14 ලෙවී 2:2
15 නෙහෙ 13:16
16 යෙරෙ 21:14
විලා 4:11
ආමො 1:4
17 2රාජා 25:9
2ලේක 36:19
යෙරෙ 39:8
යෙරෙ 52:13
18 2රාජා 22:17
එස 20:47

**18 පරි.**
19 යෙරෙ 19:1
20 යෙසා 45:9
රෝම 9:20

යෙරෙ **17:19*** මූ.අ., "සෙනඟගේ දොරටුව."

**5** එවිට යෙහෝවා දෙවි මට මෙසේ
පැවසුවේය. **6** "'ඊශ්‍රායෙල් ජන-
යෙනි, මේ කුඹල්කරු ඔහු අතේ තිබූ
මැටි පිඩට කළ දේම ඔබටත් කිරී-
මට මට නොහැකිද' කියා යෙහෝවා
දෙවි වන මම ඔබෙන් අසමි. 'ඊශ්‍රා-
යෙල් ජනයෙනි, තම අතේ තිබෙන
මැටි පිඩට කැමති දෙයක් කිරීමට
කුඹල්කරුට අයිතියක් තිබෙන්නාක්
මෙන් ඔබ සම්බන්ධයෙන් කැමති දෙ-
යක් කිරීමට මටද අයිතියක් තිබේ.[1]
**7** ජාතියක් හෝ රාජ්‍යයක් පෙරළා
දමා එය විනාශ කර දමන බව යම්
අවස්ථාවක මා ප්‍රකාශ කළත්[2] **8** ඒ
ජාතිය තමන් ගිය වැරදි මාර්ගවලින්
ඉවත් වී හරි මාර්ගයට පැමිණියොත්[3]
මම ඔවුන් පිටට විපත්ති ගෙන
ඒමට ගත් තීරණය වෙනස් කරමි.[4]
**9** එමෙන්ම යම් ජාතියක් හෝ රාජ්‍ය-
යක් නඟා සිටුවා, එය ස්ථිරවම පිහිටු-
වන බව යම් අවස්ථාවක මා ප්‍රකාශ
කළත්[5] **10** ඒ ජාතිය මට අකීකරු වී
දුෂ්ට දේවල් කළොත්[6] මම ඔවුන් වෙ-
නුවෙන් යහපත් දේ කිරීමට ගත් තීර-
ණය වෙනස් කරමි.'

**11** "යූදා හා යෙරුසලමේ වැසි-
යන්ට මේ දේවල් පවසන මෙන්
මම ඔබෙන් ඉල්ලමි. 'යෙහෝවා
දෙවි මෙසේ පවසන්නේය. "ඔබ පිටට
විපත්තියක් ගෙන ඒමට මම තීර-
ණය කළෙමි.[7] එබැවින් ඔබ ගමන්
කරන දුෂ්ට මාවත්වලින් ඉවත් වී
යහපත් ලෙස හැසිරෙන්න කියා මම
ඔබෙන් ඉල්ලමි. ජනයෙනි, හරි මාර්-
ගයේ ගමන් කරන්න."'"[8]

**12** නමුත් සෙනඟ මෙසේ පැවසු-
වෝය. "ඔය දේවල්වලින් අපට වැඩක්
නැහැ.[9] අපේ දුෂ්ට සිතුවිලිවලට අනුව
අපි කැමති දෙයක් කරනවා. අපි යන්-
නේ අපි කැමති මාර්ගයෙයි."[10]

**13** එබැවින් යෙහෝවා දෙවි මෙසේ
පැවසුවේය. "එවැනි වදන් කිසිවෙකු
මීට පෙර අසා ඇද්ද කියා වෙනත්
ජාතීන්ගෙන් විමසා බලන්න. ඊශ්‍රා-
යෙල් සෙනඟ කළේ මොන තරම්
පිළිකුල්සහගත දෙයක්ද![11] **14** ලෙ-

**18 පරි.**
**1** රෝම 9:21
**2** යෙරෙ 1:10; යෙරෙ 12:14; යෙරෙ 25:9; යෙරෙ 45:4; ආමො 9:8; යෝනා 3:4
**3** 1රාජා 8:33; යෙරෙ 7:3; එස 18:21; එස 33:11; යෝනා 3:5
**4** ගීතා 106:45; යෙරෙ 26:3; යෝවෙ 2:13; යෝනා 3:10; යෝනා 4:2
**5** යෙරෙ 30:18; යෙරෙ 32:41; ආමො 9:11
**6** ගීතා 125:5
**7** යෙරෙ 26:3; මීකා 2:3
**8** 2රාජා 17:13; යෙසා 1:16; යෙරෙ 7:3; යෙරෙ 26:13; එස 18:23; ක්‍රියා 26:20
**9** යෙරෙ 2:25; රෝම 2:5; හෙබ්‍රෙ 3:13
**10** ද්වි 29:19; යෙරෙ 7:24
**11** යෙරෙ 2:13; යෙරෙ 5:30

**2 තීරුව**
**1** යෙරෙ 2:19; යෙරෙ 3:21; යෙරෙ 13:25; යෙරෙ 16:19; යෙරෙ 17:13
**2** ද්වි 32:21; යෙසා 41:29; යෙරෙ 10:15
**3** මලා 2:8
**4** යෙරෙ 6:16
**5** ලෙවී 26:33; යෙරෙ 19:8; යෙරෙ 49:13; එස 6:14
**6** ද්වි 29:24; 1රාජා 9:8; විලා 2:15; මීකා 6:16
**7** ද්වි 28:37; ගීතා 44:14
**8** ගීතා 48:7; යෙරෙ 13:24
**9** ද්වි 31:17; යෙරෙ 2:27
**10** ගීතා 21:11; යෙරෙ 11:19
**11** ලෙවී 10:11; මලා 2:7
**12** 1රාජා 22:24
**13** ගීතා 52:2; හිතෝ 18:21

බනොන්හි උස් කඳු මත ඇති හිම
කිසිදාක නැති වී යයිද? දුර ඇත සිට
ගලා එන සිසිල් දිය පහර කෙදිනක
හෝ සිඳී යයිද? **15** නමුත් මාගේම
සෙනඟ මාව අමතක කළෝය.[1] ඔවුහු
නිෂ්ඵල දේවලට සුවඳ දුම් ඔප්පු
කරමින්[2] සෙනඟව නොමඟ යැවූහ.[3]
ඔවුහු පුරාණයේ සිට ගමන් කළ
නිවැරදි මාර්ගයෙන්[4] ඉවත් වී ගල්
බොරලු ඇති වැරදි මාර්ගවල ගමන්
කළෝය. **16** එබැවින් ඔවුන්ගේ දේ-
ශයට සිදු වන විපත දකින සියලුදෙ-
නාම පුදුමයට පත් වනු ඇත.[5] දේශය
සදහටම සියල්ලන්ගේ නින්දාවට ලක්
වන්නේය.[6] එය පසු කර යන සෑම
කෙනෙක්ම සිදු වී ඇති විපත දෙස
පුදුමයෙන් බලා සමච්චලේට මෙන්
හිස වනනු ඇත.[7] **17** නැඟෙනහිරින්
හමන සුළඟින් සියල්ල විසිරී යන්නාක්
මෙන් මම මේ සෙනඟව ඔවුන්ගේ සතු-
රන් ඉදිරියේ සීසීකඩ විසුරුවාහරින්-
නෙමි.[8] ඔවුන්ගේ විපත්ති දවසේදී මම
ඔවුන්ට පිටුපාන්නෙමි."[9]

**18** එවිට ඔවුහු එකිනෙකා අත-
රේ මෙසේ කියාගත්තෝය. "එන්න,
අපි යෙරෙමියාට උගුලක් අටවමු.[10]
අපිට නීතිය උගන්වන්න පූජකයන්
සිටිනවා.[11] අපිට මඟ පෙන්වන්න
ප්‍රඥාවන්තයන් සිටිනවා. අනාගත-
වක්තෘවරුන් අපට අනාවැකි කිය-
නවා.[12] ඒ නිසා යෙරෙමියා කියන
කිසි දේකට ඇහුම්කන් දෙන්න අපට
අවශ්‍ය නැහැ. එන්න, අපි ඔහුට විරුද්-
ධව චෝදනා කරමු."[13]

**19** යෙහෝවා දෙවියනි, මා සිටින
මේ තත්වය සැලකිල්ලට ගන්න.
මගේ සතුරන් මට විරුද්ධව පව-
සන දේවල්වලට ඔබේ සවන් යොමු
කරන්න.[14] **20** මා කළ යහපත් දේ-
වල්වලට මට ලැබිය යුත්තේ මෙවැනි
නපුරු ප්‍රතිඵලද?[15] ඔවුන්ට විරුද්-
ධව ඇති වූ ඔබේ උදහස නිවා
දමන පිණිස මා ඔවුන් වෙනුවෙන්
ඔබ ඉදිරියේ කන්නලව් කළ ආකා-

**14** 2රාජා 19:16; නෙහෙ 4:4; **15** ගීතා 109:5.

රය සිහි කරන්න.[1] නමුත් ඔවුන්
නිතරම උත්සාහ කරන්නේ බොරු
වළවල් හාරා මාව හසු කරගැනී-
මටය.[2] **21** ඒ නිසා ඔවුන්ගේ
පුත්‍රයන් පිටට සාගත පමුණුවන්න.[3]
ඔවුන්ව කඩුවෙන් විනාශ වී යෑමට
සලස්වන්න.[4] ඔවුන්ගේ භාර්යාවෝ
වැන්දඹුවන් වෙත්වා! ඔවුන්ගේ දරු-
වන් අහිමි වී ඔවුහු හඬා වැල-
පෙත්වා![5] පුරුෂයෝ වසංගතවලින්
මරණයට පත් වෙත්වා! තරුණයෝ
යුද්ධයේදී කඩු පහරට ලක් වෙත්වා![6]
**22** ඔබ හදිසියේම සතුරු සේනාවක්
ඔවුන්ට විරුද්ධව කැඳවන විට ඔවුන්-
ගේ නිවෙස්වලින් කෑ මොර ගැසීමක්
ඇසේවා![7] මන්ද ඔවුහු මාව හසු කර-
ගැනීමට බොරු වළවල් හාරා ඇත.
මගේ පාද පටලවා මාව බිම හෙළීමට
ඔවුහු උගුල් අටවා ඇත.[8]

**23** යෙහෝවා දෙවියනි, මාව මරා
දැමීමේ අරමුණින් ඔවුන් කරන
කුමන්ත්‍රණ සියල්ල ඔබ හොඳින් දන්-
නෙහිය.[9] ඔවුන් කළ වරදට කිසිම
සමාවක් නොදෙන්න. ඔවුන් කළ
පාපය මකා නොදමන්න. ඔවුන්ගේ
වැටීම ඔබ ඉදිරියේම සිදු වේවා![10]
ඔබේ උදහස වගුරුවන දවසේදී
ඔවුන්ට දඬුවම් කරන්න.[11]

**19** යෙහෝවා දෙවි මෙසේ පැවසු-
වේය. "කුඹල්කරුවෙකුගෙන්
මැටි බඳුනක් ඉල්ලාගන්න.[12] ඉන්පසු
සෙනඟ අතරේ සිටින වැඩිමහල්ලන්-
ගෙන් කිහිපදෙනෙකුද ප්‍රධාන පූජක-
යන් කිහිපදෙනෙකුද සමඟ **2** කුඹල්
දොරටුව අසල තිබෙන බෙන්හින්-
නොම් නිම්නයට යන්න.[13] මම ඔබට
දැනුම් දෙන පණිවිඩය එහිදී ඔවුන්ට
ප්‍රකාශ කරන්න.[14] **3** ඔබ ඔවුන්ට
මෙසේ පවසන්න. 'යූදාහි රජවරුනි,
යෙරුසලමේ වැසියෙනි, යෙහෝවා
දෙවි පැවසූ දේට ඇහුම්කන් දෙන්න.[15]
ස්වර්ගයේ සේනාවල අධිපතිද[16] ඊශ්‍රා-
යෙල්හි දෙවිද වන යෙහෝවා මෙසේ
පවසන්නේය.

"'"මම මේ ස්ථානය පිටට විපත්ති-
යක් ගෙනෙන්නෙමි. ඒ ගැන අසන
සියලුදෙනා භයෙන් තිගැස්සෙන්-
නෝය.[1] **4** මා එසේ කරන්නේ සෙ-
නඟ මාව අත්හැර ගිය නිසාය.[2]
එමෙන්ම මේ සෙනඟද ඔවුන්ගේ
මුතුන්මිත්තන්ද යූදාහි රජවරුන්ද
තමන් කලින් නොදැන සිටි වෙ-
නත් දෙවිවරුන්ට සුවඳ දුම් ඔප්පු
කර,[3] මේ ස්ථානය මට හඳුනා-
ගත නොහැකි තරම් දූෂිත තත්-
වයකට පත් කළ නිසාය.[4] ඔවුහු
මේ ස්ථානය අහිංසකයන්ගේ ලෙයින්
පිරෙව්වෝය.[5] **5** ඔවුහු තම පුත්‍ර-
යන්ව ගින්නෙන් දවා බාල් දෙවියාට
ඔප්පු කරන පිණිස මේ ස්ථානයේ පූජ-
නීය ස්ථාන ගොඩනැඟුවෝය.[6] එසේ
කරන්න කියා මම ඔවුන්ට අණ කළේ
නැත.[7] එවැනි දෙයක් කිරීමේ අද-
හසක්වත් මාගේ සිතට පහළ වූයේ
නැත."'[8]

**6** "'යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. "මේ ස්ථානය තෝෆෙත්
කියාවත්[9] බෙන්හින්නොම් නිම්නය
කියාවත්[10] හඳුන්වන්නේ නැති කාල-
යක් ඉදිරියේදී පැමිණෙනු ඇත. ඒ
වෙනුවට මෙය, මිනී මරන නිම්-
නය කියා ඒ කාලයේදී හඳුන්වනු
ඇත. **7** මම මේ ස්ථානයේදී යූදා
සහ යෙරුසලමේ වැසියන්ගේ සැල-
සුම් සියල්ල අසාර්ථක කරන්නෙමි.[11]
මම ඔවුන්ට ඔවුන්ගේ සතුරන් අතින්
පහර කෑමට සලස්වන්නෙමි. ඔවුන්ගේ
ජීවිත විනාශ කර දැමීමට මහත් සො-
යන අයගේ අතට මම ඔවුන්ව හසු
කර දෙන්නෙමි.[12] ඔවුන්ගේ මළ කඳන්
අහසේ පක්ෂීන්ටද පොළොවේ මෘග-
යන්ටද ආහාරයක් ලෙස දෙන්නෙමි.[13]
**8** මේ නගරය පිටට මා ගෙනෙන
විනාශය දැක අන් අය පුදුමයට පත්
වනු ඇත. එය සියල්ලන්ගේ නින්දාවට
ලක් වීමටද මම ඉඩහරින්නෙමි.[14] එය
පසු කර යන සෑම කෙනෙක්ම පුදුම-
යෙන් එදෙස බලනු ඇත. එයට සිදු
වූ විපත දැක ඔවුහු සමච්චල් කරනු

**18 පරි.**
1 ගීතා 106:23, එස 22:30
2 ගීතා 35:7, ගීතා 57:6, දේශ 10:8
3 ගීතා 109:10, යෙරෙ 11:22
4 යෙරෙ 12:3
5 ද්වි 32:25, විලා 5:3
6 2ලේක 36:17, යෙරෙ 9:21
7 යෙරෙ 6:26
8 ගීතා 38:12, ගීතා 64:5, ගීතා 140:5
9 ගීතා 37:32, යෙරෙ 11:19
10 ගීතා 35:4, ගීතා 59:5, ගීතා 109:14
11 යෙරෙ 11:20, යෙරෙ 15:15, රෝම 2:5

**19 පරි.**
12 යෙරෙ 18:2, රෝම 9:21
13 යොෂු 15:8, 2රාජා 23:10, 2ලේක 28:3, යෙරෙ 7:31
14 හිතෝ 1:20, යෙරෙ 7:2
15 යෙරෙ 17:20
16 ගීතා 24:10

**2 තීරුව**
1 1සාමු 3:11, 2රාජා 21:12
2 ද්වි 28:20, 2රාජා 22:17, යෙසා 65:11, යෙරෙ 2:13, යෙරෙ 15:6, යෙරෙ 17:13, ආනි 9:5
3 ද්වි 13:6, ද්වි 32:17, යෙරෙ 7:9
4 2ලේක 33:4
5 2රාජා 21:16, 2රාජා 24:4, යෙසා 59:7, යෙරෙ 2:34, විලා 4:13, මතෙ 23:35, එළි 16:6
6 2රාජා 17:17, 2ලේක 28:3, 2ලේක 33:6, ගීතා 106:38, යෙසා 57:5
7 ලෙවී 18:21, යෙරෙ 32:35
8 යෙරෙ 7:31
9 2රාජා 23:10, යෙසා 30:33, යෙරෙ 7:32
10 යොෂු 15:8

**11** හිතෝ 21:30; **12** ලෙවී 26:17; ද්වි 28:25; **13** ද්වි 28:26; ගීතා 79:2; යෙරෙ 7:33; යෙරෙ 16:4; යෙරෙ 34:20; එළි 19:18; **14** 1රාජා 9:8; යෙරෙ 18:16; විලා 2:15.

ඇත.[1] **9** එහි සෙනඟට තමන්ගේම
දරුදැරියන්වද තමන් අතරේ සිටින
අයවද මරා ඔවුන්ගේ මාංස කෑමට සිදු
වනු ඇත. ඔවුන්ට එලෙස ක්‍රියා කිරී-
මට සිදු වන්නේ ඔවුන්ගේ සතුරන්ද
ඔවුන්ගේ ජීවිත විනාශ කර දැමීමට
මාන බලන අයද ඔවුන්ව කොටු කර-
ගෙන ඔවුන් පිටට පමුණුවන දරුණු
පීඩා නිසාය. ඒ සියල්ල සිදු වීමට මම
ඉඩහරින්නෙමි.” ’[2]

**10** “ඔබ ගෙන ගිය මැටි බඳුන ඔබ
සමඟ ගිය අය ඉදිරිපිටම බිඳ දමන්න.
**11** ඉන්පසු ඔබ ඔවුන්ට මෙසේ පව-
සන්න. ‘ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. “කුඹල්කරු සෑදූ මේ මැටි බඳුන
නැවත සකස් කිරීමට නොහැකි වන
ලෙස බිඳ දැමූ ආකාරයටම මම මේ
නගරයත් එහි සෙනඟවත් විනාශ කර
දමමි.[3] එවිට තැන්පත් කිරීමට ඉඩ
නැති වන තරමටම තෝෆෙත්හි[4] මළ
කඳන් ගොඩගැසෙනු ඇත.” ’[5]

**12** “යෙහෝවා දෙවි වන මම තව-
දුරටත් මෙසේ පවසමි. ‘මැටි බඳු-
නට කළ දේම මම මේ නගරයටත්
එහි වැසියන්ටත් කරන්නෙමි. මම මේ
නගරය තෝෆෙත් මෙන් වීමට සලස්-
වන්නෙමි.[6] **13** යූදාහි රජවරුන්ගේ
මාලිගාවල හෝ යෙරුසලමේ වැසි-
යන්ගේ නිවෙස්වල හෝ පිහිටි පැතලි
වහල මත සිට සෙනඟ ආකාශ වස්-
තූන්ට සුවඳ දුම් ඔප්පු කළ නිසාත්[7]
වෙනත් දෙවිවරුන්ට පාන පූජා ඔප්පු
කළ නිසාත්[8] ඒ සෑම ස්ථානයක්ම
තෝෆෙත් මෙන් අපවිත්‍ර තත්වයකට
පත් වනු ඇත.’ ”[9]

**14** තෝෆෙත් වෙතට[10] යෙහෝවා
දෙවි විසින් අනාවැකි කීම සඳහා
යවනු ලැබූ යෙරෙමියා ඉන්පසු එතැ-
නින් පිටත්ව ඇවිත් යෙහෝවා දෙවිගේ
ගෘහයට ගියේය. ඔහු එහි මළුවේ සිට-
ගෙන සෙනඟට මෙසේ පැවසුවේය.[11]
**15** “ස්වර්ගයේ සේනාවල අධිපතිද
ඊශ්‍රායෙල්හි දෙවිද වන යෙහෝවා
මෙසේ පවසන්නේය. ‘සෙනඟ මට
අකීකරු වී මුරණ්ඩු ලෙස ක්‍රියා කළ
නිසා[1] මම කලින් පැවසූ සෑම විප-
තක්ම මේ නගරය පිටටත් ඒ අවට
පිහිටි සියලු කුඩා නගර පිටටත් ගෙ-
නෙන්නෙමි.’ ”

**20** ඒ අනාවැකි යෙරෙමියා පව-
සද්දී ඉම්මේර්ගේ[2] පුත්‍රයා වූ
පෂ්හූර් එය අසාගෙන සිටියේය. පූජක-
යෙකු වූ ඔහු යෙහෝවා දෙවිගේ ගෘහ-
යේ ප්‍රධාන නිලධාරියා ලෙස කටයුතු
කළේය.[3] **2** ඔහු අනාගතවක්තෘ
යෙරෙමියාට පහර දී[4] ඔහුව යෙහෝවා
දෙවිගේ ගෘහයට අයත් බෙන්ජමින්
නමැති ඉහළ දොරටුව අසල තිබූ
දඬුකඳේ ගැසුවේය.[5] **3** නමුත් දඬු-
කඳේ ගසා සිටි යෙරෙමියාව ඔහු පසු
දින නිදහස් කළේය.[6] එවිට යෙරෙ-
මියා ඔහුට මෙසේ කීවේය.

“යෙහෝවා දෙවි ඔබට පෂ්හූර් වෙ-
නුවට මාගොර්-මිස්සාබිබ්*[7] යන නම
දී ඇත.[8] **4** මන්ද යෙහෝවා දෙවි
මෙසේ පවසයි. ‘ඔබ හා ඔබට හිත-
වත් සියලුදෙනාවම මම භීතියට පත්
වීමට සලස්වන්නෙමි. ඔබ බලා සිටි-
යදීම[9] ඔබට හිතවත් අය ඔවුන්ගේ
සතුරන් අතින් මැරුම් කනු ඇත.[10]
මම යූදා වැසියන් සියලුදෙනාවම
බැබිලෝනියේ රජුගේ අතට හසු කර
දෙන්නෙමි. ඔහු ඔවුන්ගෙන් සමහ-
රෙකුව බැබිලෝනියට වහලුන් ලෙස
රැගෙන යනු ඇත. තවත් සමහරුන්ව
කඩුවෙන් පහර දී මරා දමනු ඇත.[11]
**5** මේ නගරයේ සම්පත් සියල්ලද එහි
තිබෙන අනර්ඝ වස්තූද සෙනඟ වෙ-
හෙසී ඉපැයූ සියල්ලද යූදාහි රජ-
වරුන්ගේ සියලු ධන සම්පත්ද මම
ඔවුන්ගේ සතුරන්ට කොල්ල කෑමට
ඉඩහරින්නෙමි.[12] ඔවුහු ඒවා සියල්ල
බැබිලෝනියට රැගෙන යනු ඇත.[13]
**6** පෂ්හූර්, ඔබට සිදු වීමට යන දෙය-
ටත් ඇහුම්කන් දෙන්න. ඔබවත් ඔබේ
ගෙයි වැසියන් සියලුදෙනාවත් වහ-
ලුන් ලෙස[14] බැබිලෝනියට ගෙන යනු

**19 පරි.**
1 2ලේක 7:21; යෙරෙ 25:18
2 ලෙවී 26:29; ද්වි 28:53; යෙසා 9:20; විලා 2:20; විලා 4:10; එස 5:10
3 2ලේක 36:16; ගීතා 2:9; යෙසා 30:14; විලා 4:2; එළි 2:27
4 යෙසා 30:33; යෙරෙ 19:6
5 යෙරෙ 7:32
6 2රාජා 23:10
7 යෙරෙ 8:2; යෙරෙ 32:29; යෙරෙ 44:17; ශෙප 1:5
8 යෙරෙ 7:18
9 2රාජා 23:12; 2රාජා 23:14; ගීතා 79:1; එස 7:21
10 යෙරෙ 19:6
11 2ලේක 20:5; 2ලේක 24:20; යෙරෙ 26:2

**2 තීරුව**
1 නෙහෙ 9:17; නෙහෙ 9:29; යෙරෙ 7:26; යෙරෙ 17:23; සෙක 7:12; ක්‍රියා 7:51

**20 පරි.**
2 1ලේක 24:14
3 ක්‍රියා 5:24
4 ක්‍රියා 23:2
5 2ලේක 16:10; යෙරෙ 29:26; ක්‍රියා 16:24
6 ක්‍රියා 4:3
7 ගීතා 31:13; යෙරෙ 6:25; යෙරෙ 46:5; යෙරෙ 49:29; විලා 2:22
8 හොෂෙ 1:4
9 ද්වි 28:32; 2රාජා 25:7; යෙරෙ 29:21; යෙරෙ 39:6
10 ද්වි 28:65; ගීතා 73:19
11 යෙරෙ 25:9; යෙරෙ 39:9
12 2රාජා 20:17; 2රාජා 24:13; 2රාජා 25:13; විලා 1:10; එස 22:25
13 2ලේක 36:10; යෙරෙ 15:13

14 යෙරෙ 15:2; යෙරෙ 29:21; එස 12:11.

යෙරෙ **20:3*** තේරුම, “දසත පැතුරුණු භීතිය.”

ලබන්නේය. ඔබ මිය යන්නේ එහි-
දීය. ඔබේ හිතවතුන් සියලුදෙනාත්
සමඟ ඔබවත් එහිදී තැන්පත් කරනු
ලැබේ.[1] ඔබට මේ දේ අත් වන්නේ
ඔබ සෙනඟට බොරු අනාවැකි පැවසූ
නිසාය.’ ”[2]

**7** යෙහෝවා දෙවියනි, ඔබ මාව
පුදුමයට පත් කළෙහිය. ඇත්තෙන්ම
මම පුදුමයට පත් වුණෙමි. ඔබ මට
වඩා බලවත් බව ඔප්පු කර පෙන්වා
ජය ගත්තෙහිය.[3] මම දවස පුරාම
සමච්චලයට ලක් වුණෙමි. සියලු-
දෙනාම මට කවටකම් කළෝය.[4]
**8** මා මොරගසමින් සැමවිටම ප්‍රකාශ
කළේ විපත්ති හා විනාශය ගැනයි.[5]
යෙහෝවා දෙවි වන ඔබේ පණිවිඩ මම
ප්‍රකාශ කරන නිසා දවස පුරාම නින්-
දාවටත් සමච්චලයටත් ලක් වීමට
මට සිදු විය.[6] **9** එබැවින් මම මෙසේ
සිතුවෙමි. “මින්පසු මම දෙවි ගැන
කතා කරන්නේ නැහැ. ඔහුගේ නාම-
යෙන් මම කිසි දෙයක් ප්‍රකාශ කරන්-
නෙත් නැහැ.”[7] මම එසේ සිතුවත්
ඔබේ වදන් මගේ හදවතට තදින්
කාවැදී තිබූ නිසා එය ගින්නක් මෙන්
මගේ ඇටකටු තුළ දැල්වුණේය. මට
එය තවදුරටත් සිතේ තද කරගත
නොහැකි විය. ඒ ගැන කතා නොකර
සිටීම මට දරාගත නොහැකි වේද-
නාවකි.[8] **10** බිය උපදවන බොහෝ
දේවල් මා අවට සිදු වේ.[9] බො-
හෝදෙනෙකු දොස් කියන ආකාරය
මට ඇසෙයි. “ඔහුට විරුද්ධව යමක්
කියන්න” කියා සෙනඟ එකිනෙකාව
දිරිගන්වති.[10] මට මතුපිටින් හොඳ
මුහුණක් පෙන්වන අය මා අතින් වර-
දක් සිදු වන තෙක් බලා සිටිති.[11]
මන්ද ඔවුහු තමන් අතරේ මෙසේ
කියාගත්තෝය. “සමහරවිට ඔහුගේ
අතින් වරදක් සිදු වෙයි.[12] එවිට ඔහුව
හසු කරගෙන ඔහුගෙන් පළිගන්න
අපට හැකි වෙයි.” **11** නමුත් යෙ-
හෝවා දෙවියනි, ඔබ බලවත් මෙන්ම
බිය උපදවන සටන්කරුවෙකු මෙන්[13]
මා සමඟ සිටින්නෙහිය.[14] එබැවින්
මට පීඩා කරන අයට කිසිසේත් සාර්-
ථක විය නොහැක.[1] ඔවුහු සම්පූර්-
ණයෙන්ම ඇද වැටෙන්නෝය. ජය
ගත නොහැකි වූ නිසා ඔවුහු බොහෝ
සෙයින් ලැජ්ජාවට පත් වන්නෝය.
කිසිදා මැකී නොයන නින්දාවකට
මුහුණ දීමට ඔවුන්ට සිදු වනු ඇත.[2]

**12** ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවියනි, ඔබ ධර්මිෂ්-
ඨයාව සෝදිසි කර බලන්නෙහිය.[3]
මිනිසාගේ හදවතේ ඇති දේද ඇතු-
ළාන්ත හැඟීම්ද ඔබ හොඳින් දන්නෙ-
හිය.[4] ඔබ සතුරන්ට දඬුවම් කරන
අයුරු මට දකින්න ලැබේවා![5] මන්ද
මගේ නඩුව මා භාර දුන්නේ ඔබටය.[6]

**13** ජනයෙනි, යෙහෝවා දෙවිට
ප්‍රශංසා ගී ගයන්න. යෙහෝවා දෙවිව
පසසන්න. මන්ද අසරණයාගේ ජීවි-
තය ඔහු දුෂ්ටයන්ගේ අතින් ගලවා-
ගත්තේය.[7]

**14** මා උපන් දවසට ශාප වේවා!
මගේ මව් මා බිහි කළ දවසට ශාප
වේවා![8] **15** “ඔබට පුතෙක් ලැබුණා”
කියා පවසමින්, මගේ පියාට මහත්
ප්‍රීතියක් ගෙන දුන් පණිවිඩය[9] ප්‍රකාශ
කළ තැනැත්තාට ශාප වේවා! **16** ඒ
මිනිසා, යෙහෝවා දෙවි කිසි අනු-
කම්පාවක් නොපෙන්වා විනාශ කර
දැමූ නගර මෙන් වේවා![10] උදැසනින්ම
මොරගැසීමේ හඬද මධ්‍යාහ්නයේ යුධ
නලාවේ හඬද ඔහුට ඇසේවා![11]

**17** දෙවි මාව මව්කුසේදීම නොමැ-
රුවේ ඇයි? දෙවි එසේ කළා නම් මව්-
කුස මගේ සොහොන වනු ඇත. එවිට
සදහටම ඇගේ කුස තුළ සිටීමට මට
හැකි වනු ඇත.[12] **18** මා මව්කුසින්
මෙලොවට බිහි වුණේ කුමකටද?[13]
මේ මහත් දුක් ගැහැටවලට මුහුණ
දෙන්නද?[14] ජීවිත කාලය පුරාම ලැජ්-
ජාව අද්දකින්නද?[15]

**21** යෙහෝවා දෙවිගෙන් යෙරෙ-
මියාට පණිවිඩයක් ලැබිණ.[16]
යෙරෙමියාට මෙම පණිවිඩය ලැබුණේ

**20 පරි.**
**1** යෙරෙ 5:31
**2** යෙරෙ 14:14; යෙරෙ 28:15; යෙරෙ 29:21
**3** එස 3:14; මීකා 3:8
**4** යෝබ් 12:4; ගීතා 22:7; යෙරෙ 15:10; විලා 3:14; ක්‍රියා 17:32
**5** යෙරෙ 6:7
**6** 2ලේක 36:16; යෙරෙ 6:10; යෙරෙ 15:15
**7** 1රාජා 19:4; යෝනා 1:3
**8** යෝබ් 32:18; ගීතා 39:3; යෙරෙ 6:11; ආමො 3:8; ක්‍රියා 4:20; ක්‍රියා 18:5
**9** ගීතා 31:13
**10** නෙහෙ 6:6; හිතෝ 10:18; ලූක් 20:20
**11** යෝබ් 19:19; ගීතා 38:16; ගීතා 41:9
**12** ලූක් 11:54
**13** ගීතා 47:2; ගීතා 66:5
**14** යෙසා 41:10; යෙරෙ 1:8; රෝම 8:31

**2 තීරුව**
**1** ද්වි 32:35; ගීතා 27:2; යෙරෙ 15:15; යෙරෙ 15:20; යෙරෙ 17:18
**2** ගීතා 6:10; ගීතා 35:26; ගීතා 40:14; යෙරෙ 23:40
**3** ගීතා 11:5; ගීතා 17:3; යෙරෙ 17:10
**4** ගීතා 7:9; යෙරෙ 11:20
**5** ගීතා 54:7; ගීතා 59:10; යෙරෙ 17:18
**6** ගීතා 62:8; 1පේත්‍ර 2:23
**7** ගීතා 35:9; ගීතා 109:31
**8** යෝබ් 3:3; යෙරෙ 15:10
**9** ගීතා 127:3; ලූක් 1:58
**10** උත් 19:25; ද්වි 29:23; ආමො 4:11; 2පේත්‍ර 2:6
**11** යෙරෙ 4:19; යෙරෙ 18:22; ශෙප 1:16

**12** යෝබ් 3:10; යෝබ් 10:18; **13** යෝබ් 3:20; යෝබ් 14:1; **14** ගීතා 90:10; විලා 3:1; **15** යාකො 5:10; **21 පරි.** **16** එස 33:30.

ශෙදකියා රජු,[1] මල්කියාගේ පුත්‍රයා
වූ පෂ්හූර්ව[2] සහ මයසේයාගේ පුත්‍රයා
වූ පූජක ශෙපනියාව[3] ඔහු වෙතට
එවමින් මෙසේ ඇසූ අවස්ථාවේදීය.
**2** “බැබිලෝනියේ රජු වන නෙබු-
කද්රෙෂර්* අපට විරුද්ධව යුද්ධයට
සැරසෙන නිසා[4] අපට කුමක් සිදු වෙ-
යිද කියා යෙහෝවා දෙවිගෙන් විමසා
අපට කියන්න.[5] සමහරවිට යෙහෝවා
දෙවි අතීතයේ කළාක් මෙන් අප වෙ-
නුවෙන් මේ වතාවෙදීත් බලවත් ක්‍රියා-
වක් සිදු කරන්න ඉඩ තියෙනවා. දෙවි
එසේ කළොත් බැබිලෝනියේ රජුට
ආපසු හැරී යන්න සිදු වෙයි.”[6]
**3** එවිට යෙරෙමියා ඔවුන්ට මෙසේ
කීවේය. “ඔබ ශෙදකියා රජුට මෙසේ
කියන්න. **4** ‘ඊශ්‍රායෙල්හි දෙවි වන
යෙහෝවා පැවසුවේ මෙයයි. “පවුරට
පිටින් ඔබේ නගරය වටලා සිටින බැබි-
ලෝනියේ රජුටත් කල්දිවරුන්ටත්[7]
විරුද්ධව සටන් කිරීමට ඔබේ සෙ-
නඟ යුධායුධ අතැතිව පැමිණියත් ඒ
යුධායුධවලින්ම ඔබේ සෙනඟට පහර
කෑමට මම සලස්වන්නෙමි.[8] මම ඒ
යුධායුධ සියල්ල මේ නුවර මැද ගොඩ-
ගසන්නෙමි.[9] **5** මම ඔබට විරුද්ධව
සටන් කරන්නෙමි.[10] මාගේ බල-
වත් හස්තය මහත් උදහසකින් යුතුව
ඔබට විරුද්ධව දිගු කරන්නෙමි. මාගේ
කෝපය ඔබ පිටට වගුරුවන්නෙමි.[11]
**6** මේ නුවරේ සිටින මනුෂ්‍යයන්ටත්
මෘගයන්ටත් මම පහර දෙන්නෙමි.
ඔවුහු සියලුදෙනාම භයානක වසංගත-
යකින් මිය යනු ඇත.”’[12]
**7** “‘යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ පැවසුවේය. “යූදාහි රජු වන
ශෙදකියාව හා ඔහුගේ සේවකයන්ව
මම බැබිලෝනියේ රජු වන නෙබු-
කද්රෙෂර්ගේ අතට හසු කර
දෙන්නෙමි. එනම්, ඔවුන්ව මරන්න
සොයන ඔවුන්ගේ සතුරන් අතට හසු
කර දෙන්නෙමි. වසංගතවලින්ද සාග-
තයෙන්ද කඩු පහරින්ද බේරී මේ
නගරයේ ඉතුරු වූ සෙනඟවත් මම
ඔහුගේ අතට හසු කර දෙන්නෙමි. ඔහු
ඔවුන්ව කඩුවෙන් මරා දමනු ඇත.[1]
ඔහුට ඔවුන් ගැන කිසි දුකක් ඇති
වන්නේ නැත. ඔහු ඔවුන්ට කිසි අනු-
කම්පාවක් පෙන්වන්නේද නැත.”’[2]
**8** “සෙනඟට ඔබ මෙසේ කියන්න.
‘යෙහෝවා දෙවි මෙසේ පැවසුවේය.
“ජීවිතය හෝ මරණය තෝරාගැනීමට
මම ඔබට නිදහස දෙමි.[3] **9** යමෙක්
මේ නුවරෙහි රැඳී සිටියොත් ඔහු සාග-
තයෙන්ද වසංගතවලින්ද කඩුවෙන්ද
පහර කනු ඇත.[4] නමුත් යමෙක් මේ
නුවරින් පිට වී මෙය වටලා සිටින
කල්දිවරුන්ට භාර වුණොත් ඔහුට
ජීවත් වීමට හැකි වන්නේය. එසේය,
තමන්ගේ ජීවිතය රැකගැනීමට ඔහුට
හැකිකම ලැබෙන්නේය.”’[5]
**10** “‘“මේ නුවරට යහපතක් කර-
නවා වෙනුවට මේ නුවර පිටට
විපත්ති ගෙන ඒමට මම තීරණය
කළෙමි.[6] බැබිලෝනියේ රජුගේ අතට
මම මේ නුවර භාර දෙමි.[7] ඔහු මුළු
නුවරම ගිනිබත් කරනු ඇත”[8] කියා
යෙහෝවා දෙවි පැවසුවේය.
**11** “‘ජනයෙනි, යූදාහි රජ පෙළ-
පත ගැන යෙහෝවා දෙවි පවසන
දේට සවන් දෙන්න.[9] **12** දාවිත්-
ගෙන් පැවතෙන්නෙනි,[10] යෙහෝවා
දෙවි මෙසේ පවසන්නේය. “ඔබ නඩු
විභාග කරන විට සැමවිටම[11] යුක්තිය
ඉටු කරන්න.[12] වංචනිකයන්ගේ අතින්
පීඩාවට පත් වූ අයව බේරාගන්න.[13]
එසේ නොකළොත් ඔබේ දුෂ්ට ක්‍රියා
නිසා මාගේ උදහස ඔබට විරුද්-
ධව ගින්නක් මෙන් ඇවිළෙනු ඇත.[14]
එය නිවා දැමීමට කිසිවෙකුට නොහැ-
කිය.”’[15]
**13** “යෙහෝවා දෙවි මෙසේද පව-
සන්නේය. ‘තැනිතලාවේ ජීවත් වන
වැසියෙනි, පර්වතයෙහි පිහිටි නුව-
රෙහි ජීවත් වන සෙනඟෙනි, මම
ඔබට විරුද්ධව නැඟී සිටින්නෙමි.[16]

**21 පරි.**
**1** 2රාජා 24:18; 1ලේක 3:15; 2ලේක 36:10
**2** 1ලේක 9:12; යෙරෙ 38:1
**3** 2රාජා 25:18; යෙරෙ 29:25; යෙරෙ 37:3; යෙරෙ 52:24
**4** 2රාජා 25:1; යෙරෙ 32:28; යෙරෙ 39:1
**5** විනි 20:27; 2රාජා 22:13
**6** 1සාමු 7:10; 2ලේක 14:11; ගීතා 44:1; ගීතා 105:5; යෙසා 37:37
**7** එස්රා 5:12
**8** යෙරෙ 32:5; යෙරෙ 33:5
**9** යෙසා 13:4; එස 16:37
**10** යෙසා 63:10; විලා 2:5
**11** යෙසා 5:25; යෙරෙ 32:17
**12** ද්වි 28:22; යෙරෙ 32:24; එස 7:15

**2 තීරුව**
**1** 2රාජා 25:6; 2ලේක 36:17; යෙරෙ 37:17; යෙරෙ 39:5; යෙරෙ 52:9; එස 17:20
**2** ද්වි 28:50; 2ලේක 36:17; යෙසා 47:6
**3** ද්වි 30:19; යෙසා 1:19
**4** යෙරෙ 27:13; යෙරෙ 38:2; එස 7:15
**5** යෙරෙ 38:17; යෙරෙ 39:18; යෙරෙ 45:5
**6** ලෙවී 26:17; ගීතා 34:16; යෙරෙ 44:11; එස 15:7; ආමෝ 9:4; 1පේතෘ 3:12
**7** යෙරෙ 38:3
**8** 2ලේක 36:19; යෙරෙ 17:27; යෙරෙ 34:2; යෙරෙ 37:10; යෙරෙ 39:8; යෙරෙ 52:13
**9** යෙරෙ 17:20
**10** යෙසා 7:2; ලූක් 1:69
**11** ගීතා 101:8

**12** 2සාමු 8:15; යෙසා 1:17; යෙරෙ 7:5; යෙරෙ 22:3; සෙක 7:9; **13** ගීතා 72:4; හිතෝ 14:31; එස 22:29; මීකා 2:2; **14** ද්වි 32:22; යෙරෙ 4:4; නාහු 1:6; ශෙප 1:18; **15** යෙසා 1:31; යෙරෙ 7:20; **16** යෙරෙ 51:25; එස 13:8.

යෙරෙ **21:2*** හෝ, “නෙබුකද්නෙෂර්.”

“අපට විරුද්ධව නැඟී සිටිය හැක්කේ
කාටද? අපේ වාසස්ථානවලට ඇතුල්
විය හැක්කේ කාටද”[1] කියා පවසන
වැසියෙනි, **14** ඔබ කළ ක්‍රියාවලට[2]
මා ඉදිරියේ ඔබට ගණන් දීමට සිදු
වනු ඇත.[3] ඔබ වෙසෙන නුවර අවට
පිහිටි වනලැහැබට මම ගිනි තබන්-
නෙමි.[4] නුවර අවට තිබෙන සියල්ල ඒ
ගින්නෙන් දැවී විනාශ වී යන්නේය.’[5]
මේ සෑම දෙයක්ම පැවසුවේ යෙහෝවා
දෙවිය.”

**22** යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. “ඔබ යූදාහි රජු-
ගේ මාලිගාවට ගොස් මෙම පණිවිඩය
ඔහුට දන්වන්න. **2** ‘දාවිත්ගේ පෙ-
ළපතින් පැවතෙන යූදාහි රජ්ජුරු-
වනි,[6] යෙහෝවා දෙවි පවසන දේට
සවන් දෙන්න. නගරයේ දොරටුව-
ලින් ඇතුල් වන ඔබේ සේවක-
යන්ද ඔබේ සෙනඟද මීට සවන් දිය
යුතුයි.[7] **3** යෙහෝවා දෙවි පවසන්-
නේ මෙයයි. “යුක්තිය ඉටු කරන්න.
ධර්මිෂ්ඨව ක්‍රියා කරන්න. වංචාකරු-
වන්ගේ අතින් පීඩාවට පත් වන අයව
බේරාගන්න. ඔබ අතරේ ජීවත් වන
විදේශිකයාටත් පියා නැති දරුවාටත්
වැන්දඹුවටත් අයුක්තියක් සිදු වීමට
ඉඩ නොදෙන්න.[8] ඔවුන්ට කුරිරු
ලෙස නොසලකන්න.[9] මේ ස්ථාන-
යේදී අහිංසකයන්ගේ ලේ වැගිරීමෙන්
වළකින්න.[10] **4** ඔබ මා පැවසූ ලෙස
ක්‍රියා කළොත් දාවිත්ගේ පෙළපතින්
පැමිණෙන රජවරුද[11] ඔවුන්ගේ සේව-
කයෝද අශ්වයන් පිට හා අශ්ව රථවල
නැඟී සෙනඟ සමඟ මේ නුවරෙහි දො-
රටුවලින් ඇතුල් වනු ඇත.” ’[12]

**5** “යෙහෝවා දෙවි වන මම මෙ-
සේද පවසමි. ‘මා පැවසූ ලෙස ඔබ
ක්‍රියා නොකළොත් මේ මාලිගාව
විනාශ වී පාළුවට යන බව[13] මම
මාගේ නාමයෙන් දිවුරා පවසමි.’[14]

**6** “යූදාහි රජුගේ මාලිගාව සම්-
බන්ධයෙන් යෙහෝවා දෙවි වන මම
මෙසේ පවසමි. ‘මට ඔබව ගිලි-
යද් ප්‍රදේශය මෙන්ද ලෙබනොන්
කඳු මුදුන[15] මෙන්ද දිස් වන්නේය.
නමුත් මම ඔබව පාළුකරයක් මෙන්
වීමට සලස්වන්නෙමි.[1] ඔබේ නුවර-
වල් සියල්ල පාළු වී යෑමට ඉඩහරින්-
නෙමි.[2] **7** ඔබව විනාශ කර දැමීමට
අවි ගත් සෙනඟක්[3] මම තෝරාගන්-
නෙමි.[4] ඔවුහු ඔබේ අනර්ඝතම දේව-
දාර ගස් කපා[5] ගින්නට හෙළනු ඇත.[6]
**8** මේ නුවර පසු කර යන සියලු-
දෙනා එකිනෙකාගෙන් මෙසේ අසනු
ඇත. “යෙහෝවා දෙවි මේ මහත් නුව-
රට මෙවැනි දෙයක් කළේ ඇයි?”[7]
**9** එවිට ඔවුහු මෙසේ කියනු ඇත.
“මේ නුවරේ වැසියන්ට මේ දේ සිදු
වුණේ ඔවුන්ගේ දෙවි වන යෙහෝවා
සමඟ ඇති කරගත් ගිවිසුම ඔවුන් කඩ
කර[8] වෙනත් දෙවිවරුන්ට නමස්කාර
කළ නිසයි.” ’[9]

**10** “ජනයෙනි, මිය යන තැනැත්-
තා ගැන හඬා වැලපෙමින් දුක්
නොවන්න.[10] නමුත් වහලෙකු ලෙස
බැබිලෝනියට ගෙන යන තැනැත්තා
වෙනුවෙන් හඬා වැලපෙන්න. මන්ද
ඔහුට නැවත කිසිදාක ඔහුගේ මව්-
බිම දකින්න ලැබෙන්නේ නැත. ඔහුට
කවදාවත් නැවත මේ දේශයට පැමි-
ණීමට අවස්ථාවක් නොලැබෙන්නේය.
**11** මේ ස්ථානයෙන් පිටතට ගෙන
යනු ලැබූ ෂල්ලුම්*[11] ගැන එනම්,
යොෂියා රජුගෙන් පසුව යූදාහි රජක-
මට පත් වූ ඔහුගේ පුත්‍රයා[12] ගැන
යෙහෝවා දෙවි වන මම මෙසේ
පවසමි. ‘ඔහු නැවත කිසිදාක
මේ ස්ථානයට පැමිණෙන්නේ නැත.
**12** ඔහුව රැගෙන යන ස්ථානයේදීම
ඔහු මිය යන්නේය. ඔහුට මේ දේශය
නැවත කිසිදාක දකින්න ලැබෙන්නේ
නැත.’[13]

**13** “තමාට සේවය කළ තැනැත්-
තාට කුලී නොදී[14] අධර්මිෂ්ඨකමින්
තමාට මාලිගාවක් ගොඩනඟාගන්නා,
අසාධාරණකමින් එහි උඩුමහල්
කාමර සාදාගන්නා තැනැත්තාට අත්

**21 පරි.**
**1** 2සාමු 5:6; යෙරෙ 49:4; විලා 4:12; ඔබ 3
**2** හිතෝ 1:31; යෙසා 3:11; ගලා 6:7
**3** යෙරෙ 5:9; යෙරෙ 9:9
**4** යෙසා 10:18
**5** 2ලේක 36:19; යෙරෙ 52:13

**22 පරි.**
**6** යෙරෙ 13:13; යෙරෙ 17:25; ලූක් 1:32
**7** යෙරෙ 7:2; යෙරෙ 17:20
**8** ලෙවී 19:15; ද්වි 16:18; යෙසා 1:17; යෙරෙ 21:12; එස 22:7; එස 22:29; මීකා 2:2; සෙක 7:9
**9** ගීතා 94:6
**10** ද්වි 19:10; 2රාජා 24:4; යෙරෙ 7:6
**11** 1රාජා 2:12
**12** යෙරෙ 17:25
**13** යෙරෙ 39:8; මීකා 3:12; මලා 3:5
**14** ගණන් 23:19; ද්වි 32:40; ආමෝ 6:8; හෙබ්‍රෙ 6:17
**15** ද්වි 3:25

**2 තීරුව**
**1** ගීතා 107:34; යෙසා 27:10
**2** යෙසා 6:11; යෙසා 24:1; යෙරෙ 7:34
**3** එස 9:1
**4** යෙසා 13:3
**5** යෙසා 37:24
**6** යෙරෙ 21:14; සෙක 11:1
**7** 1රාජා 9:8; විලා 2:15
**8** ද්වි 29:25; යෙරෙ 31:32
**9** ද්වි 29:26; ද්වි 31:20; 2රාජා 22:17; 2ලේක 34:25
**10** 2රාජා 22:20
**11** 1ලේක 3:15
**12** 2රාජා 23:30; 2ලේක 36:1
**13** 2රාජා 23:34; 2ලේක 36:4

14 ලෙවී 19:13; ද්වි 24:14; මීකා 3:10; හබ 2:9; හබ 2:12; මලා 3:5; යාකො 5:4.

යෙරෙ **22:11*** යෙහෝයහාෂ් ලෙසද හැඳින්වේ.

වන විපත මොන තරම් දරුණුද![1]
**14** ‘මම විශාල උඩුමහල් කාමර සහිත
සුවිසල් මන්දිරයක් සාදාගන්නෙමි.[2]
එයට මම විශාල කවුළු දමා, ඒවා
දේවදාර ලීයෙන් සරසා,[3] රතු සායම්
ආලේප කරන්නෙමි’[4] කියා පවසන
තැනැත්තා අද්දකින්නේ මොන තරම්
භයානක විපතක්ද! **15** ඔබ කිසිවෙ-
කුට දෙවෙනි නොවන සේ දේවදාර ලී
යොදා ඔබේ මාලිගාව සාදාගත් නිසා
ඔබට දිගටම රජකම් කිරීමට ලැබෙයි
කියා ඔබ සිතන්නෙහිද? ඔබේ පියා
යුක්තිය ඉටු කරමින් ධර්මිෂ්ඨ ලෙස
පාලනය කළේය.[5] එබැවින් ඔහු කා
බී සන්තෝෂයෙන් කල් ගෙව්වේය.[6]
**16** ඔහු පීඩිතයන් හා අසරණයන් වෙ-
නුවෙන් යුක්තිය ඉටු කළේය.[7] ඔහුට
යහපත් දේවල් අද්දැකීමට හැකි වූයේ
ඒ නිසාය. ඔහු එසේ ක්‍රියා කළේ යෙ-
හෝවා දෙවි වන මාව හොඳින් දැන
හඳුනා ගෙන සිටි නිසා නොවේද?
**17** නමුත් ඔබේ ඇස්ද ඔබේ සිතද
නිතරම යොමු වී තිබෙන්නේ වංචාවක්
කර වාසි ප්‍රයෝජන ලබාගැනීමටය.[8]
අසරණයන්ට තව තවත් පීඩා කිරී-
මටය. එමෙන්ම අහිංසකයන්ගේ ලේ
නිරපරාදේ වැගිරවීමටය.[9]

**18** “එබැවින් යොෂියාගේ පුත්‍රයා වූ
යුදාහි රජු වන යෙහෝයාකිම් ගැන[10]
යෙහෝවා දෙවි වන මම මෙසේ පව-
සමි. ‘“අනේ මගේ සහෝදරයා! අනේ
මගේ සහෝදරී” කියා සාමාන්‍යයෙන්
මිනිසුන් මිය ගිය පුද්ගලයාව මතක්
කරමින් වැලපුණත් ඔහු වෙනුවෙන්
නම් කිසිවෙක් වැලපෙන්නේ නැත.
“අනේ අපේ ස්වාමියා! අනේ, ඔහුගේ
තේජශ්‍රීය නැති වූ හැටි” කියමින් කිසි-
වෙක් ඔහු ගැන දුක් වන්නේද නැත.[11]
**19** මිය ගිය බූරුවෙකුව යෙරුසල-
මේ දොරටුවලින් පිටතට[12] ඇදගෙන
ගොස් වීසි කර දමන්නාක් මෙන් ඔහු-
ගේ මළ කඳත් වීසි කර දමනු ඇත.’[13]

**20** “ඔබට බොහෝ සෙයින් ආලය
කළ අය විනාශ වී ගිය නිසා[14] ලෙ-
බනොන් කඳු මුදුනට[15] ගොස් මො-
රගසන්න. බාෂාන්[16] වෙතට ගොස්
මහත් හඬින් කෑගසන්න. අබරිම්හි[1]
සිට කෑ මොර දෙන්න. **21** ඔබ
බියක් සැකක් නැතුව නිදහසේ කල්
ගෙවූ කාලයේදී මම ඔබට සිහිගැන්වීම්
දුන්නෙමි.[2] නමුත් ඔබ මට පැවසුවේ
‘ඔබට ඇහුම්කන් දෙන්න මට බැහැ’
කියාය.[3] මට අකීකරු වී කටයුතු
කිරීමට ඔබ පුරුදු වී සිටියේ තරුණ
කාලයේ සිටය.[4] **22** එබැවින් ඔබේ
එඬේරු සියලුදෙනාම සුළඟට ගසා-
ගෙන යනු ඇත.[5] ඔබේ ආලවන්ත-
යන්ව වහල්භාවයට ගෙන යනු ඇත.[6]
ඒ කාලයේදී ඔබට මුහුණ දීමට
සිදු වන විපත්ති නිසා ඔබ ලැජ්ජා-
වත් නින්දාවත් අද්දකිනු ඇත.[7]
**23** ලෙබනොන්හි දේවදාර ගස්වල
තම කැදැල්ල සාදාගෙන[8] එහි වසන්-
නෙනි,[9] දරුවෙකු බිහි කරන අවස්ථා-
වේදී වේදනාවෙන් කෑගසන ස්ත්‍රියක
මෙන්[10] ඔබත් මහත් වේදනාවෙන්
කෑගසන දවසක් පැමිණෙනු ඇත.”[11]

**24** “යෙහෝවා දෙවි වන මම යෙ-
හෝයාකිම්ගේ පුත්‍රයා වූ[12] යුදාහි
රජු වන කොනියා*[13] ගැන පවසන්-
නේ මෙයයි. ‘මාගේ දකුණතේ පැළඳ
සිටින වටිනා මුද්දක්# මෙන් මා ඔහුව
සැලකුවත්[14] ඔහුව අනිවාර්යයෙන්ම
පහ කර දමන බවට ජීවමාන දෙවි
වන මම පවසමි.[15] **25** ඔහුගේ ජීවි-
තය විනාශ කිරීමට උත්සාහ කරන
අයගේ අතටත්[16] ඔහු භයෙන් සිටින
අයගේ අතටත් බැබිලෝනියේ රජු
වන නෙබුකද්රෙෂර්ගේ අතටත් කල්-
දිවරුන්ගේ අතටත්[17] මම ඔහුව භසු
කර දෙන්නෙමි. **26** ඔහුවත් ඔහුගේ
මවවත්[18] මව්බිමෙන් වෙනත් දේශය-
කට පන්නා දමන්නෙමි. එහිදී ඔවුහු
මිය යනු ඇත.[19] **27** ආපසු පැමි-
ණීමට මහත් ආශාවෙන් බලා සිටින
දේශයට ඔවුහු නැවත කවදාවත් පැමි-

**22 පරි.**
1 2රාජා 23:35
2 යෙසා 5:8
3 හග් 1:4
4 එස 23:14
5 2රාජා 22:2
2රාජා 23:25
2ලේක 34:2
හිතෝ 21:3
හිතෝ 31:9
6 ද්වි 4:40
ගීතා 128:2
යෙසා 3:10
යෙරෙ 42:6
7 යෝබ 29:12
ගීතා 72:2
යෙසා 1:17
8 යොෂු 7:21
ගීතා 10:3
ගීතා 119:37
9 2රාජා 24:4
10 2රාජා 23:34
2ලේක 36:4
11 2සාමු 1:23
1රාජා 13:30
12 2ලේක 36:6
13 1රාජා 21:23
යෙරෙ 36:30
14 2රාජා 24:7
15 යෙසා 35:2
16 ගීතා 68:15

**2 තීරුව**
1 ද්වි 32:49
2 2ලේක 36:15
3 යෙරෙ 2:31
යෙරෙ 6:16
4 ද්වි 9:7
විනි 2:11
නෙහෙ 9:16
යෙරෙ 3:25
යෙරෙ 7:24
5 යෙරෙ 23:1
එස 34:2
සෙක 11:8
6 2රාජා 24:7
7 යෙරෙ 2:26
8 යෙසා 2:13
එස 17:3
9 යෙරෙ 22:6
10 යෙරෙ 4:31
11 යෙරෙ 6:24
හොෂෙ 7:14
12 2රාජා 23:34
13 2රාජා 24:6
1ලේක 3:16
යෙරෙ 22:28
යෙරෙ 37:1
මතෙ 1:11
14 හග් 2:23
15 යෙරෙ 22:6
16 2රාජා 24:15
යෙරෙ 21:7
යෙරෙ 34:20
17 2රාජා 24:11
2රාජා 24:16
එස්රා 5:12
හිතෝ 10:24
යෙරෙ 24:1
යෙරෙ 27:20
යෙරෙ 29:2
18 2රාජා 24:12

**19** 2රාජා 24:15; 2ලේක 36:10; යෙරෙ 15:2.

යෙරෙ **22:24*** හෙබ්‍රෙව් බසින්, කොනියා. LXXSyVgට අනුව, “යෙකොනියා.” 2රාජා 24:6-15ට අනුව, “යෙහෝයාකින්.” **24#** මූ.අ., “මුද්‍රා තබන මුද්දක්.”

ණෙන්නේ නැත.[1] **28** කොනියා[2]
නම් ඒ තැනැත්තාවත් ඔහුගෙන් පැව-
තෙන්නන්වත් ඔවුන් සිටි තත්වයෙන්
පහතට හෙළා ඔවුන් නොදන්නා දේ-
ශයකට පන්නා දමන්නේ ඇයි?[3] ඔහු
කිසි වැඩකට නැති බිඳුණු මැටි බඳු-
නක් වූ නිසාද?[4] ඔහුගේ කිසි වටිනාක-
මක් නැති නිසාද?'[5]

**29** "පොළොවේ වැසියෙනි, සවන්
දෙන්න. පොළොවේ වැසියෙනි,
මට සවන් දෙන්න. පොළොවේ වැසි-
යෙනි, යෙහෝවා දෙවි වන මට සවන්
දෙන්න.[6] **30** යෙහෝවා දෙවි වන
මම මෙසේ පවසමි. 'ඔහු ජීවිත කාලය
පුරාම කිසි සාර්ථකත්වයක් නොලබන
පුද්ගලයෙකි. ඔහු දරුවන් නොමැති
කෙනෙකු හා සමානය.[7] ඒ බව සට-
හන් කරගන්න. ඔහුගෙන් පැවතෙන
කිසිවෙක් සාර්ථකත්වය අත් නොද-
කින්නේය.[8] මන්ද ඔවුන්ට දාවිත්ගේ
සිංහාසනයේ හිඳ[9] යූදා දේශය පාලනය
කිරීමට හැකි වන්නේ නැත.' "

**23** යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. "මාගේ තණබිමේ
සිටි බැටළුවන්ට පහර දී උන්ව විසු-
රුවාහරින එඬේරුන් අද්දකින විපත
මොන තරම්ද!"[10]

**2** ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝවා
ඔහුගේ සෙනඟව බලාගැනීමට පත්
කර ඇති අයට විරුද්ධව පවසන්නේ
මෙයයි. "ඔබ මාගේ බැටළුවන්ව සීසී-
කඩ විසුරුවාහැර තිබේ. ඔබ ඔවුන්ව
රැකබලා ගන්නවා වෙනුවට ඔවුන්ව
අතරමං කර ඇත."[11]

"එබැවින් ඔබේ නපුරු ක්‍රියාවලට
මම ඔබට දඬුවම් කරන්නෙමි"[12] කියා
යෙහෝවා දෙවි පවසන්නේය.

**3** "ඉතුරු වී සිටින මාගේ බැට-
ළුවන්ව එනම්, විවිධ දේශවලට මා
විසුරුවාහැරිය අයව මම එකතු කර-
ගන්නෙමි.[13] ඔවුන්ව ඒ දේශවලින්
පිටතට ගෙනැවිත් නැවත ඔවුන්-
ගේම තණබිමට රැගෙන එන්නෙමි.[14]
ඔවුහු ගණනින් වැඩි වී සමෘද්ධි-
මත් ජාතියක් බවට පත් වන්නෝය.[15]
**4** ඔවුන්ව හොඳින් රැකබලා ගැනී-

**22 පරි.**
**1** යෙරෙ 44:14
යෙරෙ 52:34
**2** යෙරෙ 22:24
යෙරෙ 37:1
**3** 2රාජා 24:15
1ලේක 3:17
**4** 1සාමු 5:4
**5** ගීතා 31:12
යෙරෙ 48:38
හොෂෙ 8:8
**6** ද්වි 4:26
ද්වි 32:1
යෙසා 1:2
යෙසා 34:1
යෙරෙ 6:19
මීකා 1:2
**7** මතෙ 1:12
**8** 2ලේක 36:10
යෙරෙ 36:30
**9** ලූක් 1:32

**23 පරි.**
**10** යෙරෙ 10:21
යෙරෙ 50:6
එස 34:2
සෙක 11:5
මතෙ 9:36
**11** එස 34:5
**12** හොෂෙ 2:13
මීකා 7:4
**13** ගීතා 106:47
යෙසා 11:11
යෙසා 35:10
යෙරෙ 29:14
යෙරෙ 31:8
සෙක 10:8
**14** ද්වි 30:3
යෙසා 65:10
යෙරෙ 50:19
එස 34:13
එස 34:14
මීකා 2:12
**15** ද්වි 30:5
ආමෝ 9:14

**2 තීරුව**
**1** යෙරෙ 3:15
යොහ 21:15
ක්‍රියා 20:28
1පේතෘ 5:2
**2** මීකා 5:8
**3** යෙසා 4:2
යෙසා 11:1
යෙසා 53:2
යෙරෙ 33:15
සෙක 3:8
මතෙ 2:23
යොහ 1:45
**4** ලූක් 1:32
**5** ගීතා 72:2
යෙසා 9:7
යෙසා 11:4
යෙසා 32:1
**6** 1රාජා 4:25
හොෂෙ 1:7
සෙක 10:6

මට මම එඬේරුන්ව පත් කරන්නෙමි.[1]
ඔවුහු තවදුරටත් බිය වන්නේවත්
තැතිගන්නේවත් නැත.[2] ඔවුන්ගෙන්
කිසිවෙක් මංමුළා වන්නේද නැත"
කියා යෙහෝවා දෙවි පවසන්නේය.

**5** යෙහෝවා දෙවි මෙසේද පව-
සන්නේය. "මම දාවිත්ගේ පෙළප-
තින් ධර්මිෂ්ඨ තැනැත්තෙකු* බිහි
වීමට සලස්වන්නෙමි.[3] ඔහු නුවණැ-
තිව රජකම් කරනු ඇත.[4] යුක්තිය
ඉටු කරමින් ධර්මිෂ්ඨ ලෙස පාල-
නය කරනු ඇත.[5] **6** ඔහු රජකම්
කරන කාලයේදී යූදා වැසියන්ට ගැල-
වීම ලැබෙන්නේය.[6] ඊශ්‍රායෙල් සෙනඟ
සුරක්ෂිතව වාසය කරන්නෝය.[7] 'අප
ධර්මිෂ්ඨව සිටින්නේ යෙහෝවා දෙවි
නිසාය'[8] යන නාමයෙන් ඔහුව හඳුන්-
වනු ඇත."

**7** යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. "මතු දවස්වලදී ඊශ්‍රායෙල්
සෙනඟ ජීවමාන යෙහෝවා දෙවි
වන මාගේ නමින් දිවුරන විට මම
ඊජිප්තු දේශයෙන් සෙනඟව පිටතට
ගෙනා ආකාරය සිහි නොකරනු ඇත.[9]
**8** නමුත් උතුරු දේශයට හා වෙනත්
දේශවලට මා විසුරුවාහැරිය සෙ-
නඟව මා නැවත ඔවුන්ගේ දේශයට
ගෙනා ආකාරය සිහි කරමින් ඔවුහු
ජීවමාන යෙහෝවා දෙවි වන මාගේ
නමින් දිවුරනු ඇත. ඔවුහු තමන්ගේම
දේශයේ වාසය කරනු ඇත."[10]

**9** අනාගතවක්තෘවරුන් නිසා
මගේ සිතට මහත් වේදනාවක්
දැනෙන්නේය. මගේ ඇටකටු පවා
වෙවුලන්නේය. යෙහෝවා දෙවිගෙන්
ලැබුණු ශුද්ධ පණිවිඩ නිසා මම වයින්-
වලින් මත් වූ මිනිසෙකු මෙන් සිටිමි.[11]
**10** අනාචාරයේ යෙදෙන්නන්ගෙන්[12]
දේශය පිරී තිබේ.[13] ශාපය නිසා

**7** ද්වි 33:28; ගීතා 130:7; යෙසා 62:4; යෙරෙ 32:37; සෙක 14:11; **8** යෙසා 54:17; යෙරෙ 33:16; **9** යෙරෙ 16:14; **10** යෙසා 27:12; යෙසා 43:5; එස 34:13; එස 36:24; ශෙප 3:20; **11** ගීතා 60:3; **12** යෙරෙ 3:9; යෙරෙ 9:2; යෙරෙ 13:27; එස 16:32; හොෂෙ 7:4; **13** යෙරෙ 5:7; එස 22:11; හොෂෙ 4:2.

යෙරෙ **23:5*** මූ.අ., "රිකිල්ලක්."

මුළු දේශයම හඬා වැලපෙන්නේය.[1]
තණබිම් සියල්ල වියළී ගොස් ඇත.[2]
සෙනඟ හැසිරෙන්නේ ඉතා දුෂ්ට ලෙ-
සය. ඔවුන් තම බලය පාවිච්චි කරන්-
නේ වැරදි ආකාරයටය.
**11** යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. “අනාගතවක්තෘවරු හා පූජ-
කයෝ දූෂිත දේවල් කරති.[3] මාගේ
ගෘහයේ සිටම ඔවුන් කරන නපුරුකම්
මා දැක තිබේ.[4] **12** එබැවින් ලිස්ස-
නසුලු,[5] අඳුරු මාර්ගවල ගමන් කිරී-
මට ඔවුන්ට සිදු වන්නේය. එවැනි
මාර්ග වෙතට ඔවුන්ව පන්නා දමනු
ඇත. එහිදී ඔවුහු නිසැකවම ලිස්සා
වැටෙන්නෝය.”[6]
“ඔවුන්ගේ නපුරුකම්වලට දඬු-
වම් දෙන කාලයේදී මම ඔවුන්
පිටට විපත්ති ගෙනෙන්නෙමි”[7]
කියා යෙහෝවා දෙවි පවසන්නේය.
**13** “සමාරියේ අනාගතවක්තෘවරු[8]
පිළිකුල්සහගත ලෙස හැසිරෙන්-
නෝය. ඔවුහු බාල් දෙවියාට සේවය
කරමින් ඔහුගේ නාමයෙන් අනාවැකි
කියන්නෝය.[9] ඔවුහු මාගේ සෙනඟ
වන ඊශ්‍රායෙල්වරුන්වද මුළා කරති.[10]
**14** යෙරුසලමේ අනාගතවක්තෘවරු
ඊටත් වඩා වැඩියෙන් පිළිකුල්සහගත
ලෙස ක්‍රියා කරන්නෝය.[11] අනාචාර-
යේ යෙදෙන ඔවුහු[12] බොරු දේවල්
උගන්වති.[13] දුෂ්ටයන් තමන්ගේ වැරදි
මාර්ගවලින් ඉවත්ව නොයන ලෙස
අනාගතවක්තෘවරු ඔවුන්ගේ වැරදි
ක්‍රියාවලට තව තවත් රුකුල් දෙති.[14]
මට ඔවුන් සෑම කෙනෙකුම සො-
දොම්හි වැසියන් මෙනි.[15] යෙරුසලමේ
වැසියන් මට ගොමෝරාවේ වැසියන්
මෙනි.”[16]
**15** ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි අනාගතවක්-
තෘවරුන් ගැන මෙසේ පවසන්නේය.
“යෙරුසලමේ සිටින අනාගතවක්තෘ-
වරුන් දෙවිට විරුද්ධව කරන කැරලි-
ගැසීම[17] දේශය පුරාම පැතිර ගොස්
ඇත. එබැවින් මම අනාගතවක්තෘව-
රුන්ට තිත්ත දේ කන්න දෙමි. බීමට
විෂ මිශ්‍ර වතුර දෙමි.”[18]
**16** ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි තවදුරටත් ඔවුන්
ගැන පවසන්නේ මෙයයි. “ඔබට අනා-
වැකි පවසන ඒ අනාගතවක්තෘව-
රුන්ට ඇහුම්කන් නොදෙන්න.[1] ඔවුන්
ඔබව පොලඹවන්නේ නිෂ්ඵල දේ
කිරීමටය.[2] ඔවුන් ප්‍රකාශ කරන්නේ
ඔවුන්ගේම සිතේ තිබෙන දේ[3] මිස
යෙහෝවා දෙවි වන මාගේ පණිවිඩ
නොවේ.[4] **17** මට අගෞරව කරන
අයට ඔවුහු නැවත නැවතත් මෙසේ
පවසති. ‘“ඔබට සාමයෙන් ජීවත්
වීමට හැකි වෙනවා”[5] කියා යෙ-
හෝවා දෙවි පැවසුවා.’ එමෙන්ම
ඔවුහු, ‘ඔබ පිටට කිසි විපත්තියක්
පැමිණෙන්නේ නැහැ’[6] කියා මුරණ්ඩු
ලෙස හැසිරෙන සියලුදෙනාට පව-
සති.[7] **18** යෙහෝවා දෙවි වන මාගේ
වදන් අසා එය තේරුම්ගත හැකි,[8] මට
සමීප කිසිවෙක් සිටීද?[9] මාගේ වදන්ව-
ලට උනන්දුවෙන් සවන් දෙන කවු-
රුන් හෝ සිටීද?[10] **19** දුෂ්ටයන්ට
සිදු වන දේ දෙස බලන්න! යෙහෝවා
දෙවි වන මාගේ උදහස දරුණු සුළි-
සුළඟක් මෙන්[11] ඔවුන් වෙතට හමා
එනු ඇත.[12] **20** යෙහෝවා දෙවි වන
මා අරමුණු කළ දේ සම්පූර්ණයෙන්ම
ඉටු වන තුරු[13] මාගේ උදහස පහව
නොයයි.[14] අවසාන කාලයේදී ඔබ එය
හොඳින් තේරුම්ගනු ඇත.[15]
**21** “අනාවැකි පැවසීමට මම අනා-
ගතවක්තෘවරුන්ව යැව්වේ නැත.
නමුත් ඔවුහු ගියෝය. මම ඔවුන්ට
කිසිවක් පැවසුවේ නැත. නමුත් ඔවුහු
අනාවැකි පැවසුවෝය.[16] **22** ඔවුන්ට
මා සමඟ කිට්ටු මිත්‍රත්වයක් තිබුණා
නම්[17] මාගේ වදන් සෙනඟට පවසා,
සෙනඟ ගිය වැරදි මාර්ගවලින් ඔවුන්ව
ඉවත් කරගැනීමට ඔවුන්ට හැකි වනු
ඇත. එමෙන්ම ඔවුන්ගේ දුෂ්ට ක්‍රියා
අත්හැර ඔවුන්ව යහමඟට ගැනීමටද
ඔවුන්ට හැකි වනු ඇත.”[18]

**23 පරි.**
**1** යෙසා 24:4
යෙරෙ 12:4
හොෂෙ 4:3
යෝවෙ 1:10
**2** ගීතා 107:34
යෙරෙ 9:10
යෙරෙ 12:4
**3** යෙසා 28:7
යෙරෙ 5:31
යෙරෙ 6:13
යෙරෙ 8:10
එස 22:25
ශෙප 3:4
**4** 2ලේක 33:5
2ලේක 36:14
යෙරෙ 7:11
එස 8:11
එස 23:39
**5** ගීතා 35:6
ගීතා 73:18
හිතෝ 4:19
යෙරෙ 13:16
**6** ද්වි 28:15
**7** යෙරෙ 8:12
යෙරෙ 11:23
**8** එස 16:46
**9** යෙරෙ 2:8
**10** 2ලේක 33:9
යෙසා 9:16
**11** යෙරෙ 18:13
**12** යෙරෙ 29:23
**13** යෙරෙ 14:14
යෙරෙ 23:26
**14** ද්වි 30:10
මලා 3:7
**15** යෙසා 3:9
**16** උත් 18:20
ද්වි 32:32
යෙසා 1:10
යූද් 7
**17** හිතෝ 11:9
යෙසා 9:17
යෙසා 24:5
**18** යෙරෙ 8:14
යෙරෙ 9:15

**2 තීරුව**
**1** යෙරෙ 27:9
යෙරෙ 29:8
**2** 2රාජා 17:15
යෙරෙ 2:5
**3** විලා 2:14
**4** යෙරෙ 14:14
යෙරෙ 28:15
එස 13:3
එස 22:28
**5** යෙරෙ 4:10
යෙරෙ 6:14
යෙරෙ 8:11
එස 13:10
**6** ආමො 9:10
මීකා 3:11
**7** ද්වි 29:19
යෙරෙ 3:17
**8** ආමො 3:7
**9** ගීතා 25:14
ගීතා 89:7
යෙරෙ 23:22
**10** 2ලේක 33:10
**11** යෙසා 5:25
යෙරෙ 25:32

**12** විනි 9:57; 1සාමු 25:39; නෙහෙ 4:4; යෙරෙ 30:23; යෝවෙ 3:7; ඔබ 15; **13** යෙරෙ 30:24; **14** ලෙවී 26:28; සෙක 8:14; **15** 1රාජා 8:47; **16** යෙරෙ 14:14; යෙරෙ 27:15; යෙරෙ 29:9; **17** යෝබ් 29:4; ගීතා 15:1; ගීතා 25:14; යෙරෙ 23:18; **18** යෙරෙ 25:5; යෙරෙ 29:23.

**23** යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. “මා දකින්නේ මා ආසන්න-
යේ සිදු වන දේවල් පමණක් නොවේ.
බොහෝ දුර ඈත සිදු වන දේවල් පවා
දැකීමට මට හැකියාව තිබේ.”[1]
**24** “කිසි මිනිසෙකුට මාගෙන්
සැඟවී සිටිය හැකිද”[2] කියා යෙහෝවා
දෙවි අසන්නේය.
යෙහෝවා දෙවි මෙසේද අසන්-
නේය. “මාගේ අවධානයට හසු නො-
වන කිසිම දෙයක් ස්වර්ගයේවත්
පොළොවේවත් තිබේද?”[3] **25** “බොරු
අනාගතවක්තෘවරුන්, ‘අපි සිහින-
යක් දුටුවා! අපි සිහිනයක් දුටුවා’[4]
කියා මාගේ නාමයෙන් කියන බොරු
අනාවැකි මට ඇසිණ.[5] **26** තමන්-
ගේ වංචනික සිතුවිලිවලට අනුව
බොරු අනාවැකි ප්‍රකාශ කරන මේ
අනාගතවක්තෘවරුන් තව කොප-
මණ කාලයක් මෙසේ ක්‍රියා කරයිද?[6]
**27** මාගේ සෙනඟගේ මුතුන්මිත්තන්
බාල්ට නමස්කාර කළ නිසා ඔවුන්ට
මාගේ නාමය අමතක වුණාක් මෙන්[7]
මේ අනාගතවක්තෘවරුන්ද උත්සාහ
කරන්නේ තමන් දුටු සිහින ගැන
මාගේ සෙනඟට පවසා මාගේ
නාමය ඔවුන්ට අමතක කරවීමටය.[8]
**28** සිහින දකින අනාගතවක්තෘවරු
ඔවුන් දුටු දේවල් පවසනු ලබත්වා!
නමුත් මාගේ පණිවිඩ ලැබූ තැනැත්තා
එය විශ්වාසවන්තව ප්‍රකාශ කරනු
ලැබේවා!”[9]
යෙහෝවා දෙවි මෙසේ අසන්-
නේය. “පිදුරු ධාන්‍යවලට සමාන කළ
හැකිද?”[10]
**29** “මාගේ පණිවිඩය ගින්නකට
සමාන නොවේද?[11] පර්වත කුඩු
කරන කුළු ගෙඩියකට සමාන නො-
වේද”[12] කියා යෙහෝවා දෙවි අසන්-
නේය.
**30** යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. “මාගේ වදන් එකිනෙකාගෙන්
සොරාගන්නා[13] අනාගතවක්තෘව-
රුන්ට විරුද්ධව මම ක්‍රියා කරමි.”[14]
**31** “‘මට දෙවිගෙන් පණිවිඩයක්
ලැබුණා’[15] යයි පවසමින් තමන්ගේම
අදහස් ප්‍රකාශ කරන අනාගතවක්තෘ-
වරුන්ට විරුද්ධව මම ක්‍රියා කරමි”
කියා යෙහෝවා දෙවි පවසන්නේය.
**32** “තමන් දුටු බොරු සිහින අනා-
වැකි ලෙස ප්‍රකාශ කරන්නන්ට විරුද්-
ධව මම ක්‍රියා කරමි. මන්ද ඔවුහු ඒ
බොරු සිහින ගැන පවසමින්,[1] පුරසා-
රම් දොඩමින්[2] මාගේ සෙනඟව මුළා
කරන්නෝය” කියා යෙහෝවා දෙවි
පවසන්නේය.
“අනාවැකි ප්‍රකාශ කිරීමට මම
ඔවුන්ව එව්වේවත් එසේ කරන ලෙස
මම ඔවුන්ට අණ කළේවත් නැත. ඒ
නිසා ඔවුන් පවසන දේවලින් මේ සෙ-
නඟට කිසිම ප්‍රයෝජනයක් ලැබෙන්-
නේ නැත”[3] කියාද යෙහෝවා දෙවි
පවසන්නේය.
**33** “‘යෙහෝවා දෙවිගේ පණිවිඩය
අපට මහත් බරක්’[4] කියා මේ සෙනඟ
හෝ අනාගතවක්තෘවරයෙකු හෝ
පූජකයෙකු හෝ ඔබට පවසන විට
ඔබ ඔවුන්ට මෙසේ කියන්න. ‘“ජන-
යෙනි, ඔබ මට මහත් බරක්![5] එබැ-
වින් මම ඔබව අත්හැර දමන්නෙමි”[6]
කියා යෙහෝවා දෙවි පවසන්නේය.’
**34** සෙනඟගෙන් යම් කෙනෙකු හෝ
අනාගතවක්තෘවරයෙකු හෝ පූජක-
යෙකු හෝ, ‘යෙහෝවා දෙවිගේ පණි-
විඩය මහත් බරක්’ කියා පැවසුවොත්
මම ඒ තැනැත්තාටත් ඔහුගේ ගෙයි
වැසියන්ටත් දඬුවම් කරන්නෙමි.[7]
**35** සෙනඟ තම සහෝදරයාගෙන්ද
මිතුරාගෙන්ද ඇසිය යුත්තේ මෙ-
යයි. ‘යෙහෝවා දෙවි අපට දුන් පිළි-
තුර කුමක්ද? යෙහෝවා දෙවි පවසා
තිබෙන්නේ කුමක්ද?’[8] **36** නමුත්
ජනයෙනි, යෙහෝවා දෙවිගේ පණිවි-
ඩය මහත් බරක්[9] කියා තවදුරටත්
නොකියන්න.[10] ස්වර්ගයේ සේනාවල
අධිපතිද ඊශ්‍රායෙල්හි ජීවමාන දෙවිද
වන යෙහෝවාගේ පණිවිඩ වෙනස්
කර[11] ඔබ ඔබේම අදහස් ප්‍රකාශ කරන
නිසයි දෙවිගේ පණිවිඩ ඔබට මහත්
බරක් වී තිබෙන්නේ.[12]
**37** “ඔබ ගොස් අනාගතවක්තෘව-
රුන්ගෙන් මෙසේ අසන්න. ‘යෙහෝවා

**23 පරි.**
1 ගීතා 113:6
ක්‍රියා 17:27
2 උත් 16:13
ගීතා 90:8
ගීතා 139:7
හිතෝ 15:3
ආමො 9:2
හෙබ්‍රෙ 4:13
3 ගීතා 139:7
යෙසා 66:1
4 ද්වි 13:1
ද්වි 18:20
යෙරෙ 27:9
සෙක 10:2
5 යෙරෙ 29:23
6 යෙරෙ 14:14
යෙරෙ 17:9
7 විනි 3:7
2රාජ 21:3
8 ද්වි 13:2
ක්‍රියා 13:8
9 හිතෝ 14:5
ලූක් 12:42
2කොරි 2:17
10 යෙසා 41:16
ලූක් 3:17
1කොරි 3:13
11 යෙසා 30:27
යෙරෙ 5:14
යෙරෙ 20:9
12 හෙබ්‍රෙ 4:12
13 2සාමු 15:6
ගීතා 50:17
14 ද්වි 18:20
යෙරෙ 14:15
එස 13:2
මතෙ 24:24
15 එස 13:7

**2 තීරුව**
1 ද්වි 13:1
ද්වි 18:20
සෙක 10:2
2 ශෙප 3:4
3 යෙරෙ 7:8
විලා 2:14
මතෙ 15:14
4 යෙරෙ 17:15
හබ 1:1
මලා 1:1
5 ගණන් 11:14
6 ද්වි 31:17
යෙරෙ 12:7
හොෂෙ 9:12
7 මීකා 7:4
8 යෙරෙ 31:34
හෙබ්‍රෙ 8:11
9 නික් 19:8
1ලේක 9:33
10 නෙහෙ 13:18
11 යෙරෙ 2:21
යෙරෙ 2:36
12 විනි 17:6

දෙවි ඔබට දුන් පිළිතුර කුමක්ද?
යෙහෝවා දෙවි පැවසුවේ කුමක්ද?[1]
**38** “යෙහෝවා දෙවිගේ පණිවිඩය
මහත් බරක්” කියා ඔබ දිගින් දිගටම
පවසන්නේ නම් යෙහෝවා දෙවි ඔබට
මෙසේ පවසන්නේය. “ ‘යෙහෝවා දෙ-
විගේ පණිවිඩය මහත් බරක්’ කියා
නොකියන ලෙස මම නිතර නිතර
ඔබට දැන්වූවත් ඔබ, ‘යෙහෝවා දෙ-
විගේ පණිවිඩය මහත් බරක්’ කියා
දිගින් දිගටම පවසන නිසා **39** මම
ඔබව අමතක කර දමන්නෙමි.[2]
ඔබව සම්පූර්ණයෙන්ම අත්හරින්-
නෙමි. ඔබට හා ඔබේ මුතුන්මිත්තන්ට
දුන් නගරයත් අත්හැර දමන්නෙමි.[3]
**40** සදාකාලයටම ඔබට නින්දාවත්
ලැජ්ජාවත් අත්විඳීමට සලස්වන්නෙමි.
ඔබට සිදු වන දේ කිසිදා අමතක නො-
වනු ඇත.” ’ ”[4]

**24** බැබිලෝනියේ රජු වන නෙ-
බුකද්රෙෂර්, යෙහෝයාකිම්-
ගේ පුත්‍රයා වූ[5] යූදාහි රජු වන
යෙකොනියාවද යූදාහි අධිපතීන්-
වද කැටයම්කරුවන්වද[6] පවුරු ඉදි
කරන්නන්වද යෙරුසලමේ සිට බැබි-
ලෝනියට[7] වහලුන් ලෙස රැගෙන ගිය
පසු[8] යෙහෝවා දෙවි මට දර්ශනයක්
පෙන්වූවේය. යෙහෝවා දෙවිගේ මාලි-
ගාව ඉදිරියේ අත්තික්කාවලින් පිරුණු
කූඩ දෙකක් තිබුණේය. **2** මුල් වාර-
යේ හටගන්නා අත්තික්කා ගෙඩි
මෙන් හොඳ අත්තික්කා එහි එක් කූඩ-
යක තිබුණු අතර[9] අනික් කූඩයේ
තිබුණු අත්තික්කා කෑමට ගත නො-
හැකි තරමටම නරක් වී තිබුණේය.
**3** එවිට, “යෙරෙමියා, ඔබට පෙ-
නෙන්නේ කුමක්ද” කියා යෙහෝවා
දෙවි මගෙන් ඇසුවේය. මම මෙසේ
පිළිතුරු දුනිමි. “අත්තික්කා ගෙඩිව-
ලින් පිරුණු කූඩ දෙකක් මට පෙ-
නෙනවා. එක් කූඩයක් ඉතා හොඳ
අත්තික්කා ගෙඩිවලින් පිරී තිබෙ-
නවා. නමුත් අනික් කූඩයේ තිබෙන්-
නේ කන්න බැරි තරමටම නරක් වූ
අත්තික්කා ගෙඩියි.”[10]
**4** එවිට යෙහෝවා දෙවි මට
මෙසේ පැවසුවේය. **5** “ඊශ්‍රායෙල්හි
දෙවි යෙහෝවා වන මම මෙසේ පව-
සමි. ‘මා යූදා දේශයේ සිට කල්දිව-
රුන්ගේ දේශයට පිටමං කළ අයව[1]
සලකන්නේ කූඩයේ තිබෙන හොඳ
අත්තික්කා ගෙඩි හා සමානවය.[2]
**6** මම ඔවුන්ව හොඳින් රැකබලා
ගෙන[3] නැවත මේ දේශයට ගෙනෙන්-
නෙමි.[4] ඔවුන්ව නැවත නඟා සිටු-
වන්නෙමි. ඔවුන්ව නැවත බිඳ දැමිය
නොහැකි සේ ස්ථිරව සිටුවන්නෙමි.
ඔවුන්ව නැවත උදුරා නොදමන්-
නෙමි.[5] **7** මා යෙහෝවා දෙවි බව
තේරුම්ගැනීමට හැකි හදවතක් මම
ඔවුන්ට ලබා දෙන්නෙමි.[6] ඔවුන් මුළු
හදවතින්ම මා වෙතට හැරී එන නිසා[7]
මාගේ සෙනඟ ලෙස මම ඔවුන්ව පිළි-
ගන්නෙමි.[8] ඔවුන්ගේ දෙවි වන්නෙමි.’
**8** “යෙහෝවා දෙවි වන මම මෙ-
සේද පවසමි. ‘කෑමට ගත නොහැකි
තරම් නරක් වූ අත්තික්කා ගෙඩිවලට
සිදු වන දේම[9] මම යූදාහි රජු වන
ශෙදකියාටත්[10] ඔහුගේ අධිපතීන්-
ටත් සිදු වීමට සලස්වමි. එමෙන්ම
යෙරුසලමේ වැසියන්ගෙන් මේ දේ-
ශයේ[11] සහ ඊජිප්තු දේශයේ[12] ඉතු-
රුව සිටින අයටත් ඒ දේම සිදු
වීමට සලස්වමි. **9** මම ඔවුන් පිටට
ගෙනෙන විපත්තිය නිසා පොළොවේ
සිටින සියලු රාජ්‍යයන් බියෙන් වෙ-
වුලනු ඇත.[13] වෙනත් ජාතීන් අත-
රේ ඔවුහු නින්දාවටත් සමච්චලයටත්
ලක් වනු ඇත. ඔවුන්ව විසුරුවා-
හරින ලද දේශවල වෙසෙන ජනයා[14]
ඔවුන්ට අපහාස කරමින්[15] ශාප කරනු
ඇත.[16] **10** මා ඔවුන්ගේ මුතුන්මිත්-
තන්ටත් ඔවුන්ටත් දුන් දේශයෙන්
ඔවුන් තුරන් වී යන තුරුම[17] මම
ඔවුන්ට කඩුවෙන්ද[18] සාගතයෙන්ද[19]
වසංගතයෙන්ද[20] පහර දෙමි.’ ”

**25** යොෂියාගේ පුත්‍රයා වූ යූදාහි
රජු වන යෙහෝයාකිම් රජ-
කම් කළ හතරවන අවුරුද්දේදී[21]

**23 පරි.**
1 එස 18:25
2 ද්වි 31:17
හොෂෙ 4:6
3 යෙරෙ 23:33
විලා 5:20
4 යෙරෙ 20:11
යෙරෙ 24:9
යෙරෙ 42:18
ආනි 9:16

**24 පරි.**
5 2රාජා 24:6
1ලේක 3:16
යෙරෙ 22:24
6 2රාජා 24:16
7 යෙරෙ 29:2
8 2රාජා 24:12
එස්ත 2:6
එස 19:9
9 යෙසා 28:4
හොෂෙ 9:10
10 යෙරෙ 24:8

**2 තීරුව**
1 යෙරෙ 25:11
2 යෙරෙ 29:10
3 2ලේක 16:9
1පේතෘ 3:12
4 එස්රා 1:3
යෙරෙ 12:15
යෙරෙ 23:3
යෙරෙ 29:10
එස 36:24
5 යෙරෙ 1:10
යෙරෙ 30:18
යෙරෙ 32:41
යෙරෙ 33:7
6 ද්වි 30:6
යෙරෙ 31:33
එස 11:19
7 1රාජා 8:48
යෙරෙ 29:13
8 යෙරෙ 30:22
යෙරෙ 32:38
එස 14:11
සෙක 8:8
හෙබ්‍රෙ 8:10
9 යෙරෙ 29:17
10 2රාජා 25:7
එස 12:13
11 ලෙවී 26:39
12 යෙරෙ 43:7
යෙරෙ 44:1
යෙරෙ 46:13
13 යෙරෙ 15:4
යෙරෙ 34:17
14 ද්වි 28:64
යෙරෙ 29:18
15 ද්වි 28:37
1රාජා 9:7
2ලේක 7:20
ගීතා 44:13
16 ද්වි 28:15
ද්වි 29:27
යෙරෙ 26:6
යෙරෙ 29:22
17 ද්වි 28:63
18 ලෙවී 26:33
යෙරෙ 9:16

---

**19** යෙරෙ 14:15; යෙරෙ 15:2; **20** ද්වි 28:59; එස 7:15;
**25 පරි.** **21** 2රාජා 24:1; යෙරෙ 36:1; යෙරෙ 46:2; ආනි 1:1.

යුදාහි වැසියන් සම්බන්ධයෙන් යෙරෙ-
මියාට පණිවිඩයක් ලැබුණේය. එය
බැබිලෝනියේ රජු වන නෙබුකද්‍රෙ-
ෂර්ගේ පාලනයේ පළමුවන අවුරුද්ද
විය. **2** යුදාහි වැසියන් හා යෙරුස-
ලමේ වැසියන් සම්බන්ධයෙන් තමාට
ලැබුණු පණිවිඩය දන්වමින් අනාගත-
වක්තෘ යෙරෙමියා මෙසේ පැවසුවේය.
**3** “ආමොන්ගේ පුත්‍රයා වූ යුදාහි
රජු වූ යොෂියා රජකම් කළ දහතුන්-
වන අවුරුද්දේ[1] සිට මේ දවස දක්වාම
එනම්, මේ අවුරුදු විසිතුන පුරාම යෙ-
හෝවා දෙවිගෙන් බොහෝ පණිවිඩ
මට ලැබිණ. ජනයෙනි, මා හිමිදිරි
උදැසන සිට නොනවත්වා ඒ පණිවිඩ
ඔබට දැන්වුවත් ඔබ ඒවාට ඇහුම්කන්
දුන්නේ නැත.[2] **4** යෙහෝවා දෙවි
හිමිදිරි උදැසන සිට ඔහුගේ සේවක-
යන් වන අනාගතවක්තෘවරුන්ව ඔබ
වෙතට එව්වේය. නමුත් ඔබ ඔවුන්
පැවසූ දේට ඇහුම්කන් දුන්නේවත්[3]
ඒවා ගණනකට ගත්තේවත්[4] නැත.
**5** ඒ අනාගතවක්තෘවරු ඔබට මෙසේ
පැවසුවෝය. ‘ජනයෙනි, ඔබේ නරක
මාර්ගවලින් ඉවත් වන්න. ඔබ කරන
දුෂ්ට ක්‍රියා අත්හැර යහපත් ලෙස
හැසිරෙන්න.[5] ඔබ එසේ කළොත් යෙ-
හෝවා දෙවි ඈත අතීතයේදී ඔබේ
මුතුන්මිත්තන්ට දුන් දේශයේ එනම්,
උරුමයක් ලෙස ඔබට ලැබුණු මේ
දේශයේ තව දිගු කාලයක් ජීවත්
වීමට ඔබට හැකි වනු ඇත.[6] **6** ඔබ
පිටට විපත්ති නොපැමිණෙන පිණිස
වෙනත් දෙවිවරුන්ගේ පිහිට පතමින්
ඒවා ඉදිරියේ වැඳ වැටී නමස්කාර
නොකරන්න. ඔබ දේවතා රූප සාදා-
ගෙන දෙවිව උදහසට පත් නොක-
රන්න.’[7]
**7** “‘නමුත් ඔබ මට ඇහුම්කන්
දුන්නේ නැත. ඔබ දේවතා රූප සාදා-
ගෙන මාව උදහසට පත් කළේය.
එබැවින් ඔබ පිටට විපත්ති පැමිණෙනු
ඇත’[8] කියා යෙහෝවා දෙවි පවසන්-
නේය.
**8** “ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මෙසේද පවසන්-
නේය. ‘ඔබ මට අකීකරු වූ නිසා
**9** මම මාගේ සේවකයාද බැබිලෝ-
නියේ රජුද වන නෙබුකද්‍රෙෂර්ටත්[1]
උතුරෙහි වෙසෙන සියලු ගෝත්‍රයන්-
ටත් පණිවිඩයක් යවා ඔවුන්ව ගෙන්-
වාගන්නෙමි.[2] මා එසේ කරන්නේ
මේ දේශයටත්[3] එහි වැසියන්ටත් දේ-
ශය අවට සිටින සියලු ජාතීන්ටත්[4]
විරුද්ධව ඔවුන් ක්‍රියා කරන පිණිසය.
මෙසේ පවසන මා යෙහෝවා දෙවිය.
මම මේ සෙනඟව සහමුලින්ම විනාශ
කර දමන්නෙමි. ඔවුන්ට සිදු වන දේ
දැක සියලුදෙනා පුදුමයට පත් වනු
ඇත. ඔවුන්ව සියල්ලන්ගේ නින්දා
අපහාසවලට ලක් වීමට මම සලස්-
වන්නෙමි.[5] මේ දේශය සදහටම පාළු-
වට යෑමට ඉඩහරින්නෙමි.[6] **10** ප්‍රීති
ඝෝෂාවද[7] මනාලයාගේ හා මනාලිය-
ගේ හඬද[8] තවදුරටත් ඔවුන් අතරෙන්
නොඇසීමට සලස්වන්නෙමි. ඇඹරුම්
ගලේ ශබ්දයත්[9] පහනේ ආලෝක-
යත්[10] මම ඔවුන් අතරෙන් තුරන් කර
දමන්නෙමි. **11** මුළු දේශයම පාළු-
වට යන්නේය. සියලුදෙනා එදෙස පුදු-
මයෙන් බලනු ඇත. මේ ජාතීන්ට
වසර හැත්තෑවක් පුරා බැබිලෝනියේ
රජුට සේවය කිරීමට සිදු වනු ඇත.”’[11]
**12** “යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. ‘අවුරුදු හැත්තෑව සම්-
පූර්ණ වූ පසු[12] මම බැබිලෝනියේ
රජුටත් ඔහුගේ ජාතියටත් ඔවුන් කළ
වරදට දඬුවම් කරන්නෙමි.[13] කල්දි-
වරුන්ගේ දේශය[14] සදහටම පාළු වී
යෑමට සලස්වන්නෙමි.[15] **13** මම ඒ
දේශයට විරුද්ධව ප්‍රකාශ කළ සෑම
දෙයක්ම ඉටු කරන්නෙමි. මේ ලිය-
විල්ලේ අනාවැකි ලෙස සඳහන් කර
තිබෙන සියල්ල එනම්, යෙරෙමියා
සියලු ජාතීන්ට විරුද්ධව ප්‍රකාශ කළ
සියල්ල මම ඒ දේශය පිටට ගෙනෙන්-
නෙමි.[16] **14** මන්ද බොහෝ ජාතීහුද
බලවත් රජවරුද[17] මාගේ සෙනඟව
මෙහෙකාරකමට ගෙන ගියෝය.[18]

**25 පරි.**
1 යෙරෙ 1:2
2 2ලේක 36:15
ගීතා 81:13
යෙරෙ 7:13
යෙරෙ 11:7
යෙරෙ 13:10
යෙරෙ 16:12
3 යෙරෙ 7:13
යෙරෙ 29:19
යෙරෙ 44:4
4 සෙක 7:11
ක්‍රියා 7:51
5 2රාජා 17:13
යෙසා 55:7
යෙරෙ 18:11
යෙරෙ 35:15
එස 18:30
එස 33:11
යෝනා 3:8
සෙක 1:4
මලා 3:7
2පේත්‍රු 3:9
6 ගීතා 105:11
7 නික් 20:5
ද්වි 6:15
යොෂු 24:20
8 ද්වි 32:21
2රාජා 17:17
නෙහෙ 9:26
යෙරෙ 7:19
යෙරෙ 32:30
යෙරෙ 44:5

**2 තීරුව**
1 යෙරෙ 27:6
යෙරෙ 43:10
එස 29:18
2 ලෙවී 26:25
යෙසා 5:26
යෙරෙ 1:15
යෙරෙ 5:15
3 ද්වි 28:49
යෙරෙ 5:15
එස 7:24
ආමො 6:14
4 එස 26:7
එස 29:19
හබ 1:6
5 යෙරෙ 19:8
6 1රාජා 9:7
යෙරෙ 18:16
7 යෙසා 24:7
එස 26:13
8 යෙරෙ 7:34
යෙරෙ 16:9
9 එළි 18:22
10 එළි 18:23
11 2ලේක 36:21
දානි 9:2
සෙක 1:12
සෙක 7:5
12 ද්වි 30:3
එස්රා 1:1
යෙරෙ 29:10
13 යෙසා 13:1
යෙසා 14:4
යෙසා 47:1
යෙරෙ 51:1
දානි 5:26
දානි 5:30
14 2රාජා 24:1

**15** යෙසා 13:19; යෙසා 14:23; **16** යෙරෙ 1:5; යෙරෙ 1:10; **17** යෙරෙ 50:9; යෙරෙ 51:27; **18** යෙසා 14:2; යෙරෙ 50:41; යෙරෙ 51:7; හබ 2:8.

මම ඒ ජාතීන්ට ඔවුන්ගේ ක්‍රියාවලට
අනුව දඬුවම් කරන්නෙමි.’”[1]
**15** ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝවා
මට මෙසේ පැවසුවේය. “උදහස
නමැති වයින් තිබෙන මේ කුසලානය
මාගේ අතින් ගෙන මා ඔබට පව-
සන ජාතීන් වෙතට ගොස් ඔවුන් සිය-
ලුදෙනාට එයින් බොන්න දෙන්න.[2]
**16** ඔවුහු එයින් පානය කර උමතු-
වෙන් මෙන් ඒ මේ අත වැනෙනු ඇත.
ඔවුන්ට එසේ සිදු වන්නේ මා ඔවුන්
අතරට යවන කඩුව නිසාය.”[3]
**17** මම යෙහෝවා දෙවිගේ අතේ
තිබුණු කුසලානය රැගෙන යෙ-
හෝවා දෙවි පැවසූ ජාතීන් වෙ-
තට ගොස් ඔවුන් සියල්ලන්ට එයින්
බොන්න දුන්නෙමි.[4] **18** යෙරුසල-
මේ සහ යූදාහි නගරවල වැසියන්ටද
එහි රජවරුන්ටද අධිපතීන්ටද එයින්
බොන්න දුන්නෙමි. එබැවින් වැඩි කල්
නොගොස් ඒ නගර සියල්ල පාළු-
වට යන්නේය. එහි වැසියන් අද්ද-
කින විපත දැක සියලුදෙනා පුදුමයට
පත් වන්නෝය.[5] ඔවුහු සියල්ලන්-
ගේ නින්දාවට ලක් වනු ඇත. ජනයා
ඔවුන්ට ශාප කරනු ඇත.[6] **19** මම
ඊජිප්තුවේ රජු වන පාරාවෝටද ඔහු-
ගේ සේවකයන්ටද අධිපතීන්ටද සෙ-
නඟටද එයින් බොන්න දුන්නෙමි.[7]
**20** ඔවුන් අතරේ ජීවත් වූ වෙනත්
ජාතීන්ටද ඌෂ් දේශයේ රජවරුන්-
ටද[8] පිලිස්තිවරුන්ගේ දේශයේ සිටින
සියලු රජවරුන්ටද[9] අෂ්දොද්හි ඉතුරු
වී සිටින සෙනඟගේ රජුටද[10] අෂ්කෙ-
ලොන්,[11] ගාසා[12] සහ එක්‍රොන්හි[13] රජ-
වරුන්ටද **21** ඒදොම්,[14] මෝවබ්[15]
සහ අම්මොන්වරුන්ටද[16] **22** තීර්හි
රජවරුන්ටද[17] සීදොන්හි රජවරුන්-
ටද[18] මුහුදෙන් එතෙර දූපත්වල
සිටින රජවරුන්ටද **23** දෙදාන්,[19]
තේමා[20] සහ බූෂ්හි වැසියන්ටද කම්-
මුල් දෙපස පිහිටි කෙස් කපා ඇති
සියල්ලන්ටද[21] **24** අරාබිවරුන්ගේ
රජවරුන්ටද[22] පාළුකරයේ වෙ-
සෙන විවිධ ජාතීන්ගේ රජවරුන්ටද
**25** සිම්රීහි රජවරුන්ටද ඒලාම්හි
රජවරුන්ටද[1] මේදියවරුන්ගේ රජව-
රුන්ටද[2] **26** දුර හා ළඟ සිටින උතු-
රේ රජවරුන් සියලුදෙනාටද එයින්
බොන්න දුන්නෙමි. පොළොවේ අනි-
කුත් රාජ්‍යයන්හි වැසියන්ටද එයින්
බොන්න දුන්නෙමි. එයින් අවසානය-
ටම බොන්නේ ෂේෂක්හි* රජුය.[3]
**27** “ඔබ ඔවුන්ට මෙසේ කියන්න.
‘ස්වර්ගයේ සේනාවල අධිපතිද ඊශ්‍රා-
යෙල්හි දෙවිද වන යෙහෝවා මෙසේ
පවසන්නේය. “මත් වන තුරුම එයින්
පානය කර වමනය කරන්න.[4] මා ඔබ
අතරට එවන කඩුව නිසා නැවත කිසි-
දාක නැඟිටීමට නොහැකි වන ලෙස
ඔබ වැටෙනු ඇත.”’[5] **28** ඔබේ
අතේ තිබෙන කුසලානය ගෙන එයින්
බොන්න ඔවුන් අකමැති වුණොත්
ඔබ ඔවුන්ට මෙසේ කියන්න. ‘ස්වර්ග-
යේ සේනාවල අධිපති වන යෙහෝවා
දෙවි මෙසේ කියන්නේය. “ඔබට අනි-
වාර්යයෙන්ම මෙයින් බීමට සිදු වනු
ඇත.[6] **29** මන්ද මා විපත්ති පැමි-
ණවීමට පටන්ගන්නේ මාගේ නාමය
දරන නුවරෙන්ය.[7] එසේනම් කිසි ලෙ-
සකින් හෝ මාගේ දඬුවමෙන් ගැලවී-
මට පුළුවන් කියා ඔබ සිතන්නහුද?”’[8]
“ස්වර්ගයේ සේනාවල අධිපති වන
යෙහෝවා දෙවි තවදුරටත් මෙසේ
පවසන්නේය. ‘පොළොවේ සියලු
වැසියන්ට පහර දෙන පිණිස මම කඩු-
වක් ගෙන්වාගන්නෙමි. එබැවින් කිසි-
සේත් ඔබට මාගේ දඬුවමින් බේරීමට
නොහැකි වන්නේය.’
**30** “ඔබ මේ සියල්ල ඔවුන්ට
ප්‍රකාශ කරන්න. ‘යෙහෝවා දෙවි
උස් ස්ථානයක සිට සිංහයෙකු මෙන්
ගර්ජනා කරන්නේය.[9] ඔහුගේ ශුද්ධ
වාසස්ථානයේ සිට ඔහු හඬ නඟන්-
නේය.[10] ඔහු පොළොවේ තිබෙන ඔහු-
ගේ වාසස්ථානයට විරුද්ධව ගර්ජනා

**25 පරි.**
**1** ගීතා 137:8; යෙරෙ 50:29; යෙරෙ 51:6; යෙරෙ 51:24; එළි 18:6
**2** යෝබ් 21:20; ගීතා 75:8; යෙසා 51:17; යෙරෙ 25:26; එළි 14:10; එළි 16:19
**3** යෙරෙ 51:7; විලා 4:21; එස 23:34; නාහු 3:11
**4** යෙරෙ 1:10; යෙරෙ 27:3; යෙරෙ 51:7
**5** 2රාජා 22:19; යෙරෙ 24:9
**6** එස්රා 9:7; යෙරෙ 44:22
**7** යෙරෙ 46:2; එස 29:2; එස 32:31
**8** යෝබ් 1:1
**9** යෙසා 14:31; යෙරෙ 47:1; එස 25:15; ආමො 1:8; ශෙප 2:5; සෙක 9:6
**10** යෙසා 20:1
**11** යෙරෙ 47:5; ශෙප 2:4
**12** යොෂු 13:3
**13** සෙක 9:5
**14** යෙසා 34:5; යෙරෙ 49:17; එස 35:15
**15** යෙරෙ 48:1; එස 25:8
**16** යෙරෙ 49:1; එස 25:2; ආමො 1:13
**17** යෙසා 23:15; එස 28:2
**18** යෙරෙ 27:3; යෙරෙ 47:4; එස 32:30
**19** යෙසා 21:13; යෙරෙ 49:8; එස 25:13
**20** යෙසා 21:14
**21** යෙරෙ 9:26; යෙරෙ 49:32
**22** 2ලේක 9:14; යෙරෙ 49:31

**2 තීරුව**
**1** යෙරෙ 49:34; එස 32:24
**2** යෙරෙ 51:11
**3** යෙරෙ 51:41
**4** යෙසා 63:6; විලා 4:21; හබ 2:16
**5** එස 21:4
**6** ගීතා 75:8

**7** 1රාජා 9:7; යෙරෙ 7:14; දානි 9:18; 1පේතෘ 4:17; **8** හිතෝ 11:31; යෙරෙ 49:12; ඔබ 16; **9** යෙසා 42:13; යෝවෙ 3:16; ආමො 1:2; **10** ගීතා 11:4; ගීතා 132:14.

යෙරෙ **25:26*** මෙය යොමු දක්වන්නේ බැබිලෝ-නියට විය හැක.

කරන්නේය. මිදිපල මඩින මිනිසුන්
ප්‍රීති ඝෝෂා නඟන්නාක් මෙන් ඔහුද
පොළොවේ සියලු වැසියන්ට විරුද්ධව
සටන් කර ජය ඝෝෂා නඟනු ඇත.’[1]
**31** “‘පොළොවේ ඇත කෙළ-
වර දක්වා මහා ඝෝෂාවක් පැතිරී
යනු ඇත. යෙහෝවා දෙවි වන
මට ජාතීන්ට විරුද්ධව චෝදනා-
වක් තිබේ.[2] මම සියලු මනුෂ්‍යයන්ව
නඩු විභාගයකට කැඳවන්නෙමි.[3] දුෂ්-
ටයන්ව කඩුවෙන් විනාශ වී යෑමට
නියම කරන්නෙමි’[4] කියා යෙහෝවා
දෙවි පවසන්නේය.
**32** “ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ පවසන්නේය. ‘ජාතියක් පාසා
ජාතියක් පිටට විපත්ති පැමිණෙනු
ඇත.[5] පොළොවේ ඇත කෙළවරේ
සිට චණ්ඩ මාරුතයක් හමා ඒමට
සලස්වනු ඇත.[6] **33** ඒ දවසේදී යෙ-
හෝවා දෙවි වන මාගේ අතින්
මරණයට පත් වන අය පොළොවේ
එක් කෙළවරක සිට අනික් කෙළවර
දක්වා වැටී සිටිනු ඇත.[7] කිසිවෙක්
ඔවුන් ගැන වැලපෙන්නේවත් ඔවුන්-
ගේ මළ කඳන් එකතු කරන්නේවත්
ඒවා තැන්පත් කරන්නේවත් නැත.[8]
ඔවුහු පොළොව මතුපිටම කුණු වී
පොහොර වී යන්නෝය.’[9]
**34** “සෙනඟට මඟ පෙන්වන එඬේ-
රුනි, හඬා වැලපෙන්න.[10] රැළේ ප්‍රධා-
නියෙනි,[11] අළු මත පෙරළෙන්න.[12]
මන්ද ඔබව සීසීකඩ විසුරුවාහැරී-
මටත් ඔබව මරා දැමීමටත් කාලය
පැමිණ තිබේ.[13] වටිනා බඳුනක් වැටී
විනාශ වී යන්නාක් මෙන් ඔබගේ
විනාශයත් සිදු වන්නේය.[14] **35** සෙ-
නඟට මඟ පෙන්වන එඬේරුන්ට
පලා යෑමට තැනක්වත් රැළේ ප්‍රධා-
නීන්ට ගැලවීමට මඟක්වත් නැත.[15]
**36** එඬේරුන්ගේ වැලපීමටත් රැළේ
ප්‍රධානීන්ගේ මොරගැසීමටත් ඇහුම්-
කන් දෙන්න. මන්ද යෙහෝවා දෙවි
ඔවුන්ගේ තණබිම් සියල්ල විනාශ
කළේය. **37** යෙහෝවා දෙවි ඔවුන්
සමඟ උදහස් වූ නිසා ඔවුන් සාමකා-

**25 පරි.**
**1** යෙසා 16:9 යෙරෙ 48:33
**2** යෙසා 34:8 හොෂෙ 4:1 හොෂෙ 12:2 මීකා 6:2
**3** එස 18:30 එස 20:35 යෝවෙ 3:2
**4** හිතෝ 2:22 යෙසා 66:16 ආමො 9:10
**5** යෙසා 34:2 යෙරෙ 25:17
**6** යෙසා 30:30 යෙසා 66:15 යෙරෙ 23:19 යෙරෙ 30:23 ශෙප 3:8
**7** යෙසා 34:3 යෙසා 66:16 යෙරෙ 12:12
**8** ගීතා 79:3 යෙසා 14:19
**9** ගීතා 83:10 යෙසා 5:25 යෙරෙ 8:2 යෙරෙ 9:22
**10** යෙරෙ 4:8
**11** එස 34:17
**12** යෙරෙ 6:26
**13** යෙසා 33:1
**14** යෙරෙ 22:28
**15** යෙරෙ 32:4 යෙරෙ 52:8 ආමො 2:14

**2 තීරුව**
**1** යෙසා 27:10
**2** හොෂෙ 5:14
**3** යෙරෙ 25:12

**26 පරි.**
**4** 2රාජා 23:34 2ලේක 36:4 යෙරෙ 1:3 යෙරෙ 25:1 යෙරෙ 35:1 යෙරෙ 36:1
**5** යෙරෙ 19:14 යොහ 18:20 ක්‍රියා 5:20
**6** යෙසා 58:1 යෙරෙ 1:7
**7** ද්වි 4:2 ක්‍රියා 20:27 එළි 22:19
**8** යෙසා 1:16 යෙසා 55:7 යෙරෙ 36:3 එස 18:27
**9** 1රාජා 21:29 යෙරෙ 18:8
**10** යෙරෙ 44:10
**11** ලෙවී 26:14 ද්වි 28:15
**12** 2රාජා 17:13 යෙරෙ 7:13 යෙරෙ 11:7 යෙරෙ 25:3

මීව වාසය කළ ස්ථාන දැන් පාළු-
වට ගොස් ඇත.[1] **38** රෞද්‍ර, කේශර
සිංහයෙකු මෙන් දෙවි තම වාසස්-
ථානයෙන් නික්ම එන්නේය.[2] කඩු
පහර නිසාත් ඔහුගේ මහත් උදහස
නිසාත් ඔවුන්ගේ දේශය සම්පූර්ණ-
යෙන්ම විනාශ වී යන්නේය.”[3]

**26** යොෂියාගේ පුත්‍රයා වූ යූදාහි
රජු වන යෙහෝයාකිම්ගේ
පාලන සමයේ මුල් කාලයේදී[4] යෙ-
හෝවා දෙවිගෙන් පණිවිඩයක්
ලැබිණ. **2** “යෙහෝවා දෙවිගෙන්
ලැබුණු ඒ පණිවිඩය මෙයයි. ‘ඔබ
දැන් යෙහෝවා දෙවිගේ ගෘහයේ මළු-
වට යන්න.[5] නමස්කාර කිරීම සඳහා
යෙහෝවා දෙවි වන මාගේ ගෘහ-
යට පැමිණෙන යූදාහි සියලු නගරවල
වැසියන්ට මම ඔබට පැවසීමට අණ
කරන සියලු දේ පවසන්න.[6] එයින්
එක වචනයක්වත් අඩු නොකරන්න.[7]
**3** සමහරවිට ඔවුන් ඊට සවන් දී
ඔවුන්ගේ වැරදි මාර්ගවලින් ඉවත්
වීමට ඉඩ තිබේ.[8] ඔවුන් එසේ කළොත්
ඔවුන්ගේ වැරදිවලට දඬුවමක් ලෙස
ඔවුන් පිටට විපත්ති ගෙන ඒමට මා
ගත් තීරණය මම වෙනස් කරමි.[9]
**4** ඔබ ඔවුන්ට මෙසේ කියන්න. “යෙ-
හෝවා දෙවි මෙසේ පවසන්නේය. ‘ඔබ
මට සවන් දී මා ඔබට දුන්[10] නීති-
යට අනුව ජීවත් නොවන්නේ නම්[11]
**5** මා හිමිදිරි උදෑසන සිට නොන-
වත්වා ඔබ වෙතට එවූ මාගේ සේ-
වකයන් වන අනාගතවක්තෘවරුන්ට
ඔබ ඇහුම්කන් නොදෙන්නේ නම්[12]
**6** ෂීලෝ නගරයට සිදු වූ දේ මම
මේ ගෘහයටත් සිදු වීමට සලස්වන්-
නෙමි.[13] මේ නගරය පොළොවේ සියලු
ජාතීන්ගේ ශාපයට ලක් වීමට ඉඩ-
හරින්නෙමි.’”’”[14]
**7** යෙහෝවා දෙවිගේ ගෘහයේ සිට
යෙරෙමියා ප්‍රකාශ කළ මේ සෑම දෙ-
යක්ම පූජකයෝද අනාගතවක්තෘව-
රුද සෙනඟද අසාගෙන සිටියෝය.[15]

**13** ගීතා 78:60; යෙරෙ 7:12; **14** යෙරෙ 24:9; **15** යෙරෙ 26:2.

8 යෙහෝවා දෙවි සෙනඟට පවසන්න
කියා අණ කළ සියල්ල යෙරෙමියා
දැන්වූ පසු පූජකයෝද අනාගතවක්-
තෘවරුද සෙනඟද ඔහුව අල්ලාගෙන
ඔහුට මෙසේ කීවෝය. "ඔබට අනි-
වාර්යයෙන්ම මැරුම් කන්න සිදු වෙ-
නවා.[1] 9 'ෂීලෝ නගරයට සිදු වූ
දේම මේ ගෘහයටත් සිදු වන්නේය.[2]
මේ නගරය කිසි වැසියෙකුට වාසය
කිරීමට නොහැකි වන ලෙස විනාශ
වී පාළුවට යන්නේය' කියා ඔබ
යෙහෝවා දෙවිගේ නාමයෙන් අනා-
වැකි පැවසුවේ ඇයි?" එවිට මුළු සෙ-
නඟ යෙහෝවා දෙවිගේ ගෘහයේ සිටි
යෙරෙමියාව වට කරගත්තෝය.

10 මේ දේ ගැන අසන්න ලැබුණු
යූදාහි අධිපතීහු රජමාලිගාවේ සිට
යෙහෝවා දෙවිගේ ගෘහයට පැමිණි-
යෝය.[3] ඔවුහු පැමිණ යෙහෝවා දෙ-
විගේ ගෘහයේ අලුත් දොරටුව අසල
හිඳගත්තෝය.[4] 11 එවිට පූජකයෝ
සහ අනාගතවක්තෘවරු එහි සිටි අධි-
පතීන් සහ සෙනඟ අමතමින් මෙසේ
පැවසුවෝය. "මේ මිනිසා මේ නගරය
ගැන පැවසූ අනාවැකි ඔබ සියලුදෙ-
නාම අසාගෙන සිටියා නොවේද?[5] ඔහු
පැවසූ ඒ දේවල් නිසා ඔහුට මරණ
දණ්ඩනය හිමි විය යුතුයි."[6]

12 එවිට යෙරෙමියා එතැන සිටි
සියලු අධිපතීන්ටත් සෙනඟටත්
මෙසේ පැවසුවේය. "මේ ගෘහය ගැනත්
මේ නගරය ගැනත් මා ඔබට පැවසූ
අනාවැකි සියල්ල ප්‍රකාශ කරන්න
කියා මාව එව්වේ යෙහෝවා දෙවියි.[7]
13 ඒ නිසා දැන්වත් ඔබේ දෙවි වන
යෙහෝවාගේ හඬට කීකරු වී ඔබේ
ගතිපැවතුම් හා හැසිරීම් රටාව වෙනස්
කරගන්න.[8] ඔබ එසේ කළොත් ඔබට
විරුද්ධව විපත්ති ගෙන ඒමට යෙ-
හෝවා දෙවි ගත් තීරණය ඔහු වෙනස්
කරයි.[9] 14 දැන් මම සිටින්නේ ඔබේ
භාරයෙයි.[10] ඒ නිසා ඔබට හොඳයි
කියා සිතෙන ඕනෑම දෙයක් මට
කරන්න.[11] 15 නමුත් ඔබ මේ දේත්
මතක තියාගන්න. ඔබ මාව මරා දැමු-
වොත් අහිංසකයෙකුගේ ලේ වැගිර-
වීම ගැන ඔබටත් මේ නගරයටත් එහි
වැසියන්ටත් වග කියන්න සිදු වෙයි.[1]
මන්ද ඔබට මේ සියල්ල පවසන්න
කියා මාව එව්වේ යෙහෝවා දෙවියි."[2]

16 එවිට අධිපතියෝද[3] සෙනඟද
පූජකයන්ට හා අනාගතවක්තෘ-
වරුන්ට මෙසේ පැවසුවෝය. "මේ
මිනිසා මරණ දණ්ඩනය ලබන්න
තරම් වරදක් කර නැහැ.[4] මන්ද මොහු
අපට කතා කළේ අපේ දෙවි වන යෙ-
හෝවාගේ නාමයෙනුයි."[5]

17 ඉන්පසු දේශයේ සිටි වැඩිම-
හල්ලන්ගෙන් කිහිපදෙනෙක් ඉදිරියට
ඇවිත් රැස්ව සිටි සෙනඟට මෙසේ
කීවෝය.[6] 18 "යූදාහි රජු වූ හෙස-
කියා පාලනය කළ කාලයේදී[7] මොර-
ෂෙත් නගරයේ විසූ[8] මීකා[9] පැමිණ
යූදාහි සෙනඟට මෙවැනි අනාවැකි-
යක් පැවසුවා. 'ස්වර්ගයේ සේනාවල
අධිපති වන යෙහෝවා දෙවි මෙසේ
පවසන්නේය. "කෙතක් හාන්නාක්
මෙන් සියොන් නාස්ති කරනු ලබන්-
නේය.[10] යෙරුසලම නටබුන් ගොඩක්
බවට පත් වන්නේය.[11] දේවමාලිගාව
පිහිටා තිබෙන කන්ද පාළු කැලෑවක්
බවට පත් වන්නේය."'[12] 19 නමුත්
ඒ කාලයේ සිටි යූදාහි රජු වූ හෙ-
සකියාවත් යූදාහි වැසියන්වත් මීකා
පැවසූ ඒ දේවල් නිසා ඔහුව මරා දැමු-
වාද? නැහැ. ඒ වෙනුවට හෙසකියා
රජ යෙහෝවා දෙවිට ගරුබිය පෙන්ව-
මින් දේශයට කරුණාව පෙන්වන්න
කියා යෙහෝවා දෙවිට කන්නලව්
කළා නේද?[13] ඒ නිසා ඔවුන් පිටට
විපත්ති ගෙන ඒමට යෙහෝවා දෙවි
ගත් තීරණය ඔහු වෙනස් කළා.[14]
නමුත් අපි දැන් සූදානම් වෙන්නේ අප
පිටටම මහත් විපතක් පමුණුවාගන්-
නයි.[15]

20 "එමෙන්ම කිර්යත්-යෙයාරීම්හි
විසූ[16] ෂෙමායාගේ පුත්‍රයා වූ ඌරියාහ්
නම් මනුෂ්‍යයාත් යෙහෝවා දෙවිගේ
නාමයෙන් අනාවැකි පැවසූ කෙනෙක්.
යෙරෙමියා මේ නගරයටත් මේ දේ-
ශයටත් විරුද්ධව පැවසූ අනාවැකිම
ඔහුත් පැවසුවා. 21 ඔහු පැවසූ අනා-

**26 පරි.**
1 ගීතා 37:32
ආමෝ 5:10
2 ගීතා 78:60
3 යෙරෙ 38:4
4 2රාජා 15:35
2ලේක 27:3
යෙරෙ 36:10
5 යෙරෙ 26:2
යෙරෙ 38:4
6 යෙරෙ 18:20
මතෙ 26:66
7 යෙරෙ 1:17
8 යෙරෙ 7:3
යෙරෙ 35:15
9 ගීතා 103:10
යෙරෙ 18:8
යෙරෙ 36:3
එස 18:32
යෝනා 3:9
10 යොෂු 9:25
යෙරෙ 38:5
11 2සාමු 15:26

**2 තීරුව**
1 ගණන් 35:33
ද්වි 19:10
හිතෝ 6:17
2 යෙරෙ 1:17
යෙරෙ 26:2
3 යෙරෙ 36:19
4 හිතෝ 16:7
යෙරෙ 38:9
5 යාකො 5:10
6 ක්‍රියා 5:34
7 2ලේක 29:1
8 මීකා 1:14
9 මීකා 1:1
10 ගීතා 79:1
11 යෙරෙ 9:11
12 මීකා 3:12
13 2ලේක 32:26
14 නික් 32:14
2සාමු 24:16
15 ගණන් 35:33
ක්‍රියා 5:39
16 යොෂු 15:60
යොෂු 18:14
1සාමු 7:2

වැකි ආරංචි වූ යෙහෝයාකිම් රජත්[1]
ඔහුගේ බලවත් සෙන්පතීනුත් අධිපතී-
නුත් ඔහුව මරන්න සෙව්වා.[2] තමාව
මරන්න සොයන බව දැනගත් උරි-
යාහ් භය වී[3] ඉක්මනින්ම ඊජිප්තුවට
පලා ගියා. **22** නමුත් යෙහෝයාකිම්
රජ, අක්බෝර්ගේ පුත්‍රයා වූ එල්-
නාතාන්ව[4] හා තවත් මිනිසුන් කිහි-
පදෙනෙකුව ඊජිප්තුවට යවා ඔහුව
අල්ලාගෙන එන්න කියා අණ කළා.
**23** ඔවුන් ඊජිප්තුවේ සිටි උරියාහ්ව
අල්ලාගෙන යෙහෝයාකිම් රජු වෙතට
රැගෙන ආවායින් පසු රජ උරියාහ්ට
කඩුවෙන් ඇන ඔහුව මරා,[5] ඔහුගේ
මළ කඳ සාමාන්‍ය ජනයාව තැන්පත්
කළ ස්ථානයට වීසි කර දැමුවා."
**24** මේ අවස්ථාවේදී යෙරෙමියාව
මරණයට පත් කිරීමට තැත් කළ සෙ-
නඟගෙන් ඔහුට ගැලවීමට ලැබුණේ[6]
ෂාපාන්ගේ පුත්‍රයා වූ[7] අහිකාම්[8] ඔහුට
ආරක්ෂාව ලබා දුන් නිසාය.

**27** යොෂියාගේ[9] පුත්‍රයා වූ යූදාහි
රජු වන යෙහෝයාකිම්* රජ-
කම් කිරීමට පටන්ගත් කාලයේදී යෙ-
රෙමියාට යෙහෝවා දෙවිගෙන් මෙම
පණිවිඩය ලැබිණ. **2** "යෙහෝවා
දෙවි මට මෙසේ පැවසුවේය. 'ඔබ
වියගස් කිහිපයක්ද ඊට අවශ්‍ය පටිද
සාදාගෙන[10] ඒවා ඔබේ ගෙල මත
තබාගන්න.[11] **3** ඔබ ඒවා යූදාහි රජු
වන ශෙදකියා හමු වීම සඳහා යෙරූ-
සලමට පැමිණෙන පණිවිඩකරුවන්
අතේ ඒදොම්හි රජු වෙතටත්[12] මෝ-
වබ්හි රජු වෙතටත්[13] අම්මොන්ව-
රුන්ගේ රජු වෙතටත්[14] තීර්හි රජු
වෙතටත්[15] සීදොන්හි රජු වෙතටත්[16]
යවන්න. **4** ඔවුන්ගේ ස්වාමිවරුන්ට
මේ දේ පවසන්න කියාත් ඔබ එම
පණිවිඩකරුවන්ට කියන්න.
"'"ස්වර්ගයේ සේනාවල අධිපතිද
ඊශ්‍රායෙල්හි දෙවිද වන යෙහෝවා[17]
මෙසේ පවසන්නේය. **5** 'මාගේ අති-

යෙරෙ **27:1*** සිරියානු, අරාබි අනුවාද සහ හෙබ්‍රෙව් පිටපත් තුනකට අනුව, "ශෙදකියා" ලෙසද දැක්විය හැක.

**26 පරි.**
**1** 2රාජා 23:34
2ලේක 36:5
**2** 2ලේක 16:10
**3** 1රාජා 19:3
හිතෝ 29:25
මතෙ 10:28
**4** 2රාජා 22:12
යෙරෙ 36:12
**5** යෙරෙ 2:30
මතෙ 23:31
1තෙස 2:15
**6** 1රාජා 18:4
ක්‍රියා 23:10
**7** 2රාජා 22:10
**8** 2රාජා 22:12
2ලේක 34:20
යෙරෙ 39:14
යෙරෙ 40:5

**27 පරි.**
**9** 2රාජා 23:24
**10** යෙරෙ 28:10
**11** එස 4:1
එස 24:3
**12** එස 25:12
ආමෝ 1:9
ඔබ 1
**13** 2රාජා 3:4
යෙරෙ 48:1
එස 25:8
ආමෝ 2:1
**14** යෙරෙ 25:21
යෙරෙ 49:1
එස 25:2
ආමෝ 1:13
**15** යෙසා 23:1
යෙරෙ 47:4
එස 26:3
ආමෝ 1:10
සෙක 9:3
**16** යෙසා 23:4
යෙරෙ 25:22
එස 28:21
යෝවෙ 3:4
**17** නික් 5:1
යෙරෙ 10:10

**2 තීරුව**
**1** උත් 1:2
ගීතා 136:12
යෙරෙ 32:17
**2** ගීතා 102:25
ගීතා 115:15
ගීතා 146:6
යෙසා 44:24
යෙසා 45:12
යෙරෙ 51:19
**3** උත් 1:26
උත් 2:7
යෙසා 42:5
ක්‍රියා 17:26
**4** උත් 1:24
**5** උත් 1:29
ගීතා 115:16
දානි 4:17
**6** යෙරෙ 25:9
යෙරෙ 43:10
එස 29:18
**7** යෙරෙ 28:14
දානි 2:37

මහත් බලයෙන්[1] මේ පොළොවත්[2]
මෙහි ජීවත් වන මනුෂ්‍යයන්වත්[3]
මෙහි සැරිසරන සතුන්වත්[4] මම සැදූ-
වෙමි. ඒ නිසා මට සුදුසුයි කියා
සිතෙන කෙනෙකුට මේ දේවල් භාර
දීමට මට අයිතියක් තිබේ.[5] **6** මම
මේ සියලු දේශයන් මාගේ සේවක-
යාද[6] බැබිලෝනියේ රජුද වන
නෙබුකද්නෙෂර්ට* භාර දෙන්නෙමි.[7]
වනසතුන්ව පවා ඔහුගේ ප්‍රයෝජ-
නය සඳහා දෙන්නෙමි.[8] **7** ඔහුගේ
ජාතිය* සඳහා නියම කළ කාලය අව-
සන් වන තුරු[9] සියලු ජාතීහු ඔහුටත්
ඔහුගේ පුත්‍රයාටත් ඔහුගේ මුනුපුරා-
ටත් සේවය කරනු ඇත.[10] ඉන්පසු
බොහෝ ජාතීහු හා බලවත් රජවරු
බැබිලෝනිය යටත් කර දාසකමට
ගනු ලබන්නෝය.'[11]
**8** "'"යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ පවසන්නේය. 'යම් ජාති-
යක් හෝ යම් රාජ්‍යයක් බැබිලෝ-
නියේ රජු වන නෙබුකද්නෙෂර්ට
සේවය නොකරන්නේ නම් හෝ ඔහු-
ගේ වියගහට යටත් නොවන්නේ
නම් හෝ මම බැබිලෝනියේ රජු
ලවා ඔවුන්ව සම්පූර්ණයෙන්ම විනාශ
කර දමන්නෙමි.[12] කඩුවෙන්ද[13] සාග-
තයෙන්ද[14] වසංගතවලින්ද[15] ඔවුන්ට
දඬුවම් කරන්නෙමි.'
**9** "'"'"බැබිලෝනියේ රජුට සේවය
කිරීමට ඔබට සිදු වෙන්නේ නැහැ"[16]
කියා පවසන ඔබේ අනාගතවක්-
තෘවරුන්ට,[17] ජේන කියන්නන්ට,
සිහින දකින්නන්ට,[18] මන්තර ගුරු-
කම් කරන්නන්ට[19] හා කට්ටඩියන්ට
ඇහුම්කන් නොදෙන්න. **10** මන්ද

**8** ගීතා 50:10; යෙරෙ 28:14; දානි 2:38; **9** ගීතා 137:8; යෙරෙ 25:12; යෙරෙ 50:14; යෙරෙ 50:27; දානි 5:26; **10** 2ලේක 36:20; යෙරෙ 25:11; **11** යෙරෙ 25:14; යෙරෙ 51:11; **12** යෙරෙ 24:10; **13** 2රාජා 25:7; යෙරෙ 21:9; යෙරෙ 42:16; එස 26:8; **14** 2රාජා 25:3; විලා 4:9; **15** යෙරෙ 32:24; **16** යෙරෙ 28:2; යෙරෙ 28:11; **17** ද්වි 18:20; යෙසා 8:19; **18** යෙරෙ 29:8; **19** යෙසා 47:12.

යෙරෙ **27:6*** යෙරෙ 27:6-29:3 දක්වා සඳහන් වන්නේ, "නෙබුකද්නෙෂර්" ලෙසය. නමුත් යෙරෙ 21:2හි සහ එම පොතේ අනිකුත් තැන්වල, "නෙබුකද්රෙෂර්" ලෙස සඳහන් වේ. **7*** මූ.අ., "දේශය."

ඔවුන් පවසන්නේ බොරු අනාවැකිය.
ඔබ ඔවුන්ට ඇහුම්කන් දුන්නොත් ඔබ
දැන් සිටින දේශයෙන් ඉවත්ව ඈත
එපිට පිහිටි දේශයකට යැමට ඔබට
සිදු වනු ඇත. මම ඔබව සීසීකඩ විසු-
රුවාහරින්නෙමි. එහිදී ඔබ විනාශ වී
යනු ඇත.[1]

**11** “‘“‘නමුත් යම් ජාතියක් බැබි-
ලෝනියේ රජුගේ වියගහට යටත් වී
ඔහුට සේවය කළොත් මම ඒ ජාතියට
ඔවුන්ගේම දේශයේ ජීවත් වීමට ඉඩ-
හරින්නෙමි. ඔවුහු වගා කටයුතු කර-
මින් දිගටම එහි වාසය කරනු ඇත’[2]
කියා යෙහෝවා දෙවි පවසන්නේය.”’”

**12** මම යූදාහි රජු වන ශෙදකියා-
ටත්[3] මෙසේ පැවසුවෙමි.[4] “ඔබ බැබි-
ලෝනියේ රජුගේ වියගහට යටත් වී
ඔහුටත් ඔහුගේ සෙනඟටත් සේවය
කරන්න. ඔබ එසේ කළොත් ඔබේ ජීවි-
තය රැකෙනු ඇත.[5] **13** බැබිලෝනි-
යේ රජුට සේවය නොකරන ඕනෑම
ජාතියකට කඩුවෙන්ද[6] සාගතයෙන්ද[7]
වසංගතවලින්ද[8] පහර කෑමට සිදු
වන බව යෙහෝවා දෙවි පැවසුවේය.
එබැවින් ඔබ පිටටත් ඔබේ සෙනඟ
පිටටත් එවැනි විපතක් පමුණුවාගන්-
නේ ඇයි? **14** ‘බැබිලෝනියේ රජුට
සේවය කරන්න ඔබට සිදු වෙන්නේ
නැහැ’[9] කියා පවසන අනාගතවක්තෘ-
වරුන්ට ඇහුම්කන් නොදෙන්න. මන්ද
ඔවුන් ඔබට කියන්නේ බොරු අනාවැ-
කිය.[10]

**15** “යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. ‘අනාවැකි කීමට මම
ඔවුන්ව පත් නොකළෙමි. මාගේ
නාමයෙන් ඔවුන් පවසන්නේ බොරු
අනාවැකිය. ඔබ ඒවාට ඇහුම්කන්
දුන්නොත් මම ඔබව සීසීකඩ විසු-
රුවාහරින්නෙමි.[11] ඔබටත් බොරු
අනාවැකි කියන අනාගතවක්තෘව-
රුන්ටත්[12] අනිවාර්යයෙන්ම මැරුම්
කෑමට සිදු වනු ඇත.’ ”[13]

**16** පූජකයන්ටත් සෙනඟටත් මම
මෙසේ කීවෙමි. “යෙහෝවා දෙවි
මෙසේ පැවසුවේය. ‘“යෙහෝවා දෙ-
විගේ ගෘහයට අයිති භාණ්ඩ ළඟ-
දීම බැබිලෝනියේ සිට ගෙනෙනවා”[1]
කියා අනාවැකි පවසන අනාගතවක්-
තෘවරුන්ට ඇහුම්කන් නොදෙන්න.
මන්ද ඔවුන් පවසන්නේ බොරුය.[2]
**17** ඔවුන්ට ඇහුම්කන් නොදී බැබි-
ලෝනියේ රජුට සේවය කරන්න.
එසේ කළොත් ඔබේ ජීවිත රැකෙනු
ඇත.[3] මේ නගරය විනාශ වී පාළු-
වට යැමට ඔබ ඉඩ දෙන්නේ ඇයි?[4]
**18** ඔවුන් යෙහෝවා දෙවිගේ වදන්
පවසන සැබෑ අනාගතවක්තෘවරුන්
නම් යෙහෝවා දෙවිගේ ගෘහයේත්
යූදාහි රජුගේ මාලිගාවේත් යෙරුසල-
මේත් මේ වන විට ඉතුරුව තිබෙන
භාණ්ඩ බැබිලෝනියට ගෙන යැමට
ඉඩ නොදෙන ලෙස ස්වර්ගයේ සේ-
නාවල අධිපති වන යෙහෝවා දෙ-
විට කන්නලව් කරන්න කියා ඔවුන්ට
කියන්න.’[5]

**19** “මන්ද ස්වර්ගයේ සේනාවල
අධිපති වන යෙහෝවා දෙවි ඒ භාණ්-
ඩවලට සිදු වීමට යන දේ ගැන
පවසා ඇත. ඒවා නම්, දේවමාලිගා-
වේ කුළුනු,[6] වතුර රැස් කර තිබෙන
විශාල භාජනය,[7] කරත්ත[8] හා මේ
නගරයේ ඉතුරුව තිබෙන අනිකුත්
භාණ්ඩ[9] යනාදියය. **20** බැබිලෝනි-
යේ රජු වන නෙබුකද්නෙෂර්, යෙ-
හෝයාකිම්ගේ පුත්‍රයා වූද යූදාහි රජු
වූද යෙකොනියාව යූදාහි සහ යෙ-
රුසලමේ සිටි වංශවත් අය සමඟ[10]
බැබිලෝනියට ගෙන ගිය අවස්ථා-
වේදී ඒවා රැගෙන ගියේ නැත.[11]
**21** යෙහෝවා දෙවිගේ ගෘහයේත් යූදා
සහ යෙරුසලමේ රජුගේ මාලිගා-
වේත් ඉතුරුව තිබෙන ඒ භාණ්ඩ
සම්බන්ධයෙන් ස්වර්ගයේ සේනාවල
අධිපතිද ඊශ්‍රායෙල්හි දෙවිද වන යෙ-
හෝවා මෙසේ පැවසුවේය.[12] **22** ‘ඒ
සියලු භාණ්ඩ නිසැකවම බැබිලෝනි-
යට ගෙන යනු ලබන්නේය.[13] මා ඒවා
ගැන සොයා බලන දවස පැමිණෙන
තුරුම ඒවා එහිම තිබෙනු ඇත.[14]
ඉන්පසු මම ඒවා නැවත මේ ස්ථාන-

**27 පරි.**
**1** යෙරෙ 28:16
**2** යෙරෙ 38:2; යෙරෙ 40:9; යෙරෙ 42:10
**3** 2රාජා 24:17; 1ලේක 3:15; 2ලේක 36:10; යෙරෙ 37:1
**4** 2ලේක 36:12
**5** හිතෝ 1:33; යෙරෙ 38:20
**6** ද්වි 28:63; එස 18:31; එස 33:11
**7** ද්වි 28:53; එස 14:21
**8** ද්වි 28:61; යෙරෙ 38:2
**9** යෙරෙ 37:19
**10** යෙරෙ 14:14; යෙරෙ 23:21; යෙරෙ 28:15; යෙරෙ 29:8; එස 13:6
**11** ද්වි 28:64
**12** 1රාජා 22:23; යෙරෙ 20:6; යෙරෙ 29:21; එස 13:3
**13** ලෙවී 26:38; ද්වි 30:18

**2 තීරුව**
**1** 2රාජා 24:13; 2ලේක 36:7; යෙරෙ 28:3; දානි 1:2
**2** යෙරෙ 14:13
**3** යෙරෙ 27:11
**4** ලෙවී 26:33; යෙරෙ 38:17; යෙරෙ 38:23
**5** 1රාජා 18:24; යෙරෙ 7:16
**6** 1රාජා 7:15; 2රාජා 25:17; 2ලේක 4:12; යෙරෙ 52:21
**7** 1රාජා 7:23; 2රාජා 25:13
**8** 1රාජා 7:27; 2රාජා 25:16; 2ලේක 4:14; යෙරෙ 52:17
**9** 2රාජා 25:14; 2ලේක 36:18
**10** 2රාජා 24:14; යෙරෙ 24:1; යෙරෙ 29:1; දානි 1:3
**11** 2රාජා 24:15; 2ලේක 36:10; යෙරෙ 22:28
**12** 2ලේක 36:10
**13** 2රාජා 25:13; 2ලේක 36:18; යෙරෙ 52:18; දානි 5:3

14 2ලේක 36:21; එස්රා 1:7; යෙරෙ 29:10.

යට ගෙනෙන්නෙමි.[1] මේ දේවල් පව-
සන මා යෙහෝවා දෙවිය.’ ”

**28** එම අවුරුද්දේ එනම්, යූදාහි
රජු වන ශෙදකියාගේ පාලන
සමයේ මුල් කාලය[2] වන ඔහුගේ
හතරවන අවුරුද්දේ පස්වන මාස-
යේදී අස්සූර්ගේ පුත්‍රයා වූද ගිබියොන්
නගරයේ විසූ අනාගතවක්තෘවරයෙක්
වූද[3] හනනියා,[4] යෙහෝවා දෙවි-
ගේ ගෘහයේ සිටි පූජකයන්ද සෙ-
නඟද ඉදිරියේ යෙරෙමියාට මෙසේ
කීවේය. **2** “ස්වර්ගයේ සේනාවල
අධිපතිද ඊශ්‍රායෙල්හි දෙවිද වන යෙ-
හෝවා මෙසේ පැවසුවේය. ‘බැබිලෝ-
නියේ රජු ඔබ මත තැබූ වියගහ මම
කඩා දමන්නෙමි.[5] **3** බැබිලෝනියේ
රජු වන නෙබුකද්නෙෂර්, යෙහෝවා
දෙවි වන මාගේ ගෘහයෙන් බැබි-
ලෝනියට ගෙන ගිය භාණ්ඩ සියල්ල
මම තව අවුරුදු දෙකකින් මේ ස්ථා-
නයටම නැවත ගෙනෙන්නෙමි.’ ”[6]
**4** “යෙහෝවා දෙවි තවදුරටත් මෙසේ
පැවසුවේය. ‘යෙහෝයාකිම්ගේ පුත්‍රයා
වූ[7] යූදාහි රජු වූ යෙකොනියාවද[8] යූදා
දේශයේ සිට බැබිලෝනියට ගෙන ගිය
සියලුදෙනාවද[9] මම මේ ස්ථානයට
නැවත ගෙනෙන්නෙමි. මන්ද බැබි-
ලෝනියේ රජු සෙනඟ පිට තැබූ විය-
ගහ මම කඩා දමන්නෙමි.’ ”[10]

**5** එවිට අනාගතවක්තෘ යෙරෙ-
මියා, යෙහෝවා දෙවිගේ ගෘහයේ සිටි
පූජකයන් හා සෙනඟ ඉදිරියේ අනා-
ගතවක්තෘ හනනියාට කතා කර[11]
**6** මෙසේ කීවේය. “එසේම වේවා!*[12]
යෙහෝවා දෙවි ඒ දේ එලෙසම
ඉටු කරනු ලැබේවා! යෙහෝවා දෙ-
විගේ ගෘහයේ භාණ්ඩත් බැබිලෝනි-
යට ගෙන ගිය අයවත් මේ ස්ථානයට
නැවත ගෙන එනු ලැබේවා![13] එසේ
කර, ඔබ ප්‍රකාශ කළ අනාවැකිය යෙ-
හෝවා දෙවි ඉටු කරාවා! **7** නමුත්
ඔබටත් මුළු සෙනඟටත් මම පවසන
මේ දේට සවන් දෙන්න.[14] **8** අපේ
කාලයට කලින් සිටි එනම්, අතීතයේ
විසූ අනාගතවක්තෘවරුන්[1] බොහෝ
දේශයන්වල හා බලවත් රාජ්‍යයන්වල
සිදු වීමට නියමිත යුද්ධ ගැනත් ඒවා
පිටට පැමිණීමට නියමිත විපත්ති
හා වසංගත ගැනත් අනාවැකි ප්‍රකාශ
කළා.[2] **9** යම් අනාගතවක්තෘවර-
යෙකු සාමය ගැන අනාවැකි ප්‍රකාශ
කළත්[3] ඔහු යෙහෝවා දෙවිගේ සැබෑ
අනාගතවක්තෘවරයෙකු බව සියල්-
ලන්ට ඔප්පු වන්නේ ඔහු කී දේ ඉටු වූ
විටයි.”[4]

**10** එවිට අනාගතවක්තෘ හන-
නියා, යෙරෙමියාගේ ගෙල මත
තිබූ වියගහ ගෙන එය කඩා දැමු-
වේය.[5] **11** ඉන්පසු ඔහු[6] සෙනඟ ඉදි-
රියේ මෙසේ කීවේය. “යෙහෝවා දෙවි
මෙසේ පැවසුවේය.[7] ‘බැබිලෝනියේ
රජු වන නෙබුකද්නෙෂර් සියලු ජාතීන්
පිට තැබූ වියගහ මම තව අවු-
රුදු දෙකකින් මෙලෙස කඩා දමන්-
නෙමි.’ ”[8] එය අසා අනාගතවක්තෘ
යෙරෙමියා එතැනින් පිටත්ව ගියේය.[9]

**12** අනාගතවක්තෘ හනනියා, යෙ-
රෙමියාගේ ගෙල මත තිබූ වියගහ
කඩා දැමූ පසු යෙහෝවා දෙවිගෙන්
යෙරෙමියාට මෙම පණිවිඩය ලැබු-
ණේය.[10] **13** “ඔබ ගොස් හනනියාට
මෙසේ කියන්න. ‘යෙහෝවා දෙවි පව-
සන්නේ මෙයයි. “ලීවලින් සෑදූ විය-
ගහ[11] ඔබ කඩා දැමුවෙහිය. නමුත් ඒ
වෙනුවට යකඩින් සෑදූ වියගහක් දැරී-
මට සිදු වනු ඇත.”[12] **14** මන්ද ස්වර්-
ගයේ සේනාවල අධිපතිද ඊශ්‍රායෙල්හි
දෙවිද වන යෙහෝවා තවදුරටත්
මෙසේ පවසන්නේය. “බැබිලෝනියේ
රජු වන නෙබුකද්නෙෂර්ට සේවය
කරන පිණිස මම මේ සියලු ජාතීන්-
ගේ ගෙල මත යකඩින් තැනූ වියග-
හක් තබන්නෙමි.[13] අනිවාර්යයෙන්ම
ඔහුට සේවය කිරීමට ඔවුන්ට සිදු වනු
ඇත.[14] වනසතුන්ව පවා මම ඔහුට
භාර දෙන්නෙමි.” ’ ”[15]

**15** අනාගතවක්තෘ යෙරෙමියා,
හනනියාට මෙසේද පැවසුවේය.[16]
“හනනියා, මා කියන දේට සවන්
දෙන්න. ඔබ පවසන අනාවැකි

**27 පරි.**

**1** ද්වි 30:3
එස්රා 5:14
එස්රා 7:19

**28 පරි.**

**2** 2රාජා 24:17
2ලේක 36:10
**3** යොෂු 11:19
2සාමු 21:2
**4** යෙරෙ 28:11
**5** යෙරෙ 27:8
මීකා 3:11
**6** 2රාජා 24:13
යෙරෙ 27:16
දානි 1:2
**7** 2රාජා 23:36
2රාජා 24:6
**8** 2රාජා 24:8
2රාජා 25:27
එස්ත 2:6
යෙරෙ 22:24
යෙරෙ 37:1
**9** 2රාජා 24:14
යෙරෙ 24:1
**10** යෙරෙ 30:8
**11** යෙරෙ 7:2
යෙරෙ 19:14
යෙරෙ 26:2
**12** 1රාජා 1:36
ගීතා 41:13
යෙරෙ 11:5
2කොරි 1:20
**13** යෙරෙ 28:3
**14** 1රාජා 22:28

**2 තීරුව**

**1** ද්වි 4:26
ද්වි 28:15
**2** 1රාජා 22:8
යෝනා 3:6
**3** යෙරෙ 6:14
යෙරෙ 14:13
එස 13:10
**4** ද්වි 18:22
**5** ගීතා 10:13
යෙරෙ 27:2
**6** යෙරෙ 28:1
**7** 1රාජා 13:18
2ලේක 18:10
යෙරෙ 23:17
යෙරෙ 29:9
**8** යෙරෙ 28:4
**9** හිතෝ 14:7
හිතෝ 26:4
**10** යෙරෙ 29:30
**11** යෙරෙ 27:2
යෙරෙ 28:10
**12** ද්වි 28:48
**13** ද්වි 28:49
**14** ද්වි 28:48
යෙරෙ 5:19
යෙරෙ 27:7
**15** යෙරෙ 27:6
දානි 2:38
**16** යෙරෙ 28:1

යෙරෙ **28:6*** හෙබ්‍රෙව් භාෂාවට අනුව, ආමෙන්.

යෙහෝවා දෙවිගෙන් ලැබුණු ඒවා නොවෙයි. ඔබේ බොරු අනාවැකි විශ්වාස කිරීමට ඔබ මේ සෙනඟව පොලඹවා තිබෙනවා.[1] **16** එබැවින් යෙහෝවා දෙවි ඔබට මෙසේ පවසනවා. 'මම ඔබව පොළෝතලයෙන් තුරන් කර දමන්නෙමි. යෙහෝවා දෙවි වන මට විරුද්ධව ඔබ කැරලිගැසූ නිසා[2] මේ අවුරුද්ද තුළදීම ඔබ මිය යනු ඇත.' "[3]

**17** එම අවුරුද්දේ හත්වන මාසයේදී අනාගතවක්තෘ හනනියා මිය ගියේය.[4]

**29** අනාගතවක්තෘ යෙරෙමියා යෙරුසලමේ සිට බැබිලෝනියට ලිපියක් යැව්වේය. නෙබුකද්නෙෂර් රජු යෙරුසලමේ සිට බැබිලෝනියට ගෙන ගිය[5] සෙනඟවත් ඔවුන් අතරේ ඉතුරුව සිටි වැඩිමහල්ලන්වත් පූජකයන්වත් අනාගතවක්තෘවරුන්වත් අමතමින් ඔහු එම ලිපිය යැවීය. **2** ඔහු එම ලිපිය යවන විට යෙකොනියා රජුවද[6] මව් බිසවද[7] ඔහුගේ නිලධාරීන්වද යූදාහි හා යෙරුසලමේ අධිපතීන්වද[8] කැටයම්කරුවන්ව සහ පවුරු ඉදි කරන්නන්වද[9] යෙරුසලමෙන් ගෙන ගොස් තිබිණ. **3** යෙරෙමියා එම ලිපිය යැව්වේ ෂාපාන්ගේ පුත්‍රයා[10] වන එලාසා සහ හිල්කියාගේ පුත්‍රයා වන ගෙමරියා මාර්ගයෙනි. ඒ කාලයේදී යූදාහි රජුව සිටි ශෙදකියා[11] විසින් ඔවුන් දෙදෙනාව බැබිලෝනියේ රජු වන නෙබුකද්නෙෂර් වෙතට යවන ලදි. ඒ අවස්ථාවේදී ඔවුහු එම ලිපියද රැගෙන ගියෝය. එහි සඳහන් වූයේ මෙයයි.

**4** "තම සෙනඟව යෙරුසලමේ සිට බැබිලෝනියට පිටමං කළ[12] ස්වර්ගයේ සේනාවල අධිපතිද ඊශ්‍රායෙල්හි දෙවිද වන යෙහෝවා මෙසේ පැවසුවේය. **5** 'ජනයෙනි, ඔබ දැන් ජීවත් වන දේශයෙහි ගෙවල් ගොඩනඟා ඒවාහි පදිංචි වන්න. දේශයෙහි වගා කටයුතු කර, එයින් ලැබෙන පලදාව භුක්ති විඳින්න.[13] **6** විවාහ වී දරුදැරියන් බිහි කරන්න.[14] ඔවුන් උස් මහත් වූ විට ඔවුන්වද විවාහ කර දෙන්න. එවිට ඔවුන්ටත් දරුවෝ බිහි වනු ඇත. ඔබේ ජාතිය ගණනින් අඩු නොවන පිණිස එසේ කරන්න. **7** එමෙන්ම යෙහෝවා දෙවි වන මා ඔබව වහල්භාවයට යැවූ නගරය තුළ සාමය රැකෙන අයුරින් ජීවත් වන්න. ඒ නගරය වෙනුවෙන් යාච්ඤා කරන්න. මන්ද එහි සාමකාමී වාතාවරණයක් පැවතුණොත් ඔබටත් සමාදානයෙන් ජීවත් වීමට හැකි වනු ඇත.'[1] **8** ස්වර්ගයේ සේනාවල අධිපතිද ඊශ්‍රායෙල්හි දෙවිද වන යෙහෝවා තවදුරටත් මෙසේ පැවසුවේය. 'ඔබ අතරේ සිටින අනාගතවක්තෘවරුන්ට හා ශාස්ත්‍ර කියන්නන්ට ඔබව මුළා කිරීමට ඉඩ නොදෙන්න.[2] ඔවුන්ගේ සිහින ගැන ඔවුන් පවසන විට ඊට සවන් නොදෙන්න.[3] **9** මන්ද අනාවැකි පැවසීමට මම ඔවුන්ව පත් නොකළෙමි.[4] ඔවුන් මාගේ නාමයෙන් ඔබට කියන්නේ බොරු අනාවැකිය. මේ දේවල් ඔබට පවසන මා යෙහෝවා දෙවිය.' "

**10** "යෙහෝවා දෙවි මෙසේද පැවසුවේය. 'බැබිලෝනියේ ජීවත් වීමට නියම කර ඇති අවුරුදු හැත්තෑව සම්පූර්ණ වූ විට මම ඔබව සිහි කරන්නෙමි.[5] ඔබේ මව්බිමට ඔබව නැවත රැගෙන එන බවට මා දුන් පොරොන්දුව එදාට ඉෂ්ට කරන්නෙමි.'[6]

**11** "යෙහෝවා දෙවි මෙසේද පැවසුවේය. 'මාගේ අරමුණ[7] වන්නේ ඔබ පිටට විපත්ති ගෙන ඒම නොවේ.[8] නමුත් සාමයෙන් පිරුණු ප්‍රීතිමත් ජීවිතයක් ගැන බලාපොරොත්තුවක් ඔබට ලබා දීමය.[9] **12** ඒ කාලයේදී ඔබ මා වෙතට හැරී මට හඬගසනු ඇත. මට කන්නලව් කරනු ඇත. එවිට මම ඔබට සවන් දෙන්නෙමි.'[10]

**13** " 'ඔබ මුළු හදවතින්ම මා වෙතට හැරී මාගේ මඟ පෙන්වීම් පතන නිසා[11] මට නමස්කාර කිරීමට ඔබට හැකි වනු ඇත.[12] **14** මමද ඔබ

**28 පරි.**
1 ද්වි 13:1; යෙරෙ 14:14; යෙරෙ 23:21; යෙරෙ 27:15; යෙරෙ 29:31; එස 13:3; සෙක 13:3; ලූක් 6:26
2 ද්වි 13:5; යෙරෙ 29:32
3 ද්වි 18:20; 1සාමු 2:34
4 2රාජා 7:17

**29 පරි.**
5 2රාජා 24:15; යෙරෙ 24:1
6 2රාජා 24:8; 2ලේක 36:9; යෙරෙ 22:24; යෙරෙ 27:20; යෙරෙ 28:4
7 2රාජා 24:12; යෙරෙ 22:26
8 2රාජා 24:14
9 2රාජා 24:16
10 2රාජා 22:8; යෙරෙ 26:24; යෙරෙ 39:14; එස 8:11
11 2රාජා 24:18; 2ලේක 36:11
12 ද්වි 28:41; යෙරෙ 24:5
13 යෙරෙ 29:28
14 උත් 1:28; උත් 9:7

**2 තීරුව**
1 එස්රා 6:10; එස්රා 7:23; 1තිමෝ 2:2
2 යෙරෙ 14:14; යෙරෙ 23:21; යෙරෙ 27:14; එෆී 5:6
3 ද්වි 13:3
4 යෙරෙ 23:21; යෙරෙ 28:15
5 2ලේක 36:21; එස්රා 1:1; යෙරෙ 27:22; දානි 9:2; සෙක 1:12; සෙක 7:5
6 ද්වි 30:3; එස්රා 2:1; යෙරෙ 24:6
7 යෝබ් 23:13; ගීතා 33:11; ගීතා 40:5
8 ශෙප 3:15
9 යෙරෙ 31:17
10 ගීතා 10:17; යෙසා 30:19; දානි 9:3; යොහ 9:31

11 ද්වි 4:29; ද්වි 30:2; 1රාජා 8:48; යෙරෙ 24:7; 12 ලෙවී 26:40; 1රාජා 8:47; මතෙ 7:7.

කරන නමස්කාරය පිළිගන්නෙමි’[1]
කියා යෙහෝවා දෙවි පැවසුවේය.
‘වහල්භාවයේ සිටින ඔබ සියලුදෙ-
නාවම මම එකට එකතු කරගන්-
නෙමි. මම ඔබව විසුරුවාහැරිය සියලු
ජාතීන් අතරින්ද සියලු දේශවලින්ද
ඔබව එකතු කරගන්නෙමි.[2] ඔබ
වහල්භාවයට යැමට පෙර ජීවත් වූ
දේශයටම මම නැවත ඔබව රැගෙන
එන්නෙමි’[3] කියා යෙහෝවා දෙවි තව-
දුරටත් පැවසුවේය.

**15** “නමුත්, ‘බැබිලෝනියේදීත් අපි
වෙනුවෙන් අනාවැකි කීමට යෙ-
හෝවා දෙවි අනාගතවක්තෘවරුන්ව
පත් කළා’ කියා ඔබ පැවසුවහුය.

**16** “දාවිත්ගේ සිංහාසනයේ හිඳින
රජුටත්[4] ඔබ සමඟ වහල්භාවයට
නොගොස් මේ නගරයේ ජීවත් වන
ඔබේම සහෝදරයන්ටත්[5] යෙහෝවා
දෙවි පවසන මේ දේ සැලකිල්ලට
ගන්න. **17** ‘ස්වර්ගයේ සේනාවල
අධිපති වන යෙහෝවා දෙවි මෙසේ
පවසන්නේය. “මම ඔවුන්ට කඩු-
වෙන්ද[6] සාගතයෙන්ද[7] වසංගතව-
ලින්ද[8] පහර දෙන්නෙමි. මම ඔවුන්ව
කෑමට ගත නොහැකි තරමටම නරක්
වූ අත්තික්කා ගෙඩි මෙන් වීමට
සලස්වන්නෙමි.”’[9]

**18** “‘මම ඔවුන්ව ලුහුබැඳ ගොස්,
කඩුවෙන්ද සාගතයෙන්ද වසංගතව-
ලින්ද පහර දෙන්නෙමි. ඔවුන්ට සිදු
වන විපත දැක පොළොවේ සියලු
රාජ්‍යයන් බියෙන් වෙවුලනු ඇත.[10]
මම ඔවුන්ව විසුරුවාහරින සියලු
ජාතීන් අතරේ ඔවුහු නින්දාවටත්
සමච්චලයටත් ලක් වන්නෝය. ඒ
ජාතීහු ඔවුන්ට ශාප කරනු ඇත.
ඔවුන් අද්දකින විපත දැක පුදුමයට
පත් වනු ඇත.[11] **19** ඔවුන්ට එවැනි
විපත්තිවලට මුහුණ දීමට සිදු වන්නේ
මා හිමිදිරි උදැසන සිට නොනවත්වා
ඔවුන් වෙතට එවූ මාගේ සේවකයන්
වන අනාගතවක්තෘවරුන්ට ඔවුන්
සවන් නොදුන් නිසාය’[12] කියා යෙ-
හෝවා දෙවි පවසන්නේය.

“යෙහෝවා දෙවි මෙසේද පවසන්-
නේය. ‘ඔබත් මට ඇහුම්කන් දුන්නේ
නැත.’[1]

**20** “දෙවි විසින් යෙරුසලමේ සිට
බැබිලෝනියට පිටමං කළ ජන-
යෙනි,[2] යෙහෝවා දෙවිගේ වදන්ව-
ලට ඇහුම්කන් දෙන්න.[3] **21** ඔහුගේ
නාමයෙන් ඔබට බොරු අනාවැකි
පවසන අය ගැන[4] එනම්, කොලායා-
ගේ පුත්‍රයා වන ආහබ් ගැනත් මයසේ-
යාගේ පුත්‍රයා වන ශෙදකියා ගැනත්
ස්වර්ගයේ සේනාවල අධිපතිද ඊශ්‍රා-
යෙල්හි දෙවිද වන යෙහෝවා පව-
සන මේ දේට සවන් දෙන්න. ‘මම
ඔවුන් දෙදෙනාව බැබිලෝනියේ රජු
වන නෙබුකද්රෙෂර්ගේ අතට භාර
දෙන්නෙමි. ඔබේ ඇස් පනාපිටම ඔහු
ඔවුන් දෙදෙනාට පහර දී මරා දමනු
ඇත.[5] **22** බැබිලෝනියේ වහලුන්
ලෙස සිටින යූදා සෙනඟ යමෙ-
කුට ශාප කරන විට ඔවුන් දෙදෙ-
නාට සිදු වූ විපත මතක් කරමින්
මෙසේ පවසනු ඇත. “බැබිලෝනියේ
රජ, ශෙදකියා හා ආහබ්ව ගින්නෙන්
පුළුස්සා දැමුවේය.[6] ඔවුන් දෙදෙනාට
අත් වූ විපත යෙහෝවා දෙවි ඔබ
පිටටත් ගෙනේවා!”[7] **23** ඔවුන්ට
එවැනි විපත්තියකට මුහුණ දීමට සිදු
වන්නේ ඊශ්‍රායෙල් දේශයේදී ඔවුන්
පිළිකුල්සහගත ක්‍රියාවල නියැලුණු
නිසාය.[8] ඔවුහු තම අසල්වාසීන්ගේ
භාර්යාවන් සමඟ අනාචාරයේ යෙ-
දෙන්නෝය.[9] මා නොදුන් පණිවිඩ
ඔවුහු මාගේ නාමයෙන් දිගින් දිගටම
සෙනඟට පවසන්නෝය.[10]

“‘ඔවුන් කරන සෑම දෙයක්ම මම
හොඳින් දනිමි. ඒ දේවලට මම සාක්-
ෂිකරුවෙක් වෙමි.[11] මෙසේ පවසන මා
යෙහෝවා දෙවිය.’”

**24** “නෙහෙලාම්හි ෂෙමායාට[12] ඔබ
මෙය දන්වන්න. **25** ‘ස්වර්ගයේ
සේනාවල අධිපතිද ඊශ්‍රායෙල්හි දෙවිද
වන යෙහෝවා මෙසේ පවසන්නේය.
“ඔබ ඔබේ නමින් යෙරුසලමේ සිටින
මයසේයාගේ පුත්‍රයා වන පූජක ශෙප-
නියාටත්[13] සෙසු පූජකයන්ටත් සියලු

**29 පරි.**

**1** ද්වි 4:7
යෙසා 55:6
**2** ද්වි 30:4
යෙසා 49:25
යෙරෙ 23:3
යෙරෙ 30:3
එස 39:28
යෝවෙ 3:1
**3** ගීතා 126:1
හොෂෙ 6:11
ආමො 9:14
ශෙප 3:20
**4** යෙරෙ 22:2
යෙරෙ 28:1
**5** 2රාජා 24:14
**6** ලෙවී 26:33
යෙරෙ 24:10
**7** ද්වි 28:53
යෙරෙ 15:2
**8** ද්වි 28:61
යෙරෙ 34:17
**9** යෙරෙ 24:2
යෙරෙ 24:8
**10** ලෙවී 26:33
ද්වි 28:25
2ලේක 29:8
යෙරෙ 15:4
යෙරෙ 24:10
යෙරෙ 34:17
**11** ද්වි 29:24
1රාජා 9:8
2ලේක 7:21
ගීතා 44:11
යෙරෙ 24:9
යෙරෙ 25:9
විලා 2:15
**12** යෙරෙ 7:13
යෙරෙ 25:4
යෙරෙ 32:33

---

**2 තීරුව**

**1** යෙරෙ 6:19
යෙරෙ 26:5
ක්‍රියා 28:27
**2** යෙරෙ 24:5
මීකා 4:10
**3** 2රාජා 24:14
**4** යෙරෙ 14:14
යෙරෙ 29:8
විලා 2:14
2පේත‍්‍ර 2:1
**5** යෙරෙ 52:27
**6** දානි 3:6
**7** ද්වි 29:20
යෙසා 65:15
**8** යෙරෙ 23:14
**9** යෙරෙ 7:9
හොෂෙ 4:2
**10** යෙරෙ 27:15
**11** හිතෝ 5:21
යෙරෙ 16:17
යෙරෙ 23:24
මලා 3:5
හෙබ්‍රෙ 4:13
**12** යෙරෙ 29:31
**13** 2රාජා 25:18
යෙරෙ 21:1
යෙරෙ 29:29
යෙරෙ 37:3
යෙරෙ 52:24

සෙනඟටත් ලිපි යවමින්[1] මෙසේ
දන්වා ඇත. **26** ‘යෙහෝවා දෙවි,
පූජක යෙහෝයාදා වෙනුවට ඔබව
යෙහෝවා දෙවිගේ ගෘහයේ ප්‍රධාන
පූජකයා ලෙස කටයුතු කිරීමටත්[2]
අනාවැකි පවසන ඕනෑම උන්මත්ත-
කයෙකුව[3] දඬුකඳේ* ගැසීමට[4] අයි-
තිය ඇති තැනැත්තා ලෙසත් පත්
කළේය. **27** එසේනම් සෙනඟ ඉදිරි-
යේ අනාවැකි ප්‍රකාශ කරන[5] අනා-
තොත්හි වැසියෙකු වූ යෙරෙමියාට[6]
ඔබ කිසි තරවටුවක් නොදී සිටින්නේ
ඇයි? **28** ඔහු බැබිලෝනියේ සිටින
අපට මේ වගේ දෙයක් ලියා එව්වේ ඒ
නිසාය. “ඔබට තව බොහෝ කාලයක්
වහල්භාවයේ සිටීමට සිදු වනු ඇත.
ඒ නිසා ගෙවල් ගොඩනඟා ඒවායේ
පදිංචි වන්න. දේශයෙහි වගා කට-
යුතු කරමින් එහි අස්වැන්න භුක්ති
විඳින්න.” ’ ” ’ ”[7]

**29** ෂෙමායා එවූ ලිපිය පූජක ශෙ-
පනියා[8] අනාගතවක්තෘ යෙරෙමියාට
ඇසෙන්න කියෙව්වේය.

**30** ඉන්පසු යෙහෝවා දෙවි යෙරෙ-
මියාට මෙසේ පැවසුවේය. **31** “බැබි-
ලෝනියේ සිටින සියලුදෙනාට[9]
ලිපියක් මාර්ගයෙන් මෙසේ දන්-
වන්න. ‘නෙහෙලාම්හි ෂෙමායා සම්-
බන්ධයෙන් යෙහෝවා දෙවි මෙසේ
පවසන්නේය. “අනාවැකි පැවසීමට
මම ෂෙමායාව පත් නොකළත් ඔහු
ඔබට අනාවැකි පැවසුවේය. එමෙන්ම
ඔහු පවසන බොරු අනාවැකි විශ්වාස
කිරීමට ඔහු ඔබව පෙලඹුවේය.[10] ඒ
හේතුව නිසා **32** නෙහෙලාම්හි ෂෙ-
මායාටත්[11] ඔහුගෙන් පැවතෙන සිය-
ලුදෙනාටත්[12] මම දඬුවම් කරන්නෙමි.
මෙසේ පවසන මා යෙහෝවා දෙවිය.

“ ‘ “ඔහුගෙන් පැවතෙන කිසිවෙකුට
මේ සෙනඟ අතරේ ජීවත් වීමට අවස්-
ථාවක් නොලැබෙන්නේය.[13] මාගේ
සෙනඟ වෙනුවෙන් මා කරන යහ-
පත් දේවලින් කිසිම දෙයක් ඔහුට
දකින්න නොලැබෙන්නේය.[1] මන්ද
ඔහු කැරලිගසමින් යෙහෝවා දෙවි
වන මට විරුද්ධව කතා කළේය.[2]
මේ දේවල් පවසන්නේ යෙහෝවා දෙවි
වන මමය.” ’ ”

**30** යෙහෝවා දෙවිගෙන් යෙරෙ-
මියාට ලැබුණු පණිවිඩය මෙ-
යයි. **2** “ඊශ්‍රායෙල්හි දෙවි වන
යෙහෝවා මෙසේ පවසන්නේය. ‘මා
ඔබට පවසන සෑම දෙයක්ම ලිය-
විල්ලක සටහන් කරගන්න.[3] **3** යෙ-
හෝවා දෙවි වන මම මෙසේ පවසමි.
“වහලුන්ව සිටින මාගේ සෙනඟ වන
ඊශ්‍රායෙල්වරුන්ව සහ යූදා වැසියන්ව
මා බේරාගන්නා කාලය ඉදිරියේදී
පැමිණෙනු ඇත.”[4] යෙහෝවා දෙවි
වන මම තවදුරටත් මෙසේ පවසමි.
“මම ඔවුන්ගේ මුතුන්මිත්තන්ට දුන්
දේශයට ඔවුන්ව නැවත රැගෙන එන්-
නෙමි. ඔවුහු එම දේශය නැවත අයිති
කරගන්නෝය.” ’ ”[5]

**4** යෙහෝවා දෙවි ඊශ්‍රායෙල්ව-
රුන්ට සහ යූදා වැසියන්ට පණිවිඩයක්
දුන්නේය. **5** යෙහෝවා දෙවි ඔවුන්ට
මෙසේ පැවසුවේය. “භයෙන් කෑගසන
හඬක් ඇසිණ. භීතිය හාත්පස පැතිර
තිබේ.[6] සාමයේ ඡායාවක්වත් නැත.
**6** සෙනඟෙනි, ඔබ අතරේ සිටින පුරු-
ෂයන්, දරුවන් ප්‍රසූත කරනවාද?
ඔවුන් සිටින ආකාරය දෙස බලන්න.
ප්‍රසව වේදනා විඳින ස්ත්‍රියක මෙන්
ඔවුහුද අත් දෙක තුනටියේ තබාගෙන
වේදනාවෙන් සිටිති.[7] ඔවුන්ගේ මුහුණු
හොඳටම සුදුමැලි වී තිබේ.[8] **7** මේ
දවස ඉතා භයානක දවසකි![9] අතීත-
යේ කිසිම දිනක් මීට සමාන කළ
නොහැක.[10] මෙය යාකොබ්ට විපත්ති-
වලට මුහුණ දීමට සිදු වන දවසකි.[11]
නමුත් මේ සියල්ලෙන් ඔහුට ගැලවීම
ලැබෙන්නේය.”

**8** ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. “ඒ දවසේදී ඔවුන්ගේ ගෙල මත
තිබෙන පීඩාකාරී වියගහ මම බිඳ
දමන්නෙමි. එහි බැමි කඩා වීසි කර

---

යෙරෙ **29:26*** මුල් භාෂාවේ මෙහි වචන දෙකක් සඳහන් වේ. එක් වචනයක් පාදවලට දමන දඬුකඳටත් අනික් වචනය අත් සහ ගෙලට දමන දඬුකඳටත් යොමු දැක්වූවා විය හැක.

**29 පරි.**

**1** 1රාජා 21:8
2ලේක 32:17
නෙහෙ 6:5
**2** ගණන් 3:32
ගණන් 4:16
යෙරෙ 20:1
**3** 2රාජා 9:11
හොෂෙ 9:7
**4** 2ලේක 16:10
යෙරෙ 20:2
ක්‍රියා 16:24
**5** 1සාමු 10:6
1සාමු 19:20
යෙරෙ 43:2
**6** යෙරෙ 1:1
**7** යෙරෙ 29:5
**8** 2රාජා 25:18
යෙරෙ 21:1
යෙරෙ 52:24
**9** 2රාජා 24:14
යෙරෙ 29:20
**10** යෙරෙ 14:14
යෙරෙ 23:21
යෙරෙ 28:15
එස 13:8
2පේතෘ 2:1
**11** යෙරෙ 29:24
**12** නික් 20:5
නික් 34:7
යෙරෙ 20:6
**13** 1සාමු 2:30

**2 තීරුව**

**1** හිතෝ 12:19
**2** යෙරෙ 28:16

**30 පරි.**

**3** යෙරෙ 36:2
යෙරෙ 51:60
දානි 7:1
හබ 2:2
රෝම 15:4
**4** ද්වි 30:3
ගීතා 53:6
යෙරෙ 27:22
යෙරෙ 29:14
එස 39:25
යෝවෙ 3:1
ආමො 9:14
**5** යොෂු 14:1
එස්රා 2:1
යෙරෙ 16:15
යෙරෙ 32:44
එස 20:42
**6** යෙරෙ 6:23
**7** යෙසා 13:8
යෙරෙ 4:31
යෙරෙ 6:24
මීකා 4:9
**8** යෙසා 29:22
**9** යෝවෙ 2:11
ආමො 5:18
ශෙප 1:14
**10** විලා 1:12
දානි 12:1
මතෙ 24:21
**11** හොෂෙ 12:2

දමන්නෙමි.[1] ඉන්පසු ඔවුන්ව දාසක-
මට ගෙන යෑමට කිසි විදේශිකයෙකුට
හැකි වන්නේ නැත. **9** ඔවුන්ගේ
දෙවි යෙහෝවා වන මට ඔවුහු නමස්-
කාර කරනු ඇත. ඔවුන්ගේ රජු ලෙස
මා පත් කරන[2] දාවිත්ට ඔවුහු නිසැක-
වම සේවය කරනු ඇත."[3]

**10** එහෙයින් යෙහෝවා දෙවි
මෙසේ පවසන්නේය. "මාගේ සේව-
කයා වන යාකොබ්, භය වෙන්න එපා.
ඊශ්‍රායෙල් සෙනඟෙනි, බියෙන් වෙවු-
ලන්න එපා.[4] මන්ද දුර ඈත දේශයක
සිටින ඔබව මම බේරාගන්නෙමි. වහ-
ලුන් ලෙස සේවය කරන දේශයෙන්
ඔබේ දරුවන්ව මම ගලවාගන්නෙමි.[5]
යාකොබ් නැවත හැරී ඇවිත් සතුරු
උවදුරුවලින් තොර නිදහස් ජීවිතයක්
ගත කරනු ඇත. කිසිවෙක් ඔහුව බිය-
ගන්වන්නේ නැත."[6]

**11** යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ පවසන්නේය. "ඔබව බේරාගැ-
නීමට මම නිතරම ඔබ සමඟ සිටිමි.[7]
මා ඔබව විසුරුවාහැරිය දේශවල
සිටින සියලු ජාතීන්ව මම සහමුලින්ම
විනාශ කර දමන්නෙමි.[8] මම ඔවුන්ට
එසේ කළත් ඔබට එසේ නොකරමි.[9]
නමුත් මම ඔබට දඬුවම් නොකර
සිටින්නේද නැත. සුදුසු ප්‍රමාණයට
මම ඔබට අවශ්‍ය හික්මවීම දෙන්-
නෙමි."[10]

**12** යෙහෝවා දෙවි මෙසේද පව-
සන්නේය. "ගොඩ ඒමට නොහැකි
වන ලෙස ඔබ වැටී ඇත.[11] ඔබේ
තුවාලය සුව කිරීමට නොහැකි තරම්
බරපතළය.[12] **13** එය සුව කිරීමට
කිසිවෙක් ඉදිරිපත් වන්නේ නැත.[13]
ඔබව සුව කිරීමට කිසිම මඟක්
නැත.[14] **14** ඔබට බොහෝ සෙයින්
ආලය කළ අයම දැන් ඔබව අමතක
කර ඇත.[15] ඔවුන් තවදුරටත් සො-
යන්නේ ඔබව නොවේ. ඔබ බොහෝ
වැරදි කළහුය.[16] ගණන් කිරීමට නො-
හැකි තරම් පාප කළහුය.[17] සතුරෙකු
පහර දෙන්නාක් මෙන් මා ඔබට පහර
දුන්නෙත්[18] කෲර මිනිසෙකු දඬුවම්
කරන්නාක් මෙන් මා ඔබට දඬුවම්
කළෙත්[1] ඒ නිසාය. **15** ඔබේ වැටීම
ගැන ඔබ හඬා වැලපෙන්නේ ඇයි?[2]
ඔබට දැනෙන වේදනාව නැති කිරී-
මට කිසිවෙකුට නොහැක. මා මේ
දේවල් ඔබට කළේ ඔබ බොහෝ වැරදි
කළ නිසාය. ගණන් කිරීමට නොහැකි
තරම් පාප කළ නිසාය.[3] **16** නමුත්
ඔබව විනාශ කර දමන සියල්ලෝද
විනාශ වී යනු ඇත.[4] ඔබේ සතු-
රන් සියලුදෙනාවම වහලුන් ලෙස
ගෙන යනු ලැබේ.[5] ඔබෙන් කොල්ල
කන අයව වෙනත් අය විසින් කොල්ල
කනු ඇත. ඔබේ දේපළ පැහැරගන්නා
අයගේ වස්තු නැති වී යනු ඇත."[6]

**17** "පන්නා දැමූ තැනැත්තිය ලෙස
සියොන් දියණියව ඇගේ සතුරෝ
හඳුන්වති.[7] 'ඇය ගැන කිසිවෙක්
සැලකිල්ලක් දක්වන්නේ නැත'[8] කියා
ඔවුහු පවසන්නෝය. නමුත් මම
ඇයව සුව කරන්නෙමි. ඇගේ තුවාල
සනීප කරන්නෙමි"[9] කියා යෙහෝවා
දෙවි පවසන්නේය.

**18** යෙහෝවා දෙවි මෙසේද පව-
සන්නේය. "වහල්භාවයේ සිටින
යාකොබ්ගෙන් පැවතෙන්නන්ව මම
එකතු කරගන්නෙමි.[10] ඔවුන්ට මම
අනුකම්පාවෙන් සලකා ඔවුන්ගේ
වාසස්ථාන යළි පිහිටුවන්නෙමි.
කලින් පිහිටා තිබූ කන්ද මතම ඒ
නුවර නැවත ගොඩනඟනු ලැබේ.[11]
එහි බලකොටු, ඒවා තිබුණු ස්ථා-
නවලම නැවත ඉදි කරනු ලැබේ.[12]
**19** ප්‍රශංසා ගී ගයන හඬද ප්‍රීති-
යෙන් සිනාසෙන්නන්ගේ හඬද[13] එදෙ-
සින් ඇසෙනු ඇත. සෙනඟ ගණනින්
අඩු නොවී තව තවත් වර්ධනය වීමට
මම සලස්වන්නෙමි.[14] සුළු ජාතියක්
වීමට ඉඩ නොදී මම ඔවුන්ව මහත්
ජාතියක් බවට පත් කරන්නෙමි.[15]
**20** යාකොබ්ගේ පුත්‍රයන්ව කලින්
සිටි තත්වයටම ගෙනැවිත් ඔවුන්ව
ස්ථිර ලෙස පිහිටුවන්නෙමි.[16] නමුත්

**30 පරි.**
**1** යෙසා 9:4; යෙසා 10:27
**2** එස 37:24; ලූක් 1:69; ක්‍රියා 2:30; ක්‍රියා 13:23
**3** යෙසා 55:3; එස 34:23; හොෂෙ 3:5
**4** යෙසා 41:13; යෙසා 43:5; යෙසා 44:2
**5** යෙසා 49:25; යෙරෙ 3:18
**6** යෙරෙ 33:16; යෙරෙ 46:27; එස 34:25; හොෂෙ 2:18; මීකා 4:4
**7** යෙරෙ 46:27; එස 11:17
**8** යෙසා 47:11; යෙරෙ 50:29; යෙරෙ 51:24
**9** ලෙවී 26:44; නෙහෙ 9:31; ගීතා 78:38; විලා 3:22; එස 20:17; ආමො 9:8
**10** නික් 34:7; ගීතා 6:1; යෙරෙ 10:24; යෙරෙ 46:28
**11** 2ලේක 36:16; යෙසා 6:10; යෙරෙ 8:21
**12** යෙරෙ 15:18
**13** ගීතා 106:23
**14** යෙරෙ 8:22
**15** විලා 1:2; විලා 1:19
**16** ගීතා 90:8
**17** යෙරෙ 5:6
**18** විලා 2:5

**2 තීරුව**
**1** ද්වි 28:50
**2** යෙරෙ 15:18
**3** 2ලේක 36:14; නෙහෙ 9:26
**4** නික් 23:22; යෙසා 33:1; යෙසා 41:11; යෙරෙ 10:25; යෙරෙ 25:12; යෙරෙ 50:29
**5** යෙරෙ 51:56; මීකා 5:9
**6** සෙක 2:9
**7** ගීතා 44:13
**8** නෙහෙ 4:3; විලා 2:15
**9** ගීතා 102:13; ගීතා 103:3; යෙරෙ 33:6; හොෂෙ 6:1
**10** ගීතා 85:1; යෙරෙ 24:6; යෙරෙ 29:10
**11** මීකා 4:8

**12** ගීතා 48:3; **13** එස්රා 3:12; නෙහෙ 8:17; යෙසා 35:10; යෙසා 51:11; යෙරෙ 31:4; **14** ද්වි 30:5; යෙසා 27:6; යෙරෙ 33:22; සෙක 10:8; **15** යෙසා 60:22; මීකා 4:7; ශෙප 3:19; **16** ගීතා 102:28; යෙසා 1:26.

ඔවුන්ගේ සතුරන් සියලුදෙනාටම මම
දඬුවම් කරන්නෙමි.[1] **21** යාකොබ්-
ගෙන් පැවතෙන්නන් අතරින්ම කෙ-
නෙක් ඔහුගේ උත්තමයා වන්නේය.[2]
ඔහුගේ පාලකයා වන්නේද ඔහුගෙන්
පැවතෙන කෙනෙකි.[3] ඒ පාලකයාට
මා වෙතට පැමිණීමට මම අවසර
දෙමි. එවිට ඔහු මා ළඟට පැමිණෙනු
ඇත."[4]

"මා ළඟට පිවිසීමට තම ජීවිතය
පවා පරදුවට තබන මේ තැනැත්තා
කවුද"[5] කියා යෙහෝවා දෙවි අසන්-
නේය. **22** "මම ඔබේ දෙවි වන්-
නෙමි.[6] ඔබව මාගේ සෙනඟ ලෙස
පිළිගන්නෙමි."[7]

**23** යෙහෝවා දෙවිගේ උදහස
දරුණු සුළිසුළඟක් මෙන් හමා ඇවිත්[8]
දුෂ්ටයන්ව සුනුවිසුනු කර දමනු
ඇත.[9] **24** තමා අරමුණු කළ දේ
සම්පූර්ණයෙන්ම ඉටු වන තුරු[10] යෙ-
හෝවා දෙවිගේ ඇවෙන උදහස පහව
නොයයි. අවසාන කාලයේදී ඔබ එය
හොඳින් තේරුම්ගනු ඇත.[11]

# 31

යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. "ඒ කාලයේදී මම
ඊශ්‍රායෙල්හි සෑම පවුලකටම දෙවි
වන්නෙමි. ඔවුන්ව මාගේ සෙනඟ
ලෙස පිළිගන්නෙමි."[12]

**2** "කඩු පහරින් බේරුණු ඊශ්‍රායෙල්
සෙනඟ නිදහස් ජීවිතයක් ගත කිරීම
සඳහා[13] ගමන් කරන විට පාළුකරයේදී
ඔවුන්ට කරුණාව ලැබුණේය"[14] කියා
යෙහෝවා දෙවි පවසන්නේය. **3** දුර
ඈත සිට යෙහෝවා දෙවි මා වෙතට
පැමිණ මට මෙසේ කීවේය. "මට ඔබ
කෙරෙහි තිබෙන්නේ සදා නොමියන
ප්‍රේමයකි.[15] මා ඔබව මහත් ආදරය-
කින්* මා ළඟට ගත්තේ ඒ නිසයි.[16]
**4** ඊශ්‍රායෙල් දියණිය, ඔබේ දේශය මම
නැවත ගොඩනඟන්නෙමි.[17] එවිට ප්‍රීති
ඝෝෂා නඟන්නන් සමඟ ඔබත් රබන්
අතැතිව නටමින් ප්‍රීති වනු ඇත.[18]
**5** ඔබ නැවතත් සමාරියේ කඳුකර
ප්‍රදේශයේ මිදිවතු වවනු ඇත.[19] මිදි-

**30 පරි.**

1 යෙසා 49:26
යෙරෙ 50:18
2 උත් 49:10
3 යෙසා 9:6
4 ගණන් 16:5
ගීතා 110:1
දානි 7:13
මතෙ 3:17
හෙබ්‍රෙ 9:24
5 ද්වි 30:6
යෙරෙ 24:7
මාක් 12:30
රෝම 2:29
2තිමෝ 2:22
6 යෙරෙ 31:1
එස 36:28
හෙබ්‍රෙ 8:10
7 එස 11:20
හොෂෙ 2:23
එළි 21:3
8 හිතෝ 1:27
යෙරෙ 25:32
9 විනි 9:57
හිතෝ 16:4
10 යෝබ් 23:13
යෙසා 14:24
යෙරෙ 4:28
11 උත් 49:1
යෙරෙ 23:20
එස 38:8

**31 පරි.**

12 ලෙවී 26:12
යෙරෙ 30:22
යෙරෙ 31:33
හෙබ්‍රෙ 8:10
13 ගණන් 10:33
ගීතා 95:11
යෙසා 63:14
හෙබ්‍රෙ 4:8
14 ද්වි 1:31
15 ද්වි 7:8
මලා 1:2
16 හොෂෙ 11:4
17 යෙරෙ 1:10
යෙරෙ 30:18
යෙරෙ 33:7
ආමො 9:11
18 නික් 15:20
විනි 11:34
ගීතා 149:3
යෙරෙ 30:19
19 ආමො 9:14
මීකා 4:4

**2 තීරුව**

1 ද්වි 30:9
යෙසා 65:21
2 එස්රා 1:5
ගීතා 126:1
යෙසා 2:3
යෙරෙ 50:5
මීකා 4:2
3 ද්වි 32:43
ගීතා 96:3
යෙසා 44:23
රෝම 15:10
4 යෙසා 12:5
ආමො 3:9
ක්‍රියා 26:23

වතු වවන්නෝ එයින් ලැබෙන පල-
දාව ප්‍රීතියෙන් භුක්ති විඳිනු ඇත.[1]
**6** එෆ්‍රායිම් කඳුකරයේ සිටින මුරකව-
ලුන් හඬ නඟා මෙසේ කියන කාල-
යක් පැමිණෙනු ඇත. 'ජනයෙනි, අපි
සියොන් වෙතට යමු. අපේ දෙවි වන
යෙහෝවා වෙතට යමු.' "[2]

**7** යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. "යාකොබ්ට ප්‍රීතියෙන් කෑ
මොර ගසන්න. ජාතීන් අතරේ ප්‍රධා-
නියාට ප්‍රීති ඝෝෂා නඟන්න.[3] මේ
ආරංචිය දසත පතුරුවන්න.[4] ප්‍රශංසා
ගී ගයමින් මෙසේ කියන්න. 'යෙ-
හෝවා දෙවියනි, ඉතුරු වී සිටින
ඊශ්‍රායෙල් සෙනඟව බේරාගන්න.'[5]
**8** උතුරු දේශයේ සිටින මාගේ සෙ-
නඟව මම නැවත රැගෙන එන්නෙමි.[6]
පොළොවේ ඈත දේශවල විසිරී සිටින
මාගේ සෙනඟව මම එකතු කර-
ගන්නෙමි.[7] ඒ සෙනඟ අතරේ සිටින
අන්ධ අයවත් කොර අයවත් ගර්භණී
මව්වරුන්වත් ප්‍රසව වේදනාවෙන් පසු
වන මව්වරුන්වත් මම රැගෙන එන්-
නෙමි.[8] ඒ මුළු මහත් සෙනඟ මේ දේ-
ශයට නැවත හැරී එනු ඇත.[9] **9** මා
ඔවුන්ව නැවත රැගෙන එන විට ඔවුහු
හඬමින්[10] මාගේ කරුණාව අයැදිනු
ඇත. මම ඔවුන්ව ගලා යන දිය දහරා
වෙතට ගෙන එන්නෙමි.[11] කිසිම
බාධාවකින් තොර, නිවැරදි මාර්ගයක
මම ඔවුන්ව රැගෙන එන්නෙමි. මන්ද
ඊශ්‍රායෙල්වරුන්ගේ පියා මමය.[12] එෆ්‍රා-
යිම් මාගේ කුලුඳුල් පුත්‍රයාය."[13]

**10** ජනයෙනි, යෙහෝවා දෙවි පව-
සන මේ දේට සවන් දී දුර ඈත
පිහිටි දූපත්වල වෙසෙන්නන්ටත්[14]
මේ ගැන පවසන්න. "ඊශ්‍රායෙල් සෙ-
නඟව විසුරුවාහරින තැනැත්තාම
ඔවුන්ව නැවත එකතු කරගන්-
නේය.[15] එඬේරෙක් තම රැළේ

---

යෙරෙ **31:3*** හෝ, "ළැදි ප්‍රේමයකින්."

**5** යෙසා 1:9; යෙරෙ 23:3; යෝවෙ 2:32; රෝම 9:27; රෝම 11:5; **6** යෙසා 43:6; යෙරෙ 3:12; යෙරෙ 23:8; **7** ද්වි 30:4; එස 20:34; එස 34:12; යාකො 1:1; **8** යෙසා 35:6; යෙසා 42:16; **9** එස්රා 2:64; **10** යෙරෙ 50:4; **11** යෙසා 35:7; යෙසා 49:10; **12** ද්වි 32:6; **13** උත් 48:14; නික් 4:22; **14** ගීතා 97:1; යෙසා 11:11; යෙසා 42:10; **15** ද්වි 30:4; එස 20:34; මීකා 2:12.

සිටින බැටළුවන්ව ආදරයෙන් රැක-
බලා ගන්නාක් මෙන් ඔහුත්
ඔවුන්ව ආදාරයෙන් රැකබලා ගනු
ඇත.[1] 11 යෙහෝවා දෙවි නිසැක-
වම යාකොබ්ව මුදවාගන්නේය.[2]
ඔහුට වඩා බලවත් තැනැත්තාගේ
හස්තයෙන් ඔහුව ගලවාගන්නේය.[3]
12 ඔවුහු නැවත පැමිණ, සියොන්
කන්දේ සිට ප්‍රීති ඝෝෂා නඟනු ඇත.[4]
යෙහෝවා දෙවි ඔවුන්ට ධාන්‍යව-
ලින්ද වයින්වලින්ද[5] තෙලින්ද ආශීර්-
වාද කරන්නේය. ඔවුන්ගේ එළු බැටළු
හා ගව රැළවල් ගණනින් බොහෝ
සෙයින් වැඩි කරන්නේය.[6] දෙවි ඔවුන්
වෙනුවෙන් කරන ඒ යහපත් දේවල්
නිසා ඔවුහු සතුටින් පිනා යනු ඇත.[7]
දිය දහරා ගලා යන සරුසාර උද්‍යාන-
යක් මෙන්[8] ඔවුහුද කිසිදා මැලවී නොයනු ඇත."[9]

13 "ඒ කාලයේදී තරුණ තරු-
ණියෝද මහල්ලෝද නටමින් ප්‍රීති
වන්නෝය.[10] මම ඔවුන්ගේ වැලපීම
සිනහවකට හරවන්නෙමි. මම ඔවුන්ව
සනසා ඔවුන්ගේ ශෝකය පහ කරන්-
නෙමි.[11] 14 මම පූජකයන්ට රසවත්
ආහාර ඇති තරම් දෙන්නෙමි.[12] මා
ලබා දෙන යහපත් දේ භුක්ති විඳ සෙ-
නඟ තෘප්තියට පැමිණෙනු ඇත"[13]
කියා යෙහෝවා දෙවි පවසන්නේය.

15 "යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. 'ශෝකයෙන් විලාප දෙන
හඬක්[14] රාමාහි[15] ඇසිණ. ඒ තම
පුත්‍රයන් වෙනුවෙන් හඬා වැලපෙන[16]
රාකෙල්ගේ[17] හඬයි. පුත්‍රයන් අහිමි
වූ නිසා[18] හඬා වැලපෙමින් සිටින
ඇයව සැනසවීමට කොතෙකුත් උත්-
සාහ කළත් ඇය සැනසීමට කැමති
වුණේ නැත.' "[19]

16 යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. " 'තවදුරටත් කඳුළු සලමින්
හඬා වැලපෙන්න එපා.[20] ඔබ කළ
යහපත් ක්‍රියාවලට මම ඔබට ආශීර්-
වාද කරමි.' යෙහෝවා දෙවි තව-
දුරටත් මෙසේ පවසන්නේය. 'ඔවුහු
අනිවාර්යයෙන්ම සතුරන්ගේ දේශ-
යෙන් නැවත පැමිණෙනු ඇත.'[21]

**31 පරි.**
1 යෙසා 40:11
එස 34:12
1පේතෘ 2:25
2 යෙසා 44:23
යෙසා 48:20
3 යෙසා 49:25
4 එස්රා 3:13
ගීතා 126:1
යෙසා 51:11
එස 20:40
5 යෝවෙ 3:18
සෙක 9:15
6 යෙසා 65:10
7 ගීතා 34:5
යෙසා 60:5
8 යෙසා 58:11
9 යෙසා 35:10
එළි 21:4
10 එස්රා 3:12
සෙක 8:4
11 යෙසා 51:3
යෙසා 65:19
12 ගීතා 36:8
13 ද්වි 30:9
ගීතා 31:19
යෙසා 63:7
14 විලා 1:16
මතෙ 2:16
15 යොෂු 18:25
යෙරෙ 40:1
මතෙ 2:18
16 උත් 35:24
17 උත් 35:19
18 මතෙ 2:18
19 උත් 37:35
20 එළි 7:17
21 එස්රා 1:5
යෙරෙ 23:3
එස 11:17
හොෂෙ 1:11

**2 තීරුව**
1 යෙරෙ 29:11
2 යෙරෙ 46:27
3 යෙරෙ 31:9
4 හිතෝ 26:3
5 ගීතා 94:12
6 යෙරෙ 17:14
විලා 5:21
7 යෙසා 43:3
8 ද්වි 30:2
9 එස 21:12
10 යෙරෙ 3:25
11 ලෙවී 26:41
එස්රා 9:6
12 යෙරෙ 31:9
හොෂෙ 14:4
13 ද්වි 32:36
14 යෙසා 63:15
හොෂෙ 11:8
15 යෙසා 55:7
මීකා 7:18
2කොරි 1:3
16 යෙසා 62:10
17 යෙසා 35:8
18 යෙරෙ 3:14
19 යෙරෙ 2:13
යෙරෙ 3:6
20 1රාජා 18:21
යෙරෙ 2:18

17 " 'ඔබට ප්‍රීතිමත් බලාපො-
රොත්තුවක් ඇත.[1] ඔබේ පුත්‍රයෝ
නිසැකවම තම මව්බිම කරා පැමි-
ණෙනු ඇත'[2] කියා යෙහෝවා දෙවි
පවසන්නේය."

18 "එෆ්‍රායිම් මෙසේ කියමින් ළත
වූ හැටි මට ඇසිණ.[3] 'පුරුදු පුහුණු
නොකළ වසු පැටියෙකුව පුහුණු
කරන්නාක් මෙන්[4] ඔබ මාව නිවැරදි
කළෙහිය.[5] දෙවියනි, නැවත ඔබ වෙ-
තට ඒමට මට මඟ පෙන්වන්න. එවිට
මම ඉතා කැමැත්තෙන් ඔබ වෙතට
හැරී එන්නෙමි.[6] මන්ද යෙහෝවා දෙ-
වියනි, මගේ දෙවි ඔබය.[7] 19 ඔබ
වෙතට මම හැරී ආවෙමි. මා කළ
දේවල් ගැන මම පසුතැවිලි වුණෙමි.[8]
මා කළ වැරදි මට තේරුම් කර දුන්
පසු මම බොහෝ සෙයින් කනගාටු
වුණෙමි.*[9] මා තරුණ කාලයේ කළ
නින්දාසහගත දේවල් ගැන[10] මට ඇති
වුණේ පුදුම ලැජ්ජාවකි.' "[11]

20 "එෆ්‍රායිම් මාගේ වටිනා පුත්‍ර-
යෙකු නොවේද? මා ඔහුව ඉතා
ආදරයෙන් ඇතිදැඩි කළේ නැද්ද?[12]
මා ඔහුට විරුද්ධව කොතරම් කතා
කළත් මාගේ මතකයෙන් කවදාවත්
ඔහු මැකී යන්නේ නැත.[13] ඔහු නිසා
මාගේ හදවත* කම්පා වන්නේය.[14]
එබැවින් මම අනිවාර්යයෙන්ම ඔහුට
අනුකම්පා කරන්නෙමි"[15] කියා යෙ-
හෝවා දෙවි පවසන්නේය.

21 "ඊශ්‍රායෙල් දියණිය, ඔබේ
ප්‍රයෝජනය සඳහා මං සලකුණු හා
මඟ පෙන්වන කණු සිටුවන්න.[16]
ඔබ යා යුතු නිවැරදි මාර්ගය සො-
යාගෙන[17] ඔබේ මුළු සිතින්ම හැරී
එන්න. ඔබේ නගරවලට ආපසු පැමි-
ණෙන්න.[18] 22 අවිශ්වාසවන්ත වූ
දියණිය,[19] ඔබ තව කොපමණ කාල-
යක් ඒ මේ අත සැරිසරමින් සිටින්-
නෙහිද?[20] යෙහෝවා දෙවි පොළොවේ
අලුත් දෙයක් සිදු කරනු ඇත. එනම්,
ස්ත්‍රියක් පුරුෂයෙකු ළඟට පැමිණ ඔහු

යෙරෙ **31:19*** මූ.අ., "කලවයට ගසාගත්තෙමි."
**20*** මූ.අ., "බඩවැල්."

අසලටම වී ඔහුගේ සිත දිනාගැනීමට
උත්සාහ කරනු ඇත.”
**23** ස්වර්ගයේ සේනාවල අධිපතිද
ඊශ්‍රායෙල්හි දෙවිද වන යෙහෝවා
මෙසේ පවසන්නේය. “වහල්භාවයේ
සිටි සෙනඟව මම රැගෙන ආ විට යූදා
දේශයේද එහි නගරවලද සිට ඔවුහු
නැවත මෙසේ කියනු ඇත. ‘ධර්මිෂ්-
ඨකම රජයන වාසස්ථානය,[1] ශුද්ධ
කන්ද,[2] යෙහෝවා දෙවිගේ ආශීර්-
වාදය ඔබට ලැබේවා!’[3] **24** සෙනඟ
යූදා දේශයෙත් එහි සියලු නගරව-
ලත් වාසය කරනු ඇත. ගොවියෝද
එඬේරුද එහි එකට ජීවත් වනු ඇත.[4]
**25** විඩාවට පත්ව සිටින්නන්ව මම
ප්‍රාණවත් කරමි. මලානිකව සිටින්-
නන්ව මම නැවතත් පුබුදුවන්නෙමි.”[5]
**26** එවිට සුව නින්දේ පසු වූ මම
අවදි වී ඇස් විවර කර වට පිට බැලු-
වෙමි.
**27** යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. “ඊශ්‍රායෙල් දේශයද යූදා
දේශයද මනුෂ්‍යයන්ගෙන් හා සත්ව-
යන්ගෙන් පුරවන කාලයක් ඉදිරියේදී
පැමිණෙන්නේය.”[6]
**28** “මම සෙනඟ පිට විපත්ති පමු-
ණුවා ඔවුන්ව දේශයෙන් උදුරා දැමීමට
බලා සිටියෙමි.[7] ඔවුන් පිට විනාශයක්
ගෙනාවෙමි. ඔවුන්ගේ නගර කඩා බිඳ
දැමුවෙමි.[8] නමුත් දැන් මා ඔවුන්ව
නඟා සිටුවා නැවත දේශය ගොඩ-
නැඟීමට බලා සිටින්නෙමි”[9] කියා යෙ-
හෝවා දෙවි පවසන්නේය. **29** “ ‘අමු
මිදි කෑවේ පියවරුන්ය. නමුත් හිරි
වැටුණේ දරුවන්ගේ දත්ය’[10] කියා
ඔවුන් තවදුරටත් නොකියන කාලයක්
ඉදිරියේදී පැමිණෙන්නේය. **30** මන්ද
ඒ කාලයේදී කෙනෙක් මරණයට පත්
වන්නේ ඔහුගේම වරද නිසාය.[11] එදාට
දත් හිරි වැටෙන්නේ අමු මිදි කන
තැනැත්තාගේ මිස වෙන කෙනෙකුගේ
නොවේ.”
**31** යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. “මා ඊශ්‍රායෙල්[12] සහ යූදා
සෙනඟ[13] සමඟ අලුත් ගිවිසුමක්[14]
ඇති කරගන්නා කාලයක් ඉදිරියේදී
පැමිණෙන්නේය. **32** නමුත් එය,
ඔවුන්ගේ මුතුන්මිත්තන්ව ඊජිප්තු
දේශයෙන් පිටතට ගෙන ඒමට මම
ඔවුන්ගේ අත් අල්ලාගත් දවසේදී
ඔවුන් සමඟ ඇති කරගත් ගිවිසුම
මෙන් නොවේ.[1] මා ඔවුන්ට ස්වාමිපු-
රුෂයෙකු මෙන් සිටියත්[2] ඔවුහු මාගේ
ගිවිසුම කඩ කළෝය.[3] මෙසේ පව-
සන මා යෙහෝවා දෙවිය.”
**33** යෙහෝවා දෙවි මෙසේද පව-
සන්නේය. “ඒ කාලයට පසු මම ඊශ්‍රා-
යෙල් සෙනඟ සමඟ ඇති කරගන්නා[4]
ගිවිසුම මෙයයි.[5] මම මාගේ නීති
ඔවුන්ගේ සිත්වල තබන්නෙමි.[6] ඒවා
ඔවුන්ගේ හදවත්වල ලියන්නෙමි.[7]
මම ඔවුන්ව මාගේ සෙනඟ ලෙස පිළි-
ගෙන ඔවුන්ගේ දෙවි වන්නෙමි.”[8]
**34** “ ‘යෙහෝවා දෙවිව දැන හඳුනා
ගන්න’[9] කියා එකිනෙකා තම තමා-
ගේ අසල්වැසියාටවත් සහෝදරයාට-
වත් ඉදිරියේදී උගන්වන්නේ
නැත.[10] මන්ද සුළුම තැනැත්තා-
ගේ සිට උතුම්ම තැනැත්තා දක්වා
ඔවුන් අතරේ සිටින සියලුදෙනා මාව
හොඳින් දැන හඳුනා ගෙන සිටිනු
ඇත”[11] කියා යෙහෝවා දෙවි පවසන්-
නේය. “මම ඔවුන් කළ වරදට සමාව
දෙන්නෙමි. ඔවුන් කළ පව් නැවත
කිසිදාක සිහි නොකරන්නෙමි.”[12]
**35** දහවල් කාලයේදී ආලෝකය
දෙන පිණිස හිරු පිහිටෙවූ[13] රාත්‍රිය
ආලෝකවත් කරන පිණිස සඳට[14]
හා තාරකාවලට[15] නීති දුන්නාවූ[16]
රැළි නංවන පිණිස මුහුද කලතන්-
නාවූ[17] තැනැත්තා යෙහෝවා දෙවිය.
ස්වර්ගයේ සේනාවල අධිපති වන යෙ-
හෝවා යන නාමය දරන ඔහු[18] මෙසේ
පවසන්නේය. **36** “ ‘මා ඒ සියලු දේ
සඳහා පිහිටෙවූ නීති යමෙකුට පහ
කිරීමට නොහැකි වන්නා සේම[19] මා
තෝරාගත් සෙනඟව එනම්, ඊශ්‍රා-
යෙල්ගෙන් පැවතෙන්නන්ව ජාතියක්
ලෙස තුරන් කර දැමීමට කිසිවෙකුට

**31 පරි.**
**1** යෙසා 1:26
**2** සෙක 8:3
**3** ගීතා 122:8
**4** යෙරෙ 33:12; එස 36:10
**5** ගීතා 107:9; යෙසා 40:29
**6** ද්වි 30:9; එස 36:9; හොෂෙ 2:23; සෙක 10:9
**7** යෙරෙ 44:27; දානි 9:14
**8** යෙරෙ 18:7; යෙරෙ 45:4
**9** ගීතා 102:16; ගීතා 147:2; යෙරෙ 24:6; යෙරෙ 32:41
**10** එස 18:2
**11** ද්වි 24:16; යෙසා 3:11; එස 18:4; ගලා 6:7
**12** ගලා 6:16
**13** යෙරෙ 50:4
**14** මතෙ 26:28; මාක් 14:24; ලූක් 22:20; 1කොරි 11:25; හෙබ්‍රෙ 8:8; හෙබ්‍රෙ 10:16

**2 තීරුව**
**1** නික් 19:5; ද්වි 1:31
**2** යෙරෙ 3:14
**3** එස 16:59; හෙබ්‍රෙ 8:9
**4** හෙබ්‍රෙ 8:10
**5** හෙබ්‍රෙ 8:6
**6** එස 11:19; එස 36:26
**7** ගීතා 37:31; හෙබ්‍රෙ 10:16
**8** යෙරෙ 30:22; හෙබ්‍රෙ 8:10
**9** 1ලේක 28:9; යොහ 17:3
**10** යෙසා 54:13; යොහ 6:45; 1තෙස 4:9; 1යොහ 2:27
**11** යෙසා 11:9; යෙරෙ 24:7; හබ 2:14; හෙබ්‍රෙ 8:11
**12** යෙරෙ 33:8; යෙරෙ 50:20; මීකා 7:18; මතෙ 26:28; රෝම 11:27; හෙබ්‍රෙ 8:12; හෙබ්‍රෙ 9:15; හෙබ්‍රෙ 10:17
**13** උත් 1:16; ගීතා 136:8; මතෙ 5:45
**14** යෝබ් 38:33; ගීතා 89:37; ගීතා 104:19

**15** ගීතා 136:9; **16** 1කොරි 14:33; **17** යෙසා 51:15; **18** යෙරෙ 10:16; **19** ගීතා 148:6; යෙසා 54:10; යෙරෙ 33:20.

නුපුළුවන.[1] ඔවුහු සැමදා මා ඉදිරියේ
සිටිනු ඇත' කියා යෙහෝවා දෙවි වන
මම පවසමි."
**37** යෙහෝවා දෙවි මෙසේද පව-
සන්නේය. "'කිසිවෙකුට අහස මැන
බලන්නවත් පොළොවේ අත්තිවාරම
සොයා දැනගන්නවත් කිසිදා නො-
හැකිය.[2] එසේම ඊශ්‍රායෙල්ගෙන් පැව-
තෙන්නන් අතීතයේ කොතරම් වැරදි
කර තිබුණත් මම ඔවුන්ව කවදාවත්
සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප නොක-
රමි'[3] කියා යෙහෝවා දෙවි වන මම
පවසමි."
**38** යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. "යෙහෝවා දෙවි වෙනු-
වෙන් හනානෙල්ගේ බලකොටුවේ[4]
සිට කොනේ දොරටුව[5] දක්වා නගරය
නැවත ගොඩනඟන[6] කාලයක් ඉදි-
රියේදී පැමිණෙන්නේය. **39** එතැන්
සිට මනිනු ලබන මායිම[7] ගාරෙබ්
හෙල දක්වාද එතැන් සිට ගෝයා දක්-
වාද විහිදී යනු ඇත. **40** මළ කඳන්[8]
හා අළු*[9] දමන නිම්නයද කිද්‍රොන්
නිම්නය දක්වා ඇති සියලු කෙත්-
වතුද[10] නැඟෙනහිර දෙසින් තිබෙන
අශ්ව දොරටුවේ කොනද[11] ඇතුළත්
මුළු ප්‍රදේශයම යෙහෝවා දෙවි වන
මා ඉදිරියේ ශුද්ධ ප්‍රදේශයක් බවට
පත් වන්නේය.[12] මේ නගරය නැවත
කිසිදා උදුරා දමන්නේවත් කඩා බිඳ
දමන්නේවත් නැත."[13]

# 32

යූදාහි රජු වන ශෙදකියා
පාලනය කළ දහවන අවුරුද්-
දේදී[14] එනම්, නෙබුකද්රෙෂර් රජුගේ
පාලන සමයේ දහඅටවන අවුරුද්-
දේදී[15] යෙරෙමියාට යෙහෝවා දෙ-
විගෙන් පණිවිඩයක් ලැබිණ. **2** ඒ
වන විට බැබිලෝනියේ රජුගේ යුධ
හමුදාව යෙරුසලම වටලාගෙන සිටි-
යෝය.[16] යෙරෙමියා, යූදාහි රජුගේ
මාලිගාව අසලින්ම පිහිටි මුරකරුගේ
මළුවේ තිබූ ගොඩනැඟිල්ලක, සිර-
ගෙයි භාරකරුවන් යටතේ සිටියේය.[17]
**3** යූදාහි රජු වන ශෙදකියා යෙරෙමි-
යාව සිර කිරීමට[1] කලින් ඔහුට මෙසේ
පැවසුවේය.
"'යෙහෝවා දෙවිගේ පණිවිඩය
මෙයයි' කියා ඔබ අනාවැකි පවසන්-
නේ ඇයි?[2] ඔබ මෙහෙම පැවසුවා.
'දෙවිගෙන් මට ලැබුණු පණිවිඩය මෙ-
යයි. "මම මේ නගරය බැබිලෝනියේ
රජුගේ අතට භාර දෙන්නෙමි. ඔහු
අනිවාර්යයෙන්ම එය යටත් කරගන්-
නේය.[3] **4** යූදාහි රජු වන ශෙදකියා-
ටත් කල්දිවරුන්ගේ අතින් ගැලවීමට
නොහැකි වන්නේය. මම ඔහුව අනි-
වාර්යයෙන්ම බැබිලෝනියේ රජුගේ
අතට හසු කර දෙන්නෙමි. ඔහුට ඒ
රජු සමඟ මුහුණට මුහුණ ලා කතා
කිරීමට සිදු වන්නේය.[4] **5** බැබිලෝ-
නියේ රජ, ශෙදකියාව බැබිලෝනියට
ගෙන යන්නේය. මා ඔහු ගැන පියව-
රක් ගන්නා තෙක් ඔහු එහිම රැඳී
සිටිනු ඇත.[5] ජනයෙනි, ඔබ කල්දිව-
රුන්ට විරුද්ධව යුද්ධ කර ඔවුන්ව
පැරදවීමට කොතරම් උත්සාහ කළත්
ඔබට ජය ගැනීමට නම් ලැබෙන්නේ
නැත."[6] මෙය යෙහෝවා දෙවිගෙන්
ලැබුණු පණිවිඩයකි.'"
**6** යෙරෙමියා මෙසේ පැවසුවේය.
"යෙහෝවා දෙවි මට පැවසුවේ මෙ-
යයි. **7** 'ඔබේ පියාගේ සහෝදරයා
වන ෂල්ලුම්ගේ පුත් හනමෙල් ඔබ
ළඟට පැමිණ මෙසේ කියනු ඇත.
"අනාතොත්හි[7] තිබෙන මගේ ඉඩම
මිල දී ගන්න. මන්ද එය මිල දී
ගැනීමට අයිතිය ඇති තැනැත්තා
ඔබයි."'"[8]
**8** කලක් ගත වූ පසු යෙහෝවා
දෙවි පැවසූ ලෙසම මගේ පියාගේ
සහෝදරයාගේ පුත් හනමෙල්, මුරක-
රුගේ මළුවේ තිබූ[9] ගොඩනැඟිල්ලේ
සිටි මා වෙතට පැමිණ මට මෙසේ
කීවේය. "බෙන්ජමින් දේශයේ[10] අනා-
තොත්හි ඇති මගේ ඉඩම මිල දී
ගන්න.[11] මන්ද එම ඉඩම උරුම කර-
ගැනීමට අයිතිය ඇත්තේ ඔබටයි.
එය මිල දී ගැනීමේ අයිතියත් ඔබ
සතුයි. ඉතින් ඔබ එය මිල දී ගන්න."

**31 පරි.**
1 ගීතා 72:5
2 යෝබ් 38:5; හිතෝ 30:4; යෙසා 40:12
3 යෙරෙ 30:11
4 නෙහෙ 3:1; නෙහෙ 12:39; සෙක 14:10
5 2ලේක 26:9
6 නෙහෙ 12:27; යෙසා 44:28; යෙරෙ 30:18
7 සෙක 1:16
8 යෙරෙ 19:11
9 යෙරෙ 7:32
10 2සාමු 15:23; 2රාජා 23:6; යොහ 18:1
11 2රාජා 11:16; 2ලේක 23:15; නෙහෙ 3:28
12 එස 45:1; යෝවෙ 3:17
13 යෙසා 51:22

**32 පරි.**
14 2රාජා 25:1; යෙරෙ 39:1
15 යෙරෙ 25:1
16 යෙරෙ 52:4
17 නෙහෙ 3:25; යෙරෙ 33:1; යෙරෙ 37:21; යෙරෙ 38:28

**2 තීරුව**
1 යෙරෙ 37:18; හෙබ්‍රෙ 11:36
2 ලූක් 20:2
3 යෙරෙ 34:2; යෙරෙ 37:8
4 2රාජා 25:6; යෙරෙ 34:3; යෙරෙ 37:17; යෙරෙ 38:18; යෙරෙ 39:5; යෙරෙ 52:9; එස 12:13
5 යෙරෙ 27:22
6 හිතෝ 21:30; යෙරෙ 21:4; යෙරෙ 33:5; එස 17:15
7 යොෂු 21:18; යෙරෙ 1:1
8 ලෙවී 25:24; රූත් 4:4
9 නෙහෙ 3:25; යෙරෙ 37:21
10 යොෂු 18:28
11 1රාජා 2:26; 1ලේක 6:60

යෙරෙ **31:40*** එනම්, පූජාසනයෙන් ඉවත් කරන තෙල් මිශ්‍ර අළු.

එවිට ඒ පණිවිඩය ලැබුණේ යෙහෝවා
දෙවිගෙන් බව මම දැනගත්තෙමි.[1]
**9** පසුව මම අනාතොත්හි තිබූ
ඉඩම[2] මගේ පියාගේ සහෝදරයා-
ගේ පුත් හනමෙල්ගෙන් මිල දී ගත්-
තෙමි.[3] මම රිදී ෂෙකෙල් දහහතක්*
කිරා ඔහුට දුන්නෙමි.[4] **10** ඉන්පසු
මම ඔප්පුවක් ලියා[5] එය මුද්‍රා කළෙමි.[6]
මුදල් කිරා බැලීම[7] ඇතුළු මේ සියල්ල
මා කළේ සාක්ෂිකරුවන් ඉදිරිපිට-
දීය.[8] **11** නීතිරීතිවලට අනුව සකස්
කළ මුද්‍රා තැබූ ඔප්පුවත්[9] ඔප්පු-
වේ මුද්‍රා නොතැබූ පිටපතත් ගෙන
**12** මසේයාගේ පුත්‍රයා වූ නෙරියාගේ
පුත්‍රයා වන[10] බාරුක්ගේ[11] අතට දුන්-
නෙමි. මගේ පියාගේ සහෝදරයාගේ
පුත් හනමෙල් ඉදිරියෙත් ඒ ඔප්පුවට
අත්සන් තැබූ[12] සාක්ෂිකරුවන් ඉදි-
රියෙත් මුරකරුගේ මළුවේ ඉඳගෙන
සිටි අනිකුත් යුදෙව්වන් සියලුදෙනා
ඉදිරියෙත් මම එම ඔප්පුව ඔහුට දුන්-
නෙමි.[13]

**13** ඉන්පසු ඔවුන් සියලුදෙනා ඉදි-
රියේ මම බාරුක්ට මෙසේ අණ
කළෙමි. **14** "ස්වර්ගයේ සේනාවල
අධිපතිද ඊශ්‍රායෙල්හි දෙවිද වන යෙ-
හෝවා මෙසේ පවසන්නේය. 'මුද්‍රා
තැබූ ඔප්පුවත් මුද්‍රා නොතැබූ පිට-
පතත්[14] බොහෝ කාලයක් තබාගැ-
නීම සඳහා මැටි බඳුනක දමන්න.'
**15** මන්ද ස්වර්ගයේ සේනාවල අධිප-
තිද ඊශ්‍රායෙල්හි දෙවිද වන යෙහෝවා
මෙසේ පවසන්නේය. 'ගෙවල් දොර-
වල්ද ඉඩකඩම්ද මිදිවතුද මේ දේශය
තුළ නැවත මිල දී ගන්නා කාලයක්
ඉදිරියේදී පැමිණෙන්නේය.' "[15]

**16** නෙරියාගේ පුත්[16] බාරුක්ගේ
අතට ඉඩමේ ඔප්පුව භාර දුන් පසු[17]
යෙහෝවා දෙවිට මම මෙසේ යාච්ඤා
කළෙමි.[18] **17** "විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවියනි,[19] ඔබ
ඔබේ මහත් බලයෙන් අහසත් පො-
ළොවත් සෑදුවා.[20] එය ඔබට කිසි-
සේත් අපහසු කාර්යයක් නොවෙයි.[1]
**18** මනුෂ්‍යයන් දහස් ගණනකට මහත්
ප්‍රේමයක්* පෙන්වන,[2] පියවරුන් කළ
වැරදිවලට ඔවුන්ගේ දරුවන්ට පවා
දඬුවම් කරන[3] සැබෑ දෙවි ඔබයි. බල-
වත්,[4] ශ්‍රේෂ්ඨ තැනැත්තාත්[5] ඔබයි.
ඔබේ නාමය[6] ස්වර්ගයේ සේනාවල
අධිපති වන යෙහෝවායි.[7] **19** ඔබේ
අරමුණු ඉතා ශ්‍රේෂ්ඨයි.[8] ඔබේ මහත්
ක්‍රියාවලට සීමාවක් නැහැ.[9] ඔබ එක්
එක් මනුෂ්‍යයා ගත කරන ජීවිතයට
අනුවද ඔහුගේ හැසිරීම් රටාවට අනු-
වද ඔවුන්ට නිසි ප්‍රතිඵල ලබා දෙන
පිණිස[10] ඔවුන් දෙසට නෙත් යොමා
සිටිනවා.[11] **20** ඊජිප්තු දේශයේදී ඔබ
කළ ආශ්චර්යයන් ගැනත් ඔබ කළ
පුදුමසහගත ක්‍රියා ගැනත් අද වන
තුරුම ඊශ්‍රායෙල් සෙනඟ හා වෙනත්
මනුෂ්‍යයන් අතරේ කතාබහට ලක්
වෙනවා.[12] අතීතයේදී මෙන් ඉතා ළඟ-
දීම ඔබේ නාමය සියලුදෙනා අතරේ
ගෞරවයට පත් වන බව ස්ථිරයි.[13]
**21** ඔබේ මහත් බලයෙන් ඔබ පුදුම
ක්‍රියාද ආශ්චර්යයන්ද[14] සිදු කර, සිය-
ලුදෙනාම භීතියට පත් කරමින්[15] ඔබේ
සෙනඟ වන ඊශ්‍රායෙල්වරුන්ව ඊජිප්තු
දේශයෙන් පිටතට ගෙන ආවා.[16]

**22** "පසුව ඔබ මේ සෙනඟගේ
මුතුන්මිත්තන්ට පොරොන්දු වූ ලෙස
කිරියෙන් හා පැණියෙන් ඉතිරෙන
මේ දේශය[17] ඔවුන්ට ලබා දුන්නා.[18]
**23** ඔවුන් මේ දේශයට ඇවිත් එය
හිමි කරගත්තා.[19] නමුත් ඔවුන් ඔබට
සවන් දුන්නේවත් ඔබේ අණපනත්ව-
ලට කීකරු වුණේවත් නැහැ.[20] ඔබ
ඔවුන්ට අණ කළ කිසිවක් ඔවුන්
කළේ නැහැ.[21] මේ සියලු විපත්ති
ඔබ ඔවුන් පිටට ගෙන ආවේ ඒ
නිසයි.[22] **24** බලන්න සිදු වී තිබෙන

**32 පරි.**
**1** යෙරෙ 32:25
**2** යෙරෙ 1:1
**3** යෙරෙ 32:7
**4** උත් 23:16
**5** යෙරෙ 32:44
**6** නෙහෙ 10:1
**7** උත් 23:16
**8** රූත් 4:9
යෙසා 8:2
**9** ලෙවී 25:15
**10** යෙරෙ 51:59
**11** යෙරෙ 36:4
යෙරෙ 36:26
**12** යෙරෙ 32:44
**13** නෙහෙ 3:25
යෙරෙ 33:1
**14** යෙරෙ 32:11
යෙරෙ 32:44
**15** ආමෝ 9:14
සෙක 3:10
**16** යෙරෙ 51:59
**17** යෙරෙ 32:12
**18** පිලි 4:6
**19** යෙරෙ 1:6
**20** උත් 1:1
1රාජා 8:42
2රාජා 19:15
ගීතා 102:25
යෙසා 40:26
යෙරෙ 10:12
යෙරෙ 27:5
එළි 4:11

**2 තීරුව**
**1** උත් 18:14
යෝබ් 42:2
ලූක් 1:37
රෝම 4:21
**2** නික් 20:6
නික් 34:7
**3** ගණන් 14:18
ද්වි 5:9
1රාජා 14:10
යෙසා 65:6
**4** ද්වි 10:17
යෙසා 10:21
**5** නෙහෙ 1:5
**6** යෙරෙ 10:16
**7** ගීතා 148:2
**8** යෙසා 28:29
**9** නික් 15:11
**10** නික් 34:7
ගීතා 62:12
දේශ 12:14
යෙරෙ 17:10
මතෙ 12:36
රෝම 2:6
**11** 2ලේක 16:9
යෝබ් 34:21
ගීතා 33:13
ගීතා 66:7
හිතෝ 5:21
හිතෝ 15:3
හෙබ්‍රෙ 4:13
**12** නික් 7:3
ද්වි 4:34
නෙහෙ 9:10
ගීතා 78:43

**13** නික් 9:16; 2සාමු 7:23; යෙසා 63:12; දානි 9:15; රෝම 9:17; **14** ගීතා 105:27; ගීතා 106:9; **15** නික් 6:1; නික් 15:16; ද්වි 26:8; 1ලේක 17:21; ගීතා 136:12; **16** නික් 6:6; නික් 13:14; **17** නික් 3:8; යෙරෙ 11:5; **18** උත් 13:15; උත් 17:8; උත් 26:3; ද්වි 1:8; **19** නෙහෙ 9:23; ගීතා 105:44; **20** නෙහෙ 9:26; දානි 9:10; **21** ගණන් 33:52; **22** ද්වි 28:15; යොෂු 23:16; එස්රා 9:7.

**යෙරෙ 32:9*** මූ.අ., "ෂෙකෙල් හතකුත් රිදී කාසි දහයකුත්."

**යෙරෙ 32:18*** හෝ, "ළැදි ප්‍රේමයක්."

දේ! නගරය අල්ලාගන්නා පිණිස[1]
කල්දිවරුන් නගරය වටා බැම්මක් ඉදි
කර තිබෙනවා.[2] යුද්ධ,[3] සාගත[4] හා
වසංගත[5] ඇති වී තිබෙන නිසා කල්දි-
වරුන් අනිවාර්යයෙන්ම මේ නගරය
අල්ලාගනියි.[6] ඔබ පැවසූ ලෙසම සෑම
දෙයක්ම සිදු වෙනවා.[7] **25** විශ්වයේ
පාලකයා වන යෙහෝවා දෙවියනි,
මේ නගරය කල්දිවරුන්ගේ අතට පත්
වන බව දැන දැනම,[8] ‘සාක්ෂිකරුවන්
ඉදිරියේ[9] ඉඩම මිල දී ගන්න’[10] කියා
ඔබ මට පැවසුවේ ඇයි?”

**26** එවිට යෙහෝවා දෙවි යෙරෙ-
මියාට මෙසේ පැවසුවේය. **27** “යෙ-
හෝවා වන මම මුළු මිනිස්
සංහතියේම දෙවිය.[11] මට කළ නො-
හැකි කිසිවක් තිබේද?[12] **28** යෙ-
හෝවා දෙවි වන මම මෙසේ පවසමි.
‘මම මේ නගරය කල්දිවරුන්ගේ අත-
ටත් බැබිලෝනියේ රජු වන නෙබුකද්-
රෙෂර්ගේ අතටත් භාර දෙමි. ඔහු එය
යටත් කරගන්නේය.[13] **29** මේ නග-
රයට විරුද්ධව යුද්ධ කරන කල්දිවරු
පැමිණ එයට ගිනි තබා එය සම්පූර්ණ-
යෙන්ම විනාශ කර දමනු ඇත.[14] මාව
උදහසට පත් කරන බව දැන දැනත්
නිවෙස්වල පිහිටි පැතලි වහල මත
බාල් දෙවියාට සුවඳ දුම්ද වෙනත් දෙ-
විවරුන්ට පාන පූජාද ඔප්පු කළ සෑම
නිවසක්ම නගරයත් සමඟම විනාශ වී
යනු ඇත.’[15]

**30** “‘ඊශ්‍රායෙල් හා යූදා සෙනඟ
ඔවුන්ගේ තරුණ කාලයේ සිටම මා
ඉදිරියේ කළේ දුෂ්ට දේවල්මය.[16] ඊශ්‍රා-
යෙල් සෙනඟ දේවතා රූප සාදාගෙන
මාව උදහසට පත් කරන්නෝය.’[17]
මෙසේ පවසන මා යෙහෝවා දෙ-
වියි. **31** ‘මේ නගරය ගොඩනැඟූ
දා සිට අද දක්වාම මෙහි සිදු වී
තිබෙන්නේ මාව උදහසට පත් කර-
වන දේවල්මය.[18] ඒ නිසා මම මේ
නගරය විනාශ කර දමන්නෙමි.[19]
**32** ඊශ්‍රායෙල්[20] හා යූදා සෙනඟ[21] මා
ඉදිරියේ නපුරු දේ කර මාව උදහසට
පත් කළෝය.[22] යූදා සෙනඟද යෙරූ-
සලමේ වැසියෝද ඔවුන්ගේ රජවරුද[23]
අධිපතීහුද[1] පූජකයෝද[2] අනාගත-
වක්තෘවරුද[3] **33** දිගටම මට පිටු
පෑවෝය.[4] මා හිමිදිරි උදෑසන සිට
නොනවත්වා ඔවුන්ට කාරණා ඉගැන්-
වුවත් ඔවුන්ගෙන් එක් කෙනෙක්වත්
මට ඇහුම්කන් දී මා දුන් හික්ම-
වීම් පිළිගත්තේ නැත.[5] **34** මාගේ
නාමය දරන මාගේ ගෘහයේ පවා ඔවුහු
පිළිකුල්සහගත රූප තබා එය අප-
විත්‍ර කළෝය.[6] **35** යූදා වැසියන්ව
පාපයට පොලඹවන පිණිස[7] ඔවුහු
බාල් දෙවියාට පූජා ඔප්පු කිරීම
සඳහා බෙන්හින්නොම් නිම්නයේ[8]
පූජනීය ස්ථාන ගොඩනැඟුවෝය.[9]
ඔවුහු තම පුත්‍රයන්ව හා දූවරුන්ව
ගින්නෙන් දවා[10] මෝලෙක්ට[11] පූජා
කළෝය. එවැනි පිළිකුල්සහගත දෙ-
යක් කරන්න කියා මම ඔවුන්ට අණ
කළේ නැත.[12] එවැනි අදහසක්වත්
මාගේ සිතට පහළ වුණේ නැත.’[13]

**36** “යුද්ධ, සාගත හා වසංගත
නිසා බැබිලෝනියේ රජු යටතට පත්
වෙනවායයි ඔබ පැවසූ මේ නග-
රයේ අනාගතය ගැන ඊශ්‍රායෙල්හි
දෙවි වන යෙහෝවා මෙසේ පව-
සන්නේය.[14] **37** ‘මා මහත් උදහසින්
යුක්තව මාගේ සෙනඟව විසුරුවා-
හරින දේශවලින් මම ඔවුන්ව
නැවත එකට එකතු කරගන්නෙමි.[15]
මම ඔවුන්ව නැවත මේ දේශයට ගෙ-
නැවිත් මෙහි සුරක්ෂිතව ජීවත් වීමට
සලස්වන්නෙමි.[16] **38** ඔවුන්ව මාගේ
සෙනඟ ලෙස පිළිගන්නා අතර[17] මම
ඔවුන්ගේ දෙවි වන්නෙමි.[18] **39** එක්-
සිත්ව[19] එක මඟෙහි ගමන් කිරී-
මට මම ඔවුන්ට උපකාර කරන්නෙමි.

**32 පරි.**
**1** ලෙවී 26:31 2රාජා 25:1 යෙරෙ 52:4
**2** ද්වි 28:52 යෙරෙ 33:4 එස 4:2
**3** ලෙවී 26:33 යෙරෙ 14:12
**4** ද්වි 28:57 යෙරෙ 15:2
**5** ද්වි 28:59 යෙරෙ 24:10
**6** යෙරෙ 21:4
**7** යෙසා 55:11
**8** යෙරෙ 37:10
**9** ද්වි 19:15 මතෙ 18:16
**10** ලෙවී 27:18
**11** ගණන් 16:22 ගණන් 27:16 ලූක් 3:6 රෝම 3:29
**12** උත් 18:14 යෝබ් 42:2 ලූක් 1:37 රෝම 4:21
**13** 2රාජා 25:4 යෙරෙ 20:5 යෙරෙ 21:4
**14** 2රාජා 25:9 2ලේක 36:19 යෙරෙ 37:8 යෙරෙ 52:13 විලා 4:11
**15** 2රාජා 17:16 2ලේක 28:2 යෙරෙ 7:18 යෙරෙ 19:13 යෙරෙ 44:25
**16** ද්වි 9:7 2රාජා 17:9 නෙහෙ 9:16 ගීතා 106:6 යෙරෙ 2:7 යෙරෙ 3:25 එස 16:8 එස 20:28 ක්‍රියා 7:51
**17** යෙරෙ 22:21 එස 23:3
**18** 1රාජා 11:7 2රාජා 21:4 ශෙප 3:1
**19** 2රාජා 23:27 2රාජා 24:3 විලා 1:8
**20** 2රාජා 15:18 2රාජා 17:11 2රාජා 17:18 යෙරෙ 7:12 යෙරෙ 11:17
**21** යෙරෙ 5:11 යෙරෙ 11:10 එස 8:17
**22** යෙසා 1:4
**23** 1රාජා 11:9 2රාජා 23:26 1ලේක 10:13 එස්රා 9:7 යෙරෙ 15:4

---

**2 තීරුව** **1** එස 22:6; දානි 9:8; **2** නෙහෙ 9:34; **3** මීකා 3:5; මීකා 3:11; **4** 2ලේක 29:6; යෙරෙ 2:27; යෙරෙ 7:24; සෙක 7:11; **5** 2ලේක 36:16; යෙරෙ 7:13; යෙරෙ 25:3; යෙරෙ 26:5; යෙරෙ 35:15; යෙරෙ 44:5; **6** 2රාජා 21:4; 2ලේක 33:4; යෙරෙ 7:30; යෙරෙ 23:11; එස 5:11; එස 8:5; එස 23:38; හොෂෙ 9:10; **7** 2රාජා 16:3; 2ලේක 33:9; **8** යොෂු 15:8; 2ලේක 28:3; යෙරෙ 19:5; **9** 1රාජා 11:5; 2රාජා 23:10; **10** 2ලේක 33:6; යෙසා 57:5; යෙරෙ 7:31; **11** ලෙවී 18:21; ලෙවී 20:4; **12** ද්වි 18:10; 1රාජා 11:10; **13** 1රාජා 11:33; **14** යෙරෙ 24:10; **15** ද්වි 29:24; ද්වි 30:3; යෙරෙ 23:3; යෙරෙ 29:14; එස 37:21; **16** යෙරෙ 23:6; යෙරෙ 33:16; එස 34:25; **17** යෙරෙ 24:7; යෙරෙ 31:33; මීකා 4:5; **18** උත් 17:7; යෙරෙ 30:22; **19** 2ලේක 30:12; එස 11:19.

එවිට මට සැමදා ගරුබිය පෙන්වමින්
ජීවත් වීමට ඔවුන්ට හැකි වන්නේය.
එය ඔවුන්ගෙත් ඔවුන්ගේ දරුවන්-
ගෙත් යහපතට හේතු වේ.[1] **40** සද-
හටම පවතින ගිවිසුමක් මම ඔවුන්
සමඟ ඇති කරගන්නෙමි.[2] මම ඔවුන්ව
කිසිදා අත්හරින්නේවත් ඔවුන්ට යහ-
පත කිරීමෙන් වළකින්නේවත් නැත.[3]
ඔවුන් මාව අත්හැර නොයන පිණිස මා
කෙරෙහි ගරුබියක් මම ඔවුන් තුළ
ඇති කරන්නෙමි.[4] **41** ඔවුන් වෙනු-
වෙන් යහපත් දේවල් කිරීමට මම
ඉතා සතුටින් බලා සිටින්නෙමි.[5] මම
ඔවුන්ව මේ දේශයේ ස්ථිර ලෙස පිහිටු-
වන්නෙමි.[6] මා ඒ දේ කරන්නේ මාගේ
මුළු හදවතින්මය.' "

**42** "යෙහෝවා දෙවි මෙසේද පව-
සන්නේය. 'මා සෙනඟ පිටට මේ
මහත් විපත්ති සියල්ල ගෙනා ලෙ-
සම මම ඔවුන්ට පොරොන්දු වූ සියලු
යහපත් දේවල්ද ලබා දෙන්නෙමි.[7]
**43** "කිසි මනුෂ්‍යයෙක්වත් ඔවුන්ගේ
සතුන්වත් නැතුව මේ දේශය පාළුවට
ගිහින්.[8] එය දැන් අයිති කල්දිවරුන්-
ටයි"[9] කියා සෙනඟ පවසන මේ දේශ-
යේ නැවත වරක් ඉඩකඩම් මිල දී
ගන්නා කාලයක් පැමිණෙන්නේය.'[10]

**44** " 'ජනයා, බෙන්ජමින් දේශ-
යේද[11] යෙරුසලම අවට ප්‍රදේශවලද[12]
යූදාහි නගරවලද[13] කඳුකරයේ පිහිටි
නගරවලද පහත් බිම්වල පිහිටි නගර-
වලද[14] දකුණෙහි නගරවලද[15] තිබෙන
ඉඩම් මිල දී ගෙන, සාක්ෂිකරු-
වන් ඉදිරියේ[16] ඔප්පු සකස් කර
ඒවාට මුද්‍රා තබන[17] කාලයක් ඉදිරි-
යේදී පැමිණෙන්නේය. මන්ද වහල්භා-
වයේ සිටින සෙනඟව මම නැවතත්
ඔවුන්ගේ දේශයට ගෙනෙන්නෙමි'[18]
කියා යෙහෝවා දෙවි පවසන්නේය."

# 33
යෙරෙමියා, මුරකරුගේ මළු-
වේ තිබූ ගොඩනැඟිල්ලක
සිරගෙයි භාරකරුවන් යටතේ සිටි-
යදී[19] දෙවන වරටත් යෙහෝවා දෙවි-
ගෙන් ඔහුට පණිවිඩයක් ලැබිණ. දෙවි
ඔහුට මෙසේ පැවසුවේය. **2** "පො-
ළොව සාදා[20] එය ස්ථිරව පිහිටෙව්-

**32 පරි.**
1 ද්වි 5:29; ගීතා 115:13
2 යෙසා 55:3; යෙසා 61:8
3 ගීතා 73:1; ගීතා 125:4; එස 39:29
4 එස 36:26; එළි 15:4
5 ද්වි 30:9; යෙසා 62:5; යෙසා 65:19; ශෙප 3:17
6 යෙසා 58:11; යෙසා 61:3; යෙරෙ 24:6; යෙරෙ 31:12; ආමො 9:15
7 යෙරෙ 31:28; යෙරෙ 33:11; සෙක 8:15
8 යෙරෙ 9:11; එස 23:33
9 යෙරෙ 21:4
10 එස 37:14
11 යොෂු 18:28
12 යෙරෙ 33:16
13 යෙරෙ 31:23
14 යොෂු 15:33; යෙරෙ 17:26; යෙරෙ 33:13
15 යොෂු 15:21
16 යෙරෙ 32:25
17 යෙරෙ 32:10
18 ගීතා 126:1; යෙරෙ 33:7

**33 පරි.**
19 නෙහෙ 3:25; යෙරෙ 32:2; යෙරෙ 37:21; යෙරෙ 38:28
20 උත් 14:19; ගීතා 102:25; යෙසා 45:18; එළි 10:6

**2 තීරුව**
1 ගීතා 96:10; ගීතා 104:5; ගීතා 119:90; දේශ 1:4
2 උත් 1:1; ගීතා 146:6; එළි 4:11
3 නික් 6:3; නික් 15:3; යෙරෙ 32:18; ආමො 5:8; ආමො 9:6
4 ද්වි 4:7; ගීතා 50:15; ගීතා 91:15; යෙසා 55:6; යෙරෙ 29:12
5 ගීතා 25:14; යෙසා 48:6; ආමො 3:7
6 ද්වි 28:52; යෙරෙ 32:24

වේ[1] යෙහෝවා දෙවිය.[2] ඔහුව
හඳුන්වන්නේ යෙහෝවා යන නාම-
යෙන්ය.[3] යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. **3** 'මට කතා කරන්න.
එවිට මම ඔබට පිළිතුරු දෙන්නෙමි.[4]
ඔබ කලින් නොදැන සිටි, ඔබට තේ-
රුම්ගැනීමට අපහසු වූ පුදුම දේවල්
මම ඔබට දැන් පහදා දෙන්නෙමි.' "[5]

**4** "සතුරන් නගරය වටා ගොඩ-
නැඟූ බැම්ම නිසාත් කඩු පහරට ලක්
වීම නිසාත් විනාශ වූ මේ නගරයේ
සියලු නිවාස හා යූදාහි රජවරුන්-
ගේ මාලිගා ගැන[6] ඊශ්‍රායෙල්හි දෙවි
වන යෙහෝවා පණිවිඩයක් දුන්නේය.
**5** එමෙන්ම කල්දිවරුන්ට විරුද්ධව
යුද්ධ කිරීමට පැමිණෙන අය ගැනත්
දෙවිගේ උදහසින් පහර කා[7] මිය
යන අයගේ මළ කඳන්වලින් පිරී
යන මේ නගරය ගැනත් ඒ පණිවිඩ-
යේ සඳහන් විය. ඔවුන්ගේ දුෂ්ටකම්
නිසා දෙවි මේ නගරය අත්හැර දැමු-
වේය.[8] **6** ඒ සියල්ල ගැන දෙවි දුන්
පණිවිඩය මෙයයි. 'මම මේ නගර-
යට සුවයක් ලබා දෙන්නෙමි.[9] එහි
වැසියන්ව සුව කර සමාදානය දසත
පැතුරුණු කාලයක් ඔවුන්ට ලබා
දෙන්නෙමි. සත්‍යය පිළිබඳ දැනු-
මෙන්ද ඔවුන්ව පූර්ණ කරන්නෙමි.[10]
**7** වහල්භාවයේ සිටින ඔවුන්ව එනම්,
යූදාහි වැසියන්ව හා ඊශ්‍රායෙල්ව-
රුන්ව මම නැවත මේ දේශයට
ගෙනෙන්නෙමි.[11] අතීතයේදී මෙන්
ඔවුන්ව ස්ථිර ලෙස පිහිටුවන්නෙමි.[12]
**8** ඔවුන් මට විරුද්ධව කළ සියලු පාප
මම මකා දමන්නෙමි.[13] මට විරුද්-
ධව පව් කරමින් ඔවුන් කළ සියලු
අයුතුකම්වලට ඔවුන්ට සමාව දෙන්-
නෙමි.[14] **9** මේ නගරය මාගේ ඉම-
හත් ප්‍රීතියට හේතුවක් වනු ඇත.[15]
මෙය පොළොවේ සියලු ජාතීන් ඉදිරි-

---

**7** යෙරෙ 32:5; **8** ද්වි 31:17; යෙරෙ 21:10; මීකා 3:4; **9** ද්වි 32:39; යෙසා 30:26; යෙරෙ 30:17; **10** යෙසා 54:13; **11** ද්වි 30:3; ගීතා 14:7; යෙරෙ 30:3; යෙරෙ 32:44; **12** යෙසා 1:26; යෙරෙ 24:6; සෙක 10:6; **13** ගීතා 85:2; යෙසා 40:2; යෙරෙ 31:34; සෙක 13:1; **14** ගීතා 65:3; යෙසා 43:25; යෙසා 44:22; මීකා 7:18; **15** ද්වි 30:9; ගීතා 126:3; යෙසා 62:3.

යේ මට ප්‍රශංසාවක් හා ගෞරවයක්
ගෙන දෙනු ඇත. මන්ද මේ නගරයේ
වැසියන් වෙනුවෙන් මා කරන සියලු
යහපත් ක්‍රියා ගැන පොළොවේ සියලු
ජාතීහු දැනගන්නෝය.[1] මම මෙහි
වැසියන් වෙනුවෙන් කරන සියලු යහ-
පත්කම් ගැන හා ඔවුන්ට ලබා දෙන
සමාදානය ගැන අසා[2] සියලු ජාතීහු
භීතියට පත්ව[3] කැලඹෙන්නෝය.' "[4]
**10** "යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ පවසන්නේය. 'මනුෂ්‍යයන්ද
ඔවුන්ගේ සතුන්ද නැතුව යූදාහි
නගරත් යෙරුසලමේ වීථිත් පාළුවට
ගොස් ඇතැයි[5] කියා ඔබ මේ දේ-
ශය ගැන පැවසුවත් නැවත වරක් මේ
දේශය තුළම[6] **11** ප්‍රීති ඝෝෂාවේ
හඬද[7] මනාලයාගේ හා මනාලියගේ
හඬද ඇසෙනු ඇත. "ස්වර්ගයේ සේ-
නාවල අධිපති වන යෙහෝවා දෙවිට
ප්‍රශංසා කරන්න. යෙහෝවා ඉතා යහ-
පත් දෙවි කෙනෙකි.[8] ඔහුගේ අතිම-
හත් ප්‍රේමය* සැමදා පවතින්නේය"[9]
කියා සෙනඟ පවසන හඬ දේශයෙන්
ඇසෙනු ඇත.'
" 'වහල්භාවයේ සිටින සෙනඟව
මම මේ දේශයට ගෙනෙන්නෙමි.
ඔවුහු අතීතයේදී මෙන් මෙහි සතු-
ටින් වාසය කරනු ඇත.[10] ඒ කාලයේදී
සෙනඟ යෙහෝවා දෙවිගේ ගෘහයට
ස්තුති පූජා රැගෙන එන්නෝය'[11] කියා
යෙහෝවා දෙවි පවසන්නේය.
**12** "ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ පවසන්නේය. 'කිසි මිනි-
සෙක්වත් සතෙක්වත් නැතුව පාළු-
වට ගිය මේ දේශයේත්[12] එහි සියලු
නගරවලත් ඇති තණබිම්වල නැවත
වරක් එඬේරු තම රැළට තණ කවනු
ඇත.[13] එවැනි කාලයක් අනිවාර්ය-
යෙන්ම ඉදිරියේදී පැමිණෙන්නේය.'
**13** " 'කඳුකරයේ පිහිටි නගරවලද
පහත් බිම්වල පිහිටි නගරවලද[14] දකු-
ණෙහි නගරවලද[15] බෙන්ජමින් දේශ-
යේද[16] යෙරුසලම අවට ප්‍රදේශවලද[17]

යෙරෙ **33:11*** හෝ, "ළැදි ප්‍රේමය."

**33 පරි.**
**1** යෙසා 62:7
**2** නෙහෙ 6:16
**3** 2ලේක 20:29
**4** මීකා 7:17
**5** යෙසා 24:11
**6** යෙරෙ 32:43
**7** යෙරෙ 31:12
**8** ගීතා 25:8
සෙක 9:17
මාක් 10:18
**9** 1ලේක 16:8
2ලේක 5:13
එස්රා 3:11
ගීතා 89:2
යෙසා 12:4
මීකා 7:18
**10** ද්වි 30:5
යෙරෙ 32:44
**11** ලෙවී 7:12
2ලේක 29:31
ගීතා 107:22
**12** යෙරෙ 32:43
යෙරෙ 51:62
**13** යෙසා 65:10
යෙරෙ 31:24
යෙරෙ 50:19
මීකා 2:12
**14** යොෂු 15:33
යෙරෙ 32:44
**15** යොෂු 15:21
**16** යොෂු 18:21
**17** යෙරෙ 17:26

**2 තීරුව**
**1** යෙරෙ 32:44
**2** ලෙවී 27:32
**3** යෙරෙ 31:27
**4** උත් 22:17
ද්වි 30:3
යෙරෙ 29:10
**5** යෙරෙ 23:5
**6** 1ලේක 17:11
යෙසා 4:2
යෙසා 11:1
යෙසා 53:2
යෙරෙ 23:5
සෙක 3:8
සෙක 6:12
එළි 22:16
**7** යෙසා 9:7
යෙසා 11:4
හෙබ්‍රෙ 1:9
**8** යෙසා 45:17
**9** ද්වි 33:28
එස 28:26
**10** යෙරෙ 23:6
**11** 2සාමු 7:16
1රාජා 2:4
ගීතා 89:29
යෙසා 9:7
ලූක් 1:33
**12** 1පේත්‍ර 2:5
එළි 1:6
**13** උත් 1:16
ගීතා 89:37
යෙසා 54:10
යෙරෙ 31:35
**14** යෙසා 9:6
දානි 7:14
ලූක් 1:32

යූදාහි නගරවලද[1] සිටින එඬේරුන්
විසින් තම රැළේ බැටළුවන් ගණන්
කරනු ලබන කාලයක් නැවත පැමි-
ණෙන්නේය'[2] කියා යෙහෝවා දෙවි
පවසන්නේය."
**14** "යෙහෝවා දෙවි මෙසේද පව-
සන්නේය. 'ඊශ්‍රායෙල් සෙනඟට[3] හා
යූදා වැසියන්ට මම දුන් පො-
රොන්දු ඉටු කරන්නෙමි.[4] ඒ කාලය
අනිවාර්යයෙන්ම පැමිණෙන්නේය.[5]
**15** දාවිත්ගේ පෙළපතින් ධර්මිෂ්ඨ
තැනැත්තෙකුව ඒ කාලයේදී මම
බිහි වීමට සලස්වන්නෙමි.[6] ඔහු යුක්-
තිය ඉටු කරමින් ධර්මිෂ්ඨකමින් දේ-
ශය පාලනය කරනු ඇත.[7] **16** ඒ
කාලයේදී යූදා වැසියන්ට ගැලවීම
ලැබෙන්නේය.[8] යෙරුසලමේ වැසි-
යෝද සුරක්ෂිතව වාසය කරනු ඇත.[9]
'අප ධර්මිෂ්ඨව සිටින්නේ යෙහෝවා
දෙවි නිසාය'[10] යන නාමයෙන් යෙරු-
සලම හඳුන්වනු ඇත.' "
**17** "මන්ද යෙහෝවා දෙවි මෙසේ
පවසන්නේය. 'ඊශ්‍රායෙල්හි රජකම්
කිරීමට දාවිත්ගෙන් පැවතෙන්නෙකු
නොසිටින කාලයක් කවදාවත් ඉදිරි-
යේදී පැමිණෙන්නේ නැත.[11] **18** දින-
පතා දවන පූජා ඔප්පු කිරීමටත් ධාන්‍ය
පූජා දවා මට පිළිගැන්වීමටත් වෙනත්
පූජා ඔප්පු කිරීමටත් ලෙවී ගෝත්‍රයේ
පූජකයෙක් මා ඉදිරියේ සැමදා සිටිනු
ඇත.' "[12]
**19** යෙහෝවා දෙවි තවදුරටත්
යෙරෙමියාට මෙසේ පැවසුවේය.
**20** "යෙහෝවා දෙවි පවසන්නේ මෙ-
යයි. 'රාත්‍රියත් දවාලත් නියමිත වේ-
ලාවට නොපැමිණෙන පිණිස මා
දවාල සහ රාත්‍රිය සමඟ ඇති කර-
ගත් ගිවිසුම කඩ කිරීමට කිසිවෙ-
කුට කිසිදා නුපුළුවන.[13] **21** එසේම
සැමදා රජකම් කිරීමට දාවිත්ගේ පෙ-
ළපතෙන් කෙනෙකු සිටින බවට[14]
මාගේ සේවකයා වන දාවිත් සමඟ
මා ඇති කරගත් ගිවිසුමත්[15] මාගේ
සේවකයන් වන ලෙවී ගෝත්‍රයේ

**15** 2සාමු 7:16; 2සාමු 23:5; ගීතා 89:34; ගීතා 132:11; යෙසා 55:3; යෙරෙ 31:37.

පූජකයන් සමඟ මා ඇති කරගත්
ගිවිසුමත්[1] කිසිදා කඩ නොවන්නේය.
22 අහසේ තරුද මුහුදු වෙරළේ වැලිද
කිසිවෙකුට ගණන් කිරීමට නොහැකි
වන්නා සේම[2] මාගේ සේවකයා වූ
දාවිත්ගෙන් පැවතෙන්නන්ගේ ගණ-
නද මට සේවය කරන ලෙවීවරුන්ගේ
ගණනද කිසිවෙකුට ගණන් කිරීමට
නොහැකි වන තරමට මම බොහෝ
සෙයින් වැඩි කරන්නෙමි.' "[3]

23 යෙහෝවා දෙවි තවදුරටත්
යෙරෙමියාට මෙසේ පැවසුවේය.
24 " 'යෙහෝවා දෙවි තෝරාගත්
පවුල් දෙක[4] ඔහුම ප්‍රතික්ෂේප කරයි'
කියා සෙනඟ පවසනවා ඔබට ඇසු-
ණේ නැද්ද? සතුරෝ මාගේ සෙනඟට
නින්දා අපහාස කරති.[5] ඔවුන්ව ජාති-
යක් හැටියටද තවදුරටත් පිළි නො-
ගනිති.

25 "යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. 'අහසටද පොළොව-
ටද නියමයන් දී[6] දවාල හා රාත්‍රිය
සමඟ මා ඇති කරගත් ගිවිසුම[7]
ස්ථිරව පිහිටුවා තිබෙන්නාක් මෙන්
26 යාකොබ්ගේ පෙළපතත් දාවිත්-
ගේ පෙළපතත් මම ස්ථිරව පිහි-
ටුවන්නෙමි.[8] ආබ්‍රහම්, ඊසාක් සහ
යාකොබ්ගෙන් පැවතෙන්නන්ව පාල-
නය කිරීමට මාගේ සේවක දාවිත්-
ගේ පෙළපතින් පාලකයන්ව පත්
කරන්නෙමි. එබැවින් වහල්භාවයේ
සිටින ඔවුන්ට මා අනුකම්පා කර[9]
ඔවුන්ව නැවත මේ දේශයට ගෙ-
නෙන්නෙමි.' "[10]

**34** බැබිලෝනියේ රජු වූ නෙබු-
කද්රෙෂර්ද[11] ඔහුගේ මුළු යුධ
සේනාවද[12] ඔහු යටතේ තිබූ පොළො-
වේ සියලු රාජ්‍යයන්ද[13] එහි සෙනඟද
යෙරුසලමට හා ඊට අයත් සියලු නග-
රවලට විරුද්ධව සටන් කරමින්[14] සිටි
කාලයේදී යෙහෝවා දෙවිගෙන් යෙ-
රෙමියාට මෙම පණිවිඩය ලැබිණ.

2 "ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝවා
මෙසේ පැවසුවේය. 'ඔබ ගොස්
යුදාහි රජු වන ශෙදකියාට මෙසේ
කියන්න.[15] "යෙහෝවා දෙවිගේ පණි-
විඩය මෙයයි. 'බැබිලෝනියේ රජුට
මේ නගරය යටත් කරගැනීමට මම
ඉඩහරින්නෙමි.[1] ඔහු ගින්නෙන් මෙය
දවා දමනු ඇත.[2] 3 ඔබට ඔහු-
ගෙන් කිසිසේත් ගැලවී යා නො-
හැක. ඔබව අල්ලාගෙන ඔහුගේ අතට
භාර දෙනු ලැබේ.[3] එවිට ඔබට ඔහු
සමඟ මුහුණට මුහුණ ලා කතා කිරී-
මට සිදු වන්නේය.[4] ඔබව අනිවාර්-
යයෙන්ම බැබිලෝනියට ගෙන යනු
ලබන්නේය.' 4 යුදා දේශය පාල-
නය කරන ශෙදකියා රජ්ජුරුවනි,[5]
යෙහෝවා දෙවිගේ මේ පණිවිඩයටත්
සවන් දෙන්න. 'ඔබ ගැන යෙහෝවා
දෙවි පවසන්නේ මෙයයි. "ඔබ කඩු-
වෙන් මැරුම් කන්නේ නැත. 5 ඔබ
සමාදානයෙන් මිය යනු ඇත.[6] ඔබේ
පියවරුන් එනම්, ඔබට පෙර සිටි රජ-
වරුන් මිය ගිය විට සෙනඟ සුවඳ
ද්‍රව්‍ය දැව්වාක් මෙන්[7] ඔබ වෙනුවෙ-
නුත් ඔවුහු සුවඳ ද්‍රව්‍ය දවනු ඇත.[8]
'ස්වාමීනි'[9] කියමින් ඔවුහු ඔබ නිසා
වැලපෙනු ඇත.[10] 'මේ දේවල් එලෙ-
සම ඉටු වන්නේය. මන්ද එය ප්‍රකාශ
කළේ මමය' කියා යෙහෝවා දෙවි
පවසන්නේය." ' " ' "

6 දෙවි පැවසූ සෑම දෙයක්ම අනා-
ගතවක්තෘ යෙරෙමියා, යුදාහි රජු
වන ශෙදකියාට යෙරුසලමේදී පැවසු-
වේය.[11] 7 ඔහු මේ දේවල් පැවසුවේ,
බැබිලෝනියේ රජුගේ යුධ සේනාව
යෙරුසලමටත් යුදාහි ඉතුරු වී තිබූ
නගර[12] සියල්ලටත් විරුද්ධව[13] එනම්,
ආරක්ෂාව තර කර තිබූ නගර[14]
වන ලාකිෂ්[15] හා අශේකාට[16] විරුද්ධව
යුද්ධ කරමින් සිටි කාලයේදීය.

8 ශෙදකියා රජ යෙරුසලමේ සිටි
සෙනඟගේ සේවකයන්ව නිදහස් කර
යැවීම සඳහා සෙනඟ සමඟ එකඟ-
තාවකට ආ පසු යෙහෝවා දෙවි-
ගෙන් යෙරෙමියාට පණිවිඩයක්
ලැබිණ.[17] 9 ශෙදකියා රජ සෙනඟ
සමඟ ඇති කරගත් එකඟතාවට
අනුව කිසිවෙකු තමාගේ සහෝ-

**33 පරි.**
1 ද්වි 21:5
2 උත් 13:16
උත් 15:5
උත් 22:17
යෙරෙ 31:37
හෙබ්‍රෙ 11:12
3 1ලේක 25:1
2ලේක 35:2
4 එස 37:19
5 ගීතා 83:4
එස 25:3
6 යෝබ් 38:33
ගීතා 74:16
ගීතා 104:19
යෙරෙ 31:35
7 උත් 1:16
යෙරෙ 33:20
8 ගීතා 94:14
යෙරෙ 31:37
9 යෙසා 14:1
යෙරෙ 31:20
හොෂෙ 1:7
මීකා 7:19
සෙක 10:6
10 එස්රා 2:1
එස්රා 2:70
යෙරෙ 33:7

**34 පරි.**
11 2රාජා 25:1
යෙරෙ 32:2
12 යෙරෙ 39:1
යෙරෙ 52:4
13 යෙරෙ 27:6
14 ද්වි 28:52
යෙරෙ 1:15
15 2ලේක 36:11
යෙරෙ 37:1

**2 තීරුව**
1 යෙරෙ 21:10
යෙරෙ 32:28
2 යෙරෙ 32:29
යෙරෙ 37:8
යෙරෙ 38:23
යෙරෙ 39:8
3 යෙරෙ 37:17
යෙරෙ 39:5
යෙරෙ 52:8
4 2රාජා 25:6
යෙරෙ 32:4
එස 12:13
5 2ලේක 36:10
6 එස 17:16
7 2ලේක 21:19
8 2ලේක 16:14
9 යෙරෙ 22:18
10 විලා 4:20
මීකා 2:4
11 1සාමු 3:18
1රාජා 21:19
ක්‍රියා 20:27
12 2ලේක 27:4
13 ද්වි 28:52
යෙරෙ 4:5
14 2රාජා 18:13
2ලේක 11:5
15 2රාජා 19:8
මීකා 1:13

16 යොෂු 15:35; 17 නික් 21:2; ලෙවී 25:10; ද්වි 15:12.

දරයන් වන යුදාහි වැසියන්ව තම
සේවකයන් ලෙස තමන් ළඟ තබා
නොගත යුතු විය.[1] ඒ නිසා තමන්
ළඟ සිටි හෙබ්‍රෙව් ජාතික[2] සේවක-
යන්වද සේවිකාවන්වද නිදහස් කර
යැවීමට ඔවුහු තීරණය කළෝය.
**10** සියලු අධිපතීහුද[3] ඊට කීකරු
වූහ. සේවක සේවිකාවන්ගෙන් තවදු-
රටත් වැඩ නොගෙන ඔවුන්ව නිදහස්
කර යැවීමට ගත් තීරණයට එකඟ වූ
සෙනඟ ඔවුන්ව නිදහස් කර හැරි-
යෝය.[4] **11** නමුත් තමන් ගත් තීර-
ණය පසුව ඔවුහු වෙනස් කළෝය.[5]
ඔවුහු නිදහස් කර යන්න හැරිය සේ-
වක සේවිකාවන්ව නැවත ගෙනැ-
විත් ඔවුන්ව තමන් යටතේම
තබාගත්තෝය.[6] **12** ඒ කාලයේදී
යෙරෙමියාට යෙහෝවා දෙවිගෙන්
පණිවිඩයක් ලැබිණ. යෙහෝවා දෙවි
ඔහුට මෙසේ පැවසුවේය.

**13** “ඊශ්‍රායෙල්හි දෙවි වන යෙ-
හෝවා පවසන්නේ මෙයයි. ‘ඔබේ
මුතුන්මිත්තන් වහලුන් ලෙස සිටි[7]
ඊජිප්තු දේශයෙන් ඔවුන්ව පිටතට
ගෙනා දවසේදී[8] මම ඔවුන් සමඟ
ගිවිසුමක් ඇති කරගනිමින්[9] ඔවුන්ට
මෙසේ පැවසුවෙමි. **14** “ඔබට විකු-
ණනු ලැබූ[10] ඔබේ සහෝදරයෙකු වන
හෙබ්‍රෙව් ජාතිකයෙකු[11] ඔබ යටතේ
අවුරුදු හයක් සේවය කළ පසු හත්වන
අවුරුද්දේදී ඔබ ඔහුව නිදහස් කර
යැවිය යුතුය.”[12] නමුත් ඔබේ මුතුන්-
මිත්තෝ මා පැවසූ දේට සවන් දුන්-
නේවත් ඊට කීකරු වුණේවත් නැත.[13]
**15** නමුත් ඔබ එලෙස ක්‍රියා නොකර
මා ඉදිරියේ හරි දේ කිරීමට තීරණ-
යක් ගත්තහුය. ඔබ එකඟ වුණේ ඔබ
යටතේ සේවය කළ ඔබේ සහෝද-
රයාව නිදහස් කර යැවීමටය. ඔබ
එසේ කිරීමට පොරොන්දු වූයේ මාගේ
නාමය දරන ගෘහයේ[14] මා ඉදිරිපිටදී-
මය.[15] **16** නමුත් ඔබ ගත් ඒ තීර-
ණය පසුව ඔබ වෙනස් කර[16] මාගේ
නාමයට අගෞරවයක් ගෙනාවහුය.[17]
තමන් කැමති තැනකට යන්න ඉඩ
දී නිදහස් කර හැරිය ඔබේ සේවක
සේවිකාවන්ව ඔබ නැවත ගෙනැවිත්
ඔබ යටතේම තබාගත්තහුය.’[1]

**17** “එබැවින් යෙහෝවා දෙවි තව-
දුරටත් මෙසේ පවසන්නේය. ‘තමාගේ
සහෝදරයාවද අසල්වැසියාවද නිද-
හස් කර යවන ලෙස මා දුන් ආඥා-
වට ඔබ කීකරු නොවූ නිසා[2] මම
ඔබවද මේ දේවලින් නිදහස් නොක-
රමි.[3] ඔබ කඩු පහරට[4] ගොදුරු වනු
ඇත. සාගතයෙන්[5] හා වසංගතවලින්[6]
පහර කනු ඇත. යෙහෝවා දෙවි වන
මා ඔබ පිටට ගෙනෙන විපත දැක
පොළොවේ සියලු රාජ්‍යයන් බියෙන්
වෙවුලනු ඇත.[7] **18** මා සමඟ ඇති
කරගත් ගිවිසුම කඩ කළ අයව[8] මම
සතුරන්ගේ අතට හසු කර දෙන්-
නෙමි. දෙපළු කරන ලද වසු පැටියෙ-
කුගේ පළු දෙක මැදින් ගමන් කර,[9]
මා සමඟ ඇති කරගත් ගිවිසුමට
එකඟව ක්‍රියා නොකළ[10] **19** යුදාහි
සහ යෙරුසලමේ අධිපතීන්වද[11] නිල-
ධාරීන්වද පූජකයන්වද දේශයේ සියලු
වැසියන්වද **20** ඔවුන්ගේ සතුරන්-
ගේ අතටත් ඔවුන්ගේ ජීවිත විනාශ
කර දැමීමට මං සොයන අයගේ
අතටත් මම භාර දෙන්නෙමි.[12] ඔවුන්-
ගේ මළ කඳන් පක්ෂීන්ටත් වන-
මෘගයන්ටත් ආහාරයක් වන්නේය.[13]
**21** යුදාහි රජු වන ශෙදකියාවද[14] ඔහු-
ගේ අධිපතීන්වද ඔවුන්ගේ සතුරන්ගේ
අතටත් ඔවුන්ව විනාශ කර දැමී-
මට මං සොයන අයගේ අතටත් භාර
දෙන්නෙමි. මේ නගරයෙන් අහක්ව
ගිය[15] බැබිලෝනියේ රජුගේ යුධ හමු-
දාවට ඔවුහු අනිවාර්යයෙන් හසු වන්-
නෝය.’[16]

**22** “‘මම අණක් නිකුත් කර මේ
නගරයට විරුද්ධව සටන් කරන
පිණිස ඔවුන්ව නැවත ගෙනෙන්-
නෙමි.[17] ඔවුහු මේ නගරයට විරුද්ධව
යුද්ධ කර එය යටත් කරගනු ඇත.
එයට ගිනි තබා විනාශ කරනු ඇත.[18]
මම යුදාහි නගරවල් කිසි මිනිසෙකු

**34 පරි.**
**1** ලෙවී 25:39 නෙහෙ 5:8
**2** උත් 14:13 2කොරි 11:22
**3** යෙරෙ 26:10 යෙරෙ 36:12
**4** ලෙවී 25:39
**5** හොෂෙ 6:4
**6** ලෙවී 25:42 ගීතා 36:3
**7** නික් 13:3
**8** ද්වි 7:8 ද්වි 24:18
**9** නික් 24:7 ද්වි 5:2
**10** ලෙවී 25:39
**11** ද්වි 15:12
**12** නික් 21:2 ලෙවී 25:41
**13** 1සාමු 8:8 2රාජා 17:14 නෙහෙ 9:29 යෙරෙ 7:26 සෙක 7:12
**14** 2රාජා 21:4
**15** ගීතා 119:106
**16** දේශ 5:5 එස 17:16 මතෙ 5:37
**17** ලෙවී 19:12 එස 20:39

**2 තීරුව**
**1** යෙරෙ 34:11
**2** නික් 21:2 ලෙවී 25:10 ද්වි 15:12
**3** ලෙවී 26:34 ගලා 6:7 යාකො 2:13
**4** යෙරෙ 15:2
**5** ද්වි 28:53 2රාජා 25:3 යෙරෙ 24:10 යෙරෙ 32:24
**6** ලෙවී 26:25 යෙරෙ 21:7 එස 14:19
**7** ද්වි 28:65 යෙරෙ 15:4 යෙරෙ 29:18
**8** ද්වි 17:2 යොෂු 7:11 එස 17:16 හොෂෙ 6:7
**9** උත් 15:17
**10** උත් 15:10
**11** යෙරෙ 25:18 දානි 9:6
**12** ද්වි 7:10 යෙරෙ 4:30
**13** ද්වි 28:26 1රාජා 14:11 ගීතා 79:2 යෙරෙ 7:33 යෙරෙ 16:4 යෙරෙ 19:7
**14** 2රාජා 24:18
**15** යෙරෙ 37:5

**16** 2රාජා 25:6; යෙරෙ 39:6; යෙරෙ 52:10; විලා 4:20; **17** 2ලේක 36:17; යෙරෙ 39:1; **18** 2රාජා 25:9; යෙරෙ 32:29; යෙරෙ 38:23; යෙරෙ 39:8; යෙරෙ 52:13.

වාසය නොකරන පාළු ස්ථානයක්
බවට පත් කරන්නෙමි’[1] කියා යෙ-
හෝවා දෙවි පවසන්නේය.”

**35** යොෂියාගේ පුත්‍රයා වූ යූදාහි
රජු වූ යෙහෝයාකිම්ගේ
පාලන සමයේදී[2] යෙහෝවා දෙවිගෙන්
යෙරෙමියාට මෙම පණිවිඩය ලැබිණ.
**2** “ඔබ දැන් රේකාබ්වරුන් වෙතට
යන්න.[3] ඔවුන් සමඟ කතා කර
ඔවුන්ව යෙහෝවා දෙවි වන මාගේ
ගෘහයට කැඳවාගෙන එන්න. එහි
තිබෙන කෑම කාමරයකට ඔවුන්ව
ගෙන ගොස් ඔවුන්ට බොන්න වයින්
දෙන්න.”
**3** එබැවින් මම, හබෂ්ෂිනියාගේ
පුත්‍රයා වූ යෙරෙමියාගේ පුත් යයෂ-
නියාද ඔහුගේ සහෝදරයන්ද ඔහුගේ
පුත්‍රයන්ද ඇතුළු රේකාබ්වරුන් සිය-
ලුදෙනාද සමඟ **4** යෙහෝවා දෙවි-
ගේ ගෘහයේ තිබූ කෑම කාමරයකට
ගියෙමි.[4] මා ඔවුන්ව රැගෙන ගියේ
ඉග්දලියාගේ පුත්‍රයා වන හානාන්-
ගේ පුත්‍රයන්ගේ කෑම කාමරයටය.
හානාන්, සැබෑ දෙවිගේ සේවකයෙකි.
එම කෑම කාමරය පිහිටා තිබු-
ණේ දොරටු පාලකයා වූ ෂල්ලුම්ගේ[5]
පුත්‍රයා වන මයසේයාගේ කෑම කාමර-
යට ඉහළින් තිබූ අධිපතීන්ගේ කෑම
කාමරයට යාබදවය. **5** ඉන්පසු මම
වයින් පිරුණු කුසලාන හා භාජන රේ-
කාබ්වරුන් ඉදිරියේ තබා, “මෙයින්
බොන්න” කියා ඔවුන්ට පැවසුවෙමි.
**6** නමුත් ඔවුහු මෙසේ කීවෝය.
“අපි වයින් බොන්නේ නැහැ. රේකාබ්-
ගේ පුත්, ඒ කියන්නේ අපේ මුතුන්-
මිත්තා වූ යෝනාදබ්[6] අපිට මේ
වගේ අණක් දුන්නා. ‘ඔබත් ඔබේ
පුත්‍රයනුත් කිසිදාක වයින් බොන්න
එපා.[7] **7** ඔබ නිවාස ඉදි කරන්න-
වත් බීජ වපුරන්නවත් මිදිවතු වවන්-
නවත් ඒවා අයිති කරගන්නවත් එපා.
ඔබ විදේශිකයන් ලෙස ජීවත් වන
දේශයේ බොහෝ කල් ජීවත් වීමට
හැකි වන පිණිස කූඩාරම් ගසාගෙන
ඔබේ මුළු ජීවිත කාලයේම ඒවායේ
වාසය කරන්න.’[8] **8** ඉතින් අපි අපේ
මුතුන්මිත්තා වූ රේකාබ්ගේ පුත් යෙ-
හොනාදාබ් අණ කළ සෑම දෙයක්ම ඒ
විදිහටම පිළිපදිනවා.[1] ඒ නිසා අපිත්
අපේ භාර්යාවනුත් අපේ දරුදැරියනුත්
කිසිවිටක වයින් බොන්නේ නැහැ.[2]
**9** අපි ස්ථිර ගෙවල් දොරවල් හදා-
ගන්නේ නැහැ. මිදිවත්තක්වත් කෙ-
තක්වත් බීජවත් අපිට අයිති නැහැ.
**10** අපේ මුතුන්මිත්තා වූ යෝනාදබ්[3]
අණ කළ සෑම දෙයකටම කීකරු
වෙමින් අපි දිගටම කූඩාරම්වලම
ජීවත් වෙනවා.[4] **11** නමුත් බැබි-
ලෝනියේ රජු වූ නෙබුකද්රෙෂර් අපි
වාසය කළ දේශයට විරුද්ධව සටන්
කරන්න ආවා.[5] ඒ නිසා අපි තීරණය
කළා කල්දිවරුන්ගේ හා සිරියානුවන්-
ගේ යුධ හමුදාවෙන් බේරෙන්න නම්
යෙරුසලමට ඇතුල් වෙලා එහි ජීවත්
වෙන්න ඕනෙ කියලා.”[6]
**12** යෙහෝවා දෙවි යෙරෙමියාට
මෙසේ පැවසීය. **13** “ස්වර්ගයේ සේ-
නාවල අධිපතිද ඊශ්‍රායෙල්හි දෙවිද
වන යෙහෝවා මෙසේ පවසන්නේය.
‘ගොස් යූදාහි වැසියන්ටත් යෙරුස-
ලමේ වැසියන්ටත් මෙසේ පව-
සන්න. “මාගේ වදන්වලට කීකරු
වන්න කියා මා ඔබට දිගින් දිගටම
උනන්දු කළා නොවේද”[7] කියා යෙ-
හෝවා දෙවි අසන්නේය. **14** “රේ-
කාබ්ගේ පුත් යෙහොනාදාබ්[8] වයින්
නොබොන ලෙස තම පුත්‍රයන්ට දුන්
අණ ඔවුහු එලෙසම පිළිපැද්දෝය.
ඔවුහු වයින් උගුරක්වත් නොබී අද
දක්වාම තම මුතුන්මිත්තාට කීකරුව
සිටිති.[9] නමුත් මා හිමිදිරි උදැසන
සිට නොනවත්වා ඔබට දුන් උපදෙස්-
වලට[10] ඔබ කීකරු වුණේ නැත.[11]
**15** මම හිමිදිරි උදැසන සිට මාගේ
සේවකයන් වන අනාගතවක්තෘව-
රුන්ව දිගින් දිගටම ඔබ වෙතට එවා[12]
ඔබට මේ දේවල් මතක් කර දුන්නෙමි.
‘ජනයෙනි, ඔබේ නරක මාර්ගවලින්
ඉවත් වන්න.[13] දුෂ්ට ක්‍රියා අත්හැර
යහපත් ලෙස හැසිරෙන්න.[14] වෙනත්
දෙවිවරුන්ගේ පිහිට පතමින් ඔවුන්ට
නමස්කාර නොකරන්න.[15] එවිට ඔබ-

**34 පරි.**
1 ලෙවී 26:33
ද්වි 29:28
යෙරෙ 9:11
යෙරෙ 44:2
මීකා 7:13

**35 පරි.**
2 2රාජා 23:34
2ලේක 36:5
දානි 1:1
3 2රාජා 10:15
1ලේක 2:55
4 2ලේක 31:11
5 1ලේක 9:17
එස්රා 2:42
නෙහෙ 7:45
6 2රාජා 10:15
1ලේක 2:55
7 දේශ 5:4
8 නික් 20:12
එෆී 6:3

**2 තීරුව**
1 උත් 18:19
2 හිතෝ 6:20
3 2රාජා 10:15
1ලේක 2:55
4 යෙරෙ 35:8
5 2ලේක 36:6
දානි 1:1
6 යෙරෙ 4:5
7 ද්වි 5:29
යෙරෙ 6:8
යෙරෙ 7:3
යෙරෙ 9:12
යෙරෙ 32:33
8 2රාජා 10:15
1ලේක 2:55
9 යෙරෙ 35:8
10 2ලේක 36:15
යෙරෙ 7:13
යෙරෙ 25:3
11 නෙහෙ 9:26
නෙහෙ 9:30
යෙසා 30:9
යෙරෙ 7:24
12 යෙරෙ 7:25
යෙරෙ 25:4
13 යෙසා 1:16
යෙරෙ 4:14
යෙරෙ 25:5
එස 18:30
හොෂෙ 14:1
සෙක 1:3
14 යෙරෙ 7:3
යෙරෙ 18:11
15 ද්වි 31:18
යෙරෙ 44:5

ටත් ඔබේ මුතුන්මිත්තන්ටත් මා දුන්
මේ දේශයේ දිගටම ජීවත් වීමට ඔබට
හැකි වනු ඇත.'[1] නමුත් මා පැවසූ ඒ
දේවලට ඔබ ඇහුම්කන් දුන්නේවත්
ඒවා ගණනකට ගත්තේවත් නැත.[2]
**16** නමුත් රේකාබ්ගේ පුත් යෙහොනා-
දාබ් තම පුත්‍රයන්ට[3] දුන් ආඥාව ඔවුන්
කොතරම් හොඳින් පිළිපදිනවාද කියා
බලන්න![4] ඔවුන් තම මුතුන්මිත්තාගේ
අණට එසේ කීකරු වුණත් මේ සෙනඟ
මා පවසන දේවල් කිසි ගණනකට
ගන්නේ නැත." ' "[5]

**17** "එබැවින් ස්වර්ගයේ සේනාවල
අධිපතිද ඊශ්‍රායෙල්හි දෙවිද වන යෙ-
හෝවා මෙසේ පවසන්නේය. 'මා යූදා
දේශයටත් යෙරුසලමේ සියලු වැසි-
යන්ටත් විරුද්ධව ප්‍රකාශ කළ සෑම
විපතක්ම මම ඔවුන් පිටට ගෙනෙන්-
නෙමි.[6] මන්ද මා කිහිප වතාවක්ම
ඔවුන්ට කතා කළත් මා පැවසූ දේ
ඔවුහු ගණනකටවත් ගත්තේ නැත.
මා දිගින් දිගටම ඔවුන්ව ඇමතුවත්
ඔවුහු මට කිසි ප්‍රතිචාරයක් දැක්වූයේ
නැත.' "[7]

**18** ඉන්පසු රේකාබ්වරුන් අමතා
යෙරෙමියා මෙසේ කීවේය. "ස්වර්ගයේ
සේනාවල අධිපතිද ඊශ්‍රායෙල්හි දෙවිද
වන යෙහෝවා ඔබට මෙසේ පවසන්-
නේය. 'ඔබේ මුතුන්මිත්තා වූ යෙ-
හොනාදාබ්ගේ අණට ඔබ කීකරු වී[8]
ඔහු පැවසූ සෑම දෙයක්ම මේ දක්-
වාම පිළිපැද්ද නිසා[9] **19** ස්වර්ගයේ
සේනාවල අධිපතිද ඊශ්‍රායෙල්හි දෙ-
විද වන යෙහෝවා ඔබට මේ සහති-
කය දෙන්නේය. "මා ඉදිරියේ සේවය
කිරීමට රේකාබ්ගේ පුත් යෝනාදාබ්-
ගෙන් පැවතෙන්නෙක්[10] සැමදා සිටිනු
ඇත." ' "[11]

**36** යෝෂියාගේ පුත්‍රයා වූ යූදාහි
රජු වූ යෙහෝයාකිම්ගේ
පාලන සමයේ හතරවන අවුරුද්-
දේදී[12] යෙරෙමියාට යෙහෝවා දෙ-
විගෙන් මෙම පණිවිඩය ලැබුණේය.
**2** "ලියවිල්ලක් ගෙන,[13] ඊශ්‍රායෙල්ව-
රුන්ටත් යූදාහි වැසියන්ටත්[14] සියලු
ජාතීන්ටත්[15] විරුද්ධව මා ප්‍රකාශ කළ
සියලු දේ එහි ලියන්න.[1] යෝෂියා-
ගේ කාලයේ සිට අද දක්වාම මා
ඔවුන් ගැන ඔබට පැවසූ සෑම දෙ-
යක්ම එහි ලියන්න.[2] **3** මම ඔවුන්
පිටට ගෙනෙන්න අදහස් කළ විපත්ති
ගැන යූදාහි වැසියන් අසා,[3] තමන් ගිය
වැරදි මාර්ගයෙන් ඉවත් වීමට ඉඩ
තිබේ.[4] එවිට මම ඔවුන් කළ වැරදි-
වලටත් ඔවුන්ගේ පව්වලටත් සමාව
දෙන්නෙමි."[5]

**4** ඉන්පසු යෙරෙමියා, නෙරියාගේ
පුත් බාරුක්ව තමා වෙතට කැඳවා-
ගත්තේය.[6] ඔහු එසේ කළේ තමන්ට
යෙහෝවා දෙවි පැවසූ සියල්ල බාරුක්
ලවා ලියවිල්ලක ලියා තබන පිණි-
සය.[7] **5** යෙරෙමියා බාරුක්ට මෙසේ
පැවසුවේය. "මා දැන් සිටින තත්වය
නිසා මට යෙහෝවා දෙවිගේ ගෘහ-
යට යන්න විදිහක් නැහැ.[8] **6** ඒ
නිසා ඔබ යෙහෝවා දෙවිගේ ගෘහ-
යට යන්න. සෙනඟ නිරාහාරව සිටින
දවසේදී[9] ඔබ එහි ගොස් ඔබ ලියා-
ගත්, මා ඔබට පැවසූ යෙහෝවා දෙ-
විගේ වදන් රැස්ව සිටින සෙනඟට
ඇසෙන සේ කියවන්න.[10] යූදාහි නග-
රවලින් එතැනට පැමිණෙන යූදාහි
සියලු වැසියන්ටත් හොඳින් ඇසෙන
සේ එය කියවන්න.[11] **7** එවිට ඔවුන්
වැරදි මාර්ගවලින් ඉවත් වී[12] තමන්ට
කරුණාව පෙන්වන්න කියා යෙ-
හෝවා දෙවිට යාච්ඤා කිරීමට ඉඩ
තිබේ.[13] මන්ද යෙහෝවා දෙවි මහත්
කෝපයෙන් හා උදහසින් මේ සෙ-
නඟට විරුද්ධව ක්‍රියා කරන බව පවසා
තිබේ."[14]

**8** නෙරියාගේ පුත් බාරුක්,[15] අනා-
ගතවක්තෘ යෙරෙමියා පැවසූ ලෙසම
කළේය. තමා ලියූ යෙහෝවා දෙවිගේ
වදන් සියල්ලන්ට හොඳින් ඇසෙන
සේ ඔහු යෙහෝවා දෙවිගේ ගෘහයේදී[16]
කියෙව්වේය.[17]

**9** යෝෂියාගේ පුත්‍රයා වූ යූදාහි
රජු වූ යෙහෝයාකිම්ගේ පාලන
සමයේ පස්වන අවුරුද්දේ[18] නවවන

**35 පරි.**
1 ද්වි 30:20; යොෂු 14:1; යෙරෙ 7:7
2 2ලේක 36:16
3 1ලේක 2:55
4 යෙරෙ 35:8
5 යෙසා 1:3; යෙරෙ 11:8
6 ද්වි 28:15; ද්වි 29:27; යොෂු 23:15; 2රාජා 23:27; යෙරෙ 15:3; මීකා 3:12
7 හිතෝ 1:24; යෙසා 65:12; යෙසා 66:4; යෙරෙ 7:13; යෙරෙ 26:5; යෙරෙ 32:33
8 2රාජා 10:15
9 නික් 20:12; ද්වි 5:16
10 ගීතා 5:5; යෙරෙ 15:19; ලූක් 21:36
11 එෆී 6:3; කොලො 3:20

**36 පරි.**
12 2රාජා 23:36; යෙරෙ 25:1
13 ද්වි 31:24; යෙරෙ 45:1; එස 2:9
14 යෙරෙ 4:16; යෙරෙ 32:30
15 යෙරෙ 1:5; යෙරෙ 25:9

**2 තීරුව**
1 යෙරෙ 30:2
2 යෙරෙ 1:2; යෙරෙ 25:3
3 යෙරෙ 26:3
4 යෙසා 55:7; යෙරෙ 18:8; එස 33:11; යෝනා 3:8
5 ගීතා 130:4; මීකා 7:18
6 යෙරෙ 32:12
7 යෙරෙ 45:1
8 යෙරෙ 32:2
9 ක්‍රියා 27:9
10 යෙරෙ 7:2; යෙරෙ 22:2
11 යෙරෙ 36:13
12 යෙරෙ 25:5; යෝනා 3:8; සෙක 1:4
13 2ලේක 33:12
14 2ලේක 34:21
15 යෙරෙ 32:12; යෙරෙ 36:4; යෙරෙ 45:2
16 යෙරෙ 7:2
17 නෙහෙ 8:3

18 2රාජා 23:36; යෙරෙ 35:1.

මාසයේදී[1] යෙරුසලමේ වැසියෝ
සියලුදෙනාද යූදාහි නගරවල සිට යෙ-
රුසලමට පැමිණි සියලුදෙනාද යෙ-
හෝවා දෙවිගේ කරුණාව ලබාගැනීම
සඳහා නිරාහාරව සිටීමට තීරණය
කළෝය.[2] **10** යෙරෙමියා පවසන
විට ලියවිල්ලේ සටහන් කරගත් දේ,
බාරුක් යෙහෝවා දෙවිගේ ගෘහ-
යට පැමිණි සියල්ලන්ට ඇසෙන සේ
කියෙව්වේය. ඔහු එය කියෙව්වේ යෙ-
හෝවා දෙවිගේ ගෘහයේ අලුත් දොර-
ටුව අසල[3] පිහිටි ඉහළ මළුවේ තිබූ
පිටපත්කරුවෙකු වූ[4] ෂාපාන්ගේ පුත්[5]
ගෙමරියාගේ[6] කැම කාමරයේ සිටය.[7]

**11** ලියවිල්ලේ සටහන් කර තිබූ
යෙහෝවා දෙවිගේ වදන් බාරුක්
කියවන විට ෂාපාන්ගේ පුත්‍රයා වූ[8]
ගෙමරියාගේ පුත් මීකායා එය අසා-
ගෙන සිටියේය. **12** ඉන්පසු ඔහු රජු-
ගේ මාලිගාවේ තිබූ ලේකම්ගේ කැම
කාමරයට ගියේය. අධිපතීන් සිය-
ලුදෙනා එහි වාඩි වී සිටිනවා ඔහු
දුටුවේය. ලේකම් වන එලිෂාමාද[9] ෂෙ-
මායාගේ පුත් දෙලායාද[10] අක්බෝර්-
ගේ පුත්[11] එල්නාතාන්ද[12] ෂාපාන්ගේ
පුත්[13] ගෙමරියාද[14] හනනියාගේ පුත්
ශෙදකියාද ඔවුන් අතරේ සිටියෝය.
**13** බාරුක් සෙනඟට ඇසෙන සේ ලිය-
විල්ලේ තිබූ දේවල් කියවූ අවස්ථාවේදී
තමාට ඇසුණු සෑම දෙයක්ම මීකායා[15]
ඒ අධිපතීන්ට පැවසුවේය.[16]

**14** මීකායා පැවසූ දේවල් ඇසූ පසු
බාරුක්ව කැඳවාගෙන ඒම සඳහා[17]
අධිපතීහු සියලුදෙනා, කූෂිගේ පුත්‍රයා
වූ ෂෙලෙමියාගේ පුත්‍රයා වූ නෙත-
නියාගේ පුත් යෙහූදීව[18] යැව්වෝය.
ඔවුහු බාරුක්ට මෙසේ පවසන ලෙසද
ඔහුට කීවෝය. "සෙනඟට ඇසෙන්න
ඔබ කියවූ ලියවිල්ලත් රැගෙන මෙ-
හෙට එන්න." යෙහූදී නෙරියාගේ
පුත් බාරුක්ට ඒ පණිවිඩය දුන් විට
බාරුක් ලියවිල්ලත් රැගෙන අධිප-
තීන් සිටි ස්ථානයට පැමිණියේය.[19]
**15** අධිපතීහු, "මෙතැන ඉඳගෙන ඔබ
ළඟ තිබෙන ලියවිල්ලේ සඳහන්
දේ අපිටත් ඇසෙන්න කියවන්න"

**36 පරි.**
1 නෙහෙ 1:1
2 2ලේක 20:3; නෙහෙ 9:1; එස්ත 4:16
3 යෙරෙ 26:10
4 එස්රා 7:6; ගීතා 45:1
5 2රාජා 22:8; යෙරෙ 39:14; එස 8:11
6 යෙරෙ 36:25
7 1ලේක 28:12
8 2ලේක 34:20
9 යෙරෙ 36:20
10 යෙරෙ 36:25
11 2රාජා 22:14; යෙරෙ 26:22
12 යෙරෙ 26:22; යෙරෙ 36:25
13 2රාජා 22:8; යෙරෙ 26:24; යෙරෙ 39:14
14 යෙරෙ 36:10
15 යෙරෙ 36:11
16 යෙරෙ 36:21
17 යෙරෙ 36:26
18 යෙරෙ 36:21
19 යෙරෙ 36:2

**2 තීරුව**
1 යෙරෙ 45:1
2 ආමො 7:10
3 යෙරෙ 36:4
4 3යොහ 13
5 යෙරෙ 36:26
6 යෙරෙ 36:12
7 1ලේක 28:12
8 යෙරෙ 36:10
9 යෙරෙ 36:14
10 2ලේක 34:18
11 යෙරෙ 36:12
12 එස්රා 10:9
13 ආමො 3:15
14 යෙසා 47:14

කියා බාරුක්ට කීවෝය. බාරුක්ද[1]
ඔවුන් සියලුදෙනාට ඇසෙන සේ එය
කියෙව්වේය.

**16** එහි ලියා තිබූ දේ ඇසූ
ඔවුහු සියලුදෙනා මහත් භීතියකින්
යුතුව එකිනෙකා දෙස බලාගත්-
තෝය. ඔවුහු, "අකුරක්වත් නැර
මේ සෑම දෙයක්ම අපි රජුට කියන්න
ඕනේ"[2] කියා බාරුක්ට කීවෝය.
**17** එමෙන්ම ඔවුහු, "ඔබ මේ දේවල්
ලිව්වේ කොහොමද? ඒවා යෙරෙමි-
යාද ඔබට කිව්වේ"[3] කියා බාරුක්-
ගෙන් ඇසුවෝය. **18** එවිට බාරුක්,
"ඔව්, යෙරෙමියා කියද්දී මම මේ සියලු
දේ තීන්තවලින් ලියාගත්තා"[4] කියා
ඔවුන්ට පැවසුවේය. **19** එවිට අධිප-
තීහු, "දැන් ඉක්මනට ගිහින් කිසිවෙ-
කුට සොයාගන්න බැරි තැනක ඔබත්
යෙරෙමියාත් හැංගෙන්න"[5] කියා කිය-
මින් බාරුක්ව පිටත් කර හැරියෝය.

**20** ඉන්පසු ඔවුහු ඒ ලියවිල්ල ලේ-
කම් වන එලිෂාමාගේ[6] කැම කාමරයේ
සුරක්ෂිතව තබා,[7] රජුව හමු වීමට
රජමාලිගාවේ මළුවට ගියෝය.[8] ඔවුහු
ලියවිල්ලේ තිබූ සෑම දෙයක්ම රජුට
දැන්වූවෝය.

**21** රජ ඒ දේවල් ඇසූ පසු එම ලිය-
විල්ල ගෙන ඒමට යෙහූදීව යැව්වේය.[9]
ඔහුද ලේකම් වන[10] එලිෂාමාගේ
කැම කාමරයට ගොස්[11] එය රැගෙන
ආවේය. ඉන්පසු යෙහූදී ලියවිල්ලේ
තිබූ දේ රජුටත් ඔහු අසල සිට-
ගෙන සිටි අධිපතීන්ටත් ඇසෙන සේ
කියෙව්වේය. **22** මේ දේ සිදු වූයේ
නවවන මාසයේදීය.[12] ඒ වන විට රජ
සිටියේ ශීත කාලය ගත කරන මාලි-
ගාවේය.[13] ඔහු හිඳගෙන සිටි ස්ථානය
අසල උණුසුම ලබා දීම සඳහා ගිනි
දැල්වූ භාජනයක්[14] තිබිණ. **23** යෙ-
හූදී ලියවිල්ලෙන් කොටස් තුන හත-
රක් කියවා අවසන් වනවාත් සමඟම,
රජ තම ලේකම්ගේ පිහියෙන් එම
කොටස ඉරා භාජනයේ ඇවිළෙමින්
තිබූ ගින්නට දැමුවේය. ඔහු ලියවිල්-
ලේ ඉතුරු කොටස්ද එලෙස ඉරා ඇවි-
ළෙන ගින්නට දමා මුළු ලියවිල්ලම

දවා දැමීය.[1] **24** රජවත් ලියවිල්ලේ
සඳහන් දේ කියවන විට අසාගෙන
සිටි ඔහුගේ සේවකයන්ගෙන් කිසි-
වෙක්වත් ලියවිල්ලේ සඳහන් දේට
කිසිසේත් භය වූයේ නැත.[2] ඔවුහු
තම වස්ත්‍ර ඉරා නොගත්තෝය.[3]
**25** එල්නාතාන්ද[4] දෙලායාද[5] ගෙම-
රියාද[6] ලියවිල්ල ගින්නට නොද-
මන ලෙස රජුගෙන් අයැද සිටියත්
ඔහු ඔවුන්ගේ ඉල්ලීම ගණනකටවත්
ගත්තේ නැත.[7] **26** රජ, අනාගත-
වක්තෘ යෙරෙමියාව[8] සහ ඔහුගේ ලේ-
කම් වන බාරුක්ව අල්ලාගෙන එන
ලෙස රාජ පුත්‍රයෙකු වූ යෙරාමෙයෙල්-
ටද අශ්‍රියෙල්ගේ පුත්‍රයා වූ සෙරායාටද
අබ්දෙයෙල්ගේ පුත්‍රයා වූ ෂෙලෙමියා-
ටද අණ කළේය. නමුත් යෙහෝවා
දෙවි ඔවුන් දෙදෙනාව සඟවා තැබීය.[9]
**27** යෙරෙමියා පැවසූ දේවල්[10]
බාරුක්[11] විසින් සටහන් කර තැබූ
ලියවිල්ල රජු ගින්නෙන් විනාශ කර
දැමූ පසු යෙහෝවා දෙවිගෙන් යෙරෙ-
මියාට තවත් පණිවිඩයක් ලැබුණේය.
එම පණිවිඩය මෙයයි. **28** “තවත්
ලියවිල්ලක් ගෙන, යූදාහි රජු වන යෙ-
හෝයාකිම් පුලුස්සා දැමූ[12] ලියවිල්ලේ
සඳහන්ව තිබූ සෑම දෙයක්ම ඒ විදි-
හටම එහි ලියන්න. **29** ඔබ යූදාහි
රජු වන යෙහෝයාකිම්ට විරුද්ධව මේ
දේත් කියන්න. ‘යෙහෝවා දෙවි පව-
සන්නේ මෙයයි. “ ‘ “බැබිලෝනියේ රජු
ඇවිත් මේ දේශය විනාශ කර මෙහි
සිටින මිනිසුන්වත් සතුන්වත් පහ කර
දමනවා”[13] කියා මේ ලියවිල්ලේ සඳ-
හන් වන්නේ ඇයි’[14] කියා අසමින් ඔබ
එය පුලුස්සා දැමුවෙහිය.[15] **30** එබැ-
වින් යූදාහි රජු වන යෙහෝයාකිම්
වන ඔබට විරුද්ධව යෙහෝවා දෙවි
මෙසේ පවසන්නේය. ‘ඔබේ පරම්-
පරාවෙන් පැමිණෙන කිසිවෙක් දාවිත්-
ගේ සිංහාසනයේ හිඳගන්නේ නැත.[16]
ඔබේ මළ කඳ පිටතට වීසි කර
දමනු ඇත.[17] දවාලේ හිරු රශ්මියටත්
රාත්‍රියේ සීතලටත් එය ගොදුරු වන්-
නේය. **31** මම ඔබටත්[18] ඔබේ
පැවතෙන්නන්ටත් ඔබේ සේවකයන්-
ටත්[1] ඔබ සියලුදෙනා කළ වරදට දඬු-
වම් කරන්නෙමි. මම ඔබ සියලුදෙනා
පිටටත් යෙරුසලමේ වැසියන් පිට-
ටත් යූදාහි වැසියන් පිටටත් ගෙනෙන
බවට ප්‍රකාශ කළ සෑම විපතක්ම අනි-
වාර්යයෙන්ම ගෙනෙන්නෙමි.[2] මන්ද
ඔබෙන් කිසිවෙක් මට සවන් දුන්නේ
නැත.’ ” ’ ”[3]
**32** එවිට යෙරෙමියා තවත් ලිය-
විල්ලක් ගෙන තම ලේකම් ලෙස සේ-
වය කළ[4] නෙරියාගේ පුත් බාරුක්ට
එය දුන්නේය. ඔහුද යූදාහි රජු වන
යෙහෝයාකිම් පුලුස්සා දැමූ ලියවිල්-
ලේ සඳහන්ව තිබූ සියලු දේ[5] නැව-
තත් යෙරෙමියා පවසන විට එහි
ලිව්වේය.[6] මුල් ලියවිල්ලේ සඳහන්ව
තිබූ දේවලට අමතරව තවත් බො-
හෝ තොරතුරුද ඒ ලියවිල්ලට ඇතු-
ළත් විය.

**37** බැබිලෝනියේ රජු වූ නෙබු-
කද්රෙෂර්, යූදා දේශය පාල-
නය කිරීම සඳහා[7] යෙහෝයාකිම්ගේ
පුත්‍රයා වූ[8] කොනියා[9] වෙනුවට යොෂි-
යාගේ පුත්‍රයා වූ[10] ශෙදකියාව[11] පත්
කළේය. **2** යෙහෝවා දෙවි අනා-
ගතවක්තෘ යෙරෙමියා මාර්ගයෙන්
පැවසූ දේවලට[12] ශෙදකියා රජවත්
ඔහුගේ සේවකයෝවත් දේශයේ වැසි-
යෝවත් ඇහුම්කන් නොදුන්නෝය.[13]
**3** නමුත් ශෙදකියා රජ ෂෙලෙ-
මියාගේ පුත් යෙහුකල්වද[14] පූජක
මයසේයාගේ පුත්[15] ශෙපනියාවද[16]
අනාගතවක්තෘ යෙරෙමියා වෙතට
යවා, මෙම පණිවිඩය ඔහුට දන්-
වන ලෙස ඔවුන්ට පැවසුවේය. “අපි
වෙනුවෙන් අපේ දෙවි වන යෙහෝ-
වාට යාච්ඤා කරන්න කියා අපි
ඔබෙන් ඉල්ලා සිටිනවා.”[17] **4** ඒ
වන විට ඔවුන් යෙරෙමියාව සිරගෙයි
දමා නොතිබුණේය. එබැවින් ඔහුට
තමන් කැමති තැනකට ගොස් සෙ-
නඟව හමු වීමේ නිදහස තිබුණේය.[18]
**5** පාරාවෝගේ යුධ හමුදාව ඊජිප්තු
දේශයේ සිට පැමිණෙන බව[19] යෙරුස-
ලම වටලා සිටි කල්දිවරුන්ට ආරංචි
විය. එබැවින් ඔවුහු යෙරුසලමෙන්

---

**36 පරි.**
**1** ගීතා 50:17, යෙසා 28:14
**2** ගීතා 36:1
**3** 2රාජා 19:1, යෙසා 36:22, මතෙ 26:65
**4** 2රාජා 24:8, යෙරෙ 26:22
**5** යෙරෙ 36:12
**6** යෙරෙ 36:10
**7** හිතෝ 21:29
**8** යෙරෙ 1:5, මතෙ 27:9
**9** 1රාජා 17:3, යෙරෙ 1:19, 2පේතෘ 2:9
**10** යෙරෙ 36:2
**11** යෙරෙ 32:12, යෙරෙ 45:1
**12** යෙරෙ 36:23
**13** යෙරෙ 21:4, යෙරෙ 32:28, යෙරෙ 34:21
**14** යෙසා 30:10, ආමෝ 5:10
**15** යෙරෙ 36:23
**16** 2රාජා 24:8, 2රාජා 24:15, 2ලේක 36:10, යෙරෙ 22:30
**17** යෙරෙ 22:19
**18** යෙරෙ 21:14

**2 තීරුව**
**1** යෙසා 3:11
**2** ද්වි 28:15, හිතෝ 29:1, යෙරෙ 19:15, යෙරෙ 35:17
**3** 2ලේක 36:16
**4** යෙරෙ 36:2
**5** යෙරෙ 36:23
**6** යෙරෙ 36:4, රෝම 16:22

**37 පරි.**
**7** 2රාජා 24:17, 2ලේක 36:10
**8** 2රාජා 24:6, ආනි 1:1
**9** 2රාජා 24:12, 1ලේක 3:16, 2ලේක 36:9, යෙරෙ 22:24
**10** 2රාජා 23:28
**11** 2රාජා 24:18, 1ලේක 3:15
**12** හොෂෙ 12:10
**13** 2රාජා 24:19
**14** යෙරෙ 38:1
**15** යෙරෙ 29:25
**16** 2රාජා 25:18, යෙරෙ 21:1, යෙරෙ 52:24
**17** යෙරෙ 21:2, යෙරෙ 42:2
**18** යෙරෙ 32:2, යෙරෙ 37:15
**19** එස 17:15

ඉවත්ව ගියෝය.[1] 6 එවිට අනා-
ගතවක්තෘ යෙරෙමියාට යෙහෝවා
දෙවිගෙන් මෙම පණිවිඩය ලැබු-
ණේය. 7 “ඊශ්‍රායෙල්හි දෙවි වන යෙ-
හෝවා මෙසේ පවසන්නේය. ‘මාගෙන්
කාරණා විමසන පිණිස ඔබව මා වෙ-
තට එවූ යූදාහි රජුට මේ දේ කියන්න.[2]
“ඔබේ උපකාරයට පැමිණෙන පාරා-
වෝගේ යුධ හමුදාවට ඔවුන් පැමිණි
ඊජිප්තු දේශයටම නැවත හැරී යන්න
සිදු වේ.[3] 8 නමුත් යෙරුසලමෙන්
ඉවත්ව ගිය කල්දිවරු නැවත පැමිණ
මේ නගරයට විරුද්ධව යුද්ධ කර එය
යටත් කරගන්නෝය. ඔවුහු නගරයට
ගිනි තබා එය විනාශ කර දමන්-
නෝය.”[4] 9 යෙහෝවා දෙවි මෙසේද
පවසන්නේය. “ ‘කල්දිවරුන් නැවත
අපට විරුද්ධව සටන් කරන්න එන
එකක් නැහැ’ කියා සිතමින් ඔබවම
රවටා නොගන්න.[5] මන්ද ඔවුහු ඔබට
විරුද්ධව කරන සටන කිසිසේත් අත්-
හරින්නේ නැත. 10 ඔබට විරුද්ධව
සටන් කරන කල්දිවරුන්ගේ මුළු යුධ
හමුදාවටම ඔබ පහර දුන්නත්[6] ඔබට
ජය ගැනීමට ලැබෙන්නේ නැත. මන්ද
ඔවුන් අතරින් ඉතුරු වී සිටින එනම්,
දරුණු ලෙස තුවාල වී[7] කූඩාරම්වල
වැටී සිටින අය පැමිණ මේ නගරයට
ගිනි තබා එය විනාශ කර දමන බව
ස්ථිරයි.” ’ ”

11 ඊජිප්තුවෙන් පැමිණි පාරාවෝ-
ගේ යුධ හමුදාව නිසා[8] යෙරුස-
ලම වටලා සිටි කල්දිවරුන්ගේ යුධ
හමුදාව එතැනින් ඉවත්ව ගිය අවස්-
ථාවේදී[9] 12 යෙරෙමියා තම සෙ-
නඟ අතරේ තිබූ තමාගේ ඉඩම
ලබාගන්නා පිණිස යෙරුසලමෙන්
පිටත්ව බෙන්ජමින් දේශය බලා ගමන්
කළේය.[10] 13 යෙරෙමියා බෙන්ජ-
මින් දොරටුව අසලට පැමිණි විට[11]
හනනියාගේ පුත්‍රයා වූ ෂෙලෙමියා-
ගේ පුත් ඉරියා නම් නිලධාරියා එහි
සිටියේය. ඔහු දොරටුව අසල සිටින
ප්‍රධාන ආරක්ෂක නිලධාරියා විය.
ඉරියා, අනාගතවක්තෘ යෙරෙමියාව
දුටු විගස ඔහුව අල්ලාගෙන, “ඔබ
කල්දිවරුන්ට භාර වෙන්නද යන්නේ”
කියා ඔහුගෙන් ඇසුවේය. 14 නමුත්
යෙරෙමියා, “නැහැ! නැහැ![1] මම කල්-
දිවරුන්ට භාර වෙන්න නෙවෙයි යන්-
නේ” කියා පිළිතුරු දුන්නේය. නමුත්
ඉරියා, යෙරෙමියා පැවසූ දේ පිළි
නොගත්තේය. ඔහු යෙරෙමියාව අල්-
ලාගෙන අධිපතීන් ඉදිරියට ගෙන
ගියේය. 15 අධිපතීන්ටද[2] යෙරෙ-
මියා ගැන මහත් කෝපයක් ඇති වී[3]
ඔවුහු ඔහුට පහර දුන්නෝය.[4] ඉන්පසු
ඔවුහු යෙරෙමියාව සිරගෙයක් ලෙස
භාවිත කළ[5] යෙහොනාතාන් නමැති
ලේකම්වරයාගේ නිවසෙහි[6] සිර කර
තැබුවෝය.[7] 16 එහි තිබූ උමං කුටි-
යක[8] යෙරෙමියාට බොහෝ කාලයක්
සිරගත වී සිටීමට සිදු විය.

17 කලක් ගත වූ පසු ශෙදකියා රජ
යෙරෙමියාව තම මාලිගාවට ගෙන්වා-
ගත්තේය. රජ කාටත් නොපෙනෙන
ස්ථානයකට ඔහුව ගෙන ගොස්,[9]
“යෙහෝවා දෙවිගෙන් ඔබට පණිවිඩ-
යක් ලැබුණාද” කියා ඔහුගෙන් ඇසු-
වේය. එවිට යෙරෙමියා, රජුට මෙසේ
පිළිතුරු දුන්නේය. “ඔව්, මට පණිවි-
ඩයක් ලැබුණා. ඔබ බැබිලෝනියේ
රජුගේ අතට අනිවාර්යයෙන්ම හසු
වෙනවා කියා දෙවි මට පැවසුවා.”[10]

18 ඉන්පසු යෙරෙමියා, ශෙදකියා
රජුගෙන් මෙසේ ඇසුවේය. “මාව සිර
කර තබන්න තරම් මම ඔබටත්
ඔබේ සේවකයන්ටත් මේ සෙනඟ-
ටත් විරුද්ධව කළ වරද කුමක්ද?[11]
19 ‘බැබිලෝනියේ රජු ඔබටවත් මේ
දේශයටවත් විරුද්ධව සටන් කරන්න
එන්නේ නැහැ’ කියා අනාවැකි පැවසූ
ඔබේ අනාගතවක්තෘවරුන්ට මො-
කද වුණේ?[12] 20 මගේ ස්වාමීන් වන
රජ්ජුරුවනි, මම කියන දේට ඇහුම්-
කන් දෙන්න. අනේ, මගේ ඉල්ලීම
නොසලකා හරින්න එපා.[13] මාව ලේ-
කම් වන යෙහොනාතාන්ගේ නිවසට
නම් නැවත යවන්න එපා.[14] එහි දිග-
ටම මට ඉන්න සිදු වුණොත් මම
මැරිලා යයි.”[15] 21 එබැවින් ශෙද-
කියා රජ, යෙරෙමියාව සිරගෙයි භාර-

37 පරි.
1 යෙරෙ 34:21
2 යෙරෙ 21:2
3 යෙසා 30:3
යෙසා 31:3
යෙරෙ 17:5
විලා 4:17
එස 17:17
4 යෙරෙ 32:29
යෙරෙ 34:22
යෙරෙ 38:23
යෙරෙ 39:8
5 ඔබ 3
6 යෙරෙ 21:4
7 යෙරෙ 51:4
8 එස 17:15
9 යෙරෙ 34:21
යෙරෙ 37:5
10 යොෂු 18:28
යෙරෙ 1:1
11 යෙරෙ 38:7

2 තීරුව
1 ගීතා 27:12
ගීතා 35:11
2 යෙරෙ 38:4
3 යෙරෙ 26:11
4 ලූක් 20:10
2කොරි 11:23
හෙබ්‍රෙ 11:36
5 යෙරෙ 37:4
6 යෙරෙ 38:26
7 2ලේක 16:10
යෙරෙ 20:2
ක්‍රියා 5:18
ක්‍රියා 12:6
8 යෙරෙ 38:6
9 යෙරෙ 38:14
10 යෙරෙ 21:7
යෙරෙ 24:8
යෙරෙ 34:21
එස 12:13
11 1සාමු 26:18
12 යෙරෙ 14:13
යෙරෙ 23:17
යෙරෙ 27:14
යෙරෙ 28:2
විලා 2:14
13 යෙරෙ 36:7
14 යෙරෙ 37:15
15 යෙරෙ 26:15
යෙරෙ 38:9

කරුවන් යටතේ මුරකරුගේ මළුවේ
තිබූ ගොඩනැඟිල්ලක තබන ලෙස
අණ කළේය.[1] නගරයේ රොටි පිලිස්-
සීම නතර වන තෙක්ම[2] යෙරෙමියාට
රොටි සාදන්නන්ගේ වීථියෙන් දිනප-
තාම රොටියක් බැගින් ලැබිණ.[3] ඔහු
සිරගෙයි භාරකරුවන් යටතේ මුරක-
රුගේ මළුවෙහි දිගටම සිටියේය.[4]

**38** යෙරෙමියා සෙනඟට පැවසූ
මේ සියල්ල[5] මත්තාන්ගේ
පුත්‍රයා වූ ෂෙපටියාටද පෂ්හූර්ගේ
පුත්‍රයා වූ ගෙදලියාටද ෂෙලෙමියා-
ගේ පුත්‍රයා වූ යූකල්ටද[6] මල්කියා-
ගේ පුත්‍රයා වූ පෂ්හූර්ටද[7] ආරංචි විය.
**2** “යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. ‘කෙනෙකු දිගටම මේ නගර-
යේ රැඳී සිටියොත් ඔහුට කඩුවෙන්ද[8]
සාගතයෙන්ද[9] වසංගතවලින්ද[10] පහර
කෑමට සිදු වන්නේය. නමුත්
යමෙකු නගරයෙන් පිට වී කල්දිව-
රුන්ට භාර වුණොත් තම දිවි ගල-
වාගැනීමට ඔහුට හැකි වන්නේය.’[11]
**3** යෙහෝවා දෙවි තවදුරටත් මෙසේ
පවසන්නේය. ‘බැබිලෝනියේ රජුගේ
යුධ හමුදාව මේ නගරය අල්ලාගන්-
නේය. ඔහු අනිවාර්යයෙන්ම මෙය
යටත් කරගන්නේය.’ ”[12]
**4** එවිට අධිපතීහු රජුට මෙසේ
කීවෝය. “මේ මිනිසාව මරා
දමන්න.[13] ඔහු කියන දේවල් නිසා[14]
මේ නගරයේ ඉතුරු වී සිටින යුධ භට-
යනුත් සෙනඟත් අධෛර්යයට පත්
වෙනවා. ඔහු කරන මේ දෙයින් සෙ-
නඟට සිදු වන්නේ ශුභසිද්ධියක් නො-
වෙයි. ඔහු මඟ පාදන්නේ ඔවුන්ගේ
විනාශයටයි.” **5** එවිට ශෙදකියා රජ
“ඔබ කැමති දෙයක් ඔහුට කරන්න.
ඔබට විරුද්ධ වෙන්න මට බැහැ”[15]
කියා ඔවුන්ට කීවේය.
**6** පසුව ඔවුහු යෙරෙමියාව රාජ
පුත්‍රයෙකු වූ මල්කියාට අයිතිව තිබූ
ළිඳකට ලණුවලින් බැස්සුවෝය.[16]
එය තිබුණේ මුරකරුගේ මළුවේය.[17]
එම ළිඳ වතුරින් නොව මඩින් පිරී තිබූ
නිසා යෙරෙමියා මඩේ එරුණේය.[18]
**7** ඔවුන් යෙරෙමියාට කළ දේ රජ-
මාලිගාවේ සේවය කළ ඉතියෝ-
පිය ජාතික නිලධාරියෙකු වූ
ඒබෙද්-මෙලෙක්ට[1] ආරංචි විය. ඒ
අවස්ථාවේදී රජ, බෙන්ජමින් දොර-
ටුව අසල වාඩි වී සිටියේය.[2] **8** එබැ-
වින් ඒබෙද්-මෙලෙක් රජමාලිගාවෙන්
පිටත්ව ගොස් රජුව හමු වී ඔහුට
මෙසේ කීවේය. **9** “මගේ ස්වාමීන්
වන රජ්ජුරුවනි, ඔවුන් අනාගත-
වක්තෘ යෙරෙමියාට සලකා තිබෙන්-
නේ ඉතා කෲර විදිහටයි. ඔවුන් ඔහුව
ළිඳකට ඇද දමලා. කන්න බොන්න
කිසි දෙයක් නැතුව[3] ඔහු එහිම මිය
යයි.[4] මන්ද සාගතය නිසා නගර-
යේ තවදුරටත් රොටි පුලුස්සන්නේ
නැහැ.”
**10** එවිට රජ, “ඔබ මෙහි සිටින
මිනිසුන් තිස්දෙනෙකුව රැගෙන ඉක්-
මනට එතැනට යන්න. අනාගත-
වක්තෘ යෙරෙමියා මිය යන්න
කලින් ඔහුව ළිඳෙන් එළියට ගන්න”[5]
කියා ඉතියෝපිය ජාතික ඒබෙද්-
මෙලෙක්ට කීවේය. **11** රජුගේ අණ
පරිදි ඒබෙද්-මෙලෙක් ඒ මිනිසුන්වත්
රැගෙන රජුගේ මාලිගාවේ භාණ්ඩාගා-
රයට පහතින් තිබූ කාමරයට ගොස්[6]
පරණ රෙදි කැබලි කිහිපයක් ගත්-
තේය. ඔහු ගත් ඒ රෙදි කැබලි ලණු-
වක් ආධාරයෙන් ළිඳේ සිටි යෙරෙමියා
වෙතට බැවේය.[7] **12** ඉන්පසු ඉති-
යෝපිය ජාතික ඒබෙද්-මෙලෙක්,
“ඔබට දුන්න ඔය රෙදි කැබලි ඔබේ
කිහිලි යට තබාගෙන ඊට උඩින්
ලණුව දමාගන්න” කියා යෙරෙමියාට
කීවේය. යෙරෙමියා එසේ කළ පසු[8]
**13** ඔවුහු ලණු ආධාරයෙන් ඔහුව
ළිඳෙන් එළියට ගත්තෝය. ඉන්පසු
යෙරෙමියා මුරකරුගේ මළුවෙහි දිග-
ටම සිටියේය.[9]
**14** ශෙදකියා රජ සේවකයෙකු
යවා අනාගතවක්තෘ යෙරෙමියාව
යෙහෝවා දෙවිගේ ගෘහයේ[10] තුන්-
වන දොරටුව අසලට[11] ගෙන්වාගත්-
තේය.[12] යෙරෙමියා එතැනට පැමිණි
විට රජ ඔහුට මෙසේ පැවසීය. “මම
ඔබෙන් යමක් දැනගන්න කැමතියි.

**37 පරි.**
1 නෙහෙ 3:25, යෙරෙ 32:2, යෙරෙ 33:1, යෙරෙ 38:13, යෙරෙ 38:28
2 ද්වි 28:53, 2රාජා 25:3, යෙරෙ 38:9
3 1රාජා 17:6, ගීතා 37:19
4 යෙරෙ 38:13

**38 පරි.**
5 යෙරෙ 21:8
6 යෙරෙ 37:3
7 යෙරෙ 21:1
8 යෙරෙ 21:9
9 යෙරෙ 27:13
10 යෙරෙ 29:18, එස 6:11, එස 7:15
11 යෙරෙ 21:9, යෙරෙ 45:5
12 2රාජා 25:1, 2ලේක 36:17, යෙරෙ 21:10, යෙරෙ 32:3, යෙරෙ 52:4
13 යෙරෙ 26:11
14 ආමො 7:10
15 යොහ 19:16
16 යෙරෙ 38:13
17 යෙරෙ 33:1, යෙරෙ 37:21, යෙරෙ 38:28
18 උත් 37:24, ගීතා 109:5, විලා 3:53

**2 තීරුව**
1 යෙරෙ 39:16, ක්‍රියා 8:27
2 යෙරෙ 37:13
3 යෙරෙ 52:6
4 හිතෝ 24:11
5 ගීතා 75:10, ගීතා 82:4, හිතෝ 21:1
6 2රාජා 20:13
7 හිතෝ 3:27, යෙරෙ 38:6
8 මතෙ 10:41
9 යෙරෙ 37:21
10 යෙරෙ 20:2
11 2රාජා 16:18
12 යෙරෙ 21:1

මගෙන් කිසිවක් නොසඟවා ඇත්-
තම කියන්න."[1] **15** එවිට යෙරෙ-
මියා, ශෙදකියා රජුට මෙසේ පැවසීය.
"මම ඔබට ඇත්ත කිව්වොත් ඔබ
මාව මරා දමන බව මට විශ්වා-
සයි. මම ඔබට උපදෙස් දුන්නත්
ඔබ ඊට ඇහුම්කන් දෙන්නේ නැහැ."[2]
**16** ශෙදකියා රජ රහසින් යෙරෙමි-
යාට මෙසේ දිවුරා පොරොන්දු විය.
"මම ඔබව මරන්නේ නැහැ. ඔබේ
ජීවිතේ විනාශ කර දමන්න සොයන
අයගේ අතට ඔබව හසු කර දෙන්-
නෙත් නැහැ.[3] ඒ බව අපිට ජීවිතේ දුන්
යෙහෝවා දෙවිගේ නාමයෙන් ඔබට
දිවුරා පොරොන්දු වෙනවා."[4]

**17** එවිට යෙරෙමියා, ශෙදකියා
රජුට මෙසේ කීවේය. "ස්වර්ගයේ සේ-
නාවල අධිපතිද[5] ඊශ්‍රායෙල්හි දෙවිද[6]
වන යෙහෝවා මෙසේ පවසන්නේය.
'ඔබ බැබිලෝනියේ රජුගේ අධිප-
තීන්ට යටත් වුණොත්[7] ඔබෙත් ඔබේ
පවුලේ අයගෙත් ජීවිත රැකෙනු ඇත.[8]
මේ නගරයත් ගින්නෙන් විනාශ වී
නොයනු ඇත. **18** නමුත් ඔබ
බැබිලෝනියේ රජුගේ අධිපතීන්ට
යටත් නොවුණොත් මේ නගරය නිසැ-
කවම කල්දිවරුන්ගේ අතට පත් වන්-
නේය. ඔවුහු මේ නගරයට ගිනි තබා
එය විනාශ කර දමනු ඇත.[9] ඔවුන්-
ගේ අතින් ඔබට කිසිසේත් ගැලවීමට
ලැබෙන්නේ නැත.' "[10]

**19** එය ඇසූ ශෙදකියා රජ, යෙ-
රෙමියාට මෙසේ කීවේය. "කල්දිව-
රුන්ට භාර වූ යුදෙව්වරුන් නිසා මට
භයක් දැනෙනවා.[11] ඔවුන් මාව කල්-
දිවරුන්ගේ අතට හසු කර දී කුරිරු
ලෙස මට සලකයි කියා මට භයයි."[12]
**20** නමුත් යෙරෙමියා ඔහුට මෙසේ
කීවේය. "භය වෙන්න එපා. ඔවුන්
ඔබව කල්දිවරුන්ට හසු කර දෙන්-
නේ නැහැ. මම ඔබට පවසන යෙ-
හෝවා දෙවිගේ වදන්වලට කීකරු
වෙන්න. ඔබ එසේ කළොත් ඔබට
කිසි කරදරයක් වෙන්නේ නැහැ.[13]
ඔබට ඔබේ ජීවිතේ රැකගැනීමට හැකි
වෙයි. **21** ඒත් ඔබ කල්දිවරුන්ට
යටත් වුණේ නැත්නම්[1] සිදු වෙන්න
යන දේ ගැන යෙහෝවා දෙවි මට
පෙන්නුවා. **22** බලන්න! යූදා රජු-
ගේ මාලිගාවේ ඉතුරු වී සිටින සියලු
ස්ත්‍රීන්ව[2] බැබිලෝනියේ රජුගේ අධිප-
තීන් ඉදිරියට ගෙන එනු ලබනවා.[3]
එවිට ඔවුහු මෙසේ පවසති.

> 'මිතුරන් මෙන් ඔබ සමඟ සිටි අය
> ඔබව රවටා[4] ඔබට ද්‍රෝහි
> වුණා.[5]
> ඔවුන් ඔබේ පාද මඩේ එරීමට
> සලස්වා ඔබව අත්හැර වෙ-
> නත් මඟක ගියා.'[6]

**23** එබැවින් ඔවුන් ඔබේ භාර්යා-
වන්ව සහ ඔබේ පුත්‍රයන්ව කල්දිව-
රුන් ඉදිරියට ගෙනෙනවා. ඔවුන්ගේ
අතින් ගැලවෙන්න ඔබට ලැබෙන්නේ
නැහැ.[7] බැබිලෝනියේ රජු ඔබව අල්-
ලාගෙන මේ නගරයට ගිනි තබනවා.
ඔබ නිසා එය විනාශ වී යනවා."[8]

**24** එය අසා ශෙදකියා රජ යෙරෙ-
මියාට මෙසේ කීවේය. "ඔබ මට පැවසූ
මේ දේවල් වෙන කාටවත් කියන්න
එපා. කිව්වොත් ඔබට මැරුම් කන්න
සිදු වෙයි. **25** මම ඔබ සමඟ කතා
කළ බව අධිපතීන්ට[9] ආරංචි වී ඔවුන්
ඔබ ළඟට ඇවිත්, 'ඔබ රජු සමඟ
කතා කළේ මොනවාද කියා අපි-
ටත් කියන්න. අපෙන් කිසි දෙයක්
සඟවන්න එපා. රජු මොනවාද කිව්-
වේ කියාත් භය නැතුව කියන්න. අපි
ඔබව මරන්නේ නැහැ' කියා ඔබට
කිව්වොත් **26** ඔබ ඔවුන්ට මෙහෙම
කියන්න. 'මම යෙහොනාතාන්ගේ
නිවසේම මිය යයි කියන භයට නැව-
තත් මාව ඒ නිවසට යවන්න එපා
කියා මම රජුගෙන් ඉල්ලා සිටියා.' "[10]

**27** පසුව සියලුම අධිපතීහු යෙරෙ-
මියා වෙතට පැමිණ ඔහුගෙන් ප්‍රශ්න
කිරීමට පටන්ගත්තෝය. රජු තමාට
අණ කළ ලෙසම යෙරෙමියා ඔවුන්ට
පිළිතුරු දුන්නේය.[11] රජු යෙරෙමියා
සමඟ කතා කළ දේ ඔවුන් දැන
නොගත් නිසා ඔවුහු යෙරෙමියා-
ගේ පිළිතුර අසා ඒ ගැන තවත්
කතා නොකළෝය. **28** යෙරුසලම

**38 පරි.**
1 1සාමු 3:17; 1රාජා 22:16
2 ලූක් 22:67
3 යෙරෙ 15:21; යෙරෙ 26:24
4 උත් 2:7; ද්වි 4:32; යෙසා 57:16; යෙරෙ 27:5
5 ගීතා 80:7
6 1ලේක 17:24; යෙරෙ 31:23
7 2රාජා 25:27
8 යෙරෙ 21:9; යෙරෙ 27:12
9 2රාජා 25:9; යෙරෙ 34:2
10 2රාජා 25:6; යෙරෙ 39:5; යෙරෙ 52:8
11 හිතෝ 29:25
12 1සාමු 31:4
13 2ලේක 20:20; යෙරෙ 7:23; යෙරෙ 26:13

**2 තීරුව**
1 හිතෝ 1:24
2 යෙරෙ 43:6
3 යෙරෙ 39:3
4 ගීතා 41:9; හිතෝ 16:29
5 විලා 1:2
6 යෙරෙ 46:5; යෙරෙ 46:21
7 2රාජා 25:7; 2ලේක 36:20; යෙරෙ 39:6; යෙරෙ 52:8
8 යෙරෙ 52:13
9 යෙරෙ 36:12; යෙරෙ 38:4
10 යෙරෙ 37:15; යෙරෙ 37:20
11 යොෂු 2:5; ගීතා 39:1

යටත් කරගත් දවස දක්වාම[1] යෙරෙ-
මියා මුරකරුගේ මළුවේ කල් ගෙවීය.[2]
පවසා තිබූ සැම දෙයක්ම යෙරුස-
ලම යටත් කරගත් දවසේදී එලෙසම
ඉටු විය.[3]

**39** යූදාහි රජු වූ ශෙදකියා රජ-
කම් කළ නවවන අවුරුද්-
දේ දහවන මාසයේදී[4] බැබිලෝනියේ
රජු වූ නෙබුකද්රෙෂර් ඔහුගේ මුළු
යුධ හමුදාව සමඟ පැමිණ යෙරුසලම
වැටලුවෝය.[5]
**2** ශෙදකියා රජකම් කළ එක-
ළොස්වන අවුරුද්දේ හතරවන මාස-
යේ නවවන දිනයේදී නගරයේ පවුර
බිඳ දමන ලදි.[6] **3** ඉන්පසු නේර්ගල්-
ෂරෙෂෙර්, සම්ගර්-නෙබෝ, සර්සෙ-
කිම්, රබ්සාරිස්* හා රබ්මග්# යන
තනතුර දැරූ නේර්ගල්-ෂරෙෂෙර් යන
අධිපතීන්ද ඇතුළුව බැබිලෝනියේ
රජුගේ අධිපතීහු සියලුදෙනා යෙරුස-
ලමට ඇතුල් වී මැද දොරටුව අසල
හිඳගත්තෝය.[7]
**4** යූදාහි රජු වූ ශෙදකියාත් මුළු
යුධ හමුදාවත් ඔවුන්ව දැක, රජුගේ
උයන අසල පිහිටි[8] තාප්ප දෙක අත-
රේ තිබූ දොරටුවෙන් පිට වී රාත්‍රි-
යේදී පලා ගියෝය.[9] ඔවුන් එසේ
පලා ගියේ අරබා නිම්නය[10] වෙතට
යන මාර්ගයේය. **5** නමුත් කල්දිව-
රුන්ගේ හට පිරිසක් ඔවුන් පසුපස
ලුහුබැඳ ගොස්[11] යෙරිකෝවේ පාළු-
කරයේදී ශෙදකියා රජුව අල්ලා-
ගත්තෝය.[12] ඉන්පසු ඔවුහු හමාත්
දේශයේ[13] රිබ්ලාහි සිටි බැබිලෝනියේ
රජු වූ නෙබුකද්රෙෂර් වෙතට ඔහුව
ගෙන ගියෝය.[14] ඔවුන් එසේ කළේ
ඔහු සම්බන්ධයෙන් රජුගෙන් තීන්දු-
වක් ගන්නා පිණිසය.[15] **6** බැබිලෝ-
නියේ රජ ශෙදකියාගේ පුත්‍රයන්ව
රිබ්ලාහිදී ශෙදකියා රජු ඉදිරියේම[16]
මරා දැමුවේය.[17] යූදාහි වංශවත් සිය-
ලුදෙනාවද මරා දැමුවේය.[18] **7** ඉන්-
පසු ඔහු, ශෙදකියා රජුගේ ඇස් අන්ධ
කර,[1] තඹ විලංගු දමා ඔහුව බැබිලෝ-
නියට ගෙන ගියේය.
**8** ශෙදකියා රජුගේ මාලිගාවද සෙ-
නඟගේ ගෙවල් දොරවල්ද කල්දිවරු
ගිනි තබා විනාශ කර දැමුවෝය.[2]
යෙරුසලමේ පවුරද ඔවුහු සම්පූර්-
ණයෙන්ම කඩා බිඳ දැමුවෝය.[3]
**9** ආරක්ෂක හටයන්ගේ ප්‍රධානියා වූ[4]
නෙබුෂරදාන්,[5] නගරයේ ඉතුරු වී සිටි
සෙනඟවද කල්දිවරුන්ට භාර වූ සෙ-
නඟවද ඉතුරු වී සිටි අනික් සියලුදෙ-
නාවද බැබිලෝනියට වහලුන් ලෙස
ගෙන ගියේය.[6]
**10** ආරක්ෂක හටයන්ගේ ප්‍රධා-
නියා වූ නෙබුෂරදාන් යූදා දේශයේ
රැඳී සිටීමට ඉඩහැරියේ අසරණව සිටි
සාමාන්‍ය ජනතාවට පමණය.[7] ඔහු
එදින ඔවුන්ට වැඩ නියම කර බලා
කියා ගැනීම සඳහා මිදිවතුද භාර දී
ගියේය.[8]
**11** බැබිලෝනියේ රජු වූ නෙබු-
කද්රෙෂර්, යෙරෙමියාට මෙසේ කරන
ලෙස ආරක්ෂක හටයන්ගේ ප්‍රධා-
නියා වූ නෙබුෂරදාන්ට අණ කළේය.
**12** “ඔබ යටතේම ඔහුව තබා-
ගෙන ඔහුට හොඳින් සලකන්න.
ඔහුට කිසිම කරදරයක් වෙන්න ඉඩ
තියන්න එපා.[9] ඔහු ඔබෙන් ඉල්ලා
සිටින දේවල් ඔහුට ඉටු කර
දෙන්න.”[10]
**13** එබැවින් ආරක්ෂක හටයන්ගේ
ප්‍රධානියා වූ නෙබුෂරදාන්ද[11] රබ්සා-
රිස් නම් තනතුර දැරූ නෙබුෂ්ෂ-
බාන්ද රබ්මග් නම් තනතුර දැරූ
නේර්ගල්-ෂරෙෂෙර්ද බැබිලෝනියේ
රජු යටතේ සිටි ප්‍රධානියෝ සියලු-
දෙනාද **14** මුරකරුගේ මළුවේ තිබූ
ගොඩනැගිල්ලක සිර කර සිටි යෙ-
රෙමියාව ගෙන්වාගෙන[12] ෂාපාන්ගේ
පුත්‍රයා වූ[13] අහිකාම්ගේ පුත්[14] ගෙදලි-
යාට භාර දුන්නෝය.[15] ඔවුන් එසේ
කළේ ගෙදලියා සමඟ ඔහුගේ නිවසට
ගොස් තම සෙනඟ සමඟ ජීවත් වීමට
යෙරෙමියාට හැකි වන පිණිසය.

---

යෙරෙ **39:3*** හෝ, “රජමාලිගාවේ සිටින ප්‍රධාන නිලධාරියා.” **3#** හෝ, “මායාකාරයන්ගේ ප්‍රධානියා.”

**38 පරි.**
1 ගීතා 23:4
යෙරෙ 15:20
යෙරෙ 37:21
යෙරෙ 39:14
2 යෙරෙ 32:2
යෙරෙ 33:1
3 2රාජා 25:8
2ලේක 36:17

**39 පරි.**
4 එස 24:1
5 2රාජා 25:2
යෙරෙ 52:4
6 2රාජා 25:4
යෙරෙ 52:7
එස 33:21
7 යෙරෙ 1:15
8 2රාජා 25:4
9 ද්වි 28:25
10 ද්වි 1:7
11 යෙරෙ 32:4
යෙරෙ 38:18
12 යොෂු 5:10
යෙරෙ 52:8
13 යොෂු 13:5
විනි 3:3
2රාජා 17:24
14 2රාජා 23:33
2රාජා 25:6
2රාජා 25:21
යෙරෙ 52:26
15 යෙරෙ 52:9
16 ද්වි 28:34
යෙසා 13:16
17 2රාජා 25:7
යෙරෙ 52:10
18 යෙරෙ 21:7
යෙරෙ 34:19

**2 තීරුව**
1 2රාජා 25:7
යෙරෙ 52:11
එස 12:13
2 2රාජා 25:9
2ලේක 36:19
යෙසා 5:9
යෙරෙ 38:18
3 2රාජා 25:10
නෙහෙ 1:3
යෙරෙ 52:14
4 2රාජා 25:20
යෙරෙ 40:1
5 යෙරෙ 52:12
6 2රාජා 25:11
7 යෙරෙ 52:16
8 2රාජා 25:12
9 යෙරෙ 40:4
10 හිතෝ 16:7
හිතෝ 21:1
11 2රාජා 25:20
යෙරෙ 40:1
යෙරෙ 52:12
12 යෙරෙ 38:28
13 2රාජා 22:8
14 2ලේක 34:20
යෙරෙ 26:24
15 2රාජා 25:22
යෙරෙ 40:5
යෙරෙ 41:2

**15** යෙරෙමියාව මුරකරුගේ මළු-
වේ තිබූ ගොඩනැඟිල්ලක සිර කර සිටි
කාලයේදී යෙහෝවා දෙවිගෙන් මෙම
පණිවිඩය ඔහුට ලැබිණ.[1] **16** "ඔබ
ගොස් ඉතියෝපිය ජාතික ඒබෙද්-
මෙලෙක්ට[2] මේ දේ පවසන්න. 'ස්වර්-
ගයේ සේනාවල අධිපතිද ඊශ්‍රායෙල්හි
දෙවිද වන යෙහෝවා මෙසේ පව-
සන්නේය. "මෙම නගරය පිටට යහ-
පත නොව විපත්ති ගෙනෙන බව මම
පැවසුවෙමි. ඒ වදන් මම එලෙසම ඉටු
කරන්නෙමි.[3] මා පැවසූ සෑම දෙයක්ම
ඒ දවසේදී ඔබ බලා සිටියදීම සිදු වනු
ඇත."'[4]

**17** "'යෙහෝවා දෙවි මෙසේද පව-
සන්නේය. "නමුත් ඒ දවසේදී මම
ඔබව ගලවාගන්නෙමි.[5] ඔබ භයෙන්
සිටින මිනිසුන්ගේ අතට ඔබව හසු
වීමට මම ඉඩ නොදෙන්නෙමි."'[6]

**18** "'"ඔබ කඩුවෙන් විනාශ වන්-
නේ නැත. ඔබට ගැලවී යෑමට මාර්ග-
යක් මම සලසා දෙන්නෙමි. ඔබ මා
කෙරෙහි විශ්වාසය තැබූ නිසා[7] ඔබේ
ජීවිතය ආරක්ෂා වන්නේය"'[8] කියා
යෙහෝවා දෙවි පවසන්නේය."

**40** ආරක්ෂක භටයන්ගේ ප්‍රධා-
නියා වූ නෙබුෂරදාන්[9] යෙරු-
සලමේ සහ යූදාහි වැසියන්ව වහලුන්
ලෙස රැගෙන යද්දී යෙරෙමියාවද
විලංගු දා රැගෙන ගියේය. නමුත්
බැබිලෝනියට යන අතරතුර ඔහු
යෙරෙමියාව රාමාහිදී[10] නිදහස් කර
හැරියේය.[11] ඉන්පසු යෙහෝවා දෙවි-
ගෙන් යෙරෙමියාට පණිවිඩයක්
ලැබිණ. **2** ආරක්ෂක භටයන්ගේ
ප්‍රධානියා යෙරෙමියාව නිදහස් කළ
අවස්ථාවේදී ඔහුට මෙසේ කීවේය.
"මේ ස්ථානයට සිදු වූ විපත ගැන
ඔබේ දෙවි වන යෙහෝවා කලින්
ප්‍රකාශ කළා.[12] **3** යෙහෝවා දෙවි
තමන් ප්‍රකාශ කළ ඒ විපත්ති ගෙන
ඒමට තීරණය කළේ ඔබේ සෙනඟ
යෙහෝවා දෙවිට විරුද්ධව පව් කළ
නිසයි. ඔවුන් ඔහුගේ හඬට අකීකරු
වූ නිසයි.[13] **4** ඔබේ අත්වල දමා
තිබෙන විලංගු ගලවා අද මම ඔබව
නිදහස් කරනවා. ඔබ කැමති නම්
මාත් සමඟ බැබිලෝනියට යන්න
එන්න. එහිදී මම ඔබව රැකබලා
ගන්නම්.[1] නමුත් ඔබ බැබිලෝනියට
යන්න අකමැති නම් මේ දේශයේ
කැමති තැනකට ගොස් ජීවත් වෙන්න
ඔබට නිදහස තිබෙනවා."[2]

**5** නමුත් යෙරෙමියා දෙගිඩියාවෙන්
සිටින බව දුටු නෙබුෂරදාන් ඔහුට
තවදුරටත් මෙසේ කීවේය. "යූදාහි
නගරවල ඉතුරු වී සිටින සෙනඟව
බලා කියා ගැනීමට බැබිලෝනියේ
රජ ෂාපාන්ගේ පුත්‍රයා වූ[3] අහිකාම්ගේ
පුත්[4] ගෙදලියාව[5] පත් කර තිබෙනවා.
ඔබ ගොස් ඔහු සමඟ ජීවත් වෙන්න.
ඔබ ඊට අකමැති නම් ඔබ කැමති
තැනකට ගොස් ජීවත් වෙන්න ඔබට
නිදහස තිබෙනවා."[6]

එසේ කී පසු ආරක්ෂක භටයන්-
ගේ ප්‍රධානියා යෙරෙමියාට ආහා-
රත් තෑග්ගකුත් දී යන්න හැරියේය.[7]
**6** ඉන්පසු යෙරෙමියා මිෂ්පාහි[8] සිටි
අහිකාම්ගේ පුත්‍රයා වූ ගෙදලියා වෙතට
ගියේය.[9] දේශයේ ඉතුරුව සිටි සෙනඟ
අතරේ වාසය කරමින් සිටි ගෙදලියා
සමඟ යෙරෙමියාද ජීවත් විය.

**7** බැබිලෝනියේ රජු විසින් අහි-
කාම්ගේ පුත් ගෙදලියාව දේශය
බලා කියා ගැනීමටත් බැබිලෝනි-
යේ වහල්භාවයට ගෙන නොගිය පුරු-
ෂයන්වද ස්ත්‍රීන්වද දරුවන්වද දිළිඳු
අයවද බලා කියා ගැනීමටත්[10] පත්
කර ඇති බව කලක් ගත වූ පසු
පිටිසර පෙදෙස්වල විසිරී සිටි යූදාහි
යුධ හමුදාවේ ප්‍රධානීන්ට[11] හා ඔවුන්-
ගේ භට පිරිසට දැනගැනීමට ලැබිණ.
**8** එබැවින් නෙතනියාගේ පුත්‍රයා වූ
ඉෂ්මායෙල්ද[12] කාරියාගේ පුත්‍රයන් වූ
යෝහානාන්[13] හා යොනාතාන්ද තන්-
හුමෙත්ගේ පුත්‍රයා වූ සෙරායාද නෙ-
ටෝෆා ගමෙහි වැසියෙකු වූ ඒෆයිගේ
පුත්‍රයෝද[14] මයකා නගරයේ වැසි-
යෙකුගේ පුත්‍රයෙකු වූ[15] යෙෂනියාද[16]
ඔවුන්ගේ භට පිරිස්ද[17] මිෂ්පා නගර-
යේ සිටි ගෙදලියා වෙතට ආවෝය.
**9** එවිට ෂාපාන්ගේ පුත්‍රයා වූ[18] අහි-

**39 පරි.**
1 යෙරෙ 32:2
යෙරෙ 36:5
යෙරෙ 37:21
2 යෙරෙ 38:7
3 2ලේක 36:21
දානි 9:12
4 ගීතා 91:8
5 ගීතා 41:1
ගීතා 50:15
ගීතා 91:14
6 2සාමු 24:14
7 1ලේක 5:20
ගීතා 37:3
ගීතා 37:40
ගීතා 84:12
යෙරෙ 17:7
8 යෙරෙ 21:9
යෙරෙ 45:5

**40 පරි.**
9 2රාජා 25:20
යෙරෙ 39:9
යෙරෙ 52:12
10 යොෂු 18:25
විනි 4:5
11 යෙරෙ 39:14
12 ද්වි 29:25
1රාජා 9:9
13 යෙරෙ 50:7
දානි 9:11
රෝම 2:5

**2 තීරුව**
1 යෙරෙ 39:12
2 උත් 20:15
3 2රාජා 22:8
4 2රාජා 22:12
2ලේක 34:20
යෙරෙ 26:24
5 2රාජා 25:22
යෙරෙ 39:14
යෙරෙ 41:2
6 එස්රා 7:6
හිතෝ 16:7
හිතෝ 21:1
යෙරෙ 15:11
7 ක්‍රියා 27:3
8 විනි 20:1
1රාජා 15:22
9 යෙරෙ 39:14
10 2රාජා 25:22
යෙරෙ 39:10
යෙරෙ 52:16
11 2රාජා 25:23
12 2රාජා 25:25
යෙරෙ 41:1
13 යෙරෙ 41:11
යෙරෙ 41:16
යෙරෙ 42:1
14 2සාමු 23:28
1ලේක 2:54
1ලේක 11:30
15 ද්වි 3:14
යොෂු 12:5
16 2රාජා 25:23
යෙරෙ 42:1
17 යෙරෙ 41:3
18 2රාජා 22:8

කාමිගේ පුත්[1] ගෙදලියා[2] ඔවුන්ටත්
ඔවුන් සමඟ පැමිණි භටයන්ටත්
දිවුරා[3] මෙසේ පැවසුවේය. "කල්දිව-
රුන්ට සේවය කරන්න භය වෙන්න
එපා. මේ දේශයේ වාසය කරමින්
බැබිලෝනියේ රජුට සේවය කරන්න.
එසේ කළොත් ඔබට කිසි කරදරයක්
වෙන්නේ නැහැ.[4] **10** මම මිස්පා
නගරයේම නැවතී සිටිනවා.[5] එවිට
මේ ස්ථානයට පැමිණෙන කල්දිව-
රුන් ඉදිරියේ සෙනඟ වෙනුවෙන්
පෙනී සිටින්න මට පුළුවන්. නමුත්
ඔබ වයින්ද[6] තෙල්ද ගිම්හාන කාල-
යේ හැදෙන පලතුරුද* රැස් කරගෙන
ඔබ අයිති කරගත් නගරවලට ගිහින්
ජීවත් වෙන්න."

**11** බැබිලෝනියේ රජු, යූදා සෙ-
නඟගෙන් යම් කොටසක් ඉතුරු කර
ගිය බවත් ඔවුන්ව බලා කියා ගැනීමට
ෂාපාන්ගේ පුත්‍රයා වූ අහිකාම්ගේ පුත්
ගෙදලියාව පත් කළ බවත්[7] මෝවබ්
දේශයේද අම්මොන්වරුන් අතරේද
ඒදොම් දේශයේද අනිකුත් දේශයන්ව-
ලද සිටි යුදෙව්වරුන්ට[8] දැනගැනීමට
ලැබිණ. **12** එබැවින් විවිධ දේශව-
ලට විසිරී ගොස් සිටි යුදෙව්වරු
නැවත යූදා දේශයට හැරී ඒමට පටන්-
ගත්තෝය. එසේ පැමිණි අය මිස්පා
නගරයේ සිටි ගෙදලියාව හමු වීමට
ගියෝය.[9] වයින්ද ගිම්හාන කාලයේ
හැදෙන පලතුරුද විශාල ප්‍රමාණයක්
ඔවුහු එක් රැස් කළෝය.

**13** කාරියාගේ පුත්‍රයා වූ[10] යෝ-
හානාන්ද[11] පිටිසර පෙදෙස්වල විසිරී
සිටි හමුදාවේ අනිකුත් ප්‍රධානී-
හුද[12] මිස්පාහි සිටි ගෙදලියා වෙතට
පැමිණ **14** ඔහුට මෙසේ කීවෝය.
"අම්මොන්වරුන්ගේ රජු[13] වන බාලිස්
ඔබව මරා දැමීමට නෙතනියාගේ
පුත්[14] ඉෂ්මායෙල්ව[15] එවූ බව ඔබ
දන්නේ නැද්ද?" නමුත් ඔවුන් කී දේ
අහිකාම්ගේ පුත් ගෙදලියා විශ්වාස
නොකළේය.[16]

**15** කාරියාගේ පුත් යෝහානාන්[1]
මිස්පාහිදී ගෙදලියාට රහසින් මෙසේ
කීවේය. "නෙතනියාගේ පුත් ඉෂ්-
මායෙල්ව මරා දමන්න මට අවසර
දෙන්න. ඒ ගැන මම කාටවත් දැන-
ගන්න ඉඩ තියන්නේ නැහැ.[2] ඔහුව
මැරුවේ නැත්නම් ඔහු ඔබව මරා
දමයි. එහෙමවුණොත් ඔබ වෙතට
එන යුදාහි වැසියන් නැවත සීසී-
කඩ විසිරී යයි. මේ දේශයේ ඉතුරු
වූ යුදෙව්වන්වත් නැත්තටම නැති
වී යන්න ඉඩ දෙන්න පුළුවන්ද?"[3]
**16** නමුත් අහිකාම්ගේ පුත්‍රයා වූ[4] ගෙ-
දලියා,[5] "ඔබ ඉෂ්මායෙල් ගැන කියන
දේවල් බොරු. ඒ නිසා ඔහුව මරන්න
එපා"[6] කියා කාරියාගේ පුත්‍රයා වූ යෝ-
හානාන්ට කීවේය.

**41** රජ පවුලට අයත්[7] රජුගේ
ප්‍රධාන නිලධාරියෙකු වූ ඉෂ්-
මායෙල්,[8] එලිෂාමාගේ පුත්‍රයා වූ
නෙතනියාගේ පුත්‍රයාය.[9] ඔහු හත්-
වන මාසයේදී මිනිසුන් දසදෙනෙකු
සමඟ[10] මිස්පාහි සිටි අහිකාම්ගේ
පුත්‍රයා වූ ගෙදලියා වෙතට පැමිණ[11]
ඔහු සමඟ එක්ව කෑම කෑවේය.[12]
**2** නෙතනියාගේ පුත්‍රයා වූ ඉෂ්මායෙල්
හා ඔහු සමඟ පැමිණි මිනිස්සු දස-
දෙනා එකතු වී, බැබිලෝනියේ රජු
දේශය බලා කියා ගැනීමට පත් කළ[13]
ෂාපාන්ගේ පුත්‍රයා වූ අහිකාම්ගේ පුත්
ගෙදලියාව කඩුවෙන් ඇන මරා දැමු-
වෝය.[14] **3** පසුව ඉෂ්මායෙල්, ගෙද-
ලියා සමඟ මිස්පාහි සිටි යුදෙව්වන්
සියලුදෙනාවද එහි සිටි කල්දිවරුන්-
ගේ යුධ භටයන්වද මරා දැමුවේය.

**4** නමුත් කිසිවෙක් ඒ ගැන දැන-
ගත්තේ නැත.[15] ගෙදලියාව මරා දැමූ
දවසට පසු දින **5** රැවුල් සම්පූර්ණ-
යෙන්ම කපාගත්,[16] වස්ත්‍ර ඉරාගත්,
සිරුරු කපාගත්[17] මනුෂ්‍යයෝ අසූ-
දෙනෙක් ෂීකෙම්හි සිටත්[18] ෂීලෝහි
සිටත්[19] සමාරියේ සිටත්[20] මිස්පා වෙ-
තට පැමිණියෝය. යෙහෝවා දෙවිගේ
ගෘහයේදී ඔප්පු කිරීම සඳහා ධාන්‍යද
කට්ටකුමංජල්ද ඔවුන් රැගෙන ඇවිත්

**40 පරි.**
1 2රාජා 22:12
2ලේක 34:20
යෙරෙ 26:24
2 2රාජා 25:22
යෙරෙ 39:14
යෙරෙ 41:2
3 1සාමු 20:17
2රාජා 25:24
4 ගීතා 37:3
යෙරෙ 27:11
5 යෙරෙ 40:6
6 ද්වි 16:13
යෙරෙ 39:10
7 යෙරෙ 39:14
8 යෙරෙ 24:9
9 විනි 20:1
1සාමු 7:5
1රාජා 15:22
10 යෙරෙ 40:8
11 යෙරෙ 41:11
යෙරෙ 42:1
යෙරෙ 43:2
12 යෙරෙ 40:7
13 යෙරෙ 41:10
14 2රාජා 25:23
15 යෙරෙ 40:8
යෙරෙ 41:2
16 හිතෝ 22:3

**2 තීරුව**
1 යෙරෙ 41:11
යෙරෙ 43:2
2 1සාමු 26:8
3 2සාමු 21:17
4 2රාජා 22:12
2ලේක 34:20
යෙරෙ 26:24
5 2රාජා 25:22
යෙරෙ 39:14
6 යෙරෙ 41:2

**41 පරි.**
7 එස 17:13
8 2රාජා 25:23
යෙරෙ 40:14
9 2රාජා 25:25
10 2රාජා 25:25
11 යෙරෙ 40:6
12 ගීතා 41:9
13 යෙරෙ 40:7
14 2රාජා 25:25
15 යෙරෙ 40:15
16 ලෙවී 19:27
17 ද්වි 14:1
18 යොෂු 24:32
1රාජා 12:1
19 යොෂු 18:1
යෙරෙ 7:12
20 1රාජා 16:24

යෙරෙ **40:10*** මෙහි කතා කරන්නේ විශේෂයෙන් අත්තික්කා ගැනයි. සමහරවිට ඉදිත් ඊට ඇතුළත් විය හැකියි.

තිබිණ.[1] **6** නෙතනියාගේ පුත්‍රයා වූ
ඉෂ්මායෙල් මිෂ්පාහි සිට හඬමින් ඒ
මනුෂ්‍යයන්ව හමු වීමට ඇවිදගෙන
ගියේය.[2] ඔහුට ඔවුන්ව මුණගැසුණු
විට, "අහිකාම්ගේ පුත්‍රයා වූ ගෙදලියා-
ගේ නිවසට එන්න" කියා ඔහු ඔවුන්ට
ආරාධනා කළේය. **7** ඔවුන් නගර-
යට ඇතුල් වූ විගස, නෙතනියාගේ
පුත්‍රයා වූ ඉෂ්මායෙල්ද ඔහු සමඟ සිටි
මිනිස්සුද ඒ මනුෂ්‍යයන්ව මරා දැමීමට
පටන්ගත්තෝය. එසේ මරා දැමූ අයව
ඔවුහු එහි තිබූ වතුර වළකට දැමු-
වෝය.[3]

**8** ඒ අසූදෙනාගෙන් දසදෙනෙක්
ඉෂ්මායෙල්ට මෙසේ කීවෝය. "අනේ,
අපිව මරන්න එපා. අපිට අයිති
ඉඩමක අපි තිරිඟු, බාර්ලි, තෙල්
සහ මීපැණි සඟවා තිබෙනවා."[4]
එය අසා ඉෂ්මායෙල් ඔවුන් දසදෙ-
නාව නොමැරීමට තීරණය කළේය.
**9** නෙතනියාගේ පුත්‍රයා වූ ඉෂ්මා-
යෙල්[5] විසින් මරා දැමූ අයගේ මළ
කඳන් දැමූ වළ ඉතා විශාල එකකි.
ඔහු එය මළ කඳන්වලින් පිරෙව්වේය.
එය සාදා තිබුණේ ආසා රජුගේ කාල-
යේදී ඊශ්‍රායෙල්හි රජු වූ බාෂාගෙන්
ආරක්ෂා වීම සඳහාය.[6]

**10** පසුව නෙතනියාගේ පුත් ඉෂ්-
මායෙල්, රාජ කුමාරිකාවන්[7] ඇතුළුව
මිෂ්පාහි ඉතුරුව සිටි සියලු සෙනඟව[8]
රැගෙන අම්මොන්වරුන්ගේ දේශය
බලා පිටත්ව ගියේය.[9] ආරක්ෂක භට-
යන්ගේ ප්‍රධානියා වූ නෙබුෂරදාන්
විසින් අහිකාම්ගේ පුත් ගෙදලියාට
භාර දී ගිය සියලුදෙනාවම[10] ඔහු වහ-
ලුන් ලෙස ගෙන ගියේය.[11]

**11** නෙතනියාගේ පුත් ඉෂ්මායෙල්
කළ මේ සියලු නපුරුකම් ගැන
කාරියාගේ පුත් යෝහානාන්ටද[12] ඔහු
සමඟ සිටි හමුදාවේ ප්‍රධානීන්ටද[13]
ආරංචි විය. **12** ඔවුහු සියලු යුධ
භටයන් සමඟ ඉෂ්මායෙල්ට විරුද්ධව
සටන් කිරීමට පිටත්ව ගියෝය. ඔවුහු
ගිබියෝන්හි ජලාශය අසලදී ඉෂ්මා-
යෙල්ව දුටුවෝය.[14]

**13** ඉෂ්මායෙල් වහලුන් ලෙස
රැගෙන ගිය සෙනඟ, කාරියාගේ පුත්
යෝහානාන්ව සහ ඔහු සමඟ සිටි
හමුදාවේ ප්‍රධානීන්ව දුටු විට ඉම-
හත් සේ ප්‍රීති වූහ. **14** මිෂ්පාහි සිට
ඉෂ්මායෙල් රැගෙන ආ ඒ සෙනඟ[1]
යෝහානාන් වෙතට හැරී ආවෝය.
**15** නමුත් නෙතනියාගේ පුත් ඉෂ්-
මායෙල් මිනිසුන් අටදෙනෙක් සමඟ
යෝහානාන්ගෙන් ගැලවී අම්මොන්ව-
රුන් වෙතට පලා ගියේය.[2]

**16** නෙතනියාගේ පුත් ඉෂ්මායෙල්
අහිකාම්ගේ පුත් ගෙදලියාව මරා දැමු-
වායින් පසු[3] මිෂ්පාහි සිට ගිබියෝන්
දක්වා රැගෙන ගිය යුධ භටයන්-
වද ඔවුන්ගේ භාර්යාවන්වද දරුවන්වද
නිලධාරීන්වද කාරියාගේ පුත් යෝහා-
නාන්[4] සහ ඔහු සමඟ සිටි හමුදා-
වේ ප්‍රධානීහු නැවත රැගෙන ආවෝය.
**17** පසුව ඔවුහු ඊජිප්තුව බලා පිටත්
වූහ.[5] ඒ ගමන අතරතුර ඔවුහු බෙත්-
ලෙහෙම අසල[6] පිහිටි කිම්හාම්ගේ
නවාතැනේ නතර වූහ. **18** බැබි-
ලෝනියේ රජු දේශය බලා කියා
ගැනීමට පත් කළ[7] අහිකාම්ගේ පුත්
ගෙදලියාව, නෙතනියාගේ පුත් ඉෂ්-
මායෙල් මරා දැමූ නිසා[8] ඔවුහු කල්දි-
වරුන්ට[9] භය වී[10] ඊජිප්තුවට යෑමට
තීරණය කළෝය.

# 42

**42** කාරියාගේ පුත්‍රයා වූ යෝහා-
නාන්ද හෝෂායාගේ පුත්‍රයා
වූ[11] යෙෂනියාද*[12] යුධ හමුදාවේ ප්‍රධා-
නීහු සියලුදෙනාද[13] සියලු සෙනඟද
එනම්, විවිධ තරාතිරම්වලට අයත්
සෙනඟද **2** අනාගතවක්තෘ යෙරෙ-
මියා වෙතට ගොස් ඔහුට මෙසේ
කීවෝය. "අපි ඔබෙන් ඉල්ලන මේ
දේට ඇහුම්කන් දෙන්න. අපි විශාල
සෙනඟක්ව සිටියා. ඒත් අප අතරේ
දැන් ඉතුරු වී සිටින්නේ ටිකදෙනෙක්
පමණක්[14] බව ඔබ හොඳින් දන්නවා.
ඒ නිසා ඉතුරුව සිටින අපි හැමෝම
වෙනුවෙන් ඔබේ දෙවි යෙහෝවාට
යාච්ඤා කරන්න.[15] **3** එවිට ඔබේ

---

යෙරෙ **42:1*** 2රාජා 25:23හි, "යයෂනියා" ලෙසද
යෙරෙ 43:2හි, "අෂරියා" ලෙසද සඳහන් වේ.

**41 පරි.**
**1** ලෙවී 2:1
**2** 2සාමු 3:16
**3** හිතෝ 1:16 යෙසා 59:7
**4** යෝබ් 2:4 හිතෝ 13:8 දේශ 7:12
**5** 2රාජා 25:23 යෙරෙ 40:8
**6** 1රාජා 15:22 2ලේක 16:6
**7** යෙරෙ 43:6
**8** යෙරෙ 43:5
**9** යෙරෙ 40:14
**10** යෙරෙ 40:7
**11** යෙරෙ 40:12
**12** යෙරෙ 42:1 යෙරෙ 43:2
**13** යෙරෙ 40:13
**14** 2සාමු 2:13

**2 තීරුව**
**1** යෙරෙ 40:6
**2** 1රාජා 20:20 යෝබ් 21:30
**3** යෙරෙ 41:2
**4** 2රාජා 25:23 යෙරෙ 42:1
**5** 2රාජා 25:26 යෙසා 30:2 යෙරෙ 42:14 යෙරෙ 43:7
**6** උත් 35:19 විනි 17:7 1ලේක 2:51
**7** යෙරෙ 40:5
**8** යෙරෙ 41:2
**9** යෙරෙ 21:4 යෙරෙ 37:5
**10** යෙරෙ 42:11

**42 පරි.**
**11** යෙරෙ 43:2
**12** 2රාජා 25:23
**13** යෙරෙ 40:8 යෙරෙ 40:13 යෙරෙ 41:11
**14** ලෙවී 26:22 ද්වි 28:62 යෙසා 1:9
**15** 1සාමු 7:8 1සාමු 12:19 යෙසා 37:4 යාකො 5:16

දෙවි යෙහෝවා අපි යා යුතු මාර්ගයත්
කළ යුතු දේත් අපිට කියා දෙයි.”[1]
**4** අනාගතවක්තෘ යෙරෙමියා
ඔවුන්ට මෙසේ කීවේය. “හොඳයි! ඔබ
කියූ ලෙස මම ඔබේ දෙවි යෙහෝවාට
යාච්ඤා කරන්නම්.[2] ඔබේ ඉල්ලීම්ව-
ලට යෙහෝවා දෙවි දෙන පිළිතුරත්
ඒ විදිහටම මම ඔබට කියන්නම්.[3]
මම කිසි දෙයක් ඔබෙන් හංගන්නේ
නැහැ.”[4]
**5** ඔවුහු යෙරෙමියාට මෙසේ පැව-
සුවෝය. “ඔබේ දෙවි යෙහෝවා ඔබ
මාර්ගයෙන් අපිට පවසන දේට අනුව
ක්‍රියා කරන්න අපි පොරොන්දු වෙ-
නවා.[5] ඒ පොරොන්දුවට යෙහෝවා
දෙවි සාක්ෂිකරුවෙක් වෙයි. ඔහු විශ්-
වාසවන්තයි, සැබෑයි.[6] ඒ නිසා අපි
එහෙම නොකළොත් ඔහු අපිට විරුද්-
ධව ක්‍රියා කරයි. **6** යෙහෝවා දෙවි-
ගෙන් විමසන්න කියා අපි ඔබෙන්
ඉල්ලා සිටිනවා. ඔහු පවසන දේට අපි
කැමති වුණත් නැතත් අපි අපේ දෙවි
යෙහෝවාට කීකරු වෙනවා. එහෙම
කළොත් අපිට කිසිවිටක වරදින්නේ
නැහැ.”[7]
**7** දවස් දහයකට පසු යෙහෝවා
දෙවිගෙන් යෙරෙමියාට පණිවිඩයක්
ලැබිණ.[8] **8** එබැවින් යෙරෙමියා,
කාරියාගේ පුත්‍රයා වූ යෝහානාන්වද
ඔහු සමඟ සිටි යුධ හමුදාවේ ප්‍රධා-
නීන් සියලුදෙනාවද සියලු සෙනඟවද
එනම්, විවිධ තරාතිරම්වලට අයත්
සෙනඟවද තමා වෙතට කැඳවා[9]
**9** ඔවුන්ට මෙසේ කීවේය. “ඔබේ ඉල්-
ලීම් ඊශ්‍රායෙල්හි දෙවි වන යෙහෝ-
වාට දන්වන්න කියා ඔබ මට කිව්වා.
ඊට දෙවිගෙන් ලැබුණු පිළිතුර මෙ-
යයි.[10] **10** ‘ඔබ දිගටම මේ දේශයේ
ජීවත් වුණොත්[11] මම ඔබව නඟා සිටු-
වන්නෙමි. ඔබව බිඳ නොදමන්නෙමි.
ඔබව ස්ථිරව සිටුවන්නෙමි. ඔබව
උදුරා නොදමන්නෙමි.[12] ඔබ පිටට
ගෙනා විපත්ති හැමදාටම පැවතීමට
ඉඩ නොහරින්නෙමි.[13] **11** ඔබ බැබි-
ලෝනියේ රජුට බියෙන් සිටියත් තව-
දුරටත් ඔහුට බිය නොවන්න.’[14]

“යෙහෝවා දෙවි මෙසේද පව-
සන්නේය. ‘මම ඔබ සමඟ සිට
ඔබව ඔහුගේ අතින් ගලවාගන්නෙමි.
ඔබව රජුගෙන් නිදහස් කරගන්නෙමි.[1]
ඒ නිසා ඔහුට බිය නොවන්න.[2]
**12** ඔහු ඔබට අනුකම්පා කර ඔබේ
දේශයේම ඔබට ජීවත් වීමට ඉඩහරිනු
ඇත. එසේ ඔබට මාගේ කරුණාව අද්-
දැකීමට හැකි වනු ඇත.’[3]
**13** “නමුත් ඔබ ඔබේ දෙවි වන
යෙහෝවාට අකීකරු වෙමින්,[4] ‘අපිට
නම් මේ දේශයේ ජීවත් වෙන්න බැහැ.
**14** අපි ඊජිප්තු දේශයට යනවා.[5] එහිදී
අපිට යුද්ධ ප්‍රකාශ කරන හොරණෑවේ
ශබ්දය අසන්නවත් යුද්ධ දකින්නවත්
සිදු වෙන්නේ නැහැ. අපිට බඩගින්-
නේ ඉන්න වෙන්නෙත් නැහැ. අපි
එහිම ජීවත් වෙනවා’[6] කියා පැව-
සුවොත් **15** යුදාහි ඉතුරු වී සිටින
වැසියෙනි, යෙහෝවා දෙවි ඔබට පව-
සන දේට සවන් දෙන්න. ස්වර්ග-
යේ සේනාවල අධිපතිද ඊශ්‍රායෙල්හි
දෙවිද වන යෙහෝවා මෙසේ පව-
සන්නේය. ‘ඊජිප්තු දේශයට යෑමට
ඔබ ගත් තීරණය වෙනස් නොකර,
විදේශිකයන් මෙන් ජීවත් වීමට ඔබ
එහි ගියොත්[7] **16** ඔබ දැන් භයෙන්
සිටින ඔබේ සතුරා ඔබ පසුපස ලුහු-
බැඳ ඇවිත් එහිදී ඔබට පහර දෙනු
ඇත.[8] සාගත නිසා ඔබ මෙතැ-
නින් පලා ගියත් එහිදීත් ඔබට සාග-
තයට මුහුණ දීමට සිදු වනු ඇත.[9]
අන්තිමේදී ඔබ ඊජිප්තු දේශයේදී මිය
යනු ඇත.[10] **17** ඊජිප්තුවට ගොස්
එහි පදිංචි වීමට තීරණය කළ සියලු-
දෙනා කඩුවෙන්ද සාගතයෙන්ද වසං-
ගතවලින්ද මිය යන්නෝය.[11] මා
ඔවුන් පිටට ගෙනෙන විපත්තිවලින්
ඔවුන්ගෙන් කිසිවෙකුට බේරෙන්න
ලැබෙන්නේ නැත.’ ”[12]
**18** “ස්වර්ගයේ සේනාවල අධිප-
තිද ඊශ්‍රායෙල්හි දෙවිද වන යෙහෝවා
මෙසේ පවසන්නේය. ‘ඔබ ඊජිප්තු දේ-
ශයට ගියොත් යෙරුසලමේ වැසියන්
පිටට මාගේ මහත් උදහස වැගුරූ ලෙ-
සම[13] මම ඔබ පිටටත් මාගේ උදහස

**42 පරි.**
1 එස්රා 8:21, හිතෝ 3:6
2 1සාමු 12:23
3 1රාජා 22:14
4 1සාමු 3:18, ක්‍රියා 20:20
5 නික් 19:8, ද්වි 5:27
6 විනි 11:10, 1සාමු 12:5, මීකා 1:2, මලා 3:5
7 ද්වි 5:33, ද්වි 6:3, යෙරෙ 7:23
8 2පේත්‍ර 1:21
9 යෙරෙ 41:16, යෙරෙ 42:1
10 යෙරෙ 42:2
11 ගීතා 37:3
12 යෙරෙ 24:6, යෙරෙ 31:28, යෙරෙ 33:7
13 ද්වි 32:36, යෙරෙ 18:8, යෙරෙ 26:19, මීකා 7:18
14 යෙරෙ 41:18

**2 තීරුව**
1 ගීතා 46:7, ගීතා 68:20, යෙසා 43:5, රෝම 8:31
2 2ලේක 32:7
3 නික් 34:6, නෙහෙ 9:31, ගීතා 106:45, හිතෝ 16:7, ආනි 9:9
4 යෙරෙ 44:16
5 යෙරෙ 43:7
6 ගණන් 11:5
7 ද්වි 17:16, යෙරෙ 44:12
8 ද්වි 28:45, හිතෝ 13:21, එස 11:8
9 යෙරෙ 44:13, යෙරෙ 44:27
10 යෙරෙ 44:12
11 යෙරෙ 24:10, යෙරෙ 42:22
12 යෙරෙ 44:14, යෙරෙ 44:28
13 2රාජා 25:9, 2ලේක 34:25, 2ලේක 36:16, යෙරෙ 7:20, යෙරෙ 39:8, යෙරෙ 52:4, විලා 2:4, නාහු 1:6

වගුරුවන්නෙමි. ඔබට සිදු වන දේ
දකින සියල්ලෝ පුදුමයට පත් වන්-
නෝය. ඔවුහු නින්දා අපහාස කරමින්
ඔබට ශාප කරනු ඇත.[1] ඔබ නැවත
කිසි දිනක මේ දේශයට හැරී එන්නේ
නැත.'[2]

19 “යූදාහි ඉතුරු වී සිටින වැසි-
යෙනි, ඊජිප්තු දේශයට නොයන්න
කියා යෙහෝවා දෙවි ඔබට පැව-
සුවා.[3] අද මම ඔබට ඒ ගැන අන-
තුරු ඇඟවූ බව අමතක කරන්න
එපා.[4] 20 ඔබයි මා ළඟට ඇවිත්
යෙහෝවා දෙවිගෙන් විමසන ලෙස
ඉල්ලා සිටියේ. ඔබ මට මෙහෙම
කිව්වා. 'අපේ දෙවි යෙහෝවාට අපි
වෙනුවෙන් යාච්ඤා කරන්න. අපේ
දෙවි යෙහෝවා කියන සෑම දෙ-
යක්ම ඇවිත් අපිට කියන්න. අපි ඔහු
කියන විදිහටම ක්‍රියා කරනවාමයි.'[5]
එසේ පැවසීමෙන් ඔබ ඔබටම කර-
ගත්තේ විශාල වරදක්.[6] 21 මන්ද
ඔබේ දෙවි යෙහෝවා පැවසූ සෑම දෙ-
යක්ම මම ඔබට කිව්වත් ඔබ ඔහුගේ
හඬට ඇහුම්කන් දෙන්නේ නැහැ. ඔහු
මා ලවා ඔබට පවසන කිසිම දෙය-
කට ඔබ කීකරු වෙන්නෙත් නැහැ.[7]
22 විදේශිකයන් ලෙස ජීවත් වීමට
ආශාවෙන් බලා සිටින දේශයේදීම[8]
ඔබට කඩුවෙන්ද[9] සාගතයෙන්ද වසං-
ගතවලින්ද පහර කා මිය යෑමට සිදු
වන බව දැනගන්න.”

**43** සෙනඟට පවසන්න කියා
යෙහෝවා දෙවි තමාට පැවසූ
සෑම දෙයක්ම යෙරෙමියා සෙනඟට
පැවසුවේය. ඔවුන්ගේ දෙවි වූ යෙහෝ-
වාගේ පණිවිඩය ඔහු සෙනඟට පවසා
අවසන් කළ විගස[10] 2 හෝෂායා-
ගේ පුත්‍රයා වූ අෂරියාද[11] කාරියාගේ
පුත්‍රයා වූ යෝහානාන්ද[12] එතැන සිටි
හිතුවක්කාර මනුෂ්‍යයෝද[13] මෙසේ
කීවෝය. “ඔබ ඔය කියන්නේ බො-
රුවක්.[14] 'විදේශිකයන් ලෙස ජීවත්
වීම සඳහා ඊජිප්තු දේශයට යන්න
එපා' කියා සෙනඟට පැවසීමට අපේ
දෙවි යෙහෝවා ඔබව එව්වේ නැහැ.[15]
3 ඒත් නෙරියාගේ පුත් බාරුක්[16]
තමයි අපිට එහෙම කියන්න කියා
ඔබව පොලඹවන්නේ. ඔහුට ඕනේ අපි
කල්දිවරුන්ගේ අතින් මැරුම් කනවා
දකින්නයි. එහෙමත් නැත්නම් ඔහුට
ඕනේ අපිව ඔවුන්ගේ අතට හසු කර
දී වහලුන් හැටියට බැබිලෝනියට
යවන්නයි.”[1]

4 යූදා දේශයේම දිගටම ජීවත්
වෙන්න කියා යෙහෝවා දෙවි
පැවසුවත්[2] කාරියාගේ පුත්‍රයා වූ යෝ-
හානාන්වත් යුධ හමුදාවේ ප්‍රධානි-
යෝවත් සෙනඟගෙන් කිසිවෙක්වත්
ඊට කීකරු වූයේ නැත.[3] 5 කාරියා-
ගේ පුත් යෝහානාන් හා යුධ හමු-
දාවේ ප්‍රධානීහු සියලුදෙනා යූදාහි
ඉතුරු වී සිටි මුළු සෙනඟ රැගෙන
ඊජිප්තු දේශය බලා පිටත් වූහ. ඔවුන්
එසේ රැගෙන ගියේ විවිධ දේශවලට
විසිරී ගියත් නැවත යූදා දේශයටම
ඇවිත් එහි කෙටි කාලයක් ජීවත්ව
සිටි සෙනඟවයි.[4] 6 ආරක්ෂක භට-
යන්ගේ ප්‍රධානියා වූ නෙබුෂරදාන්,[5]
ෂාපාන්ගේ පුත්‍රයා වූ[6] අහිකාම්ගේ
පුත්[7] ගෙදලියාට[8] භාර දී ගිය සියලු
පුරුෂයන්වද ඔවුන්ගේ භාර්යාවන්වද
දරුදැරියන්වද රාජ කුමාරිකාවන්වද[9]
අනාගතවක්තෘ යෙරෙමියාව හා නෙ-
රියාගේ පුත් බාරුක්වද[10] ඔවුහු එසේ
රැගෙන ගියෝය. 7 යෙහෝවා දෙවි-
ගේ වදන්වලට කීකරු නොවූ ඔවුහු
ඊජිප්තු දේශයට පැමිණියෝය.[11] ඔවුහු
තාහ්පනේස් නම් නගරය දක්වාම
ගියෝය.[12]

8 තාහ්පනේස්හිදී යෙහෝවා දෙ-
විගෙන් යෙරෙමියාට පණිවිඩයක්
ලැබිණ. දෙවි ඔහුට මෙසේ පැවසුවේය.
9 “විශාල ගල් කිහිපයක් රැගෙන
තාහ්පනේස්හි පාරාවෝගේ මාලිගාවට
ඇතුල් වන දොරටුව අසලට යන්න.
යුදෙව්වරුන් බලා සිටියදීම ඒ දො-
රටුව ඉදිරිපිට ඇති ගඩොලින් සෑදූ
වේදිකාව තුළ බදාම දමා ඒවා සඟ-
වන්න.[13] 10 ඉන්පසු ඔබ යුදෙව්ව-
රුන්ට කතා කර මෙසේ කියන්න.
'ස්වර්ගයේ සේනාවල අධිපතිද ඊශ්‍රා-
යෙල්හි දෙවිද වන යෙහෝවා මෙසේ

**42 පරි.**
1 යෙරෙ 18:16; යෙරෙ 24:9; යෙරෙ 29:18
2 යෙරෙ 22:10; යෙරෙ 22:27
3 ද්වි 17:16; යෙසා 30:3; යෙසා 31:1
4 2ලේක 24:19; නෙහෙ 9:26; මලා 3:5
5 යෙරෙ 42:2
6 හිතෝ 8:36
7 යෙරෙ 7:24; සෙක 7:11
8 හොෂෙ 9:6
9 යෙරෙ 43:11; එස 6:11

**43 පරි.**
10 යෙරෙ 1:17; යෙරෙ 26:8; යෙරෙ 42:5
11 යෙරෙ 42:1
12 යෙරෙ 40:13; යෙරෙ 41:16
13 ගීතා 123:4; හිතෝ 11:2
14 හිතෝ 21:24; හිතෝ 29:20
15 යෙරෙ 5:12
16 යෙරෙ 36:4; යෙරෙ 45:1

**2 තීරුව**
1 යෙරෙ 38:4
2 ගීතා 37:3
3 නෙහෙ 9:16
4 යෙරෙ 40:10
5 යෙරෙ 39:10; යෙරෙ 40:7
6 2රාජා 22:8
7 2ලේක 34:20; යෙරෙ 26:24
8 2රාජා 25:22
9 යෙරෙ 41:10
10 යෙරෙ 36:26; යෙරෙ 45:1
11 යෙසා 19:18
12 යෙසා 30:4; යෙරෙ 2:16; යෙරෙ 44:1; එස 30:18
13 යෙරෙ 13:1; යෙරෙ 19:1

පවසන්නේය. “මාගේ සේවකයාද[1]
බැබිලෝනියේ රජුද වන නෙබුකද්රෙ-
ෂර්ව මා කැඳවා,[2] සඟවා තැබූ මේ ගල්
මත ඔහුගේ සිංහාසනය මම පිහිටු-
වන්නෙමි. ඔහු තම රාජකීය කූඩා-
රම මේ ස්ථානයේම පිහිටුවනු ඇත.
**11** ඔහු පැමිණ ඊජිප්තු දේශයට පහර
දෙනු ඇත.[3] එවිට මාරාන්තික වසං-
ගතවලට නියම වූ අය වසංගත-
වලින් මිය යන්නෝය. වහල්භාවයට
නියම වූ අය වහල්භාවයට ගෙන යනු
ලබන්නෝය. කඩුවෙන් විනාශ වීමට
නියම වූ අය කඩුවෙන් පහර කන්-
නෝය.[4] **12** ඊජිප්තුවේ දෙවිවරුන්-
ගේ දේවාලවලට මම ගින්නක්
අවුළුවන්නෙමි.[5] ඔහු ඒ සියල්ල ගිනි-
බත් කර ඔවුන්ව වහල්කමට ගෙන
යන්නේය. එඬේරෙකු ඉතා පහසු-
වෙන් තම වස්ත්‍රය පැළඳගන්නාක්
මෙන්[6] ඔහු මුළු ඊජිප්තු දේශයම ඉතා
පහසුවෙන් යටත් කරගෙන ජයග්‍රාහීව
එතැනින් පිටත්ව යන්නේය. **13** ඔහු
ඊජිප්තුවේ බෙත්-ෂෙමෙෂ් නගරයෙහි*
කුලුනු කඩා බිඳ දමනු ඇත. දෙ-
විවරුන්ගේ දේවාලද ඔහු ගින්නෙන්
විනාශ කර දමනු ඇත.”’”

**44** ඊජිප්තුවේ මිග්දෝල්හිද[7]
තාහ්පනේස්හිද[8] නොෆ්හිද[9]
පත්‍රොස් දේශයෙහිද[10] ජීවත් වූ යුදෙව්-
වරුන්ට පැවසිය යුතු පණිවිඩ-
යක් දෙවිගෙන් යෙරෙමියාට ලැබිණ.[11]
එම පණිවිඩයෙහි මෙසේ සඳහන්
විය. **2** “ස්වර්ගයේ සේනාවල අධිප-
තිද ඊශ්‍රායෙල්හි දෙවිද වන යෙහෝවා
මෙසේ පවසන්නේය. ‘මා යෙරු-
සලම පිටටත්[12] යූදාහි සියලු
නගර පිටටත් ගෙනා සෑම විපත්ති-
යක්ම ඔබ දුටුවහුය. බලන්න! අද
එහි ඉතුරු වී තිබෙන්නේ නටබුන්
පමණි. මිනිස් පුළුටක්වත් එහි දක්නට
නැත.[13] **3** එහි විසූ සෙනඟ, තමන්ද
තම මුතුන්මිත්තන්ද කලින් නොදැන
සිටි[14] වෙනත් දෙවිවරුන්ට සුවඳ දුම්
ඔප්පු කර ඔවුන්ට නමස්කාර
කළෝය. ඔවුන්ට ඒ වගේ විපතක්
සිදු වුණේ මා උදහස් වන තරම-
ටම ඔවුන් කළ ඒ දුෂ්ටකම් නිසාය.[1]
**4** මම හිමිදිරි උදැසන සිට නොන-
වත්වා මාගේ සේවකයන් වන අනාග-
තවක්තෘවරුන්ව ඔවුන් වෙතට යවා,[2]
“ජනයෙනි, මට අප්‍රසන්න මේ පිළි-
කුල්සහගත ක්‍රියා සම්පූර්ණයෙන්ම
අත්හැර දමන්න”[3] කියා ඔවුන්ට අව-
වාද කළෙමි. **5** නමුත් ඔවුහු මට
ඇහුම්කන් දුන්නේ නැත.[4] වෙනත්
දෙවිවරුන්ට සුවඳ දුම් ඔප්පු කිරීම
අත්හරින්න කියා මා ඔවුන්ට අව-
වාද කළත් ඔවුහු ඒවා ගණනකටවත්
ගත්තේ නැත.[5] එසේ ඔවුහු දිගටම
ඔවුන්ගේ දුෂ්ට ක්‍රියාවල නිරත වූහ.
**6** එබැවින් මාගේ දැවෙන කෝප-
යත් උදහසත් මම ඔවුන් පිට වැගුරු-
වෙමි. යූදාහි නගර හා යෙරුසලමේ
වීථි එයින් දැවී ගියේය.[6] ඒ නිසා අද
එහි දකින්න ලැබෙන්නේ පාළුවට ගිය
නටබුන් ගොඩක් පමණි.’[7]

**7** “ස්වර්ගයේ සේනාවල අධිපතිද
ඊශ්‍රායෙල්හි දෙවිද වන යෙහෝවා
දැන් මෙසේ පවසන්නේය. ‘ඔබ මහත්
විපතක් ඔබ පිටටම පමුණුවාගන්න
හදන්නේ ඇයි?[8] ඉතුරු වී සිටින යූදාහි
පුරුෂයන් හා ස්ත්‍රීන්වද දරුවන් හා
ළදරුවන්වද සහමුලින්ම විනාශ වී
යෑමට සලස්වන්නේ ඇයි?[9] **8** ඔබ
විදේශිකයන් ලෙස පදිංචිව සිටින
ඊජිප්තු දේශයේදී දේවතා රූප සාද-
මින්, වෙනත් දෙවිවරුන්ට සුවඳ දුම්
ඔප්පු කරමින් මාව උදහසට පත්
කරන්නේ ඇයි?[10] ඔබ එසේ කර
ඔබ පිටටම විනාශය පමුණුවාගන්-
නහුය. සියලු ජාතීහු ඔබට අපහාස
කරමින් ශාප කරනු ඇත.[11] **9** ඔබේ
මුතුන්මිත්තන්ද[12] යූදාහි රජවරුන්ද[13]
ඔවුන්ගේ භාර්යාවන්ද[14] කළ දුෂ්ටකම්
සියල්ල ඔබට අමතක වී ඇද්ද? ඔබත්
ඔබේ භාර්යාවනුත්[15] යූදා දේශයෙහිද

යෙරෙ **43:13*** මූ.අ., “හිරුගේ මාලිගාවේ.”

**10** නික් 20:5; ද්වි 32:16; යෙරෙ 25:6; 1කොරි 10:20; **11** 1රාජා 9:7; යෙරෙ 24:9; යෙරෙ 42:18; **12** එස්රා 9:13; නෙහෙ 9:18; දානි 9:6; **13** 2රාජා 21:20; 2රාජා 24:9; **14** 1රාජා 11:3; 1රාජා 21:25; **15** යෙරෙ 44:15.

**43 පරි.**
**1** යෙරෙ 25:9
යෙරෙ 27:6
එස 29:20
**2** දානි 2:21
දානි 5:18
**3** යෙරෙ 25:19
යෙරෙ 46:2
යෙරෙ 46:13
එස 29:19
එස 30:4
එස 30:18
**4** යෙරෙ 15:2
යෙරෙ 44:13
එස 5:12
සෙක 11:9
**5** නික් 12:12
යෙසා 19:1
යෙරෙ 46:25
**6** යෙසා 49:18

**44 පරි.**
**7** එස 29:10
එස 30:6
**8** යෙරෙ 2:16
එස 30:18
**9** යෙසා 19:13
යෙරෙ 46:14
එස 30:16
හොෂෙ 9:6
**10** යෙරෙ 44:15
එස 29:14
එස 30:14
**11** යෙරෙ 43:7
**12** 2රාජා 25:10
2ලේක 36:17
යෙරෙ 39:8
යෙරෙ 52:14
**13** යෙරෙ 9:11
විලා 1:1
**14** ද්වි 13:6
ද්වි 29:26
ද්වි 32:17
යෙරෙ 19:4
යෙරෙ 22:9

**2 තීරුව**
**1** යෙරෙ 11:17
**2** 2ලේක 36:15
යෙසා 65:2
යෙරෙ 7:25
යෙරෙ 25:4
යෙරෙ 26:5
යෙරෙ 29:19
යෙරෙ 35:15
**3** යෙරෙ 16:18
**4** 2ලේක 36:16
ගීතා 81:11
**5** යෙරෙ 19:13
**6** ලෙවී 26:28
යෙරෙ 42:18
**7** යෙසා 6:11
යෙරෙ 35:17
යෙරෙ 39:8
යෙරෙ 52:14
**8** ගණන් 16:38
යෙරෙ 7:19
**9** නික් 34:7

යෙරුසලමේ වීථිවලද කළ දුෂ්ටකම්
ඔබට දැන් මතක නැද්ද? **10** අද
වන තුරු කිසි කෙනෙක් තමන්
කළ දුෂ්ටකම් ගැන පසුතැවිලි වී
නැත.[1] ඔබ කළ දේවල් ගැන ඔබට
කිසි බියක් දැනුණෙත් නැත.[2] ඔබේ
මුතුන්මිත්තන්ටත් ඔබටත් මා දුන්
නීතියට ඔබ කීකරු වුණේවත්[3] මාගේ
අණපනත් පිළිපැද්දේවත් නැත.'[4]

**11** "එබැවින් ස්වර්ගයේ සේනාවල
අධිපතිද ඊශ්‍රායෙල්හි දෙවිද වන යෙ-
හෝවා මෙසේ පවසන්නේය. 'යූදාහි
වැසියන් වන ඔබ පිටට විපත්ති ගෙ-
නැවිත් ඔබ සියලුදෙනාවම විනාශ
කර දැමීමට මම තීරණය කළෙමි.[5]
**12** යූදා දේශයේ ඉතුරුව සිටි යුදෙව්-
වරුන්ට එනම්, ඊජිප්තු දේශයට
පැමිණ එහි පදිංචි වීමට තීරණය කළ
යුදෙව්වරුන්ට විරුද්ධව මම පියවර
ගන්නෙමි.[6] ඔවුහු සියලුදෙනා ඊජිප්තු
දේශයේදීම විනාශ වී යන්නෝය.[7]
විවිධ තරාතිරම්වලට අයත් සියලුදෙ-
නාම කඩුවෙන්ද සාගතයෙන්ද පහර
කා[8] මරණයට ගොදුරු වන්නෝය.
ඔවුන්ට සිදු වන විපත දකින සියල්-
ලෝ පුදුමයට පත් වනු ඇත. ඔවුහු
අන් අය ඉදිරියේ නින්දාවට ලක් වන්-
නෝය. සියල්ලෝ ඔවුන්ට ශාප කරනු
ඇත.[9] **13** යෙරුසලමේ වැසියන්ට
මා කඩුවෙන්ද සාගතයෙන්ද වසං-
ගතවලින්ද පහර දී දඬුවම් කළාක්
මෙන් ඊජිප්තුවට පැමිණ එහි පදිංචි
වී සිටින සියලුදෙනාටත් මම දඬුවම්
කරන්නෙමි.[10] **14** පලා ගිය කිහිප-
දෙනෙකු හැරෙන්න ඊජිප්තු දේශයේ
පදිංචි වීමට පැමිණි කිසිම යුදෙව්-
වෙක්ට මා ගෙනෙන විපත්තිවලින්
බේරී යන්නවත් තම ජීවිතය ගලවා-
ගන්නවත් ලැබෙන්නේ නැත.[11] ඔවුන්
නැවත යූදා දේශයට යෑමට ආශාවෙන්
බලා සිටියත් ඔවුන්ගෙන් කිසිවෙක්ට
එහි යෑමට ලැබෙන්නේ නැත.' "[12]

**15** යෙරෙමියාගේ පණිවිඩයට
සවන් දුන් පසු, තම භාර්යාවන් වෙ-
නත් දෙවිවරුන්ට සුවඳ දුම් ඔප්පු
කරන බව දැන සිටි සියලු පුරු-
ෂයෝද[1] රැස්ව සිටි ඔවුන්ගේ භාර්-
යාවෝ සියලුදෙනාද ඊජිප්තු දේශයේ
පත්‍රොස්හි[2] ජීවත් වූ සියලුදෙනාද[3] යෙ-
රෙමියාට මෙසේ කීවෝය. **16** "ඔබ
යෙහෝවා දෙවිගේ නාමයෙන් අපට
පැවසූ දේවලට අපි කීකරු වෙන්-
නේ නැහැ.[4] **17** අපිත්[5] අපේ මුතුන්-
මිත්තනුත්[6] රජවරුනුත්[7] අධිපතීනුත්
පොරොන්දු වුණු විදිහට[8] යූදාහි නගර-
වල හා යෙරුසලමේ වීථිවල අහස් දේ-
වතාවියට සුවඳ දුම්[9] හා පාන පූජා[10]
ඔප්පු කළා. දැනුත් අපි ඒ විදිහ-
ටම කරනවා. මොකද ඒ කාලයේ
අපිට ඇති තරම් කන්න බොන්න
තිබුණා. අපි කිසි කරදරයක් නැතුව
ජීවත් වුණා.[11] **18** ඒත් අහස් දේව-
තාවියට[12] සුවඳ දුම් හා පාන පූජා ඔප්පු
කිරීම නතර කළ දවසේ සිට අපිට ඒ
හැම දෙයක්ම නැති වුණා. අපි කඩුව-
ටත් සාගතයටත් ගොදුරු වුණා.[13]

**19** "අපි අහස් දේවතාවියට සුවඳ
දුම් ඔප්පු කළෙත්[14] ඇගේ රූපයට
සමාන රොටි සාදා ඒවා ඇයට ඔප්පු
කළෙත් පාන පූජා ඇය ඉදිරියේ වැගි-
රෙව්වෙත්[15] අපේ පුරුෂයන්ගේ අනුදැ-
නුම ඇතුව නොවෙයිද?"[16]

**20** එවිට යෙරෙමියා තමාට ඒ
දේවල් පැවසූ සියලු පුරුෂයන්ටද
ඔවුන්ගේ භාර්යාවන්ටද අනික් සියලු-
දෙනාටද මෙසේ කීවේය. **21** "ඔබත්[17]
ඔබේ මුතුන්මිත්තනුත්[18] රජවරුනුත්[19]
අධිපතීනුත්[20] අනික් වැසියනුත් යූදාහි
නගරවල හා යෙරුසලමේ වීථිවල
සුවඳ දුම් ඔප්පු කළ ආකාරය[21] යෙ-
හෝවා දෙවිගේ මතකයේ තිබුණා.[22]
**22** ඔබ කළ ඒ දුෂ්ට දේවල් හා
පිළිකුල්සහගත ක්‍රියා යෙහෝවා දෙ-
විට තවදුරටත් ඉවසා සිටීමට නො-
හැකි වූ නිසා[23] ඔහු දේශය විනාශ කර
දැමුවා. එය අද දක්වාම මිනිස් පුළුටක්
නැතුව පාළුවට ගොස් තිබෙන්නෙත්
අන් අයගේ පුදුමයට හා ශාපයට ලක්
වී තිබෙන්නෙත් ඒ නිසයි.[24] **23** ඔබ
යෙහෝවා දෙවිගේ හඬට ඇහුම්කන්

**44 පරි.**

**1** ගීතා 51:17
**2** හිතෝ 28:14; යෙරෙ 36:24
**3** නෙහෙ 9:26
**4** ද්වි 6:2; එස 20:13
**5** ලෙවී 17:10; ලෙවී 20:5; යෙරෙ 21:10; ආමො 9:4
**6** යෙරෙ 42:15
**7** එස 30:13
**8** යෙරෙ 42:22
**9** යෙරෙ 42:18
**10** යෙරෙ 21:9; යෙරෙ 24:10; යෙරෙ 43:11
**11** යෙසා 30:2
**12** යෙරෙ 22:27

**2 තීරුව**

**1** ද්වි 13:6; ද්වි 13:8; යෙරෙ 44:9
**2** යෙරෙ 44:1
**3** යෙරෙ 43:7
**4** හිතෝ 21:29; යෙසා 3:9; යෙරෙ 6:16; යෙරෙ 44:5
**5** යෙරෙ 32:29
**6** 2රාජා 17:16; නෙහෙ 9:34; ගීතා 106:6
**7** 2රාජා 23:26; 2ලේක 36:12; දානි 9:8
**8** ගණන් 30:12; ගීතා 17:10; හිතෝ 1:31
**9** ද්වි 4:19; ද්වි 17:3; යෙරෙ 44:19
**10** ද්වි 32:38; යෙරෙ 7:18
**11** නික් 16:3
**12** ද්වි 4:19; යෙරෙ 7:18
**13** යෝබ් 21:14; ගීතා 73:12
**14** ද්වි 4:19; යෙරෙ 44:17
**15** යෙසා 57:6; යෙරෙ 7:18
**16** ගණන් 30:11; ගණන් 30:14; 2ලේක 21:6
**17** 1රාජා 14:22
**18** 1රාජා 11:33; ගීතා 79:8
**19** 1රාජා 15:3; 2ලේක 21:11; 2ලේක 25:14; 2ලේක 33:3; යෙරෙ 44:17
**20** යෙරෙ 32:32; එස 8:12
**21** යෙරෙ 11:13; එස 16:24
**22** හොෂෙ 7:2; ආමො 8:7

---

**23** එස 7:3; **24** 1රාජා 9:8; ගීතා 107:34; යෙරෙ 25:11; විලා 2:15; එස 11:21; එස 33:29.

නොදී[1] ඔහුගේ නීතිය කඩ කළා.[2] ඔබ
ඔහුගේ අණපනත්වලට කීකරු වුණේ-
වත් ඔහුගේ සිහිගැන්වීම්වලට ඇහුම්-
කන් දුන්නේවත් නැහැ. ඔබ වෙනත්
දෙවිවරුන්ට සුවඳ දුම් ඔප්පු කරමින්[3]
යෙහෝවා දෙවිට විරුද්ධව පව් කළා.[4]
අද ඔබට මේ හැම විපතකටම මුහුණ
දීමට සිදු වී තියෙන්නේ ඒ නිසයි.”[5]
**24** යෙරෙමියා තවදුරටත් සියලු
සෙනඟට හා ස්ත්‍රීන්ට කතා කර-
මින් මෙසේ කීවේය. “ඊජිප්තුවේ සිටින
යුදෙව්වරුනි,[6] යෙහෝවා දෙවි පවසන
දේට ඇහුම්කන් දෙන්න. **25** ස්වර්-
ගයේ සේනාවල අධිපතිද ඊශ්‍රායෙල්හි
දෙවිද වන යෙහෝවා පවසන්නේ මෙ-
යයි. ‘“අපි අහස් දේවතාවියට වූ භාර-
යට අනුව සුවඳ දුම්[7] හා පාන පූජා[8]
අනිවාර්යයෙන්ම ඇයට ඔප්පු කර-
නවා”[9] කියා ඔබේ භාර්යාවන් දුන්
පොරොන්දුව ඔබත් ඔබේ භාර්යා-
වනුත් ඉෂ්ට කරමින් සිටින්නහුය.[10]
භාර්යාවෙනි, ඔබ වූ භාරය දිග-
ටම ඔප්පු කරන්න. නොවරදවාම එය
ඉෂ්ට කරන්න.’
**26** “ඊජිප්තුවේ ජීවත් වන යුදෙව්-
වරුනි,[11] යෙහෝවා දෙවි පවසන
දේට ඇහුම්කන් දෙන්න. ‘යෙහෝවා
දෙවි පවසන්නේ මෙයයි. “ඊජිප්තු-
වේ ජීවත් වන කිසි යුදෙව්වෙක්
තවදුරටත් මාගේ නාමය භාවිත
නොකරනු ඇත.[12] ‘විශ්වයේ පාල-
කයාණන් වන යෙහෝවා දෙවි ජීව-
මානයි’[13] කියා ඔවුහු තවදුරටත්
නොකියනු ඇත. ඒ බව මම මාගේ
ශ්‍රේෂ්ඨ නාමයෙන් දිවුරා[14] ඔබට පව-
සන්නෙමි. **27** ඔවුන් පිටට යහපත
නොව විපත්ති ගෙන ඒමට මම බලා
සිටිමි.[15] ඊජිප්තුවේ ජීවත් වන යුදෙව්-
වරු සියලුදෙනාම කඩුවෙන් හා සාග-
තයෙන් පහර කා විනාශ වී යනු
ඇත.[16] **28** කඩු පහරින් බේරෙන
කිහිපදෙනෙක් පමණක් ඊජිප්තුවේ
සිට යූදා දේශයට නැවත හැරී යනු
ඇත.[17] එවිට යූදාහි ඉතුරු වූ යුදෙව්-
වරු එනම්, විදේශිකයන් ලෙස ජීවත්
වීමට ඊජිප්තු දේශයට පැමිණි යුදෙව්-
වරු, ඉටු වන්නේ තමන් පැවසූ දේද
නැත්නම් මා පැවසූ දේද කියා හොඳින්
තේරුම්ගනු ඇත.”’”[1]
**29** “යෙහෝවා දෙවි මෙසේද පව-
සන්නේය. ‘මම මේ දේශයේදීම ඔබට
දඬුවම් කරන්නෙමි. එවිට ඔබට පැමි-
ණෙන විපත්ති ගැන මා ප්‍රකාශ
කළ සෑම වචනයක්ම නිසැකවම ඉටු
වන බව ඔබ දැනගනු ඇත.[2] ඒ
සඳහා මා ඔබට දෙන ලකුණ මෙ-
යයි.’[3] **30** යෙහෝවා දෙවි තවදුර-
ටත් මෙසේ පවසන්නේය. ‘යූදාහි රජු
වූ ශෙදකියාව, ඔහුගේ ජීවිතය විනාශ
කර දැමීමට සෙවූ ඔහුගේ සතුරා
වූ බැබිලෝනියේ රජු වන නෙබුකද්-
රෙෂර්ගේ අතට මා භාර දුන්නාක්
මෙන්[4] ඊජිප්තුවේ රජු වන හොප්රා
නමැති පාරාවෝවත්[5] ඔහුගේ සතු-
රන්ගේ අතට එනම්, ඔහුගේ ජීවිතය
විනාශ කර දැමීමට සොයන අයගේ
අතට මම භාර දෙන්නෙමි.’”[6]

**45** යොෂියාගේ පුත්‍රයා වූ යූදාහි
රජු වූ යෙහෝයාකිම් පාල-
නය කළ හතරවන අවුරුද්දේදී[7]
යෙරෙමියා පැවසූ දේවල්[8] නෙරියා-
ගේ පුත් බාරුක්[9] ලියාගත්තේය. ඒ
කාලයේදී අනාගතවක්තෘ යෙරෙමියා
ඔහුට මෙය පැවසුවේය.
**2** “බාරුක්, මට ඇහුම්කන්
දෙන්න. ඊශ්‍රායෙල්හි දෙවි වන යෙ-
හෝවා ඔබ ගැන පවසා ඇත්තේ මෙ-
යයි. **3** ‘“අනේ, මට සිදු වූ විපතක
මහත![10] මම කලකිරී දුකෙන් සිටියා.
යෙහෝවා දෙවි මගේ දුක තවත් වැඩි
කළා. මට සැනසිල්ලේ ජීවත් වෙන්න-
වත් තැනක් නැහැ.[11] මම ගත කරන
මේ ජීවිතය දැන් මට ඇති වෙලා”
කියා ඔබ පැවසුවෙහිය.’
**4** “එබැවින් මේ දේ බාරුක්ට
කියන ලෙස දෙවි මට පැවසුවා. ‘යෙ-
හෝවා දෙවි පවසන්නේ මෙයයි. “මා
දේශයේ ගොඩනැඟූ දේවල් මම කඩා
බිඳ දමන්නෙමි. මා සිටෙවූ දේවල්
උදුරා දමන්නෙමි.[12] **5** නමුත් ඔබ,
ඔබ ගැනම සිතමින් ඔබටම බො-
හෝ දේවල් ලබාගැනීමට උත්සාහ

**44 පරි.**
**1** 2ලේක 36:16
යෙරෙ 44:5
**2** ගීතා 119:150
**3** යෙරෙ 44:8
**4** විලා 1:8
**5** 1රාජා 9:9
නෙහෙ 13:18
දානි 9:11
**6** යෙරෙ 43:7
යෙරෙ 46:14
**7** ද්වි 4:19
ද්වි 17:3
යෙරෙ 7:18
**8** යෙරෙ 44:17
**9** යෙසා 30:1
යෙසා 65:2
**10** යෙරෙ 44:15
**11** යෙරෙ 43:7
**12** එස 20:39
**13** යෙසා 48:2
යෙරෙ 5:2
**14** උත් 22:16
හෙබ්‍රෙ 6:13
**15** යෙරෙ 1:10
යෙරෙ 4:18
යෙරෙ 5:19
යෙරෙ 11:17
යෙරෙ 21:10
යෙරෙ 31:28
එස 7:6
**16** යෙරෙ 44:12
**17** ලෙවී 26:44
යෙසා 27:13
යෙරෙ 44:14

**2 තීරුව**
**1** ගීතා 33:11
යෙසා 55:11
**2** යෙසා 40:8
**3** 1සාමු 2:34
1සාමු 10:7
2රාජා 20:9
**4** 2රාජා 25:7
යෙරෙ 34:21
යෙරෙ 39:5
යෙරෙ 52:9
**5** යෙරෙ 46:25
එස 29:3
එස 30:10
**6** යෙරෙ 43:12
යෙරෙ 46:24

**45 පරි.**
**7** යෙරෙ 25:1
යෙරෙ 36:1
**8** යෙරෙ 36:4
යෙරෙ 36:32
**9** යෙරෙ 32:12
යෙරෙ 43:3
**10** යෙරෙ 15:10
**11** යෙරෙ 8:18
**12** යෙසා 5:5
යෙරෙ 31:28

කරමින් සිටින්නෙහිය.[1] බාරුක්, තව-
දුරටත් එසේ නොකරන්න.” ’[2]
“ ‘මන්ද සියලුදෙනා පිටට මම
මහත් විපතක් ගෙනෙන්නෙමි’[3] කියා
යෙහෝවා දෙවි පවසන්නේය. ‘නමුත්
ඔබ යන සෑම තැනකදීම මම ඔබේ
ජීවිතය ආරක්ෂා කරන්නෙමි.’ ”[4]

**46** විවිධ ජාතීන් ගැන අනාග-
තවක්තෘ යෙරෙමියාට යෙ-
හෝවා දෙවිගෙන් පණිවිඩ ලැබිණ.[5]
**2** මුලින්ම ලැබුණේ ඊජිප්තුවේ යුධ
හමුදාව ගැන පණිවිඩයයි.[6] ඒ
කාලයේදී කර්කෙමිෂ්හි[7] යුප්‍රටීස් ගඟ
අසලදී බැබිලෝනියේ රජු වූ නෙබු-
කද්රෙෂර් විසින් ඊජිප්තුවේ රජු වූ නෙ-
කෝ නමින් හැඳින්වූ පාරාවෝගේ[8]
යුධ හමුදාව පරාජයට පත් කරන ලදි.
ඔහු එසේ කළේ යොෂියාගේ පුත්‍රයා වූ
යූදාහි රජු වූ යෙහෝයාකිම් පාලනය
කළ හතරවන අවුරුද්දේදීය.[9] යෙරෙ-
මියාට දෙවිගෙන් ලැබුණු පණිවිඩය
මෙයයි. **3** “ජනයෙනි, කුඩා පලි-
හත් විශාල පලිහත් රැගෙන සටනට
යෑමට සූදානම් වෙන්න.[10] **4** අසරු-
වෙනි, අශ්වයන්ව යුද්ධයට සූදානම්
කරන්න. යුධ ඇඳුමින් සැරසී[11] හිස්-
වැසුම් පැළඳගන්න. හෙල්ලයේ තුඩ
හොඳින් උල් කරගෙන අශ්වයන් පිට
නැඟී පෙළට සිටින්න.
**5** “යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. ‘මා දකින්නේ කුමක්ද?
ඔවුහු තැතිගෙන හැරී යන්නෝය.
ඔවුන්ගේ බලවන්තයෝ අන්ත පරාජ-
යක් අද්දැක පසුපස නොබලා පලා
දුවන්නෝය.[12] භීතිය දසත පැතිරී
ගොසින්ය.[13] **6** එබැවින් වේගයෙන්
දිවීමට හපන් සියල්ලෙනි, පලා යෑමට
තැත් නොකරන්න. බලවන්තයෙනි,
බේරී යෑමට උත්සාහ නොකරන්න.[14]
උතුරු දෙසින්[15] පිහිටා ඇති යුප්‍රටීස්
ගඟ අසලදී ඔබ සියලුදෙනාම වැටී
යනු ඇත.’[16]
**7** “දෙගොඩ තලා ගලා යන නයිල්
ගංගාව මෙන්ද රැලි නංවමින් වේග-
යෙන් ඉදිරියටම ඇදී යන ගංගාවන්
මෙන්ද පැමිණෙන මේ තැනැත්තා
කවුද?[1] **8** ඒ වෙන කවුරුත් නො-
වෙයි, ඊජිප්තුවේ යුධ හමුදාවයි. ඔවුන්
දෙගොඩ තලා ගලා යන නයිල්
ගංගාව මෙනි.[2] රැලි නංවමින් වේග-
යෙන් ඇදී යන ගංගාවන් මෙනි.[3] ඔවුහු
වේගයෙන් ඉදිරියට ගමන් කරති.
‘අපි ගොස් මුළු පොළොවම යටත්
කරගනිමු. අපි නගරයත් එහි වැසි-
යන්වත් විනාශ කිරීමට ඉක්මනින්
යමු’[4] කියා ඔවුහු එකිනෙකා අතරේ
කතා කරගනිති. **9** අශ්වයෙනි, වේ-
ගයෙන් දිව යන්න. අශ්ව රථ සේනා-
වෙනි, සියල්ල සුනුවිසුනු කරගෙන
ඉදිරියට යන්න. නිර්භීත භේවායෙනි,
පසු නොබසින්න. පලිස් හොඳින් හසු-
රුවන කූෂ්වරුනි,[5] පූට්වරුනි,[6] ඉදි-
රියටම යන්න. දක්ෂ ලෙස දුනු
හසුරුවන ලූදිම්වරුනි,[7] පසු නොබැස
ඉදිරියටම යන්න.
**10** “ස්වර්ගයේ සේනාවල අධිපතිද
විශ්වයේ පාලකයාද වන යෙහෝවා
දෙවි තම සතුරන්ට දඬුවම් කරන
දවස එයයි.[8] කඩුව සියලුදෙනාට
පහර දී තෘප්තියට පත් වනු ඇත.
පිපාසය සන්සිඳෙන තුරුම එය ඔවුන්-
ගේ ලේ පානය කරනු ඇත. මන්ද
ස්වර්ගයේ සේනාවල අධිපතිද විශ්ව-
යේ පාලකයාද[9] වන යෙහෝවා දෙවි,
උතුරු දේශයේ යුප්‍රටීස් ගංගාව අසල[10]
එදින පූජාවක් සූදානම් කර ඇත.[11]
**11** “ඊජිප්තු දියණිය,[12] ගිලියද් දේ-
ශයට ගොස් බෝල්සම් තෛලය
ලබාගන්න.[13] ඔබ සුවය ලබාගැනී-
මට කොතරම් උත්සාහ දැරුවත් ඉන්
කිසිම පලක් නැත. කිසිවකින් ඔබට
සුවයක් නොලැබේ.[14] **12** ඔබ අද්දුටු
ලැජ්ජාසහගත තත්වය ගැන ජාතීන්ට
ආරංචි වී ඇත.[15] ඔබේ වැලපීමේ හඬ
මුළු දේශය පුරාම පැතිරී ගොස් ඇත.[16]
එක් බලවන්තයෙකු තවත් බලවන්-
තයෙකු සමඟ ගැටී[17] දෙදෙනාම එකට
ඇද වැටුණෝය.”
**13** ඊජිප්තු දේශයට පහර දීමට
පැමිණෙන බැබිලෝනියේ රජු වන

**45 පරි.**
1 රෝම 12:16; 1කොරි 7:31; 1තිමෝ 6:6; හෙබ්‍රෙ 13:5
2 පිලි 1:10
3 යෙසා 66:16; යෙරෙ 25:26; ශෙප 3:8
4 යෙරෙ 21:9; යෙරෙ 39:18; යෙරෙ 43:6

**46 පරි.**
5 යෙරෙ 1:10; යෙරෙ 25:15
6 යෙරෙ 25:19; එස 29:2; එස 32:2
7 යෙසා 10:9
8 2රාජ 23:29; 2ලේක 35:20
9 2රාජ 23:36; 2ලේක 36:5; යෙරෙ 25:1; යෙරෙ 36:1
10 යෙරෙ 51:11
11 1සාමු 17:5
12 2රාජ 7:7
13 යෙසා 19:16; යෙරෙ 6:25; යෙරෙ 49:29; එස 32:10
14 ගීතා 33:16
15 යෙරෙ 1:14; යෙරෙ 6:1; යෙරෙ 25:9
16 2රාජ 24:7; යෙසා 8:15

**2 තීරුව**
1 යෙසා 8:7; යෙරෙ 47:2
2 එස 29:3
3 එස 32:2
4 2ලේක 35:20
5 උත් 10:6; 1ලේක 1:8
6 එස 27:10; එස 38:5; නාහු 3:9
7 උත් 10:13; 1ලේක 1:11; යෙසා 66:19; එස 30:5
8 යෙසා 13:6; යෝවෙ 1:15; යෝවෙ 2:1; ශෙප 1:14
9 ගීතා 141:8
10 2රාජ 24:7
11 ද්වි 32:42; යෙසා 34:6; එස 39:17; ශෙප 1:7
12 යෙසා 47:1; යෙරෙ 14:17
13 උත් 37:25; යෙරෙ 8:22; යෙරෙ 51:8

**14** යෙරෙ 30:12; **15** එස 32:9; **16** යෙරෙ 49:21; **17** යෙසා 19:2.

නෙබුකද්රෙෂර් ගැන අනාගතවක්තෘ
යෙරෙමියාට යෙහෝවා දෙවි පැවසූ
දේ මෙයයි.[1] **14** “ජනයෙනි, මෙය
ඊජිප්තු දේශයේ ප්‍රකාශ කරන්න. මිග්-
දෝල්හිද[2] නොෆ්හිද[3] තාහ්පනේස්හිද[4]
මෙය දැනුම් දෙන්න. ‘ඔබ අවට ඇති
සියල්ල කඩුවෙන් විනාශ වීමට නිය-
මිත නිසා[5] එයට මුහුණ දීමට සූදා-
නමින් සිටින්න.[6] **15** දිය පහරකට
ගසාගෙන යන්නාක් මෙන් ඔබේ බල-
වන්තයෝ විනාශ වී ගියෝය.[7] යෙ-
හෝවා දෙවිම ඔවුන්ට පහර දුන්
නිසා[8] ඊට මුහුණ දීමට ඔවුන්ට නො-
හැකි විය. **16** ඔවුන්ගෙන් බොහෝ-
දෙනෙක් බිමටම ඇද වැටුණෝය.
ඔවුහු එකිනෙකා අතරේ මෙසේ කියා-
ගත්තෝය. “අපිට තවදුරටත් සතුරා-
ගේ මාරාන්තික කඩුවට මුහුණ
දෙන්න බැහැ. ඒ නිසා අපි අපේ සෙ-
නඟ වෙතටත් අපේ ඥාතීන්ගේ දේ-
ශය වෙතටත් පලා යමු.”’ **17** ඔවුහු
මෙසේ පැවසුවෝය. ‘ඊජිප්තුවේ රජු
වන පාරාවෝ පුරසාරම් දොඩන්නෙකු
පමණයි.[9] ඔහු අපිට තිබුණු උත්සව
කාලයත් නැති කර දැමුවා.’[10]
**18** “ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා යන නමින් හඳුන්වන[11]
රජ මෙසේ පවසන්නේය. ‘ඔහු අනි-
වාර්යයෙන්ම පැමිණෙන බව ජීවමාන
දෙවි වන මම පවසමි. ඔහුගේ පැමි-
ණීම කොතරම් තේජාන්විතද කිව-
හොත් එය කඳු අතරින් කැපීපෙනෙන
තාබෝර් කන්ද[12] මෙන් වන්නේය.
මුහුද අසල පිහිටි කර්මෙල් කඳුවැටිය[13]
මෙන්ද වන්නේය. **19** ඊජිප්තු දිය-
ණිය,[14] කදමලු බැඳගෙන වහල්කමට
යෑමට සූදානම් වන්න.[15] නොෆ් නගර-
යේ[16] කිසිම වැසියෙකු ඉතුරු නොවන
ලෙස එය ගින්නෙන් දැවී විනාශ වී
යන්නේය.[17] එයට සිදු වන දේ දකින
සියලුදෙනා පුදුමයට පත් වන්නෝය.
**20** ඊජිප්තුව ශෝභමාන වැස්සියක
මෙන් සිටින්නීය. නමුත් ඇයව විනාශ
කර දැමීමට මදුරුවෙක් උතුරු දෙසින්
පැමිණෙන්නේය.[18] **21** ඇය කුලියට
ගත් යුධ හටයන්, තර වස්සන් මෙනි.[19]

**46 පරි.**
1 යෙරෙ 43:10; එස 29:19; එස 30:10
2 යෙරෙ 44:1; එස 29:10; එස 30:6
3 යෙසා 19:13; යෙරෙ 2:16; හොෂෙ 9:6
4 යෙරෙ 43:7; එස 30:18
5 යෙසා 34:6; යෙරෙ 2:30; යෙරෙ 12:12; යෙරෙ 46:10
6 යෙරෙ 6:4; යෝවෙ 3:9
7 නික් 15:10; විනි 5:21; ගීතා 18:4
8 ගීතා 18:14; ගීතා 44:2; ගීතා 68:2
9 1රාජා 20:11; හිතෝ 12:24; දේශ 3:8
10 එස 29:3
11 යෙසා 48:2; යෙරෙ 44:26; යෙරෙ 48:15; මලා 1:14
12 යොෂු 19:22; විනි 4:6; ගීතා 89:12
13 1රාජා 18:42
14 යෙරෙ 48:18
15 එස 12:3
16 යෙරෙ 44:1
17 එස 32:15; ශෙප 2:5
18 යෙරෙ 1:14; යෙරෙ 47:2
19 යෙරෙ 50:27

**2 තීරුව**
1 යෙරෙ 46:15
2 යෙරෙ 46:5
3 ගීතා 37:13
4 යෙසා 29:4
5 එස 20:46
6 විනි 6:5; විනි 7:12; නාහු 3:17
7 යෙරෙ 46:11
8 යෙරෙ 1:15; යෙරෙ 47:2; එස 30:10
9 එස 30:14
10 නාහු 3:8
11 නික් 12:12; යෙසා 19:1; යෙරෙ 43:13
12 2රාජා 7:6
13 යෙසා 20:5; යෙසා 30:2; යෙසා 31:1; යෙරෙ 17:5; යෙරෙ 42:14
14 යෙරෙ 43:11; යෙරෙ 44:30; එස 32:11

නමුත් ඔවුන් පිටට විපත්ති පැමිණෙන
දවසේදී ඔවුහු සියලුදෙනා ඊට මුහුණ
දීමට නොහැකිව[1] පලා දුවන්නෝය.[2]
ඔවුන්ට දඬුවම් කරන කාලයේදී[3] එය
දරාගත නොහැකිව ඔවුහු පසුබසින්-
නෝය.’
**22** “‘සතුරු සේනාවක් ගස් කපන්-
නන් මෙන් පොරෝ අතැතිව ඇය
වෙතට පැමිණෙන නිසා ඇය සර්ප-
යෙකු මෙන් නිහඬව පලා යනු ඇත.’[4]
**23** යෙහෝවා දෙවි මෙසේද පවසන්-
නේය. ‘ඇතුල් වීමට නොහැකි තර-
මට ගනව වැඩුණු ඇගේ වනළැහැබ
ඔවුහු කපා දමනු ඇත.[5] ඔවුන්ගේ
ගණන පළඟැටියන්ගේ ගණනටත්
වඩා වැඩිය.[6] එය කිසිවෙකුට ගණන්
කළ නොහැකිය. **24** ඊජිප්තු දිය-
ණිය[7] නිසැකවම ලැජ්ජාවට පත් වනු
ඇත. උතුරු දේශයෙන් පැමිණෙන
සෙනඟගේ අතට ඇයව භාර දෙනු
ලැබේ.’[8]
**25** “ස්වර්ගයේ සේනාවල අධිප-
තිද ඊශ්‍රායෙල්හි දෙවිද වන යෙ-
හෝවා මෙසේ පවසන්නේය. ‘නෝ*
නගරයේ[9] දෙවියා වන ආමොන්ටත්[10]
ඊජිප්තුවට හා ඇගේ දෙවිවරුන්ටත්[11]
ඇගේ රජවරුන්ටත්[12] පාරාවෝටත්
ඔහු කෙරෙහි විශ්වාස තබන සියලුදෙ-
නාටත්[13] මම දඬුවම් කරන්නෙමි.’
**26** “යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ පවසන්නේය. ‘ඔවුන්ගේ ජීවිත
විනාශ කර දැමීමට සොයන අයගේ
අතටත් බැබිලෝනියේ රජු වන නෙ-
බුකද්රෙෂර්ගේ අතටත්[14] ඔහුගේ සේ-
වකයන්ගේ අතටත් මම ඔවුන්ව හසු
කර දෙන්නෙමි. නමුත් කලක් ගත වූ
පසු නැවතත් සෙනඟ ඊජිප්තු දේශයේ
පෙර මෙන් ජීවත් වනු ඇත.’[15]
**27** “‘නමුත් මාගේ සේවක
යාකොබ්, භය නොවන්න. ඊශ්‍රායෙල්,
අධෛර්යයට පත් නොවන්න.[16] මන්ද
ඈත දේශයක සිටින ඔබව මම

---

**15** එස 29:14; **16** යෙසා 41:13; යෙසා 43:1; යෙසා 44:2; යෙරෙ 30:10.

---

යෙරෙ **46:25*** තේබ්ස් ලෙසද හඳුන්වනු ලැබේ.

බේරාගන්නෙමි. වහල්භාවයේ සිටින
ඔබේ දරුවන්ව මම ගලවාගන්නෙමි.[1]
යාකොබ් නැවත පැමිණ කිසිවෙකු-
ගෙන් කරදරයක් නැතුව සුරක්ෂිතව
ජීවත් වනු ඇත.'[2] **28** යෙහෝවා
දෙවි තවදුරටත් මෙසේ පවසන්නේය.
'මාගේ සේවක යාකොබ්, මා ඔබ
සමඟ සිටින නිසා කිසි දෙයකට භය
නොවන්න.[3] ඔබව විසුරුවාහැරිය දේ-
ශවල සිටින සියලු ජාතීන්ව මම සහ-
මුලින්ම විනාශ කර දමන්නෙමි.[4] මම
ඔවුන්ට එසේ කළත් ඔබට නම් එසේ
නොකරමි.[5] නමුත් මම ඔබට දඬු-
වම් නොකර සිටින්නේද නැත.[6] සුදුසු
ප්‍රමාණයට මම ඔබට අවශ්‍ය හික්මවීම
දෙන්නෙමි.' "[7]

**47** පිලිස්තිවරුන් ගැනද අනාග-
තවක්තෘ යෙරෙමියාට යෙ-
හෝවා දෙවිගෙන් පණිවිඩයක්
ලැබිණ.[8] මෙය ලැබුණේ පාරාවෝ
විසින් ගාසා නම් නගරය විනාශ
කිරීමට පෙරය.[9] **2** යෙහෝවා දෙවි
මෙසේ පවසන්නේය.

"උතුරු දෙසින්[10] මහා ජල ධාරා-
වක් ගලා ඇවිත්[11] මුළු දේශයම ජල-
යෙන් යට කර දමනු ඇත. නගරයත්
එහි වැසියොත් එහි ඇති සියලු දේත්
ජලයෙන් වැසී යනු ඇත.[12] මනුෂ්‍ය-
යෝ හඬා වැලපෙන්නෝය. දේශ-
යේ වැසියෝ විලාප නඟන්නෝය.[13]
**3** සතුරු සේනාවේ අශ්වයන්ගේ කුර
ගැටීමේ ශබ්දයත්[14] යුධ රථවලින්
නැඟෙන මහා ඝෝෂාවත්[15] කැරකැ-
වෙන රෝදවලින් නික්මෙන බියකරු
හඬත්[16] නිසා සියලුදෙනා භීතියට
පත් වන්නෝය. තමන්ගේ දරුවන්ව
බේරාගැනීමට තරම්වත් පියවරුන්ට
දිරියක් නැතුව ඔවුහු හිස හැරුණු අත
පලා දුවන්නෝය. **4** ඔවුන් එවැනි
තත්වයකට පත් වන්නේ තීර්[17] සහ
සීදොන්හි[18] වෙසෙන අයට උපකාර
කිරීමට ඉතුරුව සිටි[19] පිලිස්තිව-
රුන් සියලුදෙනාව විනාශ කරන දවස
පැමිණ ඇති නිසාය.[20] එනම්, කප්-
තෝර් දූපතේ සිට පැමිණි අයගෙන්
ඉතුරුව සිටින[21] පිලිස්තිවරුන්ව යෙ-

**46 පරි.**
**1** යෙසා 11:11
යෙරෙ 23:3
යෙරෙ 32:37
එස 39:27
ආමො 9:14
**2** යෙරෙ 23:6
යෙරෙ 33:16
යෙරෙ 50:19
ශෙප 2:7
ශෙප 3:20
**3** ගීතා 46:7
යෙසා 43:2
යෙරෙ 1:19
යෙරෙ 15:20
යෙරෙ 30:10
රෝම 8:31
**4** යෙරෙ 25:9
**5** යෙරෙ 5:10
යෙරෙ 30:11
ආමො 9:8
**6** හෙබ්‍රෙ 12:5
එළි 3:19
**7** යෙරෙ 10:24
1කොරි 11:32

**47 පරි.**
**8** යෙරෙ 25:20
එස 25:15
ශෙප 2:4
**9** උත් 10:19
1රාජා 4:24
ආමො 1:6
සෙක 9:5
**10** යෙරෙ 1:14
යෙරෙ 46:6
**11** යෙසා 8:7
**12** 2රාජා 24:7
යෙරෙ 8:16
යෙරෙ 46:7
**13** යෙරෙ 46:12
**14** විනි 5:22
හිතෝ 21:31
යෙරෙ 8:16
**15** නාහු 2:4
**16** එස 26:10
නාහු 3:2
**17** යෙසා 23:1
යෙරෙ 25:22
එස 26:2
යෝවෙ 3:4
ආමො 1:9
**18** යෙසා 23:4
යෙරෙ 27:3
එස 28:21
**19** එස 30:8
**20** යෙසා 14:31
යෙරෙ 25:20
ආමො 1:8
ශෙප 2:5
**21** උත් 10:14
ද්වි 2:23

**2 තීරුව**
**1** එස 25:16
ආමො 1:8
**2** ශෙප 2:4
**3** යෙසා 15:2
**4** යෙරෙ 25:20
සෙක 9:5

හෝවා දෙවි සම්පූර්ණයෙන්ම විනාශ
කරන දවස පැමිණ ඇති නිසාය.[1]
**5** ගාසා නගරය[2] දුකින් හඬා වැල-
පෙන කාලයක් පැමිණෙන්නේය.*[3]
අෂ්කෙලොන් නගරය[4] පාළුවට ගිය
නටබුන් ගොඩක් බවට පත් වන්-
නේය. එහි තැනිතලාවල වෙසෙන්-
නෙනි, ඉතුරුව සිටින ජනයෙනි, ඔබ
කොපමණ කාලයක් ඔබේ ශරීර කපා-
ගනිමින් ශෝකය ප්‍රකාශ කරන්න-
හුද?[5]

**6** "යෙහෝවා දෙවිගේ අසිපත,[6]
ඔබ නිහඬ වෙන්නේ කවදාද?
ඔබේ කොපුවට ඇතුල් වී[7] නිශ්චලව
සිටින්න.

**7** "අෂ්කෙලොන් නගරයටත් මුහු-
දුබඩ ප්‍රදේශයටත් පහර දෙන ලෙස[8]
යෙහෝවා දෙවි එයට අණ දී තිබේ.
දෙවි එසේ අණ දී තිබියදී එය නිහඬව
සිටින්නේ කෙසේද?"

**48** ස්වර්ගයේ සේනාවල අධිප-
තිද ඊශ්‍රායෙල්හි දෙවිද වන
යෙහෝවා මෝවබ්[9] ගැන පවසන්-
නේ මෙයයි.[10] "නෙබෝ නගරයට
සිදු වූ විපත මොන තරම් දරුණුද![11]
ඇය සම්පූර්ණයෙන්ම විනාශ වී ගො-
සින්ය. සතුරාගේ අතට හසු වූ කිර්-
යතායිම් නගරය[12] අද්දුටු ලැජ්ජාව
මොන තරම්ද! ඇවැන්ත බලකොටුව
සුනුවිසුනු වී ගොසින්ය. එහි වැසියෝ
බියෙන් වෙළී සිටිති.[13] **2** තේජාන්වි-
තව වැජඹුණු මෝවබ් ගැන දැන් කිසි-
වෙක් කතා නොකරති.[14] 'එන්න අපි
මෝවබ් ජාතිය නැත්තටම නැති කර
දමමු'[15] කියා හෙෂ්බොන්හිදී[16] සෙ-
නඟ ඇයට විරුද්ධව කුමන්ත්‍රණය
කළෝය.

"මද්මෙන් නගරය, ඔබවද විනාශ
කර දැමීමට කඩුව ඔබ පසුපස ලුහු-

**5** ලෙවී 21:5; ද්වි 14:1; යෙරෙ 16:6; යෙරෙ 48:37; **6** ද්වි 32:41; එස 21:3; **7** එස 21:30; **8** එස 25:16; **48 පරි.** **9** උත් 19:37; **10** යෙසා 15:1; **11** ගණන් 32:38; **12** යොෂු 13:19; එස 25:9; **13** යෙසා 15:2; යෙසා 16:12; **14** යෙසා 16:14; **15** ගීතා 83:4; **16** ගණන් 32:37; යෙසා 16:8.

යෙරෙ **47:5*** මූ.අ., "ගාසා නගරයට මුඩුකම පැමිණෙන්නේය."

බඳින නිසා උජාරුවෙන් කතා නොක-
රන්න. **3** විනාශයත් බිඳ වැටීමත්
නිසා හෝරනායිම්[1] වෙතින් වැලපීමේ
හඬක් නික්මෙයි. **4** මෝවබ් නැති
නාස්ති වී ගියාය.[2] ඇගේ කුඩා දරුවන්
හඬා වැලපෙන ශබ්දය දසත පැතිරී
ගියේය. **5** ජනයා හඬා වැලපෙමින්
ලූහිත් වෙතට නැඟ යන්නෝය.[3] සිදු
වූ විපත ගැන ආරංචි වූ සෙනඟ හෝ-
රනායිම් වෙතට බැස යන මඟෙහි
විලාප නඟති.[4]

**6** "ඔබේ ජීවිතය බේරාගන්න
අවශ්‍ය නම් පලා දුවන්න.[5] ඔබ පාළු-
කරයේ තිබෙන ජුනිපර් ගසක් මෙන්
වන්න.[6] **7** නමුත් ඔබ ධන සම්පත්
සහ ඔබේම සාර්ථකත්වය මත විශ්වා-
සය තැබූ නිසා සතුරෝ ඔබව යටත්
කරගන්නෝය.[7] තම පූජකයන් හා
අධිපතීන් සමඟ[8] කෙමොෂ් දෙවියාද[9]
වහල්භාවයට යන්නේය.[10] **8** සතුරා
සෑම නගරයකටම කඩාවදින්නේය.[11]
ඔහුගෙන් බේරීමට කිසි නගරයකට
හැකි වන්නේ නැත.[12] යෙහෝවා දෙවි
පැවසූ ලෙසම නිම්නය විනාශ වී යන්-
නේය. තැනිතලාවත් නැති නාස්ති වී
යන්නේය.

**9** "ජනයෙනි, මෝවබ් සඳහා මං-
සලකුණක් තබන්න. ඇගේ නගර
විනාශ වන විට ඇය ඒ දෙසට දිව යනු
ඇත.[13] ඇගේ නගරවලට සිදු වන
විනාශය දකින සියලුදෙනා පුදුමයට
පත් වනු ඇත. ඒවා කිසිවෙකුට ජීවත්
වීමට නොහැකි වන ලෙස නටබුන්
ගොඩක් බවට පත් වනු ඇත.[14]

**10** "යෙහෝවා දෙවි භාර දුන්
වැඩය හරි හැටි ඉටු නොකරන්නාට
ශාප වේවා![15] තම කඩුවෙන් පහර
දී ලේ වැගිරීමට හවුල් නොවන්නාට
ශාප වේවා!

**11** "මෝවබ්වරු යෞවන කාල-
යේ සිට සුරක්ෂිත ජීවිතයක් ගත
කළෝය.[16] ඔවුහු කිසි දිනක වහල්භා-
වයට ගොස් තිබුණේ නැත. ඔවුන්
හරියට භාජනයෙන් භාජනයට මාරු
නොකර යටට මඬ්ඩි බසින තෙක්
එකම භාජනයක නිශ්චලව තිබෙන
වයින් මෙනි.[1] එහි රසය තව තවත්
වැඩි නොවුණෙත් සුවඳෙහි කිසිදු වෙ-
නසක් සිදු නොවුණෙත් ඒ නිසාය.

**12** "යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. 'භාජන පෙරළා දමන්නාක්
මෙන් ඔවුන්වද පෙරළා දැමීමට ඉදිරි-
යේදී මම ඔවුන් වෙතට සෙනඟක්
එවන්නෙමි.[2] ඒ සෙනඟ පැමිණ ඔවුන්-
ගේ භාජන හිස් කර ඔවුන්ගේ විශාල
බඳුන් සුනුවිසුනු කර දමනු ඇත.
**13** බෙතෙල් ගැන මහත් විශ්වාසය-
කින් සිටි ඊශ්‍රායෙල්වරුන් එයට සිදු
වූ දේ ගැන ලැජ්ජාවට පත් වුණාක්
මෙන්[3] මෝවබ්වරුද කෙමොෂ් දෙවි-
යාට සිදු වන දේ නිසා ලැජ්ජාවට පත්
වනු ඇත.[4] **14** "අපි යුද්ධයට දක්ෂ
බලවන්තයෝ" කියා ඔබ ආඩම්බර-
යෙන් කියන්නේ කෙසේද?'[5]

**15** "ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා යන නමින් හඳුන්වන
රජ[6] මෙසේ පවසන්නේය.'මෝවබ්
නැති වී ගොසින්ය. ඇගේ නගර යටත්
කරගැනීමට තැනැත්තෙක් පැමිණ
ඇත.[7] ඇයට සිටි හොඳම තරුණ-
යෝද මරණයට නියම වී ඇත.'[8]

**16** "මෝවබ්වරුන්ගේ විනාශය
අත ළඟය. වැඩි කල් නොගොස් ඔවුන්
පිටට විපත්ති පැමිණෙනු ඇත.[9]
**17** එබැවින් ඔවුන් අවට සිටින සියල්-
ලෙනි, ඔවුන්ගේ නාමය දන්නා වූ
සියල්ලෙනි,[10] 'අලංකාර සැරය-
ටිය, ශක්තිමත් යදණ්ඩ කැඩී ගිය
අයුරු බලන්න'[11] කියමින් ඔවුන් ගැන
ශෝක වන්න.

**18** "දීබොන්[12] දියණිය, ඔබේ තේ-
ජවත් තත්වය අත්හැර පහතට බැස
පිපාසිතව බලා සිටින්න.[13] මන්ද
මෝවබ් විනාශ කළ තැනැත්තා ඔබට
විරුද්ධවද පැමිණ ඔබේ බලකොටු
සියල්ල විනාශ කර දමනු ඇත.[14]

**19** "අරෝයේර් දියණිය,[15] මහ අස-
ලට වී බලා සිටින්න. බේරී පලා
දුවන අයගෙන්, 'කුමක්ද සිදු වුණේ'
කියා අසන්න.[16] **20** මෝවබ් භයා-
නක ලෙස පහර කෑ නිසා[17] දැන්
ලැජ්ජාවට පත්ව සිටින්නීය. එබැවින්

**48 පරි.**
1 යෙසා 15:5
යෙරෙ 48:34
2 ගණන් 21:28
3 යෙසා 15:5
4 ගණන් 21:29
යෙසා 15:3
5 එස 18:23
6 යෝබ් 30:3
යෙරෙ 17:6
7 යෙරෙ 9:23
එස 7:19
හොෂෙ 10:13
8 යෙරෙ 49:3
9 ගණන් 21:29
විනි 11:24
1රාජා 11:7
2රාජා 23:13
10 යෙසා 46:2
යෙරෙ 43:12
11 යෙරෙ 6:26
12 එස 25:9
13 යෙසා 16:14
14 ශෙප 2:9
15 ගණන් 31:15
විනි 5:23
1සාමු 15:19
1රාජා 20:42
16 ගීතා 123:4
හිතෝ 1:32

**2 තීරුව**
1 ශෙප 1:12
2 එස 25:9
3 1රාජා 12:29
හොෂෙ 10:15
ආමො 5:5
4 විනි 11:24
1රාජා 11:7
යෙසා 45:16
5 ගීතා 33:16
හිතෝ 8:13
හිතෝ 15:25
දේශ 9:11
යෙසා 2:12
යෙසා 16:6
6 ගීතා 24:8
යෙරෙ 46:18
දානි 4:37
මලා 1:14
7 යෙසා 16:14
යෙරෙ 48:8
8 යෙසා 34:2
9 ද්වි 32:35
යෙසා 16:14
එස 12:28
එස 25:11
10 රෝම 1:32
11 යෙසා 9:4
යෙසා 14:4
12 ගණන් 21:30
යොෂු 13:17
යෙසා 15:2
13 යෙසා 47:1
යෙරෙ 46:19
14 යෙරෙ 48:8
15 ගණන් 32:34
ද්වි 2:36
2සාමු 24:5
1ලේක 5:8
16 1සාමු 4:14
17 යෙසා 15:5

හඬා වැලපෙන්න. ජනයෙනි, මෝ-
වබ්ට සිදු වූ විපත ගැන ආනොන්හි[1]
ප්‍රකාශ කරන්න. **21** තැනිතලා දේ-
ශය පිටට තීන්දුව ලැබී තිබේ.[2]
එනම්, හෝලොන්, යහෂ්,[3] මෙ-
ෆයත්,[4] **22** දීබොන්,[5] නෙබෝ,[6]
බෙත්-දිබ්ලාතායිම්, **23** කිර්යතා-
යිම්,[7] බෙත්-ගමුල්, බෙත්-මෙයොන්,[8]
**24** කෙරියොත්,[9] බොෂ්රා[10] සහ ළඟ-
පාත මෙන්ම දුර ඈත පිහිටි මෝවබ්
දේශයේ සියලු නගරවලට විරුද්ධව
තීන්දුව ලැබී තිබේ.

**25** "'මෝවබ්ගේ බලය* බිඳ දමා
ඇත.[11] ඔහුගේ බලවත් හස්තය කඩා
දමා ඇත'[12] කියා යෙහෝවා දෙවි
පවසන්නේය. **26** 'ජනයෙනි, මත්
වී වමනය දමන තෙක්ම මෝවබ්ට
බොන්න දෙන්න.[13] මන්ද ඔහු යෙ-
හෝවා දෙවිට විරුද්ධව මහත් ආඩම්-
බරයෙන් කතා කළේය.[14] ඔහු තම
වමනය මත පෙරළෙමින්[15] සියලුදෙ-
නාගේ නින්දාවට ලක් වුණේය.

**27** "'ඔබ ඊශ්‍රායෙල්වරුන්ට කවට-
කම් කළා නොවේද?[16] ඇයි ඔබ
ඊශ්‍රායෙල්වරුන් ගැන කතා කරන
සෑමවිටකම සමච්චලයට මෙන් හිස
වනන්නේ? ඔවුන් සොරුන් අතරේ
සිටිනවා ඔබ දුටුවාද?[17]

**28** "'මෝවබ්හි වැසියෙනි, ඔබේ
නගර අත්හැර දමා ගොස් පර්වත-
වල ජීවත් වෙන්න.[18] පර්වත විවර-
වල කැදලි සාදාගන්නා වූ පරෙවියන්
මෙන් ඔබත් එහි ජීවත් වෙන්න.'"[19]

**29** "මෝවබ්ගේ පුරාජේරුව ගැන
අපට ආරංචි විය.[20] ඔහු ඉතා උඩඟුය.
ඔහුගේ තේජස ගැන ඔහු ඉතා ආඩම්-
බරයෙන් කතා කරන්නේය. ඔහු අහං-
කාරයෙන් ඉදිමී සිටින්නේය."[21]

**30** "යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. 'මෝවබ් කිසිම ගරුසරු-
වක් නැතුව කෝපයෙන් හැසිරෙන
හැටි මම දැක ඇත. ඔහු ආඩම්බ-
රයෙන් මහත් දේවල් පැවසුවත් ඒ
කිසිවක් ඔහුට ඉටු කළ නොහැක.[22]
ඔහුගේ වචන නිකම්ම නිකම් හිස්
වචන පමණි.[1] **31** මා මෝවබ් ගැන
දුක් වී විලාප නඟන්නේ ඒ නිසාය. මම
මුළු මෝවබ් දේශය ගැනම හඬා වැල-
පෙන්නෙමි.[2] කිර්-හෙරෙස්හි වැසියන්[3]
ගැන විලාප නඟන්න.

**32** "'සිබ්මාහි මිදිවැල,[4] යාසෙර්[5]
ගැන මා දුක් වුණාටත් වඩා වැඩි-
යෙන් මම ඔබ ගැන දුක් වන්නෙමි.
ඔබේ අතු සරුව වැඩී මුහුදෙන් එපිටට
විහිදී ගියේය. එය යාසෙර් දක්වාද[6]
විහිදී ගියේය. ඔබේ මිදි පලදාවත්
ගිම්හාන කාලයේ ඔබ ලැබූ පලදා-
වත්[7] සතුරා විනාශ කර දැමුවේය.[8]
**33** මෝවබ් දේශයෙන් හා පලතුරු
වතුවලින් ඇසුණු ප්‍රීති ඝෝෂාව දැන්
පහව ගොසින්ය.[9] මිදි මඩින යන්ත්‍ර-
යෙන් වෑස්සෙන වයින් සිඳී යෑමට මම
සැලැස්වූවෙමි.[10] මින් මත්තට කිසි-
වෙක් ප්‍රීති ඝෝෂා නඟමින් මිදි පාගන්-
නේ නැත. ඔවුන් ඝෝෂා නැඟුවත් එය
ප්‍රීතියෙන් නඟන හඬක් නොවේ.'"[11]

**34** "'හෙෂ්බොන්හි සිට[12] හඬන
ඔවුන්ගේ ශබ්දය[13] එලෙයාලෙ දක්-
වාද[14] යහෂ් දක්වාද[15] විහිදී ගියේය.
ෂොවර්හිදී[16] නැඟුණු ඔවුන්ගේ විලාප-
යේ හඬ හෝරනායිම්ටත්[17] එග්ලත්-
ෂෙලීෂියාටත්[18] ඇසිණ. නිම්රිම්හි දිය
දහරා[19] සියල්ල සිඳී යති. **35** පූජ-
නීය ස්ථානවල ඔප්පු කිරීම සඳහා
පූජා ගෙනෙන අයවත් තමාගේ දෙ-
වියාට සුවඳ දුම් ඔප්පු කරන අය-
වත් මම මෝවබ් දේශයෙන් තුරන්
කර දමන්නෙමි'[20] කියා යෙහෝවා
දෙවි පවසන්නේය. **36** 'මෝවබ් දේ-
ශය ගැනත් කිර්-හෙරෙස් නගරයේ
වැසියන්[21] ගැනත් මාගේ හදවත
හඬා වැලපෙන්නේය. මාගේ හදව-
තෙන් නැඟෙන හඬ බට නළාවකින්
නැඟෙන දුක්මුසු හඬකට සමානය.[22]

---

යෙරෙ **48:25*** මූ.අ., "අඟ."

**48 පරි.**

**1** ගණන් 21:13 යොෂු 13:9 විනි 11:18 යෙසා 16:7
**2** ශෙප 2:9
**3** ගණන් 21:23 විනි 11:20 යෙසා 15:4
**4** යොෂු 13:18 යොෂු 21:37 1ලේක 6:79
**5** ගණන් 32:34 යෙරෙ 48:18
**6** ගණන් 32:3 1ලේක 5:8
**7** ගණන් 32:37 යෙරෙ 48:1
**8** ගණන් 32:38 යොෂු 13:17 එස 25:9
**9** ආමෝ 2:2
**10** ද්වි 4:43
**11** ගීතා 75:10
**12** යෝබ් 38:15 ගීතා 10:15 ගීතා 37:17 එස 30:21
**13** ගීතා 75:8 යෙරෙ 25:15
**14** යෙරෙ 48:42 එස 35:13
**15** යෙසා 19:14
**16** ගීතා 44:13 හිතෝ 24:17 විලා 2:15 ශෙප 2:8
**17** යෙරෙ 2:26
**18** විනි 6:2
**19** ගණන් 24:21 ගීතා 55:6 සල 2:14 යෙරෙ 49:16
**20** ගීතා 94:2 හිතෝ 8:13 යෙසා 16:6 ශෙප 2:10
**21** යෝබ් 40:12 හිතෝ 18:12 යෙසා 25:11 යාකො 4:6
**22** ගීතා 33:10 හිතෝ 21:30

**2 තීරුව**

**1** යෙසා 16:6 යෙසා 44:25 යෙරෙ 50:36
**2** යෙසා 15:5
**3** 2රාජා 3:25 යෙසා 16:7
**4** ගණන් 32:38 යොෂු 13:19 යෙසා 16:8
**5** ගණන් 21:32 ගණන් 32:35 යොෂු 21:39
**6** යොෂු 13:25
**7** යෙරෙ 40:10
**8** යෙසා 16:9 යෙරෙ 48:8
**9** යෙරෙ 25:10; යෝවෙ 1:12; **10** යෙසා 5:10; යෙසා 7:23; **11** යෙසා 16:10; යෙරෙ 25:30; **12** ගණන් 21:25; යොෂු 13:17; යෙරෙ 48:2; **13** යෙසා 15:4; **14** ගණන් 32:37; යෙසා 16:9; **15** ගණන් 21:23; ද්වි 2:32; විනි 11:20; **16** ද්වි 34:3; **17** යෙරෙ 48:3; **18** යෙසා 15:5; **19** යෙසා 15:6; **20** ගණන් 22:40; යෙසා 16:12; **21** යෙරෙ 48:31; **22** යෙසා 15:5; යෙසා 16:11; මතෙ 9:23.

ඔවුන් උපයාගත් වස්තු සම්භාරයම
නැති නාස්ති වී යන්නේය.[1] 37 සිය-
ලුදෙනාම තම හිස් බූ ගාගෙන[2] රැවුල්
කපාගෙන[3] සිටිති. ඔවුහු සියලුදෙනා
අත්වල කැපීම් සිදු කරගෙන,[4] ඉණ
වටා ගෝණි රෙදි ඔතාගෙන සිටිති.' "[5]

38 "යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. 'මෝවබ්හි මංසන්ධිවලින්ද
සෑම නිවසකම පියස්සෙන්ද නික්ම
එන්නේ වැලපීමේ හඬය.[6] මන්ද කිසි
ප්‍රයෝජනයක් නැති භාජනයක් සුනු-
විසුනු කර දමන්නාක් මෙන් මම
මෝවබ් සුනුවිසුනු කර දැමුවෙමි.[7]
39 ඇය බියපත් වූ හැටි බලන්න!
ජනයෙනි, හඬා වැලපෙන්න. මෝ-
වබ් ලැජ්ජාවෙන් පසුබැස ගිය හැටි
බලන්න![8] ඇය වටා සිටින අයගේ
නින්දාවට ඇය ලක් වී ඇත. ඇයට
සිදු වූ දේ දකින සියලුදෙනා භයෙන්
වෙවුලන්නෝය.' "

40 "යෙහෝවා මෙසේ පවසන්-
නේය. 'පියාපත් විහිදුවාගෙන රාජා-
ලියෙක් තම ගොදුර ඩැහැගැනීමට
වේගයෙන් පැමිණෙන්නාක් මෙන්[9]
මෝවබ්ව ගොදුරු කරගැනීමට
තැනැත්තෙක් පැමිණෙන්නේය.[10]
41 ඔහු නගරත් ඇගේ බලකොටු
සියල්ලත් යටත් කරගන්නේය. දරු-
වෙකු බිහි කරන ස්ත්‍රියක අද්දකින
වේදනාවට සමාන වේදනාවක් ඒ දව-
සේදී මෝවබ්හි බලවන්තයෝ අද්ද-
කිනු ඇත.' "[11]

42 " 'යෙහෝවා දෙවිට විරුද්ධව
මහත් ආඩම්බරයෙන් කතා කළ
නිසා[12] මෝවබ් ජාතිය සම්පූර්ණ-
යෙන්ම නැති කර දමනු ලැබේ.[13]
43 මෝවබ්හි වැසියෙනි, භීතිය ඔබ
පසුපස ලුහුබැඳ එන්නේය. ඔබ බොරු
වළකට වැටෙන්නහුය. මර උගුල-
කට හසු වන්නහුය'[14] කියා යෙහෝවා
දෙවි පවසන්නේය. 44 'භයෙන්
පලා දුවන සියලුදෙනා බොරු වළට
වැටෙනු ඇත. එයින් ගොඩ එන අය
මර උගුලට හසු වනු ඇත.'[15]

" 'මා මෝවබ්ට දඬුවම් කරන
කාලයේදී[16] ඇයට මේ සියල්ල-
ටම මුහුණ දීමට සිදු වන්නේය'
කියා යෙහෝවා දෙවි පවසන්නේය.
45 'රැකවරණය සොයා හෙෂ්බොන්
නගරය වෙතට පලා ගිය අය කිසි-
වක් කරකියාගත නොහැකිව අසර-
ණව සිටිති. මන්ද හෙෂ්බොන් වෙතින්
ගින්නක් නැඟී ගියේය.[1] සීහොන්ගේ
නුවර මැදින් ගිනි ජාලාවක් පැමිණි-
යේය.[2] ඒ ගින්නෙන් මෝවබ්ගේ හිසද
ඝෝෂාකාරයන්ගේ පුත්‍රයන්ගේ හිස්
මුදුන්ද දැවී යනු ඇත.'[3]

46 " 'මෝවබ්, ඔබට සිදු වූ විපත
මොන තරම් දරුණුද![4] කෙමොෂ් දෙ-
වියාගේ සෙනඟ[5] විනාශ වී ගියෝය.
ඔබේ පුත්‍රයන්වත් දූවරුන්වත් වහලුන්
ලෙස රැගෙන යන ලදි. 47 නමුත්
මම අවසාන කාලයේදී වහල්භාවයේ
සිටින මෝවබ්වරුන්ව නැවත එකතු
කරගන්නෙමි.[6] මෝවබ්ට දුන් තීන්-
දුව මෙතැනින් අවසන්ය'[7] කියා යෙ-
හෝවා දෙවි පවසන්නේය."

**49** අම්මොන්වරුන්[8] ගැන යෙ-
හෝවා දෙවි පවසන්නේ මෙ-
යයි. "ඊශ්‍රායෙල්ට පුත්‍රයන් නැද්ද?
ඔහුට උරුමක්කාරයෙක් නැද්ද?
එසේනම්, ගාද්ට අයිති දේශය මල්-
කාම්[9] උදුරාගෙන සිටින්නේ ඇයි?[10]
මල්කාම් දෙවියාට නමස්කාර කරන
අය එහි නගරවල වාසය කරන්නේ
ඇයි?"[11]

2 "යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. 'ඉදිරියේදී අම්මොන්වරුන්ට
අයත් නගරයක් වූ රබ්බා නගරයට
විරුද්ධව[12] යුද හඬක් ඇසීමට මම
සලස්වන්නෙමි.[13] ඒ නගරය නටබුන්
ගොඩක් බවට පත් වන්නේය.[14] එහි
අවට පිහිටි කුඩා නගර[15] සියල්ල ගින්-
නෙන් විනාශ වී යනු ඇත.'[16]

" 'එවිට ඊශ්‍රායෙල්, තමන්ගෙන් දේ-
ශය උදුරාගත් අයගෙන් නැවත
එය ලබාගන්නේය'[17] කියා යෙහෝවා
දෙවි පවසන්නේය.

**48 පරි.**
1 හිතෝ 11:4; හිතෝ 18:11; යෙසා 15:7; යෙරෙ 17:11
2 යෙරෙ 16:6; යෙරෙ 47:5; මීකා 1:16
3 යෙසා 7:20; යෙසා 15:2
4 ලෙවි 19:28; 1රාජා 18:28; යෙරෙ 47:5
5 උත් 37:34; එස 27:31; ආනි 9:3
6 යෙසා 15:3; යෙසා 22:1
7 යෙරෙ 22:28; හොෂෙ 8:8
8 යෙසා 20:4
9 ද්වි 28:49; විලා 4:19; හොෂෙ 8:1; හබ 1:8
10 යෙසා 8:8; යෙරෙ 49:22
11 යෙසා 13:8; යෙසා 21:3; යෙරෙ 49:22; මීකා 4:9; 1තෙස 5:3
12 යෝබ් 9:4; හිතෝ 16:18; යෙරෙ 48:29
13 ගීතා 83:4; යෙසා 7:8; යෙරෙ 30:11
14 ගීතා 11:6; යෙසා 24:17
15 1රාජා 19:17; 1රාජා 20:30; ආමො 2:14; ආමො 5:19
16 යෙසා 10:3

**2 තීරුව**
1 ගණන් 21:28; ආමො 2:2
2 ගණන් 21:26; ද්වි 2:26; යොෂු 13:21
3 ගණන් 24:17
4 ගණන් 21:29
5 විනි 11:24; 1රාජා 11:7; 2රාජා 23:13; යෙරෙ 48:7
6 යෙරෙ 49:6; යෙරෙ 49:39
7 එස 25:11

**49 පරි.**
8 උත් 19:38; ද්වි 2:19; 2ලේක 20:1; නෙහෙ 2:19
9 1රාජා 11:5; 1රාජා 11:33; 2රාජා 23:13; ශෙප 1:5

10 ආමො 1:13; 11 ගීතා 9:6; 12 ද්වි 3:11; යොෂු 13:25; එස 25:5; ආමො 1:14; 13 යෙරෙ 4:19; 14 එස 21:20; 15 ගණන් 21:25; යොෂු 17:11; 16 ශෙප 2:9; 17 යෙසා 14:2; යෙරෙ 50:19; මීකා 7:14.

3 "'ආයි නගරය විනාශ වී ගො-
සින්ය. එබැවින් හෙෂ්බොන්හි වැසි-
යෙනි,[1] විලාප නඟන්න.[2] රබ්බා අවට
තිබෙන කුඩා නගරවල වෙසෙන්-
නෙනි, ගෝණි රෙදි ඇඳගෙන[3] බැටළු
කොටු අතරේ එහා මෙහා දුවමින් හඬා
වැලපෙන්න. මන්ද මල්කාම්වද ඔහු-
ගේ පූජකයන්වද අධිපතීන්වද[4] වහ-
ලුන් ලෙස ගෙන යනු ලබන්නේය.[5]
4 "මට විරුද්ධව පැමිණෙන්නේ
කවුද"[6] කියමින් තම වස්තුව මත විශ්-
වාසය තැබූ[7] අවිශ්වාසවන්ත දියණිය,
ඔබට තිබෙන සරුසාර තැනිතලා බිම්
ගැන ඔබ මෙතරම් ආඩම්බරෙන් කතා
කරන්නේ ඇයි?' "[8]
5 "විශ්වයේ පාලකයාද[9] ස්වර්ගයේ
සේනාවල අධිපතිද වන යෙහෝවා
දෙවි මෙසේ පවසන්නේය. 'ඔබ අවට
සිටින්නන් ලවා භයානක දෙයක්
මම ඔබ පිටට පමුණුවන්නෙමි.[10]
ඔබව විවිධ තැන්වලට විසුරුවාහරිනු
ඇත.[11] එසේ පලා දුවන අයව ආපසු
එකට එකතු කිරීමට කිසිවෙක් ඉදිරි-
පත් වන්නේ නැත.' "
6 "'නමුත් කාලයක් ගත වූ පසු
වහල්කමට ගෙන ගිය අම්මොන්ව-
රුන්ව මම නැවත එක් රැස්
කරන්නෙමි'[12] කියා යෙහෝවා දෙවි
පවසන්නේය."
7 ඒදොම් ගැන ස්වර්ගයේ සේ-
නාවල අධිපති වන යෙහෝවා දෙවි
පවසන්නේ මෙයයි. "තේමාන්හි[13] බුද්-
ධිමතුන් කොහේද?[14] ඔවුන්ගේ දැන-
මුතුකම්වලට සිදු වූයේ කුමක්ද?
ඔවුන්ට තිබුණු ප්‍රඥාව දැන් අතු-
රුදහන් වී ගොසින්ද?[15] 8 දෙදාන්හි
වැසියෙනි,[16] පලා දුවන්න.[17] ගැඹුරු
තැන්වලට ගොස් සැඟවෙන්න.[18]
මන්ද ඒසව්ට දඬුවම් කරන කාලය
පැමිණි විට[19] මම අනිවාර්යයෙන්ම
ඔහු පිටට විපත්ති ගෙනෙන්නෙමි.
9 මිදිපල නෙළන්නන් මුළු අස්වැන්-
නම නෙළා නොගෙන අන් අය වෙ-
නුවෙන් යම් ප්‍රමාණයක් ඉතුරු කර
යන්නේ නැද්ද? එමෙන්ම රාත්‍රියේදී
නිවසකට පනින සොරුන් ඔවුන්ට
අවශ්‍ය දේ පමණක් ගෙන ඉතුරු
දේ නිවසේ තබා යන්නේ නැද්ද?[1]
10 නමුත් මම ඒසව්ට අයිති සෑම
දෙයක්ම ඔහුගෙන් උදුරාගන්නෙමි.[2]
ඔහුට තවදුරටත් සැඟවී සිටීමට නො-
හැකි වන සේ[3] ඔහුගේ රහස් තැන්
සියල්ල හෙළි කරන්නෙමි.[4] ඔහුවද[5]
ඔහුගේ දරුවන්වද ඔහුගේ සහෝ-
දරයන්වද අසල්වාසීන්වද සම්පූර්-
ණයෙන්ම විනාශ කර දමන්නෙමි.[6]
11 ඔබ අතරේ සිටින පියා නැති දරු-
වන්ව මට භාර දෙන්න.[7] මම ඔවුන්ගේ
ජීවිත රක්ෂා කරන්නෙමි. ඔබ අතරේ
සිටින වැන්දඹුවන් මා කෙරෙහි විශ්-
වාසය තැබුවොත් මම ඔවුන්වත් රැක-
බලා ගන්නෙමි."[8]
12 යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. "මාගේ සෙනඟට පවා මාගේ
උදහස නමැති කුසලානයෙන් බීමට
සිදු වෙනවා නම්,[9] මාගේ දඬුවමින්
ගැලවීමට ඔබට පුළුවන් වෙයි කියා
ඔබ සිතන්නෙහිද? ඔබට අනිවාර්ය-
යෙන්ම දඬුවම් ලැබෙන්නේය. මාගේ
උදහස නමැති කුසලානයෙන් ඔබට
බීමට සිදු වන බව නියතයි."[10]
13 "බොෂ්රාට සිදු වන විපත[11]
දකින අය පුදුමයට පත් වනු ඇත.[12]
සම්පූර්ණයෙන්ම වැනසී යන ඒ නග-
රය සියලුදෙනාගේ නින්දාවටත් ශාප-
යටත් ලක් වනු ඇත. ඇයට අයත්
අන් සියලු නගරද විනාශ වී සදහ-
ටම පාළුවට යන්නේය.[13] මා කියූ ඒ
සියල්ල එලෙසම සිදු වන බව මමම
දිවුරා කියන්නෙමි"[14] කියා යෙහෝවා
දෙවි පවසන්නේය.
14 "එකට එකතු වෙන්න. අපි
ගොස් ඒදොම්වරුන්ට විරුද්ධව යුද්ධ
කරමු" කියා ජාතීන්ට දැන්වීමට දෙවි
පණිවිඩකරුවෙකුව යැව්වේය. යෙ-
හෝවා දෙවි මට ඒ බව දැන්වූවේය.[15]
15 "ජාතීන් ඉදිරියේ මම ඔබව
පහත් කරන්නෙමි. සියලුදෙනා ඔබව
හෙළාදකිනු ඇත.[16] 16 පර්වතවල
හා කඳු මුදුන්වල සුරක්ෂිතව වසන්-
නෙනි, ඔබ අනුන්ව භයගන්වමින්
මහත් ආඩම්බරයෙන් සිටියත් ඔබ

**49 පරි.**
1 යෙසා 15:4; යෙසා 16:8
2 යෙසා 13:6
3 යෙසා 32:11; යෙරෙ 4:8; යෙරෙ 6:26
4 යෙරෙ 48:7; ආමො 1:15
5 1රාජා 11:5; 1රාජා 11:33; 2රාජා 23:13
6 යෙරෙ 21:13
7 යෙරෙ 48:7
8 යෙරෙ 9:23
9 යෙරෙ 46:10
10 යෙරෙ 48:41
11 යෙරෙ 46:5
12 යෙරෙ 46:26
13 උත් 36:11; 1ලේක 1:35; 1ලේක 1:36; එස 25:13; ආමො 1:12
14 ඔබ 8
15 යෙසා 29:14
16 යෙසා 21:13; යෙරෙ 25:23
17 යෙරෙ 48:6; යෙරෙ 49:30
18 විනි 6:2; 1සාමු 13:6
19 මලා 1:3

**2 තීරුව**
1 ඔබ 5
2 ඔබ 6; මලා 1:3
3 ආමො 9:3
4 යෙරෙ 23:24
5 යෙසා 17:14
6 ඔබ 9
7 ගීතා 82:3
8 ගීතා 68:5; හොෂෙ 14:3; යාකො 1:27
9 යෙරෙ 25:15; යෙරෙ 25:17; යෙරෙ 25:28; විලා 4:21; ඔබ 16
10 යෙරෙ 25:29; යෙරෙ 46:28
11 උත් 36:33; යෙසා 34:6; යෙසා 63:1; යෙරෙ 49:22; ආමො 1:12
12 යෙරෙ 49:17
13 ඔබ 18; මලා 1:3
14 උත් 22:16; යෙසා 45:23; ආමො 6:8
15 ඔබ 1
16 ඔබ 2

ඇත්තෙන්ම රවටී සිටින්නහුය.[1] ඔබ
රාජාලියෙකු මෙන් උස් ස්ථානයක
ඔබේ කැදැල්ල සාදාගෙන සිටියත්[2]
මම ඔබව එතැනින් පහතට ඇද
දමන්නෙමි”[3] කියා යෙහෝවා දෙවි
පවසන්නේය. **17** “ඒදොම්ට සිදු වන
විපත සියල්ලන්ගේ පුදුමයට හේතු-
වක් වනු ඇත.[4] ඇයව පසු කර යන
සියලුදෙනා පුදුමයෙන් ඇය දෙස බල-
මින් ඇයට සමච්චල් කරනු ඇත.[5]
**18** සොදොම් සහ ගොමෝරාද ඒ අවට
තිබූ නගරද සහමුලින්ම විනාශ කර
දැමූ පසු කිසි මිනිසෙකු එහි වාසය
නොකළාක් මෙන්[6] ඇය තුළත් කිසි
මිනිසෙක් නැවත වාසය කරන්නේ
නැත. විදේශිකයෙකු ලෙස ජීවත් වීම-
ටද කිසිවෙක් පැමිණෙන්නේ නැත”[7]
කියා යෙහෝවා දෙවි පවසන්නේය.
**19** “යොර්දාන් ගඟ අසල පිහිටි
වනළැහැබේ සිට සිංහයෙකු,[8] ඉතා
සුව සේ වෙසෙන බැටළුවන්ගෙන් පිරි
තණබිමකට කඩාපනින්නාක් මෙන්
එක්තරා තැනැත්තෙක් ඒදොම් වෙ-
තට පැමිණෙන්නේය.[9] ඒ සමඟම
ඒදොම්වරුන්ට තම දේශය අත්හැර
පලා දිවීමට මම සලස්වන්නෙමි.[10]
ඉන්පසු මම තෝරාගත් තැනැත්-
තාට ඒදොම් දේශය භාර දෙන්නෙමි.
මා කිරීමට යන දේට අභියෝග කළ
හැකි කෙනෙක් සිටීද?[11] මට විරුද්-
ධව කිසිම නායකයෙකුට නැඟී සිටිය
හැකිද?[12] මට සමාන කෙනෙක් තවත්
සිටීද?[13] **20** ජනයෙනි, ඒදොම්ට
විරුද්ධව යෙහෝවා දෙවි ගෙන ඇති
තීරණයට ඇහුම්කන් දෙන්න.[14] තේ-
මාන්හි වැසියන්ට විරුද්ධව ඔහු අර-
මුණු කළ දේට සවන් දෙන්න.[15]
රැළේ සිටින බැටළු පැටවුන්ව වන-
මෘගයෙකු ඇදගෙන යන්නාක් මෙන්
ඔවුන්වද ඇදගෙන යනු ලැබේ. ඔවුන්
කළ දේවල් නිසා ඔහු ඔවුන්ගේ තණ-
බිම් සියල්ල පාළු කර දමන්නේය.[16]
**21** ඔවුන්ගේ වැටීමේ ශබ්දය නිසා
පොළොව දෙදරා යන්නේය.[17] ඔවුන්-
ගේ හැඬීමේ ශබ්දය[18] රතු මුහුද දක්-
වාම විහිදී යන්නේය.[19] **22** පියාපත්
විහිදුවාගෙන රාජාලියෙකු තම ගො-
දුර ඩැහැගැනීමට වේගයෙන් පැමි-
ණෙන්නාක් මෙන්[1] බොෂ්රාව ගොදුරු
කරගැනීමටත් කෙනෙක් පැමිණෙන්-
නේය.[2] දරුවෙකු බිහි කරන ස්ත්‍රියක
අද්දකින වේදනාවට සමාන වේදනා-
වක් ඒ දවසේදී ඒදොම්හි බලවන්ත-
යෝ අද්දකිනු ඇත.”[3]
**23** දමස්කය ගැන දෙවි පැවසුවේ
මෙයයි.[4] “හමාත්[5] හා අර්පාද්[6] නගර-
වල වෙසෙන්නන්ට අසන්න ලැබුණු
නරක ආරංචිය නිසා ඔවුහු අධෛර්යට
පත්ව සිටිති.[7] ඔවුන්ට මහත් ලැජ්ජා-
වක් දැනිණ. ඔවුන් නිශ්චල කිරීමට
නොහැකි කැලඹුණු මුහුදක් මෙනි.[8]
**24** දමස්කයේ වැසියන්ට තිබූ ධෛර්-
යය නැති වී ගොසින්ය. භීතියෙන්
වෙළී සිටින ඔවුන්ට කිරීමට ඉතුරුව
ඇත්තේ පලා දිවීම පමණි.[9] දරුවෙකු
බිහි කරන ස්ත්‍රියක මෙන්[10] ඔවුහු
වේදනාවෙන් මිරිකී සිටිති. **25** තේ-
ජාන්විතව වැජඹුණු ඒ ප්‍රීතිමත් නග-
රය අත්හැර නොගියේ මන්ද![11]
**26** එබැවින් ස්වර්ගයේ සේනාවල
අධිපති වන යෙහෝවා දෙවි
මෙසේ පවසන්නේය. “ඇගේ තරු-
ණයෝ මැරුම් කා මංසන්ධිවල ඇද
වැටෙන්නෝය. ඒ දවසේදී සියලු
යුධ භටයෝද නිසලව වැටී සිටින්-
නෝය.[12] **27** මම දමස්කයේ පවුරට
ගිනි තබන්නෙමි. ඒ ගින්නෙන් බෙන්-
හාදද්ගේ බලකොටු සියල්ල දැවී යන්-
නේය.”[13]
**28** කේදාර් දේශය[14] හා හාෂෝර්හි
රාජ්‍යයන්[15] ගැන යෙහෝවා දෙවි පව-
සන්නේ මෙයයි. (පසු කාලයක බැබි-
ලෝනියේ රජු වන නෙබුකද්රෙෂර් ඒ
පළාත් යටත් කරගත්තේය.)[16] “ජන-
යෙනි, කේදාර් වෙතට යන්න. පෙර-
දිග වෙසෙන සෙනඟව විනාශ කර
දමන්න.[17] **29** ඔවුන්ගේ කූඩාරම්ද[18]
ඒවායේ රෙදිද[19] ඔවුන්ගේ සත්ව රැළ-
වල්ද[20] ඔවුන්ට අයිති ඔටුවන්ද[21]
සියලු බඩු බාහිරාදියද පැහැරගනු

**49 පරි.**
**1** ඔබ 3
**2** යෝබ් 39:27
**3** හිතෝ 15:25; ආමො 9:2; ඔබ 4
**4** යෙරෙ 49:13
**5** 1රාජා 9:8; යෙරෙ 51:37; ශෙප 2:15
**6** උත් 19:25; ද්වි 29:23; යෙරෙ 50:40; ආමො 4:11; ශෙප 2:9
**7** යෙසා 34:10; යෙරෙ 49:33
**8** යෙරෙ 4:7; සෙක 11:3
**9** යෙරෙ 12:5
**10** යෙරෙ 50:44
**11** යෝබ් 40:2
**12** යෝබ් 41:10; ගීතා 76:7; නාහු 1:6
**13** නික් 15:11; ගීතා 89:6; ගීතා 113:5
**14** ගීතා 33:11; හිතෝ 19:21; යෙසා 46:10; ක්‍රියා 4:28
**15** ඔබ 9
**16** මලා 1:4
**17** එස 31:16
**18** යෙරෙ 50:46
**19** 1රාජා 9:26

**2 තීරුව**
**1** ද්වි 28:49; යෙරෙ 4:13; හොෂෙ 8:1
**2** යෙරෙ 48:40; යෙරෙ 49:13
**3** යෙසා 26:17
**4** යෙසා 17:1; ආමො 1:3
**5** ගණන් 13:21; 2රාජා 17:24; යෙසා 10:9; සෙක 9:2
**6** 2රාජා 18:34
**7** යොෂු 2:11
**8** යෙසා 57:20
**9** ගීතා 48:5
**10** යෙරෙ 6:24; යෙරෙ 48:41
**11** යෙරෙ 51:41
**12** යෙරෙ 50:30; යෙරෙ 51:4; විලා 2:21
**13** 2රාජා 16:9; ආමො 1:4
**14** උත් 25:13; 1ලේක 1:29; යෙසා 42:11; යෙරෙ 2:10; එස 27:21
**15** යෙරෙ 49:33
**16** යෙරෙ 27:6
**17** විනි 6:3

**18** ගීතා 120:5; **19** හබ 3:7; **20** යෙසා 60:7; **21** විනි 6:5.

ලබන්නේය. එවිට සෙනඟ මොරගා-
සමින් ඔවුන්ට මෙසේ කියනු ඇත.
'භීතිය දසත පැතිරී තිබේ.' "[1]
**30** යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. "භාෂෝර්හි වැසියෙනි,[2] දුර
ඈතට පලා දුවන්න. ගැඹුරු තැනකට
ගොස් සැඟවෙන්න. මන්ද බැබිලෝ-
නියේ රජු වන නෙබුකද්රෙෂර්[3] ඔබට
විරුද්ධව කුමන්ත්‍රණයක් කර ඇත.
ඔබ පිටට විපත්ති ගෙන ඒමට සැල-
සුම් කර ඇත."
**31** "ජනයෙනි, සූදානම් වන්න"
කියා යෙහෝවා දෙවි පවසන්නේය.
"ඉතා සැහැල්ලුවෙන් ජීවිතය ගත
කරන ජාතියට විරුද්ධව යුද්ධයට
යෑමට සූදානම් වන්න.[4] ඔවුහු තම
නිවෙස්වල දොර අගුල් නොදමා, අන්
අයගෙන් වෙන්ව[5] සුරක්ෂිත ජීවිතයක්
ගත කරන්නෝය.[6] **32** යෙහෝවා
දෙවි මෙසේද පවසන්නේය. "ඔවුන්ගේ
ඔටුවන්ව[7] හා සත්ව රැළවල් සියල්ල
කොල්ල කනු ලැබේ. කම්මුල් දෙපස
පිහිටි කෙස් කපා ඇති සියලුදෙනා-
වම[8] මම සීසීකඩ* විසුරුවාහරින්-
නෙමි.[9] අවට පිහිටි සෑම පළාතකින්ම
මම ඔවුන් පිටට විපත්ති පමුණුවන්-
නෙමි. **33** භාෂෝර්[10] සදහටම පාළු-
වට ගොස් හිවලුන්ගේ වාසස්ථානයක්
බවට පත් වන්නේය.[11] කිසි වැසි-
යෙක් නැවත එහි වාසය කරන්නේ
නැත. විදේශිකයෙකු ලෙස ජීවත් වීම-
ටද කිසිවෙක් පැමිණෙන්නේ නැත."[12]
**34** යූදාහි රජු වූ ශෙදකියා තම
පාලනය ආරම්භ කළ කාලයේදී[13]
යෙහෝවා දෙවිගෙන් අනාගතවක්තෘ
යෙරෙමියාට ඒලාම් දේශය ගැන
පණිවිඩයක් ලැබිණ.[14] එම පණි-
විඩය මෙයයි. **35** "ස්වර්ගයේ සේ-
නාවල අධිපති වන යෙහෝවා දෙවි
මෙසේ පවසන්නේය. 'ඒලාම්ගේ ශක්-
තිය වූ දුනු හේවායන්ව මම විනාශ
කර දමන්නෙමි.[15] **36** පොළොවේ
සතර දිගින් චණ්ඩ මාරුත සතරක්
ඒලාම් පිටට හමා ඒමට සලස්වන්-
නෙමි.[1] ඒ සුළඟින් මම ඔවුන්ව ඒ මේ
අත විසුරුවාහරින්නෙමි.[2] ඒලාම් සිට
විසිරී යන අය පලා නොයන දේශයක්
නැති තරම්ය.' "[3]
**37** යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. "මම ඒලාම්වරුන්ගේ සිත් තුළ,
ඔවුන්ගේ ජීවිත විනාශ කර දැමීමට මං
සොයන අය ගැනද ඔවුන්ගේ සතු-
රන් ගැනද භීතියක් ඇති කරන්නෙමි.
ඔවුන්ට විරුද්ධව ඇවිළී තිබෙන
මාගේ උදහස නිසා මම ඔවුන් පිටට
විපත්ති ගෙනෙන්නෙමි.[4] ඔවුන් සහමු-
ලින්ම නැති වී යන තුරු මම ඔවුන්ට
කඩුවෙන් පහර කෑමට සලස්වන්-
නෙමි."[5]
**38** "මම ඒලාම්හි රජුවත් එහි අධි-
පතීන්වත් විනාශ කර දමා මාගේ
සිංහාසනය එහි පිහිටුවන්නෙමි"[6] කියා
යෙහෝවා දෙවි පවසන්නේය.
**39** "නමුත් අවසාන කාලයේදී[7]
විසිරී ගිය ඒලාම්වරුන්ව මම නැවත
එකතු කරන්නෙමි"[8] කියා යෙහෝවා
දෙවි පවසන්නේය.

**50** අනාගතවක්තෘ යෙරෙමියා
මාර්ගයෙන් යෙහෝවා දෙවි
බැබිලෝනිය ගැනද[9] එනම්, කල්දි-
වරුන්ගේ දේශය ගැනද[10] අනාවැකි
පැවසුවේය. ඔහු පැවසුවේ මෙයයි.
**2** "ජනයෙනි, සංඥාවක් ඔසවා[11] මෙය
සියලු ජාතීන් අතරේ දැනුම් දෙන්න.[12]
'බැබිලෝනිය යටත් කරගෙන ඇත.[13]
බෙල්* මහත් සේ ලැජ්ජාවට පත්
විය.[14] මෙරොදක් බියෙන් වෙවුලන්-
නේය. බැබිලෝනියේ දේවතා රූප
සියල්ල නින්දාවට පත්ව ඇත.[15]
ඇගේ පිළිකුල්සහගත රූප සියල්ල
තැතිගෙන ඇත.' මේ කිසිවක් නො-
සඟවා සිදු වූ දේ සියල්ලන්ට ප්‍රකාශ
කරන්න. **3** බැබිලෝනියට පහර
දීමට උතුරු දෙසින් ජාතියක් පැමිණ
ඇත.[16] ඒ ජාතිය සියල්ලන්ව පුදුම-
යට පත් කරවමින් බැබිලෝනිය සම්-
පූර්ණයෙන්ම පාළු කර දමන්නේය.[17]

**49 පරි.**
**1** ගීතා 31:13, යෙරෙ 6:25, යෙරෙ 46:5
**2** යෙරෙ 49:28
**3** යෙරෙ 27:6
**4** ගීතා 123:4, යෙරෙ 48:11
**5** ගණන් 23:9, ද්වි 33:28, මීකා 7:14
**6** යෙසා 47:8
**7** විනි 6:5
**8** ලෙවී 19:27, යෙරෙ 9:26, යෙරෙ 25:23
**9** එස 5:10
**10** යෙරෙ 49:28
**11** යෙරෙ 9:11, යෙරෙ 10:22, මලා 1:3
**12** යෙරෙ 50:39
**13** 2රාජා 24:18
**14** උත් 10:22, යෙසා 21:2, යෙරෙ 25:25, එස 32:24, දානි 8:2, ක්‍රියා 2:9
**15** යෙසා 22:6, යෙරෙ 51:56

**2 තීරුව**
**1** දානි 8:8, දානි 11:4, එළි 7:1
**2** එස 5:10
**3** ගීතා 147:2
**4** ගීතා 69:24, ගීතා 90:11
**5** යෙරෙ 9:16
**6** යෙරෙ 25:25
**7** දානි 2:28
**8** දානි 8:2

**50 පරි.**
**9** යෙසා 13:1
**10** ක්‍රියා 7:4
**11** යෙසා 13:2
**12** යෙරෙ 4:16, යෙරෙ 46:14
**13** යෙරෙ 50:24, යෙරෙ 50:46, යෙරෙ 51:8, එළි 14:8
**14** යෙසා 46:1, යෙරෙ 51:44
**15** යෙසා 37:19, ශෙප 2:11
**16** යෙසා 13:17, යෙරෙ 51:11, යෙරෙ 51:48
**17** යෙරෙ 51:29

යෙරෙ **49:32*** මූ.අ., "සුළඟ හමන සෑම දිශාවකටම."

යෙරෙ **50:2*** බැබිලෝනියේ දෙවියෙක්.

බැබිලෝනියේ වැසියෝද ඔවුන්ගේ
සත්තුද දේශය අත්හැර පලා ගොස්
ඇත.[1] ඔවුන්ගෙන් කිසිවෙක් එහි
නැත.”[2]
**4** යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. “ඒ කාලයේදී[3] ඊශ්‍රායෙල්වරු
යුදෙව්වරුන් සමඟ එකට එකතු වී[4]
කඳුළු සලමින්[5] නැවත පැමිණෙනු
ඇත. ඔවුහු තම දෙවි වන යෙ-
හෝවාගේ මඟ පෙන්වීම් පතනු ඇත.[6]
**5** සියොන් වෙතට යන මාර්ගය විමස-
මින් ඔවුහු ඒ දෙසට ගමන් කරන්-
නෝය.[7] ‘අපි යෙහෝවා දෙවි සමඟ
සදාතනික ගිවිසුමකට ඇතුල් වෙමු.
ඒ ගිවිසුම නැවත කිසිදාක අම-
තක නොකිරීමට අධිෂ්ඨාන කරගමු’[8]
යයි කියමින් ඔවුහු සියොන් දෙසට
ගමන් කරති. **6** මාගේ සෙනඟ සිටි-
යේ නාස්ති වී යන බැටළු රැළක්
මෙනි.[9] ඔවුන්ගේ එඬේරු ඔවුන්ව
රැකබලා ගන්නවා වෙනුවට ඔවුන්ට
මංමුළා වීමට ඉඩහැරියෝය.[10] ඔවුහු
කඳු අතරේ ඉබාගාතෙ සැරිසැරු-
වෝය.[11] අන්තිමේදී ඔවුන්ගේ සුරක්-
ෂිත වාසස්ථානය ඔවුන්ට අමතක
වී ගියේය.[12] **7** එසේ සැරිසරන විට
ඔවුන්ව මුණගැසුණු සියල්ලෝ ඔවුන්ව
ගොදුරක් කරගත්තෝය.[13] ඔවුන්ව
ගොදුරු කරගත් ඔවුන්ගේ සතුරෝ,
එකිනෙකා අතරේ මෙසේ කියාගත්-
තෝය.[14] ‘ධර්මිෂ්ඨකමේ උල්පත වන
යෙහෝවා දෙවිට විරුද්ධව එනම්,
ඔවුන්ගේ මුතුන්මිත්තන් බලාපො-
රොත්තු තැබූ[15] යෙහෝවා දෙවිට
විරුද්ධව ඔවුහු පව් කළෝය.[16] ඒ නිසා
අප ඔවුන්ට මොන දේ කළත් අප
කරන්නේ වරදක් නොවෙයි.’ ”[17]
**8** “සෙනඟෙනි, බැබිලෝනියෙන්
ඉවත්ව යන්න. රැළේ ඉදිරියෙන් යන
එළු බැටළුවන් මෙන්[18] කල්දිවරුන්ගේ
දේශයෙන් පලා යන්න.[19] **9** බැබි-
ලෝනියට විරුද්ධව සටන් කිරීමට
මම උතුරු දෙසින් බලවත් ජාතීන්
සමූහයක් රැගෙන එන්නෙමි.[20] ඔවුහු
ඇයව වටලා පහර දී[21] ඇයව යටත්
කරගනු ඇත.[22] දක්ෂ දුනුවායන්
මෙන් සටන් කරන ඔවුන්ගේ ඉලක්-
කය කවදාවත් වරදින්නේ නැත.[1]
ඔවුන්ගේ ඊපහර වැදීමෙන් මිය යන
දරුවන්ගේ දෙමාපියෝ මහත් වේ-
දනාවක් අද්දකිනු ඇත. **10** ඔවුහු
තෘප්තිමත් වන තුරුම[2] කල්දිවරුන්-
ගේ දේශය කොල්ල කනු ඇත”[3] කියා
යෙහෝවා දෙවි පවසන්නේය.
**11** “ජනයෙනි, ඔබ මාගේ උරු-
මය කොල්ල කැවේ මහත් ප්‍රීතිය-
කිනි.[4] ඔබ ප්‍රීති වූයේ ළා තණ
නිල්ල පාගමින් එහෙ මෙහෙ පැන
දුවන වැස්සියක ලෙසිනි.[5] ප්‍රීතියෙන්
හේෂාරාවය නඟන අශ්වයන් මෙනි.[6]
**12** එබැවින් ඔබේ මව් මහත් සේ
ලැජ්ජාවට පත්ව සිටින්නීය.[7] ඔබව
බිහි කළ තැනැත්තියගේ බලාපො-
රොත්තු සියල්ල සුන් වී ගොසිනි.[8]
ඇය දිය පොදක් නැති පාළු කාන්තා-
රයක් මෙනි.[9] ඇය දැන් ජාතීන් අත-
රේ පහත්ම තැනැත්තිය වී සිටින්නීය.
**13** යෙහෝවා දෙවිගේ උදහස ඇය
පිටට පැමිණි නිසා ඇයට නැවත කිසි-
දාක ජනාවාස වූ නගරයක් බවට පත්
වීමට නොහැකි වනු ඇත.[10] මුළු නග-
රයම නටබුන් බවට පත් වන්නේය.[11]
බැබිලෝනිය පසු කර යන සියලු-
දෙනා ඇයට සිදු වූ මේ මහත් විපත
දෙස දැස් අයා බලා සිටිනු ඇත. පීඩා
නිසා ඇද වැටුණු ඇයට ඔවුහු සරදම්
කරන්නෝය.[12]
**14** “දුනුවායෙනි,[13] යුද්ධයට සැර-
සෙන්න. බැබිලෝනිය වට කර,[14]
අන්තිම ඊගස දක්වාම ඇයට පහර
දෙන්න.[15] මන්ද ඇය පව් කර ඇත්-
තේ යෙහෝවා දෙවිට විරුද්ධවය.[16]
**15** ඇයව වට කර ඇයට විරුද්ධව
යුධ ඝෝෂා නඟන්න.[17] ඇගේ අති-
දැවැන්ත කුලුනු බිඳ වැටුණේය. ඈ
වට කර තිබූ පවුරු දෙදරා ගියේය.[18]
යටත් වෙනවා හැරෙන්න ඇයට කිරී-
මට වෙන කිසිවක් නොතිබුණේය.
එය ඇයට යෙහෝවා දෙවිගෙන්

**50 පරි.**
1 ශෙප 1:3
2 යෙරෙ 51:29
3 යෙරෙ 33:15
4 යෙසා 11:12; යෙරෙ 3:18; හොෂෙ 1:11
5 ගීතා 126:5; යෙරෙ 31:9; යෝවෙ 2:12
6 හොෂෙ 3:5; සෙක 8:21
7 යෙසා 35:10
8 යෙරෙ 31:31; හොෂෙ 3:5
9 යෙසා 53:6; 1පේතෘ 2:25
10 යෙරෙ 10:21; යෙරෙ 23:2; එස 34:2; සෙක 11:5
11 එස 34:6
12 ගීතා 23:2; එස 34:25
13 ගීතා 79:7
14 විලා 1:7
15 ගීතා 22:4; යෙරෙ 14:8; යෙරෙ 17:13
16 ගීතා 90:1; ගීතා 91:1; ආනි 9:16
17 යෙරෙ 2:3
18 හිතෝ 30:31
19 යෙසා 48:20; යෙරෙ 51:6; යෙරෙ 51:45; සෙක 2:7; 2කොරි 6:17; එළි 18:4
20 යෙසා 21:2; යෙරෙ 51:48; ආනි 5:28
21 යෙරෙ 50:14; යෙරෙ 51:27; යෙරෙ 51:28
22 යෙරෙ 50:2

**2 තීරුව**
1 යෙසා 13:18; යෙරෙ 51:11
2 එළි 17:16
3 යෙරෙ 25:12; යෙරෙ 27:7
4 හිතෝ 17:5; යෙසා 14:6; යෙසා 47:6; යෙරෙ 30:16; විලා 1:21; ඔබ 12
5 හොෂෙ 10:11
6 යෙරෙ 5:8
7 යෙසා 47:8
8 එළි 17:5
9 යෙසා 13:21; යෙසා 25:12
10 සෙක 1:15
11 යෙසා 13:20; යෙරෙ 25:12
12 යෙරෙ 25:9; යෙරෙ 51:37
13 යෙරෙ 46:9

**14** යෙරෙ 51:2; යෙරෙ 51:12; **15** යෙසා 13:18; යෙරෙ 51:11; **16** යෙරෙ 51:35; **17** යෙරෙ 51:14; යෙරෙ 51:25; **18** යෙරෙ 51:58.

ලැබුණු දඬුවමය.[1] එබැවින් ඇයට
දඬුවම් කරන්න. ඇය අන් අයට
කළ ලෙසම දැන් ඇයටත් කරන්න.[2]
**16** බැබිලෝනියේ බීජ වපුරන්නාවත්
අස්වැන්න නෙළන්නාවත් විනාශ කර
දමන්න.[3] ඇයට පහර දීමට පැමි-
ණෙන මාරාන්තික කඩුවට භයෙන්
සියලුදෙනා ඇයව අත්හැර තමන්ගේ
දේශයට එනම්, තම සෙනඟ වෙතට
පලා දුවන්නෝය.[4]

**17** "ඊශ්‍රායෙල් සිටියේ මංමුළා වූ
බැටළුවෙකු මෙනි.[5] ඒ බැටළුවා පසු-
පස සිංහයෝ ලුහුබැඳ ගියෝය.[6]
මුලින්ම ඒ බැටළුවා ඇසිරියාවේ රජු-
ගේ ගොදුරක් බවට පත් විය.[7] ඉන්පසු
බැබිලෝනියේ රජු වූ නෙබුකද්රෙ-
ෂර් ඒ බැටළුවාව අල්ලාගෙන උගේ
ඇටකටු පවා හපා පොඩි කර දැමු-
වේය.[8] **18** එබැවින් ස්වර්ගයේ සේ-
නාවල අධිපතිද ඊශ්‍රායෙල්හි දෙවිද
වන යෙහෝවා මෙසේ පවසන්නේය.
'මම ඇසිරියාවේ රජුට දඬුවම් කළ
ලෙසම බැබිලෝනියේ රජුටත් ඔහු-
ගේ දේශයටත් දඬුවම් කරන්නෙමි.[9]
**19** බැටළුවෙකුව සිටි ඊශ්‍රායෙල්ව මම
යළිත් ඔහුගේ තණබිමට ගෙනෙන්-
නෙමි.[10] එවිට ඔහුට කර්මෙල්[11] හා
බාෂාන්හි[12] සැරිසරමින් හිතේ හැටියට
තණ කෑමට හැකි වන්නේය. එෆ්‍රා-
යිම්[13] හා ගිලියද්[14] කඳුකරයේ ඔහු
සුවසේ වාසය කරන්නේය.'"

**20** "මාගේ කරුණාව ලැබ ඉතුරු
වූ සියලු ඊශ්‍රායෙල්වරුන්ගේ හා
යුදෙව්වරුන්ගේ පව්වලට[15] ඒ කාල-
යේදී මම සමාව දෙන්නෙමි.[16] ඒ කාල-
යේදී[17] යමෙකු ඔවුන් අතීතයේ කළ
වැරදි සෙව්වත්[18] ඔවුන්ට විරුද්ධව
කිසි වරදක් හෝ පාපයක් හෝ සො-
යාගැනීමට ලැබෙන්නේ නැත" කියා
යෙහෝවා දෙවි පවසන්නේය.

**21** යෙහෝවා දෙවි මෙසේද පව-
සන්නේය. "මෙරතායිම් දේශයටත්[19]
පෙකෝඩ්හි වැසියන්ටත්[20] විරුද්ධව
පැමිණ ඔවුන්ව සහමුලින්ම විනාශ කර
දමන්න. මා ඔබට අණ කරන ලෙ-
සම කරන්න.[21] **22** යුධ ඝෝෂාවේ

**50 පරි.**
1 යෙරෙ 51:6
යෙරෙ 51:11
2 ගීතා 137:8
2තෙස 1:6
එළි 18:6
3 යෙරෙ 51:23
4 යෙසා 13:14
යෙරෙ 46:16
යෙරෙ 51:9
5 යෙරෙ 23:1
යෙරෙ 50:6
එස 34:5
මතෙ 9:36
6 යෙරෙ 2:15
7 2රාජා 17:6
යෙසා 8:7
8 2රාජා 25:1
2ලේක 36:17
යෙරෙ 4:7
9 2රාජා 19:35
යෙසා 14:25
ශෙප 2:13
10 යෙසා 11:16
යෙසා 65:10
යෙරෙ 23:3
යෙරෙ 33:7
මීකා 2:12
11 යෙසා 35:2
එස 34:14
12 මීකා 7:14
13 යෙරෙ 31:6
14 ඔබ 19
15 යෙරෙ 31:34
16 යෙසා 1:9
මීකා 7:19
17 යෙරෙ 33:15
18 යෙසා 44:22
19 යෙරෙ 50:1
20 එස 23:23
21 යෙසා 10:6
යෙසා 44:28

**2 තීරුව**
1 යෙරෙ 51:54
2 යෙසා 10:15
යෙසා 14:6
3 යෙරෙ 51:20
4 යෙරෙ 50:13
යෙරෙ 51:41
එළි 18:16
5 යෙරෙ 51:8
යෙරෙ 51:31
දානි 5:30
එළි 18:8
6 යෝබ් 9:4
1කොරි 10:22
7 යෙසා 13:5
යෙරෙ 51:11
8 යෙරෙ 46:10
9 යෙරෙ 51:12
10 යෙරෙ 51:27
11 යෙරෙ 50:10
12 යෙසා 25:10
13 එළි 18:21
14 යෙසා 14:23
15 ගීතා 22:12
යෙසා 34:7
16 යෙරෙ 25:33

හා විනාශයේ හඬ දේශය සිසාරා පැතිරී
ගොස් ඇත.[1] **23** බලවත් බැබිලෝ-
නිය, ඔබ කුළු ගෙඩියක් මෙන්[2] මුළු
ලොවටම පහර දුන්නහුය. නමුත්
කුමක්ද ඔබට සිදු වුණේ? ශක්තිමත්
කුළු ගෙඩියක්ව සිටි ඔබ කැඩී බිඳී ගිය-
හුය.[3] ඔබට සිදු වූ දේ සියලු ජාතීන්ට
පුදුමයකි.[4] **24** අහෝ බැබිලෝනිය,
මම ඔබට උගුලක් ඇටෙව්වෙමි. ඔබත්
නොදැනුවත්වම ඒ උගුලට හසු විය.[5]
ඔබ එලෙස හසු වූයේ යෙහෝවා දෙවිට
විරුද්ධව ඔබ මුරණ්ඩු ලෙස ක්‍රියා කළ
නිසාය.[6]

**25** "යෙහෝවා දෙවි තම උදහස
ප්‍රකාශ කරන ආයුධ, ගබඩාවෙන්
පිටතට ගෙන ඇත.[7] මන්ද විශ්-
වයේ පාලකයාද[8] ස්වර්ගයේ සේනා-
වල අධිපතිද වන යෙහෝවා දෙවිට
කල්දිවරුන්ගේ දේශයෙහි කාර්යයක්
කිරීමට තිබේ.[9] **26** දුර ඈත වෙ-
සෙන්නෙනි, ඇය වෙතට පැමිණ[10]
ඇගේ ගබඩාවලින් ධාන්‍ය සියල්ල
පිටතට ගන්න.[11] ඈ සතු සියල්ල
කඩා බිඳ දමා ධාන්‍ය ගොඩගසන්-
නාක් මෙන් ඒවා ගොඩගසන්න.[12]
ඇය තුළ සිටින කිසිවෙකු ඉතුරු
නොකර[13] ඇයව සම්පූර්ණයෙන්ම
විනාශ කර දමන්න.[14] **27** ඇගේ
තරුණ වස්සන්ව මරා දමන්න.[15]
ඔවුන්ව සහමුලින්ම විනාශ කරන්න.[16]
ඔවුන්ට දඬුවම් දෙන දවස පැමිණ
තිබේ.[17] එබැවින් ඔවුන්ට අත් වන
විපත මොන තරම් දරුණුද!

**28** "මේ ඇසෙන්නේ බැබිලෝනි-
යෙන් ගැලවී පලා යන අයගේ හඬය![18]
ඔවුන් පිටත්ව යන්නේ තම දේවමා-
ලිගාවට කළ විනාශය නිසා[19] අපේ
දෙවි වන යෙහෝවා බැබිලෝනිව-
රුන්ට දුන් දඬුවම ගැන සියොන්හි
ප්‍රකාශ කිරීමටය.[20]

**29** "බැබිලෝනියට පහර දීමට
දක්ෂ දුනුවායන්ව කැඳවන්න.[21] කිසි-
වෙකුට පලා යෑමට ඉඩ නොලැබෙන

**17** යෙරෙ 23:12; යෙරෙ 48:44; යෙරෙ 51:52; **18** යෙරෙ 51:55; **19** ගීතා 94:1; යෙරෙ 51:11; **20** යෙරෙ 50:15; **21** යෙරෙ 50:14.

ලෙස ඇය වටා කඳවුරු බැඳගන්න.[1]
ඇගේ ක්‍රියාවලට සුදුසු දඬුවම ඇයට
දෙන්න.[2] ඇය අනුන්ට කළ ලෙ-
සම ඇයටත් දැන් කරන්න.[3] මන්ද
ඇය අහංකාර ලෙස ක්‍රියා කළේ යෙ-
හෝවා දෙවිට විරුද්ධවය. ඊශ්‍රායෙල්හි
ශුද්ධ තැනැත්තාණන්ට විරුද්ධවය.[4]
**30** ඇගේ තරුණයෝ මැරුම් කා
මංසන්ධිවල ඇද වැටෙන්නෝය.[5] ඒ
දවසේදී ඇගේ සියලු යුධ භටයෝද
නිසලව වැටී සිටින්නෝය"[6] කියා යෙ-
හෝවා දෙවි පවසන්නේය.

**31** "අහංකාරකමින් වැජඹෙන
බැබිලෝනිය,[7] මම ඔබට විරුද්ධව
නැඟී සිටින්නෙමි"[8] කියා විශ්වයේ
පාලකයාද[9] ස්වර්ගයේ සේනාවල අධි-
පතිද වන යෙහෝවා දෙවි පවසන්-
නේය. "මා ඔබට දඬුවම් කරන දවස
අනිවාර්යයෙන්ම පැමිණෙන්නේය.
**32** අහංකාරයෙන් ඉදිමී සිටින ඔබ
එදාට බිම ඇද වැටෙනු ඇත.[10] ඔබට
අත දීමට කිසිවෙක් ඉදිරිපත් වන්නේ
නැත.[11] ඔබේ නගර තුළ මම ගින්නක්
අවුළුවන්නෙමි. ඒ ගින්නෙන් මුළු දේ-
ශයම විනාශ වී යන්නේය."[12]

**33** ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. "ඊශ්‍රායෙල්වරුන් හා යුදෙව්-
වරුන් යන දෙපිරිසම පීඩා විඳිති.
ඔවුන්ව වහල්කමට ගත් අය ඔවුන්ට
කිසි නිදහසක් නොදී[13] ඔවුන්ව තම
අණසක යටතේම තබාගෙන
සිටිති.[14] **34** නමුත් ඔවුන්ගේ ගැල-
වුම්කරු ඉතා බලසම්පන්නය.[15] ඔහුව
හඳුන්වන්නේ ස්වර්ගයේ සේනාවල
අධිපති වන යෙහෝවා යන නාම-
යෙන්ය.[16] ඔහු ඔවුන්ට යුක්තිය ඉටු
කර[17] ඔවුන්ගේ දේශයට සාමය ගෙන
දෙන්නේය.[18] නමුත් ඔහු බැබිලෝනි-
යේ වැසියන්ව කලඹවා ඔවුන්ව විය-
වුල් කරන්නේය."[19]

**35** යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. "කල්දිවරුද[20] බැබිලෝනි-
යේ වැසියෝද[21] ඔවුන්ගේ අධිපතීහුද[22]
ප්‍රඥාවන්තයෝද[23] කඩුවෙන් පහර
කනු ඇත. **36** නිෂ්ඵල කතා
කියන්නෝද කඩුවෙන් පහර කන්-
නෝය.[1] ඔවුහු සියලුදෙනා අඥාන
ලෙස ක්‍රියා කරනු ඇත.[2] ඇගේ බල-
වන්තයෝද කඩුවෙන් පහර කන්-
නෝය.[3] ඔවුහු සියලුදෙනා භීතියෙන්
වෙවුලන්නෝය.[4] **37** ඔවුන්ගේ අශ්-
වයෝද[5] යුධ රථද බැබිලෝනියේ
සිටින විවිධ ජාතීහුද[6] ඒ ප්‍රහාර-
යට ගොදුරු වන්නෝය. ඔවුහු ස්ත්‍රීන්
මෙන් දුර්වල වන්නෝය.[7] ඇගේ වස්තු
සම්භාරයද[8] කොල්ල කනු ඇත.
**38** ඇගේ ජල ධාරාවෝද පහර කනු
ඇත. එබැවින් ඒවා සිඳී යන්නේය.[9]
මන්ද බැබිලෝනිය දේවතා රූපව-
ලින් පිරුණු දේශයක්ය.[10] එහි සෙ-
නඟ බියකරු දර්ශන දැක උමතුවෙන්
හැසිරෙති. **39** එබැවින් ඇය මනුෂ්‍ය
වාසයක් නැති පාළු තැනක් බවට
සදහටම පත් වන්නීය.[11] ජලය නැති
පාළු තැන්වල සැරිසරන සත්තුද හිව-
ලුද පැස්බරුද ඇය තුළ ලැගුම් ගනු
ඇත."[12]

**40** "දෙවි සොදොම් සහ ගොමෝ-
රාද[13] ඒ අවට තිබූ නගරද[14] සහ-
මුලින්ම විනාශ කර දැමූ පසු කිසි
මිනිසෙකු එහි වාසය නොකළාක්
මෙන් ඇය තුළත් කිසි මිනිසෙක්
නැවත වාසය කරන්නේ නැත. විදේ-
ශිකයෙකු ලෙස ජීවත් වීමටද කිසි-
වෙක් පැමිණෙන්නේ නැත"[15] කියා
යෙහෝවා දෙවි පවසන්නේය.

**41** "බලන්න! උතුරු දේශයෙන්
සෙනඟක් පැමිණෙන්නෝය. පොළො-
වේ දුර ඇත ප්‍රදේශවලින්[16]
බලවත් ජාතියක්ද[17] ශ්‍රේෂ්ඨ රජව-
රුද[18] ඇයට විරුද්ධව නැඟී එන්-
නෝය. **42** දුනු හා හෙල්ල අතැතිව
පැමිණෙන ඔවුහු[19] කිසිම දයාවක්
නොපෙන්වා කුරිරු ලෙස ඇයට පහර
දෙනු ඇත.[20] අශ්වයන් පිට නැඟී
එන[21] ඔවුන්ගේ ශබ්දය කැලඹුණු
මුහුදේ ඝෝෂාකාරී හඬට සමානය.[22]

**50 පරි.**

**1** යෙසා 13:19
**2** ගීතා 137:8
යෙරෙ 51:56
**3** විලා 3:64
2තෙස 1:6
එළි 18:6
**4** යෙසා 14:13
යෙසා 47:4
**5** යෙසා 13:18
යෙරෙ 9:21
යෙරෙ 49:26
යෙරෙ 51:4
**6** යෙරෙ 51:56
**7** හිතෝ 11:2
යෙසා 14:13
දානි 4:30
**8** යෙරෙ 51:25
**9** යෙරෙ 46:10
එළි 6:10
**10** හිතෝ 18:12
දානි 5:20
එළි 18:2
**11** යෙරෙ 51:26
එළි 18:8
**12** යෙරෙ 21:14
**13** යෙසා 14:17
**14** යෙසා 47:6
**15** යෙසා 41:14
එළි 18:8
**16** යෙසා 47:4
**17** ගීතා 35:1
ගීතා 43:1
විලා 3:59
**18** යෙසා 14:3
**19** යෙසා 13:1
යෙරෙ 51:24
**20** යෙසා 66:16
යෙරෙ 50:1
**21** යෙරෙ 51:12
**22** යෙරෙ 51:57
**23** යෙසා 47:13
දානි 5:7

**2 තීරුව**

**1** යෙසා 44:25
**2** 2සාමු 15:31
**3** යෙරෙ 51:23
**4** යෙරෙ 51:30
**5** යෙරෙ 51:21
**6** යෙරෙ 25:20
එස 30:5
**7** යෙසා 13:8
**8** යෙසා 45:3
**9** යෙසා 44:27
යෙරෙ 51:36
එළි 16:12
**10** යෙසා 46:1
යෙරෙ 51:52
දානි 5:4
**11** යෙසා 13:20
යෙරෙ 25:12
යෙරෙ 51:43
යෙරෙ 51:64
**12** යෙසා 13:21
යෙරෙ 51:37
එළි 18:2
**13** උත් 19:24
ද්වි 29:23
යෙසා 13:19

---

**14** උත් 19:25; යූද් 7; **15** යෙසා 1:9; යෙරෙ 49:18; යෙරෙ 51:26; **16** යෙසා 13:5; **17** යෙසා 13:17; යෙරෙ 25:14; යෙරෙ 51:27; **18** යෙසා 45:1; යෙරෙ 51:11; යෙරෙ 51:28; **19** යෙරෙ 50:9; **20** ගීතා 137:8; යෙසා 13:18; එළි 17:16; **21** යෙරෙ 47:3; **22** යෙසා 5:30; යෙරෙ 51:42.

බැබිලෝනීය දියණිය, ඔවුන් එක්-
සත්ව එසේ පැමිණෙන්නේ ඔබට
විරුද්ධව යුද්ධ කිරීමටය.[1]
**43** “ඔවුන්ගේ පැමිණීම ගැන දැන-
ගත් බැබිලෝනියේ රජ[2] කිසි-
වක් කරකියාගත නොහැකිව අසරණ
විය.[3] දරුවෙකු බිහි කරන ස්ත්‍රියකට
දැනෙන වේදනාවට සමාන වේදනා-
වක් ඔහුටත් දැනිණ.[4]
**44** “යොර්දාන් ගඟ අසල තිබෙන
වනළැහැබේ සිට සිංහයෙකු, ඉතා
සුව සේ වෙසෙන බැටළුවන්ගෙන් පිරි
තණබිමකට කඩාපනින්නාක් මෙන්
එක්තරා තැනැත්තෙක් බැබිලෝනිය
වෙතට පැමිණෙන්නේය.[5] ඒ සමඟම
මම බැබිලෝනිවරුන්ට තම දේශය
අත්හැර පලා දිවීමට සලස්වන්නෙමි.[6]
ඉන්පසු මම තෝරාගත් තැනැත්-
තාට බැබිලෝනිය භාර දෙන්නෙමි.[7]
මා කිරීමට යන දේට අභියෝග කළ
හැකි කෙනෙක් සිටීද?[8] මට විරුද්-
ධව කිසිම නායකයෙකුට නැඟී සිටිය
හැකිද?[9] මට සමාන කෙනෙක් තවත්
සිටීද?[10] **45** ජනයෙනි, බැබිලෝනි-
යට විරුද්ධව[11] යෙහෝවා දෙවි ගෙන
ඇති තීරණයට ඇහුම්කන් දෙන්න.[12]
කල්දිවරුන්ගේ දේශයට විරුද්ධව ඔහු
අරමුණු කළ දේට සවන් දෙන්න.[13]
වනමෘගයෙකු පැමිණ බැටළු පැට-
වුන්ව ඇදගෙන යන්නාක් මෙන්
ඔවුන්වත් ඇදගෙන යනු ලැබේ.[14]
ඔවුන් කළ දේවල් නිසා ඔහු ඔවුන්-
ගේ තණබිම් සියල්ල පාළු කර දමන්-
නේය.[15] **46** බැබිලෝනියේ වැටීමේ
ශබ්දය නිසා පොළොව දෙදරා යන්-
නේය.[16] ඔවුන්ගේ හැඬීමේ ශබ්දය
සියලු ජාතීන්ටද ඇසෙන්නේය.”[17]

**51** යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. “මම බැබිලෝනි-
යටත්[18] ලෙබ්කේමායිහි* වැසියන්ටත්
විරුද්ධව දරුණු සුළඟක් හමා ඒමට[19]
සලස්වන්නෙමි. **2** ධාන්‍ය පොළන්-
නාක් මෙන් බැබිලෝනියේ වැසියන්ව
පොළා දේශය පාළු කර දැමීමට
මම පිරිසක් යවන්නෙමි.[1] බැබිලෝ-
නිය පිටට විපත්ති ගෙනෙන දවසේදී
ඇයට පහර දීමට ඔවුහු සෑම පැත්ත-
කින්ම ඇයව වට කරගන්නෝය.[2]
**3** “දුනුවායෙනි, ඔබේ දුනු සූදානම්
කර නොගන්න.[3] යුධ ඇඳුමින් සැරසී
සිටින සෙබළුනි, සටන් කිරීම සඳහා
නැඟී සිටීමට ඔබට නොහැක.
“ජනයෙනි, ඇගේ තරුණයන්ට
කිසිම අනුකම්පාවක් නොපෙන්-
වන්න.[4] ඇගේ මුළු යුධ හමුදාවම
විනාශ කර දමන්න.[5] **4** කල්දිව-
රුන්ගේ දේශයේදී ඔවුහු සියලුදෙනා
මැරුම් කා ඇද වැටෙනු ඇත.[6] කඩු-
වෙන් පහර කා ඇගේ වීථි පුරා වැටී
සිටිනු ඇත.[7]
**5** “ඊශ්‍රායෙල් හා යූදා,[8] වැන්දඹුවක
මෙන් අසරණ වී නැත. මන්ද ඔවුන්-
ගේ ස්වාමිපුරුෂයා ස්වර්ගයේ සේනා-
වල අධිපති වන යෙහෝවා දෙවිය.[9]
ඔහු ඔවුන්ව අත්හැර දමා නැත.
නමුත් කල්දිවරුන්ගේ දේශය ඊශ්‍රා-
යෙල්හි ශුද්ධ තැනැත්තාණන් ඉදිරියේ
ඉතා පව්කාර තත්වයක තිබේ.[10]
**6** “දිවි ගලවාගෙන[11] බැබිලෝනි-
යෙන් පලා දුවන්න.[12] ඇගේ පාපව-
ලට හවුල් වී මැරුම් කන්න එපා.[13]
මන්ද යෙහෝවා දෙවි ඇයට දඬුවම්
කරන කාලය පැමිණ තිබේ.[14] ඇය
කළ දේවලට සුදුසු දඬුවම දෙවි නියම
කරනු ඇත.[15] **7** බැබිලෝනිය යෙ-
හෝවා දෙවිගේ හස්තයේ තිබූ රන්
කුසලානයක් මෙනි.[16] ඒ කුසලාන-
යෙන් ඇය මුළු ලොවම මත් කළාය.[17]
සියලු ජාතීන් උමතුවෙන් හැසිරු-
ණේ[18] ඇගේ කුසලානයේ තිබූ වයින්
පානය කළ නිසාය.[19] **8** එක මො-
හොතින් බැබිලෝනිය වැටී විනාශ
වී ගියේය.[20] ජනයෙනි, ඇයට සිදු වූ
විපත නිසා විලාප නඟන්න.[21] වේද-
නාවෙන් පෙළෙන ඇයට බෝල්සම්
තෙලය ගෙනත් දෙන්න.[22] සමහර-
විට ඇයට ඉන් සුවයක් ලැබෙයි.”

**50 පරි.**
1 යෙරෙ 51:27
2 යෙරෙ 51:31
3 ආනි 5:6
4 යෙරෙ 49:24
5 සෙක 11:3
6 යෙරෙ 49:19
7 යෙසා 41:25
8 යෝබ 40:2
9 යෝබ 41:10; යෙරෙ 49:19
10 ගීතා 89:6; යෙසා 40:18
11 යෙසා 14:24; යෙසා 46:10; යෙරෙ 51:11
12 යෙසා 42:9
13 යෙරෙ 1:10
14 යෙරෙ 49:20
15 යෙසා 13:20; යෙරෙ 51:43
16 යෙසා 14:9
17 එළි 18:9

**51 පරි.**
18 යෙරෙ 50:9
19 යෙරෙ 4:11; යෙරෙ 49:36

**2 තීරුව**
1 යෙසා 41:16; යෙරෙ 15:7; මතෙ 3:12
2 යෙරෙ 50:14; යෙරෙ 50:29
3 යෙරෙ 50:14
4 යෙසා 13:18; යෙරෙ 50:30
5 යෙරෙ 50:21
6 යෙරෙ 25:12
7 යෙසා 13:15
8 සෙක 2:12
9 ගීතා 94:14; යෙසා 44:21; යෙරෙ 46:28
10 යෙරෙ 16:18; එස 8:17
11 සෙක 2:7
12 යෙරෙ 50:8; එළි 18:4
13 උත් 19:26; ගණන් 16:26
14 ගීතා 94:1; යෙරෙ 46:10; යෙරෙ 50:15
15 යෙරෙ 25:14
16 එළි 17:4
17 එළි 17:2
18 යෙරෙ 25:16; යෙරෙ 50:38
19 එළි 18:3; එළි 19:2
20 යෙසා 21:9; යෙසා 47:9; 1තෙස 5:2; එළි 14:8; එළි 18:2
21 යෙරෙ 48:20; එළි 18:9

යෙරෙ **51:1*** පෙනෙන විදිහට කල්දිවරුන්ගේ දේශයට දී ඇති තවත් නාමයකි.

**22** යෙරෙ 8:22; යෙරෙ 46:11.

9 “බැබිලෝනිය සුව කිරීමට අපි
උත්සාහ කළෙමු. නමුත් ඇයට සුව-
යක් ලැබුණේ නැත. එබැවින් ජන-
යෙනි, ඇයව අත්හැර[1] අපි ආපසු අපේ
දේශවලට යමු.[2] මන්ද ඇගේ පව්
කොතරම්ද කියනවා නම් ඒවා අහස
දක්වාම ඉහළට නැඟ ඇත. එබැ-
වින් ඇයට අනිවාර්යයෙන්ම දඬුවම්
ලැබෙන්නේය.[3] 10 යෙහෝවා දෙවි
අපට යුක්තිය ඉටු කර දුන්නේය.[4]
එන්න, අපි සියොන් වෙතට ගොස්
අපේ දෙවි වන යෙහෝවාගේ ක්‍රියා
ප්‍රකාශ කරමු.”[5]
11 “වැසියෙනි, ඔබේ ඊතල මුව-
හත් කරගන්න.[6] පලිස් සූදානම් කර-
ගෙන යුද්ධයට රැස් වන්න. මන්ද
බැබිලෝනියේ වැසියන් තම මාලිගා-
වට කළ දේට දඬුවම් දීමක් ලෙස[7]
බැබිලෝනිය විනාශ කර දැමීමට
යෙහෝවා දෙවි අරමුණු කළේය.[8]
ඒ සඳහා යෙහෝවා දෙවි මේදිය
ජාතික රජවරුන්ව පෙලඹෙව්වේය.[9]
12 බැබිලෝනියේ පවුරු දෙසට මං-
සලකුණක් තබන්න.[10] තව තවත්
මුරකරුවන් යොදවා මුරකාවල් වැඩි
කරන්න.[11] මඟ රැක පහර දීමට සැරසී
සිටින්න.[12] බැබිලෝනියට විරුද්ධව
ක්‍රියා කිරීම යෙහෝවා දෙවිගේ අර-
මුණ නිසා ඔහු එහි වැසියන්ට විරුද්-
ධව ප්‍රකාශ කළ දේ අනිවාර්යයෙන්ම
ඉටු කරන්නේය.”[13]
13 “බැබිලෝනිය, යස ඉසුරෙන්
පොහොසත්,[14] ජල ධාරා මධ්‍යයයේ
සිටින[15] ඔබේ අවසානය අත ළඟයි.[16]
බොහෝ සෙයින් ලාභ ඉපයූ ඔබේ ඉසු-
රුමත් යුගයේ අවසානය කරා ඔබ
දැන් පැමිණ තිබේ.[17] 14 ‘පළඟැටි
රංචුවක් මෙන් වූ විශාල සෙනඟක් මම
ඔබ වෙතට එවන්නෙමි.[18] ඔවුහු ඔබව
පරාජය කර ජය ඝෝෂා නඟනු ඇත’[19]
කියා ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි තම නමින්
දිවුරා පැවසුවේය.[20] 15 දෙවි තම
මහත් බලයෙන් පොළොව සාදා[21]
ප්‍රඥාවෙන්[22] එය ස්ථිර ලෙස පිහි-
ටෙව්වේය.[23] ඔහු තම නුවණින්[24]
අහස්තලය ඇතිරිල්ලක් මෙන් දිග-
හැරියේය.[1] 16 ඔහුගේ හඬට අහස්-
කුසෙහි ඇති ජල කඳ ගිගුරුම්
දෙයි. ඔහු පොළොවේ සතර දෙසින්
ජලය වාෂ්ප වී ඉහළට ඇදී යෑමට
සැලැස්වූවේය.[2] වැසි වස්සවන පිණිස
ඔහු අහසේ කවුළු සෑදුවේය.[3] ඔහු තම
ගබඩාවලින් සුළං හමා ඒමට සැලැස්-
වූවේය. 17 නමුත් මේවා තේරුම්-
ගැනීමට බැරි තරමටම මනුෂ්‍යයන්
අඥාන ලෙස කටයුතු කර තිබේ.[4]
තමන් සෑදූ රූප නිසා ලෝහක-
රුවන් සියලුදෙනාම ලැජ්ජාවට පත්
වන බව නියතයි.[5] ඔවුන් සාදාගෙන
තිබෙන රූපවල කිසිම ජීවයක් නැත.[6]
ඒ සියල්ල පුහු දේවල්ය.[7] 18 ඒවා
නිෂ්ඵලය.[8] ඒවා නිසා අත් වන්-
නේ නින්දාව පමණි.[9] නියමිත කාලය
පැමිණි විට ඒවා සියල්ල විනාශ කරනු
ලැබේ.[10]
19 “නමුත් යාකොබ්ගේ දෙවි ඒ
රූපවලට වඩා බොහෝ සෙයින් වෙ-
නස්ය.[11] සෑම දෙයක්ම සෑදුවේ
ඔහුය.[12] ඔහුගේ උරුමයට සවිය දෙන්-
නේද ඔහුය.[13] ස්වර්ගයේ සේනාවල
අධිපති වන යෙහෝවා යන නාම-
යෙන් ඔහුව හඳුන්වයි.”[14]
20 “ඔබ මාගේ අතෙහි ඇති මුගු-
රය. යුධ ආයුධයය.[15] මම ඔබ
මාර්ගයෙන් ජාතීන්ව සුනුවිසුනු
කර දමන්නෙමි. රාජ්‍යයන් කඩා
බිඳ දමන්නෙමි. 21 ඔබ මාර්ගයෙන්
අශ්වයන්වත් අසරුවන්වත් සුනුවි-
සුනු කර දමන්නෙමි. යුධ රථත් ඒවා
පදවන්නන්වත් කැබලි කර දමන්-
නෙමි.[16] 22 ස්ත්‍රීන් හා පුරුෂයන්වද
බාලයන් හා මහල්ලන්වද තරුණ-
යන් හා තරුණියන්වද මම ඔබ
මාර්ගයෙන් විනාශ කර දමන්නෙමි.
23 එඬේරුන් හා ඔවුන්ගේ රැළ-
වල්ද ගොවියන් හා ඔවුන්ගේ සතුන්-
වද ආණ්ඩුකාරයන්වද නිලධාරීන්වද
මම ඔබ මාර්ගයෙන් සහමුලින්ම
නැති කර දමන්නෙමි. 24 නමුත්
බැබිලෝනිවරුන් හා කල්දිය දේ-
ශයේ වැසියන් ඔබේ ඇස් ඉදිරියේම

51 පරි.
1 එළි 18:4
2 යෙසා 13:14
යෙරෙ 50:16
3 එළි 18:5
4 ගීතා 37:6
මීකා 7:9
5 යෙරෙ 50:28
6 යෙරෙ 50:14
7 යෙරෙ 50:28
8 යෙරෙ 50:45
9 2ලේක 36:22
යෙසා 13:17
යෙසා 45:1
10 යෙසා 13:2
11 නාහු 2:1
12 යොෂු 8:14
13 එළි 17:17
14 යෙසා 45:3
යෙරෙ 50:37
එළි 18:12
15 එළි 17:1
එළි 17:15
16 යෙරෙ 50:27
17 හබ 2:9
එළි 18:19
18 විනි 6:5
නාහු 3:15
19 යෙරෙ 50:15
20 යෙරෙ 49:13
ආමො 6:8
හෙබ්‍රෙ 6:13
21 උත් 1:1
ගීතා 146:6
යෙසා 45:18
යෙරෙ 10:12
ක්‍රියා 14:15
22 ගීතා 104:24
හිතෝ 3:19
23 ගීතා 93:1
ගීතා 96:10
24 ගීතා 136:5

2 තීරුව
1 යෝබ් 9:8
ගීතා 104:2
යෙසා 40:22
2 ගීතා 135:7
3 යෙරෙ 10:13
4 ගීතා 14:2
5 යෙසා 44:11
6 ගීතා 135:17
යෙරෙ 10:14
හබ 2:19
7 1කොරි 8:4
8 යෙරෙ 8:19
යෙරෙ 14:22
9 යෙසා 41:29
10 යෙරෙ 10:15
11 ගීතා 16:5
12 යෙරෙ 33:2
රෝම 9:20
13 ද්වි 32:9
යෙරෙ 10:16
14 යෙසා 47:4
15 යෙසා 13:3
16 යෙරෙ 50:37

සියොන්හිදී කළ දුෂ්ටකම්වලට මම
ඔවුන්ට දඬුවම් කරන්නෙමි”[1] කියා
යෙහෝවා දෙවි පවසන්නේය.
**25** යෙහෝවා දෙවි මෙසේද පව-
සන්නේය. “බැබිලෝනිය, ඔබ මුළු
පොළොවම නැති නාස්ති කර දමන[2]
විනාශකාරී කන්දක් මෙනි.[3] නමුත්
මම ඔබට විරුද්ධව නැඟී සිටිමි.[4] මම
මාගේ හස්තය දිගු කර කඳු අත-
රේ වැජඹෙන ඔබව පෙරළා දමන්-
නෙමි. ඔබව පිලිස්සී ගිය කන්දක්
මෙන් වීමට සලස්වන්නෙමි.”[5]
**26** “ගොඩනැඟිල්ලක කොනේ
තැබීම සඳහාවත් අත්තිවාරමක් සඳ-
හාවත් මිනිස්සු ඔබෙන් කිසි ගලක්
ගෙන යන්නේ නැත.[6] ඔබ සදහටම
පාළුවට යන්නෙහිය”[7] කියා යෙහෝවා
දෙවි පවසන්නේය.
**27** “ජනයෙනි, දේශයෙහි සංඥා-
වක් ඔසවන්න.[8] ජාතීන්ට ඇසෙන සේ
හොරණෑව පිඹ බැබිලෝනියට විරුද්-
ධව යුද්ධයට යෑමට ඔවුන්ව සූදා-
නම් කරන්න.*[9] අරරත්,[10] මින්නි
සහ අෂ්කෙනස්[11] යන රාජ්‍ය-
යන්ද යුද්ධයට යෑමට කැඳවන්න.
ඇයට විරුද්ධව යුද්ධයට යන හමුදාව
ගොඩනැංවීමට නිලධාරියෙකුව පත්
කරන්න. පළඟැටි සේනාවක් මෙන්
අශ්ව සේනාව[12] රැගෙන යුද්ධයට
එන්න. **28** බැබිලෝනියට විරුද්ධව
යුද්ධයට යෑමට ජාතීන්වද මේදියාවේ
රජවරුන්වද[13] එහි ආණ්ඩුකාරයන්වද
සියලු නිලධාරීන්වද ඔවුන් යටතේ
තිබෙන දේශවල වැසියන්වද සූදානම්
කරන්න. **29** සියලුදෙනා පුදුමයට
පත් කරමින් බැබිලෝනිය කිසි මිනි-
සෙකු වාසය නොකරන පාළු ස්ථාන-
යක් බවට පත් කිරීමට යෙහෝවා
දෙවි තීරණය කර ඇත.[14] එබැවින්
පොළොව දෙදරුම් කන්නේය. මහත්
සේ වේදනාවට පත් වන්නේය.[15]
**30** “බැබිලෝනියේ දක්ෂ යුධ සෙ-
බළු සටනින් පසුබැස ඔවුන්ගේ බල-
කොටු තුළම රැඳී සිටිති. ඔවුන්ගේ
බලය සිඳී ගොසින්ය.[1] ඔවුහු ස්ත්‍රීන්
මෙන් දුර්වල වී සිටිති.[2] බැබිලෝනි-
යේ වාසස්ථානවලට ගිනි තබා ඇත.
ඇගේ දොරටුවල අගුලු සියල්ල කඩා
බිඳ දමා ඇත.[3]
**31** “නගරය සෑම පැත්තෙන්ම අල්-
ලාගෙන ඇති බව බැබිලෝනියේ
රජුට දන්වන පිණිස[4] පණිවිඩකරුවෝ
පිට පණිවිඩකරුවෝ පැමිණෙති.[5]
**32** ඔවුහු රජු වෙතට පැමිණ සතු-
රන් තොටුපොළවල් සියල්ල අල්ලා-
ගත් බවත්[6] පැපිරස් බෝට්ටු සියල්ල
ඔවුන් ගිනිබත් කළ බවත් සිදු වූ දේ
නිසා යුධ භටයන් සියලුදෙනා වියවුල්
වී සිටින බවත්[7] දන්වති.”
**33** ස්වර්ගයේ සේනාවල අධිපතිද
ඊශ්‍රායෙල්හි දෙවිද වන යෙහෝවා
මෙසේ පවසන්නේය. “බැබිලෝනිය
දියණිය, ඔබ ධාන්‍ය මඩින කම-
තක් මෙනි.[8] ටික දිනකින් අස්වැන්න
කපන කාලය පැමිණෙන්නේය.[9] එවිට
ඔබව සම්පූර්ණයෙන්ම පාගා දමනු
ලබන්නේය.”
**34** “බැබිලෝනියේ රජු වන නෙබු-
කද්රෙෂර් මාව කා දැමුවේය.[10] ඔහු
මාව වියවුලට පත් කළේය. භාජ-
නයක් පෙරළා හිස් කර දමන්නාක්
මෙන් ඔහු මාව සම්පූර්ණයෙන්ම හිස්
කර දැමුවේය. දැවැන්ත සර්පයෙකු
මෙන් ඔහු මාව ගිල දැමුවේය.[11] මා
සතු අගනා දෙයින් ඔහු තම කුස
පුරවාගෙන මාව වීසි කර දැමුවේය.
**35** ‘අපටත් අපේ පෙළපතටත් කළ
දරුණු අපරාධ සියල්ල බැබිලෝනිය
පිටටත් පැමිණේවා’ කියා සියොන්
දියණිය පවසන්නීය.[12] ‘දේශය තුළ
වැඟිරෙවූ ලේවලට කල්දිය දේශයේ
වැසියන්ට දඬුවම් කරන්න’ කියා යෙ-
රුසලම පවසන්නේය.”[13]
**36** එබැවින් යෙහෝවා දෙවි මෙසේ
පවසන්නේය. “මා ඔබේ නඩුව විභාග
කර[14] ඔවුන් ඔබට කළ දේට මම
ඔවුන්ට දඬුවම් කරන්නෙමි.[15] මම
බැබිලෝනියේ මහ ගංගාව සිඳී යෑමට
සලස්වන්නෙමි. ඇගේ දිය උල්පත්

**51 පරි.**
**1** යෝබ් 34:11, ගීතා 137:8, ගලා 6:7
**2** යෙරෙ 25:9, එළි 11:18
**3** සෙක 4:7
**4** යෙරෙ 50:31
**5** එළි 8:8, එළි 18:9
**6** යෙරෙ 50:13
**7** යෙරෙ 50:40, එළි 18:21
**8** යෙසා 13:2, යෙරෙ 51:12
**9** යෙරෙ 22:7
**10** උත් 8:4, යෙරෙ 50:41
**11** උත් 10:3, 1ලේක 1:6
**12** යෙරෙ 50:42
**13** යෙසා 13:17, යෙරෙ 25:25, දානි 5:31
**14** යෙසා 13:19, යෙරෙ 50:13, යෙරෙ 50:39, යෙරෙ 50:40
**15** යෙසා 13:13

**2 තීරුව**
**1** යෙසා 13:7, යෙරෙ 50:38
**2** යෙසා 19:16, යෙරෙ 50:37
**3** ගීතා 107:16, යෙසා 45:2, ආමො 1:5
**4** යෙසා 47:11, යෙරෙ 50:24, යෙරෙ 50:43
**5** 2සාමු 18:19, එස්ත 8:14
**6** යෙසා 44:27, යෙරෙ 50:38, එළි 16:12
**7** යෙරෙ 50:36
**8** යෙසා 21:10, යෙසා 41:15, ආමො 1:3, මීකා 4:13, හබ 3:12
**9** මතෙ 13:30, එළි 14:15
**10** 2ලේක 36:18, යෙරෙ 50:17
**11** යෙරෙ 51:44, විලා 2:16
**12** ගීතා 137:8, යෙරෙ 50:29
**13** ගීතා 9:12, එළි 6:10
**14** ගීතා 140:12, යෙරෙ 50:34
**15** ද්වි 32:35, යෙසා 14:5

යෙරෙ **51:27*** එනම්, ශුද්ධ දෙයක් සඳහා වෙන් කරන්න.

සියල්ලද වියළී යෑමට සලස්වන්-
නෙමි.[1] **37** බැබිලෝනියේ ඉතුරු
වන්නේ නටබුන් ගොඩක් පමණි.[2]
එය මනුෂ්‍ය වාසයක් නැති හිවලුන්-
ගේ රාජධානියක් බවට පත් වනු
ඇත.[3] සියලුදෙනාගේ අපහාසවලට
ලක් වන ඇය දෙස සියල්ලෝ පුදුම-
යෙන් බලා සිටිනු ඇත.[4] **38** බැබි-
ලෝනියේ වැසියෝ තරුණ සිංහයන්
මෙන් ගොරවන්නෝය. ඔවුහු සිංහ
පැටවුන් මෙන් කෑ මොර ගසන්-
නෝය.”

**39** යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. “ඔවුන් උමතු වී සිටින විට
මම ඔවුන්ට උත්සවයක් සූදානම් කර
මත් වන තුරු ඔවුන්ට බීමට දෙන්-
නෙමි.[5] ප්‍රීතියෙන් කුල්මත්ව සිටින
ඔවුහු නොදැනුවත්වම සදාකාල නින්-
දකට වැටෙනු ඇත. කිසි දිනක ඔවුහු
ඒ නින්දෙන් අවදි නොවනු ඇත.[6]
**40** බැටළුවන් හා එළුවන් මෙන් මම
ඔවුන්ව මරණයට ගෙන යන්නෙමි.”[7]

**41** “අහෝ, ෂේෂක් පරාජයට පත්
වූ හැටි![8] මුළු ලොවෙහි කීර්තිය දිනා-
ගත් නගරය බිඳ වැටුණු හැටි![9] බැබි-
ලෝනිය සියලු ජාතීන්ගේ පුදුමයට
ලක් වූ හැටි![10] **42** මහ සයුර බැබි-
ලෝනියට එරෙහිව පැමිණියේය. මහා
රළ පහරින් ඇයව සම්පූර්ණයෙන්ම
යට වී ගියේය.[11] **43** සියලුදෙනාව
පුදුමයට පත් කරවමින් ඇගේ නගර
සියල්ල කිසිවෙකු නොවසන පාළු
කාන්තාරයක් බවට පත් වී ඇත.[12] ඒ
මැදින් කිසි මිනිසෙක් ගමන් නො-
කරයි.[13] **44** බැබිලෝනියේ සිටින
බෙල්ට මම දඬුවම් කරන්නෙමි.[14] ඔහු
ගිල දැමූ සෑම දෙයක්ම එදාට ඔහුට
වැමෑරීමට සිදු වන්නේය.[15] පෙර මෙන්
ජාතීහු ඔහු වටා එක් රොක් වන්නේ
නැත.[16] බැබිලෝනියේ පවුරුද බිඳී
වැටෙන්නේය.[17]

**45** “මාගේ සෙනහෙනි, ඇගෙන්
ඉවත්ව පලා දුවන්න.[18] යෙහෝවා දෙ-
විගේ මහත් උදහසට[19] හසු නොවී
ඔබේ ජීවිත බේරාගන්නා පිණිස[20]
ඇගෙන් ඉවත්ව යන්න. **46** නැත්-
නම් ඔබට දේශයේදී අසන්න ලැබෙන
ආරංචි නිසා ඔබේ හදවත් සසල
වී[1] ඔබ භීතියට පත් වනු ඇත.
පොළොව පුරා සිදු වන සැහැසික-
කම් ගැනද එක් රජෙකු තවත් රජෙ-
කුට විරුද්ධව නැඟී සිටීම ගැනද
අවුරුද්දක් අවුරුද්දක් පාසා ඔබට
අසන්න ලැබෙනු ඇත. **47** සෙන-
හෙනි, මෙය අසන්න. මම බැබිලෝ-
නියේ තිබෙන දේවතා රූප සියල්ල
විනාශ කරන කාලය පැමිණෙන්-
නේය.[2] එදාට ඇගේ මුළු දේශයම
මහත් ලැජ්ජාවකට පත් වන්නේය.
පහර කන සියලුදෙනා ඇය තුළම
මැරී වැටෙන්නෝය.[3]

**48** යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. “බැබිලෝනිය කොල්ල කා
එය විනාශ කර දැමීමට උතුරු දෙ-
සින් පිරිසක් පැමිණෙන නිසා[4] අහසත්
පොළොවත් එහි වෙසෙන සියලු-
දෙනාත් ප්‍රීති ඝෝෂා නඟන්නෝය.[5]
**49** එවැනි විපතක් අත් වන්නේ ඔවුන්
ඊශ්‍රායෙල්වරුන්ව මරා දැමූ නිසා පම-
ණක් නොව[6] පොළොවේ සිටින වෙ-
නත් ජාතීන්වද බැබිලෝනියේදී මරා
දැමූ නිසාය.[7]

**50** “කඩු පහරින් තම දිවි ගල-
වාගත් සියල්ලෙනි, නොනැවතී පලා
දුවන්න.[8] ඈත එපිට පිහිටි යෙරු-
සලම ඔබේ මතකයට නඟාගන්න.[9]
යෙහෝවා දෙවිව සිහි කරන්න.”[10]

**51** “අපට අසන්න ලැබුණු නින්දා-
සහගත දේවල් නිසා[11] අපි ලැජ්ජා-
වට පත් වුණෙමු.[12] අවමානය නිසා
අපි අපේ මුහුණු සඟවාගත්තෙමු.[13]
අපි මේ දේවල් අද්දුටුවේ යෙහෝවා
දෙවිගේ මාලිගාවේ ශුද්ධස්ථානවලට
ඇතුල් වීමට නුසුදුසු අය එයට ඇතුල්
වූ නිසාය.”[14]

**52** “බැබිලෝනියේ තිබෙන දේ-
වතා රූප සියල්ල මා විනාශ
කර දමන කාලය පැමිණෙන්නේය.[15]
එදාට තුවාල ලැබූවන් නඟන මර

**51 පරි.**
**1** යෙසා 44:27; යෙරෙ 50:38
**2** යෙසා 13:19; යෙරෙ 25:12; යෙරෙ 50:15
**3** යෙසා 13:22; යෙරෙ 50:39; එළි 18:2
**4** යෙරෙ 50:13
**5** යෙරෙ 25:27; දානි 5:4
**6** යෝබ් 14:12; යෙරෙ 51:57
**7** යෙසා 34:6; යෙරෙ 50:27; එස 39:18; සෙක 10:3
**8** යෙරෙ 25:26
**9** යෙසා 13:19; යෙසා 14:4; යෙරෙ 49:25; දානි 4:30
**10** යෙරෙ 50:46
**11** ගීතා 18:4; යෙසා 8:8; එස 27:26; දානි 9:26
**12** යෙසා 33:9; යෙරෙ 50:39
**13** යෙසා 13:20
**14** යෙසා 46:1; යෙරෙ 50:2
**15** 2ලේක 36:7; එස්රා 1:7; යෙරෙ 51:34; දානි 1:2
**16** දානි 4:1
**17** යෙරෙ 51:58
**18** යෙසා 48:20; යෙරෙ 50:8; 2කොරි 6:17; එළි 18:4
**19** ගීතා 90:11; යෙසා 13:13
**20** උත් 19:17; යෙරෙ 51:6; සෙක 2:7

**2 තීරුව**
**1** ලූක් 21:26
**2** යෙසා 46:1; යෙරෙ 50:2; යෙරෙ 51:52
**3** යෙසා 13:15; දානි 5:30
**4** යෙරෙ 50:3; යෙරෙ 50:41
**5** හිතෝ 11:10; යෙසා 44:23; යෙසා 48:20; යෙසා 49:13; එළි 18:20; එළි 19:2
**6** යෙරෙ 50:17; යෙරෙ 51:24
**7** ගීතා 137:8
**8** යෙසා 48:20; යෙරෙ 44:28; යෙරෙ 50:8; එළි 18:4

**9** එස්රා 1:3; ගීතා 137:5; **10** ලෙවී 26:40; **11** ගීතා 44:13; ගීතා 79:4; **12** යෙරෙ 3:25; **13** ගීතා 44:15; **14** ගීතා 79:1; විලා 1:10; **15** යෙසා 46:1; යෙරෙ 50:2; යෙරෙ 51:47.

ළතෝනිය දේශය සිසාරා පැතිර යනු
ඇත"[1] කියා යෙහෝවා දෙවි පවසන්-
නේය.
**53** "බැබිලෝනිය අහස තරම්
උසට නැඟුණත්[2] කිසිවෙකුට ළඟා
විය නොහැකි තරමටම ඇය තම
සුරක්ෂිත බලකොටු උස්ව තනාගත්-
තත්[3] මම ඇයව විනාශ කර දැමීමට
සෙනඟක් එවන්නෙමි"[4] කියා යෙ-
හෝවා දෙවි පවසන්නේය.
**54** "බැබිලෝනියෙන් නැඟෙන
විලාප දීමේ හඬට ඇහුම්කන්
දෙන්න.[5] කල්දිවරුන්ගේ දේශයෙන්
නික්මෙන විනාශයේ හඬට ඇහුම්-
කන් දෙන්න.[6] **55** යෙහෝවා දෙවි
බැබිලෝනිය විනාශ කර ඇයව නිහඬ
කරන්නේය.[7] ඇගේ සතුරෝ මුහුදේ
රැළි මෙන් ඝෝෂා නඟමින් ඇයට
විරුද්ධව නැඟී එන්නෝය.[8] ඔවුන්ගේ
ඝෝෂාව බොහෝ සෙයින් වැඩි වන්-
නේය. **56** බැබිලෝනිය විනාශ කර
දැමීමට නැනැත්තෙක් පැමිණෙන්-
නේය.[9] ඇගේ බලවන්තයන් සියලු-
දෙනාව යටත් කරගෙන[10] ඔවුන්ගේ
දුනු කැබලිවලට කඩා දමනු ලබන්-
නේය.[11] මන්ද යෙහෝවා දෙවි මිනි-
සුන්ගේ ක්‍රියාවලට සුදුසු ප්‍රතිඵල
ලබා දෙන දෙවි කෙනෙකි.[12] එබැවින්
ඔහු අනිවාර්යයෙන්ම ඔවුන්ට දඬුවම්
කරන්නේය."[13] **57** ස්වර්ගයේ සේ-
නාවල අධිපති වන යෙහෝවා යන
නමින් හඳුන්වන[14] රජ[15] මෙසේද පව-
සන්නේය. "මම ඇගේ අධිපතීන්ටද
ප්‍රඥාවන්තයන්ටද ආණ්ඩුකාරයන්ටද
නිලධාරීන්ටද දක්ෂ යුධ භටයන්-
ටද මත් වන තුරුම බීමට දෙන්-
නෙමි.[16] එවිට ඔවුහු නොදැනුවත්වම
සදාකාල නින්දට වැටෙනු ඇත. කිසි
දිනක ඔවුහු ඒ නින්දෙන් අවදි වන්නේ
නැත."[17]
**58** ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ පවසන්නේය. "බැබිලෝනියේ
පවුර කොතරම් පළල් වුණත් එය
නිසැකවම කඩා බිඳ දමනු ලබන්-
නේය.[18] ඇගේ දොරටු කොතරම්
උසට සාදා තිබුණත් ඒවා ගින්නෙන්
දවා දමනු ලබන්නේය.[1] මනුෂ්‍යයන්-
ගේ වෙහෙසින් කිසිම පලක් වන්නේ
නැත.[2] ජාතීන් දැරූ උත්සාහය ගින්-
නෙන් දැවී යන්නේය.[3] ඔවුන්ගේ වෙ-
හෙස නිෂ්ඵල වන්නේය."
**59** මසේයාගේ පුත්‍රයා වූ[4] නෙරි-
යාගේ පුත්[5] සෙරායා, යූදාහි රජු වූ
ශෙදකියා සමඟ බැබිලෝනියට යන
අවස්ථාවේදී අනාගතවක්තෘ යෙරෙ-
මියා ඔහුට කිරීමට යම් පැවරුමක්
දුන්නේය. යෙරෙමියා, රජුගේ ප්‍රධාන
නිලධාරියෙකු වූ සෙරායාට එම පැව-
රුම දුන්නේ ශෙදකියා රජු පාල-
නය කළ හතරවන අවුරුද්දේදීය.
**60** බැබිලෝනිය පිටට පැමිණෙන
සියලු විපත්ති එනම්, බැබිලෝනි-
යට විරුද්ධව පැවසූ ඒ සියලු දේ
ගැන යෙරෙමියා ලියවිල්ලක සටහන්
කළේය.[6] **61** යෙරෙමියා එය සෙරා-
යාට දී ඔහුට මෙසේ පැවසුවේය. "ඔබ
බැබිලෝනියට ඇතුල් වූ විට මෙහි
සඳහන් දේවල් ශබ්ද නඟා කියවන්න.[7]
**62** එමෙන්ම ඔබ මෙසේද පවසන්න.
'යෙහෝවා දෙවියනි, බැබිලෝනිය
සඳහටම කිසි මිනිසෙකුවත් සතෙකු-
වත් වාසය නොකරන පාළු ස්ථානයක්
බවට පත් වෙනවා කියා ඔබ පැව-
සුවා.'[8] **63** ඔබ මේ ලියවිල්ලේ සඳ-
හන් දේ කියවා අවසන් වූ පසු එයට
ගලක් බැඳ යුප්‍රටීස් ගඟට වීසි කර[9]
**64** මෙසේ කියන්න. 'මේ ලියවිල්ල
ගඟේ පත්ලටම ගිලී ගිය ලෙසම මම
බැබිලෝනිය පිටට ගෙනෙන විපත්ති
නිසා ඇය නැවත කිසිදාක උඩට මතු
නොවන ලෙස ගිලී යන්නේය.[10] එය
ගොඩගැනීමට දරන සියලු උත්සාහ-
යන්ද අසාර්ථක වන්නේය.' "[11]

මෙතෙක් සඳහන් වූයේ යෙරෙමියා
පැවසූ දේය.

# 52

ශෙදකියා[12] රජකමට පත්
වන විට ඔහුට වයස අවු-
රුදු විසිඑකක් විය.[13] ඔහු යෙරුසල-
මේ සිට අවුරුදු එකොළහක් පාලනය
කළේය.[14] ඔහුගේ මව ලිබ්නා නග-
රයෙහි වැසියෙකු වූ[15] යෙරෙමියාගේ

**51 පරි.**
1 යෙසා 13:15
2 උත් 11:4, යෙසා 14:13, ආමෝ 9:2
3 යෙරෙ 49:16, දානි 4:30
4 යෙරෙ 50:10
5 යෙසා 13:6
6 යෙරෙ 50:22
7 එළි 18:22
8 එස 26:3, එළි 17:15
9 යෙසා 21:2, එළි 17:16
10 යෙරෙ 50:36
11 ගීතා 37:15
12 ද්වි 32:35, ගීතා 94:1, යෙසා 34:8, යෙරෙ 50:29, 2තෙස 1:6, එළි 18:5
13 ගීතා 137:8, එළි 19:2
14 යෙරෙ 48:15
15 යෙරෙ 46:18, මලා 1:14
16 යෙරෙ 25:27
17 යෝබ් 14:12, යෙරෙ 51:39
18 යෙරෙ 50:15, යෙරෙ 51:44

**2 තීරුව**
1 යෙරෙ 51:30
2 ගීතා 127:1
3 හබ 2:13
4 යෙරෙ 32:12
5 යෙරෙ 36:4, යෙරෙ 45:1
6 යෙරෙ 30:2
7 යෙරෙ 29:1, එළි 1:3
8 යෙසා 13:20, යෙසා 14:23, යෙරෙ 50:3, යෙරෙ 50:39, යෙරෙ 51:29, යෙරෙ 51:37, එළි 18:23
9 යෙරෙ 46:10, එළි 18:21
10 යෙරෙ 25:27
11 යෙරෙ 51:58

**52 පරි.**
12 2රාජා 24:17
13 2රාජා 24:18
14 2ලේක 36:11
15 යොෂු 10:29

දියණිය වූ හමුතල්ය.[1] 2 ඔහුද යෙ-
හෝයාකිම් රජු මෙන්[2] යෙහෝවා දෙවි
පිළිකුල් කළ දේවල් දිගටම කළේය.[3]
3 යෙරුසලමේ සහ යූදා දේශයේ වැසි-
යන්ගේ දුෂ්ටකම් නිසා යෙහෝවා
දෙවිගේ උදහස ඔවුන්ට විරුද්ධව ඇවු-
ළුණු අතර අවසානයේදී ඔහු ඔවුන්ව
ප්‍රතික්ෂේප කළේය.[4] ඒ කාලයේදී
ශෙදකියා රජ බැබිලෝනියේ රජුට
විරුද්ධව කැරලිගැසුවේය.[5] 4 ශෙද-
කියා රජුගේ පාලන සමයේ නවවන
අවුරුද්දේ[6] දහවන මාසයේ දහවන
දින, බැබිලෝනියේ රජු වූ නෙබුකද්-
රෙෂර් ඔහුගේ මුළු හමුදාවත් සමඟ
යෙරුසලමට විරුද්ධව සටන් කිරීමට
පැමිණියේය.[7] ඔහු ඒ අවට කඳවුරු
බැඳගෙන යෙරුසලම වටා පවුරක්ද
ගොඩනැඟුවේය.[8] 5 ශෙදකියා රජු
පාලනය කළ එකොළොස්වන අවු-
රුද්ද දක්වාම[9] නෙබුකද්රෙෂර් රජුගේ
හමුදාව යෙරුසලම වටලා සිටියෝය.
6 එබැවින් හතරවන මාසයේ නව-
වනදා[10] වන විට ඒ දේශයේ වැසියන්ට
රොටි කැබැල්ලක්වත් සොයාගැනී-
මට නොහැකි වන තරමටම සාගතය
දරුණු විය.[11] 7 ඒ අතරතුරදී කල්දි-
වරු පවුර බිඳ නුවරට ඇතුල් වූහ.[12]
එදින රාත්‍රියේ නුවරේ සිටි සියලු යුධ
භටයෝ රජුගේ උයන අසල පිහිටි
තාප්ප දෙක අතරේ තිබූ දොරටු-
වෙන්[13] පලා ගියෝය.[14] ඔවුන් එසේ
පලා ගියේ අරබා නිම්නය දෙසට යන
මාර්ගයේය.[15] නමුත් කල්දිවරු නුවර
සැම පැත්තෙන්ම වටලා සිටියෝය.
8 කල්දිවරුන්ගේ භට පිරිසක්, පලා
ගිය ශෙදකියා රජුව ලුහුබැඳ ගොස්[16]
යෙරිකෝවේ පාළුකරයේදී ඔහුව අල්-
ලාගත්තෝය.[17] එවිට රජුගේ භට
පිරිස ඔහුව අත්හැර දමා ඒ මේ අත
පලා ගියෝය.[18] 9 ශෙදකියා රජුව
අල්ලාගත් ඔවුහු, ඔහුට දිය යුතු දඬු-
වම තීරණය කරන පිණිස[19] හමාත්
දේශයේ[20] රිබ්ලා නගරයේ[21] සිටි බැබි-
ලෝනියේ රජු වෙතට ඔහුව ගෙ-
නාවෝය.[22] 10 බැබිලෝනියේ රජ,
ශෙදකියා රජු ඉදිරියේම ඔහුගේ පුත්‍ර-
යන්ව මරා දැමුවේය.[1] ඔහු යූදාහි අධි-
පතීන් සියලුදෙනාවද රිබ්ලාහිදී මරා
දැමුවේය.[2] 11 ඉන්පසු බැබිලෝනි-
යේ රජ, ශෙදකියා රජුගේ ඇස් අන්ධ
කර[3] ඔහුට තඹ විලංගු දමා බැබිලෝ-
නියට රැගෙන ගියේය.[4] ඔහු මිය යන
තෙක්ම මුරකරුවන් යටතේ සිර කර
තැබුවේය.
12 බැබිලෝනියේ රජු වූ නෙබුකද්-
රෙෂර් පාලනය කළ දහනවවන අවු-
රුද්දේ පස්වන මාසයේ දහවන දින,[5]
බැබිලෝනියේ රජුගේ සේවකයෙකු
වූද ආරක්ෂක භටයන්ගේ ප්‍රධානියා
වූද නෙබුෂරදාන්[6] යෙරුසලමට පැමි-
ණියේය. 13 ඔහු යෙහෝවා දෙවිගේ
ගෘහයද[7] රජමාලිගාවද යෙරුසලමේ
තිබූ සියලුම නිවෙස්ද[8] උත්තමයන්ගේ
නිවෙස්ද[9] ගිනි තබා විනාශ කළේය.
14 ආරක්ෂක භටයන්ගේ ප්‍රධානියා
සමඟ සිටි කල්දිවරුන්ගේ මුළු හමු-
දාව යෙරුසලම වටා තිබූ පවුර මුළුම-
නින්ම විනාශ කර දැමුවෝය.[10]
15 නෙබුෂරදාන්, සෙනඟ අතරේ
සිටි දුගී අයගෙන් සමහරෙකුවද නග-
රයේ ඉතුරු වී සිටි අයවද[11] බැබිලෝ-
නියේ රජුට භාර වූ අයවද ඉතුරු
වී සිටි විවිධ කාර්යයන්වලට දක්ෂ
ශිල්පීන්වද වහලුන් ලෙස බැබිලෝ-
නියට රැගෙන ගියේය.[12] 16 ආරක්-
ෂක භටයන්ගේ ප්‍රධානියා දේශයේ සිටි
දුගී අයගෙන් සමහරදෙනෙකුව මිදි-
වතු වැවීමටත් ගොවිතැන් කිරීමටත්
තබා ගියේය. ඔවුහු එහි වහලුන් ලෙස
සේවය කළෝය.[13]
17 යෙහෝවා දෙවිගේ ගෘහයේ
තිබූ තඹ කුලුනුද[14] යෙහෝවා දෙවිගේ
ගෘහයේ තිබූ කරත්තද[15] වතුර දැමී-
මට තිබූ විශාල වටකුරු තඹ භාජ-
නයද[16] කල්දිවරු කැබලිවලට කඩා
ඒවායෙහි තිබූ තඹ බැබිලෝනියට
ගෙන ගියෝය.[17] 18 අළු දමන භාජ-
නද සවල්ද[18] පහන් තිර නිවා දැමීමට

**52 පරි.**
1 2රාජා 23:31
2 2රාජා 24:1; 2ලේක 36:5
3 2රාජා 24:19; 2ලේක 36:12; 2ලේක 36:13
4 ලෙවී 26:33; ද්වි 31:17
5 2රාජා 24:20; 2ලේක 36:13; එස 17:15
6 යෙරෙ 39:1
7 2රාජා 25:1
8 ද්වි 28:52; යෙසා 29:3; එස 4:2; එස 21:22; ලූක් 19:43
9 2ලේක 36:11
10 2රාජා 25:3; යෙරෙ 39:2
11 ලෙවී 26:26; ද්වි 28:53; යෙසා 3:1; එස 4:16
12 2රාජා 25:4; යෙරෙ 34:2
13 යෙරෙ 39:4
14 ද්වි 28:25
15 ද්වි 3:17; යොෂු 3:16
16 යෙරෙ 32:4
17 2රාජා 25:5; යෙරෙ 24:8; යෙරෙ 34:21; යෙරෙ 37:17; යෙරෙ 38:18; යෙරෙ 39:5; එස 12:13
18 ආමො 2:14
19 2රාජා 25:6; යෙරෙ 39:5
20 ගණන් 13:21; 1රාජා 8:65
21 2රාජා 25:21
22 යෙරෙ 32:4

**2 තීරුව**
1 2රාජා 25:7
2 යෙරෙ 39:6
3 එස 12:13
4 2රාජා 25:7; යෙරෙ 39:7
5 2රාජා 25:8
6 2රාජා 25:11; යෙරෙ 39:9
7 1රාජා 9:8; 2රාජා 25:9; 2ලේක 7:21; 2ලේක 36:19; ගීතා 74:8; ගීතා 79:1; යෙරෙ 26:18; විලා 2:7; එස 24:21
8 යෙරෙ 38:23; ආමො 2:5
9 ලෙවී 26:31; යෙරෙ 34:22; යෙරෙ 37:8

**10** 2රාජා 25:10; යෙරෙ 39:8; **11** 2රාජා 25:11; **12** යෙරෙ 39:9; **13** 2රාජා 25:12; 2රාජා 25:22; යෙරෙ 39:10; **14** 1රාජා 7:15; 2රාජා 25:16; 2ලේක 4:12; යෙරෙ 27:19; **15** 1රාජා 7:27; 2ලේක 4:14; **16** 1රාජා 7:23; 2ලේක 4:15; **17** 2රාජා 25:13; **18** 1රාජා 7:45.

භාවිත කළ උපකරණද[1] බේසම්ද[2]
කුසලානද අන් සියලු තඹ භාජනද[3]
ඔවුහු රැගෙන ගියෝය. **19** ආරක්-
ෂක හටයන්ගේ ප්‍රධානියා පිරිසිදු
රනින්ද[4] රිදීවලින්ද[5] සාදා තිබූ විශාල
භාජනද[6] අඟුරු දමන භාජනද බේ-
සම්ද[7] හැළිද පහන් රුක්ද[8] කුසලා-
නද අනිකුත් භාජනද රැගෙන ගියේය.[9]
**20** යෙහෝවා දෙවිගේ ගෘහය සඳහා
සලමොන් රජු විසින් සාදනු ලැබූ[10]
කුලුනු දෙකද[11] විශාල වටකුරු තඹ
භාජනයද[12] එය දරා සිටි තඹ ගො-
නුන් දොළොස්දෙනාවද[13] කරත්තද
ඔහු රැගෙන ගියේය. ඒ සියල්ලෙහි
තිබූ තඹවල බර කිරා මැන බලන්-
නත් බැරි තරම්ය.[14]

**21** ඒ එක් කුලුනක උස රියන්
දහඅටක්ද[15] වටප්‍රමාණය රියන් දො-
ළහක්ද විය.[16] එහි ගනකම ඇඟිලි
හතරක පළල මෙන් විය. කුලුන
මැද හිස්ව තිබිණ. **22** කුලුන මුදු-
නේ තිබූ කොටසද තඹවලින් නිමවා
තිබිණ.[17] කුලුන මුදුනේ තිබූ එම
කොටසේ උස රියන් පහකි.[18] ඒ කො-
ටස වටා තිබූ දැල් සැරසිල්ලද ඒ මත
සවි කර තිබූ දෙළුම් ගෙඩිද තඹවලින්
සාදා තිබිණ.[19] දෙවන කුලුනෙත් දෙ-
ළුම් ගෙඩි සවි කළ දැල් සැරසිල්-
ලක් තිබිණ.[20] **23** කුලුන මුදුනේ
තිබූ කොටසේ දැලෙහි දෙළුම් ගෙඩි
සියයක් බැගින් එල්ලා තිබිණ.[21] එය
වටා* දෙළුම් ගෙඩි අනූහයක් තිබිණ.

**24** ආරක්ෂක හටයන්ගේ ප්‍රධා-
නියා, නායක පූජක සෙරායාවද[22]
ඔහුගේ උපකාරයට සිටි පූජක ශෙප-
නියාවද[23] දොරටු පාලකයන් තුන්-
දෙනාවද[24] අල්ලාගත්තේය. **25** ඊට
අමතරව යුධ හටයන් කෙරෙහි පත්
කර සිටි නිලධාරියෙකුවද රජුට ඉතා
සමීපව සිටි පුද්ගලයන් හත්දෙනෙකු-
වද[25] ඔහු නුවරේදී අල්ලාගත්තේය.
එමෙන්ම ඔහු යුද්ධයට සෙනඟ එකතු
කරගත් හමුදාපතිගේ ලේකම්වද නග-
රය තුළ සිටි දේශයේ වැසියන්ගෙන්
පුරුෂයන් හැටදෙනෙකුවද අල්ලා-
ගත්තේය.[1] **26** ආරක්ෂක හටයන්-
ගේ ප්‍රධානියා වූ නෙබුෂරදාන්[2] ඔවුන්ව
රිබ්ලාහි සිටි බැබිලෝනියේ රජු වෙ-
නට රැගෙන ගියේය.[3] **27** බැබිලෝ-
නියේ රජ ඔවුන්ව හමාත් දේශයේ[4]
රිබ්ලා නගරයේදී[5] මරා දැමුවේය.[6]
යූදා දේශයේ වැසියන්ව වහලුන් ලෙ-
සද ගෙන යන ලදි.[7]

**28** නෙබුකද්‍රෙෂර් රජු වහලුන්
ලෙස ගෙන ගිය සෙනඟගේ ගණන
පහත දැක්වේ. ඔහුගේ පාලන සම-
යේ හත්වන අවුරුද්දේදී යුදෙව්වරුන්
තුන්දහස් විසිතුන්දෙනෙකුව ගෙන
ගියේය.[8]

**29** නෙබුකද්‍රෙෂර් රජු පාලනය
කළ දහඅටවන වන අවුරුද්දේදී[9] අට-
සිය තිස්දෙදෙනෙකුව යෙරුසලමෙන්
ගෙන යනු ලැබීය.

**30** නෙබුකද්‍රෙෂර් රජු පාලනය
කළ විසිතුන්වන අවුරුද්දේදී ආරක්-
ෂක හටයන්ගේ ප්‍රධානියා වූ
නෙබුෂරදාන් යුදෙව්වන් හත්සිය හත-
ළිස්පස්දෙනෙකුව ගෙන ගියේය.[10]

මෙලෙස ගෙන ගිය අයගේ මුළු
සංඛ්‍යාව හාරදහස් හයසියයක් විය.

**31** යූදාහි රජු වූ යෙහෝයාකින්ව
බැබිලෝනියට ගෙන ගොස් අවු-
රුදු තිස්හතක් ගත විය. එම තිස්-
හත්වන අවුරුද්දේ[11] එවිල්-මෙරොදක්
බැබිලෝනියේ රජකමට පත් විය.
ඒ අවුරුද්දේ දොළොස්වන මාසයේ
විසිපස්වන දින ඔහු යෙහෝයාකින්
රජුව සිරගෙයින් නිදහස් කළේය.[12]
**32** එවිල්-මෙරොදක් රජ යෙහෝයා-
කින්ට කාරුණිකව සලකා, බැබිලෝ-
නියේ සිරකරුවන් ලෙස සිටි අනික්
රජවරුන්ට වඩා ඉහළ තනතුරක්
ඔහුට දුන්නේය.[13] **33** එබැවින් යෙ-
හෝයාකින් තම සිර ඇඳුම් ඉවත්
කළේය.[14] තම ජීවිත කාලය පුරාම[15]
රජු සමඟ ආහාර ගැනීමේ වරප්‍රසාදයද
ඔහුට හිමි විය.[16] **34** ඔහු මිය යන
තෙක්ම බැබිලෝනියේ රජුගේ භෝ-
ජනයෙන් කොටසක් දිනපතා ඔහුට
ලැබිණ.[17]

**52 පරි.**
**1** 2ලේක 4:22
**2** 1රාජා 7:50
2රාජා 25:15
**3** 2රාජා 25:14
**4** 2ලේක 24:14
**5** 2රාජා 25:15
**6** 1රාජා 7:38
**7** 2ලේක 4:22
**8** 1රාජා 7:49
**9** 2රාජා 25:11
2ලේක 36:18
**10** 1රාජා 7:14
**11** 1රාජා 7:21
**12** 1රාජා 7:23
2ලේක 4:15
**13** 1රාජා 7:25
**14** 2රාජා 25:16
**15** 2රාජා 25:17
**16** 1රාජා 7:15
**17** 1රාජා 7:16
**18** 2ලේක 3:15
**19** 2ලේක 4:13
**20** 1රාජා 7:18
2ලේක 3:16
**21** 1රාජා 7:20
**22** 1ලේක 6:14
එස්රා 7:1
**23** යෙරෙ 21:1
යෙරෙ 29:25
යෙරෙ 29:29
**24** 2රාජා 25:18
**25** එස්ත 1:14

**2 තීරුව**
**1** 2රාජා 25:19
**2** 2රාජා 25:8
යෙරෙ 39:9
යෙරෙ 40:1
**3** 2රාජා 25:20
**4** 2සාමු 8:9
**5** 2රාජා 25:6
යෙරෙ 52:10
**6** 2රාජා 25:21
**7** ලෙවී 18:25
ලෙවී 26:33
ද්වි 28:36
යෙසා 24:3
යෙරෙ 25:9
**8** 2රාජා 24:14
**9** යෙරෙ 32:1
**10** යෙරෙ 6:9
**11** 2රාජා 24:8
2රාජා 25:27
යෙරෙ 24:1
යෙරෙ 37:1
මතෙ 1:11
**12** උත් 40:20
**13** 2රාජා 25:28
**14** උත් 41:14
**15** 2රාජා 25:29
**16** 2සාමු 9:13
1රාජා 2:7
**17** 2රාජා 25:30

---
යෙරෙ **52:23*** හෝ, "පෙනෙන්න තිබුණේ."

# විලාප ගී

א [ආලෙෆ්]

**1** අනේ, ජනාකීර්ණ නගරයක්ව
තිබූ මේ නුවර[1] අද පාළුවට
ගොස් ඇත![2]
සෙනඟ පිරිවරාගෙන ජාතීන්
අතරේ උසස්ව සිටි ඇය,[3] අද
වැන්දඹුවක මෙන් තනි වී
සිටින්නීය.[4]
වරෙක කුමාරිකාවක මෙන් සිටි
ඇය, අද බැළ මෙහෙවරකම්
කරන වහලියකව සිටින්-
නීය.[5]

ב [බේත්]

**2** මුළු රාත්‍රිය පුරාම ඇය හඬා වැල-
පෙන්නීය.[6] ඇගේ කඳුළු දෙ-
කොපුල් දිගේ ගලා යන්-
නේය.[7]
ඇයව සැනසවීමට ඇගේ එක
පෙම්වතෙක්වත් අද ඇය
අසල නැත්තේය.[8]
ඇය වටා රොක් වී සිටි
ඇගේ මිතුරු මිතුරියෝ අද
ඇයට සතුරුකම් කරන්-
නෝය.[9] ඇයට ද්‍රෝහිකම්
කරන්නෝය.[10]

ג [ගීමෙල්]

**3** බොහෝ පීඩා ඇති විය. මෙ-
හෙකාරකම්ද අධික විය.[11]
එහෙයින් යූදා වහල්කමට
ගෙන යන ලදි.[12]
ඉන්න හිටින්න තැනක් නැතුව
ඇය ජාතීන් අතරේ ඒ මේ
අත සැරිසැරුවාය.[13]
ඇය විපත්ති අද්දකිමින් සිටියදී
ඇය පසුපස ලුහුබැඳ ආ අය
ඇයව හසු කරගත්තෝය.[14]

ד [ දාලෙත්]

**4** උත්සවයට කිසිවෙකු නොපැමි-
ණෙන බැවින් සියොන්හි වීථි
හඬා වැලපෙන්නේය.[15]
ඇගේ දොරටු අසල කිසිවෙක්
නැත.[16] ඇගේ පූජකයෝ
සුසුම්ලති.[17]
ඇගේ තරුණියෝ හඬා වැල-
පෙති. ඇයද ශෝකයෙන්
වෙළී සිටින්නීය.[1]

ה [හේ]

**5** ඇගේ සතුරෝ ඇයට වඩා ඉහළින්
වැජඹෙති.[2] ඔවුහු කිසි කරද-
රයක් නොමැතිව සුරක්ෂි-
තව දිවි ගෙවති.[3]
යෙහෝවා දෙවි ඇයට දුක් විඳී-
මට ඉඩහැරියේ ඇය බොහෝ
පව් කළ බැවිනි.[4]
සතුරෝ ඇගේ දරුවන්ව වහල්-
කමට ඇදගෙන ගියෝය.[5]

ו [වාව්]

**6** සියොන් දියණියගේ තේජශ්‍රීය දැන්
පහව ගොසින්ය.[6]
ඇගේ පාලකයන් ගොදුරුබිම්
නැතුව සාගින්නෙන් පෙ-
ළෙන මුව රංචුවක් මෙනි.[7]
ඔවුන්ව ලුහුබැඳ පැමිණි අය ඉදි-
රියේ ඔවුහු අසරණ වී ඇත.[8]

ז [ෂායින්]

**7** ඉන්න හිටින්න තැනක් නොමැ-
තිව තම සෙනඟ කල් ගෙ-
වන විටදීද බොහෝ පීඩා
අද්දකින විටදීද
යෙරුසලමට තම සුන්දර අතී-
තය සිහි විය.[9]
ඇගේ සෙනඟ සතුරාගේ අතට හසු
වූ විට ඇයට උපකාර කිරීමට
කිසිවෙක් නොසිටියේය.[10]
එය දුටු ඇගේ සතුරෝ ඇගේ
වැටීම ගැන සිනාසුණෝය.[11]

ח [චේත්]

**8** යෙරුසලම නින්දිත තත්වයකට
පත්ව සිටින්නේ[12] ඇගේම
බරපතළ පව් නිසාය.[13]
කලින් ඇයට ගෞරවයෙන්
සැලකූ සියල්ලෝ ඇයට සිදු

**1 පරි.**

**1** ගීතා 122:4
**2** යෙසා 3:26
විලා 2:10
**3** 1රාජා 4:20
**4** යෙසා 54:4
**5** ද්වි 28:48
2රාජා 25:12
**6** යෙරෙ 9:1
විලා 1:16
**7** යෙරෙ 13:17
**8** යෙරෙ 4:30
එස 16:37
**9** යෙසා 30:3
**10** යෙරෙ 30:14
**11** ද්වි 30:7
යෙරෙ 17:4
**12** ලෙවී 26:33
2රාජා 24:14
2රාජා 25:21
යෙරෙ 39:9
යෙරෙ 52:27
**13** ද්වි 28:64
යෙරෙ 24:9
විලා 2:9
**14** විලා 4:19
**15** විලා 2:6
හොෂෙ 2:11
ආමො 8:10
**16** යෙසා 3:26
යෙරෙ 14:2
**17** යෙරෙ 4:9

**2 තීරුව**

**1** යෙරෙ 9:20
**2** ද්වි 28:44
**3** ගීතා 80:6
යෙසා 47:6
සෙක 1:15
**4** 2ලේක 36:16
නෙහෙ 9:33
යෙරෙ 30:14
විලා 1:18
එස 8:17
දානි 9:7
දානි 9:16
**5** යෙරෙ 39:9
යෙරෙ 52:30
**6** එස 24:21
**7** යෙසා 5:13
**8** යෙරෙ 46:15
**9** 1රාජා 9:19
1රාජා 10:27
විලා 1:10
**10** යෙරෙ 52:4
**11** ගීතා 137:3
හිතෝ 24:17
විලා 2:16
**12** 1රාජා 9:7
විලා 4:6

---

**13** 1රාජා 8:46; යෙසා 1:4; යෙසා 59:2; යෙරෙ 6:28; එස 14:13; එස 22:4.

වූ නින්දාව දැක[1] ඇයව පහත් කොට සලකති.[2]
එහෙයින් ඇය තම මුහුණ ඉවනට හරවාගෙන, සුසුම්ලමින් පිටත්ව යන්නීය.[3]

ט [ටේත්]

9 ඇගේ අපවිත්‍රකම ඇගේ වස්ත්‍රවලිනුත් දිස් විය.[4] ඇයට මෙවැනි ප්‍රතිඵල විඳීමට සිදු වෙයි කියා ඇය කිසිවිටෙකත් සිතුවේ නැත.[5]
සියල්ලන්ව පුදුමයට පත් කරමින් ඇය විනාශය අද්දුටුවාය. ඇයව සැනසවීමට කිසිවෙක් නොවීය.[6]
අනේ යෙහෝවා දෙවියනි, මා විඳින පීඩා දෙස බලන්න.[7] මාගේ සතුරා මහත් ආඩම්බරයකින් මට විරුද්ධව කතා කරන්නේය.[8]

י [යෝද්]

10 ඇ සතු සෑම වස්තුවක්ම සතුරා පැහැරගත්තේය.[9]
ඔබේ සෙනඟ සමඟ විසීමට ඔබ අවසර නොදුන් ජාතීහු,
ඇ බලා සිටියදීම ශුද්ධස්ථානයට ඇතුල් වූහ.[10]

כ [කෆ්]

11 කුසගින්න දරාගත නොහැකිව ඇගේ සෙනඟ සුසුම්ලති.[11]
පණකෙන්ද රැකගැනීම සඳහා කෑම ටිකක් ලබාගැනීමට ඔවුහු තමන් සතු වටිනාම දේ පවා දෙති.[12]
අනේ යෙහෝවා දෙවියනි, මා දෙස බලන්න. මම නින්දාවට ලක් වූ ස්ත්‍රියක මෙන් සිටිමි.[13]

ל [ලාමෙද්]

12 මඟ තොටේ යන කිසිවෙකුට මා විඳින වේදනාව ගැන කිසි හැඟීමක් නැද්ද?[14]
යෙහෝවා දෙවි මා සමඟ උදහස් වී මා පිටට ගෙනා විපත්තිය දෙස බලන්න.[15]
මේ වගේ මහත් වේදනාවක් විඳින කෙනෙක් තවත් සිටියිද?[1]

מ [මෙම්]

13 මාගේ ඇටකටු දවා දැමීමට ඔහු අහසින් ගින්නක් එව්වේය.[2] සියල්ල ඊට හසු විය.
ඔහු මාව හසු කරගැනීමට දැලක් එළුවේය.[3] ඔහු මාව ආපසු හරවා යැව්වේය.
මාව තනි වීමට ඔහු සැලැස්වූවේය. මම දවස පුරාම රෝගාතුරව සිටිමි.[4]

נ [නන්]

14 මා කරන වැරදි සියල්ල ඔහු හොඳින් දන්නේය.[5] ඔහු ඒවා ලණු මෙන් එකට අඹරා,
මාගේ ගෙල වටා තදින් එතුවේය.[6] එහෙයින් මාගේ ශක්තිය හීන විය.
යෙහෝවා දෙවි මාව බලවතුන්ගේ අතට භාර දුන්නේය. ඔවුන්ට විරුද්ධව මට නැඟී සිටිය නොහැක.[7]

ס [සාමෙක්]

15 යෙහෝවා දෙවි මාගේ රණ ශූරයන්ව මගෙන් ඈත් කළේය.[8]
ඔහු හමුදාවක් කැඳවා මාගේ තරුණයන්ව විනාශ කළේය.[9]
මිදි යන්ත්‍රයකින් මිදි මඩින්නාක් මෙන් යෙහෝවා දෙවි යූදා දියණියව[10] පාගා දැමුවේය.[11]

ע [ආයින්]

16 මම විලාප නඟමි.[12] කඳුළින් මාගේ දෙකොපුල් තෙත් වී ඇත.[13]
මාව සනසා, මට දිරියක් දිය හැකි කිසිවෙක් මා ළඟ නැත.
ජය ඝෝෂා නඟන සතුරෝ නිසා[14] මාගේ පුත්‍රයෝ අසරණ වී සිටිති.[15]

**1 පරි.**

1 යෙරෙ 13:22 යෙරෙ 13:26 එස 16:37 එස 23:29 හොෂෙ 2:10
2 යෙරෙ 24:9
3 යෙරෙ 4:31
4 යෙරෙ 2:34
5 ද්වි 32:29 යෙරෙ 8:7
6 දේශ 4:1 විලා 1:2 විලා 2:13
7 නික් 3:7
8 යෙරෙ 50:29
9 2ලේක 36:18 යෙසා 39:6 යෙරෙ 15:13 යෙරෙ 20:5 යෙරෙ 52:17 යෙරෙ 52:19 දානි 1:2
10 2ලේක 36:17 ගීතා 74:7 ගීතා 79:1 යෙසා 63:18 යෙසා 64:11 යෙරෙ 52:13 එස 7:22
11 යෙරෙ 38:9 යෙරෙ 52:6 විලා 2:12 විලා 4:4
12 උත් 18:5 සල 2:5
13 යෙසා 54:1
14 විලා 2:15
15 යෙරෙ 51:45

**2 තීරුව**

1 විලා 2:13 දානි 9:12
2 ගීතා 102:3
3 යෝබ් 19:6 ගීතා 66:11 එස 12:13 එස 17:20 හොෂෙ 7:12
4 ද්වි 28:65 යෙරෙ 4:19
5 යොෂු 24:19 ගීතා 5:10 යෙසා 59:12
6 ද්වි 28:48
7 ලෙවී 26:37 යෙරෙ 52:28 එස 11:9
8 2රාජා 24:14
9 2ලේක 36:17
10 යෙරෙ 14:17
11 යෙසා 63:3 යෝවෙ 3:13 එළි 14:19 එළි 19:15
12 යෙරෙ 31:15
13 යෙරෙ 9:1 යෙරෙ 13:17 යෙරෙ 14:17 විලා 2:18
14 ගීතා 137:3 යෙරෙ 50:29

**15** යෙරෙ 9:21; යෙරෙ 31:15.

פ [පේ]

17 සියොන් දැන් විහිදුවා පිහිට අයැදුවත්[1] ඇයව සැනසවීමට කිසිවෙක් නැත.[2]
යාකොබ්ට සතුරුකම් කරන ලෙස ඒ අවට සිටි ජාතීන්ට යෙහෝවා දෙවි ආඥාවක් දුන්නේය.[3]
යෙරුසලම ඒ ජාතීන්ට පිළිකුලක්ව සිටින්නීය.[4]

צ [ට්සාධේ]

18 යෙහෝවා දෙවි මට දඬුවම් කිරීම ධර්මිෂ්ඨ ක්‍රියාවකි.[5] මන්ද මම ඔහුගේ ආඥාවලට අකීකරු වී ක්‍රියා කළෙමි.[6]
ජනයෙනි, දැන් මා විඳින දුක දෙස බලන්න.
මාගේ තරුණ තරුණියන්ව වහලුන් ලෙස ගෙන ගොස් ඇත.[7]

ק [කෝෆ්]

19 මට බොහෝ සෙයින් ප්‍රේම කළ අයගෙන් මා උපකාර පැතුවත්[8] ඔවුහු මට පිහිට වුණේ නැත.
පණකෙන්ද රැකගැනීම සඳහා කෑමට යමක් සොයමින්[9]
නුවරේ ඒ මේ අත ඇවිද ගිය මාගේ පූජකයොත් වැඩිමහල්ලොත් එහිදීම මිය ගියෝය.[10]

ר [රේෂ්]

20 යෙහෝවා දෙවියනි, මා ඔබට විරුද්ධව කැරලිගැසූ නිසා[11] දැන් මම බොහෝ සෙයින් දුක් විඳිමි.
මාගේ සිත කැලඹී ඇත.[12] මාගේ හදවත දෙදරා ගොස් ඇත.[13]
වීථිවලදී මාගේ දරුවන්ව කඩුවෙන් මරා දමා තිබේ.[14] නිවෙස් තුළට වී සිටියත් ඔවුහු මරණයට ගොදුරු වෙති.[15]

ש [ෂින්]

21 මාගේ සුසුම්ලෑම ජනයාට ඇසුණේය.[1] මාව සැනසවීමට කිසිවෙක් පැමිණියේ නැත.[2]
මට සිදු වූ විපත මාගේ සියලු සතුරන්ට ආරංචි වී ඇත.[3] මට එසේ සිදු වීමට ඔබ ඉඩහැරිය නිසා ඔවුහු ප්‍රීතියෙන් ඉපිල යති.[4]
ඔබ පැවසූ ලෙස මට මෙන් ඔවුන්ටද ඔබ දඬුවම් කරන බව[5] මම හොඳින් දනිමි. ඒ දවස පැමිණෙන බව මට නිසැකය.[6]

ת [ටාව්]

22 මම කළ වැරදිවලට ඔබ මට දඬුවම් කළ ආකාරයටම[7]
ඔවුන්ගේ දුෂ්ටකම්වලටද ඔවුන්ට දඬුවම් කරන්න.[8]
මාගේ සිත ශෝකයෙන් පිරී ඇත.[9] මම බොහෝ සෙයින් සුසුම්ලමි.[10]

א [ආලෙෆ්]

**2** යෙහෝවා දෙවි උදහස් වී සියොන් දියණියව අඳුරු වලාවකින් වසා ඇමූ හැටි බලන්න![11]
අහස්කුස දක්වාම නැඟ තිබූ ඊශ්‍රායෙල්හි තේජශ්‍රීය[12] දෙවි පොළොවට හෙළුවේය.[13]
ඔහු තම උදහස ප්‍රකාශ කළ දවසේදී තම පා පුටුව සිහි නොකළේය.[14]

ב [බේත්]

2 යෙහෝවා දෙවි යාකොබ්ගේ වාසස්ථාන විනාශ වී යෑමට ඉඩහැරියේය. ඔහු ඔවුන්ට කිසිම අනුකම්පාවක් නොපෙන්වූවේය.[15]
ඔහු මහත් උදහසින් යූදාහි දියණියගේ බලකොටු බිඳ හෙළුවේය.[16]
එහි රාජ්‍යයත්[17] පාලකයන්වත්[18]

**1 පරි.**
1 යෙසා 1:15 යෙරෙ 4:31
2 යෙසා 51:18 යෙරෙ 30:14 විලා 1:9
3 ද්වි 28:49 2රාජා 24:2 2රාජා 25:1
4 විලා 1:8 එස 36:17
5 ද්වි 32:4 නෙහෙ 9:33 දානි 9:7
6 1සාමු 12:14 1සාමු 12:15 ගීතා 107:11 යෙසා 1:2
7 ද්වි 28:32
8 යෙරෙ 30:14
9 විලා 1:11
10 යෙරෙ 14:15 යෙරෙ 23:11
11 ද්වි 9:23 ගීතා 5:10 ගීතා 107:11 යෙසා 1:2 යෙසා 63:10 එස 20:8
12 ගීතා 13:2 ගීතා 25:17
13 යෝබ් 30:27 යෙරෙ 4:19 විලා 2:11
14 ද්වි 32:25 යෙරෙ 9:21 යෙරෙ 15:2
15 යෙරෙ 14:18 යෙරෙ 18:21 එස 7:15

**2 තීරුව**
1 විලා 1:16
2 ගීතා 69:20 යෙරෙ 30:14
3 යෙරෙ 40:2
4 එස 25:6 ඔබ 12
5 ගීතා 137:8 යෙසා 51:23
6 ගීතා 37:13 යෙසා 13:19 යෙරෙ 25:14 යෝවෙ 3:19
7 යෝබ් 34:11 යෙරෙ 16:18
8 ගීතා 109:15 යෙරෙ 51:35 රෝම 2:6 යාකො 2:13
9 යෙසා 1:5 යෙරෙ 8:18 විලා 5:17
10 විලා 1:11

**2 පරි.**
11 විලා 3:44
12 විලා 2:15 එස 16:14

**13** මතෙ 11:23; **14** 1ලේක 28:2; ගීතා 99:5; ගීතා 132:7; යෙසා 60:13; **15** ද්වි 28:30; විලා 2:17; විලා 3:43; **16** ද්වි 28:52; මීකා 5:11; **17** ගීතා 89:39; යෙසා 47:6; එස 21:27; **18** යෙසා 39:7; යෙසා 43:28.

නින්දාවට ලක් කළේය. ඔහු
සියල්ල බිමට ඇද දැමුවේය.[1]

ג [ගීමෙල්]

3 ඔහු උදහස් වී ඊශ්‍රායෙල්හි සවිය*
මුළුමනින්ම සිඳ දැමුවේය.[2]
සතුරා ඊශ්‍රායෙල්ට විරුද්ධව
පැමිණි විට දෙවි අපේ උප-
කාරයට නොපැමිණියේය.[3]
ගින්නක් මෙන් ඇවුළුණු ඔහුගේ
උදහස යාකොබ්ව සම්පූර්-
ණයෙන්ම දවා දැමුවේය.[4]

ד [දාලෙත්]

4 දෙවි තම දුන්න සූදානම් කරගත්-
තේ සතුරෙකු ලෙසිනි.[5] ඔහු
දකුණත ඔසවා[6]
අපේ ඇසට ප්‍රිය සියල්ලන්ට[7]
පහර දුන්නේ විරුද්ධකරු-
වෙකු ලෙසිනි.[8]
ඔහුගේ උදහස ඔහු සියොන් දිය-
ණියගේ කූඩාරම පිටට වැගු-
රුවේය.[9] එය ගින්නක් මෙන්
ඇවුළුණේය.[10]

ה [හේ]

5 යෙහෝවා දෙවි සතුරෙකු මෙන්
ක්‍රියා කරමින්[11] ඊශ්‍රායෙල්
නටබුන් ගොඩක් බවට පත්
කළේය.[12]
ඇගේ බලකොටු සියල්ලද[13]
පවුරුද විනාශ කර දැමු-
වේය.[14]
යූදා දියණියගේ ශෝකය වැඩි
කළේය. ඇය බොහෝ සෙ-
යින් වැලපුණාය.[15]

ו [වාව්]

6 කෙතක තිබෙන පැල්පතක් කඩා
බිඳ දමන්නාක් මෙන්[16] දෙවි
තම ගෘහය විනාශ කර
දැමුවේය.[17] උත්සවයට ඔහු
නිමාවක් ගෙනාවේය.
සියොන්හි පැවැත්වූ උත්සවයන්
සහ සබත් දිනයන් මතක-
යෙන් ඈත් වී යෑමට යෙ-
හෝවා දෙවි සැලැස්වූවේය.[18]

2 පරි.
1 යෙසා 25:12
යෙසා 26:5
2 යෝබ් 16:15
ගීතා 75:10
3 ගීතා 74:11
4 ද්වි 32:22
2රාජා 25:9
ගීතා 89:46
යෙසා 42:25
යෙරෙ 4:4
යෙරෙ 7:20
විලා 4:11
හෙබ්‍රෙ 12:29
5 යෝබ් 6:4
යෙසා 63:10
යෙරෙ 21:5
යෙරෙ 30:14
6 නික් 15:6
7 2රාජා 25:21
විලා 5:12
8 ද්වි 28:63
9 යෙරෙ 10:20
10 යෙසා 42:25
යෙරෙ 4:4
11 යෙරෙ 30:14
12 2ලේක 36:16
13 2රාජා 25:9
යෙරෙ 52:13
හොෂෙ 8:14
14 යෙරෙ 5:17
15 එස 2:10
16 ගීතා 80:12
ගීතා 89:40
යෙසා 1:8
17 2ලේක 36:19
ගීතා 78:60
යෙසා 63:18
යෙසා 64:11
18 විලා 1:4
හොෂෙ 2:11
ශෙප 3:18

2 තීරුව
1 යෝබ් 34:19
යෙරෙ 52:24
රෝම 2:11
2 යෙරෙ 52:18
3 ලෙවී 26:31
යෙරෙ 26:6
යෙරෙ 52:13
එස 24:21
මීකා 3:12
4 2ලේක 36:19
යෙරෙ 32:29
හොෂෙ 8:14
5 ගීතා 74:4
6 2රාජා 25:10
යෙරෙ 39:8
7 2රාජා 21:13
යෙසා 28:17
ආමො 7:7
8 යෝබ් 13:21
විලා 2:2
9 යෙසා 3:26
10 නෙහෙ 1:3
යෙරෙ 14:2

රජුටවත් පූජකයාටවත් ඔහුගේ
උදහසින් බේරීමට නොහැකි
විය. ඔහු ඔවුන්ව ප්‍රතික්ෂේප
කළේය.[1]

ז [ෂායින්]

7 යෙහෝවා දෙවි තම පූජාසනය
ප්‍රතික්ෂේප කළේය.[2] ශුද්ධස්-
ථානය අත්හැර දැමුවේය.[3]
නුවරෙහි බලකොටු සතුරාගේ
අතට යටත් කර දුන්නේය.[4]
සතුරෝ යෙහෝවා දෙවිගේ
ගෘහයේදී, උත්සව දිනයකදී
මෙන් ප්‍රීති ඝෝෂා නැඟු-
වෝය.[5]

ח [චේත්]

8 සියොන් දියණියගේ පවුරු විනාශ
කර දැමීමට යෙහෝවා දෙවි
තීරණය කළේය.[6]
ඔහු ලණුව ඇද එය මැන බැලු-
වේය.[7] විනාශ කිරීමට තමා
ගත් තීරණය ඔහු වෙනස්
නොකළේය.[8]
බලකොටුවට හා ආරක්ෂිත
පවුර පිටට ඔහු මහත් වේද-
නාවක් ගෙනැවිත්[9] එහි ශක්-
තිය හීන කළේය.

ט [ටේත්]

9 ඇගේ දොරටු[10] පොළොවටම සම-
තලා කළේය. දොරගුල්
සුනුවිසුනු කළේය.
ඇගේ රජද පාලකයෝද වෙ-
නත් ජාතීන් අතරේ අසර-
ණව සිටිති.[11] දේශයෙහි දැන්
නීතියක් නැත.[12]
ඇගේ අනාගතවක්තෘවරුන්ට
යෙහෝවා දෙවිගෙන් දර්ශන
ලැබෙන්නේද නැත.[13]

י [යෝද්]

10 සියොන් දියණියෙනි, ඔබේ වැඩි-
මහල්ලෝ කිසි කතාබහක්
නැතුව බිම වැතිර සිටිති.[14]

විලා 2:3* මූ.අ., “අඟ.”

11 ද්වි 28:36; 2රාජා 24:15; 2රාජා 25:7; යෙසා 39:7; යෙරෙ 52:9; විලා 1:6; විලා 4:20; එස 12:13; ආනි 1:3; 12 2ලේක 15:3; එස 7:26; 13 ගීතා 74:9; යෙරෙ 23:16; විලා 2:14; එස 13:3; 14 යෙසා 3:26; යෙරෙ 8:14; විලා 3:28; ආමො 5:13.

ඔවුහු ගෝණි රෙදි ඇඳ,[1] හිස
පිටට දූවිලි දමාගනිති.[2]
යෙරුසලමේ තරුණියෝ තම
හිස් බිමට පහත් කරගෙන
සිටිති.[3]

כ [කෆ්]

11 මාගේ දෙනෙතෙහි තවත් කඳුළු
ඉතුරුව නැත.[4] මාගේ හද-
වත* කැලඹී ඇත.[5]
මාගේ සෙනඟ විනාශ වී ගිය අයු-
රුද[6] දරුවන් සහ කිරි දරුවන්
මංසන්ධිවල ක්ලාන්තව වැටී
සිටින අයුරුද දැක[7]
මාගේ අක්මාව දිය වී ගියේය.[8]

ל [ලාමෙද්]

12 මව්වරුන්ගේ ළයේ හාමතින්
වැතිර සිටින දරුවෝ පණ
අදිමින්,
"අනේ, අපිට කන්න බොන්න
මුකුත් නැද්ද"[9] කියා අසති.
ඔවුහු තුවාල වූවන් මෙන් නුව-
රේ මංසන්ධිවල වැටී සිටිති.

מ [මෙම්]

13 යෙරුසලම් දියණියනි, මම ඔබව
කෙසේ සනසවන්නද? ඔබේ
දුක තුනී කිරීමට මම කවු-
රුන් ගැන ඔබට කියන්-
නද?[10]
සියොන් කන්‍යා දියණියනි, මා
ඔබව කාට සමාන කරන්-
නද?[11]
ඔබ අද්දුටු විපත[12] සාගරය
තරම් මහත්ය. ඔබට සුවයක්
දිය හැක්කේ කාටද?[13]

נ [නන්]

14 ඔබේ අනාගතවක්තෘවරු කිසි
පලක් නැති දර්ශන දුටු-
වෝය.[14]
ඔවුන් එදා ඔබේ වරද පෙන්වා
දුන්නා නම් අද ඔබ වහල්ක-
මට නොයනු ඇත.[15]
නමුත් ඔවුහු කිසි කමකට නැති
දේවල් පවසා ඔබව නොමඟ
යැවූහ.[1]

ס [සාමෙක්]

15 යෙරුසලම් දියණියනි, ඔබව පසු
කර යන සියල්ලෝ ඔබට
උසුළුවිසුළු කරමින්[2] අත්-
පොළසන් දෙති.[3]
ඔවුහු හිස වනමින් සමච්චලේට
මෙන්[4] මෙසේ කියති.
"සුන්දරත්වයෙන් පිරිපුන්ම
නගරය මෙයයි කියා සියල්-
ලන් ආඩම්බරයෙන් කතා
කළේ මේ නගරය ගැන
නේද?"[5]

פ [පේ]

16 ඔබේ සතුරෝ ඔබට විරුද්ධව
කෑගසමින් ඔබට අපහාස
කරති.[6]
ඔවුහු දත්මිටි කමින්,[7] "අපි
යෙරුසලම සම්පූර්ණයෙන්ම
විනාශ කර දමමු.[8]
අපි බලාගෙන හිටියේ මේ දවස
එන තුරුයි.[9] දැන් ඇවිත්
තිබෙන්නේ අපි බලා හිටිය ඒ
දවසයි"[10] කියා කියති.

ע [ආයින්]

17 යෙහෝවා දෙවි තමා තීරණය
කළ ලෙසම ක්‍රියා කළේය.[11]
ඔහු පැවසූ දේ ඒ අයුරින්ම
ඉටු කළේය.[12]
අතීතයේදී ඔහු අනතුරු ඇඟවූ
ලෙසම ක්‍රියා කළේය.[13] ඔහු
කිසි අනුකම්පාවක් නො-
පෙන්වා සියල්ල විනාශ
කළේය.[14]
ඔබේ විපත දැක සතුරන්ට ප්‍රීති
වීමට ඔහු ඉඩහැරියේය.[15]
ඔවුන්ව ඔබට වඩා බලවත්
කළේය.[16]

צ [ට්සාඩේ]

18 සියොන් පවුර,[17] ඔබේ සෙනඟ යෙ-
හෝවා දෙවිගේ උපකාරය

**2 පරි.**
1 යෙරෙ 6:26, එස 7:18, එස 27:31
2 යොෂු 7:6, යෝබ් 2:12
3 විලා 1:4
4 ගීතා 6:7, විලා 1:16, විලා 3:48
5 විලා 1:20
6 යෙසා 22:4, යෙරෙ 14:17
7 යෙරෙ 11:22, විලා 2:19, විලා 4:4
8 යෝබ් 30:16
9 ද්වි 28:51, 2රාජා 25:3, යෙසා 3:1, යෙරෙ 18:21
10 විලා 1:12
11 යෙසා 51:19
12 යෙරෙ 8:21, යෙරෙ 14:17, ආමි 9:12
13 යෙරෙ 30:12
14 යෙරෙ 2:8, යෙරෙ 5:12, යෙරෙ 5:31, යෙරෙ 23:16, යෙරෙ 27:14, යෙරෙ 29:9, එස 13:2
15 යෙසා 58:1, යෙරෙ 23:14

**2 තීරුව**
1 යෙරෙ 23:32, යෙරෙ 27:9, මීකා 3:5, ශෙප 3:4
2 1රාජා 9:8, යෙරෙ 18:16, යෙරෙ 19:8, යෙරෙ 25:9, මීකා 6:16
3 එස 25:6, නාහු 3:19
4 ගීතා 22:7, ගීතා 44:14, මතෙ 27:39, මාක් 15:29
5 ගීතා 48:2, ගීතා 50:2, එස 16:14
6 යෝබ් 16:10, ගීතා 22:13, ගීතා 35:21, ගීතා 109:2
7 යෝබ් 16:9, ගීතා 37:12, ක්‍රියා 7:54
8 යෙසා 49:19, යෙරෙ 51:34
9 මීකා 4:11
10 ගීතා 35:21, ඔබ 13
11 යෙරෙ 18:11, මීකා 2:3

12 2රාජා 23:27; යෙසා 46:10; යෙසා 55:11; 13 ලෙවී 26:17; ද්වි 28:15; 14 එස 5:11; එස 7:9; එස 9:10; 15 ගීතා 38:16; ගීතා 89:42; 16 විලා 1:5; 17 විලා 2:8.

විලා 2:11* මූ.අ., "බඩවැල්."

අයැදිමින් හඬා වැලපෙන්නෝය.[1]
ඔබත් රෑ දහවල් නොබලා හඬා වැලපෙන්න.[2]
සිදු වූ විපත ගැන නොනවත්වාම කඳුළු සලන්න.

ק [කෝෆ්]

19 රෑ යාමේ නැඟිට හඬන්න.[3]
ඔබේ සිතේ ඇති සියල්ල යෙහෝවා දෙවිට[4] පවසන්න.[5]
හාමතය නිසා මංසන්ධිවල ක්ලාන්තව වැටී සිටින[6]
ඔබේ දරුවන් වෙනුවෙන් දෑත් ඔසවා ඔහුට කන්නලව් කරන්න.[7]

ר [රේෂ්]

20 අනේ යෙහෝවා දෙවියනි, ඔබ දඬුවම් කළ තැනැත්තා දෙස බලන්න.[8]
මව්වරු තම කිරිකැටි දරුවන්ව පවා මරාගෙන කන කාලයක් උදා වී ඇත.[9]
යෙහෝවා දෙවියනි, ඔබේ ශුද්ධස්ථානයේදීම පූජකයන්වත් අනාගතවක්තෘවරුන්වත් මරා දමා ඇත.[10]

ש [ෂින්]

21 තරුණයෝද මහල්ලෝද[11] වීථිවල වැටී සිටිති.[12]
තරුණ තරුණියෝ කඩු පහරට ගොදුරු වී මැරුම් කා වැටී සිටිති.[13]
ඔබ උදහස ප්‍රකාශ කළ දවසේදී සියල්ලන්ව එසේ විනාශ වී යෑමට ඔබ ඉඩහැරියෙහිය.[14]
ඔබ කිසි අනුකම්පාවක් නොපෙන්වා[15] ඔවුන්ට පහර දුන්නෙහිය.[16]

ת [ටාව්]

22 උත්සවයකට සෙනඟ රැස් කරන්නාක් මෙන්[17] විදේශිකයන් ලෙස වෙනත් ප්‍රදේශවල ජීවත් වූ සියල්ලන්ව ඔබ එක් රැස් කළෙහිය.
යෙහෝවා දෙවි වන ඔබ ඔබේ උදහස ප්‍රකාශ කළ දවසේදී කිසිවෙකුට ඉන් ගැලවී යෑමට නොහැකි විය.[1]
මා විසින් බිහි කර, ඇතිදැඩි කළ දරුවන්ව සතුරා විනාශ කළේය.[2]

א [ආලෙෆ්]

3 දෙවිගේ කෝපය නමැති සැරයටියෙන් පහර ලැබූ තැනැත්තා මමය.[3]
2 ඔහු මාව ආලෝකයේ නොව අන්ධකාරයේ ගෙන ගියේය.[4]
3 දවස පුරාම මට පහර දුන්නේය.[5]

ב [බේත්]

4 මාගේ ශරීරය දුර්වල වෙන්නත් සම වැහැරී යන්නත් ඔහු සැලැස්වූවේය.[6] මාගේ ඇටකටු බිඳ දැමුවේය.[7]
5 මාව කොටු කළේය.[8] විෂ ගස්වලින්[9] මාව වට කර මාගේ ජීවිතය දුෂ්කර කළේය.
6 අඳුරු තැන්වල[10] ජීවත් වීමට ඔහු මට සැලැස්වූවේය. මා දැන් සිටින්නේ බොහෝ කාලයකට පෙර මිය ගිය කෙනෙකු මෙනි.[11]

ג [ගීමෙල්]

7 පවුරු වළල්ලක් බැඳ සිර කර තබන්නාක් මෙන් කිසි තැනකට යෑමට නොහැකි වන ලෙස ඔහු මාව සිර කළේය.[12] මට බර අධික, තඹ විලංගු දැමුවේය.[13]
8 මම ඔහුගේ උපකාරය පතා හඬා වැලපුණෙමි. නමුත් ඔහු මාගේ යාච්ඤාවට සවන් නොදුන්නේය.[14]
9 ඔහු ගල් අහුරා මාගේ මාවත අවහිර කළේය.[15] මට හරි මාර්ගය සොයාගැනීමට නොහැකි වන සේ මාවත් සියල්ල අවුල් කළේය.[16]

**2 පරි.**
1 ගීතා 119:145
2 යෙරෙ 9:1; යෙරෙ 13:17; යෙරෙ 14:17; විලා 1:16
3 ගීතා 119:148
4 ගීතා 88:1; දානි 9:3
5 1සාමු 1:15; ගීතා 62:8; ගීතා 142:2
6 යෙසා 51:20; විලා 4:9; එස 5:16
7 1රාජා 8:54
8 යෙරෙ 14:21
9 ලෙවී 26:29; ද්වි 28:53; යෙරෙ 19:9; විලා 4:10; එස 5:10
10 ගීතා 78:64; මතෙ 23:35
11 ද්වි 28:50; 2ලේක 36:17
12 ගීතා 18:42
13 යෙරෙ 9:21; යෙරෙ 18:21; විලා 1:15
14 යෙරෙ 21:7
15 නික් 34:7; යෙරෙ 13:14; විලා 2:2; විලා 3:43; එස 5:11; එස 7:4
16 එස 9:6
17 ද්වි 16:16

**2 තීරුව**
1 යෙරෙ 46:5; ආමො 9:1
2 ද්වි 28:18; යෙරෙ 16:4; හොෂෙ 9:12

**3 පරි.**
3 ගීතා 71:20
4 ද්වි 28:29; යෙසා 59:9; යෙරෙ 13:16
5 යෙසා 63:10
6 ගීතා 38:3
7 ගීතා 51:8; යෙසා 38:13; යෙරෙ 50:17
8 යෝබ් 3:23
9 යෙරෙ 8:14; යෙරෙ 9:15; යෙරෙ 23:15; විලා 3:19
10 ගීතා 88:6
11 ගීතා 88:5; ගීතා 143:3
12 යෝබ් 19:8; ගීතා 88:8; හොෂෙ 2:6
13 යෙරෙ 39:7; යෙරෙ 52:11

14 යෝබ් 30:20; ගීතා 22:2; ගීතා 80:4; ගීතා 102:2; හිතෝ 15:29; යෙසා 1:15; මීකා 3:4; 15 යෝබ් 19:8; 16 යෝබ් 34:11; යෙසා 63:17.

ד [දාලෙත්]

10 ඔහු මහ රැක සිටින වලහෙකු
මෙනි.[1] ගොදුර ඩැහැගැ-
නීමට කුරුමානම් අල්ලන
සිංහයෙකු මෙනි.[2]
11 ඔහු මාව මංමුළා කළේය. කිසිවක්
කරකියාගත නොහැකි තත්-
වයකට මා පත් විය. මම
දැන් හුදකලා වී සිටිමි.[3]
12 ඔහු තම දුන්න සූදානම් කර[4]
මා දෙසට ඊතලය එල්ල
කළේය.[5]

ה [හේ]

13 මාගේ වකුගඩු පසාරු කරගෙන
යන සේ ඔහු ඊතල විද්දේය.[6]
14 මම සියල්ලන් ඉදිරියේ විහිළුවක්ව
සිටිමි.[7] ඔවුන්ගේ සරදමට
දවස පුරා ලක් වුණෙමි.[8]
15 එපා වන තරමට ඔහු මට
තිත්ත දේ කන්න දුන්-
නේය.[9] තිත්ත දේ බොන්න
දුන්නේය.[10]

ו [වාව්]

16 වැලි කැට හැපී මාගේ දත් කැඩී
යෑමට ඔහු සැලැස්වූවේය.[11]
ඔහු මාව අළු ගොඩේ දමා
පෑගුවේය.[12]
17 ඔහු මාව ප්‍රතික්ෂේප කළ නිසා මා
තුළ කිසිදු සැනසීමක් නැත.
යහපත කියන්නේ කුමක්ද
කියාවත් දැන් මට මතක
නැත.[13]
18 මාගේ තේජශ්‍රීය දැන් පහව ගොස්
ඇත. යෙහෝවා දෙවි
දුන් බලාපොරොත්තුද දැන්
බොඳ වී ඇත.[14]

ז [ෂායින්]

19 ඉන්න හිටින්න තැනක් නැතුව
මා අසරණ වී සිටින බව
සිහි කරන්න.[15] මා ආහාර-
යට ගන්නේ තිත්ත හා විෂ
දේ බවත් සිහි කරන්න.[16]
20 ඔබ මාව සිහි කර, මා වෙතට
පැමිණ මාගේ දුකට පිහිට
වන බව මට ස්ථිරය.[17]
21 මෙම කාරණය මම සිහියේ තබා-
ගෙන[1] ඔබ මට පිහිට වන
තෙක් ඉවසිලිවන්තව බලා
සිටිමි.[2]

ח [හේත්]

22 යෙහෝවා දෙවියනි, අපේ පණ
රැකුණේ[3] ඔබේ අතිමහත්
ප්‍රේමය* ඔබ අපට පෙන්වූ
නිසාය.[4] ඔබ අපට පෙන්වන
දයාව කෙදිනකවත් නිම
නොවන්නේය.[5]
23 ඔබ සෑම උදෑසනකම ඔබේ දයාව
පෙන්වන්නෙහිය.[6] ඔබේ
විශ්වාසවන්තකම අතිම-
හත්ය.[7]
24 "මාගේ එකම උරුමය යෙහෝවා
දෙවිය.[8] එහෙයින් මම
ඔහු කෙරෙහි ඉවසිලිවන්තව
බලා සිටිමි"[9] කියා මම සිතා-
ගත්තෙමි.

ט [ටේත්]

25 යෙහෝවා දෙවි කෙරෙහි බලාපො-
රොත්තු තබා,[10] නිරතුරුවම
ඔහුගේ මඟ පෙන්වීම් පතන
අයට[11] ඔහු යහපත කරන්-
නේය.
26 යෙහෝවා දෙවි ගැලවීම ලබා
දෙන තෙක්[12] නිහඬව[13] බලා
සිටීම යහපත්ය.[14]
27 යොවුන් වියේදී දුෂ්කරතාවලට
මුහුණ දීම මනුෂ්‍යයෙකුට
යහපත්ය.[15]

י [යෝද්]

28 යමෙකු දුෂ්කරතා අද්දකින විට,
දෙවි ඊට ඉඩහැර තිබෙන
නිසා[16] නිහඬව සිට ඔහු
තනිව ඊට මුහුණ දිය
යුතුයි.[17]
29 ඔහු දණින් වැටී තම හිස බිම

**3 පරි.**
1 හොෂෙ 13:8 ආමෝ 5:19
2 යෝබ් 10:16 යෝබ් 38:40 හොෂෙ 5:14
3 යෙරෙ 6:8 යෙරෙ 32:43
4 ගීතා 7:12
5 යෝබ් 6:4 යෝබ් 7:20 යෝබ් 16:12 ගීතා 38:2
6 යෝබ් 6:4 යෝබ් 16:13
7 යෝබ් 30:1 ගීතා 44:13 යෙරෙ 20:7
8 යෝබ් 30:9 ගීතා 69:12 ගීතා 137:3
9 රූත් 1:20 යෝබ් 9:18
10 යෙරෙ 9:15 යෙරෙ 23:15
11 හිතෝ 20:17
12 ගීතා 102:9 යෙරෙ 6:26
13 උත් 41:30
14 යෝබ් 17:15 ගීතා 31:22
15 නෙහෙ 9:32 ගීතා 137:1
16 යෙරෙ 9:15 විලා 3:5
17 ගීතා 113:7

**2 තීරුව**
1 ගීතා 77:11
2 ගීතා 130:7 මීකා 7:7
3 එස්රා 9:8 ගීතා 77:8 ගීතා 106:45 මලා 3:6
4 ගීතා 25:6 ගීතා 69:16
5 නෙහෙ 9:31 ගීතා 78:38 ගීතා 86:15 යෙරෙ 30:11 මීකා 7:18 ලූක් 1:50
6 ගීතා 30:5 යෙසා 33:2
7 ද්වි 32:4 ගීතා 36:5 ගීතා 89:2
8 ගීතා 16:5 ගීතා 73:26 ගීතා 119:57 ගීතා 142:5
9 ගීතා 31:24 ගීතා 130:7
10 ගීතා 25:3 ගීතා 39:7 ගීතා 130:5 යෙසා 25:9 යෙසා 30:18 මීකා 7:7

11 1ලේක 28:9; ගීතා 38:9; යෙසා 26:9; ශෙප 2:3; **12** ගීතා 36:6; ගීතා 116:6; හිතෝ 20:22; **13** ගීතා 37:7; **14** ගීතා 31:24; **15** ගීතා 119:71; **16** ගීතා 39:9; යෙරෙ 15:17; විලා 3:39; **17** ගීතා 4:4; විලා 2:10.

විලා **3:22*** හෝ, "ඇදී ප්‍රේමය."

ගසාගෙන සිටීවා![1] මන්ද
සමහරවිට දෙවිගේ දයාව
ඔහුට ලැබෙනු ඇත.[2]
30 තමාට පහර දෙන තැනැත්තා-
ගෙන් ඔහු කම්මුල ඉවතට
හරවා නොගනීවා![3] තමාට
කරන බොහෝ නින්දා අප-
හාස ඔහු දරාගනීවා![4]

כ [කෆ්]

31 මන්ද යෙහෝවා දෙවි තම සෙ-
නහව සදහටම අත්හැර
දමන්නේ නැත.[5]
32 යම් කලකට දුක් විඳීමට දෙවි
සැලැස්වුවත්[6] ඔහු අතිමහත්
ප්‍රේමයකින්* යුත් දෙවි කෙ-
නෙක් නිසා ඔහු අනිවාර්-
යයෙන්ම දයාව පෙන්වනු
ඇත.[7]
33 ඔහු මිනිසුන්ට දුක් ගැහැට විඳී-
මට ඉඩහැරියත් ඔහු එසේ
කරන්නේ සිතේ කැමැත්-
තෙන් නොවෙයි.[8]

ל [ලාමෙද්]

34 දේශයේ සිරකරුවන්ව[9] බිම දමා
පාගා දැමීම[10] දෙවි අනුමත
නොකරන්නේය.
35 තමා ඉදිරිපිටදීම මනුෂ්‍යයෙකු
සතු අයිතීන් ඔහුගෙන් පැහැ-
රගැනීමත්[11]
36 නඩු විභාගයකදී අයුක්තියක් සිදු
කිරීමත් මහෝත්තම දෙවි
වන යෙහෝවා අනුමත
නොකරන්නේය.[12]

מ [මෙම්]

37 යෙහෝවා දෙවි අරමුණු නොකළ
යමක් ගැන පවසා එය සාර්-
ථකව ඉටු කළ හැක්කේ
කාටද?[13]
38 මහෝත්තමයාණන්ගේ මුඛයෙන්
යහපත සහ අයහපත යන
දෙකම පිට විය හැකිද?[14]
39 මනුෂ්‍යයෙක් තමා කළ පාපව-
ලට දඬුවම් ලබද්දී[15] ඒ ගැන
මැසිවිලි නැඟීමට ඔහුට අයි-
තියක් තිබේද?[1]

נ [නන්]

40 අපි අපිවම සෝදිසි කර අපට වැර-
දුණේ කොතැනද කියා තේ-
රුම්ගනිමු.[2] ඉන්පසු නැව-
තත් යෙහෝවා දෙවි වෙතට
හැරී ඔහුට මුළු හදින්ම සේ-
වය කරමු.[3]
41 අපි කළ වැරදි ගැන පසුතැවිලි
වී, දැත් දිගු කර ස්වර්ගයේ
සිටින අපේ දෙවිට මෙසේ
යාච්ඤා කරමු.[4]
42 "දෙවියනි, අපි ඔබට අකීකරු වී
ඔබට විරුද්ධව පව් කළෙමු.[5]
ඔබ අපට සමාව දුන්නේ
නැත.[6]

ס [සාමෙක්]

43 ඔබ අප සමඟ උදහස් වී ඔබට
ළං වීමට අපට තිබූ මාර්-
ගය ඔබ අවහිර කළෙහිය.[7]
ඔබ නොනවත්වා අප පසුපස
ලුහුබැඳ එන්නෙහිය.[8] කිසිදු
අනුකම්පාවක් නොපෙන්වා[9]
ඔබ සෙනඟව විනාශ කර
දැමුවෙහිය.
44 අපේ යාච්ඤා ඔබට නොඇසෙන
සේ[10] වලාකුළකින් ඔබ ඔබ-
වම වසාගත්තෙහිය.[11]
45 වෙනත් ජාතීන් අතරේ අපව
කසළ ගොඩක් මෙන් වීමට
ඔබ සැලැස්වුවෙහිය."[12]

פ [පේ]

46 අපේ සියලු සතුරෝ අපට විරුද්-
ධව දෝවල් පවසති.[13]
47 අපට උරුම වූයේ භීතියත් මර
උගුලත් පමණි.[14] විනාශයත්
හිස්කමත් අපව වෙළාගත්-
තේය.[15]
48 මාගේ සෙනඟගේ විනාශය දැක

3 පරි.
1 යෝබ් 42:6 එස 16:63
2 2සාමු 12:22 යෝවෙ 2:14 යෝනා 3:9
3 මීකා 5:1 මතෙ 5:39 1පේතෘ 2:23
4 ගීතා 123:3 යෙසා 50:6
5 ගීතා 77:7 ගීතා 94:14 යෙරෙ 3:12 යෙරෙ 31:37 යෙරෙ 32:40 මීකා 7:18
6 යෝබ් 5:18 ගීතා 30:5 යෙසා 54:7
7 2රාජා 13:23 ගීතා 13:5 ගීතා 78:38 ගීතා 103:9 ගීතා 103:11 ගීතා 106:45 යෙරෙ 31:20
8 යෙසා 55:7 යෙරෙ 7:31 යෙරෙ 18:8 එස 33:11 හෙබ්‍රෙ 12:10 යාකො 1:13 2පේතෘ 3:9
9 ගීතා 69:33 ගීතා 79:11 ගීතා 102:20
10 යෙසා 51:23
11 ගීතා 12:5 ගීතා 140:12 හිතෝ 17:15 හිතෝ 22:22 යෙසා 5:23
12 යෙසා 59:15 හබ 1:13
13 ගීතා 33:9 හිතෝ 16:9 හිතෝ 19:21 යෙසා 46:10
14 යාකො 3:11
15 ගීතා 103:10 මීකා 7:9

2 තීරුව
1 හිතෝ 19:3
2 ගීතා 119:59 එස 18:28 හග් 1:5
3 ද්වි 4:30 යෙසා 55:7 හොෂෙ 6:1 යෝවෙ 2:13 යාකො 4:8
4 ද්වි 4:29 2ලේක 7:14 2ලේක 34:27 ගීතා 28:2 ගීතා 119:58
5 නෙහෙ 9:26 යෙසා 1:2 දානි 9:5

විලා 3:32* හෝ, "ළැදි ප්‍රේමයකින්."

6 2රාජා 24:4; එස 24:13; දානි 9:12; 7 හිතෝ 15:8; 1පේතෘ 3:12; 8 ද්වි 28:64; 9 ද්වි 4:26; විලා 2:2; එස 9:10; 10 ගීතා 80:4; හිතෝ 15:29; හිතෝ 28:9; යෙසා 1:15; යෙරෙ 14:11; මීකා 3:4; සෙක 7:13; 11 විලා 2:1; 12 ද්වි 28:37; යෙරෙ 6:30; 13 යෝබ් 16:10; ගීතා 22:13; විලා 2:16; 14 ද්වි 28:66; යෙසා 24:18; යෙරෙ 48:44; 15 යෙසා 51:19; යෙරෙ 4:6; විලා 2:13.

මාගේ දෙනෙතින් කඳුළු
ගංගාවක් කඩා හැළෙයි.[1]

ע [ආයින්]

49 මාගේ දෙනෙතින් කඳුළු බිඳු නො-
නැවතී කඩා හැළෙයි.[2]
50 යෙහෝවා දෙවි අප දෙස බලන
තුරු මම එසේ හඬමි.[3]
51 නුවර අවට පිහිටි කුඩා නගරවලට
සිදු වූ විපත දැක[4] මාගේ සිත
කම්පා විය.[5]

צ [ට්සාඩේ]

52 කුරුල්ලෙකු දඩයම් කරගන්නාක්
මෙන් මාගේ සතුරෝ නික-
රුණේ[6] මාව හසු කරගත්-
තෝය.[7]
53 ඔවුහු මාව වළකට දමා[8] ගල් ගස-
මින් මාගේ දිවි කෙළවර
කිරීමට තැත් කළෝය.
54 මාව ගිලෙන තරමටම වතුර පිරු-
ණේය.[9] “මම මිය යන බව
නම් නිසැකයි”[10] කියා එවිට
මට සිතුණි.

ק [කෝෆ්]

55 යෙහෝවා දෙවියනි, ගැඹුරු වළේ
සිටියදී ඔබේ නාමය කියා
මම ඔබට හඬගැසුවෙමි.[11]
56 ඔබේ උපකාරය ඉල්ලා මා ඔබට
අයැදින විට ඔබේ දෙස-
වන් වසා නොගන්න.[12] ඔබ
මාගේ කන්නලව්වට ඇහුම්-
කන් දෙන බව ස්ථිරය.[13]
57 මා ඔබට කන්නලව් කළ විට
ඔබ මා ළඟින්ම සිට,[14]
“භය නොවන්න”[15] කියා මට
කීවෙහිය.

ר [රේෂ්]

58 යෙහෝවා දෙවියනි, ඔබ මා වෙ-
නුවෙන් ඉදිරිපත් වී කතා
කළෙහිය.[16] මාගේ ජීවිතය
ගලවාගත්තෙහිය.[17]
59 යෙහෝවා දෙවියනි, මට සිදු
වූ අසාධාරණය ඔබ දුටුවෙ-
හිය.[18] එහෙයින් මට යුක්තිය
ඉටු කර දෙන්න.[19]
60 ඔවුන් මහත් වෛරයකින් මට
කළ සියලු නපුරුකම්ද මට
විරුද්ධව කළ සියලු කුමන්-
ත්‍රණද ඔබ දුටුවෙහිය.[1]

ש [සින්] හෝ [ෂින්]

61 යෙහෝවා දෙවියනි, ඔවුන් මට
කළ නින්දාවන් ඔබට ඇසු-
ණේය. ඔවුන් මට විරුද්ධව
කළ කුමන්ත්‍රණ ඔබ දුටුවෙ-
හිය.[2]
62 මාගේ සතුරෝ දවස පුරා මට
විරුද්ධව පවසන දේත්[3]
ඔවුන් මා ගැන මුමුණන
දේත්[4] ඔබට ඇසුණේය.
63 දෙවියනි, ඔවුන්ගේ සෑම ක්‍රියා-
වක්ම සෝදිසි කර බලන්න.[5]
දවස පුරා ඔවුහු මට සරදම්
කරති.[6]

ת [ටාව්]

64 යෙහෝවා දෙවියනි, ඔවුන්ගේ
ක්‍රියාවන්ට ඔබ දඬුවම් කරන
බව නිසැකය.[7]
65 ඔබ ඔවුන්ට මුරණ්ඩු වීමට ඉඩ-
හැර[8] ඔවුන්ට දඬුවම් කරන්-
නෙහිය.[9]
66 යෙහෝවා දෙවියනි, ඔබ මහත්
උදහසකින් යුතුව ඔවුන්
පසුපස ලුහුබැඳ ගොස්
ඔවුන්ව පොළොවෙන්[10]
තුරන් කර දමන්නෙහිය.[11]

א [ආලෙෆ්]

4 පිරිසිදු රන්වල[12] දිස්නය දැන්
අඳුරු වී ගොස් ඇති හැටි
බලන්න!
දේවමාලිගාවේ ගල්,*[13] වීථිවල
සීසීකඩ විසිරී තිබෙන හැටි
බලන්න![14]

ב [බේත්]

2 කලක් පිරිසිදු රන් මෙන් අනර්ඝව
සිටි සියොන්හි පුතුන්[15]

**3 පරි.**
**1** ගීතා 119:136 යෙරෙ 9:1
**2** යෙරෙ 14:17 විලා 1:16
**3** ගීතා 80:14 ගීතා 102:19 යෙසා 63:15
**4** යෙරෙ 11:22 විලා 2:21
**5** ද්වි 28:34 යෙරෙ 14:18
**6** 1සාමු 26:18 ගීතා 35:7 ගීතා 69:4 ගීතා 109:3 ගීතා 119:161 යෙරෙ 37:18
**7** 1සාමු 26:20 ගීතා 11:1
**8** යෙරෙ 37:20 යෙරෙ 38:6
**9** ගීතා 18:4 ගීතා 69:2 ගීතා 88:17 ගීතා 124:4
**10** ගීතා 31:22
**11** ගීතා 88:6 ගීතා 116:4 ගීතා 130:1 යෝනා 2:2
**12** ගීතා 55:1
**13** ගීතා 3:4 ගීතා 6:8 ගීතා 116:1
**14** ගීතා 69:18 ගීතා 145:18 යෙසා 58:9 යාකො 4:8
**15** යෙරෙ 1:8
**16** ගීතා 7:8 ගීතා 35:1 ගීතා 69:18 යෙරෙ 11:20 යෙරෙ 51:36
**17** ගීතා 71:23 යෙරෙ 50:34
**18** යෙරෙ 15:10
**19** 1සාමු 25:39 ගීතා 9:4 ගීතා 35:23 ගීතා 43:1 යෙරෙ 51:36

**2 තීරුව**
**1** ගීතා 10:14 යෙරෙ 11:19
**2** ගීතා 74:18 ගීතා 89:50 යෙරෙ 11:19 යෙරෙ 18:18
**3** ගීතා 59:12 ගීතා 140:3
**4** යෙරෙ 38:4
**5** ගීතා 1:1 ගීතා 139:2
**6** යෝබ් 30:9 විලා 3:14
**7** යෝබ් 34:11 ගීතා 28:4 යෙරෙ 11:20 2තිමෝ 4:14

**8** ද්වි 2:30; යෙරෙ 18:12; රෝම 2:5; හෙබ්‍රෙ 3:12; **9** ද්වි 28:15; යෙරෙ 17:5; **10** ගීතා 8:3; යෙරෙ 10:12; **11** ද්වි 4:26; ද්වි 28:20; ගීතා 35:6; යෙරෙ 11:23; **4 පරි.** **12** 1රාජා 6:22; **13** 1රාජා 5:17; 1රාජා 7:9; **14** යෙරෙ 52:13; **15** යෙසා 51:18.

**විලා 4:1*** මූ.අ., “ශුද්ධ ගල්.”

දැන් කුඹල්කරුවෙකු සෑදූ මැටි
බඳුන් මෙනි.[1]

ג [ගීමෙල්]

3 හිවල්ලු පවා තම පැටවුන්ට කිරි දී
උන්ව ආදරයෙන් රැකබලා
ගන්නේය.
නමුත් මාගේ සෙනඟ පාළුකා-
රයේ සැරිසරන පැස්බරුන්
මෙන්[2] කෲරය.[3]

ד [දාලෙත්]

4 පිපාසය නිසා කිරි බොන දරුවන්-
ගේ දිව් උඩුතල්ලේ ඇලී
ඇත.[4]
දරුවෝ කෑම ඉල්ලා හඬා වැල-
පුණත්[5] කිසිවෙක් ඔවුන්ට
කෑම දුන්නේ නැත.[6]

ה [හේ]

5 කලක් රස බොජුන් කෑ අය දැන්
තමන්ට සිදු වී ඇති දේ ගැන
අදහාගත නොහැකිව වීථි-
වල ඉබාගාතේ සැරිසරති.[7]
වටිනා සළුපිළි පැළඳ සිටි අය[8]
අද අළු ගොඩේ වැතිර
සිටිති.[9]

ו [වාව්]

6 සොදොම් දේශය ඇසිපිය හෙළන
සැණින් විනාශ වී ගියේය.
ඇගේ සරණට කිසිවෙක්
පැමිණියේ නැත.[10]
නමුත් මාගේ සෙනඟ කළ වර-
දට ලැබුණු දඬුවම සො-
දොම්හි වැසියන්ගේ පව්වලට
ලැබුණු දඬුවමට වඩා බරප-
තළය.[11]

ז [ෂායින්]

7 කලක් නසරීතවරු[12] හිමටත් වඩා
පවිත්‍රව,[13] කිරිවලටත් වඩා
සුදුව සිටියෝය.
රතු කොරල්වලට වඩා පැහැ-
පත්ව[14] සිටි ඔවුහු නීල
මාණික්‍යවලට වඩා දීප්ති-
මත්ව සිටියෝය.[15]

ח [චේත්]

8 දැන් ඔවුන්ගේ පෙනුම ඇලිවලටත්
වඩා කලුය. වීථිවලදී ඔවුන්ව
දුටුවත් හඳුනාගැනීමට නො-
හැකිය.[1]
වියළුණු ගසක් මෙන් ඔවුන්ගේ
සම ඇටවලටම ඇලී ඇත.[2]

ט [ටේත්]

9 සාගතයෙන් මිය යනවාට වඩා[3]
කඩු පහරට ලක් වී මිය යෑම
හොඳය.[4]
මන්ද ඔවුහු කෑම නොමැතිව
කුසගින්නේ පණ අදින්-
නෝය.

י [යෝද්]

10 දරු සෙනෙහසින් පිරී සිටි මව්වරු
පවා තම දරුවන්ව තම්බා
කෑවෝය.[5]
විනාශය අද්දකින විට මාගේ
සෙනඟගේ ආහාරය වූයේ ඒ
දරුවන්ය.[6]

כ [කෆ්]

11 යෙහෝවා දෙවි තම උදහස මුළු-
මනින්ම ප්‍රකාශ කළේය.[7]
ගින්නක් මෙන් ඇවුළුණු ඔහු-
ගේ උදහස ඔහු වැගුරුවේය.[8]
සියොන්හි අත්තිවාරම් පවා දවා
දමන ගින්නක් ඔහු ඇවුළු-
වේය.[9]

ל [ලාමෙද්]

12 සතුරෙකුට යෙරුසලමේ දොරටු-
වලින් ඇතුල් වීමට හැකි
වෙයි කියා[10]
දේශයේ කිසි රජෙක්වත් වැසි-
යෙක්වත් කෙදිනකවත්
සිතුවේ නැත.[11]

מ [මෙම්]

13 නමුත් එසේ සිදු වුණේ, ඇගේ
අනාගතවක්තෘවරුන්ද පූජ-
කයන්ද බරපතළ ලෙස පව්
කළ නිසාය.[12]
ඔවුහු ධර්මිෂ්ඨයන්ගේ ලේ වැගු-
රුවෝය.[13]

נ [නන්]

14 ඔවුහු අන්ධයන් මෙන් වීථි-
වල[14] ඔබ මොබ ඇවිද්-

14 ද්වි 28:28; යෙසා 56:10; මතෙ 15:14.

4 පරි.
1 යෙසා 30:14 යෙරෙ 19:11 යෙරෙ 22:28 විලා 5:12
2 යෝබ් 39:16
3 ලෙවී 26:29 ද්වි 28:53 යෙරෙ 19:9 විලා 4:10
4 ගීතා 22:15 විලා 2:11
5 විලා 1:11 විලා 2:12
6 යෙරෙ 52:6
7 ආමො 6:4 ආමො 6:7
8 යෙරෙ 6:2
9 යෝබ් 2:8
10 උත් 19:25 ආනි 9:12
11 උත් 19:24 එස 16:48
12 ගණන් 6:2 විනි 13:5
13 ගීතා 51:7
14 1සාමු 16:12 සල 5:10
15 යෝබ් 28:16

2 තීරුව
1 යෝබ් 2:12
2 යෝබ් 19:20 යෝබ් 33:21 ගීතා 102:5
3 යෙරෙ 29:17
4 යෙරෙ 38:2
5 ලෙවී 26:29 ද්වි 28:55 විලා 2:20 විලා 4:3
6 ද්වි 28:57 යෙසා 49:15 විලා 3:48
7 ද්වි 28:20 2ලේක 36:16 යෙරෙ 6:11 යෙරෙ 9:11 එස 22:31 ආනි 9:12 සෙක 1:6
8 ලෙවී 26:28 යෙරෙ 7:20
9 ද්වි 32:22 2රාජා 25:9
10 2රාජා 25:10 යෙරෙ 52:13
11 ද්වි 29:24 1රාජා 9:8
12 යෙරෙ 5:31 යෙරෙ 6:13 යෙරෙ 14:14 යෙරෙ 23:11 විලා 2:14 මීකා 3:11 ශෙප 3:4
13 යෙරෙ 26:8 මතෙ 23:31 ලූක් 11:47 ක්‍රියා 7:52

දෝය.[1] ඔවුහු ලෙයින් අපවි-
ත්‍රව සිටිති.[2]
එහෙයින් කිසිවෙකුට ඔවුන්ගේ
වස්ත්‍රවලට අත තැබිය නො-
හැකිය.[3]

ס [සාමෙක්]

15 සෙනඟ එසේ අපවිත්‍රව සිටින
අයට, “අපිට ළං වෙන්නවත්
එපා! අපිට ළං වෙන්නවත්
එපා! ඔබ අපවිත්‍රයි.[4] අපෙන්
ඈත් වෙන්න. අපිව අල්-
ලන්න එපා”[5] කියා පැවසු-
වෝය.
ඔවුහු ඉන්න හිටින්න තැනක්
නැතුව[6] ඉබාගාතේ සැරිසැ-
රුවෝය.[7] වෙනත් දේශවල
වැසියෝද ඔවුන්ට මෙසේ
පැවසුවෝය. “මේ අයට අපේ
දේශයේ ඉඩක් නැහැ.[8]

פ [පේ]

16 යෙහෝවා දෙවි ඔවුන්ව විසුරුවා-
හැරියා.[9] ඔහු ඔවුන් ගැන
තවදුරටත් සැලකිල්ල දක්-
වන්නේ නැහැ.[10]
කිසිවෙක් පූජකයන්ව ගණනක-
ටවත් ගන්නේ නැහැ.[11] මහලු
අයටද කිසිදු සැලකිල්ලක්
දක්වන්නේ නැහැ.”[12]

ע [ආයින්]

17 අපේ දෙනෙත් විඩාවට පත් වන
තරමටම උපකාරය ලැබෙන
තුරු බලා සිටියත් ඉන් කිසිදු
පලක් නැත.[13]
අප උපකාර පතා තිබෙන ජාති-
යට අපිට ගැලවීම ලබා දිය
නොහැකිය.[14]

צ [ට්සාධේ]

18 අපේ සතුරන් අප පසුපස ලුහු-
බඳින හෙයින්[15] අපට ප්‍රසිද්ධ
මංසන්ධිවලටවත් යෑමට
නොහැක.
අපේ අවසානය ළං වී ඇත.
විනාශයට අපි දවසින් දවස
ළඟා වූවෙමු.[16]

ק [කෝෆ්]

19 රාජාලීන්ටත් වඩා වේගයෙන්
අපේ සතුරෝ අපි පසුපස
ලුහුබැඳ ආවෝය.[1]
කඳු මුදුන්වලට පවා ඔවුහු අපව
සොයාගෙන ආවෝය.[2] අප
පාළුකරයට දිව යන විට
ඔවුහු මඟ රැක සිටියෝය.[3]

ר [රේෂ්]

20 “යෙහෝවා දෙවිගේ අභිෂේක
ලත් තැනැත්තාගේ[4] සෙව-
ණෙහි සිටින අපට[5] වෙනත්
ජාතීන්ගෙන් කිසිදු විපතක්
සිදු නොවෙයි”[6] කියා අපි
කීවෙමු.
එහෙත් අපේ පණ මෙන් සිටි[7]
ඔහුව උගුලක් අටවා ඔවුහු
අල්ලාගත්තෝය.[8]

ש [සින්]

21 ඌෂ් දේශයේ[9] වාසය කරන
ඒදොම් දියණියනි,[10] හැකි
තරම් සතුටු වන්න.[11]
නමුත් ඔබටත් උදහස නමැති
කුසලානයෙන් බීමට සිදු වනු
ඇත.[12] ඔබ මත් වී ලැජ්ජාවට
පත් වනු ඇත.[13]

ת [ටාව්]

22 සියොන් දියණියනි, ඔබේ වර-
දට දඬුවම් ලැබී අවසන්ය.[14]
ඔහු* නැවත ඔබව වහල්ක-
මට ගෙන යන්නේ නැත.[15]
ඒදොම් දියණියනි, ඔහු ඔබේ
පාප එළිදරව් කර ඇති
නිසා[16] දැන් ඔහු ඔබේ වරදට
දඬුවම් දෙන්නේය.

5 අනේ යෙහෝවා දෙවියනි, අපව
අමතක කරන්න එපා.[17]
අප විඳින නින්දාව දෙස
බලන්න.[18]

**4 පරි.**
1 යෙසා 59:10 ශෙප 1:17
2 ගණන් 35:33 යෙසා 1:15 යෙරෙ 2:34 එස 33:25 හොෂෙ 4:2
3 ගණන් 19:16
4 ලෙවී 13:45
5 2කොරි 6:17
6 ලෙවී 26:33 විලා 1:7
7 ද්වි 28:65
8 ද්වි 28:25 ද්වි 28:68
9 ලෙවී 26:33 ද්වි 28:64 යෙරෙ 24:9
10 යෝබ් 34:29 ගීතා 34:16 යෙසා 59:2 යෙරෙ 18:17 හෙබ්‍රෙ 8:9
11 2රාජා 25:18
12 විලා 5:12 එස 9:6
13 2රාජා 24:7 යෙසා 20:5 විලා 1:19
14 යෙසා 30:3 යෙසා 31:3 යෙරෙ 37:7 එස 29:6
15 2රාජා 25:5 යෙරෙ 39:4 විලා 3:52
16 එස 7:2 එස 12:23 ආමො 8:2

**2 තීරුව**
1 ද්වි 28:49 යෙසා 5:26 යෙරෙ 4:13 හොෂෙ 8:1 හබ 1:8
2 2රාජා 25:5 ආමො 2:14
3 විලා 3:10
4 ගීතා 89:20 යෙරෙ 37:1
5 විනි 9:15 දානි 4:12
6 1සාමු 9:16
7 උත් 2:7
8 2රාජා 25:6 යෙරෙ 39:5 යෙරෙ 52:8 එස 12:13
9 යෙරෙ 25:20
10 ගීතා 137:7 ඔබ 12
11 හිතෝ 2:14 1කොරි 13:6
12 යෙරෙ 25:15 යෙරෙ 49:12 ඔබ 16
13 යෙරෙ 49:10

**14** ලෙවී 26:43; යෙසා 40:2; යෙරෙ 50:20; **15** ලෙවී 26:44; යෙසා 52:1; යෙසා 60:18; **16** ගීතා 137:7; යෙසා 34:5; එස 25:13; එස 35:15; ආමො 1:11; ඔබ 13; **5 පරි.** **17** ලෙවී 26:44; යෙරෙ 15:15; විලා 1:20; **18** ගීතා 44:13; ගීතා 79:4; විලා 2:15.

විලා **4:22*** හෝ, “කිසිවෙක්.”

2 අපේ උරුමය වෙනත් ජාතීන්ටත්
අපේ නිවෙස් විදේශිකයන්-
ටත් අයිති වී ඇත.[1]
3 අප පියා නැති දරුවන් මෙනි.[2]
අපේ මව්වරු වැන්දඹුවන්
මෙනි.[3]
4 අප අපේම වතුර ටික ලබාගන්නේ
මුදලටය.[4] අපේ දර අපිටම
විකුණනු ලැබේ.
5 අපිට මහත් වෙහෙසක් දැනෙයි.
විඩාව නිවාගන්නවත් අපිට
නොහැකිය.[5] මන්ද අපේ
සතුරෝ අප පසුපස ලුහුබැඳ
එති. ඔවුහු අප අසලටම
පැමිණ සිටිති.[6]
6 අපි කෑම ඉල්ලා ඊජිප්තුව දෙස-
ටත්[7] ඇසිරියාව දෙසටත්[8]
දැත් දිගු කළෙමු.[9]
7 පව් කළේ අපේ මුතුන්-
මිත්තන්ය.[10] නමුත් ඔවුහු
දැන් නැත. ඔවුන්ගේ පව්ව-
ලට වන්දි ගෙවීමට සිදු වී
ඇත්තේ අපටය.[11]
8 කලින් දාසයන්ව සිටි අය දැන්
අපව පාලනය කරති.[12]
ඔවුන්ගෙන් අපව ගලවාගැ-
නීමට කිසිවෙක් නැත.[13]
9 කඩුගත් සතුරෝ පාළුකරයේ
සිටින නිසා අපට කෑම
සොයා යෑමට සිදු වී ඇත්තේ
අපේ ජීවිත පරදුවට තබ-
මිනි.[14]
10 දරාගත නොහැකි කුසගින්න නිසා
අපේ මුළු ගතම උදුනක්
මෙන් රත් වී ඇත.[15]
11 සියොන්හි ස්ත්‍රීහුද යූදාහි නගරවල
සිටි කන්‍යාවෝද ලැජ්ජාවට
පත් වූහ.[16]
12 සතුරෝ අපේ අධිපතීන්ව අත්ව-
ලින් එල්ලා තැබුවෝය.[17]
වැඩිහිටි අයටවත් ඔවුහු කිසි
ගෞරවයක් නොපෙන්වූ-
වෝය.[18]
13 අපේ තරුණයන්ට පවා ඇඹරුම්
ගලේ වැඩ කිරීමට සිදු වී
ඇත.[1] පිරිමි දරුවෝ දර මිටි
උසුලාගෙන වැටි වැටී යති.[2]
14 නගරයේ දොරටු අසල දැන්
වැඩිමහල්ලෝ පෙනෙන්-
නට නැත.[3] සංගීත භාණ්ඩ
අතැති තරුණයෝද එහි
නැත.[4]
15 කලින් තිබූ සිතේ සතුට දැන්
පහ වී ගොසින්ය. නැටුම්
ගැයුම් දැන් වැලපීමකට පෙ-
රළී ඇත.[5]
16 අප අද්දකින වේදනාව මොන
තරම්ද! හිස පැළඳි කිරුළ
දැන් අපෙන් පහව ගොසිනි.[6]
මන්ද අපි බොහෝ සෙයින්
පව් කළෙමු.[7]
17 සිදු වූ දේවල් නිසා අපේ හදවත්
සෝදුකින් පිරී ඇත.[8] දෙ-
නෙත් මලානික වී ඇත.[9]
18 සියොන් කන්ද දැන් පාළුවට
ගොස් ඇත.[10] එය හිවලුන්ට
තෝතැන්නක් වී ඇත.[11]
19 යෙහෝවා දෙවියනි, ඔබ සදා-
කාලයෙන් සදාකාලයටම
රජුය.[12] ඔබේ රජකම පරම්-
පරාවෙන් පරම්පරාවට පව-
තින්නේය.[13]
20 ඔබ සදහටම අපව අමතක කළෙ-
හිද?[14] මෙතරම් දිගු කාල-
යකට ඔබ අපෙන් ඈත්ව
සිටින්නේ මන්ද?[15]
21 අනේ යෙහෝවා දෙවියනි, නැවත
ඔබ වෙතට ළං වීමට අපට
ඉඩ දෙන්න.[16] අතීතයේදී
මෙන් නැවතත් අපට හොඳ
කාලයක් උදා කර දෙන්න.[17]
22 ඔබ අපව අත්හැරියෙහිය.[18] ඔබ
අපත් සමඟ බොහෝ සෙයින්
උදහස් වී සිටින්නෙහිය.[19]

**5 පරි.**

**1** ද්වි 28:30
ගීතා 79:1
ගීතා 136:21
යෙසා 1:7
යෙරෙ 6:12
ශෙප 1:13
**2** නික් 22:24
**3** යෙරෙ 18:21
**4** ද්වි 28:48
යෙසා 3:1
එස 4:11
එස 4:16
**5** ද්වි 28:65
**6** ද්වි 28:48
යෙරෙ 27:8
යෙරෙ 28:14
**7** යෙසා 30:2
යෙසා 31:1
යෙරෙ 2:18
යෙරෙ 2:36
යෙරෙ 44:12
**8** 2ලේක 28:16
හොෂෙ 5:13
හොෂෙ 7:11
හොෂෙ 9:3
හොෂෙ 12:1
**9** එස 17:18
**10** යෙරෙ 16:12
යෙරෙ 31:29
එස 18:2
**11** නික් 20:5
යෙරෙ 14:20
සෙක 1:5
**12** ද්වි 28:43
හිතෝ 30:22
යෙසා 3:4
**13** සෙක 11:6
**14** යෙරෙ 52:6
එස 4:10
**15** 2රාජා 25:3
යෝබ් 30:30
විලා 4:8
**16** ද්වි 28:30
සෙක 14:2
**17** යෙරෙ 39:6
**18** යෙසා 47:6
යෙරෙ 6:11
විලා 4:16

**2 තීරුව**

**1** විනි 16:21
**2** නික් 1:11
**3** ද්වි 16:18
යොෂු 20:4
රූත් 4:11
**4** යෙරෙ 25:10
**5** ආමො 8:10
**6** යෝබ් 19:9
ගීතා 7:5
ගීතා 89:39
**7** හිතෝ 14:34
යෙසා 3:9
යෙසා 59:12
**8** යෙසා 1:5
යෙරෙ 8:18
විලා 1:22
**9** ද්වි 28:65
යෝබ් 17:7
ගීතා 6:7
යෙසා 59:10
විලා 2:11

**10** ලෙවී 26:43; යෙරෙ 26:18; **11** යෙසා 32:14; යෙරෙ 9:11; එස 13:4; **12** ගීතා 9:7; ගීතා 90:2; ගීතා 102:12; **13** ගීතා 102:27; ගීතා 145:13; ගීතා 146:10; හබ 1:12; **14** ගීතා 13:1; යෙරෙ 14:19; **15** ගීතා 79:5; **16** ද්වි 4:30; ගීතා 80:3; ගීතා 85:4; යෙරෙ 31:18; යෙරෙ 32:37; **17** යෙරෙ 33:13; **18** ගීතා 44:9; **19** ද්වි 28:15; ගීතා 60:1; යෙරෙ 31:37.

# එසකියෙල්*

**1** තිස්වන අවුරුද්දේ හතරවන
මාසයේ පස්වන දින මම වහල්-
කමට[1] ගෙන ගිය සෙනඟ සමඟ කේ-
බාර් ගඟ[2] අසල සිටියෙමි. ඒ දිනයේදී
අහස විවර විය.[3] එවිට මට දෙවිගෙන්
දර්ශන මාලාවක් ලැබිණ.[4] **2** (එම
දර්ශන ලැබුණේ යෙහෝයාකින්[5] රජු
වහල්භාවයට පත් වී ගත වන පස්-
වන අවුරුද්දේදීය.) එම දිනයේදී,
**3** කල්දිවරුන්ගේ[6] දේශයේ කේබාර්
ගඟ අසල සිටි පූජක බූසීගේ පුත්‍රයා වූ
එසකියෙල්[7] වන මට යෙහෝවා දෙවි-
ගෙන් පණිවිඩයක් ලැබිණ.[8] ඒ අවස්-
ථාවේදී යෙහෝවා දෙවිගේ බලය මා
තුළ ක්‍රියාත්මක විය.[9]

**4** මම අහස දෙස බැලුවෙමි. එවිට
උතුරු දිශාවෙන් හමා එන චණ්ඩ
මාරුතයක්[10] මම දුටුවෙමි. ඒ
සමඟ මහත් දීප්තියකින් බැබළෙන
දැවැන්ත වලා පටලයක්ද[11] බුර-
බුරා නඟින ගින්නක්ද[12] දුටු-
වෙමි. එම ගින්න මැදින් රන් හා
රිදී මිශ්‍ර ලෝහයක තිබෙන කාන්ති-
යට සමාන දිස්නයක් නික්මුණේය.[13]
**5** එම ගින්න මැද ජීවීහු හතරදෙ-
නෙක් සිටියෝය.[14] ඔවුන්ට මනුෂ්‍ය-
යන්ට සමාන හැඩරුවක් තිබිණ.
**6** එහෙත් ඒ සෑම ජීවියෙකුටම
මුහුණු හතර බැගින්ද[15] පියාපත් හතර
බැගින්ද තිබිණ.[16] **7** ඔවුන්ගේ පාද-
වල කිසිම ඇදයක් තිබුණේ නැත. ඒ
පාදවල අග කොටස වහු පැටවෙකුගේ
කුරවලට සමානය.[17] ඒවා දිදුලන තඹ
පැහැයෙන් යුක්ත විය.[18] **8** ඔවුන්-
ගේ පියාපත් යටින් මිනිසෙකුට සමාන
අත් ඔවුන්ට තිබිණ.[19] ඔවුන් හතරදෙ-
නාටම මුහුණු හතර බැගින් තිබුණු
අතර පියාපත්ද තිබිණ.[20] **9** එම
පියාපත් එකිනෙකට ළං වී තිබිණ.
ඔවුහු වෙනත් දිශාවකට නොහැරී ඉදි-
රියටම ගමන් කළහ.[21]

එස නම* තේරුම, "දෙවි ශක්තිමත් කරයි."

**1 පරි.**
**1** 2රාජා 24:14 එස්ත 2:6
**2** ගීතා 137:1 එස 3:15 එස 10:15 එස 43:3
**3** මතෙ 3:16 ක්‍රියා 7:55 ක්‍රියා 10:11 එළි 19:11
**4** උත් 15:1 ගණන් 12:6 දානි 8:1
**5** 2රාජා 24:12 2ලේක 36:10 යෙරෙ 24:1
**6** 2රාජා 24:16 යෙරෙ 22:25
**7** එස 24:24
**8** 2පේතෘ 1:21
**9** 1රාජා 18:46 2රාජා 3:15 එස 3:14
**10** 1රාජා 19:11
**11** ගීතා 97:2
**12** නික් 19:18 නික් 24:17
**13** එස 8:2
**14** එස 10:9 එළි 4:6
**15** එස 10:14
**16** යෙසා 6:2 එස 10:21 එළි 4:8
**17** ලෙවී 11:3
**18** දානි 10:6 එළි 1:15
**19** යෙසා 6:6 එස 10:8
**20** එස 10:21
**21** එස 10:11

**2 තීරුව**
**1** එළි 4:7
**2** එස 10:14
**3** 2සාමු 17:10 හිතෝ 28:1
**4** එළි 4:7
**5** හිතෝ 14:4
**6** යෝබ් 39:29 හිතෝ 30:19 එස 10:14
**7** ගීතා 18:10
**8** යෙසා 6:2
**9** ගීතා 103:20 එස 1:20 හෙබ්‍රෙ 1:14
**10** එස 1:17
**11** එස 10:22
**12** ගීතා 104:4
**13** දානි 7:10
**14** ගීතා 97:3
**15** ගීතා 18:10 මතෙ 24:27
**16** එළි 4:7

**10** ඔවුන් හතරදෙනාටම මුහුණු
හතර බැගින් තිබිණ. මිනිසෙකු-
ගේ[1] මුහුණක්ද ඊට දකුණු පැත්-
තෙන්[2] සිංහයෙකුගේ[3] මුහුණක්ද වම්
පැත්තෙන්[4] ගවයෙකුගේ[5] මුහුණක්ද
තිබිණ. ඔවුන් හතරදෙනාටම රාජාලි-
යෙකුගේ මුහුණක්ද තිබිණ.[6]
**11** ඔවුන් එක් එක් කෙනාට මුහුණු
හතර බැගින් පිහිටා තිබුණේ ඒ ආකා-
රයටය. ඔවුහු එක් එක් කෙනාට
තිබුණු පියාපත්[7] හතරෙන් දෙකක්
එකට ළං කර තම ශරීර වසාගෙන
සිටියෝය. අනික් පියාපත් දෙක ඉහ-
ළට විදහාගෙන සිටියෝය.[8]

**12** ඔවුන් හතරදෙනා ගමන් කළේ
දෙවිගේ බලයේ ආධාරයෙනි. ඔවුන්
ගමන් කළේ දෙවි මඟ පෙන්වූ දිශාව-
ටමය.[9] ඔවුහු වෙනත් දිශාවකට නො-
හැරී[10] ඉදිරියටම ගමන් කළෝය.[11]
**13** එම ජීවීහු දැවෙමින් තිබූ ගිනි
අඟුරු මෙන් දිස් වූහ.[12] දැල්වෙමින්
තිබූ ගිනිසිළු රැසක්ද[13] ඔවුන් අතරේ
තිබිණ. ඒවා එක තැන නොනැවතී
ඒ මේ අත ගමන් කළේය. ඒවායින්
අතිමහත් දීප්තියක් නික්මුණේය. එම
ගිනිසිළුවලින් අකුණු සැර නික්මෙන
ආකාරයද මම දුටිමි.[14] **14** ජීවීන්ද
එක තැනක රැඳී සිටියේ නැත. ඔවුහුද
අකුණු ගසන ආකාරයට ඉදිරියට හා
පිටුපසට ගමන් කරමින් සිටියහ.[15]

**15** මම මුහුණු හතර[16] බැගින් ඇති
ඒ ජීවීන් දෙස තවත් හොඳින් බැලු-
වෙමි. ඔවුන් එක් එක් කෙනා අසල
රෝදය බැගින් පොළොවේ පිහිටා
තිබිණ.[17] **16** මා දුටු රෝදවල[18] පෙ-
නුම මෙසේය. ඒ රෝදවලින් ක්‍රිසොල-
යිට් මැණිකක*[19] කාන්තියට සමාන
දීප්තියක් නික්මුණේය. එම රෝද
හතරම එක හා සමානය. ඒ එක් එක්

**17** එස 10:9; එස 10:13; එස 11:22; **18** එස 10:9; **19** නික් 39:13; දානි 10:6.

එස **1:16*** රන් පැහැයෙන් බැබළෙන මැණිකකි.

රෝදය හරහට ඒ හා සමාන තවත්
රෝදයක් සවි කර තිබිණ.[1] **17** එම
රෝද එලෙස පිහිටා තිබුණු නිසා
ඒවාට ඕනෑම දිශාවකට පහසුවෙන්
ගමන් කරන්න හැකියාව තිබිණ.[2]
ඒවා ගමන් කරද්දී වෙනත් දිශාවකට
නොහැරී නියමිත දිශාවටම ගියේය.[3]
**18** එම රෝදවල විශාලත්වය දුටු මා
තුළ මහත් බියක් හටගත්තේය. ඒ
සෑම රෝදයක් වටේටම ඇස් පිහිටා
තිබිණ.[4] **19** ජීවීන් ගමන් කළ සෑම
තැනකටම එම රෝදද ගමන් කළේය.
ජීවීන් ඉහළට පියාසර කළ විට
රෝදද ඉහළට ගියේය.[5] **20** දෙවිගේ
බලය ආධාරයෙන් ගමන් කළ එම
ජීවීහු දෙවි පෙන්වූ දිශාවටම ගියෝය.
ජීවීන් හතරදෙනාට තිබූ බලය රෝද
තුළත් ක්‍රියාත්මක වූ නිසා ඒවාත්
ඔවුන් සමඟම ඉහළට ගමන් කළේය.
**21** ජීවීන් ගිය සෑම තැනකටම රෝ-
දද ගමන් කළේය. ඔවුන් නතර වූ
විට රෝදද නතර විය. ඔවුන් ඉහ-
ළට පියාසර කළ විට රෝදද ඉහළට
ගියේය. එසේ වූයේ දෙවිගේ බලය
ජීවීන් තුළ පමණක් නොව එම රෝද
තුළත් ක්‍රියාත්මක වූ නිසාය.[6]

**22** පළිඟු* මෙන් දීප්තිමත්ව බැබ-
ළෙන විශාල වේදිකාවක්[7] එම ජීවීන්-
ගේ හිසට ඉහළින් පිහිටා තිබෙනවා
මම දුටිමි.[8] **23** එම විශාල වේදිකාව
යටින් සිටි ඔවුහු පියාපත් දෙක බැගින්
ඉහළට ඔසවාගෙන සිටියෝය. අනික්
පියාපත් දෙක එකිනෙකට ළං කර තම
ශරීර වසාගෙන සිටියෝය. **24** ඔවුන්
ගමන් කරන විට ඔවුන්ගේ පියාපත්වල
හඬ කඩා හැළෙන මහා ජල කඳක
හඬ මෙනි.[9] ඒ හඬ විශාල හමුදාවක
ඝෝෂාවකටත්[10] සියලු බලැති දෙවිගේ
හඬටත් සමානය.[11] ඔවුහු එක තැන
නතර වූ විට තම පියාපත් පහත් කර-
ගෙන සිටියෝය.

**25** ඔවුන්ගේ හිසට උඩින් පිහිටා
තිබුණු එම විශාල වේදිකාවට ඉහ-
ළින් හඬක් නික්මුණේය. (ඔවුහු එක
තැන නතර වූ විට තම පියා-
පත් පහත් කරගත්තෝය.) **26** එම
ජීවීන්ට උඩින් තිබූ වේදිකාවටත් ඉහ-
ළින් නිල් මැණිකක[1] කාන්තියෙන්
බැබළෙන සිංහාසනයක්[2] මම දුටිමි.
ඉතා ඉහළින් පිහිටා තිබූ එම සිංහාස-
නය මත මිනිසෙකුගේ පෙනුම ඇති
තැනැත්තෙක් හිඳගෙන සිටියේය.[3]
**27** එම තැනැත්තාගේ ඉණට ඉහ-
ළින් රන් රිදී මිශ්‍ර ලෝහයක තිබෙන
දීප්තිය හා සමාන දීප්තියක් විහි-
දෙමින් තිබිණ.[4] ඒ දීප්තිය ගින්නක්
මෙන් විය. ඒ ගින්න ඔහුගේ මුළු
ශරීරය පුරාම එනම්, ඇතුළතින් හා
පිටතින් දැල්වෙමින් තිබුණේය.[5] ඔහු-
ගේ ඉණට පහළිනුත් ගිනිමය දීප්ති-
යක් විහිදුණේය. ඔහු වටාම දීප්තියක්
බැබළුණේය. **28** ඒ වටා පැතිර තිබූ
දීප්තිය වැස්සක් පැව්වායින් පසු වලා-
කුළු අතරෙහි පායන දේදුන්නක[6]
තිබෙන දීප්තියට සමානය. ඇත්-
තෙන්ම එය යෙහෝවා දෙවිගේ තේජ-
සට සමානය.[7] මේ සියල්ල දුටු විට
මම මුණින් වැටුණෙමි.[8] එවිට මට
කතා කරන හඬක් ඇසුණේය.

**2** එවිට ඔහු මට කතා කර,
“මනුෂ්‍ය පුත්‍රය,[9] නැඟිටින්න.
ඔබට කීමට පණිවිඩයක් මා ළඟ
තිබේ”[10] යයි කීවේය. **2** ඔහු මට
කතා කළ සැණින් දෙවිගේ බලය මා
තුළ ක්‍රියාත්මක වෙන්න පටන්ගත්-
තේය.[11] එවිට මට සිටගැනීමට අවශ්‍ය
ශක්තිය ලැබිණ. මම නැඟිට මා සමඟ
කතා කරමින් සිටි තැනැත්තාණන්ට
සවන් දීමට සූදානම් වුණෙමි.[12]

**3** ඔහු මට මෙසේ කීවේය. “මනුෂ්‍ය
පුත්‍රය, මම ඔබව ඊශ්‍රායෙල් සෙ-
නඟ වෙතට යවන්නෙමි.[13] මට විරුද්-
ධව කැරලිගැසූ ඒ ජාතීන් වෙතට
මම ඔබව යවන්නෙමි.[14] අතීතයේ විසූ
ඔවුන්ගේ මුතුන්මිත්තන් කළ ලෙසම
අද වන තෙක්ම ඔවුහුද මට විරුද්ධව
ක්‍රියා කර ඇත.[15] **4** කිසි කෙනෙ-
කුව ගණනකට නොගන්නා,[16] දැඩි
සිත්[17] ඇති ඒ සෙනඟ වෙතට මම
ඔබව යවන්නෙමි. ‘විශ්වයේ පාලක-

---

එස 1:22* මූ.අ., “අයිස්.”

---

**1 පරි.**

1 එස 10:10
දානි 7:9
2 එස 10:11
3 එස 1:12
4 හිතෝ 15:3
එස 10:12
සෙක 4:10
5 එස 10:16
6 එස 10:17
7 උත් 1:6
8 එස 10:1
9 එස 43:2
එළි 1:15
එළි 14:2
10 2රාජා 7:6
11 යෝබ් 37:2
ගීතා 29:3
ගීතා 68:33

**2 තීරුව**

1 නික් 24:10
ගීතා 96:6
එස 10:1
2 1රාජා 22:19
ගීතා 99:1
යෙසා 6:1
එළි 4:2
3 දානි 7:9
4 එස 8:2
5 ද්වි 4:24
ගීතා 104:2
6 උත් 9:13
එළි 4:3
7 නික් 24:16
එස 8:4
8 එස 3:23
එස 43:3
දානි 8:17
එළි 1:17

**2 පරි.**

9 එස 8:5
එස 37:3
10 දානි 10:11
11 එස 3:24
12 එළි 11:11
13 2ලේක 36:15
එස 33:7
මතෙ 10:16
14 ගීතා 107:11
යෙසා 1:4
යෙසා 30:9
යෙරෙ 16:12
විලා 1:20
දානි 9:9
15 ද්වි 9:24
නෙහෙ 9:26
ගීතා 78:8
යෙරෙ 3:25
එස 20:18
ක්‍රියා 7:51
16 මතෙ 22:6
17 යොෂු 11:20
ගීතා 95:8
එස 3:7
හෙබ්‍රෙ 3:15

යාණන් වන යෙහෝවා දෙවිගෙන් ලද
පණිවිඩය මෙයයි’ කියා ඔබ ඔවුන්ට
පවසන්න. **5** ඔවුහු කැරලිකාර සෙ-
නඟකි.[1] ඔවුන් ඔබ කියන දෙය පිළි-
ගත්තත්[2] නැතත්[3] ඔවුන් අතරෙහි
සිටියේ සැබෑ අනාගතවක්තෘවරයෙකු
බව අනිවාර්යයෙන්ම තේරුම්ගන්-
නවා ඇත.[4]

**6** “මනුෂ්‍ය පුත්‍රය, ඔවුන්ටවත්
ඔවුන් පවසන දේවලටවත් බිය නො-
වන්න.[5] ඔබ ජීවත් වන්නේ ගෝනුස්-
සන්ට[6] හා කටු පඳුරුවලට[7] සමාන
සෙනඟක් අතරේය. ඔවුහු මුරණ්ඩු,[8]
කැරලිකාර සෙනඟකි.[9] එහෙත්
ඔවුන්ගේ වචනවලටවත්[10] ඔවුන්ගේ
දරුණු පෙනුමටවත් බිය නොවන්න.[11]
**7** ඔවුන් ඔබ කියන දේ අසන්න
කැමති වුවත් නැතත් මාගේ පණිවි-
ඩය ඔවුන්ට පැවසිය යුතුයි. මන්ද
ඔවුහු කැරලිකාර සෙනඟකි.[12]

**8** “මනුෂ්‍ය පුත්‍රය, මා දැන් කියන
දෙයට හොඳින් සවන් දෙන්න. ඔබත්
ඒ සෙනඟ හා සමානව කැරලිකාර-
යෙකු නොවන්න.[13] දැන් ඔබේ මුඛය
විවෘත කර මා ඔබට දෙන දේ අනුභව
කරන්න.”[14]

**9** මා බලා සිටියදීම මා වෙත
අතක් දිගු කරන ලදි.[15] ඒ අතේ
අකුළන ලද ලියවිල්ලක් තිබිණ.[16]
**10** ඔහු ඒ ලියවිල්ල මා ඉදිරියෙහිම
දිගහැරියේය. වැලපීමට හේතු වන
දුක්මුසු වචනද විලාප ගීයක්ද[17] එම
ලියවිල්ල දෙපැත්තේම ලියා තිබිණ.[18]

**3** ඔහු මට මෙසේ කීවේය. “මනුෂ්‍ය
පුත්‍රය, ඔබ ඉදිරියේ තිබෙන
මෙම ලියවිල්ල කන්න.[19] ඉන්පසු
ඊශ්‍රායෙල් සෙනඟ වෙත ගොස් මාගේ
පණිවිඩය කියන්න.”

**2** මම මාගේ මුඛය විවෘත කළෙමි.
එවිට ඔහු මට ඒ ලියවිල්ල කන්න
දුන්නේය.[20] **3** ඉන්පසුව ඔහු මට
මෙසේ උපදෙස් දුන්නේය. “මනුෂ්‍ය
පුත්‍රය, මා ඔබට දෙන මේ ලියවිල්ල
කා එයින් ඔබේ බඩ පුරවාගත යුතුයි.”
ඔහු කී ලෙසම මම එය කෑවෙමි. එය
මීපැණි මෙන් මිහිරි විය.[21]

**2 පරි.**
**1** එස 12:2
**2** එස 33:15
**3** එස 3:11
එස 33:4
**4** එස 33:33
යොහ 15:22
**5** 2රාජ 1:15
හිතෝ 29:25
යෙරෙ 1:17
ලූක් 12:4
**6** ලූක් 10:19
**7** යෙසා 9:18
මීකා 7:4
**8** ද්වි 2:30
ක්‍රියා 7:51
**9** යෙසා 51:7
**10** එස 3:9
**11** යෙරෙ 1:8
**12** යෙරෙ 1:17
එස 3:27
**13** ගණන් 20:24
යෙසා 50:5
**14** යෙරෙ 15:16
එළි 10:9
**15** යෙරෙ 1:9
එස 8:3
**16** එස 3:1
එළි 10:8
**17** යෙසා 3:11
යෙරෙ 7:29
එස 19:1
**18** සෙක 5:3
එළි 5:1

**3 පරි.**
**19** එස 2:8
එළි 10:9
**20** එළි 10:10
**21** ගීතා 19:10
ගීතා 119:103
යෙරෙ 15:16
එළි 10:9

**2 තීරුව**
**1** මතෙ 10:6
මතෙ 15:24
**2** ගීතා 81:5
යෙසා 33:19
**3** ද්වි 28:49
යෙසා 28:11
**4** යෙරෙ 5:15
**5** යෝනා 3:5
මතෙ 11:21
මතෙ 12:41
ක්‍රියා 13:46
**6** නික් 34:9
නෙහෙ 9:16
යෙරෙ 3:3
යෙරෙ 5:3
යෙරෙ 7:26
එස 2:4
**7** 1සාමු 8:7
යෙරෙ 25:7
ලූක් 10:16
**8** යෙසා 50:7
යෙරෙ 1:18
යෙරෙ 15:20
මීකා 3:8
**9** යෙසා 50:7
සෙක 7:12

**4** ඔහු මට මෙසේද කීවේය.
“මනුෂ්‍ය පුත්‍රය, ඔබ ඊශ්‍රායෙල්ව-
රුන්ට[1] මාගේ පණිවිඩය කිව යුතුයි.
**5** මා ඔබව යවන්නේ ඔබ නොදන්නා
භාෂාවක් කතා කරන[2] එසේත් නැත්-
නම්, ඔබට තේරුම්ගන්න අපහසු
ආකාරයකින් වචන හසුරුවන[3] ජන
පිරිසක් වෙත නොව ඊශ්‍රායෙල් සෙ-
නඟ වෙතටය. **6** මා ඔබව යවන්-
නේ ඔබට නොතේරෙන භාෂා කතා
කරන හා ඔබට තේරුම්ගන්න අප-
හසු ආකාරයකින් වචන හසුරුවන
විවිධ ජන පිරිස් වෙතට නොවෙයි.[4]
මා ඔබව යවන්නේ එවැනි සෙ-
නඟක් වෙතට නම් ඔවුහු ඔබ දෙන
පණිවිඩය පිළිගනු ඇත.[5] **7** නමුත්
ඊශ්‍රායෙල් සෙනඟ නම් ඔබ පව-
සන දේ පිළිගන්න කැමති වන්-
නේ නැත. මන්ද ඔවුහු මුරණ්ඩු, දැඩි
සිත් ඇති ජනතාවකි.[6] ඔවුන්ගෙන්
එක් කෙනෙක්වත් මා කියන දේ පිළි-
ගැනීමට කැමති නැත.[7] **8** එහෙත්
දරුණු සිත් ඇති ඒ මුරණ්ඩු සෙනඟට
මුහුණ දීමට අවශ්‍ය ශක්තිය මම
ඔබට දෙන්නෙමි.*[8] **9** මම ඔබේ
නළල ගිනිගලකටත්[9] වඩා ශක්ති-
මත් වූ දියමන්තියක් මෙන් වීමට
සලස්වන්නෙමි. ඒ නිසා ඔවුන්ට භය
නොවන්න.[10] ඔවුන්ගේ දරුණු පෙනුම
දෙස බලා තැති නොගන්න.[11] මන්ද
ඔවුහු කැරලිකාර සෙනඟකි.”[12]

**10** ඔහු මට මෙසේද කීවේය.
“මනුෂ්‍ය පුත්‍රය, මා කියන සෑම දෙය-
කටම හොඳින් සවන් දී ඒවා ඔබේ
සිතට ගන්න.[13] **11** තම දේශයෙන්
පිටුවහල් කර ඇති ඒ ජනතාව[14] වෙත
ගොස්, ‘විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන දේට සවන්
දෙන්න’ කියා ඔවුන්ට කියන්න. ඔවුන්
ඔබ කියන දෙයට සවන් දුන්නත්

---

**10** හිතෝ 29:25; යෙසා 41:10; **11** යෙරෙ 1:18; යෙරෙ 17:18; **12** එස 24:3; **13** ගීතා 119:11; ලූක් 8:15; **14** 2රාජ 24:14.

---

එස **3:8*** මූ.අ., “මම ඔවුන්ගේ මුහුණු හා නළල්වලට සමානව ඔබේ මුහුණ හා නළලද ශක්තිමත් කරන්නෙමි.”

නැතත් එම පණිවිඩය ඔවුන්ට දැනුම්
දෙන්න.”[1]
12 එවිට යම් බලයක්* මාව උසු-
ලාගෙන යන බව මට දැනිණ.[2]
“තම වාසස්ථානයේ සිටින තේජාන්-
විත යෙහෝවා දෙවිට ප්‍රශංසා වේවා”[3]
කියා පවසන හඬක්ද මට පිටුපසින්
ඇසිණ. එය මහ සුළඟකට සමාන
ඝෝෂාකාරී හඬක් විය.[4] 13 ඒ හඬට
අමතරව ජීවීන්ගේ පියාපත් එකි-
නෙක ගැටෙන හඬද මට ඇසිණ.[5]
ජීවීන් අසලම පිහිටා තිබූ රෝදවලින්ද
ශබ්දයක් නික්මුණේය.[6] 14 ඒ බලය
දැඩි ශෝකයෙන් හා දැවෙන උද-
හසකින් සිටි මාව දිගටම උසුලා-
ගෙන ගියේය.[7] යෙහෝවා දෙවිගේ
බලය මා කෙරෙහි ප්‍රබලව ක්‍රියාත්-
මක විය.[8] 15 එවිට මම කේබාර්
ගඟ[9] අසල ටෙල්-ආබිබ් නම් ස්ථාන-
යට පැමිණ, එහි වාසය කළ[10] පිටුව-
හල් කරන ලද ජනතාව සමඟ වාසය
කරන්න පටන්ගත්තෙමි. කම්පනයට
පත්ව සිටි මම දවස් හතක් පුරාම ගල්-
ගැසුණාක් මෙන් සිටියෙමි.[11]
16 දවස් හතක් ගෙවී ගිය පසු යෙ-
හෝවා දෙවි නැවතත් මට කතා කර
මෙසේ කීවේය.
17 “මනුෂ්‍ය පුත්‍රය, මම ඔබව ඊශ්‍රා-
යෙල් සෙනඟ වෙනුවෙන් මුරකරු-
වෙකු ලෙස පත් කරන්නෙමි.[12] ඔබ මා
පවසන දෙයට සවන් දී මා දෙන
අනතුරු ඇඟවීම ඔවුන්ට දැනුම් දිය
යුතුයි.[13] 18 ‘ඔබ අනිවාර්යයෙන්ම
මිය යනවා’[14] කියා මා දුෂ්ට කෙනෙ-
කුට පැවසුවොත් ඔබ ඔහුට කතා
කර ඔහුගේ දුෂ්ට ක්‍රියා ගැන අනතුරු
අඟවා ඔහුගේ ජීවිතය බේරාගැනීමට
උත්සාහ කළ යුතුයි.[15] ඔබ එසේ නො-
කළොත් ඔහු කළ දුෂ්ටකම් නිසා ඔහු
මිය යයි.[16] නමුත් ඔබ ඔහුගේ ජීවිතය
වෙනුවෙන් මට වන්දි ගෙවිය යුතුයි.[17]
19 එහෙත් ඔබ දුෂ්ට කෙනෙකුට අන-
තුරු අඟවා තිබියදීත්[1] ඔහු තම
දුෂ්ට ක්‍රියාවලින් හැරෙන්නේ නැත්නම්
ඒ දුෂ්ටකම් නිසා ඔහුට මිය යන්න
සිදු වෙයි.[2] නමුත් ඔබ ඔබේ ජීවිතය
ගලවාගන්නවා ඇත.[3] 20 ධර්මිෂ්ඨ
කෙනෙකු තම ධර්මිෂ්ඨකම අත්හැර[4]
අයුක්තිසහගත ලෙස ක්‍රියා කරනවා
නම් මම ඔහුව වැටීමට සලස්වමි.[5]
ඔහු පව් කළ නිසා මිය යන්නේය.[6]
ඔහු කළ ධර්මිෂ්ඨ ක්‍රියාද සිහි කරනු
නොලබන්නේය.[7] එහෙත් ඔහුට අන-
තුරු ඇඟවූයේ නැති නිසා ඔහුගේ
ජීවිතය වෙනුවෙන් ඔබ මට වන්දි ගෙ-
විය යුතුයි.[8] 21 අනික් අතට ඔබ
ධර්මිෂ්ඨ කෙනෙකුට පව් නොකර
සිටින්න කියා අනතුරු ඇඟෙවූ පසු[9] ඒ
තැනැත්තා ඔබ දුන් අනතුරු ඇඟවීම
සිතට ගෙන පව් නොකර සිටිනවා
නම් ඔහු අනිවාර්යයෙන්ම තම ජීවිතය
බේරාගන්නේය.[10] ඔබද ඔබේ ජීවිතය
ගලවාගන්නවා ඇත.”[11]
22 යෙහෝවා දෙවිගේ බලය මා
කෙරෙහි ක්‍රියාත්මක වෙන්න පටන්-
ගත්තේය. ඔහු මට මෙසේ පැව-
සීය. “නැඟිට තැනිතලාවට යන්න.[12]
එහිදී මම ඔබට කතා කරන්නෙමි.”
23 මම නැඟිට තැනිතලාවට ගිය විට
ඒ මුළු ස්ථානයම යෙහෝවා දෙවිගේ
තේජසින් පිරී තිබුණ බව දුටිමි.[13] එය
කේබාර් නදිය අසල සිටිද්දී මා දුටුවා
හා සමාන තේජසකි.[14] එය දැක මම
මුණින් වැටුණෙමි.[15] 24 නමුත් දෙ-
විගේ බලය මා තුළ ක්‍රියාත්මක වූ
නිසා[16] මම නැඟිට සිටියෙමි.[17] එවිට
දෙවි මට මෙසේ පැවසීය.
“ඔබ ගොස් ඔබේ නිවස තුළම රැඳී
සිටින්න. 25 මනුෂ්‍ය පුත්‍රය, ඔබට
ඔවුන් අතරට යෑමට නොහැකි
වන ලෙස ඔවුන් අනිවාර්යයෙන්ම
ඔබව දම්වැල්වලින් බඳිනවා ඇත.[18]
26 එවිට මම ඔබේ දිව ඔබේ උඩු
තල්ලේ ඇලෙන්න සලස්වන්නෙමි.[19]
ඔබ ගොළුවෙක් මෙන් වන්නෙ-
හිය.[20] ඔවුන්ට අවවාද දෙන්න ඔබට

---

**එස 3:12*** මුල් භාෂාවේ භාවිත කර ඇති වචනයෙන්, ‘දෙවිගේ බලය’ හෝ ‘දේවදූතයෙක්’ හෝ අදහස් විය හැකියි.

**3 පරි.**
1 එස 2:5; ක්‍රියා 20:26
2 1රාජා 18:12; 2රාජා 2:16; එස 8:3; ක්‍රියා 8:39
3 එස 11:22
4 ක්‍රියා 2:2
5 එස 1:24
6 එස 10:16
7 එස 8:3
8 1රාජා 18:46; 2රාජා 3:15
9 ගීතා 137:1; එස 1:3; එස 43:3
10 යෙරෙ 29:5
11 යෙරෙ 23:9
12 යෙසා 21:8; යෙසා 62:6; යෙරෙ 6:17; එස 33:7
13 යෙසා 58:1
14 2රාජා 1:4
15 ක්‍රියා 2:40; 1තිමෝ 4:16
16 හිතෝ 14:32; එස 33:4; රෝම 6:23
17 උත් 9:5; එස 33:8

**2 තීරුව**
1 2රාජා 17:13
2 රෝම 2:6
3 යෙසා 49:4; යෙරෙ 45:5; එස 33:9; ක්‍රියා 18:6; ක්‍රියා 20:26
4 2ලේක 24:18; එස 18:24; එස 33:12
5 අව් 13:3; 1පේතෘ 2:8
6 එස 18:26; එස 33:18
7 එස 33:12
8 ලෙවී 19:17; එස 33:6; හෙබ්‍රෙ 13:17
9 1සාමු 25:33; ක්‍රියා 20:31
10 හිතෝ 17:10; එස 33:15; යාකො 5:20
11 ක්‍රියා 18:6
12 එස 8:4
13 එස 1:28
14 එස 1:1
15 දානි 8:17; එළි 4:10
16 එස 2:2; එස 37:10
17 දානි 10:19
18 එස 4:8; යොහ 21:18; ක්‍රියා 20:23
19 ගීතා 137:6
20 එස 24:27; ලූක් 1:22.

නොහැකි වෙයි.[1] මන්ද ඔවුහු කැර-
ලිකාර[2] සෙනඟකි. **27** එහෙත් මම
ඔබට කතා කර ඔබේ මුඛය විවෘත
කරන්නෙමි. ඉන්පසු ඔබ ඔවුන්ට
මෙසේ පැවසිය යුතුයි.[3] 'විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවි
පවසන දේට සවන් දෙන්න.' සවන්
දීමට කැමති අය සවන් දුන්නාවේ.[4]
අකමැති අය සවන් නොදී සිටියාවේ.
මන්ද ඔවුහු කැරලිකාර සෙනඟකි.[5]

**4** "මනුෂ්‍ය පුත්‍රය, ගඩොල් කැට-
යක් ගෙන එය ඔබ ඉදිරියේ තබා
යෙරුසලම් නුවරේ[6] රූපසටහනක් ඒ
මත කැටයම් කරන්න. **2** ඊළඟට
ඔබ එය වැටලිය යුතුය.[7] එය වටා පස්
වැටියක් හා පවුරක් ගොඩනඟන්න.[8]
එයට විරුද්ධව කඳවුරු බැඳගෙන එහි
පවුරු බිඳ දැමීමට[9] එය වටේටම
යුධෝපකරණත් සිටුවා තබන්න.[10]
**3** ඊළඟට ඔබ යකඩ තැටියක් ගෙන
පවුරක් මෙන් නුවර හා ඔබ අත-
රේ තබන්න. ඉන්පසු නුවර දෙසට
ඔබේ මුහුණ හරවන්න. නුවර වැටලී-
මේ කාර්යය භාර දී තිබෙන්නේ ඔබ-
ටයි. මේ සියල්ල ඊශ්‍රායෙල්වරුන්ට
ලකුණක් පිණිස කරන්න.[11]
**4** "ඔබ වම් පැත්තට හැරී දිගා
වී සිටිය යුතුයි. ඔබ ඊශ්‍රායෙල් ජන-
යාගේ වැරදි ඔබේ වම්පසින් තබා-
ගන්න.[12] වම් පැත්තට හැරී දිගා වී
සිටින දවස් ගණන පුරාම ඔවුන්ගේ
වැරදි ඔබ දරනවා ඇත. **5** ඔවුන්
වැරදි කරමින් ගත කරන වර්ෂ ගණන
මම ඔබට දවස් ලෙස ප්‍රකාශ කරන්-
නෙමි.[13] එය නම් දවස් තුන්සිය අනූ-
වකි.[14] ඒ කාලය පුරාම ඔබ ඊශ්‍රායෙල්
ජනයාගේ වැරදි දැරිය යුතුයි. **6** ඒ
කාලය අවසන් වන තෙක්ම ඔබ එයා-
කාරයෙන් සිටිය යුතුයි.

"ඊළඟට ඔබ දකුණු පැත්තට හැරී
දිගා වී සිටින්න. යූදා රාජ්‍යයේ අයු-
තුකම දවස් හතළිහක් පුරා දැරීමට
ඔබට සිදු වේ.[15] ඒ එක් දවසකින්
නියෝජනය වන්නේ එක් අවුරුද්-
දකි.[16] **7** ඉන්පසුව ඔබේ මුහුණ යෙ-
රුසලමේ වටලෑම දෙසට යොමු කර,[17]
ඔබේ අත* ඒ දෙසට දිගු කරමින් එයට
විරුද්ධව අනාවැකි පවසන්න.

**8** "මම ඔබව ලණුවලින් බඳින්-
නෙමි.[1] එසේ කරන්නේ නුවර වට-
ලාගෙන සිටිය යුතු දවස් අවසන්
වන තුරු කිසිම පැත්තකට හැරෙන්න
ඔබට නොහැකි වන ලෙසයි.

**9** "ඔබ තිරිඟු,[2] බාර්ලි, බෝංචි,[3]
පරිප්පු,[4] මෙනේරි හා තණ හාල්*[5]
ගෙන, ඒවා බඳුනකට දමා ඔබේ ආහා-
රය සඳහා එයින් රොටි සාදාගන්න.
ඔබ වම් පැත්තට හැරී දිගා වී සිටින
දවස් තුන්සිය අනූව පුරාම රොටි සාදා
අනුභව කළ යුතුයි.[6] **10** ඔබ දවස-
කට ෂෙකෙල්* විස්සක බරින් යුත්
ආහාර අනුභව කළ යුතුයි.[7] එම
ආහාර දවස පුරාම විටින් විට අනුභව
කරන්න.

**11** "ඔබ දවසකට පානය කරන
ජලයත් මැනිය යුතුයි. එනම්, හින
මිනුමෙන්* හයෙන් කොටසක්ය. ඔබ
විටින් විට එයින් පානය කළ යුතුයි.

**12** "ඔබ රවුම් බාර්ලි රොටි[8] හා
සමානව රොටි පිළියෙල කර කන්න.
ඔබ ඒ රොටි පිලිස්සිය යුත්තේ ඔවුන්
ඉදිරියේමය. ඒ සඳහා ඔබ ඉන්ධන
ලෙස භාවිත කළ යුත්තේ මිනිසුන්ගේ
අසූචිය."[9] **13** "මා ඊශ්‍රායෙල්වරුන්ව
ජාතීන් අතරට විසුරුවාහරින විට[10]
ඔවුන්ටද එලෙසින්ම අපවිත්‍ර රොටි[11]
අනුභව කරන්න සිදු වෙනවා ඇත"
කියා යෙහෝවා දෙවි පැවසීය.

**14** එවිට මම මෙසේ කීවෙමි.
"අනේ විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවියනි, මා අපවිත්‍ර කෙ-
නෙක් නම් නොවේ.[12] මගේ තරුණ
කාලයේ සිට මේ දක්වාම මිය ගිය
සතෙකුගේ හෝ ඉරා දමා මරනු ලැබූ
කිසිම සතෙකුගේ හෝ මස් මාංස මම
ආහාරයට ගෙන නැත.[13] අපවිත්‍ර වූ
මස් මම කෙදිනකවත් අනුභව නොක-
ළෙමි."[14]

**3 පරි.**
1 ආමො 5:10
2 යෙසා 1:2; එස 2:6
3 එස 24:27; එස 33:22
4 මතෙ 11:15; එළි 2:29
5 යෙසා 30:9; යෙරෙ 5:23; එස 12:2

**4 පරි.**
6 යෙරෙ 32:31
7 2රාජා 24:11; යෙරෙ 39:1
8 2රාජා 25:1; ලූක් 19:43
9 2සාමු 20:15; යෙරෙ 6:6; යෙරෙ 32:24; එස 26:8
10 එස 21:22
11 එස 12:6; එස 24:24
12 2රාජා 17:21
13 ගණන් 14:34
14 1රාජා 12:19
15 2රාජා 23:27
16 ගණන් 14:34
17 2ලේක 36:17; යෙරෙ 52:4

**2 තීරුව**
1 එස 3:25
2 නික් 29:2
3 2සාමු 17:28
4 උත් 25:34
5 නික් 9:32
6 එස 4:5
7 ලෙවී 26:26
8 2රාජා 4:42
9 ද්වි 23:13
10 හොෂෙ 9:3
11 ලෙවී 19:19
12 ක්‍රියා 10:14
13 නික් 22:31; ලෙවී 7:24; ලෙවී 11:40
14 ලෙවී 7:18; ද්වි 14:3; යෙසා 65:4; යෙසා 66:17

එස **4:7*** මූ.අ., "නොවැසූ අත." **9*** නික් 9:32හි පාදසටහන බලන්න. **10*** ෂෙකෙලයක් යනු ග්‍රෑම් 11.4කි. **11*** හින මිනුමක් යනු ලීටර් 3.67කි.

**15** එවිට දෙවි මට මෙසේ පැවසීය.
“මිනිස් අසූචි වෙනුවට ගොම යොදා-
ගැනීමට මම ඔබට අවසර දෙන්-
නෙමි. ඔබ එම ගොම යොදාගෙන
රොටි පුලුස්සාගන්න.” **16** ඔහු මට
මෙසේද පැවසුවේය. “මනුෂ්‍ය පුත්‍රය,
මම යෙරුසලමේ පිහිටා ඇති ආහාර
ගබඩාවන්* කඩා බිඳ දමන්නෙමි.[1]
මහත් කනස්සල්ලකින් යුතුව කෑම
කිරා කන්න ඔවුන්ට සිදු වේ.[2] ඔවුන්ට
ජලය පානය කරන්න සිදු වන්නේත්
මහත් භීතියකින් යුතුවය. ඔවුහු එයද
මැන බොන්නෝය.[3] **17** ඒ කාල-
යේදී ආහාර හිඟයක්ද ජල හිඟයක්ද
ඇති වන්නේය. ඔවුහු එකිනෙකා දෙස
පුදුමයෙන් බලා සිටින අතර, තමන්
කළ වැරදි නිසා වැහැරී යන්නෝය.[4]

**5** “මනුෂ්‍ය පුත්‍රය, තියුණු කඩුවක්
ඔබේ අතට ගෙන කරණවෑමියෙ-
කුගේ දැළි පිහියක් ලෙස එය භාවිත
කරන්න. එයින් ඔබේ හිස බූ ගා ඔබේ
රැවුලද කපාගන්න.[5] ඉන්පසුව තරාදි-
යක් ගෙන කපන ලද කෙස් කිරා කො-
ටස්වලට වෙන් කරන්න. **2** වටලෑම
සඳහා නියම කර තිබූ දින ගණන නිම
වූ සැණින්[6] කොටස් තුනකට වෙන්
කළ කෙස්වලින් එක කොටසක් ගෙන
එය නුවර මැද ගින්නෙන් පුලුස්සා
දමන්න. ඉන්පසුව තවත් කොටසක්
ගෙන එය නුවර වටේට අල්ලමින්
එයට කඩුවෙන් පහර දෙන්න.[7] ඉතුරු
කොටස ගෙන අහසට විසි කරන්න.
එම කොටසට විරුද්ධවත් මම කඩු-
වක් ඔසවන්නෙමි.[8]
**3** “විසි කරන කෙස්වලින් ස්වල්ප
කොටසක් ඉතුරු කරගෙන ඔබේ වස්-
ත්‍රයේ ඔතාගන්න.[9] **4** එයින් තවත්
ස්වල්පයක් ගෙන ගින්න මැදට හෙළා
පිලිස්සිය යුතුයි. ඒ ගින්න මුළු ඊශ්‍රා-
යෙල් ජාතියටම විරුද්ධව ඇවිළෙ-
නවා ඇත.”[10]
**5** විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි මෙසේ පවසයි. “මේ
තිබෙන්නේ යෙරුසලම් නගරයයි.
විවිධ දේශවලින් වට වී සිටින සේ
මම ඇයව ජාතීන් මැද පිහිටෙව්වෙමි.
**6** නමුත් ඇය ක්‍රියා කළේ එම ජාතීන්-
ටත් වඩා දුෂ්ට ලෙසය.[1] ඇය මාගේ
අණපනත්වලට එකඟව ගමන් කළේ
නැත. ඇය මා තීන්දු කළ දේ ප්‍රතික්-
ෂේප කරමින් මට විරුද්ධව කැරලිගැ-
සුවාය.”[2]
**7** විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි මෙසේ පවසන්නේය.
“ඔබ හැසිරී ඇත්තේ අවට සිටින
සියලු ජාතීන්ටත් වඩා නොහික්මුණු
ආකාරයකිනි.[3] මාගේ අණපනත්ව-
ලට අනුව ඔබ ගමන් කළේ නැත.
මා තීන්දු කළ දේ පිළිගන්නවා වෙ-
නුවට[4] ඔබ අවට සිටින ජාතීන්ගේ
තීන්දුවලට එකඟව ක්‍රියා කළහුය.”[5]
**8** ඒ නිසා විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේ පවසන්නේය.
“නුවරේ වැසියෙනි! සියලු ජාතීන්ගේ
ඇස් පනාපිටම[6] මම ඔබට විරුද්ධව
තීන්දු කර ඇති දේ ක්‍රියාත්මක කරන්-
නෙමි.[7] **9** ඔබ කළ සියලුම පිළි-
කුල්සහගත දේවල් නිසා මම ඔබට
විරුද්ධව මහත් විපතක් ගෙනෙන්-
නෙමි. මා මීට පෙර කෙදිනකවත්
එවැනි දෙයක් සිදු කළේවත් මින් මත්-
තට එවැනි දෙයක් සිදු කරන්නේවත්
නැත.[8]
**10** “ඔබ අතරේ සිටින පියවරු තම
පුතුන්ව මරා කන්නෝය.[9] පුත්‍රයෝ
තම පියවරුන්ව මරා කන්නෝය.
මමද ඔබට විරුද්ධව මාගේ විනිශ්චය
ක්‍රියාත්මක කර ඔබෙන් ඉතුරු වන
අයව සතර දිග සුළඟට ගසාගෙන
යෑමට සලස්වන්නෙමි.”[10]
**11** විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේ පවසන්නේය.
“මා ජීවමාන දෙවිය. එබැවින් මා පව-
සන මේ දේ අනිවාර්යයෙන්ම සිදු
වන්නේය. ඔබේ සියලු පිළිකුල්ස-
හගත, නින්දිත ක්‍රියාවලින්[11] ඔබ
මාගේ ශුද්ධස්ථානය අපවිත්‍ර කළ
නිසා[12] මම ඔබව විනාශ කර දමන්-
නෙමි.[13] මට ඔබ ගැන කිසි අනුකම්-

**4 පරි.**
1 ලෙවී 26:26; ගීතා 105:16; යෙසා 3:1; එස 5:16
2 2රාජා 25:3; යෙරෙ 37:21; විලා 1:11; විලා 4:9; විලා 5:9; එළි 6:6
3 එස 12:18
4 ලෙවී 26:39; එස 24:23

**5 පරි.**
5 ලෙවී 21:5; එස 44:20
6 යෙරෙ 9:21; එස 4:8
7 යෙරෙ 15:2
8 ලෙවී 26:33; එස 12:14; ආමො 9:1
9 යෙරෙ 40:6; යෙරෙ 52:16
10 යෙරෙ 4:4

**2 තීරුව**
1 ද්වි 32:15; 2රාජා 17:8; එස 16:47
2 නෙහෙ 9:16; ගීතා 78:10; යෙරෙ 8:5; යෙරෙ 11:10
3 2රාජා 21:9; 2ලේක 33:9
4 යෙරෙ 44:23
5 2රාජා 21:11; යෙරෙ 2:11; එස 16:47
6 ද්වි 29:24; 1රාජා 9:8; විලා 2:15
7 යෙරෙ 21:5; එස 15:7
8 විලා 4:6; දානි 9:12; ආමො 3:2
9 ලෙවී 26:29; ද්වි 28:53; 2රාජා 6:29; යෙරෙ 19:9; විලා 2:20; විලා 4:10
10 ලෙවී 26:33; ද්වි 4:27; ද්වි 28:64; නෙහෙ 1:8; එස 12:14; එස 17:21
11 ද්වි 7:25; යෙරෙ 16:18; එස 23:38
12 ලෙවී 19:30; ලෙවී 20:3; 2රාජා 21:7; 2ලේක 36:14; යෙරෙ 32:34
13 ගීතා 107:39

එස **4:16*** ලෙවී 26:26හි පාදසටහන බලන්න.

පාවක්වත්[1] දුකක්වත් ඇති වන්නේ
නැත.[2] **12** ඔබෙන් තුනෙන් කොට-
සක් වසංගත නිසාත් සාගතය නිසාත්
මිය යන්නෝය.[3] ඔවුහු ඔබ ඉදිරියේම
මිය යන්නෝය.[4] තවත් කොටසක්
ඔබ ඉදිරිපිටම කඩුවෙන් මිය යන්-
නෝය. මම ඉතුරු කොටස සතර දිග
සුළඟ මගින් විසුරුවාහැර[5] ඔවුන්ට
විරුද්ධව කඩුවක්ද ඔසවන්නෙමි.[6]
**13** මෙසේ, මම මාගේ කෝපය පිට
කරන්නෙමි.[7] එවිට මාගේ උදහස පහ
වී ගොස්[8] මට සැනසීමක් ලැබෙනු
ඇත.[9] මා ඔබට විරුද්ධව මාගේ උද-
හස සම්පූර්ණයෙන්ම ප්‍රකාශ කරන
විට යෙහෝවා දෙවි වන මා එලෙස
ක්‍රියා කළේ ඇයි කියා ඔබ දැනගන්න-
හුය. මා වෙනත් දෙවිවරුන්ට කරන
නමස්කාරය ඇඩී සේ හෙළාදකින බව
ඔබ එවිට දැනගන්නහුය.[10]

**14** “මම ඔබව පාළු තැනක් බවට
පත් කරන්නෙමි. ඔබ අවට සිටින
සියලු ජාතීන් ඉදිරියේ ඔබව නින්-
දාවට පත් කරන්නෙමි. ඔබ අව-
ටින් ගමන් කරන සෑම කෙනෙක්ම
ඔබට සිදු වූ නින්දාව දකිනු ඇත.[11]
**15** මම ඔබට විරුද්ධව මාගේ උදහස
පිට කරමින් මාගේ විනිශ්චය ක්‍රියාත්-
මක කරන්නෙමි. ඔබට විරුද්ධව දැඩි
දඬුවම් පමුණුවන්නෙමි.[12] එවිට ඔබ
වටා සිටින ජාතීන් අතරේ ඔබ නින්-
දාවට පත් වී[13] ඔවුන්ගේ සරදමට ලක්
වනු ඇත.[14] ඔබට සිදු වූ දේ අවට
සිටින ජාතීන්ට අනතුරු ඇඟවීමක්
වනු ඇත.[15] ඔවුහු ඔබ දෙස බලා
තැතිගන්නෝය. මේ දේ පවසන්නේ
වෙන කිසිවෙකු නොව යෙහෝවා දෙවි
වන මමය.

**16** “මා ඔබව විනාශ කරන පිණිස
ඔබට විරුද්ධව සාගතයක් ගෙනෙන්-
නෙමි.[16] එම සාගතය දරුණු ඊතල
ප්‍රහාරයක් මෙන් වන්නේය.[17] මම ඒ
සාගතය තව තවත් වැඩි කරන අතර
ඔබේ ආහාර ගබඩාවන්* බිඳ දමන්-
නෙමි.[18] **17** මම සාගතයෙන් ඔබට

එස **5:16*** ලෙවී 26:26හි පාදසටහන බලන්න.

**5 පරි.**
**1** විලා 2:21; සෙක 11:6
**2** ද්වි 29:20; එස 7:4; එස 8:18
**3** යෙරෙ 14:12; එස 6:12
**4** යෙරෙ 15:2; යෙරෙ 21:9
**5** යෙරෙ 9:16
**6** ලෙවී 26:33; යෙරෙ 42:16; එස 12:14
**7** විලා 4:11
**8** එස 16:42
**9** ද්වි 32:36; යෙසා 1:24
**10** නික් 20:5; නික් 34:14; ද්වි 4:24; ද්වි 6:15; යොෂු 24:19; යෙසා 59:17; එස 39:25
**11** ලෙවී 26:31; ද්වි 28:37; 1රාජා 9:7; නෙහෙ 2:17
**12** එස 25:17
**13** ගීතා 79:4; යෙරෙ 24:9; විලා 2:15
**14** විලා 3:62
**15** 1කොරි 10:11
**16** එස 14:21
**17** ද්වි 32:23; ගීතා 7:13
**18** ලෙවී 26:26; එස 4:16; එස 14:13

**2 තීරුව**
**1** ලෙවී 26:22; ද්වි 32:24; 2රාජා 17:25; එස 14:21; එස 33:27
**2** එස 38:22
**3** එස 14:19
**4** එස 21:3

**6 පරි.**
**5** එස 36:1
**6** එස 20:46; එස 21:2; එස 33:28
**7** මීකා 6:2
**8** යෙරෙ 3:23; යෙරෙ 17:3
**9** ලෙවී 26:30
**10** යෙසා 27:9
**11** ලෙවී 26:30; 1රාජා 13:2; යෙරෙ 16:18; එස 8:10
**12** යෙරෙ 8:2
**13** යෙරෙ 9:19; යෙරෙ 32:29

පහර දෙන්නෙමි. දරුණු වනමෘගයන්
ඔබ අතරට එවන්නෙමි.[1] ඔබේ දරු-
වන් ඔබට අහිමි වෙයි. ඔබ වසං-
ගතයෙන්ද පීඩා විඳින්නහුය.[2] ඔබේ
දේශය පුරාම ලේ වැගිරීම් සිදු වනු
ඇත.[3] මම ඔබට විරුද්ධව කඩුවක්ද
ඔසවන්නෙමි.[4] මේ දේ පවසන්නේ
වෙන කිසිවෙකු නොව යෙහෝවා දෙවි
වන මමය.”

**6** යෙහෝවා දෙවි මට තවදුරටත්
මෙසේ පැවසුවේය. **2** “මනුෂ්‍ය
පුත්‍රය, ඔබ ඊශ්‍රායෙල් දේශයේ කඳු
දෙසට හැරී ඒවාට[5] විරුද්ධව අනා-
වැකි කියන්න.[6] **3** ඔබ මෙසේ පැව-
සිය යුතුයි. ‘ඊශ්‍රායෙල් දේශයේ කඳු
සියල්ලෙනි, විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි ඔබට පවසන මේ
වදන්වලට සවන් දෙන්න.[7] විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවි
කඳුවලටත් හෙල්වලටත්[8] දිය පහ-
රවලටත් නිම්නවලටත් පවසන්නේ
මෙයයි. “මම ඔබට විරුද්ධව කඩු-
වක් ගෙනෙන්නෙමි. මම ඔබේ පූජ-
නීය ස්ථාන අනිවාර්යයෙන්ම විනාශ
කර දමන්නෙමි.[9] **4** ඔබ සාදාගත්
පූජාසන විනාශ කරනු ලබන්-
නේය.[10] ඔබ සුවඳ දුම් ඔප්පු කරන
පූජාසනද කඩා බිඳ දමනු ලබන්-
නේය. ඔබේ සෙනඟ ඔබ සාදා-
ගත් පිළිකුල්සහගත රූප ඉදිරියෙහිම
මැරී වැටෙන්නෝය.[11] **5** මම ඊශ්‍රා-
යෙල්වරුන්ගේ මළ සිරුරු ඔවුන්-
ගේම පිළිකුල්සහගත රූප ඉදිරියෙහි
තබන්නෙමි. ඔවුන් සාදාගත් පූජා-
සන වටේට ඔවුන්ගේ ඇටකටු විසු-
රුවා දමන්නෙමි.[12] **6** ඔබගේ සෑම
නුවරකම[13] පාළුවට ගොස් විනාශ වී
යන අතර[14] එහි තිබූ පූජනීය ස්ථානද
නටබුන් ගොඩක් බවට පත් වන්-
නේය.[15] ඔබේ පූජාසන කඩා බිඳ දමනු
ලබන්නේය. ඔබේ පිළිකුල්සහගත
රූපද[16] සුවඳ දුම් ඔප්පු කරන පූජාස-
නද[17] විනාශ කරනු ලබන්නේය.[18] ඔබ

**14** යෙසා 32:14; යෙරෙ 2:15; මීකා 3:12; **15** යෙරෙ 17:3; එස 16:39; **16** මීකා 1:7; **17** යෙසා 17:8; **18** හොෂෙ 10:2.

සාදාගත් ඒ සෑම දෙයක්ම සුනුවිසුනු වී
යන්නේය. **7** ඔබේ ඇස් ඉදිරිපිටම
ඔබේ සෙනඟ මැරී වැටෙන්නෝය.[1]
එවිට මා යෙහෝවා දෙවි බව පිළි-
ගන්න ඔබට සිදු වෙනවා ඇත.*[2]

**8** "'"එහෙත් ඒ දේ සිදු වන විට
ඔබ අතර සිටින කුඩා පිරිසකට
බේරී ජීවත් වෙන්න මම ඉඩහරින්-
නෙමි. ඔවුහු කඩුවෙන් ගැලවී ජාතීන්
අතරටද විවිධ දේශයන් වෙතටද
විසිර යන්නෝය.[3] **9** ඒ විනාශයෙන්
බේරෙන අයව ජාතීන් අතරට වහලුන්
ලෙස ගෙන යන විට ඔවුහු සැබවින්ම
මාව සිහි කරනවා ඇත.[4] ඔවුන්ගේ
සිත් වේශ්‍යාකමට ලොල් වී තිබෙන
නිසාත් ඔවුන්ගේ දෑස් පිළිකුල්සහගත
රූප දෙසට යොමු වී ඇති නිසාත්[5] මම
දැඩි ශෝකයට පත්ව සිටිමි.[6] එලෙස
ඔවුන් මට ද්‍රෝහි වූ නිසා මා දැඩි ශෝ-
කයෙන් සිටින බව ඔවුහු තේරුම්ගන්-
නෝය. එවිට තමන් කළ සියලුම
දූෂිත දේවල් ගැන ඔවුන්ට මහත් පිළි-
කුලක් දැනෙයි.[7] **10** මා පවසන්නේ
නිකම්ම හිස් වචන නොවේ.[8] මා කියූ
සෑම විපතක්ම ඔවුන් පිටට පැමිණෙ-
නවා ඇත.[9] එවිට මා යෙහෝවා දෙවි
බව ඔවුන්ට පිළිගන්න සිදු වෙනවා
ඇත."'"

**11** විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේද පවසන්නේය.
"ඊශ්‍රායෙල් ජනතාවට විඳින්න සිදු
වන නපුරු, පිළිකුල්සහගත දේවල්
සියල්ල නිසා[10] ඔබේ අත්ලට ගසාග-
නිමින්ද[11] ඔබේ පය පොළොවට ගස-
මින්ද 'අහෝ' කියා විලාප නඟන්න.
මන්ද ඔවුහු කඩුවෙන්ද[12] සාගත-
යෙන්ද[13] වසංගතයෙන්ද පහර කනවා
ඇත.[14] **12** දුර ඈත සිටින අය[15]
වසංගතයෙන්ද ළඟපාත සිටින අය
කඩු පහරින්ද විනාශ වී යනු ඇත.
එවන් විපතකට හසු නොවී බේ-
රුණු අය සාගතයෙන් මිය යනු ඇත.
මමද ඔවුන්ට විරුද්ධව මාගේ උද-
හස සම්පූර්ණයෙන්ම ප්‍රකාශ කරන්-
නෙමි.[1] **13** මිය යන අයගේ මළ
සිරුරු සෑම තැනකම වැටී ඇති
අයුරු දක්නට ලැබෙනවා ඇත. ඒවා
ඔවුන්ගේ පිළිකුල්සහගත රූප අත-
රද[2] ඔවුන්ගේ පූජාසන වටාද[3] සියලුම
හෙල්[4] හා කඳු මුදුන් මතද[5] සරුසාරව
වැඩෙන සියලුම ගස් යටද[6] අතු විහිදී
ඇති සෑම විශාල ගසක් යටද[7] දක්-
නට ලැබේ. ඔවුහු තම පිළිකුල්සහ-
ගත රූප ඉදිරියේ ප්‍රසන්න සුවඳක්
නැඟෙන පිණිස ඒ සෑම තැනකම පූජා
ඔප්පු කළෝය.[8] ඒ දේ සිදු වන කල,
මා යෙහෝවා දෙවි බව පිළිගන්න ඔබ
සැමට සිදු වෙනවා ඇත.[9] **14** මම
ඔවුන්ට විරුද්ධව මාගේ අත ඔසවා[10]
දේශය පාළු බිමක් බවට පත් කරන්-
නෙමි. ඔවුන්ගේ සියලුම වාසස්ථානද
පාළු කරන්නෙමි. එය දිබ්ලා නම්
ස්ථානය දෙසට විහිදී තිබෙන පාළුක-
රයටත් වඩා අන්ත තත්වයකට පත්
වන්නේය. එවිට මා යෙහෝවා දෙවි
බව ඔවුන්ට පිළිගන්න සිදු වෙනවා
ඇත."

**7** යෙහෝවා දෙවි තවදුරටත් මට
මෙසේ පැවසීය. **2** "මනුෂ්‍ය
පුත්‍රය, මුළු විශ්වයටම අධිපති වූ යෙ-
හෝවා දෙවි වන මා ඊශ්‍රායෙල් දේශ-
යට විරුද්ධව පවසන්නේ මෙයයි. 'මුළු
දේශයේම අවසානය ළඟා වී තිබේ.[11]
**3** ඒ අවසානය දැන් අත ළඟටම
පැමිණ තිබේ.[12] ඔබට විරුද්ධව මාගේ
කෝපය ප්‍රකාශ කර, ඔබ කළ දේ-
වලට අනුව මම ඔබව විනිශ්චය
කරන්නෙමි.[13] ඔබ කළ සියලුම පිළි-
කුල්සහගත දේවල ප්‍රතිඵල විඳින්න
ඔබට සිදු වෙනවා ඇත. **4** මට ඔබ
ගැන කිසි දුකක්වත්[14] අනුකම්පාවක්-
වත් ඇති වන්නේ නැත. මන්ද ඔබ
කර තිබෙන දේවලට අනුව මේ සියලු
දඬුවම් ඔබ පිටට පැමිණිය යුතුමය.
ඔබ කළ පිළිකුල්සහගත දේවල ප්‍රති-
ඵල ඔබ අනිවාර්යයෙන්ම අද්දකින්න-
හුය.[15] එවිට මා යෙහෝවා දෙවි බව

එස **6:7*** මුල් වරට සඳහන් වන මේ යෙදුම මෙම පොතේ 60 වතාවකටත් වැඩියෙන් දක්නට ලැබේ. ඉන් අදහස් වන්නේ, මිහිපිට යෙහෝවා දෙවිගේ නාමය සියල්ලන් ඉදිරියේ මහිමයට පත් කරන බවයි.

**6 පරි.**
**1** යෙරෙ 14:18
**2** එස 7:4
**3** යෙරෙ 30:10, යෙරෙ 44:28, එස 14:22
**4** ද්වි 30:1, ගීතා 137:1, එස 12:16, සෙක 10:9
**5** ගණන් 15:39, එස 20:7
**6** ගීතා 78:40, යෙසා 7:13, යෙසා 63:10
**7** යෙසා 64:6, එස 20:43, එස 36:31
**8** යෙසා 46:10, යෙසා 55:11
**9** එස 14:23, එස 33:29, දානි 9:12, සෙක 1:6
**10** යෝවෙ 1:15
**11** එස 21:14
**12** යෙරෙ 15:2
**13** යෙරෙ 16:4
**14** යෙරෙ 24:10, එස 5:12
**15** දානි 9:7

**2 තීරුව**
**1** විලා 4:22, එස 5:13
**2** එස 6:4
**3** යෙරෙ 8:2
**4** ද්වි 12:2, යෙසා 65:7, යෙරෙ 2:20, එස 20:28
**5** යෙරෙ 3:6, හොෂෙ 4:13
**6** 1රාජා 14:23
**7** යෙසා 57:5
**8** යෙසා 65:3
**9** එස 12:15, එස 38:23
**10** යෙසා 5:25

**7 පරි.**
**11** ආමෝ 8:2
**12** එස 5:13
**13** ගණන් 32:23, යෙරෙ 40:3, එස 18:30, එස 33:20, රෝම 2:6
**14** යෙරෙ 13:14, එස 5:11, එස 8:18, එස 9:10, සෙක 11:6
**15** යෙරෙ 16:18, එස 11:21, එස 16:43

පිළිගන්න ඔබ සැමට සිදු වෙනවා
ඇත.’[1]
**5** “මුළු විශ්වයටම අධිපති වූ යෙ-
හෝවා දෙවි වන මම, ඔවුන්ට මෙ-
සේද පවසමි. ‘බලන්න, විපත්තියක්
පැමිණෙන්නේය! එය මෙතෙක් සිදු
නොවූ දරුණු විපතකි.[2] **6** ඔබේ අව-
සානය පැමිණෙනවා ඇත.[3] එය හදිස්-
සියේම ඔබ පිටට පැමිණෙන්නේය.
අනිවාර්යයෙන්ම එය පැමිණෙනවා
ඇත.[4] **7** දේශයේ වැසියෙනි, විපත්-
තිය නමැති මල් මාලය ඔබට පළඳ-
වනු ලැබේ. ඒ දවස අනිවාර්යයෙන්ම
පැමිණෙනවා ඇත. එය අත ළඟටම
පැමිණ තිබේ.[5] ඒ දවසේදී මහා ඝෝ-
ෂාවක් ඇසෙනු ඇත. එහෙත් එය කඳු-
වලින් නැඟෙන ප්‍රීති ඝෝෂාවක් නම්
නොවේ.
**8** “‘වැඩි කලක් යන්න මත්තෙන්
ඔබට විරුද්ධව මාගේ උදහස වගුරු-
වන්නෙමි.[6] මාගේ කෝපය සම්පූර්-
ණයෙන්ම ප්‍රකාශ කරන්නෙමි.[7] ඔබ
කළ දේවලට අනුව මා ඔබව විනිශ්-
චය කරන්නෙමි.[8] ඒ නිසා ඔබ කළ
සියලු පිළිකුල්සහගත ක්‍රියාවල ප්‍රති-
ඵල විඳින්න ඔබට සිදු වෙයි. **9** මට
ඔබ ගැන කිසි දුකක්වත්[9] අනුකම්පා-
වක්වත් ඇති වන්නේ නැත.[10] මන්ද
ඔබ කර තිබෙන දේවලට අනුව මේ
සියලු දඬුවම් ඔබ පිටට පැමිණිය යුතු-
මයි. ඔබ කළ පිළිකුල්සහගත දේවල
ප්‍රතිඵල ඔබ අනිවාර්යයෙන්ම අද්ද-
කින්නහුය.[11] එවිට ඔබට පහර දෙන්-
නේ යෙහෝවා දෙවි වන මා බව ඔබ
සැමට පිළිගන්න සිදු වෙනවා ඇත.[12]
**10** “‘ඒ දවස පැමිණෙන්නේය.[13]
මෙන්න, ඒ දවස! විපත්තිය නමැති
මල් මාලය ඔබට පැළඳවීමට කාලය
අත ළඟය.[14] අහංකාරකම වැජඹෙන
කාලය පැමිණ ඇත.[15] ඔබට දඬුවම්
කිරීමට වේවැල සූදානම් කර තිබේ.[16]
**11** දුෂ්ටකමට දඬුවම් කිරීම සඳහා
සැහැසියාව වේවැලක් සේ භාවිත
කරනු ඇත.[17] ධන සම්පත් තිබු-
ණත් කීර්තිය තිබුණත් ඒ දඬුවමෙන්
කිසිවෙකුට ගැලවිය නොහැක. කවුරු

**7 පරි.**
**1** එස 6:13
**2** 2රාජ 21:12 දානි 9:12
**3** යෙරෙ 44:27
**4** එස 21:25 එස 39:8
**5** එස 12:23 ශෙප 1:14
**6** 2ලේක 34:21 එස 36:18
**7** යෙරෙ 7:20
**8** යෝබ 34:11 එස 18:30 ගලා 6:7
**9** යෙරෙ 13:14
**10** යෙරෙ 15:5
**11** එස 11:21 එස 16:43
**12** යෙසා 66:6 එස 33:29
**13** ශෙප 1:14
**14** එස 7:7
**15** යෙරෙ 50:31
**16** යෙසා 10:5
**17** යෙසා 59:6 යෙරෙ 6:7 මීකා 6:12

**2 තීරුව**
**1** ශෙප 1:18
**2** යෙරෙ 4:5 යෙරෙ 6:1
**3** යෙරෙ 7:20 යෙරෙ 12:12
**4** ලෙවී 26:25
**5** ද්වි 32:25 යෙරෙ 21:9 යෙරෙ 27:13 විලා 1:20
**6** යෙරෙ 14:18 යෙරෙ 15:2 එස 5:12
**7** එස්රා 9:15 යෙසා 1:9 යෙසා 37:31 එස 6:8
**8** යෙසා 38:14 යෙසා 59:11 නාහු 2:7
**9** යෙසා 13:7 යෙරෙ 6:24
**10** එස 21:7
**11** යෙසා 3:24 යෙසා 15:3 යෙරෙ 48:37 ආමො 8:10
**12** ගීතා 55:5
**13** යෙසා 22:12
**14** යෙරෙ 3:25

කුමක් කළත් ඉන් ගැලවිය නොහැක.
**12** ඒ දවසත් ඒ කාලයත් පැමිණිය
යුතුමය. මිල දී ගත් තැනැත්තාට ප්‍රීති
වීමටවත්[1] විකුණූ තැනැත්තාට දුක්
වීමටවත් හේතුවක් නැත. මන්ද එහි
සියලු වැසියන්ට විරුද්ධව දෙවිගේ
උදහස එක හා සමානව ඇවිළ ඇත.
**13** විකුණූ තැනැත්තාට තමා විකුණූ
දේ දිවි ඇති තුරා නැවත ලැබෙන්නේ
නැත. මන්ද මේ දර්ශනයේ පණිවි-
ඩය මුළු සෙනඟටම අදාළ වන්නේය.
ඔවුන්ගෙන් කිසිවෙක්වත් ආපසු පැමි-
ණෙන්නේ නැත. තම දිවි ගලවාගැනී-
මට ඔවුන් යොදන කිසිම උපායක්
සාර්ථක නොවන්නේය.
**14** “‘ඔවුන් හොරණෑව පිඹ[2] සියලු-
දෙනාව යුද්ධයට සූදානම් කරගෙන
සිටියත් කිසිවෙක් යුද්ධයට යන්නේ
නැත. මන්ද ඔවුන් සියලුදෙනාටම
විරුද්ධව මාගේ උදහස ඇවිළ තිබේ.[3]
**15** නුවරින් පිටත සිටින අය කඩු-
වෙන්[4] පහර කන්නෝය. නුවර ඇතු-
ළෙහි සිටින අය සාගතයටත්
වසංගතයටත් ගොදුරු වන්නෝය.[5]
යමෙකු කෙතේ සිටියොත් ඔහු කඩු-
වෙන් මිය යනු ඇත. නුවර ඇතුළේ
සිටියොත් සාගතයටත් වසංගතයටත්
ගොදුරු වනු ඇත.[6] **16** ජීවිත ගල-
වාගෙන පලා යන සියල්ලන්[7] කඳුව-
ලට වී තමන් කළ වැරදි ගැන සිතමින්
තැනිතලාවල ගැවසෙන පරෙවියන්
මෙන් හඬනවා ඇත.[8] **17** ඔවුන්
සියලුදෙනාගේම දෑත් අප්‍රාණික
වන්නේය.[9] ඔවුන්ගේ දණහිස් තෙමී
යන්නේය.*[10] **18** ඔවුහු ගෝණි රෙදි
ඇඳගෙන[11] බියෙන් වෙවුලන්නෝය.[12]
ඔවුහු තමන්ගේ හිස බූ ගාගෙන[13]
ලැජ්ජාවෙන් මුහුණ පහත් කරගෙන
සිටින්නෝය.[14]
**19** “‘ඔවුහු තමන් සතු රිදී වීථි-
යට විසි කරන්නෝය. රත්තරන් පවා
ඔවුන්ට පිළිකුලක් වනු ඇත. යෙ-
හෝවා දෙවි තම උදහස ප්‍රකාශ කරන

එස **7:17*** දණහිස් තෙමී යන්නේ බිය වූ ඔවුන්ගෙන් මුත්‍රා පිට වන නිසාය.

දවසේදී ඔවුන්ට තමන් සතුව තිබෙන
රන් රිදීවලින් ගැලවීම ලබාගත නො-
හැක.[1] ඔවුන්ට එයින් කිසි තෘප්තියක්
ලැබෙන්නේ නැත. එයින් තමන්ගේ
කුස පුරවාගන්නවත් ඔවුන්ට නො-
ලැබෙයි. මන්ද ඔවුන් සතු ධන-
යම ඔවුන්ව වරදට හසු කර
ඔවුන්ගේ වැටීමට හේතු වී ඇත.[2]
**20** ඔවුහු තම විසිතුරු ආභරණ ගැන
මහත් ආඩම්බරයෙන් සිටින්නෝය.
ඔවුහු තමන් සතු රන් රිදීවලින්
පිළිකුල්සහගත රූප[3] හා වෙනත්
අපවිත්‍ර දේවල් සාදා ඇත.[4] මා ඒ
සියල්ල ඔවුන් ඉදිරියේ පිළිකුල් දේවල්
බවට පත් කරන්නේ ඒ නිසාය.[5]
**21** මම විදේශිකයන්ටද පොළොවේ
වෙසෙන දුෂ්ටයන්ටද ඔවුන්ගේ වටිනා
දේ කොල්ල කෑමට ඉඩහරින්නෙමි.[6]
කොල්ලකරුවෝ ඒ සියල්ල අපවිත්‍ර
කරන්නෝය.

**22** "'මම මාගේ මුහුණ ඔවුන්-
ගෙන් ඉවතට හරවාගන්නෙමි.[7] ඔවුහු
මාගේ ශුද්ධස්ථානය* කෙලෙසන්-
නෝය. කොල්ලකරුවෝ ඒ තුළට
කඩාවැද එය කෙලෙසනවා ඇත.[8]

**23** "'විලංගු සූදානම් කරගන්න.[9]
මන්ද අසාධාරණ විනිශ්චයන් නිසා
දේශය ලෙයින් තෙත් වී තිබේ.[10]
නුවරද සැහැසියාවෙන් පිරී ඇත.[11]
**24** මම ජාතීන් අතරේ සිටින දරු-
ණුම අයව කැඳවන්නෙමි.[12] ඔවුහු
ඇවිත් ජනයාගේ නිවෙස්වල පදිංචි
වන්නෝය.[13] අහංකාරකමින් ඉදිමී
සිටින බලවතුන්ව මම පහත් කරන්-
නෙමි.[14] ඔවුන්ගේ ශුද්ධස්ථානද කෙ-
ලෙසනු ලබනවා ඇත.[15] **25** ඔවුහු
මහත් සේ වේදනා විඳින්නෝය. ඔවුන්
සාමය පැතුවත් ඔවුන්ට එය ලැබෙන්-
නේ නැත.[16] **26** විපත්ති එක පිට
එක ඔවුන් පිටට පැමිණෙන්නේය.[17]
ඔවුන්ට කෙළවරක් නැතුව නරක
ආරංචි අසන්න ලැබේ. ජනයා අනා-
ගතවක්තෘවරයෙකුගෙන් දර්ශනයක්
ලබන්න උත්සාහ කළත් ඔවුන්ට
එයින් කිසි පලක් නොවෙයි.[1] පූජ-
කයන්ගෙන් නීතිය ගැන නිසි
අවබෝධයක් ලබාගන්නවත් වැඩි-
හිටියන්ගෙන් හොඳ උපදෙස් ලබා-
ගන්නවත් ඔවුන්ට නොහැකි වෙයි.[2]
**27** රජ පවා වැලපෙන්නේය.[3] අධි-
පතීන්ගේ බලාපොරොත්තු සුන් වී
යන්නේය.[4] දේශයේ වැසියන්ගේ දෑත්
වෙවුලන්නේය. ඔවුන්ගේ ක්‍රියාවලට
අනුව මම ඔවුන්ට ප්‍රතිඵල දෙන්-
නෙමි.[5] මම ඔවුන්ව විනිශ්චය කර
ඔවුන්ට ලැබිය යුතු දඬුවම ලබා
දෙන්නෙමි.[6] එවිට මා යෙහෝවා දෙවි
බව පිළිගන්න ඔවුන්ට සිදු වෙනවා
ඇත.'"[7]

**8** හයවන අවුරුද්දේ හයවන මාස-
යේ පස්වන දින, මා යූදාහි
වැඩිමහල්ලන් සමඟ මාගේ නිව-
සේ සිටියදී[8] විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවිගේ
බලය මා කෙරෙහි ක්‍රියාත්මක විය.[9]
**2** මම බැලූ විට මිනිසෙකුගේ පෙ-
නුම ඇති තැනැත්තෙකු සිටිනවා
දුටිමි. ගින්නකට සමාන දීප්තියක්[10]
ඔහුගේ ඉණෙන් පහළ කොටසෙන්
විහිදුණේය.[11] ඔහුගේ ඉණට ඉහළින්
රන් රිදී මිශ්‍ර ලෝහයක තිබෙන
කාන්තියට සමාන දීප්තියක් විහිදී
ගියේය.[12] **3** ඔහු අතක් වැනි වූ දෙ-
යක්[13] දිගු කොට මගේ හිසකෙස්වලින්
මාව අල්ලාගත්තේය. පසුව දෙවි-
ගෙන් ලැබුණු එම දර්ශනයේදී යම්
බලයක්*[14] මාව අහසත් පොළොවත්
මැද්දෙන් උසුලාගෙන යෙරුසලමට
ගෙන ගියේය.[15] මාව ගෙන ගියේ දේව-
මාලිගාවේ උතුරු දෙසින් පිහිටා ඇති
අභ්‍යන්තර දොරටුවට පිවිසෙන ස්ථා-
නයටයි.[16] දෙවිව උදහසට පත් කර-
වන රූපයක් එහි පිහිටා තිබුණේය.[17]
**4** මම තැනිතලාවේ දුටු ලෙසම ඒ

**7 පරි.**
**1** හිතෝ 11:4; ශෙප 1:18
**2** එස 14:3; එස 44:12
**3** 2රාජා 17:12; 2රාජා 21:7; එස 6:4
**4** යෙරෙ 7:30; යෙරෙ 32:34
**5** ද්වි 27:15; යෙරෙ 7:14; විලා 1:17; හොෂෙ 9:10
**6** 2ලේක 36:19
**7** යෙරෙ 18:17
**8** ද්වි 28:29; 2ලේක 36:19; විලා 1:10
**9** යෙරෙ 27:2; යෙරෙ 39:7; යෙරෙ 40:1; විලා 3:7; නාහු 3:10
**10** 2රාජා 21:16; 2රාජා 24:4; යෙරෙ 2:34; යෙරෙ 22:17; එස 9:9; එස 11:6; හොෂෙ 4:2
**11** යෙසා 59:6; මීකා 2:2
**12** ද්වි 28:50; එස 21:31; හබ 1:6
**13** යෙරෙ 6:12; විලා 5:2
**14** යෙසා 5:14
**15** එස 21:2
**16** යෙසා 57:21; යෙරෙ 8:15
**17** ලෙවී 26:28; ද්වි 32:23; යෙරෙ 4:20

**2 තීරුව**
**1** යෙරෙ 21:2; යෙරෙ 37:17
**2** 1රාජා 21:11; ගීතා 74:9; යෙරෙ 18:18; විලා 2:9; එස 20:3
**3** යෙරෙ 52:10
**4** එස 19:1
**5** යෝබ් 34:11; රෝම 2:6
**6** යෙසා 3:11; මතෙ 7:2; යාකො 2:13
**7** එස 6:13

**8 පරි.**
**8** එස 14:1; එස 20:1
**9** එස 1:3; එස 3:22
**10** එස 1:27
**11** දානි 7:9

**12** එස 1:4; එස 1:27; **13** එස 2:9; දානි 5:5; **14** එස 3:14; හෙබ්‍රෙ 1:7; **15** එස 40:2; **16** යෙරෙ 20:2; එස 9:2; **17** නික් 20:5; ද්වි 32:16; යොෂු 24:19; ගීතා 78:58.

එස **7:22*** හෝ, "රහස් ස්ථානය."

එස **8:3*** එස 3:12හි පාදසටහන බලන්න.

අවස්ථාවේද ඊශ්‍රායෙල්හි දෙවිගේ තේ-
ජස දුටුවෙමි.[1]
**5** ඉන්පසුව ඔහු මට මෙසේ පැවසු-
වේය. “මනුෂ්‍ය පුත්‍රය, උතුර දෙස
බලන්න.” මමද ඒ දෙස බැලුවෙමි.
එවිට පූජාසනයට පිවිසෙන ඒ දොරටු-
වට උතුරින් ඇතුල් වන ස්ථානයෙ-
හිම දෙවිව උදහසට පත් කරවන ඒ
රූපය[2] මම දුටුවෙමි. **6** ඔහු මට මෙ-
සේද පැවසීය. “මනුෂ්‍ය පුත්‍රය, ඔවුන්
කරන ඉතා පිළිකුල්සහගත දේවල්
ඔබට පෙනෙනවාද?[3] මාගේ ශුද්ධස්-
ථානයෙන් මාව ඈත් කරන පිණිස
ඊශ්‍රායෙල් ජනයා කරන මේ දේවල්
ඔබ දුටුවාද?[4] ඔවුන් කරන තවත්
පිළිකුල්සහගත දේවල්ද ඔබ දකිනු
ඇත.”
**7** එහෙයින් ඔහු මාව දේවමාලිගා-
වේ මළුවට ඇතුල් වන ස්ථානය අස-
ලට ගෙනාවේය. මම ඒ දෙස බැලූ
විට එහි තාප්පයේ සිදුරක් තිබෙ-
නවා දුටුවෙමි. **8** ඊළඟට ඔහු මට
මෙසේ පැවසීය. “මනුෂ්‍ය පුත්‍රය, ඒ
සිදුර තවත් විශාල කරන්න.”[5] මා
තාප්පයේ තිබූ ඒ සිදුර තවත් විශාල
කළ විට දොරටුවක් දක්නට ලැබිණ.
**9** ඔහු මට තවදුරටත් මෙසේ පැව-
සීය. “ඇතුළට ගොස් ඔවුන් කරන
දුෂ්ට, පිළිකුල්සහගත දේවල් දෙස
බලන්න.”[6] **10** මම ඇතුල් වී බැලූ
විට, බඩ ගා යන සතුන්ගේද පිළිකුල්-
සහගත තිරිසනුන්ගේද[7] ඊශ්‍රායෙල්ව-
රුන් වැඳුම්පිදුම් කළ පිළිකුල්සහගත
දෙවිවරුන්ගේද[8] රූප බිත්තිය වටේ-
ටම කැටයම් කර තිබූ ආකාරය
දුටුවෙමි.[9] **11** ෂාපාන්ගේ[10] පුත්‍ර වූ
යයෂනියා ඇතුළු ඊශ්‍රායෙල් ජනයා-
ගේ වැඩිමහල්ලන්ගෙන් හැත්තෑදෙ-
නෙක්[11] සුවඳ දුම් ඔප්පු කරන භාජන
අතැතිව ඒ රූප ඉදිරියේ සිටගෙන
සිටියෝය. එම භාජනවල තිබූ ද්‍රව්‍ය-
වල සුවඳ සෑම තැනටම විහිදුණේය.[12]
**12** එවිට ඔහු මට මේ දේ පැවසුවේය.
“මනුෂ්‍ය පුත්‍රය, ඊශ්‍රායෙල් ජනයා-
ගේ වැඩිමහල්ලන් ඇතුල් කාමරව-
ලට ගොස් තම තමන්ගේ කැටයම්
රූප ඉදිරියේ කරන දේවල් ඔබ දුටු-
වාද? ‘යෙහෝවා දෙවිට අපව පේන්-
නේ නැහැ.[1] යෙහෝවා දෙවි දේශය
අත්හැර ගිහින්’ යයි කියමින් ඔවුන්
අඳුරේ කරන දේවල් ඔබට පෙනෙන-
වාද?”[2]
**13** ඔහු මට මෙසේද පැවසීය.
“ඔවුන් තවත් පිළිකුල්සහගත දේවල්
කරන බව ඔබට දකින්න ලැබෙයි.”[3]
**14** පසුව යෙහෝවා දෙවිගේ ගෘහයේ
උතුරු දෙසින් පිහිටා ඇති දොර-
ටුව අසලට මාව ගෙන යන ලදි.
එහි ස්ත්‍රීන් තම්මුස් නම් දෙවියා ගැන
වැලපෙමින් සිටි ආකාරය මම දුටු-
වෙමි.
**15** ඔහු මට මෙසේ පැවසීය.
“මනුෂ්‍ය පුත්‍රය, ඔබ මේ දේවල් දුටු-
වාද? මීටත් වඩා දරුණු, පිළිකුල්ස-
හගත දේවල් ඔබ දකිනවා ඇත.”[4]
**16** ඊළඟට යෙහෝවා දෙවිගේ ගෘහ-
යේ අභ්‍යන්තර මළුවට[5] මාව ගෙන
ගියේය. යෙහෝවා දෙවිගේ මාලි-
ගාවට පිවිසෙන ස්ථානයෙහිම ශුද්-
ධස්ථානයට ඇතුල් වන ශාලාව හා
පූජාසනය[6] අතර පුරුෂයෝ විසිපස්-
දෙනෙක් සිටියෝය.[7] යෙහෝවා දෙවි-
ගේ මාලිගාවට පිටුපස හරවාගෙන
සිටි ඔවුහු[8] නැඟෙනහිර දෙසට හැරී
හිරුට වන්දනාමාන කරමින් සිටි-
යෝය.[9]
**17** ඔහු මට මෙසේද පැවසීය.
“මනුෂ්‍ය පුත්‍රය, ඔබ මේ දේවල් දුටු-
වාද? යූදාහි වැසියන් මෙහි කරන පිළි-
කුල්සහගත දේවල් සැහැල්ලුවට ගත
හැකිද? ඔවුන් මුළු දේශයම සැහැසියා-
වෙන් පුරවා තිබේ.[10] ඔවුහු මාගේ
මුහුණ ඉදිරියෙහිම අශික්ෂිත දේ*
තබමින් නැවත නැවතත් මාව උද-
හස් කරති. **18** ඒ නිසා මම මහත්
කෝපයකින් ඔවුන්ට විරුද්ධව ක්‍රියා
කරන්නෙමි.[11] මට ඔවුන් ගැන කිසි
දුකක්වත් අනුකම්පාවක්වත් ඇති

**8 පරි.**
1 නික් 40:34, එස 1:28
2 එස 7:20
3 2ලේක 36:14
4 ගීතා 78:60, යෙරෙ 26:6
5 යෙරෙ 23:24, හෙබ්‍රෙ 4:13
6 යෙරෙ 7:10
7 ලෙවී 11:10, ක්‍රියා 10:12, රෝම 1:23
8 2රාජා 23:24
9 නික් 20:4, ද්වි 4:18
10 2රාජා 22:3, 2රාජා 25:22, 2ලේක 34:8, යෙරෙ 26:24
11 නික් 24:1, ගණන් 11:16
12 2ලේක 26:16, යෙරෙ 7:9, එස 16:18

**2 තීරුව**
1 ගීතා 73:11, ගීතා 94:7, යෙසා 29:15, එස 9:9
2 යෝබ් 24:16, යොහ 3:19
3 යෙරෙ 9:3
4 2ලේක 36:14
5 2ලේක 4:9
6 යෝවෙ 2:17
7 එස 11:1
8 1රාජා 8:29, යෙරෙ 2:27, යෙරෙ 32:33
9 ද්වි 4:19, ද්වි 17:3, 2රාජා 17:16, 2රාජා 23:5, යෝබ් 31:26, යෙරෙ 8:2, යෙරෙ 44:17
10 උත් 6:13, 2රාජා 21:16, යෙරෙ 19:4, එස 9:9, ශෙප 1:9
11 එස 5:13

එස **8:17*** මූ.අ., “රිකිල්ලක් හෝ අත්තක්.” මෙම සංකේතය රූප වන්දනාවේදී භාවිත කරන්න ඇත.

වන්නේ නැත.[1] ඔවුන් මහත් හඬින්
මට මොරගැසුවද මම ඔවුන්ට සවන්
නොදෙන්නෙමි.”[2]

9 “නුවර විනාශ කිරීමට පත්
කර ඇති සියල්ලන්ට තමන්-
ගේ ආයුධ රැගෙන මෙතැනට එන්න
කියන්න” යයි දෙවි මහත් හඬකින්
පවසනවා මට ඇසුණේය.
2 එවිට උතුරු දෙසින් පිහිටා ඇති
ඉහළ දොරටුවෙන්[3] පුරුෂයන් හය-
දෙනෙකු පැමිණෙනවා මම දුටුවෙමි.
මහත් විනාශයක් ඇති කළ හැකි
ආයුධ ඔවුන් අත තිබිණ. සිහින්
ලිනන් රෙද්දෙන් මැසූ වස්ත්‍රයක් ඇඳ-
ගෙන සිටි[4] පුරුෂයෙක් ඔවුන් සමඟ
සිටි අතර ලේකම්වරයෙකු භාවිත
කරන තීන්ත කූඩුවක් ඔහු තම ඉණේ
බැඳගෙන සිටියේය. ඔවුහු සියලුදෙ-
නාම තඹ පූජාසනය අසලට පැමිණ
සිටගත්තෝය.[5]
3 මීට පෙරාතුව කෙරුබ්වරුන්ට*[6]
ඉහළින් දක්නට තිබුණු ඊශ්‍රායෙල්හි
දෙවිගේ තේජස[7] ශුද්ධස්ථානයට
පිවිසෙන ස්ථානයෙහි[8] බැබළෙන්න
පටන්ගත්තේය. සිහින් ලිනන් වස්ත්‍ර-
යක් ඇඳ,[9] ලේකම්වරයෙකු භාවිත
කරන තීන්ත කූඩුවක් ඉණේ බැඳ-
ගෙන සිටි පුරුෂයාට දෙවි කතා
කළේය. 4 යෙහෝවා දෙවි ඔහුට
මෙසේ පැවසීය. “යෙරුසලම් නුවර
මැදින් ගොස් එහි සිදු වන සිය-
ලුම පිළිකුල්සහගත දේවල් ගැන[10]
දුක් වෙමින් සුසුම්ලන[11] මිනිසුන්ගේ
නළල්වල ලකුණක් දමන්න.”
5 දෙවි අනික් අයට මෙසේ පවස-
නවා මට ඇසුණේය. “ඔහු පසුපස
යන්න. ඔහු තම කාර්යය නිම කළ
පසු නුවරේ වැසියන්ට පහර දෙන්න.
ඒ ගැන දුක් නොවන්න. ඔවුන්ට
කිසි අනුකම්පාවක් නොපෙන්වන්න.[12]
6 ඔබ මහල්ලන්ද තරුණයන්ද
කන්‍යාවන්ද කුඩා දරුවන්ද ස්ත්‍රීන්ද[13]
යන සියලුදෙනාවම මරා දැමිය යුතුයි.
කිසිවෙකුව ඉතුරු නොකරන්න.
එහෙත් යමෙකුගේ නළල මත ලකු-
ණක් ඇත්නම් ඔහු ළඟට නොයන්න.[1]
ඔබේ කාර්යය මාගේ ශුද්ධස්ථානයේ
සිටම ආරම්භ කළ යුතුය.”[2] එහෙ-
යින් ඔවුහු දෙවිගේ ගෘහය ඉදිරියේ
සිටි වැඩිමහල්ලන්ගෙන්[3] තම කාර්-
යය ආරම්භ කළෝය. 7 ඔහු ඔවුන්ට
මෙසේද පැවසීය. “යන්න! ගොස් මාගේ
ගෘහය කෙලෙසන්න. මළ සිරුරුවලින්
එම ගෘහයේ මළු පුරවන්න.”[4] එවිට
ඔවුහු ගොස් නුවරේ සිටි සෙනඟට
පහර දුන්නෝය.
8 ඔවුන් පහර දෙන විට ඉන් බේරු-
ණේ මා පමණයි. මම මුණින් වැටී[5]
මෙසේ මොරගැසුවෙමි. “අනේ,[6] විශ්ව-
යේ පාලකයාණන් වන යෙහෝවා දෙ-
වියනි! යෙරුසලම පිට ඔබේ උදහස
වගුරුවා මුළු ඊශ්‍රායෙල් ජාතිය අතරින්
ඉතුරුව සිටි මේ අයවත් ඔබ විනාශ
කර දමනවාද?”[7]
9 එවිට ඔහු මට මෙසේ පැවසීය.
“ඊශ්‍රායෙල් සහ යූදා වැසියන් කර
ඇති වැරදි[8] අතිමහත්ය.[9] දේශය ලේ-
යින් නැහැවී ඇත.[10] නුවරද වංචා-
වෙන් පිරී තිබේ.[11] මන්ද, ‘යෙහෝවා
දෙවි දේශය අත්හැර ගිහින්.[12] යෙ-
හෝවා දෙවිට අපව පේන්නේ නැහැ’[13]
කියා ඔවුහු පවසුවෝය. 10 ඔවුන්
ගැන කිසි දුකක්වත්[14] අනුකම්පාවක්-
වත් මට ඇති වන්නේ නැත.[15] ඔවුන්
කළ දේවල ප්‍රතිඵල මම ඔවුන් පිටටම
ගෙනෙන්නෙමි.”[16]
11 එවිට සිහින් ලිනන් වස්ත්‍රයක්
ඇඳ, තීන්ත කූඩුවක් ඉණේ බැඳගෙන
සිටි පුරුෂයා නැවත පැමිණ මෙසේ
පැවසීය. “ඔබ අණ කළ ලෙසම මම
කළෙමි.”[17]

10 මම බැලූ විට කෙරුබ්වරුන්-
ගේ හිසට උඩින් පිහිටා තිබූ
වේදිකාවට[18] ඉහළින් නිල් මැණික-
කට සමාන යමක් තිබෙනවා

---

එස 9:3* ‘කෙරුබ්වරුන්’ යන වචනය මෙම පොතේ මුල් වරට සඳහන් වන්නේ මෙතැනය. එස 1:22-28ද බලන්න.

**8 පරි.**
1 එස 5:11; එස 7:9; එස 9:10
2 හිතෝ 1:28; යෙසා 1:15; යෙරෙ 11:11; යෙරෙ 14:12; මීකා 3:4; සෙක 7:13

**9 පරි.**
3 යෙරෙ 20:2; එස 8:3
4 ලෙවී 16:4
5 2ලේක 4:1; 2ලේක 7:7
6 උත් 3:24
7 එස 3:23; එස 8:4; එස 11:22
8 එස 10:4
9 එළි 19:8
10 එස 5:11; එස 8:6
11 ගීතා 119:53; ගීතා 119:136; 2කොරි 12:21; 2පේතෘ 2:8
12 නික් 32:27; එස 7:4
13 2ලේක 36:17

**2 තීරුව**
1 නික් 12:23; යොෂු 2:18; එළි 9:4
2 2රාජා 25:18; යෙරෙ 25:29; 1පේතෘ 4:17
3 එස 8:11
4 2ලේක 36:17; විලා 2:21
5 ගණන් 14:5; ගණන් 16:45
6 යෙරෙ 4:10; එස 11:13
7 උත් 18:23
8 යෙරෙ 11:10
9 ද්වි 31:29; 2රාජා 17:7; 2ලේක 36:14; යෙසා 1:4
10 2රාජා 21:16; යෙරෙ 2:34; එස 24:9; මතෙ 23:30
11 එස 22:29
12 එස 8:12
13 ගීතා 10:11; යෙසා 29:15
14 එස 7:4; එස 8:18
15 එස 5:11
16 ද්වි 32:41; 2ලේක 6:23; එස 11:21; හෙබ්‍රෙ 10:30
17 උත් 6:22; නික් 39:32;

**10 පරි.** 18 එස 1:22.

දුටිමි.[1] එය සිංහාසනයකට සමාන
විය.[2] **2** දෙවි සිහින් ලිනන් වස්ත්‍ර-
යක් ඇඳගෙන සිටි පුරුෂයාට මෙසේ
පැවසුවේය.[3] “කෙරුබ්වරුන්ට යටින්
කරකැවෙන රෝද[4] අතරට ගොස්
ඔවුන් අතරේ දැල්වෙමින් තිබෙන
ගින්නෙන් ගිනි අඟුරු[5] ඔබේ දෑතට
ගන්න. ඒවා නුවර පුරා විසුරුවන්න.”[6]
මා බලා සිටියදීම ඔහු ඔවුන් අතරට
ගියේය.

**3** ඔහු කෙරුබ්වරුන් අතරට යන
විට ඔවුන් සිටගෙන සිටියේ දේවමාලි-
ගාවේ උතුරු පැත්තට වෙන්නය. ඒ
අවස්ථාවේදී, අභ්‍යන්තර මළුව වලා-
කුළකින් වැසී ගියේය.[7] **4** කෙරුබ්-
වරුන් සිටි ස්ථානයේ දක්නට තිබුණු
යෙහෝවා දෙවිගේ තේජස[8] ඉහ-
ළට නැඟ ශුද්ධස්ථානයට පිවිසෙන
ස්ථානය වෙතට පැමිණියේය. පසුව
මුළු දේවමාලිගාවම වලාකුළෙන් වැසී
ගියේය.[9] එහි මළුව පුරාම යෙහෝවා
දෙවිගේ තේජසද දීප්තියෙන් බැබ-
ළුණේය. **5** කෙරුබ්වරුන්ගේ පියා-
පත්වල හඬ[10] පිටත මළුවට පවා
ඇසුණේය. ඒ ශබ්දය සියලු බලැති
දෙවිගේ හඬට සමානය.[11]

**6** “කරකැවෙන රෝද අසල සිටින
කෙරුබ්වරුන් අතරට ගොස් ගිනි
අඟුරු අතට ගන්න” කියා සිහින්
ලිනන් වස්ත්‍රයක් ඇඳගෙන සිටි පුරු-
ෂයාට අණ කළ විට, ඔහු ඔවුන්
අතරට ගොස් රෝදයක් අසල සිට-
ගත්තේය. **7** එවිට එක් කෙරුබ්-
වරයෙක් ඔවුන් අතරේ තිබෙන[12]
ගින්නෙන් ගිනි අඟුරු ගෙන[13] ඒ පුරු-
ෂයාගේ දෑත්වලටම දුන්නේය.[14] ඔහු
ඒ ගිනි අඟුරු ගෙන පිටතට ගියේය.
**8** සෑම කෙරුබ්වරයෙකුගේම පියාපත්
යට මිනිසෙකුගේ අත්වලට සමාන
අත් තිබිණ.[15]

**9** මම බැලූ විට කෙරුබ්වරුන් අස-
ළම රෝද හතරක් තිබෙනවා
දුටිමි. සෑම කෙරුබ්වරයෙකු අසලම
රෝදයක් බැගින් තිබිණ.[16] ඒ රෝද-
වලින් ක්‍රිසොලයිට් මැණිකක කාන්ති-
යට සමාන දීප්තියක් නික්මුණේය.
**10** එම රෝද හතරම එක හා සමා-
නය. ඒ එක් එක් රෝදය හරහට
ඒ හා සමාන තවත් රෝදයක් සවි
කර තිබිණ.[1] **11** එම රෝද එලෙස
පිහිටා තිබුණු නිසා ඕනෑම දිශාව-
කට පහසුවෙන් ගමන් කිරීමට ඒවාට
හැකියාව තිබිණ. ඒවා ගමන් කරද්දී
වෙනත් දිශාවකට නොහැරී නියමිත
දිශාවටම ගමන් කළේය. කෙරුබ්ව-
රුන්ගේ අවධානය* යොමු වූ දිශාව-
ටම ඒවා ගමන් කළ නිසා වෙනත්
දිශාවකට නොහැරී නියමිත දිශාවටම
ගමන් කළේය.[2] **12** කෙරුබ්වරුන්-
ගේ ශරීර පුරාම එනම්, ඔවුන්ගේ පිට-
වල්වලද අත්වලද පියාපත්වලද ඇස්
පිහිටා තිබිණ.[3] රෝදද ඇස්වලින් පිරී
තිබිණ. ඔවුන් හතරදෙනා අසලම
රෝදය බැගින් තිබිණ. **13** “ඉදිරියට
ගමන් කරනු” කියා කරකැවෙන රෝද
හතරට අණ කරන හඬක් මට ඇසිණ.

**14** ඔවුන් එක් එක් කෙනාට මුහුණු
හතර බැගින් තිබිණ.[4] පළමුවන
මුහුණ කෙරුබ්වරයෙකුගේ මුහුණක්ය.
දෙවන මුහුණ මිනිසෙකුගේය.[5] තුන්-
වන මුහුණ සිංහයෙකුගේය. හතරවන
මුහුණ රාජාලියෙකුගේය.[6]

**15** එම කෙරුබ්වරු කේබාර් ගඟ[7]
අසලදී මා දුටු ජීවීන්මය. ඔවුහු ඉහ-
ළට නැග්ගෝය.[8] **16** කෙරුබ්වරුන්
යන යන තැනට රෝදද ගියේය.[9]
ඔවුන් තම පියාපත් විහිදුවා පොළො-
වේ සිට ඉහළට නැඟුණු විටත් රෝදද
වෙනත් දිශාවකට නොගොස් ඔවුන්
සමඟම ගියේය.[10] **17** කෙරුබ්වරුන්
නතර වූ විට රෝදද නතර විය.
ඔවුන් ඉහළට පියාසර කළ විට රෝදද
ඔවුන් සමඟ ඉහළට ගමන් කළේය.[11]
එසේවූයේ දෙවිගේ බලය ජීවීන් තුළ
පමණක් නොව එම රෝද තුළත්
ක්‍රියාත්මක වූ නිසාය.[12]

**18** ශුද්ධස්ථානය ආසන්නයේ දක්-
නට තිබූ යෙහෝවා දෙවිගේ
තේජස[13] එතැනින් ඉවත් වී කෙ-
රුබ්වරුන්ට ඉහළින් බැබළෙන්න

**10 පරි.**
1 එස 1:26; එළි 4:3
2 යෙසා 6:1; එළි 4:2
3 එස 9:2
4 එස 1:16
5 එස 1:13
6 2රාජා 25:9; ගීතා 120:4; ගීතා 140:10; එළි 8:5
7 එස 9:3
8 එස 1:28
9 නික් 40:35; 1රාජා 8:10; 2ලේක 5:13; එස 43:5
10 එස 1:24; එස 11:22
11 ගීතා 29:3; යොහ 12:28; යොහ 12:29
12 එස 1:13
13 විලා 2:4; විලා 4:11
14 එස 9:2
15 එස 1:8
16 එස 1:15

**2 තීරුව**
1 එස 1:16
2 එස 1:17; එස 1:20
3 එස 1:18; එළි 4:6; එළි 4:8
4 එස 1:6
5 එස 1:10; එළි 4:7
6 එළි 8:13
7 එස 1:3; එස 43:3
8 එස 11:22
9 එස 1:19
10 එස 1:21
11 එස 1:20
12 යෝබ් 27:3
13 1රාජා 8:11; 2ලේක 7:3; එස 1:28; එස 9:3

එස **10:11*** මු.අ., “හිස.”

පටන්ගත්තේය.[1] **19** මා බලා සිටිය-
දීම කෙරුබ්වරු තම පියාපත් ඉහ-
ළට විහිදුවා පොළොවේ සිට නැඟී
ගියෝය.[2] ඔවුන් එසේ ඉහළට නැඟුණු
විට රෝදද ඔවුන් සමඟම ගමන්
කළේය. ඉන්පසු ඔවුහු යෙහෝවා දෙ-
විගේ ගෘහයේ නැඟෙනහිර දෙසින්
පිහිටි දොරටුව අසලට ගොස් සිටගත්-
තෝය. ඊශ්‍රායෙල්හි දෙවිගේ තේජස
ඔවුන්ට ඉහළින් බැබළුණේය.

**20** කේබාර් ගඟ අසල[3] මා දුටු දර්-
ශනයේදී ඊශ්‍රායෙල්හි දෙවිගේ සිංහා-
සනයට පහළින් සිටියේද එම
ජීවීන්මය.[4] ඔවුන් කෙරුබ්වරුන් බව
මම තේරුම්ගත්තෙමි. **21** ඔවුන්
එක් එක් කෙනාට මුහුණු හතරක්[5]
හා පියාපත් හතරක් බැගින් තිබිණ.
ඔවුන්ගේ පියාපත් යට මිනිසෙකු-
ගේ අත්වලට සමාන අත්ද දුටිමි.
**22** ඔවුන්ගේ මුහුණුවල පෙනුමද කේ-
බාර් ගඟ අසලදී මා දුටු ජීවීන්ගේ
මුහුණුවල පෙනුමට සමානය.[6] ඔවුහු
වෙනත් දිශාවකට නොහැරී ඉදිරියටම
ගමන් කළෝය.[7]

**11** එවිට යම් බලයක්*[8] මාව
උසුලාගෙන[9] යෙහෝවා දෙ-
විගේ ගෘහයේ නැඟෙනහිර දෙසින්
පිහිටි දොරටුව අසලට ගෙන යන
ලදි.[10] ඒ දොරටුව ඉදිරියෙහි පුරුෂයෝ
විසිපස්දෙනෙක් සිටියෝය.[11] අස්සූර්-
ගේ පුත් යයෂනියාද බෙනායාගේ
පුත් පෙලතියාද ඔවුන් අතර සිටිනවා
දුටිමි. ඔවුහු අධිපතීන් ලෙස කට-
යුතු කරමින් සිටියෝය.[12] **2** එවිට
දෙවි මට මෙසේ පැවසීය. "මනුෂ්‍ය
පුත්‍රය, මෙම නුවරට විරුද්ධව කුමන්-
ත්‍රණය කරමින් ජනතාවට වැරදි මඟ
පෙන්වීම් ලබා දෙන්නේ[13] මේ පුරුෂ-
යන්ය. **3** ඔවුහු මෙසේ පවසති. 'මේ
නුවර කල්දේරමක්[14] මෙනි. අප ඒ තුළ
සුරක්ෂිතව තිබෙන මස් හා සමානය.
අප දැන් එහි ගෙවල් ගොඩනඟන්නත්
සැලසුම් කර තිබෙනවා නොවේද?'[15]

**4** "එබැවින් මනුෂ්‍ය පුත්‍රය, ඔවුන්ට
විරුද්ධව අනාවැකි කියන්න."[1]

**5** එවිට යෙහෝවා දෙවිගේ බලය
මා තුළ ක්‍රියාත්මක වී[2] දෙවි මට
මෙසේ පැවසුවේය. "ජනයාට මෙසේ
දන්වන්න. 'යෙහෝවා දෙවි ඔබට
මෙසේ කියයි.[3] "ඊශ්‍රායෙල් ජනයෙනි,
ඔබ කියන දේ හරිය. ඔබ සිතන්නේ
කුමක්ද කියාත් මම දනිමි.[4] **6** ඔබ
මේ නුවරේ බොහෝදෙනෙකුව ඝාත-
නය කර ඇත. ඔවුන්ගේ මළ සිරුරු-
වලින් ඔබ එහි වීථි පුරවා ඇත." ' "[5]
**7** "එබැවින් විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි ඔබට මෙසේ
පවසන්නේය. 'මේ නුවර කල්දේර-
මක්[6] බව සැබෑය. එහි ඇති මස් නම්
නුවර පුරාම ඔබ මරා දැමූ වැසියන්ගේ
මළ සිරුරුය.[7] එහෙත් ඔබව නුවරෙන්
පිටතට ඇද දමනු ලබන්නේය.' "[8]

**8** " 'ඔබ යම් කඩුවකට බිය වී සිටි-
යහුය.[9] මම දැන් ඒ කඩුවම ඔබට
විරුද්ධව ගෙනෙන්නෙමි' යයි විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවි පවසන්නේය.[10] **9** 'මම අනි-
වාර්යයෙන්ම ඔබව නුවරින් පිටතට
ගෙනැවිත් වෙනත් ජාතීන්ගේ අතට
භාර කර දී[11] ඔබට විරුද්ධව මාගේ
විනිශ්චය ඉටු කරන්නෙමි.[12] **10** ඔබ
කඩුවෙන් මැරුම් කන්නහුය.[13] ඊශ්‍රා-
යෙල්හි දේශ සීමාව අසලදී[14] මම
ඔබව විනිශ්චය කරමි. එවිට මා යෙ-
හෝවා දෙවි බව පිළිගන්න ඔබට
සිදු වෙනවා ඇත.[15] **11** කල්දේර-
මක්[16] වැනි වූ මෙම නුවරෙන් ඔබට
ආරක්ෂාවක් ලැබෙන්නේ නැත. ඒ
තුළ සුරක්ෂිතව තිබෙන මස් ඔබ-
යයි නොසිතන්න. ඊශ්‍රායෙල්හි දේශ
සීමා අසලදී මම ඔබව විනිශ්චය
කරන්නෙමි. **12** මා දුන් නියෝගව-
ලට එකඟව ඔබ ජීවත් වූයේ නැත.
මාගේ තීන්දුවලට එකඟව ඔබ ක්‍රියා
කළේ නැත.[17] ඒ වෙනුවට ඔබ ක්‍රියා
කළේ අවට සිටින ජාතීන්ගේ තීන්දුව-

**10 පරි.**

1 එස 10:4; එස 11:23
2 එස 11:22
3 එස 1:1
4 එස 1:22
5 එස 1:8
6 එස 1:10
7 එස 1:12; එස 10:11

**11 පරි.**

8 හෙබ්‍රෙ 1:7
9 එස 3:12; එස 8:3; 2කොරි 12:2
10 එස 10:19
11 එස 8:16
12 යෙසා 1:23; එස 22:27; හොෂෙ 5:10
13 යෙසා 30:1; මීකා 2:1
14 යෙරෙ 1:13; එස 24:3
15 එස 12:22; 2පේත්‍ර 3:4

**2 තීරුව**

1 යෙසා 58:1; එස 3:17; එස 20:46; එස 21:2
2 ගණන් 11:25; 1සාමු 10:6; එස 2:2; එස 3:24; මීකා 3:8; 2පේත්‍ර 1:21
3 1රාජා 22:14; යෙරෙ 1:7
4 එස 20:32; හෙබ්‍රෙ 4:13
5 2රාජා 21:16; යෙරෙ 2:34; එස 7:23; එස 22:4; මතෙ 23:35
6 යෙරෙ 1:13; එස 24:6
7 මීකා 3:3
8 යෙරෙ 52:27
9 යෙරෙ 38:19; යෙරෙ 42:14
10 යෙරෙ 44:12; 1තෙස 2:16
11 ද්වි 28:36; ගීතා 106:41; යෙරෙ 39:6
12 එස 5:8; එස 16:41; යූද් 15
13 2රාජා 25:21; 2ලේක 36:17; යෙරෙ 52:10
14 1රාජා 8:65; 2රාජා 14:25; යෙරෙ 52:27
15 ගීතා 9:16; එස 6:13
16 යෙරෙ 1:13

එස **11:1*** එස 3:12හි පාදසටහන බලන්න.

**17** නික් 19:8; ලෙවී 26:40; 1රාජා 11:33; එස්රා 9:7; නෙහෙ 9:34; එස 20:16.

ලට අනුවය.[1] එහෙයින් මා යෙහෝවා
දෙවි බව පිළිගන්න ඔබට සිදු වෙනවා
ඇත.’ ”
**13** මා මේ අනාවැකි පවසා අව-
සන් වනවාත් සමඟම බෙනායාගේ
පුත්‍රයා වූ පෙලතියා මිය ගියේය.[2]
එවිට මම මුණින් වැටී මහත් හඬින්
මෙසේ මොරගැසුවෙමි.[3] “අනේ, විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවියනි![4] ඊශ්‍රායෙල් ජාතියේ ඉතුරු
වී සිටින අයව ඔබ සම්පූර්ණයෙන්ම
විනාශ කර දමනවාද?”[5]
**14** ඉන් අනතුරුව යෙහෝවා දෙවි
මට මෙසේ පැවසීය. **15** “මනුෂ්‍ය
පුත්‍රය, ඔබේ ලේ නෑයන්ටද*[6] මුළු
ඊශ්‍රායෙල් සෙනඟටද යෙරුසලමේ
වැසියෝ මෙසේ කියා ඇත. ‘ඔබ යෙ-
හෝවා දෙවිගේ මෙම දේශයෙන් ඈත්
වෙලයි සිටින්නේ. ඒ නිසා දැන් දේශය
අයිති අපටයි. එය උරුමයක් ලෙස
දී තිබෙන්නේ අපටයි.’[7] **16** ඒ නිසා
දැන් ඔවුන්ට මෙසේ කියන්න. ‘විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවි පවසන්නේ මෙයයි. “මා ජාතීන්
අතරට ඔවුන්ව පලවාහැරියත් දේශ-
යන් පුරාම ඔවුන්ව විසුරුවාහැරියත්[8]
ඔවුන් ඒ දේශයන්වල ජීවත් වන කෙටි
කාලය තුළදී මම ඔවුන්ට ශුද්ධස්ථා-
නයක්* මෙන් වන්නෙමි.” ’[9]
**17** “එමනිසා ඔවුන්ට මෙසේ පව-
සන්න. ‘විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි.
“මම ඔවුන්ව ජාතීන් අතරින් නැවත
එකතු කරගන්නෙමි. ඔවුන්ව විසු-
රුවාහැරිය දේශවලින් එක් රැස් කර
නැවත ඊශ්‍රායෙල් භූමිය ඔවුන්ට ලබා
දෙන්නෙමි.[10] **18** ඔවුහු නියත වශ-
යෙන්ම ඊශ්‍රායෙල් දේශයට පැමිණ
එහි තිබෙන සියලු පිළිකුල්සහ-
ගත දේවල් හා සියලුම නින්දාසහ-
ගත දේවල් ඉවත් කරනවා ඇත.[11]
**19** මම ඔවුන්ව එකමුතු සෙනඟක්
කරන්නෙමි.[1] මම ඔවුන් සිතන ආකා-
රය වෙනස් කරන්නෙමි.[2] ගලක් මෙන්
තදව තිබූ ඔවුන්ගේ සිත වෙනුවට[3]
මම ඔවුන්ට ප්‍රේමයෙන් පිරි හදවතක්
දෙන්නෙමි.[4] **20** එවිට මාගේ ආඥා-
වලට එකඟව ජීවත් වීමටත් මා තීන්දු
කර ඇති දේට අවනත වී ඒවා පිළිපැ-
දීමටත් ඔවුහු පෙලඹෙනු ඇත.[5] ඔවුහු
ඇත්තටම මාගේ සෙනඟ වන්නෝය.[6]
මමද ඔවුන්ගේ දෙවි වන්නෙමි.” ’[7]
**21** “ ‘ “නමුත් තමන්ගේ සිත් පිළි-
කුල්සහගත හා නින්දිත දේවලට
යොමු කර ඇති අයට[8] තමන් කරන
දේවල ප්‍රතිඵල අද්දකින්න සිදු වෙයි”
කියා විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි පවසන්නේය.’ ”[9]
**22** කෙරුබ්වරුන්[10] තම පියාපත්
විහිදුවා ඉහළට නැඟී ගිය විට රෝදද
ඔවුන් සමඟම ගියේය.[11] ඊශ්‍රායෙල්හි
දෙවිගේ තේජස[12] කෙරුබ්වරුන්ට
ඉහළින් බැබළුණේය.[13] **23** ඉන්පසු
නුවර මධ්‍යයෙහි බැබළෙමින් තිබූ
යෙහෝවා දෙවිගේ තේජස[14] නුවරේ
නැඟෙනහිර දෙසින් පිහිටි[15] කන්ද වෙ-
තට ගොස්[16] ඊට ඉහළින් බැබළෙන්න
පටන්ගත්තේය. **24** එවිට යම් බල-
යක්[17] මාව ඔසවාගෙන ගොස්[18] කල්-
දිවරුන්ගේ දේශයේ වහලුන් ලෙස සිටි
ජනතාව[19] අතරේ තැබුවේය. ඉන්-
පසු දෙවි තම බලය මාර්ගයෙන් මට
පෙන්වූ එම දර්ශනය එතැනින් නිමා
විය. **25** එවිට යෙහෝවා දෙවි මට
දකින්න සැලැස්වූ සෑම දෙයක් ගැනම
ඒ දේශයේ වහලුන් ලෙස සිටි ජනතා-
වට මම පැවසුවෙමි.[20]

**12** යෙහෝවා දෙවි මට තව-
දුරටත් මෙසේ පැවසීය.
**2** “මනුෂ්‍ය පුත්‍රය, ඔබ සිටින්නේ කැර-
ලිකාර සෙනඟක්[21] අතරෙහිය. ඇස්
තිබුණත් ඔවුන්ට නොපෙනේ.[22]
කන් තිබුණත් ඔවුන්ට නොඇසේ.[23]
මන්ද ඔවුහු කැරලිකාර සෙනඟකි.[24]
**3** මනුෂ්‍ය පුත්‍රය, වහල්කමට යන

---

එස **11:15*** හෝ, “ඔබේ උරුමය මුදවාගැනීමට ඔබට ඇති අයිතිය ගැන උනන්දුවක් දක්වන ඔබේ සහෝදරයන්ට.” **16*** හෝ, “රක්ෂස්ථානයක්.”

**11 පරි.**
**1** ද්වි 12:30, 2රාජා 21:2, 2ලේක 28:3, ගීතා 106:35, එස 8:10
**2** හිතෝ 6:15, ක්‍රියා 5:5
**3** ගීතා 119:120
**4** එස 9:8
**5** ද්වි 9:19
**6** යෙසා 66:5
**7** එස 33:24
**8** ලෙවී 26:44, ද්වි 30:3, 2රාජා 24:15, ගීතා 44:11, යෙරෙ 24:5, යෙරෙ 30:11, යෙරෙ 31:10
**9** ගීතා 31:20, ගීතා 90:1, ගීතා 91:9, හිතෝ 18:10
**10** යෙසා 11:11, යෙරෙ 30:10, යෙරෙ 32:37, එස 20:42, එස 34:13, එස 36:24, එස 37:12, ආමො 9:14
**11** එස 37:23

**2 තීරුව**
**1** 2ලේක 30:12, යෙරෙ 24:7, යෙරෙ 32:39
**2** ගීතා 51:10, යෙරෙ 31:33, යෙරෙ 32:39, එස 36:31, එෆී 4:23
**3** යෙසා 48:4, සෙක 7:12, මාක් 10:5, රෝම 2:5
**4** එස 36:26
**5** ගීතා 105:45
**6** යෙරෙ 11:4
**7** එස 14:11
**8** යෙරෙ 17:9
**9** එස 9:10, එස 22:31
**10** එස 9:3, එස 10:2
**11** එස 1:19, එස 10:19
**12** 1රාජා 8:11, 2ලේක 7:3
**13** එස 10:18
**14** එස 8:4, එස 9:3, එස 10:4, එස 43:4
**15** එස 43:2
**16** සෙක 14:4, මතෙ 24:3, ක්‍රියා 1:12
**17** එස 8:3, හෙබ්‍රෙ 1:7
**18** 2කොරි 12:2

**19** ගීතා 137:1; **20** එස 2:7; **12 පරි.** **21** එස 2:3; එස 3:26; **22** යෙසා 6:9; යෙසා 44:18; මතෙ 13:13; **23** යෙරෙ 5:21; රෝම 11:8; **24** එස 2:5.

කෙනෙකු මෙන් දහවල් කාලයේදී
ඔබේ බඩු බාහිරාදිය සූදානම් කරගෙන
ඔවුන් බලා සිටියදීම පිටත්ව යන්න.
ඔබ එක් තැනක සිට තවත් තැන-
කට වහලෙකු සේ ඔවුන්ට පෙනෙන්න
ගමන් කළ යුතුයි. ඔවුන් කැරලිකාර
සෙනඟක් වුවත් සමහරවිට එහි අර්-
ථය ඔවුහු තේරුම්ගනු ඇත.[1] **4** ඔබ
වහල්කමට යැම සඳහා අවශ්‍ය බඩු
බාහිරාදිය ඔවුන්ට පෙනෙන්නම දහ-
වල් කාලයේදී එළියට ගෙනා යුතුය.
ඔවුන් බලා සිටියදීම සවස් වරුවේ ඔබ
වහලෙකු ලෙස පිටත්ව යා යුතුය.[2]
**5** “ඔවුන්ට පෙනෙන්න බිත්තිය
සිදුරු කර එයින් ඔබේ බඩු බාහිරා-
දිය පිටතට ගෙනෙන්න.[3] **6** ඔවුන්
බලා සිටියදීම ඔබේ බඩු බාහිරාදිය
කර මත තබාගෙන යන්න. අන්ධ-
කාරයෙහි ඔබේ බඩු බාහිරාදිය පිට-
තට ගෙන යන්න. ඔබ යන විට
මඟ නොපෙනෙන පිණිස ඔබේ මුහුණ
වසාගෙන යන්න. මන්ද ඔබ කරන
මේ දේ ඊශ්‍රායෙල් ජනතාවට[4] ලකු-
ණක් වනු ඇත.”[5]
**7** මට අණ කළ ලෙස මම ඒ
සියල්ල කළෙමි.[6] වහලෙකු සේ යැමට
මාගේ බඩුමුට්ටු දහවල් කාලයේදී මම
එළියට ගෙනාවෙමි. සවස් වරුවේදී
මාගේ දෑතින් බිත්තිය සිදුරු කර
මගේ බඩුමුට්ටු රාත්‍රියෙහි පිටතට ගෙ-
නාවෙමි. මා ඒ බඩු බාහිරාදිය කර පිට
තබාගෙන පිටතට ගෙනාවේ ඔවුන්
බලා සිටියදීමය.
**8** පසුදා උදෑසන යෙහෝවා දෙවි
මට මෙසේ පැවසීය. **9** “මනුෂ්‍ය
පුත්‍රය, ‘ඔබ කරන්නේ කුමක්ද’ කියා
කැරලිකාර[7] ඊශ්‍රායෙල් සෙනඟ ඔබෙන්
ඇසුවේ නැද්ද? **10** ඔවුන්ට මෙසේ
පවසන්න. ‘විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි පවසන්නේ මෙ-
සේය. “යෙරුසලමට හා එහි අධිපති-
යාට විරුද්ධවත්[8] එහි සිටින සියලුම
ඊශ්‍රායෙල් ජනතාවට විරුද්ධවත් මා
ප්‍රකාශ කරන තීන්දුව මෙයයි.” ’
**11** “ඊශ්‍රායෙල් සෙනඟට මෙසේ
කියන්න. ‘මා කළ දේ ඔබට ලකුණක්
වන්නේය.[1] මා කළ ලෙසම ඔවුන්ටත්
කරන්න සිදු වෙයි. ඔවුහු අනිවාර්-
යයෙන්ම වහල්කමට යනවා ඇත.[2]
**12** ඔවුන්ගේ අධිපතියාද තම බඩු
බාහිරාදිය කර පිට තබාගෙන අන්-
ධකාරයේදී පිටත්ව යන්නේය. බඩු-
මුට්ටු සමඟ ඔහුට පිටතට යැම
සඳහා පවුර සිදුරු කරනු ලබන්-
නේය.[3] තමන් යන මඟ නොදකින
පිණිස ඔහු තම මුහුණ වසාගෙන යනු
ඇත.’ **13** මම ඔහුව හසු කරගැනී-
මට ඔහු පිට දැලක් එළන්නෙමි. ඔහු
එම දැලට හසු වනු ඇත.[4] මම ඔහුව
කල්දිවරුන්ගේ දේශය වන බැබි-
ලෝනියට ගෙන යන්නෙමි.[5] නමුත්
ඔහුට කිසිවක් නොපෙනේ. ඔහු එහිදී
මිය යනු ඇත.[6] **14** ඔහුගේ ආරක්-
ෂාවට ඔහු වටා සිටින සියලුදෙනාවද
ඔහුගේ සියලු හමුදා බළඇණිද සතර
දිග සුළඟෙන් විසුරුවාහරින්නෙමි.[7]
ඔවුන්ව ලුහුබැඳ යැමට මම කඩු-
වක් එවන්නෙමි.[8] **15** මම ඔවුන්ව
විවිධ දේශයන් වෙතට පන්නා දමන්-
නෙමි. ජාතීන් අතරේ සීසීකඩ විසුරු-
වාහරින්නෙමි. එවිට මා යෙහෝවා
දෙවි බව පිළිගන්න ඔවුන්ට සිදු වෙ-
නවා ඇත.[9] **16** එහෙත් මම ඔවුන්
අතරින් කිහිපදෙනෙකුව කඩුවෙන්ද[10]
සාගතයෙන්ද වසංගතයෙන්ද බේරා-
ගන්නෙමි. මා එසේ කරන්නේ ඔවුන්
ජාතීන් අතරට විසිර ගොස් ඊශ්‍රායෙල්
ජනයා සිදු කළ සියලුම පිළිකුල්සහ-
ගත දේවල්[11] එම ජාතීන්ට දන්වන
පිණිසය.[12] එවිට මා යෙහෝවා දෙවි
බව පිළිගන්න ඔවුන්ට සිදු වෙනවා
ඇත.”
**17** යෙහෝවා දෙවි මට තවදු-
රටත් මෙසේ පැවසීය. **18** “මනුෂ්‍ය
පුත්‍රය, ඔබ ගන්නා ආහාර වෙ-
වුලමින් අනුභව කරන්න. මහත්
භීතියකින්ද කනස්සල්ලකින්ද ජලය
පානය කරන්න.[13] **19** ඉන්පසුව දේ-
ශයේ ජනතාවට මෙසේ පවසන්න.
‘ඊශ්‍රායෙල් භූමියේ වෙසෙන[14] යෙ-
රුසලමේ වැසියන් ගැන විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවි

**12 පරි.**
**1** යෙසා 1:2
**2** 2ලේක 36:20; යෙරෙ 52:11
**3** 2රාජා 25:4; යෙරෙ 39:4
**4** යෙසා 8:18; එස 4:3; එස 12:3
**5** එස 24:24
**6** උත් 6:22; නික් 39:32
**7** ද්වි 31:27; නෙහෙ 9:26; ගීතා 78:8; එස 3:9; එස 24:3
**8** යෙරෙ 21:7; එස 21:25

---

**2 තීරුව**
**1** එස 24:24
**2** යෙරෙ 15:2; යෙරෙ 20:6; යෙරෙ 44:30; යෙරෙ 52:15
**3** 2රාජා 25:4; යෙරෙ 39:4; යෙරෙ 52:7
**4** යෝබ් 19:6; ගීතා 66:11; යෙරෙ 52:9; විලා 1:13; එස 17:20; එස 19:8; එස 32:3; හොෂෙ 5:1; හොෂෙ 7:12; ලූක් 21:35
**5** යෙරෙ 24:5
**6** 2රාජා 25:7; යෙරෙ 34:3; යෙරෙ 39:7; යෙරෙ 52:11; එස 17:16
**7** 2රාජා 25:5; එස 5:10; එස 17:21
**8** ලෙවී 26:33; යෙරෙ 42:16
**9** ගීතා 9:16; එස 6:14
**10** යෙසා 1:9; යෙසා 10:22; එස 6:8; රෝම 9:27
**11** යෙරෙ 44:22; එස 6:11; එස 7:3; එස 33:29
**12** ලෙවී 26:41
**13** ලෙවී 26:26; ගීතා 80:5
**14** එස 18:2; එස 21:3

පවසන්නේ මෙයයි. “ඔවුහු මහත්
කනස්සල්ලකින් යුතුව ආහාර අනුභව
කරන්නෝය. ඔවුහු භයෙන්ද වෙවු-
ලමින්ද ජලය පානය කරන්නෝය.
දේශයේ සියලු වැසියන් කළ සැහැසි-
කකම් නිසා[1] එය සම්පූර්ණයෙන්ම
පාළුවට යන්නේය.[2] **20** ජනාකීර්ණ
නගර පවා පාළු කරනු ලබන්නේය.[3]
දේශයද කිසිවෙකු නොවසන පාළු
තැනක් බවට පත් වන්නේය.[4] එවිට
මා යෙහෝවා දෙවි බව පිළිගන්න
ඔබට සිදු වෙනවා ඇත.” ’ ”[5]

**21** යෙහෝවා දෙවි මට ඊළඟට
පැවසුවේ මෙයයි. **22** “මනුෂ්‍ය පුත්‍රය,
‘කාලය ගෙවී ගියත්[6] කිසි දර්ශනයක්
නම් ඉටු වී නැහැ’[7] කියා ඊශ්‍රායෙල් දේ-
ශයේ වෙසෙන ජනයා අතරේ ප්‍රසිද්ධ
කියමනක් පතළ වී තිබෙනවා නො-
වේද?[8] **23** එහෙයින් ඔවුන්ට මෙසේ
පවසන්න. ‘විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවිගේ වචනය මෙ-
යයි. “ඔවුන් පවසන ඒ ප්‍රසිද්ධ කියමන
මම නැති කර දමන්නෙමි. ඉදිරි-
යේදී ඊශ්‍රායෙල් දේශයෙහි කිසිවෙක්
එය නොපවසනු ඇත.” ’[9] ඒ වෙනු-
වට ඔවුන්ට මෙසේ කියන්න. ‘කාලය
අත ළඟයි.[10] සෑම දර්ශනයක්ම ඉටු
වනු ඇත.’ **24** තවදුරටත් ඊශ්‍රායෙල්
වැසියන් අතර බොරු දර්ශන පතළ
වන්නේවත්[11] මුළා කරවන අනාවැකි
පළ වන්නේවත් නැත.[12] **25** ‘ “කිව
යුතු දේ යෙහෝවා වන මම ප්‍රකාශ
කරන්නෙමි. එය අනිවාර්යයෙන්ම ඉටු
වෙනවා ඇත.[13] එය පමා නොවී නිසි
කාලයේදී ඉටු වන්නේය.[14] කැරලිකාර
ජනයෙනි, ඔබ ජීවත්ව සිටින කාලයේ-
දීම[15] මා පවසන දේ ඉටු කරන්නෙමි.”
එසේ පවසන්නේ විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවිය.’ ”

**26** ඉන්පසුව යෙහෝවා දෙවි
මට මෙසේ පැවසුවේය. **27** “මනුෂ්‍ය
පුත්‍රය, ඊශ්‍රායෙල් සෙනඟ තමන් අතර
මෙවැනි දෙයක් කතා කරති. ‘ඔහු
දකින දර්ශන ඉටු වෙන්න තවත්
බොහෝ කල් තිබෙනවා. ඔහු
අනාවැකි කියන්නේ තව බො-
හෝ කාලයකට පසුව ඉටු වෙන්න
තිබෙන දේවල් ගැනයි.’[1] **28** එම-
නිසා ඔවුන්ට මෙසේ කියන්න. ‘විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවි මෙසේ පවසයි. “ ‘මා කියන මේ
දේවල් ඉටු කරන්න මම තවත් ප්‍රමාද
නොවන්නෙමි.[2] මා යමක් පැවසුවොත්
එය අනිවාර්යයෙන්ම ඉටු වන්නේය.’[3]
එසේ පවසන්නේ විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවිය.” ’ ”[4]

**13** යෙහෝවා දෙවි මට මෙසේ
පැවසීය. **2** “මනුෂ්‍ය පුත්‍රය,
හිතුමතේට අනාවැකි කියන[5] ඊශ්‍රා-
යෙල් දේශයේ අනාගතවක්තෘව-
රුන්ට[6] මෙසේ කියන්න. ‘යෙහෝවා
දෙවි පවසන දේට සවන් දෙන්න.[7]
**3** විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි මෙසේ පවසයි. “තමන්ගේ
කැමැත්ත පරිදි ක්‍රියා කරන[8] කිසිම
දෙයක් නොදකින[9] අඥාන අනාග-
තවක්තෘවරුන්ට අත් වන්නේ මහත්
විපතකි![10] **4** ඊශ්‍රායෙල් ජනයෙනි,
ඔබේ අනාගතවක්තෘවරුන් පාළු
තැන්වල ලගින සිවලුන් හා සමා-
නය.[11] **5** පවුර කැඩී බිඳී ඇති තැන්-
වලට ගොස් ඔබ සටන් කරන්නේ
නැත.[12] යෙහෝවා දෙවිගේ විනිශ්චය
පැමිණෙන දවසේදී[13] ඇති වන සටනට
මුහුණ දීම සඳහා ඔබ ඊශ්‍රායෙල් ජන-
තාව වෙනුවෙන් ගලින් පවුරක්වත්
ගොඩනඟන්නේ නැත.”[14] **6** “ඔවුහු
බොරු දර්ශන දකින අතර මුළා කර-
වන අනාවැකි පළ කරන්නෝය.[15] යෙ-
හෝවා දෙවි ඔවුන්ට කිසි පැවරුමක්
භාර නොදුන්නේය. එහෙත් ඔවුහුද
‘යෙහෝවා දෙවි මෙසේ පවසයි’ කිය-
මින් විවිධ දේවල් පවසති. එපමණක්ද
නොව, තමන් පවසන දේවල් ඉටු වෙයි
කියාද ඔවුහු බලාපොරොත්තු වෙති.[16]
**7** මා ඔබට කිසිවක් නොපැවසුවද,
‘යෙහෝවා දෙවි මෙසේ පවසයි’ කිය-
මින් ඔබ විවිධ අනාවැකි පළ කරන්න-
හුය. දර්ශන දකින්නහුය. ඔබ පළ
කරන අනාවැකි මුළා කරවනසුලු ඒවා
නොවේද? ඔබ දකින දර්ශන බොරු
නොවේද?” ’[17]

**12 පරි.**
1 ගීතා 107:34, යෙරෙ 6:7
2 යෙසා 6:11, සෙක 7:14
3 යෙසා 64:10, යෙරෙ 25:9
4 යෙසා 7:24, යෙරෙ 4:23
5 එස 6:13
6 යෙසා 5:19, ආමො 6:3
7 2පේතෘ 3:4
8 එස 18:2
9 යෙසා 28:22, එස 18:3
10 යෝවෙ 2:1, ශෙප 1:14
11 එස 13:23
12 1රාජා 22:11, යෙරෙ 14:14, විලා 2:14
13 යෙසා 14:24, යෙසා 55:11, විලා 2:17, දානි 9:12, සෙක 1:6
14 එළි 10:6
15 යෙරෙ 16:9, හබ 1:5

**2 තීරුව**
1 යෙසා 5:19, යෙසා 28:15, 2පේතෘ 3:4
2 යෙරෙ 44:28, ගලා 4:4, එළි 10:6
3 යොෂු 23:14, යෙසා 46:10, යෙසා 55:11
4 එස 2:4

**13 පරි.**
5 යෙරෙ 14:14, යෙරෙ 23:16
6 මීකා 3:5, ශෙප 3:4, 2පේතෘ 2:1
7 ආමො 7:16
8 ගීතා 81:12
9 යෙරෙ 23:32
10 හිතෝ 28:26
11 සල 2:15, ගලා 2:4, එෆි 4:14
12 ගීතා 106:23
13 යෙසා 2:12, යෝවෙ 1:15
14 එස 22:30
15 එස 12:24
16 යෙරෙ 29:31
17 2පේතෘ 2:1

**8** "'එබැවින් විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි මෙසේ පව-
සයි. "'ඔබ අසත්‍ය දේවල් කතා කළ
නිසාත් බොරු දර්ශන දුටු නිසාත්
මම ඔබට විරුද්ධව නැඟී සිටින්-
නෙමි.'[1] එසේ පවසන්නේ විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවිය."
**9** බොරු දර්ශන දකිමින් මුළා කර-
වන අනාවැකි පළ කරන අනාගත-
වක්තෘවරුන්ට විරුද්ධව මම මාගේ
හස්තය ඔසවන්නෙමි.[2] ඔවුහු මාගේ
සෙනඟ සමඟ කිට්ටු මිතුරන් සේ[3]
තවදුරටත් ඇසුරු නොකරන්නෝය.
ඔවුන්ගේ නම් ඊශ්‍රායෙල්හි නාම ලේඛ-
නයේ ලියනු ලබන්නේ නැත.[4] ඔවුහු
ඊශ්‍රායෙල් දේශයට නැවත නොපැ-
මිණෙන්නෝය.[5] මා විශ්වයේ පාල-
කයාණන් වන යෙහෝවා දෙවි බව
පිළිගන්න ඔබට සිදු වෙනවා ඇත.[6]
**10** ඔවුන්ට ඒ දේ සිදු වන්නේ සාමයක්
නැති විටදී පවා, "සාමය" ඇති බව
කියමින් ඔවුන් මාගේ සෙනඟව නො-
මඟ යවා ඇති නිසාය.[7] ජනතාව තම
නිවෙස්වල බිත්ති ඉදි කළත් ඒවාට
සුදු හුණු ගෑවත්[8] ඔවුන්ගේ වෙහෙස
නිෂ්ඵලය.'[9]

**11** "බිත්තිවලට ගෑ බදාම වැටෙන
බව සුදු හුණු ගාන්නාවූ අයට
කියන්න. ධාරානිපාත වැස්සක් ඇද
හැළෙනවා ඇත. හිම කැට වර්ෂාවක්ද
චණ්ඩ මාරුතයක්ද ඇති වන්නේය. ඒ
හේතුවෙන් බිත්ති බිඳී යන්නේය.[10]
**12** බලන්න සිදු වන දේ! බිත්තිය
වැටෙනවා ඇත. එවිට 'ඔබ ගෑ බදා-
මට සිදු වුණේ කුමක්ද'[11] කියා සෙනඟ
ඔබෙන් අසනු ඇත.

**13** "විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙසේය.
'මම මහත් සේ කෝප වී චණ්ඩ
මාරුතයක් එවන්නෙමි. මාගේ උද-
හස වගුරුවමින් ධාරානිපාත වර්ෂා-
වක්ද ඇද හැළෙන්න සලස්වන්නෙමි.
හිම කැට වර්ෂාවක්ද එවා මහත් විනා-
ශයක් සිදු කරන්නෙමි.[12] **14** ඔබ
බදාම ගා සුදු හුණු තැවරූ බිත්-
තිය බිඳ දමා එහි අත්තිවාරම මතු
වන තෙක් එය පොළොවටම සම-
තලා කරන්නෙමි.[1] නුවරද අනිවාර්ය-
යෙන්ම වැටෙන්නේය. ඔබත් නුවර
සමඟම විනාශ වන්නහුය. එවිට මා
යෙහෝවා දෙවි බව පිළිගන්න ඔබට
සිදු වෙනවා ඇත.'[2]

**15** "'බිත්තියටත් එයට බදාම ගා
සුදු හුණු තවරන අයටත් විරුද්-
ධව මාගේ කෝපය සම්පූර්ණයෙන්ම
ප්‍රකාශ කරන්නෙමි. මම ඔබට මෙසේ
කියමි. "බිත්තිය විනාශ වී ඇත. එයට
බදාම ගෑ අයත් නැත.[3] **16** ඔවුන්
නම් යෙරුසලමේ වැසියන්ට අනාවැකි
කියමින් සාමයක් නැති විටදී පවා
සාමයේ දර්ශන දකින ඊශ්‍රායෙල්හි
අනාගතවක්තෘවරුන්ය."'[4] එසේ පව-
සන්නේ විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවිය.[5]

**17** "මනුෂ්‍ය පුත්‍රය, හිතුමතේට[6]
අනාවැකි කියන ඔබේ සෙනඟ අතර
සිටින කාන්තාවන්ට[7] විරුද්ධවත්
අනාවැකි පළ කරන්න.[8] **18** ඔබ
ඔවුන්ට මෙසේ කිව යුතුයි. 'විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවි
පවසන්නේ මෙසේය. "වැලමිට වටා
බැඳීමට පටි මහන්නාවූද උස, මිටි
හැම කෙනෙකු සඳහා ආවරණ සාදන්-
නාවූද කාන්තාවන්ට මහත් විපතක්
අත් වන්නේය! ඔවුන් ඒ දේ කරන්නේ
මිනිසුන්ව ගොදුරු කරගැනීම සඳ-
හාය.[9] මාගේ සෙනඟව දඩයම් කරන
ඔබට ඔබවත් ඔබේ අනුගාමිකයන්-
වත් ආරක්ෂා කරගන්න පුළුවන්ද?
**19** ඔබ බාර්ලි මිටක් වෙනුවෙනුත්
රොටි කැබලි කිහිපයක් වෙනුවෙ-
නුත්[10] මාගේ සෙනඟ අතරේ මා පිටට
මහත් නින්දාවක් ගෙනාවා නොවේද?
ඔබට සවන් දෙන මාගේ සෙනඟට
ඔබ බොරු කියමින්[11] නිදොස් අයව
මරා දමා ඇත.[12] මරා දැමිය යුතු අයව
ඔබ මරණයෙන් බේරා ඇත."'

**20** "එබැවින් විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි මෙසේ
පවසයි. 'කාන්තාවෙනි, මිනිසුන්ව
පක්ෂීන් මෙන් ගොදුරු කරගැනී-
මට[13] ඔබ භාවිත කරන පටිවලට

**13 පරි.**
1 එස 21:3; එස 22:28
2 යෙරෙ 14:14; යෙරෙ 28:16; යෙරෙ 29:9
3 ගීතා 111:1
4 නික් 32:32; නෙහෙ 7:5; ගීතා 69:28
5 එස 20:38
6 එස 6:13; එස 11:10
7 යෙසා 57:21; යෙරෙ 6:14; යෙරෙ 8:11
8 2ලේක 18:12; යෙසා 30:10; එස 22:28
9 ගීතා 127:1
10 යෙසා 25:4; යෙසා 27:8; එස 38:22
11 යෙරෙ 37:19
12 හග් 2:17

**2 තීරුව**
1 මීකා 1:6; මතෙ 7:27
2 එස 14:8
3 යෙසා 30:13
4 යෙරෙ 6:14; යෙරෙ 28:9
5 යෙසා 48:22
6 එළි 2:20
7 නික් 15:20; 2රාජා 22:14; ලූක් 2:36
8 එස 20:46; එස 21:2
9 එස 22:25; 2පේත්‍ර 2:14
10 හිතෝ 28:21; මීකා 3:11
11 යෙරෙ 23:14; ලූක් 6:26
12 1රාජා 21:15
13 හොෂෙ 9:8

විරුද්ධව මම කටයුතු කරමි. මම
ඒවා ඔබේ අත්වලින් ඉරා දමා පක්-
ෂීන් මෙන් ඔබට හසු වී සිටින අයව
නිදහස් කරන්නෙමි. **21** ඔබේ ආව-
රණද ඉරා දමා ඔබේ ග්‍රහණයෙන්
මාගේ සෙනඟව මුදාගන්නෙමි. දඩය-
මකදී හසු වූ ගොදුරක් මෙන් ඔවුන්
ඔබේ ග්‍රහණයට හසු වී සිටියත් ඔවුහු
තවදුරටත් එසේ නොසිටිනු ඇත. මා
යෙහෝවා දෙවි බව පිළිගන්න ඔබට
සිදු වෙනවා ඇත.[1] **22** මා ධර්මිෂ්-
ඨයන්ව වේදනාවට පත් නොකළත්
ඔබ බොරු දේවල් පවසා[2] ඔවුන් තුළ
කලකිරීමක් ඇති කළහුය. එසේම
දුෂ්ටයාට තම දුෂ්ටකම්වලින් හැරී
දිවි රැකගන්න උදව් කරනවා වෙ-
නුවට[3] ඔබ ඔහුව දුෂ්ටකම් කිරීමට
තව තවත් පෙලඹවූහුය.[4] **23** එබැ-
වින් කාන්තාවෙනි, ඔබ තවදුරටත්
බොරු දර්ශන නොදකින්නහුය.[5] මුළා
කරවන අනාවැකිද[6] ඔබ තවදුරටත්
නොපවසන්නහුය.[7] මම මාගේ සෙ-
නඟව ඔබේ ග්‍රහණයෙන් මුදන්නෙමි.[8]
එවිට මා යෙහෝවා දෙවි බව පිළි-
ගන්න ඔබට සිදු වෙනවා ඇත.’ ”[9]

**14** ඊශ්‍රායෙල්හි වැඩිමහල්ලන්-
ගෙන් කිහිපදෙනෙක් මා
ළඟට ඇවිත් මා ඉදිරියෙහි හිඳගත්-
තෝය.[10] **2** එවිට යෙහෝවා දෙවි
මට මෙසේ පැවසීය. **3** “මනුෂ්‍ය
පුත්‍රය, මේ මිනිස්සු තමන් සාදාගත්
පිළිකුල්සහගත රූපවලට මහත් ආශා-
වෙන් නමස්කාර කරති. ඔවුහු තමන්-
ගේ වැටීමට හේතු වන ඒ දේවල් තමන්
ඉදිරියෙහිම තබාගෙන[11] මගෙන්ද මඟ
පෙන්වීම් පතති. එවැනි අයට මා පිළි-
තුරු දෙයි කියා ඔබ සිතනවාද?[12]
**4** එහෙයින් ඔබ ඔවුන්ට මෙසේ පැව-
සිය යුතුය. ‘විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි පවසන්නේ මෙ-
යයි. “තමාගේ වැටීමට හේතු වන ඒ
පිළිකුල්සහගත රූප[13] ළඟ තබාගෙන
මහත් ආශාවෙන් ඒවාට නමස්කාර
කරන අතරතුරේදීම, මගේ අනාගත-
වක්තෘවරුන් ළඟටත් පැමිණෙන සිය-
ලුම ඊශ්‍රායෙල්වරුන්ට යෙහෝවා දෙවි
වන මම හොඳ පිළිතුරක් දෙන්නෙමි.
පිළිකුල්සහගත රූප සම්භාරයක් රැස්
කරගෙන සිටින ඔවුන්ට මම නිසි
ලෙස දඬුවම් කරන්නෙමි.[1] **5** මා
එසේ කරන්නේ ඊශ්‍රායෙල් සෙනඟව
බියෙන් නැතිගන්වන පිණිසය.[2] මන්ද
ඔවුහු සියලුදෙනාම තමන් සාදාගත්
පිළිකුල්සහගත රූප නිසා මාගෙන්
ඈත් වී සිටිති.” ’[3]

**6** “ඊශ්‍රායෙල් ජනතාවට මෙසේ
පවසන්න. ‘විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි පවසන්නේ මෙ-
සේය. “හැරී එන්න. ඔබ සාදාගත්
පිළිකුල්සහගත රූප අත්හැර දමා
මා ළඟට එන්න.[4] ඔබ කරන සෑම
නින්දිත දෙයකින්ම ඉවත් වන්න.[5]
**7** ඊශ්‍රායෙල් ජාතිකයෙකු හෝ ඊශ්‍රා-
යෙල් දේශයේ වාසය කරන විදේශික-
යෙකු හෝ මාව අත්හැර[6] තමාගේ
වැටීමට හේතු වන මේ පිළිකුල්සහ-
ගත රූප සාදාගෙන ඒවාට මහත්
ආශාවෙන් නමස්කාර කරන අත-
රේම, මඟ පෙන්වීම් පතා මගේ
අනාගතවක්තෘවරයෙකු ළඟට පැමි-
ණියහොත්[7] යෙහෝවා දෙවි වන මම
ඔහුට හොඳ පිළිතුරක් දෙන්නෙමි.
**8** මම එවැනි කෙනෙකුට විරුද්ධව
නැඟී සිට[8] මාගේ සෙනඟ අතරින්
ඔහුව විනාශ කර දමන්නෙමි.[9] ඔහුට
සිදු වන දේ සියල්ලන්ට අනතුරු ඇඟ-
වීමක් වන්නේය.[10] එය නිතරම අන්‍ය-
යන්ගේ කතාබහට ලක් වනු ඇත.*[11]
එවිට මා යෙහෝවා දෙවි බව පිළි-
ගන්න ඔබට සිදු වෙනවා ඇත.” ’[12]

**9** “ ‘අනාගතවක්තෘවරයෙකු රැවටී
බොරු අනාවැකියක් පැවසීමට පෙල-
ඹෙන්නේ නම් ඒ දේ සිදු වෙන්න සලස්-
වන්නේ යෙහෝවා දෙවි වන මමය.[13]
මම ඔහුට විරුද්ධව මාගේ හස්තය
ඔසවා මාගේ සෙනඟ වන ඊශ්‍රායෙල්ව-
රුන් අතරින් ඔහුව නැති කර දමන්-
නෙමි.[14] **10** බොරු අනාවැකි පැවසූ
අනාගතවක්තෘවරයාද ඔහුගේ මඟ

එස **14:8*** ද්වි 28:37හි පාදසටහන බලන්න.

**13 පරි.**
1 ගීතා 9:16; එස 6:13
2 යෙරෙ 27:14
3 යෙරෙ 23:17; 2පේත්‍ර 2:18
4 යෙරෙ 23:14
5 හිතෝ 12:19
6 ද්වි 18:10; ද්වි 18:14; යෙසා 44:25; යෙරෙ 27:9
7 එස 12:24; මීකා 3:6
8 එස 34:10; 2පේත්‍ර 2:9
9 එස 14:8

**14 පරි.**
10 එස 8:1; එස 20:1; එස 33:31
11 එස 7:19; එළි 2:14
12 2රාජා 3:13; යෙසා 1:15; යෙරෙ 11:11; සෙක 7:13
13 එස 6:4

**2 තීරුව**
1 2රාජා 1:16; යෙසා 66:4
2 හොෂෙ 10:2; සෙක 7:12; හෙබ්‍රෙ 3:12
3 ද්වි 32:16; යෙරෙ 2:5
4 1සාමු 7:3; 1රාජා 8:47; යෙසා 55:7; යෙරෙ 8:5; ක්‍රියා 3:19
5 යෙසා 30:22; යෙරෙ 13:27
6 යෙසා 59:13; යෙරෙ 17:5
7 යෙරෙ 21:2; එස 33:31
8 ලෙවී 17:10; යෙරෙ 44:11; එස 15:7
9 ලෙවී 20:3
10 ගණන් 26:10
11 ද්වි 28:37; යෙරෙ 24:9
12 එස 6:7
13 1රාජා 22:22; යෙරෙ 4:10; 2තෙස 2:11
14 යෙසා 5:25; යෙසා 9:17

පෙන්වීම පැතූ තැනැත්තාද යන දෙ-
දෙනාම වරදකරුවෝ වන්නෝය.[1]
තමන් කළ වරදේ ප්‍රතිඵල විඳින්න
ඔවුන්ට සිදු වෙයි.[2] **11** මා එසේ
කරන්නේ ඊශ්‍රායෙල් ජනයා තවදුරටත්
මාගෙන් ඈත් වී මංමුළා නොවන පිණි-
සත්[3] වැරදි දේවල් කිරීමෙන් තවදුර-
ටත් අපවිත්‍ර නොවන පිණිසත්ය. එවිට
ඔවුහු මාගේ සෙනඟ වන්නෝය. මමද
ඔවුන්ගේ දෙවි වන්නෙමි.'[4] එසේ පව-
සන්නේ විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි වන මමය."

**12** යෙහෝවා දෙවි මට තවදුර-
ටත් පැවසුවේ මෙසේය. **13** "මනුෂ්‍ය
පුත්‍රය, යම් දේශයක් මට විරුද්ධව පව්
කර මට ද්‍රෝහි වුණොත්[5] මම ඒ දේශ-
යට විරුද්ධව මාගේ හස්තය ඔසවා
එහි ඇති ආහාර ගබඩාවන්* විනාශ
කර දමන්නෙමි.[6] මම ඒ දේශය තුළ
සාගතයක් ඇති වීමට සලස්වා[7] එහි
සිටින මිනිසුන්ව හා සතුන්ව නැති
කර දමන්නෙමි."[8] **14** "'නෝවා,[9]
දානියෙල්[10] හා යෝබ්[11] යන තිදෙනා
එම දේශයේ සිටියා නම් ඔවුන්ගේ
ධර්මිෂ්ඨකම[12] නිසා ඔවුන්ට ගලවා-
ගත හැකි වන්නේ ඔවුන්ගේ ජීවිත
පමණි.'[13] එසේ පවසන්නේ විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවි
වන මමය."

**15** "'එසේත් නැත්නම් මා දේ-
ශය පුරා දරුණු වනමෘගයන්ව එවීමට
තීරණය කළ හැකිය.[14] එවිට ඒ වන-
මෘගයෝ එහි වැසියන්ගේ දරුවන්ව
මරා දමනවා ඇත.[15] උන් නිසා දේශය
පාළු තැනක් බවට පත් වන්නේය.
කිසිවෙක් ඒ මැදින් ගමන් කරන්නේද
නැත.[16] **16** එම පුරුෂයන් තිදෙනා
එහි සිටියත් තමන්ගේ දූපුතුන්වවත්
බේරාගැනීමට ඔවුන්ට නොහැකි වනු
ඇත. ගැලවෙන්නේ ඔවුන් තිදෙනා
පමණයි. දේශයද පාළු ස්ථානයක්
බවට පත් වන්නේය. ජීවමාන දෙවි
වන මා පවසන මේ දේ අනිවාර්ය-
යෙන්ම සිදු වන්නේය.'[17] එසේ පව-
සන්නේ විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි වන මමය."

**17** "'එසේත් නැත්නම් මා එම දේ-
ශයට කඩුවෙන් පහර දීමට තීරණය
කළ හැකිය.[1] එවිට, "කඩුව දේශය
පුරාම යවන්නෙමි" යයි පවසා මම එහි
සිටින මිනිසුන්ව හා සතුන්ව විනාශ
කර දමන්නෙමි.[2] **18** එම පුරුෂ-
යන් තිදෙනා එහි සිටියත්[3] තමන්-
ගේම පුත්‍රයන්ව හෝ දූවරුන්ව හෝ
බේරාගැනීමට ඔවුන්ට නොහැකි වනු
ඇත. ගැලවෙන්නේ ඔවුන් තිදෙනා
පමණයි.[4] ජීවමාන දෙවි වන මා පව-
සන මේ දේ අනිවාර්යයෙන්ම සිදු
වන්නේය.' එසේ පවසන්නේ විශ්වයේ
පාලකයාණන් වූ යෙහෝවා දෙවි වන
මමය."

**19** "'එසේත් නැත්නම් එම දේ-
ශයට වසංගතයකින් පහර දීමට
තීරණය කළොත්[5] මම මාගේ උද-
හස ප්‍රකාශ කර බොහෝදෙනෙකුව
මරණයට පත් කරන්නෙමි.[6] මෙසේ,
මම මිනිසුන්ව හා සතුන්ව දේශ-
යෙන් නැති කර දමන්නෙමි. **20** එහි
නෝවා,[7] දානියෙල්[8] සහ යෝබ්[9]
සිටියා නම්[10] තමන්ගේ දූපුතුන්ව
බේරාගැනීමට ඔවුන්ටවත් නොහැකි
වනු ඇත. ඔවුන්ගේ ධර්මිෂ්ඨකම
නිසා තමන්ගේ ජීවිත පමණක් ගලවා-
ගැනීමට ඔවුන්ට හැකි වනු ඇත.[11]
ජීවමාන දෙවි වන මා පවසන මේ
දේ අනිවාර්යයෙන්ම සිදු වන්නේය.'
එසේ පවසන්නේ විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි වන මමය."

**21** "විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේ පවසන්නේය.
'මා කඩුව, සාගතය, දරුණු වන-
මෘගයන් හා වසංගතය[12] යන ඒ
ක්‍රම හතරෙන්ම[13] යෙරුසලමට පහර
දෙන විට දේශයෙහි මොන තරම්
මහත් විනාශයක් සිදු වනු ඇද්ද! මා
එසේ කරන්නේ මිනිසුන්ව හා සතුන්ව
දේශයෙන් අතු ගා දමන පිණිසය.[14]
**22** එහෙත් එම විනාශයෙන් පවා බේ-
රෙන පිරිසක් සිටිනු ඇත.[15] එසේ බේ-
රෙන ඒ දූපුතුන් දෙස බලන්න! ඔවුහු

**14 පරි.**
1 යෙරෙ 14:16
2 එස 3:18
රෝම 1:27
3 ද්වි 13:11
2පේතෘ 2:15
4 උත් 17:7
යෙරෙ 24:7
එස 11:20
එස 37:27
හෙබ්‍රෙ 8:10
5 එස්රා 9:6
6 ලෙවී 26:26
7 යෙසා 3:1
යෙරෙ 15:2
8 යෙරෙ 7:20
9 උත් 6:8
යෙසා 54:9
හෙබ්‍රෙ 11:7
10 දානි 10:11
11 යෝබ් 1:8
යෝබ් 42:8
12 හිතෝ 11:4
යෙරෙ 15:1
13 2පේතෘ 2:9
14 2රාජා 17:25
15 ලෙවී 26:22
2රාජා 2:24
16 යෙරෙ 15:3
17 උත් 19:29
හෙබ්‍රෙ 11:7

**2 තීරුව**
1 ලෙවී 26:25
යෙරෙ 25:9
එස 5:12
එස 21:3
එස 38:21
2 යෙරෙ 33:12
එස 25:13
හොෂෙ 4:3
ශෙප 1:3
3 එස 14:14
4 1පේතෘ 1:17
2පේතෘ 2:9
එළි 20:13
5 ද්වි 28:21
2සාමු 24:15
යෙරෙ 14:12
ආමො 4:10
6 එස 7:8
එස 36:18
7 උත් 7:1
8 එස 28:3
9 යෝබ් 1:8
යෝබ් 42:8
10 එස 14:14
11 එස 18:20
හොෂෙ 10:12
ශෙප 2:3
12 එස 5:17
එස 33:27
13 යෙරෙ 15:2
14 යෙරෙ 32:43
15 ද්වි 4:31
2ලේක 36:20
යෙසා 6:13
යෙසා 10:20
එස 6:8
මීකා 5:7

එස **14:13*** ලෙවී 26:26හි පාදසටහන බලන්න.

ඔබ වෙතට පැමිණෙන්නෝය. ඔවුන්-
ගේ ගතිපැවතුම් ඔබ දකින්නහුය.[1]
එවිට මා යෙරුසලම පිට ගෙනා සෑම
විපතක්ම සාධාරණ බව ඔබ තේරුම්-
ගනු ඇත.’ ”
**23** “ ‘ඔබ ඔවුන්ගේ ගතිපැවතුම්
දකින විට එය සැබවින්ම ඔබට සැන-
සීමක් වනු ඇත. මා මේ දේශයට
කළ සෑම දෙයකටම හොඳ හේතුවක්
තිබෙන බව ඔබ දැනගන්නවා ඇත.’
එසේ පවසන්නේ විශ්වයේ පාලකයා-
ණන් වූ යෙහෝවා දෙවි වන මමය.”[2]

**15** යෙහෝවා දෙවි මට තව-
දුරටත් පැවසුවේ මෙසේය.
**2** “මනුෂ්‍ය පුත්‍රය, වනයේ වැඩෙන
ගසකට වඩා මිදිවැලේ[3] හෝ එහි
ලීයේ හෝ යම් විශේෂත්වයක් ඇද්ද?
**3** එයින් යම් වැඩකට ගත හැකි
පොල්ලක්වත් කපාගත හැකිද? නැත්-
නම් යම් භාජන එල්ලා තැබීමට
ඉන් ඇණයක්වත් සාදාගත හැකිද?
**4** එය භාවිත කළ හැක්කේ ගින්නට
දමන දර ලෙස පමණයි.[4] ගින්නෙන්
දැවී එය සම්පූර්ණයෙන්ම අඟුරු වී
යයි.[5] එවිට ඉන් කිසි ප්‍රයෝජනයක්
ඇද්ද? **5** මිදිවැලක් හොඳින් වැවී
තිබියදීත් එයින් කිසි ප්‍රයෝජනයක්
ගත නොහැක. එසේනම් එය ගින්-
නෙන් දැවී සම්පූර්ණයෙන්ම අඟුරු වී
ගිය පසු එයින් ප්‍රයෝජනයක් ගත
හැකිද?”[6]
**6** “එබැවින් විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි මෙසේ පව-
සයි. ‘වනයේ ගස් අතරේ වැඩෙන
මිදිවැලක් මා ගින්නට දමන්නා
සේම යෙරුසලමේ වැසියන්වත් මම
ගින්නට නියම කරන්නෙමි.[7] **7** මම
ඔවුන්ට විරුද්ධව නැඟී සිටින්නෙමි.[8]
ඔවුන් කලින් ගින්නෙන් බේරුණත්
දැන් ඔවුහු ගින්නෙන් දැවී යනු ඇත.[9]
මා ඔවුන්ට විරුද්ධව නැඟී සිටින විට
මා යෙහෝවා දෙවි බව පිළිගන්න
ඔබට සිදු වෙනවා ඇත.’ ”[10]
**8** “ ‘ඔවුහු මට ද්‍රෝහි වූහ.[11] ඒ නිසා
මම දේශය පාළු ස්ථානයක් බවට
පත් කරන්නෙමි.’[12] මේ දේ පවසන්-
නේ විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි වන මමය.”

**16** යෙහෝවා දෙවි මට මෙසේ
පැවසුවේය. **2** “මනුෂ්‍ය
පුත්‍රය, යෙරුසලම් දියණියට ඇය
කරන පිළිකුල්සහගත ක්‍රියා[1] ගැන
දන්වන්න.[2] **3** ඔබ ඇයට මෙසේ
පැවසිය යුතුයි. ‘විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි යෙරුස-
ලම් දියණියට පවසන්නේ මෙයයි.
“ඔබ පැමිණියේ කානානිවරුන්ගේ දේ-
ශයෙනි.[3] ඔබ උපත ලැබුවේ එහි-
දීය. ඔබේ පියා අමෝරි ජාතිකයෙකි.[4]
මව හිත්තී ජාතික[5] ස්ත්‍රියකි. **4** ඔබ
උපන් දවසේදී[6] ඔබේ පෙකණිවැල
කපා තිබුණේ නැත. ඔබව නහවා
තිබුණේවත් ඔබේ සිරුරේ ලුණු ගල්වා
තිබුණේවත් නැත. ඔබව රෙදිකඩ-
කින් ඔතා තිබුණේද නැත. **5** ඔබට
අනුකම්පා කර ඒ කිසිවක් කරන්න
කිසිම කෙනෙක් ඉදිරිපත් වූයේ
නැත.[7] ඔබ උපන් දවසේදී ඔබ ගැන
පිළිකුලක් ඇති වූ නිසා ඔබව එළිමහ-
නේ කෙතක දමා යන ලදි.
**6** “ ‘ “මමද එතැන පසු කරමින්
යද්දී ලෙයින් තැවරී දඟලමින් සිටින
ඔබව දුටිමි. එවිට ලෙයින් තැවරී සිටි
ඔබට, ‘ජීවත් වන්න’ කියා මම පැවසු-
වෙමි.[8] එසේ කියා මම ඔබට ජීවිතයක්
දුනිමි. **7** මම ඔබව උස් මහත් කර
සරුසාරව වැඩෙන කෙතක් හා සමා-
නව වර්ධනය වීමට සැලැස්වූවෙමි.[9]
ඔබ උස මහතින් වැඩී සියලු වටිනා
ආභරණවලින්ද සැරසී සිටියෙහිය.[10]
නිරුවතින් සිටි ඔබට දිගු වරලසක්ද
මනාව වැඩුණු පියයුරුද තිබිණ.” ’
**8** “ ‘පසුව මා නැවත ඔබ සිටි තැන
පසු කරමින් යද්දී ඔබ පෙම් කරන
වයසට එළඹ ඇති බව මම දුටිමි.[11]
එවිට මාගේ වස්ත්‍රය ඔබ මතට
එළා ඔබේ නිරුවත වසා ඇමුවෙමි.[12]
මම ඔබට පොරොන්දුවක් දෙමින්
ඔබ සමඟ ගිවිසුමක් ඇති කළෙමි.’[13]

**14 පරි.**
**1** යෙරෙ 3:25; එස 6:9; එස 20:43
**2** උත් 18:20; නෙහෙ 9:33; යෙරෙ 22:9; එස 8:6; එස 9:9; ආනි 9:7; රෝම 2:5

**15 පරි.**
**3** ද්වි 32:32; ගීතා 80:8; යෙසා 5:1; මාක් 12:1
**4** ගීතා 80:16; යොහ 15:6
**5** යෙසා 1:31; ආමෝ 4:11
**6** මලා 4:1
**7** යෙසා 5:24; යෙරෙ 4:7; යෙරෙ 7:20; එස 20:47
**8** ලෙවී 17:10; ගීතා 34:16; එස 14:8
**9** ආමෝ 5:19
**10** නික් 14:4; ගීතා 9:16; එස 6:7; එස 7:4
**11** 2ලේක 36:14
**12** යෙසා 6:11; යෙරෙ 25:11; එස 6:14

**2 තීරුව**

**16 පරි.**
**1** එස 8:10
**2** යෙසා 58:1; එස 20:4; එස 22:2; එස 23:36
**3** යොෂු 10:5; 1ලේක 1:13; 1ලේක 1:14
**4** 1රාජා 21:26; 2රාජා 21:11; එස 16:45
**5** උත් 10:15
**6** හොෂෙ 2:3
**7** යෙසා 49:15
**8** ගීතා 147:20; රෝම 9:15
**9** උත් 22:17; නික් 1:7; නික් 12:37; ද්වි 1:10; ක්‍රියා 7:17
**10** ද්වි 4:8; නෙහෙ 9:22
**11** ද්වි 7:8

**12** රූත් 3:9; 1සාමු 12:22; යෙසා 41:9; **13** නික් 19:5; ද්වි 4:31; යෙරෙ 2:2.

එසේ පවසන්නේ විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි වන
මමය. ‘මම එසේ කර ඔබව අයිති
කරගතිමි.[1] **9** මම ඔබව නහවා[2]
ඔබේ ඇඟේ තැවරී තිබුණු ලේ සෝදා-
හැර ඔබේ සිරුරේ තෙල් ගැල්වුවෙමි.[3]
**10** මෝස්තර දමා මැසූ වස්ත්‍රයක්
ඔබට අන්දවා[4] සීල් මත්ස්‍යයාගේ හම්-
වලින් සෑදූ වහන් පැළඳුවෙමි.[5] ඔබේ
හිස සිහින් ලිනන් රෙද්දකින් වසා[6]
අගනා වස්ත්‍රවලින් ඔබව සැරසුවෙමි.
**11** ඔබේ දෑතට වළලුද[7] ගෙලට මාල-
යක්ද[8] දමා ඔබට විවිධ ආභරණ
පැළඳුවෙමි. **12** ඔබේ නාසයට ආභ-
රණයක්ද[9] කන්වලට කරාබුද[10] ඔබේ
හිසට අලංකාර ඔටුන්නක්ද මම දැමු-
වෙමි.[11] **13** මම රනින් හා රිදීව-
ලින් ඔබව සැරසුවෙමි. සිහින් ලිනන්
හා වෙනත් අගනා රෙදිවලින් නිමැවූ
වස්ත්‍රද මෝස්තර දමා මැසූ වස්ත්‍ර-
යක්ද ඔබට ඇන්දුවෙමි.[12] ඔබ ආහාර-
යට ගත්තේ සිහින් පිටි, මීපැණි හා
තෙල්ය.[13] ඔබ ඉතා රූමත් වී රාජකීය
ගෞරවය ලබන්න සුදුසු තැනැත්ති-
යක බවට පත් විය.’ ”[14]

**14** “ ‘ඔබ කොතරම් රූමත් වුවාද
කිවහොත් ජාතීහු පවා ඔබ ගැන කතා
කළෝය. එසේ වූයේ මාගේ තේජසින්
ඔබව අලංකාරවත් කළ නිසාය.’[15]
එසේ පවසන්නේ විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවිය.”

**15** “ ‘එහෙත් ඒ රූමත්කම ඔබේ
ආඩම්බරකමට හේතු විය.[16] ඔබේ
කීර්තිය අතකොළුවක් කරගෙන ඔබ
රාගයෙන් මත්ව මඟ යන එන සෑම
කෙනෙකු සමඟම[17] වේශ්‍යාකම් කර-
මින් ගණිකාවක් බවට පත් විය.[18]
ඔවුහුද ඔබේ රූ සපුවෙන් වින්දනා-
යක් ලැබුවෝය. **16** ඔබේ වස්ත්‍රව-
ලින් කිහිපයක් රැගෙන ඔබ විසිතුරු,
වර්ණවත් පූජනීය ස්ථාන සාදාගත්-
තෙහිය.[19] එම ස්ථානවල ඔබ වේශ්‍යා-
කම් කළෙහිය.[20] මෙවැනි දේවල් නම්
කිසිසේත් සිදු විය යුතු දේවල් නොවේ.
**17** මා ඔබට දුන් අලංකාර රන් හා
රිදී ආභරණවලින්[21] ඔබ පුරුෂයන්-
ගේ රූප සාදාගෙන[1] ඒවා ඉදිරියෙහි
වේශ්‍යාකම් කළෙහිය.[2] **18** ඔබ එම
රූප ආවරණය කළේ මෝස්තර දමා
මැසූ ඔබේ වස්ත්‍රවලිනි. මා ඔබට
දුන් තෙල් හා සුවඳ ද්‍රව්‍යද[3] ඔබ
ඒවා ඉදිරියේ තැබුවෙහිය. **19** මා
ඔබට දුන් සිහින් පිටි, තෙල්, මීපැණි
යනාදි ආහාර[4] එම රූප ඉදිරියෙහි
දවා ප්‍රසන්න සුවඳක් නැඟෙන පිණිස
ඒවා ඔප්පු කළෙහිය.[5] ඔබ ඒ දේ
නොනවත්වාම කළෙහිය.’ එසේ පව-
සන්නේ විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවිය.”

**20** “ ‘ඔබ වේශ්‍යාකම් කළා මදිවට
මට දාව ඔබ බිහි කළ දරුදැරියන්-
වද[6] එම රූප ඉදිරියෙහි ඔප්පු කළෙ-
හිය.[7] **21** ඔබ මාගේ පුතුන්ව මරා
දැමුවෙහිය.[8] ඔවුන්ව ගින්නෙන් දවා*
එම රූපවලට පිදුවෙහිය.[9] **22** මේ
පිළිකුල්සහගත ක්‍රියා හා වේශ්‍යා-
කම් කරන අතරතුරේදී ඔබට ඔබේ
ළමා කාලය සිහි වූයේ නැත. ඔබ
නිරුවත්ව ලෙයින් තැවරී දඟලමින්
සිටි කාලය ඔබේ මතකයට නැඟුණේ
නැත.[10] **23** (එහෙයින්, “ඔබට අත්
වන්නේ මහත් විපතකි”[11] කියා විශ්ව-
යේ පාලකයාණන් වන යෙහෝවා දෙවි
පවසයි.) නොනවත්වාම මේ නපුරු-
කම්වල නියැලුණු ඔබ **24** පස්වලින්
ගොඩැලි තනා සෑම ප්‍රධාන මංසන්ධි-
යකම වෙනත් දෙවිවරුන්ට පූජනීය
ස්ථාන ඉදි කළෙහිය.[12] **25** ඔබ සෑම
මංසන්ධියකම ඉදි කළ එම ස්ථානව-
ලදී[13] ඔබේ රූමත්කම ප්‍රයෝජනයට
ගෙන පිළිකුල්සහගත දේවල් කළෙ-
හිය.[14] ඔබව පසු කරගෙන යන සෑම
කෙනෙකු පසුපස ගොස්[15] ඔබ ඉවක්බ-
වක් නැතුව වේශ්‍යාකම් කළෙහිය.[16]
**26** අධික කාමාශාවෙන් මත්ව සිටින[17]

**16 පරි.**
**1** ද්වි 26:18; ද්වි 32:9
**2** ගීතා 26:6; යෙසා 1:16
**3** ගීතා 23:5
**4** නික් 28:6; යෙසා 62:3
**5** නික් 25:5; නික් 26:14
**6** නික් 39:27
**7** උත් 24:22; යෙසා 3:19
**8** සල 4:9
**9** උත් 24:47; යෙසා 3:21
**10** නික් 35:22
**11** නික් 28:36
**12** ගීතා 48:2
**13** ද්වි 7:13; යෙරෙ 41:8
**14** ද්වි 32:13; 2සාමු 5:3; 1රාජා 4:21
**15** ද්වි 4:6; 2සාමු 7:23; 1රාජා 10:1; ගීතා 50:2; විලා 2:15
**16** ද්වි 32:15; යෙරෙ 7:4; මීකා 3:11; ශෙප 3:11
**17** යෙරෙ 3:13
**18** 1රාජා 11:5; ගීතා 106:35; යෙසා 1:21; යෙසා 57:8; යෙරෙ 2:20; හොෂෙ 1:2; යාකො 4:4
**19** 1රාජා 14:23; 2ලේක 21:11
**20** 2රාජා 23:7; එස 7:20
**21** නික් 32:2; යෙරෙ 10:4

**2 තීරුව**
**1** යෙසා 57:8; එස 16:26; එස 23:20
**2** යෙරෙ 3:9
**3** එස 8:11; එස 23:41
**4** ද්වි 32:13; හොෂෙ 2:8
**5** 2රාජා 22:17; යෙරෙ 7:9
**6** නික් 13:2; ගීතා 106:38
**7** 2රාජා 16:3; 2ලේක 33:6; යෙසා 57:5; යෙරෙ 7:31; යෙරෙ 32:35; එස 20:26
**8** ගීතා 106:37; යෙරෙ 2:34

**9** ලෙවී 18:21; ලෙවී 20:2; 2රාජා 17:17; 2රාජා 23:10; **10** යෙරෙ 2:2; හොෂෙ 2:3; හොෂෙ 11:1; **11** යෙරෙ 13:27; ශෙප 3:1; **12** ලෙවී 26:30; ගීතා 78:58; යෙසා 57:5; යෙරෙ 2:20; යෙරෙ 3:2; **13** හිතෝ 9:14; **14** යෙරෙ 6:15; **15** යෙරෙ 2:24; එස 23:9; **16** එස 23:30; **17** යෙසා 57:8; එස 23:20.

එස **16:21*** මූ.අ., “ගින්න මැදින් යැමට සලස්වා.”

ඔබේ අසල්වාසීන් වන ඊජිප්තුවේ පුත්‍ර-
යන් සමඟද ඔබ වේශ්‍යාකම් කළෙ-
හිය.[1] ඔබ තව තවත් වේශ්‍යාකම්වල
යෙදුණේ මාව උදහස් කරන පිණි-
සය. **27** බලන්න! මම ඔබට විරුද්-
ධව මාගේ හස්තය ඔසවා[2] ඔබට හිමි වූ
කොටස අඩු කරන්නෙමි.[3] ඔබට වෛර
කරන ස්ත්‍රීන්[4] එනම්, ඔබේ නින්දිත
හැසිරීම නිසා මහත් සේ ලැජ්ජාවට
පත්ව සිටින[5] පිලිස්තියේ දූවරුන්ගේ[6]
අතට මම ඔබව හසු කර දෙන්නෙමි.[7]
**28** "'ඔබේ කාමාශාව සන්සිඳුවා
ගත නොහැකි වූ නිසා ඔබ ඇසිරියාවේ
පුත්‍රයන් සමඟද වේශ්‍යාකම් කළෙ-
හිය.[8] ඔවුන් සමඟ වේශ්‍යාකම් කළත්
ඔබ තෘප්තියට පත් වුණේ නැත.
**29** එහෙයින් ඔබ කානාන් දේශ-
යේ වැසියන් සමඟත්[9] කල්දිවරුන්
සමඟත් නිරතුරුව වේශ්‍යාකම් කළෙ-
හිය.[10] එයින්වත් ඔබ තෘප්තියට පත්
වුණේ නැත.' **30** විශ්වයේ පාලක-
යාණන් වන යෙහෝවා දෙවි මෙසේ
පවසයි. 'ඔබ කිසි ලැජ්ජාවක් හයක්
නැති ගණිකාවකි![11] ඔබ කළ මේ
දේවල් නිසා මාගේ කෝපය ඔබට
විරුද්ධව ඇවිළෙන්නේය![12] **31** ඔබ
පස්වලින් ගොඩැලි තනා සෑම ප්‍රධාන
මංසන්ධියකම වෙනත් දෙවිවරුන්ට
පූජනීය ස්ථාන ඉදි කළෙහිය. එහෙත්
ඔබ නම් සාමාන්‍ය ගණිකාවකට වඩා
වෙනස්ය. මන්ද ඔබේ සේවාවන්
සඳහා ඔබ කුලියක් ගැනීමට අක-
මැති විය. **32** සාමාන්‍යයෙන් අනා-
චාරයෙහි* යෙදෙන ස්ත්‍රියක ඇසුරු
කරන්නේ තම සැමියා සමඟ නොව
වෙනත් පුරුෂයන් සමඟය.[13] **33** ඒ
වගේම ගණිකාවන් සමඟ ඇසුරු
කරන පුරුෂයෝ ඔවුන්ට තෑගි දීමට
පුරුදුව සිටිති.[14] නමුත් ඔබ ඊට
වඩා වෙනස්ය. ඔබ කෙරෙහි රාග-
යෙන් මත්ව සිටින සියලුදෙනාටම
ඔබ තෑගි දෙන්නෙහිය.[15] ඔබ සමඟ
වේශ්‍යාකම් කිරීමට දස දෙසින් මිනි-
සුන්ව ඇදගැනීම සඳහා ඔබ ඔවුන්ට
අල්ලස් දෙන්නෙහිය.[1] **34** වේශ්‍යා-
කම් කරන වෙනත් ස්ත්‍රීන්ට වඩා
ඔබ හාත්පසින්ම වෙනස්ය. ඔබ කරන
ආකාරයේ වේශ්‍යාකමක් කෙදිනක-
වත් සිදු වී නැත. මන්ද ඔබ ඔවුන්ට
මුදල් දෙනවා මිස ඔවුන්ගෙන් කිසි
මුදලක් ලබාගන්නේ නැත.'
**35** "ගණිකාව,[2] යෙහෝවා දෙවිගේ
වචනයට සවන් දෙන්න.[3] **36** විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවි පවසන්නේ මෙයයි. 'ඔබ අධික
කාමාශාවෙන් මත්ව සිටින්නෙහිය.[4]
ඔබ කෙරෙහි රාගයෙන් මත්ව සිටින
අය[5] ඉදිරියෙත් ඔබේ පිළිකුල්සහ-
ගත රූප ඉදිරියෙත්[6] ඔබේ නිරුවත
පෙන්වමින්[7] වේශ්‍යාකම් කළෙහිය. ඒ
රූප ඉදිරියේ ඔබේ පුතුන්ගේ ලේ පවා
ඔබ පූජා කළෙහිය.[8] **37** ඒ නිසා
ඔබ කෙරෙහි රාගයෙන් මත්ව ඔබෙන්
මහත් වින්දනයක් ලැබූ සියලුදෙනා-
වත් ඔබ පෙම් කළ සියලුදෙනාවත්
ඔබ වෛර කළ සියලුදෙනාවත් ඔබට
විරුද්ධව රැස් කරන්නෙමි. දස දෙසින්
පැමිණෙන ඔවුන්ට ඔබේ නිරුවත පෙ-
නෙන පිණිස මම ඔබේ වස්ත්‍ර ගලවා
දමන්නෙමි.[9]
**38** "'අනාචාර ස්ත්‍රීන්ට[10] හා ලේ
වගුරුවන ස්ත්‍රීන්ට ලැබිය යුතු විනිශ්-
චය මම ඔබට දෙන්නෙමි.[11] මාගේ
දැවෙන උදහස ඔබ පිට වගුරුවා ඔබේ
ලේ හළන්නෙමි.[12] **39** මම ඔවුන්-
ගේ අතට ඔබව හසු කර දෙන්-
නෙමි. ඔවුහු ඔබ ඉදි කළ ගොඩැලි
බිමට සමතලා කර[13] ඔබ ගොඩ-
නැඟූ පූජනීය ස්ථාන කඩා බිඳ දමන්-
නෝය.[14] ඔවුහු ඔබේ වස්ත්‍රද[15] ඔබේ
අලංකාර ආභරණද ගලවා දමා[16]
ඔබව නිරුවත් කර ඔබව අත්හරි-
නවා ඇත. **40** පසුව ඔවුහු ඔබට
විරුද්ධව සමූහයක් රැස් කර[17] ඔබට
ගල් ගසා[18] ඔවුන්ගේ කඩුවලින් ඔබව
මරා දමන්නෝය.[19] **41** ඔවුහු ඔබේ
නිවෙස්වලට ගිනි තබා[20] බොහෝ

එස **16:32*** මූ.අ., "පරදාර සේවනයෙහි."

**16 පරි.**
**1** 2රාජා 23:34 යෙසා 30:2 යෙසා 30:3 යෙරෙ 2:36 විලා 5:6 එස 20:7
**2** යෙසා 5:25
**3** ද්වි 28:48
**4** ගීතා 106:41
**5** යෙරෙ 2:11 එස 5:6
**6** 2ලේක 28:18
**7** යෙසා 56:11
**8** 2රාජා 16:7 2ලේක 28:23 යෙරෙ 2:18 එස 23:5
**9** විනි 2:12 2රාජා 21:9
**10** එස 23:14
**11** හිතෝ 7:11 යෙරෙ 3:3
**12** ද්වි 29:28
**13** යෙරෙ 2:25 යෙරෙ 3:1 යෙරෙ 3:20 හොෂෙ 3:1
**14** උත් 38:16 ද්වි 23:18 හොෂෙ 2:12 ලූක් 15:30
**15** යෙසා 57:9 හොෂෙ 8:9

**2 තීරුව**
**1** 2ලේක 16:2
**2** යෙසා 1:21 යෙරෙ 3:6 හොෂෙ 2:5
**3** එස 13:2
**4** විලා 1:9
**5** එස 23:9 හොෂෙ 2:5
**6** 1රාජා 15:12 2රාජා 17:12 2රාජා 21:11
**7** එස 16:37
**8** ගීතා 106:38 යෙරෙ 2:34
**9** යෙරෙ 13:22 විලා 1:8 හොෂෙ 2:10 නාහු 3:5
**10** උත් 38:24 ලෙවී 20:10 ද්වි 22:22
**11** උත් 9:6 නික් 21:12 ගීතා 79:3
**12** එස 23:25 නාහු 1:2 ශෙප 1:17
**13** එස 16:24
**14** යෙසා 27:9
**15** යෙසා 3:18 යෙරෙ 4:30 එස 23:26 හොෂෙ 2:3
**16** යෙසා 3:20
**17** එස 23:46 හබ 1:6
**18** ද්වි 22:21; **19** 2ලේක 36:17; යෙරෙ 25:9; **20** ලෙවී 26:33; 2රාජා 25:9; යෙරෙ 39:8.

ස්ත්‍රීන් ඉදිරියේම ඔබට දඬුවම් කර-
නවා ඇත.[1] මෙලෙස, මම ඔබ කරන
වේශ්‍යාකම් නතර කර දමන්නෙමි.[2]
ඔබ තවදුරටත් ඔබේ පෙම්වතුන්ට
කුලී නොගෙවන්නෙහිය. **42** එවිට
මාගේ උදහස නිවී යන්නේය.[3] මාගේ
දැවෙන කෝපය සන්සිඳෙනු ඇත.[4]
මාගේ සිතින් අමනාපය ඉවත් කර
මම සන්සුන් වෙමි.'

**43** "'ඔබේ යොවුන් විය අමතක
කර[5] ඔබ කළ සෑම දෙයකින්ම මාව
කුපිත කළෙහිය.[6] එමනිසා ඔබ කළ
සියලු දේවල ප්‍රතිඵල මම ඔබ පිට-
ටම ගෙනෙන්නෙමි.[7] තවදුරටත් ඔබේ
පිළිකුල්සහගත ක්‍රියාද ඔබේ නින්දිත
හැසිරීම්ද දක්නට ලැබෙන්නේ නැත.'
එසේ පවසන්නේ විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවිය.

**44** "'බලන්න! ජනයා ඔබව
පෙන්වා, "අම්මා වගේමයි දුවත්"[8]
යන කියමන පවසනු ඇත.[9] **45** ඒ
දුව ඔබය. ඔබ වගේම ඔබේ මවත්[10]
ඇගේ පුරුෂයාව හා පුතුන්ව පිළි-
කුල් කොට සැලකුවාය.[11] ඔබ වගේම
ඔබේ සහෝදරියෝද ඔවුන්ගේ පුරුෂ-
යන්ව හා පුතුන්ව පිළිකුල් කොට
සැලකුවෝය. ඔබ සැමගේ මව හිත්තී
ජාතික ස්ත්‍රියකි.[12] ඔබේ පියා අමෝරි-
වරයෙකි.'"[13]

**46** "'ඔබේ වැඩිමල් සොහොයුරිය
නම් ඔබට වම් පසින් පිහිටි සමා-
රිය[14] හා ඒ අවට තිබෙන නුවර-
වල්ය.[15] ඔබේ බාල සොහොයුරිය නම්
ඔබට දකුණු පසින් පිහිටි සොදොම[16]
හා ඒ අවට තිබෙන නුවරවල්ය.[17]
**47** ඔබ ඔවුන් හැසිරුණු ආකාරයටත්
ඔවුන් කළ පිළිකුල්සහගත දේවලටත්
අනුව ක්‍රියා කළා පමණක් නොව,[18]
වැඩි කල් නොගොස් ඔබ ඊටත් වඩා
නින්දිත ලෙස හැසිරෙන්න පටන්-
ගත්තෙහිය.'[19] **48** විශ්වයේ පාල-
කයාණන් වන යෙහෝවා දෙවි
පවසන්නේ මෙයයි. 'ඔබේ සොහොයු-
රිය වූ සොදොම හා ඒ අවට පිහිටි
නුවරවල් පවා ඔබ හා ඔබ අවට
පිහිටි නුවරවල් තරම් දරුණු විදිහට
ක්‍රියා කර නැත කියා ජීවමාන දෙවි
වන මම සහතිකවම පවසන්නෙමි.[1]
**49** ඔබේ සොහොයුරිය වූ සොදොම
හා ඒ අවට පිහිටි නුවරවල් කළ
වරද නම් උඩඟු ලෙස ක්‍රියා කිරී-
මත්[2] අනුන් ගැන නොතකා[3] තමන්
ලැබූ සමෘද්ධිය ගැන සතුටු වී කා
බී තෘප්තියට පත්ව සිටීමත්ය.[4] ඇය
තමන්ගේ වැසියන්ටවත් අවට නුව-
රවල වැසියන්ටවත්[5] පීඩාවට පත්-
වූවන්ටවත්[6] දුප්පතුන්ටවත් අතහිත
දුන්නේ නැත.[7] **50** ඔවුන්ගේ අහං-
කාරකමට නිමක් නොවීය.[8] ඔවුහුද
දිගටම මා ඉදිරියේ පිළිකුල්සහගත
ක්‍රියා කළෝය.[9] ඒ නිසා ඔවුන්ව තුරන්
කර දැමීමට මම තීරණය කළෙමි.[10]

**51** "'සමාරිය[11] ඔබ කළ පාපවලින්
අඩක්වත් කළේ නැත. ඔබ ඔවුන්ට
වඩා බොහෝ සෙයින් පිළිකුල්සහගත
දේවල් කළෙහිය. ඔබ කළ පිළිකුල්ස-
හගත ක්‍රියා හා සසඳද්දී ඔබේ සො-
හොයුරියන් ඔබට වඩා ධර්මිෂ්ඨය.[12]
**52** ඔබ ක්‍රියා කර ඇති ආකාරය
නිසා ඔබේ සහෝදරියන් ඔබට වඩා
නිදොස් බව පෙනේ. එහෙයින් ඔබ
බොහෝ සෙයින් ලැජ්ජාවටත් නින්දා-
වටත් පත් වෙනවා ඇත. මන්ද ඔබ
කළ පිළිකුල්සහගත දේවල් හා සසඳා
බලද්දී ඔබේ සහෝදරියන් ඔබට වඩා
ධර්මිෂ්ඨ බව පෙනේ.[13] ඒ නිසා ඔබ
අනිවාර්යයෙන්ම නින්දාවට ලක් වනු
ඇත.'

**53** "'එහෙත් මම සොදොම හා
ඒ අවට නුවරවල වහලුන්ටද සමා-
රියේ හා ඒ අවට නුවරවල වහ-
ලුන්ටද නිදහස දෙන්නෙමි.[14] ඔවුන්
අතරේ සිටින ඔබේ වහලුන්ටද නිද-
හස දෙන්නෙමි.[15] **54** එහෙත් ඔබ
කළ සියලු දේවල් නිසා ඔබ ලැජ්ජා-
වට පත් වන්නෙහිය.[16] ඔබේ නින්දාව
ඔබට දරාගැනීමට සිදු වෙයි. එමගින්
ඔවුහු අස්වැසිල්ලක් ලබන්නෝය.[17]

**16 පරි.**
**1** එස 5:8
**2** එස 23:27
**3** එස 5:13
**4** යෙසා 40:2
**5** ගීතා 78:42; යෙරෙ 2:32
**6** ගීතා 95:10
**7** එස 9:10; එස 11:21; එස 22:31
**8** 1රාජා 21:26; 2රාජා 21:9; එස්රා 9:1; ගීතා 106:35
**9** 1සාමු 24:13; එස 18:2
**10** එස 16:3
**11** යෙසා 1:4; යෙසා 54:5; හොෂෙ 2:2
**12** එස 16:3
**13** ද්වි 9:5; ද්වි 20:17; යොෂු 10:5; 2රාජා 21:11
**14** එස 23:33
**15** යෙරෙ 3:8
**16** උත් 18:20; උත් 19:24; ද්වි 29:23; ද්වි 32:32; යෙසා 1:10; යෙසා 3:9; යෙරෙ 23:14; යූද් 7
**17** උත් 19:25
**18** 1රාජා 16:31
**19** 2රාජා 21:9; එස 5:6

**2 තීරුව**
**1** මතෙ 10:15; මතෙ 11:24
**2** උත් 19:9; හිතෝ 16:5; හිතෝ 16:18; හිතෝ 21:4; යාකො 4:16
**3** හිතෝ 1:32
**4** උත් 13:10; ද්වි 8:10; ද්වි 32:15; හිතෝ 30:9; ලූක් 12:21
**5** යූද් 7
**6** හිතෝ 21:13
**7** එස 18:12
**8** හිතෝ 16:18; යෙසා 3:16; යෙරෙ 13:15; 1පේත්‍රු 5:5
**9** උත් 13:13; උත් 18:20; උත් 19:5
**10** උත් 19:24; යෙසා 13:19; යෙරෙ 49:18; විලා 4:6; 2පේත්‍රු 2:6

**11** 2රාජා 21:13; යෙරෙ 23:13; එස 23:33; **12** යෙරෙ 3:11; මතෙ 12:41; **13** 1රාජා 2:32; **14** ගීතා 14:7; ගීතා 126:1; යෙසා 1:9; **15** යෙසා 19:24; **16** යෙරෙ 2:26; එස 36:31; **17** එස 14:22.

**55** ඔබේ සහෝදරියන් වන සොදොම
සහ ඒ අවට නුවරවල්ද සමාරිය හා ඒ
අවට නුවරවල්ද මුල් තත්වයට පත්
වනු ඇත. එසේම ඔබද ඔබ අවට
පිහිටි නුවරවල්ද මුල් තත්වයට පත්
වනු ඇත.[1] **56** ඔබ උඩඟුකමින් හිස
උදුම්මාගෙන සිටි කාලයේදී ඔබ ඔබේ
සොහොයුරිය වූ සොදොම සැලකු-
වේ සඳහන් කිරීමට තරම්වත් වටින්-
නේ නැති කෙනෙකු ලෙසය.[2] **57** ඒ
ඔබේ දුෂ්ටකම සියල්ලන්ටම හෙළි
වීමට පෙරාතුවය.[3] සිරියාවේ දූවරුන්[4]
හා ඒ අවට සිටි සියලුදෙනා අතින්ද
පිලිස්තියේ දූවරුන්[5] අතින්ද ඔබ
මුහුණ දුන් නින්දාවට සමාන නින්දාව-
කට නැවතත් මුහුණ දෙන්න ඔබට සිදු
වේ. ඔබව වට කරගෙන සිටින ඔවුහු
ඔබට සරදම් කරන්නෝය.[6] **58** ඔබ
නින්දිතව හැසිරුණු නිසාත්[7] පිළිකුල්-
සහගත ක්‍රියා කළ නිසාත් එහි ප්‍රතිඵල
විඳින්න ඔබට සිදු වෙනවා ඇත.’[8]
එසේ පවසන්නේ යෙහෝවා දෙවිය.”

**59** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙසේය.
‘ඔබ මාගේ ගිවිසුම කඩ කරමින්
මට දුන් පොරොන්දු සුළු කොට
සැලකුවෙහිය.[9] මමද ඔබේ ක්‍රියා-
වලට අනුව ඔබට දඬුවම් කරන්-
නෙමි.[10] **60** එහෙත් ඔබේ යොවුන්
වියේදී මා ඔබ සමඟ කළ ගිවි-
සුම සිහි කර[11] සදාකාලයටම පව-
තින ගිවිසුමක් මම ඔබ සමඟ ඇති
කරගන්නෙමි.[12] **61** ඔබේ වැඩිමල්
සහෝදරියවද ඔබේ බාල සහෝදරිය-
වද ඔබ පිළිගන්නා විට ඔබට ඔබේ
අතීතය සිහි වී[13] ඔබ ලැජ්ජාවට පත්
වනවා ඇත. මම ඔවුන්ව ඔබට දූව-
රුන් ලෙස දෙන්නෙමි.[14] එහෙත් මා
එසේ කරන්නේ ඔබ සමඟ ඇති කර-
ගත් ගිවිසුම නිසා නම් නොවේ.’[15]

**62** “‘මම ඔබ සමඟ ඇති කරගත්
ගිවිසුම ස්ථිර කරන්නෙමි.[16] එවිට මා
යෙහෝවා දෙවි බව පිළිගන්න ඔබට
සිදු වෙනවා ඇත. **63** එසේ වන්නේ
ඔබ කළ දේවල් සිහි කර ඔබ සැබ-
වින්ම ලැජ්ජාවට පත් වන පිණිසය.[17]
ඔබ කළ සියලු දේට මම ඔබට සමාව
දෙන්නෙමි.[1] එවිට ඔබට දැනෙන
ලැජ්ජාව නිසා ඔබ කට පියාගෙන
සිටිනු ඇත.’[2] එසේ පවසන්නේ විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවිය.”

# 17

යෙහෝවා දෙවි මට තව-
දුරටත් මෙසේ පැවසුවේය.
**2** “මනුෂ්‍ය පුත්‍රය, ඊශ්‍රායෙල් ජන-
තාවට තේරවිල්ලක්ද[3] උපමාවක්ද
කියන්න.[4] **3** ඔබ මෙසේ පැවසිය
යුතුයි. ‘විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි.
“මහා රාජාලියෙක් සිටියේය.[5] ඌට
නොයෙක් වර්ණවලින් යුත් දිගු පිහාටු
සහිත විශාල පියාපත් දෙකක් තිබු-
ණේය.[6] ඌ ලෙබනොන් දේශයට
ඇවිත්[7] එහි තිබූ දේවදාර ගසක[8] මුදුන
කඩාගත්තේය.[9] **4** ඌ එහි මුදුනේම
තිබුණු රිකිලි කඩා කානාන් දේශ-
යට ගෙනැවිත්[10] වෙළෙඳුන්ගේ නුව-
රක සිටෙව්වේය. **5** ඉන් අනතුරුව
ඌ දේශයෙන් බීජ ස්වල්පයක් ගෙන[11]
සරු කෙතක පැළ කළේය. ඌ ඒවා
බොහෝ දිය පහරවල් අසල විලෝ
ගසක් මෙන් සිටෙව්වේය.[12] **6** එම
බීජ දලු ලා කෙමෙන් කෙමෙන් වැඩු-
ණේය. ඒ අතරින් සරුසාරව වැඩෙන
මිදිවැලක්ද හටගත්තේය. එහෙත් එය
එතරම් උසට වැඩුණේ නැත.[13] එහි
අතු විහිදී ගියේද නැත. එය ක්‍රමානුකූ-
ලව මුල් ඇද ශක්තිමත් විය. කල්
යත්ම එය අතු හා රිකිලි විහිදුවන මිදි-
වැලක් බවට පත් වූයේය.[14]

**7** “‘“එවිට දිගු පිහාටු සහිත විශාල
පියාපත් ඇති[15] තවත් මහා රාජාලි-
යෙක් පැමිණියේය.[16] ඒ මොහොතේම,
මිදිවැල එය සිටුවා තිබූ පාත්ති-
යෙන් බැහැර වී[17] කැදරකමින් ඌ දෙ-
සට මුල් හා අතු විහිදුවේය.[18] එසේ
කළේ උගෙන් වතුර ලබාගන්නා පිණි-
සය. **8** එහෙත් අතු පතර විහිදී පල
දරන විශාල මිදිවැලක් මෙන් වැඩෙන
පිණිස ඒ වන විටත් එය බොහෝ දිය

**16 පරි.**
1 එස 36:11
මලා 3:4
2 යෙසා 65:5
ශෙප 3:11
3 විලා 4:22
එස 21:24
හොෂෙ 2:10
4 2රාජා 16:5
2ලේක 28:5
යෙසා 7:1
5 2ලේක 28:18
6 යෙරෙ 33:24
7 ගලා 5:19
1පේතෘ 4:3
8 විලා 5:7
එස 23:49
9 ද්වි 29:12
යෙරෙ 22:9
10 ගීතා 62:12
යෙසා 3:11
රෝම 2:6
ගලා 6:7
11 ලෙවී 26:42
ගීතා 106:45
12 යෙරෙ 32:40
යෙරෙ 50:5
13 එස 20:43
14 යෙසා 54:1
ගලා 4:26
15 යෙරෙ 31:31
හෙබ්‍රෙ 8:13
16 හොෂෙ 2:19
17 එස්රා 9:6
එස 36:31

**2 තීරුව**
1 ගීතා 103:12
මීකා 7:19
2 ගීතා 39:9
රෝම 3:19

**17 පරි.**
3 විනි 14:12
හිතෝ 1:6
4 එස 20:49
හොෂෙ 12:10
මතෙ 13:13
5 ද්වි 28:49
යෙරෙ 4:13
විලා 4:19
හොෂෙ 8:1
6 ආනි 7:4
7 යෙරෙ 22:23
8 2රාජා 24:12
2ලේක 36:10
යෙරෙ 24:1
9 යෙරෙ 22:7
10 2රාජා 24:15
11 යෙරෙ 37:1
එස 17:13
12 2රාජා 24:17
13 එස 17:14
14 2ලේක 36:11
15 යෙරෙ 37:7
16 යෙරෙ 37:5
එස 17:15
17 2රාජා 24:20
2ලේක 36:13

18 යෙසා 36:6.

පහරවල් අසල පිහිටි සරුබිමක පැළ
කර තිබිණ.”’[1]
9 “ඔවුන්ට මෙසේද කියන්න. ‘විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවි පවසන්නේ මෙයයි. “ඒ මිදිවැල
සරුවට වැඩෙයිද?[2] එය මුලිනුපුටා
දමනු නොලබන්නේද?[3] එහි පල කුණු
වී යැමට සලස්වන්නේ නැද්ද? අලුත
කැපූ එහි දලු සියල්ල වියළී යන්-
නේ නැද්ද?[4] එය මුලිනුපුටා දැමීමට
මහත් බලයක්වත් විශාල සමූහයක්-
වත් අවශ්‍ය වන්නේ නැත. 10 එය
වෙනත් තැනකට ගොස් පැළ වුණත්
එය සරුවට වැඩෙයිද? නැඟෙනහිර
දෙසින් හමන සුළඟට එය සම්පූර්ණ-
යෙන්ම වියළී යන්නේ නැද්ද?[5] එය
වැඩෙන පාත්තියේම වියළී යනවා
ඇත.”’”[6]
11 යෙහෝවා දෙවි මට තවදුර-
ටත් පැවසුවේ මෙසේය. 12 “කැර-
ලිකාර සෙනඟට මෙසේ පවසන්න.[7]
‘මේ දේවලින් අදහස් වන දේ ඔබට
වැටහෙන්නෙම නැද්ද?’ පසුව මෙසේද
කියන්න. ‘බැබිලෝනියේ රජ යෙරුස-
ලමට ගොස් එහි රජුවද[8] එහි අධිප-
තීන්වද බැබිලෝනියට ගෙනාවේය.[9]
13 ඉන්පසුව ඔහු යෙරුසලමේ රජ
පෙළපතට අයත් කෙනෙකු සමඟ[10]
ගිවිසුමක් ඇති කරගෙන එය කඩ
නොකරන බවට පොරොන්දුවක්ද
ඔහුගෙන් ගත්තේය.[11] ඔහු ඒ දේ-
ශයේ ප්‍රධානීන්වද රැගෙන ගියේය.[12]
14 එසේ කළේ එම රාජ්‍යය පහත්
තත්වයකට පත් කර[13] නැවත බල-
වත් නොවන පිණිසත් ගිවිසුම
නොමැතිව රාජ්‍යය නොපවතින පිණි-
සත්ය.[14] 15 එහෙත් ඒ තැනැත්තා
බැබිලෝනියේ රජුට විරුද්ධව කැරලි-
ගැසුවේය.[15] ඊජිප්තුවට දූත පිරිසක්
යවා උපකාර පැතූ ඔහු, ඔවුන්ගෙන්
අශ්වයන්ද[16] විශාල සෙනඟක්ද ඉල්-
ලීය. නමුත් ඔහුගේ සැලසුම් සාර්ථක
වෙයිද? මේ දේවල් කරන ඔහුට ගැල-
විය හැකිද? ගිවිසුම කඩ කරන ඔහුට
ඇත්තටම ගැලවිය හැකිද?’[17]

16 “‘“ඔහු තමා දුන් පොරොන්දුව
සුළු කොට තකමින් ගිවිසුම කඩ කළ
බැවින්[1] තමාව රජු ලෙස පත් කළ
තැනැත්තාගේ දේශයෙහිම මිය යනු
ඇත.[2] ඔහු බැබිලෝනියෙහි මිය යන්-
නේය. ජීවමාන දෙවි වන මා[3] පව-
සන මේ දේ අනිවාර්යයෙන්ම සිදු
වන්නේය.” එසේ පවසන්නේ විශ්ව-
යේ පාලකයාණන් වන යෙහෝවා දෙ-
විය. 17 පාරාවෝ ප්‍රබල හමුදාවක්
හා විශාල සමූහයක් රැගෙන ඔහුගේ
සහයට පැමිණියත් යුද්ධයේදී ඔවුහු
සාර්ථක වන්නේ නැත.[4] බොහෝදෙ-
නෙකුව විනාශ කරන පිණිස කඳවුරු
බැඳගෙන පවුරු ගොඩනැඟුවත් එයින්
පලක් වන්නේ නැත.[5] 18 ඔහු තමා
දුන් පොරොන්දුව සුළු කොට තකමින්
ගිවිසුම කඩ කළේය.[6] අතට අත දී[7] ඒ
ගිවිසුම ස්ථිර කළත් ඔහු ඒ ගිවිසුමට
විරුද්ධව කටයුතු කළේය. ඔහු කිසි-
සේත් ගැලවෙන්නේ නැත.’”[8]
19 “‘එබැවින් විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි පවසන්නේ
මෙයයි. “ඔහු මාගේ නාමයෙන් වූ පො-
රොන්දුව සුළු කළ නිසාත් මාගේ
නාමයෙන් ඇති කළ ගිවිසුම කඩ කළ
නිසාත්[9] මම ඔහුට දඬුවම් කරන්-
නෙමි. ජීවමාන දෙවි වන මා පවසන
මේ දේ අනිවාර්යයෙන්ම සිදු වන්-
නේය. 20 එහෙයින් ඔහුව හසු කර-
ගැනීමට මම දැලක් හෙළන්නෙමි.
ඔහුද ඒ දැලට අනිවාර්යයෙන්ම හසු
වන්නේය.[10] ඔහුව බැබිලෝනියට ගෙ-
නැවිත් ඔහු මට විරුද්ධව කළ සෑම
ද්‍රෝහිකමක් සඳහාම ඔහුට විරුද්ධව
මාගේ විනිශ්චය ප්‍රකාශ කරන්නෙමි.[11]
21 ඔහුගේ සේනාවෙන් පලා යන අය
කඩු පහරින් මිය යනු ඇත. ඉතුරු
වන අය සතරදිග සුළඟට විසිරී යන්-
නෝය.[12] යෙහෝවා දෙවි වන මා මේ
සියල්ල පැවසූ බව පිළිගන්න ඔබට
සිදු වනු ඇත.”’[13]
22 “‘විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි.
“මම දේවදාර ගසේ මුදුන් කොටස

**17 පරි.**
1 යෙරෙ 37:1
2 ගණන් 14:41; 2ලේක 13:12; යෙරෙ 32:5
3 යෙරෙ 21:7
4 2රාජා 25:7; යෙරෙ 52:10
5 හොෂෙ 13:15; යෝනා 4:8
6 එස 19:12
7 යෙසා 1:2; එස 2:5; එස 3:9; එස 12:9
8 2රාජා 24:12; යෙරෙ 22:25
9 යෙසා 39:7; යෙරෙ 52:32
10 2රාජා 24:17; යෙරෙ 37:1
11 2ලේක 36:13; යෙරෙ 5:2
12 2රාජා 24:15; යෙරෙ 24:1
13 ද්වි 28:43; 1සාමු 2:7
14 යෙරෙ 27:12; යෙරෙ 38:17
15 2රාජා 24:20; 2ලේක 36:13; යෙරෙ 52:3; එස 17:7
16 ද්වි 17:16; යෙසා 30:2; යෙසා 31:1; යෙරෙ 37:5
17 හිතෝ 19:5; යෙරෙ 32:4

**2 තීරුව**
1 මලා 3:5
2 යෙරෙ 34:3; යෙරෙ 52:11
3 හෙබ්‍රෙ 6:13
4 යෙසා 31:1; යෙරෙ 37:7; විලා 4:17; එස 29:6
5 යෙරෙ 33:5
6 මතෙ 5:37; රෝම 1:31
7 විලා 5:6
8 එස 17:15
9 ද්වි 5:11; යෙරෙ 5:2
10 2ලේක 33:11; එස 12:13; එස 32:3; හොෂෙ 7:12
11 එස 20:36; මීකා 6:2
12 එස 5:10; එස 12:14
13 එස 6:13

ගෙන[1] එහි රිකිලි අතරින් ළපටි එකක්
කඩා[2] උස් කන්දක් මත සිටුවන්-
නෙමි.[3] **23** එය ඊශ්‍රායෙල්හි පිහිටි
උස් කන්දක සිටුවන්නෙමි.[4] එයද අතු
පතර විහිදී ගිය බොහෝ පල දරන[5]
දැවැන්ත දේවදාර ගසක් බවට පත්
වන්නේය.[6] ඒ ගසේ සියලු ආකාර
කුරුල්ලන් වාසය කරනු ඇත. උන්
එහි අතුවල සෙවණෙහි ලගිනු ඇත.[7]
**24** යෙහෝවා දෙවි වන මා,[8] උසට
වැඩෙන ගස බිම හෙළන බවත්[9] කුඩා
ගස දැවැන්ත ගසක් බවට පත් කරන
බවත්[10] සරුවට වැඩෙන ගස වියළ-
වන බවත්[11] වියළී ගිය ගස සරුවට
වැඩෙන්න සලස්වන බවත් භූමියේ
වැඩෙන සියලු ගස් තේරුම්ගනු ඇත.
මේ දේ පැවසුවෙත් සිදු කළෙත් යෙ-
හෝවා දෙවි වන මමය."'"[12]

**18** යෙහෝවා දෙවි මට තව-
දුරටත් පැවසුවේ මෙසේය.
**2** "'අමු මිදි කෑවේ පියවරුය. එහෙත්
හිරි වැටුණේ දරුවන්ගේ දත්ය' යන
කියමන ඔබ ඊශ්‍රායෙල් දේශය පුරාම
පතළ කර තිබේ.[13] එහෙත් එම කිය-
මනෙහි අරුත ඔබ දන්නවාද?

**3** "'මෙම ප්‍රසිද්ධ කියමන යළි කෙ-
දිනක හෝ ඊශ්‍රායෙල් දේශයේ ඔබට
භාවිත කරන්න ලැබෙන්නේ නැත. මා
ජීවමාන දෙවිය. එබැවින් මා පව-
සන මේ දේ අනිවාර්යයෙන්ම සිදු
වන්නේය.' එසේ පවසන්නේ විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවිය.
**4** සියලු ජීවිත මට අයිතිය.[14] පියා-
ගේ ජීවිතය[15] මෙන්ම පුත්‍රයාගේ ජීවි-
තය අයිති වන්නෙත් මටය.[16] පව්
කරන පුද්ගලයා[17] අනිවාර්යයෙන්ම
මිය යන්නේය.[18]

**5** "'යහපත්, යුක්තිගරුක ජීවිත-
යක් ගත කරමින් ධර්මිෂ්ඨව ක්‍රියා
කරන[19] මිනිසෙකු ගැන සිතන්න.
**6** ඔහු කඳු මත[20] ඇති රූපව-
ලට පිදූ ආහාර අනුභව කරන්නේ
නැත.[21] ඊශ්‍රායෙල් දේශයේ තිබෙන
පිළිකුල්සහගත රූප දෙස බලන්නේ-
වත් නැත.[22] ඔහු තම මිතුරාගේ

**17 පරි.**
1 ගීතා 80:15 යෙසා 11:1 යෙරෙ 23:5 යෙරෙ 33:15 සෙක 3:8
2 යෙසා 53:2
3 ගීතා 2:6
4 ගීතා 92:13 දානි 4:17
5 යෙසා 27:6
6 ගීතා 92:12
7 ගීතා 72:8 හොෂෙ 14:7
8 යෙසා 55:12
9 1සාමු 2:7 ගීතා 75:7 ලූක් 1:52
10 යෙසා 9:6 එස 21:27 දානි 4:17 ආමො 9:11
11 ලූක් 23:31
12 එස 22:14 එස 24:14

**18 පරි.**
13 යෙරෙ 15:4 යෙරෙ 31:29 විලා 5:7
14 ගීතා 100:3 ක්‍රියා 17:26
15 උත් 2:7
16 ද්වි 26:18
17 රෝම 3:23 රෝම 5:12
18 උත් 2:17 උත් 17:14 විනි 16:30 යෝබ් 33:22 ගීතා 78:50 යෙසා 53:12 ක්‍රියා 3:23 රෝම 6:23 එළි 16:3
19 ගීතා 15:2
20 ද්වි 12:2 යෙරෙ 3:6 හොෂෙ 4:13
21 ගණන් 25:2 එස 22:9
22 එස 36:25

**2 තීරුව**
1 ලෙවී 20:10
2 ලෙවී 18:19 ලෙවී 20:18
3 ලෙවී 25:14 හිතෝ 14:21
4 ද්වි 24:12 එස 33:15
5 ලෙවී 6:2
6 ද්වි 15:11 හිතෝ 28:27
7 යෙසා 58:7 මතෙ 25:36 යාකො 2:15

බිරිඳ සමඟ සයනය නොකරන්-
නේය.[1] අපවිත්‍ර තත්වයක සිටින
ස්ත්‍රියක සමීපයටවත් නොයන්නේය.[2]
**7** ඔහු කිසිවෙකුට හිංසා කර නැත.[3]
ණයකට ඇපයක් ලෙස ගත් දේ ඔහු
ආපසු භාර දෙන්නේය.[4] ඔහු කිසිම
දෙයක් කොල්ල කන්නේ නැත.[5] කුස-
ගින්නෙන් පෙළෙන පුද්ගලයාට ඔහු
තමාගේම කෑම වේල වුවද දෙන්-
නේය.[6] නිර්වස්ත්‍රව සිටින කෙනෙ-
කුට අඳින්න වස්ත්‍රයක්ද දෙන්නේය.[7]
**8** ඔහු පොලියට මුදල් නොදෙන්-
නේය.*[8] අයුතු ලෙස ලාභ උප-
යාගන්නේද නැත.[9] අයුක්තිසහගත
දේවල් කිරීමෙන් ඔහු වැළකී සිටින්-
නේය.[10] මිනිසුන්ට මැනවින් යුක්තිය
ඉටු කර දෙන්නේය.[11] **9** ඔහු මාගේ
අණපනත්වලට අනුව ජීවත් වන්-
නේය.[12] සත්‍යවාදීව කටයුතු කිරීමට
තිබෙන ආශාව නිසා ඔහු මා තීන්දු
කළ දේට එකඟව ජීවත් වෙයි.[13] ඔහු
ධර්මිෂ්ඨ තැනැත්තෙකු වන බැවින්[14]
අනිවාර්යයෙන්ම ජීවත් වන්නේය.'[15]
එසේ පවසන්නේ විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවිය.

**10** "'යමෙකුගේ පුත්‍රයෙකු, සො-
රෙකු,[16] මිනී මරුවෙකු[17] හා වෙනත්
දුෂ්ට දේවල් කරන කෙනෙකු බවට
පත් වී ඇතැයි සිතමු. **11** (එහෙත්
පියා මේ කිසිවක් කර නැත.) ඒ පුත්‍රයා
කඳු මත තිබෙන රූපවලට පිදූ ආහාර
අනුභව කරන්නේය.[18] තම මිත්‍රයා-
ගේ බිරිඳ සමඟ ඔහු සයනය කර
ඇත.[19] **12** අසරණ වූ අයටත් දුප්-
පත් අයටත් ඔහු පීඩා කරන්නේය.[20]
ඔහු අන් අයගේ වස්තු කොල්ල කන්-
නේය.[21] ඇපයට යමක් ගත් පසු

**8** නික් 22:25; ද්වි 23:19; ගීතා 15:5; ලූක් 6:35; **9** ලෙවී 25:36; නෙහෙ 5:7; **10** ලෙවී 19:35; ද්වි 25:16; **11** ලෙවී 19:15; ලෙවී 25:14; ද්වි 1:16; සෙක 8:16; **12** ද්වි 8:11; **13** ද්වි 4:1; ද්වි 5:1; එස 20:11; **14** ගීතා 24:5; **15** ලෙවී 18:5; නෙහෙ 9:29; ආමො 5:4; රෝම 10:5; ගලා 3:12; **16** ලෙවී 19:13; **17** උත් 9:6; නික් 21:12; ගණන් 35:31; **18** නික් 34:15; **19** ලෙවී 20:10; **20** ද්වි 15:7; යෝබ් 31:17; හොෂෙ 12:7; **21** ලෙවී 6:2.

එස **18:8*** එනම්, දුගී අයගෙන් පොලී නොගත්-නේය.

එය නැවත භාර දෙන්නේ නැත.[1]
ඔහු පිළිකුල්සහගත රූපවලින් පිහිට
පතයි.[2] එවැනි කෙනෙකු හැසිරෙන්-
නේ ඉතා නින්දාසහගත ලෙසය.[3]
**13** ඔහු පොලී අය කරන්නෙකි.[4]
අයුතු ලෙස ලාභ උපයාගන්නේය.[5]
ඔහු මේ සියලු පිළිකුල්සහගත ක්‍රියා-
වල යෙදී ඇත.[6] ඒ නිසා ඔහු ජීවත්
වීමට සුදුස්සෙකු නොවෙයි. අනිවාර්-
යයෙන්ම ඔහුව මරා දමනු ඇත.
ඔහුගේ ජීවිතයට වග කිව යුත්තේ
ඔහුමය.[7]

**14** "'පියා කළ සෑම පාපයක්ම දැක
ඒ සියල්ලෙන් වැළකී සිටින පුතෙකු
සිටිනවායයි සිතමු.[8] **15** ඔහු කඳු
මත රූපවලට පිදූ ආහාර අනුභව
කරන්නේ නැත. ඊශ්‍රායෙල් දේශ-
යේ තිබෙන පිළිකුල්සහගත රූප-
වලින් පිහිට පතන්නේ නැත.[9] ඔහු
තම මිත්‍රයාගේ බිරිඳ සමඟ සයනය
කරන්නේ නැත.[10] **16** ඔහු කිසිම
මිනිසෙකුට හිරිහැර නොකරන්නේය.[11]
ණයක් දුන් පසු ඒ වෙනුවෙන් ගත්
ඇපය නොදී සිටින්නේද නැත.[12]
ඔහු කිසිවක් සොරකම් කර නැත.[13]
කුසගින්නෙන් සිටින කෙනාට ඔහු
තමාගේ කෑම වේලද ලබා දෙන්-
නේය.[14] නිර්වස්ත්‍රව සිටින කෙනාට
වස්ත්‍රයක්ද දෙන්නේය.[15] **17** අසර-
ණව සිටින අයට පීඩා කරන්නේ
නැත. ඔහු පොලී අය කරන්නේ-
වත්[16] අයුතු ලෙස ලාභ උපයාගන්-
නේවත් නැත.[17] ඔහු මා තීන්දු කළ
දේට අනුව කටයුතු කරන්නේය.[18]
ඔහු ජීවත් වන්නේ මාගේ අණපනත්ව-
ලට එකඟවය.[19] එහෙයින් ඔහු තම
පියා කළ වැරදි නිසා මිය යන්නේ
නැත.[20] අනිවාර්යයෙන්ම ඔහුගේ ජීවි-
තය ගැලවෙන්නේය.[21] **18** එහෙත්
ඔහුගේ පියා තමා කළ වරදට[22] මිය යා
යුතුය.[23] මන්ද ඔහු එළිපිටම වංචා
කරමින් සහෝදරයෙකුගෙන් කොල්ල
කෑවේය.[24] ඔහු තම සෙනඟ අතරේ
දුෂ්ට දේ කළේය.[25]

**19** "'ජනයෙනි, "පියා කළ වරදට
පුතා දඬුවම් නොලබන්නේ මන්ද"[1]
කියා ඔබ අසනවා ඇත. එහෙත්
පුත්‍රයා යුක්තියෙන් හා ධර්මිෂ්ඨකමින්
ක්‍රියා කර ඇත.[2] ඔහු මාගේ සියලු
අණපනත් රකිමින් ජීවත් වන්නේය.[3]
එමනිසා ඔහු අනිවාර්යයෙන්ම ජීවත්
වන්නේය.[4] **20** නමුත් පව් කරන
පුද්ගලයා අනිවාර්යයෙන්ම මිය යන්-
නේය.[5] පියා කළ වරදට කිසි ලෙ-
සකින්වත් පුත්‍රයෙකු වග කිව යුතු
නැත. පුත්‍රයා කළ වරදට කිසි ලෙස-
කින්වත් පියාද වග කිව යුතු නැත.[6]
ධර්මිෂ්ඨයා කළ යහපත් දේවල ප්‍රති-
ඵල ඔහුම භුක්ති විඳින්නේය.[7] දුෂ්ටයා
කළ නපුරුකම්වල ප්‍රතිඵල ඔහුටම
විඳින්න සිදු වෙයි.[8]

**21** "'දුෂ්ටයෙක් තමා කළ සියලු
පාප ගැන පසුතැවී[9] මාගේ සියලු
අණපනත් රකිමින් යුක්තියෙන් හා
ධර්මිෂ්ඨකමින් ක්‍රියා කරන්න පටන්-
ගන්නේ නම්[10] ඔහු අනිවාර්යයෙන්ම
ජීවත් වන්නේය. ඔහු මිය යන්-
නේ නැත.[11] **22** ඔහු අතින් සිදු වූ
සෑම වරදක්ම නැවත නැවතත් මතක්
කරනු ලබන්නේ නැත.[12] ඔහුගේ ධර්-
මිෂ්ඨ ක්‍රියා නිසා ඔහුගේ ජීවිතය
රැකෙයි.'[13]

**23** "විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙසේය.
'දුෂ්ටයෙකු වැරදි මාර්ගයෙන් හැරී
දිගටම ජීවත් වෙනවාට මිස[14] ඔහු මිය
යනවා දකින්න මම කිසි ලෙසකින්-
වත් කැමති නැත.'[15]

**24** "'ධර්මිෂ්ඨ කෙනෙක් තම ධර්-
මිෂ්ඨ ජීවිතය අත්හැර අයුක්තිස-
හගත දේවල් කරමින්[16] දුෂ්ටයන්
මෙන් සියලුම පිළිකුල්සහගත ක්‍රියා-
වල නිරත වන්නේ නම්[17] ඔහු කලින්
කළ කිසිම ධර්මිෂ්ඨ ක්‍රියාවක් මතක්
කරනු ලබන්නේ නැත.[18] ඔහුගේ ද්‍රෝ-
හිකම නිසාත් ඔහු කළ පව් නිසාත්
ඔහු මිය යන්නේය.[19]

**18 පරි.**
1 ද්වි 24:12
2 ලෙවී 26:30
3 2රාජා 21:11
4 ද්වි 23:19 යෙසා 24:2
5 ලෙවී 25:36 එස 22:12
6 ලෙවී 18:30
7 ලෙවී 20:9 ලෙවී 20:27 එස 3:18 එස 33:4 ක්‍රියා 18:6
8 යෙරෙ 8:6
9 ලෙවී 26:30
10 ලෙවී 20:10
11 නික් 22:21 හිතෝ 19:26
12 ද්වි 24:12
13 ලෙවී 6:2
14 ද්වි 15:11 යෝබ් 31:17 මතෙ 25:35
15 යෝබ් 31:19 යෙසා 58:7 යාකො 2:15
16 නික් 22:25 ද්වි 23:19
17 ලෙවී 25:36
18 ද්වි 4:1 ද්වි 5:1
19 ද්වි 8:11
20 එස 3:21
21 එස 18:9
22 ලෙවී 19:13
23 එස 3:18
24 ලෙවී 6:2
25 යෙසා 3:11

**2 තීරුව**
1 නික් 20:5 ද්වි 5:9 2රාජා 23:26
2 ලූක් 1:6
3 එස 20:18
4 ද්වි 16:20 එස 18:9 රෝම 10:5
5 ද්වි 24:16 2රාජා 14:6 යෙරෙ 31:30 එස 18:4
6 2ලේක 25:4
7 1රාජා 8:32 යෙසා 3:10
8 2ලේක 6:23 එස 33:10 රෝම 2:9 ගලා 6:7
9 2ලේක 33:12 යෙසා 55:7 එස 33:12 ක්‍රියා 3:19
10 ලූක් 1:6
11 එස 3:21
12 2ලේක 33:13 ගීතා 25:7 යෙසා 43:25 එස 33:16
13 2ලේක 6:23

**14** මීකා 7:18; **15** විලා 3:33; එස 33:11; 1තිමෝ 2:4; 2පේතෘ 3:9; **16** 1සාමු 15:11; 1රාජා 11:4; එස 33:12; **17** රෝම 1:28; **18** හෙබ්‍රෙ 10:38; 2යොහ 8; **19** හිතෝ 14:32; හිතෝ 21:16.

25 "'ජනයෙනි, ඔබ එවිට අනි-
වාර්යයෙන්ම මෙසේ පවසනවා ඇත.
"යෙහෝවා දෙවි ක්‍රියා කරන ආකාරය
සාධාරණ නැහැ."[1] එහෙත් ඊශ්‍රායෙල්
ජනයෙනි, මා පවසන දේට සවන්
දෙන්න. මා ක්‍රියා කරන ආකාරය
සාධාරණ නැද්ද?[2] අසාධාරණව ක්‍රියා
කරන්නේ ඔබ නොවේද?[3]
26 "'ධර්මිෂ්ඨ කෙනෙක් තම ධර්-
මිෂ්ඨ ක්‍රියාවලින් ඉවත් වී අයුක්තිසහ-
ගත දේවල් කර[4] එහි ප්‍රතිඵලයක්
ලෙස මිය යන විට, ඔහු මිය යන්-
නේ ඔහුම කළ අයුක්තිසහගත දේවල්
නිසාය.[5]
27 "'දුෂ්ට කෙනෙක් තමාගේ දුෂ්ට
ක්‍රියාවලින් ඉවත් වී ධර්මිෂ්ඨ ජීවිත-
යක් ගත කරමින් යුක්තිගරුකව ක්‍රියා
කරන්න පටන්ගන්නා විට[6] ඔහු තමා-
ගේ ජීවිතය රැකගන්නේය.[7] 28 ඔහු
තමා කළ වැරදි තේරුම්ගෙන[8] තමා
කළ සෑම නපුරු ක්‍රියාවක්ම අත්හරින
විට[9] ඔහු අනිවාර්යයෙන්ම ජීවත් වන්-
නේය. ඔහු මිය යන්නේ නැත.[10]
29 "'එවිට ඊශ්‍රායෙල් වැසියන්
නිසැකවම මෙසේ පවසනු ඇත. "යෙ-
හෝවා දෙවි ක්‍රියා කරන ආකාරය
සාධාරණ නැහැ."[11] එහෙත් ඊශ්‍රායෙල්
වැසියෙනි, මා ක්‍රියා කරන ආකාරය
සාධාරණ නැද්ද?[12] අසාධාරණව ක්‍රියා
කරන්නේ ඔබ නොවේද?'[13]
30 "විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි.[14]
'ඊශ්‍රායෙල් ජනයෙනි, මා සියලුදෙනාව
විනිශ්චය කරන්නේ ඔවුන් එකිනෙකා
ක්‍රියා කරන ආකාරයට අනුවය.[15]
එබැවින් ඔබ අතින් සිදු වූ සියලු
වැරදි ගැන පසුතැවිලි වී ඒවායින්
ඉවත් වන්න.[16] එවිට ඔබේ විනාශයට
හේතු විය හැකි කිසි වරදක් ඔබ
අතින් සිදු වන්නේ නැත.[17] 31 ඔබ
කළ සියලු වැරදිවලින් ඉවත් වන්න.[18]
ඔබේ සිතත්[19] මනසත් අලුත් කර-
ගන්න.[20] ඊශ්‍රායෙල් ජනයෙනි, ඔබ
නිකරුණේ මිය යා යුත්තේ මන්ද?'[21]
32 "විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි.
'කිසිවෙකු මිය යනවාට මම කැමති
නැත.[1] එමනිසා ජනයෙනි, ඔබේ
සියලු වැරදි අත්හැර ජීවත් වන්න.'"[2]

**19** "ඔබ ඊශ්‍රායෙල්හි අධිපතීන්
ගැන[3] විලාප ගීයක් ගයන්න.[4]
2 ඔබ පැවසිය යුත්තේ මෙසේය.
'ඔබේ මව කවුද? ඇය සිංහයන් අතරේ
වාසය කළ සිංහ ධේනුවකි.[5] කේශර
සිංහයන් අතරේ ලැගුම් ගනිමින් ඇය
තම පැටවුන්ව පෝෂණය කළාය.
3 "'ඇය ඇතිදැඩි කළ එක් පැට-
වෙක්[6] කේශර සිංහයෙක් මෙන් වැඩී
තම ගොදුරු ඉරා දමන්න ඉගෙනගත්-
තේය.[7] ඌ මිනිසුන්ව පවා කා දැමීය.
4 අවට ජාතීන්ට ඌ ගැන ආරංචි විය.
ඔවුහු ඌට බොරු වළක් අටවා, ඌව
හසු කරගෙන කොකු දමා ඊජිප්තුවට
ගෙනාවෝය.[8]
5 "'බලාපොරොත්තු සුන් වූ ඇසින්
එදෙස බැලූ ඇය, තවත් පැටවෙකු
ගෙන[9] කේශර සිංහයෙකු වන තෙක්
ඌව ඇතිදැඩි කළාය. 6 ඌ කේශර
සිංහයෙකු මෙන් වැඩුණු පසු සිංහයන්
අතරේ සැරිසරන්න පටන්ගත්තේය.
ගොදුරු ඉරා දමන්න ඌද ඉගෙන-
ගත්තේය.[10] ඌ මිනිසුන්ව පවා කා
දැමීය.[11] 7 ඌ ඒ මිනිසුන්ගේ බල-
කොටු පුරාම ඇවිද ඒවා ගැන දැනුවත්
වී ඔවුන්ගේ නුවරවල් විනාශ කර දැමු-
වේය.[12] ඌ නිසා මුළු දේශයම පාළුවට
ගියේය. උගේ ගර්ජනා හඬ දේශය
පුරාම දෝංකාර දුන්නේය.[13] 8 එවිට
අවට විසූ ජාතීහු ඌට විරුද්ධව නැඟී
සිට[14] ඌ මත දැලක් හෙළූහ.[15]
ඌද ඔවුන් ඇටවූ උගුලට හසු විය.[16]
9 අන්තිමේදී ඔවුහු කොකු දමා ඌව
කූඩුවක සිර කර බැබිලෝනියේ රජු
වෙතට ගෙනාවෝය.[17] තවදුරටත්
ඊශ්‍රායෙල් කඳුකරයෙහි උගේ හඬ නො-
ඇසෙන පිණිස[18] ඔවුහු ඌ මත දැලක්
එළා බැබිලෝනියට ගෙනාවෝය.

**18 පරි.**
1 යෝබ් 34:5
යෝබ් 35:2
හිතෝ 19:3
එස 33:17
මලා 2:17
රෝම 9:20
2 ද්වි 32:4
ගීතා 145:17
3 ගීතා 50:21
යෙසා 55:9
යෙරෙ 2:17
4 ද්වි 25:16
5 ගලා 6:7
6 යෙසා 1:18
යෙසා 55:7
ක්‍රියා 26:20
7 1තිමෝ 4:16
8 ද්වි 32:29
9 1සාමු 7:3
එස 33:12
10 එස 18:9
11 ගීතා 92:15
හිතෝ 19:3
12 උත් 18:25
ද්වි 32:4
ගීතා 145:17
යෙසා 40:14
13 යෝබ් 9:2
14 දේශ 12:14
15 යෝබ් 34:11
රෝම 2:6
1පේත 1:17
16 හොෂෙ 12:6
යෝවෙ 2:13
මතෙ 3:2
17 රෝම 2:5
18 ගීතා 34:14
යෙසා 1:16
19 ගීතා 51:10
යෙරෙ 32:39
20 යෙසා 1:19
එස 11:19
එෆී 4:24
21 ද්වි 30:15
හිතෝ 8:36
ක්‍රියා 13:46

**2 තීරුව**
1 යෙරෙ 29:11
විලා 3:33
එස 33:11
ලූක් 15:10
2පේත 3:9
2 ද්වි 30:16
එස 18:9

**19 පරි.**
3 2ලේක 35:25
4 යෙරෙ 7:29
එස 26:17
5 ගීතා 7:2
නාහු 2:11
ශෙප 3:3
6 2රාජා 23:31
2ලේක 36:1
7 2රාජා 23:32

**8** 2රාජා 23:33; 2ලේක 36:4; යෙරෙ 22:11; **9** 2රාජා 23:34; **10** 2ලේක 36:5; යෙරෙ 22:17; **11** 2රාජා 24:4; **12** එස 12:19; **13** හිතෝ 19:12; හිතෝ 28:15; එස 22:25; **14** 2රාජා 24:2; **15** එස 12:13; එස 17:20; **16** විලා 4:20; **17** 2රාජා 24:12; **18** එස 6:2.

**10** "'ඔබේ මව[1] දිය දහරා අසල සිටෙවූ මිදිවැලක්*[2] හා සමානය. කිසිදු ජල හිඟයක් නොතිබූ නිසා[3] ඇය බොහෝ අතු විහිදුවමින් පල දැරුවාය. **11** එම අතුවලින් පාලකයන්ගේ රාජ යෂ්ටි තැනීමට උචිත සවිශක්තියෙන් යුත් දඬු කපාගන්නා ලදි.[4] එම මිදිවැලේ අතු අවට පිහිටි සියලු ගස්වල අතුවලට වඩා ඉහළින් විහිදෙන්න පටන්ගත්තේය.[5] **12** එහෙත් දෙවිගේ උදහසේ ප්‍රතිඵලයක් ලෙස ඇයව උදුරා දමා[6] පොළොවට හෙළා දමන ලදි. ඉන්පසු නැඟෙනහිර දෙසින් හැමූ සුළඟකින් ඇගේ පල වියළී ගියේය.[7] ඇගේ සවිමත් දඬු කඩා දමනු ලැබූ අතර ඒවා වියළී ගියේය.[8] ඒවා ගින්නෙන් දවා දමන ලදි.[9] **13** දැන් ඇයව සිටුවා තිබෙන්නේ දිය පොදක්වත් නැති පාළු,[10] වියළි දේශයකය.[11] **14** ගින්නක් ඇගේ දඬුවලින් නික්ම ඇවිත්[12] ඇගේ අතු රිකිලි සහ පල සියල්ල දවා දැමීය. ඒ නිසා සවිශක්තියෙන් යුත් දණ්ඩක්වත් පාලකයන්ගේ රාජ යෂ්ටියක්වත් ඇයට ඉතුරු නොවීය.[13]

"'එය විලාප ගීයකි. ඒ කතා පුවත විලාපයක් සේ ගයනා කළ යුතුය.'"[14]

**20** සත්වන අවුරුද්දේ, පස්වන මාසයේ දහවන දින, ඊශ්‍රායෙල්හි වැඩිමහල්ලන්ගෙන් කිහිපදෙනෙක් යෙහෝවා දෙවිගෙන් මඟ පෙන්වීම් ලබාගැනීමට[15] මා ඉදිරියට පැමිණ හිඳගත්තෝය.[16] **2** එවිට යෙහෝවා දෙවි මට මෙසේ පැවසුවේය. **3** "මනුෂ්‍ය පුත්‍රය, ඔබ ඊශ්‍රායෙල්හි වැඩිමහල්ලන් සමඟ කතා කර මෙසේ පැවසිය යුතුයි. 'විශ්වයේ පාලකයාණන් වන යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි. "ඔබ සියලුදෙනා පැමිණ සිටින්නේ මාගෙන් මඟ පෙන්වීම් පතන්නද?[17] ඔබ මාගෙන් විමසුවත් මා ඔබට කිසි දෙයක් එළිදරව් නොකරන බව ජීවමාන දෙවි වන මම සහතිකවම පවසන්නෙමි."[1] මේ දේ කියන්නේ විශ්වයේ පාලකයාණන් වන යෙහෝවා දෙවිය.'

**4** "මනුෂ්‍ය පුත්‍රය, ඔබ ඔවුන්ව විනිශ්චය කරන්න සූදානම්ද?[2] ඇත්තටම ඔබ සූදානම්ද? එසේනම් ඔවුන්ගේ මුතුන්මිත්තන් කළ පිළිකුල්සහගත දේවල් ගැන ඔවුන්ට දන්වන්න.[3] **5** ඔබ ඔවුන්ට මෙසේ පැවසිය යුතුයි. 'විශ්වයේ පාලකයාණන් වන යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි. "මා ඊශ්‍රායෙල් ජාතිය තෝරාගත් දවසේදී[4] මම අත ඔසවා දිවුරා,[5] යාකොබ්ගේ පෙළපතට පොරොන්දුවක් වුණෙමි.[6] ඔවුන් ඊජිප්තු දේශයේ සිටියදී මා කවුද කියා ඔවුන්ට පෙන්වා දුනිමි.[7] ඔවුන් ඉදිරියේ මාගේ අත ඔසවා, 'ඔබේ දෙවි වන යෙහෝවා මමය' කියා ඔවුන්ට පැවසුවෙමි.[8] **6** ඒ අවස්ථාවේදී මම ඔවුන්ට පොරොන්දුවක් වුණෙමි. ඔවුන්ව ඊජිප්තු දේශයෙන් නිදහස් කර ඔවුන් වෙනුවෙන් විශේෂයෙන්ම තෝරාගත් දේශයකට එනම්, කිරියෙන් පැණියෙන් ඉතිරී යන දේශයකට ගෙන යන බවට[9] මම අත ඔසවා ඔවුන්ට පොරොන්දු වුණෙමි.[10] මා ඔවුන් වෙනුවෙන් තෝරාගත් ඒ දේශය සැබවින්ම අන් සියලු දේශවලට වඩා අලංකාර දේශයකි.[11] **7** මම ඒ අවස්ථාවේදී ඔවුන්ට මෙසේ පැවසුවෙමි. 'ඔබ සියලුදෙනාම ඔබව වශී කරවන පිළිකුල්සහගත දේවල් අහක දමන්න.[12] ඊජිප්තුවේ වැසියන්ගේ පිළිකුල්සහගත රූපවලින් අපවිත්‍ර නොවන්න.[13] මන්ද ඔබේ දෙවි වන යෙහෝවා මමය.'[14]

**8** "'"එහෙත් ඔවුහු මට විරුද්ධව කැරලිගසන්න පටන්ගත් නිසා[15] මට සවන් දෙන්න කැමති වූයේ නැත. ඔවුන්ගෙන් එක් කෙනෙක්වත් තමන් ඉදිරියේ තබා තිබූ පිළිකුල්-

**19 පරි.**
**1** හොෂෙ 2:2
**2** ගීතා 80:8; යෙසා 5:1; එස 15:2; එස 17:6
**3** ගණන් 24:6; ද්වි 8:7
**4** ගණන් 24:17; එස්රා 4:20
**5** එස 31:3; දානි 4:11
**6** යෙසා 5:5; යෙරෙ 17:10; යෙරෙ 31:28; එස 15:6
**7** හොෂෙ 13:15
**8** 2රාජා 23:34; 2රාජා 24:6; 2රාජා 25:6
**9** ද්වි 32:22; එස 15:4
**10** යෙරෙ 9:11
**11** ද්වි 28:48; යෙරෙ 17:6; යෙරෙ 52:27
**12** විනි 9:15; 2රාජා 24:20
**13** නෙහෙ 9:37; එස 17:18; එස 21:26
**14** විලා 4:20

**20 පරි.**
**15** එස 8:1
**16** එස 14:1
**17** යෙසා 1:12

**2 තීරුව**
**1** 1සාමු 28:6; හිතෝ 15:8; හිතෝ 28:9; යෙසා 1:15; එස 14:3; මීකා 3:7
**2** එස 14:4
**3** එස 16:2; එස 16:51; එස 22:2; එස 23:36; ලූක් 11:47; ක්‍රියා 7:51
**4** නික් 6:7; ද්වි 7:6; යෙසා 41:8
**5** යෙසා 62:8
**6** නික් 6:8; ද්වි 32:40; එස 47:14
**7** නික් 3:8; නික් 4:31; ද්වි 4:34; ගීතා 103:7
**8** නික් 20:2
**9** නික් 3:8; ද්වි 6:3; ද්වි 8:7; යොෂු 5:6; යෙරෙ 11:5; යෙරෙ 32:22
**10** හෙබ්‍රෙ 6:13
**11** ගීතා 48:2; දානි 8:9; දානි 11:41; සෙක 7:14; **12** 2ලේක 15:8; එස 18:31; **13** ලෙවී 17:7; ලෙවී 18:3; ද්වි 29:17; යොෂු 24:14; **14** නික් 16:12; ලෙවී 11:44; ලෙවී 20:7; **15** ද්වි 9:7; 1සාමු 15:23; නෙහෙ 9:26; යෙසා 63:10.

එස **19:10*** හෙබ්‍රෙව් භාෂාවේ, "ඔබේ ලෙයින් වට වූ මිදිවැලක්" යන අදහසද ඇතුළත්ය.

සහගත දේවල් අහක දැමුවේ නැත.
ඔවුහු ඊජිප්තුවරුන්ගේ පිළිකුල්සහ-
ගත රූපද ඉවත නොදැමුවෝය.[1]
එබැවින් ඔවුන් ඊජිප්තු දේශයේ
සිටියදීම මාගේ කෝපය සම්පූර්ණ-
යෙන්ම ප්‍රකාශ කර ඔවුන් පිටට මාගේ
උදහස වැගිරවීමට මම සිතුවෙමි.[2]
**9** එහෙත් ඔවුන් වටා සිටි ජාතීන්
ඉදිරියෙහි මාගේ නාමයට අගෞරව-
යක් නොපැමිණෙන පිණිස මම එසේ
නොකළෙමි.[3] මම ඒ සියලු ජාතීන්
ඉදිරියෙහි ඔවුන්ව ඊජිප්තු දේශයෙන්
පිටතට ගෙනැවිත් මා කවුද කියා
ඔවුන්ට හෙළි කර දුනිමි. මා එසේ
කළේ මාගේ නාමය වෙනුවෙනි.[4]
**10** එහෙයින් මම ඔවුන්ව ඊජිප්තු දේ-
ශයේ සිට පාළුකරයට ගෙනාවෙමි.[5]

**11** “‘“මාගේ අණපනත්[6] හා තීරණ
මම ඔවුන්ට දැනුම් දුන්නෙමි.[7] එසේ
කළේ ඔවුන් ඒවා පිළිපැද දිගටම
ජීවත් වන පිණිසය.[8] **12** එමෙන්ම
ඔවුන් සමඟ මා පිහිටෙවූ ගිවිසුමට
සාක්ෂියක් වශයෙන්[9] මම ඔවුන්ට
සබත පැවැත්වීමට නියම කළෙමි.[10]
එසේ කළේ යෙහෝවා දෙවි වන මා
ඔවුන්ව පවිත්‍ර සෙනඟක් ලෙස වෙන්
කර තබා ඇති බව ඔවුන් තේරුම්-
ගන්නා පිණිසය.

**13** “‘“එහෙත් ඊශ්‍රායෙල් ජාතිය
පාළුකරයේදී මට විරුද්ධව කැරලි-
ගැසුවෝය.[11] ඔවුහු මාගේ අණපනත්
පිළිපැද්දේ නැත.[12] මාගේ තීරණද
කිසි ගණනකට ගත්තේ නැත.[13]
ඇත්තෙන්ම ඔවුන් ඒවා පැවැත්වූවා
නම් ඔවුන්ගේ දිවි රැකෙනු ඇත.[14]
නමුත් ඔවුහු මා නියම කළ සබ-
තද කඩ කළෝය.[15] එමනිසා ඔවුන්ව
සම්පූර්ණයෙන්ම විනාශ කර දැමීමේ
අදහසින් පාළුකරයේදීම ඔවුන් පිටට
මාගේ උදහස වැගිරවීමට සිතුවෙමි.[16]
**14** එහෙත් මා ඊජිප්තුවෙන් ඔවුන්ව
නිදහස් කළ ආකාරය දුටු ජාතීන් ඉදි-
රිපිට මාගේ නාමය අවමානයට ලක්
නොවන පිණිස මාගේ නාමය වෙ-
නුවෙන් මම ක්‍රියා කළෙමි.[17]
**15** ඔවුන්ට හිමි කර දීමට සිටි, කිරි-
යෙන් පැණියෙන් ඉතිරී යන දේශ-
යට ඔවුන්ව රැගෙන නොයන බව[1]
මම පාළුකරයේදී ඔවුන්ට පැවසුවෙමි.
සියලු දේශවලට වඩා අලංකාර වූ[2]
ඒ දේශයට ඔවුන්ව ගෙන නොයන
බව මාගේ අත ඔසවා දිවුරා මම
ප්‍රකාශ කළෙමි.[3] **16** එසේ කළේ
ඔවුන් මාගේ තීරණ ප්‍රතික්ෂේප කර
මාගේ අණපනත් ගණනකට නො-
ගෙන මාගේ සබත් දවස් කඩ කළ
නිසාය. ඔවුන්ගේ සිත් නිතරම ඇදී
ගියේ ඔවුන්ගේ පිළිකුල්සහගත රූපව-
ලටය.[4]

**17** “‘“එහෙත් මට ඔවුන් ගැන
දුකක් ඇති වූ නිසා මම ඔවුන්ව
විනාශ නොකළෙමි.[5] පාළුකරයේදී
ඔවුන් සියලුදෙනාවම නැති කර දැමී-
මට මම පියවර ගත්තේ නැත.
**18** පාළුකරයේදී ඔවුන්ගේ පුතුන්ට
මම මෙසේ පැවසුවෙමි.[6] ‘ඔබේ පිය-
වරුන් පැවැත්වූ වත්පිළිවෙත්වලින්
ඈත් වී සිටින්න.[7] ඔවුන් තීරණය කළ
දේවලට අනුව ක්‍රියා නොකරන්න.[8]
ඔවුන්ගේ පිළිකුල්සහගත රූපවලින්
අපවිත්‍ර නොවන්න.[9] **19** ඔබේ දෙවි
වන යෙහෝවා මමය.[10] එබැවින්
මාගේ අණපනත්වලට එකඟව ජීවත්
වන්න.[11] මාගේ තීරණවලට[12] කීකරු
වන්න.[13] **20** මා නියම කළ සබත්
දවස් ශුද්ධ දවස් සේ සලකන්න.[14] මා
සබත් දවස් නියම කළේ ඔබේ දෙවි
වන යෙහෝවා මා බව ඔබ තේරුම්-
ගන්නා පිණිසය. ඒවා මා ඔබ සමඟ
පිහිටෙවූ ගිවිසුමට ලකුණකි.’[15]

**21** “‘“එහෙත් ඔවුන්ගේ පුතුයෝද
මට විරුද්ධව කැරලිගසන්න පටන්-
ගත්තෝය.[16] ඔවුහු මාගේ අණ-
පනත්වලට එකඟව ජීවත් නොවූහ.
ඔවුහු මාගේ තීරණවලට කීකරු
වූයේ නැත. ඔවුන් ඒවා පැවැත්-
වූවා නම් ඇත්තෙන්ම ඔවුන්ගේ ජීවිත
රැකෙනු ඇත.[17] නමුත් ඔවුහු මාගේ

**20 පරි.**

**1** නික් 32:4
**2** යොෂු 24:14; එස 7:8
**3** නික් 32:12; ගණන් 14:13; ද්වි 9:28; යොෂු 7:9; 1සාමු 12:22
**4** යොෂු 2:10; යොෂු 9:9; 1සාමු 4:8
**5** නික් 13:17; නික් 15:22
**6** ලෙවී 3:17
**7** ද්වි 4:8; නෙහෙ 9:13; ගීතා 147:19
**8** ද්වි 8:3; ද්වි 30:16; ලූක් 10:28; රෝම 10:5; ගලා 3:12
**9** නික් 13:9; නික් 31:13; නික් 35:2
**10** නික් 20:8; ලෙවී 23:3; ලෙවී 23:24; ලෙවී 23:32; ලෙවී 25:4; ලෙවී 25:11; ද්වි 5:12; නෙහෙ 9:14
**11** නික් 32:8; ගණන් 14:22; ගීතා 78:40; ගීතා 95:8
**12** ලෙවී 26:15
**13** ලෙවී 26:43; හිතෝ 1:25; එස 16:24
**14** එස 18:9; රෝම 10:5
**15** යෙසා 56:6
**16** ගණන් 14:12
**17** යොෂු 7:9; එස 36:22

**2 තීරුව**

**1** ලෙවී 20:24; ගණන් 13:27
**2** සෙක 7:14
**3** ගණන් 14:30; ගීතා 95:11; ගීතා 106:26
**4** නික් 32:4; ගණන් 15:39; ගණන් 25:2; 1රාජා 21:26; එස 14:4; ක්‍රියා 7:42
**5** නෙහෙ 9:19; ගීතා 78:38; යෙරෙ 30:11; විලා 3:22
**6** ගණන් 14:33
**7** ගීතා 78:8; එස 5:7
**8** ක්‍රියා 7:51; 1පේතෘ 1:18
**9** යෙරෙ 2:7

---

**10** ද්වි 5:6; ගීතා 81:10; **11** ලෙවී 25:18; ද්වි 5:32; **12** ද්වි 4:1; **13** ද්වි 5:1; **14** යෙරෙ 17:22; **15** නික් 31:13; **16** ගණන් 25:1; ද්වි 9:23; 1රාජා 13:21; **17** එස 20:11.

සබත් දවස් කඩ කළෝය.[1] එමනිසා
ඔවුන් පාළුකරයේ සිටියදීම මාගේ
කෝපය සම්පූර්ණයෙන්ම ප්‍රකාශ කර
ඔවුන් පිටට මාගේ උදහස වැගිරවී-
මට මම සිතුවෙමි.[2] **22** එහෙත් මම
මාගේ නාමය නිසා එසේ කිරීමෙන්
වැළකී සිටියෙමි.[3] මා ඊජිප්තුවෙන්
ඔවුන්ව නිදහස් කළ ආකාරය දුටු
ජාතීන් ඉදිරිපිට මාගේ නාමය නින්-
දාවට ලක් නොවන පිණිස මාගේ
නාමය වෙනුවෙන් මම ක්‍රියා කළෙමි.[4]
**23** ඔවුන්ව ජාතීන් අතරේ විසුරු-
වාහරින බවත් වෙනත් දේශවලට
පලවාහරින බවත් මම පාළුකර-
යේදී ඔවුන්ට කීවෙමි.[5] මාගේ අත
ඔසවා දිවුරා එසේ ප්‍රකාශ කළෙමි.[6]
**24** එසේ කළේ ඔවුන් මාගේ තීරණ
ප්‍රතික්ෂේප කර[7] මාගේ අණපනත්
ගණනකට නොගෙන[8] මාගේ සබත්
දවස් සුළු කොට තැකූ නිසාය.[9] ඔවුන්-
ගේ මුතුන්මිත්තන් නමස්කාර කළ
පිළිකුල්සහගත රූපවලට ඔවුහු වශී
වී සිටියෝය.[10] **25** එමනිසා කිසි
පලක් නැති ඔවුන්ගේම වත්පිළිවෙත්-
වලට අනුව ජීවත් වෙන්නත් ඔවුන්ගේ
ජීවිතයට හානියක් ගෙන දෙන තීරණ
ගන්නත් මම ඔවුන්ට ඉඩහැරියෙමි.[11]
**26** ඔවුහු තම කුලුඳුල් පුත්‍රයන්ව ගින්-
නෙන් පුලුස්සා* වෙනත් දෙවිවරුන්ට
ඔප්පු කළෝය.[12] මමද ඔවුන්ට එසේ
අපවිත්‍ර වීමට ඉඩහැරියෙමි. මා එසේ
කළේ ඔවුන්ව විනාශ කර දමන පිණි-
සය. එවිට මා යෙහෝවා දෙවි බව
පිළිගන්න ඔවුන්ට සිදු වනු ඇත.”’[13]

**27** “මනුෂ්‍ය පුත්‍රය, ඊශ්‍රායෙල් ජන-
තාව අමතා ඔවුන්ට මෙසේ පව-
සන්න.[14] ‘විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි.
“ඔබේ මුතුන්මිත්තෝ මට ද්‍රෝහි වී
මා ගැන අපහාසාත්මක ලෙස කතා
කළෝය.[15] **28** එහෙත් මාගේ අත
ඔසවා දිවුරා ඔවුන්ට දෙන්න පො-
රොන්දු වූ[16] දේශයට මම ඔවුන්ව ගෙ-
නාවෙමි.[17] මා එසේ කළ පසුත් ඔවුහු
උස් වූ හෙල් දුටු විටත්[1] අතු විහිදී ඇති
සරුසාර ගස් දුටු විටත් එම ස්ථානව-
ලට ගොස් පූජා ඔප්පු කරන්න පටන්-
ගත්තෝය.[2] ඔවුහු ප්‍රසන්න සුවඳක්
නැඟෙන පූජාද[3] පාන පූජාද වෙ-
නත් පිළිකුල්සහගත පූජාද එම ස්ථා-
නවල ඔප්පු කළෝය.[4] **29** එමනිසා
මම ඔවුන්ට මෙසේ පැවසුවෙමි. ‘මේ
වන තුරුත් පූජනීය ස්ථාන ලෙස
හඳුන්වන මෙම ස්ථාන සාදා තිබෙන්-
නේ කුමකටද? ඔබ එම ස්ථානවලට
යන්නේ මන්ද?’”’[5]

**30** “ඊශ්‍රායෙල් ජනතාවට මෙසේ
පවසන්න. ‘විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි පවසන්නේ මෙ-
යයි. “ඔබත් ඔබේ මුතුන්මිත්තන්
මෙන් මට ද්‍රෝහිව කටයුතු කර-
මින්[6] ඔවුන්ගේ පිළිකුල්සහගත
දේවල් පසුපස ගොස් අපවිත්‍ර වෙ-
නවාද?[7] **31** ඔබේ පුත්‍රයන්ව ගින්-
නෙන් පුලුස්සා[8] ඔබේ පිළිකුල්සහගත
රූප ඉදිරියේ ඔප්පු කරනවාද?[9] ඔබේ
පිළිකුල්සහගත රූප වෙනුවෙන් ඔබ
අද වන තුරු අපවිත්‍ර වී සිටින්-
නහුය. ඔබ මගෙන්ද මඟ පෙන්වීම්
ලබාගැනීමට පැමිණෙන්නහුය. ඊශ්‍රා-
යෙල් ජනයෙනි, මා කිසි ලෙසකින්-
වත් ඔබට පිළිතුරු දෙයි කියා ඔබ
සිතනවාද?”’[10]

“‘මා ඔබට කිසි දෙයක් එළි-
දරව් නොකරන බව ජීවමාන
දෙවි වන මම සහතිකවම පවසන්-
නෙමි.’[11] මේ දේ පවසන්නේ විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවිය.
**32** ‘“වෙනත් ජාතීන් හා අවට දේශ-
වල වැසියන් මෙන්[12] අපිත් ලීවලින් හා
ගල්වලින් නෙළූ දෙවිවරුන්ට වන්ද-
නාමාන කරමු”[13] යයි ඔබ පවසන්න-
හුය. නමුත් ඔබ සිතන[14] එම දේ
කිසිසේත් ඉටු නොවන්නේය.’”[15]

**33** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි.
‘ජීවමාන දෙවි වන මා පවසන මේ දේ

---

එස **20:26*** එස 16:21හි පාදසටහන බලන්න.

**20 පරි.**

**1** එස 20:13
**2** 1සාමු 12:15, 1සාමු 15:23, ගීතා 5:10, යෙසා 1:20, යෙසා 63:10, එස 7:8
**3** ගීතා 78:38
**4** ගීතා 25:11, ගීතා 79:9, යෙරෙ 14:7, දානි 9:19
**5** ලෙවී 26:33, ද්වි 28:64, ගීතා 106:27, යෙරෙ 15:4
**6** ද්වි 32:40
**7** ලෙවී 26:43
**8** ලෙවී 26:15
**9** එස 20:13
**10** යෙරෙ 2:7, යෙරෙ 3:9, එස 6:9
**11** ගීතා 81:12, යෙසා 66:4, රෝම 1:24, 2තෙස 2:11
**12** ලෙවී 18:21, 2රාජා 16:3, 2රාජා 17:17, 2රාජා 21:6, 2ලේක 28:3, 2ලේක 33:6, යෙරෙ 7:31, යෙරෙ 19:5, යෙරෙ 32:35, එස 16:20
**13** එස 6:7
**14** එස 2:7
**15** රෝම 2:24
**16** ගීතා 105:9, එස 20:6
**17** යොෂු 23:5, නෙහෙ 9:22

**2 තීරුව**

**1** ද්වි 12:2, 1රාජා 14:23, යෙසා 65:7, යෙරෙ 2:20
**2** ගීතා 78:58, යෙසා 57:5, එස 6:13
**3** එස 16:19
**4** යෙරෙ 19:13
**5** එස 16:24
**6** ගණන් 32:14
**7** විනි 2:19, 2ලේක 21:13, යෙරෙ 7:28, යෙරෙ 13:27, ක්‍රියා 7:51
**8** ද්වි 18:10, ගීතා 106:37, යෙරෙ 7:31
**9** ද්වි 29:17, 1රාජා 21:26, එස 20:7
**10** 1සාමු 28:6, හිතෝ 1:28, යෙසා 1:15
**11** සෙක 7:13; **12** රෝම 12:2; **13** ද්වි 4:28; ද්වි 28:36; යෙරෙ 44:17; **14** එස 11:5; **15** හිතෝ 19:21; විලා 3:37.

අනිවාර්යයෙන්ම සිදු වන්නේය. මම
මාගේ බලවත් හස්තය පෙන්වමින්[1]
මාගේ කෝපය වගුරුවන්නෙමි.[2] ඔබ
කෙරෙහි මා රජකම් කරන්නේ එලෙ-
සයි. **34** විසිරී ගිය දේශවලින් මම
ඔබව එකතු කරන්නෙමි. විවිධ ජාතීන්
අතරෙන් ඔබව රැගෙන එන්නෙමි.
මාගේ බලවත් හස්තය පෙන්වා මාගේ
කෝපය වගුරුවමින් මම එසේ කරන්-
නෙමි.[3] **35** එසේ කර මම ඔබව
ජාතීන්ගේ පාළුකරයට ගෙන යන්-
නෙමි.[4] එහිදී මුහුණට මුහුණ ලා මම
ඔබ සමඟ වාද කරන්නෙමි.[5]

**36** “ ‘ඊජිප්තු දේශයේ පාළුකරයේදී
ඔබේ මුතුන්මිත්තන් මාගේ විනිශ්ච-
යට ලක් වූවාක් මෙන්[6] ඔබත් මාගේ
විනිශ්චයට ලක් වනු ඇත.’ එසේ
පවසන්නේ විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවිය. **37** ‘එඬේ-
රෙකු තම බැටළුවන්ව තම සැරය-
ටියෙන් කීකරු කරවන්නාක් මෙන්[7]
මමද ඔබව මාගේ ගිවිසුම යටතට
ගෙනෙන්නෙමි.[8] **38** මම ඔබ අත-
රේ සිටින කැරලිකරුවන්වද පව්කා-
රයන්වද ඉවත් කරන්නෙමි.[9] ඔවුන්
විදේශිකයන් ලෙස සිටින දේශයෙන්
ඔවුන්ව නිදහස් කරන්නෙමි. එහෙත්
ඊශ්‍රායෙල් දේශයෙහි නම් ඔවුන්ට පය
තබන්න ලැබෙන්නේ නැත.[10] එවිට
මා යෙහෝවා දෙවි බව පිළිගන්න ඔබ
සැමට සිදු වෙනවා ඇත.’[11]

**39** “ඊශ්‍රායෙල් ජනයෙනි, විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවි
ඔබට පවසන්නේ මෙයයි. ‘ඔබ සාදා-
ගත් පිළිකුල්සහගත රූපවලට ඇති
තරම් මෙහෙ කරන්න.[12] නමුත් එහි
ප්‍රතිඵල විඳින්න ඔබට සිදු වන
බවත් මතක තබාගන්න. ඔබ පුදන
දේවලින් හා ඔබ සාදාගත් පිළිකුල්-
සහගත රූපවලින් මාගේ ශුද්ධ නාම-
යට නින්දා කරන්න ඔබට තවදුරටත්
හැකි වන්නේ නැත.’[13]

**40** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේද පවසන්නේය.
‘ඊශ්‍රායෙල් දේශයේ පිහිටි උස් කන්ද
වන මාගේ ශුද්ධ කන්දේදී[14] ඔබ මට
නමස්කාර කරනු ඇත. මුළු ඊශ්‍රා-
යෙල් ජනතාවම තමන්ට හිමි දේශ-
යෙහි මට සේවය කරනු ඇත.[1] මමද
ඔබ ගැන සතුටු වන්නෙමි. ඒ කාල-
යේදී සම්මාදම් හා ප්‍රථම ඵල ඇතුළුව
පුදනු ලබන සියලුම ශුද්ධ දේවල් මම
ඔබෙන් බලාපොරොත්තු වන්නෙමි.[2]
**41** ඒ පූජාවලින් නික්මෙන මිහිරි සුවඳ
නිසා මම ඇත්තටම ඔබ ගැන සතුටු
වන්නෙමි.[3] ඒ දේ සිදු වන්නේ මා ඔබව
ජාතීන් අතරින්ද ඔබ විසිර සිටින
සියලු දේශයන් අතරින්ද එක් රැස් කර
ඔබේ දේශයට ගෙනෙන කාලයේදීය.[4]
ඔබ නිසා සියලු ජාතීහු මා ශුද්ධ බව
දැනගන්නවා ඇත.’[5]

**42** “ ‘මාගේ අත ඔසවා ඔබේ
මුතුන්මිත්තන්ට දෙන්න පොරොන්දු
වූ දේශය වන ඊශ්‍රායෙල් දේශයට
මම ඔබව ගෙන යන්නෙමි.[6] එවිට
මා යෙහෝවා දෙවි බව පිළිගන්න
ඔබට සිදු වෙනවා ඇත.[7] **43** ඒ
කාලයේදී, ඔබ අතීතයේ කළ සියලු
දේවල්ද එමගින් ඔබ අපවිත්‍ර වූ ආකා-
රයද ඔබට අනිවාර්යයෙන්ම සිහි වනු
ඇත.[8] ඔබ කළ ඒ සියලු නපුරු
දේවල් නිසා[9] ඔබට ඇති වන පිළිකුල
ඔබේ මුහුණුවලින් පැහැදිලිව දැක-
ගැනීමට හැකි වෙයි.[10] **44** ඊශ්‍රායෙල්
ජනයෙනි, මම ඔබ කළ සියලු නපුරු-
කම්වලට හා දූෂිත ක්‍රියාවලට අනුව
ඔබට විරුද්ධව පියවර නොගෙන ඔබ
වෙනුවෙන් නැඟී සිටින්නෙමි.[11] මා ඒ
දේ කරන්නේ මාගේ නාමය වෙනු-
වෙනි.[12] එවිට මා යෙහෝවා දෙවි බව
පිළිගන්න ඔබට සිදු වෙනවා ඇත.’[13]
එසේ පවසන්නේ විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවිය.”

**45** යෙහෝවා දෙවි මට තවදු-
රටත් මෙසේ පැවසීය. **46** “මනුෂ්‍ය
පුත්‍රය, ඔබ දකුණු දෙසට හැරී[14] කතා
කරන්න. දකුණු පැත්තෙහි පිහිටා
ඇති[15] මුළු වනාන්තරයටම ඇසෙන
සේ අනාවැකි කියන්න. **47** ඔබ
දකුණු දෙසින් පිහිටි ඒ වනාන්ත-
රයට මෙසේ පැවසිය යුතුය. ‘යෙ-
හෝවා දෙවි පවසන දේට සවන්

---

**20 පරි.**
1 යෙසා 40:10
2 යෙරෙ 21:5
එස 8:18
3 යෙසා 27:13
එස 34:16
ආමෝ 9:9
4 හොෂෙ 2:14
මීකා 4:10
5 යෙරෙ 2:9
යෙරෙ 25:31
එස 17:20
හොෂෙ 4:1
6 1කොරි 10:9
7 ලෙවී 27:32
යෙරෙ 33:13
එස 34:17
8 ගීතා 89:34
9 ගණන් 14:30
එස 34:20
මලා 3:3
මතෙ 3:12
10 එස 13:9
11 ගීතා 9:16
එස 6:13
12 විනි 10:14
ගීතා 81:12
ආමෝ 4:4
13 හිතෝ 21:27
යෙසා 1:13
යෙරෙ 7:10
එස 23:39
14 යෙසා 2:2
යෙසා 66:20
එස 17:23
මීකා 4:1

---

**2 තීරුව**
1 යෙසා 56:7
මීකා 4:2
සෙක 8:22
2 මලා 3:4
රෝම 12:1
හෙබ්‍රෙ 13:15
3 උත් 8:21
එෆී 5:2
පිලි 4:18
4 යෙසා 11:11
යෙරෙ 23:3
2කොරි 6:17
5 යෙසා 5:16
එස 38:23
6 එස 11:17
එස 37:12
7 යෙරෙ 24:7
එස 36:23
8 ලෙවී 26:40
නෙහෙ 1:9
එස 16:61
හොෂෙ 5:15
9 එස 6:9
10 යෙරෙ 31:18
11 1තිමෝ 1:16
12 ගීතා 79:9
එස 36:22
13 එස 24:24
14 එස 6:2
15 එස 21:2
ආමෝ 7:16

දෙන්න. විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි.
“මම ඔබට විරුද්ධව ගින්නක් අවුළු-
වන්නෙමි.[1] එමගින් ඔබ තුළ සරුවට
වැඩෙන සෑම ගසක් වගේම සෑම වියළි
ගසක්ද මම දවා දමන්නෙමි.[2] බුර-
බුරා නැඟෙන ඒ ගින්න නිවී යන්නේ
නැත.[3] දකුණේ සිට උතුර දක්වා
සිටින සියලුදෙනාගේ මුහුණු* එයින්
පිලිස්සී යනවා ඇත.[4] **48** සියල්ලට
ගිනි අවුළුවා ඇත්තේ යෙහෝවා දෙවි
වන මා බව සියලුම මනුෂ්‍යයෝ දකි-
නවා ඇත. ඒ ගින්න නම් කිසි ලෙස-
කින්වත් නිවී යන්නේ නැත.” ’ ”[5]

**49** එවිට මම මෙසේ පැවසුවෙමි.
“අනේ විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවියනි! ‘ඔහු නිතරම
උපමා කතා කියනවා’[6] යයි ඔවුහු මා
ගැන පවසති.”

**21** යෙහෝවා දෙවි මට තව-
දුරටත් පැවසුවේ මෙසේය.
**2** “මනුෂ්‍ය පුත්‍රය, ඔබ යෙරුසලම දෙ-
සට හැරී ශුද්ධස්ථානයට* ඇසෙන
සේ[7] කතා කරන්න.[8] ඊශ්‍රායෙල්
දේශයේ වැසියන්ට විරුද්ධව අනා-
වැකි කියන්න.[9] **3** ඊශ්‍රායෙල් දේශ-
යේ වැසියන්ට ඔබ මෙසේ පැවසිය
යුතුයි. ‘යෙහෝවා දෙවි පවසන්නේ
මෙයයි. “මම ඔබට විරුද්ධව නැඟී
සිටිමි.[10] මම මාගේ කඩුව කොපුවෙන්
ඇද[11] ඔබ අතරේ සිටින ධර්මිෂ්ඨයන්-
ටද දුෂ්ටයන්ටද පහර දෙන්නෙමි.[12]
**4** ඔබ අතරේ සිටින ධර්මිෂ්ඨයන්-
වද දුෂ්ටයන්වද සහමුලින්ම නැති
කර දමන පිණිස කොපුවෙන් ඉව-
තට ගත් මාගේ කඩුවෙන් දකුණේ
සිට උතුර දක්වා සිටින සියලුදෙනා-
ටම පහර දෙන්නෙමි.[13] **5** එවිට යෙ-
හෝවා දෙවි වන මා, මාගේ කඩුව
කොපුවෙන් ඉවතට ගෙන ඇති බව
සියලුදෙනාටම දැනගන්න සිදු වෙ-
නවා ඇත.[14] ඒ කඩුව නැවත කොපු-
වට දමන්නේ නැත.” ’[15]

**6** “මනුෂ්‍ය පුත්‍රය, බියෙන් වෙ-
වුලන්න.[1] ඔවුන් ඉදිරියෙහිම මහත්
වේදනාවෙන් සුසුම්ලන්න.[2] **7** ‘ඔබ
සුසුම්ලමින් සිටින්නේ ඇයි’ කියා
ඔවුන් ඔබෙන් ඇසුවොත්,[3] ‘ලැබුණු
ආරංචියක් නිසාය’[4] කියා ඔවුන්ට පව-
සන්න. ඔබට ආරංචි වන එම දේ
අනිවාර්යයෙන්ම සිදු වන්නේය.[5] සිය-
ලුදෙනාගේම සිත් බියෙන් සලිත වනු
ඇත.[6] ඔවුන්ගේ අත් වෙවුලනු ඇත.
සෑම කෙනෙක්ම කලකිරෙන්නෝය.
ඔවුන්ගේ දණහිස් තෙමී යන්නේය.*[7]
ඒ විපත ඔවුන් පිටට පැමිණෙන බව
විශ්වයේ පාලකයාණන් වූ යෙහෝවා
දෙවි වන මම ස්ථිර වශයෙන්ම පව-
සමි.”[8]

**8** යෙහෝවා දෙවි මට තවදුර-
ටත් මේ දේද පැවසුවේය. **9** “මනුෂ්‍ය
පුත්‍රය, අනාවැකි කියන්න. ‘යෙහෝවා
දෙවි ඔබට මෙසේ පවසා ඇත’ කිය-
මින් ඔවුන්ට මෙසේ දැනුම් දෙන්න.
‘කඩුවක්! කඩුවක්![9] ඒ කඩුව මුවහත්
කර තිබේ.[10] එය දීප්තියෙන් බැබ-
ළෙයි. **10** එය මුවහත් කර තිබෙන්-
නේ මහත් ඝාතනයක් සිදු කිරීමටය.
එය ඔප දමා ඇත්තේ දීප්තියෙන්
බැබළීමටය.’ ”[11]

“එහෙත් අපට ප්‍රීති වෙන්න හේතු-
වක් නැද්ද?”[12]

“ ‘ඒ කඩුව අන් සියලු රාජ යෂ්ටීන්*
පහ කර දැමුවාක් මෙන්[13] මගේම පුත්‍ර-
යාගේ[14] රාජ යෂ්ටියත් පහ කර දමනු
ඇත.[15]

**11** “ ‘මෙම කඩුව හොඳින් මුවහත්
කර ඔප දමා තිබේ. එය මුවහත්
කළෙත් ඔප දැමුවෙත් මිනී මරන්නෙ-
කුගේ අතට භාර දීමටය.[16]

**12** “ ‘මනුෂ්‍ය පුත්‍රය, මහත් හඬින්
කෑ මොර ගසන්න.[17] මන්ද එය පැමි-
ණෙන්නේ මාගේම සෙනඟ පිටටත්[18]
ඊශ්‍රායෙල්හි අධිපතීන් පිටටත්ය.[19]
මාගේ සෙනඟ සමඟ අධිපතීහුද කඩු-
වට ගොදුරු වනු ඇත.[20] එමනිසා

---

එස **20:47*** හෝ, “මුළු භූමියම.” **21:2*** මූ.අ., “ශුද්ධස්ථානවලට.”

එස **21:7*** එස 7:17හි පාදසටහන බලන්න. **10*** මූ.අ., “ගස්.”

---

**20 පරි.**
**1** ද්වි 32:22
යෙරෙ 21:14
**2** එස 17:24
ලූක් 23:31
**3** යෙසා 66:24
මතෙ 3:12
**4** එස 21:4
**5** ද්වි 29:24
2ලේක 7:20
විලා 2:17
**6** එස 17:2

**21 පරි.**
**7** එස 6:3
**8** ආමො 7:16
**9** එස 12:19
එස 20:42
**10** එස 5:8
**11** ලෙවී 26:33
එස 14:17
**12** යෝබ් 9:22
**13** එස 7:2
එස 20:47
**14** ද්වි 29:24
1රාජා 9:7
ගීතා 9:16
**15** යෙසා 45:23
යෙරෙ 23:20
නාහු 1:9

**2 තීරුව**
**1** ගීතා 69:23
එස 29:7
**2** යෙසා 22:4
යෙරෙ 4:19
එස 9:8
**3** එස 24:19
**4** 2රාජා 21:12
**5** යෙරෙ 6:22
**6** යොෂු 2:11
යොෂු 5:1
**7** එස 7:17
**8** එස 7:12
1පේතෘ 4:7
**9** යෙසා 66:16
යෙරෙ 12:12
ආමො 9:4
**10** ගීතා 7:12
**11** යෙරෙ 46:4
**12** යෙසා 5:14
**13** එස 19:11
**14** 2සාමු 7:14
**15** උත් 49:10
**16** යෙරෙ 25:9
යෙරෙ 25:33
යෙරෙ 51:20
**17** එස 9:8
මීකා 1:8
**18** යෙරෙ 25:2
**19** එස 19:1
**20** යෙරෙ 25:16

ශෝකයෙන් ඔබේ කළවයට ගසා-
ගන්න.[1] **13** කඩුව මුවහත්ද කියා
සෝදිසි කරනු ඇත.[2] ඒ කඩුව රාජ
යෂ්ටියට පවා අවමන් කරයි. එවිට
කුමක් සිදු වෙයිද?[3] රාජ යෂ්ටිය තව-
දුරටත් නොපවතිනු ඇත.'[4] එසේ පව-
සන්නේ විශ්වයේ පාලකයාණන් වූ
යෙහෝවා දෙවි වන මමය.

**14** "මනුෂ්‍ය පුත්‍රය, අනාවැකි කියා
ඔබේ අත්ලට ගසාගන්න.[5] 'කඩුවක්'
කියා තුන් වතාවක් පවසන්න.[6] එය
ලේ වගුරුවන කඩුවකි. එය උත්තම-
යන්ව ඝාතනය කරන කඩුවකි. සැම
පැත්තකින්ම ඔවුන්ව වට කරගෙන
පහර දෙන කඩුවකි.[7] **15** කඩුවෙන්
මෙම විනාශය සිදු කරන්නේ මමය.
ඔවුන්ව බියගැන්වීම සඳහාත්[8] නුවර
දොරටුව අසලදීම[9] බොහෝදෙනෙ-
කුව යටත් කරගැනීම සඳහාත් මම
එය එවන්නෙමි. එය මුවහත් කර
ඔප දමා තිබෙන්නේ මහත් ඝාත-
නයක් සිදු කිරීමටය.[10] **16** කඩුව,
ඔබේ මුවහත රැකගනු![11] දකුණ-
ටත් වමටත් ගොස් පහර දෙනු!
හැරෙන හැරෙන පැත්තට පහර දෙනු!
**17** මමද මාගේ අත්ලට ගසාගන්-
නෙමි.[12] එවිට ඔබට විරුද්ධව ඇවිළ
තිබූ මාගේ උදහස[13] නිවී යන්නේය.[14]
මේ සියල්ල පවසන්නේ යෙහෝවා
දෙවි වන මමය."

**18** යෙහෝවා දෙවි මට තවදුර-
ටත් පැවසුවේ මෙසේය. **19** "මනුෂ්‍ය
පුත්‍රය, යම් දේශයකින් ඇරඹෙන මාර්-
ගයක් දැන් සටහන් කරගන්න. ඒ
මාර්ගය එක්තරා මංසන්ධියකදී දිශා
දෙකකට විහිදෙයි. කඩුවක් අතැ-
තිව එන බැබිලෝනියේ රජුට එම
මංසන්ධියේදී තමන් කුමන මාර්ග-
යේ යනවාදැයි තේරීමක් කරන්න සිදු
වෙයි.[15] නුවරට යන දිශාව පෙන්වන
සලකුණක් එක් මාර්ගයක තබන්න.[16]
**20** කඩුවක් අතැතිව සටනට එන
රජුට යැම සඳහා මාර්ග දෙකක් ඔබ
මෙලෙස සලකුණු කළ යුතුය. අම්-
මොන්වරුන්ට අයත් රබ්බා නුවරට[17]
යන මාර්ගයද යූදා දේශය හා යෙරුස-
ලමේ බලකොටු දෙසට යන මාර්ගයද
සලකුණු කරන්න.[1] **21** බැබිලෝනි-
යේ රජ එම මංසන්ධියට පැමිණ නව-
තිනු ඇත. ඒ ස්ථානයේදී ඔහු නිමිති
බලනු ඇත.[2] ඔහු ඒ සඳහා ඊතල
සොලවා, ටෙරෆිම් රූප මාර්ගයෙන්
තොරතුරු විමසන්නේය.[3] ඔහු සතෙ-
කුගේ අක්මාව මගින්ද නිමිති බලනු
ඇත. **22** ඔහුගේ දකුණතට හසු වන
දේ අනුව තමන් යෙරුසලම බලා යා
යුතුයි කියා ඔහු තීරණය කරනු ඇත.[4]
එහෙයින් යුද්ධයට සැරසෙන්නයයි
මහත් හඬින් අණක් නික්මෙයි.[5] යෙරු-
සලමට පහර දී මහත් ඝාතනයක් සිදු
කිරීමට ඔහුගෙන් අණක් නික්මෙයි.
නුවරේ දොරටු කඩා දැමීමට යුධෝප-
කරණ සූදානම් කිරීමටත් නුවර වටලා
පවුරු ගොඩනැඟීමටත් ඔහුගෙන් අණ
ලැබෙනු ඇත.[6] **23** එහෙත් යෙරු-
සලමේ වැසියන් නිමිති බැලීමෙන්
හෙළි වූ ඒ දේ සත්‍යයක් ලෙස පිළි-
ගන්නේ නැත.[7] මන්ද ඔවුන් දිවු-
රුම් දී ඔහු සමඟ ගිවිසුමක් ඇති
කරගෙන තිබෙන හෙයිනි.[8] නමුත්
ඔවුන්ගේ කැරලිකාරකම නිසා[9] බැබි-
ලෝනියේ රජ ඔවුන්ව හසු කරගැනී-
මට පැමිණෙන්නේය.[10]

**24** "එබැවින් විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි මේ දේ පව-
සයි. 'ඔබ කළ සැම වරදක්ම හෙළි වී
ඇත. ඔබ කර ඇති දේවලින් ඔබේ
පව්කාරකමද පැහැදිලිව පෙනේ. එම-
නිසා ඔබේ සියලු වැරදි සිහි කරනු
ඇත.[11] ඒවාට ප්‍රතිඵල විඳින්න ඔබට
සිදු වේ. ඔබ සියලුදෙනා ඔබේ සතුරා-
ගේ අතට හසු වන්නහුය.'[12]

**25** "දරුණු ලෙස පහර කෑ ඊශ්‍රා-
යෙල්හි[13] දුෂ්ට අධිපති වූ ඔබ[14]
කළ සියලු වැරදිවලට දඬුවම්
විඳීමට දැන් කාලය පැමිණ ඇත.
ඔබේ අයුතුකම්වල අවසානය පැමිණ
ඇත.[15] **26** විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි මෙසේ පවසයි.
'හිස්වැස්ම ගලවා දමන්න. ඔටුන්න
ඉවත් කරන්න.[16] දැන් මහත් වෙ-
නසක් සිදු වෙනවා ඇත.[17] පහත්

**21 පරි.**
**1** යෙරෙ 31:19
**2** යෙරෙ 6:27
**3** 2රාජා 25:7
එස 19:14
**4** යෙරෙ 39:6
එස 21:26
**5** ගණන් 24:10
එස 6:11
**6** ලෙවී 26:21
**7** 2රාජා 25:1
2රාජා 25:2
ලූක් 19:43
**8** එස 21:7
**9** යෙරෙ 17:27
**10** එස 21:10
**11** එස 14:17
**12** එස 22:13
**13** එස 5:13
**14** ද්වි 28:63
යෙසා 1:24
එස 16:42
**15** යෙරෙ 1:10
**16** එස 4:1
එස 5:1
**17** ද්වි 3:11
යෙරෙ 49:2
එස 25:5
ආමො 1:14

**2 තීරුව**
**1** 2සාමු 5:9
2ලේක 26:9
2ලේක 32:5
2ලේක 33:14
ගීතා 48:12
විලා 4:12
**2** ගණන් 22:7
ද්වි 18:10
**3** විනි 18:14
2රාජා 23:24
සෙක 10:2
**4** 2රාජා 25:1
එස 4:2
**5** යොෂු 6:20
1සාමු 17:20
**6** යෙරෙ 32:24
යෙරෙ 52:4
එස 4:3
**7** යෙසා 28:15
**8** 2ලේක 36:13
එස 17:13
**9** 2රාජා 24:20
යෝබ් 34:11
**10** 2රාජා 25:6
**11** යෙරෙ 2:34
**12** යෙරෙ 15:2
**13** 2ලේක 36:13
යෙරෙ 24:8
යෙරෙ 52:2
එස 17:19
**14** 1රාජා 11:34
**15** එස 7:6
**16** 2රාජා 25:6
යෙරෙ 13:18
යෙරෙ 44:30
යෙරෙ 52:11
**17** එස 21:13

තැනැත්තාව උසස් කරන්න.[1] උත්ත-
මයාව පහත් කරන්න.[2] **27** විනාශ-
යක්! විනාශයක්! මම මහත්
විනාශයක් සිදු කරන්නෙමි.[3] නීත්‍යා-
නුකූල අයිතිය ඇති තැනැත්තා
පැමිණෙන තෙක්[4] ඔටුන්න කිසිවෙකු-
ටවත් හිමි වන්නේ නැත. ඔහු පැමිණි
විට මම එය ඔහුට දෙන්නෙමි.'[5]
**28** "මනුෂ්‍ය පුත්‍රය, දැන් අනා-
වැකි කියන්න. ඔබ පැවසිය යුත්-
තේ මෙයයි. 'විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි අම්මොන්-
වරුන් ගැනත් ඔවුන්ගෙන් සිදු වූ
නින්දාව ගැනත් පවසන්නේ මෙ-
සේය. කඩුවක් කොපුවෙන් ඉවතට
ගෙන ඇත. ඒ කඩුව ඔසවා ඇත්-
තේ ඝාතනයක් සිදු කිරීමටය. එය
ඔප දමා ඇත්තේ මහත් විනාශයක්
කිරීමටය. එය දිදුලයි.[6] **29** එසේ
වන්නේ ඔබේ අනාගතවක්තෘවරුන්
ඔබට බොරු අනාවැකි පැවසූ නිසාය.
ඔවුන් නිමිති බලා ඔබව මුළා කළ
නිසාය.[7] එහෙයින් සියලු අයුතුකම්-
වල අවසානය පැමිණෙන දවසේදී මරා
දමනු ලබන අයගේ මළ කඳන් සමඟ
ඔබේ මළ කඳන්ද ගොඩගසනු ලැබේ.[8]
**30** කඩුව නැවත කොපුවේ දැමිය
යුතුය. ඔබ උපන් දේශයේදීම[9] මම
ඔබව විනිශ්චය කරන්නෙමි. **31** මම
ඔබට විරුද්ධව ප්‍රකාශ කර ඇති මාගේ
කෝපය වගුරුවන්නෙමි. මාගේ උදහ-
සද ගින්නක් මෙන් ඔබට විරුද්ධව
ඇවිළෙන්නේය.[10] මම තිරිසන් ගති
ඇති දරුණු මිනිසුන් අතට ඔබව හසු
කර දෙන්නෙමි. ඔවුහු විනාශ කිරීමට
දක්ෂ සෙනඟකි.[11] **32** ඔබ ගින්නට
ඉන්ධන මෙන් වනු ඇත.[12] ඔබේ ලේ
දේශය පුරා ගලා යන්නේය. ඔබව
නැවත සිහි කරනු ලබන්නේ නැත.
මන්ද මේ දේ නියම කරන්නේ යෙ-
හෝවා දෙවි වන මමය.'"[13]

**22** යෙහෝවා දෙවි මට මෙසේ
පැවසුවේය. **2** "මනුෂ්‍ය
පුත්‍රය, ලේ වගුරුවනු ලැබූ මෙම
නුවර[14] විනිශ්චය කරන්න ඔබ සූදා-
නම්ද?[15] ඇයව විනිශ්චය කරන්න!
ඇය සිදු කළ සියලුම පිළිකුල්සහගත
දේවල් ගැන ඇයට දැනුම් දෙන්න.[1]
**3** ඔබ මෙසේ පැවසිය යුතුයි. 'විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවි පවසන්නේ මෙයයි. "ලේ වගු-
රුවන නුවර,[2] විනිශ්චය පැමිණෙන
තෙක්ම ඔබ ලේ වගුරුවන්නෙහිය.[3]
ඔබේ වැසියන් නුවර මධ්‍යයෙහිම ලේ
වගුරුවමින් පිළිකුල්සහගත රූප තනා
අපවිත්‍ර වී ඇත.[4] **4** ඔබ වැගිරවූ ලේ-
වලට ඔබ වග කිව යුතුය.[5] ඔබ
තැනූ පිළිකුල්සහගත රූප නිසා ඔබ
අපවිත්‍ර වී සිටින්නෙහිය.[6] ඔබට තව
ඉතුරුව ඇත්තේ ඉතා කෙටි කාල-
යකි. ඔබව විනිශ්චය කිරීම සඳහා
කාලය පැමිණෙනු ඇත. එහෙයින් මම
ජාතීන් ඉදිරියේ ඔබව නින්දාවට පත්
කරන්නෙමි. සියලු දේශයන්හි වෙ-
සෙන ජනයා ඔබව සමච්චලයට ලක්
කරනු ඇත.[7] **5** ඔබ මහත් සේ වියවු-
ලට පත්ව සිටින්නෙහිය. ඔබේ නාමය
කෙලෙසී ඇත. එබැවින් ළඟපාත හා
දුර ඈත සිටින සියලු දේශවල වැසියන්
ඔබව සමච්චලයට ලක් කරනු ඇත.[8]
**6** ඊශ්‍රායෙල් දේශයේ අධිපතීන්[9] නුවර
මැද හැසිරෙන ආකාරය දෙස බලන්න.
අනුන්ගේ ලේ වගුරුවන පිණිස ඔවුහු
තමන් සතු බලය* අනකොළුවක් කර-
ගෙන සිටිති.[10] **7** ඔවුහු තම පියාටත්
මවටත් අවමන් කර ඇත.[11] ඔවුන්
ඔබ තුළ වාසය කරන විදේශිකයන්ට
වංචා කර ඇත.[12] පියා නැති දරු-
වන්ට හා වැන්දඹුවන්ට ඔවුහු හිරිහැර
කළෝය."'"[13]

**8** "'ඔබ මාගේ ශුද්ධස්ථාන හෙළා-
දකින්නෙහිය. මා නියම කළ සබත්
දවස් කඩ කර මට අගෞරව කරන්-
නෙහිය.[14] **9** අන්‍යායන්ට නින්දා අප-
හාස කරමින් ලේ වැගිරවීමට මාන
බලන අය[15] ඔබේ වැසියන් අතර

**21 පරි.**
1 1සාමු 2:7; ගීතා 75:7; ගීතා 113:7; දානි 4:17; පිලි 2:9
2 යෙරෙ 24:8; එස 12:13; දානි 4:37; ලූක් 21:24
3 2ලේක 20:23; එස 5:16
4 උත් 49:10; ගීතා 89:3; ගීතා 110:1; යෙසා 9:6; යෙසා 11:10; එස 37:25; ලූක් 1:32; රෝම 15:12; එළි 5:5
5 ගීතා 2:8; දානි 7:14; ලූක් 22:29
6 යෙරෙ 49:2
7 එස 12:24; එස 22:28
8 ගීතා 37:13
9 ද්වි 3:11
10 යෙරෙ 22:22; යෙරෙ 49:3
11 යෙරෙ 4:7; එස 25:5
12 යෙරෙ 49:2
13 යෙසා 55:11

**22 පරි.**
14 2රාජා 21:16; යෙරෙ 2:34; හොෂෙ 4:2; මතෙ 23:37
15 එස 20:4; එස 23:36

**2 තීරුව**
1 යෙසා 58:1; එස 16:2; එස 16:51
2 එස 24:6
3 එස 12:25; 2පේතෘ 2:3
4 2රාජා 21:11; 2රාජා 23:24
5 උත් 9:6; 2රාජා 21:16; ගීතා 106:38; එස 23:37
6 ලෙවී 26:30
7 ද්වි 28:37; 1රාජා 9:7; 2ලේක 7:20; ගීතා 79:4; ගීතා 80:6; යෙරෙ 18:16; එස 5:14; එස 23:32; දානි 9:16
8 ගීතා 79:4

**9** යෙසා 1:23; එස 19:1; මීකා 3:1; ශෙප 3:3; **10** මීකා 2:1; **11** ද්වි 27:16; හිතෝ 20:20; **12** නික් 22:21; හිතෝ 22:22; **13** ගීතා 82:3; ගීතා 94:6; යෙසා 1:17; යෙරෙ 7:6; සෙක 7:10; මලා 3:5; **14** ලෙවී 19:30; එස 20:13; එස 23:38; **15** නික් 23:1; ලෙවී 19:16.

එස **22:6*** මූ.අ., "හස්තය."

සිටිති. ඔවුහු කඳුවල තබා ඇති රූප-
වලට පිදූ දේ අනුභව කරති.[1] ඔබේ
ඇස් ඉදිරියෙහිම ඔවුහු ඉතා නින්දිතව
හැසිරෙන්නෝය.[2] **10** ඔවුන් අශික්-
ෂිත දේ කරමින් තම පියාට මහත්
නින්දාවක් ගෙන දී ඇත.*[3] ඔවුන්
ස්ත්‍රියකගේ ඔසප් කාලයේදී ඇයට
බලහත්කාරකම් කර ඇයව නින්දා-
වට පත් කර ඇත.[4] **11** ඇතමෙක්
තම මිතුරාගේ බිරිඳ සමඟ අනා-
චාරයේ යෙදී ඇත.[5] තවත් සමහ-
රෙක් තමාගේම ලේලිව කෙලෙසමින්
ඇය සමඟ නින්දිත ලෙස හැසිර
ඇත.[6] එමෙන්ම තවත් අයෙක් තම
පියාගේ දියණියට එනම්, තමාගේම
සහෝදරියට පවා බලහත්කාරකම්
කර ඇයව නින්දාවට පත් කළේය.[7]
**12** ඔබ ලේ වගුරුවන පිණිස අල්-
ලස් ගෙන ඇත.[8] ඔබ පොලී අය
කරන්නෙහිය.*[9] අයුතු ලෙස අනා-
යන්ගෙන් ලාභ උපයාගන්නෙහිය.[10]
ඔබ බලපුළුවන්කාරකම් පෙන්වමින්[11]
ඔබේ ආශ්‍රිතයන්ට අයිති දේ වංචනික
ලෙස පැහැරගන්නෙහිය.[12] ඔබට මාව
සම්පූර්ණයෙන්ම අමතක වී ඇත.'[13]
එසේ පවසන්නේ විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවිය.

**13** "'ඔබ අයුතු ලෙස ලාභ උප-
යාගත් නිසාත්[14] ඔබ ලේ වැගිරවූ
නිසාත්[15] මම කෝපයෙන් මගේ අත්-
ලට ගසාගන්නෙමි.[16] **14** මා ඔබට
විරුද්ධව පියවර ගන්නා විට එය දරා-
ගැනීමට ඔබට හැකි වෙයිද?[17] ඊට
නොබියව මුහුණ දීමට ඔබට හැකි
වෙයිද?[18] මේ සියල්ල පවසන්නේ යෙ-
හෝවා දෙවි වන මමය. මම අනි-
වාර්යයෙන්ම ඔබට විරුද්ධව පියවර
ගන්නෙමි.[19] **15** මම ඔබව ජාතීන්
අතරට පලවාහැර දේශයන් අතරේ
සීසීකඩ විසුරුවන්නෙමි.[20] ඔබ අතරේ
සිදු වන සියලු අපවිත්‍රකම් සහමු-
ලින්ම ඉවත් කරන්නෙමි.[21] **16** වෙ-
නත් ජාතීන්ගේ ඇස් පනාපිටම ඔබව
කෙලෙසනු ඇත. එවිට මා යෙහෝවා
දෙවි බව පිළිගන්න ඔබට සිදු වෙනවා
ඇත.'"[1]

**17** යෙහෝවා දෙවි මට නැව-
තත් කතා කර මෙසේද පැවසුවේය.
**18** "මනුෂ්‍ය පුත්‍රය, ඊශ්‍රායෙල් දේශයේ
වැසියන් ලෝහවලින් ඉවත් කරගත්
බොර මෙනි.[2] එමෙන්ම ඔවුන් සියල්-
ලන්ම උදුනක දැවෙන තඹ, බෙ-
ලෙක්, යකඩ සහ ඊයම් වැනිය. ඔවුහු
රිදීවලින් ඉවත් කරගත් බොර හා
සමාන තත්වයකට පත් වී ඇත.[3]

**19** "එබැවින් විශ්වයේ පාලකයා-
ණන් වූ යෙහෝවා දෙවි වන මා පව-
සන මේ දේට සවන් දෙන්න. 'ඔබ
සියලුදෙනාම ලෝහවලින් ඉවත් කර-
ගත් බොර හා සමාන තත්වයකට
පත්ව සිටින බැවින්[4] මම ඔබව එක්
රැස් කර යෙරුසලම මැදට ගෙනෙන්-
නෙමි.[5] **20** රිදී, තඹ, යකඩ,[6] ඊයම්
හා බෙලෙක් උදුනකට දමා එහි ගින්-
නට පිඹ[7] එම ලෝහ උණු කරගන්-
නාක් මෙන්[8] උදහස්ව සිටින මමද
ඔවුන්ව එකතු කර ඔවුන්ට විරුද්ධව
ගින්නක් අවුළුවන්නෙමි. **21** ඔබව
රැස් කර මාගේ උදහස නමැති ගින්න
ඔබට විරුද්ධව අවුළුවන්නෙමි.[9] ඔබ
නුවර ඇතුළෙහි දිය වී යන ලෝහ
මෙන් වන්නහුය.[10] **22** එසේය, ඔබ
නුවර මැද උදුනක දිය වී යන
රිදී මෙන් වන්නහුය. එවිට යෙහෝවා
දෙවි වන මා ඔබ මතට මාගේ උදහස
වගුරුවා ඇති බව ඔබට පිළිගන්න සිදු
වෙනවා ඇත.'"[11]

**23** යෙහෝවා දෙවි මට මේ
දේද කීවේය. **24** "මනුෂ්‍ය පුත්‍රය,
ඔබ ගොස් දේශයට මෙසේ පව-
සන්න. 'ඔබ අපවිත්‍ර දේශයකි. දෙවිගේ
කෝපය ප්‍රකාශ වන දවසේදී[12] ඔබට
වැසි නොලැබෙනු ඇත. **25** ඔබේ
අනාගතවක්තෘවරු නුවර ඇතුළෙ-
හිම කුමන්ත්‍රණය කරති.[13] ඔවුන්

**22 පරි.**
**1** එස 18:6
**2** විනි 20:6; ගීතා 26:10; හිතෝ 10:23; යෙරෙ 13:27; එස 16:27; 2පේතෘ 2:7
**3** ලෙවී 18:7; ලෙවී 20:11; ද්වි 27:20; 1කොරි 5:1
**4** ලෙවී 18:19; ලෙවී 20:18
**5** ලෙවී 18:20; ලෙවී 20:10; ද්වි 22:22; යෙරෙ 5:8
**6** ලෙවී 18:15; ලෙවී 20:12; එස 18:11
**7** ලෙවී 20:17; ද්වි 27:22; 2සාමු 13:1
**8** නික් 23:8; ද්වි 16:19; ද්වි 27:25; ගීතා 26:9; යෙසා 1:23; ආමෝ 5:12
**9** නික් 22:25; ද්වි 23:19
**10** ලෙවී 25:36; එස 18:13
**11** හිතෝ 1:19
**12** ලෙවී 6:2
**13** ද්වි 32:18; ගීතා 106:21
**14** හිතෝ 28:8
**15** එස 22:2
**16** එස 21:17
**17** එස 21:7
**18** යෝබ් 40:9; 1කොරි 10:22
**19** එස 17:24
**20** ද්වි 4:27; ද්වි 28:25; එස 12:15
**21** යෙසා 1:25; එස 23:27; මලා 3:3

**2 තීරුව**
**1** ගීතා 9:16; එස 6:7; එස 6:13
**2** යෙසා 1:22; යෙරෙ 6:28
**3** හිතෝ 17:3; යෙසා 48:10; යෙරෙ 6:29
**4** ගීතා 119:119; හිතෝ 25:4
**5** මීකා 4:12; මතෙ 13:30
**6** යෝබ් 28:2
**7** යෙසා 54:16; යෙරෙ 6:29
**8** එස 21:31
**9** ද්වි 4:24; ගීතා 21:9; යෙසා 30:33; යෙරෙ 21:12; එස 22:20; **10** ගීතා 68:2; ගීතා 112:10; **11** එස 20:8; හොෂෙ 5:10; **12** යෙසා 10:5; **13** යෙරෙ 5:31; යෙරෙ 6:13; හොෂෙ 6:9.

එස **22:10*** මූ.අ., "පියාව නිරුවත් කර ඇත." **12*** මින් අදහස් කරන්නේ, ඔවුන් දුගී අයගෙන් පොලී ගත් බවයි.

ගොදුරු ඉරා දමන ගොරවන සිංහ-
යන් වැනිය.[1] ඔවුහු මිනිස් ජීවිත ගිල
දමති.[2] වස්තු සම්පත්ද පැහැරගනිති.[3]
ඔවුන් නිසා නුවරේ සිටින වැන්දඹුවන්-
ගේ සංඛ්‍යාව වැඩි වී ඇත.[4] **26** දේශ-
යේ පූජකයන් මාගේ නීතිය බොහෝ
සෙයින් උල්ලංඝනය කර ඇත.[5] මාගේ
ශුද්ධස්ථානද ඔවුහු දිගින් දිගටම කෙ-
ලෙසති.[6] ශුද්ධ දේ හා පොදු දේ අතර
ඇති වෙනස ගැන[7] ඔවුන්ට කිසි තැකී-
මක් නැත.[8] පවිත්‍ර හා අපවිත්‍ර දේ අතර
ඇති වෙනසද ඔවුහු ජනයාට අවබෝධ
කර දී නැත.[9] ඔවුහු මාගේ සබත්
දවස්ද නොසලකාහරිති.[10] ඔවුන් මාව
නින්දාවට පත් කර ඇත.[11] **27** ලේ
වගුරුවන ඔවුන්ගේ අධිපතීන් ගො-
දුරු ඉරා දමන වෘකයන් වැනිය.[12]
ඔවුහු අයුතු ලෙස මුදල් ඉපයීමට
මිනී මරති.[13] **28** එහෙත් බිත්තියක
හුණු ගාන්නාක් මෙන් දේශයේ අනා-
ගතවක්තෘවරු ඔවුන්ගේ වැරදි වසා
දමති.[14] ඔවුහු බොරු දර්ශන දකිති.[15]
බොරු අනාවැකි කියති.[16] යෙහෝවා
දෙවි වන මා ඔවුන්ට කිසිවක් නො-
පැවසුවද, “විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි මෙසේ පව-
සයි” කියා ඔවුහු ජනයාට කියති.
**29** දේශයේ ජනතාව බලහත්කාර-
යෙන් දේවල් පැහැරගනිති.[17] ඔවුහු
කොල්ල කමින්,[18] අසරණ දුගී අයට
පීඩා කරති.[19] විදේශිකයන්ට යුක්තිය
ඉටු නොකර ඔවුන්ට වංචා කරති.’[20]

**30** “‘පවුර අලුත්වැඩියා කිරීමටත්
එහි කැඩී බිඳී ගිය තැන්වල සිට මුර
කිරීමටත්[21] මම මිනිසෙකුව සෙව්-
වෙමි.[22] එසේ කළේ දේශය විනාශ
නොකිරීමට හේතුවක් සෙවීම සඳ-
හාය.[23] එහෙත් මට කිසිවෙකු සො-
යාගත නොහැකි විය. **31** එබැවින්
මාගේ උදහස ඔවුන් පිට වගුරු-
වන්නෙමි.[24] මාගේ කෝපය නමැති
ගින්නෙන් ඔවුන්ව සහමුලින්ම දවා
දමන්නෙමි.[25] ඔවුන්ගේ ක්‍රියාවල ප්‍රති-
ඵල විඳින්න ඔවුන්ට සිදු වනු ඇත.’[26]
එසේ පවසන්නේ විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවිය.”

**22 පරි.**
1 මීකා 3:5
2 මාක් 12:40 ලූක් 20:47
3 යාකො 5:4
4 යෙරෙ 15:8
5 යෙරෙ 2:8 විලා 4:13 මීකා 3:11 ශෙප 3:4 මලා 2:8
6 ලෙවී 20:3 ලෙවී 22:2
7 එස 44:23
8 ලෙවී 10:10
9 ලෙවී 11:47 ක්‍රියා 10:14
10 එස 20:13
11 එස 36:20 රෝම 2:24
12 මීකා 3:2 ශෙප 3:3
13 මතෙ 21:13
14 යෙසා 30:10 එස 13:10
15 එස 21:29
16 ද්වි 13:3 යෙරෙ 23:25 විලා 2:14
17 ලෙවී 6:2 යෙසා 1:23 යෙරෙ 5:26 යෙරෙ 7:9 යෙරෙ 21:12 මීකා 2:2
18 ගීතා 62:10 යෙසා 3:14
19 නික් 22:21 ලෙවී 19:33
20 නික් 23:9
21 ගීතා 106:23
22 යෙරෙ 5:1
23 උත් 18:23 නික් 32:11
24 යෙසා 26:20
25 යෙසා 10:22 නාහු 1:6
26 එස 11:21 රෝම 2:6 ගලා 6:7

**2 තීරුව**

**23 පරි.**
1 2පේතෘ 1:21
2 යෙරෙ 3:7
3 ලෙවී 17:7 ද්වි 29:17 යොෂු 24:14 එස 20:8
4 එස 23:21
5 එස 16:22 හොෂෙ 2:13
6 නික් 19:5 යෙරෙ 2:3 එස 16:8
7 එස 16:20 ගලා 4:25
8 1රාජා 16:24
9 1රාජා 8:29

**23** යෙහෝවා දෙවි මට මෙසේ
පැවසුවේය.[1] **2** “මනුෂ්‍ය
පුත්‍රය, එක මවකගේ දූවරුන් දෙදෙ-
නෙකු ගැන මම දැන් ඔබට කියමි.[2]
**3** ඔවුහු දෙදෙනා තම තරුණ වියේ-
දීම ඊජිප්තුවේදී වේශ්‍යාකම් කරන්න
පටන්ගත්තෝය.[3] ඔවුහු ඒ දේශ-
යේදී කායික ඇසුරෙහි රස විඳිමින්[4]
තම පිවිතුරු බව නැති කරගත්-
තෝය.[5] **4** වැඩිමල් තැනැත්තියගේ
නම ඔහොලාය. ඇගේ නැඟණිය
ඔහොලිබාය. මම ඔවුන්ව අයිති
කරගත්තෙමි.[6] ඔවුහු දූපුතුන්ව බිහි
කළෝය.[7] ඔහොලා නමින් හඳුන්වන්-
නේ සමාරිය නුවරය.[8] ඔහොලිබා යෙ-
රුසලමය.[9]

**5** “ඔහොලා මට අයිතිව සිටියදී
වේශ්‍යාකම් කරන්න පටන්ගත්තාය.[10]
කාමාශාවෙන් උමතුව සිටි ඇය, ඇගේ
පෙම්වතුන්[11] වන අසල්වාසී ඇසිරි-
යානුවන් පසුපස ගියාය.[12] **6** ඔවුහු
නිල් සළුපිළි පැළඳ සිටි ආණ්ඩුකා-
රයෝ සහ නියෝජ්‍ය නායකයෝය.
ඔවුහු සියලුදෙනාම අශ්වයන් පිට
නැඟ යන සිත් වශී කරවනසුලු කඩ-
වසම් තරුණයෝය. **7** ඇය ඇසි-
රියාවේ හැඩිදැඩි තරුණයන් සමඟ
නොනවත්වාම වේශ්‍යාකම් කළාය.
ඔවුන් සියලුදෙනා පසුපස කාමාශා-
වෙන් හඹා ගිය ඇය ඔවුන්ගේ පිළි-
කුල්සහගත රූප පසුපසද යමින් තව
තවත් අපවිත්‍ර වූවාය.[13] **8** ඊජිප්තු-
වේ සිටි කාලයේදී කළ වේශ්‍යාකම්
ඇය තවමත් අත්හැර නැත. එකල
තරුණ වියේ සිටි ඇය තම පිවිතුරු
බව නැති කරගනිමින් ඔවුන් සමඟ
සයනය කළාය. රාගයෙන් මත්ව සිටි
ඊජිප්තුවරුද නොනැවතී ඇය සමඟ
අනාචාරයෙහි යෙදුණෝය.[14] **9** එම-
නිසා ඇගේ පෙම්වතුන්[15] වන ඇසි-
රියානුවන් කෙරෙහි කාමාශාවෙන්

**10** 1රාජා 14:16; 1රාජා 21:26; 2රාජා 17:7; **11** හොෂෙ 2:5; **12** 2රාජා 15:19; 2රාජා 16:7; 2රාජා 17:3; යෙරෙ 2:18; යෙරෙ 2:36; විලා 5:6; එස 16:28; හොෂෙ 5:13; හොෂෙ 7:11; හොෂෙ 8:9; **13** ගීතා 106:39; හොෂෙ 5:3; හොෂෙ 6:10; **14** නික් 32:4; 1රාජා 12:28; 2රාජා 10:29; 2රාජා 17:16; **15** 2රාජා 15:29.

උමතුව සිටි ඇයව ඇගේ පෙම්වතුන්-
ගේම අතට භාර දුනිමි.[1] **10** ඔවුහු
ඇගේ නිරුවත දකින පිණිස ඇයව
නිර්වස්ත්‍ර කළෝය.[2] ඇගේ දූපුතුන්ව
පැහැරගෙන ගියෝය.[3] පසුව ඇයව
කඩුවෙන් මරා දමන ලදි. ඇසිරියානු-
වන් ඇයට දඬුවම් කළේ එලෙසිනි.
ඇගේ නින්දිත හැසිරීම ස්ත්‍රී වංශයටම
ලැජ්ජාවකි.

**11** "ඇගේ සොහොයුරිය වූ ඔහො-
ලිබා සිදු වූ දේ දුටු විට,[4] ඇය
තම සොහොයුරියටත් වඩා කාමාශා-
වෙන් උමතුව හැසිරුණාය. ඇය තම
සොහොයුරියටත් වඩා පහත් ලෙස
වේශ්‍යාකම් කළාය.[5] **12** ඇය තම
කාමාශාව සන්සිඳුවා ගැනීම සඳහා[6]
තම අසල්වාසීන් වන ඇසිරියාවේ
ආණ්ඩුකාරයන් සහ නියෝජ්‍ය නාය-
කයන් පසුපස ගියාය. වටිනා සළුපිළි-
වලින් සැරසී, අශ්වයන් පිට නැඟ
ගිය ඔවුහු සියලුදෙනාම සිත් වශී
කරවනසුලු, කඩවසම් තරුණයෝය.[7]
**13** ඇයද එලෙස අපවිත්‍ර වූ නිසා
ඔවුන් දෙදෙනා අතරේ කිසිම වෙ-
නසක් නැති බව මම දුටුවෙමි.[8]
**14** බිත්තිය පුරා කැටයම් කළ පුරුෂ-
යන්ගේ රූප[9] එනම්, තද රතු පාටින්
සායම් කළ[10] කල්දිවරුන්ගේ රූප[11]
දුටු ඇය වේශ්‍යාකමට තව තවත්
පෙලඹුණාය. **15** ඒ කැටයම් කළ
රූපවල සිටි මිනිසුන්ගේ පෙනුම රණ-
ශූරයන් මෙනි. ඔවුන්ට විසිතුරු හිස්-
වැසුම්ද ඉණපටිද[12] තිබිණ. ඔවුන්ගේ
පෙනුම කල්දිවරුන්ගේ දේශයේ උපන්
බැබිලෝනියේ පුත්‍රයන්ගේ පෙනුම
මෙනි. **16** ඇය එම රූප දුටු විගස
වශී වී[13] ඔවුන් කෙරෙහි කාමාශාවෙන්
උමතු වූවාය. එබැවින් ඇය කල්දිව-
රුන්ගේ දේශය වෙත පණිවිඩකරු-
වන් යවා ඔවුන්ව ගෙන්වාගත්තාය.[14]
**17** බැබිලෝනියේ පුත්‍රයෝද දිගින්
දිගටම ඇයව සොයා ඇවිත් ඇගේ
යහනට නැඟ ඇය සමඟ අනාචා-
රයේ හැසිරුණෝය.[15] ඇයද දිගටම
ඔවුන් සමඟ අනාචාරයේ හැසිර අප-
විත්‍ර වූවාය. පසුව ඇයට ඔවුන් ගැන
පිළිකුලක් ඇති වී ඔවුන්ගෙන් ඉවත්
වූවාය.

**18** "ඇය එළිපිටම වේශ්‍යාකම්
කරමින් ඇගේ නිරුවත හෙළි
කළාය.[1] ඒ නිසා මම ඇගේ සොහො-
යුරියව පිළිකුල් කළාක් මෙන් ඇයවද
පිළිකුල් කර ඇගෙන් ඈත් වුණෙමි.[2]
**19** එහෙත් ඇය තම තරුණ වියේදී[3]
ඊජිප්තුවේදී[4] වේශ්‍යාකම් කළ ආකා-
රය සිහියට නඟමින් දිගටම වේශ්‍යා-
කම් කළාය.[5] **20** ඇය රාගයෙන්
මත් වී අනාචාරයේ යෙදෙන ස්ත්‍රියක
මෙන් ඔවුන් පසුපස ගියාය. ඇගේ
පෙම්වතුන්ගේ රහසඟ බූරුවන්ගේ හා
අශ්වයන්ගේ රහසඟට සමාන විය.[6]
**21** 'ඔහොලිබා, ඊජිප්තුවේ ගත කළ
ඔබේ යොවුන් වියේ පටන්ම ඔබ නින්-
දිත ක්‍රියාවලට ලොල්කමක් දැක්වූ-
වෙහිය.[7] එසේ කළේ තරුණ වියේ
සිටම ඔබ තුළ තිබූ කාමාශාව සන්-
සිඳුවා ගැනීම සඳහාය.[8]

**22** "'එබැවින් විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි ඔබට පව-
සන මේ දේට ඇහුම්කන් දෙන්න.
"කලක් කාමාශාවෙන් උමතුව ඔබ
පසුපස ලුහුබැඳ ආ ඔබේ පෙම්වතුන්ව
මම ඔබට විරුද්ධව එවන්නෙමි.[9] ඔබ
පිළිකුල් කර අත්හැර ගිය ඒ පෙම්ව-
තුන් මාගේ අණ පරිදි ඔබව වට කර
ඔබට පහර දෙනු ඇත.[10] **23** මම
බැබිලෝනියේ පුත්‍රයන්වද[11] සියලුම
කල්දිවරුන්වද[12] පෙකොඩ්,[13] ෂෝවා
හා කෝවා යන ප්‍රදේශවල පුරුෂයන්-
වද ඔවුන් සමඟ ඇසිරියාවේ සියලු
පුත්‍රයන්වද ඔබට විරුද්ධව එවන්-
නෙමි. උපදේශකයන් ලෙස නෝ-
රාගත් ඒ සියලුදෙනා අශ්වයන් පිට
නැඟ එන්නෝය. සිත් වශී කරවන-
සුලු, කඩවසම් තරුණයන් වන ඔවුහු
ආණ්ඩුකාරයෝ, නියෝජ්‍ය නායක-
යෝ සහ රණශූරයෝය. **24** ලොකු
කුඩා පලිස් අතැතිව, හිස්වැසුම්ව-
ලින් සැරසුණු මහත් සමූහයක් සමඟ
පැමිණෙන ඔවුහු වේගයෙන් ධාවනය
වන යුධ රථවල නැඟ ඔබට විරුද්ධව
එති.[14] ඔවුහු ඔබව සම්පූර්ණයෙන්ම

**23 පරි.**
1 2රාජා 17:23; 1ලේක 5:26
2 එස 16:37; හොෂෙ 2:10
3 2රාජා 17:6; 2රාජා 18:11
4 යෙරෙ 3:7
5 යෙරෙ 3:8; එස 16:47
6 2රාජා 16:7; 2ලේක 28:16
7 එස 23:6
8 2රාජා 17:19
9 එස 8:10
10 යෙරෙ 22:14
11 යෙරෙ 50:2
12 1සාමු 18:4
13 ගීතා 119:37; මතෙ 5:28; 1යොහ 2:16
14 එස 16:29
15 එස 16:37

**2 තීරුව**
1 යෙරෙ 3:2; එස 16:36
2 ද්වි 32:19; ගීතා 78:59; ගීතා 106:40; යෙරෙ 6:8; යෙරෙ 12:8
3 එස 16:22
4 එස 20:7
5 එස 16:25; ආමො 4:4
6 එස 16:26
7 යොෂු 24:14
8 එස 23:3
9 යෙසා 10:5; එස 16:37; හබ 1:6; එළි 17:16
10 යෙරෙ 6:22; යෙරෙ 12:9
11 2රාජා 20:14; යෙසා 39:3; එස 21:19
12 2රාජා 24:2; යෙසා 23:13
13 යෙරෙ 50:21
14 යෙරෙ 47:3; එස 26:10; නාහු 3:2

වට කරන්නෝය. ඔබව විනිශ්වය
කරන්න මම ඔවුන්ට අවසර දෙන්-
නෙමි. එහෙයින් ඔවුහු තමන් කැමති
ලෙස ඔබව විනිශ්වය කර ඔබට දඬුවම්
කරන්නෝය.[1] **25** මම ඔබට විරුද්-
ධව මාගේ උදහස ප්‍රකාශ කරන්නෙමි.[2]
එවිට ඔවුහු දැඩි කෝපයකින් ඔබට
විරුද්ධව කටයුතු කරනවා ඇත.[3]
ඔවුහු ඔබේ නාස් හා කන් කපා ඉවත්
කරන්නෝය. ඉන්පසු ඔබව කඩුවෙන්
මරා දමන්නෝය. ඔවුහු ඔබේ දූපුතුන්-
වද[4] රැගෙන යනු ඇත.[5] ඉතුරු වන
සියල්ල ගින්නෙන් දවා දමනු ලබන්-
නේය.[6] **26** ඔවුහු ඔබේ වස්ත්‍රද[7] ඔබ
පැළඳ සිටින අලංකාර ආභරණද ගල-
වාගනු ඇත.[8] **27** මෙලෙස, ඔබේ
නින්දිත හැසිරීමද ඔබ ඊජිප්තු දේශ-
යේ සිටි කාලයේ පටන් කළ වේශ්‍යා-
කම්ද[9] මම සම්පූර්ණයෙන්ම නතර
කර දමන්නෙමි.[10] ඔබ නැවතත් ඊජිප්-
තුවරුන්ගෙන් පිහිට පතන්නේ නැත.
ඔවුන්ව නැවත කිසිදා ඔබේ මතකයට
නැඟෙන්නේ නැත."

**28** "'විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි.
"මේ අසන්න! ඔබට පිළිකුලක් වූ,
ඔබ වෛර කර ප්‍රතික්ෂේප කළ
අයට මම ඔබව භාර දෙන්නෙමි.[11]
**29** ඔවුහු මහත් වෛරයකින් ඔබට
විරුද්ධව ඇවිත් ඔබ වෙහෙස මහන්සි
වී උපයාගත් සියලු දේ පැහැරගන්-
නෝය. ඔවුහු ඔබව නිරුවත් කර
ඔබව අත්හැර යනු ඇත.[12] එමෙන්ම
ඔබ වේශ්‍යාකම් කළ ආකාරයද ඔබේ
නින්දිත ක්‍රියාද අනාචාර හැසිරීමද
සියල්ලන් ඉදිරියේ හෙළි කරනු ලබ-
නවා ඇත.[13] **30** ඔබ ගණිකාවක
මෙන් වෙනත් ජාතීන් පසුපස ගොස්[14]
ඔවුන්ගේ පිළිකුල්සහගත රූපවලින්
අපවිත්‍ර වූ නිසා[15] මේ සියල්ල ඔබට
සිදු වන්නේය. **31** ඔබේ සොහොයු-
රියගේ අඩිපාරෙහිම ඔබ ගමන් කළ
බැවින්[16] මම ඇයට දුන් කුසලානෙන්
ඔබටත් බොන්න දෙන්නෙමි."[17]

**32** "'විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේද පවසයි.
"ඔබේ සොහොයුරියට දුන් විශාල කුස-
ලානෙන් ඔබටත් පානය කරන්න සිදු
වෙයි.[1] කට දක්වාම පුරවා ඇති ඒ
කුසලානෙන් පානය කළ පසු ඔබ
සියලුදෙනාගේ සමච්චලයටද නින්-
දාවටද ලක් වනු ඇත.[2] **33** ඔබේ
සොහොයුරිය වූ සමාරියට දුන් කුස-
ලානෙන් බිවූ පසු ඔබ වෙරි වී ශෝක-
යෙන් සිටිනු ඇත. මන්ද එය ඔබව
විනාශ කර අන්ත අසරණ තත්-
වයකට පත් කරවන කුසලානයකි.
**34** එම කුසලානය හිස් වන තෙක්ම
ඔබට බොන්න සිදු වෙයි.[3] ඉන්පසු එය
කඩා එහි මැටි කැබලි කන්නත් ඔබට
සිදු වනු ඇත. ඔබේ පියයුරුද ඔබ
කපා ඉවත් කරනු ඇත.[4] 'මන්ද මේ
දේ පවසන්නේ මමය' කියා විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවි
පවසයි."

**35** "'විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි තවදුරටත් මෙසේ
පවසයි. "ඔබ මාව අමතක කර[5] මට
පිටු පා ඇති නිසා[6] ඔබේ නින්දිත
ක්‍රියාවල හා වේශ්‍යාකම්වල ප්‍රතිඵල
විඳින්න ඔබට සිදු වනු ඇත."'"

**36** යෙහෝවා දෙවි මට තවදුරටත්
මෙසේ පැවසීය. "මනුෂ්‍ය පුත්‍රය, ඔබ
ඔහොලා සහ ඔහොලිබා[7] විනිශ්වය
කර[8] ඔවුන් සිදු කළ පිළිකුල්සහ-
ගත දේවල් ගැන ඔවුන්ට කියන්න
සූදානම්ද?[9] **37** ඔවුන් අනාචාරයේ*
යෙදී ඇති අතර[10] ඔවුන්ගේ අත්-
වල ලේ තැවරී තිබේ.[11] ඔවුන්-
ගේ පිළිකුල්සහගත රූපවලට කරන
නමස්කාරය අනාචාරයකි.[12] එපම-
ණක්ද නොව ඔවුහු තමන් විසින්
බිහි කළ මාගේ පුත්‍රයන්වද ගින්නෙන්
දවා# ඒ රූපවලට ආහාරයක් සේ
පුදා ඇත.[13] **38** ඔවුහු මට විරුද්-
ධව තවත් දේවල්ද කර ඇත. ඔවුහු
මාගේ ශුද්ධස්ථානය[14] කෙලෙසා[15]

**23 පරි.**
**1** 2සාමු 24:14 යෙරෙ 39:5
**2** ද්වි 29:20 එස 38:19 ශෙප 1:18
**3** එස 16:38
**4** එස 23:4 ගලා 4:25
**5** හොෂෙ 2:4
**6** එස 15:7 එස 20:47 එළි 18:8
**7** යෙරෙ 13:22 එස 16:39 හොෂෙ 2:3 එළි 17:16
**8** යෙසා 3:18 යෙරෙ 4:30 එස 16:11
**9** එස 23:3 එස 23:19
**10** යෙසා 27:9 එස 16:41 එස 22:15 සෙක 13:2
**11** යෙරෙ 21:7 යෙරෙ 34:20
**12** ද්වි 28:51 එස 16:39
**13** එස 16:36 එස 16:37
**14** ගීතා 106:35 යෙරෙ 2:18 යෙරෙ 16:11 යෙරෙ 22:9 එස 6:9
**15** එස 23:7
**16** යෙරෙ 3:8 එස 16:47
**17** 2රාජා 21:13 ගීතා 11:6 යෙරෙ 7:15 යෙරෙ 25:15 ආනි 9:12

**2 තීරුව**
**1** යෙසා 51:17
**2** ද්වි 28:37 1රාජා 9:7 විලා 2:15 එස 22:5
**3** ගීතා 75:8 යෙසා 51:17
**4** යෙසා 32:12
**5** යෙසා 17:10 යෙරෙ 2:32 යෙරෙ 3:21 යෙරෙ 13:25
**6** 1රාජා 14:9 නෙහෙ 9:26
**7** එස 23:4
**8** යෙරෙ 1:10
**9** යෙසා 58:1 එස 16:2 එස 20:4 එස 22:2
**10** හොෂෙ 1:2 යාකො 4:4
**11** එස 16:38 එස 22:2
**12** එස 16:36

**13** ලෙවී 18:21; 2රාජා 17:17; එස 16:20; **14** 2රාජා 21:4;
**15** යෙරෙ 32:34; එස 5:11; එස 8:5.

එස **23:37*** මූ.අ., "පරදාර සේවනයේ." **37#** එස 16:21හි පාදසටහන බලන්න.

මා නියම කළ සබත් දවස් සුළු
කළෝය.[1] **39** පිළිකුල්සහගත රූප
ඉදිරියේ තමන්ගේ පුත්‍රයන්ව මරා දැමූ
දවසේදීම[2] ඔවුහු මාගේ ශුද්ධස්ථාන-
යට පැමිණ එය අපවිත්‍ර කළෝය.[3] මේ
සෑම දෙයක්ම ඔවුන් කළේ මාගේ
ගෘහය තුළය.[4] **40** එපමණක්ද
නොව ඔවුහු පණිවිඩකරුවෙකුව යවා[5]
බොහෝ දුර බැහැර සිටින පුරුෂ-
යන්ව පවා කැඳෙව්වෝය.[6] 'ඔහො-
ලිබා, ඔබද ඒ පුරුෂයන්ව පිළිගැනීම
සඳහා ඇඟපත සෝදාගෙන,[7] දෑස්ව-
ලට අඳුන් ගා[8] ආභරණ පැළඳගත්තෙ-
හිය.[9] **41** ඔබ සරසන ලද විශාල
යහනක් මත හිඳගත්තෙහිය.[10] ඒ ඉදි-
රියෙහි ඔබ මේසයක් තබා[11] ඒ මත
මාගේ සුවඳ ද්‍රව්‍යද[12] තෙල්ද තැබුවෙ-
හිය.'[13] **42** ඇය සමඟ වින්දනයක්
ලබන සමූහයකගේ හඬ ඇසිණ.[14] ඒ
සමූහයට අමතරව පාළුකරයෙන් බේ-
බද්දන්වද[15] ගෙන්වාගනු ලැබීය. ඔවුහු
ඒ ස්ත්‍රීන් දෙදෙනාගේ අත්වලට වළලු
දමා ඔවුන්ට අලංකාර ඔටුනුද පැළඳු-
වෝය.[16]

**43** "එවිට අනාචාරයේ යෙදී වෙ-
හෙසට පත්ව සිටි[17] ඇය ගැන මම
මෙසේ පැවසුවෙමි. 'ඇය දිගටම
වේශ්‍යාකම් කරනු ඇත.'[18] **44** මිනි-
සුන් ගණිකාවක ළඟට යන්නාක්
මෙන් ඔවුහුද වැල නොකැඩී ඇය
ළඟට ආවෝය. මෙසේ, ඔවුහු නින්දි-
තව හැසිරෙන ඔහොලා සහ ඔහො-
ලිබා යන ස්ත්‍රීන් දෙදෙනා වෙත
ගියෝය.[19] **45** එහෙත් ධර්මිෂ්ඨ
පුරුෂයෝ[20] ඇවිත් ඔවුන්ව විනිශ්-
චය කරන්නෝය. ඔවුන්ට ලැබෙන්-
නේ අනාචාර ස්ත්‍රීන්ට[21] හා ලේ
වගුරුවන ස්ත්‍රීන්ට ලැබෙන විනිශ්චය-
මයි.[22] මන්ද ඔවුහු අනාචාරයේ යෙ-
දෙන ස්ත්‍රීහුය. ඔවුන්ගේ අත්වල ලේද
තැවරී ඇත.[23]

**46** "විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙ-
සේය. 'ඔවුන්ට විරුද්ධව සමූහයක්
කැඳවනු ලබන්නේය.[24] ඔවුන්ට සිදු
වන දේ දැක ජනයා බියපත් වන්-
නෝය. ඒ සමූහය ඔවුන් සතු සියල්ල
කොල්ල කන්නෝය.[1] **47** ඒ සමූහය
ඔවුන්ට ගල් ගසා[2] කඩුවෙන්ද ඔවුන්ව
මරා දමන්නෝය. ඔවුන්ගේ දූපුතුන්ව
මරා දමා[3] ඔවුන්ගේ ගෙවල් ගිනිබත්
කරන්නෝය.[4] **48** මෙසේ, දේශයේ
සිදු වන නින්දිත ක්‍රියා[5] මම තුරන් කර
දමන්නෙමි.[6] සියලු ස්ත්‍රීහුද ඔබට සිදු
වන දේ දැක පාඩමක් ඉගෙනගෙන
නින්දිත හැසිරීමෙන් වැළකී සිටින්-
නෝය.[7] **49** නින්දිත ලෙස හැසි-
රුණු ඔබට ඒ සමූහය අතින් නිසි
දඬුවම් විඳින්න සිදු වෙයි.[8] පිළිකුල්ස-
හගත රූප ඉදිරියේ වැඳ වැටී ඔබ කළ
වැරදිවලට වන්දි ගෙවන්නද ඔබට සිදු
වෙයි. එවිට මා විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි බව ඔබ
සෑමට පිළිගන්න සිදු වෙනවා ඇත.' "[9]

## 24

නවවන වසරේ දහවන මාස-
යේ දහවන දින යෙහෝවා
දෙවි මට කතා කර මෙසේ පැවසු-
වේය. **2** "මනුෂ්‍ය පුත්‍රය, මේ දවස
සටහන් කරගන්න. බැබිලෝනියේ
රජු යෙරුසලමට විරුද්ධව පැමිණියේ
මේ දවසේදීය.[10] **3** මෙම කැරලිකාර
සෙනඟ ගැන උපමාවකින් මෙසේ පව-
සන්න.[11]

" 'විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි මෙසේ පවසයි. "විශාල
හැළියක් ලිප මත තබා, එයට වතුර
වත් කරන්න.[12] **4** එයට මස් කැබ-
ලිද දමන්න.[13] හොඳ මස් කැබලි
එනම්, බැටළුවාගේ ඉදිරිපස සහ
පසුපස ගාතය ඒ තුළට දමන්න.
හොඳම මස් කටුවලින්ද හැළිය පුර-
වන්න. **5** ඒ සඳහා හොඳම බැටළු-
වන්ව මරන්න.[14] ඉන්පසුව ලිපට දර
දමා හැළියේ තිබෙන මස් කැබලිද
මස් කටුද හොඳට තම්බන්න." ' "[15]

**6** "විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේ පවසයි. 'මහා
ලේ ගැලීමක් සිදු කර ඇති මේ නුවර
පිටට මහත් විපතක් පැමිණෙනවා

**23 පරි.**
**1** නෙහෙ 13:17; එස 22:8
**2** යෙරෙ 7:31
**3** ලෙවී 20:3; යෙරෙ 7:11
**4** 2ලේක 33:4
**5** යෙසා 57:9
**6** 2රාජා 20:13
**7** රූත් 3:3; එස්ත 2:12
**8** 2රාජා 9:30; යෙරෙ 4:30
**9** හිතෝ 7:10; යෙසා 3:18; එස 16:13
**10** එස්ත 1:6; යෙසා 57:7; ආමො 2:8; ආමො 6:4
**11** යෙසා 65:11
**12** එස 8:11
**13** හිතෝ 7:17; යෙරෙ 44:17; එස 16:18; හොෂෙ 2:8
**14** නික් 32:6; හොෂෙ 13:6
**15** යෙසා 28:1
**16** එස 16:11
**17** යාකො 4:4
**18** එස්රා 9:7; යෙරෙ 13:23
**19** එස 23:3; එස 23:9
**20** එස 14:14; එස 14:20
**21** ලෙවී 20:10; ද්වි 22:21; එස 16:38
**22** උත් 9:6; එස 23:37
**23** 2රාජා 24:4; ගීතා 106:38; යෙසා 1:15; හොෂෙ 4:2
**24** යෙරෙ 25:9; එස 16:40

**2 තීරුව**
**1** යෙරෙ 15:4; යෙරෙ 24:9; යෙරෙ 34:17
**2** ලෙවී 20:2; එස 16:40
**3** 2ලේක 36:17
**4** ද්වි 13:16; 2රාජා 25:9; යෙරෙ 39:8; යෙරෙ 52:13
**5** විනි 20:6; එස 22:9
**6** යෙසා 26:9
**7** ද්වි 13:11; 2පේතෘ 2:6
**8** යෙසා 59:18; එස 16:43; රෝම 2:6; ගලා 6:7
**9** ගීතා 9:16; එස 6:13

**24 පරි.** **10** 2රාජා 25:1; යෙරෙ 39:1; යෙරෙ 52:4; **11** එස 17:12; ලූක් 8:10; **12** යෙරෙ 1:13; එස 11:3; **13** එස 11:7; **14** යෙරෙ 39:6; එස 34:16; **15** එස 24:10.

ඇත.[1] මේ නුවර මුළුමනින්ම මල බැඳී
ඇති විශාල හැළියක් බඳුය. එහි මල-
කඩ කෙදිනකවත් ඉවත් කළ නො-
හැක. මස් කැබලි එයින් ඉවතට
ගන්න. කැබැල්ලෙන් කැබැල්ල ඉව-
තට ගන්න.[2] ඒ සඳහා ආදු දැමිය යුතු
නැත.[3] **7** ඇය වැගිරවූ ලේ නුවර
පුරාම විසිර ඇත.[4] ඇය එම ලේ
බිමට වත් කර පස්වලින් වසා දැමුවේ
නැත.[5] ඇය එය වත් කළේ පර්වත-
යක් මතය. **8** මමද ඇය වැගිරවූ
ලේ පස්වලින් වසා නොදමා පර්-
වත මතුපිටම තිබෙන්න හරින්නෙමි.[6]
මාගේ උදහස වගුරුවා ඇයට ලැබිය
යුතු දඬුවම ගෙනෙන තුරු[7] එසේ
තිබෙන්න හරින්නෙමි.'

**9** "එබැවින් විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි මෙසේද
පවසයි. 'ලේ හළන නුවරට සිදු වන
විපත මොන තරම්ද![8] මම විශාල
දර ගොඩක් ගසන්නෙමි.[9] **10** ඔබ
බොහෝ දර දමා ගිනි අවුළුවා මස්
හොඳින් තම්බන්න. හොද්ද ඉවත්
කර මස් කටු හොඳින් පුලුස්සන්න.
**11** හැළිය හිස් කර ගිනි අඟුරුවල
තබන්න. එවිට එහි තඹ උණු වී එහි
අපවිත්‍රකමද දිය වී යනු ඇත.[10] එහි
බැඳී ඇති මලකඩද දැවී විනාශ වී
යයි.[11] **12** එහි මලකඩ සම්පූර්ණ-
යෙන්ම ඉවත් කිරීම මොන තරම් වෙ-
හෙසකර කාර්යයක්ද![12] එහෙයින් මල
බැඳුණු හැළිය ගින්නට දමන්න!'

**13** "'ඔබ ඉතා නින්දිත ලෙස
හැසිර අපවිත්‍ර වී ඇත.[13] ඔබව පවිත්‍ර
කරන්න මා උත්සාහ කළේ ඒ නිසාය.
එහෙත් ඔබ ඊට කැමති වූයේ නැත.[14]
මාගේ උදහස සම්පූර්ණයෙන්ම ඔබ
පිටට වගුරුවන තුරු ඔබ පවිත්‍ර නො-
වන්නහුය.[15] **14** මේ සියල්ල පව-
සන්නේ යෙහෝවා දෙවි වන මමය.[16]
මා කියූ විනාශය නිසැකවම පැමි-
ණෙනු ඇත.[17] එය ඉටු කිරීමට මම
කිසිසේත් පසුබට නොවන්නෙමි.[18] මම
අනිවාර්යයෙන්ම පියවර ගන්නෙමි. ඒ
ගැන මම කනගාටු වන්නේවත්[19] පසු-
තැවිලි වන්නේවත් නැත.[20] ඔබ කළ
දේවලට අනුව ඔබව විනිශ්වය කරනු
ලැබේ.'[1] එසේ පවසන්නේ විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවිය."

**15** යෙහෝවා දෙවි මට තවදුර-
ටත් මෙසේ පැවසුවේය. **16** "මනුෂ්‍ය
පුත්‍රය, ඔබේ ජීවිතයට ප්‍රබල පහ-
රක් එල්ල වනු ඇත.[2] ඔබ
ආදරය කරන දේ ඔබට අහිමි වන්-
නේය.[3] එහෙත් ඔබ පපුවට ගසාගනි-
මින් දුක් නොවන්න. කඳුළු සලමින්
හඬා නොවැලපෙන්න.[4] **17** නිහඬව
සුසුම්ලන්න. වියෝදුකින් නොතැ-
වෙන්න.[5] සාමාන්‍ය පරිදි ඔබේ
හිස්වැස්ම පැළඳගෙන[6] පාවහන් දමා-
ගන්න.[7] ඔබේ කට* වසා නොගන්න.[8]
මිනිසුන් ඔබට දෙන රොටි අනුභව
නොකරන්න."[9]

**18** මම උදැසන ඒ දේවල් ජන-
තාවට කීවෙමි. සවස් වූ විට මාගේ
බිරිඳ මිය ගියාය. පසුවදා උදැ-
සන මට අණ කර තිබූ ලෙසම
මම කළෙමි. **19** ජනතාව මගෙන්
මෙසේ ඇසුවෝය. "ඔබ කරන මේ
දේවල තේරුම අපට කියා දෙන්නේ
නැද්ද? ඔබ අපට කියන්න හදන්නේ
මොකක්ද?"[10] **20** එවිට මම ඔවුන්ට
මෙසේ කීවෙමි. "යෙහෝවා දෙවිම
මට කතා කර මෙසේ පැවසුවා.
**21** 'ඊශ්‍රායෙල් ජනතාවට කතා කර
මෙසේ කියන්න. "විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි පවසන්නේ
මෙයයි. 'මෙන්න, ඔබ මහත් ආඩම්බ-
රයෙන් සලකන,[11] ඔබේ ගෞරවාදර-
යට ලක් වූ[12] මාගේ ශුද්ධස්ථානය මම
කෙලෙසන්නෙමි.[13] ඔබ සමඟ නොපැ-
මිණි, ඔබ ආදරය කරන ඔබේ දූපු-
තුන් කඩුවෙන් මැරුම් කනවා ඇත.[14]
**22** එසකියෙල් කළ ලෙසම ඔබටත්
කරන්න සිදු වෙයි. ඔබත් කට වසා-
ගන්නේ නැත.[15] මිනිසුන් දෙන රොටි
කන්නේද නැත.[16] **23** ඔබේ හිස්-
වැස්මද ඔබේ පාවහන්ද ඔබ ගලවන්-

**24 පරි.**
**1** 2රාජා 21:16 එස 22:3 මීකා 7:2 මතෙ 23:35
**2** එස 11:7 එස 11:9
**3** යෝවෙ 3:3 ඔබ 11 නාහු 3:10
**4** 1රාජා 21:19 යෙරෙ 2:34
**5** ලෙවී 17:13 ද්වි 12:16 යෙසා 26:21
**6** 2රාජා 24:4 යෙරෙ 16:17
**7** ද්වි 32:35 ගීතා 94:1
**8** නාහු 3:1 හබ 2:12 මතෙ 23:37
**9** යෙසා 30:33
**10** යෙරෙ 21:10 යෙරෙ 32:29 එස 22:15
**11** එස 24:6
**12** යෙරෙ 5:3 යෙරෙ 6:29
**13** විනි 20:6 2ලේක 36:14 එස 22:9 2පේත‍්‍ර 2:7
**14** යෝබ් 9:4
**15** එස 5:13 එස 8:18
**16** ගණන් 23:19
**17** ගීතා 33:9
**18** යෙරෙ 13:14
**19** එස 5:11 එස 9:10
**20** 1සාමු 15:29

**2 තීරුව**
**1** යෙසා 3:11 එස 16:43 මතෙ 16:27 රෝම 2:6
**2** ද්වි 13:6
**3** එස 24:18 එස 24:21 හොෂෙ 4:9
**4** ද්වි 13:8
**5** යෙරෙ 16:5
**6** ලෙවී 10:6
**7** 2සාමු 15:30
**8** මීකා 3:7
**9** යෙරෙ 16:7
**10** එස 12:9 එස 37:18
**11** ගීතා 96:6
**12** ගීතා 27:4 ගීතා 84:1
**13** ගීතා 74:7 ගීතා 79:1 යෙරෙ 7:14 විලා 1:10 විලා 2:7 එස 9:7

**14** 2ලේක 36:17; යෙරෙ 6:11; යෙරෙ 9:21; එස 23:25; **15** මීකා 3:7; **16** යෙරෙ 16:7; එස 24:17.

එස **24:17*** හෝ, "උඩු රැවුල."

නේ නැත. ඔබ පපුවට ගසාගනිමින්
වැලපෙන්නේද නැත.[1] ඔබ කළ වැරදි
නිසා ඔබ වැහැරී යනු ඇත.[2] එකිනෙ-
කාට සිදු වන දේ දැක ඔබ සුසුම්ලන්-
නහුය.[3] **24** එසකියෙල් කළ සෑම
දෙයක්ම ඔබටත් කරන්න සිදු වෙයි.[4]
ඔහු ඔබට ලකුණක් වනු ඇත. ඒ
දේවල් සිදු වන විට[5] මා විශ්වයේ පාල-
කයාණන් වන යෙහෝවා දෙවි බව
පිළිගන්න ඔබට සිදු වෙයි.’ ” ’ ”[6]

**25** “මනුෂ්‍ය පුත්‍රය, ඒ දවසේදී
ඔවුන්ගේ බලකොටුවද ඔවුන් ආඩම්බ-
රයෙන් සලකන ඔවුන්ගේ තේජාන්විත
වස්තුවද ඔවුන් මහත් ගෞරවාදර-
යකින් රැකගත් දේද[7] ඔවුන් ආදරය
කරන දූපුතුන්වද මම පැහැරගන්-
නෙමි.[8] **26** එදින ඒ විපතෙන් බේරී
පලා යන අය සිදු වූ දේ සැමට ප්‍රකාශ
කරනවා ඇත.[9] **27** එසේ බේරී පලා
යන අයට ඔබ නිහඬව නොසිට[10] කතා
කළ යුතුයි.[11] ඔබ අනිවාර්යයෙන්ම
ඔවුන්ට ලකුණක් වනු ඇත.[12] එවිට
මා යෙහෝවා දෙවි බව පිළිගන්න
ඔවුන්ට සිදු වන්නේය.”[13]

**25** යෙහෝවා දෙවි මට තවදුර-
ටත් කතා කර මෙසේ පැවසු-
වේය. **2** “මනුෂ්‍ය පුත්‍රය, ඔබ දැන්
අම්මොන්වරුන්ට විරුද්ධව අනාවැකි
පැවසිය යුතුයි.[14] **3** අම්මොන්ව-
රුන්ට මෙසේ පවසන්න. ‘විශ්ව-
යේ පාලකයාණන් වන යෙහෝවා
දෙවි කියන දේට හොඳින් ඇහුම්-
කන් දෙන්න. විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි මෙසේ පවසයි.
“මාගේ ශුද්ධස්ථානය නැති වී ගිය
නිසාත් ඊශ්‍රායෙල් දේශය පාළුවට ගිය
නිසාත් යූදාහි වැසියන්ව වහල්භාවයට
ගෙන යනු ලැබූ නිසාත් ඔබ සිටින්නේ
ඉමහත් සතුටකිනි.[15] **4** ඒ නිසා පෙ-
රදිග වැසියන්ට ඔබව යටත් කිරීමට
මම ඉඩ දෙන්නෙමි.[16] ඔවුහු ඇවිත්
ඔබ අතරෙහි කඳවුරු බැඳගෙන කූඩා-
රම්ද ගසාගන්නෝය. ඔවුහු ඔබ නෙ-
ළාගත් පලදාව කා ඔබ දොවාගත්
කිරිද බොන්නෝය.[17] **5** මම රබ්බා
ප්‍රදේශය[18] ඔටුවන් ගැවසෙන ස්ථාන-
යක් බවටද අම්මොන්වරුන්ගේ දේ-
ශය එළු බැටළුවන් ලගින ස්ථානයක්
බවටද පත් කරන්නෙමි.[1] එවිට මා
යෙහෝවා දෙවි බව පිළිගන්න ඔබට
සිදු වනු ඇත.” ’ ”[2]

**6** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේ කීවේය. ‘ඊශ්‍රා-
යෙල් දේශයට සිදු වූ දේ නිසා ඔබ
ප්‍රීතියෙන් උඩ පනිමින් අත්පොළසන්
ගැසූ නිසාත්[3] එහි වැසියන්ට ඔච්චම්
කළ නිසාත්[4] **7** මාගේ බලවත් හස්-
තයෙන් ඔබට පහර දෙන්නෙමි.[5] මම
ජාතීන්ගේ අතට ඔබව භාර දෙන්-
නෙමි. ඔවුහු ඇවිත් ඔබ සතු සියල්ල
කොල්ල කනු ඇත. මම සියලු දේශව-
ලින් ඔබව පන්නා දමා විනාශ කර
දමන්නෙමි.[6] මම ඔබව සහමුලින්ම
නැති කරන්නෙමි.[7] එවිට මා යෙ-
හෝවා දෙවි බව පිළිගන්න ඔබට සිදු
වනු ඇත.’

**8** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේද පවසයි. ‘ “මේ
බලන්න, යූදා ජනතාවත් අන් ජාතී-
නුත් අතර කිසිම වෙනසක් නැහැ”[8]
කියා මෝවබ්වරුන්[9] හා සේයිර්හි වැසි-
යන්[10] පවසා ඇත. **9** ඒ නිසා, මම
මෝවබ් රටේ කඳු බෑවුම සතුරන්ගේ
අතට හසු කර දෙන්නෙමි. එහි දේශ
සීමාවේ පිහිටි ප්‍රසිද්ධ නුවරවල් වන
බෙත්-යෙෂිමොත්,[11] බාල්-මෙයොන්[12]
හා කිර්යතායිම්[13] යනාදිය සතුරන්-
ගේ අතට පත් කරන්නෙමි. **10** ඒ
සතුරෝ නම් පෙරදිග වැසියෝය.[14]
අම්මොන්වරුන්වද[15] ඔවුන්ගේ අතට
හසු කර දෙන්නෙමි. මම මෝවබ් සහ
අම්මොන් දේශ ඒ ජාතීන්ට උරුම-
යක් ලෙස දෙන්නෙමි. මෝවබ්වරුන්
යළි කෙදිනකවත් ජාතීන්ගේ මතක-
යට නැඟෙන්නේ නැත.[16] **11** මෝ-
වබ් දේශයට විරුද්ධව මා ගත් තීන්දුව
මම ඉටු කරන්නෙමි.[17] එවිට මා යෙ-
හෝවා දෙවි බව පිළිගන්න ඔවුන්ට සිදු
වනු ඇත.’[18]

**24 පරි.**
**1** යෝබ් 27:15; ගීතා 78:64
**2** ලෙවී 26:39; එස 4:17; එස 33:10
**3** යෙසා 59:11
**4** යෙසා 8:18; යෙසා 20:3; එස 4:3
**5** යෙසා 46:10
**6** ගීතා 9:16; යෙරෙ 17:15; එස 25:5
**7** එස 24:16
**8** ද්වි 28:32; යෙරෙ 11:22
**9** එස 33:21
**10** එස 3:26; එස 33:22; ලූක් 1:20
**11** ගීතා 51:15
**12** එස 12:3
**13** එස 6:13

**25 පරි.**
**14** උත් 19:38; යෙරෙ 49:1; ආමො 1:13; ශෙප 2:9
**15** හිතෝ 17:5; හිතෝ 24:17; එස 26:2; එස 35:2; එස 35:12
**16** යෝබ් 1:3; එස 25:10
**17** ලෙවී 26:16; ද්වි 28:33
**18** 2සාමු 12:26; එස 21:20

**2 තීරුව**
**1** යෙසා 17:2; යෙසා 32:14; ශෙප 2:14
**2** යෙසා 37:20; එස 26:6
**3** යෝබ් 27:23; විලා 2:15
**4** නෙහෙ 4:4; යෝබ් 31:29; හිතෝ 24:17; ඔබ 12; ශෙප 2:8
**5** එස 35:3; ශෙප 1:4
**6** යෙරෙ 49:2; ආමො 1:14
**7** ගීතා 145:20
**8** යෙසා 10:9; යෙසා 36:18
**9** යෙසා 15:1; යෙරෙ 48:1; ආමො 2:1
**10** ද්වි 2:4
**11** යොෂු 13:20
**12** ගණන් 32:38
**13** යොෂු 13:19
**14** එස 25:4

**15** ගීතා 83:7; **16** එස 21:32; **17** ගීතා 149:7; යෙරෙ 9:26; යෙරෙ 48:1; **18** එස 6:13.

**12** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේ පවසයි.
‘ඒදොම්වරු යූදා වැසියන්ට විරුද්-
ධව නැඟී සිට ඔවුන්ගෙන් පළිගත්-
තෝය. ඔවුහු නොනැවතීම ඔවුන්ට
විරුද්ධව බරපතළ වැරදි කළෝය.[1]
**13** එහෙයින් විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. “මම ඒදොම් වැසියන්ටද මාගේ
බලවත් හස්තයෙන් පහර දී[2] ඔවුන්-
වත් ඔවුන්ගේ සතුන්වත් විනාශ කර
දමන්නෙමි.[3] තේමාන්[4] සිට දෙදාන්
දක්වා මුළු ප්‍රදේශයම පාළු හිස් බිමක්
බවට පත් කරන්නෙමි.[5] ඔවුහු කඩු-
වෙන් මැරුම් කන්නෝය. **14** ‘මා
ඒදොම්වරුන්ට ලැබිය යුතු එම දඬු-
වම ලබා දෙන්නේ මාගේ සෙනඟ
වන ඊශ්‍රායෙල්වරුන් ලවාය.[6] ඔවුහු
මාගේ දැවෙන උදහස ප්‍රකාශ කරමින්
ඒදොම්වරුන්ට විරුද්ධව ක්‍රියා කරනු
ඇත. එවිට තමන් කළ වැරදිවලට මා
දෙන දඬුවම අද්දකින්න ඔවුන්ට සිදු
වනු ඇත’[7] යයි විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි පවසයි.” ’

**15** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේද පවසයි.
‘පිලිස්තිවරු පළිගැනීමේ චේතනාව
ඇති නපුරු සෙනඟකි.[8] සතුරන් කෙ-
රෙහි තිබෙන බද්ධ වෛරය නිසා[9]
ඔවුහු තම සිතින් ඔවුන්ව හෙළාද-
කින්නෝය. ඔවුන්ව විනාශ කිරී-
මට මාන බලමින් සිටින්නෝය.[10]
**16** එහෙයින් විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. “මම පිලිස්තිවරුන්ට මාගේ
බලවත් හස්තයෙන් පහර දී[11] කෙරෙ-
තිවරුන්වද සහමුලින්ම නැති කර
දමන්නෙමි.[12] මුහුදුබඩ ප්‍රදේශයේ ඉතු-
රුව සිටින අනික් වැසියන්වද විනාශ
කර දමන්නෙමි.[13] **17** මම මහත්
උදහසකින් යුතුව ඔවුන්ට විරුද්ධව
මාගේ විනිශ්චය ඉටු කරන්නෙමි.[14] මා
ඔවුන් කළ දුෂ්ට දේවලට නිසි ප්‍රතිඵල
දෙන විට මා යෙහෝවා දෙවි බව පිළි-
ගන්න ඔවුන්ට සිදු වනු ඇත.” ’ ”[15]

# 26

**26** එකොළොස්වන වසරේ, මා-
සයේ පළමු දින යෙහෝවා
දෙවි මට මෙසේ පැවසීය. **2** “මනුෂ්‍ය
පුත්‍රය, තීර් නුවර[1] යෙරුසලමට සිදු
වූ විපත ගැන සතුටු වෙමින් මෙසේ
පවසයි.[2] ‘සියලුදෙනාව ආකර්ෂණය
කරගත් ඇය[3] දැන් වැටී ඇත.[4] ඇය
සහමුලින්ම විනාශ වී ඇත.[5] දැන් සිය-
ලුදෙනා මා වෙතට ඇදී එන්නෝය.
සියලු ධන සම්පත් මට හිමි වනු
ඇත.’ **3** එහෙයින් විශ්වයේ පාලක-
යාණන් වන යෙහෝවා දෙවි මෙසේ
පවසයි. ‘තීර් වැසියෙනි, මෙය හොඳින්
සිතට ගන්න. මම ඔබට විරුද්ධව
නැඟී සිටින්නෙමි. මුහුදෙන් රළ නැඟී
එන්නාක් මෙන්[6] මම ඔබට විරුද්ධව
බොහෝ ජාතීන්ව රැස් කරන්නෙමි.[7]
**4** ඔවුහු පැමිණ තීර් නුවරේ පවුරු බිඳ
දමා[8] ඇගේ මුරකොටු බිමටම සමතලා
කරන්නෝය.[9] මම ඇගේ සුන්බුන් අතු
ගා දමා ගස් කොළන් නැති හිස් පර්ව-
තයක් බවට ඇයව පත් කරන්නෙමි.
**5** ඇය සයුර මැද[10] මාදැල් අතුරන
පාළු දූපතක් බවට පත් වන්නීය.’[11]

“ ‘මේ දේ පවසන්නේ මා බැවින්
එය ස්ථිර වශයෙන්ම සිදු වනු ඇත’
කියා විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි පවසන්නේය. ‘ජාතීහු
ඇය සතු සියල්ල කොල්ල කනු ඇත.
**6** ඇය අවට පිහිටි කුඩා ගම්මානවල
ජනතාව කඩුවෙන් පහර කන්නෝය.
එවිට මා යෙහෝවා දෙවි බව ජනයාට
පිළිගන්න සිදු වනු ඇත.’[12]

**7** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේද පවසයි.
‘මේ අසන්න. මම බැබිලෝනියේ රජු
වන නෙබුකද්රෙෂර්ව* තීර් නුවරට
විරුද්ධව එවන්නෙමි. උතුරු දිශා-
වෙන් පැමිණෙන ඔහු[13] රජවරුන්-
ගෙන් රජෙකි.[14] ඔහු අශ්වයන්ගෙන්ද[15]
යුධ රථවලින්ද[16] අසරුවන්ගෙන්ද
මහත් සමූහයකින්ද සන්නද්ධව තීර්ට
විරුද්ධව පැමිණෙයි.[17] **8** ඔහු ඔබ
අවට පිහිටි කුඩා ගම්මානවල වැසි-

**25 පරි.**
1 2ලේක 28:17; ගීතා 137:7; විලා 4:22; ආමො 1:11; ඔබ 10
2 මලා 1:4
3 යෙරෙ 7:20
4 යෙරෙ 49:7
5 යෙරෙ 49:8
6 යෙසා 11:14; යෙසා 63:1; යෙරෙ 49:2
7 ද්වි 32:35; ගීතා 58:10; නාහු 1:2; එළි 6:16
8 යෙසා 14:29; යෙරෙ 25:20; යෝවෙ 3:4
9 1සාමු 31:7; 2සාමු 5:17
10 2ලේක 28:18; යෙසා 9:12; යෙරෙ 47:1; ආමො 1:6
11 ශෙප 2:4
12 1සාමු 30:14; ශෙප 2:5
13 යෙරෙ 47:4
14 එස 5:15; නාහු 1:2
15 ගීතා 9:16

**2 තීරුව**

**26 පරි.**
1 යොෂු 19:29
2 යෝවෙ 3:6; ආමො 1:9
3 විලා 1:1
4 එස 25:3
5 එස 19:7
6 යෙරෙ 51:42
7 ගීතා 82:8
8 යෙසා 23:11; ආමො 1:10
9 සෙක 9:4
10 එස 27:32
11 එස 26:14
12 ගීතා 9:16
13 යෙරෙ 25:9; එස 29:18
14 එස්රා 7:12; දානි 2:37
15 යෙරෙ 6:23; හබ 1:8
16 යෙරෙ 4:13
17 එස 23:24

එස **26:7*** හෝ, “නෙබුකද්නෙෂර්.”

යන්ව කඩුවෙන් මරා දමන්නේය.
ඔහු ඔබව වටලා ඔබට පහර දෙන
පිණිස ඔබ වටේට පවුරු ගොඩනඟන්-
නේය.[1] ඔබට විරුද්ධව විශාල පලි-
හක්ද ඔසවන්නේය. **9** ඔබේ පවුරු
බිඳ දැමීමට ඔහු ප්‍රබල යුධෝපකරණ
භාවිත කරන අතර තම අවිවලින්
ඔබේ මුරකොටු සියල්ල කඩා බිඳ
දමන්නේය. **10** ඔහුගේ අශ්ව සේ-
නාව මොන තරම් විශාලද කිවහොත්
උන්ගෙන් ඇවිස්සෙන දූවිල්ලෙන් ඔබ
නැහැවී යන්නෙහිය.[2] කඩා බිඳ දැමූ
පවුරකින් නුවරකට ඇතුල් වන සේ-
නාවක් මෙන් ඔහු තම සේනාව
සමඟ ඔබේ දොරටු තුළින් ඇතුල්
වන්නේය. ඔහුගේ අසරුවන්ගෙන් හා
යුධ රථවලින් නැඟෙන මහා ඝෝෂාව
නිසා ඔබේ පවුරු පවා දෙදරුම් කන්-
නේය. **11** ඔබේ සියලු වීථි පුරා ඔහු-
ගේ අශ්වයන් දුවන ශබ්දය ඇසෙනු
ඇත.[3] ඔහු ඔබේ වැසියන්ව කඩු-
වෙන් මරා දමන්නේය. ඔබේ ශක්ති-
මත් කුලුනු බිමට කඩා වැටෙන්නේය.
**12** ඔහුගේ හමුදාව ඔබේ සියලු සම්-
පත් නැති නාස්ති කර[4] ඔබ වෙළඳාම්
කරන සියල්ල පැහැරගන්නෝය.[5]
ඔබේ පවුරු බිඳ දමා ඔබේ අලංකාර
නිවෙස්ද ඔවුහු සුනුවිසුනු කර දමන්-
නෝය. ඒවායෙන් ඉතුරු වන ගල්ද
ලීද දූවිලිද මුහුදට ඇද දමන්නෝය.’
**13** “‘ඔබේ සතුටු ගී නද මම නැති
කර දමන්නෙමි.[6] ඔබේ වීණාවලින්ද
තවත් හඬක් නොඇසෙනු ඇත.[7]
**14** මම ඔබව ගස් කොළන් නැති හිස්
පර්වතයක් බවට පත් කරන්නෙමි.[8]
ඔබ මාදැල් අතුරන පාළු ස්ථානයක්
බවට පත් වනු ඇත.[9] කිසිවෙක් ඔබව
නැවත කිසිදා ගොඩනඟන්නේ නැත.
මේ දේ පවසන්නේ යෙහෝවා දෙවි
වන මා බැවින් එය ස්ථිර වශයෙන්ම
සිදු වනු ඇත.’ එසේ පවසන්නේ විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවිය.[10]
**15** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි තීර් නුවර ගැන මෙ-
සේද පවසයි. ‘ඔබේ වැටීමේදී දූපත්

**26 පරි.**
1 2සාමු 20:15, එස 21:22
2 යෙරෙ 47:3, එස 26:4
3 යෙසා 5:28, හබ 1:8
4 එස 27:33, 1තිමෝ 6:17
5 නෙහෙ 13:16, එස 27:33, එස 28:5, එස 28:18, සෙක 9:3
6 යෙසා 14:11
7 යෙසා 23:16, යෙසා 24:8, එළි 18:22
8 එස 26:4
9 එස 26:5
10 යෙසා 14:27

**2 තීරුව**
1 යෙරෙ 49:21, එස 27:28, එස 31:16
2 යෙසා 23:8
3 1සාමු 2:7, යෝනා 3:6
4 යෙසා 3:26
5 නික් 15:15, එස 27:35, එස 32:10
6 එස 27:32
7 ආමො 1:9, එළි 18:10
8 යෙසා 23:4, එස 28:2
9 යෙසා 23:5, එස 27:32
10 යෙසා 8:7, එස 27:34, දානි 9:26
11 යෙසා 38:18
12 ගීතා 143:7, එස 28:8, ලූක් 10:15
13 ද්වි 32:22, ගීතා 88:6, එස 32:18
14 ගීතා 27:13, එස 32:23

කම්පා කරවන තරම් භයංකර ශබ්ද-
යක් ඇසෙනු ඇත. මහත් ඝාතන-
යක් සිදු වන ඒ දවසේදී දරුණු ලෙස
තුවාල ලැබූවන්ගේ කෙඳිරිලි හඬ දේ-
ශය සිසාරා යයි.[1] **16** සමුද්‍රයේ වැජ-
ඹෙන සියලු අධිපතීහු[2] ඔවුන්ගේ
සිහසුන්වලින් වැටෙනු ඇත.[3] ඔවුහු
තමන් පැළඳ සිටින සළුද විසිතුරු
මෝස්තර සහිත වස්ත්‍රද ගලවා ඉවත
දමන්නෝය. ඔවුහු බිම හිඳගෙන[4]
බියෙන් ගැහිගැහී[5] ඔබ දෙස පුදුම-
යෙන් මෙන් දිගටම බලා සිටිනු ඇත.
**17** ඔවුහු ඔබ ගැන විලාප නඟමින්[6]
මෙසේ පවසනු ඇත.
“‘“අනේ, ඔබට සිදු වූ විනාශය
මොන තරම් මහත්ද![7] සත් සමුද්‍රයෙන්
පැමිණි සෙනඟගෙන් ජනාකීර්ණ වූ
ඔබව බොහෝදෙනෙක් මොන තරම්
පැසසුමට ලක් කළාද! ඔබ සමුද්‍ර-
යේ බලවත්තයෙක් විය.[8] පොළොවේ
සියලු වැසියෝ ඔබ නිසාත් ඔබ තුළ
වාසය කළ ජනතාව නිසාත් බියෙන්
කල් ගෙවූහ. එනමුත් ඔබට මේ සිදු
වූයේ කුමක්ද? **18** ඔබේ වැටීම දැක
දූපත් දෙදරුම් කන්නේය. ඔබේ විනා-
ශය දැක සමුද්‍රයේ විසිරී ඇති දූපත්
කැලඹෙන්නේය.”’[9]
**19** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙසේය.
‘මම ඔබව කිසිදු මිනිසෙකු නොවා-
සන පාළු නුවරක් මෙන් වීමට සලස්-
වන්නෙමි. මහත් ජල ධාරා ඔබ
පිට පමුණුවා ඒ ජලයෙන් ඔබව වැසී
යන්න සලස්වන්නෙමි.[10] **20** මම
ඔබව පහත් කරන්නෙමි. පුරාණයේ
මිය ගිය අය වෙතට යන අන් සියලු
ජනයාට සිදු වන දේම මම ඔබටත්
සිදු කරන්නෙමි.[11] මිනී වළට යන
අය සමඟ ඔබද සිටිනු ඇත.[12] මා
ඔබට හිමි කර දෙන්නේ පහත්ම පහත්
ස්ථානයකි.[13] ඔබ බොහෝ කලකට
පෙර විනාශ වී පාළුවට ගිය දේශයන්
මෙන් වන්නෙහිය. යළි කෙදිනකවත්
ඔබ තුළ කිසිවෙකු වාසය කරන්නේ
නැත. එහෙත් ජීවත්ව සිටින අයගේ
දේශය මම අලංකාර කරන්නෙමි.[14]

21 "'ඔබට භයංකර විනාශයක්
අත් වනු ඇත.[1] මම ඔබව මිහිපි-
ටින් තුරන් කරන්නෙමි. ඇතමෙක්
ඔබව සෙව්වද[2] ඔවුන්ට කිසිදා ඔබව
සොයාගැනීමට නොහැකි වනු ඇත.'[3]
එසේ පවසන්නේ විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවිය."

**27** යෙහෝවා දෙවි මට මෙසේ
පැවසීය. 2 "මනුෂ්‍ය පුත්‍රය,
ඔබ තීර් ගැන විලාප ගීයක් ගයන්න.[4]
3 තීර් නගරයට මෙසේ පවසන්න.
"'සමුද්‍රයේ දොරටුව අසල වාසය
කරන[5] කාන්තාව, බොහෝ දූපත්-
වල වැසියන් සමඟ වෙළඳාම් කරන[6]
ඔබට විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේ පවසයි. "තීර්
නුවර මේ අසන්න. 'මා තරම් රුවැත්-
තියක් තවත් නැත' යයි ඔබ පවසා
ඇත.[7] 4 ඔබේ රාජධානිය තිබෙන්-
නේ මහ මුහුද මැදය.[8] ඔබව ගො-
ඩනැඟූ අය ඔබේ රුව තව තවත්
ඔප්නැංවූහ.[9] 5 නෞකාවක් බඳු වූ
ඔබව තැනීමට ඔවුන් දැව ඉරා-
ගත්තේ සෙනීර් ප්‍රදේශයෙන්[10] කපා-
ගත් ජුනිපර් ගස්වලිනි. ඔබ මත
කුඹගසක් ඉදි කිරීමට ඔවුහු ලෙබ-
නොන් රටෙන්[11] දේවදාර ගසක්
ගෙන්වාගත්තෝය. 6 ඔබේ හබල්
සෑදුවේ බාෂාන් ප්‍රදේශයෙන් කපාගත්
දැවැන්ත ගස්වලිනි. ඔවුහු කිත්තිම්
දූපත්වලින්[12] ලබාගත් සයිප්‍රස් ලීව-
ලින් හා ඇත්දළවලින් ඔබේ ඇණිය
තැනුවෝය. 7 ඊජිප්තුවෙන් ගෙන්-
වාගත් නානාවිධ වර්ණයන්ගෙන් යුත්
ලිනන් රෙදිවලින්[13] ඔබේ රුවල් සෑදු-
වෝය. එලිෂාහ් දූපත්වලින්[14] ගෙනා
නිල් පැහැති නූල්වලින්[15] හා රත්නිල්
පැහැති ලොම්වලින්[16] ඔබට වියනක්
තැනුවෝය.
8 "'"තීර්, ඔබේ හබල්කරුවෝ
සීදොන්[17] සහ අර්වද්හි වැසියෝය.[18]
ඔබ අතරේ සිටි දක්ෂයෝ[19] ඔබේ
නාවිකයෝ වූහ.[20] 9 ඔබේ කැඩී බිඳී
ගිය තැන් අලුත්වැඩියා කළේ[21] ගෙ-
බල් නුවරේ[22] සිටි බොහෝ අද්දැ-
කීම් ලත් පළපුරුදු පුරුෂයන්ය. ඔබ
සමඟ වෙළඳාම් කිරීම සඳහා සත් සමු-
ද්‍ර තරණය කළ නැව්ද නැවියෝද
ඔබ වෙතට පැමිණියෝය. 10 ඔබේ
යුධ හමුදාවේ සෙබළුන් වූයේ පර්සි-
යාව,[1] ලුද්[2] හා පූට්[3] යන දේශයන්
සිට පැමිණි රණශූරයන්ය. ඔවුහු තම
පලිස් හා හිස්වැසුම් ඔබ මත එල්ලා
තැබූහ.[4] ඔබ අලංකාර වුණේ ඔවුන්
නිසාය. 11 ඔබේ හමුදාව සමඟ අර්-
වද්හි වැසියෝද[5] ඔබ වටේට ඉදි
කර තිබූ ඔබේ පවුර මත සිටියෝය.
ඔබේ මුරකොටුවල ආරක්ෂාවට සිටි-
යේ නිර්භීත පුරුෂයන්ය. ඔබේ පවුරු
වටා ඔවුහු තම පලිස් එල්ලුවෝය.[6]
ඔවුන් නිසා ඔබේ රුව තව තවත් ඔප්-
නැංවිණ.
12 "'"ඔබට වටිනා වස්තු සම්-
භාරයක්[7] ලබා දුන් තර්ෂීෂ්හි වැසි-
යෝද[8] ඔබ සමඟ වෙළඳාම් කළෝය.
ඔබේ භාණ්ඩ වෙනුවට ඔවුහු ඔබට
රිදී, යකඩ, බෙලෙක් හා ඊයම් ලබා
දුන්නෝය.[9] 13 යාවාන්,[10] තූබල්,[11]
මෙෂෙක්[12] යන ප්‍රදේශවල වැසියෝද
ඔබ සමඟ වෙළඳාම් කළෝය. ඔවුහු
ඔබ සතු භාණ්ඩ ලබාගැනීම සඳහා
ඔබ සමඟ වහලුන්[13] හා තඹ හුවමාරු
කරගත්තෝය. 14 ඔබේ භාණ්ඩ
වෙනුවෙන් තොගර්මා[14] නම් පළාතේ
ජනයා ඔබට අශ්වයන් හා කොටළු-
වන් දුන්නෝය. 15 දෙදාන්හි වැසි-
යෝද[15] ඔබ සමඟ වෙළඳාම් කළෝය.
බොහෝ දූපත්වල වැසියෝ ඔබ වෙ-
නුවෙන් වෙළඳාම් කළෝය. ඔවුහු
ඇත්දළ[16] හා කළුවර ලී ඔබට තෑගි
කළෝය. 16 ඔබ බොහෝ දේ නිෂ්-
පාදනය කළ නිසා ඒදොම් වැසියෝද
ඔබ සමඟ වෙළඳාම් කළෝය. ඔවුහු
ඔබ විකුණූ දේ ලබාගැනීමට පච්ච
ගල්,[17] රත්නිල් පැහැගැන්වූ ලොම්,
නානාවිධ වර්ණයන්ගෙන් යුත් සළු-
පිළි, අනර්ඝ රෙදිපිළි, කොරල් හා රතු
කැට ඔබට දුන්නෝය.
17 "'"යූදා හා ඊශ්‍රායෙල් දේශ-
යේ වැසියෝද ඔබ සමඟ වෙළඳාම්
කළෝය. ඔබ විකුණූ දේ ලබාගැ-

**26 පරි.**
1 එස 27:36
2 ගීතා 37:10
ගීතා 37:36
3 එස 28:19

**27 පරි.**
4 එස 26:17
5 එස 28:2
6 යෙසා 23:8
7 හිතෝ 27:2
යෙසා 23:9
එස 28:12
8 එස 26:5
9 එස 26:12
10 ද්වි 3:9
1ලේක 5:23
සල 4:8
11 1රාජා 5:6
12 උත් 10:4
යෙසා 23:1
යෙරෙ 2:10
13 හිතෝ 7:16
14 1ලේක 1:7
15 නික් 25:4
16 යෙරෙ 10:9
17 යොෂු 11:8
18 උත් 10:18
19 2ලේක 2:14
20 1රාජා 9:27
21 1රාජා 5:18
එස 27:27
22 යොෂු 13:5
ගීතා 83:7

**2 තීරුව**
1 එස 38:5
2 උත් 10:13
3 1ලේක 1:8
යෙරෙ 46:9
එස 30:5
නාහු 3:9
4 එස 38:5
5 උත් 10:18
6 සල 4:4
7 2ලේක 9:21
2ලේක 20:36
ගීතා 72:10
8 උත් 10:4
1රාජා 10:22
යෙසා 2:16
යෝනා 1:3
9 යෙරෙ 10:9
10 උත් 10:2
යෙසා 66:19
11 1ලේක 1:5
12 එස 32:26
13 යෝවෙ 3:6
එළි 18:13
14 උත් 10:3
1ලේක 1:6
එස 38:6
15 උත් 10:7
1ලේක 1:9
යෙරෙ 25:23
16 1රාජා 10:22
එළි 18:12
17 එස 28:13

නීමට[1] ඔවුහු මින්නිත් ප්‍රදේශයේ[2]
තිරිඟුද[3] විශේෂ ආහාර වර්ගද මීපැ-
ණිද[4] තෙල්ද බෝල්සම් තෙල්ද[5] ඔබට
දුන්නෝය.

**18** "'"ඔබ වටිනා දේවල් බො-
හොමයක් නිෂ්පාදනය කළ නිසා
දමස්කයේ වැසියෝ[6] ඔබ සමඟ වෙ-
ළඳාම් කළෝය. ඒ දේවල් වෙ-
නුවෙන් ඔවුහු රතු හා අළු
පැහැයෙන් මිශ්‍ර ලොම්ද හෙල්බොන්
ප්‍රදේශයේ වයින්ද[7] ඔබට ලබා දුන්-
නෝය. **19** ඔබේ ගබඩාවල රැස්
කරගත් දේවල් ලබාගැනීම සඳහා
ඌසාල් ප්‍රදේශයෙන් පැමිණි වෙදාන්
හා යාවාන්හි වැසියෝ ඔබ සමඟ වෙ-
ළඳාම් කළෝය. ඔවුහු ඔබට ඔප්-
නැංවූ යකඩ, පැඟිරි කුරුඳු හා සුවඳැති
පැළෑටි[8] යනාදිය ගෙනාවෝය.
**20** දෙදාන්හි වැසියන්ගෙන්[9] අශ්වයන්
පිට තබන රෙදිපිළි ඔබ ලබාගත්-
තෙහිය. **21** අරාබි ජාතිකයෝ[10] හා
කේදාර් ගෝත්‍රයේ[11] සියලු අධිපතීහු
ඔබ වෙනුවෙන් වෙළඳාම් කළෝය.
ඔවුහු ඔබ වෙත එළුවන්වද බැටළුවන්-
වද ගෙනාවෝය.[12] **22** ෂෙබා[13] හා
රයමාහි[14] වෙළෙන්දෝද ඔබ සමඟ
ගනු දෙනු කළෝය. ඔබ ඔවුන්ගෙන්
ඉතා වටිනා සුවඳ විලවුන්ද නානාවිධ
මැණික්ද රත්තරන්ද ලබාගත්තෙ-
හිය.[15] **23** ෂෙබා,[16] හාරාන්,[17] කන්-
නේහ් හා ඒදන්[18] යන ස්ථානවලින්
පැමිණි වෙළෙන්දෝද අෂූර්[19] හා කිල්-
මද් යන ස්ථානවලින් පැමිණි වෙ-
ළෙන්දෝද ඔබ සමඟ ගනු දෙනු
කළෝය. **24** ඔවුහු ඔබේ වෙළඳ-
පොළෙහි අලංකාර වස්ත්‍ර, නිල්
පැහැති සළු, විවිධ වර්ණයන්ගෙන්
යුත් සළුපිළි, වර්ණ දෙකකින් යුත්
බුමුතුරුණු හා ශක්තිමත්ව අඹරන
ලද ලණුද හුවමාරු කරගත්තෝය.

**25** "'"ඔබේ භාණ්ඩ ප්‍රවාහණය
කිරීමට තර්ෂිෂ් නැව්[20] යොදාගන්නා
ලදි. ඔබ බොහෝ සෙයින් ධනවත් වී
ඔබේ කීර්තිය මහ සයුර පුරාම පැතිර
ගියේය.[21]

**26** "'"එහෙත් ඔබේ හබල්කරුවෝ
ඔබව මහ මුහුද මැදට ගෙන යනු
ඇත.[1] ඔබ නැඟෙනහිර දෙසින් හමන
සුළඟට හසු වී මහ මුහුද මැදම
මුහුදුබත් වන්නෙහිය.[2] **27** ඔබ පරා-
ජය වන දවසේදී ඔබ සතු සියලු
වටිනා දේ[3] එනම්, ඔබේ වෙළඳ භාණ්-
ඩද[4] ඔබේ නැවියෝද[5] නැව් පිළිසකර
කරන්නෝද[6] වෙළෙන්දෝද රණශූ-
රයෝද[7] මුහුදු පත්ලටම ගිලී යනු
ඇත.[8]

**28** "'"ඔබේ නැවියන් මර ළතෝනි
දෙන කල මුළු දේශයම දෙදරුම් කන්-
නේය.[9] **29** මුහුද මැද යාත්‍රා කරමින්
සිටින නැව්වල සියලු හබල්කරුවෝද
නැවියෝද තම නැව්වලින් බැස ගො-
ඩට එනු ඇත.[10] **30** එවිට ඔවුහු
ඔබට සිදු වූ දේ ගැන සියලුදෙනාට
ඇසෙන්න විලාප නඟන්නෝය.[11] තම
හිස මතට වැලි දමාගෙන[12] අළුවල
වැතිර සිටිනු ඇත.[13] **31** ඔවුහු ඔබ
ගැන ශෝක වී හිස බූ ගාගෙන,[14]
ගෝණි රෙදි ඇඳ[15] ඉමහත් දුකකින්
හඬා වැලපෙන්නෝය.[16] **32** ඔවුහු
ඔබ වෙනුවෙන් මෙසේ විලාප නඟනු
ඇත.[17]

"'"'මහ සයුර මැද නිහඬ වූ[18]
තීර්ට සමාන වෙන කවරෙකු සිටීද?[19]
**33** ඔබ මහ මුහුද තරණය කර-
මින්[20] ඔබේ වෙළඳ භාණ්ඩ[21] බො-
හෝදෙනෙකුගේ අතට පත් කරමින්
ඔවුන්ව තෘප්තියට පත් කළෙහිය.[22]
ඔබේ වටිනා වස්තු සම්භාරයෙන්
ඔබ පොළොවේ රජවරුන්ව ධන-
වත් කළෙහිය.[23] **34** දැන් නම් ඔබ
මහ මුහුද මැද රළ පහරින් බිඳී
ගොස් ඇත.[24] ඔබේ සම්පත්ද ඔබ
සමඟ සිටි මුළු පිරිසද[25] ඔබ සමඟම
මුහුදුබත් වී ඇත. **35** දූපත්වල වෙ-
සෙන සියලුදෙනා[26] ඔබ දෙස පුදුම-
යෙන් මෙන් බලන්නෝය. ඔවුන්ගේ
රජවරුද මහත් භීතියෙන් වෙවුලති.[27]
ඔබට සිදු වූ දේ දැක බොහෝදෙනා

**27 පරි.**

**1** 1රාජා 5:9 2ලේක 2:10 එස්රා 3:7 ක්‍රියා 12:20
**2** විනි 11:33
**3** ද්වි 8:8
**4** උත් 43:11
**5** යෙරෙ 8:22
**6** යෙසා 7:8
**7** දේශ 10:19
**8** සල 4:14
**9** උත් 25:3
**10** යෙරෙ 25:24
**11** උත් 25:13 1ලේක 1:29 සල 1:5 යෙසා 60:7
**12** 2ලේක 17:11
**13** 1රාජා 10:1 2ලේක 9:1 ගීතා 72:10
**14** උත් 10:7 1ලේක 1:9
**15** 1රාජා 10:2 යෙසා 60:6
**16** උත් 25:3 යෝබ් 6:19
**17** උත් 11:31
**18** 2රාජා 19:12 යෙසා 37:12 ආමො 1:5
**19** උත් 10:22 1ලේක 1:17
**20** 1රාජා 10:22 යෙසා 2:16 යෙසා 23:14 යෙසා 60:9
**21** එස 27:4 යෝනා 2:3

**2 තීරුව**

**1** එස 27:8
**2** ගීතා 48:7
**3** එස 27:14
**4** එස 27:13
**5** එස 27:8
**6** එස 27:9
**7** එස 27:11
**8** හිතෝ 11:4 එස 26:14
**9** එස 26:15 එළි 18:17
**10** එස 26:16
**11** යෙසා 23:1 එස 26:17 එළි 18:9 එළි 18:11
**12** නෙහෙ 9:1 යෝබ් 2:12 එළි 18:19
**13** එස්ත 4:1 යෙරෙ 6:26
**14** යෙසා 15:2 යෙරෙ 16:6 මීකා 1:16
**15** එස්ත 4:3 යෙසා 22:12 දානි 9:3
**16** යෙසා 22:4

**17** එස 26:17; එස 27:2; **18** එස 26:5; **19** විලා 2:13; එළි 18:18; **20** එස 27:26; **21** එස 27:14; එස 27:16; එළි 18:19; **22** යෙසා 23:3; **23** සෙක 9:3; එළි 18:3; **24** එස 26:19; **25** එස 27:27; **26** යෙසා 23:6; එස 26:15; **27** එස 28:17; එස 32:10; එළි 18:9.

කැලඹෙනු ඇත.[1] **36** වෙළෙන්දෝ
පුදුමයට පත්ව ඔබ දෙස බලා සිටිනු
ඇත.[2] ඔබ බියෙන් බිරාන්ත වන්නෙ-
හිය. ඔබ සදහටම තුරන් වී යනු
ඇත.’ ” ’ ”[3]

**28** යෙහෝවා දෙවි මට මෙසේ
පැවසුවේය. **2** “මනුෂ්‍ය
පුත්‍රය, තීර් වැසියන්ගේ නායකයාට
මේ දේ කියන්න. ‘විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි පවසන්නේ
මෙයයි.

“ ‘ “ ‘මම දෙවි කෙනෙකි.[4] මම මහ
මුහුද මැද[5] දෙවි කෙනෙකුගේ සිංහා-
සනයේ හිඳ රජකම් කරමි’[6] කියා
ඔබ ඉතා උඩඟු ලෙස පවසන්නෙ-
හිය.[7] ඔබ සිතන්නේ ඔබ දෙවි කෙ-
නෙකු කියාය.[8] එහෙත් ඇත්තටම ඔබ
නිකම්ම නිකම් මිනිසෙකු පමණයි.[9]
**3** ඔබ දානියෙල්ටත් වඩා නුවණැත්-
තෙකු කියාත්[10] ඔබෙන් කිසිම රහ-
සක් සැඟවිය නොහැකියි කියාත්
ඔබ සිතන්නෙහිය.[11] **4** ඔබේ නැණ-
නුවණින් ඔබ ධනය උපයාගත්තෙ-
හිය. රන් හා රිදීවලින් ඔබේ ගබඩා
පුරවාගත්තෙහිය.[12] **5** ඔබ බොහෝ
නුවණැත්තෙක් නිසාත්[13] ඔබ බො-
හෝ දේ අළෙවි කළ නිසාත්[14] ඔබ
මහත් ධන සම්භාරයක් රැස් කරගත්-
තෙහිය.[15] ඔබ හිමි කරගත් ඒ ධනය
නිසා ඔබ උඩඟුකමින් මත් විය.” ’[16]

**6** “ ‘එබැවින් විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි ඔබට
මෙසේ පවසයි. “ඔබ දෙවි හා සමා-
නයි කියා සිතීමට තරම් නිර්භීත වූ
නිසා[17] **7** මම ජාතීන් අතරේ සිටින
ඉතාම කුරිරු සෙනඟව[18] ඔබට විරුද්-
ධව එවන්නෙමි.[19] ඔබේ නැණනුව-
ණින් ගොඩනඟා ගත් අලංකාර දේවල්
ඔවුහු ඇවිත් නැති නාස්ති කරන්-
නෝය. ඔබේ තේජශ්‍රීයද ඔබට අහිමි
වනු ඇත.[20] **8** ඔවුහු ඔබව මිනී
වළට යවන්නෝය.[21] මහ මුහුදේදී
මරා දැමූ කෙනෙකු මෙන් ඔබද විනාශ
වී යනු ඇත.[22] **9** ඔබ මැරෙන මො-
හොතේදී, ‘මම දෙවි කෙනෙක්’ කියා
ඔබේ සතුරාට ඔබ පවසනු ඇද්ද?[1]
සතුරාගේ අතට ඔබ හසු වූ විට ඔබ
දෙවි කෙනෙකු නොව නිකම්ම නිකම්
මිනිසෙකු බව පැහැදිලිව ඔප්පු වන්-
නේ නැද්ද?” ’[2]

**10** “ ‘ඔබ විදේශිකයන් අතින්
මැරුම් කන්නෙහිය. ඔබට අත් වන්-
නේ චර්මච්ඡේදනය නොවූ අයට අත්
වන මරණයකි.[3] මේ සියල්ල පව-
සන්නේ මා වන බැවින් එය ස්ථිර
වශයෙන්ම ඉටු වන්නේය.’ එසේ පව-
සන්නේ විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවිය.”

**11** යෙහෝවා දෙවි මට නැව-
තත් කතා කර මෙසේ පැවසුවේය.
**12** “මනුෂ්‍ය පුත්‍රය, තීර්හි රජු ගැන
විලාප ගීයක් ගයන්න.[4] ඔබ ඔහුට
මෙසේ කිව යුතුයි. ‘විශ්වයේ පාලක-
යාණන් වන යෙහෝවා දෙවි පවසන්-
නේ මෙයයි.

“ ‘ “ප්‍රඥාවෙන්ද[5] රූපශ්‍රීයෙන්ද පිරි-
පුන් ඔබ,[6] පරිපූර්ණත්වයේ සංකේ-
තයකි. **13** ඔබ දෙවිගේ උයන වූ
ඒදන්හි වාසය කළෙහිය.[7] රතු කැට,
පඩියන්, ජැස්පර් ගල්, ක්‍රිසොලයිට්
ගල්, ඔනික්ස් ගල්,[8] ජේඩ් ගල්, නීල
මාණික්‍ය, පච්ච ගල්[9] හා මරකත
යනාදි සියලු අනර්ඝ මැණික් ඔබ්බ-
වන ලද රන් ආභරණවලින් ඔබ සැරසී
සිටියෙහිය. ඔබව සෑදූ දවසේදීම
මේ සියල්ල ඔබ වෙනුවෙන් සූදානම්
කර තිබිණ. **14** ආරක්ෂක කෙරුබ්-
වරයා ලෙස අභිෂේක ලැබූ ඔබට ඒ
තනතුර පිරිනැමුවේ මමය. ඔබ සිටි-
යේ දෙවිගේ ශුද්ධ කන්දෙහිය.[10] ඔබ
ගිනි ඇවිළෙන ගල් අතරේ ඇවිද්දෙ-
හිය. **15** ඔබව බිහි කළේ නිර්දෝෂ
අයෙකු ලෙසිනි.[11] පසු කලෙක ඔබ
අධර්මිෂ්ඨයෙක් විය. ඒ වන තුරු ඔබ
තුළ කිසි දෝෂයක් තිබුණේ නැත.[12]

**16** “ ‘ “ඔබේ ව්‍යාපාරික කටයුතු
බොහෝ සෙයින් දියුණු වූ නිසා[13]
ඔබ අනුන්ට පීඩා කරමින් දිගින් දිග-
ටම වැරදි කරන්න පටන්ගත්තෙ-
හිය.[14] ගිනිදැල් මෙන් දිදුලන ගල්
අතරේ ඇවිදින ආරක්ෂක කෙරුබ්වර-

**27 පරි.**
1 එළි 18:10
2 යෙරෙ 18:16
යෙරෙ 19:8
එළි 18:15
3 ගීතා 37:10
එස 26:14

**28 පරි.**
4 දානි 11:36
1කොරි 8:5
5 එස 27:4
6 යෙසා 14:13
2තෙස 2:4
7 හිතෝ 16:18
යෙසා 2:12
එස 28:5
8 යෙසා 31:3
9 ගීතා 144:3
10 දානි 2:48
11 සෙක 9:2
12 ද්වි 8:17
හිතෝ 23:4
සෙක 9:3
13 සෙක 9:2
14 එස 26:12
එස 28:18
15 යෙසා 23:3
එස 27:12
16 හිතෝ 11:28
හිතෝ 18:11
17 ලූක් 14:11
18 ද්වි 28:50
19 එස 30:11
20 යෙසා 23:9
21 යෝබ් 17:16
22 එස 27:26

**2 තීරුව**
1 ගීතා 82:7
2 යෙසා 31:3
3 යෙරෙ 9:26
4 එස 26:17
5 හිතෝ 21:30
යෙසා 10:13
යෙරෙ 9:23
එස 28:3
සෙක 9:2
6 එස 27:3
7 එස 31:8
8 උත් 2:12
9 එස 27:16
10 යෙසා 14:13
11 1රාජා 5:1
12 යෝවෙ 3:4
ආමො 1:9
13 1රාජා 10:11
2ලේක 9:21
එස 27:12
යෝවෙ 3:5
14 යෝවෙ 3:6

යාණෙනි, අපවිත්‍ර දෙයක් ඉවත දමන්-
නාක් මෙන් මාගේ කන්දෙන් මම
ඔබව පිටමං කර විනාශ කරන්නෙමි.[1]
**17** “ ‘ “ඔබේ අලංකාරය නිසා ඔබ
උඩඟු විය.[2] ඔබේ තේජශ්‍රීය නිසා ඔබ
අනුවණයෙකු ලෙස කටයුතු කරන්න
පටන්ගත්තෙහිය.[3] එමනිසා මම ඔබව
පොළොවට හෙළන්නෙමි.[4] රජවරුන්-
ගේ ඇස් පනාපිටම මම ඔබට ඒ දේ
කරන්නෙමි.[5]
**18** “ ‘ “ඔබ වංචනික ලෙස වෙ-
ළඳාම් කර[6] බොහෝ අසාධාරණකම්
කළ නිසා,[7] ඔබේ ශුද්ධස්ථාන ඔබ
කෙලෙසා ඇත. මම ඔබ තුළින්ම
ගින්නක් හටගන්න සලස්වන්නෙමි.
ඔබ එයින් පිලිස්සී යනු ඇත.[8] සියල්-
ලන්ගේ ඇස් පනාපිටම මම ඔබව
අළු ගොඩක් බවට පත් කරන්නෙමි.[9]
**19** ඔබව දන්නා හඳුනන සියලු
ජාතීන් ඔබ දෙස ඇස් අයාගෙන පුදුම-
යෙන් මෙන් බලා සිටිනු ඇත.[10] ඔබ
හදිස්සියේම බියෙන් තැතිගෙන සදහ-
ටම තුරන් වී යනු ඇත.” ’ ”[11]
**20** යෙහෝවා දෙවි මට මෙ-
සේද පැවසීය. **21** “මනුෂ්‍ය පුත්‍රය,
දැන් සීදොන්ට[12] විරුද්ධව අනාවැකි
කියන්න. **22** ඔබ මෙසේ පැවසිය
යුතුය. ‘විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි.
“සීදොන් වැසියෙනි, මම ඔබට විරුද්-
ධව සිටිමි.[13] මම ඔබ ඉදිරියෙහි ගෞ-
රවයට පත් වනු ඇත.[14] මම සීදොන්ව
විනිශ්චයට ලක් කර මා ශුද්ධ බව
ඇය ඉදිරිපිටම පැහැදිලිව පෙන්වන්-
නෙමි. එවිට මා යෙහෝවා දෙවි බව
පිළිගන්න ජනයාට සිදු වනු ඇත.
**23** මම ඇයට වසංගතවලින් පහර
දෙන්නෙමි. ඇගේ වීථි ලෙයින් නැහැවී
යනු ඇත.[15] මා ඇයව වට කර ඇයට
කඩුවෙන් පහර දෙන විට බොහෝදෙ-
නෙක් මැරී වැටෙන්නෝය.[16] එවිට මා
යෙහෝවා දෙවි බව පිළිගන්න ජන-
යාට සිදු වනු ඇත.[17] **24** මේ දේ
සිදු වූ පසු ඊශ්‍රායෙල් සෙනඟව සරද-
මට ලක් කරන කිසිවෙකුවත් ඉතුරු
වන්නේ නැත.[18] හානිකර කටු පඳු-

**28 පරි.**
1 යෙසා 23:9; යෙරෙ 25:17; යෙරෙ 25:22; යෙරෙ 47:4; යෝවෙ 3:8
2 හිතෝ 11:2; හිතෝ 16:18; එස 27:3
3 යෙසා 14:14; යෙරෙ 8:9
4 යෝබ් 40:11; ගීතා 73:18; ගීතා 147:6; යෙසා 14:15
5 එස 26:3
6 එස 28:16
7 එස 28:2
8 ආමො 1:10
9 මලා 4:3
10 එස 27:35
11 එස 26:21; එස 27:36
12 යෙසා 23:4; යෙරෙ 25:22; එස 32:30
13 එස 26:3
14 නික් 9:16; එස 39:13
15 එස 38:22
16 යෙරෙ 25:33
17 එස 26:6
18 ගණන් 33:55; යොෂු 23:13

**2 තීරුව**
1 ද්වි 30:3; ගීතා 106:47; යෙසා 11:12; යෙරෙ 30:18; හොෂෙ 1:11
2 උත් 28:13
3 යෙරෙ 23:8; එස 36:28
4 යෙසා 5:16
5 යෙරෙ 30:16
6 යෙසා 65:21; යෙරෙ 31:4
7 යෙරෙ 31:5; එස 36:36; ආමො 9:14
8 යෙසා 32:18; යෙරෙ 23:6; එස 38:11; හොෂෙ 2:18

**29 පරි.**
9 යෙරෙ 44:30
10 යෙසා 19:1; යෙරෙ 25:19; යෙරෙ 43:11; එස 31:2
11 යෙරෙ 46:25; එස 31:18
12 එස 32:2
13 ගීතා 74:13; යෙසා 27:1; යෙසා 30:7; යෙසා 51:9

රක් ලෙස හෝ වේදනාකාරී කටුවක්
ලෙස හෝ ක්‍රියා කරන ජනයා ඔවුන්
අවට තවත් නොසිටින්නෝය. එවිට
මා විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි බව පිළිගන්න ජනයාට
සිදු වනු ඇත.” ’
**25** “ ‘විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි.
“ජාතීන් අතරේ සීසීකඩ විසිර සිටින
ඊශ්‍රායෙල් සෙනඟව මම නැවතත්
එකතු කරන්නෙමි.[1] මාගේ සේවක
යාකොබ්ට දුන් දේශයේ[2] මම ඔවුන්ව
නැවත පදිංචි කරවමි.[3] එවිට මා ශුද්ධ
දෙවි කෙනෙකු බව සියලු ජාතීන්
පැහැදිලිව දකිනු ඇත.[4] **26** මම
අනිවාර්යයෙන්ම ඔවුන්ට සරදම් කළ
සියලුදෙනාට විරුද්ධව මාගේ විනිශ්-
චය ක්‍රියාත්මක කරන්නෙමි.[5] ඉන්පසු
ඔවුහු එම දේශයෙහි ගෙවල් ඉදි කර-
මින්[6] හා මිදිවතු වවමින්[7] සුරක්ෂිතව
කල් ගෙවනු ඇත.[8] එවිට මා යෙ-
හෝවා දෙවි බව පිළිගන්න ඔවුන්ට
සිදු වනු ඇත.” ’ ”

**29** දසවන අවුරුද්දේ, දසවන
මාසයේ, දොළොස්වන දින
යෙහෝවා දෙවි මට මේ දේ පැවසු-
වේය. **2** “මනුෂ්‍ය පුත්‍රය, ඊජිප්තුවේ
රජු වූ පාරාවෝට[9] හා මුළු
ඊජිප්තු දේශයට විරුද්ධව අනාවැකි
පවසන්න.[10] **3** ඔබ මෙසේ පැවසිය
යුතුයි. ‘විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි.
“ඊජිප්තුවේ රජ්ජුරුවෙනි,[11] නයිල් නදි-
යෙන් නික්මෙන සියලු දිය ධාරා
පුරාම අණසක පතුරුවන[12] සද්දන්-
තයා ඔබයි.[13] ‘නයිල් නදිය මට අයි-
තිය. එය සෑදුවේ මමය’[14] කියා ඔබ
පවසා ඇත. ඒ නිසා මම ඔබට විරුද්-
ධව සිටිමි. **4** මම ඔබේ හකුවලට
කොකු දමා[15] ඔබව මෙල්ල කරන්-
නෙමි. නයිල් නදියෙන් විහිදී ගිය ඇළ
මාර්ගවල සිටින සියලුම මත්ස්‍යයන්
ඔබේ හමේ එල්ලීමට සලස්වන්නෙමි.

---
**14** යෙසා 10:13; එස 29:9; **15** 2රාජා 19:28; යෙසා 37:29; එස 38:4.

ඉන්පසුව මම ඔබවත් ඔබේ හමේ
එල්ලී සිටින සියලු මත්ස්‍යයන්වත්
ගොඩට ගන්නෙමි. **5** ඔබවද ඔබත්
සමඟ නයිල් නදියේ ඇළ මාර්ගවලින්
ගොඩගත් සියලු මත්ස්‍යයන්වද පාළු-
කරයට ගෙන ගොස් විසි කර දමන්-
නෙමි.[1] ඔබ භූමිය මත වැටී මිය යනු
ඇත.[2] ඔබව භූමදාන කරනු ලබන්නේ
නැත. ඔබේ මළ සිරුර වනමෘගයන්ට
හා පක්ෂීන්ට ආහාර පිණිස දෙන්-
නෙමි.[3] **6** එවිට ඊජිප්තුවේ සිටින
සියලුම වැසියන් මා යෙහෝවා දෙවි
බව පිළිගනු ඇත.[4] මන්ද ඔබෙන්
ආධාර පැතූ ඊශ්‍රායෙල්වරුන්ට ඔබ
දුර්වල බට දණ්ඩක් මෙන් විය.[5]
**7** සහය පතමින් ඔවුන් ඔබව දෑතින්
අල්ලාගත් විට ඔබ තැළී පොඩි වී
ගියෙහිය.[6] එහෙයින් ඔවුන් වැටී ඔවුන්-
ගේ උරහිස් බිඳුණේය. ඔවුන් ඔබ මත
රඳා සිටි විට ඔබ ඔවුන්ගේ බලා-
පොරොත්තු සුන් කළෙහිය.[7] ඔවුන්ගේ
තුනටියේ ශක්තිය හීන විය."[8]

**8** "'එබැවින් විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි ඔබට
මෙසේ පවසයි. "මම ඔබට විරුද්-
ධව කඩුවක් එවන්නෙමි.[9] මිනිසුන්
හා සතුන් අතරින් මම ඔබව තුරන්
කර දමන්නෙමි.[10] **9** 'නයිල් නදිය
මට අයිතිය. එය සෑදුවේ මමය'[11]
කියා ඔබ පවසා තිබෙන හෙයින්
ඊජිප්තු දේශය විනාශ වී පාළු ස්ථාන-
යක් බවට පත් වනු ඇත.[12] එවිට මා
යෙහෝවා දෙවි බව පිළිගන්න ජන-
යාට සිදු වනු ඇත. **10** එබැවින් මම
ඔබටත් නයිල් නදියේ සියලු ඇළ
මාර්ගවලටත් විරුද්ධව ක්‍රියා කරමි.[13]
ඊජිප්තු දේශය මම නැති නාස්ති කර
දමන්නෙමි.[14] මිග්දෝල්[15] සිට සෙයේ-
නේ දක්වාද[16] ඉතියෝපියාවේ දේශ
සීමාව දක්වාද තිබෙන මුළු ප්‍රදේශ-
යම වියළී ගොස් පාළුවට යනු ඇත.
**11** කිසි මිනිසෙක් එහි පය තබන්නේ
නැත.[17] හීලෑ සත්තුද එහි සැරිසරන්-
නේ නැත.[18] වසර හතළිහක් පුරා එය
ජනශූන්‍යව පවතිනු ඇත.[19] **12** මම
ඊජිප්තුව පාළුවට ගිය දේශවලින් වට
වූ පාළු දේශයක් බවට පත් කරන්-
නෙමි.[1] එහි නුවරවල්ද නැති නාස්ති
වී වසර හතළිහක් පුරාම පාළුවට
යන්න හරින්නෙමි.[2] මම ඊජිප්තු ජාති-
කයන්ව විවිධ දේශවලට සීසීකඩ විසු-
රුවාහරින්නෙමි."[3]

**13** "'විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේද පවසයි.
"වසර හතළිහක් අවසන් වූ පසු[4]
මම විවිධ ජාතීන් අතර විසිර සිටින
ඊජිප්තුවරුන්ව නැවතත් එකතු කර-
ගන්නෙමි.[5] **14** වහල්භාවයේ සිටින
ඊජිප්තුවරුන්ව මම නැවතත් ගෙන්-
වාගන්නෙමි. ඔවුන්ගේ උපන් දේ-
ශය වන පත්‍රොස්හි[6] මම නැවතත්
ඔවුන්ව පදිංචි කරවන්නෙමි. එහෙත්
එහිදී ඔවුන් පිහිටුවන රාජ්‍යය බල-
වත් එකක් නොවනු ඇත. **15** එය
වෙනත් රාජ්‍යයන්වලට වඩා දුර්වල
රාජ්‍යයක් වන්නේය. උඩඟු වී වෙ-
නත් ජාතීන්ට විරුද්ධව නැඟී සිටින්න
එය තවදුරටත් සමත් නොවන්නේය.[7]
සෙසු ජාතීන් අතරේ තම අණසක
පැතිරවීමට නොහැකි වන සේ මම
ඔවුන්ගේ ගණනද අඩු කරන්නෙමි.[8]
**16** ඊශ්‍රායෙල්වරු තවදුරටත් ඊජිප්තු
රාජ්‍යයේ සරණ පතා පැමිණෙන්-
නේ නැත.[9] ඔවුහු නැවත වරක් ඒ
වරද නොකරන්නෝය.[10] මේ සියල්ල
සිදු වන විට මා විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි බව පිළි-
ගන්න ඊශ්‍රායෙල්වරුන්ට සිදු වෙනවා
ඇත."'"

**17** විසිහත්වන වසරේ, පළමුවන
මාසයේ, පළමුවන දින යෙ-
හෝවා දෙවි මට මෙසේ කීවේය.
**18** "මනුෂ්‍ය පුත්‍රය, බැබිලෝනියේ රජු
වන නෙබුකද්රෙෂර්[11] තම හමුදා බල-
ඇණිය යොදාගෙන තීර් වැසියන්ව
පරාජය කිරීමෙන් ඉටු කළේ ඉමහත්
සේවයකි.[12] ඒ යුද්ධයේදී සෙබළුන්ගේ
කෙස් හැළී ගියේය. ඔවුන්ගේ උරහිස්-
වල හම ගියේය.[13] එහෙත් තීර් වැසි-
යන්ට එරෙහිව ඔහු දියත් කළ ඒ
සටන වෙනුවෙන් ඔහුටවත් ඔහුගේ

**29 පරි.**
**1** නික් 7:21
**2** යෙරෙ 16:4
යෙරෙ 25:33
**3** 1සාමු 17:44
යෙරෙ 7:33
යෙරෙ 34:20
එස 32:4
එස 39:4
එළි 19:18
**4** නික් 9:14
රෝම 9:17
**5** 2රාජා 18:21
යෙසා 30:3
යෙසා 31:3
යෙසා 36:6
එස 17:17
**6** යෙරෙ 37:7
**7** ගීතා 118:8
ගීතා 146:3
යෙරෙ 17:5
**8** ගීතා 69:23
එස 21:6
**9** යෙරෙ 46:14
එස 30:4
**10** නික් 12:12
යෙරෙ 7:20
**11** එස 29:3
**12** යෙරෙ 43:12
එස 30:7
**13** නික් 7:19
**14** යෙසා 19:7
එස 30:12
**15** නික් 14:2
යෙරෙ 44:1
යෙරෙ 46:14
**16** එස 30:6
**17** එස 31:12
**18** එස 32:13
**19** 2ලේක 36:21

**2 තීරුව**
**1** එස 30:7
**2** යෙරෙ 46:19
**3** එස 30:23
**4** එස 29:11
**5** යෙසා 19:22
යෙරෙ 46:26
**6** උත් 10:14
1ලේක 1:12
එස 30:14
**7** එස 30:13
**8** එස 32:2
දානි 11:42
**9** යෙසා 30:2
යෙසා 36:4
යෙරෙ 2:18
යෙරෙ 37:5
විලා 4:17
හොෂෙ 7:11
**10** ගීතා 79:8
යෙසා 64:9
**11** යෙරෙ 25:9
යෙරෙ 27:6
**12** එස 26:7
**13** එස 26:17

සෙබළුන්ටවත් කිසි කුලියක් ගෙවනු
ලැබුවේ නැත.[1]
19 “එබැවින් විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි මෙසේ පව-
සයි. ‘මම බැබිලෝනියේ රජු වන
නෙබුකද්රෙෂර්ට ඊජිප්තු දේශය ලබා
දෙන්නෙමි.[2] ඔහු ඔවුන් සතු සියලු
ධනය කොල්ල කා රැගෙන යනු
ඇත. ඔහු කිසිවක් ඉතුරු නොකර ඒ
සියල්ල පැහැරගන්නේය.[3] ඒ කොල්ල
කා ගත් සියල්ල ඔහුගේ හමුදා බළඇ-
ණියට කුලී වශයෙන් මම ලබා දෙමි.’
20 “‘ඔහු තීර් වැසියන්ට විරුද්-
ධව සටන් කර සිදු කළ සේවයට
කුලියක් වශයෙන් මම ඔහුට ඊජිප්තු
දේශය දෙන්නෙමි. මන්ද බැබිලෝනි-
වරුන් සටන් කළේ මා වෙනුවෙන්ය’[4]
කියා විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි පවසයි.
21 “ඒ කාලයේදී මම ඊශ්‍රායෙල්
ජාතිය වෙනුවෙන් අඟක්* හටගැන්වී-
මට සලස්වන්නෙමි.[5] ඔවුන් අතරේ
කතා කිරීමට අවස්ථාවක් මම ඔබට
උදා කර දෙන්නෙමි.[6] එවිට මා යෙ-
හෝවා දෙවි බව පිළිගන්න ඔවුන්ට
සිදු වනු ඇත.”

30 යෙහෝවා දෙවි මට තව-
දුරටත් මෙසේ පැවසීය.
2 “මනුෂ්‍ය පුත්‍රය, ඔබ මෙම අනා-
වැකිය පළ කළ යුතුයි.[7] ‘විශ්ව-
යේ පාලකයාණන් වන යෙහෝවා
දෙවි කියන්නේ මෙයයි. “ජනයෙනි,
ඔබ සියලුදෙනා, ‘ඒ දවස අප පිට
පැමිණෙන්නේය’ කියා බියෙන් මොර-
ගසන්න.[8] 3 මන්ද යෙහෝවා දෙවි
තම විනිශ්චය ක්‍රියාත්මක කරන දවස
අත ළඟටම ඇවිත් තිබේ.[9] එය අඳුරු
වලාකුළුවලින් ගහන වූ දවසකි.[10] ඒ
දවස වෙන් කර තිබෙන්නේ ජාතීන්ව
විනිශ්චය කිරීම සඳහාය.[11] 4 ඒ
කාලයේදී ඊජිප්තුව අනිවාර්යයෙන්ම
කඩුවකින් පහර කනු ඇත.[12] ඊජිප්තු-
වේ ජනයා මැරුම් කන විටද එහි ඇති
ධනය කොල්ල කන විටද එහි අත්ති-
වාරම් කඩා දමන විටද ඉතියෝපියාව
භීතියට පත් වන්නේය.[1] 5 ඉති-
යෝපියාවේ වැසියන්ද[2] පූට්,[3] ලුද් හා
කුබ් ජාතිකයන්ද වෙනත් දේශවලින්
පැමිණි සියලු ජාතීන්ද[4] දෙවි සමඟ
ගිවිසුමෙන් බැඳී සිටින ජනයාද කඩු-
වෙන් මැරුම් කනවා ඇත.”’[5]
6 “යෙහෝවා දෙවි පවසන්නේ මෙ-
යයි. ‘ඊජිප්තුවට අනුහිත දෙන සිය-
ලුදෙනාම වැටී යන්නෝය. මහත්
ආඩම්බරයෙන් සැලකූ එහි බලයද බිඳී
යන්නේය.’[6]
“‘මිග්දෝල්[7] සිට සෙයේනේ දක්-
වාම[8] සිටින ඔවුහු කඩුවෙන් මැරුම්
කනවා ඇත.’ එසේ පවසන්නේ විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවිය. 7 ‘ඊජිප්තුව පාළුවට ගිය
දේශවලින් වට වූ පාළු දේශයක් බවට
පත් වන්නේය. එහි සියලු නුවර-
වල්ද නැති නාස්ති වී පාළුවට යන්-
නේය.[9] 8 මම ඊජිප්තුවට ගිනි තබා
එයට අනුහිත දෙන සියලුදෙනාවම
විනාශ කර දමන්නෙමි.[10] එවිට මා
යෙහෝවා දෙවි බව පිළිගන්න ජන-
යාට සිදු වෙනවා ඇත. 9 ඒ දවසේදී
තමන් කෙරෙහි විශ්වාසය තබා-
ගෙන සිටින ඉතියෝපියාවේ වැසි-
යන් වෙතට මම පණිවිඩකරුවන්ව
යවන්නෙමි. ඔවුහු නැව්වලින් පැමිණ
ඉතියෝපියාවේ ජනයාව බියගන්වනු
ඇත.[11] ඊජිප්තුවට විපත්ති පැමිණෙන
විට ඉතියෝපියාවේ වැසියෝ දරුණු
වේදනා විඳින්නෝය. ඒ දවස අනිවාර්-
යයෙන්ම පැමිණෙනු ඇත.’[12]
10 “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේද පවසයි. ‘මම
බැබිලෝනියේ රජු වන නෙබුකද්රෙ-
ෂර් අතින් ඊජිප්තුවරුන්ව නැති කර
දමන්නෙමි.[13] 11 මම ඔහුවද ඔහු-
ගේ සෙනඟවද ඊජිප්තු දේශය විනාශ
කර දැමීමට කැඳවන්නෙමි. ජාතීන්
අතරේ සිටින ඉතාම කුරිරු සෙනඟ
ලෙස නම් දරන ඔවුහු[14] ඊජිප්තුවට

**29 පරි.**
1 යෙසා 62:11
2 යෙරෙ 43:10; යෙරෙ 43:12
3 එස 32:12
4 එස 30:9; එස 30:10
5 1සාමු 2:10; ගීතා 132:17; යෙරෙ 23:5; ලූක් 1:69
6 ගීතා 51:15; එස 3:27; එස 24:27; ලූක් 21:15

**30 පරි.**
7 2පේත්‍ර 1:21
8 යෙරෙ 25:34
9 යෝවෙ 2:1; ඔබ 15; ශෙප 1:7
10 එස 32:7; යෝවෙ 2:2
11 ගීතා 110:6; යෙසා 24:21; සෙක 14:3
12 යෙසා 19:2

**2 තීරුව**
1 යෙසා 19:16; එස 32:12
2 ශෙප 2:12
3 නාහූ 3:9
4 යෙරෙ 25:24; එස 27:10
5 යෙරෙ 44:27
6 යෙසා 20:5; යෙසා 31:3; එස 30:18
7 නික් 14:2; යෙරෙ 44:1; යෙරෙ 46:14
8 එස 29:10
9 යෙරෙ 46:19; එස 29:12; එස 32:18
10 එස 30:6
11 යෙසා 20:4
12 යෙසා 55:11; එස 33:33
13 එස 29:19; එස 32:11
14 එස 28:7; හබ 1:6

එස 29:21* බයිබලයේ පාලන බලය හෝ ශක්තිය සංකේතවත් කිරීමට සතෙකුගේ අඟ භාවිත කෙරේ.

කඩුවෙන් පහර දී දේශය මළ සිරු-
රුවලින් පුරවන්නෝය.[1] **12** මමද
නයිල් ගඟේ ඇළ මාර්ග[2] වියළවා,
ඊජිප්තු දේශය දුෂ්ට සෙනඟකට විකු-
ණන්නෙමි.[3] ඒ විදේශීය සෙනඟ අතින්
දේශයද එහි සියලු සම්පත්ද විනාශ
කර දමන්නෙමි.[4] මේ දේ පවසන්නේ
යෙහෝවා දෙවි වන මමය.'[5]
**13** "විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේද පවසයි. 'මම
නොෆ් නුවරෙහි[6] ඇති පිළිකුල්සහ-
ගත රූප විනාශ කර කිසි වටිනාක-
මක් නැති සියලුම දෙවි දේවතාවන්ව
තුරන් කර දමන්නෙමි.[7] මින් මතු-
වට ඊජිප්තු දේශයෙන් අධිපතියෙක්
බිහි වන්නේ නැත. මම ඊජිප්තු දේ-
ශය පුරා මහත් බියක් ඇති වෙන්න
සලස්වන්නෙමි.[8] **14** මම පත්‍රොස්
දේශය[9] නැති නාස්ති කර, ෂො-
වන් නුවරට[10] ගිනි තබන්නෙමි. නෝ
නුවරට විරුද්ධවද මාගේ විනිශ්චය
ඉටු කරන්නෙමි.[11] **15** මම ඊජිප්තු-
වේ බලකොටුව වන සීන් නුවර පිටද
මාගේ උදහස වගුරුවා,[12] නෝ නුව-
රේ වැසියන්ව සහමුලින්ම නැති කර
දමන්නෙමි.[13] **16** මම ඊජිප්තු දේ-
ශයේ ගින්නක් අවුළුවන්නෙමි. සීන්
නුවරට දරුණු වේදනාවක් ඇති වන්-
නේය. සතුරා නෝ නුවරේ බිඳී
ගිය පවුරෙන් ඇතුල් වී එය අල්-
ලාගන්නේය. මහ දවාලේද නොෆ්
නුවරට සතුරෝ කඩාපනින්නෝය.
**17** ඕන්[14] හා පිබෙසෙත් යන නුව-
රවල තරුණයෝ කඩුවෙන් මැරුම්
කන්නෝය. එම නුවරවල වැසියන්ව
වහලුන් ලෙස ගෙන යනු ලබනවා
ඇත. **18** ඊජිප්තුව අනුන් පිට තැබූ
වියගහ මම බිඳ දමන්නෙමි.[15] එවිට
තාහ්පනේස් නුවරේ[16] දවාල අඳුරු
වන්නේය. ඇගේ ආඩම්බරයට හේතු
වූ ඇගේ බලය බිඳී යන්නේය.[17] ඇය
ගන වලාවකින් වැසී යන්නීය.[18] ඇය
අවට පිහිටි කුඩා නුවරවල වැසියන්වද
වහලුන් ලෙස ගෙන යනු ලබනවා
ඇත.[19] **19** මෙසේ, මම ඊජිප්තුවට
විරුද්ධව මාගේ විනිශ්චය ඉටු කරන්-
නෙමි.[1] එවිට මා යෙහෝවා දෙවි
බව පිළිගන්න ඔවුන්ට සිදු වෙනවා
ඇත.'"
**20** එකොළොස්වන වසරේ, පළ-
මුවන මාසයේ, සත්වන දින යෙ-
හෝවා දෙවි නැවතත් මට කතා කර
මෙසේ කීවේය. **21** "මනුෂ්‍ය පුත්‍රය,
ඊජිප්තුවේ රජු වන පාරාවෝගේ බල-
වත් හස්තය මම අනිවාර්යයෙන්ම බිඳ
දමන්නෙමි.[2] යළි කිසි දිනක කඩුවක්
අතට ගැනීමට ඔහුට නොහැකි වනු
ඇත. මන්ද ඔහුගේ තුවාල වෙළුම්
පටිවලින් බැඳ ඔහුව සුවපත් කිරීමට
කිසිවෙක් ඉදිරිපත් වන්නේ නැත."[3]
**22** "එබැවින් විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි පවසන්නේ
මෙයයි. 'මම ඊජිප්තුවේ රජු වන පාරා-
වෝට විරුද්ධව සිටිමි.[4] මන්ද මම
ඔහුගේ සවිමත් අතද දුර්වල අතද[5]
දෙකම කඩා දමා[6] ඔහුගේ අතින්
කඩුව වැටෙන්න සලස්වන්නෙමි.[7]
**23** ඊජිප්තුවරුන්ව සියලු ජාතීන් අත-
රේද දේශයන් අතරේද විසුරුවා-
හරින්නෙමි.[8] **24** මම බැබිලෝනියේ
රජුගේ දෑත් සවිමත් කර[9] මාගේ
කඩුව ඔහුගේ අතට භාර දෙන්නෙමි.[10]
නමුත් මම පාරාවෝගේ දෑත් කඩා
දමන්නෙමි. දරුණු ලෙස පහර ලබන
පාරාවෝ ඔහු ඉදිරියේ මහත් වේදනා-
වකින් කෙඳිරිගානු ඇත.[11] **25** මම
බැබිලෝනියේ රජුගේ හස්තය ශක්-
තිමත් කරන්නෙමි. එවිට පාරාවෝ-
ගේ දෑත් බෙලහීන වන්නේය. මාගේ
කඩුව බැබිලෝනියේ රජුගේ අතට
දුන් විට ඔහු එයින් ඊජිප්තු දේශයට
පහර දෙන්නේය. එවිට මා යෙහෝවා
දෙවි බව පිළිගන්න ඔවුන්ට සිදු
වනු ඇත.[12] **26** මම ඊජිප්තුවරුන්ව
ජාතීන් අතරේද විවිධ දේශයන් අත-
රේද සීසීකඩ විසුරුවාහරින්නෙමි.[13]
එවිට මා යෙහෝවා දෙවි බව පිළි-
ගන්න ඔවුන්ට සිදු වනු ඇත.'"

**31** ඉන් අනතුරුව එකොළොස්-
වන වසරේ, තුන්වන මාස-
යේ, පළමුවන දින යෙහෝවා දෙවි මට
මෙසේ පැවසීය. **2** "මනුෂ්‍ය පුත්‍රය,

**30 පරි.**
1 යෙසා 34:3; එස 29:5
2 යෙසා 19:6; එස 29:3
3 යෙසා 19:4
4 එස 31:12
5 යෙසා 46:10
6 යෙරෙ 44:1; යෙරෙ 46:14
7 යෙසා 19:1; යෙරෙ 43:12; සෙක 13:2
8 යෙසා 19:16; යෙරෙ 46:5
9 උත් 10:14; 1ලේක 1:12; යෙරෙ 44:1
10 ගණන් 13:22; ගීතා 78:12
11 යෙරෙ 46:25
12 නාහු 1:6
13 යෙරෙ 46:25
14 යෙරෙ 43:13
15 එස 30:8
16 යෙරෙ 2:16
17 යෙරෙ 46:20; එස 31:18
18 යෙසා 19:1
19 යෙරෙ 46:19

**2 තීරුව**
1 ගීතා 9:16
2 ගීතා 10:15
3 යෙරෙ 46:11
4 යෙරෙ 46:25; එස 29:3
5 2රාජා 24:7; යෙරෙ 46:2
6 ගීතා 37:17
7 යෙරෙ 46:21
8 එස 29:12
9 යෙරෙ 27:6
10 ද්වි 32:41; ගීතා 17:13; එස 32:11
11 යෙරෙ 51:52
12 නික් 7:5; ගීතා 9:16; එස 29:12; එස 29:19; එස 29:20
13 එස 29:12

ඊජිප්තුවේ රජු වන පාරාවෝට හා ඔහු-
ගේ ජනතාවට මෙසේ කියන්න.[1]
“‘ඔබ ශ්‍රේෂ්ඨය. ඔබේ ශ්‍රේෂ්ඨත්-
වය මා කුමකට සමාන කරන්නද?
**3** ඔබ ඇසිරියානු ජාතිකයෙකු මෙන්
බලවත්ය. ඔබ ලෙබනොන් දේශයේ
හොඳින් වැඩුණු දේවදාර ගසකට සමා-
නය.[2] වලාකුළුවල ගැවෙන තරම් උස්
වූ ඔබ,[3] සැමට සෙවණ දෙන ශෝභන
අතු ඇති[4] දැවැන්ත ගසකි.[5] **4** ඒ
ගස ඒ තරම් සරුසාරව හැදුණේ එයට
හොඳින් ජලය ලැබුණු නිසාය.[6] ගැඹුරු
දිය උල්පත් ඒ අවට තිබූ හෙයින් එය
අහස උසට වැඩුණේය. ඒ දිය උල්පත්-
වලින් නික්මුණු ජල දහරා ගස වටා
ගලා ගියේය. ඒ දිය පහරවල් වනයේ
සියලු ගස් දක්වාද ගලා ගියේය. **5** ඒ
නිසා මෙම ගස වනයේ අන් සියලු ගස්-
වලට වඩා උසට වැඩුණේය.[7]
“‘බොහෝ ජලයෙන් පෝෂණය
ලැබූ නිසා එහි අතු තව තවත් සරු-
සාරව වැඩුණේය.[8] **6** සියලු පක්ෂීහු
එහි අතුවල තම කැදැලි තනාගත්-
තෝය.[9] වනමෘගයෝ එහි අතු යට
තම පැටවුන් බිහි කළෝය.[10] එහි සෙ-
වණේ මහත් ජාතීහු වාසය කළෝය.
**7** එය දිග අතු ඇති විශාල ගසක්
බවට පත් විය. එහි පෙනුම ඉතා අලං-
කාර විය.[11] මන්ද එහි මුල් බො-
හෝ ජලය ඇති දිය උල්පත් දක්වා
ගැඹුරට විහිදී ගියේය. **8** මාගේ උය-
නෙහි ඇති සියලුම දේවදාර ගස්වලට
වඩා ඒ ගස ඉතා සරුසාරව වැඩු-
ණේය.[12] එහි අතු ජුනිපර් ගස්වල අතු-
වලට වඩා හාත්පසින්ම වෙනස්ය.
ඒවා ප්ලේන් ගස්වල අතුවලටත් වඩා
වෙනස්ය. මාගේ උයනෙහි වැඩුණු
කිසිදු ගසක් එයට සම කළ නොහැකි
විය.[13] **9** අතු විහිදී ගිය අලංකාර
ගසක් වූ එය සරුසාරව වැඩෙන්න
සැලැස්වූවේ මමය.[14] සැබෑ දෙවි වන
මාගේ උයන වන ඒදන්හි සියලු ගස්
එම ගසට ඊර්ෂ්‍යා කළෝය.’[15]
**10** “එබැවින් විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි මෙසේ පව-
සයි. ‘එම ගස* වලාකුළුවල ගැවෙන
තරම් උසට වැඩුණේය.[1] එහෙත් උසට
වැඩෙන්න වැඩෙන්න ඒ ගස උඩඟු
විය.[2] **11** එහෙයින් මම, ජාතීන් අත-
රේ ඒකාධිපතියෙකු ලෙස බලය පාන
කෙනෙකුගේ අතට ඒ ගස පත් කරන්-
නෙමි.[3] ඔහු නොවරදවාම එම ගසට
විරුද්ධව පියවර ගන්නේය. එම ගස
බොහෝ දුෂ්ටකම්වලට වග කිව යුතු
නිසා මම ඔහු ලවා එය විනාශ
කර දමන්නෙමි.[4] **12** ජාතීන් අතරේ
ඉතාම කුරිරු ලෙස බලය පාන විදේ-
ශීය සෙනඟක් ඇවිත් ඒ ගස කපා
දමන්නෝය. එය කඳුවල අත්හැර
දමනු ලැබේ. සියලු තැනිතලාවල එහි
කොළ අතු වැටී තිබෙනු ඇත. එහි
අතු කඩා දමා පොළොවේ සියලු දිය
පහරවල් අසල දමනු ලබන්නේය.[5]
එයින් සෙවණ ලැබූ පොළොවේ සියලු
වැසියෝ එය අත්හැර යන්නෝය.[6]
**13** කපා දමනු ලබන එහි කඳ මත
සියලු පක්ෂීන් ලැගුම් ගන්නා අතර, ඒ
මේ අත විසිරී ඇති එහි අතු අතරේ
සියලු වනමෘගයෝ සැරිසරන්නෝය.[7]
**14** මා ඒ ගසට එසේ කරන්නේ දිය
දහරාවලින් පෝෂණය ලබන අන්
කිසිදු ගසක් වලාකුළුවල ගැවෙන
තරම් උසට වැඩී උඩඟු නොවන පිණි-
සය. එහෙයින් කිසිදු ගසක් අහස උසට
වැඩෙන්නේ නැත. ඒ සියල්ල විනාශ-
යට නියම කරන්නෙමි.[8] ඒවා පො-
ළෝගැබටම යවන්නෙමි.[9] මිනී වළෙහි
සැතපී සිටින මිනිසුන්ට සිදු වූ දේම
ඒවාටද සිදු වනු ඇත.’
**15** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේ කියයි. ‘එම
ගස මිනී වළට යන දවසේදී මහත්
වැලපීමක් සිදු වීමට සලස්වන්නෙමි.[10]
මම පොළොව යටින් ගලා යන
දිය උල්පත් වසා දමන්නෙමි. ගලා
යන ජල දහරා සිඳුවන්නෙමි. මම
ලෙබනොන් දේශය ඝන අන්ධකා-
රයෙන් වසා දමන්නෙමි. වනයේ
සියලු ගස්ද මලානික වනු ඇත.

එස **31:10*** මූ.අ., “ඔහු.”

**31 පරි.**
1 යෙරෙ 46:2; එස 29:2
2 ගීතා 80:10; යෙසා 37:24; එස 17:3
3 එස 17:22
4 යෙසා 10:33
5 දානි 4:10
6 එස 17:5
7 ගීතා 37:35
8 දානි 4:12
9 ගීතා 84:3
10 එස 17:23; දානි 4:21
11 දානි 4:22; ආමො 2:9
12 උත් 2:8; උත් 13:10; ගීතා 80:10; එස 28:13
13 ගීතා 37:35
14 දානි 4:21
15 හිතෝ 28:22

**2 තීරුව**
1 මතෙ 23:12
2 යෙරෙ 50:31; එස 28:17; දානි 4:30
3 එස 30:11; හබ 1:6
4 ද්වි 18:12
5 එස 32:5
6 දානි 4:14
7 යෙසා 18:6; එස 29:5; එස 32:4
8 ගීතා 82:7
9 ගීතා 63:9; එස 32:18
10 එළි 18:9

**16** එම ගස වැටී යන විට නැඟෙන
ශබ්දයෙන් මම ජාතීන්ව සොලවන්-
නෙමි. මිනී වළට යන සියලුදෙනා
සමඟ එයද මිනී වළට යනු ඇත.[1]
ඒ දේ සිදු වන විට පොළෝගැබට
ගිය ඒදන් උයනෙහි ගස්ද[2] ලෙබ-
නොන්හි වටිනා ගස්ද දිය දහරාවලින්
පෝෂණය ලැබූ සියලු ගස්ද සැනසී-
මක් ලබනු ඇත.[3] **17** මන්ද ඒ සියලු
ගස්ද ඔහු සමඟ මිනී වළට ගොස්
ඇත.[4] ඔහුද කඩුවෙන් මැරුම් කෑ
අය සැතපී සිටින තැනටම යන්නේය.
ඔහුගේ සෙවණෙහි වාසය කළ විවිධ
ජාතීන් අතරේ සිටි ඔහුගෙන් පැව-
තෙන්නන්ද යන්නේ එතැනටමය.’[5]

**18** “‘ඔබ තරම් සරුසාරව, තේ-
ජාන්විතව වැඩුණු ගසක්[6] ඒදන් උය-
නෙහි නොවීය.[7] එහෙත් ඒදන්හි ගස්
සමඟම ඔබටත් පොළෝගැබට යන්න
සිදු වනු ඇත.[8] ඔබට සැතපෙන්න සිදු
වන්නේ අචර්මච්ඡේදිතයන් හා කඩු-
වෙන් මරන ලද අය සමඟයි. පාරා-
වෝටත් ඔහුගේ මුළු සෙනඟටත් සිදු
වන්නේ එයයි.’ එසේ පවසන්නේ විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවිය.”

**32** දොළොස්වන වසරේ, දො-
ළොස්වන මාසයේ පළමුවන
දින යෙහෝවා දෙවි මට මෙසේ පැව-
සුවේය. **2** “මනුෂ්‍ය පුත්‍රය, ඊජිප්තු-
වේ රජු වන පාරාවෝ ගැන විලාප
ගීයක් ගයන්න. ඔබ ඔහුට මෙසේ
පැවසිය යුතුයි. ‘ජාතීන් අතරේ සැරි-
සැරූ තරුණ කේශර සිංහයෙකු මෙන්
වූ ඔබව දැන් නිහඬ කර ඇත.[9]

“‘ඔබ මහ සයුරේ ජීවත් වූ සද්-
දන්තයෙකු වැනිය.[10] ඔබේ අණසක
යටතේ තිබූ ගංගා දිගේ ඔබ බිය පතු-
රුවමින් වේගයෙන් ගමන් කළෙහිය.
ඔබේ දෙපාවලින් ඔබ දිය පහරවල්
මඩ කළෙහිය. ගංගාවන් කලඹවා අප-
විත්‍ර කළෙහිය.’

**3** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි ඔබට මෙසේ පවසයි.
‘මම විශාල ජන සමූහයක් එවා ඔබ
මතට දැලක් හෙළන්නෙමි.[11] ඔවුහු
ඔබව ඒ දැලට හසු කරගෙන ගො-
ඩට ඇදගෙන එන්නෝය.[1] **4** මම
ඔබව බිම හෙළා අත්හැර යන්නෙමි.
ඔබව වනාන්තරයට ඇද දමන්නෙමි.[2]
මාගේ අණ පරිදි සියලු පක්ෂීහු ඔබ
මත වහන්නෝය. පොළොවේ සියලු
වනමෘගයෝ ඔබේ මස් කා තෘප්ති-
යට පත් වනු ඇත.[3] **5** මම ඔබේ
මාංසය කඳු මත විසුරුවා, ඔබේ මළ
කුණෙන් තැනිතලා පුරවන්නෙමි.[4]
**6** වැගිරෙන ඔබේ ලෙයින් මුළු දේශ-
යම තෙමන්නෙමි.[5] කඳුකරයද දිය
පහරවල්ද ඔබේ ලෙයින් පිරී යනු
ඇත.’

**7** “‘මම ඔබව විනාශ කර දමන
විට අහස අඳුරු කර එහි තරුවල දීප්-
තිය නැති කරන්නෙමි. වලාකුළුව-
ලින් හිරුව වසන්නෙමි. සඳෙන්ද කිසි
ආලෝකයක් නික්මෙන්න ඉඩ නො-
දෙන්නෙමි.[6] **8** මම ඔබ නිසා අහ-
සේ සියලුම ආලෝක වස්තු අඳුරු
කරන්නෙමි. ඔබේ දේශය පුරාම ඝන
අඳුර පතුරුවන්නෙමි.’ එසේ පවසන්-
නේ විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවිය.

**9** “‘ඔබ නොදන්නා දේශවල වෙ-
සෙන ජාතීන් වෙතට ඔබෙන් සම-
හරෙකුව වහල්කමට රැගෙන යනු
ඇත.[7] එය දැක බොහෝදෙනෙක්
කුපිත වන්නෝය. **10** ඔබට සිදු
වන දේ නිසා බොහෝදෙනෙක් විස්ම-
යට පත් වනු ඇත.[8] ඔවුන්ගේ රජව-
රුන් ඉදිරිපිට මාගේ කඩුව ඔසවන
විට ඔවුහු බියෙන් වෙව්ලන්නෝය.[9]
ඔබ වැටී යන දවසේදී ඔවුහු මර
බියෙන් ගැහිගැහී සිටිනු ඇත.’[10]

**11** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේද පවසයි.
‘බැබිලෝනියේ රජුගේ කඩුව ඔබට
විරුද්ධව පැමිණෙන්නේය.[11] **12** මම
ඔබට පහර දීමට ජාතීන් අතරේ සිටින
කුරිරු බලවතුන්ව එවන්නෙමි.[12] ඔවුහු
ඇවිත් කඩුවලින් පහර දී ඔබේ ජන-
යාව මරා දමා ඊජිප්තුවේ තේජස නැති
කරන්නෝය. ඔබේ ජනතාවද සහමු-
ලින්ම නැති වී යනු ඇත.[13] **13** දිය

**31 පරි.**
1 යෙසා 14:15
2 යෙසා 14:8; එස 31:9
3 එස 32:31
4 එස 32:21
5 විලා 4:20; එස 30:6; එස 32:31
6 එස 32:19
7 එස 31:9
8 1සාමු 2:7

**32 පරි.**
9 හිතෝ 28:15
10 යෙසා 27:1; යෙසා 51:9; එස 29:3
11 ගීතා 66:11

**2 තීරුව**
1 දේශ 9:12; හොෂෙ 7:12; හබ 1:17
2 එස 29:5
3 ගීතා 63:10; ගීතා 79:2; එස 29:5; එස 39:17
4 එස 31:12
5 එළි 14:20
6 යෙසා 13:10; යෝවෙ 2:31; ආමො 8:9; මතෙ 24:29; එළි 6:12
7 එස 29:12; එස 30:26
8 එස 27:35
9 ද්වි 32:41
10 නික් 15:14
11 යෙරෙ 43:10; යෙරෙ 46:26; එස 30:24
12 එස 30:11; හබ 1:6
13 එස 29:19

පහරවල් අසල ලගින ඔබේ සියලු
සතුන්වද මම විනාශ කර දමන්නෙමි.[1]
තවදුරටත් ඒ දිය පහරවල් මිනිසුන්ගේ
පාදවලින් හෝ සතුන්ගේ කුරවලින්
හෝ කැලඹී මඩ වන්නේ නැත.'[2]
**14** "'ඒ කාලයේදී මම මඩ වූ
දිය පිරිසිදු කරන්නෙමි. ගංගා තෙල්
මෙන් ගලා යැමට සලස්වන්නෙමි.'
එසේ පවසන්නේ විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවිය.
**15** "'මම ජනාකීර්ණව තිබෙන
ඊජිප්තුවේ සියලු වැසියන්ට පහර දී
එය පාළු, හිස් දේශයක් බවට පත්
කරන්නෙමි.[3] එවිට මා යෙහෝවා
දෙවි බව පිළිගන්න ඔවුන්ට සිදු වනු
ඇත.[4]
**16** "'මෙය විලාප ගීයකි. ජන-
තාව අනිවාර්යයෙන්ම එය ගයනු
ඇත. අවට ජාතීන්ගේ දූවරු පවා එම
ගායනයට හවුල් වන්නෝය. ඔවුන්
එම විලාපය නඟන්නේ ඊජිප්තුවටත්
එහි වැසියන්ටත් සිදු වූ දේ නිසාය.'[5]
එසේ පවසන්නේ විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවිය."
**17** ඉන් අනතුරුව දොළොස්වන
වසරේ, මාසයේ පහළොස්වන දින
යෙහෝවා දෙවි මට මේ දේද කීවේය.
**18** "මනුෂ්‍ය පුත්‍රය, ඊජිප්තුවේ ජන-
තාව ගැන විලාප නඟන්න.[6] මිනී
වළට යන අය සමඟ[7] ඔවුන්වද කීර්-
තිමත් ජාතීන්ගේ දූවරුන්වද පො-
ළෝගැබට හෙළනු ලබන බව ප්‍රකාශ
කරන්න.[8]
**19** "'ඔබ සිතන්නේ ඔබ අනික්
අයට වඩා ප්‍රියකරුයි කියාද?[9] එසේ-
නම් ඔබ සිටින තැනින් දැන් පහතට
බසින්න. ඔබව අචර්මච්ඡේදිතයන්
සමඟ තැන්පත් කරනු ලබන්නේය.'[10]
**20** "'කඩුවෙන් මරා දමන අය
සමඟම ඊජිප්තුවරු මිය යනු ඇත.[11]
ඊජිප්තු දේශය කඩුවෙන් විනාශ කිරී-
මට නියම කර ඇත. ජනයෙනි, ඇය-
වත් ඇගේ සියලු වැසියන්වත් දැන්
ඇදගෙන යන්න.
**21** "'බලවතුන්ගේ නායකයන්
මිනී වළේ සිට ඊජිප්තුවේ රජුටත්
ඔහුගේ මෙහෙකරුවන්ටත් හඬගසනු
ඇත.[1] ඊජිප්තුවරු අනිවාර්යයෙන්ම
ඔවුන් වෙතට බැස යන්නෝය.[2]
ඔවුහු අචර්මච්ඡේදිතයන් හා කඩු-
වෙන් මැරුම් කෑ අය සමඟ සැතපෙන්-
නෝය. **22** ඇසිරියාවත් ඇගේ මුළු
ජන පිරිසත් සැතපී සිටින්නේ එහිය.[3]
ඇසිරියාවේ රජුගේ සොහොන අසලම
ඔහුගේ යටත්වැසියන්ගේ සොහොන්
ගෙවල්ද පිහිටා ඇත. ඔවුහු සියල්-
ලෝම කඩුවෙන් මැරුම් කෑවෝය.[4]
**23** ඔවුන්ව තැන්පත් කර ඇත්තේ
පොළෝගැබේ ඉතා පාළු තැන්වලය.[5]
රජුගේ සෙනඟවද ඔහු වටා තැන්පත්
කරන ලදි. ඔවුහු සියලුදෙනාම කඩු-
වෙන් පහර කෑවෝය. ඔවුන්ට ඒ දේ
සිදු වූයේ ඔවුන් ජීවත්ව සිටි කාලයේදී
ලෝවැසියන් අතරේ භීතිය පැතිරෙවූ
නිසාය.
**24** "'ඒලාම්ද[6] ඇය වටා ඇගේ මුළු
සෙනඟද එහි තැන්පත් කර ඇත.
ඔවුහු සියල්ලෝම කඩුවෙන් මැරුම්
කෑවෝය. ඔවුහු ගෞරවනීය භූමදාන-
යක් නොලබා* පොළෝගැබට බැස
ගියෝය. ජීවත්ව සිටි කාලයේදී ලෝ-
වැසියන් අතරේ භීතිය පැතිරෙවූ
නිසා මිනී වළට යන අන් සිය-
ලුදෙනා සමඟම ඔවුහුද අවමානයට
ලක් වනු ඇත.[7] **25** ඒලාම් වෙනු-
වෙන් යහනක් පිළියෙල කර ඇත.[8]
මරා දමනු ලැබූ ඇගේ සෙනඟ මැද
එය තබා ඇත. ඔවුහු සියල්ලෝම
කඩුවෙන් මැරුම් කෑ අචර්මච්ඡේදිත-
යෝය.[9] ඔවුන්ට ඒ දේ සිදු වූයේ ඔවුන්
ලෝවැසියන් අතරේ භීතිය පැති-
රෙවූ හෙයිනි. මිනී වළට යන අන්
සියලුදෙනා සමඟම ඔවුහුද අවමාන-
යට ලක් වනු ඇත. මෙසේ, ඒලාම්
මැරුම් කෑ අය අතරේ සිටියි.
**26** "'මෙෂෙක්වද[10] තූබල්වද[11]
ඔවුන්ගේ යටත්වැසියන්වද තැන්පත්
කර ඇත්තේ එතැනය. ඔවුහු සියලු-
දෙනාවම ඔවුන්ගේ රජු වටා තැන්-
පත් කර ඇත. ඔවුහු සියලුදෙනා

**32 පරි.**
1 එස 29:8; එස 30:12
2 එස 29:11
3 ගීතා 107:34; එස 29:12
4 නික් 7:5; නික් 14:4; ගීතා 9:16; එස 30:26
5 2සාමු 1:17; 2ලේක 35:25
6 යෙරෙ 1:10
7 ගීතා 30:9
8 ගීතා 63:9; එස 31:14
9 එස 31:2
10 එස 28:10
11 එස 29:8

**2 තීරුව**
1 යෙසා 14:9
2 ගීතා 9:17; ගීතා 55:15
3 ගණන් 24:24
4 යෙසා 37:36; සෙක 10:11
5 යෙසා 14:15
6 උත් 10:22; යෙරෙ 49:34
7 එස 32:29
8 යෝබ් 17:13
9 2සාමු 1:19
10 උත් 10:2; එස 27:13; එස 38:2
11 1ලේක 1:5; එස 39:1

එස **32:24*** මූ.අ., "අචර්මච්ඡේදිතයන් ලෙස."

කඩුවෙන් පහර කෑ අචර්මච්ඡේදිත-
යෝය. ඔවුන්ට එවැනි දෙයක් අත්
වූයේ ඔවුන් ලෝවැසියන් අතරේ භීතිය
පැතිරෙවූ නිසාය. **27** අවි අමෝරා-
ගෙන මිනී වළට ගිය අචර්මච්ඡේදිත
බලවන්තයන් සමඟ ඔවුහු සදහටම
සැතපී සිටිනු ඇත.[1] ඔවුන්ගේ කඩු
ඔවුන්ගේ හිස යට තබා තිබේ. ඔවුන්
කළ වැරදි නිසා ඔවුන්ට ගෞරවනීය
භූමදානයක් නොලැබෙයි.*[2] මන්ද ඒ
බලවන්තයෝද ලෝවැසියන් අතරේ
භීතිය පැතිරෙව්වෝය.[3] **28** ඊජිප්තු-
වේ රජ්ජුරුවෙනි, අචර්මච්ඡේදිතයන්
ඉදිරියේම ඔබ මිය යනු ඇත. කඩු-
වෙන් මැරුම් කෑ අය සමඟ ඔබ සැත-
පෙනු ඇත.

**29** "'ඒදොම් දේශයද[4] ඇගේ රජ-
වරුද ඇගේ සියලු අධිපතීහුද මිනී
වළෙහි සැතපී සිටිති. බලවන්තයන්ව
සිටි ඔවුහු මැරී වැටුණෝය. කඩු-
වෙන් මැරුම් කෑ අය අතරේ ඔවුහුද
සිටිති.[5] අචර්මච්ඡේදිතයන් සමඟද[6]
මිනී වළට යන අය සමඟද ඔවුන්ව
තැන්පත් කර තිබේ.

**30** "'උතුරු දේශවල විසූ සියලුම
පාලකයන්වද සියලුම සීදොන්වරුන්-
වද[7] තැන්පත් කර ඇත්තේ එතැනය.
මහත් බලයක් හොබවමින් බොහෝ-
දෙනෙකුව බියට පත් කළත් නින්දිත
මරණයකට ගොදුරු වෙන්න ඔවුන්ට
සිදු වී ඇත. ගෞරවනීය භූමදානයක්
නොලැබූ ඔවුන්ව කඩුවෙන් මැරුම් කෑ
අය සමඟ තැන්පත් කර ඇත. මිනී
වළට යන අන් සියලුදෙනා සමඟම
ඔවුහුද අවමානයට ලක් වනු ඇත.[8]

**31** "'පාරාවෝද ඔහුගේ මුළු හමුදා
බළඇණියද කඩුවෙන් මැරුම් කන්-
නෝය. එහෙත් ඔහුට කලින් පො-
ළෝගැබට ගිය අයව දැක පාරාවෝ
තමාට අහිමි වූ අතිමහත් ජනතාව
ගැන සැනසෙනු ඇත.'[9] එසේ පවසන්-
නේ විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවිය.

**32** "'ඔහුට ඒ දේ සිදු වූයේ ඔහු
ලෝවැසියන් අතරේ භීතිය පැතිරෙවූ
නිසාය.[1] පාරාවෝවත් ඔහුගේ මුළු
සමූහයවත් අචර්මච්ඡේදිතයන් හා
කඩුවෙන් මැරුම් කෑ අය අතර තැන්-
පත් කළ යුතුය.' එසේ පවසන්නේ
විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවිය."

**33** යෙහෝවා දෙවි මට මෙසේ
කීවේය. **2** "මනුෂ්‍ය පුත්‍රය,
ගොස් ඔබේ ජනතාවට කතා
කරන්න.[2] ඔබ ඔවුන්ට පැවසිය යුත්-
තේ මෙයයි.

"'යම් දේශයකට කඩුවකින් පහර
දීමට මා තීරණය කර ඇතැයි
සිතන්න.[3] එවිට ඒ දේශයේ වැසියෝ
එකතු වී මිනිසෙකුව තෝරාගෙන
ඔහුව මුරකරුවෙකු ලෙස පත් කරති.[4]
**3** දේශයට කඩු ප්‍රහාරය එල්ල වන
බවට ලකුණු දැක ජනතාවට ඒ ගැන
අනතුරු ඇඟවීමට ඔහු හොරණෑ-
වක් පිඹියි.[5] **4** ඒ හොරණෑවේ ශබ්-
දය ඇසුණද අනතුරු ඇඟවීමට කන්
නොදුන් නිසා[6] යමෙක් ඒ කඩු පහරට
හසු වී මිය ගියේ නම් ඔහුගේ මර-
ණයට වග කිව යුත්තේ ඔහුමය.[7]
**5** එසේ වන්නේ හොරණෑවේ ශබ්දය
ඔහුට ඇසුණද ඔහු එයට කන් නොදුන්
නිසාය. ඔහුම ඔහුගේ මරණයට වග
කිව යුතුය. එහෙත් ඒ අනතුරු ඇඟවී-
මට ඔහු කන් දුන්නා නම් ඔහුගේ ජීවි-
තය බේරාගැනීමට ඔහුට හැකි වනු
ඇත.[8]

**6** "'එහෙත් ප්‍රහාරයක් එල්ල වන
බව දැක දැකත් මුරකරු හොර-
ණෑව පිඹින්නේ නැත්නම්,[9] ජනතාවට
ඒ අනතුර ගැන කිසිම හෝඩුවා-
වක් ලැබෙන්නේ නැත. එවිට තමා
කළ වැරදි නිසා දුෂ්ටයා මැරුම් කන්-
නේය.[10] නමුත් ඔහුගේ ජීවිත වෙනු-
වෙන් ඒ මුරකරු මට වන්දි ගෙවිය
යුතුය.'[11]

**7** "මනුෂ්‍ය පුත්‍රය, මේ දේ අසන්න.
මම ඔබව ඊශ්‍රායෙල් සෙනඟ වෙනු-
වෙන් මුරකරුවෙකු ලෙස පත්

**32 පරි.**
**1** යෝබ් 3:14, යෙසා 14:18
**2** ගීතා 92:9, යොහ 8:24
**3** එස 32:23
**4** උත් 25:30, උත් 36:1, යෙසා 34:5, එස 25:12, ආමෝ 1:11, ඔබ 1, මලා 1:4
**5** යෙරෙ 25:31
**6** යෙරෙ 9:26
**7** උත් 10:15, එස 28:21
**8** එස 32:24
**9** එස 31:16

**2 තීරුව**
**1** එස 32:27

**33 පරි.**
**2** එස 3:11
**3** ලෙවී 26:25, යෙරෙ 25:31, එස 6:3, එස 14:17, එස 21:9
**4** 2සාමු 18:24, 2රාජා 9:17, යෙසා 21:8, යෙරෙ 51:12, හොෂෙ 9:8
**5** නෙහෙ 4:18, යෙසා 58:1, යෙරෙ 4:5, හොෂෙ 8:1
**6** 2ලේක 25:16, හිතෝ 29:1, යෙරෙ 6:17, සෙක 1:4
**7** ලෙවී 20:9, 1රාජා 2:37, එස 3:19, ක්‍රියා 18:6, ක්‍රියා 20:26
**8** 2රාජා 6:10, හෙබ්‍රෙ 11:7
**9** යෙසා 56:10
**10** එස 18:24
**11** උත් 42:22, එස 3:18

එස **32:27*** මූ.අ., "ඔවුන්ගේ ඇටකටු පිට දඬුවම් පැමිණෙයි."

කළෙමි.[1] ඔබ මා කියන දේ අසා
මා දෙන අනතුරු ඇඟවීම ඔවුන්ට
දැන්විය යුතුයි.[2] **8** 'ඔබ අනිවාර්ය-
යෙන්ම මිය යනවා' කියා මා දුෂ්ට-
යන්ට පවසන විට[3] ඔබ ඔවුන් කරන
දුෂ්ට ක්‍රියා ගැන අනතුරු ඇඟවිය
යුතුයි.[4] ඔබ එසේ නොකළොත් ඔවුන්
කරන දුෂ්ටකම් නිසා ඔවුහු මිය යන්-
නෝය.[5] නමුත් ඔවුන්ගේ ජීවිත වෙනු-
වෙන් ඔබ මට වන්දි ගෙවිය යුතුයි.
**9** තමන් කරන දුෂ්ටකම් අත්හැර
දමන්න කියා ඔබ දුෂ්ටයන්ට අනතුරු
ඇඟෙවූ පසුත් ඔවුන් තමන් කරන
වැරදි දේවලින් ඉවත් වූයේ නැත්නම්
ඔවුන් කළ දුෂ්ටකම් නිසා ඔවුහු මිය
යන්නෝය.[6] නමුත් ඔබ එයට වග කිව
යුතු නැත. ඔබේ ජීවිතය ඔබ බේරා-
ගන්නවා ඇත.[7]

**10** "මනුෂ්‍ය පුත්‍රය, මේ දේ
අසන්න. ඔබ ගොස් ඊශ්‍රායෙල් සෙ-
නඟට මේ දේ කියන්න. 'ජනයෙනි,
ඔබ මෙසේ පවසා ඇත. "අපි කැර-
ලිගැසුවෙමු. පව් කළෙමු. අප කළ
වැරදි අපේ සිතට බොහෝ සෙයින්
වද දෙයි. ඒ නිසා දිනෙන් දින අපි
වැහැරී යන්නෙමු.[8] අප දිගටම ජීවත්
වෙයි කියා කෙසේ නම් සිතන්නද?" '[9]
**11** ඔවුන්ට මෙසේ පවසන්න. 'විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවි මෙසේ කියයි. "ජීවමාන දෙවි වන
මම සහතිකවම මෙසේ පවසන්නෙමි.
දුෂ්ටයෙකු වැරදි මාර්ගයෙන් හැරී[10]
දිගටම ජීවත් වෙනවාට මිස[11] ඔහු
මිය යනවාට මම කිසිසේත් කැමති
නැත.[12] අනේ ඊශ්‍රායෙල් ජනයෙනි,
ඔබ කරන නපුරු දේවල් අත්හැර
දමන්න.[13] ඔබ නිකරුණේ මිය යා
යුත්තේ මන්ද?" '[14]

**12** "මනුෂ්‍ය පුත්‍රය, ඔබේ ජනතා-
වට මෙසේ පවසන්න. 'ධර්මිෂ්ඨයෙක්
තම ධර්මිෂ්ඨ ප්‍රමිති අත්හැර කැරලිග-
සනවා නම් අතීතයේ ධර්මිෂ්ඨ ජීවිත-
යක් ගත කළ පමණින් ඔහුට තම
ජීවිතය ගලවාගත නොහැක.[15] අනික්
අතට දුෂ්ටයෙක් තම දුෂ්ට ක්‍රියා අත්-
හැර යහමඟට එනවා නම් අතීතයේ
කළ දුෂ්ටකම් නිසා ඔහුට මරණය අත්
වන්නේ නැත.[1] ධර්මිෂ්ඨයෙකු වුවත්
පව් කරනවා නම් ජීවත් වීමේ ප්‍රස්-
තාව ඔහුටද අහිමි වෙයි.[2] **13** "ඔබ
සැබවින්ම ජීවත් වන්නෙහිය" කියා
මම ධර්මිෂ්ඨ කෙනෙකුට පැවසූ පසු
ඔහු තම ධර්මිෂ්ඨකම ගැන ආඩම්බර
වෙමින් අයුක්තිසහගත ලෙස ක්‍රියා
කරන්න පටන්ගන්නවා නම්[3] ඔහු
අතීතයේ කළ එක ධර්මිෂ්ඨ ක්‍රියාවක්-
වත් සිහි කරනු ලබන්නේ නැත. ඔහු
අයුක්තිසහගත ලෙස ක්‍රියා කළ නිසා
මිය යනු ඇත.[4]

**14** " 'මා දුෂ්ටයෙකුට, "ඔබ සැබ-
වින්ම මිය යන්නෙහිය" කියා පැවසූ
පසු[5] ඔහු තමාගේ පව්කාර ක්‍රියා අත්-
හැර[6] යුක්තිගරුක, ධර්මිෂ්ඨ ජීවිත-
යක් ගත කරන්න පටන්ගන්නවා නම්[7]
**15** ඔහු මිය යන්නේ නැත. ඔහු ණය-
කට ඇපයක් ලෙස ගත් දේ ආපසු
භාර දෙන නිසාත්[8] සොරකම් කළ
දේ වෙනුවෙන් වන්දි ගෙවන නිසාත්[9]
කිසිවෙකුට අසාධාරණයක් නොකර
ප්‍රතිපත්තිගරුක ජීවිතයක් ගත කරන
නිසාත්[10] ඔහු විනාශ නොවී දිගටම
ජීවත් වනු ඇත.[11] **16** මම අතීත-
යේ ඔහු අතින් සිදු වූ වැරදි දේවල්
නැවත මතක් කර ඔහුට විරුද්ධව
පියවර ගන්නේ නැත.[12] ඔහු දැන්
යුක්තිගරුක, ධර්මිෂ්ඨ ජීවිතයක් ගත
කරන නිසා ඔහු සැබවින්ම ජීවත් වනු
ඇත.'[13]

**17** " 'යෙහෝවා දෙවි ක්‍රියා කරන
ආකාරය සාධාරණ නැහැ' කියා ඔබේ
ජනතාව පවසා ඇත.[14] එහෙත් අසා-
ධාරණ ලෙස ක්‍රියා කරන්නේ ඔවුන්ය.

**18** "ධර්මිෂ්ඨ කෙනෙක් තමන් ගත
කරන ධර්මිෂ්ඨ ජීවිතය අත්හැර
අයුක්තිසහගත දේවල් කරන්න
පටන්ගන්නවා නම් ඔහු කරන ඒ
අයුක්තිසහගත දේවල් නිසා ඔහු
මිය යා යුතුය.[15] **19** අනික් අතට
දුෂ්ටයෙක් තමාගේ දුෂ්ට ක්‍රියාව-
ලින් ඉවත් වී යුක්තිගරුක, ධර්මිෂ්ඨ
ජීවිතයක් ගත කරන්න පටන්ගන්-
නවා නම් එතැන් සිට ගත කරන

**33 පරි.**
**1** යෙසා 62:6; එස 3:17
**2** 2ලේක 19:10; යෙරෙ 1:17
**3** යෙසා 3:11; එස 18:4
**4** හිතෝ 24:12; එස 13:9
**5** ගණන් 27:3; හිතෝ 11:21; දේශ 8:13
**6** හිතෝ 15:10
**7** එස 3:19; ක්‍රියා 18:6
**8** ලෙවී 26:39; යෙසා 64:6; එස 24:23
**9** එස 37:11
**10** යෙසා 31:6
**11** ගීතා 130:7
**12** 2සාමු 14:14; එස 18:23; ලූක් 15:10; 1තිමෝ 2:4
**13** හිතෝ 1:23; යෙසා 55:7; යෙරෙ 3:22; යෙරෙ 25:5; එස 14:6; හොෂෙ 14:1; ක්‍රියා 3:19
**14** එස 18:31; 2පේත෯ 3:9
**15** එස 3:20; එස 18:24

**2 තීරුව**
**1** 1රාජා 8:48; 2ලේක 7:14; එස 18:21
**2** එස 18:26
**3** එස 3:20; එස 18:24; 2පේත෯ 2:20
**4** යෙරෙ 18:10; එස 18:4
**5** යෙසා 3:11; එස 3:18; ලූක් 13:3
**6** හිතෝ 28:13; යෙසා 55:7; ක්‍රියා 3:19
**7** එස 18:21; මීකා 6:8
**8** නික් 22:26; එස 18:7
**9** ලෙවී 6:2; එස 22:29
**10** ලෙවී 18:5; ලෙවී 19:15
**11** එස 18:27
**12** යෙසා 1:18
**13** එස 20:11
**14** යෝබ් 34:10; යෝබ් 40:8; ගීතා 92:15; රෝම 3:4
**15** හෙබ්‍රෙ 10:38; 2පේත෯ 2:20

ධර්මිෂ්ඨ ජීවිතය නිසා ඔහු දිගටම ජීවත් වන්නේය.[1]

**20** “ජනයෙනි, ‘යෙහෝවා දෙවි ක්‍රියා කරන ආකාරය සාධාරණ නැහැ’ කියා ඔබ පවසා ඇත.[2] එහෙත් ඊශ්‍රායෙල් ජනයෙනි, මේ දේ අසන්න. මා ඔබව විනිශ්චය කරන්නේ ඔබ එක් එක් කෙනා ගත කරන ජීවිතයට අනුවයි.”[3]

**21** යම් කලක් ගත වූ පසු එනම්, අප වහල්භාවයේ සිටි දොළොස්වන වසරේ දහවන මාසයේ පස්වන දිනයේදී, යෙරුසලමෙන් පලා ආ කෙනෙක් මා ළඟට ඇවිත් මෙසේ පැවසීය.[4] “සතුරන් ඇවිත් අපේ නුවර අල්ලාගෙන!”[5]

**22** ඒ තැනැත්තා මා ළඟට පැමිණියේ උදෑසනින්මය. ඊට කලින් දවසේ සවස් වරුවේ යෙහෝවා දෙවිගේ බලය මා තුළ ක්‍රියාත්මක විය.[6] එහෙයින් එතෙක් කතා කිරීමට නොහැකිව සිටි මට කතා කිරීමේ හැකියාව ලැබිණ.[7]

**23** යෙහෝවා දෙවි මට මෙසේ පැවසීය. **24** “මනුෂ්‍ය පුත්‍රය, ඊශ්‍රායෙල් දේශයේ පාළුවට ගිය තැන්වල වෙසෙන අය[8] ඊශ්‍රායෙල් දේශය ගැන මෙලෙස කතා වෙති. ‘ආබ්‍රහම් මේ දේශය යටත් කරගත්තේ තනිවමයි.[9] එහෙත් අපට විශාල පිරිසක් ඉන්නවා. ඉතින් අපට උරුම වූ මේ දේශය අපට අහිමි වෙන්නේ කොහොමද?’[10]

**25** “එබැවින් ඔවුන්ට මෙසේ පවසන්න. ‘විශ්වයේ පාලකයාණන් වන යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි. “ඔබ ලේ සමඟ මස් කන්නහුය.[11] ඔබ පිහිට පතන්නේ ඔබේ පිළිකුල්සහගත රූපවලිනි.[12] ඔබ මිනී මරන්නහුය.[13] එබැවින් මා ඔබට මේ දේශයේ දිගටම ජීවත් වෙන්න ඉඩ දෙන්නේ කොහොමද?[14] **26** ඔබ විශ්වාසය තැබුවේ ඔබේම යුධ ශක්තිය කෙරෙහිය.[15] ඔබ කළේම පිළිකුල්සහගත දේවල්ය.[16] ඔබේ මිතුරාගේ බිරිඳ සමඟ ඔබ අනාචාරයේ යෙදී ඇත.[1] එබැවින් ඔබට මේ දේශයේ දිගටම ජීවත් වෙන්න ඉඩහරින්නේ කෙසේද?”’[2]

**27** “ඔබ ඔවුන්ට මෙසේ කිව යුතුයි. ‘විශ්වයේ පාලකයාණන් වන යෙහෝවා දෙවි මෙසේ පවසයි. “ජීවමාන දෙවි වන මා පවසන මේ දේ අනිවාර්යයෙන්ම සිදු වන්නේය. පාළුවට ගිය තැන්වල ජීවත් වන ඔවුහු අනිවාර්යයෙන්ම කඩුවෙන් මැරුම් කන්නෝය.[3] කෙත්වතුවල සිටින අයව මම වනමෘගයන්ට ආහාර පිණිස දෙන්නෙමි.[4] ආරක්ෂිත තැන්වලත් ගුහාවලත් සැඟවී සිටින අය[5] වසංගතයෙන් මිය යන්නෝය. **28** මම මේ දේශය නැති නාස්ති කර පාළු ඉඩමක් බවට පත් කරන්නෙමි.[6] ඔබේ මහත් ආඩම්බරයට හේතු වූ ඔබේ බලමහිමයද නැති වී යන්නේය.[7] ඊශ්‍රායෙල් දේශයට අයත් මුළු කඳුකරයම කිසිවෙකු පය නොතබන පාළු ප්‍රදේශයක් බවට පත් කරන්නෙමි.[8] **29** ඔවුන් කර ඇති පිළිකුල්සහගත දේවල් නිසා[9] මම මේ දේශය පාළු ස්ථානයක් බවට පත් කරන්නෙමි.[10] එවිට මා යෙහෝවා දෙවි බව පිළිගන්න ඔවුන්ට සිදු වනු ඇත.”’

**30** “මනුෂ්‍ය පුත්‍රය, ඔබ සමඟ සිටින ජනතාව පවුරු අසලත් තමන්ගේ නිවෙස්වල දොරකඩ අසලත් එකිනෙකා සමඟ ඔබ ගැන කතා කරමින් සිටිති.[11] ඔවුහු එකිනෙකාට කතා කරමින්, ‘එන්න, යෙහෝවා දෙවිගේ පණිවිඩයට සවන් දෙමු’ කියා පවසති.[12] **31** ඔවුහු මගේ වචනවලට ඇහුම්කන් දෙන සෙනඟක් මෙන්, සුපුරුදු පරිදි ඔබ ළඟට ඇවිත් ඔබ ඉදිරියේ හිඳගෙන[13] ඔබ පවසන දේට සවන් දෙනු ඇත. එහෙත් ඔවුහු කිසිසේත් ඒවා පිළිපදින්නේ නැත.[14] මන්ද ඔවුහු අයුතු ලෙස ලාභ ලැබීමට වෙහෙසෙති. ඔවුන්ගේ මුවින්

**33 පරි.**
1 එස 18:27
2 හිතෝ 19:3; යෙසා 55:8; යෙසා 55:9; එස 18:25; එස 18:29
3 උත් 18:25; ගීතා 62:12; හිතෝ 24:12; රෝම 2:6
4 එස 24:26
5 2රාජා 25:4; 2ලේක 36:17; යෙරෙ 39:2
6 එස 3:22
7 එස 3:26
8 යෙරෙ 39:10; එස 36:4
9 උත් 12:7; යෙසා 51:2; ක්‍රියා 7:5
10 මීකා 3:11; මතෙ 3:9; යොහ 8:39
11 උත් 9:4; ලෙවී 17:12; ද්වි 12:16; 1සාමු 14:32; ක්‍රියා 15:29
12 එස 18:6
13 එස 22:6
14 යෙරෙ 7:10; යෙරෙ 44:22
15 මීකා 2:1
16 යෙරෙ 17:5; ශෙප 3:3

**2 තීරුව**
1 යෙරෙ 5:8; හෙබ්‍රෙ 13:4
2 ද්වි 4:26; යොෂු 23:15
3 යෙරෙ 15:2; යෙරෙ 42:22; එස 5:12
4 එස 39:4; එළි 19:18
5 විනි 6:2; 1සාමු 13:6
6 2ලේක 36:21; යෙසා 6:11; යෙරෙ 9:11; යෙරෙ 44:2; එස 36:34; මීකා 7:13
7 එස 24:21
8 එස 6:3
9 ගීතා 9:16; යෙරෙ 9:11; යෙරෙ 25:11; යෙරෙ 32:43
10 2රාජා 17:9; 2ලේක 36:14
11 යෙරෙ 11:19; යෙරෙ 18:18
12 මතෙ 15:8
13 එස 8:1; එස 20:1

14 යෙසා 29:13; යෙරෙ 6:16; යෙරෙ 44:17; මතෙ 7:21; ලූක් 6:49.

පිට වන්නේ අශික්ෂිත දේවල්ය.[1]
**32** බලන්න, ඔවුන් ඔබව සලකන්-
නේ බොළඳ පෙම් ගී ගයන ගායක-
යෙකු ලෙසය. මියුරු කටහඬකින් ගී
ගයන දක්ෂ වීණා වාදකයෙකු ලෙ-
සය.[2] ඔවුහු අනිවාර්යයෙන්ම ඔබට
සවන් දෙනු ඇත. එහෙත් ඔබ කියන
දේට එකඟව ක්‍රියා කරන්නේ නැත.[3]
**33** මේ සියල්ල නිසැකවම ඉටු වන්-
නේය.[4] ඒවා ඉටු වන විට ඔවුන් අතර
අනාගතවක්තෘ කෙනෙකු සිටින බව
පිළිගන්න ඔවුන්ට සිදු වනු ඇත.”[5]

**34** යෙහෝවා දෙවි මට මෙසේ
කීවේය. **2** “මනුෂ්‍ය පුත්‍රය,
දැන් ඔබ ඊශ්‍රායෙල් දේශයේ සිටින
එඬේරුන්ට* විරුද්ධව අනාවැකි
කියන්න. ඔබ ඔවුන්ට මෙසේ පැව-
සිය යුතුය. ‘විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි පවසා ඇත්-
තේ මෙයයි. “එඬේරුන් සැලකිලි-
මත් විය යුත්තේ ඔවුන්ගේ බැටළු
රැළ පෝෂණය කිරීම ගැන නො-
වේද?[6] එහෙත් ඊශ්‍රායෙල්හි එඬේරු
රැළ ගැන නොතකා තමන්වම පෝෂ-
ණය කරගන්නෝය.[7] ඒ නිසා මම
ඔවුන් පිටට මහත් විපතක් පමුණු-
වන්නෙමි.[8] **3** එඬේරුනි, ඔබ කිසි-
සේත් ඔබේ රැළ පෝෂණය කරන්නේ
නැත. ඔබ තර සතුන්ව[9] මරා[10]
උන්ගේ හොඳම කොටස්* කෑමට
ගන්නහුය.[11] උන්ගේ වටිනා ලොම්-
වලින් ඔබ ඇඳුම් සාදාගන්නහුය.
**4** ඔබ ලෙඩ වූ සතුන්ට සාත්තු කළේ
නැත. බෙලහීන වූ සතුන්ව ශක්තිමත්
කළේ නැත.[12] උන්ගේ තුවාලවලට
බෙහෙත් බැන්දේද නැත. අයාලේ ගිය
සතාව නැවත රැළට ගෙනෙන්න ඔබ
කිසි උත්සාහයක් ගත්තේවත් නැති
වූ සතාව සොයා ගියේවත් නැත.[13]
ඒ වෙනුවට ඔබ කළේ කුමක්ද?
උන්ට බොහෝ හිංසා පීඩා කර උන්ව
කුරිරු ලෙස යටත් කරගත්තහුය.[14]
**5** එඬේරෙකුගේ හව් හරණක් නො-

**33 පරි.**
1 මතෙ 6:24
2 මාක් 6:20
3 යාකො 1:22
4 යොෂු 23:14 යෙසා 55:11
5 2රාජා 5:8 එස 2:5

**34 පරි.**
6 යෙසා 40:11 යොහ 21:15
7 යූද් 12
8 යෙරෙ 23:1 මීකා 3:1 මීකා 3:11 ශෙප 3:3 සෙක 11:17 මතෙ 23:13
9 එස 34:20
10 2රාජා 21:16 යෙරෙ 22:17 මීකා 3:3 සෙක 11:5
11 යෙසා 56:11
12 සෙක 11:16 මතෙ 9:36
13 මතෙ 10:6 ලූක් 15:4
14 යෙරෙ 22:13

**2 තීරුව**
1 1රාජා 22:17 යෙරෙ 23:2 යෙරෙ 50:6 මතෙ 9:36 මාක් 6:34
2 යෙසා 56:9 යෙරෙ 23:1
3 ගීතා 23:1
4 එස 7:16
5 යූද් 12
6 එස 13:8 සෙක 10:3
7 යෙරෙ 52:24 යෙරෙ 52:27
8 1සාමු 2:29
9 ගීතා 72:12
10 ගීතා 80:1 යෙසා 56:8

ලැබූ උන් ඒ මේ අත විසිර ගියෝය.[1]
විසිර ගිය ඒ බැටළුවෝ වනමෘගයන්ට
ගොදුරු වී තව තවත් අසරණ වූහ.[2]
**6** මාගේ බැටළුවෝ[3] සියලු කඳු මතද
හෙල් මතද මංමුළා වී ගියෝය.[4] උන්
පොළොවේ සිසිකඩ විසිර ගියෝය.
එහෙත් උන්ව සොයාගැනීමට කිසි-
වෙක් උත්සාහ කළේ නැත.
**7** “ ‘“එබැවින් එඬේරුනි, යෙ-
හෝවා දෙවි පවසන මේ දේට සවන්
දෙන්න. **8** ‘විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි මෙසේ පව-
සයි. “ජීවමාන දෙවි වන මා සහතික-
වම පවසන මේ දේට සවන් දෙන්න.
මාගේ බැටළුවන්ව රැකබලා ගැනීමට
කිසි එඬේරෙක් සිටියේ නැත. එහෙ-
යින් වනමෘගයෝ ඇවිත් මාගේ බැට-
ළුවන්ව ඩැහැගෙන ගොස් උන්ව කා
දැමුවෝය. එහෙත් මාගේ බැටළුවන්
සොයාගැනීමට එඬේරුන් කිසිම උත්-
සාහයක් ගත්තේ නැත. ඔවුහු තමන්-
වම පෝෂණය කරගන්නවා මිසක[5]
මාගේ බැටළුවන්ව පෝෂණය කරන්-
නේ නැත.” ’ **9** එඬේරුනි, දැන් යෙ-
හෝවා දෙවි ඔබට පවසන දේට සවන්
දෙන්න. **10** විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි පවසන්නේ මෙ-
යයි. ‘මම ඒ එඬේරුන්ට විරුද්ධව
අනිවාර්යයෙන්ම පියවර ගන්නෙමි.[6]
මාගේ බැටළුවන්ව පෝෂණය කිරීමට
දුන් වගකීමෙන් ඔවුන්ව පහ කර[7]
ඔවුන් අතින් මාගේ බැටළුවන්ව ගන්-
නෙමි. ඔවුන්ට තවදුරටත් තමන්වම
පෝෂණය කරගන්න හැකි වන්නේ
නැත.[8] මාගේ බැටළුවන්ගෙන් ඔවුන්
තවදුරටත් පෝෂණය නොවන පිණිස
ඔවුන්ගේ කටින් උන්ව ගලවාගන්-
නෙමි.’ ”[9]
**11** “ ‘විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේ පවසයි.
“මාගේ බැටළුවන් වෙනුවෙන් මම ඉදි-
රිපත් වන්නෙමි. මම උන්ව සොයා
ගොස් මා වෙතට ගෙනැවිත් හොඳින්
රැකබලා ගන්නෙමි.[10] **12** සිසිකඩ
විසිර සිටින බැටළුවන්ව සොයා ගොස්
උන්ව ආදරයෙන් රැගෙන ඇවිත්

එස **34:2*** එනම්, නායකයන්ට. **3*** මූ.අ., “තෙල.”

පෝෂණය කරන එඬේරෙකු මෙන්,[1]
මමද මාගේ බැටළුවන්ව මා වෙ-
නට ගෙනැවිත් රැකබලා ගන්නෙමි.[2]
ගන වලාවන්ගෙන් වැසුණු ඒ අඳුරු
කාලයේදී[3] ඒ මේ අත විසිර ගිය
මාගේ බැටළුවන්ව නැවත සොයා මා
වෙතට රැගෙන එන්නෙමි. **13** විවිධ
ජාතීන් හා දේශයන් අතරේ විසිර
සිටින උන්ව මම නැවතත් තමන්-
ගේම දේශයට[4] ගෙනෙන්නෙමි.[5] ඉන්-
පසු මම උන්ව ඊශ්‍රායෙල් දේශයේ
කඳුවලද දිය පහරවල් අසලද වාස-
යට සුදුසු සියලුම ස්ථානවලද පෝ-
ෂණය කරන්නෙමි.[6] **14** මම උන්ව
ඉතා සරුසාර තණබිම්වලට ගෙ-
නැවිත් පෝෂණය කරන්නෙමි. උන්
ඊශ්‍රායෙල් දේශයේ උස් කඳුවල වාසය
කරනු ඇත.[7] සුරක්ෂිත වාසස්ථාන-
වල සැතපෙනු ඇත.[8] ඊශ්‍රායෙල් දේශ-
යේ කඳුවල වැවුණු ඉතා සරුසාර
තණබිම්වලින් මම උන්ව පෝෂණය
කරන්නෙමි.”

**15** “‘“මම නියත වශයෙන්ම
මාගේ බැටළුවන්ව පෝෂණය කර[9]
උන්ට සුව සේ සැතපෙන්න සලස්වන්-
නෙමි.”[10] එසේ පවසන්නේ විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවිය.
**16** “මම නැති වූ බැටළුවන්ව සොයා
යන්නෙමි.[11] අයාලේ ගිය බැටළුවන්ව
නැවත රැගෙන එන්නෙමි. උන්ගේ
තුවාලවලට බෙහෙත් බැඳ සාත්තු
කරන්නෙමි. ලෙඩ වූ බැටළුවන්ව සුව
කර ශක්තිමත් කරන්නෙමි. එහෙත්
හොඳින් කා බී තරව සිටින[12] ශක්-
තිමත් බැටළුවන්ව මම විනාශ කර
දමන්නෙමි. උන් මාගේ විනිශ්චයට
මුහුණ දිය යුතුයි.”[13]

**17** “‘මාගේ බැටළුවෙනි, විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවි
පවසන දේට ඇහුම්කන් දෙන්න. “මම
බැටළුවන්ව විනිශ්චය කරන්නෙමි.
මම බැටළුවන් හා එළුවන් අතරේද
විනිශ්චයක් කරන්නෙමි.[14] **18** ඔබ
හොඳම තණබිම්වලින් කනවා විත-
රක් නොව,[15] ඉතුරු හොඳ තණබිම්
සියල්ල පාගා දමා නාස්ති කරන්-
නහුය. ඔබ පිරිසිදු වතුර බී සෑහී-
මට පත් වෙනවා වෙනුවට ඉතුරු
වතුරට පය දමා මඩ කරන්නහුය.
**19** මාගේ බැටළුවන් පෝෂණය විය
යුත්තේ ඔබ පයින් පාගා දැමූ තණ-
බිම්වලින්ද? උන් පිපාසය සන්සිඳුවා
ගත යුත්තේ ඔබ මඩ කළ වතු-
රෙන්ද?”

**20** “‘එබැවින් විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි ඔවුන්ට
මෙසේ පවසන්නේය. “මාගේ බැටළු-
වන් වෙනුවෙන් මම ඉදිරිපත්
වන්නෙමි. මම තර වූ බැටළු-
වන්ව විනිශ්චය කර කෙට්ටු
බැටළුවන්ට සාධාරණය ඉටු කරන්-
නෙමි. **21** තර වූ බැටළුවෙනි, ඔබ
ලෙඩ වූ බෙලහීන සතුන්ට ඔබේ
අංවලින් ඇන ඇලපතෙන්ද උරහි-
සෙන්ද උන්ව තල්ලු කරමින් රැළෙන්
පන්නා දැමුවහුය.[1] **22** එහෙත් මම
අනිවාර්යයෙන්ම මාගේ බැටළුවන්ව
ගලවාගන්නෙමි. උන්ගෙන් තවදුර-
ටත් ඔබ කොල්ල කන්නේ නැත.[2]
මම මාගේ බැටළුවන්ව විනිශ්චය
කර සාධාරණය ඉටු කරන්නෙමි.
**23** මම උන් වෙනුවෙන් එක එඬේරෙ-
කුව පත් කරන්නෙමි.[3] මාගේ සේවක
දාවිත්*[4] උන්ගේ එඬේරා වන්නේය.[5]
ඔහු උන්ව පෝෂණය කර රැකබලා
ගනු ඇත. **24** යෙහෝවා දෙවි වන
මම ඔවුන්ගේ දෙවි වන්නෙමි.[6] මාගේ
සේවක දාවිත් ඔවුන් අතරේ අධිපති-
යෙකු වන්නේය.[7] මෙසේ පවසන්නේ
යෙහෝවා දෙවි වන මමය.

**25** “‘“මම ඔවුන් සමඟ සමාදාන-
යේ ගිවිසුමක් ඇති කරගන්නෙමි.[8]
දේශයේ සැරිසරන දරුණු වන-
මෘගයන්ව පන්නා දමන්නෙමි.[9] එවිට
මාගේ බැටළුවන්ට වනයේ සුරක්-
ෂිතව සැරිසරන්නත් කැලෑවල සුව
සේ සැතපෙන්නත් හැකි වනු ඇත.[10]

**34 පරි.**
**1** 1සාමු 17:35
**2** යෙසා 40:11
**3** එස 30:3
යෝවෙ 2:2
ශෙප 1:15
**4** ගීතා 106:47
යෙසා 65:9
යෙරෙ 23:3
යෙරෙ 30:3
එස 11:17
එස 28:25
ආමො 9:14
**5** 1පේතෘ 2:25
**6** මීකා 7:14
**7** ගීතා 23:2
යෙසා 25:6
යෙසා 30:23
යෙරෙ 31:12
**8** යෙරෙ 33:12
**9** ගීතා 23:1
යෙරෙ 3:15
**10** ශෙප 3:13
**11** මීකා 4:6
මතෙ 15:24
ලූක් 15:4
**12** ද්වි 32:15
යෙසා 10:16
ආමො 4:1
**13** යෙසා 49:26
යෙරෙ 9:15
**14** යෙසා 34:6
යෙරෙ 51:40
සෙක 10:3
මතෙ 25:33
**15** මීකා 2:2

**2 තීරුව**
**1** සෙක 11:5
සෙක 11:16
ලූක් 13:14
**2** ගීතා 72:12
යෙසා 40:11
යෙරෙ 23:3
සෙක 11:7
**3** දේශ 12:11
යෙරෙ 23:4
යොහ 10:11
හෙබ්‍රෙ 13:20
1පේතෘ 5:4
එළි 7:17
**4** යෙසා 11:1
යෙසා 55:3
යෙරෙ 30:9
**5** එස 37:24
හොෂෙ 3:5
**6** උත් 17:7
නික් 29:45
යෙරෙ 31:1
සෙක 13:9
**7** ගීතා 2:6
යෙසා 9:6
යෙරෙ 23:5
මීකා 5:2
ලූක් 1:32
ක්‍රියා 5:31
**8** යෙසා 55:3
එස 37:26

---

**9** ලෙවි 26:6; යෙසා 11:6; යෙසා 35:9; යෙසා 65:25; හොෂෙ 2:18; **10** ගීතා 4:8; යෙරෙ 23:6; යෙරෙ 33:16.

---

එස **34:23*** එනම්, දාවිත්ගෙන් පැවතෙන තැනැත්තෙකි.

**26** මම උන්ටද මාගේ කන්ද අවට
මුළු ප්‍රදේශයටද ආශීර්වාද කරන්-
නෙමි.*[1] මම දේශයට නියම කලට
වර්ෂාව දෙන්නෙමි. ආශීර්වාද නමැති
වැස්ස කඩා හැළෙන්න සලස්වන්-
නෙමි.[2] **27** වනයේ ගස්, පලවලින්
බර වනු ඇත.[3] දේශයේ කෙත්-
වතු නියම කලට අස්වැන්නෙන් පිරී
යනු ඇත.[4] සියලුදෙනා තම දේශ-
යේ සුරක්ෂිතව වාසය කරන්නෝය.[5]
ඔවුන් පිට තැබූ වියගහ මම බිඳ දමා,[6]
ඔවුන්ව දාසකමට ගත් අයගේ ග්‍රහණ-
යෙන් ඔවුන්ව මුදන්නෙමි.[7] එවිට මා
යෙහෝවා දෙවි බව පිළිගන්න ඔවුන්ට
සිදු වනු ඇත. **28** ඔවුන්ව තවදු-
රටත් ජාතීන් විසින් කොල්ල කනු
ලබන්නේ නැත.[8] ඔවුහු තවදුරටත්
පොළොවේ වෙසෙන වනමෘගයන්ගේ
ගොදුරක් වන්නේ නැත. ඔවුහු සැබ-
වින්ම සුරක්ෂිතව කල් ගෙවන්නෝය.
ඔවුන්ව බියගැන්වීමට කිසිවෙක් නො-
සිටිනු ඇත.[9]

**29** "'"මම ඔවුන්ට සරුසාර වතු-
පිටි දෙන්නෙමි. එසේ කරන්නේ ඔවුන්
කීර්ති නාමයක් ලබාගන්නා පිණි-
සය.[10] ඔවුහු තවදුරටත් සාගතයකින්
පීඩා විඳින්නේවත්[11] ජාතීන් අතින්
අවමානයට ලක් වන්නේවත් නැත.[12]
**30** 'යෙහෝවා දෙවි වන මා ඔවුන්
සමඟ සිටින බවත්[13] ඊශ්‍රායෙල් ජනයා
මා තෝරාගත් සෙනඟ බවත් පිළි-
ගන්න ඔවුන්ට සිදු වනු ඇත.' එසේ
පවසන්නේ විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවිය."'[14]

**31** "'මාගේ ජනයෙනි, මාගේ තණ-
බිම්වල වෙසෙන බැටළුවන්[15] ලෙස
හඳුන්වන්නේ ඔබවයි. මම ඔබේ දෙවි
වන්නෙමි.' එසේ පවසන්නේ විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවිය."

**35** යෙහෝවා දෙවි මට මෙසේ
පැවසුවේය. **2** "මනුෂ්‍ය
පුත්‍රය, සේයිර් කඳුකරය[16] දෙසට
හැරී[1] ඊට විරුද්ධව අනාවැකි
කියන්න.[2] **3** ඔබ ඔවුන්ට මෙසේ
පැවසිය යුතුය. 'විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. "සේයිර් කඳුකරයේ
වැසියෙනි, මම ඔබට විරුද්ධ වන්-
නෙමි.[3] මම ඔබට විරුද්ධව මාගේ
හස්ත බලය යොදා[4] ඔබව විනාශ
කර පාළු දේශයක් බවට පත් කරන්-
නෙමි.[5] **4** ඔබේ නුවරවල් සියල්ල
නටබුන් ගොඩක් බවට පත් කරන්-
නෙමි. ඔබ පාළු වූ දේශයක් බවට පත්
වනු ඇත.[6] එවිට මා යෙහෝවා දෙවි
බව පිළිගන්න ඔබට සිදු වනු ඇත.[7]
**5** ඔබට එවැනි දෙයක් සිදු වන්නේ
ඔබ ඊශ්‍රායෙල්වරුන් සමඟ බොහෝ
කලක් පුරා බද්ධ වෛරයකින් සිටි
නිසාය.[8] ඔවුන්ගේ අයුතුකම් අවසන්
කරන පිණිස[9] ඔවුන් පිටට ගෙනා විප-
තේදී[10] ඔබ ඔවුන්ව සතුරාගේ කඩුවට
හසු කර දුන්නහුය."'[11]

**6** "විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේ පවසයි. 'ජීව-
මාන දෙවි වන මා පවසන මේ
දේ අනිවාර්යයෙන්ම සිදු වන්නේය.
මම ඔබව මරණයට නියම කළෙමි.
ඒ නිසා ඔබ අනිවාර්යයෙන්ම මර-
ණය අද්දකිනු ඇත.[12] ඔබ මිනි-
සුන්ට වෛර කරමින් ඔවුන්ගේ ලේ
වැගිරෙවූ නිසා ඔබටද ඒ දේම සිදු
වනු ඇත.[13] **7** මම සේයිර් කඳුක-
රය සම්පූර්ණයෙන්ම විනාශ කර දමා
එය පාළු දේශයක් බවට පත් කරන්-
නෙමි.[14] කිසිවෙකුට ඒ දේශය මැදින්
ගමන් කිරීමටවත් ආපසු එයට හැරී
ඒමටවත් මම ඉඩ නොදෙන්නෙමි.[15]
**8** එහි කඳුකරය මළ කඳන්වලින්
පුරවන්නෙමි. කඩුවෙන් මැරුම් කෑ
අය එහි හෙල්වලද තැනිතලාවලද
දිය පහරවලද වැටී සිටිනු ඇත.[16]
**9** ඔබේ දේශය පාළුවට ගොස් සදහ-
ටම ඒ තත්වයේ පවතිනු ඇත. ඔබේ
නුවරවල් නැවත කිසිදා ජනාවාස

**34 පරි.**
**1** යෙසා 56:7; එස 20:40; මීකා 4:1
**2** උත් 12:2; ලෙවී 26:4; ද්වි 28:12; ගීතා 68:9; හිතෝ 10:22; සෙක 8:13; මලා 3:10
**3** ලෙවී 26:4; යෙසා 35:2; යෙසා 55:12
**4** ගීතා 85:12; එස 36:30
**5** ලෙවී 25:18
**6** ලෙවී 26:13; යෙරෙ 2:20; එස 30:18
**7** යෙරෙ 25:14
**8** යෙරෙ 30:10; එස 36:4
**9** යෙරෙ 46:27
**10** ගීතා 72:7; යෙසා 11:1
**11** එස 36:29
**12** එස 36:15
**13** ගීතා 46:7; එස 37:27
**14** රෝම 9:25
**15** ගීතා 78:52; ගීතා 100:3; යෙසා 40:11; 1පේතෘ 5:2

**35 පරි.**
**16** උත් 32:3; ද්වි 2:5; එස 25:8

**2 තීරුව**
**1** එස 6:2
**2** යෙරෙ 49:8; විලා 4:22; එස 36:5; ආමො 1:11; ඔබ 1; ඔබ 10
**3** එස 25:12
**4** යෙරෙ 6:12
**5** එස 25:13
**6** යෝවෙ 3:19; මලා 1:3
**7** ගීතා 9:16
**8** උත් 27:41
**9** ගීතා 137:7
**10** ඔබ 10
**11** ආමො 1:11
**12** ගීතා 109:16; ඔබ 15; රෝම 2:6; ගලා 6:7
**13** ගීතා 109:17; එස 25:14
**14** එස 25:13
**15** විනි 5:6; එස 29:11

එස **34:26*** සමහරවිට මෙයින් අදහස් කරන්නේ, උන් අන්‍යයන්ට ආශීර්වාදයක් වන බව විය හැකිය.

**16** යෙසා 34:2; යෙරෙ 25:33.

වන්නේ නැත.[1] එවිට මා යෙහෝවා
දෙවි බව පිළිගන්න ඔබට සිදු වනු
ඇත.'[2]
10 "යෙහෝවා දෙවි දේශයේ සිටි-
යදීම,[3] 'මේ ජාතීන් දෙකත් මේ දේශ
දෙකත් මම අයිති කරගන්නවා. අපි
මේ දේශ දෙකම හිමි කරගන්නවා'
කියා ඔබ පැවසුවහුය.[4] 11 එහෙ-
යින් විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි මෙසේ පවසයි. 'ජීවමාන
දෙවි වන මා සහතිකවම පවසන
මේ දේට සවන් දෙන්න. ඔබ තුළ
ඔවුන් කෙරෙහි තිබෙන බද්ධ වෛරය
හා ඊර්ෂ්‍යාව නිසා ඔබ කෝපයෙන්
ඔවුන් සමඟ ක්‍රියා කළහුය.[5] එහෙයින්
ඔබ කළ සෑම දෙයකටම නිසි දඬුවම්
ලබා දෙන්නෙමි. ඔබ පිටට මාගේ
විනිශ්චය ගෙනෙන විට මා කවුද කියා
ජනයා හොඳින් තේරුම්ගනු ඇත.[6]
12 ඔබ ඊශ්‍රායෙල්හි කඳුකරය ගැන
මෙසේ පැවසුවහුය. "මුළු කඳුකරයම
පාළුවට ගිහින්. දැන් අපි දේශයට
ඇතුල් වී එය නැති නාස්ති කරමු."[7]
යෙහෝවා දෙවි වන මා ඔබ පැවසූ
එම අගෞරවනීය වදන් අසාගෙන සිටි
බව ඔබ අනිවාර්යයෙන්ම තේරුම්-
ගනු ඇත.[8] 13 ඔබ මහ උජාරුවෙන්
උදම් අනමින්[9] මට විරුද්ධව බොහෝ
දේ පවසා ඇත.[10] මම ඒ සියල්ල අසා-
ගෙන සිටියෙමි.'[11]
14 "විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි.
'පොළොවේ සියලු වැසියන් ප්‍රීති-
යෙන් ඉපිල යන කාලයේදී මම ඔබව
පාළු නටබුන් ගොඩක් බවට පත්
කරන්නෙමි. 15 ඊශ්‍රායෙල් ජාතියට
උරුම වූ දේශය පාළු කරනු ලැබූ
විට ඔබ ප්‍රීතියෙන් ඉපිල ගිය නිසා
ඔබටත් ඒ දේම සිදු වෙයි.[12] සේයීර්
කඳුකරයේ වෙසෙන ජනයෙනි, මුළු
ඒදොම් රාජධානියේ වැසියෙනි, ඔබේ
දේශය සම්පූර්ණයෙන්ම පාළුවට යනු
ඇත.[13] එවිට මා යෙහෝවා දෙවි බව
පිළිගන්න සියලුදෙනාටම සිදු වනු
ඇත.' "[14]

**35 පරි.**
1 යෙරෙ 49:17
යෙරෙ 49:18
එස 25:13
මලා 1:4
2 ගීතා 9:16
3 ගීතා 48:1
එස 48:35
ශෙප 3:15
4 ගීතා 83:4
එස 36:5
ඔබ 13
5 ලෙවී 19:17
ගීතා 37:7
ආමෝ 1:11
මතෙ 7:2
1යොහ 3:15
6 හිතෝ 11:21
යෙසා 26:9
7 ගීතා 83:12
එස 36:2
8 ගීතා 94:9
9 1සාමු 2:3
2ලේක 32:15
දානි 11:36
එළි 13:6
10 ඔබ 3
11 2රාජ 19:28
යෙරෙ 29:23
12 හිතෝ 17:5
විලා 4:21
ඔබ 12
ඔබ 15
13 යෙසා 34:5
එස 25:13
එස 36:5
14 ගීතා 9:16

**2 තීරුව**

**36 පරි.**
1 එස 6:2
2 එස 25:3
3 ද්වි 32:13
ගීතා 78:69
යෙසා 58:14
4 යෙරෙ 49:1
එස 35:10
5 ලෙවී 26:43
6 ආමෝ 8:4
7 එස 25:4
8 ද්වි 28:37
ගීතා 44:13
යෙරෙ 18:16
විලා 2:15
දානි 9:16
9 1රාජ 9:7
10 යෙසා 44:23
යෙසා 49:13
එස 6:2
11 යෙරෙ 25:9
12 ගීතා 79:4
එස 34:28
13 සෙක 1:15

# 36
"මනුෂ්‍ය පුත්‍රය, ඊශ්‍රායෙල් දේ-
ශයේ කඳු ගැන අනාවැකි
කියන්න. ඔබ මෙසේ පැවසිය යුතුය.
'ඊශ්‍රායෙල් දේශයේ කඳුකරය,[1] යෙ-
හෝවා දෙවි පවසන දේට සවන්
දෙන්න. 2 විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි පවසන්නේ මෙ-
යයි. "සතුරෝ ඔබ මුහුණ දුන් විපත
ගැන ප්‍රීති වෙමින්,[2] 'පුරාණයේ සිටම
තිබූ උස් තැන්[3] දැන් අයිති අපටයි'
කියා උදම් අනති." '[4]
3 "එබැවින් ඔබ මෙම අනාවැකිය
දැනුම් දෙන්න. 'විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි පව-
සන්නේ මෙයයි. "ඔවුහු ඔබව පාළු
කළෝය.[5] සෑම පැත්තකින්ම ඔබව
වට කර ඔබව ගිලගැනීමට උත්සාහ
කළෝය.[6] එමනිසා විනාශ නොවී
ඉතුරු වූ අවට ජාතීහු ඔබව අයිති
කරගත්තෝය.[7] ඔබ ජනයාගේ කතා-
බහට ලක් විය.[8] ඔවුහු ඔබ ගැන බො-
හෝ නරක ආරංචි පැතිරෙව්වෝය.[9]
4 එබැවින් ඊශ්‍රායෙල් දේශයේ කඳුක-
රය,[10] විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන දේට සවන්
දෙන්න. විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි කඳු, හෙල්, ගංගා,
තැනිතලා හා පාළුවට ගිය ස්ථානව-
ලට පවසන දේට සවන් දෙන්න.[11]
ඉතුරුව සිටින අවට ජාතීන්ගේ සරද-
මටත් කොල්ල කෑමටත් ලක් වූ අත්-
හැර ගිය නුවරවලට ඔහු පවසන දේට
සවන් දෙන්න.[12] 5 විශ්වයේ පාලක-
යාණන් වන යෙහෝවා දෙවි පවසන්-
නේ මෙයයි. 'ඉතුරුව සිටින ජාතීන්ට
හා මුළු ඒදොම් දේශයට විරුද්ධව[13]
මාගේ දැවෙන උදහසින් මම කතා
කරන්නෙමි.[14] ඔවුහු මාගේ දේශයේ
තණබිම් අයිති කරගෙන එහි තිබෙන
සියල්ල කොල්ල කන පිණිස[15] මාගේ
දේශය යටත් කරගත්තෝය.[16] ඔවුහු
මාගේ සෙනඟට ඔච්චම් කරමින්[17]
මහත් සතුටක් ලැබුවෝය.' " '

**14** ද්වි 4:24; යෙසා 66:15; එස 38:19; ශෙප 3:8; **15** එස 25:12; ආමෝ 1:11; **16** ගීතා 83:4; එස 35:10; **17** හිතෝ 17:5; ඔබ 12.

**6** "දැන් ඊශ්‍රායෙල් දේශය ගැන
අනාවැකි කියන්න. ඔබ එහි කඳු,
හෙල්, ගංගා සහ තැනිතලාවලට
මෙසේ කිව යුතුය. 'විශ්වයේ පාලක-
යාණන් වන යෙහෝවා දෙවි පව-
සන්නේ මෙයයි. "මම බොහෝ සේ
උදහස්ව සිටිමි. මාගේ දැවෙන කෝ-
පය නිසා මට නිහඬව සිටිය නො-
හැක. මන්ද ජාතීන් අතින් ඔබ
අවමානයට ලක්ව ඇත." '[1]
**7** "එබැවින් විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි මෙසේ
පවසයි. 'ඔබ අවට සිටින ජාතීන්ව
මම අවමානයට ලක් කරන බවට[2]
අත ඔසවා දිවුරන්නෙමි.[3] **8** ඊශ්‍රා-
යෙල් දේශයේ කඳුකරය, ඔබේ සෙ-
නඟ ළඟදීම පැමිණෙනු ඇත![4]
එහෙයින් දැන් සූදානම් වන්න. ඔබේ
ගස්, අතු ඉති ලිය ලා සරුසා-
රව වැඩෙනු ඇත. මාගේ සෙනඟ වූ
ඊශ්‍රායෙල් වෙනුවෙන් ඔබ පල දරනු
ඇත.[5] **9** මන්ද මම ඔබ දෙස සතු-
ටින් බලා ඔබට කරුණාව පෙන්වන්-
නෙමි.[6] එවිට ඔබ තුළ බීජ වපුරා වගා
කරනු ලබන්නේය.[7] **10** මම ඔබව
ජනාවාස කරන්නෙමි.[8] මුළු ඊශ්‍රායෙල්
ජනයාම පාළුවට ගිය ඔබේ නුවරවල
පදිංචි වනු ඇත.[9] නටබුන් වූ තැන්
නැවත ගොඩනඟනු ලබනවා ඇත.[10]
**11** මම ඔබ තුළ වසන මිනිසුන්ගේද
සතුන්ගේද සංඛ්‍යාව බොහෝ සේ
වැඩි කරන්නෙමි.[11] මිනිසුන්ද සතුන්ද
දිනෙන් දින වැඩි වනු ඇත. අතීත-
යේදී මෙන් මම ඔබව ජනාකීර්ණ
කර[12] කලින් ආශීර්වාද කළාටත්
වඩා ඔබට බොහෝ සේ ආශීර්-
වාද කරන්නෙමි.[13] එවිට මා යෙ-
හෝවා දෙවි බව පිළිගන්න ඔබට
සිදු වනු ඇත.[14] **12** ඔබ තුළ මාගේ
සෙනඟ වන ඊශ්‍රායෙල් ජාතිය නැව-
තත් සැරිසරනු ඇත. ඔවුහු ඔබව හිමි
කරගන්නෝය.[15] ඔබද ඔවුන්ගේ උරු-
මය වන්නහුය.[16] ඔබ නැවත කිසිදා
ඔවුන්ගේ දරුදැරියන්ව සොරාගන්නේ
නැත.' "[17]

**36 පරි.**
**1** ගීතා 74:10
ගීතා 123:4
එස 34:29
**2** යෙරෙ 25:9
යෙරෙ 49:17
ආමෝ 1:11
**3** ද්වි 32:40
එස 20:5
එස 20:15
**4** යෙසා 2:3
**5** ගීතා 98:8
යෙසා 44:23
යෙසා 51:3
යෙසා 60:5
එස 36:30
**6** ශෙප 3:9
**7** හග් 2:19
**8** යෙරෙ 30:19
**9** සෙක 8:4
**10** යෙසා 51:3
යෙසා 58:12
යෙසා 61:4
ආමෝ 9:14
**11** යෙරෙ 31:27
යෙරෙ 33:12
**12** යෙරෙ 30:18
**13** යෙසා 54:7
එස 37:6
හග් 2:9
**14** හොෂෙ 2:20
යෝවෙ 3:17
**15** යෙරෙ 32:44
ඔබ 17
**16** යෙසා 60:21
**17** යෙසා 65:23
යෙරෙ 15:7

**2 තීරුව**
**1** යෙරෙ 15:7
**2** හිතෝ 30:14
**3** යෙරෙ 32:35
**4** යෙසා 54:4
යෙසා 60:14
එස 34:29
මීකා 7:8
ශෙප 3:19
**5** ගීතා 89:50
එස 36:20
එස 36:21
ශෙප 2:8
**6** ලෙවී 18:25
ගීතා 106:38
යෙසා 24:5
යෙරෙ 2:7
යෙරෙ 3:1
යෙරෙ 16:18
**7** ලෙවී 12:2
යෙසා 64:6
**8** එස 23:37
**9** 2ලේක 34:21
යෙසා 42:25
**10** ලෙවී 26:38
ද්වි 28:64
එස 22:15
**11** එස 7:3
එස 18:30
එස 39:24
**12** ගණන් 14:16
යොෂු 7:9
**13** යෙසා 52:5
රෝම 2:24

**13** "විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි.
'ඇතමෙක් ඔබ ගැන මෙසේ පවසා
ඇත. "ඔබ මිනිසුන්ව ගිල දමන,
ඔබ තුළ වසන ජාතීන්ගෙන් දරු-
දැරියන්ව සොරාගන්නා දේශයකි." '[1]
**14** 'එහෙත් ඔබ තවදුරටත් මිනිසුන්ව
ගිල දමන්නේ නැත.[2] මින් මතු ඔබ
තුළ වෙසෙන ජාතීන්ගෙන් දරුදැරි-
යන්ව සොරාගන්නේ නැත.'[3] එසේ
පවසන්නේ විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවිය. **15** 'ඔබ
ගැන අවමන්සහගත දේවල් පැවසී-
මට මම ජාතීන්ට තවදුරටත් ඉඩ
නොදෙන්නෙමි.[4] මින් මතු ජනයාගේ
නින්දා අපහාසවලට ඔබ ලක් වන්නේ
නැත.[5] ඔබ තුළ වෙසෙන ජාතීන්ව
නැවත කිසිදා යටත් කරගන්න කිසි-
වෙකුට හැකි වන්නේ නැත.' එසේ
පවසන්නේ විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවිය."
**16** ඊළඟට යෙහෝවා දෙවි මට
මෙසේද කීවේය. **17** "මනුෂ්‍ය පුත්‍රය,
ඊශ්‍රායෙල් සෙනඟ තම දේශයේ වාසය
කරමින් සිටි කාලයේදී, ඔවුන් කළ
දේවල් නිසාත් ඔවුන්ගේ හැසිරීම
නිසාත් දේශය දිගින් දිගටම අපවිත්‍ර
විය.[6] ඔවුන් ගත කළ දූෂිත ජීවි-
තය මා සැලකුවේ ඔසප් කාලයේ
ස්ත්‍රියකගේ අපවිත්‍රකමට සමානවය.[7]
**18** ඔවුහු තම පිළිකුල්සහගත රූපව-
ලින් දේශය අපවිත්‍ර කළා පමණක්
නොව[8] ඒ මත අහිංසකයන්ගේ ලේද
හැළුවෝය.[9] එහෙයින් මාගේ උද-
හස ඔවුන් මත වැගිරුවෙමි. **19** මම
ඔවුන්ව ජාතීන් අතරටත් විවිධ දේ-
ශයන් අතරටත් විසුරුවාහැරියෙමි.[10]
ඔවුන් ගත කළ ජීවිතයට අනුව මම
ඔවුන්ව විනිශ්චය කර ඔවුන්ට දඬුවම්
කළෙමි.[11] **20** ඔවුහු ඒ විවිධ ජාතීන්
අතරට ගියෝය. 'මේ යෙහෝවා දෙවි-
ගේ ජනතාව නේද? ඔවුන්ගේ දේශ-
යෙන් ඔවුන්ව දැන් පිටමං කරලා'[12]
කියා පවසමින් ඒ ජාතීහු මාගේ ශුද්ධ
නාමයට නින්දා කරන්න පටන්ගත්-
තෝය.[13] **21** ඊශ්‍රායෙල් ජාතිය විවිධ

ජාතීන් අතරට ගොස් මාගේ නාමය
නින්දාවට පත් කළෝය. මාගේ ශුද්ධ
නාමයට ගෙනා ඒ නින්දාව ඉවත්
කිරීමට මම අනිවාර්යයෙන්ම පියවර
ගන්නෙමි.”[1]
**22** “එබැවින් ඊශ්‍රායෙල් සෙනඟට
මෙසේ කියන්න. ‘විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි පවසන්-
නේ මෙයයි. “ඊශ්‍රායෙල් ජනයෙනි, මා
මේ දේ කරන්නේ ඔබ නිසා නොවේ.
ඔබ ජාතීන් අතරේ නින්දාවට පත්
කළ මාගේ ශුද්ධ නාමය වෙනුවෙන්
මම මේ දේ කරමි.”’[2] **23** ‘ජාතීන්
අතරේ ඔබ නින්දාවට පත් කළ
මාගේ ශ්‍රේෂ්ඨ නාමය මම අනිවාර්-
යයෙන්ම ගෞරවයට පත් කරන්-
නෙමි.[3] මා ඔවුන් ඉදිරියෙහිත් ඔබ
ඉදිරියෙහිත් මාගේ නාමය ගෞරව-
යට පත් කරන විට[4] මා යෙහෝවා
දෙවි බව පිළිගන්න ඒ ජාතීන්ට සිදු
වනු ඇත.’[5] එසේ පවසන්නේ විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවිය. **24** ‘ඔබ විසිරී සිටින දේශ-
යන් අතරින්ද ජාතීන් අතරින්ද මම
ඔබව එකතු කරගෙන ඔබේම දේ-
ශයට ගෙනෙන්නෙමි.[6] **25** මම ඔබ
මතට පිරිසිදු ජලය වත් කර ඔබව
පවිත්‍ර කරන්නෙමි.[7] ඔබ කළ සියලු
අපවිත්‍ර ක්‍රියාවලින් ඔබ පවිත්‍ර වනු
ඇත.[8] ඔබේ පිළිකුල්සහගත රූප
සියල්ල ඉවත් කර මම ඔබව පවිත්‍ර
කරමි.[9] **26** මම ඔබට අලුත් හදව-
තක් දී[10] ඔබ සිතන ආකාරයද වෙ-
නස් කරන්නෙමි.[11] ගලක් මෙන් දැඩිව
තිබෙන ඔබේ සිත ඉවත් කර ප්‍රේ-
මයෙන් පිරි හදවතක් ඔබට දෙන්-
නෙමි.[12] **27** මාගේ බලය ඔබ තුළ
ක්‍රියාත්මක වීමට සලස්වන්නෙමි.[13]
මම ඔබ වෙනුවෙන් පියවර ගන්නෙමි.
එවිට ඔබ මාගේ අණපනත්වලට
එකඟවද[14] මාගේ තීරණවලට එකඟ-
වද ජීවත් වනු ඇත.[15] **28** මා ඔබේ
මුතුන්මිත්තන්ට දුන් දේශයෙහි ඔබ
වාසය කරනවා ඇත.[16] ඔබ මාගේ
සෙනඟ වන්නහුය. මමද ඔබේ දෙවි
වන්නෙමි.’[17]

**29** “ ‘ඔබ කළ සියලු අපවිත්‍ර දේව-
ලට මම ඔබට සමාව දෙන්නෙමි.[1]
මාගේ අණට කීකරු වන ධාන්‍ය
ගස් ඔබට සරුසාර අස්වැන්නක් දෙනු
ඇත. ඔබට සාගතයකින් පීඩා විඳින්න
මම ඉඩ නොදෙන්නෙමි.[2] **30** මම
ගස්වල පලදාවද කෙත්වල අස්වැන්-
නද වැඩි කරන්නෙමි. එවිට ඔබ
නැවත කිසිදා සාගතයකට හසු වී
ජාතීන්ගේ නින්දාවට ලක් නොවනු
ඇත.[3] **31** ඒ කාලයේදී, ඔබ අතී-
තයේ කළ සියලු වැරදිද ඔබ දුෂ්-
ටව හැසිරුණු ආකාරයද ඔබට සිහි
වනු ඇත.[4] එවිට ඔබ ගැනත් ඔබ
කළ වැරදි ගැනත් ඔබ කළ නින්-
දිත දේවල් ගැනත් ඔබටම මහත්
පිළිකුලක් දැනෙනු ඇත.’[5] **32** විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවි මෙසේද පවසන්නේය. ‘මා මෙ-
ලෙස ක්‍රියා කරන්නේ ඔබ වෙනුවෙන්
නොවන බව හොඳින් මතක තබා-
ගන්න.[6] එහෙයින් ඊශ්‍රායෙල් ජනයෙනි,
ඔබ කළ දේවල් ගැන ලැජ්ජා වී දුක්
වන්න.’[7]
**33** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේ පවසන්නේය.
‘ඔබේ සියලු අපවිත්‍රකම්වලින් මා
ඔබව පවිත්‍ර කරන දවසේදී මම ඔබේ
සෑම නුවරක්ම ජනාකීර්ණ කරන්-
නෙමි.[8] නටබුන් වූ තැන් නැවත
ගොඩනැඟීමටද පියවර ගන්නෙමි.[9]
**34** ඒ දේශය කොතරම් පාළුවට ගොස්
ඇද්ද කියා එය පසු කරගෙන යන
සියල්ලෝම දුටුවෝය.[10] නමුත් එය
යළි අස්වැන්නෙන් පිරුණු සරුසාර
දේශයක් බවට පත් වනු ඇත. **35** ඒ
දේශය ගැන ජනතාව මෙසේ පව-
සනු ඇත. “පාළුවට ගිය ඒ දේශය
දැන් ඒදන් උයන මෙනි.[11] සතුරන්
අතින් විනාශ වී පාළුවට ගිය නුවරවල්
දැන් හොඳින් ගොඩනඟා ආරක්ෂාව
තර කර තිබේ. ඒ නුවරවල් දැන් මිනි-
සුන්ගෙන් පිරී ඇත.”[12] **36** කඩා බිඳ
දැමූ දේ නැවත ගොඩනැඟුවෙන් පාළු-
වට ගිය තැන් පුරා ගස් සිටෙව්වෙන්

**36 පරි.**
1 නික් 20:7, ගීතා 74:18, යෙසා 48:9, යෙසා 52:5, එස 20:9
2 ගීතා 106:8
3 ගීතා 46:10, යෙසා 5:16, එස 20:41
4 එස 28:22
5 ගීතා 102:15
6 ද්වි 30:3, යෙසා 43:5, යෙරෙ 23:3, එස 34:13, එස 37:21, හොෂෙ 1:11
7 ගණන් 19:13, ගීතා 51:7, හෙබ්‍රෙ 10:22
8 යෙසා 4:4, යෙරෙ 33:8, 1කොරි 6:11
9 එස 6:4
10 ද්වි 30:6, යෙරෙ 32:39, එස 11:19
11 ගීතා 51:10
12 සෙක 7:12
13 යෙසා 44:3, යෝවෙ 2:28
14 යෙරෙ 31:33
15 එස 11:20
16 එස 28:25, එස 37:25
17 යෙරෙ 30:22, එස 11:20, එස 37:27

**2 තීරුව**
1 මතෙ 1:21, රෝම 11:26
2 ගීතා 33:19, එස 34:29
3 එස 34:27, එස 36:8, එස 36:35
4 ලෙවී 26:39, එස්රා 9:6, නෙහෙ 9:26, යෙරෙ 31:18
5 එස 6:9, එස 20:43, සෙක 12:10
6 ද්වි 9:5, දානි 9:19
7 රෝම 6:21
8 සෙක 8:8
9 යෙසා 58:12, යෙරෙ 33:10, ආමො 9:14
10 2ලේක 36:21, යෙරෙ 25:9
11 උත් 2:8, උත් 13:10
12 යෙසා 51:3

යෙහෝවා දෙවි වන මා බව ඔබ අවට
ඉතුරුව සිටින ජාතීන්ට පිළිගන්න සිදු
වෙයි.[1] මේ දේ පවසන්නේ යෙහෝවා
දෙවි වන මමය. එබැවින් මම එය අනි-
වාර්යයෙන්ම ඉටු කරන්නෙමි.'[2]
**37** "විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි.
'මා ඊශ්‍රායෙල් සෙනඟ වෙනුවෙන්
කුමක් කරනු ඇද්ද කියා මගෙන් විම-
සීමට මම ඔවුන්ට ඉඩ දෙන්නෙමි.[3]
බැටළු රැළක් බෝ වී වැඩි වෙන්නාක්
මෙන් මම ඔවුන්ගේ ගණනද වැඩි
කරන්නෙමි.[4] **38** ඔවුහු ශුද්ධ සෙ-
නඟකි. ඔවුහු උත්සව කාලයේදී යෙ-
රුසලමට එක් රොක් වන සෙනඟක්
මෙන් වන්නෝය.[5] මෙලෙස පාළුවට
ගිය නුවරවල් මිනිසුන්ගෙන් පිරී ඉතිරී
යනු ඇත.[6] එවිට මා යෙහෝවා දෙවි
බව පිළිගන්න ජනතාවට සිදු වනු
ඇත.'"

**37** යෙහෝවා දෙවිගේ බලය මා
තුළ ක්‍රියා කරන්න පටන්-
ගත්තේය.[7] එවිට යෙහෝවා දෙවි තම
බලය මාර්ගයෙන් මාව තැනිතලාවක්
මැදට ගෙන ගියේය.[8] එම තැනිතලාව
ඇටකටුවලින් පිරී තිබිණ.[9] **2** ඔහු-
ගේ අණ පරිදි මම ඒ ඇටකටු අවට
ඇවිද්දෙමි. හොඳටම වියළී තිබුණු ඒ
ඇටකටු[10] තැනිතලාව පුරාම විසිර
තිබිණ. **3** දෙවි මට මෙසේ කීවේය.
"මනුෂ්‍ය පුත්‍රය, මේ ඇටකටුවලට
පණ දිය හැකිද?" එවිට මම, "විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවි-
යනි, ඒවාට පණ දිය හැකිද කියා දන්-
නේ ඔබ පමණයි"[11] කියා පිළිතුරු
දුන්නෙමි. **4** එවිට ඔහු මට මෙසේ
කීවේය. "මේ ඇටකටු ගැන මෙසේ
අනාවැකි කියන්න. 'වියළී ගිය ඇට-
කටු, යෙහෝවා දෙවි පවසන මේ දේට
දැන් සවන් දෙන්න.
**5** "'විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙම ඇටකටුවලට
පවසන්නේ මෙයයි. "ඔබව නැවත
ජීවත් කරවන පිණිස මම ඔබ තුළට
ජීවන හුස්ම හෙළන්නෙමි.[12] **6** මම
ඔබව නහරවලින්ද* මස්වලින්ද
සමෙන්ද වසන්නෙමි. මම ඔබට ජීවන
හුස්මද දී ඔබව යළි ජීවත් කරවන්-
නෙමි.[1] එවිට මා යෙහෝවා දෙවි බව
පිළිගන්න ඔබට සිදු වනු ඇත."'"[2]
**7** මට කියූ ලෙසම මම අනා-
වැකි කීවෙමි.[3] මා අනාවැකි පැවසූ
වහාම මට ශබ්දයක් ඇසුණේය. එය
නම් ඇටකටු එකිනෙක ගැටෙන ශබ්-
දයයි. ඒත් සමඟම, ඒ එක් එක්
ඇටකටු ඒවාට ගැළපෙන ඇටකටු
ළඟට ගොස් ඒවා සමඟ සම්බන්ධ
විය. **8** මා ඒ දෙස බලා සිටියදීම,
එම ඇටකටු නහරවලින්ද මස්වලින්ද
වැසී සමෙන් ආවරණය විය. එහෙත්
ඒවා තුළ ජීවන හුස්ම තිබුණේ නැත.
**9** දෙවි මට තවදුරටත් මෙසේ
පැවසීය. "මනුෂ්‍ය පුත්‍රය, ඔබ දැන්
සුළඟට අනාවැකි කියන්න. ඔබ
මෙසේ පැවසිය යුතුයි. 'විශ්වයේ පාල-
කයාණන් වන යෙහෝවා දෙවි පව-
සන්නේ මෙයයි. "සුළඟ, සතර දිගින්
හමා එන්න! මැරුම් කෑ[4] මේ ජන
පිරිස මත හමා ඔවුන්ට ජීවය ලබා
දෙන්න!"'"[5]
**10** ඔහු අණ කළ ලෙසම මම
අනාවැකි කීවෙමි. එවිට ජීවන හුස්ම
ඔවුන් වෙත පැමිණ ඔවුන්ට පණ
දුන්නේය. ඒත් සමඟම ඔවුහු සිට-
ගත්තෝය.[6] ඔවුහු දැවැන්ත යුධ හමු-
දාවක් මෙන් වූහ.
**11** දෙවි මට තවදුරටත් මෙසේ
පැවසීය. "මනුෂ්‍ය පුත්‍රය, මේ ඇටක-
ටුවලින් සංකේතවත් කරන්නේ මුළු
ඊශ්‍රායෙල් ජනතාවයි.[7] 'අපේ ඇටකටු
හොඳටම වියළී ගොස් ඇත. අපේ
බලාපොරොත්තු සුන් වී තිබේ.[8] අපව
සියලුදෙනාගෙන්ම වෙන් කර තනි
කර ඇත' කියා ඊශ්‍රායෙල් ජනයා පව-
සති. **12** එබැවින් ඔබ ඔවුන්ට මෙම
අනාවැකිය කියන්න. 'විශ්වයේ පාල-
කයාණන් වන යෙහෝවා දෙවි පව-
සන්නේ මෙයයි. "මාගේ ජනයෙනි,

**36 පරි.**
1 එස 17:24; එස 37:28
2 ගණන් 23:19; එස 22:14; එස 28:26; එස 37:14
3 ගීතා 102:17; යෙසා 55:6; යෙරෙ 29:12; යෙරෙ 50:5; සෙක 13:9; මතෙ 7:7
4 එස 36:10
5 නික් 23:17; 2ලේක 7:8
6 යෙරෙ 30:19; යෙරෙ 31:27

**37 පරි.**
7 එස 1:3
8 එස 3:14; එළි 21:10
9 එළි 11:9
10 එස 37:11
11 ද්වි 32:39; 1සාමු 2:6; රෝම 4:17; 2කොරි 1:9
12 උත් 2:7; ගීතා 104:30; එස 37:14

**2 තීරුව**
1 එළි 11:11
2 යෝවෙ 2:27
3 එස 37:10
4 එළි 11:7
5 ගීතා 104:30
6 එළි 11:11
7 එස 36:10
8 ගීතා 141:7; යෙසා 49:14

එස **37:6*** මූ.අ., "පේශී සහ අස්ථි සම්බන්ධ කරන ඇඩි තන්තුමය පටක."

මේ අසන්න! මම ඔබේ සොහොන්
ගෙවල් විවෘත කර[1] ඔබව පිටතට
ගන්නෙමි. ඉන්පසු මම ඔබව නැවත
ඊශ්‍රායෙල් දේශයට රැගෙන යන්නෙමි.[2]
**13** මාගේ ජනයෙනි, මා ඔබේ සො-
හොන් විවෘත කර ඔබව පිටතට ගෙ-
නෙන විට මා යෙහෝවා දෙවි බව
පිළිගන්න ඔබට සිදු වනු ඇත.”’[3]
**14** ‘මම මාගේ බලය ඔබ තුළ
ක්‍රියාත්මක වීමට සලස්වන්නෙමි.
එවිට ඔබ ජීවත් වන්නහුය.[4] ඉන්-
පසු මම ඔබේ දේශයෙහි ඔබව පදිංචි
කරන්නෙමි. එවිට මේ දේ පැවසුවෙත්
ඒවා ඉටු කළෙත් යෙහෝවා දෙවි වන
මා බව පිළිගන්න ඔබට සිදු වනු
ඇත.’ එසේ පවසන්නේ යෙහෝවා
දෙවිය.”[5]

**15** යෙහෝවා දෙවි මට තවදුර-
ටත් මෙසේ පැවසුවේය. **16** “මනුෂ්‍ය
පුත්‍රය, ගසක දිගටි අත්තක් ගෙන,[6]
‘යූදා සහ ඔහුගේ සහෝදරයන්* වූ
ඊශ්‍රායෙල් සෙනඟ සඳහාය’ කියා ඒ
මත ලියන්න.[7] තවත් දිගටි අත්තක්
ගෙන, ‘යෝසෙප් සහ ඔහුගේ සහෝද-
රයන් වූ මුළු ඊශ්‍රායෙල් සෙනඟ සඳහා
වූ[8] එෆ්‍රායිම්ගේ අත්ත’ කියා ඒ මත
ලියන්න.[9] **17** පසුව ඒ අතු දෙක
එකට ළං කරන්න. එවිට ඒවා ඔබේ
අතේ එක අත්තක් බවට පත් වනු
ඇත.[10] **18** පසුව, ‘මේ දේවල අර්-
ථය ඔබ අපට පැහැදිලි කර දෙන්නේ
නැද්ද’ කියා ඔබේ ජනතාව ඔබෙන්
විමසනු ඇත.[11] **19** ඔවුන්ට මෙසේ
පවසන්න. ‘විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි පවසන්නේ මෙ-
යයි. “මෙන්න, එෆ්‍රායිම් අතේද ඔහුගේ
සහෝදරයන් වන ඊශ්‍රායෙල්හි සියලුම
ගෝත්‍රයන් අතේද තිබෙන යෝසෙප්-
ගේ අත්ත රැගෙන යූදාගේ අත්තට යා
කරන්නෙමි. ඒවා මාගේ අතේ එක
අත්තක් බවට පත් කරන්නෙමි.”’[12]
**20** එසේ ළං කළ අතු දෙක සියලු-
දෙනාට පෙනෙන සේ ඔබේ අතේම
තබාගන්න.[13]

එස 37:16* මූ.අ., “හවුල්කරුවන්.”

**37 පරි.**
1 යෙසා 66:14; එළි 11:11
2 එස 11:17; එස 20:42; එස 36:24; ආමො 9:14
3 ගීතා 126:2; එස 37:6
4 යෙසා 32:15; එස 36:27; එස 37:5
5 ගණන් 23:19; එස 36:36
6 ගණන් 17:2; එස 37:19
7 2ලේක 15:9; 2ලේක 30:11
8 1රාජ 11:31
9 1රාජ 12:20
10 යෙසා 11:13; යෙරෙ 3:18; යෙරෙ 50:4
11 එස 12:9
12 යෙරෙ 50:4; සෙක 10:6
13 එස 12:3

**2 තීරුව**
1 ද්වි 30:3; යෙසා 11:12; යෙරෙ 16:15; යෙරෙ 23:3; ආමො 9:14
2 යෙරෙ 3:18; හොෂෙ 1:11
3 උත් 49:10; ගීතා 2:6; යෙසා 9:6; යෙරෙ 23:5; ලූක් 1:32
4 එස 37:16; සෙක 10:6
5 යෙසා 2:18; එස 11:18; එස 20:43; හොෂෙ 14:8; සෙක 13:2
6 ලෙවී 20:7
7 උත් 17:7; යෙරෙ 31:33; එස 36:28
8 යෙරෙ 23:5; යෙරෙ 30:9; හොෂෙ 3:5; ලූක් 1:32
9 යොහ 10:16; 1පේතෘ 5:4
10 ගීතා 25:9
11 ද්වි 30:10
12 යෙරෙ 32:39; එස 36:27
13 යෝවෙ 3:20
14 යෙරෙ 30:3; එස 28:25
15 යෙසා 60:21; ආමො 9:15

**21** “ඔවුන්ට මෙසේ පවසන්න.
‘විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි පවසන්නේ මෙයයි.
“විවිධ ජාතීන් අතර විසිර ගොස් සිටින
ඊශ්‍රායෙල් සෙනඟව මම රැස් කර
තමන්ගේම දේශයට ගෙනෙන්නෙමි.[1]
**22** මම ඔවුන්ව එක ජාතියක් බවට
පත් කරන්නෙමි.[2] ඔවුහු ඊශ්‍රායෙල්
කඳුකරය මත එක සෙනඟක් සේ
වසන්නෝය. එක් රජෙක් ඔවුන් සිය-
ලුදෙනාවම පාලනය කරනු ඇත.[3]
ඔවුහු තවදුරටත් ජාතීන් දෙකක් සේ
ක්‍රියා කරන්නේ නැත. රාජ්‍යයන් දෙ-
කක් සේ බෙදී පවතින්නේද නැත.[4]
**23** තවදුරටත් ඔවුහු තමන්ව අපවිත්‍ර
කරවන දේවල යෙදෙන්නේ නැත.
ඔවුහු පිළිකුල්සහගත රූප සාදාගන්-
නේවත් නින්දිත ලෙස හැසිරෙන්නේ-
වත් පව්කාර ක්‍රියාවල යෙදෙන්නේවත්
නැත.[5] ඔවුන් තම වාසස්ථානවලදී
කළ සියලුම පව්කාර ක්‍රියාවලට මම
සමාව දී ඔවුන්ව පවිත්‍ර කරන්නෙමි.[6]
ඔවුහු මාගේ සෙනඟ වන්නෝය. මමද
ඔවුන්ගේ දෙවි වන්නෙමි.[7]

**24** “ ‘ “මාගේ සේවක දාවිත් ඔවුන්-
ගේ රජු වනු ඇත.*[8] ඔවුන් සියලුදෙ-
නාටම එක එඬේරෙක් සිටිනු ඇත.[9]
ඔවුහුද මාගේ තීරණවලට යටත්
වී[10] මා දුන් අණපනත්වලට කීක-
රුව ජීවත් වන්නෝය.[11] ඔවුහු ඒවා
කිසිවිටෙක කඩ කරන්නේ නැත.[12]
**25** ඔවුහු මාගේ සේවකයා වූ
යාකොබ්ට මා දුන් දේශයෙහි අනි-
වාර්යයෙන්ම වාසය කරන්නෝය.[13]
ඔවුන්ගේ මුතුන්මිත්තන් වාසය කළ
ඒ දේශයේ[14] ඔවුහුද ඔවුන්ගේ පුත්‍ර-
යෝද පුත්‍රයන්ගේ පුත්‍රයෝද සදහටම
වාසය කරනු ඇත.[15] මාගේ සේවක
වූ දාවිත් සදහටම ඔවුන්ගේ අධිපති
ලෙස කටයුතු කරන්නේය.[16]

**26** “ ‘ “මම ඔවුන් සමඟ සමාදාන-

**16** එස 34:24; ලූක් 1:32; යොහ 12:34.

එස **37:24*** එනම්, දාවිත්ගෙන් පැවතෙන තැනැත්තෙකි.

යේ ගිවිසුමක් ඇති කරන්නෙමි.[1] ඒ
ගිවිසුම සදහටම පවතිනු ඇත.[2] මම
ඔවුන්ව දේශයේ පදිංචි කරවා ඔවුන්ගේ
ගණන මහත් සේ වැඩි කරන්නෙමි.[3]
ඔවුන් අතරෙහි මාගේ ශුද්ධස්ථානය
සදහටම පිහිටුවන්නෙමි.[4] **27** මාගේ
කූඩාරමද ඔවුන් අතරෙහි පිහිටුවන්-
නෙමි.[5] මම ඔවුන්ගේ දෙවි වන්නෙමි.
ඔවුහුද මාගේ සෙනඟ වන්නෝය.[6]
**28** මාගේ ශුද්ධස්ථානය ඔවුන් අත-
රෙහි සදහටම පිහිටුවනු ලබන විට,[7]
ඊශ්‍රායෙල් ජාතිය ගෞරවයට පත්
කරන්නේ යෙහෝවා දෙවි වන මා බව
සියලු ජාතීන්ට පිළිගන්න සිදු වනු
ඇත.” ’ ”[8]

**38** යෙහෝවා දෙවි මට තව-
දුරටත් මෙසේ පැවසුවේය.
**2** “මනුෂ්‍ය පුත්‍රය,[9] මෙෂෙක්[10] හා
තූබල්[11] යන දේශවල ප්‍රධාන අධිප-
තියා වන මාගොග් දේශයේ[12] ගොග්ට
විරුද්ධව දැන් අනාවැකි කියන්න.
**3** ඔබ මෙසේ පැවසිය යුතුයි. ‘විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවි පවසන්නේ මෙයයි. “මෙ-
ෂෙක් හා තූබල්හි මහ අධිපතියා
වන ගොග්, මම ඔබට විරුද්ධව
නැඟී සිටිමි. **4** මම ඔබව මෙල්ල
කර, ඔබේ හකුවලට කොකු දමා[13]
ඔබවත් ඔබේ මුළු මහත් හමුදා-
වත් ඇදගෙන යන්නෙමි.[14] මනා ලෙස
සරසන ලද[15] අශ්වයන්ගෙන්ද අසරු-
වන්ගෙන්ද සමන්විත, ලොකු කුඩා
පලිස්වලින් හා කඩුවලින් සන්නද්ධ වූ
ඒ අතිමහත් සේනාව ඔබත් සමඟම
එනු ඇත.[16] **5** පර්සියාවේද[17] ඉති-
යෝපියාවේද[18] පූට් දේශයේද[19] වැසි-
යෝ ඔබේ හමුදාවට එකතු වී
සිටිති. ඔවුහු සියලුදෙනා හිස්වැ-
සුම් පැළඳගෙන කුඩා පලිස් අතැතිව
සිටින්නෝය. **6** ගොමෙර් දේශයේ[20]
වැසියෝද ඔවුන්ගේ සියලු බළඇණිද
උතුරු දිශාවේ ඉතා පිටිසර පළා-
තක් වන තොගර්මාහි වැසියෝ[21] සහ
ඔවුන්ගේ සියලු බළඇණිද ඇතුළුව
විශාල ජන පිරිසක් ඔබ සමඟ සිටිති.[22]
**7** “ ‘ “දැන් සූදානම් වන්න. ඔබ

**37 පරි.**
1 එස 34:25
2 යෙසා 55:3
යෙරෙ 32:40
3 යෙරෙ 30:19
සෙක 8:5
හෙබ්‍රෙ 6:14
4 ලෙවී 26:11
2කොරි 6:16
5 එළි 21:3
6 ලෙවී 26:12
එස 11:20
එස 36:28
එස 43:7
හොෂෙ 2:23
7 එස 20:12
8 එස 36:23

**38 පරි.**
9 එස 39:1
10 එස 32:26
11 යෙසා 66:19
එස 27:13
12 එස 38:15
එස 39:6
13 2රාජා 19:28
එස 29:4
එස 39:2
14 එස 38:15
15 එස 23:12
16 යෙරෙ 46:9
17 එස 27:10
18 එස 30:5
19 1ලේක 1:8
20 උත් 10:2
21 උත් 10:3
එස 27:14
22 එස 39:2

**2 තීරුව**
1 යෙසා 8:9
යෙරෙ 46:3
යෝවෙ 3:9
2 යෙසා 66:8
3 මතෙ 24:31
4 යෙරෙ 23:6
එස 28:26
එස 34:25
5 යෙසා 28:2
6 යෙරෙ 4:13
7 ගීතා 83:4
8 හිතෝ 6:18
එළි 17:13
9 නික් 15:9
යෙරෙ 49:31
10 යෙසා 26:1
සෙක 2:4
11 යෙරෙ 33:12
12 සෙක 10:8
13 සෙක 2:8

සමඟ සිටින සමූහයවත් ඔබ අසල
රැස්ව සිටින සියලුදෙනාවත් සූදානම්
කරන්න.[1] ඔබ ඔවුන්ගේ නායකයා
විය යුතුයි.
**8** “ ‘ “බොහෝ කාලයක් ගත වූ පසු
මම ඔබ වෙතට මාගේ අවධානය
යොමු කරන්නෙමි. මන්දයත් අවසාන
කාලයේදී, කඩු ප්‍රහාරයෙන් බේරාගනු
ලැබූ ජනයාගේ දේශයට විරුද්ධව ඔබ
පැමිණෙනු ඇත.[2] බොහෝ ජාතීන්
අතරින් එකතු කරනු ලැබූ ඒ ජනයාව[3]
බොහෝ කාලයක් පුරා පාළුවට ගොස්
තිබුණු ඊශ්‍රායෙල්හි කඳු මතට ගෙ-
නෙන ලදි. විවිධ දේශයන් අතරේ
විසිර සිටි ඔවුන්ව එකතු කර එම දේ-
ශයට ගෙනෙන ලදි. ඔවුන් සියලු-
දෙනා දැන් සුරක්ෂිතව එම දේශයෙහි
වාසය කරන බව ඔබ දකින්නෙහිය.[4]
**9** එබැවින් ඔබ චණ්ඩ මාරුතයක්
මෙන් ඔවුන්ට විරුද්ධව පැමිණෙනු
ඇත.[5] මුළු දේශයම වසාගන්නා ඝන
වලාවක් මෙන්[6] ඔබද ඔබත් සමඟ
එකතු වී සිටින සියලු බළඇණිද
ජන සමූහයද ඔවුන්ට විරුද්ධව පැමි-
ණෙන්නෝය.” ’
**10** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසා ඇත්තේ මෙ-
යයි. ‘ඒ කාලයේදී විවිධාකාර අද-
හස් ඔබේ සිතට පහළ වී[7] ඔබ කූට
උපායක් යෙදීමට පෙලඹෙනු ඇත.[8]
**11** එහෙයින් ඔබ මෙසේ කියාගන්-
නෙහිය. “කිසි ආරක්ෂාවක් නැති ඒ
ගම්බද පළාතට පහර දෙන්න මම
පිටත්ව යන්නෙමි.[9] එහි ජීවත් වන
සියලුදෙනාම කිසිවෙකුගෙන් හිරිහැර-
යක් නැතුව සුරක්ෂිතව වාසය කරන්-
නෝය. එහි නිවෙස්වලට දොරවල්වත්
දොරගුලුවත් දමා නැත. ඒ දේශය
වටා පවුරක්වත් නැත.[10] ඒ නිසා ඒ
දේශය අල්ලාගන්න මට හැකි වෙයි.”
**12** යළි ගොඩනඟා ජනාවාස කරනු
ලැබූ ඒ දේශයටත්[11] විවිධ ජාතීන් අත-
රින් එකතු කරනු ලැබූ ඒ ජනයාටත්[12]
පහර දෙන පිණිස ඔබ පිටත්ව එන්-
නෙහිය. පොළොව මැද වාසය කරන
ඒ ජනයා[13] බොහෝ ඉඩකඩම් හා

ධන සම්පත් රැස් කරගෙන සිටිති.[1] ඒ
නිසා සිතේ හැටියට කොල්ල කෑමේ
අධිෂ්ඨානයෙන් ඔබ ඔවුන්ට විරුද්ධව
පිටත්ව එන්නෙහිය.[2]
13 "'ෂෙබා,[3] දෙදාන්[4] සහ තර්-
ෂීෂ්හි වෙළෙන්දෝද[5] කේශර සිංහයන්
වැනි වූ එහි නායකයෝද[6] ඔබෙන්
මෙසේ අසනු ඇත. "ඔබ ඒ දේශයට
යන්නේ කොල්ල කන්න නේද? ඔබ
මේ මහත් සමූහය රැස් කරගත්තේ එහි
තිබෙන ධන සම්පත් සියල්ල පැහැ-
රගන්න නේද? එහි ඇති රන් රිදී,
ඉඩකඩම් හා මහා ධන සම්භාරය
ලබාගන්න නේද ඔබ මේ යන්නේ?"'
14 "එහෙයින් මනුෂ්‍ය පුත්‍රය, ඔබ
ගොග්ට මෙම අනාවැකිය පවසන්න.
'විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි මෙසේ පවසයි. "ඒ
කාලයේදී මාගේ සෙනඟ සුරක්ෂිතව
වාසය කරන බව ඔබ දකින්නෙහිය.[7]
15 ඔබ උතුරුකරයේ ඉතා ඈතින්
පිහිටි ඔබේ වාසස්ථානයෙන් පිටත්ව
එනු ඇත.[8] අශ්වයන් පිට නැඟී එන
අතිවිශාල යුධ හමුදාවක් ඔබ සමඟ
පැමිණෙනු ඇත.[9] 16 ඔබ දේශය
වසාගන්නා ගන වලාවක් මෙන් මාගේ
සෙනඟ වන ඊශ්‍රායෙල් ජාතියට විරුද්-
ධව පැමිණෙන්නෙහිය.[10] මේ දේ සිදු
වන්නේ අවසාන කාලයේදීය. එහෙත්
මාගේ දේශයට විරුද්ධව පියවර ගැනී-
මට ඔබේ සිත පොළඹවන්නේ මා
බව හොඳින් මතක තබාගන්න.[11] මා
එසේ කරන්නේ ජාතීන් ඉදිරියේ මාගේ
නාමය ගෞරවයට පත් වන පිණි-
සයි. එවිට සියලුදෙනා මා කවුද කියා
හොඳින්ම දැනගනු ඇත."'[12]
17 "විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි.
'මා අතීතයේදී ඊශ්‍රායෙල් දේශයේ
සිටි මාගේ සේවකයන් වන අනාගත-
වක්තෘවරුන් මාර්ගයෙන් ඔබ ගැන[13]
කතා කළා නොවේද? ඔබ ඔවුන්ට
විරුද්ධව පැමිණෙන බව මා වසරක්
වසරක් පාසා අනාවැකි තුළින් පැව-
සුවා නොවේද?'[14]

**38 පරි.**
1 යෙසා 60:5; යෙසා 61:6
2 හිතෝ 1:13
3 එස 27:22
4 එස 27:15
5 එස 27:25
6 යෙරෙ 50:17
7 එස 38:8
8 එස 39:2
9 ශෙප 3:8
10 එස 38:9
11 යෝවෙ 3:2
12 නික් 14:4; 2රාජා 19:19; ගීතා 83:18; ගීතා 148:14; එස 36:23; එස 39:21; මතෙ 6:9
13 නික් 9:16; යෙසා 14:12; යෙරෙ 50:31; එස 28:17
14 යෝවෙ 3:16; සෙක 2:8

**2 තීරුව**
1 ද්වි 32:22; නාහු 1:2; හෙබ්‍රෙ 12:29
2 ගීතා 78:21; හෙබ්‍රෙ 12:29
3 හබ 3:6
4 හොෂෙ 4:3
5 යෙරෙ 4:24; නාහු 1:5
6 එස 14:17
7 2ලේක 20:23; හග් 2:22; සෙක 14:13
8 යෙරෙ 25:31
9 යෙසා 66:16
10 සෙක 14:12
11 නික් 9:22; යොෂු 10:11; ගීතා 18:12
12 යෙසා 29:6; යෙසා 30:30
13 උත් 19:24; ගීතා 11:6
14 ලෙවී 22:32; එස 36:23
15 ගීතා 9:16; එස 25:17

**39 පරි.**
16 එස 38:2

18 "විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේ පවසන්නේය.
'ගොග් ඊශ්‍රායෙල් දේශයට විරුද්-
ධව පැමිණෙන දවසේදී මාගේ උද-
හස දැවෙනු ඇත.*[1] 19 මා දැවෙන
කෝපයකින් යුතුව[2] කතා කරන ඒ
දවසේදී ඊශ්‍රායෙල් දේශය තුළ මහත්
කම්පනයක් ඇති වන්නේය.[3] 20 මා
නිසා මත්ස්‍යයෝද පක්ෂීහුද වනයේ
සැරිසරන මෘගයෝද බඩ ගා යන
සියලු සත්වයෝද මුළු මිනිස් වර්ගයාද
බියෙන් වෙවුලන්නෝය.[4] කඳු පවා
බිමට හෙළනු ලැබේ.[5] මහා පර්වත
සුනුවිසුනු කරනු ලැබේ. සෑම පවුරක්ම
පොළොවට සමතලා කරනු ඇත.'
21 "විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේ පවසයි.[6] 'මම
ගොග්ට විරුද්ධව කඩුවක් එවන්-
නෙමි. ඒ කඩුව මාගේ දේශයේ සියලු
කඳු වෙතට ගොස් ගොග්ගේ සෙනඟට
පහර දෙන්නේය. එවිට එක් එක්
කෙනා තම තමාගේ සහෝදරයාට
කඩුවෙන් පහර දෙනු ඇත.[7] 22 මම
ඔහුට විරුද්ධව මාගේ විනිශ්චය
ක්‍රියාත්මක කරන්නෙමි.[8] මම ඔහුටත්
ඔහුගේ හමුදාවටත් ඔහු කැටුව එන
ජන සමූහයටත් පහර දී මහා ලේ
වැගිරීමක් සිදු කරන්නෙමි.[9] වසංගත-
යෙන්ද[10] ධාරානිපාත වැසිවලින්ද හිම
කැට වර්ෂාවෙන්ද[11] ගින්නෙන්[12] හා
ගෙන්දගම්වලින්ද මම ඔවුන්ට පහර
දෙන්නෙමි.[13] 23 මෙසේ, මා ගෞ-
රවයට පත් වන පිණිස මම පිය-
වර ගන්නෙමි.[14] මට සිදු වී ඇති
නින්දාව සම්පූර්ණයෙන්ම ඉවත් කර
සියලු ජාතීන්ට මා කවුදැයි දැන-
ගන්න සලස්වන්නෙමි. එවිට මා යෙ-
හෝවා දෙවි බව පිළිගන්න ඔවුන්ට
සිදු වනු ඇත.'[15]

**39** "මනුෂ්‍ය පුත්‍රය, ඔබ ගොග්ට
විරුද්ධව මෙම අනාවැකිය
ප්‍රකාශ කරන්න.[16] 'විශ්වයේ පාලක-
යාණන් වන යෙහෝවා දෙවි මෙසේ

එස **38:18*** මූ.අ., "මාගේ උදහස නාස්පුඩුවලින් නික්මෙයි."

පවසන්නේය. “මෙෂෙක්[1] හා තුබල්හි[2]
මහ අධිපතියා වන ගොග්, මම ඔබට
විරුද්ධව පියවර ගන්නෙමි. **2** මම
ඔබව මෙල්ල කර ඊශ්‍රායෙල් දේ-
ශයට විරුද්ධව ඔබව යවන්නෙමි.[3]
ඔබ උතුරුකරයේ ඉතා ඈතින් පිහිටි
ස්ථානයකින් පිටත් වී[4] ඊශ්‍රායෙල් කඳු-
කරයට පැමිණෙනු ඇත. **3** එවිට
මම ඔබේ වමතේ තිබෙන දුන්නටද
ඔබේ දකුණතේ තිබෙන ඊතලවලටද
ගසා ඒවා බිම වට්ටන්නෙමි. **4** ඔබද
ඔබේ මහත් සේනාවද ඔබ සමඟ රැස්ව
සිටින මුළු සමූහයද ඊශ්‍රායෙල් දේශ-
යේ කඳු මත වැටෙනු ඇත.[5] මම
ගොදුරු අල්ලාගෙන කන පක්ෂීන්ටත්
වෙනත් පක්ෂීන්ටත් වනමෘගයන්ටත්
ඔබව ආහාර පිණිස දෙන්නෙමි.” ’[6]
**5** “ ‘ඔබ භූමිය මතුපිටම ඇද
වැටෙනවා ඇත.[7] මන්ද එසේ වීමට
නියම කර ඇත්තේ මමය’ කියා විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවි පවසයි.
**6** “ ‘මම මාගොග් දේශයටත්[8]
සුරක්ෂිතව වාසය කරන දූපත්-
වල වැසියන්ටත්[9] විරුද්ධව ගින්නක්
එවන්නෙමි. එවිට මා යෙහෝවා දෙවි
බව පිළිගන්න ජනයාට සිදු වනු ඇත.
**7** මාගේ සෙනඟ වන ඊශ්‍රායෙල් ඉදිරි-
යේ මාගේ ශුද්ධ නාමය මම ප්‍රකාශ
කරන්නෙමි. මාගේ ශුද්ධ නාමය තව-
දුරටත් නින්දාවට ලක් වෙන්න මම
ඉඩ දෙන්නේ නැත.[10] එවිට මා ඊශ්‍රා-
යෙල් දේශයේ ශුද්ධ තැනැත්තා[11] වන
යෙහෝවා දෙවි බව පිළිගන්න සියලු
ජාතීන්ට සිදු වනු ඇත.’[12]
**8** “ ‘ඒ දවස අනිවාර්යයෙන්ම පැමි-
ණෙන්නේය. මා පැවසූ සියල්ල එලෙ-
සම ඉටු වන්නේය’[13] කියා විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවි
පවසයි. ‘මා කී දවස මෙයයි.[14] **9** ඒ
දවසේදී, ඊශ්‍රායෙල් දේශයේ නුවරවල
වැසියෝ ඇවිත් ලොකු කුඩා පලිස්,
දුනු, ඊතල, හෙල්ල, මුගුරු යනාදි
සියලු යුද්ධායුධ ගොඩගසා ඒවාට ගිනි
තබන්නෝය.[15] ඔවුහු අවුරුදු හතක්
පුරා ඒවා දවන්නෝය. **10** ගින්-
නක් ඇවිළීම සඳහා එළිමහනට හෝ
වනාන්තරයට හෝ ගොස් කෝටු
කැලිවත් දරවත් එකතු කරන්න
ඔවුන්ට අවශ්‍ය වන්නේ නැත. මන්ද
ඔවුන් ගිනි අවුළුවන්නේ යුධ අවිව-
ලිනි.’
“ ‘තමන්ගෙන් කොල්ල කෑ අය-
ගෙන් ඔවුහු කොල්ල කන්නෝය.[1]
තම දේපළ පැහැරගත් අයගෙන් ඔවු-
හුද දේපළ පැහැරගන්නෝය’ කියා
විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි පවසයි.
**11** “ ‘ඒ කාලයේදී මම ගොග්ට[2]
ඊශ්‍රායෙල් දේශයේ සොහොනක් සූදා-
නම් කර දෙන්නෙමි. එම සොහොන
තිබෙන්නේ මුහුදට නැඟෙනහිරින්
පිහිටි මඟීන්ගේ තැනිතලාවේය. ඒ
නිසා එතැනින් යන එන අයගේ
ගමන අවහිර වනු ඇත. ගොග්-
වත් ඔහුගේ මුළු සෙනඟවත් වළලනු
ලබන්නේ එහිදීය. එම ස්ථානයට,
“හාමොන්-ගොග් තැනිතලාව”* යන
නම තබනු ඇත.[3] **12** ඊශ්‍රායෙල්
දේශයේ වැසියෝ සත් මසක් පුරා
ගොග්වත් ඔහුගේ සමූහයවත් එහි
වළලමින් දේශය පවිත්‍ර කරන්නෝය.[4]
**13** ඔවුන්ව වැළලීමට දේශයේ සියලු
වැසියෝ අනිවාර්යයෙන්ම සහභාගි
වනු ඇත. මා ගෞරවයට පත් වන ඒ
දවසේදී[5] දේශයේ ඒ වැසියන්ටද කීර්ති
නාමයක් ලැබෙන්නේය’ කියා විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවි පවසයි.
**14** “ ‘දේශයේ තවත් මළ කඳන්
ඇද්දැයි සෝදිසි කර බැලීමට පුරුෂ-
යන්ව තෝරාගනු ලැබේ. නිරතුරු-
වම එම කාර්යයේ යෙදෙන ඔවුන්ගේ
උපකාරයට වෙනත් අයද පැමිණෙන්-
නෝය. ඔවුහු දේශය පුරා ඇවිදිමින්
ඉතුරුව ඇති මළ කඳන් වළලා දමා
දේශය පිරිසිදු කරන්නෝය. ඔවුහු සත්
මසක් පුරා එම කාර්යයෙහි නියැ-
ළෙන්නෝය. **15** දේශය සෝදිසි

එස **39:11*** තේරුම, “ගොග්ගේ සමූහයට අයිති තැනිතලාව.”

**39 පරි.**
1 එස 32:26
2 එස 27:13
3 එස 38:4
4 එස 38:15
5 එස 38:21
6 එස 32:4; එස 33:27; එළි 19:18
7 යෙරෙ 8:2; යෙරෙ 25:33
8 එස 38:22
9 ගීතා 72:10
10 ලෙවී 18:21; එස 20:9
11 යෙසා 6:3
12 එස 38:16
13 එළි 16:17
14 යෙසා 46:10; 2පේතෘ 3:10
15 යොෂු 11:6; ගීතා 46:9

**2 තීරුව**
1 යෝබ් 34:11; යෙසා 14:2; මතෙ 7:2; එළි 18:6
2 එස 38:2
3 එස 39:15
4 ද්වි 21:23
5 එස 28:22; එස 38:16

කර බලන අය මුළු දේශය පුරාම
යා යුතුය. එසේ සෝදිසි කරන අත-
රේදී මිනිසෙකුගේ ඇටකටු දක්නට
ලැබුණොත් ඔවුන් ඒ අසල ලකුණක්
තබා යා යුතුය. ඉන්පසුව වැළලීමේ
කාර්යයේ නිරත වන අය ඒ ඇට-
කටු රැගෙන ගොස්, “හාමොන්-ගොග්”
නම් තැනිතලාවෙහි වැළලිය යුතුය.[1]
**16** එම තැනිතලාවේ පිහිටි නුවරේ
නම, “හාමොනාය.”* මෙසේ, ඔවුහු
දේශය සම්පූර්ණයෙන්ම පවිත්‍ර කරන්-
නෝය.’[2]

**17** “මනුෂ්‍ය පුත්‍රය, විශ්වයේ පාල-
කයාණන් වන යෙහෝවා දෙවි ඔබට
මෙසේ පවසන්නේය. ‘සියලු පක්-
ෂීන්ටත් වනයේ සැරිසරන සියලුම
සතුන්ටත් මෙසේ කියන්න.[3] “එන්න!
රංචු පිටින් එන්න. මා පිළියෙල කර
ඇති පූජාව වටා එක් රොක් වන්න.
ඒ පූජාව මා සූදානම් කරන්නේ ඔබ
වෙනුවෙන්ය. එය ඊශ්‍රායෙල් කඳුකර-
යේ සිදු කරන දැවැන්ත පූජාවකි.[4]
එහිදී ඔබ සියලුදෙනාම මස් කා ලේ
බොන්නහුය.[5] **18** ඔබ බලවතුන්ගේ
මස් කන්නහුය.[6] එළුවන්, බැටළු-
වන්,[7] තරුණ ගවයන්[8] මෙන් සිටින
පොළොවේ අධිපතීන්ගේ ලේ බොන්-
නහුය. ඔවුහු සියලුදෙනා බාෂාන් දේ-
ශයේ තර සත්තුය.[9] **19** මා ඔබ
වෙනුවෙන් පිළියෙල කරන මෙම පූජා-
වෙන් ඔබ තෙල් කොටස් කා තෘප්ති-
යට පැමිණෙන්නහුය.[10] ඔබ මත් වන
තෙක්ම ඔවුන්ගේ ලේ බොන්නහුය.”’

**20** “‘ඔබ මාගේ මේසය ළඟට
ඇවිත් අශ්වයන්ගේද අශ්ව රථ පද-
වන්නන්ගේද බලවතුන්ගේද බොහෝ
රණශූරයන්ගේද මස් කා තෘප්තියට
පැමිණෙනවා ඇත’ කියා විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවි
පවසයි.[11]

**21** “‘මම ජාතීන්ට මාගේ තේ-
ජස දකින්න සලස්වන්නෙමි. එවිට
මා නියම කළ දේ ඉටු වන ආකාර-
යත්[12] මාගේ අතිමහත් බලය ඔවුන්ට
විරුද්ධව ක්‍රියාත්මක වන ආකාර-
යත් සියලු ජාතීහු දකිනු ඇත.[1]
**22** ඒ දවසේදී, යෙහෝවා වන මා
ඔවුන්ගේ දෙවි බව ඊශ්‍රායෙල් දේශ-
යේ වැසියන්ට පිළිගන්න සිදු වනු
ඇත.[2] **23** ඊශ්‍රායෙල් ජනයා වහල්-
භාවයට ගියේ තමන්ගේම වැරදි නිසා
කියා සියලු ජාතීහු තේරුම්ගනු ඇත.[3]
මන්ද ඔවුන් මට ද්‍රෝහි වූ නිසා මම
ඔවුන්ට පිහිට නොවී[4] ඔවුන්ව සතු-
රන්ගේ අතට පත් වෙන්න ඉඩහැ-
රියෙමි. ඔවුහු සියලුදෙනා කඩුවෙන්
මැරුම් කැවෝය.[5] **24** මා ඔවුන්ට
දඬුවම් කළේ ඔවුන් කළ අපවිත්‍ර
දේවල් හා ඔවුන්ගේ වැරදි නිසාය.[6]
මම මාගේ මුහුණ ඔවුන්ගෙන් ඉවතට
හරවාගතිමි.’

**25** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේ පවසයි. ‘මම
දැන් වහල්භාවයේ සිටින යාකොබ්-
ගේ පෙළපතට අයත් සියලුදෙ-
නාව නැවත ගෙනෙන්නෙමි.[7] මෙසේ,
මුළු ඊශ්‍රායෙල් ජාතියටම මම දයාව
පෙන්වන්නෙමි.[8] මාගේ ශුද්ධ නාමය
වෙනුවෙන් මම නැඟී සිටින්නෙමි.[9]
**26** මට විරුද්ධව කළ සියලු ද්‍රෝහි-
කම්වලට ඔවුහු දඬුවම් විඳ ඇත.[10]
ඔවුන් අද්දුටු නින්දාවද[11] දැන් අව-
සන්ය. මෙතැන් පටන් ඔවුහු තමන්-
ගේම දේශයේ සුරක්ෂිතව වාසය
කරන්නෝය.[12] කිසිවෙක් ඔවුන්ව
බියගන්වන්නේ නැත.[13] **27** ඔවුන්
විසිර සිටි ජාතීන් අතරින්ද ඔවුන්ගේ
සතුරන්ගේ දේශවලින්ද මම ඔවුන්ව
නැවතත් එකතු කරන්නෙමි.[14] සියලු
ජාතීන් ඉදිරියෙන් මාගේ සෙනඟ ඉදි-
රියෙන් මා ශුද්ධ දෙවි කෙනෙකු බව
මම ඔප්පු කර පෙන්වන්නෙමි.’[15]

**28** “‘ඔවුන්ව ජාතීන් අතරට වහ-
ලුන් ලෙස යැව්වද මම නැවතත්
ඔවුන් සියලුදෙනාව ඔවුන්ගේ දේශයට
රැගෙන එන්නෙමි.[16] එවිට මා ඔවුන්-
ගේ දෙවි වන යෙහෝවා බව පිළි-
ගන්න ඔවුන්ට සිදු වනු ඇත. මම
ඔවුන්ගෙන් එක් කෙනෙකුවත් ඒ
දේශවල අත්හැර දමන්නේ නැත.[17]

**39 පරි.**
**1** එස 39:11
**2** එස 39:12
**3** යෙරෙ 12:9
ශෙප 1:7
**4** යෙසා 34:6
යෙරෙ 46:10
එස 32:4
එළි 19:17
**5** එළි 19:18
**6** එස 29:5
**7** යෙරෙ 51:40
**8** යෙසා 34:7
යෙරෙ 50:27
**9** ද්වි 32:14
ගීතා 22:12
ආමො 4:1
**10** එළි 19:21
**11** ගීතා 76:6
එස 38:4
හග් 2:22
එළි 19:18
**12** නික් 14:4
යෙසා 37:20
එස 36:23
එස 38:16
මලා 1:11

**2 තීරුව**
**1** නික් 7:4
නික් 8:19
1සාමු 5:7
1සාමු 6:9
**2** ගීතා 9:16
යෙරෙ 24:7
**3** 2ලේක 7:22
යෙරෙ 22:9
**4** ද්වි 31:18
ගීතා 30:7
යෙසා 59:2
**5** ලෙවී 26:25
ද්වි 32:30
ගීතා 106:41
**6** ලෙවී 26:24
එස 36:19
**7** යෙරෙ 30:3
එස 34:13
**8** යෙරෙ 31:1
හොෂෙ 1:11
සෙක 1:16
**9** නික් 34:14
එස 36:21
**10** ගීතා 99:8
**11** දානි 9:16
**12** ලෙවී 26:5
**13** යෙරෙ 23:6
**14** යෙරෙ 30:10
යෙරෙ 46:27
එස 28:25
ආමො 9:14
ශෙප 3:20
**15** යෙසා 5:16
එස 36:23
එස 38:16
**16** එස 34:30
**17** ද්වි 30:4

එස **39:16*** තේරුම, “සමූහය.”

**29** මම නැවත කිසිදා ඊශ්‍රායෙල්
සෙනඟගෙන් ඇත් නොවන්නෙමි.[1]
මම නොඅඩුව ඔවුන්ට මාගේ බලය
දෙන්නෙමි'[2] කියා විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි පවසන්-
නේය."

**40** යෙරුසලම් නුවර විනාශ
වීමෙන් අනතුරුව[3] ගත වන
දහහතරවන අවුරුද්දේ එනම්, අප
වහලුන් ලෙස ගත කළ විසිපස්වන
අවුරුද්දේ[4] මුල්ම මාසයේ දහවන දින
යෙහෝවා දෙවිගේ බලය මා තුළ
ක්‍රියාත්මක වීමට පටන්ගත්තේය.[5] ඒ
අවස්ථාවේදී දෙවි මාව වෙනත් ස්ථා-
නයකට ගෙන යන බව මට දැනිණ.[6]
**2** මා දකිමින් සිටියේ දෙවිගෙන් ලද
දර්ශනයකි. ඒ දර්ශනයේදී ඔහු මාව
ඊශ්‍රායෙල් දේශයට ගෙනැවිත් ඉතා
උස් කන්දක් මත තැබුවේය.[7] ඒ කන්-
දට දකුණින් නුවරකට සමාන වූ ගො-
ඩනැඟිල්ලක් ඉදි කර තිබිණ.[8]
**3** ඔහු මාව ඒ ගොඩනැඟිල්ල දෙ-
සට ගෙන ගියේය. ඒ ගොඩනැඟිල්-
ලට ඇතුල් වන ස්ථානය අසල තඹ
පැහැයෙන් යුත් මිනිසෙක් සිටගෙන
සිටියේය.[9] ඔහුගේ අතේ හණ කෙඳි-
වලින් සෑදූ ලණුවක්ද මිනුම් දණ්-
ඩක්ද තිබිණ.[10] **4** ඒ මිනිසා මට
මෙසේ පැවසුවේය. "මනුෂ්‍ය පුත්‍රය,[11]
ඔබව මෙතැනට ගෙනාවේ ඔබට යම්
විශේෂ දෙයක් පෙන්වන්නයි. ඒ නිසා,
ඒ දේවල් දෙස හොඳින් බලා ඒවා-
යේ වැදගත්කම සිතට ගන්න. මා
කියන දේටත් හොඳින් සවන් දෙන්න.
පසුව ඔබ ගොස්, ඔබ දකින මේ සෑම
දෙයක්ම ඊශ්‍රායෙල් ජනයාට පැවසිය
යුතුයි."[12]
**5** මා දුටු ඒ ගොඩනැඟිල්ල වටා
පවුරක් ඉදි කර තිබිණ. මා සමඟ
කතා කළ මිනිසාගේ අතේ රියන්
හයක් දිග මිනුම් දණ්ඩක් තිබු-
ණේය. එහෙත් ඒවා සාමාන්‍ය රියන්*
නොවේ. ඒ එක් රියනක් සාමාන්‍ය
රියනකට වඩා අල්ලකින්* වැඩිය.
එම දණ්ඩ යොදාගෙන ඔහු පවුරෙහි
පළල මනින්න පටන්ගත්තේය. එහි
පළල ඔහුගේ මිනුම් දණ්ඩේ දිගට
සමාන විය. පවුරේ උසද දණ්ඩේ දිගට
සමාන විය.
**6** ඔහු නැඟෙනහිරට මුහුණ ලා
පිහිටි ඇතුල් වීමේ ස්ථානය අස-
ලට පැමිණියේය.[1] ඔහු පඩි පෙළ
දිගේ නැඟගෙන ගොස් දොරටුව ළඟට
පැමිණියේය. ඉන්පසුව ඔහු ශාලාවට
පිවිසෙන ස්ථානය මැන බැලුවේය.[2]
එහි පළල මිනුම් දණ්ඩේ දිගට සමාන
විය. ඒ හා සමාන තවත් ස්ථානයක්ද
තිබිණ. එහි පළලත් දණ්ඩේ දිගට
සමාන විය. **7** දොරටුවෙන් ඇතුල්
වූ විට තිබෙන ශාලාව දෙපස මුර-
කුටි[3] පිහිටා තිබිණ. ඔහු ඒවාද මැන්-
නේය. කුටියක දිග දණ්ඩේ දිගට
සමාන විය. පළලත් දණ්ඩේ දිගට
සමාන විය. මෙම මුරකුටි අතර රියන්
පහක පරතරයක් තිබිණ. දේවමාලි-
ගාවට මුහුණ ලා තිබෙන දොරටු-
වට යාබදව ආලින්දයක් තිබිණ. ඔහු
ආලින්දයට පිවිසෙන ස්ථානයද මැන්-
නේය. එය දණ්ඩේ දිගට සමාන විය.
**8** ඉන්පසු ඔහු දේවමාලිගාවට
මුහුණ ලා තිබෙන දොරටුවට යාබදව
තිබූ ආලින්දය මැන්නේය. එයද දණ්-
ඩේ දිගට සමාන විය.[4] **9** ආලින්ද-
යේ දිග රියන් අටක් විය. ඊට යාබදව
තිබූ දොරටුව දෙපස පිහිටි කණුවල
පළල රියන් දෙකක් විය. ආලින්දය
තිබුණේ දේවමාලිගාවට මුහුණ ලාය.
**10** නැඟෙනහිර දෙසට මුහුණ ලා
පිහිටි ඇතුල් වීමේ ශාලාව දෙපස මුර-
කුටි තුන බැගින් තිබිණ. මුරකුටි
තුනේම මිම් එක හා සමාන විය. මුර-
කුටි අසල පිහිටා තිබුණු කණුවල
මිම්ද එක හා සමාන විය.
**11** ඇතුල් වන ස්ථානයේ ප්‍රධාන
දොරටුවේ දිග රියන් දහතුනක් විය.
ශාලාවට පිවිසෙන ස්ථානයේ දිග
රියන් දහයකි.

**39 පරි.**
1 යෙසා 45:17; යෙසා 54:8; යෙරෙ 29:14
2 යෙසා 32:15; යෝවෙ 2:28; සෙක 12:10

**40 පරි.**
3 2රාජා 25:9; 2ලේක 36:19; එස 33:21
4 2රාජා 24:15
5 එස 1:3
6 එස 8:3
7 යෙසා 2:2; මීකා 4:1
8 එළි 21:10
9 එස 1:7; දානි 10:6
10 ගීතා 78:55; එස 47:3; සෙක 2:1; එළි 11:1; එළි 21:15
11 එස 44:5
12 යෙරෙ 26:2; එස 43:10; ක්‍රියා 20:27

**2 තීරුව**
1 එස 40:10; එස 43:1
2 එස 46:2
3 1ලේක 9:26
4 එස 40:5

එස **40:5*** උත් 6:15හි පාදසටහන බලන්න.

එස **40:5*** සෙන්ටිමීටර් 7.4ක් පමණ.

**12** සෑම මුරකුටියකම ඉදිරිපසින්
මුරකුටියට සම්බන්ධ වන සේ කුඩා
වැටක් බැඳ තිබිණ. ඒ වැටවල් බැඳ
තිබුණේ මුරකුටිවලට රියනක් ඉදිරි-
යෙනි. එක් මුරකුටියක පළල රියන්
හයක් විය.

**13** ඊළඟට ඔහු එක් පැත්තක
ඇති මුරකුටියක ඇතුල් බිත්තියේ
සිට ඊට මුහුණ ලා පිහිටි මුරකුටියේ
ඇතුල් බිත්තිය දක්වා ඇති දුර ප්‍රමා-
ණය මැන්නේය. මේ අනුව ඇතුල්
වීමේ ශාලාවේ මුළු පළල රියන් විසිප-
හක් විය.[1] එම මුරකුටිවලට ඇතුල්
වන ස්ථාන පිහිටා තිබුණේ එකිනෙ-
කට සමාන්තරවයි. **14** පිටත මළු-
වට මුහුණ ලා තිබූ ශාලාවේ දොරටුව
දෙපස ඉදි කර තිබුණු කණුවලට
අමතරව තවත් කණු පෙළක් ඉදි
කර තිබිණ. එම කණු පෙළ ඉදි
කර තිබුණේ මළුවේ මායිම දිගේය.
එක් කණුවක උස රියන් හැටක් විය.
**15** ශාලාවේ ඉදිරිපස දොරටුවේ සිට
ආලින්දය කෙළවරේ පිහිටි අනික් දො-
රටුව දක්වා ශාලාවේ මුළු දිග රියන්
පනහක් විය.

**16** මුරකුටිවල පිටුපස තිබූ බිත්ති-
යේද ඒවා දෙපස තිබූ කණුවලද කවුළු
පිහිටා තිබිණ.[2] ඒ කවුළු සාදා තිබුණේ
ශාලාවේ බිත්තියේ ඇතුල් පැත්තේ
සිට පිට පැත්ත දක්වා ක්‍රමක්‍රමයෙන්
පටු වී යන ආකාරයටය. ආලින්ද-
යේ දෙපස බිත්තිවලද එවැනිම කවුළු
පිහිටා තිබිණ. ශාලාව දෙපස පිහිටි
කණුවල තාල ගස්වල රූප දක්නට
තිබිණ.[3]

**17** ඔහු මාව පිටත මළුවට ගෙනා-
වේය. පිටත මළුවේ මායිම වටා වේදි-
කාවක් ඉදි කර තිබූ අතර ඒ වේදිකාව
මත භෝජන ශාලා තිහක් ගොඩනඟා
තිබිණ.[4] **18** මෙම වේදිකාවේ පළල
ඇතුල් වීමේ ශාලාවල දිගට සමාන
විය. එම වේදිකාව හැඳින්වූයේ පහළ
වේදිකාව ලෙසයි.

**19** ඔහු ගොඩනැඟිල්ලට ඇතුල්
වීම සඳහා නැඟෙනහිර දෙසින් පිහිටි
ශාලාවේ ඇතුල් දොරටුවේ සිට ඇතුල්
මළුවේ මායිම දක්වා ඇති දුර ප්‍රමා-
ණය මැන්නේය. එය රියන් සියයක්
විය. ඔහු ගොඩනැඟිල්ලට ඇතුල් වීම
සඳහා උතුරු දෙසින් පිහිටි ශාලාවේ
ඇතුල් දොරටුවේ සිට ඇතුල් මළුවේ
මායිම දක්වාද මැන්නේය. එහි දුර
ප්‍රමාණයද රියන් සියයක් විය.

**20** ගොඩනැඟිල්ලට ඇතුල් වීම
සඳහා උතුරු දෙසින්ද ශාලාවක්
තිබිණ. එය පිහිටා තිබුණේ පිටත
මළුවේය. ඔහු එම ශාලාවේ දිග හා
පළල මැන්නේය. **21** එම ශාලාවේ
දෙපසද මුරකුටි තුන බැගින් පිහිටා
තිබිණ. එහි දෙපස පිහිටි කණුවල
මිම්ද ආලින්දයේ මිම්ද නැඟෙනහිර
දෙසින් පිහිටි ඇතුල් වීමේ ශාලා-
වේ මිම්වලටම සමාන විය. ශාලාවේ
දිග රියන් පනහක්ද එහි පළල රියන්
විසිපහක්ද විය. **22** එහි කවුළුවල
මිම්ද ආලින්දයේ මිම්ද තාල ගස් රූප-
වල[1] මිම්ද නැඟෙනහිර දෙසින් පිහිටි
ඇතුල් වීමේ ශාලාවේ මිම්වලටම
සමාන විය. එම ශාලාවේ දොරටුව
වෙත පිවිසීමට පඩි හතක් නැඟීමට
සිදු විය. එහි ආලින්දය පිහිටා තිබු-
ණේ ශාලාවට ඇතුල් වන දොරටුවට
මුහුණ ලාය.

**23** උතුරු දෙසින් පිහිටා තිබූ මෙම
ශාලාවට ඉදිරියෙන් ඇතුල් මළුවට
පිවිසීමට දොරටුවක් සහිත ශාලාවක්
තිබිණ. එය පිහිටා තිබුණේ ඇතුල්
මළුවේය. ඔහු එම ශාලාවේ දොරටු-
වේ සිට ඊට ඉදිරියෙන් පිහිටි ඇතුල්
වීමේ ශාලාවේ දොරටුව දක්වා ඇති
දුර ප්‍රමාණය මැන්නේය. එය රියන්
සියයක් විය. ඇතුල් මළුවට පිවිසීම
සඳහා නැඟෙනහිර දෙසින්ද දොරටු-
වක් සහිත ශාලාවක් ඉදි කර තිබිණ.

**24** ඔහු ඊළඟට මාව දකුණු දෙසට
ගෙනාවේය. දකුණු දෙසින්ද ගොඩ-
නැඟිල්ලට ඇතුල් වීම සඳහා ශාලා-
වක් පිහිටා තිබිණ.[2] ඔහු එහි දොරටුව
දෙපස පිහිටි කණුද එහි ආලින්දයද
මැන්නේය. එහි මිම්ද කලින් සඳහන්
කළ ශාලාවල මිම්වලටම සමාන විය.

**40 පරි.**
1 එස 40:21
2 1රාජා 6:4 එස 41:26
3 1රාජා 6:35
4 1ලේක 28:12 එස 45:5

**2 තීරුව**
1 එස 41:20 එස 41:26
2 එස 46:9

**25** එහි බිත්ති වටාද ආලින්දය දෙප-
සද කවුළු පිහිටා තිබිණ. ඒ කවුළු
කලින් සඳහන් කළ ඒවාට සමාන
විය. දකුණු දෙසින් පිහිටි ඇතුල්
වීමේ ශාලාවේ දිග රියන් පනහකි.
පළල රියන් විසිපහකි. **26** ඒ ශාලා-
වට ඇතුල් වීම සඳහාද පඩි සතක්
නැඟීමට සිදු විය.[1] එහි ආලින්දය තිබු-
ණේද ශාලාවට ඇතුල් වන දොරටුවට
මුහුණ ලාය. දොරටුව දෙපස පිහිටි
කණුවල තාල ගස්වල රූප තිබිණ.
**27** ඇතුල් මළුවට පිවිසීම සඳහා
දකුණු දෙසින් ශාලාවක් ඉදි කර
තිබිණ. එම ශාලාවේ සිට ගොඩ-
නැඟිල්ලට පිවිසීම සඳහා දකුණු දෙ-
සින් පිහිටි ශාලාවේ ඇතුල් දොරටුව
අතර දුර ප්‍රමාණය ඔහු මැන්නේය.
එය රියන් සියයක් විය. **28** ඔහු
ඊළඟට, ඇතුල් මළුවට පිවිසීම සඳහා
දකුණු දෙසින් පිහිටි ශාලාව අස-
ලට මාව ගෙනාවේය. ඔහු එයද
මැන්නේය. එහි මිම්ද කලින් සඳ-
හන් කළ ශාලාවල මිම්වලට සමාන
විය. **29** එහි පිහිටා තිබුණු මුරකුටි-
වල මිම්ද දෙපස පිහිටි කණුවල මිම්ද
එහි ආලින්දයේ මිම්ද කලින් සඳ-
හන් කළ ශාලාවල මිම්වලට සමාන
විය. එහි බිත්තිය වටාද ආලින්-
දය දෙපසද කවුළු පිහිටා තිබිණ.
ශාලාවේ දිග රියන් පනහකි. පළල
රියන් විසිපහකි.[2] **30** (ඇතුල් මළු-
වට පිවිසීම සඳහා තිබූ මෙම ශාලාවල
සෑම දොරටුවකටම යාබදව ආලින්දය
බැගින් පිහිටා තිබිණ. ඒවායේ දිග
රියන් විසිපහකි. පළල රියන් පහකි.)
**31** ආලින්දය පිහිටා තිබුණේ පිටත
මළුවට මුහුණ ලාය. දොරටුව දෙපස
පිහිටි කණුවල තාල ගස් රූප තිබිණ.[3]
මෙම ශාලාවලට ඇතුල් වීම සඳහා
පඩි අටක් නැඟීමට සිදු විය.[4]
**32** ඔහු ඊළඟට මාව ඇතුල් මළු-
වට පිවිසීම සඳහා නැඟෙනහිර දෙසින්
ඉදි කර තිබූ ශාලාවට ගෙනාවේය.
ඔහු එම ශාලාවද මැන්නේය. එහි
මිම්ද කලින් සඳහන් කළ ශාලා-
වල මිම්වලට සමාන විය. **33** එහි
තිබුණු මුරකුටිවල මිම්ද දෙපස පිහිටි
කණුවල මිම්ද එහි ආලින්දයේ මිම්ද
කලින් සඳහන් කළ ශාලාවල මිම්ව-
ලට සමාන විය. එම ශාලාවේ බිත්ති
වටාද ආලින්දය දෙපසද කවුළු පිහිටා
තිබිණ. ශාලාවේ දිග රියන් පනහක්ද
පළල රියන් විසිපහක්ද විය. **34** එහි
ආලින්දය පිහිටා තිබුණේ පිටත මළු-
වට මුහුණ ලාය. දොරටුව දෙපස
පිහිටි කණුවල තාල ගස් රූප තිබිණ.
දොරටුව වෙත පිවිසීම සඳහා පඩි
අටක් නැඟීමට සිදු විය.
**35** ඔහු මාව ඇතුල් මළුවට පිවිසීම
සඳහා උතුරු දෙසින් පිහිටි ශාලා-
වට ගෙනාවේය.[1] ඔහු එයද මැන්-
නේය. එහි මිම්ද කලින් සඳහන්
කළ ශාලාවල මිම්වලට සමාන විය.[2]
**36** එහි මුරකුටිවල මිම්ද දොරටුව දෙ-
පස පිහිටි කණුවල මිම්ද ආලින්දයේ
මිම්ද කලින් සඳහන් කළ ශාලාවල
මිම්වලට සමානය. ශාලාවේ බිත්-
තිය වටේටම කවුළුද පිහිටා තිබිණ.
ශාලාවේ දිග රියන් පනහක්ද පළල
රියන් විසිපහක්ද විය. **37** එහි දොර-
ටුව දෙපස තිබූ කණු පිහිටා තිබුණේ
පිටත මළුවට මුහුණ ලාය. එම කණු-
වලද තාල ගස් රූප තිබිණ.[3] එහි දො-
රටුව වෙත පිවිසීම සඳහා පඩි අටක්
නැඟීමට සිදු විය.
**38** ඇතුල් වීමේ ශාලාවල දොරටු
දෙපස පිහිටි කණු අසල භෝජන
ශාලා ඉදි කර තිබිණ. භෝජන ශාලා-
වලට දොරටුව බැගින් තිබිණ. දවන
පූජාව සඳහා ගෙනා සතුන්ව සෝදනු
ලැබුවේ එම ශාලාවලදීය.[4]
**39** උතුරු දෙසින් පිහිටි ඇතුල්
වීමේ ශාලාවේ ආලින්දය දෙපස මේස
දෙක බැගින් තබා තිබිණ. එම මේස
හතර භාවිත කළේ දවන පූජාවන්,[5]
පාප පූජාවන්[6] හා වන්දි පූජාවන්[7]
සඳහා ඔප්පු කරන සතුන්ව මැරීමටය.
**40** මීට අමතරව උතුරු දෙසින් පිහිටි
ඇතුල් වීමේ ශාලාවේ දොරටුවට
නඟින පඩි පෙළ දෙපසද මේස දෙක
බැගින් තබා තිබිණ. **41** එම දොර-
ටුව අසල පිහිටි ආලින්දයේ මේස

**40 පරි.**
1 එස 40:22
2 එස 40:21
3 එස 40:16
4 එස 40:34 එස 40:37

**2 තීරුව**
1 එස 44:4
2 එස 40:32
3 එස 40:31
4 ලෙවී 8:21
5 ලෙවී 1:3 එස 43:18
6 ලෙවී 4:3
7 ලෙවී 5:6 ලෙවී 7:1 එස 42:13 එස 44:29

හතරක්ද පඩි පෙළ දෙපස මේස හත-
රක්ද වශයෙන් මේස අටක් තබා
තිබිණ. පූජා සඳහා ඔප්පු කරන
සතුන්ව මරනු ලැබුවේ එම මේස
මතය. 42 දවන පූජා සඳහා වෙන්
කළ මේස හතර කැපූ ගල්වලින්
සාදා තිබිණ. ඒවායෙහි දිග රියන්
එකහමාරක්ද පළල රියන් එකහමා-
රක්ද විය. උස රියනකි. දවන පූජා-
වන් හා වෙනත් පූජාවන් සඳහා ඔප්පු
කරන සතුන්ව මැරීම සඳහා භාවිත
කළ ආයුධ තැබුවේ ඒවා මතය.
43 ආයුධ ගබඩා කිරීමට තනා තිබූ
රාක්කවල පළල අල්ලක පළලට
සමානය. එම රාක්ක බිත්තිවලට සවි
කර තිබිණ. තෑගි පූජාවලට පිදූ මස්
තබනු ලැබුවේ මේස මතය.[1]

44 ඇතුල් මළුවට පිවිසීම සඳහා
උතුරු දෙසින් පිහිටි ශාලාව අසල එක්
පැත්තක ගායකයන්[2] සඳහා භෝජන
ශාලා ඉදි කර තිබිණ. එම භෝජන
ශාලාවලට පිවිසෙන දොරටු තිබුණේ
දකුණු දෙසට මුහුණ ලාය. ඇතුල්
මළුවට පිවිසීම සඳහා නැඟෙනහිර
දෙසින් පිහිටි ශාලාව අසල එක් පැත්-
තක තවත් භෝජන ශාලාවක් ඉදි
කර තිබිණ. එහි දොරටුව පිහිටා තිබු-
ණේ උතුරු දෙසට මුහුණ ලාය.

45 ඔහු මට මෙසේ කීවේය. "දකුණු
දෙසට මුහුණ ලා තිබෙන දොර-
ටුව සහිත භෝජන ශාලාව දේවමා-
ලිගාවේ වගකීම් උසුලන පූජකයන්
සඳහාය.[3] 46 උතුරු දෙසට මුහුණ
ලා තිබෙන දොරටුව සහිත භෝජන
ශාලාව පූජාසනයට අදාළ වගකීම්
උසුලන පූජකයන් සඳහාය.[4] යෙ-
හෝවා දෙවි ඉදිරියට ගොස් සේවය
කරන ඔවුහු[5] ලෙවීගෙන් පැවතෙන
සාදොක්ගේ පුත්‍රයෝය."[6]

47 ඉන්පසුව ඔහු ගොස් ඇතුල්
මළුව මැන්නේය. එහි දිගද පළලද
රියන් සියයක් බැගින් විය. එය සමච-
තුරස්‍රයකි. පූජාසනය පිහිටා තිබුණේ
දේවමාලිගාවට ඇතුල් වන ස්ථානය
ඉදිරියෙහිය.

48 ඔහු ඊළඟට මාව දේවමාලි-
ගාවේ පිවිසුම් ශාලාව තුළට ගෙ-
නාවේය.[1] ඔහු එම ශාලාවේ දෙපස
තිබුණු කණු දෙක මැන්නේය. එම
කණුවල දිග රියන් පහ බැගින් විය.
ඉන්පසුව ඔහු එහි දොරටුවද මැන්-
නේය. දොරටුවේ පැති දෙකෙහි පළල
රියන් තුන බැගින් විය.

49 පිවිසුම් ශාලාවේ දිග රියන් විස්-
සකි. එහි පළල රියන් එකොළහකි.
එම ශාලාවට පිවිසීම සඳහා පඩි කිහි-
පයක් නැඟීමට සිදු විය. දෙපස පිහිටි
කණු අසල කුලුනු දෙකක්ද ඉදි කර
තිබිණ.[2]

## 41

41 ඔහු ඊළඟට මාව දේවමා-
ලිගාව ඇතුළට ගෙනාවේය.
ඔහු ඊට ඇතුල් වන ස්ථානය දෙ-
පස පිහිටි කණු දෙක මැන්නේය. එම
කණු දෙකේම දිග රියන් හය බැගින්
විය. 2 ශුද්ධස්ථානයට ඇතුල් වන
දොරටුවේ පළල රියන් දහයකි. එම
දොරටුව දෙපස තිබෙන කොටස්වල
පළල රියන් පහ බැගින් විය. ඔහු
දොරටුවෙන් ඇතුල් වී ශුද්ධස්ථාන-
යේ අභ්‍යන්තරයද මැන්නේය. එහි දිග
රියන් හතළිහක්ද පළල රියන් විස්-
සක්ද විය.

3 ඔහු තවත් ඇතුළට ගොස් අති-
ශුද්ධස්ථානයට ඇතුල් වන ස්ථානයේ
දෙපස පිහිටි බිත්ති දෙක ළඟ තිබූ
කණු දෙක මැන්නේය. ඒ කණුවල
ඝනකම රියන් දෙකකි. එහි දෙපස
තිබුණු බිත්ති දෙකෙහි දිග රියන් හත
බැගින් විය. ඒ බිත්ති දෙක අතර
පිහිටි දොරටුවේ පළල රියන් හයකි.
4 ඉන්පසුව ඔහු දොරටුවෙන් ඇතුල්
වී එම ස්ථානය මැන්නේය. එහි දිග
රියන් විස්සක් විය. ශුද්ධස්ථානයට*
යාබදව තිබූ කෙළවරේ සිට ඔහු එහි
පළල මැන්නේය. එයද රියන් විස්සක්
විය.[3] එවිට ඔහු, "මෙයයි අතිශුද්ධස්-
ථානය"[4] කියා මට පැවසීය.

5 ඔහු ඊළඟට දේවමාලිගාව වටේ
තිබූ බිත්තිය මැන්නේය. එහි ඝන-
කම රියන් හයකි. ඒ බිත්තියටම

**40 පරි.**
1 ලෙවී 1:6
ලෙවී 8:20
2 1ලේක 6:31
එෆි 5:19
කොලො 3:16
3 ලෙවී 8:35
ගණන් 3:7
ගණන් 3:32
1ලේක 9:23
2ලේක 13:11
ගීතා 134:1
4 ලෙවී 6:12
ගණන් 18:5
5 ගණන් 16:40
එස 44:15
6 1රාජා 2:35
එස 43:19

**2 තීරුව**
1 1රාජා 6:3
2ලේක 3:4
2 1රාජා 7:21
යෙරෙ 52:17
එළි 3:12

**41 පරි.**
3 1රාජා 6:20
2ලේක 3:8
4 නික් 26:33

එස 41:4* මූ.අ., "දේවමාලිගාවට."

සම්බන්ධ කර කාමර ගණනාවක්ම
තනා තිබිණ. එක් කාමරයක දිග
රියන් හතරකි. ඒ කාමර දේවමාලිගා-
වේ බිත්තිය වටේටම ඉදි කර තිබිණ.[1]
**6** මෙම කාමර ඉදි කර තිබුණේ එක
පිට එක තට්ටු තුනක් සිටින සේය.
එක තට්ටුවක කාමර තිහක් තිබිණ.
එම කාමර දේවමාලිගාව වටා ඉදි
කර තිබිණ. ඒවා දේවමාලිගාවේ බිත්-
තියට යම් ආකාරයකින් සම්බන්ධ
වී තිබුණත් ඒවා බිත්තියට නොවැ-
දෙන සේ පිහිටා තිබිණ.[2] කාමර එසේ
ඉදි කරන ලද්දේ ඒවායේ සවිශක්-
තිය සඳහාය. **7** දේවමාලිගාව වටා
පිහිටි මෙම කාමරවල පළල තට්ටු-
වෙන් තට්ටුවට ඉහළ යද්දී වැඩි විය.
ඒ කාමරවලට නැඟීම සඳහා වක්‍රාකාර
තරප්පු පෙළක් ඉදි කර තිබිණ.[3] මෙම
තරප්පු පෙළ ආධාරයෙන් පහළ තට-
ටුවේ සිට මැද තට්ටුව හරහා තුන්වන
තට්ටුවට නැඟීමට හැකි විය.[4]
**8** දේවමාලිගාව තනා තිබුණේ උස්
වේදිකාවක් මතය. දේවමාලිගාව වටා
පිහිටි කාමරවල අත්තිවාරමද දමා
තිබුණේ එම වේදිකාව මතය. එම
වේදිකාවේ උස රියන් හයකින් යුත්
දණ්ඩේ දිගට සමාන විය.[5] **9** දේව-
මාලිගාව වටා පිහිටි කාමරවල පිටත
බිත්තියේ ඝනකම රියන් පහකි. වේදි-
කාවේ කෙළවරේ සිට එම බිත්තියේ
කෙළවර දක්වා හිස් තීරයක් තිබිණ.
**10** දේවමාලිගාව පිහිටා තිබූ මෙම
වේදිකාවේ සිට දේවමාලිගාව දෙ-
පස තිබූ භෝජන ශාලා[6] අතර දුර
ප්‍රමාණය රියන් විස්සකි. **11** දේ-
වමාලිගාව වටා පිහිටි කාමරවලට
ඇතුල් වීම සඳහා වේදිකාවේ හිස්
තීරයට සම්බන්ධ කර පඩි පෙළවල්
දෙකක් සවි කර තිබිණ. එක් පඩි පෙ-
ළක් පිහිටා තිබුණේ උතුරු දෙසින්ය.
අනික තිබුණේ දකුණු දෙසින්ය. වේදි-
කාවේ හිස් තීරයේ පළල රියන් පහකි.
**12** දේවමාලිගාව වටා පිහිටි බිම්
තීරයේ* බටහිර දෙසට ගොඩනැඟිල්-
ලක් ඉදි කර තිබිණ. එහි පළල රියන්
හැත්තෑවකි. එහි දිග රියන් අනූවකි.
එම ගොඩනැඟිල්ලෙහි බිත්තියේ ඝන-
කම රියන් පහකි.
**13** ඔහු ඊළඟට දේවමාලිගාවේ දිග
මැන්නේය. එය රියන් සියයකි. ඉන්-
පසුව බටහිර දෙසින් පිහිටි ගොඩ-
නැඟිල්ලේ පිටුපස බිත්තියේ සිට ඊට
යාබදව පිහිටි බිම් තීරයේ කෙළවර
දක්වා ඇති දුර මැන්නේය. ඒ දුර ප්‍රමා-
ණය රියන් සියයකි. **14** නැඟෙනහි-
රට මුහුණ ලා පිහිටි දේවමාලිගාවේ
ඉදිරිපස කොටසේ පළලද ඒ දෙ-
පස පිහිටි බිම් තීරවල පළලද එකට
එකතු කළ විට මුළු පළල රියන් සිය-
යක් විය.
**15** දේවමාලිගාවට පිටුපසින් තිබූ
බිම් තීරය ඉදිරිපිට සිට, ඊට පිටුපසින්
තිබූ ගොඩනැඟිල්ලේ පළලද එහි දෙ-
පස තිබූ ඉස්තෝප්පුවල පළලද ඔහු
මැන්නේය. එහි මුළු පළල රියන් සිය-
යක් විය.
ඉන්පසුව ඔහු දේවමාලිගාවේ අති-
ශුද්ධස්ථානයද[1] ශුද්ධස්ථානයද මළු-
වට මුහුණ ලා පිහිටි පිවිසුම් ශාලාවද
මැන්නේය. **16** ඔහු එම කාමර
තුනට පිවිසෙන ස්ථානද ඒවාට යාබ-
දව පිහිටි පටු ශාලාද ඇතුල් පැත්තේ
සිට පිට පැත්ත දක්වා ක්‍රමක්‍රම-
යෙන් පටු වී යන ආකාරයට සැදූ
ඒවායේ කවුළුද[2] මැන්නේය. එම පිවි-
සෙන ස්ථානවල බිත්තිවලට ලෑලි
අල්ලා තිබිණ.[3] ඒවා බිම් මට්ට-
මේ සිට ඉහළින් පිහිටි කවුළු දක්වා
අල්ලා තිබුණේය. ඒ කවුළුවලට
පියන්ද සවි කර තිබිණ. **17** දේ-
වමාලිගාවට ඇතුල් වන ස්ථානයේ
දොරටුවට ඉහළින් පිහිටි කොටසද
අතිශුද්ධස්ථානයද ඒ වටා පිහිටි බිත්-
තිද ඉන් පිටත තිබූ ස්ථානයද නිසියා-
කාර මිම්වලට අනුව සාදා තිබිණ.
**18** දේවමාලිගාවේ ඇතුළත බිත්ති-
වල කෙරුබ්වරුන්ගේ[4] හා තාල ගස්-
වල රූප කැටයම් කර තිබිණ.[5]
ඒවා කැටයම් කර තිබුණේ කෙ-
රුබ්වරුන් දෙදෙනෙකු අතර තාල

---

එස **41:12*** එනම්, ඇතුල් මළුවේ.

**41 පරි.**
1 1රාජා 6:5
2 1රාජා 6:6
1රාජා 6:10
3 1රාජා 6:8
4 එස 42:5
5 එස 40:5
6 1ලේක 28:12

**2 තීරුව**
1 2ලේක 3:8
එස 41:4
2 1රාජා 6:4
3 1රාජා 6:15
2ලේක 3:5
4 1රාජා 6:29
1රාජා 7:36
2ලේක 3:7
5 එස 40:16

ගසක් බැගින් පිහිටන ලෙසය. සෑම
කෙරුබ්වරයෙකුටම මුහුණු දෙකක්
තිබිණ.[1] **19** එක මුහුණක් මිනිසෙ-
කුගේ මුහුණක්ය. අනික තරුණ කේ-
ශර සිංහයෙකුගේ මුහුණක්ය.[2] එක
මුහුණක් එක් පැත්තක පිහිටි තාල
ගස දෙසටත් අනික් මුහුණ අනික්
පැත්තේ පිහිටි තාල ගස දෙසටත්
හැරී තිබිණ. මෙම රූප දේවමාලිගාවේ
ඇතුල් බිත්ති පුරාම කැටයම් කර
තිබිණ. **20** ඒ රූප බිම් මට්ටමේ සිට
ඉහළටම කැටයම් කර තිබිණ. ඒවා
ඇතුල් වීමේ දොරටුවේ උළුවස්සේ සිට
ඉහළටත් කැටයම් කර තිබිණ.

**21** දේවමාලිගාවේ දොරටුවට දමා
තිබුණේ හතරැස් හැඩැති උළුව-
හුය.[3] අතිශුද්ධස්ථානයේ දොරටුව
ඉදිරියෙන්ම යමක් දක්නට ලැබිණ.
**22** එය ලීයෙන් සාදන ලද හත-
රැස් පූජාසනයකි. එහි උස රියන්
තුනක්ද දිග රියන් දෙකක්ද විය. එහි
හතර පැත්තේම කණු සාදා තිබිණ.[4]
“මෙය යෙහෝවා දෙවි ඉදිරියෙහි තබා
තිබෙන මේසයයි”[5] කියා ඔහු මට
පැවසීය.

**23** ශුද්ධස්ථානයට ඇතුල් වන
ස්ථානයේද අතිශුද්ධස්ථානයට ඇතුල්
වන ස්ථානයේද දොරටු දෙක බැගින්
තිබිණ.[6] **24** ඒ එක් එක් දොරකට
පියන් දෙක බැගින් තිබිණ. එමනිසා
එම දොරවල් හැකිළීමට පුළුවන් විය.
**25** දේවමාලිගාවේ ඇතුල් බිත්තිවල
කැටයම් කර තිබූ කෙරුබ්වරුන්ගේ හා
තාල ගස්වල රූප මෙම දොර පියන්ව-
ලත් කැටයම් කර තිබිණ.[7] මීට අමත-
රව දේවමාලිගාවේ පිවිසුම් ශාලාවට
ඉදිරියෙන් පිහිටි දොරටුවට ඉහළින්
පිටතට නෙරා ගිය ලී රාමුවක් සවි කර
තිබිණ. **26** මෙම රාමුව දේවමාලි-
ගාව වටාද සවි කර තිබිණ. ඒ රාමුවට
යටින් දේවමාලිගාව වටා කවුළු පිහිටා
තිබිණ. මෙම කවුළු සකස් කර තිබු-
ණේ බිත්තියේ ඇතුල් පැත්තේ සිට
පිට පැත්ත දක්වා ක්‍රමක්‍රමයෙන් පටු වී
යන ආකාරයටය.[8] දේවමාලිගාව වටා
සවි කර තිබූ රාමුව මතද පිවිසුම්
ශාලාවේ දොරටු දෙපසද දේවමාලිගාව
වටේ සාදා තිබූ කාමරවල බිත්තිව-
ලද තාල ගස්වල රූප කැටයම් කර
තිබිණ.

**42** ඔහු මාව උතුරු දෙසට ගෙන
ගොස් පිටත මළුවට[1] රැගෙන
ආවේය.[2] ඉන්පසුව ඔහු මාව දේව-
මාලිගාවට උතුරින් පිහිටි භෝජන
ශාලා[3] සංකීර්ණය ළඟට ගෙනාවේය.
මෙම ශාලා සංකීර්ණය පිහිටා තිබු-
ණේ උතුරු දෙසින් පිහිටි බිම් තීරයට[4]
සහ ඒ අසල පිහිටි ගොඩනැඟිල්ලට
යාබදවය. **2** මෙම ශාලා සංකීර්ණ-
යට ඇතුල් වීම සඳහා උතුරු දෙසින්
දොරකඩක් තිබිණ. සංකීර්ණයේ දිග
රියන් සියයක් විය. එහි පළල රියන්
පනහකි. **3** භෝජන ශාලා සංකීර්-
ණය එකිනෙකට මුහුණ ලා ඇති
තට්ටු තුනකින් යුත් ගොඩනැඟිලි[5]
දෙකකින් සමන්විතය. එම තට්ටුවල
සඳලුතල පිහිටා තිබිණ. එක ගොඩ-
නැඟිල්ලක් ඇතුල් මළුවේ පිහිටි රියන්
විස්සක් පළල බිම් තීරය අසලද[6]
අනික් ගොඩනැඟිල්ල පිටත මළුවේ
පිහිටි පහළ වේදිකාවට[7] දකුණු දෙ-
සින්ද පිහිටා තිබිණ. **4** මෙම ගොඩ-
නැඟිලි දෙක මැදින් රියන් දහයක්
පළල මාර්ගයක් දිව ගියේය.[8] මෙම
මාර්ගයට රියනක් පළල තවත් කුඩා
මාර්ගයක් සම්බන්ධ කර තිබිණ.
භෝජන ශාලාවල දොරටු තිබුණේ
උතුරු දෙසට මුහුණ ලාය. **5** භෝ-
ජන ශාලාවල පළල පහළ තට්ටුවේ
සිට උඩ තට්ටුව දක්වා ක්‍රමක්‍රමයෙන්
අඩු වන ආකාරයට සාදා තිබිණ.
ඒවා එලෙස සාදා තිබුණේ එක් එක්
තට්ටුව සඳහා සාදා තිබුණු සඳලු-
තලයට ඉඩ සලසාගැනීම සඳහාය.
**6** එක් ගොඩනැඟිල්ලකට තට්ටු තුන
බැගින් තිබිණ.[9] එම සංකීර්ණය තැනී-
මට මළුවල යොදා තිබුණක් මෙන්
කණු භාවිත කර තිබුණේ නැත. පහළ
තට්ටුවේ සිට උඩම තට්ටුව දක්වා
පළල ක්‍රමක්‍රමයෙන් අඩු වන ආකාර-
යට භෝජන ශාලා සාදා තිබුණේ ඒ
නිසාය.

**41 පරි.**
1 එස 10:14
2 එස 1:10; එළි 4:7
3 1රාජා 6:33
4 නික් 30:1; 1රාජා 7:48; 2ලේක 4:19; එළි 8:3
5 එස 44:16; මලා 1:7
6 1රාජා 6:32; 2ලේක 4:22
7 එස 41:18
8 එස 40:16

**2 තීරුව**

**42 පරි.**
1 එස 40:20; එළි 11:2
2 එස 40:2; එස 41:1
3 එස 42:13
4 එස 41:12; එස 41:15
5 එස 41:16
6 එස 41:10
7 2ලේක 7:3; එස 40:18
8 එස 42:11
9 1රාජා 6:8; එස 41:6

**7** පිටත මළුවට යාබදව පිහිටි
භෝජන ශාලා ගොඩනැඟිල්ලට
සම්බන්ධ කර රියන් පනහක් දිග
තාප්පයක් ගලින් බැඳ තිබිණ. එය ඉදි
කර තිබුණේ දේවමාලිගාවට යාබ-
දව තිබූ භෝජන ශාලා ගොඩනැඟිල්-
ලට සමාන්තරවය. **8** පිටත මළුවට
යාබදව පිහිටි භෝජන ශාලා ගොඩ-
නැඟිල්ලේ දිග රියන් පනහකි. එහෙත්
එයට මුහුණ ලා පිහිටි දේවමාලි-
ගාවට යාබදව තිබූ භෝජන ශාලා
ගොඩනැඟිල්ලේ දිග රියන් සියයකි.
**9** පිටත මළුවට යාබදව පිහිටි භෝ-
ජන ශාලා ගොඩනැඟිල්ලට නැඟෙ-
නහිරින් තිබූ තාප්පය කෙළවරේ
දොරටුවක් තිබිණ. පිටත මළුවේ සිට
භෝජන ශාලා සංකීර්ණයට ඇතුල්
වීම සඳහා භාවිත කළේ එම දොර-
ටුවයි.

**10** දේවමාලිගාවට දකුණින් තිබූ
බිම් තීරයට[1] සහ ඒ අසල පිහිටි ගො-
ඩනැඟිල්ලට යාබදවද භෝජන ශාලා
සංකීර්ණයක්[2] පිහිටා තිබිණ. භෝ-
ජන ශාලාවල පළල, නැඟෙනහිර දෙ-
සින් පිහිටි ගල් තාප්පයේ පළලට
සමාන විය. **11** උතුරු දෙසින් පිහිටි
භෝජන ශාලා සංකීර්ණයට සමානව[3]
එම සංකීර්ණය මැදින්ද මාර්ගයක් දිව
ගියේය. එම භෝජන ශාලා සංකීර්-
ණයේ සැලැස්මද එහි දිග හා පළ-
ළද ඒවාට ඇතුල් වීම හා පිට වීම
සඳහා තිබුණු දොරටුද උතුරු දෙ-
සින් පිහිටි සංකීර්ණයට සමාන විය.
**12** නැඟෙනහිර දෙසින් පිහිටි ගල්
තාප්පයට යාබදව දිව ගිය මාර්ගය
කෙළවරේ දොරටුවක් තිබිණ. එම
දොරටුව භෝජන ශාලාවල දොරටු-
වලට සමාන විය. භෝජන ශාලා
සංකීර්ණයට ඇතුල් වීම සඳහා භාවිත
කළේ එම දොරටුවයි.[4]

**13** ඔහු මට මෙසේ පැවසීය. “දේව-
මාලිගාවට උතුරින් තිබෙන බිම් තීරය
අසල ඇති ශාලා සංකීර්ණයත් එයට
දකුණින් තිබෙන බිම් තීරය[5] අසල
ඇති ශාලා සංකීර්ණයත් ශුද්ධ භෝ-
ජන ශාලාවන්ය. ඒවා ශුද්ධ ශාලාවන්
වන නිසා ඉතා ශුද්ධ පූජාවන් වන
ධාන්‍ය පූජා, පාප පූජා සහ වන්දි
පූජා තබන්නේ එහිය.[1] යෙහෝවා
දෙවි ඉදිරියේ සේවය කරන පූජක-
යන්[2] පරිශුද්ධ පූජා අනුභව කරන්නේ
එම ශාලාවලදීය.[3] **14** දේවමාලිගා-
වේ සේවය කරන පූජකයෝ පිටත
මළුවට යන්න කලින් ඔවුන්ගේ පූජක
වස්ත්‍ර මාරු කළ යුතුය. ඒ වස්ත්‍ර ඔවුන්
තබා යා යුත්තේ එම භෝජන ශාලාව-
ලය.[4] මන්ද ඒ වස්ත්‍ර ශුද්ධය. ඔවුන්
සෙනඟ ඉදිරියට යන විට වෙනත්
වස්ත්‍ර ඇඳිය යුතුය.”[5]

**15** දේවමාලිගාව හා ඒ අවට පිහිටි
සියලු ගොඩනැඟිලි මැන අවසන්
කළායින් පසු, ඔහු මාව නැඟෙනහිර
දෙසින් පිහිටි ඇතුල් වීමේ ශාලාව
මාර්ගයෙන් පිටතට ගෙන ගියේය.[6]
ඔහු පිටත ඇති ප්‍රදේශයද මැන්නේය.

**16** ඔහු තම මිනුම් දණ්ඩෙන් මුළු
දේවමාලිගා සංකීර්ණයේ නැඟෙනහිර
මායිම මැන්නේය. එහි දිග දණ්ඩේ දිග
මෙන් පන්සියයක් විය.[7]

**17** ඔහු එහි උතුරු මායිමද මැන්-
නේය. එහි දිගද දණ්ඩේ දිග මෙන්
පන්සියයකි.

**18** ඔහු එහි දකුණු මායිම මැන්න
විට එහි දිගද දණ්ඩේ දිග මෙන් පන්සි-
යයක් විය.

**19** ඔහු බස්නාහිර මායිමටද
ගියේය. එය මැන්න විට එහි දිගද දණ්-
ඩේ දිග මෙන් පන්සියයක් විය.

**20** මෙසේ ඔහු පැති හතරම මැන්-
නේය. ඒ පැති හතරේ මායිම වටා
පවුරක් ගොඩනඟා තිබිණ.[8] පවුරේ
දිග දණ්ඩේ දිග මෙන් පන්සියයක්ද
පළල දණ්ඩේ දිග මෙන් පන්සිය-
යක්ද විය.[9] ඒ පවුර ඉදි කර තිබුණේ
ශුද්ධ දෙයින් අපවිත්‍ර දේ වෙන් කරන
පිණිසය.[10]

**43** පසුව ඔහු මාව නැඟෙන-
හිර දෙසින් පිහිටි ඇතුල්
වීමේ ශාලාව ළඟට ගෙන
ගියේය.[11] **2** එවිට නැඟෙනහිර දෙ-
සින්[12] ඊශ්‍රායෙල්හි දෙවිගේ තේජස[13]

**42 පරි.**
1 එස 41:12
2 එස 42:1
3 එස 42:4
4 එස 42:9
5 එස 42:1

**2 තීරුව**
1 ලෙවී 2:3, ගණන් 18:9, නෙහෙ 13:5
2 ගණන් 16:5, ද්වි 21:5, එස 40:46
3 ලෙවී 6:16, ලෙවී 7:6, ලෙවී 10:13, ලෙවී 24:9, ගණන් 18:10
4 නික් 28:40, නික් 29:8, ලෙවී 8:13, එස 44:19
5 යෙසා 61:10
6 එස 40:6
7 එස 40:5
8 එස 40:5
9 එස 45:2
10 ලෙවී 10:10, එස 22:26, එස 44:23, 2කොරි 6:17, එළි 21:27

**43 පරි.**
11 එස 10:19, එස 40:6, එස 42:15, එස 44:1
12 එස 11:23
13 යෙසා 6:3, එස 3:23, එස 9:3

පැමිණෙනවා මම දුටුවෙමි. දෙවි-
ගේ හඬ මහා ජල ධාරාවක සෝ-
ෂාව මෙනි.[1] මුළු පොළොවම ඔහුගේ
තේජසින් බැබළුණේය.[2] **3** මා දකි-
මින් සිටියේ කලින් මා දුටු දර්ශන-
යට සමාන දෙයකි.[3] එය නුවරට අත්
වීමට යන විනාශය ගැන කියන්න මා
පැමිණි විට*[4] දුටු දර්ශනයට සමාන
විය. මම කේබාර් ගඟ අසබඩ සිටියදී
දුටු දර්ශනයේ තිබූ දේවලට සමාන
දේවල් මේ දර්ශනයේදීද දුටිමි.[5] එය
දුටු විට මම මුහුණින් වැටුණෙමි.
**4** යෙහෝවා දෙවිගේ තේජස[6]
නැඟෙනහිර දෙසින් පිහිටි ඇතුල්
වීමේ ශාලාවෙන් ඇතුල් වී දේවමා-
ලිගාවට පැමිණියේය.[7] **5** එවිට යම්
බලයක්* මාව ඔසවාගෙන[8] ඇතුල්
මළුවට ගෙනාවේය. ඒ අවස්ථාවේදී,
දේවමාලිගාව යෙහෝවා දෙවිගේ තේ-
ජසින් පිරී තිබුණේය.[9] **6** එවිට දේව-
මාලිගාවේ සිට යම් කෙනෙකු කතා
කරනවා මට ඇසිණ.[10] මට දේවමාලි-
ගාවේ විස්තර පෙන්වූ තැනැත්තා ඒ
අවස්ථාවේදී මා ළඟ සිටගෙන සිටි-
යේය.[11] **7** දෙවි මට මෙසේ පැවසීය.
“මනුෂ්‍ය පුත්‍රය, මාගේ සිංහාසනය
මෙයයි.[12] මා පා තබන ස්ථානය මෙ-
යයි.[13] මම මේ ස්ථානයේ සිට ඊශ්‍රා-
යෙල් පුත්‍රයන් සමඟ සදහටම වාසය
කරන්නෙමි.[14] අතීතයේදී මාගේ සෙ-
නඟද ඔවුන්ගේ රජවරුද[15] වේශ්‍යාකම්
කිරීමෙන් හා තම රජවරුන්ගේ මළ
කඳන්*[16] මාගේ ශුද්ධ භූමියේ තැබී-
මෙන් මාගේ ශුද්ධ නාමයට නින්දා
ගෙනාවෝය. නමුත් නැවත කිසිදා
එසේ කරන්න මම ඔවුන්ට ඉඩ නො-
දෙන්නෙමි.[17] **8** ඒ අරමුණින්ම ඔවුහු
තම පූජනීය ස්ථානය මාගේ ශුද්-
ධස්ථානය අසලම ගොඩනැඟුවෝය.
ඔවුන්ගේ දේවාලවල උළුවහු ඉදි
කළේ මාගේ දේවමාලිගාවේ උළුවහු
අසලය. ඔවුන්ගෙන් මාව වෙන් කිරී-
මට තිබුණේ දේවමාලිගාවේ බිත්තිය
පමණි.[1] මෙම පිළිකුල්සහගත දේවල්
කර ඔවුහු මාගේ ශුද්ධ නාමය නින්දා-
වට පත් කළෝය.[2] ඒ නිසා මාගේ උද-
හස පිට කරමින් මම ඔවුන්ව විනාශ
කර දැමුවෙමි.[3] **9** මෙතැන් පටන්
ඔවුන් තම වේශ්‍යාකම් නතර කළ
යුතුය.[4] ඔවුන්ගේ රජවරුන්ගේ මළ
කඳන්ද මාගේ ශුද්ධ භූමියෙන් ඉවත්
කළ යුතුය.[5] එවිට මම ඔවුන් සමඟ
සදහටම වාසය කරන්නෙමි.[6]
**10** “මනුෂ්‍ය පුත්‍රය, ඔබ දුටු දේව-
මාලිගාව ගැන ඊශ්‍රායෙල් ජනයාට පව-
සන්න.[7] එවිට ඔවුහු තමන් කළ වැරදි
ගැන ලැජ්ජාවට පත් වනු ඇත.[8] ඔවුන්
දේවමාලිගාවේ සැලැස්ම බලා එහි
සියලු අංග මැනිය යුතුය. **11** ඔවුන්
තමන් කළ සියලු වැරදි ගැන ලැජ්ජා-
වට පත් වෙනවා නම් දේවමාලිගා-
වේ භූමියේ සැලැස්ම,[9] දේවමාලිගාවට
ඇතුල් වන හා පිට වන ස්ථාන, එහි
සියලු මිනුම් හා ඊට අදාළ සියලු නීති-
රීති ඔබ ඔවුන්ට දැනුම් දෙන්න. ඔවුන්
එහි භූමියේ සැලැස්ම හා සියලු මිනුම්
ගැන දැනුවත් වී ඊට අදාළ නීති-
රීති සියල්ල පිළිපදින පිණිස ඔවුන්-
ගේ ඇස් ඉදිරියේම ඒවා සටහන්
කරන්න.[10] **12** දේවමාලිගාව සම්-
බන්ධයෙන් පිළිපැදිය යුතු නීතිය මෙ-
යයි. දේවමාලිගාව පිහිටා ඇති කඳු
මුදුනත් ඒ අවට මුළු භූමියත් ඉතා ශුද්-
ධය.[11]
**13** “පූජාසනය මැන ඇත්තේ
රියන්වලිනි.[12] (ඒ රියන් සාමාන්‍ය
රියනකට වඩා අල්ලකින් වැඩිය.)[13]
පූජාසනයේ පහළම තට්ටුවේ මිනුම්
මෙසේය. එහි උස රියනකි. එම
තට්ටුව ඊට උඩින් ඇති තට්ටු-
වට වඩා එක රියනකින් ඉදිරියට
නෙරා ඇත. ඉදිරියට නෙරා ඇති
ඒ තීරය වටා වියතක් උසට රාමු-
වක් සවි කර ඇත. **14** පූජාසනයේ
පහළම තට්ටුව මත පිහිටි දෙවන
තට්ටුවේ උස රියන් දෙකකි. එම
තට්ටුවද ඊට උඩින් පිහිටි තට්ටුවට

එස **43:3*** මූ.අ., “මා නුවර විනාශ කිරීමට පැමිණි විට” **5*** එස 3:12හි පාදසටහන බලන්න. **7*** ඇතැම්විට, මේවා ඔවුන් තම රජවරුන් ලෙස සැලකූ පිළිම විය හැකියි.

**43 පරි.**
**1** ගීතා 29:3
එස 1:24
යොහ 12:29
**2** යෙසා 60:1
එස 10:4
හබ 2:14
එළි 21:23
**3** එස 1:4
**4** යෙරෙ 1:10
**5** එස 1:3
එස 3:23
**6** එස 10:19
**7** එස 44:2
**8** එස 3:12
එස 8:3
එස 11:24
**9** නික් 40:34
1රාජා 8:10
2ලේක 5:14
යෙසා 6:3
එස 44:4
**10** එළි 16:1
**11** එස 40:3
**12** ගීතා 47:8
යෙසා 6:1
යෙරෙ 3:17
එස 1:26
**13** 1ලේක 28:2
ගීතා 99:5
**14** නික් 29:45
ගීතා 68:16
ගීතා 132:14
යෝවෙ 3:17
2කොරි 6:16
**15** 1රාජා 11:7
2රාජා 21:2
2ලේක 33:7
**16** යෙරෙ 16:18
**17** එස 39:7
හොෂෙ 14:8
සෙක 13:2

**2 තීරුව**
**1** 2රාජා 16:14
එස 8:3
**2** ආමො 2:7
**3** දානි 9:12
**4** හොෂෙ 2:2
**5** එස 37:23
**6** එස 37:26
2කොරි 6:16
**7** එස 40:4
**8** එස 16:63
රෝම 6:21
**9** එස 44:5
හෙබ්‍රෙ 8:5
**10** එස 11:20
එස 36:27
යොහ 13:17
**11** ගීතා 93:5
එස 40:2
එස 42:20
**12** නික් 27:1
2ලේක 4:1
**13** එස 40:5

වඩා එක රියනක් ඉදිරියට නෙරා
තිබිණ. මෙම තට්ටුව මත පිහිටි තුන්-
වන තට්ටුව රියන් හතරක් උසය.
එයද ඊට උඩින් පිහිටි කොටසට
වඩා රියනක් ඉදිරියට නෙරා තිබිණ.
**15** පූජා දවන ස්ථානය රියන් හතරක්
උසය. එහි කොන් හතරේම අං හත-
රක් සවි කර තිබිණ.[1] **16** පූජාසන-
යේ ඉහළම කොටසේ දිග හා පළල
රියන් දොළහ බැගින් විය.[2] එය හරි
හතරැස් කොටසකි.[3] **17** ඊට යටින්
පිහිටි තට්ටුවේ දිග හා පළල රියන්
දහහතර බැගින් විය. එයද හරි හත-
රැස් හැඩයකින් යුක්තය. එය වටේටම
රියනක් පළල තීරයක් තිබිණ. එම
තීරය වටා රියන් භාගයක් උසට රාමු-
වක් සවි කර තිබිණ.

“පූජාසනයට නැඟීම සඳහා නැඟෙ-
නහිර දෙසින් පඩි සාදා තිබුණේය.”

**18** ඔහු මට මෙසේ පැවසීය.
“මනුෂ්‍ය පුත්‍රය, විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි පවසන්නේ
මෙයයි. ‘පූජාසනය ඉදි කර ඒ මත
දවන පූජා[4] ඔප්පු කරන විටදී හා ඒ
මත රුධිරය ඉසින විටදී[5] අනුගමනය
කළ යුතු ක්‍රියාපිළිවෙත මෙයයි.’

**19** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේ පවසන්නේය.
‘මට[6] පාප පූජාවක් ලෙස[7] ඔප්පු
කිරීම සඳහා සාදොක්ගෙන් පැව-
තෙන[8] ලෙවී ගෝත්‍රයේ පූජකයන්ට[9]
ගව රැළෙන් ගත් වස්සෙකු දෙන්න.
**20** ඔබ ඒ සතාගේ ලේවලින් ටිකක්
ගෙන පූජාසනයේ අං හතර මතද ඊට
යට තිබෙන තට්ටුවේ ඉදිරියට නෙරා
ඇති තීරයේ කොන් හතර මතද
එම තීරයට සවි කර ඇති රාමුව
මතද ගෑ යුතුය.[10] මෙයාකාරයට පූජා-
සනය පවිත්‍ර කළ යුතුය.[11] **21** ඔබ
පාප පූජාව සඳහා ඔප්පු කරන වස්සා-
ගේ මළ කඳ දේවමාලිගාවේ භූමි-
යෙන් පිටතට ගෙන ගොස් ඒ සඳහා
නියම කර ඇති ස්ථානයේ දවා
දැමිය යුතුය.[12] **22** දෙවන දින ඔබ
කිසි කැළැලක් නැති තරුණ එළුවෙ-
කුව පාප පූජාවක් ලෙස ඔප්පු කිරීමට
ගෙනා යුතුය. වස්සාව ඔප්පු කරන
විටදී පූජාසනය පවිත්‍ර කළ ලෙසම
මෙම එළුවාව ඔප්පු කරන විටදීද පූජා-
සනය පවිත්‍ර කළ යුතුය.’

**23** “‘පවිත්‍ර කිරීමේ එම පිළිවෙත
නිම කිරීමෙන් පසු ඔබ කිසි කැළැලක්
නැති වස්සෙකුව හා කිසි කැළැලක්
නැති බැටළුවෙකුව **24** යෙහෝවා
දෙවි වන මා ඉදිරියට ගෙනා යුතුය.
ඉන්පසු පූජකයන් උන් පිට ලුණු ඉස,[1]
යෙහෝවා දෙවි වන මට දවන පූජා-
වක් ලෙස උන්ව ඔප්පු කළ යුතුය.
**25** දවස් හතක් පුරා නොකඩවාම
ඔප්පු කිරීම සඳහා ඔබ පාප පූජා-
වක් ලෙස එළුවෙකුව ගෙනා යුතුය.[2]
පූජකයන් කිසි කැළැලක් නැති වස්-
සෙකුව හා බැටළුවෙකුව ඔප්පු කළ
යුතුය. **26** ඔවුන් නොකඩවා දවස්
හතක් පුරා පූජාසනය පවිත්‍ර කර සූදා-
නම් කළ යුතුය.[3] **27** ඒ දිනවලට
නියමිත කටයුතු නිම වූ විට අටවන
දිනේ සිට[4] පූජකයන් සෙනඟ වෙනු-
වෙන් දවන පූජාද හවුල් පූජාද ඔප්පු
කළ යුතුය. එවිට මම මාගේ සෙනඟ
ගැන සතුටු වන්නෙමි’[5] කියා විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවි
පවසයි.”

**44** ඔහු නැවතත් මාව දේවමා-
ලිගාවේ නැඟෙනහිර දෙසින්
තිබූ ඇතුල් වීමේ ශාලාව ළඟට ගෙ-
නාවේය.[6] එහි දොරටුව වසා තිබිණ.[7]
**2** එවිට යෙහෝවා දෙවි මට මෙසේ
පැවසීය. “මෙම දොරටුව විවෘත නො-
කර දිගටම වසා තබනු ලබන්නේය.
කිසි මිනිසෙක් එයින් ඇතුල් වන්-
නේ නැත. යෙහෝවා නම් වූ ඊශ්‍රා-
යෙල්හි දෙවි වන මා[8] එම දොරටුවෙන්
ඇතුල් වී තිබෙන හෙයින් එය දිග-
ටම වසා තැබිය යුතුය. **3** එහෙත්
එයින් ඇතුල් වී එහි හිඳගෙන යෙ-
හෝවා දෙවි වන මා ඉදිරියේ ආහාර
අනුභව කිරීමට[9] අධිපතියාට[10] අවසර
ලැබෙනු ඇත. ඔහු ශාලාවේ දොරටු-
වට යාබදව පිහිටි ආලින්දය හරහා

**43 පරි.**
1 නික් 27:2; එළි 9:13
2 2ලේක 4:1
3 නික් 38:1
4 නික් 40:29
5 ලෙවී 1:5; ලෙවී 8:19; එස 45:19
6 ගණන් 16:40
7 නික් 29:10; ලෙවී 8:14; හෙබ්‍රෙ 7:27
8 එස 40:46; එස 44:15; එස 48:11
9 යෙසා 61:6; යෙරෙ 33:18; 1පේතෘ 2:5
10 ලෙවී 8:15; ලෙවී 16:19; හෙබ්‍රෙ 9:23
11 නික් 29:36; ලෙවී 4:26
12 නික් 29:14; ලෙවී 8:17; හෙබ්‍රෙ 13:11

**2 තීරුව**
1 ලෙවී 2:13
2 නික් 29:35
3 ලෙවී 8:34
4 ලෙවී 9:1
5 යෝබ් 42:8; එස 20:40; රෝම 12:1; 1පේතෘ 2:5

**44 පරි.**
6 එස 43:1
7 එස 46:1
8 නික් 24:10; එස 43:2
9 උත් 31:54; ද්වි 12:7; 1කොරි 10:18
10 ගීතා 45:16; යෙසා 32:1

පිටත මළුවට පිවිසෙයි. ඔහු නැවත
පිටත් වී යන්නෙත් ඒ හරහාමය."[1]
**4** ඉන්පසුව ඔහු උතුරු දෙසින්
පිහිටි ඇතුල් වීමේ ශාලාව හරහා මාව
දේවමාලිගාව ඉදිරියට ගෙනාවේය. ඒ
අවස්ථාවේදී, යෙහෝවා දෙවිගේ තේ-
ජසින් යෙහෝවා දෙවිගේ ගෘහය පිරී
තිබුණ බව මම දුටුවෙමි.[2] එය දැක
මම මුණින් වැටුණෙමි.[3] **5** පසුව
යෙහෝවා දෙවි මට මෙසේ පැවසීය.
"මනුෂ්‍ය පුත්‍රය, මේ දේවල් හොඳින්
සිතට ගන්න.[4] මා ඔබට පෙන්-
වන දේවල් දෙස හොඳින් බලන්න.
යෙහෝවා දෙවි වන මාගේ ගෘහයට
සම්බන්ධව මා දෙන සියලු නීතිරී-
තිවලට හොඳින් ඇහුම්කන් දෙන්න.
ඔබ මෙම ගෘහයට ඇතුල් වන මාර්-
ගය ගැනද එයින් පිට වීමට ඇති
සියලු ස්ථාන ගැනද හොඳ අවධාන-
යකින් සිටිය යුතුයි. **6** ඔබ කැර-
ලිකාර[5] ඊශ්‍රායෙල් ජනතාවට මේ
දේ කියන්න. 'විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. "ඊශ්‍රායෙල් ජනයෙනි, මේ සියලු
පිළිකුල්සහගත දේවල් කිරීමට මා
ඔබට ඉඩහැරිය කාලය දැන් හොඳටම
ඇති.[6] **7** සිත් පවිත්‍ර කර නොගත්
අචර්මච්ඡේදිත විදේශිකයන්ව මාගේ
ශුද්ධස්ථානයට ගෙනැවිත්[7] ඔබ එය
කෙලෙසා ඇත. ඔබ මට කැප කළ
ආහාරද[8] තෙල්ද[9] ලේද[10] මා ඉදිරියට
ගෙනැවිත් ඔප්පු කළත් ඔබේ පිළිකුල්-
සහගත ක්‍රියා නිසා මා සමඟ කළ ගිවි-
සුම කඩ කර ඇත.[11] **8** මට කැප
කළ පරිශුද්ධ දේවල් හා බැඳි වගකීම්
ඔබ පැහැරහැර ඇත.[12] මාගේ ශුද්-
ධස්ථානයේ ඔබට ඇති වගකීම් ඉටු
කිරීම සඳහා ඔබ වෙන කිසිවෙකුව
පත් කළේද නැත."'[13]

**9** "'එහෙයින් විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි මෙසේ පව-
සයි. "ඊශ්‍රායෙල් සෙනඟ අතරේ සිටින
සිතින් පවිත්‍ර නොවූ මෙන්ම අචර්මච්-
ඡේදිත වූ කිසි විදේශිකයෙකුට මාගේ
ශුද්ධස්ථානයට ඇතුල් වෙන්න මම
අවසර නොදෙමි."'[14]

**10** "'ඊශ්‍රායෙල් ජනයා මාගෙන්
ඉවත් වී පිළිකුල්සහගත රූප පසු-
පස ගිය විට ලෙවීවරුද මාව අත්හැර
ගියෝය.[1] එහෙයින් ඔවුන් කළ වැරදි-
වල ප්‍රතිඵල විඳින්න ඔවුන්ටද සිදු
වනු ඇත.[2] **11** ඉන්පසුව නැවතත්
මා වෙතට එන ඔවුහු මාගේ ශුද්ධස්-
ථානයේ ඇතුල් වීමේ ශාලාවල හා ඒ
අවට භූමියෙහි අධීක්ෂණ කටයුතු-
වල නිරත වෙමින් මට සේවය කරනු
ඇත.[3] ඔවුහු සතුන්ව මරා, දවන පූජා
හා ජනයා වෙනුවෙන් ඔප්පු කරන පූජා
සූදානම් කරනු ඇත.[4] ඔවුහු ජනයා
ඉදිරියට ගොස් සේවය කරන්නෝය.[5]
**12** එහෙත් අතීතයේදී ඊශ්‍රායෙල් සෙ-
නඟව වැරදි මඟට යොමු කරමින්[6]
ඔවුහු පිළිකුල්සහගත රූපවලට පුද-
පූජා ඔප්පු කළෝය.[7] මාගේ බලවත්
හස්තයෙන් ඔවුන්ට පහර දුන්නේ ඒ
නිසාය'[8] කියා විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි පවසයි. 'ඒ නිසා
ඔවුන් කළ වැරදිවල ප්‍රතිඵල විඳින්න
ඔවුන්ට සිදු වන්නේය. **13** ඔවුහු
පූජකයන් ලෙස මා ඉදිරියේ සේවය
නොකරන්නෝය. මා ඉතා පරිශුද්-
ධව සලකන මාගේ ශුද්ධස්ථානයට
ඔවුහු පැමිණෙන්නේ නැත.[9] ඔවුන්
කළ පිළිකුල්සහගත දේවල් නිසා
ඔවුහු අනිවාර්යයෙන්ම අවමානයට
ලක් වන්නෝය.[10] **14** එහෙත් පසු
කලෙක මාගේ ගෘහයේ සියලු වගකීම්
භාරව කටයුතු කරන්න මම ඔවුන්ව
පත් කරන්නෙමි. මාගේ ගෘහය හා
බැඳි සියලුම සේවාවන් මම ඔවුන්ට
භාර දෙන්නෙමි.'[11]

**15** "'ඊශ්‍රායෙල් සෙනඟ මාගෙන්
ඈත් වූ විට,[12] ලෙවී ගෝත්‍රයේ පූජ-
කයන්[13] වන සාදොක්ගේ පුත්‍රයෝ[14]
මට සේවය කරන පිණිස මාගේ
ශුද්ධස්ථානයට පැමිණියෝය. ඔවුහු
මට සතුන්ගේ තෙල්ද[15] ලේද[16] ඔප්පු
කරන පිණිස මා ඉදිරියට පැමිණ
මට සේවය කරනු ඇත.'[17] එසේ පව-
සන්නේ විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවිය. **16** 'මාගේ ශුද්-
ධස්ථානයට ඇතුල් වී,[18] මට සේවය

**44 පරි.**

1 එස 40:9, එස 46:2
2 යෙසා 6:3, එස 3:23, එස 10:4
3 උත් 17:3, එස 1:28
4 ද්වි 32:46, 2ලේක 11:16, හිතෝ 24:32, එස 40:4
5 ද්වි 31:27, යෙසා 1:20, යෙසා 30:9, එස 2:5
6 එස 45:9, 1පේතෘ 4:3
7 ලෙවී 22:25, ක්‍රියා 21:28
8 ලෙවී 21:6, මලා 1:7
9 ලෙවී 3:16
10 ලෙවී 17:11
11 ලෙවී 26:15, ද්වි 31:16, යෙරෙ 11:10, හෙබ්‍රෙ 8:9
12 ලෙවී 22:2, ගණන් 18:3, ක්‍රියා 7:53
13 1ලේක 23:32
14 ගීතා 50:16, යෝවෙ 3:17, සෙක 14:21

**2 තීරුව**

1 2රාජා 23:8, 2ලේක 29:5, නෙහෙ 9:34, යෙරෙ 23:11, එස 8:12
2 එස 48:11
3 1ලේක 26:1
4 2ලේක 29:34
5 ගණන් 16:9
6 යෙසා 9:16, මලා 2:8
7 එස 6:13
8 ද්වි 32:40, ගීතා 106:26
9 ගණන් 18:3, 2රාජා 23:9
10 එස 32:30
11 ගණන් 18:4, 1ලේක 23:28, 1ලේක 23:32
12 එස 44:10, එස 48:11
13 එස 40:46, එස 43:19
14 1රාජා 2:35
15 ලෙවී 3:16
16 ලෙවී 17:6
17 ද්වි 10:8, එස 43:19
18 එළි 1:6

කරන පිණිස මාගේ මේසය* අසලට
පැමිණෙන්නේ ඔවුන්ය.[1] ඔවුහු මගේ
ගෘහයේ කළ යුතු සියලුම වගකීම් ඉටු
කරමින් මට සේවය කරන්නෝය.[2]

**17** “ ‘ඇතුල් මළුවට පිවිසෙන
ශාලා තුළින් පැමිණෙන විට ඔවුන්
ලිනන් රෙදිවලින් නිමැවූ වස්ත්‍ර ඇඳ-
ගෙන සිටිය යුතුය. ඔවුන් ඇතුල්
මළුවට පිවිසෙන ශාලාවල සේවය
කරන විටදී හා ඇතුල් මළුවේ සේ-
වය කරන විටදී ලොම්වලින් නිමැවූ
වස්ත්‍ර නොඇඳිය යුතුය.[3] **18** ඔවුන්
ලිනන් රෙදිවලින් සෑදූ හිස්වැසුම්ද[4]
ලිනන් රෙදිවලින් මසන ලද යට
ඇඳුම්ද ඇඳගෙන සිටිය යුතුය.[5] දහ-
ඩිය දමන වස්ත්‍ර ඇඳීමෙන්ද වැළකිය
යුතුය. **19** ඔවුන් ජනතාව රැස්ව
සිටින ස්ථානය වන පිටත මළුවට
යෑමට පෙර, ඇතුල් මළුවේදී ඇඳ-
ගෙන සිටි වස්ත්‍ර ගලවා[6] ශුද්ධ භෝ-
ජන ශාලාවල තබා යා යුතුය.[7] ඔවුන්
ඒ වෙනුවට වෙනත් වස්ත්‍රයක් ඇඳිය
යුතුය. එසේ කළ යුත්තේ පූජකයන්ට
පමණක් හිමි විය යුතු ශුද්ධ තත්-
වය ජනතාවට නොලැබෙන පිණි-
සය.[8] **20** හිස බූ ගෑමවත්[9] හිසකෙස්
දිගට වැවීමවත් පූජකයන්ට සුදුසු
නැත. ඔවුන් තම හිසකෙස් කොටට
කැපිය යුතුය.[10] **21** ඇතුල් මළුවට
පැමිණෙන විට වයින් පානය කිරීම
පූජකයන්ට තහනම්ය.[11] **22** පූජක-
යෙක් වැන්දඹුවක හෝ දික්කසාද වූ
ස්ත්‍රියක විවාහ කර නොගත යුතුය.[12]
ඔහුට විවාහ කරගත හැක්කේ ඊශ්‍රා-
යෙල් ජනයා අතරේ සිටින කන්‍යා
ස්ත්‍රියක[13] හෝ පූජකයෙකුගේ වැන්-
දඹුවක පමණය.’

**23** “ ‘ඔවුන් මාගේ ජනතාවට ශුද්ධ
දේ හා දූෂිත දේ අතර ඇති වෙනස
පැහැදිලිව අවබෝධ කර දිය යුතුය.
ඔවුන්ට පවිත්‍ර හා අපවිත්‍ර දේ අතර
ඇති වෙනසද තෝරා දිය යුතුය.[14]
**24** යමෙකු නඩුවක් ඔවුන් වෙත ගෙ-
නාවොත් ඒ නඩුව විනිශ්චය කිරීමේ
වගකීම පැවරී ඇත්තේ ඔවුන්ටය.[1]
ඔවුන් විනිශ්චයක් දිය යුත්තේ මා
තීන්දු කර ඇති දේවලට එකඟවය.[2]
මා නියම කර ඇති උත්සව පවත්වද්දී
ඔවුන් ඒ සඳහා මා දී ඇති නීති-
රීති පිළිපැදිය යුතුය.[3] මා නියම කර
ඇති සබත් දවස් ශුද්ධ බව සිහි කළ
යුතුය.[4] **25** ඔවුන් අපවිත්‍ර නොවන
පිණිස මළ සිරුරක් ළඟටවත් නොයා
යුතුය. නමුත් මිය ගිය තැනැත්තා
තමන්ගේ පියා හෝ මව හෝ පුත්‍රයා
හෝ දියණිය හෝ සහෝදරයෙකු හෝ
අවිවාහක සහෝදරියක හෝ වේ නම්
ඒ අවස්ථාවේදී ඔවුන්ට මේ නියෝගය
අදාළ නොවේ.[5] **26** එවැනි අවස්ථා-
වකට සහභාගි වූ පූජකයෙකු පවිත්‍ර
වීමෙන් අනතුරුව දවස් හතක් ගත
වන තෙක් සේවයට නොයා යුතුය.[6]
**27** ඔහු සේවය සඳහා ඇතුල් මළුවේ
පිහිටි ශුද්ධස්ථානයට පැමිණෙන දව-
සේදී පාප පූජාවක් ඔප්පු කළ යුතුය.’[7]
එසේ පවසන්නේ විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවිය.

**28** “ ‘ඔවුන්ට උරුමයක් ලැබෙනු
ඇත. ඒ උරුමය මමය.[8] ඒ නිසා
ඊශ්‍රායෙල් දේශයේ ඔවුන්ට උරුම-
යක් නොදිය යුතුය. මන්ද ඔවුන්ගේ
උරුමය මමය. **29** ඔවුන්ට ධාන්‍ය
පූජාව, පාප පූජාව හා වන්දි පූජාව
අනුභව කිරීමට අවසර ඇත.[9] ඊශ්‍රා-
යෙල් දේශයේ දෙවි වන මට කැප
කරන සෑම දෙයක්ම ඔවුන්ට අයිති
වන්නේය.[10] **30** ඔබේ කෙත්වතුවල
මුල්ම පලදාවෙන් හොඳම කොට-
සද සෙනඟ ප්‍රදානය කරන සියලු
තෑගිවලින් හොඳම තෑගිද පූජක-
යන්ට අයිති වන්නේය.[11] ඔබේ
මුල්ම ධාන්‍ය අස්වැන්නෙන් ලබා-
ගත් පිටිද පූජකයාට දිය යුතුය.[12]
ජනයෙනි, ඔබ එසේ කළොත් ඔබේ
නිවහනට මගෙන් ආශීර්වාද ලැබෙනු
ඇත.[13] **31** මිය ගොස් ඇති සතෙකු-
වත් සතෙකු හෝ පක්ෂියෙකු විසින්
මරා දමනු ලැබූ සතෙකුවත් පූජකයන්
ආහාරයට නොගත යුතුය.’[14]

එස 44:16* එනම්, පූජාසනය.

**44 පරි.**
**1** එස 41:22
මලා 1:7
**2** ගණන් 18:7
**3** නික් 28:39
නික් 39:27
ලෙවී 16:4
එළි 19:8
**4** නික් 28:40
නික් 39:28
**5** නික් 28:42
**6** ලෙවී 6:10
එස 42:14
**7** එස 42:13
**8** නික් 30:29
ලෙවී 6:27
**9** ලෙවී 21:5
ද්වි 14:1
**10** 1කොරි 11:14
**11** ලෙවී 10:9
ලූක් 1:15
**12** ලෙවී 21:7
**13** ලෙවී 21:14
**14** ලෙවී 10:10
එස 22:26
මලා 2:7

**2 තීරුව**
**1** ද්වි 17:9
**2** 1ලේක 23:4
2ලේක 19:8
**3** ලෙවී 23:2
**4** යෙසා 58:13
එස 22:26
**5** ලෙවී 21:2
**6** ගණන් 19:12
**7** ලෙවී 4:3
ලෙවී 8:14
**8** ගණන් 18:20
ද්වි 10:9
ද්වි 18:1
යොෂු 13:14
යොෂු 13:33
එස 45:4
**9** ලෙවී 2:3
ලෙවී 6:18
ලෙවී 7:6
1කොරි 9:13
හෙබ්‍රෙ 13:10
**10** ලෙවී 27:21
ගණන් 18:14
**11** නික් 23:19
ගණන් 3:13
ගණන් 18:12
ගණන් 18:27
ද්වි 18:4
2ලේක 31:4
2ලේක 31:10
නෙහෙ 10:35
**12** ගණන් 15:20
නෙහෙ 10:37
**13** හිතෝ 3:9
මලා 3:10
**14** නික් 22:31
ලෙවී 22:8
ද්වි 14:21

**45** “‘ඔබට උරුම වූ දේශය කො-
ටස්වලට වෙන් කර එක් එක්
කෙනාට බෙදා දෙන විට[1] එයින් කො-
ටසක් යෙහෝවා දෙවි වන මටද වෙන්
කළ යුතුය.[2] එය හැඳින්විය යුත්තේ
ශුද්ධ භූමිය[3] ලෙසයි. එහි දිග රියන්
විසිපන්දහසක්ද පළල රියන් දසදහ-
සක්ද විය යුතුය.[4] වෙන් කරන ලද ඒ
භූමිය ශුද්ධය. **2** එම ශුද්ධ භූමියෙන්
කොටසක් දේවමාලිගාව සඳහා වෙන්
කරන්න. එය රියන් පන්සියයක් දිග
රියන් පන්සියයක් පළල හරි හතරැස්
භූමියක් විය යුතුය.[5] එම භූමිය වටේට
රියන් පනහක් පළල බිම් තීරයක්ද
වෙන් කරන්න. එය සතුන්ට තණ-
බිමක් වනු ඇත.[6] **3** මෙලෙස ඔබ
මා වෙනුවෙන් රියන් විසිපන්දහසක්
දිග හා රියන් දසදහසක් පළල භූමි-
යක් වෙන් කළ යුතුය. ඉතා ශුද්ධ
දේවමාලිගාව පිහිටා තිබිය යුත්තේ
එම භූමිය තුළය.[7] **4** එය දේශයෙන්
වෙන් කරන ලද ශුද්ධ භූමියකි. එය
උරුම වන්නේ[8] යෙහෝවා දෙවි වන
මට සේවය කරන පූජකයන්ටය.[9] දේ-
වමාලිගාවට අමතරව පූජකයන්ගේ
නිවෙස්ද මෙම පරිශුද්ධ භූමියේ පිහිටා
තිබෙනු ඇත.

**5** “‘මීට අමතරව රියන් විසිපන්ද-
හසක් දිග හා රියන් දසදහසක් පළල
තවත් බිම් කොටසක් වෙන් කරනු
ලැබේ.[10] එය හිමි වන්නේ මාගේ ගෘහ-
යේ සේවය කරන ලෙවීවරුන්ටය.
උරුමයක් ලෙස භෝජන ශාලා විස්-
සක් ඔවුන්ට අයිති වේ.[11]

**6** “‘මීට අමතරව ශුද්ධ භූමියට
යාබදව රියන් පන්දහසක් පළල හා
රියන් විසිපන්දහසක් දිග තවත් බිම්
කොටසක් වෙන් කරනු ලැබේ. එහි
නුවරක්ද තිබෙනු ඇත.[12] එය මුළු
ඊශ්‍රායෙල් ජනයාට අයිති වන්නේය.

**7** “‘වෙන් කරන ලද ශුද්ධ භූමිය
හා නුවර පිහිටි බිම් කොටස දෙපසින්
එනම්, ඊට බස්නාහිරින් හා නැගෙ-
නහිරින් අධිපතියා සඳහා කොටස්
දෙකක්ද වෙන් කරනු ලැබේ.[13] දේශ-
යේ බස්නාහිර මායිමේ සිට නැගෙ-
නහිර මායිම දක්වා ඇති මුළු දිග
එනම්, වෙන් කරන ලද භූමිය ඇතු-
ළුව අධිපතියාට හිමි කොටස් දෙකේ
මුළු දිග ඊට උතුරින් හා දකුණින්
පිහිටි ගෝත්‍ර දෙකට අයත් ප්‍රදේශවල
දිගට සමාන වන්නේය.[1] **8** අධිපති-
යාට ලැබෙන කොටස් දෙක ඔහුගේ
උරුමය වනු ඇත. මා යටතේ සේවය
කරන අධිපතීහු ඊශ්‍රායෙල් ජාතියට
තම ගෝත්‍ර අනුව දේශය නිසියාකාරව
බෙදා උරුමයක් ලෙස දෙන්නෝය.[2]
ඔවුහු තවදුරටත් මාගේ සෙනඟට හිරි-
හැර කරන්නේ නැත.’ ”[3]

**9** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි.
‘ඊශ්‍රායෙල් දේශයේ අධිපතිවරුනි, ඔබ
කළ දුෂ්ටකම් දැන් හොඳටම ඇති!’[4]

“‘ඔබේ ප්‍රචණ්ඩකාරී ක්‍රියා නතර
කරන්න. මින් ඉදිරියට අන් අය
සතු දේ පැහැර නොගන්න.[5] සාධා-
රණය ඉටු කර ධර්මිෂ්ඨ ජීවිතයක්
ගත කරන්න.[6] ඔබ තවදුරටත් මාගේ
සෙනඟට අයිති කිසිවක් බලහත්-
කාරයෙන් පැහැර නොගත යුතුය.’[7]
එසේ පවසන්නේ විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවිය.
**10** ‘ඔබ නිවැරදි තරාදිද නිවැරදි
ඒපා මිනුම්ද* නිවැරදි බාත් මිනුම්ද#
භාවිත කළ යුතුය.[8] **11** හෝමර-
යකට* නියම කළ මිනුමක් ඇත.
ඒපා මිනුම හා බාත් මිනුම තීරණය
විය යුත්තේ හෝමරයේ මිනුමට අනු-
වය. බාත් මිනුමක් යනු හෝමරයකින්
දහයෙන් එකකි. ඒපා මිනුමද හෝ-
මරයකින් දහයෙන් එකකි.[9] **12** ෂෙ-
කෙලයක් යනු[10] ගේරා* විස්සකි.[11]
ෂෙකෙල් විස්සක්ද ෂෙකෙල් විසිප-
හක්ද ෂෙකෙල් පහළවක්ද ඔබ මෙනා
ඒකකයක් ලෙස සැලකිය යුතුය.’#

**13** “‘ඔබ ඔප්පු කරන පූජා සඳහා
සැපයිය යුතු දේවල් මේවාය. තිරිඟු

---

එස **45:10*** නික් 16:36හි පාදසටහන බලන්න. **10#** බාත් ඒකකයක් යනු ලීටර් 22කි. **11*** එනම්, ලීටර් 220කි. **12*** ගේරා එකක් යනු ග්‍රෑම් 0.57කි. **12#** එනම්, ෂෙකෙල් හැටක් යනු මෙනා ඒකකයකි.

---

**45 පරි.**
**1** යොෂු 14:2, එස 47:22
**2** හිතෝ 3:9, එස 48:8
**3** එස 48:20
**4** එස 48:9
**5** එස 42:20
**6** යොෂු 21:2
**7** එස 48:10
**8** එස 48:11
**9** ගණන් 16:5, එස 40:46, එස 43:19
**10** එස 48:10, එස 48:13
**11** 1ලේක 9:26, එස 40:17
**12** එස 48:15
**13** එස 46:16

**2 තීරුව**
**1** එස 48:21
**2** යොෂු 11:23
**3** හිතෝ 28:16, යෙසා 32:1, යෙසා 60:17, යෙරෙ 22:17, යෙරෙ 23:5, එස 22:27, එස 46:18, මීකා 3:1
**4** එස 44:6
**5** නෙහෙ 5:10, ගීතා 82:2, යෙසා 1:17
**6** යෙරෙ 22:3, මීකා 6:8, සෙක 8:16
**7** යෝබ් 24:2, මීකා 2:2
**8** ලෙවී 19:36, හිතෝ 11:1, හිතෝ 16:11, හිතෝ 20:10, ආමො 8:5, මීකා 6:11
**9** නික් 16:36
**10** නික් 30:13, ලෙවී 27:25
**11** ගණන් 3:47

හෝමරයකින් ඒපා මිනුමක් මැන
එයින් හයෙන් එකක්ද බාර්ලි හෝම-
රයකින් ඒපා මිනුමක් මැන එයින්
හයෙන් එකක්ද ඔප්පු කරන්න.
**14** ඔබ ඔප්පු කළ යුතු තෙල් ප්‍රමා-
ණය මනින්නේ බාත් මිනුම ආධා-
රයෙනි. බාත් මිනුමක් යනු කෝර්
ඒකකයකින්* දහයෙන් එකකි. කෝර්
ඒකකයක් හෝමරයකට සමානය.#
**15** ඔබ බැටළුවෙකුවද ඔප්පු කළ
යුතුය. ඊශ්‍රායෙල් ජනයාට හිමි සෑම
බැටළුවන් දෙසියයකින් එක බැටළු-
වෙකුව ගෙනා යුතුය.[1] දවන පූජාව[2]
සඳහාද හවුල් පූජාව[3] සඳහාද උන්ව
ගෙන එන්න. ඉහත කී තිරිඟු හා
බාර්ලි ගෙනා යුත්තේ ධාන්‍ය පූජාව
සඳහාය.[4] එම පූජා මගින් ජනයාගේ
පාපවලට සමාව ලබාගත හැකිය.'[5]
එසේ පවසන්නේ විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවිය.

**16** "'ඊශ්‍රායෙල්හි අධිපතියාට[6] මේ
සියලු දේවල් ලබා දීම දේශයේ
වෙසෙන ජනයා සතු වගකීමකි.[7]
**17** උත්සව පවත්වන දවස්වලදී,[8]
නව සඳ පායන දවස්වලදී,[9] සබත්
දවස්වලදී[10] හා ඊශ්‍රායෙල් ජනයා-
ගේ සියලුම උත්සව සමයන්වලදී[11]
ඉදිරිපත් කරන දවන පූජා,[12] ධාන්‍ය
පූජා[13] සහ පාන පූජා[14] සඳහා අවශ්‍ය
සියලු දේවල් සපයා දීමේ වගකීම
පැවරී ඇත්තේ අධිපතියාටය.[15] ඊශ්‍රා-
යෙල් ජනයා කර ඇති පව්වලට සමාව
ලබාගැනීම පිණිස පාප පූජා, ධාන්‍ය
පූජා, දවන පූජා සහ හවුල් පූජා සඳහා
අවශ්‍ය සියල්ල ගෙනා යුත්තේ ඔහුය.'

**18** "විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි.
'පළමු මාසයේ පළමු දින පූජා-
වක් ලෙස ඔප්පු කරන පිණිස ඔබේ
ගව රැළේ සිටින නිකැළැල් වස්-
සෙකුව රැගෙන යා යුතුය.[16] එම
පූජාව මගින් ශුද්ධස්ථානය පවිත්‍ර කළ
යුතුය.[17] **19** පූජකයා පාප පූජාවෙන්
ගත් ලේ ස්වල්පයක් දේවමාලිගාවේ
උළුවහුවලද[1] පූජාසනය වටා ඉදිරියට
නෙරා ඇති තීරයේ කොන් හතරේද[2]
ඇතුල් මළුවට ඇතුල් වන ශාලා-
වල දොරටුවේ උළුවහුවලද තැවරිය
යුතුය. **20** ඔබ එම මාසයේ හත්වන
දිනයේදී, නොදැනුවත්කම නිසා හෝ
අතපසු වීමක් නිසා හෝ වරදක් කරන
අය වෙනුවෙන්[3] එම පිළිවෙතම අනුග-
මනය කළ යුතුය. ඔබ නමස්කාරය
සඳහා දේවමාලිගාව පවිත්‍ර කළ යුත්-
තේ එලෙසය.[4]

**21** "'පළමු මාසයේ දහහතරවන
දින ඔබ පාස්කුව පැවැත්විය යුතුය.[5]
ඉන්පසුව දින හතක් පුරා පවත්-
වන උත්සවයේදී මුහුන් නොදැමූ
රොටි අනුභව කරන්න.[6] **22** ඒ දව-
සේදී අධිපතියා තමා වෙනුවෙන්ද දේ-
ශයේ වෙසෙන ජනතාව වෙනුවෙන්ද
පාප පූජාවක් ලෙස ඔප්පු කිරීම
සඳහා වස්සෙකුව සැපයිය යුතුය.[7]
**23** එම උත්සවය පවත්වන දින හත
පුරා[8] යෙහෝවා දෙවි වන මට දවන
පූජාවක් ලෙස ඔහු වස්සන් හත්දෙ-
නෙකුවද නිකැළැල් බැටළුවන් හත්-
දෙනෙකුවද දිනපතා සැපයිය යුතුය.[9]
පාප පූජාවක් සඳහා දිනපතා
තරුණ එළුවෙකුවද සැපයිය යුතුය.[10]
**24** එක් වස්සෙකු සමඟ ධාන්‍ය පූජා-
වක් ලෙස ඔප්පු කිරීමට ධාන්‍ය ඒපා-
වක්ද එක් බැටළුවෙක් සමඟ ධාන්‍ය
ඒපාවක්ද එසේ සපයන ධාන්‍ය ඒපාව-
කට තෙල් හින මිනුමක් බැගින්ද සැප-
යිය යුතුය.[11]

**25** "'හත්වන මාසයේ, පහළොස්-
වන දිනෙන් ඇරඹෙන උත්සවයේ-
දීද[12] ඔහු කලින් උත්සවයේදී සැපයූ
දේවල්ම දින හතක් පුරා සැපයිය
යුතුය.[13] එනම්, පාප පූජාවට හා දවන
පූජාවට සැපයූ සතුන්ද ධාන්‍ය පූජාවට
සැපයූ ධාන්‍ය හා තෙල්ද එලෙසම
ලබා දිය යුතුය.'"

**46** "විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ
මෙයයි. 'ඇතුල් මළුවට නැඟෙනහිර

**45 පරි.**
1 හිතෝ 3:9
2 ලෙවී 1:10
3 ලෙවී 3:1
4 ලෙවී 2:1
5 ලෙවී 1:4 ලෙවී 6:30 හෙබ්‍රෙ 9:22
6 යෙසා 16:1
7 නික් 30:14
8 2ලේක 35:7
9 2ලේක 8:13 2ලේක 31:3
10 යෙසා 66:23
11 ලෙවී 23:2
12 1ලේක 16:2 2ලේක 30:24
13 1රාජා 8:64
14 එස්රා 6:9
15 එස 45:22
16 ලෙවී 22:20
17 ලෙවී 16:16 එස 43:26

**2 තීරුව**
1 එස 41:21 එස 46:2
2 එස 43:20
3 ලෙවී 4:27 ගීතා 19:12
4 ලෙවී 16:20
5 ලෙවී 23:5 ගණන් 9:2 ගණන් 28:16 ද්වි 16:1
6 නික් 12:18 ලෙවී 23:6
7 ලෙවී 4:14
8 ලෙවී 23:8
9 යෝබ් 42:8
10 ගණන් 28:15
11 එස 46:5
12 ලෙවී 23:34 2ලේක 5:3
13 ගණන් 29:12 ද්වි 16:13 2ලේක 7:8 සෙක 14:16

එස **45:14*** කෝර් මිනුමක් යනු ලීටර් 220කි.
**14#** මුල් භාෂාවේ මෙම වාක්‍යය දෙවරක් සඳහන් වේ.

දෙසින් පිහිටි[1] ඇතුල් වීමේ ශාලා-
වේ දොරටුව වැඩ කරන දින හය
පුරා[2] වසා තැබිය යුතුය.[3] එය විවෘත
කළ යුත්තේ සබත් දවසේදී හා නව
සඳ පායන දවසේදී පමණි.[4] **2** අධි-
පතියා පිටත මළුවේ සිට ඇතුල් මළු-
වට පිවිසෙන ශාලාවේ දොරටුවෙන්
ඇතුල් වී එහි ආලින්දය හරහා ගොස්
අනික් කෙළවරේ පිහිටි දොරටුව
ළඟට පැමිණ[5] එහි උළුවහු අසල සිට-
ගෙන සිටිය යුතුය.[6] එහිදී ඔහු රැගෙන
එන දවන පූජාද හවුල් පූජාද පූජකයන්
විසින් භාරගනු ලැබේ. ඉන්පසුව ඔහුන්
ඒවා ඔප්පු කළ යුතුය. අධිපතියා දො-
රටුව ඉදිරියෙහි වැඳ වැටී[7] හැරී යා
යුතුය. එහෙත් දොරටුව සවස් වන
තෙක් නොවැසිය යුතුය. **3** දේශයේ
වෙසෙන ජනතාව සබත් දිනයේදී හා
නව සඳ පායන දිනයේදී එම දොර-
ටුව ඉදිරියේ යෙහෝවා දෙවි වන මට
නමස්කාර කළ යුතුය.[8]

**4** "'සෑම සබත් දවසකදීම අධි-
පතියා බැටළු පැටවුන් හයදෙනෙ-
කුව හා බැටළුවෙකුව ගෙනා යුතුය.
ඔහු ගෙනා යුත්තේ කිසිම කැළැලක්
නැති සතුන්ය. ඔහු ඒ සතුන්ව යෙ-
හෝවා දෙවි වන මට දවන පූජාවක්
ලෙස ඔප්පු කිරීම සඳහා ඉදිරිපත්
කළ යුතුය.[9] **5** ඔහු සපයන බැට-
ළුවා සමඟ ධාන්‍ය පූජාවක් ලෙස
ඔප්පු කිරීමට ධාන්‍ය ඒපාවක්ද[10] සෑම
බැටළු පැටවෙකු සමඟම ධාන්‍ය පූජා-
වක් ලෙස තමාට දිය හැකි ධාන්‍ය
ප්‍රමාණයක්ද[11] තෙල්ද සැපයිය යුතුය.
සෑම ධාන්‍ය ඒපාවකටම තෙල් හින
මිනුමක් බැගින් ඔහු සැපයිය යුතුය.[12]
**6** ඔහු නව සඳ පායන දවසේදීද[13]
නිකැළැල් බැටළුවෙකුව හා බැටළු
පැටවුන් හයදෙනෙකුව ගෙනා යුතුය.
මීට අමතරව ගව රැළෙන් ගත් නිකැ-
ළැල් වස්සෙකුවද ගෙනා යුතුය.[14]
**7** ඔහු සපයන වස්සා සමඟ ධාන්‍ය
ඒපාවක්ද බැටළුවා සමඟ ධාන්‍ය ඒපා-
වක්ද ධාන්‍ය පූජාවක් ලෙස සැපයිය
යුතුය. බැටළු පැටවුන් සමඟ ඔහු
තමාට දිය හැකි ධාන්‍ය ප්‍රමාණයක්
සැපයිය යුතුය. ඒ සෑම ධාන්‍ය ඒපාව-
කටම තෙල් හින මිනුමක් බැගින්ද
ඔහු සැපයිය යුතුය.[1]

**8** "'ඒ දේවල් සැපයීම සඳහා අධිප-
තියා[2] පැමිණිය යුත්තේ පිටත මළුවට
පිවිසෙන ශාලාවේ ආලින්දයේ සිටය.
ඔහු පිටත් විය යුත්තේද එය හර-
හාමය.[3] **9** දේශයේ ජනතාව උත්-
සව සමයේදී යෙහෝවා දෙවි වන
මට නමස්කාර කරන පිණිස පැමි-
ණෙන විට,[4] උතුරු දෙසින් පිහිටි
ඇතුල් වීමේ ශාලාවෙන්[5] පැමිණෙන
අය පිටත් විය යුත්තේ දකුණු දෙසින්
පිහිටි ඇතුල් වීමේ ශාලාවෙනි.[6] දකුණු
දෙසින් පිහිටි ඇතුල් වීමේ ශාලාවෙන්
පැමිණෙන අය පිටත් විය යුත්තේ
උතුරු දෙසින් පිහිටි ඇතුල් වීමේ
ශාලාවෙනි. කිසිවෙකු තමා ඇතුල් වූ
ශාලාවෙන්ම පිටත් නොවිය යුතුය.
ඔවුන් ආපසු නොහැරී අනික් කෙළව-
රේ පිහිටි ශාලාවෙන් පිටත් විය යුතුය.
**10** ඔවුන් ඇතුල් වන විට අධිපතියාද
ඇතුල් විය යුතුය. ඔහු පිටත් විය යුත්-
තේ ඔවුන් පිටත්ව යන අවස්ථාවේ-
දීය.[7] **11** උත්සවයකදී[8] හා උත්සව
සමයකදී පූජාව වෙනුවෙන් සපයන
වස්සා සමඟ ධාන්‍ය පූජාවක් ලෙස
ධාන්‍ය ඒපාවක්ද බැටළුවා සමඟ
ධාන්‍ය ඒපාවක්ද බැටළු පැටවුන්
සඳහා තමාට දිය හැකි ධාන්‍ය ප්‍රමා-
ණයක්ද අධිපතියා සැපයිය යුතුය.
සපයන ඒ සෑම ධාන්‍ය ඒපාවකටම
තෙල් හින මිනුමක් බැගින්ද ඔහු සැප-
යිය යුතුය.[9]

**12** "'යෙහෝවා දෙවි වන මා වෙ-
නුවෙන් දවන පූජාවක් හෝ හවුල්
පූජාවක් සිය කැමැත්තෙන් ඔප්පු කිරී-
මටද අධිපතියාට හැක.[10] ඔහු ඒ
සඳහා පැමිණෙන විට ඇතුල් මළු-
වේ නැඟෙනහිර දෙසින් පිහිටි ඇතුල්
වීමේ ශාලාවේ දොරටුව ඔහු වෙනු-
වෙන් විවෘත කළ යුතුය.[11] ඔහු සබත්
දවසේදී කළාක් මෙන් දවන පූජා හා
හවුල් පූජා සඳහා සතුන් හා අවශ්‍ය
අනිකුත් දේවල් සැපයිය යුතුය.[12] ඔහු

**46 පරි.**
1 එස 40:32
2 නික් 20:9
3 එස 44:2
4 ගීතා 81:3; යෙසා 66:23
5 එස 44:3
6 එස 41:21
7 2ලේක 29:29
8 යෙසා 66:23; ලූක් 1:10
9 ගණන් 28:9; එස 45:17
10 ගණන් 28:12; එස 45:24
11 ද්වි 16:17
12 ලෙවී 14:21; එස 46:11
13 ආමො 8:5
14 1ලේක 23:31

**2 තීරුව**
1 නික් 16:36; එස 45:24
2 එස 45:16; එස 45:22
3 එස 46:2
4 නික් 23:14; ද්වි 16:16
5 එස 40:20
6 එස 40:24
7 2ලේක 7:4
8 ලෙවී 23:2; ගණන් 29:1; ද්වි 16:10
9 එස 45:24; එස 46:7
10 ලෙවී 1:3; 1රාජා 3:4
11 එස 46:1
12 එස 45:17

පිටත්ව ගිය පසු දොරටුව වසා දැමිය
යුතුය.[1]
13 "'ඔබ දිනපතා යෙහෝවා දෙවි
වන මට දවන පූජාවක් ඔප්පු කිරීම
සඳහා අවුරුද්දක් වයසැති නිකැ-
ළැල් බැටළු පැටවෙකුව සැපයිය
යුතුය.[2] ඔබ සෑම උදෑසනකදීම එසේ
කළ යුතුය. 14 සෑම උදෑසනකදීම
එය සමඟ ධාන්‍ය පූජාවක්ද සැපයිය
යුතුය. ඒ සඳහා සිහින් පිටි ඒපා-
වකින් හයෙන් කොටසක්ද ඒ මත
ඉසීම සඳහා තෙල්ද ගෙනා යුතුය.
එම තෙල් ප්‍රමාණය හින මිනුමකින්
තුනෙන් එකක් විය යුතුය.[3] යෙ-
හෝවා දෙවි වන මට පුද කරන
මෙම ධාන්‍ය පූජාව නොකඩවා සැප-
යිය යුත්තකි. 15 මෙසේ, ඔබ සෑම
උදෑසනක් පාසාම බැටළු පැටවෙකු-
වද ධාන්‍ය පූජාවක්ද තෙල්ද සැපයිය
යුතුය. එය නොකඩවා ඔප්පු කළ යුතු
දවන පූජාවකි.'
16 "විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි.
'අධිපතියාට අවශ්‍ය නම් තමාගේ
සියලු පුත්‍රයන්ට උරුමයක් දිය හැක.
එසේ දුන් උරුමය ඔහුගේ පුත්‍රයන්ට
අයිති වන්නේය. එතැන් පටන් උරුම
වූ එම දේ සදහටම ඔවුන්ට අයිති වනු
ඇත. 17 ඔහුට අවශ්‍ය නම් තමාට
උරුම වූ දෙයින් තම සේවකයෙකු-
ටද යමක් දිය හැක. එය නිදහස
ලැබෙන වසර[4] දක්වා එම සේවක-
යාට අයිති වන්නේය. ඉන්පසුව එය
අධිපතියාට නැවත භාර දිය යුතුය.
එහෙත් ඔහුගේ උරුමයෙන් තම පුත්‍ර-
යන්ට දුන් දේ එම පුත්‍රයන්ට සදහටම
හිමි වනු ඇත. 18 එහෙත් ජනතා-
වට උරුම වී ඇති කිසිවක් අධිපතියා
නොගත යුතුය. ඔවුන්ට හිමි ස්ථා-
නවලින් ඔවුන්ව පන්නා නොදැමිය
යුතුය.[5] ඔහු තම පුත්‍රයන්ට උරුමයක්
දිය යුත්තේ තමා සතු දෙයිනි. එවිට
මාගේ ජනයා තමන්ට හිමි ස්ථානව-
ලින් විසිර නොයන්නෝය.'"[6]
19 එවිට ඔහු මාව උතුරු දෙ-
සින් පිහිටි ශුද්ධ භෝජන ශාලා
සංකීර්ණය අසලට ගෙනාවේය.[1] මම
පූජකයන්ට අයිති වූ මෙම භෝ-
ජන ශාලාවලට පිවිසෙන දොරටු-
වෙන් ඇතුල් වී ගොඩනැගිලි දෙක
මැද පිහිටි මාර්ගයට පිවිසුණෙමි.[2]
එම මාර්ගය කෙළවරේ එනම්, බටහිර
පැත්තෙහි එක්තරා ස්ථානයක් වෙන්
කර තිබුණේය. 20 ඔහු මට මෙසේ
පැවසීය. "පූජකයන් වන්දි පූජා සහ
පාප පූජා[3] සඳහා පුද කරන සතුන්-
ගේ මස් තම්බන්නේ මෙතැනය.[4]
ධාන්‍ය පූජාව පුලුස්සන්නේද මෙතැ-
නය.[5] එසේ කරන්නේ ඒවා පිටත මළු-
වට ගෙන යෑම තහනම් නිසාය. එය
තහනම් කර තිබෙන්නේ පූජකයන්ට
පමණක් හිමි විය යුතු ශුද්ධ තත්වය
එහි සිටින ජනතාවට නොලැබෙන
පිණිසය."[6]
21 ඔහු ඊළඟට මාව පිටත මළුවට
ගෙනැවිත් එහි කොන් හතර පසු කර-
ගෙන යෑමට සැලැස්වීය. සෑම කො-
නකම කුඩා මළුවක් බැගින් පිහිටා
තිබිණ. 22 මෙසේ, පිටත මළුවේ
කොන් හතරෙහිම කුඩා මළු හතරක්
තිබිණ. ඒවායේ දිග රියන් හතළිහක්ද
පළල රියන් තිහක්ද විය. ඒ එක් එක්
මළුව වටේට එක සමාන මිනුම් ඇති
බිත්තියක් ඉදි කර තිබිණ. 23 ඒ
බිත්තියේ ඇතුල් පැත්තෙහි, බිත්ති-
යටම අල්ලා ගල්වලින් සෑදූ කුඩා
බිත්තියක් වටේටම බැඳ තිබිණ.
සතුන්ගේ මස් තැම්බීම සඳහා[7] ස්ථාන
වෙන් කර තිබුණේ එම කුඩා බිත්ති-
යට යාබදවය. 24 එවිට ඔහු මට
මෙසේ පැවසීය. "දේවමාලිගාවේ සේ-
වකයන් ජනතාව පුද කරන සතුන්ගේ
මස් තම්බන කාර්යය ඉටු කරන්නේ
මෙම ස්ථානවලදීය."[8]

**47** ඔහු නැවත මාව දේවමාලිගා-
වේ දොරකඩ අසලට ගෙනා-
වේය.[9] නැඟෙනහිර දෙසට මුහුණ ලා
පිහිටි දේවමාලිගාවට පිවිසෙන දොර-
ටුවට යටින්[10] ජල ධාරාවක් ගලා
ගියේය.[11] දේවමාලිගාවේ සිට නික්ම
ආ ඒ ජල ධාරාව පූජාසනය පසු කර-
මින් නැඟෙනහිර දෙසට ගලාගෙන

**46 පරි.**
1 එස 46:2
2 නික් 29:38; ගණන් 28:3
3 ගණන් 28:5
4 ලෙවී 25:10
5 1රාජා 21:19; එස 22:27
6 එස 34:5

**2 තීරුව**
1 එස 42:1
2 එස 42:9
3 එස 44:29
4 නික් 29:31; 2ලේක 35:13
5 ලෙවී 2:4; ලෙවී 2:5
6 එස 44:19
7 1සාමු 2:13
8 2ලේක 35:13; එස 46:20

**47 පරි.**
9 එස 41:2
10 එස 43:4; එළි 22:1
11 යෙරෝ 2:13; සෙක 13:1; සෙක 14:8

ගියේය. එය ගලා ගියේ පූජාසනයේ
දකුණු පැත්තෙනි.
2 ඉන්පසු ඔහු මාව උතුරු දෙසින්
පිහිටි ඇතුල් වීමේ ශාලාවෙන් පිටතට
රැගෙන ආවේය.[1] එතැන් සිට ඔහු මාව
නැඟෙනහිර දෙසින් තිබෙන පිටත
මළුවට ඇතුල් වන ශාලාව ළඟට ගෙ-
නාවේය.[2] දේවමාලිගාවේ සිට පැමිණි
ජල ධාරාව[3] එම ශාලාවට දකුණු
පසින් ගලාගෙන ගියේය.
3 ඒ මිනිසා ජල පහර දිගේ නැඟෙ-
නහිර දෙසට ගොස් තම අතේ
ඇති මිනුම් දණ්ඩෙන්[4] රියන් දහසක්
මැන්නේය. ඉන්පසුව ඒ ජල පහරට
බසින්න කියා ඔහු මට කීවේය. එහි
ජල මට්ටම මාගේ වළලුකර දක්වා
තිබිණ.
4 එතැන් සිට ඔහු තවත් රියන්
දහසක් මැන්නේය. ඉන්පසු ජල පහර
දිගේ ඇවිදගෙන එන්න කියා ඔහු මට
කීවේය. එහි ජල මට්ටම මාගේ දණ-
හිස් දක්වා තිබිණ.
ඔහු තවත් රියන් දහසක් මැන්-
නේය. ඔහු කී පරිදි මම නැවතත් ජල
පහර දිගේ ඉදිරියට ගමන් කළෙමි.
එවිට ජල මට්ටම මගේ ඉණ දක්වා
වැඩි වී තිබිණ.
5 එතැන් සිට ඔහු තවත් රියන් දහ-
සක් ඉදිරියට මැන්නේය. ඒ අවස්ථා-
වේදී ජල පහර දිගේ ඇවිදගෙන යන්න
මට බැරි විය. මන්ද ජල පහර ගැඹුරු
ගංගාවක් බවට පත් වී තිබිණ. එය
හරහා යෑමට නම් පීනන්න අවශ්‍ය විය.
6 එවිට ඔහු ගංගාවේ බැස සිටි මාව
ඉවුර අසලට කැඳවා,
"මනුෂ්‍ය පුත්‍රය, ඔබ මේ දේ දුටුවාද"
කියා ඇසීය.
7 මා බැලූ විට, ගංගාව දෙපස
ඉවුරේ ගස් බොහොමයක් වැවී තිබු-
ණේය.[5] 8 එවිට ඔහු මට මෙසේ
පැවසීය. "නැඟෙනහිර දෙසට ගලා
යන මේ ගංගාව අරබා ප්‍රදේශය[6]
මැදින් ගොස් මුහුදට* ගලා බසී.[7] එය
මුහුදට ගලා ගොස්[8] එහි ජලය නැවුම්
ජලය බවට හරවන්නේය. 9 ක්‍රමක්‍ර-
මයෙන් විශාල වන මෙම ගංගාව*
ගලා බසින සෑම ප්‍රදේශයකම විවිධා-
කාර සත්තු බොහොමයක් ජීවත් වනු
ඇත.[1] මේ ගංගාව මුහුදට ගලා බසින
විට මුහුදේ ජලය නැවුම් ජලය බවට
හැරෙන නිසා[2] එහි මත්ස්‍යයෝ සුල-
බව සිටිති. ගංගාව ගලා බසින සෑම
තැනකම විවිධාකාර සතුන් බොහො-
මයකට ජීවත් වීමට හැකි වෙයි.
10 "ඒන්-එග්ලයිම් සිට ඒන්-ගෙදී[3]
දක්වා වෙරළ තීරය දිගේ ධීවරයෝ
බොහෝදෙනෙක් සිටිනු ඇත. ඔවුන්-
ගේ දැල් වේලීම සඳහා ස්ථානයක්ද
එහි තිබෙනු ඇත. මහ මුහුදේ*[4] මෙන්
විවිධාකාර මත්ස්‍යයෝ බොහොමයක්
මෙම මුහුදේද ජීවත් වෙති.
11 "නමුත් ගංගාව ගලා නොගිය
මුහුද අවට ඇති මඩ වගුරු හා වගුරු-
බිම් පවිත්‍ර වන්නේ නැත.[5] ඒවා ලුණු
සහිත නිසරු බිම් ලෙස අත්හරිනු
ලැබේ.[6]
12 "ගංගාවේ ඉවුරු දෙපස විවිධා-
කාර පලතුරු ගස් සරුවට වැඩෙනු
ඇත.[7] ඒවායේ කොළ මැලවී නො-
යයි.[8] ඒවායේ පලදාවද කිසිදා නතර
නොවේ.[9] සෑම මාසයක් පාසාම ඒවා-
යේ අලුත් පල හටගන්නේය. මන්ද
එම ගස්වලට ජලය ලැබෙන්නේ දේව-
මාලිගාවෙන් ගලා එන ගංගාවෙනි.[10]
එහි පල ආහාර පිණිසද එහි කොළ
සුව කිරීම පිණිසද යොදාගනු ලබන්-
නේය."[11]
13 විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි පවසන්නේ මෙයයි.
"ඊශ්‍රායෙල් ජාතියේ ගෝත්‍ර දොළහ
සඳහා උරුමයක් ලෙස ඔබ දිය
යුත්තේ මෙම දේශයයි. යෝසෙප්-
ගේ පුත්‍රයන් සඳහා කොටස් දෙකක්
දිය යුතුය.[12] 14 ජනයෙනි, මේ දේ-
ශය උරුම වන්නේ ඔබටය. සෑම
කෙනෙකුටම තමාගේ සහෝදරයාට

**47 පරි.**
1 එස 40:20
2 එස 40:6
එස 44:2
3 එළි 22:1
4 එස 40:3
එළි 21:15
5 එළි 22:2
6 ද්වි 4:49
7 යොෂු 3:16
8 එස 47:18
සෙක 14:8

**2 තීරුව**
1 උත් 1:20
2 ගීතා 103:3
3 යොෂු 15:62
2ලේක 20:2
4 ගණන් 34:6
යොෂු 23:4
එස 48:28
5 හෙබ්‍රෙ 10:26
එළි 22:11
6 ද්වි 29:23
ගීතා 107:34
යෙරෙ 17:6
7 එස 47:7
8 ගීතා 1:3
9 යෙරෙ 17:8
10 එස 47:1
එළි 22:1
11 එළි 22:2
12 උත් 48:5
1ලේක 5:1
එස 48:5

එස 47:8* එනම්, මළ මුහුදට.

එස 47:9* මූ.අ., "ජල පහර දෙක." මෙයින් අද-
හස් වන්නේ, ජල පහර ප්‍රමාණයෙන් දෙගුණයක්
වී ඇති බවයි. 10* එනම්, මධ්‍යධරණී මුහුද.

ලැබෙන උරුමයට සමාන උරුම-
යක් ලැබෙන්නේය. මේ දේශය ඔබේ
මුතුන්මිත්තන්ට දෙන බවට[1] මම අත
ඔසවා දිවුරුවෙමි.[2] එය ඔබට උරුම-
යක් ලෙස ලැබෙන්නේය.[3]
**15** “ඔබට උරුම වන දේශයේ
උතුරු දේශ සීමාව මෙයයි. එය
මහ මුහුදෙන් ආරම්භ වී හෙත්ලොන්[4]
නම් ස්ථානය දෙසට යන මාර්ගය
ඔස්සේ ගොස් ෂෙදාද්,[5] **16** හමාත්,[6]
බෙරොතා[7] හා සිබ්‍රායිම් නම් ස්ථාන
දක්වා දිව යයි. මෙම ස්ථාන පිහිටා
තිබෙන්නේ හමාත්හි දේශ සීමාව
හා දමස්කයේ[8] දේශ සීමාව අත-
රය. එතැන් සිට එය හවුරාන්හි[9] දේශ
සීමාව ළඟ පිහිටි හෂේර්-හත්තිකොන්
නම් ස්ථානය දක්වා දිව යයි.
**17** මෙසේ, මෙම සීමාව මහ මුහුදේ
සිට දමස්කයේ දේශ සීමාව ආසන්න-
යේ පිහිටි හෂර්-ඒනොන්[10] නම් ස්ථා-
නය දක්වාද උතුරට වෙන්න පිහිටි
හමාත්හි[11] දේශ සීමාව දක්වාද විහිදී
යයි. දේශයේ උතුරු සීමාව වන්නේ
එයයි.
**18** “නැඟෙනහිර දේශ සීමාව
මැනිය යුත්තේ මෙයාකාරයටයි. එම
දේශ සීමාව හවුරාන්[12] හා දමස්කය[13]
මැදින් දිව ගොස් ඊශ්‍රායෙල් දේශය හා
ගිලියද් දේශය[14] අතර පිහිටි යොර්-
දාන් ගඟ[15] හරහා නැඟෙනහිර මුහුද*
දක්වා විහිදී යයි. දේශයේ නැඟෙනහිර
සීමාව වන්නේ එයයි.
**19** “දකුණු දේශ සීමාව මෙයයි.
එය තාමර්[16] නම් ස්ථානයේ සිට
මෙරිබාත්-කාදෙෂ්හි[17] දිය පහර දක්-
වාද ඉන්පසුව ඊජිප්තු නිම්නය[18] දිගේ
මහ මුහුද දක්වාද විහිදී යයි. නෙගෙබ්
නම් ප්‍රදේශයට යාබදව පිහිටි දකුණු
දේශ සීමාව වන්නේ එයයි.
**20** “බස්නාහිර දේශ සීමාව නම්
මහ මුහුදේ වෙරළ තීරයයි. එය මහ
මුහුදේ වෙරළ දිගේ හමාත් දේශ-
යෙහි[19] සීමාව දක්වා විහිදී යයි. දේශ-
යේ බස්නාහිර සීමාව වන්නේ එයයි.”

එස **47:18*** එනම්, මළ මුහුද.

**21** “ඔබ මෙම දේශය ඊශ්‍රායෙල්
ජාතියේ ගෝත්‍ර දොළහ අතරේ බෙදා
දිය යුතුය. **22** ඔබ එය උරුමයක්
ලෙස ඊශ්‍රායෙල් සෙනඟටත්[1] ඔවුන්
අතරේ වාසය කරන විදේශිකයන්-
ටත් බෙදා දිය යුතුය.[2] ඔබ අතරේම
ජීවත් වෙමින් දරුවන් බිහි කර ඇති
එම විදේශිකයන්ට ඊශ්‍රායෙල් පුත්‍ර-
යන්ට හා සමානව සැලකිය යුතුය.
ඊශ්‍රායෙල් සෙනඟට සමානව ඔවුන්ටද
උරුමයක් හිමි වන්නේය.[3] **23** විදේ-
ශිකයෙකුට උරුමයක් ලෙස ලැබෙන
ඉඩම ඔහුට ලබා දිය යුත්තේ ඔහු
පදිංචි වී සිටින ගෝත්‍රයට අයත් ප්‍රදේ-
ශයෙනි.” එසේ පවසන්නේ විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවිය.

**48** “එක් එක් ගෝත්‍රයට හිමි
වන ප්‍රදේශයේ සීමා මායිම්
මතු දැක්වේ. දාන් ගෝත්‍රයට හිමි
කොටස මෙයයි. එය උතුරු
දේශ සීමාවේ කෙළවරේ සිට හෙත්-
ලොන්[4] දෙසට යන මාර්ගය ඔස්සේ
හමාත් දේශයට[5] ඇතුල් වන ස්ථා-
නය දක්වා දිව යයි. එතැන් සිට
උතුරු දෙසින් පිහිටි හෂර්-ඒනොන්[6]
දක්වාද දිව යයි. හෂර්-ඒනොන්
පිහිටා ඇත්තේ හමාත් නුවරට යාබ-
දව තිබෙන දමස්කයේ දේශ සීමා-
වේය. දාන්ට[7] හිමි මෙම කොටසට
නැඟෙනහිර මායිමක්ද බස්නාහිර
මායිමක්ද තිබේ. **2** ආෂේර්ට[8] හිමි
කොටස පිහිටා තිබෙන්නේ දාන්-
ගේ දේශ සීමාවට දකුණින්ය.
ආෂේර්ට හිමි එම කොටසටත් නැඟෙ-
නහිර මායිමක්ද බස්නාහිර මායි-
මක්ද තිබේ. **3** නප්තලීට[9] හිමි
කොටස පිහිටා තිබෙන්නේ ආෂේර්-
ගේ දේශ සීමාවට දකුණින්ය. නප්ත-
ලීට හිමි එම කොටසටත් නැඟෙනහිර
මායිමක්ද බස්නාහිර මායිමක්ද
තිබේ. **4** මනස්සේට[10] හිමි කො-
ටස පිහිටා තිබෙන්නේ නප්තලීගේ
දේශ සීමාවට දකුණින්ය. මනස්-
සේට හිමි එම කොටසටත් නැඟෙන-
හිර මායිමක්ද බස්නාහිර මායිමක්ද
තිබේ. **5** එප්‍රායිම්ට[11] හිමි කොටස

**47 පරි.**
1 උත් 28:13 එස 20:42
2 උත් 26:3 ගණන් 14:16
3 හිතෝ 16:33 එස 48:29
4 එස 48:1
5 ගණන් 34:8
6 ගණන් 13:21
7 2සාමු 8:8
8 උත් 14:15
9 එස 47:18
10 ගණන් 34:9
11 එස 48:1
12 එස 47:16
13 2සාමු 8:5
14 උත් 31:23 ගණන් 32:1 විනි 10:8
15 උත් 13:10
16 එස 48:28
17 ගණන් 20:13 ද්වි 32:51 ගීතා 81:7
18 2රාජා 24:7 එස 48:28
19 යොෂු 13:5 එස 48:28

**2 තීරුව**
1 එස 47:13
2 රෝම 10:12 ගලා 3:8 එළි 7:9
3 කොලො 3:11

**48 පරි.**
4 එස 47:15
5 ගණන් 34:8
6 එස 47:17
7 උත් 30:6
8 උත් 30:13 යොෂු 19:24
9 උත් 30:8 යොෂු 19:32
10 උත් 41:51 උත් 48:14 යොෂු 13:29
11 උත් 48:5 යොෂු 16:5 යොෂු 17:17

පිහිටා තිබෙන්නේ මනස්සේගේ දේශ
සීමාවට දකුණින්ය. එෆ්‍රායිම්ට හිමි
එම කොටසටත් නැඟෙනහිර මායි-
මක්ද බස්නාහිර මායිමක්ද තිබේ.
**6** රූබේන්ට[1] හිමි කොටස පිහිටා
තිබෙන්නේ එෆ්‍රායිම්ගේ දේශ සීමාවට
දකුණින්ය. රූබේන්ට හිමි එම කොට-
සටත් නැඟෙනහිර මායිමක්ද බස්නා-
හිර මායිමක්ද තිබේ. **7** යූදාට[2] හිමි
කොටස පිහිටා තිබෙන්නේ රූබේන්-
ගේ දේශ සීමාවට දකුණින්ය. යූදාට
හිමි එම කොටසටත් නැඟෙනහිර
මායිමක්ද බස්නාහිර මායිමක්ද
තිබේ. **8** නැඟෙනහිර සිට බස්නා-
හිර දක්වා විහිදී යන යූදාගේ දේශ
සීමාවට දකුණින් ඔබ විශේෂ බිම්
කොටසක් වෙන් කළ යුතුය. එහි
දිග රියන් විසිපන්දහසක් වේ.[3] එහි
උතුරු මායිමේ පළල තීරණය වන්-
නේ නැඟෙනහිර සිට බස්නාහිර දක්වා
විහිදී යන යූදාහි දේශ සීමාවේ පළ-
ලට අනුවය. එහි දකුණු මායිමේ
පළල තීරණය වන්නේ නැඟෙන-
හිර සිට බස්නාහිර දක්වා විහිදෙන
ඊට පහළින් තිබෙන දේශ සීමාවේ
පළලට අනුවය. දේවමාළිගාව පිහිටා
තිබෙන්නේ ඒ භූමියේ මධ්‍යයෙහිය.[4]

**9** “මුළු භූමියෙන් රියන් විසිපන්දහ-
සක් දිග හා රියන් දසදහසක් පළල
කොටසක් යෙහෝවා දෙවි වන මා වෙ-
නුවෙන් වෙන් කරන්න. **10** පූජක-
යන් සඳහාද වෙන් කරන ලද මෙම
ශුද්ධ භූමියේ[5] උතුරු මායිම රියන් විසි-
පන්දහසක්ද බස්නාහිර මායිම රියන්
දසදහසක්ද නැඟෙනහිර මායිම රියන්
දසදහසක්ද දකුණු මායිම රියන් විසි-
පන්දහසක්ද වේ. යෙහෝවා දෙවි වන
මාගේ ශුද්ධස්ථානය එහි මැද පිහිටා
තිබේ.[6] **11** එම කොටස වෙන් කරනු
ලබන්නේ සාදොක්ගේ පුත්‍රයන්[7] අත-
රින් තෝරාගත් පූජකයන් සඳහාය.
ඔවුහු මා වෙනුවෙන් ඉටු කළ යුතු
වගකීම් නිසියාකාරව ඉටු කළෝය.
ඊශ්‍රායෙල් පුත්‍රයන් හා ලෙවීවරුන්
මාගෙන් ඉවත්ව ගියත් ඔවුහු මාගෙන්
ඉවත්ව නොගියෝය. **12** එමනිසා
දේශයෙන් වෙන් කරන ලද භූමියෙන්
කොටසක් ඔවුන්ට හිමි විය යුතුය. එය
ඉතා ශුද්ධ වූ භූමියකි. එය ලෙවීවරුන්
සඳහා වෙන් කරන ලද කොටසට
යාබදව පිහිටා තිබේ.[1]

**13** “පූජකයන්ට හිමි කොටසට
උතුරින් පිහිටි ලෙවීවරුන් සඳහා
වෙන් කළ[2] එම භූමියේ දිග රියන් විසි
පන්දහසක්ද පළල රියන් දසදහසක්ද
විය යුතුය.[3] **14** එයින් කිසි කො-
ටසක් විකිණීමටවත් වෙනත් ඉඩ-
මක් සමඟ හුවමාරු කිරීමටවත් එහි
සරුසාර කොටස් වෙනත් කෙනෙකුට
පවරා දීමටවත් ඔවුන්ට අයිතියක්
නැත. එසේ වන්නේ එය යෙහෝවා
දෙවි වන මට කැප කළ ශුද්ධ භූමියක්
වන නිසාය.[4]

**15** “පූජකයන්ට හිමි කොටසට
පහළින් තිබෙන රියන් විසිපන්දහ-
සක් දිග හා රියන් පන්දහසක් පළල
ඉතුරු කොටස ජනතාව වෙනුවෙන්
වෙන් කර ඇති පොදු භූමියකි.[5] එහි
මැද නුවරක් පිහිටා තිබෙන අතර[6]
නුවර වටා සතුන් සඳහා තණ-
බිම් තීරයක්ද තිබේ. **16** එම නුවරේ
මායිම් මෙසේය. එහි උතුරු, දකුණු,
නැඟෙනහිර හා බස්නාහිර යන සතර
මායිම්වල දිග රියන් හාරදහස් පන්-
සියය බැගින් වේ. **17** එම නුව-
රේ හතර වටේටම තිබෙන තණබිම්[7]
තීරයේ පළල රියන් දෙසිය පනහකි.

**18** “එම නුවර හා ඒ වටා ඇති
තණබිම් තීරය දෙපස රියන් දස-
දහසක් පළල බිම් කොටස් දෙ-
කක් ඉතුරුව තිබේ. එහි වගා කරන
ධාන්‍ය නුවරේ සේවය කරන අයට
අවශ්‍ය රොටි සාදාගැනීමට පාවිච්චි
කළ යුතුය.[8] පොදු භූමියේ දිග ශුද්ධ
භූමියේ දිග හා සමාන විය යුතුයි.[9]
**19** නුවරේ සේවය කිරීම සඳහා ඊශ්‍රා-
යෙල්හි සියලු ගෝත්‍රවලට අයත් අය
පැමිණෙන අතර එහි වගා කටයුතුවල
නිරත වන්නේද ඔවුන්ය.[10]

**20** “ශුද්ධ භූමිය හා පොදු භූමිය
ඇතුළු මුළු භූමියේ දිග හා පළල රියන්
විසිපන්දහස බැගින් වේ. කලින් සඳ-

**48 පරි.**
1 උත් 49:3
2 උත් 29:35 යොෂු 15:1 යොෂු 19:9
3 එස 45:1
4 එළි 21:3
5 ගණන් 35:2 යොෂු 21:3 එස 45:4
6 එස 48:8
7 එස 40:46 එස 43:19 එස 44:15

**2 තීරුව**
1 එස 45:4
2 එළි 12:19
3 එස 45:3
4 ලෙවී 27:21
5 එස 45:6
6 එස 48:35
7 එස 45:2
8 2රාජා 25:3
9 එස 45:1
10 එස 45:6

හත් නුවරද ඇතුළත් මෙම හරි හත-
රැස් භූමිය ශුද්ධ කොටසක් ලෙස ඔබ
මා වෙනුවෙන් වෙන් කළ යුතුය.
21 “ශුද්ධ භූමිය හා නුවර ඇතුළත්
පොදු භූමිය දෙපස අධිපතියාට අයිති
කොටස් දෙක පිහිටා තිබේ.[1] අධිපති-
යාට[2] අයිති ඒ එක් කොටසක් මට
කැප කළ මුළු භූමියේ රියන් විසි-
පන්දහසක් දිග නැඟෙනහිර මායිමට
අලළාද අනික් කොටස රියන් විසිපන්-
දහසක් දිග බස්නාහිර මායිමට අල-
ළාද පිහිටා තිබේ.[3] මෙම කොටස්වල
උතුරු හා දකුණු මායිම් ඊට උතු-
රින් හා දකුණින් ඇති ගෝත්‍ර දෙකේ
මායිම්වලටම අලළා පිහිටා තිබේ.
මෙසේ, අධිපතියාට වෙන් කළ කො-
ටස් දෙක මැද මට කැප කළ මුළු භූමි-
යද ශුද්ධ වූ එම භූමිය මැද මාගේ
ශුද්ධස්ථානයද පිහිටා තිබේ.
22 “අධිපතියාට හිමි කොටස් දෙක
අතර පිහිටි මට කැප කළ මුළු භූමියේ
ලෙවීවරුන් සඳහා හිමි කොටස යූදා
ගෝත්‍රයේ දකුණු මායිමට අලළාද[4]
නුවර ඇතුළත් පොදු භූමිය බෙන්ජ-
මින් ගෝත්‍රයේ උතුරු මායිමට අළ-
ළාද පිහිටා තිබේ. අධිපතියාට හිමි
කොටස් දෙකද පිහිටා ඇත්තේ යූදා
හා බෙන්ජමින් ගෝත්‍රවලට හිමි බිම්
කොටස් අතරේය.
23 “ඉතුරු ගෝත්‍රවලට හිමි කො-
ටස් පිළිබඳව විස්තර මෙසේය.
නැඟෙනහිර මායිමේ සිට බස්නා-
හිර මායිම දක්වා විහිදෙන බෙන්ජ-
මින්ට[5] හිමි කොටස පොදු භූමියට
දකුණින් පිහිටා තිබේ. 24 බෙන්ජ-
මින්ගේ දේශ සීමාවට දකුණින් සිමි-
යොන්ට[6] හිමි කොටස පිහිටා තිබේ.
එම කොටසද නැඟෙනහිර මායිමේ
සිට බස්නාහිර මායිම දක්වා විහිදෙයි.
25 සිමියොන්ගේ දේශ සීමාවට දකු-
ණින් ඉසකාර්ට[7] හිමි කොටස පිහිටා
තිබේ. එම කොටසද නැඟෙනහිර
මායිමේ සිට බස්නාහිර මායිම දක්වා
විහිදෙයි. 26 ඉසකාර්ගේ දේශ සීමා-
වට දකුණින් සෙබුලූන්ට[8] හිමි කො-
ටස පිහිටා තිබේ. එම කොටසද

48 පරි.
1 එස 45:7
2 ගීතා 45:16 යෙසා 32:1
3 එස 48:8
4 එස 48:8
5 උත් 35:18 යොෂු 18:21
6 උත් 49:5 යොෂු 19:1
7 උත් 49:14 යොෂු 19:17
8 උත් 49:13 යොෂු 19:10

2 තීරුව
1 උත් 30:11 උත් 49:19
2 එස 47:19
3 ගණන් 20:13
4 උත් 15:18
5 එස 47:15
6 ගණන් 34:2 ගණන් 34:13 යොෂු 14:2 එස 47:13
7 එස 48:16
8 යෙරෙ 3:17 යෝවෙ 3:21 සෙක 2:10

නැඟෙනහිර මායිමේ සිට බස්නාහිර
මායිම දක්වා විහිදෙයි. 27 සෙබුලූ-
ලන්ගේ දේශ සීමාවට දකුණින් ගාද්ට[1]
හිමි කොටස පිහිටා තිබේ. එම කොට-
සද නැඟෙනහිර මායිමේ සිට බස්නා-
හිර මායිම දක්වා විහිදෙයි. 28 මුළු
දේශයේ දකුණු සීමාව වන්නේ ගාද්ට
හිමි දේශයේ දකුණු සීමාවයි. එම
දකුණු දේශ සීමාව තාමර්[2] නම් ස්ථා-
නයේ සිට මෙරිබාත්-කාදෙෂ්හි[3] දිය
පහර දක්වාද ඊජිප්තු නිම්නය[4] දිගේ
මහ මුහුද*[5] දක්වාද විහිදී යයි.
29 “ඔබ මෙම දේශය ඊශ්‍රායෙල්
ජාතියේ ගෝත්‍රවලට උරුමයක් සේ
බෙදා දිය යුත්තේ එයාකාරයටයි.”[6]
එසේ පවසන්නේ විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවිය.
30 “පොදු භූමියේ තිබෙන නුවරේ
උතුරු මායිම රියන් හාරදහස් පන්සි-
යයකි.[7] ඒ නුවර වටාම දොරටු පිහිටා
තිබේ.
31 එම දොරටු නම් කර ඇත්තේ
ඊශ්‍රායෙල් ගෝත්‍රවල නම්වලට අනු-
වය. උතුරු දෙසින් රූබෙන්, යූදා සහ
ලෙවී යන නම්වලින් දොරටු තුනක්
තිබේ.
32 “රියන් හාරදහස් පන්සියයක්
දිග නුවරේ නැඟෙනහිර මායිම දිගේ
යෝසෙප්, බෙන්ජමින් සහ දාන් යන
නම්වලින් දොරටු තුනක් තිබේ.
33 “රියන් හාරදහස් පන්සියයක්
දිග නුවරේ දකුණු මායිම දිගේ සිමි-
යොන්, ඉසකාර් සහ සෙබුලූලන් යන
නම්වලින් දොරටු තුනක් තිබේ.
34 “රියන් හාරදහස් පන්සියයක්
දිග නුවරේ බස්නාහිර මායිම දිගේ
ගාද්, ආෂෙර් සහ නප්තලී යන නම්ව-
ලින් දොරටු තුනක් තිබේ.
35 “මෙම නුවරේ වටප්‍රමාණය
රියන් දහඅටදහසකි. එතැන් පටන්
එම නුවරට ‘යෙහෝවා දෙවි එහි
වාසය කරයි’*[8] යන නාමය තැබිය
යුතුය.”

එස **48:28*** එනම්, මධ්‍යධරණී මුහුද. **35*** හෙබ්‍රෙව් බසින්, යෙහෝවා-ෂම්මාහ්.

# දානියෙල්*

1 යූදාහි රජු වූ යෙහෝයාකිම්[1]
රජකම් කළ තුන්වන අවුරුද්-
දේදී බැබිලෝනියේ රජු වන නෙබු-
කද්නෙෂර් යෙරුසලම් නුවරට පැමිණ
එය වැටලුවේය.[2] **2** පසුව යෙහෝවා
දෙවි යූදාහි රජු වූ යෙහෝයාකිම්ව ඔහු-
ගේ අතට හසු කර දුන්නේය.[3] සැබෑ
දෙවි තම ගෘහයේ තිබූ භාණ්ඩ සමහ-
රක්[4] රැගෙන යැමටද ඔහුට ඉඩහැරි-
යේය. ඔහු එම භාණ්ඩ ෂීනාර් දේශයේ[5]
පිහිටි තමන් නමස්කාර කළ දෙවියන්-
ගේ දේවාලයට රැගෙන ගොස් එහි
භාණ්ඩාගාරයේ තැන්පත් කළේය.[6]
**3** දිනක් රජ තම ප්‍රධාන නිලධා-
රියා[7] වන අෂ්පෙනස්ට කතා කළේය.
ඊශ්‍රායෙල් සෙනඟගෙන්ද රජ පවු-
ලට අයත් තරුණයන්ගෙන්ද වංශවත්
පවුල්වලට අයත් තරුණයන්ගෙන්ද
කිහිපදෙනෙකුව තෝරා තමා වෙ-
තට ගෙන එන ලෙස රජ ඔහුට
අණ කළේය.[8] **4** රජුගේ අණ පරිදි
කඩවසම් පෙනුමකින් යුත්, නිරෝගී
ශරීරයක් ඇති,[9] සියලුම ශිල්ප ශාස්-
ත්‍රයන්හි දක්ෂ වූ,[10] දැනුම් තේරුම්
ඇති,[11] රජමාලිගාවේ සේවය කිරී-
මට හැකියාවක් ඇති[12] තරුණයන්ව
තෝරාගන්නා ලදි. රජ ඒ අයට කල්-
දිවරුන්ගේ සියලු ශාස්ත්‍ර හා භාෂා
ඉගැන්වීමට අෂ්පෙනස්ට පැවරුවේය.
**5** තමා වෙනුවෙන් පිළියෙල කළ
භෝජනයෙන් හා වයින්වලින් කො-
ටසක් දිනපතාම එම තරුණයන්ට
දෙන ලෙසද රජ අණ කළේය.[13] අවු-
රුදු තුනක් ඔවුන්ව එලෙස පුහුණු කළ
පසු ඔවුන් තමා ඉදිරියට පැමිණ සේ-
වය කළ යුතු බවට රජ නියම කළේය.
**6** ඔවුන් අතරේ යූදා ගෝත්‍රයට
අයත් තරුණයෝ කිහිපදෙනෙක්ද
සිටියෝය. ඔවුන්ගේ නම් දානියෙල්,[14]
හනනියා, මිෂායෙල් සහ අෂරියාය.[15]
**7** රජුගේ ප්‍රධාන නිලධාරියා ඔවුන්ට
අලුත් නම් දුන්නේය.[1] දානියෙල්ට
බෙල්ටෂසර්[2] කියාද හනනියාට ෂද්‍රක්
කියාද මිෂායෙල්ට මේෂක් කියාද අෂ-
රියාට අබෙද්නෙගෝ[3] කියාද ඔහු නම්
තැබුවේය.
**8** රජු ඔවුන්ට නියම කළ කෑමව-
ලින් හෝ වයින්වලින් අපවිත්‍ර නොවී
සිටීමට දානියෙල් තම හදවතින්ම
අදිටන් කරගත්තේය.[4] ඒ නිසා අප-
විත්‍ර දේවල් ආහාරයට නොගෙන සිටී-
මට තමාට අවසර දෙන ලෙස රජුගේ
ප්‍රධාන නිලධාරියාගෙන් නිතර නිතර
ඔහු ඉල්ලා සිටියේය.[5] **9** සැබෑ දෙවි
දානියෙල්ට ආශීර්වාද කළ නිසා රජු-
ගේ ප්‍රධාන නිලධාරියා ඔහුට අනු-
කම්පා කර ඉතා කාරුණිකව*
සැලකුවේය.[6] **10** පසුව ඔහු දානි-
යෙල්ට මෙසේ කීවේය. "ඔබට ඒ කෑම
බීම දෙන්න නියම කළේ මගේ ස්වාමි-
යයි. ඔහුගේ අණට විරුද්ධව යමක්
කරන්න මට බයයි.[7] ඔබේම වය-
සේ අනික් තරුණයන් හොඳින් සිටි-
යදී ඔබේ මුහුණ විතරක් මැලවිලා
තියෙනවා දැක්කොත් ඔහු මගේ හිස
ගසා දමයි!" **11** පසුව රජුගේ ප්‍රධාන
නිලධාරියා[8] දානියෙල්වද හනනියා-
වද මිෂායෙල්වද අෂරියාවද බලාගැ-
නීම සඳහා වෙනත් නිලධාරියෙකුව
පත් කළේය. දානියෙල් ඔහු වෙතටද
ගොස් මෙසේ කීවේය. **12** "ඔබේ සේ-
වකයන් වන අපි කරන මේ ඉල්ලීම
අහක දාන්න එපා. අපිට දවස් දහයක්
එළවුළු විතරක් කන්න දෙන්න.[9] වතුර
විතරක් බොන්න දෙන්න. **13** දවස්
දහය ඉවර වුණාම රජුගේ කෑම කන
තරුණයන්ගේ පෙනුමයි අපේ පෙනු-
මයි අතර වෙනසක් තියෙනවාද කියා
බලන්න. ඊටපස්සේ ඔබට අප ගැන
තීරණයක් ගන්න පුළුවන්."
**14** අන්තිමේදී ඔහු ඔවුන්ගේ ඉල්ලී-
මට එකඟ විය. **15** දවස් දහයෙන්

**1 පරි.**
1 2ලේක 36:4; යෙරෙ 22:18; යෙරෙ 36:30
2 ද්වි 28:49; 2රාජා 24:1; 2ලේක 36:6
3 ගීතා 106:41; යෙසා 42:24
4 2ලේක 36:7; යෙරෙ 27:19
5 උත් 10:10; උත් 11:2
6 එස්රා 1:7
7 දානි 1:11
8 2රාජා 20:18; යෙසා 39:7
9 2සාමු 14:25; සල 4:7
10 දානි 1:17
11 දේශ 7:19; දානි 1:20; දානි 2:20; දානි 5:11
12 හිතෝ 22:29
13 1රාජා 4:22; දානි 1:15
14 දානි 2:48; දානි 5:13; දානි 5:29
15 දානි 2:17

**2 තීරුව**
1 උත් 41:45; 2රාජා 23:34; 2රාජා 24:17
2 දානි 4:8; දානි 5:12
3 දානි 2:49; දානි 3:12; දානි 3:28
4 ලෙවී 11:4; ලෙවී 11:13; ලෙවී 17:12
5 ලෙවී 11:47; ගීතා 119:2; එස 4:13
6 1රාජා 8:50; ගීතා 106:46; හිතෝ 16:7
7 හිතෝ 29:25
8 දානි 1:3
9 උත් 1:29

**දානි නම*** තේරුම, "මාගේ විනිශ්චයකරු දෙවිය."

**දානි 1:9*** හෝ, "ළැදි ප්‍රේමයකින්."

පසු රජුගේ කෑම කන තරුණයන්ට
වඩා හැඩිදැඩි පෙනුමක් ඔවුන් හතර-
දෙනාට තිබුණු බව ඔහුට පෙනී
ගියේය.[1] **16** එමනිසා ඔවුන් භාරව
සිටි නිලධාරියා රජු නියම කළ කෑම
හා වයින් කොටස වෙනුවට දිග-
ටම ඔවුන්ට කෑමට එළවුළු දුන්නේය.[2]
**17** සැබෑ දෙවි ඔවුන් හතරදෙනාට
ප්‍රඥාව දුන්නේය. සියලු ලියකියවිලි
ගැනද ශිල්ප ශාස්ත්‍ර ගැනද මනා දැනු-
මක් හා අවබෝධයක් ලබා දුන්නේය.[3]
ඕනෑම දර්ශනයක් හෝ සිහිනයක්
හෝ තෝරා දීමේ හැකියාවද දානි-
යෙල්ට තිබිණ.[4]

**18** නෙබුකද්නෙෂර් රජු තරුණ-
යන්ව පුහුණු කිරීමට නියම කළ
කාලය අවසන් වූ පසු, රජුගේ
ප්‍රධාන නිලධාරියා ඔවුන්ව රජු ඉදිරි-
යට ගෙන ආවේය.[5] **19** තරුණයන්
සමඟ කතා කළ පසු දානියෙල්, හන-
නියා, මිෂායෙල් සහ අෂරියා[6] තරම්
දක්ෂ වෙන කිසිවෙකු ඔවුන් අතරේ
නොසිටි බව රජ තේරුම්ගත්තේය.
ඔවුහු දිගටම රජුට සේවය කළෝය.[7]
**20** ඉතා ගැඹුරු කාරණා ගැන විමසන
විටත් ඔවුන් ප්‍රඥාවෙන් හා අවබෝධ-
යෙන් යුක්තව[8] පිළිතුරු දුන් බව රජ
තේරුම්ගත්තේය. ඇත්තෙන්ම ඔවුහු
මුළු රාජධානියේම සිටි මන්තර ගුරු-
කම් කරන පූජකයන්ට[9] හා ජේන
කියන්නන්ට[10] වඩා දහස් ගුණයකින්
දක්ෂ වූහ. **21** සයිරස් රජුගේ පළමු-
වන අවුරුද්ද දක්වාම දානියෙල් එහි
සිටියේය.[11]

**2** නෙබුකද්නෙෂර් රජු රජකම් කළ
දෙවන අවුරුද්දේදී ඔහු සිහින
දුටුවේය.[12] ඒ සිහින දැකීමෙන්
පසු නින්ද නොයන තරමටම ඔහු-
ගේ සිත කැලඹුණේය.[13] **2** එබැවින්
මන්තර ගුරුකම් කරන පූජකයන්-
ගෙන්,[14] ජේන කියන්නන්ගෙන්, කට-
ටඩියන්ගෙන් හා කල්දිවරුන්ගෙන්*
තමා දුටු සිහින ගැන අසා දැන-
ගැනීමට රජ තීරණය කළේය.[1] ඒ
සියලුදෙනා රජුගේ අණ පරිදි ඔහු ඉදි-
රියට පැමිණියෝය. **3** ඉන්පසු රජ
ඔවුන්ට මෙසේ කීවේය. “මම සිහින-
යක් දුටුවා. ඒ සිහිනයේ අර්ථය දැන-
ගන්නා තුරු මට සැනසිල්ලක් නැහැ.”
**4** එවිට කල්දිවරු ඇරමයික භාෂා-
වෙන්[2] කතා කරමින් රජුට මෙසේ
කීවෝය.* “රජතුමනි, ඔබ සදහටම
ජීවත් වේවා![3] ඔබ දුටු සිහිනය අපිට
කියන්න. එවිට ඔබේ සේවකයන් වන
අපි එහි අර්ථය පැහැදිලි කර දෙන්-
නම්.”[4]

**5** එහෙත් රජ ඔවුන්ට මෙසේ
කීවේය. “මගේ තීරණය මෙයයි. මම
දැක්ක සිහිනයත් ඒකේ අර්ථයත්
නුඹලා මට කිව්වේ නැත්නම් මම
නුඹලාව මරා කෑලි කෑලිවලට කපා
දමනවා.[5] නුඹලාගේ ගෙවල් මම වැසි-
කිළි බවට පත් කරනවා.[6] **6** නමුත්
සිහිනය හා එහි අර්ථය මට කිව්වොත්
මම නුඹලාට තෑගිබෝග බොහොම-
යක් දී නුඹලාව ගෞරවයට පත් කර-
නවා.[7] ඒ නිසා මම දැක්ක සිහිනය
විස්තර කර එහි අර්ථය මට කියන්න.”

**7** ඔවුහු නැවතත් මෙසේ කීවෝය.
“රජතුමනි, ඔබ දුටු සිහිනය අපිට
කියන්න. එවිට ඔබේ සේවකයන් වන
අපි එහි අර්ථය පැහැදිලි කර දෙන්-
නම්.”

**8** එවිට රජ මෙසේ කීවේය. “මම
දන්නවා නුඹලා මට මේ ගැන කිසිවක්
නොකියන්නේ ඇයි කියලා. නුඹලා
හිතනවාද මෙහෙම කාලය නාස්ති
කර කර හිටියොත් මම මගේ තීර-
ණය වෙනස් කරයි කියලා? **9** මම
මගේ තීරණය කොහොමටවත් වෙ-
නස් කරන්නේ නැහැ.[8] නුඹලා හැදුවේ
මට බොරු කියලා කාලය තවත් දික්
කරගන්න නේද?[9] මම දැක්ක සිහි-
නය විස්තර කරන්න නුඹලාට බැරි
වුණොත් මම කියපු විදිහටම නුඹලාට

**1 පරි.**
**1** හිතෝ 10:22
**2** දානි 1:12
**3** ගීතා 119:98, හිතෝ 2:6, දේශ 2:26, යෙසා 28:26
**4** ගණන් 12:6, දානි 1:20, දානි 4:9, දානි 5:11
**5** දානි 1:5
**6** දානි 1:6
**7** හිතෝ 22:29
**8** ගීතා 119:100, හිතෝ 4:7, හිතෝ 4:8
**9** නික් 7:11
**10** දානි 2:2, දානි 4:7, දානි 5:8
**11** දානි 6:28, දානි 10:1

**2 පරි.**
**12** උත් 40:5
**13** උත් 41:8, දානි 4:5
**14** දානි 1:20

**2 නීරුව**
**1** යෙසා 19:3, යෙසා 47:13, දානි 2:10, දානි 2:27, දානි 4:7, දානි 5:7
**2** එස්රා 4:7, යෙසා 36:11
**3** 1සාමු 10:24, නෙහෙ 2:3, දානි 3:9
**4** උත් 41:8
**5** දානි 3:29
**6** 2රාජා 10:27, එස්රා 6:11
**7** දානි 2:48, දානි 5:7, දානි 5:16, දානි 5:29
**8** දානි 2:5
**9** හිතෝ 12:19

**දානි 2:2*** එනම්, ශාස්ත්‍ර කියන්නන්ගේ විශේෂ කණ්ඩායමකි. මායා බලයෙන් දේවල් කිරීමට ඔවුන් සතු හැකියාව ඉතා විශිෂ්ටයයි ඔවුහු සිතුවෝය.

**දානි 2:4*** දානියෙල්ගේ වාර්තාව මෙතැන් සිට 7වන පරිච්ඡේදයේ අවසානය දක්වා ලියා තිබෙන්නේ අරාමීය භාෂාවෙනි.

දඬුවම් කරනවා. ඒ නිසා මම දැක්ක
සිහිනය මට විස්තර කරන්න. එත-
කොට ඇත්තටම ඒකේ අර්ථය පැහැ-
දිලි කරන්න නුඹලාට පුළුවන් කියා
මම පිළිගන්නවා.”
**10** එවිට කල්දිවරු රජුට මෙසේ
කීවෝය. “රජතුමනි, ඔබ ඉල්ලන
මේ දේ කරන්න පුළුවන් කෙනෙක්
මේ ලෝකයේ කොතැනකවත් නැහැ.
මන්තර ගුරුකම් කරන පූජකයන්-
ගෙන්වත් පේන කියන්නන්ගෙන්වත්
කල්දිවරුන්ගෙන්වත් කිසි රජ කෙ-
නෙක් හෝ පාලකයෙක් මීට කලින්
මේ වගේ ඉල්ලීමක් නම් කරලා නැහැ.
**11** රජතුමා ඉල්ලන්නේ හරිම අමාරු
දෙයක්. ඔබ ඉල්ලන දේ මනුෂ්‍ය-
යෙකුට නම් කරන්න බැහැ.[1] ඒ දේ
කරන්න පුළුවන් දෙවි කෙනෙකුට
විතරයි.”[2]
**12** මෙය අසා රජ අතිශයින් කෝප
වී[3] බැබිලෝනියේ සිටි සියලුම බුද්-
ධිමතුන්ව මරා දමන ලෙස අණ
කළේය.[4] **13** එවිට රජුගේ නියෝග-
යට අනුව බුද්ධිමතුන්ව මරා දැමීමට
සැලසුම් කරනු ලැබීය. ඔවුහු දානි-
යෙල්ව හා ඔහුගේ මිතුරන්වද මරා
දැමීමට සෙව්වෝය.
**14** බැබිලෝනියේ සිටි බුද්ධිම-
තුන්ව මරා දැමීමට රජුගේ ප්‍රධාන
ආරක්ෂක නිලධාරියා වන අරියෝක්ව
පිටත් කර යැවූ අවස්ථාවේදී දානි-
යෙල් ඔහුව හමු වී ඉතා ඥානවන්තව
ඔහුට කතා කළේය.[5] **15** “රජතුමා
මේ තරම් දරුණු නියෝගයක් දුන්නේ
ඇයි” කියා දානියෙල් අරියෝක්ගෙන්
ඇසීය. එවිට ඔහු සිදු වූ සියල්ල දානි-
යෙල්ට පැහැදිලි කළේය.[6] **16** ඉන්-
පසු දානියෙල්, රජු වෙතට ගොස්
රජුගේ සිහිනයේ අර්ථය පැහැදිලි කර
දීමට[7] තමන්ට යම් කාලයක් දෙන
ලෙස ඉල්ලා සිටියේය.
**17** පසුව දානියෙල් තම නිවසට
ගියේය. ඔහු තම මිත්‍රයන් වන හන-
නියා, මිෂායෙල් සහ අෂරියාට සිදු වූ
සියල්ල කීවේය. **18** බැබිලෝනියේ
ඉතුරුව සිටි අනික් බුද්ධිමතුන් සමඟ

**2 පරි.**
1 2ලේක 6:18
2 දානි 2:23
දානි 2:28
දානි 2:47
3 හිතෝ 16:14
හිතෝ 19:12
හිතෝ 20:2
4 දානි 2:24
5 දේශ 10:4
6 දානි 2:9
7 උත් 41:16

**2 නිරුව**
1 උත් 18:23
මලා 3:18
2පේතෘ 2:9
2 ගීතා 50:15
හිතෝ 3:5
මතෙ 18:19
3 ගීතා 115:3
ගීතා 115:16
4 ගීතා 116:5
5 ගණන් 12:6
යෝබ් 33:15
ගීතා 25:14
දානි 2:28
1කොරි 2:11
6 ගීතා 50:15
ගීතා 145:10
7 1ලේක 29:20
ගීතා 34:1
ගීතා 72:18
ගීතා 113:2
8 1ලේක 29:11
යෝබ් 12:13
ගීතා 147:5
යෙරෙ 32:18
9 යෙසා 60:22
දානි 7:25
ක්‍රියා 1:7
10 1සාමු 2:7
ගීතා 75:7
හිතෝ 8:15
යෙරෙ 27:5
දානි 4:17
11 හිතෝ 2:6
දේශ 2:26
එපී 1:17
යාකො 1:5
12 යෝබ් 12:22
යෙරෙ 33:3
1කොරි 2:10
13 ගීතා 139:12
හෙබ්‍රෙ 4:13
14 ගීතා 36:9
ගීතා 112:4
1යොහ 1:5
15 දේශ 7:19
දානි 1:17
16 ගීතා 145:3
දානි 2:28
17 ආමො 3:7
18 දානි 2:12
19 දානි 2:15
20 දානි 1:19
දානි 2:16
21 නෙහෙ 7:6
දානි 1:6
දානි 6:13

ඔවුන්වත් විනාශ නොවන පිණිස[1]
සිහිනයත් එහි අර්ථයත් පැහැදිලි කර
දෙන ලෙස[2] දෙවිගෙන්[3] අයැදින්න[4]
කියාද දානියෙල් තම මිත්‍රයන් තිදෙ-
නාට කීවේය.
**19** පසුව රාත්‍රියේදී දෙවි දර්ශනයක්
මගින් දානියෙල්ට ඒ සිහිනය හෙළි
කළේය.[5] එවිට දානියෙල් ස්වර්ගයේ
දෙවිට ප්‍රශංසා කරමින්[6] **20** මෙසේ
කීවේය. “දෙවියනි, ඔබේ නාමයට
සදාකාලයෙන් සදාකාලයටම ප්‍රශං-
සාව ලැබේවා![7] මන්ද ප්‍රඥාවත් බල-
යත් ලබා දෙන්නේ ඔබයි.[8] **21** ඔබ
නියමිත කාල වකවානු වෙනස්
කරනවා.[9] රජුන්ව පත් කරන්නෙත්
ඔවුන්ව රජකමෙන් පහ කරන්නෙත්
ඔබයි.[10] ප්‍රඥාවන්තයන්ට ප්‍රඥාව
ලබා දෙන්නෙත් වටහාගැනීමේ ශක්-
තිය ඇති අයට දැනගැන්ම ලබා
දෙන්නෙත් ඔබයි.[11] **22** ඔබ ගැඹුරු
කාරණා හා රහස් හෙළි කර දෙ-
නවා.[12] අඳුරේ සැඟවුණු දේවල් පවා
ඔබට පැහැදිලිව පෙනේ.[13] ඔබ වටා
ආලෝකය විහිදෙනවා.[14] **23** මගේ
මුතුන්මිත්තන්ගේ දෙවියනි, ඔබ මට
ප්‍රඥාවත්[15] බලයත් ලබා දුන් නිසා මම
ස්තුති ප්‍රශංසා කරන්නේ ඔබටයි.[16] අපි
ඔබෙන් ඉල්ලූ ලෙසම රජුගේ සිහිනය
සහ එහි අර්ථය ගැන ඔබ මට හෙළි
කළා.”[17]
**24** ඉන්පසු දානියෙල්, බැබිලෝ-
නියේ බුද්ධිමතුන්ව මරා දැමීමට[18]
රජු පත් කළ තැනැත්තා වන අරි-
යොක්ව[19] හමු වීමට ගියේය.
දානියෙල් ඔහුට මෙසේ කීවේය. “බැබි-
ලෝනියේ සිටින බුද්ධිමතුන්ගෙන්
එක් කෙනෙකුවත් මරන්න එපා. මාව
රජු ළඟට රැගෙන යන්න.[20] මම ඔහු-
ගේ සිහිනයේ අර්ථය පැහැදිලි කර
දෙන්නම්.”
**25** අරියොක් එවෙලේම දානියෙල්ව
රජු වෙතට ගෙන ගොස් රජුට මෙසේ
කීවේය. “රජතුමනි, යූදා දේශයෙන්
ගෙනා අය අතරේ[21] ඔබේ සිහින-
යේ අර්ථය පැහැදිලි කර දෙන්න පුළු-
වන් කෙනෙක් ඉන්නවා.” **26** එවිට

රජ, බෙල්ටෂසර්[1] ලෙස හැඳින්වූ
දානියෙල්ගෙන් මෙසේ ඇසුවේය. “මා
දැක්ක සිහිනයත් එහි අර්ථයත් කියා
දෙන්න ඔබට ඇත්තටම පුළුවන්ද?”[2]
**27** එවිට දානියෙල් රජුට මෙසේ පිළි-
තුරු දුන්නේය. “රජතුමනි, බුද්ධි-
මතුන්ටවත් ජේන කියන්නන්ටවත්
මන්තර ගුරුකම් කරන පූජකයන්ට-
වත් ජ්‍යොතිඃ ශාස්ත්‍රඥයන්ටවත් ඔබේ
සිහිනය පැහැදිලි කරන්න බැහැ.[3]
**28** නමුත් රහස් හෙළි කිරීමට හැකි-
යාව ඇති දෙවි කෙනෙක් ස්වර්ගයේ
ඉන්නවා.[4] ඔහු මතු දවස්වලදී සිදු
වීමට නියමිත දේ සිහිනයක් මාර්ග-
යෙන් ඔබට දන්වා තිබෙනවා.[5] නෙබු-
කද්නෙෂර් රජතුමනි, ඔබ නිදාගෙන
සිටියදී දුටු සිහිනයත් දර්ශනත් මම
දැන් ඔබට කියා දෙන්නම්.

**29** “රජතුමනි, ඔබ යහනට වී[6] ඉදි-
රියේදී සිදු වීමට යන දේවල් ගැන
කල්පනා කරමින් සිටියා. එවිට රහස්
හෙළි කරන දෙවි ඒ ගැන ඔබට දැනුම්
දුන්නා.[7] **30** මේ සිහිනය ගැන දෙවි
මට හෙළි කළේ අනික් මනුෂ්‍යයන්ට
වඩා මට විශේෂ ප්‍රඥාවක් තිබෙන
නිසා නොවෙයි.[8] ඔහු මට එය හෙළි
කළේ සිහිනයේ අර්ථය හා ඔබ කල්-
පනා කරමින් සිටි දේ ඔබට පැහැදිලි
කර දෙන පිණිසයි.[9]

**31** “රජතුමනි, ඔබ දුටු සිහිනය
මෙයයි. ඔබ ඉදිරියේ අතිවිශාල රූප-
යක් තිබුණා. එය දීප්තියෙන් බැබ-
ළෙන විශාල රූපයක්. එහි පෙනුම
ඉතා භයංකරයි. **32** රූපයේ හිස
පවිත්‍ර රනින් සාදා තිබුණා.[10] පපුව
හා අත් දෙක රිදීවලින්ද[11] බඩ හා
කලවා තඹවලින්ද[12] **33** කෙණ්ඩා
යකඩවලින්ද[13] සාදා තිබුණා. පාදවල
සමහර කොටස් යකඩවලින්ද තවත්
සමහර කොටස් මැටිවලින්ද සාදා
තිබුණා.[14] **34** ඔබ රූපය දෙස බලා
සිටියදී මිනිසෙකුගේ අතින් නොකැපූ
ගලක්[15] වේගයෙන් ඇවිත් යකඩව-
ලින් හා මැටිවලින් සෑදී තිබුණු ඒ
රූපයේ පාද සුනුවිසුනු කර දැමුවා.[16]
**35** ඒ මොහොතේම රූපයේ තිබුණු
යකඩද මැටිද තඹද රිදීද රත්තරන්ද
යන සියල්ල කුඩු වී ගියා. ගිම්හාන
කාලයේදී කමතෙන් ගසාගෙන යන
දහයියා මෙන්[1] ඒ සියල්ල සුළඟට
ගසාගෙන ගියා. ඉන්පසු එතැන රූප-
යක් තිබුණාද කියාවත් සොයාගන්න
බැරි වුණා.[2] නමුත් රූපය සුනුවිසුනු
කළ ගල විශාල කන්දක් වී පොළොව
පුරාම පැතිර ගියා.[3]

**36** “ඔබ දුටු සිහිනය එයයි. අපි
දැන් සිහිනයේ අර්ථය ඔබට පැහැ-
දිලි කර දෙන්නම්.[4] **37** රජතුමනි,
රාජ්‍යයද බලයද ගෞරවයද ශක්තියද
දෙවි දී තිබෙන්නේ රජවරුන්ගෙත් රජු
වන ඔබටයි.[5] **38** මනුෂ්‍යයන් ජීවත්
වන සෑම පළාතකම සිටින සතුන්වද
කුරුල්ලන්වද දෙවි ඔබට යටත් කර දී
ඒ සියල්ල කෙරෙහි ඔබව පාලකයා
ලෙස පත් කළා.[6] රූපයේ රන් හිස
ඔබයි.[7]

**39** “ඔබේ රාජ්‍යයෙන් පසුව තවත්
රාජ්‍යයක් පැමිණෙනවා.[8] එය ඔබේ
රාජ්‍යය තරම් බලවත් වෙන්නේ
නැහැ.[9] ඉන්පසු තුන්වන රාජ්‍යයකුත්
පැමිණෙනවා. එම රාජ්‍යය මුළු පො-
ළොවම පාලනය කරයි.[10] රූපයේ තඹ
කොටස එයයි.

**40** “හතරවන රාජ්‍යය[11] යකඩ
මෙන් ශක්තිමත් රාජ්‍යයක්.[12] යකඩය-
කින් ඕනෑම දෙයක් බිඳ දමා සුනුවිසුනු
කළ හැකි ආකාරයටම ඒ රාජ්‍යයත්
අන් සියලු රාජ්‍යයන් බිඳ දමා විනාශ
කරයි.[13]

**41** “පාද හා පා ඇඟිලිවල සම-
හර කොටස් යකඩවලින්ද තවත් සම-
හර කොටස් කුඹල්කරුවෙකු අතින්
ඇඹූ මැටිවලින්ද සාදා තිබුණු බව
ඔබට මතක ඇති.[14] ඒ හා සමානව
එම රාජ්‍යය තුළත් බෙදීමක් දක්නට
ලැබෙයි.[15] එහෙත් මැටි සමඟ යකඩ
කලවමේ තිබුණු නිසා එම රාජ්‍යයද
යකඩ මෙන් දැඩි ස්වභාවයක් පෙන්-
වයි.[16] **42** පා ඇඟිලිවල මැටි සමඟ
යකඩද කලවම් වී තිබුණු ලෙසම එම
රාජ්‍යයේ සමහර කොටස් බිඳෙනසුලු

**2 පරි.**
1 දානි 1:7
දානි 4:8
දානි 4:19
දානි 5:12
2 දානි 4:18
දානි 5:16
3 යෙසා 47:12
දානි 2:10
4 උත් 40:8
දානි 1:17
5 දානි 10:14
6 යෝබ 33:15
7 එළි 4:1
8 ක්‍රියා 3:12
9 දානි 2:47
10 යෙරෙ 51:7
දානි 2:38
දානි 4:22
දානි 7:4
11 දානි 2:39
දානි 5:28
දානි 7:5
දානි 8:3
12 දානි 7:6
දානි 8:5
13 දානි 2:40
දානි 7:7
දානි 7:19
14 දානි 2:41
15 දානි 2:45
දානි 7:14
දානි 7:27
එළි 12:5
16 දානි 2:44
එළි 11:15

**2 තීරුව**
1 ගීතා 1:4
2 ගීතා 37:10
එළි 20:11
3 ගීතා 22:27
යෙසා 11:9
4 දානි 2:23
5 යෙරෙ 28:14
දානි 5:18
6 යෙරෙ 27:5
7 දානි 2:32
දානි 4:21
8 යෙසා 45:1
යෙරෙ 51:28
දානි 5:28
දානි 11:2
9 දානි 8:20
10 දානි 7:6
දානි 8:21
දානි 10:20
දානි 11:3
11 දානි 2:33
12 දානි 7:19
දානි 7:23
යොහ 11:48
13 දානි 7:7
14 දානි 2:33
15 මතෙ 12:25
16 දානි 2:34

වන අතර තවත් සමහර කොටස්
ශක්තිමත්ව තිබෙයි. **43** එමෙන්ම
යකඩ සමඟ මැටි කලවම් වී තිබෙන
නිසා එම රාජ්‍යයට සාමාන්‍ය ජනයාද
සම්බන්ධයි. නමුත් යකඩ සමඟ මැටි
මිශ්‍ර නොවන්නාක් මෙන් ඒ රාජ්‍යය
තුළ කිසි එකමුතුකමක් නොතිබෙයි.
**44** “ඒ රජුන්ගේ දවස්වලදී[1] ස්වර්ග-
යේ දෙවි[2] කිසිදාක විනාශ නොවන[3]
රාජ්‍යයක් පිහිටුවයි.[4] එය වෙන සෙ-
නඟක් අතට පත් නොවෙයි.[5] එම
රාජ්‍යය ඒ සියලු රාජ්‍යවල් පොඩි
කර නැති කර දමයි.[6] නමුත් එය
සදහටම පවතියි.[7] **45** මිනිසෙකුගේ
අතින් නොකැපූ ගලක්[8] කන්දෙන්
ගැලවී ඇවිත් රූපයේ තිබුණු යකඩද
තඹද මැටිද රිදීද රන්ද සුනුවිසුනු කර
දමනවා ඔබ දුටු ලෙසම ඒ රාජ්‍ය-
යන්ටත් සිදු වෙයි.[9] මෙලෙස ශ්‍රේෂ්ඨ
දෙවි[10] මතු දවස්වලදී සිදු වීමට නියා-
මිත දේ ඔබට දැනුම් දී තිබේ.[11]
සිහිනය සැබෑ වන බව ස්ථිරයි. එහි
අර්ථයද නිවැරදියි.”[12]
**46** එවිට නෙබුකද්නෙෂර් රජ
දණින් වැටී, නැමී දානියෙල්ට ගෞර-
වය පිරිනැමුවේය. ඔහුට තෑග්ගක් හා
සුවඳ ද්‍රව්‍ය දෙන ලෙසද රජ අණ
කළේය.[13] **47** රජ දානියෙල්ට මෙ-
සේද කීවේය. “ඇත්තටම ඔබේ දෙවි
දෙවිවරුන්ගෙත් දෙවි![14] ඔහු රජව-
රුන්ගෙත් රජ![15] රහස් හෙළි කරන
තැනැත්තා ඔහුයි. ඔබට මේ සිහිනය
ගැන හෙළි කරන්න බලය ලැබුණේ
ඔහුගෙන්.”[16] **48** පසුව රජ දානි-
යෙල්ට බොහෝ බලතල දුන්නේය.[17]
ඔහුට තෑගිබෝග රැසක්ද දුන්නේය.
බැබිලෝනියට අයත් මුළු ප්‍රදේශයේම
ආණ්ඩුකාරයා ලෙසද[18] බැබිලෝනියේ
සියලුම බුද්ධිමතුන්ගේ ප්‍රධානියා ලෙ-
සද ඔහු දානියෙල්ව පත් කළේය.
**49** බැබිලෝනියේ පරිපාලන කටයුතු
බලාගැනීම සඳහා ෂද්‍රක්වද මේෂක්-
වද අබෙද්නෙගෝවද[19] පත් කරන
මෙන් දානියෙල් රජුගෙන් ඉල්ලීමක්
කළේය. දානියෙල් දිගටම රජමාලිගා-
වේ[20] සේවය කරමින් සිටියේය.

**2 පරි.**
**1** දානි 7:12; එළි 17:12
**2** එස්රා 1:2; ගීතා 115:3; ගීතා 115:16
**3** 2සාමු 7:13; යෙසා 9:7; එස 37:25; දානි 7:14; මීකා 4:7; එළි 11:15
**4** උත් 49:10; ගීතා 2:6; මතෙ 6:10; ලූක් 22:29; යොහ 18:36; එළි 11:15; එළි 20:6
**5** දානි 4:17; දානි 7:27
**6** ගීතා 2:9; ගීතා 110:5; යෙසා 60:12; දානි 11:45; එළි 19:15
**7** දානි 4:3; දානි 4:34; ලූක් 1:33
**8** යෙසා 28:16; දානි 2:34
**9** දානි 2:35
**10** 2සාමු 7:22; ගීතා 96:4; ගීතා 145:3; යෙරෙ 32:18
**11** උත් 41:28; දානි 2:28
**12** යෙසා 14:24; යෙසා 44:26
**13** එස්රා 6:10
**14** ද්වි 32:39; ගීතා 136:2; දානි 11:36; 1කොරි 8:5
**15** ද්වි 10:17; ගීතා 136:3
**16** උත් 41:39; දානි 1:17; දානි 2:28; දානි 4:9; ආමො 3:7
**17** දානි 5:16
**18** දානි 2:6; දානි 5:29
**19** දානි 1:7
**20** එස්ත 2:19; එස්ත 3:2; යෙරෙ 39:3; ආමො 5:15

**2 තීරුව**

**3 පරි.**
**1** එස්ත 1:1; දානි 2:48
**2** යෙසා 40:19; ක්‍රියා 17:29; 1කොරි 8:4
**3** දානි 6:7

**3** නෙබුකද්නෙෂර් රජ බැබිලෝනි-
යේ පිහිටි දූරා නම් සමභූමියේ[1]
රන් රූපයක් ඉදි කළේය.[2] එහි උස
රියන්* හැටක්ද පළල රියන් හයක්ද
විය. **2** නෙබුකද්නෙෂර් රජ එම
රූපය විවෘත කරන පිණිස උත්සවයක්
පැවැත්වීමට සැලසුම් කළේය. ඔහු
තම රාජධානියේ දිසාපතීන්වද ප්‍රධාන
නිලධාරීන්වද[3] ආණ්ඩුකාරයන්වද
උපදේශකයන්වද භාණ්ඩාගාරිකයන්-
වද විනිශ්චයකරුවන්වද මුලාදෑනීන්-
වද[4] පළාත් පරිපාලන කටයුතු භාරව
සිටි සියලුදෙනාවද එම උත්සවයට
කැඳවන ලෙස නියෝග කළේය.[5]
**3** එවිට දිසාපතීහුද[6] ප්‍රධාන
නිලධාරීහුද ආණ්ඩුකාරයෝද උපදේ-
ශකයෝද භාණ්ඩාගාරිකයෝද විනිශ්-
චයකරුවෝද මුලාදෑනීහුද පළාත්
පරිපාලන කටයුතු භාරව සිටි සියලු-
දෙනාද එම රූපය විවෘත කිරීමේ උත්-
සවයට පැමිණියහ. එම රූපය ඉදිරියේ
රැස්ව සිටි ඔවුන්ට **4** රජුගේ පණිවි-
ඩකරු[7] මහ හඬින් මෙසේ කීවේය.
“ජනයෙනි, විවිධ භාෂා කතා කරන,
විවිධ ජාතීන්ට හා ගෝත්‍රයන්ට අයත්
ඔබ සියලුදෙනාටම[8] රජු මෙසේ අණ
කර තිබේ. **5** හොරණෑ, බටනළා,
නළා, වීණා, මහා වීණා, කුඩා වීණා
ඇතුළු අනිකුත් සියලුම සංගීත භාණ්ඩ
වාදනය කළ වහාම[9] ඔබ සියලුදෙ-
නාම නෙබුකද්නෙෂර් රජු ඉදි කළ
මේ රූපය ඉදිරියේ වැඳ වැටිය යුතුයි.
**6** යමෙක් එය ඉදිරියේ වැඳ වැටුණේ
නැත්නම්[10] ඔහුව ඒ මොහොතේම[11]
ඇවිළෙන ගිනි උදුනට දමනු ඇත.”[12]
**7** එබැවින් සංගීතය ඇසුණු වහාම*
විවිධ ජාතීන්ට අයත්, විවිධ භාෂා

**4** එස්රා 7:25; ක්‍රියා 16:20; **5** එස්රා 6:16; **6** එස්ත 8:9; දානි 6:1; **7** දානි 5:29; **8** එස්ත 8:9; දානි 4:1; **9** දානි 3:10; දානි 3:15; **10** නික් 20:5; මතෙ 4:9; **11** දානි 4:19; දානි 4:33; **12** යෙරෙ 29:22; දානි 3:11; දානි 3:17; දානි 3:26; එළි 13:15.

**දානි 3:1*** උත් 6:15හි පාදසටහන බලන්න. **7*** මූ.අ., “හොරණෑ, නළා, වීණා, මහා වීණා, කුඩා වීණා ඇතුළු අනිකුත් සියලුම සංගීත භාණ්ඩ වාදනය කළ වහාම”

කතා කරන ඒ සෙනඟ[1] රූපය ඉදිරියේ
වැඳ වැටුණෝය.
8 එවිට කල්දිවරු කිහිපදෙනෙක්
රජු වෙතට ගොස් යුදෙව්ව-
රුන්ට විරුද්ධව චෝදනාවක් එල්ල
කළෝය.*[2] 9 ඔවුහු නෙබුකද්නෙෂර්
රජුට මෙසේ කීවෝය. “රජතුමනි, ඔබ
සදහටම ජීවත් වේවා![3] 10 රජතු-
මනි, සංගීතය[4] ඇසෙද්දී* සියලුදෙ-
නාම රන් රූපය ඉදිරියේ වැඳ වැටිය
යුතුයි කියා ඔබ අණ කළා නේද?
11 එය ඉදිරියේ වැඳ වැටෙන්නේ නැති
සියලුදෙනාවම ඇවිළෙන ගිනි උදු-
නට දමනවා කියාත් ඔබ නියෝග
කළා නේද?[5] 12 නමුත් රජතුමනි,
ඔබ දුන් නියෝගය ගණනකටවත්
ගත්තේ නැති යුදෙව්වරු කිහිපදෙ-
නෙක් ඉන්නවා. ඔවුන් බැබිලෝනියේ
පරිපාලන කටයුතු බලාගැනීමට ඔබ
විසින්ම පත් කළ පුරුෂයන්.[6] ඔවුන්-
ගේ නම් ෂද්‍රක්, මේෂක් සහ අබෙද්-
නෙගෝ. ඔවුන් ඔබේ දෙවිවරුන්ටවත්
ඔබ ඉදි කළ රන් රූපයටවත් නමස්-
කාර කරන්නේ නැහැ.”[7]
13 එය අසා නෙබුකද්නෙෂර් රජ
අතිශයින් කෝප වී[8] ෂද්‍රක්වද මේෂක්-
වද අබෙද්නෙගෝවද[9] එතැනට කැඳ-
වන ලෙස අණ කළේය. එබැවින්
ඔවුන් තිදෙනාව රජු ඉදිරියට ගෙන
එන ලදි. 14 එවිට නෙබුකද්නෙ-
ෂර් රජ ඔවුන්ගෙන් මෙසේ ඇසුවේය.
“ෂද්‍රක්, මේෂක්, අබෙද්නෙගෝ, මේ
අය කියන දේ ඇත්තද? නුඹලා ඇත්-
තටම මගේ දෙවිවරුන්ටත්[10] මම ඉදි
කළ රූපයටත් නමස්කාර කරන්නේ
නැද්ද?[11] 15 මම දැන් සංගීතය වාද-
නය කරන්න අණ කරනවා. සංගීතය
ඇසෙද්දී*[12] නුඹලා මම හදපු රූපය
ඉදිරියේ වැඳ වැටිය යුතුයි. එහෙම
කළේ නැත්නම් මම නුඹලාව ඇවි-
ළෙන ගිනි උදුනට විසි කර දමනවා.
මගේ අතින් නුඹලාව ගලවාගන්න
පුළුවන් දෙවි කෙනෙක් ඉන්නවාද
කියා අපි බලමු.”[1]
16 එවිට ෂද්‍රක්, මේෂක් සහ අබෙද්-
නෙගෝ මෙසේ පිළිතුරු දුන්නෝය.
“නෙබුකද්නෙෂර් රජතුමනි, මේ කාර-
ණය සම්බන්ධයෙන් ඔබට කිසි උත්-
තරයක් දෙන්න අපි බැඳී නැහැ.[2]
17 ඔබ අපිව ගිනි උදුනට විසි කළත්
අපි නමස්කාර කරන දෙවිට පුළුවන්
එයින් අපිව බේරගන්න. ඔහුට පුළු-
වන් ඔබේ අතින් අපිව බේරගන්න.[3]
18 නමුත් මේ දේ අපි ඔබට දැන්-
විය යුතුයි. දෙවි අපිව බේරාගත්තේ
නැතත් අපි කවදාවත් ඔබේ දෙවි-
වරුන්ට නම් නමස්කාර කරන්නේ
නැහැ. ඔබ ඉදි කළ මේ රන් රූප-
යට අපි කොහොමටවත් නමස්කාර
කරන්නේ නැහැ.”[4]
19 එවිට නෙබුකද්නෙෂර් රජ
ෂද්‍රක්, මේෂක් සහ අබෙද්නෙගෝ
සමඟ අතිශයින් කෝප විය. ඔහුගේ
මුහුණේ පෙනුම පවා වෙනස් විය. ගිනි
උදුන සාමාන්‍ය උෂ්ණත්වයට වඩා
හත් ගුණයකින් රත් කරන ලෙස ඔහු
නියෝග කළේය. 20 ඉන්පසු ෂද්‍රක්,
මේෂක් සහ අබෙද්නෙගෝව ඇවිළෙන
ගිනි උදුනට දැමීමට[5] පෙර ඔවුන්ගේ
අත් පා බඳින ලෙස රජ තම හමුදාවේ
සේවය කළ ශක්ති සම්පන්න මිනි-
සුන්[6] කිහිපදෙනෙකුට අණ කළේය.
21 එබැවින් ඔවුන් තිදෙනාගේ
ඇඳුම්වත් හිස්වැසුම්වත් නොගලවා
ඒ සියල්ල පිටින්ම ඔවුන්ව බැඳ,
ඇවිළෙන ගිනි උදුනට දැමුවෝය.
22 රජු දුන් දැඩි නියෝගය නිසා උදු-
නේ උෂ්ණත්වය දරාගත නොහැකි
තරමට වැඩි කර තිබිණ. එබැවින්
ෂද්‍රක්, මේෂක් සහ අබෙද්නෙගෝව
උසුලාගෙන ගිය ශක්ති සම්පන්න
මිනිස්සු ගින්නට පිලිස්සී මිය ගියෝය.
23 අත් පා බැඳ තිබූ ෂද්‍රක්, මේ-
ෂක් සහ අබෙද්නෙගෝ ඇවිළෙන ගිනි
උදුන මැදට වැටුණෝය.[7]
24 එවිට නෙබුකද්නෙෂර් රජ
භය වී හිඳගෙන සිටි තැනින් විගස
නැඟිට ඔහු යටතේ සේවය කළ

3 පරි.
1 යෙරෙ 51:7
ක්‍රියා 14:16
2 දානි 3:12
3 නෙහෙ 2:3
දානි 2:4
දානි 5:10
4 යෝබ් 21:12
දානි 3:5
දානි 3:15
5 දානි 3:6
6 දානි 2:49
7 දානි 3:18
දානි 3:28
8 හිතෝ 29:22
දානි 2:12
9 දානි 1:7
10 යෙසා 46:1
යෙරෙ 50:2
11 දානි 3:28
12 දානි 3:10

2 තීරුව
1 නික් 5:2
2ලේක 32:15
යෙසා 36:20
යෙසා 37:23
2 ලූක් 12:11
ලූක් 21:14
ක්‍රියා 5:29
3 1සාමු 17:37
2සාමු 22:26
ගීතා 27:1
හිතෝ 18:10
යෙසා 12:2
දානි 6:27
මීකා 7:7
2කොරි 1:10
4 නික් 20:5
ලෙවී 19:4
හිතෝ 28:1
ක්‍රියා 5:29
හෙබ්‍රෙ 11:34
5 දානි 3:15
6 2සාමු 22:40
යෙරෙ 48:14
7 ගීතා 34:19

**දානි 3:8*** හෝ, “නින්දා කළෝය.” මූ.අ., “කැලි-
වලට ඉරා මස් කා දැමුවෝය.” **10*** දානි 3:7හි
පාදසටහන බලන්න. **15*** දානි 3:7හි පාදසට-
හන බලන්න.

නිලධාරීන්ගෙන් මෙසේ ඇසුවේය.
“අපි උදුනට දැම්මේ අත පය බැඳ තිබූ
මිනිස්සු තුන්දෙනෙක්ව නේද?”[1] ඔවු-
හුද, “එසේය රජතුමනි” කියා පිළිතුරු
දුන්හ. **25** එවිට රජ මෙසේ කීවේය.
“අර බලන්න! උදුන ඇතුළේ දැන්
මිනිස්සු හතරදෙනෙක් ඇවිද ඇවිද
ඉන්නවා. අපි උදුනට දැම්ම තුන්-
දෙනා එක්ක ඉන්න අනික් කෙනා
දෙවි කෙනෙක් වගෙයි. ඔවුන්ට කිසිම
හානියක් වෙලා නැහැ!”[2]
**26** ඉන්පසු නෙබුකද්නෙෂර් රජ
උදුනේ දොර ළඟට ගොස්[3] මෙසේ
කීවේය. “මහෝත්තම දෙවිට[4] සේ-
වය කරන ෂද්‍රක්, මේෂක් හා අබෙද්-
නෙගෝ උදුනෙන් පිටතට එන්න.”
එවිට ඔවුහු තිදෙනා උදුනෙන් පිටතට
ආවෝය. **27** එතැන රැස්ව සිටි දිසා-
පතිහු, ප්‍රධාන නිලධාරීහු, ආණ්ඩුකා-
රයෝ සහ රජු යටතේ සේවය කළ
නිලධාරීහු[5] ඔවුන් තිදෙනාට ගින්-
නෙන් කිසි හානියක් සිදු වී නැති බව
දුටුවෝය.[6] ඔවුන්ගේ එක කෙස්ගහක්-
වත් පිලිස්සී නැති බවත්[7] ඔවුන්ගේ
ඇඳුම්වලින් දුම් ගඳවත් නික්මුණේ
නැති බවත් සියලුදෙනාටම පෙනී
ගියේය.
**28** නෙබුකද්නෙෂර් රජ මෙසේ
කීවේය. “ෂද්‍රක්, මේෂක් හා අබෙද්-
නෙගෝ නමස්කාර කරන දෙවිට
ප්‍රශංසා වේවා![8] ඔවුන්ගේ දෙවි කෙ-
රෙහි ඔවුන්ට තිබෙන්නේ මොන
තරම් විශ්වාසයක්ද! මගේ අණ කඩ
කර මැරෙන්න වුණත් ඔවුන් සූදාන-
මින් සිටියා. ඔවුන් තමන්ගේ දෙවි
හැර[9] වෙන කිසි දෙවි කෙනෙකුට
නමස්කාර කළේ නැහැ.[10] ඒ නිසා
දෙවි තම දූතයාව එවා[11] ඔවුන්ව
ගලවාගත්තා.[12] **29** තමන්ගේ සේ-
වකයන්ව මේ විදිහට ගලවාගන්න
පුළුවන් වෙන කිසි දෙවි කෙනෙක්
නැහැ.[13] ඒ නිසා යම් කෙනෙක් ෂද්‍රක්,
මේෂක් හා අබෙද්නෙගෝ නමස්කාර
කරන දෙවිට විරුද්ධව යමක් කිව්-
වොත් ඔහුව මරා කැලිවලට කපා
දමන්නත්[14] ඔහුගේ නිවස වැසිකි-
ළියක් බවට පත් කරන්නත්[1] මම
නියෝග කරනවා.[2] ඔහු මොනම
භාෂාවක් කතා කළත් ඔහු මොනම
ජාතියකට හෝ ගෝත්‍රයකට අයිති
වුණත් ඔහුට ලැබෙන දඬුවම එයයි.”
**30** රජු ෂද්‍රක්, මේෂක් හා අබෙද්-
නෙගෝට හොඳින් සැලකූ නිසා බැබි-
ලෝනියේ ගෞරවනීය තත්වයක්
ඔවුන්ට හිමි විය.[3]

**4** ලෝකයේ සැම තැනකම ජීවත්
වන සියලු ජාතීන්ට, ගෝත්‍ර-
යන්ට හා විවිධ භාෂා කතා
කරන මිනිසුන්ට[4] නෙබුකද්නෙෂර්
රජ මෙසේ දැනුම් දෙන්නේය. “ඔබ
සියලුදෙනාටම බොහෝ සමාදානය
ලැබේවා![5] **2** මහෝත්තම දෙවි මට
පෙන්වූ ලකුණුද ඔහු කළ අරුම
පුදුම ක්‍රියාද ඔබ සියල්ලන්ට දැන්-
විය යුතුයයි මම සිතුවෙමි.[6] **3** ඔහු
පෙන්වූ ලකුණු මොන තරම් පුදුමාකා-
රද! ඔහු කළ අරුම පුදුම ක්‍රියා මොන
තරම් බලවත්ද![7] ඔහුගේ රාජ්‍යය
සදාකාලයෙන් සදාකාලයටම පව-
තින්නේය.[8] ඔහුගේ පාලනයද පරම්-
පරාවෙන් පරම්පරාවට පවතින්නේය.[9]
**4** “නෙබුකද්නෙෂර් වන මම, රජ-
මාලිගාවේ[10] සැප සම්පත් භුක්ති
විඳිමින් සතුටින් කල් ගෙවමින් සිටි-
යෙමි.[11] **5** ඒ කාලයේදී මම සිහි-
නයක් දුටුවෙමි. ඒ සිහිනය නිසා
මම මහත් සේ බියට පත් වුණෙමි.[12]
සිහිනෙන් මා දුටු ඒ රූප හා දර්-
ශන නිසා මගේ සිත කැලඹුණේය.[13]
**6** ඉන්පසු ඒ සිහිනයේ අර්ථය දැන-
ගන්නා පිණිස බැබිලෝනියේ සිටින
සියලු බුද්ධිමතුන්ව මා වෙතට කැඳ-
වන ලෙස මම නියෝග කළෙමි.[14]
**7** “එවිට මන්තර ගුරුකම් කරන
පූජකයෝද පේන කියන්නෝද කල්දි-
වරුද[15] ජ්‍යොතිඃ ශාස්ත්‍රඥයෝද[16] මා
ඉදිරියට පැමිණියහ. මා ඔවුන්ට මගේ
සිහිනය විස්තර කළ නමුත් ඔවුන්
කිසිවෙකුට එහි අර්ථය පැහැදිලි කර
දීමට නොහැකි විය.[17] **8** ඉන්පසු

**3 පරි.**
**1** ගීතා 66:12 ගීතා 91:1 යෙසා 43:2
**2** යෝබ් 38:7 ගීතා 34:7
**3** දානි 6:20
**4** උත් 14:18 දානි 2:47 1කොරි 8:5
**5** දානි 3:2
**6** යෙසා 43:2 හෙබ්‍රෙ 11:34
**7** මතෙ 10:30 ලූක් 21:18 ක්‍රියා 27:34
**8** දානි 2:47 දානි 4:34
**9** නික් 20:5 මතෙ 4:10
**10** නික් 23:24 දානි 3:5 දානි 3:15 එළි 12:11
**11** ගීතා 34:7 හෙබ්‍රෙ 1:14
**12** 1ලේක 5:20 ගීතා 3:8 ගීතා 22:4 ගීතා 91:14 2කොරි 1:9 හෙබ්‍රෙ 11:6
**13** ද්වි 32:31 දානි 4:35 දානි 6:27
**14** දානි 2:5

**2 තීරුව**
**1** එස්රා 6:11
**2** දානි 6:26
**3** ගීතා 1:3 දානි 2:49 දානි 3:12

**4 පරි.**
**4** එස්ත 8:9 දානි 3:4
**5** දානි 6:25
**6** ගීතා 66:16 දානි 2:23
**7** ද්වි 4:34 ගීතා 71:19 දානි 6:27 රෝම 11:33
**8** ගීතා 10:16 ගීතා 29:10 ගීතා 66:7 ගීතා 90:2 යෙරෙ 10:10
**9** ගීතා 146:10
**10** ලූක් 11:21
**11** යෙසා 47:8
**12** දානි 5:6
**13** දානි 2:1
**14** උත් 41:8 දානි 2:2
**15** දානි 5:7
**16** යෙසා 47:13 දානි 2:27
**17** දානි 2:11

බෙල්ටෂසර්[1] යන නමින්ද හඳුන්වන
දානියෙල් මා ඉදිරියට ආවේය. (බෙල්-
ටෂසර් යනු මගේ දෙවියන්ගේ නමින්
සාදාගත් නමකි.)[2] ශුද්ධ දෙවිවරුන්-
ගේ බලය ඔහුට තිබේ.[3] ඒ නිසා
මා දුටු සිහිනය ඔහුට මම විස්තර
කළෙමි.
**9** "'බෙල්ටෂසර්, මන්තර ගුරු-
කම් කරන පූජකයන්ගේ ප්‍රධානියා[4]
වන ඔබට ශුද්ධ දෙවිවරුන්ගේ බලය
තිබෙන බව මම හොඳින් දන්නෙමි.[5]
ඔබට හෙළි කරන්න බැරි රහසක්
නැත.[6] එබැවින් මම සිහිනයෙන් දුටු
දර්ශන හා ඒවායේ අර්ථය මට කියා
දෙන්න.[7]
**10** "'මා නිදාගෙන සිටිද්දී මා දුටු
දර්ශනය මෙයයි.[8] පොළොව මැද
විශාල ගසක්[9] තිබිණ. එය ඉතා
උස ගසකි.[10] **11** ඒ ගස වැඩී ශක්-
තිමත් විය. කල් යත්ම එය අහස
උසට වැඩුණේය. පොළොවේ සතර
දිශාවෙන්ම එය දැකගත හැකි විය.[11]
**12** එය ඉතා අලංකාර කොළවලින්
පිරුණු, පලවලින් බර වූ ගසකි. සියල්-
ලන්ටම කන්න ඇති තරම් පලතුරු
එහි තිබිණ. වනසත්තු[12] එහි සෙවණ
සොයා ආවෝය.[13] කුරුල්ලෝද එහි
අතුවල ලැගුම් ගත්තෝය.[14] සෑම ජීවි-
යෙක්ම එයින් කෑවෝය.
**13** "'ඉන්පසු මම තවත් දර්ශන-
යක් දුටුවෙමි. ස්වර්ගයේ සිට මුරකා-
රුවෙක්[15] ආවේය. ඔහු ශුද්ධ
තැනැත්තෙකි.[16] **14** ඔහු හඬ නඟා
මෙසේ කීවේය. "ගස කපා දමන්න.[17]
එහි අතුද කපන්න. එහි අතු සො-
ලවා කොළ සියල්ල වැටෙන්න සලස්-
වන්න. පලද කඩා විසි කර
දමන්න. එහි සෙවණේ සිටින සතුන්-
වද එහි අතුවල සිටින කුරුල්ලන්-
වද එළවා දමන්න.[18] **15** එහෙත්
එහි කඳ කොටස උගුල්ලා නොද-
මන්න. එය යකඩ හා තඹ පටිවලින්
බඳින්න. එය පිනිවලට තෙමිතෙමී
තණකොළ අතරේ තිබුණාවේ. තණ-
කොළ කන සත්තුද ඒ අවට වාසය
කරත්වා![19] **16** මිනිසෙකුගේ සිතක්
වෙනුවට එයට මෘගයෙකුගේ සිතක්
දෙන්න.[1] කාලවල් සතක්[2] පසු වන
තුරු එය එම තත්වයේම තිබුණා-
වේ. **17** එය නියෝග කර තිබෙන්-
නේ මුරකරුවන්[3] විසින්ය. දෙවිගේ ඒ
තීන්දුව ප්‍රකාශ කර තිබෙන්නේ ශුද්ධ
තැනැත්තන් විසින්ය. මනුෂ්‍ය ආණ්ඩු-
වලට වඩා ඉහළින් සිටින, පූර්ණ
බලයක් ඇති එකම තැනැත්තා වන්-
නේ මහෝත්තම දෙවියි.[4] දෙවි තමා
කැමති කෙනෙකුට පාලනය භාර
දෙන අතර[5] ඉතාම පහත්යයි සල-
කන තැනැත්තාට වුවද පාලනය භාර
දෙන්නේය.[6] ලෝකයේ ජීවත් වන
සියලු ජනයා ඒ කාරණා දැනගන්නා
පිණිස ඒ තීන්දුව දී තිබේ."
**18** "'නෙබුකද්නෙෂර් රජු වන මා
දුටු සිහිනය එයයි. මගේ රාජධානියේ
සිටින බෙල්ටෂසර්, බුද්ධිමතුන්ගෙන්
එක් කෙනෙකුටවත් එහි අර්ථය පහදා
දීමට නොහැකි වූ නිසා[7] දැන් ඔබ-
වත් එහි අර්ථය මට පැහැදිලි කර
දෙන්න. ශුද්ධ දෙවිවරුන්ගේ බලය
ඔබට තිබෙන නිසා ඔබට එය කළ
හැකි බව මම දනිමි.'[8]
**19** "එවිට බෙල්ටෂසර්[9] එනම්,
දානියෙල් ඒ සිහිනයේ අර්ථය නිසා
හොඳටම කැලඹී පුදුමයෙන් බලා සිටි-
යේය.[10]
"එවිට මම ඔහුට මෙසේ කීවෙමි.
'බෙල්ටෂසර්, මා කියන දේ අහන්න.
සිහිනය නිසාවත් එහි අර්ථය නිසාවත්
භය නොවන්න.'[11]
"එවිට බෙල්ටෂසර් මට මෙසේ පිළි-
තුරු දුන්නේය. 'මාගේ ස්වාමීනි, මේ
සිහිනයෙන් ඔබ දුටු දේවල් ඔබට
වෛර කරන ඔබේ සතුරන්ට සිදු
වේවා![12]
**20** "'රජතුමනි, ක්‍රමක්‍රමයෙන්
අහස උසටම වැඩී ශක්තිමත් වූ
විශාල ගසක් ඔබ සිහිනයේ දුටුවෙහිය.
ඒ ගස මුළු පොළොවටම පෙනෙන්න
තිබිණ.[13] **21** එය අලංකාර කොළව-
ලින් පිරුණු, පලවලින් බර වූ ගසක්

**4 පරි.**
1 දානි 1:7; දානි 5:12
2 යෙසා 46:1; යෙරෙ 50:2
3 ගණන් 11:17; යෙසා 63:11; දානි 4:18; දානි 4:24; දානි 5:11
4 දානි 1:20; දානි 2:48
5 උත් 41:38; දානි 6:3
6 දානි 1:17
7 දානි 2:30
8 දානි 2:19
9 දානි 4:26
10 යෙසා 10:33; එස 31:3
11 උත් 11:4; මතෙ 11:23
12 යෙරෙ 27:6; එස 31:6
13 විලා 4:20
14 මතෙ 13:32
15 ගීතා 103:20; ගීතා 103:21; දානි 4:23
16 ද්වි 33:2; ගීතා 89:7; දානි 8:13; මතෙ 18:10; ලූක් 4:34
17 එස 21:26; එස 21:27; දානි 4:31; දානි 5:20; ලූක් 3:9
18 යෙරෙ 51:6; එස 31:12
19 යෝබ් 14:7; දානි 4:33

**2 තීරුව**
1 දානි 4:32
2 දානි 7:25; දානි 12:7; ලූක් 21:24; එළි 12:14
3 දානි 4:13
4 ගීතා 83:18; යෙරෙ 16:21; දානි 4:34
5 ගීතා 75:7; ගීතා 89:36; මතෙ 25:31; ලූක් 1:32; ලූක් 1:33
6 1සාමු 2:8; එස 17:24; සෙක 9:9; මතෙ 11:29
7 යෙසා 47:13; දානි 5:8; දානි 5:15
8 උත් 41:16; දානි 2:28; දානි 4:8
9 දානි 1:7
10 දානි 7:28
11 1සාමු 3:17

**12** 2සාමු 18:32; **13** එස 31:3; දානි 4:10.

බවත් සියල්ලන්ටම ඇති තරම් කන්න
පලතුරු එහි තිබුණු බවත් වනසතුන්
එහි සෙවණේ සිටි බවත් කුරුල්ලන්
එහි අතුවල ලැග සිටි බවත් ඔබ
පැවසුවෙහිය.[1] **22** රජතුමනි, ඒ ගස
ඔබයි.[2] මන්ද ඔබේ රාජ්‍යය පොළොව
පුරාම පැතිර තිබේ.[3] ඔබ ඉතා ශ්‍රේෂ්ඨ
මෙන්ම බලවත් පාලකයෙකි. ඔබේ
තේජස මොන තරම්ද! එය අහස දක්-
වාම නැඟ ඇත.[4]
**23** "'රජතුමනි, ස්වර්ගයේ සිට
ශුද්ධ මුරකරුවෙකු[5] පැමිණෙනවා
ඔබ දුටුවෙහිය. ඔහු මෙසේ පව-
සනවා ඔබට ඇසිණ. "ගස කපා
විනාශ කර දමන්න. නමුත් එහි කඳ
කොටස යකඩ හා තඹ පටිවලින්
බැඳ තබන්න. එය පිනිවලට තෙමී-
තෙමී තණකොළ අතරේ තිබුණාවේ.
කාලවල් සතක් පසු වන තුරු වන-
සත්තු ඒ අවට වාසය කරත්වා!"[6]
**24** මාගේ ස්වාමීනි,[7] ඔබ ඇසූ දුටු ඒ
දේවල අර්ථය හා මහෝත්තම දෙවි[8]
ඔබට නියම කර තිබෙන දේ මෙයයි.[9]
**25** මිනිස් වාසයෙන් ඔබව එළවා
දමනු ඇත. ඔබ වනසතුන් සමඟ
ජීවත් වන්නෙහිය.[10] හරකුන්ට[11] මෙන්
ඔබටත් තණකොළ කෑමට සිදු වේ.
කාලවල් සතක්[12] පසු වන තුරු ඔබ
පිනිවලට තෙමිතෙමී ජීවත් වන්නෙ-
හිය. මනුෂ්‍ය ආණ්ඩුවලට වඩා ඉහ-
ළින් සිටින, පූර්ණ බලයක් ඇති එකම
තැනැත්තා මහෝත්තම දෙවි බවත්[13]
දෙවි තමා කැමති කෙනෙකුට පාල-
නය භාර දෙන බවත්[14] ඔබ පිළිගන්නා
තෙක් ඔබ එම තත්වයේම සිටින්-
නෙහිය.
**26** "'ගසේ කඳ කොටස උගුල්ලා
නොදමන්න කියා ඔවුන් පැවසූ
නිසා,[15] දෙවි ස්වර්ගයේ සිට පාල-
නය කරන බව ඔබ පිළිගත්
පසු[16] රාජ්‍යය නැවතත් ඔබේ අතට
ලැබෙන බව ස්ථිරයි. **27** එබැවින්
රජතුමනි, මගේ උපදෙස් පිළිගන්න.[17]
පව් නොකර ධර්මිෂ්ඨ ජීවිතයක් ගත
කරන්න.[18] අයුතුකම් නොකර දුප්ප-
තුන්ට ප්‍රේමණීයව සලකන්න.[19] ඔබ
එසේ කළොත් දිගු කාලයක් පුරා සැප-
වත් ජීවිතයක් ගත කිරීමට ඔබට
හැකි වනු ඇත.'"[1]
**28** ඒ සියල්ල නෙබුකද්නෙෂර්
රජුට එලෙසම සිදු විය.[2]
**29** සිහිනය දැක මාස දො-
ළහක් ගත වූ පසු නෙබුකද්නෙෂර්
රජ බැබිලෝනියේ පිහිටි රජමාලිගා-
වේ සඳලුතලයේ ඇවිදිමින් සිටියේය.
**30** එවිට ඔහු මෙසේ කීවේය.[3] "මේ,
මගේ තේජසත් ගෞරවයත් සියල්-
ලන්ටම පෙන්වන පිණිස[4] මගේම
බලයෙන් මා ගොඩනැඟූ[5] රජවාසල
වන මහා බැබිලෝනිය නොවේද?"
**31** රජු එසේ කියමින් සිටියදී ස්වර්-
ගය දෙසින් හඬක් පැමිණ මෙසේ
පැවසීය. "නෙබුකද්නෙෂර් රජතුමනි,
මෙයට සවන් දෙන්න. 'රාජ්‍යය ඔබේ
අතින් පහ කර තිබේ.[6] **32** මිනිස්
වාසයෙන් ඔබව එළවා දමනු ඇත.
ඔබ වනසතුන් සමඟ ජීවත් වන්නෙ-
හිය.[7] හරකුන්ට මෙන් ඔබටත් තණ-
කොළ කෑමට සිදු වේ. කාලවල්
සතක් පසු වන තුරු ඔබ ඒ තත්ව-
යේම සිටින්නෙහිය. මනුෂ්‍ය ආණ්-
ඩුවලට වඩා ඉහළින් සිටින,
පූර්ණ බලයක් ඇති එකම තැනැත්තා
මහෝත්තම දෙවි බවත් දෙවි තමා
කැමති කෙනෙකුට පාලනය භාර
දෙන බවත්[8] ඔබ පිළිගන්නා තෙක්
ඔබ එලෙසම සිටින්නෙහිය.'"
**33** ඒ මොහොතේම[9] නෙබුකද්නෙ-
ෂර් රජුට ඒ සියල්ල සිදු විය. මිනිස්
වාසයෙන් ඔහුව එළවා දැමුවේය. ඔහු
පිනිවලට තෙමි තෙමී හරකුන් මෙන්
තණකොළ කෑවේය. ඔහුගේ හිසකෙස්
රාජාලියෙකුගේ පිහාටු මෙන්ද ඔහුගේ
නියපොතු කුරුල්ලෙකුගේ නියපොතු
මෙන්ද දික් විය.[10]
**34** "කාලය ගත වූ පසු[11] නෙබු-
කද්නෙෂර් වන මම ස්වර්ගය
දෙස බැලුවෙමි.[12] එවිට මම නැවත
පියවි සිහියට ආවෙමි. ඉන්පසු මම
මහෝත්තම දෙවිට ප්‍රශංසා කළෙමි.[13]
සදහටම ජීවත් වන ඒ තැනැත්-
තාණන්ට ප්‍රශංසා කර ඔහුට ගෞර-

**4 පරි.**
1 දානි 4:12
2 දානි 2:37
3 දානි 2:38
4 යෙසා 14:13; යෙසා 14:14
5 ගණන් 22:32; ද්වි 33:2; ගීතා 89:7; දානි 4:13; දානි 8:13; මතෙ 18:10; ක්‍රියා 10:3; ක්‍රියා 12:23
6 දානි 4:16; දානි 5:21; ලූක් 21:24
7 යෝබ් 34:19; ගීතා 107:40
8 ගීතා 83:18
9 යෙසා 23:9; යෙසා 55:11; දානි 4:17
10 දානි 4:32; දානි 5:21
11 ගීතා 106:20
12 දානි 4:16; ලූක් 21:24
13 ගීතා 83:18
14 යෝබ් 34:24; යෙරෙ 27:5; දානි 2:21; දානි 5:21; දානි 7:14
15 දානි 4:15
16 ගීතා 11:4; යෙසා 66:1
17 ගීතා 119:46
18 හිතෝ 16:6; හිතෝ 28:13; යෙසා 55:7; එස 18:21; මතෙ 3:8
19 ගීතා 41:1; යෙසා 58:7; මීකා 6:8; 1යොහ 3:17

**2 තීරුව**
1 1රාජා 21:29; යෝවෙ 2:14; යෝනා 3:10
2 ගණන් 23:19; හිතෝ 10:24; යෙසා 55:11
3 ගීතා 73:9
4 ගීතා 49:11
5 හිතෝ 16:18
6 දානි 4:25; ක්‍රියා 12:23
7 දානි 4:14; දානි 5:21
8 දානි 4:17
9 දානි 3:6; දානි 5:5
10 දානි 4:25
11 දානි 4:16
12 ගීතා 121:1; ගීතා 123:1; ගීතා 123:2
13 ගීතා 7:17; ගීතා 92:1

වය දුන්නෙමි.[1] මන්ද ඔහුගේ රාජ්‍යය
සදාකාලයෙන් සදාකාලයටම පව-
තින්නේය. ඔහුගේ පාලනයද පරම්-
පරාවෙන් පරම්පරාවට පවතින්නේය.[2]
**35** පොළොවේ වැසියන්ව කිසිසේත්
දෙවිට සම කළ නොහැක.[3] ඔහු
ස්වර්ගයේ සේනාවන් හා පොළො-
වේ මනුෂ්‍යයන් ඉදිරියේ ක්‍රියා කරන්-
නේ තම කැමැත්තට අනුවය.[4] ඔහුට
බාධා කරන්න කිසිවෙකුට නොහැක.[5]
'ඔබ මොනවාද කරන්නේ' කියා ඔහු-
ගෙන් ප්‍රශ්න කිරීමට අයිතිය ඇති
කිසිවෙක් නැත.[6]

**36** "මා නැවත පියවි සිහියට ආ
දවසේදීම, මගේ රාජ්‍යය උසස් කරන
පිණිස මාව පෙර සේම ගෞරව-
යට පත් කරන ලදි.[7] මගේ රාජ්‍යයේ
උසස් නිලධාරීහුද මගේ උපදේශක-
යෝද මාව සොයා ආවෝය. රාජ්‍යය
නැවතත් මගේ අතට පත් විය. පෙරට
වඩා ශ්‍රේෂ්ඨ තත්වයකට මාව පත්
කරනු ලැබීය.[8]

**37** "නෙබුකද්නෙෂර් වන මම දැන්
ස්වර්ගයේ රජුට ප්‍රශංසා කරමින් ඔහුට
නිසි ගෞරවය දෙන්නෙමි.[9] දෙවි
උඩඟු අයව පහත් කරන්නේය.[10]
ඔහුගේ සියලු ක්‍රියා යුක්තිසහගතය.
ඔහු සැමවිටම විශ්වාසවන්තව ක්‍රියා
කරන්නේය."[11]

**5** බෙල්ෂසර් රජ[12] තම රාජ්‍යයේ
අධිපතීන් දහසකට මහා භෝ-
ජන සංග්‍රහයක් පිළියෙල කළේය. ඒ
මංගල්‍යයේදී ඔවුන් සියලුදෙනා ඉදිරි-
යේ ඔහු වයින් බොමින් සිටියේය.[13]
**2** ටික වේලාවකින් පසුව මත්ව සිටි
ඔහු,[14] යෙරුසලමේ දේවමාලිගාවෙන්
පැහැරගත් රන් රිදී භාජන[15] රැගෙන
එන ලෙස නියෝග කළේය. ඒ භාජන
ඔහුගේ පියා* වූ නෙබුකද්නෙෂර් රජු
විසින් පැහැරගනු ලැබූ ඒවාය. ඔහු
ඒවා රැගෙන එන ලෙස නියෝග
කළේ තමාටත් එහි සිටි අධිපතීන්ටත්
තම භාර්යාවන්ටත් උපභාර්යාවන්-
ටත් ඒවායින් වයින් බීම සඳහාය.[16]

**3** එවිට ඔවුහු යෙරුසලමේ තිබූ දෙවි-
ගේ ගෘහයෙන් පැහැරගෙන ආ රන්
භාජන එතැනට ගෙනාවෝය. රජද
අධිපතීහුද උපභාර්යාවෝද භාර්යා-
වෝද ඒවායින් වයින් බොන්න පටන්-
ගත්හ. **4** ඔවුහු වයින් බොමින් රන්,
රිදී, තඹ, යකඩ, ලී හා ගල්වලින්
සාදාගත් තම දෙවිවරුන්ට ප්‍රශංසා
කළෝය.[1]

**5** ඔවුන් එසේ විනෝද වෙමින් සිටි-
යදී මිනිසෙකුගේ අතක් පෙනිණ. ඒ
අත රජමාලිගාවේ පහන් රුක ඉදිරිපිට
තිබූ බිත්තිය* මත ලියන්න පටන්-
ගත්තේය.[2] ඒ දෙස බලා සිටි රජ
**6** අතිශයින් භය විය.[3] ඔහුගේ මුහුණද
සුදුමැලි විය. ඔහුගේ කකුල් පණ නැති
වී[4] දණිස් එකිනෙකට වදින්න පටන්-
ගත්තේය.[5]

**7** එවිට රජ මහත් හඬින් කෑගසා
පේන කියන්නන්වද කල්දිවරුන්වද
ජ්‍යෝතිඃ ශාස්ත්‍රඥයන්වද එතැනට
කැඳවන ලෙස නියෝග කළේය.[6]
ඉන්පසු රජ බැබිලෝනියේ බුද්ධිම-
තුන්ව අමතා, මෙසේ කීවේය. "බිත්-
තියේ ලියා ඇති මේ අකුරු කියවා එහි
තේරුම මට කියා දෙන්න පුළුවන්
කෙනෙක් ඉන්නවා නම් මම ඔහුට දම්
පාට වස්ත්‍රයක් අන්දවා[7] ඔහුගේ කරට
රන් මාලයක් දමා ඔහුව මගේ රාජ්‍ය-
යේ තුන්වන තැනට පත් කරනවා."[8]

**8** බැබිලෝනියේ සිටි සියලු බුද්ධි-
මතුන් එතැනට පැමිණියත් ඔවුන්ට
ඒ අකුරු කියවන්නවත් එහි තේරුම
රජුට කියා දෙන්නවත් බැරි විය.[9]
**9** එබැවින් බෙල්ෂසර් රජ අතිශ-
යින් භය විය. ඔහුගේ මුහුණද සම්-
පූර්ණයෙන්ම සුදුමැලි විය. එතැන
සිටි අධිපතීහුද කිසිවක් කරකියාගත
නොහැකි තත්වයකට පත් වූහ.[10]

**10** රජු හා අධිපතීන් අතර ඇති වූ
කතාබහ ආරංචි වී රැජින* මංගල්‍යය
පැවැත්වූ ස්ථානයට පැමිණියාය. ඇය

**4 පරි.**
**1** යෙරෙ 10:10 1තිමෝ 1:17 එළි 4:11
**2** ගීතා 10:16 දානි 4:3 මීකා 4:7
**3** ගීතා 39:5 යෙසා 40:15
**4** 1සාමු 3:18 ගීතා 33:11 යෙසා 46:10
**5** යෝබ් 34:24 යෙසා 43:13 1කොරි 10:22
**6** යෝබ් 9:12 යෙසා 45:9 රෝම 9:20
**7** 2ලේක 33:13 දානි 4:26
**8** හිතෝ 22:4
**9** දානි 4:3 ක්‍රියා 17:24
**10** නික් 18:11 යෝබ් 40:11 යාකො 4:6
**11** ද්වි 32:4 ගීතා 33:5 එළි 15:3

**5 පරි.**
**12** දානි 5:9 දානි 7:1 දානි 8:1
**13** යෙසා 21:5 යෙරෙ 51:39
**14** හිතෝ 20:1 හිතෝ 31:4
**15** 2රාජා 25:15 2ලේක 36:18 එස්රා 1:7 යෙරෙ 27:16 යෙරෙ 52:19 දානි 1:2
**16** හිතෝ 11:2

**2 තීරුව**
**1** ගීතා 115:4 ගීතා 135:15 ක්‍රියා 17:29 එළි 9:20
**2** දානි 5:24
**3** ගීතා 102:15
**4** ගීතා 69:23 යෙසා 21:3
**5** එස 7:17 නාහු 2:10
**6** උත් 41:8 දානි 2:2 දානි 4:6
**7** උත් 41:42 1සාමු 17:25
**8** දානි 2:6 දානි 2:48 දානි 6:2
**9** උත් 41:8 දානි 2:27 දානි 4:7
**10** යෙසා 13:7

දානි **5:2*** හෝ, "ඔහුගේ සීයා."

දානි **5:5*** එම බිත්තිය කපරාරු කර තිබූ බව මුල් භාෂාවෙන් පැහැදිලි වේ. **10*** මෙහි සඳහන් කරන්නේ මව් රැජින ගැනය.

රජුට මෙසේ කීවාය. “රජතුමනි, ඔබ
සදහටම ජීවත් වේවා![1] ඔබේ මුහුණ
සුදුමැලි වී තිබෙන්නේ ඇයි? කල-
බල වෙන්න කිසිම හේතුවක් නැහැ.
**11** බිත්තියේ ලියා තිබෙන මේ දේවල
තේරුම කියන්න පුළුවන් කෙනෙක්
ඔබේ රාජධානියේ ඉන්නවා. ඔහුට
ශුද්ධ දෙවිවරුන්ගේ බලය තිබෙ-
නවා.[2] දෙවිවරුන්ට සමාන ප්‍රඥා-
වක්ද ගැඹුරු අවබෝධයක්ද* ඔහුට
තිබෙන බව ඔබේ පියාගේ# දවස්වලදී
පැහැදිලිව දැකගන්න ලැබුණා. ඔබේ
පියා වන නෙබුකද්නෙෂර් රජ ඔහුව
මන්තර ගුරුකම් කරන පූජකයන්ගේද
ජේන කියන්නන්ගේද කල්දිවරුන්ගේද
ජ්‍යොතිඃ ශාස්ත්‍රඥයන්ගේද ප්‍රධානියා
ලෙස පත් කළා.[3] **12** බෙල්ටෂසර්[4]
කියා රජ නම් කළ දානියෙල් විශේෂ
දක්ෂතා හා මනා දැනුමක් ඇති, සිහි-
නවල අර්ථ තෝරා දීමට[5] හා සංකීර්ණ
ගැටලු විසඳීමට හැකියාවක් තිබෙන
පුද්ගලයෙක් බව පෙනී ගියා.[6] දැන්
දානියෙල්ව මෙතැනට කැඳවන්න.
බිත්තියේ ලියා තිබෙන මේ දේවල
තේරුම ඔහු ඔබට කියා දෙයි.”

**13** ඉන්පසු දානියෙල්ව රජු ඉදිරියට
ගෙනාවේය. එවිට රජ දානියෙල්ගෙන්
මෙසේ ඇසුවේය. “මගේ පියා[7] යුදා දේ-
ශයෙන් රැගෙන ආ දානියෙල්[8] ඔබද?
**14** දෙවිවරුන්ගේ බලය ඔබට තිබෙන
බව[9] මට දැනගන්න ලැබුණා. පුදුමා-
කාර ප්‍රඥාවක් හා ගැඹුරු අවබෝධ-
යක්[10] ඔබට තිබෙන බවත් මට ආරංචි
වුණා. **15** බිත්තියේ ලියා තිබෙන
මේ දේ කියවා එහි තේරුම දැනගැනී-
මට බුද්ධිමතුන්ව හා ජේන කියන්-
නන්ව මා ඉදිරියට කැඳෙව්වා. නමුත්
ඔවුන්ගෙන් එක් කෙනෙකුටවත් ඒ
දේ කරන්න බැරි වුණා.[11] **16** නමුත්
සිහිනවල අර්ථ තෝරා දෙන්න[12] හා
සංකීර්ණ ගැටලු විසඳන්න ඔබට පුළු-
වන් බව මට දැනගන්න ලැබුණා.
ලියා තිබෙන මේ දේ කියවා එහි තේ-
රුම මට කියා දෙන්න ඔබට පුළුවන්
වුණොත් මම ඔබට දම් පාට වස්ත්‍රයක්
අන්දවා ඔබේ කරට රන් මාලයක් දමා
ඔබව මගේ රාජ්‍යයේ තුන්වන තැනට
පත් කරනවා.”[1]

**17** එවිට දානියෙල් රජුට මෙසේ
කීවේය. “ඔබේ තනතුරු මට එපා.
ඔබේ තෑගිබෝග වෙනත් කෙනෙකුට
දෙන්න.[2] නමුත් ලියා තිබෙන මේ දේ
කියවා එහි තේරුම මම ඔබට කියා
දෙන්නම්.[3] **18** මහෝත්තම දෙවි[4]
ඔබේ පියා[5] වන නෙබුකද්නෙෂර්
රජුට රාජ්‍යයත් බලයත් තේජසත්
ලබා දුන්නා.[6] **19** දෙවි ඔහුව බල-
වත් කළ නිසා සියලු ජාතීන්ද ගෝ-
ත්‍රයන්ද විවිධ භාෂා කතා කරන
මිනිසුන්ද ඔහු ඉදිරියේ බියෙන් වෙවු-
ලුවා.[7] ඔහු කැමති ආකාරයට මිනි-
සුන්ව මරා දැමුවා. ඔහු කැමති
විදිහට මිනිසුන්ට පහර දුන්නා. යමෙ-
කුව උසස් කරන්න අවශ්‍ය වුණා
නම් ඔහු එසේ කළා. යමෙකුව පහත්
කරන්න අවශ්‍ය වුණා නම් ඔහු
එයද කළා.[8] **20** ඔහු උඩඟු වී අහං-
කාර ලෙස ක්‍රියා කළ විට[9] දෙවි
ඔහුගේ සිංහාසනයෙන් ඔහුව ඉවත්
කර දැමුවා. ඔහුගේ ගෞරවයද නැති
කර දැමුවා.[10] **21** ඔහුව මිනිස් වාස-
යෙන් එළවා දමා ඔහුට මෘගයෙ-
කුගේ සිතක් දුන්නා. ඔහු බූරුවන්
සමඟ කැලේ ජීවත් වුණා.[11] පින්-
නෙන් තෙමුණා. හරකුන්ට මෙන් ඔහු-
ටත් තණකොළ කන්න සිදු වුණා.[12]
මනුෂ්‍ය ආණ්ඩුවලට වඩා ඉහළින්
සිටින, පූර්ණ බලයක් ඇති එකම
තැනැත්තා මහෝත්තම දෙවි බවත්
දෙවි තමා කැමති කෙනෙකුට පාල-
නය භාර දෙන බවත් ඔහු පිළිගන්නා
තෙක් ඔහු ඒ තත්වයේම සිටියා.[13]

**22** “ඔහුගේ පුතා*[14] වන ඔබ මේ
සියල්ල දැන සිටියත්[15] ඔබ යටහත්-
පහත් නොවී උඩඟු ලෙස ක්‍රියා
කළා.[16] **23** ඔබ ස්වර්ගයේ දෙවි-
ටත් වඩා ඉහළින් යන්න සිතුවා.[17]

**5 පරි.**
**1** දානි 3:9
**2** දානි 2:47, දානි 4:8, දානි 4:18
**3** දානි 2:48, දානි 4:9
**4** දානි 1:7, දානි 4:8
**5** දානි 1:17, දානි 6:3
**6** 1රාජා 4:30, දානි 5:16
**7** 2රාජා 24:14
**8** දානි 1:6, දානි 2:25, දානි 6:13
**9** දානි 1:17, දානි 2:23, දානි 4:9
**10** හිතෝ 2:6, දානි 1:20
**11** යෙසා 47:12, දානි 2:10, දානි 5:8
**12** උත් 40:8, දානි 2:28

**2 තීරුව**
**1** දානි 2:6, දානි 5:7
**2** එස්ත 8:15
**3** ගීතා 119:46
**4** ගීතා 47:2, ගීතා 83:18, ගීතා 92:8, දානි 4:17
**5** දානි 5:11
**6** දානි 2:37, දානි 2:38
**7** යෙරෙ 25:9, දානි 3:4, දානි 4:22
**8** හිතෝ 16:14, දානි 2:12, දානි 3:6, දානි 3:29
**9** හිතෝ 16:5, යෙසා 14:13, දානි 4:30, මීකා 6:8
**10** යෙසා 47:1
**11** දානි 4:25, දානි 4:32
**12** දානි 4:33
**13** යෝබ් 34:24, ගීතා 83:18, එස 17:24, දානි 4:17, දානි 4:35
**14** දානි 5:11, දානි 5:18
**15** ලූක් 12:47, යාකො 4:17
**16** මතෙ 23:12
**17** යෙසා 37:23, යෙරෙ 50:29

දානි **5:11*** මු.අ., “ඥානාලෝකය.” **11#** දානි 5:2හි පාදසටහන බලන්න.

දානි **5:22*** හෝ, “මුනුපුරා.”

දෙවිගේ ගෘහයේ භාජන[1] ඔබ මෙ-
තැනට ගෙනැවිත් ඔබේ අධිපතියන්,
ඔබේ භාර්යාවන් සහ උපභාර්යාවන්
සමඟ ඒවායින් වයින් බිව්වා. කිසිම
දෙයක් පෙනෙන්නේවත් ඇසෙන්නේ-
වත් නැති, කිසිවක් තේරුම්ගන්න-
වත් බැරි[2] රන්, රිදී, තඹ, යකඩ, ලී
හා ගල්වලින් සාදාගත්[3] කිසි කම-
කට නැති දෙවිවරුන්ට ඔබ ප්‍රශංසා
කළා. නමුත් ඔබට ජීවිතය දෙන්-
නත් ඔබෙන් ජීවිතය ගන්නත්*[4]
ඔබේ ජීවිත ගමන නියම කරන්-
නත් බලය ඇති දෙවිව[5] ඔබ ගෞරව-
යට පත් කළේ නැහැ.[6] **24** දෙවි මේ
අකුරු ලිවීමට සැලැස්සුවේ ඒ නිසයි.[7]
**25** ලියා තිබෙන්නේ මෙයයි. මෙනේ,
මෙනේ, තෙකෙල් හා පර්සීන්.*

**26** “මෙනේ යන්නෙන් අදහස්
කරන්නේ මෙයයි. දෙවි ගණන් බලා
ඔබේ රාජ්‍යය අවසන් කිරීමට දවසක්
නියම කර තිබේ. ඔබේ රාජ්‍යය දැන්
අවසන් වනු ඇත.[8]

**27** “තෙකෙල් යන්නෙන් අදහස්
කරන්නේ මෙයයි. ඔබව තරාදියේ
දමා කිරා මැන බලා තිබේ. ඔබ නො-
වටිනා කෙනෙක් බව පෙනී ගොස්
ඇත.[9]

**28** “පෙරෙස් යන්නෙන් අදහස්
කරන්නේ මෙයයි. ඔබේ රාජ්‍යය බෙදා
මේදියවරුන්ට හා පර්සියානුවරුන්ට දී
තිබේ.”[10]

**29** එවිට බෙල්ෂසර් රජ දානි-
යෙල්ට දම් පාට වස්ත්‍රයක් අන්ද-
වන්නද ඔහුගේ කරට රන් මාලයක්
දමන්නද නියෝග කළේය. එමෙන්ම
ඔහුව රාජ්‍යයේ තුන්වන තැනට පත්
කළ බව ප්‍රකාශ කරන ලදි.[11]

**30** ඒ රාත්‍රියේදීම කල්දිවරුන්ගේ
රජු වන බෙල්ෂසර්ව මරා දමනු
ලැබීය.[12] **31** මේදිය ජාතික දාරියුස්-
ගේ[1] අතට එම රාජ්‍යය පත් විය.
ඒ වන විට දාරියුස්ගේ වයස අවුරුදු
හැටදෙකක් විය.

**6** දාරියුස් තම මුළු රාජධානිය
බලාගැනීමට දිසාපතීන් එක-
සිය විසිදෙනෙකුව පත් කළේය.[2]
**2** තමාට කිසි වංචාවක් නොවීම
සඳහා[3] එම දිසාපතීන්ගේ[4] වැඩ බලා-
ගැනීමට රජ උසස් නිලධාරීන් තුන්-
දෙනෙකුව පත් කළේය. දිසාපතීන්
තමන් කළ වැඩ සම්බන්ධයෙන් ඒ
තුන්දෙනාට නිතරම වාර්තා කළ
යුතුව තිබිණ. දානියෙල්ද ඒ උසස්
නිලධාරීන්ගෙන් එක් කෙනෙකු විය.[5]
**3** දානියෙල් ශ්‍රේෂ්ඨ ගතිගුණ තිබෙන
ඉතා බුද්ධිමත් කෙනෙකු වූ නිසා[6]
අනික් නිලධාරීන්ට හා දිසාපතීන්ට
වඩා ඔහු කැපීපෙනිණ.[7] එබැවින් මුළු
රාජධානියම බලාගැනීම සඳහා ඔහුව
පත් කිරීමට රජ තීරණය කළේය.

**4** දානියෙල්ට විරුද්ධව චෝදනා-
වක් එල්ල කිරීමට උසස් නිලධාරීන්ට
හා දිසාපතීන්ට වුවමනා විය. ඒ නිසා
දානියෙල් රාජකාරිය ඉටු කරන ආකා-
රයේ යම් වරදක් සොයාගන්න ඔවුහු
උත්සාහ කළෝය.[8] එහෙත් දානියෙල්
සැමවිටම තම වගකීම් හොඳින් ඉටු
කරමින් විශ්වාසවන්තව ක්‍රියා කළ
නිසා ඔහුට විරුද්ධව කිසි වරදක්-
වත් කිසි දූෂිත ක්‍රියාවක්වත් සො-
යාගැනීමට ඔවුන්ට නොහැකි විය.[9]
**5** එබැවින් ඒ මනුෂ්‍යයෝ එකිනෙකා
අතරේ මෙසේ කතා වූහ. “දානියෙල්ට
විරුද්ධව චෝදනාවක් එල්ල කරන්න
ඔහු කිසි වරදක් කර නැහැ. ඒ නිසා
අපි ඔහු නමස්කාර කරන දෙවියන්-
ගේ නීතිය ප්‍රයෝජනයට ගෙන ඔහුට
විරුද්ධව උගුලක් අටවමු.”[10]

**6** ඉන්පසු සියලු නිලධාරීහුද දිසා-
පතීහුද මහත් කලබලයකින් රජු
වෙතට ගොස්[11] මෙසේ කීවෝය. “දාරි-
යුස් රජතුමනි, ඔබ සදහටම ජීවත්
වේවා![12] **7** ප්‍රධාන නිලධාරීන්, දිසා-
පතීන්, රජුගේ නිලධාරීන් හා ආණ්ඩු-
කාරයන් ඇතුළු රාජධානියේ සිටින
සියලු උසස් නිලධාරීන් ඔබෙන් යම්

**5 පරි.**
**1** දානි 5:3
**2** ද්වි 32:21; ගීතා 115:5; ගීතා 135:17; යෙසා 46:7; 1කොරි 8:4
**3** යෙසා 37:19; ක්‍රියා 17:29
**4** ගීතා 104:29; යෙසා 42:5; ක්‍රියා 17:25
**5** හිතෝ 20:24; යෙරෙ 10:23
**6** රෝම 1:21
**7** දානි 5:5
**8** යෙසා 13:11; යෙරෙ 25:12; යෙරෙ 27:7; යෙරෙ 50:1; යෙරෙ 51:11
**9** යෝබ් 31:6; රෝම 2:6; 1කොරි 3:13; කොලො 3:25
**10** එස්රා 1:1; යෙසා 21:2; යෙසා 45:1; යෙරෙ 50:9; දානි 6:28; දානි 9:1
**11** යෙසා 14:2; දානි 5:7; දානි 5:16
**12** යෙසා 21:9; යෙරෙ 51:8; යෙරෙ 51:31; යෙරෙ 51:39; යෙරෙ 51:57

**2 තීරුව**
**1** දානි 6:1; දානි 9:1

**6 පරි.**
**2** එස්ත 1:1
**3** එස්රා 4:22; එස්ත 7:4; ලූක් 19:23
**4** එස්රා 8:36; එස්ත 8:9; දානි 3:2
**5** හිතෝ 3:16; යෙසා 14:2; දානි 2:48; දානි 5:29
**6** දානි 1:17; දානි 5:12
**7** හිතෝ 3:35; හිතෝ 22:29
**8** ගීතා 37:12; හිතෝ 29:27; දේශ 4:4
**9** පිලි 2:15; 1පේතෘ 2:12
**10** එස්ත 3:8
**11** ගීතා 56:6; හිතෝ 6:18
**12** නෙහෙ 2:3; දානි 2:4

දානි **5:23*** මූ.අ., “ඔබේ හුස්ම තම හස්තයේ තිබෙන.” **25*** මූ.අ., “මීනාවක්, මීනාවක්, ෂෙකෙලයක් හා ෂෙකෙල භාගයක්.” අරාමීය භාෂාවෙන්, ‘මෙනේ, මෙනේ තෙකෙල් ඌ පාර්සීන්.’ පාර්සීන් යනු, “ෂෙකෙල් භාගයක්” යන අර්ථය ඇති පෙරෙස් යන වචනයෙහි බහු වචනයයි.

ඉල්ලීමක් කරන්න සතුටුයි. දවස්
තිහක් යන තෙක් ඔබට හැර වෙන
දෙවි කෙනෙකුට හෝ මනුෂ්‍යයෙකුට
යාච්ඤා කරන ඕනෑම කෙනෙකුව
සිංහ ගුහාවට විසි කරන ලෙස[1] නීති-
යක් පනවන මෙන්[2] රජුගෙන් ඉල්-
ලන්න අපි කැමතියි. **8** රජ්ජුරුවනි,
දැන් ඒ නීතිය පනවන්න. එම නීතිය
වෙනස් නොවන ලෙස එම නීතිය
සඳහන් ලියකියවිලිවලට අත්සන්
තබන්න.[3] එවිට මේදියවරුන්ගේද
පර්සියානුවරුන්ගේද[4] නීතියට අනුව
එය කිසිවිටෙක අහෝසි කරන්න බැරි
වෙයි.”[5]

**9** දාරියුස් රජ ඔවුන් කී දේ අසා ඒ
නීතිය සඳහන් ලියකියවිලිවලට අත්-
සන් තැබුවේය.[6]

**10** රජු එම ලියකියවිලිවලට අත්-
සන් තැබූ බව ආරංචි වූ විට දානියෙල්
තම නිවසට ගොස් උඩුමහල් කාමර-
යට ඇතුල් විය. එම කාමරයේ කවුළු
යෙරුසලම දෙසට ඇරී තිබිණ.[7] ඔහු
සුපුරුදු පරිදි දණ ගසා දෙවිට ප්‍රශංසා
කරමින්[8] යාච්ඤා කළේය.[9] ඔහු දව-
සට තුන් වතාවක්ම[10] එසේ කිරීමට
පුරුදු වී සිටියේය.[11] **11** තමන්ට
උපකාර කරන ලෙස දානියෙල් තම
දෙවිගෙන් අයැදිමින් සිටියදී ඔහු සමඟ
වෛර බැඳගෙන සිටි මිනිස්සු ඔහුගේ
කාමරයට කඩාවැදුණෝය.[12]

**12** ඉන්පසු ඔවුහු රජු ළඟට ගොස්
ඔහු පනවා තිබූ නීතිය ගැන මතක්
කරමින් මෙසේ ඇසුවෝය. “රජතු-
මනි, දවස් තිහක් යන තෙක් ඔබට
හැර වෙන දෙවි කෙනෙකුට හෝ
මනුෂ්‍යයෙකුට යාච්ඤා කරන ඕනෑම
කෙනෙකුව සිංහ ගුහාවට[13] විසි කරන
ලෙස ඔබ නීතියක් පනවා එයට
අත්සන් තැබුවා නේද?” එවිට රජ
ඔවුන්ට මෙසේ කීවේය. “ඔව්, එය මේ-
දියවරුන්ගේ හා පර්සියානුවරුන්ගේ
නීතියට අනුව මම ස්ථිර කළා. එය
අහෝසි කරන්න කාටවත් බැහැ.”[14]
**13** එවිට ඔවුහු රජුට මෙසේ කීවෝය.
“රජතුමනි, යූදා දේශයෙන් ආ[15] දානි-
යෙල්[16] ඔබ කී දේ ගණනකටවත්
ගත්තේ නැහැ. ඔහු ඔබ පැනවූ නීතිය
කඩ කරමින් දවසට තුන් වතාවක්ම
ඔහුගේ දෙවියන්ට යාච්ඤා කරනවා.”[1]
**14** එය ඇසූ විට රජ බොහෝ සෙයින්
දුකට පත් වී[2] දානියෙල්ව බේරාගැනී-
මට මඟක් සෙව්වේය.[3] සවස් වන
තෙක්ම ඔහු දානියෙල්ව බේරාගැනී-
මට උත්සාහ කළේය. **15** එහෙත්
දානියෙල් සමඟ වෛර බැඳගෙන
සිටි සියලුදෙනාම මහත් කලබල-
යකින් රජු වෙතට ගොස් ඔහුගෙන්
මෙසේ ඇසුවෝය. “රජතුමනි, මේ-
දියවරුන්ගේ හා පර්සියානුවරුන්ගේ
නීතියට අනුව ඔබ යම් නීතියක් හෝ
තහංචියක් පැනෙව්වොත්[4] එය වෙ-
නස් කරන්න බැරි බව ඔබ දන්නේ
නැද්ද?”[5]

**16** එබැවින් දානියෙල්ව ගෙනැ-
විත් සිංහ ගුහාවට විසි කරන ලෙස
රජ අණ කළේය.[6] එහෙත් දානි-
යෙල්ව සිංහ ගුහාවට දැමීමට පෙර
රජ ඔහුට මෙසේ කීවේය. “ඔබ අත්
නෑර නමස්කාර කරන ඔබේ දෙවි
ඔබව ගලවාගනී කියා මට විශ්-
වාසයි.”[7] **17** ඉන්පසු ඔවුහු ගුහාවේ
කට විශාල ගලකින් වසා රජුගේ මුද්-
දෙන් හා උසස් නිලධාරීන්ගේ මුද්‍රව-
ලින් එම ගලට මුද්‍රාවක් තැබුවෝය.
ඔවුන් එසේ කළේ දානියෙල් සම්බන්-
ධයෙන් ගත් ඒ තීරණය වෙනස් නො-
කරන පිණිසය.[8]

**18** ඉන්පසු රජ තම මාලිගාවට
ගොස් නොකා නොබී දුකෙන් සිටි-
යේය.[9] ඔහු ඉදිරියේ සංගීතය වාදනය
නොකරන ලෙසද කියා සිටියේය. මුළු
රාත්‍රියේම ඔහුට නින්ද නොගියේය.[10]
**19** එළිය වැටීගෙන එද්දීම රජ නැඟිට
සිංහ ගුහාව ළඟට දුවගෙන ගියේය.
**20** ගුහාවට ළං වෙත්ම ඔහු ඉතා
දුකින් දානියෙල්ට හඬගසා ඔහුගෙන්
මෙසේ ඇසුවේය. “අනේ දානියෙල්,
ඔබ අත් නෑර[11] නමස්කාර කරන ඔබේ
ජීවමාන දෙවි ඔබව බේරාගත්තාද?”[12]
**21** දානියෙල් එවෙලේම රජුට මෙසේ
කීවේය. “රජතුමනි, ඔබ සදහටම
ජීවත් වේවා! **22** සිංහයන්ගෙන් මට

**6 පරි.**

**1** දානි 3:6, දානි 6:16, දානි 6:24
**2** ගීතා 59:3, ගීතා 94:20
**3** එස්ත 3:12, එස්ත 8:10
**4** එස්ත 1:19
**5** එස්ත 8:8
**6** දානි 6:7
**7** 1රාජා 8:30, 1රාජා 8:44, 2ලේක 6:38, ගීතා 5:7
**8** ගීතා 34:1, රෝම 12:12
**9** 1රාජා 8:54, 2ලේක 6:13, එස්රා 9:5, ගීතා 95:6, ලූක් 22:41, ක්‍රියා 7:60
**10** ගීතා 55:17, ගීතා 86:3, කොලො 4:2
**11** 1තෙස 5:17
**12** ගීතා 10:9, ගීතා 37:32
**13** දානි 6:7, දානි 6:24
**14** එස්ත 8:8, දානි 6:8
**15** දානි 2:25, දානි 5:13
**16** දානි 1:6

---

**2 තීරුව**

**1** එස්ත 3:8
**2** මාක් 6:26
**3** 1රාජා 8:50
**4** දානි 6:7
**5** එස්ත 8:8, ගීතා 94:20, දානි 6:8
**6** හෙබ්‍රෙ 11:33
**7** ගීතා 37:39, ගීතා 91:14, ගීතා 118:5, යෙසා 41:10, යෙසා 43:2, 2කොරි 1:10
**8** මතෙ 27:66, ක්‍රියා 12:4
**9** 2සාමු 12:16, 1රාජා 21:27
**10** එස්ත 6:1, දානි 2:1
**11** ද්වි 6:5, 1ලේක 16:11, හිතෝ 23:17
**12** උත් 18:14, මතෙ 19:26, ලූක් 1:37

කිසි හානියක් වුණේ නැහැ. මා
නිදොස් බව දෙවි දන්නවා.[1] රජතුමනි,
මම ඔබට විරුද්ධව කිසි වරදක් කළේ
නැහැ.[2] ඒ නිසා මගේ දෙවි[3] ඔහුගේ
දූතයෙකුව එවා[4] සිංහයන්ගේ කටවල්
වසා දැමුවා.”[5]
**23** එවිට රජ මහත් ප්‍රීතියෙන්[6]
දානියෙල්ව ගුහාවෙන් එළියට ගන්නා
ලෙස අණ කළේය. දානියෙල්ව ගුහා-
වෙන් එළියට ගත් විට ඔහුට කිසි අන-
තුරක් සිදු වී නැති බව පෙනී ගියේය.
ඔහුට කිසි හානියක් සිදු නොවුණේ
ඔහු තම දෙවිව විශ්වාස කළ නිසාය.[7]
**24** පසුව දානියෙල්ට විරුද්ධව
චෝදනා එල්ල කළ මිනිසුන්වද[8]
ඔවුන්ගේ භාර්යාවන් හා පුත්‍රයන්වද
එතැනට ගෙනැවිත්[9] සිංහ ගුහාවට
විසි කරන ලෙස[10] රජ අණ කළේය.
ඔවුන් ගුහාවේ අඩියට වැටෙන්නත්
කලින් සිංහයෝ ඔවුන්ව අල්ලාගෙන
කෑලි කෑලිවලට ඉරා දැමුවෝය. උන්
ඔවුන්ගේ ඇටකටු පවා පොඩි කර
දැමුවෝය.[11]
**25** පසුව දාරියුස් රජ ලෝකය
පුරාම ජීවත් වන සියලු ජාතීන්ට,
ගෝත්‍රයන්ට හා විවිධ භාෂා කතා
කරන මිනිසුන්ට මෙසේ ලීවේය.[12]
“ඔබ සියල්ලන්ට බොහෝ සමාදා-
නය ලැබේවා![13] **26** මගේ රාජධානි-
යේ සෑම පළාතකම ජීවත් වන ජනයා
දානියෙල්ගේ දෙවි ඉදිරියේ භයෙන්ද
වෙවුලමින්ද සිටිය යුතු බවට[14] මම
නියෝග කරමි.[15] සදාකාලයෙන් සදා-
කාලයට සිටින ජීවමාන දෙවි ඔහුය.[16]
ඔහුගේ රාජ්‍යය[17] කිසිදා විනාශ නො-
වන්නේය.[18] ඔහුගේ පාලනයද සද-
හටම පවතින්නේය.[19] **27** ඔහු තම
සේවකයන්ව ගලවාගන්නේය.[20] ඔහු
අහසේද[21] පොළොවේද ලකුණු පෙන්-
වන්නේය.[22] පුදුම ක්‍රියා කරන්නේය.
ඔහු දානියෙල්ව සිංහයන්ගෙන් බේරා-
ගත්තේය.”
**28** දාරියුස්ගේ[23] හා පර්සියානු
ජාතික සයිරස්ගේ පාලන සමයේදී[24]
දානියෙල්ව මහත් ගෞරවයෙන් සල-
කනු ලැබීය.

**6 පරි.**
**1** ගීතා 24:4 ගීතා 26:6
**2** රෝම 13:1 1පේතෘ 2:17
**3** 2සාමු 22:7 ගීතා 31:14
**4** ගීතා 34:7 දානි 3:28
**5** 1සාමු 17:37 2තිමෝ 4:17 හෙබ්‍රෙ 11:33
**6** හිතෝ 16:13
**7** 2ලේක 20:20 ගීතා 37:40 හිතෝ 18:10
**8** ද්වි 19:19 එස්ත 7:10 හිතෝ 11:8
**9** යොෂු 7:24
**10** හිතෝ 14:35
**11** ගීතා 54:5 යෙසා 38:13
**12** එස්ත 3:12 එස්ත 8:9 දානි 4:1
**13** එස්රා 4:17
**14** ගීතා 99:1 යෙරෙ 10:10
**15** දානි 3:29
**16** ද්වි 5:26 ගීතා 90:2 දානි 4:34 1පේතෘ 1:23 එළි 4:9
**17** දානි 2:44
**18** ගීතා 93:1
**19** ගීතා 29:10 එළි 15:3
**20** ගීතා 18:48 ගීතා 32:7 දානි 3:28
**21** ක්‍රියා 2:19
**22** යෙරෙ 32:20 දානි 4:3 හෙබ්‍රෙ 2:4
**23** දානි 5:31 දානි 6:2
**24** 2ලේක 36:22 එස්රා 1:1 යෙසා 44:28

**2 තීරුව**

# 7
බැබිලෝනියේ රජු වූ බෙල්ෂසර්[1]
රජකම් කළ පළමුවන අවුරුද්-
දේදී දානියෙල් දර්ශන ඇතුළත් සිහි-
නයක් දුටුවේය.[2] ඒ සිහිනයේ දුටු
සියල්ල ඔහු විස්තර ඇතුව ලියා තැබු-
වේය.[3] **2** දානියෙල් මෙසේ ලීවේය.
“රාත්‍රියේ නිදාගෙන සිටියදී මා දුටු
දර්ශන මම දැන් විස්තර කරන්නෙමි.
අහසේ සතර දිශාවෙන්ම සැඩ සුළං[4]
හමා ඇවිත් මහ මුහුද කලඹනවා මම
දුටුවෙමි.[5] **3** එවිට විශාල මෘගයන්
හතරදෙනෙක්[6] මුහුදෙන් උඩට මතු
වූහ.[7] ඒ මෘගයන් සතරදෙනාම එකි-
නෙකාට වෙනස්ය.[8]
**4** “පළමුවන මෘගයා සිංහයෙකු
මෙනි.[9] ඌට රාජාලියෙකුගේ පියා-
පත් තිබුණේය.[10] මා බලා සිටිය-
දීම උගේ පියාපත් උගුලා දැමුවේය.
ඉන්පසු මෘගයාව පොළොවෙන් ඉහ-
ළට ඔසවා,[11] මිනිසෙකු මෙන් ඌට
කකුල් දෙකකින් හිටගන්න සැලැස්-
වූවේය. ඌට මිනිසෙකුගේ සිතක්ද
දෙනු ලැබුවේය.[12]
**5** “ඉන්පසු මම තවත් මෘගයෙකු
දුටුවෙමි. ඌ වලසෙකු මෙනි.[13] එක
කකුලක් ඔසවාගෙන[14] සිටි ඌ ඉළ
ඇට තුනක් තදින් හපාගෙන සිටි-
යේය. ඌට මෙසේ කියන ලදි.
‘නැඟිට බොහෝ මස් කන්න!’[15]
**6** “ඉන්පසු තවත් මෘගයෙකු මතු
වෙනවා මම දුටුවෙමි. ඌ දිවියෙකු
මෙනි.[16] උගේ පිටේ පක්ෂියෙකුගේ
පියාපත් හතරක් තිබිණ. ඌට හිස්
හතරක්ද තිබිණ.[17] පාලන බලය
උගේ අතට භාර දෙනු ලැබුවේය.
**7** “රාත්‍රියේ මම නිදාගෙන සිටියදී
භයානක පෙනුමක් ඇති තවත් මෘග-
යෙකු දර්ශනයෙන් දුටුවෙමි. ඌ අසා-
මාන්‍ය ශක්තියක් ඇති ඉතා රෞද්‍ර
මෘගයෙකි.[18] ඌට විශාල යකඩ දත්

**7 පරි.**
**1** යෙරෙ 27:7 දානි 5:1 දානි 5:30
**2** ගණන් 12:6 යෝබ් 33:15 යෙරෙ 23:28 දානි 2:19 දානි 8:1
**3** යෙසා 30:8 හබ 2:2 2තිමෝ 3:16 එළි 1:11
**4** එෆී 2:2 එෆී 6:12

**5** යෙසා 57:20; එළි 17:15; **6** දානි 7:17; **7** එළි 13:1; **8** දානි 7:19; **9** හිතෝ 30:30; දානි 2:38; යෝවෙ 1:6; **10** ද්වි 28:49; යෙරෙ 48:40; විලා 4:19; හබ 1:8; **11** දානි 4:30; **12** 2සාමු 17:10; ගීතා 9:20; **13** හිතෝ 17:12; දානි 2:39; **14** දානි 5:28; දානි 8:3; **15** යෙසා 13:18; දානි 11:2; **16** දානි 2:39; දානි 8:5; දානි 10:20; දානි 11:3; **17** දානි 8:8; දානි 11:4; **18** දානි 2:40; දානි 7:19.

තිබිණ. මෘගයා සියල්ල පොඩි කර
දමා ඒවා කා ගිල දැමුවේය. ඉතුරු වූ
දේ පාගා දැමුවේය. මීට කලින් දුටු
මෘගයන් තුන්දෙනාටම වඩා ඌ සම්-
පූර්ණයෙන්ම වෙනස්ය. ඌට අං දහ-
යක්ද තිබිණ.[1] **8** මම උගේ අං දෙස
බලා සිටියදී තව පොඩි අඟක්[2] ඒවා
අතරේ හටගන්නවා දුටුවෙමි. කලින්
තිබූ අං තුනක් උගුලා දමමින් ඒ අඟ
උඩට මතු විය. ඒ අඟට මිනිසෙකුට
මෙන් ඇස් තිබුණේය. පුරසාරම් දොඩ-
ඩන කටක්ද තිබිණ.[3]

**9** “මා බලා සිටියදී සිංහාසන ගෙ-
නැවිත් තබන ලදි.[4] පුරාතන
තැනැත්තා[5] එතැන හිඳගත්තේය.
ඔහුගේ වස්ත්‍ර හිම මෙන් සුදුය.[6] ඔහුගේ
හිසකෙස් පවිත්‍ර ලොම් මෙනි.[7] ඔහු-
ගේ සිංහාසනය වටා ගිනිදලු විහිදී
තිබිණ.[8] එහි රෝද ඇවිළෙන ගින්නක්
මෙනි.[9] **10** ඔහු වෙතින් ගිනි ජාලා-
වක් ගලා ගියේය.[10] දහසක් වර දහසක්
දෙනා ඔහුට සේවය කරමින් සිටි-
යෝය.[11] ඔහු ඉදිරියේ දසදහස් වර දස-
දහසක් දෙනා සිටගෙන සිටියෝය.[12]
විනිශ්චය මණ්ඩලය[13] හිඳගත්තෝය.
ලියවිලි දිග හරින ලදි.

**11** “කලින් මා සඳහන් කළ අඟ
පුරසාරම් දොඩන ආකාරය[14] දෙස
මම බලා සිටියෙමි. පසුව එම මෘග-
යාව මරා උගේ මළ සිරුර ඇවි-
ළෙන ගින්නට විසි කර විනාශ කරන
ලදි.[15] **12** අනික් මෘගයන්ගෙන්[16]
පාලන බලය ඉවත් කළ නමුත් උන්ට
යම් කාලයකට ජීවත් වීමට ඉඩහැරි-
යේය.[17]

**13** “රාත්‍රියේ නිදාගෙන සිටියදී අහ-
සේ වලාකුළු අතරින්[18] මනුෂ්‍ය
පුත්‍රයෙකු[19] වැනි කෙනෙකු පුරාතන
තැනැත්තා[20] වෙතට එනවා මම දර්-
ශනයෙන් දුටුවෙමි. ඔහුව පුරාතන
තැනැත්තා ඉදිරියට ගෙනෙන ලදි.[21]
**14** සියලු ජාතීන්, ගෝත්‍ර හා විවිධ
භාෂා කතා කරන මිනිසුන් ඔහුට සේ-
වය කරන පිණිස[22] රාජ්‍යයද[23] බල-
යද[24] ගෞරවයද[25] ඔහුට දෙන ලදි.
ඔහුගේ පාලනය කිසිදා නැති නොවන
සදහටම පවතින පාලනයකි. ඔහු-
ගේ රාජ්‍යය කිසිදාක විනාශ නොවන්-
නේය.[1]

**15** “දානියෙල් වන මම මේ දේවල්
දැක අතිශයින් කැලඹුණෙමි. මා දුටු
මේ දර්ශන නිසා මහත් සේ භය
වුණෙමි.[2] **16** එබැවින් මම එතැන
සිටගෙන සිටි කෙනෙකු ළඟට ගොස්
මේ සියල්ලෙහි නිවැරදි අර්ථය තෝරා
දෙන ලෙස ඉල්ලා සිටියෙමි.[3] එහි අර්-
ථය කියා දෙමින් ඔහු මට මෙසේ
කීවේය.

**17** “‘මෘගයන් හතරදෙනාගෙන්[4]
නියෝජනය කරන්නේ පොළොව
පාලනය කිරීමට සිටින රජව-
රුන් හතරදෙනෙකුවය.[5] **18** එහෙත්
අතිශ්‍රේෂ්ඨ තැනැත්තාණන්ට[6] සේවය
කරන ශුද්ධ තැනැත්තන්ට[7] රාජ්‍යය
භාර දෙනු ලැබේ.[8] ඔවුන්ට එම රාජ්‍යය
සදහටම හිමි වන්නේය. සදාකාල-
යෙන් සදාකාලයටම එය ඔවුන්ගේ
අතේ පවතිනු ඇත.’

**19** “ඉන්පසු අනික් මෘගයන්ට වඩා
වෙනස් වූ හතරවන මෘගයා ගැනද
තොරතුරු දැනගැනීමට මට උව-
මනා විය. භයානක පෙනුමක්ද යකඩ
දත් හා තඹ නියපොතුද තිබුණාවූ
ඒ මෘගයා ඌ ඉදිරියේ තිබූ සියල්ල
පොඩි කර ඒවා කා ගිල දැමුවේය.
ඉතුරුව තිබූ දේ පවා ඌ පාගා දැමු-
වේය.[9] **20** උගේ හිසේ තිබූ අං දහය
ගැනද[10] අං තුනක් උගුලා දමමින්[11]
උඩට මතු වූ අනික් අඟ ගැනද[12] දැන-
ගැනීමට මට උවමනා විය. අලුතින්
හටගත් ඒ අඟට ඇස්ද පුරසාරම් දොඩ-
ඩන කටක්ද තිබිණ.[13] එය අනික්
අංවලට වඩා විශාල විය.

**21** “මා බලා සිටියදී ඒ අඟ
ශුද්ධ තැනැත්තන්ට විරුද්ධව යුද්ධ
කර ඔවුන්ව යටත් කරගත්තේය.[14]

**7 පරි.**
**1** එළි 13:1
**2** දානි 7:24
එළි 13:11
**3** 1සාමු 2:3
ගීතා 12:3
දානි 8:25
එළි 13:5
**4** එළි 20:4
**5** ගීතා 90:2
දානි 7:13
දානි 7:22
හබ 1:12
එළි 4:2
**6** ගීතා 104:2
එළි 19:8
**7** එළි 1:14
**8** යෙසා 6:1
**9** ද්වි 9:3
හෙබ්‍රෙ 12:29
**10** ගීතා 50:3
ගීතා 97:3
**11** හෙබ්‍රෙ 1:14
**12** ද්වි 33:2
1රාජා 22:19
ගීතා 68:17
හෙබ්‍රෙ 12:22
යූද් 14
එළි 5:11
**13** ද්වි 32:36
1සාමු 2:10
ගීතා 7:11
ගීතා 50:6
දේශ 3:17
**14** දානි 7:8
දානි 7:25
දානි 8:23
**15** දානි 8:25
එළි 19:20
එළි 20:10
**16** දානි 7:3
**17** දානි 2:21
ක්‍රියා 1:7
**18** මතෙ 24:30
මතෙ 26:64
මාක් 13:26
මාක් 14:62
ලූක් 21:27
එළි 1:7
**19** මතෙ 25:31
යොහ 3:13
ක්‍රියා 7:56
පිලි 2:7
හෙබ්‍රෙ 2:14
එළි 1:13
එළි 14:14
**20** දානි 7:9
හබ 1:12
**21** හෙබ්‍රෙ 12:23
එළි 5:5
**22** උත් 49:10
**23** ලූක් 19:12
ලූක් 22:29
යොහ 3:35
**24** ගීතා 2:6
ගීතා 8:6
ගීතා 89:27
ගීතා 110:2
යෙසා 9:6
මතෙ 28:18
ලූක් 10:22
1කොරි 15:25
එෆී 1:22
එළි 3:21

**25** පිලි 2:9; **2 තීරුව** **1** ගීතා 45:6; යෙසා 9:7; දානි 2:44; ලූක් 1:33; එළි 11:15; **2** දානි 8:27; **3** දානි 12:6; **4** දානි 7:3; **5** දානි 2:39; **6** දානි 7:22; දානි 7:25; දානි 7:27; **7** ගීතා 50:5; ගීතා 149:5; 2තිමෝ 2:12; එළි 3:21; එළි 5:10; එළි 13:10; **8** මතෙ 5:5; මතෙ 19:28; ලූක් 22:29; **9** දානි 2:40; දානි 7:7; **10** දානි 7:24; එළි 13:1; **11** දානි 7:8; **12** දානි 8:9; **13** එළි 13:11; **14** දානි 8:24; දානි 12:7; එළි 11:7; එළි 13:7.

**22** එහෙත් පුරාතන තැනැත්තා[1]
එතැනට පැමිණියේය. අතිශ්‍රේෂ්ඨ
තැනැත්තාණන්ට[2] සේවය කරන
ශුද්ධ තැනැත්තන්ට ඔහුගෙන් සාධා-
රණ විනිශ්චයක් ලැබිණ. ශුද්ධ
තැනැත්තන්ගේ අතට රාජ්‍යය භාර
දීමට කාලය පැමිණියේය.[3]
**23** "ඔහු තවදුරටත් මෙසේ
කීවේය. 'හතරවන මෘගයාගෙන්
නියෝජනය කරන්නේ මෙයයි. පො-
ළොව පාලනය කිරීමට හතරවන
රාජ්‍යයක් පැමිණෙන්නේය. එය අන්
සියලු රාජ්‍යයන්ට වඩා වෙනස් වන්-
නේය. එය මුළු පොළොවම පාගා
දමා එහි ඇති සියල්ල පොඩි කර
විනාශ කරයි.[4] **24** අං දහය නම් එම
රාජ්‍යයෙන් නැඟී එන රජවරු දහදෙ-
නෙකි.[5] ඔවුන්ට පසුව තව රජ කෙ-
නෙක් නැඟී එන්නේය. ඔහු මුලින්
පැමිණි රජවරුන්ට වඩා වෙනස් වන්-
නේය.[6] ඔහු රජවරුන් තුන්දෙනෙකුව
අන්ත පරාජයට පත් කරන්නේය.[7]
**25** ඔහු මහෝත්තම දෙවිට විරුද්ධ-
වද කතා කරන්නේය.[8] අතිශ්‍රේෂ්ඨ
තැනැත්තාණන්ට සේවය කරන ශුද්ධ
තැනැත්තන්ට ඔහු දිගටම හිරිහැර
කරන්නේය.[9] කාලවල්[10] සහ නීති
පවා වෙනස් කරන්න ඔහු උත්සාහ
කරන්නේය.[11] කාලයකටද කාලවල-
ටද කාල භාගයකටද ඔවුන්ව ඔහුගේ
අතට භාර දෙනු ලැබේ.[12] **26** ඉන්-
පසු විනිශ්චය මණ්ඩලය හිඳගන්-
නෝය.[13] පාලනය ඔහුගේ අතින් පහ
කර ඔහුව සම්පූර්ණයෙන්ම විනාශ
කිරීමට ඔවුහු තීන්දු කරනු ඇත.[14]
**27** " 'රාජ්‍යයද බලයද පොළොවේ
තිබූ සියලු රාජ්‍යයන්ට හිමිව තිබූ ගෞ-
රවයද අතිශ්‍රේෂ්ඨ තැනැත්තාණන්ට
සේවය කරන ශුද්ධ තැනැත්තන්ට
දෙනු ලබන්නේය.[15] ඔවුන්ගේ රාජ්‍යය
සදහටම පවතින රාජ්‍යයකි.[16] සියලු
පාලකයෝ පවා ඔවුන්ට කීකරු වී සේ-
වය කරන්නෝය.'[17]
**28** "සිහිනයේ අර්ථය එයයි. දානි-
යෙල් වන මම ඒ දේවල් ගැන සිතා
අතිශයින් බය වුණෙමි. මා මලානික
විය. සිහිනයේ අර්ථය මම සිතෙහි
තබාගත්තෙමි."[1]

**8** දානියෙල් වන මම තවත් දර්ශ-
නයක් දුටුවෙමි.[2] මා එය දුටුවේ
බෙල්ෂසර් රජු[3] පාලනය කළ තුන්-
වන අවුරුද්දේදීය. **2** මම ඒලාම්
නම් පළාතේ[4] පිහිටි ෂූෂන්[5] මාලිගා-
වේ සිටියෙමි. එවිට මම දර්ශනය-
කින් යූලායි ගඟ[6] දුටුවෙමි. මමත්
ඒ ගඟ ළඟ සිටියෙමි. **3** මම වට-
පිට බැලූ විට ගඟ අසල බැටළු-
වෙකු[7] සිටිනවා දුටුවෙමි. ඌට අං
දෙකක් තිබිණ. අං දෙකම උසට තිබූ
නමුත් එකක් අනිකට වඩා උසය.
උස අඟ හටගත්තේ කෙටි අඟට පසු-
වය.[8] **4** බැටළුවා බස්නාහිර දෙස-
ටත් උතුරු දෙසටත් දකුණු දෙසටත්
ඇනගෙන ඇනගෙන ගියේය. ඌට
විරුද්ධව සටන් කිරීමට වෙන කිසි
සතෙකුට නොහැකි විය. ඌට ගො-
දුරු වූ කෙනෙකුව බේරාගන්න පුළු-
වන් කිසිවෙක්ද සිටියේ නැත.[9] ඌ
උද්ධච්ච ලෙස උගේම කැමැත්තට
අනුව ක්‍රියා කරමින් ඉතා බලවත් විය.
**5** මම බලාගෙන සිටියදී බස්නා-
හිර දෙසින් එළුවෙකු[10] එනවා දුටු-
වෙමි. උගේ ඇස් දෙක අතරේ විශාල
අඟක් තිබිණ.[11] ඌ අඩිය බිම නොගෑ-
වෙන තරම් මහත් වේගයකින් දුව-
ගෙන ආවේය. ඌ මුළු පොළොව
පුරාම දිව්වේය. **6** ගඟ අසල සිටි අං
දෙකක් ඇති බැටළුවා වෙතටද ඌ
මහත් කෝපයෙන් දුවගෙන ආවේය.
**7** ඌ බැටළුවා ළඟට දුව ගොස්
මහත් කෝපයෙන් ඌට ඇන උගේ අං
දෙකම බිඳ දැමුවේය. ඌට විරුද්-
ධව සටන් කිරීමට බැටළුවාට කිසි
ශක්තියක් තිබුණේ නැත. එබැවින්
ඌ බැටළුවාව බිම දමා පාගා දැමු-
වේය. බැටළුවාව ගලවාගන්න කිසි-
වෙක් සිටියේ නැත.[12]
**8** එළුවා උද්ධච්ච ලෙස ක්‍රියා කර-
මින්[13] ඉතා බලවත් විය. එහෙත් ඌ

**7 පරි.**
1 දානි 7:9; දානි 7:13; හබ 1:12
2 දානි 7:18; දානි 7:27
3 මතෙ 19:28; ලූක් 22:29; එළි 1:6; එළි 3:21; එළි 5:10; එළි 20:4
4 දානි 2:40; දානි 7:7
5 දානි 7:20; එළි 13:1; එළි 17:12
6 දානි 2:41; දානි 7:8; දානි 8:9
7 දානි 7:20
8 දානි 7:8; දානි 8:25; එළි 13:11
9 මතෙ 24:9; එළි 11:7; එළි 13:7; එළි 16:6; එළි 17:6; එළි 18:24
10 දානි 4:23; ලූක් 21:24
11 මතෙ 24:14
12 දානි 12:7; එළි 11:2; එළි 11:3; එළි 13:5
13 දානි 7:10
14 දානි 7:11
15 යෙසා 54:3; දානි 7:22; මතෙ 19:28; ලූක් 22:29; එළි 20:4
16 එළි 11:15
17 යෙසා 60:12

**2 තීරුව**
1 ලූක් 2:19

**8 පරි.**
2 දානි 7:1; දානි 7:15
3 දානි 5:1
4 උත් 10:22; යෙසා 11:11; යෙසා 21:2
5 නෙහෙ 1:1; එස්ත 2:8
6 දානි 8:16
7 යෙසා 13:17; යෙසා 21:2; යෙරෙ 51:11; දානි 7:5; දානි 8:20
8 එස්ත 1:3; යෙසා 44:28; දානි 11:2
9 යෙසා 45:1; යෙරෙ 51:12; දානි 5:30

**10** දානි 2:39; දානි 7:3; දානි 8:21; **11** දානි 11:3; **12** දානි 7:6; **13** හිතෝ 21:24; යෙසා 29:20.

බලවත් වූ විගසම උගේ විශාල අඟ
කඩා දමන ලදි. ඉන්පසු ඒ අඟ වෙනු-
වට තව විශාල අං හතරක් හට-
ගත්තේය. ඒ අං පොළොවේ සතර
දිශාවටම* විහිදී ගියේය.[1]
**9** ඒ එක් අඟකින් තව කුඩා අඟක්
මතු විය.[2] ඒ අඟ ටිකෙන් ටික බලවත්
වී දකුණු දෙසටත් නැඟෙනහිර දෙස-
ටත් අලංකාර දේශය*[3] දෙසටත් පහර
දුන්නේය. **10** එය මොන තරම් බල-
වත් වූවාද කිවහොත් ස්වර්ගය දෙස-
ටත් එය නැඟ ගියේය.[4] එය ස්වර්ගයේ
සේනාවෙන් සමහරක්ද තාරකාවලින්
සමහරක්ද[5] පොළොවට හෙළා පාගා
දැමුවේය.[6] **11** ඒ අඟ ඉතා අහංකාර
ලෙස ස්වර්ගයේ සේනාවෙහි අධිප-
තියාණන්ට[7] පවා අභියෝග කළේය.
එහි ප්‍රතිඵලයක් ලෙස, ඒ අධිපතියා-
ණන්ට දිනපතා ඔප්පු කරන පූජාව[8]
නවත්වනු ලැබීය. ස්ථිර ලෙස පිහි-
ටෙවූ ඔහුගේ ශුද්ධස්ථානය පවා පො-
ළොවට හෙළනු ලැබුවේය.[9] **12** සිදු
කළ අපරාධය[10] නිසා ඒ අඟ සේනාව
යටත් කරගත් අතර[11] දිනපතා ඔප්පු
කරන පූජාව[12] නතර කළේය. ඒ අඟ
සත්‍යය[13] පොළොවට හෙළා[14] තම
කැමැත්තට අනුව ක්‍රියා කරමින් සාර්-
ථක විය.[15]
**13** ඉන්පසු ශුද්ධ තැනැත්තෙකු[16]
කතා කරනවා මට ඇසුණේය.
එවිට ඒ තැනැත්තාගෙන් තවත් ශුද්ධ
තැනැත්තෙක් මෙසේ ඇසුවේය. "දින-
පතා ඔප්පු කරන පූජාව හා විනාශයට
හේතු වන අපරාධය[17] ගැන දුටු දර්ශ-
නයේ සිදුවීම් කොපමණ කාලයක් පුරා
දිව යයිද?[18] ශුද්ධස්ථානය හා ස්වර්-
ගයේ සේනාව කොපමණ කාලයක්
පුරා පාගා දමනු ඇද්ද?"[19] **14** එවිට
ඔහු මට මෙසේ කීවේය. "රාත්‍රි හා
දිවා කාලවල්* දෙදහස් තුන්සියයක්
පසු වන තුරු එම තත්වය පවතිනු
ඇත. ඉන්පසු ශුද්ධස්ථානය නැවත
නිසි තත්වයට ගෙනෙනු ඇත."[1]
**15** දානියෙල් වන මා දර්ශනය
බලමින් එහි අර්ථය තේරුම්ගන්න
උත්සාහ කළ විට[2] ශක්තිමත් මිනි-
සෙක් මා ඉදිරියේ පෙනී සිටි-
යේය.[3] **16** යූලායි ගඟ[4] මැදින් මට
මනුෂ්‍ය පුත්‍රයෙකුගේ හඬද ඇසිණ.
ඔහු හඬ නඟා මෙසේ කීවේය. "ගාබ්‍රි-
යෙල්,[5] මොහුට දර්ශනය තේරුම්
කර දෙන්න."[6] **17** එබැවින් ඔහු මා
සිටි තැනට ආවේය. එවිට මම බො-
හෝ සෙයින් භය වී බිම ඇද වැටු-
ණෙමි. එහෙත් ඔහු මට මෙසේ කීවේය.
"මනුෂ්‍ය පුත්‍රය,[7] දර්ශනයේ ඉටු වීම
අවසාන කාලයේදී සිදු වන බව[8]
තේරුම්ගන්න."[9] **18** ඔහු මා සමඟ
කතා කරමින් සිටියදීම මම මුණින්
අතට හැරී තද නින්දකට වැටුණෙමි.[10]
එවිට ඔහු මාව අල්ලා මට නැඟිටින්න
උදව් කළේය.[11] **19** ඔහු මට නැවත
මෙසේ කීවේය. "දෙවි තම විනිශ්චය
ප්‍රකාශ කර අවසන් වීමට පෙර සිදු වන
දේවල් මම දැන් ඔබට කියා දෙන්නම්.
මන්ද දර්ශනය ඉටු වීමට නියමිත
කාලය වන්නේ අවසාන කාලයයි."[12]
**20** "ඔබ දුටු අං දෙකක් ඇති
බැටළුවාගෙන් නියෝජනය වන්නේ
මේදිය සහ පර්සියානු රජවරුන්ය.[13]
**21** එළුවා* නම් ග්‍රීසියේ රජය.[14] උගේ
ඇස් අතරේ තිබූ විශාල අඟ නම් එම
රාජ්‍යයේ පළමුවන රජය.[15] **22** ඒ
අඟ කඩා දැමුවාට පසු ඒ වෙනුවට
හටගත් අනික් අං හතර,[16] ඔහුගේම
රාජ්‍යයෙන් බිහි වන රාජ්‍යයන් හත-
රකි. එහෙත් එම රාජ්‍යයන් ඔහු තරම්
බලවත් නොවනු ඇත.
**23** "ඔවුන්ගේ පාලන සමය අව-
සානයේදී අපරාධකරුවන්ගේ පාප-
තර ක්‍රියා පහත්ම අඩියට වැටෙනු
ඇත. එවිට සංකීර්ණ ගැටලු විසඳී-
මට හැකියාව තිබෙන ඉතා දරුණු

**8 පරි.**
**1** දානි 8:22; දානි 11:4
**2** දානි 7:8; දානි 7:20
**3** ගීතා 48:2; යෙසා 4:2; යෙසා 28:5; එස 20:6; දානි 11:16; දානි 11:45
**4** යෙසා 14:13; දානි 7:25
**5** දානි 12:3; එළි 1:20
**6** එළි 11:7
**7** දානි 8:25
**8** නික් 29:38; දානි 12:11
**9** දානි 11:31; 1කොරි 3:17; එළි 3:12; එළි 11:2
**10** ගීතා 106:6; යෙසා 44:22
**11** මතෙ 24:9; එළි 11:7; එළි 13:7
**12** ගණන් 28:23; එස්රා 3:5; හොෂෙ 14:2; හෙබ්‍රෙ 13:15
**13** යොහ 4:24
**14** යෙසා 59:14
**15** යෙරෙ 12:1
**16** 1පේතෘ 1:12
**17** දානි 12:11; මතෙ 24:15; මාක් 13:14
**18** එළි 6:10
**19** යෙසා 63:18; දානි 7:25; දානි 12:7; එළි 11:2

**2 තීරුව**
**1** යෙසා 1:27; යෙසා 45:25; යෙසා 60:17; එළි 11:11
**2** දානි 1:17
**3** දානි 7:16
**4** දානි 8:2
**5** දානි 9:21; ලූක් 1:19; ලූක් 1:26
**6** දානි 9:22
**7** එස 2:1
**8** දානි 10:14; දානි 12:4; දානි 12:9
**9** දානි 9:23
**10** දානි 10:9
**11** දානි 10:10; සෙක 4:1
**12** දානි 11:27; මතෙ 24:3
**13** දානි 7:5; දානි 8:3; දානි 11:2
**14** දානි 7:6; දානි 8:5
**15** දානි 11:3; **16** දානි 8:8; දානි 11:4.

දානි **8:8*** මූ.අ., "අහසේ සතර සුළං දෙසට." **9*** හෝ, "අලංකාරය." සමහරවිට යෙරුසලම සහ එහි පිහිටි දේවමාලිගාව මෙයින් අදහස් වූවා විය හැක. දානි 11:16, 41 බලන්න. **14*** මූ.අ., "සවස් හා උදේ කාලවල්."

දානි **8:21*** මූ.අ., "ලොම් සහිත එළුවා."

පෙනුමක් ඇති රජෙක් නැඟී සිටිනු
ඇත.[1] **24** ඔහු ඉතා බලවත් වන්-
නේය. එහෙත් ඔහු බලවත් වන්නේ
ඔහුගේම ශක්තියෙන් නොවේ.[2] ඔහු
මහත් විනාශයක් සිදු කරනු ඇත.[3]
ඔහු කරන සෑම දෙයක්ම සාර්ථක
වන්නේය. ඔහු බලවතුන්ට හා ශුද්ධ
තැනැත්තන්ට පවා හානි පමුණු-
වන්නේය.[4] **25** ඔහු කපටි නුවණින්
ක්‍රියා කරන නිසා බොහෝදෙනෙ-
කුව මුළා කරන්නේය.[5] ඔහු තමන්-
වම උසස් කරගනිමින් උද්ධච්ච ලෙස
ක්‍රියා කරන්නේය.[6] සියලුදෙනා බියක්
සැකක් නැතුව ජීවත් වන කාලය-
කදී[7] ඔහු බොහෝදෙනෙකුව විනාශ
කරන්නේය. අධිපතීන්ගෙත් අධිපති-
යාණන්ට විරුද්ධව ඔහු නැඟී සිටින්-
නේය.[8] එවිට ඔහුව විනාශ කරනු
ලබන්නේය. එහෙත් ඔහුව විනාශ
කරනු ලබන්නේ මනුෂ්‍යයෙකු විසින්
නොවේ.[9]

**26** “රාත්‍රි හා දිවා කාලවල් ගැන
ඔබ දුටු දර්ශනය සැබෑය.[10] ඔබද දර්-
ශනය ලියා මුද්‍රා කර තබන්න. මන්ද
එය ඉටු වීමට තව බොහෝ දවස් ගත
වන්නේය.”[11]

**27** මේ දේවලින් පසුව දානියෙල්
වන මම මහත් සේ වෙහෙසට පත් වී
දවස් ගණනාවක් ලෙඩින් සිටියෙමි.[12]
ඉන්පසු මම රජුගේ වැඩවල යෙදු-
ණෙමි.[13] එහෙත් මා දුටු දර්ශනය
නිසා මම කම්පනයට පත්ව සිටි-
යෙමි. දර්ශනය කිසිවෙකුට තේරුම්-
ගත නොහැකි විය.[14]

**9** මේදිය ජාතිකයෙකු වූ[15] අහෂ්වේ-
රොෂ්ගේ පුත්‍රයා වන දාරියුස්[16]
කල්දිවරුන්ගේ රාජ්‍යයේ රජකමට
පත් විය.[17] ඔහු රජකම් කළ පළමුවන
අවුරුද්දේදී **2** දානියෙල් වන මම
අනාගතවක්තෘ යෙරෙමියාගේ ලියවිලි
සෝදිසි කර බලා,[18] යෙරුසලම කො-
පමණ කාලයක් පුරා පාළුවට යන්න
ඉඩහැර තිබුණාද කියා තේරුම්ගත්-
තෙමි.[19] යෙහෝවා දෙවි යෙරෙමියාට
හෙළි කර තිබූ පරිදි එය අවුරුදු හැත්-
තෑවක් විය.[20] **3** එබැවින් මම නිරා-
හාරව සිට ගෝණි රෙදි ඇඳ, හිස මත
අළු දමාගෙන[1] සැබෑ දෙවි වන යෙ-
හෝවාට ඉතා බැගෑපත්ව[2] කන්නලව්
කළෙමි.[3] **4** මම මගේ දෙවි වන යෙ-
හෝවාට අප කළ පව් ගැන කියමින්
මෙසේ යාච්ඤා කළෙමි.[4]

“යෙහෝවා දෙවියනි, සැබෑ දෙවි
ඔබයි. ඔබ ඉතා ශ්‍රේෂ්ඨ වූ[5] ගරුබිය
ලැබීමට වටිනා දෙවි කෙනෙක්. ඔබට
ප්‍රේම කරමින් ඔබේ ආඥාවලට කීකරු
වන අයට[6] ඔබ ප්‍රේමය* නොඅඩුව
පෙන්වනවා.[7] ඔබ ඔවුන් සමඟ කළ
ගිවිසුම කිසිදා කඩ කරන්නේ නැහැ.[8]
**5** අපි ඔබට විරුද්ධව කැරලිගසමින්[9]
පව් කළා.[10] අපි ඔබේ ආඥාවලට හා
නීතිවලට විරුද්ධ වෙමින් දුෂ්ට ලෙස
ක්‍රියා කළා.[11] **6** ඔබේ සේවකයන්
වන අනාගතවක්තෘවරු ඔබේ නාම-
යෙන් අපේ රජවරුන්ටත් අධිපතීන්-
ටත් අන් සියලු වැසියන්ටත් කතා
කළා. අපේ මුතුන්මිත්තන්ටත් ඔවුන්
කතා කළා.[12] නමුත් අපි ඔවුන් කී
දේට සවන් දුන්නේ නැහැ.[13] **7** යෙ-
හෝවා දෙවියනි, ඔබ සැබවින්ම ධර්-
මිෂ්ඨයි. නමුත් අපි ඔබට ද්‍රෝහිව
කටයුතු කළා. ඔබ යූදා දේශයේ, යෙ-
රුසලමේ හා මුළු ඊශ්‍රායෙල් දේශයේ
වැසියන්ව පන්නා දමා අවට ජාතීන්-
ගේ හා දුර ඈත ජාතීන්ගේ අතට
ඔවුන්ව භාර දුන්නේ ඒ නිසයි.[14] අද
අපි ලැජ්ජාවට පත්ව සිටින්නෙත් ඒ
නිසයි.[15]

**8** “යෙහෝවා දෙවියනි, අපි ඔබට
විරුද්ධව පව් කළා. අපේ රජවරුන්ද
අධිපතීන්ද මුතුන්මිත්තන්ද ඔබට
විරුද්ධව පව් කළා. අප නින්දාවට
පත්ව සිටින්නේ අපේම පව්කාර-
කම නිසයි.[16] **9** යෙහෝවා අපේ දෙ-
වියනි, ඔබ සමාව දීමට කැමති[17]

**8 පරි.**

**1** දානි 7:8, දානි 7:11, එළි 13:11
**2** ලූක් 4:6, එළි 13:2, එළි 13:7
**3** දානි 7:25, එළි 11:18
**4** දානි 8:10, එළි 13:10, එළි 16:6
**5** දානි 7:8, එළි 13:13
**6** හිතෝ 16:18, හිතෝ 21:4
**7** යෙරෙ 22:21
**8** යෙරෙ 48:26, දානි 5:23, දානි 8:11
**9** දානි 7:26, එළි 19:20
**10** යෙසා 14:24, යෙසා 46:10, යෙසා 55:11
**11** දානි 10:14, එළි 22:10
**12** දානි 7:28, දානි 10:16
**13** දානි 2:48
**14** දානි 8:17

**9 පරි.**

**15** දානි 11:1
**16** දානි 5:31, දානි 6:1, දානි 6:28
**17** දානි 5:28, දානි 5:30
**18** 2ලේක 36:21, එස්රා 1:1, යෙරෙ 27:7, සෙක 1:12
**19** ගීතා 79:1, යෙසා 64:10, යෙරෙ 7:34, විලා 1:1
**20** යෙරෙ 25:11, යෙරෙ 29:10, සෙක 7:5

**2 තීරුව**

**1** එස්රා 8:21, එස්ත 4:3, ගීතා 35:13, ගීතා 69:10, එස 27:31
**2** 2කොරි 1:11
**3** හිතෝ 15:8, හිතෝ 15:29, යෙරෙ 33:3
**4** 1රාජා 8:47
**5** නෙහෙ 1:5
**6** ද්වි 5:10
**7** නික් 34:6, ගීතා 40:11
**8** ද්වි 7:9
**9** නෙහෙ 9:26, නෙහෙ 9:33
**10** එස්රා 9:6, ගීතා 106:6

**11** යෙරෙ 3:25; **12** එස්රා 9:7; නෙහෙ 9:32; **13** 2රාජා 17:14; 2ලේක 36:16; යෙරෙ 7:13; යෙරෙ 29:19; යෙරෙ 44:5; **14** ලෙවි 26:33; ද්වි 4:27; ද්වි 28:41; 2රාජා 17:6; යෙසා 11:11; **15** ගීතා 44:15; යෙරෙ 2:26; යෙරෙ 3:25; **16** ගීතා 106:6; යෙරෙ 14:20; විලා 3:42; **17** ගණන් 14:18; ගීතා 86:5.

දානි **9:4*** හෝ, “ලැදි ප්‍රේමය.”

දයාවන්ත දෙවි කෙනෙක්.[1] නමුත්
අපි ඔබට විරුද්ධව කැරලිගැසුවා.[2]
**10** යෙහෝවා අපේ දෙවියනි, අපි
ඔබේ හඬට සවන් දුන්නේ නැහැ.
ඔබේ සේවකයන් වන අනාගතවක්-
තෘවරුන් මාර්ගයෙන් ඔබ දුන් නීතිව-
ලට අනුව අපි ජීවත් වුණේ
නැහැ.[3] **11** මුළු ඊශ්‍රායෙල් ජාතියම
ඔබේ නීතිය ගණනකටවත් නො-
ගෙන ඔබට අකීකරු වුණා. ඔවුන්
ඔබට සවන් නොදී ඔබව අත්හැර
ගියා.[4] එබැවින් ඔබේ සේවකයා වූ
මෝසෙස්ට ඔබ දුන් නීතියේ සඳ-
හන් සියලුම ශාප අප පිටට පැමි-
ණියා.[5] දිවුරුමකින් ස්ථිර කළ ඒ
සියල්ල අප පිටට පැමිණීමට ඔබ ඉඩ-
හැරියේ, අපි සැබෑ දෙවි වන ඔබට
විරුද්ධව පව් කළ නිසයි. **12** ඔබ
අපිටත් අපේ පාලකයන්ටත්[6] අන-
තුරු ඇඟවූ ලෙසම මහත් විපතක් අප
පිටට ගෙන ආවා.[7] යෙරුසලමේ සිදු වූ
ඒ විපත තරම් දරුණු විපතක් අහ-
සින් යට වෙන කිසිම තැනක සිදු
වී නැහැ.[8] **13** මෝසෙස්ගේ නීතියේ
ලියා තිබෙන ලෙසම[9] සෑම විපතක්ම
අප පිටට පැමිණියා.[10] යෙහෝවා අපේ
දෙවියනි, ඒ සියල්ල සිදු වූ පසුත් පසු-
තැවිලි වී ඔබේ අනුමැතිය දිනාගැනී-
මට අපි කිසිවක් කළේ නැහැ.[11] අපේ
වැරදි මාර්ගවලින් ඉවත් වෙන්නවත්
ඔබේ විශ්වාසවන්තකම අගය කරන්-
නවත් අපි පෙලඹුණේ නැහැ.[12]

**14** "යෙහෝවා දෙවියනි, ඔබ සුදුසු
කාලය පැමිණෙන තෙක් බලා සිට
විපත්තිය අප පිටට ගෙනාවා.[13] යෙ-
හෝවා දෙවියනි, ඔබගේ සෑම ක්‍රියා-
වක්ම ධර්මිෂ්ඨයි. නමුත් අපි ඔබේ
හඬට සවන් දුන්නේ නැහැ.[14]

**15** "යෙහෝවා දෙවියනි, ඔබේ
මහත් බලය යොදාගෙන ඔබේ සෙ-
නඟව ඔබ ඊජිප්තු දේශයෙන් පිටතට
ගෙනාවා.[15] ඔබේ නාමය ගෞරව-
යට පත් කළ ඒ බලවත් ක්‍රියාව අද
වන තුරුත් කිසිවෙකුට අමතක වී
නැහැ.[16] නමුත් අපි දුෂ්ට ලෙස ක්‍රියා
කරමින් පව් කළා.[17] **16** අනේ යෙ-
හෝවා දෙවියනි, ඔබේ නුවර වන
යෙරුසලම හා ඔබේ සෙනඟ අවට
ජාතීන්ගේ නින්දා අපහාසවලට ලක්
වී තිබෙනවා.[1] අපිත් අපේ මුතුන්-
මිත්තනුත් පව් කළ නිසයි ඒ දේ සිදු
වුණේ.[2] ඔබ සැමදා ධර්මිෂ්ඨ ලෙස
ක්‍රියා කරනවා.[3] එබැවින් දැනුත් ඔබේ
කෝපය පහ කර ඔබේ ශුද්ධ කන්ද
වූ[4] ඔබේ නුවර වන යෙරුසලමට
කරුණාව පෙන්වන්න. **17** අපේ දෙ-
වියනි, දැන් ඔබේ සේවකයාගේ යාච්-
ඤාවටත් කන්නලව්වලටත් සවන්
දෙන්න. පාළුවට ගොස් තිබෙන ඔබේ
ශුද්ධස්ථානය දෙස[5] නැවත බලා
කරුණාව පෙන්වන්න.[6] අනේ යෙ-
හෝවා දෙවියනි, ඔබේ නාමය උදෙසා
එසේ කරන්න. **18** මාගේ දෙවියනි,
අපේ කන්නලව්වලට සවන් දෙන්න.[7]
ඔබේ නාමය දරන අපේ නුවර[8] පාළු-
වට ගොස් තිබෙන ආකාරය දෙස
බලන්න. අපි ඔබ ඉදිරියේ මෙසේ
කන්නලව් කරන්නේ අපේ ධර්මිෂ්ඨ
ක්‍රියා නිසා නොවෙයි.[9] නමුත් ඔබ
මහත් සේ අනුකම්පාව පෙන්වන දෙවි
කෙනෙකු වන නිසයි.[10] **19** අනේ
යෙහෝවා දෙවියනි, අපිට සවන්
දෙන්න.[11] අනේ යෙහෝවා දෙවියනි,
අපිට සමාව දෙන්න.[12] මන්ද මේ සෙ-
නඟත් මේ නුවරත් ඔබේ නාමය දර-
නවා.[13] යෙහෝවා, මාගේ දෙවියනි,
දැන් ප්‍රමාද නොවී[14] ඔබේ නාමය වෙ-
නුවෙන් ක්‍රියා කරන්න."[15]

**20** මම යාච්ඤාවෙන් මගේ පාප[16]
හා මගේ සෙනඟ වන ඊශ්‍රායෙල්වරුන්-
ගේ පාප[17] ගැන මෙසේ ප්‍රකාශ කරමින්
සිටියෙමි. මගේ දෙවි වන යෙහෝවා
ඉදිරියේ ඔහුගේ ශුද්ධ කන්ද[18] වෙ-
නුවෙන් කන්නලව් කළෙමි. **21** මා
යාච්ඤා කර අවසන් වෙන්නත් කලින්
ගාබ්‍රියෙල්*[19] මා ඉදිරියට ආවේය. ඔහු
මා ළඟට ආවේ සැන්දෑවේ නැගි පූජාව
ඔප්පු කරන වේලාවේදීය.[20] මා මීට

**9 පරි.**
**1** නික් 34:6; නෙහෙ 9:17
**2** නෙහෙ 9:26
**3** 2රාජා 17:13; එස්රා 9:10
**4** යෙසා 1:4; යෙරෙ 8:10
**5** ද්වි 28:15; ද්වි 31:17
**6** හොෂෙ 7:7
**7** විලා 2:17
**8** යෙරෙ 1:14; යෙරෙ 39:8
**9** ලෙවී 26:16; ද්වි 28:15
**10** විලා 1:1
**11** යෙසා 9:13; යෙසා 64:7; යෙරෙ 2:30; යෙරෙ 5:3
**12** ගීතා 25:10; ගීතා 117:2
**13** යෙරෙ 44:2
**14** නෙහෙ 9:33
**15** නික් 6:1; නික් 32:11
**16** නික් 9:16; නෙහෙ 9:10; ගීතා 106:8
**17** දානි 9:5

**2 තීරුව**
**1** 1රාජා 9:7; ගීතා 79:4; යෙරෙ 24:9
**2** ලෙවී 26:39; ගීතා 106:6
**3** ගීතා 9:8; ගීතා 31:1; ගීතා 89:14; යෙසා 26:9
**4** ගීතා 48:2; යෙසා 66:20; යෝවෙ 3:17
**5** යෙසා 64:10; විලා 5:18
**6** ගණන් 6:25; ගීතා 4:6; ගීතා 67:1
**7** 1රාජා 8:29; ගීතා 17:6
**8** යෙරෙ 7:10; යෙරෙ 25:29
**9** යෙසා 64:6; යෙරෙ 14:7
**10** ද්වි 13:17; ගීතා 25:6; ගීතා 102:13; යෙසා 54:7
**11** 1රාජා 8:30
**12** ගණන් 14:19
**13** යෙසා 63:19; යෙරෙ 14:9
**14** ගීතා 79:8
**15** 2ලේක 6:21
**16** ගීතා 32:5; දේශ 7:20
**17** යෙසා 6:5
**18** ගීතා 87:1; යෙසා 56:7; සෙක 8:3

**19** දානි 8:16; ලූක් 1:19; **20** 1රාජා 18:36; එස්රා 9:5.

දානි **9:21*** මූ.අ., "ගාබ්‍රියෙල් නම් මිනිසා."

පෙර දුටු දර්ශනයේ විඩාවට පත්ව
සිටියදී මා ඉදිරියට ආවෙත් ඔහුමය.[1]
**22** ඔහු මට සියල්ල පැහැදිලිව තේ-
රුම් කර දෙමින් මෙසේ කීවේය.

“දානියෙල්, ඔබට සියල්ල පැහැදි-
ලිව අවබෝධ කර දෙන පිණිස
මම ආවෙමි.[2] **23** ඔබ කන්නලව්
කරන්න පටන්ගත් මොහොතේම මට
පණිවිඩයක් ලැබිණ. මම ඒ ගැන
ඔබට දැන්වීමට ආවෙමි. මන්ද ඔබ
බොහෝ ප්‍රේම ලත් තැනැත්තෙකි.[3]
ඉතින් මා දැන් කියන්න යන දේට
හොඳින් සවන් දෙන්න.[4] ඔබ දකින දේ
හොඳින් තේරුම්ගන්න.

**24** “ඔබේ සෙනඟ[5] හා ඔබේ ශුද්ධ
නුවර[6] වෙනුවෙන් සති හැත්තෑවක්
නියම කර තිබේ. එම කාලය නියම
කර තිබෙන්නේ අපරාධ තුරන් කිරී-
මට,[7] පාපය ඉවත් කිරීමට,[8]
වැරදිවලට සමාව ලබා දීමට[9] හා
ධර්මිෂ්ඨකම සදහටම පිහිටුවීමටයි.[10]
දර්ශනය හා අනාවැකිය ස්ථිර කිරී-
මට[11] හා අතිශුද්ධස්ථානය කැප කිරී-
මටද එම කාලය වෙන් කර තිබේ.[12]
**25** යෙරුසලම යළි පිහිටුවා ගොඩ-
නැඟීමට[13] නියෝගයක් නිකුත් කරන
අවස්ථාවේ සිට[14] නායකයා වන[15]
මෙසියස්ගේ[16] පැමිණීම දක්වා සති
හතක්ද සති හැටදෙකක්ද ගත වන
බව අවබෝධ කරගන්න.[17] ප්‍රධාන
මංසන්ධියක්ද අගලක්ද ඇතුව දුෂ්කර
කාලයකදී නුවර නැවත ගොඩනඟනු
ලබන්නේය.

**26** “සති හැටදෙක අවසන් වූ පසු
මෙසියස්ව මරා දමනු ලබන්නේය.[18]
ඔහුට අයිති කිසිම දෙයක් ඉතුරු වන්-
නේ නැත.[19]

“මතු පැමිණෙන පාලකයෙකුගේ
යටත්වැසියෝ නුවර හා ශුද්ධස්ථා-
නය[20] විනාශ කරන්නෝය.[21] ශුද්ධස්-
ථානය ජලගැල්මකට හසු වී විනාශ වී
යන්නේය. අවසානය දක්වාම යුද්ධ
පවතින්නේය. නියම කර තිබෙන ලෙ-
සම එය විනාශ වී පාළුවට යන්නේය.[22]

**27** “ඔහු බොහෝදෙනෙකු උදෙසා
සතියක් පුරා[23] ගිවිසුමට බැඳී සිටින්-
නේය.[1] සතිය මැදදී සත්ව පූජා හා
තෑගි පූජා ඔප්පු කිරීම ඔහු නවත්වන්-
නේය.[2]

“විනාශය සිදු කරන තැනැත්තා
පිළිකුල් දේවල පියාපත් මත නැඟ
එන්නේය.[3] විනාශ කරනු ලබන දේට
නියම කළ ලෙසම සිදු වන්නේය. එය
මුළුමනින්ම විනාශ වනු ඇත.”[4]

**10** පර්සියාවේ රජු වන සයිරස්
පාලනය කළ තුන්වන අවු-
රුද්දේදී[5] බෙල්ටෂසර්[6] ලෙස හැඳින්වූ
දානියෙල්ට යම් කාරණයක් හෙළි
කරන ලදි. හෙළි කරන ලද දේ සත්‍ය-
යකි. එය මහා යුද්ධයක් ගැනය.[7] දර්-
ශනය හා හෙළි කරන ලද කාරණා
දානියෙල් හොඳින් තේරුම්ගත්තේය.[8]

**2** ඒ දවස්වලදී දානියෙල් වන මම
සති තුනක් පුරා වැලපෙමින් සිටි-
යෙමි.[9] **3** ඒ සති තුන සම්පූර්ණ වන
තුරු මම ප්‍රණීත ආහාර කෑවේවත් මස්
හෝ වයින් කටේ තිබ්බේවත් නැත.
මගේ ඇඟේ තෙල් ආලේප කරගත්-
තේද නැත.[10] **4** පළමුවන මාසයේ
විසිහතරවනදා මා හිද්දෙකෙල්* නම්
මහ ගඟ[11] අසල සිටියදී, **5** ලිනන්
වස්ත්‍රයක් ඇඳගෙන සිටි[12] මිනිසෙකු
මා ඉදිරියේ සිටිනවා මම දුටුවෙමි.
උෆාස්හි පවිත්‍ර රනින් සෑදූ[13] පටියක්ද
ඔහුගේ ඉණ වටා තිබිණ.[14] **6** ඔහු-
ගේ ශරීරය ක්‍රිසොලයිට් මැණිකක්
මෙන්ද[15] මුහුණ විදුලිය මෙන්ද[16] ඇස්
ගිනිදලු මෙන්ද විය.[17] ඔහුගේ අත පය
දිලිසෙන තඹ මෙන්ද[18] කටහඬ ජන
සමූහයකගෙන් නික්මෙන හඬ මෙන්ද
විය. **7** ඒ දර්ශනය දුටුවේ දානියෙල්
වන මා පමණි. මා සමඟ සිටි අනික්
පුරුෂයෝ එය දුටුවේ නැත.[19] එහෙත්

**9 පරි.**
**1** දානි 8:1
**2** දානි 8:15
**3** දානි 10:11 දානි 10:19
**4** හිතෝ 2:3
**5** නික් 33:16
**6** නෙහෙ 11:1 ගීතා 87:3 යෙසා 52:1
**7** යෙසා 61:1
**8** යෙරෙ 31:34 ලූක් 1:77 රෝම 6:18 හෙබ්‍රෙ 9:26
**9** රෝම 3:25 2කොරි 5:19 1යොහ 2:2 1යොහ 4:10
**10** යෙසා 53:11 යෙසා 61:11 රෝම 1:17
**11** යොහ 3:33 2කොරි 1:20
**12** හෙබ්‍රෙ 9:7 හෙබ්‍රෙ 9:24
**13** නෙහෙ 6:15
**14** නෙහෙ 2:5
**15** 1ලේක 5:2 යෙසා 55:4 දානි 11:22 මතෙ 23:10 යොහ 1:49
**16** 1සාමු 2:10 ගීතා 2:2 ලූක් 17:21 යොහ 1:41
**17** ලූක් 3:1
**18** ගීතා 22:15 යෙසා 53:8 යෙසා 53:12 මතෙ 26:2 ලූක් 24:26 1කොරි 15:3
**19** මාක් 9:12
**20** මතෙ 24:15
**21** ලූක් 19:43 ලූක් 21:20
**22** මතෙ 24:7 ලූක් 21:22 ලූක් 21:24
**23** මතෙ 3:9 මතෙ 10:6 මතෙ 15:24 යොහ 19:15

**2 තීරුව**
**1** උත් 15:18 උත් 17:7 ලූක් 1:55
**2** මතෙ 27:51 2කොරි 5:17 හෙබ්‍රෙ 9:12 හෙබ්‍රෙ 10:10
**3** මාක් 13:14
**4** දානි 7:7 දානි 7:23 ලූක් 21:20

**10 පරි.** **5** එස්රා 1:1; යෙසා 45:1; දානි 1:21; දානි 6:28; **6** දානි 1:7; දානි 4:8; **7** දානි 10:13; දානි 11:2; **8** දානි 1:17; **9** යෙරෙ 9:1; දානි 9:3; **10** 2සාමු 14:2; **11** උත් 2:14; **12** දානි 12:6; එළි 19:8; එළි 19:14; **13** යෙරෙ 10:9; **14** යෙසා 11:5; එළි 1:13; **15** නික් 28:20; එස 1:16; එළි 21:20; **16** එස 1:14; මතෙ 17:2; **17** එළි 1:14; එළි 2:18; **18** එස 1:7; එළි 1:15; **19** 2රාජා 6:17; ක්‍රියා 9:7; ක්‍රියා 22:9.

**දානි 10:4*** හෙබ්‍රෙව් භාෂාවෙන් ටයිග්‍රීස් ගඟ හඳුන්වන්නේ මේ නමිනි.

ඔවුහු මහත් සේ භය වී එතැනින් පලා
ගොස් සැඟවුණෝය.
**8** ඒ නිසා මම තනියෙන් එතැන
සිටියෙමි. දර්ශනය දුටු පසු මගේ ශක්-
තිය හීන වී ඇඟ සම්පූර්ණයෙන්ම
පණ නැතුව ගියේය. මගේ මුහුණද
මලානික විය.[1] **9** එවිට ඔහු කතා
කරන හඬ මට ඇසුණේය. ඔහුගේ
කටහඬ ඇසෙන විට මම මුණින් අතට
බිම වැටී[2] තද නින්දකට වැටුණෙමි.[3]
**10** පසුව යමෙක් මාව අල්ලා[4] නින්-
දෙන් ඇහැරුවේය. ඔහු මට නැඟි-
ටින්න උදව් කළේය. මම දණ
ගසාගෙන අත් දෙක බිම තබාගත්-
තෙමි. **11** ඉන්පසු ඒ තැනැත්තා
මට මෙසේ කීවේය.

"දානියෙල්, ඔබ බොහෝ ප්‍රේම ලත්
තැනැත්තෙකි.[5] ඔබ වෙතට මාව එවා
තිබෙන්නේ ඒ නිසාය. ඉතින් දැන්
නැඟිටින්න. මා ඔබට කියන්න යන
දේ හොඳින් තේරුම්ගන්න උත්සාහ
කරන්න."[6]

ඔහු මට එසේ කී පසු මම භයෙන්
වෙවුලමින් සිටගත්තෙමි.

**12** ඔහු මට දිගටම කතා කර-
මින් මෙසේ කීවේය. "භය වෙන්න
එපා[7] දානියෙල්. ඔබ මේ කාරණා
පැහැදිලිව තේරුම්ගන්නා පිණිස
යටහත්පහත් සිතක් ඇතුව දෙවිට
කන්නලව් කළෙහිය.[8] ඔබ කන්නලව්
කරන්න පටන්ගත් දවසේම[9] දෙවි
ඔබට සවන් දුන්නේය. මාව ඔබ වෙ-
තට එවා තිබෙන්නෙත් ඒ නිසාය.[10]
**13** එහෙත් පර්සියානු රාජධානියේ[11]
අධිපතියා[12] දවස් විසිඑකක් මුළුල්-
ලේම මට විරුද්ධව නැඟී සිටියේය.[13]
එවිට අධිපතීන්ගේ ප්‍රධානියෙකු[14] වන
මිකායෙල්*[15] එතැනට ඇවිත් මට
උදව් කළේය. ඒ කාලය පුරාම
මම පර්සියාවේ රජවරුන් ළඟ රැඳී
සිටියෙමි.[16] **14** මා මෙතැනට ආවේ
අන්තිම දවස්වලදී[17] ඔබේ සෙනඟට[18]
සිදු වන දේ ඔබට තේරුම් කර දෙන
පිණිසයි. මන්ද මේ දර්ශනය[1] අනාග-
තය පිළිබඳවය."[2]
**15** ඔහු මා සමඟ මෙසේ කතා
කරමින් සිටියදී මම වචනයක්වත්
නොකියා බිම බලාගෙන සිටියෙමි.[3]
**16** එවිට මනුෂ්‍ය පුත්‍රයෙකුගේ පෙනුම
ඇති කෙනෙක් ඇවිත් මගේ තොල්
ස්පර්ශ කළේය.[4] ඉන්පසු මා ඉදිරි-
යේ සිටි තැනැත්තාට කතා කර මම
මෙසේ කීවෙමි.[5] "මාගේ ස්වාමීනි,[6] දර්-
ශනය නිසා මම හොඳටම භය වී
ගැහෙන්න පටන්ගත්තා. මගේ ඇඟ
සම්පූර්ණයෙන්ම පණ නැතුව ගියා.[7]
**17** මාගේ ස්වාමීනි, ඔබේ සේවකයා
වන මා එවැනි තත්වයක සිටියදී ඔබ
සමඟ කතා කරන්නේ කොහොමද?[8]
මේ මොහොත වන තුරුම මගේ ඇඟට
කිසි ශක්තියක් තිබුණේ නැහැ. මා
හුස්ම ගත්තෙත් හරිම අමාරුවෙන්."[9]
**18** එවිට මනුෂ්‍ය පුත්‍රයෙකුගේ
පෙනුම ඇති තැනැත්තා මා
පිට අත තබා නැවත මාව ශක්-
තිමත් කළේය.[10] **19** ඉන්පසු ඔහු
මට මෙසේ කීවේය. "බොහෝ ප්‍රේම
ලත් තැනැත්ත,[11] ඔබට සමාදා-
නය ලැබේවා![12] භය නොවන්න.[13]
ධෛර්යය උපදවාගෙන ශක්තිමත්ව
ඉන්න."[14] ඔහු කතා කළ විගසම
මම ශක්තිය උපදවාගෙන මෙසේ
කීවෙමි. "මාගේ ස්වාමීනි, ඔබ මාව
ශක්තිමත් කළා.[15] එබැවින් දැන්
කතා කරන්න."[16] **20** එවිට ඔහු මට
මෙසේ කීවේය.

"මා ඔබ වෙතට ආවේ ඇයි කියා
ඔබ දන්නවාද? මම ආපසු පර්සියාවේ
අධිපතියා සමඟ සටන් කිරීමට යන්-
නෙමි.[17] මා හැරී යද්දී ග්‍රීසියේ අධිපති-
යාද පැමිණෙන්නේය.[18] **21** එහෙත්
ඊට කලින් සත්‍ය වූ ලියවිල්ලේ
සඳහන් වන දේ මම ඔබට කියා
දෙන්නෙමි.[19] ඔබේ සෙනඟව රැක-
බලා ගන්නා අධිපතියා වන[20] මිකා-
යෙල් හැර මේ සටනේදී මට උපකාර
කරන්න වෙන කවුරුත් නැත.[21]

---

**දානි 10:13*** තේරුම, "දෙවි වැනි තවත් කෙනෙක් සිටීද?"

**21** දානි 10:13; යූද් 9; එළි 12:7.

---

**10 පරි.**

**1** දානි 7:28; දානි 8:27; හබ 3:16; මතෙ 17:6
**2** දානි 8:18
**3** උත් 15:12; යෝබ් 33:15
**4** යෙරෙ 1:9; දානි 9:21; එළි 1:17
**5** හිතෝ 15:9; දානි 10:19
**6** දානි 9:22
**7** යෙසා 35:4; එළි 1:17
**8** දානි 9:3
**9** 1රාජා 8:49; ක්‍රියා 10:4
**10** හිතෝ 15:8; හිතෝ 15:29; දානි 9:23
**11** එස්රා 4:5; දානි 11:2
**12** එෆි 6:12; එළි 13:4
**13** 1තෙස 2:18
**14** යොහ 17:5; කොලො 2:10; 1පේතෘ 3:22
**15** දානි 10:21; දානි 12:1; යූද් 9; එළි 12:7
**16** දානි 6:28
**17** දානි 2:28
**18** ගලා 3:29; ගලා 6:16

**2 තීරුව**

**1** යෙසා 46:10
**2** දානි 8:17; දානි 8:26; දානි 12:4
**3** දානි 8:18
**4** යෙසා 6:7; යෙරෙ 1:9
**5** එස 33:22
**6** යොෂු 5:14; දානි 12:8
**7** දානි 10:8
**8** විනි 6:22
**9** යෙසා 6:5
**10** දානි 10:10
**11** දානි 9:23
**12** ලූක් 24:36
**13** විනි 6:23; එළි 1:17
**14** යෙසා 35:4; හග් 2:4; සෙක 8:9; 1කොරි 16:13
**15** ගීතා 138:3
**16** 1සාමු 3:10
**17** දානි 10:13
**18** දානි 7:6; දානි 8:5; දානි 11:3
**19** යෙසා 43:9; ආමො 3:7
**20** දානි 12:1

**11** “මමද ඔහුව ශක්තිමත් කරන
පිණිසත් ඔහුට උපකාර
කරන පිණිසත් ඔහු සමඟ සිටියෙමි.
මා ඔහුගේ උපකාරයට සිටියේ මේදිය
ජාතික[1] දාරියුස් රජකම් කළ පළමු-
වන අවුරුද්දේදීය. **2** මම දැන් සත්‍ය
තොරතුරු ඔබට හෙළි කරන්නෙමි.[2]
“පර්සියාවේ රජවරු තුන්දෙනෙක්
නැඟී සිටින්නෝය.[3] එහි හතරවන
රජ[4] අනික් සියලුම රජවරුන්ට වඩා
විශාල ධන සම්භාරයක් රැස් කර-
ගෙන ශක්තිමත් වන්නේය.[5] ඉන්පසු
ඔහු ප්‍රමාද නොවී ග්‍රීසියේ රාජධානි-
යට[6] විරුද්ධව කටයුතු කරන්නේය. ඒ
සඳහා ඔහු තමා සතු සියල්ලම යොද-
වනු ඇත.
**3** “එවිට බලවත් රජෙක් නැඟී
සිටිනු ඇත. ඔහු තමා කැමති ලෙස
ක්‍රියා කරමින්[7] ඉතා බලවත් රාජ්‍ය-
යක් පිහිටුවන්නේය.[8] **4** එහෙත් ඔහු
බලවත් වූ පසු[9] ඔහුගේ රාජ්‍යය බිඳ
වැටී පොළොවේ සතර දිශා දෙසට*[10]
බෙදී යනු ඇත. එම රාජ්‍යය ඔහුගෙන්
පැවත එන්නන්ගේ අතට පත් වන්-
නේ නැත.[11] එය ඔවුන්ගෙන් උදුරා
දමා වෙනත් සෙනඟකට දෙනු ලැබේ.
එහෙත් ඔවුන්ගේ පාලනය ඔහුගේ
පාලනය තරම් බලවත් නොවන්-
නේය.
**5** “ඔහුගේ අධිපතියෙකුව සිටි දකු-
ණේ රජ ඉතා බලවත් වන්නේය.
එහෙත් ඔහු* ඒ රජුට වඩා බලවත් වී
ඔහුව යටත් කරගන්නේය.
**6** “අවුරුදු කිහිපයකට පසුව ඒ දෙ-
දෙනා එකිනෙකා සමඟ ගිවිසුමක්
ඇති කරගන්නෝය. දකුණේ රජුගේ
දුව උතුරේ රජු වෙතට පැමිණ ඔහු
සමඟ ගිවිසුමක් ඇති කරගන්නීය.
නමුත් ඇගේ බලය* දිගටම පවතින්-
නේ නැත.[12] ඔහුද සාර්ථක නොවන්-
නේය. ඔහුගේ බලයද පහ කරනු ඇත.
ඇයව පාවා දෙනු ලබන අතර ඇය
සමඟ පැමිණි අයත් ඇගේ පියාත්
ඇයව බලවත් කළ තැනැත්තාත්
වැටී යන්නෝය. **7** ඇගේම පවුලේ
කෙනෙක්[1] ඔහුගේ තැන ගන්නේය.*
ඒ රජ යුධ හමුදාවක් වෙතට ගොස්
උතුරේ රජුගේ බලකොටුවට පහර දී
ඔවුන්ව යටත් කරගන්නේය. **8** ඒ
රජ ඔවුන්ගේ දෙවිවරුන්ද[2] දේවතා
රූපද ආකර්ෂණීය වූ රන් හා රිදී භාණ්-
ඩද වහලුන්ද රැගෙන ඊජිප්තු දේශයට
පැමිණෙන්නේය. අවුරුදු කිහිපයකට
ඔහු උතුරේ රජුට විරුද්ධව නැඟී නො-
සිටිනු ඇත.
**9** “ඒ රජු දකුණේ රජුගේ රාජධා-
නිය දෙසට යන නමුත් ඔහු ආපසු
ඔහුගේ දේශයටම හැරී යන්නේය.
**10** “ඔහුගේ* පුත්‍රයෝ සටනට
සූදානම් වෙමින් විශාල හමුදාවක් රැස්
කරගන්නෝය. ඔවුන්ගෙන් එක් කෙ-
නෙක්# ගංවතුරක් මෙන් වේගයෙන්
ඉදිරියට ගොස් මුළු ප්‍රදේශයම යටත්
කරගන්නේය. ඔහු ආපස්සට හැරී
ඔහුගේ බලකොටුව දක්වාම සටන්
කරමින් යන්නේය.
**11** “දකුණේ රජ ඉමහත් කෝ-
පයෙන් ඉදිරියට ගොස් උතුරේ රජු
සමඟ සටන් කරනු ඇත. ඔහුද විශාල
සේනාවක් එක් රැස් කරගෙන ඒ රජු
ඉදිරියට යන්නේය. එහෙත් ඒ රජු-
ගේ අතින් සේනාව පරාජයට පත්
වන්නෝය.[3] **12** සේනාව පහව යනු
ඇත. ඔහුගේ සිත උඩඟු වන්නේය.[4]
ඔහු දසදහස් ගණන් සෙනඟ විනාශ
කරන්නේය. එහෙත් ඔහු තම බලය
තහවුරු කරගන්නේ නැත.
**13** “උතුරේ රජ පෙරට වඩා විශාල
සේනාවක් රැස් කරගෙන නැවත ඉදි-
රියට එනු ඇත. අවුරුදු කිහිපයක්
ගෙවුණු පසු ඔහු විශාල යුධ හමු-
දාවක්ද[5] වස්තු සම්භාරයක්ද ඇතුව
පැමිණෙන්නේය.[6] **14** ඒ කාලයේදී

**11 පරි.**
1 දානි 5:31, දානි 9:1
2 හිතෝ 22:21
3 එස්රා 4:5
4 එස්රා 4:6
5 එස්ත 1:1
6 උත් 10:2, උත් 10:4, යෙසා 66:19, දානි 8:21, සෙක 9:13
7 දානි 5:19
8 දානි 7:6, දානි 8:5, දානි 8:21
9 ගීතා 37:35
10 එස 12:14, එස 17:21
11 දේශ 4:8
12 යෝබ් 38:15

**2 තීරුව**
1 යෝබ් 14:7
2 යෙසා 37:19, යෙසා 43:10
3 දේශ 9:11
4 2රාජා 14:10, 2ලේක 26:16, හිතෝ 16:18, එස 28:2, දානි 5:20
5 2රාජා 6:15
6 1සාමු 25:13

**දානි 11:4*** මූ.අ., “අහසේ සතර සුළං දෙසට.” **5*** එනම්, උතුරේ රජ. **6*** මූ.අ., “හස්තයේ බලය.”

**දානි 11:7*** මූ.අ., “ඇගේ මුල්වලින් අංකුරයක් දලු ලන්නේය. එම අංකුරය ඔහුගේ තැන ගන්නේය.” ‘ඔහුගේ’ කියා සඳහන් වන්නේ දකුණේ රජු ගැනයි. **10*** එනම්, උතුරේ රජුගේ. **10#** මූ.අ., “ඔහු.”

බොහෝදෙනෙක් දකුණේ රජුට විරුද්-
ධව නැඟී සිටිනු ඇත.
“ඔබේ සෙනඟ අතරින් දාමරිකයන්
නැඟී සිට දර්ශනයක් ඉටු කිරීමට
වෑයම් කරන නමුත්[1] ඔවුහු අසාර්ථක
වන්නෝය.[2]
**15** “උතුරේ රජ ඇවිත් බලකොටු
සහිත නුවරක් වටා පවුරක් ගොඩ-
නඟා[3] එය අල්ලාගන්නේය. එහෙත්
ඔහුට විරුද්ධව නැඟී සිටීමට දකු-
ණේ රජුට නොහැකි වනු ඇත. මන්ද
ඔහුගේ බලය* හීන වන්නේය. ඔහු-
ගේ හොඳම සටන්කරුවෝ පවා දුබල
වන්නෝය. සටන් කිරීමට ඔවුන්ට
කිසි ශක්තියක් නොතිබෙනු ඇත.
**16** ඒ රජුට* විරුද්ධව සටන් කරන
තැනැත්තා තම කැමැත්තට අනුව
ක්‍රියා කරන්නේය. ඔහුට විරුද්ධව
නැඟී සිටින්න කිසිවෙකුට නොහැක.
අලංකාර දේශය තුළද ඔහු තම
බලය තහවුරු කරගන්නේය.[4] විනාශ
කිරීමට ඔහුට බලය ලැබෙනු ඇත.[5]
**17** ඔහු අධිෂ්ඨානපූර්වකව[6] තම මුළු
රාජධානියේම යුධ බලය රැස් කර-
ගෙන ඉදිරියට යන නමුත්[7] අවසාන-
යේදී ඔහු ඒ රජු සමඟ ගිවිසුමක් ඇති
කරගැනීමට පියවර ගන්නේය.[8] දිය-
ණියක විනාශ කිරීමට ඔහුට අවසර
දෙනු ඇත. ඇය දිගටම ඔහුට පක්ෂව
නොසිටින බැවින් ඇය සාර්ථක නො-
වන්නීය.[9] **18** ඔහු නැවත හැරී වෙර-
ළබඩ තීරය දෙසට ගමන් කරමින්[10]
බොහෝ ප්‍රදේශ අල්ලාගන්නේය. හමු-
දාපතියෙකු තමා පිට ගෙනා නින්-
දාව නැති කර දමා තමාට නින්දා
කළ තැනැත්තාව නින්දාවට පත්
කරන්නේය. **19** ඔහු තමාගේ දේශ-
යේ බලකොටු දෙසට නැවත හැරී
යන්නේය. ආපසු සොයාගත නො-
හැකි වන සේ ඔහු වැටී විනාශ වී
යන්නේය.[11]
**20** “ඔහු වෙනුවට වෙනත් කෙ-
නෙක් නැඟී සිටිනු ඇත.[12] ඔහු තේ-
ජාන්විත රාජ්‍යය පුරා බදු එකතු
කරන්නෙකුව*[1] යවන්නේය. ස්වල්ප
දවසකින් ඔහු වැටෙන්නේය. එහෙත්
එය සතුරුකමක් නිසාවත් යුද්ධයක්
නිසාවත් නොවේ.
**21** “ඔහුගේ ස්ථානයේ නීචයෙකු
ලෙස සලකන කෙනෙක් නැඟී සිටිනු
ඇත.[2] රජෙකුට හිමි ගෞරවය ඔහුට
නොලැබෙන්නේය. සාමකාමී කාලය-
කදී ඔහු පැමිණ[3] සූක්ෂ්ම ලෙස[4] රාජ්‍ය
බලය ලබාගන්නේය. **22** ඔහු ජල-
ගැල්මක් වැනි වූ සේනා[5] මැඩපවත්-
වන්නේය. ඒවා විනාශ කරනු ලැබේ.[6]
ගිවිසුමේ[7] නායකයාවද[8] විනාශ කරනු
ලැබේ.[9] **23** ඔවුන් ඔහු සමඟ සුහද
සබඳතා ඇති කරගන්නා නිසා ඔහු
වංචනික ලෙස ක්‍රියා කරමින් ශක්-
තිමත් වන්නේය. කුඩා ජාතියක්
නිසා ඔහු ඉතා බලවත් වන්-
නේය.[10] **24** සාමකාමී කාලයකදී[11]
ඔහු රාජධානියේ සාරවත්ම ප්‍රදේශව-
ලට ඇතුල් වී ඔහුගේ පියවරුන්වත්
පියවරුන්ගේ පියවරුන්වත් නොකළ
දේවල් කරන්නේය. සොරාගත් දේද
කොල්ල කෑ දේද වස්තුද ඔහු ඒ
ප්‍රදේශ පුරා බෙදාහරින්නේය. බල-
කොටු සහිත ස්ථානවලට විරුද්ධවත්
ඔහු උපා යොදනු ඇත.[12] නමුත් එය
කෙටි කාලයකට පමණි.
**25** “ඔහු බලයද ධෛර්යයද උපද-
වාගෙන විශාල යුධ හමුදාවක් සමඟ
දකුණේ රජුට විරුද්ධව නැඟී සිටිනු
ඇත. දකුණේ රජද අතිවිශාල යුධ
හමුදාවක් සමඟ යුද්ධයට සැරසෙන්-
නේය. ඔහුට විරුද්ධව උපා යොදන
නිසා ඔහු* වැටෙන්නේය. **26** ඔහු
සමඟ එකට කෑම කන අයම ඔහුව
විනාශ කරන්නෝය.
“ඔහුගේ යුධ හමුදාවද විසුරුවා-
හරිනු ලැබේ. බොහෝදෙනා මැරුම්
කන්නෝය.
**27** “මේ රජවරුන් දෙදෙනාගේ සිත්

---

**දානි 11:15*** හෝ, “යුධ සේනාවල බලය.” **16*** එනම්, දකුණේ රජුට.

**දානි 11:20*** හෝ, “හමුදා සේවයට පුරුෂයන්ව ලියාපදිංචි කරන්නෙකුව.” **25*** එනම්, උතුරේ රජ.

---

**11 පරි.**
1 ක්‍රියා 5:36
2 ක්‍රියා 5:37
3 යෙරෙ 6:6, යෙරෙ 32:24
4 ගීතා 48:2, එස 20:6, දානි 8:9, දානි 11:41, දානි 11:45
5 දේශ 8:9
6 2ලේක 20:3
7 දානි 11:28
8 දානි 11:6
9 හිතෝ 19:21
10 යෙරෙ 2:10
11 ගීතා 27:2, ගීතා 37:17, ගීතා 37:36
12 ලූක් 2:1

**2 තීරුව**
1 ලූක් 2:2, ක්‍රියා 5:37
2 ගීතා 12:8, ලූක් 2:1, ලූක් 3:1
3 යෙරෙ 22:21, දානි 8:25
4 ගීතා 55:21
5 2ලේක 32:8
6 ගීතා 10:15
7 උත් 15:18, දානි 9:27, ලූක් 1:55, ක්‍රියා 3:25
8 1ලේක 5:2, යෙසා 55:4, දානි 9:25, යොහ 1:49
9 උත් 3:15, යෙසා 53:10, මාක් 15:20, ක්‍රියා 3:15
10 පිලි 1:13
11 දානි 8:25
12 ගීතා 36:4, හිතෝ 6:18

නපුරටම යොමු වී තිබෙනු ඇත. ඔවුහු
දෙදෙනා එකම මේසයේ හිඳගෙන[1]
එකිනෙකාට බොරු කියන්නෝය.[2]
නමුත් ඔවුහු සාර්ථක නොවන්-
නෝය.[3] මන්ද නියමිත කාලයේදී අව-
සානය පැමිණෙන්නේය.[4]
**28** "ඔහු* බොහෝ සම්පත් ඇතුව
නැවත ඔහුගේ දේශයට හැරී යන්-
නේය. ඔහු ශුද්ධ ගිවිසුමට[5] විරුද්ධව
නැඟී සිටින්නේය. ඔහු සාර්ථක ලෙස
ක්‍රියා කරමින්[6] තම දේශයට ආපසු
හැරී යන්නේය.
**29** "නියම කරන ලද කාලයේදී[7]
ඔහු නැවත දකුණට විරුද්ධව නැඟී
සිටින්නේය.[8] එහෙත් මේ වතාවේදී
මුල් වතාවට වඩා වෙනස් ප්‍රතිඵලයක්
ඇති වන්නේය. **30** ඔහුට විරුද්ධව
කිත්තිම්හි[9] නැව් එන්නේය. ඔහු කල-
කිරෙන්නේය.
"ඔහු නැවත හැරී ඇවිත්, ශුද්ධ
ගිවිසුම හෙළාදකිමින්[10] ඊට විරුද්-
ධව චෝදනා එල්ල කරන්නේය.[11] ඔහු
සාර්ථකව ක්‍රියා කරන්නේය. ඔහු ශුද්ධ
ගිවිසුම අත්හැර යන අය වෙනට
ගොස් ඔවුන්ට අනුග්‍රහය දක්වන්නේය.
**31** ඔහු තම බලය* යොදාගෙන නැඟී
සිටින්නේය. ඔවුහු බලකොටුව එනම්,
ශුද්ධස්ථානය කෙලෙසන්නෝය.[12]
දිනපතා ඔප්පු කරන පූජාවද නවත්-
වනු ඇත.[13]
"විනාශයක් සිදු කරන[14] පිළිකුල්
දේද පිහිටුවනු ලැබේ.[15]
**32** "ඔහු ගිවිසුම[16] කඩ කරමින්
ද්‍රෝහිව කටයුතු කරන අයට චාටු
බස් දොඩමින්[17] දෙවිව අත්හැර යෑමට
ඔවුන්ව පොලඹවන්නේය.[18] එහෙත්
දෙවිව හොඳින් දැන හඳුනා ගෙන
සිටින[19] ඔහුගේ සෙනඟ ස්ථිරව
සිට[20] සාර්ථකව ක්‍රියා කරන්නෝය.
**33** ගැඹුරු අවබෝධයක් ඇති අය[21]
බොහෝදෙනෙකුව දැනුවත් කරන්-
නෝය.[22] ඔවුහු කඩුව හා ගින්න නිසාද
සිරදඬුවම් හා කොල්ල කෑම් නිසාද[23]

**දානි 11:28*** එනම්, උතුරේ රජ. **31*** හෝ, "හමුදා බලය."

**11 පරි.**
**1** 1කොරි 10:21 1තිමෝ 4:1
**2** ගීතා 12:2 ගීතා 58:3 ගීතා 64:5 හිතෝ 12:5 හිතෝ 12:20 හිතෝ 26:23 1තිමෝ 4:2
**3** හිතෝ 19:21
**4** දානි 12:9 හබ 2:3 2තිමෝ 3:1
**5** 2සාමු 7:12 2සාමු 23:5 ගීතා 89:28 ලූක් 1:33 ලූක් 22:29
**6** දානි 11:17
**7** මතෙ 24:3 ලූක් 21:24
**8** මතෙ 24:7
**9** උත් 10:4 ගණන් 24:24 යෙසා 23:1 යෙරෙ 2:10 එස 27:6
**10** දානි 11:28
**11** යොහ 15:20
**12** දානි 8:11 දානි 12:7 එළි 11:2
**13** නික් 29:38 ගණන් 28:3 ගීතා 119:44 දානි 8:12 දානි 12:11
**14** ලූක් 21:20
**15** දානි 12:11 මතෙ 24:15 එළි 13:15 එළි 17:8
**16** ලූක් 22:29
**17** ගීතා 55:21
**18** 2තෙස 2:3
**19** 1ලේක 28:9 යොහ 17:3 රෝම 10:13
**20** යෝවේ 2:32
**21** හිතෝ 1:3 යෙසා 32:3 දානි 12:10 මතෙ 13:11 මතෙ 24:45
**22** හිතෝ 9:9 සෙක 8:23 මතෙ 24:14
**23** මතෙ 10:18 මතෙ 24:9 යොහ 16:2 එළි 2:10 එළි 12:17 එළි 16:6

**2 තීරුව**
**1** ලූක් 18:7 එළි 7:15 එළි 12:16

දවස් කිහිපයකට වැටෙන්නෝය.
**34** ඔවුන් වැටුණු පසු ඔවුන්ට සුළු වශ-
යෙන් උපකාර ලැබෙනු ඇත.[1] බො-
හෝදෙනෙක් චාටුවෙන් ඔවුන් හා
එක් වන්නෝය.[2] **35** ගැඹුරු අව-
බෝධයක් ඇති සමහරදෙනෙක් පවා
වැටෙන්නෝය.[3] ඔවුන්ව පවිත්‍ර කර
නිකැළැල් තත්වයකට ගෙන එන
පිණිස[4] අවසාන කාලය දක්වා එසේ
සිදු වන්නේය.[5] මන්ද එය නියමිත
කාලයේදී සිදු වන්නේය.[6]
**36** "ඔහු තමා කැමති ලෙස ක්‍රියා
කරන්නේය. ඔහු සියලු දෙවිවරුන්ට
වඩා තමාවම උසස් කරගනිමින්
තමාටම ප්‍රශංසාව ලබාගන්නේය.[7]
ඔහු දෙවිවරුන්ගෙත් දෙවිට[8] විරුද්-
ධව උදම් අනන්නේය. දඬුවම නියම
කරන තුරු ඔහු සාර්ථක ලෙස ක්‍රියා
කරන්නේය.[9] මන්ද තීන්දු කළ දේ
අනිවාර්යයෙන්ම ඉටු විය යුතුයි.
**37** ඔහුගේ පියවරුන්ගේ දෙවියන්ව
ඔහු ගණන් ගන්නේ නැත. ස්ත්‍රීන්ගේ
කැමැත්තට ඔහු යටත් නොවන්නේය.
අන් සෑම දෙවි කෙනෙකුවද ඔහු ගණ-
නකටවත් ගන්නේ නැත. සියල්ලන්ට
වඩා ඔහු තමාව උසස් කරගන්-
නේය.[10] **38** එහෙත් ඔහු තමාට හිමි
ස්ථානයේ හිඳ බලකොටුවල දෙවි-
යන්ට ගෞරවය දෙන්නේය. ඔහු රන්ද
රිදීද අනර්ඝ මැණික්ද වටිනා දේවල්ද
පුද කරමින් ඔහුගේ පියවරුන් නොදත්
දෙවි කෙනෙකුට ගෞරව කරන්නේය.
**39** ඔහු නාඳුනන දෙවි කෙනෙකුගේ
උපකාරය ඇතුව ශක්තිමත්ම බල-
කොටුවලට විරුද්ධව නැඟී සිට සාර්-
ථක වන්නේය. ඔහුට ගෞරවය දෙන
ඕනෑම කෙනෙකුව ඔහු ගෞරවයට
පත් කරන්නේය. බොහෝදෙනෙකුව
පාලනය කරන පිණිස ඔහු ඔවුන්ව
පත් කරන්නේය. ඔහු මුදලට දේශය
බෙදා දෙන්නේය.
**40** "අවසාන කාලයේදී දකුණේ

**2** ගීතා 5:9; මතෙ 7:15; ක්‍රියා 20:29; ගලා 1:10; 2පේතෘ 2:3; **3** මතෙ 10:22; එළි 2:10; **4** දානි 12:10; **5** මලා 3:2; මතෙ 24:3; එළි 7:14; **6** දානි 11:40; **7** යෙසා 14:14; දානි 8:25; 2තෙස 2:4; **8** ද්වි 10:17; ගීතා 82:1; ගීතා 136:2; **9** ශෙප 3:8; **10** යෙසා 14:13.

රජ[1] ඔහුට විරුද්ධව පියවර ගන්නේය.
උතුරේ රජද යුධ රථ, අසරුවන් හා
බොහෝ නැව් රැස් කරගෙන කුණාටු-
වක් මෙන් ඒ රජුට විරුද්ධව පැමිණෙනු
ඇත. ඔහු ගංවතුරක් මෙන් ඇවිත්
මුළු දේශයම යටත් කරගන්නේය.
**41** ඔහු අලංකාර දේශයද[2] ආක්‍රම-
ණය කරන්නේය.[3] ඔහු බොහෝ දේ-
ශයන් යටත් කරගන්නේය.[4] එහෙත්
ඒදොම්වරුද මෝවබ්වරුද[5] අම්මොන්-
වරුන්ගේ ප්‍රධානියෝද ඔහුගේ අතින්
ගැලවෙන්නෝය. **42** ඔහු විවිධ දේ-
ශයන්ට දිගින් දිගටම පහර දෙන්-
නේය. ඊජිප්තු දේශයද[6] ඔහුගේ අතින්
නොගැලවෙන්නේය. **43** ඊජිප්තු දේ-
ශයට අයිති රන්, රිදී හා සියලු
වටිනා දේවල් ඔහුගේ පාලනය යට-
තේ තිබෙනු ඇත. ලිබියන්වරු සහ
ඉතියෝපියන්වරු ඔහුගේ අණසකට
යටත් වන්නෝය.

**44** "එහෙත් නැඟෙනහිරෙන්ද[7]
උතුරෙන්ද අසන්න ලැබෙන ආරංචි
නිසා ඔහු කැලඹෙන්නේය.[8] ඔහු
බොහෝදෙනෙකුව විනාශ කරන්නත්
සියල්ල නැත්තටම නැති කරන්නත්
මහත් උදහසකින් පිටත්ව යන්නේය.[9]
**45** අලංකාර වූ ශුද්ධ කන්ද[10] සහ
මහ මුහුද අතර ඔහු තම කූඩාරම්*
තනන්නේය. ඔහු විනාශ වන තෙක්ම
ඉදිරියට යන්නේය.[11] ඔහුගේ උපකාර-
යට කිසිවෙක් නොපැමිණෙන්නේය.[12]

**12** "ඔබේ සෙනඟ[13] වෙනුවෙන්
නැඟී සිටින ශ්‍රේෂ්ඨ අධිප-
තියා[14] වන මිකායෙල්[15] ඒ කාලයේදී
පියවර ගන්නේය.*[16] විපත්ති සහිත
කාලයක් පැමිණෙන්නේය. මුල්ම
ජාතිය පිහිටෙවූ දා පටන් ඒ කාලය
පැමිණෙන තුරු එවැනි දරුණු තත්ව-
යක් උදා නොවන්නේය.[17] ඒ කාල-
යේදී ඔබේ සෙනඟ ගැලවෙනු ඇත.[18]
ලියවිල්ලෙහි සඳහන් කර ඇති සියලු-
දෙනාම ගැලවෙන්නෝය.[1] **2** භූමි-
යේ සැතපී සිටින බොහෝදෙනෙක්
නැඟිටින්නෝය.[2] නැඟිට එන සමහ-
රෙකුට සදාකාල ජීවනය ලැබෙන්-
නේය.[3] එහෙත් නැඟිට එන තවත්
සමහරෙකු නින්දාවට පත් වන අතර
ඔවුන්ව සදාකාලයෙන් සදාකාලයටම
පිළිකුල් කරනු ලබන්නේය.[4]

**3** "ගැඹුරු අවබෝධය ඇති අය
දීප්තිමත් අහස මෙන් බැබළෙන්-
නෝය.[5] ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරී-
මට බොහෝදෙනෙකුට උදව් කරන
සියලුදෙනා[6] තාරකා මෙන් සදා-
කාලයෙන් සදාකාලයටම බැබළෙන්-
නෝය.

**4** "දානියෙල්, ඔබට හෙළි කළ මේ
වචන ලියවිල්ලක සටහන් කර අව-
සාන කාලය දක්වා[7] එම ලියවිල්ල
වසා මුද්‍රා කර තබන්න.[8] බොහෝදෙ-
නෙකු නිවැරදි දැනුම සෙවීමට මහත්
වෙහෙසක් දරන නිසා ඔවුන්ට එය
නොඅඩුව ලැබෙන්නේය."[9]

**5** දානියෙල් වන මම, තවත්
දෙදෙනෙකු ගඟ අසල සිටිනවා දුටු-
වෙමි.[10] එක් කෙනෙක් මෙගොඩ සිට-
ගෙන සිටියේය. අනික් කෙනා එගොඩ
සිටියේය.[11] **6** ඔවුන්ගෙන් එක් කෙ-
නෙක් ලිනන් වස්ත්‍රය ඇඳගෙන[12]
ගඟට ඉහළින් සිටි තැනැත්තාගෙන්
මෙසේ ඇසුවේය. "මේ පුදුමසහගත
දේවල් සියල්ල සිදු වීමට කොපමණ
කාලයක් ගත වෙයිද?"[13] **7** එවිට
ලිනන් වස්ත්‍රය ඇඳගෙන සිටි ඒ
තැනැත්තා අත් දෙකම ස්වර්ගය දෙ-
සට ඔසවා සදාකාලයෙන් සදාකාලය-
ටම ජීවත් වන තැනැත්තාණන්ගේ
නාමයෙන්[14] දිවුරා[15] මෙසේ කීවේය.
"කාලයක්ද කාලවල්ද කාල භාගයක්ද
නියම කර ඇත.[16] ශුද්ධ තැනැත්තන්-
ගේ බලය නැති කර දමා[17] වැඩි කල්

---

**දානි 11:45*** මුල් භාෂාවේ මාලිගා වැනි කූඩාරම් යන අදහස ඇතුළත් කර තිබේ. **12:1*** මූ.අ., "නැඟී සිටින්නේය." හෙබ්‍රෙව් භාෂාවේ, තමා සතු රාජ්‍ය බලය යොදාගන්නවා යන අදහසද ඇතුළත් වී තිබේ.

**11 පරි.**
**1** එළි 13:11
**2** ගීතා 48:2; එස 20:6; දානි 8:9; දානි 11:16; දානි 11:45
**3** එස 38:11; එස 38:18
**4** මතෙ 24:10
**5** යෙරෙ 48:46
**6** යෙරෙ 9:26
**7** එළි 16:12
**8** එස 38:16
**9** එස 38:9
**10** දානි 11:16
**11** යෙසා 34:2; යෙරෙ 25:31; එස 39:4; 2තෙස 1:9
**12** එළි 19:20

**12 පරි.**
**13** රෝම 2:29; ගලා 3:29; ගලා 6:16
**14** යොෂු 5:14; යෙසා 9:6; එස 34:24; දානි 10:21
**15** දානි 10:13; යූද් 9
**16** ගීතා 110:1; මතෙ 24:30; හෙබ්‍රෙ 10:13; එළි 12:7
**17** මතෙ 24:21
**18** යෙසා 26:20; යෝවෙ 2:31; මතෙ 24:22; එළි 7:13

**2 තීරුව**
**1** මලා 3:16; ලූක් 10:20; හෙබ්‍රෙ 12:23; එළි 3:5
**2** යොහ 5:28; එළි 20:4
**3** මතෙ 25:46; යොහ 5:29; යොහ 6:40
**4** හිතෝ 10:7; මතෙ 24:51; මතෙ 25:46
**5** දානි 11:33; මතෙ 13:43
**6** 1තිමෝ 4:16; එළි 7:9
**7** දානි 8:17; දානි 12:9
**8** දානි 8:26; එළි 10:4
**9** ගීතා 97:11; යෙසා 11:9; යෙසා 58:10; එළි 22:17
**10** දානි 10:6; දානි 10:16; **11** දානි 10:4; **12** දානි 10:5; **13** ගීතා 74:10; එළි 6:10; **14** දානි 4:34; එළි 4:9; එළි 10:6; **15** ද්වි 32:40; යෝබ් 27:2; යෙරෙ 4:2; යෙරෙ 12:16; එළි 10:5; **16** දානි 7:25; එළි 11:2; එළි 12:6; එළි 12:14; එළි 13:5; **17** දානි 8:24; මතෙ 24:9; එළි 11:7.

ගත වීමට කලින් මේ සියල්ල සිදු වී
අවසන් වනු ඇත.”
**8** ඔහුගේ වචන ඇසූ නමුත් මම
ඒවා තේරුම් නොගත්තෙමි.[1] එබැ-
වින් මම ඔහුගෙන් මෙසේ ඇසුවෙමි.
“මාගේ ස්වාමීනි, මේ දේවල් අවසන්
වෙන්නේ කොහොමද?”[2]
**9** ඔහු මට මෙසේ පිළිතුරු දුන්-
නේය. “දානියෙල්, ඔබ දැන් යන්න.
මන්ද අවසාන කාලය දක්වා ලිය-
විල්ල වසා මුද්‍රා කර තිබේ.[3]
**10** බොහෝදෙනෙක් තමන්වම පවිත්‍ර
කරගෙන[4] නිකැළැල් තත්වයකට පත්
වන්නෝය.[5] දුෂ්ටයෝ දිගටම දුෂ්ට
ලෙස ක්‍රියා කරන්නෝය.[6] ඔවුන්ගෙන්
කිසිවෙක් මේ දේවල් තේරුම් නො-
ගන්නෝය.[7] එහෙත් ගැඹුරු අවබෝ-
ධය ඇති අය තේරුම්ගන්නෝය.[8]

**12 පරි.**
1 ලූක් 18:34 ක්‍රියා 1:7 1පේතෘ 1:11
2 දානි 8:17 දානි 10:14
3 දානි 8:26 දානි 12:4
4 ගීතා 51:7 එස 36:25
5 යෙසා 1:18 දානි 11:35 මලා 3:3 එළි 7:14
6 2තිමෝ 3:2 2තිමෝ 3:13
7 යෙසා 32:6 හොෂෙ 14:9
8 ගීතා 111:10 හිතෝ 3:4 දානි 11:33 දානි 12:3 1යොහ 5:20

**11** “දිනපතා ඔප්පු කරන පූජාව[1]
නවත්වා,[2] විනාශයට හේතු වන පිළි-
කුල් දේ[3] පිහිටුවනු ලබන කාලය
පටන් දවස් එක්දහස් දෙසිය අනූවක්
ගත වන්නේය.
**12** “දවස් එක්දහස් තුන්සිය තිස්-
පහ අවසන් වන තෙක්ම ඉවසිලි-
වන්තව බලා සිටින තැනැත්තා
සන්තෝෂවත්ය.[4]
**13** “ඔබ අවසානය දක්වාම ස්ථිරව
සිටින්න.[5] ඉන්පසු ඔබ සැතපී සිටිනු
ඇත.[6] එහෙත් ඔබට වෙන් කළ කො-
ටස ලබාගැනීම සඳහා ඔබ ආපසු
නැඟිටිනු ඇත.”[7]

**2 තීරුව** **1** දානි 8:11; දානි 11:31; හෙබ්‍රෙ 13:15; 1පේතෘ 2:5; **2** එළි 11:7; **3** දානි 11:31; මාක් 13:14; **4** යාකො 1:12; යාකො 5:11; **5** උත් 25:8; **6** යොහ 11:13; 1තෙස 4:13; **7** ගීතා 45:16; යොහ 11:24; ක්‍රියා 17:31; ක්‍රියා 24:15; එළි 20:12.

# හොෂෙයා*

**1** යෙහෝවා දෙවි[1] බෙයේරීගේ
පුත් හොෂෙයා[2] ලවා අනාවැකි
කියන්න පටන්ගත්තේය. හොෂෙයා
අනාවැකි කීවේ යූදාහි රජකම් කළ
උසියා,[3] යෝතම්,[4] ආහස්[5] සහ හෙ-
සකියා[6] යන රජවරුන්ගේ පාලන
සමයේදීය.[7] ඒ කාලයේ ඊශ්‍රායෙල්හි
රජකම් කළේ යෝවාෂ්ගේ[8] පුත් යෙ-
රොබොවම්ය.[9] **2** යෙහෝවා දෙවි
හොෂෙයා මාර්ගයෙන් පළමු වරට
කතා කළ අවස්ථාවේදී යෙහෝවා
දෙවි ඔහුට මෙසේ කීවේය. “ඔබ
ගොස්[10] ස්ත්‍රියක විවාහ කරගන්න.
පසු කාලයකදී ඇය ඔබට ද්‍රෝහි
වී වේශ්‍යාකමෙහි යෙදෙන්නීය. එම-
ගින් ඇය දරුවන්ද බිහි කරන්නීය.
මන්ද මේ දේශයේ වැසියෝද වේශ්‍යා-
කමෙහි යෙදෙන්නන් මෙන් යෙහෝවා
දෙවි වන මට ද්‍රෝහිකම් කර මාගෙන්
දුරස්ව සිටිති.”[1]
**3** එහෙයින් හොෂෙයා ගොස් දිබ්ල-
යිම්ගේ දියණිය වූ ගොමෙර්ව විවාහ
කරගත්තේය. පසුව ඇය ඔහුට දාව
පුත්‍රයෙකු බිහි කළාය.[2]
**4** එවිට යෙහෝවා දෙවි හොෂෙ-
යාට මෙසේ කීවේය. “දරුවාට යෙෂ්‍රෙ-
යෙල්*[3] යන නම තබන්න. මන්ද
යෙෂ්‍රෙයෙල්හි# වැගිරෙවූ ලේ වෙ-
නුවෙන් යේහුගේ[4] පවුල තව
කෙටි කාලයකින් මට ගණන් දිය
යුතුයි. ඊශ්‍රායෙල්හි රාජකීය පෙළපත
මම නැති කර දමන්නෙමි.[5] **5** මම
ඒ දවසේදී යෙෂ්‍රෙයෙල් නිම්නයේදී

**1 පරි.**
1 2පේතෘ 1:21
2 රෝම 9:25
3 2රාජා 15:13 2ලේක 26:1
4 2රාජා 15:32
5 2රාජා 16:1
6 2රාජා 18:1
7 යෙසා 1:1 මීකා 1:1
8 2රාජා 13:10
9 2රාජා 14:23
10 යෙසා 20:2 යෙරෙ 13:1

**2 තීරුව**
1 ද්වි 31:16 ගීතා 73:27
2 යෙසා 8:3 හොෂෙ 3:1
3 හොෂෙ 2:22
4 2රාජා 10:31
5 2රාජා 15:10

**හොෂෙ නම*** හෝෂායා යන නමේ කෙටි කිරීමකි. එහි අර්ථය වන්නේ, ‘යෙහෝවා දෙවිගෙන් ගැලවීම ලැබුවේය’ නැත්නම් ‘යෙහෝවා දෙවි ගැලෙව්වේය’ යන්නයි.

**හොෂෙ 1:4*** තේරුම, “දෙවි බීජ වපුරනු ඇත.” **4#** ඊශ්‍රායෙල්හි උතුරු රාජ්‍යයේ අගනුවර සමාරිය වුවත් එහි රජවරුන් පදිංචිව සිටි රාජකීය නුවර වූයේ යෙෂ්‍රෙයෙල්ය. 1රාජා 21:1 බලන්න.

ඊශ්‍රායෙල්වරුන්ගේ දුන්න කඩා
දමන්නෙමි.”[1]
**6** ගොමෙර් නැවත වරක් ගැබ්-
ගෙන දියණියක බිහි කළාය. එවිට
දෙවි හොෂෙයාට මෙසේ කීවේය.
“දරුවාට ලෝ-රුහාමා*[2] යන නම
තබන්න. මන්ද මම නැවත වරක්
ඊශ්‍රායෙල් සෙනඟට දයාව නොපෙන්-
වන්නෙමි.[3] මම ඔවුන්ව දේශයෙන්
පන්නා දමන්නෙමි.[4] **7** නමුත් යූදා
සෙනඟට මම දයාව පෙන්වන්නෙමි.[5]
ඔවුන්ගේ දෙවි වූ යෙහෝවා වන මම
ඔවුන්ව ගලවාගන්නෙමි.[6] එහෙත් මා
එසේ කරන්නේ දුන්නෙන්වත් කඩු-
වෙන්වත් යුද්ධයෙන්වත් අශ්වයන් හා
අසරුවන් මාර්ගයෙන්වත් නොවෙයි.”[7]
**8** ලෝ-රුහාමා කිරි වැරූ පසු,
ගොමෙර් නැවත ගැබ්ගෙන පුත්‍රයෙකු
බිහි කළාය. **9** එවිට දෙවි මෙසේ
කීවේය. “දරුවාට ලෝ-අම්මී* යන
නම තබන්න. මන්ද මම ඔබ සියලු-
දෙනාව මගේ සෙනඟ හැටියට තවදු-
රටත් පිළි නොගන්නෙමි. මෙතැන්
පටන් මා ඔබේ දෙවි නොවෙයි.
**10** “‘මෙතැන් පටන් මම ඔබව
මාගේ සෙනඟ ලෙස පිළි නොගන්-
නෙමි’[8] කියා පැවසූ ස්ථානයේදීම,
‘ජීවමාන දෙවිගේ පුත්‍රයන්’[9] ලෙස
ඔබව හඳුන්වන කාලයක් පැමිණෙයි.
ඒ කාලයේදී, ඊශ්‍රායෙල්වරුන්ගේ
ගණන බොහෝ සෙයින් වැඩි වන්-
නේය. ඔවුහු කිරා මැන බලන්නවත්
ගණන් කරන්නවත් බැරි මුහුදු වෙරළේ
වැලි මෙන් වනු ඇත.[10] **11** යූදා හා
ඊශ්‍රායෙල් එක සෙනඟක් මෙන් එක්
රැස් කරනු ඇත.[11] ඔවුහු එක නායක-
යෙකු පත් කරගෙන තමන්ගේ දේ-
ශයට නැවත හැරී යන්නෝය.[12] ඒ
කාලයේදී යෙෂ්‍රෙයෙල් නගරයට ඉතා
යහපත් කාලයක් උදා වනු ඇත.[13]

**2** “ඔබේ සහෝදරයාට, ‘මගේ සෙ-
නඟ’[14] කියාද ඔබේ සහෝද-
රියට, ‘දයාව ලැබූ තැනැත්තිය’[15]
කියාද අමතන්න. **2** ඔබේ මවට
විරුද්ධව නඩුවක් ඉදිරිපත් කරන්න.[1]
ඇයට විරුද්ධව පැමිණිලි කරන්න.
මන්ද මෙතැන් පටන් ඇය මගේ භාර්-
යාව නොවෙයි.[2] මම ඇගේ ස්වා-
මිපුරුෂයාද නොවෙමි.[3] ඇය කරන
වේශ්‍යාකම්ද වෙනත් පුරුෂයන්ව
ළයට තුරුල් කරගනිමින් මට විරුද්-
ධව කරන ද්‍රෝහිකම්ද ඇය නතර කළ
යුතුයි.[4] **3** ඇය එසේ නොකළොත්
උපන් දා සිටියාක් මෙන්[5] මම ඇයව
නිරුවත් කරන්නෙමි.[6] ඇයව පාළු
කාන්තාරයක්[7] හා වතුර නැති දේශ-
යක්[8] මෙන් වීමට සලස්වා ඇයට පිපා-
සයෙන් මැරෙන්න ඉඩහරින්නෙමි.[9]
**4** ඇගේ දරුවන් වේශ්‍යාකමින් ඉප-
දුණු නිසා[10] මම ඔවුන්ට කිසි දයාවක්
නොපෙන්වන්නෙමි.[11] **5** ඔවුන්ගේ
මව වේශ්‍යාකම් කළාය.[12] ඔවුන්ව බිහි
කළ ඇය කිසි ලැජ්ජාවක් නැති ස්ත්‍රී-
යකි.[13] මන්ද ඇය මෙසේ කියා තිබේ.
‘මගේ පෙම්වතුන් පිටුපස මම යන්-
නෙමි.[14] මට කෑම, වතුර, තෙල්, බීම
වර්ග, ලොම් හා ලිනන් රෙදි දෙන
ඔවුන් පිටුපස මම යන්නෙමි.’[15]
**6** “ඒ නිසා, ඇගේ ගමන් මඟ හරහා
මම කටු වැටක්ද ගල් පවුරක්ද ඉදි
කර[16] ඇයව අතරමං කරන්නෙමි.[17]
**7** ඇය තම පෙම්වතුන් පසුපස දිව්වද
ඇයට ඔවුන් ළඟට යන්න ලැබෙන්-
නේ නැත.[18] ඔවුන්ව සෙව්වද ඇයට
ඔවුන්ව සම්බ වන්නේ නැත. එවිට
ඇය මෙසේ කියනු ඇත. ‘මම නැවත
මගේ පළමු පුරුෂයා[19] ළඟට යමි.[20]
ඔහු සමඟ ගත කළ කාලය මීට
වඩා කොපමණ හොඳද!’[21] **8** ඇයට
ධාන්‍ය,[22] අලුත් වයින් හා තෙල් දුන්-
නේ මමයි කියා ඇය තේරුම්ගත්-
තේ නැත.[23] මම ඇයට ඇති තරම්
රන් හා රිදී දුන්නෙමි. නමුත් ඇය

---

හොෂෙ **1:6*** තේරුම, “ඇයට දයාව පෙන්වූයේ නැත.” **9*** තේරුම, “මගේ සෙනඟ නොවෙයි.”

**1 පරි.**
**1** ගීතා 37:15
**2** හොෂෙ 2:23
**3** යෙසා 27:11; 1පේතෘ 2:10
**4** 2රාජා 17:6; 2රාජා 17:23
**5** 2රාජා 19:34; හොෂෙ 11:12
**6** 2රාජා 19:35
**7** ගීතා 33:16; යෙසා 37:36
**8** රෝම 9:26; 1පේතෘ 2:10
**9** යොහ 1:12; රෝම 8:14; 2කොරි 6:18
**10** උත් 13:16; උත් 26:4; රෝම 9:27; හෙබ්‍රෙ 11:12
**11** එස්රා 3:1; යෙසා 11:12; යෙරෙ 3:18; යෙරෙ 30:3; එස 37:17; මීකා 2:12; රෝම 11:26
**12** යෙරෙ 23:5; එස 34:23
**13** හොෂෙ 2:22

**2 පරි.**
**14** යෙරෙ 31:33; එස 36:28; සෙක 13:9
**15** හොෂෙ 2:23; 1පේතෘ 2:10

**2 තීරුව**
**1** යෙරෙ 2:2; එස 20:4
**2** යෙසා 50:1; යෙරෙ 3:8
**3** යෙරෙ 3:1
**4** යෙරෙ 3:9; එස 16:25
**5** එස 16:4
**6** යෙරෙ 13:22; එස 16:37
**7** යෙසා 33:9; එස 19:13
**8** යෙරෙ 51:43
**9** විනි 15:18
**10** යෙසා 57:3; යොහ 8:41
**11** යෙරෙ 13:14; එස 9:10; රෝම 9:18
**12** යෙසා 1:21; යෙරෙ 3:1; එස 16:15; එස 23:5; හොෂෙ 3:1

**13** එස්රා 9:6; යෙරෙ 2:26; දානි 9:7; හොෂෙ 9:10; **14** යෙසා 57:8; එස 23:16; හොෂෙ 8:9; **15** යෙරෙ 44:18; **16** යෝබ් 3:23; විලා 3:7; **17** යෝබ් 19:8; **18** යෙසා 30:2; හොෂෙ 5:13; **19** එස 16:8; එස 23:4; **20** යෙරෙ 31:18; හොෂෙ 5:15; ලූක් 15:18; **21** ද්වි 32:13; නෙහෙ 9:25; ලූක් 15:17; **22** යෙරෙ 44:17; එස 16:19; **23** ද්වි 32:28; යෙසා 1:3.

ඒවා බාල් දෙවියාට නමස්කාර කිරීම
සඳහා භාවිත කළාය.[1]
**9** "'එබැවින් අස්වැන්න නෙළන
කාලයේදී ධාන්‍යවත් මිදි කපන කාල-
යේදී අලුත් වයින්වත් මම තවදු-
රටත් ඇයට නොදෙන්නෙමි.[2] ඇගේ
නිර්වස්ත්‍රකම වසාගැනීමට මා දුන්
ලොම් හා ලිනන් රෙදි මම ඇගෙන්
උදුරාගන්නෙමි.[3] **10** ඇගේ පෙම්ව-
තුන් ඉදිරියේ ඇයව නිරුවත් කරන්-
නෙමි.[4] කිසිවෙකුටවත් ඇයව
මගේ අතින් ගලවාගන්න ලැබෙන්-
නේ නැත.[5] **11** ඇගේ ප්‍රීතියට හේතු
වන සෑම දෙයක්ම මම නැති කර
දමන්නෙමි.[6] උත්සව දිනයන්ද[7] නව
සඳ පායන දවස්ද[8] සබත් දවස්ද
ඇතුළු ඇය සමරන සෑම උත්ස-
වයක්ම මම නැති කර දමන්නෙමි.
**12** "මේ සියල්ල මගේ පෙම්වතුන්-
ගෙන් මට ලැබුණු තෑගි" කියා ඇය
තම මිදිවැල්[9] ගැනත් අත්තික්කා
ගස්[10] ගැනත් පවසන්නීය. එහෙත්
මම ඒ සියල්ල නැති නාස්ති කර
දමන්නෙමි. මම ඇගේ වතු කැලෑවක්
බවට පත් කරන්නෙමි.[11] වනසත්තු
ඇවිත් එහි ගස් වැල් සියල්ල කා දමනු
ඇත. **13** ඇය බාල් දේවතා රූපව-
ලට[12] සුවඳ දුම් ඔප්පු කිරීම[13] සඳහා
දින වෙන් කරගත්තාය. ඇය මුදු මාල
පැළඳගෙන[14] ඇගේ පෙම්වතුන් පසු-
පස යමින්[15] මාව අමතක කළාය.[16]
ඒ හැම දෙයක් වෙනුවෙන් ඇය මට
ගණන් දිය යුතුයි.'[17] එසේ පවසන්නේ
යෙහෝවා දෙවිය.
**14** "'එබැවින් මම ඇයව පාළුක-
රයට යවන්නෙමි.[18] එහෙත් මාගේ
කැමැත්ත කිරීමට මම ඇයව පොලඹ-
වන්නෙමි. ඇගේ හදවතට දැනෙන
සේ මම ඇයට කතා කරන්නෙමි.[19]
**15** ඉන්පසු ඇගේ මිදිවතු මම නැවත
ඇයට දෙන්නෙමි.[20] ඇය ආකෝර්
තැනිතලාව[21] මැදින් ගමන් කර පැතූ
දේ ලබාගන්නීය. ඒ දවසේදී ඇය මට
උත්තර දෙනු ඇත. ඇය යෞවන
කාලයේදී[22] හා ඊජිප්තු දේශයෙන් පිට-
තට ආ කාලයේදී කළාක් මෙන් මට

**2 පරි.**
**1** නික් 32:4
විනි 17:4
යෙසා 46:6
හොෂෙ 8:4
හොෂෙ 13:2
**2** යෙසා 17:11
එස 16:27
**3** එස 23:26
ශෙප 1:13
**4** යෙරෙ 13:26
එස 16:37
එස 23:29
**5** ගීතා 50:22
හොෂෙ 5:14
**6** යෙසා 24:8
යෙරෙ 7:34
ආමො 8:10
**7** 1රාජා 12:32
ආමො 5:21
**8** යෙසා 1:13
**9** ගීතා 80:12
යෙසා 5:5
**10** යෙරෙ 5:17
යෙරෙ 8:13
**11** යෙසා 29:17
යෙරෙ 26:18
මීකා 3:12
**12** විනි 3:7
1රාජා 16:31
2රාජා 10:28
**13** යෙරෙ 7:9
යෙරෙ 18:15
හොෂෙ 11:2
**14** එස 23:40
**15** යෙරෙ 2:25
**16** යෙසා 17:10
යෙරෙ 2:32
එස 22:12
**17** යෙරෙ 23:2
ආමො 3:2
සෙක 10:3
**18** එස 20:35
**19** යෙසා 40:2
**20** ද්වි 30:5
යෙසා 65:21
යෙරෙ 32:15
එස 28:26
ආමො 9:14
**21** යොෂු 7:26
යෙසා 65:10
**22** යෙරෙ 2:2
එස 16:22

**2 තීරුව**
**1** නික් 15:1
හොෂෙ 12:13
**2** යෙසා 54:5
යෙරෙ 3:14
**3** නික් 23:13
යොෂු 23:7
සෙක 13:2
**4** යෙරෙ 10:11
**5** යෙසා 11:6
එස 34:25
**6** ගීතා 46:9
යෙසා 2:4
එස 39:9
සෙක 9:10

උත්තර දෙනු ඇත.[1] **16** ඒ දවසේදී
ඇය තවදුරටත්, "මගේ ස්වාමියා"*
කියා මට කියන්නේ නැත. ඒ වෙනු-
වට, "ඔබ මගේ ස්වාමිපුරුෂයා" කියා
ඇය මාව අමතන්නීය.'[2] එසේ පව-
සන්නේ යෙහෝවා දෙවිය.
**17** "'මම ඇගේ මුවින් බාල් දේ-
වතා රූපවල නම් ඉවත් කරන්නෙමි.[3]
එවිට ඒ රූපවල නම් ඇයට තවදුර-
ටත් මතක් වන්නේ නැත.[4] **18** ඒ
දවසේදී මම මාගේ සෙනඟ වෙනු-
වෙන් වනමෘගයන්ද[5] ආකාශයේ පක්-
ෂීන්ද බඩ ගා යන සතුන්ද සමඟ
ගිවිසුමක් ඇති කරගන්නෙමි. ඒ දේශ-
යෙන් දුන්නද කඩුවද යුද්ධයද පහ
කර,[6] ඔවුන්ට සුරක්ෂිතව ජීවත් වීමට
සලස්වන්නෙමි.[7] **19** මම ඔබ සමඟ
විවාහ වී සදහටම ඔබට බැඳී සිටින
බවට දිවුරා පොරොන්දු වන්නෙමි.[8]
ඔබට ධර්මිෂ්ඨකමද යුක්තියද ප්‍රේ-
මයද* දයාවද පෙන්වා[9] ඔබ සමඟ
විවාහයෙන් බැඳී සිටින බවට දිවුරා
පොරොන්දු වන්නෙමි. **20** ඔබ සමඟ
බැඳී සිට විශ්වාසවන්තකමින් ක්‍රියා
කරන බවට දිවුරා පොරොන්දු වන්-
නෙමි. එවිට ඔබ යෙහෝවා දෙවි වන
මාව සැබවින්ම හඳුනාගනු ඇත.'[10]
**21** "යෙහෝවා දෙවි මෙසේද පව-
සන්නේය. 'ඒ දවසේදී මම ඔබට
පිළිතුරු දෙමි. අහසට අවශ්‍ය දේ
මම අහසට දෙන්නෙමි. පො-
ළොවට අවශ්‍ය දේ අහසෙන්
ලැබෙනු ඇත.[11] **22** එවිට පොළො-
වෙන් ධාන්‍යද[12] අලුත් වයින්ද තෙල්ද
ලැබෙන්නේය. යෙෂ්‍රෙයෙල්ට* අවශ්‍ය
දේ ලැබෙනු ඇත.[13] **23** මම ඇයව
බීජ මෙන් පොළොව පුරා වපුරන්-
නෙමි.[14] දයාව නොලැබූ තැනැත්තියට

---

**7** ලෙවී 26:5; යෙරෙ 23:6; එස 34:25; මීකා 4:4; **8** යෙරෙ 3:14; **9** ගීතා 85:10; යෙරෙ 4:2; මීකා 7:18; **10** යෙසා 54:13; යෙරෙ 9:24; යෙරෙ 24:7; යෙරෙ 31:34; එස 38:23; හෙබ්‍රෙ 8:11; **11** ද්වි 28:12; සෙක 8:12; **12** ගීතා 72:16; **13** හොෂෙ 1:11; **14** යෙරෙ 31:27; සෙක 10:9.

---

හොෂෙ **2:16*** හෝ, "මගේ බාල්." මූ.අ., "මගේ අයිතිකරු." **19*** හෝ, "ඇදි ප්‍රේමය." **22*** තේරුම, "දෙවි බීජ වපුරනු ඇත."

මම දයාව පෙන්වන්නෙමි.[1] මට අයිති
නැති සෙනඟකට මම, “මාගේ සෙනඟ”
කියා අමතන්නෙමි.[2] ඔවුහුද, “ඔබ අපේ
දෙවි” කියා පවසන්නෝය.’ ”[3]

**3** යෙහෝවා දෙවි තවදුරටත් මට
මෙසේ කීවේය. “ඔබ දැන් නැවත
ගොස්, අනාචාරයේ යෙදෙන ස්ත්‍රී-
යකට ආදරය කරන්න.[4] වෙනත්
දෙවිවරුන්ට නමස්කාර කරමින්[5] ඒ
දෙවිවරුන්ට වියළි මිදි කුට්ටි ඔප්පු
කිරීමට ආශා කරන[6] ඊශ්‍රායෙල්ව-
රුන්ට යෙහෝවා දෙවි වන මා ප්‍රේම
කරන්නාක් මෙන්[7] ඔබත් අන් පුරුෂ-
යෙකුගෙන් ආදරය ලබන ඒ ස්ත්‍රියට
ප්‍රේම කරන්න.”
**2** මම රිදී ෂෙකෙල් පහළවක්ද
බාර්ලි හෝමර්* එකහමාරක්ද දී
ඇයව මිල දී ගත්තෙමි.[8] **3** ඉන්-
පසු මම ඇයට මෙසේ කීවෙමි. “ටික
කාලයක් මා සමඟ සිටින්න.[9] ඔබ
වේශ්‍යාකම් නොකළ යුතුයි.[10] වෙනත්
පුරුෂයෙකු සමඟ සම්බන්ධකම් නො-
පැවැත්විය යුතුයි.[11] මමද ඔබ සමඟ
සම්බන්ධකම් නොපවත්වන්නෙමි.”
**4** මන්ද ඊශ්‍රායෙල්වරු බොහෝ
කාලයක් පුරා රජෙකු හෝ පාලක-
යෙකු හෝ නොමැතිව සිටිනු
ඇත.[12] ඒ කාලයේදී කිසිම පූජා-
වක් ඔප්පු කරන්නේවත්[13] නමස්කා-
රය සඳහා කණු ඉදි කරන්නේවත්
නැත. ඒෆොද් හැට්ටයක්[14] හෝ ටෙර-
ෆිම් රූපයක්[15] හෝ නොතිබෙනු ඇත.
**5** පසුව ඊශ්‍රායෙල්වරු නැවත හැරී
ඇවිත් ඔවුන්ගේ දෙවි වන යෙහෝවා[16]
සහ ඔවුන්ගේ රජු වන දාවිත්ව සොය-
යන්නෝය.[17] අවසාන කාලයේදී[18]
යෙහෝවා දෙවි වෙත වෙවුලමින්
පැමිණෙන ඔවුහු දෙවිගේ යහපත්කම
අද්දකින්නෝය.[19]

**4** ඊශ්‍රායෙල්වරුනි, යෙහෝවා දෙ-
විගේ වචනයට සවන් දෙන්න.
අවංකකම හා ප්‍රේමය* මේ දේශයේ
වැසියන් තුළ නැත.[20] දෙවිව නො-
දන්නා අය මෙන් ඔවුහු ක්‍රියා කරති.[1]
එබැවින් දේශයේ වැසියන්ට විරුද්-
ධව යෙහෝවා දෙවිට නඩුවක් තිබේ.[2]
**2** ශාප කිරීම්,[3] වංචා කිරීම්,[4] මිනී
මැරීම්,[5] සොරකම්[6] හා අනාචාරය දේ-
ශයේ අස්සක් මුල්ලක් නැර පැතිර
තිබේ.[7] දේශය පුරා එක පිට එක මිනී
මැරීම් සිදු වේ.[8] **3** එබැවින් මුළු දේ-
ශයම වැලපෙන කාලයක් පැමිණෙන්-
නේය.[9] එහි සියලු වැසියෝ බෙලහීන
වන්නෝය. වනමෘගයන්ද ආකාශයේ
පක්ෂීන්ද මුහුදේ මත්ස්‍යයන්ද සමඟ
ඔවුහු විනාශ වී යන්නෝය.[10]
**4** “කිසිවෙක් මේ සෙනඟ සමඟ
වාද කරන්නවත්[11] ඒ අයට අව-
වාද කරන්නවත් නොයා යුතුයි. මන්ද
මේ සෙනඟ පූජකයන්ට විරුද්ධව
වාද කරන සෙනඟක් හා සමානයි.[12]
**5** යමෙකු රාත්‍රියේදී වැටෙන්නාක්
මෙන් ඔබ දහවල් කාලයේදීද වැටෙනු
ඇත.[13] අනාගතවක්තෘවරු පවා ඔබ
සමඟ වැටෙනු ඇත.[14] මම ඔබේ මව
විනාශ කර දමන්නෙමි.[15] **6** මගේ
සෙනඟ දැනගැන්මට අනුව ක්‍රියා
නොකරන නිසා ඔවුහු නාස්ති වී
යති.[16] ඔබ දැනුම ප්‍රතික්ෂේප කළ
නිසා[17] මමත් ඔබව ප්‍රතික්ෂේප කර
පූජකයෙකු ලෙස මට සේවය කිරී-
මට ඔබට ඉඩ නොදෙමි.[18] ඔබේ දෙවි
දුන් නීතිය ඔබ අමතක කළ නිසා[19]
මමද ඔබේ පුත්‍රයන්ව අමතක කරමි.[20]
**7** පූජකයන්ගේ ගණන වැඩි වෙන්න
වැඩි වෙන්න ඔවුහු තව තවත් මට
විරුද්ධව පව් කරන්නෝය.[21] ඔවුහු
මට ගෞරව කරනවා වෙනුවට මට
නින්දා කරති.[22] **8** මගේ සෙනඟ පව්
කරන තුරු ඔවුහු ආශාවෙන් බලා
සිටිති. මන්ද සෙනඟ කරන පව්වලින්
වාසි ප්‍රයෝජන ලබන්නේ ඔවුන්මය.[23]
**9** “එබැවින් සෙනඟට අත් වන

**2 පරි.**
**1** රෝම 11:30
**2** රෝම 9:25; 1පේත 2:10
**3** හොෂෙ 1:10; සෙක 13:9

**3 පරි.**
**4** යෙරෙ 3:20; හොෂෙ 1:3
**5** විනි 10:13; නෙහෙ 9:18
**6** යෙරෙ 7:18
**7** ද්වි 7:7; විනි 10:16; 2රාජා 13:23; ගීතා 106:45
**8** උත් 34:12
**9** ද්වි 21:13
**10** ද්වි 5:18
**11** රෝම 7:3
**12** 2රාජා 17:6; 2රාජා 18:10
**13** දානි 9:27
**14** විනි 8:27
**15** විනි 17:5; 1සාමු 19:16; එස 21:21
**16** යෙරෙ 3:22; යෙරෙ 50:4
**17** යෙරෙ 30:9; එස 34:23; එස 37:22; ආමො 9:11; ලූක් 1:32; එළි 22:16
**18** ද්වි 4:30; මීකා 4:1
**19** ගීතා 130:4; යෙරෙ 33:9

**4 පරි.**
**20** යෙසා 59:13; යෙරෙ 6:13; මීකා 7:2

**2 තීරුව**
**1** යෙරෙ 4:22; රෝම 1:28
**2** යෙසා 3:13; යෙරෙ 25:31; මීකා 6:2
**3** ගීතා 10:7; ගීතා 59:12
**4** ගීතා 5:6; යෙසා 59:13; හොෂෙ 11:12
**5** 1රාජා 21:19; යෙරෙ 7:9
**6** සෙක 5:3
**7** යෙරෙ 29:23; එස 23:37
**8** විලා 4:13; හොෂෙ 6:9; මතෙ 23:35; ක්‍රියා 7:52

**9** යෙසා 24:4; යෙරෙ 4:28; යෝවෙ 1:10; ආමො 8:8; **10** යෙරෙ 4:25; යෙරෙ 9:10; යෙරෙ 12:4; ශෙප 1:3; **11** ආමො 5:13; **12** ද්වි 17:12; යෙරෙ 18:18; **13** යෙරෙ 6:4; **14** යෙරෙ 14:15; **15** යෙසා 50:1; **16** යෙසා 5:13; යෙරෙ 4:22; **17** යෙරෙ 2:8; ලූක් 11:52; **18** මතෙ 21:43; **19** 2රාජා 17:16; **20** යෝබ් 34:11; **21** එස්රා 9:7; **22** රෝම 1:23; **23** 1සාමු 2:29; යෙසා 56:11; මීකා 3:11.

හොෂෙ **3:2*** හෝමරයක් යනු ලීටර් 220කි. **4:1*** හෝ, “ළැදි ප්‍රේමය.”

විනාශයම පූජකයන්ටත් අද්දකින්න
සිදු වෙයි.[1] ඔවුන් කරන දේවලට මා
ඉදිරියේ ගණන් දෙන්න ඔවුන්ට සිදු
වනු ඇත.[2] ඔවුන්ගේ ක්‍රියාවලට මම
ඔවුන්ට සුදුසු ප්‍රතිඵල දෙන්නෙමි.[3]
**10** ඔවුහු කොතරම් කෑවත් තෘප්-
තියට පැමිණෙන්නේ නැත.[4] ඔවුහු
ඔවුන් අතරේ සිටින ස්ත්‍රීන්ව ගණිකා-
වන් මෙන් සලකමින් ඔවුන් සමඟ
අනාචාරයේ යෙදෙන්නෝය. නමුත්
ඔවුන්ට දරුපල ලැබෙන්නේ නැත.[5]
මන්ද ඔවුහු දැන් යෙහෝවා දෙවි වන
මගේ කීම් ගණනකටවත් නොගන්-
නෝය.[6] **11** වේශ්‍යාකම් කිරීමෙන්ද
පරණ සහ අලුත් වයින් පානය කිරී-
මෙන්ද සිතුවිලි විකෘති වී යහපත්
චේතනා නැති වී යයි.[7] **12** මගේ
සෙනඟ තමුන්ම සාදාගත් ලී රූපය-
කට[8] කන්නලව් කරති.[9] ඔවුන්ගේම
සැරයටියෙන් මඟ පෙන්වීම් ලබති.
ඔවුන්ගේ සිත් වේශ්‍යාකමට ඇදී ගොස්
ඇති නිසා ඔවුහු නොමඟ යන්-
නෝය.[10] ඔවුහු වේශ්‍යාකම් කර මගේ
පාලනය ප්‍රතික්ෂේප කරන්නෝය.[11]
**13** ඔවුහු කඳු මුදුන්වල පූජා ඔප්පු
කරති.[12] උස්බිම් මත සුවඳ දුම්ද ඔප්පු
කරති.[13] හොඳ සෙවණක් ලබා දෙන
ඇවැන්ත ගස් යටද ස්ටෝරැක්ස් ගස්
යටද වෙනත් ගස් යටද ඔවුහු පූජා
ඔප්පු කරති.[14] එබැවින් ඔබේ දූවරු
වේශ්‍යාකම් කරති. ඔබේ පුත්‍රයන්ගේ
භාර්යාවෝද අනාචාරයේ යෙදෙති.

**14** "ඔබේ දූවරුන් වේශ්‍යාකම්
කළත් ඔබේ ලේලියන් අනාචාරයේ
යෙදුණත් මම ඔවුන්ට දඬුවම් නො-
කරමි. මන්ද පුරුෂයෝද ගණිකාවන්
සමඟ හුදෙකලා තැන්වලට යති.[15]
ඔවුහු දේවාලවල සිටින ගණිකාවන්[16]
සමඟ එකතු වී පූජා ඔප්පු කරති.
කිසි අවබෝධයක් නැති මේ සෙ-
නඟ[17] ගමන් කරන්නේ විනාශයටය.
**15** 'ඊශ්‍රායෙල්වරු වේශ්‍යාකම් කරන්-
නෝය.[18] නමුත් යූදා වැසියෙනි, ඔබත්
එම පාපයටම වැටෙන්න එපා.[19] ඔබ
ගිල්ගාල් නගරයටවත්[20] බෙත්-ආවෙන්
නගරයටවත් නොයන්න.[21] ජීවමාන
යෙහෝවා දෙවිගේ නාමයෙන් නැවත
නොදිවුරන්න.[1] **16** ඊශ්‍රායෙල්වරුන්
දැන් හැසිරෙන්නේ මුරණ්ඩු එළදෙ-
නක මෙනි.[2] එසේනම්, ආරක්ෂිත
ස්ථානයක සිටින බැටළු පැටවෙකු
මෙන් යෙහෝවා දෙවි ඔවුන්ව රැක-
බලා ගන්නේ කෙසේද? **17** එෆ්‍රායිම්
වැසියෝ රූප නමස්කාරයේ යෙදෙති.[3]
ඔවුන් තමන්ට කැමති ලෙස හැසු-
රුණාවේ![4] **18** ඔවුහු තමන්ගේ බීර
අවසන් වන තෙක්ම පානය කර ඇත.[5]
ඔවුහු තමන් අතරේ සිටින ස්ත්‍රීන්ව
ගණිකාවන් මෙන් සලකමින් ඔවුන්
සමඟ අනාචාරයේ යෙදෙන්නෝය.[6]
ඔවුන්ගේ දේශය රකින්නෝ[7] ගෞරව-
යට වඩා නින්දාවට ඇලුම් කරති.[8]
**19** ඔවුන්ව තද සුළඟකින් ගසාගෙන
යනු ඇත.[9] තමන් ඔප්පු කළ පූජා
ගැන ඔවුහුම ලැජ්ජාවට පත් වන්-
නෝය.' "[10]

**5** "පූජකයෙනි, මෙයට සවන්
දෙන්න.[11] ඊශ්‍රායෙල් සෙනඟ, මේ
දේ හොඳින් සිතට ගන්න. රාජ
වංශය, ඔබත් හොඳින් සවන්
දෙන්න.[12] මන්ද ඔබට විරුද්ධව තීන්-
දුවක් ගෙන ඇත. ඔබ මිශ්පා නුව-
රේ අටවන ලද උගුලකි.[13] ඔබ
තාබෝර් කන්ද[14] මත එළන
ලද දැලකි. **2** 'මාව අත්හැර ගිය
අය බොහෝ සෙයින් ලේ වැගුරුවා
ඇත.[15] මම ඒ සියලුදෙනාටම අව-
වාද කළෙමි.[16] **3** මම එෆ්‍රායිම්ව[17]
හොඳින් හඳුනන්නෙමි. ඊශ්‍රායෙල්ද
මගෙන් සැඟවී නැත.'[18] එෆ්‍රායිම්, ඔබ
ස්ත්‍රීන්ව ගණිකාවන් මෙන් සලක-
මින් ඔවුන් සමඟ අනාචාරයේ යෙ-
දෙන්නෙහිය.[19] ඊශ්‍රායෙල් මුළුමනින්ම
දූෂ්‍ය වී ඇත.[20] **4** ඔවුන්ගේ සිතේ
එකම ආශාව වේශ්‍යාකම් කිරීමය.[21]
ඔවුන්ට යෙහෝවා දෙවි ගැන කිසි
තැකීමක් නැත.[22] එබැවින් ඔවුන්ට

**4 පරි.**
1 යෙසා 24:2
2 හොෂෙ 12:2; ආමො 3:2; රෝම 14:12; හෙබ්‍රෙ 4:13
3 ගීතා 62:12; හිතෝ 5:22; යෙරෙ 17:10; සෙක 1:6
4 ලෙවි 26:26; මීකා 6:14; හග් 1:6
5 හොෂෙ 9:11
6 2ලේක 24:18; ගීතා 125:5; එස 18:24
7 හිතෝ 6:32; හිතෝ 20:1; හිතෝ 23:33; යෙසා 28:7
8 යෙසා 44:13
9 යෙරෙ 2:27; හබ 2:19
10 යෙරෙ 3:9
11 එස 16:17
12 1රාජා 14:23; යෙසා 65:7; යෙරෙ 3:6; එස 20:28
13 2රාජා 17:11; එස 6:13
14 යෙසා 1:29; යෙසා 57:5; යෙරෙ 2:20; එස 20:28
15 1කොරි 6:16
16 ද්වි 23:17
17 යෙසා 44:18; යෙරෙ 4:22; දානි 12:10; හොෂෙ 14:9; රෝම 3:11; එෆී 4:18
18 එස 23:5
19 2රාජා 17:18; යෙරෙ 3:10
20 හොෂෙ 9:15; හොෂෙ 12:11; ආමො 4:4
21 හොෂෙ 5:8; හොෂෙ 10:5

**2 තීරුව**
1 යෙසා 48:1; යෙරෙ 5:2; එස 20:39
2 ගීතා 78:8; ගීතා 81:12; යෙසා 65:2; සෙක 7:11
3 හොෂෙ 11:2; හොෂෙ 13:2
4 මතෙ 15:14
5 යෙසා 1:22
6 හොෂෙ 4:10
7 ගීතා 47:9
8 මීකා 3:11; මීකා 7:3
9 යෙරෙ 4:11
10 යෙසා 42:17; යෙරෙ 2:26

**5 පරි.** **11** හොෂෙ 4:9; මලා 1:6; **12** හොෂෙ 7:3; **13** මීකා 7:2; හබ 1:15; **14** විනි 4:6; යෙරෙ 46:18; **15** යෙසා 29:15; **16** 2ලේක 36:15; **17** යෙසා 7:9; **18** ආමො 3:2; **19** හොෂෙ 4:18; **20** එස 23:5; **21** හොෂෙ 4:12; ආමො 2:7; සෙක 13:2; **22** 1සාමු 2:12; යෙරෙ 9:6.

නැවත තමුන්ගේ දෙවි වෙතට හැරී
එන්න නොහැකිය.[1] **5** ඊශ්‍රායෙල්ව-
රුන්ගේ උඩඟුකම ඔවුන්ට විරුද්-
ධවම සාක්ෂි දෙයි.[2] ඊශ්‍රායෙල් හා
එෆ්‍රායිම් තමන්ගේම පාප නිසා වැටී
යන්නෝය.[3] යූදාද ඔවුන් සමඟම
වැටී යයි.[4] **6** ඔවුන් යෙහෝවා දෙ-
විව සොයමින් තම බැටළුවන් හා ගව-
යන් ඔහු වෙතට රැගෙන යන නමුත්
ඔවුන්ට ඔහුව සම්බ නොවෙයි.[5] මන්ද
දෙවි ඔවුන්ව ප්‍රතික්ෂේප කර ඇත.
**7** ඔවුන් ජාතක කළේ දෙවි නාඳුනන
දරුවන්ය.[6] ඒ නිසා ඔවුන් ද්‍රෝහී වී
සිටින්නේ අන් කිසිවෙකුට නොව, යෙ-
හෝවා දෙවිටය.[7] මාසයක් ඇතුළත
ඔවුහුද ඔවුන්ගේ දේපළද විනාශ වනු
ඇත.[8]

**8** "'ගිබෙයාහි[9] නළාවද රාමාහි
හොරණෑවද පිඹින්න![10] බෙත්-
ආවෙන්හි[11] සිට යුධ ඝෝෂා නඟන්න.
බෙන්ජමින්,[12] ඔබ ඉදිරියෙන් ගමන්
කරන්න. **9** එෆ්‍රායිම්, ඔබට තර-
වටු කරන දවසේදී අන් අය ඔබ
දෙස බලා බොහෝ සෙයින් පුදුමයට
පත් වන්නෝය.[13] සිදු වීමට නිය-
මිත දේ ගැන කිසිවක් නොසඟවා,
මම ඊශ්‍රායෙල්හි සියලු ගෝත්‍රවලට
දැනුම් දුන්නෙමි.[14] **10** යූදාහි පාල-
කයෝ ඉඩම්වල මායිම් වෙනස් කරන
අය මෙන් හැසිරෙන්නෝය.[15] එබැවින්
වේගයෙන් ගලා යන දිය පහරක් මෙන්
මම ඔවුන් පිටට මගේ උදහස වගු-
රුවන්නෙමි. **11** එෆ්‍රායිම් උපකාරය
පැතුවේ සතුරෙකුගෙන්ය. එබැවින්
ඔහු නැති නාස්ති වී ගියේය.[16] ඔහුට
ලැබුණු විනිශ්චය යුක්තිසහගතය.[17]
**12** මම කාවෙකු මෙන්[18] එෆ්‍රායිම්ව
කා දැමුවෙමි. යූදා සෙනඟව කුණු වී
යන්න සැලැස්වුවෙමි.

**13** "'එවිට එෆ්‍රායිම් තම රෝගී
තත්වය වටහාගත්තේය. යූදා තමා-
ගේ තුවාලය දුටුවේය.[19] එබැවින් එෆ්‍රා-
යිම්, ඇසිරියාවේ උපකාරය පතා[20]
මහ රජු වෙතට[21] පණිවිඩකරුවන්
යැව්වේය. නමුත් ඔහුටවත් ඔබේ රෝ-
ගය සුව කිරීමට නොහැකි විය.[22] ඔබේ

**5 පරි.**
1 ගීතා 78:8
2 හිතෝ 30:13
යෙසා 9:9
හොෂෙ 7:10
3 හිතෝ 11:5
4 2රාජා 17:19
එස 23:31
ආමො 2:4
5 හිතෝ 1:28
යෙසා 1:15
යෙරෙ 11:11
එස 8:18
මීකා 3:4
6 මලා 2:11
7 යෙසා 48:8
යෙරෙ 3:20
8 සෙක 11:8
9 යෙසා 10:29
10 යෙරෙ 4:5
හොෂෙ 8:1
යෝවේ 2:1
11 හොෂෙ 4:15
හොෂෙ 10:5
12 විනි 5:14
13 යෙසා 28:3
14 හොෂෙ 9:13
සෙක 1:6
15 ද්වි 19:14
ද්වි 27:17
යෝබ් 24:2
හිතෝ 22:28
16 1රාජා 20:1
17 ද්වි 28:33
18 යෙසා 50:9
යෙසා 51:8
19 යෙරෙ 30:13
20 2රාජා 15:29
2රාජා 16:7
හොෂෙ 8:9
හොෂෙ 12:1
21 හොෂෙ 10:6
22 2ලේක 28:20

**2 තීරුව**
1 යෙරෙ 30:15
2 ගීතා 50:22
විලා 3:10
3 යෙසා 5:29
ආමො 2:14
4 ලෙවී 26:40
5 2ලේක 7:14
යෙරෙ 29:12
හොෂෙ 11:10
6 ද්වි 4:30
1සාමු 13:6
7 ද්වි 30:10
ගීතා 78:34

**6 පරි.**
8 යෙසා 55:7
යෙරෙ 3:22
9 හොෂෙ 5:14
10 යෙරෙ 33:6
හොෂෙ 14:4
11 ද්වි 32:39
යෙරෙ 30:17

තුවාලය සුව කරන්නද ඔහුට නො-
හැකි විය.[1] **14** මම එෆ්‍රායිම් ඉදිරි-
යේ තරුණ සිංහයෙකු මෙන්ද[2] යූදා
සෙනඟ ඉදිරියේ කේශර සිංහයෙකු
මෙන්ද ක්‍රියා කරමි. මම ඔවුන්ව
ඩැහැගෙන කෑලි කෑලිවලට ඉරා
දමා ඇදගෙන යන්නෙමි. ඔවුන්ව
බේරාගැනීමට කිසිවෙකුට නුපුළුවන.[3]
**15** තමන් කළ වරදට[4] ඔවුන් සම්පූර්-
ණයෙන්ම වන්දි ගෙවන තෙක් මම
මාගේ වාසස්ථානයට වී සිටින්නෙමි.
ඔවුහු මාව සොයා එනු ඇත.[5] පීඩා
අද්දකින විට[6] මාගේ උපකාරය පතනු
ඇත.'"[7]

**6** "ජනයෙනි, එන්න අපි නැවත
යෙහෝවා දෙවිට ළං වෙමු.[8]
ඔහු අපිව කැබලිවලට ඉරා දැමුවද[9]
නැවත සුවය ලබා දෙයි.[10] ඔහු අපිට
පහර දුන්නද අපේ තුවාල වෙළුම් පටි-
වලින් බඳිනු ලබයි.[11] **2** දවස් දෙක-
කට පසු ඔහු අපව නැවත ප්‍රාණවත්
කරයි.[12] තුන්වනදා ඔහු අපව නැඟි-
ටුවා, ඔහු ඉදිරියෙහි ජීවත් වන්න
සලස්වයි.[13] **3** එවිට අපි යෙහෝවා
දෙවිව දැන හඳුනා ගන්නෙමු. තව
තවත් හොඳින් ඔහුව දැන හඳුනා
ගන්න උත්සාහ කරන්නෙමු.[14] අලුයම
ස්ථිර ලෙස උදා වන්නාක් මෙන්[15]
ඔහුගේ පැමිණීමද ස්ථිරය.[16] වර්ෂාව
පොළොවට ඇද හැළෙන්නාක් මෙන්
ඔහු අප වෙතට පැමිණෙයි.[17] වසන්ත
කාලයේ පොළොව තෙත් කරන වර්-
ෂාව මෙන් ඔහු පැමිණෙන්නේය."[18]

**4** "'අනේ එෆ්‍රායිම්, අනේ යූදා,
ඔබට මා කෙරෙහි ඇති ප්‍රේමය*
මොහොතකින් නැති වී යන අලු-
යම මීදුම වැනිය. නිමේෂයකින් නැති
වී යන පිනි වැනිය. මා ඔබව කෙ-
සේ නිවැරදි මාර්ගයට ගන්නද?[19]
**5** ඒ නිසා මම අනාගතවක්තෘව-

**12** 2රාජා 20:5; යෙසා 26:19; එස 37:14; 1කොරි 15:4; **13** එළි 11:11; **14** යෙසා 54:13; යෙරෙ 24:7; **15** 2සාමු 23:4; **16** මලා 4:2; **17** යෙසා 44:3; යෝවේ 2:23; **18** යෝබ් 29:23; ගීතා 72:6; **19** යෙසා 5:3; හොෂෙ 11:8.

හොෂෙ **6:4*** හෝ, "ලැදි ප්‍රේමය."

රුන් මාර්ගයෙන් ඔබට විනිශ්ච-
යේ පණිවිඩයක් ප්‍රකාශ කරන්නෙමි.[1]
මගේ මුවින් නික්මෙන ඒ පණිවිඩ-
යෙන් කියාපාන්නේ ඔබේ විනාශයයි.[2]
ඔබ ලබන දඬුවම, එදාට හිරු එළිය
මෙන් පැහැදිලිව දිස් වෙයි.[3] **6** මට
වටින්නේ ප්‍රේමය* මිස[4] පූජාව නො-
වෙයි.[5] මාව දැන හඳුනා ගෙන කට-
යුතු කිරීම දවන පූජාවලට වඩා මම
අගය කරන්නෙමි.[6] **7** නමුත් අන්
මිනිසුන් මෙන් ඔවුහුද මගේ ගිවිසුම
කඩ කළෝය.[7] ඔවුහු තම තමන්ගේ
නගරවල සිට මට ද්‍රෝහිකම්
කරන්නෝය.[8] **8** ගිලියද්[9] අපරාධ-
කරුවන්ගෙන් පිරී ඇත. ඔවුහු යන
යන තැන ලේ වගුරුවන්නෝය.[10]
**9** එහි සිටින පූජකයෝ කොල්ලකරු-
වෝය.[11] ඔවුහු කවරෙකු හෝ මරා
දමන්න මාන බලමින් සිටින්නෝය.[12]
ඔවුන්ගේ සිත් පෙලඹෙන්නේ නින්-
දිත දේ කිරීමටය.[13] ඔවුන් ෂීකෙම්
නගරය[14] අසල මිනී මරන්නේ ඒ
නිසාය. **10** ඊශ්‍රායෙල් දේශය තුළ
පිළිකුල්සහගත දෙයක් මම දුටු-
වෙමි.[15] එෆ්‍රායිම් වේශ්‍යාකම් කරන්-
නේය.[16] ඊශ්‍රායෙල් දූෂ්‍ය වී ඇත.[17]
**11** එහෙත් යූදා වැසියෙනි, සරුසාර
අස්වැන්නක් මෙන් මම ඔබව එකතු
කරන්නෙමි. විසිරී සිටින මගේ සෙ-
නඟ නැවත රැගෙන ඒමට මම තීර-
ණය කළෙමි.’ ”[18]

# 7

“මා ඊශ්‍රායෙල් සෙනඟට සුවය
ගෙන දෙන්න උත්සාහ කරන
සෑම අවස්ථාවකදීම[19] එෆ්‍රායිම් කරන
වැරදිද[20] සමාරියේ දුෂ්ටකම්ද හෙළි
වන්නේය.[21] ඔවුහු දිගටම වංච-
නික ලෙස හැසිරෙන්නෝය.[22] ඔවුහු
ගෙවල්වලට කඩාපැන සොරකම්
කරති. ඔවුහු මඟ රැක සිට කොල්ල
කති.[23] **2** තමන් කරන සෑම නරක
දෙයක්ම මට අමතක නොවන බව[24]
ඔවුහු සැලකිල්ලට ගන්නේ නැත.[25]
ඔවුන්ගේ දුෂ්ට ක්‍රියාවල ප්‍රතිඵලවලින්
ඔවුන්ට කිසිසේත් ගැලවීමට නො-
හැකිය.[1] ඒ කිසිවක් මගෙන් සැඟවී
නැත.[2] **3** ඔවුහු දුෂ්ට ක්‍රියා කර රජු-
ගේ සිත සතුටු කරති. වංචනික
දේවල් කර පාලකයන්ගේ සිත් දිනා-
ගනිති.[3] **4** ඒ සියලුදෙනාම අනා-
චාරයේ* යෙදෙති.[4] ඔවුන් රොටි
පුලුස්සන්නෙකු විසින් අවුළුවන ලද
ගිනි උඳුනකට සමානය. ඔහු පිටි
අනා පිපෙන තුරු බලා සිටින අත-
රතුර උඳුන දිගටම ඇවිළෙයි. එය
මොන තරම් රත් වී ඇද්ද කිව්වොත්
ඔහු ගින්න තවත් අවුළුවන්නේ නැත.
**5** අපේ රජුගේ උත්සව දවසේදී පාල-
කයෝ ඔක්කාරයට එන තෙක් වයින්
බීවෝය.[5] වයින් නිසා ඔවුන්ගේ කෝ-
පය ඇවිස්සී ඇත.[6] සමච්චල් කරන්-
නන් සමඟ රජද එකතු වී සිටියි.
**6** ගිනි උඳුනක් ළඟ තිබෙන යමක්
රත් වන්නා සේ ඔවුන්ගේ වැරදි ආශා[7]
ඔවුන් තුළම දැවෙමින් තිබේ.[8] මුළු
රාත්‍රිය පුරා රොටි පුලුස්සන්නා නිදා-
ගෙන සිටියි. උදේ වන විට ඔහු ගිනි
උඳුන තව තවත් අවුළවන්නේය.[9]
**7** ඔවුහු සියලුදෙනා ගිනි උඳුන මෙන්
ඇවිළී ඔවුන්ගේ විනිශ්චයකරුවන්ව
විනාශ කර දමති. ඔවුන්ගේ රජ-
වරු සියලුදෙනාම වැටී ගොස් ඇත.[10]
ඔවුන්ගෙන් එක් කෙනෙක්වත් මට
හඬගසන්නේ නැත.[11]

**8** “එෆ්‍රායිම් වෙනත් ජාතීන් සමඟ
මිත්‍රකම් පවත්වයි.[12] ඔහු එක් පැත්-
තක් පමණක් පුලුස්සන ලද රොටියක්
වැනිය.[13] **9** විදේශිකයෝ පැමිණ
ඔහුගේ බලය බිඳ දැමූහ.[14] නමුත් ඔහු
ඒ වගක් නොදනියි.[15] ඔහුගේ හිස-
කෙස් සියල්ල සුදු වී ඇත. නමුත් ඔහු
ඒ වගක් නොදනියි. **10** ඊශ්‍රායෙල්ව-
රුන්ගේ උඩඟුකම ඔවුන්ටම විරුද්ධව
සාක්ෂි දෙයි.[16] ඔවුහු තම දෙවි වන
යෙහෝවා වෙතට තවමත් හැරුණේ

**6 පරි.**

**1** 2ලේක 21:12 යෙසා 58:1 යෙරෙ 1:10 එස 3:9
**2** යෙරෙ 23:29
**3** ශෙප 3:5
**4** මීකා 6:8 මීකා 7:18 මතෙ 12:7
**5** හිතෝ 21:3 යෙසා 1:11 මීකා 6:6 මතෙ 9:13
**6** 1සාමු 15:22 1යොහ 2:3
**7** 2රාජා 17:15 යෙසා 24:5 හොෂෙ 8:1 හෙබ්‍රෙ 8:9
**8** යෙසා 48:8
**9** හොෂෙ 12:11
**10** 1රාජා 2:5 මීකා 7:2
**11** එස 22:25
**12** හිතෝ 1:11
**13** එස 22:9
**14** 1රාජා 12:25
**15** යෙරෙ 5:30 යෙරෙ 23:14
**16** 2රාජා 17:7 යෙරෙ 3:6
**17** එස 23:4 එස 23:11
**18** ද්වි 30:3 යෙරෙ 29:14 ආමො 9:14

**7 පරි.**

**19** ද්වි 32:39
**20** යෙසා 28:1 මීකා 6:16
**21** එස 16:46 ආමො 8:14 මීකා 1:5
**22** යෙරෙ 9:3 මීකා 7:3
**23** හොෂෙ 6:9
**24** යෙරෙ 14:10 ආමො 8:7
**25** ද්වි 32:29 යෙසා 1:3 යෙසා 44:19

**2 තීරුව**

**1** ගීතා 9:16 හිතෝ 5:22
**2** ගීතා 90:8 හිතෝ 5:21
**3** 1රාජා 22:6 යෙරෙ 5:31 රෝම 1:32
**4** යෙරෙ 3:9 මලා 3:5
**5** හිතෝ 20:1 යෙසා 28:1
**6** යෙසා 5:11 හබ 2:15

**7** 2සාමු 13:28; **8** හිතෝ 4:16; **9** මීකා 2:1; **10** 2රාජා 15:10; 2රාජා 15:14; **11** යෙසා 9:13; එස 22:30; දානි 9:13; **12** ගීතා 106:35; එස 23:5; **13** 1රාජා 18:21; එළි 3:15; **14** 2රාජා 13:3; 2රාජා 15:19; **15** හිතෝ 23:35; **16** යෙරෙ 3:3; හොෂෙ 5:5.

හොෂෙ **6:6*** හෝ, “ළැදි ප්‍රේමය.”

හොෂෙ **7:4*** මූ.අ., “පරදාර සේවනයේ.”

නැත.[1] මෙතරම් දේ සිදු වුණත්
ඔවුහු දෙවිගෙන් මඟ පෙන්වීම් පැතු-
වේ නැත.[2] **11** එෆ්‍රායිම් මෝඩ ලෙස
හැසිරෙන[3] පරෙවියෙකු වැනිය.[4] ඔහු
උපකාරය පතා හඬගැසුවේ ඊජිප්තුව-
ටය.[5] ඔහු උපකාර පතා ඇසිරියාව
පිටුපසද ගියේය.[6]

**12** "'ඔවුන් කොතැනට ගියත් මා
හෙළන දැලෙන් ඔවුන්ට ගැලවී යා
නොහැක.[7] ආකාශයේ පක්ෂීන්ව අල්-
ලාගන්නාක් මෙන් මම ඔවුන්ව අල්-
ලාගෙන බිමට හෙළමි.[8] ඔවුන්ට
අනතුරු ඇඟවූ ලෙසම මම ඔවුන්ට
දඬුවම් කරන්නෙමි.[9] **13** මාගෙන්
ඈත්ව ගිය නිසා[10] ඔවුන් පිටට මහත්
විපතක් පැමිණෙනු ඇත.[11] මට විරුද්-
ධව පව් කළ නිසා ඔවුහු විනාශ
වී යන්නෝය. මා ඔවුන්ව බේරා-
ගන්න කොතරම් උත්සාහ කළද[12]
ඔවුහු මා ගැනද බොරු කියති.[13]
**14** ඔවුන් ඇඳේ පෙරළෙමින් මො-
රගැසුවත් ඔවුන් මගෙන් උපකාරය
පතන්නේ අවංක සිතකින් නො-
වෙයි.[14] ධාන්‍ය හා අලුත් වයින්
භුක්ති විඳිමින් නිකරුණේ කාලය ගත
කරන ඔවුහු[15] මට විරුද්ධව කැරලිග-
සති.[16] **15** මම ඔවුන්ට හික්මවීමක්
දුන්නෙමි.[17] ඔවුන්ගේ දැත් සවිමත්
කළෙමි.[18] එනමුත් ඔවුන් දුෂ්ට ලෙස
කුමන්ත්‍රණ කළේ මට විරුද්ධවයි.[19]
**16** ඔවුහු සැබෑ නමස්කාරයට නැවත
හැරී ආවේ නැත.[20] ඔවුන් පටිය ලිහිල්
වූ දුන්නක් හා සමානය.[21] ඔවුන්-
ගේ අපහාසාත්මක කතා නිසා ඔවුන්-
ගේ පාලකයෝ කඩුවෙන් මැරුම් කනු
ඇත.[22] ඔවුන්ට ඊජිප්තු දේශයේදී අත්
විඳින්න සිදු වන නින්දාව එයයි.' "[23]

**8** "'හොරණෑව පිඹින්න සූදානම්
වෙන්න![24] සතුරෝ රාජාලියෙකු
මෙන්[25] යෙහෝවා දෙවි වන මාගේ
ගෘහයට හදිසියෙන් කඩාවදින්නෝය.
මන්ද මාගේ සෙනඟ මාගේ ගිවිසුමද[26]
නීතියද කඩ කර තිබේ.[27] **2** නමුත්
ඊශ්‍රායෙල් සෙනඟ, "අපේ දෙවියනි, අපි
ඔබව හඳුනාගෙන සිටින්නෙමු" කියා
මට කියන්නෝය.[28]

**3** "'ඊශ්‍රායෙල් සෙනඟ යහපත් දේ
ප්‍රතික්ෂේප කර ඇත.[1] එබැවින් සතු-
රෝ ඔවුන්ව ලුහුබැඳ එත්වා![2]
**4** ඔවුහු මාගේ සැලැස්ම ප්‍රතික්-
ෂේප කරමින් හිතුමනාපෙට රජව-
රුන්ව පත් කරගෙන ඇත.[3] තමන්ගේ
කැමැත්තට අනුව පාලකයන්ව පත්
කරගෙන ඇත. නමුත් ඔවුහු ඒ ගැන
මාගෙන් විමසුවේ නැත. ඔවුහු තමන්-
ගේ රන් රිදීවලින් දේවතා රූප සාදා-
ගත්තෝය.[4] එබැවින් ඔවුන්ට අත්
වන්නේ විනාශය පමණි.[5] **5** සමාරි-
යේ ජනයෙනි, ඔබ සාදාගත් වස්සාව
මට පිළිකුලකි.[6] මාගේ කෝපය ඔබට
විරුද්ධව ඇවිළෙයි.[7] ඔබේ සිත් පිරිසිදු
කරගන්න තව කොපමණ කලක් ගත
වෙයිද?[8] **6** සමාරිවරුන්ගේ වස්සා
සුනුවිසුනු වී යයි.[9] මන්ද එය ඊශ්‍රායෙල්
සෙනඟ විසින් නිර්මාණය කරන ලද්-
දකි.[10] එය රන්කරුවෙකු විසින් සාදන
ලද රූපයක් පමණි.[11] එසේනම්, එයට
සැබෑ දෙවි කියා පවසන්නේ කෙසේද?

**7** "'ඔවුහු සුළඟ වපුරා සුළිසු-
ළඟ කපාගනිති.[12] ඔවුන්ගේ කෙත්වල
කරල් හටගන්නේ නැත.[13] කෙත්වල
පැළ හටගත්තත් ඒවායින් පිටි ලබා-
ගත නොහැක.[14] පිටි ලැබුණත් විදේ-
ශිකයෝ ඇවිත් ඒ සියල්ල කා දමති.[15]

**8** "'ඊශ්‍රායෙල් සෙනඟ සතුරාගේ
අතට හසු වෙති.[16] ඔවුන්ව වෙනත්
ජාතිකයන් අතරට යවනු ලබයි.[17]
අහක දමන භාජනයක් මෙන් ඔවුහු
කිසි වැදගැම්මකට නැති සෙනඟක්
බවට පත් වන්නෝය.[18] **9** නොහික්-
මුණු සීබ්‍රාවෙකු මෙන් ක්‍රියා කරන
ඔවුහු[19] ඇසිරියාවට ගොස් ඇත.[20]
එෆ්‍රායිම්වරු ගණිකාවන්ව කුලියට
ගෙන ඇත.[21] **10** ඔවුන් එම ගණි-

**7 පරි.**

**1** නෙහෙ 9:35
යෙසා 9:13
යෙරෙ 8:5
ආමො 4:6
සෙක 1:4
**2** ගීතා 14:2
රෝම 3:11
**3** හිතෝ 15:32
යෙසා 1:3
**4** හොෂෙ 11:11
**5** 2රාජා 17:4
යෙසා 30:2
**6** 2රාජා 15:19
යෙරෙ 2:18
එස 23:5
**7** එස 12:13
**8** දේශ 9:12
**9** ද්වි 28:15
2රාජා 17:13
යෙසා 28:26
**10** යෙරෙ 2:5
**11** යෙසා 31:1
එස 16:23
**12** යෙසා 41:14
මීකා 6:4
**13** යෙසා 59:13
**14** ගීතා 78:37
යෙසා 29:13
යෙරෙ 3:10
සෙක 7:5
**15** විනි 9:27
ආමො 2:8
**16** ගීතා 78:57
**17** ගීතා 94:12
හෙබ්‍රෙ 12:6
**18** 2රාජා 13:5
**19** හිතෝ 6:14
නාහු 1:9
**20** යෙරෙ 3:10
**21** ගීතා 78:57
**22** ගීතා 12:4
ගීතා 73:9
යෙසා 3:8
**23** එස 36:20
හොෂෙ 9:3

**8 පරි.**

**24** යෙරෙ 4:5
හොෂෙ 5:8
**25** ද්වි 28:49
යෙරෙ 48:40
හබ 1:8
**26** යෙරෙ 31:32
එස 16:59
හොෂෙ 6:7
**27** 2රාජා 17:15
යෙසා 24:5
**28** යෙසා 48:1
මීකා 3:11
තීත 1:16

**2 තීරුව**

**1** ගීතා 36:3
ගීතා 50:17
**2** ලෙවී 26:36
විලා 4:19
**3** 1රාජා 12:20
**4** 1රාජා 12:28
හොෂෙ 13:2

**5** 1රාජා 13:34; යෙරෙ 44:8; **6** යෙසා 45:20; හොෂෙ 10:5; **7** ද්වි 32:22; 2රාජා 17:18; **8** යෙරෙ 4:14; යෙරෙ 13:27; **9** 2රාජා 23:15; 2රාජා 23:19; 2ලේක 31:1; **10** ගීතා 106:19; **11** ගීතා 135:15; යෙසා 44:9; යෙරෙ 10:3; හබ 2:18; **12** යෝබ් 4:8; හිතෝ 22:8; ගලා 6:7; **13** යෙසා 17:11; **14** යෙරෙ 12:13; **15** ද්වි 28:33; 2රාජා 15:29; **16** 2රාජා 18:11; යෙරෙ 50:17; යෙරෙ 51:34; **17** ලෙවී 26:33; **18** යෙසා 30:14; යෙරෙ 22:28; යෙරෙ 48:38; **19** යෙරෙ 2:24; **20** 2රාජා 15:19; එස 23:5; හොෂෙ 5:13; හොෂෙ 12:1; **21** එස 16:33.

කාවන්ව කුලියට ගත්තේ වෙනත්
ජාතිකයන් අතරින්ය.[1] එහෙත් මම
දැන් ඔවුන්ව එක් රැස් කරන්නෙමි.
එවිට ඊශ්‍රායෙල් සෙනඟ කෙටි කල-
කට ඔවුන්ගේ රජු නිසාද පාලකයන්
නිසාද පීඩා විඳින්නෝය.[2]

**11** “‘එප්‍රායිම්, බොහෝ පූජාසන
සාදාගනිමින් තව තවත් පව් කළේය.[3]
එම පූජාසන නිසා ඔවුහු තව තවත්
පාපයට ඇද වැටුණෝය.[4] **12** මගේ
නීතියේ සඳහන් බොහෝ දේවල්
මා ඔවුන්ට ලියා දුන්නද[5] ඔවුහු ඒ
ගැන කිසිදු තැකීමක් කළේ නැත.[6]
**13** ඔවුහු තෑගි වශයෙන් මට පූජා
ඔප්පු කර[7] ඒවායින් කන්නෝය.
නමුත් යෙහෝවා දෙවි වන මම
ඔවුන්ගේ පූජා පිළිකුල් කරන්නෙමි.[8]
දැන් මම ඔවුන්ගේ පාප සිහි කර-
මින් ඔවුන්ට දඬුවම් කරන්නෙමි.[9]
ඔවුහු නැවතත් ඊජිප්තුවට ගියෝය.[10]
**14** ඊශ්‍රායෙල්වරු ඔවුන්ගේ සැදුම්ක-
රුව අමතක කර[11] දේවස්ථාන සාදා-
ගත්තෝය.[12] යූදා බලකොටු සහිත
නුවරවල් බොහොමයක් තනාගත්-
තේය.[13] එබැවින් මම ගින්නක් එවා
ඒ නුවරවල තිබෙන සියලු මාලිගා
විනාශ කර දමන්නෙමි.’ ”[14]

**9** “ඊශ්‍රායෙල් සෙනඟෙනි, ප්‍රීති
නොවන්න.[15] වෙනත් ජාතිකයන්
මෙන් විනෝද නොවන්න.[16] මන්ද
ඔබ ඔබේ දෙවිට විරුද්ධව ද්‍රෝහි-
කම් කර ඔහුගෙන් ඈත් වී ඇත.[17]
ඔබ කමත්වල අනාචාරයේ යෙදෙමින්
කුලී ලබාගන්නේ මහත් සතුටිනි.[18]
**2** එබැවින් කමතෙන්වත් මිදි යන්ත්‍ර-
යෙන්වත් ඔබට කිසිවක් ලැබෙන්නේ
නැත.[19] ඔබ අලුත් වයින්වලින් තෘප්-
තියට පත් වන්නේ නැත.[20] **3** ඔබ
යෙහෝවා දෙවිගේ දේශයේ තව වැඩි
කල් ජීවත් වන්නේ නැත.[21] එප්‍රා-
යිම්ට නැවත ඊජිප්තුවට යන්න සිදු
වෙයි.[22] ඇසිරියාවේදී ඔවුන්ට අපවිත්‍ර
දේ කන්න සිදු වෙයි.[23] **4** ඔවුන්ට
ඒ කාලයේදී යෙහෝවා දෙවිට පාන
පූජා ලෙස වයින් ඔප්පු කිරීමට

**8 පරි.**

1 එස 16:37 එස 23:9
2 2රාජා 14:26 1ලේක 5:26
3 යෙසා 10:11 එස 6:13
4 ද්වි 4:28 හොෂෙ 12:11
5 ද්වි 4:6 ගීතා 119:18 හිතෝ 22:20
6 2රාජා 17:15 නෙහෙ 9:26 යෙසා 30:9
7 යෙරෙ 7:21
8 1සාමු 15:22 හිතෝ 21:27 යෙසා 1:11 ආමො 5:22
9 හොෂෙ 9:9 ආමො 8:7
10 හොෂෙ 7:16 හොෂෙ 9:3
11 ද්වි 32:18 යෙසා 51:13
12 1රාජා 12:31
13 2ලේක 26:10
14 2රාජා 18:13 2ලේක 36:19 යෙරෙ 17:27 යෙරෙ 34:7

**9 පරි.**

15 හොෂෙ 10:5 ආමො 6:13
16 එස 20:32
17 එස 23:5 හොෂෙ 4:12
18 හොෂෙ 2:12 මීකා 1:7
19 හොෂෙ 2:9
20 යෙසා 24:7 ආමො 5:11
21 ලෙවී 20:22 ද්වි 28:64 යොෂු 23:15 1රාජා 9:7
22 ද්වි 28:68 හොෂෙ 8:13
23 2රාජා 17:6 එස 4:13

**2 තීරුව**

1 ගණන් 15:5 ගණන් 28:14 යෝවෙ 1:13
2 යෙසා 1:11 යෙරෙ 6:20
3 ගණන් 28:2
4 ද්වි 26:14
5 යෝවෙ 1:14
6 හොෂෙ 7:13
7 හොෂෙ 7:16 හොෂෙ 8:13
8 යෙරෙ 2:16
9 හිතෝ 24:31 යෙසා 7:23

ලැබෙන්නේ නැත.[1] ඔවුන් පූජා ඔප්පු
කළද ඒ පූජාවලින් දෙවි කිසිසේත්
සතුටට පත් වන්නේ නැත.[2] එම
පූජා කන සියලුදෙනාම අපවිත්‍ර වන්-
නෝය. ඒ කෑම ප්‍රයෝජනවත් වන්-
නේ ඔවුන්ගේ කුසගින්න නිවාලීමට
පමණි. ඒවා යෙහෝවා දෙවිගේ ගෘහය
තුළට ගෙන යෑමට සුදුසු නැත.[3] ඒවා
මළ ගෙවල්වල දෙන කෑම හා සමා-
නය.[4] **5** ශුද්ධ එක්රැස්වීම් පවත්වන
දවස්වලදීත් යෙහෝවා දෙවි වෙනු-
වෙන් උත්සව පවත්වන දවස්වලදීත්
ඔබ කුමක් කරනු ඇද්ද?[5] **6** සතු-
රෝ දේශය ආක්‍රමණය කර ඔබෙන්
සියල්ල පැහැරගන්නෝය. ඔබට දේ-
ශයෙන් පලා යන්න සිදු වෙයි.[6] ඔබ
පලා ගියද ඊජිප්තුවරුන්ගේ අතට
ඔබව හසු වනු ඇත.[7] ඔබේ මළ සිරුරු
මෙම්ෆිස් නගරයේදී[8] තැන්පත් කරනු
ලබයි. ඔබ සතු වටිනා රිදී භාණ්ඩ
කටු ගස් අතරේ සැඟවී යනු ඇත.[9]
ඔබේ කූඩාරම්ද කටු පඳුරුවලින් වැසී
යනු ඇත.[10]

**7** “ඊශ්‍රායෙල් සෙනඟව සෝදිසි
කරනු ලබන දවස නොවරදවාම පැමි-
ණෙයි.[11] ඒ දවසේදී ඔවුන් කළ වැරදි-
වලට නිසි දඬුවම් ලැබෙයි.[12] එවිට
ඔවුන්ගේ අනාගතවක්තෘවරුන් මෝ-
ඩයන් බවත්[13] දිවැසිවරුන් සිහිවි-
කල්ව කටයුතු කරන අය බවත් දෙවි
ඔප්පු කරනු ඇත.[14] ඊශ්‍රායෙල් සෙ-
නඟටත් එය පිළිගැනීමට සිදු වනු
ඇත.[15] මන්ද ඔවුහු සීමාවක් නො-
මැතිව බරපතළ වැරදි කරන්නෝය.
මහත් වෛරයකින් දෙවිට විරුද්ධව
ක්‍රියා කරන්නෝය.”

**8** එප්‍රායිම්හි මුරකරුවා[16] මාගේ
දෙවිට සමීපව සිටියේය.[17] නමුත්
දැන් එහි අනාවැකි පවසන තැනැත්-
තාගේ ක්‍රියාවන්[18] කුරුලු දඩයක්-
කරුවෙකු විසින් අටවන උගුලක්

**10** යෙසා 5:6; යෙසා 32:13; යෙසා 34:13; **11** යෙසා 10:3; යෙරෙ 10:15; ලූක් 19:44; **12** ලූක් 21:22; **13** යෙසා 44:25; යෙරෙ 6:14; **14** එස 14:10; **15** ගීතා 9:16; **16** යෙරෙ 6:17; යෙරෙ 31:6; එස 33:7; **17** 1රාජා 17:1; 2රාජා 2:14; **18** 1රාජා 18:19; යෙරෙ 6:14; යෙරෙ 14:13.

මෙනි.[1] එෆ්‍රායිම්ගේ දෙවිගේ ගෘහය
තුළ එකිනෙකා වෛරයෙන් කටයුතු
කරති. **9** ගිබෙයා නගරයේ වැසි-
යන් මෙන්[2] ඔවුහුද සහමුලින්ම පිරිහී
ඇත.[3] දෙවි ඔවුන්ගේ පාප සිහි කර[4]
ඔවුන්ට දඬුවම් කරනු ඇත.

**10** "'ඊශ්‍රායෙල් මට මුලදී සම්බ
වූ විට ඔහු පාළුකරයෙන් කඩා-
ගත් මිදිපොකුරක් මෙන් විය.[5] ඔබේ
මුතුන්මිත්තන්ව මුලින්ම දුටුදා මා
ඔවුන්ව සැලකුවේ අත්තික්කා ගසේ
මුල් පලදාව ලෙසය.[6] නමුත් ඔවුහු
පෙයෝර් කන්දේ බාල් දෙවියා පසුපස
ගියෝය.[7] ඔවුහු පිළිකුල් දේට ඇලුම්
කර ඒ වෙනුවෙන් තම ජීවිත කැප
කළහ.[8] ඒ නිසා, ඔවුන් ඇලුම් කළ
ඒ පිළිකුල් දේ මෙන් ඔවුහුද මට
මහත් පිළිකුලක් වූහ.[9] **11** කුරුල්-
ලෙකු ඉගිලී යන්නාක් මෙන් එෆ්‍රායිම්-
ගේ තේජසද පහ වී යයි.[10] එබැවින්
එහි වැසියන් අතරේ ගැබිනි මවක
දක්නට නොලැබෙයි. කිසිවෙක් දරු-
වෙකු පිළිසිඳගන්නේවත් බිහි කරන්-
නේවත් නැත.[11] **12** ඔවුන් දරුවන්
හදා වඩා ගත්තද වැඩිහිටිභාවයට
පා තැබීමට පෙර ඒ දරුවෝ මිය
යනු ඇත.[12] මා ඔවුන්ගෙන් ඈත් වන
විට ඔවුන්ට දැනෙන වේදනාව මොන
තරම්ද![13] **13** මා එෆ්‍රායිම්ව සැලකු-
වේ, සශ්‍රීක භූමියක පිහිටා තිබෙන
තීර් දේශය මෙනි.[14] නමුත් එෆ්‍රායිම්
පවා තම දරුවන්ව මිනී මරුවෙකුට
භාර දෙනු ඇත.'"[15]

**14** යෙහෝවා දෙවියනි, ඔවුන්ට
ලැබිය යුතු දඬුවම දෙන්න.[16] ඔවුන්ට
දරුපලවත්[17] කිරි එරෙන පියයුරුවත්
නොදෙන්න.

**15** "'ඔවුහු ගිල්ගාල් නගරයේදී
සියලු දුෂ්ටකම් කළෝය.[18] ඒ නිසා
මම ඔවුන්ව හෙළාදකින්නෙමි.[19] ඔවුන්
කළ නපුරු දේවල් නිසා මම මගේ
ගෘහයෙන් ඔවුන්ව පන්නා දමන්-
නෙමි.[20] තවදුරටත් මම ඔවුන්ට ප්‍රේම
නොකරන්නෙමි.[21] ඔවුන්ගේ සෑම
පාලකයෙකුම මුරණ්ඩුය.[22] **16** එෆ්‍රා-
යිම් ගසක් මෙන් කපා දැමිය යුතුයි.[23]
එහි මුල් වියළී යා යුතුයි.[1] එවිට කිසි
පලදාවක් එයින් නොලැබේ.[2] ඔවුන්
දරුවන් බිහි කළද ආදරයෙන් හදා
වඩා ගන්නා එම දරුවන්ව මම විනාශ
කරන්නෙමි.'"[3]

**17** ඔවුහු මගේ දෙවිට[4] සවන් නො-
දුන්නෝය.[5] ඒ නිසා දෙවිද ඔවුන්ව
ප්‍රතික්ෂේප කරනු ඇත. ඔවුහු ජාතීන්
අතරේ මංමුළා වනු ඇත.[6]

**10** "ඊශ්‍රායෙල් ක්‍රමක්‍රමයෙන්
නිසරුභාවයට පත් වන මිදි-
වැලක් හා සමානය.[7] ඔහු පල දරන්-
නේ තමා වෙනුවෙන් පමණි.[8] ඔහුගේ
පලදාව වැඩි වන තරමටම ඔහු පූජා-
සනද වැඩි කරගනියි.[9] දේශයේ සශ්‍රී-
කත්වය වැඩි වන තරමටම ඔහු
බොරු නමස්කාරය සඳහා අලංකාර
කණුද ඉදි කරගනියි.[10] **2** ඔවුන්ගේ
සිත් කුහකකමින් පිරී තිබේ.[11] ඔවුන්-
ගේ වැරදි හෙළි කරනු ඇත.

"දෙවි ඔවුන්ගේ පූජාසන කඩා දමා,
බොරු නමස්කාරය සඳහා ඔවුන්
ඉදි කළ කණු විනාශ කරන්නේය.[12]
**3** එවිට ඔවුහු මෙසේ කියති. 'අප යෙ-
හෝවා දෙවිට ගරුබිය නොපෙන්වූ
නිසා දැන් අපට රජෙක් නැත.[13] අපට
රජෙකු සිටියත් අප වෙනුවෙන් කිසි-
වක් කරන්න ඔහුට පුළුවන්ද?'

**4** "ඔවුහු නිෂ්ඵල වචන පවසන්-
නෝය. බොරු පොරොන්දු දෙමින්[14]
ගිවිසුම් ඇති කරගන්නෝය.[15] කුඹුරේ
ලියැදිවල විෂ පැළෑටි වැඩෙන්නාක්
මෙන් අයුක්තිය දසත පැතිර තිබේ.[16]
**5** බෙත්-ආවෙන්හි වසු රූපය[17] සතු-
රෝ පැහැරගන්නෝය.[18] එයට කුමක්
සිදු වේවිදැයි සිතමින් සමාරියේ වැසි-
යෝ භය වන්නෝය. ඊට නමස්-
කාර කරමින් එහි තේජස ගැන මහත්
ආඩම්බරයෙන් සිටි පූජකයන්ටත් ජන-
යාටත් ඒ ගැන හඬා වැලපෙන්න සිදු
වනු ඇත. **6** ඒ රූපය ඇසිරියාවේ

**9 පරි.**
**1** විලා 2:14
**2** විනි 19:22
විනි 20:5
හොෂෙ 10:9
**3** යෙසා 31:6
**4** හොෂෙ 8:13
**5** යෙරෙ 2:2
යෙරෙ 31:2
**6** ගණන් 13:23
යෙසා 28:4
මීකා 7:1
**7** ගණන් 25:3
ද්වි 4:3
ගීතා 106:28
**8** 1රාජා 16:31
යෙරෙ 11:13
**9** යෙසා 66:3
එස 7:20
ආමො 4:5
**10** යාකො 1:11
**11** ද්වි 28:18
**12** ද්වි 28:32
ද්වි 32:25
යෙරෙ 15:7
**13** ද්වි 31:17
2රාජා 17:18
**14** එස 28:12
**15** 2රාජා 15:16
යෙරෙ 9:21
**16** ලූක් 23:29
**17** ගීතා 58:8
**18** හොෂෙ 4:15
හොෂෙ 12:11
ආමො 5:5
**19** එස 23:18
**20** ලෙවී 26:33
2රාජා 17:18
ගීතා 78:60
ආමො 5:27
**21** ද්වි 29:20
**22** යෙසා 1:23
එස 22:27
මීකා 3:11
**23** යෙසා 7:8

**2 තීරුව**
**1** මලා 4:1
**2** යෙසා 5:24
**3** එස 24:21
**4** ගීතා 31:14
යෙසා 7:13
මීකා 7:7
**5** 2රාජා 17:14
2ලේක 36:16
යෙරෙ 25:3
සෙක 1:4
**6** ද්වි 28:64
ආමො 9:9

**10 පරි.**
**7** යෙසා 5:1
එස 15:6
**8** සෙක 7:6
**9** යෙරෙ 2:28
එස 6:13
හොෂෙ 8:11
හොෂෙ 12:11
**10** 1රාජා 14:23
හොෂෙ 8:4

**11** 1රාජා 18:21; ශෙප 1:5; **12** යෙරෙ 43:13; මීකා 5:13; සෙක 13:2; **13** හොෂෙ 3:4; හොෂෙ 13:11; **14** 2රාජා 17:4; එස 17:13; **15** හොෂෙ 6:7; **16** ද්වි 29:18; යෙසා 5:7; ආමො 5:7; ආමො 6:12; **17** 1රාජා 12:28; හොෂෙ 4:15; ආමො 3:14; **18** 1සාමු 4:21.

මහ රජුට[1] තෑගි කරනු ලැබේ. එවිට
එෆ්‍රායිම් ලැජ්ජාවට පත් වෙයි.[2] ඊශ්‍රා-
යෙල් තමන් යෙදූ උපායන් ගැන ලැජ්-
ජාවට පත් වෙයි.[3] **7** සමාරිය සහ
එහි රජ, වතුරට ගසාගෙන යන කෝටු
කැල්ලක් මෙන් පහ වී යන්නෝය.[4]
**8** ඊශ්‍රායෙල්වරුන්ගේ පාපයට හේතු
වූ[5] බෙත්-ආවෙන්හි පූජනීය ස්ථාන[6]
සියල්ල සම්පූර්ණයෙන්ම විනාශ වී
යනු ඇත. ඔවුන්ගේ පූජාසන[7] කටු පඳු-
රුවලින් හා වල් පැළෑටිවලින් වැසී යනු
ඇත.[8] ඒ කාලයේදී සෙනඟ කඳුවලට
කතා කර 'අපව වසාගන්න' කියාද
හෙල්වලට කතා කර 'ඇවිත් අපව
සඟවාගන්න' කියාද පවසනු ඇත.[9]

**9** "'ඊශ්‍රායෙල්වරුනි, ඔබ ගිබෙයා
නගරයේදී[10] පව් කළ දවසේ සිට[11] මේ
දක්වාම පාපයේ නියැලී ඇත. ඔබේ
හැසිරීමේ කිසි වෙනසක් සිදු වී නැත.
ගිබෙයාහි දුෂ්ට මනුෂ්‍යයන්ට විරුද්ධව
යුද්ධ කළද ඔවුහු සම්පූර්ණයෙන්ම
විනාශ වී ගියේ නැත.[12] **10** නමුත්
මම කැමති වේලාවට ඔවුන්ට දඬුවම්
කරන්නෙමි.[13] ජාතීහු ඔවුන්ට විරුද්-
ධව නැඟී එති. එවිට ඔවුන් කළ අප-
රාධ දෙකේම බර ඔවුන්ට උසුලාගෙන
යන්න සිදු වෙයි.[14]

**11** "'එෆ්‍රායිම් කරල් පාගන්න පුරුදු
කළ වැස්සියක මෙන් සිටියාය. ඇයද
ඉතා ආශාවෙන් කරල් පෑගුවාය.[15] මම
ඇගේ ශෝභමාන ගෙලට මගේ අත
තැබුවෙමි. නමුත් සීසාන පිණිස ඇයව
දක්කාගෙන යන්න මම සතුරෙකුට
ඉඩහරින්නෙමි.[16] යූදාට සතුරා වෙනු-
වෙන් සීසාන්න සිදු වෙයි.[17] යාකොබ්-
ටද පස සැකසීමට සිදු වෙයි.'[18]
**12** යෙහෝවා දෙවිව සෙවීමට තවමත්
කාලය තිබේ.[19] එබැවින් ඔබ ගොවි-
තැන් කිරීම සඳහා සරු පසක් තෝරා-
ගෙන එය හොඳින් සකසන්න.[20] එහි
ධර්මිෂ්ඨකම නමැති බීජ වපුරා[21] දෙවි-
ගේ කරුණාව* නෙළාගන්න.[22] එවිට
දෙවි පැමිණ ධර්මිෂ්ඨකම ගැන තවදු-
රටත් ඔබට උපදෙස් දෙනු ඇත.[23]

**13** "ජනයෙනි, ඔබ වගා කළේ
දුෂ්ටකමය.[1] එහෙයින් ඔබ නෙළා-
ගත්තේ අධර්මිෂ්ඨකමය.[2] ඔබ රවටා-
ගත්තේ ඔබවමය.[3] මන්ද ඔබේ ක්‍රියා
නිවැරදියයි ඔබ සිතුවහුය.[4] ඔබේ
බලවන්තයන් සියලුදෙනා මත ඔබ
විශ්වාසය තැබුවහුය.[5] **14** එහෙයින්
ඔබේ සෙනඟ අතරේ කෝලහල හට-
ගනු ඇත.[6] ෂල්මන් අතින් බෙත්-
අර්බේල් විනාශ වුණාක් මෙන් ඔබේ
බලකොටු සහිත සුරක්ෂිත නුවරවල්
සියල්ලම විනාශ වී යනු ඇත.[7] ඒ
යුද්ධයේදී මව්වරුද දරුවෝද එකට
පොළොවේ ගසා මරනු ලැබුවෝය.[8]
**15** බෙතෙල් වැසියෙනි, ඔබේ දුෂ්ට-
කම් ඉතා බරපතළ නිසා ඔබට සිදු
වන්නෙත් ඒ දේමය.[9] අලුයම වන විට
ඊශ්‍රායෙල්හි රජ විනාශ වී යනු ඇත."[10]

**11** "ඊශ්‍රායෙල් දරුවෙකුව සිටි
කාලයේ පටන් මම ඔහුට
ප්‍රේම කළෙමි.[11] ඊජිප්තුවෙන් මාගේ
පුත්‍රයාව මම කැඳවාගතිමි.[12]

**2** "ඊශ්‍රායෙල් සෙනඟට හඬගසන්න
හඬගසන්න[13] ඔවුහු තව තවත් ඈත්ව
ගියෝය.[14] ඔවුහු බාල් රූපව-
ලට පූජා ඔප්පු කරන්නත්[15] දේවතා
රූපවලට සුවඳ දුම් ඔප්පු කරන්-
නත් පටන්ගත්තෝය.[16] **3** එහෙත්
මම එෆ්‍රායිම්ට ඇවිදින්න ඉගැන්-
වූවෙමි.[17] මම ඔවුන්ව දෑතින්
අල්ලාගෙන ළයට තුරුල් කරගත්-
තෙමි.[18] නමුත් ඔවුන්ට සුවය දුන්නේ
මා බව ඔවුහු පිළිගත්තේ නැත.[19]
**4** මම ඔවුන්ට කරුණාව හා ප්‍රේමය
පෙන්වා* මා වෙතට ඇදගන්න උත්-
සාහ කළෙමි.[20] ඔවුන් පිට තිබූ විය-
ගහ මම ඉවත් කර[21] ඉතා ආදරයෙන්

**10 පරි.**
1 2රාජා 17:3 හොෂෙ 5:13
2 යෙරෙ 2:26 යෙරෙ 48:13 එස 36:32
3 යෙසා 30:3 යෙරෙ 7:24 මීකා 6:16
4 2රාජා 17:4
5 ද්වි 9:21 1රාජා 12:28 1රාජා 12:30 මීකා 1:5
6 හොෂෙ 4:15 ආමො 7:9
7 2රාජා 23:15
8 යෙසා 32:13 යෙසා 34:13
9 යෙසා 2:19 ලූක් 23:30 එළි 6:16
10 විනි 20:5
11 හොෂෙ 9:9
12 විනි 20:19
13 හෙබ්‍රෙ 12:6
14 1රාජා 14:16 එස 16:37
15 යෙරෙ 50:11
16 2රාජා 17:6
17 යෙරෙ 4:3
18 යෙසා 28:24
19 යෙසා 55:6 ආමො 5:4
20 යෙරෙ 4:3
21 හිතෝ 11:19 යාකො 3:18
22 හිතෝ 11:18
23 ද්වි 32:2 යෙසා 45:8

**2 තීරුව**
1 ගලා 6:7
2 හිතෝ 22:8 හොෂෙ 8:7
3 ගීතා 52:7
4 ගීතා 33:16 ගීතා 146:3 යෙරෙ 17:5
5 හිතෝ 1:31
6 ගීතා 74:23
7 2රාජා 18:9 2රාජා 19:13
8 යෙසා 13:16 නාහු 3:10
9 ආමො 7:9
10 2රාජා 18:10

**11 පරි.**
11 ද්වි 7:8 යෙරෙ 2:2 එස 16:6
12 නික් 4:22 මතෙ 2:15
13 ද්වි 29:2 2ලේක 36:15 සෙක 1:4
14 2ලේක 36:16 යෙසා 30:9

**15** විනි 2:13; විනි 3:7; 1රාජා 16:31; 1රාජා 18:19; 2රාජා 17:16; හොෂෙ 2:13; **16** 1රාජා 12:33; යෙසා 65:7; යෙරෙ 18:15; හොෂෙ 13:2; **17** ද්වි 8:2; **18** ද්වි 1:31; ද්වි 33:27; යෙසා 40:11; යෙසා 46:3; යෙසා 63:9; **19** නික් 15:26; ගීතා 103:3; යෙසා 30:26; **20** 2සාමු 7:14; යෙසා 63:9; යොහ 6:44; **21** ලෙවී 26:13.

හොෂෙ **10:12*** හෝ, "ළැදි ප්‍රේමය."

හොෂෙ **11:4*** මූ.අ., "මනුෂ්‍යයන් භාවිත කරන රැහැන් හා ප්‍රේමයේ රැහැන්වලින්." සමහරවිට මෙයින් අදහස් කළේ, දෙමාපියන් රැහැන් භාවිත කර තම දරුවාට ඇවිදින්න උදව් කිරීම විය හැකියි.

ඔවුන්ට ආහාර ගෙනැවිත් දුන්නෙමි.[1]
5 ඔවුහු නැවත ඊජිප්තු දේශයට නො-
යනු ඇත. ඔවුන් නැවත මා වෙතට
හැරී එන්න කැමති නොවූ නිසා[2] ඇසි-
රියාවට යටත් වීමට ඔවුන්ට සිදු වනු
ඇත.[3] 6 ඔවුන් යෙදූ උපායන් නිසා[4]
සතර දිශාවටම පහර දෙන කඩුවක්
පැමිණෙනු ඇත. ඒ කඩුව ඔවුන්ගේ
නගර සියල්ල විනාශ කර[5] දොරටු-
වල අගුල් සුනුවිසුනු කර දමනු ඇත.
ඔවුහුද ඒ කඩු පහරින් මැරුම් කනු
ඇත.[6] 7 මගේ සෙනඟ මට ද්‍රෝහි-
කම් කරන්න පුලපුලා බලා සිටිති.[7]
නැවත මා වෙතට හැරෙන්න කියා
ඔවුන්ට අවවාද කළද ඔවුහු ඊට කිසිදු
ප්‍රතිචාරයක් නොදක්වති.

8 "එෆ්‍රායිම්, මා ඔබව කෙසේ අත්-
හරින්නද?[8] ඊශ්‍රායෙල්, මා ඔබව
සතුරන් අතට කෙසේ භාර දෙන්-
නද?[9] අද්මා නගරයටත්[10] ෂෙබෝ-
යිම් නගරයටත් සිදු කළ දේ මා
ඔබට කරන්නේ කෙසේද?[11] මගේ අද-
හස මම වෙනස් කළෙමි.[12] මගේ සිත
උණු වූ නිසා මම ඔබට අනුකම්පා
කරන්න පටන්ගත්තෙමි. 9 මා තුළ
දැවෙන කෝපය මම පිට නො-
කරන්නෙමි.[13] මම එෆ්‍රායිම්ව විනාශ
කර දමන්නේ නැත.[14] මහත් කෝ-
පයකින් ඔබට විරුද්ධව පැමිණෙන්-
නේ නැත. මන්ද ඔබ අතරේ සිටින
ශුද්ධ තැනැත්තා[15] වන මා මනුෂ්‍යා-
යෙකු නොව මහෝත්තම දෙවිය.[16]
10 එවිට ඔවුහු යෙහෝවා දෙවි වන
මා පසුපස ගමන් කරන්නෝය.[17]
මම සිංහයෙකු මෙන් ගර්ජනා කරන්-
නෙමි.[18] එවිට පුත්‍රයෝ වෙවුලමින්
බස්නාහිර දෙසින් පැමිණෙන්නෝය.[19]
11 භයෙන් වෙවුලන කුරුල්ලෙකු
මෙන් ඔවුහු ඊජිප්තුවෙන් පිටතට එන්-
නෝය.[20] පරෙවියෙකු මෙන් ඇසිරියා-
වෙන් පිටතට එන්නෝය.[21] එවිට මම
ඔවුන්ට ඔවුන්ගේම නිවෙස්වල වාසය
කිරීමට සලස්වන්නෙමි." එසේ පව-
සන්නේ යෙහෝවා දෙවිය.[22]

12 "එෆ්‍රායිම් මට පවසන්නේ බො-
රුමය.[1] මා බලන බලන සෑම
තැනකම ඊශ්‍රායෙල් සෙනඟ කරන
වංචාවන් මට පෙනේ. නමුත් යූදා සෙ-
නඟ තවමත් මා සමඟ ගමන් කරන්-
නෝය.[2] අතිශුද්ධ තැනැත්තා වන
මා සමඟ ඔවුහු විශ්වාසවන්තව ක්‍රියා
කරන්නෝය."

**12** "එෆ්‍රායිම් සුළං රොදක් කෙ-
රෙහි බලාපොරොත්තු තබා
ඇත.[3] දවස මුළුල්ලේ ඔවුහු පෙරදිග
සුළඟ පසුපස හඹා යති.[4] බොරු කීම
හා ප්‍රචණ්ඩ ක්‍රියා දේශය පුරා පැතිර
තිබේ.[5] ඔවුහු ඇසිරියාව සමඟ ගිවිසු-
මක් ඇති කරගත්තෝය.[6] ඊජිප්තුවට
තෙල් යවන ලදි.

2 "යූදාට විරුද්ධව යෙහෝවා දෙ-
විට නඩුවක් තිබේ.[7] යාකොබ් තමා
කළ දේවල් ගැන දෙවිට ගණන්
දිය යුතුයි.[8] ඔහු කළ ක්‍රියාවලට
දෙවි ඔහුට සුදුසු දඬුවම දෙයි.[9]
3 යාකොබ් මව්කුසේ සිටියදීම තම
සහෝදරයාගේ විලුඹ අල්ලාගත්-
තේය.[10] පසුව ඔහු මුළු වැර යොදා
දෙවි සමඟ පොරබැද්දේය.[11] 4 ඔහු
දේවදූතයෙකු සමඟ දිගටම පොරබැද
අන්තිමේදී ජය ගත්තේය.[12] ඔහු හඬ-
මින් තමාට කරුණාව පෙන්වන ලෙ-
සඳ කන්නලව් කළේය."[13]

දෙවිට යාකොබ්ව සම්බ වූයේ බෙ-
තෙල්හි සිටියදීය.[14] එදා දෙවි කතා
කළේ අප ගැනය.[15] 5 යෙහෝවා
දෙවි, ස්වර්ගයේ සේනාවල අධිපතියා-
ණන්ය.[16] ඔහුව සිහි කරනු ලබන්නේ
යෙහෝවා යන ඔහුගේ නාමයෙන්ය.[17]

6 "ප්‍රේමයෙන්* කටයුතු කර[18]
යුක්තිය ඉටු කරන්න.[19] එසේ කර-
මින් නැවත ඔබේ දෙවි වෙතට
හැරී එන්න.[20] ඔබේ සියලු බලා-
පොරොත්තු ඔබේ දෙවි කෙරෙහි
තබන්න.[21] 7 වෙළෙඳුන්ගේ අතේ

**11 පරි.**
1 ගීතා 78:24
ගීතා 105:40
2 2රාජා 17:13
යෙරෙ 8:5
ආමෝ 4:6
3 2රාජා 17:3
4 යෙසා 30:1
5 ලෙවී 26:31
යෙරෙ 5:17
6 එස 20:47
මලා 4:1
7 ගීතා 78:57
යෙරෙ 3:6
යෙරෙ 8:5
8 හොෂෙ 6:4
9 යෙරෙ 9:7
10 උත් 10:19
ද්වි 29:23
11 උත් 14:8
12 ද්වි 32:36
යෙරෙ 31:20
13 ගීතා 78:38
14 යෙරෙ 30:11
15 යෙසා 12:6
16 ගණන් 23:19
යෙසා 55:8
මලා 3:6
17 යෙසා 2:5
18 යෙසා 31:4
යෝවෙ 3:16
ආමෝ 1:2
19 සෙක 8:7
20 යෙසා 11:11
සෙක 10:10
21 යෙසා 11:12
යෙසා 60:8
22 යෙරෙ 23:6
එස 28:25
එස 37:21
ආමෝ 9:14

**2 තීරුව**
1 ගීතා 78:36
යෙසා 29:13
මීකා 6:12
2 2රාජා 18:5
2ලේක 29:2
ගීතා 89:18
හොෂෙ 4:15

**12 පරි.**
3 යෙරෙ 22:22
4 හොෂෙ 8:7
5 2රාජා 17:4
6 2රාජා 15:19
7 2රාජා 17:19
යෙරෙ 2:35
හොෂෙ 4:1
මීකා 6:2
8 ගීතා 62:12
යෙරෙ 17:10
9 යෙසා 3:11
යෙසා 59:18
10 උත් 25:26
11 උත් 32:28
12 උත් 32:25
13 උත් 32:26
14 උත් 28:19
15 උත් 28:13
16 උත් 28:16; උත් 32:30; 17 නික් 3:15; ගීතා 135:13; යෙසා 42:8; 18 මීකා 6:8; 19 ද්වි 16:20; 20 යෙසා 31:6; යෙරෙ 3:14; හොෂෙ 14:1; යෝවෙ 2:13; සෙක 1:3; 21 ගීතා 27:14; විලා 3:25.

හොෂෙ **12:6*** හෝ, "ළැදි ප්‍රේමය."

හොර තරාදි තිබේ.[1] ඔවුන්ගේ එකම
ආශාව වංචා කර ලාභ ඉපයීමය.[2]
**8** ‘මා දැන් පොහොසතෙකි.[3] මම
වටිනා දේවල් බොහොමයක් රැස් කර-
ගෙන සිටිමි.[4] මා අතින් බරපතළ වර-
දක් සිදු වී ඇතැයි කියා කිසිවෙකුට
චෝදනා කළ නොහැක’ කියා එෆ්‍රා-
යිම් පවසන්නේය.[5]

**9** “ ‘ඔබ ඊජිප්තු දේශයේ සිටි කාල-
යේ පටන් මේ දක්වාම මම ඔබේ දෙවි
වන යෙහෝවාය.[6] ඔබ උත්සව දවස්-
වලදී කළාක් මෙන් මම නැවතත්
ඔබට කූඩාරම්වල වාසය කරන්න
සලස්වන්නෙමි. **10** මම අනාගත-
වක්තෘවරුන්ට කතා කර[7] ඔවුන්ට
බොහෝ දර්ශන පෙන්වූවෙමි. අනා-
ගතවක්තෘවරුන් මාර්ගයෙන් උපමා
කියා දුන්නෙමි.’[8]

**11** “ගිලියද් දේශය මන්තර ගුරු-
කම්වලින් පිරී ඇත.[9] එහි වැසියෝ
බොරු කියති.[10] ගිල්ගාල් නගර-
යේ වැසියෝ ගොනුන්ව පවා පූජා
කරති.[11] ඔවුන්ගේ පූජාසන, වගා කිරී-
මට සූදානම් කළ කෙතක් අසල අහක
දැමීමට ගොඩගැසූ ගල් වැනිය.[12]
**12** යාකොබ් සිරියාවට පලා ගියේය.[13]
ඊශ්‍රායෙල්,[14] බිරිඳක් වෙනුවෙන්[15]
බැටළු රැළවල් බලාගනිමින් වෙ-
හෙස මහන්සි වී සේවය කළේය.[16]
**13** යෙහෝවා දෙවි අනාගතවක්තෘව-
රයෙකු මාර්ගයෙන් ඊශ්‍රායෙල් ජාතිය
ඊජිප්තුවෙන් පිටතට ගෙනාවේය.[17]
දෙවි අනාගතවක්තෘවරයෙකු මාර්ග-
යෙන් ඔවුන්ව රැකබලා ගත්තේය.[18]
**14** නමුත් එෆ්‍රායිම් බොහෝ සෙ-
යින් දෙවිව උදහස් කළේය.[19] එෆ්‍රායිම්
බොහෝ ලේ වගුරුවා ඇත. ඒ වර-
දින් ඔහු නිදහස් නොවන්නේය.[20] ඔහු
තම ශ්‍රේෂ්ඨ ස්වාමීන්ව නින්දාවට පත්
කළ නිසා දෙවි ඔහුවද නින්දාවට පත්
කරන්නේය.”[21]

**13** “එෆ්‍රායිම් ඊශ්‍රායෙල්හි අන්
සියලු ගෝත්‍රවලට වඩා බල-
වත්ව සිටියේය.[22] ඔහු කතා කරන
විට සියලුදෙනා බියෙන් තැති-
ගත්තෝය. නමුත් බාල් දෙවියාට
නමස්කාර කරන්න පටන්ගත් පසු[1]
එෆ්‍රායිම් මිය ගියේය.[2] **2** එහෙත් එහි
වැසියෝ තමන්ගේ රිදීවලින් බොරු
දෙවිවරුන්ගේ රූප සාදාගෙන තව
තවත් පව් කරති.[3] රන්කරුවන් ලවා[4]
හිතුමනාපෙට සාදාගත් ඒ රූප[5] ගැන
ඔවුහු මෙසේ කියති. ‘ඇවිත් මේ වස්-
සන්ව සිපගන්න කියා පූජා ඔප්පු කිරී-
මට පැමිණෙන මිනිසුන්ට කියන්න.’[6]
**3** ඔවුන් එලෙස ක්‍රියා කරන නිසා
මොහොතකින් නැති වී යන අලුයම
මීදුම[7] හා නිමේෂයකින් නැති වී යන
පිනි මෙන් ඔවුහුද නැති වී යන්නෝය.
කමතෙන් ගසාගෙන යන දහයියා[8] හා
පියස්සේ සිදුරෙන් නඟින දුම මෙන්
ඔවුහුද පහ වී යන්නෝය.

**4** “ ‘ඔබ ඊජිප්තු දේශයේ සිටි කාල-
යේ පටන් මේ දක්වාම මා ඔබේ
දෙවි වන යෙහෝවාය.[9] මා හැර
වෙන කිසි දෙවි කෙනෙකු නැති
බවත් මා හැර වෙන ගැලවුම්කරු-
වෙකු නැති බවත් ඔබ හොඳාකාරවම
දන්නහුය.[10] **5** ලෙඩ රෝග පැතිර
ගිය[11] පාළුකරයේදී මම ඔබව රැකබලා
ගත්තෙමි.[12] **6** නමුත් ඔබේ තණ-
බිම්වලින් කා තෘප්තියට පත් වූ පසු[13]
ඔබේ සිත උඩඟු විය.[14] ඔබ මාව
අමතක කළේ ඒ නිසාය.[15] **7** මම
කේශර සිංහයෙකු මෙන් ඔබට විරුද්-
ධව ක්‍රියා කරන්නෙමි.[16] මඟ රැක
සිටින දිවියෙකු මෙන් ඔබ එන-
තුරු බලා සිටින්නෙමි.[17] **8** පැටවුන්
නැති වූ වැලහින්නියක මෙන්[18] මම
ඔබේ ඇඟට කඩාපැන ඔබේ පපුව
ඉරා දමන්නෙමි. සිංහයෙකු මෙන්[19]
ඔබව කා දමන්නෙමි. වනමෘගයෙක්
ඇවිත් ඔබව කෑලි කෑලිවලට ඉරා
දමනු ඇත.[20] **9** ඊශ්‍රායෙල් සෙන-
හෙනි, ඔබ පව් කළේ ඔබේ උපකාර-
යට පැමිණි මට විරුද්ධවය.[21] එබැවින්
නිසැකවම ඔබ විනාශයට පත් වනු
ඇත.[22]

**12 පරි.**

**1** ලෙවී 19:35 හිතෝ 11:1 ආමො 8:5
**2** එස 22:29 මීකා 2:1
**3** හිතෝ 28:20 යෙරෙ 9:23 සෙක 11:5 එළි 3:17
**4** ද්වි 8:17
**5** හිතෝ 30:12 මලා 2:17
**6** නික් 20:2 හොෂෙ 13:4
**7** 1රාජා 17:1 2රාජා 17:13 ආමො 7:15
**8** යෙසා 5:1 යෙරෙ 13:1
**9** හොෂෙ 6:8
**10** එස 13:8
**11** ආමො 4:4
**12** 2රාජා 17:10 හොෂෙ 8:11
**13** උත් 28:5 ද්වි 26:5
**14** උත් 32:28
**15** උත් 29:18
**16** උත් 31:38
**17** නික් 12:51 ගීතා 77:20 යෙසා 63:11 මීකා 6:4
**18** යොෂු 24:17 1සාමු 12:8
**19** 2රාජා 17:11 එස 23:5
**20** එස 22:13
**21** ද්වි 28:37 රෝම 2:6

**13 පරි.**

**22** යොෂු 17:17

**2 තීරුව**

**1** 2රාජා 17:16 හොෂෙ 11:2
**2** නික් 20:5
**3** ගීතා 115:4 යෙසා 46:6 යෙරෙ 10:4 හොෂෙ 2:8
**4** යෙරෙ 10:3 හබ 2:18
**5** යෙසා 44:17 යෙරෙ 10:9
**6** 1රාජා 12:28 1රාජා 19:18
**7** හොෂෙ 6:4
**8** යෝබ් 21:18 ගීතා 1:4 දානි 2:35
**9** නික් 20:2 ලෙවී 11:45 ගීතා 81:10 හොෂෙ 12:9
**10** යෙසා 43:11 යෙසා 45:21
**11** යෙරෙ 2:6

---

**12** ද්වි 2:7; ද්වි 32:10; යෙරෙ 2:2; **13** ද්වි 8:12; නෙහෙ 9:25; **14** ද්වි 32:15; **15** ද්වි 6:12; ද්වි 32:18; හිතෝ 30:9; යෙසා 17:10; **16** හොෂෙ 5:14; **17** යෙරෙ 5:6; **18** 2සාමු 17:8; හිතෝ 17:12; **19** විලා 3:10; **20** යෙසා 56:9; යෙරෙ 12:9; **21** ගීතා 33:20; ගීතා 46:1; **22** හිතෝ 6:32.

10 “ ‘“අපට රජෙක් දෙන්න. අපට
පාලකයන් දෙන්න” කියා ඔබ මගෙන්
ඉල්ලුවහුය.[1] එහෙත් නුවරවල් තුළ
ජීවත් වන ඔබව ගලවාගැනීමට පත්
කළ ඔබේ රජ්ජුරුවන් දැන් කො-
හේද?[2] ඔබේ විනිශ්චයකරුවන් දැන්
කොහේද? 11 මම අකමැත්තෙන්
වුවද ඔබට රජෙකු දුනිමි.[3] නමුත්
දැන් මා තුළ ඇවිළෙන කෝපය නිසා
ඔහුව රජකමින් ඉවත් කරන්නෙමි.’[4]
12 “එප්‍රායිම් කළ වැරදි අමතක
නොකරනු ඇත. ඔහු කළ පව් සියල්ල
එකිනෙක ගණන් කර වාර්තා කර
තබා ඇත.[5] 13 ප්‍රසව වේදනාව අද්-
දකින ස්ත්‍රියක මෙන් මහත් වේදනා-
වක් අත්විඳින්න ඔහුට සිදු වනු ඇත.[6]
ඔහු අඥාන දරුවෙකු මෙන්ය.[7] මන්ද
බිහි කරන කාලය පැමිණ තිබුණත්
ඔහු පිටතට නොපැමිණෙයි.[8]
14 “ ‘මිනී වළෙන්[9] හා මරණයෙන්
මුදවාගන්නේ මමය.[10] මරණය, ගෝ-
නුස්සෙකු මෙන් අනතුරු කරන ඔබේ
විෂ තුඩ කොතැනද?[11] මිනී වළ,
විනාශයට පමුණුවන ඔබ කොතැ-
නද?[12] එහෙත් එප්‍රායිම්ට මම අනු-
කම්පා නොකරන්නෙමි.’[13]
15 “ඔහු සශ්‍රීක බට ගසක් මෙන්
සරුවට වැඩුණත්[14] නැඟෙනහිරෙන්
හමා එන සුළඟක් ඔහුට විරුද්ධව
පැමිණෙනු ඇත.[15] යෙහෝවා දෙවි-
ගෙන් පැමිණෙන ඒ සුළඟ පාළුකර-
යෙන් ඇවිත් ඔහුගේ ළිංද දිය උල්පත්ද
සිඳුවනු ඇත.[16] ඒ සුළඟට ඔහුගේ
වටිනා වස්තු සම්භාරයම ගසාගෙන
යයි.[17]
16 “සමාරියේ වැසියන් ඇත්-
තෙන්ම කැරලිගැසුවේ ඔවුන්ගේම දෙ-
විට විරුද්ධවය.[18] ඔවුන්ට ඒ වරදට
ගණන් දෙන්න සිදු වෙයි.[19] ඔවුහු කඩු-
වෙන් මැරුම් කන්නෝය.[20] ඔවුන්-
ගේ දරුවෝ පොළොවේ ගසා මරනු
ලබන්නෝය.[21] ගැබිනි ස්ත්‍රීන්ව කඩු-
වෙන් කපා දමනු ඇත.”[22]

14 “ඊශ්‍රායෙල් සෙනඟෙනි, ඔබේ
දෙවි වන යෙහෝවා ළඟට
නැවත හැරී එන්න.[23] ඔබට මෙ-
වන් විපතක් සිදු වුණේ ඔබේම
වැරදි නිසයි.[1] 2 යෙහෝවා දෙවි-
ගෙන් සමාව ඉල්ලා නැවත ඔහු වෙ-
තට හැරී එන්න.[2] ජනයෙනි, ඔහුගෙන්
මෙසේ අයැදින්න. ‘අප කළ වැරදිව-
ලට සමාව දෙන්න.[3] අප කරන යහ-
පත් දේ සතුටින් භාරගන්න.
අපේ මුවින් කරන ප්‍රශංසාව* පූජාවක්
මෙන් අපි ඔබට ඔප්පු කරන්නෙමු.[4]
3 අපව බේරාගන්න ඇසිරියාවට නො-
හැකිය.[5] අපි අශ්වයන් පිට නැඟ යන්-
නේ නැත.[6] මින් ඉදිරියට අපේ දෑතින්
නිම කළ රූපවලට, “මේ අපේ දෙවිය”
කියා අපි නොකියන්නෙමු. මන්ද පියා
නැති දරුවාට කරුණාව පෙන්වන්නේ
ඔබ පමණයි.’[7]
4 “ ‘ඔවුන් මට විරුද්ධව ද්‍රෝහි-
කම් කළත් මම ඔවුන්ව සුව
කරන්නෙමි.[8] ඔවුන්ට විරුද්ධව ඇවි-
ළුණු මගේ උදහස දැන් පහව ගොස්
ඇති නිසා[9] මම මගේ හදවතින්ම*
ඔවුන්ට ප්‍රේම කරමි.[10] 5 මම ඊශ්‍රා-
යෙල්වරුන්ට පිනි බිඳු මෙන් වන්-
නෙමි.[11] එවිට ඔවුහු ලිලී මල් මෙන්
පිපී, ලෙබනොන්හි ගස් මෙන් හොඳින්
මුල් ඇද සරුසාරව වැඩෙන්නෝය.
6 ඔවුහු අතු ඉති විහිදුවමින් තේජවත්
ඔලීව ගසක් මෙන් වැඩෙන්නෝය.[12]
ලෙබනොන්හි ගස්වලින් නික්මෙන
සුවඳ ඔවුන්ගෙන්ද නික්ම එනු ඇත.’
7 ඔවුහු යළි දෙවිගේ සෙවණෙහි සිසි-
ලස ලබනු ඇත.[13] ඔවුහු ධාන්‍ය වගා
කරන්නෝය. මිදිවැලක් මෙන් දලු ලා
වැඩෙන්නෝය.[14] ලෙබනොන්හි වයින්
ගැන බොහෝදෙනා ඉමහත් ආශා-
වෙන් කතා කරන්නාක් මෙන් ඔවුහුද
තමන්ගේ දෙවි ගැන මහත් ආශාවෙන්
කතා කරන්නෝය.
8 “එප්‍රායිම් මෙසේ කියනු ඇත.

**13 පරි.**
1 1සාමු 8:5
2 1සාමු 8:20; 2රාජා 17:4
3 1සාමු 8:7; 1සාමු 12:13
4 1සාමු 12:25; යෙරෙ 52:11
5 ද්වි 32:34; යෝබ් 14:17
6 යෙරෙ 30:6; මීකා 4:9
7 හිතෝ 22:3
8 2රාජා 19:3
9 ගීතා 30:3; ගීතා 49:15; ගීතා 69:18
10 යෙසා 25:8
11 යෙසා 26:19; 1කොරි 15:55
12 එළි 20:13
13 1සාමු 15:29; යෙරෙ 15:6
14 උත් 41:52; උත් 48:19
15 යෙරෙ 4:11; හොෂෙ 4:19
16 හොෂෙ 9:11
17 2රාජා 17:20
18 1සාමු 15:23; ගීතා 5:10; එස 20:21
19 2රාජා 17:18; ආමො 3:9
20 යෙසා 1:20; යෙසා 7:8
21 2රාජා 8:12
22 2රාජා 15:16; ආමො 1:13

**14 පරි.**
23 1සාමු 7:3; 2ලේක 30:6; යෙසා 55:6; හොෂෙ 12:6; යෝවෙ 2:13

**2 තීරුව**
1 යෙරෙ 2:19; විලා 4:6
2 හොෂෙ 12:6
3 නික් 34:7; 2සාමු 24:10; ගීතා 51:2; මීකා 7:18
4 ගීතා 69:31; හෙබ්‍රෙ 13:15
5 හොෂෙ 5:13
6 ද්වි 17:16; ගීතා 33:17; යෙසා 31:1

**7** ද්වි 10:18; ගීතා 10:14; ගීතා 68:5; ගීතා 146:9; හිතෝ 23:11; යාකො 1:27; **8** ගීතා 103:3; යෙසා 57:18; යෙරෙ 3:22; **9** ගීතා 78:38; යෙසා 12:1; **10** ද්වි 7:7; ශෙප 3:17; **11** ද්වි 32:2; හිතෝ 19:12; **12** ගීතා 52:8; **13** ගීතා 91:1; **14** සෙක 8:12.

**හොෂෙ 14:2*** මූ.අ., “මුවින් වස්සන්.” **4*** හෝ, “කිසිවෙකුගේ බල කිරීමකින් තොරව.”

‘මේ බොරු දෙවිවරුන්ගේ රූපවලින්
මට දැන් කිසි වැඩක් නැත.’[1]
“ ‘මම ඔවුන්ට පිළිතුරු දෙන්නෙමි.
මම ඔවුන්ට රැකවරණයද දෙන්-
නෙමි.[2] මා සරුසාරව වැඩෙන ජුනිපර්
ගසක් මෙනි.[3] මා හටගන්වන පලව-
ලින් ඔබ පෝෂණය ලබනු ඇත.’ ”
**9** මේ දේවල් තේරුම්ගත හැකි
ප්‍රඥාවන්තයෙක් සිටීද?[4] මේ දේවල්
දන්නා නැණවතෙක් සිටීද?[1] යෙ-
හෝවා දෙවිගේ සියලු ක්‍රියා යහ-
පත්ය.[2] ඒ මඟෙහි ගමන් කරන්නේ
ධර්මිෂ්ඨයෝය.[3] නමුත් අධර්මිෂ්ඨ-
යෝ ඒ මාර්ගයෙන් ඉවතට ගොස්
විනාශ වී යන්නෝය.[4]

**14 පරි.**
**1** හොෂෙ 14:3 ක්‍රියා 19:18
**2** යෙරෙ 31:18
**3** යෙසා 41:19 යෙසා 55:13 යෙසා 60:13

4 ගීතා 107:43; හිතෝ 1:5; යෙරෙ 9:12; **2 තීරුව** **1** මතෙ 24:45; **2** ද්වි 32:4; දානි 4:37; **3** ලූක් 1:6; **4** දානි 12:10.

# යෝවෙල්*

**1** යෙහෝවා දෙවි පෙතුයෙල්ගේ
පුත් යෝවෙල් මාර්ගයෙන් දුන්
පණිවිඩය මෙයයි.[1]
**2** “වැඩිමහල්ලෙනි, දේශයේ සියලු
වැසියෙනි, මා පැවසීමට යන මේ දේ
සිතට ගන්න.[2] මෙවැනි දෙයක් ඔබේ
ජීවිත කාලයේදී හෝ ඔබේ මුතුන්-
මිත්තන්ගේ කාලයේදී හෝ සිදු වී
ඇද්ද?[3] **3** මා පවසන දේ ගැන ඔබේ
පුත්‍රයන්ට දන්වන්න. පසුව ඔවුන් තම
පුත්‍රයන්ටත් එම පුත්‍රයන් ඊළඟ පරම්-
පරාවටත් ඒ ගැන දැන්විය යුතුය.[4]
**4** දළඹුවා කා, කෙතේ ඉතුරු කළ දේ
පළඟැටියා කා දැමුවේය.[5] පළඟැටියා
ඉතුරු කළ දේ පිලවා කා දැමුවේය.
පිලවා ඉතුරු කළ දේ කැරපොත්තා
කා දැමුවේය.[6]
**5** “බේබද්දෙනි, අවදි වන්න.[7] හඬා
වැලපෙන්න.[8] වයින් බීමට ලොල්
වූ සියල්ලෙනි,[9] මොරගසන්න. මන්ද
ඔබට නැවත අලුත් වයින් බොන්න
ලැබෙන්නේ නැත.[10] **6** ගණන් කිරී-
මටවත් නොහැකි තරම් විශාල වූ
බලවත් ජාතියක් මගේ දේශය ආක්‍රම-
ණය කර ඇත.[11] උන්ගේ දත් සහ හකු
සිංහයෙකුගේ මෙන් ශක්තිමත්ය.[12]
**7** උන් මගේ මිදිවැල වැනසුවෝය.[13]
මගේ අත්තික්කා ගසද කඳ දක්වාම
උන් කා දැමුවෝය.[1] මිදිවැලෙත් අත්-
තික්කා ගසෙත් පොතු ඉරා බිමටම
විසි කර ඇත.[2] ඒවායේ අතු දැන් සුදු
පාටය. **8** එහෙයින් දැන් ඔබ සියල්-
ලෝම වැලපෙන්න. විවාහ බස් දුන්
පුරුෂයා මිය ගිය කන්‍යාවක මෙන්
ගෝණි රෙදි ඇඳගෙන වැලපෙන්න.[3]
**9** “යෙහෝවා දෙවිගේ ගෘහයට
දැන් ධාන්‍ය පූජාවත්[4] පාන පූජාවත්[5]
ගෙන එන්නේ නැත. යෙහෝවා දෙ-
විට සේවය කරන පූජකයන්[6] හඬා
වැලපෙන්නේ ඒ නිසාය.[7] **10** කෙත
නැති නාස්ති වී ගොස් ඇත.[8] පො-
ළොව හඬා වැලපෙයි.[9] මන්ද ධාන්‍ය
කරල් මුළුමනින්ම විනාශ වී ඇත.
වයින් සෑදීම නතර වී ඇත.[10] තෙල්ද
සිඳී ගොසින්ය.[11] **11** තිරිඟු අස්-
වැන්න හා බාර්ලි අස්වැන්න
දෙස බලා ගොවියෝ ලැජ්ජාවට
පත් වෙති.[12] මිදිවතු වවන්නෝ හඬා
වැලපෙන්නෝය. මන්ද කෙත්වතු-
වල කිසි පලදාවක් නැත.[13] **12** මිදි-
වැල මැලවී, අත්තික්කා ගස වියළී
ගොස් ඇත. දෙළුම්, ඇපල්, තාල ගස්
ඇතුළු කෙතේ සියලු ගස් වියළී ගොස්
ඇත.[14] දැන් සියලුදෙනාගේ සතුට
ගිලිහී ගොසින්ය.[15]
**13** “පූජකයෙනි, ගෝණි රෙදි

**1 පරි.**
**1** 2පේතෘ 1:21
**2** ගීතා 49:1 ආමෝ 3:1
**3** යෝවෙ 2:2
**4** නික් 10:14 නික් 13:14 ද්වි 6:7 ද්වි 29:22 ගීතා 78:4
**5** නික් 10:15 ද්වි 28:38 ආමෝ 4:9
**6** යෝවෙ 2:25
**7** යෙසා 28:1 ආමෝ 6:6 ලූක් 21:34
**8** යෙරෙ 4:8 යාකො 5:1
**9** හොෂෙ 4:11
**10** ද්වි 28:39 යෙසා 32:10
**11** යෝවෙ 2:2
**12** එළි 9:8
**13** යෙසා 5:6

**2 තීරුව**
**1** යෙරෙ 5:17 යෙරෙ 8:13
**2** යෙරෙ 48:32
**3** එස 7:18
**4** ලෙවී 2:1 යෝවෙ 2:14
**5** නික් 29:40 හොෂෙ 9:4
**6** 2ලේක 13:10
**7** යෝවෙ 2:17
**8** ද්වි 28:30
**9** ලෙවී 26:20 යෙරෙ 4:28 යෙරෙ 14:2
**10** ද්වි 28:39 යෙසා 24:7 හොෂෙ 9:2
**11** ද්වි 28:40
**12** යෙරෙ 14:4

යෝවෙ නම* තේරුම, “යෙහෝවා දෙවිය.”

**13** යෙසා 17:11; **14** ලෙවී 26:20; **15** යෙසා 24:11.

ඇඳගෙන පපුවට ගසාගෙන දුක්
වෙන්න.[1] පූජාසනයේ වැඩකටයුතු
කරන සේවකයෙනි,[2] හඬා වැල-
පෙන්න. මාගේ දෙවිගේ සේවක-
යෙනි, රාත්‍රිය පුරාම ගෝණි රෙදි
ඇඳගෙන සිටින්න. මන්ද ඔබේ දෙවි-
ගේ ගෘහයේ ඔප්පු කිරීමට දැන්
ධාන්‍ය පූජාවත්[3] පාන පූජාවත් නැත.[4]
**14** එහෙයින් දැන් ජනයාව රැස් කර
ඔවුන්ට නිරාහාරව සිටින්නයයි පව-
සන්න.[5] විශේෂ රැස්වීමකට ඔවුන්ව
කැඳවන්න.[6] වැඩිමහල්ලන්වද දේශ-
යේ සියලු වැසියන්වද ඔබේ දෙවි
වන යෙහෝවාගේ ගෘහයට කැඳවා[7]
යෙහෝවා දෙවිගේ උපකාරය පතා
යාච්ඤා කරන්න.[8]

**15** "යෙහෝවා දෙවිගේ දවස
ළඟය![9] එය ඉතා භයානක දවසකි.[10]
සියලු බලැති දෙවි මහත් විනාශයක්
සිදු කරන එම දවස නිසැකවම පැමි-
ණෙන්නේය. **16** අපේ ඇස් පනාපි-
ටම ආහාර සියල්ල විනාශ වී ඇත.
අපේ දෙවිගේ ගෘහය තුළ ප්‍රීති ප්‍රමෝද-
යෙන් ඉපිල යන සෙනඟගේ හඬ තවත්
නොඇසෙයි.[11] **17** වියළි අත්තික්කා
ගෙඩි කුණු වී ඇත. ගබඩා කාමර
ගරාවැටී ඇත. ධාන්‍ය වියළී ගොස්
ඇති නිසා අටුකොටු කඩා දමා ඇත.
**18** සතුන් විඳින දුක බලන්න! ගොදු-
රුබිම් නැති බැවින් ගව රංචු ඉබාගා-
තේ යති.[12] මිනිසුන් කළ වැරදිවලට
බැටළුවෝ පවා වන්දි ගෙවති.

**19** "යෙහෝවා දෙවියනි, මා උප-
කාරය පතන්නේ ඔබගෙන්ය.[13] පාළු-
කරයේ තණබිම් සියල්ල වියළී ගොස්
ඇත. ගස් කොළන්ද ගින්නට දැවී
ගොසින්ය.[14] **20** වනසත්තු පවා
ඔබගෙන් පිහිට පතන්නෝය.[15] මන්ද
උන්ට බීමට දිය බිඳක්වත් නැත.[16]
පාළුකරයේ තණබිම් සියල්ල ගින්නට
දැවී ගොස් ඇත."

**2** "ජනයෙනි, සියොන්හි හොර-
ණෑව පිඹින්න.[17] දෙවිගේ ශුද්ධ
කන්දේදී[18] යුධ ඝෝෂා නඟන්න.[19]
දේශයේ සියලු වැසියෝ කැල-
ඹෙත්වා![1] මන්ද යෙහෝවා දෙවිගේ
දවස ඉතා ළඟය.[2] එය අනිවාර්ය-
යෙන්ම පැමිණෙන්නේය. **2** ඒ දවස
වලාකුළුවලින් වැසුණු අඳුරු දවසකි.[3]
හිමිදිරියේ කඳු මත පැතිර යන අඳුරු
වලාවක් මෙන් ඒ දවසේද ඝන අන්ධ-
කාරය දසත පැතිර යන්නේය.[4]

"මින් පෙර කිසි දිනක නොසි-
ටියාවූ යළි කිසි දිනක නොසිටින්-
නාවූ,[5] ගණන් කිරීමට නොහැකි
තරම් විශාල වූ බලවත් සේනාවක්[6]
එදින දක්නට ලැබෙයි. **3** ඔවුන්ට
ඉදිරියෙන්ද පිටුපසින්ද ගින්නක් ඇවි-
ළෙයි.[7] ඒ ගින්නට සියල්ල විනාශ වී
යයි. ඔවුහු ඒදන් උයන වැනි වූ දේශ-
යක්[8] මැදින් ගොස් එය පාළුකරයක්
බවට පත් කරනු ඇත. ඒ ගින්නෙන්
සියල්ල දැවී අළු වී යයි.

**4** "ඔවුන්ගේ පෙනුම අශ්වයන්
මෙනි. ඔවුහු යුද්ධයට සැරසී සිටින
අශ්වයන් මෙන් දිව යන්නෝය.[9]
**5** ඔවුහු කඳු මුදුන්වල එක පිම්මට
දිව යන්නෝය.[10] ඔවුන් දිව යන හඬ
යුධ රථවල හඬටද දැවෙන පිදුරු-
වල හඬටද සමානය.[11] ඔවුන් යුද්ධ-
යට සැරසී සිටින බලවත් සේනාවක්
මෙනි.[12] **6** ඒ සේනාව නිසා ජනයා
බොහෝ වේදනා විඳින්නෝය.[13] කල-
බල වී භයෙන් වෙවුලන්නෝය.[14]

**7** "ඔවුන් දිව යන්නේ ශක්තිමත්
මිනිසුන් මෙනි.[15] යුධ සෙබළුන් මෙන්
ඔවුහු පවුරු උඩට නඟින්නෝය.
එක් එක් කෙනා තම තමාට
නියම කළ මාර්ගයේ මිස අන් මඟක
නොයන්නෝය. ඔවුහු කිසිවිටෙ-
කත් තම මාර්ගයෙන් ඉවතට නො-
යන්නෝය.[16] **8** ඔවුහු ගමන් කරද්දී
එකිනෙකාව තල්ලු කරන්නේ නැත.
ඔවුහු එඩිතර මිනිසුන් මෙන් නොනැ-
වතීම ඉදිරියට ගමන් කරන්නෝය.
ඊතල වැදී ඔවුන්ගෙන් සමහරෙකු
මැරී වැටුණත් අනික් අය නොනවත්-
වාම ඉදිරියට යති.

**1 පරි.**

**1** යෙරෙ 4:8
එස 7:18
**2** නික් 30:20
1කොරි 9:13
**3** ලෙවී 2:8
**4** ගණන් 29:6
**5** 2ලේක 20:3
යෝවෙ 2:15
**6** ලෙවී 23:36
නෙහෙ 8:18
**7** 2ලේක 20:13
නෙහෙ 9:1
**8** ද්වි 4:30
ගීතා 50:15
යෝනා 3:8
**9** යෙසා 13:6
යෝවෙ 2:1
ශෙප 1:7
ශෙප 1:14
ශෙප 2:2
2පේතෘ 3:10
එළි 6:17
**10** යෙරෙ 30:7
**11** ද්වි 12:7
**12** 1රාජා 18:5
යෙරෙ 12:4
හොෂෙ 4:3
**13** ගීතා 50:15
ගීතා 91:15
මීකා 7:7
හබ 3:18
පිලි 4:6
**14** යෙරෙ 9:10
**15** යෝබ් 38:41
ගීතා 104:21
ගීතා 145:15
ගීතා 147:9
**16** 1රාජා 17:7
1රාජා 18:5
යෙරෙ 14:1

**2 පරි.**

**17** යෙරෙ 4:5
එස 33:3
**18** සෙක 8:3
**19** ශෙප 1:16

**2 තීරුව**

**1** ආමො 3:6
**2** ශෙප 1:14
මලා 4:1
**3** යෙරෙ 4:28
යෙරෙ 13:16
ආමො 5:18
**4** ආමො 4:13
ශෙප 1:15
**5** නික් 10:14
**6** යෝවෙ 1:6
**7** යෝවෙ 1:19
ආමො 7:4
**8** උත් 2:8
උත් 13:10
යෙසා 51:3
**9** එළි 9:7
**10** එළි 9:9
**11** යෙසා 5:24

---

**12** හිතෝ 30:27; **13** යෙරෙ 8:21; **14** නාහු 2:10; **15** 2සාමු 1:23; **16** හිතෝ 30:27.

**9** “ඔවුහු නුවරට කඩා පැන පවුර
මත දිව යන්නෝය. ඔවුහු ගෙවල්ව-
ලට නැඟ සොරුන් මෙන් ජනෙල්ව-
ලින් ඇතුල් වන්නෝය. **10** ඒ
සේනාව දැක දේශය කැලඹෙයි.
අහස දෙදරුම් කයි. හිරුත් සඳුත්
අඳුරු වී[1] තාරකාවල ආලෝකයද නිවී
යයි.[2] **11** යෙහෝවා දෙවි තම සේ-
නාවට ඉදිරියෙන්[3] ගමන් කරමින් හඬ
නඟන්නේය.[4] දෙවිගේ හමුදාව අතිවි-
ශාලය.[5] ඔහු ඉතා බලවත්ය. තමා
කියන දේ ඒ අයුරින්ම ඉටු කරන්-
නේය. යෙහෝවා දෙවිගේ දවස භයා-
නක දවසකි.[6] ඒ බිය උපදවන දවසට
මුහුණ දිය හැක්කේ කාටද?”[7]
**12** “‘නිරාහාරව සිට[8] හඬා වැල-
පෙන්න.[9] මුළු හදින්ම පසුතැවිලි වී
මා වෙතට හැරී එන්න’[10] කියා යෙ-
හෝවා දෙවි දැන් ඔබෙන් ඉල්ලා
සිටියි. **13** එහෙයින් ඔබේ වස්ත්‍ර
නොව[11] සිත ඉරාගෙන[12] ඔබේ දෙවි
වන යෙහෝවා වෙතට හැරී එන්න.
මන්ද ඔහු දයාවන්තය. කරුණාවන්-
තය.[13] ඉක්මනින් කෝප නොවන්-
නේය.[14] ඔහුගේ ප්‍රේමය* ඉමහත්ය.[15]
තම සෙනඟ විපත්තියට මුහුණ දෙන
විට ඔහු මහත් සේ දුකට පත් වන්-
නේය.[16] **14** සමහරවිට ඔහු ඔබට
අනුකම්පා කර ඔහු ගත් තීරණය වෙ-
නස් කරන්න ඉඩ තිබේ.[17] ඔබේ දෙවි
වන යෙහෝවාට ධාන්‍ය පූජාවක් සහ
පාන පූජාවක් ඔප්පු කිරීමට හැකි
වන සේ ඔහු යමක් ඉතුරු කර ඔබට
ආශීර්වාද කරන්නත් ඉඩ තිබේ.[18]
**15** “ජනයෙනි, සියොන්හි හොර-
ණෑව පිඹින්න.[19] ජනයාව රැස්
කර ඔවුන්ට නිරාහාරව සිටින්න-
යයි පවසන්න.[20] විශේෂ රැස්වීමකට
ඔවුන්ව කැඳවන්න.[21] **16** ජනයාව
ශුද්ධ තත්වයකට ගෙනෙන පිණිස[22]
ඔවුන්ව රැස් කර සූදානම් කරන්න.
මහලු අයවද දරුවන්වද කිරි බොන
ළදරුවන්වද රැස් කරන්න.[23] මනා-
ලයා තම ඇතුල් කාමරයෙන්ද මනා-
ලිය තම විවාහ යහනෙන්ද නික්ම
එත්වා!
**17** “යෙහෝවා දෙවිට සේවය
කරන පූජකයෝ ශුද්ධස්ථානය ඉදිරි-
යෙන් පූජාසනය අසලත්[1] වැලපෙමින්
මෙසේ කියත්වා. ‘අනේ යෙහෝවා
දෙවියනි, ඔබේ සෙනඟට අනුකම්පා
කරන්න. ඔබේ උරුමයට නින්දාවක්
වෙන්න ඉඩ නොදෙන්න.[2] ඔවුන්ව
පාලනය කරන්න වෙනත් ජාතීන්ට
ඉඩ නොදෙන්න. “ඔවුන්ගේ දෙවි
කොහේද”[3] කියා සරදම් කරන්න ඒ
ජාතීන්ට ඉඩ නොදෙන්න.’ **18** ඒ
කාලයේදී යෙහෝවා දෙවි තම සෙ-
නඟට අනුකම්පා කර[4] ඔවුන් වෙ-
නුවෙන් නැඟී සිටිනු ඇත.[5]
**19** යෙහෝවා දෙවි තම සෙනඟ-
ගේ කන්නලව් අසා මෙසේ පිළි-
තුරු දෙනු ඇත. ‘මම ඔබට ධාන්‍යද
අලුත් වයින්ද තෙල්ද දෙන්නෙමි.
ඔබද එයින් තෘප්තියට පත් වන්න-
හුය.[6] වෙනත් ජාතීන් අතින් තව-
දුරටත් නින්දා විඳින්න මම ඔබට
ඉඩ නොදෙන්නෙමි.[7] **20** උතුරෙන්
පැමිණෙන සේනාව[8] මම විසුරුවා-
හරින්නෙමි. ඔබ වෙතට ළං වීමට
නොහැකි වන සේ මම එම සේ-
නාව වතුර නැති, පාළු දේශයකට
පන්නා දමන්නෙමි. ඒ සේනාවේ ඉදි-
රියෙන් පැමිණෙන භටයින් නැඟෙ-
නහිර දෙසින් පිහිටි මුහුද දෙසටත්[9]
පිටුපසින් ගමන් කරන භටයින් බස්-
නාහිර දෙසින් පිහිටි මුහුද දෙස-
ටත්[10] විසුරුවාහරින්නෙමි. ඔවුන්ගේ
මළ කඳන්වලින් හමන දුගඳ දසත
පැතිරී යන්නේය.[11] සිතාගැනීමටවත්
නොහැකි පුදුම දේවල් මම කරන්-
නෙමි.’
**21** “භූමිය, භය නොවන්න. ප්‍රීති
ප්‍රමෝදයෙන් පිනා යන්න. මන්ද

**2 පරි.**
**1** යෙරෙ 4:28 යෝවෙ 2:31 මතෙ 24:29 ලූක් 21:25 ක්‍රියා 2:20 එළි 9:2
**2** යෙසා 13:10
**3** යෝවෙ 2:25
**4** ගීතා 46:6 යෙසා 42:13 යෙරෙ 25:30 යෝවෙ 3:16 ආමො 1:2
**5** යෝවෙ 2:2
**6** යෙරෙ 30:7 ආමො 5:18 ශෙප 1:15
**7** ගණන් 24:23 නාහු 1:6 එළි 6:17
**8** 1සාමු 7:6 2ලේක 20:3
**9** එස්රා 10:1 යෙසා 22:12 යාකො 4:9
**10** යෙරෙ 4:1 හොෂෙ 12:6 හොෂෙ 14:1
**11** උත් 37:34 2සාමු 1:11
**12** 2රාජා 22:19 ගීතා 34:18 ගීතා 51:17 යෙසා 57:15
**13** නික් 34:6 මීකා 7:19
**14** ගණන් 14:18 යෙසා 48:9 මීකා 7:18 නාහු 1:3
**15** නෙහෙ 9:17 ගීතා 86:15 ගීතා 103:8 යෝනා 4:2
**16** ගීතා 106:45
**17** 2ලේක 30:8 යෙරෙ 18:8 යෝනා 3:9 ශෙප 2:3
**18** යෙසා 65:8 මීකා 7:20 හග් 2:19
**19** යෝවෙ 2:1
**20** යෙරෙ 36:9 යෝවෙ 1:14
**21** 2ලේක 7:9
**22** නික් 19:10
**23** ද්වි 29:11 ද්වි 31:12 2ලේක 20:13

**2 තීරුව**
**1** 2ලේක 8:12 මතෙ 23:35
**2** ද්වි 28:37 ගීතා 44:14

**3** ද්වි 32:27; ගීතා 42:10; ගීතා 79:10; ගීතා 115:2; මීකා 7:10; **4** ද්වි 32:36; ගීතා 103:13; යෙසා 60:10; විලා 3:22; හොෂෙ 11:8; ලූක් 15:20; යාකො 5:11; **5** සෙක 1:14; සෙක 8:2; **6** යෙසා 62:8; ආමො 9:13; මලා 3:10; **7** එස 34:29; එස 36:15; **8** යෙරෙ 1:14; **9** එස 47:18; **10** ද්වි 11:24; ද්වි 34:2; **11** යෙසා 34:3.

යෝවෙ **2:13*** හෝ, “ළැදි ප්‍රේමය.”

යෙහෝවා දෙවි සිතාගැනීමටවත්
නොහැකි පුදුම දේවල් කරනු ඇත.[1]
**22** නිදැල්ලේ සැරිසරන සත්වයෙනි,
භය නොවන්න.[2] මන්ද පාළුකරයේ
තණබිම් සරුසාරව වැඩෙනු ඇත.[3]
ගස් වැල් පලවලින් බර වෙයි.[4]
අත්තික්කා ගස්ද මිදිවැල්ද බොහෝ
සෙයින් පල දරයි.[5] **23** සියොන්හි
වැසියෙනි, සතුටු වෙන්න. ඔබේ දෙවි
වන යෙහෝවා නිසා ප්‍රීති වෙන්න.[6]
මන්ද දෙවි ඔබට අවශ්‍ය ප්‍රමාණ-
යටම වැසි වස්සවන්නේය.[7] පෙර
සේම වසන්ත සමයේදී හා සරත්
සමයේදී ඔබට වර්ෂාව ලැබෙන්-
නේය.[8] **24** ඔබේ කමත් ධාන්‍යව-
ලින් පිරී යයි. ඔබේ වයින් හා තෙල්
යන්ත්‍රද පිරී ඉතිරී යයි.[9] **25** මගේ
මහත් සේනාව වන පළඟැටියන්වද
පිලවුන්වද කැරපොත්තන්වද දළඹු-
වන්වද එවා අවුරුදු ගණනාවක් පුරා
ඔබට පාඩුවක් සිදු කළත් ඊට සරි-
ලන අස්වැන්නක් මම ඔබට නැවත
ලබා දෙන්නෙමි.[10] **26** ඒ කාලයේදී
ඔබ කා බී තෘප්තියට පැමිණෙ-
නවා ඇත.[11] එවිට ඔබට මෙතරම්
ආශීර්වාද කළ[12] ඔබේ දෙවි වන යෙ-
හෝවාගේ නාමයට ප්‍රශංසා කරන්න
ඔබ පෙලඹෙනු ඇත.[13] 'මගේ සෙ-
නඟ නැවත කිසි දිනක ලැජ්ජාවට
පත් වන්නේ නැත.[14] **27** ඒ කාල-
යේදී, මා ඊශ්‍රායෙල් සෙනඟ සමඟ
සිටින බවත්[15] මා ඔබේ දෙවි වන යෙ-
හෝවා බවත් මා හැර වෙන කිසි දෙවි
කෙනෙකු නැති බවත් ඔබ දැනගනු
ඇත.[16] යළි කිසි දිනක මගේ සෙ-
නඟව ලැජ්ජාවට පත් වෙන්න මම
ඉඩ නොදෙන්නෙමි.

**28** "'පසුව මම සියලු ජනයාට[17]
මගේ බලය නොඅඩුව දෙන්නෙමි.[18]
එවිට ඔබේ පුත්‍රයෝද ඔබේ දූවරුද[19]
අනාවැකි කියනු ඇත. ඔබේ මහල්-
ලෝ සිහින දකිනු ඇත. ඔබේ තරු-
ණයෝ දර්ශන දකිනු ඇත. **29** ඒ
කාලයේදී දාසදාසීන්ටද මම මගේ
බලය දෙන්නෙමි.[20]

**30** "'මම අහසේ පුදුම දේවල්
දකින්න සලස්වන්නෙමි.[1] පොළො-
වේද පුදුම ක්‍රියා සිදු කරන්නෙමි.
ලේද ගින්දරද ඉහළට නැඟෙන දුම්
වලාවන්ද දකිනු ඇත.[2] **31** යෙ-
හෝවා දෙවිගේ බිය උපදවන දවස
පැමිණීමට පෙර[3] හිරු අඳුරු වන්-
නේය.[4] සඳද ලේ මෙන් වන්නේය.'[5]
**32** ඒ දවසේදී, යෙහෝවා යන දෙවි-
ගේ නාමය කියා අයැදින සියලුදෙනා-
වම ගලවාගනු ඇත.[6] යෙහෝවා දෙවි
පැවසූ ලෙසම, විනාශයෙන් ගැලවෙන
අය සියොන් කන්දේද යෙරුසලමේද
සිටිනු ඇත.[7] යෙහෝවා දෙවි විසින්
කැඳවනු ලැබූ අය බේරී ජීවත් වනු
ඇත."[8]

**3** "'ඒ දවස්වලදී,[9] යූදා හා යෙරු-
සලමෙන් වහලුන් ලෙස ගෙන
යනු ලැබූ අයව මම නිදහස් කර
නැවත ගෙන්වාගන්නෙමි.[10] **2** මම
සියලු ජාතීන්ව රැස් කර[11] යෙහෝෂ-
පාට්ගේ තැනිතලාවට ඔවුන්ව ගෙන
යන්නෙමි.[12] මම එතැනදී ඔවුන්ව
විනිශ්චය කරන්නෙමි.[13] මන්ද ඔවුහු
මගේ සෙනඟද උරුමයද වන ඊශ්‍රා-
යෙල්වරුන්ව ජාතීන් අතරට පන්නා
දමා මගේ දේශය ඔවුන් අත-
රේ බෙදාගත්තෝය.[14] **3** ඔවුහු දාදු
දමා මගේ සෙනඟ ඔවුන් අතරේ බෙ-
දාගත්තෝය.[15] ගණිකාවකගේ කුලිය
ගෙවීම සඳහා ඔවුහු දරුවෙකුව විකු-
ණුවෝය.[16] වයින් ටිකක් ලබාගැනී-
මට දැරියකව විකුණුවෝය.

**4** "'තීර්, සීදොන්[17] සහ පිලිස්තියා-
වේ සියලු වැසියෙනි,[18] එවැනි දේවල්
මට විරුද්ධව කරන්න තරම් ඔබ එඩි-
තර වූයේ කෙසේද? ඔබ උත්සාහ
කරන්නේ මගෙන් පළිගන්නද? මම
ඔබට නිසි දඬුවම ලබා දෙන්නෙමි. ඒ
දේ කරන්න මම කිසිසේත් ප්‍රමාද නො-

**2 පරි.**

**1** ගීතා 126:3
**2** ගීතා 36:6
**3** ගීතා 65:12
යෙසා 30:23
සෙක 8:12
**4** ගීතා 67:6
යෙසා 51:3
එස 34:27
**5** ආමො 9:14
**6** ගීතා 28:7
යෙසා 12:6
යෙසා 41:16
යෙසා 61:10
හබ 3:18
සෙක 10:7
**7** ලෙවී 26:4
**8** ද්වි 11:14
සෙක 10:1
යාකො 5:7
**9** ලෙවී 26:10
හිතෝ 3:10
ආමො 9:13
මලා 3:10
**10** යෝවෙ 1:4
ආමො 4:9
**11** ලෙවී 26:5
ද්වි 6:11
ගීතා 22:26
**12** ගීතා 13:6
ගීතා 72:18
යෙසා 25:1
**13** ද්වි 26:10
**14** ගීතා 37:19
ශෙප 3:11
රෝම 5:5
**15** ලෙවී 26:11
ගීතා 46:5
එස 37:26
**16** ද්වි 4:35
1රාජා 8:60
යෙසා 45:5
**17** සෙක 12:10
යොහ 7:39
ක්‍රියා 10:45
**18** යෙසා 32:15
යෙසා 44:3
එස 39:29
ක්‍රියා 2:17
**19** ක්‍රියා 21:9
**20** ක්‍රියා 2:18

**2 තීරුව**

**1** ක්‍රියා 2:19
**2** එළි 9:2
**3** ශෙප 1:14
මලා 4:5
**4** ක්‍රියා 2:20
**5** යෙසා 13:10
යෝවෙ 3:15
මතෙ 24:29
මාක් 13:24
ලූක් 21:25
එළි 6:12
**6** ගීතා 50:15
ක්‍රියා 2:21
රෝම 10:13
**7** යෙසා 46:13
ඔබ 17

**8** යෙසා 11:11; යෙරෙ 31:7; මීකා 4:7; රෝම 9:27; **3 පරි.** **9** යෙරෙ 30:3; එස 38:14; ශෙප 3:20; **10** ද්වි 30:3; යෙරෙ 16:15; එස 39:28; ආමො 9:14; **11** ශෙප 3:8; සෙක 14:2; එළි 16:16; **12** යෝවෙ 3:12; **13** යෙසා 66:16; එස 38:22; **14** යෙරෙ 12:14; එස 35:10; ශෙප 2:8; **15** ඔබ 11; **16** ද්වි 23:17; **17** යෙසා 23:12; සෙක 9:2; **18** යෙරෙ 47:4; එස 25:15.

වන්නෙමි.[1] **5** ඔබ මගේ රන් රිදී
කොල්ල කා,[2] මගේ වටිනා වස්තු
ඔබේ දේවස්ථානවලට රැගෙන ගිය-
හුය.[3] **6** ඔබ යූදා හා යෙරුසලමේ
වැසියන්ව ග්‍රීක ජාතිකයන්ට[4] විකුණා
ඇත.[5] ඔබ එසේ කළේ ඔවුන්ව තම
දේශයෙන් බොහෝ සෙයින් ඈත් කර-
වන පිණිසය.[6] **7** නමුත් වහල්කමට
යැවූ තැන්වලින් මම ඔවුන්ව පිට-
තට ගෙනෙන්නෙමි.[7] ඔබ ඔවුන්ට කළ
ලෙසම මම ඔබටත් සිදු කරන්නෙමි.[8]
**8** මම ඔබේ පුත්‍රයන්ව හා දූවරුන්ව
යූදා දේශයේ වැසියන්ට විකුණන්-
නෙමි.[9] යූදා දේශයේ වැසියෝ ඔවුන්ව
දුර ඈත පිහිටි[10] ෂෙබා දේශයේ වැසි-
යන්ට විකුණනු ඇත.[11] එය එසේ සිදු
වන බවට යෙහෝවා දෙවි වන මම
සහතික කරන්නෙමි.

**9** "'ජනයෙනි, වෙනත් ජාතීන්ට
මෙසේ දැනුම් දෙන්න.[12] "යුද්ධයට
සූදානම් වෙන්න! යුධ දක්ෂයන්ව රැස්
කරගන්න![13] සියලු භටයන්ට ඉදිරියට
ඇවිත් පහර දෙන්නයයි කියන්න![14]
**10** ඔබේ නගුල්වලින් කඩුද දෑකැ-
ත්වලින් හෙල්ලද සාදාගන්න.[15] දුර්-
වල තැනැත්තා, 'මම ශක්තිමත්' යයි
කියනු ලැබේවා![16] **11** අවට වෙ-
සෙන සියලු ජනයෙනි, ඇවිත් එකමු-
තුව වැඩ කරන්න. "'"[17]

යෙහෝවා දෙවියනි, ඔබේ බලවත්
සේනාව එතැනට ගෙනෙන්න.[18]

**12** "'සියලු ජාතීන්ට අයත් ජන-
යෙනි, නැඟිට යෙහෝෂාපාට්ගේ
තැනිතලාවට පැමිණෙන්න.[19] ඒ
ස්ථානයේදී මම ඒ සියලු ජාතීන්ව
විනිශ්චය කරන්නෙමි.'[20]

**13** "අස්වැන්න නෙළන කාලය
පැමිණ තිබේ.[21] එහෙයින් දෑකැත්ත
අතට ගෙන කපන්න.[22] ඇවිත්
බලන්න, මිදි යන්ත්‍රය පිරී ඇත.[23]
එය වයින්වලින් පිරී ඉතිරී යයි. මන්ද
ඔවුන්ගේ නපුරුකම ඉතා මහත්ය.[24]
**14** තීන්දුව දෙන තැනිතලාවේ
විශාල සමූහයක් රැස්ව සිටිති.[25] මන්ද
යෙහෝවා දෙවිගේ දවස ළඟය. තීන්-
දුව දෙන තැනිතලාවේදී එය දැක-
ගත හැක.[1] **15** හිරු, සඳු අඳුරු වී
තාරකාවල ආලෝකයද නිවී යනු
ඇත.[2] **16** යෙහෝවා දෙවි සියොන්
සිට සිංහයෙකු මෙන් ගර්ජනා කරනු
ඇත. යෙරුසලමේ සිට ඔහු මහත්
හඬින් කතා කරනු ඇත.[3] අහසත්
පොළොවත් දෙදරුම් කනු ඇත.[4]
නමුත් යෙහෝවා දෙවි තම සෙ-
නඟට රැකවරණය දෙන්නේය.[5] ඊශ්‍රා-
යෙල්වරුන්ගේ රක්ෂස්ථානය ඔහුය.[6]
**17** 'මාගේ ශුද්ධ කන්ද වන
සියොන්හි[7] වාසය කරන මා ඔබේ
දෙවි වන යෙහෝවා බව ඔබ සියලු-
දෙනා දැනගනු ඇත.[8] යෙරුසලමද
ශුද්ධස්ථානයක් බවට පත් වනු ඇත.[9]
මින්පසු කිසි දිනක වෙනත් ජාතීහු ඒ
මැදින් ගමන් කරන්නේ නැත.'[10]

**18** "ඒ දවසේදී අලුත් වයින් කඳු
දිගේ ගලා හැලෙයි.[11] කඳු මුදුන් කිරි-
වලින් නැහැවී යයි. යූදාහි ඇළදොළ
සියල්ල වතුරෙන් පිරී ඉතිරී යයි. යෙ-
හෝවා දෙවිගේ ගෘහයෙන් දිය උල්ප-
තක් නික්ම ඇවිත්[12] ෂිට්ටිම්*[13] නිම්නය
දෙසට ඇද හැලෙයි. **19** ඊජිප්තුව
පාළු දේශයක් බවටත්[14] ඒදොම් පාළු-
කරයක් බවටත් පත් වනු ඇත.[15]
මන්ද ඔවුහු යූදා දේශයේ වැසියන්ට
හිරිහැර කර එහි සිටි අහිංසක ජනයා-
ගේ ලේ වැගුරුවෝය.[16] **20** නමුත්
යූදා දේශය සදාකාලයෙන් සදාකාල-
යට ජනාවාස ස්ථානයක් වනු ඇත.[17]
මතු පැමිණෙන සියලු පරම්පරාවලදී
යෙරුසලමද ජනාකීර්ණ වනු ඇත.[18]
**21** 'මා ඔවුන්ව වැරදිකරුවන් ලෙස
සැලකුවත් ඒ කාලයේදී ඔවුන්ව සල-
කන්නේ නිදොස් අය ලෙසය.'[19] යෙ-
හෝවා දෙවි සියොන්හි වාසය කරනු
ඇත."[20]

**3 පරි.**
**1** ආමො 1:10 රෝම 2:6
**2** 2ලේක 21:17
**3** 1සාමු 5:2
**4** උත් 10:2 සෙක 9:13
**5** ද්වි 28:32 එස 27:13
**6** ද්වි 28:68
**7** යෙසා 11:12 යෙසා 43:5 යෙසා 49:12 යෙරෙ 23:8 එස 34:12
**8** ගීතා 62:12 යෙරෙ 17:10 යෙරෙ 25:14 යෙරෙ 30:23
**9** ඔබ 20
**10** යෙරෙ 6:20
**11** යෝබ් 1:15 එස 27:22
**12** යෙසා 34:1 යෙරෙ 31:10
**13** යෙසා 8:9 යෙරෙ 46:3
**14** එස 38:7
**15** යෙසා 2:4 මීකා 4:3
**16** සෙක 12:8
**17** එස 38:9 ශෙප 3:8 එළි 16:14
**18** ගීතා 103:20 2තෙස 1:7 එළි 19:14
**19** යෝවෙ 3:2
**20** ගීතා 76:9 ගීතා 96:13
**21** යෙරෙ 51:33 එළි 14:18
**22** එළි 14:19
**23** යෙසා 63:3 විලා 1:15 එළි 14:20
**24** උත් 6:5 යෙසා 13:11
**25** එළි 19:19

**2 තීරුව**
**1** යෙසා 34:2 යෝවෙ 2:1 ශෙප 1:14
**2** යෙසා 13:10 එස 32:7 යෝවෙ 2:31 ක්‍රියා 2:20
**3** යෙරෙ 25:30 ආමො 1:2
**4** යෙසා 13:13
**5** ගීතා 18:2 ගීතා 50:15
**6** හිතෝ 18:10
**7** ඔබ 16 සෙක 8:3
**8** ගීතා 9:16
**9** යෙසා 4:3

**10** යෙසා 35:8; යෙසා 60:18; නාහු 1:15; සෙක 14:21; එළි 21:27; **11** ආමො 9:13; සෙක 9:17; **12** ගීතා 46:4; එස 47:1; එළි 22:1; **13** යෙසා 41:19; **14** යෙසා 19:1; **15** යෙරෙ 49:17; එස 25:13; **16** ආමො 1:11; ඔබ 10; **17** යෙසා 33:20; **18** ගීතා 48:8; යෙසා 60:15; ආමො 9:15; **19** ගීතා 103:10; යෙසා 4:4; එස 36:25; මීකා 7:19; **20** ගීතා 48:1; යෙසා 24:23; මීකා 4:7.

යෝවෙ **3:18*** තේරුම, "ඇකේෂියා ගස්."

# ආමොස්*

1 තෙකෝවා නගරයේ[1] එඬේරෙකු
වූ ආමොස් විසින් ලියන ලද
පණිවිඩය මෙයයි. ඊශ්‍රායෙල්වරුන්
පිළිබඳව දුටු දර්ශනයක්[2] මාර්ගයෙන්
ඔහුට එම අනාවැකිය හෙළි විය.
ආමොස් එම දර්ශනය දුටුවේ ඊශ්‍රා-
යෙල්හි රජු වූ යෝවාෂ්ගේ[3] පුත් යෙ-
රොබොවම්[4] හා යූදාහි රජු වූ උසියා[5]
රජකම් කළ කාලයේදීය. භූමිකම්-
පාව සිදු වීමට අවුරුදු දෙකකට පෙර[6]
ආමොස්ට මෙම පණිවිඩය දන්වන
ලදි. 2 ඔහුගේ පණිවිඩය මෙයයි.
"යෙහෝවා දෙවි සියොන් සිට සිංහ-
යෙකු මෙන් ගර්ජනා කරයි.[7] යෙරුස-
ලමේ සිට ඔහු මහත් ශබ්දයකින් කතා
කරයි.[8] එවිට කර්මෙල් කඳු මුදුන
වියළී යයි.[9] තණබිම් හඬා වැලපෙයි."
3 "යෙහෝවා දෙවි මෙසේ පැවසු-
වේය. 'දමස්කයේ[10] වැසියන් නිමක්
නොමැතිව කරන අපරාධ නිසා*
ඔවුන්ට විරුද්ධව මම ගත් තීරණය
වෙනස් නොකරන්නෙමි. යකඩ යන්-
ත්‍රවලින් ධාන්‍ය තළා පොළන්නාක්
මෙන් ඔවුහු ගිලියද් දේශයේ වැසි-
යන්ට හිරිහැර කළෝය.[11] 4 එබැ-
වින් මම හසායෙල්ගේ[12] මාලිගාවට
ගිනි තබන්නෙමි.[13] ඒ ගින්නෙන්
බෙන්-හාදද්ගේ බලකොටුද දැවී යනු
ඇත.[14] 5 මම දමස්කයේ නුවර දො-
රටුවේ අගුල් කඩා[15] බිකත්-ආවෙන්
ප්‍රදේශයේ වැසියන්වද බෙත්-ඒදන්
ප්‍රදේශයේ රාජ යෂ්ටිය හිමි තැනැත්-
තාවද විනාශ කර දමන්නෙමි. සිරියා-
වේ වැසියන්ව කිර් දේශයට[16] ගෙන
යනු ලබයි.' එසේ පැවසුවේ යෙහෝවා
දෙවිය."
6 "යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ කීවේය. 'ගාසා නගරයේ වැසි-
යන් නිමක් නොමැතිව කරන අප-
රාධ නිසා[17] ඔවුන්ට විරුද්ධව මම
ගත් තීරණය වෙනස් නොකරන්-
නෙමි. ඔවුහු විශාල පිරිසක් වහලුන්
ලෙස රැගෙන ගොස්[1] පසුව ඒදොම්-
වරුන්ගේ අතට භාර දුන්නෝය.[2]
7 ඒ නිසා මම ගාසා නගරයේ[3] පවුරද
එහි රාජකීය බලකොටුද ගින්නෙන්
දවාලන්නෙමි. 8 මම අෂ්දොද් නග-
රයේ[4] වැසියන්වද අෂ්කෙලොන් නග-
රයේ රාජ යෂ්ටිය හිමි තැනැත්තාවද
විනාශ කරන්නෙමි.[5] එක්‍රොන් නගර-
යේ වැසියන්ට[6] මම පහර දෙන්නෙමි.[7]
ඉතුරු වූ පිලිස්තිවරුන්වද මම විනාශ
කර දමන්නෙමි.'[8] එසේ පැවසුවේ විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවිය."
9 "යෙහෝවා දෙවි මෙසේ කීවේය.
'තීර් දේශයේ[9] වැසියන් නිමක් නො-
මැතිව කරන අපරාධ නිසා ඔවුන්ට
විරුද්ධව මම ගත් තීරණය වෙනස්
නොකරන්නෙමි. මන්ද ඔවුහු විශාල
පිරිසක් වහලුන් ලෙස රැගෙන
ගොස් පසුව ඒදොම්වරුන්ගේ අතට
භාර දුන්නෝය. සහෝදරකම නිසා
ඇති කරගත් ගිවිසුම ඔවුහු අමතක
කළෝය.[10] 10 එබැවින් මම තීර්
දේශයේ පවුරද එහි රාජකීය බලකො-
ටුද ගින්නෙන් දවාලන්නෙමි.'[11]
11 "යෙහෝවා දෙවි මෙසේ පැව-
සුවේය. 'ඒදොම් දේශයේ වැසියන්
නිමක් නොමැතිව කරන අපරාධ
නිසා[12] ඔවුන්ට විරුද්ධව මම ගත් තීර-
ණය වෙනස් නොකරන්නෙමි. මන්ද
ඔවුන් කඩු රැගෙන[13] තමන්ගේම
සහෝදරයන් පසුපස පන්නාගෙන
ගියේ කිසි අනුකම්පාවක් නොමැති-
වය.[14] සතෙකු ගොදුරක් ඉරා දමන්-
නාක් මෙන් ඔවුහු මහත් කෝපයෙන්
දිගින් දිගටම පහර දුන්නෝය. ඔවුන්-
ගේ වෛරය කිසි දිනක සන්සි-
ඳෙන්නේ නැත.[15] 12 ඒ නිසා මම
තේමාන් නගරයේ[16] පවුරද බොෂ්රා[17]
නගරයේ රාජකීය බලකොටුද ගින්-
නෙන් දවාලන්නෙමි.'

**1 පරි.**
1 2සාමු 14:2 2ලේක 11:6
2 2රාජා 17:13
3 2රාජා 13:13
4 2රාජා 14:23 ආමො 7:10
5 2ලේක 26:1 යෙසා 1:1 හොෂෙ 1:1
6 සෙක 14:5
7 යෝවෙ 3:16
8 යෙරෙ 25:30
9 1සාමු 25:2 යෙසා 33:9 නාහු 1:4
10 යෙසා 7:8 යෙසා 8:4
11 2රාජා 8:12 2රාජා 10:32 2රාජා 10:33 2රාජා 13:7
12 1රාජා 19:15 2රාජා 8:8
13 යෙරෙ 49:27
14 1රාජා 20:21
15 යෙසා 7:8 යෙසා 17:1
16 2රාජා 16:9 යෙසා 22:6 ආමො 9:7
17 එස 25:15

**2 තීරුව**
1 2ලේක 21:17 2ලේක 28:18 යෝවෙ 3:6
2 ඔබ 11
3 යෙරෙ 25:20 යෙරෙ 47:1 සෙක 9:5
4 යෙසා 20:1
5 යෙරෙ 47:5
6 ශෙප 2:4 සෙක 9:7
7 ගීතා 81:14
8 යෙසා 14:29 යෙරෙ 47:4 එස 25:16 ශෙප 2:5
9 එස 26:2
10 යෝවෙ 3:6
11 එස 26:12
12 යෙසා 34:5 යෝවෙ 3:19
13 එස 25:12
14 යෝබ 6:14
15 2ලේක 28:17 ඔබ 10
16 උත් 36:11 ඔබ 9
17 උත් 36:33 යෙසා 34:6 යෙරෙ 49:13

**ආමො නම*** තේරුම, "බරක්" හෝ, "බරක් ඉසි-
ලීම." **1:3*** මූ.අ., "දමස්කයේ කැරලිකාර ක්‍රියා
තුනක් නිසාද? කැරලිකාර ක්‍රියා හතරක් නිසාද?"

**13** “යෙහෝවා දෙවි මෙසේ පැවසු-
වේය. ‘අම්මොන්වරුන්[1] නිමක් නො-
මැතිව කරන අපරාධ නිසා ඔවුන්ට
විරුද්ධව මම ගත් තීරණය වෙනස්
නොකරන්නෙමි.[2] මන්ද ඔවුහු තමුන්-
ගේ දේශ සීමා පුළුල් කරගැනීමට
ගිලියද් නගරයේ ගැබිනි ස්ත්‍රීන්ව කඩු-
වෙන් කපා දැමුවෝය.[3] **14** ඒ නිසා
යුධ දවසේදී මම රබ්බා නගරයේ[4] පවු-
රට ගිනි තබන්නෙමි. යුධ ඝෝෂා හා
චණ්ඩ මාරුතයක්[5] සමඟ පැමිණෙන
එම ගින්න එහි රාජකීය බලකොටුද
දවා දමනු ඇත. **15** ඔවුන්ගේ රජු-
වත් පාලකයන්වත් බලයෙන් පහ කර
වහලුන් ලෙස රැගෙන යනු ලබයි.’[6]
එසේ පැවසුවේ යෙහෝවා දෙවිය.”

**2** “යෙහෝවා දෙවි මෙසේ කීවේය.
‘මෝවබ්වරුන්[7] නිමක් නොමැ-
තිව කරන අපරාධ නිසා ඔවුන්ට
විරුද්ධව මම ගත් තීරණය වෙනස්
නොකරන්නෙමි. මන්ද ඔවුහු ඒදොම්
දේශයේ රජුගේ ඇටකටු පුලුස්සා
එයින් හුණු[8] සාදාගත්තෝය.
**2** එබැවින් මම මෝවබ් දේශයට ගිනි
තබන්නෙමි. ඒ ගින්නෙන් කෙරියොත්
නගරයේ[9] රාජකීය බලකොටුද දැවී
යනු ඇත. යුධ ඝෝෂා සහ හොරණෑ
හඬ මැද මෝවබ් දේශය විනාශ වී
යන්නේය.[10] **3** මම මෝවබ් දේශයේ
විනිශ්චයකරුවද එහි සියලු පාලක-
යන්වද එකට විනාශ කර දමන්-
නෙමි.’[11] එසේ පැවසුවේ යෙහෝවා
දෙවිය.”

**4** “යෙහෝවා දෙවි මෙසේ කීවේය.
‘යුදා දේශයේ වැසියන් නිමක් නොමැ-
තිව කරන අපරාධ නිසා[12] ඔවුන්ට
විරුද්ධව මම ගත් තීරණය වෙ-
නස් නොකරන්නෙමි. මන්ද ඔවුහු
යෙහෝවා දෙවි වන මාගේ නීතිය
ප්‍රතික්ෂේප කළෝය.[13] මාගේ නියෝ-
ගද නොපැවැත්වූවෝය. ඔවුන්ගේ
මුතුන්මිත්තන් විශ්වාස කළ බොරු
දේවල්[14] ඔවුහුද විශ්වාස කරමින්
මංමුළා වී ගියෝය.[15] **5** එබැවින්
මම යුදා දේශයට ගිනි තබන්නෙමි. ඒ
ගින්නෙන් යෙරුසලමේ රාජකීය බල-
කොටුද දැවී යනු ඇත.’[1]

**6** “යෙහෝවා දෙවි මෙසේ කීවේය.
‘ඊශ්‍රායෙල්වරුන්[2] නිමක් නොමැතිව
කරන අපරාධ නිසා ඔවුන්ට විරුද්-
ධව මම ගත් තීරණය වෙනස් නො-
කරන්නෙමි. මන්ද ඔවුහු රිදී
ලබාගන්නා පිණිස ධර්මිෂ්ඨ අයව
විකුණන්නෝය. පාවහන් කුට්ටමක්
ලබාගන්නා පිණිස දුප්පතුන්ව විකු-
ණන්නෝය.[3] **7** දිළිඳුන් අන්ත අස-
රණ තත්වයකට පත් වී තමුන්ගේ හිස
මත වැලි දමාගන්නා ආකාරය දැක-
ගැනීමට ඔවුහු මහත් ආශාවෙන් බලා
සිටිති.[4] මෘදු ගතිගුණ තිබෙන අයට
ඔවුහු යුක්තිය ඉටු නොකරති.[5] පියා
සහ පුත්‍රයා එකම ගණිකාව වෙනට
ගොස්[6] මගේ ශුද්ධ නාමය කෙලසති.[7]
**8** ඔවුහු ඇපයක් ලෙස පැහැරගත්
වස්ත්‍ර පූජාසන ළඟ එළාගෙන ඒවා
මත දිගා වී සිටිති.[8] ඔවුහු මිනිසුන්-
ගෙන් ලබාගත් දඩ මුදල්වලින් වයින්
මිල දී ගෙන ඔවුන්ගේ දේවාල[9] ඇතු-
ළට ගොස් බොති.’

**9** “‘තේජවත් දේවදාර ගස් හා
දැවැන්ත ගස් මෙන්[10] බලවත් වූ
අමෝරිවරුන්ව[11] මා විනාශ කළේ
කවුරුන් වෙනුවෙන්ද? ඔබ වෙනු-
වෙන් නොවෙයිද? ගසක පල හා
මුල් විනාශ කරන්නාක් මෙන් මම
ඔවුන්ව සම්පූර්ණයෙන්ම විනාශ කර
දැමුවෙමි.[12] **10** මම ඔබව ඊජිප්තු
දේශයෙන් පිටතට ගෙනාවෙමි.[13]
අවුරුදු හතළිහක් පුරා[14] පාළුකර-
යේ ඔබව ගෙන ගොස් අවසානයේදී
අමෝරිවරුන්ගේ දේශය ඔබට හිමි
කර දුන්නෙමි.[15] **11** ඔබේ පුත්‍රයන්-
ගෙන් සමහරදෙනෙකුව අනාගතවක්-
තෘවරුන්[16] ලෙසත් තරුණයන්ගෙන්
සමහරදෙනෙකුව නසරීතවරුන්[17]
ලෙසත් මම පත් කළෙමි. ඊශ්‍රායෙල්

**1 පරි.**
**1** එස 25:3 ශෙප 2:8
**2** ද්වි 23:3 2ලේක 20:1
**3** විනි 11:13 යෙරෙ 49:1 එස 35:10
**4** යෙරෙ 49:2 එස 25:5
**5** ගීතා 83:15
**6** යෙරෙ 27:3 යෙරෙ 49:3

**2 පරි.**
**7** යෙරෙ 48:29 එස 25:8 ශෙප 2:8
**8** යෙසා 33:12
**9** යෙරෙ 48:24
**10** යෙසා 15:1
**11** ගණන් 24:17 යෙසා 16:14 යෙරෙ 48:7
**12** 2රාජා 17:19 යෙරෙ 2:13 යෙරෙ 9:26
**13** ලෙවී 26:15 2ලේක 36:14 නෙහෙ 1:7 දානි 9:11
**14** යෙසා 28:15 යෙරෙ 16:19
**15** 2ලේක 30:7 යෙරෙ 9:14

**2 තීරුව**
**1** 1සාමු 12:15 1ලේක 28:9 2ලේක 36:19 යෙරෙ 17:27 යෙරෙ 37:8 යෙරෙ 52:13 හොෂෙ 8:14
**2** ද්වි 28:45 2රාජා 17:7 එස 23:5 හොෂෙ 4:1
**3** නික් 23:6 එස 22:12 යෝවෙ 3:3 ආමො 5:11 ආමො 8:6
**4** ආමො 4:1
**5** යෙසා 10:2 ආමො 5:12
**6** ලෙවී 18:8 ලෙවී 18:15 එස 22:11 1කොරි 5:1
**7** එස 36:20 එස 43:8 රෝම 2:24
**8** නික් 22:26 ද්වි 24:12 එස 18:12 හොෂෙ 8:11 හොෂෙ 10:1
**9** විනි 9:27
**10** යෙසා 2:13

**11** ගණන් 21:24; ද්වි 2:31; යොෂු 24:8; ගීතා 135:11; **12** ද්වි 2:32; ද්වි 2:33; **13** නික් 12:51; ගීතා 105:43; මීකා 6:4; **14** ගණන් 14:34; ද්වි 2:7; නෙහෙ 9:21; ක්‍රියා 7:42; **15** ද්වි 1:20; **16** 1සාමු 3:20; 1රාජා 17:1; 1රාජා 19:19; 2ලේක 36:15; **17** ගණන් 6:2; විනි 13:5; විලා 4:7.

ජනයෙනි, එය සුදුසු දෙයක් නොවෙ-
යිද?' එසේ කීවේ යෙහෝවා දෙවිය.
12 "'නමුත් ඔබ නසරීනවරුන්ට
වයින් බොන්න දුන්නහුය.[1] "අනා-
වැකි නොකියන්න" කියා අනාගත-
වක්තෘවරුන්ට තර්ජනය කළහුය.[2]
13 එබැවින් අලුත් ධාන්‍ය පැටවූ
කරත්තයක් සෙලවෙන්නාක් මෙන්
ඔබ ගමන් කරන භූමියද මම සොල-
වන්නෙමි. 14 වේගයෙන් දුවන අය-
ටවත් පලා ගොස් සැඟවීමට තැනක්
නොතිබෙනු ඇත.[3] ශක්තිමත් අය-
ගේ සවිය නැති වී යයි. ඔවුන්ගෙන්
කිසිවෙක් ගැලවී යන්නේ නැත.[4]
15 එක දුනුවායෙක්වත් ඉතුරු වන්-
නේ නැත. වේගයෙන් දුවන එක් කෙ-
නෙක්වත් බේරෙන්නේ නැත. අසුන්
පිට නැඟ යන කිසිවෙකුට ගැලවී
යෑමට නොහැකි වෙයි.[5] 16 එදින
නිර්භීත තැනැත්තා පවා නිර්වස්ත්‍රව
පලා දුවනු ඇත.'[6] එසේ පැවසුවේ යෙ-
හෝවා දෙවිය."

**3** "ඊශ්‍රායෙල් ජනයෙනි, යෙහෝවා
දෙවි ඔබ ගැන කී දේට ඇහුම්-
කන් දෙන්න.[7] ඊජිප්තු දේශයෙන්
පිටතට ගෙනා[8] ඊශ්‍රායෙල්ගෙන් පැව-
තෙන්නන් වන ඔබ ගැන ඔහු මෙසේ
කියා ඇත. 2 'පොළොවේ සියලු
ජාතීන් අතරින්[9] ඔබව පමණක් මම
තෝරාගත්තෙමි.[10] ඒ නිසා ඔබ කළ
සියලු වැරදිවලට ඔබ මට ගණන් දිය
යුතුයි.'[11]

3 "දෙදෙනෙකු ගමනක් යෑමට
නියම කරගත් දවසේදී මුණගැසු-
ණොත් මිසක ඔවුන්ට එම ගමන යා
හැකිද?[12] 4 වනයේ සැරිසරන සිංහ-
යෙකු ගොදුරක් නැති තැන ගර්ජනා
කරයිද?[13] ගුහාවක සිටින කේශර
සිංහයෙකු තමන් ළඟ ගොදුරක් නැති
විට ගර්ජනා කරයිද? 5 ඇමක්
නැතුව කුරුල්ලෙකු උගුලකට හසු
වෙයිද?[14] උගුලකට යමක් හසු නො-
වුණොත් එය ඉබේටම ගැස්සෙයිද?
6 නගරයක හොරණෑව පිඹින විට එහි
ජනයා කලබල නොවනු ඇද්ද?[15] නග-
රයේ වැසියන්ට විපතක් සිදු වුණොත්
එය යෙහෝවා දෙවිගෙන් නොවෙයිද?
7 විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි තම සේවකයන් වන
අනාගතවක්තෘවරුන්ට තම අරමුණු
හෙළි නොකර කිසිවක් නොකරන්-
නේය.[1] 8 සිංහයෙක් ගර්ජනා කර
ඇත.[2] ඊට බිය නොවන්නේ කවුද?
විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි අනාවැකියක් ප්‍රකාශ කර
ඇත. ඒ ගැන දැනුම් නොදී සිටිය
හැක්කේ කාටද?[3]

9 "අෂ්දොද් නගරයේ බලකොටු-
වල හා ඊජිප්තු දේශයේ බලකොටුවල
සිට මේ පණිවිඩය ප්‍රකාශ කරන්න.[4]
'සමාරියේ කඳුවලට විරුද්ධව රැස්
වී[5] ඒ දේශය මුහුණ පා තිබෙන
ප්‍රශ්න ගැටලු දෙසත් එහි සිදු
වන වංචා දූෂණ දෙසත් බලන්න.[6]
10 හරි දේ කුමක්ද කියා ඔවුන්ට
අමතක වී ඇත.[7] ඔවුන් බලහත්කා-
රයෙන් කොල්ල කා ගත් දේවලින්
ඔවුන්ගේ රාජකීය බලකොටු පුරවා-
ගත්තෝය.'[8] එසේ පවසන්නේ යෙ-
හෝවා දෙවිය."

11 "එමනිසා විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි මෙසේ පව-
සයි. 'සතුරු සේනාවක් පැමිණ ඔබේ
දේශය වටලාගන්නෝය.[9] ඔවුහු ඔබේ
ශක්තිය බෙලහීන කරන්නෝය. ඔබේ
බලකොටු සුනුවිසුනු කර එහි ඇති
වටිනා දේවල් කොල්ල කන්නෝය.'[10]

12 "යෙහෝවා දෙවි මෙසේද පව-
සයි. 'බැටළුවෙකු සිංහයෙකුට ගො-
දුරු වූ විට එඬේරා උගේ කටෙන්
බැටළුවාගේ කකුලක්* හෝ කනෙන්
කොටසක් හෝ බේරාගන්නාක්
මෙන්[11] ඊශ්‍රායෙල්වරුන්වද තම සතු-
රන් අතින් බේරාගනු ඇත. සමාරි-
යේ වටිනා යහන්වලත්[12] දමස්කයෙන්
ගෙන්වාගත් ඇඳන්වලත්[13] සැතපෙන
ඒ අයගෙන් බේරෙන්නේ ස්වල්පදෙ-
නෙකු පමණි.'

**2 පරි.**
1 ගණන් 6:3
2 යෙසා 30:10
යෙරෙ 11:21
ආමො 7:12
ක්‍රියා 4:18
1තෙස 2:16
3 ආමො 9:1
4 2රාජා 25:5
ගීතා 33:16
5 යෙසා 30:16
6 ද්වි 28:25

**3 පරි.**
7 යෙසා 46:3
හොෂෙ 4:1
8 ආමො 2:10
9 උත් 10:32
යෙරෙ 10:25
10 නික් 19:5
ද්වි 7:6
ගීතා 147:19
11 යෝබ් 34:11
යෙරෙ 9:25
එස 9:6
දානි 9:12
හොෂෙ 12:2
ආමො 4:12
රෝම 2:9
12 උත් 6:9
උත් 17:1
2කොරි 6:14
13 ගීතා 104:21
යෙසා 31:4
14 දේශ 9:12
15 යෙරෙ 4:5
ශෙප 1:16

**2 තීරුව**
1 උත් 6:13
උත් 18:17
1රාජා 22:23
2රාජා 3:17
2රාජා 22:20
ගීතා 25:14
යෙසා 42:9
දානි 9:22
දානි 11:2
යොහ 15:15
එළි 1:1
2 හිතෝ 20:2
හිතෝ 30:30
යෙරෙ 4:7
ආමො 1:2
3 යෙරෙ 20:9
ආමො 7:15
ක්‍රියා 4:20
ක්‍රියා 5:20
4 යෙරෙ 46:14
5 2රාජා 17:23
6 යෙසා 9:9
හොෂෙ 7:1
ආමො 4:1
7 යෙසා 26:10
යෙරෙ 4:22
8 ශෙප 1:9
9 2රාජා 17:6
යෙසා 7:17
10 හොෂෙ 11:6
ආමො 6:8
11 1සාමු 17:34

**12** යෙසා 8:4; **13** ආමො 6:4.

ආමො **3:12*** මූ.අ., "ගාත් දෙකක්."

13 "'මේ සියල්ලට හොඳින් සවන්
දී යාකොබ්ගේ ගෘහයට ගොස්
පවසන්න'[1] කියා විශ්වයේ පාල-
කයාණන්ද ස්වර්ගයේ සේනාවල අධි-
පතියාණන්ද වන යෙහෝවා දෙවි
කියන්නේය. 14 'ඊශ්‍රායෙල්වරුන්
මට විරුද්ධව කැරලිගැසූ නිසා ඔවුන්
මට ගණන් දිය යුතුයි.[2] ඒ දවසේදී බෙ-
තෙල් නගරයේ සෑදූ පූජාසන[3] ගැනත්
ඔවුන් මට ගණන් දිය යුතුයි. ඒ කාල-
යේදී මම පූජාසනයේ අං කඩා බිම
හෙළන්නෙමි.[4] 15 ඔවුන් ශීත කාල-
යේදී වාසය කිරීමට සෑදූ ගෙවල්ද[5]
ගිම්හාන කාලයේදී වාසය කිරීමට
සෑදූ ගෙවල්ද[6] මම කඩා දමන්නෙමි.'
"'ඇත්දළවලින් නිමැවූ ගෙවල්[7]
විනාශ වී යනු ඇත. ගෙවල් දොරවල්
විශාල ප්‍රමාණයක් සුනුවිසුනු වී යනු
ඇත.'[8] එසේ පවසන්නේ යෙහෝවා
දෙවිය."

4 "සමාරියේ කන්ද[9] උඩට වී සිටින
බාෂාන් දේශයේ එළදෙනුනි,[10]
මේ පණිවිඩයට සවන් දෙන්න. 'අපට
බොන්න ගෙනැවිත් දෙන්න' කියා
ඔබේ ස්වාමිපුරුෂයන්ට පෙරත්ත
කරන ඔබ නැති බැරි අයට
වංචා කරන්නහුය.[11] දුප්පතුන්ට පීඩා
කරන්නහුය. 2 විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි තම ශුද්-
ධකම සහතිකයක් ලෙස දෙමින්
මෙසේ දිවුරන්නේය.[12] 'මතු දවස්ව-
ලදී ඔබව කොකුවලින් ඇදගෙන
යනු ලබන්නේය. ඉතුරුව සිටින සෙ-
නඟව බිලි කොකුවලින්[13] ඇදගෙන
යනු ලබන්නේය. 3 ඔබව ඇදගෙන
ගොස් නුවර පවුරේ කඩා දැමූ තැන්ව-
ලින් එළියට තල්ලු කර දමනු ඇත.[14]
ඔබව හර්මොන්* මතට විසි කර දමනු
ඇත.' එසේ පවසන්නේ යෙහෝවා
දෙවිය."
4 "'ඊශ්‍රායෙල් ජනයෙනි, බෙතෙල්
නගරයට ඇවිත් දූෂිත ක්‍රියාවල නියැ-

**3 පරි.**
1 2ලේක 24:19; එස 3:17
2 නික් 32:34; යෙරෙ 9:25; හොෂෙ 4:9
3 1රාජා 12:33; 2රාජා 23:15; 2ලේක 31:1; හොෂෙ 13:2
4 2ලේක 34:7; හොෂෙ 10:2; මීකා 1:6
5 යෙරෙ 36:22
6 විනි 3:20
7 1රාජා 22:39
8 යෙසා 5:9; ආමෝ 6:11

**4 පරි.**
9 ආමෝ 6:1
10 ගීතා 22:12; එස 39:18; හොෂෙ 4:16
11 හිතෝ 22:22; හොෂෙ 4:2; මීකා 2:2; මලා 3:5; යාකො 5:4
12 නික් 15:11; ගීතා 89:35
13 හබ 1:15
14 2රාජා 25:4; එස 12:12

**2 තීරුව**
1 1රාජා 12:29; එස 20:39; හොෂෙ 4:13; ආමෝ 3:14
2 හොෂෙ 4:15; හොෂෙ 9:15; ආමෝ 5:5
3 ගණන් 28:4; ද්වි 14:28; ද්වි 26:12; හොෂෙ 8:13
4 ලෙවී 7:12
5 ලෙවී 22:18; ද්වි 12:6
6 හොෂෙ 9:1
7 ද්වි 32:24; 2රාජා 8:1
8 ලෙවී 26:26; ද්වි 28:38; 1රාජා 18:2; 2රාජා 4:38
9 2ලේක 28:22; යෙරෙ 3:7; යෙරෙ 5:3
10 ද්වි 28:23; 1රාජා 8:35; 2ලේක 7:13; යෙසා 5:6
11 යෝවෙ 1:20
12 1රාජා 18:5; යෙරෙ 14:3
13 යෙරෙ 23:14; හොෂෙ 7:10

ළෙන්න.[1] ගිල්ගාල් නගරයටත් ගොස්
ඇති තරම් දූෂිත ක්‍රියාවල නියැ-
ළෙන්න.[2] සෑම උදෑසනකම ඔබේ පූජා
රැගෙන එන්න. තුන්වනදා දසයෙන්
කොටස් ගෙනෙන්න.[3] 5 මුහුන් මිශ්‍ර
කළ ස්තුති පූජා පූජාසනය මත
දවන්න.[4] ඔබේ කැමැත්තෙන්ම ඔප්පු
කරන පූජා[5] ගැන ප්‍රසිද්ධියේ දැනුම්
දෙන්න. ඔබේ සිත් පෙලඹෙන්නේ
එවැනි දේවල් කිරීමට නොවෙයිද?'[6]
එසේ පවසන්නේ විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවිය.
6 "'මම ඔබ ජීවත් වන සිය-
ලුම නුවරවලත් සියලුම පළාත්වලත්
ආහාර හිඟයක්[7] ඇති කළෙමි. ඔබට
කන්න මම කිසිවක් ඉතුරු නොක-
ළෙමි.[8] එහෙත් ඔබ මා වෙතට හැරී
ආවේ නැත.'[9] එසේ පවසන්නේ යෙ-
හෝවා දෙවිය.
7 "'අස්වැන්න නෙළන්න මාස
තුනක් තිබියදී ඔබට අවශ්‍ය වර්-
ෂාව මම නොදුන්නෙමි.[10] මම තෝරා-
ගත් නගරවල පමණක් වර්ෂාව ඇද
හැළෙන්න සැලැස්වූවෙමි. මම කැමති
ඉඩම්වලට පමණක් වර්ෂාව දුන්-
නෙමි. අනික් ඉඩම් සියල්ල වර්ෂාව
නොමැතිව වියළී ගියේය.[11] 8 එහෙ-
යින් නගර කිහිපයක වැසියෝ දැඩි
පිපාසයකින් වතුර ඇති නගරයක්
සොයා ගියෝය.[12] නමුත් ඔවුන්ට
බීමට ප්‍රමාණවත් වතුර ලැබුණේ
නැත. මේ සියල්ල සිදු වුණත් ඔබ මා
වෙතට හැරී ආවේ නැත.'[13] එසේ පව-
සන්නේ යෙහෝවා දෙවිය.
9 "'මම ඔබේ අස්වැන්න වියළි
සුළඟකින් හා දිලීර රෝගයකින්[14]
විනාශ කළෙමි. ඔබට බොහෝ පල-
තුරු උයන් හා මිදිවතු තිබුණද දළඹු-
වෝ ඔබේ අත්තික්කා ගස්ද ඔලීව
ගස්ද කා වනසා දැමුවෝය.[15] ඒ
සියල්ල සිදු වූ පසුත් ඔබ මා වෙතට
හැරී ආවේ නැත.'[16] එසේ පවසන්නේ
යෙහෝවා දෙවිය.

**ආමෝ 4:3*** හර්මොන් කියා මෙහි යොමු දක්වන්නේ කුමකටද කියා නිශ්චිතවම පැවසිය නොහැක.

**14** ද්වි 28:22; 1රාජා 8:37; හග් 2:17; **15** ද්වි 28:42; **16** යෙසා 42:24; යෙරෙ 5:3.

**10** “‘මම ඊජිප්තුවට සිදු කළ ලෙ-
සම ඔබට පීඩාවලින් පහර දුන්නෙමි.[1]
ඔබේ තරුණයන්ව කඩුවෙන් මරා
දමා[2] ඔබේ අශ්වයන්ව පැහැරගෙන
යන්න ඉඩහැරියෙමි.[3] ඔබට පිළිකු-
ලක් වන තරමටම ඔබේ කඳවුරුව-
ලින් දුගඳක් හමන්න සැලැස්වූවෙමි.[4]
එහෙත් ඔබ මා වෙතට හැරී ආවේ
නැත.’[5] එසේ පවසන්නේ යෙහෝවා
දෙවිය.

**11** “‘මම සොදොම් සහ ගොමෝ-
රාවට දඬුවම් කළ ලෙසම ඔබටත්
දඬුවම් කළෙමි.[6] ඔබ ගින්නෙන් ඉව-
තට ඇදගත් දර කැබැල්ලක් මෙනි.[7]
එහෙත් ඔබ මා වෙතට හැරී ආවේ
නැත.’[8] එසේ පවසන්නේ යෙහෝවා
දෙවිය.

**12** “‘ඊශ්‍රායෙල් ජනයෙනි, ඔබ හැරී
මා වෙතට නොපැමිණි නිසා නැවතත්
මම ඔබට ඒ ආකාරයෙන්ම දඬුවම්
කරන්නෙමි.’ එබැවින් දැන් යුද්ධ-
යට සැරසී ඔබේ දෙවි ඉදිරියට පැමි-
ණෙන්න.[9] **13** කඳු සෑදුවෙත්[10] සුළං
හමන්න සැලැස්වූවෙත්[11] තම සිතු-
විලි මනුෂ්‍යයන්ට දැනගන්න සැලැස්-
වූවෙත් කවුද?[12] අරුණාලෝකය පහ
කර දමන,[13] කඳු පාගා දමන[14] ඒ
තැනැත්තා කවුද? ඔහු වෙන කිසි-
වෙකු නොව ස්වර්ගයේ සේනාවල අධි-
පතියාණන් වන යෙහෝවා දෙවිය.”[15]

**5** “ඊශ්‍රායෙල් ජනයෙනි, මා ඔබ
ගැන කියන මේ විලාප ගීයට
සවන් දෙන්න.[16]

**2** “ඊශ්‍රායෙල් කන්‍යා දියණිය[17] අසර-
ණව වැටී සිටින්නීය.[18]
ඇයට නැවත කිසිදා නැඟි-
ටින්න නොහැකිය.[19]
සියලුදෙනා ඇයව අත්හැර
ගියෝය.
ඇයට අත දෙන්න කිසිවෙක්
නැත.[20]

**3** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේ පවසයි.
‘නගරයකින් දහස්දෙනෙකුව යුද්ධ-
යට පිටත් කර හැරියත් නැවත හැරී
එන්නේ සියදෙනෙකු පමණි. සියයක්
පිටත් කර යැව්වත් නැවත හැරී එන්-
නේ දසදෙනෙකු පමණි.[1] ඊශ්‍රායෙල්
දේශයට සිදු වන්නෙත් එයයි.’

**4** “යෙහෝවා දෙවි ඊශ්‍රායෙල් ජන-
යාට මෙසේ පවසන්නේය. ‘මගෙන්
මඟ පෙන්වීම් ලබා[2] ඒ අනුව ජීවත්
වන්න. එවිට ඔබේ ජීවිත රැක-
ගන්න[3] ඔබට හැකි වෙයි. **5** බෙ-
තෙල් නගරය[4] සොයා නොයන්න.
ගිල්ගාල්[5] නගරයටවත් බෙයර්-ෂෙබා
නගරයටවත් නොයන්න.[6] මන්ද ගිල්-
ගාල් නගරයේ වැසියන්ව වෙනත්
දේශයකට රැගෙන යෑමට නියමි-
තය.[7] බෙතෙල් නගරය දූෂිත දේ-
වලට තෝන්තැන්නක් වනු ඇත.[8]
**6** යෝසෙප්ගෙන් පැවතෙන්නෙනි,[9]
යෙහෝවා දෙවි වන මගෙන් මඟ
පෙන්වීම් ලබා ඒ අනුව ජීවත් වන්න.
එවිට ඔබේ ජීවිත රැකගැනීමට[10] ඔබට
හැකි වනු ඇත. ඔබ එසේ නොක-
ළොත් මම ඇවිළෙන ගින්නක් මෙන්[11]
ඔබ වෙතට පැමිණ ඔබව විනාශ
කර දමන්නෙමි. බෙතෙල් නගරය
දවාලන ඒ ගින්න නිවා දමන්න
කිසිවෙකුට නොහැක.[12] **7** ඔබ යුක්-
තිය කණපිට පෙරළුවහුය.[13] ඒ නිසා
ජනයාට ජීවිතය අමිහිරි, කටුක අද්දැ-
කීමක් වී තිබේ.* ධර්මිෂ්ඨකම කො-
තැනකවත් සොයාගත නොහැක.’[14]
**8** කයිමා[15] තාරකා මණ්ඩලයත් කේ-
සිල්[16] තාරකා මණ්ඩලයත්*[17] සෑදු-
වේ කවුද? ඝන අන්ධකාරය[18] අලුයම්
ආලෝකයට හරවන්නෙත් දහවල
අඳුරු රාත්‍රියට[19] හරවන්නෙත් මුහුදේ
වතුරට හඬගසා එය වැසි සේ වස්ස-
වන්නෙත්[20] කවුද? ඒ සියලු දේ කරන
තැනැත්තාගේ නම යෙහෝවාය.[21]
**9** ඕනෑම බලවන්තයෙකු පිටට හදිසි
විනාශයක් ගෙනෙන්න ඔහුට පුළුවන.

**4 පරි.**
**1** නික් 9:3; ද්වි 28:27; ද්වි 28:60; ගීතා 78:50
**2** ලෙවී 26:25; 2රාජා 8:12
**3** 2රාජා 13:7
**4** ද්වි 28:26
**5** යෙරෙ 23:14
**6** උත් 19:24; යූද් 7
**7** සෙක 3:2; යූද් 23
**8** එස 24:13; හොෂෙ 7:10
**9** යෙරෙ 17:10; එස 18:30; එස 22:31; හෙබ්‍රෙ 4:13
**10** ගීතා 65:6; ගීතා 95:4; යෙසා 40:12
**11** ගීතා 147:18; යෙරෙ 10:13
**12** ගීතා 139:2; දානි 2:28
**13** නික් 10:22; නික් 14:20; යෙසා 5:30; යෙරෙ 13:16; ආමො 8:9
**14** ද්වි 32:13; මීකා 1:3
**15** යෙසා 47:4; යෙරෙ 10:16

**5 පරි.**
**16** යෙරෙ 7:29; එස 19:1; එස 27:2
**17** යෙරෙ 14:17
**18** යෙසා 3:8
**19** යෙසා 24:20
**20** යෙරෙ 2:28

**2 තීරුව**
**1** ද්වි 4:27; ද්වි 28:62; යෙසා 10:22
**2** 2ලේක 15:2; යෙසා 55:6; යෙරෙ 29:12
**3** ගීතා 69:32; හිතෝ 4:4; යෙසා 55:3
**4** 1රාජා 12:29; ආමො 4:4
**5** හොෂෙ 4:15
**6** ආමො 8:14
**7** 2රාජා 17:6; හොෂෙ 9:15
**8** යෙසා 1:13
**9** සෙක 10:6
**10** එස 33:11
**11** හෙබ්‍රෙ 12:29
**12** එස 20:47
**13** ආමො 6:12
**14** එස 3:20; එස 18:24

**15** යෝබ් 9:9; **16** යෙසා 13:10; **17** යෝබ් 38:31; **18** යෝබ් 12:22; **19** නික් 10:21; **20** යෝබ් 36:27; දේශ 1:7; **21** ගීතා 83:18; ආමො 4:13.

ආමො **5:7*** මූ.අ., “යුක්තිය තිත්ත පැළෑටියක් බවට පත් කළෝය.” **8*** යෝබ් 9:9හි පළමුවන පාදසටහන බලන්න.

බලකොටු සුනුවිසුනු කර දමන්නත්
ඔහුට පුළුවන.
10 “‘නුවර දොරටුව අසල වාඩි
වී අවවාද දෙන තැනැත්තාට ඔවුහු
වෛර කරති.[1] සත්‍යය කතා කරන
තැනැත්තා ඔවුන්ට පිළිකුලක්ය.[2]
11 ඔබ දුප්පත් ගොවියන්ගෙන් බල-
හත්කාරයෙන් කුලී ගන්නහුය.
ධාන්‍ය අස්වැන්නෙන් කොටසක් පවා
ඔබ ඔවුන්ගෙන් ගන්නහුය.[3] ඔබ
මේ දේවල් කරමින් ලස්සනට කැපූ
ගල්වලින් ගෙවල් තනාගන්නහුය.[4]
නමුත් ඔබට සැමදා ඒ ගෙවල්වල
ජීවත් වෙන්න ලැබෙන්නේ නැත.
ඔබ සරුසාරව මිදිවතු වවාගත්-
තත් ඔබට සැමදාම ඒ මිදිවතුවලින්
වයින් බොන්න ලැබෙන්නේ නැත.[5]
12 ඔබ මට විරුද්ධව කී වතාවක්
කැරලිගැසුවාද කියාත්[6] ඔබ කළ පාප
කොතරම් බරපතළද කියාත්[7] මම
දනිමි. මන්ද ඔබ ධර්මිෂ්ඨ අයට සතු-
රුකම් කරන්නහුය.[8] අල්ලස් ගන්න-
හුය.[9] නුවර දොරටුව අසලට[10] පැමිණ
තමන්ට යුක්තිය ඉටු කර දෙන
මෙන් ඉල්ලන දිළිඳුන්ට ඔබ අසා-
ධාරණකම් කරන්නහුය.[11] 13 මෙ-
වැනි දුෂ්ට දේවල් සිදු වන කාලයකදී
නුවණ ඇති තැනැත්තා නිහඬව
සිටිනු ඇත.[12]
14 “‘ස්වර්ගයේ සේනාවල අධිපති-
යාණන් වන යෙහෝවා දෙවිගේ අනු-
මැතිය ඔබට තිබෙනවා කියා ඔබ
කියන්නහුය.[13] නමුත් එය සත්‍යයක්
වීමට නම් ඔබ අයහපත් දේ අත්හැර
යහපත් දේ කළ යුතුයි.[14] එවිට මාගේ
අනුමැතිය ඔබට නිසැකවම ලැබෙනු
ඇත. ඔබට බේරී ජීවත් වීමටත් හැකි
වනු ඇත.[15] 15 දුෂ්ට දේට පිළිකුල්
කර යහපත් දේට ඇලුම් කරන්න.[16]
නුවර දොරටුව අසල යුක්තිය ඉටු
කරන්න.[17] ඔබ එසේ කළොත් සමහ-
රවිට ස්වර්ගයේ සේනාවල අධිපති වූ
යෙහෝවා දෙවි වන මම යෝසෙප්ගේ
පෙළපතෙන් ඉතුරු වන අයට[18] කරු-
ණාව පෙන්වන්නෙමි.’[19]
16 “ස්වර්ගයේ සේනාවල අධිපති-
යාණන් වන යෙහෝවා දෙවි මෙසේ
පවසන්නේය. ‘ජනයා වැලපෙන හඬ[1]
සැම මංසන්ධියකම ඇසෙනු ඇත.
“අහෝ! අහෝ” යයි කියමින් ඔවුන්
කෑගසන හඬ මංමාවත් සිසාරා යයි.
ගොවියන්ටත්[2] කුලියට හඬා වැල-
පෙන අයටත්[3] ඇවිත් විලාප නඟන්න
කියා පැවසීමට ඔවුන්ට සිදු වනු
ඇත.’ එසේ පවසන්නේ යෙහෝවා
දෙවිය. 17 ‘මා ඔබේ දේශයට පැමි-
ණෙන නිසා[4] ජනයා වැලපෙන හඬ
සැම මිදිවත්තකින්ම ඇසෙනු ඇත.’[5]
එසේ පවසන්නේ යෙහෝවා දෙවිය.
18 “යෙහෝවා දෙවිගේ දවස[6] එන
තෙක් මහත් ආශාවෙන් බලා සිටින
අයට බොහෝ දුක් විඳින්න සිදු වනු
ඇත. ඔවුන්ටත් දුක් විඳින්න සිදු
වේ නම් යෙහෝවා දෙවිගේ දවසේදී
ඔබට කුමක් සිදු වෙයිද?[7] එය ආලෝ-
කය නැති, ඝන අන්ධකාරයෙන් වැසී
ගිය දවසක් වනු ඇත.[8] 19 සිංහයෙ-
කුගෙන් බේරී පලා යන මිනිසෙකු
වලසෙකුට හසු වුණා හා සමාන දෙ-
යක් ඔබටත් ඒ දවසේදී සිදු වෙයි.
ඔහු කෙසේ හෝ බේරී තම ගෙට දිව
ගොස් බිත්තිය මත හේත්තු වූ නමුත්
සර්පයෙක් ඔහුට දෂ්ට කළේය.[9]
20 යෙහෝවා දෙවිගේ දවස කෙ-
බඳු එකක් වේවිද? එය ආලෝකය
නැති, අඳුරු දවසක් වනු ඇත. දීප්-
තිය නැති, අන්ධකාරයෙන් වැසුණු
දවසක් වනු ඇත.[10] 21 ‘මම ඔබේ
උත්සවවලට පිළිකුල් කරමි.[11] ඒවා
ප්‍රතික්ෂේප කරමි. විශේෂ රැස්වීම්වලදී
ඔබ ඔප්පු කරන පූජා මම පිළි නො-
ගන්නෙමි.[12] 22 ඔබ මට දවන පූජා
ඔප්පු කළද[13] තෑගි පූජා ඔප්පු කළද
මම ඒවා ගැන සතුටු නොවෙමි.[14]
තර කළ සතුන්ව ගෙනැවිත් හවුල්
පූජා ලෙස ඔප්පු කළද මම ඒවා පිළි
නොගන්නෙමි.[15] 23 ඔබේ ගීතිකා
මගේ කන්වලට අමිහිරිය. ඔබේ තත්
භාණ්ඩවල නාදය මගේ දෙසවනට

**5 පරි.**
1 1රාජා 18:17 හිතෝ 13:19 යෙසා 29:21
2 1රාජා 22:8 1පේතෘ 3:16
3 මීකා 2:2
4 යෙසා 9:10 ශෙප 1:13
5 ද්වි 28:30 හග් 1:6
6 ද්වි 31:21 යෙරෙ 29:23
7 2රාජා 17:7
8 ගීතා 37:12 ආමො 2:6
9 1සාමු 12:3
10 හිතෝ 22:22 යෙසා 10:2
11 ද්වි 15:7 යෙසා 29:21 එස 22:12 ආමො 2:7 යාකො 2:6
12 මීකා 2:3
13 2ලේක 15:2 මීකා 3:11 මීකා 7:20
14 හිතෝ 11:27 යෙසා 1:16 මීකා 6:8 රෝම 2:7
15 ලෙවී 18:5 ද්වි 30:20 ගීතා 69:32 රෝම 10:5
16 ගීතා 34:14 ගීතා 97:10 රෝම 12:9 3යොහ 11
17 2ලේක 19:6 ආමො 5:24
18 යෙරෙ 31:7 සෙක 10:6
19 නික් 32:30 ගීතා 62:12 ශෙප 2:3

**2 තීරුව**
1 යෙසා 22:12 යෙරෙ 9:10
2 යෝවෙ 1:11
3 යෙරෙ 9:17
4 නික් 12:12 නාහු 1:12
5 යෙසා 16:10 යෙරෙ 48:33 හොෂෙ 9:2
6 යෙසා 5:19 යෙරෙ 17:15 මලා 3:2
7 යෙරෙ 30:7 යෝවෙ 1:15 ආමො 4:12
8 ශෙප 1:15
9 1රාජා 20:30 යෙසා 24:17 යෙසා 24:18 යෙරෙ 15:2
10 එස 34:12 එළි 16:10

11 හිතෝ 15:8; හිතෝ 21:27; යෙසා 1:11; යෙරෙ 6:20; 12 උත් 8:21; ලෙවී 26:31; 13 ගීතා 50:8; යෙසා 66:3; හොෂෙ 6:6; 14 උත් 4:5; ලෙවී 7:12; 15 යෙසා 1:11.

වැටෙන්නවත් ඉඩ නොතබන්න.[1]
**24** යුක්තිය ගලා බසින ගංගාවක්
මෙන්ද[2] ධර්මිෂ්ඨකම නොසිඳෙන දිය
දහරක් මෙන්ද වේවා![3] **25** ඊශ්‍රා-
යෙල් ජනයෙනි, ඔබ පාළුකරයේ
ගෙවූ අවුරුදු හතළිහ පුරා යාග පූජා
හා තෑගි පූජා මට ඔප්පු නොක-
ළහුය.[4] **26** ඔබේ දෙවියාගේ තරුව
වන සක්කුත්වද[5] ඔබ සාදාගත් කයි-
වන් රූපද[6] ඔබ ඔසවාගෙන යන්-
නහුය. **27** දමස්කයෙනුත් බොහෝ
ඈතට ඔබව රැගෙන යෑමට[7] මම ඉඩ-
හරින්නෙමි.' එසේ පවසන්නේ ස්වර්-
ගයේ සේනාවල අධිපතියාණන් වන
යෙහෝවා දෙවිය."[8]

**6** "සියලු ජාතීන් අතරින් ප්‍රමුඛත්-
වය ගන්නා ඊශ්‍රායෙල්වරුන්ගේ
උත්තමයන් පිටට මහත් විපතක්
පැමිණෙනු ඇත. ඔවුහු සියොන්හි
විවේක සුවයෙන් කල් ගෙවති.[9] සමා-
රිය කන්ද මත තමන් සුරක්ෂිතව
සිටිනවායයි විශ්වාස කරති. ඊශ්‍රා-
යෙල් ජනයා පිහිට පතා යන්නේ
ඔවුන් වෙතටය. **2** කල්නේ නම්
ස්ථානයට ගොස් බලන්න. ඉන්-
පසු ජනාකීර්ණ හමාත්[10] නගරයටත්
පිලිස්තිවරුන්ගේ ගාත්[11] නගරයටත්
ගොස් බලන්න. ඒ නගර ඔබේ රාජ්‍ය-
යන්ට වඩා උසස්ද? ඔවුන්ගේ දේ-
ශය ඔබේ දේශයට වඩා විශාලද?[12]
**3** ඔබ මතු පැමිණෙන විපත්ති දවස[13]
අමතක කරමින් සැහැසික ක්‍රියාවලට
දිරි දෙන්නහුද?[14] **4** ඔබ ඇත්දළව-
ලින් නිමැවූ යහන්වල සැතපෙන්න-
හුය.[15] ඇඳන්වල වැතිර සිටින්නහුය.
රැළෙන් ගත් බැටළුවන්ගේ හා තර
කළ වස්සන්ගේ මස් කමින් ඔබ සුව
සේ කල් ගෙවන්නහුය.[16] **5** දාවිත්
මෙන් විවිධ සංගීත භාණ්ඩ[17] සාදන
ඔබ සංගීතය වාදනය කරමින් ගී
පද ගොතන්නහුය.[18] **6** ඔබ විශාල
බඳුන්වලින් වයින් බොන්නහුය.[19]
ඉස්තරම්ම තෙල්[20] සිරුරේ ආලේප
කරගන්නහුය. යෝසෙප්ගේ පෙළප-
තට සිදු වන විපත ගැන ඔබට කිසි
ශෝකයක් දැනෙන්නේ නැත.[21]

**7** "එබැවින් මුලින්ම දේශයෙන්
පිටමං කරනු ලබන්නේ ඔබවය.[1]
එවිට ඔබ ගත කරන සැපවත් ජීවිතය
නිමා වනු ඇත. සෝෂාකාරී උත්සවද
අවසන් වනු ඇත.
**8** "ස්වර්ගයේ සේනාවල අධිපති-
යාණන් වන යෙහෝවා දෙවි මෙසේ
පවසන්නේය. 'විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි වන මම
මගේම නමින් දිවුරන්නෙමි.[2]
යාකොබ්ගේ උඩඟුකම මට පිළිකු-
ලකි.[3] ඔහුගේ රාජකීය බලකොටු දෙස
බලන්නවත් මම කැමති නැත.[4] ඒ
නගරයත් එහි ඇති සියල්ලත් මම
සතුරන්ගේ අතට භාර දෙන්නෙමි.[5]
**9** නිවසක දහදෙනෙකු ඉතුරු වුවත්
ඔවුන්වද විනාශ කර දමන්නෙමි.[6]
**10** ඔවුන්ගේ පියාගේ ඥාතියෙකු
විසින් එම මළ සිරුරු එකිනෙක නිව-
සින් පිටතට ගෙනැවිත් දවා දමනු
ඇත. එසේ කරන්නේ ඔවුන්ගේ ඇට-
කටු නිවස තුළ ඉතුරු නොවන පිණි-
සය.[7] ඉන්පසු ඔහු නිවස ඇතුළේ
සිටින තැනැත්තාගෙන්, "තව කවු-
රුත් ඔබ සමඟ සිටිනවාද" කියා අසනු
ඇත. "මා සමඟ කිසිවෙක් නැත" කියා
කාමරයේ සිටින තැනැත්තා කියන්-
නේය. එවිට ඔහු, "නිහඬ වන්න. යෙ-
හෝවා දෙවිගේ නම කියා කන්නලව්
කිරීමෙන් දැන් පලක් නැත" කියා පව-
සනු ඇත.'[8]
**11** "යෙහෝවා දෙවි අණ දෙන
විට[9] මාලිගා වැනි වූ විශාල නිවාස
ගල් ගොඩක් බවට පත් වනු ඇත.
කුඩා ගෙවල් දූවිලි ගොඩක් බවට පත්
වනු ඇත.[10]
**12** "අශ්වයන්ට පර්වත පිට දුවන්න
පුළුවන්ද? සීසාන පිණිස ගවයෙකුව
පර්වතයක් උඩට ගෙන යනු ලබ-
නවාද? ඔබ යුක්තිය ඉටු කර දෙ-
නවා වෙනුවට ජනයාට හානියක්
වන අයුරින් ඔබේ බලය යොදා-
ගත්තහුය.* ඔබ ධර්මිෂ්ඨකමින් ක්‍රියා

**5 පරි.**
1 හිතෝ 28:9; ආමො 6:5; ආමො 8:10
2 හිතෝ 21:3; මීකා 6:8; හෙබ්‍රෙ 13:16
3 රෝම 14:17
4 යොෂු 24:14; එස 20:8; ක්‍රියා 7:42
5 ලෙවී 20:2
6 නික් 20:4; ගීතා 115:8; ක්‍රියා 7:43
7 2රාජා 15:29; 2රාජා 17:6
8 ආමො 4:13

**6 පරි.**
9 1රාජා 22:39; ආමො 3:15
10 ගණන් 34:8; 2රාජා 14:28
11 2ලේක 26:6
12 යෙසා 10:10; නාහු 3:8
13 ගීතා 10:13; දේශ 8:11; යෙසා 56:12; එස 12:27; 2පේතෘ 3:4
14 ආමො 5:12
15 1රාජා 22:39
16 යෙසා 22:13
17 යෙසා 5:12
18 2ලේක 7:6; 2ලේක 29:25
19 යෙසා 5:11
20 මතෙ 26:7; යොහ 12:3
21 2රාජා 15:29; 2රාජා 17:6

**2 තීරුව**
1 ද්වි 28:41; ආමො 5:5
2 යෙරෙ 51:14; ආමො 4:2; හෙබ්‍රෙ 6:13
3 හිතෝ 16:18; එස 33:28; හොෂෙ 5:5
4 විලා 2:5
5 මීකා 1:6
6 ගීතා 109:13
7 1සාමු 31:12
8 2රාජා 6:33
9 යෙසා 10:5; යෙසා 55:11
10 2රාජා 25:9; ආමො 3:15

ආමො **6:12*** මූ.අ., "යුක්තිය විෂ පැළෑටියක් බවට පත් කළෝය."

කරනවා වෙනුවට[1] ජීවිතය තිත්ත
වන තරමටම ජනයාට හිංසා පීඩා
කළහුය.* **13** 'අපේම උත්සාහයෙන්
අපි බලවත් වුණෙමු'[2] යයි කිය-
මින් ඔබ සතුටු වූයේ නැද්ද? එහෙත්
සිදු වී ඇත්තේ ඔබ ඔබවම රවටාගැ-
නීමක් පමණි.[3] **14** 'ඊශ්‍රායෙල් ජන-
යෙනි, මම ඔබට විරුද්ධව සෙනඟක්
එවන්නෙමි.[4] ඔවුහු හමාත් නගරයට[5]
ඇතුල් වන ස්ථානයේ සිට අරබා ප්‍රදේ-
ශයේ දකුණු කෙළවරේ පිහිටි නිම්නය
දක්වා තිබෙන මුළු පළාතම යටත්
කරගෙන ඔබට පීඩා කරන්නෝය.'
එසේ පවසන්නේ ස්වර්ගයේ සේනාවල
අධිපතියාණන් වන යෙහෝවා දෙවිය."

**7** විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි තමා කිරීමට අදහස්
කරන දේ මට පෙන්වූවේය. රජුගේ
ප්‍රයෝජනය පිණිස පිදුරු එකතු කිරී-
මෙන් අනතුරුව නැවත වරක් බීජ
වපුරන ලදි. දෙවන වරට වැපුරූ
බීජ දලු ලන්න පටන්ගත් කාලයේදී
දෙවි දේශය තුළට පළඟැටියන්ව එව්-
වේය.[6] උන් රංචු පිටින් ඇවිත් **2** දේ-
ශයේ තිබූ සෑම පැළෑටියක්ම කා
දැමුවෝය. එවිට මම මෙසේ කීවෙමි.
"අනේ, විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවියනි, ඔවුන්ට සමාව
දෙන්න.[7] යාකොබ්ගේ පරම්පරාවෙන්
ඉතුරු වී සිටින්නේ අතළොස්සක්
පමණි![8] ඔවුන්ට පිහිට විය හැකි කිසි-
වෙක් ඔවුන් අතරේ නැත."
**3** එවිට ඔවුන් ගැන යෙහෝවා දෙ-
විට අනුකම්පාවක් ඇති විය.[9] යෙ-
හෝවා දෙවි මෙසේ කිවේය. "මම ඒ
දේ සිදු වීමට ඉඩ නොදෙන්නෙමි."
**4** පසුව විශ්වයේ පාලකයාණන්
වන යෙහෝවා දෙවි මට තවත් දෙ-
යක් පෙන්වූවේය. විශ්වයේ පාලක-
යාණන් වන යෙහෝවා දෙවි තම
සෙනඟ සමඟ උදහස් වී ගින්නක් එව්-
වේය.[10] ඒ ගින්න වතුපිටි සියල්ල දවා
ගැඹුරු දිය උල්පත් පවා සිඳ දැමුවේය.

**5** එවිට මම මෙසේ කීවෙමි. "අනේ,
විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවියනි, එසේ කරන්න එපා.[1]
යාකොබ්ගේ පරම්පරාවෙන් ඉතුරු
වී සිටින්නේ අතළොස්සක් පමණි![2]
ඔවුන්ට පිහිට විය හැකි කිසිවෙක්
ඔවුන් අතරේ නැත."
**6** එවිට ඔවුන් ගැන යෙහෝවා දෙ-
විට අනුකම්පාවක් ඇති විය.[3] විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවි මෙසේ කීවේය. "එසේනම් ඒ දේ
සිදු වීමටත් මම ඉඩ නොදෙන්නෙමි."
**7** පසුව දෙවි තවත් දෙයක් මට
පෙන්වූවේය. ලඹයකින්[4] මැන බලා
සෑදූ බිත්තියක් ළඟ යෙහෝවා දෙවි
සිටිනවා මට පෙනිණ. ඔහුගේ අතේ
ලඹයක් තිබිණ. **8** එවිට යෙහෝවා
දෙවි, "ආමොස්, ඔබට පෙනෙන්-
නේ කුමක්ද" කියා මගෙන් ඇසීය.
"මට ලඹයක් පෙනේ" කියා මම
කීවෙමි. එවිට යෙහෝවා දෙවි මෙසේ
කීවේය. "මම මේ ලඹය යොදාගෙන
මගේ සෙනඟ වන ඊශ්‍රායෙල්ව සෝදිසි
කර බලන්නෙමි.[5] මේ වතාවේදී නම්
මම ඔවුන්ට සමාව නොදෙන්නෙමි.[6]
**9** ඊසාක්ගේ පූජනීය ස්ථාන[7] විනාශ
කරනු ලබන්නේය. ඊශ්‍රායෙල් සෙනඟ-
ගේ දේවාල[8] වනසා දමනු ලබන්-
නේය.[9] මම යෙරොබොවම්ගේ*
පවුලට විරුද්ධව කඩුවක් රැගෙන
එන්නෙමි."[10]
**10** ඒ කාලයේදී බෙතෙල් නග-
රයේ[11] සේවය කළ පූජක අමශියා,
ඊශ්‍රායෙල්හි රජු වූ යෙරොබො-
වම්ට[12] මෙසේ දන්වා යැවීය.
"ආමොස් ඊශ්‍රායෙල් සෙනඟ අත-
රට පැමිණ ඔබට විරුද්ධව කුමන්-
ත්‍රණය කරන්නේය.[13] ඔහු පවසන
දේ ජනයාට දරාගත නොහැක.[14]
**11** 'යෙරොබොවම් කඩුවෙන් මැරුම්
කන්නේය. ඊශ්‍රායෙල්වරුන්ව අනිවාර්-
යයෙන්ම වෙනත් දේශයකට රැගෙන

**6 පරි.**
1 1රාජා 21:13; ගීතා 94:20; යෙසා 59:13; හොෂෙ 10:4; ආමො 5:7
2 ද්වි 8:17; ගීතා 75:5; දානි 4:30
3 යෙසා 44:9
4 ද්වි 28:49; 2රාජා 15:29; 2රාජා 17:6; යෙසා 7:20; යෙසා 8:4; යෙසා 10:5; හොෂෙ 10:6
5 ගණන් 34:8; 1රාජා 8:65

**7 පරි.**
6 යෝවෙ 1:4; යෝවෙ 2:25
7 ගීතා 130:4; යෙරෙ 14:7; දානි 9:19
8 යෙසා 37:4; යෙරෙ 42:2
9 ද්වි 32:36; ගීතා 106:45; හොෂෙ 11:8; යෝනා 3:10; යාකො 5:16
10 යෙරෙ 4:4

**2 තීරුව**
1 නික් 32:11
2 යෙසා 1:9
3 නික් 32:14
4 සෙක 4:10
5 විලා 2:8
6 යෙරෙ 15:6; එස 7:2; ආමො 8:2
7 1රාජා 12:32; හොෂෙ 10:8
8 1රාජා 12:31
9 ආමො 5:5; ආමො 8:14
10 2රාජා 15:10; හොෂෙ 13:16
11 1රාජා 12:32; 1රාජා 13:33
12 2රාජා 14:23
13 යෙරෙ 26:8
14 යෙරෙ 18:18; ලූක් 23:2

---

**ආමො 6:12*** මූ.අ., "ධර්මිෂ්ඨකම තිත්ත පැළෑ-
ටියක් බවට පත් කළෝය."

**ආමො 7:9*** මෙහි සඳහන් කරන්නේ, දෙවන යෙ-
රොබොවම් රජ ගැනයි. ඔහු යෝවාෂ්ගේ පුත්‍රයා
විය. ආමො 1:1 බලන්න.

යනු ලබන්නේය'[1] කියා ඔහු ජනයාට
පවසයි."
**12** ඉන්පසු අමශියා ආමොස්ට
මෙසේ කීවේය. "ඔබ[2] යූදා දේශ-
යට ගොස් එහි අනාවැකි කියන්න. ඒ
දේශයට වී කෑම බීම සොයාගන්න.
**13** බෙතෙල් නගරය ශුද්ධස්ථාන-
යක්. රාජධානියේ ප්‍රධාන පූජනීය
ස්ථානය[3] මෙයයි. ඒ නිසා බෙතෙල්
නගරයේ තවදුරටත් අනාවැකි නො-
කියන්න."[4]
**14** එවිට ආමොස් අමශියා රජුට
පිළිතුරු දෙමින් මෙසේ කීවේය. "මම
අනාගතවක්තෘවරයෙකුවත් අනා-
ගතවක්තෘවරයෙකුගේ පුත්‍රයෙකුවත්
නොවෙමි.[5] මම කලින් එඬේරෙකු[6]
ලෙසත් අත්තික්කා ගස් බලාගන්-
නෙකු ලෙසත් වැඩ කළෙමි. **15** මා
බැටළු රැළ රකබලා ගෙන සිටි-
යදී යෙහෝවා දෙවි මාව කැඳෙව්-
වේය. 'මගේ සෙනඟ වන
ඊශ්‍රායෙල්වරුන් අතරට ගොස් අනා-
වැකි කියන්න'[7] කියා යෙහෝවා
දෙවි මට කීවේය. **16** දැන් ඔබ යෙ-
හෝවා දෙවි පැවසූ දේට ඇහුම්කන්
දෙන්න. '"ඊශ්‍රායෙල්වරුන්ට විරුද්-
ධව අනාවැකි නොකියන්න"[8] කියාත්,
"ඊසාක්ගේ පෙළපතට විරුද්ධව වච-
නයක්වත් නොකියන්න"[9] කියාත් ඔබ
කී නිසා **17** යෙහෝවා දෙවි ඔබට
මෙසේ කියන්නේය. "නගරයේදී ඔබේ
බිරිඳට ගණිකාවකට මෙන් සලකනු
ලබන්නේය.[10] ඔබේ දූවරුද පුත්‍ර-
යෝද කඩුවෙන් මැරුම් කන්නෝය.
ඔබේ දේශය මැන අන්‍යයන්ට බෙදා
දෙනු ලබන්නේය. ඊශ්‍රායෙල්වරුන්ව
වෙනත් දේශයකට බලහත්කාරයෙන්
රැගෙන යනු ලබන්නේය.[11] ඔබ අප-
විත්‍ර දේශයක මිය යනු ඇත."'"[12]

**8** විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි මට පලතුරු* කූඩ-
යක් පෙන්වූවේය.[13] **2** එවිට දෙවි,
"ආමොස්, ඔබට පෙනෙන්නේ
කුමක්ද"[1] කියා මගෙන් ඇසීය. "පල-
තුරු කූඩයක්* මට පෙනේ"[2] කියා මම
කීවෙමි. එවිට යෙහෝවා දෙවි මට
මෙසේ කීවේය. "මගේ සෙනඟ වන
ඊශ්‍රායෙල්වරුන්ගේ අවසානය# ළංව
තිබේ.[3] මම තවදුරටත් ඔවුන්ට සමාව
නොදෙන්නෙමි.[4] **3** 'ඒ දවසේදී, දේ-
වමාළිගාවේ සිට ගීතිකා ගයනවා වෙ-
නුවට ඔවුහු විලාප නඟන්නෝය.'[5]
එසේ පවසන්නේ විශ්වයේ පාලක-
යාණන් වන යෙහෝවා දෙවිය. 'ඒ
දවසේදී දේශයේ සෑම තැනකම මළ
කඳන් දක්නට ලැබෙයි.[6] ඒ මළ කඳන්
පිටතට විසි කර දමනු ඇත. එදින මුළු
දේශයම නිහඬ වනු ඇත.'
**4** "නිහතමානී, අසරණ අයව පාගා
දමා[7] ඔවුන්ව නැති කර දැමීමට
මාන බලන දුෂ්ටයෙනි,[8] ඇහුම්කන්
දෙන්න. **5** ඔබ මෙසේ කියන්නහුය.
'අපේ ධාන්‍ය* විකුණාගන්න[9] නව සඳ
පායන දවස පසු වන තුරුත්[10] සබත්
දවස ගෙවෙන තුරුත්[11] අපි නොඉව-
සිල්ලෙන් බලා සිටිමු. ඒ දවස එන
තුරු අපි හොර තරාදි ලෑස්ති කර-
ගෙන බලා සිටිමු.[12] එවිට බඩු හො-
රට කිරා වැඩි මිලකට විකුණන්න
පුළුවන.[13] **6** රිදී කාසි කිහිපයකට
දුප්පතෙකුව මිල දී ගන්නත් පාව-
හන් කුට්ටමක මිලට දිළිඳෙකුව මිල
දී ගන්නත් පුළුවන. ධාන්‍ය වෙනුවට
රොඩු විකුණන්නත් පුළුවන.'[14]
**7** "යාකොබ්ගේ තේජස වන යෙ-
හෝවා දෙවි තමාගේ නාමයෙන්
මෙසේ දිවුරා තිබේ.[15] 'ඔවුන් කරන
සෑම දෙයක්ම මම අමතක නොක-
රන්නෙමි.[16] **8** ඔවුන්ගේ ක්‍රියා නිසා
මුළු දේශයම කැලඹෙනු ඇත.[17] එහි
සියලු වැසියෝ වැලපෙනු ඇත.[18]

**7 පරි.**
1 ආමො 5:5 ආමො 6:7
2 යෙසා 30:10
3 1රාජා 12:29 1රාජා 12:32 1රාජා 13:1
4 ආමො 2:12 ක්‍රියා 4:17 ක්‍රියා 5:28
5 1රාජා 20:35 2රාජා 4:38
6 ආමො 1:1
7 යෙරෙ 1:7 එස 2:3 2පේත්‍රැ 1:21
8 යෙරෙ 11:21 ආමො 7:13
9 ද්වි 32:2 මීකා 2:6
10 විලා 5:11
11 ලෙවී 26:33 යෙරෙ 36:31
12 2රාජා 17:6

**8 පරි.**
13 යෙරෙ 24:1

**2 තීරුව**
1 යෙරෙ 1:11
2 යෙරෙ 24:8
3 විලා 4:18 එස 7:2
4 ආමො 4:12 ආමො 7:8
5 හොෂෙ 10:5 යෝවෙ 1:13 ආමො 5:23
6 යෙරෙ 9:21 ආමො 6:10
7 ගීතා 37:14 ගීතා 140:12 හිතෝ 30:14
8 ගීතා 14:4 ආමො 2:6
9 නෙහෙ 10:31
10 ගණන් 10:10
11 නික් 20:8 නෙහෙ 13:15
12 ලෙවී 19:36 මීකා 6:10
13 හිතෝ 11:1 හිතෝ 20:23 හොෂෙ 12:7
14 ලෙවී 25:39 ආමො 2:6
15 ද්වි 33:26 ගීතා 47:4 ගීතා 68:34
16 යෙරෙ 17:1 හොෂෙ 8:13 නාහු 1:3
17 යෙසා 5:25
18 හොෂෙ 4:3

ආමො **8:1*** මූ.අ., "ගිම්හාන පලතුරු." මෙය විශේෂයෙන්ම යොමු දක්වන්නේ, අත්තික්කා-වලටය. සමහරවිට රටඉදිත් ඊට ඇතුළත් විය හැකියි.

ආමො **8:2*** මූ.අ., "ගිම්හාන පලතුරු." මෙහි භාවිත කර ඇති 'කායිට්ස්' නම් හෙබ්‍රෙව් වචනය භාවිත කරන්නේ, අවුරුද්දේ අන්තිම අස්වැන්න සඳහාය. **2#** "අවසානය" යන අර්ථය ඇති 'හාකෙට්ස්' නම් හෙබ්‍රෙව් වචනය හා, "ගිම්හාන පලතුරු" යන අර්ථය ඇති 'කායිට්ස්' නම් වචනය අතර යම් සමානකමක් ඇත. **5*** සමහරවිට තිරිඟු හෝ බාර්ලි විය හැක.

ඔවුහු සියලුදෙනා ඊජිප්තුවේ නයිල්
ගඟ මෙන් කැලඹී පහව යන්නෝය.’[1]
**9** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේ පවසන්නේය.
‘ඒ දවසේදී, මම මධ්‍යාහ්න වේලාවේදී
ඉර බැස යන්න සලස්වන්නෙමි.[2] මහ
දවාලේදී දේශය අන්ධකාරයෙන් වැසී
යන්න සලස්වන්නෙමි. **10** ඔබේ
උත්සව දවස්වලදී ඔබට වැලපෙන්න
සිදු වෙයි.[3] ඔබේ ගීතිකා විලාප
ගීවලට හරවන්නෙමි. සියල්ලන්ටම
ගෝණි රෙදි අඳින්නත් හිස මුඩු කර-
ගන්නත් සලස්වන්නෙමි.[4] එකම පුතා
මිය ගිය කෙනෙකු වැලපෙන්නාක්
මෙන් ඔබත් වැලපෙනු ඇත.[5] ඒ දවස
ඉතා දුක්මුසු දවසක් වනු ඇත.’
**11** “විශ්වයේ පාලකයාණන් වන
යෙහෝවා දෙවි මෙසේ පවසන්නේය.
‘මම මේ දේශය තුළ සාගතයක් ඇති
කරන්නෙමි. එය කෑම හිඟයක් නිසා-
වත් වතුර හිඟයක් නිසාවත් ඇති
වන සාගතයක් නොව යෙහෝවා දෙවි
වන මාගේ වචන අසන්න නොලැබීම
නිසා ඇති වන සාගතයකි.[6] **12** ඒ
දිනයේදී මිනිස්සු යෙහෝවා දෙවි
වන මාගේ වචනය සොයමින් එක
මුහුදක සිට තවත් මුහුදක් දක්වාද
උතුරේ සිට නැඟෙනහිර දක්වාද ඒ
මේ අත දුවන්නෝය. නමුත් ඔවුන්ට
කොතැනකදීවත් එය සොයාගැනී-
මට ලැබෙන්නේ නැත.[7] **13** ඒ දව-
සේදී ඇති වන පිපාසය නිසා[8] රුවැති
කන්‍යාවෝද තරුණයෝද ක්ලාන්ත
වී වැටෙන්නෝය. **14** “දාන්, ඔබේ
දෙවියන් ජීවමානයි![9] බෙයර්-ෂෙබා,
ඔබේ මාවත් සැමදා පවතිනු ඇත”[10]
කියමින් සමාරියේ බොරු දෙවිවරුන්-
ගේ නම්වලින් දිවුරන ඒ සියලුදෙනා[11]
වැටී විනාශ වී යන්නෝය.’ ”[12]

**9** යෙහෝවා දෙවි පූජාසනයට ඉහ-
ළින් සිටින අයුරු මම දුටුවෙමි.[13]
දෙවි මෙසේ පැවසුවේය. “නමස්-
කාරය සඳහා සාදා ඇති කණුවල
මුදුනටම ගසන්න. ඒවායෙහි අත්ති-
වාරම් දෙදරා යන ලෙස ගසන්න. ඒ

**8 පරි.**
1 ආමො 9:5
2 යෙරෙ 15:9; මීකා 3:6; මතෙ 24:29
3 හොෂෙ 2:11
4 එස 7:18
5 යෙරෙ 6:26; ලූක් 7:12
6 1සාමු 3:1; ගීතා 74:9; එස 7:26; මතෙ 4:4
7 හිතෝ 1:28
8 විලා 2:19
9 1රාජ 12:29
10 ආමො 5:5
11 යොෂු 23:7; 1රාජ 12:30; හොෂෙ 8:5; හොෂෙ 10:5
12 2රාජ 18:11; හොෂෙ 13:16

**9 පරි.**
13 යෙසා 6:1; එස 1:28

**2 නිරුව**
1 ගීතා 68:21; හබ 3:13
2 යෙසා 24:18; යෙසා 30:16; ආමො 2:14
3 ගීතා 139:8; හිතෝ 15:11
4 යෝබ් 20:6; යෙරෙ 49:16; යෙරෙ 51:53; ඔබ 4
5 යෝබ් 34:22; ගීතා 139:7; යෙරෙ 23:24
6 ගීතා 139:9
7 ලෙවී 26:33; ද්වි 28:65; එස 5:12
8 ලෙවී 17:10; ද්වි 28:63; යෙරෙ 44:11; 1පේත 3:12
9 ගීතා 46:6; මීකා 1:4
10 හොෂෙ 4:3
11 ආමො 8:8
12 ගීතා 102:19
13 යෙසා 45:18
14 යෝබ් 36:27; ගීතා 135:7
15 ගීතා 147:8; ආමො 5:8
16 නික් 3:15; යෙරෙ 31:35; ආමො 4:13
17 නික් 12:51; හොෂෙ 12:13; ආමො 2:10
18 යෙරෙ 47:4

සෑම කණුවකම ඉහළ කොටස කපා
දමන්න.[1] බේරී ජීවත් වන කිසි-
වෙකු ඇත්නම් ඒ සියලුදෙනාවම
මම කඩුවෙන් මරා දමන්නෙමි. කිසි-
වෙකුට මගෙන් බේරී පලා යෑමට
ඉඩ ලැබෙන්නේ නැත.[2] **2** ඔවුන්
පොළොව හාරාගෙන ගොස් ඉතා
ගැඹුරු ස්ථානයක සැඟවුණත් මම
ඔවුන්ව සොයාගන්නෙමි.[3] අහස තරම්
උස් තැනකට ගොස් සැඟවී සිටියත්
මම ඔවුන්ව පහතට හෙළන්නෙමි.[4]
**3** ඔවුන් කර්මෙල් කඳු මුදුනේ සැඟවු-
ණත් මම ඔවුන්ව සොයා යන්නෙමි.[5]
ඔවුන් මුහුදු පත්ලට ගොස්[6] මගෙන්
සැඟවුණත් ඔවුන්ට දෂ්ට කිරීමට
මුහුදු සර්පයෙකුට මම අණ කරන්-
නෙමි. **4** සතුරන් ඔවුන්ව ඈත දේ-
ශයකට රැගෙන ගියොත් මම ඔවුන්ව
මරා දමන්න[7] ඔවුන් පසුපස කඩුවක්
යවන්නෙමි. ඔවුන්ට ආශීර්වාද කර-
නවා වෙනුවට මම ඔවුන්ව විනාශ
කරන්නෙමි.”[8] **5** විශ්වයේ පාලක-
යාණන්ද ස්වර්ගයේ සේනාවල අධි-
පතියාණන්ද වන යෙහෝවා දෙවි
දේශයට අත තැබූ විට එය දිය වී
යයි.[9] එවිට එහි සිටින සියලු වැසියෝ
වැලපෙන්නෝය.[10] ඔවුහු සියලුදෙනා
ඊජිප්තුවේ නයිල් ගඟ මෙන් කැලඹී
පහව යන්නෝය.[11]
**6** “අහස දිගේ පඩි පේළියක් තැනු-
වේ කවුද?[12] තමා සෑදූ පොළොවට
ඉහළින් වාසස්ථානයක්ද ඉදි කළේ
කවුද?[13] මුහුදෙන් වතුර ගෙන[14] පො-
ළොවට වැසි වස්සවන්නේ කවුද?[15]
ඔහුගේ නාමය යෙහෝවාය.”[16]
**7** “ ‘ඊශ්‍රායෙල් ජනයෙනි, ඔබ මා
ඉදිරියේ හැසිරෙන්නේ කූෂ් ජාතික-
යන්* හැසිරෙන ආකාරයටය.’ එසේ
පවසන්නේ යෙහෝවා දෙවිය. ‘ඊශ්‍රා-
යෙල්වරුන්ව ඊජිප්තු දේශයෙන්
පිටතට ගෙනාවේ[17] මා නොවෙ-
යිද? පිලිස්තිවරුන්ව[18] ක්‍රීට් දූප-
තෙන් පිටතට ගෙනාවෙත් සිරියානු

ආමො **9:7*** MSy; LXXVgට අනුව, “ඉතියෝපීය ජාතිකයන්.”

ජාතිකයන්ව කිර් දේශයෙන් පිටතට
ගෙනාවෙත්[1] මමය.'
8 "පව්කාර ජනයෙනි, විශ්වයේ
පාලකයාණන් වන යෙහෝවා දෙවි
ඔබ දෙස බලා සිටියි.[2] ඔහු ඔබේ
රාජ්‍යය සම්පූර්ණයෙන්ම පොළොවෙන්
තුරන් කරන බව[3] නිසැකය. 'එහෙත්
මම යාකොබ්ගේ පෙළපත මුළුමනින්ම
නැති කර නොදමන්නෙමි.'[4] එසේ පව-
සන්නේ යෙහෝවා දෙවිය. 9 'මගේ
අණ පරිදි ඊශ්‍රායෙල්වරුන්ව සියලු
ජාතීන් අතරේ සොලවනු ලැබේ.[5] කුල්-
ලකින් ධාන්‍ය පොළන්නාක් මෙන් මම
ඔවුන්වද සොලවන්නෙමි. එක ගල්
කැටයක්වත් ධාන්‍ය ගොඩට නොවැ-
ටෙන සේ මම ඔවුන්ව පොළා සෝදිසි
කරන්නෙමි. 10 එවිට මගේ සෙනඟ
අතරේ සිටින සියලු පව්කාරයෝ කඩු-
වෙන් මැරුම් කන්නෝය.[6] "අපට කිසි
විපතක් සිදු වන්නේ නැත" කියා පව-
සන ඒ එක් කෙනෙකුවත් මම ඉතුරු
නොකරන්නෙමි.'[7]
11 "'ඒ දවසේදී, බිඳ වැටී ඇති[8]
දාවිත්ගේ ගෘහය[9] මම නැවත ගො-
ඩනඟන්නෙමි.[10] එහි කැඩී බිඳී ගිය
තැන් අලුත්වැඩියා කර එහි නටබුන්
නැවත ගොඩනඟන්නෙමි. අතීත-
යේදී තිබුණු තත්වයටම නැවත එය
ගෙනෙන්නෙමි.[11] 12 ඒදොම් දේශ-
යෙන්[12] ඉතුරු වන සියලු ප්‍රදේශද
මාගේ නාමය දරන[13] සියලු ජාතීන්ද
ඔවුන්ට උරුමයක් ලෙස දෙන පිණිස
මම ඒ දේ කරන්නෙමි.' එසේ පවසන්-
නේ ඒ සියල්ල ඉටු කරන්නාවූ යෙ-
හෝවා දෙවිය.
13 "යෙහෝවා දෙවි මෙසේ පැවසු-
වේය. 'ඉදිරියේදී පැමිණීමට නියමිත
කාලය ගැන මම දැන් ඔබට කියන්-
නෙමි. ඊළඟ කන්නය සඳහා වැපිරීමට
පටන්ගන්නා විටත් කලින් කන්නයේ
අස්වැන්න කපා අවසන් කිරීමට නො-
හැකි වන කාලයක් පැමිණෙනු ඇත.[1]
මිදි පාගා අවසන් වීමට පෙර පැළ කිරී-
මට බීජ රැගෙන එනු ඇත.[2] කඳු මත
වයින් බහුලව සාදන නිසා[3] ඒ කඳු
දිගේ අලුත් වයින් ගලා යයි.[4] 14 මම
මගේ සෙනඟ වන ඊශ්‍රායෙල්වරුන්ව
නැවතත් ඔවුන්ගේ දේශයට ගෙනෙන්-
නෙමි.[5] ඔවුහු පාළු වී ගිය නගර නැවත
ගොඩනඟා එහි වාසය කරන්නෝය.[6]
මිදිවතු වවා එයින් සාදාගත් වයින්
පානය කරන්නෝය. පලතුරු උයන්
වවා එයින් ලැබෙන පලදාව භුක්ති
විඳින්නෝය.'[7]
15 "'මම ඔවුන්ව ගැඹුරට මුල් ඇද
තිබෙන ගසක් මෙන් වීමට සලස්-
වන්නෙමි. ඔවුන්ව තම දේශයේ ස්ථිර
ලෙස පිහිටුවන්නෙමි. ඔවුන්ගේ දේශ-
යෙන් ඔවුන්ව පන්නා දමන්න කිසිවෙ-
කුට මම නැවත ඉඩ නොදෙන්නෙමි.'[8]
එසේ පවසන්නේ ඔබේ දෙවි වන යෙ-
හෝවාය."

**9 පරි.**
1 2රාජා 16:9 යෙසා 22:6 ආමො 1:5
2 ගීතා 11:4 හිතෝ 5:21 හිතෝ 15:3
3 1රාජා 13:34 2රාජා 18:11
4 යෙරෙ 30:11
5 ලෙවී 26:33 ද්වි 28:64
6 2රාජා 18:12 එස 20:38 නාහු 1:3
7 ගීතා 10:13 2පේත 3:4
8 එස 21:27 ක්‍රියා 15:16
9 යෙසා 16:5
10 යෙසා 9:6 යෙසා 11:1 යෙරෙ 23:5 එස 17:24 එස 37:24 සෙක 12:8 ලූක් 1:31
11 2සාමු 7:11 ගීතා 89:36
12 ගණන් 24:18 යෙසා 11:14 ඔබ 19
13 ක්‍රියා 15:17

**2 තීරුව**
1 ලෙවී 26:5 එස 36:35
2 හොෂෙ 2:22
3 යෙසා 35:1 යෙසා 55:12
4 යෝවෙ 3:18
5 එස්රා 3:1 යෙරෙ 30:3 එස 39:25
6 යෙසා 61:4 යෙසා 65:21 එස 36:33

7 යෙසා 62:8; යෙරෙ 30:10; එස 28:26; මීකා 4:4; 8 යෙසා 60:21; යෙරෙ 24:6; එස 34:28; එස 37:25; යෝවෙ 3:20.

# ඔබදියා*

1 ඔබදියාට ලැබුණු දර්ශනය
මෙයයි.
විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි දර්ශනයක් මාර්ග-
යෙන් ඒදොම් දේශය ගැන ප්‍රකාශ
කළ දේ මෙහි සඳහන් වේ.[1] "යෙ-
හෝවා දෙවිගෙන් අපට ලැබුණු
පණිවිඩය මෙයයි. 'ජනයෙනි, නැඟි-
ටින්න. අපි ගොස් ඒදොම් දේශ-
යට විරුද්ධව යුද්ධ කරමු.' ඒ ගැන
ජාතීන්ට දැන්වීමට ඔහු පණිවිඩක-
රුවෙකුව යැව්වේය."[2]

**2 තීරුව**
1 යෙසා 21:11 එස 25:12 යෝවෙ 3:19 ආමො 1:11
2 යෙරෙ 49:14 ඔබ 15 මලා 1:4

ඔබ නම* තේරුම, "යෙහෝවා දෙවිගේ සේවකයා."

**2** “මම ජාතීන් ඉදිරියේ ඔබව පහත්
කරන්නෙමි.[1] සියලුදෙනා ඔබව හෙ-
ළාදකිනු ඇත.[2] **3** කඳු මුදුන්වල
සුරක්ෂිතව වසන ඔබ,[3] ‘මාව බිමට
ඇද දමන්න පුළුවන් කාටද’ කියා
ආඩම්බරයෙන් සිතන්නහුය. නමුත්
ඔබ ඇත්තෙන්ම මුළා වී ඇත.[4]
**4** ඔබ රාජාලියෙකු මෙන් උස් ස්ථාන-
යක ඔබේ කැදැල්ල සාදාගෙන සිටියද
තාරකා අතරේ ඔබේ කැදැල්ල තනා-
ගත්තද මම ඔබව එතැනින් පහතට
ඇද දමන්නෙමි.”[5] එසේ පවසන්නේ
යෙහෝවා දෙවිය.

**5** “සොරුන් හෝ කොල්ලකරුවන්
හෝ රාත්‍රියේදී ඔබේ නිවසට පැන්-
නොත් ඔවුන් රැගෙන යන්නේ ඔවුන්ට
අවශ්‍ය දේ පමණය.[6] මිදි නෙළන්-
නෝ පවා මුළු අස්වැන්නම නෙ-
ළාගන්නේ නැත. අන් අය සඳහාත්
ඔවුහු යමක් ඉතුරු කර යන්නෝය.[7]
**6** නමුත් ඒසව්ගේ සතුරෝ ඔහු සඟවා
තැබූ වස්තු එකිනෙක සොයාගන්-
නෝය.[8] ඔහුගේ මුළු වස්තු සම්භාර-
යම සොරකම් කරන්නෝය. **7** ඔබ
සමඟ ගිවිසුම් ඇති කරගත් අය පවා
ඔබට ද්‍රෝහී වන්නෝය.[9] ඔවුන්ගේ
දේශ සීමාවලින් ඔබව පිටමං කරනු
ඇත. ඔබ සමඟ සමාදානයෙන් සිටි
අය ඔබ සමඟ යුද්ධ කර ඔබව පරාජය
කරන්නෝය.[10] ඔබ මෝඩයෙකු මෙන්
කටයුතු කරන නිසා ඔබ සමඟ එකට
ආහාර ගන්න අය පවා ඔබට විරුද්-
ධව උගුලක් අටවන්නෝය.[11] **8** ඒ
දවසේදී මම අනිවාර්යයෙන්ම විප-
තක් ගෙනෙන්නෙමි.” එසේ පවසන්-
නේ යෙහෝවා දෙවිය.

“ඒදොම් දේශයේ සිටින බුද්ධි-
මතුන්ව මම විනාශ කර දමන්-
නෙමි.[12] ඒසව්ගෙන් පැවතෙන්නන්ට
අයිතිව තිබෙන කඳුකරයේදී නුව-
ණින් කටයුතු කරන එක් කෙනෙක්-
වත් ඉතුරු වන්නේ නැත. **9** ඒ
සියලුදෙනාම[13] මැරුම් කන්නෝය.[14]
එබැවින් තේමාන් නගරයේ[15] බල-
වන්තයෝ බියෙන් වෙවුලන්නෝය.[16]
**10** ඔබේ සහෝදරයා වූ යාකොබ්ට
ඔබ කළ නපුරුකම් නිසා[1] මම ඔබව
නින්දාවට පත් කර[2] ඔබව සහමුලින්ම
විනාශ කර දමන්නෙමි.[3] **11** විදේශි-
කයන් පැමිණ ඔබේ සහෝදරයාගේ
හමුදාව පරාජය කර ඔවුන්ව රැගෙන
ගිය දවසේදී[4] ඔබ කිසිවක් නොකර
පැත්තකට වී බලා සිටියහුය. නාඳු-
නන අය නුවර දොරටුව කඩා,[5] යෙරු-
සලමේ වටිනා දේ බෙදාගැනීමට දාදු
දැමූ[6] විට ඔබත් ඔවුන් සමඟ සිටි-
යහුය.

**12** “ඔබේ සහෝදරයාගේ විපතේදී
ඔබ ඒ දෙස මහත් ප්‍රීතියෙන් බලා සිටි-
යහුය.[7] යූදා දේශයේ වැසියන් විනාශ
වූ දවසේදී ඔබ සතුටු වූවා විතරක්
නොව ඔවුන් දුක් වේදනා විඳින විට
ඔබ ඔවුන්ට සමච්චල් කළහුය.[8] ඔබේ
සහෝදරයාගේ දුකේදී එලෙස හැසිරීම
සුදුසු දෙයක් කියා ඔබ සිතනවාද?
**13** මගේ සෙනඟට විනාශයක් අත් වූ
දවසේදී ඔබ ඔවුන්ගේ නුවරට ඇතුල්
වී ඔවුන්ට සිදු වූ විපත දෙස ආශා-
වෙන් බලා සිටියහුය.[9] ඔබ ඔවුන්-
ගේ වස්තුව පවා පැහැරගත්තහුය.[10]
**14** විපතෙන් පලා යෑමට උත්සාහ
දැරූ අයව අල්ලාගැනීමට ඔබ මංසන්-
ධිවල රැකබලා සිටියහුය.[11] විපතෙන්
බේරුණු අයව ඔබ අල්ලාගෙන සතු-
රාගේ අතට භාර දුන්නහුය.[12] ඔබ
කළ ඒ එක් දෙයක්වත් කිසිසේත්
අනුමත කළ හැකිද? **15** යෙහෝවා
දෙවි වන මා සියලු ජාතීන්ට විරුද්ධව
පියවර ගන්නා දවස ළං වී[13] තිබෙන
බව අමතක නොකරන්න. එදින ඔබ
ඔබේ සහෝදරයන්ට කළ ලෙසම[14]
ඔබටත් සිදු වනු ඇත.[15] **16** ඔබ
සියලුදෙනා මගේ ශුද්ධ කන්දේදී මත්
වෙන තෙක්ම බීවහුය. ඒ ආකාරයටම
මගේ කෝපය නමැති කුසලානයෙන්
සියලු ජාතීන්ට බීමට සිදු වෙයි.[16] සහ-
මුලින්ම විනාශ වී යන තෙක්ම ඔවුහු
එම කුසලානයෙන් බොන්නෝය.

**17** “ ‘බේරී ජීවත් වන අය සියොන්
කන්දට යන්නෝය.[17] නැවතත් එය
ශුද්ධස්ථානයක් බවට පත් වන්-
නේය.[18] යාකොබ්ගෙන් පැවතෙන

**1** යෙරෙ 49:15
**2** යෙරෙ 49:8
**3** 2ලේක 25:12
**4** හිතෝ 16:18
යෙරෙ 49:16
මලා 1:4
**5** යෙරෙ 49:16
ආමො 9:2
**6** යෙරෙ 49:9
**7** ද්වි 24:21
යෙසා 17:6
**8** යෙරෙ 49:10
**9** යෙරෙ 27:6
විලා 1:19
එස 23:22
**10** යෙරෙ 38:22
**11** යෙරෙ 49:7
**12** ගීතා 33:10
1කොරි 3:19
**13** යෙසා 34:5
**14** යෙසා 34:6
**15** උත් 36:11
එස 25:13
ආමො 1:12
**16** ගීතා 76:7
යෙරෙ 49:22

**2 තීරුව**

**1** උත් 27:42
ගණන් 20:20
ගීතා 83:5
ගීතා 137:7
යෝවෙ 3:19
ආමො 1:11
**2** යෙරෙ 49:13
**3** මලා 1:3
මලා 1:4
**4** 2රාජා 24:10
2රාජා 25:5
යෙරෙ 52:28
**5** 2රාජා 25:4
**6** යෝවෙ 3:3
**7** මීකා 4:11
**8** හිතෝ 17:5
හිතෝ 24:17
විලා 4:21
**9** සෙක 1:15
**10** ගීතා 137:7
එස 25:12
**11** ගීතා 83:4
ආමො 1:11
**12** යෙරෙ 30:7
**13** යෙරෙ 9:25
යෙරෙ 25:32
යෙරෙ 49:12
යෝවෙ 3:14
මීකා 5:15
2පේතෘ 3:10
**14** එස 35:15
මතෙ 7:2
**15** යෙරෙ 30:23
2තෙස 1:6
යාකො 2:13
**16** යෙරෙ 25:17
යෙරෙ 49:12
**17** යෝවෙ 2:32
**18** යෙසා 4:3
සෙක 8:3

අය තමන්ට අයිති උරුමය හිමි
කරගනු ඇත.[1] 18 යාකොබ්ගෙන්
පැවතෙන අය ගින්නක් මෙන්ද[2] යෝ-
සෙප්ගෙන් පැවතෙන අය ගිනිදැල්ලක්
මෙන්ද වන්නෝය. නමුත් ඒසව්ගෙන්
පැවතෙන්නෝ පිදුරු මිටක් මෙන්
වන්නෝය.[3] ඔවුහු ගිනි අවුළුවා ඒසව්-
ගෙන් පැවතෙන්නන්ව විනාශ කර
දමන්නෝය. ඒසව්ගෙන් පැවතෙන්-
නන් අතරින් කිසිවෙක් ඉතුරු වන්-
නේ නැත.[4] මන්ද ඒ දේ තීන්දු
කර තිබෙන්නේ යෙහෝවා දෙවිය.
19 මුළු නෙගෙබ් ප්‍රදේශයද ඒසව්ගෙන්
පැවතෙන්නන්ට හිමි වූ කඳුකර ප්‍රදේ-
ශයද[5] පිලිස්තිවරුන්ගේ දේශයද[6] ඒ
අසල තිබෙන පහත් බිම්ද යාකොබ්-
ගෙන් පැවතෙන අය හිමි කරගනු
ඇත. ඔවුහු එෆ්‍රායිම් දේශයත්[7] සමාරි-
යත්[1] හිමි කරගනු ඇත. බෙන්ජමින්
ගෝත්‍රයට ගිලියද් දේශය උරුම වනු
ඇත.[2] 20 සාරෆෙත් නගරය දක්වා[3]
කානානිවරුන්ට අයිතිව තිබූ මුළු
ප්‍රදේශයම බලකොටුවේ සිට[4] පැහැර-
ගෙන ගිය ඊශ්‍රායෙල්වරුන්ට උරුම
වන්නේය.[5] යෙරුසලමේ සිට සෙෆාරද්
නම් ස්ථානයට රැගෙන ගිය අය නෙ-
ගෙබ් ප්‍රදේශයේ[6] නුවරවල් හිමි කර-
ගනු ඇත.
21 "'ගැලවුම්කරුවෝ[7] සියොන්
කන්දට පැමිණ,[8] ඒසව්ට හිමි වූ කඳු-
කර ප්‍රදේශයේ වැසියන්ව විනිශ්චය
කරනු ඇත.[9] රජකම හිමි වන්නේ යෙ-
හෝවා දෙවිටය.'"[10]

1 යෙසා 14:2 එස 35:10 ආමො 9:12
2 යෙසා 10:17 සෙක 12:6
3 යෙසා 5:24
4 යෙරෙ 49:18 එස 35:15 ඔබ 9
5 යෙසා 11:14 ආමො 9:12
6 ආමො 1:8
7 යෙරෙ 31:6

2 නිරුව
1 2රාජා 17:24
2 යොෂු 13:25
3 1රාජා 17:9 ලූක් 4:26
4 ගීතා 122:7
5 උත් 13:7 සෙක 14:21
6 යෙරෙ 13:19 යෙරෙ 33:13

7 නෙහෙ 9:27; ගීතා 2:6; යෙසා 19:20; එළි 7:4; 8 යෙරෙ 31:6; යෝවෙ 2:32; 9 ගීතා 149:7; එස 35:11; 10 ගීතා 22:28; සෙක 14:9.

# යෝනා

1 යෙහෝවා දෙවි අමිත්තයිගේ
පුත් යෝනාට[1] කතා කර
මෙසේ කීවේය. 2 "නිනිවය[2] නම්
මහත් නුවරේ වැසියන්ගේ දුෂ්ටකම්
මට පෙනිණ.[3] දැන් එතැනට ගොස්
මගේ විනිශ්චය ගැන එහි වැසියන්ට
කියන්න."
3 නමුත් යෝනා, යෙහෝවා දෙවි
වෙතින් පලා ගොස්[4] තර්ෂිෂ්[5] දෙ-
සට ගමන් කළේය. ඔහු යොප්පාවට
පැමිණි[6] විට තර්ෂිෂ් බලා යන නැවක්
දුටුවේය. ඔහු ගාස්තු ගෙවා එම නැවට
ඇතුල් වුණේය. ඔහු එසේ කළේ යෙ-
හෝවා දෙවි වෙතින් පලා යෑමටය.
4 පසුව යෙහෝවා දෙවි මුහුද දෙ-
සට තද සුළඟක් හමන්න සැලැස්වූ-
වේය.[7] මහ කුණාටුවක් ඇති
වී[8] නැව ගිලෙන්න පටන්ගත්තේය.
5 එහි සිටි නැවියෝ භය වී එක් එක්
කෙනා තම තමාගේ දෙවියන්ගෙන්
උපකාර ඉල්ලා[9] කෑගසන්න පටන්-
ගත්තෝය. පසුව ඔවුහු නැවේ බර
සැහැල්ලු කිරීමට එහි තිබුණු බඩු
බාහිරාදිය මුහුදට විසි කළෝය.[1] මේ
දේවල් සිදු වන විට යෝනා නැවේ
පහළම තට්ටුවේ තද නින්දක සිටි-
යේය.[2] 6 කපිතාන්වරයා ඔහු ළඟට
ගොස් කෑගසා මෙසේ කීවේය. "මේ
වගේ වෙලාවක ඔබ නිදාගෙන ඉන්-
නේ ඇයි? නැඟිට ඔබේ දෙවිට යාච්ඤා
කරන්න.[3] සමහරවිට සැබෑ දෙවි අපිට
අනුකම්පා කර අපිව බේරාගනීවි."[4]
7 "අපිට මේ විපත වුණේ කවුරු
නිසාද කියා[5] බලන්න අපි ආදු දමමු"[6]
කියා නැවියෝ එකිනෙකා අත-
රේ කතා කරගත්තෝය. ආදු දැමූ
විට තෝරාගනු ලැබුවේ යෝනාවය.[7]
8 එවිට ඔවුහු, "අපිට මෙවැනි දෙයක්
සිදු වෙන්නේ ඇයි කියලා කියන්න.[8]
ඔබ මොනවා කරන කෙනෙක්ද? ඔබ

1 පරි.
1 2රාජා 14:25 ලූක් 11:29
2 උත් 10:11 නාහු 1:1 ශෙප 2:13 මතෙ 12:41
3 උත් 18:20 යාකො 5:4 එළි 18:5
4 හෙබ්‍රෙ 10:38
5 උත් 10:4 2ලේක 9:21 යෙසා 23:1 යෙරෙ 10:9
6 යොෂු 19:46 ක්‍රියා 9:36 ක්‍රියා 10:5
7 ගීතා 78:26 ආමො 4:13
8 ගීතා 107:25 ක්‍රියා 27:14
9 ගීතා 96:5 යෙසා 41:29 1කොරි 8:4

2 නිරුව
1 ක්‍රියා 27:18 ක්‍රියා 27:38
2 මතෙ 8:24
3 ගීතා 107:6
4 යෝනා 3:9

5 යොෂු 7:14; 1සාමු 14:42; 6 හිතෝ 16:33; හිතෝ 18:18; ක්‍රියා 13:19; 7 යොෂු 7:18; 8 යොෂු 7:19; 1සාමු 14:43.

ආවේ කොයි ප්‍රදේශයේ ඉඳලද? ඔබේ
ගම කොහේද? ඔබ කුමන ජාතියේ
කෙනෙක්ද” යනුවෙන් යෝනාගෙන්
ප්‍රශ්න කළෝය.
**9** එවිට යෝනා ඔවුන්ට මෙසේ
කීවේය. “මම හෙබ්‍රෙව් ජාතිකයෙක්.[1]
මම ගරුබිය දක්වන්නේ[2] මුහුදත් ගො-
ඩබිමත් නිර්මාණය කළ[3] ස්වර්ගයේ
දෙවි වන යෙහෝවාටයි.”[4]
**10** එය ඇසූ විට ඒ මිනිස්සු බො-
හෝ සෙයින් භය වී, “ඔබ මේ
වගේ දෙයක් කළේ ඇයි”[5] කියා
යෝනාගෙන් ඇසුවෝය. මන්ද තමා
යෙහෝවා දෙවි වෙතින් පලා යන
බව යෝනා ඔවුන්ට කියා තිබිණ.
**11** ඉන්පසු ඔවුහු ඔහුගෙන් මෙසේ
ඇසුවෝය. “මුහුද නිශ්චල කරන්න
අපි මොනවද කරන්න ඕනේ?”[6] මන්ද
ඒ වන විට කුණාටුව තව තවත්
දරුණු වෙමින් තිබිණ. **12** යෝනා
ඔවුන්ට මෙසේ කීවේය. “මේ මහ
කුණාටුව ඇති වුණේ මම නිසයි.
ඒ නිසා දැන් මාව මුහුදට
විසි කරන්න. එවිට මුහුද නිශ්චල
වෙයි.”[7] **13** නමුත් ඒ මිනිස්සු එසේ
කිරීමට අකමැති වී, ආපසු ගොඩ-
බිම බලා යාත්‍රා කිරීමට උත්සාහ
කළෝය. එහෙත් මුහුද එන්න එන්-
නම කැලඹුණු නිසා ඔවුන්ට එසේ
කිරීමට නොහැකි විය.[8]
**14** අන්තිමේදී ඔවුහු යෝනා කී
දේට එකඟ වී ශබ්ද නඟා යෙ-
හෝවා දෙවිට මෙසේ කන්නලව්
කළෝය.[9] “අනේ යෙහෝවා දෙවියනි,
අපි දැන් කරන්න යන දේ නිසා උද-
හස් වෙන්න එපා! යෙහෝවා දෙවි-
යනි, ඔබ මේ හැම දෙයක්ම කළේ
ඔබේම කැමැත්තට එකඟවයි.[10] ඒ
නිසා මේ අහිංසක මිනිසාගේ ජීවි-
තය නැති කළා කියා අපිට දඬු-
වම් කරන්න එපා!”[11] **15** එසේ කියා
ඔවුහු යෝනාව ඔසවා මුහුදට විසි
කළෝය. එවෙලේම කුණාටුව නතර
විය.[12] **16** මේ දේවල් සිදු වූ පසු ඒ
මිනිසුන්ට යෙහෝවා දෙවි කෙරෙහි
මහත් ගරුබියක් ඇති විය.[13] පසුව
ඔවුහු යෙහෝවා දෙවිට පූජාවක් ඔප්පු
කර,[1] ඔහු වෙනුවෙන් නොයෙකුත්
දේවල් කිරීමට පොරොන්දු වූහ.[2]
**17** යෙහෝවා දෙවි යෝනාව ගිල-
ගන්න විශාල මත්ස්‍යයෙකුව එව්-
වේය.[3] යෝනා ඒ මත්ස්‍යයාගේ බඩේ
දහවල් තුනක්ද රාත්‍රී තුනක්ද සිටි-
යේය.[4]

**2** යෝනා ඒ මත්ස්‍යයාගේ බඩේ
සිටියදී තම දෙවි වන යෙහෝ-
වාට යාච්ඤා කරමින්[5] **2** මෙසේ
කීවේය.

“මගේ දුකේදී මම යෙහෝවා දෙ-
විට හඬගැසුවෙමි.[6] ඔහු මට
පිළිතුරු දුන්නේය.[7]
මිනී වළේ සිට උපකාරය ඉල්ලා
මම කෑගැසුවෙමි.[8]
ඔබ මට කන් දුන්නෙහිය.[9]
**3** ඔබ මාව ගැඹුරු මුහුදට විසි
කළෙහිය.[10]
ජල ධාරා මාව වට කරගත්-
තේය.
රළ පහර මාගේ හිසට උඩින්
ගියේය.[11]
**4** ‘ඔබට මාව නොපෙනී යන සේ
ඈතින් ඈතට මාව ගසා-
ගෙන ගියේය.[12]
ඔබේ ශුද්ධ මාලිගාව මට නැවත
දැකගන්න ලැබෙයිද’ කියා
මම කල්පනා කළෙමි.[13]
**5** රළ පහර මාව යට කරගත්තේය.
ගැඹුරු මුහුදේ පතුලටම මා
ගිලෙන්න පටන්ගත්තේය.[14]
මුහුදු පැළෑටි මගේ හිස වටා
එතුණේය.
**6** මුහුදු පත්ලටම* මම කිඳා බැස්-
සෙමි.
පොළොව මාව වසාගෙන සදහ-
ටම සිර කර තැබුවායයි මට
සිතුණි.
එහෙත් යෙහෝවා මාගේ දෙවි-
යනි, ඔබ මාව මිනී වළෙන්
මුදවා මාගේ ජීවිතය රැක
දුන්නෙහිය.[15]

**1 පරි.**
1 උත් 14:13, උත් 40:15
2 දේශ 12:13, එළි 15:4
3 ගීතා 103:19, ගීතා 115:16, ගීතා 136:26
4 නෙහෙ 9:6, ගීතා 95:5, ගීතා 146:6, ක්‍රියා 14:15
5 යොෂු 7:25, ගීතා 96:4
6 2සාමු 21:3
7 2සාමු 24:17, 1ලේක 21:17, ගීතා 25:9
8 ගීතා 107:25
9 ගීතා 65:2, ගීතා 107:28, යෙසා 26:16
10 ගීතා 115:3, ගීතා 135:6, දානි 4:35
11 උත් 9:6, ද්වි 21:8
12 ගීතා 65:7, ගීතා 89:9, ගීතා 107:29, මතෙ 8:26
13 දානි 6:26, ක්‍රියා 5:11

**2 තීරුව**
1 ගීතා 50:15
2 උත් 28:20, ගීතා 50:14
3 උත් 1:21, ගීතා 104:25
4 මතෙ 12:40, මතෙ 16:4, ලූක් 11:30

**2 පරි.**
5 2ලේක 33:13, ගීතා 91:15, යෙසා 26:16, හොෂෙ 5:15
6 ගීතා 130:1, විලා 3:55
7 ගීතා 22:24, ගීතා 120:1
8 ගීතා 16:10, මතෙ 12:40, ක්‍රියා 2:27
9 ගීතා 18:6, ගීතා 34:6
10 ගීතා 69:1
11 ගීතා 42:7
12 ගීතා 31:22
13 1රාජා 8:38, 2ලේක 6:38, ගීතා 5:7
14 ගීතා 69:1
15 යෝබ් 33:24, ගීතා 16:10, ගීතා 30:3, යෙසා 38:17, ක්‍රියා 2:31

**යෝනා 2:6*** මූ.අ., “කඳු ආරම්භ වන ස්ථානය.”

7 යෙහෝවා දෙවියනි, මරණය අබි-
යස සිටියදී[1] මට සිහි වූයේ
ඔබ පමණය.[2]
මම ඔබට යාච්ඤා කළෙමි.
ඔබේ ශුද්ධ මාලිගාවේ සිට
මාගේ යාච්ඤාවට ඔබ සවන්
දුන්නෙහිය.[3]
8 බොරු දෙවිවරුන්ට නමස්කාර
කරන සියල්ලෝ ප්‍රේමයේ*
උල්පත වන ඔබව අත්හැර
ගොස් ඇත.#[4]
9 එහෙත් ගැලවීම ලබා දෙන්නේ
යෙහෝවා දෙවි වන ඔබ
පමණි.[5] ඒ නිසා මම ඔබට
පොරොන්දු වූ සියල්ල එලෙ-
සම ඉටු කරන්නෙමි.[6]
මම ස්තුති ප්‍රශංසා දෙමින් ඔබට
පුදපූජා ඔප්පු කරන්නෙමි.”[7]
10 පසුව යෝනාව ගොඩබිමට
වමාරන ලෙස යෙහෝවා දෙවි
මත්ස්‍යයාට අණ කළේය. එවිට ඌ
යෝනාව ගොඩබිමට වැමැරුවේය.[8]

**3** එවිට යෙහෝවා දෙවි දෙවන වර-
ටත් යෝනාට කතා කර මෙසේ
පැවසුවේය.[9] 2 “නිනිවය නම් විශාල
නුවරට ගොස් මා ඔබට පවසන දේ
එහි වැසියන්ට කියන්න.”[10]
3 යෝනා යෙහෝවා දෙවි පැවසූ
ලෙස නිනිවය නුවර බලා පිටත්ව
ගියේය.[11] නිනිවය ඉතා වැදගත්
මෙන්ම විශාල නුවරකි.[12] ඒ වටා
පයින් ගමන් කිරීමට දවස් තුනක් ගත
විය. 4 යෝනා නුවරට ඇතුල් වී
මුළු දවසම පයින් ගමන් කළේය. “තව
දවස් හතළිහකින් නිනිවය විනාශ
වෙනවා”[13] කියා ඔහු එහි වැසියන්ට
ප්‍රකාශ කළේය.
5 එය ඇසූ විට නිනිවයේ වැසි-
යෝ දෙවි කෙරෙහි විශ්වාසය
තබන්න පටන්ගත්තෝය.[14] නුවරේ
සියලු වැසියන් නිරාහාරව සිටිය
යුතුයි කියා නියෝගයක්ද පනවන
ලදි. උස් පහත් භේදයකින් තොරව
සියලුදෙනාම ගෝණි රෙදි ඇඳගෙන
නිරාහාරව සිටියෝය.[1] 6 නිනිවයේ
රජුට[2] මෙය ආරංචි වූ විට ඔහුද සිංහා-
සනයෙන් නැඟිට තමාගේ නිලවස්-
ත්‍රය පසෙක ලා ගෝණි රෙදි ඇඳගෙන
අළු ගොඩක හිඳගත්තේය.[3] 7 තවද
රජතුමා තම අධිපතීන් සමඟ එකතු
වී පැනවූ මෙම නියෝගයද නිනිවය
පුරා නිවේදනය කරන ලදි.
“කිසි මිනිසෙකුවත් සතෙකුවත්
කෑම නොකෑ යුතුයි. ආහාරයක රස-
වත් නොබැලිය යුතුයි. වතුර බීමෙ-
නුත් වැළකී සිටිය යුතුයි.[4]
8 ගෝණි රෙදි ඇඳ දිගටම දෙ-
විට කන්නලව් කරන්න. සතුන් පිටද
ගෝණි රෙදි දමන්න. ඔබේ දුෂ්ට ක්‍රියා
අත්හැර තවදුරටත් අනුන්ට හිරිහැර
නොකරන්න.[5] 9 සමහරවිට සැබෑ
දෙවි අපිට අනුකම්පා කරාවි.[6] ඔහු-
ගේ කෝපය පහ වී මේ විපත අප
පිට නොගෙන ඒමට ඔහු තීරණය
කරන්නත් ඉඩ ඇත.”[7]
10 ජනයා තම දුෂ්ටකම් අත්-
හැර ඇති බව[8] සැබෑ දෙවි දුටු-
වේය.[9] ඒ නිසා ඔවුන්ට දඬුවම් කිරීමට
ගත් තීරණය දෙවි වෙනස් කළේය.[10]
ඔහු ඔවුන් පිටට ඒ විපත ගෙනාවේ
නැත.[11]

**4** එහෙත් දෙවි ගත් තීරණය ගැන
අසතුටු වූ යෝනා[12] බොහෝ
සෙයින් කෝප විය. 2 ඔහු යෙ-
හෝවා දෙවිට යාච්ඤා කරමින් මෙසේ
කීවේය. “යෙහෝවා දෙවියනි, ඔබ මේ
වගේ දෙයක් කරාවි කියා මම මගේම
රටේ සිටියදී දැනගෙන සිටියා. ඔබ
ඉතා කරුණාවන්ත, දයාන්විත දෙවි
කෙනෙක් බව මම දන්නවා.[13] ඔබ
ඉක්මනින් කෝප නොවන බොහෝ
සෙයින් ප්‍රේමය* පෙන්වන දෙවි කෙ-
නෙක්.[14] ඔබ දඬුවමක් නියම කළ
පසුත් අනුකම්පා කර තීරණය වෙ-
නස් කරන බව මම දන්නවා.[15] මම

**යෝනා 2:8*** හෝ, “ළැදි ප්‍රේමයේ.” **8#** හෝ, “ඔවුහු ප්‍රේමය නොපෙන්වූවෝය.”

**15** යෙරෙ 18:8; එස 33:11; ආමො 7:3.

**යෝනා 4:2*** හෝ, “ළැදි ප්‍රේමය.”

**2 පරි.**
1 ගීතා 119:81; ගීතා 142:3
2 ගීතා 77:11; ගීතා 143:5; 2කොරි 1:9
3 2ලේක 30:27; ගීතා 18:6
4 1සාමු 12:21; යෙරෙ 16:19; හබ 2:18; 1කොරි 12:2
5 ගීතා 3:8; යෙසා 12:2
6 දේශ 5:4
7 ගීතා 50:14; හොෂෙ 14:2; රෝම 12:1; හෙබ්‍රෙ 13:15
8 ගීතා 33:9; යෙසා 50:2

**3 පරි.**
9 යෝනා 1:1
10 යෝනා 1:2
11 එස 9:11; යෝනා 2:9
12 උත් 10:11; යෝනා 4:11
13 යෙරෙ 18:7; ශෙප 2:13
14 නික් 9:20; මතෙ 12:41; ලූක් 11:32

**2 තීරුව**
1 2ලේක 20:3; එස්රා 8:21; යෝවෙ 1:13
2 ගීතා 2:10
3 ආනි 9:3; මතෙ 11:21; මතෙ 12:41
4 එස්රා 8:21
5 යෙසා 1:16; එස 18:21; යෝවෙ 2:12; මතෙ 3:8; ක්‍රියා 3:19
6 යෝවෙ 2:13
7 යෙරෙ 18:8
8 ලූක් 11:32
9 2ලේක 16:9
10 එස 18:23; යෝනා 4:2
11 යෙරෙ 18:8

**4 පරි.**
12 මතෙ 20:15; රෝම 12:16; යාකො 4:5
13 නික් 34:6; ගීතා 103:8; ගීතා 145:8; යෝවෙ 2:13
14 ගීතා 78:38; ගීතා 86:5; මීකා 7:18

තර්ෂිෂ් වෙතට පලා යන්න[1] තීරණය
කළෙත් ඒ නිසයි. **3** ඉතින් මම
තවත් ජීවත් වෙලා වැඩක් තියෙන-
වාද?[2] යෙහෝවා දෙවියනි, ඔබ මාව
මරලා දැම්මා නම් මීට වඩා හොඳයි."[3]
**4** එවිට යෙහෝවා දෙවි ඔහුගෙන්
මෙසේ ඇසුවේය. "ඔබට කෝප වීමට
සාධාරණ හේතුවක් තිබෙනවා කියා
ඔබ සිතනවාද?"[4]
**5** යෝනා එවෙලේම නගරයෙන්
පිට වී නැඟෙනහිර දෙසට ගොස්
හිඳගත්තේය. පසුව ඔහු අව් රශ්මි-
යෙන් ආරක්ෂාව ලබාගැනීමට එතැන
පැලක් සාදාගත්තේය.[5] ඔහු පැල
ඇතුළට වී නුවරට කුමක් සිදු වේදැයි
බලා සිටියේය.[6] **6** අව් රශ්මිය නිසා
පීඩා විඳිමින් සිටි යෝනාට සෙව-
ණක් ලබා දීමට යෙහෝවා දෙවි ලබු
වැලක් හටගන්න සැලැස්වූවේය.[7] ඒ
ගැන යෝනා ඉතා සතුටු විය.
**7** නමුත් පසුවදා අලුයම වෙද්දී
සැබෑ දෙවි ඒ ලබු වැල කා දමන්න
පණුවෙකුව[8] එව්වේය. අන්තිමේදී ඒ
ලබු වැල වියළී ගියේය.[9] **8** ඉර
මුදුන් වූ විට දෙවි නැඟෙනහිර දෙ-
සින් වියළි සුළඟක් හමන්න සැලැස්වූ-
වේය.[1] යෝනා ක්ලාන්ත වන
තරමටම අව් රශ්මිය දැඩි විය.[2] එවිට
යෝනා, "අනේ, මම මැරුණා නම් මීට
වඩා හොඳයි" කියා පවසමින් තම ජීවි-
තය නැති කර දමන මෙන් දෙවිගෙන්
අයැදුවේය.[3]
**9** ඉන්පසු දෙවි යෝනාගෙන් මෙසේ
ඇසුවේය. "ලබු වැලක් නිසා මෙ-
ලෙස කෝප වීම සාධාරණයි කියා ඔබ
සිතනවාද?"[4]
එවිට යෝනා, "ඔව්, ඒක සාධාර-
ණයි. මට දැන් ජීවිතෙත් එපා වෙලා"
කියා කීවේය. **10** එවිට යෙහෝවා
දෙවි ඔහුට මෙසේ පැවසුවේය. "ඔබ ඒ
ලබු වැල වවන්නවත් බලාගන්නවත්
මහන්සි වුණේ නැහැ. එක රැයකින්
වැඩී වියළී ගිය ලබු වැලක් ගැන
ඔබ දුක් වුණා. **11** එහෙමනම් හරි
වැරැද්ද අතර වෙනස නොදන්න* එක්-
ලක්ෂ විසිදාහකට වඩා වැඩි මිනිසුන්
සහ සතුන් ප්‍රමාණයක් සිටින[5] මේ
විශාල නුවර වන නිනිවය විනාශ
කිරීම ගැන මට දුක් වෙන්න අයිතියක්
නැද්ද?"[6]

**4 පරි.**
1 යෝනා 1:3
2 උත් 35:18
3 ගණන් 11:15; 1රාජා 19:4; යෝබ් 6:9
4 මතෙ 20:15
5 1රාජා 19:4
6 යෝනා 3:4
7 ගීතා 103:10; ගීතා 103:13; ගීතා 121:5
8 ද්වි 28:39
9 යෙසා 40:7

**2 තීරුව**
1 එස 17:10; එස 19:12; හොෂෙ 13:15
2 ආමො 8:13
3 යෝනා 4:3
4 යෝනා 4:4
5 ගීතා 36:6; ගීතා 145:9
6 යෝනා 3:3; මතෙ 18:33

**යෝනා 4:11*** මූ.අ., "ඔවුන්ගේ වමතත් දකුණ-
තත් අතර වෙනස නොදන්න."

# මීකා

**1** යෝතම්,[1] ආහස්[2] සහ හෙස-
කියා[3] යූදාහි රජකම් කළ දවස්ව-
ලදී[4] මොරෂෙත් නගරයේ විසූ මීකා[5]
සමාරිය[6] හා යෙරුසලම[7] පිළිබඳව
දර්ශන දුටුවේය. යෙහෝවා දෙවිගෙන්
මීකාට ලැබුණු එම පණිවිඩය මෙයයි.
**2** "සියලු ජනයෙනි, මා පවසන
දේට සවන් දෙන්න. යෙහෝවා දෙවි
තම ශුද්ධ මාලිගාවේ සිට[8] පවසන
දේට පොළොවත් එහි ජීවත් වන
සියලුදෙනාත්[9] සවන් දෙන්න. විශ්-
වයේ පාලකයාණන් වන යෙහෝවා
දෙවි ඔබට විරුද්ධව සාක්ෂි දෙයි.[10]
**3** යෙහෝවා දෙවි තම වාසස්ථාන-
යෙන් බැස ඇවිත්[1] පොළොවේ කඳු
මුදුන් පාගා පොඩි කර දමනු ඇත.[2]
**4** එවිට කඳු දිය වී යන්නේය.[3] තැනි-
තලා බිම්ද ඉරි තැළී ගොස් කඩා
වැටෙයි.[4] ඒවා ගින්නට දිය වී යන ඉටි
මෙන්ද උස් තැනකින් ඇද හැළෙන
ජල ධාරාවක් මෙන්ද වැටෙනු ඇත.
**5** "යාකොබ් කැරලිගැසුවේය. ඊශ්‍රා-
යෙල් පව් කළේය. මේ සෑම දෙයක්ම

**1 පරි.**
1 2රාජා 15:7; 2රාජා 15:32; 1ලේක 3:12; 2ලේක 27:1
2 2රාජා 16:2; 2ලේක 28:1; යෙසා 7:1; හොෂෙ 1:1
3 2රාජා 18:1; 2ලේක 29:1; යෙසා 36:1
4 යෙසා 1:1
5 යෙරෙ 26:18
6 1රාජා 16:24; ආමො 4:1
7 මීකා 3:10
8 ගීතා 11:4; හබ 2:20
9 යෙසා 1:2

**10** ගීතා 50:7; මලා 3:5; **2 තීරුව** **1** ගීතා 115:3; යෙසා 26:21; එස 3:12; **2** ද්වි 32:13; ද්වි 33:29; ආමො 4:13; **3** විනි 5:5; ගීතා 97:5; **4** 2පේත්‍රු 3:10.

සිදු වී ඇත්තේ ඒ නිසාය.[1] යාකොබ්-
ගේ කැරලිගැසීමට වග කිව යුත්තේ
කවුද? සමාරියේ වැසියන් නොවෙ-
යිද?[2] යූදාහි සාදා තිබෙන පූජනීය
ස්ථානවලට වග කිව යුත්තේ කවුද?[3]
යෙරුසලමේ වැසියන් නොවෙයිද?
**6** ‘මම සමාරිය නටබුන් ගොඩක්
බවට පත් කරන්නෙමි.[4] මිදිවත්තක්
සඳහා සකසන වගාබිමක් මෙන් සම-
තලා කරන්නෙමි. මම සමාරියේ ගො-
ඩනැඟිලි අත්තිවාරම දක්වාම කඩා
දමා ඇගේ ගල් නිම්නයට විසි කර
දමන්නෙමි.[5] **7** ඇගේ දේවතා රූප
සියල්ලම කැබලි කරන්නෙමි.[6] ගණි-
කාවකට ගෙවන කුලිය හා සමානව
ඇයට ලැබී තිබෙන තෑගි සියල්ල
මම පුලුස්සා දමන්නෙමි.[7] ඇගේ රූප
සියල්ලම මම විනාශ කරන්නෙමි.
මන්ද ඒ සියල්ල ඇය වේශ්‍යාකම් කර
ලබාගත් තෑගිය. තවද ඒ සියල්ල වෙ-
නත් ගණිකාවන්ට කුලී ගෙවන පිණිස
රැගෙන යනු ඇත.’ ”[8]
**8** ඒ නිසා මම හඬා වැලපෙන්-
නෙමි.[9] පාවහන්වත් ඇඳුම්වත් නැතුව
ඇවිදින්නෙමි.[10] මම හිවලුන් මෙන්
කෑගසමින් පැස්බරුන් මෙන් හඬන්-
නෙමි. **9** මන්ද සමාරියට ඇති වූ
තුවාලය සුව කළ නොහැකි තරම්
දරුණුය.[11] ඒ තුවාලය යූදා දේශය
දක්වාම ඔඩු දුවන්නේය.[12] මගේ සෙ-
නඟ වාසය කරන යෙරුසලමේ දොර-
ටුව දක්වාද එය පැතිර යන්නේය.[13]
**10** “මේ දේවල් ගැන ගාත් නග-
රයේ කිසිවෙකුටවත් නොපවසන්න.
ඔවුන් ඉදිරියේ නොවැලපෙන්න.[14]
“බෙත්-අප්‍රාහිදී* දූවිල්ලේ පෙරළෙ-
මින් හඬන්න.[15] **11** ෂාපීර්හි වැසි-
යෙනි, නග්නව ඔබේ දේශයෙන්
පිටත්ව යන්න.[16] නමුත් ෂයනාන්
නගරයේ වැසියෝ පිටත්ව නොයන්-
නෝය. බෙත්-ඒෂෙල් නගරයේ වැසි-
යන්ටද හඬා වැලපෙන්න සිදු වෙයි.
එබැවින් ඒ ස්ථානයෙන්වත් ඔබට
කිසි ආරක්ෂාවක් නොලැබෙන්නේය.

මීකා 1:10* හෝ, “දූවිලි නිවසේ.”

1 පරි.
1 2රාජා 17:7 යෙරෙ 2:17
2 හොෂෙ 7:1
3 2රාජා 16:4
4 2රාජා 19:25
5 එස 13:14 මතෙ 24:2
6 ලෙවී 26:30 හොෂෙ 8:6
7 හොෂෙ 2:5 හොෂෙ 9:1
8 ද්වි 23:18
9 යෙරෙ 4:19
10 යෙසා 20:2
11 යෙසා 1:5 යෙරෙ 15:18
12 2රාජා 18:13 යෙසා 8:8
13 2ලේක 32:2 මීකා 1:12
14 2සාමු 1:20
15 යෙරෙ 6:26 එස 27:30
16 යෙසා 47:3 යෙරෙ 13:26 එස 16:37

2 තීරුව
1 යෙසා 59:9 යෙරෙ 8:15
2 යෙසා 45:7 ආමො 3:6
3 1රාජා 14:16 2රාජා 16:3 යෙරෙ 3:8
4 යොෂු 15:39 2රාජා 18:14
5 2රාජා 15:19
6 යොෂු 15:44
7 2ලේක 11:8
8 යෙසා 7:17
9 උත් 38:1 නෙහෙ 11:30
10 යෝබ් 1:20 යෙසා 15:2 යෙසා 22:12 යෙරෙ 7:29
11 ද්වි 28:41 2රාජා 17:6 යෙසා 39:7

2 පරි.
12 එස්ත 3:8 ගීතා 36:4 ලූක් 22:2
13 හොෂෙ 7:6 මතෙ 27:1 ක්‍රියා 23:12
14 උත් 31:29 1රාජා 21:7 යොහ 19:10
15 නික් 20:17 1රාජා 21:2 නෙහෙ 5:11 යෙසා 5:8 එස 22:29
16 නෙහෙ 5:5

**12** මාරොත් නගරයේ වැසියන් යහ-
පතක් සිදු වේයයි බලාපොරොත්තු-
වෙන් සිටියද[1] යෙහෝවා දෙවි
යෙරුසලමේ දොරටුව දක්වාම විප-
තක් ඇති වෙන්න සැලැස්වූවේය.[2]
**13** ඊශ්‍රායෙල්වරුන් මෙන් සියොන්
දියණියද කැරලිගැසුවාය.[3] ඇය පව්
කරන්න පටන්ගත්තේ ලාකිෂ් නගර-
යේදීය.[4] ලාකිෂ් නගරයේ වැසියෙනි,
දැන් ඔබේ අශ්ව රථ සූදානම් කර-
ගන්න. **14** දේශයෙන් පිටත්ව යන
විට මොරෂෙත්-ගාත් නගරයට තෑගි
දෙන්න ඔබට සිදු වන්නේය.[5] අක්-
ෂිබ්[6] නගරය ඊශ්‍රායෙල්හි රජවරුන්-
ගේ බලාපොරොත්තු සුන් කර ඇත.
**15** මරේෂාහ් නගරයේ වැසියෙනි,[7]
ඔබේ උරුමය පැහැරගැනීමට මම
යමෙකුව එවන්නෙමි.[8] ඊශ්‍රායෙල්හි
තේජාන්විත තැනැත්තා* අදුල්-
ලාම් නගරය දක්වාම යන්නේය.[9]
**16** ඔබේ ප්‍රිය දරුවන් නිසා ඔබේ
හිසකෙස් කපාගන්න. හිස මුඩු කර-
ගන්න.[10] මන්ද ඔබේ දරුවන්ව ඔබෙන්
උදුරාගෙන දේශයෙන් පිටතට රැගෙන
ගොස් ඇත. එබැවින් රාජාලියෙකුගේ
හිස මෙන් ඔබේ හිසත් බූ ගාගන්න.”[11]

**2** “යහනට ගිය පසුත් නපුරු දේ
කිරීමට සැලසුම් කරන අයට
දුක් වේ! ඔවුහු යහනේදී දුෂ්ට උපා-
යන් යොදති.[12] උදෙන්ම නැඟිට ඒ
දේ කිරීමට පිටත්ව යති.[13] ඔවුන්ට
බලය තිබෙන නිසා ඔවුන්ගේ කුමන්-
ත්‍රණ සාර්ථක වන්නේය.[14] **2** යමෙ-
කුගේ කෙතකට හෝ ගෙයකට හෝ
ආශා වුණොත් ඔවුහු කෙසේ හෝ ඒ
දෙය අයිති කරගනිති.[15] මිනිසෙකුගේ
ගේ දොර හෝ ඔහුට උරුම වූ ඉඩක-
ඩම්[16] හෝ ඔවුහු වංචාවෙන් පැහැර-
ගන්නෝය.[17]
**3** “එබැවින් යෙහෝවා දෙවි මෙසේ
පවසන්නේය. ‘මම මේ සෙනඟට[18]

17 යෙරෙ 22:17; එස 18:12; එස 22:12; 18 යෙරෙ 8:3; ආමො 3:1.

මීකා 1:15* මූ.අ., “ඊශ්‍රායෙල්හි තේජස.”

දඬුවම් කිරීමට අදහස් කරගෙන
සිටින්නෙමි.[1] ඒ විපතෙන් ගැලවීමට
ඔබෙන් කිසිවෙකුටවත් හැකියාවක්
ලැබෙන්නේ නැත.[2] ඒ විපතෙන් පසු
උඩඟු ලෙස හැසිරෙන[3] ඔබව පහත්
තත්වයකට ගෙනෙනු ලබන්නේය.[4]
**4** ඒ දවසේදී ඔබට සිදු වන දේ
නිසා ඔබ නින්දා අපහාසවලට ලක්
වනු ඇත.*[5] "අප සතු සියල්ල අපෙන්
පැහැරගෙන ඇත![6] අපේ උරුමය ඔහු
අන් අයගේ අතට පත් කළේය![7] අපේ
කෙත්වතු සතුරන්ට බෙදා දුන්නේය"
කියා ඇතමෙක් ශෝකයෙන් පවසනු
ඇත.[8] **5** පෙර සේ ආදූ දමා දේශයේ
ඉඩකඩම් බෙදා ලණුවලින් මැන බැලී-
මට[9] යෙහෝවා දෙවි වන මාගේ සෙ-
නඟ අතරේ දැන් කිසිවෙක් ඉතුරු වී
නැත. **6** ජනයෙනි, අනාවැකි නො-
කියන්න.[10] ඔවුහු අනාවැකි කිව්වත්
මේ කාරණා ගැන අනාවැකි නො-
කියන්නෝය. ඔවුහු අනිවාර්යයෙන්ම
නින්දාවට පත් වනු ඇත.[11]
**7** "'යාකොබ්ගේ පුත්‍රයෙනි,[12]
යමෙක් මාගේ වචනය පිළිපදිමින්
නිර්දෝෂ ජීවිතයක් ගත කළොත්
ඔහුට යහපතක් සිදු වන්නේ නැද්ද?[13]
එසේනම්, "යෙහෝවා දෙවි තවත් අපි
ගැන ඉවසන්නේ නැද්ද? ඔහු ඇත්-
තටම අප සමඟ කටයුතු කරන්නේ
මේ ආකාරයටද"[14] කියා ඔබ අසන්නේ
මන්ද?
**8** "'මාගේ සෙනඟ දැන් කටයුතු
කරන්නේ සතුරන් ලෙසය.[15] යුද්ධ-
යෙන් පසුව හැරී එන අය කිසි
භයක් නැතුව තම ගම්බිම් බලා එන්-
නෝය. ඒ අය ඇඳ පැළඳ සිටින
වටිනා දේ පවා ඔබ උදුරාගන්න-
හුය. **9** ස්ත්‍රියක තම නිවසේ සතු-
ටින් කල් ගෙවනවා දුටුවොත් ඔබ
ඇයව එතැනින් පන්නා දමන්නහුය.
ඇගේ දරුවන්ට මගේ ආශීර්වාද හිමි
කරගන්න ඔබ ඉඩ දෙන්නේ නැත.[16]
**10** ජනයෙනි, යූදා දේශයෙන් පිටත්ව
යන්න.[1] එය තවදුරටත් සුරක්ෂිතව
ජීවත් විය හැකි ස්ථානයක් නො-
වෙයි.[2] දේශය දූෂ්‍ය වී ඇති නිසා[3]
එය පිටට මහත් විපතක් පැමිණෙන්-
නේය. ඒ විපත නිසා බොහෝ දුක්
වේදනා ඇති වන්නේය.[4] **11** නිෂ්-
ඵල දේ පසුපස හඹා යන වංක මිනි-
සෙකු මේ සෙනඟ ළඟට පැමිණ,[5]
"ඔබට ඇති තරම් වයින්ද මත්පැන්ද
බොන්න ලැබෙයි" කියා චාටුබස් දෙ-
ඩුවොත් ඔවුහු අනාගතය ගැන දැන-
ගැනීමට හැමදාමත් ඒ මිනිසා ළඟට
යන්නෝය.[6]
**12** "'යාකොබ්ගේ සෙනඟෙනි, මම
නැවත ඔබව එක් රැස් කරන්නෙමි.[7]
ඊශ්‍රායෙල්වරුන් අතරින් ඉතුරු වන
අයව මම එක් රැස් කරන්නෙමි.[8]
එකම ගාලක සිටින බැටළුවන් මෙන්ද
තණබිමේ සිටින බැටළු රැළක් මෙන්ද
මම ඔවුන්ට එකමුතුව විසීමට සලස්-
වන්නෙමි.[9] එවිට ඔවුහුද ප්‍රීති ඝෝෂා
නඟමින් එකට ජීවත් වන්නෝය.'[10]
**13** "ඔවුන්ගේ නායකයා වැටකඩුලු
බිඳ දමමින් ඔවුන්ට ඉදිරියෙන් යයි.[11]
ඔවුහු තමන් ඉදිරියේ තිබෙන දොර-
ටුව බිඳ දමා පිටත්ව යන්නෝය.[12]
ඔවුන්ගේ නායකයා වන රජු ඔවුන්ට
ඉදිරියෙන් ගමන් කරයි. ඔවුන්ට පෙර-
ටුවෙන් ගමන් කරන්නේ යෙහෝවා
දෙවිය."[13]

**3** මම මෙසේ පැවසුවෙමි. "යා-
කොබ්ගේ පෙළපතට අයත් ප්‍රධා-
නියෙනි, ඊශ්‍රායෙල්හි නායකයෙනි, මා
පවසන දේට සවන් දෙන්න.[14] යුක්තිය
ඉටු කිරීම ඔබේ වගකීම නොවෙයිද?[15]
**2** එහෙත් ඔබ යහපතට පිළිකුල්
කර[16] අයහපතට ඇලුම් කරන්න-
හුය.[17] ඔබ මිනිසුන්ගේ හම ඉරා
ඇටකටු පැදෙන තෙක් මස් ගලවා
දමන්නහුය.[18] **3** ඔබ ඔවුන්ගේ මස්
කා දමන්නහුය.[19] විශාල හැළියක
පිසීමට සූදානම් කරන සතෙකු මෙන්
ඔබ ඔවුන්ගේ හම ඉරා, මස් කැලි

**2 පරි.**

**1** යෙරෙ 18:11; යාකො 2:13
**2** ආමෝ 2:14
**3** යෙසා 2:11; දානි 5:20; 1පේතෘ 5:5
**4** ආමෝ 5:13
**5** ගණන් 23:18; යෝබ් 27:1; හබ 2:6
**6** යෙසා 6:11; යෙරෙ 25:9; ශෙප 1:2
**7** 2රාජා 17:23
**8** යෙරෙ 9:10; විලා 1:1; එස 2:10
**9** ගණන් 26:55; ගීතා 78:55
**10** එස 21:2; ක්‍රියා 4:17
**11** යෙරෙ 6:15; යෙරෙ 8:12
**12** යෙරෙ 2:4
**13** ද්වි 32:4; යෙසා 50:2
**14** ගීතා 15:2; ගීතා 19:7; ගීතා 33:4; හිතෝ 2:7; යෙරෙ 15:16
**15** යෙසා 9:21
**16** එස 16:14; යෝවෙ 3:6

**2 තීරුව**

**1** යොෂු 23:15
**2** ද්වි 12:9
**3** ලෙවී 18:25; ගීතා 106:38
**4** යෙරෙ 9:19; යෙරෙ 10:18
**5** 1රාජා 22:6; යෙසා 9:15; යෙරෙ 6:14; එස 13:3; 1යොහ 4:1
**6** 2තෙස 2:11
**7** යෙසා 11:11; යෙරෙ 31:8; මීකා 4:6
**8** යෙරෙ 23:3
**9** එස 34:11
**10** එස 36:38; සෙක 8:22
**11** යෙසා 45:1; යෙසා 59:16
**12** යෙසා 62:10
**13** යෙසා 42:13; යෙසා 49:10; යෙසා 52:12; සෙක 9:14; සෙක 10:5

**3 පරි.**

**14** මීකා 3:9
**15** ද්වි 1:13; 1කොරි 6:5

---

**මීකා 2:4*** මූ.අ., "ඔබ ගැන අපහාසාත්මක කිය-මන් ගොතනු ඇත."

**16** 1රාජා 22:8; ආමෝ 5:10; ලූක් 19:14; **17** 2ලේක 19:2; හිතෝ 28:4; **18** එස 22:27; ආමෝ 8:4; ශෙප 3:3; **19** ගීතා 53:4; එස 34:3.

කැලිවලට කපා ඇටකටු කඩා පොඩි
කර දමන්නහුය.[1] **4** ඒ කාලයේදී
ඔබ යෙහෝවා දෙවිගෙන් උපකාරය
පැතුවද ඔහු ඔබට ඇහුම්කන් දෙන්-
නේ නැත.[2] ඔබ නපුරු දේ කරන නිසා
ඔහු ඔබ දෙස නොබලන්නේය.[3]
**5** "අනාගතවක්තෘවරුන් සාමයේ
පණිවිඩයක් ප්‍රකාශ කරන්නේ[4]
ඔවුන්ට කෑමට යමක් ලැබුණොත්
පමණි. නමුත් කෑමට යමක් නො-
දුන් අයට විරුද්ධව ඔවුහු යුද්ධය
ප්‍රකාශ කරන්නෝය.[5] මාගේ සෙ-
නඟව මංමුළා කරන ඒ අනාගතවක්-
තෘවරුන්ට[6] විරුද්ධව යෙහෝවා දෙවි
පවසන්නේ මෙයයි. **6** 'ඔබට දර්-
ශන නොපෙනෙන ලෙස රාත්‍රිය උදා
වන්නේය.[7] ඔබ පිට පැමිණෙන අන්-
ධකාරය නිසා ඔබට ශාස්ත්‍ර කීමට
නොහැකි වෙයි.[8] අනාගතවක්තෘවරු
නැවත කිසිදා හිරු එළිය නොදකින්-
නෝය. ඔවුන්ට දහවල රාත්‍රිය මෙන්
පෙනෙනු ඇත.[9] **7** දිවැසිවරු[10] ලැජ්-
ජාවට පත් වන්නෝය.[11] පේන කියන්-
නෝ[12] කලකිරෙන්නෝය. මාගෙන්
කිසි පිළිතුරක් නොලැබෙන[13] ඔවුන්ට
ලැජ්ජාවෙන් තමන්ගේ මුහුණු වසා-
ගන්න සිදු වෙයි.' "[14]
**8** තමන් දෙවිට විරුද්ධව කැරලිග-
සමින් කරන පාප ගැන යාකොබ්ටත්
ඊශ්‍රායෙල්ටත් පෙන්වා දෙන පිණිස[15]
යෙහෝවා දෙවි මාව බලවත් කළේය.
ඔහුගේ බලය නොඅඩුවම මට ලබා
දුන්නේය. ඒ නිසා මම යුක්තිගරුකව
හා එඩිතරකමින් ක්‍රියා කරන්නෙමි.[16]
**9** යාකොබ්ගේ පෙළපතේ ප්‍රධානි-
යෙනි, ඊශ්‍රායෙල්හි නායකයෙනි,[17] මා
පවසන දේට ඇහුම්කන් දෙන්න. යුක්-
තියට පිළිකුල් කරන ඔබ හරි දේ
නොපිටට පෙරළන්නහුය.[18] **10** ඔබ
සියොන් නුවර ලෙයින් ගොඩනැඟූ
අතර යෙරුසලම අධර්මිෂ්ඨකමින්
ඉදි කළහුය.[19] **11** ප්‍රධානීන් තීන්දු
දෙන්නේ තමන්ට ලැබෙන අල්ලසට
අනුවය.[20] පූජකයන් උපදෙස් දෙන්-
නෙත් අනාගතවක්තෘවරුන් අනා-
වැකි කියන්නෙත් මුදලටය.[1] මේ සෑම
දෙයක්ම කළ පසුත් ඔවුහු යෙහෝවා
දෙවිගෙන් පිහිට පතමින්, "යෙහෝවා
දෙවි අප සමඟය.[2] අපට කිසි විප-
තක් සිදු වන්නේ නැත"[3] කියාද
පවසන්නෝය. **12** ඔබ කරන මේ
දේවල් නිසා කෙතක් හාන්නාක් මෙන්
සියොන් නුවර නාස්ති කරනු ලබන්-
නේය. යෙරුසලම නටබුන් ගොඩක්
බවට පත් වන්නේය.[4] දේවමාලිගාව
පිහිටා තිබෙන කන්ද පාළු කැලෑවක්
මෙන් වන්නේය.

**4** නමුත් අවසාන කාලයේදී,[5] යෙ-
හෝවා දෙවිගේ ගෘහය[6] පිහිටි
කන්ද[7] නොසෙල්වන ලෙස ස්ථිරව
පිහිටුවනු ලබන්නේය. එය සියලුම
කඳුවලටත් හෙල්වලටත් වඩා ඉහ-
ළින්[8] පිහිටුවනු ලබන්නේය. ඒ කාල-
යේදී ජනයා වැල නොකැඩී ඒ කන්ද
වෙතට ඇදී එන්නෝය.[9] **2** එතැ-
නට යන බොහෝ ජාතීහු මෙසේ
කියන්නෝය. "ජනයෙනි, එන්න.[10]
අපි යෙහෝවා දෙවිගේ කන්දට නඟිමු.
යාකොබ්ගේ දෙවිගේ ගෘහයට යමු.[11]
එහිදී දෙවි අපට ඔහුගේ මාර්ග ගැන
උගන්වයි.[12] අපිද ඔහුගේ මඟ පෙන්වී-
මට අනුව ජීවත් වෙමු."[13] මන්ද දෙ-
විගේ නීතිය සියොන් කන්දේ සිට
ප්‍රකාශ කරනු ලැබේ. යෙරුසලමේ
සිට යෙහෝවා දෙවි තම වචනය
දැනුම් දෙන්නේය.[14] **3** ඔහු බොහෝ
ජනයා අතරේ තමාගේ තීන්දු ප්‍රකාශ
කරන්නේය.[15] දුර ඈත වෙසෙන බල-
වත් ජාතීන්ගේ[16] ගැටලු විසඳා ඔවුන්ව
නිවැරදි කරන්නේය.[17] ඔවුහු තමුන්-
ගේ කඩුවලින් නගුල්ද හෙල්ලවලින්
දෑකැතිද සාදාගන්නෝය.[18] ඒ සෙ-
නඟ තවදුරටත් එකිනෙකාට විරුද්-
ධව කඩු ඔසවන්නේවත් යුද්ධයට

**3 පරි.**
**1** යෙසා 3:15
**2** ද්වි 31:17; හිතෝ 1:28; යෙසා 1:15; යෙරෙ 33:5; විලා 3:44; යොහ 9:31
**3** යෙසා 3:11; රෝම 2:8
**4** යෙරෙ 23:17; එස 13:10
**5** ගීතා 55:3; ගීතා 120:7; ගීතා 140:2
**6** යෙසා 9:16; යෙසා 56:10; එස 13:10; එස 13:19; එස 34:2; මතෙ 7:15; මතෙ 15:14; රෝම 16:18
**7** යෙසා 8:20; යෙරෙ 13:16
**8** ගීතා 74:9; එස 13:23
**9** යෙසා 59:10; ආමො 8:9
**10** 1සාමු 9:9; යෙසා 29:10
**11** සෙක 13:4
**12** යෙසා 44:25
**13** 1සාමු 28:6
**14** එස 24:17
**15** යෙසා 58:1; මතෙ 3:7; ක්‍රියා 7:51
**16** යෙසා 11:2; සෙක 4:6; ක්‍රියා 4:8; 1කොරි 2:4
**17** මීකා 3:1
**18** ලෙවී 26:15; ද්වි 27:19; යෙරෙ 5:28
**19** යෙරෙ 22:13; හබ 2:9; හබ 2:12
**20** 1සාමු 8:3; යෙසා 1:23; යෙසා 5:23; එස 22:12

**2 තීරුව**
**1** යෙසා 56:11; යෙරෙ 6:13; තීත 1:11; යූද් 11
**2** යෙසා 48:2; යෙරෙ 7:4; රෝම 2:17
**3** ආමො 9:10
**4** ගීතා 79:1; යෙරෙ 26:18; මීකා 1:6; මතෙ 24:2

**4 පරි.** **5** යෙසා 2:2; දානි 12:9; ක්‍රියා 2:17; **6** 1පේතෘ 2:5; **7** යෙසා 11:9; සෙක 8:3; එළි 21:10; **8** යෙසා 2:2; **9** ගීතා 86:9; යෙසා 60:3; එළි 15:4; **10** එළි 22:17; **11** යෙසා 2:3; යෙරෙ 31:6; සෙක 8:20; **12** ද්වි 6:1; ගීතා 25:9; යොහ 6:45; **13** හිතෝ 3:6; යෙසා 2:3; හෙබ්‍රෙ 12:13; **14** ගීතා 128:5; **15** 1සාමු 2:10; ගීතා 96:13; යෙසා 51:4; යෙසා 51:5; **16** යෙසා 60:12; **17** 2තිමෝ 3:16; **18** හොෂෙ 2:18; සෙක 9:10.

පුහුණු වන්නේවත් නැත.[1] 4 ඔවුහු
එක් එක් කෙනා තම තමාගේ මිදිවැල
යටද අත්තික්කා ගස යටද සුව සේ
කල් ගෙවනු ඇත.[2] කිසිවෙක් ඔවුන්ව
බියගන්වන්නේ නැත.[3] මේ සෑම දෙ-
යක්ම පොරොන්දු වී ඇත්තේ ස්වර්-
ගයේ සේනාවල අධිපතියාණන් වන
යෙහෝවා දෙවිය.[4]
5 අන් අය තම තමන්ගේ දෙ-
විවරුන්ගේ කැමැත්තට අනුව ජීවත්
වුණත්[5] අපි සදහටම[6] අපේ දෙවි වන
යෙහෝවාගේ නාමය දරමින් ඔහුගේ
කැමැත්තට එකඟව ජීවත් වෙමු.[7]
6 යෙහෝවා දෙවි මෙසේ පව-
සයි. "ඒ කාලයේදී, මගෙන් දඬු-
වම් ලැබ කොරගසමින් සිටි ජනයාව[8]
මම නැවත එක් රැස් කරන්නෙමි.[9]
විසිර ගිය ඒ සෙනඟ මම එක් රැස්
කරන්නෙමි. 7 කොරගසමින් සිටි
ඔවුන්ගෙන් ඉතුරු වන අයව මම ගල-
වාගන්නෙමි.[10] ඈත දේශයකට ගෙන
ගිය ඔවුන්ව මම බලවත් ජාතියක්
බවට පත් කරන්නෙමි.[11] යෙහෝවා
දෙවි වන මම මෙතැන් පටන් සදහටම
සියොන් කන්දේ සිට ඔවුන් කෙරෙහි
රජකම් කරන්නෙමි.[12]
8 "සෙනඟට මුරපොළක් මෙන් වූ
සියොන් කන්ද![13] ඔබව පාලනය කිරී-
මට රජෙක් පැමිණෙනු ඇත.[14]
ඔහු යෙරුසලම මුලින්ම පාලනය
කළ රාජකීය පෙළපතට අයත් කෙ-
නෙකි.[15]
9 "ඔබ මහත් හඬින් මොරගසන්-
නේ ඇයි?[16] ප්‍රසූත වේදනා විඳින ස්ත්‍රි-
යක මෙන්[17] ඔබ මහත් වේදනාවෙන්
කෑගසන්නේ ඔබව පාලනය කරන්න
රජෙකු නැති නිසාද? එසේත් නැත්-
නම් ඔබට උපදෙස් දෙන තැනැත්තා
මිය ගොස් ඇති නිසාද? 10 සියොන්
දියණිය, බොහෝ වේදනා විඳිමින්,
මහත් ආයාසයක් දරා දරුවෙකු බිහි
කරන ස්ත්‍රියක මෙන් ඔබත් පීඩා-
කාරී තත්වයකට මුහුණ දෙනු ඇත.[18]
ඔබට නුවරෙන් පිට වී එළිමහනේ
ජීවත් වීමට සිදු වෙයි.[19] බැබිලෝනිය
දක්වාම[20] ඔබට යන්න සිදු වෙයි. එහිදී
ඔබේ සතුරන්ගේ අතින්[1] යෙහෝවා
දෙවි වන මම ඔබව මුදවාගන්නෙමි.[2]
11 "බොහෝ ජාතීහු ඔබට විරුද්-
ධව එක් රැස් වනු ඇත. 'සියොන් දූෂ්‍ය
වී, නැති නාස්ති වී යන හැටි අපේ
ඇස් දෙකෙන්ම දැකගන්න ලැබේවා'[3]
කියා ඔවුහු කියති. 12 නමුත් ඔවුහු
යෙහෝවා දෙවි වන මාගේ සිතුවිලි
නොදන්නෝය. මාගේ අරමුණ තේ-
රුම් නොගන්නෝය.[4] කමතට ගෙන
යනු ලබන අලුතෙන් කැපූ ධාන්‍ය
කරල් මෙන් පාගා පොඩි කර දැමීමට
මම ඔවුන්ව එක් රැස් කරන්නෙමි.[5]
13 "සියොන් දියණිය, නැඟිට
කරල් පාගන්න.[6] ඔබට බොහෝ
ජාතීන්ව පොඩි කර දමන්න හැකි වන
පිණිස[7] මම ඔබට යකඩ අංද තඹ
කුරද දෙන්නෙමි. ඔවුන් අයුතු ලෙස
උදුරාගත් වටිනා දේවල්ද ඔවුන්ට
අයිති වස්තුද ඔබ රැගෙන,[8] මුළු පො-
ළොවටම අධිපති වූ යෙහෝවා දෙවි
වන මට කැප කරන්නෙහිය."[9]

5 "සතුරාගේ ආක්‍රමණයට හසු වූ
ජනයෙනි, ඔබ ඔබේ ශරීර කපා
තුවාල කරගනු ඇත.[10] සතුරා ඔබව
වටලාගෙන ඇත.[11] ඔහු ඊශ්‍රායෙල්හි
විනිශ්චයකරුගේ කම්මුලට සැරයටි-
යෙන් පහර දෙන්නේය.[12]
2 "'යූදාහි නගර අතරින් කුඩාම
නගරය[13] වන බෙත්ලෙහෙම් එෆ්‍රා-
තා![14] ඊශ්‍රායෙල් පාලනය කිරීමට
නියමිත තැනැත්තා[15] පැමිණෙන්නේ
ඔබගෙන්ය.[16] ඔහු පාලනය කරන්-
නේ මාගේ කැමැත්තට අනුවය.
ඔහුගේ පටන්ගැන්ම ඈත අතීතයට
දිව යයි.'[17]
3 "ගැබිනි ස්ත්‍රිය දරුවා වදන
තුරු[18] දෙවි ඔවුන්ව සතුරාගේ අතට
භාර දුන්නේය.[19] පසු කලෙක, එම
පාලකයාගේ සහෝදරයන්ගෙන් බේරී

**4 පරි.**
1 ගීතා 72:7, යෙසා 2:4, යෙසා 9:7, යෙසා 60:18, මතෙ 26:52, එෆී 6:12
2 1රාජා 4:25, සෙක 3:10
3 යෙසා 54:14, එස 34:25, එස 39:26
4 යෙසා 55:11
5 2රාජා 17:29, යෙරෙ 2:11
6 නික් 3:15, ගීතා 48:14, ගීතා 145:1
7 සෙක 10:12
8 එස 34:16, ශෙප 3:19, හෙබ්‍රෙ 12:12
9 ගීතා 147:2, යෙසා 56:8, එස 34:12, එස 37:21
10 යෙසා 10:21, මීකා 2:12, මීකා 7:18, රෝම 9:27, රෝම 11:5
11 යෙසා 60:22
12 ගීතා 50:2, යෙරෙ 10:10
13 2සාමු 5:7, යෙසා 10:32
14 ඔබ 21
15 සෙක 9:9, යොහ 12:15
16 යෙරෙ 8:19
17 ගීතා 48:6, යෙසා 21:3, යෙරෙ 30:6
18 හොෂෙ 13:13
19 හොෂෙ 2:14
20 2රාජා 20:18, 2ලේක 36:20

**2 තීරුව**
1 ගීතා 106:10, ගීතා 107:2, යෙසා 48:20, යෙරෙ 15:21
2 යෙසා 45:13, සෙක 2:7
3 විලා 2:16, ඔබ 12, මීකා 7:10
4 යෙසා 55:8, යෙරෙ 29:11, රෝම 11:33
5 යෙසා 21:10, ලූක් 3:17
6 යෙසා 41:15, යෙරෙ 51:33
7 සෙක 9:13
8 යොෂු 6:19, 2සාමු 8:11, යෙසා 18:7, යෙසා 23:18
9 සෙක 4:14, සෙක 6:5

**5 පරි.** **10** යෙරෙ 41:5; යෙරෙ 48:37; **11** ද්වි 28:52; 2රාජා 25:1; ලූක් 19:43; **12** මතෙ 26:31; මතෙ 26:67; මතෙ 27:30; මාක් 14:27; යොහ 18:22; යොහ 19:3; **13** 1සාමු 23:23; **14** උත් 35:19; ලූක් 2:4; **15** උත් 49:10; 1ලේක 5:2; යෙසා 9:6; මතෙ 2:6; ලූක් 1:32; **16** ලූක් 2:11; යොහ 7:42; **17** හිතෝ 8:22; යොහ 1:1; යොහ 8:58; කොලො 1:17; එළි 3:14; **18** යෙසා 66:8; **19** 1රාජා 14:16.

ඉතුරු වන අය නැවත තම මව්බිම
වෙතට හැරී එන්නෝය.
**4** “තම දෙවි වන යෙහෝවාගේ
ශ්‍රේෂ්ඨ නාමය දරමින් පැමිණෙන
ඒ තැනැත්තා යෙහෝවා දෙවි දෙන
ශක්තියෙන්[1] සෙනඟව රැකබලා ගන්-
නේය.[2] ඔහුගේ පාලනය පොළොවේ
දසත පැතිරෙන නිසා[3] සෙනඟ බියක්
සැකක් නොමැතිව සුව සේ ජීවත්
වනු ඇත.[4] **5** සාමය උදා කර දෙන්-
නේ ඔහුය.[5] ඇසිරියානු ජාතිකයන්
අපේ දේශයට ඇවිත් අපේ බලකොටු
ආක්‍රමණය කරද්දී,[6] අපේ සෙනඟ
අතරින් ඔවුන්ට විරුද්ධව නැඟී සිටී-
මට අපි එඬේරුන් සත්දෙනෙකුව පත්
කරන්නෙමු. අධිපතීන් අටදෙනෙකුව
පත් කරන්නෙමු. **6** ඔවුහු ඇසිරියා-
වට කඩුවෙන් පහර දෙන්නෝය.[7]
නිම්රොද්ගේ දේශයටද[8] ඇතුල් වී එහි
වැසියන්ට පහර දෙන්නෝය. ඇසිරි-
යානු ජාතිකයන් අපේ දේශයට පා
තබන විට ඔහු ඔවුන්ගෙන් අපව ගල-
වාගනු ඇත.[9]
**7** “යාකොබ්ගේ පෙළපතෙන් ඉතුරු
වන අය,[10] බොහෝ ජනයා අත-
රේ යෙහෝවා දෙවි වෙතින් නික්මෙන
පිනි මෙන්ද[11] කඩා හැළෙන වර්ෂාව
මෙන්ද වන්නෝය.[12] ඔවුහු කිසිම මිනි-
සෙකු මත රඳා පවතින්නේවත් බලා-
පොරොත්තු තබන්නේවත් නැත.[13]
**8** යාකොබ්ගේ පෙළපතෙන් ඉතුරු
වන අය, වනසතුන් අතරේ සැරිසරන
සිංහයෙකු මෙන් බොහෝ ජාතීන් අත-
රේ වැජඹෙන්නෝය. ඔවුහු බැටළු රැළ-
වල් අතරට ගොස් උන් පිටට කඩා
පැන කෑලි කෑලිවලට ඉරා දමන කේ-
ශර සිංහයෙකු මෙන් ක්‍රියා කරන්-
නෝය.[14] ඔවුන්ගේ අතට හසු වන
අයව බේරාගැනීමට කිසිවෙකුට නො-
හැක. **9** ඔවුහු තමුන්ගේ සතුරන්ව
පරාජය කරන්නෝය.[15] ඔවුන්ට විරුද්-
ධව නැඟී සිටින සියලුදෙනාව විනාශ
කරනු ලබන්නෝය.”[16]
**10** යෙහෝවා දෙවි මෙසේ පව-
සයි. “ඒ දවසේදී මම ඔබේ අශ්වයන්
හා අශ්ව රථ විනාශ කර දමන්-
නෙමි.[1] **11** ඔබේ රටේ නගර සුනු-
විසුනු කර ඔබේ සියලු බලකොටු
බිමට සමතලා කර දමන්නෙමි.[2]
**12** මන්ත්‍ර ගුරුකම් කරන සියල්ලන්-
වම මම විනාශ කර දමන්නෙමි. මින්
මතුවට එක මායාකාරයෙක්වත් ඔබේ
දේශයේ දක්නට ලැබෙන්නේ නැත.[3]
**13** ඔබේ දේවතා රූපද නමස්කාරය
සඳහා සෑදූ කණුද මම කඩා දමන්-
නෙමි. මින් මතුවට ඔබේ අත්ව-
ලින් සෑදූ කිසිම දෙයකට ඔබ වැඳ
වැටෙන්නේ නැත.[4] **14** නමස්කාරය
සඳහා ඔබ සාදාගත් කුලුනු ගලවා
දමා[5] ඔබේ නගර සියල්ල මම විනාශ
කරන්නෙමි. **15** මම ඇවෙන උදහ-
සින් යුක්තව මට අකීකරු වූ සියලු
ජාතීන්ට දඬුවම් කරන්නෙමි.”[6]

**6** ජනයෙනි, දැන් යෙහෝවා දෙවි
පවසන දේට සවන් දෙන්න.[7]
නැඟිට, කඳු වෙතට ගොස් ඔබේ චෝ-
දනාව ඉදිරිපත් කරන්න. හෙල් ඉදිරි-
යේ ඔබේ හඬ නඟන්න.[8] **2** කඳුද
ඈත අතීතයේ සිට තිබුණාවූ පොළො-
වේ ස්ථිර අත්තිවාරම්ද[9] යෙහෝවා
දෙවිගේ නඩුවට සවන් දෙන්න. මන්ද
යෙහෝවා දෙවිට තමන්ගේ සෙනඟට
විරුද්ධව නඩුවක් තිබේ. ඔහු ඊශ්‍රා-
යෙල්වරුන්ට විරුද්ධව කරන චෝද-
නාව මෙයයි.[10]
**3** “අනේ මාගේ සෙනඟෙනි,[11] මා
ඔබට විරුද්ධව කිසිවක් කර ඇද්ද?
ඔබව වෙහෙසට පත් කර ඇද්ද?[12]
මා එසේ කර ඇත්නම් මට විරුද්-
ධව සාක්ෂි දෙන්න.[13] **4** මම ඔබව
ඊජිප්තු දේශයෙන් පිටතට ගෙනා-
වෙමි.[14] ඔබ වහලුන් ලෙස සිටි ඒ දේ-
ශයෙන් මම ඔබව මුදවාගත්තෙමි.[15]
මම ඔබට මඟ පෙන්වන්න මෝසෙස්,
ආරොන් සහ මිරියම්ව එව්වෙමි.[16]
**5** මාගේ සෙනඟෙනි, මෝවබ් දේශ-
යේ රජු වූ බාලාක් කළ කුමන්ත්‍රණ-

**5 පරි.**
**1** ගීතා 93:1
එස 37:24
**2** යෙසා 49:9
එස 34:23
මීකා 7:14
යොහ 10:11
**3** ගීතා 72:8
සෙක 9:10
ලූක් 1:33
එළි 11:15
**4** යෙසා 32:18
යෙරෙ 23:6
**5** ගීතා 72:7
යෙසා 9:6
ලූක් 2:14
**6** යෙසා 8:7
**7** යෙසා 14:2
යෙසා 33:1
**8** උත් 10:9
උත් 10:11
**9** යෙසා 14:25
ලූක් 1:71
**10** එස 14:22
යෝවෙ 2:32
මීකා 4:7
රෝම 11:5
**11** ද්වි 32:2
ගීතා 110:3
**12** ගීතා 72:6
යෙසා 44:3
1කොරි 3:6
**13** යෙරෙ 14:22
**14** යෙසා 41:15
සෙක 10:5
**15** ගීතා 21:8
යෙසා 26:11
**16** ලූක් 19:27

**2 තීරුව**
**1** ගීතා 20:7
ගීතා 33:16
හොෂෙ 1:7
හොෂෙ 14:3
සෙක 9:10
**2** යෙසා 2:15
**3** ද්වි 18:10
යෙසා 2:6
යෙසා 8:19
එළි 22:15
**4** යෙසා 2:8
යෙසා 17:8
එස 36:25
හොෂෙ 14:3
සෙක 13:2
**5** යෙසා 27:9
**6** ගීතා 149:7
2තෙස 1:8

**6 පරි.**
**7** යෙරෙ 13:15
හෙබ්‍රෙ 1:1
**8** ගීතා 50:4
යෙසා 5:3
එස 36:1
**9** ද්වි 32:22
ගීතා 50:1
හිතෝ 8:29
යෙසා 1:2
යෙරෙ 31:37

**10** යෙසා 43:26; යෙරෙ 2:35; හොෂෙ 4:1; **11** ගීතා 81:8; **12** යෙරෙ 2:5; **13** යෙසා 43:9; රෝම 3:4; **14** නික් 12:51; ද්වි 4:20; ක්‍රියා 7:36; **15** ද්වි 7:8; 2සාමු 7:23; **16** නික් 15:20; ගණන් 12:1.

යත්[1] බෙයෝර්ගේ පුත් බාලාම් ඔහුට
පිළිතුරු දුන් ආකාරයත්[2] මතකයට
නඟන්න.[3] ෂිට්ටිම්[4] සිට ගිල්ගාල්[5]
නගරය දක්වාම සිදු වූ සියල්ල ඔබට
මතක නැද්ද? ඒ සෑම දෙයක්ම සිදු
වුණේ යෙහෝවා දෙවි වන මාගේ ධර්-
මිෂ්ඨ ක්‍රියා ප්‍රකාශ වන පිණිසය."[6]

**6** මා යෙහෝවා දෙවි වෙතට
රැගෙන යන්නේ කුමක්ද?[7] ස්වර්ගයේ
වසන දෙවි ඉදිරියට ගොස් නමස්-
කාර කරද්දී ඔහුට දෙන්නේ කුමක්ද?[8]
මා ඔහුට දවන පූජා ඔප්පු කරන්-
නද?[9] ඔහු ඉදිරියට අවුරුද්දක් වය-
සැති වස්සන්ව රැගෙන යන්නද?
**7** යෙහෝවා දෙවිට බැටළුවන් දහස්
ගණනක් දුන්නොත් ගංගා දසදහස්
ගණනක් තරම් විශාල තෙල් ප්‍රමා-
ණයක් ඔප්පු කළොත් ඔහු ඒ ගැන
සතුටු වෙයිද?[10] මා දෙවිට විරුද්-
ධව කැරලිගසා පව් කළ පසු මගේම
ලේවලින් උපන් මගේ කුලුඳුල් පුත්‍ර-
යාව කැප කළොත් ඔහු සෑහීමට
පත් වෙයිද?[11] **8** මනුෂ්‍යයෙනි, යහ-
පත් දේ කුමක්ද කියා දෙවි ඔබට
පැහැදිලිව කියා දී තිබේ.[12] සාධාර-
ණව ක්‍රියා කරන්න.[13] ප්‍රේමයෙන්
කටයුතු කරන්න.*[14] ඔබේ දෙවි ඉදි-
රියේ[15] නිහතමානීව හැසිරෙන්න.[16]
යෙහෝවා දෙවි ඔබෙන් බලාපො-
රොත්තු වන්නේ ඒ දේවල් මිස වෙන
කිසිවක් නොවෙයි.

**9** යෙහෝවා දෙවි නුවරේ වැසි-
යන්ට හඬගසන්නේය.[17] එවිට ප්‍රඥා-
වන්ත තැනැත්තා දෙවිගේ නාමය
කෙරෙහි ගරුබිය පෙන්වනු ඇත.[18]
ජනයෙනි, දඬුවමට* අවනත වී ඒ
දඬුවම නියම කළේ කවුද කියා
සිතට ගන්න.[19] **10** දුෂ්ටකමින් උප-
යාගත් වස්තු තවමත් දුෂ්ටයාගේ
නිවස තුළ තිබේද?[20] ඔහු තවමත්
භාවිත කරන්නේ දෙවි පිළිකුල් කරන
හොර ඒපා මිනුම්ද?* **11** අවංක පුද්-
ගලයෙක් හොර තරාදි සහ හොර
මිනුම් පඩි* මල්ලක් ළඟ තබාගෙන
වෙළඳාම් කරයිද?[1] **12** ඒ නගරයේ
ජීවත් වන ධනවතුන් බලහත්කාරකම්
කරති. එහි වැසියෝ බොරු කියති.[2]
ඔවුන්ගේ කතා රැවටිලිකාරය.[3]

**13** "ඔබ කළ පාප නිසා මම ඔබට
පහර දෙන්නෙමි.[4] ඔබ ලෙඩ වී බො-
හෝ වේදනා විඳින්නහුය.[5] **14** ඒ
කාලයේදී ඔබ කෑම කැවත් තෘප්ති-
යට පත් වන්නේ නැත. ඔබේ බඩ-
ගින්න නිවාගැනීමට නොහැකි වනු
ඇත.[6] ඔබේ වස්තුව සඟවන්න උත්-
සාහ කළද ඔබට ඒවා අහිමි වනු
ඇත. ආරක්ෂා සහිතව සඟවා තබන
වස්තුව පවා මම ඔබේ සතුරන්-
ගේ අතට පත් කරන්නෙමි.[7] **15** ඔබ
බීජ වැපුරුවත් ඔබට අස්වැන්න නෙ-
ළාගන්න ලැබෙන්නේ නැත. ඔලීව
ගෙඩි තැලුවද ඒ තෙල් ඔබේ සිරුරේ
ගල්වන්න ලැබෙන්නේ නැත. අලුත්
වයින් සෑදුවද ඔබට එය බොන්න
ලැබෙන්නේ නැත.[8] **16** ඔබ ඔම්රී[9]
රජු පැනවූ නියෝගද ආහබ් රජුගේ
පෙළපතේ අය කළ සියලු ක්‍රියාද අනු-
ගමනය කරන්නහුය.[10] ඔබ පිළිපදින්-
නේ ඔවුන්ගේ ප්‍රතිපත්තිය.[11] එබැවින්
මම ඔබට මේ දේ නියම කරන්නෙමි.
ඔබට සිදු වන විපත දැක සෙනඟ පුදු-
මයට පත් වෙති. ඔබේ නගරයේ වැසි-
යෝ අන් අය ඉදිරියේ නින්දාවට ලක්
වෙති.[12] ඔබද අන්‍යයන්ගේ සමච්චල-
යට පාත්‍ර වන්නහුය."[13]

**7** අනේ මා වැනි කාලකණ්ණි මිනි-
සෙක්![14] මා, අස්වැන්න* නෙළූ
පසුත් මිදිපල නෙළූ පසුත් ඉතුරු වී

**6 පරි.**
**1** ගණන් 22:5
යොෂු 24:9
**2** ගණන් 23:7
ගණන් 24:10
යොෂු 24:10
2පේතෘ 2:15
එළි 2:14
**3** ද්වි 9:7
එෆි 2:11
**4** ගණන් 25:1
ගණන් 33:49
**5** යොෂු 4:19
**6** විනි 5:11
ගීතා 71:15
රෝම 3:25
**7** ගීතා 50:12
ක්‍රියා 17:25
**8** ගීතා 95:6
එෆි 3:14
**9** 1සාමු 15:22
ගීතා 50:8
ගීතා 51:16
යෙසා 1:11
යෙසා 40:16
හොෂෙ 6:6
**10** ගීතා 50:10
ගීතා 51:16
එස 16:18
**11** 2රාජා 3:27
ගීතා 49:7
එස 16:20
**12** ගීතා 119:72
**13** ද්වි 10:12
හිතෝ 21:3
යෙසා 1:17
යෙරෙ 22:3
එස 45:9
හොෂෙ 12:6
**14** හිතෝ 3:3
හිතෝ 19:22
හොෂෙ 6:6
සෙක 7:9
එෆි 4:32
කොලො 3:12
**15** උත් 6:9
ගලා 5:22
**16** හිතෝ 8:13
ලූක් 18:13
යාකො 4:6
**17** ශෙප 3:2
**18** නෙහෙ 1:11
හිතෝ 9:10
ලූක් 1:17
**19** යෙසා 9:13
**20** යොෂු 7:1
2රාජා 5:23
හිතෝ 10:2
ආමො 3:10
යාකො 5:3

**2 තීරුව**
**1** ද්වි 25:13
හිතෝ 11:1
හිතෝ 20:10
හොෂෙ 12:7
**2** යෙසා 59:3
මීකා 7:2
**3** යෙරෙ 9:3
**4** ලෙවී 26:16; ද්වි 28:21; යෙසා 1:5; ක්‍රියා 12:23; **5** යෙරෙ 18:16; **6** ලෙවී 26:26; එස 4:16; හොෂෙ 4:10; **7** යෙසා 24:17; එස 5:12; **8** ද්වි 28:38; යෙරෙ 12:13; යෝවෙ 1:10; ආමො 5:11; හග් 1:6; **9** 1රාජා 16:25; **10** 1රාජා 16:30; 2රාජා 16:3; 2රාජා 21:3; **11** යෙසා 30:1; යෙරෙ 7:24; **12** යෙරෙ 18:16; යෙරෙ 19:8; **13** ගීතා 44:13; යෙරෙ 51:51; විලා 5:1; දානි 9:16; **7 පරි.** **14** යෙරෙ 4:31; යෙරෙ 45:3.

**මීකා 6:8*** හෝ, "ළැදි ප්‍රේමය." **9*** මූ.අ., "වේ-වැලට." **10*** නික් 16:36හි පාදසටහන බලන්න.

**මීකා 6:11*** හිතෝ 11:1හි පාදසටහන බලන්න. **7:1*** මූ.අ., "ගිම්හාන පලතුරු අස්වැන්න. මෙය විශේෂයෙන්ම යොමු දක්වන්නේ අත්තික්කාවලටය. සමහරවිට රටඉඳිත් ඊට ඇතුළත් විය හැකියි."

තිබෙන පලතුරු සොයා යන
මිනිසෙකු වැනිය.[1] එක මිදිපොකු-
රක්වත් දිව පිනවන එක අත්-
තික්කා ගෙඩියක්වත් මට කන්න
ඉතුරු වී නැත![2] **2** දෙවිට විශ්-
වාසවන්තව සිටින එක් මිනිසෙකු-
වත් මිහිපිට සොයාගත නොහැකිය.
එක ධර්මිෂ්ඨ මිනිසෙක්වත් නැත.[3]
සියලුදෙනා මාන බලන්නේ ලේ වගු-
රුවන්නයි.[4] ඔවුහු තමන්ගේම සහෝ-
දරයන්ට පවා උගුල් අටවන්නෝය.*[5]
**3** ඔවුහු නපුරු දේ කිරීමට දක්ෂ-
යෝය.[6] පාලකයෝ අල්ලස් ගනිති.
විනිශ්චයකරුවන් තීන්දු දෙන්නේ
තමන්ට ලැබෙන මුදලට අනුවය.[7]
බලවන්තයෝ තම සිතේ ආශාව
පැවසූ පමණින් එය ඉටු කරගනිති.[8] ඒ
සියල්ලෝ එක්ව කුමන්ත්‍රණය කරති.
**4** ඔවුන් අතරේ සිටින හොඳම අය
වුවද කටු පඳුරු හා සමානය. ඔවුන්
අතරේ සිටින අවංකම තැනැත්තා
කටු වැටකටත් වඩා දරුණුය.[9] නමුත්
ඔබේ මුරකරුවන් අනතුරු ඇඟවූ ලෙ-
සම සිදු වන්නේය. ඔවුන්ගේ දුෂ්ටකම්-
වලට ගණන් දිය යුතු දවස පැමිණෙන
බව නියතය.[10] ඒ දවසේදී ඔවුහු සියල්-
ලෝම වියවුලට පත් වන්නෝය.[11]

**5** ඔබේ මිත්‍රයන්ව විශ්වාස නො-
කරන්න. ඔබේ කිට්ටුම මිත්‍රයාවවත්
විශ්වාස නොකරන්න.[12] ඔබේ ළයේ
සැතපෙන තැනැත්තියට පවා ඔබ
කියන දේ ගැන පරෙස්සම් වන්න.[13]
**6** මන්ද පුත්‍රයා තම පියාව හෙළාද-
කින්නේය. දුව ඇගේ මවට විරුද්-
ධවද[14] ලේලිය ඇගේ නැන්දම්මාට
විරුද්ධවද[15] කටයුතු කරන්නීය. මිනි-
සෙකුගේ සතුරෝ නම් ඔහුගේම පවු-
ලේ සාමාජිකයන්ය.[16]

**7** එහෙත් මා බලාපොරොත්තු
තබන්නේ යෙහෝවා දෙවි කෙරෙ-
හිය.[17] මට ගැලවීම දෙන දෙවි ක්‍රියා
කරන තුරු මම ඉවසිල්ලෙන් බලා
සිටින්නෙමි.[18] මාගේ දෙවි මට සවන්
දෙන බව මට විශ්වාසය.[19]

**8** මට සතුරුකම් කරන තැනැත්-
තිය, මට සිදු වූ විපත ගැන ප්‍රීති නො-
වන්න.[1] මම දැන් වැටී සිටියද නැවත
නැඟිටින්නෙමි.[2] දැන් මා අන්ධකාර-
යේ සිටියද[3] ඉදිරියේදී යෙහෝවා දෙවි-
ගෙන් මට ආලෝකය ලැබෙනු ඇත.[4]
**9** දෙවි මා වෙනුවෙන් නැඟී සිට මට
සාධාරණය ඉටු කරන තුරු[5] මම
යෙහෝවා දෙවිගේ උදහස ඉවසන්-
නෙමි. මන්ද මම දෙවිට විරුද්ධව පව්
කළෙමි.[6] ඔහු මාව අන්ධකාරයෙන්
ආලෝකයට ගෙන එයි. එවිට ඔහුගේ
ධර්මිෂ්ඨකම පැහැදිලිව දැකගැනීමට
මට හැකි වනු ඇත.[7] **10** මට සතු-
රුකම් කරමින්, "ඔබේ දෙවි යෙහෝවා
කොහේද"[8] කියා මට සමච්චල් කළ
ස්ත්‍රිය ඒ දවසේදී ලැජ්ජාවට පත් වන්-
නීය.[9] ඇය මිනිසුන්ගේ පයට පෑගෙන
මඩ මෙන් වන්නීය.[10] ඇයට සිදු වන
දේ මට දැකගන්න ලැබෙයි.[11]

**11** ඔබේ පවුරු ගොඩනඟන දව-
සේදී ඔබට විරුද්ධව දුන් නියෝගය
අවලංගු වනු ඇත.*[12] **12** ඒ දවසේදී,
ජනයා ඇසිරියාවේ සිටද ඊජිප්තුවේ
නගරවල සිටද ඔබ ළඟට පැමිණෙන්-
නෝය. ඊජිප්තුවේ සිට මහ ගඟ*[13]
දක්වාද එක මුහුදක සිට තවත් මුහුදක්
දක්වාද එක කන්දක සිට තවත් කන්-
දක් දක්වාද[14] ජීවත් වන ජනයා ඔබ
ළඟට පැමිණෙනු ඇත. **13** එහෙත්
මේ දේශයේ වැසියන් කරන දේවල්
නිසා දේශය පාළු වී යයි.[15]

**14** දෙවියනි, වනාන්තරයක පිහිටි
පලතුරු උයනක් මැද[16] තනිව වාසය
කරන බැටළු රැළක් මෙන් වූ ඔබේ
සෙනඟව රැකබලා ගන්න. ඔවුන්ට
ඔබේ සැරයටියෙන් මඟ පෙන්වන්න.[17]

**7 පරි.**
**1** යෙසා 17:6
යෙසා 24:13
යෙරෙ 6:9
**2** යෙසා 28:4
හොෂෙ 9:10
**3** ගීතා 12:1
ගීතා 14:1
යෙසා 57:1
රෝම 3:10
**4** හිතෝ 1:11
හිතෝ 1:16
යෙසා 59:7
රෝම 3:15
**5** 1සාමු 24:11
ගීතා 57:6
හබ 1:15
**6** හිතෝ 4:16
යෙරෙ 3:5
යෙරෙ 4:22
එස 22:6
**7** යෙසා 1:23
හොෂෙ 4:18
මීකා 3:11
**8** 1රාජා 21:5
**9** 2සාමු 23:6
එස 2:6
**10** යෙසා 10:3
එස 12:23
හොෂෙ 9:7
**11** යෙසා 22:5
ලූක් 21:25
**12** යෝබ් 6:15
ගීතා 118:8
යෙරෙ 9:4
ලූක් 21:16
**13** විනි 16:18
**14** හිතෝ 30:11
එස 22:7
මතෙ 10:21
ලූක් 21:16
**15** ලූක් 12:53
2තිමෝ 3:2
**16** ගීතා 41:9
යෙරෙ 12:6
මතෙ 10:36
යොහ 13:18
**17** ගීතා 34:5
ගීතා 123:2
යෙසා 8:17
**18** උත් 49:18
ගීතා 25:5
ගීතා 62:1
විලා 3:26
ලූක් 2:25
**19** ගීතා 4:3
ගීතා 40:1
ගීතා 65:2
යෙසා 12:2
යෙසා 25:9
1යොහ 5:14

**2 තීරුව**
**1** එස 25:6
එළි 11:10
**2** ගීතා 37:24
හිතෝ 24:16
**3** ගීතා 107:10
**4** ගීතා 27:1
ලූක් 1:78
2කොරි 4:6

**5** 1සාමු 24:15; එළි 18:20; **6** විලා 1:18; ලූක් 15:18; **7** ගීතා 37:6; 1කොරි 4:5; 2තෙස 1:10; **8** ගීතා 42:3; ගීතා 79:10; ගීතා 115:2; දානි 3:15; යෝවෙ 2:17; මතෙ 27:43; **9** ගීතා 35:26; **10** 2සාමු 22:43; **11** ගීතා 58:10; **12** නෙහෙ 2:17; **13** උත් 15:18; **14** යෙසා 11:16; යෙසා 27:13; හොෂෙ 11:11; **15** ලෙවී 26:33; යෙරෙ 21:14; යෙරෙ 25:11; ලූක් 21:24; ගලා 6:7; **16** යෙසා 37:24; **17** ගීතා 23:1; ගීතා 28:9; යෙසා 40:11; යොහ 10:27.

**මීකා 7:2*** මූ.අ., "ඇලක් එළන්නෝය."

**මීකා 7:11*** මූ.අ., "නියෝගය දුරස්ව තිබේ."
**12*** එනම්, යුප්‍රටීස් ගඟ.

අතීතයේදී මෙන්[1] බාෂාන් දේශයේදී
හා ගිලියද් දේශයේදී ඔවුන්ව පෝෂ-
ණය කරන්න.[2]
15 “ඔවුන් ඊජිප්තු දේශයෙන්
පිටත්ව ආ කාලයේදී කළාක් මෙන්
මම ඇනුදු ඔවුන් වෙනුවෙන් පුදුම
දනවන ක්‍රියා කරන්නෙමි.[3] 16 බල-
වත් ජාතීහු පවා ඒ පුදුම දනවන
දේවල් දැක ලැජ්ජාවට පත් වෙති.[4]
ඔවුහු තම අත්වලින් කට වසා-
ගන්නෝය.[5] ඔවුන්ගේ කන් බිහිරි
වනු ඇත. 17 සර්පයන් මෙන් ඔවුහු
දූවිලි කන්නෝය.[6] උරගයන් භයෙන්
තම සුරක්ෂිත ස්ථානවලින් පිටතට
නික්ම එන්නාක් මෙන් ඔවුහු වෙවු-
ලමින් එන්නෝය.[7] ‘අපේ දෙවි වන
යෙහෝවා වෙතට ඔවුහු භයෙන් වෙ-
වුලමින් එන්නෝය.’ ”[8]
18 දෙවියනි, ඔබ වැනි දෙවි කෙ-
නෙක් තවත් සිටියිද?[9] ඔබ වරදට
සමාව දෙන්නෙහිය. ඔබේ උරුමය
වන ඔබේ සෙනඟගෙන් ඉතුරු වූ අය-
ගේ[1] වැරදි අමතක කර දමන්නෙහිය.[2]
ඔබ ප්‍රේමයට* ප්‍රිය කරන[3] නිසා ඔබ
සැමදා කෝපය සිතේ තබාගන්නේ
නැත. 19 ඔබ නැවත අපට දයාව
පෙන්වා[4] අපේ පාපවලින් ජය ගන්න
අපට උදව් කරන්නෙහිය.[5] ඔබ අපේ
සියලු පාප මුහුදු පත්ලටම හෙළන්-
නෙහිය.[6] 20 ඔබ අතීතයේ අපේ
මුතුන්මිත්තන්ට දිවුරා පොරොන්දු වූ
ලෙස ආබ්‍රහම්ට පෙන්වූ මහත් ප්‍රේමය*
හා යාකොබ්ට දැක්වූ විශ්වාසවන්ත-
කම දැන් අපටත් පෙන්වන්නෙහිය.[7]

**7 පරි.**
1 මලා 3:4
2 යෙරෙ 50:19 එස 34:23
3 ගීතා 78:12 යෙසා 63:11 යෙරෙ 23:7
4 ගීතා 126:2 යෙසා 26:11 යෙසා 66:18
5 යෝබ් 29:9 යෙසා 52:15
6 ගීතා 72:9 යෙසා 49:23
7 ගීතා 18:45
8 යොෂු 2:9 යෙරෙ 33:9
9 නික් 15:11 ගීතා 35:10 යෙසා 40:18

**2 තීරුව**
1 යෙරෙ 23:3 යෝවෙ 2:32 රෝම 9:27 එළි 12:17

**2** නික් 34:7; නෙහෙ 9:17; ගීතා 65:3; ගීතා 86:5; යෙසා 1:18; යෙසා 44:22; යෙරෙ 50:20; දානි 9:9; **3** ගීතා 36:7; ගීතා 62:12; ගීතා 103:9; යෙසා 57:16; විලා 3:22; **4** ද්වි 30:3; ගීතා 103:13; දානි 9:9; හොෂෙ 2:19; එෆී 2:4; **5** ගීතා 130:8; **6** ගීතා 103:12; යෙසා 38:17; යෙසා 55:7; යෙරෙ 31:34; යෙරෙ 50:20; **7** උත් 22:17; ගීතා 105:9; ලූක් 1:72; ක්‍රියා 3:25; හෙබ්‍රෙ 6:13.

**මීකා 7:18*** හෝ, “ලැදි ප්‍රේමය.” **20*** හෝ, “ලැදි ප්‍රේමය.”

# නාහුම්*

**1** මෙය එල්කොෂ් නගරයේ වැසි-
යෙකු වන නාහුම්ට ලැබුණු දර්-
ශනය ඇතුළත් ලියවිල්ලයි. මෙම
දර්ශනයෙන් කියැවෙන්නේ නිනි-
වය නගරයට විරුද්ධව දුන් තීන්දුව
ගැනයි.[1]
2 යෙහෝවා දෙවි වෙනත් දෙවිව-
රුන්ට කරන නමස්කාරය දැඩි ලෙස
හෙළාදකින දෙවි කෙනෙකි.[2] යෙ-
හෝවා දෙවි තම සතුරන්ට දඬුවම්
කරන්නේය.[3] ඔහු තම සතුරන්ගේ
දුෂ්ට ක්‍රියා අමතක නොකර ඔවුන්ට
විරුද්ධව මහත් උදහසකින් යුක්තව
ක්‍රියා කරන්නේය.[4] යෙහෝවා දෙවි
තම සතුරන්ට[5] නිසි දඬුවම් දෙන්-
නේය.[6]
3 යෙහෝවා දෙවි ඉතා බලවත්
දෙවි කෙනෙකු වුවත්[1] ඔහු කෝප
වීමට ඉක්මන් නොවෙයි.[2] එහෙත් යෙ-
හෝවා දෙවි, වරදකරුවන්ව කිසිවි-
ටෙකත් ලැබිය යුතු දඬුවමින් නිදහස්
කරන්නේ නැත.[3]
දෙවි සැඩ සුළං හා කුණාටු මැදින්
ගමන් කරයි. වලාකුළු දිස් වන්නේ
ඔහුගේ ගමන් මඟෙහි ඇවිස්සුණු දූවිලි
මෙනි.[4]
4 දෙවි මුහුදට තරවටු කළ[5] විට
එය වියළී යයි. සියලු ගංගාද සිඳී යන්-
නේය.[6]
බාෂාන් සහ කර්මෙල් දේශ වියළී

**1 පරි.**
1 යෙසා 10:12 නාහු 3:7 ශෙප 2:13
2 නික් 20:5 ද්වි 4:24 යොෂු 24:19
3 ද්වි 32:35 මීකා 5:15 රෝම 13:4 හෙබ්‍රෙ 10:30
4 යෙසා 59:18 යෙරෙ 30:24 රෝම 3:5
5 ද්වි 32:41 ගීතා 81:14 ගීතා 97:3
6 මීකා 5:9 රෝම 2:5 2පේතෘ 2:9

**2 තීරුව**
1 යෝබ් 9:4 ගීතා 62:11 එෆී 1:19
2 ගණන් 14:18 යෝවෙ 2:13

නාහු නම* තේරුම, “සනසන්නා.”

**3** නික් 34:7; යෙරෙ 46:28; ආමො 3:2; **4** නික් 19:18; යෝබ් 38:1; ගීතා 50:3; සෙක 9:14; **5** යෝබ් 38:11; ගීතා 104:7; ගීතා 107:29; **6** යොෂු 3:16; ගීතා 74:15; යෙසා 19:5.

යයි.[1] ලෙබනොන් දේශයේ මල් පර
වී යයි.
**5** දෙවි ඉදිරියේ කඳු දෙදරයි. කඳු
බෑවුම් දිය වී යයි.[2]
ඔහු ඉදිරියේ භූමිය කම්පනය වී
පොළොව සහ එහි ජීවත් වන සියලු-
දෙනා වෙවුලන්නෝය.[3]
**6** දෙවිගේ උදහසට මුහුණ දිය
හැක්කේ කාටද?[4] ඔහු තම දැවෙන
උදහස ප්‍රකාශ කරන විට ඔහුට විරුද්-
ධව නැඟී සිටිය හැක්කේ කාටද?[5]
දැවෙන ගින්නක් මෙන් වූ ඔහුගේ
උදහස පිට කරන විට[6] පර්වත පවා
ඔහු ඉදිරියේ ඇද වැටෙනු ඇත.
**7** යෙහෝවා දෙවි යහපත්ය.[7] දුක්
කරදරවලදී[8] අපට පිහිට වන බල-
කොටුවකි.[9]
දෙවි තමාගෙන් රැකවරණය පතන
අයව රැකබලා ගන්නේය.[10]
**8** ඔහු ජලගැල්මකින් ඒ නුවර සහ-
මුලින්ම විනාශ කර දමන්නේය.[11]
ඔහුගේ සතුරන්ව අන්ධකාරයෙන් වට
කරන්නේය.[12]
**9** ජනයෙනි, ඔබ යෙහෝවා දෙවිට
විරුද්ධව කුමන උපායක් යෙදුවත්[13]
ඔහු ඔබව සහමුලින්ම විනාශ කරන්-
නේය.
විපත්තිය නැවත පැමිණෙන්නේ
නැත.[14]
**10** දෙවිගේ සතුරන් එකට පැට-
ලුණු කටු වැලක් මෙනි.[15] බීරවලින්
මත් වී සිටින අය මෙනි.[16] එහෙත්
ඔවුහු පිදුරු මෙන් දැවී යන්නෝය.[17]
**11** යෙහෝවා දෙවිට විරුද්ධව
කුමන්ත්‍රණය කරන කූට උපායන්
යොදන කෙනෙක් ඔබ වෙතින් නික්ම
එන්නේය.[18] ඔහු නිෂ්ඵල දේ සැලසුම්
කරන්නේය.[19]
**12** යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. “ඔවුහු ඉතා බලවත් වූ
විශාල සෙනඟකි. ඔවුන් එලෙස සිටි-
යත් යමෙක් ඔවුන්ට විරුද්ධව නැඟී
සිටින්නේය. ඔවුහු විනාශ වී යන්-
නෝය.[20] මාගේ සෙනඟෙනි, මම
ඔබටද නිසි ප්‍රමාණයට දඬුවම් කරන්-
නෙමි. නැවත වරක් ඔබට දඬු-
වම් කරන්න අවශ්‍ය වන්නේ නැත.[1]
**13** දැන් ඔවුන් ඔබ පිට තැබූ වියගහ*
මම බිඳ දමා[2] ඔවුන්ගේ විලංගු දෙ-
කට කඩා දමන්නෙමි.[3] **14** ඒ නුව-
රට සිදු වන දේ යෙහෝවා දෙවි වන
මා මෙසේ නියම කර තිබේ. ‘ඔබේ
පරම්පරාව මෙතැනින් අවසන් වී යයි.[4]
ඔබේ දේවාල තුළ තිබෙන දේවතා
රූපද වාත්තු කළ පිළිමද මම විනාශ
කර දමන්නෙමි.[5] කිසි කමකට නැති
ඔබට මම සොහොන් ගෙයක් සූදානම්
කරන්නෙමි.’[6]
**15** “බලන්න! ශුභාරංචියක් රැගෙන
එන පණිවිඩකරුවෙක් කඳු අත-
රින් පැමිණෙන්නේය. ඔහු පැමිණෙන්-
නේ සාමය ප්‍රකාශ කිරීමටය.[7] යූදා
දේශයේ වැසියෙනි, නැවතත් ඔබේ
උත්සව සැමරීමට සූදානම් වෙන්න.[8]
ඔබ දුන් පොරොන්දු ඉටු කරන්න.[9]
මන්ද නැවත කිසි කලෙක වැදගැම්-
මකට නැති කෙනෙක් ඔබේ දේශය
තුළට පැමිණෙන්නේ නැත.[10] ඒ සිය-
ලුදෙනා සම්පූර්ණයෙන්ම විනාශ වී
යන්නෝය.”[11]

## 2
ඔබව* විනාශ කරන කෙනෙක්
ඔබ ඉදිරියට පැමිණ සිටියි.[12]
එබැවින් ඔබේ බලකොටු ආරක්ෂා
කරගන්න. ඔබේ මාර්ග මුර කරන්න.
ඔබේ ඉඟටි බැඳ සටනට සූදා-
නම් වෙන්න. සවිශක්තිය වැඩි කර-
ගන්න.[13]
**2** කොල්ලකරුවෝ දෙවිගේ දේශය
පාළු කර ඇත.[14] එහි මිදිවැල්වල අතු
කපා දමා තිබේ.[15] නමුත් යෙහෝවා
දෙවි ඊශ්‍රායෙල් දේශය මෙන් යාකොබ්-
ගේ දේශයද නැවත තේජවත් තත්ව-
යකට පත් කරන්නේය.[16]

**1 පරි.**
**1** යෙසා 33:9; ආමෝ 1:2
**2** 2සාමු 22:8; ගීතා 68:8; ගීතා 97:5; හෙබ්‍රෙ 12:26
**3** ගීතා 97:4; යෙසා 24:1
**4** යෙරෙ 10:10; එළි 6:17
**5** ද්වි 32:22; එළි 16:1
**6** එළි 16:8
**7** ගීතා 25:8; ගීතා 136:1; මතෙ 19:17
**8** ගීතා 46:1; ගීතා 50:15; ගීතා 91:15
**9** ගීතා 18:2; ගීතා 91:2; හිතෝ 18:10; යෙසා 25:4
**10** ගීතා 1:6; 2තිමෝ 2:19
**11** යෙසා 28:17; එස 13:13; දානි 9:26
**12** යෙසා 8:22; යෙරෙ 13:16; ශෙප 1:15; යූද් 6
**13** ගීතා 2:1; ගීතා 21:11; යෙසා 8:10
**14** යෙසා 10:25
**15** මීකා 7:4
**16** හොෂෙ 4:18
**17** යෙසා 9:19; යෙසා 33:11; මලා 4:1
**18** 2රාජා 18:13; 2රාජා 19:22; යෙසා 10:7
**19** 2ලේක 32:16
**20** 2රාජා 19:35; යෙසා 37:36

**2 තීරුව**
**1** යෙසා 60:18; යෝවෙ 2:19
**2** යෙසා 14:25; යෙරෙ 30:8; හොෂෙ 11:4
**3** ගීතා 107:14; යෙරෙ 5:5
**4** ගීතා 109:13; හිතෝ 10:7
**5** නික් 34:13
**6** 2ලේක 32:21
**7** යෙසා 52:7; ලූක් 2:10
**8** ද්වි 16:16; නෙහෙ 10:33
**9** ගීතා 116:14
**10** යෙසා 52:1
**11** ගීතා 37:10; ගීතා 109:13; මතෙ 25:46

**2 පරි.** **12** යෙරෙ 25:9; යෙරෙ 49:32; එස 29:12; **13** යෙරෙ 46:3; **14** 2රාජා 17:6; **15** උත් 49:22; හොෂෙ 10:1; **16** ගීතා 47:4; ආමෝ 8:7.

**නාහු 1:13*** සමහරවිට වියගහක් නැත්නම් බර උසුලාගෙන යෑමට භාවිත කළ පොල්ලක් විය හැකියි. **2:1*** මෙහි, “ඔබ” කියා සඳහන් වන්නේ නිනිවය නගරයටයි.

3 හමුදාවේ බලවන්තයෝ තද රතු
පාට වස්ත්‍රවලින් සැරසී පැමිණ සිටිති.
ඔවුහු රතු තීන්ත ආලේප කළ පලිස්
අතැතිව සිටිති.[1] ඔවුහු ජුනිපර් ලීව-
ලින්[2] සාදාගත් හෙල්ල ඔසවාගෙන
යුද්ධයට සූදානමින් සිටිති. ඔවුන්ගේ
යුධ රථවලට සවි කර තිබෙන යකඩ
ආයුධ ගිනිදලු මෙන් දිදුලන්නේය.
4 යුධ රථ ඉතා වේගයෙන් වීථී-
වල ගමන් කරන්නේය.[3] ඒවා ප්‍රධාන
මංසන්ධියෙහි විදුලි වේගයෙන්[4] එහා
මෙහා ගමන් කරන්නේය. වියරු වැටු-
ණාක් මෙන් ගමන් කරන ඒවායේ පෙ-
නුම ගිනිදැල් මෙනි.

5 රජතුමා තමාගේ වික්‍රමාන්විත-
යන්ව[5] කැඳවන විට ඔවුහු වැටි වැටී ඒ
මේ අත දුවන්නෝය.[6] ඔවුහු නගරයේ
පවුරු දෙසට දුව ගොස් එහි ආරක්ෂාව
තර කරන්නෝය. 6 නමුත් ගංගා-
වල දොරටු විවර වී රජමාලිගාවද
වතුරට යට වී යන්නේය. 7 නගර-
යට විරුද්ධව දුන් තීන්දුව කිසිසේත්
වෙනස් නොවන්නේය. එය නින්දාවට
පත් වනු ඇත. සතුරා එය ආක්‍රම-
ණය කර එහි වැසියන්ව වහල්කමට
රැගෙන යන්නේය.[7] එහි සේවිකා-
වෝ පපුවට ගසාගනිමින්[8] පරෙවියන්
මෙන් හඬ නඟන්නෝය.[9] 8 පුරාණ-
යේ සිට[10] නිනිවය නගරය නිසල
දිය පොකුණක් මෙන්[11] තිබුණද දැන්
එහි වතුර පිටාර ගලන්නේය. “ජන-
යෙනි, නගරයේ රැඳී සිටින්න” කියා
පැවසුවත් කිසිවෙක් නගරයේ රැඳෙන්-
නේ නැත.[12]

9 දැන් නගරයට ගිහින් එහි රන් හා
රිදී කොල්ල කන්න.[13] එහි ඇති තරම්
වස්තුවද නානාවිධ වටිනා භාණ්ඩද
තිබේ.[14]

10 නගරය හිස් වී ඇත.[15] එය
නාස්ති වී පාළුවට ගොස් ඇත.
එහි වැසියන්ගේ හදවත් බියෙන් ගැ-
හෙන්නේය.[16] ඔවුන්ගේ කකුල් වෙ-
වුලන්නේය.[17] ඔවුන්ගේ තුනටි කකි-
යන්නේය.[18] ඔවුහු සියලුදෙනා කලබල
වී ඇත. ඔවුන්ගේ මුහුණු සුදුමැලි
වී ඇත.[1] 11 සිංහයන්ගේ ගුහාවට
සිදු වූයේ කුමක්ද?[2] තරුණ කේ-
ශර සිංහයෝද සිංහ පැටවද කිසිවෙ-
කුට බිය නොවී එහි ගැවසුනෝය.[3]
12 සිංහයා උගේ ගොදුර ගෙලෙන්
අල්ලා මරා දමා සිංහ ධේනුවට කන්න
දුන්නේය. ඌ ගොදුර කැලි කැලිව-
ලට ඉරා පැටවුන්ට ඇති තරම් කන්න
දුන්නේය. උගේ ගුහාව දඩයම් කළ
සතුන්ගෙන් පිරී තිබිණ. ඌ ඒ සතුන්-
ගේ මස් ගුහාව පුරා සඟවා තැබුවේය.[4]

13 ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මෙසේ කීවේය.
“මම ඔබට විරුද්ධව එන්නෙමි.[5] ඔබේ
යුධ රථ ගින්නෙන් විනාශ කරන්-
නෙමි.[6] ඔබේ තරුණ කේශර සිංහ-
යෝ කඩුවෙන් මැරුම් කන්නෝය.[7]
මම ඔබට ගොදුරක් ඉතුරු නොක-
රන්නෙමි. ඔබේ පණිවිඩකරුවන්ගේ
හඬ තවදුරටත් ඔබට නොඇසෙනු
ඇත.”[8]

**3** ලේ පිපාසිත නගරයට දුක් වේ![9]
ඇය නිමාවක් නොමැතිව වංචා,
දූෂණ හා කොල්ල කෑම් සිදු කරන්-
නීය. ඇය කෙසේ හෝ ගොදුරක්
අල්ලාගන්නීය. 2 අශ්ව රථ මහත්
කලබලයකින් ඇගේ වීථි දිගේ ඒ
මේ අත දිව යයි.[10] අශ්වයන් දුවන
ශබ්දයද රෝද කැරකැවෙන හඬද
කස පහරේ[11] හඬද ඇසෙයි. 3 අස-
රුවෝ වේගයෙන් ඉදිරියට ඇදී එන්-
නෝය. කඩු ගිනිදලු මෙන් දිස් වෙයි.
හෙල්ලද දිදුලයි.[12] බලන බලන සෑම
තැනකම ඇත්තේ මළ මිනී පමණි.
පය තැබීමටවත් ඉඩක් නැත. 4 මේ
සියල්ල සිදු වී ඇත්තේ ඒ ගණිකාව
බොහෝ වේශ්‍යාකම් කළ නිසාය.[13]
සිත වසඟ කරවන ඇගේ වේශ්‍යාකම්-
වලට ජාතීහු හසු වී සිටින්නෝය.
දක්ෂ මායාකාරියක වන ඇය මන්ත්‍ර
ගුරුකම්වලින් ජනයාව මුළා කරගෙන
සිටින්නීය.[14]

5 ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. “මම ඔබට දඬුවම්

**2 පරි.**
1 යෙසා 63:3
2 යෙසා 14:8 සෙක 11:2
3 යෙසා 37:24 එස 26:10
4 හබ 3:11
5 ගීතා 136:18 යෙරෙ 50:29
6 යෙරෙ 46:12
7 යෙසා 20:4 යෙරෙ 29:1
8 යෙසා 38:14 යෙසා 59:11
9 ලූක් 23:27
10 උත් 10:11
11 එළි 17:15
12 යෙරෙ 50:16 ශෙප 2:13
13 යෙසා 33:1 එස 26:12
14 එළි 18:12
15 යෙසා 24:1 ශෙප 2:13
16 යොෂු 2:11 ගීතා 22:14 යෙසා 13:7
17 දානි 5:6
18 යෙසා 21:3

**2 නිරුව**
1 යෝවේ 2:6
2 යෙරෙ 2:15 යෙරෙ 50:17
3 යෙසා 31:4 ශෙප 3:3
4 ගීතා 17:12
5 යෙසා 10:12
6 යොෂු 11:9 ගීතා 46:9
7 යෙසා 31:8
8 2රාජා 18:17 2රාජා 19:35

**3 පරි.**
9 හබ 2:12
10 විනි 5:22 යෙරෙ 47:3
11 හිතෝ 26:3
12 හබ 3:11
13 යෙසා 23:17 එස 23:30
14 ලෙවී 19:26 ද්වි 18:10 1කොරි 10:20

කරන්නෙමි.[1] මම ඔබේ වස්ත්‍ර ගලවා
දමා ජාතීන්ට ඔබේ නග්නභාවයද[2]
රාජ්‍යයන්ට ඔබේ නින්දාවද හෙළි
කරන්නෙමි. **6** ඔබ අන් අය ඉදි-
රියේ පිළිකුලක් වන සේ මම ඔබ
පිටට කුණු කසළ විසි කරන්නෙමි.[3]
ඔබ සියල්ලන්ගේ අවමානයට ලක්
වනු ඇත.[4] **7** ඔබව දකින සිය-
ලුදෙනා ඔබ සිටින තත්වය ගැන
භය වී, 'නිනිවය නාස්ති වී ගිය
හැටි බලන්න! එහි වැසියන්ව සනස-
වන්න කිසිවෙක් නැත' කියා පව-
සමින් ඔබව අත්හැර යයි.[5] ඔබව
සැනසීමට කෙනෙකුව මා කොතැ-
නින් සොයාගන්නද? **8** නයිල් ගඟ
අසල* පිහිටි[6] නෝ-ආමෝන්[7] නග-
රයට වඩා ඔබ බලවත් කියා ඔබ
සිතනවාද? ජලාශවලින් වට වූ ඒ
නගරය සුරක්ෂිතව පිහිටා තිබිණ.
මුහුද ඇයට පවුරක් මෙන් විය. මුහුද
ඇයව ධනවත් කළේය. **9** ඉති-
යෝපියාව ඇගේ සවිය විය. ඊජිප්තු-
වද[8] නොඅඩුව ඇයට සහය දුන්නේය.
පූට් ජාතිකයෝද ලිබියාවේ වැසියෝද
ඇයට උපකාර කළෝය.[9] **10** එන-
මුත් ඇයවද යටත් කර වහල්භා-
වයට ගෙන යනු ලැබීය.[10] සෑම
වීථියකම ඇගේ දරුවන්ව පොළො-
වේ ගසා මරා දමන ලදි.[11] සතුරෝ
ආදු දමා ඇගේ ප්‍රභූවරුන්ව තමන්
අතරේ බෙදාගත්තෝය.[12] ඔවුන්ගේ
සියලු උත්තමයන්ව විලංගුවලින් සිර
කරනු ලැබීය.[13]

**11** "ඔබත් බේබද්දෙකු මෙන් මත්
වනු ඇත.[14] ඔබව සොයාගැනීමට
නොහැකි වන සේ ඔබ අතුරුදහන්
වී යන්නහුය.[15] සතුරාගෙන් පවා ඔබ
ආරක්ෂාව පතනු ඇත.[16] **12** ඔබේ
බලකොටු සියල්ල, පළමු වරට පල
දරන අත්තික්කා ගසක් මෙන් වන්-
නේය. ගස සෙලවූ විගස එහි පල වැටී
යමෙකු විසින් ඒවා ගිලගනු ලබන්-
නේය.[17]

**13** "ඔබේ හටයන් ස්ත්‍රීන් මෙනි.[1]
ඔබේ සතුරන් ඉදිරියේ දේශයේ
ආරක්ෂක දොරටු සියල්ල විවෘත
වනු ඇත. ඒවායේ අගුලු ගින්-
නෙන් දැවී යයි.[2] **14** සතුරු සේනා
ඔබව වටලීමට පෙර අවශ්‍ය වතුර
එකතු කරගන්න.[3] ඔබේ බලකො-
ටුවල ආරක්ෂාව තර කරගන්න.[4]
මැටි පාගා බදාම සකස් කරගන්න.
ගඩොල් අච්චුව සූදානම් කරගන්න.
**15** පළඟැටියන් දේශය වනසන්නාක්
මෙන්[5] ඔබ ගින්නෙන් හා කඩුවෙන්
විනාශ වනු ඇත.[6] ඔබ පළඟැටි-
යන් හා පළඟැටි පිලවුන් මෙන් ගණ-
නින් වැඩි වී සූදානම් වන්න. එහෙත්
එයින් කිසි පලක් නැත. **16** ඔබ
ඔබේ වෙළෙඳුන්ගේ ගණන අහසේ
තරුවලටත් වඩා වැඩි කරගත්ත-
හුය.[7]

"පළඟැටි පිලවුන් උන්ගේ හම ඉව-
තලා ඉගිලී යයි. **17** ඔබේ මුරකා-
රුවන් ඒ පළඟැටියන් හා සමානය.
හමුදා නිලධාරීන් පළඟැටි රංචුව-
කට සමානය. ශීත කාලයේදී පළඟැ-
ටියෝ ගල් පවුරුවල කුහර අතරේ
සැඟවී සිටිති. එනමුත් හිරුරැස් විහි-
දුණු විගස උන් සැඟවී සිටි තැන්ව-
ලින් එළියට ඇවිත් ඉගිල යති.
ඉන්පසු උන්ව සොයාගන්න ලැබෙන්-
නේවත් නැත.[8]

**18** "ඇසිරියාවේ රජ්ජුරුවෙනි, ඔබේ
රට වැසියෝ කඳුකරය පුරා විසිරී
ගොස් ඇත. ඔවුන්ව නැවත එක්
රැස් කරගන්න කිසිවෙක් නැත.[9] ඔබේ
එඬේරු නිදිකිරා වැටෙති.[10] ඔබේ
වික්‍රමාන්විතයෝ ඔවුන්ගේ නිවෙස්-
වලට වැද විවේක සුවයෙන් පසු
වෙති.[11] **19** මේ විපතෙන් ගොඩ
ඒමට ඔබට නොහැකිය. ඔබේ තුවා-
ලය සුව වන්නේද නැත.[12] ඔබේ
නපුරු ක්‍රියාවලින් දුක් නොවින්ද
කෙනෙක් සොයාගැනීමට නොහැකි
තරම්ය![13] එබැවින් ඔබට සිදු වූ දේ
ගැන අසන සියලුදෙනා ප්‍රීතියෙන් අත්-
පොළසන් දෙති."[14]

**3 පරි.**
**1** නාහු 2:13
**2** යෙසා 47:2 යෙරෙ 13:22 එස 16:37 එළි 17:16
**3** මලා 2:3
**4** ශෙප 2:15 යූද් 7
**5** නාහු 2:8
**6** යෙසා 19:6
**7** යෙරෙ 46:25 එස 30:14
**8** යෙසා 20:5
**9** උත් 10:6 2ලේක 16:8 යෙරෙ 46:9 එස 27:10
**10** ගීතා 33:16 යෙසා 20:4
**11** ගීතා 137:9 යෙසා 13:16
**12** යෝවෙ 3:3 ඔබ 11
**13** ගීතා 149:8
**14** ගීතා 75:8 යෙරෙ 25:15
**15** යොෂු 10:16 1සාමු 13:6
**16** යෙරෙ 4:5
**17** යෙසා 28:4 එළි 6:13

**2 තීරුව**
**1** යෙසා 19:16 යෙරෙ 51:30
**2** ගීතා 107:16 යෙසා 45:2
**3** 2ලේක 32:3 2ලේක 32:4
**4** යෙසා 8:9 යෝවෙ 3:9
**5** නික් 10:14 යෝවෙ 1:4
**6** ශෙප 2:13
**7** උත් 15:5 යෙරෙ 33:22
**8** ගීතා 109:23
**9** 1රාජා 22:17 නාහු 2:8 එළි 6:15
**10** ගීතා 76:5 යෙසා 56:10 යෙරෙ 51:39
**11** යෙරෙ 51:30
**12** යෙරෙ 46:11 එස 30:21
**13** යෙසා 10:6 යෙසා 37:18
**14** යෝබ් 27:23 ශෙප 2:15

**නාහු 3:8*** මූ.අ., "නයිල් ගඟේ වතුර ලබාගැනීම සඳහා කපා ඇති ඇළ මාර්ග."

# හබක්කුක්

1 අනාගතවක්තෘ හබක්කුක්ට
දර්ශනයක් මාර්ගයෙන් දෙවි-
ගෙන් ලැබුණු පණිවිඩය මෙයයි.
2 යෙහෝවා දෙවියනි, තව කො-
තරම් කාලයක් ඔබෙන් උපකාර
ඉල්ලා අඬන්නද? දාමරිකයන්ගේ
අතින් අපව බේරගන්න කියා තව
කොතරම් කාලයක් ඔබෙන් අයැද
සිටින්නද? ඔබ මට ඇහුම්කන් දී පිය-
වර ගන්නා තුරු මා තව කොපමණ
කල් බලා සිටින්නද?[1] 3 ඔබ මේ
නපුරුකම් දෙස බලා සිටින්නේ කෙ-
සේද? මා බලන බලන සෑම තැනම
සොරකම්ද මැරවරකම්ද සිදු වෙයි.
මගේ දෑසින් මේ දුෂ්ට දේවල් දකින්න
ඔබ මට ඉඩහරින්නේ ඇයි? මෙත-
රම් කෝලහල අඬදබර සිදු වන්නේ
මන්ද?[2]
4 යුක්තියටවත් නීතියටවත් කිසිම
තැනක් නැත.[3] දුෂ්ටයෝ ධර්මිෂ්-
ඨයන්ව පාගා දමන්නෝය. යුක්තිය
කණපිට පෙරළී ඇත.[4]
5 “ජනයෙනි, ඔබ අවට සිටින
ජාතීන් දෙස බලා පුදුම වන්න.[5] ඔබ
ජීවත්ව සිටින මේ කාලයේදී ඔබ
නොසිතන දෙයක් සිදු වනු ඇත.
ඔබට ඒ ගැන කීවත් ඔබ විශ්-
වාස නොකරන්නහුය.[6] 6 නොඉ-
වසිල්ලෙන් කටයුතු කරන, ඉතා
දරුණු ජාතියක් වන කල්දිවරුන්ව
මම බලයට පත් කරන්නෙමි.[7] ඔවුහු
විශාල ප්‍රදේශයක් හරහා ගමන් කර-
මින් තමන්ට අයිති නැති දේශ යටත්
කරගන්නෝය.[8] 7 ඔවුන් භයානක
ජාතියක්ය. ඔවුහු හිතුමනාපෙට නීති
පනවාගන්නා, තමන්ටම කීර්ති
නාමයක් හදාගන්නා සෙනඟකි.[9]
8 ඔවුන්ගේ අශ්වයෝ පොළොවේ
දූවිලි අවුස්සමින් නොඉවසිල්ලෙන්
බලා සිටිති. උන් දිවියන්ටත් වඩා
වේගවත්ය. රාත්‍රියේ සැරිසරන වෘක-
යන්ට වඩා දරුණුය.[10] දුර සිට පැමි-
ණෙන උන්, ගොදුර ඩැහැගැනීමට
වේගයෙන් බැස එන රාජාලීන් මෙනි.[1]
9 විනාශයට පමුණුවන අරමුණින්
එක සේනාවක් මෙන් ඒ සෙනඟ
පැමිණෙන්නෝය.[2] නැඟෙනහිර දෙ-
සින් හමන සුළිසුළඟක් හා සමා-
නව ඔවුහු ගමන් කරන්නෝය.[3] වැලි
එකතු කරන්නාක් මෙන් ඔවුහු විශාල
පිරිසක් අල්ලාගන්නෝය. 10 ඔවුහු
රජවරුන්ට සරදම් කරති. උසස්
නිලධාරීන් දෙස බලා සිනාසෙන්-
නෝය.[4] බලකොටු දුටු විටද ඔවුහු
සිනාසෙන්නෝය.[5] ඔවුහු ඒවා වටා
බැම්මක් තනා ඒවා අල්ලාගන්-
නෝය. 11 ඒ හමුදාව සුළිසුළඟක්
මෙන් ඉදිරියට ගමන් කරමින් බො-
හෝ අපරාධ සිදු කරනු ඇත.[6]
ඔවුන්ගේ ශක්තිය ඔවුන්ගේ දෙවි-
යන්ය.”[7]
12 යෙහෝවා දෙවියනි, ඔබ පුරා-
තනයේ පටන් සිටියේය.[8] මාගේ
දෙවියනි, මාගේ ශුද්ධ තැනැත්තා-
ණෙනි, ඔබ කිසිදා මිය යන්නේ
නැත.[9] යෙහෝවා දෙවියනි, ඔබ
ඒ ජාතිය තෝරාගෙන තිබෙන්නේ
ඔබේ විනිශ්චයන් ඉටු කරගැනීම-
ටය. මාගේ පර්වතය,[10] වරදකරු-
වන්ට හික්මවීමක් දීම සඳහා[11] ඔබ ඒ
අයව තෝරාගත්තෙහිය.
13 ඔබ මොන තරම් ශුද්ධ දෙවි
කෙනෙක්ද කිවහොත් නපුර ගණන්
නොගෙන සිටීමට ඔබට නො-
හැක. දුෂ්ටකම් නොසලකාහරින්න
ඔබට නුපුළුවන.[12] එසේනම්, ද්‍රෝ-
හිකම් කරන අයට විරුද්ධව ඔබ
පියවර නොගන්නේ මන්ද?[13] දුෂ්-
ටයා තමාට වඩා යහපත් කෙනෙ-
කුව විනාශ කරද්දී ඔබ නිහඬව බලා
සිටින්නේ මන්ද?[14] 14 උපකාරක-
යෙකු නොමැති මුහුදේ මත්ස්‍යයන්-
ගේ තත්වයට මනුෂ්‍යයන්ව පත්
වීමට ඔබ ඉඩහරින්නේ මන්ද?[15]

**1 පරි.**

1 ගීතා 13:1
ගීතා 22:1
ගීතා 74:10
දේශ 5:8
එළි 6:10
2 දේශ 4:1
රෝම 9:22
2පේතෘ 2:8
2පේතෘ 3:9
3 යෝබ් 12:6
ගීතා 12:8
දේශ 8:11
මතෙ 23:23
4 යෝබ් 33:27
හිතෝ 29:2
යෙසා 1:21
මතෙ 26:59
ක්‍රියා 7:52
5 විලා 4:12
6 යෙසා 28:21
යෙසා 29:14
ක්‍රියා 13:41
7 යෙරෙ 22:7
යෙරෙ 46:2
8 ද්වි 28:49
යෙරෙ 5:15
යෙරෙ 6:22
එස 23:23
9 යෙරෙ 39:5
යෙරෙ 52:9
දානි 5:19
10 යෙරෙ 5:6

**2 තීරුව**

1 යෙරෙ 4:13
විලා 4:19
එස 17:3
2 ද්වි 28:51
යෙරෙ 25:9
3 යෙසා 27:8
එස 17:10
4 2රාජා 24:12
2ලේක 36:17
5 යෙරෙ 32:24
යෙරෙ 52:7
6 යෙසා 47:6
යෙරෙ 51:24
සෙක 1:15
7 දානි 5:4
8 ගීතා 90:2
ගීතා 93:2
එළි 1:8
9 1තිමෝ 1:17
එළි 15:3
10 ද්වි 32:4
1සාමු 2:2
ගීතා 18:2
11 යෙරෙ 10:24
යෙරෙ 30:11
හෙබ්‍රෙ 12:5
12 ගීතා 5:4
යෙසා 59:2
1පේතෘ 1:15

---

**13** යෙරෙ 12:1; **14** ගීතා 35:22; ගීතා 37:14; ගීතා 50:21; **15** හිතෝ 6:7; යෙසා 63:19.

ඔවුහු මුහුදු ජීවීන් හා සමාන වී ඇත.
**15** සතුරා ඇවිත් ඔවුන් සියලුදෙ-
නාව බිලි කොකු දමා අල්ලාගනියි.[1]
තම මාදැලට ඔවුන්ව හසු කරග-
නියි.[2] සතුරා තම දැලට හසු වූ
ඔවුන්ව මහත් සතුටකින්[3] ඇදගෙන
යනු ඇත. **16** ගුණයෙන් පිරි ඉස්ත-
රම් කෑම ඔහු අනුභව කරන්නේය.
ඔහු තමාගේ මාදැලට පුදපූජා ඔප්පු
කරන්නේ ඒ නිසයි. ඔහු නිතරම තම
දැලට සුවඳ දුම් ඔප්පු කරන්නෙත් ඒ
නිසයි.[4] **17** ඔහුට නිරතුරුවම තම
දැල පුරවාගැනීමට හැකි වෙයිද? ඔහු
සිත්පිත් නැතුව හැමදාමත් ජාතීන්ව
නැති නාස්ති කර දමයිද?[5]

**2** දෙවි මට කුමක් කියාවිද?[6] ඔහු-
ගෙන් ලැබෙන හික්මවීම්වලට
මා කෙසේ ප්‍රතිචාරය දක්වයිද?[7] ඔහු
මට කතා කරන තුරු මගේ මුරපො-
ළට වී මම බලා සිටින්නෙමි.[8] බල-
කොටුව උඩට වී සිටින්නෙමි.[9]

**2** යෙහෝවා දෙවි මට මෙසේ පිළි-
තුරු දුන්නේය. “ඔබ දකින දර්ශ-
නය ලියාගන්න. අන් අය ඉදිරියේ
එය පහසුවෙන් කියවීමට හැකි වන
සේ[10] ගල් පුවරුවල පැහැදිලිව ඒ දේ
ලියන්න.[11] **3** මන්ද දර්ශනය ඉටු
වීමට නියමිත කාලයක් තිබේ.[12] ඒ
නියමිත කාලය ඉක්මනින්ම පැමි-
ණෙන්නේය. දර්ශනය කිසිවිටෙක
බොරුවක් නොවන්නේය. එය ඉටු
වීමට ප්‍රමාද වන්නේයයි පෙනුණද ඒ
ගැන බලාපොරොත්තුවෙන් සිටින්න.
මන්ද එය ප්‍රමාද නොවන්නේය. නිය-
මිත කාලයේදී එය අනිවාර්යයෙන්ම
ඉටු වන්නේය.[13]

**4** “ධර්මිෂ්ඨ තැනැත්තා විශ්වාස-
වන්තකමින් ක්‍රියා කරන නිසා ඔහු-
ගේ ජීවිතය රැකෙනු ඇත.[14] එහෙත්
හිස උදුම්මාගත් කෙනෙක්[15] තුළ
අවංකකම නැත. **5** ඔහු වයින්ව-
ලින් මුළාව ගොස් අහංකාර ලෙස
ක්‍රියා කරන්නේය.[16] නිරතුරුවම ගො-
දුරක් ගිලගන්න මාන බලන මිනී
වළ මෙන්ද මරණය මෙන්ද වූ මිනි-
සාද ක්‍රියා කරන්නේ එලෙසමය. ඔහු
කිසිවිටෙක සෑහීමට පත් නොවන්-
නේය.[1] ඔහු සියලු ජාතීන්ව යටත්
කරගන්නේය. සියලු ජනයාව පරා-
ජය කරන්නේය.[2] එහෙත් ඔහුට තම
ඉලක්ක අත් කරගන්න ලැබෙන්නේ
නැත.[3] **6** ඔහු තමන් යටත් කර-
ගත් සියලුදෙනාගේ නින්දා අපහාසව-
ලටත්* සරදමටත් ලක් වන්නේය.[4]
ඔවුහු මෙසේ කියති.

“ ‘තමන්ට අයිති නැති දේවල්
රැස් කරගනිමින්[5] තමන්ට ගෙවීමට
තිබෙන ණය ප්‍රමාණය තව තවත්
වැඩි කරගන්නා තැනැත්තාට දුක්
වේ! තව කොපමණ කල් මේ අප-
රාධ සිදු වෙයිද?[6] **7** ඔහුගෙන්
පොලී ඉල්ලමින් ණයහිමියෝ හදිසි-
යෙන්ම ගෙට කඩාවදින්නෝය. ඔහුව
භයගන්වන අය ඔහු සතු සියල්ල
කොල්ල කන්නෝය.[7] **8** ඔබ බො-
හෝ ජාතීන්ගෙන් වස්තු උදුරාගත්-
තෙහිය. ලේ වැගිරුවෙහිය. භූමියද
නගරද එහි වැසියන්වද නැති නාස්ති
කර දැමුවෙහිය.[8] එබැවින් ඔවුන් අත-
රින් ඉතුරු වී සිටින අය ඇවිත් ඔබ-
ගේ වස්තුව කොල්ල කනු ඇත.[9]

**9** “ ‘වංචාවෙන් වස්තු රැස් කර-
ගෙන,[10] විපතෙන් බේරී සිටීමට
තමන්ගේ නිවහන උස් තැනක සාදා-
ගන්නා තැනැත්තාට දුක් වේ![11]
**10** ඔබ බොහෝදෙනෙකුව විනාශ
කරමින්[12] පව් කළෙහිය.[13] එයින්
සිදු වූයේ ඔබ ඔබේම ගෙයි වැසි-
යන් මත නින්දාව පමුණුවාගැනීමය.
**11** ගෙයි බිත්තිවල ගල් ඔබට විරුද්-
ධව මොරගසයි. වහලේ පරාලද ඔබට
විරුද්ධව හඬ නඟයි.[14]

**12** “ ‘නගරයක් ගොඩනැඟීමට ලේ
වගුරුවා, අධර්මිෂ්ඨකම් කර නුව-
රක් දියුණු කළ තැනැත්තාට දුක්
වේ![15] **13** ජනයා වෙහෙස මහන්සි
වී උපයාගත් දේ ගින්නෙන් විනාශ වී

**1 පරි.**
**1** දේශ 9:12
**2** ගීතා 10:9
මීකා 7:2
**3** යෙරෙ 50:11
**4** ද්වි 8:17
ගීතා 37:1
**5** 2ලේක 36:17
නාහු 3:7

**2 පරි.**
**6** ගීතා 85:8
2කොරි 13:3
හෙබ්‍රෙ 1:1
**7** යෝබ් 23:5
**8** මීකා 7:7
**9** යෙසා 21:8
යෙසා 62:6
**10** ද්වි 31:11
නෙහෙ 8:8
**11** නික් 17:14
ද්වි 27:8
**12** දානි 8:19
දානි 10:14
ක්‍රියා 17:26
**13** මීකා 7:7
යාකො 5:7
**14** දානි 5:20
ලූක් 18:14
**15** යොහ 3:36
රෝම 1:17
ගලා 3:11
හෙබ්‍රෙ 10:38
**16** 2රාජා 14:10
හිතෝ 20:1
හිතෝ 21:24

**2 තීරුව**
**1** හිතෝ 27:20
දේශ 5:10
**2** යෙසා 14:17
**3** හිතෝ 11:2
හිතෝ 16:18
**4** යෙසා 14:4
මීකා 2:4
**5** හිතෝ 22:16
යාකො 5:4
**6** ගීතා 94:3
**7** හිතෝ 29:1
යෙරෙ 51:11
**8** 2ලේක 36:17
ගීතා 137:8
එළි 6:10
**9** යෙසා 13:19
යෙසා 33:1
යෙරෙ 27:7
සෙක 2:9
**10** 1රාජා 21:2
යෙරෙ 22:13
**11** ගීතා 49:11
හිතෝ 18:11
ඔබ 4
**12** යෙසා 14:20
**13** ගණන් 16:38
1රාජා 2:23
හිතෝ 8:36
එස 18:20
**14** උත් 4:10
යාකො 5:4

**15** යෙරෙ 22:13; එස 24:9; නාහු 3:1; එළි 17:6.

හබ **2:6*** මූ.අ., “සියලුදෙනා ඔහු ගැන අපහා-
සාත්මක කියමන් ගොතනු ඇත.”

යන්නේය. ජාතීහු කිසිම පලක් නො-
මැතිව වෙහෙසෙන්නෝය. එලෙස
සිදු වන ලෙසට තීන්දු කර ඇත්-
තේ ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි නොවෙයිද?[1]
**14** මුහුද වතුරෙන් පිරී තිබෙන්-
නාක් මෙන් යෙහෝවා දෙවිගේ තේ-
ජස ගැන පොළොවේ සියලු වැසියෝ
දැනගනු ඇත.[2]

**15** "'මිත්‍රයන්ට බොන්න දුන්
තැනැත්ත, ඔබට දුක් වේ! මන්ද
ඔබේ කෝපයත් වෛරයත් ඒ පාන-
යට මිශ්‍ර කරමින් මත් වන තරමටම
ඔබ ඔවුන්ට බොන්න දුන්නෙහිය.[3]
ඔබ එසේ කළේ, ඔවුන්ව නිරුවත්
කර නින්දාවට පත් කරන පිණි-
සය.[4] **16** ඔබ ගෞරවයෙන් පිදුම්
ලබනවා වෙනුවට නින්දාවට පත්
වන්නෙහිය.[5] ඔබටත් ඒ හා
සමාන පානයක් බීමට සිදු වනු
ඇත.[6] මන්ද යෙහෝවා දෙවිගේ දකු-
ණතේ තිබෙන කුසලානය ඔබේ
අතට දෙනු ලැබේ.[7] එවිට ඔබව
අචර්මච්ඡේදිතයෙකු ලෙස සලකනු
ඇත.[8] ඔබට හිමි වන්නේ ගෞරවය
නොව නින්දාවය. **17** මන්ද ඔබ
ලෙබනොන් කඳුකරය වනසා දැමු-
වෙහිය.[9] සිත්පිත් නොමැතිව වනස-
තුන්ව බියගන්වමින් උන්වද විනාශ
කළෙහිය. ලේ වැගිරුවෙහිය.[10] භූමි-
යද නගරද එහි වැසියන්වද නැති
නාස්ති කර දැමුවෙහිය.[11] ඔබ පිට-
ටත් එවන් විනාශයක් පැමිණෙනු
ඇත. **18** දේවතා රූපවලින් ඇති
ප්‍රයෝජනය කුමක්ද?[12] රූප සාදන්-
නෝ මහත් විශ්වාසයක් ඇතුව ඒවා
සාදන්නෝය.[13] ඔවුහු මුළාව ගොස්
ඒ රූපවලින් මඟ පෙන්වීම්ද පතන්-
නෝය.[14] නමුත් කතා කරන්නවත්
බැරි ඒ රූපවල කිසි වටිනාකමක්
නැත.[15]

**19** "'ලී කැබැල්ලකට කතා කර,
"අනේ, නැඟිටින්න" කියාත් කතා
කළ නොහැකි ගලකට, "අනේ, දැන්
අවදි වී කළ යුතු දේ අපට කියා
දෙන්න"[16] කියාත් පවසන තැනැත්-

**2 පරි.**
**1** හිතෝ 21:30
යෙසා 50:11
යෙරෙ 51:58
**2** ගීතා 72:19
යෙසා 11:9
සෙක 14:9
**3** 2සාමු 11:13
2සාමු 13:28
එළි 17:2
එළි 18:3
**4** උත් 9:22
එස 22:10
**5** පිලි 3:19
**6** ගීතා 75:8
යෙසා 51:22
යෙරෙ 51:57
එළි 18:6
**7** යෙරෙ 25:28
**8** එස 28:10
එස 32:19
**9** සෙක 11:1
**10** ගීතා 137:8
හිතෝ 28:17
එළි 18:24
**11** යෙරෙ 50:28
යෙරෙ 51:24
**12** යෙසා 37:38
යෙසා 42:17
යෙරෙ 2:28
1කොරි 8:4
**13** යෝනා 2:8
සෙක 10:2
රෝම 1:21
**14** ගීතා 115:8
යෙසා 44:19
යෙසා 45:20
**15** යෙරෙ 10:5
1කොරි 12:2
**16** ගීතා 97:7
යෙසා 37:19
දානි 3:29

**2 තීරුව**
**1** යෙසා 40:19
යෙසා 46:6
ක්‍රියා 17:29
ක්‍රියා 19:24
**2** ගීතා 135:17
යෙරෙ 10:14
යෙරෙ 51:17
**3** ගීතා 11:4
ගීතා 115:3
යෙසා 6:1
හෙබ්‍රෙ 8:2
**4** ගීතා 76:8
ශෙප 1:7
සෙක 2:13

**3 පරි.**
**5** ගීතා 145:11
යෙසා 53:1
**6** ගීතා 64:9
**7** නික් 32:13
යෙරෙ 31:20
විලා 3:32
මතෙ 24:22
**8** ද්වි 33:2
විනි 5:4
**9** ගීතා 68:7

තාට දුක් වේ! මන්ද ඒවා රන් රිදීව-
ලින් ආලේප කර තිබුණද[1] ඒවාට
පණ නැත.[2] **20** නමුත් යෙහෝවා
දෙවි තම ශුද්ධ මාලිගාවේ සිටින්-
නේය.[3] පොළොවේ සියලු වැසියෙනි,
ඔහු ඉදිරියේ නිහඬ වන්න!'"[4]

**3** අනාගතවක්තෘ හබක්කුක් විලාප
ගීයක ස්වරයෙන්* කළ යාච්-
ඤාව මෙයයි. **2** යෙහෝවා දෙවි-
යනි, අතීතයේ ඔබ කළ දේවල් ගැන
මා අසා තිබේ.[5] යෙහෝවා දෙවියනි,
ඒවා ගැන අසද්දී මා තුළ මහත් බියක්
ඇති විය.[6]

දෙවියනි, ඔබ නියම කරන කාල-
යේදී* නැවත වරක් එවැනි ක්‍රියා සිදු
කරන්න. ඒ කාලයේදී, නැවත වරක්
ඔබේ ක්‍රියා ගැන දැනුම් දෙන්න.
එහෙත් ඔබේ උදහස ප්‍රකාශ කරන
දවසේදී දයාව පෙන්වීමට අමතක
නොකරන මෙන් ඉල්ලමි.[7]

**3** දෙවි තේමාන් නගරයේ සිට
පැමිණියේය. ශුද්ධ තැනැත්තාණන්
පාරාන් කන්දේ[8] සිට පැමිණියේය.
සීලා.*[9]

ඔහුගේ තේජසින් මුළු අහස්තල-
යම වැසී ගියේය.[10] ඔහුට ලැබුණු
ප්‍රශංසා පොළොවේ එක් කෙළවරක
සිට අනික් කෙළවර දක්වා පැතිර
ගියේය.[11]

**4** ඔහුගේ තේජස සූර්යාලෝකය
මෙනි.[12] ඔහුගේ අතින් ආලෝක
ධාරාවන් දෙකක් විහිදී ගියේය. ඔහු-
ගේ ශක්තිය ඔහුගේ දෑතේ සැඟවී
තිබේ.[13]

---

**10** නික් 19:16; ගීතා 18:13; හෙබ්‍රෙ 12:18; **11** ගීතා 148:13; යෙසා 6:3; **12** නික් 13:21; ගීතා 104:2; යෙසා 60:20; එළි 22:5; **13** ගීතා 68:34; ගීතා 150:1.

---

**හබ 3:1*** මෙහි භාවිත කර තිබෙන හෙබ්‍රෙව් වචනයේ අර්ථය ස්ථිරවම කිව නොහැක. තාලය ක්ෂණිකව වෙනස් වන ඉතා හැඟීම්බර ගීයක් ඉන් අදහස් විය හැකියි. අන්තරාවන් හමුවේ පිහිට පැතීම සහ අවසානයේදී ප්‍රීති ප්‍රමෝදය සමඟින් ප්‍රශංසා දීම වැනි හැඟීම් ඊට ඇතුළත් වේ. **2*** මූ.අ., "මේ කාලයේදී." **3*** සංගීත ක්ෂේත්‍රයේදී භාවිත කරන හෙබ්‍රෙව් වචනයකි. එහි නියම අර්ථය ස්ථිරවම කිව නොහැක.

**5** ඔහුට ඉදිරියෙන් වසංගතයක් ගමන් කරන්නේය.[1] ඔහුට පිටුපසින් භයානක උණ රෝගයක් පැමිණෙන්නේය.[2]

**6** ඔහු නවතින විට පොළොව දෙදරුම් කන්නේය.[3] ඔහුගේ එක බැල්මකට ජාතීහු වෙවුලන්නෝය.[4]

අතීතයේ සිට තිබූ කඳු සුනුවිසුනු වී ගියේය.[5] පුරාණයේ සිට පවතින කඳු බැවුම් කඩා වැටුණේය.[6] අතීතයේ සිට දෙවි ක්‍රියා කළේ එලෙසය.

**7** කූෂාන් දේශයේ කූඩාරම් වෙත බොහෝ දුක් පීඩා පැමිණියේය. මිදියන් දේශයේ[7] කූඩාරම් කැලඹුණේය.[8]

**8** යෙහෝවා දෙවියනි, ඔබේ උදහස ඇවිළී ගියේ ගංගාවලට විරුද්ධවද?[9] ඔබ අශ්වයන් පිට නැඟ ආවේ[10] මුහුදට විරුද්ධව ඔබේ කෝපය ඇවිස්සුණු නිසාද?[11] ඒ අවස්ථාවේදී, ඔබේ අශ්ව රථ පසු නොබැස ජයග්‍රහණය අත් කර දුන්නේය.[12]

**9** ගෝත්‍ර ගිවිසුමකින් බැඳී සිටින බවට දිවුරුම් දුන්හ.[13] ඔබේ දුන්න ඔබ පිටතට ඇදගත්තෙහිය.[14] සීලා. ඔබ සැඩ ජල ධාරාවක් එවා පොළොව දෙබෑ කළෙහිය.[15]

**10** ඔබව දුටු විට කඳු නැතිගත්තේය.[16] ධාරානිපාත වර්ෂාවක් කඩා හැළුණේය. ගැඹුරු දිය උල්පත් මහත් සේ කැලඹුණේය.[17] ඒවා පොළොව බිඳගෙන ඉහළට මතු වුණේය.

**11** හිරුද සඳුද ඉහළ අහසේ නතර විය.[18] ඔබේ ඊතලවලින් ආලෝකය නික්ම ගියේය.[19] අකුණකින් ආලෝකය නිකුත් වන්නාක් මෙන් ඔබේ හෙල්ලයෙන් ආලෝකය දිස් විය.[20]

**12** ඔබ උදහස් වී පොළොව හරහා ගමන් කළෙහිය. කෝපයෙන් ජාතීන්ව පාගා දැමුවෙහිය.[21]

**13** ඔබේ සෙනඟ හා ඔබේ අභිෂේක ලත් තැනැත්තාව බේරාගන්නා පිණිස ඔබ ඉදිරියට ගමන් කළෙහිය.[22] එවිට දුෂ්ටයන්ගේ අධිපතියාව ඔබ පොඩි කර දැමුවෙහිය.[23] වහළේ සිට අත්තිවාරම දක්වා ගෘහය සම්පූර්ණයෙන්ම විනාශ කර දැමුවෙහිය.[1] සීලා.

**14** මාව පන්නා දමන පිණිස[2] ඔහුගේ භටයෝ සුළිසුළඟක් මෙන් ආවෝය. සැඟවී සිට[3] අසරණයන්ව අල්ලා ඔවුන්ව විනාශ කර දැමීම ඔවුන්ගේ එකම ප්‍රීතියයි. එහෙත් ඔබ ඔවුන්ගේම ආයුධ රැගෙන ඔවුන්ගේ හිසට ඇන්නෙහිය.[4]

**15** ඔබේ අශ්වයන් රැගෙන ඔබ මුහුද මැදින් ගමන් කළෙහිය. මහා ජල ධාරා හරහා ගියෙහිය.[5]

**16** මේ පණිවිඩය ඇසූ විට මගේ බඩ කැලඹුණේය. මගේ තොල් වෙවුලුවේය. මගේ ඇටකටු දිරා ගියේය.[6] මා දුටු දේ නිසා මම අතිශයින් බියට පත් වුණෙමි. විපත්ති දවස එන තෙක් මම නිහඬව බලා සිටින්නෙමි.[7] සතුරු හමුදාවක් මත කඩාවදින මිනිසෙකු මෙන් ඒ දවසද හදිසියේම පැමිණෙන්නේය.[8]

**17** අත්තික්කා ගසේ මල් හට නොගත්තත්[9] මිදිවැල හා ඔලීව ගස පල නොදැරුවත් කෙත්වල අස්වැන්න නාස්ති වී ගියත්[10] බැටළු රළේ හා ගව රළේ සතුන් විනාශ වී ගියත්[11]

**18** යෙහෝවා දෙවි නිසා මම බොහෝ සෙයින් සතුටු වන්නෙමි.[12] මට ගැලවීම ලබා දෙන දෙවි කෙරෙහි ප්‍රීති වන්නෙමි.[13]

**19** මට ශක්තිය ලැබෙන්නේ විශ්වයේ පාලකයාණන් වන යෙහෝවා දෙවිගෙන්ය.[14] මුවදෙනක මෙන් දිව යන්න ඔහු මට උපකාර කරන්නේය.[15] මට තනියෙන් යා නොහැකි උස් තැන්වලට ඔහු මාව රැගෙන යන්නේය.[16]

මගේ තත් භාණ්ඩ වාදනය කරන
අතරතුරේදී ගායනා කිරීම සඳහා
සංගීත අධ්‍යක්ෂක වෙත ලියන ලද්දකි.

**3 පරි.**
**1** නික් 9:15; ගණන් 14:12; ගණන් 16:46; ගණන් 25:9
**2** ද්වි 28:22; ද්වි 32:24
**3** ගීතා 60:2; යෙසා 13:13; හග් 2:21; හෙබ්‍රෙ 12:26
**4** නික් 14:25; නික් 23:27
**5** උත් 49:26; යෙසා 54:10
**6** ගීතා 46:2; ගීතා 114:4; නාහු 1:5
**7** උත් 25:2; ගීතා 83:9
**8** නික් 15:14; ගණන් 22:4
**9** යෙසා 50:2; නාහු 1:4
**10** ද්වි 33:26; ගීතා 18:10; යෙසා 19:1
**11** ගීතා 114:3
**12** ගීතා 68:17; ගීතා 104:3
**13** ලූක් 1:73
**14** ගීතා 7:12; විලා 2:4
**15** ගීතා 105:41
**16** නික් 19:18; ගීතා 114:4
**17** ගීතා 77:16; ගීතා 93:3; ගීතා 98:7
**18** යොෂු 10:12; ගීතා 19:6
**19** ගීතා 77:17; ගීතා 77:18; ගීතා 144:6
**20** ද්වි 32:41; එස 21:10
**21** මීකා 4:12
**22** ගීතා 28:8; ගීතා 68:7
**23** යොෂු 11:12; ගීතා 68:21; ගීතා 110:6

**2 තීරුව**
**1** ගීතා 18:15; එස 13:14
**2** ගීතා 83:2
**3** ගීතා 10:8; ගීතා 64:4
**4** 2රාජා 18:21
**5** එළි 17:15
**6** ගීතා 119:120; යෙරෙ 23:9; දානි 8:27
**7** ගීතා 42:5; යෙසා 26:20; විලා 3:26
**8** යෙසා 10:12; යෙසා 13:17; ඔබ 1
**9** යෙරෙ 8:13; හොෂෙ 2:12

**10** යෝබ් 24:11; යෝවෙ 1:10; **11** ආමො 4:9; හග් 2:16; **12** 1සාමු 2:1; යෙසා 61:10; රෝම 5:2; රෝම 5:11; **13** නික් 15:2; ගීතා 18:2; යෙසා 12:2; ලූක් 2:30; **14** ගීතා 27:1; එෆී 3:16; පිලි 4:13; කොලො 1:11; **15** 2සාමු 22:34; ගීතා 18:33; **16** ද්වි 32:13; යෙසා 58:14.

# ශෙපනියා

**1** ආමොන් රජුගේ[1] පුත් යොෂියා
යූදාහි රජකම් කළ කාලයේදී,[2]
කූෂිගේ පුත්‍ර වූ ශෙපනියාට යෙහෝවා
දෙවිගෙන් පණිවිඩයක් ලැබිණ. කූෂි
ගෙදලියාගේ පුත්‍රයාය. ගෙදලියා අම-
රියාගේ පුත්‍රයාය. අමරියා හෙසකි-
යාගේ පුත්‍රයාය. ශෙපනියාට ලැබුණු
පණිවිඩය මෙයයි.
**2** "මම පොළොව මතුපිට තිබෙන
සෑම දෙයක්ම සම්පූර්ණයෙන්ම විනාශ
කරන්නෙමි" කියා යෙහෝවා දෙවි පව-
සන්නේය.[3]
**3** "මම මිනිසුන්වද සතුන්වද[4]
ආකාශයේ පක්ෂීන්වද මුහුදේ මත්ස්‍ය-
යන්වද සම්පූර්ණයෙන්ම විනාශ
කරන්නෙමි.[5] මිනිසුන්ව පාපයට හසු
කරන දේවල් විනාශ කර දුෂ්ටයන්ව
පොළොවෙන් තුරන් කර දමන්නෙමි.[6]
එක මිනිසෙකුවත් මම දේශයේ
ඉතුරු නොකරන්නෙමි"[7] කියා යෙ-
හෝවා දෙවි පවසන්නේය. **4** "මම
යූදා දේශයට විරුද්ධවත් යෙරුසල-
මේ සියලු වැසියන්ට විරුද්ධවත්
මගේ බලය පෙන්වන්නෙමි.*[8] බාල්
දෙවියාට නමස්කාර කරන කිසිවෙ-
කුවත් මම මේ ස්ථානයේ ඉතුරු
නොකරන්නෙමි.[9] බොරු දෙවිවරුන්ට
වැඳුම්පිදුම් කරන පූජකයන් ඇතුළු
සියලුම පූජකයන්ව මම විනාශ කර
ඔවුන්ගේ නම් මකා දමන්නෙමි.[10]
**5** සඳළුතලයේ සිට ආකාශ වස්-
තූන්ට[11] වැඳුම්පිදුම් කරන අයවත්[12]
යෙහෝවා නම් වූ මාගේ නාමයෙන්
දිවුරන අතරතුරේ[13] මල්කාම් දෙවි-
යාගේ නාමයෙන්ද දිවුරා නමස්කාර
කරන අයවත් මම විනාශ කරන්-
නෙමි.[14] **6** යෙහෝවා දෙවි වන මට
ළං වී මාගෙන් මඟ පෙන්වීම් පත-
නවා වෙනුවට[15] යෙහෝවා දෙවි වන
මාගෙන් ඈත් වී සිටින සියලුදෙනා-
වත් මම විනාශ කරන්නෙමි."[16]

---

**ශෙප 1:4*** මූ.අ., "මාගේ බලවත් හස්තය."

**7** විශ්වයේ පාලකයාණන් වන යෙ-
හෝවා දෙවි ඉදිරියේ නිහඬ වන්න.[1]
මන්ද යෙහෝවා දෙවිගේ දවස ළං වී
තිබේ.[2] යෙහෝවා දෙවි පූජාවක් සූදා-
නම් කර[3] ඒ සඳහා ආරාධිතයන්ව
කැඳවා තිබේ.[4]
**8** "යෙහෝවා දෙවි වන මම ඒ
පූජාව ඔප්පු කරන දවසේදී පාලක-
යන්ටත් රජුගේ පුත්‍රයන්ටත් විදේශි-
කයන්ගේ වස්ත්‍රවලින් සැරසී සිටින
සියලුදෙනාටත්[5] දඬුවම් කරන්නෙමි.[6]
**9** ඒ දවසේදී, සිංහාසනය ළඟට වී
සිටින සියලුදෙනාටත් තමුන්ගේ ස්වා-
මිවරුන්ගේ නිවෙස්වල සැහැසියා-
වෙන් සහ වංචාවෙන් ක්‍රියා කරන
අයටත් මම දඬුවම් කරන්නෙමි."[7]
**10** යෙහෝවා දෙවි තවදුරටත් මෙසේ
පවසන්නේය. "ඒ දවසේදී මත්ස්‍ය දො-
රටුවෙන්[8] මහත් ආන්දෝලනයක්ද
අලුත් නුවරින්[9] වැලපීමේ හඬක්ද කඳු-
වලින්[10] මහත් ඝෝෂාවක්ද ඇසෙනු
ඇත. **11** මක්තෙෂ්හි* වැසියෙනි,
මොරගසන්න.[11] මන්ද වෙළඳා-
මේ නිරත වූ සියල්ලෝ විනාශ
වී ගියෝය.[12] රිදී ගනුදෙනුකරුවෝද
විනාශ වී ඇත.
**12** "ඒ කාලයේදී මම පහන් දල්වා-
ගෙන යෙරුසලමේ අස්සක් මුල්ලක්
නෑර සෝදිසි කරන්නෙමි.[13] මණ්ඩි
බසින තෙක්ම එකම භාජනයේ නිශ්-
චලව තිබෙන වයින් මෙන් තම ජීවිත
වෙනස් කිරීමට කැමැත්තක් නොදක්-
වන මිනිසුන්ට මම දඬුවම් කරන්-
නෙමි.[14] 'යෙහෝවා දෙවි හොඳක්වත්
නරකක්වත් නොකරයි' කියා ඔවුහු
සිතන්නෝය.[15] **13** සතුරෝ ඇවිත්

---

**11** යෙරෙ 4:8; යෙරෙ 25:34; යෝවෙ 1:5; යාකො 5:1; **12** නෙහෙ 3:31; එළි 18:11; **13** දේශ 12:14; යෙසා 26:21; ආමො 9:2; හෙබ්‍රෙ 4:13; එළි 2:23; **14** යෙසා 56:12; යෙරෙ 48:11; **15** ගීතා 10:13; ගීතා 14:1; ගීතා 94:7; 2පේතෘ 3:4.

---

**ශෙප 1:11*** යෙරුසලමේ මත්ස්‍ය දොරටුව සහ අලුත් නුවර අසල පිහිටි ස්ථානයක් බව පෙනේ.

**1 පරි.**

**1** 2රාජා 21:18
**2** 2රාජා 22:1
යෙරෙ 1:2
**3** 2රාජා 22:16
යෙසා 6:11
යෙරෙ 6:8
මීකා 7:13
**4** හොෂෙ 4:3
**5** යෙරෙ 4:25
යෙරෙ 12:4
හොෂෙ 4:3
**6** එස 7:19
එස 14:3
**7** එස 14:13
**8** නික් 15:12
යෙසා 14:27
යෙරෙ 7:30
**9** ගණන් 25:3
විනි 2:13
2ලේක 28:2
යෙරෙ 11:17
**10** 2රාජා 23:5
හොෂෙ 10:5
**11** 2රාජා 23:12
2ලේක 33:3
යෙරෙ 19:13
යෙරෙ 32:29
**12** 1රාජා 18:21
2රාජා 17:33
මතෙ 6:24
**13** යෙසා 48:1
හොෂෙ 4:15
**14** යොෂු 23:7
1රාජා 11:33
යෙරෙ 49:1
**15** ගීතා 14:2
යෙසා 43:22
රෝම 3:11
**16** 1සාමු 15:11
යෙසා 1:4
යෙසා 9:17
යෙරෙ 2:13
හෙබ්‍රෙ 3:12
හෙබ්‍රෙ 10:38

**2 තීරුව**

**1** ගීතා 76:8
හබ 2:20
සෙක 2:13
**2** යෙසා 13:6
2පේතෘ 3:10
**3** යෙසා 34:6
යෙරෙ 46:10
එස 39:17
එළි 19:17
**4** 1සාමු 16:5
**5** 2රාජා 10:22
**6** 2රාජා 25:7
යෙසා 24:21
යෙරෙ 39:6
**7** 2රාජා 5:21
නෙහෙ 5:15
**8** 2ලේක 33:14
නෙහෙ 3:3
නෙහෙ 12:39
**9** 2ලේක 34:22
**10** 2ලේක 3:1

ඔවුන්ගේ වස්තුව කොල්ල කා ගෙවල්
පාළු කරනු ඇත.[1] ඔවුන් ගෙවල් ගො-
ඩනැඟුවද ඒ ගෙවල්වල ජීවත් වන්න
ඔවුන්ට ලැබෙන්නේ නැත.[2] ඔවුන්
මිදිවතු වවන නමුත් එවායින් සාදන
වයින් ඔවුන්ට බොන්න ලැබෙන්-
නේ නැත.[3]
**14** "'යෙහෝවා දෙවිගේ මහත්
දවස[4] ළං වී තිබේ.[5] ඒ දවස ඉතා ඉක්-
මනින් පැමිණෙන්නේය.[6] යෙහෝවා
දෙවිගේ දවසේදී බියකරු හඬක් දසත
පැතිරෙයි.[7] එදින බලවන්තයෝ පවා
කෑ මොර දෙති.[8] **15** ඒ දවස උදහස
ප්‍රකාශ කරන දවසක්ය. දුක් කරදර
හා වේදනාවලින් පිරුණු දවසක්ය.[9]
සැඩ කුණාටුවෙන් සියල්ල වැනසී
යන විපත්තිවලින් පිරුණු අඳුරු දව-
සක්ය.[10] වලාකුළුවලින් වැසුණු ඝන
අන්ධකාරය දසත පැතිරුණු දව-
සක්ය. **16** ඒ දවසේදී, පවුරුවලින්
වට වූ සුරක්ෂිත නුවරවලටත් උස්
බලකොටුවලටත්*[11] විරුද්ධව නඟන
යුධ ඝෝෂා හා හොරණෑ හඬ ඇසෙනු
ඇත.'[12] **17** මම මනුෂ්‍යයන් පිට
විපත්ති ගෙනෙන්නෙමි. යෙහෝවා
දෙවි වන මට විරුද්ධව පව් කළ
බැවින්[13] ඔවුහු අන්ධයන් මෙන් ඉබා-
ගාතේ යන්නෝය.[14] මම ඔවුන්ගේ
ලේ දූවිලි මෙන්ද[15] ඔවුන්ගේ බඩවැල්
ගොම මෙන්ද සෑම තැනම විසුරු-
වන්නෙමි.[16] **18** 'යෙහෝවා දෙවිගේ
උදහස ප්‍රකාශ කරන ඒ දවසේදී ඔවුන්
සතුව තිබෙන රන්වලින්වත් රිදීව-
ලින්වත් ඔවුන්ට ගැලවීම ලබාගත
නොහැක.[17] ගින්නක් මෙන් ඇවිළෙන
ඔහුගේ උදහස නිසා මුළු ලෝක-
යම විනාශ වී යයි.[18] ඔහු ලෝකයේ
සියලු වැසියන් මත භයානක විනාශ-
යක් ගෙනෙන්නේය.'"[19]

**2** කිසි ලැජ්ජාවක් නැතුව[20] දිග-
ටම දුෂ්ට මාර්ගයේ ගමන් කරන
ජනයෙනි, රැස් වෙන්න.[21] **2** දෙවි
තීන්දු කළ දේ ඉටු වන්නේය.[22]
යෙහෝවා දෙවිගේ උදහස[1] ප්‍රකාශ
කරන දවස පැමිණ සුළඟට ගසා-
ගෙන යන දහයියා මෙන් සැණෙකින්
අවසන් වන්නේය. ඒ දවස පැමිණ
යෙහෝවා දෙවිගේ දැවෙන උදහස
ඔබ පිට වැගිරීමට පෙර[2] **3** දේශ-
යේ වසන නිහතමානී සියල්ලෙනි,[3]
මේ දේ කරන්න. දෙවිගේ නීති පිළි-
පදින ඔබ සියලුදෙනාම යෙහෝවා
දෙවි වෙතට හැරෙන්න.[4] ධර්මිෂ්ඨ-
කම සොයා ඒ අනුව ජීවත් වන්න.[5]
නිහතමානීව කටයුතු කිරීමට වෙර
දරන්න.[6] එසේ කළොත් යෙහෝවා
දෙවිගේ උදහස ප්‍රකාශ කරන දව-
සේදී සමහරවිට[7] ඔබට රැකවරණය
ලැබෙයි.[8] **4** ගාසා නගරයේ සියලු
වැසියෝ ඇයව අත්හැර යන්නෝය.[9]
අෂ්කෙලොන් නගරය පාළු බිමක් වනු
ඇත.[10] මහ දවාලේ සතුරෝ ඇවිත්[11]
අෂ්දොද් නගරයේ වැසියන්ව පන්නා
දමන්නෝය.[12] එක්‍රොන් නගරයද සම්-
පූර්ණයෙන්ම විනාශ කරනු ලැබේ.[13]
**5** මුහුදුබඩ ප්‍රදේශයේ වාසය කරන
කෙරෙතිවරුන්ට මුහුණ දීමට සිදු
වන විපත මොන තරම් දරුණුද![14]
මන්ද යෙහෝවා දෙවි ඔබට විරුද්-
ධව තීන්දුවක් දී තිබේ. කානාන් දේ-
ශයේ වාසය කරන පිලිස්තිවරුනි,
මම ඔබෙන් එක් කෙනෙකුවත් ඉතුරු
නොකර ඔබ සියලුදෙනාවම විනාශ
කර දමන්නෙමි.[15] **6** එවිට මුහුදු-
බඩ ප්‍රදේශය තණබිමක් බවට පත්
වෙයි.[16] එඬේරු එහි ළිංද බැටළු ගාල්ද
සාදාගනු ඇත. **7** යූදා පෙළපතෙන්
ඉතුරු වී සිටින අය එහි වාසය කරන්-
නෝය.[17] එහිදී ඔවුන්ට ඇති තරම්
කෑම තිබෙනු ඇත. සවස් වරුවේදී
ඔවුහු අෂ්කෙලොන් නගරයේ නිවෙස්-
වලට වී විවේක සුවයෙන් කල් ගෙවනු
ඇත. මන්ද ඒ කාලයේදී ඔවුන්ගේ

**1 පරි.**

**1** යෙසා 6:11; යෙරෙ 5:17; හබ 2:7
**2** ආමො 5:11
**3** ද්වි 28:30
**4** මලා 4:1
**5** යෝවෙ 2:1; ක්‍රියා 2:20; එළි 6:17
**6** හබ 2:3
**7** යෙසා 66:6; හෙබ්‍රෙ 12:26
**8** යෙසා 33:7; යෙරෙ 48:41; යෝවෙ 1:15; එළි 6:16
**9** යෙරෙ 30:7; ලූක් 21:25; එළි 6:17
**10** යෝවෙ 2:2; ආමො 5:18
**11** යෙසා 2:15
**12** යෙරෙ 4:19
**13** යෙසා 24:5; දානි 9:5
**14** ද්වි 28:28; යෙසා 59:10
**15** ගීතා 79:3; එළි 14:20
**16** ගීතා 83:10; යෙරෙ 9:22; යෙරෙ 16:4; යෙරෙ 25:33
**17** හිතෝ 11:4; යෙසා 2:20; එස 7:19; යාකො 5:1
**18** ද්වි 32:22; යෙරෙ 7:20; ශෙප 3:8
**19** යෙරෙ 4:27

**2 පරි.**

**20** යෙසා 1:4; යෙරෙ 6:15
**21** යෝවෙ 1:14; යෝවෙ 2:16
**22** 2පේතෘ 3:9

**2 තීරුව**

**1** 2ලේක 36:16; යෙරෙ 23:20; විලා 4:11
**2** 2රාජා 23:26; නාහු 1:6; මලා 4:1
**3** ගීතා 25:9; ගීතා 76:9; මතෙ 5:5
**4** ගීතා 105:4; යෙසා 2:3; යෙසා 55:6; ආමො 5:6
**5** මතෙ 6:33; රෝම 1:17; රෝම 10:3; එෆී 4:24
**6** ගීතා 25:9; හිතෝ 22:4

---

ශෙප **1:16*** මූ.අ., "පවුරු කොනේ තිබෙන බල-
කොටු."

---

**7** ගීතා 37:11; යෝවෙ 2:14; ආමො 5:15; යෝනා 3:9; **8** උත් 7:16; ගීතා 31:20; යෙසා 26:20; **9** යෙරෙ 25:20; ආමො 1:6; සෙක 9:5; **10** යෙරෙ 25:20; යෙරෙ 47:5; එස 25:16; **11** ගීතා 91:6; යෙරෙ 15:8; **12** ආමො 1:8; **13** සෙක 9:5; **14** එස 25:16; **15** යොෂු 13:3; යෙසා 14:29; **16** යෙසා 17:2; එස 25:5; **17** යෙසා 11:11; යෙරෙ 31:7; මීකා 2:12; මීකා 4:7; හග් 1:12.

දෙවි වන යෙහෝවා ඔවුන්ට කරු-
ණාව පෙන්වනු ඇත.[1] සතුරු දේශවල
සිටින ඔවුන්ව ඔහු නැවත එක් රැස්
කරනු ඇත.[2]

**8** “මාගේ සෙනඟට මෝවබ්වරු
නින්දා කරන ආකාරයත්[3] අම්මොන්-
වරු අපහාසාත්මකව කතා කරන
ආකාරයත් මට ඇසුණි.[4] මාගේ සෙ-
නඟගේ දේශයට කරන්න යන දේ
ගැන ඔවුහු උදම් අනති.” **9** නමුත්
ස්වර්ගයේ සේනාවල අධිපතිද ඊශ්‍රා-
යෙල්වරුන්ගේ දෙවිද වන යෙහෝවා
මෙසේ පවසන්නේය. “සොදොම් දේශ-
යට සිදු වූ දේ මෝවබ් දේශයටත්[5]
ගොමෝරාවට සිදු වූ දේ අම්මොන්-
වරුන්ටත්[6] සිදු වන බව ජීවමාන
දෙවි වන මම[7] සහතිකවම පවසන්-
නෙමි. ඒ දේශ සදහටම කටු පඳුරුව-
ලින් වැසී ගිය ලුණු වළවල් සහිත
පාළු ස්ථාන බවට පත් වනු ඇත.[8]
නිදහස් වී පැමිණෙන මාගේ සෙනඟ
ඔවුන්ගේ දේපළ කොල්ල කා ඔවුන්-
ගේ දේශය අයිති කරගන්නෝය.[9]
**10** ‘ඔවුන්ගේ අහංකාරකම නිසා
ඔවුන්ට ලැබෙන දඬුවම එයයි.[10] මන්ද
ඔවුහු ස්වර්ගයේ සේනාවල අධිපති වූ
යෙහෝවා දෙවිගේ සෙනඟට අපහාස
කරමින් උඩඟු ලෙස ක්‍රියා කළෝය.[11]
**11** යෙහෝවා දෙවි ඔවුන්ට විරුද්ධව
ගෙනෙන දඬුවම ඉතා භයානකය.[12]
පොළොවේ වැසියන් නමස්කාර කරන
සියලු දෙවිවරුන්ව ඔහු සම්පූර්ණ-
යෙන්ම විනාශ කර දමන්නේය.[13]
ඉන්පසු සියලුදෙනා තම තමන්-
ගේ ස්ථානයේ සිට දෙවිට නමස්-
කාර කරන්නෝය.[14] දූපත්වල සියලු
වැසියෝද ඔහුට නමස්කාර කරන්-
නෝය.’[15]

**12** “ඉතියෝපියාවේ වැසියෙනි,[16]
මගේ කඩුවෙන්[17] ඔබත් පහර කා
නසිනු ඇත.”

**13** “දෙවි උතුරු දෙසින් පිහිටි ඇසි-
රියාවට විරුද්ධවද විනාශයක් ගෙ-
නෙන්නේය.[18] ඔහු නිනිවය නගරය
විනාශ කර[19] දිය පොදක් නැති
පාළුකරයක් බවට පත් කරන්නේය.
**14** අවට සිටින සියලු වනසතුන් ඒ
දේශයට පැමිණ එහි ලගින්නෝය.[1]
පැස්තුඩුවාද ඉත්තෑවාද[2] ඒ දේශ-
යේ කැඩී බිඳී ගිය කණු[3] අතරේ
රාත්‍රිය ගත කරන්නෝය. කුරුල්-
ලෝද කවුළු අතරින් හඬ නඟන්-
නෝය.* ලීයෙන් කළ කැටයම් කැඩී
බිඳී ගොස් සියලු ගොඩනැඟිලි ජරා-
වාස වී යයි.[4] **15** ‘මා හා සමාන
වෙන කිසිවෙක් නැත’[5] කියා සිතමින්
කිසි බියක් සැකක් නොමැතිව තේ-
ජාන්විතව වැජඹුණු නගරයට ලැබෙන
දඬුවම එයයි.[6] ඒ නගරය වනසතුන්-
ගේ තෝතැන්නක් වනු ඇත. ඒ නග-
රයට සිදු වන දේ දැක සියලු ජනයා
පුදුමයට පත් වන්නෝය. එය පසු කර
යන සියලුදෙනා ඒ දෙස බලා කවට-
කම් කරන්නෝය.”[7]

**3** කෲර ලෙස අධිපතිකම් කරන
කැරලිකාර වූ දූෂිත නගරයට
දුක් වේ![8] **2** ඇය අකීකරුය.[9] හික්-
මවීම පිළි නොගන්නීය.[10] ඇය ඇගේ
දෙවි වන යෙහෝවාව විශ්වාස කළේ-
වත්[11] ඔහුට ළං වෙන්න උත්සාහ
දැරුවේවත් නැත.[12] **3** ඇගේ පාල-
කයන් ගොරවන සිංහයන් මෙනි.[13]
ඇගේ විනිශ්චයකරුවන්, ඊළඟ දව-
සට කිසිවක් ඉතුරු නොකර ගොදුර
සම්පූර්ණයෙන්ම ගිල දමන රාත්‍රි-
යේ සැරිසරන වෘකයන් මෙනි.[14]
**4** ඇගේ අනාගතවක්තෘවරු ද්‍රෝහීන්
ලෙස කටයුතු කරන අහංකාර පුරු-
ෂයෝය.[15] ඇගේ පූජකයෝ ශුද්ධ
දේ කෙලෙසන්නෝය. ඔවුහු නීතිය
කඩ කරන්නෝය.[16] **5** එහෙත් යෙ-
හෝවා දෙවි සැමවිටම ඔහුගේ සෙ-
නඟ සමඟ ධර්මිෂ්ඨ ලෙස කටයුතු

**2 පරි.**
**1** මීකා 4:10
ලූක් 1:68
**2** ගීතා 126:1
යෙරෙ 23:3
යෙරෙ 29:14
යෙරෙ 30:10
එස 39:25
ආමො 9:14
ශෙප 3:20
**3** යෙරෙ 48:27
එස 25:8
**4** ගීතා 83:4
යෙරෙ 49:1
එස 25:3
**5** උත් 19:24
එස 25:11
ආමො 2:1
**6** එස 25:2
ආමො 1:13
**7** ගණන් 14:21
යෙසා 49:18
යෙරෙ 46:18
රෝම 14:11
**8** ද්වි 29:23
යෙසා 13:19
යෙරෙ 50:40
යෝවෙ 3:19
යූද් 7
**9** මීකා 5:8
**10** යෙසා 16:6
යෙරෙ 48:29
ඔබ 3
**11** යෙසා 10:12
යෙසා 37:23
එස 38:11
යාකො 5:4
1පේතෘ 5:5
**12** නෙහෙ 1:5
**13** හොෂෙ 2:17
සෙක 13:2
**14** ගීතා 22:27
ගීතා 72:9
මලා 1:11
**15** යෙසා 42:4
යෙසා 49:1
**16** යෙසා 20:4
යෙසා 43:3
එස 30:4
**17** ගීතා 17:13
යෙරෙ 47:6
**18** යෙසා 10:12
එස 31:3
එස 31:11
නාහු 3:5
**19** නාහු 3:7
නාහු 3:18

**2 තීරුව**
**1** එළි 18:2
**2** යෙසා 34:11
**3** ආමො 9:1
**4** යෙරෙ 22:14
**5** යෙසා 47:8
**6** යෙසා 22:2
යෙසා 47:7
නාහු 3:1
**7** නාහු 3:19

**3 පරි.** **8** යෙසා 5:7; යෙරෙ 6:6; මලා 3:5; **9** ද්වි 28:15; යෙරෙ 22:21; යෙරෙ 32:23; **10** ගීතා 50:17; යෙසා 1:5; යෙරෙ 5:3; **11** ගීතා 78:22; යෙසා 31:1; යෙරෙ 17:5; **12** යෝබ් 21:14; යෙසා 29:13; හෙබ්‍රෙ 10:22; **13** හිතෝ 28:15; යෙසා 1:23; **14** හබ 1:8; **15** යෙරෙ 23:11; විලා 2:14; මතෙ 7:15; 2පේතෘ 2:1; **16** 1සාමු 2:12; එස 22:26; මීකා 3:9.

**ශෙප 2:14*** හෝ, “සුළඟේ ශබ්දය නැත්නම් වන-සතෙකුගේ හඬ විය හැක.”

කළේය.[1] ඔහු කිසි අධර්මිෂ්ඨකමක්
නොකළේය.[2] ඔහු සෑම උදෑසන-
කම[3] නොවරදවාම ඔවුන්ට ඔහු-
ගේ විනිශ්චයන් දැනුම් දුන්නේය.[4]
එහෙත් අධර්මිෂ්ඨ අය කිසිම ලැජ්ජා-
වක් නැතුව[5] දිගටම අධර්මිෂ්ඨකම්
කළෝය.

**6** "මම ජාතීන්ව විනාශ කර දැමු-
වෙමි. ඔවුන්ගේ උස් බලකොටු* පාළු
වී ගියේය. මංමාවත් විනාශ වී ගියේය.
ඔවුන්ගේ නගරවල ඉතුරු වූයේ නට-
බුන් පමණි.[6] **7** එවිට ඇගේ වාසස්-
ථානය විනාශ නොවන පිණිස,[7] 'මා
කෙරෙහි ගරුබියක් ඇතුව, මාගේ
හික්මවීම පිළිගන්න'[8] කියා මම ඇයට
ආයාචනා කළෙමි. එහෙත් ඇගේ සිත
ඇදී ගියේ දූෂිත දේ වෙතටමය.[9] ඇය
කළ හැම පාපයකටම ඇය මට ගණන්
දිය යුතුයි."[10]

**8** යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. "මගේ සතුරන්ට විරුද්ධව මා
නැඟී සිටින දවස පැමිණෙන තුරු[11]
බලා සිටින්න.[12] ජාතීන් සහ රාජ්‍යයන්
එක් රැස් කර[13] ඔවුන් පිට මාගේ
උදහස වැගිරවීමට මම තීරණය
කළෙමි.[14] ගින්නක් මෙන් ඇවිළෙන
මාගේ උදහස නිසා ලෝකයේ සියලු
වැසියෝ විනාශ වනු ඇත.[15] **9** ඒ
කාලයේදී මම ජනයාට පවිත්‍ර භාෂාව
උගන්වා ඒ ගැන නිවැරදි අවබෝධ-
යක් ඔවුන්ට ලබා දෙන්නෙමි.[16] එවිට
ඒ සියලුදෙනාටම යෙහෝවා දෙවි
වන මාගේ නාමයට අයැදින්නත්[17]
එක්සත්කමින් මට සේවය කරන්නත්
හැකි වනු ඇත."[18]

**10** "ඉතියෝපියාවේ ගංගා දක්වාම
විසිරී සිටින මාගේ සෙනඟ මට තෑග්-
ගක් රැගෙන එනු ඇත.[19] **11** උඩඟු
ලෙස තමන් ගැනම පුරසාරම් දො-
ඩන අයව මම ඒ කාලයේදී ඔබ
අතරෙන් ඉවත් කරන්නෙමි.[20] එබැ-
වින් ඔබ මට විරුද්ධව කළ දේවල්
ගැන ඒ දවසේදී ඔබ ලැජ්ජා නො-
වනු ඇත.[21] ඔබ අතරෙන් කිසිවෙක්
මගේ ශුද්ධ කන්දේදී නැවත කිසිදාක
උඩඟු ලෙස හැසිරෙන්නේ නැත.[1]
**12** යටහත්පහත්, නිහතමානී අය
පමණක් ඔබ අතරේ ඉතුරු වන්-
නෝය.[2] ඔවුහු යෙහෝවා යන මාගේ
නාමය තම රැකවරණය කරගන්-
නෝය.[3] **13** ඊශ්‍රායෙල්වරුන් අත-
රින් ඉතුරු වන අය[4] අධර්මිෂ්ඨකම්
කරන්නේවත්[5] බොරු කියන්නේවත්
නැත.[6] අන් අයව රවටන කිසිවෙක්ද
ඔවුන් අතරේ සිටින්නේ නැත.[7] ඔවුහු
හොඳින් පෝෂණය වී කිසිවෙකුට බිය
නොවී[8] විවේක සුවයෙන් කල් ගෙවනු
ඇත."[9]

**14** සියොන් දියණිය, ප්‍රීති ඝෝෂා
නඟන්න![10] ඊශ්‍රායෙල්, සතුටින් පිනා
යන්න! යෙරුසලම් දියණිය, මුළු
හදවතින්ම ප්‍රීති වෙන්න![11] **15** යෙ-
හෝවා දෙවි ඔබට දුන් දඬුවම දැන්
අවසන් වී ඇත.[12] ඔහු ඔබේ සතු-
රාව පන්නා දැමුවේය.[13] ඊශ්‍රා-
යෙල්හි රජු වන යෙහෝවා දෙවි
දැන් ඔබ සමඟය.[14] ඔබ යළි කිසිදා
විපත්තිවලට බිය වන්නේ නැත.[15]
**16** ඒ දවසේදී යෙරුසලමට මෙසේ
කියනු ලබයි. "සියොන් දියණිය,
භය නොවන්න.[16] ඔබේ දෑත් සවි-
මත් කරගන්න.*[17] **17** ඔබේ දෙවි
වන යෙහෝවා ඔබ සමඟය. බල-
වන්තයෙකු මෙන් දෙවි ඔබව බේරා-
ගන්නේය.[18] ඔහු ඔබ ගැන බොහෝ
සෙයින් ප්‍රීති වනු ඇත.[19] ඔබට දක්වන
ප්‍රේමය ගැන ඔහු සතුටු වන්නේය. ඔබ
ගැන ප්‍රීති ඝෝෂා නඟනු ඇත.

**18** "ඔබේ උත්සවයන්ට සහභාගි
වීමට නොහැකිව ශෝකයෙන් සිටින

**3 පරි.**

**1** ද්වි 32:4
ගීතා 99:4
රෝම 3:26
**2** යෝබ් 34:10
**3** මීකා 7:9
ලූක් 12:2
රෝම 2:5
1කොරි 4:5
**4** යෙරෙ 21:12
සෙක 7:9
**5** යෙරෙ 3:3
යෙරෙ 8:12
ශෙප 2:1
**6** ලෙවී 18:28
යෙසා 37:11
යෙරෙ 25:33
**7** යෙරෙ 7:7
යෙරෙ 25:5
**8** යෙසා 5:4
යෙසා 63:8
ලූක් 19:42
2පේතෘ 3:9
**9** උත් 6:12
ද්වි 32:5
හොෂෙ 9:9
මීකා 2:1
**10** 2ලේක 36:16
**11** යෙසා 42:13
**12** ගීතා 27:14
ගීතා 37:34
ගීතා 62:1
ගීතා 130:7
හිතෝ 20:22
යෙසා 30:18
යාකො 5:7
**13** යෝවෙ 3:2
සෙක 14:2
එළි 16:14
එළි 19:19
**14** ගීතා 69:24
යෙරෙ 10:10
**15** ද්වි 32:22
යෙසා 34:2
එස 36:5
ශෙප 1:18
**16** යෙසා 19:18
එෆී 4:25
**17** 1රාජා 8:43
සෙක 8:21
**18** සෙක 8:23
පිලි 1:27
**19** ගීතා 68:31
ගීතා 72:10
යෙසා 18:7
යෙසා 60:4
ක්‍රියා 8:27
රෝම 15:16
**20** ලූක් 1:51
යාකො 4:6
1පේතෘ 5:5
**21** යෙසා 45:17
යෙසා 54:4

**2 තීරුව**

**1** 2සාමු 22:28
යෙසා 11:9
**2** යෙසා 57:15
යෙසා 61:1
මතෙ 5:3
1කොරි 1:27

**3** හිතෝ 18:10; හෙබ්‍රෙ 6:18; **4** යෙසා 10:22; මීකා 4:7; **5** යෙසා 60:21; මතෙ 13:41; **6** යෙසා 63:8; එෆී 4:25; කොලො 3:9; එළි 14:5; එළි 21:27; **7** හිතෝ 12:22; **8** යෙරෙ 30:10; එස 39:26; **9** එස 34:28; හොෂෙ 2:18; මීකා 4:4; එළි 7:17; **10** එස්රා 3:11; යෙසා 12:6; සෙක 2:10; **11** මීකා 4:8; **12** යෙසා 40:2; සෙක 8:13; **13** මීකා 7:10; සෙක 2:9; රෝම 8:33; **14** යෙසා 33:22; එස 48:35; එළි 7:15; **15** ආමො 9:15; සෙක 14:11; **16** යෙරෙ 46:28; යොහ 12:15; **17** යෙසා 35:3; හෙබ්‍රෙ 12:12; **18** ගීතා 24:8; යෙසා 12:6; **19** ද්වි 30:9; ගීතා 147:11; යෙසා 62:3; යෙසා 65:19; යෙරෙ 32:41.

ශෙප **3:6*** ශෙප 1:16හි පාදසටහන බලන්න.

ශෙප **3:16*** මූ.අ., "සැලෙන්න එපා."

අයව[1] මම එක් රැස් කරන්නෙමි.[2]
ඔවුන්ට ඔබ ළඟට ඒමට නොහැකි
වූයේ ඔවුන් අන් දේශයක නින්දා
විඳිමින් සිටි නිසයි.[3] **19** ඒ කාල-
යේදී ඔබට පීඩා කරන අයට විරුද්ධව
මම ක්‍රියා කරන්නෙමි.[4] කොරගසමින්
සිටින සෙනඟව ගලවාගන්නෙමි.[5]
දසත විසිර සිටින සෙනඟව මම එකට
එකතු කරන්නෙමි.[6] ඔවුහු තමන්
නින්දාවට ලක් වූ දේශයේදීම සියලු-
දෙනාගේ ප්‍රශංසාවට ලක් වනු ඇත.
සියලුදෙනා ඉදිරියේ හොඳ නාමයකුත්
මම ඔවුන්ට ලබා දෙන්නෙමි. **20** ඒ
කාලයේදී මම ඔබේ සෙනඟ එක් රැස්
කරගෙන නැවත ඔවුන්ගේ මව්බිමට
රැගෙන එන්නෙමි. ඔබේ ඇස් පනාපි-
ටම මම ඔවුන්ව නිදහස් කර නැවත
රැගෙන එන්නෙමි. එවිට පොළොවේ
සියලු වැසියන්ගේ ගෞරවය ඔබට
ලැබෙනු ඇත. ඔවුන් අතරේ ඔබට
හොඳ නාමයක්ද ලැබෙනු ඇත.” එසේ
පවසන්නේ යෙහෝවා දෙවිය.[1]

**3 පරි.**
**1** ගීතා 42:3 විලා 1:4 විලා 2:6
**2** යෙරෙ 23:3 හොෂෙ 1:11
**3** විලා 5:1
**4** යෙසා 26:11 යෙසා 60:14 සෙක 14:3
**5** එස 34:16 මීකා 4:6
**6** යෙසා 11:11 යෙසා 27:12 එස 28:25 ආමො 9:14 මීකා 4:7

**2 තීරුව** **1** යෙසා 60:15; යෙසා 61:7; යෙරෙ 30:10; යෙරෙ 33:9; එස 39:25.

# හග්ගයි*

**1** දාරියුස් රජකම් කළ දෙවන
අවුරුද්දේ[1] හයවන මාසයේ
පළමුවන දින යෙහෝවා දෙවි අනාග-
තවක්තෘ හග්ගයි[2] මාර්ගයෙන්, යූදා
දේශයේ ආණ්ඩුකාරයා වූ[3] ෂෙයල්-
ටියල්ගේ[4] පුත් සෙරුබාබෙල්ට[5] හා
උත්තම පූජකයා වූ යෙහොෂාදාක්-
ගේ[6] පුත් යොෂුවාට[7] මෙම පණිවිඩය
දුන්නේය.
**2** “ස්වර්ගයේ සේනාවල අධිපති*[8]
වන යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. ‘“යෙහෝවා දෙවිගේ ගෘහය
නැවත ගොඩනඟන්න තවම කාලය
පැමිණ නැත” කියා මේ ජනතාව
කියන්නෝය.’ ”[9]
**3** යෙහෝවා දෙවි අනාගතවක්තෘ
හග්ගයි මාර්ගයෙන් තවදුරටත් මෙසේ
පැවසුවේය. **4** “මාගේ ගෘහය මෙසේ
නාස්ති වී තිබියදී[10] ඔබ අලංකාර
ලීවලින් සැරසූ ඔබේ ගෙවල්වල සුව
සේ ජීවත් වන්නහුය.[11] මෙවැනි කාල-
යක ඔබ එලෙස කටයුතු කිරීම
සුදුසු දෙයක් කියා ඔබ සිතන්න-
හුද? **5** ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි වන මා පව-
සන මේ දේට දැන් සවන් දෙන්න.
‘ඔබේ ක්‍රියාකලාපය ගැන හොඳින්
සිතා බලන්න.[1] **6** ඔබ බොහෝ බීජ
වැපුරූ නමුත් නෙළාගන්නේ ඉතා අඩු
අස්වැන්නකි.[2] ඔබට කන්න යමක්
තිබුණත් තෘප්තියට පත් වන තුරු
කන්න ලැබෙන්නේ නැත.[3] ඔබට
බොන්න යමක් තිබුණත් ඇති තරම්*
බොන්න ලැබෙන්නේ නැත. ඇඳුම්
ඇන්දත් ඔබට උණුසුමක් ලැබෙන්-
නේ නැත. ඔබ මුදල් හම්බ කළත්
හිල් ඇති පසුම්බියකට දමන්නාක්
මෙන් ඒවා ඔබෙන් ගිලිහී යයි.’ ”[4]
**7** “ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. ‘ජනයෙනි, ඔබේ ක්‍රියාකලාපය
ගැන හොඳින් සිතා බලන්න.’[5]
**8** “ ‘කඳුකරයට ගොස් ගස් කපා-
ගෙන ඇවිත්[6] මේ ගෘහය ගොඩ-
නඟන්න.[7] මාව ගෞරවයට පත් කරන
පිණිස එසේ කරන්න.[8] එවිට මේ

**1 පරි.**
**1** එස්රා 4:24 සෙක 1:1
**2** එස්රා 5:1 එස්රා 6:14
**3** එස්රා 1:8 එස්රා 5:14
**4** 1ලේක 3:17 ලූක් 3:27
**5** 1ලේක 3:19 එස්රා 3:2 එස්රා 5:2 මතෙ 1:12
**6** 1ලේක 6:15
**7** සෙක 3:1 සෙක 6:11
**8** 1සාමු 1:3 2රාජා 6:17
**9** එස්රා 4:4 එස්රා 4:23
**10** යෙරෙ 26:18 යෙරෙ 52:13 දානි 9:17
**11** 2සාමු 7:2

**2 තීරුව**
**1** විනි 19:30 ගීතා 119:59 විලා 3:40 මලා 2:2
**2** ද්වි 28:38 ආමො 4:9
**3** ලෙවී 26:26 එස 4:16
**4** දේශ 5:6 යාකො 4:2
**5** හග් 1:5
**6** 2ලේක 2:8 එස්රා 3:7

**7** එස්රා 5:2; එස්රා 6:15; සෙක 1:16; **8** නික් 29:43; ගීතා 29:9; යෙසා 60:13.

හග් නම* තේරුම, “උත්සව දවසක උපන ලැබූ.”
**1:2*** හග්ගයිගේ අනාවැකි පොත තුළ 14 වතාවක් යෙහෝවා දෙවිව මෙලෙස හඳුන්වා ඇත.

හග් **1:6*** මූ.අ., “මත් වන තුරු බොන්න.”

ගෘහය ගැන මම සතුටු වෙමි.’[1] එසේ
පවසන්නේ යෙහෝවා දෙවිය.”
9 “ ‘ඔබ බොහෝ දේවල් බලාපො-
රොත්තුවෙන් සිටියත් ඔබට ලැබුණේ
අල්පයකි.[2] ලැබුණු දේ ඔබේ නිවසට
ගෙනාවත් මම එක හුස්මක් හෙළා
ඒ සියල්ල නැති කර දැමුවෙමි.[3] මා
එසේ කළේ ඇයි කියා ඔබ දන්න-
වාද?’[4] ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මෙසේ පවසයි.
‘මා එසේ කළේ ඔබ මාගේ ගෘහය
පාළුවට යන්න ඉඩහැර, ඔබේ ගෙවල්
දොරවල් වැඩි දියුණු කරගන්න වෙ-
හෙසෙන නිසයි.[5] 10 ඔබේ දේශයට
අහසින් පිනි වැටුණේවත් පොළො-
වෙන් අස්වැන්න ලැබුණේවත් නැත්-
තේ ඒ නිසයි.[6] 11 මම දේශය පුරා
නියඟයක් ඇති කළෙමි. එය කඳුකර-
යටත් ධාන්‍යවලටත් අලුත් වයින්-
වලටත්[7] තෙල්වලටත් පොළොවෙන්
හටගන්න පලදාවටත් දේශයේ වැසි-
යන්ටත් සියලු සතුන්ටත් ඔබේ දැතේ
වීර්යයෙන් කරන සියලු වැඩවලටත්
බලපෑවේය.’ ”[8]
12 ෂෙයල්ටියල්ගේ පුත් සෙරුබා-
බෙල්ද[9] යෙහොෂාදාක්ගේ[10] පුත්‍රයා වූ
උත්තම පූජක යොෂුවාද අන් සියලු-
දෙනාද තමන්ගේ දෙවි වන යෙහෝවා
පැවසූ දේට ඇහුම්කන් දුන්නෝය.[11]
ඔවුන්ගේ දෙවි වන යෙහෝවා අනාග-
තවක්තෘ හග්ගයිව[12] ඔවුන් වෙතට
එවූ නිසා ඔහු කී දේට ඔවුහු ඇහුම්කන්
දුන්නෝය. ජනයාට යෙහෝවා දෙවි
කෙරෙහි ගරුබියක්ද ඇති විය.[13]
13 යෙහෝවා දෙවිගේ පණිවිඩ-
කරු[14] වූ හග්ගයි, යෙහෝවා
දෙවි තමාට නියම කළ ආකාර-
යට[15] ජනයාට මෙසේ කීවේය. “ ‘මා
ඔබ සමඟය’[16] කියා යෙහෝවා දෙවි
කියන්නේය.”
14 යෙහෝවා දෙවි, යූදා දේශයේ
ආණ්ඩුකාරයා වූ ෂෙයල්ටියල්ගේ පුත්
සෙරුබාබෙල්වද යෙහොෂාදාක්ගේ
පුත්‍රයා වූ උත්තම පූජක යොෂුවා[17] හා
අන් සියලුදෙනාවද දිරිගැන්වූවේය.[18]
එහෙයින් ඔවුහු මහත් උද්‍යෝගයකින්
ගොස් ස්වර්ගයේ සේනාවල අධිපති
වන තමුන්ගේ දෙවි වූ යෙහෝවා-
ගේ ගෘහයේ වැඩ පටන්ගත්තෝය.[1]
15 ඔවුන් වැඩ පටන්ගත්තේ දාරියුස්[2]
රජකම් කළ දෙවන අවුරුද්දේ හයවන
මාසයේ විසිහතරවනදාය.

2 හත්වන මාසයේ[3] විසිඑක්-
වන දින අනාගතවක්තෘ හග්-
ගයි[4] මාර්ගයෙන් යෙහෝවා දෙවි
මෙම පණිවිඩය දුන්නේය. 2 “යූදා
දේශයේ ආණ්ඩුකාරයා වූ[5] ෂෙයල්ටි-
යල්ගේ[6] පුත් සෙරුබාබෙල්ටත්[7] යෙ-
හොෂාදාක්ගේ[8] පුත්‍රයා වූ උත්තම
පූජක යොෂුවාටත්[9] අන් සියලුදෙනා-
ටත් මෙසේ කියන්න. 3 ‘මීට පෙර
මේ ගෘහය මොන තරම් තේජාන්-
විත තත්වයක තිබුණාද කියා මතක
තිබෙන්නේ කාටද?[10] දැන් මේ ගෘහ-
යේ තත්වය ගැන ඔබ සිතන්නේ
කුමක්ද? නැවත කිසිදාක මේ ගෘහය
මුලින් තිබූ තත්වයට ගත හැකියි
කියා ඔබ සිතනවාද?’ ”[11]
4 “එහෙත් යෙහෝවා දෙවි දැන්
මෙසේ පවසයි. ‘සෙරුබාබෙල්, ධෛර්-
යවත් වෙන්න.[12] උත්තම පූජක යො-
ෂුවා, ඔබත් ධෛර්යවත් වෙන්න.’
“ ‘දේශයේ සියලු වැසියෙනි, ධෛර්-
යවත් වී දැන් වැඩ පටන්ගන්න’[13]
කියා යෙහෝවා දෙවි පවසන්නේය.
“ ‘මන්ද මම ඔබ සමඟ සිට ඔබට
උපකාර කරන්නෙමි’[14] කියා ස්වර්ග-
යේ සේනාවල අධිපති වන යෙහෝවා
දෙවි කියන්නේය. 5 ‘ඔබ ඊජිප්තු
දේශයෙන් පිටතට එන විට මා ඔබ
සමඟ ඇති කරගත් ගිවිසුම මතක්
කරගන්න.[15] එදා මාගේ බලය ලබා දී
ඔබට මඟ පෙන්නුවාක් මෙන් අදත්
මම ඔබට මඟ පෙන්වන්නෙමි.[16] එබැ-
වින් දැන් භය නොවන්න.’ ”[17]
6 “ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මෙසේද පවසයි.

**1 පරි.**
1 1රාජා 9:3; 2ලේක 7:16
2 යෙසා 17:11; හොෂෙ 8:7
3 යෙසා 40:7; මලා 2:2
4 යෝබ් 10:2; 1කොරි 11:31; යාකො 4:1; එළි 3:19
5 නෙහෙ 10:39; හග් 1:4; පිලි 2:21
6 ලෙවී 26:19; ද්වි 28:23; 1රාජා 8:35
7 යෙසා 24:7; හොෂෙ 2:8
8 ද්වි 28:20; යෝවෙ 1:11
9 එස්රා 5:2
10 1ලේක 6:15
11 යෙරෙ 7:23; හෙබ්‍රෙ 3:7
12 එස්රා 5:1; එස්රා 6:14
13 ගීතා 112:1; හිතෝ 1:7; දේශ 12:13; ක්‍රියා 9:31; හෙබ්‍රෙ 12:28
14 2ලේක 36:15; යෙසා 44:26
15 යෙරෙ 1:17; 2කොරි 5:20
16 2ලේක 15:2; ගීතා 46:7; යෙසා 8:10; රෝම 8:31
17 සෙක 3:6; සෙක 6:13
18 එස්රා 1:1; එස්රා 1:5; සෙක 4:6; පිලි 2:13

**2 තීරුව**
1 එස්රා 5:2; සෙක 6:15; හෙබ්‍රෙ 13:21
2 හග් 1:1

**2 පරි.**
3 1රාජා 8:2
4 එස්රා 5:1; එස්රා 6:14
5 එස්රා 1:8
6 1ලේක 3:17
7 සෙක 4:9
8 1ලේක 6:15
9 සෙක 3:8; සෙක 6:11
10 1රාජා 6:1; එස්රා 3:12
11 සෙක 4:10
12 1ලේක 22:13; සෙක 8:9; 1කොරි 16:13; එෆී 6:10
13 යොහ 6:28; ක්‍රියා 18:9; කොලො 3:23; 14 නික් 3:12; යෙසා 43:2; රෝම 8:31; 15 නික් 29:45; නික් 34:10; 16 ගණන් 11:25; යෙසා 63:11; සෙක 4:6; යොහ 14:16; 17 යෙසා 41:10; සෙක 8:13.

‘තව කෙටි කලකින්[1] මම නැවත
වරක් අහසත් පොළොවත් මුහුදත්
ගොඩබිමත් සොලවන්නෙමි.’[2]

**7** “‘මම සියලු ජාතීන්ව සොලවා
ඔවුන්ගේ වටිනා වස්තු මේ ගෘහයට
රැස් කරන්නෙමි.[3] ඒ කාලයේදී මම මේ
ගෘහය තේජසින් පිරී ඉතිරී යන්න
සලස්වන්නෙමි’[4] කියා ස්වර්ගයේ සේ-
නාවල අධිපති වන යෙහෝවා දෙවි
පවසන්නේය.

**8** “‘රිදී මාගේය. රන්ද මාගේය’[5]
කියාද ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි පවසන්නේය.

**9** “ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ පවසයි. ‘මේ අලුත් ගෘහයේ
තේජස කලින් තිබුණු ගෘහයේ තේජස
අභිභවා යයි.’[6]

“‘මම මේ ස්ථානයේදී මාගේ සෙ-
නඟට සමාදානය දෙන්නෙමි’[7] කියා
ස්වර්ගයේ සේනාවල අධිපති වන යෙ-
හෝවා දෙවි පවසයි.”

**10** දාරියුස් රජකම් කළ දෙවන
අවුරුද්දේ නවවන මාසයේ විසිහත-
රවන දින යෙහෝවා දෙවි අනාග-
තවක්තෘ හග්ගයි[8] මාර්ගයෙන් මෙම
පණිවිඩය දුන්නේය. **11** “ස්වර්ගයේ
සේනාවල අධිපති වන යෙහෝවා
දෙවි මෙසේ පවසයි. ‘මේ කාර-
ණය ගැන නීතියේ සඳහන්ව ඇත්-
තේ කුමක්ද කියා පූජකයන්ගෙන් අසා
දැනගන්න.[9] **12** “මිනිසෙක් දෙවිට
කැප කළ මස් කැබැල්ලක් තමාගේ
වස්ත්‍රයේ ඔතාගෙන යන විට, ඒ වස්-
ත්‍රය රොටිවල හෝ හොදිවල හෝ
වයින්වල හෝ තෙල්වල හෝ වෙනත්
කෑමක හෝ ගැවුණොත් ඒවා ශුද්ධ
තත්වයකට පත් වෙයිද?” ’ ”[10]

එවිට පූජකයෝ, “නැත” කියා පිළි-
තුරු දුන්නෝය.

**13** එවිට හග්ගයි මෙසේ ඇසුවේය.
“මළ සිරුරක් ස්පර්ශ කිරීම නිසා අප-
විත්‍ර තත්වයක සිටින කෙනෙක් ඒ
ආහාර ස්පර්ශ කළොත් ඒවා අපවිත්‍ර
වෙන්නේ නැද්ද?”[11]

එවිට පූජකයෝ, “ඔව්, ඒවා අපවිත්‍ර
වෙනවා” කියා පිළිතුරු දුන්නෝය.

**14** ඉන්පසු හග්ගයි මෙසේ කීවේය.
“යෙහෝවා දෙවි මෙසේ පවසන්නේය.
‘මා ඉදිරියේ සිටින මේ ජනතාවත් මේ
ජාතියත් සිටින්නේ ඒ හා සමාන තත්-
වයකය.[1] ඔවුන් කරන සියල්ලද ඔවුන්
ඔප්පු කරන සියලු පූජාද අපවිත්‍රය.’[2]

**15** “‘නමුත් අද සිට මේ කාර-
ණය ගැන හොඳින් සිතා බලන්න.[3]
යෙහෝවා දෙවි වන මාගේ ගෘහ-
යේ අත්තිවාරම දැමීමට කලින් එය
තිබුණු තත්වය ගැන සිතන්න.[4]
**16** ඒ කාලයේදී ධාන්‍ය මිනුම් විස්-
සක් ලබාගැනීමේ බලාපොරොත්තු-
වෙන් ධාන්‍ය ගොඩ අසලට ගිය
කෙනෙකුට ලැබුණේ මිනුම් දහයකි.
වයින් මිනුම් පනහක් ලබාගැනීමේ
අටියෙන් වයින් යන්ත්‍රය ළඟට ගිය
කෙනෙකුට ලබාගන්න හැකි වුණේ
මිනුම් විස්සකි.[5] **17** මම වියළි සුළ-
ඟෙන්ද[6] දිලීර රෝගයෙන්ද[7] හිම කැට
වර්ෂාවෙන්ද[8] ඔබේ අස්වැන්න විනාශ
කළෙමි. ඔබ දැරූ සෑම උත්සාහයක්ම
අසාර්ථක කළෙමි.[9] නමුත් ඔබ අත-
රෙන් කිසිවෙක්වත් මා වෙතට හැරී
ආවේ නැත.’[10] එසේ පවසන්නේ යෙ-
හෝවා දෙවිය.

**18** “‘යෙහෝවා දෙවි වන මාගේ
ගෘහයේ අත්තිවාරම දැමූ මේ දවසේ
සිට[11] එනම්, නවවන මාසයේ විසිහ-
තරවනදා සිට මා ඔබ වෙනුවෙන්
කිරීමට යන දේ බලන්න.[12] **19** මේ
වන විට ධාන්‍ය ගබඩාවේ එක ධාන්‍ය
ඇටයක්වත් ඉතුරු වී තිබෙනවාද?[13]
මිදිවැලේවත් අත්තික්කා ගසේවත්
දෙළුම් ගසේවත් ඔලීව ගසේවත් එක
ගෙඩියක්වත් දකින්න තිබෙනවාද?
නමුත් මේ දවසේ සිට මා ඔබට ආශීර්-
වාද කරන හැටි බලන්න.’ ”[14]

**20** ඒ දවසේදීම එනම්, ඒ මා-
සයේ විසිහතරවන දින[15] යෙ-
හෝවා දෙවි අනාගතවක්තෘ හග්ගයි[16]

**2 පරි.**

**1** ගීතා 37:10
යෙසා 10:25
හෙබ්‍රෙ 12:27
**2** යෙසා 34:4
යෙරෙ 4:24
යෝවෙ 3:16
හෙබ්‍රෙ 12:26
**3** යෙසා 2:2
යෙසා 60:5
යෙසා 60:11
එළි 7:9
**4** නික් 40:35
1රාජා 8:11
යෙසා 66:12
**5** 1ලේක 29:14
ගීතා 24:1
**6** යෙසා 60:13
යෙසා 66:12
හෙබ්‍රෙ 3:6
**7** ගීතා 85:8
යෙසා 2:4
යෙසා 60:17
සෙක 8:12
යොහ 14:27
**8** හග් 1:1
**9** ලෙවී 10:11
ද්වි 33:10
එස 44:23
මලා 2:7
තීත 1:9
**10** නික් 29:37
මතෙ 23:19
**11** ලෙවී 7:21
ගණන් 5:2
ගණන් 9:6
ගණන් 19:11
ගණන් 31:19

**2 තීරුව**

**1** හිතෝ 15:8
හිතෝ 28:9
**2** යෙසා 66:3
**3** හොෂෙ 14:9
මලා 2:2
හෙබ්‍රෙ 3:12
**4** එස්රා 3:10
සෙක 4:9
**5** හග් 1:6
සෙක 8:10
**6** උත් 41:27
ආමො 4:9
**7** ද්වි 28:22
1රාජා 8:37
2ලේක 6:28
**8** යෙසා 28:2
**9** ගීතා 78:46
යෙරෙ 3:24
**10** 2ලේක 28:22
යෙසා 29:13
යෙරෙ 5:3
ආමො 4:6
**11** එස්රා 5:2
සෙක 8:9
**12** ද්වි 32:29
හග් 1:5
**13** හග් 1:6

---

**14** උත් 26:12; ලෙවී 26:4; ගීතා 128:2; හිතෝ 3:10; හිතෝ 10:22; සෙක 8:12; මතෙ 6:33; **15** හග් 2:10; **16** එස්රා 5:1; එස්රා 6:14.

මාර්ගයෙන් තවත් පණිවිඩයක් දුන්-
නේය. **21** “යූදා දේශයේ ආණ්ඩු-
කාරයා වූ සෙරුබාබෙල්ට[1] මෙසේ
කියන්න. ‘මම අහසත් පොළොවත්
සොලවන්නෙමි.[2] **22** මම රාජ්‍යයන්
පෙරළා දමා ජාතීන්ගේ බලය සුනුවි-
සුනු කර දමන්නෙමි.[3] අශ්ව රථද
ඒවා පදවන්නන්වද විනාශ කරන්-
නෙමි. අශ්වයෝද අසරුවෝද එක්ව
මැරුම් කනු ඇත.[4] ඔවුහු එක් එක්
කෙනා තම තමාගේ සහෝදරයාගේ
කඩුවෙන් මැරුම් කන්නෝය.’ ”[5]
**23** “ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මෙසේද පව-
සන්නේය. ‘ෂෙයල්ටියල්ගේ[1] පුත්
සෙරුබාබෙල්,[2] ඒ දවසේදී වැදගත්
කාර්යයක් ඉටු කිරීමට මම ඔබව
තෝරාගන්නෙමි.’ යෙහෝවා දෙවි
තවදුරටත් මෙසේ පවසන්නේය. ‘මා
තෝරාගත් සේවකයා ඔබය.[3] එහෙ-
යින් මාගේ ඇඟිල්ලේ පැළඳ සිටින
වටිනා මුද්දක් සේ මම ඔබව සල-
කන්නෙමි.’[4] එසේ පවසන්නේ ස්වර්ග-
යේ සේනාවල අධිපති වන යෙහෝවා
දෙවිය.”[5]

**2 පරි.**
**1** හග් 1:1
**2** හග් 2:6 හෙබ්‍රෙ 12:26
**3** ගීතා 2:8 යෙසා 60:12 දානි 2:44 ශෙප 3:8
**4** නික් 14:28 ගීතා 76:6 එස 39:20
**5** විනි 7:22 යෙසා 19:2

**2 තීරුව**
**1** 1ලේක 3:17 මතෙ 1:12

**2** 1ලේක 3:19; එස්රා 3:8; **3** යෙසා 42:1; මතෙ 12:18; 1පේතෘ 2:4; **4** යෙරෙ 22:24; යොහ 6:27; 2තිමෝ 2:19; **5** ගීතා 103:21.

# සෙකරියා*

**1** දාරියුස් රජකම් කළ දෙ-
වන අවුරුද්දේ[1] අටවන මාස-
යේ යෙහෝවා දෙවි අනාගතවක්තෘ
සෙකරියාට පණිවිඩයක් දුන්නේය.[2]
සෙකරියා බෙරෙකියාගේ පුත්‍ර-
යාය. බෙරෙකියා ඉද්දෝගේ[3] පුත්‍ර-
යාය. දෙවි සෙකරියාට දුන් පණිවිඩය
මෙයයි. **2** “යෙහෝවා දෙවි වන මම
ඔබේ පියවරුන් සමඟ බොහෝ සේ
උදහස් වුණෙමි.[4]
**3** “ස්වර්ගයේ සේනාවල අධිපති
ලෙස හඳුන්වන යෙහෝවා දෙවි වන
මා පවසන මේ දේ ජනතාවට දන්-
වන්න. ‘ස්වර්ගයේ සේනාවල අධිපති
වන මා යෙහෝවා දෙවිය.* මා වෙ-
තට හැරී එන්න.[5] එවිට මමද ඔබ වෙ-
තට හැරී එන්නෙමි.’[6] එසේ පවසන
මා ස්වර්ගයේ සේනාවල අධිපති වන
යෙහෝවා දෙවිය.”
**4** “ ‘ඔබ ඔබේ පියවරුන් මෙන්
ක්‍රියා නොකරන්න.[7] “ඔබ කරන
නරක දේවල් අත්හැර ස්වර්ගයේ සේ-
නාවල අධිපති වන යෙහෝවා දෙවි
වෙතට නැවත හැරී එන්න”[1] කියා
අනාගතවක්තෘවරු ඔබේ පියවරුන්ට
පැවසුවෝය.’ ”[2]
“ ‘නමුත් අනාගතවක්තෘවරුන්
මාර්ගයෙන් මා කියූ දේට ඔවුහු ඇහුම්-
කන් දුන්නේ නැත. යෙහෝවා දෙවි
වන මා කී දේ ගණනකටවත් ගත්තේ
නැත.[3]
**5** “ ‘ඔබේ පියවරු අද ජීවතුන්
අතර නැත.[4] ඔබේ පියවරුන්ගේ
කාලයේ ජීවත් වූ අනාගතවක්තෘ-
වරුද මිය ගොස් ඇත.[5] **6** නමුත්
මාගේ සේවකයන් වූ අනාගතවක්තෘ-
වරුන් මාර්ගයෙන් පැවසූ සෑම දෙ-
යක්ම එලෙසම ඉටු වූයේ නැද්ද?[6]
මා තීන්දු කළ දේද එලෙසම සිදු
වූයේ නැද්ද?[7] ඔබේ පියවරු ඒ සියල්ල
ඔවුන්ගේ ඇස් දෙකෙන්ම දුටුවෝය.’
ඒ නිසා ඔවුන්ට මෙසේ පිළිගැනීමට
සිදු විය. ‘ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි තමා කියූ ලෙසම
අපට ප්‍රතිඵල දුන්නේය.’ ”[8]

සෙක නම* තේරුම, “යෙහෝවා දෙවි සිහි කර ඇත.” **1:3*** මෙම පොත තුළ 53 වතාවක් යෙහෝවා දෙවිව මෙලෙස හඳුන්වා ඇත.

**1 පරි.**
**1** එස්රා 4:24 හග් 1:1 හග් 2:10
**2** එස්රා 5:1 සෙක 1:7
**3** නෙහෙ 12:4
**4** ද්වි 29:27 2රාජා 22:17 යෙරෙ 44:6 සෙක 8:14
**5** යෙරෙ 25:5 එස 33:11 මලා 3:7
**6** යෙසා 55:7 යෙරෙ 12:15 හොෂෙ 14:4 මීකා 7:19
**7** 2ලේක 29:6 එස්රා 9:7 නෙහෙ 9:16 ගීතා 106:6

**2 තීරුව**
**1** යෙසා 1:16 යෙරෙ 3:12 හොෂෙ 14:1
**2** 2ලේක 36:16
**3** යෙරෙ 11:8 යෙරෙ 44:16 සෙක 7:11
**4** දේශ 9:5 දේශ 12:7
**5** හෙබ්‍රෙ 11:37
**6** යෙරෙ 26:15 සෙක 7:7
**7** 2ලේක 36:17 දානි 9:12

**8** ගණන් 33:56; ද්වි 28:20; ද්වි 28:45; යෙසා 3:8; යෙරෙ 23:20; එස 20:43; හොෂෙ 9:15.

**7** දාරියුස් රජකම් කළ දෙවන අවු-
රුද්දේ[1] එකළොස්වන මාසයේ එනම්,
ෂෙබට් මාසයේ විසිහතරවන දින,
යෙහෝවා දෙවි ඉද්දෝගේ[2] පුත්‍රයා
වූ බෙරෙකියාගේ පුත් අනාගතවක්තෘ
සෙකරියාට[3] මෙම දර්ශනය පෙන්වූ-
වේය. **8** “මම රාත්‍රියේ රතු පැහැති
අශ්වයෙකු පිට නැඟ සිටින[4] මිනිසෙ-
කුව දුටුවෙමි.[5] ඔහු නිම්නයේ තිබුණු
මරඳ ගස්[6] අතරෙහි නැවතී සිටියේය.
ඔහු පිටුපසින් තවත් අශ්වයන් සිටි-
නවා මම දුටුවෙමි. උන් රතු, දුඹුරු
සහ සුදු පැහැති අශ්වයෝය.”[7]
**9** එය දුටු මම, “මගේ ස්වාමීනි, මේ
අසරුවන් කවුද”[8] කියා ඇසුවෙමි.
“මේ අසරුවන් කවුද කියා මම
ඔබට කියන්නම්” කියා මා සමඟ
කතා කළ දේවදූතයා මට කීවේය.[9]
**10** එවිට මරඳ ගස් අතරේ නැවතී
සිටි මිනිසා මෙසේ කීවේය. “යෙ-
හෝවා දෙවි මේ අසරුවන්ව එවා
තිබෙන්නේ පොළොවේ අස්සක් මුල්-
ලක් නැර ගමන් කර එය සෝදිසි කර
බැලීමටයි.”[10] **11** ඉන්පසු මරඳ ගස්
අතරේ සිටගෙන සිටි යෙහෝවා දෙ-
විගේ දූතයාට ඒ අසරුවෝ මෙසේ
කීවෝය. “අපි අස්සක් මුල්ලක් නැර
මුළු පොළොව පුරාම ගමන් කළෙමු.[11]
එහි සෑම තැනක්ම සන්සුන්ව සාමකා-
මීව තිබේ.”[12]
**12** එවිට යෙහෝවා දෙවිගේ දූතයා
මෙසේ කීවේය. “ස්වර්ගයේ සේනාවල
අධිපති වන යෙහෝවා දෙවියනි, ඔබ
අවුරුදු හැත්තෑවක් පුරා යෙරුසලමත්
යූදා දේශයේ සියලු නගරත් හෙළාදුටු-
වෙහිය.[13] ඔබ තව කොපමණ කල් එහි
වැසියන්ට දයාව නොපෙන්වා සිටින්-
නෙහිද?”[14]
**13** යෙහෝවා දෙවි, සැනසිල්ලක්
ගෙන දෙන අයුරින් ඒ දේවදූත-
යාට කාරුණිකව පිළිතුරු දුන්නේය.[15]
**14** මා සමඟ කතා කරමින් සිටි
ඒ දේවදූතයා තවදුරටත් මට මෙසේ
කීවේය. “ස්වර්ගයේ සේනාවල අධි-
පති වන යෙහෝවා දෙවි පැවසූ මේ
පණිවිඩය සියලුදෙනාටම ඇසෙන්න
කියන්න. ‘මාගේ සෙනඟට සිදු කළ
දේ දැක මගේ උදහස බොහෝ සෙ-
යින් ඇවිළුණේය. මම යෙරුසලම
හා සියොන් වෙනුවෙන් නැඟී සිටින්-
නෙමි.[1] **15** මාගේ සෙනඟ සමඟ මා
උදහස් වූ බව ඇත්තයි. නමුත් මගේ
උදහසට සීමාවක් තිබිණ.[2] නමුත්
ජාතීහු සීමාව ඉක්මවා ඔවුන්ට පීඩා
කර ඔවුන්ව අන්ත අසරණ තත්වය-
කට පත් කළෝය.[3] කිසි කරදරයක්
නැතුව සුරක්ෂිතව සිටින ඒ ජාතීන්
සමඟ මම බොහෝ සෙයින් උදහස්ව
සිටින්නෙමි.’ ”[4]
**16** “එබැවින් යෙහෝවා දෙවි
මෙසේ කියන්නේය. ‘“මම යෙරුසල-
මට යළි දයාව පෙන්වන්නෙමි.[5] මාගේ
ගෘහය නැවතත් යෙරුසලමෙහි ගො-
ඩනඟන්නෙමි.[6] යෙරුසලම යළි ගො-
ඩනඟන පිණිස එය ලණුවකින් මනිනු
ලබන්නේය.”[7] එසේ පවසන මා ස්වර්-
ගයේ සේනාවල අධිපති වන යෙ-
හෝවා දෙවිය.’
**17** “ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි පැවසූ මෙම
පණිවිඩයත් සියලුදෙනාටම ඇසෙන
සේ කියන්න. ‘මාගේ නගරවලට
මම නොඅඩුව ආශීර්වාද කරන්නෙමි.[8]
යෙහෝවා දෙවි වන මම සියොන්ට
අනුකම්පා කර[9] නැවතත් යෙරුසලම
තෝරාගන්නෙමි.’ ”[10]
**18** මම නැවත දර්ශනයක් මාර්ග-
යෙන් අං සතරක් දුටුවෙමි.[11] **19** “මා
දකින මේ දේවල තේරුම කුමක්ද”
කියා මා සමඟ කතා කරමින් සිටි
දේවදූතයාගෙන් මම ඇසුවෙමි. “යූදා
දේශයත්[12] ඊශ්‍රායෙල් දේශයත්[13] යෙ-
රුසලමත්[14] පාළු කළ බලවතුන්ව මේ
අංවලින් නියෝජනය වන්නේය.”
**20** ඉන්පසු යෙහෝවා දෙවි මට
කම්මල්කරුවන් සතරදෙනෙකුව
පෙන්වූවේය. **21** එවිට මම, “මේ අය
මෙතැනට ඇවිත් සිටින්නේ ඇයි”
කියා ඇසුවෙමි.
ඔහු මෙසේ කීවේය. “ඔබ දුටු
අංවලින්[15] නියෝජනය වන්නේ යූදා
දේශයේ එක් වැසියෙකුටවත් හිස

**1 පරි.**
1 එස්රා 4:24
2 නෙහෙ 12:4
3 එස්රා 5:1
4 හිෂෝ 21:31, එළි 6:4
5 ගීතා 45:3
6 යෙසා 41:19, යෙසා 55:13
7 සෙක 6:2, සෙක 6:6
8 දානි 7:16, සෙක 4:4
9 දානි 8:16, සෙක 4:5
10 ගීතා 91:11, ගීතා 103:21, හෙබ්‍රෙ 1:14
11 ගීතා 103:20
12 සෙක 1:15
13 2ලේක 36:21, යෙරෙ 25:12, දානි 9:2, සෙක 7:5
14 ගීතා 74:10, ගීතා 102:13, යෙසා 64:9
15 යෙසා 40:1, යෙරෙ 29:10, යෙරෙ 30:10, ශෙප 3:15

**2 තීරුව**
1 හොෂෙ 11:8, යෝවෙ 2:18, නාහු 1:2, සෙක 8:2
2 යෙසා 54:8, හෙබ්‍රෙ 12:7
3 ගීතා 69:26, ගීතා 137:7, යෙසා 47:6, යෙරෙ 51:35
4 යෙරෙ 48:11, සෙක 1:11
5 යෙසා 12:1, යෙරෙ 33:14, සෙක 8:3
6 එස්රා 6:14, යෙසා 44:28, හග් 1:14
7 යෙරෙ 31:39, එස 40:3, සෙක 2:1
8 ගීතා 69:35
9 යෙසා 51:3
10 ගීතා 132:13, සෙක 3:2
11 සෙක 1:21
12 2රාජා 24:12, 2රාජා 25:11
13 2රාජා 15:29, 2රාජා 17:6, 2රාජා 18:11, යෙරෙ 50:17
14 2ලේක 36:20
15 දානි 8:9

ඔසවන්න බැරි වන තරමට ඔවුන්ට
පහර දුන් බලවතුන්වයි. දැන් ඔබ
දකින මේ කම්මල්කරුවන් ඇවිත්
සිටින්නේ යූදා දේශයට විරුද්ධව නැඟී
සිටින ඒ බලවතුන්ව විනාශ කර
දමන්නයි.”[1]

**2** මම නැවතත් දර්ශනයක් මාර්ග-
යෙන් බිම මැනීමට භාවිත කරන
ලණුවක් අතැති මිනිසෙකුව දුටු-
වෙමි.[2] **2** “ඔබ කොහේද යන්නේ”
කියා මම ඔහුගෙන් ඇසුවෙමි.
“මම යන්නේ යෙරුසලමේ දිග
පළල මනින්නයි”[3] කියා ඔහු මට
කීවේය.
**3** එවිට මා සමඟ කලින් කතා
කරමින් සිටි දේවදූතයා මා වෙ-
තින් ඉවත්ව ගියේය. ඒ වේලාවේදී,
ඔහුව හමු වීමට තවත් දේවදූතයෙක්
පැමිණියේය. **4** ඔහු පළමු දේවදූත-
යාට මෙසේ කීවේය. “අර තරුණයා
වෙතට දුව ගොස් මෙසේ පවසන්න.
‘“යෙරුසලම, අතිමහත් ජන පිරිසක්
සහ සතුන් විශාල ප්‍රමාණයක් වාසය
කරන පවුරකින් වට කළ නොහැකි
විශාල දේශයක් මෙන් වනු ඇත.[4]
**5** මම ඒ දේශය ගින්නකින් වට කර[5]
මාගේ තේජසින් පුරවන්නෙමි” කියා
යෙහෝවා දෙවි කියන්නේය.”’ ”[6]
**6** තවදුරටත් යෙහෝවා දෙවි
මෙසේ පවසන්නේය. “පොළොවේ
සතර දිශාවට මා විසුරුවාහැරිය ජන-
යෙනි,[7] සවන් දෙන්න!”
යෙහෝවා දෙවි මෙසේද පවසන්-
නේය. “ප්‍රමාද නොවී දැන් උතුරු දේ-
ශයෙන් පිටත්ව එන්න.”[8]
**7** “සියොන් ජනයෙනි,[9] සවන්
දෙන්න! බැබිලෝනියෙන් පලා
එන්න.[10] **8** ස්වර්ගයේ සේනාවල
අධිපති වන යෙහෝවා දෙවි ගෞරව-
යට පත් වීමෙන් අනතුරුව,[11] ඔබව
සූරා කෑ ජාතීන්[12] ළඟට මාව යවමින්
මෙසේ කීවේය. ‘යමෙක් ඔබට හිරි-
හැර කළොත්[13] මා එය සලකන්නේ
මාගේ ඇසේ කලු ඉංගිරියාවට අත
ගසන්නාක් මෙනි.[14] **9** එබැවින් මම
ඒ ජාතීන්ට පහර දෙන්නෙමි.[1] ඔවුන්
වහල්භාවයේ තබාගත් අයම ඔවුන්-
ගෙන් කොල්ල කන්නෝය.’[2] එවිට
ස්වර්ගයේ සේනාවල අධිපති වන යෙ-
හෝවා දෙවි මාව එවූ බව ඔබ දැන-
ගනු ඇත.[3]
**10** යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. “සියොන් දියණිය, ප්‍රීතියෙන්
පිනා යන්න. ප්‍රීති ඝෝෂා නඟන්න.[4]
මන්ද මම ඔබ අතරට පැමිණ[5] ඔබ
සමඟ වාසය කරන්නෙමි.[6] **11** ඒ
කාලයේදී, බොහෝ ජාතීහු යෙහෝවා
දෙවි වන මා වෙතට එක් රැස්
වී[7] මට අයිති සෙනඟක් බවට පත්
වන්නෝය.[8] මමද ඔබ සමඟ වාසය
කරන්නෙමි.” එවිට මාව එව්වේ ස්වර්-
ගයේ සේනාවල අධිපති වන යෙ-
හෝවා දෙවි බව ඔබ දැනගනු ඇත.[9]
**12** ඒ කාලයේදී යෙහෝවා දෙවි, ශුද්ධ
දේශයෙන් තමන්ගේ උරුමය ලෙස
තෝරාගන්නේ යූදා සෙනඟවය.[10]
ඔහු යෙරුසලමද තෝරාගන්නේය.[11]
**13** ජනයෙනි, යෙහෝවා දෙවි ඉදිරි-
යේ නිහඬ වන්න.[12] මන්ද දෙවි මහත්
උද්‍යෝගයෙන් තම ශුද්ධ වාසස්ථාන-
යෙන්[13] නික්ම එන්නේය.[14]

**3** පසුව දෙවි මට දර්ශනයක්
මාර්ගයෙන් උත්තම පූජක යො-
ෂුවාව[15] පෙන්වූවේය. යොෂුවා, යෙ-
හෝවා දෙවිගේ දූතයා ඉදිරියේ
සිටගෙන සිටියේය. සාතන්*[16] යොෂු-
වාට විරුද්ධව නැඟී සිටීමේ අරමුණින්
ඔහුගේ දකුණු පැත්තේ සිටියේය.[17]
**2** එවිට යෙහෝවා දෙවිගේ දූතයා[18]
සාතන්ට මෙසේ කීවේය. “සාතන්,
ඔබට තරවටු කළ යුත්තේ යෙහෝවා
දෙවිමය.[19] නැවතත් යෙරුසලම තම
නුවර ලෙස තෝරාගත්[20] යෙහෝවා
දෙවිම ඔබට තරවටු කළාවේ! මේ

**1 පරි.**
**1** ගීතා 75:4, ගීතා 110:5, ලූක් 21:24

**2 පරි.**
**2** සෙක 1:16, එළි 11:1
**3** යෙරෙ 31:39, එස 45:6, එළි 21:15
**4** යෙසා 33:20, යෙසා 44:26, යෙරෙ 30:18, යෙරෙ 31:24, යෙරෙ 33:10, එස 36:10, සෙක 8:4, සෙක 12:6
**5** 2රාජා 6:17, ගීතා 46:11, ගීතා 125:2, යෙසා 26:1
**6** යෙසා 12:6, යෙසා 60:19, හග් 2:9
**7** ද්වි 28:64, එස 5:12
**8** යෙසා 11:12, යෙසා 11:16, යෙරෙ 1:14
**9** යෙසා 52:2, මීකා 4:10
**10** යෙසා 48:20, යෙරෙ 50:8
**11** යෙසා 60:13, යෙසා 66:12, සෙක 2:5
**12** 2රාජා 24:2, මීකා 4:11
**13** ගීතා 105:14, ගීතා 105:15, 2තෙස 1:6
**14** ද්වි 32:10

**2 තීරුව**
**1** යෙසා 10:32
**2** යෙසා 14:2
**3** යෙරෙ 28:9
**4** යෙසා 35:10
**5** යෙසා 40:9
**6** ලෙවී 26:12, ගීතා 46:5, යෙසා 12:6
**7** ගීතා 22:27, යෙසා 2:2, සෙක 8:23, මතෙ 28:19
**8** නික් 12:49, ගීතා 82:8, හග් 2:7
**9** එස 33:33
**10** නික් 19:5, ද්වි 32:9, ගීතා 135:4
**11** සෙක 1:17
**12** ගීතා 46:10, හබ 2:20, ශෙප 1:7

**13** 2ලේක 30:27; ගීතා 68:5; යෙසා 57:15; **14** ගීතා 78:65; යෙසා 26:21; ශෙප 3:8; **3 පරි.** **15** එස්රා 5:2; හග් 1:14; සෙක 6:11; **16** යෝබ් 1:6; **17** ගීතා 109:6; 1පේතෘ 5:8; **18** ගීතා 34:7; **19** මාක් 1:25; ලූක් 9:42; යූද් 9; **20** 2ලේක 6:6; සෙක 2:12.

සෙක **3:1*** හෝ, “විරුද්ධකාරයා.” යෝබ් 1:6හි, දෙවන පාදසටහන බලන්න.

තැනැත්තා ගින්නෙන් ඉවතට ඇද
ඇමූ දර කැබැල්ලක් මෙනි.”[1]
**3** යොෂුවා දේවදූතයා ඉදිරියේ
සිටියේ කිලිටි වස්ත්‍ර ඇඳගෙනය.[2]
**4** දේවදූතයා තමා ඉදිරියේ සිටි අයව
අමතා, “මොහු ඇඳගෙන සිටින කිලුටු
ඇඳුම් ගලවා දමන්න” යයි කීවේය.
ඔහු යොෂුවාව අමතා, “මම ඔබේ පාප
ඉවත් කළෙමි.[3] ඔබට දැන් විශේෂ
වස්ත්‍රයක් අන්දවනු ඇත”[4] කියා
කීවේය.
**5** එවිට මම, “ඔහුට පිරිසිදු හිස්-
වැස්මක් පළඳවන්න”[5] කියා කීවෙමි.
ඔවුහු ඔහුට අලුත් වස්ත්‍රයක් දී පිරිසිදු
හිස්වැස්මක් ඔහුට පැළඳුවෝය. යෙ-
හෝවා දෙවිගේ දූතයා එතැන සිට-
ගෙන මේ සියල්ල දෙස බලාගෙන
සිටියේය. **6** ඉන්පසු යෙහෝවා දෙ-
විගේ දූතයා යොෂුවාට මෙම උපදෙස
දුන්නේය. **7** “ස්වර්ගයේ සේනාවල
අධිපති වන යෙහෝවා දෙවි මෙසේ
පවසන්නේය. ‘ඔබ මගේ අණපනත්
පිළිපදිමින් මා පෙන්වන මාර්ගයේ
ගමන් කරන්න.[6] ඔබ එසේ කළොත්,
මාගේ සෙනඟට යුක්තිය ඉටු කර
දීමට[7] හා මාගේ ගෘහය* හොඳින් බලා
කියා ගැනීමට මම ඔබව පත් කරන්-
නෙමි. මෙතැන ඔබ සමඟ සිටින
අනික් අයට මෙන් ඔබටත් නිදහසේ
මා වෙතට ළඟා වෙන්න අවසර දෙන්-
නෙමි.’
**8** “‘උත්තම පූජක යොෂුවා, මා
දැන් ඔබට කියන දේට ඇහුම්කන්
දෙන්න. යොෂුවා ඉදිරියේ වාඩි වී
සිටින පුරුෂයෙනි, අනාගතයේ සිදු
වීමට නියමිත දෙයක් ඔබෙන් නියෝ-
ජනය කරයි.[8] එබැවින් ඔබත් මට
සවන් දෙන්න. ඉදිරියේදී අංකුරය
ලෙස හඳුන්වන[9] මාගේ සේවකයාව
මම එවන්නෙමි.[10] **9** මා දැන් යො-
ෂුවා ඉදිරියේ තබන ගල[11] දෙස
බලන්න. එහි ඇස් සතක් පෙනෙන්න
තිබේ.[12] මම ඒ ගල මත අකුරු
පෙළක් කොටන්නෙමි.[13] එමෙන්ම

සෙක **3:7*** මූ.අ., “ගෘහය අවට තිබෙන මළු.”

දේශයේ වැසියන්ගේ පාප මම එක දව-
සකින් ඉවත් කර දමමි.’[1] මේ දේවල්
පැවසුවේ ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවිය.
**10** “ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ පවසන්නේය. ‘ඒ දවසේදී ඔබ
ඔබේ මිත්‍රයන්ට ආරාධනා කර, ඔවුන්
සමඟ මිදිවැල් හා අත්තික්කා ගස් යට
සුව සේ කල් ගෙවනු ඇත.’ ”[2]

**4** මා සමඟ කතා කළ දේව-
දූතයා නැවත වරක් පැමිණ,
නිදා සිටින කෙනෙකුව අවදි කරන්-
නාක් මෙන් ගැඹුරු කල්පනාවක සිටි
මගේ අවධානය ඔහු වෙතට ඇද-
ගත්තේය.[3] **2** ඉන්පසු, “ඔබට පෙ-
නෙන්නේ කුමක්ද”[4] කියා ඔහු මගෙන්
ඇසුවේය.
එවිට මම මෙසේ කීවෙමි. “සම්පූර්-
ණයෙන්ම රනින් නිමැවූ පහන් රුකක්
මට පෙනේ.[5] එහි මුදුනේ භාජන-
යක් තිබේ. ඒ පහන් රුක මත පහන්
හතක් ඇත.[6] ඒ පහන් හතට නළ
හතක් සම්බන්ධ කර ඇත. **3** පහන්
රුක දෙපැත්තේ ඔලීව ගස් දෙ-
කක් තිබේ.[7] එනම්, පහන් රුක මත
තිබෙන භාජනයට දකුණු පැත්තෙන්
එක් ගසක්ද වම් පැත්තෙන් අනික්
ගසද තිබේ.”
**4** එවිට මා සමඟ කතා කරමින්
සිටි දේවදූතයාගෙන් මම මෙසේ ඇසු-
වෙමි. “මගේ ස්වාමීනි, මේ පෙනෙන
දේවල තේරුම කුමක්ද?”[8] **5** එවිට
ඒ දේවදූතයා මට මෙසේ කීවේය. “ඔබ
ඇත්තටම මේ දේවල තේරුම දන්නේ
නැද්ද?”
“අනේ ස්වාමීනි, මට මේ දේවල්
ගැන කිසිම වැටහීමක් නැහැ”[9] කියා
මම කීවෙමි.
**6** එවිට දේවදූතයා මට මෙසේ
කීවේය. “යෙහෝවා දෙවි සෙරුබා-
බෙල්ට දෙන පණිවිඩය මෙයයි. ‘“මේ
සියල්ල ඉටු වන්නේ මගේ බල-
යෙන් මිසක[10] ඔබේ ශක්තියෙන්වත්[11]

**11** 1සාමු 17:45; හොෂෙ 1:7; මීකා 3:8.

**3 පරි.**
1 යුද් 23
2 ගණන් 19:7
ගණන් 19:21
හග් 2:14
එළි 3:4
3 2සාමු 12:13
2ලේක 30:18
ගීතා 32:1
ගීතා 51:9
හෙබ්‍රෙ 8:12
4 නික් 28:2
නික් 28:40
යෙසා 61:10
5 නික් 29:6
ලෙවි 8:9
6 1රාජා 2:3
ගීතා 119:4
එස 44:8
7 ද්වි 17:9
මලා 2:7
8 යෙසා 8:18
යෙසා 20:3
එස 12:11
එස 24:24
9 යෙසා 11:1
යෙසා 53:2
යෙරෙ 23:5
යෙරෙ 33:15
සෙක 6:12
10 යෙසා 42:1
යෙසා 52:13
යෙසා 53:11
11 ගීතා 118:22
යෙසා 28:16
මතෙ 21:42
1පේතෘ 2:4
12 2ලේක 16:9
එළි 5:6
13 නික් 28:11
යොහ 6:27

**2 තීරුව**
1 යෙරෙ 50:20
2 1රාජා 4:25
යෙසා 36:16
හොෂෙ 2:18
මීකා 4:4

**4 පරි.**
3 දානි 8:18
4 යෙරෙ 1:11
සෙක 5:2
5 නික් 25:31
1රාජා 7:49
එළි 1:12
6 නික් 25:37
එළි 4:5
7 විනි 9:9
සෙක 4:11
එළි 11:4
8 දානි 7:16
සෙක 1:9
9 ගීතා 139:6
10 විනි 6:34
විනි 15:14
යෙසා 63:14
ක්‍රියා 10:38

යුද බලයෙන්වත් නොවෙයි.”[1] එසේ
පවසන මා ස්වර්ගයේ සේනාවල
අධිපති වන යෙහෝවා දෙවිය.
**7** සෙරුබාබෙල්[2] ඉදිරියේ අතිමහත්
කන්දක් වැනි බාධකයක් තැබුවද[3]
එය සමතලා කරනු ලබයි. ඔහු මාගේ
ගෘහයේ ප්‍රධාන ගල[4] තබා එහි වැඩ
අවසන් කරයි. ප්‍රධාන ගල දකින
ජනයා, “මෙය ඉතා අලංකාරයි! ඉතා
අලංකාරයි”[5] කියා ප්‍රීති ඝෝෂා නඟනු
ඇත.’ ”[6]

**8** යෙහෝවා දෙවි තවදුරටත් මට
මෙසේ පැවසුවේය. **9** “මේ ගෘහ-
යේ අත්තිවාරම[7] තැබුවේ සෙරුබා-
බෙල්ය. එහි වැඩ අවසන් කරන්නෙත්
ඔහුමය.[8] ‘මේ සියල්ල සිදු වන විට,
මාව එවන ලද්දේ ස්වර්ගයේ සේනා-
වල අධිපති වන යෙහෝවා දෙවි බව
ඔබ දැනගනු ඇත.’[9] **10** එබැවින්
සුළුවෙන් පටන්ගත් වැඩක් කිසිවි-
ටෙක හෙළා නොදකින්න.[10] සෙරුබා-
බෙල්ගේ අතේ තිබෙන ලඹය දැක
ජනයා ප්‍රීති වන්නෝය.[11] ‘ඇස් සතද
මේ දේවල් දකින්නෝය.[12] මුළු පො-
ළොවම සෝදිසි කර බලන ඒ ඇස්
යෙහෝවා දෙවිගේය.’ ”[13]

**11** එවිට මම දේවදූතයාගෙන්
මෙසේ ඇසුවෙමි. “පහන් රුකට
දකුණු පැත්තෙන් සහ වම් පැත්-
තෙන් තිබෙන ඔලීව ගස් දෙකෙන්
අදහස් වන්නේ කුමක්ද?”[14] **12** මම
ඔහුගෙන් මෙසේද ඇසුවෙමි. “රනින්
නිමැවූ නළ දෙකකින් රන් පැහැති
දියරයක් ගලා එනවා මට පෙනේ. ඒ
නළ දෙක ඔලීව ගස් දෙකේ අතු දෙක-
කට සම්බන්ධ වී තිබේ. එම ඔලීව අතු
දෙකෙන් අදහස් කරන්නේ කුමක්ද?”

**13** එවිට ඔහු මගෙන් මෙසේ ඇසු-
වේය. “ඔබ ඇත්තටම මේ දේවල තේ-
රුම දන්නේ නැද්ද?”

“අනේ ස්වාමීනි, මේ දේවල් ගැන
මට කිසිම වැටහීමක් නැහැ”[15] කියා
මම කීවෙමි.

**14** එවිට ඔහු මෙසේ කීවේය. “ඒ
ගස්වලින් නියෝජනය වන්නේ මුළු
පොළොවටම ස්වාමීන් වන[16] දෙවි
ළඟ සිටගෙන සිටින අභිෂේක ලත්
තැනැත්තන් දෙදෙනාවය.”[1]

**5** මම නැවතත් දර්ශනයක් මාර්ග-
යෙන් සුළඟේ පාවෙන ලියවිල්-
ලක් දුටුවෙමි.[2] **2** එවිට දේවදූතයා,
“ඔබට පෙනෙන්නේ මොනවද” කියා
මගෙන් ඇසුවේය.[3]

“රියන් විස්සක් දිග, රියන් දහයක්
පළල ලියවිල්ලක් සුළඟේ පාවෙනවා
මට පෙනෙනවා” කියා මම කීවෙමි.

**3** එවිට ඔහු මෙසේ කීවේය. “මුළු
පොළොව පිටට පැමිණෙන්න යන
ශාපය එහි ලියා තිබේ.[4] සොරකම්
කරන අයට[5] දිය යුතු දඬුවම ගැන
ලියවිල්ලේ එක් පැත්තක ලියා ඇත.
බොරුවට දිවුරන අයට[6] දිය යුතු දඬු-
වම ගැන එහි අනික් පැත්තේ ලියා
ඇත.[7] නමුත් මේ දේවල් කළ කිසිවෙ-
කුට තවමත් දඬුවමක් ලැබී නැත.
**4** ස්වර්ගයේ සේනාවල අධිපති වන
යෙහෝවා දෙවි මෙසේ පවසා තිබේ.
‘මම මේ ලියවිල්ල සොරාගේ ගෙදර-
ටත් මාගේ නාමයෙන් බොරුවට දිවු-
රන තැනැත්තාගේ ගෙදරටත් යවමි.[8]
ඒ ලියවිල්ල ඔහුගේ නිවසට ඇතුළු
වූ පසු නිවසත් එහි තිබෙන පරා-
ලත් ගලුත් සම්පූර්ණයෙන්ම විනාශ වී
යයි.’ ”[9]

**5** මා සමඟ කතා කළ දේවදූ-
තයා මා ළඟට පැමිණ, “අහසේ දැන්
පාවෙන්නේ කුමක්ද කියා බලන්න”
යයි කීවේය.

**6** “අහසේ පාවෙන ඒ දේ කුමක්ද”
කියා මම ඇසුවෙමි.

එවිට ඔහු, “එය මිනුම් භාජනයකි.*
මුළු පොළොව පුරාම සිදු කෙරෙන දුෂ්-
ටකම් මේ භාජනය තුළ ඇත” කියා
කීවේය. **7** එවිට වසා තිබුණු භාජ-
නයේ රවුම් ඊයම් පියන ඉවත් කරන
ලදි. භාජනය තුළ ස්ත්‍රියක් වාඩි වී
සිටියාය. **8** එවිට දේවදූතයා, “මේ
ස්ත්‍රියට දුෂ්ටකම යන නාමය දී තිබේ”
කියා කීවේය. ඉන්පසු ඔහු ඇයව ඇතු-

**4 පරි.**
1 නික් 14:4; යෙසා 43:17
2 එස්රා 3:2; හග් 1:1
3 යෙසා 40:4; මතෙ 21:21
4 ගීතා 118:22; යෙසා 28:16
5 ගීතා 45:2
6 එස්රා 3:11
7 එස්රා 3:10; එස්රා 5:16
8 එස්රා 6:14; සෙක 6:12
9 සෙක 6:15
10 එස්රා 3:12; හග් 2:3
11 යෙසා 66:14
12 එළි 5:6
13 2ලේක 16:9; හිතෝ 15:3; යෙරෙ 16:17
14 සෙක 4:3; එළි 11:4
15 සෙක 4:5
16 යොෂු 3:11; යොෂු 3:13; යෙසා 54:5; මීකා 4:13

**2 තීරුව**
1 නික් 29:7; හග් 2:4; 2කොරි 1:21; එළි 11:3; එළි 11:4

**5 පරි.**
2 යෙරෙ 36:2; එස 2:9
3 සෙක 4:2
4 ද්වි 11:28; ද්වි 28:15; ගීතා 109:17; යෙසා 24:6; මලා 4:6
5 නික් 20:15; හිතෝ 29:24; යෙරෙ 7:9; හොෂෙ 4:2
6 ලෙවී 19:12; යෙසා 48:1; යෙරෙ 5:2
7 එස 2:10; එළි 5:1
8 නික් 20:7
9 ලෙවී 14:45; හිතෝ 3:33; යාකො 5:3

සෙක **5:6*** මූ.අ., “ඒපා භාජනයකි.” නික් 16:36හි පාදසටහන බලන්න.

ළට තල්ලු කර[1] විගසම ඊයම් පිය-
නෙන් භාජනය වසා දැමුවේය.
9 මම නැවත බැලූ විට ස්ත්‍රීන් දෙ-
දෙනෙකු සුළඟ හමන දිශාවට පියාඹ-
නවා දුටුවෙමි. ඔවුන්ගේ පියාපත්
මානකොකෙකුගේ පියාපත් මෙනි.
ඔවුහු මා කලින් දුටු භාජනය සෙ-
මින් අහසට ඔසවාගෙන ගියෝය.
10 එවිට, “ඔවුන් ඒ භාජනය රැගෙන
යන්නේ කොතැනටද” කියා මා සමඟ
කතා කළ දේවදූතයාගෙන් මම ඇසු-
වෙමි.
11 ඔහු මට මෙසේ කීවේය. “ඔවුන්
ඒ භාජනය රැගෙන යන්නේ ශීනාර් දේ-
ශයටය.[2] ඔවුන් එසේ යන්නේ එහි
ඇයට නිවසක් සාදා දීමටය.[3] නිවස
ශක්තිමත්ව සාදා ඇයව එහි පදිංචි
කරනු ඇත. ඇය සිටිය යුතු නියමිත
ස්ථානය එතැනය.”

6 මම දර්ශනයක් මාර්ගයෙන් තඹ
පැහැති කඳු දෙකක් අතරින්
අශ්ව රථ හතරක් එනවා දුටුවෙමි.
2 පළමුවෙන් පැමිණි අශ්ව රථයේ
බැඳ සිටියේ රතු පැහැති අශ්වයෝය.[4]
දෙවන අශ්ව රථයේ කලු පැහැති අශ්-
වයෝ[5] බැඳ සිටියෝය. 3 තුන්වන
අශ්ව රථයේ සුදු පැහැති අශ්වයෝද[6]
හතරවන අශ්ව රථයේ විවිධ පැහැ-
යෙන් යුත් පුල්ලි වැටුණු අශ්වයෝද[7]
බැඳ සිටියෝය.
4 මා සමඟ කතා කරමින් සිටි දේ-
වදූතයාගෙන් මම මෙසේ ඇසුවෙමි.
“මාගේ ස්වාමීනි, මේ අශ්ව රථ පැමි-
ණීමේ අරමුණ කුමක්ද?”[8]
5 එවිට දේවදූතයා මට මෙසේ
පැවසුවේය. “මේ අශ්ව රථවලින්
නියෝජනය කරන්නේ දේවදූතයන්
හතරදෙනෙක්ය.[9] මුළු පොළොවටම
අධිපති වන තැනැත්තාණන්[10] ඉදිරි-
යේ පෙනී සිටි[11] ඔවුහු දැන් ඔහුගේ
අණ පරිදි පිටත්ව ආවෝය.[12] 6 කලු
පැහැති අශ්වයන් ගමන් කරන්නේ
උතුරු දෙසින් පිහිටි දේශයටය.[13]
සුදු පැහැති අශ්වයෝ ආපස්සට හැරී
මුහුද දෙසට ගමන් කරන්නෝය.
පුල්ලි වැටුණු අශ්වයන්ව දකුණු දෙ-
සින් පිහිටි දේශයට[1] යවන ලදි.
7 සෝදිසි කර බැලිය යුතු ප්‍රදේශ
තවත් තිබේදැයි සොයා බැලීමටත්[2]
පුල්ලි වැටුණු අශ්වයන්ට[3] නියම
කර තිබේ. උන් ඒ ප්‍රදේශවලටත්
යා යුතුය.” එවිට දේවදූතයා, “ඔබට
පවරා ඇති ප්‍රදේශය පුරාම ගමන්
කරන්න” කියා උන්ට පැවසූ විට උන්
පිටත්ව ගියෝය.
8 ඉන්පසු ඔහු මහත් හඬින් මට
මෙසේ පැවසුවේය. “උතුරු දේශයට[4]
ගිය අශ්වයන් නිසා ඒ දේශයට විරුද්-
ධව ඇවිළුණු යෙහෝවා දෙවිගේ උද-
හස නිවුණේය.”[5]
9 යෙහෝවා දෙවි මට තවදුරටත්
මෙසේ පැවසුවේය. 10 “බැබිලෝනි-
යේ පදිංචිව සිටින මාගේ සෙනඟ
අතරින් පිටත්ව එන හෙල්දයි, ටො-
බීයා හා යෙදායා ගෙනෙන දේව-
ලින් කොටසක් ඔබ ගන්න.[6]
ඔවුන් පැමිණෙන දවසේදීම ඔබ ඔවුන්
තිදෙනාත් සමඟ ශෙපනියාගේ[7] පුත්
යොෂියාගේ ගෙදරට යන්න. 11 ඔබ
ගන්න රන් රිදීවලින් ඉතා අලංකාර
ඔටුන්නක් සාදා,[8] යෙහොෂාදාක්ගේ
පුත්‍රයා වන උත්තම පූජක යොෂුවාට
පළඳවන්න.[9] 12 ඉන්පසු ඔබ ඔහුට
මෙසේ කියන්න.
“‘ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මෙසේ පැව-
සුවේය. “අංකුරය ලෙස හඳුන්වන[10]
තැනැත්තා මොහුය.[11] ඔහු තමා-
ගේ ස්ථානයේදී වර්ධනය වී යෙ-
හෝවා දෙවි වන මාගේ ගෘහය
නැවත ගොඩනඟන්නේය.[12] 13 යෙ-
හෝවා දෙවි වන මාගේ ගෘහය නැවත
ගොඩනඟන ඔහුට ගෞරවය හිමි වන්-
නේය.[13] ඔහු තම සිංහාසනය මත
වාඩි වී රජකම් කරන්නේය. රජකම්
කරන අතරතුරේදී ඔහු පූජකයෙකු
ලෙසද කටයුතු කරනු ඇත.[14] ඔහු ඒ
තනතුරු දෙකම හොඳින් හසුරුවනු
ඇත.[15] 14 හේලෙම්, ටොබීයා, යෙ-
දායා[16] හා ශෙපනියාගේ පුත් හෙන්

**5 පරි.**
1 උත් 15:16; මතෙ 23:32; 1තෙස 2:16
2 උත් 10:10; උත් 11:2; යෙසා 11:11; ආනි 1:2
3 යෙරෙ 29:5; යෙරෙ 29:28

**6 පරි.**
4 සෙක 1:8
5 සෙක 6:6
6 සෙක 1:8
7 සෙක 6:7
8 සෙක 1:9
9 ගීතා 104:4
10 මීකා 4:13; සෙක 4:14
11 2ලේක 18:18; යෝබ් 1:6; දානි 7:10; ලූක් 1:19
12 හෙබ්‍රෙ 1:14
13 යෙසා 14:31; යෙසා 43:6; යෙරෙ 1:14; යෙරෙ 25:9

**2 තීරුව**
1 දානි 11:5
2 යෝබ් 1:7; යෝබ් 2:2
3 සෙක 6:3
4 යෙරෙ 51:48
5 විනි 8:3; දේශ 10:4
6 එස්රා 1:11; එස්රා 7:16; එස්රා 8:30; ක්‍රියා 24:17
7 සෙක 6:14
8 නික් 28:36
9 හග් 1:1; හග් 2:4; සෙක 3:5
10 යෙසා 11:1; සෙක 3:8; ලූක් 1:32
11 යෙසා 9:6; යෙසා 32:1; දානි 7:13; සෙක 13:7; මාක් 15:39; යොහ 19:5
12 සෙක 8:9; මතෙ 16:18; එෆී 2:20; හෙබ්‍රෙ 3:6
13 ගීතා 21:5; ගීතා 45:3; යෙසා 22:24; හෙබ්‍රෙ 5:5
14 ගීතා 110:4; හෙබ්‍රෙ 3:1; හෙබ්‍රෙ 4:14; හෙබ්‍රෙ 6:20; හෙබ්‍රෙ 8:1
15 යෙසා 9:6; කොලො 1:20

16 සෙක 6:10.

කළ දේ සිහි කරන පිණිස[1] යො-
ෂුවාට පැළඳෙවූ ඔටුන්න යෙහෝවා
දෙවි වන මාගේ ගෘහයේ තබනු
ඇත. **15** යෙහෝවා දෙවි වන මාගේ
ගෘහය ගොඩනැඟීම සඳහා දුර ඈත
සිට මනුෂ්‍යයෝ පැමිණෙනු ඇත."[2]
ඔබ ඔබේ දෙවි වන යෙහෝවාගේ
හඬට ඇහුම්කන් දුන්නොත්[3] මාව එවූ-
වේ ස්වර්ගයේ සේනාවල අධිපති වන
යෙහෝවා දෙවි බව ඔබ දැනගනු
ඇත.' "[4]

**7** දාරියුස්[5] රජකම් කළ හතර-
වන අවුරුද්දේ නවවන මාසයේ
එනම්, කිස්ලෙව් මාසයේ[6] හතරවන
දින යෙහෝවා දෙවිගෙන් සෙකරි-
යාට පණිවිඩයක් ලැබුණේය. **2** ඒ
කාලයේදී බෙතෙල් නගරයේ වැසි-
යෝ, යෙහෝවා දෙවිට කන්නලව්
කර[7] ඔහුගේ අනුමැතිය ලබාගන්නා
පිණිස ෂරෙෂේර්, රෙගෙම්-මෙලෙක්
සහ ඔහුගේ සේවකයන්ව පිටත් කර
යැව්වෝය. **3** ස්වර්ගයේ සේනාවල
අධිපති වන යෙහෝවා දෙවිගේ ගෘහ-
යේ සිටි පූජකයන්ගෙන්[8] හා අනා-
ගතවක්තෘවරුන්ගෙන් මෙසේ අසා
දැනගන්නා ලෙස ඔවුන්ට පවසා
තිබිණ. "අපි මේ අවුරුදු ගණනාව
පුරා කළාක් මෙන්[9] මේ අවුරුද්දේ පස්-
වන මාසයෙන්[10] නිරාහාරව සිට වැල-
පෙන්නද?"

**4** එවිට ස්වර්ගයේ සේනාවල අධි-
පති වන යෙහෝවා දෙවි මට මෙසේ
පැවසුවේය. **5** "දේශයේ සියලු වැසි-
යන්ගෙනුත් පූජකයන්ගෙනුත් මෙසේ
අසන්න. 'ඔබ මේ අවුරුදු හැත්-
තෑව පුරා,[11] පස්වන මාසයේදී හා
හත්වන මාසයේදී[12] නිරාහාරව සිට[13]
වැලපුණේ මා ඔබට පැවසූ නිසාද?[14]
**6** ඔබ කා බී ප්‍රීතිමත් වූ අවස්ථාවලදී-
වත් මාව සිහි කළාද? **7** යෙරුස-
ලමේ හා එහි අවට තිබුණු සියලු
නුවරවලත් නෙගෙබ් පළාතේ[15] හා
පහත් බිම්වලත්*[16] සෙනඟ සුව සේ
කල් ගෙවූ කාලයේදී, අනාගතවක්තෘ-
වරුන් මාර්ගයෙන් යෙහෝවා දෙවි
වන මා පැවසූ දේවලට[1] ඔබ කීකරු
වුණාද? ඔබ කළ යුතුව තිබුණේ එය
නොවෙයිද?' "[2]

**8** යෙහෝවා දෙවි සෙකරියාට
තවදුරටත් මෙසේ පැවසුවේය.
**9** "ස්වර්ගයේ සේනාවල අධිපති වූ
යෙහෝවා දෙවි වන මා ඔබට පවසන්-
නේ මෙයයි. 'ඔබ විනිශ්චය කරද්දී
සාධාරණය ඉටු කරන්න.[3] එකි-
නෙකා සමඟ ප්‍රේමණීයව* කටයුතු
කරන්න.[4] එකිනෙකාට දයාව පෙන්-
වන්න.[5] **10** වැන්දඹුවකටවත්[6] පියා
නැති දරුවෙකුටවත්[7] ඔබ අතරේ
වාසය කරන විදේශිකයෙකුටවත්[8]
පීඩාවට පත්ව සිටින කෙනෙකුට-
වත් කිසි අසාධාරණයක් නොක-
රන්න.[9] එකිනෙකාට විරුද්ධව දුෂ්ට
දේ කිරීමට කුමන්ත්‍රණය නොක-
රන්න.'[10] **11** නමුත් ඔවුහු මා පැවසූ
දේට ඇහුම්කන් දුන්නේ නැත.[11] ඔවුහු
මුරණ්ඩු ලෙස මට පිටු පෑවෝය.[12] මා
කතා කළ විට කන් වසාගත්තෝය.[13]
**12** ඔවුහු තමන්ගේ සිත්[14] ගල් මෙන්
දැඩි කරගත්තෝය.[15] ස්වර්ගයේ සේ-
නාවල අධිපති වූ යෙහෝවා දෙවි
වන මාගේ බලය මාර්ගයෙන්[16] අතී-
තයේ විසූ අනාගතවක්තෘවරුන්ට[17]
දුන් නීතියට ඔවුහු අකීකරු වූහ. ඔවුහු
මාගේ වචනය ගැන කිසි තැකීමක්
කළේ නැත. මේ නිසා ස්වර්ගයේ සේ-
නාවල අධිපති ලෙස හඳුන්වන යෙ-
හෝවා දෙවි වන මම ඔවුන් සමඟ
අතිශයින් උදහස් වුණෙමි."[18]

**13** " 'මා ඔවුන්ට කතා කළ
විට ඔවුහු මට ඇහුම්කන් නො-
දුන්නෝය.[19] එබැවින් ඔවුන් මට
හඬගසන විට මමද ඔවුන්ට සවන්
නොදුන්නෙමි.'[20] එසේ පවසන මා
ස්වර්ගයේ සේනාවල අධිපති වන

**6 පරි.**
1 නික් 28:12; යොෂු 4:7
2 යෙසා 56:6; යෙසා 60:10
3 යෙරෙ 7:23
4 සෙක 4:9

**7 පරි.**
5 එස්රා 6:14; සෙක 1:1
6 යෙරෙ 36:22
7 නික් 32:11; 1සාමු 13:12; 1රාජා 13:6; යෙරෙ 26:19
8 ද්වි 17:9; එස 44:15; හොෂෙ 4:6; මලා 2:7
9 යෙසා 22:12; සෙක 7:5
10 2රාජා 25:8; යෙරෙ 52:12
11 යෙරෙ 25:11; සෙක 1:12
12 යෙරෙ 41:1; යෙරෙ 41:2
13 යෙසා 58:6
14 යෙසා 58:4; මතෙ 6:16; කොලො 2:23
15 යෙරෙ 17:26
16 1ලේක 27:28

**2 තීරුව**
1 2ලේක 36:15; යෙරෙ 7:25; යෙරෙ 44:4
2 යෙසා 55:3; යෙරෙ 36:2
3 හිතෝ 21:3; යෙරෙ 7:5; යෙරෙ 21:12
4 හිතෝ 16:6; හිතෝ 19:22; හොෂෙ 10:12; මීකා 6:8
5 යාකො 2:13
6 ද්වි 27:19; යෙසා 1:17
7 නික් 22:22; ද්වි 24:17; හිතෝ 23:10; යාකො 1:27
8 නික් 23:9; ද්වි 24:14; මලා 3:5
9 ගීතා 72:4; හිතෝ 22:22
10 ගීතා 36:4; හිතෝ 6:18; සෙක 8:17; මාක් 7:21
11 2රාජා 17:14; 2ලේක 33:10; හිතෝ 1:24; යෙරෙ 6:10
12 නෙහෙ 9:29

**13** යෙසා 6:10; යෙරෙ 25:7; සෙක 1:4; **14** එස 3:7; **15** යෙසා 44:18; මතෙ 13:15; **16** 2පේතෘ 1:21; **17** නෙහෙ 9:30; ක්‍රියා 7:51; **18** 2ලේක 36:16; යෙරෙ 21:5; **19** හිතෝ 1:24; යෙසා 50:2; **20** හිතෝ 21:13; යෙසා 1:15; විලා 3:44.

සෙක **7:7*** හෝ, "ෂෙපේලා."

සෙක **7:9*** හෝ, "ලැදි ප්‍රේමය."

යෙහෝවා දෙවිය. 14 ‘මම සුළිසු-
ළඟක් යවා ඔවුන් නොදන්නා දේ-
ශවලට[1] ඔවුන්ව විසුරුවාහැරියෙමි.[2]
ඔවුන් අත්හැර ගිය දේශයට කිසිවෙක්
ආපසු හැරී ආවේ නැත. කිසිවෙක් ඒ
මැදින් ගමන් කළේද නැත.[3] අලංකා-
රව තිබුණු ඒ දේශය[4] පාළු වී ගියේය.
එයට සිදු වූ දේ දුටු සියලුදෙනාම පුදු-
මයට පත් වූහ.’ ”

**8** ස්වර්ගයේ සේනාවල අධිපති වන
යෙහෝවා දෙවි මට නැවත
මෙසේ පැවසුවේය. 2 “ස්වර්ගයේ
සේනාවල අධිපති වන යෙහෝවා දෙවි
මමය.[5] මාගේ සෙනඟට සිදු වූ විපත
දැක මගේ උදහස බොහෝ සෙයින්
ඇවිළුණේය. මම සියොන් වෙනුවෙන්
නැඟී සිටින්නෙමි.[6] ඔවුන්ගේ සතුරන්
පිට මගේ උදහස වගුරුවන්නෙමි.”[7]
3 “යෙහෝවා දෙවි වන මම නැවත
සියොන් වෙතට පැමිණ[8] යෙරුසල-
මේ වාසය කරන්නෙමි.[9] ඒ කාලයේදී,
යෙරුසලම සැබෑකමේ නුවර ලෙස
හඳුන්වනු ලැබේ.[10] ස්වර්ගයේ සේනා-
වල අධිපති වූ යෙහෝවා දෙවි වන
මාගේ කන්ද,[11] ශුද්ධ කන්ද[12] ලෙස
හඳුන්වනු ලැබේ.”
4 “ස්වර්ගයේ සේනාවල අධිපති
වන මා යෙහෝවා දෙවිය. ඒ කාල-
යේදී, සැරයටි අතැති ඉතා වයසක
ස්ත්‍රීහු හා පුරුෂයෝ පවා යෙරුසලමේ
ප්‍රධාන මංසන්ධිවල විවේක සුවයෙන්
කල් ගෙවනු ඇත.[13] 5 ඒ මංසන්ධි
පුරා දුව පැන සෙල්ලම් කරන දරුදැරි-
යන්ද දක්නට ලැබෙයි.”[14]
6 “ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මමය. මේ දේවල්
කෙදිනකවත් ඉෂ්ට විය නොහැ-
කියි කියා මේ සෙනඟ සිතන්නෝය.
නමුත් මා ස්වර්ගයේ සේනාවල අධි-
පති වන යෙහෝවා දෙවිය. එබැවින් ඒ
දේ ඉටු කිරීමට මට කිසිසේත් අපහසු
වන්නේ නැත.”[15]
7 “ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මමය. නැඟෙන-
හිරෙන් හා බස්නාහිරෙන් පිහිටි දේ-
ශවලින් මාගේ සෙනඟව මම
ගලවාගන්නෙමි.[1] 8 ඔවුන්ව යෙරු-
සලමට ගෙනැවිත් එහි පදිංචි කරවන්-
නෙමි.[2] විශ්වාසවන්තව හා ධර්මිෂ්ඨ
ලෙස කටයුතු කරන මම ඔවුන්ගේ
දෙවි වන්නෙමි.[3] ඔවුහු මාගේ සෙනඟ
වන්නෝය.”[4]
9 “ජනයෙනි, ස්වර්ගයේ සේනාවල
අධිපති ලෙස හඳුන්වන යෙහෝවා
දෙවි වන මාගේ ගෘහය නැවත ගො-
ඩනඟන්න අත්තිවාරම දැමූ දවසේ
සිට[5] මේ දක්වා අනාගතවක්තෘවරුන්
කියූ ඒ සෑම කාරණයක්ම ඔබ අසා
ඇත.[6] එබැවින් ධෛර්යවත් වී ඔබට
දී තිබෙන වැඩ කොටස කරන්න.[7]
මා ස්වර්ගයේ සේනාවල අධිපති වන
යෙහෝවා දෙවිය. 10 ඒ කාලයේදී,
මිනිසෙකුටවත් සතෙකුටවත් තමන්
කළ වැඩවලට කුලියක් ලැබුණේ
නැත.[8] සතුරු උවදුරු නිසා කිසිවෙ-
කුට නිදහසේ ගමන්බිමන් යන්නවත්
නොහැකි විය.[9] සෙනඟ අතරේ මෙ-
වැනි භේදකාරී තත්වයක් පවතින්න
මම ඉඩහැරියෙමි.”[10]
11 “නමුත් දැන් ඉතුරු වී සිටින
මේ සෙනඟ සමඟ මා ක්‍රියා කරන්-
නේ ඊට වඩා වෙනස් ආකාරයකටය.[11]
මා ස්වර්ගයේ සේනාවල අධිපති වන
යෙහෝවා දෙවිය. 12 මම සමාදා-
නය නමැති බීජ ඔබ අතරේ වපු-
රන්නෙමි.[12] මිදිවැලෙන් පලදාවද[13]
කෙතෙන් අස්වැන්නද[14] අහසින් පිනිද
ඔබට දෙන්නෙමි.[15] බේරී ජීවත් වන
මාගේ සෙනඟට[16] මේ සෑම දෙ-
යක්ම උරුම වනු ඇත.[17] 13 යූදා
හා ඊශ්‍රායෙල් දේශයේ වැසියෙනි,[18]
ජාතීන් ඔබව ශාප ලත් සෙනඟක්
ලෙස සැලකූ බව ඇත්තයි.[19] නමුත්
මම ඔබව ගලවාගන්නෙමි. එවිට ඔබ
මාර්ගයෙන් ජාතීහු ආශීර්වාද ලබන්-
නෝය.[20] එබැවින් භය නොවන්න.[21]
ධෛර්යවත් වී ඔබට දුන් වැඩ කොටස
නිම කරන්න.”[22]

**7 පරි.**
1 ද්වි 28:33; යෙරෙ 5:15
2 ලෙවී 26:33; ද්වි 28:64
3 ලෙවී 26:22; 2ලේක 36:21
4 ද්වි 8:7; ද්වි 11:12

**8 පරි.**
5 ගීතා 103:21
6 යෝවෙ 2:18
7 යෙසා 63:5; නාහූ 1:2
8 සෙක 1:16; මලා 3:7
9 යෙසා 12:6; යෝවෙ 3:17; සෙක 8:8
10 යෙසා 1:26; යෙරෙ 33:16
11 යෙසා 2:2; යෙසා 60:14
12 ගීතා 48:1; යෙසා 11:9; යෙසා 66:20; යෙරෙ 31:23
13 යෙසා 65:20; යෙරෙ 30:10
14 යෙරෙ 30:19; යෙරෙ 31:4; යෙරෙ 31:27; සෙක 2:4; මතෙ 11:16
15 යෝබ් 42:2; යෙරෙ 32:27; මාක් 10:27; ලූක් 18:27

**2 තීරුව**
1 ගීතා 107:3
2 යෙරෙ 3:17; යෝවෙ 3:20; ආමො 9:14
3 යෙරෙ 4:2; එළි 21:7
4 ලෙවී 26:12; යෙරෙ 30:22; එස 11:20; එළි 21:3
5 එස්රා 6:14
6 එස්රා 5:1
7 1ලේක 22:13; යෙසා 35:4; හග් 2:4
8 හග් 1:6
9 විනි 5:6; 2ලේක 15:5
10 යෙසා 19:2; ආමො 9:4
11 ගීතා 103:9; යෙසා 12:1; හග් 2:19
12 ගීතා 67:6; ගීතා 72:3; යෙසා 30:23; යාකො 3:18
13 හිතෝ 3:10
14 ලෙවී 26:4; ද්වි 28:4

15 ද්වි 33:13; හොෂෙ 14:5; 16 මීකා 4:6; 17 යෙසා 35:10; යෙසා 61:7; 18 2රාජා 17:18; 19 ද්වි 28:37; යෙරෙ 42:18; 20 උත් 22:18; යෙසා 19:24; 21 යෙසා 41:10; 22 යෙසා 35:4.

14 “ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මමය. ඔබේ
මුතුන්මිත්තන් දුෂ්ට ලෙස ක්‍රියා කර
මාව උදහස් කළ නිසා ඔබව විනාශ
කර දමන්න මම තීරණය කළෙමි.[1] ඒ
අවස්ථාවේදී මට ඔබ ගැන කිසි අනු-
කම්පාවක් දැනුණේ නැත.[2] එහෙත්
ස්වර්ගයේ සේනාවල අධිපති වූ යෙ-
හෝවා දෙවි වන මම, **15** නැව-
තත් යෙරුසලමට හා යූදා දේශයේ
වැසියන්ට කරුණාවන්තව සලකන්න
තීරණය කළෙමි.[3] ඒ නිසා භය නො-
වන්න.”[4]

**16** “නමුත් ඔබ මේ අත්‍යවශ්‍ය
කාරණා ඉටු කළ යුතුයි.[5] ඔබ එකි-
නෙකා සමඟ ඇත්ත කතා කළ
යුතුයි.[6] නුවර දොරටුව අසල නඩු
විභාග කරන විට සත්‍යය කුමක්දැයි
සොයා බලා සමාදානය රැකෙන ලෙස
කටයුතු කළ යුතුයි.[7] **17** ඔබ තවත්
කෙනෙකුට විරුද්ධව දුෂ්ට දේවල්
කුමන්ත්‍රණය නොකළ යුතුයි.[8] ඔබ
බොරු සාක්ෂි නොදිය යුතුයි.[9] මන්ද
යෙහෝවා දෙවි වන මම මේ සෑම දෙ-
යක්ම හෙළාදකිමි.”[10]

**18** ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මට නැවත කතා
කර මෙසේ පැවසුවේය. **19** “ඔබ
මුළු සිතින්ම සත්‍යයට ප්‍රිය කර සමා-
දානය රැකෙන සේ ක්‍රියා කරන්න.[11]
එවිට හතරවන,[12] පස්වන,[13] හත්-
වන[14] හා දහවන මාසවලදී[15] නිරාහා-
රව සිටිනවා වෙනුවට උත්සව දවස්
සමරමින් ප්‍රීති වීමට යූදා සෙනඟට
අවස්ථාවක් උදා වනු ඇත.[16] මා
ස්වර්ගයේ සේනාවල අධිපති වන යෙ-
හෝවා දෙවිය.”

**20** “ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මමය. විවිධ
නගරවල වැසියන් මේ නුවරට පැමි-
ණෙන කාලයක් ඉදිරියේදී එනු ඇත.[17]
**21** එක නගරයක වැසියෝ තවත්
නගරයකට ගොස් මෙසේ කියනු
ඇත. ‘ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවිගේ අනුමැතිය
ලබාගන්නා පිණිස[18] යෙහෝවා දෙවි-
ගේ මහ පෙන්වීම් පැතීමට අපි දැන්
යනවා.[1] ඔබත් පමා නොවී අප සමඟ
එන්න.’[2] **22** එදින විශාල සෙනඟක්
හා බලවත් ජාතීහු ස්වර්ගයේ සේනා-
වල අධිපති වූ යෙහෝවා දෙවි වන
මාගේ අනුමැතිය ලබාගන්නා පිණිස
යෙරුසලමට පැමිණ යෙහෝවා දෙවි
වන මාගෙන් මහ පෙන්වීම් පතනු
ඇත.”[3]

**23** “ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මමය. ඒ දවස්-
වලදී, සෑම භාෂාවක්ම නියෝජනය
කරන විවිධ ජාතීන්ට අයත් මිනිස්සු
දසදෙනෙක්[4] යුදෙව් ජාතිකයෙකු[5]
වෙත පැමිණ, ඔහුගේ වස්ත්‍රය අල්ලා-
ගෙන[6] මෙසේ පවසනු ඇත. ‘දෙවි ඔබ
සමඟ සිටින බව අපට ආරංචි විය.[7]
එහෙයින් ඔබ සමඟ යන්න අපි සතුටු
වන්නෙමු.’ ”[8]

**9** මෙය විනිශ්චයේ පණිවිඩයකි.[9]
“යෙහෝවා දෙවි ඊශ්‍රායෙල්හි
සියලු ගෝත්‍ර ගැනත් පොළො-
වේ සියලු වැසියන් ගැනත් විමසිල්-
ලෙන් සිටියි.[10] එබැවින් යෙහෝවා
දෙවි හද්‍රාක් දේශයටත් දමස්කය-
ටත්,[11] **2** ඇගේ* දේශ සීමාවේ පිහිටි
හමාත් දේශයටත්[12] විරුද්ධව තීන්දු-
වක් දී තිබේ. ඉතා බුද්ධිමත් වැසි-
යන් සිටින බවට ප්‍රසිද්ධ වී සිටින[13]
තීර්[14] හා සීදොන්[15] නුවරවලට විරුද්-
ධවත් ඒ තීන්දුව ප්‍රකාශ කර තිබේ.
**3** තීර්හි වැසියෝ විශාල බලකො-
ටුවක් සාදාගත්තෝය. ඔවුහු පස්
ගොඩගසන්නාක් මෙන් රිදී ගොඩගැ-
සුවෝය. මඩ ගොඩගසන්නාක් මෙන්
රන්ද ගොඩගැසුවෝය.[16] **4** නමුත්
යෙහෝවා දෙවි ඒ නුවර විනාශ
කර දමන්නේය. එහි හමුදාවට මුහු-
දේදී පහර දී ඔවුන්ව සම්පූර්ණ-

**8 පරි.**
**1** යෙරෙ 31:28 යෙරෙ 32:31 මලා 3:7
**2** යෙරෙ 4:28 යෙරෙ 20:16 එස 24:14
**3** යෙරෙ 29:11 යෙරෙ 32:42 මීකා 4:10
**4** යෙසා 43:1 ශෙප 3:16
**5** ද්වි 10:12 මීකා 6:8
**6** ලෙවී 19:11 හිතෝ 12:19 යෙරෙ 9:5 එෆී 4:15 එෆී 4:25
**7** යෙසා 11:4 ආමෝ 5:15 සෙක 7:9
**8** හිතෝ 3:29 යෙරෙ 4:14 සෙක 7:10 මතෙ 15:19
**9** යෙරෙ 4:2 සෙක 5:4
**10** හිතෝ 6:16 හිතෝ 8:13
**11** ගීතා 119:165
**12** යෙරෙ 52:6
**13** යෙරෙ 52:12 සෙක 7:5
**14** 2රාජා 25:25
**15** යෙරෙ 52:4
**16** ගීතා 30:11 යෙසා 35:10 යෙරෙ 31:12
**17** ගීතා 22:27 යෙසා 2:2 යෙසා 11:10 හොෂෙ 1:10 මතෙ 8:11
**18** සෙක 7:2

**2 තීරුව**
**1** යෙරෙ 50:4
**2** ගීතා 122:1
**3** යෙසා 55:5 යෙසා 60:3 මීකා 4:2 හග් 2:7 ගලා 3:8
**4** එළි 7:9 එළි 14:6
**5** රෝම 2:29 ගලා 3:29
**6** මතෙ 25:40
**7** ද්වි 4:7 යෙසා 45:14 1කොරි 14:25
**8** නික් 12:38 ගණන් 10:29 රූත් 1:16 ක්‍රියා 13:47

**9 පරි.**
**9** යෙසා 13:1
**10** 2ලේක 16:9; හෙබ්‍රෙ 4:13; 1පේත්‍රු 3:12; **11** යෙරෙ 49:27; ආමෝ 1:3; **12** යෙරෙ 49:23; ආමෝ 6:14; **13** එස 28:3; **14** යෙසා 23:1; යෝවෙ 3:4; ආමෝ 1:9; **15** එස 28:21; **16** එස 27:33.

**සෙක 9:2*** සමහරවිට මෙහි සඳහන් වන්නේ හද්‍රාක් දේශයේ හෝ දමස්කයේ දේශ සීමාව ගැන විය හැකියි.

යෙන්ම පරාජයට පත් කරන්නේය.[1]
මුළු නගරයම ගින්නෙන් දවා දමන්-
නේය.[2] **5** තීර්ට සිදු වූ දේ ගැන
අසා අෂ්කෙලොන් භයෙන් වෙවු-
ලනු ඇත. ගාසා නුවරේ වැසියෝද
මේ දේවල් නිසා දැඩි සිත් වේද-
නාවකට පත් වන්නෝය. තීර් මත
විශ්වාසය තැබූ[3] එක්‍රොන් නුවරේ
වැසියන්ගේ[4] බලාපොරොත්තු සුන්
වී යන්නේය. ගාසා නුවර පාල-
නය කිරීමට කිසිවෙක් ඉතුරු
වන්නේ නැත. අෂ්කෙලොන් නුවර
සම්පූර්ණයෙන්ම පාළු වී යන්නේය.[5]
**6** අෂ්දොද් නගරයට[6] අවජාතක දරු-
වෙක්[7] පැමිණෙනු ඇත. පිලිස්තිවරුන්
ආඩම්බරයෙන් සැලකූ දේ නැති කර
දමනු ඇත.[8] **7** ලේ තැවරුණු මස්
ඇතුළු සියලු පිළිකුල්සහගත කෑම
ඔවුන්ගේ කටින් ඉවත් කරනු ඇත.[9]
ඉන්පසු ඔවුන්වද අපේ දෙවිට සේ-
වය කිරීමට තෝරාගනු ලබයි. ඔවුහු
යූදා දේශයේ[10] අධිපතීන්[11] හා සමා-
නව කටයුතු කරන්නෝය. එක්‍රොන්
දේශයේ වැසියෝද යෙබූසිවරුන්[12]
මෙන් ක්‍රියා කරන්නෝය. **8** ‘සතු-
රන් මාගේ සෙනඟට කරන්න හදන
දේ මම හොඳින් දනිමි.[13] එහෙයින්
මම ඔවුන්ගේ දේශය ළඟින්ම කඳවුරු
බැඳගෙන රැකවලෙකු සේ කටයුතු
කරන්නෙමි.[14] තමන්ගේ කැමැත්ත
පරිදි ඒ දේශය හරහා ගමන් කිරී-
මට මම කිසිවෙකුට ඉඩ දෙන්නේ
නැත. මම නැවත කිසිවෙකුට ඔවුන්-
ගෙන් බලෙන් වැඩ ගැනීමට ඉඩ නො-
දෙන්නෙමි.[15]

**9** “‘සියොන් දියණිය, ප්‍රීතියෙන්
ඉපිල යන්න.[16] යෙරුසලම් දියණිය,
ප්‍රීති ඝෝෂා නඟන්න.[17] මන්ද ඔබේ
රජ[18] බූරුවෙකු* පිට නැඟී[19] ඔබ
වෙතට එන්නේය.[20] ඔබේ රජු ධර්-
මිෂ්ඨ, නිහතමානී රජෙකි.[21] ඔහු සතු-
රන්ගෙන් ජය ලබා[22] ඔබ වෙතට
එන්නේය. **10** මම එෆ්‍රායිම් දේශයේ
ඇති යුධ රථ විනාශ කර දමන්නෙමි.
යෙරුසලමේ සිටින අශ්වයන්ව පන්නා
දමන්නෙමි.[1] ඔවුන්ගේ දුනු[2] සුනුවිසුනු
කර දමන්නෙමි. ඔබේ රජ ජාතීන්ට
සාමය ප්‍රකාශ කරනු ඇත.[3] සයුරෙන්
සයුරටද මහ ගඟේ* සිට පොළොවේ
සියලු සීමා දක්වාද ඔහුගේ පාලනය
විහිදී යන්නේය.[4]

**11** “‘සියොන් දියණිය, වතුර සිඳී
ගිය ගැඹුරු වළක සිර කර තැබූ ඔබේ
සෙනඟව[5] මම මුදවාගන්නෙමි. මා
එසේ කරන්නේ ඔබ සමඟ ලෙයින්
ඇති කරගත් ගිවිසුම[6] පදනම් කර-
ගෙනය.

**12** “‘බලාපොරොත්තුවක් ඇතුව
සිටින සිරකරුවෙනි,[7] දැන් බලකො-
ටුව[8] වෙතට පියනඟන්න.

“‘සියොන් දියණිය, ඔබ වින්ද
වේදනා වෙනුවට මම ඔබට දෙ-
ගුණයක් ආශීර්වාද කරන්නෙමි.[9]
**13** මම යූදා නමැති මාගේ දුන්න
ගෙන* එෆ්‍රායිම් නමැති ඊතලය එහි
රඳවන්නෙමි. සියොන් දියණිය, මම
ඔබේ පුත්‍රයන්ව[10] ග්‍රීසියේ[11] හමුදා-
වට විරුද්ධව නැඟී සිටින්න සලස්-
වන්නෙමි. යුධ දක්ෂයෙකුගේ කඩුවක්
මෙන් මම ඔබව බලවත් කරන්-
නෙමි.’[12] **14** එවිට යෙහෝවා දෙවි
තම සෙනඟ සමඟ සිටින බව සියලු-
දෙනාම පැහැදිලිව දකිනු ඇත.[13] දෙ-
විගේ ඊතලය විදුලිය මෙන් වේගයෙන්
ගමන් කරයි.[14] විශ්වයේ පාලකයා-
ණන් වන යෙහෝවා දෙවි හො-
රණෑව පිඹ,[15] කුණාටුවක් සමඟින්
දකුණු දිශාවෙන් පැමිණෙන්නේය.[16]
**15** ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි තම සෙනඟව
ආරක්ෂා කරනු ඇත. ඔවුන්ට ගල්පටි-
වලින් දරුණු ප්‍රහාර එල්ල කළත්

**16** යෙසා 21:1; යෙසා 66:15.

සෙක **9:9*** “ඔහු බූරුදෙනකගේ නාම්බෙකු පිට නැඟ එන්නේය” යන වාක්‍යයද මුල් භාෂාවේ ඇතුළත් කර ඇත.

සෙක **9:10*** එනම්, යුප්‍රටීස් ගඟ. **13*** මූ.අ., “යූදා පාගන්නෙමි.” සාමාන්‍යයෙන් දුන්නක රැහැන් සවි කරන පිණිස එය පාගනු ලැබුවේය. මෙහි භාවිත කර ඇති හෙබ්‍රෙව් ක්‍රියා පදයෙන්ද අදහස් කළේ එයයි.

**9 පරි.**

**1** එස 26:17 එස 27:26
**2** එස 28:18
**3** යෙසා 20:5
**4** යොෂු 13:3 1සාමු 5:10
**5** ශෙප 2:4
**6** දේශ 2:18 ආමො 1:8
**7** ද්වි 23:2 හෙබ්‍රෙ 12:8
**8** යෙසා 2:17 දානි 4:37
**9** ගීතා 58:6 ආමො 3:12
**10** යෙසා 60:14
**11** උත් 36:40
**12** 2සාමු 5:6 1රාජා 9:20 1ලේක 11:4 1ලේක 21:28
**13** නික් 3:7 2සාමු 16:12
**14** ගීතා 125:2
**15** යෙසා 54:14
**16** යෙසා 12:6
**17** යෙසා 44:23 ශෙප 3:14
**18** ගීතා 2:6 යෙසා 32:1 යෙරෙ 23:5 ලූක් 19:38 යොහ 1:49
**19** 1රාජා 1:33 මතෙ 21:7
**20** යොහ 12:15
**21** මතෙ 11:29 මතෙ 21:5
**22** යොහ 16:33

**2 තීරුව**

**1** හිතෝ 21:31
**2** සෙක 10:4
**3** යෙසා 9:7 එෆී 2:14
**4** නික් 23:31 ගීතා 2:8 ගීතා 72:8
**5** යෙසා 49:9
**6** යෙරෙ 31:31 මතෙ 26:28 හෙබ්‍රෙ 12:24 හෙබ්‍රෙ 13:20 1පේතෘ 1:19
**7** යෙසා 61:1 යෙරෙ 31:17
**8** 2සාමු 5:7 යෙරෙ 31:6
**9** යෝබ් 42:10 යෙසා 61:7
**10** මතෙ 13:38
**11** දානි 8:21 යෝවෙ 3:6
**12** ගීතා 149:6 යෙසා 41:15
**13** නික් 14:24
**14** ගීතා 18:14
**15** යොෂු 6:5 යෙසා 18:3

ඔවුහු ඒ ප්‍රහාරවලින් ජය ගන්නෝය.[1]
පූජාසනය[2] වෙතට ගෙනෙන භාජන
ලෙයින් පිරී තිබෙන්නාක් මෙන්ද ඒ
ලේ පූජාසනය පුරාම වත් කරන්-
නාක් මෙන්ද ඔවුන්ගේ දේශය පුරාම
බොහෝ ලේ වගුරුවනු ඇත. එවිට
ඔවුහු බොහෝ වයින් පානය කර[3]
තෘප්තියට පත් වූ අය මෙන් හැසිරෙනු
ඇත.
**16** "ඒ කාලයේදී, එඬේරෙකු බැටළු
රැළ ආදරයෙන් රැකබලා ගන්නාක්
මෙන්,[4] ඔවුන්ගේ දෙවි වන යෙහෝවා
ඔවුන්ව ආරක්ෂා කරනු ඇත.[5] ඔටුන්-
නක තිබෙන මැණික් ගල් මෙන් ඔවුහු
දෙවිගේ දේශයේ බැබළෙනු ඇත.[6]
**17** දෙවි මොන තරම් යහපත්ද![7] ඔහු
මොන තරම් තේජාන්විතද![8] ඒ කාල-
යේදී, ධාන්‍ය හා අලුත් වයින් බහුලව
තිබෙන නිසා තරුණ තරුණියෝ කා
බී තෘප්තියට පැමිණෙන්නෝය."[9]

**10** "වැහි වලාකුළු සාදන්නේ යෙ-
හෝවා දෙවිය.[10] ඔහු වැසි
වස්සවා[11] සියලුදෙනාටම අවශ්‍ය පල-
දාව ලබා දෙන්නේය.[12] එබැවින්
වසන්ත කාලයේදී[13] ඔබේ කෙත්-
වතුවලට අවශ්‍ය වැසි ලබා
දෙන මෙන් යෙහෝවා දෙවිගෙන්
අයැදින්න.[14] **2** බොරු දෙවිවරු*[15]
තමන්ගෙන් පිහිට පතන අයව නො-
මඟ යවන්නෝය. මන්තර ගුරුකම්
කරන මිනිස්සු දර්ශන දකින නමුත්
ඒවා කිසිදා ඉටු වන්නේ නැත.[16] ඔවුහු
කිසි අර්ථයක් නැති සිහින දකින්-
නෝය. ඔවුන් අන් අයව සනසවන්න
උත්සාහ කළත් එයින් කිසිදු පලක්
නැත.[17] එබැවින් ජනයා එඬේරෙකු
නැති[18] බැටළුවන් මෙන් හිරිහැර විඳි-
මින් සිසිකඩ විසිර යති.[19]
**3** "'එඬේරුන් සේ ජනයාව රැක-
බලා ගැනීමට පත් කර සිටින අයට
විරුද්ධව මාගේ උදහස ඇවිළී තිබේ.[20]
එළුවන් මෙන් ක්‍රියා කරන කෲර පාල-
කයන්ද[21] මට ගණන් දිය යුතුයි.'[22]
ස්වර්ගයේ සේනාවල අධිපති වන යෙ-
හෝවා දෙවි තම බැටළු රැළ[1] වන
යූදා සෙනඟව රැකබලා බලවත් යුධ
අශ්වයෙකු සේ[2] ඔවුන්ව ශක්තිමත්
කරන්නේය. **4** අතිවැදගත් කාර්ය-
යක් ඉටු කරන තැනැත්තා[3] පැමි-
ණෙන්නේ යූදා සෙනඟ අතරින්ය.
අපේ උපකාරයට සිටින පාල-
කයා[4] පැමිණෙන්නේ ඔවුන්ගෙන්ය.
වැඩ අධීක්ෂණය කරන අයද[5]
යූදා පෙළපතෙන් පැමිණෙන්නෝය.
සතුරන්ට පහර දීමට යොදාගන්නා
දුන්න[6] නික්ම එන්නේද ඔවුන්ගෙන්ය.
**5** යූදා පෙළපතට අයත් අය ගමන්
කරන්නේ ජයග්‍රාහී හමුදාවක් මෙනි.[7]
ඔවුහු මැරුම් කෑ සතුරන්ගේ මළ
සිරුරු මැදින් ගමන් කරති.[8] ඔවුන්
සටන් කරන විට යෙහෝවා දෙවිද
ඔවුන්ගේ උපකාරයට සිටින්නේය.[9]
එබැවින් අශ්වයන් පිට නැඟී එන සතු-
රෝ ඔවුන් අබියස අන්ත පරාජයකට
ලක් වනු ඇත.[10] **6** 'මම යූදා පෙ-
ළපත උසස් කරන්නෙමි. යෝසෙප්-
ගේ පෙළපතත් බේරාගන්නෙමි.[11] මා
ඔවුන්ගේ දෙවි වන යෙහෝවාය. එබැ-
වින් මම ඔවුන්ට දයාව පෙන්වා[12]
ඔවුන්ට වාසය කිරීමට තැනක් ලබා
දෙන්නෙමි. ඔවුන් මට හඬගසන විට
මම ඔවුන්ට උත්තර දෙන්නෙමි.[13]
එවිට මාගේ ආශීර්වාදය අහිමි වී තිබූ
කාලය ඔවුන්ගේ මතකයට නැඟෙන්-
නේ නැත.'[14] **7** එෆ්‍රායිම් බලවන්ත-
යෙකු මෙන් ක්‍රියා කරනු ඇත.[15] වයින්
බී ප්‍රීතියෙන් සිටින අය මෙන් ඔවු-
හුද ප්‍රීතියෙන් කල් ගෙවන්නෝය.[16]
ඔවුන්ගේ දරුවෝද එය දැක සතුටු
වන්නෝය.[17] යෙහෝවා දෙවි ඔවුන්
වෙනුවෙන් කළ දේවල් නිසා ඔවුහු
ප්‍රීතියෙන් පිනා යන්නෝය.[18]
**8** "'මම ඔවුන්ව මා වෙතට කැඳ-
වාගන්නෙමි.[19] මම ඔවුන්ව මුදවා-
ගෙන,[20] අතීතයේදී මෙන් විශාල
සෙනඟක් බවට පත් කරන්නෙමි.[21]

**9 පරි.**
**1** මීකා 5:9; සෙක 10:5; සෙක 12:6
**2** නික් 27:2; ලෙවී 4:7
**3** යෙසා 55:1
**4** ගීතා 100:3; මීකා 5:4; සෙක 11:7; ලූක් 12:32
**5** එස 34:22; එස 37:23
**6** යෙසා 62:3; ශෙප 3:20
**7** ගීතා 25:8; ගීතා 31:19; යෙසා 63:7
**8** ගීතා 50:2; ගීතා 90:17
**9** යෙසා 62:8; යෝවෙ 3:18; ආමො 9:13

**10 පරි.**
**10** යෙරෙ 51:16
**11** එස 34:26; යාකො 5:7
**12** ගීතා 104:14
**13** ද්වි 11:14; යෝවෙ 2:23
**14** යෙරෙ 14:22; යාකො 5:18
**15** 1සාමු 15:23
**16** යෙරෙ 27:9; යෙරෙ 29:21
**17** යෙරෙ 8:11
**18** ගණන් 27:17; එස 34:5
**19** යෙරෙ 50:17
**20** යෙසා 56:11; යෙරෙ 10:21; එස 34:10
**21** එස 34:16; එස 34:17
**22** මාක් 12:40

**2 තීරුව**
**1** ලූක් 1:68
**2** හිතෝ 21:31
**3** යෙසා 19:13; හග් 2:23
**4** උත් 49:10; එස්රා 9:8
**5** යෙසා 60:17
**6** උත් 49:24; යෙසා 49:2
**7** යෝවෙ 2:7
**8** ගීතා 18:42; මීකා 7:10
**9** ද්වි 20:1; යෙසා 41:13
**10** ගීතා 20:7; ගීතා 33:16; හග් 2:22
**11** යෙරෙ 3:18; එස 37:16; හොෂෙ 1:10
**12** යෙරෙ 31:20
**13** යෙරෙ 33:3
**14** යෙරෙ 30:18; **15** යෙරෙ 31:9; එස 37:19; **16** ගීතා 104:15; සෙක 9:15; **17** ගීතා 90:16; යෙරෙ 32:39; **18** යෙසා 66:14; ශෙප 3:14; **19** එස්රා 1:1; **20** යෙසා 44:22; යෙසා 51:11; 1තිමෝ 2:6; **21** 1රාජා 4:20; යෙරෙ 33:22.

සෙක **10:2*** මූ.අ., "ටෙරෆිම් රූප."

**9** කෙතක බීජ වපුරන්නාක් මෙන්
මම ඔවුන්ව දුර ඈත පිහිටි දේ-
ශවලට විසුරුවාහරින්නෙමි.[1] නමුත්
ඒ දේශවලදී ඔවුහු නැවත මාව සිහි
කරනු ඇත.[2] ඔවුහු නව ජීවයක්
ලබා තම දරුවන් සමඟ නැවත මා
වෙතට පැමිණෙන්නෝය.[3] **10** මම
ඔවුන්ව ඊජිප්තු දේශයෙන්ද[4] ඇසිරියා-
වෙන්ද නැවත එක් රැස් කරන්නෙමි.[5]
ඔවුන්ට ජීවත් වීමට දේශයේ ඉඩ
මදි වන නිසා[6] ගිලියද් දේශයේ[7] හා
ලෙබනොන්හි මම ඔවුන්ව පදිංචි කර-
වන්නෙමි. **11** මුහුද ඔවුන්ගේ ගම-
නට බාධා කරන විට මම ඒ මැදින්
ගමන් කරන්නෙමි.[8] එයට පහර දෙ-
මින් එහි රළ පහර නිහඬ කරන්-
නෙමි.[9] නයිල් ගඟ ඔවුන්ට බාධා
කරන විට එහි පතුල පෙනෙන
තෙක් වතුර සිඳවන්නෙමි.[10] ඇසිරි-
යාව ලැජ්ජාවට පත් කර[11] ඊජිප්තුවේ
බලය*[12] බිඳ දමන්නෙමි.[13] **12** යෙ-
හෝවා දෙවි වන මම ඔවුන්ගේ සවිය
වන්නෙමි.[14] ඔවුහුද මාගේ නාමයට
ගෞරවය ගෙන දෙන අන්දමින් කට-
යුතු කරනු ඇත.'[15] එසේ පවසන්නේ
යෙහෝවා දෙවිය."

**11** "ලෙබනොන්හි වැසියෙනි,[16]
ඔබේ දේශය තුළට ගින්නක්
පැමිණ ඔබේ දේවදාර ගස් දවා දමනු
ඇත.[17] එබැවින් ඔබේ දේශයේ දො-
රටු විවෘත කර තබන්න. **2** ජුනිපර්
වෘක්ෂයෙනි, දැවී ගිය දේවදාර ගස්
වෙනුවෙන් හඬා වැලපෙන්න. අතිවි-
ශාල ගස් ගින්නෙන් දැවී ගියේය.[18]
බාෂාන්හි දැවැන්ත වෘක්ෂයෙනි,
දැවී ගිය ඝන වනාන්තර වෙනුවෙන්
හඬා වැලපෙන්න.[19] **3** එඬේරුන්ගේ
විලාප හඬට ඇහුම්කන් දෙන්න.[20]
මන්ද සරුසාර තණබිම් විනාශ වී
ගියේය.*[21] තරුණ කේශර සිංහයන්-
ගේ ගර්ජනාවට ඇහුම්කන් දෙන්න.
මන්ද යොර්දාන් ගඟ අසල තිබුණු
වනළැහැබ විනාශ වී ගියේය.[22]

**4** "මගේ දෙවි වන යෙහෝවා මට
මෙසේ පැවසුවේය. 'මරණයට නියම
වූ බැටළු රැළක් මෙන් සිටින මේ
සෙනඟව රැකබලා ගන්න.[1] **5** මන්ද
ඔවුන්ගේ එඬේරු ඔවුන්ට කිසි
අනුකම්පාවක් පෙන්වන්නේ නැත.[2]
ඔවුන්ව විකුණන අය,[3] "අපව පොහො-
සත් කළ යෙහෝවා දෙවිට ප්‍රශංසා
වේවා" කියා පවසති.[4] ඔවුන්ව මිල දී
ගන්නා අය ඔවුන්ව මරා දැමුවත්[5] දඬු-
වම් විඳින්නේ නැත.'[6]
**6** "යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ පවසයි. 'මම දේශයේ වැසි-
යන්ට තවදුරටත් අනුකම්පා නොක-
රන්නෙමි.[7] එබැවින් එක් එක්
කෙනා තමාගේ සහෝදරයන්ට විරුද්-
ධව නැඟී සිටිනු ඇත.[8] ඔවුන්ගේ රජුද
ඔවුන්ට විරුද්ධව නැඟී සිටින්නේය.[9]
ඔවුන් නිසා මුළු දේශයම නැති නාස්ති
වී යනු ඇත. මම ඔවුන්ගෙන් එක් කෙ-
නෙකුවත් බේරා නොගන්නෙමි.' "[10]
**7** මම මරණයට නියම වූ[11] බැටළු
රැළ රැකබලා ගැනීමට එකඟ
වුණෙමි.[12] මා එසේ කළේ රැළේ හිරි-
හැර විඳින බැටළුවන් වෙනුවෙනි.[13]
මම සැරයටි දෙකක් අතට ගෙන[14]
එක් සැරයටියක් 'ප්‍රසන්නකම' ලෙ-
සද[15] අනික් සැරයටිය 'එකමුතු-
කම' ලෙසද[16] හැඳින්වූවෙමි. මම ඒ
සැරයටි රැගෙන බැටළු රැළ රැකබලා
ගැනීමට පටන්ගත්තෙමි. **8** මාස-
යක් ගත වන්නත් කලින්[17] මම එඬේ-
රුන් තුන්දෙනෙකුව පන්නා දැමුවෙමි.
මන්ද ඔවුන් කරන දේවල් මට තවදුර-
ටත් ඉවසාගත නොහැකි විය.[18] ඔවු-
හුද මට වෛර කළෝය. **9** නමුත්
කලක් ගත වූ පසු මම මෙසේ
කීවෙමි. "මම තවදුරටත් ඔබව රැක-
බලා නොගන්නෙමි.[19] ඒ නිසා පණ
අදින අයට මිය යෑමට ඉඩහරිනු ඇත.
අතරමං වූ අයව අත්හරිනු ඇත.[20]
ඉතුරු වී සිටින අය එකිනෙකාව

---

සෙක **10:11*** මූ.අ., "ඊජිප්තුවේ රාජ යෂ්ටිය."
**11:3*** මූ.අ., "ඔවුන්ගේ තේජස නැති වී ගියේය."

**10 පරි.**
**1** යෙරෙ 31:27, හොෂෙ 2:23, මීකා 5:7, ක්‍රියා 8:4
**2** 1රාජා 8:47, යෙරෙ 51:50
**3** යෙසා 65:23, ක්‍රියා 2:39
**4** යෙසා 11:11
**5** යෙරෙ 50:19, රෝම 11:25
**6** යෙසා 49:20, යෙසා 54:2
**7** මීකා 7:14
**8** ගීතා 66:12
**9** යෙසා 11:15
**10** යෙසා 19:6
**11** යෙසා 14:25, මීකා 5:5
**12** යෙසා 19:1
**13** එස 30:13
**14** යෙසා 41:10, යෙසා 45:24
**15** හිතෝ 18:10, මීකා 4:5

**11 පරි.**
**16** යෙරෙ 22:23
**17** යෙරෙ 22:7
**18** යෙසා 10:33, එස 31:3
**19** යෙසා 2:13, යෙසා 32:19
**20** එස 34:10, යෝවේ 1:13
**21** යෙරෙ 2:30
**22** යෙරෙ 49:19, යෙරෙ 50:44

**2 තීරුව**
**1** එස 34:8
**2** එස 34:4
**3** 2රාජා 4:1, නෙහෙ 5:8
**4** හොෂෙ 12:8
**5** යෙරෙ 23:1, එස 22:25, එස 34:2, මීකා 3:2
**6** යෙරෙ 2:3
**7** එස 8:18
**8** එස 38:21, මීකා 7:2, හග් 2:22, සෙක 11:9, සෙක 14:13
**9** මතෙ 22:7
**10** ගීතා 50:22, හෙබ්‍රෙ 10:27
**11** සෙක 11:4, සෙක 13:8
**12** ගීතා 23:1, ගීතා 80:1, ගීතා 95:7, යෙසා 40:11
**13** ශෙප 3:12, සෙක 11:11

**14** 1සාමු 17:40; ගීතා 23:4; **15** ගීතා 133:1; සෙක 11:10; **16** එස 37:19; සෙක 11:14; **17** හොෂෙ 5:7; **18** ද්වි 32:19; **19** යෙරෙ 23:33; සෙක 10:2; **20** යෙරෙ 15:2.

මරාගන්නෝය.”[1] **10** එබැවින් මම,
‘ප්‍රසන්නකම’ යන නමින් හැඳින්වූ
මගේ සැරයටිය රැගෙන[2] එය කැලි
කැලිවලට කඩා දැමුවෙමි.[3] මා එසේ
කළේ මාගේ සෙනඟ සමඟ මා ඇති
කරගත් ගිවිසුම අහෝසි කළ බව
පෙන්වීමටය.[4] **11** ඔවුන් සමඟ ඇති
කරගත් ඒ ගිවිසුම එදිනම අවසන් විය.
ඉන්පසු සෙනඟ අතරේ හිරිහැර විඳි-
මින් සිටි අය,[5] මා මේ සියල්ල කළේ
යෙහෝවා දෙවිගේ අණ පරිදි බව තේ-
රුම්ගත්තෝය.

**12** ඉන්පසු මම ඔවුන්ට මෙසේ
කීවෙමි. “ඔබ සුදුසුයි කියා සිතනවා
නම් මට ලැබිය යුතු කුලිය දෙන්න.
නමුත් ඔබ අකමැති නම් එය නොදී
සිටින්න.” එවිට ඔවුහු මාගේ කුලිය
ලෙස රිදී ෂෙකෙල් තිහක් දුන්නෝය.[6]

**13** එය දුටු යෙහෝවා දෙවි මට
මෙසේ පැවසුවේය. “ඔවුන් මාව කො-
තරම් සුළු කොට සලකනවාද කියා
ඔබ දුටුවාද?[7] ඔබට ලැබුණු රිදී ෂෙ-
කෙල් භාණ්ඩාගාරයට විසි කරන්න.”[8]
එබැවින් මම ඒ රිදී ෂෙකෙල් තිහ
රැගෙන යෙහෝවා දෙවිගේ ගෘහ-
යේ තිබෙන භාණ්ඩාගාරයට විසි
කළෙමි.[9]

**14** ඉන්පසු මම ‘එකමුතුකම’ යන
නමින් හැඳින්වූ මගේ අනික් සැරයටිය
රැගෙන[10] එයත් කැලි කැලිවලට කඩා
දැමුවෙමි. එසේ කළේ යූදා සහ ඊශ්‍රා-
යෙල් අතර[11] තිබුණු සහෝදරත්වය[12]
නැති වන බව පෙන්වීමටය.

**15** යෙහෝවා දෙවි මට තවදුරටත්
මෙසේ පැවසුවේය. “දැන් කිසි කම-
කට නැති එඬේරෙකුගේ[13] ආම්පන්න
අතට ගන්න. **16** මන්ද මම මේ
දේශයට එවැනි එඬේරෙකුව එවන්-
නෙමි.[14] නැති වූ බැටළුවන් ගැන
ඔහු කිසිදු සැලකිල්ලක් නොදක්වයි.[15]
ඔහු බැටළු පැටවුන් ගැන සොයා
බලන්නේවත් තුවාල වූ බැටළුවන්ව
සුව කරන්නේවත් නැත.[16] ශක්ති-
මත්ව සිටින බැටළුවන්ට ඔහු කෑම
නොදෙන්නේය. ඔහු තර සතාව මරා

**11 පරි.**
**1** යෙරෙ 19:9 එස 5:10
**2** ගීතා 90:17 සෙක 11:7
**3** මතෙ 23:38
**4** යෙරෙ 14:21 එස 16:59
**5** යෙසා 14:32 ශෙප 3:12
**6** මතෙ 26:15 මතෙ 27:9
**7** නික් 21:32 මාක් 14:11
**8** මතෙ 27:5
**9** මතෙ 27:6 ක්‍රියා 1:18
**10** සෙක 11:7
**11** 1රාජා 12:20 යෙසා 9:21
**12** යෙසා 11:13 එස 37:16
**13** එස 34:2 මතෙ 15:14
**14** 1පේත්‍ර 5:3
**15** යෙරෙ 23:2 එස 34:6 මතෙ 9:36
**16** එස 34:21

**2 තීරුව**
**1** උත් 31:38 එස 34:3
**2** එස 34:10
**3** යොහ 10:12
**4** යෙරෙ 23:1 එස 13:2 මතෙ 23:13
**5** 1රාජා 13:4 එස 30:22

**12 පරි.**
**6** යෝබ් 26:7 ගීතා 104:2 යෙසා 42:5 යෙසා 44:24
**7** ගීතා 102:25 ගීතා 136:6 යෙසා 45:18 යෙසා 48:13
**8** යෝබ් 34:14 ගීතා 146:4 දේශ 12:7 ක්‍රියා 17:25
**9** හෙබ්‍රෙ 12:22
**10** ගීතා 75:8 සෙක 14:13
**11** සෙක 14:14
**12** ශෙප 3:19
**13** ගීතා 2:2 එස 38:9 මීකා 4:11 සෙක 14:2 එළි 16:14
**14** දානි 2:34 දානි 2:45 මතෙ 21:44
**15** යෙසා 24:21
**16** හිතෝ 21:31

කන්නේය.[1] ඔහු උන්ගේ කුරද කඩා
දමන්නේය.[2] **17** නමුත් රැළ ගැන
කිසිදු තැකීමක් නොකරන,[3] කිසි
කමකට නැති එඬේරා පිටට මහත්
විපතක් පැමිණෙනු ඇත.[4] සතුරෝ
පැමිණ කඩුවකින් ඔහුගේ දකුණත-
ටත් දකුණු ඇසටත් පහර දෙන්-
නෝය. ඔහුගේ අත වැහැරී යනු ඇත.[5]
ඔහුගේ ඇස අන්ධ වනු ඇත.”

**12** අහස්තලය දිගහැර[6] පො-
ළොවේ අත්තිවාරම් දමා[7]
මනුෂ්‍යයාට ජීවිතය දුන්[8] යෙහෝවා
දෙවිගෙන් ලද පණිවිඩය මෙයයි.

“යෙහෝවා දෙවි වන මා ඊශ්‍රායෙල්
දේශය ගැන කියන මේ පණිවිඩයට
සවන් දෙන්න. **2** මම යෙරුසලම[9]
මත් කරවන පානයක් අඩංගු බඳු-
නක් මෙන් වීමට සලස්වන්නෙමි. ඇය
වටා සිටින සියලු ජාතීන්ව ඇය මත්
කරන්නීය.[10] නමුත් ඔවුහු පැමිණ යෙ-
රුසලම හා මුළු යූදා දේශය වට
කරන්නෝය.[11] **3** ඒ කාලයේදී,[12]
යෙරුසලමට විරුද්ධව පොළොවේ
සියලු ජාතීහු නැඟී සිටින්නෝය.[13]
එහෙත් යෙරුසලම ඔවුන් ඉදිරියේ
නොසෙල්වෙන ගලක්[14] මෙන් වනු
ඇත. ඒ ගල පෙරළා දැමීමට තැත්
කරන සියලුදෙනාම බරපතළ ලෙස
තුවාල ලබන්නෝය.” **4** යෙහෝවා
දෙවි තවදුරටත් මෙසේ කියන්-
නේය. “ඒ කාලයේදී,[15] මම සියලු
අශ්වයන්ව[16] වියවුල් කරන්නෙමි.
අසරුවන්ට වියරුවෙන් හැසිරෙන්න
සලස්වන්නෙමි.[17] ජාතීන්ගේ අශ්ව-
යන්ව මම අන්ධ කරන්නෙමි.
එහෙත් යූදා සෙනඟව මම ආදර-
යෙන් රැකබලා ගන්නෙමි.[18] **5** එවිට
යූදා සෙනඟ අතරේ සිටින අධිප-
තීහු[19] මෙසේ සිතනු ඇත. ‘ස්වර්ග-
යේ සේනාවල අධිපති වන යෙහෝවා
දෙවි යෙරුසලමේ වැසියන් මාර්ග-
යෙන් අපව ශක්තිමත් කරන්නේය.’[20]
**6** ඒ කාලයේදී මම, යූදා දේශ-

---

**17** ද්වි 28:28; ගීතා 76:6; **18** 1රාජා 8:29; 2ලේක 7:15; යෙසා 37:17; **19** සෙක 9:7; **20** ගීතා 46:1; යෙසා 41:10; යෝවෙ 3:16; සෙක 12:8.

යේ අධිපතීන්ව ළැව් ගින්නක්[1] හා
අලුත කැපූ ධාන්‍ය කරල් විනාශ කර
දමන ගිනි පන්දමක් මෙන් වීමට
සලස්වන්නෙමි.[2] ඔවුහු හතර වටේ-
ටම පහර දී සියලුදෙනාවම විනාශ
කර දමන්නෝය.[3] ඉන්පසු යෙරුස-
ලමේ වැසියෝ තම නගරයේම රැඳී
සිටින්නෝය.[4]

**7** “යෙහෝවා දෙවි වන මා මුලින්ම
ආරක්ෂා කරන්නේ යූදා දේශයේ
කූඩාරම් බැඳගෙන සිටින වැසියන්-
වය. එබැවින් දාවිත්ගේ රාජකීය
පෙළපතට හා යෙරුසලමේ වැසි-
යන්ට ලැබුණා හා සමාන ගෞරවයක්
යූදා සෙනඟටත් ලැබෙනු ඇත. **8** ඒ
කාලයේදී යෙහෝවා දෙවි වන මම
යෙරුසලමේ වැසියන් වටා ආරක්-
ෂක වැටක් මෙන් වන්නෙමි.[5] ‘ඒ සෙ-
නඟ අතරේ සිටින දුර්වල අය පවා
දාවිත් මෙන් ශක්තිමත් වන්නෝය.[6]
දාවිත්ගේ රාජකීය පෙළපත දෙවි
කෙනෙකු මෙන්ද[7] යෙහෝවා දෙවි-
ගේ දූතයෙකු මෙන්ද බලවත් කරනු
ලබන්නේය.’[8] **9** ඒ කාලයේදී, යෙ-
රුසලමට විරුද්ධව පැමිණෙන සෑම
ජාතියක්ම මම විනාශ කර දමන්-
නෙමි.[9]

**10** “මම දාවිත්ගේ රාජකීය පෙ-
ළපතට හා යෙරුසලමේ වැසියන්ට
මාගේ බලය නොඅඩුව ලබා දෙන්-
නෙමි.[10] එබැවින් මගේ අනුමැතිය
ලබා දෙන ලෙසට ඉතා බැගෑපත්ව
ඔවුහු මට අයැදිනු ඇත.[11] ඔවුහු තම
හෙල්ලයෙන් තුවාල කළ තැනැත්තා
දෙස බලා,[12] තමන්ගේ එකම පුත්‍රයා
මිය ගියාක් මෙන් හඬා වැලපෙන්-
නෝය. තමන්ගේ කුලුඳුල් පුත්‍රයා
නැති වුණාක් මෙන් ඔවුහු මහත්
සේ දුක් වන්නෝය.[13] **11** එදින යෙ-
රුසලමෙන් ඇසෙන වැලපීමේ හඬ,
මෙගිද්දෝ තැනිතලාවේ[14] පිහිටි හදද්-
රිම්මොන්හි ඇසුණු වැලපීමේ හඬ
තරම් බලවත් වන්නේය. **12** මුළු
දේශයේ වැසියෝ හඬා වැලපෙන්-
නෝය.[15] සියලු පවුල් හඬා වැල-
පෙන්නෝය. දාවිත්ගේ පවුලේ අයද
නාතන්ගේ[1] පවුලේ අයද ඒ ඒ පවුල්-
වල සිටින ස්ත්‍රීහුද තනි තනියෙන්
හඬා වැලපෙන්නෝය.[2] **13** ලෙවී-
ගේ පවුලේ අයද[3] ෂිමෙයිගේ පවු-
ලේ අයද[4] ඒ ඒ පවුල්වල ස්ත්‍රීහුද
තනි තනියෙන් හඬා වැලපෙන්-
නෝය. **14** අනික් සියලු පවුල්ද ඒ
පවුල්වල ස්ත්‍රීහුද එලෙසම හඬා වැල-
පෙන්නෝය.[5]

**13** “ඒ කාලයේදී,[6] දාවිත්ගේ
පෙළපතේ අය හා යෙරුසල-
මේ වැසියන් කළ අපවිත්‍ර දේ පහ කර
දමන පිණිසත්[7] පව් සෝදාහරින පිණි-
සත්[8] ළිඳක් හාරනු ලබන්නේය.”[9]

**2** ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. “ඒ කාලයේදී, මම දේශයේ
වැසියන් නමස්කාර කරන දේවතා
රූප සහමුලින්ම විනාශ කරන්නෙමි.
ඉන්පසුව ඒ දෙවිවරුන්ව ඔවුන්ගේ
මතකයටවත් නැඟෙන්නේ නැත.[10]
බොරු අනාගතවක්තෘවරුන්වද[11]
භූතයන්ගේ බලපෑමද මම දේශයෙන්
තුරන් කර දමන්නෙමි.[12] **3** ඉන්-
පසු යමෙකු බොරු අනාවැකි ප්‍රකාශ
කළොත් ඔහුගේ මවද පියාද ඔහුට
මෙසේ කිව යුතුයි. ‘ඔබ යෙහෝවා දෙ-
විගේ නමින් බොරු අනාවැකි පැවසූ
නිසා තවදුරටත් ජීවත් වීමට වටින්-
නේ නැත.’ ඔහුගේ මව සහ පියා ඔහුට
ඇන ඔහුව මරා දැමිය යුතුයි.[13]

**4** “ඒ කාලයේදී, බොරු අනා-
ගතවක්තෘවරු තමන් දුටු දර්-
ශන ගැනත් තමන් පැවසූ අනාවැකි
ගැනත් ලැජ්ජාවට පත් වන්නෝය.[14]
ඔවුහු තවදුරටත් මනුෂ්‍යයන්ව මුළා
කරවන පිණිස ලොම්වලින් නිමැවූ
නිලවස්ත්‍ර[15] අඳින්නේ නැත. **5** ඒ
අනාගතවක්තෘවරු තමන් ගැනම
මෙසේ පවසනු ඇත. ‘මම
අනාගතවක්තෘවරයෙක් නොවෙයි.
මම ගොවියෙක්. මා තරුණයෙක්ව

**12 පරි.**
1 යෙසා 10:17 ඔබ 18
2 යෙසා 41:15 යෙසා 62:1
3 මීකා 4:13 සෙක 9:15
4 යෙරෙ 31:38 සෙක 2:4 සෙක 12:10
5 යෙරෙ 23:6 යෝවෙ 3:16 සෙක 2:5 සෙක 9:15
6 එස 34:24
7 ගීතා 45:6 යෙසා 9:6 හොෂෙ 3:5
8 නික් 14:19 නික් 23:20
9 යෙසා 54:17 හග් 2:22 එළි 16:14
10 යෙසා 32:15 යෙසා 44:3 යෝවෙ 2:28 ක්‍රියා 3:19
11 2ලේක 6:21 ගීතා 28:2 යෙරෙ 31:9
12 යොහ 19:34 යොහ 19:37 යොහ 20:27 එළි 1:7
13 යෙරෙ 6:26 ආමො 8:10
14 2රාජා 23:29 2ලේක 35:22
15 යෙරෙ 3:21 ලූක් 23:48

**2 තීරුව**
1 2සාමු 5:14 ලූක් 3:31
2 මාක් 15:40 ලූක් 23:49
3 නික් 6:16
4 නික් 6:17 1රාජා 1:8 1ලේක 23:10
5 මාක් 15:41

**13 පරි.**
6 සෙක 12:3
7 2ලේක 29:5 විලා 1:8 එස 36:17 එස 36:29
8 යෙසා 1:6 එස 36:25 යොහ 1:29 ක්‍රියා 2:38 ක්‍රියා 2:41
9 ගීතා 51:7
10 නික් 23:13 ද්වි 12:3 යෙසා 2:18 එස 36:25 ශෙප 1:4

**11** ද්වි 13:5; යෙරෙ 8:10; යෙරෙ 23:14; එස 14:9; **12** 2කොරි 7:1; **13** ද්වි 13:6; ද්වි 13:9; ද්වි 18:20; මතෙ 10:37; **14** යෙරෙ 2:26; මීකා 3:7; **15** 2රාජා 1:8; මතෙ 3:4.

සිටියදී මිනිසෙකු මාව දාසකමට මිල
දී ගත්තා.' **6** 'එසේනම් ඔබේ ශරී-
රය මෙසේ තුවාල වුණේ කොහොමද'
කියා යමෙක් ඔහුගෙන් ඇසූ විට ඔහුට
මෙසේ පැවසීමට සිදු වෙයි. 'මම ආද-
රය කරන අය මට පහර දුන්නා.'"
**7** ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. "කඩුව, දැන් නැඟිට මා
පත් කළ එඬේරාට[1] පහර දෙන්න. මා
සමඟ කිට්ටුවෙන් වැඩ කළ තැනැත්-
තාට[2] පහර දෙන්න. එඬේරාට පහර
දෙන්න.[3] එවිට රැළේ බැටළුවෝ සීසී-
කඩ විසිරී යනු ඇත.[4] නමුත් සමා-
ජයේ පහත්යයි සලකන අයට මම
අනුකම්පා කර මාගේ ප්‍රේමය පෙන්-
වන්නෙමි."[5]
**8** යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ පවසන්නේය. "මේ දේශයේ
වෙසෙන මුළු සෙනඟගෙන් තුනෙන්
දෙකක් විනාශ වී යනු ඇත.[6]
නමුත් සෙනඟගෙන් තුනෙන් එකක්
බේරී ජීවත් වන්නෝය.[7] **9** රන් හා
රිදී ගින්නට දමා අපද්‍රව්‍ය ඉවත්
කරන්නාක් මෙන්[8] බේරී ජීවත් වන ඒ
අයව මම සෝදිසි කර[9] පවිත්‍ර තත්ව-
යකට ගෙනෙන්නෙමි.[10] ඒ සෙනඟ
මාගේ නාමය කියා මට හඬගසනු
ඇත. එවිට මමද ඔවුන්ට පිළිතුරු
දෙන්නෙමි.[11] 'මේ මාගේ සෙනඟ'[12]
කියා මම ඔවුන්ව පිළිගන්නෙමි. ඔවු-
හුද, 'යෙහෝවා අපේ දෙවිය' කියා
කියනු ඇත."[13]

**14** "යෙහෝවා දෙවිගේ දවස
පැමිණෙන්නේය.[14] ඒ දව-
සේදී, සතුරා ඔබේ වස්තු කොල්ල
කා ඒවා ඔබ ඉදිරියේම එකිනෙකා
අතරේ බෙදාගනු ඇත. **2** යෙරුස-
ලමට විරුද්ධව යුද්ධ කිරීමට දෙවි
සියලු ජාතීන්ව රැස් කරන්නේය.[15]
ඔවුහු ඇවිත් නුවර අල්ලාගෙන,[16] ගෙ-
වල් කොල්ල කා ස්ත්‍රීන්ව දූෂණය
කරන්නෝය.[17] නුවරේ වැසියන්ගෙන්
අඩක්ම පැහැරගන්නෝය.[18] නමුත්
ඉතුරු අයව[19] පැහැරගැනීමට ඔවුහු
සමත් වන්නේ නැත.[20]

**13 පරි.**
**1** එස 34:23; මීකා 5:4; මතෙ 26:55; යොහ 10:11; හෙබ්‍රෙ 13:20; 1පේතෘ 5:4
**2** හිතෝ 8:30; යොහ 1:1; යොහ 16:28; යොහ 17:5
**3** යෙසා 53:8; දානි 9:26; මාක් 14:27; ක්‍රියා 3:18; එළි 13:8
**4** මතෙ 26:31; මාක් 14:50; යොහ 16:32
**5** යෙසා 1:25; මතෙ 11:25; 1කොරි 1:27
**6** මතෙ 13:41; ලූක් 12:46
**7** යෝවෙ 2:32; මතෙ 24:22; රෝම 9:27
**8** යෙසා 43:2
**9** මලා 3:3; 1පේතෘ 1:7
**10** ගීතා 66:10; යෙසා 48:10; මලා 3:2
**11** යෙසා 58:9
**12** යෙරෙ 30:22; රෝම 9:25
**13** ගීතා 144:15; එළි 21:7

**14 පරි.**
**14** යෙසා 2:12; යෝවෙ 2:31; 2පේතෘ 3:10
**15** යෝවෙ 3:2; එළි 16:14
**16** ලූක් 21:20
**17** ද්වි 28:30; විලා 5:11
**18** ලූක් 21:24
**19** යෙසා 65:8; මතෙ 21:43; මතෙ 24:22
**20** යෙසා 65:18; හෙබ්‍රෙ 12:22; එළි 21:2

**2 තීරුව**
**1** නික් 15:3; 2ලේක 20:15
**2** යෙසා 66:16; එස 38:23; යෝවෙ 3:14; එළි 16:14
**3** එස 11:23; ක්‍රියා 1:12
**4** ලූක් 19:29
**5** මීකා 1:4
**6** ආමො 1:1
**7** ලූක් 21:21

**3** "නමුත් යෙහෝවා දෙවි අතීත-
යේ තම සතුරන්ට විරුද්ධව සටන්
කළාක් මෙන්[1] ඒ ජාතීන්ට විරුද්ධවද
යුද්ධ කරන්නේය.[2] **4** එදින දෙවි,
යෙරුසලමට නැඟෙනහිරෙන් පිහිටි
කන්ද[3] මත සිටගන්නේය. එවිට ඔලීව
ගස් ඇති ඒ කන්ද*[4] දෙපළු වී,[5]
කන්දෙන් කොටසක් උතුරු පැත්ත-
ටත් අනික් කොටස දකුණු පැත්තටත්
වෙන් වී යනු ඇත. ඉන්පසු නැඟෙ-
නහිර සිට බස්නාහිර දක්වා විහිදී
යන විශාල නිම්නයක් ඇති වන්නේය.
**5** දෙවිගේ කඳු දෙක අතරේ තිබෙන
ඒ නිම්නය ආෂෙල් දක්වාම දිව යනු
ඇත. යූදාහි රජු වූ උසියාගේ කාල-
යේදී[6] භූමිකම්පාව ඇති වූ විට ආරක්-
ෂාව පතා ඔබ පලා ගියාක් මෙන් එදින
ආරක්ෂාව පතමින් ඒ නිම්නය වෙනට
ඔබ දිව යන්නහුය.[7] එදින මාගේ දෙවි
වන යෙහෝවා ඔහුගේ සියලු ශුද්ධ
තැනැත්තන් සමඟ[8] ඒ ජාතීන්ට දඬු-
වම් කිරීමට පැමිණෙනු ඇත.[9]
**6** "ඒ දවසේදී කිසි ආලෝකයක්
දක්නට නොලැබෙයි.[10] අධික ශීතල
නිසා සියල්ල මිදෙන්නේය.[11] **7** එය
යෙහෝවා දෙවිගේ දවස ලෙස හැඳින්-
වෙන විශේෂ දවසකි.[12] ඒ දවසේදී
දවාල හා රාත්‍රිය අතර වෙනස නො-
පෙනෙනු ඇත.[13] සවස් වරුවේ පවා
ආලෝකය එක සේ පවතිනු ඇත.[14]
**8** එදින යෙරුසලමෙන්[15] ජීවනදායක
වතුර ගලා එන්නේය.[16] ගලා එන ඒ
වතුරෙන් භාගයක් නැඟෙනහිර දෙ-
සින් පිහිටි මුහුදටත්[17] ඉතුරු භාගය
බස්නාහිර දෙසින් පිහිටි මුහුදටත්[18]
ගලා යනු ඇත. ගිම්හාන කාල-
යේදී මෙන්ම ශීත කාලයේදීත් ඒ
වතුර නොනැවතී ගලා එනු ඇත.[19]

**8** ද්වි 33:2; ගීතා 149:9; යෝවෙ 3:11; **9** ගීතා 96:13; ගීතා 98:9; යූද් 14; **10** යෙසා 13:10; ආමො 5:18; **11** නික් 15:8; යෝබ් 38:22; **12** ගීතා 118:24; 1තෙස 5:2; 2තෙස 2:2; **13** ගීතා 97:11; හිතෝ 4:18; එළි 21:25; **14** යෙසා 30:26; **15** යෙරෙ 17:13; එස 47:1; යෝවෙ 3:18; එළි 22:1; **16** යොහ 4:10; එළි 21:6; එළි 22:17; **17** ද්වි 3:17; එස 47:8; **18** යොෂු 1:4; යෝවෙ 2:20; **19** යෙසා 49:10.

සෙක **14:4*** හෝ, "ඔලීව කන්ද."

**9** යෙහෝවා දෙවි මුළු පොළොවටම
රජ වන්නේය.[1] ඒ කාලයේදී සියලු-
දෙනා යෙහෝවා දෙවිව එකම සැබෑ
දෙවි ලෙස පිළිගනු ඇත.[2] ඔහුව එක
නාමයකින් හඳුන්වනු ඇත.[3]

**10** “ගෙබා නගරයේ[4] සිට යෙරු-
සලමට දකුණෙන් පිහිටි රිම්මොන්
නගරය[5] දක්වා ඇති මුළු දේශ-
යම, අරබා නිම්නය[6] මෙන් පහත්
බිමක් බවට පත් වන්නේය. එහෙත්
යෙරුසලම සියල්ලට ඉහළින් ස්ථිර
ලෙස පිහිටවනු ඇත. බෙන්ජමින් දො-
රටුවේ[7] සිට පළමුවන දොරටුව දක්-
වාද එතැන සිට කොනේ දොරටුව
දක්වාද හනානෙල්ගේ මුරකොටුවේ[8]
සිට රජතුමාගේ වයින් යන්ත්‍ර ඇති
ස්ථානය දක්වාද ඇති මුළු ප්‍රදේශ-
යම ජනාවාස වන්නේය.[9] **11** සෙ-
නඟ යෙරුසලමෙහි සුරක්ෂිතව කල්
ගෙවනු ඇත.[10] නැවත කිසිදා එහි
වැසියන්ව විනාශයට නියම කරන්නේ
නැත.[11]

**12** “යෙරුසලමට විරුද්ධව යුද්ධ
කිරීමට පැමිණෙන සියලුදෙනා[12]
මතට යෙහෝවා දෙවි ගෙනෙන වසං-
ගතය මෙයයි. පණපිටින් සිටිද්දීම
ඔවුන්ගේ ශරීර කුණු වී යනු ඇත.[13]
ඔවුන්ගේ ඇස්ද දිව්ද කුණු වී යනු
ඇත.

**13** “ඒ දවසේදී, යෙහෝවා දෙවි
ඔවුන් සියලුදෙනාවම වියවුල් කරන්-
නේය.[14] ඔවුහු තම තමන්ගේ මිත්‍ර-
යාට විරුද්ධව සටන් කරන්නෝය.
**14** යූදා දේශයේ සියලුම වැසියෝද
යෙරුසලමේ උපකාරයට පැමිණ
ඔවුන් සමඟ සටන් කරන්නෝය.
ඔවුහු ඒ අවට ජාතීන්ගේ රන්, රිදී,
ඇඳුම් පැළඳුම් ඇතුළු මුළු වස්තු සම්-
භාරයම එකතු කරගන්නෝය.[15]

**15** “ඒ වසංගතයෙන් අශ්වයෝද
කොටළුවෝද ඔටුවෝද බූරුවෝද
කඳවුරුවල සිටින අනිකුත් සියලු
සත්තුද පහර කන්නෝය.

**16** “යෙරුසලමට විරුද්ධව යුද්ධ
කිරීමට පැමිණි ඒ ජාතීන් අතරින්
යම් පිරිසක් ඒ වසංගතයෙන් බේරෙනු
ඇත.[1] ඒ අය වසරක් වසරක් පාසා,[2]
ස්වර්ගයේ සේනාවල අධිපතිද රජ්-
ජුරුවන්ද වන[3] යෙහෝවා දෙවිට
නමස්කාර කිරීම සඳහාත්[4] පැල් උත්-
සවය පැවැත්වීම සඳහාත්[5] ඒ නුවරට
යන්නෝය. **17** පොළොවේ ජාතීන්
අතරින්[6] යම් ජාතියක් ස්වර්ගයේ සේ-
නාවල අධිපතිද රජ්ජුරුවන්ද වන යෙ-
හෝවා දෙවිට නමස්කාර කිරීම සඳහා
යෙරුසලමට පැමිණෙන්නේ නැත්-
නම්,[7] ඔවුන්ගේ දේශයට වර්ෂාව නො-
ලැබෙනු ඇත.[8] **18** ඊජිප්තු දේශයේ
වැසියන් දෙවිට නමස්කාර කිරීමට
පැමිණෙන්නේ නැත්නම් ඔවුන්ටත්
සිදු වන්නේ ඒ දේමය. පැල් උත්සවය
පැවැත්වීමට යෙරුසලමට නොපැමි-
ණෙන සෑම කෙනෙකුටම යෙහෝවා
දෙවි ඒ වසංගතයෙන් පහර දෙනු ඇත.
**19** ඊජිප්තු දේශයේ වැසියන් හෝ වෙ-
නත් ජාතීන්ට අයත් ජනයා හෝ පැල්
උත්සවය[9] පැවැත්වීමට යෙරුසලමට
පැමිණෙන්නේ නැත්නම් ඔවුන්ටද එම
දඬුවම විඳින්න සිදු වෙයි.

**20** “ඒ දවසේදී,[10] ‘ශුද්ධකමේ උල්-
පත යෙහෝවා දෙවිය’[11] කියා, අශ්ව-
යන්ට පළඳවන ගෙජ්ජිවල කොටා
තිබෙනු ඇත. ඒ කාලයේදී, පූජා-
සනය[12] ළඟ තිබෙන භාජනවලට[13]
අමතරව යෙහෝවා දෙවිගේ ගෘහ-
යේ පිසීමට ගන්නා විශාල භාජනද[14]
භාවිත කරනු ලබයි. **21** යෙරුසල-
මේ හා යූදා දේශයේ පිසීමට ගන්නා
සියලු භාජනද ස්වර්ගයේ සේනා-
වල අධිපති වන යෙහෝවා දෙවිට
කැප කළ ශුද්ධ භාජන ලෙස සලකනු
ලබයි. පූජා ඔප්පු කරන අය එම භාජ-
නවල පූජා කළ සතුන්ගේ මස් තම්-
බන්නෝය.[15] ඒ කාලයේදී, ස්වර්ගයේ
සේනාවල අධිපති වන යෙහෝවා
දෙවිගේ ගෘහයේ[16] කානානිවරයෙකු*
දකින්න ලැබෙන්නේ නැත.”[17]

**14 පරි.**

**1** ගීතා 97:1; එළි 19:6
**2** ද්වි 6:4; මලා 2:10; ගලා 3:20
**3** යෙසා 42:8; යෙසා 44:6
**4** 1රාජා 15:22
**5** 1ලේක 4:32
**6** ද්වි 1:7
**7** යෙරෙ 37:13; එස 48:32
**8** නෙහෙ 3:1; යෙරෙ 31:38
**9** යෙරෙ 30:18
**10** යෙරෙ 23:6; යෙරෙ 33:16
**11** යෙසා 60:18; යෙරෙ 31:40
**12** 2රාජා 19:35; ගීතා 110:5; යෝවෙ 3:2; මීකා 4:11; එළි 16:14
**13** ක්‍රියා 12:23
**14** විනි 7:22; එස 38:21; සෙක 11:6
**15** 2ලේක 14:13; 2ලේක 20:25; සෙක 2:9

**2 තීරුව**

**1** යෙසා 66:19; ක්‍රියා 15:17
**2** 1සාමු 1:7; යෙසා 66:23
**3** ගීතා 24:8; ගීතා 103:21
**4** ගීතා 86:9; යෙසා 27:13; යෙරෙ 48:15; රෝම 15:11
**5** ලෙවී 23:34; නෙහෙ 8:14; යොහ 7:2
**6** උත් 10:32; යෙරෙ 10:25; ආමො 3:2
**7** යෙසා 45:23; යෙසා 60:12
**8** ද්වි 11:17; 1රාජා 8:35; යෙසා 5:6
**9** කොලො 2:17; හෙබ්‍රෙ 10:1
**10** මලා 1:11
**11** නික් 28:36; නික් 39:30; යෙසා 35:8
**12** 2ලේක 29:22
**13** නික් 25:29; නික් 37:16; ගණන් 4:7
**14** 1සාමු 2:14
**15** ද්වි 16:7; 1සාමු 2:13; එස 46:23
**16** 1තිමෝ 3:15
**17** යෙසා 35:8; එස 44:9; එළි 21:27.

සෙක **14:21*** හෝ, “වෙළඳාම් කරන්නෙක්.”

# මලාකි*

1 මෙය අනතුරු ඇඟවීමේ පණිවි-
ඩයකි.
යෙහෝවා දෙවි ඊශ්‍රායෙල්වරුන්
ගැන මලාකි මාර්ගයෙන් කියන මේ
පණිවිඩයට[1] සවන් දෙන්න.
2 යෙහෝවා දෙවි ඔබට මෙසේ
පැවසුවේය. “මා ඔබට මොන තරම්
ප්‍රේම කළාද!”[2]
එහෙත් ඔබ ඔහුගෙන් මෙසේ ඇසු-
වහුය. “ඔබ අපට ප්‍රේමය පෙන්වූයේ
මොන අවස්ථාවලදීද?”[3]
එවිට යෙහෝවා දෙවි මෙසේ පිළි-
තුරු දුන්නේය. “ඒසව් සහ යාකොබ්
එක කුසේ උපන් දරුවන් නොවෙයිද?[4]
එහෙත් මා ප්‍රේම කළේ යාකොබ්ටය.[5]
3 එහෙත් ඒසව්ව[6] මම ප්‍රතික්ෂේප*
කළෙමි. කාලයක් ගෙවුණු පසු, ඔහුට
අයිති කඳුකර පළාත මම පාළු ස්ථා-
නයක් බවට පත් කළෙමි.[7] ඔහුට
උරුම වූ දේශය හිවලුන්ට දුන්නෙමි.”[8]
4 “එහෙත් ඒදොම් දේශයේ වැසි-
යෝ මෙසේ කීවෝය. ‘අපව සීසීකඩ
විසුරුවාහැරියත් අපි ආපසු ඇවිත්
පාළුවට ගිය තැන් ගොඩනඟන්නෙමු.’
නමුත් ස්වර්ගයේ සේනාවල අධිපති*
වන යෙහෝවා දෙවි මෙසේ පවසන්-
නේය. ‘ඔවුන් එය නැවත ගොඩ-
නැඟුවත් මම එය කඩා දමන්නෙමි.[9]
එබැවින් අවට සිටින සෙනඟ ඔවුන්ගේ
දේශය, “දුෂ්ටකම රජයන දේශයක්”
ලෙසද ඔවුන්ව, “යෙහෝවා දෙවි සදා-
හටම හෙළාදකින ජාතියක්”[10] ලෙසද
හඳුන්වන්නෝය. 5 ඔවුන්ට සිදු වන
දේ දැක ඔබ මෙසේ පවසනු ඇත. “මුළු
ඊශ්‍රායෙල් දේශය පුරාම යෙහෝවා දෙ-
විව ගෞරවයට පත් වේවා!” ’ ”[11]
6 “ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. ‘මගේ නාමයට අගෞ-
රව කරන පූජකයෙනි,[1] මේ ගැන
සිතා බලන්න. සාමාන්‍යයෙන් පුතෙකු
තම පියාට ගෞරව කරන්නේ නැද්ද?[2]
එසේනම්, ඔබේ පියා වන මට[3] ඔබ
ගෞරව නොකරන්නේ මන්ද?[4] සේව-
කයෙකු තම ස්වාමියාට නිසි ගෞර-
වය දෙන්නේ නැද්ද?[5] එසේනම්, ඔබේ
ස්වාමීන් වන මට ගරුබිය නොපෙන්-
වන්නේ මන්ද?’[6]
“ ‘නමුත් ඔබ මගෙන් මෙසේ අසන්-
නහුය. “අපි ඔබේ නාමයට අගෞරව
කළේ කෙසේද?” ’
7 “ ‘ඔබ මගේ පූජාසනය මත අප-
විත්‍ර ආහාර ඔප්පු කළහුය.’[7]
“ ‘එවිට ඔබ, “අපි ඔබේ නාමයට
අගෞරවයක් වන ලෙසින් පූජා ඔප්පු
කළා කියා ඔබ පවසන්නේ ඇයි” කියා
මගෙන් අසන්නහුය.’
“ ‘යෙහෝවා දෙවි වන මාගේ පූජා-
සනය*[8] ඔබ හෙළාදකින්නහුය.[9]
8 ඔබ පූජාවක් ලෙස ඔප්පු කිරීමට
අන්ධ සතෙකුව රැගෙන ආ විට, “මේ
සතාව පූජා කළාට කමක් නැහැ”
කියා සිතන්නහුය. කොර සතෙ-
කුව හෝ ලෙඩ සතෙකුව හෝ ඔප්පු
කළ විටත් ඔබ සිතන්නේ එයින්
කිසිදු හානියක් සිදු වන්නේ නැත
කියාය.’ ”[10]
එහෙත් ස්වර්ගයේ සේනාවල අධි-
පති වන යෙහෝවා දෙවි මෙසේ
අසන්නේය. “ඔබ ඒ වගේ සතෙකුව
ඔබේ ආණ්ඩුකාරයාට දුන්නොත් ඔහු
කුමක් කියාවිද? ඔහු ඒ ගැන සතුටු
වෙයි කියා ඔබ සිතනවාද?”
9 “මෙපමණ කාලයක් පුරා ඔබ
කළ මේ දේවල් ගැන දෙවි සතුටු වෙයි
කියා ඔබ සිතනවාද? දැන් දෙවිගෙන්
සමාව අයැදින්න.[11] එවිට දෙවි ඔහු-
ගේ අනුමැතිය අපට ලබා දී[12] අපට
ආශීර්වාද කරනු ඇත.” එය ස්වර්ගයේ

**1 පරි.**
1 2පේත්‍රු 1:21
2 ද්වි 7:6
ද්වි 10:15
යෙසා 41:8
රෝම 11:28
3 යෙසා 49:14
4 උත් 25:25
5 රෝම 9:13
6 උත් 25:34
උත් 27:41
හෙබ්‍රෙ 12:16
7 යෙසා 34:10
යෙරෙ 49:20
එස 25:13
එස 35:3
යෝවෙ 3:19
ඔබ 10
8 යෙසා 34:13
9 යෝබ් 12:14
ගීතා 127:1
10 ගීතා 137:7
යෙසා 34:5
ඔබ 18
11 ගීතා 35:27

**2 තීරුව**
1 යෙරෙ 5:31
යෙරෙ 23:11
එස 22:26
හොෂෙ 4:6
2 නික් 20:12
මතෙ 15:4
මාක් 10:19
එෆී 6:2
3 නික් 4:22
4 යෙසා 1:2
මතෙ 6:9
5 1තිමෝ 6:1
තීත 2:9
6 හිතෝ 8:13
1පේත්‍රු 2:17
7 ලෙවී 21:6
8 එස 41:22
1කොරි 10:21
9 1සාමු 2:17
10 ලෙවී 22:20
ද්වි 15:21
11 නික් 32:11
යෙරෙ 26:19
යෝවෙ 1:13
යෝවෙ 1:14
12 යෝවෙ 2:17

මලා නම* තේරුම, “මාගේ පණිවිඩකරු (දේවදූතයා).” **1:3*** මුල් භාෂාවේ, “වෛර” ලෙස සඳහන් වේ. **4*** “ස්වර්ගයේ සේනාවල අධිපති” යන යෙදුම මෙම පොතේ 24 වතාවක් භාවිත කර ඇත.

මලා **1:7*** මූ.අ., “මේසය.”

සේනාවල අධිපති වන යෙහෝවා දෙ-
විගෙන් ලද පණිවිඩයකි.
**10** ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ පවසන්නේය. “ඔබ මගේ ගෘහ-
යේ දොරටු වැසීමටත්[1] මුදලක් අය
කරන්නහුය. මගේ පූජාසනයේ ගිනි
දල්වන්නෙත් මුදලක් බලාපොරොත්-
තුවෙනි.[2] වාසියක් නොබලා ඒ සේවා-
වන් කරන එක් කෙනෙකුවත් ඔබ
අතරේ සිටිනවාද? මම කිසිසේත් ඔබ
ගැන සතුටු නොවන්නෙමි. ඔබ මට
තෑගි වශයෙන් ගෙනෙන පූජා මම
කොහොමටවත් පිළිගන්නේ නැත.”[3]
**11** “පොළොවේ එක් සීමාවක සිට
අනික් සීමාව දක්වා සිටින සියලු
ජාතීන් අතරේ මාගේ නාමය ගෞරව-
යට පත් වනු ඇත.[4] පොළොවේ සියලු
වැසියෝ මාගේ නාමයට ප්‍රශංසා කිරීම
සඳහා සුවඳ දුම්[5] හා පූජා ඔප්පු කරන්-
නෝය. ඔවුන් ගෙනෙන ඒ පූජා[6] මම
පිළිගන්නෙමි. මෙසේ, සියලු ජාතීන්
අතරේ මාගේ නාමය අතිශයින් උසස්
වන්නේය”[7] කියා ස්වර්ගයේ සේනාවල
අධිපති වන යෙහෝවා දෙවි පවසන්-
නේය.
**12** “නමුත් ඔබ, ‘යෙහෝවා දෙවි-
ගේ පූජාසනයෙන් අපට කිසි වැඩක්
නැහැ. ඒ නිසා වටිනාකමක් නැති
පූජා ඔප්පු කළාට ප්‍රශ්නයක් නැහැ’[8]
කියමින් මට අගෞරව කරන්න-
හුය.[9] **13** එමෙන්ම පූජා ඔප්පු කරන
විට, ‘මේ මොන කරදරයක්ද’[10] කිය-
මින් ඔබ මැසිවිලි නඟන්නහුය” කියා
ස්වර්ගයේ සේනාවල අධිපති වන
යෙහෝවා දෙවි පවසන්නේය. “ඔබ
තෑගි හැටියට මා ළඟට ගෙනෙන්නේ
කුමක්ද? සොරකම් කළ, තුවාල වූ,
ලෙඩින් සිටින, කොර සතුන්වය![11]
එවැනි තෑග්ගකින් මා සතුටට පත්
වෙයි කියා ඔබ සිතනවාද?”[12] එසේ
අසන්නේ යෙහෝවා දෙවිය.
**14** “රැළේ හොඳ බැටළුවෙක් සිටි-
යදී, යෙහෝවා දෙවි වන මට කිසිදු
වටිනාකමක් නැති සතෙකුව භාර-
යක් ලෙස ඔප්පු කරන ඒ කපටි
තැනැත්තා ශාප ලද්දෙක් වනු ඇත.[1]
මන්ද මා ශ්‍රේෂ්ඨ රජෙකි.[2] සියලු
ජාතීහු මාගේ නාමයට ගරුබිය දක්-
වන්නෝය”[3] කියා ස්වර්ගයේ සේ-
නාවල අධිපති වන යෙහෝවා දෙවි
පවසන්නේය.

**2** “පූජකයෙනි, මා මේ අවවාදය
දෙන්නේ ඔබටයි.[4] **2** ඔබ දැන්
මා කියන දේ සිතට ගෙන[5] මාගේ
නාමයට ප්‍රශංසාව ගෙන දෙන අයුරින්
කටයුතු කිරීමට අදිටන් කරගන්න.[6]
ඔබ එසේ නොකළොත්[7] ඔබ පිටට
ශාපයක් පැමිණෙනු ඇත.[8] ඔබ සෙ-
නඟට ආශීර්වාද කළත් එය ශාපයක්
බවට හැරෙනු ඇත.*[9] මා කියන දේ
ඔබ හිතට නොගත් නිසා දැනටමත් ඒ
දේ සිදු වී ඇත” කියා ස්වර්ගයේ සේ-
නාවල අධිපති වන යෙහෝවා දෙවි
පවසන්නේය.
**3** “ඔබ වැපුරූ බීජ සියල්ල නාස්ති
වී යෑමට මම සලස්වන්නෙමි.[10] උත්-
සවවලදී ඔප්පු කිරීමට ගෙනෙන
සතුන්ගේ අසූචි මම ඔබේ මුහුණ-
ටම විසි කරන්නෙමි. ඉන්පසු ඔබවත්
අසූචි ගොඩගසා තිබෙන ස්ථානයට
ගෙන යනු ලබන්නේය. **4** ඔබට මේ
අවවාදය දෙන්නේ,[11] ලෙවී සමඟ මා
ඇති කරගත් ගිවිසුම[12] අවසන් වෙ-
නවා දකින්න මා අකමැති නිසයි”[13]
කියා ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි පවසන්නේය.
**5** “මා ඔහු සමඟ ඇති කරගත් ඒ
ගිවිසුම මගින් ඔහුගේ ජීවිතය රැකු-
ණේය. ඔහුට සමාදානයෙන් ජීවත්
වීමටද හැකි විය.[14] ඔහුට ලැබුණු ඒ
ආශීර්වාද නිසා මා කෙරෙහි ගරුබි-
යක් ඇතුව ජීවත් වීමට ඔහු පෙලඹු-
ණේය.[15] ඔහු මාගේ නාමයට ගරු කළ
නිසා මාව අසතුටට පත් කිරීමට අක-
මැති විය.[16] **6** ඔහු සත්‍යය ඉගැන්වී-
මට ඇපකැප වී සිටියේය.[17] ඔහුගේ
මුවින් කිසිවිටෙක දුෂ්ට දේ නික්මුණේ
නැත. ඔහු අවංකකමින් ක්‍රියා කරමින්

**1 පරි.**
1 2ලේක 23:4
2 යෙරෙ 6:13; මීකා 3:11
3 යෙසා 1:11; යෙරෙ 6:20; යෙරෙ 14:12; ආමො 5:21
4 ගීතා 113:3; යෙසා 45:6; යෙසා 59:19; සෙක 14:16
5 ගීතා 66:15; රෝම 12:1; හෙබ්‍රෙ 13:15
6 යෙසා 66:20; යොහ 4:23
7 ගීතා 22:27; ශෙප 3:9; මතෙ 28:19; එළි 15:4
8 මලා 1:7
9 එස 22:26
10 යෙසා 43:22; මීකා 6:3
11 ද්වි 15:21; ද්වි 17:1
12 ලෙවී 22:20; යෙසා 1:13; මලා 2:13

**2 තීරුව**
1 ක්‍රියා 5:3
2 ගීතා 47:2; යෙරෙ 10:10; දානි 9:4
3 ගීතා 76:12; එළි 15:4

**2 පරි.**
4 විලා 4:13; හොෂෙ 5:1; මලා 1:6
5 ගීතා 81:11; යෙසා 42:25; යෙසා 57:11
6 යෙරෙ 13:16
7 ලෙවී 26:14; යෙසා 30:9
8 ද්වි 28:15
9 හොෂෙ 4:7; හග් 1:11
10 හොෂෙ 8:7; යෝවෙ 1:17
11 යෙරෙ 28:9; එස 33:33
12 නික් 40:15
13 ගණන් 3:6; ගණන් 18:23; එස 44:15
14 ගීතා 119:165
15 ගීතා 19:9; ගීතා 111:10
16 ගීතා 111:9
17 2ලේක 17:9; එස 44:24

**මලා 2:2*** හෝ, “ඔබ ආශීර්වාද වෙනුවට ශාප අද්දකිනු ඇත.”

මා සමඟ කිට්ටු බැඳීමක් පවත්වා-
ගත්තේය.[1] වැරදි මාර්ගයෙන් ඉව-
තට එන්න ඔහු බොහෝදෙනෙකුට
උපකාර කළේය.[2] **7** දෙවි පිළිබඳ
දැනුම සෙනඟට ලබා දීම පූජකයන්
සතු වගකීමකි. නීතිය පැහැදිලි කර
දීම ඔවුන්ගේ යුතුකමය.[3] මන්ද ඔවුහු
ස්වර්ගයේ සේනාවල අධිපති වූ යෙ-
හෝවා දෙවි වන මාගේ පණිවිඩකරු-
වෝය.[4]

**8** "නමුත් පූජකයෙනි, ඔබ මාව
අත්හැර ගොස් ඇත.[5] ඔබ නීතිය
නිසි ලෙස පහදා නොදුන් නිසා බො-
හෝදෙනෙක් වැරදි මාර්ගයේ ගොස්
ඇත.[6] මා ලෙවී සමඟ ඇති කර-
ගත් ගිවිසුම ඔබ කඩ කළහුය"[7] කියා
ස්වර්ගයේ සේනාවල අධිපති වන යෙ-
හෝවා දෙවි පවසන්නේය. **9** "ඔබ
මට ඇහුම්කන් නොදී, නීතිය සාධාර-
ණව ඉටු නොකර පැති ගත්තහුය.[8] ඒ
නිසා සියල්ලන් ඉදිරියේ මම ඔබව
නින්දාවට පත් කරන්නෙමි. ඔවුහු
ඔබව සුළු කොට සලකනු ඇත."[9]

**10** "අප සියලුදෙනාටම සිටින්-
නේ එක පියෙක් නොවෙයිද?[10] අප
සියලුදෙනාවම සෑදුවේ එකම දෙවි
කෙනෙක් නොවෙයිද?[11] එසේනම්,
අප එකිනෙකාට ද්‍රෝහිකම් කරමින්[12]
අපේ මුතුන්මිත්තන් සමඟ දෙවි ඇති
කරගත් ගිවිසුමට විරුද්ධව කටයුතු
කරන්නේ ඇයි?[13] **11** යූදා වැසියෝ
ද්‍රෝහිකම් කර ඇත. ඊශ්‍රායෙල් දේශ-
යේ හා යෙරුසලමේ වැසියෝ නින්දිත
ලෙස හැසිරෙන්නෝය.[14] ඔවුහු වෙ-
නත් දෙවිවරුන්ට නමස්කාර කරන
ස්ත්‍රීන්ව විවාහ කරගෙන[15] ශුද්ධක-
මට ප්‍රිය කරන යෙහෝවා දෙවිට
නින්දා කළෝය.*[16] **12** යෙහෝවා
දෙවි එලෙස හැසිරෙන සියලුදෙනා-
වම විනාශ කර දමන්නේය.[17] ඒ වරද
කරන තැනැත්තා කවුරු වුණත්*
ඔහුව යාකොබ්ගේ වාසස්ථානයෙන්
පන්නා දමන්නේය. ස්වර්ගයේ සේනා-
වල අධිපති වන යෙහෝවා දෙවිට
පූජා ඔප්පු කරන තැනැත්තාව පවා
දෙවි විනාශ කර දමන්නේය."[1]

**13** "ඔබ තවත් වරදක් කරන්න-
හුය. ඒ වරද නිසා යෙහෝවා දෙවිගේ
පූජාසනය කඳුළුවලින් තෙත් වී ඇත.
සුසුම්ලමින් හඬා වැලපෙන අයගේ
ශබ්දය ඒ ස්ථානයෙන් ඇසෙන්නේය.
ඒ වරද නිසා ඔබ ඔප්පු කරන කිසිම
පූජාවක් තවදුරටත් දෙවි පිළිගන්-
නේ නැත.[2] **14** නමුත්, 'අප කරන
වරද කුමක්ද' කියා ඔබ අසන්නහුය.[3]
ඔබ තරුණ කාලයේදී විවාහ කරගත්
බිරිඳට ද්‍රෝහි වී ඇත.[4] ඔබ ඇයව
සහකාරියක ලෙස තෝරාගෙන මුළු
ජීවිත කාලය පුරාවටම ඇය සමඟ
සිටින්න ගිවිසගත්තා නොවෙයිද?[5]
නමුත් ඔබ ඒ ගිවිසුම කඩ කළ බවට
යෙහෝවා දෙවි ඔබට විරුද්ධව සාක්ෂි
දෙන්නේය. **15** ඒ වරද නොකිරී-
මට අදිටන් කරගත් ටිකදෙනෙක්
ඔබ අතරේ සිටිති. ඔවුන් එසේ කරන්-
නේ, දෙවිට අවංකව සේවය කරන
දරුවන්*[6] බිහි කිරීමට ඇති ආශාව
නිසාය. ඒ අය තවමත් දෙවිගේ බල-
යේ මඟ පෙන්වීමට අනුව ක්‍රියා කරන්-
නෝය. දැන් ඔබත් ඔබේ සිත් සෝදිසි
කර ඔබේ ආකල්ප නිවැරදි කර-
ගන්න.[7] තරුණ කාලයේදී ඔබ විවාහ
කරගත් බිරිඳට ද්‍රෝහි නොවී සිටී-
මට අදිටන් කරගන්න.[8] **16** මන්ද
ඊශ්‍රායෙල්වරුන්ගේ දෙවි වන යෙ-
හෝවා මෙසේ පවසන්නේය. "මම,
දික්කසාද වීම හෙළාදකින්නෙමි.[9] දුෂ්-
ටකම් කරන තැනැත්තාවද* මම
හෙළාදකින්නෙමි."[10] එසේ පවසන්නේ
ස්වර්ගයේ සේනාවල අධිපති වන යෙ-
හෝවා දෙවිය. "එබැවින් ඔබේ සිත
සෝදිසි කර ඔබේ ආකල්ප නිවැරදි
කරගන්න. ඔබේ බිරිඳට ද්‍රෝහි නොවී
සිටීමට අදිටන් කරගන්න.[11]

**2 පරි.**
1 නික් 32:26
2 යාකො 5:20
3 ලෙවී 10:11 ද්වි 24:8 2ලේක 15:3 නෙහෙ 8:8
4 හග් 1:13
5 යෙසා 1:4 යෙසා 30:9 හෙබ්‍රෙ 3:12
6 යෙරෙ 18:15 ලූක් 11:52
7 නෙහෙ 13:29
8 ලෙවී 19:15 ද්වි 1:17 ද්වි 16:19 යාකො 2:9
9 1සාමු 2:30 මීකා 3:7
10 1කොරි 8:6 එෆී 4:6
11 උත් 2:7 ගීතා 100:3 ක්‍රියා 17:25
12 නෙහෙ 5:8 මීකා 7:2
13 යොෂු 23:16
14 යෙරෙ 7:10
15 ද්වි 7:3 විනි 3:6 1රාජා 11:1 නෙහෙ 13:23
16 ලෙවී 20:26
17 ගණන් 15:31

**2 තීරුව**
1 1සාමු 15:22 ආමො 5:22
2 හිතෝ 21:27 යෙසා 1:11
3 යෙරෙ 8:12
4 හිතෝ 5:18 දේශ 9:9
5 හිතෝ 2:17 මතෙ 19:5
6 උත් 3:15 ක්‍රියා 3:25 ගලා 3:16
7 හිතෝ 25:28
8 ද්වි 22:13
9 උත් 2:24 මතෙ 5:32 මතෙ 19:8 මාක් 10:9
10 ගීතා 11:5 යෙසා 59:6
11 යෙරෙ 5:11 හොෂෙ 5:7 මලා 2:10

මලා **2:11*** "යෙහෝවා දෙවිගේ ශුද්ධකම සුළු කළෝය" යන අදහසද මුල් භාෂාවේ ඇතුළත් කර තිබේ. **12*** මූ.අ.,"අවදිව සිටින තැනැත්තාවද උත්තර දෙන තැනැත්තාවද."

මලා **2:15*** මූ.අ., "දෙවිගෙන් පැවතෙන තැනැත්තා." **16*** මූ.අ., "දුෂ්ටකම වස්ත්‍රයක් සේ පැළඳ සිටින තැනැත්තාවද."

17 “ඔබ පවසන දේවල් නිසා යෙ-
හෝවා දෙවි ඔබ ගැන කලකිරී-
මට පත්ව ඇත.[1] නමුත්, ‘දෙවිට
එලෙස හැඟෙන්න අපි පැවසුවේ මො-
නවද’ කියා ඔබ ඇසුවහුය. දෙවි ඔබ
ගැන කලකිරී සිටින්නේ ඔබ මෙසේ
කියන නිසාය. ‘යෙහෝවා දෙවි දුෂ්ට-
කම් කරන අයව සලකන්නේ ධර්මිෂ්-
ඨයන් ලෙසයි. දෙවි ප්‍රේම කරන්නේ
එවැනි අයටයි.[2] යුක්තිය ඉටු කරන
දෙවි කෙනෙක් ඇත්තටම නැහැ.’ ”[3]

3 “මම මාගේ පණිවිඩකරුව මා
ඉදිරියෙන් යවන්නෙමි.[4] ඔහු මට
කලින් ගොස් මාර්ගය සූදානම් කරනු
ඇත.[5] සැබෑ ස්වාමීන්*[6] තම ගෘහයට
පැමිණෙනු ඇත.[7] ඔබ මහ පෙන්වීම්
පතන ඒ තැනැත්තා ඔබ නොසිතන
වේලාවක පැමිණෙන්නේය. ඔබ ආශා-
වෙන් බලා සිටින තැනැත්තා[8] වන
ගිවිසුමට[9] සම්බන්ධ දූතයාද[10] ඔහු
සමඟ පැමිණෙන්නේය. ඔහු නිසැක-
වම පැමිණෙනු ඇත.” ඒ දේ දන්වන්-
නේ ස්වර්ගයේ සේනාවල අධිපති වන
යෙහෝවා දෙවිය.[11]
2 “ඔහු පැමිණෙන දවසේදී[12] විඳ-
දරාගනිමින් ස්ථිරව සිටිය හැක්කේ
කාටද?[13] මන්ද ඔහු ලෝහ පිරිසිදු
කරන ගින්නක් මෙන්ද[14] රෙදි සේදී-
මට[15] භාවිත කරන සබන්*[16]
මෙන්ද ක්‍රියා කරනු ඇත. 3 රිදී
උණු කර පවිත්‍ර තත්වයකට පත් වන
තුරු ඒ දෙස බලා සිටින රන්ක-
රුවෙකු මෙන්[17] ඔහු ලෙවීගේ පුත්‍ර-
යන්ව පවිත්‍ර කරන්නේය.[18] රන්[19] හා
රිදීවල තිබෙන බොර ඉවත් කරන්-
නාක් මෙන් ඔහු ඔවුන් තුළ ඇති
අපවිත්‍ර දේ ඉවත් කරනු ඇත. ඉන්-
පසු ඔවුහු යෙහෝවා දෙවිට ධර්මිෂ්ඨ
සිතකින් පූජා ඔප්පු කරන්නෝය.[20]
4 එවිට යූදා දේශයේ වැසියන් හා යෙ-
රුසලමේ වැසියන් ඔප්පු කරන පූජා
යෙහෝවා දෙවිට ඉතා ප්‍රසන්න වනු
ඇත.[1] ඔවුන් ඈත අතීතයේදී ඔප්පු
කළ පූජා මෙන් දෙවි ඒවාද පිළිගනු
ඇත.”[2]
5 “පමා නොවී මම ඔබව විනිශ්චය
කරන්නෙමි.[3] මන්ත්‍ර ගුරුකම් කරන්-
නන්ට,[4] අනාචාරයේ යෙදෙන්නන්ට,[5]
බොරුවට දිවුරන්නන්ට,[6] සේවක-
යන්ට දිය යුතු වැටුප නොගෙවා
වංචා කරන්නන්ට,[7] වැන්දඹුවන්ව[8]
හා පියා නැති දරුවන්ව රවටන්-
නන්ට[9] සහ විදේශිකයන්ගේ අයිති-
වාසිකම් පැහැරගන්නන්ට[10] විරුද්ධව
මට සාක්ෂි තිබේ.[11] ඉන් එක්
කෙනෙක්ටවත් මා කෙරෙහි කිසිම
ගරුබියක් නැත”[12] කියා ස්වර්ගයේ
සේනාවල අධිපති වන යෙහෝවා
දෙවි පවසන්නේය.
6 “මා යෙහෝවා දෙවිය. මම කිසි-
දාක වෙනස් නොවෙමි.[13] ඔබ
යාකොබ්ගේ පුත්‍රයන්ය. මා ඔබව
විනාශ නොකළේ ඒ නිසාය.[14]
7 නමුත් ඔබේ මුතුන්මිත්තන්ගේ
කාලයේ සිට මේ දක්වාම ඔබ මාගේ
නියෝග පිළිපැද්දේ නැත.[15] දැන්වත්
ඔබේ වැරදි නිවැරදි කරගෙන මා
ළඟට එන්න. එවිට මමත් ඔබට ළං
වන්නෙමි”[16] කියා ස්වර්ගයේ සේනා-
වල අධිපති වන යෙහෝවා දෙවි පව-
සන්නේය.
එවිට ඔබ මෙසේ අසන්නහුය.
“අපිට හදාගන්න තියෙන වැරදි මො-
නවාද?”
8 “දෙවිට අයිති දේ සොරකම්
කරන්න මනුෂ්‍යයෙකුට පුළුවන්ද?
නමුත් ඔබ මගෙන් සොරකම් කරන්-
නහුය.”
එවිට ඔබ, “අපි මොනවාද ඔබෙන්
සොරකම් කළේ” කියා අසන්නහුය.
“මට ලැබිය යුතු දසයෙන් කො-
ටසත් මගේ පූජාත් ඔබ සොරකම්
කළේ නැද්ද? 9 මුළු ජාතියම මට
අයිති දේ සොරකම් කරමින් මට

**2 පරි.**
1 යෙසා 1:15
යෙසා 7:13
යෙසා 43:24
යෙරෙ 15:6
2 හිතෝ 30:12
එස 18:29
3 ද්වි 32:4
ගීතා 37:28
යෙසා 58:2

**3 පරි.**
4 මතෙ 11:10
ලූක් 1:76
යොහ 1:6
5 මතෙ 3:3
මාක් 1:3
යොහ 1:23
යොහ 3:28
ක්‍රියා 13:24
ක්‍රියා 19:4
6 ගීතා 11:4
යෙසා 6:1
එළි 11:19
7 මතෙ 21:12
8 යොහ 12:19
9 නික් 2:24
ලූක් 1:72
10 යෙසා 63:9
මතෙ 15:24
ලූක් 1:69
11 යෙසා 44:26
12 ආමො 5:18
13 මතෙ 24:13
ලූක් 21:36
14 දානි 11:35
දානි 12:10
1කොරි 3:13
15 යෙසා 1:25
16 යෙරෙ 2:22
17 ගීතා 66:10
හිතෝ 25:4
සෙක 13:9
18 යෙරෙ 33:18
එළි 1:6
19 1පේත 1:7
20 ගීතා 69:31
හෙබ්‍රෙ 13:15
1පේත 2:5

**2 තීරුව**
1 මලා 1:11
2 2ලේක 7:1
යෙරෙ 2:2
3 හෙබ්‍රෙ 10:30
4 එළි 21:8
5 යෙරෙ 29:23
6 නික් 20:7
7 ගීතා 62:10
හිතෝ 14:31
යාකො 5:4
8 ද්වි 24:17
ලූක් 20:47
9 යෙසා 1:17
යාකො 1:27
10 නික් 23:9
සෙක 7:10

**මලා 3:1*** එනම්, ස්වර්ගයේ සේනාවල අධිපති වන යෙහෝවා දෙවි. **2*** සෝඩියම් කාබනේට්වලින් සාදාගත් පිරිසිදු කරන ද්‍රව්‍යයක්.

**11** මීකා 1:2; එළි 22:12; **12** හිතෝ 8:13; **13** යෙසා 43:10; යෙසා 46:4; යාකො 1:17; **14** ගීතා 105:8; විලා 3:22; රෝම 11:29; **15** ද්වි 9:7; නෙහෙ 9:26; ක්‍රියා 7:51; **16** ද්වි 4:30; යෙරෙ 3:12; සෙක 1:3; යාකො 4:8.

අපහාස කරන්නෝය."[1] **10** ස්වර්ග-
යේ සේනාවල අධිපති වන යෙ-
හෝවා දෙවි තවදුරටත් මෙසේ
පවසන්නේය. "ඔබේ මුළු ආදායමෙන්
දසයෙන් කොටසක්[2] මගේ ගබඩාවට
ගෙනෙන්න. මාගේ ගෘහය පුරවන
පිණිස ඒ සියල්ල නොමසුරුව රැගෙන
එන්න.[3] එවිට මා ඔබට ආශීර්වාද
කරන්නේ නැද්ද කියා බලන්න.[4] මම
අහසේ කවුළු විවර කර[5] ඔබේ ගබඩා
පිරී ඉතිරී යන තරමට ඔබට ආශීර්-
වාද කරන්නෙමි."[6]

**11** "ඔබේ වගාව කා දමන සියලු
පළඟැටියන්ව*[7] මම පන්නා දමන්-
නෙමි. කෙතේ ඇති අස්වැන්න විනාශ
කර දමන්නවත් මිදිවැලේ පලදාව
නාස්ති කරන්නවත් මම උන්ට ඉඩ
නොතබන්නෙමි"[8] කියාද ස්වර්ගයේ
සේනාවල අධිපති වන යෙහෝවා
දෙවි පවසන්නේය.

**12** "ඔබේ මුළු දේශයටම මා ආශීර්-
වාද කරන නිසා[9] ඔබ සන්තෝෂවත්
සෙනඟක් බව සියලු ජාතීහු පව-
සනු ඇත."[10] එසේ පවසන්නේ ස්වර්ග-
යේ සේනාවල අධිපති වන යෙහෝවා
දෙවිය.

**13** යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ පවසන්නේය. "ඔබ මගේ සිත
වේදනාවට පත් වන අයුරින් කතා
කළහුය."[11]

නමුත් ඔබ මෙසේ අසන්නහුය.
"ඔබේ සිත වේදනාවට පත් වෙන්න
අපි මොනවාද කිව්වේ?"[12]

**14** "'දෙවිට සේවය කිරීමෙන් කිසි
පලක් තියෙනවාද?[13] අපි ස්වර්ග-
යේ සේනාවල අධිපති වන යෙහෝවා
දෙවි ඉදිරියේ හඬා වැලපුණා.[14] ඔහු-
ගේ ආඥා පිළිපැද්දා. නමුත් එයින්
අපිට කිසි ප්‍රයෝජනයක් වුණේ
නැහැ' කියා ඔබ පැවසුවා නොවෙයිද?
**15** එමෙන්ම, 'සන්තෝෂයෙන් කල්
ගෙවන්නේ අප අතරේ සිටින උඩඟු
අයයි.[15] හොඳින් දියුණු වන්නේ දුෂ්-
ටකම් කරන අයයි.[16] ඔවුන් දෙවිට
විරුද්ධව කොපමණ දේවල් කළත්
කිසි කරදරයක් නැතුව හොඳින් කල්
ගෙවනවා' කියාත් ඔබ පැවසුවහුය."[1]

**16** එවිට යෙහෝවා දෙවිට ගරුබිය
ඇති අය[2] එකිනෙකා සමඟ කතා
කළෝය. යෙහෝවා දෙවි ඔවුන් කතා
කළ දේවලට හොඳින් අවධානය දුන්-
නේය.[3] ඉන්පසු දෙවි තම මතකයේ
සිටින අයගේ නම් ලියවිල්ලක සට-
හන් කිරීමට අණ කළේය.[4] යෙහෝවා
දෙවිගේ නාමය සිහි කරමින්[5] ඔහුට
ගරුබිය පෙන්වන අයගේ නම් එහි
ලියන ලදි.

**17** ස්වර්ගයේ සේනාවල අධිපති
වන යෙහෝවා දෙවි මෙසේ පව-
සන්නේය. "ඒ කාලයේදී මම ඔවුන්ව
අගනා වස්තුවක් ලෙස පිළිගන්නෙමි.[6]
ඔවුහු මාගේ සෙනඟ වන්නෝය.[7]
පියෙක් තමාට කීකරු වන පුත්‍ර-
යෙකුට දයාව පෙන්වන්නාක් මෙන්
මමත් ඔවුන්ට දයාව පෙන්වන්නෙමි.[8]
**18** ඒ කාලයේදී ධර්මිෂ්ඨයා කවුද
කියාත් දුෂ්ටයා කවුද කියාත්[9] දෙවිට
සේවය කරන්නේ කවුද කියාත් නො-
කරන්නේ කවුද කියාත් පැහැදිලිව
දැකගැනීමට හැකි වනු ඇත."[10]

**4** ස්වර්ගයේ සේනාවල අධිපති වන
යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ පවසන්නේය. "සියල්ල දවා
දමන ගිනි උදුනක් මෙන් ඒ දවස
පැමිණෙන්නේය.[11] ඒ දවසේදී අහංකා-
රයෙන් ඉදිමී සිටින සියලුදෙනාද දුෂ්-
ටකම් කරන සියලුදෙනාද පිදුරු මෙන්
දැවී යන්නෝය.[12] ඒ දවසේදී ගසක
මුල් සමඟ එහි කඳ විනාශ කරන්නාක්
මෙන් ඒ සියලුදෙනාම සහමුලින්ම
විනාශ වී යන්නෝය.[13] **2** නමුත්
මාගේ නාමයට ගරුබිය දක්වමින්
ජීවත් වන ඔබේ තත්වය ඊට වඩා වෙ-
නස් වන්නේය. ඔබ ඉදිරියේ ධර්මිෂ්ඨ-
කම නමැති හිරු උදා වී එහි රැස්
විහිදුවනු ඇත.[14] ඒ හිරු රැස් දහරාව-
ලින් සුවයක් ලැබෙනු ඇත.[15] ඔබ තර

**3 පරි.**
**1** ලෙවී 24:15 යෙසා 8:21
**2** ලෙවී 27:30 ද්වි 14:28
**3** 2ලේක 31:11 නෙහෙ 12:44 නෙහෙ 13:10
**4** 2කොරි 9:8
**5** ද්වි 28:12 2රාජා 7:19
**6** ලෙවී 26:10 2ලේක 31:10 හිතෝ 3:10 හිතෝ 10:22
**7** යෝවෙ 1:4 ආමො 4:9 ආමො 7:1
**8** ද්වි 11:14 යෝවෙ 2:24 සෙක 8:12
**9** යෙසා 62:4
**10** ගීතා 72:17 යෙසා 61:9
**11** යෙසා 5:19 යෙසා 28:14
**12** යෝබ් 40:8 මලා 1:6
**13** යෝබ් 21:15 ගීතා 73:13 යෙසා 58:3 ශෙප 1:12
**14** සෙක 7:5 යාකො 4:9
**15** ගීතා 10:3 ගීතා 49:18
**16** යෙරෙ 12:1

**2 තීරුව**
**1** දේශ 8:11
**2** උත් 22:12 ගීතා 66:16 ක්‍රියා 9:31 එළි 15:4
**3** මතෙ 18:19
**4** ගීතා 56:8 ගීතා 69:28 ගීතා 139:16
**5** ගීතා 20:7 යෙසා 26:8
**6** යෙසා 62:3 1පේතෘ 2:9
**7** යෙරෙ 31:33 යොහ 17:9
**8** ගීතා 103:13
**9** ගීතා 58:11 රෝම 2:6
**10** දානි 12:3 මතෙ 13:43

**4 පරි.**
**11** ගීතා 21:9 ශෙප 2:2 මතෙ 13:42 2තෙස 1:8 2පේතෘ 3:7
**12** නික් 15:7 යෙසා 5:24 ඔබ 18 මතෙ 3:12

**13** හොෂෙ 9:16; ආමො 2:9; **14** යෙසා 30:26; ලූක් 1:78; එෆි 5:14; **15** ගීතා 147:3; යෙරෙ 30:17; යෙරෙ 33:6.

මලා **3:11*** සියලු කෘමීන්ව.

වස්සෙකු මෙන් සතුටින් දුව පැන
යන්නෙහිය."[1]

3 "මා විනාශයක් ගෙනෙන ඒ දව-
සේදී, ඔබ දුෂ්ටයන්ව පාගා දමන්-
නෙහිය. ඔවුහු ඔබේ පයට පෑගෙන
දූවිලි මෙන් වන්නෝය"[2] කියා ස්වර්ග-
යේ සේනාවල අධිපති වන යෙහෝවා
දෙවි පවසන්නේය.

4 "හොරෙබ් කන්දේදී මගේ සේව-
කයා වන මෝසෙස් මාර්ගයෙන් මා
මුළු ඊශ්‍රායෙල් සෙනඟට දුන් නීතිය
සිහි කරන්න. එහි සඳහන් නියෝග හා
ආඥා පිළිපදින්න.[3]

5 "යෙහෝවා දෙවි වන මාගේ
විනිශ්චය ප්‍රකාශ කරන, බිය උපදවන
ඒ භයානක දවස පැමිණීමට පෙර[1] මම
අනාගතවක්තෘ එලියාව ඔබ වෙතට
එවන්නෙමි.[2] 6 මා ඇවිත් පොළොව
සම්පූර්ණයෙන්ම විනාශ නොකරන
පිණිස, ඔහු පියවරුන්ගේ සිත් දරු-
වන්ගේ සිත් මෙන් වීමටද දරුවන්ගේ
සිත් පියවරුන්ගේ සිත් මෙන් වීමටද
සලස්වන්නේය."[3]

4 පරි.
1 යෙසා 49:9
2 උත් 3:15 මීකා 7:10 සෙක 10:5 රෝම 16:20
3 ද්වි 4:5 ගීතා 119:4 ගීතා 147:19

2 තීරුව 1 යෝවෙ 2:31; ක්‍රියා 2:20; 2පේතෘ 3:10; 2 යෙසා 40:3; මතෙ 11:14; මාක් 9:11; 3 ද්වි 29:20; සෙක 14:11; ලූක් 1:17.

(හෙබ්‍රෙව් සහ ඇරමයික යන භාෂාවලින් ලියැවුණු ශුද්ධ ලියවිල්ලේ පරිවර්තනය
මෙතැනින් අවසන් වෙයි. මීළඟට තිබෙන්නේ ක්‍රිස්තියානි
ග්‍රීක ශුද්ධ ලියවිල්ලේ පරිවර්තනයයි.)

# මතෙව්ගේ

## වාර්තාව

1 ආබ්‍රහම්ගෙන්ද[1] දාවිත්ගෙන්ද[2]
පැවතෙන යේසුස් ක්‍රිස්තුස්ගේ
පෙළපතෙහි වාර්තාව[3] මතු දැක්වේ.
2 ආබ්‍රහම්ගේ පුත්‍රයා ඊසාක්ය.[4]
ඊසාක්ගේ පුත්‍රයා යාකොබ්ය.[5]
යාකොබ්ගේ පුත්‍රයා යූදාය.[6]
යාකොබ්ට තවත් පුත්‍රයෝ සිටි-
යෝය.
3 යූදාගේ පුත්‍රයන් නම් පේරෙස්[7] සහ
සේරාය. ඔවුන්ගේ මව තාමර්ය.
පේරෙස්ගේ පුත්‍රයා හෙස්‍රොන්ය.[8]
හෙස්‍රොන්ගේ පුත්‍රයා රාම්ය.[9]
4 රාම්ගේ පුත්‍රයා අමිනදාබ්ය.
අමිනදාබ්ගේ පුත්‍රයා නාෂොන්ය.[10]
නාෂොන්ගේ පුත්‍රයා සල්-
මොන්ය.[11]
5 සල්මොන්ගේ පුත්‍රයා බෝවස්ය.
බෝවස්ගේ මව රාහබ්ය.[12]
බෝවස්ගේ පුත්‍රයා ඕබෙද්ය.
ඕබෙද්ගේ මව රූත්ය.[13]
ඕබෙද්ගේ පුත්‍රයා යෙස්සේය.[14]
6 යෙස්සේගේ පුත්‍රයා දාවිත්[15]
රජුය.[16]
දාවිත්ගේ පුත්‍රයා සලමොන්ය.[17]
සලමොන්ගේ මව උරියාගේ
බිරිඳව සිටි තැනැත්තියයි.
7 සලමොන්ගේ පුත්‍රයා රෙහබෝ-
වම්ය.[18]
රෙහබෝවම්ගේ පුත්‍රයා අබියාය.[19]
අබියාගේ පුත්‍රයා ආසාය.[20]
8 ආසාගේ පුත්‍රයා යෙහෝෂපාට්ය.[21]
යෙහෝෂපාට්ගේ පුත්‍රයා යෙහෝ-
රම්ය.[22]
යෙහෝරම්ගේ පුත්‍රයා උසියාය.
9 උසියාගේ පුත්‍රයා යෝතම්ය.[23]
යෝතම්ගේ පුත්‍රයා ආහස්ය.[24]
ආහස්ගේ පුත්‍රයා හෙසකියාය.[25]
10 හෙසකියාගේ පුත්‍රයා මනස්සේය.[26]
මනස්සේගේ[27] පුත්‍රයා ආමොන්ය.[28]
ආමොන්ගේ[29] පුත්‍රයා යොෂියාය.

**1 පරි.**
1 උත් 22:18
2 1ලේක 17:11
මතෙ 9:27
ලූක් 1:32
3 උත් 5:1
4 උත් 21:3
1ලේක 1:28
ලූක් 3:34
5 උත් 25:26
1ලේක 1:34
6 උත් 29:35
7 උත් 38:29
1ලේක 2:4
8 රූත් 4:18
ලූක් 3:33
9 1ලේක 2:9
10 ගණන් 2:3
රූත් 4:20
1ලේක 2:10
ලූක් 3:32
11 1ලේක 2:11
12 යොෂු 2:1
13 රූත් 4:13
14 1ලේක 2:12
15 රූත් 4:17
1ලේක 2:15
16 2සාමු 5:4
17 2සාමු 12:24
1ලේක 3:5
ලූක් 3:31
18 1රාජා 11:43
19 1ලේක 3:10
20 2ලේක 14:1
21 1රාජා 15:24
22 1ලේක 3:11
2ලේක 21:1
23 2රාජා 15:32
24 2රාජා 15:38
25 2රාජා 18:1
1ලේක 3:13
26 2රාජා 20:21
27 2රාජා 21:18
28 2ලේක 33:20
29 2රාජා 21:24
1ලේක 3:14

**2 තීරුව**
1 2රාජා 23:34
2 1ලේක 3:15
1ලේක 3:16
යෙරෙ 28:4
3 2රාජා 24:15
2ලේක 36:10
යෙරෙ 27:20
යෙරෙ 29:2
4 1ලේක 3:17
ලූක් 3:27
5 1ලේක 3:19
එස්රා 3:2
නෙහෙ 12:1
ලූක් 3:27
6 මතෙ 13:55
මාක් 6:3

11 යොෂියාගේ[1] පුත්‍රයා යෙකොනි-
යාය.[2] යොෂියාට තවත්
පුත්‍රයෝ සිටියෝය. ඊශ්‍රායෙල්-
වරුන්ට බැබිලෝනියේ වහල්-
කමට[3] යෑමට සිදු වූයේ එම
පුත්‍රයන් සිටි කාලයේදීය.
12 ඊශ්‍රායෙල්වරුන් බැබිලෝනියේ
වහල්කමට යෑමෙන් පසු
වාර්තාව මෙසේය. යෙකො-
නියාගේ පුත්‍රයා ෂෙයල්ටි-
යල්ය.[4]
ෂෙයල්ටියල්ගේ පුත්‍රයා සෙරුබා-
බෙල්ය.[5]
13 සෙරුබාබෙල්ගේ පුත්‍රයා අබියූද්ය.
අබියූද්ගේ පුත්‍රයා එලියාකිම්ය.
එලියාකිම්ගේ පුත්‍රයා ආෂොර්ය.
14 ආෂොර්ගේ පුත්‍රයා සාදොක්ය.
සාදොක්ගේ පුත්‍රයා ආකීම්ය.
ආකීම්ගේ පුත්‍රයා එලියූද්ය.
15 එලියූද්ගේ පුත්‍රයා එලියාසර්ය.
එලියාසර්ගේ පුත්‍රයා මතන්ය.
මතන්ගේ පුත්‍රයා යාකොබ්ය.
16 යාකොබ්ගේ පුත්‍රයා යෝසෙප්ය.
ඔහු මරියාගේ ස්වාමිපුරුෂයා
විය.[6] ක්‍රිස්තුස් ලෙස හඳුන්වන[7]
යේසුස්ගේ මව වූයේ මරියාය.
17 මෙසේ මුළු පෙළපත දෙස බැලූ
විට ආබ්‍රහම් පටන් දාවිත් දක්වා
පරම්පරා දහහතරකි. දාවිත් පටන්
ඊශ්‍රායෙල්වරුන් බැබිලෝනියේ වහල්-
භාවයට ගිය කාලය දක්වා පරම්පරා
දහහතරකි. බැබිලෝනියේ වහල්භා-
වයට ගිය කාලයේ පටන් ක්‍රිස්තුස්
දක්වා පරම්පරා දහහතරකි.
18 යේසුස් ක්‍රිස්තුස්ගේ උපත සිදු
වූයේ මෙලෙසය. ඔහුගේ මව වූ
මරියා යෝසෙප් සමඟ විවාහ ගිවිස-
ගෙන[8] සිටියාය. නමුත් ඔවුන් අඹුසැ-
මියන් ලෙස ජීවත් වීමට පෙර දෙවිගේ

7 මතෙ 27:17; 8 ලූක් 1:27.

බලයේ ක්‍රියාකාරිත්වය තුළින් ඇය
ගැබ්ගත්තාය.*[1] **19** මෙය දැනගත්
ඇගේ ස්වාමිපුරුෂයා වූ යෝසෙප්
ඇයව දික්කසාද කිරීමට තීරණය
කළේය. නමුත් ඔහු ධර්මිෂ්ඨ කෙ-
නෙකු වූ නිසා ඇයව ප්‍රසිද්ධියේ
ලැජ්ජාවට පත් නොකර[2] රහසින්
දික්කසාද කිරීමට[3] අදහස් කළේය.
**20** ඒ ගැන ඔහු කල්පනා කළ පසු
යෙහෝවා දෙවිගේ දූතයා සිහිනය-
කින් ඔහුට පෙනී මෙසේ කීවේය.
“දාවිත්ගේ පුත් යෝසෙප්, කිසි දෙ-
යකට භය නොවන්න. ඔබේ බිරිඳ
වන මරියාව නිවසට කැන්දාගෙන
යන්න. මන්ද ඇගේ කුසෙහි සිටින
දරුවා පිළිසිඳගෙන ඇත්තේ දෙවි-
ගේ බලයේ ක්‍රියාකාරිත්වය නිසයි.[4]
**21** ඇය පුත්‍රයෙක් බිහි කරයි. ඔබ
ඔහුට යේසුස් යන නම[5] තැබිය
යුතුයි. මන්ද ඔහු තම ජනයාව[6]
ඔවුන්ගේ පාපවලින්[7] ගලවාගනියි.”[8]
**22** මේ සියල්ල සිදු වූයේ යෙහෝවා
දෙවි[9] තම අනාගතවක්තෘ ලවා[10]
පැවසූ මේ දේ ඉටු වීම සඳහාය.
**23** “කන්‍යාව[11] ගැබ්ගෙන පුතෙකු බිහි
කරයි. ඔහුට එම්මානුවෙල්[12] යන නම
තබනු ඇත.” එහි අර්ථය “දෙවි අප
සමඟය”[13] යන්නයි.

**24** නින්දෙන් අවදි වූ යෝසෙප්
පසුව යෙහෝවා දෙවිගේ දූතයා නියම
කළ ආකාරයටම තම බිරිඳව නිවසට
කැන්දාගෙන ආවේය. **25** නමුත්
ඇය තම දරුවාව බිහි කරන තුරු[14]
ඔවුහු අඹුසැමි ඇසුරක් පැවැත්වූයේ
නැත.[15] දරුවා ඉපදුණු විට ඔහු දරු-
වාට යේසුස් යන නම[16] තැබුවේය.

**2** යේසුස් උපන්නේ හෙරොද් රජු-
ගේ කාලයේදී[17] යුදයට අයත්ව
තිබූ බෙත්ලෙහෙම් නම් නුවරෙහිය.[18]
දිනක් නැඟෙනහිර දෙසින් ජ්‍යෝතිඃ
ශාස්ත්‍රඥයෝ[19] යෙරුසලමට පැමිණ,
**2** “ඉදිරියේදී යුදෙව්වරුන්ව පාලනය
කරන රජෙක් දැන් ඉපදිලා ඉන්-
නවා.[1] ඔහු ඉන්නේ කොහේද? අපි
නැඟෙනහිර දේශවල සිටිද්දී ඔහු
වෙනුවෙන් පායා තිබුණු තාරකා-
වක් දැක්කා.[2] අපි මෙතනට ආවේ
ඔහුට ගරුබුහුමන් දක්වන්න අපිට
අවශ්‍ය නිසයි” කියා පැවසූහ. **3** එය
ඇසූ හෙරොද් රජද මුළු යෙරුස-
ලමේ ජනතාවද බොහෝ සෙයින්
කැලඹුණෝය. **4** ඉක්මනින්ම ජන-
තාව අතර සිටි සියලුම නායක
පූජකයන්වද නීතිය පිටපත් කරන්-
නන්වද* එකට රැස් කරගත් හෙරොද්,
ක්‍රිස්තුස් ඉපදෙන්නේ කොහේද කියා
ඔවුන්ගෙන් විමසුවේය. **5** ඔවුහු
ඔහුට මෙසේ කීවෝය. “ඔහු ඉපදෙන්-
නේ යුදයට අයත් බෙත්ලෙහෙමෙ-
දීයි.[3] මන්ද අනාගතවක්තෘවරයෙක්
ඒ ගැන මෙසේ ලියා තිබෙනවා.
**6** ‘යූදා දේශයේ බෙත්ලෙහෙම,[4] ඔබ
යූදාහි ආණ්ඩුකාරයන්ගේ නුවරවල්
අතරින් වැදගත්කමින් අඩුම නුව-
රක් නම් නොවෙයි. මන්ද මාගේ සෙ-
නඟ වන ඊශ්‍රායෙල්වරුන්ව එඬේරෙකු
මෙන් රැකබලා ගැනීමට[5] ආණ්ඩුකාර-
යෙක්[6] ඔබෙන් බිහි වන්නේය.’”

**7** එවිට හෙරොද් නැඟෙනහිර දෙ-
සින් පැමිණි ජ්‍යෝතිඃ ශාස්ත්‍රඥයන්ව
රහසින් හමු වී, තාරකාව පෙනෙන්න
පටන්ගත් කාලය ඔවුන්ගෙන් නිවැ-
රදිව දැනගත්තේය. **8** ඉන්පසු ඔහු
ඔවුන්ව බෙත්ලෙහෙමට යවමින්, “ඔබ
ගොස් ඒ දරුවා ගැන හොඳින් සොයා
බලන්න. ඔහු සිටින තැන ඔබ දැන-
ගත් විට ඒ ගැන මට දන්වන්න.
එවිට මටත් පුළුවන් එතැනට ගොස්
ඔහුට ගරුබුහුමන් දක්වන්න”[7] කියා
ඔවුන්ට පැවසුවේය. **9** ඔවුහු රජුට
කීකරු වෙමින් පිටත්ව ගියහ. ඔවුන්
නැඟෙනහිර දේශවල සිටියදී දුටු ඒ
තාරකාව[8] ඔවුන්ට ඉදිරියෙන් ගොස්
කුඩා දරුවා සිටි ස්ථානයට ඉහ-
ළින් නැවතුණේය. **10** ඔවුහු තාර-
කාව නතර වූ ස්ථානය දැක මහත්

---

මතෙ **1:18*** මූ.අ., “ඇය ගැබ්ගෙන ඇති බව දැනගන්න ලැබිණ.”

මතෙ **2:4*** නීතිය උගන්වන අයව හැඳින්වූයේ එලෙසය.

---

**1 පරි.**
1 ලූක් 1:35
2 ද්වි 22:23
3 ද්වි 24:1
4 ලූක් 1:35
5 මතෙ 1:25; ලූක් 1:31; ලූක් 2:21
6 ක්‍රියා 5:31
7 යොහ 1:29; ක්‍රියා 4:12; එෆී 1:7; 1පේත 2:24
8 ලූක් 2:30; හෙබ්‍රෙ 7:25
9 යෙසා 55:11
10 යාකො 5:10; 2පේත 1:21
11 යෙසා 7:14
12 යෙසා 8:8
13 යෙසා 8:10
14 ලූක් 2:7
15 ලූක් 1:34
16 ලූක් 1:31; ලූක් 2:21

**2 පරි.**
17 ලූක් 1:5
18 මීකා 5:2; ලූක් 2:4
19 දානි 1:20

**2 තීරුව**
1 උත් 49:10; මතෙ 27:37
2 යෙසා 47:13; මතෙ 2:9
3 යොහ 7:42
4 මීකා 5:2
5 2සාමු 5:2
6 යෙසා 44:28
7 ගීතා 37:12; හිතෝ 10:11
8 මතෙ 2:2

සේ ප්‍රීති වූහ. **11** දරුවා සිටි නිවසට
ඇතුල් වූ ඔවුහු, කුඩා දරුවා සිය
මව වූ මරියා සමඟ සිටිනවා දැක
ඔහු ඉදිරියේ දණින් වැටී ඔහුට ගරු-
බුහුමන් දැක්වූහ. පසුව ඔවුහු තම
මංජුසාවන් ඇර රන්ද කට්ටකුමංජල්ද
සුවඳ ලාටුද යන තෑගි දරුවාට දුන්-
නෝය. **12** නමුත් ඔවුහු හෙරොද්
වෙතට ආපසු නොගියෝය. ඔවුන්
එසේ කළේ එහි නොයන්න කියා දෙවි
සිහිනයක් මගින් ඔවුන්ට අනතුරු
අඟවා[1] තිබූ නිසාය. ඒ අනුව ඔවුහු
එතැනින් පිටත්ව වෙනත් මඟකින්
තම රට බලා ගියහ.
**13** ඔවුන් එතැනින් පිටත්ව ගිය
සැණින් යෙහෝවා දෙවිගේ දූතයා[2]
සිහිනයකින් යෝසෙප්ට පෙනී, “නැඟි-
ටින්න, කුඩා දරුවාද ඔහුගේ
මවද රැගෙන ඊජිප්තුවට පලා යන්න.
මා ඔබට කියන තුරු එහි නැවතී
සිටින්න. මන්ද හෙරොද් කුඩා දරු-
වාව මරා දැමීමට සොයමින් සිටියි”
කියා පැවසුවේය. **14** එහෙයින් ඔහු
නැඟිට කුඩා දරුවාද දරුවාගේ මවද
රැගෙන රාත්‍රියේදීම එතැනින් පිටත්ව
ඊජිප්තුවට ගොස්, **15** හෙරොද්ගේ
මරණය දක්වා එහි නැවතී සිටි-
යේය. එසේ වූයේ, “ඊජිප්තුවෙන්[3]
මාගේ පුත්‍රයාව මම කැඳවාගතිමි”
කියා යෙහෝවා දෙවි විසින් තම අනා-
ගතවක්තෘ මාර්ගයෙන් පැවසූ දේ ඉටු
වීම සඳහාය.[4]
**16** ජ්‍යොතිඃ ශාස්ත්‍රඥයන් තමාව
රැවටූ බව තේරුම්ගත් හෙරොද් බො-
හෝ සෙයින් කෝප විය. ඉන්පසු
ඔහු බෙත්ලෙහෙමට සහ ඒ අවට
සියලු ප්‍රදේශවලට මිනිසුන්ව යවා,
ජ්‍යොතිඃ ශාස්ත්‍රඥයන්ගෙන් නිවැරදිව
දැනගෙන තිබූ කාලයට අනුව[5] අවු-
රුදු දෙකක් හෝ ඊට වඩා බාල සිය-
ලුම පිරිමි දරුවන්ව මරා දැමුවේය.
**17** එවිට අනාගතවක්තෘ යෙරෙමියා
ලවා පවසනු ලැබූ මේ දේ ඉටු
විය. එනම්, **18** “ශෝකයෙන් විලාප
දෙන හඬක් රාමාහි ඇසිණ.[6] ඒ තම
දරුවන් වෙනුවෙන් හඬා වැලපෙන
රාකෙල්ගේ හඬයි.[1] තම දරුවන් අහිමි
වූ නිසා වැලපෙමින් සිටින ඇයව
සනසවන්න බොහෝදෙනෙකු උත්-
සාහ කළත් ඇය සැනසෙන්න කැමති
වුණේ නැත.”
**19** කල් යත්ම හෙරොද් මිය ගිය
අතර ඊජිප්තුවේ සිටි යෝසෙප්ට
යෙහෝවා දෙවිගේ දූතයා සිහිනය-
කින් පෙනී,[2] **20** “නැඟිටින්න, කුඩා
දරුවාද ඔහුගේ මවද රැගෙන ඊශ්‍රා-
යෙල් දේශයට යන්න. මන්ද කුඩා
දරුවාගේ ජීවිතය නැති කර දමන්න
උත්සාහ කළ අය දැන් මිය ගිහින්”
කියා පැවසුවේය. **21** එහෙයින් ඔහු
නැඟිට කුඩා දරුවාද දරුවාගේ මවද
රැගෙන ඊශ්‍රායෙල් දේශයට පැමිණි-
යේය. **22** නමුත් ආකෙලාවුස් තම
පිය වූ හෙරොද් වෙනුවට යුදයේ
රජකම් කරන බව ඔහු දැනගත්
විට යුදයට යන්න ඔහු තුළ බියක්
ඇති විය. එමෙන්ම දෙවි සිහින-
යක් මාර්ගයෙන්ද එහි නොයන්න
කියා ඔහුට අනතුරු අඟවා තිබූ
නිසා[3] ඔහු එතැනින් පිටත්ව ගලීලය
අවට ප්‍රදේශයට[4] ගොස්, **23** නාස-
රෙත් නම් නගරයට[5] පැමිණ එහි
වාසය කළේය. එසේ වූයේ, ‘ඔහුව
නාසරෙත්හි වැසියෙක්යයි හඳුන්වනු
ලබන්නේය’[6] කියා අනාගතවක්තෘව-
රුන් මාර්ගයෙන් පැවසූ දේ ඉටු වීම
සඳහාය.

**3** ඒ කාලයේදී යොහන් බව්තීස්ත[7]
යුදා පාළුකරයෙහි දේශනා
කරන්න පටන්ගත්තේය.[8] **2** “පසු-
තැවිලි වන්න,[9] මන්ද ස්වර්ග රාජ්‍යය
ළං වී තිබෙනවා”[10] කියා ඔහු පව-
සමින් සිටියේය. **3** “සවන් දෙන්න!
‘ජනයෙනි, යෙහෝවා දෙවිගේ මඟ
එළි පෙහෙළි කර සූදානම් කරන්න!
ඔහුගේ මාවත් සමතලා කරන්න’[11]
යයි කියමින් යමෙක් පාළුකරයේ
සිට හඬ නඟන්නේය” කියා අනා-
ගතවක්තෘ යෙසායා පැවසුවේ ඔහු
ගැනය.[12] **4** යොහන්ගේ ඇඳුම් ඔටු
රෝමවලින් සාදා[13] තිබුණු අතර ඔහු
ඉඟටිය වටා සම් පටියක්[14] බැඳගෙන

**2 පරි.**
1 මතෙ 2:22
2 මතෙ 1:20, මතෙ 2:19
3 හොෂෙ 11:1
4 මතෙ 5:17
5 මතෙ 2:7
6 යෙරෙ 31:15, යෙරෙ 31:16

**2 තීරුව**
1 උත් 35:19
2 මතෙ 1:20
3 මතෙ 2:12
4 මාක් 1:9, ලූක් 2:39
5 ලූක් 2:51, යොහ 1:45
6 යෙසා 11:1, යෙසා 53:2, යෙරෙ 23:5, සෙක 3:8

**3 පරි.**
7 මාක් 1:4, යොහ 1:6
8 මතෙ 11:7
9 ලූක් 3:3
10 මතෙ 4:17
11 යෙසා 40:3
12 මාක් 1:2, යොහ 1:23
13 2රාජා 1:8
14 මාක් 1:6

සිටියේය. ඔහු ආහාරයට ගත්තේ
පළහැටියන්[1] හා වනයේ මීපැණිය.[2]
5 ඒ කාලයේදී යෙරුසලමේද මුළු යුද-
යේද යෝර්දාන් ගඟ අවට මුළු ප්‍රදේශ-
යේද වැසියෝ ඔහු වෙතට ගොස්,
6 තමන් කර ඇති වැරදි ප්‍රසිද්ධි-
යේ පිළිගත්තෝය. යොහන් ඔවුන්ව
යෝර්දාන් ගඟේදී[3] බව්තීස්ම කළේය.
7 බව්තීස්ම කරන ස්ථානයට පරි-
සිවරුන් සහ සද්දුසිවරුන්*[4] බොහෝ-
දෙනෙකු එනවා දුටු යොහන්
ඔවුන්ට මෙසේ කීවේය. "පොළඟුන්-
ගෙන් පැවතෙන්නෙනි![5] දෙවිගේ උද-
හසින්[6] පලා යන්න අවශ්‍යයි කියා
ඔබට පෙන්වා දුන්නේ කවුද? 8 ඔබ
ඇත්තටම පසුතැවිලි වී ඇත්නම් ඒ
බව ඔබේ ක්‍රියාවලින් ඔප්පු කරන්න.[7]
9 'අපේ පියා ආබ්‍රහම්'[8] කියා සිතා-
ගෙන සිටින්න එපා. දෙවිට අවශ්‍ය
නම් මේ ගල්වලින් වුණත් ආබ්‍ර-
හම්ට දරුවන්[9] ලබා දෙන්න පුළු-
වන්. 10 ගස කපා දැමීමට සියල්ල
සූදානම්. දැනටමත් එහි මුල ළඟ
පොරොවක්[10] තබා තිබෙනවා. හොඳ
පල නොදරන සෑම ගසක්ම කපා[11]
ගින්නෙහි දමනු ලබනවා.[12] 11 ඔබ
පසුතැවිලි වී ඇති නිසා[13] ඊට සාක්ෂි-
යක් ලෙස මම ඔබව වතුරෙන් බව්-
තීස්ම කරනවා.[14] නමුත් මට පසුව
එන තැනැත්තා[15] මට වඩා බල-
වත් කෙනෙක්. මම ඔහුගේ පාවහන්
ගලවන්න තරම්වත් වටින කෙනෙක්
නොවෙයි.[16] ඒ තැනැත්තා ඔබව බව්-
තීස්ම කරන්නේ දෙවිගේ බලයෙන්[17]
හා ගින්නෙනුයි.[18] 12 ඇනුත් ඔහු-
ගේ අතේ ධාන්‍ය පොළන කුල්-
ලක් තිබෙනවා. ඔහු තමන්ගේ කමත
හොඳින් පිරිසිදු කර හොඳ තිරිඟු ගබ-
ඩාවට රැස් කරයි.[19] නමුත් කිසිවෙකුට
නිවිය නොහැකි ගින්නකින් ඔහු දහ-
යියා සියල්ල දවා දමයි."[20]
13 මේ අතර යේසුස් බව්තීස්ම
වීම සඳහා[21] යෝර්දාන් ගඟ අසල
සිටි යොහන් වෙතට ගලීලයේ
සිට ආවේය.[1] 14 නමුත් යොහන් ඒ
සඳහා ඔහුට ඉඩ නොදී, "ඔබෙන් බව්-
තීස්ම විය යුත්තේ මමයි. ඒත් ඔබ මා
වෙතට එන්නේ ඇයි" කියා ඔහුගෙන්
ඇසුවේය. 15 යේසුස් ඔහුට උත්තර
දෙමින්, "දැනට මේ දේ සිදු වෙන්න
ඉඩහරින්න. එසේ කිරීම සුදුසුයි. මන්ද
ඉටු විය යුතු සෑම ධර්මිෂ්ඨ දෙයක්ම
එමගින් ඉටු වෙයි"[2] කියා පැවසුවේය.
එමනිසා යොහන් ඔහුව තවදුරටත්
වැළැක්වූයේ නැත. 16 යේසුස් බව්-
තීස්ම වී දියෙන් උඩට මතු වෙනවාත්
සමඟම අහස විවර විය.[3] දෙවිගේ
බලය[4] පරෙවියෙකුගේ ස්වරූපයෙන්[5]
ඔහු පිටට පැමිණි ආකාරය යොහන්
දුටුවේය. 17 ඒ අවස්ථාවේදී, "මේ
මාගේ ප්‍රේමණීය[6] පුත්‍රයාය,[7] මම මො-
හුව අනුමත කළෙමි"[8] කියා පැවසූ
හඬක්[9] ස්වර්ගයෙන් නික්මුණේය.

4 ඉන්පසු දෙවි තම බලයෙන් පාළු-
කරයට[10] යන්න යේසුස්ට මඟ
පෙන්වූවේය. එහිදී යක්ෂයා ඔහුව
වරදකට හසු කරගන්න[11] උත්-
සාහ කළේය. 2 දින හතළිහක් පුරා
දිවා රෑ දෙකේම නිරාහාරව[12] සිටි
ඔහුට බඩගින්නක් දැනිණ. 3 වර-
දට පොලඹවන්නා[13] ඇවිත්, "ඔබ
දෙවිගේ පුත්‍රයෙකු නම්[14] මේ ගල්
රොටි කරන්න" කියා ඔහුට කීවේය.
4 නමුත් ඔහු මෙසේ පිළිතුරු දුන්-
නේය. "'මිනිසාගේ ජීවිතය රඳා පව-
තින්නේ කෑම වේලක් මත පමණක්
නොව යෙහෝවා දෙවි පවසන සෑම
දෙයක් මතම'[15] බව ලියා තිබෙනවා."
5 එවිට යක්ෂයා ඔහුව ශුද්ධ නුව-
රට[16] රැගෙන ගියේය. එහිදී ඔහුව දේව-
මාලිගාවේ පවුර මුදුනට ගෙන ගොස්,
6 "ඔබ දෙවිගේ පුත්‍රයෙකු නම් පහ-
නට පනින්න.[17] මන්ද 'ඔහු තම දූත-
යන්ට ඔබව ආරක්ෂා කිරීමට අණ

**3 පරි.**
1 ලෙවී 11:22
2 1සාමු 14:27
හිතෝ 24:13
3 මාක් 1:5
මාක් 1:9
4 මාක් 12:18
ලූක් 7:30
5 ගීතා 58:4
මතෙ 12:34
6 මතෙ 23:33
ලූක් 3:7
ලූක් 21:23
රෝම 2:5
එළි 6:17
7 ක්‍රියා 26:20
8 යොහ 8:33
යොහ 8:39
9 රෝම 4:12
10 ලූක් 3:9
11 මතෙ 7:19
ලූක් 13:6
12 යොහ 15:6
13 ක්‍රියා 13:24
ක්‍රියා 19:4
14 යොහ 1:33
ක්‍රියා 1:5
ක්‍රියා 11:16
15 මතෙ 11:3
යොහ 1:15
16 මාක් 1:7
යොහ 1:27
ක්‍රියා 13:25
17 යොහ 1:33
ක්‍රියා 2:4
1කොරි 12:13
18 ලූක් 3:16
19 මතෙ 13:30
20 යෙරෙ 15:7
මලා 4:1
ලූක් 3:17
21 ලූක් 3:21

**2 තීරුව**
1 මාක් 1:9
2 දානි 9:24
මතෙ 5:17
හෙබ්‍රෙ 10:9
3 එස 1:1
මාක් 1:10
ලූක් 3:21
ක්‍රියා 7:56
4 යෙසා 11:2
ලූක් 3:22
ලූක් 4:18
ක්‍රියා 10:38
5 යොහ 1:32
6 මතෙ 17:5
ලූක් 3:22
7 උත් 22:2
ගීතා 2:7
ලූක් 9:35
8 යෙසා 42:1
මතෙ 12:18
2පේතෘ 1:17
9 යොහ 12:28

මතෙ **3:7*** යේසුස්ගේ කාලයේ සිටි ප්‍රසිද්ධ ආගමික නායකයන් දෙපිරිසකි.

**4 පරි.** **10** ලෙවී 16:21; මාක් 1:12; ලූක් 4:1; **11** හෙබ්‍රෙ 4:15; **12** නික් 34:28; ද්වි 9:9; 1රාජා 19:8; මාක් 1:13; ලූක් 4:2; **13** 1තෙස 3:5; **14** මතෙ 27:40; ලූක් 4:3; **15** ද්වි 8:3; ලූක් 4:4; යොහ 4:34; **16** නෙහෙ 11:1; යෙසා 52:1; මතෙ 27:53; **17** ලූක් 4:9.

දෙන්නේය. ඔබේ පය කිසිවිටකත්
ගලක නොවදින පිණිස ඔවුහු සිය අත්-
වලින් ඔබව උසුලනවා ඇත’[1] කියා
ලියා තිබෙනවා” යයි ඔහුට කීවේය.
**7** එවිට යේසුස් ඔහුට මෙසේ පිළිතුරු
දුන්නේය. “ ‘ඔබේ දෙවි වන යෙහෝවා
ඔබ වෙනුවෙන් මැදිහත් වෙයිද නැද්ද
කියා පරීක්ෂා නොකළ යුතුයි’[2] කියාද
ලියා තිබෙනවා.”

**8** නැවතත් යක්ෂයා ඔහුව ඉතා
උස් කන්දකට ගෙන ගොස් ඔහුට
ලෝකයේ සියලු රාජ්‍යයන්ද[3] ඒවායේ
තේජසද පෙන්වා, **9** “ඔබ වැඳ වැටී
මට එක් වරක් නමස්කාර කළොත්[4]
මම මේ සියල්ල ඔබට දෙනවා”[5] කියා
ඔහුට කීවේය. **10** එවිට යේසුස්
මෙසේ පිළිතුරු දුන්නේය. “සාතන්,
අහකට යන්න! මන්ද ‘ඔබ නමස්කාර
කළ යුත්තේ ඔබේ දෙවි වන යෙහෝ-
වාටයි.[6] ඔබේ පරිශුද්ධ සේවය[7] පිරි-
නැමිය යුත්තේ ඔහුට පමණයි’[8] කියා
ලියා තිබෙනවා.” **11** එවිට යක්ෂයා
ඔහු වෙතින් අහක්ව ගියේය.[9] එසැ-
ණින්ම දේවදූතයෝ ඇවිත් යේසුස්ට
උපස්ථාන කළෝය.[10]

**12** යොහන්ව අත්අඩංගුවට ගෙන
ඇති බව[11] යේසුස්ට ආරංචි වූ විට ඔහු
ගලීලයට පිටත්ව ගියේය.[12] **13** ඔහු
නාසරෙත් නුවරින් පිටත් වී, සෙබ්‍යූ-
ලන් සහ නෆ්තලී ප්‍රදේශයන්ට[13] අයත්
ගලීල මුහුද අසල පිහිටි කපර්ණවු-
මට ගොස්[14] එහි නැවතී සිටියේය.
**14** එසේ කළේ අනාගතවක්තෘ යෙ-
සායා මාර්ගයෙන් කියන ලද අනාවැ-
කිය ඉටු වීම සඳහාය. එම අනාවැකිය
නම්, **15** ‘යොර්දාන් ගඟෙන් එතෙර
මුහුදු මාර්ගයේ පිහිටි සෙබ්‍යූලන්
පළාතේ වැසියෙනි, නෆ්තලී පළා-
තේ වැසියෙනි, ගලීලයේ[15] වෙසෙන
සියලු ජාතීන්ට අයත් වැසියෙනි,
ඔබට ආශීර්වාද ලැබේවා! **16** අඳු-
රෙහි සිටි ජනයා[16] මහත් ආලෝක-
යක් දුටුවෝය.[17] මරණය ගෙන දෙන
සනාන්ධකාරයකින් වැසී ගිය දේශයේ
වැසියන්ට ආලෝකය[18] උදා විය’[19]
යන්නයි. **17** එතැන් පටන් යේසුස්,
“ජනයෙනි, පසුතැවිලි වන්න.[1] මන්ද
ස්වර්ග රාජ්‍යය[2] ළං වී ඇත” කියා පව-
සමින් දේශනා කරන්න පටන්ගත්-
තේය.

**18** ඔහු ගලීල මුහුද අසල ඇවිදි-
මින් සිටියදී ධීවරයන් වූ පේතෘස්[3] යන
නමින්ද හැඳින්වූ සීමොන්[4] සහ ඔහුගේ
සහෝදරයා වූ අන්ද්‍රෑ මාළු දැලක්
දියට හෙළමින් සිටින ආකාරය දුටු-
වේය. **19** එවිට ඔහු, “මා පසුපස
එන්න. මම ඔබව මසුන් අල්ලන්-
නන් වෙනුවට මිනිසුන් අල්ලන්නන්
කරනවා”[5] කියා ඔවුන්ට කීවේය.
**20** ඔවුහු ඒ මොහොතේම දැල්
පසෙක තබා[6] ඔහු අනුව* ගියෝය.
**21** ඔහු තවත් ඈතට ගිය විට තවත්
සහෝදරයන් දෙදෙනෙකු වූ[7] සෙබදී-
ගේ පුතුන් වන[8] යාකොබ් සහ යො-
හන්ව දුටුවේය. ඔවුහු ඔරුවක ඉඳ
තම පියා වූ සෙබදී සමඟ තම දැල්-
වල ඉරුම් සකසමින් සිටියෝය. ඔහු
ඔවුන්ටත් අඬගැසුවේය. **22** ඔවුහුද
එසැණින්ම ඔරුවෙන් බැස තම පියා-
ගෙන් සමුගෙන ඔහු අනුව ගියෝය.

**23** ඉන්පසු යේසුස් සිනගෝගවල[9]
උගන්වමින්ද රාජ්‍යයේ ශුභාරංචිය
ගැන දේශනා කරමින්ද ජනයාට
වැලඳී තිබූ සියලු ආකාර රෝග[10] සහ
ආබාධ සුව කරමින්ද මුළු ගලීලය
පුරාම[11] සංචාරය කළේය.[12] **24** ඔහු
ගැන ආරංචිය මුළු සිරියාව පුරාම[13]
පැතිරිණ. එවිට අසනීපව සිටි සියල්-
ලන්ව එනම්, විවිධාකාර රෝගවලින්
හා වේදනාවලින් පීඩිතව සිටි[14] අයවද
භූතයන් ආවේශ වූ අයවද මීමැස්-
මොර රෝගීන්වද[15] අංශභාග රෝ-
ගීන්වද ඔහු වෙතට ගෙනෙන ලදි.
ඔහු ඔවුන් සියල්ලන්වම සුව කළේය.
**25** එහෙයින් ගලීලයෙන්ද[16] දෙක-
පොලිසයෙන්ද* යෙරුසලමෙන්ද[17]
යුදයෙන්ද යොර්දාන් ගඟ එගොඩින්ද
පැමිණි මහත් ජන සමූහයක් ඔහුගේ
අනුගාමිකයෝ වූවෝය.

**4 පරි.**

**1** ගීතා 91:11
ගීතා 91:12
ලූක් 4:10
ලූක් 4:11
**2** ද්වි 6:16
ලූක් 4:12
1කොරි 10:9
**3** මතෙ 16:26
ලූක් 4:5
1යොහ 2:16
එළි 11:15
**4** ද්වි 11:16
**5** ලූක් 4:6
ලූක් 4:7
යොහ 12:31
2කොරි 4:4
**6** ද්වි 5:9
එළි 22:9
**7** ද්වි 10:20
යොෂු 24:14
ලූක් 4:8
**8** ද්වි 6:13
**9** ලූක් 4:13
යාකො 4:7
**10** ලූක් 22:43
හෙබ්‍රෙ 1:14
**11** මතෙ 14:3
මාක් 1:14
මාක් 6:17
ලූක් 3:20
**12** ලූක් 4:14
**13** යොෂු 19:32
**14** ලූක් 4:31
යොහ 2:12
**15** යෙසා 9:1
**16** යෙසා 8:22
යෙසා 9:2
**17** ලූක් 1:79
**18** යොහ 1:9
**19** යෙසා 9:2

**2 තීරුව**

**1** මාක් 1:15
**2** මතෙ 10:7
**3** යොහ 1:42
**4** මාක් 1:16
**5** ලූක් 5:10
**6** මාක් 10:28
ලූක් 18:28
**7** මාක් 1:19
යොහ 21:2
**8** මතෙ 10:2
මතෙ 27:56
මාක් 3:17
මාක් 10:35
**9** ලූක් 4:16
ක්‍රියා 13:14
**10** ලූක් 9:11
ක්‍රියා 10:38
**11** මාක් 1:14
මාක් 1:39
**12** මතෙ 9:35
මාක් 6:6
**13** ක්‍රියා 15:41
**14** මාක් 6:55
**15** මතෙ 17:15
මාක් 1:32
ක්‍රියා 5:16
**16** මාක් 3:7
**17** ලූක් 6:17

---

මතෙ **4:20*** “අනුව” යන්න භාවිත කර තිබෙන්-
නේ ඔවුන් ඔහුගේ අනුගාමිකයන් වූ බව දැක්වීම-
ටයි. **25*** හෝ, “නුවරවල් දසයෙන්ද.”

**5** ඒ විශාල සමූහය දුටු ඔහු කන්-
දට නැඟ එක්තරා ස්ථානයක
ඉඳගත්තේය. ඉන්පසු ඔහුගේ ගෝ-
ලයෝද ඔහු අසලට පැමිණියෝය.
**2** එවිට ඔහු ඔවුන් සියල්ලන්ට මෙසේ
උගන්වන්න පටන්ගත්තේය.

**3** "නිරතුරුවම දෙවිගේ මඟ පෙන්-
වීම් ලබාගන්න මහත් ආශාවකින්
සිටින අය[1] සන්තෝෂවත්. මන්ද
ස්වර්ග රාජ්‍යය හිමි වන්නේ ඔවුන්-
ටයි.[2]

**4** "වැලපෙමින් සිටින අය සන්-
තෝෂවත්. මන්ද ඔවුන්ව සනසනු
ලබයි.[3]

**5** "මෘදු ගුණැති අය[4] සන්තෝෂ-
වත්. මන්ද ඔවුන්ට පොළොව උරුම
වෙයි.[5]

**6** "දෙවිගේ ධර්මිෂ්ඨ ප්‍රමිතිවලට
මහත් ඇල්මක් දක්වන*[6] අය සන්-
තෝෂවත්. මන්ද ඔවුන් තෘප්තියට
පත් වෙයි.[7]

**7** "දයාවන්ත අය[8] සන්තෝෂවත්.
මන්ද ඔවුන්ට දයාව පෙන්වනු ලබයි.

**8** "නිර්මල සිත් ඇති අය[9] සන්-
තෝෂවත්. මන්ද දෙවිව දකින්න[10]
ඔවුන්ට හැකි වෙයි.

**9** "සාමය ඇති කිරීමට වෙහෙ-
සෙන අය[11] සන්තෝෂවත්. මන්ද
ඔවුන්ව 'දෙවිගේ පුත්‍රයන්'[12] ලෙස
හඳුන්වනු ලබයි.

**10** "දෙවිගේ ධර්මිෂ්ඨ ප්‍රමිති රැකීම
නිසා පීඩා විඳින අය[13] සන්තෝෂවත්.
මන්ද ස්වර්ග රාජ්‍යය හිමි වන්නේ
ඔවුන්ටයි.

**11** "මා නිසා මිනිසුන් ඔබට
නින්දා[14] පීඩා[15] කළත් ඔබට විරුද්-
ධව බොරු චෝදනා නැඟුවත් සියලු
ආකාර දුෂ්ට දේ පැවසුවත් ඔබ සන්-
තෝෂවත් බව මතක තබාගන්න.
**12** ස්වර්ගයෙහි ඔබට මහත් ත්‍යාග-
යක්[16] තිබෙයි. ඒ නිසා ප්‍රීති වන්න,
ප්‍රීතියෙන් ඉපිල යන්න.[17] ඔබට කලින්
සිටි අනාගතවක්තෘවරුන්ටත් ඔවුන්
එලෙසම පීඩා කළ බව[1] මතක තබා-
ගන්න.

**13** "ඔබ පොළොවෙහි ලුණු හා
සමානයි.[2] නමුත් ලුණුවල ලුණු
රසය නැති වුණොත් එය නැවත
ඇති කරන්නේ කොහොමද? පිටතට
විසි කරනු ලැබීමට[3] මිස එය වෙන
කිසිම දෙයකට ප්‍රයෝජනවත් වන්-
නේ නැහැ. අන්තිමේදී එය මිනිසුන්ගේ
පයට පෑගී යයි.

**14** "ලෝකයේ ආලෝකය ඔබයි.[4]
කන්දක් මුදුනෙහි නුවරක් පිහිටා
ඇති විට එය සැඟවිය නොහැකියි.
**15** මිනිසුන් පහනක් දල්වා පහන්
රුකක් මත තබනවා මිස බඳුනකින්
එය වසා තබන්නේ නැහැ.[5] එමගින්
ගෙයි සිටින සියල්ලන්ටම ආලෝකය
විහිදෙයි. **16** එලෙසම ඔබත් ඔබේ
ආලෝකය[6] මිනිසුන් ඉදිරියෙහි විහිදු-
වන්න. එවිට ඔවුන් ඔබේ යහපත්
ක්‍රියා[7] දැක ස්වර්ගයේ සිටින ඔබේ
පියාණන්ට ප්‍රශංසා කරයි.[8]

**17** "මා පැමිණියේ නීතිය හෝ
අනාගතවාක්‍යය නැති කර දමන්න[9]
කියා නොසිතන්න. මා පැමිණියේ
ඒවා සම්පූර්ණ කිරීමට[10] මිස නැති
කර දැමීමට නොවෙයි. **18** ඇත්-
තෙන්ම මා ඔබට කියන්නේ, අහස
හා පොළොව පහව ගියත්[11] නීති-
යේ සඳහන් සෑම දෙයක්ම අනිවාර්ය-
යෙන් ඉටු වන බවයි.[12] එහි සඳහන්
කුඩාම අකුරක් වුණත් අකුරකින්
අංශුමාත්‍රයක් වුණත් ඉතා වැදගත්
බව මතක තබාගන්න. **19** එහෙ-
යින් මේ අණපනත්වලින් ඉතා සුළු
එකක් වුණත් කඩ කරන[13] හෝ
කඩ කිරීමට අනුන්ව පොළඹවන
ඕනෑම කෙනෙකුව ස්වර්ග රාජ්‍ය-
යට සුදුසු නැති 'සුළු' තැනැත්තෙකු
ලෙස හඳුන්වනු ලැබෙයි.[14] නමුත්
යමෙක් ඒවා පිළිපැද ඒවා උගන්ව-
නවා නම්[15] ඔහුව ස්වර්ග රාජ්‍යයට
සුදුසු 'උතුම්' තැනැත්තෙකු[16] ලෙස
හඳුන්වනු ලැබෙයි. **20** මා ඔබට

**5 පරි.**
1 ලූක් 6:20, 1කොරි 2:14
2 යාකො 2:5
3 යෙසා 12:1, යෙසා 61:3, මතෙ 11:28
4 1තිමෝ 6:11, තීත 3:2
5 ගීතා 37:11
6 යෙසා 55:1, ලූක් 6:21
7 යොහ 6:35, එළි 7:16
8 මතෙ 6:14, මතෙ 18:33, යාකො 2:13
9 ගීතා 24:4, ගීතා 73:1, හිතෝ 22:11, තීත 1:15
10 1යොහ 3:2
11 රෝම 12:18, හෙබ්‍රෙ 12:14, යාකො 3:18
12 ගලා 4:6
13 මාක් 10:30, 1පේත 3:14
14 මතෙ 10:22, ලූක් 6:22, යාකො 1:2, 1පේත 4:14
15 යොහ 15:20
16 හෙබ්‍රෙ 11:6
17 හබ 3:18, ලූක් 6:23, ක්‍රියා 5:41, රෝම 5:3

**2 තීරුව**
1 2ලේක 36:16, මතෙ 23:30, ලූක් 6:23, ක්‍රියා 7:52, 1තෙස 2:15, හෙබ්‍රෙ 11:37, යාකො 5:10
2 මාක් 9:50
3 ලූක් 14:35
4 යෙසා 51:4, යොහ 3:19, යොහ 8:12, යොහ 9:5, යොහ 12:36, 2කොරි 6:14, පිලි 2:15
5 මාක් 4:21, ලූක් 11:33
6 එෆි 5:8, පිලි 2:15, 1පේත 2:9
7 යොහ 10:32, යොහ 15:8, එෆි 5:9
8 1පේත 2:12
9 රෝම 3:31
10 ලූක් 4:21
11 මතෙ 24:35, ලූක් 16:17, ලූක් 21:33
12 යෙසා 40:8, යෙසා 55:11

**13** යාකො 2:10; **14** ලූක් 13:28; **15** මතෙ 28:20; **16** මතෙ 11:11.

මතෙ **5:6*** මූ.අ., "සාපිපාසයෙන් සිටින."

කියන්නේ, නීතිය පිටපත් කරන්-
නන්ටත් පරිසිවරුන්ටත්[1] වඩා ඔබ
ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කළ යුතු
බවයි. එසේ නොකළොත් ඔබ කිසි-
සේත් ස්වර්ග රාජ්‍යයට සුදුස්සෙක්[2]
වන්නේ නැහැ.
**21** “‘මිනී නොමරන්න’[3] කියාද
‘මිනී මරන ඕනෑම කෙනෙකු[4] අධික-
රණය ඉදිරියේ පෙනී සිටිය යුතුයි’[5]
කියාද පුරාණයේ විසූ අයට පැවසූ
බව ඔබ අසා ඇති. **22** නමුත් මා
ඔබට කියන්නේ මෙයයි. තම සහෝ-
දරයා සමඟ දිගින් දිගටම කෝපයෙන්
සිටින[6] සෑම කෙනෙකුම අධිකරණය
ඉදිරියේ පෙනී සිටිය යුතුයි.[7] සඳහන්
කිරීමට තරම්වත් සුදුසු නැති අව-
මන්සහගත වචනයකින් තම සහෝ-
දරයාව අමතන ඕනෑම කෙනෙකු
ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පෙනී
සිටිය යුතුයි. යමෙකුට ‘නීච මෝඩයා’
කියා පවසන ඕනෑම කෙනෙක් ගෙ-
හෙන්නාවට* සුදුස්සෙක් වෙයි.[8]
**23** “එහෙයින් ඔබ යමක් පරිත්‍යාග
කිරීමට පූජාසනය ළඟට යන විට[9]
ඔබේ සහෝදරයාට ඔබ සමඟ යම්
ගැටලුවක් තිබෙන බව එහිදී ඔබට
මතක් වෙයි නම්,[10] **24** පරිත්‍යාග
කිරීමට රැගෙන ආ දේ පූජාසනය ඉදි-
රිපිට තබන්න. මුලින්ම ගොස් ඔබේ
සහෝදරයා සමඟ සමාදාන වන්න.[11]
ඉන්පසුව ඇවිත් ඒ දේ පරිත්‍යාග
කරන්න.[12]
**25** “යම් කෙනෙක් ඔබට විරුද්-
ධව නඩුවක් දමා ඇත්නම්[13] ඒ නඩු-
වට යන්න පෙර ඔහුව හමු වී ඇති
වී තිබෙන ප්‍රශ්නය ඉක්මනින් නිර-
වුල් කරගන්න. එසේ නොකළොත්
ඔහු ඔබව විනිශ්චයකරු ඉදිරියට ගෙ-
නැවිත් ඔබව වරදකරුවෙක් කරන්න
ඉඩ තිබෙයි. එවිට විනිශ්චයකරු
ඔබව සිරගෙයි දැමීම සඳහා අධිකර-
ණයේ නිලධාරියාට භාර දීමට පිය-
වර ගත හැකියි. **26** ඇත්තෙන්ම මා
ඔබට කියන්නේ, ඔබ අන්තිම සතය*
ගෙවන තුරු[1] ඔබට කොහොමටවත්
එතැනින් පිටතට එන්න ලැබෙන්නේ
නැති බවයි.
**27** “‘අනාචාරයේ* නොහැ-
සිරෙන්න’[2] කියා පවසා තිබෙන බව
ඔබ අසා ඇති. **28** නමුත් මා ඔබට
කියන්නේ, කාමාශාවකින් ස්ත්‍රියක්
දෙස දිගින් දිගටම බලමින්[3] සිටින
සෑම කෙනෙකුම ඒ වන විටත් සිතින්[4]
ඇය සමඟ අනාචාරයේ* හැසිරී ඇති
බවයි.[5] **29** එහෙයින් ඔබේ දකුණු
ඇස නිසා ඔබ වරදක් කිරීමට පෙල-
ඹෙනවා නම්* එය උගුලා අහකට විසි
කරන්න.[6] මන්ද ඔබේ මුළු ශරීරය
ගෙහෙන්නාවෙහි# හෙළනවාට[7] වඩා
ඔබේ ශරීරයේ එක අවයවයක් අහිමි
වීම වඩාත් හොඳයි. **30** ඔබේ දකු-
ණත නිසා ඔබ වරදක් කිරීමට පෙල-
ඹෙනවා නම්* එය කපා අහකට විසි
කරන්න.[8] මන්ද ඔබේ මුළු ශරීරය ගෙ-
හෙන්නාවෙහි හෙළනවාට වඩා ඔබේ
ශරීරයේ එක අවයවයක් අහිමි වීම
වඩාත් හොඳයි.
**31** “‘තම බිරිඳව දික්කසාද කරන[9]
කෙනෙකු දික්කසාද වන බවට ලිය-
විල්ලක්[10] ඇයට දිය යුතුයි’ කියා
පවසා තිබෙනවා. **32** නමුත් මා
ඔබට කියන්නේ, වේශ්‍යාකමේ* යෙ-
දීම නිසා[11] මිස අන් හේතුවක් නිසා
තම බිරිඳව දික්කසාද කරන සෑම
කෙනෙක්ම, ඇයව අනාචාරයට# පො-
ලඹවන බවයි.[12] එසේම එලෙස දික්-
කසාද කළ ස්ත්‍රියකව විවාහ
කරගන්නා තැනැත්තාව අනාචාර-
යේ හැසිරෙන්නෙකු ලෙස සැලකිය
යුතුයි.[13]

---

මතෙ **5:22*** යෙරුසලමෙන් පිටත කසළ පුලුස්සා දැමීම සඳහා භාවිත කළ ස්ථානය. උපග්‍ර. 2 බලන්න.

මතෙ **5:26*** මූ.අ., “ඉතා සුළු වටිනාකමකින් යුත් ‘ක්වොඩ්‍රන්ස්’ නම් කුඩා කාසියක්.” **27*** මූ.අ., “පරදාර සේවනයේ.” මෙය භාවිත කරන්නේ විවාහක පුරුෂයෙකු හෝ ස්ත්‍රියක අනාචාරයේ යෙදීම විස්තර කිරීමටය. **28*** මතෙ 5:27හි පාදසටහන බලන්න. **29*** මූ.අ., “පය පැකිළී වැටුණොත්.” **29#** මතෙ 5:22හි පාදසටහන බලන්න. **30*** පය පැකිළී වැටුණොත්. **32*** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න. **32#** මතෙ 5:27හි පාදසටහන බලන්න.

---

**5 පරි.**

**1** මතෙ 15:9
මතෙ 23:23
ලූක් 11:42
**2** මතෙ 18:3
යොහ 3:5
**3** උත් 9:6
නික් 20:13
ද්වි 5:17
**4** ලෙවී 24:17
**5** ද්වි 17:9
**6** එෆී 4:26
කොලො 3:8
යාකො 1:19
යාකො 5:6
**7** 1යොහ 3:15
**8** 2රාජා 23:10
යෙරෙ 7:31
මතෙ 10:28
ලූක් 12:5
**9** ද්වි 16:16
මතෙ 23:19
**10** ලෙවී 19:17
මාක් 11:25
ලූක් 17:3
**11** මතෙ 18:15
1පේතෘ 3:11
**12** 1තිමෝ 2:8
1යොහ 4:20
**13** ලූක් 12:58
ලූක් 18:3

**2 තීරුව**

**1** මතෙ 18:34
ලූක් 12:59
**2** නික් 20:14
ද්වි 5:18
ලූක් 18:20
රෝම 13:9
**3** ද්වි 5:21
2සාමු 11:2
යෝබ් 31:1
2පේතෘ 2:14
**4** මාක් 7:21
මාක් 7:23
**5** 1යොහ 2:16
**6** මතෙ 18:8
ලූක් 11:34
**7** මතෙ 18:9
මාක් 9:47
**8** කොලො 3:5
**9** මතෙ 19:3
මාක් 10:2
**10** ද්වි 24:1
මතෙ 19:8
මාක් 10:4
**11** ගණන් 14:33
විනි 19:2
එස 23:11
හොෂෙ 2:5
මාක් 7:21
ක්‍රියා 5:29
**12** මාක් 10:11
ලූක් 16:18
රෝම 7:3
**13** මතෙ 19:9

**33** "'ඔබ දිවුරුමක් දුන් විට[1] එය
කඩ නොකර ඉටු කරන්න. ඔබ යෙ-
හෝවා දෙවිට වූ පොරොන්දු ඉටු
කළ යුතුයි'[2] කියා පුරාණයේ විසූ
අයට පවසා තිබූ බව ඔබ අසා ඇති.
**34** නමුත් මා ඔබට කියන්නේ, කිසි-
සේත් නොදිවුරන්න[3] කියායි. ස්වර්ගය
දෙවිගේ සිංහාසනය[4] වන නිසා ඒ
නමින්වත්, **35** පොළොව ඔහුගේ පා
පුටුව[5] වන නිසා ඒ නමින්වත් යෙරු-
සලම මහා රජුගේ නුවර[6] වන නිසා ඒ
නමින්වත් නොදිවුරන්න. **36** ඔබේ
හිස මත අත තබා නොදිවුරන්න.
මන්ද එක හිසකෙස් ගසක්වත් සුදු
කරන්න හෝ කලු කරන්න ඔබට
හැකියාවක් නැහැ. **37** එසේය කියා
කිව යුතු අවස්ථාවලදී එසේය කියාත්
නැත කියා කිව යුතු අවස්ථාවලදී
නැත කියාත් පැවසීම ප්‍රමාණවත්.[7]
මන්ද කෙනෙක් ඊට වැඩි දෙයක් පැව-
සීමට පෙලඹෙන්නේ දුෂ්ටයාගේ බල-
පෑම නිසයි.[8]

**38** "'ඇසකට ඇසක්, දතකට
දතක්'[9] කියා පැවසූ බව ඔබ අසා
ඇති. **39** නමුත් මා ඔබට කියන්-
නේ, දුෂ්ට අයට විරුද්ධව කිසිම දෙ-
යක් නොකරන්න කියායි. යමෙකු
ඔබේ දකුණු කම්මුලට ගැසුවොත්[10]
ඔහුට අනික් කම්මුලත් හරවන්න.
**40** ඔබට විරුද්ධව නඩු කියා
ඔබේ ඇතුල් වස්ත්‍රය අයිති කර-
ගන්න යමෙකුට අවශ්‍ය නම් ඒ
සමඟ ඔබේ පිට වස්ත්‍රයත් ඔහුට
ගන්න ඉඩහරින්න.[11] **41** යම් නිල-
ධාරියෙකු සැතපුමක් යන ලෙස ඔබට
අණ කළොත් ඔහු සමඟ සැතපුම් දෙ-
කක් යන්න.[12] **42** ඔබෙන් ඉල්ලන්-
නාට දෙන්න. යමෙක් ඔබෙන් පොලී
රහිතව ණයක්[13] ඉල්ලුවොත් ඔහුට
පිටු නොපාන්න.

**43** "'ඔබේ අසල්වැසියාට ප්‍රේම
කරන්න'[14] කියාත් 'ඔබේ සතුරාට
වෛර කරන්න'[15] කියාත් පවසා ඇති
බව ඔබ අසා ඇති. **44** නමුත් මා
ඔබට කියන්නේ, ඔබේ සතුරන්ටත්
නොකඩවා ප්‍රේම කරන්න[16] කියායි.
ඔබට පීඩා කරන්නන් වෙනුවෙන්
දිගටම යාච්ඤා කරන්න.[1] **45** ඔබ
ස්වර්ගයෙහි සිටින ඔබේ පියාණන්-
ගේ පුත්‍රයන් බව ඔප්පු කිරීම සඳහා
එසේ කරන්න.[2] මන්ද ඔහු දුෂ්ටයන්-
ටත් යහපතුන්ටත් තම හිරු උදා
කරවයි. ධර්මිෂ්ඨයන්ටත් අධර්මිෂ්ඨ-
යන්ටත් වැසි ලබා දෙයි.[3] **46** ඔබට
ප්‍රේම කරන අයට පමණක් ඔබ
ප්‍රේම කරනවා නම් එයින් ඇති
පලය කුමක්ද?[4] බදු එකතු කරන්-
නන් පවා ඒ දේම කරනවා නොවෙ-
යිද? **47** ඔබ සුබ පතන්නේ ඔබේ
සහෝදරයන්ට පමණක් නම් එහි ඇති
විශේෂත්වය කුමක්ද? වෙනත් ජාතීන්
පවා ඒ දේම කරනවා නොවෙයිද?
**48** එහෙයින් ස්වර්ගයේ සිටින ඔබේ
පියාණන් පරිපූර්ණව සිටින්නා සේම
ඔබද පරිපූර්ණව සිටිය යුතුයි.[5]

**6** "මෙය මතක තබාගන්න. ඔබ
යම් ධර්මිෂ්ඨ ක්‍රියාවක් කර-
නවා නම්[6] එය කළ යුත්තේ මිනි-
සුන්ට පෙන්වීමේ අදහසින් නොවෙයි.
මන්ද ඔබ එසේ කළොත් ස්වර්ග-
යෙහි සිටින ඔබේ පියාණන්ගෙන් කිසි
ත්‍යාගයක් ඔබට ලැබෙන්නේ නැහැ.
**2** ඔබ දිළිඳුන්ට යම් යහපතක් කරන
විට[7] ඔබට ඉදිරියෙන් හොරණෑවක්
පිඹිමින් එය ප්‍රසිද්ධ නොකරන්න.[8]
කුහක පුද්ගලයන් මිනිසුන්ගෙන් ගෞ-
රවය ලැබීම සඳහා සිනගෝගවලදීත්
වීථිවලදීත් එසේ කරනවා. ඇත්-
තෙන්ම මා ඔබට කියන්නේ, ඔවුන්ට
මිනිසුන්ගේ ගෞරවය ලැබුණත් ඊට
වඩා වැඩි යමක් නම් ඔවුන්ට නො-
ලැබෙන බවයි.* **3** එහෙයින් ඔබ
දිළිඳුන්ට යම් යහපතක් කරන විට
ඔබේ දකුණත කරන දේ වමතට
දැනගන්න ඉඩ නොදෙන්න. **4** ඔබ
දිළිඳුන්ට කරන ඒ යහපත් දෙය
අනුන්ට නොපෙනෙන සේ කරන්න.
එවිට ස්වර්ගයේ සිට බලා සිටින ඔබේ
පියාණන් ඔබට ආශීර්වාද කරයි.[9]

---

මතෙ **6:2*** මූ.අ., "ඔවුන්ගේ ත්‍යාගය ඔවුන්ට සම්පූර්ණයෙන්ම ලැබී තිබෙන බවයි."

**5 පරි.**
1 ලෙවී 19:12; ගණන් 30:2
2 ද්වි 23:21; ගීතා 50:14; දේශ 5:4
3 යාකො 5:12
4 ක්‍රියා 7:49
5 යෙසා 66:1; විලා 2:1
6 ගීතා 48:2
7 2කොරි 1:17; යාකො 5:12
8 යොහ 8:44
9 නික් 21:24; ලෙවී 24:20; ද්වි 19:21
10 හිතෝ 24:29; යෙසා 50:6; විලා 3:30; ලූක් 6:29; යොහ 18:22; රෝම 12:17; 1පේත්‍රු 2:23
11 ලූක් 6:29; 1කොරි 6:7
12 මාක් 15:21
13 ලෙවී 25:36; ද්වි 23:19
14 ලෙවී 19:18; මාක් 12:31
15 නික් 23:4
16 හිතෝ 25:21; රෝම 12:20

**2 තීරුව**
1 ලූක් 6:28; ලූක් 23:34; ක්‍රියා 7:60; රෝම 12:14
2 මතෙ 5:9; එෆී 5:1
3 ලූක් 6:35; ක්‍රියා 14:17
4 ලූක් 6:32
5 ලෙවී 19:2; ද්වි 18:13; ලූක් 6:36; 1පේත්‍රු 1:16

**6 පරි.**
6 මතෙ 5:20; මතෙ 23:5
7 ක්‍රියා 9:36; ක්‍රියා 10:2; 1කොරි 13:3
8 ලූක් 18:12
9 හිතෝ 19:17; මතෙ 10:42

**5** “ඔබ යාච්ඤා කරද්දී, කුහකයන්
මෙන් කටයුතු කරන්න එපා. මන්ද
ඔවුන් කැමති වන්නේ සිනගෝගවල-
දීත් ප්‍රධාන මංසන්ධිවලදීත් සිටගෙන
යාච්ඤා කිරීමටයි.[1] ඔවුන්ගේ අර-
මුණ වන්නේ මිනිසුන්ට පෙනෙන්න[2]
ඒ දේවල් කිරීමයි. ඇත්තෙන්ම මා
ඔබට කියන්නේ, ඔවුන්ට මිනිසුන්ගේ
ගෞරවය ලැබුණත් වෙන කිසි දෙ-
යක් නම් නොලැබෙන බවයි. **6** ඔබ
යාච්ඤා කරන විට ඔබේම කාමරයට
ගොස්[3] දොර වසාගෙන ස්වර්ගයේ සිට
බලා සිටින ඔබේ පියාණන්ට යාච්ඤා
කරන්න.[4] එවිට ස්වර්ගයේ සිට බලා
සිටින ඔබේ පියාණන් ඔබට ආශීර්වාද
කරයි. **7** නමුත් ඔබ යාච්ඤා කරන
විට වෙනත් ජාතීන් කරන ආකාරයට
එකම දේ නැවත නැවතත් නොකි-
යන්න.[5] ඔවුන් සිතන්නේ වචන රාශි-
යක් පැවසුවොත් දෙවි ඔවුන්ට සවන්
දෙයි කියායි. **8** නමුත් ඔබ, ඔවුන්ට
සමාන නොවන්න. මන්ද ඔබේ පියා-
ණන් වන දෙවිගෙන් ඔබ ඉල්ලන්නත්
කලින් ඔබට අවශ්‍ය කුමක්ද කියා ඔහු
දන්නවා.[6]

**9** “එමනිසා ඔබ යාච්ඤා කළ යුත්-
තේ මෙයාකාරයටයි.[7]

“ ‘ස්වර්ගයෙහි සිටින අපගේ පියා-
ණෙනි, ඔබේ නාමය[8] සැමදා ශුද්ධව
පවතීවා!*[9] **10** ඔබගේ රාජ්‍යය[10]
පැමිණේවා! ඔබගේ කැමැත්ත[11]
ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද[12]
සිදු වේවා! **11** දිනපතා අපට
අවශ්‍ය ආහාර*[13] අපට ලබා දෙන්න.
**12** අපට වැරදි කළ අයට* අප
සමාව දී තිබෙන ආකාරයටම[14] අපේ
වැරදිවලටද# අපට සමාව දෙන්න.
**13** වරදට පෙලඹීමට ඉඩ නොදී[15]
දුෂ්ටයාගෙන් අපව ගලවාගන්න.’[16]

**14** “ඔබ අනිත් අයගේ වැරදිවලට
සමාව දෙනවා නම් ස්වර්ගයේ සිටින
ඔබේ පියාණන් ඔබටත් සමාව දෙයි.[1]
**15** නමුත් ඔබ ඔවුන්ගේ වැරදිවලට
සමාව දෙන්නේ නැත්නම් ඔබේ පියා-
ණන් ඔබේ වැරදිවලටත් සමාව දෙන්-
නේ නැහැ.[2]

**16** “ඔබ නිරාහාරව සිටින විට[3]
කුහකයන් මෙන් දුක්මුසු මුහුණක්
ඇතුව තවදුරටත් නොසිටින්න. මන්ද
ඔවුන් දුක්මුසු මුහුණක් මවාපාමින්
සිටින්නේ තමන් නිරාහාරව සිටින
බව මිනිසුන්ට පෙන්වන්නයි.[4] ඇත්-
තෙන්ම මා ඔබට කියන්නේ, ඔවුන්ට
මිනිසුන්ගේ ගෞරවය ලැබුණත් ඊට
වඩා වැඩි යමක් නම් ඔවුන්ට නොලැ-
බෙන බවයි.* **17** නමුත් ඔබ නිරා-
හාරව සිටින විට ඔබේ හිසේ තෙල්
ආලේප කර මුහුණ සෝදාගෙන[5] නිරා-
හාරව සිටින්න. **18** එසේ කරද්දී ඔබ
නිරාහාරව සිටින බව පෙන්වන්නේ
මිනිසුන්ට නොව ස්වර්ගයේ සිට බලා
සිටින ඔබේ පියාණන්ටයි.[6] එවිට
ස්වර්ගයේ සිට බලා සිටින ඔබේ පියා-
ණන් ඔබට ආශීර්වාද කරයි.

**19** “තවදුරටත් මෙලොවෙහි වස්තු
රැස් කර නොගන්න.[7] මන්ද කාවෝ
සහ මලකඩ නිසා ඒවා නාස්ති වී
යයි. සොරුන් ඇවිත් ඒවා සොරා-
ගනියි. **20** ඒ වෙනුවට ස්වර්ගයෙහි
වස්තු රැස් කරගන්න.[8] එහිදී කාවන්ට-
වත් මලකඩවලටවත් ඒවා නාස්ති
කරන්න බැහැ.[9] සොරුන්ටවත් ඇවිත්
ඒවා සොරා ගන්න බැහැ. **21** ඔබේ
වස්තුව කොතැනද ඔබේ සිතත් ඇත්-
තේ එතැනමයි.

**22** “ඇස ශරීරයට පහනක් හා
සමානයි.[10] එමනිසා ඔබේ ඇස වෙ-
නතකට යොමු නොකර එකම දෙ-
යක් කෙරෙහි යොමු කර* තැබුවොත්
එයින් ඔබේ මුළු ජීවිතයම ආලෝක-
වත් වෙයි. **23** නමුත් ඔබේ ඇස වෙ-
නතකට ගොස් දුෂ්ට දේවලට
යොමු වෙයි* නම්[11] ඔබේ මුළු ජීවිත-
යම අඳුරු වෙයි. ඔබව ආලෝකවත්

**6 පරි.**
1 ලූක් 18:11
2 මතෙ 6:16; මතෙ 23:5
3 2රාජා 4:33; යෙසා 26:20
4 ලූක් 6:12
5 1රාජා 18:26
6 ලූක් 12:30
7 ලූක් 11:2
8 නික් 6:3; ගීතා 83:18; යෙසා 42:8; යෙසා 54:5
9 එස 36:23; එස 38:23
10 දානි 2:44; මතෙ 6:33; එළි 11:15
11 මතෙ 26:42; එළි 4:11
12 ගීතා 37:10; ලූක් 23:43; ක්‍රියා 24:15; 1තිමෝ 2:4
13 ගීතා 37:25; හිතෝ 30:8; මතෙ 6:34; 1තිමෝ 6:8
14 මතෙ 18:21; මාක් 11:25; ලූක් 11:4
15 මතෙ 26:41; 1කොරි 10:13; එළි 3:10
16 ගීතා 82:4; ගීතා 97:10; යොහ 17:15; 1යොහ 5:19

**2 තීරුව**
1 එෆී 4:32; කොලො 3:13
2 මතෙ 18:35; යාකො 2:13
3 සෙක 8:19; ක්‍රියා 13:2; ක්‍රියා 13:3; ක්‍රියා 14:23
4 යෙසා 58:5; සෙක 7:5; ලූක් 18:12
5 දේශ 9:8
6 ගීතා 91:1
7 මතෙ 13:22; ලූක් 12:20; යාකො 5:3
8 මතෙ 19:21; මාක් 10:21; ලූක් 12:33; ලූක් 18:22
9 1පේතෘ 1:4
10 හිතෝ 4:25; ලූක් 11:34; එෆී 1:18
11 මතෙ 5:28; මතෙ 20:15; මාක් 7:22; 2පේතෘ 2:14

---

මතෙ **6:9*** හෝ, “ඔබේ නාමයට ඇති වී තිබෙන කැළැල ඉවත් කරනු ලැබේවා!” **11*** මූ.අ., “රොටි.” **12*** හෝ, “අපේ ණයකාරයන්ට.” **12#** හෝ, “ණයවලටද.”

මතෙ **6:16*** මතෙ 6:2හි පාදසටහන බලන්න. **22*** මූ.අ., “ඔබේ ඇස සරලව.” **23*** මූ.අ., “ඔබේ ඇස දුෂ්ට.”

කළ යුතු ඇස ඔබේ ජීවිතය අඳුරු
කරයි නම් එය කොතරම් භයානක
දෙයක්ද![1]
**24** “ස්වාමිවරුන් දෙදෙනෙකුට
දාසයෙක් වෙන්න කිසිවෙකුටවත්
බැහැ. මන්ද ඔහු එක් කෙනෙකුට
වෛර වී අනික් තැනැත්තාට ප්‍රේම
කරන්න[2] පෙලඹෙයි. නැතහොත් ඔහු
එක් කෙනෙකුට ඇලුම් වී අනික්
තැනැත්තාව හෙළාදකියි. එසේම දෙ-
විට සේවය කරන අතරම ඔබට මුදල්
පසුපස හඹා යන්න බැහැ.[3]
**25** “ඒ නිසා මා ඔබට කියන්-
නේ මෙයයි. කන්නේ බොන්නේ මො-
නවාද කියා සිතමින් ඔබේ ජීවිත
ගැනවත් අඳින්නේ මොනවාද කියා
සිතමින්[4] ඔබේ ශරීර ගැනවත් තවදුර-
ටත් කනස්සලු නොවන්න.[5] කෑමට
වඩා ජීවිතයත් ඇඳුම්වලට වඩා
ශරීරයත් වැදගත් වන්නේ නැද්ද?[6]
**26** අහසේ කුරුල්ලන් දෙස හොඳින්
බලන්න.[7] උන් බීජ වපුරන්නේවත්
කපන්නේවත් ගබඩාවලට රැස් කරන්-
නේවත් නැහැ. නමුත් ස්වර්ගයේ
සිටින ඔබේ පියාණන් උන්ව පෝ-
ෂණය කරනවා. ඔබ උන්ට වඩා
වටින්නේ නැද්ද?[8] **27** කනස්සලු
වුණා කියා තම ආයු කාලය දවස-
කින්වත්* දික් කරගන්න ඔබ අත-
රෙන් කාටවත් පුළුවන්ද?[9] **28** ඔබ
ඇඳුම් ගැන කනස්සලු වන්නේ කුමක-
ටද? තණබිම්වල ලිලී මල් වැවෙන
ආකාරයෙන් පාඩමක් ඉගෙනගන්න.[10]
ඒවා මහන්සි වී වැඩ කරන්නේ-
වත් තමන්ට ඇඳුම් සාදාගන්නේවත්
නැහැ. **29** නමුත් මා ඔබට කියන්-
නේ, මේ මල්වල තිබෙන අලං-
කාරය සලමොන්[11] තම රාජකීය
තේජසින් යුතුව පැළඳ සිටි ඇඳුම්-
වලවත් නොතිබුණු බවයි. **30** අද
තිබී හෙට දවා දමන තණබිමේ
පැළෑටි දෙවි එසේ සරසනවා නම්
ඔහු කෙරෙහි යම් විශ්වාසයක් ඇති
ඔබව පළඳවන්න ඔහු ඊටත් වඩා
සතුටු වන්නේ නැද්ද?[1] **31** එමනිසා
‘කන්නේ බොන්නේ මොනවාද’ කියා-
වත් ‘අඳින්නේ මොනවාද’ කියාවත්
සිතමින් කිසිවිටක කනස්සලු නො-
වන්න.[2] **32** ජනයා මහත් උනන්දු-
වකින් හඹා යන්නේ ඒ දේවල්
පසුපසයි. නමුත් ඒ සියල්ල ඔබට
අවශ්‍ය බව ස්වර්ගයේ සිටින ඔබේ
පියාණන් දන්නා බව මතක තබා-
ගන්න.[3]
**33** “එහෙයින් නොකඩවා දෙවිගේ
රාජ්‍යයටත් ඔහුගේ ධර්මිෂ්ඨ ප්‍රමිතිව-
ලටත්[4] මුල් තැන දෙන්න. එවිට ඔබට
අවශ්‍ය ඒ සියලු දේම ඔබට දෙනු
ලැබෙයි.[5] **34** හෙට දවස ගැන කිසි-
විටක කනස්සලු නොවන්න.[6] මන්ද
හෙට දවසෙත් කරදර තිබෙයි. හැම
දවසකම කරදර තිබෙන බව මතක
තබාගන්න.

**7** “තවදුරටත් අනුන්ව විනිශ්-
චය නොකරන්න.[7] එවිට ඔබ-
වත් විනිශ්චය කරනු ලබන්නේ නැහැ.
**2** මන්ද ඔබ අනුන්ව යම් ආකා-
රයකින් විනිශ්චය කරනවාද එයා-
කාරයෙන්ම ඔබවත් විනිශ්චය කරනු
ලබනවා.[8] ඔබටත් මැන දෙනු
ලබන්නේ ඔබ මනින මිම්මෙන්මයි.[9]
**3** එසේනම් ඔබේ ඇසේ ඇති පරාලය
ගැන නොතකා ඔබේ සහෝදරයාගේ
ඇසේ ඇති රොඩ්ඩ දෙස බලන්නේ
ඇයි?[10] **4** ඔබේ ඇසෙහි පරාලයක්
තිබියදී ඔබේ සහෝදරයාට, ‘ඔබේ
ඇසෙන් රොඩ්ඩ ඉවතට ගන්න මට
ඉඩ දෙන්න’ කියා ඔබට කිව හැක්-
කේ කෙසේද?[11] **5** එය මොන තරම්
කුහකකමක්ද! මුලින්ම ඔබේ ඇසේ
තිබෙන පරාලය ඉවතට ගන්න. එවිට
ඔබේ සහෝදරයාගේ ඇසෙන් රොඩ්ඩ
ඉවතට ගන්න පුළුවන් කෙසේද කියා
ඔබට පැහැදිලිව පෙනෙයි.
**6** “දෙවිට අයිති දේවල් බල්ලන්ට
නොදෙන්න.[12] ඔබේ මුතු ඌරන්
ඉදිරියෙහි නොදමන්න. මන්ද එසේ
කළොත් උන් ඒවා පාගා දමා[13] ඇවිත්
ඔබට අනතුරක් කරයි.

**6 පරි.**

1 යොහ 11:10
2 ලූක් 16:13, රෝම 6:16, යාකො 4:4
3 මතෙ 13:22, ලූක් 16:9
4 ගීතා 55:22, 1තිමෝ 6:8, හෙබ්‍රෙ 13:5, 1පේතෘ 5:7
5 ලූක් 12:22, පිලි 4:6
6 ලූක් 12:23
7 යෝබ් 38:41, ගීතා 147:9, මතෙ 10:29, ලූක් 12:24
8 ද්වි 7:6
9 ගීතා 39:5, ලූක් 12:25
10 ලූක් 12:27
11 1රාජා 10:5

**2 තීරුව**

1 මතෙ 8:26, මතෙ 14:31, මතෙ 16:8, ලූක් 12:28
2 ලූක් 10:41, ලූක් 12:29
3 ලූක් 12:30
4 රෝම 1:17, රෝම 14:17
5 ගීතා 37:25
6 නික් 16:4, නික් 16:19

**7 පරි.**

7 ලූක් 6:37, රෝම 2:1, රෝම 14:13, 1කොරි 4:5
8 මතෙ 18:34, යාකො 2:13
9 මාක් 4:24, ලූක් 6:38, ගලා 6:7
10 ලූක් 6:41
11 ලූක් 6:42
12 හිතෝ 9:7, හිතෝ 15:12, මතෙ 10:14
13 හෙබ්‍රෙ 10:29

මතෙ **6:27*** මූ.අ., “රියනකින්වත්.”

7 "නොකඩවාම ඉල්ලන්න.[1] එවිට
ඔබට දෙනු ලැබෙයි. නොකඩවාම
සොයන්න. එවිට ඔබට සම්බ වෙයි.
නොකඩවාම තට්ටු කරන්න.[2] එවිට
ඔබට විවෘත කර දෙනු ලැබෙයි.
8 මන්ද ඉල්ලමින් සිටින සියල්ලන්ට
ලැබෙයි.[3] සොයමින් සිටින සියල්-
ලන්ට සම්බ වෙයි. තට්ටු කරමින්
සිටින සියල්ලන්ට විවෘත කර දෙනු
ලැබෙයි. 9 ඔබ අතරේ සිටින කිසිම
කෙනෙක් තමන්ගේ පුතා[4] රොටි-
යක් ඉල්ලුවොත් ඔහුට ගලක් දෙයිද?
10 නැත්නම් ඔහු මාළුවෙක් ඉල්-
ලුවොත් සර්පයෙකු දෙයිද? 11 ඔබ
දුෂ්ට වුණත්[5] ඔබේ දරුවන්ට හොඳම
දේ දෙන්නේ කෙසේද කියා ඔබ දන්-
නවා. එසේනම් ස්වර්ගයෙහි සිටින
ඔබේ පියාණන් තමන්ගෙන් ඉල්ලන්-
නන්ට ඊටත් වඩා කොපමණ වැඩි-
යෙන් හොඳම දේ[6] දෙයිද!
12 "අනුන් ඔබට යම් දෙයක් කර-
නවාට ඔබ කැමතිද[7] ඔබත් ඒ දේම
ඔවුන්ට කරන්න. නීතියෙත් අනාගත-
වාක්‍යයෙත් හරය එයයි.[8]
13 "පටු දොරටුවෙන් ඇතුල්
වන්න.[9] මන්ද විනාශය කරා යන පාර
පළල්. එහි බොහෝ ඉඩකඩද තිබෙ-
නවා. එයින් ඇතුල් වන්නන්ද බො-
හෝයි. 14 නමුත් ජීවනය කරා යන
පාරේ අවහිරකම් තිබෙයි. එහි දොරටු-
වත් පටුයි. එය සොයාගන්නේ ස්වල්-
පදෙනෙක් පමණයි.[10]
15 "බොරු අනාගතවක්තෘවරුන්
ගැන සෝදිසියෙන් සිටින්න.[11] ඔවුන්
බැටළු වෙස් ගෙන[12] ඔබ වෙතට
පැමිණියත් ඔවුන් ඇතුළතින් රෞද්‍ර
වෘකයෝයි.[13] 16 නමුත් ඔවුන්ගේ
පලවලින්* ඔබට ඔවුන්ව හඳුනාගත
හැකියි.[14] මිනිසුන් කිසි කලෙක කටු
ගස්වලින් මිදිවත් ගොකටුවලින් අත්-
තික්කා ගෙඩිවත් නෙළාගනියිද?[15]
17 එසේම සෑම හොඳ ගසකින්ම
ලැබෙන්නේ හොඳ පලයි. නමුත් සෑම
නරක ගසකින්ම නෙළාගත හැක්-

**7 පරි.**
1 මාක් 11:24 යාකො 1:5 1යොහ 5:14
2 ලූක් 11:9
3 යෙරෙ 29:12 යොහ 14:13 1යොහ 3:22
4 ලූක් 11:11
5 ලූක් 11:13
6 යාකො 1:17
7 ලූක් 6:31
8 රෝම 13:10 ගලා 5:14 1තිමෝ 1:5
9 ලූක් 13:24
10 ක්‍රියා 14:22 1පේත 4:18
11 මතෙ 24:11 2පේත 2:1 1යොහ 4:1
12 ලූක් 6:26
13 එස 22:27 ක්‍රියා 20:29
14 හිතෝ 20:11 රෝම 16:17 ගලා 5:19
15 උත් 1:11 ලූක් 6:44 යාකො 3:12

**2 තීරුව**
1 මතෙ 12:33 ලූක් 6:43
2 මතෙ 3:10 ලූක් 13:9 යොහ 15:2 තීත 3:14
3 මතෙ 12:33
4 මතෙ 21:29 රෝම 2:13 යාකො 1:22 1යොහ 5:3
5 1යොහ 2:17
6 ලූක් 6:46
7 යෙරෙ 14:14 යෙරෙ 27:15
8 ලූක් 13:25
9 ගීතා 6:8 ලූක් 13:27 1යොහ 3:4
10 ලූක් 6:47 ලූක් 6:48 යාකො 1:25
11 ලූක් 6:49 යාකො 1:23
12 යෙරෙ 8:9
13 එස 13:13 1කොරි 3:13
14 ලූක් 6:49
15 මාක් 1:22 ලූක් 4:32

කේ කිසි වැඩකට නැති පලයි.[1]
18 හොඳ ගසකට වැඩකට නැති පල
දරන්නවත් නරක ගසකට හොඳ පල
දරන්නවත් බැහැ. 19 හොඳ පල
නොදරන සෑම ගසක්ම කපා ගින්නට
දමනු ලබයි.[2] 20 ඒ හා සමානව ඒ
බොරු අනාගතවක්තෘවරුන්ව හඳු-
නාගත හැකි වන්නෙත් ඔවුන්ගේ පල-
වලින්* පමණයි.[3]
21 "ස්වර්ගයෙහි සිටින මගේ පියා-
ණන්ගේ කැමැත්ත කරන්නා[4] මිස
මට 'ස්වාමීනි, ස්වාමීනි' කියන සිය-
ලුදෙනාටම ස්වර්ග රාජ්‍යයට ඇතුල්
වෙන්න[5] ලැබෙන්නේ නැහැ. 22 ඒ
දවසේදී බොහෝදෙනෙක්, 'ස්වාමීනි,
ස්වාමීනි,[6] අපි ඔබේ නාමයෙන් අනා-
වැකි කිව්වේ නැද්ද? ඔබේ නාමයෙන්
භූතයන් දුරු කළේ නැද්ද? ඔබේ නාම-
යෙන්[7] නොයෙක් බලවත් ක්‍රියා කළේ
නැද්ද' කියා මගෙන් අසයි. 23 එවිට
මම ඔවුන්ට පවසන්නේ මෙයයි. මම
ඔබව කිසි කලක හඳුනාගෙන සිටියේ
නැහැ![8] අධර්මිෂ්ඨ ක්‍රියා කරන්නෙනි,[9]
මා වෙතින් අහක්ව යන්න.
24 "මගේ මේ වචන අසා ඒවා පිළි-
පදින සෑම කෙනෙක්ම පර්වතයක්
මත තම ගෙය ගොඩනැඟූ නුවණැති
මිනිසෙකුට සමානයි.[10] 25 වැසි
වැස, ගංවතුර ගලා, තද සුළං හමා, ඒ
ගෙට ගැසුවත් එය පර්වතයක් මත
ගොඩනඟා තිබුණු නිසා එය බිඳ වැටු-
ණේ නැහැ. 26 මගේ මේ වචන අසා
ඒවා පිළිපදින්නේ නැති[11] සෑම කෙ-
නෙක්ම වැලි මත තම ගෙය ගො-
ඩනැඟූ නුවණ නැති මිනිසෙකුට[12]
සමානයි. 27 ඒ ගෙය වැස්සෙන්ද
ගංවතුරෙන්ද සුළඟින්ද පහර ලැබූ
විට[13] කිසිවක් ඉතුරු නොවන සේ එය
මුළුමනින්ම බිඳ වැටුණා."[14]
28 යේසුස් ඒ වචන කියා නිම වූ
පසු සමූහයා ඔහු උගන්වන ආකාරය
ගැන මවිත වූහ.[15] 29 ඔහු ඉගැන්වූ-
යේ නීතිය පිටපත් කරන්නන්ට වඩා
වෙනස්වය. එම වෙනසට හේතු වූයේ

මතෙ **7:16*** එනම්, ක්‍රියාවලින්.

මතෙ **7:20*** එනම්, ක්‍රියාවලින්.

ඔහු දෙවි මත රඳා සිටිමින්[1] ඉගැන්වූ
නිසාය.*

8 යේසුස් කන්දෙන් බැස ආ පසු
මහත් සමූහයක් ඔහු පසුපස
ගියෝය. 2 එවිට ලාදුරු රෝග-
යෙන් පෙළුණු මිනිසෙක්[2] ඇවිත් ඔහු
ඉදිරියේ දණින් වැටී, “ස්වාමීනි, ඔබ
කැමති නම් ඔබට පුළුවන් මාව පවිත්‍ර
කරන්න” යයි කීවේය. 3 එහෙ-
යින් ඔහු තම අත දිගු කර ඔහුව
ස්පර්ශ කරමින්, “මා කැමතියි. පවිත්‍ර
වෙන්න”[3] යයි කීවේය. ඒ මොහොතේ-
දීම ඔහුට තිබූ ලාදුරු රෝගය සුව
විය.[4] 4 එවිට යේසුස්, “මේ ගැන
කාටවත් කියන්න එපා.[5] ගොස් පූජ-
කයා ඉදිරියේ පෙනී සිට[6] ඔහුට ඔබව
පරීක්ෂා කරන්න ඉඩ දෙන්න. ඉන්-
පසු මෝසෙස් අණ කළ පූජාව ඔප්පු
කරන්න.[7] එය ඔබ සුව වී ඇති බවට
පූජකයන්ට සාක්ෂියක් වෙයි” කියා
ඔහුට කීවේය.

5 යේසුස් කපර්ණවුමට ඇතුල් වූ
විට[8] හමුදා නිලධාරියෙක් ඔහු වෙ-
තට ඇවිත් බැගෑපත්ව, 6 “ස්වා-
මීනි, මගේ මෙහෙකරුවා අංශභාග
රෝගය නිසා ඔත්පළ වෙලා මහත්
සේ දුක් විඳිනවා” කියා පැවසුවේය.
7 යේසුස්ද, “මම එතැනට ඇවිත්
ඔහුව සුව කරන්නම්” කියා කීවේය.
8 එවිට හමුදා නිලධාරියා මෙසේ
කීවේය. “ස්වාමීනි, ඔබ මගේ වහල
යටට ඒමට තරම්වත් මම සුදුස්-
සෙක් නොවෙයි. ඔබ මෙතනදීම
ඔහුට සුව වෙන්න එක වචනයක්
කිව්වත් මගේ මෙහෙකරුවා සුව
වෙයි. 9 මන්ද මාත් බලධාරීන් යට-
තේ සේවය කරන මිනිසෙක්. මා
යටතෙත් භේවායෝ සිටිනවා. මා
කෙනෙකුට ‘යන්න’[9] කියා පැවසු-
වොත් ඔහු යයි. වෙන කෙනෙ-
කුට ‘එන්න’ කියා පැවසුවොත් ඔහු
එයි. මගේ දාසයාට ‘මෙය කරන්න’
කියා කිව්වොත් ඔහු එය කරයි.”
10 මෙය අසා යේසුස් විස්මයට පත්
විය. එවිට තමා පසුපස පැමිණි
අයට ඔහු මෙසේ කීවේය. “ඇත්-
තෙන්ම මා ඔබට කියන්නේ, ඊශ්‍රායෙ-
ලයේ සිටින කිසිවෙකු තුළ මෙතරම්
විශ්වාසයක් මා දුටුවේ නැති බවයි.[1]
11 මා කියන මේ දේත් සැලකිල්ලට
ගන්න. බොහෝ පිරිසක් නැඟෙනහිර
දෙසින්ද බස්නාහිර දෙසින්ද[2] ඇවිත්
ස්වර්ග[3] රාජ්‍යයෙහි[4] ආබ්‍රහම්ද ඊසාක්ද
යාකොබ්ද සමඟ එකම මේසයෙහි
ඉඳගනියි. 12 නමුත් රාජ්‍යය හිමි
වීමට සිටි පුත්‍රයන්ව[5] පිටත අන්ධකා-
රයට හෙළාදමනු ලබයි. එහිදී ඔවුන්ට
සිදු වන්නේ අඬමින් හා දත්මිටි
කමින් කල් ගෙවන්නයි.”[6] 13 ඉන්-
පසු යේසුස් හමුදා නිලධාරියාට මෙසේ
කීවේය. “යන්න. ඔබේ විශ්වාසය නිසා
ඔබ බලාපොරොත්තු වූ දේ අනිවාර්ය-
යෙන්ම ඉටු වෙයි.”[7] ඒ පැයේදීම මෙ-
හෙකරුවා සුවය ලැබුවේය.

14 යේසුස්, පේතෘස්ගේ ගෙට
ඇතුල් වූ විට ඔහුගේ බිරිඳගේ මවට[8]
උණ රෝගයක් වැලඳී[9] ඇය ඇඳට
වී සිටිනවා දුටුවේය. 15 ඔහු ඇගේ
අත ස්පර්ශ කළ විට[10] ඇගේ උණ
රෝගය සුව වූ අතර ඇය නැඟිට
ඔහුට සංග්‍රහ කරන්න පටන්ගත්-
තාය.[11] 16 සවස් වූ විට භූතයන්
ආවේශ වූ බොහෝදෙනෙකුව ඔහු වෙ-
තට ගෙනෙන ලදි. ඔහු අණ කළ
පමණින් ඒ භූතයන් දුරු වූ අතර
ඔහු අසනීපව සිටි සියල්ලන්වද සුව
කළේය. 17 එසේ වූයේ අනාගත-
වක්තෘ යෙසායා මාර්ගයෙන් කී මේ
දේ ඉටු වීම සඳහාය. එනම්, “ඔහු තම
කරපිට උසුලාගෙන ගියේ අපේ ලෙඩ
රෝගයි.”[12]

18 තමන් වටා විශාල සමූහයක්
එක් රොක් වී සිටිනවා දුටු යේ-
සුස්, එගොඩට[13] ඔරුව පදවන්න
කියා කීවේය. 19 එවිට නීතිය පිට-
පත් කරන්නෙක් ඔහු වෙතට
පැමිණ, “ගුරුතුමනි, ඔබ යන ඕනෑම

**7 පරි.**
1 යොහ 7:46

**8 පරි.**
2 මාක් 1:40
ලූක් 5:12
3 මාක් 1:41
4 නික් 4:7
යෙසා 53:4
5 මතෙ 9:30
මතෙ 12:16
මාක් 7:36
ලූක් 5:14
6 ලෙවී 13:49
ලෙවී 14:2
ලූක් 17:14
7 ලෙවී 14:4
ලෙවී 14:20
මාක් 1:44
ලූක් 5:14
8 ලූක් 7:1
9 ක්‍රියා 10:7

**2 තීරුව**
1 මතෙ 15:28
ලූක් 7:9
2 යෙසා 49:12
3 මතෙ 11:12
4 ලූක් 13:29
5 මතෙ 25:30
6 මතෙ 22:13
මතෙ 24:51
ලූක් 13:28
7 මතෙ 9:29
මතෙ 15:28
මාක් 9:23
ලූක් 7:10
8 1කොරි 9:5
9 මාක් 1:30
ලූක් 4:38
10 මාක් 5:41
ක්‍රියා 3:7
11 මාක් 1:31
ලූක් 4:38
ලූක් 4:39
12 යෙසා 53:4
යොහ 1:29
13 මාක් 4:35
ලූක් 8:22

මතෙ **7:29*** යේසුස් වෙනත් ගුරුවරුන්ගේ ඉගැන්වීම්වලින් උපුටා දැක්වූයේ නැති අතර දෙවි සහ ඔහුගේ වචනයේ නියෝජිතයෙකු ලෙස ඉගැන්වූයේය.

තැනකට මමත් ඔබ අනුව එන්න
කැමතියි”[1] කියා කීවේය. **20** නමුත්
යේසුස් ඔහුට මෙසේ කීවේය. “හිව-
ලුන්ට ගුහා තිබුණත් අහසේ
කුරුල්ලන්ට ලගින්න තැන් තිබුණත්
මනුෂ්‍ය පුත්‍රයාට තම හිස තබන්න-
වත් තැනක් නැහැ.”[2] **21** එවිට
ගෝලයන්ගෙන් කෙනෙක් ඇවිත්
“ස්වාමීනි, මගේ පියාව තැන්පත්
කරන තුරු මට කල් දෙන්න” කියා
කීවේය. **22** යේසුස් ඔහුට මෙසේ
කීවේය. “දිගටම මා අනුව එන්න. මිය
ගිය අයව තැන්පත් කරන්න මිය ගිය
අයටම ඉඩහරින්න.”[3]

**23** ඔහු ඔරුවකට නැඟුණු විට[4]
ඔහුගේ ගෝලයෝද ඔහු සමඟ
ගියෝය. **24** ටික වේලාවකින් ඔරුව
කුණාටුවකට හසු විය. ඔරුව රළ පහ-
රින් වැසී යන තරම් එය බිහිසුණු
එකක් විය. නමුත් යේසුස් සිටියේ
නිදාගෙනය.[5] **25** එවිට ඔවුහු ඇවිත්
ඔහුව අවදි කරමින්,[6] “ස්වාමීනි, අපව
බේරගන්න. අපිව ගිලෙන්නයි යන්-
නේ” කියා පැවසුවෝය. **26** නමුත්
ඔහු, “ඇයි ඔබ මේ තරම් භය වෙලා?
ඔබේ විශ්වාසය අඩු වෙලාද”[7] කියා
ඇසුවේය. පසුව ඔහු නැඟිට, සුළඟ-
ටත් මුහුදටත් තදින් කතා කළේය.
එවිට මහත් නිශ්චලතාවක් ඇති විය.[8]
**27** ඔවුහු මහත් පුදුමයකින්, “ඇත්ත-
ටම මොහු කවුද?[9] සුළඟත් මුහුදත්
ඔහුට කීකරු වෙනවා” කියා පැවසු-
වෝය.

**28** ඔහු එගොඩ තිබුණු ගදරීන-
යන්ගේ පළාතට[10] පැමිණියේය. එවිට
සොහොන් ගෙවල් අතරින් නික්ම
ආ භූතයන් ආවේශ වූ මිනිසුන් දෙ-
දෙනෙක්[11] ඔහු වෙතට පැමිණියහ.
ඔවුන් ඉතා දරුණු වූ නිසා ඒ පාරෙන්
යන්න කිසිවෙකුටවත් ධෛර්යයක්
තිබුණේ නැත. **29** ඔවුහු කෑගස-
මින්, “දෙවිගේ පුත්‍රය,[12] ඔබ හා අප
අතර කිසිම ගනු දෙනුවක් නැහැ!
ඉතින් ඔබ මෙතැනට ආවේ නියමිත
කාලයට කලින්[13] අපට වධ දෙන්-
නද”[14] කියා ඇසූහ. **30** මේ අතර
ඔවුන්ට සැහෙන ඈතකින් තිබූ තණ-
බිමක විශාල ඌරු රැළක් සිටියහ.
**31** එහෙයින් භූතයෝ, “ඔබ අපව
දුරු කරනවා නම් ඒ ඌරු රැළට
වැහෙන්න අපට ඉඩ දෙන්න”[1] කියා
ඔහුගෙන් බැගෑපත්ව ඉල්ලා සිටියහ.
**32** එමනිසා ඔහු, “පිටත්ව යන්න”
කියා ඔවුන්ට පැවසුවේය. එවිට ඔවුහු
ඒ මිනිසුන්ගෙන් පිට වී ඌරන්ට වැහු-
ණෝය. මුළු ඌරු රැළම වේගයෙන්
දුව ගොස් ප්‍රපාතයකින් දියට වැටී මිය
ගියෝය.[2] **33** එම සතුන් රැකබලා
ගත් අය එතැනින් පලා ගොස් නුවරට
ඇතුල් වී භූතයන් ආවේශ වූ මිනි-
සුන්ට සිදු වූ දේ ඇතුළුව සිද්ධියට
අදාළ සියලු තොරතුරු ගැන නුව-
රේ වැසියන්ට කීවෝය. **34** එවිට ඒ
නුවරේ සියලු වැසියෝ යේසුස්ව හමු
වෙන්න ඇවිත් ඔහුගෙන් ඉතා ඕනෑක-
මින් ඉල්ලා සිටියේ තම ප්‍රදේශවලින්
පිට වී යන ලෙසයි.[3]

**9** එහෙයින් ඔහු ඔරුවට නැඟී,
එගොඩ වී තම නුවරට ගියේය.[4]
**2** එවිට පිරිසක් අංශභාග රෝගි-
යෙකුව ඇඳක තබා[5] ඔහු වෙතට
ගෙනාවෝය. යේසුස් ඔවුන්ගේ විශ්වා-
සය දැක අංශභාග රෝගියාට, “පුතේ,
ධෛර්යවත් වන්න. දැන් ඔබේ පව්ව-
ලට සමාව ලැබී තිබෙනවා”[6]
කියා කීවේය. **3** සෙනඟ අතර සිටි
නීතිය පිටපත් කරන්නන් කිහිපදෙ-
නෙක්, “මොහු දෙවිට අපහාස කර-
නවා”[7] කියා තමන්ටම කියාගත්හ.
**4** ඔවුන් සිතූ දේ තේරුම්ගත් යේසුස්[8]
ඔවුන්ට මෙසේ කීවේය. “ඔබ එවැනි
දුෂ්ට දෙයක් ගැන සිතන්නේ ඇයි?[9]
**5** වඩාත් පහසු ඔබේ පව්වලට සමාව
ලැබී තිබෙනවා කියා කීමද? නැත්-
නම් නැඟිට ඇවිදින්න කියා කීමද?[10]
**6** පොළොවේ පව්වලට සමාව දෙන්න
මනුෂ්‍ය පුත්‍රයාට අධිකාරියක් තිබෙ-
නවා.[11] ඒ බව ඔබත් දැනගන්න-
වාට මා කැමතියි. . . .” ඉන්පසු
ඔහු අංශභාග රෝගියාට, “නැඟිට,
ඔබේ ඇඳත් රැගෙන ගෙදර යන්න”[12]
කියා කීවේය. **7** එවිට ඔහු නැඟිට

**8 පරි.**
1 ලූක් 9:57
2 ලූක් 9:58; 2කොරි 8:9
3 ලූක් 9:60; යොහ 1:43; රෝම 6:13
4 මාක් 4:36
5 ගීතා 4:8; ලූක් 8:23
6 මාක් 4:38
7 මතෙ 14:31; මාක් 4:40
8 ගීතා 65:7; ගීතා 89:9; ගීතා 107:29; ලූක් 8:25
9 මාක් 4:41
10 ලූක් 8:26
11 මාක් 5:2; ලූක් 8:27
12 1රාජා 17:18; ලූක් 4:34; ලූක් 4:41; ලූක් 8:28
13 යූද් 6
14 මාක් 1:24; යාකො 2:19

**2 තීරුව**
1 අවි 14:8; යෙසා 65:4
2 මාක් 5:13; ලූක් 8:33
3 මාක් 5:17; ලූක් 8:37; ක්‍රියා 16:39

**9 පරි.**
4 මතෙ 4:13; මාක් 2:1; ලූක් 8:37
5 මාක් 2:3; ලූක් 5:18; ලූක් 5:19
6 මාක් 2:5; මාක් 2:9; ලූක් 5:20
7 මතෙ 26:65; මාක් 2:7; ලූක් 5:21
8 මතෙ 12:25; මාක් 2:8
9 සෙක 8:17; යොහ 2:25
10 මාක් 2:9
11 මාක් 2:10; ලූක් 5:24
12 මාක් 2:11; යොහ 5:8

තම නිවස බලා ගියේය. **8** මෙය දුටු
සමූහයා පුදුම වී, එවැනි බලයක් මිනි-
සෙකුට දුන්[1] දෙවිට ප්‍රශංසා කළෝය.[2]
**9** ඊළඟට යේසුස් එතැනින්
පිටත්ව යද්දී, මතෙව් නම් මිනිසෙකු
බදු එකතු කිරීමේ කාර්යාලයේ ඉඳ-
ගෙන සිටිනවා දැක, “මගේ අනුගාමි-
කයෙක් වන්න”[3] කියා ඔහුට කීවේය.
එවිට ඔහු නැඟිට, ඔහු අනුව ගියේය.[4]
**10** පසුව යේසුස් මතෙව්ගේ නිවසෙහි
කෑමට ඉඳගෙන සිටියදී[5] බදු එකතු
කරන්නන්ද පව්කාරයන්ද බොහෝ-
දෙනෙක් ඇවිත් යේසුස් සහ
ඔහුගේ ගෝලයන් සමඟ ඉඳගත්හ.
**11** නමුත් පරිසිවරු එය දැක, “ඔබේ
ගුරුතුමා බදු එකතු කරන්නන් හා
පව්කාරයන් සමඟ එකට ඉඳගෙන
කෑම කන්නේ ඇයි”[6] කියා යේසුස්ගේ
ගෝලයන්ගෙන් ඇසූහ. **12** එවිට
යේසුස් මෙසේ කීවේය. “රෝගීන්ට
මිස නිරෝගීන්ට වෛද්‍යවරයෙකු-
ගෙන් පලක් නැහැ.[7] **13** එසේනම්
ගොස්, ‘මට වටින්නේ දයාව මිස
පූජාව නොවෙයි’[8] යන කියමනේ
නියම අර්ථය තේරුම්ගන්න. මන්ද
මා ආවේ පව්කාරයන්ට උපකාර
කරන්න මිස ධර්මිෂ්ඨයන්ට උපකාර
කරන්න නොවෙයි.”
**14** එවිට යොහන්ගේ ගෝලයෝ
ඔහු වෙතට ඇවිත්, “අපත් පරි-
සිවරුනුත් සිරිතක් ලෙස නිරාහා-
රව සිටිනවා. නමුත් ඔබේ ගෝලයන්
නිරාහාරව නොසිටින්නේ ඇයි”[9] කියා
ඇසූහ. **15** එවිට යේසුස් ඔවුන්ට
මෙසේ කීවේය. “මනාලයා[10] තමන්
සමඟ සිටින විට මනාලයාගේ මිතු-
රන්ට ශෝක වෙන්න හේතුවක් තිබෙ-
නවාද? නමුත් මනාලයාව ඔවුන්ගෙන්
වෙන් කරනු ලබන දවස්[11] පැමි-
ණෙනවා. එවිට ඔවුන් නිරාහාරව
සිටියි.[12] **16** කිසි කෙනෙක් අලුත්
රෙදි කැබැල්ලක් තබා පරණ වස්-
ත්‍රයක ඉරුණු තැනක් මහන්නේ
නැහැ. මන්ද එසේ කළොත් එම රෙදි
කැබැල්ල වඩා ශක්තිමත් නිසා එය

**9 පරි.**
1 යොහ 17:2
2 මාක් 2:12 ලූක් 5:26 ක්‍රියා 4:21
3 මාක් 2:14
4 ලූක් 5:27 ලූක් 5:28
5 ලූක් 5:29
6 මාක් 2:15 මාක් 2:16 ලූක් 5:30 ලූක් 7:39 ලූක් 15:2 ලූක් 19:7
7 ලූක් 4:23 ලූක් 5:31
8 හිතෝ 21:3 හොෂෙ 6:6 මතෙ 12:7
9 මාක් 2:18 ලූක් 5:33 ලූක් 18:12
10 මතෙ 22:2 මාක් 2:19 ලූක් 5:34 යොහ 3:29 එළි 21:2
11 මතෙ 26:2 ලූක් 17:22
12 මාක් 2:20 ලූක් 5:35

**2 තීරුව**
1 මාක් 2:21 ලූක් 5:36
2 මාක් 2:22 ලූක් 5:37 ලූක් 5:38
3 යෝබ් 32:19
4 මාක් 5:22
5 ලූක් 8:41
6 ලූක් 8:42
7 ලූක් 4:40 යොහ 11:25
8 ලෙවී 15:25 මාක් 5:25
9 මතෙ 14:36 මාක් 6:56
10 ලෙවී 6:27 ලූක් 8:44
11 මාක් 10:52 ලූක් 7:50 ලූක් 17:19 ලූක් 18:42 ක්‍රියා 14:9
12 යොහ 4:53
13 මාක් 5:38 ලූක් 8:51
14 ලූක් 8:52
15 මාක් 5:39 යොහ 11:11
16 මාක් 5:40
17 මාක් 9:27
18 ලූක් 8:55
19 මතෙ 20:30

ඇදී යෑමෙන් ඉරුම තවත් වැඩි වෙයි.[1]
**17** ඒ වගේම කිසි කෙනෙක් අලුත්
වයින් පරණ සම් භාජනවලට දමන්-
නෙත් නැහැ. එසේ කළොත් ඒ සම්
භාජන පැළී, වයින් ඉහිරී සම් භාජන
නාස්ති වී යයි.[2] අලුත් වයින් දමන්නේ
අලුත් සම් භාජනවලටයි. එවිට ඒ දෙ-
කම ආරක්ෂා වෙයි.”[3]
**18** ඔහු ඔවුන්ට ඒ දේවල් කියමින්
සිටියදී එක්තරා ප්‍රධානියෙක්[4] ඇවිත්
ඔහු ඉදිරියේ දණින් වැටී,[5] “මේ වන
විටත් මගේ දුව මිය ගිහින් ඇති.[6]
නමුත් ඔබ ඇවිත් ඇය පිට අත තැබු-
වොත් ඇය ජීවත් වෙයි”[7] කියා පැව-
සුවේය.
**19** එවිට යේසුස් නැඟිට ඔහු සමඟ
ගියේය. ඔහුගේ ගෝලයෝද ඔහු පසු-
පස ගියෝය. **20** ඒ අතරවාරයේදී
අවුරුදු දොළහක් පුරා ලේ ගැලීමක්[8]
නිසා දුක් විඳිමින් සිටි ස්ත්‍රියක් පිටුප-
සින් ඇවිත් ඔහුගේ වස්ත්‍රයේ වාටිය
ඇල්ලුවාය.[9] **21** එසේ කළේ, “ඔහු-
ගේ වස්ත්‍රය විතරක් ඇල්ලුවත් ඇති.
එයින් මාව සුව වෙයි”[10] කියා ඇය
නිරතුරුවම සිතූ නිසාය. **22** එවිට
යේසුස් හැරී ඇයව දැක, “දුවේ, හය
වෙන්න එපා. ඔබට සුවය ලැබුණේ
ඔබ තුළ තිබූ විශ්වාසය නිසයි”[11] කියා
කීවේය. ඒ පැයේදීම ඒ ස්ත්‍රියට සුවය
ලැබිණ.[12]
**23** ඔහු ප්‍රධානියාගේ නිවසට[13]
ඇතුල් වූ විට නළාකාරයන්වද විය-
වුල් වී හඬා වැලපෙමින් සිටි සමූහ-
යාවද[14] දුටුවේය. **24** එවිට යේසුස්,
“සියලුදෙනාම එළියට යන්න. දැරිය
මිය ගිහින් නැහැ. ඇය නිදාගෙනයි
සිටින්නේ”[15] කියා කීවේය. එවිට ඔවුහු
උපහාසාත්මක ලෙස ඔහුට සිනා-
සුණෝය.[16] **25** සමූහයාව එතැනින්
පිට කරනු ලැබූ විගස ඔහු නිවස ඇතු-
ළට ගොස් ඇගේ අත ඇල්ලුවේය.[17]
එවිට දැරිය නැඟිට්ටාය.[18] **26** මෙම
සිද්ධිය පිළිබඳ පුවත ඒ මුළු පළාත
පුරාම පැතිර ගියේය.
**27** යේසුස් එතැනින් පිටත්ව
යද්දී අන්ධ මිනිස්සු දෙදෙනෙක්,[19]

“දාවිත්ගේ පුත්‍රය, අපට අනුකම්පා
කරන්න”[1] කියා කෑගසමින් ඔහු පසු-
පස ආවෝය. 28 ඔහු ගෙට ඇතුල්
වූ විට ඒ අන්ධ මිනිස්සු ඔහු ළඟ-
ටම ආවෝය. යේසුස්, “මට මේ
දේ කළ හැකි බව ඔබට විශ්වා-
සද”[2] කියා ඔවුන්ගෙන් ඇසුවේය.
“ඔව්, ස්වාමීනි” කියා ඔවුහු පිළිතුරු
දුන්නෝය. 29 එවිට ඔහු ඔවුන්ගේ
ඇස් ස්පර්ශ කරමින්,[3] “ඔබේ විශ්වා-
සය නිසා ඔබ බලාපොරොත්තු වූ දේ
ඉටු වෙයි” කියා කීවේය. 30 එවිට
ඔවුන්ට පෙනීම ලැබිණ. “මේ ගැන
කාටවත් කියන්න එපා”[4] කියා යේ-
සුස් ඔවුන්ට තදින් අණ කළේය.
31 නමුත් එතැනින් පිටත්ව ගිය
ඔවුහු, යේසුස් කළ දේ ගැන ඒ මුළු
පළාත පුරාම ප්‍රසිද්ධ කළහ.[5]

32 ඔවුන් එතැනින් පිටත්ව යද්දී
භූතයෙකු ආවේශ වූ ගොළු මිනිසෙ-
කුව[6] යේසුස් වෙතට ගෙනෙන ලදී.
33 භූතයාව දුරු කළ පසු ගොළු
මිනිසා කතා කළේය.[7] පුදුමයට පත්
සමූහයා,[8] “කිසිම දවසක ඊශ්‍රායෙලයේ
මේ වගේ දෙයක් නම් දැක තිබුණේ
නැහැ” කියා කීවෝය. 34 නමුත්
පරිසිවරු මෙසේ කියන්න පටන්ගත්-
තෝය. “ඔහු භූතයන් දුරු කරන්-
නේ භූතයන්ගේ පාලකයා ඔහුට උදව්
කරන නිසයි.”[9]

35 යේසුස් ඔවුන්ගේ සිනගෝග-
වල උගන්වමින්ද රාජ්‍යයේ ශුභාරං-
චිය දේශනා කරමින්ද සියලු ආකාර
රෝග සහ ආබාධ සුව කරමින්ද[10]
සියලු නුවරවලද ගම්වලද සංචා-
රය කළේය. 36 ඔහු සමූහයන් දුටු
විට ඔවුන් එඬේරෙකු නැති බැට-
ළුවන් මෙන්[11] දරුණු ලෙස හිරි-
හැර විඳිමින් විසිර ගොස් සිටින අය
බව තේරුම්ගත්තේය. ඒ නිසා ඔහුට
ඔවුන් කෙරෙහි අනුකම්පාවක් ඇති
විය.[12] 37 එහෙයින් ඔහු තම ගෝ-
ලයන්ට මෙසේ කීවේය. “අස්වැන්න
නම් විශාලයි. නමුත් වැඩකරුවන්
සිටින්නේ ස්වල්පදෙනෙකු පමණයි.[13]
38 එමනිසා අස්වැන්න නෙළීමට[14]

**9 පරි.**
1 මතෙ 15:22
මතෙ 20:33
හෙබ්‍රෙ 2:17
2 ක්‍රියා 14:9
3 මතෙ 20:34
4 යෙසා 42:2
මතෙ 12:16
මාක් 1:44
ලූක් 5:14
5 මාක් 1:45
මාක් 7:36
6 මතෙ 12:22
ලූක් 11:14
7 මතෙ 15:31
8 මාක් 2:12
9 මතෙ 12:24
මාක් 3:22
ලූක් 11:15
10 මතෙ 4:23
ලූක් 9:11
11 ගණන් 27:17
1රාජා 22:17
එස 34:5
මාක් 6:34
12 මතෙ 14:14
හෙබ්‍රෙ 4:15
13 ලූක් 10:2
යොහ 4:35
14 මතෙ 13:39
රෝම 10:15

**2 තීරුව**

**10 පරි.**
1 මාක් 3:14
මාක් 3:15
මාක් 6:7
ලූක් 9:1
2 එළි 21:14
3 මාක් 3:16
ලූක් 6:13
ක්‍රියා 1:13
4 යොහ 1:42
ක්‍රියා 15:14
5 මාක් 1:16
යොහ 1:40
6 මතෙ 4:21
මාක් 3:17
7 මාක් 3:18
ලූක් 6:14
යොහ 1:45
8 යොහ 11:16
යොහ 20:27
9 මාක් 2:14
ලූක් 5:27
10 ලූක් 6:15
11 මාක් 3:18
12 ගීතා 41:9
මතෙ 26:47
යොහ 13:18
13 මතෙ 28:19
මාක් 6:7
ලූක් 9:2
14 2රාජා 17:24
ලූක් 9:52
යොහ 4:9

වැඩකරුවන්ව එවන්න කියා අස්-
වැන්නේ ස්වාමියාට කන්නලව්
කරන්න.”

**10** ඔහු තම ගෝලයන් දො-
ළොස්දෙනා කැඳවා, භූත-
යන්ව දුරු කිරීමටත්[1] සියලු ආකාර
රෝග සහ ආබාධ සුව කිරීමටත්
අවශ්‍ය බලය ඔවුන්ට දුන්නේය.
2 යේසුස්ගේ නියෝජිතයන්*[2]
ලෙස පත් කළ ගෝලයන් දොළොස්-
දෙනාගේ නම් මතු දැක්වේ.[3] පළ-
මුව පේතෘස්[4] යන නමින්ද හැඳින්වූ
සීමොන් සහ ඔහුගේ සහෝදර අන්-
ද්‍රෑය.[5] සෙබදීගේ පුත්[6] යාකොබ් සහ
ඔහුගේ සහෝදර යොහන්ය.
3 පිලිප් සහ බාතොලමෙව්ය.[7] තෝ-
මස්[8] සහ බදු එකතු කරන මතෙව්ය.[9]
අල්ෆෙවුස්ගේ පුත් යාකොබ්[10] සහ
තදියස්ය. 4 මහත් උද්‍යෝගයකින්
දේවල් කිරීමට ප්‍රසිද්ධව සිටි සීමොන්[11]
සහ පසුව යේසුස්ට ද්‍රෝහි වූ යුදස් ඉස්-
කාරියොත්ය.[12]

5 එම දොළොස්දෙනාව පිටත් කර
යැවූ යේසුස් ඔවුන්ට මෙසේ අණ
කළේය.[13] “වෙනත් ජාතීන් සිටින
පළාත්වලට යන මාවත් දිගේ යන්න
එපා. සමාරියේ කිසි නුවරකටවත්
ඇතුල් වෙන්න එපා.[14] 6 ඒ වෙ-
නුවට ඊශ්‍රායෙල් වංශයේ නැති
වූ බැටළුවන් වෙතට නොකඩවාම
යන්න.[15] 7 එසේ යන අතරතුරේදී
‘ස්වර්ග රාජ්‍යය ළං වී ඇත’[16] කියා
දේශනා කරන්න. 8 ලෙඩුන්ව සුව
කරන්න.[17] මිය ගිය අයව නැඟි-
ටුවන්න. ලාදුරු රෝගීන්ව පවිත්‍ර
කරන්න. භූතයන්ව දුරු කරන්න.
ඔබට එසේ කිරීමට බලය ලැබු-
ණේ නොමිලේ. ඒ නිසා නොමිලේම
දෙන්න.[18] 9 ඔබේ ඉහටියේ බැඳ-
ගත් පසුම්බිවල රන් හා රිදී කාසිවත්
තඹ කාසිවත් ගෙන යන්න එපා.[19]

**15** යෙසා 53:6; යෙරෙ 50:6; එස 34:6; ක්‍රියා 13:46;
**16** මතෙ 4:17; ලූක් 10:9; **17** ලූක් 9:2; **18** ක්‍රියා 8:20;
**19** ලූක් 22:35; 1කොරි 9:7.

මතෙ **10:2*** හෝ, “යවනු ලැබූවන්.”

10 ගමන සඳහා අමතර ඇතුල් වස්-
ත්‍රයක්වත් පාවහන්වත් සැරයටියක්-
වත් කෑම මල්ලක්වත් ගෙන යන්න
එපා. මන්ද වැඩකරුවාට ආහාර
ලැබිය යුතුයි.[1]
11 “ඔබ යම් නුවරකට හෝ ගම-
කට හෝ ඇතුල් වූ විට එහි සුදුස්-
සන්ව සොයන්න. එයින් පිටත්ව යන
තුරුම ඔවුන් සමඟ නැවතී සිටින්න.[2]
12 ඔබ නිවසකට ඇතුල් වෙද්දී ගෙයි
වැසියන්ට සුබ පතන්න. 13 ගෙයි
වැසියන් සුදුස්සන් නම් ඔබ පතන
සාමය ඔවුන් පිට පැමිණෙයි.[3] නමුත්
ඔවුන් සුදුස්සන් නොවෙයි නම් ඔබ
පැතූ සාමය නැවත ඔබ පිට පැමි-
ණෙයි. 14 යම් කිසි තැනක කෙ-
නෙක් ඔබව පිළිගන්නේ නැත්නම්
හෝ ඔබේ වදන්වලට සවන් දෙන්නේ
නැත්නම් ඒ නිවසින් හෝ ඒ නුවරින්
හෝ ඔබ පිට වන විට ඔබේ පාදවලින්
දූවිලි ගසා දමන්න.*[4] 15 මා ඇත්-
තෙන්ම ඔබට කියන්නේ, විනිශ්චය
දවසේදී ඒ නුවරට ලැබෙන දඬුවම[5]
සොදොම්[6] සහ ගොමෝරා දේශයට
ලැබුණු දඬුවමට වඩා දරුණු වන
බවයි.
16 “මම ඔබව යවන්නේ වෘක-
යන් මැදට යවන බැටළුවන් වගෙයි.[7]
එමනිසා ඔබ සර්පයන් මෙන් සුප-
රීක්ෂාකාරීව[8] සිටිය යුතුයි. නමුත්
පරෙවියන් මෙන් අහිංසක[9] වන්න.
17 මිනිසුන්ගෙන් පරෙස්සම් වන්න.[10]
මන්ද ඔවුන් ඔබව උසාවිවලට භාර
දී[11] ඔවුන්ගේ සිනගෝගවලදී[12] ඔබට
කසයෙන් තළයි.[13] 18 මා නිසා
ඔබව ආණ්ඩුකාරයන් හා රජුන් ඉදි-
රියට[14] ඇදගෙන යනු ලබයි. එය
ඔවුන්ටත් ජාතීන්ටත් මා ගැන සාක්ෂි
දරන්න ඔබට හොඳ අවස්ථාවක්.[15]
19 ඔවුන් ඔබව එවැනි අය ඉදි-
රියට ගෙන ගිය විට ඔබ කෙසේ
කතා කළ යුතුද කියාවත් කුමක්
කිව යුතුද කියාවත් සිතමින් කනස්-
සලු වෙන්න එපා. ඔබ කිව යුත්තේ
කුමක්ද කියා ඔබට ඒ අවස්ථාවේ-
දීම දැනගන්න ලැබෙයි.[1] 20 ඔබේ
පියාණන්ගේ බලය ඔබ තුළ ක්‍රියාත්-
මක වන නිසා ඔබට හොඳින් කතා
කරන්න හැකි වෙයි.[2] එමනිසා ඒ
අවස්ථාවේදී ඔබ කිසිවිටකත් අස-
රණ වන්නේ නැහැ. 21 කෙනෙක්[3]
තමන්ගේම සහෝදරයාවද පියෙක්
තමන්ගේම දරුවාවද මරණයට පත්
කිරීම සඳහා සතුරන් අතට භාර දෙයි.
දරුවන්ද දෙමාපියන්ට විරුද්ධව නැඟී
සිට ඔවුන්ව මරණයට පත් කිරීම
සඳහා[4] සතුරන්ට භාර දෙයි. 22 ඔබ
මගේ නාමය දරන නිසා[5] සියල්ලන්
ඔබට වෛර කරයි. නමුත් ගැලවීම
ලබන්නේ අවසානය දක්වාම විඳ-
දරාගන්නා තැනැත්තායි.[6] 23 එක්
නුවරකදී ඔවුන් ඔබට පීඩා කරද්දී ඔබ
වෙනත් නුවරකට පලා යන්න.[7] ඇත්-
තෙන්ම මා ඔබට කියන්නේ, මනුෂ්‍ය
පුත්‍රයා එන තෙක්[8] ඔබ ඊශ්‍රායෙලය
පුරා සංචාරය කළත් එහි සෑම නුවර-
කටම යන්න ඔබට නොහැකි වන
බවයි.[9]
24 “ගෝලයෙකු තම ගුරුවරයාට
වඩා උසස් වන්නේවත් දාසයෙකු
තමන්ගේ ස්වාමියාට වඩා උසස් වන්-
නේවත් නැහැ.[10] 25 ගෝලයෙකු
තම ගුරුවරයා හා සමාන වෙන්න
ලැබීම ගැනත් දාසයෙකු තම ස්වා-
මියා හා සමාන වෙන්න ලැබීම
ගැනත්[11] සතුටු වී ඉන් සෑහීමට
පත් විය යුතුයි. ඔවුන් ගෙහිමියාට
බෙල්සෙබුබ්*[12] කියා පවසනවා නම්
ඔහුගේ ගෙයි වැසියන්ට ඊටත් වඩා
කොපමණ වැඩියෙන් එසේ කියයිද!
26 එමනිසා ඔවුන්ට බිය නොවන්න.
දැන් සැඟවී තිබෙන කිසි දෙයක් අනා-
වරණය නොකර තිබෙන්නේ නැහැ.
දැන් රහසිගතව තිබෙන කිසි දෙයක්
හෙළි නොකර තිබෙන්නේත් නැහැ.[13]

**10 පරි.**

1 ගණන් 18:31; මාක් 6:8; ලූක් 9:3; ලූක් 10:7; 1කොරි 9:14; 1තිමෝ 5:18
2 ලූක් 9:4
3 ලූක් 10:5
4 මාක් 6:11; ලූක් 10:6; ලූක් 10:11; ක්‍රියා 13:51; ක්‍රියා 18:6
5 මතෙ 11:22; මතෙ 12:41; ලූක් 11:32
6 උත් 19:4; 2පේත්‍ර 2:6; යූද් 7
7 ශෙප 3:3; ක්‍රියා 20:29
8 උත් 3:1; රෝම 16:19
9 පිලි 2:15
10 පිලි 3:2
11 මතෙ 24:9; මාක් 13:9
12 මතෙ 23:34
13 ක්‍රියා 5:40; 2කොරි 11:24
14 ක්‍රියා 4:8; ක්‍රියා 24:10; ක්‍රියා 25:23; ක්‍රියා 26:25; ක්‍රියා 27:24
15 ද්වි 31:26; මතෙ 24:14; ක්‍රියා 4:20

**2 තීරුව**

1 යෙරෙ 1:7; මාක් 13:11; ලූක් 12:11; ලූක් 21:14
2 ලූක් 12:12; යොහ 14:26
3 මතෙ 10:36; මතෙ 24:10
4 මීකා 7:6
5 මතෙ 24:9; ලූක් 21:17; යොහ 15:21
6 මතෙ 24:13; එළි 2:10
7 2සාමු 15:14; මතෙ 23:34; ක්‍රියා 8:1
8 මතෙ 16:28; මතෙ 24:14; රෝම 10:18; කොලො 1:23
9 මාක් 6:6
10 ලූක් 6:40; යොහ 13:16; යොහ 15:20
11 1පේත්‍ර 2:21
12 මතෙ 12:24; මාක් 3:22; ලූක් 11:15; යොහ 8:48

13 මාක් 4:22; ලූක් 8:17; 1කොරි 4:5.

මතෙ **10:14*** එසේ කළේ තමන් වගකීමෙන් නිදහස් බව පෙන්වීමටය.

මතෙ **10:25*** සාතන්ට භාවිත කරන තවත් නමකි.

**27** මා ඔබට රහසින් පවසන දෙය
සියල්ලන් ඉදිරියේ ප්‍රසිද්ධ කරන්න.
ඔබේ කනට රහසින් ඇසෙන
දේ වහල්තලවලට ගොස් සියල්-
ලන්ට ඇසෙන සේ ප්‍රකාශ කරන්න.[1]
**28** ඔබව මරා දැමිය හැකි වුණත්
අනාගතයේදී ඔබට ලැබෙන්න යන
ජීවිතය උදුරාගත නොහැකි අයට
බිය නොවන්න.[2] නමුත් ඔබව ගෙ-
හෙන්නාවට*[3] නියම කර සහමුලින්ම
විනාශ කළ හැකි තැනැත්තාට පම-
ණක් බිය වන්න.[4] **29** ගේකුරුල්-
ලන් දෙදෙනෙකුව විකුණන්නේ ඉතා
සුළු මුදලකටයි.[5] උන්ගෙන් එකෙක්
බිමට ආවත් ඒ බව පියාණන් දන්-
නවා.[6] **30** එසේනම් ඔබ ගැන කිව
හැක්කේ කුමක්ද? ඔබේ පියාණන්
ඔබේ සියලුම හිසකෙස් පවා ගණන්
කර තිබෙනවා.[7] **31** ඔබ ගේකුරුල්-
ලන් බොහෝදෙනෙකුට වඩා වටින්-
නේ නැද්ද?[8] එමනිසා කිසිම දෙයකට
බිය නොවන්න.

**32** "මාව පිළිගන්නවා කියා
යමෙක් මිනිසුන් ඉදිරියේ පවසනවා
නම් ස්වර්ගයෙහි සිටින මගේ පියා-
ණන් ඉදිරියේ මමත් ඔහුව පිළි-
ගන්නවා කියා පවසන්න කැමතියි.[9]
**33** නමුත් යමෙක් මිනිසුන් ඉදිරි-
යේ මාව ප්‍රතික්ෂේප කරනවා
නම් ස්වර්ගයෙහි සිටින මගේ පියා-
ණන් ඉදිරියේ මමත් ඔහුව ප්‍රතික්-
ෂේප කරනවා.[10] **34** මා මෙලොවට
සාමය දෙන්න පැමිණියා කියා නො-
සිතන්න. මා ආවේ කඩුවක්* දීමට
මිස සාමය දීමට නොවෙයි.[11] **35** මා
ආවේ මිනිසෙකු තම පියා සමඟද දුව
ඇගේ මව සමඟද අලුතෙන් විවාහ වූ
ස්ත්‍රිය ඇගේ නැන්දම්මා සමඟද භේද
කරවීමටයි.[12] **36** ඇත්තෙන්ම මිනි-
සෙකුගේ සතුරන් වන්නේ ඔහුගේම
පවුලේ සාමාජිකයන්. **37** මට වඩා
පියාටවත් මවටවත් ආදරය කරන
තැනැත්තා මට සුදුසු කෙනෙක් නො-
වෙයි. මට වඩා පුතාටවත් දුවට-
වත් ආදරය කරන තැනැත්තා මට
සුදුසු කෙනෙක් නොවෙයි.[1] **38** තම
වධකණුව භාරගෙන මා අනුව නො-
එන තැනැත්තාද මට සුදුසු කෙනෙක්
නොවෙයි.[2] **39** යමෙක් තම ජීවිතය
රැකගන්න කොතරම් උත්සාහ කළත්
ඔහුට එය නැති වෙයි. නමුත් මා නිසා
තම ජීවිතය අහිමි කරගන්නාට එය
නැවත හිමි වෙයි.[3]

**40** "ඔබව පිළිගන්නා තැනැත්තා
මාවද පිළිගනියි. මාව පිළිගන්නා
තැනැත්තා මාව එවූ තැනැත්තා-
වද පිළිගනියි.[4] **41** කෙනෙක් අනා-
ගතවක්තෘවරයෙකුව පිළිගෙන ඔහුට
අනාගතවක්තෘවරයෙකු ලෙස සල-
කනවා නම් අනාගතවක්තෘවරයෙ-
කුට හිමි වන ත්‍යාගය[5] ඔහුටත් හිමි
වෙයි. කෙනෙක් ධර්මිෂ්ඨ මිනිසෙකුව
පිළිගෙන ඔහුට ධර්මිෂ්ඨ කෙනෙකු
ලෙස සලකනවා නම් ධර්මිෂ්ඨයෙකුට
හිමි වන ත්‍යාගය[6] ඔහුටත් හිමි වෙයි.
**42** මගේ ගෝලයන් වන මේ කුඩා අය-
ගෙන් එක් කෙනෙකුට හෝ යමෙක්
බොන්න ඇල් වතුර කෝප්පයක්වත්
දෙනවා නම් ඇත්තෙන්ම මා ඔබට
කියන්නේ, ඔහුගේ ත්‍යාගය කිසිසේත්
ඔහුට අහිමි නොවන බවයි."[7]

**11** යේසුස් තම ගෝලයන් දො-
ළොස්දෙනාට උපදෙස් දුන්
පසු එතැනින් පිටත් වී අවට නුවර-
වල ඉගැන්වීමටත් දේශනා කිරීමටත්
ගියේය.[8]

**2** ක්‍රිස්තුස්ගේ ක්‍රියා ගැන සිර-
ගෙයි සිටි[9] යොහන්ට ආරංචි වී තමා-
ගේ ගෝලයන් යවා, **3** "පැමිණීමට
සිටින තැනැත්තා ඔබද? නැතහොත්
අප වෙන කෙනෙකු ගැන බලා සිටිය
යුතුද"[10] කියා යේසුස්ගෙන් ඇසුවේය.
**4** යේසුස් මෙසේ පිළිතුරු දුන්-
නේය. "ගොස් ඔබට අහන්න දකින්න
ලැබෙන දේවල් ගැන යොහන්ට
කියන්න. **5** අන්ධ අයට පෙනීම
ලැබෙනවා.[11] කොර වී සිටින අය[12]

මතෙ **10:28*** යෙරුසලමෙන් පිටත කසළ පුළුස්සා දැමීම සඳහා භාවිත කළ ස්ථානය. උපග්‍ර. 2 බලන්න. **34*** එනම්, භේදයක්.

**12** මතෙ 21:14.

**10 පරි.**
**1** ලූක් 12:3
**2** හිතෝ 29:25
යෙසා 51:12
එස 3:9
එළි 2:10
**3** ලූක් 12:5
**4** හෙබ්‍රෙ 10:31
**5** ලූක් 12:6
**6** ද්වි 22:6
මතෙ 6:26
ලූක් 12:7
**7** 1සාමු 14:45
2සාමු 14:11
ක්‍රියා 27:34
**8** මතෙ 6:26
ලූක් 12:7
**9** ලූක් 12:8
රෝම 10:9
එළි 3:5
**10** මාක් 8:38
ලූක් 9:26
ලූක් 12:9
2තිමෝ 2:12
**11** ලූක් 12:51
**12** මීකා 7:6
ලූක් 12:52
ලූක් 12:53

**2 තීරුව**
**1** ද්වි 33:9
මතෙ 19:29
ලූක් 14:26
**2** මතෙ 16:24
මාක් 8:34
ලූක් 9:23
ලූක් 14:27
**3** මතෙ 16:25
මාක් 8:35
ලූක් 17:33
යොහ 12:25
**4** මතෙ 25:40
ලූක් 10:16
යොහ 12:44
යොහ 13:20
**5** 1රාජා 17:10
2රාජා 4:8
**6** යොෂු 2:14
2රාජා 4:13
**7** මතෙ 25:40
මාක් 9:41
හෙබ්‍රෙ 6:10

**11 පරි.**
**8** මතෙ 4:23
මතෙ 19:1
ලූක් 9:6
**9** මතෙ 14:3
මාක් 6:17
ලූක් 7:18
**10** උත් 49:10
දානි 9:24
මලා 3:1
මතෙ 3:11
යොහ 1:15
යොහ 7:31
**11** යෙසා 35:5
යෙසා 61:1
ලූක් 17:22

නැවත ඇවිදිනවා. ලාදුරු රෝගීන්ව[1]
පවිත්‍ර කරනු ලබනවා. බිහිරි අයට[2]
ඇසෙනවා. මිය ගිය අයව[3] නැවත
ජීවත් කරනු ලබනවා. දිළිඳුන්ට
ශුභාරංචිය[4] ප්‍රකාශ කරනු ලබනවා.
**6** යමෙකුට මා ගැන සැකයක් නැත්-
නම්*[5] ඒ තැනැත්තා සන්තෝෂවත්.”
**7** යොහන්ගේ ගෝලයන් පිටත්ව
යද්දී යොහන් ගැන යේසුස් එහි
සිටි සමූහයන්ට මෙසේ කීවේය. “ඔබ
පාළුකරයට ගියේ කුමක් බලන්-
නද?[6] සුළඟට එහා මෙහා වැනෙන
බට ගසක් බලන්නද?[7] **8** ඔබ ගියේ
කුමක් දකින්නද? වටිනා වස්ත්‍ර ඇඳ
සිටින මිනිසෙකුව දකින්නද? අනර්ඝ
වස්ත්‍රවලින් සැරසුණු අය සිටින්නේ
රජුන්ගේ මාලිගාවලයි.[8] **9** ඇත්-
තෙන්ම ඔබ ගියේ ඇයි? අනාගතවක්-
තෘවරයෙකුව දැක බලා ගන්නද? මා
ඔබට කියන්නේ, ඔහු අනාගතවක්-
තෘවරයෙකුටත් වඩා උතුම් කෙනෙක්
බවයි.[9] **10** මෙසේ ලියා තිබෙන්-
නෙත් ඔහු ගැනයි. ‘මම මාගේ පණිවි-
ඩකරුව ඔබ ඉදිරියෙන් යවමි. ඔහු
ඔබට කලින් ගොස් ඔබේ මඟ සූදානම්
කරයි.’[10] **11** ඇත්තෙන්ම මා ඔබට
කියන්නේ, ස්ත්‍රීන්ගෙන් උපන් අය
අතරෙන්[11] යොහන් බව්තීස්තට වඩා
උතුම් කෙනෙක් ඉපදී නැති බවයි.
නමුත් ස්වර්ග රාජ්‍යයේ සිටින සුළු
තැනැත්තෙක්[12] වුණත් ඔහුට වඩා
උතුම්. **12** යොහන් බව්තීස්ත තම
සේවය ආරම්භ කළ කාලයේ පටන්
මේ දක්වාම මිනිසුන් ස්වර්ග රාජ්‍යය
ගැන සිතේ තබාගෙන එයට ඇතුල්
වෙන්න මහත් උත්සාහයක් දරමින්
සිටිනවා. එසේ මහත් උත්සාහයක්
දරන අයට ඊට ඇතුල් වෙන්න හැකි
වෙයි.[13] **13** මන්ද අනාගතවක්තෘව-
රුන් පැවසූ දේවලින්ද නීතියේ සඳ-
හන් දේවලින්ද අවධාරණය කළේ
ඒ ගැනයි. එය යොහන් තම සේවය
පටන්ගත් කාලය දක්වාම[14] සිදු වුණා.

**11 පරි.**
1 මතෙ 8:3
2 මාක් 7:32
ලූක් 7:22
3 මාක් 5:41
4 මතෙ 4:23
5 යෙසා 8:14
මාක් 6:3
ලූක් 7:23
යොහ 6:61
1කොරි 1:23
1පේතෘ 2:8
6 මතෙ 3:5
7 ලූක් 7:24
එෆී 4:14
8 1රාජා 10:5
ලූක් 7:25
9 මතෙ 14:5
මතෙ 21:25
ලූක් 1:76
10 යෙසා 40:3
මලා 3:1
මතෙ 3:3
ලූක් 1:17
යොහ 3:28
යොහ 10:41
11 ලූක් 1:15
12 යොහ 3:3
13 ලූක් 13:24
14 ලූක් 16:16

**2 තීරුව**
1 මලා 4:5
මතෙ 17:10
මතෙ 17:12
2 එළි 2:7
3 මතෙ 12:41
ලූක් 7:31
4 සෙක 8:5
ලූක් 7:32
5 ලූක් 23:27
6 මතෙ 9:14
ලූක් 7:33
7 මතෙ 9:10
මාක් 2:15
යොහ 2:2
8 ලූක් 5:30
ලූක් 7:34
ලූක් 15:2
ලූක් 19:7
9 ලූක් 7:35
10 යොහ 12:37
11 යොහ 12:21
12 දානි 9:3
යෝනා 3:6
ලූක් 10:13
13 යොහ 5:29
එළි 20:13

**14** ඔබ ඒ කාරණය පිළිගන්න කැමති
වුණත් නැතත්, ‘පැමිණීමට නියම
කර තිබූ එලියා’ ඔහුයි.[1] **15** මා පව-
සන දේට සවන් දී එය තේරුම්ගැනී-
මට උත්සාහ කරන්න.[2]
**16** “පවතින මේ පරම්පරාව මම
සමාන කරන්නේ කාටද?[3] ඔවුන් වෙ-
ළඳපොළවල ඉඳගෙන තම යහළු-
වන් සමඟ සෙල්ලම් කරන කුඩා
දරුවන්ට සමානයි.[4] **17** ඒ දරු-
වන් සෙල්ලම් කරමින්, ‘අපි
ඔබට නළාව පිම්බත් ඔබ නැටු-
වේ නැහැ. අපි විලාප නැඟුවත්
ඔබ ශෝකයෙන් පපුවට ගසාගත්තේ
නැහැ’[5] කියා එකිනෙකාට පවසනවා.
**18** මේ පරම්පරාවත් ක්‍රියා කරන්නේ
එලෙසයි. යොහන් සාමාන්‍ය විදිහට
කමින් බොමින් තම ජීවිතය ගත
කළේ නැහැ.[6] නමුත් ‘ඔහුට භූත-
යෙක් ආවේශ වෙලා’ කියා කිසි දෙය-
කින් සතුටු වන්නේ නැති මිනිසුන්
කියනවා. **19** මනුෂ්‍ය පුත්‍රයා කමින්
බොමින් සාමාන්‍ය විදිහට තම ජීවි-
තය ගත කළ විට,[7] ‘මෙන්න, කෑදර,
වයින් බීමට ලොල් වූ මිනිසෙක්
ඇවිත්. ඔහු බදු එකතු කරන්නන්ගේද
පව්කාරයන්ගේද මිත්‍රයෙක්’[8] කියා
මිනිසුන් කියනවා. නමුත් ප්‍රඥාවන්ත-
යෙක් ධර්මිෂ්ඨයි කියා ඔප්පු වන්නේ
ඔහු කරන ක්‍රියාවලිනුයි.”[9]
**20** ඉන්පසු යේසුස් තම බලවත්
ක්‍රියාවලින් වැඩි ප්‍රමාණයක් සිදු කළ
නුවරවල වැසියන් පසුතැවිලි නොවූ
ආකාරය[10] දැක ඔවුන් කෙරෙහි තම
අප්‍රසාදය පළ කරමින් මෙසේ කීවේය.
**21** “කොරාසීන නුවර, බෙත්සයිදා
නුවර,[11] ඔබට මොන තරම් දරුණු
ප්‍රතිඵලවලට මුහුණ දෙන්න සිදු වෙ-
යිද! මන්ද ඔබ තුළ සිදු වූ බලවත්
ක්‍රියා තීර් හා සීදොන් යන නුව-
රවල සිදු වුණා නම් එහි වැසියන්
ගෝණි රෙදි ඇඳ අළුවල ඉඳ පසුතැ-
විලි වන්නේ[12] මීට බොහෝ කල-
කට කලිනුයි. **22** ඒ නිසා මා ඔබට
කියන්නේ, විනිශ්චය සිදු වන දව-
සේදී[13] ඔබට ලැබෙන දඬුවම තීර්

---

මතෙ **11:6*** මූ.අ., “මා නිසා පය පැකිළී වැටෙන්-නේ නැත්නම්.”

හා සීදොන්හි වැසියන්ට ලැබෙන
දඬුවමට වඩා දරුණු වන බවයි.[1]
**23** කපර්ණවුම නුවර,[2] ඔබව අහස
දක්වාම උසස් කරයි කියා සිතුවාද?
නමුත් ඔබව මිනී වළ දක්වාම[3] පහ-
තට හෙළනු ලබයි.[4] මන්ද ඔබ තුළ
සිදු වූ බලවත් ක්‍රියා සොදොම් නුව-
රෙහි සිදු වුණා නම් එය අද දක්-
වාම පවතියි. **24** එමනිසා මා ඔබට
කියන්නේ, විනිශ්චය සිදු වන දවසේදී
ඔබට ලැබෙන දඬුවම සොදොම් නුව-
රෙහි වැසියන්ට ලැබුණු දඬුවමට වඩා
දරුණු වන බවයි."[5]

**25** යේසුස් ඒ අවස්ථාවේදී මෙසේද
පැවසුවේය. "ස්වර්ගයටත් පොළොව-
ටත් ස්වාමීන් වන පියාණෙනි, ඔබ
මේ දේවල් ප්‍රඥාවන්තයන්ගෙන්ද බුද්-
ධිමතුන්ගෙන්ද සඟවා බිළිඳුන් වැනි
අයට හෙළි කළ නිසා[6] ඔබට ප්‍රසිද්ධි-
යේ ප්‍රශංසා කරන්න මම කැමතියි.
**26** පියාණෙනි, එසේ සිදු වුණේ ඔබේ
කැමැත්තට එකඟවයි." **27** ඔහු
මෙසේද පැවසුවේය. "සියලු දේ මට
භාර දී තිබෙන්නේ මගේ පියාණන්.[7]
පියාණන් හැර වෙනත් කිසිවෙකු
පුත්‍රයාව සම්පූර්ණයෙන් හඳුනන්නේ
නැහැ.[8] පියාණන්ව සම්පූර්ණයෙන්ම
හඳුනන්නෙත් පුත්‍රයායි. ඒ වගේම
යම් කෙනෙක් පියාණන්ව හඳුනාගන්-
නවාට පුත්‍රයා කැමති නම් ඔහු ඒ
තැනැත්තාට පියාණන් ගැන එළිදරව්
කරයි.[9] **28** වෙහෙස වූ බරින් පීඩිත
වූ[10] සියල්ලෙනි, මා වෙතට එන්න.
ඔබව ප්‍රාණවත් කරන්න මා කැමතියි.
**29** මා මෘදු ගුණැති[11] නිහතමානී කෙ-
නෙකු වන නිසා මා ඔබ පිට තබන
වියගහ[12] පිළිගෙන මගෙන් ඉගෙන-
ගන්න.[13] එමගින් ඔබට මහත් සහ-
නයක්[14] ලබාගත හැකියි. **30** මන්ද
මා ඔබ පිට තබන වියගහ පහසුයි.
ඔබට උසුලාගෙන යෑමට තිබෙන
බරද සැහැල්ලුයි."[15]

**12** ඒ සමයේ සබත් දවසකදී,[16]
යේසුස් ධාන්‍ය කෙත් මැදින්
ගියේය. ඔහුගේ ගෝලයන්ට බඩගින්-
නක් දැනුණු නිසා ඔවුහු ධාන්‍ය කරල්

**11 පරි.**
1 ලූක් 10:14
2 ලූක් 4:31
3 යෙසා 14:15
4 ලූක් 10:15
5 මතෙ 10:15
මතෙ 12:41
ලූක් 10:12
6 ගීතා 8:2
යෙසා 29:14
මතෙ 13:15
ලූක් 10:21
1කොරි 1:27
7 යොහ 3:35
යොහ 17:2
1කොරි 15:27
8 යොහ 1:18
9 මතෙ 28:18
ලූක් 10:22
යොහ 10:15
1යොහ 5:20
10 යෙසා 55:2
11 ගණන් 12:3
සෙක 9:9
2කොරි 10:1
12 2කොරි 6:14
ගලා 5:1
13 ද්වි 18:18
14 යෙරෙ 6:16
15 1යොහ 5:3

**12 පරි.**
16 මාක් 2:23

**2 තීරුව**
1 නික් 12:16
ද්වි 23:25
ලූක් 6:1
2 මාක් 2:24
ලූක් 6:2
3 නික් 20:10
නික් 31:15
ද්වි 5:14
4 1සාමු 21:6
මාක් 2:25
ලූක් 6:3
5 නික් 29:33
ලූක් 6:4
6 ලෙවී 24:5
ලෙවී 24:9
මාක් 2:26
7 නික් 25:30
නික් 40:23
8 යොහ 7:22
9 ගණන් 28:9
10 ලූක් 11:31
ලූක් 11:32
යොහ 2:19
11 මතෙ 23:23
12 හොෂෙ 6:6
මීකා 6:6
මතෙ 9:13
13 නික් 34:21
ලෙවී 25:4
ලෙවී 25:10
14 මාක් 2:28
ලූක් 6:5
15 මාක් 3:1
ලූක් 6:6

කිහිපයක් කඩාගෙන කන්න පටන්-
ගත්හ.[1] **2** පරිසිවරු[2] එය දැක,
"බලන්න! ඔබේ ගෝලයෝ සබත් දව-
සේදී කිරීමට තහනම් දෙයක්
කරනවා"[3] කියා යේසුස්ට කීවෝය.
**3** ඔහු ඔවුන්ට මෙසේ කීවේය. "දාවිත්
තමාටත් තමා සමඟ සිටි මිනි-
සුන්ටත් බඩගිනි වූ විට කළ දේ[4]
ඔබ කියවා නැද්ද? **4** ඔහු දෙවිගේ
ගෘහයට ඇතුල් වී පූජකයන්ට මිස[5]
තමාටවත් තමා සමඟ සිටි අයටවත්
කෑමට අවසර නොතිබූ[6] පිදීමේ රොටි
කෑ බව[7] ඔබට මතක නැද්ද? **5** දේ-
වමාලිගාවෙහි පූජකයන් සබත් දව-
සේදී පවා වැඩ කරනවා. ඒ වුණත්
ඔවුන් නිදොස් බවට[8] නීතියේ සඳ-
හන්ව ඇති දේ ඔබ කියවා නැද්ද?[9]
**6** නමුත් මා ඔබට කියන්නේ, දේව-
මාලිගාවට වඩා උතුම් ලෙස සැලකිය
යුතු කෙනෙක්[10] මෙහි සිටින බවයි.
**7** 'මට වටින්නේ දයාව[11] මිස පූජාව
නොවෙයි'[12] යන කියමනේ නියම අර්-
ථය ඔබ තේරුම්ගෙන සිටියා නම්
ඔබ නිදොස් අය පිට වරද තබන්නේ
නැහැ. **8** ඇත්තෙන්ම සබත් දවස[13]
පවතින්නේ මනුෂ්‍ය පුත්‍රයාගේ බලය
යටතේයි."[14]

**9** ඔහු එතැනින් පිටත් වී සින-
ගෝගයකට ඇතුල් විය. **10** එහි
අතක් පණ නැති මිනිසෙක් සිටි-
යේය.[15] එවිට, "සබත් දවසේ සුව
කිරීමෙහි වරදක් නැද්ද" කියා එම පරි-
සිවරු යේසුස්ගෙන් ඇසූහ. ඔවුන් එසේ
ඇසුවේ ඔහුට විරුද්ධව චෝදනා කිරී-
මට හේතුවක්[16] සොයාගැනීම සඳහාය.
**11** ඔහු ඔවුන්ට මෙසේ කීවේය. "ඔබ
අතරෙන් යමෙකුට බැටළුවෙකු සිටි-
නවා කියා සිතන්න. ඒ බැටළුවා සබත්
දවසේදී වළක වැටුණොත්[17] ඔබ ඌව
ගොඩගන්නේ නැද්ද?[18] **12** එසේනම්
බැටළුවෙකුට වඩා මිනිසෙක් කොත-
රම් වටිනවාද![19] එමනිසා සබත් දව-
සේදී යහපත් දෙයක් කිරීමෙහි වරදක්
නැහැ." **13** ඉන්පසු ඔහු ඒ මිනිසාට,

**16** මාක් 3:4; ලූක් 14:3; යොහ 9:16; **17** නික් 21:33;
**18** නික් 23:4; ද්වි 22:4; ලූක් 14:5; **19** මතෙ 10:31.

“ඔබේ අත දිගු කරන්න” කියා කීවේය.
ඔහු අත දිගු කළ විට එය අනික් අත
මෙන් ප්‍රාණවත් විය.[1] **14** නමුත් පරි-
සිවරු එතැනින් පිටත් වී යේසුස්ව මරා
දැමීම සඳහා[2] ඔහුට විරුද්ධව කුමන්-
ත්‍රණය කළෝය. **15** එය දැනගත්
යේසුස් එතැනින් අහක්ව ගියේය. බො-
හෝදෙනෙක්ද ඔහු පසුපස ගියහ. ඔහු
ඒ සියල්ලන්ව සුව කළද,[3] **16** තමන්
ගැන කිසිවක් ප්‍රසිද්ධ නොකරන ලෙස[4]
ඔහු ඔවුන්ට තදින් අණ කළේය.
**17** එසේ වූයේ අනාගතවක්තෘ යෙ-
සායා මාර්ගයෙන් කියන ලද දෙය ඉටු
වීම සඳහාය. එනම්,

**18** “මෙන්න! මාගේ අනුමැතිය
ඇති මාගේ ප්‍රේමණීය[5] සේවකයා![6] මා
තෝරාගත් සේවකයා මොහුය. මම
ඔහුට මාගේ බලය ලබා දෙන්නෙමි.[7]
ඔහු ජාතීන්ට යුක්තිය යනු කුමක්-
දැයි පැහැදිලි කරන්නේය. **19** ඔහු
දබර කරන්නේවත්[8] කෑගසන්නේ-
වත් නැත. ඔහුගේ හඬ ප්‍රධාන වීථි-
වල කිසිවෙකුට ඇසෙන්නෙත් නැත.
**20** ඔහු සාර්ථකව යුක්තිය ඉටු කරන
තුරු[9] තැළුණු බට ගසක් පොඩි කරන්-
නේවත් නිවී යන පහන් තිරයක් නිවා
දමන්නේවත් නැත.[10] **21** නිසැක-
වම ජාතීන් තම බලාපොරොත්තු
පදනම් කරගන්නේ[11] ඔහුගේ නාමය
මතය.”

**22** භූතයෙක් ආවේශ වූ, අන්ධ,
ගොළු මිනිසෙකුව යේසුස් වෙතට
ගෙනෙන ලදි. යේසුස් ඔහුව සුව
කළේය. ඉන්පසු ගොළු මිනිසා කතා
කරන්න පටන්ගත් අතර ඔහුට පෙනී-
මද ලැබිණ. **23** එතැන සිටි සියලු-
දෙනා අතිශයින් පුදුම වී,[12] “දාවිත්ගේ
පුත්‍රයා මොහු වෙන්න බැරිද”[13] කියා
එකිනෙකා අතර කතා වෙන්න පටන්-
ගත්තෝය. **24** පරිසිවරු එය අසා,
“මේ මිනිසා භූතයන් දුරු කරන්-
නේ භූතයන්ගේ පාලකයා වන
බෙල්සෙබුබ්ගේ* උපකාරයෙනුයි.[14] ඒ
හැර වෙන විදිහකින් නම් ඔහුට
මේවා කරන්න බැහැ” කියා කීවෝය.
**25** ඔවුන් සිතූ දේ තේරුම්ගත්[1] යේ-
සුස් ඔවුන්ට මෙසේ කීවේය. “යම්
රාජ්‍යයක භේද ඇත්නම් ඒ රාජ්‍යය
නැති වී යයි.[2] යම් නුවරක් හෝ
ගෙයක් ඇතුළත සිටින අය අතරම
භේද ඇත්නම් ඒ නුවර හෝ ගෙය
වැඩි කල් පවතින්නේ නැහැ. **26** ඒ
ආකාරයෙන්ම සාතන්ව දුරු කිරීමට
සාතන්ම ක්‍රියා කරනවා නම් ඔහු භේද
ඇති කරන්නේ තමන්ටම විරුද්ධ-
වයි. එසේනම් ඔහුගේ රාජ්‍යය පව-
තින්නේ කොහොමද? **27** එහෙයින්
මා භූතයන් දුරු කරන්නේ බෙල්සෙ-
බුබ්ගේ උපකාරයෙන්[3] නම් ඔබේ අනු-
ගාමිකයන් භූතයන්ව දුරු කරන්නේ
කාගේ උපකාර ඇතුවද? ඔබ කියන
දේ වැරදියි කියා ඔබේම අනුගාමික-
යන් නිගමනය කරන්නේ ඒ නිසයි.
**28** නමුත් මා භූතයන්ව දුරු කරන්-
නේ දෙවිගේ බලයෙන් නම් දෙවිගේ
රාජ්‍යයෙන් ඔබට උදා කර දෙන ප්‍රස්-
තාව දැන් ඔබ අහිමි කරගෙන තිබෙන
බව[4] මතක තබාගන්න. **29** සො-
රුන් ශක්තිමත් මිනිසෙකුගේ නිවසට
කඩා වදිනවා කියා සිතන්න. ඔහුගේ
බඩු බාහිරාදිය ගැනීමට නම් ඔවුන්
මුලින්ම ඔහුව බැඳ දැමීමට අවශ්‍යයි.
සොරුන් ඔහුගේ නිවසෙහි තිබෙන
දේවල් කොල්ල කන්නේ ඔහුව බැඳ
තැබුවායින් පසුවයි.[5] **30** කෙනෙක්
මට පක්ෂව නොසිටියොත් ඔහු මට
විරුද්ධව ක්‍රියා කරයි. කෙනෙක් මා
සමඟ එක්ව මිනිසුන්ව රැස් කරන්නේ
නැත්නම් ඔහු කරන්නේ මගෙන් මිනි-
සුන්ව ඈත් කිරීමයි.[6]

**31** “මා ඔබට කියන මේ දේ
හොඳින් මතක තබාගන්න. ඕනෑම
පාපයකට සහ අපහාස කිරීමකට
මිනිසුන්ට සමාව ලැබෙයි. නමුත් දෙ-
විගේ බලයේ ක්‍රියාකාරිත්වයට විරුද්-
ධව කරන අපහාසයට කිසි
සමාවක් නැහැ.[7] **32** උදාහරණයක්
වශයෙන්, යමෙක් මනුෂ්‍ය පුත්‍රයාට
විරුද්ධව කතා කළොත් ඒ සඳහා

**12 පරි.**
**1** ලූක් 6:10
**2** මතෙ 27:1 මාක් 3:6 ලූක් 6:11 යොහ 5:18
**3** මාක් 3:7 ලූක් 6:17
**4** මතෙ 8:4 මාක් 3:12 මාක් 7:36
**5** මතෙ 3:17 මතෙ 17:5
**6** යෙසා 42:1 හග් 2:23 ක්‍රියා 3:13
**7** යෙසා 61:1 මාක් 1:10
**8** යෙසා 42:2 2තිමෝ 2:24
**9** හබ 1:4
**10** මතෙ 11:28
**11** යෙසා 11:10 යෙසා 42:4 ක්‍රියා 4:12 රෝම 15:12
**12** ලූක් 11:14
**13** යොහ 7:31
**14** මාක් 3:22 ලූක් 11:15

**2 තීරුව**
**1** යොහ 2:25
**2** මාක් 3:24 ලූක් 11:17
**3** මාක් 3:26
**4** ලූක් 11:20 1යොහ 3:8
**5** යෙසා 49:24 මාක් 3:27 ලූක් 11:22 1යොහ 4:4
**6** මාක් 9:40 ලූක් 9:50
**7** මාක් 3:28 ක්‍රියා 7:51 හෙබ්‍රෙ 6:4 හෙබ්‍රෙ 6:6 1යොහ 5:16

මතෙ **12:24*** සාතන්ට භාවිත කරන තවත් නමකි.

ඔහුට සමාව ලැබෙයි.[1] නමුත් යමෙක්
දෙවිගේ බලයේ ක්‍රියාකාරිත්වය දැක
දැකත් ඊට විරුද්ධව කතා කරනවා
නම් මේ කාලයේදීවත්* පැමිණෙන්න
තිබෙන කාලයේදීවත් ඒ සඳහා ඔහුට
කිසිම සමාවක් ලැබෙන්නේ නැහැ.[2]

**33** “ගස හොඳ නම් එහි පලත්
හොඳයි. ගස නරක නම් එහි පලත්
නරකයි. ගසක් හොඳද කියා හඳු-
නාගත හැක්කේ එහි පලවලිනුයි.[3]
**34** පොළඟුන්ගෙන් පැවතෙන්නෙනි![4]
ඔබ දුෂ්ටව සිටියදී[5] හොඳ දේ
කතා කරන්නේ කෙසේද? කෙනෙකු-
ගේ මුවින් පිට වන්නේ ඔහුගේ සිත
තුළ පිරී ඇති දෙයයි.[6] **35** යහපත්
මිනිසා තමාගේ සිතේ ගබඩා කර-
ගත් යහපත් දේ පිටතට ගෙන එයි.[7]
නමුත් දුෂ්ට මිනිසෙකු තමාගේ සිතේ
දුෂ්ට දේවල් ගබඩා කරගෙන ඇති
නිසා ඔහු පිටතට ගෙනෙන්නේ දුෂ්ට
දේවලුයි.[8] **36** මිනිසුන් කියන පලක්
නැති, හානිකර සෑම දෙයක් ගැනම
ඔවුන්ට විනිශ්චය දවසේදී ගණන්
දෙන්න සිදු වන බව[9] මතක තබා-
ගන්න. **37** මන්ද ඔබ ධර්මිෂ්ඨයෙක්
ලෙස ප්‍රකාශ කරනු ලබන්නේ ඔබ
පවසන දේට අනුවයි. ඔබ වරදකරු-
වෙක් බවට පත් වන්නෙත් ඔබ පව-
සන දේට අනුවයි.”[10]

**38** එවිට නීතිය පිටපත් කරන්-
නන්ගෙන්ද පරිසිවරුන්ගෙන්ද සම-
හරෙක්, “ගුරුතුමනි, ආශ්චර්යවත්
ලෙස යම් ලකුණක් අපට පෙන්නු-
වොත් ඔබව අපි පිළිගන්නවා”[11] කියා
කීවෝය. **39** එවිට ඔහු ඔවුන්ට
මෙසේ පිළිතුරු දුන්නේය. “දුෂ්ට,
ද්‍රෝහී[12] පරම්පරාවක් දිගින් දිගටම
ලකුණක් සොයයි. නමුත් අනාගත-
වක්තෘ යෝනාගේ ලකුණ[13] මිස වෙන
ලකුණක් ඔවුන්ට දෙනු ලබන්නේ
නැහැ. **40** යෝනා[14] මහා මත්ස්‍ය-
යාගේ බඩෙහි දිවා රෑ දෙකේම දින
තුනක් සිටි ලෙසම මනුෂ්‍ය පුත්‍රයාද[15]
පොළෝගැබෙහි[16] දිවා රෑ දෙකේම
දින තුනක් පුරා[1] සිටියි. **41** විනිශ්ච-
යේදී නිනිවය නුවරේ මිනිසුන් නැඟිට,
මේ පරම්පරාව[2] කොතරම් දුෂ්ටද
කියා පැහැදිලි කරයි.[3] මන්ද යෝනා
දේශනා කළ නිසා[4] ඔවුන් පසුතැ-
විලි වුණා. නමුත් බලන්න! යෝ-
නාට වඩා උතුම් කෙනෙක් මෙහි
සිටියි. **42** විනිශ්චයේදී දකුණු දිශා-
වේ රැජින[5] නැඟිට, මේ පරම්පරාව
කොතරම් දුෂ්ටද කියා පැහැදිලි කර
දෙයි. මන්ද සලමොන්ගේ ප්‍රඥාව ඇසී-
මට ඇය පැමිණියේ පොළොවේ ඈත
කෙළවරක සිටයි. නමුත් බලන්න!
සලමොන්ට වඩා උතුම් කෙනෙක්
ඔබ අතරේම සිටියි.[6]

**43** “භූතයෙක් මිනිසෙකුගෙන් පිට
වී යද්දී ඔහු නවාතැනක් සොය-
මින් වියළි බිම්වල සැරිසරයි. නමුත්
ඔහුට කිසිවක් හමු වන්නේ නැහැ.[7]
**44** එවිට ඔහු, ‘මා කලින් සිටි ගෙට
ආපසු යනවා’ කියා පවසයි. ඔහු එහි
පැමිණි විට එය අතුගා පවිත්‍ර කර
සරසා තිබෙන ආකාරය දකියි. නමුත්
එය තිබෙන්නේ හිස්වයි. **45** එම-
නිසා ඔහු ගොස් තමාට වඩා දුෂ්ට,
වෙනත් භූතයන් හත්දෙනෙකු කැඳ-
වාගෙන[8] ඇවිත් එයට ඇතුල් වී එහි
වාසය කරයි. එවිට ඒ මිනිසාගේ අව-
සන් තත්වය ඔහුගේ පළමු තත්වයට
වඩා භයානක වෙයි.[9] මේ දුෂ්ට පරම්-
පරාවට සිදු වන්නෙත් ඒ දේමයි.”[10]

**46** යේසුස් සමූහයන්ට කතා කර-
මින් සිටියදී ඔහුගේ මවද සහෝ-
දරයෝද[11] ඔහු සමඟ කතා
කිරීම සඳහා පිටත සිටගෙන සිටියහ.
**47** එහෙයින් එක් කෙනෙක් ඇවිත්,
“ඔබේ මවද ඔබේ සහෝදරයන්ද
මෙහි ඇවිත් සිටිනවා. ඔවුන්ට ඔබ
සමඟ කතා කරන්න අවශ්‍ය
වෙලා” කියා ඔහුට කීවේය. **48** ඔහු
තමන්ට කතා කළ තැනැත්තා-
ගෙන්, “කවුද මගේ මව? කවුද
මගේ සහෝදරයන්”[12] කියා ඇසු-
වේය. **49** ඉන් අනතුරුව ඔහු තම
ගෝලයන් දෙසට අත දිගු කරමින්,
“මෙන්න! මොවුන් තමයි මගේ මව

---

මතෙ **12:32*** එනම්, පවතින මේ සමාජයේදීවත්.

**12 පරි.**

**1** ලූක් 7:34
යොහ 7:12
1තිමෝ 1:13
**2** මාක් 3:29
ලූක් 12:10
හෙබ්‍රෙ 10:26
**3** මතෙ 7:17
ලූක් 6:43
**4** මතෙ 3:7
මතෙ 23:33
ලූක් 3:7
**5** යෝබ් 14:4
**6** මතෙ 15:11
**7** යෙසා 32:8
**8** මතෙ 13:52
ලූක් 6:45
යාකො 3:6
**9** දේශ 12:14
රෝම 14:12
යූද් 15
**10** හිතෝ 13:3
ලූක් 19:22
**11** මතෙ 16:1
මාක් 8:11
යොහ 2:18
1කොරි 1:22
**12** යෙසා 57:3
මතෙ 16:4
මතෙ 17:17
මාක් 8:38
යාකො 4:4
**13** ලූක් 11:29
**14** යෝනා 1:17
**15** මතෙ 27:63
**16** මතෙ 27:60
එෆී 4:9

**2 තීරුව**

**1** මතෙ 16:21
මතෙ 17:23
ලූක් 24:46
**2** ලූක් 11:30
**3** රෝම 2:27
**4** යෝනා 3:5
**5** 1රාජා 10:1
2ලේක 9:1
**6** මතෙ 11:16
මතෙ 12:6
ලූක් 11:31
**7** ලූක් 11:24
**8** 1පේත්‍රෘ 5:8
**9** ලූක් 11:26
යොහ 5:14
හෙබ්‍රෙ 6:4
හෙබ්‍රෙ 6:6
2පේත්‍රෘ 2:20
**10** මාක් 8:12
**11** මතෙ 13:55
මාක් 3:31
යොහ 2:12
ක්‍රියා 1:14
1කොරි 9:5
ගලා 1:19
**12** මාක් 3:33

සහ මගේ සහෝදරයෝ![1] **50** මන්ද
මගේ සහෝදරයා හෝ සහෝදරිය
හෝ මව හෝ වන්නේ ස්වර්ගයේ
සිටින මගේ පියාණන්ගේ කැමැත්ත
කරන තැනැත්තායි” කියා පැව-
සුවේය.

**13** එදින යේසුස් තමා නැවතී
සිටි නිවසින් පිටත්ව ගොස්
ගලීල මුහුද අසල ඉඳගෙන සිටි-
යේය. **2** මහත් සමූහයක් ඔහු වටා
එක් රොක් වූ නිසා ඔහු ඔරුව-
කට නැඟ එහි ඉඳගත්තේය.[2] මුළු
සමූහයා සිටගෙන සිටියේ වෙරළෙ-
හිය. **3** ඔහු උපමා යොදාගනිමින්
බොහෝ දේ ඔවුන්ට කියා දුන්නේය.
“එක්තරා වපුරන්නෙක් කෙතක වපුර-
මින් යද්දී,[3] **4** සමහර බීජ මඟ දිගේ
වැටුණා. කුරුල්ලන් ඇවිත් ඒවා කා
දැමුවා.[4] **5** තවත් සමහර බීජ වැටු-
ණේ නොගැඹුරු පස් තට්ටුවක් සහිත
ගල් බිම් මතයි. එම බීජ ඉක්මනින්
වැඩුණත් ඒවාට හොඳින් මුල් අදින්න
නොහැකි වුණා.[5] **6** දැඩි අව් රශ්මිය
නිසා ඒවා මැලවී ගිය අතර ඒවායේ
මුල් ගැඹුරටම විහිදී ගියේ නැති නිසා
ඒවා සම්පූර්ණයෙන්ම මැරී ගියා.[6]
**7** තවත් සමහර බීජ කටු ගස් අතරේ
වැටුණා. කටු ගස් වැවී ඒවා යට
කර දැමුවා.[7] **8** තවත් සමහර බීජ
සරු පසෙහි වැටී පල දරන්න පටන්-
ගත්තා.[8] එකකින් සිය ගුණයක්ද එක-
කින් හැට ගුණයක්ද තවත් එකකින්
තිස් ගුණයක්ද[9] බැගින් පල ලබා-
ගත හැකි වුණා. **9** මා පවසන දේට
සවන් දී එය තේරුම්ගැනීමට උත්සාහ
කරන්න.”[10]

**10** පසුව ගෝලයෝ ඔහු ළඟට
ඇවිත්, “ඔබ උපමා යොදාගනිමින්
ඔවුන්ට කතා කරන්නේ ඇයි”[11] කියා
ඇසූහ. **11** ඔහු ඔවුන්ට මෙසේ පිළි-
තුරු දුන්නේය. “ස්වර්ග රාජ්‍යයේ
පරිශුද්ධ රහස් තේරුම්ගැනීමේ හැකි-
යාව[12] ඔබට දී තිබෙනවා. නමුත්
ඔවුන්ට දී නැහැ.[13] **12** මන්ද යම් අව-
බෝධයක් ඇති තැනැත්තාට තවත්
වැඩියෙන් අවබෝධය ලැබෙයි. එයින්
ඔහුට බොහෝ ආශීර්වාද ලැබෙයි.[1]
නමුත් අවබෝධයක් නැති තැනැත්-
තාට තිබෙන අවබෝධය පවා අහිමි
වෙයි.[2] **13** මා කරමින් සිටින දේවල්
දෙස ඔවුන් බලා සිටියත් මා පවසන
දේවල් ඔවුන් අසා සිටියත් ඔවුන්ට
ඒවායෙහි නියම අර්ථය වැටහෙන්-
නේ නැහැ.[3] මා උපමා යොදාගනිමින්
ඔවුන්ට කතා කරන්නේ ඒ නිසයි.
**14** යෙසායාගේ මේ අනාවැකිය ඉටු
වන්නේ ඔවුන් සම්බන්ධයෙනුයි. එය
නම්, ‘ඇහුම්කන් දෙන නිසා ඔබට
ඇසෙයි. නමුත් ඔබට එහි නියම අර්-
ථය කිසිසේත් වැටහෙන්නේ නැත.
බලන නිසා ඔබට පෙනෙයි. නමුත්
ඔබට කිසි දෙයක් අවබෝධ වන්නේ
නැත.[4] **15** මන්ද මේ ජනයාගේ සිත්
දැඩි වී තිබේ. ඔවුහු කන්වලින් ඇසූ-
වත් ප්‍රතිචාරයක් නොදක්වති. ඔවුහු
තම ඇස් පියාගෙන සිටිති. එසේ වී
තිබෙන්නේ ඔවුන් කිසි කලෙක තම
ඇස්වලින් නොදැක, තම කන්වලින්
නොඅසා, තම සිත්වලින් එහි අර්-
ථය වටහා නොගැනීම සඳහායි. ඔවුහු
කිසිවිටකත් හැරී එන්නේ නැත. ඒ
නිසා ඔවුන්ට මාගෙන් සුවයක්ද නො-
ලැබෙයි.’[5]

**16** “නමුත් ඔබේ ඇස්වලට පෙ-
නෙන නිසාත්[6] ඔබේ කන්වලට
ඇසෙන නිසාත් ඒ ගැන සතුටු වන්න
ඔබට පුළුවන්. **17** මන්ද ඇත්-
තෙන්ම මා ඔබට කියන්නේ,
බොහෝ අනාගතවක්තෘවරුන්ද[7] ධර්-
මිෂ්ඨයන්ද ඔබට පෙනෙන දේ දකින්-
නත් ඔබට ඇසෙන දේ අසන්නත්
මහත් ආශාවකින් සිටි බවයි.[8] නමුත්
ඒවා අසන්නවත් දකින්නවත් ඔවුන්ට
හැකි වුණේ නැහැ.[9]

**18** “එමනිසා වපුරන්නාගේ උප-
මාවට සවන් දෙන්න.[10] **19** යමෙක්
රාජ්‍යය පිළිබඳ පණිවිඩය ඇසුවත් එහි
නියම අර්ථය වටහාගන්නේ නැත්-
නම් දුෂ්ටයා[11] ඇවිත් ඔහුගේ සිතේ
වපුරා තිබූ දේ උදුරාගනියි. මඟ
දිගේ වපුරා තිබූ බීජවලට සිදු වුණු
දේ එවැනි කෙනෙකුට සිදු වන දේට

**12 පරි.**
1 මාක් 3:35, යොහ 14:23, යොහ 15:14, යොහ 20:17, රෝම 8:29, හෙබ්‍රෙ 2:11

**13 පරි.**
2 මාක් 4:1
3 මතෙ 13:34, මාක් 4:3, ලූක් 8:4
4 මතෙ 13:19, මාක් 4:4, ලූක් 8:5
5 මාක් 4:5, ලූක් 8:6
6 මතෙ 13:20, මතෙ 13:21, මාක් 4:6
7 මතෙ 13:22, මාක් 4:7, මාක් 4:18, මාක් 4:19, ලූක් 8:7, හෙබ්‍රෙ 6:8
8 යොහ 15:16
9 මාක් 4:8, ලූක් 8:8
10 මතෙ 11:15
11 මතෙ 13:34, මාක් 4:10, ලූක් 8:9
12 1කොරි 2:10, එෆී 1:9, කොලො 1:26
13 ලූක් 8:10

**2 තීරුව**
1 මතෙ 25:29
2 මාක් 4:25, ලූක් 8:18
3 යෙසා 6:10, යෙරෙ 5:21, එස 12:2, මාක් 4:12, මාක් 8:18
4 යෙසා 6:9, යොහ 12:40, ක්‍රියා 28:26, රෝම 11:8, 2කොරි 3:14
5 ද්වි 32:28, යෙසා 44:18, මාක් 8:17, හෙබ්‍රෙ 5:11
6 ලූක් 10:23
7 1පේත 1:10
8 යොහ 8:56, එෆී 3:5
9 ලූක් 10:24
10 මාක් 4:14, ලූක් 8:11
11 මාක් 4:15, ලූක් 8:12, 1පේත 5:8

සමානයි. **20** පණිවිඩය ඇසූ විගස එය ඉතා සතුටින් පිළිගන්නා[1] කෙනෙකුට සිදු වන දේ ගල් බිම්වල වපුරා තිබූ බීජවලට සිදු වුණු දේට සමානයි. **21** නමුත් පණිවිඩය ඔහු තුළ ගැඹුරට මුල් බැස නැති නිසා එය ඔහු තුළ පවතින්නේ කෙටි කලකටයි. හිංසා හෝ පීඩා හෝ පැමිණි විට පණිවිඩය ගැන ඔහුට තිබූ විශ්වාසය සැණින් නැති වී යයි.[2] **22** කටු ගස් අතරේ වපුරා තිබූ බීජවලට සිදු වන දේ සමාන වන්නේ පණිවිඩය ඇසුවත් එය යටපත් වී පල නොදරන[3] තැනැත්තාට සිදු වන දෙයටයි. ඔහු මේ සමාජයේ තිබෙන දේවල් ගැන අනවශ්‍ය ලෙස කරදර වන නිසාත්[4] ධනය පසුපස ගොස් එයින් මුළා වන නිසාත් ඔහුට එලෙස සිදු වෙයි. **23** සරු පසෙහි වපුරා තිබූ බීජවලට සිදු වන දේ සමාන වන්නේ පණිවිඩය අසා එහි නියම අර්ථය වටහාගෙන සැබවින්ම පල දරන තැනැත්තන්ට සිදු වන දෙයටයි. එක් කෙනෙක් සිය ගුණයක්ද එක් කෙනෙක් හැට ගුණයක්ද තවත් කෙනෙක් තිස් ගුණයක්ද පල දරයි.”[5]

**24** ඔහු තවත් උපමාවක් විස්තර කරමින් ඔවුන්ට මෙසේ පැවසුවේය. “තම කෙතෙහි හොඳ බීජ වැපුරූ මිනිසෙකුට ස්වර්ග රාජ්‍යය සමාන කළ හැකියි.[6] **25** මිනිසුන් නිදා සිටියදී ඔහුගේ සතුරා ඇවිත් තිරිඟු අතරේ කිරිඳි* වපුරා ගියා. **26** තිරිඟු පැළ වැඩී පල දරන්න පටන්ගත් විට කිරිඳිත් මතු වුණා. **27** එවිට ඔහුගේ දාසයන් ඇවිත්, ‘ස්වාමීනි, ඔබේ කෙතෙහි ඔබ වැපුරුවේ හොඳ බීජ පමණයි[7] නේද? එසේනම් එහි කිරිඳි තිබෙන්නේ කොහොමද’[8] කියා ඔහුගෙන් ඇසුවා. **28** ‘මේ දේ කර ඇත්තේ සතුරෙක්’[9] කියා ඔහු ඔවුන්ට පැවසුවා. එවිට ඔවුන්, ‘එසේනම් අප ගොස් ඒවා උදුරා දමන්නද’ කියා ඔහුගෙන් ඇසුවා. **29** ඔහු පිළිතුරු දුන්නේ මෙසේයි. ‘එසේ කරන්න එපා. මන්ද එසේ කළොත් කිරිඳි උදුරද්දී ඒ සමඟම තිරිඟු පැළත් ඉදිරෙන්න පුළුවන්. **30** කපන කාලය වන තුරුම දෙවර්ගයටම එකට වැඩෙන්න ඉඩහරින්න. එවිට කපන කාලයේදී මුලින්ම කිරිඳි උදුරා මිටි බැඳ ඒවා පුලුස්සා දැමිය හැකියි.[1] ඉන්පසුව තිරිඟු මගේ ගබඩාවේ රැස් කරන්න[2] කියා අස්වැන්න නෙළන අයට කියන්න මට පුළුවන්.’ ”

**31** ඔහු ඔවුන්ට තවත් උපමාවක් මෙසේ විස්තර කළේය.[3] “ස්වර්ග රාජ්‍යය අබ ඇටයකට සමානයි.[4] එක්තරා මිනිසෙක් අබ ඇටයක් තම කෙතෙහි පැළ කළා. **32** එය සියලුම බීජවලට වඩා කුඩා වුණත් එය වැඩුණු පසු අනික් පලා ජාතිවලට වඩා විශාල වී අහසේ කුරුල්ලන්ට[5] ඇවිත් එහි අතුවල ලැගුම් ගැනීමට[6] හැකි තරම් විශාල ගසක් බවට පත් වෙයි.”

**33** ඔහු ඔවුන්ට තවත් උපමාවක් මෙසේ විස්තර කළේය. “ස්ත්‍රියක් පිටි ඒකක තුනක් ගෙන එයට මුහුන් මිශ්‍ර කළා* කියා සිතන්න. මිශ්‍ර කළ එම මුහුන් නිසා වැඩි වේලාවක් යන්න කලින් ඒ මුළු පිටි පිඩම පිපෙයි. ස්වර්ග රාජ්‍යයත් එම මුහුන්වලට සමානයි.”[7]

**34** යේසුස් ඒ සියල්ල සමූහයන්ට පැවසුවේ උපමා යොදාගෙනය. ඔහු උපමාවක් භාවිත නොකර ඔවුන්ට කතා කළේ නැත.[8] **35** ඔහු එසේ කළේ අනාගතවක්තෘ මාර්ගයෙන් කියන ලද, “මම උපමා මඟින් ඔබට කතා කරන්නෙමි. බොහෝ කලකට පෙර සිට* සඟවා තිබුණු දේවල් මම ප්‍රකාශ කරන්නෙමි”[9] යන අනාවැකිය ඉටු වීම සඳහායි.

**36** ඉන්පසු ඔහු සමූහයන්ට යන්න හැර නිවස ඇතුළට ගියේය. එවිට ඔහුගේ ගෝලයෝ ඔහු ළඟට ඇවිත්,

**13 පරි.**
1 යෙසා 58:2; එස 33:31; යොහ 5:35
2 මතෙ 24:10; මාක් 4:17; ලූක් 8:13; 2තිමෝ 1:15
3 මතෙ 6:21; මාක් 4:19; මාක් 10:23; ලූක් 8:14; 1තිමෝ 6:9; 2තිමෝ 4:10
4 ලූක් 12:22
5 මාක් 4:20; ලූක් 8:15
6 මාක් 4:26
7 මතෙ 13:38
8 උත් 1:11
9 මතෙ 13:39

**2 තීරුව**
1 මතෙ 3:12; ලූක් 3:17
2 එළි 14:15
3 මාක් 4:30
4 මතෙ 17:20; ලූක් 13:19
5 ගීතා 104:12; ආනි 4:12
6 එස 17:23
7 ලූක් 13:21; 1කොරි 5:6; ගලා 5:9
8 මාක් 4:34
9 ගීතා 78:2; රෝම 16:25; 1කොරි 2:7

මතෙ **13:25*** තිරිඟු පැළයේ පෙනුමට සමාන විෂ සහිත වල් පැළෑටියකි.

මතෙ **13:33*** මූ.අ., “ඒ තුළ මුහුන් සඟවා තැබුවා.” **35*** මූ.අ., “මුල පටන්.”

“කෙතේ පැළ වූ කිරිඳි ගැන උපමාව
අපට පැහැදිලි කර දෙන්න” කියා
කීවෝය. **37** ඔහු ඔවුන්ට පිළිතුරු
දුන්නේ මෙසේයි. “හොඳ බීජ වපු-
රන තැනැත්තා නම් මනුෂ්‍ය පුත්‍රයායි.
**38** කෙත කියන්නේ ලෝකයටයි.[1]
හොඳ බීජ නම් රාජ්‍යයේ පුත්‍ර-
යෝයි. කිරිඳි නම් දුෂ්ටයාගේ පුත්‍ර-
යෝයි.[2] **39** ඒවා වැපුරූ සතුරා නම්
යක්ෂයායි.[3] කපන කාලයෙන්[4] අද-
හස් වන්නේ පවතින මේ සමාජයේ
අවසාන කාලයයි.[5] අස්වැන්න කපන
අය නම් දේවදූතයෝයි. **40** කිරිඳි
එකතු කර ඒවා ගින්නෙන් දවා දැමුවා
ඔබට මතක ඇති. පවතින මේ සමා-
ජයේ අවසානයේදීත්[6] ඒ හා සමාන
දෙයක් සිදු වෙනවා. **41** මනුෂ්‍ය
පුත්‍රයා තම දූතයන්ව එවා, මිනිසුන්ව
පාපයට පොලඹවන සියලුදෙනාවද*[7]
දෙවිගේ නීතියට විරුද්ධව ක්‍රියා කරන
පුද්ගලයන්වද ඔහුගේ රාජ්‍යයෙන් පිට-
තට රැස් කර, **42** ගිනි උදුනට
හෙළයි.[8] එහිදී හැඬීමටත් දත්මිටි
කෑමටත් ඔවුන්ට සිදු වෙයි.[9] **43** ඒ
කාලයේදී ධර්මිෂ්ඨයන් තම පියා-
ණන්ගේ රාජ්‍යයෙහි සූර්යයා මෙන්[10]
දීප්තියෙන් බැබළෙයි.[11] මා පවසන
දේට සවන් දී එය තේරුම්ගැනීමට
උත්සාහ කරන්න.[12]

**44** “ස්වර්ග රාජ්‍යය තණබිමක
සඟවා තිබෙන වස්තුවකට සමානයි.
එක්තරා මිනිසෙකුට එය සම්බ වූ විට
ඔහු එය එතැනම සඟවා තැබුවා.
ඔහුට ඇති වූ ප්‍රීතිය කොතරම්ද කිය-
නවා නම් ඔහු ගොස් තමා සතු
සියල්ල විකුණා[13] ඒ තණබිම මිල දී
ගත්තා.[14]

**45** “ස්වර්ග රාජ්‍යය අගනා මුතු
සොයා ගිය සංචාරක වෙළෙන්දෙකු-
ටත් සමානයි. **46** ඉතා වටිනා එක්
මුතු ඇටයක්[15] ඔහුට සම්බ වූ විට ඔහු
වහාම ගොස් තමා සතු සෑම දෙයක්ම
විකුණා එය මිල දී ගත්තා.[16]

**47** “ස්වර්ග රාජ්‍යය මුහුදට හෙළා
සෑම වර්ගයකම මසුන් අසු කර-
ගන්නා දැලකටද සමානයි.[1] **48** ඒ
දැල පිරුණු විට මසුන් අල්ලන්-
නන් එය වෙරළට ඇද්දා. ඉන්පසු
ඔවුන් ඉඳගෙන හොඳ මසුන්[2] භාජන-
වලට එකතු කරගත් නමුත් නුසුදුසු
මසුන්[3] අහකට විසි කළා. **49** මේ
ලෝක සමාජයේ අවසානයේදීත් සිදු
වන්නේ එවැනිම දෙයක්. දේවදූතයන්
ඇවිත් ධර්මිෂ්ඨයන් අතරින්[4] දුෂ්ට-
යන්ව[5] වෙන් කර, **50** ඔවුන්ව ගිනි
උදුනට හෙළයි. ඔවුන්ට එහි හඬමින්
හා දත්මිටි කමින් කල් ගෙවන්න සිදු
වෙයි.[6]

**51** “ඔබට මේ සියල්ලේ අර්ථය
වැටහුණාද” කියා ඔහු ඇසූ විට ඔවුහු
“එසේය” කියා කීවෝය. **52** එවිට
ඔහු මෙසේ කීවේය. “ස්වර්ග රාජ්‍යය
ගැන ඉගෙනගත් පසු ඒ ගැන ප්‍රසිද්-
ධියේ අන් අයට උගන්වන සිය-
ලුදෙනාම,[7] තම වස්තුව රැස් කර
ඇති ගබඩාවෙන් අලුත් දේත් පරණ
දේත් පිටතට ගෙනෙන[8] ගෙහිමියෙ-
කුට සමානයි.”

**53** යේසුස් මේ උපමා පවසා නිම
වූ පසු එතැනින් පිටත්ව, **54** තමන්
ජීවත් වූ ගමට[9] පැමිණ, එහි සින-
ගෝගයේදී[10] සෙනඟට උගන්වන්න
පටන්ගත්තේය. ඔවුහු මවිතයට
පත්ව මෙසේ ඇසූහ. “මේ මිනි-
සාට මෙතරම් ප්‍රඥාවක් හා බල-
වත් ක්‍රියා කිරීමට තරම් බලයක්
ලැබුණේ කොහෙන්ද? **55** ඔහු වඩු-
වෙක්ගේ පුතෙක් නේද?[11] ඔහුගේ
මව මරියා නේද? ඔහුගේ සහෝදර-
යන් යාකොබ්, යෝසෙප්, සීමොන්
සහ යූදස් නේද? **56** ඔහුගේ සියලු
සහෝදරියන්ද අප සමඟ සිටි-
නවා නේද?[12] එසේනම් මේ මිනිසාට
මේ සියල්ල ලැබුණේ කොහෙන්ද?”[13]
**57** එහෙයින් ඔවුහු ඔහුව ප්‍රතික්ෂේප
කළෝය.[14] යේසුස් ඔවුන්ට මෙසේ
කීවේය. “අනාගතවක්තෘවරයෙකුට
ගෞරවය නොලැබෙන්නේ තමාගේම

**13 පරි.**
1 මතෙ 24:14 රෝම 10:18 කොලො 1:6
2 යොහ 8:44
3 1යොහ 3:8
4 යෝවෙ 3:13 එළි 14:15
5 හෙබ්‍රෙ 9:26
6 මතෙ 13:30
7 ශෙප 1:3 1කොරි 6:9
8 දානි 3:6 මතෙ 13:30 මතෙ 13:50 එළි 21:8
9 ගීතා 112:10 මතෙ 8:12 ලූක් 13:28
10 විනි 5:31 2සාමු 23:4
11 දානි 12:3
12 මාක් 4:23 එළි 2:7
13 පිලි 3:7
14 යෙසා 55:1 එළි 3:18
15 පිලි 3:8
16 හිතෝ 2:4 හිතෝ 8:18

**2 තීරුව**
1 මතෙ 22:10
2 ලෙවී 11:9
3 ලෙවී 11:12
4 මතෙ 25:32
5 ගීතා 1:5
6 මතෙ 8:12 මතෙ 22:13
7 1කොරි 4:1
8 මතෙ 12:35 ලූක් 6:45
9 මතෙ 2:23 මාක් 6:1
10 ලූක් 4:16
11 මාක් 6:3 ලූක් 3:23 ලූක් 4:22 යොහ 6:42
12 මතෙ 12:46 යොහ 2:12 ක්‍රියා 1:14 1කොරි 9:5 ගලා 1:19
13 යොහ 7:15
14 මතෙ 15:12 1පේත්‍ර 2:8

මතෙ **13:41*** මූ.අ., “පය පැකිළී වැටීමට සලස්වන සියල්ලද.”

ගමේදීත් තමාගේම ගෙදරදීත් පම-
ණයි."[1] 58 ඔවුන් තුළ විශ්වාසයක්
නොතිබූ නිසා[2] ඔහු එහිදී බලවත්
ක්‍රියා බොහොමයක් නොකළේය.

14 ඒ කාලයේදී දේශාධිපතිව
සිටි හෙරොද්ට යේසුස් ගැන
බොහෝ දේවල් ආරංචි විය.[3] 2 ඔහු
තම සේවකයන්ට මෙසේ කීවේය.
"මේ මරණයෙන් නැඟිට සිටින යො-
හන් බව්තීස්ත විය යුතුයි. ඔහුට
මේ වගේ බලවත් ක්‍රියා කළ
හැක්කේ ඒ නිසයි."[4] 3 ඔහු එසේ
කීමට හේතු වූ සිද්ධිය මෙයයි. හෙ-
රොද්ට පිලිප් නම් සහෝදරයෙක්
සිටි අතර පිලිප්ගේ භාර්යාව වූයේ
හෙරෝදියස්ය. හෙරොද් යොහන්ව
අත්අඩංගුවට ගෙන ඔහුව බැඳ, සිර-
ගෙයි දමා තිබුණේ ඇය නිසයි.[5]
4 එසේ කළේ, "ඇයව ඔබේ භාර්-
යාව ලෙස තබාගැනීම නීත්‍යානු-
කූල නැහැ"[6] කියා යොහන් හෙරොද්ට
පැවසූ නිසයි. 5 යොහන්ව මරන්න
ඔහුට වුවමනාවක් තිබුණත් සෙ-
නඟ යොහන්ව අනාගතවක්තෘව-
රයෙකු ලෙස සැලකූ නිසා[7] ඔහු
එසේ කිරීමට බිය විය. 6 හෙරොද්-
ගේ උපන් දිනය[8] සමරද්දී හෙ-
රෝදියස්ගේ දුව නටමින් හෙරොද්ව
කොතරම් සතුටු කළාද කිවහොත්,
7 ඇය ඉල්ලන ඕනෑම දෙයක් ඇයට
දීමට ඔහු දිවුරා පොරොන්දු විය.[9]
8 එවිට ඇය තම මවගේ පෙලඹවීම
මත, "මට යොහන් බව්තීස්තගේ හිස
තැටියක තබා දෙන්න" කියා ඉල්ලු-
වාය.[10] 9 ඒ ගැන හෙරොද් රජ බො-
හෝ සෙයින් දුක් වුවත් තමා කළ
දිවුරුම නිසාත් තමා සමඟ ඉඳගෙන
සිටි අය නිසාත් ඒ දේ කරන මෙන්
ඔහු අණ කළේය.[11] 10 ඔහු මිනි-
සුන් යවා සිරභාරයේ සිටි යොහන්-
ගේ හිස ගසා දැමීමට අණ කළේය.
11 ඉන්පසුව යොහන්ගේ හිස තැටි-
යක තබා තරුණියට දෙන ලදි. තරු-
ණියද එය රැගෙන තම මව වෙතට
ගොස් ඇයට දුන්නාය.[12] 12 පසුව
යොහන්ගේ ගෝලයෝ ඇවිත් ඔහු-
ගේ මළ සිරුර රැගෙන ගොස් තැන්-
පත් කළෝය.[1] ඉන්පසු ඔවුහු ඇවිත්
ඒ ගැන යේසුස්ට දැන්වූහ. 13 එය
ඇසූ යේසුස් එතැනින් පිටත් වී, ඔරු-
වකින් පාළු තැනකට ගියේය.[2] නමුත්
ඒ ගැන දැනගත් සමූහයෝ නුවරවල්-
වලින් පිටත් වී ඔහු ගිය ස්ථානයට
පයින්ම ගියෝය.

14 යේසුස් ඔරුවෙන් ගොඩ බැස්ස
විට මහත් සමූහයක් සිටිනවා දුටු-
වේය. ඔහුට ඔවුන් ගැන අනුකම්පා-
වක් ඇති වූ[3] නිසා ඔවුන් අතරේ සිටි
රෝගීන්ව සුව කළේය.[4] 15 සවස්
වූ විට ඔහුගේ ගෝලයෝ ඇවිත්,
"දැන් හුඟක් පරක්කු වෙලා. මේ
තැනත් හරිම පාළුයි. ඉතින් ගම්-
වලට ගොස් තමන්ට අවශ්‍ය කෑම
මිල දී ගන්න කියා සමූහයන්ට කිව්-
වොත් හොඳයි"[5] කියා ඔහුට කීවෝය.
16 නමුත් යේසුස්, "ඔවුන් යන්න
අවශ්‍ය නැහැ. ඔබ ඔවුන්ට කන්න
යමක් දෙන්න"[6] කියා ඔවුන්ට කීවේය.
17 එවිට ඔවුහු, "රොටි පහකුත් මසුන්
දෙදෙනෙකුත් හැර වෙන කිසිවක්
අපි ළඟ නැහැ"[7] කියා ඔහුට පැව-
සූහ. 18 එවිට ඔහු, "ඒවා මා අසලට
ගෙනෙන්න" කියා ඔවුන්ට කීවේය.
19 ඊළඟට ඔහු සමූහයන්ට තණබිම
මත ඉඳගන්න කියා පැවසුවේය. පසුව
ඔහු රොටි පහත් මසුන් දෙදෙනාත්
ගෙන ස්වර්ගය දෙසට තම හිස ඔසවා
යාච්ඤා කර[8] රොටි කඩා ගෝලයන්ට
දුන්නේය. ගෝලයෝ ඒවා සමූහයන්
අතරේ බෙදා දුන්නෝය.[9] 20 සෑම-
දෙනාම කා තෘප්තියට පැමිණියහ.
පසුව ගෝලයෝ ඉතුරු වූ කෑමව-
ලින් කූඩ දොළහක් පුරවාගත්හ.[10]
21 ස්ත්‍රීන් හා කුඩා දරුවන් හැර
කෑම කෑ පුරුෂයෝ පන්දහසක් පමණ
වූහ.[11] 22 ඉන්පසු ඔහු වහාම සමූහ-
යන්ව පිටත් කර යවා,[12] තමන්ට
කලින් ඔරුවෙන් එගොඩට යන මෙන්
තම ගෝලයන්ට අණ කළේය.

23 සමූහයන් පිටත්ව ගිය පසු යේ-
සුස් යාච්ඤා කිරීම සඳහා[13] තනිව
කන්දකට නැංගේය. සවස් වී තිබුණත්

**13 පරි.**
1 යෙරෙ 11:21, ලූක් 4:24, යොහ 4:44
2 මාක් 6:6

**14 පරි.**
3 මාක් 6:14, ලූක් 9:7, ක්‍රියා 4:27
4 මතෙ 16:14, මාක් 6:14, මාක් 6:16
5 මතෙ 4:12, මාක් 6:17, ලූක් 3:19
6 ලෙවී 18:16, ලෙවී 20:21, මතෙ 19:9
7 මතෙ 21:26, මාක් 6:20, ලූක් 1:76, ලූක් 20:6
8 උත් 40:20
9 1සාමු 14:28, 1සාමු 25:22, මාක් 6:22
10 මාක් 6:24
11 මාක් 6:26
12 මතෙ 17:12, මාක් 6:28

**2 තීරුව**
1 මාක් 6:29, ක්‍රියා 8:2
2 මාක් 6:31, ලූක් 9:10
3 මතෙ 9:36, මතෙ 15:32, මාක් 1:41, ලූක් 7:13, හෙබ්‍රෙ 2:17, හෙබ්‍රෙ 5:2
4 ලූක් 9:11
5 ලූක් 9:12
6 මාක් 6:37
7 ලූක් 9:13, යොහ 6:9
8 මතෙ 15:36, මාක් 6:41, ලූක් 9:16
9 මාක් 6:39, යොහ 6:10
10 2රාජා 4:44, මාක් 8:8, ලූක් 9:17, යොහ 6:12
11 මාක් 6:44, ලූක් 9:14, යොහ 6:10
12 මාක් 6:45, යොහ 6:15
13 මාක් 6:46, ලූක් 6:12, ලූක් 9:18

ඔහු එහි තනිව සිටියේය. **24** ඒ වන
විට ඔරුව තිබුණේ ඉවුරේ සිට යාර
සිය ගණනක් ඈතිනි. තද හුළඟක්
හැමූ නිසා රළ පෙළ වේගයෙන්
ඔරුවට හැපෙමින්[1] තිබිණ. එහෙයින්
ඔරුව පදවමින් සිටි ඔවුහු දැඩි අසීරු-
තාවකට මුහුණ දෙමින් සිටියෝය.
**25** රාත්‍රියේ හතරවෙනි යාමයේදී*
යේසුස් ජලය මත ඇවිදගෙන[2] ඔවුන්
වෙතට ආවේය. **26** ගෝලයෝ ඔහු
ජලය මත ඇවිදිනවා දැක කැලඹී, "ඒ
අවතාරයක්"[3] යයි කියමින් බියෙන්
කෑගැසූහ. **27** එසැණින්ම යේසුස්,
"භය වෙන්න එපා. මේ මමයි.[4] ධෛර්-
යවත් වන්න" කියා ඔවුන්ට පැවසු-
වේය. **28** එවිට පේතෘස්, "ස්වාමීනි,
ඒ ඔබ නම් වතුර මත ඇවිදගෙන ඔබ
ළඟට එන්න කියා මට පවසන්න"
යයි ඔහුට පැවසුවේය. **29** යේසුස්ද,
"එන්න" කියා කීවේය. එවිට පේ-
තෘස් ඔරුවෙන් බැස,[5] වතුර මත
ඇවිදගෙන යේසුස් වෙතට ආවේය.
**30** නමුත් එසේ ඇවිදගෙන යන අත-
රේ ඔහු කුණාටුව දැක භය වූ නිසා
ගිලෙන්න පටන්ගත්තේය. "ස්වාමීනි,
මාව බේරගන්න" කියා ඔහු කෑගැසු-
වේය. **31** යේසුස් විගස තම අත දිගු
කර ඔහුව අල්ලාගත්තේය. එවිට යේ-
සුස්, "ඔබේ විශ්වාසය දුර්වල වුණේ
ඇයි? ඔබ තුළ සැකයක් ඇති වෙන්න
ඉඩ දුන්නේ ඇයි"[6] කියා ඔහුගෙන්
ඇසුවේය. **32** ඔවුන් දෙදෙනා ඔරු-
වට නැඟුණු විට කුණාටුව නතර විය.
**33** එවිට ඔරුවේ සිටි අය ඔහු ඉදිරි-
යේ දණින් වැටී, "සැබවින්ම ඔබ නම්
දෙවිගේ පුත්‍රයායි"[7] කියා කීවෝය.
**34** ඔවුහු එගොඩ වී ගෙනසරෙත්
තැනිතලාවට ගොඩ බැස්සෝය.[8]
**35** එහි විසූ ජනයා ඔහුව හඳු-
නාගෙන අවට ප්‍රදේශවලට ඒ බව
දන්වා යැවූහ. එවිට ජනයා අසනීපව
සිටි සියල්ලන්ව ඔහු වෙතට ගෙනා-
වෝය.[1] **36** ඔවුහුද ඔහුගේ පිට වස්-
ත්‍රයේ වාටිය පමණක්වත් අල්ලන්න[2]
ඉඩ දෙන මෙන් ඔහුගෙන් බැගෑපත්ව
ඉල්ලා සිටියහ. එය ඇල්ලූ සියල්-
ලෝම සම්පූර්ණයෙන් සුවය ලැබූහ.

**15** පරිසිවරුද නීතිය පිට-
පත් කරන්නෝද යෙරුස-
ලමේ සිට[3] යේසුස් වෙතට ඇවිත්
මෙසේ කීවෝය. **2** "ඔබේ ගෝල-
යන් පුරාණයේ සිටි මිනිසුන් ඇති
කළ සම්ප්‍රදායන් කඩ කරන්නේ ඇයි?
උදාහරණයක් වශයෙන්, කෑම කන්න
කලින් ඔවුන් අත් සෝදාගන්නේ
නැහැ."[4]
**3** එවිට ඔහු ඔවුන්ට මෙසේ පිළි-
තුරු දුන්නේය. "එසේනම් ඔබත්
ඔබේ සම්ප්‍රදායන් නිසා දෙවිගේ ආඥා
කඩ කරන්නේ ඇයි?[5] **4** උදාහරණ-
යක් වශයෙන්, 'ඔබේ පියාටද මව-
ටද ගෞරව කරන්න'[6] කියාත් 'පියාට
හෝ මවට හෝ නින්දා කරන්නා මර-
ණයට සුදුසුයි'[7] කියාත් දෙවි පවසා
තිබෙනවා. **5** නමුත්, 'යමෙක් තම
පියාට හෝ මවට, "ඔබේ ප්‍රයෝජ-
නය සඳහා මා ඔබට දෙන්න සිටි
දේවල් දෙවිට කැප කළා" කියා පැව-
සුවොත්, **6** තම පියාට හෝ මවට
සලකන්න ඔහුට අවශ්‍ය නැහැ'[8] කියා
ඔබ කියනවා. මෙසේ ඔබ, ඔබේ සම්-
ප්‍රදායන් නිසා දෙවිගේ වචනය අවලංගු
කර තිබෙනවා.[9] **7** කුහකයෙනි,[10]
යෙසායා[11] කී මේ අනාවැකිය ඔබට
හොඳින් ගැළපෙයි. **8** 'මේ ජනයා
තම තොල්වලින් මට ගෞරව කරති.
නමුත් ඔවුන්ගේ සිත මා වෙතින් බො-
හෝ ඈත්ව තිබේ.[12] **9** ඔවුන් මට
කරන නමස්කාරයෙන් පලක් නැත.
මන්ද ඔවුන් දෙවිගේ ඉගැන්වීම් ලෙස
උගන්වන්නේ මිනිසුන්ගේ ආඥා පම-
ණයි.' "[13] **10** පසුව ඔහු සමූහයාව
තමන් වෙතට කැඳවා මෙසේ පැවසු-
වේය. "සවන් දී මෙහි සැබෑ අර්ථය
වටහාගන්න.[14] **11** මිනිසෙකු දූෂ්‍ය

**14 පරි.**
1 යොහ 6:18
2 මාක් 6:48, යොහ 6:19
3 ලූක් 24:37
4 මාක් 6:50, යොහ 6:20, ක්‍රියා 23:11
5 යොහ 21:7
6 මතෙ 6:30, මතෙ 8:26, මතෙ 28:17, යාකො 1:6
7 මතෙ 16:16, යොහ 6:69
8 මාක් 6:53, යොහ 6:21

**2 තීරුව**
1 මාක් 6:56
2 ලෙවී 6:27, ගණන් 15:38, මතෙ 9:21, මාක් 3:10, ලූක් 6:19

**15 පරි.**
3 මාක් 7:1
4 මාක් 7:2, ලූක් 11:38, යොහ 2:6
5 මතෙ 15:9, මාක් 7:8, කොලො 2:8, තීත 1:14
6 නික් 20:12, ද්වි 5:16, එෆී 6:2
7 නික් 21:17, ලෙවී 20:9, ද්වි 27:16, මාක් 7:10
8 මාක් 7:12
9 මාක් 7:13
10 මතෙ 23:13
11 මාක් 7:6
12 යෙසා 29:13
13 ගීතා 78:37, එස 33:31, මාක් 7:7, කොලො 2:22
14 මාක් 7:14

---

මතෙ **14:25*** ග්‍රීකවරු හා රෝමවරු මුර කිරීමට රාත්‍රිය කොටස් හතරකට බෙදූහ. හතරවෙනි යාමය යනු පෙ.ව. 3 සිට හිරු උදාව දක්වා වූ අවසාන යාමයයි. නික් 14:24 සහ විනි 7:19ට අනුව යුදෙව්වන් මුලින් රාත්‍රිය කොටස් තුනකට බෙදුවත් පසුව රෝමවරුන්ගේ ක්‍රමය අනුගමනය කළෝය. මාක් 13:35හි පාදසටහනද බලන්න.

වන්නේ ඔහුගේ කටට ඇතුල් වන දෙ-
යින් නොවෙයි. ඔහු දූෂ්‍ය වන්නේ ඔහු-
ගේ කටින් පිට වෙන දෙයින්.”[1]
**12** එවිට ගෝලයෝ ඇවිත්, “ඔබ
කී දේ අසා මේ පරිසිවරුන් කෝප
වූ බව ඔබ දන්නවාද” කියා ඔහු-
ගෙන් ඇසූහ.[2] **13** එවිට ඔහු මෙසේ
පිළිතුරු දුන්නේය. “ස්වර්ගයේ සිටින
මගේ පියාණන් පැළ නොකළ
සෑම පැළයක්ම උදුරා දමනු ලබයි.[3]
**14** ඔවුන් ඔහේ සිටියාවේ. ඔවුන්
අන්ධ මඟ පෙන්වන්නෝ වගෙයි.
අන්ධ මිනිසෙක් තවත් අන්ධ මිනි-
සෙකුට මඟ පෙන්නුවොත් ඒ දෙ-
දෙනාම වළක වැටෙයි.”[4] **15** එවිට
පේතෘස්, “කලින් පැවසූ උපමාව අපට
පැහැදිලි කර දෙන්න”[5] කියා ඔහුට
කීවේය. **16** ඔහු මෙසේ කීවේය.
“ඔබට තවමත් ඒ දේ තේරුණේ
නැද්ද?[6] **17** කටින් ඇතුල් වන සෑම
දෙයක්ම බඩට ගිය පසු වැසිකිළි-
යේදී එය බැහැර වන බව ඔබ දන්-
නේ නැද්ද? **18** නමුත් කෙනෙකුගේ
කටින් පිට වන දේ නික්මෙන්නේ ඔහු-
ගේ සිතිනුයි. මිනිසෙකු දූෂ්‍ය වන්නේ
ඒ දේවල්වලිනුයි.[7] **19** උදාහරණ-
යක් වශයෙන් දුෂ්ට අදහස්,[8] මිනී
මැරීම, අනාචාරය,* වේශ්‍යාකම,#
සොරකම, බොරු සාක්ෂි කීම සහ
අපහාස කිරීම වැනි දේවල් ඇරඹෙන්-
නේ සිතිනුයි.[9] **20** මිනිසෙකු දූෂ්‍ය
වන්නේ ඒ දේවල්වලිනුයි. නමුත් අත්
නොසෝදා කෑවාට මිනිසෙකු දූෂ්‍ය
වන්නේ නැහැ.”[10]
**21** යේසුස් එතැනින් පිටත්ව තීර්
හා සීදොන්ට අයත් ප්‍රදේශවලට
ගියේය.[11] **22** ඒ පළාතේ විසූ ෆිනී-
ෂියානු[12] ස්ත්‍රියක් ඇවිත්, “දාවිත්-
ගේ පුත්‍ර වූ ස්වාමීනි, මට අනුකම්පා
කරන්න.[13] මගේ දුවට භූතයෙක්
ආවේශ වෙලා. ඇය එයින් මහත්
සේ පීඩා විඳිනවා” කියා හඬ නඟා
කීවාය. **23** නමුත් ඔහු ඇයට වච-
නයක්වත් පැවසුවේ නැත. එහෙ-
යින් ඔහුගේ ගෝලයෝ ඇවිත්, “ඇය
කෑගසමින් අප පසුපස එනවා. ඇයට
යන්න කියන්න” කියා ඔහුගෙන් ඉල්-
ලුවෝය. **24** ඔහු ඔවුන්ට මෙසේ
පිළිතුරු දුන්නේය. “මාව එවන ලද්-
දේ ඊශ්‍රායෙල් වංශයේ නැති වුණු
බැටළුවන් වෙතට[1] මිස වෙන කිසි-
වෙකු වෙතට නොවෙයි.” **25** ස්ත්‍රිය
ඇවිත් ඔහු ඉදිරියේ දණින් වැටී,
“ස්වාමීනි, මට උදව් කරන්න”[2] කියා
පැවසුවාය. **26** එවිට ඔහු පිළිතුරු
දෙමින්, “දරුවන්ගේ රොටි රැගෙන
බලු පැටවුන්ට දැමීම සුදුසු නැත”
යයි කීවේය. **27** එවිට ඇය, “ස්වා-
මීනි, ඔබ කියන දේ හරි. නමුත්
බලු පැටවුන් පවා තම ස්වාමිවරුන්-
ගේ මේසයෙන් වැටෙන කෑම කනවා
නේද” කියා පැවසුවාය.[3] **28** එවිට
යේසුස්, “ස්ත්‍රිය, ඔබ තුළ තිබෙන විශ්-
වාසය මහත්ය. ඔබේ කැමැත්ත ලෙස
ඔබට වේවා” කියා කීවේය. ඒ පැයේ-
දීම ඇගේ දුව සුව වූවාය.[4]
**29** යේසුස් එම ප්‍රදේශයෙන් පිටත්
වී ගලීල මුහුද[5] ළඟට ආවේය. ඉන්පසු
ඔහු කන්දකට නැඟ[6] එහි එක්තරා
තැනක ඉඳගත්තේය. **30** එවිට
මහත් සමූහයක් කොර වූ මිනිසුන්-
වද අබ්බගාත අයවද අන්ධ මිනි-
සුන්වද ගොළු මිනිසුන්ව හා වෙනත්
රෝගවලින් පෙළුණු බොහෝ අයවද
රැගෙන කඩිමුඩියේ යේසුස් වෙතට
පැමිණ ඔවුන්ව ඔහුගේ පාමුල තැබූහ.
ඔහු ඔවුන් සියල්ලන්ව සුව කළේය.[7]
**31** එවිට ගොළු මිනිසුන් කතා කරන
බවද කොර වූ මිනිසුන් ඇවිදින බවද
අන්ධ අයට පෙනීම ලැබී ඇති බවද
දුටු සමූහයා විස්මයට පත් වී ඊශ්‍රායෙ-
ලයේ දෙවිට ප්‍රශංසා කළෝය.[8]
**32** නමුත් යේසුස් තම ගෝල-
යන්ව තමන් වෙතට කැඳවා මෙසේ
කීවේය.[9] “මේ සමූහයා ගැන මට
මහත් අනුකම්පාවක් දැනෙනවා.[10]
මන්ද ඔවුන් දැනටමත් දවස් තුනක්

**15 පරි.**
**1** මතෙ 12:34, මාක් 7:15, එෆී 4:29, 1තිමෝ 4:4, යාකො 3:6
**2** මාක් 7:17
**3** යොහ 15:6, ක්‍රියා 5:38
**4** යෙසා 9:16, මලා 2:8, මතෙ 23:16, ලූක් 6:39, යොහ 9:40
**5** මතෙ 13:36, මාක් 4:10, ලූක් 8:9
**6** මාක් 7:18
**7** ගීතා 5:9, මාක් 7:20, රෝම 3:13
**8** උත් 8:21, ද්වි 15:9, හිතෝ 6:14, යෙරෙ 17:9, රෝම 1:28
**9** මාක් 7:21, ගලා 5:19
**10** මාක් 7:23
**11** මාක් 7:24
**12** 1රාජා 17:9, මාක් 7:26, ලූක් 4:26
**13** මතෙ 20:30

**2 තීරුව**
**1** යෙසා 53:6, මතෙ 10:6, ක්‍රියා 3:26, ක්‍රියා 13:46, රෝම 15:8
**2** මාක් 7:26
**3** මාක් 7:28
**4** මාක් 7:29, යොහ 4:53
**5** මාක් 7:31
**6** මතෙ 5:1
**7** යෙසා 35:5, මතෙ 19:2, මාක් 3:10, මාක් 7:32
**8** මතෙ 9:33, මාක් 7:37
**9** මාක් 8:1
**10** මතෙ 14:14, මාක් 6:34

---

මතෙ **15:19*** මූ.අ., “පරදාර සේවනය.” මෙය භාවිත කරන්නේ විවාහක පුරුෂයෙකු හෝ ස්ත්‍රියක අනාචාරයේ යෙදීම විස්තර කිරීමටය. **19#** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න.

මා සමඟ සිටිනවා. ඔවුන්ට කන්න
කිසිවක් නැහැ. ඔවුන්ව කුසගින්-
නෙන් යවන්නත් මම කැමති නැහැ.
එසේ කළොත් සමහරවිට ඔවුන් මඟදී
ක්ලාන්ත වී වැටෙන්න පුළුවන්.”
**33** නමුත් ගෝලයෝ, “මේ පාළු ස්ථා-
නයේ සිටින අපි මෙතරම් විශාල සමූ-
හයකට අවශ්‍ය රොටි ලබාගන්නේ
කොතැනින්ද”[1] කියා ඔහුගෙන් ඇසූහ.
**34** එවිට යේසුස්, “ඔබ ළඟ රොටි
කීයක් තිබෙනවාද” කියා ඔවුන්ගෙන්
ඇසුවේය. “රොටි හතකුත් කුඩා මසුන්
කිහිපදෙනෙකුත් අපි ළඟ තිබෙ-
නවා” කියා ඔවුහු කීවෝය. **35** ඉන්-
පසු ඔහු සමූහයාට බිම ඉඳගන්න
කියා, **36** රොටි හත සහ මසුන්
ගෙන දෙවිට ස්තුති දීමෙන් පසු ඒවා
කඩා ගෝලයන්ට දුන්නේය. ගෝල-
යෝ ඒවා සමූහයන් අතරේ බෙදා
දුන්හ.[2] **37** සැමදෙනාම කා තෘප්-
තියට පැමිණියහ. ගෝලයෝ ඉතුරු
කෑමවලින් විශාල කූඩ හතක් පුර-
වාගත්තෝය.[3] **38** ස්ත්‍රීන් හා කුඩා
දරුවන් හැර කෑම කෑ පුරුෂයන්ගේ
ගණන හාරදහසක් විය. **39** අන්ති-
මේදී ඔහු සමූහයන්ව යවා ඔරුවට
නැඟ, මගදානයට අයත් පළාත්වලට
ගියේය.[4]

**16** එහිදී පරිසිවරු[5] සහ සද්-
දුසිවරු ඔහු වෙතට ඇවිත්
ඔහුගේ වරදක් අල්ලාගැනීමේ අද-
හසින් තමුන්ට අහසෙන් ලකුණක්[6]
පෙන්වන මෙන් ඔහුගෙන් ඉල්ලු-
වෝය. **2** ඔහු ඔවුන්ට මෙසේ උත්-
තර දුන්නේය. “[[ඔබ සාමාන්‍යයෙන්
පුරුදු වී සිටින්නේ සවස් වූ විට
‘අහස ගින්දර මෙන් රතු පාට නිසා
අද කාලගුණය හොඳ වෙයි’ කියා
කීමට හා, **3** උදේට ‘අහස ගින්දර
මෙන් රතු පාට වී අඳුරුව තිබුණොත්
අද ශීත, වැසි සහිත කාලගුණ-
යක් වෙයි’ කියා කීමටයි. අහස
දෙස බලා දවසේ කාලගුණය තෝරා
දෙන්න ඔබ දැන සිටියත් මේ කාලයට
අදාළ ලකුණු තෝරා දෙන්න ඔබට
බැහැ.]][7] **4** දුෂ්ට, ද්‍රෝහී පරම්පරා-
වක් දිගින් දිගටම ලකුණක් සො-
යයි. නමුත් යෝනාගේ ලකුණ[1] මිස
වෙන ලකුණක් ඔවුන්ට දෙනු ලබන්-
නේ නැහැ.”[2] ඔහු එසේ කියා ඔවුන්ව
අත්හැර ගියේය.[3]

**5** ගෝලයන් එගොඩට යද්දී රොටි
ගෙන යෑමට ඔවුන්ට අමතක
විය.[4] **6** මේ අතර යේසුස්, “සෝදිසි-
යෙන් සිටින්න. පරිසිවරුන්ගේ සහ
සද්දුසිවරුන්ගේ මුහුන්වලින් පරෙස්-
සම් වීමට වගබලා ගන්න”[5] කියා
ඔවුන්ට කීවේය. **7** එවිට ඔවුහු, “අප
රොටි රැගෙන ආවේ නැහැ නේද”
කියා එකිනෙකා අතරේ සාකච්ඡා
කරන්න පටන්ගත්තෝය. **8** යේ-
සුස් එය දැන මෙසේ කීවේය.
“ඔබ ළඟ රොටි නැති නිසා ඔබ
ඒ ගැන කතා කරන්නේ ඇයි? ඔබ-
ගේ විශ්වාසය තවත් වැඩි කර-
ගන්න අවශ්‍යයි.[6] **9** ඔබට තවමත්
තේරෙන්නේ නැද්ද? පන්දහස්දෙනා
සහ රොටි පහ පිළිබඳ සිද්ධියේදී
ඔබ කූඩ කීයක් පුරවාගත්තාද[7] කියා-
වත් ඔබට මතක නැද්ද? **10** නැත්-
නම් හාරදහස්දෙනා සහ රොටි
හත පිළිබඳ සිද්ධියේදී ඔබ විශාල
කූඩ කීයක් පුරවාගත්තාද[8] කියා-
වත් මතක නැද්ද? **11** මා ඔබට
ඒ රොටි ගැන කතා නොකළ බව
ඔබට නොතේරුණේ ඇයි? මම කිව්-
වේ පරිසිවරුන්ගේ සහ සද්දුසිවරුන්-
ගේ මුහුන්වලින් පරෙස්සම් වෙන්න[9]
කියායි.” **12** ඔහු පැවසුවේ පරිසිව-
රුන්ගේ සහ සද්දුසිවරුන්ගේ ඉගැන්-
වීම්වලින්[10] පරෙස්සම් වන්න කියා
මිස රොටිවල මුහුන් ගැන නොවන
බව ඔවුන් තේරුම්ගත්තේ එවිටයි.

**13** යේසුස්, සිසේරිය පිලිප්පියට
අයත් ප්‍රදේශවලට පැමිණි විට ඔහු
තම ගෝලයන්ගෙන් මෙසේ ඇසු-
වේය. “මනුෂ්‍ය පුත්‍රයා කවුරුන් කියාද
මිනිසුන් කියන්නේ?”[11] **14** ඔවුහු
පිළිතුරු දෙමින්, “සමහරුන් යොහන්
බව්තීස්ත[12] කියාත් අන් අය එලියා[13]
කියාත් කියනවා. තවත් අය යෙරෙ-
මියා හෝ අනාගතවක්තෘවරුන්ගෙන්

**15 පරි.**
1 ගණන් 11:22 2රාජා 4:43 මාක් 8:4
2 ද්වි 8:10 1සාමු 9:13 මතෙ 14:19 මාක් 8:6
3 මතෙ 16:10 මාක් 8:8
4 මාක් 8:10

**16 පරි.**
5 මතෙ 12:38
6 මාක් 8:11 ලූක් 11:16 1කොරි 1:22
7 යෙසා 7:14 මීකා 5:2 ලූක් 12:54

**2 තීරුව**
1 යෝනා 1:17
2 මාක් 8:12
3 මතෙ 12:39 ලූක් 11:29
4 මාක් 8:13 මාක් 8:14
5 මතෙ 24:4 මාක් 8:15 ලූක් 12:1 රෝම 16:17 කොලො 2:8
6 මතෙ 8:26 මාක් 8:17
7 මතෙ 14:17 මාක් 8:19
8 මතෙ 15:34 මාක් 8:20
9 ලෙවී 2:11 ලෙවී 6:17 මාක් 8:21 ලූක් 12:1
10 මතෙ 15:3
11 මාක් 8:27 ලූක් 9:18
12 මතෙ 14:2 ලූක් 9:7
13 යොහ 1:25

කෙනෙකු කියාත් කියනවා” කියා
පැවසුවෝය. **15** එවිට ඔහු, “ඔබ
හිතන්නේ මා කවුරුන් කියාද”[1] කියා
ඔවුන්ගෙන් ඇසුවේය. **16** සීමොන්
පේතෘස් පිළිතුරු දෙමින්, “ඔබ ක්‍රිස්-
තුස්.[2] ජීවමාන දෙවිගේ පුත්‍රයා[3] ඔබයි”
කියා කීවේය. **17** එවිට යේසුස්
ඔහුට මෙසේ කීවේය. “යෝනාගේ පුත්
සීමොන්, ඔබ බොහෝ සෙයින් සන්-
තෝෂ විය යුතු කෙනෙක්. මන්ද මේ
දේ ඔබට හෙළි කර දුන්නේ මිනිසුන්*
නොව ස්වර්ගයේ සිටින මගේ පියා-
ණන්.[4] **18** මා ඔබට කියන මේ දේ-
ටත් සවන් දෙන්න. ඔබ පේතෘස්ය.*[5]
මා මගේ සභාව ගොඩනඟන්නේ
මේ පර්වතය[6] මතයි. මිනී වළෙහි
දොරටුවත්[7] එය පරාජය කරන්නේ
නැහැ.[8] **19** ස්වර්ග රාජ්‍යයේ යතුරු
මා ලබා දෙන්නේ ඔබටයි. ඔබ පො-
ළොවෙහි යම් දෙයක් වසා දැමුවොත්*
ඒ දේම ඒ වන විටත් ස්වර්ගයෙහි වසා
දමා තිබෙන බවත් ඔබ පොළොවෙහි
යම් දෙයක් විවෘත කළොත්# ඒ දේම
ස්වර්ගයෙහි ඒ වන විටත් විවෘත කර
තිබෙන බවත්[9] මතක තබාගන්න.”
**20** ඉන්පසු ඔහු තමන් ක්‍රිස්තුස් බව
කිසිවෙකුට නොකියන්න[10] කියා ගෝ-
ලයන්ට තදින් අණ කළේය.
**21** එතැන් පටන් යේසුස් ක්‍රිස්තුස්,
තමන් යෙරුසලමට යා යුතු බවත්
වැඩිමහල්ලන්, නායක පූජකයන් සහ
නීතිය පිටපත් කරන්නන් අතින් බො-
හෝ දුක් විඳ මරනු ලබන බවත්
තුන්වෙනිදා නැඟිටුවනු ලබන බවත්[11]
තම ගෝලයන්ට පැහැදිලි කළේය.
**22** එවිට පේතෘස් ඔහුව පැත්තකට
ගෙන ගොස් ඔහුට තදින් කතා කර-
මින්, “ස්වාමීනි, ඔබ ගැනත් ටිකක්
හිතන්න. ඒ වගේ දෙයක් ඔබට
කවදාවත් සිදු විය යුතු නැහැ”[12]
කියා කීවේය. **23** නමුත් ඔහු හැරී,
“සාතන්! මගෙන් අහකට යන්න![13]
මට බාධා කරන්න එපා. ඔබ සිතන්-
නේ මිනිසුන් සිතන විදිහටයි. දෙවි
සිතන විදිහට නොවෙයි”[1] කියා පේ-
තෘස්ට කීවේය.
**24** එවිට යේසුස් තම ගෝලයන්ට
මෙසේ කීවේය. “යමෙකු මා අනුව
එන්න කැමති නම් ඔහු තම ජීවි-
තය දෙවිට කැප කර* තම වධ-
කණුව රැගෙන දිගටම[2] මා අනුව
එන්න අවශ්‍යයි. **25** මන්ද යමෙකු
තම ජීවිතය ගලවාගන්න කැමැත්-
තෙන් සිටියොත් ඔහුට එය නැති
වෙයි. නමුත් මා නිසා තම ජීවි-
තය නැති කරගන්නාට එය ලැබෙයි.[3]
**26** මිනිසෙකු මුළු ලෝකයම ලබා-
ගත්තත් තම ජීවිතය අහිමි කර-
ගන්නවා නම්[4] ඔහුට එයින් ඇති
ප්‍රයෝජනය කුමක්ද? තමන් සතු
සියල්ල දුන්නත් මිනිසෙකුට තම ජීවි-
තය බේරාගත හැකිද?[5] **27** මනුෂ්‍ය
පුත්‍රයා සිය පියාණන්ගේ තේජසින්
තම දූතයන් සමඟ ඒමට නියමි-
තයි. එවිට ඔහු එකිනෙකාට ඔවුන්-
ගේ ක්‍රියාවලට අනුව ප්‍රතිඵල දෙයි.[6]
**28** ඇත්තෙන්ම මා ඔබට කියන්නේ
මනුෂ්‍ය පුත්‍රයා රජු හැටියට පැමිණෙ-
නවා දකින තුරු මෙතැන සිටින්නන්-
ගෙන් සමහරෙකු කිසිවිටකත් මරණය
අද්දකින්නේ නැති බවයි.”[7]

**17** දවස් හයකට පසු යේසුස්
පේතෘස්වද යාකොබ්වද ඔහු-
ගේ සහෝදර යොහන්වද කැඳවාගෙන
උස් කන්දකට ගියේය.[8] **2** එවිට
ඔවුන් ඉදිරියෙහිම ඔහුගේ පෙනුම
සම්පූර්ණයෙන්ම වෙනස් විය. ඔහු-
ගේ මුහුණ සූර්යයා මෙන් බැබ-
ළෙන්නත්[9] ඔහුගේ වස්ත්‍ර ආලෝකය
මෙන් දීප්තිමත් වෙන්නත්[10] පටන්-
ගත්තේය. **3** එවිට මෝසෙස් සහ
එලියා ඔහු සමඟ කතා කරමින් සිටි-
නවා[11] ඔවුන්ට පෙනිණ. **4** එය දුටු
පේතෘස්, “ස්වාමීනි, මේ අවස්ථාවේදී
මෙතැන සිටින්න ලැබීම අපට ලොකු
සතුටක්. ඔබ කැමති නම් මම මෙහි

**16 පරි.**
1 මාක් 8:29
ලූක් 9:20
2 යොහ 1:41
යොහ 4:25
යොහ 11:27
3 ගීතා 2:7
මතෙ 14:33
ක්‍රියා 9:20
හෙබ්‍රෙ 1:2
1යොහ 4:15
4 මතෙ 11:27
මතෙ 17:5
5 යොහ 1:42
6 රෝම 9:33
1කොරි 3:11
1කොරි 10:4
එෆී 2:20
1පේතෘ 2:8
7 යෙසා 28:18
8 එළි 1:18
9 මතෙ 18:18
යොහ 20:23
10 මාක් 8:30
ලූක් 9:21
11 ගීතා 16:10
යෙසා 53:12
මතෙ 17:23
මතෙ 20:19
මාක් 8:31
ලූක් 9:22
ලූක් 24:46
1කොරි 15:4
12 මාක් 8:32
13 මතෙ 4:10

**2 තීරුව**
1 1කොරි 2:11
2 මතෙ 10:38
මාක් 8:34
ලූක් 9:23
ලූක් 14:27
3 ලූක් 17:33
යොහ 12:25
එළි 12:11
4 මාක් 8:36
5 ගීතා 49:8
6 ගීතා 62:12
හිතෝ 24:12
රෝම 2:6
2කොරි 5:10
1පේතෘ 1:17
7 මතෙ 10:23
මතෙ 17:2
මාක් 9:1

**17 පරි.**
8 මාක් 9:2
ලූක් 9:28
2පේතෘ 1:18
9 නික් 34:29
10 2පේතෘ 1:17
එළි 1:16
11 මාක් 9:4

මතෙ **16:17*** මූ.අ., “මාංසය හා රුධිරය.” **18*** ග්‍රීක බසට අනුව ගලක්ය. **19*** මූ.අ., “බැඳ තැබුවොත්.” **19#** මූ.අ., “මුදාහැරියොත්.”

මතෙ **16:24*** එනම්, තවදුරටත් තමා ගැන නොසිතා හෝ තම අවශ්‍යතාවලට මුල් තැන නොදී.

කූඩාරම් තුනක්, එකක් ඔබටද එකක්
මෝසෙස්ටද එකක් එලියාටද සාදන්-
නම්” කියා යේසුස්ට කීවේය.[1] **5** ඔහු
ඒ දේ පැවසූ මොහොතේම දීප්තිමත්
වලාකුළකින් ඔවුන් වට විය. එවිට
වලාකුළ අතරින් හඬක් නික්ම ඇවිත්,
“මේ මාගේ ප්‍රේමණීය පුත්‍රයාය. මො-
හුට මාගේ අනුමැතිය ඇත.[2] මො-
හුට සවන් දෙන්න”[3] කියා කීවේය.
**6** එය ඇසූ ගෝලයෝ අතිශයින් බිය
වී[4] දණින් වැටුණෝය. **7** එවිට යේ-
සුස් ඔවුන් ළඟට ඇවිත් ඔවුන් පිට
අත තබා, “නැඟිටින්න, භය වෙන්න
එපා”[5] කියා කීවේය. **8** ඔවුහු තම
හිස් ඔසවා බැලූ විට යේසුස් හැර වෙන
කිසිවෙකු එහි සිටිනවා දුටුවේ නැත.[6]
**9** ඔවුන් කන්දෙන් බැස එද්දී, “මනුෂ්‍ය
පුත්‍රයා මරණයෙන් නැඟිටින තුරු
ඔබ දුටු දේ ගැන කිසිවෙකුට නොකි-
යන්න”[7] කියා යේසුස් ඔවුන්ට අණ
කළේය.

**10** එවිට ගෝලයෝ, “එසේනම්
එලියා පළමුවෙන් පැමිණිය යුතුයි[8]
කියා නීතිය පිටපත් කරන්නන්
කියන්නේ ඇයි” කියා ඔහුගෙන් ඇසූහ.
**11** ඔහු මෙසේ උත්තර දුන්නේය.
“අනිවාර්යයෙන්ම මුලින්ම පැමිණෙන්-
නේ එලියායි. ඔහු ඇවිත් සියල්ල
නැවත පිහිටුවයි.[9] **12** නමුත් මා
ඔබට කියන්නේ, එලියා දැනටමත්
පැමිණ ඇති බවයි. නමුත් ඔවුන් ඔහුව
හඳුනා නොගෙන තමන්ට කැමති
දේ ඔහුට කළා. මනුෂ්‍ය පුත්‍රයාටත්
ඔවුන් අතින් පීඩා විඳින්න සිදු වෙයි.”[10]
**13** ඔහු කතා කළේ යොහන් බව්-
තීස්ත[11] ගැන බව ගෝලයන් තේරුම්-
ගත්තේ එවිටයි.

**14** ඔවුන් සමූහයා[12] ළඟට පැමිණි
විට මිනිසෙක් යේසුස් වෙතට පැමිණ
ඔහු ඉදිරියේ දණින් වැටී මෙසේ පැව-
සුවේය. **15** “ස්වාමීනි, මගේ පුතාට
අනුකම්පා කරන්න. ඔහු මීමැස්මොර
රෝගියෙක්. ඔහුගේ රෝගය ඉතා
දරුණුයි. ඔහු නිතරම ගින්න හා
වතුර සොයාගෙන ගිහින් එහි වැටෙ-
නවා.[13] **16** මා ඔහුව ඔබේ ගෝල-
යන් වෙතට ගෙන ආවත් ඔහුව සුව
කරන්න ඔවුන්ට හැකි වුණේ නැහැ.”[1]
**17** එවිට යේසුස් මෙසේ පැවසුවේය.
“ඔබ සියලුදෙනා තුළ කිසිම විශ්වාස-
යක් නැහැ. ඔබ නොමඟ ගිය පරම්ප-
රාවක්.[2] මා ඔබ සමඟ තව කොපමණ
කල් සිටින්නද? ඔබ ගැන තව කොප-
මණ කල් ඉවසන්නද? ඔහුව මා වෙ-
නට ගෙනෙන්න.” **18** එවිට යේසුස්
දරුවාට වැහී සිටි භූතයාට තදින්
කතා කළේය. භූතයා ඔහුගෙන් දුරු
වී[3] ගිය අතර ඒ පැයේදී දරුවාට සුවය
ලැබිණ.[4] **19** එවිට ගෝලයෝ පම-
ණක් යේසුස් ළඟට ඇවිත්, “අපට ඒ
භූතයාව දුරු කරන්න බැරි වුණේ
ඇයි”[5] කියා ඇසූහ. **20** “ඒ ඔබ තුළ
තිබෙන විශ්වාසයේ මදිකම නිසයි.
ඇත්තෙන්ම මා ඔබට කියන්නේ, අබ
ඇටයක් තරම්වත් විශ්වාසයක් ඔබ
තුළ ඇත්නම් ඔබ මේ කන්දට, ‘මෙ-
තැනින් අතනට යන්න’ කියා කිව්-
වොත් එය එතැනට යයි. ඔබට කළ
නොහැකි කිසිවක් නැහැ”[6] කියා ඔහු
ඔවුන්ට පැවසුවේය. **21** ——

**22** ඔවුන් ගලීලයේ රැස් වී සිටි-
යදී යේසුස් ඔවුන්ට මෙසේ කීවේය.
“මනුෂ්‍ය පුත්‍රයාව මිනිසුන් අතට පාවා
දෙන්න නියමිතයි.[7] **23** ඔවුන් ඔහුව
මරණයට පත් කරයි. නමුත් තුන්වෙ-
නිදා ඔහුව නැඟිටුවනු ලබයි.”[8] එය
ඇසූ විට ඔවුහු අතිශයින් දුක් වූහ.[9]

**24** ඔවුන් කපර්ණවුමට පැමිණි විට
දේවමාලිගාවට දෙන බද්ද* එකතු
කරන මිනිස්සු පේතෘස් ළඟට
ඇවිත්, “ඔබේ ගුරුතුමා දේවමාලිගා-
වට දෙන බද්ද ගෙවන්නේ නැද්ද”[10]
කියා ඇසූහ. **25** “ගෙවනවා” කියා
ඔහු කීවේය. ඔහු ගෙට ඇතුල් වූ
විට ඔහු යමක් කියන්න කලින්
යේසුස් ඔහුගෙන් මෙසේ ඇසුවේය.
“සීමොන්, ඔබ හිතන්නේ කුමක්ද?
පොළොවේ රජවරුන් තීරු බදු හෝ
ඇඟ බදු හෝ ලබාගන්නේ කාගෙන්ද?

**17 පරි.**
1 මාක් 9:5
2 ගීතා 2:7; යෙසා 42:1; මතෙ 3:17; ලූක් 9:35
3 ද්වි 18:15; ක්‍රියා 3:23; හෙබ්‍රෙ 2:3
4 මාක් 9:6
5 එළි 1:17
6 මාක් 9:8
7 මතෙ 16:20; මාක් 9:9; ලූක් 9:36
8 මතෙ 11:14
9 යෙසා 40:3; මලා 3:1; මලා 4:5; ලූක් 1:17
10 මතෙ 16:21; මාක් 9:13; ලූක් 23:25
11 ලූක් 1:17
12 ලූක් 9:37
13 මාක් 9:17

**2 තීරුව**
1 ලූක් 9:40
2 ද්වි 32:5; ද්වි 32:20; පිලි 2:15
3 මාක් 9:25
4 මතෙ 8:13; මතෙ 9:22; මතෙ 15:28; යොහ 4:52
5 මාක් 9:28
6 මතෙ 21:21; මාක් 11:23; ලූක් 17:6; 1කොරි 13:2
7 2සාමු 24:14; මතෙ 20:18; මාක් 9:31; ලූක් 9:44
8 මතෙ 16:21; මතෙ 28:6
9 මාක් 9:32; ලූක් 9:45
10 නික් 30:13; නික් 38:26

මතෙ **17:24*** මූ.අ., “ඩ්‍රැක්මා දෙකේ බද්ද.” දවස් දෙකක වැටුපට සමානය.

තම පුතුන්ගෙන්ද නැත්නම් අනුන්-
ගෙන්ද?” **26** “අනුන්ගෙන්” කියා
ඔහු පැවසුවේය. එවිට යේසුස් ඔහුට
මෙසේ කීවේය. “එසේනම් ඇත්ත-
ටම පුතුන් බදු ගෙවීමෙන් නිදහස්.
**27** නමුත් ඔවුන් සමඟ ප්‍රශ්න ඇති
කරගන්න අපට අවශ්‍ය නැහැ.[1] එම-
නිසා ඔබ මුහුදට ගොස් බිලි බාන්න.
ඔබ මුලින්ම අල්ලාගන්නා මාළුවා
ගෙන උගේ කට අරින විට රිදී කාසි-
යක්* තිබෙනවා ඔබ දකියි. ඒ කාසිය
ගෙන මා සහ ඔබ වෙනුවෙන් ඔවුන්ට
දෙන්න.”[2]

**18** ඒ පැයේදීම ගෝලයෝ යේ-
සුස් ළඟට ඇවිත්, “ස්වර්ග
රාජ්‍යයේ උතුම්ම තැනැත්තා කවුද”[3]
කියා ඇසූහ. **2** එවිට ඔහු කුඩා දරු-
වෙකු තමන් ළඟට කැඳවා,
ඔහුව ඔවුන් මැද සිටුවා,[4] **3** මෙසේ
කීවේය. “ඇත්තෙන්ම මා ඔබට
කියන්නේ, ඔබ වෙනස් වී කුඩා දරු-
වන් හා සමාන වන්නේ නැත්නම්[5]
ඔබට ස්වර්ග රාජ්‍යයට ඇතුල් වන්න
කිසි ලෙසකින්වත් හැකි වන්නේ නැති
බවයි.[6] **4** එමනිසා ඕනෑම කෙනෙක්
මේ කුඩා දරුවා මෙන් නිහතමානී[7]
වෙනවා නම් ස්වර්ග රාජ්‍යයේ උතුම්ම
තැනැත්තා වන්නේ ඔහුයි.[8] **5** මා
නිසා* යමෙකු කුඩා දරුවෙකු මෙන්
සිටින කෙනෙකුව මගේ අනුගාමික-
යෙකු ලෙස පිළිගත්තොත් ඔහු මාවත්
පිළිගන්නවා.[9] **6** නමුත් යම් කෙ-
නෙක් කරන දෙයක් නිසා මා කෙරෙහි
විශ්වාසය තබන කුඩා දරුවන් හා
සමාන අයගෙන් එක් කෙනෙක් හෝ
වැටී ගියොත්* බූරුවෙකු විසින් කරක-
වනු ලබන ඇඹරුම් ගලක්[10] ඔහුගේ
බෙල්ලේ එල්ලා ඔහුව මහ මුහුදේ[11]
ගිල්වා දැමීම වඩාත් හොඳයි.
**7** “මිනිසුන්ව වරදට පොලඹවන
මේ ලෝකයට මොන තරම් දරුණු
ප්‍රතිඵලවලට මුහුණ දෙන්න සිදු වෙ-
යිද! ඕනෑම කෙනෙක් වරදට පෙල-
ඹෙන්න ඉඩ තිබෙන බව ඇත්තයි.[1]
නමුත් වරදක් කිරීමට අන් අයව පො-
ලඹවන තැනැත්තාට මොන තරම්
දරුණු ප්‍රතිඵල අත් වෙයිද![2] **8** එසේ-
නම් ඔබේ අත නිසා හෝ ඔබේ පය
නිසා හෝ ඔබ වරදක් කරන්න පෙල-
ඹෙනවා නම්* එය කපා අහකට විසි
කරන්න.[3] මන්ද ඔබ අත පය ඇතුව
සදාකාල ගින්නට[4] හෙළනු ලබනවාට
වඩා කොර වූ කෙනෙකු ලෙස හෝ
අබ්බගාතයෙකු ලෙස ඔබට ජීවනය
හිමි වෙනවා නම් එය වඩාත් හොඳ
නැද්ද? **9** ඔබේ ඇස නිසා ඔබ වර-
දක් කරන්න පෙලඹෙනවා නම්* එයද
උගුලා අහකට විසි කරන්න. මන්ද
ඔබේ දෑස් ඇතුව ගිනිමය ගෙහෙන්නා-
වට#[5] හෙළනු ලබනවාට වඩා එක
ඇසක් නැතුව වුණත් ඔබට ජීවනය
හිමි වෙනවා නම් එය වඩාත් හොඳය.
**10** මේ කුඩා අයගෙන් එක් කෙනෙකු-
වත් සුළු කොට නොසැලකිය යුතු බව
මතක තබාගන්න. මන්ද ඔවුන්ව රැක-
බලා ගන්නා ස්වර්ගයෙහි සිටින ඔවුන්-
ගේ දේවදූතයන්[6] නිතරම සිටින්නේ
ස්වර්ගයේ සිටින මගේ පියාණන්ගේ
මුහුණ ඉදිරියෙහියි.[7] **11** ——
**12** “ඔබ සිතන්නේ කුමක්ද? යම්
මිනිසෙකුට බැටළුවන් සියදෙනෙකු
සිටිද්දී උන්ගෙන් එකෙකු මංමුළා
වී ගියොත්[8] ඔහු අනික් අනූනව-
දෙනාට කඳුවල ඉන්න හැර මංමුළා
වී ගිය[9] බැටළුවා සොයා යන්නේ
නැද්ද? **13** ඌව සොයාගත්තොත්
අනික් අනූනවදෙනා ගැන ප්‍රීති වෙන-
වාට වඩා ඔහු සොයාගත් ඒ එක බැට-
ළුවා ගැන ප්‍රීති වන[10] බව මම ඔබට
සහතිකවම කියනවා. **14** එලෙසම
කුඩා දරුවන් හා සමාන මේ අය-
ගෙන් එක් කෙනෙකුවත් විනාශ වෙන-
වාට ස්වර්ගයේ සිටින මගේ පියාණන්
කැමති නැහැ.[11]

**17 පරි.**
1 රෝම 14:13 1කොරි 8:13 1කොරි 10:32 2කොරි 6:3
2 මාක් 12:17 රෝම 13:7

**18 පරි.**
3 මාක් 9:34 ලූක් 9:46 ලූක් 22:24
4 මාක් 9:36
5 මතෙ 19:14 1කොරි 14:20 1පේතෘ 2:2
6 ලූක් 18:17
7 මතෙ 20:26 මතෙ 23:12 ලූක් 14:11 ලූක් 22:26 යාකො 4:10
8 හිතෝ 15:33 ලූක් 9:48 1පේතෘ 5:5
9 මාක් 9:37
10 එළි 18:21
11 මාක් 9:42 ලූක් 17:2

**2 තීරුව**
1 මතෙ 26:24
2 ලූක් 17:1
3 මතෙ 5:29 මාක් 9:43 කොලො 3:5
4 මතෙ 25:41
5 මතෙ 5:22 මතෙ 5:29 මාක් 9:47 රෝම 8:13
6 ක්‍රියා 12:15 හෙබ්‍රෙ 1:14
7 ලූක් 1:19
8 1පේතෘ 2:25
9 ලූක් 15:4
10 ලූක් 15:6
11 ලූක් 15:7 2පේතෘ 3:9

මතෙ **17:27*** මූ.අ., “ස්ටේටර් කාසියක්.” මෙය වටිනාකමින් ඩ්‍රැක්මා කාසි හතරකට සමානයි. **18:5*** හෝ, “මාගේ නාමයෙන්.” **6*** මූ.අ., “පය පැකිළී වැටුණොත්.”

මතෙ **18:8*** මතෙ 18:6හි පාදසටහන බලන්න. **9*** මතෙ 18:6හි පාදසටහන බලන්න. **9#** යෙරුසලමෙන් පිටත කසළ පුලුස්සා දැමීම සඳහා භාවිත කළ ස්ථානය. උපග්‍ර. 2 බලන්න.

15 "ඔබේ සහෝදරයා පාපයක්
කළොත් ගොස් තනිව ඔහුව හමු වී[1]
ඔහුගේ වරද පෙන්වා දෙන්න. ඔහු ඔබ
කියන දේ පිළිගත්තොත් ඔබේ සහෝ-
දරයාව ඔබ දිනාගෙන තිබෙනවා.[2]
16 නමුත් ඔහු එය පිළිගන්නේ නැත්-
නම් තවත් එක් කෙනෙකු හෝ දෙදෙ-
නෙකු සමඟ ඔහුව හමු වීමට යන්න.
එසේ කළ යුත්තේ සාක්ෂිකරුවන්
දෙදෙනෙකුගේ හෝ තුන්දෙනෙකුගේ
හෝ සාක්ෂියෙන් සෑම කාරණයක්ම
ස්ථිර වන නිසයි.[3] 17 ඔහු ඔවුන්
කියන දේත් පිළිගන්නේ නැත්නම්
සභාවට දැනුම් දෙන්න. ඔහු සභාව
කියන දේත් පිළිගන්නේ නැත්නම්
වෙනත් ජාතිකයෙකු[4] හා බදු එකතු
කරන්නෙකු[5] හා සමානව ඔහුට සැල-
කිය යුතුයි.

18 "ඇත්තෙන්ම මා ඔබට කියන්-
නේ, පොළොවේදී ඔබ යම් දෙයක්
බැඳ තැබුවොත් එය ඒ වන විටත්
ස්වර්ගයෙහි බැඳ තබා ඇති බවයි.*
ඔබ පොළොවේදී යම් දෙයක් නිදහස්
කළොත් එය නිදහස් බව ඒ වන විටත්
ස්වර්ගයෙහි තීරණය කර තිබෙ-
නවා.#[6] 19 නැවතත් මා ඔබට
කියන්නේ, පොළොවේදී ඔබ අත-
රෙන් දෙදෙනෙකු යම් බැරෑරුම් කාර-
ණයක් ගැන එකඟතාවකට පැමිණ ඒ
ගැන ස්වර්ගයේ සිටින මගේ පියා-
ණන්ගෙන් ඉල්ලීමක් කළොත් ඔහු
ඔවුන්ට එම ඉල්ලීම ඉටු කර දෙන
බවයි.[7] 20 එසේම දෙදෙනෙකු හෝ
තුන්දෙනෙකු හෝ මගේ නාමයෙන්
යම් තැනක රැස්ව සිටියොත්[8] ඔවුන්
අතරෙහි මමත් සිටිනවා."[9]

21 එවිට පේතෘස් ඔහු ළඟට
ඇවිත්, "ස්වාමීනි, මට විරුද්ධව පව්
කරන මගේ සහෝදරයාට මා කොප-
මණ වතාවක් සමාව දිය යුතුද?[10]
හත් වරක් දක්වා සමාව දුන්නොත්
සෑහෙයිද"[1] කියා ඇසුවේය. 22 යේ-
සුස් ඔහුට මෙසේ කීවේය. "මා ඔබට
කියන්නේ, හත් වරක් දක්වා නොව
හැත්තෑහත් වරක් දක්වා සමාව
දෙන්න[2] කියායි.

23 "තම දාසයන් සමඟ ගණන්
හිලව් බලන්න[3] අවශ්‍ය වූ රජෙ-
කුට[4] ස්වර්ග රාජ්‍යය සමාන වන්-
නේ ඒ නිසයි. 24 ඔහු ගණන් හිලව්
බලන්න පටන්ගත් විට තමන්ට
තලෙන්ත* දසදහසක් [එනම්
ඩිනාරි# 6,00,00,000ක්] ණයව සිටි
දාසයෙකුව ඔහු වෙතට ගෙනෙනු
ලැබුවා. 25 නමුත් ඔහුට එය ගෙ-
වන්න හැකියාවක් තිබුණේ නැහැ. ඒ
නිසා ඔහුවද ඔහුගේ බිරිඳවද ඔහු-
ගේ දරුවන්වද ඔහුට අයිති සියල්ලද
විකුණා එය ගෙවන මෙන් ඔහු-
ගේ ස්වාමියා වූ ඒ රජ අණ කළා.[5]
26 නමුත් ඒ දාසයා බිම වැටී ඔහුට
වැඳ, 'අනේ, මට තව කල් දෙන්න.
මම ඔබට ඒ සියල්ල ගෙවන්නම්'
කියා පැවසුවා. 27 ස්වාමියාට ඒ
දාසයා ගැන මහත් අනුකම්පාවක්
ඇති වූ නිසා ඔහුව නිදහස් කර[6]
ඔහුගේ ණය පවා අහෝසි කළා.[7]
28 නමුත් ඒ දාසයා තමන්ට ඩිනාරි
සියයක්[8] ණයව සිටි වෙන දාස-
යෙකුව සොයාගෙන ගොස් ඔහුව
අල්ලාගෙන ඔහුගේ බෙල්ල මිරික-
මින්, 'මගේ ණය ගෙවන්න' කියා
පැවසුවා. 29 ඒ දාසයා දණින් වැටී,
'අනේ, මට තව කල් දෙන්න.[9]
ඒ ණය මම ඔබට ගෙවන්නම්'
කියා බැගෑපත්ව ඉල්ලා සිටියා.
30 නමුත් ඔහු එසේ කිරීමට අකමැ-
තිව ණය ගෙවන තුරු ඔහුව සිරගෙයි
දමන්න පියවර ගත්තා. 31 සිදු වූ
දේ දුටු අනික් දාසයෝ බොහෝ සෙ-
යින් දුක් වී ස්වාමියා වෙතට ගොස්
සිදු වූ සියල්ල ඔහුට දැන්වූවා.[10]

**18 පරි.**
1 ලෙවී 19:17 හිතෝ 25:9 ලූක් 17:3
2 යාකො 5:20
3 ද්වි 19:15 යොහ 8:17 2කොරි 13:1 1තිමෝ 5:19 හෙබ්‍රෙ 10:28
4 යොහ 18:28 ක්‍රියා 10:28 ක්‍රියා 11:3
5 රෝම 16:17 1කොරි 5:11
6 මතෙ 16:19 යොහ 20:23
7 මාක් 11:24 යොහ 14:13 යොහ 16:24 1යොහ 3:22 1යොහ 5:14
8 1කොරි 5:4
9 මතෙ 28:20
10 හිතෝ 19:11

**2 තීරුව**
1 මතෙ 6:12
2 මාක් 11:25 ලූක් 17:4 එෆී 4:32 කොලො 3:13
3 රෝම 14:12
4 මතෙ 22:2
5 නික් 21:7 ලෙවී 25:39 2රාජා 4:1 නෙහෙ 5:8
6 ලූක් 7:42
7 1යොහ 1:9
8 ලූක් 7:41
9 මතෙ 18:26
10 ලෙවී 5:1

මතෙ **18:18*** ඇතැම්විට මෙහි සඳහන් වන්නේ කළ වරදක් ගැන පියවර ගැනීම හෝ ඇතැම් ක්‍රියා තහනම් කිරීම ගැනය. **18#** ඇතැම්විට මෙහි සඳහන් වන්නේ කෙනෙකු නිදොස් බව තීරණය කිරීම හෝ යම් ක්‍රියාවලට අවසර දීම ගැනය.

මතෙ **18:24*** බර කිරීමට හා මූල්‍යමය වටිනාකම මැනීමට හෙබ්‍රෙව් ජාතිකයන් භාවිත කළ විශාලතම ඒකකයි. ක්‍රි.ව. 1වන සියවසේදී භාවිත වූ තලෙන්තයක බර කිලෝග්‍රෑම් 20.4ක් විය. **24#** ග්‍රෑම් 3.85ක් බර රෝමානු රිදී කාසියක්.

**32** එවිට ස්වාමියා ඔහුව කැඳවා,
'ඔබ ඉතා දුෂ්ට දාසයෙක්! ඔබ
මාගෙන් බැගෑපත්ව ඉල්ලා සිටි විට
මම ඔබේ මුළු ණයම අහෝසි කර
දැමුවා. **33** මා ඔබට අනුකම්පා
කළා වගේම[1] ඔබත් ඒ දාසයාට
අනුකම්පා කරන්න තිබුණා[2] නේද?'
**34** උදහසට පත් ඒ ස්වාමියා,[3] ඔහු
තමාට ගෙවිය යුතු සම්පූර්ණ ණය
ගෙවන තුරු ඔහුව සිරගෙයි භාරකරු-
වන්ට භාර දුන්නා. **35** ඔබ එකි-
නෙකාත් තම තමාගේ සහෝදරයාට
ඔබේ මුළු හදවතින්ම සමාව නොදුන්-
නොත්[4] ස්වර්ගයේ සිටින මගේ පියා-
ණන්ද ඔබට එසේම කරයි."[5]

**19** යේසුස් ඒ වචන කියා නිම
කළ පසු ගලීලයෙන් පිටත් වී
යොර්දාන් ගඟෙන් එතෙර පිහිටි යුද-
යේ මායිම්වලට ගියේය.[6] **2** මහත්
සමූහයෝද ඔහු පසුපස ගියහ. ඔහු
එහිදී ඔවුන්ව සුව කළේය.[7]

**3** එවිට පරිසිවරුද ඔහුගේ වරදක්
අල්ලාගැනීමේ අදහසින් ඔහු ළඟට
ආවෝය. ඔවුහු, "කුමන හේතුවක්
නිසා හෝ මිනිසෙකු තම බිරිඳව දික්-
කසාද කිරීම නීත්‍යානුකූල දෙයක්ද"[8]
කියා ඔහුගෙන් ඇසූහ. **4** ඔහු
ඔවුන්ට මෙසේ පිළිතුරු දුන්නේය.
"ඔබ ඒ ගැන කලින් කියවා නැද්ද?
දෙවි මිනිසුන්ව සෑදූ කාලයේදී ඔහු
ඔවුන්ව පුරුෂයෙකු සහ ස්ත්‍රියක වශ-
යෙන් සෑදුවා.[9] **5** 'ඒ නිසා මිනිසෙක්
තම පියාගෙන්ද මවගෙන්ද වෙන් වී[10]
තම බිරිඳට ඇලුම් වන්නේය කියාද
ඔවුහු දෙදෙනා එක් කෙනෙකු මෙන්
වන්නෝය'[11] කියාද ලියා තිබෙනවා.
**6** එසේ ඔවුන් එතැන් පටන් දෙදෙ-
නෙකු නොව එක් කෙනෙකු මෙන්
වෙනවා. දෙවි ඔවුන්ව එලෙස එක්
කළ නිසා කිසි මිනිසෙක් ඔවුන්ව
වෙන් නොකළ යුතුයි."[12] **7** එවිට
ඔවුහු, "එසේනම් අත්හැරීමේ පත්‍රයක්
දී ඇයව දික්කසාද කළ හැකි බව
මෝසෙස් පැවසුවේ ඇයි"[13] කියා ඔහු-
ගෙන් ඇසූහ. **8** ඔහු ඔවුන්ට මෙසේ
කීවේය. "ඔබේ භාර්යාවන් දික්කසාද
කිරීමට මෝසෙස් ඉඩ දුන්නේ ඔබ
ඉතා දැඩි සිත් ඇති පිරිසක්[1] වන
නිසයි. නමුත් පටන්ගැන්මේදී එවැනි
දෙයක් සිදු වූයේ නැහැ.[2] **9** මා
ඔබට කියන්නේ, වේශ්‍යාකම* නිසා
මිස වෙන හේතුවකට තම බිරිඳව
දික්කසාද කර වෙන ස්ත්‍රියක විවාහ
කරගන්නා කෙනෙක් අනාචාරයේ#
යෙදෙන බවයි."[3]

**10** ගෝලයෝද, "මිනිසෙකු හා
තම බිරිඳ අතර තත්වය එසේනම්
විවාහ නොවී සිටීම වඩාත් හොඳයි"[4]
කියා ඔහුට කීවෝය. **11** එවිට ඔහු
ඔවුන්ට මෙසේ කීවේය. "හැමදෙනාම
එම වදන් පිළිගන්නේ නැහැ. විවාහ
නොවී සිටීමේ දීමනාව ඇති අය පම-
ණයි එය පිළිගෙන ඒ සඳහා ඉඩකඩ
සලසාගන්නේ.[5] **12** උපතේදී උරුම
වූ යම් දෝෂයක් නිසා[6] සමහරු
විවාහ නොවී සිටියි. තවත් අය විවාහ
නොවන්නේ ඔවුන්ව මිනිසුන් විසින්
නපුංසකයන් බවට පත් කර ඇති
නිසයි. තවත් පිරිසක් විවාහ නොවී
සිටින්නේ ස්වර්ග රාජ්‍යය වෙනුවෙන්
සේවය කිරීමටයි. එවැනි සේවයක්
කිරීමට ඉඩකඩ සලසාගන්නා පුද්ගල-
යාට එසේ කළ හැකියි."[7]

**13** ඉන්පසු කුඩා දරුවන්ව යේසුස්
ළඟට ගෙනෙන ලදි. එසේ කළේ යේ-
සුස් කුඩා දරුවන්ට ආශීර්වාද කර
ඔවුන් ගැන යාච්ඤා කරන පිණි-
සය. නමුත් එය දුටු ගෝලයෝ ඒ
දෙමාපියන්ට තදින් කතා කළෝය.[8]
**14** එනමුත් යේසුස්, "එහෙම කරන්න
එපා. මේ කුඩා දරුවන්ට මා ළඟට
එන්න ඉඩහරින්න. මන්ද ස්වර්ග
රාජ්‍යය අයිති වන්නේ මේ දරුවන්
වගේ සිටින අයටයි"[9] කියා කීවේය.
**15** ඔහු ඔවුන් පිට අත් තබා ඔවුන්ට
ආශීර්වාද කර එතැනින් පිටත්ව
ගියේය.[10]

**18 පරි.**
1 යෙසා 55:7
2 මතෙ 6:12
මතෙ 7:12
යාකො 2:13
3 මතෙ 22:7
4 හිතෝ 21:13
මතෙ 6:14
මාක් 11:25
ලූක් 17:3
එෆී 4:32
5 යෝබ් 34:11
ගීතා 62:12
හිතෝ 24:12
රෝම 2:6

**19 පරි.**
6 මාක් 10:1
යොහ 10:40
7 මතෙ 12:15
මතෙ 14:14
මතෙ 15:30
ලූක් 5:15
8 ද්වි 24:1
මතෙ 16:1
මාක් 10:2
9 උත් 1:27
උත් 5:2
මාක් 10:6
10 මාක් 10:7
එෆී 5:31
11 උත් 2:24
12 මාක් 10:9
1කොරි 7:11
13 ද්වි 24:1
මතෙ 5:31

**2 තීරුව**
1 මාක් 10:5
2 උත් 2:24
3 මලා 2:14
මතෙ 5:32
මාක් 10:11
ලූක් 16:18
රෝම 7:3
1කොරි 7:10
හෙබ්‍රෙ 13:4
4 1කොරි 7:8
1කොරි 7:38
1කොරි 7:40
5 1කොරි 7:7
6 ද්වි 23:1
යෙසා 56:3
7 1කොරි 7:32
1කොරි 7:38
1කොරි 9:5
8 මාක් 10:13
ලූක් 18:15
9 මතෙ 18:3
මාක් 10:14
ලූක් 18:16
10 මාක් 10:16

මතෙ **19:9*** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න. **9#** මූ.අ., "පරදාර සේවනයේ." මෙය භාවිත කරන්නේ විවාහක පුරුෂයෙකු හෝ ස්ත්‍රියක අනාචාරයේ යෙදීම විස්තර කිරීමටය.

**16** මේ අතර එක්තරා තැනැත්-
තෙක් ඔහු වෙතට ඇවිත්, “ගුරුතු-
මනි, සදාකාල ජීවනය ලබාගන්න මා
කළ යුත්තේ කුමනාකාරයේ යහපත්
දේවල්ද”[1] කියා ඔහුගෙන් ඇසුවේය.
**17** ඔහු ඔහුට මෙසේ කීවේය. “යහ-
පත් දේ කුමක්ද කියා ඔබ මගෙන්
අසන්නේ ඇයි? යහපත්ව සිටින්-
නේ එක් තැනැත්තෙක් පමණයි.[2]
නමුත් ඔබට ජීවනය ලබාගන්න
ඕනෑ නම් දිගටම දෙවිගේ ආඥා
පවත්වන්න.”[3] **18** එවිට ඔහු, “ඒ
කුමන ආඥාද”[4] කියා ඔහුගෙන් ඇසු-
වේය. යේසුස් පිළිතුරු දෙමින්, “මිනී
නොමරන්න.[5] අනාචාරයේ* නොහැ-
සිරෙන්න.[6] සොරකම් නොක-
රන්න.[7] බොරු සාක්ෂි නොදෙන්න.[8]
**19** ඔබේ පියාටද ඔබේ මවටද ගෞරව
කරන්න.[9] ඔබට මෙන් ඔබේ අසල්වැ-
සියාට ප්‍රේම කරන්න”[10] කියා පැවසු-
වේය. **20** එවිට තරුණයා, “මම ඒ
සියලුම දේවල් පිළිපදිනවා. මම තව
කළ යුත්තේ කුමක්ද” කියා ඔහුගෙන්
ඇසුවේය. **21** යේසුස් ඔහුට මෙසේ
පිළිතුරු දුන්නේය. “ඔබේ සේවය සම්-
පූර්ණ කරන්න ඕනෑ නම් ගොස් ඔබ
සතු දේවල් විකුණා එයින් ලැබෙන
මුදල් දිළිඳුන්ට දෙන්න. එවිට ස්වර්ග-
යෙහි ඔබට වස්තු රැස් කරගත හැකි
වෙයි.[11] ඉන්පසු ඇවිත් මගේ අනුගා-
මිකයෙක් වන්න.”[12] **22** තරුණයා
එය ඇසූ විට තමන්ට බොහෝ ධන
සම්පත් තිබූ නිසා ශෝකයෙන් යන්න
ගියේය.[13] **23** යේසුස් තම ගෝල-
යන්ට මෙසේ කීවේය. “ඇත්තෙන්ම
මා ඔබට කියන්නේ, ධනවතෙකුට
ස්වර්ග රාජ්‍යයට ඇතුල් වීම දුෂ්කර
දෙයක් වන බවයි.[14] **24** නැවතත්
මා ඔබට කියන්නේ, ධනවතෙකුට
දෙවිගේ රාජ්‍යයට ඇතුල් වෙනවාට
වඩා ඔටුවෙකුට ඉඳිකටුවක සිදුරෙන්
යෑම පහසු බවයි.”[15]
**25** ගෝලයෝ එය අසා, “එසේ-
නම් ගැලවීම ලැබිය හැක්කේ කාටද”[1]
කියා මහත් පුදුමයකින් ඇසූහ.
**26** යේසුස් ඔවුන්ගේ මුහුණු දෙස
බලා, “මිනිසුන්ට නම් ඒ දේ කොහො-
මටවත් අත් කරගන්න බැහැ. නමුත්
දෙවිට සියල්ල කළ හැකියි”[2] කියා
ඔවුන්ට පැවසුවේය.

**27** එවිට පේතෘස්, “බලන්න! අපි
සියල්ල අත්හැර ඔබ අනුව ආවා.
ඇත්තටම අපට කුමක් ලැබෙයිද”[3]
කියා ඔහුගෙන් ඇසුවේය. **28** යේ-
සුස් ඔවුන්ට මෙසේ කීවේය. “ඇත්-
තෙන්ම මා ඔබට කියන්නේ, සියල්ල
අලුත් කරන කාලයේදී මනුෂ්‍ය පුත්‍රයා
තම තේජවත් සිංහාසනයේ ඉඳ-
ගන්නා විට මා අනුව ආ ඔබත්
සිංහාසන දොළොසක ඉඳගෙන, ඊශ්‍රා-
යෙලයේ ගෝත්‍ර දොළොස විනිශ්-
චය කරන බවයි.[4] **29** මගේ නාමය
නිසා ගේදොර හෝ සහෝදරයන් හෝ
සහෝදරියන් හෝ පියා හෝ මව හෝ
දරුවන් හෝ වතුපිටි හෝ අත්හැර
තිබෙන සියල්ලන්ට ඊටත් වඩා බො-
හෝ වැඩියෙන් ලැබෙයි. ඔවුන්ට සදා-
කාල ජීවනයත් උරුම වෙයි.[5]

**30** “නමුත් ප්‍රථමයන්ව සිටි බො-
හෝදෙනෙක් අන්තිමයන් බවටත්
අන්තිමයන් ප්‍රථමයන් බවටත් පත්
වෙයි.[6]

# 20
“තම මිදිවත්තට වැඩකරු-
වන්ව කුලියට ගැනීම සඳහා
හිමිදිරි උදැසනින්ම පිටත්ව ගිය වතු-
හිමියෙකුට ස්වර්ග රාජ්‍යය සමානයි.[7]
**2** ඔහු වැඩකරුවන්ට දවසකට ඩිනා-
රිය*[8] බැගින් දීමට එකඟ වී, ඔවුන්ව
තම මිදිවත්තේ වැඩට පිටත් කළා.
**3** තුන්වෙනි පැයේදී*[9] පමණ ඔහු
පිටත්ව යද්දී රැකියාවක් නැතුව වෙ-
ළඳපොළේ සිටගෙන සිටින තවත්
අයව ඔහු දුටුවා.[10] **4** ‘ඔබත්
මිදිවත්තට යන්න. ඔබට ලැබිය

**19 පරි.**
1 මතෙ 19:29 මාක් 10:17 ලූක් 10:25 ලූක් 18:18
2 මාක් 10:18
3 ලෙවී 18:5 ලූක් 10:28 ලූක් 18:20
4 ලූක් 10:26
5 නික් 20:13 ද්වි 5:17 රෝම 13:9
6 නික් 20:14 ද්වි 5:18
7 නික් 20:15 ද්වි 5:19
8 නික් 20:16 ද්වි 5:20
9 නික් 20:12 ද්වි 5:16
10 ලෙවී 19:18 මතෙ 22:39 මාක් 12:31 ලූක් 10:27
11 මතෙ 6:20
12 ලූක් 12:33 ලූක් 18:22 පිලි 3:7
13 ගීතා 62:10 මාක් 10:22 ලූක් 18:23
14 මාක් 10:23 ලූක් 18:24 1තිමෝ 6:10
15 මාක් 10:25 ලූක් 18:25

**2 තීරුව**
1 මාක් 10:26
2 උත් 18:14 යෝබ් 42:2 යෙරෙ 32:17 සෙක 8:6 ලූක් 18:27
3 මාක් 10:28 ලූක් 5:11 ලූක් 18:28 පිලි 3:8
4 දානි 7:14 මතෙ 20:21 මතෙ 25:31 ලූක් 18:29 ලූක් 22:30 1කොරි 6:2 එළි 20:4
5 මාක් 10:30 ලූක් 18:29 ලූක් 18:30 හෙබ්‍රෙ 10:34
6 මතෙ 20:16 මාක් 10:31 ලූක් 13:30

**20 පරි.**
7 යෙසා 5:1 මතෙ 21:33
8 එළි 6:6

**9** මාක් 15:25; ක්‍රියා 2:15; **10** ක්‍රියා 17:17.

මතෙ **19:18*** මතෙ 19:9හි දෙවෙනි පාදසටහන බලන්න.

මතෙ **20:2*** මතෙ 18:24හි දෙවෙනි පාදසටහන බලන්න. **3*** එනම්, පෙ.ව. 9ට පමණ.

යුතු දේ මම ඔබට දෙන්නම්’ කියා
ඔහු ඔවුන්ට පැවසුවා. **5** එහෙයින්
ඔවුන්ද මිදිවත්තට ගියා. නැවතත්
ඔහු හයවෙනි පැයේදී*[1] හා නව-
වෙනි පැයේදී#[2] පමණ පිටත්ව ගොස්
තවත් අයව වැඩට පිටත් කළා.
**6** අවසානයේදී ඔහු එකොළොස්වෙනි
පැයේදී* පමණ පිටත්ව යද්දී තවත්
අය සිටගෙන සිටිනවා දැක, ‘ඔබ
රැකියාවක් නැතුව දවස මුළුල්ලේම
මෙතැන සිටගෙන සිටින්නේ ඇයි’
කියා ඔවුන්ගෙන් ඇසුවා. **7** ඔවුන්ද,
‘කිසිවෙකු අපව කුලියට නොගත්
නිසයි’ කියා ඔහුට පිළිතුරු දුන්නා.
‘ඔබත් මිදිවත්තට යන්න’[3] කියා ඔහු
ඔවුන්ට පැවසුවා.

**8** “සවස් වූ විට[4] මිදිවත්තේ ස්වා-
මියා තම වැඩ බලන තැනැත්-
තාට අඬගසා, ‘වැඩකරුවන් කැඳවා,
අන්තිමට පැමිණි අයගෙන් පටන්-
ගෙන මුලින්ම පැමිණි අය දක්වා
ඔවුන්ට ඔවුන්ගේ කුලිය ගෙවන්න’[5]
කියා පැවසුවා. **9** එකොළොස්-
වෙනි පැයේදී පැමිණි වැඩ-
කරුවන්ටත් ඩිනාරිය බැගින්
ලැබුණා. **10** මුලින්ම වැඩට ගිය
අය සිතුවේ තමන්ට වැඩියෙන් ගෙ-
වයි කියායි. නමුත් ඔවුන්ටත් ගෙ-
වනු ලැබුවේ ඩිනාරිය බැගින් පමණයි.
**11** එවිට ඔවුන් වතුහිමියාට විරුද්-
ධව මැසිවිලි නඟමින්,[6] **12** ‘අන්ති-
මට පැමිණි මේ අය වැඩ කළේ පැයක්
විතරයි. නමුත් ඔබ, මුළු දවසම අව්
රස්නයේ දුක් විඳිමින් වැඩ කළ අපට
සැලකුවෙත් ඔවුන්ට සැලකූ විදිහට-
මයි’ කියා පැවසුවා. **13** එවිට ඔහු
ඔවුන්ගෙන් එක් කෙනෙකුට පිළිතුරු
දුන්නේ මෙසේයි. ‘මා ඔබට අසා-
ධාරණයක් කරනවා නොවෙයි. ඔබ
මා හා එකඟ වුණේ ඩිනාරියක-
ටයි.[7] එසේ නොවෙයිද? **14** ඔබට
අයිති දේ රැගෙන යන්න. ඔබට
දුන් දෙයම අන්තිමට පැමිණි මොහු-
ටත් දෙන්න මම කැමතියි.[1] **15** මා
සතු දෙයින් මා කැමති දෙයක් කිරී-
මට මට අයිතියක් නැද්ද? නැත-
හොත් ඔබ,* දුෂ්ට විදිහට කටයුතු
කරන්නේ[2] මා යහපත් කෙනෙක් වන
නිසාද?’[3] **16** එයාකාරයෙන් අන්ති-
මයන් ප්‍රථමයන් බවටත් ප්‍රථමයන්
අන්තිමයන් බවටත් පත් වෙයි.”[4]

**17** යේසුස් යෙරුසලමට යද්දී ඔහු
ගෝලයන් දොළොස්දෙනාව[5] පැත්ත-
කට අඬගසා ඔවුන්ට මෙසේ
කීවේය. **18** “අපි දැන් යන්නේ යෙ-
රුසලමටයි. එහිදී මනුෂ්‍ය පුත්‍රයාව
නායක පූජකයන් හා නීතිය පිටපත්
කරන්නන් අතට භාර දෙනු ලබයි.
එවිට ඔවුන් ඔහුව මරණයට නියම
කරයි.[6] **19** ඉන්පසු ඔවුන් ඔහුව වෙ-
නත් ජාතීන් අතට භාර දෙයි. ඒ
ජාතීන් ඔහුට කවටකම් කර කසයෙන්
තළා, කණුවක ඇණ ගසා[7] මරා දමයි.
නමුත් තුන්වෙනිදා ඔහුව නැඟිටුවනු
ලබයි.”[8]

**20** එවිට සෙබදීගේ පුත්‍රයන්ගේ[9]
මව ඇගේ පුත්‍රයන් සමඟ යේසුස්
වෙතට ඇවිත්, ඔහු ඉදිරියේ දණින්
වැටී ඔහුගෙන් ඉල්ලීමක් කළාය.[10]
**21** ඔහුද, “ඔබට මොනවාද ඕනේ”
කියා ඇයගෙන් ඇසුවේය. “ඔබේ
රාජ්‍යයේදී මගේ මේ පුතුන් දෙ-
දෙනාගෙන් එක් කෙනෙකුට ඔබේ
දකුණු පැත්තේද අනික් පුතාට ඔබේ
වම් පැත්තේද ඉඳගැනීමට අවසර
දෙන්න”[11] කියා ඇය ඔහුට කීවාය.
**22** එවිට යේසුස්, “ඔබ දෙදෙනා ඉල්-
ලන්නේ කුමක්ද කියා ඔබ දන්නේ
නැහැ. මට බොන්න සිදු වන දේ
බොන්න ඔබට පුළුවන්ද”[12] කියා ඇසු-
වේය. “අපට පුළුවන්” කියා ඔවුහු පිළි-
තුරු දුන්හ. **23** එවිට ඔහු ඔවුන්ට
මෙසේ කීවේය. “ඔබට අනිවාර්ය-
යෙන්ම මගේ කුසලානයෙන් බොන්න
සිදු වෙයි.[13] නමුත් මගේ දකුණු පැත්-
තේද මගේ වම් පැත්තේද ඉඳගන්න
ලැබීමේ වරප්‍රසාදය ලබා දෙන්නේ

**20 පරි.**
1 මාක් 15:33 යොහ 4:6
2 මතෙ 27:45
3 යොහ 15:8
4 විනි 19:16
5 ලෙවී 19:13 ද්වි 24:15
6 මතෙ 13:27
7 මතෙ 20:2

**2 තීරුව**
1 යොහ 17:2
2 ද්වි 15:9 මතෙ 6:23 මාක් 7:22
3 1පේතෘ 2:3
4 මතෙ 19:30 මාක් 9:35 මාක් 10:31 ලූක් 13:30
5 මාක් 10:32 ලූක් 18:31
6 මතෙ 16:21 ලූක් 9:22
7 මතෙ 27:31 යොහ 19:1
8 මතෙ 17:23 මතෙ 28:6 මාක් 10:34 ලූක් 18:33 ක්‍රියා 10:40 1කොරි 15:4
9 මතෙ 4:21 මතෙ 27:56
10 මාක් 10:35
11 මතෙ 19:28 මාක් 10:37
12 මතෙ 26:39 මාක් 14:36 යොහ 18:11
13 ක්‍රියා 12:2 රෝම 8:17 2කොරි 1:7 එළි 1:9

---

මතෙ **20:5*** එනම්, දහවල් 12ට පමණ. **5#** එනම්, ප.ව. 3ට පමණ. **6*** එනම්, ප.ව. 5ට පමණ.

මතෙ **20:15*** මූ.අ., “ඔබේ ඇස.”

කාටද කියා තීරණය කරන්න මට
අයිතියක් නැහැ. එය හිමි වන්නේ
මගේ පියාණන් ඒ සඳහා සූදානම් කර
තිබෙන අයටයි.”[1]
**24** අනික් දසදෙනාට ඒ ගැන
ආරංචි වූ විට ඔවුහු ඒ සහෝදරයන්
දෙදෙනා ගැන උදහස් වූහ.[2] **25** යේ-
සුස් ඔවුන්ව තමන් ළඟට කැඳවා
මෙසේ කීවේය. “විවිධ ජාතීන්ව පාල-
නය කරන අය තම තනතුරුවල
වැජඹෙමින් සිටින බවත් බලධාරීන්
තමන් යටතේ සිටින්නන් කෙරෙහි
දැඩි ලෙස තම අණසක පතුරුවන
බවත්[3] ඔබ දන්නවා. **26** නමුත් ඔබ
අතරේ එවැනි දෙයක් සිදු නොවිය
යුතුයි.[4] ඔබ අතරෙහි උතුම් වෙන්න
ඕනෑ කරන යමෙක් සිටිනවා නම්
ඔහු ඔබේ සේවකයා විය යුතුයි.[5]
**27** ඔබ අතරෙහි ප්‍රථමයා වෙන්න
ඕනෑ කරන යමෙක් සිටිනවා නම් ඔහු
ඔබේ දාසයා විය යුතුයි.[6] **28** එලෙ-
සම මනුෂ්‍ය පුත්‍රයා පැමිණියේ සේවය
ලබන්න නොවෙයි. ඔහු පැමිණියේ
සේවය කරන්න[7] හා බොහෝදෙනෙ-
කුව මුදවාගැනීම සඳහා තම ජීවිතය
පූජා කරන්නයි.”[8]
**29** ඔවුන් යෙරිකෝවෙන් පිටත්ව
යද්දී[9] මහත් සමූහයක් ඔහු පසු-
පස ගියෝය. **30** පාර අයිනේ
ඉඳගෙන සිටි අන්ධ මිනිසුන් දෙදෙ-
නෙක් යේසුස් ඒ අසලින් යන බව
අසා, “ස්වාමීනි, දාවිත්ගේ පුත්‍රය,[10]
අපට අනුකම්පා කරන්න” කියා හඬ
නැඟූහ. **31** නමුත් නිහඬව සිටින්න
කියා සමූහයා ඔවුන්ට තදින් පැව-
සූහ. එසේවුවත් ඔවුහු වැඩි වැඩියෙන්
හඬ නඟමින්, “ස්වාමීනි, දාවිත්ගේ
පුත්‍රය,[11] අපට අනුකම්පා කරන්න”
කියා කීවෝය. **32** එවිට යේසුස්
නැවතී ඔවුන්ව කැඳවා, “මා ඔබ වෙ-
නුවෙන් කුමක් කරනවාට කැමතිද”
කියා ඇසුවේය. **33** “ස්වාමීනි, අපේ
ඇස් පාදන්න”[12] කියා ඔවුහු ඔහුට
කීවෝය. **34** යේසුස්ට මහත් අනු-
කම්පාවක් ඇති වී, ඔහු ඔවුන්ගේ ඇස්
ස්පර්ශ කළේය.[1] ඔවුන්ට එසැණින්ම
පෙනීම ලැබුණු අතර ඔවුහු ඔහු අනුව
ගියෝය.[2]

**21** ඔවුහු යෙරුසලමට ළඟා වී,
ඔලීව කන්දේ පිහිටි බෙත්පා-
ගයට පැමිණියහ. යේසුස් ගෝලයන්
දෙදෙනෙකුව යවමින්,[3] **2** ඔවුන්ට
මෙසේ කීවේය. “ඔබට පෙනෙන අර
ගමට යන්න. ඔබ ඒ ගමට ඇතුල් වූ
විට එහි බැඳ සිටින බූරුදෙනක හා ඌ
සමඟ සිටින බූරු නාම්බෙකු ඔබට
හමු වෙයි. උන්ව ලිහා මා වෙතට ගෙ-
නෙන්න.[4] **3** යමෙකු ඔබට කුමක්
හෝ පැවසුවොත් ‘ස්වාමීන්ට උන්ව
අවශ්‍ය වී තිබෙනවා’ කියා කියන්න.
එවිට ඔහු වහාම උන්ව ගෙන යෑමට
ඉඩහරියි.”
**4** එය සිදු වූයේ අනාගතවක්තෘ
මාර්ගයෙන් කියන ලද මේ දේ ඉටු වීම
සඳහාය. එනම්, **5** “සියොන් දියණි-
යට මෙසේ කියන්න, ‘බලන්න! ඔබේ
රජ බූරුවෙකු පිට නැඟී, ඔබ වෙතට[5]
මෘදුකමින්[6] යුතුව එන්නේය. එසේය,
ඔහු බර අදින සතෙකුගේ පැටවෙකු
එනම්, බූරු නාම්බෙකු පිට නැඟී එන්-
නේය.’ ”[7]
**6** එහෙයින් ගෝලයෝ ගොස් යේ-
සුස් ඔවුන්ට අණ කළ පරිදි
කළෝය. **7** ඔවුහු බූරුදෙනද බූරු
නාම්බාද ගෙනැවිත් උන් පිට තම
පිටත වස්ත්‍ර දැමුවෝය. පසුව යේ-
සුස් බූරු නාම්බා මත ඉඳගත්තේය.[8]
**8** සමූහයාගෙන් වැඩිදෙනෙකු තම
පිටත වස්ත්‍ර මඟ දිගේ එළූ අතර[9]
අන් අය ගස්වල අතු කපා, ඒවා
මඟ දිගේ තැබුවෝය.[10] **9** ඔහුට ඉදි-
රියෙන් හා පසුපසින් ගමන් කළ සමූ-
හයෝ, “දාවිත්ගේ පුත්‍රයාව[11] ආරක්ෂා
කරන්න![12] යෙහෝවා දෙවිගේ නාම-
යෙන් එන තැනැත්තාට ආශීර්වාද
ලැබේවා![13] ඉතා උස් තැන්හි සිටින
ඔබ ඔහුව ආරක්ෂා කරන්න”[14] කියා
මහත් හඬින් කීවෝය.
**10** ඔහු යෙරුසලමට පැමිණි විට[15]
මුළු නුවරම කැලඹී, “මේ කවුද” කියා

**20 පරි.**
1 මාක් 10:40
2 මාක් 10:41
ලූක් 22:24
3 1කොරි 2:6
2කොරි 1:24
4 1පේතෘ 5:3
5 මතෙ 18:4
මතෙ 23:11
මාක් 10:43
ලූක් 22:26
6 මාක් 9:35
මාක් 10:44
7 ලූක් 22:27
යොහ 13:14
පිලි 2:7
8 ලෙවී 4:21
යෙසා 53:11
1තිමෝ 2:6
තීත 2:14
හෙබ්‍රෙ 9:28
9 මාක් 10:46
ලූක් 18:35
10 මතෙ 9:27
මතෙ 15:22
මාක් 10:47
ලූක් 18:38
11 ලූක් 18:39
12 ලූක් 18:41

**2 තීරුව**
1 මතෙ 9:29
2 මාක් 10:52
ලූක් 18:43

**21 පරි.**
3 මාක් 11:1
ලූක් 19:29
4 මාක් 11:2
ලූක් 19:30
5 යෙසා 62:11
යොහ 12:15
6 මතෙ 11:29
7 සෙක 9:9
8 1රාජා 1:38
ලූක් 19:35
යොහ 12:14
9 2රාජා 9:13
ලූක් 19:36
10 1රාජා 1:40
යොහ 12:13
11 මතෙ 9:27
මතෙ 21:15
12 ගීතා 118:25
13 ගීතා 118:26
මතෙ 23:39
ලූක් 13:35
යොහ 5:43
යොහ 12:13
14 ලූක් 2:14
15 මාක් 11:11

ඇසූහ. **11** “මේ ගලීලයේ නාසරෙත්
නුවරෙහි අනාගතවක්තෘ[1] වන යේ-
සුස්” කියා සමූහයෝ පැවසූහ.
**12** යේසුස් දේවමාලිගාවට ඇතුල්
වී, එහි විකුණමින්ද මිල දී ගනිමින්ද
සිටි සියල්ලන්ව එතැනින් පිටතට
එළවා දමා මුදල් මාරු කරන්-
නන්ගේ මේසද පරෙවියන් විකුණ-
මින් සිටි අයගේ බංකුද පෙරළා දමා,[2]
**13** “‘මාගේ ගෘහය යාච්ඤා ගෘහයක්
ලෙස හඳුන්වනු ලබන්නේය’[3] කියා
ලියා තිබුණත් ඔබ එය කොල්ලකා-
රයන්ගේ ගුහාවක් කරනවා”[4] කියා
ඔවුන්ට කීවේය. **14** ඔහු දේවමාලි-
ගාවේ සිටියදී අන්ධ හා කොර මිනිස්සු
ඔහු වෙතට ආවෝය. ඔහු ඔවුන්ව සුව
කළේය.
**15** නායක පූජකයෝ සහ නීතිය
පිටපත් කරන්නෝ ඔහු සිදු කළ විස්-
මයජනක ක්‍රියාද,[5] “දාවිත්ගේ පුත්‍ර-
යාව[6] ආරක්ෂා කරන්න”[7] කියා
දේවමාලිගාවේ හඬ නඟමින් සිටි
පිරිමි දරුවන්ද දැක උදහස් වූහ.
**16** ඔවුහු ඔහුගෙන් මෙසේ ඇසූහ.
“මොවුන් කියන දේ ඔබට ඇසෙ-
නවාද?” එවිට යේසුස්, “ඔව්, මට
ඇසෙනවා. ‘බිළිඳුන්ගේද කිරි බොන
දරුවන්ගේද මුවින් ඔබ ප්‍රශංසාව ගෙන
දී තිබේ’[8] යන කොටස ඔබ කවදා-
වත් කියවා නැද්ද”[9] කියා ඔවුන්ගෙන්
ඇසුවේය. **17** ඉන්පසු ඔහු ඔවුන්
වෙතින් ගොස් නුවරින් පිටත් වී බෙ-
තානියෙහි රාත්‍රිය ගත කළේය.[10]
**18** හිමිදිරි උදෑසනින්ම නැවත ඒ
නුවරට යන අතරේ යේසුස්ට බඩ-
ගින්නක් දැනිණ.[11] **19** අත්තික්කා
ගසක් පාර ළඟ තිබෙනවා දුටු ඔහු ඒ
අසලට ගියේය. නමුත් එහි කොළ
පමණක් මිස වෙන කිසිවක් නොති-
බුණු නිසා,[12] “මෙතැන් පටන් කිසි-
දාක මේ ගසෙන් පල හටගන්නේ
නැහැ”[13] කියා ඔහු කීවේය. ඒ මො-
හොතේදීම අත්තික්කා ගස මැලවී
ගියේය. **20** ගෝලයෝ එය දුටු විට,
“මෙතරම් ඉක්මනින් අත්තික්කා ගස
මැලවී ගියේ කොහොමද”[1] කියා පුදු-
මයෙන් ඇසූහ. **21** එවිට යේසුස්
ඔවුන්ට මෙසේ පිළිතුරු දුන්නේය.
“ඇත්තෙන්ම මා ඔබට කියන්නේ,
ඔබ කිසිම සැකයක් ඇති කරගන්-
නේ නැතුව[2] විශ්වාසයකින් සිටියොත්
මා අත්තික්කා ගසට කළ දේ ඔබ-
ටත් කරන්න හැකි වෙයි. ඒ විතරක්
නොවෙයි, ඔබ මේ කන්දට, ‘මෙතැ-
නින් ඉවත් වී මුහුදේ ගිලෙන්න’ කියා
කීවොත් එයද සිදු වෙයි.[3] **22** මෙයා-
කාරයට විශ්වාසයක් ඇතුව ඕනෑම
දෙයක් ඔබ යාච්ඤාවෙන් ඉල්ලුවොත්
ඒ දේ ඔබට ලැබෙයි.”[4]
**23** ඔහු දේවමාලිගාවට ඇතුල් වී
උගන්වමින් සිටියදී නායක පූජක-
යෝද ජනතාවගේ වැඩිමහල්ලෝද
ඔහු වෙතට ඇවිත්,[5] “ඔබට මේ
දේවල් කරන්න අවසර තිබෙනවාද?
කවුද ඔබට ඒ සඳහා අවසර දුන්-
නේ”[6] කියා ඇසූහ. **24** එවිට යේසුස්
ඔවුන්ට මෙසේ පිළිතුරු දුන්නේය.
“මාත් ඔබෙන් යමක් අහන්න කැම-
තියි. ඔබ එයට පිළිතුරු දුන්නොත්
මට මේ දේවල් කරන්න අවසර
දුන්නේ කවුද කියා මමත් ඔබට
කියන්නම්.[7] **25** යොහන් මිනිසුන්ව
බව්තීස්ම කළේ කාගේ අවසරයෙන්ද?
දෙවිගේ අවසරයෙන්ද නැත්නම් මිනි-
සුන්ගේ අවසරයෙන්ද?”[8] ඔවුහු තම
තමන් අතරේ කතා කරගනිමින්,
“අප ‘දෙවිගේ අවසරයෙන්’ කියා කිව්-
වොත්, ‘ඔබ ඔහුව විශ්වාස නොක-
ළේ ඇයි’[9] කියා ඔහු අපෙන් අසයි.
**26** නමුත් ‘මිනිසුන්ගේ අවසරයෙන්’
කියා කීවොත් අපට සමූහයාගෙන්
නම් බේරෙන්න ලැබෙන්නේ නැහැ.[10]
මන්ද මේ සියලුදෙනාම යොහන්ව
සලකන්නේ අනාගතවක්තෘවරයෙකු
ලෙසයි”[11] කියා කීවෝය. **27** එහෙ-
යින් ඔවුහු, “අපි දන්නේ නැහැ” කියා
යේසුස්ට පිළිතුරු දුන්නෝය. එවිට
ඔහු ඔවුන්ට මෙසේ කීවේය. “එසේනම්
මා මේ දේවල් කරන්නේ කාගේ අවස-
රයෙන්ද කියා මමත් ඔබට කියන්නේ
නැහැ.[12]

**21 පරි.**
**1** මතෙ 21:46 ලූක් 7:16 ලූක් 24:19
**2** මාක් 11:15 ලූක් 19:45 යොහ 2:15
**3** 2ලේක 6:33 යෙසා 56:7
**4** යෙරෙ 7:11 මාක් 11:17 ලූක් 19:46 යොහ 2:16
**5** මාක් 11:18
**6** මතෙ 21:9
**7** ගීතා 118:25
**8** ගීතා 8:2
**9** ලූක් 6:3
**10** මාක් 11:11 ලූක් 21:37 යොහ 11:1
**11** මාක් 11:12
**12** මාක් 11:13 ලූක් 13:6
**13** මතෙ 3:10

**2 තීරුව**
**1** මාක් 11:21
**2** යාකො 1:6
**3** මතෙ 17:20 ලූක් 17:6 1කොරි 13:2
**4** මාක් 11:24 ලූක් 11:9 යොහ 14:13 යාකො 1:5 1යොහ 3:22
**5** මාක් 11:27 ලූක් 20:1
**6** නික් 2:14 ලූක් 20:2 යොහ 2:18 ක්‍රියා 4:7
**7** මාක් 11:29
**8** ලූක් 20:4 යොහ 1:33
**9** මතෙ 21:32 මාක් 11:31 ලූක් 7:30
**10** මතෙ 14:5 මතෙ 21:46
**11** මාක් 11:32 ලූක් 20:6
**12** ලූක් 20:8

**28** “ඔබ මේ ගැන සිතන්නේ
කුමක්ද? එක්තරා මිනිසෙකුට දරුවන්
දෙදෙනෙක් සිටියා.[1] ඔහු පළමුවෙනි
පුතා ළඟට ගොස්, ‘පුතාට පුළුවන්ද
අද ගිහින් මිදිවත්තේ වැඩ කරන්න’
කියා ඇසුවා. **29** එවිට ඔහු, ‘පියා-
ණෙනි, මම යන්නම්’[2] කියා කිව්වත්
ඔහු ගියේ නැහැ. **30** ඉන්පසු එම
මිනිසා දෙවෙනි පුතා ළඟට ගොස් ඒ
දේම ඇසුවා. ඔහු, ‘මට යන්න බැහැ’
කියා පැවසුවත් පසුව ඔහු තමන්
කී දේ ගැන කනගාටු වී[3] මිදිවත්තේ
වැඩට ගියා. **31** ඒ දෙදෙනා අතරින්
තම පියාගේ කැමැත්ත කළේ කවුද”[4]
කියා ඔහු ඔවුන්ගෙන් ඇසුවේය. ඔවුහු,
“දෙවෙනි පුතා” කියා කීවෝය. යේසුස්
ඔවුන්ට මෙසේ කීවේය. “ඇත්තෙන්ම
මා ඔබට කියන්නේ, බදු එකතු
කරන්නන් සහ ගණිකාවන් ඔබට පළ-
මුවෙන් දෙවිගේ රාජ්‍යයට ඇතුල් වන
බවයි. **32** මන්ද යොහන් ඔබට ධර්-
මිෂ්ඨ මාර්ගය[5] පෙන්වමින් ඔබ වෙ-
තට ආවත් ඔබ ඔහුව විශ්වාස කළේ
නැහැ.[6] එනමුත් බදු එකතු කරන්නන්
සහ ගණිකාවන් ඔහුව විශ්වාස කළා.[7]
ඒ සියල්ල දුටුවත් ඔබ කළ දේ ගැන
පසුතැවිලි වී ඔබ ඔහුව විශ්වාස කළේ
නැහැ.

**33** “තවත් උපමාවකට සවන්
දෙන්න. මිදිවත්තක් වැවූ වතුහිමි-
යෙක්[8] සිටියා. ඔහු එය වටා වැටක්
බැඳ, මිදි පැගීම සඳහා එහි වළක්
හාරා ටැඹක්ද ඉදි කර,[9] එය වැවිලි-
කරුවන්ට බද්දට දී පිටරට ගියා.[10]
**34** පලදාව නෙළන කාලය පැමිණි
විට බදු ලෙස තමාට අයිති පල
ලබාගැනීමේ අදහසින් ඔහු වැවිලි-
කරුවන් වෙතට තමාගේ දාසයන්ව
යැව්වා. **35** නමුත් වැවිලිකරුවන්
ඔහුගේ දාසයන්ව අල්ලාගෙන එක්
කෙනෙකුට තැළුවා. එක් කෙනෙකුව
මරා දැමුවා. තවත් කෙනෙකුට ගල්
ගැසුවා.[11] **36** නැවතත් ඔහු පළමු-
වෙන් යැවූ ගණනට වඩා වැඩියෙන්
වෙනත් දාසයන් පිරිසක්ව යැව්වා.
නමුත් ඔවුන් ඒ පිරිසටත් කළේ ඒ
දේමයි.[1] **37** අන්තිමට ඔහු, ‘ඔවුන්
මගේ පුත්‍රයාට ගරු කරයි’ කියා පව-
සමින් තම පුත්‍රයාව ඔවුන් වෙතට
යැව්වා. **38** වැවිලිකරුවන් පුත්‍රයාව
දැක තම තමන් අතරේ කතා කර-
ගනිමින්, ‘මේ ඉන්නේ උරුමක්කා-
රයා.[2] එන්න, අපි මොහුව මරා දමා
මොහුගේ උරුමය ලබාගනිමු’[3] කියා
පැවසුවා. **39** එමනිසා ඔවුන් ඔහුව
අල්ලාගෙන මිදිවත්තෙන් පිටතට
ගෙන ගොස් මරා දැමුවා.[4] **40** මිදි-
වත්තේ හිමිකරු පැමිණි විට ඔහු
ඒ වැවිලිකරුවන්ට කුමක් කරයිද?”
**41** ඔවුහු මෙසේ පිළිතුරු දුන්නෝය.
“ඔවුන් නපුරු නිසා ඔහු ඔවුන් පිට
දරුණු විනාශයක්[5] ගෙනැවිත් නියම
කාලයේදී තමන්ට පලදාව ලබා දෙන
වෙනත් වැවිලිකරුවන්ට ඒ මිදිවත්ත
බද්දට දෙයි.”[6]

**42** යේසුස් ඔවුන්ට මෙසේ කීවේය.
“‘ඉදි කරන්නන් ඉවත දැමූ ඒ ගල[7]
ප්‍රධාන ගල වී ඇත.[8] එය යෙහෝවා
දෙවි විසින්ම කළ මහත් ක්‍රියාවක්ය.
අපේ ඇස්වලට එය අදහාගත නො-
හැකි තරමිය’ යන දේ ඔබ ශුද්ධ ලිය-
විල්ලෙහි කවදාවත් කියවා නැද්ද?
**43** එහෙයින් මා ඔබට කියන්නේ, දෙ-
විගේ රාජ්‍යය ඔබෙන් ගෙන රාජ්‍යය
වෙනුවෙන් පල උපදවන වෙනත්
ජාතියකට එය දෙනු ලබන බවයි.[9]
**44** මා සඳහන් කළ එම ගල පිට යම්
කෙනෙක් වැටුණොත් ඔහු සුනුවිසුනු
වී යයි. එය යමෙකු පිට වැටුණු විටද
එය ඔහුව සුනුවිසුනු කර දමයි.”[10]

**45** නායක පූජකයෝද පරිසිවරුද
ඔහුගේ උපමා ඇසූ විට ඔහු තමන්
ගැන කතා කරමින් සිටි බව තේරුම්-
ගත්තෝය.[11] **46** ඔවුන් ඔහුව අල්-
ලාගන්න අවස්ථාවක් සොයමින්
සිටියත් සමූහයන් ඔහුව අනාගතවක්-
තෘවරයෙකු ලෙස සැලකූ නිසා[12] ඔවුහු
ඒ සඳහා පියවර ගැනීමට බිය වූහ.

**22** ඔවුන්ට තවත් කාරණා පැව-
සීම සඳහා යේසුස් නැව-
තත් උපමා යොදාගනිමින් මෙසේ
කීවේය.[13] **2** “තම පුත්‍රයාගේ විවාහය

**21 පරි.**
1 ලූක් 15:11
2 මතෙ 7:21
ලූක් 6:46
3 හිතෝ 24:32
4 ලූක් 18:14
5 මතෙ 21:25
ලූක් 7:30
6 යොහ 7:48
7 මාක් 2:15
ලූක් 3:12
ලූක් 7:29
8 මතෙ 20:1
9 යෙසා 5:2
යෙරෙ 2:21
10 මාක් 12:1
ලූක් 20:9
11 නෙහෙ 9:26
මතෙ 22:6
ලූක් 20:10

**2 තීරුව**
1 2ලේක 36:15
මාක් 12:5
ක්‍රියා 7:52
1තෙස 2:15
හෙබ්‍රෙ 11:37
2 හෙබ්‍රෙ 1:2
3 ලූක් 20:14
4 මතෙ 27:18
මාක් 12:8
ක්‍රියා 2:23
ක්‍රියා 3:15
හෙබ්‍රෙ 13:12
5 සෙක 12:2
6 මාක් 12:9
ලූක් 20:16
ක්‍රියා 18:6
7 ගීතා 118:22
1පේතෘ 2:7
8 යෙසා 28:16
මාක් 12:10
ලූක් 20:17
ක්‍රියා 4:11
රෝම 9:33
එෆී 2:20
9 මතෙ 8:12
මතෙ 22:9
හෙබ්‍රෙ 8:9
10 යෙසා 8:14
දානි 2:34
දානි 2:44
ලූක් 20:18
1පේතෘ 2:8
11 ලූක් 20:19
12 මතෙ 21:11
මාක් 12:12
යොහ 7:32
යොහ 7:40

**22 පරි.**
13 ලූක් 14:16

වෙනුවෙන් උත්සවයක්[1] පිළියෙල කළ
රජෙකුට ස්වර්ග රාජ්‍යය සමාන කළ
හැකියි. **3** විවාහ උත්සවය[2] සඳහා
ආරාධනා කළ අයව කැඳවා-
ගෙන ඒමට ඔහු තම දාසයන්ව යැව්-
වත් ඒ ආරාධිතයන් එන්න කැමති
වුණේ නැහැ.[3] **4** නැවත වරක් ඔහු
තවත් දාසයන් කිහිපදෙනෙකුව යවා,[4]
'“මෙන්න! දහවල් භෝජනය පිළියෙල
කර තිබෙනවා.[5] මගේ ගවයන්වත්
තර කළ සතුන්වත් මරා, සියල්ල
සූදානම් කර තිබෙනවා. විවාහ උත්-
සවයට එන්න” කියා ආරාධිතයන්ට
කියන්න'[6] කියා පැවසුවා. **5** නමුත්
ආරාධිතයන් එය නොසලකා, කෙ-
නෙක් තමාගේම කෙතටත් තව කෙ-
නෙක් තමාගේ ව්‍යාපාරික කටයුතු
සඳහාත් ගියා.[7] **6** නමුත් අනික් අය
එම දාසයන්ව අල්ලාගෙන ඔවුන්ට
අගෞරවනීය ලෙස සලකා ඔවුන්ව
මරා දැමුවා.[8]

**7** “රජ උදහස් වී, තමාගේ සේ-
නාව යවා ඒ මිනී මරුවන්ව විනාශ
කර ඔවුන්ගේ නුවර ගිනිබත් කළා.[9]
**8** ඉන්පසු ඔහු තම දාසයන්ව
කැඳවා, 'විවාහ උත්සවය සූදානම්
කර තිබෙනවා. නමුත් ආරාධිතයන්
ඊට හවුල් වීමට වටින අය නම් නො-
වෙයි.[10] **9** ඒ නිසා නුවරින් පිට විහිදී
ඇති මාවත්වලට ගොස් ඔබට හමු
වන සියල්ලන්ටම විවාහ උත්සවයට
ආරාධනා කරන්න'[11] කියා පැවසුවා.
**10** ඒ අනුව එම දාසයන් මාවත්වලට
ගොස් තමුන්ට හමු වූ සියල්ලන්ව
එනම්, දුෂ්ට හා යහපත් යන දෙපිරි-
සම[12] එකට රැස් කළා. කෑමට ඉඳ-
ගෙන සිටි අයගෙන් විවාහ උත්සව
ශාලාව පිරී ගියා.[13]

**11** “අමුත්තන්ව බැලීමට රජ
පැමිණි විට උත්සවයට සුදුසු නැති
වස්ත්‍රයක් ඇඳගෙන සිටි[14] මිනිසෙ-
කුව ඔහු දුටුවා. **12** එහෙයින් ඔහු ඒ
මිනිසාට කතා කරමින්, 'ඔබ උත්-
සවයට සුදුසු වස්ත්‍රයක්[15] අඳින්නේ
නැතුව මෙතැනට ඇතුල් වුණේ කො-
හොමද' කියා ඇසුවා. එයට කිසි පිළි-
තුරක් දීමට ඒ මිනිසාට හැකි වුණේ
නැහැ. **13** එවිට රජ තම සේවක-
යන්ව කැඳවා, 'මොහුගේ අත් පා
බැඳ, පිටතට ඇද දමා අන්ධකාරයට
දමන්න. එහිදී ඔහුට හඬමින්ද දත්මිටි
කමින්ද කල් ගෙවන්න සිදු වෙයි'[1]
කියා ඔවුන්ට පැවසුවා.

**14** “ආරාධිතයන් නම් බොහෝයි.
නමුත් තෝරාගන්නේ ස්වල්පදෙ-
නෙක්වයි.”[2]

**15** එවිට පරිසිවරු ගොස් ඔහු පව-
සන දෙයකින් ඔහුව අසු කරගන්-
නේ කෙසේද කියා සාකච්ඡා කළහ.[3]
**16** ඒ අනුව ඔවුහු තම ගෝලයන්-
වද හෙරොද්ට පක්ෂව සිටි අය-
වද[4] යේසුස් ළඟට යවා මෙසේ
කියන්න කියා ඔවුන්ට පැවසූහ. “ගුරු-
තුමනි, ඔබ සත්‍යය කතා කරන
බවත් දෙවි පෙන්වා දෙන මාර්-
ගය උගන්වන්නේ සත්‍ය කාරණා පද-
නම් කරගෙන බවත් අපි දන්නවා.
ඔබ මිනිසුන්ගේ බාහිර පෙනුම දෙස
බලන්නේ නැති නිසා[5] ඔබ කිසිවෙකු-
ටවත් විශේෂ සැලකිල්ලක් නොදක්-
වන බවත් අපි දන්නවා. **17** ඒ නිසා
ඔබ මේ ගැන සිතන්නේ කුමක්ද?
සීසර්ට බදු ගෙවිය යුතුද නැද්ද[6]
කියා අපට කියන්න.” **18** නමුත්
යේසුස් ඔවුන්ගේ දුෂ්ට අදහස තේ-
රුම්ගෙන මෙසේ කීවේය. “ඔබ මොන
තරම් කුහකයෝද? ඔබ මගේ වර-
දක් අල්ලාගන්න උත්සාහ කරන්-
නේ ඇයි?[7] **19** බදු ගෙවීමට භාවිත
කරන කාසියක් මට දෙන්න.” ඔවුහු
ඔහුට ඩිනාරි කාසියක්* දුන්නෝය.
**20** එවිට ඔහු, “මෙහි තිබෙන රූපයත්
නමත් කාගේද”[8] කියා ඔවුන්ගෙන්
ඇසුවේය. **21** “සීසර්ගේ” කියා ඔවුහු
පිළිතුරු දුන්නෝය. එවිට ඔහු, “එසේ-
නම් සීසර්ට අයිති දේ සීසර්ට දෙන්න.
දෙවිට අයිති දේ දෙවිට දෙන්න”[9]
කියා ඔවුන්ට පැවසුවේය. **22** එය

**22 පරි.**
1 උත් 29:22 මතෙ 9:15 එළි 19:9
2 යොහ 13:20
3 ලූක් 14:17
4 මතෙ 21:36
5 විනි 14:10
6 එළි 19:9
7 ලූක් 14:18
8 මතෙ 21:35 මතෙ 23:37 1තෙස 2:15
9 දානි 9:26 ලූක් 19:27
10 ක්‍රියා 13:46
11 මතෙ 21:43 ලූක් 14:21
12 මතෙ 13:47
13 මාක් 2:15
14 එළි 19:8
15 එෆී 4:24

**2 තීරුව**
1 ගීතා 112:10 මතෙ 8:12 මතෙ 13:42 මතෙ 24:51 මතෙ 25:30
2 මතෙ 7:14 ලූක් 13:23
3 මාක් 12:13 ලූක් 20:20
4 මාක් 3:6 මාක් 12:13
5 ලූක් 20:21 යොහ 3:2
6 මතෙ 17:25 ලූක් 20:22
7 මාක් 12:15
8 මාක් 12:16
9 දානි 3:18 මලා 3:8 මාක් 12:17 ලූක් 20:25 ලූක් 23:2 රෝම 13:7

මතෙ **22:19*** මතෙ 18:24හි දෙවෙනි පාදසටහන බලන්න.

ඇසූ ඔවුහු මවිතයට පත් වී ඔහුව අත්-
හැර ගියහ.[1]
**23** මිය ගිය අය නැවත නැඟි-
ටින්නේ නැති බව කියන සද්දුසිව-
රුන් පිරිසක් එදිනම ඔහු ළඟට ඇවිත්
ඔහුගෙන් මෙසේ ඇසූහ.[2] **24** “ගුරු-
තුමනි, ‘මිනිසෙකු දරුවන් නැතුව
මිය ගියොත් ඔහුගේ සහෝදරයෙක්
ඔහුගේ බිරිඳව විවාහ කරගෙන තම
සහෝදරයාගේ නමින් දරුවන් බිහි
කළ යුතුයි’[3] කියා මෝසෙස් පැවසුවා.
**25** අප අතර සහෝදරයන් හත්දෙ-
නෙක් සිටියා. පළමුවෙනියා විවාහ
වූ පසුව මිය ගියා. ඔහුට දරුවන්
නොසිටි නිසා ඔහුගේ බිරිඳව ඔහු-
ගේ සහෝදරයාට විවාහ කර දුන්නා.[4]
**26** දෙවෙනියාත් තුන්වෙනියාත් දරු-
වන් නැතුව මිය ගියා. එයාකාරයට
හත්දෙනාම ඇයව විවාහ කරගත්-
තත් ඔවුන් සියලුදෙනාම දරුවන්
නැතුව මිය ගියා.[5] **27** පසුව ස්ත්‍රි-
යත් මිය ගියා. **28** ඒ හත්දෙනාම
ඇයව විවාහ කරගත් නිසා නැවත
නැඟිටීමේදී ඇය බිරිඳ වෙන්නේ ඒ
හත්දෙනා අතරින් කුමන කෙනා-
ගේද?”[6]
**29** යේසුස් ඔවුන්ට මෙසේ පිළිතුරු
දුන්නේය. “ශුද්ධ ලියවිල්ල ගැනවත්
දෙවිගේ බලය ක්‍රියා කරන ආකා-
රය ගැනවත් හරි අවබෝධයක් නැති
ඔබ, මේ ගැන ලබා තිබෙන්නේ
වැරදි වැටහීමක්.[7] **30** මන්ද නැවත
නැඟිටීමේදී මිනිසුන් විවාහ වෙන්නේ-
වත් ස්ත්‍රීන්ව විවාහ කර දෙන්නේ-
වත් නැහැ.[8] නමුත් ඔවුන් ස්වර්ගයේ
සිටින දේවදූතයන් හා සමාන වෙ-
නවා. **31** මිය ගිය අය නැවත නැඟි-
ටින ආකාරය ගැන දෙවි විසින් ඔබට
කී මේ දේ ඔබ කියවා නැද්ද?[9]
එනම්, **32** ‘ආබ්‍රහම්ගේ, ඊසාක්ගේ
සහ යාකොබ්ගේ දෙවි මමය.’[10] දෙවි
මිය ගිය අයගේ නොව ජීවත් වන අය-
ගේ දෙවියි.”[11] **33** එය ඇසූ විට සමූ-
හයෝ ඔහු ඉගැන්වූ දේ ගැන විස්මයට
පත් වූහ.[12]
**34** ඔහු සද්දුසිවරුන්ව නිශ්ශබ්ද

**22 පරි.**
1 ලූක් 20:26
2 මාක් 12:18 ලූක් 20:27 ක්‍රියා 4:2 ක්‍රියා 23:8
3 උත් 38:8 ද්වි 25:5 රූත් 1:11 රූත් 3:13 මාක් 12:19
4 ලූක් 20:29
5 මාක් 12:21 ලූක් 20:31
6 මාක් 12:23 ලූක් 20:33
7 මාක් 12:24
8 ලූක් 20:35
9 මාක් 12:26
10 නික් 3:6 ක්‍රියා 3:13 හෙබ්‍රෙ 11:16
11 ලූක් 20:37 ලූක් 20:38 රෝම 4:17
12 මතෙ 7:28 මාක් 11:18

**2 තීරුව**
1 ලූක් 10:25
2 මාක් 12:28
3 ද්වි 6:5 ද්වි 10:12 යොෂු 22:5 මාක් 12:30 ලූක් 10:27
4 ලෙවී 19:18 මාක් 12:31 ලූක් 10:27 කොලො 3:14 යාකො 2:8 1පේතෘ 1:22
5 රෝම 13:10 ගලා 5:14
6 මාක් 12:35
7 ලූක් 20:41 යොහ 7:42
8 2සාමු 23:2
9 ගීතා 110:1 ක්‍රියා 2:34 1කොරි 15:25 හෙබ්‍රෙ 1:13 හෙබ්‍රෙ 10:13
10 මාක් 12:37
11 මාක් 12:34 ලූක් 20:40

කළ බව පරිසිවරුන්ට ආරංචි වූ
විට ඔවුහු එක කණ්ඩායමක්
ලෙස එකතු වී ඔහු වෙතට පැමි-
ණියෝය. **35** ඔවුන් අතරින් නීතිය
ගැන මනා දැනුමක් ඇති කෙනෙක්[1]
යේසුස්ගේ දැනුම පරීක්ෂා කරමින්
මෙසේ ඇසුවේය. **36** “ගුරුතුමනි,
නීතියේ උතුම්ම ආඥාව කුමක්ද?”[2]
**37** එවිට යේසුස් ඔහුට මෙසේ
කීවේය. “ ‘ඔබේ දෙවි වන යෙහෝවාට
ඔබේ මුළු හදවතින්ම ප්‍රේම කරන්න.
ඔහු වෙනුවෙන් ඔබේ මුළු ජීවිතයම
කැප කරන්න. නිතරම ඔබේ මනසේ
මුල් තැන හිමි විය යුත්තේ ඔහු-
ටයි.’*[3] **38** උතුම්ම සහ පළමුවෙනි
ආඥාව එයයි. **39** දෙවෙනි ආඥා-
වත් ඒ හා සමානව වැදගත්. එනම්,
‘ඔබට මෙන් ඔබේ අසල්වැසියාට
ප්‍රේම කරන්න.’[4] **40** මුළු නීතියත්
සියලු අනාවැකිත් රඳා පවතින්නේ ඒ
ආඥා දෙක මතයි.”[5]
**41** පරිසිවරුන් එකට රැස්ව සිටි-
යදී යේසුස්,[6] **42** “ඔබ ක්‍රිස්තුස් ගැන
සිතන්නේ කුමක්ද? ඔහු කාගේ පුත්‍ර-
යාද” කියා ඔවුන්ගෙන් ඇසුවේය. ඔවු-
හුද, “දාවිත්ගේ පුත්‍රයා”[7] කියා පිළිතුරු
දුන්නෝය. **43** එවිට ඔහු ඔවුන්ට
මෙසේ කීවේය. “එසේනම් දාවිත් දෙවි-
ගේ මඟ පෙන්වීමෙන්[8] ඔහුට ‘ස්වා-
මීන්’ කියා පැවසුවේ ඇයි? **44** මන්ද
දාවිත් එක් අවස්ථාවක, ‘යෙහෝවා
දෙවි මාගේ ස්වාමීන්ට මෙසේ කීවේය.
“මාගේ දකුණු පැත්තේ ඉඳගන්න. මා
ඔබේ සතුරන්ව ඔබේ පාද යට දමන
තුරු එසේ සිටින්න” ’[9] කියා පැවසුවා.
**45** දාවිත් ඔහුට ‘ස්වාමීන්’ යයි කිය-
නවා නම් ඔහු දාවිත්ගේ පුත්‍රයා
වන්නේ කොහොමද?”[10] **46** කිසිවෙ-
කුට වචනයකින්වත් ඔහුට පිළිතුරු
දෙන්න නොහැකි විය. එදා පටන් ඔහු-
ගෙන් තවත් ප්‍රශ්න අසන්න කිසිවෙ-
කුට ධෛර්යයක් නොතිබිණ.[11]

---

මතෙ **22:37*** ග්‍රීක බසට අනුව ඔහුට ඔබේ මුළු හදවතින්ම, මුළු ජීවිතයෙන්ම, මුළු මනසින්ම ප්‍රේම කරන්න.

**23** එවිට යේසුස් සමූහයන්ටත්
තම ගෝලයන්ටත්[1] මෙසේ
කීවේය. **2** “නීතිය පිටපත් කරන්-
නන්ද[2] පරිසිවරුන්ද මෝසෙස්ගේ
තැන හිමි කරගෙන සිටිනවා.[3]
**3** ඔවුන් ඔබට කියන සියල්ල[4]
කරන්න. ඒවා පිළිපදින්න. නමුත්
ඔවුන් කරන දේවල් නම් කරන්න
එපා.[5] මන්ද ඔවුන් කියනවා මිස
කරන්නේ නැහැ. **4** ඔවුන් පනවන
නීති මිනිසුන්ගේ කර පිට තබන
මහත් බරකට සමානයි.[6] නමුත්
ඒවා ඉසිලීමට තමන්ගේ ඇඟිල්ලක්-
වත් තබන්න ඔවුන් කැමති වන්-
නේ නැහැ.[7] **5** ඔවුන් සෑම දෙයක්ම
කරන්නේ මිනිසුන්ට පෙනෙන්නයි.[8]
ඔවුන් තම ආරක්ෂාවට කුඩා පෙට්ටි
සාදා ශුද්ධ ලියවිල්ලේ කොටස් ඒවාට
දමා ඒවා තම නළල්වල පළඳි-
නවා.[9] ඒ විතරක් නොවෙයි, ඔවුන්
ඒ පෙට්ටි තව තවත් විශාල කර-
නවා. ඔවුන් තම වස්ත්‍රවල වාටි
තවත් පළල් කරනවා.[10] **6** සන්ධ්‍යා
භෝජනවලදී ප්‍රධානතම ස්ථානය-
ටත්[11] සිනගෝගවලදී ඉදිරි ආසන-
වල අසුන්ගන්නත්[12] ඔවුන් කැමතියි.
**7** වෙළඳපොළවලදී ඔවුන්ව ගෞර-
වයෙන් පිළිගන්නවාටත්[13] මිනිසුන්
ඔවුන්ට රබ්බි* කියා අමතනවාටත්[14]
ඔවුන් කැමතියි. **8** නමුත් අන් අය
ඔබට රබ්බි කියා ඇමතිය යුතුයි කියා
නොසිතන්න. මන්ද ඔබට සිටින්නේ
එකම ගුරුවරයෙක්.[15] ඔබ සියලුදෙ-
නාම සහෝදරයෝයි. **9** පොළො-
වෙහි සිටින කාටවත් ‘පියාණන්’ කියා
නොකියන්න. මන්ද ඔබට සිටින්නේ
එකම පියෙක්.[16] ඒ ස්වර්ගයෙහි සිටින
තැනැත්තායි. **10** ඔබ අතරේ සිටින
කිසිම කෙනෙකුට ‘නායකයා’ කියා
නොකියන්න.[17] මන්ද ඔබට සිටින්-
නේ එකම නායකයෙක්. ඒ ක්‍රිස්-
තුස්. **11** ඔබ අතරේ සිටින උතුම්ම
තැනැත්තා ඔබේ සේවකයා විය
යුතුයි.[1] **12** උසස් වෙන්න උත්සාහ
කරන කෙනෙකුව පහත් කරනු
ලබයි.[2] නමුත් නිහතමානීව සේ-
වය කරන කෙනෙකුව උසස් කරනු
ලබයි.[3]
**13** “නීතිය පිටපත් කරන්නෙනි,
පරිසිවරුනි, කුහක වූ ඔබට මොන
තරම් දරුණු ප්‍රතිඵලවලට මුහුණ
දෙන්න සිදු වෙයිද! මන්ද ඔබ ස්වර්ග
රාජ්‍යයට ඇතුල් වීමට ඇති දොර-
ටුවලට අගුල් දමා[4] මිනිසුන්ට ඊට
ඇතුල් වෙන්න ඉඩ දෙන්නේ නැහැ.
ඔබ එයින් ඇතුල් වෙන්නෙත් නැහැ.[5]
ඇතුල් වෙන්න උත්සාහ කරන අයට
ඇතුල් වෙන්න ඔබ ඉඩ දෙන්නෙත්
නැහැ. **14** ——
**15** “නීතිය පිටපත් කරන්නෙනි,
පරිසිවරුනි, කුහක වූ ඔබට[6] මොන
තරම් දරුණු ප්‍රතිඵලවලට මුහුණ
දෙන්න සිදු වෙයිද! මන්ද ඔබ එක්
කෙනෙකුව හරවාගන්න* මුහුදේ හා
ගොඩබිමේ බොහෝ දුර ඈත ගමන්
කරනවා. නමුත් ඔහුව හරවාගත්
පසු ඔහුවත් ගෙහෙන්නාවට# සුදුස්-
සෙක් කරනවා. එසේ ඔබ ඔහුව ඔබට
වඩා දෙගුණයකින් ඒ සඳහා සුදුස්-
සෙක් කරනවා.
**16** “අන්ධ මඟ පෙන්වන්නෙනි,[7]
ඔබට මොන තරම් දරුණු ප්‍රතිඵ-
ලවලට මුහුණ දෙන්න සිදු වෙයිද!
මන්ද, ‘යමෙකු දේවමාළිගාවේ නාම-
යෙන් දිවුරුවොත් එය වලංගු
නැහැයි කියාත් යමෙකු දේවමාළි-
ගාවේ රන්වල නාමයෙන් දිවුරුමක්
කළොත් ඔහු එම දිවුරුම ඉටු කිරී-
මට බැඳී සිටියි’[8] කියාත් ඔබ කිය-
නවා. **17** අඥානයෙනි, අන්ධයෙනි!
වඩා උතුම් වන්නේ කොයි එකද?
රන්ද නැත්නම් ඒ රන් ශුද්ධ දෙ-
යක් බවට පත් කරන දේවමාළි-
ගාවද?[9] **18** මීට අමතරව ‘යමෙකු
පූජාසනයේ නාමයෙන් දිවුරුවොත්
එහි කිසි පලක් නැහැයි කියාත්

---

මතෙ **23:7*** යුදෙව් ආගමේ ගුරුවරයෙකුට භාවිත කළ ගෞරවනීය පදවි නාමයක්.

මතෙ **23:15*** එනම්, යුදෙව් ආගමට හරවාගන්න. **15#** යෙරුසලමෙන් පිටත කසළ පුළුස්සා දැමීම සඳහා භාවිත කළ ස්ථානය. උපග. 2 බලන්න.

---

**23 පරි.**
**1** ලූක් 20:45
**2** මාක් 12:38
**3** නික් 18:13
**4** මලා 2:7
**5** මලා 2:8
**6** මතෙ 11:28 ක්‍රියා 15:10
**7** ලූක් 11:46
**8** මතෙ 6:1
**9** ද්වි 6:8
**10** ගණන් 15:38 ද්වි 22:12
**11** මාක් 12:39 ලූක් 14:7 ලූක් 14:10
**12** ලූක් 11:43
**13** ලූක් 20:46
**14** යෝබ් 32:22
**15** යොහ 13:13
**16** මතෙ 6:9
**17** 1පේතෘ 5:3

**2 තීරුව**
**1** මතෙ 20:26 මාක් 9:35 ලූක් 22:26
**2** හිතෝ 16:18 හිතෝ 29:23
**3** හිතෝ 15:33 මතෙ 18:4 ලූක් 14:11 රෝම 12:3 එෆී 4:2 1පේතෘ 5:5
**4** මතෙ 16:19
**5** ලූක් 11:52
**6** මතෙ 6:2 මතෙ 7:5 ලූක් 12:56
**7** මතෙ 15:14 රෝම 2:19
**8** මතෙ 5:34
**9** නික් 30:29

යමෙකු පරිත්‍යාග කරන දේ ඒ මත
තබා එම පරිත්‍යාගයේ නාමයෙන්
දිවුරුවොත් ඔහු එය ඉටු කිරීමට
බැඳී සිටියි' කියාත් ඔබ කියනවා.
**19** අන්ධයෙනි! වඩා උතුම් වන්නේ
කොයි එකද? පරිත්‍යාගයද නැත්නම්
ඒ පරිත්‍යාගය ශුද්ධ දෙයක් බවට
පත් කරන පූජාසනයද?[1] **20** එහෙ-
යින් පූජාසනයේ නාමයෙන් දිවුරන
තැනැත්තා දිවුරන්නේ පූජාසනයේ
හා ඒ මත තිබෙන දේවල නාම-
යෙනුයි. **21** දේවමාලිගාවේ නාම-
යෙන් දිවුරන තැනැත්තා දිවුරන්නේ
දේවමාලිගාවේ නාමයෙන් සහ එහි
වාසය කරන තැනැත්තාණන්ගේ
නාමයෙනුයි.[2] **22** ස්වර්ගයේ නාම-
යෙන් දිවුරන තැනැත්තා දෙවිගේ
සිංහාසනයේ නාමයෙන්ද[3] ඒ මත
ඉඳගෙන සිටින තැනැත්තාණන්ගේ
නාමයෙන්ද දිවුරයි.

**23** "නීතිය පිටපත් කරන්නෙනි,
පරිසිවරුනි, කුහක වූ ඔබට මොන
තරම් දරුණු ප්‍රතිඵලවලට මුහුණ
දෙන්න සිදු වෙයිද! මන්ද ඔබ මිංචි,
ඇඳුරු, සූදුරු යන දේවලින් දස-
යෙන් කොටස දෙන[4] නමුත් යුක්-
තිය,[5] දයාව,[6] විශ්වාසවන්තකම[7] යන
නීතියේ වඩා බැරෑරුම් කාරණාව-
ලට ඔබ කිසිම සැලකිල්ලක් දක්-
වන්නේ නැහැ. මුලින් සඳහන් කළ
දේවල් කිරීමට අවශ්‍ය බව ඇත්-
තයි. නමුත් වඩා වැදගත් වන්නේ
දෙවෙනියට සඳහන් කළ දේවලුයි.
ඔබ නොසලකාහැර තිබෙන්නෙත්
ඒ දේවලුයි. **24** අන්ධ මඟ පෙන්-
වන්නෙනි![8] ඔබ කරන්නේ මදුරුවාව
අයින් කර[9] ඔටුවා ගිල දමනවා[10] හා
සමාන වැඩක්.

**25** "නීතිය පිටපත් කරන්නෙනි,
පරිසිවරුනි, කුහක වූ ඔබට මොන
තරම් දරුණු ප්‍රතිඵලවලට මුහුණ
දෙන්න සිදු වෙයිද! මන්ද ඔබ කුසලා-
නයත් දීසියත් පිටතින් පවිත්‍ර කළත්[11]
එහි ඇතුළත ඔබේ කොල්ල කෑම්ව-
ලින්[12] හා කිසිම පාලනයකින් තොරව
ඔබ කරන ක්‍රියාවලින් පිරී තිබෙනවා.
**26** අන්ධ[1] පරිසිවරුනි, කුසලානයත්
දීසියත් පිටතින් පවිත්‍ර කරන්න කලින්
ඒවායේ ඇතුළත පවිත්‍ර කරන්න.[2]

**27** "නීතිය පිටපත් කරන්නෙනි,
පරිසිවරුනි, කුහක වූ ඔබට[3] මොන
තරම් දරුණු ප්‍රතිඵලවලට මුහුණ
දෙන්න සිදු වෙයිද! මන්ද ඔබ හුණු
ගා සුදු කළ[4] සොහොන් ගෙවල්ව-
ලට සමානයි. ඒවා පිටතින් අලංකා-
රව පෙනුණත් එහි ඇතුළත මිය ගිය
අයගේ ඇටකටුවලින්ද සියලු ආකාර
අපවිත්‍ර දේවලින්ද පිරී තිබෙනවා.
**28** එලෙසම ඔබේ මවාපෑම නිසා
මිනිසුන් සිතන්නේ ඔබ ඉතා ධර්මිෂ්ඨ
අය කියායි.[5] නමුත් ඔබේ සිත කුහක-
කමින් හා අධර්මිෂ්ඨ දේවලින් පිරී
තිබෙනවා.

**29** "නීතිය පිටපත් කරන්නෙනි,
පරිසිවරුනි, කුහක වූ ඔබට[6] මොන
තරම් දරුණු ප්‍රතිඵලවලට මුහුණ
දෙන්න සිදු වෙයිද! මන්ද ඔබ අනා-
ගතවක්තෘවරුන්ට සොහොන් ගෙ-
වල් සාදා ධර්මිෂ්ඨයන්ගේ සොහොන්
ගෙවල් සරසමින්,[7] **30** 'අපේ මුතුන්-
මිත්තන්ගේ දවස්වලදී අප සිටියා නම්
අනාගතවක්තෘවරුන්ගේ ලේ වැගිරී-
මට අපි ඔවුන් සමඟ හවුල් වන්නේ
නැහැ'[8] කියා පවසනවා. **31** එලෙස
ඔබ අනාගතවක්තෘවරුන්ව මරණ-
යට පත් කළ අයගේ පුත්‍රයන්[9] බව
ඔබ පවසන දේවල්ම ඔබට විරුද්-
ධව සාක්ෂි දරනවා. **32** එසේනම්
ඔබේ මුතුන්මිත්තන් පටන්ගත් කාර්-
යය සම්පූර්ණ කරන්න.[10]

**33** "සර්පයෙනි, පොළඟුන්ගෙන්
පැවතෙන්නෙනි![11] ගෙහෙන්නාවේ*
විනිශ්චයෙන්[12] ඔබ පලා යන්නේ
කොහොමද? **34** ඒ නිසා මෙන්න,
මම ඔබ වෙතට අනාගතවක්-
තෘවරුන්ද ප්‍රඥාවන්තයන්ද ප්‍රසිද්ධි-
යේ උගන්වන්නන්ද[13] එවනවා.[14] ඔබ
ඔවුන්ගෙන් සමහරෙකුව මරා[15] කණු-
වල ඇණ ගසයි. ඇතමෙකුට ඔබේ

**23 පරි.**
**1** නික් 29:37
**2** 1රාජා 8:13, ගීතා 11:4, ගීතා 26:8, ගීතා 132:14
**3** මතෙ 5:34
**4** ලෙවී 27:30, ලූක් 11:42
**5** යෙරෙ 22:15, යොහ 7:24
**6** හොෂෙ 6:6, මීකා 6:8, මතෙ 9:13, මතෙ 12:7
**7** 1තිමෝ 1:5
**8** මතෙ 15:14
**9** ලෙවී 11:42
**10** ලෙවී 11:4
**11** මාක් 7:4
**12** මාක් 12:40

**2 තීරුව**
**1** යොහ 9:40
**2** ලූක් 11:39
**3** ලූක් 12:56
**4** ද්වි 27:4, ලූක් 11:44, ක්‍රියා 23:3
**5** ලූක් 16:15
**6** මතෙ 6:2
**7** ලූක් 11:47
**8** ලූක් 11:50
**9** ලූක් 11:48, ක්‍රියා 7:52, හෙබ්‍රෙ 11:37
**10** 1තෙස 2:16
**11** උත් 3:15, මතෙ 3:7, මතෙ 12:34, ලූක් 3:7
**12** මතෙ 10:28, මාක් 12:40, ලූක් 12:5
**13** මතෙ 10:41, මතෙ 13:52
**14** ලූක් 11:49
**15** ක්‍රියා 7:59

මතෙ **23:33*** මතෙ 23:15හි දෙවෙනි පාදසටහන බලන්න.

සිනගෝගවලදී කසයෙන් තළා[1] සෑම
නුවරකදීම ඔවුන්ට පීඩා කරයි.
**35** ඒ අනුව ධර්මිෂ්ඨ වූ[2] ආබෙල්[3]
පටන් ශුද්ධස්ථානය හා පූජාසනය
අතරේ ඔබ මරණයට පත් කළ බරකි-
යාගේ පුත් සෙකරියා[4] දක්වා පොළො-
වෙහි වැගිරෙවූ සියලු ධර්මිෂ්ඨයන්ගේ
ලේවලට වග කිව යුත්තේ ඔබයි.[5]
**36** ඒ සියල්ලම මේ පරම්පරාව පිටට
පැමිණෙයි[6] කියා ඇත්තෙන්ම මම
ඔබට කියනවා.

**37** "යෙරුසලම! යෙරුසලම! අනා-
ගතවක්තෘවරුන්ව මරා දැමූ,[7] තමන්
වෙතට එවූ අයට[8] ගල් ගැසූ[9] නුවර!
කිකිළියක් තමන්ගේම පැටවුන්ව තම
පියාපත් යටට එකතු කරගන්නා
සේ[10] ඔබේ දරුවන්ව එකතු කර-
ගන්න මම කී වරක් නම් කැමති
වුණාද! නමුත් ඔබ ඊට කැමති
වූයේ නැහැ.[11] **38** බලන්න! ඔබට
ඉතුරු වන්නේ පාළු වූ සියලුදෙනා
අත්හැර දැමූ[12] දේවමාලිගාවක්[13] පම-
ණයි. **39** එමෙන්ම 'යෙහෝවා දෙ-
විගේ නාමයෙන් එන තැනැත්තාට
ආශීර්වාද ලැබේවා'[14] කියා ඔබ කියන
තුරු මෙතැන් සිට ඔබ මාව කිසිසේත්
දකින්නේ නැහැ කියා මම ඔබට කිය-
නවා."

**24** යේසුස් දේවමාලිගාවෙන්
පිටත්ව යද්දී ඔහුගේ ගෝල-
යෝ ඔහු ළඟට ඇවිත් දේවමාලිගා-
වට අයත් ගොඩනැඟිලි පෙන්වමින්[15]
ඒවා ගැන කතා කරන්න පටන්ගත්-
තෝය. **2** යේසුස් ඔවුන්ට මෙසේ
කීවේය. "ඔබට මේ සියල්ල පේනවා
නේද? ඇත්තෙන්ම මා ඔබට කියන්-
නේ, මෙහි සෑම ගලක්ම බිමට හෙළනු
ලබන බවයි."[16]

**3** ඔහු ඔලිව කන්දේ එක් තැනක
වාඩි වී සිටියදී ගෝලයෝ ඔහුව තනිව
හමු වී ඔහුගෙන් මෙසේ ඇසුවෝය.
"ඔබ පැවසූ ඒ දේ සිදු වන්නේ කව-
දාද? ඔබ පැමිණ සිටින කාලය*[17]
හා පවතින සමාජයේ අවසාන කාල
පරිච්ඡේදය[1] දැනගන්න කුමක් හෝ
ලකුණක් තිබෙනවාද?"

**4** එවිට යේසුස් ඔවුන්ට මෙසේ
පිළිතුරු දුන්නේය. "ඔබව නොමඟ
යවන්න කිසිම කෙනෙකුට ඉඩ නො-
දෙන්න.[2] **5** මන්ද, 'මම ක්‍රිස්තුස්'
කියා කියමින් බොහෝදෙනෙක් මගේ
නාමයෙන් ඇවිත් බොහෝදෙනෙ-
කුව නොමඟ යවයි.[3] **6** ඔබට යුද්ධ
ගැනත් යුද්ධ පිළිබඳ ආරංචි ගැනත්
අසන්න ලැබෙයි. එයින් බිය නොවී-
මට වගබලා ගන්න. මන්ද ඒ දේවල්
සිදු විය යුතු වුණත් අවසානය තවම
පැමිණ නැහැ.[4]

**7** "ජාතියක් ජාතියකට විරුද්ධ-
වත්[5] රාජ්‍යයක් රාජ්‍යයකට විරුද්ධ-
වත්[6] නැඟී සිටියි. එක් තැනක් පාසා
තවත් තැනක ආහාර හිඟකම්ද[7] භූමි-
කම්පාද[8] සිදු වෙයි. **8** ඒ සියල්ල
දරුණු විපත්වල ආරම්භයක් පමණයි.

**9** "මිනිසුන් ඔබට පීඩා කර[9] ඔබව
මරණයට පත් කරයි.[10] ඔබ මගේ
නාමය දරන නිසා[11] සියලු ජාතීන්
ඔබට වෛර කරයි.[12] **10** එවිට
බොහෝදෙනෙක් සත්‍ය ඉගැන්වීම්-
වලින් වැටී යයි.[13] ඔවුන් එකිනෙ-
කාව පාවා දෙයි. එකිනෙකාට වෛර
කරයි.[14] **11** බොරු අනාගතවක්තෘ-
වරුන් රාශියක්[15] මතු වී බොහෝ-
දෙනෙකුව නොමඟ යවන අතරම,[16]
**12** අධර්මිෂ්ඨ ක්‍රියා වැඩි වන නිසා[17]
වැඩිදෙනාගේ ප්‍රේමයද හීන වී යයි.[18]
**13** ගැලවීම ලබන්නේ[19] අවසානය
දක්වාම විඳදරාගන්නා තැනැත්-
තායි.[20] **14** රාජ්‍යය පිළිබඳ[21] මේ
ශුභාරංචිය[22] සියලු ජාතීන්ට[23] සාක්ෂි-
යක් වන පිණිස ජනාවාස වූ මුළු පො-

---

මතෙ **24:3*** පැමිණ සිටීම. ග්‍රීක බසින්, පරූසියා. උපග්‍ර. 7 බලන්න.

---

**23 පරි.**
**1** ලූක් 21:12, යොහ 16:2, ක්‍රියා 5:40, 2කොරි 11:24, 1තෙස 2:15
**2** ලූක් 11:50, ලූක් 11:51, එළි 18:24
**3** උත් 4:10, හෙබ්‍රෙ 11:4
**4** 2ලේක 24:22
**5** මතෙ 27:25
**6** නික් 20:5
**7** ලූක් 13:34
**8** 2ලේක 24:21, යොහ 8:59, 1තෙස 2:15
**9** හෙබ්‍රෙ 11:37
**10** ගීතා 91:4
**11** ලූක් 19:14
**12** ලූක් 21:20
**13** 1රාජා 9:7, යෙරෙ 12:7, යෙරෙ 22:5, මතෙ 21:43, ලූක් 19:42
**14** ගීතා 118:26, මතෙ 21:9

**24 පරි.**
**15** මාක් 13:1, ලූක් 21:5
**16** යෙරෙ 7:14, යෙරෙ 26:18, මීකා 3:12, මතෙ 22:7, ලූක් 19:44
**17** මතෙ 24:27, මතෙ 24:37, මතෙ 24:39

**2 තීරුව**
**1** මතෙ 13:39, මතෙ 28:20, මාක් 13:4, ලූක් 21:7
**2** යෙරෙ 14:14, මාක් 13:5, ලූක් 21:8, කොලො 2:8, 2තෙස 2:3
**3** මතෙ 24:24
**4** මාක් 13:7, ලූක් 21:9
**5** හග් 2:22, මාක් 13:8, එළි 6:4
**6** ලූක් 21:10
**7** ක්‍රියා 11:28, එළි 6:6
**8** මාක් 13:8, ලූක් 21:11
**9** මතෙ 10:17, යොහ 15:20, ක්‍රියා 11:19, එළි 2:10

**10** යොහ 16:2; ක්‍රියා 7:59; ක්‍රියා 12:2; එළි 6:11; **11** මාක් 13:9; ලූක් 21:12; 2තිමෝ 3:12; 1පේත‍ 2:21; **12** මතෙ 10:22; යොහ 15:21; ක්‍රියා 8:3; **13** මතෙ 13:21; **14** මතෙ 10:21; **15** මතෙ 7:15; 2පේත‍ 2:1; 1යොහ 4:3; **16** ක්‍රියා 20:29; 1තිමෝ 4:1; **17** මතෙ 7:23; 2තිමෝ 3:2; **18** 2තෙස 2:10; **19** මතෙ 10:22; එළි 2:10; **20** හෙබ්‍රෙ 10:36; **21** දානි 2:44; මතෙ 6:10; **22** යෙසා 52:7; මතෙ 9:35; කොලො 1:23; **23** මතෙ 28:19; මාක් 13:10; රෝම 10:18; එළි 14:6.

ලොව පුරාම දේශනා කරනු ලබයි.
එවිට අවසානය[1] පැමිණෙයි.
**15** "එහෙයින් අනාගතවක්තෘ
දානියෙල් මාර්ගයෙන් කියන ලද
විනාශය සිදු කරන පිළිකුල් දෙය[2] ශුද්-
ධස්ථානයක තිබෙනවා[3] ඔබ දකින
විට (පාඨකයා මෙය අවබෝධ-
යෙන් කියවිය යුතුයි), **16** යුදයේ
සිටින අය කඳුවලට පලා යා යුතුයි.[4]
**17** වහල්තලයේ සිටින්නා පහතට
ඇවිත් තම ගෙයින් කිසිවක් ගැනීම
සඳහා එයට ඇතුල් නොවිය යුතුයි.
**18** කෙතෙහි සිටින්නා තමාගේ පිට
වස්ත්‍රය ගන්න තම නිවසට නොපැමි-
ණිය යුතුයි. **19** ඒ දවස්වලදී ගැබිනි
මව්වරුන්ටත් කිරි දෙන මව්වරුන්-
ටත් මොන තරම් දුෂ්කරතා ඇති වේ-
විද![5] **20** ඔබට පලා යන්න සිදු වන
දවස ශීත කාලයකදීවත් සබත් දවස-
කදීවත් උදා නොවන්න කියා නො-
කඩවා යාච්ඤා කරන්න. **21** මන්ද
ලෝකයේ පටන්ගැන්මේ සිට මේ
දක්වා නොවූ[6] නැවත කිසිදාක සිදු
නොවන මහත් පීඩාවක්[7] එදාට පැමි-
ණෙයි. **22** ඇත්තෙන්ම ඒ පීඩාව
පවතින කාලය කෙටි කළේ නැත්-
නම් කිසි කෙනෙක් ගැලවෙන්නේ
නැහැ. නමුත් තෝරාගත් අය නිසා[8] ඒ
කාලය කෙටි කරනු ලබයි.[9]
**23** "එදාට, 'මෙන්න! ක්‍රිස්තුස් මෙ-
තැනය'[10] නැත්නම්, 'එතැනය' කියා
යමෙක් ඔබට කිව්වොත් ඒ වචන
විශ්වාස නොකරන්න.[11] **24** මන්ද
බොරු ක්‍රිස්තුස්වරුන්ද[12] බොරු අනා-
ගතවක්තෘවරුන්ද[13] මතු වී හැකි
නම් තෝරාගත් අයව[14] පවා නොමඟ
යැවීම සඳහා මහත් ලකුණු[15] හා පුදුම
දේ පෙන්වයි. **25** මා කල්තියාම
ඔබට මේ දේවල් ගැන අනතුරු ඇඟවූ
බව මතක තබාගන්න.[16] **26** එහෙ-
යින් මිනිසුන්, 'අන්න! ඔහු පාළුකරයේ
සිටිනවා' කියා ඔබට කිව්වොත් පිට-
තට නොයන්න. 'මෙන්න! ඔහු ඇතුල්
කාමරයේ සිටිනවා' කියා කිව්වත් එය
විශ්වාස නොකරන්න.[17] **27** අකුණු
ගසද්දී[1] එම විදුලි සැරය නැගෙන-
හිර දෙසින් නික්ම ඇවිත් බස්නාහිර
දක්වා ආලෝකය විහිදුවන ආකාරය
ඔබ දැක ඇති. මනුෂ්‍ය පුත්‍රයා පැමිණ
සිටින කාලයෙත්* එලෙසම වෙයි.[2]
**28** යම් තැනකට රාජාලීන්[3] රැස් වන
විට මළ කුණක් එතැන තිබෙන බව
වටහාගන්න.[4]
**29** "ඒ දවස්වලදී එම පීඩාව ඇති වූ
සැණින්ම හිරු අඳුරු වී යයි.[5] සඳෙන්[6]
කිසි එළියක් නොලැබෙයි. තාරකා
අහසින් වැටෙයි. අහසේ සියලු බල-
යන්ද සොලවනු ලබයි.[7] **30** එවිට
මනුෂ්‍ය පුත්‍රයාගේ ලකුණ[8] අහසේ
පෙනෙයි. එවිට පොළොවේ වාසය
කරන සියලු ගෝත්‍ර ශෝකයෙන්
තම පපුවට ගසාගනියි.[9] බලයෙන්ද
මහත් තේජසින්ද යුතුව අහසේ වලා-
කුළු මත පැමිණෙන මනුෂ්‍ය පුත්‍ර-
යාව ඔවුන් දකියි.[10] **31** ඔහු මහත්
හොරණෑ ශබ්දයක්[11] පතුරුවමින් තම
දූතයන්ව එවයි. ඔවුන් මුළු අහස්ත-
ලය යට තිබෙන පොළොවේ* හතර
දිගින්ම[12] ඔහුගේ තෝරාගත් අයව රැස්
කරයි.[13]
**32** "දැන් අත්තික්කා ගස නිදසු-
නක් ලෙස ගෙන මේ කරුණ ඉගෙන-
ගන්න. එහි අලුතින් වැඩුණු අත්තේ
දලු ලියලන විට ගිම්හානය ළඟ බව
ඔබ දන්නවා.[14] **33** එලෙසම ඔබ
මේ සියල්ල දකින විට ඔහු දොර-
කඩ අසලම සිටින බව දැනගන්න.[15]
**34** ඇත්තෙන්ම මා ඔබට කියන්-
නේ, මේ සියල්ල සිදු වන තුරු
මේ පරම්පරාව[16] කිසි ලෙසකින්වත්
පහව යන්නේ නැති බවයි. **35** අහ-
සත් පොළොවත් පහව ගියත්[17] මගේ
වචන නම් කිසිසේත් පහව යන්නේ
නැහැ.[18]
**36** "පියාණන් මිස[19] ඒ දේ සිදු
වන දවස හා වේලාව[20] කිසිවෙක්
දන්නේ නැහැ. ස්වර්ගයෙහි දේවදූත-
යන්වත් පුත්‍රයාවත් දන්නේ නැහැ.

**24 පරි.**

**1** එළි 16:16 එළි 19:19
**2** ද්වි 29:17 1රාජ 11:5 එළි 13:15
**3** දානි 9:27 දානි 11:31 දානි 12:11 මාක් 13:14
**4** උත් 19:17 ලූක් 21:21
**5** මාක් 13:17 ලූක් 21:23
**6** දානි 12:1
**7** එළි 7:14
**8** යෙසා 65:8 1පේතෘ 2:9
**9** මාක් 13:20
**10** මතෙ 24:5 ලූක් 17:23
**11** 1යොහ 4:1
**12** 1යොහ 2:18
**13** ද්වි 13:1 මතෙ 7:15 මාක් 13:22 2පේතෘ 2:1
**14** මාක් 13:22
**15** මතෙ 7:22 2තෙස 2:9 එළි 13:13
**16** යොහ 13:19
**17** ලූක් 17:23

**2 තීරුව**

**1** යෝබ් 37:3
**2** දානි 7:13 ලූක් 17:24 1කොරි 15:23 1තෙස 4:15
**3** ලූක් 17:37
**4** යෝබ් 39:30
**5** යෝවෙ 2:31
**6** එළි 6:12
**7** මාක් 13:25 ලූක් 21:25 එළි 6:13
**8** දානි 7:13 ලූක් 21:27
**9** සෙක 12:12 එළි 1:7
**10** දානි 7:14 මතෙ 26:64 මාක් 13:26
**11** යෙසා 27:13
**12** මාක් 13:27
**13** එළි 7:3
**14** මාක් 13:28 ලූක් 21:30
**15** යාකො 5:9
**16** මතෙ 23:36
**17** හෙබ්‍රෙ 1:11
**18** මතෙ 5:18 ලූක් 21:33
**19** මාක් 13:32
**20** ක්‍රියා 1:7 1තෙස 5:1

---

මතෙ **24:27*** පැමිණ සිටීම. ග්‍රීක බසින්, පරූසියා. උපග්‍ර. 7 බලන්න. **31*** මූ.අ., "සුළඟේ."

**37** මනුෂ්‍ය පුත්‍රයා පැමිණ සිටින
කාලයේ*[1] සිදු වන දේවල් නෝවා-
ගේ කාලයේ[2] සිදුවීම්වලට සමානයි.
**38** ජලගැල්මට පෙර කාලය පුරාම
එනම්, නෝවා[3] නැවට ඇතුල් වූ දවස
දක්වාම[4] ඔවුන් කමින් බොමින් විවාහ
වෙමින් සහ විවාහ කර දෙමින් සිටියා.
**39** ජලගැල්ම ඇවිත් ඔවුන් සියල්-
ලන්වම ගසාගෙන යන තුරු ඔවුන්
සිදු වන දේ ගැන කිසි තැකීමක්
කළේ නැහැ.[5] මනුෂ්‍ය පුත්‍රයා පැමිණ
සිටින කාලයද* ඒ හා සමානයි.
**40** ඒ කාලයේදී මිනිසුන් දෙදෙනෙක්
කෙතෙහි සිටියි. එක් තැනැත්තෙකුව
ගෙන යනු ලබයි. අනික් තැනැත්-
තාව අත්හරිනු ලබයි. **41** ස්ත්‍රීන්
දෙදෙනෙක් ඇඹරුම් ගලේ අඹරමින්
සිටියි.[6] එක් තැනැත්තියකව ගෙන
යනු ලබයි. අනික් තැනැත්තියව අත්-
හරිනු ලබයි.[7] **42** එහෙයින් සෝදිසි-
යෙන් සිටින්න. මන්ද ඔබේ ස්වාමීන්
කොයි දවසේ එනවාදැයි ඔබ දන්නේ
නැහැ.[8]
**43** "නමුත් මේ දේ දැනගන්න.
එනම් සොරා කොයි රැකවල් යාම-
යේ එනවාද කියා ගෙහිමියා දැන
සිටියා නම්[9] ඔහු අවදිව සිට තමාගේ
ගෙය බිඳීමට ඉඩ දෙන්නේ නැහැ.
**44** එහෙයින් ඔබත් සූදානමින් සිටින
බව පෙන්වන්න.[10] මන්ද මනුෂ්‍ය
පුත්‍රයා එන්නේ ඔබ නොසිතන පැය-
කදීයි.
**45** "ස්වාමියා විසින් තම මෙහෙ-
කරුවන්ට නියම වේලාවට[11] ආහාර
දීම සඳහා ඔවුන් කෙරෙහි පත් කළ
විශ්වාසවන්ත නුවණ ඇති දාසයා[12]
කවුද? **46** ඔහුගේ ස්වාමියා පැමිණි
විට ඔහු එසේ කරනවා දකී නම් ඒ
දාසයා සන්තෝෂවත්ය![13] **47** ඇත්-
තෙන්ම මා ඔබට කියන්නේ, ඒ ස්වා-
මියා තමන් සතු සියලු දේවල් බලා
කියා ගැනීම සඳහා ඔහුව පත් කරන
බවයි.[14]

**48** "නමුත් යම් විටක දුෂ්ට දාසයා,
'මගේ ස්වාමියා ප්‍රමාද වෙනවා'[1]
කියා සිතින්[2] කියාගෙන, **49** තමන්
සමඟ සිටින සෙසු දාසයන්ට තළන්න
පටන්ගෙන බේබද්දන් සමඟ කමින්
බොමින් සිටියොත්, **50** ඒ දාසයා-
ගේ ස්වාමියා ඔහු බලාපොරොත්තු
නොවන දවසක, ඔහු නොදන්නා
පැයකදී[3] ඇවිත්, **51** ඔහුට ඉතා
තදින් දඬුවම් කර[4] කුහකයන්ට හිමි
වන ස්ථානයට දමයි. එහිදී ඔහුට සිදු
වන්නේ හඬමින් හා දත්මිටි කමින්
සිටින්නයි.[5]

**25** "පහන් රැගෙන[6] මනාලයා
හමු වන්න[7] පිටත්ව ගිය
අවිවාහක තරුණියන් දහදෙනෙකුට
ස්වර්ග රාජ්‍යය සමානයි. **2** ඔවුන්
අතරෙන් පස්දෙනෙක් නුවණ නැති
අයයි.[8] අනික් පස්දෙනා නුවණ ඇති
අයයි.[9] **3** මන්ද නුවණ නැති අය
තම පහන් ගෙන ගියත් තෙල් ගෙන
ගියේ නැහැ. **4** නමුත් නුවණ ඇති
අය තමන්ගේ පහන් සමඟ තෙල් පිරවූ
බඳුන්ද ගෙන ගියා. **5** මනාලයා
එන්න ප්‍රමාද වෙද්දී ඒ සියල්ලන්ම
නිදිබර වී නිදාගත්තා.[10] **6** එකව-
රම 'මෙන්න මනාලයා ඇවිත්! ඔහුව
හමු වන්න පිටත්ව යන්න' කියන
හඬක්[11] මධ්‍යම රාත්‍රියේදී ඔවුන්ට
ඇසුණා. **7** එවිට ඒ සියලු තරු-
ණියන් නැඟිට තම පහන් සකස්
කළා.[12] **8** නුවණ නැති අය, නුවණ
ඇති අය ළඟට ගොස්, 'අපේ පහන්
නිවීගෙන යනවා. ඒ නිසා ඔබේ
තෙල්වලින් ටිකක් අපට දෙන්න'[13]
කියා ඉල්ලුවා. **9** නුවණ ඇති අය[14]
මෙසේ පිළිතුරු දුන්නා. 'අපි ඔබට
තෙල් දුන්නොත් අපි දෙගොල්ලන්-
ටම තෙල් මදි වෙන්න පුළුවන්. ඒ
නිසා තෙල් විකුණන්නන් ළඟට ගොස්
තෙල් මිල දී ගන්න.' **10** ඔවුන්
තෙල් මිල දී ගැනීමට පිටත්ව යන
අතරතුර මනාලයා පැමිණි අතර සූදා-
නම්ව සිටි තරුණියන් ඔහු සමඟ
විවාහ උත්සවයට ගියා.[15] ඉන්පසුව

---

මතෙ **24:37*** පැමිණ සිටීම. ග්‍රීක බසින්, පරූසියා. උපග්‍ර. 7 බලන්න. **39*** පැමිණ සිටීම. ග්‍රීක බසින්, පරූසියා. උපග්‍ර. 7 බලන්න.

**24 පරි.**
**1** මතෙ 24:27 ලූක් 17:26
**2** උත් 6:11 යෙසා 54:9
**3** උත් 7:7
**4** ලූක් 17:27 හෙබ්‍රෙ 11:7 1පේත්‍ර 3:20 2පේත්‍ර 2:5
**5** උත් 7:23 2පේත්‍ර 3:6
**6** යෙසා 47:2
**7** ලූක් 17:35
**8** මතෙ 25:13 මාක් 13:33 ලූක් 21:36
**9** ලූක් 12:39 1තෙස 5:2 2පේත්‍ර 3:10 එළි 3:3
**10** මාක් 13:35 ලූක් 12:40
**11** ලූක් 12:42
**12** 1කොරි 4:2 හෙබ්‍රෙ 3:5
**13** එළි 16:15
**14** මතෙ 25:21 ලූක් 12:44

**2 තීරුව**
**1** 2පේත්‍ර 3:4
**2** දේශ 8:11 හෙබ්‍රෙ 3:12
**3** මතෙ 25:13
**4** ලූක් 12:46
**5** ගීතා 112:10 මතෙ 8:12 මතෙ 25:30 ලූක් 13:28

**25 පරි.**
**6** ලූක් 12:35 පිලි 2:15
**7** යොහ 3:29 එළි 19:7
**8** මතෙ 7:26
**9** මතෙ 7:24
**10** 1තෙස 5:6
**11** මතෙ 24:31
**12** ලූක් 12:35
**13** හෙබ්‍රෙ 1:9
**14** මතෙ 7:24
**15** එළි 19:9

දොර වසා දමනු ලැබුවා. **11** අනික්
තරුණියන් පසුව ඇවිත්, ‘මහත්-
මයාණෙනි, මහත්මයාණෙනි, අපට
දොර අරින්න’[1] කියා පැවසුවා.
**12** එවිට ඔහු මෙසේ පිළිතුරු දුන්නා.
‘ඇත්තෙන්ම මම ඔබව හඳුනන්නේ
නැහැ.’[2]

**13** “එමනිසා සෝදිසියෙන්
සිටින්න.[3] මන්ද ඔබ ඒ දවසවත්
පැයවත් දන්නේ නැහැ.[4]

**14** “පිටරට[5] යන්න සූදානම් වූ
මිනිසෙකුටත්[6] ස්වර්ග රාජ්‍යය සමාන
කළ හැකියි. ඔහු තම දාසයන්ව
කැඳවා තමා සතු දේ ඔවුන්ට භාර
දුන්නා.[7] **15** ඔහු ඒවා භාර දුන්-
නේ එකිනෙකාගේ හැකියාව අනු-
වයි.[8] ඔහු එක් කෙනෙකුට තලෙන්ත*
පහක්ද තව කෙනෙකුට දෙකක්ද
තවත් කෙනෙකුට එකක්ද බැගින්
දී පිටරට ගියා. **16** තලෙන්ත පහ
ලැබූ තැනැත්තා වහාම ගොස් ඒවා-
යින් වෙළඳාම් කොට තව පහක් උප-
යාගත්තා.[9] **17** එලෙසම තලෙන්ත
දෙක ලැබූ තැනැත්තාද තවත් දෙ-
කක් උපයාගත්තා. **18** නමුත් එක
තලෙන්තයක් පමණක් ලැබූ
තැනැත්තා ගොස් පොළොවෙහි වළක්
හාරා, තම ස්වාමියා දුන් රිදී මුදල එහි
සඟවා තැබුවා.

**19** “බොහෝ කලකට පසු[10] ඒ
දාසයන්ගේ ස්වාමියා ඔවුන් සමඟ
ගණන් හිලව් බැලීමට[11] පැමි-
ණියා. **20** එවිට තලෙන්ත පහ ලැබූ
තැනැත්තා තවත් තලෙන්ත පහක්
ගෙනැවිත්, ‘ස්වාමීනි, ඔබ තලෙන්ත
පහක් මට භාර දුන්නා. මෙන්න,
මම තව තලෙන්ත පහක් උපයා-
ගත්තා’[12] කියා පැවසුවා. **21** ඔහු-
ගේ ස්වාමියා, ‘ඔබ ඉතා යහපත්,
විශ්වාසවන්ත දාසයෙක්![13] මට ඔබ
ගැන ඉතාමත් සතුටුයි. ඔබ ස්වල්-
පයක් ගැන විශ්වාසවන්තව කට-
යුතු කළා.[14] බොහෝ දේවල් භාරව
සිටීමට මම දැන් ඔබව පත් කර-
නවා.[1] ඇවිත් ඔබේ ස්වාමියා සමඟ
ප්‍රීති වන්න’[2] කියා ඔහුට පැවසුවා.
**22** ඊළඟට තලෙන්ත දෙක ලැබූ
තැනැත්තා ඉදිරියට ඇවිත්, ‘ස්වා-
මීනි, ඔබ මට තලෙන්ත දෙකක්
භාර දුන්නා. මෙන්න, මම තවත්
තලෙන්ත දෙකක් උපයාගත්තා’[3]
කියා පැවසුවා. **23** ඔහුගේ ස්වාමියා
ඔහුව අමතා, ‘ඔබත් ඉතා යහපත්,
විශ්වාසවන්ත දාසයෙක්! මට ඔබ
ගැනත් ඉතාමත් සතුටුයි. ඔබට දුන්
ස්වල්ප දේ ගැන ඔබ විශ්වාසවන්තව
කටයුතු කළා. දැන් බොහෝ දේවල්
භාරව සිටින්න මම ඔබව පත් කර-
නවා.[4] ඇවිත් ඔබේ ස්වාමියා සමඟ
ප්‍රීති වන්න’[5] කියා පැවසුවා.

**24** “අන්තිමට එක් තලෙන්තයක්
ලැබූ තැනැත්තා ඉදිරියට ඇවිත්,[6]
‘ස්වාමීනි, ඔබ වපුරන්නේ නැති
තැන්වලින් කපාගන්නා, පොළා නො-
ගත් තැන්වලින් රැස් කරගන්නා තද
හිතක් ඇති මිනිසෙකු බව මම දැන-
ගෙන හිටියා. ඒ නිසා, **25** මම භය
වී[7] ඔබේ තලෙන්තය පොළොවේ
වළක් හාරා සඟවා තැබුවා. මෙන්න,
ඔබ සතු දේ’ කියා කිව්වා. **26** එවිට
ඔහුගේ ස්වාමියා ඔහුට මෙසේ පිළි-
තුරු දුන්නා. ‘ඔබ නම් ඉතා දුෂ්ට,
කම්මැලි දාසයෙක්! මා වපුරන්නේ
නැති තැන්වලින් කපාගත් බවත් මා
පොළන්නේ නැති තැන්වලින් රැස්
කරගත් බවත් ඔබ දැනගෙන සිටියා
නොවෙයිද? **27** එසේනම් මගේ රිදී
මුදල් බැංකුකරුවන්ට දී ඔවුන් ළඟ
එය තැන්පත් කරන්න ඔබට තිබුණා.
එවිට මා නැවත පැමිණි විට මා සතු
දේ පොලියත් සමඟ මට ලැබෙන්න
තිබුණා.[8]

**28** “ ‘එමනිසා ඔහුගෙන් ඒ
තලෙන්තය ගෙන තලෙන්ත දහ-
යක් ඇති තැනැත්තාට දෙන්න.[9]
**29** මන්ද යමක් ඇති සෑම කෙනෙ-
කුටම තවත් දෙනු ලබනවා. එවිට
ඔහුට බොහෝ දේවල් භුක්ති විඳිය
හැකියි. නමුත් යමෙකුට නැත්නම්

**25 පරි.**
**1** ලූක් 13:25 හෙබ්‍රෙ 12:17
**2** ලූක් 13:27
**3** 1තෙස 5:6 1පේතෘ 5:8
**4** මතෙ 24:42 මතෙ 24:50 මාක් 13:33
**5** මතෙ 21:33
**6** ලූක් 19:12
**7** ලූක් 19:13
**8** රෝම 12:6
**9** හිතෝ 10:4
**10** මතෙ 24:48
**11** මතෙ 18:23 ලූක් 19:15
**12** ලූක් 19:16
**13** ලූක් 19:17
**14** හිතෝ 28:20 ලූක් 16:10

**2 තීරුව**
**1** හිතෝ 12:24 ලූක් 12:44
**2** හෙබ්‍රෙ 12:2
**3** ලූක් 19:18
**4** ලූක් 19:19
**5** හෙබ්‍රෙ 12:2
**6** ලූක් 19:20
**7** හිතෝ 26:13 ලූක් 19:21 එළි 21:8
**8** ලූක් 19:23
**9** ලූක් 19:24

මතෙ **25:15*** මතෙ 18:24හි පළමුවෙනි පාදසටහන බලන්න.

ඔහුට තිබෙන දේ පවා ඔහුගෙන් ගනු
ලබනවා.[1] **30** කිසි වැඩකට නැති
මේ දාසයාව පිටතට ඇද දමා අන්ධ-
කාරයට දමන්න. එහිදී හඬමින් හා
දත්මිටි කමින් සිටින්න ඔහුට සිදු
වෙයි.'[2]

**31** "මනුෂ්‍ය පුත්‍රයා[3] තම තේජසින්
සියලු දේවදූතයන් සමඟ එන අවස්-
ථාවේදී[4] ඔහු තම තේජවත් සිංහා-
සනයේ ඉඳගනියි.[5] **32** එවිට සියලු
ජාතීන් ඔහු ඉදිරියට රැස් කරනු
ලබයි.[6] ඉන්පසුව එඬේරෙකු එළුවන්-
ගෙන් බැටළුවන් වෙන් කරන්නා සේ[7]
ඔහු මිනිසුන්ව වෙන් කරයි.[8] **33** ඔහු
බැටළුවන්ව තම දකුණු පැත්තටත්[9]
එළුවන්ව තම වම් පැත්තටත්[10] දමයි.

**34** "එවිට රජ තම දකුණු පැත්තේ
සිටින අයට මෙසේ කියයි. 'මාගේ
පියාණන්ගෙන් ආශීර්වාද ලද්දෙනි,[11]
එන්න. පොළොවේ දරුවන් බිහි වූ
දා*[12] සිට ඔබට සූදානම් කර තිබෙන
රාජ්‍යය[13] උරුමයක් වශයෙන් ලබා-
ගන්න.[14] **35** මන්ද මට බඩගිනි වූ
විට ඔබ මට කන්න යමක් දුන්නා.[15]
මට පිපාස වූ විට ඔබ මට බොන්න
යමක් දුන්නා. ආගන්තුකයෙකුව සිටි
මාව ඔබ සාදරයෙන් පිළිගත්තා.[16]
**36** මට ඇඳුම් නොතිබුණු විට[17] ඔබ
මට ඇඳුම් ලබා දුන්නා. මට අසනීප වූ
විට ඔබ මට සාත්තු කළා. මම සිර-
ගෙයි සිටි විට[18] ඔබ මාව බලන්න
ආවා.' **37** එවිට ධර්මිෂ්ඨ අය ඔහුට
මේ වචනවලින් පිළිතුරු දෙයි. 'ස්වා-
මීනි, ඔබ බඩගින්නෙන් සිටිනවා
දැක අපි ඔබට කන්න යමක් දුන්-
නේ කවදාද? පිපාසයෙන් සිටිනවා[19]
දැක ඔබට බොන්න යමක් දුන්-
නේ කවදාද?[20] **38** ඔබ ආගන්තුක-
යෙක් හැටියට සිටිනවා දැක ඔබව
සාදරයෙන් පිළිගත්තේ කොයි කාල-
යේද? ඔබට ඇඳුම් නැති බව දැක
ඔබට ඇඳුම් ලබා දුන්නේ කවදාද?
**39** ඔබ අසනීප වී සිටිනවා දැක අපි
ඔබට සාත්තු කළෙත් ඔබ සිරගෙයි
සිටිනවා දැක ඔබව බලන්න ආවෙත්
කවදාද?' **40** එවිට රජ[1] ඔවුන්ට
මෙසේ උත්තර දෙයි. 'ඇත්තෙන්ම
මා ඔබට කියන්නේ, මගේ මේ සහෝ-
දරයන්[2] අතරින් සුළුම[3] තැනැත්තන්-
ගෙන් කෙනෙකුට හෝ ඔබ එසේ කළා
නම් ඔබ ඒ දේ කළේ මටයි.'[4]

**41** "ඊළඟට ඔහු තම වම් පැත්තේ
සිටින්නන්ට මෙසේ කියයි. 'ශාප ලද්-
දෙනි, මා වෙතින් ඉවත් වී[5] යක්ෂයා-
ටත් ඔහුගේ දූතයන්ටත් සූදානම් කර
තිබෙන[6] සදාකාල ගින්නට යන්න.[7]
**42** මන්ද මට බඩගිනි වූ විට ඔබ මට
කන්න කිසිවක් දුන්නේ නැහැ.[8] මට
පිපාස වූ විට[9] ඔබ මට බොන්න යමක්
දුන්නේ නැහැ. **43** ආගන්තුකයෙ-
කුව සිටි මාව ඔබ සාදරයෙන් පිළිගත්-
තේ නැහැ. ඇඳුම් නැතුව සිටි විට ඔබ
මට ඇඳුම් දුන්නේ නැහැ.[10] අසනීප
වී සිටියත් සිරගෙයි සිටියත්[11] ඔබ
මාව බලාගත්තේ නැහැ.' **44** එවිට
ඔවුන්ද මේ වචනවලින් පිළිතුරු දෙයි.
'ස්වාමීනි, අපි ඔබට උපකාර නො-
කළා කියා පවසන්නේ කොහොමද?
අපි ඔබ බඩගින්නෙන් හෝ පිපාස-
යෙන් හෝ ආගන්තුකයෙකු හැටියට
හෝ ඇඳුම් නැතුව හෝ අසනීපව හෝ
සිරගෙයි හෝ සිටිනවා දැක්කේ කව-
දාද?' **45** එවිට ඔහු ඔවුන්ට මෙසේ
පිළිතුරු දෙයි. 'ඇත්තෙන්ම මා ඔබට
කියන්නේ, මේ ඉතා සුළු තැනැත්-
තන්ගෙන් එක් කෙනෙකුට වුණත්[12]
ඔබ එසේ කළේ නැත්නම්[13] ඔබ ඒ දේ
නොකළේ මටයි.'[14] **46** ඔවුන්ට හිමි
වන්නේ සදාකාල මරණයයි.[15] නමුත්
ධර්මිෂ්ඨයන්ට සදාකාල ජීවනය හිමි
වෙයි."[16]

**26** යේසුස් ඒ වදන් සියල්ල කියා
නිම කළ පසු ඔහු තම
ගෝලයන්ට මෙසේ කීවේය. **2** "නව
දවස් දෙකකින් පාස්කුව පැමිණෙන
බව ඔබ දන්නවා.[17] එවිට ඔවුන්

---

මතෙ **25:34*** හෝ, "මිනිසුන් (ග්‍රීක බසින්, කොස්-
මොස්) ජනිත කිරීමට පෙර." මෙයින් විස්තර
කරන්නේ ආදම් සහ ඒව බිහි කළ දරුවන් ගැනයි.

**25 පරි.**
**1** මතෙ 13:12 මාක් 4:25 ලූක් 8:18 යොහ 15:2
**2** ගීතා 112:10 මතෙ 8:12
**3** දානි 7:13 මතෙ 16:27 ක්‍රියා 1:11 එළි 1:7
**4** සෙක 14:5 මතෙ 13:41 මතෙ 19:28
**5** එළි 3:21
**6** 2කොරි 5:10
**7** එස 20:38
**8** එස 34:17 මතෙ 13:49
**9** යොහ 10:16
**10** මතෙ 25:41
**11** ගීතා 115:15
**12** මතෙ 13:35 හෙබ්‍රෙ 9:26 1පේතෘ 1:20 එළි 13:8
**13** 1තෙස 2:12 එළි 5:10
**14** රෝම 8:17
**15** යෙසා 58:7 එස 18:16
**16** හෙබ්‍රෙ 13:2 3යොහ 5
**17** එස 18:7 යාකො 2:15
**18** 2තිමෝ 1:16
**19** මතෙ 10:42
**20** මතෙ 6:3

**2 තීරුව**
**1** ලූක් 19:38 එළි 17:14
**2** 2කොරි 5:20 හෙබ්‍රෙ 2:11
**3** හිතෝ 19:17 මතෙ 10:40 මාක් 9:41
**4** හෙබ්‍රෙ 6:10
**5** මතෙ 7:23 ලූක් 13:27
**6** එළි 12:9
**7** මතෙ 18:8 එළි 20:10
**8** යෙසා 58:7 එස 18:16
**9** මතෙ 10:42
**10** එස 18:7 යාකො 2:15
**11** 2තිමෝ 1:16
**12** අදි 23:4 2කොරි 5:20 හෙබ්‍රෙ 2:11
**13** සෙක 2:8
**14** ක්‍රියා 9:5
**15** දානි 12:2 2පේතෘ 2:9
**16** රෝම 2:7

---

**26 පරි.** **17** නික් 12:14; මාක් 14:1; ලූක් 22:1; යොහ 13:1.

මනුෂ්‍ය පුත්‍රයාව කණුවක ඇණ ගසා
මරා දමයි.”[1]

**3** නායක පූජකයෝද ජනතාව
අතර සිටි වැඩිමහල්ලෝද කායෆස්[2]
නම් උත්තම පූජකයාගේ නිවසෙහි
ඇතුල් මළුවට එක් රැස් වී, **4** කපටි
උපායක් යොදාගෙන යේසුස්ව අල්ලා-
ගෙන මරා දැමිය හැකි අයුරු ගැන
සාකච්ඡා කළහ.[3] **5** නමුත් “සෙනඟ
අතර කෝලහලයක් ඇති විය හැකි
නිසා අපි ඒ දේ උත්සව දවස්වලදී
නොකර සිටිමු”[4] කියා ඔවුහු පැවසු-
වෝය.

**6** යේසුස් බෙතානියේ[5] ලාදුරු
රෝගී සීමොන්ගේ නිවසෙහි සිටි-
යදී,[6] **7** එක් ස්ත්‍රියක් එහි පැමි-
ණියාය. ඇගේ අතෙහි මිල අධික
සුවඳ තෙල්[7] අඩංගු ඇලබැස්ටර්වලින්
සාදන ලද බඳුනක් තිබූ අතර ඇය
යේසුස් ළඟට ඇවිත් කෑම මේසයෙහි
ඉඳගෙන සිටි ඔහුගේ හිස මත ඒ
තෙල් වත් කරන්න පටන්ගත්තාය.
**8** එය දුටු ගෝලයෝ කෝප වී,
“මේ විදිහට නාස්ති කරන්නේ ඇයි?[8]
**9** මෙය විශාල මුදලකට විකුණා
ඒ මුදල් දිළිඳුන්ට දෙන්න තිබුණා”[9]
කියා කීවෝය. **10** යේසුස් එය දැන-
ගෙන[10] ඔවුන්ට මෙලෙස පැවසුවේය.
“ඔබ මේ ස්ත්‍රියට කරදර කරන්නේ
ඇයි? ඇය මා වෙනුවෙන් කළේ ඉතා-
මත් විශිෂ්ට ක්‍රියාවක්.[11] **11** දිළිඳු
අය ඔබ සමඟ සැමදාම සිටියි.[12]
නමුත් මම ඔබ සමඟ සැමදා සිටින්-
නේ නැහැ.[13] **12** මේ ස්ත්‍රිය මෙම
සුවඳ තෙල මගේ සිරුරේ වත් කළේ
මාව තැන්පත් කිරීමට සූදානමක්
ලෙසයි.[14] **13** ඇත්තෙන්ම මා ඔබට
කියන්නේ, ලොව පුරාම ශුභාරංචිය
දේශනා කරන සෑම තැනකදීම මේ
ස්ත්‍රියව සිහි කිරීම සඳහා ඇය කළ
දෙය ගැන පවසනු ලබන බවයි.”[15]

**14** ඉන්පසු දොළොස්දෙනාගෙන්
එක් කෙනෙක් වූ යූදස් ඉස්කාරි-
යොත්[16] නායක පූජකයන් වෙතට
ගොස්, **15** “මම ඔහුව ඔබට පාවා
දුන්නොත් ඔබ මට දෙන්නේ මොන-
වාද”[1] කියා ඇසුවේය. ඔවුහු ඔහුට
රිදී කාසි තිහක් දීමට එකඟ වූහ.[2]
**16** ඔහු එතැන් පටන් යේසුස්ව පාවා
දීමට සුදුසු අවස්ථාවක් එන තුරු බලා
සිටියේය.[3]

**17** මුහුන් නොදැමූ රොටි උත්සව-
යේ පළමුවෙනි දවසේදී[4] ගෝලයෝ
යේසුස් වෙතට ඇවිත්, “පාස්කු උත්-
සවය පවත්වන්න අපි කොයි වගේ
තැනක් සූදානම් කරනවාටද ඔබ
කැමති” කියා ඇසූහ.[5] **18** එවිට
ඔහු මෙසේ කීවේය. “නුවරට ගොස්
අහවල් කෙනාව[6] හමු වී, ‘මගේ නිය-
මිත වේලාව ළඟයි. මම කැමතියි
මගේ ගෝලයන් සමඟ ඔබේ ගෙද-
රදී පාස්කුව පවත්වන්න’ කියා ගුරු-
තුමා පවසන බව ඔහුට කියන්න.”[7]
**19** යේසුස් අණ කළ ලෙස ඔවුහු
පාස්කුව සඳහා දේවල් සූදානම්
කළෝය.[8]

**20** සවස් වූ විට[9] ඔහු ගෝලයන්
දොළොස්දෙනා සමඟ කෑම මේස-
යේ ඉඳගෙන සිටියේය.[10] **21** ඔවුන්
කමින් සිටියදී, “මා ඔබට
කියන මේ දේට හොඳින් ඇහුම්-
කන් දෙන්න. ඔබ අතරෙන් එක්
කෙනෙක් මාව පාවා දෙනවා” කියා
කීවේය.[11] **22** ඒ දේ ඇසූ ඔවුන්
අතිශයින් ශෝක වී, “ස්වාමීනි, ඒ
මමද”[12] කියා එකිනෙකා අසන්න
පටන්ගත්හ. **23** ඔහු මෙසේ පිළි-
තුරු දුන්නේය. “මාව පාවා දෙන්-
නේ මා සමඟ බඳුනේ අත දමන
මෙහි සිටින අයගෙන් කෙනෙක්.[13]
**24** මනුෂ්‍ය පුත්‍රයා ගැන ලියා තිබෙන
ආකාරයට[14] ඔහු ඔබෙන් අනිවාර්-
යයෙන්ම සමුගනියි. නමුත් මනුෂ්‍ය
පුත්‍රයාව පාවා දෙන ඒ තැනැත්තාට[15]
මොන තරම් දරුණු විපතකට මුහුණ
දෙන්න සිදු වෙයිද![16] ඔහු ඉපදු-
ණේ නැත්නම් ඔහුට වඩාත් හොඳයි.”
**25** එවිට ඔහුව පාවා දෙන්න

**26 පරි.**
**1** මතෙ 16:21 මතෙ 20:19 මතෙ 27:26 මාක් 15:15 යොහ 19:16
**2** මතෙ 26:57 ලූක් 3:2 ලූක් 22:2 යොහ 18:13 යොහ 18:24
**3** ගීතා 2:2 මාක් 14:1 යොහ 11:49
**4** මාක් 14:2
**5** මතෙ 21:17
**6** මතෙ 8:2
**7** මාක් 14:3 යොහ 12:3
**8** මාක් 14:4 යොහ 12:4
**9** මාක් 14:5 යොහ 12:5
**10** යොහ 12:6
**11** මාක් 14:6
**12** ද්වි 15:11 මාක් 14:7
**13** මතෙ 9:15 යොහ 12:8 යොහ 17:11
**14** මාක් 14:8 යොහ 12:7
**15** මාක් 14:9
**16** මතෙ 10:4 ලූක් 22:3 යොහ 13:2

**2 තීරුව**
**1** මාක් 14:10 යොහ 11:57 1තිමෝ 6:10
**2** නික් 21:32 සෙක 11:12 මතෙ 27:3 මාක් 14:11 ලූක් 22:5
**3** මාක් 14:11 ලූක් 22:6
**4** නික් 12:18 නික් 23:15 ලෙවී 23:6 මාක් 14:12 ලූක් 22:7
**5** ලූක් 22:9
**6** මතෙ 21:3 මාක් 14:13 ලූක් 22:10
**7** මාක් 14:14 ලූක් 22:11
**8** මාක් 14:16 ලූක් 22:13
**9** ද්වි 16:6
**10** මාක් 14:17 ලූක් 22:14
**11** මාක් 14:18 යොහ 6:70 යොහ 13:21
**12** මාක් 14:19 යොහ 13:22

---

**13** ගීතා 41:9; මාක් 14:20; ලූක් 22:21; යොහ 13:26; **14** මතෙ 5:17; **15** මාක් 14:21; යොහ 17:12; **16** ද්වි 27:25; ලූක් 22:22.

සූදානම්ව සිටි යූදස්, "ගුරුතුමනි, ඒ මමද" කියා ඇසුවේය. ඔහු, "ඒ ප්‍රශ්නයට පිළිතුර ඔබෙන් දැන් ලැබුණා" කියා ඔහුට පැවසුවේය.

**26** ඔවුන් කමින් සිටියදී යේසුස් රොටියක් ගෙන[1] යාච්ඤා කර, එය කඩා[2] ගෝලයන්ට දුන්නේය. ඔහුද, "රැගෙන කන්න. මෙයින් නියෝජනය වන්නේ මගේ ශරීරයයි"[3] කියා කීවේය. **27** ඉන්පසු ඔහු කුසලානයක් ගෙන[4] ඒ සඳහා ස්තුති යාච්ඤාවක් කළ පසු ඔවුන්ට එය දෙමින් මෙසේ කීවේය. "ඔබ සියල්ලන්ම මෙයින් බොන්න.[5] **28** මන්ද මෙයින් නියෝජනය වන්නේ[6] පව් සමාව සඳහා[7] බොහෝදෙනා උදෙසා වගුරුවනු ලබන[8] මගේ රුධිරයයි.[9] ගිවිසුම ස්ථිර වන්නේ මේ රුධිරයෙනුයි.[10] **29** මා ඔබට කියන්නේ, මගේ පියාණන්ගේ රාජ්‍යයෙහි මා ඔබ සමඟ අලුත් වයින් බොන දවස එන තුරු මා මෙතැන් සිට මිදිවැලේ පලයෙන් ලැබෙන වයින් කිසිසේත් බොන්නේ නැති බවයි."[11] **30** ඔවුහු ප්‍රශංසා ගී ගැයීමෙන් පසු[12] ඔලීව කන්දට පිටත්ව ගියෝය.[13]

**31** යේසුස් ඔවුන්ට මෙසේ කීවේය. "අද රාත්‍රියේ මට සිදු වන දේ නිසා ඔබ සැමදෙනාම මාව අත්හැර යනවා. මන්ද 'මම එඬේරාට පහර දෙන්නෙමි. එවිට රැළේ බැටළුවෝ සීසීකඩ විසිරී යනු ඇත'[14] කියා ලියා තිබෙනවා. **32** නමුත් මාව මරණයෙන් නැඟිටුවනු ලැබූ පසු ඔබට කලින් මම ගලීලයට යනවා."[15] **33** නමුත් පේතෘස්, "අන් සියලුදෙනාම ඔබට සිදු වන දේ නිසා ඔබව අත්හැර ගියත් මම නම් කවදාවත් ඔබව අත්හරින්නේ නැහැ"[16] කියා ඔහුට කීවේය. **34** එවිට යේසුස්, "ඇත්තෙන්ම මා ඔබට කියන්නේ, කුකුළෙක් හඬලන්න කලින් මේ රාත්‍රියේම ඔබ මාව හඳුනන්නේ නැහැ කියා තුන් වතාවක් කියන බවයි"[17] කියා ඔහුට කීවේය. **35** එවිට පේතෘස්, "මට ඔබ සමඟ මැරෙන්න සිදු වුණත් ඔබව හඳුනන්නේ නැති බව නම් කොහොමටවත් කියන්නේ නැහැ" කියා ඔහුට කීවේය. අන් සියලු ගෝලයෝද ඒ දේම පැවසූහ.[1]

**36** එවිට යේසුස් ඔවුන් සමඟ ගෙත්සෙමනය ලෙස හැඳින්වූ ස්ථානයට[2] ඇවිත්, "මා අතනට ගොස් යාච්ඤා කරන තුරු මෙහි ඉඳගෙන සිටින්න"[3] කියා ගෝලයන්ට කීවේය. **37** ඔහු පේතෘස්වද සෙබදීගේ පුත්‍රයන් දෙදෙනාවද[4] කැඳවාගෙන යද්දී, ඔහු තුළ දැඩි ශෝකයක්ද මහත් කැලඹීමක්ද ඇති වෙන්න පටන්ගත්තේය.[5] **38** එවිට ඔහු, "මා තුළ ඇති වී තිබෙන ශෝකය කොතරම්ද කියනවා නම් මට දැනෙන්නේ මා මිය යනවා වගෙයි.[6] ඔබ මෙහි නැවතී මා සමඟ අවදියෙන් සිටින්න"[7] කියා ඔවුන්ට කීවේය. **39** ඔහු මදක් ඉදිරියට ගොස් දණින් වැටී යාච්ඤා කරමින්,[8] "මගේ පියාණෙනි, පුළුවන් නම් මේ කුසලානය*[9] මගෙන් ඉවත් කරන්න. නමුත් මගේ කැමැත්ත නොව[10] ඔබේ කැමැත්ත සිදු වේවා"[11] කියා කීවේය.

**40** ඉන්පසු ඔහු ගෝලයන් ළඟට ඇවිත් ඔවුන් නිදාගෙන සිටිනවා දැක පේතෘස්ට මෙසේ කීවේය. "එක පැයක්වත් මා සමඟ අවදියෙන් සිටින්න ඔබට බැරි වුණාද?[12] **41** යම් වරදක් කිරීමට පෙලඹීමක් ඇති නොවීම සඳහා[13] ඔබ අවදිව සිට[14] නොකඩවා යාච්ඤා කළ යුතුයි.[15] නමුත් ඒ දේ කරන්න සිත කොතරම් කැමති වුණත් මිනිසුන්ගේ දුර්වලකම එයට ඉඩ දෙන්නේ නැහැ."[16] **42** ඔහු නැවතත් එනම්, දෙවෙනි වතාවටත්[17] එතැනට ගොස් යාච්ඤා කරමින්, "මගේ පියාණෙනි, මෙම කුසලානයෙන් මට පානය කරන්නම අවශ්‍ය නම් ඔබගේ

**26 පරි.**

1 1කොරි 11:23
2 1කොරි 10:16; 1කොරි 11:24
3 මාක් 14:22; ලූක් 22:19
4 1කොරි 11:25
5 ලූක් 22:20
6 1කොරි 10:16
7 එෆි 1:7; හෙබ්‍රෙ 9:22
8 මතෙ 20:28; මාක් 14:24
9 නික් 24:8; සෙක 9:11
10 යෙරෙ 31:31; හෙබ්‍රෙ 7:22; හෙබ්‍රෙ 9:20
11 ලූක් 22:18
12 ගීතා 113–118
13 ලූක් 22:39; යොහ 18:1
14 සෙක 13:7; මාක් 14:27; යොහ 16:32
15 මතෙ 28:7; මතෙ 28:16
16 හිතෝ 11:2; මාක් 14:29
17 මාක් 14:30; ලූක් 22:34; යොහ 13:38

**2 තීරුව**

1 මාක් 14:31; ලූක් 22:33
2 ලූක් 22:39; යොහ 18:1
3 මාක් 14:32; ලූක් 22:40
4 මාක් 5:37
5 යෙසා 53:3; මාක් 14:33
6 ගීතා 42:11; ගීතා 43:5
7 මාක් 14:34
8 හෙබ්‍රෙ 5:7
9 මතෙ 20:22; යොහ 18:11
10 යොහ 5:30; යොහ 6:38
11 ගීතා 40:8; මාක් 14:36; ලූක් 22:42; හෙබ්‍රෙ 10:9
12 මාක් 14:37; ලූක් 22:45
13 මතෙ 6:13; ලූක් 22:46
14 මාක් 13:33; 1පේතෘ 5:8; එළි 16:15
15 ලූක් 18:1; රෝම 12:12; එෆී 6:18; 1පේතෘ 4:7
16 මාක් 14:38; රෝම 7:23; ගලා 5:17
17 මාක් 14:39

මතෙ **26:39*** කුසලානයෙන් අදහස් කරන්නේ දෙවිගේ කැමැත්තයි. එනම්, දෙවිට අපහාස කරන්නෙකු යන බොරු චෝදනාව මත යේසුස්ව මරණයට පත් කිරීමයි.

කැමැත්ත සිදු වේවා”[1] කියා කීවේය.
**43** ඔහු නැවත ඔවුන් ළඟට පැමිණි
විට ඔවුන් නිදාගෙන සිටිනවා දුටු-
වේය. මන්ද ඔවුහු නිදිබරව සිටි-
යෝය.[2] **44** එහෙයින් ඔහු ඔවුන්
වෙතින් ගොස් නැවතත් තුන්වෙනි
වතාවටත්[3] කලින් පැවසූ දේවල්ම
කියමින් යාච්ඤා කළේය. **45** ඉන්-
පසු ඔහු ගෝලයන් ළඟට ඇවිත්
ඔවුන්ට මෙසේ කීවේය. “මෙවැනි
වේලාවක ඔබ නිදාගෙන විවේක
ගන්නවාද? බලන්න! මනුෂ්‍ය පුත්‍රයා
පව්කාරයන්ගේ අතට පාවා දෙනු
ලබන පැය ළඟා වෙලා![4] **46** නැඟි-
ටින්න, අපි යමු. මෙන්න! මාව පාවා
දෙන තැනැත්තා ළඟටම ඇවිත්.”[5]
**47** ඔහු කතා කරමින් සිටියදීම, දො-
ළොස්දෙනාගෙන් එක් කෙනෙක් වූ
යූදස්[6] ආවේය. ඔහු සමඟ විශාල පිරි-
සක්ද කඩු[7] මුගුරු රැගෙන පැමිණි-
යෝය. ඔවුන්ව එවා තිබුණේ නායක
පූජකයන් හා ජනතාව අතර සිටි වැඩි-
මහල්ලන්ය.[8]
**48** යේසුස්ව පාවා දෙන තැනැත්තා
ඔහුව අල්ලාගැනීම සඳහා ඔවුන්ට
ලකුණක් දී තිබිණ. ඔහු ඔවුන්ට
කියා තිබුණේ, “ඔබට ඔහුව හඳුනාගැ-
නීම සඳහා මම ඔහුව සිඹගන්නවා.
ඉන්පසු ඔහුව අත්අඩංගුවට ගන්න”
කියායි.[9] **49** එහෙයින් ඔහු කෙළින්ම
යේසුස් වෙතට ගොස්, “ගුරුතුමනි,[10]
සුබ දවසක් වේවා” කියා පවසමින්
මහත් ආදරයක් මවාපාමින් ඔහුව
සිඹගත්තේය.[11] **50** නමුත් යේසුස්,[12]
“ඔබ පැමිණ සිටින්නේ කුමක් සඳ-
හාද” කියා ඔහුගෙන් ඇසුවේය. එවිට
ඔවුහු ඉදිරියට ඇවිත් යේසුස්ව අත්අ-
ඩංගුවට ගත්හ.[13] **51** යේසුස් සමඟ
සිටි අයගෙන් එක් කෙනෙක් තම
කඩුව ඉවතට ගෙන උත්තම පූජකයා-
ගේ දාසයාට පහර දුන්නේය. එයින්
ඒ දාසයාගේ කන කැපී ගියේය.[14]
**52** එවිට යේසුස් ඔහුට මෙසේ කීවේය.
“ඔබේ කඩුව තිබුණ තැනට ආපසු
දමාගන්න.[15] මන්ද කඩු ගන්න සැම
කෙනෙක්ම කඩුවෙන්ම නසිනවා.[1]
**53** මේ මොහොතේ වුණත් දේවදූත
සේනාංක දොළොසකටත් වඩා මගේ
උපකාරයට එවන්න[2] කියා මගේ පියා-
ණන්ගෙන් ඉල්ලන්න මට බැහැයි කියා
ඔබ සිතනවාද? **54** නමුත් මා එසේ
කළොත් සිදු විය යුතු දේවල් ගැන
ශුද්ධ ලියවිල්ලේ සඳහන් දේ ඉටු වන්-
නේ කොහොමද?” **55** ඒ පැයේදී යේ-
සුස් පැමිණ සිටි පිරිසට මෙසේ කීවේය.
“ඔබ කඩු මුගුරු රැගෙන මාව අත්අඩං-
ගුවට ගන්න ආවේ මා සොරෙක් කියා
හිතාගෙනද?[3] මම හැමදාම දේවමාලි-
ගාවේ[4] ඉඳගෙන උගන්වමින් සිටියා
නේද? නමුත් එහිදී ඔබ මාව අත්අ-
ඩංගුවට ගත්තේ නැහැ. **56** නමුත්
මේ සියල්ල මෙලෙස සිදු වී තිබෙන්-
නේ අනාගතවක්තෘවරුන් ලියා ඇති
දේවල් ඉටු වීම සඳහායි.”[5] එවිට ගෝ-
ලයෝ සියලුදෙනාම ඔහුව අත්හැර
පලා ගියෝය.[6]
**57** යේසුස්ව අත්අඩංගුවට ගත් අය
උත්තම පූජකයා වූ කායෆස්[7] වෙතට
ඔහුව ගෙන ගියහ. නීතිය පිටපත්
කරන්නෝද වැඩිමහල්ලෝද එහි රැස්
වී සිටියහ.[8] **58** පේතෘස් උත්තම
පූජකයාගේ නිවසෙහි ඇතුල් මළුව
දක්වා[9] යේසුස් පසුපස ඔහුට තර-
මක දුරකින් පැමිණියේය. ඔහු මළුවට
ඇතුල් වී සිදු වන්නේ කුමක්ද කියා
බැලීමට නිවසේ සේවකයන් සමඟ
ඉඳගෙන සිටියේය.[10]
**59** මේ අතරතුරේ යේසුස්ව මර-
ණයට පත් කිරීම සඳහා නායක පූජ-
කයෝද මුළු මන්ත්‍රණ සභාවද* ඔහුට
විරුද්ධව බොරු සාක්ෂි සෙවූහ.[11]
**60** බොරු සාක්ෂිකරුවන් බොහෝ-
දෙනෙකු ඉදිරිපත් වුවත් ඔප්පු කළ
හැකි කිසි සාක්ෂියක් සොයාගත
නොහැකි විය.[12] පසුව දෙදෙනෙක්
ඉදිරිපත් වී, **61** මෙසේ කීවෝය.
“ ‘දෙවිගේ මාලිගාව කඩා දමා එය
දවස් තුනකින් ගොඩනඟන්න මට
පුළුවන්’[13] කියා මේ මිනිසා පැවසුවා

**26 පරි.**
1 මතෙ 6:10 යොහ 12:27 ක්‍රියා 21:14
2 මාක් 14:40
3 2කොරි 12:8
4 මාක් 14:41
5 මාක් 14:42
6 ලූක් 22:47 යොහ 18:3
7 ලූක් 22:52 ක්‍රියා 1:16
8 මාක් 14:43
9 මාක් 14:44
10 මාක් 14:45
11 2සාමු 20:9 හිතෝ 27:6
12 ලූක් 22:48
13 ගීතා 41:9 මාක් 14:46
14 මාක් 14:47 ලූක් 22:50 යොහ 18:10
15 යොහ 18:11

**2 තීරුව**
1 උත් 9:6 එළි 13:10
2 2රාජා 6:17 දානි 7:10 මතෙ 4:11
3 මාක් 14:48 ලූක් 22:52
4 ලූක් 19:47 යොහ 18:20
5 ගීතා 22 යෙසා 53 විලා 4:20 දානි 9:26
6 සෙක 13:7 මාක් 14:50 යොහ 16:32
7 මාක් 14:53 යොහ 18:13
8 ලූක් 22:54
9 ලූක් 22:55
10 යොහ 18:16
11 නික් 20:16 මාක් 14:55
12 ද්වි 19:15 ගීතා 27:12 ගීතා 35:11 මාක් 14:57
13 මතෙ 27:40 යොහ 2:19 ක්‍රියා 6:14

මතෙ **26:59*** එනම්, යුදෙව් සැන්හෙඩ්‍රින සභාව.

අපිට මතකයි.” **62** එවිට උත්තම
පූජකයා නැඟිට, “ඔබට දෙන්න කිසි
පිළිතුරක් නැද්ද? මොවුන් ඔබට
විරුද්ධව දෙන මේ සාක්ෂි ඔබට
ඇහෙනවාද”[1] කියා ඔහුගෙන් ඇසු-
වේය. **63** නමුත් යේසුස් නිහඬව
සිටියේය.[2] එහෙයින් උත්තම පූජ-
කයා ඔහුට මෙසේ කීවේය. “මා
ජීවමාන දෙවිගේ නාමයෙන් දිවුරා
ඔබ ඉදිරියේ ප්‍රශ්නයක් අසන්න කැම-
තියි.[3] ඔබ දෙවිගේ පුත්‍රයා වන
ක්‍රිස්තුස්ද[4] කියා අපට කියන්න.”
**64** යේසුස් ඔහු අමතා,[5] “ඒ ප්‍රශ්න-
යට පිළිතුර ඔබෙන් දැන් ලැබුණා.[6]
නමුත් මා ඔබ සැමට කියන්නේ මෙ-
යයි. එනම් මෙතැන් පටන්[7] මනුෂ්‍ය
පුත්‍රයා[8] බලවත් තැනැත්තාණන්-
ගේ දකුණු පැත්තේ ඉඳගෙන[9] සිටින
ආකාරයත් ආකාශයේ වලාකුළු මත
පැමිණෙන ආකාරයත්[10] ඔබ දකින
බවයි” කියා කීවේය. **65** එවිට උත්-
තම පූජකයා තම පිට වස්ත්‍ර ඉරාගනි-
මින් මෙසේ කීවේය. “ඔහු දැන් කළේ
දේවඅපහාසයක්![11] අපට තව සාක්ෂි-
කරුවන් අවශ්‍ය නැහැ.[12] දැන් ඔහුගේ
දේවඅපහාසය ඔබට ඇහුණා නේද?[13]
**66** ඔබ සිතන්නේ කුමක්ද?” ඔවුහුද,
“ඔහුට මරණ දණ්ඩනය නියම කළ
යුතුයි”[14] කියා පිළිතුරු දුන්නෝය.
**67** එවිට ඔවුහු ඔහුගේ මුහුණට කෙළ
ගසා,[15] තම අත් මිටමොළවමින්
ඔහුට පහර දුන්හ.[16] අන් අය ඔහුගේ
කම්මුලට පහර දෙමින්,[17] **68** “ඔබ
ක්‍රිස්තුස් නේද?[18] ඔබ අනාගතවක්-
තෘවරයෙක් නම් ඔබට පහර දුන්නේ
කවුද කියා අපට කියන්න”[19] කියා
කීවෝය.

**69** ඒ අවස්ථාවේ පේතෘස්, පිටත
මළුවෙහි ඉඳගෙන සිටියේය. එවිට
සේවිකාවක් ඔහු වෙතට ඇවිත්,
“ඔබත් ගලීලයේ යේසුස් සමඟ සිටියා
නේද”[20] කියා ඇසුවාය. **70** නමුත්
ඔහු ඒ සියල්ලන් ඉදිරියෙහි එය
ප්‍රතික්ෂේප කරමින්, “ඔබ මොනව
කියනවාද කියා මම නම් දන්-
නේ නැහැ” කියා කීවේය. **71** ඔහු
එතැනින් පිටත් වී දොරටුව අසලට
ගිය පසු වෙනත් තරුණියක් ඔහුව
දැක, “මේ මිනිසා නාසරෙත් නුවරින්
පැමිණි යේසුස් සමඟ සිටියා”[1] කියා
එහි සිටි අයට කීවාය. **72** එවිට ඔහු
එය නැවතත් ප්‍රතික්ෂේප කරමින්,
“මම ඒ මිනිසාව හඳුනන්නේ නැහැ”
කියා දිවුරමින් කීවේය.[2] **73** මද
වේලාවකට පසු එතැන සිටගෙන සිටි
අය ඇවිත්, “අනිවාර්යයෙන්ම ඔබත්
ඔවුන්ගෙන් එක් කෙනෙක්. ඒ බව ඔබ
කතා කරන විදිහෙන්ම තේරෙනවා”[3]
කියා පේතෘස්ට කීවෝය. **74** එවිට
ඔහු තමාටම ශාප කරමින්, “මම
ඒ මිනිසාව හඳුනන්නේ නැහැ” කියා
දිවුරන්න පටන්ගත්තේය. ඒ මො-
හොතේදීම කුකුළෙක් හැඬලුවේය.[4]
**75** “කුකුළෙකු හඬලන්න කලින් ඔබ
මාව හඳුනන්නේ නැති බව තුන්
වතාවක් කියනවා”[5] කියා යේසුස්
පැවසූ දේ එවිට පේතෘස්ට මතක් විය.
ඔහු පිටතට ගොස් මහත් ශෝකයෙන්
හැඬුවේය.[6]

**27** ඊළඟ උදෑසන සියලු නායක
පූජකයෝද ජනතාව අතර
සිටි වැඩිමහල්ලෝද යේසුස්ව මර-
ණයට පත් කරන ආකාරය
ගැන සාකච්ඡා පැවැත්වූහ.[7] **2** ඔවුහු
ඔහුව බැඳ ආණ්ඩුකාරයා වූ පිලාත්
වෙතට ගෙන ගොස් භාර දුන්හ.[8]

**3** එවිට ඔහුව පාවා දුන් යූදස් යේ-
සුස්ව මරණයට නියම කර ඇති බව
දැක බලවත් සේ තැවී, තමා ලබාගත්
රිදී කාසි තිහ[9] නායක පූජකයන්-
ටද වැඩිමහල්ලන්ටද නැවත දීමට
ගෙනැවිත්, **4** “මා කර තිබෙන්නේ
පාපයක්! මා පාවා දුන්නේ ධර්-
මිෂ්ඨ කෙනෙක්ව”*[10] කියා කීවේය.
ඔවුහු, “ඉතින් එයින් අපට ඇති
පලේ මොකක්ද? ඒක ඔබේ ප්‍රශ්න-
යක්”[11] කියා කීවෝය. **5** එහෙයින්
ඔහු රිදී කාසි ටික දේවමාලිගාව ඇතු-
ළට විසි කර එතැනින් අහක්ව ගොස්

**26 පරි.**
**1** මාක් 14:60
**2** හිතෝ 11:12
යෙසා 53:7
ක්‍රියා 8:32
**3** 1රාජා 22:16
**4** මතෙ 16:16
ලූක් 22:67
යොහ 10:24
**5** මාක් 14:62
**6** ලූක් 22:70
**7** ලූක් 22:69
**8** යොහ 1:51
**9** ගීතා 110:1
දානි 7:14
ලූක් 22:69
**10** දානි 7:13
මාක් 14:62
එළි 1:7
**11** මාක් 14:63
**12** ලූක් 22:71
**13** මාක් 14:64
**14** ලෙවී 24:16
යොහ 19:7
**15** යෙසා 50:6
මතෙ 27:30
මාක් 14:65
**16** ලූක් 22:63
**17** යෙසා 53:3
යොහ 19:3
**18** ලූක් 23:39
**19** මාක් 14:65
ලූක් 22:64
**20** ලූක් 22:57
යොහ 18:17

**2 තීරුව**
**1** මාක් 14:67
යොහ 18:25
**2** ලූක් 22:58
**3** විනි 12:6
ලූක් 22:59
යොහ 18:26
**4** ලූක් 22:60
යොහ 18:27
**5** මතෙ 26:34
මාක් 14:30
යොහ 13:38
**6** මාක් 14:72
ලූක් 22:62

**27 පරි.**
**7** ගීතා 2:2
මාක් 15:1
ලූක් 22:66
යොහ 18:28
**8** මතෙ 20:19
ලූක් 23:1
යොහ 18:28
ක්‍රියා 3:13
**9** මතෙ 26:15
මාක් 14:11
**10** ද්වි 19:10
2රාජා 24:4
**11** මතෙ 27:24
හෙබ්‍රෙ 10:26

---

මතෙ **27:4*** මූ.අ., “ධර්මිෂ්ඨ ලේ.”

එල්ලී මැරුණේය.[1] **6** නායක පූජ-
කයෝ රිදී කාසි ටික ගෙන, “මේ
මුදල් මිනී මැරුමකට ගෙවූ කුලි-
යක්* වන නිසා ඒවා පරිශුද්ධ භාණ්-
ඩාගාරයට දැමීම සුදුසු නැහැ” කියා
කීවෝය. **7** පසුව ඔවුහු ඒ ගැන
සාකච්ඡා කර විදේශිකයන්ව භූමදාන
කිරීම සඳහා කුඹල්කරුගේ පිට්ටනිය
එයින් මිල දී ගත්හ. **8** එහෙයින් අද
දක්වා ඒ පිට්ටනියට “ලේ පිට්ටනිය”[2]
යයි කියනු ලැබේ. **9** එවිට අනා-
ගතවක්තෘ යෙරෙමියා* මාර්ගයෙන්
කියන ලද මේ දේ ඉටු විය. එනම්,
“ඊශ්‍රායෙල්වරුන් අතරෙන් සමහරෙක්
ඔහු වෙනුවෙන් නියම කළ මුදල වූ රිදී
කාසි තිහ ගෙන,[3] **10** කුඹල්කරු-
ගේ[4] පිට්ටනිය සඳහා දුන්නෝය. එය
සිදු වූයේ යෙහෝවා දෙවි මට නියම
කළ පරිදිය.”

**11** යේසුස්, ආණ්ඩුකාරයා ඉදිරි-
යෙහි පෙනී සිටියේය. ආණ්ඩුකා-
රයාද, “ඔබ යුදෙව්වරුන්ගේ රජද”[5]
කියා ඔහුගෙන් ඇසුවේය. “එයට පිළි-
තුර ඔබේ ප්‍රශ්නයෙන්ම පැහැදිලියි”[6]
කියා යේසුස් පිළිතුරු දුන්නේය.
**12** නමුත් නායක පූජකයන්ද වැඩිම-
හල්ලන්ද ඔහුට විරුද්ධව චෝදනා
නඟමින් සිටියදී[7] ඔහු කිසි පිළිතු-
රක් දුන්නේ නැත.[8] **13** එවිට
පිලාත්, “ඔබට විරුද්ධව ඔවුන් කො-
පමණ චෝදනා නඟනවාද කියා
ඔබට ඇසෙනවාද”[9] යයි ඇසුවේය.
**14** නමුත් ඔහු එක වචනයකින්-
වත් පිළිතුරු දුන්නේ නැත. එහෙ-
යින් ආණ්ඩුකාරයා බොහෝ සෙයින්
පුදුම විය.[10]

**15** සාමාන්‍යයෙන් සෑම උත්සවය-
කදීම සෙනඟට කැමති සිරකරුවෙ-
කුව ආණ්ඩුකාරයා විසින් නිදහස් කර
දීමේ සිරිතක් තිබිණ.[1] **16** මෙම
කාලයේදීම අපරාධකරුවෙකු ලෙස
ප්‍රසිද්ධ වූ බරබ්බස් නමැති කෙනෙක්
සිරභාරයේ සිටියේය.[2] **17** එහෙයින්
සෙනඟ රැස්ව සිටියදී පිලාත් ඔවුන්-
ගෙන් මෙසේ ඇසුවේය. “ඔබ කැමති
මා කවුරු නිදහස් කර දෙනවා-
ටද? බරබ්බස්වද නැත්නම් ක්‍රිස්-
තුස් ලෙස හඳුන්වන යේසුස්වද?”[3]
**18** ඔහු එවැනි දෙයක් ඇසුවේ යේ-
සුස්ව ඔවුන් පාවා දුන්නේ ඔහු ගැන
ඔවුන්ට තිබූ ඊර්ෂ්‍යාව නිසා[4] බව ඔහු
තේරුම්ගෙන සිටි නිසාය.[5] **19** මීට
අමතරව ඔහු විනිශ්චයාසනයෙහි ඉඳ-
ගෙන සිටියදී ඔහුගේ බිරිඳ ඔහුට
පණිවිඩයක් එවමින් මේ දේ පැව-
සුවාය. “ඒ ධර්මිෂ්ඨ[6] මිනිසා සම්-
බන්ධ කාරණයට කොහොමටවත්
හවුල් වෙන්න එපා. මම මේ දේ
කියන්නේ මා සිහිනයක්[7] දුටු නිසයි.
එය මගේ හිතට හුඟක් වධ දෙ-
නවා.” **20** නමුත් නායක පූජක-
යෝද වැඩිමහල්ලෝද බරබ්බස්ව[8]
නිදහස් කරන ලෙස ඉල්ලන්නත් යේ-
සුස්ව මරන්නත් සෙනඟව කැමති
කරවාගත්හ. **21** ඉන්පසු ආණ්ඩු-
කාරයා, “ඔබ කැමති වන්නේ මේ
දෙදෙනාගෙන් මා කවුරු නිදහස් කර-
නවාටද” කියා ඔවුන්ගෙන් ඇසුවේය.
“බරබ්බස්ව නිදහස් කරන්න”[9] කියා
ඔවුහු කීවෝය. **22** එවිට පිලාත්,
“එසේනම් ක්‍රිස්තුස් ලෙස හඳුන්-
වන යේසුස්ට මම මොනවාද කරන්-
නේ” කියා ඔවුන්ගෙන් ඇසුවේය.
“ඔහුව කණුවක ඇණ ගසා මරන්න”[10]
කියා ඔවුහු එක හඬින් කීවෝය.
**23** එවිට ඔහු, “ඒ ඇයි? ඔහු කළ වරද
මොකක්ද” කියා ඇසුවේය. එසේ-
වුවත්, “ඔහුව කණුවක ඇණ ගසා
මරන්න” කියා කියමින් ඔවුහු තව
තවත් කෑගැසූහ.[11]

**24** තමාගේ උත්සාහයෙන් කිසි
පලක් නැති බවත් කෝලාහලයක්
ඇති වන බවත් දුටු පිලාත්, වතුර
ගෙන[12] සෙනඟ ඉදිරියෙහි තම දෑත්

---

මතෙ **27:6*** මූ.අ., “ලේ වැගිරවීමට ගෙවූ මුද-
ලක්.” **9*** මෙම වචන සෙක 11:12, 13න් රැගෙන
තිබේ. මතෙව්ගේ කාලයේදී අනාවැකි පොත් සමූ-
හයේ මුලින්ම තැබුවේ යෙරෙමියා පොතයි. එම-
නිසා “යෙරෙමියා” යන නම සෙකරියා ඇතුළුව
සියලුම අනාවැකි පොත් සඳහා භාවිත කළ පොදු
නමක් විය හැකියි. ලූක් 24:44 බලන්න.

---

**27 පරි.**
**1** 2සාමු 17:23 ගීතා 55:23 ක්‍රියා 1:18
**2** ක්‍රියා 1:19
**3** සෙක 11:12
**4** සෙක 11:13
**5** මාක් 15:2 ලූක් 23:3 යොහ 18:33
**6** මතෙ 26:64 1තිමෝ 6:13
**7** මාක් 15:3
**8** හිතෝ 11:12 යෙසා 53:7 මතෙ 26:63 යොහ 19:9
**9** මාක් 15:4
**10** මාක් 15:5

**2 තීරුව**
**1** ලූක් 23:17 යොහ 18:39
**2** ලූක් 23:19 යොහ 18:40
**3** මාක් 15:9
**4** හිතෝ 27:4 යොහ 12:19 රෝම 1:29
**5** මාක් 15:10
**6** යෙසා 53:11 සෙක 9:9 1යොහ 2:1
**7** මතෙ 2:12
**8** ලූක් 23:18 යොහ 18:40 ක්‍රියා 3:14
**9** මාක් 15:11
**10** මාක් 15:13 ලූක් 23:21
**11** මාක් 15:14 ලූක් 23:23 ක්‍රියා 3:13
**12** ද්වි 21:6

සෝදමින්, “මේ මිනිසාගේ මරණ-
යට* මම නම් වග කියන්නේ නැහැ.
එයට වග කිව යුත්තේ ඔබයි” කියා
කීවේය. **25** එවිට ඒ සියලුදෙනාම,
“ඔහුගේ මරණයේ වගකීම අපිත් අපේ
දරුවනුත් භාරගන්න සූදානම්”[1] කියා
පිළිතුරු දුන්නෝය. **26** එවිට ඔහු
බරබ්බස්ව ඔවුන්ට නිදහස් කර දුන්-
නේය. නමුත් ඔහු යේසුස්ට කසයෙන්
තළන්න[2] කියා අණ කර ඔහුව කණු-
වක ඇණ ගසා මරණයට පත් කිරීම
සඳහා භාර දුන්නේය.[3]
**27** එවිට ආණ්ඩුකාරයාගේ හේවා-
යෝ යේසුස්ව ආණ්ඩුකාරයාගේ මාලි-
ගාවට ගෙන ගියෝය. එහිදී සියලුම
හේවායෝ ඔහු වටා එක් රොක් වූහ.[4]
**28** ඔවුහු යේසුස්ගේ පිට වස්ත්‍ර ගලවා
දමා තද රතු පාට සළුවක්[5] ඔහුට
පැළඳෙව්වෝය. **29** කටු අතුවලින්
ඔටුන්නක් සාදා ඔහුගේ හිස මත
ඇමූ ඔවුහු, ඔහුගේ දකුණු අතට බට
දණ්ඩක්ද දුන්හ. ඔවුහු යේසුස් ඉදිරි-
යෙහි දණ ගසා කවටකම් කරමින්,[6]
“යුදෙව්වරුන්ගේ රජ්ජුරුවෙනි, ඔබට
සුබ දවසක් වේවා” කියා කීවෝය.[7]
**30** ඔවුහු ඔහුට කෙළ ගසා[8] ඔහුගේ
අතේ තිබූ බට දණ්ඩ ගෙන ඔහු-
ගේ හිසට පහර දෙන්න පටන්ගත්හ.
**31** එසේ කවටකම් කළ පසු[9] ඔවුහු
ඔහුගේ සළුව ගලවා ඔහුගේම පිට
වස්ත්‍ර ඔහුට අන්දවා ඔහුව කණුවක
ඇණ ගැසීම සඳහා ගෙන ගියහ.[10]
**32** ඔවුන් පිටත්ව යද්දී සිරේනිය
නම් නුවරේ උපන් සීමොන් නමැති
තැනැත්තෙකු[11] ඔවුන්ට හමු විය. යේ-
සුස්ගේ වධකණුව උසුලාගෙන යැමට
ඔවුහු ඔහුට බල කළෝය. **33** ඔවුහු
හිස්කබල නම් අර්ථය ඇති ගොල්-
ගොතා[12] නම් ස්ථානයට පැමිණි විට,
**34** තිත්ත යමක්*[13] මිශ්‍ර කළ වයින්
ඔහුට බොන්න දුන්හ. නමුත් ඔහුට
එහි රස දැනුණු විට ඔහු එය ප්‍රතික්-
ෂේප කළේය.[14] **35** ඔහුව කණුවේ
ඇණ ගැසීමෙන් පසු[1] ඔවුහු ආදු දමා[2]
ඔහුගේ පිට වස්ත්‍ර තමන් අතරේ බෙ-
දාගත්හ.[3] **36** ඔවුහු එහි ඉඳගෙන
ඔහුව මුර කළහ. **37** එමෙන්ම, “මේ
යුදෙව්වරුන්ගේ රජ වන යේසුස්ය”[4]
කියා ඔහුට විරුද්ධව කළ චෝදනාව
ලියා ඔහුගේ හිසට ඉහළින් තැබූහ.
**38** මේ අතර කොල්ලකරුවන් දෙ-
දෙනෙකුව ඔහුගේ දෙපැත්තේ කණු-
වල එල්ලන ලදි. එක් කෙනෙකු
සිටියේ ඔහුගේ දකුණු පැත්තෙහිය.
අනික් තැනැත්තා සිටියේ ඔහුගේ වම්
පැත්තෙහිය.[5] **39** මඟ යන එන අය
නම හිස් වනවනා[6] ඔහුට නින්දා
කරමින්,[7] **40** “දේවමාලිගාව කඩා
දමා දවස් තුනකින් ගොඩනඟන
බව ඔබ පැවසුවා නේද?[8] ඉතින්,
ඇයි බැරි ඔතනින් ගැලවෙන්න. ඔබ
දෙවිගේ පුත්‍රයෙක් නම් වධකණුවෙන්
බහින්න”[9] කියා කීවෝය. **41** එලෙ-
සම නායක පූජකයෝ, නීතිය පිටපත්
කරන්නන් හා වැඩිමහල්ලන් සමඟ
එකතු වී ඔහුට කවටකම් කරමින්
මෙසේ කීවෝය.[10] **42** “ඔහු අනුන්ව
ගලවාගත්තා. නමුත් තමන්ව ගලවා-
ගන්න ඔහුට බැහැ. ඔහු ඊශ්‍රායෙලයෙහි
රජු නේද?[11] ඉතින් ඔහු දැන් වධකණු-
වෙන් බැස ආවොත් නම් අපි අනිවාර්-
යයෙන්ම ඔහුව විශ්වාස කරනවා.[12]
**43** ‘මම දෙවිගේ පුත්‍රයා’[13] කියා ඔහු
කිව්වා නේද? ඔහුට දෙවි ගැන මහත්
විශ්වාසයක් තිබෙනවා. ඉතින් දෙවි
කැමති නම් දෙවිට පුළුවන්නේ ඔහුව
බේරාගන්න.”[14] **44** ඔහු සමඟ කණු-
වල එල්ලන ලද කොල්ලකරුවෝ
පවා ඒ ආකාරයෙන්ම ඔහුට නිග්‍රහ
කරන්න පටන්ගත්හ.[15]
**45** මේ අතර හයවෙනි පැයේ පටන්
නවවෙනි පැය* දක්වා[16] මුළු පොළො-
වම අන්ධකාරයෙන් වැසී ගියේය.[17]
**46** නවවෙනි පැයේදී පමණ යේ-
සුස්, “ඒලී, ඒලී, ලාමා සබක්තානි”
කියා මහත් හඬකින් පැවසුවේය.

මතෙ **27:24*** මූ.අ., “ලේවලට.” **34*** ශාකයකින් ලබාගත් තිත්ත, මත් කරවනසුලු ද්‍රව්‍යයක් විය හැකියි.

මතෙ **27:45*** එනම්, දහවල් 12 සිට ප.ව. 3 දක්වා.

**27 පරි.**
**1** ද්වි 19:10
යොෂු 2:19
ක්‍රියා 5:28
1තෙස 2:15
**2** ලූක් 18:33
යොහ 19:1
**3** මාක් 15:15
ලූක් 23:25
**4** මාක් 15:16
**5** යොහ 19:2
**6** විනි 16:25
**7** මාක් 15:19
යොහ 19:3
**8** යෙසා 49:7
යෙසා 50:6
මතෙ 26:67
**9** යෙසා 53:7
මතෙ 20:19
**10** මාක් 15:20
**11** මාක් 15:21
ලූක් 23:26
යොහ 19:17
**12** ලූක් 23:33
යොහ 19:17
**13** ගීතා 69:21
**14** මාක් 15:23

**2 තීරුව**
**1** ගීතා 22:16
යොහ 19:18
**2** මාක් 15:24
**3** ගීතා 22:18
ලූක් 23:34
යොහ 19:23
**4** මාක් 15:26
ලූක් 23:38
යොහ 19:19
**5** යෙසා 53:12
මාක් 15:27
ලූක් 23:33
යොහ 19:18
**6** ගීතා 22:7
ගීතා 109:25
ලූක් 23:35
**7** ලූක් 18:32
හෙබ්‍රෙ 12:3
**8** මතෙ 26:61
යොහ 2:19
**9** මාක් 15:30
ලූක් 4:3
**10** මාක් 15:31
ලූක් 23:35
**11** යොහ 1:49
යොහ 12:13
**12** මාක් 15:32
**13** මාක් 14:62
යොහ 5:18
යොහ 10:36
**14** ගීතා 3:2
ගීතා 22:8
ගීතා 42:10
**15** මාක් 15:32
ලූක් 23:39
**16** මාක් 15:33
ලූක් 23:44
**17** ආමො 8:9

එනම්, “මගේ දෙවියනි, මගේ දෙ-
වියනි, ඔබ මාව අත්හැරියේ ඇයි”[1]
කියා ඔහු මහත් හඬකින් පැවසු-
වේය. **47** එහි සිටගෙන සිටි අය-
ගෙන් සමහරෙක් ඒ වචන අසා, “ඔහු
එලියාට අඬගසනවා”[2] කියා පැවසූහ.
**48** එවිට ඔවුන්ගෙන් එක් කෙනෙක්
ඉක්මනින් දුව ගොස් ස්පොන්ජියක්
හා සමාන දෙයක් ගෙන එය
ඇඹුල්[3] වයින්වල පොඟවා බට දණ්-
ඩක ගසා ඔහුට බොන්න දුන්නේය.[4]
**49** නමුත් සෙසු අය, “ඔහුට ඉන්න
හරින්න! ඔහුව ගලවාගන්න එලියා
එයිද කියා බලමු” කියා කීවෝය.[5]
[[තවත් මිනිසෙක් හෙල්ලයක් ගෙන
ඔහුගේ ළයට පහළින් පිහිටි පෙදෙසට
ඇන්නේය. එවිට ලේත් වතුරත් පිට-
තට ගලා ආවේය.]][6] **50** නැවතත්
යේසුස් මහත් හඬකින් කෑගසා අවසන්
හුස්ම හෙළුවේය.[7]

**51** එවිට ශුද්ධස්ථානයේ තිරය[8]
ඉහළ පටන් පහළ දක්වා දෙ-
පළු වී ගියේය.[9] පොළොව දෙද-
රුම් කෑවේය. පර්වතද පැළී ගියේය.[10]
**52** ඒ සමගම සොහොන් ගෙවල් විවර
වී, සැතපී සිටි ශුද්ධ තැනැත්තන්-
ගේ දේහයන් බොහොමයක් පිටතට
විසි විය. **53** එය බොහෝදෙනෙකුට
දැකගත හැකි විය. (ඔහුව මරණයෙන්
නැඟිටුවනු ලැබූ පසු සොහොන් ගෙ-
වල් අතරට ගිය අය ශුද්ධ නුවරට[11]
ඇතුල් වූහ.*) **54** හමුදා නිලධාරියා
සහ ඔහු සමඟ යේසුස්ව මුර කරමින්
සිටි අය භූමිකම්පාවද සිදු වූ දේවල්ද
දැක මහත් බියකින්, “ඇත්තෙන්ම මේ
දෙවිගේ පුත්‍රයා” කියා කීවෝය.[12]

**55** යේසුස්ට උපකාර කිරීම සඳහා
ගලීලයේ සිට ඔහු සමඟ පැමිණි බො-
හෝ ස්ත්‍රීහු[13] දුරින් ඉඳ සියල්ල බලා
සිටියහ.[14] **56** ඔවුන් අතරෙහි මරියා
මග්දලේනාද යාකොබ් සහ යෝසෙස්-
ගේ මව වූ මරියාද සෙබදීගේ පුත්‍රයන්-
ගේ මවද සිටියෝය.[15]

මතෙ **27:53*** පෙනෙන විදිහට ඔවුන් එසේ ඇතුල් වූයේ තමන් දුටු දේ දැන්වීමටය.

**27 පරි.**
1 ගීතා 22:1 යෙසා 53:10 මාක් 15:34
2 මාක් 15:35
3 ගීතා 69:21
4 ලූක් 23:36 යොහ 19:29
5 මාක් 15:36
6 යොහ 19:34
7 මාක් 15:37 ලූක් 23:46 යොහ 19:30
8 නික් 26:31 හෙබ්‍රෙ 9:3 හෙබ්‍රෙ 10:20
9 මාක් 15:38 ලූක් 23:45
10 1සාමු 14:15
11 මතෙ 4:5
12 මාක් 15:39 ලූක් 23:47
13 මාක් 15:41 ලූක් 8:3
14 ලූක් 23:49
15 මතෙ 20:20 මාක් 15:40 යොහ 19:25

**2 තීරුව**
1 මාක් 15:43
2 ද්වි 21:23 මාක් 15:43 ලූක් 23:52
3 මාක් 15:45 යොහ 19:38
4 මාක් 15:46 ලූක් 23:53 යොහ 19:40
5 යෙසා 53:9 ක්‍රියා 13:29
6 මාක් 15:46 ලූක් 23:53 යොහ 19:41
7 මාක් 15:47 ලූක් 23:55
8 මාක් 15:42 ලූක් 23:54 යොහ 19:14
9 මතෙ 12:40 යොහ 2:19
10 මතෙ 28:13
11 මතෙ 28:11
12 දානි 6:17

**57** සවස් වූ විට අරිමාතිය නම්
නුවරේ විසූ ධනවතෙකු වූ යෝසෙප්
නම් මිනිසෙක් ආවේය. ඔහුද යේසුස්-
ගේ ගෝලයෙකි.[1] **58** ඔහු පිලාත්
ළඟට ගොස් යේසුස්ගේ දේහය භාර-
ගැනීමට අවසර ඉල්ලුවේය.[2] එවිට
පිලාත් එය ඔහුට භාර දෙන්න අණ
කළේය.[3] **59** දේහය ගෙන පිරිසිදු
අනර්ඝ ලිනන් රෙදිවලින් එතූ[4] යෝ-
සෙප්, **60** පර්වතයක කපා තිබුණු
ඔහුටම අයත් අලුත් සොහොන් ගෙ-
යක එය තැන්පත් කළේය.[5] ඉන්-
පසු ඔහු එහි දොරකඩ වැසෙන සේ
විශාල ගලක් පෙරළා තබා ගියේය.[6]
**61** නමුත් මරියා මග්දලේනා සහ
මරියා යන නමින් හැඳින්වූ අනික්
ස්ත්‍රියද සොහොන් ගෙය ඉදිරිපිට දිග-
ටම ඉඳගෙන සිටියහ.[7]

**62** සූදානම් වීමේ දවසට*[8] පසු
දින නායක පූජකයෝද පරිසිවරුද
පිලාත් ඉදිරියෙහි රැස් වී, **63** මෙසේ
කීවෝය. “උතුමාණෙනි, ඒ ප්‍රෝඩා-
කාරයා ජීවත්ව සිටියදී, ‘දවස්
තුනකට පසු[9] මාව මරණයෙන් නැඟි-
ටුවනු ලබනවා’ කියා පැවසූ බව අපට
මතක් වුණා. **64** එමනිසා තුන්-
වෙනි දවස දක්වා සොහොන් ගෙය
ආරක්ෂා කරන ලෙස අණ කරන්න.
නැතහොත් සමහරවිට ඔහුගේ ගෝ-
ලයන් ඇවිත් ඔහුගේ දේහය සො-
රාගෙන ගොස්,[10] ‘ඔහුව මරණයෙන්
නැඟිටුවනු ලැබුවා’ කියා ජනයාට
කියන්න පුළුවන්. එවිට මේ අව-
සන් වංචාව මුලින් සිදු වූ වංචාවටත්
වඩා දරුණු වෙයි.” **65** පිලාත්ද,
“ඔබට මුරකරුවන් සිටිනවා නේද?[11]
ඉතින්, ගොස් ඔබට පුළුවන් විදිහට
සොහොන ආරක්ෂා කරගන්න” කියා
කීවේය. **66** එහෙයින් ඔවුහු ගොස්
ගල මුද්‍රා කර,[12] මුරකරුවන් ලවා
සොහොන් ගෙය මුර කිරීමට පියවර
ගත්තෝය.

මතෙ **27:62*** සතිපතා පවත්වන සබත් දිනයට කලින් දිනය. යුදෙව්වන් සබත් දිනට සූදානම් වූයේ එම දිනයේදීය.

**28** සබත් දවසට පසු සතියේ
පළමුවෙනි දින පහන් වූ විට
මරියා මග්දලේනාද මරියා නමින්
හැඳින්වූ අනික් ස්ත්‍රියද සොහොන්
ගෙය බලන්න ගියෝය.[1]
**2** ඔවුන් එහි ගිය විට මහත් භූමි-
කම්පාවක් සිදු වී තිබුණු ආකාරය
ඔවුන්ට දැකගත හැකි විය. මන්ද යෙ-
හෝවා දෙවිගේ දූතයා ස්වර්ගයෙන්
බැස ගල අහකට පෙරළා ඒ මත ඉඳ-
ගෙන සිටියේය.[2] **3** විදුලි කෙටීම-
කින් නික්මෙන ආලෝකය හා සමාන
ආලෝකයක්[3] ඔහු අවට දැකගත
හැකි විය. ඔහුගේ ඇඳුම්ද හිම මෙන්
සුදුව තිබිණ.[4] **4** ඔහු දැක බියෙන්
වෙවුලන්න පටන්ගත් මුරකරුවෝ
මිය ගිය අය මෙන් බිම ඇද වැටු-
ණෝය.
**5** එවිට ඒ දේවදූතයා[5] ස්ත්‍රීන්ට
මෙසේ කීවේය. “බිය නොවන්න. ඔබ
සොයන්නේ කණුවක ඇණ ගසා මරා
දැමූ යේසුස්ව[6] බව මම දන්නවා.
**6** ඔහු මෙහි නැහැ. ඔහු කී ලෙසම
ඔහුව මරණයෙන් නැඟිටුවා තිබෙ-
නවා.[7] ඇවිත් ඔහුව තැන්පත් කළ
ස්ථානය බලන්න. **7** දැන් ඉක්මෙ-
නින් ගොස් ඔහුව මරණයෙන් නැඟිටු-
වනු ලැබූ බව ඔහුගේ ගෝලයන්ට
කියන්න.[8] ඔහු ඔවුන්ට කලින් ගලීල-
යට[9] යනවා කියාත් කියන්න. එහිදී
ඔහුව දකින්න ඔබටත් පුළුවන් වෙයි.
ඉතින් මා කියූ මේ දේවල් හොඳින්
මතක තබාගන්න.”[10]
**8** ඔවුන් තුළ යම් බියක් ඇති
වුවත් ඔවුහු මහත් ප්‍රීතියකින් එතැ-
නින් ඉක්මනින්ම පිටත්ව ගොස්
ඔහුගේ ගෝලයන්ට ඒ බව දැන්-
වීම සඳහා දිව ගියෝය.[11] **9** එවිට
ඔවුන්ට යේසුස්ව හමු විය. ඔහුද,
“සුබ දවසක් වේවා” කියා ඔවුන්ට
පැවසුවේය. ඔවුහු ඔහු ළඟට ඇවිත්
ඔහුගේ පාද අල්ලාගෙන ඔහු ඉදි-
රියේ දණින් වැටුණෝය. **10** ඉන්-
පසු යේසුස්, “බිය නොවන්න! ගොස්
මගේ සහෝදරයන්ට මේ ගැන දන්-
වන්න.[1] එවිට ඔවුන් ගලීලයට යයි.
එහිදී මාව දකින්න ඔවුන්ට අවස්ථා-
වක් ලැබෙයි” කියා ඔවුන්ට කීවේය.
**11** ඔවුහු මඟ යන අතරේ මුරකරු-
වන්ගෙන් සමහරෙක්[2] නුවරට ගොස්
සිදු වූ සෑම දෙයක්ම නායක පූජ-
කයන්ට දැන්වූහ. **12** ඔවුහු වැඩිම-
හල්ලන් සමඟ රැස් වී සාකච්ඡා කර
හේවායන්ට ප්‍රමාණවත් රිදී කාසි දී,[3]
**13** මෙසේ කීවෝය. “‘ඔහුගේ ගෝ-
ලයන්[4] රාත්‍රියෙහි ඇවිත් අප නිදා
සිටියදී ඔහුගේ දේහය සොරාගෙන
ගියා’ කියා කියන්න. **14** මේ ගැන
ආණ්ඩුකාරයාට ආරංචි වුණොත් අපි
ඔහු සමඟ එය බේරුමක් කරගන්නම්.
ඔබට කරදරයක් වෙන්න අපි ඉඩ
දෙන්නේ නැහැ.” **15** එහෙයින් ඔවුහු
රිදී කාසි ගෙන ඔවුන්ට පැවසූ ලෙ-
සම කළෝය. ප්‍රතිඵලයක් ලෙස මේ
කතාව අද දක්වා යුදෙව්වරුන් අතරේ
පැතිර තිබේ.
**16** ගෝලයෝ එකොළොස්දෙනා
යේසුස් තමන්ට සූදානම් කළ ස්ථා-
නය වන ගලීලයේ[5] පිහිටි කන්-
දට ගියහ. **17** ඔවුහු ඔහුව දුටු විට
ඔහු ඉදිරියේ දණින් වැටුණෝය. ඒ
අතර සමහරුන් තුළ යම් සැකයක්
ඇති විය.[6] **18** යේසුස් ඔවුන් ළඟට
ඇවිත් මෙසේ කීවේය. “ස්වර්ගයෙහිත්
පොළොවෙහිත් සියලුම බලය[7] මට
දී තිබෙනවා. **19** එමනිසා ගොස්
සෑම ජාතියකටම අයත් මිනිසුන්ට[8]
මගේ ගෝලයන් වෙන්න උපකාර
කරන්න.[9] පියාණන්වත්[10] පුත්‍රයා-
වත්[11] දෙවිගේ බලයේ ක්‍රියාකාරිත්-
වයත්[12] පිළිගන්නා අයව බව්තීස්ම
කරන්න.[13] **20** මා ඔබට අණ කළ
සෑම දෙයක්ම[14] පිළිපදින්න[15] ඔවුන්ට
උගන්වන්න.[16] මෙයද මතක තබා-
ගන්න. මම මෙතැන් පටන් පවතින
සමාජයේ අවසාන කාල පරිච්ඡේදය
නිමා වන තුරුම[17] ඔබ සමඟ සැමදා
සිටිනවා.”[18]

**28 පරි.**
**1** මාක් 16:1; ලූක් 24:1; ලූක් 24:10; යොහ 20:1
**2** මාක් 16:4; ලූක් 24:2
**3** විනි 13:6; දානි 10:6
**4** මාක් 16:5; ලූක් 24:4; ක්‍රියා 1:10; එළි 10:1
**5** හෙබ්‍රෙ 1:14
**6** මාක් 16:6
**7** මතෙ 16:21; මතෙ 17:23; ලූක් 24:6; 1කොරි 15:4
**8** 2තිමෝ 2:8
**9** මතෙ 26:32; මතෙ 28:16; මාක් 14:28
**10** මාක් 16:7
**11** මාක් 16:8; ලූක් 24:9

**2 තීරුව**
**1** යොහ 20:17; රෝම 8:29; හෙබ්‍රෙ 2:11
**2** මතෙ 27:65
**3** හිතෝ 17:23
**4** මතෙ 27:64
**5** මතෙ 26:32; 1කොරි 15:6
**6** මතෙ 14:31
**7** දානි 7:14; මතෙ 11:27; එෆී 1:21; පිලි 2:9
**8** ක්‍රියා 1:8; රෝම 10:18; රෝම 11:13; එළි 14:6
**9** ක්‍රියා 14:21; ක්‍රියා 21:16
**10** ගීතා 83:18; යෙසා 64:8
**11** පිලි 2:9; එළි 19:16
**12** යොහ 14:16
**13** ක්‍රියා 2:38; ක්‍රියා 8:12
**14** 1කොරි 11:23; 2පේත 3:2; 1යොහ 3:23
**15** මතෙ 7:24; යොහ 14:23; 1තිමෝ 6:14
**16** මතෙ 5:19; ක්‍රියා 20:20; 2තිමෝ 2:2

**17** මතෙ 13:39; මතෙ 13:49; මතෙ 24:3; **18** මතෙ 18:20; ක්‍රියා 18:10.

# මාක්ගේ

## වාර්තාව

**1** යේසුස් ක්‍රිස්තුස් පිළිබඳ ශුභාරංචියේ ආරම්භය මෙයයි. **2** අනාගතවක්තෘ යෙසායාගේ ලියවිල්ලෙහි මෙසේ ලියා තිබේ. එනම්, “(මම මාගේ පණිවිඩකරුව ඔබ ඉදිරියෙන් යවමි. ඔහු ඔබේ මඟ සූදානම් කරයි.)*[1] **3** සවන් දෙන්න! ‘ජනයෙනි, යෙහෝවා දෙවිගේ මඟ එළි පෙහෙළි කර සූදානම් කරන්න! ඔහුගේ මාවත් සමතලා කරන්න’[2] කියා යමෙක් පාළුකරයේ සිට හඬ නඟන්නේය.” **4** එහි සඳහන් වූයේ මිනිසුන්ව බව්තීස්ම කරන පාළුකරයේ සිටි යොහන් නමැති තැනැත්තා ගැනයි. ඔහු පව්වලට සමාව ලබාගැනීම සඳහා පසුතැවිලි වෙන්න කියාත් එය බව්තීස්මය මගින් සංකේතවත් කරන්න කියාත් දේශනා කළේය.[3] **5** එහෙයින් යුදයේ සියලු පළාත්වලින් පැමිණි ජනයාද යෙරුසලමේ සියලු වැසියෝද ඔහු වෙතට ගොස් තමන් කර ඇති වැරදි ප්‍රසිද්ධියේ පිළිගත්තෝය.[4] ඔහු ඔවුන්ව යොර්දාන් ගඟෙහි බව්තීස්ම කළේය. **6** යොහන් ඇඳගෙන සිටියේ ඔටු රෝමවලින් සෑදූ වස්ත්‍රයක්ය. ඔහුගේ ඉඟටිය වටා සම් පටියක්[5] බැඳ තිබිණ. ඔහු ආහාරයට ගත්තේ පළඟැටියන්[6] හා වනයේ මීපැණිය.[7] **7** ඔහු දේශනා කරමින් මෙසේ කීවේය. “මට වඩා බලවත් තැනැත්තෙක් මට පසුව පැමිණෙයි. නැමී, ඔහුගේ පාවහන් පටි ලිහන්න තරම්වත් මම වටින්නේ නැහැ.[8] **8** මම ඔබව බව්තීස්ම කරන්නේ වතුරෙන්. නමුත් ඔහු ඔබව බව්තීස්ම කරන්නේ දෙවිගේ බලයෙනුයි.”[9]

**9** ඒ දවස්වලදී යේසුස්, ගලීලයේ නාසරෙත් නම් නුවරේ සිට පැමිණියේය. යොහන් ඔහුව යොර්දාන් ගඟෙහි බව්තීස්ම කළේය.[1] **10** ඔහු දියෙන් උඩට මතු වූ සැණින්ම අහස විවර වී දෙවිගේ බලය පරෙවියෙකුගේ ස්වරූපයෙන් ඔහු පිට පැමිණි ආකාරය[2] යොහන් දුටුවේය. **11** එවිට “මාගේ ප්‍රේමණීය පුත්‍රයා ඔබයි. මම ඔබව අනුමත කළෙමි”[3] කියා පවසන හඬක් ස්වර්ගයෙන් නික්මුණේය.

**12** එසැණින්ම දෙවිගේ බලය ඔහු තුළ ක්‍රියාත්මක වූ නිසා ඔහු වනසතුන් සිටි පාළුකරයට ගොස්,[4] **13** එහි දවස් හතළිහක් ගත කළේය.[5] එහිදී සාතන් ඔහුව වරදකට හසු කරගන්න උත්සාහ කළේය.[6] පසුව දේවදූතයෝ ඇවිත් ඔහුට උපස්ථාන කළෝය.[7]

**14** මේ අතරතුර යොහන්ව අත්අඩංගුවට ගන්නා ලදී. ඉන්පසු යේසුස් ගලීලයට ගොස්[8] දෙවිගේ ශුභාරංචිය දේශනා කරමින්,[9] **15** මෙසේ කීවේය. “නියමිත කාලය දැන් සම්පූර්ණයි.[10] දෙවිගේ රාජ්‍යය ළඟයි. ජනයෙනි, පසුතැවිලි වී[11] ශුභාරංචිය කෙරෙහි ඔබට විශ්වාසයක් ඇති බව පෙන්වන්න.”

**16** දිනක් යේසුස් ගලීල මුහුද අසල ඇවිදිමින් සිටියදී ධීවරයන් වූ[12] සීමොන්[13] සහ ඔහුගේ සහෝදරයා වූ අන්ද්‍රෑ දියට දැල් හෙළමින් සිටිනවා දුටුවේය. **17** යේසුස්, “මා පසුපස එන්න. මම ඔබව මසුන් අල්ලන්නන් වෙනුවට මිනිසුන් අල්ලන්නන් කරන්නම්”[14] කියා ඔවුන්ට කීවේය. **18** ඔවුහු වහාම තම දැල් පසෙක තබා ඔහු අනුව ගියහ.[15] **19** වෙරළේ ටික දුරක් ගිය ඔහුට සෙබදීගේ පුතුන් දෙදෙනා වූ යාකොබ්ව සහ යොහන්ව හමු විය. ඔවුහු තම ඔරුවෙහි ඉඳ තම දැල්වල ඉරුම් සකසමින් සිටියෝය.[16] **20** යේසුස්

**1 පරි.**

1 මලා 3:1, මතෙ 11:10, ලූක් 7:27
2 යෙසා 40:3, ලූක් 3:4, යොහ 1:23
3 මතෙ 3:2, ලූක් 3:3, ක්‍රියා 13:24
4 හිතෝ 28:13, මලා 3:5, ක්‍රියා 19:4
5 2රාජා 1:8
6 ලෙවී 11:22
7 මතෙ 3:4
8 යොහ 1:27, ක්‍රියා 13:25
9 යෙසා 44:3, යෝවෙ 2:28, ලූක් 3:16, ක්‍රියා 2:4, ක්‍රියා 11:16, 1කොරි 12:13

**2 තීරුව**

1 මතෙ 3:13
2 යෙසා 42:1, මතෙ 3:16, ලූක් 3:22, යොහ 1:32
3 ගීතා 2:7, මතෙ 3:17, 2පේතෘ 1:17
4 ලූක් 4:1
5 මතෙ 4:2
6 මතෙ 4:1
7 මතෙ 4:11
8 මතෙ 4:12, ලූක් 4:14
9 ලූක් 8:1
10 දානි 9:26, ගලා 4:4, එෆී 1:10
11 මතෙ 4:17
12 මතෙ 4:18, ලූක් 5:4
13 මතෙ 10:2
14 මතෙ 4:19
15 මතෙ 19:27, ලූක් 5:11
16 මතෙ 4:21

**මාක් 1:2*** වරහන් තුළ ඇති කොටස උපුටාගෙන තිබෙන්නේ මලා 3:1නි.

ඒ මොහොතේදීම ඔවුන්ටත් අඬගැසු-
වේය. ඔවුහුද ඔරුවේ කුලීකරුවන්
සමඟ සිටි තම පියා වූ සෙබදී-
ගෙන් සමුගෙන ඔහු පසුපස ගියෝය.
**21** පසුව ඒ සියලුදෙනාම කපර්ණවු-
මට[1] පැමිණියෝය.

සබත් දවස උදා වීමත් සමඟම ඔහු
එහි සිනගෝගයට ඇතුල් වී උගන්-
වන්න පටන්ගත්තේය. **22** ඔහු
ඉගැන්වූ ආකාරය ගැන රැස්ව සිටි අය
මවිතයට පත් වූහ.[2] මන්ද ඔහු නීතිය
පිටපත් කරන්නන් මෙන් නොව දෙවි
මත රඳා සිටිමින් ඉගැන්වුවේය.[3]
**23** එම සිනගෝගයෙහි භූතයෙකුගේ
ග්‍රහණයට හසු වී සිටි මිනිසෙක් සිටි-
යේය. ඔහු කෑගසමින්,[4] **24** මෙසේ
කීවේය. "නාසරෙත් නුවරින් පැමිණි
යේසුස්,[5] ඔබ අපට කරදර කරන්නේ
ඇයි? ඔබ ආවේ අපව විනාශ කරන්-
නද? ඔබ කවුද කියා මම හොඳටම
දන්නවා.[6] දෙවිගේ[7] ශුද්ධ තැනැත්තා[8]
ඔබයි." **25** නමුත් යේසුස් භූතයාට
තදින් කතා කර, "නිහඬ වී, ඔහුගෙන්
පිට වෙන්න"[9] කියා අණ කළේය.
**26** එවිට භූතයා එම මිනිසාට තදින්
වෙවුලන්නත් යටි ගිරියෙන් කෑගසන්-
නත් සලස්වා ඔහුගෙන් පිට විය.[10]
**27** එය දුටු ජනයා කොතරම් විස්ම-
යට පත් වුණාද කිව්වොත් ඔවුහු තම
තමන් අතරේ මෙසේ කතා වුණෝය.
"මොකක්ද මේ සිදු වුණේ? මේ වගේ
උගන්වන කෙනෙක් නම් මීට කලින්
අපි දැකලා නැහැ. ඔහුට මොන තරම්
බලයක් තිබෙනවාද! ඔහු අණ කරන
විට භූතයන් පවා ඔහුට කීකරු වෙ-
නවා."[11] **28** එහෙයින් ඔහු පිළිබඳ
ඒ ආරංචිය ඉක්මනින් ගලීලය පුරාම
පැතිර ගියේය.[12]

**29** පසුව යාකොබ් සහ යොහන්
සමඟ සිනගෝගයෙන් පිට වූ යේසුස්,
ඔවුන් සමඟ සීමොන්[13] සහ අන්ද්‍ර-
ගේ නිවසට ගියේය. **30** සීමොන්-
ගේ බිරිඳගේ මවට[14] උණ රෝගය
වැලඳී[15] ඇඳට වී සිටි නිසා ඔවුහු ඉක්-
මනින්ම ඇය ගැන ඔහුට කීවෝය.
**31** ඔහු ඇය සිටි තැනට ගොස් ඇගේ
අතින් අල්ලා ඇයට නැඟිටින්න උප-
කාර කළේය. එවිට ඇගේ උණ රෝ-
ගය සුව වූ අතර[1] ඇය ඔවුන්ට සංග්‍රහ
කරන්නද පටන්ගත්තාය.[2]

**32** සවස් වී හිරු බැස ගිය පසු
ජනයා රෝගීව සිටි[3] සියල්ලන්ව සහ
භූතයන් ආවේශ වූ[4] අයව ඔහු වෙතට
ගෙනෙන්න පටන්ගත්හ. **33** ඇත්-
තෙන්ම මුළු නුවරම පාහේ එම නිව-
සේ දොරකඩ අසල රැස්ව සිටියහ.
**34** ඔහු විවිධ රෝගවලින් පෙළුණු[5]
බොහෝදෙනෙකුව සුව කළේය. බො-
හෝ භූතයන්වද දුරු කළේය. නමුත්
ඔහු ක්‍රිස්තුස් බව ඒ භූතයන් දැන සිටි
නිසා ඔහු ඔවුන්ට කතා කරන්න ඉඩ
නොදුන්නේය.[6]

**35** පසුදා හිමිදිරියේ එළිය
වැටෙන්නත් පෙර ඔහු නැඟිට පාළු
තැනකට ගොස්[7] යාච්ඤා කරන්න
පටන්ගත්තේය.[8] **36** මේ අතරතු-
රේදී සීමොන් සහ ඔහු සමඟ සිටි අය
මහත් වෙහෙසක් දරමින් ඔහුව සොයා
ගියෝය. **37** ඔවුහු ඔහුව හමු වූ විට,
"සියලුදෙනාම ඔබව සොයනවා" කියා
ඔහුට කීවෝය. **38** නමුත් ඔහු, "අපි
වෙන තැනකට යමු. අනික් ගම්බද
පළාත්වල ඇති නුවරවලත් මට දේ-
ශනා කරන්න අවශ්‍යයි.[9] මම ආවේ
ඒ කාර්යය සඳහායි"[10] කියා ඔවුන්ට
කීවේය. **39** එලෙස ඔහු සිනගෝග-
වල දේශනා කරමින්ද භූතයන්ව දුරු
කරමින්ද[11] මුළු ගලීලය පුරාම ගියේය.

**40** එක්තරා අවස්ථාවක ලාදුරු
රෝගියෙක් ඔහු වෙතට ඇවිත් දණින්
වැටී, "ඔබ කැමති නම් ඔබට පුළු-
වන් මාව පවිත්‍ර කරන්න"[12] කියා
ඉතා බැගෑපත්ව ඔහුට පැවසුවේය.
**41** එවිට යේසුස්ට ඔහු ගැන මහත්
අනුකම්පාවක් ඇති විය.[13] ඔහු තම
අත දිගු කර ඔහුව ස්පර්ශ කර,
"මා කැමතියි. පවිත්‍ර වෙන්න"[14] කියා
ඔහුට කීවේය. **42** ඒ මොහොතේ-
දීම ලාදුරු රෝගය සුව වී ඔහු
පවිත්‍ර විය.[15] **43** එම මිනිසාව ඉක්-
මනින්ම පිටත් කර යැවූ යේසුස්,
ඔහුට මෙලෙස තදින් අවවාද කළේය.

**1 පරි.**
1 මතෙ 4:13 ලූක් 4:31
2 මතෙ 7:28
3 මතෙ 7:29
4 ලූක් 4:33
5 මතෙ 8:29
6 යාකො 2:19
7 ලූක් 4:34
8 එළි 3:7
9 ලූක් 4:35
10 මාක් 9:20 මාක් 9:26
11 ලූක් 4:36
12 මතෙ 4:24 ලූක් 4:37
13 ලූක් 4:38
14 1කොරි 9:5
15 මතෙ 8:14

**2 තීරුව**
1 ගීතා 103:3
2 මතෙ 8:15 ලූක් 4:39
3 මතෙ 4:24 ලූක් 4:40
4 මතෙ 8:16
5 යෙසා 53:4
6 මාක් 3:12 ලූක් 4:41
7 ලූක් 4:42
8 මතෙ 14:23 මාක් 14:32 හෙබ්‍රෙ 5:7
9 යෙසා 61:1
10 ලූක් 4:43 යොහ 17:4
11 මතෙ 4:23 ලූක් 4:44
12 මතෙ 8:2 ලූක් 5:12
13 හෙබ්‍රෙ 2:17
14 මතෙ 8:3
15 ලූක් 5:13

**44** “මේ ගැන කාටවත් කිසිම දෙ-
යක් කියන්න එපා. පූජකයා ඉදිරියට
ගොස්[1] ඔහුට ඔබව පරීක්ෂා කරන්න
ඉඩ දෙන්න. ඉන්පසු මෝසෙස් අණ
කළ ආකාරයට[2] ඔබේ පූජාව ඔප්පු
කරන්න. ඔබ සුව වී ඇති බවට
එය පූජකයන්ට සාක්ෂියක් වෙයි.”[3]
**45** නමුත් එම මිනිසා පිටත් වූ පසු සිදු
වූ දේ ගැන ගිය ගිය තැන්වල ප්‍රචාරය
කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රසිද්-
ධියේ කිසි නුවරකට ඇතුල් වෙන්න
යේසුස්ට නොහැකි විය. එහෙයින් ඔහු
පිටත පාළු ප්‍රදේශවල රැඳී සිටියේය.
නමුත් සෑම පළාතකින්ම ජනයා ඔහු
වෙතට දිගින් දිගටම පැමිණියෝය.[4]

**2** කෙසේවෙතත් ඔහු දවස් කිහිප-
යකට පසු නැවත කපර්ණවුමට
පැමිණියේය. ඔහු නැවතී සිටි නිව-
සට නැවත පැමිණි බව[5] සියල්ලන්ට
ආරංචි වූ නිසා, **2** ඒ නිවසට බො-
හෝදෙනෙක් රැස් වූහ. කොතරම් සෙ-
නඟක් රැස්ව සිටියාද කිවහොත් නිවස
තුළත් දොරකඩ අසලත් කිසිම ඉඩ-
කඩක් නොතිබිණ. ඔහු ඔවුන් සිය-
ලුදෙනාට ශුභාරංචිය[6] ගැන දේශනා
කළේය. **3** ඒ අතරේදී හතරදෙ-
නෙකු විසින් උසුලාගෙන ආ අංශභාග
රෝගියෙකු[7] සමඟ මිනිසුන් පිරි-
සක් ඔහු වෙතට ආවෝය. **4** නමුත්
විශාල සමූහයක් රැස්ව සිටි නිසා ඔහුව
යේසුස් ළඟටම ගෙන එන්න ඔවුන්ට
නොහැකි විය. ඒ නිසා ඔවුහු යේසුස්
සිටි තැනට ඉහළින් වහලෙන් කොට-
සක් ඉවත් කර එතැනින් අංශභාග
රෝගියා සිටි ඇඳ පහත් කළෝය.[8]
**5** යේසුස් ඔවුන්ගේ විශ්වාසය[9] දැක,
“පුතේ, දැන් ඔබේ පව්වලට සමාව
ලැබී තිබෙනවා”[10] කියා අංශභාග
රෝගියාට කීවේය. **6** එතැන ඉඳ-
ගෙන සිටි නීතිය පිටපත් කරන්-
නන්ගෙන් සමහරෙක් මෙසේ සිතූහ.[11]
**7** “මේ මිනිසා මේ විදිහට කතා
කරන්නේ ඇයි? ඔහු කරන්නේ දේවඅ-
පහාසයක්. පව්වලට සමාව දෙන්න
පුළුවන් දෙවිට මිස[12] වෙන කාටද?”
**8** නමුත් ඔවුන් සිතන ආකාරය යේ-
සුස්ට විගස අවබෝධ වී ඔවුන්ගෙන්
මෙසේ ඇසුවේය. “ඔබ එසේ සිතන්-
නේ ඇයි?[1] **9** වඩා පහසු කුමක්ද?
අංශභාග රෝගියාට, ‘ඔබේ පව්වලට
සමාව ලැබී තිබෙනවා’ කියා පැවසී-
මද නැතහොත්, ‘නැඟිට, ඔබේ ඇඳ
රැගෙන ඇවිදින්න’ කියා පැවසීමද?[2]
**10** මනුෂ්‍ය පුත්‍රයාට[3] මේ පොළො-
වෙහි පව්වලට සමාව දෙන්න බලය
තිබෙන බව[4] ඔබ දැනගත යුතුයි.
. . .” ඉන්පසු ඔහු අංශභාග රෝ-
ගියාට මෙසේ කීවේය. **11** “නැඟිට,
ඔබේ ඇඳ රැගෙන ගෙදර යන්න.”[5]
**12** එවිට ඔහු විගස නැඟිට, තම ඇඳ
රැගෙන සියලුදෙනා ඉදිරියෙහි ඇවිද-
ගෙන පිටත්ව ගියේය.[6] එය දුටු සියල්-
ලෝම අතිශයින් පුදුමයට පත් වී,
“මේ වගේ දෙයක් නම් අපි කවදාවත්
දැකලා නැහැ”[7] කියා පවසමින් දෙවිට
ප්‍රශංසා කළෝය.

**13** තවත් අවස්ථාවකදී ඔහු ගලීල
මුහුද අසලට ගියේය. විශාල සමූ-
හයක් ඔහු වෙතට පැමිණි අතර
ඔහු ඔවුන්ට උගන්වන්න පටන්ගත්-
තේය. **14** ඔහු පිටත්ව යද්දී අල්ෆෙ-
වුස්ගේ පුත් ලෙවී[8] බදු එකතු කිරීමේ
කාර්යාලයේ ඉඳගෙන සිටිනවා දැක,
“මගේ අනුගාමිකයෙක් වන්න” කියා
ඔහුට කීවේය. ඔහු නැඟිට, යේසුස්
අනුව ගියේය.*[9] **15** පසු අවස්ථාව-
කදී යේසුස් තම ගෝලයන් සමඟ
ලෙවීගේ නිවසෙහි කෑමකට ඉඳ-
ගෙන සිටියදී, බදු එකතු කරන්නන්[10]
සහ පව්කාරයන් බොහෝදෙනෙක්
ඔවුන් සමඟ කෑමට ඉඳගත්හ. ඔවුන්-
ගෙන් බොහෝදෙනෙක් එතැන් සිට
ඔහුගේ අනුගාමිකයන් බවට පත්
වූහ.[11] **16** නමුත් ඔහු පව්කාරයන්
සහ බදු එකතු කරන්නන් සමඟ කෑම
කනවා දුටු පරිසිවරුන්ගේ* නිකායට
අයත් නීතිය පිටපත් කරන්නන් කිහි-
පදෙනෙක් ඔහුගේ ගෝලයන්ගෙන්

**1 පරි.**
1 ලෙවී 13:49; ලෙවී 14:3
2 ලෙවී 14:10; ද්වි 24:8
3 මතෙ 8:4; ලූක් 5:14
4 මාක් 2:13; ලූක් 5:15

**2 පරි.**
5 මතෙ 9:1
6 ගීතා 40:9; යෙසා 61:1; එෆී 2:17; හෙබ්‍රෙ 2:3
7 මතෙ 9:2; ලූක් 5:18
8 ලූක් 5:19
9 ක්‍රියා 14:9
10 යෙසා 53:11; ලූක් 5:20; ලූක් 7:48
11 ලූක් 5:21
12 ගීතා 130:4; යෙසා 43:25

**2 තීරුව**
1 ගීතා 7:9; මතෙ 9:4; ලූක් 6:8; හෙබ්‍රෙ 4:13; එළි 2:23
2 මතෙ 9:5; ලූක් 5:23
3 දානි 7:13
4 යෙසා 53:11; ක්‍රියා 5:31
5 මතෙ 9:6; ලූක් 5:24
6 මතෙ 9:8; ලූක් 5:26
7 මතෙ 9:33; යොහ 7:31; යොහ 9:32
8 මතෙ 9:9
9 ලූක් 5:27
10 ලූක් 15:1
11 මතෙ 9:10; ලූක් 5:29

---

මාක් **2:14*** “අනුව” යන්න භාවිත කර තිබෙන්නේ ඔවුන් ඔහුගේ අනුගාමිකයන් වූ බව දැක්වීමටයි.
**16*** යේසුස්ගේ කාලයේ සිටි ප්‍රසිද්ධ ආගමික නායකයන් පිරිසකි.

මෙසේ ඇසූහ. “ඔහු බදු එකතු කරන්-
නන් හා පව්කාරයන් සමඟත් කෑම
කනවාද?”[1] **17** යේසුස්ට එය ඇසී,
“වෛද්‍යවරයෙක් අවශ්‍ය වෙන්නේ
රෝගීන්ටයි. නිරෝගී අයට වෛද්‍යව-
රයෙකුගෙන් වැඩක් නැහැ. මම ආවේ
ධර්මිෂ්ඨයන්ට උපකාර කරන්න
නොවෙයි. පව්කාරයන්ට උපකාර
කරන්නයි”[2] කියා ඔවුන්ට කීවේය.

**18** යොහන්ගේ ගෝලයනුත් පරි-
සිවරුනුත් සිරිතක් ලෙස නිරාහා-
රව සිටියහ. දිනක් පිරිසක් ඇවිත්
ඔහුගෙන් මෙසේ ඇසූහ. “යොහන්ගේ
ගෝලයනුත් පරිසිවරුන්ගේ ගෝල-
යනුත් සිරිතක් හැටියට නිරාහාරව
සිටිනවා. ඒත් ඇයි ඔබේ ගෝල-
යන් එහෙම කරන්නේ නැත්තේ?”[3]
**19** යේසුස් ඔවුන්ට මෙසේ කීවේය.
“මනාලයා තමන් සමඟ සිටින
විට මනාලයාගේ මිතුරන් නිරාහා-
රව සිටිය යුතුද?[4] මනාලයා ඔවුන්
සමඟ සිටින තුරු ඔවුන්ට නිරාහාරව
සිටින්න බැහැ.[5] **20** නමුත් මනාල-
යාව ඔවුන්ගෙන් වෙන් කරනු ලබන
දවස පැමිණෙයි. ඒ දවසේදී ඔවුන්
නිරාහාරව සිටියි.[6] **21** කිසි කෙ-
නෙක් අලුත් රෙදි කැබැල්ලක්
තබා පරණ වස්ත්‍රයක ඉරුණු
තැනක් මහන්නේ නැහැ. එවැනි දෙ-
යක් කළොත් ඒ අලුත් රෙදි කැබැල්ල
වඩා ශක්තිමත් නිසා එය වස්ත්‍රයෙන්
ඇදී, ඉරුම තවත් වැඩි වෙයි.[7] **22** ඒ
වගේම කිසි කෙනෙක් අලුත් වයින්
පරණ සම් භාජනවලට දමන්නෙත්
නැහැ. එසේ කළොත් ඒ සම් භාජන
පැළී යයි. එවිට වයින් ඉහිරී යන අතර
සම් භාජනද නාස්ති වී යයි.[8] අලුත්
වයින් දමන්නේ අලුත් සම් භාජන-
වලටයි.”[9]

**23** තවත් අවස්ථාවක සබත් දවස-
කදී ඔහු ධාන්‍ය කෙත් මැදින් ගමන්
කරමින් සිටියේය. ඔහු සමඟ ගිය
ඔහුගේ ගෝලයෝ ධාන්‍ය කරල්[10]
කඩමින්[11] ගියහ. **24** එහෙයින් පරි-
සිවරු, “මේ බලන්න ඔවුන් කරන
දේ! ඔවුන් කරන්නේ සබත් දව-
සේදී කිරීමට තහනම් දෙයක්![1] ඔවුන්
එහෙම දෙයක් කරන්නේ ඇයි” කියා
ඔහුගෙන් ඇසූහ. **25** ඔහු ඔවුන්ට
මෙසේ කීවේය. “දාවිත්,[2] තමාටත්
තමා සමඟ සිටි මිනිසුන්ටත් කෑමට
කිසිවක් නැතුව බඩගිනි වූ විට කළ
දේ[3] ඔබ කවදාවත් කියවා නැද්ද?
**26** ඒ අවස්ථාවේදී දෙවිගේ ගෘහ-
යේ නායක පූජකයා හැටියට සිටියේ
අබියාතර්.[4] ඔහු ගැන සඳහන් කර
ඇති වාර්තාවට අනුව දාවිත් දෙවි-
ගේ ගෘහයට ඇතුළ් වී, පූජකයන්ට
මිස වෙන කිසිවෙකුට කෑමට අවසර
නොතිබුණු[5] පිදීමේ රොටි[6] කා, ඔහු
සමඟ සිටි මිනිසුන්ටත් ඉන් කොට-
සක් දුන්නා.”[7] **27** ඔහු ඔවුන්ට මෙ-
සේද කීවේය. “දෙවි සබත් දවස ඇති
කළේ මිනිසාගේ ප්‍රයෝජනයටයි.[8]
එසේ නැතුව සබත් දවස මාර්ගයෙන්
මිනිසාව බැඳ තබන්න නොවෙයි.[9]
**28** ඇත්තෙන්ම සබත් දවස පව-
තින්නේ මනුෂ්‍ය පුත්‍රයාගේ බලය
යටතේයි.”[10]

**3** නැවතත් යේසුස් සිනගෝගය-
කට ඇතුළ් වුණේය. එහි අතක්
පණ නැති මිනිසෙක් සිටියේය.[11]
**2** ඔහු ඒ මිනිසාව සබත් දවසේදී සුව
කරයිද කියා පරිසිවරු මහත් ඕනෑක-
මින් බලා සිටියෝය. එසේ කළේ
ඔහුව සුව කළොත් යේසුස්ට විරුද්-
ධව චෝදනා කිරීමේ අදහසිනි.[12]
**3** එවිට යේසුස් අතක් පණ නැති ඒ
මිනිසාට, “නැඟිට, මේ පිරිස මැදට
එන්න” කියා කීවේය. **4** ඉන්පසු
ඔහු පරිසිවරුන්ගෙන් මෙසේ ඇසු-
වේය. “සබත් දවසේදී මොන වගේ
දේවල් කිරීමද හොඳ? හොඳ ක්‍රියා-
වක්ද නැත්නම් නරක ක්‍රියාවක්ද?
ජීවිතයක් බේරාගැනීමද[13] නැත්නම්
එය නැති කර දැමීමද?” එවිට ඔවුහු
නිහඬව සිටියහ. **5** ඔවුන්ගේ සිත්-
වල දැඩිකම[14] ගැන බොහෝ සෙයින්
දුක් වූ යේසුස් ඔවුන් දෙස උදහසින්
බලා, “ඔබේ අත දිගු කරන්න” කියා
ඒ මිනිසාට කීවේය. ඔහු අත දිගු

**2 පරි.**
**1** යෙසා 65:5 මතෙ 9:11 ලූක් 5:31
**2** යෙසා 61:1 මතෙ 9:12 ලූක් 5:31 ලූක් 19:10 1තිමෝ 1:15
**3** මතෙ 9:14 ලූක් 5:33
**4** යොහ 3:29
**5** ගීතා 45 මතෙ 22:2 2කොරි 11:2 එළි 19:7
**6** මතෙ 9:15 ලූක් 5:35 ලූක් 17:22
**7** මතෙ 9:16 ලූක් 5:36
**8** යෝබ 32:19
**9** මතෙ 9:17 ලූක් 5:38
**10** මතෙ 12:1 ලූක් 6:1
**11** ද්වි 23:25

**2 තීරුව**
**1** මතෙ 12:2
**2** 1සාමු 21:6
**3** මතෙ 12:3 ලූක් 6:3
**4** 1සාමු 22:20
**5** නික් 25:30 නික් 29:32 ලෙවී 24:9
**6** ලෙවී 24:6
**7** ලූක් 6:4
**8** නික් 20:10 එස 20:12
**9** මතෙ 12:7 කොලො 2:16
**10** මතෙ 12:8 ලූක් 6:5

**3 පරි.**
**11** මතෙ 12:9 ලූක් 6:6
**12** මතෙ 12:10 ලූක් 6:7 ලූක් 14:1
**13** මතෙ 12:11 ලූක් 14:3
**14** යොහ 12:40 රෝම 11:25

කළ විට එය සුව විය.[1] **6** එතැනින්
වහාම පිටත් වූ පරිසිවරු ඔහුව මරා
දැමීම සඳහා[2] හෙරොද්ගේ පක්ෂයට
අයත්ව සිටි අයව[3] හමු වී ඔහුට විරුද්-
ධව කුමන්ත්‍රණය කරන්න පටන්-
ගත්හ.

**7** නමුත් යේසුස් තම ගෝලයන්
සමඟ එතැනින් පිට වී ගලීල මුහුද දෙ-
සට ගියේය. ගලීලයෙන් සහ යුදයෙන්
පැමිණි විශාල සමූහයක් ඔහු පසුපස
ගියෝය.[4] **8** යෙරුසලමෙන්ද ඉදුම-
යෙන්ද යොර්දානයේ එගොඩින්ද තීර්[5]
සහ සීදොන් යන නුවරවල් අව-
ටින්ද විශාල සමූහයක් ඔහු කරමින්
සිටි බොහෝ දේ ගැන අසා ඔහු සිටි
තැනට ආවෝය. **9** ඒ සෙනඟ අත-
රේ තමන්ට තෙරපෙන්න සිදු වන බව
යේසුස් දැන සිටි නිසා තමන්ට කුඩා
ඔරුවක් නිතරම සූදානම් කර තබන
ලෙස ඔහු තම ගෝලයන්ට කීවේය.
**10** මන්ද ඔහු බොහෝදෙනෙකුව සුව
කළ නිසා බරපතළ රෝග වැලඳී සිටි
සියලුදෙනාම ඔහුව ස්පර්ශ කිරීමට[6]
තෙරපෙමින් ඔහු වෙතට පැමිණියහ.
**11** භූතයෝ[7] පවා ඔහුව දුටු හැමවිටම
ඔහු ඉදිරියෙහි දණින් වැටී, “ඔබ දෙවි-
ගේ පුත්‍රයා”[8] කියා කියමින් කෑගැසූහ.
**12** නමුත් තමන් කවුද කියා ප්‍රසිද්ධ
නොකරන ලෙස ඔහු බොහෝ වර
ඔවුන්ට තදින් අණ කළේය.[9]

**13** ඔහු කන්දකට නැඟ, තෝරා-
ගත් කිහිපදෙනෙකුව[10] තමන් වෙ-
තට කැඳෙව්වේය. ඔවුහු ඔහු වෙතට
ගියහ.[11] **14** මෙසේ ඔහු තමන්
සමඟ නිතර සිටීම සඳහා
දොළොස්දෙනෙකුගෙන් යුත් කණ්ඩා-
යමක් සාදා ඔවුන්ව තම “නියෝ-
ජිතයන්”* ලෙස නම් කළේය. ඔහු
ඔවුන්ව තෝරාගත්තේ දේශනා කිරී-
මේ කාර්යය සඳහා පිටත් කිරීමටය.[12]
**15** එසේම භූතයන් දුරු කිරීම සඳ-
හාද[13] ඔවුන්ට බලය දෙන ලදි.

**16** දොළොස්දෙනෙකුගෙන් යුත්
එම කණ්ඩායමට ඇතුළත් වූ අය මෙ-
සේය. ඔහු පේතෘස් යන වාසගම[1]
දුන් සීමොන්ද, **17** සෙබදීගේ පුත්
යාකොබ් සහ යාකොබ්ගේ සහෝදර
වූ[2] යොහන්ද, (ඔහු මොවුන්ට ගර්ජ-
නාවේ පුත්‍රයන් යන අර්ථය ඇති බො-
වනර්ගේස් යන වාසගමද දුන්නේය.)
**18** අන්ද්‍රෑ, පිලිප් සහ බාතොලමෙව්ද
මතෙව් සහ තෝමස්ද අල්ෆෙවුස්-
ගේ පුත් යාකොබ්ද තදියස් සහ
මහත් උද්‍යෝගයකින් දේවල් කිරී-
මට ප්‍රසිද්ධව සිටි සීමොන්ද, **19** පසු
කාලයකදී ඔහුට ද්‍රෝහි වූ යූදස් ඉස්-
කාරියොත්ද[3] යන අයයි.

ඉන්පසු ඔහු එක්තරා නිවසකට
ඇතුල් විය. **20** නැවතත් සමූහයා
එතැනට එක් රොක් වූ නිසා ඔවුන්ට
කෑම කන්නවත් වේලාවක් ලැබු-
ණේ නැත.[4] **21** යේසුස්ගේ නෑදෑ-
යන්ට[5] ඔහු ගැන ආරංචි වී, “ඔහු
සිහිවිකල් වී සිටියි”[6] කියා පවස-
මින් ඔහුව රැගෙන යෑමට පැමි-
ණියෝය. **22** එසේම යෙරුසලමේ
සිට පැමිණි නීතිය පිටපත් කරන්-
නෝද, “ඔහුට බෙල්සෙබුබ්* ආවේශ
වෙලා. ඔහු භූතයන් දුරු කරන්නේ
භූතයන්ගේ පාලකයා මාර්ගයෙන්”[7]
කියා පැවසූහ. **23** එවිට ඔහු ඔවුන්ව
තමන් ළඟට කැඳවා, උදාහරණ යො-
දාගනිමින් ඔවුන්ට මෙසේ කීවේය.
“සාතන්ට සාතන්වම දුරු කරන්න
පුළුවන් කොහොමද? **24** යම් රාජ්‍ය-
යක් තුළ භේද ඇත්නම් ඒ රාජ්‍යයට
කොහොමටවත් පවතින්න බැහැ.[8]
**25** යම් නිවසක සිටින අය අතර
භේද තිබෙනවා නම් ඒ නිවසේ සිටින
අයටත් එකට ජීවත් වෙන්න බැහැ.[9]
**26** එමෙන්ම සාතන් තමන්ටම විරුද්-
ධව ක්‍රියා කර තමන්ට පක්ෂ අය අතර
භේද ඇති කළොත් ඔහුටත් පැව-
තිය නොහැකියි. ඔහු නැති වී යයි.[10]
**27** යම් හොරෙක් ශක්තිමත් මිනි-
සෙකුගේ නිවසට කඩාවැද ඔහුගේ
නිවසේ ඇති බඩු බාහිරාදිය කොල්ල
කනවා නම්[11] ඔහු මුලින්ම ඒ මිනිසාව

**3 පරි.**
**1** මතෙ 12:13 ලූක් 6:10
**2** මතෙ 12:14 ලූක් 6:11 යොහ 11:53
**3** මතෙ 22:16 මාක් 12:13
**4** මතෙ 12:15 ලූක් 6:17
**5** මතෙ 11:21
**6** මතෙ 9:21 මාක් 5:28 මාක් 6:56
**7** මතෙ 8:31 මාක් 1:23
**8** මාක් 5:7 ලූක් 4:41
**9** මතෙ 12:16 මාක් 1:25
**10** යොහ 15:16
**11** ලූක් 6:12 ලූක් 9:1
**12** ලූක් 6:13
**13** මතෙ 10:1

**2 තීරුව**
**1** යොහ 1:42
**2** මතෙ 10:2 ලූක් 6:14 ලූක් 9:54 ක්‍රියා 1:13
**3** මතෙ 10:4 ලූක් 6:16
**4** මාක් 6:31
**5** යොහ 7:5
**6** යොහ 10:20
**7** මතෙ 9:34 මතෙ 10:25 ලූක් 11:15 යොහ 8:48
**8** මතෙ 12:25
**9** ලූක් 11:17
**10** මතෙ 12:26 ලූක් 11:18
**11** යෙසා 49:24

මාක් **3:14*** හෝ, “යවනු ලැබූවන්.”

මාක් **3:22*** සාතන්ට භාවිත කරන තවත් නමකි.

බැඳ දැමිය යුතුයි. එසේ නොකළොත්
ඔහුට කොල්ල කන්න හැකි වන්නේ
නැහැ.[1] **28** ඇත්තෙන්ම මා ඔබට
කියන්නේ, මිනිසුන් මොන පාප-
යක් කළත් මොන තරම් අපහසාත්-
මක දේවල් පැවසුවත් ඔවුන්ට ඒවා
සඳහා සමාව ලබාගත හැකි බවයි.[2]
**29** නමුත් කෙනෙක් දෙවිගේ බලයේ
ක්‍රියාකාරිත්වය දැක එයට විරුද්ධව
අපහාස කළොත් ඔහුගේ ඒ වරදට
කොහොමටවත් සමාවක් නැහැ. ඔහු-
ගේ ඒ පාපයට කිසි දිනක සමාවක්
නොලැබෙයි."[3] **30** ඔහු ඒ දේවල්
පැවසුවේ, "ඔහුට භූතයෙක් වැහිලා"[4]
කියා ඔවුන් පැවසූ නිසාය.

**31** ඔහු සමූහයන්ට කතා කර-
මින් සිටියදී ඔහුගේ මවද සහෝ-
දරයෝද[5] ඔහු සමඟ කතා කිරීම
සඳහා පිටත සිටගෙන සිටියහ.[6]
**32** ඒ අවස්ථාවේදී විශාල පිරිසක් ඔහු
වටා ඉඳගෙන සිටි නිසා ඔවුහු, "ඔබේ
මවත් සහෝදරයනුත් ඔබව සොයා-
ගෙන ඇවිත්"[7] කියා ඔහුට කීවෝය.
**33** නමුත් ඔහු, "කවුද මගේ මව?
කවුද මගේ සහෝදරයන්"[8] කියා
ඔවුන්ගෙන් ඇසුවේය. **34** ඉන්පසු
ඔහු තමන් වටා ඉඳගෙන සිටි අය
දෙස බලමින් මෙසේ පැවසුවේය.
"මෙන්න, මගේ මව සහ මගේ සහෝ-
දරයෝ![9] **35** මගේ සහෝදරයා හෝ
සහෝදරිය හෝ මව හෝ වන්නේ
දෙවිගේ කැමැත්ත කරන තැනැත්-
තායි."[10]

**4** නැවතත් යේසුස් ගලීල මුහුද
අසලදී[11] සමූහයාට උගන්වන්න
පටන්ගත්තේය. අතිමහත් සමූහයක්
ඔහු ළඟට රැස් වූ නිසා ඔහු දියේ
තිබුණු ඔරුවකට නැඟ එහි ඉඳගත්-
තේය. මුළු සමූහයා සිටියේ ගොඩබි-
මෙහිය.[12] **2** ඔහු ඔවුන්ට බොහෝ
දේවල් ඉගැන්වූයේ උපමා යොදාගෙ-
නය.[13] ඔහු ඔවුන්ට මෙසේ කීවේය.[14]
**3** "සවන් දෙන්න. එක්තරා වපුරන්-
නෙක් කෙතක බීජ වපුරමින් සිටියා.[15]
**4** ඔහු වපුරමින් සිටින අතරේදී සම-
හර බීජ මහ දිගේ වැටුණා. කුරුල්ලන්
ඇවිත් ඒවා කා දැමුවා.[1] **5** තවත්
බීජ වැටුණේ නොගැඹුරු පස් තට්-
ටුවක් තිබූ ගල් බිමක් මතයි. එම
බීජ විගස වැඩෙන්න පටන්ගත්තත්
ඒවාට හොඳින් මුල් අදින්න නොහැකි
වුණා.[2] **6** දැඩි අව් රශ්මිය නිසා ඒවා
මැලවී ගියා. ඒවායේ මුල් ගැඹුරටම
විහිදී ගියේ නැති නිසා ඒවා සම්පූර්ණ-
යෙන්ම මැරී ගියා.[3] **7** තවත් සමහර
බීජ වැටුණේ කටු ගස් අතරෙහියි.
නමුත් කටු ගස් වැවී ඒවා යට කර
දැමුවා. එමනිසා එම බීජද පල දැරුවේ
නැහැ.[4] **8** නමුත් තවත් සමහර බීජ
සරු පසෙහි වැටුණා.[5] ඒවා පැළ වී,
වැඩී, පල දරන්න පටන්ගත්තා. සම-
හරකින් තිස් ගුණයක්ද සමහරකින්
හැට ගුණයක්ද තවත් සමහරකින් සිය
ගුණයක්ද බැගින් අස්වැන්න නෙළා-
ගන්න හැකි වුණා."[6] **9** ඉන් අනතු-
රුව, "මා පවසන දේට සවන් දී එය
තේරුම්ගැනීමට උත්සාහ කරන්න"[7]
කියාත් ඔහු පැවසුවේය.

**10** ඉන්පසු ඔහු තනිව සිටි අවස්-
ථාවකදී දොළොස්දෙනාද ඔවුන් සමඟ
තවත් පිරිසක්ද ඔහු පැවසූ උපමා
ගැන ඔහුගෙන් ප්‍රශ්න අසන්න පටන්-
ගත්හ.[8] **11** ඔහු ඔවුන්ට මෙසේ
කීවේය. "දෙවිගේ රාජ්‍යය පිළිබඳ පරි-
ශුද්ධ රහස[9] තේරුම්ගන්න ඔබට
අවස්ථාව ලබා දී තිබුණත් අන් අයට
ඒවා ඇසෙන්නේ උපමා කතා ලෙස
පමණයි.[10] **12** එමනිසා මා කරන
දේ ඔවුන් දැක්කත් ඔවුන්ට වැටහෙන්-
නේ නැහැ. මා පවසන දේ ඔවුන්
අසාගෙන සිටියත් එහි නියම අර්ථය
ඔවුන්ට අවබෝධ වන්නේ නැහැ. ප්‍රති-
ඵලයක් ලෙස හැරී සමාව ලබාගන්න
ඔවුන්ට කිසි කලෙක හැකි වන්නේ
නැහැ."[11] **13** ඔහු ඔවුන්ට මෙසේද
කීවේය. "ඔබට ඒ උපමාව තේරුම්-
ගන්න බැරි නම් අනික් උපමා තේ-
රුම්ගන්න ඔබට පුළුවන් කොහොමද?

---

**11** ද්වි 29:4; යෙසා 6:9; යෙරෙ 5:21; මතෙ 13:14; යොහ 12:40; ක්‍රියා 28:26.

---

**3 පරි.**
**1** මතෙ 12:29
**2** මතෙ 12:31
ලූක් 12:10
**3** මතෙ 12:32
හෙබ්‍රෙ 6:4
හෙබ්‍රෙ 6:6
හෙබ්‍රෙ 10:26
1යොහ 5:16
**4** යොහ 7:20
යොහ 10:20
**5** මතෙ 13:55
යොහ 2:12
ක්‍රියා 1:14
**6** මතෙ 12:46
ලූක් 8:19
**7** මතෙ 12:47
මාක් 6:3
ලූක් 8:20
**8** මතෙ 10:37
**9** මතෙ 12:49
රෝම 8:29
හෙබ්‍රෙ 2:11
**10** මතෙ 12:50
ලූක් 8:21
යොහ 15:14

**4 පරි.**
**11** යෙසා 9:1
**12** මතෙ 13:1
ලූක් 8:4
**13** මතෙ 13:34
**14** මතෙ 13:3
මාක් 12:38
**15** මාක් 4:14
ලූක් 8:5

**2 තීරුව**
**1** මතෙ 13:4
**2** මතෙ 13:5
මාක් 4:16
මාක් 4:17
ලූක් 8:6
**3** මතෙ 13:6
යාකො 1:11
**4** මතෙ 13:7
මාක් 4:18
මාක් 4:19
ලූක් 8:7
**5** හෙබ්‍රෙ 6:7
**6** මතෙ 13:8
මාක් 4:20
ලූක් 8:8
යොහ 15:5
කොලො 1:6
**7** හිතෝ 1:5
මතෙ 11:15
**8** හිතෝ 4:7
මතෙ 13:10
ලූක් 8:9
**9** එෆී 1:9
කොලො 1:26
**10** මතෙ 13:11
ලූක් 8:10
කොලො 4:5
1තිමෝ 3:7

**14** “වපුරන්නා වපුරන්නේ රාජ්‍යය
පිළිබඳ පණිවිඩයයි.[1] **15** එම පණිවි-
ඩය මඟ දිගේ වපුරනු ලැබුවා. එයින්
අදහස් වන්නේ ඒ පණිවිඩය ඇසූ
විගස, සාතන් ඇවිත්[2] එය ඇසූ අයගේ
සිත් තුළ තිබූ පණිවිඩය පැහැරගෙන
ගිය බවයි.[3] **16** එම පණිවිඩය ගල්
බිම්වල වපුරනු ලැබුවා කීමෙන් අද-
හස් වන්නේ සමහර අය පණිවිඩය
අසා එය ප්‍රීතියෙන් පිළිගන්නා[4] බවයි.
**17** නමුත් ඒ පණිවිඩය ඔවුන් තුළ
ගැඹුරටම මුල් බැස නැති නිසා එය
ඔවුන් තුළ පවතින්නේ කෙටි කාලය-
කටයි. පණිවිඩය පිළිගත් නිසා යම්
හිංසා හෝ පීඩා හෝ පැමිණි විගස
ඔවුන් තුළ තිබෙන විශ්වාසය දුර්-
වල වී ඔවුන් වැටී යයි.[5] **18** මෙම
පණිවිඩය කටු ගස් අතරේ වපුරනු
ලැබුවා. එයින්ද ඒ පණිවිඩය අසන
පිරිසක්[6] අදහස් වෙනවා. **19** නමුත්
පවතින මේ සමාජයේ තිබෙන දේවල්
ගැන අනවශ්‍ය ලෙස කරදර වන
නිසාත්[7] ධනය පසුපස හඹා යෑමෙන්
මුළා වන නිසාත්[8] අනිකුත් දේවල්
සඳහා දැඩි ආශාවක් ඇති කරගන්නා
නිසාත්[9] ඔවුන්ගේ සිත් තුළ තිබෙන
පණිවිඩය යටපත් වී යන අතර
ඔවුන් පල නොදරන තත්වයකට පත්
වෙනවා.[10] **20** සරු පසෙහි වපුරනු
ලැබුවා කීමෙන් අදහස් වන්නේ පණි-
විඩයට සවන් දී එය මහත් සතු-
ටකින් පිළිගෙන පල දරන අයවෙයි.
සමහරුන් තිස් ගුණයකින්ද සමහරුන්
හැට ගුණයකින්ද තවත් සමහරුන්
සිය ගුණයකින්ද පල දරනවා.”[11]

**21** ඉන්පසු ඔහු ඔවුන්ට මෙසේ
කීවේය. “කෙනෙක් පහනක් රැගෙන
එන්නේ එය බඳුනකින් වසා තබන්න
හෝ ඇඳක් යට තබන්නද? ඔහු එය
රැගෙන එන්නේ පහන් රුකක් මත
තැබීමට නොවෙයිද?[12] **22** යම් දෙ-
යක් සඟවා තබනු ලබන්නේ එය
කවදා හරි අනාවරණය වන නිසයි.
යමක් ඉතා ඕනෑකමින් රහසක්ව
තබන්නේ එයත් කවදා හරි හෙළි
කරනු ලබන නිසයි.[13] **23** මා පව-
සන දේට සවන් දී එය තේරුම්ගැනී-
මට උත්සාහ කරන්න.”[1]

**24** යේසුස් ඔවුන්ට මෙසේද
කීවේය. “ඔබ දැන් සවන් දෙන දේවල්
හොඳින් සිතට ගන්න.[2] ඔබ අනුන්
සමඟ කටයුතු කරන ආකාරය අනු-
වයි ඔවුන් ඔබ සමඟත් කට-
යුතු කරන්නේ.[3] ඔබ කරන දේට
වඩා වැඩියෙන් ඔවුන්ගෙන් ඔබට
ලැබෙයි.[4] **25** මන්ද යම් අවබෝධ-
යක් ඇති තැනැත්තාගේ අවබෝධය
තවත් වැඩි වෙයි. නමුත් අවබෝධ-
යක් නැති තැනැත්තාට තිබෙන අව-
බෝධය පවා අහිමි වෙයි.”[5]

**26** එවිට ඔහු මෙසේ කීවේය. “දෙ-
විගේ රාජ්‍යය සමාන කළ හැකි තවත්
උපමාවක් මම ඔබට කියන්නම්. එක්-
තරා මිනිසෙක් බීජ වපුරයි.[6] **27** ඔහු
සෑම දිනකම සාමාන්‍ය පරිදි රාත්‍රි-
යෙහි නිදාගෙන උදෑසනින් අවදි වෙයි.
ඒ අතරතුර බීජය පැළ වී උසට
වැඩී ඇති ආකාරය ඔහු දකියි. නමුත්
එය සිදු වුණේ කොහොමද කියා ඔහු
දන්නේ නැහැ.[7] **28** මුලින්ම පො-
ළොවෙන් මතු වන්නේ කුඩා අංකු-
රයක්. ඉන්පසුව ක්‍රමානුකූලව ඒ
අංකුරය පැළයක් බවට වැඩී එහි
කරල් හටගනී. අන්තිමට සම්පූර්ණ-
යෙන් පැසී ඇති ධාන්‍ය කරල් එහි
දක්නට ලැබෙයි. **29** ධාන්‍ය සම්-
පූර්ණයෙන්ම පැසුණු වහාම අස්-
වැන්න නෙළීමේ කාලය පැමිණ
තිබෙන නිසා එම මිනිසා දෑකැත්-
තෙන් එය කපාගනියි.”

**30** ඔහු ඊළඟට පැවසුවේ මෙ-
සේයි. “අපි දෙවිගේ රාජ්‍යය සමාන
කරන්නේ කුමකටද? ඒ ගැන පැහැ-
දිලි කිරීමට භාවිත කළ හැක්කේ
මොන වගේ උපමාවක්ද?[8] **31** එය
අබ ඇටයකට සමානයි. අබ ඇට-
යක් පොළොවෙහි වපුරන විට එය
පොළොවෙහි තිබෙන සියලුම බීජව-
ලට වඩා කුඩායි.[9] . . . **32** නමුත්
එය වැපුරූ පසු එය වැඩී සියලුම
පලා ගස්වලට වඩා විශාල වෙයි. එහි
හටගන්නා විශාල අතුවල[10] අහසේ

**4 පරි.**
**1** මතෙ 13:19, 1පේත්‍ර 1:25
**2** 2කොරි 2:11, 1පේත්‍ර 5:8
**3** හෙබ්‍රෙ 2:1
**4** මතෙ 13:20, ලූක් 8:13
**5** මතෙ 13:21
**6** මතෙ 13:22, ලූක් 8:14
**7** මතෙ 6:25, මතෙ 24:38
**8** හිතෝ 23:5, මාක් 10:23, ලූක් 18:24, 1තිමෝ 6:9, 2තිමෝ 4:10
**9** 1යොහ 2:16
**10** මතෙ 13:22, ලූක් 8:14
**11** මතෙ 13:23, රෝම 7:4, කොලො 1:10, 2පේත්‍ර 1:8
**12** මතෙ 5:15, ලූක් 11:33
**13** මතෙ 10:26, ලූක් 12:2, ක්‍රියා 4:20, 1තිමෝ 5:25, 1යොහ 1:2

**2 තීරුව**
**1** හිතෝ 1:5, මතෙ 11:15, එළි 2:7
**2** ලූක් 8:18, යාකො 1:25
**3** හිතෝ 11:25
**4** මතෙ 7:2, ලූක් 6:38, 2කොරි 9:6
**5** මතෙ 13:12, මතෙ 25:23, ලූක් 8:18, ලූක් 19:26
**6** මතෙ 13:24
**7** උත් 1:11, ගලා 6:7
**8** මතෙ 13:31, ලූක් 13:18
**9** මතෙ 13:32, ලූක් 13:19
**10** දානි 4:12, දානි 4:21

කුරුල්ලන් ලැගුම් ගෙන[1] එහි සෙව-
ණෙහි උන් වාසය කරයි."[2]
**33** ඔවුන්ට තේරුම්ගත හැකි
තරම අවබෝධ කරගත් ඔහු, එවැනි
උපමා කිහිපයක්ම[3] යොදාගනිමින්
රාජ්‍යය පිළිබඳ පණිවිඩය ගැන කතා
කිරීමට පුරුදු වී සිටියේය. **34** ඔහු
උපමාවක් නැතුව ඔවුන්ට කතා
කළේ නැත. පසුව ඔහු තම ගෝල-
යන්ට පෞද්ගලිකව ඒ සියල්ල පහදා
දුන්නේය.[4]
**35** එදින අඳුර වැටීගෙන එද්දී,
"අපි එගොඩට[5] යමු" කියා යේ-
සුස් ඔවුන්ට පැවසුවේය. **36** එතැන
රැස්ව සිටි සෙනඟව පිටත් කර
යැවූ ගෝලයෝ, ඒ වන තුරු ඔහු
සිටි ඔරුවේම නැඟී එගොඩට යාත්‍රා
කළෝය. තවත් ඔරු කිහිපයක්ද
ඔවුන් පසුපස ගියේය.[6] **37** එවිට
ඉතා බිහිසුණු කුණාටුවකට ඔවුන්
හසු විය. සැඩ සුළං නිසා කැලඹුණු
රළ වේගයෙන් ඔරුවට ගසන්න
පටන්ගත්තේය. කුණාටුව කොත-
රම් බිහිසුණුද කියනවා නම් දියෙන්
ඔරුව පිරී එය ගිලෙන්න ආසන්න
විය.[7] **38** නමුත් ඔරුවේ අවරෙහි
කොට්ටයක හිස තබාගෙන යේසුස්
නිදාගෙන සිටියේය. ඔවුහු ඔහුව අවදි
කර, "ගුරුතුමනි, අපිව ගිලෙන්නයි
යන්නේ.[8] ඔබට ඒ ගැන ගානක්වත්
නැද්ද" කියා ඔහුට පැවසූහ. **39** එය
අසා අවදි වූ ඔහු සුළඟටත් මුහුද-
ටත් තදින් කතා කරමින්, "නිශ්-
ශබ්ද වන්න! නිශ්චල වන්න"[9] කියා
පැවසුවේය. එවිට සැඩ සුළං නතර
වී, මහත් නිශ්චලතාවක් ඇති විය.[10]
**40** එවිට ඔහු, "ඇයි ඔබ මේ තරම්
භය වෙලා? ඔබට තවමත් කිසිම
විශ්වාසයක් නැද්ද" කියා ඔවුන්ගෙන්
ඇසුවේය. **41** ඇත්තෙන්ම ඒ අවස්-
ථාවේදී ඔවුන් තුළ මහත් බියක් ඇති
විය. එහෙයින් ඔවුහු, "සුළඟත් මුහු-
දත් ඔහුට කීකරු වෙනවා. ඇත්-
තටම මේ කවුද"[11] කියා පවසමින්
එකිනෙකා අතර කතා කරන්න
පටන්ගත්තෝය.

4 පරි.
1 ගීතා 104:12 එස 31:6
2 මතෙ 13:34
3 ගීතා 78:2
4 මතෙ 13:11 මතෙ 13:35 මාක් 4:11
5 මතෙ 8:18
6 මතෙ 8:23 ලූක් 8:22
7 මතෙ 8:24 ලූක් 8:23
8 මතෙ 8:25 ලූක් 8:24
9 ගීතා 89:9
10 මතෙ 8:26 ලූක් 8:24
11 මතෙ 8:27 ලූක් 8:25 යොහ 6:19

2 තීරුව

5 පරි.
1 මතෙ 8:28 ලූක් 8:26
2 ලූක් 8:27
3 ක්‍රියා 16:17
4 1රාජා 17:18 යාකො 2:19
5 මතෙ 8:29
6 මතෙ 26:63
7 ක්‍රියා 16:18
8 ලූක් 8:30
9 මතෙ 12:45
10 ලූක් 8:31
11 ලෙවී 11:7 ද්වි 14:8
12 මතෙ 8:30 ලූක් 8:32

**5** ඔවුහු ගලීල මුහුදෙන් එගොඩ
වී ගෙරසීනයන්ගේ පළාතට
ගියහ.[1] **2** ඔහු ඔරුවෙන් බැස ආ
විගස සොහොන් ගෙවල් අතර ගැව-
සුණු මිනිසෙක් ඔහු ළඟට පැමිණි-
යේය. ඒ මිනිසාට භූතයෙකු ආවේශ
වී තිබිණ.[2] **3** ඔහු නිතරම පාහේ
ගැවසුණේ සොහොන් ගෙවල් අත-
රය. මේ දක්වා ඔහුව දම්වැල්ව-
ලින් වුවත් බැඳ මෙල්ල කරගැනීමට
කිසිවෙකුට නොහැකි විය. **4** මන්ද
බොහෝ වර විලංගු යොදා දම්වැල්ව-
ලින් ඔහුව බඳිනු ලැබුවත් ඔහු දම්-
වැල් කඩා දමා, විලංගු සුනුවිසුනු
කර දැමුවේය. කිසි කෙනෙකුට ඔහුව
මෙල්ල කරන්න ශක්තියක් නොති-
බිණ. **5** දිවා රෑ දෙකෙහිම නොක-
ඩවා මොරගසමින් සිටි මේ මිනිසා
ගල්වලින් තමාගේ සිරුර කපාගනි-
මින් සොහොන් ගෙවල්වලත් කඳුව-
ලත් ගැවසෙමින් සිටියේය. **6** නමුත්
ඈතක සිට යේසුස්ව දුටු ඔහු දුවගෙන
ඇවිත් ඔහුගේ පාමුල දණින් වැටු-
ණේය. **7** ඔහු මහත් හඬකින් මො-
රගසා,[3] "මහෝත්තම දෙවිගේ පුත්
යේසුස්,[4] ඔබ හා මා අතර කිසිම
ගනු දෙනුවක් නැහැ. මට වධ දෙන්-
නේ නැහැ කියා[5] දෙවිගේ නාම-
යෙන් මට දිවුරන්න"[6] කියා කීවේය.
**8** ඔහු එසේ කීවේ, "මේ මිනිසාගෙන්
පිටතට එන්න"[7] කියා යේසුස් එම
භූතයාට පැවසූ නිසාය. **9** යේසුස්,
"ඔබේ නම මොකක්ද" කියා ඔහුගෙන්
ඇසුවේය. එවිට ඔහු මෙසේ පිළිතුරු
දුන්නේය. "බොහෝදෙනෙක් සිටින
නිසා[8] අපිට කියන්නේ සේනාංකය[9]
කියලයි." **10** එමෙන්ම ඔහු කිහිප
වතාවක්ම බැගෑපත් වෙමින් යේසුස්-
ගෙන් ඉල්ලුවේ එම භූතයන්ව මේ
ප්‍රදේශයෙන් පිට නොකරන ලෙසයි.[10]
**11** මේ අතරතුර එක්තරා කන්දක
විශාල ඌරු රැළක්[11] කෑම කමින්
සිටියහ.[12] **12** එහෙයින් ඔවුහු, "ඒ
ඌරු රැළට වැහෙන්න අපට ඉඩ
දෙන්න" කියා ඔහුගෙන් බැගෑපත්ව
ඉල්ලා සිටියහ. **13** ඔහු ඔවුන්ට ඒ

සඳහා අවසර දුන් විට ඒ භූතයෝ
මිනිසාගෙන් පිටතට ඇවිත් ඌරන්ට
වැහුණෝය. දෙදහසක් පමණ වූ ඒ
ඌරු රැළ වේගයෙන් දුව ගොස් එකා
පිට එකා ප්‍රපාතයකින් වැටී දියේ
ගිලී මිය ගියෝය.[1] **14** එවිට එම
රැළ රකබලා ගත් අය දුව ගොස්
නුවරේ වැසියන්ටත් පිටිසර පළාත්-
වල සිටි අයටත් සිදු වූ දේ ගැන
දැනුම් දුන්නෝය. සිදු වූ දේ කුමක්-
දැයි බැලීමට මිනිස්සු පැමිණියහ.[2]
**15** ඔවුහු යේසුස් ළඟට පැමිණි විට
භූතයන් ආවේශ වූ මිනිසා එනම්, භූත-
යන් සේනාංකය වැහී සිටි ඒ මිනිසා
ඇඳුම් ඇඳගෙන හොඳ සිහිකල්පනාව
ඇතුව ඉඳගෙන සිටිනවා දැක බිය
වූහ. **16** එම සිද්ධිය දුටු අය භූතයන්
ආවේශ වී සිටි ඒ මිනිසා සුව වූ ආකා-
රය ගැනත් ඌරන්ට සිදු වූ දේ ගැනත්
ඔවුන්ට විස්තර කළෝය. **17** එවිට
ඔවුහු තම ප්‍රදේශවලින් පිටත් වී යන
ලෙස ඔහුගෙන් බැගෑපත්ව ඉල්ලා
සිටියහ.[3]

**18** එතැනින් පිටත් වීමට යේසුස්
ඔරුවට නඟිනවාත් සමඟම කලින්
භූතයන් ආවේශ වී සිටි මිනිසා, තමා-
ටත් ඔහු සමඟ එන්න ඉඩ දෙන්න
කියා ඔහුගෙන් බැගෑපත්ව ඉල්ලු-
වේය.[4] **19** නමුත් යේසුස් ඊට ඉඩ
නොදී, "ඔබේ ගෙදර ගිහින්, යෙහෝවා
දෙවි ඔබ වෙනුවෙන් කළ සියලු දේ[5]
ගැනත් ඔහු ඔබට පෙන්වූ දයාව[6]
ගැනත් ඔබේ නෑදෑයන්ට කියන්න"[7]
කියා කීවේය. **20** එවිට ඔහු එතැ-
නින් පිටත් වී, යේසුස් තමන් වෙනු-
වෙන් කළ සියල්ල ගැන නුවරවල්
දසයකින් යුත් දෙකපොලිසය[8] පුරාම
ප්‍රකාශ කරන්න පටන්ගත්තේය. එය
ඇසූ සියලුදෙනාම පුදුම වූහ.[9]

**21** යේසුස් නැවතත් ඔරුවෙන්
එගොඩට ගිය විට මහත් සමූහයක්
වෙරළෙහි සිටි ඔහුව හමු වීමට රැස්
වූහ.[10] **22** එවිට සිනගෝගයේ සේ-
වය කළ නිලධාරියෙකු වූ යායිරස්
නම් තැනැත්තෙක් ඇවිත් ඔහුව දැක
ඔහුගේ පාමුල වැටී,[11] **23** "මගේ චූටි
දුව දරුණු අසනීපයකින් පෙළෙනවා.
අනේ ඔබට පුළුවන්ද ඇවිත් ඇය පිට
ඔබේ අත තියන්න.[1] එවිට ඇයට
සුවය ලැබිලා ඇය ජීවත් වෙයි"[2] කියා
බොහෝ වර ඔහුගෙන් බැගෑපත්ව
ඉල්ලා සිටියේය. **24** එවිට යේසුස්
ඔහු සමඟ ගියේය. විශාල සෙනඟක්
තෙරපෙමින් ඔහු පසුපස ගියහ.[3]

**25** මේ අතර අවුරුදු දොළහක්
පුරා[4] ලේ ගැලීමක්[5] නිසා රෝගී
වූ ස්ත්‍රියක් සිටියාය. **26** මේ වන
විට ඇය බොහෝ වෛද්‍යවරුන්-
ගෙන්[6] ප්‍රතිකාර ලබා තිබිණ. ඇය
සතු සෑම දෙයක්ම වියදම් කර තිබු-
ණේ ඒ අසනීපය වෙනුවෙනි. නමුත්
එයින් සුවය ලබනවා වෙනුවට බො-
හෝ සෙයින් ඇය දුක් වින්ද අතර
ඇගේ තත්වය තවත් දරුණු අතට
හැරී තිබිණ. **27** ඇයට යේසුස් ගැන
ආරංචි වූ විට ඇය සමූහයා මැදින් ඔහු-
ගේ පිටුපසින් ඇවිත් ඔහුගේ වස්ත්‍රය
ඇල්ලුවාය.[7] **28** මන්ද "ඔහුගේ වස්-
ත්‍රය ඇල්ලුවත් ඇති. ඒකෙන් මාව
සුව වෙයි"[8] කියා ඇය නිරතුරුව සිතු-
වාය. **29** ඒ මොහොතේදීම ඇගේ
ලේ ගැලීම නතර වූ අතර ඒ බරපතළ
රෝගයෙන් තමන් සුව වූ බව ඇයට
දැනිණ.[9]

**30** යේසුස්ද ඒ මොහොතේදී
තමන්ගෙන් ශක්තිය[10] පිට වූ බව
තේරුම්ගත්තේය. එහෙයින් සමූහ-
යාගෙන් වට වී සිටි ඔහු පිටුප-
සට හැරී, "මාගේ වස්ත්‍රය ඇල්ලුවේ
කවුද"[11] කියා ඇසුවේය. **31** එවිට
ඔහුගේ ගෝලයෝ, "අප මෙතන ඉන්-
නේ හොඳටම තෙරපෙමින් කියලා
ඔබට පෙනෙනවා නේද?[12] ඉතින්
'මාව ඇල්ලුවේ කවුද' කියා ඔබ
අහන්නේ ඇයි" කියා ඔහුගෙන් ඇසූහ.
**32** කෙසේවෙතත් ඒ දේ කළ
තැනැත්තියව දැකගැනීම සඳහා ඔහු
වටපිට බලමින් සිටියේය. **33** එවිට
තමන්ට සිදු වූ දේ හොඳින්ම දැනගත්
ස්ත්‍රිය භයින් වෙවුලමින් ඔහු ළඟට
ඇවිත් දණින් වැටී, කිසිවක් නො-
සඟවා ඇත්ත කීවාය.[13] **34** ඔහු

**5 පරි.**
1 මතෙ 8:32 ලූක් 8:33
2 මතෙ 8:33 ලූක් 8:35
3 මතෙ 8:34 ලූක් 8:37 ක්‍රියා 16:39 1කොරි 2:14
4 ලූක් 8:38
5 නික් 18:8
6 රෝම 9:15 එෆි 2:4
7 මාක් 6:4
8 මාක් 7:31
9 ලූක් 8:39
10 ලූක් 8:40
11 ලූක් 8:41

**2 තීරුව**
1 මාක් 6:5 ලූක් 4:40 ක්‍රියා 9:17
2 මතෙ 9:18
3 මතෙ 9:19 ලූක් 8:42
4 මතෙ 9:20 ලූක් 8:43
5 ලෙවී 15:25
6 ගීතා 108:12
7 මතෙ 14:36 මාක් 6:56
8 ලෙවී 6:27 මතෙ 9:21
9 ලූක් 8:44
10 ලූක් 5:17 ලූක් 6:19
11 ලූක් 8:46
12 ලූක් 8:45
13 ලූක් 8:47

ඇයට මෙසේ පැවසුවේය. "දුවේ, ඔබ සුව වුණේ ඔබ තුළ තිබෙන විශ්වාසය නිසයි. සමාදානයෙන් යන්න.[1] ඔබේ බරපතළ රෝගය දැන් සුව වෙලා."[2]

**35** ඔහු කතා කරමින් සිටියදීම, සිනගෝගයේ සේවය කළ ප්‍රධාන නිලධාරියාගේ ගෙදරින් කිහිපදෙනෙක් ඇවිත්, "ගුරුතුමාට තවත් කරදර කරන්න එපා. ඔබේ දුව මිය ගියා" කියා කීවෝය.[3] **36** ඔවුන් පැවසූ දේ යේසුස්ට ඇසී, "භය වෙන්න එපා. ඔබේ විශ්වාසය නැති කරගන්නත් එපා"[4] කියා සිනගෝගයේ නිලධාරියාට කීවේය. **37** ඔහු පේතෘස්ට, යාකොබ්ට සහ යාකොබ්ගේ සහෝදරයා වූ යොහන්ට හැර වෙන කිසිවෙකුට තමන් සමඟ එන්න ඉඩ නොදුන්නේය.[5]

**38** ඔවුහු සිනගෝගයේ නිලධාරියාගේ ගෙදරට පැමිණියහ. එවිට ඔහු දුටුවේ බොහෝදෙනෙකු කලබල වී සෝෂා කරන ආකාරයයි. ඒ අතර සමහරු හඬමින් සහ බොහෝ සෙයින් වැලපෙමින් සිටියෝය. **39** ඔහු නිවසට ඇතුල් වූ විට, "ඔබ කලබල වී සෝෂා කරන්නෙත් හඬන්නෙත් ඇයි? කුඩා දැරිය මිය ගිහින් නැහැ. ඇය නිදාගෙන සිටිනවා විතරයි" කියා ඔවුන්ට කීවේය.[6] **40** එවිට ඔවුහු උපහාසාත්මක ලෙස ඔහුට සිනාසුණෝය. නමුත් ඔහු ඒ සියල්ලන්වම එතැනින් පිටත් කර, කුඩා දැරියගේ පියාද මවද තමන් සමඟ සිටි අයවද කැඳවාගෙන කුඩා දැරිය සිටි තැනට ඇතුල් වූයේය.[7] **41** ඔහු කුඩා දැරියගේ අත ගෙන, "තලිතා කූමි" කියා කීවේය. එහි අර්ථය නම්, "දුවේ, දැන් නැඟිටින්න" කියායි.[8] **42** දොළොස් හැවිරිදි ඒ දැරිය ඒ මොහොතේදීම නැඟිට ඇවිදින්න පටන්ගත්තාය. එය දුටු විගස දෙමාපියෝ ඉමහත් ප්‍රීතියකින් ඉපිල ගියෝය.[9] **43** දැරියට කෑමට යමක් දෙන ලෙස පැවසූ ඔහු, සිදු වූ දේ ගැන කිසිවෙකුට දැනගැනීමට ඉඩ නොතබන ලෙස කිහිප වරක්ම ඔවුන්ට අවවාද කළේය.[10]

**5 පරි.**
1 විනි 18:6; 1සාමු 1:17; ලූක් 7:50; ලූක් 8:48
2 මතෙ 9:22
3 ලූක් 8:49
4 2ලේක 20:20; ලූක් 8:50; යොහ 11:40
5 මතෙ 17:1; මතෙ 26:37
6 මතෙ 9:23; ලූක් 8:52; යොහ 11:11
7 මතෙ 9:24; ලූක් 8:51; ලූක් 8:53
8 මතෙ 9:25; ලූක් 7:14; ලූක් 8:54; ක්‍රියා 9:40
9 ලූක් 8:55
10 මාක් 1:44; මාක් 7:36

**2 තීරුව**

**6 පරි.**
1 මතෙ 13:54; ලූක් 4:16
2 මතෙ 13:54; යොහ 6:42; යොහ 7:15
3 යෙසා 53:2; 1කොරි 1:23
4 යොහ 6:42
5 ගලා 1:19
6 මාක් 3:31
7 මතෙ 13:56
8 යෙරෙ 11:21
9 මතෙ 13:57; ලූක් 4:24; යොහ 4:44
10 මතෙ 9:35; මතෙ 10:23; ලූක් 13:22
11 දේශ 4:9; ලූක් 10:1
12 මතෙ 10:1; ලූක් 9:1
13 රෝම 15:27; ගලා 6:6
14 මතෙ 10:9; ලූක් 9:3
15 මතෙ 10:10; ක්‍රියා 12:8

**6** එතැනින් පිටත්ව ගිය ඔහු සිය ගෝලයන් සමඟ තම ගමට ගියේය.[1] **2** සබත් දවස පැමිණි විට ඔහු සිනගෝගයේ උගන්වන්න පටන්ගත්තේය. සවන් දෙමින් සිටි අයගෙන් වැඩිදෙනෙක් පුදුමයට පත් වී, "මේ මිනිසාට මේ තරම් ප්‍රඥාවක් කොහෙන්ද?[2] ඔහුට කොහොමද මෙතරම් බලවත් ක්‍රියා කරන්න තරම් බලයක් ලැබුණේ? මේ වගේ බලයක් ඔහුටම දී තිබෙන්නේ ඇයි? **3** ඔහු නිකම්ම නිකම් වඩුවෙක්.[3] ඔහු මරියාගේ පුතා[4] නේද? ඔහු යාකොබ්,[5] යෝසෙප්, යූදස් සහ සීමොන්ගේ සහෝදරයා[6] නේද? ඔහුගේ සහෝදරියනුත් මේ ගමේම අය නේද" කියා පවසමින් ඔහුව ප්‍රතික්ෂේප කළෝය.[7] **4** එවිට යේසුස් ඔවුන්ට මෙසේ පැවසුවේය. "අනාගතවක්තෘවරයෙකුට ගෞරවය නොලැබෙන්නේ තමාගේම ගමේදීත්[8] තමාගේම නෑදෑයන් අතරේදීත් තමාගේම ගෙදරදීත්[9] පමණයි." **5** එහෙයින් ලෙඩින් සිටි කිහිපදෙනෙකු මත තම අත් තබා ඔවුන්ව සුව කළා මිස ඔහුට එහිදී වෙන කිසි බලවත් ක්‍රියාවක් කිරීමට ඉඩකඩ නොලැබිණ. **6** ඔවුන් තුළ විශ්වාසයක් නොතිබීම ගැන ඔහු පුදුම විය. එහෙයින් ඔහු අවට ගම්වල සංචාරය කරමින් එහි ඉගැන්වූවේය.[10]

**7** ඔහු දොළොස්දෙනාව කැඳවා, ඔවුන්ව දෙදෙනා බැගින්[11] යැවීමට පියවර ගත්තේය. භූතයන්ව පලවාහැරීමට[12] ඔවුන්ට බලයද දුන්නේය. **8** ඔහු ඔවුන්ට දුන් මඟ පෙන්වීම් මෙසේය. එනම් ගමන සඳහා සැරයටියක් හැර වෙන කිසිම දෙයක් රැගෙන නොයන්න. රොටිවත් කෑම මල්ලක්වත්[13] රැගෙන නොයන්න කියාත් තම ඉඟටි පටියේ පසුම්බිවල තඹ කාසි නොදමන්න[14] කියාත් ඔහු පැවසුවේය. **9** මීට අමතරව පාවහන් පැළඳ යන ලෙසත් ඇතුල් වස්ත්‍ර දෙකක් රැගෙන නොයන* ලෙසත්[15] ඔහු ඔවුන්ට පැව-

මාක් **6:9*** මූ.අ., "පැළඳ නොගන්නා."

සුවේය. **10** ඔහු ඔවුන්ට මෙසේද
කීවේය. “ඔබ යම් ප්‍රදේශයකට ගොස්
නිවසකට ඇතුල් වූ පසු[1] එහි සිටින
කෙනෙක් ඔබව පිළිගත්තොත් එම
නිවසේ නවාතැන් ගන්න.[2] ඒ ප්‍රදේශ-
යේ සේවය කර අවසන් වන තුරුම
එහි නැවතී සිටින්න. **11** යම් තැන-
කදී ඔවුන් ඔබව පිළිගන්නේවත් ඔබ
කියන දේ අසන්නේවත් නැත්නම් ඔබ
එතැනින් පිට වූ විට ඔවුන්ට සාක්ෂි-
යක් ලෙස ඔබේ පාදවල තිබෙන දූවිලි
ගසා දමන්න.”*[3] **12** ඒ අනුව ඔවුහු
පිටත් වී, පසුතැවිලි වෙන්න[4] කියා
ජනයාට දේශනා කළහ. **13** ඔවුහු
බොහෝ භූතයන්ව දුරු කර,[5] ලෙඩින්
සිටි බොහෝදෙනෙකුට තෙල් ආලේප
කර[6] සුව කළහ.[7]

**14** යේසුස්ගේ නාමය ප්‍රසිද්ධ වූ
ආකාරය හෙරොද් රජුටත් ආරංචි විය.
මන්ද, “බව්තීස්ම කරන්නා වූ යො-
හන් මරණයෙන් නැඟිටලා. ඔහුට මේ
වගේ බලවත් ක්‍රියා කරන්න හැකි
වී තිබෙන්නේ ඒ නිසයි” කියා සම-
හරු පවසමින් සිටියහ.[8] **15** නමුත්
තවත් අය, “මොහු එලියා”[9] කියාත්
තවත් සමහරු, “පෙර සිටි අනාග-
තවක්තෘවරුන් මෙන් මොහුත්
අනාගතවක්තෘවරයෙක්”[10] කියාත්
පවසමින් සිටියහ. **16** හෙරොද්ට ඒ
දේවල් ගැන ආරංචි වූ විට, “මේ මා
විසින් හිස කපා දැමූ යොහන්ම විය
යුතුයි. ඔහු මරණයෙන් නැඟිටලා”[11]
කියා කීවේය. **17** එයට හේතු වූ
සිද්ධිය මෙයයි. හෙරොද් තම සහෝ-
දරයා වන පිලිප්ගේ භාර්යාව වන
හෙරෝදියස්ව විවාහ කරගත්තේය.
ඉන්පසු ඔහු ඇයව සතුටු කිරී-
මට මිනිසුන් යවා යොහන්ව
අත්අඩංගුවට ගෙන ඔහුව බැඳ සිර-
ගෙයි දැමුවේය.[12] **18** මන්ද, “ඔබේ
සහෝදරයාගේ භාර්යාව ඔබේ භාර්-
යාව ලෙස තබාගැනීම නීත්‍යානුකූල
දෙයක් නොවෙයි”[13] කියා යොහන්
කිහිප වරක් හෙරොද්ට කියා තිබිණ.

**19** එහෙයින් හෙරෝදියස් ඔහු කෙ-
රෙහි වෛර බැඳගත් අතර[1] ඔහුව
මරා දැමීමට අවශ්‍ය වුණත් එසේ කිරී-
මට අවස්ථාවක් ඇයට නොලැබිණ.[2]
**20** යොහන් ශුද්ධ හා ධර්මිෂ්ඨ මිනි-
සෙකු[3] බව හෙරොද් දැන සිටි නිසා
ඔහුට යම් අනතුරක් කරන්න ඔහු
බිය විය.[4] ඔහු යොහන් කියන දේව-
ලට නිතරම පාහේ සවන් දුන් අතර[5]
එයින් මහත් ආස්වාදයක්ද ලැබුවේය.
එහෙයින් ඔහු යොහන් සම්බන්ධ-
යෙන් කවර තීරණයක් ගත යුතුද
කියා සිතමින් ළත විය.

**21** නමුත් හෙරොද් තමාගේ උපන්
දිනය[6] සැමරීමට තම උසස් නිල-
ධාරීන් වෙනුවෙන්ද සේනාධිපතීන්
වෙනුවෙන්ද ගලීලයේ ප්‍රධානීන් වෙනු-
වෙන්ද සන්ධ්‍යා භෝජනයක් පිළියෙල
කළ විට හෙරෝදියස් බලබලා සිටි
අවස්ථාව උදා විය.[7] **22** ඒ උත්සව-
යේදී හෙරෝදියස්ගේ දුව ඇවිත් සිය-
ලුදෙනා වෙනුවෙන් නැටුවාය. ඇගේ
නැටුමෙන් හෙරොද් සහ ඔහු සමඟ
ඉඳගෙන සිටි අය[8] මහත් වින්දනයක්
ලැබූ නිසා රජ තරුණියට මෙසේ පැව-
සුවේය. “දුව කැමති ඕනෑම දෙයක්
ඉල්ලන්න. මම ඒ දේ දුවට දෙන්නම්.”
**23** ඔහු දිවුරමින් මෙසේද පැවසුවේය.
“මගෙන් ඉල්ලන ඕනෑම දෙයක් මම
දෙන්න කැමතියි.[9] මගේ රාජ්‍යයෙන්
භාගයක් වුණත් මම ඔබට දෙනවා.”[10]
**24** එවිට ඇය තම මව වෙතට
ගොස්, “මම මොනවාද ඉල්ලන්-
නේ” කියා ඇගෙන් ඇසුවාය. “බව්-
තීස්ම කරන්නා වන යොහන්ගේ හිස
ඉල්ලන්න”[11] කියා ඇය පැවසුවාය.
**25** ඇය ඉක්මනින්ම රජු වෙතට දුව
ගොස්, “ඔබ යොහන් බව්තීස්තගේ
හිස තැටියක තබා මට දැන්මම දෙ-
නවාට මම කැමතියි” කියා කීවාය.
**26** එය අසා රජුට මහත් දුකක් දැනු-
ණත් තමා කළ දිවුරුම නිසාත්
කෑමට ඉඳගෙන සිටි අය ඉදිරියේ අප-
හසුතාවකට පත් වෙන්න අකමැති වූ
නිසාත් ඇගේ ඉල්ලීම ඉටු කිරීමට

**6 පරි.**
1 මතෙ 10:11
2 ලූක් 9:4
3 මතෙ 10:14 ලූක් 10:10 ක්‍රියා 13:51
4 ක්‍රියා 2:38 ක්‍රියා 3:19
5 ලූක් 10:17
6 යාකො 5:14
7 ලූක් 9:6
8 මතෙ 14:1 ලූක් 9:7
9 මාක් 8:28
10 මතෙ 16:14 ලූක් 9:8
11 ලූක් 9:9
12 මතෙ 14:3 ලූක් 3:19
13 ලෙවී 18:16 ලෙවී 20:21 මතෙ 14:4 හෙබ්‍රෙ 13:4

**2 තීරුව**
1 ලෙවී 19:18
2 ගීතා 37:32 මතෙ 14:5
3 මතෙ 11:11
4 මතෙ 21:26
5 ක්‍රියා 24:24
6 උත් 40:20
7 මතෙ 14:6
8 මාක් 2:15
9 එස්ත 5:6 එස්ත 7:2
10 ලෙවී 5:4 මතෙ 14:7
11 හිතෝ 12:10 මතෙ 14:10

මාක් **6:11*** මතෙ 10:14හි පාදසටහන බලන්න.

ඔහු පියවර ගත්තේය.[1] **27** එහෙ-
යින් ඔහු ආරක්ෂක භටයෙකුව වහාම
පිටත් කරමින් යොහන්ගේ හිස ගෙන
එන මෙන් ඔහුට අණ කළේය. ඔහු
සිරගෙයට ගොස් යොහන්ගේ හිස ගසා
දැමුවේය.[2] **28** පසුව එය තැටියක
තබා තරුණියට ගෙනැවිත් දෙන ලදි.
තරුණිය එය ඇගේ මවට දුන්නාය.[3]
**29** සිදු වූ දේ යොහන්ගේ ගෝලයන්ට
ආරංචි වූ විට ඔවුහු ඇවිත් ඔහුගේ
මළ සිරුර රැගෙන සොහොන් ගෙයක
තැන්පත් කළහ.[4]

**30** මේ අතර යේසුස්ගේ නියෝ-
ජිතයන්* දොළොස්දෙනා ඔහු ඉදි-
රියට පැමිණ, තමන් කළ සියල්ල
ගැනද තමන් ඉගැන්වූ සියල්ල ගැනද
ඔහුට දැන්වූහ.[5] **31** ඔහු ඔවුන්ට,
"එන්න, අපි පාළු තැනකට යමු.[6]
අපිට පුළුවන් ටිකකට විවේක ගන්න"[7]
කියා කීවේය. මන්ද බොහෝදෙ-
නෙක් ඔවුන් වටා සිටි නිසා ඔවුන්ට
කෑම කන්නවත් විවේකයක් තිබුණේ
නැත.[8] **32** එහෙයින් විවේක සුව-
යෙන් සිටිය හැකි පාළු තැනකට ඔවුහු
ඔරුවෙන් පිටත්ව ගියහ.[9] **33** ඔවුන්
එසේ පිටත්ව යනවා ජනයා දුටු-
වේය. ඒ ගැන තවත් බොහෝදෙනෙ-
කුටද ආරංචි විය. සියලු නුවරවලින්
පැමිණි ඔවුහු දුව ගොස් ඔවුන්ටත්
කලින් ඒ පාළු තැනට පැමිණියෝය.[10]
**34** ඔහු ගොඩ බැස්ස විට මහත්
සමූහයක් සිටිනවා දුටුවේය. ඔවුන්
එඬේරෙකු නැති බැටළුවන් මෙන්[11]
සිටි නිසා ඔහුට ඔවුන් ගැන මහත්
අනුකම්පාවක් ඇති විය.[12] එහෙයින්
ඔහු ඔවුන්ට බොහෝ දේ උගන්වන්න
පටන්ගත්තේය.[13]

**35** සවස් වූ නිසා ඔහුගේ ගෝ-
ලයෝ ඔහු ළඟට ඇවිත්
මෙසේ කීවෝය. "දැන් හොඳටම
හවස් වෙලා.[14] අපි ඉන්නෙත් හරිම
පාළු තැනක. **36** සෙනඟට කෑම
අවශ්‍යයි. ඒ නිසා ඔවුන්ට දැන් යන්න
දුන්නොත් හොඳයි. එතකොට ළඟ-

මාක් **6:30*** හෝ, "යවනු ලැබූවන්."

**6 පරි.**
**1** මතෙ 14:9
**2** මතෙ 14:10
**3** මතෙ 14:11
**4** මතෙ 14:12 ක්‍රියා 8:2
**5** ලූක් 9:10
**6** මතෙ 14:13
**7** මතෙ 11:29
**8** මාක් 3:20
**9** යොහ 6:1
**10** ලූක් 9:11 යොහ 6:2
**11** 1රාජා 22:17 යෙසා 53:6 එස 34:5 මතෙ 9:36
**12** මීකා 6:8 මතෙ 9:36 මතෙ 14:14 හෙබ්‍රෙ 4:15
**13** යෙසා 61:1 ලූක් 9:11
**14** මතෙ 14:15 ලූක් 9:12

**2 තීරුව**
**1** යොහ 6:5
**2** ගණන් 11:13 2රාජා 4:43 මතෙ 15:33 යොහ 6:7
**3** මතෙ 14:17 ලූක් 9:13 යොහ 6:9
**4** මතෙ 15:35 1කොරි 14:40
**5** මතෙ 14:19 යොහ 6:10
**6** ලූක් 9:14
**7** 1සාමු 9:13 ලූක් 24:30 1තිමෝ 4:4
**8** මතෙ 26:26 මාක් 8:6 ක්‍රියා 27:35
**9** මතෙ 14:20 ලූක් 9:17 යොහ 6:12
**10** මතෙ 14:21 යොහ 6:13
**11** මතෙ 14:22 යොහ 6:14
**12** මතෙ 6:6 මතෙ 14:23 මාක් 1:35 ලූක් 6:12

පාත ගම් පළාත්වලට ගිහින් කෑමට
මොනව හරි දෙයක් මිල දී ගන්න
ඔවුන්ට පුළුවන්."[1] **37** එවිට ඔහු
ඔවුන්ට මෙසේ පිළිතුරු දුන්නේය.
"ඔවුන්ට මොනව හරි කන්න දෙන්න
ඔබට බැරිද?" එවිට ඔවුහු, "ඔවුන් සිය-
ලුදෙනාටම අවශ්‍ය රොටි ගන්න අපට
ඩිනාරි* දෙසීයක් විතර අවශ්‍ය වෙයි.
අපි කොහොමද ඒ වගේ දෙයක් කරන්-
නේ" කියා ඇසූහ.[2] **38** ඔහු "ඔබ
ළඟ රොටි කීයක් තිබෙනවාද කියලා
ගිහින් බලන්න" කියා ඔවුන්ට කීවේය.
ඔවුහු ඇවිත්, "රොටි පහකුත් මසුන්
දෙදෙනෙකුත් තිබෙනවා"[3] කියා
කීවෝය. **39** එවිට ඔහු සියලුදෙ-
නාට කණ්ඩායම් වශයෙන්[4] තණ-
බිම මත[5] ඉඳගන්න කියා කීවේය.
**40** ඔවුහු සියදෙනා බැගින්ද පනස්-
දෙනා බැගින්ද කණ්ඩායම් වශයෙන්
ඉඳගත්හ.[6] **41** ඔහු රොටි පහද
මසුන් දෙදෙනාවද ගෙන ස්වර්ගය
දෙසට තම හිස ඔසවමින් යාච්ඤා-
වක් කළේය.[7] ඉන්පසු ඔහු රොටි
කැබලිවලට කඩා,[8] ඒවා සෙනඟට
ලබා දීම සඳහා ගෝලයන්ට දුන්-
නේය. ඔහු මසුන් දෙදෙනාවත් එසේ
බෙදා දුන්නේය. **42** කෑම කා තෘප්-
තියට පත් වීමට සියලුදෙනාටම හැකි
විය.[9] **43** ඉන්පසු ඔවුහු ඉතුරු කෑම-
වලින් කූඩ දොළහක් පුරවාගත්හ.
මීට අමතරව තවත් මසුන් ප්‍රමාණ-
යක්ද ඉතිරිව තිබිණ. **44** රොටි කෑ
අය අතරෙහි පුරුෂයන් පන්දහසක්
සිටියෝය.[10]

**45** තමන්ට පෙර එගොඩ පිහිටි
බෙත්සයිදාවට වහාම යන්න කියා
යේසුස් ගෝලයන්ට අණ කළේය. ඒ
අතරතුරේදී ඔහු රැස්ව සිටි සමූහයා-
වද පිටත් කර යැව්වේය.[11] **46** ඔහු
ඔවුන්ගෙන් සමුගෙන යාච්ඤා කිරී-
මේ අදහසින් කන්දකට ගියේය.[12]
**47** අඳුර වැටෙමින් තිබෙද්දී ගෝල-
යන් සිටි ඔරුව තිබුණේ ගලීල මුහුද

මාක් **6:37*** ග්‍රෑම් 3.85ක් බර රෝමානු රිදී කාසියක්.

මැදය. ඒ අවස්ථාවේදී ඔහු සිටියේ
තනිව ගොඩබිමෙහිය.[1] **48** තදින්
සුළං හැමූ නිසා ගෝලයන් ඉතා අමා-
රුවෙන්[2] ඔරුව පදවන ආකාරය යේ-
සුස් දුටුවේය. රාත්‍රියේ හතරවෙනි
යාමයේදී* පමණ ජලය මත ඇවිද-
ගෙන ගිය ඔහු, ඔවුන් අසලට ගියේය.
පෙනෙන විදිහට ඔහු ඇවිදගෙන
ගියේ ඔවුන්ව පසු කරගෙන යෑමේ
අදහසිනි. **49** ඔහු ජලය මත ඇවිදි-
නවා දුටු ඔවුහු, "ඒ අවතාරයක්" කියා
සිතා කෑගැසූහ.[3] **50** ඔහුව එසේ
දුටු ඔවුන් තුළ ඇති වුණේ මහත්
කැලඹීමකි. නමුත් ඔහු වහාම ඔවුන්
සමඟ කතා කර, "භය වෙන්න එපා.
මේ මමයි. දැන් ධෛර්යවත් වෙන්න"
කියා පැවසුවේය.[4] **51** ඔහු ඔවුන්
සිටි ඔරුවට නැංගේය. සුළඟද නැව-
තුණේය. එය දුටු ඔවුහු බොහෝ සෙ-
යින් පුදුමයට පත් වූහ.[5] **52** ඔවුන්
එසේ පුදුමයට පත් වූයේ රොටි
රැගෙන ඔහු කළ ආශ්චර්යයෙන් වට-
හාගත යුතු දේ ඔවුන් වටහාගෙන
නොසිටි නිසාය. ඒ දේ තේරුම්ගැනී-
මට ඔවුන්ට හැකි වූයේ නැත.[6]

**53** ඔවුහු එගොඩ වී ගෙනසරෙත්
වෙතට පැමිණ, ඒ අසල ඔරුව බැන්-
දෝය.[7] **54** ඔවුන් ඔරුවෙන් ගොඩ
බැස්ස වහාම ඒ අවට සිටි මිනිස්සු
ඔහුව හඳුනාගත්තෝය. **55** ඔවුහු
ප්‍රදේශය පුරා දුව ගොස් රෝගාතු-
රව සිටින අයව යහන් මත තබා-
ගෙන ඔහු සිටිනවා කියා ආරංචි වූ
ස්ථානයට උසුලාගෙන එන්න පටන්-
ගත්හ. **56** ඔහු යම් කිසි ගම්මාන-
යකට හෝ නුවරකට හෝ ගම්බද
පළාතකට[8] හෝ පැමිණි විට ඔවුහු
ලෙඩුන්ව රැගෙන වෙළඳපොළවල්
අසල රැස් වූහ. ඔවුහුද ඔහුගේ පිට
වස්ත්‍රයේ වාටිය පමණක්වත්[9] අල්-
ලන්න[10] ඉඩ දෙන මෙන් ඔහුගෙන්
බැගෑපත්ව ඉල්ලා සිටියහ. එය ඇල්ලූ
සියලුදෙනාම සුවය ලැබූහ.[11]

මාක් **6:48*** මතෙ 14:25හි පාදසටහන බලන්න.

**7** යෙරුසලමේ සිට ආ පරිසිවරු
සහ නීතිය පිටපත් කරන්නන්-
ගෙන් සමහරෙක් දිනක් ඔහු
ළඟට පැමිණියෝය.[1] **2** එවිට ඔහු-
ගේ ගෝලයන් කිහිපදෙනෙකු අත්
සෝදන්නේ නැතුව අපවිත්‍ර අත්ව-
ලින් කෑම කන ආකාරය ඔවුහු
දුටුවෝය.[2] . . . **3** සියලු යුදෙව්ව-
රුන්, විශේෂයෙන්ම පරිසිවරුන් පුරුදු
වී සිටියේ පුරාණයේ සිටි මිනිසුන්
ඇති කරගත් සම්ප්‍රදායන්ට ඇලී සිටී-
මටයි. එහෙයින් ඔවුහු කෑමට පෙර
තම අත් වැලමිට දක්වා අනිවාර්ය-
යෙන්ම සේදුවෝය. **4** මීට අමතරව
ඔවුහු වෙළඳපොළේ සිට පැමිණෙන
අවස්ථාවලදී කෑමට පෙර තමන්-
ගේ ඇඟට වතුර ඉසගත්තෝය. ඔවුහු
තවත් බොහෝ සම්ප්‍රදායන්[3] අනු-
ගමනය කළෝය. ඒ අතර කුස-
ලානද ජෝගුද තඹ භාජනද දියෙහි
ගිල්වා පවිත්‍ර කිරීම සඳහන් කළ
හැකිය.[4] . . . **5** එහෙයින් එම පරි-
සිවරු සහ නීතිය පිටපත් කරන්-
නෝ යේසුස්ගෙන් මෙසේ ඇසූහ.
"ඔබේ ගෝලයන් පුරාණයේ සිටි මිනි-
සුන් ඇති කරගත් සම්ප්‍රදායන්ට ගරු
කරන්නේ නැතුව අපවිත්‍ර අත්වලින්
කෑම කන්නේ ඇයි?"[5] **6** එවිට ඔහු
ඔවුන්ට මෙසේ කීවේය. "ඔබ සැම-
ගේ කුහකකම මොන තරම්ද! යෙ-
සායා ඔබ ගැන පළ කළ අනාවැකිය
ඔබට හොඳින්ම ගැළපෙනවා. එහි
ලියා තිබෙන්නේ මෙයයි.[6] 'මේ ජනයා
තම තොල්වලින් මට ගෞරව කරති.
නමුත් ඔවුන්ගේ සිත මා වෙතින් බො-
හෝ ඈත්ව තිබේ.[7] **7** ඔවුන් මට
කරන නමස්කාරයෙන් පලක් නැත.
මන්ද ඔවුන් දෙවිගේ ඉගැන්වීම් ලෙස
උගන්වන්නේ මිනිසුන් ඇති කරගත්
ආඥා පමණයි.'[8] **8** එහෙයින් ඔබත්
දෙවිගේ ආඥාවන් අත්හැර මිනිසුන්-
ගේ සම්ප්‍රදායන්වලට ඇලී සිටිනවා."[9]

**9** ඔහු ඔවුන්ට මෙසේද කීවේය.
"ඔබේ සම්ප්‍රදායන් කෙසේ හෝ
ආරක්ෂා කරන්න ඔබ ඉතා කපටි
විදිහට දෙවිගේ ආඥාවන් පසෙක

**6 පරි.**
1 මතෙ 14:24, යොහ 6:16
2 යොහ 6:19
3 ලූක් 24:37, යොහ 6:19
4 මතෙ 14:27, යොහ 6:20
5 මතෙ 14:32, යොහ 6:21
6 මතෙ 16:9, මාක් 3:5, මාක් 8:17
7 මතෙ 14:34
8 මතෙ 14:35
9 ගණන් 15:38
10 මතෙ 9:20, මාක් 5:27, ලූක් 8:44, ක්‍රියා 19:12
11 මතෙ 14:36

**2 තීරුව**

**7 පරි.**
1 මතෙ 15:1
2 ලූක් 11:38
3 මතෙ 15:6
4 මතෙ 23:25, ලූක් 11:39
5 මතෙ 15:2
6 මතෙ 15:7
7 එස 33:31, මතෙ 15:8
8 යෙසා 29:13, මතෙ 15:9, කොලො 2:8
9 මතෙ 15:3, ගලා 1:14, තීත 1:14

දමනවා.[1] **10** උදාහරණයක් වශ-
යෙන්, ‘ඔබේ පියාටද මවටද ගෞරව
කරන්න’[2] සහ ‘පියාට හෝ මවට හෝ
නින්දා කරන්නා මරණයට සුදුසුයි’[3]
යන ආඥා ගැන මෝසෙස් පැවසුවා.
**11** නමුත් ඔබ මොනවාද කියන්නේ?
‘යමෙක් තම පියාට හෝ මවට, “මම
ඔබේ ප්‍රයෝජනයට දෙන්න තිබුණු
දේවල් ‘කොර්බාන්’ කළා,[4] (එනම්
දෙවිට කැප කළා)”[5] කියා කිව්-
වොත් ඔහු නිදහස්’ කියා පවසමින්,
. . . **12** තම පියා හෝ මව වෙනු-
වෙන් කිසිම දෙයක් තවදුරටත් නො-
කර සිටින්න ඔබ ඔහුට ඉඩ දෙනවා.[6]
**13** එවැනි තවත් බොහෝ දේවල්
කරමින්[7] ඔබේ සම්ප්‍රදායන් රැකගැනී-
මට ඔබ දෙවිගේ වචනය[8] අවලංගු
කරනවා. **14** ඉන්පසු ඔහු නැව-
තත් සමූහයාව තමන් ළඟට කැඳවා,
ඔවුන්ට මෙසේ කීවේය. “ඔබ සැමෝම
මට සවන් දී මා කියන දෙයෙහි
නියම අර්ථය තේරුම්ගන්න උත්-
සාහ කරන්න.[9] **15** මිනිසෙකු අප-
විත්‍ර වන්නේ ඔහු කන බොන දේවලින්
නොවෙයි. නමුත් මිනිසෙකු අපවිත්‍ර
වන්නේ ඔහු තුළින්ම නික්මෙන දෙයි-
නුයි.”[10] **16** ——

**17** ඔහු සමූහයාගෙන් වෙන් වී නිව-
සකට ඇතුල් වූ විට ඔහුගේ ගෝල-
යෝ ඔහු පැවසූ එම උපමාව ගැන
ඔහුගෙන් ඇසූහ.[11] **18** ඔහු ඔවුන්ට
මෙසේ කීවේය. “ඔවුන්ට මෙන්
ඔබටත් එය වැටහෙන්නේ නැද්ද?[12]
කන බොන දේවලින් මිනිසෙකු අප-
විත්‍ර වන්නේ නැති බව ඔබ දන්-
නේ නැද්ද? **19** මන්ද එය කටින්
ඇතුල් වූ විට එය එම තැනැත්තා-
ගේ සිත තුළට නොව ඔහුගේ බඩට
ගිය පසු ඔහු වැසිකිළියට ගොස්
ඒවා බැහැර කර දමයි.”[13] එසේ
කීමෙන් සියලු ආහාර පවිත්‍ර බව
ඔහු පෙන්වා දුන්නේය.[14] **20** ඔහු
මෙසේද පැවසුවේය. “මිනිසෙකු
අපවිත්‍ර වන්නේ ඔහුගේ ඇතුළාන්-
තයෙන් නික්මෙන දේවල්වලිනුයි.[15]
**21** මන්ද ඇතුළාන්තයෙන් එනම්,
මිනිසුන්ගේ සිතින්[1] හානිකර සිතු-
විලි නික්මෙයි. උදාහරණයක් වශ-
යෙන් වේශ්‍යාකම,*[2] සොරකම, මිනී
මැරීම,[3] **22** අනාචාරය,* තණ්-
හාව,[4] දුෂ්ට ක්‍රියා, වංචාව, නින්දිත
හැසිරීම,[5] ඊර්ෂ්‍යාවෙන් බැලීම, අප-
හාස කිරීම, උඩඟුකම, තම මන-
යේ එල්බගෙන සිටීම යනාදි සියල්ල
නික්මෙන්නේ සිතිනුයි. **23** ඒ දුෂ්ට
දේවල් සියල්ල නික්මෙන්නේ ඇතු-
ළාන්තයෙනුයි. මිනිසෙකු අපවිත්‍ර
වන්නේ ඒ දේවලිනුයි.”[6]

**24** ඔහු එතැනින් පිටත් වී තීර්
සහ සීදොන්[7] යන ප්‍රදේශවලට අයත්
පළාත්වලට ගොස් නිවසකට ඇතුල්
විය. කිසිවෙකු ඒ බව දැනගන්න-
වාට ඔහු අකමැති වුවත් මිනිසුන්-
ගේ අවධානයට ලක් නොවී සිටීමට
ඔහුට නොහැකි විය.[8] **25** භූතයෙකු
වැහී සිටි පුංචි දුවක් සිටින ස්ත්‍රිය-
කට ඔහු ගැන ආරංචි වූ නිසා ඇය
ඒ මොහොතේදීම ඔහු ළඟට ඇවිත්
ඔහුගේ පාමුල දණින් වැටුණාය.[9]
**26** ඇය සිරොෆිනීෂියානු ජාතියට
අයත් ග්‍රීක පුරවැසියෙකි. ඇගේ දුව-
ගෙන් භූතයාව දුරු කරන මෙන්
ඇය ඔහුගෙන් දිගින් දිගටම ඉල්ලා
සිටියාය.[10] **27** නමුත් ඔහු ඇයට
මෙසේ කීවේය. “මුලින්ම තෘප්තිමත්
කළ යුත්තේ දරුවන්වයි. දරුවන්-
ගේ රොටි[11] රැගෙන බලු පැටවුන්ට
දැමීම[12] සුදුසු නැහැ.” **28** නමුත්
ඇය මෙසේ පිළිතුරු දුන්නාය. “ඇත්-
තයි මහත්මයාණෙනි. ඒත් මේසය
යට ඉන්න බලු පැටව් පොඩි දරුවන්-
ගේ කෑමවලින්[13] ඉතුරු වූ දේවල්[14]
කනවා නේද?” **29** එවිට ඔහු, “ඔබ
පැවසූ ඒ දේ නිසා භූතයා ඔබේ
දුවගෙන් පිට වෙලා. එමනිසා දැන්
ඔබට යන්න පුළුවන්” කියා ඇයට
කීවේය.[15] **30** ඇය තම නිවසට ගිය

**7 පරි.**
1 යෙසා 24:5
2 නික් 20:12; ද්වි 5:16; මතෙ 15:4; එෆී 6:2
3 නික් 21:17; ලෙවී 20:9; හිතෝ 20:20
4 මතෙ 15:5; මතෙ 23:18
5 ලෙවී 1:2; ලෙවී 2:1
6 1තිමෝ 5:8
7 මාක් 7:3
8 මතෙ 15:6
9 හිතෝ 8:5; මතෙ 15:10
10 මතෙ 15:11; ක්‍රියා 10:14; 1කොරි 8:8; 1තිමෝ 4:4; තිත 1:15
11 මතෙ 15:15; ලූක් 8:9
12 මතෙ 15:16
13 මතෙ 15:17
14 ලූක් 11:41; ක්‍රියා 10:15
15 මතෙ 15:18

**2 තීරුව**
1 උත් 6:5; උත් 8:21; ගීතා 14:1; යෙරෙ 17:9
2 ගලා 5:19
3 මතෙ 15:19
4 තිත 3:3
5 ගලා 5:19; එෆී 4:19
6 මතෙ 15:20; රෝම 1:28
7 මතෙ 11:21; මතෙ 15:21
8 මාක් 2:1
9 මතෙ 15:22
10 මතෙ 15:22
11 මතෙ 15:24
12 මතෙ 7:6; මතෙ 10:5; මතෙ 15:26; රෝම 9:4; එෆී 2:12
13 මතෙ 15:27
14 ලූක් 16:21
15 මතෙ 15:28

මාක් **7:21*** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න. **22*** මූ.අ., “පරදාර සේවනය.” මෙය භාවිත කරන්නේ විවාහක පුරුෂයෙකු හෝ ස්ත්‍රියක අනාචාරයේ යෙදීම විස්තර කිරීමටය.

විට ඇඳේ හාන්සි වී සිටි ඇගේ දැරිය-
ගෙන් භූතයා පිට වී ඇති බව ඇය
තේරුම්ගත්තාය.[1]
**31** ඉන්පසු ඔහු තීර් ප්‍රදේශයට
අයත් පළාත්වලින් පිටත් වී ආපසු
සීදොන් දේශය හරහා ගමන් කර
ගලීල මුහුද පසු කර දෙකපොලි-
සයට අයත් පළාත්වලට ගියේය.[2]
**32** එහිදී පිරිසක් බිහිරි මෙන්ම
කතා කිරීමේ ආබාධයක් ඇති මිනි-
සෙකුව ඔහු වෙතට ගෙනාවෝය. ඒ
මිනිසා පිට අත් තබා ඔහුව සුව
කරන මෙන් ඔවුහු ඔහුගෙන් බැගෑ-
පත්ව ඉල්ලා සිටියහ.[3] **33** ඔහු ඒ
මිනිසාව රැස්ව සිටි සමූහයාගෙන්
මදක් ඈතට ගෙන ගොස් ඔහුගේ
කන්වලට තමන්ගේ ඇඟිලි දැමු-
වේය. ඉන්පසු ඔහු තම ඇඟිල්ල-
කට කෙළ ගසා ඒ මිනිසාගේ දිව
ස්පර්ශ කළේය.[4] **34** ඔහු අහස දෙස
බලමින්[5] මහත් සුසුමක් හෙළා,[6]
“එප්ඵාතා” එනම්, “ඇරෙන්න” කියා
ඔහුට කීවේය. **35** එවිට ඔහුගේ
සවන් දීමේ හා කතා කිරීමේ ආබාධය
සුව වී,[7] ඔහු පැහැදිලිව කතා කරන්න
පටන්ගත්තේය. **36** යේසුස් සිදු වූ
දේ කිසිවෙකුට නොකියන ලෙස
ඔවුන්ට අවවාද කළේය.[8] නමුත් යේ-
සුස් කොතරම් අවවාද කළත් ඔවුහු
එය නොතකා සිදු වූ දේ ගැන සෑම
කෙනෙකුටම කිව්වෝය.[9] **37** සිය-
ලුදෙනා අතිශයින් පුදුම වී,[10] “ඔහු
බිහිරි අයට ඇසෙන්නත් ගොළු අයට
කතා කරන්නත් සලස්වනවා. ඔහු
කරන්නේ මොන තරම් හොඳ සේව-
යක්ද” කියා කීවෝය.[11]

**8** එම කාලයේ තවත් දවසක ඉතා
විශාල සමූහයක් එක් රැස් වී
සිටියෝය. ඒ අවස්ථාවේදීත් ඔවුන්ට
කන්න කිසිවක් තිබුණේ නැත. එම-
නිසා යේසුස් ගෝලයන්ව කැඳවා
ඔවුන්ට මෙසේ කීවේය.[12] **2** “මට
මේ සෙනඟ ගැන මහත් අනුකම්පා-
වක් දැනෙනවා.[13] දවස් තුනක් පුරා
ඔවුන් මා සමඟ ඉන්නවා. ඔවුන්ට
කන්නත් කිසි දෙයක් නැහැ. **3** සම-
හරුන් ඇවිත් ඉන්නේ ඉතා දුර
බැහැර සිටයි. කෑමට බීමට කිසිවක්
නොදී ඔවුන්ව යැව්වොත් යන අතර-
මඟදී ඔවුන් ක්ලාන්ත වී වැටෙයි.”
**4** නමුත් ඔහුගේ ගෝලයෝ ඔහුට
මෙසේ පිළිතුරු දුන්නෝය. “අපි ඉන්-
නේ පාළු තැනක. ඉතින් මෙත-
රම් විශාල සෙනඟකට අපි රොටි
හොයන්නේ කොහොමද?”[1] **5** එවිට
ඔහු, “ඔබ ළඟ රොටි කීයක් තිබෙ-
නවාද” කියා ඔවුන්ගෙන් ඇසුවේය.
“හතක්”[2] කියා ඔවුහු පිළිතුරු දුන්හ.
**6** ඔහු සමූහයාට බිම ඉඳගන්න කියා
පවසා රොටි හත ගෙන දෙවිට ස්තුති
දී[3] ඒවා කඩා, සමූහයාට බෙදා දීම
සඳහා තම ගෝලයන්ට ඒවා දුන්-
නේය. ඔවුහු ඒවා ගෙන සමූහයා අතර
බෙදා දුන්හ.[4] **7** ඔවුන් ළඟ කුඩා
මසුන් කිහිපයක්ද තිබිණ. ඔහු ඒ සඳ-
හාද දෙවිට ස්තුති කර ඒවාද බෙදා
දෙන්න කියා ඔවුන්ට පැවසුවේය.[5]
**8** සියලුදෙනා කා තෘප්තිමත් වූහ.
ඉන්පසු ඉතුරු වූ කෑමවලින් ඔවුහු
විශාල කූඩ හතක් පුරවාගත්තෝය.[6]
**9** ඒ අවස්ථාවේදී එතැන පුරුෂයෝ
හාරදහසක් පමණ සිටියෝය. ඉන්පසු
ඔහු ඔවුන්ව පිටත් කර යැව්වේය.[7]
**10** ඔහු තම ගෝලයන් සමඟ
ඉක්මනින් ඔරුවට නැඟ එම ස්ථා-
නයෙන් පිටත් වී දල්මනූතය
නම් ප්‍රදේශයට අයත් පළාත්වලට
ගියේය.[8] **11** එහිදී පරිසිවරු ඇවිත්
ඔහු සමඟ විවාද කරන්න පටන්ගෙන
ඔහුගේ යම් වරදක් අල්ලාගැනීමේ
අදහසින් අහසේ ආශ්චර්යවත් ලකු-
ණක් පෙන්වන මෙන් ඔහුගෙන් ඉල්ලා
සිටියහ.[9] **12** එවිට ඔහු මහත් දුක-
කින්[10] මෙසේ කීවේය. “මේ පරම්පරාව
මේ වගේ ලකුණක් ඉල්ලන්නේ ඇයි?
ඇත්තෙන්ම මේ පරම්පරාවට කිසිම
ලකුණක් දෙනු ලබන්නේ නැහැ.”[11]
**13** එය පවසා ඔහු එතැනින් පිටත්
වී නැවත ඔරුවට නැඟ එගොඩට
ගියේය.
**14** නමුත් රොටි ගෙන යෑමට
ඔවුන්ට අමතක විය. ඔරුවේ සිටි

**7 පරි.**
1 යොහ 4:51
2 මතෙ 15:29; මාක් 5:20
3 මතෙ 9:32; ලූක් 11:14; ක්‍රියා 9:12
4 මාක් 8:23; යොහ 9:6
5 මාක් 6:41; යොහ 17:1
6 යොහ 11:33; යොහ 11:38
7 යෙසා 35:5; මතෙ 11:5; මතෙ 15:30
8 යෙසා 42:2; මතෙ 8:4; මාක් 5:43
9 මාක් 1:45
10 ක්‍රියා 14:11
11 යෙසා 35:5; මතෙ 15:31

**8 පරි.**
12 මතෙ 15:32
13 හෙබ්‍රෙ 2:17; හෙබ්‍රෙ 4:15; හෙබ්‍රෙ 5:2

**2 තීරුව**
1 ගණන් 11:21; 2රාජා 7:2; මතෙ 15:33; මාක් 6:52
2 මතෙ 15:34; මාක් 6:38
3 ද්වි 8:10; ලූක් 22:19; 1තිමෝ 4:4
4 මතෙ 15:36; මාක් 6:41
5 මතෙ 14:19
6 මතෙ 15:37
7 මතෙ 15:38
8 මතෙ 15:39
9 මතෙ 12:38; මතෙ 16:1; යොහ 6:30
10 මාක් 7:34
11 මතෙ 16:4

ඔවුන් ළඟ එක රොටියක් හැර වෙන
කිසිවක් තිබුණේ නැත.[1] **15** ඒ
අවස්ථාවේදී ඔහු ඔවුන්ට මෙසේ අව-
වාද කළේය. "සෝදිසියෙන් සිටින්න.
පරිසිවරුන්ගේ මුහුන්වලින්ද හෙරොද්-
ගේ මුහුන්වලින්ද පරෙස්සම් වීමට
වගබලා ගන්න."[2] **16** එවිට ගෝ-
ලයෝ රොටි නොතිබීම ගැන
එකිනෙකාට චෝදනා කරන්න පටන්-
ගත්හ.[3] **17** එය දුටු ඔහු ඔවුන්ට
මෙසේ කීවේය. "ඔබ ළඟ රොටි
නැති එක ගැන එකිනෙකාට චෝ-
දනා කරන්නේ ඇයි?[4] ඔබට
තවම මා කියූ දේ වැටහෙන්නේවත්
එහි අර්ථය තේරෙන්නේවත් නැද්ද?
ඔබට එය තේරුම්ගන්න අමාරුද?[5]
**18** 'ඇස් තිබුණත් ඔබට පෙනෙන්නේ
නැද්ද? කන් තිබුණත් ඔබට ඇසෙන්-
නේ නැද්ද?'[6] ඔබට මතක නැද්ද,
**19** මා පුරුෂයන් පන්දහසට රොටි
පහකින් කන්න දුන්නා?[7] එයින් ඉතුරු
වූ කෑමවලින් කූඩ කීයක් පුරවාගත්-
තාද කියා ඔබට මතකද?" ඔවුහුද,
"දොළහක්"[8] කියා පිළිතුරු දුන්නෝය.
**20** "මා පුරුෂයන් හාරදහසකට රොටි
හතක් කඩා දුන් අවස්ථාවේ, ඔබ
ඉතුරු කෑමවලින් විශාල කූඩ කීයක්
පුරවාගත්තාද?" ඔවුහුද, "හතක්"[9]
කියා පිළිතුරු දුන්නෝය. **21** එවිට
ඔහු, "තවමත් ඔබට තේරෙන්නේ
නැද්ද"[10] කියා ඔවුන්ගෙන් ඇසුවේය.

**22** පසුව ඔවුහු බෙත්සයිදාවට
ගියහ. එහිදී මිනිස්සු ඔහු වෙ-
තට අන්ධ මිනිසෙකුව ගෙනැවිත්
ඔහුව අල්ලා[11] සුව කරන මෙන්
ඔහුගෙන් බැගෑපත්ව ඉල්ලා සිටි-
යහ. **23** එවිට ඔහු ඒ අන්ධ මිනිසාව
අතින් අල්ලාගෙන ගමෙන් මදක් පිට-
තට ගෙන ගියේය. ඉන්පසු යේසුස්
ඔහුගේ දෙනෙත්වල කෙළ තවරා[12]
ඔහු පිට අත් තබමින් "ඔබට මො-
නව හරි පෙනෙනවාද" කියා ඔහුගෙන්
ඇසුවේය. **24** ඒ මිනිසා අවට බල-
මින්, "මට මිනිසුන්ව පේනවා. හැබැයි
ඔවුන්ව මට පෙනෙන්නේ ගස් එහා
මෙහා යනවා වගෙයි" කියා කීවේය.
**25** නැවතත් ඔහු ඒ මිනිසාගේ දෙ-
නෙත් මත තම අත් තැබුවේය. එවිට
ඒ මිනිසාට පැහැදිලිව පෙනිණ. ඔහු
සුව වූ අතර ඔහුට සෑම දෙයක්ම නිසි-
යාකාරව පෙනුණේය. **26** එවිට ඔහු
ඒ මිනිසාව යවමින්, "දැන්මම ගමට
යන්න එපා"[1] කියා කීවේය.

**27** යේසුස් සහ ඔහුගේ ගෝල-
යෝ සිසේරිය පිලිප්පියට අයත් ගම්ව-
ලට පිටත්ව ගියහ. ගමන අතරමඟදී
ඔහු තම ගෝලයන්ගෙන් මෙසේ ඇසු-
වේය. "මිනිසුන් මම කවුරුන් කිය-
ලද කියන්නේ?"[2] **28** ඔවුහු මෙසේ
පිළිතුරු දුන්නෝය. "සමහරුන්
නම් කියන්නේ ඔබ යොහන් බව්-
තීස්ත[3] කියායි. තවත් අය ඔබට
එලියා[4] කියලා කියනවා. තවත් සම-
හරුන් කියන්නේ ඔබ අනාගතවක්-
තෘවරුන්ගෙන් කෙනෙක්[5] කියායි."
**29** එවිට යේසුස්, "ඔබ මොනවාද
හිතන්නේ? මම කවුද" කියා ඔවුන්-
ගෙන් ඇසුවේය. පේතෘස් පිළිතුරු දෙ-
මින්, "ඔබ ක්‍රිස්තුස්"[6] කියා ඔහුට
කීවේය. **30** එවිට තමන් ගැන කිසි-
වෙකුට නොකියන ලෙස ඔහු ඔවුන්ට
තදින් අවවාද කළේය.[7] **31** ඉන්පසු
මනුෂ්‍ය පුත්‍රයා බොහෝ දුක් විඳිය යුතු
බවත් ඔහුව වැඩිමහල්ලන් විසින්ද
නායක පූජකයන් විසින්ද නීතිය පිට-
පත් කරන්නන් විසින්ද ප්‍රතික්ෂේප
කර මරනු ලබන බවත්[8] දවස් තුන-
කින් ඔහුව මරණයෙන් නැඟිටුවන
බවත්[9] ඔහු ඔවුන්ට පැහැදිලි කරන්න
පටන්ගත්තේය. **32** ඔහු ඒ දේවල්
පැවසුවේ කිසිම බියක් සැකක් නො-
මැතිවය. නමුත් පේතෘස් ඔහුව පැත්-
තකට ගෙන ගොස් ඔහුට තදින් කතා
කළේය.[10] **33** ඔහු හැරී, තම ගෝල-
යන් දෙස බලා, "සාතන් මගෙන් අහ-
කට යන්න! ඔබ සිතන්නේ මිනිසුන්
සිතන විදිහටයි. දෙවි සිතන විදිහට
නොවෙයි"[11] කියා පේතෘස්ට තදින්
පැවසුවේය.

**34** ඔහු තම ගෝලයන් ඇතුළු
සමූහයාව තමන් වෙතට කැඳවා
ඔවුන්ට මෙසේ කීවේය. "යමෙකු

**8 පරි.**
1 මතෙ 16:5
2 මතෙ 16:6 ලූක් 12:1 1කොරි 5:7 ගලා 5:9
3 මතෙ 16:7
4 යොහ 4:33
5 යෙසා 29:24 මතෙ 16:8 මාක් 6:52
6 යෙසා 44:18 යෙරෙ 5:21 එස 12:2 මතෙ 13:13
7 මාක් 6:38
8 මතෙ 14:20 මාක් 6:43 ලූක් 9:17 යොහ 6:13
9 මතෙ 15:37
10 මතෙ 16:11 මාක් 6:52
11 මාක් 6:56
12 මාක් 7:33 යොහ 9:6

**2 තීරුව**
1 මතෙ 8:4 මාක් 5:43
2 මතෙ 16:13 ලූක් 9:18
3 මතෙ 14:2 මාක් 6:14
4 මාක් 9:11
5 මතෙ 16:14 ලූක් 9:19
6 මතෙ 16:16 ලූක් 9:20 යොහ 1:41 යොහ 6:69 1යොහ 4:15
7 මතෙ 16:20 මාක් 9:9 ලූක් 9:21
8 මතෙ 26:2
9 මතෙ 16:21 මතෙ 17:23 ලූක් 9:22
10 මතෙ 16:22
11 මතෙ 16:23 රෝම 8:7 1කොරි 2:14

මා අනුව එන්න කැමති නම් ඔහු
තම ජීවිතය දෙවි වෙනුවෙන් කැප
කර තමන්ගේ වධකණුව රැගෙන,*
දිගටම මා අනුව එන්න අවශ්‍යයි.[1]
**35** මන්ද යමෙකු තම ජීවිතය ගල-
වාගන්න කැමැත්තෙන් සිටියොත්
ඔහුට එය නැති වෙයි. නමුත් මා
නිසාත් ශුභාරංචිය නිසාත් තම ජීවි-
තය නැති කරගන්නාට එය ගලවා-
ගන්න හැකි වෙයි.[2] **36** ඇත්තෙන්ම
මිනිසෙකු මුළු ලෝකයම ලබා-
ගත්තත් ඔහුට තම ජීවිතය අහිමි
වුණොත් ඔහුට එයින් ප්‍රයෝජන-
යක් තිබෙනවාද?[3] **37** තමන් සතු
සියල්ල දුන්නත් මිනිසෙකුට තම ජීවි-
තය බේරාගත හැකිද?[4] **38** දෙවිට
ද්‍රෝහි වන* මේ පව්කාර පරම්පරාව
අතරේ සිටින යමෙක් මගේ ගෝල-
යෙක් වෙන්නත් මා පවසන දේවල්
පිළිගන්නත් ලැජ්ජා වුණොත් මනුෂ්‍ය
පුත්‍රයා තම පියාණන්ගේ තේජසින්
වැජඹෙමින්, ශුද්ධ දේවදූතයන් සමඟ[5]
එන අවස්ථාවේදී ඒ තැනැත්තාව පිළි-
ගන්න මනුෂ්‍ය පුත්‍රයාත් කැමති වන්-
නේ නැහැ.”[6]

**9** තවදුරටත් ඔහු ඔවුන්ට මෙසේ
කීවේය. “ඇත්තෙන්ම මා ඔබට
කියන්නේ, දෙවිගේ රාජ්‍යයේ පාල-
නය මොන තරම් බලවත් එකක්ද
කියා දකින්න පෙර මෙතැන සිටගෙන
සිටින්නන්ගෙන් සමහරෙක් කිසිවි-
ටකත් මරණය අද්දකින්නේ නැති
බවයි.”[7] **2** දවස් හයකට පසු යේ-
සුස්, පේතෘස්ව යාකොබ්ව සහ යො-
හන්ව පමණක් කැඳවාගෙන උස්
කන්දකට ගියේය. එවිට ඔවුන් ඉදි-
රියෙහිම ඔහුගේ පෙනුම සම්පූර්-
ණයෙන්ම වෙනස් විය.[8] **3** ඔහුගේ
වස්ත්‍ර මිහිපිට සිටින මොනම රෙදි
සෝදන්නෙකුටවත් සුදු කළ නො-
හැකි තරමට සුදු වී බැබළුණේය.[9]
**4** ඔහු අසල මෝසෙස් සහ එලියා
සිටින ආකාරයත් ඔවුන් යේසුස් සමඟ
කතා කරන ආකාරයත්[1] ඔවුන්ට
දැකගත හැකි විය. **5** එය දුටු පේ-
තෘස්, “ගුරුතුමනි,* මේ අවස්ථා-
වේදී මෙතැන සිටින්න ලැබීම අපට
ලොකු සතුටක්. අපි මෙහි කූඩාරම්
තුනක්, එකක් ඔබටත් එකක් මෝ-
සෙස්ටත් එකක් එලියාටත් සාදන්-
නම්”[2] කියා යේසුස්ට කීවේය. **6** ඒ
සිද්ධිය දුටු ඔවුන් කොතරම් බියට
පත් වූවාද කිවහොත් කුමක් කියන්-
නද කියාවත් ඔහු දැනගෙන සිටි-
යේ නැත. **7** එකවරම වලාකුළක්
ඇවිත් ඔවුන්ව වසාගත්තේය. එවිට,
“මේ මාගේ ප්‍රේමණීය පුත්‍රයාය.[3] මො-
හුට සවන් දෙන්න”[4] කියා පවසන
හඬක්[5] ඒ වලාකුළ අතරින් නික්මු-
ණේය. **8** ඉන්පසු ඔවුහු ඉක්මනින්
වටපිට බැලුවත් ඔවුන් සමඟ යේසුස්
මිස වෙන කිසිවෙකු නොසිටින බව
දුටුවෝය.[6]

**9** ඔවුන් කන්දෙන් බැස එන විට
මනුෂ්‍ය පුත්‍රයා මරණයෙන් නැඟි-
ටින තුරු[7] තමන් දුටු දේ කිසිවෙ-
කුට නොපවසන්න[8] කියා ඔහු ඔවුන්ට
තදින් අවවාද කළේය. **10** ඔවුහු
ඔහු පැවසූ දේ සිතට ගත් නමුත් මර-
ණයෙන් නැඟිටුවීම ගැන ඔහු පැවසූ
දෙයින් අදහස් කළේ කුමක්ද කියා
ඔවුනොවුන් අතරේ කතා කළෝය.
**11** එවිට ඔවුහු, “පළමුවෙන් එලියා[9]
පැමිණිය යුතුයි[10] කියා නීතිය පිට-
පත් කරන්නන් කියන්නේ ඇයි” කියා
ඔහුගෙන් ඇසූහ. **12** ඔහු ඔවුන්ට
මෙසේ කීවේය. “එලියා පළමුවෙන්
ඇවිත් සියල්ල නැවත පිහිටුවයි.[11]
නමුත් මනුෂ්‍ය පුත්‍රයා ගැන ලියා
තිබෙන්නේ ඊට වඩා වෙනස් දෙ-
යක්. ඔහු බොහෝ දුක් විඳින බවත්[12]
කිසි වැදගැම්මකට නැති කෙනෙකු
ලෙස ඔහුට සලකන බවත්[13] ලියා
තිබෙනවා. එසේ ලියා තිබෙන්නේ
ඇයි කියා ඔබ දන්නවාද? **13** ඇත්-
තටම මා ඔබට කියන්නේ, එලියා[14]
මේ වන විටත් ඇවිත් තිබෙන බවයි.

---

මාක් **8:34*** උපග්‍ර. 6 බලන්න. **38*** මූ.අ., “අනා-
චාරයට නැඹුරු.”

මාක් **9:5*** එනම්, රබ්බි.

---

**8 පරි.**
**1** මතෙ 10:38
මතෙ 16:24
ලූක් 9:23
ලූක් 14:27
ගලා 5:24
**2** මතෙ 10:39
මතෙ 16:25
ලූක් 9:24
යොහ 12:25
එළි 12:11
**3** මතෙ 16:26
ලූක් 9:25
**4** ගීතා 49:8
**5** මතෙ 25:31
2තෙස 1:7
**6** මතෙ 10:33
මතෙ 16:27
ලූක් 9:26
ලූක් 12:9
රෝම 1:16
2තිමෝ 1:8

**9 පරි.**
**7** මතෙ 16:28
ලූක් 9:27
1කොරි 4:20
**8** මතෙ 17:1
ලූක් 9:28
**9** දානි 7:9
මතෙ 17:2
මතෙ 28:3
ලූක් 9:29

**2 තීරුව**
**1** මතෙ 17:3
ලූක් 9:30
**2** මතෙ 17:4
ලූක් 9:33
**3** ගීතා 2:7
යෙසා 42:1
මතෙ 3:17
**4** ද්වි 18:15
මතෙ 17:5
ලූක් 9:35
ක්‍රියා 3:22
2පේතෘ 1:17
**5** ලූක් 3:22
යොහ 12:28
**6** මතෙ 17:8
ලූක් 9:36
**7** මතෙ 17:9
ලූක් 9:36
**8** මතෙ 12:16
මාක් 8:30
**9** මලා 4:5
මාක් 8:28
**10** මතෙ 17:10
**11** මතෙ 17:11
**12** උත් 3:15
ගීතා 22:6
යෙසා 50:6
යෙසා 53:3
දානි 9:26
**13** ලූක් 23:11
පිලි 2:7
**14** මතෙ 11:14
ලූක් 1:17

ඔහු ගැන ලියා තිබෙන ආකාරය-
ටම ජනයා තමන් කැමති කැමති දේ
ඔහුට කළා.”[1]
**14** ඔවුන් අනික් ගෝලයන් සිටි
තැනට පැමිණි විට විශාල පිරි-
සක් ඔවුන්ව වට කරගෙන සිටින
ආකාරයත් නීතිය පිටපත් කරන්නන්
ඔවුන් සමඟ විවාද කරමින්
සිටින ආකාරයත් ඔවුන්ට දැකගත
හැකි විය.[2] **15** නමුත් මුළු සමූ-
හයා ඔහුව දුටු විගස පුදුම වී ඔහු
වෙතට දුව ගොස් ඔහුව සාදරයෙන්
පිළිගත්තෝය. **16** එවිට ඔහු, “ඔබ
ඔවුන් සමඟ විවාද කරන්නේ කුමක්
ගැනද” කියා ඔවුන්ගෙන් ඇසුවේය.
**17** සමූහයා අතරින් එක් කෙනෙක්
ඔහුට මෙසේ පිළිතුරු දුන්නේය.
“ගුරුතුමනි, මගේ පුතාට භූතයෙක්
වැහිලා. ඒ නිසා ඔහු ගොළු වෙලා.
මම පුතාව ඔබ වෙතට ගෙනාවේ
ඔහුව සුව කරගන්නයි.[3] **18** භූතයා
මගේ පුතාට ආවේශ වන ඕනෑම
තැනකදී ඔහුව බිම දමනවා. ඊටපස්-
සේ ඔහු කටින් පෙණ දමමින්, දත්-
මිටි කනවා. ඒ වෙලාවලදී ඔහුගේ
ඇඟට කිසිම පණක් නැහැ. ඒ භූතයාව
දුරු කරන්න කියලා මා ඔබේ ගෝ-
ලයන්ට කිව්වා. නමුත් ඔවුන්ට ඒ
දේ කරන්න බැරි වුණා.”[4] **19** එවිට
ඔහු, “ඔබ සියලුදෙනා තුළ කිසිම
විශ්වාසයක් නැහැ.[5] මා මේ පරම්-
පරාව සමඟ තව කොපමණ කල්
සිටින්නද? ඔබ ගැන තව කො-
පමණ කල් ඉවසන්නද? ඔහුව මා
ළඟට ගෙනෙන්න”[6] කියා ඔවුන්ට
කීවේය. **20** එවිට ඔවුහු යේසුස් වෙ-
තට ඔහුව ගෙන ආවෝය. ඒ
භූතයා යේසුස්ව දුටු විගස දරු-
වාව ගැහෙන්න සැලැස්වූවේය. දරුවා
බිම වැටී, පෙරළෙමින් කටින් පෙණ
දමමින් සිටියේය.[7] **21** යේසුස් දරු-
වාගේ පියාගෙන් මෙසේ ඇසුවේය.
“මෙය කොතරම් කාලයක් පුරා මො-
හුට සිදු වෙනවාද?” එවිට ඔහු මෙසේ
පිළිතුරු දුන්නේය. “කුඩා කාලයේ
ඉඳලා. **22** ඔහුට වැහෙන භූතයා
ඔහුව විනාශ කර දැමීමේ අදහසින්
වරින් වර ඔහුව ගින්නටත් වතුර-
ටත් දමනවා.[1] අනේ, අපට අනු-
කම්පා කරන්න. පුළුවන් නම් මොනව
හරි කරලා අපට උපකාර කරන්න.”
**23** එවිට යේසුස්, “‘පුළුවන් නම්’
කියා ඔබ කිව්වා නේද? කෙනෙකුට
විශ්වාසය තිබෙනවා නම්[2] ඕනෑම
දෙයක් කරන්න පුළුවන්” කියා පැවසු-
වේය. **24** එවිට ඒ දරුවාගේ පියා,
“මට විශ්වාසය තිබෙනවා. ඒත් මගේ
විශ්වාසය ශක්තිමත් කරගන්න මට
උපකාර කරන්න”[3] කියා වහාම හඬ
නඟා පැවසුවේය.
**25** සමූහයක් එකතු වී ඔවුන් ළඟට
දුවගෙන එනවා දුටු යේසුස් භූත-
යාට තදින් කතා කරමින්[4] මෙසේ
කීවේය. “ගොළු වීමත් බිහිරිකමත්
ඇති කරන භූතයෙක් වන ඔබට මා
අණ කරන්නේ මොහුගෙන් පිටතට
ඇවිත් නැවතත් ඔහුට ආවේශ වෙන්න
එපා කියායි.” **26** භූතයා මොරගසා,
බොහෝ වර දරුවාට ගැහෙන්න
සලස්වා පිටතට ආවේය.[5] දරුවා මළ
කෙනෙකු මෙන් වූ නිසා බහුතරයක්,
“ඔහු මැරිලා” කියා පවසන්න පටන්-
ගත්තෝය. **27** නමුත් යේසුස් ඔහු-
ගේ අත අල්ලා ඔහුව නැඟිටෙවූ විට
ඔහු සිටගත්තේය.[6] **28** ඉන්පසු යේ-
සුස් එක්තරා නිවසකට ගියේය. එවිට
ඔහුගේ ගෝලයෝ පමණක් ඔහු ළඟට
ඇවිත් ඔහුගෙන් මෙසේ ඇසූහ. “අපට
ඒ භූතයාව දුරු කරන්න බැරි වුණේ
ඇයි?”[7] **29** ඔහු ඔවුන්ට මෙසේ පිළි-
තුරු දුන්නේය. “ඒ වගේ භූතයන්ව
දුරු කරන්න ලෙහෙසි නැහැ. ඒ සඳහා
යාච්ඤාව ඉතාමත් වැදගත්.”[8]
**30** පසුව ඔවුහු එතැනින් පිටත්ව
ගලීලය හරහා ගමන් කළෝය.
නමුත් ඒ ගැන කිසිවෙකු දැනගන්න-
වාට ඔහු අකමැති විය. **31** මන්ද
ඔහු තම ගෝලයන්ට මෙසේ පැහැදිලි
කළේය. “මනුෂ්‍ය පුත්‍රයාව මිනිසුන්
අතට පාවා දෙන්න නියමිතයි. ඔවුන්
ඔහුව මරා දමයි.[9] ඒ වුණත් දවස්
තුනකින් ඔහුව නැවත නැඟිටුවනු

**9 පරි.**
1 මතෙ 17:12
2 ලූක් 9:37
3 මතෙ 17:14 ලූක් 9:38
4 මතෙ 17:15 ලූක් 9:39
5 ද්වි 32:20
6 මතෙ 17:17 ලූක් 9:41
7 මාක් 1:26 ලූක් 9:42

**2 තීරුව**
1 මතෙ 17:15
2 2ලේක 20:20 මතෙ 17:20 මාක් 11:23 ලූක් 17:6 යොහ 11:40 ක්‍රියා 14:9
3 ලූක් 17:5 එෆි 2:8 හෙබ්‍රෙ 12:2
4 මතෙ 17:18 මාක් 1:25 ලූක් 4:35 ක්‍රියා 10:38
5 මාක් 1:26
6 ලූක් 9:42
7 මතෙ 17:19
8 මතෙ 17:20
9 මතෙ 17:22 මතෙ 26:2

ලබනවා.”[1] **32** ඔහු පැවසූ ඒ දේ
තේරුම්ගැනීමට ඔවුන්ට නොහැකි වූ
අතර ඒ ගැන ඔහුගෙන් ප්‍රශ්න අසන්-
නත් ඔවුහු බිය වූහ.[2]

**33** පසුව ඔවුහු කපර්ණවුමට
ගියහ. ඔහු එහි නිවසක සිටියදී,
“ඔබ මඟදී වාද කරමින් සිටියේ
කුමක් ගැනද”[3] කියා ඔවුන්ගෙන් ඇසු-
වේය. **34** ඔවුන් මඟ එන විට වාද
කළේ තමන් අතරේ වඩා උතුම් වන්-
නේ කවුද[4] යන්න ගැන නිසා ඔවුහු
නිශ්ශබ්දව සිටියෝය. **35** එහෙයින්
ඔහු වාඩි වී දොළොස්දෙනාව කැඳවා,
“කවුරු හරි උතුම්ම තැනැත්තා
වෙන්න කැමති නම් ඔහු සියල්ලන්
අතරින් සුළුම තැනැත්තා වී ඔවුන්ගේ
සේවකයා විය යුතුයි”[5] කියා ඔවුන්ට
පැවසුවේය. **36** ඉන්පසු ඔහු තමන්
ළඟට කුඩා දරුවෙකු ගෙන ඔවුන්
මැද සිටුවා ඔහුව තුරුලු කරගෙන
ඔවුන්ට මෙසේ කීවේය.[6] **37** “මා
නිසා* යමෙකු කුඩා දරුවන් මෙන්
සිටින කෙනෙකුව මගේ අනුගාමික-
යෙකු ලෙස පිළිගත්තොත් ඔහු මාවත්
පිළිගන්නවා කියා පැවසිය හැකියි.
මාව පිළිගන්නා පුද්ගලයා මාව පම-
ණක් නොව මාව එවූ තැනැත්තාවත්
පිළිගන්නවා.”[7]

**38** යොහන් ඔහුට මෙසේ කීවේය.
“ගුරුතුමනි, භූතයන් දුරු කරන මිනි-
සෙක් අපිට හමු වුණා. ඔහු එය
කරන්නේ ඔබේ නාමයෙන්. ඔහු අපත්
සමඟ ආවේ නැති නිසා[8] අපි ඔහු
කරන දේ නතර කරන්න උත්සාහ
කළා.”[9] **39** නමුත් යේසුස් මෙසේ
කීවේය. “ඔහුව නතර කරන්න එපා.
මන්ද කිසිම කෙනෙක් මගේ නාම-
යෙන් බලවත් ක්‍රියාවක් කළ පසු
මා ගැන අගුණ කියන්නේ නැහැ.[10]
**40** අපිට විරුද්ධව වැඩ කරන්නේ
නැති කෙනෙක් ඇත්තටම සිටින්නේ
අපට පක්ෂවයි.[11] **41** ඇත්තෙන්ම
මා ඔබට කියන්නේ, ඔබ ක්‍රිස්තුස්ගේ
අනුගාමිකයෙක්[12] නිසා යමෙක් ඔබට
බොන්න වතුර කෝප්පයක්[1] දුන්-
නොත් ඔහුට ලැබීමට නියමිත ත්‍යා-
ගය ඔහුට අනිවාර්යයෙන්ම ලැබෙන
බවයි. **42** නමුත් යමෙක් කරන
දෙයක් නිසා මා කෙරෙහි විශ්වා-
සය තබන කුඩා දරුවන් හා සමාන
ඔවුන්ගෙන් එක් කෙනෙකු හෝ වැටී
ගියොත්* බූරුවෙකු විසින් කරකවනු
ලබන ඇඹරුම් ගලක් ඒ දේ කරන
තැනැත්තාගේ බෙල්ලේ එල්ලා ඔහුව
මුහුදේ හෙළීම වඩාත් හොඳයි.[2]

**43** “ඔබේ අත නිසා ඔබ වරදක්
කරන්න පෙලඹෙනවා නම්* එය කපා
ඉවත් කරන්න. අත් දෙක සහිතව
ගෙහෙන්නාවට# එනම්, නිවිය නො-
හැකි ගින්නට දමනවාට වඩා අතක්
නැති කෙනෙකු ලෙස ඔබට ජීව-
නය හිමි වෙනවා නම් එය වඩාත්
හොඳ නැද්ද?[3] **44** —— **45** ඔබේ
පය නිසා ඔබ වරදක් කරන්න පෙ-
ලඹෙනවා නම්* එය කපා ඉවත්
කරන්න. දෙපා සහිතව ගෙහෙන්නා-
වට හෙළනු ලබනවාට[4] වඩා පාදයක්
නැතුව[5] ඔබට ජීවනය හිමි වෙ-
නවා නම් එය වඩාත් හොඳ නැද්ද?
**46** —— **47** ඔබේ ඇස නිසා ඔබ
වරදක් කිරීමට පෙලඹෙනවා නම්
එය උගුලා අහකට විසි කරන්න.[6]
දෑස් ඇතුව ගෙහෙන්නාවට හෙළනු
ලබනවාට[7] වඩා එක ඇසක් නැතුව
වුණත් දෙවිගේ රාජ්‍යය හිමි කරගැනීම
වඩාත් හොඳයි. **48** ගෙහෙන්නාවේ
තිබෙන ගින්න නිවී යන්නේවත් එහි
සිටින පණුවෝ නසින්නේවත් නැහැ.[8]

**49** “කෑම මත ලුණු ඉසිනවා වගේ
දෙවි එවැනි අය මත ගින්නක් එවා
ඔවුන්ව දවා දමයි.[9] **50** ලුණුවල
ප්‍රයෝජන තිබෙනවා. නමුත් ලුණු-
වල ලුණු රසය නැති වුණොත් එය
නැවත ඇති කරන්නේ කොහො-
මද?[10] ඔබත් ලුණු රසය ඇති ලුණු

**9 පරි.**
**1** මතෙ 16:21 මතෙ 17:23 මාක් 8:31 ලූක් 9:44
**2** ලූක් 9:45 යොහ 16:19
**3** මතෙ 18:1 ලූක් 9:46 ලූක් 22:24
**4** හිතෝ 13:10
**5** මතෙ 18:1 මතෙ 20:28 මාක් 10:43 ලූක් 9:46 පිලි 2:8
**6** මතෙ 18:2 මාක් 10:16 ලූක් 9:47 ලූක් 18:16
**7** මතෙ 10:40 මතෙ 18:3 ලූක් 9:48 යොහ 13:20
**8** ලූක් 9:49
**9** ගණන් 11:28 ක්‍රියා 19:13
**10** 1කොරි 12:3
**11** මතෙ 12:30 ලූක් 9:50 ලූක් 11:23
**12** මතෙ 25:40 රෝම 8:9 2කොරි 10:7

**2 තීරුව**
**1** මතෙ 10:42 මතෙ 25:35
**2** මතෙ 18:6 ලූක් 17:1
**3** මතෙ 5:30 කොලො 3:5
**4** මතෙ 10:28 මතෙ 23:33 ලූක් 12:5
**5** මතෙ 18:8
**6** මතෙ 5:29 මතෙ 18:9 රෝම 8:13 ගලා 5:24
**7** එළි 21:8
**8** යෙසා 66:24
**9** ලූක් 17:29
**10** මතෙ 5:13 ලූක් 14:34

මාක් **9:37*** හෝ, “මාගේ නාමයෙන්.”

මාක් **9:42*** මූ.අ., “පය පැකිළී වැටුණොත්.”
**43*** මූ.අ., “ඔබේ පය පැකිළී ඔබ වැටෙනවා නම්.”
**43#** යෙරුසලමෙන් පිටත කසළ පුළුස්සා දැමීම සඳහා භාවිත කළ ස්ථානය. උපග්‍ර. 2 බලන්න.
**45*** මාක් 9:43හි පළමුවෙනි පාදසටහන බලන්න.

මෙන් විය යුතුයි.[1] එසේ සිටීමෙන්
එකිනෙකා අතර සමාදානය පවත්වා-
ගන්න[2] ඔබට පුළුවන්.”

**10** එතැනින් පිටත්ව ගිය ඔහු
යොර්දාන් ගඟෙන් එගොඩ වී
යුදයේ මායිම්වලට ගියේය. නැවතත්
සමූහයා ඔහු වෙතට රැස් වූහ. ඔහුද
සුපුරුදු පරිදි ඔවුන්ට උගන්වන්න
පටන්ගත්තේය.[3] **2** මේ අතර පරිසි-
වරු ඔහුගේ වරදක් අල්ලාගැනීමේ
අදහසින් ඔහු ළඟට ඇවිත් මිනි-
සෙකු තම බිරිඳව දික්කසාද කිරීම
නීත්‍යානුකූලද[4] කියා ඔහුගෙන් ප්‍රශ්න
කළෝය. **3** එවිට ඔහු, “මෝසෙස්
ඔබට අණ කළේ කුමක්ද” කියා
ඔවුන්ගෙන් ඇසුවේය. **4** ඊට පිළි-
තුරු වශයෙන් “අත්හැරීමේ පත්‍රයක්
ලියා ඇයව දික්කසාද කිරීමට[5] මෝ-
සෙස් ඉඩ දී තිබෙනවා” කියා ඔවුහු
කීවෝය. **5** එවිට යේසුස් ඔවුන්ට
මෙසේ කීවේය. “ඔහු ඒ ආඥාව ඔබට
ලියා දුන්නේ ඔබ ඉතා දැඩි සිත් ඇති[6]
පිරිසක් වන නිසයි. **6** නමුත් දෙවි
මිනිසුන්ව සෑදූ කාලයේදී ඔහු ඔවුන්
ගැන අරමුණු කළ දේ පැහැදිලියි. ‘ඔහු
ඔවුන්ව පුරුෂයෙකු සහ ස්ත්‍රියක වශ-
යෙන් සෑදුවා.[7] **7** ඉන්පසු මිනිසෙක්
තම පියාගෙන්ද මවගෙන්ද වෙන්
වෙයි. **8** එවිට ඔවුන් දෙදෙනා එක්
කෙනෙකු මෙන් වෙයි’[8] කියා සඳහන්
වී තිබෙනවා. ඔවුන් එතැන් පටන් දෙ-
දෙනෙකු නොව එක් කෙනෙකු මෙන්
වෙනවා. **9** දෙවි ඔවුන්ව එලෙස
එක් කළ නිසා කිසි මිනිසෙක් ඔවුන්ව
වෙන් නොකළ යුතුයි.”[9] **10** ඔවුන්
නැවතත් නිවසක් තුළ සිටියදී[10] ගෝ-
ලයෝ ඔහුගෙන් ඒ ගැන තවත් ප්‍රශ්න
කරන්න පටන්ගත්තෝය. **11** එවිට
ඔහු ඔවුන්ට මෙසේ කීවේය. “තම
බිරිඳව දික්කසාද කර වෙන ස්ත්‍රියක
විවාහ කරගන්න කෙනෙක් ඇයට
ද්‍රෝහි වෙමින් අනාචාරයේ*[11] යෙදෙ-
නවා. **12** ඒ වගේම ස්ත්‍රියක් තම
ස්වාමිපුරුෂයාව දික්කසාද කර වෙන
පුරුෂයෙකු සමඟ විවාහ වෙනවා නම්
ඇයත් අනාචාරයේ*[1] යෙදෙනවා.”
**13** මේ අතර මිනිසුන් කිහිපදෙ-
නෙක් තම කුඩා දරුවන් සමඟ ඔහු
ළඟට ආවෝය. ඔවුන් එසේ කළේ
යේසුස් ඔවුන් පිට අත් තබා ඔවුන්ට
ආශීර්වාද කරයි කියා සිතූ නිසාය.
නමුත් ගෝලයෝ ඇවිත් ඔවුන්ට
තදින් කතා කළහ.[2] **14** එය දුටු
යේසුස්, ගෝලයන් කළ ඒ දේට
සතුටු වූයේ නැත. ඒ නිසා ඔහු
ඔවුන්ට මෙසේ පැවසුවේය. “එහෙම
කරන්න එපා. මේ කුඩා දරු-
වන්ට මා ළඟට එන්න ඉඩහරින්න.
මන්ද දෙවිගේ රාජ්‍යය අයිති වන්නේ
මේ දරුවන් වගේ සිටින අයටයි.[3]
**15** ඇත්තෙන්ම මා ඔබට කියන්නේ,
කෙනෙක් කුඩා දරුවෙක් මෙන් වී දෙ-
විගේ රාජ්‍යය පිළිගත යුතු බවයි. එසේ
නොකළොත් ඊට ඇතුල් වන්න ඔහුට
බැරි වෙයි.”[4] **16** ඉන්පසු ඔහු දරු-
වන්ව තමන් ළඟට ගෙන ඔවුන්ව
තුරුලු කරගෙන ඔවුන් පිට අත් තබා
ආශීර්වාද කළේය.[5]
**17** ඔහු එතැනින් පිටත්ව යද්දී
මිනිසෙක් ඔහු ළඟට දුවගෙන ඇවිත්
ඔහු ඉදිරියෙහි දණින් වැටී, “යහපත්
ගුරුතුමනි, සදාකාල ජීවනය උරුම
කරගැනීමට නම් මා කළ යුත්තේ
කුමක්ද”[6] කියා ඔහුගෙන් ඇසුවේය.
**18** යේසුස් ඔහුට මෙසේ කීවේය. “ඔබ
මට යහපත් කියා පවසන්නේ ඇයි?[7]
යහපත් කියා හැඳින්විය හැක්කේ
එක් කෙනෙකුව පමණයි. ඒ දෙවියි.[8]
**19** ‘මිනී නොමරන්න,[9] අනාචාර-
යේ* නොහැසිරෙන්න,[10] සොරකම්
නොකරන්න,[11] බොරු සාක්ෂි නො-
දෙන්න,[12] වංචා නොකරන්න,[13] ඔබේ
පියාටත් මවටත් ගෞරව කරන්න’[14]
යන ආඥා ගැන ඔබ හොඳින් දන්-
නවා ඇති.” **20** එවිට ඒ මිනිසා,

---

**මාක් 10:11*** මූ.අ., “පරදාර සේවනයේ.” මෙය භාවිත කරන්නේ විවාහක පුරුෂයෙකු හෝ ස්ත්‍රියක අනාචාරයේ යෙදීම විස්තර කිරීමටය.

**මාක් 10:12*** මූ.අ., “පරපුරුෂ සේවනයේ.” **19*** මාක් 10:11හි පාදසටහන බලන්න.

---

**9 පරි.**
**1** හිතෝ 15:1, හිතෝ 16:23, කොලො 4:6
**2** රෝම 12:18, එෆී 4:29, 1තෙස 5:13, හෙබ්‍රෙ 12:14

**10 පරි.**
**3** මතෙ 19:1, යොහ 10:40
**4** මලා 2:16, මතෙ 19:3
**5** ද්වි 24:1, මතෙ 5:31, මතෙ 19:7
**6** ද්වි 9:6, ක්‍රියා 13:18
**7** උත් 1:27, උත් 5:2, මතෙ 19:4
**8** උත් 2:24, එෆී 5:31
**9** මතෙ 19:6
**10** මාක් 9:28
**11** මතෙ 5:32, මතෙ 19:9, ලූක් 16:18

**2 තීරුව**
**1** රෝම 7:3, 1කොරි 7:13
**2** මතෙ 19:13, ලූක් 18:15
**3** මතෙ 18:4, මතෙ 19:14, ලූක් 18:16, 1පේතෘ 2:2
**4** මතෙ 18:3, ලූක් 18:17
**5** උත් 48:14, මාක් 9:36
**6** මතෙ 19:16, ලූක් 18:18
**7** ගීතා 86:5
**8** මතෙ 19:17, ලූක් 18:19
**9** නික් 20:13, ද්වි 5:17, මතෙ 5:21, 1යොහ 3:15
**10** නික් 20:14, ද්වි 5:18
**11** නික් 20:15, ද්වි 5:19
**12** නික් 20:16, ද්වි 5:20
**13** ලෙවී 19:13
**14** නික් 20:12, ද්වි 5:16, එෆී 6:2

“ගුරුතුමනි, මම ඒ සෑම දෙයක්ම
කුඩා කාලයේ පටන්ම පිළිපදිනවා”
කියා ඔහුට කීවේය. **21** එවිට යේ-
සුස් ඔහු දෙස ආදරයෙන් බලා ඔහුට
මෙසේ පැවසුවේය. “ඔබේ එක අඩු-
පාඩුවක් තිබෙනවා. ගොස් ඔබට
තිබෙන හැම දෙයක්ම විකුණා එයින්
ලැබෙන මුදල් දිළිඳුන්ට දෙන්න.
එසේ කළොත් ඔබට ස්වර්ගයෙහි
වස්තු රැස් කරන්න පුළුවන් වෙයි.
ඉන්පසු ඇවිත් මගේ අනුගාමිකයෙක්
වෙන්න.”[1] **22** නමුත් ඔහු යේසුස්
පැවසූ දේ ගැන දුක් වී, ශෝකයෙන්
යන්න ගියේය. එයට හේතුව නම්
ඔහුට බොහෝ ධන සම්පත් තිබීමය.[2]
**23** යේසුස් අවට බලමින්, “මුදල්
ඇති අයට[3] දෙවිගේ රාජ්‍යයට ඇතුල්
වෙන්න[4] මොන තරම් අමාරු දෙ-
යක්ද” කියා තම ගෝලයන්ට
කීවේය. **24** ගෝලයෝ ඔහු පැවසූ
දේ ගැන පුදුම වූහ.[5] එවිට යේසුස්
නැවත වරක් ඔවුන්ට මෙසේ කීවේය.
“මගේ දරුවෙනි, දෙවිගේ රාජ්‍යයට
ඇතුල් වීම මොන තරම් අමාරු
දෙයක්ද! **25** ධනවතෙකුට දෙවිගේ
රාජ්‍යයට ඇතුල් වෙනවාට වඩා ඔටු-
වෙකුට ඉඳිකටුවක සිදුරෙන් ඇතුල්
වීම පහසුයි.”[6] **26** ඔවුහු තවත් මවි-
තයට පත් වී, “එසේනම් ගැලවීම
ලැබිය හැක්කේ කාටද”[7] කියා ඔහු-
ගෙන් ඇසූහ. **27** යේසුස් ඔවුන් දෙස
හොඳින් බලා, “මිනිසුන් මොනව
කළත් තමාගේම උත්සාහයෙන් ගැල-
වීම ලබාගන්න ඔවුන්ට බැහැ. නමුත්
දෙවිට ඒ දේ ලබා දිය හැකියි. මන්ද
දෙවිට සෑම දෙයක්ම කරන්න පුළු-
වන්”[8] කියා පැවසුවේය. **28** එවිට
පේතෘස් මෙසේ කීවේය. “බලන්න,
අපි සියල්ල අත්හැර ඔබ අනුව
ආවා.”[9] **29** යේසුස් ඊට මෙසේ පිළි-
තුරු දුන්නේය. “ඇත්තෙන්ම මා
ඔබට කියන්නේ, මා නිසාත් ශුභාරං-
චිය නිසාත් කෙනෙක් ගෙවල් දො-
රවල් හෝ සහෝදර සහෝදරියන්
හෝ මව හෝ පියා හෝ දරුවන්
හෝ වතුපිටි හෝ අත්හැර ඇත්නම්,[10]

**10 පරි.**
1 මතෙ 19:21
2 ලූක් 18:23
3 යෝබ් 31:24, ගීතා 17:14, ගීතා 52:7, ගීතා 62:10, යෙරෙ 9:23, 1තිමෝ 6:17
4 මතෙ 19:24, ලූක් 18:25
5 ලූක් 4:32
6 මතෙ 19:24, ලූක් 18:25
7 මතෙ 19:25, ලූක් 18:26, 1පේතෘ 4:18
8 උත් 18:14, යෝබ් 42:2, යෙරෙ 32:17, සෙක 8:6, ලූක් 18:27
9 මතෙ 19:27, ලූක් 18:28
10 මතෙ 10:37, මතෙ 19:29, ලූක් 18:29

**2 තීරුව**
1 ලූක් 18:30
2 මතෙ 5:11, යොහ 16:22, ක්‍රියා 14:22
3 මතෙ 19:30, මතෙ 20:16, ලූක් 13:30
4 මාක් 8:31, මාක් 9:31, ලූක් 9:22, ලූක් 18:31
5 මතෙ 20:18, ලූක් 18:31
6 මතෙ 20:19, ලූක් 18:33, ක්‍රියා 10:40, 1කොරි 15:4
7 මතෙ 10:2
8 මතෙ 20:20

**30** ඔහුට මේ කාලයේදීම සිය ගුණය-
කින්[1] ගෙවල්ද සහෝදර සහෝදරි-
යන්ද මව්වරුන්ද දරුවන්ද වතුපිටිද ඒ
සමඟ හිංසා පීඩාද[2] ලැබෙන බවයි. ඒ
වගේම මතු පැමිණෙන කාලයේදී*
සදාකාල ජීවනයත් ඔහුට ලැබෙයි.
**31** නමුත් ප්‍රථමයන්ව සිටි බොහෝ-
දෙනෙක් අන්තිමයන් බවටත් අන්ති-
මයන් ප්‍රථමයන් බවටත් පත් වෙයි.”[3]
**32** ඔවුහු යෙරුසලමට නැඟ යන
මාර්ගය දිගේ ගියෝය. සියලුදෙනාටම
ඉදිරියෙන් ගමන් කළේ යේසුස්ය. ඔහු
සමඟ සිටි ඔහුගේ ගෝලයෝ එය දැක
පුදුම වූහ. නමුත් පසුපසින් පැමිණි
අනිකුත් අයට දැනුණේ බියකි. ඔහු
නැවත වරක් දොළොස්දෙනාව පැත්-
තකට කැඳවා, තමන්ට සිදු වීමට
නියමිත දේවල් ගැන ඔවුන්ට මෙසේ
කීවේය.[4] **33** “අපි දැන් මේ යන්නේ
යෙරුසලමටයි. එහිදී මනුෂ්‍ය පුත්‍රයාව
නායක පූජකයන් හා නීතිය පිටපත්
කරන්නන් අතට භාර දෙනු ලබ-
නවා. ඔවුන් ඔහුව මරණයට නියම
කර වෙනත් ජාතීන්ට භාර දෙයි.[5]
**34** ඒ අය ඔහුට කවටකම් කර කෙළ
ගසා, කසයෙන් තළයි. අන්තිමේදී
ඔහුව මරණයට පත් කරයි. ඒ වුණත්
තුන් දවසකින් ඔහුව නැවත නැඟිටු-
වනවා.”[6]
**35** සෙබදීගේ පුත්‍රයන් දෙදෙනා වූ[7]
යාකොබ් සහ යොහන් ඔහු ළඟට
ඇවිත්, “ගුරුතුමනි, අපි ඔබෙන් ඉල්-
ලන ඕනෑම දෙයක් ඔබ අප
වෙනුවෙන් කරනවාද”[8] කියා ඔහු-
ගෙන් ඇසුවෝය. **36** ඔහු, “මා ඔබ
වෙනුවෙන් කුමක් කරනවාටද ඔබ
කැමති” කියා ඔවුන්ගෙන් ඇසුවේය.
**37** ඔවුහු ඔහුට මෙසේ කීවෝය.
“ඔබට ස්වර්ගයේ පාලන බලය
ලැබෙන විට අප දෙදෙනාගෙන් එක්
කෙනෙකුට ඔබේ දකුණු පැත්තෙන්
අනික් තැනැත්තාට ඔබේ වම් පැත්-
තෙන් ඔබ සමඟම ඉඳගෙන සිටින්න

මාක් **10:30*** හෝ, “සමාජ ක්‍රමයේදී.” ග්‍රීක බසින්, එඔනි.

අවස්ථාව ලබා දෙන්න."[1] **38** එවිට
යේසුස් ඔවුන්ට මෙසේ පිළිතුරු දුන්-
නේය. "ඔබ ඉල්ලන්නේ කුමක්ද කියා
ඔබටවත් හරියට තේරෙන්නේ නැහැ.
මට බොන්න සිදු වන දේ බොන්න-
වත් මා බව්තීස්ම වන අයුරින් බව්-
තීස්ම වන්නවත් ඔබට පුළුවන්ද?"[2]
**39** ඔවුහුද, "අපට පුළුවන්" කියා පිළි-
තුරු දුන්නෝය. එවිට යේසුස් ඔවුන්ට
මෙසේ කීවේය. "මට බොන්න සිදු
වන දේ බොන්න ඔබටත් සිදු වෙයි.
මා බව්තීස්ම වන අයුරින් ඔබවත්
බව්තීස්ම කරයි.[3] **40** නමුත් මගේ
දකුණු පැත්තේ හෝ වම් පැත්තේ
හෝ ඉඳගන්න ලැබීමේ වරප්‍රසාදය
ලබා දෙන්නේ කාටද කියා තීර-
ණය කරන්න මට අයිතියක් නැහැ.[4]
එය හිමි වන්නේ ඒ සඳහා දෙවි තීර-
ණය කර ඇති අයටයි."

**41** අනික් දසදෙනාට ඒ ගැන
අසන්න ලැබුණු විට ඔවුහු යාකොබ්
සහ යොහන් සමඟ අමනාප වූහ.[5]
**42** නමුත් යේසුස් ඔවුන්ව කැඳවා
මෙසේ පැවසුවේය. "විවිධ ජාතීන්ව
පාලනය කරන අය තම තනතුරුවල
වැජඹෙමින් සිටින බවත් බලධාරීන්
තමන් යටතේ සිටින්නන් කෙරෙහි
දැඩි ලෙස තම අණසක පතුරුවන
බවත් ඔබ දන්නවා.[6] **43** නමුත් ඔබ
අතරේ එවැනි දෙයක් සිදු නොවිය
යුතුයි. ඔබ අතරෙහි උතුම් වන්න
ඕනෑ කරන යමෙක් සිටිනවා නම්
ඔහු ඔබේ සේවකයා විය යුතුයි.[7]
**44** ඔබ අතරෙහි ප්‍රථමයා වන්න ඕනෑ
කරන යමෙක් සිටිනවා නම් ඔහු අන්
සියලුදෙනාගේ දාසයා විය යුතුයි.[8]
**45** මනුෂ්‍ය පුත්‍රයා පවා පැමිණියේ
සේවය ලබන්න නොවෙයි.[9] සේවය
කරන්න හා බොහෝදෙනෙකුව[10] මුද-
වාගැනීම සඳහා තම ජීවිතය පූජා
කරන්නයි."[11]

**46** ඉන්පසු ඔවුහු යෙරිකෝවට
ගියහ. ඔහු තම ගෝලයන් සහ විශාල
සමූහයක් සමඟ යෙරිකෝවෙන්
පිටත්ව යද්දී, (තිමේයස්ගේ පුත්)
බාතිමේයස් නම් අන්ධ හිඟන්නෙක්
පාර අයිනේ ඉඳගෙන සිටියේය.[1]
**47** නාසරෙත් නුවරින් පැමිණි යේ-
සුස් තමන් සිටින ස්ථානය පසු කර-
ගෙන යන බව ඔහු දැනගත් විට,
"දාවිත්ගේ පුත්[2] යේසුස්, මට අනු-
කම්පා කරන්න"[3] කියා මහත් හඬින්
පැවසුවේය. **48** නිහඬ වෙන්න කියා
බොහෝදෙනෙකු ඔහුට තදින් කතා
කළත්, "දාවිත්ගේ පුත්‍රය, මට අනු-
කම්පා කරන්න"[4] කියා ඔහු තව තවත්
හයියෙන් කෑගැසුවේය. **49** එවිට
යේසුස් නැවතී, "ඔහුට අඬගසන්න"
කියා කීවේය. ඔවුහු අන්ධ මිනිසාට
අඬගසා, "කිසිම දෙයකට භය වෙන්න
එපා. නැඟිටලා යන්න. ඔහු ඔබට
අඬගසනවා"[5] කියා ඔහුට කීවෝය.
**50** ඔහු තම පිට වස්ත්‍රය ගලවා
පැත්තකට දමා ඉක්මනින්ම නැඟිට
යේසුස් ළඟට ගියේය. **51** යේසුස්,
"මා ඔබ වෙනුවෙන් කුමක් කර-
නවාටද ඔබ කැමති"[6] කියා ඇසු-
වේය. අන්ධ මිනිසා, "ගුරුතුමනි,*
මගේ ඇස් පාදන්න"[7] කියා ඔහුට
කීවේය. **52** යේසුස් ඔහුට, "ඔබේ
විශ්වාසය නිසා ඔබට සුවය ලැබෙ-
නවා.[8] ඔබට දැන් යන්න පුළුවන්"
කියා කීවේය. ඒ මොහොතේදීම ඔහුට
පෙනීම ලැබිණ.[9] ඉන්පසු ඔහු යේසුස්
ගිය මඟ දිගේ ඔහු පසුපස ගියේය.[10]

**11** යේසුස් සහ ඔහුගේ ගෝ-
ලයෝ යෙරුසලමට ළං වී
ඔලීව කන්ද මත පිහිටි බෙත්පා-
ගය සහ බෙතානිය[11] නම් නුවරවල්
ළඟට ගියෝය. එහිදී යේසුස් තම
ගෝලයන් දෙදෙනෙකුව පිටත් කර
යවමින්,[12] **2** ඔවුන්ට මෙසේ පැව-
සුවේය. "ඔබට පෙනෙන අර ගමට
යන්න. ඔබ එයට ඇතුල් වූ ගමන්ම
කිසි මිනිසෙකු මේ වන තුරු ඉඳ-
ගෙන නැති බූරු නාම්බෙක් බැඳ
තබා ඇති ආකාරය ඔබ දකියි.
ඌව ලිහා මෙතනට ගෙනෙන්න.[13]
**3** කවුරු හරි කෙනෙක්, 'ඔබ මො-
නවාද ඔය කරන්නේ' කියා ඇසු-

**10 පරි.**
1 මතෙ 19:28
මතෙ 20:21
2 මතෙ 20:22
ලූක් 12:50
යොහ 18:11
රෝම 6:3
3 මතෙ 20:23
ක්‍රියා 12:2
එළි 1:9
4 යාකො 4:3
5 මතෙ 20:24
6 මතෙ 20:25
ලූක් 22:25
1පේතෘ 5:3
7 මතෙ 20:26
මාක් 9:35
ලූක් 9:48
8 මතෙ 20:27
ලූක් 22:26
9 යොහ 13:14
පිලි 2:7
10 ලෙවී 16:17
මතෙ 20:28
11 යෙසා 53:10
දානි 9:24
2කොරි 5:21
ගලා 3:13
තීත 2:14

**2 තීරුව**
1 මතෙ 20:29
ලූක් 18:35
2 යෙරෙ 23:5
මතෙ 9:27
මතෙ 15:22
රෝම 1:3
3 ලූක් 18:38
4 මතෙ 20:31
ලූක් 18:39
5 මතෙ 20:32
ලූක් 18:40
6 මාක් 10:36
7 මතෙ 20:33
ලූක් 18:41
8 මතෙ 9:22
ලූක් 8:48
9 යෙසා 35:5
යෙසා 42:7
මාක් 8:25
ක්‍රියා 26:18
10 මතෙ 20:34
ලූක් 18:43

**11 පරි.**
11 යොහ 11:18
12 මතෙ 21:1
ලූක් 19:29
13 මතෙ 21:2
ලූක් 19:30

මාක් **10:51*** එනම්, රබ්බෝනි.

වොත්, 'ස්වාමීන්ට ඌව දැන් අවශ්‍ය
වී තිබෙනවා. ඔහු ඌව ඉක්මනින්ම
ආපසු භාර දෙයි'[1] කියා කියන්න."
**4** එහෙයින් ඔවුහු ගොස් අතුරු පාරේ
ගෙයක දොරකඩ බූරු නාම්බෙකු
බැඳ සිටිනවා දැක ඌව ලිහන්න
පටන්ගත්තෝය.[2] **5** එවිට එහි සිට-
ගෙන සිටි අයගෙන් සමහරෙක්, "ඔබ
මොනවාද කරන්නේ? ඔය බූරු නාම්-
බාව ලිහන්නේ ඇයි"[3] කියා ඔවුන්-
ගෙන් ඇසූහ. **6** ඔවුහු යේසුස් පැවසූ
ආකාරයට ඔවුන්ට කාරණා පැහැදිලි
කළෝය. එවිට ඔවුහු ඔවුන්ට යන්න
ඉඩහැරියහ.[4]

**7** ඔවුහු බූරු නාම්බාව යේසුස්
ළඟට ගෙන[5] ගොස් ඌ පිට තම
පිට වස්ත්‍ර ඇමුවෝය. ඉන්පසු යේ-
සුස් ඌ පිට ඉඳගත්තේය.[6] **8** බො-
හෝදෙනෙක් තම පිට වස්ත්‍ර මඟ
දිගේ එළූ අතර[7] තවත් අය ඒ මඟ
දෙපස[8] තිබූ රටඉඳි ගස්වලින් අතු
කපාගෙන[9] ඔවුන්ට එක් වූහ. **9** යේ-
සුස්ට ඉදිරියෙන්ද පිටුපසින්ද ගමන්
කරමින් සිටි අය, "ඔහුට ආරක්ෂාව
ලැබේවා![10] යෙහෝවා දෙවිගේ නාම-
යෙන්[11] එන තැනැත්තාට ආශීර්වාද
ලැබේවා! **10** අපේ පිය වූ දාවිත්-
ගේ මතු පැමිණෙන රාජ්‍යයට ආශීර්-
වාද වේවා![12] ඉතා උස් තැන්හි සිටින
තැනැත්තාණෙනි, ඔහුව ආරක්ෂා
කරන්න" කියා හඬ නඟා කීවෝය.
**11** යේසුස් යෙරුසලමට පැමිණ දේව-
මාලිගාවට ඇතුල් වී අවට සිදු වන
සියල්ල දෙස බැලුවේය. අඳුර වැටී
තිබූ නිසා ඔහු ගෝලයන් දොළොස්-
දෙනා සමඟ එතැනින් පිටත් වී බෙ-
තානියට ගියේය.[13]

**12** පසුවදා ඔවුන් බෙතානියෙන්
පිටත් වී ගමන් කරන විට ඔහුට බඩ-
ගින්නක් දැනිණ.[14] **13** ඔහු කොළ
ඇති අත්තික්කා ගසක් දුරදීම දුටු-
වේය. ඒ කාලය අත්තික්කා වාරය
නොවුණත් කෑමට එහි අත්තික්කා
තිබේද කියා බැලීමට ඔහු ගස ළඟට
ගිය විට එහි කොළ හැර ගෙඩි කිසි-
වක් තිබුණේ නැත.[15] **14** එවිට ඔහු,
"මෙතැන් පටන් සදහටම කිසිවෙකු
මේ ගසෙන් පල කන්නේ නැහැ"[1] කියා
කීවේය. ඔහු ඒ අවස්ථාවේදී පැවසූ
දේට සවන් දෙමින් සිටියේ ඔහුගේ
ගෝලයන්ය.

**15** ඔවුහු ඉන්පසු නැවතත් යෙරු-
සලමට ගියහ. එහිදී ඔහු දේවමාලි-
ගාවට ඇතුල් වී, එහි විකුණමින්ද
මිල දී ගනිමින්ද සිටි අයව පිට-
තට එළවා දැමුවේය. ඔහු මුදල්
මාරු කරන්නන්ගේ මේසද පරෙවි-
යන් විකුණමින් සිටි අයගේ බංකුද
පෙරළා දැමුවේය.[2] **16** ඊට අමතරව
දේවමාලිගාව මැදින් කිසිම භාණ්ඩ-
යක් ගෙන යෑමට ඔහු කිසිවෙකුට
ඉඩ නොදුන්නේය. **17** ඔහු, " 'මාගේ
ගෘහය හඳුන්වනු ලබන්නේ සියලු
ජාතීන් සඳහා[3] තිබෙන යාච්ඤා ගෘහ-
යක්[4] ලෙසයි' කියා ලියා තිබෙ-
නවා නොවෙයිද? නමුත් ඔබ එය
කොල්ලකාරයන්ගේ ගුහාවක්[5] බවට
පත් කර තිබෙනවා" කියා පැවසුවේය.
**18** ඔහු පැවසූ දේ නායක පූජකයන්-
ටත් නීතිය පිටපත් කරන්නන්ටත්
ඇසුණු විට ඔවුහු යේසුස්ව මරා දැමී-
මට මං සෙවූහ.[6] නමුත් ඔහු ඉගැන්වූ
දේවල් අසා මුළු සමූහයා නිතරම මවි-
තයට පත් වන ආකාරය[7] දුටු ඔවුහු
ඔහුට භය වූහ.

**19** අඳුර වැටුණු විට ඔවුහු නුවරින්
පිටත්ව ගියෝය. **20** ඊළඟ දවසේ
හිමිදිරි උදෑසනින්ම ඔවුහු නැවතත්
ගමන් කරන විට කලින් දවසේ
දුටු අත්තික්කා ගස සම්පූර්ණයෙන්ම
මැලවී තිබෙන ආකාරය ඔවුහු දුටු-
වෝය. එහි මුලත් වියළී තිබිණ.[8]
**21** පේතෘස් කලින් දින සිදු වූ දේ
මතකයට නංවමින්, "ගුරුතුමනි, අර
බලන්න! ඔබ ශාප කළ අර අත්-
තික්කා ගස මැලවී ගිහිල්ලා" කියා
කීවේය.[9] **22** එවිට යේසුස් මෙසේ
පිළිතුරු දුන්නේය. "දෙවි කෙරෙහි
විශ්වාසය ඇතුව සිටින්න. **23** මා
ඔබට කියන මේ දේට සවන් දෙන්න.
යමෙක් මේ කන්දට, 'මෙතැනින්
ඉවත් වී මුහුදේ ගිලෙන්න' කියා පවසා

**11 පරි.**
1 මතෙ 21:3, ලූක් 19:31, යොහ 13:13
2 මතෙ 21:6, ලූක් 19:32
3 ලූක් 19:33
4 ලූක් 19:34
5 1රාජා 1:33, සෙක 9:9
6 මතෙ 21:7, යොහ 12:14
7 2රාජා 9:13
8 මතෙ 21:8, ලූක් 19:36
9 යොහ 12:13
10 ගීතා 118:25, මතෙ 21:15
11 ගීතා 118:26, මතෙ 21:9, ලූක් 19:38, යොහ 12:13
12 සෙක 9:9, ලූක් 1:32, ක්‍රියා 2:29
13 මතෙ 21:10
14 මතෙ 21:18
15 මතෙ 21:19

**2 තීරුව**
1 මාක් 11:20
2 මතෙ 21:12, ලූක් 19:45, යොහ 2:14
3 යෙසා 60:7, සෙක 2:11
4 1රාජා 8:43, යෙසා 56:7
5 යෙරෙ 7:11, මතෙ 21:13, ලූක් 19:46, යොහ 2:16
6 මාක් 14:1, ලූක් 19:47, ලූක් 20:19
7 මතෙ 21:46, ලූක් 19:48
8 මතෙ 21:19
9 මාක් 11:14

ඒ ගැන කිසිම සැකයක් නොතබා
තමන් කී දේ සිදු වෙනවාමයි යන විශ්-
වාසයෙන් සිටියොත් ඒ දේ අනිවාර්ය-
යෙන්ම සිදු වෙයි.[1] **24** එමෙන්ම මා
ඔබට කියන මේ දේ හොඳින් මතක
තබාගන්න. ඔබ යාච්ඤාවෙන් ඉල්-
ලන සෑම දෙයක්ම ඔබට මේ වන
විටත් ලැබී තිබෙනවා කියා විශ්-
වාස කරන්න. එවිට ඒ දේවල් ඔබට
අනිවාර්යයෙන්ම ලැබෙයි.[2] **25** ඔබ
යාච්ඤා කරන අවස්ථාවේදී තව කෙ-
නෙකු සමඟ යම් ගැටලුවක් ඔබට
තිබිය හැකියි. එසේනම් ඔහුට සමාව
දෙන්න.[3] ස්වර්ගයේ සිටින ඔබේ පියා-
ණන් ඔබේ වැරදිවලට සමාව දෙන්-
නේ ඔබ එසේ කළොත් පමණයි."[4]
**26** ——

**27** ඔවුහු නැවතත් යෙරුසලමට
ගියහ. ඔහු දේවමාලිගාවෙහි ඇවිදි-
මින් සිටියදී නායක පූජකයෝද නීතිය
පිටපත් කරන්නෝද වැඩිමහල්ලෝද
ඔහු ළඟට ඇවිත්,[5] **28** "අවසරයක්
ඇතුවද ඔබ මේ දේවල් කරන්නේ?
කවුද ඔබට ඒ අවසරය දුන්නේ" කියා
ඔහුගෙන් ඇසූහ.[6] **29** එවිට යේසුස්
ඔවුන්ට මෙසේ කීවේය. "මමත් කැම-
තියි ඔබෙන් ප්‍රශ්නයක් අසන්න. ඔබ
ඒ ප්‍රශ්නයට පිළිතුරු දුන්නොත් මා
කරන දේවල් කරන්න මට අවසර
ලැබුණේ කාගෙන්ද කියා මමත් ඔබට
කියන්නම්.[7] **30** යොහන් මිනිසුන්ව
බව්තීස්ම කළේ[8] දෙවිගේ අවසර-
යෙන්ද නැත්නම් මිනිසුන්ගේ අවස-
රයෙන්ද කියා මට කියන්න
පුළුවන්ද?"[9] **31** ඔවුහු තම තමන්
අතරේ මෙසේ කතා කරගත්තෝය.
"අප 'දෙවිගේ අවසරයෙන්' කියා කිව්-
වොත්, 'ඔබ ඔහුව විශ්වාස නොක-
ළේ ඇයි' කියා ඔහු අපෙන්
අසයි.[10] **32** නමුත් 'මිනිසුන්ගේ අව-
සරයෙන්' කියා පවසන්නත් අපට
බැහැ." . . . සියලුදෙනා යොහන්ව
අනාගතවක්තෘවරයෙකු ලෙස පිළි-
ගත් නිසා ඔවුහු සමූහයාට භයෙන්
සිටියහ.[11] **33** එහෙයින් ඔවුහු පිළි-
තුරු වශයෙන් යේසුස්ට මෙසේ පැවසු-
වෝය. "අපි දන්නේ නැහැ." යේසුස්ද,
"එසේනම් මම මේ දේවල් කරන්-
නේ කාගේ අවසරයෙන්ද කියා මමත්
ඔබට කියන්නේ නැහැ" කියා කීවේය.[1]

**12** ඔහු උපමා යොදාගෙන
ඔවුන්ට මෙසේ කීවේය. "මිදි-
වත්තක් වැවූ එක්තරා මිනිසෙක්
සිටියා.[2] ඔහු එය වටා වැටක් බැඳ,[3]
මිදි පෑගීම සඳහා වළක් හාරා, ටැඹක්
ඉදි කර එය වැවිලිකරුවන් පිරිස-
කට බද්දට දී[4] පිටරට ගියා.[5] **2** පල-
දාව නෙළන කාලය පැමිණි විට
මිදිවත්තේ පලදාවෙන් යමක් ලබා-
ගැනීමට ඔහු ඒ වැවිලිකරුවන් වෙ-
නට ඔහුගේ දාසයෙකුව යැව්වා.[6]
**3** නමුත් ඔවුන් ඔහුව අල්ලාගෙන
ඔහුට තැළුවා. ඔහු එතැනින් පිටත්
වූයේ හිස් අතින්.[7] **4** පසුව ඔහු
තවත් දාසයෙකුව ඔවුන් වෙනට
යැව්වා. ඔවුන් මේ දාසයාගෙත් හිසට
පහර දී ඔහුට නින්දා කළා.[8] **5** ඔහු
තවත් දාසයෙකුව යැවූ විට ඔවුන්
ඔහුව මරණයට පත් කළා. ඉන්ප-
සුව ඔහු දාසයන් බොහෝදෙනෙකුව
යැව්වා. ඔවුන්ගෙන් සමහරදෙනෙකු-
ටද ඔවුන් තැළුවා. තවත් සමහරෙකුව
මරා දැම්මා. **6** අවසානයේදී ඔවුන්
වෙත යැවීමට ඔහුට ඉතුරුව සිටියේ
එක් කෙනෙක් පමණයි. ඒ ඔහුගේ ප්‍රේ-
මණීය පුත්‍රයායි.[9] 'ඔවුන් මාගේ පුත්‍ර-
යාට ගරු කරයි'[10] කියා සිතාගෙන
ඔහු ඔහුවත් ඔවුන් වෙනට යැව්වා.
**7** එවිට ඒ වැවිලිකරුවන් තම තමන්
අතරේ කතා කරගනිමින්, 'මොහු
තමයි උරුමක්කාරයා.[11] එන්න, අපි
මොහුව මරා දමමු. එතකොට ඔහුගේ
උරුමය අයිති වන්නේ අපටයි'[12] කියා
පැවසුවා. **8** එමනිසා ඔවුන් ඔහුව
අල්ලාගෙන මරා[13] ඔහුව මිදිවත්තෙන්
පිටතට ඇද දැමුවා.[14] **9** මිදිවත්තේ
අයිතිකරු පැමිණි විට ඔහු ඒ වැවිලික-
රුවන්ට කුමක් කරයිද? ඔහු ඔවුන්ව
විනාශ කර මිදිවත්ත[15] වෙනත් පිරිස-
කට භාර දෙයි.[16] **10** මේ දේ ඔබ
ශුද්ධ ලියවිල්ලෙන් කවදාවත් කියවා

**11 පරි.**
1 මතෙ 17:20, මතෙ 21:21, ලූක් 17:6, 1කොරි 13:2
2 මතෙ 7:7, මතෙ 18:19, මතෙ 21:22, ලූක් 11:9, යොහ 14:13, යොහ 15:7, යොහ 16:24
3 මතෙ 6:14, එෆී 4:32, කොලො 3:13
4 ගීතා 103:12, මතෙ 6:12
5 මතෙ 21:23, ලූක් 20:1
6 ලූක් 20:2
7 මතෙ 21:24, ලූක් 20:3
8 මාක් 1:4
9 මතෙ 21:25, ලූක් 20:4
10 ලූක් 20:5
11 මතෙ 3:5, මතෙ 14:5, මතෙ 21:26, මාක් 6:20, ලූක් 20:6

**2 තීරුව**
1 හිතෝ 26:4, මතෙ 7:6, මතෙ 21:27, ලූක් 20:8

**12 පරි.**
2 ගීතා 80:8, යෙරෙ 2:21
3 යෙසා 5:2
4 සල 8:11
5 මතෙ 21:33, ලූක් 20:9
6 මතෙ 21:34, ලූක් 20:10
7 මතෙ 21:35
8 මතෙ 21:36, ලූක් 20:11, හෙබ්‍රෙ 11:37
9 ගීතා 2:7, මතෙ 1:23, ගලා 4:4, 1යොහ 4:9
10 මතෙ 21:37, ලූක් 20:13
11 ගීතා 2:8, හෙබ්‍රෙ 1:2
12 මතෙ 21:38, ලූක් 20:14
13 ක්‍රියා 2:23
14 මතෙ 21:39, ලූක් 20:15, හෙබ්‍රෙ 13:12
15 ක්‍රියා 28:28
16 මතෙ 21:41, ලූක් 20:16

නැද්ද? එනම්, ‘ඉදි කරන්නන් ඉවත
දැමූ ඒ ගල[1] ප්‍රධාන ගල වී ඇත.[2]
**11** එය යෙහෝවා දෙවි විසින්ම කළ
මහත් ක්‍රියාවක්ය. අපේ ඇස්වලට එය
අදහාගත නොහැකි තරම්ය.’ ”[3]

**12** ඔහු එම උපමාව පැවසුවේ
තමන් ගැන බව තේරුම්ගත් ඔවුහු,
ඔහුව අල්ලාගන්න මඟක් සෙවූහ.
නමුත් ඔවුහු සමූහයාට බිය වූ නිසා
ඔහුගෙන් අහකට ගියෝය.[4]

**13** යේසුස් පවසන දෙයකින් ඔහුව
වරදකට අසු කරගැනීම සඳහා[5] ඔවුහු,
පරිසිවරුන් පිරිසක් සහ හෙරොද්ට
පක්ෂව සිටි[6] අයගෙන් කිහිපදෙනෙ-
කුව ඔහු වෙතට යැවූහ. **14** ඔවුහු
පැමිණ ඔහුට මෙසේ කීවෝය. “ගුරු-
තුමනි, ඔබ සත්‍යය කතා කරන
බවත් මිනිසුන්ගේ බාහිර පෙනුම දෙස
බලා කිසිවෙකුට විශේෂ සැලකිල්ලක්
නොදක්වන බවත් අපි දන්නවා. දෙවි
පෙන්වා දෙන මාර්ගය ඔබ උගන්වන්-
නේ සත්‍ය කාරණා පදනම් කරගෙ-
නයි.[7] ඒ නිසා සීසර්ට බදු ගෙවිය යුතුද
නැද්ද කියා අපට කියන්න පුළුවන්ද?
**15** අප ගෙවන්නද නැත්නම් නො-
ගෙවා සිටින්නද?”[8] යේසුස් ඔවුන්ගේ
කුහකකම අවබෝධ කරගෙන, “ඔබ
මගේ වරදක් අල්ලගන්න උත්සාහ
කරන්නේ ඇයි? ඩිනාරි* කාසියක්
මට දෙන්න”[9] කියා ඔවුන්ට කීවේය.
**16** ඔවුහු එක් කාසියක් ඔහුට දුන්
විට, “මෙහි තිබෙන රූපයත් නමත්
කාගේද” කියා ඔහු ඔවුන්ගෙන් ඇසු-
වේය. “සීසර්ගේ”[10] කියා ඔවුහු පිළි-
තුරු දුන්නෝය. **17** එවිට යේසුස්,
“සීසර්ට අයිති දේ සීසර්ටත්[11] දෙවිට
අයිති දේ දෙවිටත් දෙන්න”[12] කියා
පැවසුවේය. ඔහු පැවසූ දේ ගැන ඔවුහු
මවිත වූහ.[13]

**18** මිය ගිය අය නැවත නැඟි-
ටින්නේ නැති බව කියන සද්දුසිව-
රුන්ගෙන්* කිහිපදෙනෙක් ඔහු ළඟට
ඇවිත් ඔහුගෙන් මෙසේ ඇසූහ.[14]

12 පරි.
1 ක්‍රියා 4:11
2 ගීතා 118:22 මතෙ 21:42 ලූක් 20:17 එෆී 2:20 1පේතෘ 2:7
3 ගීතා 118:23
4 මතෙ 21:45 මාක් 11:18 ලූක් 20:19
5 මතෙ 22:15 ලූක් 20:20
6 මාක් 3:6
7 මතෙ 22:16 ලූක් 20:21
8 මතෙ 22:17 ලූක් 20:22
9 මතෙ 22:18 ලූක් 20:23
10 මතෙ 22:20 ලූක් 20:24
11 රෝම 13:7 තීත 3:1 1පේතෘ 2:13
12 මතෙ 22:21 ලූක් 20:25
13 මතෙ 22:22
14 මතෙ 22:23 ලූක් 20:27 ක්‍රියා 23:8

2 තීරුව
1 මතෙ 22:24 ලූක් 20:28
2 උත් 38:8 ද්වි 25:5
3 මතෙ 22:25 ලූක් 20:29
4 මතෙ 22:26 ලූක් 20:31
5 මතෙ 22:28 ලූක් 20:33
6 මතෙ 22:29 ලූක් 20:34
7 මතෙ 22:30 ලූක් 20:35
8 නික් 3:2 මතෙ 22:31 ලූක් 20:37
9 මතෙ 22:32 ලූක් 20:38

**19** “ගුරුතුමනි, ‘කෙනෙකු දරුවන්
නැතුව මිය ගියොත් ඔහුගේ සහෝද-
රයා[1] ඔහුගේ බිරිඳව විවාහ කරගෙන
තම සහෝදරයාගේ නමින්[2] දරුවන්
බිහි කළ යුතුයි’ කියා මෝසෙස්ට
දෙන ලද නීතියේ සඳහන් වී තිබුණා.
**20** එක්තරා පවුලක සහෝදරයන්
හත්දෙනෙක් සිටියා. පළමුවෙනියා
ස්ත්‍රියක් සමඟ විවාහ වුණත් ඔහු
දරුවන් නැතුව මිය ගියා.[3] **21** එම-
නිසා පවුලේ දෙවෙනියා ඇයව විවාහ
කරගත්තා. නමුත් ඔහුත් මිය ගියා.
ඔහුටත් දරුවන් සිටියේ නැහැ. තුන්-
වෙනියාත් ඇයව විවාහ කරගත්-
තත් ඔහුත් දරුවන් නැතුව මිය
ගියා. **22** එයාකාරයට එම පවුලේ
සිටි සහෝදරයන් හත්දෙනාම ඇයව
විවාහ කරගත්තත් ඒ හත්දෙනාම
දරුවන් නැතුව මිය ගියා. අන්ති-
මේදී ඒ ස්ත්‍රියත් මිය ගියා.[4] **23** හත්-
දෙනාම ඇයව විවාහ කරගත් නිසා
නැවත නැඟිටීමේදී ඇය කාගේ බිරිඳ
වෙයිද?”[5] **24** එවිට යේසුස් ඔවුන්ට
මෙසේ කීවේය. “ඔබට මේ ගැන
තිබෙන්නේ වැරදි වැටහීමක්. ශුද්ධ
ලියවිල්ල ගැනවත් දෙවිගේ බලයේ
ක්‍රියාකාරිත්වය ගැනවත් හරි අව-
බෝධයක් ඔබට නැති බව මෙ-
යින් පෙනෙනවා.[6] **25** මන්ද නැවත
නැඟිටීමේදී මිනිසුන් විවාහ වන්නේ-
වත් ස්ත්‍රීන්ව විවාහ කර දෙන්නේවත්
නැහැ. ඔවුන් ස්වර්ගයේ සිටින දේවදූ-
තයන්ට සමාන වෙනවා.[7] **26** මිය
ගිය අය නැවත නැඟිටුවනු ලබන
බව මෝසෙස්ගේ ලියවිල්ලෙහි සඳ-
හන් කටු පඳුර අසල සිද්ධියෙන් පැහැ-
දිලි වෙනවා. ඒ ගැන ඔබ කියවා
නැද්ද? එම වාර්තාවේ ‘මම ආබ්‍රහම්-
ගේද ඊසාක්ගේද යාකොබ්ගේද දෙ-
විය’ කියා දෙවි මෝසෙස්ට කිව්වා.[8]
**27** එයින් පැහැදිලි වන්නේ ඔහු මිය
ගොස් ඇති අයගේ දෙවි නොව ජීවත්
වන අයගේ දෙවි බවයි. එහෙයින් ඔබේ
නිගමනය සම්පූර්ණයෙන්ම වැරදියි.”[9]

**28** එතැනට ඇවිත් ඔවුන්ගේ විවා-
දය අසාගෙන සිටි නීතිය පිටපත්

---

**මාක් 12:15*** මාක් 6:37හි පාදසටහන බලන්න.
**18*** යේසුස්ගේ කාලයේ සිටි ප්‍රසිද්ධ ආගමික නායකයන් පිරිසකි.

කරන්නෙක් යේසුස් ඔවුන්ට ඉතා
හොඳින් පිළිතුරු දුන් බව තේ-
රුම්ගෙන, “සියලු ආඥා අතරින්
ප්‍රධානම ආඥාව කුමක්ද”[1] කියා ඔහු-
ගෙන් ඇසුවේය. **29** එවිට යේසුස්
මෙසේ පිළිතුරු දුන්නේය. “පළමු-
වෙනි ආඥාව මෙයයි. ‘ඊශ්‍රායෙල්ව-
රුනි, සවන් දෙන්න. අපගේ දෙවි
යෙහෝවායි. යෙහෝවා යන නමින්
සිටින්නේ එකම දෙවි කෙනෙක් පම-
ණයි.[2] **30** ඔබේ දෙවි වන යෙහෝ-
වාට ඔබේ මුළු හදවතින්ම ප්‍රේම
කරන්න. ඔහු වෙනුවෙන් ඔබේ මුළු
ජීවිතයම කැප කරන්න. එලෙසම
ඔබේ මුළු ශක්තියම ඔහු වෙනු-
වෙන් වැය කරන්න. නිතරම ඔබේ
මනසේ මුල් තැන හිමි විය යුත්-
තේ ඔහුටයි.’*[3] **31** දෙවෙනි ආඥාව
මෙයයි. ‘ඔබට මෙන් ඔබේ අසල්වැ-
සියාටද ප්‍රේම කරන්න.’[4] ඒ ආඥා දෙ-
කට වඩා උතුම් ආඥාවක් නැහැ.”
**32** නීතිය පිටපත් කරන එම
තැනැත්තා ඔහුට මෙසේ කීවේය.
“ගුරුතුමනි, ‘දෙවි එක් කෙනෙක්. ඔහු
හැර වෙන කිසි දෙවි කෙනෙක් නැහැ’[5]
කියා ඔබ පැවසූ දේ ඉතා නිවැරදියි.
එය සත්‍යයක්. **33** ඔහුට මුළු හදව-
තින්ම ප්‍රේම කිරීමත් ඔහු වෙනුවෙන්
මුළු ශක්තිය යොදා උපරිමය කිරී-
මත් ඔහුව සතුටු කිරීම ගැන නිතරම
මනස යොමු කර තැබීමත් තමන්ට
මෙන් තම අසල්වැසියාට ප්‍රේම කිරී-
මත් අවශ්‍යයි. ඒ වගේම ඒ දේවල් සිය-
ලුම දවන පූජා හා යාගවලට වඩා
වටිනවා.”[6] **34** එවිට යේසුස්, ඔහු
බුද්ධිමත් ලෙස පිළිතුරු දුන් බව වට-
හාගෙන, “දෙවිගේ රාජ්‍යයට ඇතුල්
වෙන්න ඔබට තව වැඩි දුර යන්න
අවශ්‍ය නැහැ” කියා කීවේය. ඉන් අන-
තුරුව යේසුස්ගෙන් කිසි ප්‍රශ්නයක්
අසන්න කිසිවෙකු තුළ ධෛර්යයක්
නොතිබිණ.[7]

**35** යේසුස් දේවමාලිගාවේදී සෙ-
නහට උගන්වමින් සිටිද්දී ඔහු ඔවුන්-
ගෙන් මෙසේ ඇසුවේය. “ක්‍රිස්තුස්
දාවිත්ගේ පුත්‍රයා[1] කියා නීතිය පිට-
පත් කරන්නන් කියන්නේ කුමන
පදනමක් මතද? **36** දාවිත්ම දෙවි-
ගේ මඟ පෙන්වීමට එකඟව[2] මෙසේ
පැවසුවා. ‘යෙහෝවා දෙවි මාගේ
ස්වාමීන්ට මෙසේ කීවේය. “මාගේ
දකුණු පැත්තේ ඉඳගන්න. මා ඔබේ
සතුරන්ව ඔබේ පාද යට දමන
තුරු එසේ සිටින්න.” ’[3] **37** දාවිත්ම
ඔහුට, ‘ස්වාමීන්’ කියා පවසනවා
නම් ඔහු දාවිත්ගේ පුත්‍රයා වන්නේ
කොහොමද?”[4]

එතැන සිටි විශාල සමූහයා ඔහුට
සවන් දෙමින් සිටියේ මහත් ආශා-
වකිනි.[5] **38** ඔහු උගන්වන අතර-
තුර මෙසේද පැවසුවේය. “විශේෂ සළු
ඇඳගෙන එහා මෙහා ඇවිදීමටත්
වෙළඳපොළවලදී ආචාර ලබන්නත්
කැමති නීතිය පිටපත් කරන්නන්-
ගෙන් පරෙස්සම් වන්න.[6] **39** ඔවුන්
කැමති වන්නේ සිනගෝගවලදී ඉදිරි
ආසනවල සහ සන්ධ්‍යා භෝජනව-
ලදී ප්‍රධානතම ස්ථානවල සිටීමටයි.[7]
**40** ඔවුන් අනුන් ඉදිරියේ මවාපෑ-
මක් කරමින් දීර්ඝ යාච්ඤා ඉදිරිපත්
කළත් වැන්දඹුවන්ගේ ඉඩකඩම් දේ-
පොළ පැහැරගෙන යනවා.[8] ඒ නිසා
ඔවුන්ට වඩාත් බරපතළ විනිශ්චයක්
ලැබෙයි.”[9]

**41** ඉන්පසු ඔහු දේවමාලිගාවේ
මුදල් බඳුන්[10] පෙනෙන තැනක ඉඳ-
ගෙන සමූහයා ඒවාට මුදල් දමමින්
සිටි ආකාරය බලාගෙන සිටි-
යේය. ධනවතුන් බොහෝදෙනෙක්
ඇවිත් කාසි බොහොමයක් දැමූහ.[11]
**42** ඊළඟට දිළිඳු වැන්දඹුවක් ආවාය.
ඇය දැම්මේ ඉතා සුළු වටිනාකමක්
ඇති කුඩා කාසි දෙකක් පමණි.[12]
**43** යේසුස් තම ගෝලයන්ව තමන්
ළඟට කැඳවා, ඔවුන්ට මෙසේ
කීවේය. “මා ඔබට කියන මේ දේට
සවන් දෙන්න. ඇත්තෙන්ම මේ දිළිඳු
වැන්දඹුව මුදල් බඳුන්වලට මුදල් දැමූ
අනික් සියලුදෙනාට වඩා දැම්මා.[13]

**12 පරි.**
1 මතෙ 22:35
2 ද්වි 6:4
3 ද්වි 6:5; යොෂු 22:5; මතෙ 22:37; ලූක් 10:27
4 ලෙවී 19:18; මතෙ 22:39; රෝම 13:9; ගලා 5:14; යාකො 2:8
5 ද්වි 4:39; ද්වි 6:4; යෙසා 45:21; යෙසා 46:9; 1කොරි 8:4
6 ද්වි 6:5; 1සාමු 15:22; හොෂෙ 6:6; මීකා 6:6
7 මතෙ 22:46

**2 තීරුව**
1 මතෙ 22:42; ලූක් 20:41; යොහ 7:42
2 2සාමු 23:2; 2තිමෝ 3:16; 2පේතෘ 1:21
3 ගීතා 110:1; මතෙ 22:44; ක්‍රියා 2:34; 1කොරි 15:25; හෙබ්‍රෙ 1:13
4 රෝම 1:3; එළි 22:16
5 ලූක් 19:48; ලූක් 21:38
6 මතෙ 23:1; ලූක් 20:46
7 මතෙ 23:6; ලූක් 11:43; ලූක් 20:46
8 2තිමෝ 3:6
9 මතෙ 23:14
10 2රාජ 12:9; යොහ 8:20
11 ලූක් 21:1
12 ලූක් 21:2
13 1ලේක 29:9; ලූක් 21:3; 2කොරි 8:12

**මාක් 12:30*** ග්‍රීක බසට අනුව ඔහුට ඔබේ මුළු හදවතින්ම, මුළු ජීවිතයෙන්ම, මුළු මනසින්ම හා මුළු ශක්තියෙන්ම ප්‍රේම කරන්න.

44 ඒ සියලුදෙනාම දැම්මේ තමන්ට
වැඩිපුර තිබුණු දෙයිනුයි. නමුත්
ඇයට අගහිඟකම් තිබුණත් තමන්
සතුව තිබුණු සියල්ල එනම්, ජීවිතය
ගෙන යෑමට තිබුණු සියල්ලම ඇය
දැම්මා.”[1]

13 ඔහු දේවමාලිගාවෙන් පිටත්
වී යද්දී ඔහුගේ එක් ගෝල-
යෙක්, “ගුරුතුමනි, බලන්න මේ අලං-
කාර ගොඩනැඟිලි දිහා! එහි ගල්
කොයි තරම් විශාලද” කියා ඔහුට
පැවසුවේය.[2] 2 එවිට යේසුස්, “ඔබ
දකින මේ මහත් ගොඩනැඟිලි[3] සම්-
පූර්ණයෙන්ම විනාශ වෙනවා. මෙහි
තිබෙන සෑම ගලක්ම[4] බිමට හෙළනු
ලබනවා”[5] කියා පැවසුවේය.
3 පසුව ඔහු ඔලීව කන්දේ දේවමා-
ලිගාව පෙනෙන ස්ථානයක වාඩි වී
සිටියේය. එවිට පේතෘස්,[6] යාකොබ්,
යොහන් සහ අන්ද්‍රෑ පමණක්[7] ඔහු
ළඟට ඇවිත් ඔහුගෙන් මෙසේ ඇසුහ.
4 “ඔබ පැවසූ ඒ දේ සිදු වන්නේ
කවදාද? ඒ වගේම මේ සියල්ල අව-
සන් වීමට නියමිත කාලය දැනගන්න
කුමක් හෝ ලකුණක් තිබෙනවාද?”[8]
5 එවිට යේසුස් ඔවුන්ට මෙසේ
කීවේය. “කාටවත් ඔබව නොමඟ
යවන්න ඉඩ දෙන්න එපා.[9] 6 ‘මමයි
ක්‍රිස්තුස්’ කියමින් බොහෝදෙනෙක්
මාගේ නාමයෙන් ඇවිත් බොහෝ-
දෙනෙකුව නොමඟ යවයි.[10] 7 විවිධ
තැන්වල සිදු වන යුද්ධ ගැන ඔබට
ආරංචි වෙයි. නමුත් භය වෙන්න එපා.
ඒ දේවල් සිදු විය යුතුයි. නමුත් සියල්-
ලේ අවසානය එය නොවෙයි.[11]
8 “ජාතියක් ජාතියකට විරුද්ධ-
වත් රාජ්‍යයක් රාජ්‍යයකට විරුද්-
ධවත් යුද්ධ කරයි.[12] එක් තැනක්
පාසා තවත් තැනක භූමිකම්පා[13] හා
ආහාර හිඟකම් ඇති වෙයි.[14] නමුත් ඒ
සියල්ල දරුණු විපත්තිවල ආරම්භ-
යක් පමණයි.[15]
9 “ඒ අතරම ඔබ කල්පනාකාරීව
සිටිය යුතුයි. මන්ද මිනිසුන් ඔබව
උසාවිවලට භාර දෙයි.[16] සිනගෝගව-
ලදී ඔබට තළයි.[17] ඔබට ආණ්ඩු-
කාරයන් හා රජුන් ඉදිරියෙහි පෙනී
සිටින්නත් සිදු වෙයි. ඒ සෑම දෙයක්ම
ඔබට විඳින්න සිදු වන්නේ මා නිසයි.
එය මා ගැන සාක්ෂි දරන්න ඔබට
හොඳ අවස්ථාවක්.[1] 10 අවසානයට
කලින්*[2] සියලු ජාතීන්ට ශුභාරංචිය[3]
දේශනා කළ යුතුයි. 11 මිනිසුන්
ඔබව අත්අඩංගුවට ගන්නා විට කුමක්
කියන්නද කියා සිතමින් කනස්-
සලු වෙන්න එපා.[4] ඒ පැයේදී ඔබ
කතා කළ යුතු දේ දෙවි තම බලය
මාර්ගයෙන් ඔබට කියා දෙයි. මන්ද
ඔබ කතා කරන්නේ ඔබේ හැකියා-
වෙන් නොව දෙවිගේ බලයේ උප-
කාරයෙනුයි.[5] 12 සහෝදරයා තම
සහෝදරයාවත් පියා තම දරුවාවත්
මරණයට පත් කිරීම සඳහා[6] සතුරන්
අතට භාර දෙයි. දරුවන්ද තම දෙ-
මාපියන්ට විරුද්ධ වී ඔවුන්ව මරා
දැමීමට සතුරන් අතට භාර දෙයි.[7]
13 ඔබ මගේ නාමය දරන නිසා
සියල්ලන් ඔබට වෛර කරයි.[8] නමුත්
ගැලවීම ලබන්නේ[9] අවසානය දක්-
වාම විඳදරාගන්නා තැනැත්තායි.[10]
14 “නමුත් විනාශය සිදු කරන[11]
පිළිකුල් දෙය,[12] නොතිබිය යුතු
තැනක තිබෙනවා ඔබ දකින විට
(පාඨකයා මෙය අවබෝධයෙන් කිය-
විය යුතුයි),[13] යුදයේ සිටින
අය කඳුවලට පලා යා යුතුයි.[14]
15 වහල්තලයේ සිටින්නා පහතට
ඇවිත් තම ගෙයින් කිසිවක් ගැනීම
සඳහා එයට ඇතුල් නොවිය යුතුයි.[15]
16 කෙතෙහි සිටින තැනැත්තා තමා-
ගේ පිට වස්ත්‍රය ගැනීමට ආපසු
හැරී නොයා යුතුයි.[16] 17 ඒ දවස්ව-
ලදී ගැබිනි මව්වරුන්ටත් කිරි දෙන
මව්වරුන්ටත් මොන තරම් දුෂ්ක-
රතා ඇති වේවිද![17] 18 ඔබට පලා
යන්න සිදු වන දවස ශීත කාල-
යේදී උදා නොවන්න කියා නොකඩවා
යාච්ඤා කරන්න.[18] 19 මන්ද දෙවි

**12 පරි.**
1 1ලේක 29:9; ලූක් 21:4

**13 පරි.**
2 මතෙ 24:1; ලූක් 21:5
3 යෙරෙ 7:14
4 ලූක් 19:44
5 ලෙවී 26:31; මතෙ 24:2; ලූක් 21:6
6 මතෙ 17:1
7 මතෙ 24:3
8 ලූක් 21:7
9 යෙරෙ 29:8; මතෙ 24:4
10 මතෙ 24:5; ලූක් 21:8
11 මතෙ 24:6
12 ලූක් 21:10; එළි 6:4
13 මතෙ 24:7
14 ලූක් 21:11; එළි 6:6; එළි 6:8
15 මතෙ 24:8
16 ක්‍රියා 4:15
17 මතෙ 10:17; ලූක් 21:12; යොහ 16:2; එළි 2:10

**2 තීරුව**
1 මතෙ 24:9; ලූක් 21:12; 2තිමෝ 3:12
2 මතෙ 24:14; රෝම 10:18; එළි 14:6
3 ක්‍රියා 8:12
4 මතෙ 10:19; ලූක් 12:11; ලූක් 21:14
5 නික් 4:12; ලූක් 21:15; ක්‍රියා 4:8; ක්‍රියා 6:10
6 මීකා 7:6; මතෙ 10:21; ලූක් 21:16; 2තිමෝ 3:3
7 මතෙ 24:10; 2තිමෝ 3:1
8 ලූක් 21:17
9 එළි 2:10
10 දානි 12:12; 2තිමෝ 4:7; හෙබ්‍රෙ 3:6
11 දානි 9:27
12 ද්වි 29:17; 1රාජා 11:5; එළි 13:15
13 මතෙ 24:15
14 මතෙ 24:16
15 මතෙ 24:17
16 මතෙ 24:18

17 මතෙ 24:19; ලූක් 19:44; ලූක් 21:23; ලූක් 23:28; 18 මතෙ 24:20.

මාක් **13:10*** මූ.අ., “මුලින්ම.”

පොළොව සැදූ කාලයේ පටන් මේ
වන තුරු සිදු නොවූ නැවතත් කිසිදා
සිදු නොවන[1] පීඩාවක්[2] ඒ දවස්-
වලදී ඇති වෙයි. **20** ඇත්තෙන්ම
යෙහෝවා දෙවි[3] ඒ දවස් කෙටි කළේ
නැත්නම් කිසි කෙනෙක් ගැලවෙන්-
නේ නැහැ. නමුත් ඔහු ඒ දවස් කෙටි
කරන්නේ[4] තමන් තෝරාගත්[5] අය
නිසයි.[6]

**21** "කෙනෙක්, 'බලන්න! ක්‍රිස්තුස්
මෙතැනය,' 'අන්න! ඔහු එතැනය'[7]
කියා ඔබට කිව්වොත් එය විශ්වාස
නොකරන්න.[8] **22** මන්ද බොරු
ක්‍රිස්තුස්වරුන්ද බොරු අනාගතවක්-
තෘවරුන්ද පැමිණ,[9] හැකි නම් තෝ-
රාගත් අයව පවා නොමඟ යැවීමට[10]
ලකුණු හා පුදුම දේවල් පෙන්වයි.[11]
**23** පරෙස්සම් වන්න.[12] මම ඔබට
කල්තියාම මේ ගැන අනතුරු අඟවා
තිබෙනවා.[13]

**24** "ඒ දවස්වලදී එම පීඩාවෙන්
පසුව හිරු අඳුරු වෙයි. සඳෙන්
කිසි එළියක් දකින්න නොලැබෙයි.
**25** තාරකා අහසින් වැටෙයි. අහසේ
සියලු බලයන්ද සොලවනු ලබයි.[14]
**26** එවිට මනුෂ්‍ය පුත්‍රයා[15] මහත් බල-
යෙන්ද තේජසින්ද වලාකුළුවලින් එන
ආකාරය දැකගන්න ඔවුන්ට හැකි
වෙයි.[16] **27** එවිට ඔහු දේවදූතයන්ව
එවා තමා වෙනුවෙන් තෝරාගත්
අයව[17] පොළොවෙන්ද ස්වර්ගයෙන්ද
එනම්, සෑම තැනකින්ම රැස් කරයි.[18]

**28** "අත්තික්කා ගසෙන් මේ දේ
ඉගෙනගන්න. එහි අලුතින් වැඩුණු
අතුවලින් දලු ලියලන විට ගිම්හානය
ළඟ බව ඔබ දන්නවා.[19] **29** එලෙ-
සම මා පැවසූ මේ දේවල් සිදු වෙ-
නවා ඔබ දකින විට ඔහුගේ පැමිණීම
ළඟ බව එනම්, දොරකඩ අසල-
ටම පැමිණ ඇති බව දැනගන්න.[20]
**30** ඇත්තෙන්ම මා ඔබට කියන්නේ,
මේ සියල්ල සිදු වන තුරු මේ පරම්ප-
රාව කිසිසේත් පහව නොයන බවයි.[21]
**31** අහසත්[22] පොළොවත් පහව ගියත්
මගේ වචන[23] පහව යන්නේ නැහැ.[24]

**32** "නමුත් මා පැවසූ ඒ දේවල්
සිදු වන දවස හෝ වේලාව* කිසි-
වෙක් දන්නේ නැහැ. ස්වර්ගයේ සිටින
දේවදූතයන්වත් පුත්‍රයාවත් එය දන්-
නේ නැහැ. ඒ ගැන දන්නේ පියා-
ණන් පමණයි.[1] **33** නියමිත කාලය
කවදාද කියා ඔබ නොදන්නා
නිසා[2] අවදිව, සෝදිසියෙන් සිටින්න.[3]
**34** තම නිවසින් පිට වී පිටරට[4] සංචා-
රයක් සඳහා ගිය මිනිසෙකු ගැන සිතා
බලන්න. මුලින්ම ඒ මිනිසා තම දාස-
යන්ට යම් බලතල දී එකිනෙකාට
තම තමන් කළ යුතු වැඩ කොටස්
පවරා දුන්නා. ඉන්පසු ඔහු සෝදිසි-
යෙන් සිටින්න කියා දොරටු පාල-
කයාට අණ දී තම ගමන සඳහා
පිටත් වුණා. **35** ඒ හා සමානව
ඔබත් සෝදිසියෙන් සිටින්න.[5] නිවස
අයිති ස්වාමියා එන වේලාව කුමක්ද
කියා ඔබ දන්නේ නැහැ. ඔහු එන්-
නේ සවස් යාමයේදීද මධ්‍යම රාත්‍රි-
යේදීද කුකුළා හඬලන වේලාවේදීද*
නැත්නම් හිමිදිරි උදෑසනින්මද කියා
ඔබ දන්නේ නැහැ.[6] **36** ඔහු හදිසි-
යෙන්ම එන විට ඔබ නිදා සිටිනවා
ඔහුට දකින්න ඉඩ තියන්න එපා.[7] ඔබ
සෝදිසියෙන් සිටිය යුත්තේ ඒ නිසයි.
**37** මා ඔබට කියන දේ සියලුදෙනා-
ටම කියන්න කැමතියි. එනම් සෝදි-
සියෙන් සිටින්න."[8]

# 14

**14** පාස්කු උත්සවයද[9] මුහුන්
නොදැමූ රොටි උත්සව-
යද[10] පැවැත්වීමට තිබුණේ තව
දවස් දෙකක් පමණි.[11] ඒ වන විට
නායක පූජකයෝ සහ නීතිය පිටපත්
කරන්නෝ උපායශීලී ලෙස යේසුස්ව
අල්ලා මරා දැමීමට මඟක් සොයමින්
සිටියහ.[12] **2** නමුත් "සෙනඟ අතර
කෝලාහලයක් ඇති විය හැකි නිසා
එය උත්සව කාලයේදී නොකරමු"[13]

**13 පරි.**
1 මතෙ 24:21
2 දානි 12:1; යෝවෙ 2:2; එළි 7:14
3 යෙසා 1:9; සෙක 13:8
4 මතෙ 24:22
5 රෝම 8:33; එෆී 1:4
6 එළි 17:14
7 ලූක් 17:23; ලූක් 21:8
8 මතෙ 24:23; 1යොහ 4:1
9 ද්වි 13:1; ද්වි 18:22; මතෙ 7:15
10 මතෙ 24:24
11 එළි 13:13
12 මතෙ 7:15; මතෙ 24:42; එෆී 6:18; 2පේතෘ 3:17
13 යොහ 13:19
14 මතෙ 24:29
15 දානි 7:13; ක්‍රියා 1:11; එළි 1:7
16 මතෙ 24:30; ලූක් 21:27
17 එළි 7:3
18 ද්වි 30:4; සෙක 2:6; මතෙ 24:31
19 මතෙ 24:32; ලූක් 21:29
20 මතෙ 24:33; මාක් 13:28
21 මතෙ 24:34; ලූක් 21:32
22 ගීතා 102:26; යෙසා 51:6
23 යොෂු 23:14; යෙසා 40:8
24 මතෙ 5:18; මතෙ 24:35; ලූක් 16:17

**2 තීරුව**
1 මතෙ 24:36; ක්‍රියා 1:7
2 මතෙ 25:13; ලූක් 21:34
3 රෝම 13:11; 1තෙස 5:6
4 මතෙ 25:14
5 මතෙ 24:42; ලූක් 12:36; ක්‍රියා 20:31; එළි 3:3
6 ලූක් 12:38; ලූක් 21:36
7 මතෙ 25:5
8 හබ 2:3

**14 පරි.** 9 නික් 12:6; ලෙවී 23:5; ලූක් 22:1; යොහ 13:1; 10 ලෙවී 23:6; 11 මතෙ 26:2; 12 මතෙ 26:4; ලූක් 22:2; 13 මතෙ 26:5.

මාක් **13:32*** මූ.අ., "පැය." **35*** ග්‍රීකවරු හා රෝමවරු මුර කිරීමට රාත්‍රිය කොටස් හතරකට බෙදූහ. "කුකුළා හඬලන වේලාව" යනු මධ්‍යම රාත්‍රියේ සිට පෙ.ව. 3 දක්වා කාලයයි.

කියා ඔවුහු තම තමන් අතරේ නිත-
රම පවසමින් සිටියෝය.
**3** මේ අතර යේසුස් සිටියේ බෙතා-
නියේ ලාදුරු රෝගී සීමොන්ගේ[1] නිව-
සෙහිය. ඔහු එහි කෑමට ඉඳගෙන
සිටින විට ස්ත්‍රියක් ඉතා මිල අධික,
පිරිසිදු, සුවඳැති ජටාමාංස තෙල්*
අඩංගු ඇලබැස්ටර් බඳුනක් රැගෙන
එම ස්ථානයට පැමිණියාය. ඇය ඒ
බඳුන විවෘත කර එහි තිබූ තෙල් යේ-
සුස්ගේ හිස මත වත් කරන්න පටන්-
ගත්තාය.[2] **4** එවිට සමහරු ඊට
දැඩි ලෙස විරෝධය පාමින් එකි-
නෙකාට මෙසේ පැවසුවෝය. “මේ
සුවඳ තෙල් ඇයි මෙහෙම නාස්ති
කළේ?[3] **5** ඇයට තිබුණේ ඒ තෙල්
ඩිනාරි* තුන්සියයකට වඩා වැඩි මුද-
ලකට විකුණා දිළිඳුන්ට දෙන්නයි.”
ඇත්තෙන්ම ඔවුන්ට ඇය ගැන ඇති
වූයේ මහත් කේන්තියකි.[4] **6** එවිට
යේසුස් ඔවුන්ට මෙසේ කීවේය. “ඇයි
ඔබ හැමෝම එකතු වී ඇයට කරදර
කරන්නේ? ඇයට ඉන්න දෙන්න. ඇය
මට කළේ ඉතා යහපත් දෙයක්.[5]
**7** දිළිඳු අය නම් ඔබ සමඟ හැමදාම
සිටිනවා.[6] ඔබට කැමති ඕනෑම වේ-
ලාවක ඔවුන් වෙනුවෙන් යහපත් දෙ-
යක් කරන්න ඔබට පුළුවන්. ඒත් මම
ඔබ සමඟ හැමදාම සිටින්නේ නැහැ.[7]
**8** ඇය කළේ ඇයට පුළුවන් දෙයයි.
ඇය කල් ඇතුව මගේ ශරීරයේ සුවඳ
තෙල් වත් කළේ මගේ ශරීරය තැන්-
පත් කරනු ලබන නිසයි.[8] **9** ඇත්-
තෙන්ම මා ඔබට කියන්නේ, ලොව
පුරාම ශුභාරංචිය දේශනා කරන හැම
තැනකදීම[9] මේ ස්ත්‍රියව සිහි කිරීම
සඳහා ඇය කළ දෙය ගැන කියනු
ලබන බවයි.”[10]
**10** මේ අතර දොළොස්දෙනාගෙන්
එක් කෙනෙක් වූ යූදස් ඉස්කාරියෝත්
නායක පූජකයන්ව හමු වීමට ගියේය.
ඔහු එහි ගියේ යේසුස්ව ඔවුන්ට
පාවා දීමටයි.[11] **11** එය ඇසූ නායක
පූජකයෝ මහත් සතුටකින් ඔහුට
රිදී මුදල් දෙන්න පොරොන්දු වූහ.[1]
එතැන් පටන් යූදස් ඔහුව පාවා දීමට
සුදුසු අවස්ථාවක් හා ක්‍රමයක් සොය-
මින් සිටියේය.[2]
**12** චාරිත්‍රානුකූලව පාස්කු යාගය
පූජා කළ දවසේදී එනම්, මුහුන්
නොදැමූ[3] රොටි උත්සවයේ පළමු-
වෙනි දවසේදී ඔහුගේ ගෝලයෝ,[4]
“අපි පාස්කු භෝජනය සූදානම් කළ
යුත්තේ කොහේද”[5] කියා ඔහුගෙන්
ඇසූහ. **13** එවිට ඔහු තම ගෝල-
යන් දෙදෙනෙකුව යවමින් ඔවුන්ට
මෙසේ කීවේය. “මුලින්ම නුවරට
යන්න. වතුර පිරුණු මැටි භාජ-
නයක් උසුලාගෙන යන මිනිසෙකුව
ඔබට හමු වෙයි.[6] ඔහු පසුපස යන්න.
**14** ඔහු යම් නිවසකට ඇතුල් වෙයි.
ඒ නිවස අයිති තැනැත්තාව හමු
වී ඔහුට මෙසේ කියන්න. ‘“මගේ
ගෝලයන්[7] සමඟ පාස්කු භෝජනය[8]
ගැනීම සඳහා මට වෙන් කළ කාමරය
කොතැනද” කියා ගුරුතුමා අසනවා’
යයි පවසන්න. **15** එවිට ඔහු අවශ්‍ය
දේවල් සහිතව පිළියෙල කර ඇති
විශාල උඩුමහල් කාමරයක් ඔබට
පෙන්වයි. ඔබ භෝජනය සූදානම් කළ
යුත්තේ එතැනයි.”[9] **16** ඒ අනුව එම
ගෝලයෝ දෙදෙනා පිටත් වී නුවරට
ඇතුල් වූහ. ඔහු ඔවුන්ට කී ලෙසම
සියල්ල සිදු විය. ඉන්පසු ඔවුහු පාස්-
කුව සඳහා අවශ්‍ය සෑම දෙයක්ම සූදා-
නම් කළහ.[10]
**17** අඳුර වැටීගෙන එද්දී ඔහු දො-
ළොස්දෙනා සමඟ එම ස්ථානයට
ගියේය.[11] **18** ඔවුන් කෑම මේසයේ
ඉඳගෙන කමින් සිටියදී යේසුස්, “මා
ඔබට කියන මේ දේ අසන්න. මා
සමඟ ආහාර ගනිමින් සිටින ඔබ
අතරෙන් කෙනෙක්[12] මාව පාවා
දෙනවා”[13] කියා කීවේය. **19** එය
අසා බොහෝ සෙයින් ශෝක වූ
ඔවුහු, “ඒ මමද”[14] කියා එක් කෙ-
නෙක් පාසා එක් කෙනෙක් ඔහුගෙන්
අසන්න පටන්ගත්තෝය. **20** එවිට
ඔහු ඔවුන්ට මෙසේ කීවේය. “ඒ

**14 පරි.**
1 මතෙ 26:6
2 මතෙ 26:7; යොහ 12:3
3 මතෙ 26:8; යොහ 12:4
4 මතෙ 26:9; යොහ 12:5
5 මතෙ 26:10; යොහ 12:7
6 ද්වි 15:11; යොහ 12:8
7 මතෙ 26:11; යොහ 12:8
8 මතෙ 26:12
9 මතෙ 24:14
10 මතෙ 26:13
11 මතෙ 26:14; ලූක් 22:4

**2 තීරුව**
1 ද්වි 27:25; සෙක 11:12; මතෙ 26:15; ලූක් 22:5; 1තිමෝ 6:10
2 මතෙ 26:16; ලූක් 22:6
3 නික් 12:15; නික් 12:18; නික් 23:15; ලෙවී 23:6; ලූක් 22:7
4 ලූක් 22:8
5 ගණන් 9:2; මතෙ 26:17; ලූක් 22:9
6 මතෙ 26:18; ලූක් 22:10
7 ලූක් 22:11
8 නික් 12:6; ලෙවී 23:5
9 ලූක් 22:12
10 මතෙ 26:19; ලූක් 22:13
11 මතෙ 26:20; ලූක් 22:14
12 ගීතා 41:9
13 මතෙ 26:21; ලූක් 22:21; යොහ 13:21
14 මතෙ 26:22; ලූක් 22:23; යොහ 13:22

---

**මාක් 14:3*** සුවඳවත් අල සහිත ශාකයකින් සාදනු ලබන සුවඳවත් තෙලක්. **5*** මාක් 6:37හි පාදසටහන බලන්න.

තැනැත්තා ඔබ දොළොස්දෙනාගෙන්
කෙනෙක්. මා මේ බඳුනට අත
දමන අවස්ථාවේදීම ඔහුත් එයට අත
දමයි.[1] **21** ලියා තිබෙන ආකාරය-
ටම මනුෂ්‍ය පුත්‍රයා ඔබෙන් අනිවාර්-
යයෙන්ම සමුගනියි. නමුත් මනුෂ්‍ය
පුත්‍රයාව පාවා දෙන ඒ මිනිසාට
මොන තරම් දරුණු විපතකට මුහුණ
දෙන්න සිදු වෙයිද! ඇත්තෙන්ම ඒ
මිනිසා ඉපදුණේ නැත්නම් වඩාත්
හොඳයි."[2]

**22** ඉන්පසු ඔවුන් කමින් සිටි-
යදී ඔහු රොටියක් ගෙන යාච්ඤා-
වක් ඉදිරිපත් කර එය කඩා ඔවුන්ට
දී, "මෙය ගන්න. මෙයින් නියෝජ-
නය වන්නේ මාගේ ශරීරයයි"[3] කියා
කීවේය. **23** ඊළඟට ඔහු කුසලාන-
යක් ගෙන දෙවිට ස්තුති යාච්ඤාවක්
කර එය ඔවුන්ට දුන්නේය. සියලු-
දෙනාම එයින් බිව්වෝය.[4] **24** ඔහු
ඔවුන්ට මෙසේ කීවේය. "මෙයින්
නියෝජනය වන්නේ බොහෝදෙනා
උදෙසා[5] වගුරුවනු ලබන[6] මගේ රුධි-
රයයි.[7] ගිවිසුම*[8] ස්ථිර වන්නේ මේ
රුධිරයෙනුයි. **25** ඇත්තෙන්ම මා
ඔබට කියන්නේ, දෙවිගේ රාජ්‍යයෙහි
මා අලුත් වයින් බොන දවස එන
තුරු මා මෙතැන් පටන් මිදිවැලේ
පලයෙන් ලැබෙන වයින් කිසිසේත්
බොන්නේ නැති බවයි."[9] **26** අවසා-
නයේදී ප්‍රශංසා ගී ගැයූ[10] ඔවුහු, ඔලීව
කන්දට පිටත්ව ගියහ.[11]

**27** යේසුස් ඔවුන්ට මෙසේ කීවේය.
"ඔබ සැමදෙනාම මාව අත්හැර යයි.
මන්ද 'මම එඬේරාට පහර දෙන්-
නෙමි.[12] එවිට බැටළුවෝ සීසීකඩ
විසිරී යනු ඇත'[13] කියා ලියා තිබෙ-
නවා. **28** නමුත් මාව මරණයෙන්
නැඟිටුවනු ලැබූ පසු ඔබට කලින්
මම ගලීලයට යනවා."[14] **29** නමුත්
පේතෘස්, "අන් සියලුදෙනාම ඔබව
අත්හැර ගියත් මම නම් කවදාවත්
ඔබව අත්හරින්නේ නැහැ"[15] කියා
ඔහුට කීවේය. **30** එවිට යේසුස්
ඔහුට මෙසේ කීවේය. "ඇත්තෙන්ම
මා ඔබට කියන්නේ, කුකුළෙක් දෙව-
තාවක් හඬලන්න කලින් අදම
මේ රාත්‍රියේම වෙන කවුරුත් නො-
වෙයි ඔබම, මාව හඳුනන්නේ නැහැ
කියා තුන් වතාවක් පවසන බවයි."[1]
**31** නමුත් ඔහු, "මට ඔබ සමඟ
මැරෙන්න සිදු වුණත් ඔබව හඳුනන්-
නේ නැහැ කියා නම් මම කොහොම-
ටවත් කියන්නේ නැහැ" කියා තරයේ
කියා සිටියේය. අන් සියලුදෙනාද ඒ
දේම පැවසූහ.[2]

**32** ටික වේලාවකින් ඔවුහු ගෙත්-
සෙමනය ලෙස හැඳින්වූ ස්ථානය-
කට ගියහ. "මා යාච්ඤා කරන තුරු
මෙහි ඉඳගෙන සිටින්න"[3] කියා ඔහු
තම ගෝලයන්ට කීවේය. **33** ඉන්-
පසු ඔහු පේතෘස්වද යාකොබ්
සහ යොහන්වද[4] ඔහු සමඟ රැගෙන
ගියේය. එවිට ඔහු තුළ කම්පනයක්ද
මහත් කැලඹීමක්ද ඇති වෙන්න
පටන්ගත්තේය.[5] **34** ඔහු, "මා තුළ
ඇති වී තිබෙන ශෝකය කොත-
රම්ද කියනවා නම්[6] මට දැනෙන්නේ
මා මිය යනවා වගෙයි. ඔබ මෙහි
නැවතී අවදියෙන් සිටින්න"[7] කියා
ඔවුන්ට කීවේය. **35** ඉන්පසු ඔහු
ටික දුරක් ඉදිරියට ගොස් බිම වැටී,
තමාට මුහුණ දෙන්න සිදු වන අසීරු
අවස්ථාව හැකි නම් විගස අවසන්
කරන ලෙස ඉල්ලා යාච්ඤා කළේය.[8]
**36** ඔහු, "අබ්බා, පියාණෙනි,[9] ඔබට
සැම දෙයක්ම කරන්න පුළුවන්. මේ
කුසලානය* මගෙන් ඉවත් කරන්න.
නමුත් සිදු විය යුත්තේ මා කැමති
දේ නොව ඔබ කැමති දෙයයි"[10]
කියා කීවේය. **37** ටික වේලාවකින්
ඔහු පැමිණ ඔවුන් නිදා සිටිනවා
දැක පේතෘස්ට මෙසේ කීවේය.
"සීමොන්, ඔබට නින්ද ගියාද? ඔබට
එක පැයක්වත් අවදියෙන් සිටින්න
ශක්තිය නැද්ද?[11] **38** යම් වරදක්
කිරීමට පෙළඹීමක් ඇති නොවීම
සඳහා අවදිව සිට යාච්ඤා කරන්න.[12]

මාක් **14:24*** මෙය අලුත් ගිවිසුමකි.

මාක් **14:36*** මතෙ 26:39හි පාදසටහන බලන්න.

**14 පරි.**
**1** මතෙ 26:23
**2** යෝබ් 3:3
මතෙ 26:24
**3** මතෙ 26:26
ලූක් 22:19
1කොරි 10:16
1කොරි 11:24
**4** මතෙ 26:27
යොහ 6:53
1කොරි 10:16
1කොරි 11:25
**5** යෙසා 53:12
**6** මතෙ 26:28
ලූක් 22:20
**7** නික් 24:8
ලෙවී 17:11
සෙක 9:11
හෙබ්‍රෙ 9:22
**8** යෙරෙ 31:31
හෙබ්‍රෙ 7:22
හෙබ්‍රෙ 9:15
**9** 1කොරි 11:26
**10** ගීතා 113–118
**11** මතෙ 26:30
ලූක් 22:39
යොහ 18:1
**12** යෙසා 53:5
දානි 9:26
සෙක 13:7
**13** මතෙ 26:31
මතෙ 26:56
මාක් 14:50
යොහ 16:32
**14** මතෙ 26:32
මාක් 16:7
**15** හිතෝ 11:2
මතෙ 26:33
ලූක් 22:33
යොහ 13:37

**2 තීරුව**
**1** මතෙ 26:34
ලූක් 22:34
යොහ 13:38
**2** මතෙ 26:35
**3** මතෙ 26:36
ලූක් 22:39
යොහ 18:1
**4** මතෙ 17:1
**5** මතෙ 26:37
**6** ගීතා 42:5
ගීතා 43:5
යොහ 12:27
**7** මතෙ 26:38
**8** මතෙ 26:39
ලූක් 22:41
**9** රෝම 8:15
ගලා 4:6
**10** ලූක් 22:42
යොහ 6:38
හෙබ්‍රෙ 5:7
**11** මතෙ 26:40
ලූක් 22:45
**12** මතෙ 6:13
ලූක් 11:4

නමුත් ඒ දේ කරන්න සිත කොතරම්
කැමති වුණත් මිනිසුන්ගේ දුර්වල-
කම එයට ඉඩ දෙන්නේ නැහැ.”[1]
**39** ඔහු නැවත ගොස් කලින් පැවසූ
වදන්ම පවසමින් යාච්ඤා කළේය.[2]
**40** ඔහු නැවතත් පැමිණි විට ඔවුන්
නිදා සිටිනවා දුටුවේය. නිදිබරව
සිටි ඔවුහු නිදහසට කුමක් කියන්-
නද කියාවත් නොදැන සිටියෝය.[3]
**41** ඔහු තුන්වෙනි වතාවටත් ඇවිත්
ඔවුන්ට මෙසේ කීවේය. “මෙවැනි වේ-
ලාවක ඔබ නිදාගෙන විවේක ගන්-
නවාද? දැන් ඇති! මෙන්න
බලන්න! මනුෂ්‍ය පුත්‍රයාව පව්කාර-
යන්ගේ අතට පාවා දෙන්න[4] වේලාව
ඇවිත්.[5] **42** නැඟිටින්න, අපි යමු.[6]
මෙන්න! මාව පාවා දෙන තැනැත්තා
ළඟටම ඇවිත්!”[7]

**43** ඔහු කතා කරමින් සිටි-
යදීම, දොළොස්දෙනාගෙන් එක් කෙ-
නෙක් වූ යූදස් ආවේය. ඔහු සමඟ
කඩු මුගුරු රැගත් පිරිසක් පැමිණි-
යෝය. ඔවුන්ව එවා තිබුණේ නායක
පූජකයන්, නීතිය පිටපත් කරන්-
නන් හා වැඩිමහල්ලන්ය.[8] **44** ඔහුව
පාවා දෙන්නා ඔහුව අල්ලාගැනීම
සඳහා ඔවුන්ට කලින්ම ලකුණක්
දී තිබිණ. ඔහු ඔවුන්ට කියා තිබු-
ණේ, “මම ඔහුව සිඹගන්නවා. එවිට
ඔබට ඔහුව හඳුනාගත හැකියි. ඉන්-
පසු ඔහුව අත්අඩංගුවට ගෙන රැගෙන
යන්න” කියායි.[9] **45** ඔහු කෙළින්ම
යේසුස් ළඟට ගොස්, “ගුරුතුමනි”*
කියා මහත් ආදරයක් මවාපාමින්
ඔහුව සිඹගත්තේය.[10] **46** එවිට
ඔවුහු යේසුස්ව අත්අඩංගුවට ගත්හ.[11]
**47** නමුත් එතැන සිටගෙන සිටි කෙ-
නෙක් තම කඩුව ඉවතට ගෙන
උත්තම පූජකයාගේ දාසයාට පහර
දුන්නේය. එවිට ඒ දාසයාගේ කන
කැපී ගියේය.[12] **48** යේසුස් ඔවුන්ට
මෙසේ කීවේය. “ඔබ කඩු මුගුරු
රැගෙන මාව අත්අඩංගුවට ගන්න
ආවේ මා සොරෙක් කියා හිතා-
ගෙනද?[1] **49** මම හැමදාම දේවමා-
ලිගාවේ උගන්වමින්[2] සිටියා නේද?
නමුත් ඔබ මාව අත්අඩංගුවට ගත්තේ
නැහැ. මේ සියල්ල මෙසේ සිදු වුණේ
ශුද්ධ ලියවිල්ලේ[3] සඳහන් කළ දේ ඉටු
වීම සඳහායි.”[4]

**50** එවිට සියලුදෙනා ඔහුව අත්-
හැර[5] පලා ගියහ.[6] **51** නමුත්
අනර්ඝ ලිනන් වස්ත්‍රයක් ඇඳ සිටි
එක්තරා තරුණයෙක් යේසුස්ට නුදු-
රින් ඔහු පසුපස ගියේය. ඔවුන් එම
තරුණයාව අල්ලාගන්න උත්සාහ
කළ විට,[7] **52** ඔහු තම ලිනන් වස්-
ත්‍රය අත්හැර පලා ගියේය.

**53** ඔවුහු යේසුස්ව උත්තම පූජ-
කයා ළඟට ගෙන ගියහ. ඒ
අවස්ථාවේදී සියලු නායක පූජකා-
යෝ, වැඩිමහල්ලෝ සහ නීතිය
පිටපත් කරන්නෝ එහි රැස්ව සිටි-
යෝය.[8] **54** පේතෘස් උත්තම පූජ-
කයාගේ නිවසේ ඇතුල් මළුව දක්වා
යේසුස්ට පිටුපසින් තරමක දුරකින්
ගියේය.[9] පසුව ඔහු ඇතුල් මළුවේදී
නිවසේ සේවකයන් සමඟ ගිනිමැල-
යක් ඉදිරියෙහි ඉඳගෙන ගිනි තපිමින්
සිටියේය. **55** මේ අතර යේසුස්ව
මරණයට පත් කිරීම සඳහා[10] නායක
පූජකයෝද මුළු මන්ත්‍රණ සභාවද*
ඔහුට විරුද්ධව සාක්ෂි සොයමින්
සිටියෝය. නමුත් කිසිම සාක්ෂි-
යක් සොයාගැනීමට ඔවුන්ට නො-
හැකි විය.[11] **56** බොහෝදෙනෙකු
ඔහුට විරුද්ධව බොරු සාක්ෂි
දුන්නත්[12] ඔවුන්ගේ සාක්ෂි අතර
කිසි එකඟතාවක් තිබුණේ නැත.[13]
**57** සමහරු නැඟිට ඔහුට විරුද්ධව
බොරු සාක්ෂි දෙමින් මෙසේ පැවසූහ.
**58** “අපට ඇහුණා ඔහු මෙහෙම කිය-
නවා. ‘අතින් සෑදූ මෙම දේවමාලිගාව
කඩා දමා, අතින් නොසෑදූ වෙන
එකක් දවස් තුනකින් මම ගොඩනඟ-
නවා.’ ”[14] **59** නමුත් මේ සම්බන්ධ-
යෙන්ද ඔවුන් දුන් සාක්ෂි අතර කිසිම
එකඟතාවක් තිබුණේ නැත.

**14 පරි.**
1 මතෙ 26:41 රෝම 7:23 ගලා 5:17
2 මතෙ 26:42
3 මතෙ 26:43
4 මතෙ 26:45
5 යොහ 13:1
6 යොහ 14:31
7 මතෙ 26:46 යොහ 18:2
8 මතෙ 26:47 ලූක් 22:47 යොහ 18:3
9 මතෙ 26:48
10 2සාමු 20:9
11 මතෙ 26:50 ලූක් 22:49
12 මතෙ 26:51 ලූක් 22:50 යොහ 18:10

**2 තීරුව**
1 මතෙ 26:55 ලූක් 22:52
2 ලූක් 19:47 යොහ 18:20
3 ගීතා 22:6 යෙසා 53:7 දානි 9:26 ලූක් 22:37
4 මතෙ 26:56 එළි 19:10
5 ගීතා 38:11 ගීතා 88:8 2තිමෝ 4:16
6 සෙක 13:7 මතෙ 26:31 යොහ 16:32
7 යොහ 18:15
8 මතෙ 26:57 ලූක් 22:54 යොහ 18:13
9 මතෙ 26:58 යොහ 18:15
10 ගීතා 37:12 ගීතා 37:32
11 දානි 6:4 මතෙ 26:59 1පේත 3:16
12 නික් 20:16 ද්වි 19:16 ගීතා 35:11 හිතෝ 19:5
13 මතෙ 26:60
14 මතෙ 26:61 මාක් 15:29 යොහ 2:19

මාක් **14:45*** එනම්, රබ්බි.

මාක් **14:55*** එනම්, යුදෙව් සැන්හෙඩ්‍රින සභාව.

60 එවිට උත්තම පූජකයා නැඟිට,
“ඔබ කිසි පිළිතුරක් දෙන්නේ නැද්ද?
මොවුන් ඔබට විරුද්ධව දෙන මේ
සාක්ෂි ඔබට ඇහෙනවාද”[1] කියා යේ-
සුස්ගෙන් ඇසුවේය. 61 නමුත් යේ-
සුස් කිසි පිළිතුරක් නොදී නිහඬව
සිටියේය.[2] එහෙයින් උත්තම පූජකයා
නැවතත්, “ඔබ ශුද්ධ දෙවිගේ පුත්
ක්‍රිස්තුස්ද”[3] කියා ඔහුගෙන් ඇසුවේය.
62 එවිට යේසුස්, “ඒ මම තමයි.
මනුෂ්‍ය පුත්‍රයා[4] බලවත් තැනැත්-
තාණන්ගේ දකුණු පැත්තේ ඉඳ-
ගෙන සිටින ආකාරයත්[5] ආකාශයේ
වලාකුළු සහිතව එන ආකාරයත්[6]
ඔබට දකින්න ලැබෙයි” කියා කීවේය.
63 එය අසා උත්තම පූජකයා තම
ඇතුල් වස්ත්‍ර ඉරාගනිමින්[7] මෙසේ
කීවේය. “අපට සාක්ෂිකාරයන් තවත්
අවශ්‍ය නැහැ.[8] 64 ඔහු කළ දේවඅ-
පහාසය[9] ඔබට දැන් ඇහුණා. එයින්
ඔබට පැහැදිලි වන්නේ කුමක්ද?”
එවිට සියලුදෙනාම ඔහුට මරණ දණ්-
ඩනය නියම කළ යුතුයි කියා
කීවෝය. 65 සමහරු ඔහුට කෙළ
ගසන්න[10] පටන්ගත් අතර ඔහුගේ
මුහුණ සම්පූර්ණයෙන්ම වසා අත් මිට-
මොළවා ඔහුට පහර දී, “ඔබ අනාග-
තවක්තෘවරයෙක් කියලා ඔප්පු කර
පෙන්වන්න” කියා පැවසූහ. පසුව අධි-
කරණයේ සේවකයෝද ඔහුගේ කම්මු-
ලට පහර දෙමින් ඔහුව ගෙන ගියහ.[11]

66 මේ අතරේ පේතෘස් මළුවෙහි
සිටියේය. උත්තම පූජකයාගේ එක්
සේවිකාවක් ඇවිත්,[12] 67 පේතෘස්
ගිනි තපිමින් සිටිනවා දැක ඔහු දෙස
හොඳින් බලා, “ඔබත් නාසරෙත් නුව-
රින් පැමිණි යේසුස් සමඟ සිටියා
නේද”[13] කියා ඇසුවාය. 68 එවිට
ඔහු එය ප්‍රතික්ෂේප කරමින්, “ඔබ
මොනව කියනවාද කියලා මම නම්
දන්නේ නැහැ. මම ඔහුව හඳුනන්-
නෙත් නැහැ” කියා පවසා පිටතට
ගොස් දොරටුව අසල සිටියේය.[14]
69 එතැනදීද ඒ සේවිකාව ඔහුව
දැක, “මොහු ඔවුන්ගෙන් කෙනෙක්”[15]
කියා ඒ අසල සිටි අයට නැව-
තත් කිව්වාය. 70 ඔහු නැවත වරක්
එය ප්‍රතික්ෂේප කළේය. මද වේ-
ලාවකට පසු ඔහු අසල සිටගෙන
සිටි අය, “ඇත්තෙන්ම ඔබ ඔවුන්-
ගෙන් එක් කෙනෙක් විය යුතුයි.
ඔබ ගලීලයේ වැසියෙක් නේද”[1] කියා
පේතෘස්ගෙන් ඇසුවෝය. 71 නමුත්
ඔහු තමාටම ශාප කරමින්, “ඔබ
කියන මේ මිනිසාව මම හඳුනන්නේ-
වත් නැහැ”[2] කියා දිවුරා පැවසුවේය.[3]
72 ඒ මොහොතේදීම කුකුළෙක් දෙ-
වෙනි වරටත් හැඬලුවේය.[4] “කුකු-
ළෙකු දෙවතාවක් හඬලන්න කලින්
ඔබ මාව හඳුනන්නේ නැහැ කියා
තුන් වතාවක් කියනවා”[5] කියා යේසුස්
පැවසූ දේ එවිට පේතෘස්ට මතක් විය.
එයින් ඇති වූ ශෝකය දරාගත නො-
හැකිව ඔහු බොහෝ සෙයින් හැඬු-
වේය.[6]

**15** අලුයම උදා වූ සැණින්
නායක පූජකයන්, වැඩිමහල්-
ලන් සහ නීතිය පිටපත් කරන්-
නන්ගෙන් සමන්විත මුළු මන්ත්‍රණ
සභාව* රැස් වී කළ යුතු දේ ගැන
සාකච්ඡා කර[7] යේසුස්ව බැඳ පිලාත්
වෙතට ගෙන ගොස් භාර දුන්හ.[8]
2 එවිට පිලාත්, “ඔබ යුදෙව්වරුන්ගේ
රජද”[9] කියා ඔහුගෙන් ප්‍රශ්න කළේය.
“එයට පිළිතුර ඔබේ ප්‍රශ්නයෙන්ම
පැහැදිලියි”[10] කියා යේසුස් උත්-
තර දුන්නේය. 3 මේ අතර නායක
පූජකයෝ ඔහුට විරුද්ධව බොහෝ
චෝදනා එල්ල කළෝය.[11] 4 එවිට
පිලාත් නැවතත් ඔහුගෙන් මෙසේ
ප්‍රශ්න කළේය. “ඔවුන් ඔබට විරුද්ධව
කොතරම් චෝදනා කරනවාද කියා
බලන්න.[12] ඔබට දෙන්න කිසිම පිළි-
තුරක් නැද්ද?”[13] 5 නමුත් යේසුස්
කිසි පිළිතුරක් දුන්නේ නැත. එහෙ-
යින් පිලාත් බොහෝ සෙයින් පුදුම
විය.[14]

6 සෑම පාස්කු උත්සවයකදීම
සමූහයා නිදහස් කරන ලෙස
ඉල්ලා සිටින සිරකරුවෙකුව නිදහස්

මාක් **15:1*** මාක් 14:55හි පාදසටහන බලන්න.

14 පරි.
1 මතෙ 26:62
2 යෙසා 53:7
1පේතෘ 2:23
3 මතෙ 26:63
4 දානි 7:13
මතෙ 24:30
5 ගීතා 110:1
එෆී 1:20
කොලො 3:1
6 මතෙ 26:64
ලූක් 21:27
එළි 1:7
එළි 14:14
7 ලෙවී 10:6
8 මතෙ 26:65
9 ලෙවී 24:16
1රාජා 21:13
යොහ 19:7
10 යෙසා 50:6
යෙසා 53:3
මතෙ 26:67
11 ලූක් 22:64
12 මතෙ 26:69
ලූක් 22:55
යොහ 18:18
13 ලූක් 22:56
14 මතෙ 26:70
ලූක් 22:57
15 මතෙ 26:71
ලූක් 22:58
යොහ 18:25

2 තීරුව
1 මතෙ 26:73
ලූක් 22:59
යොහ 18:26
2 මතෙ 26:74
3 හිතෝ 29:25
මතෙ 5:37
4 ලූක් 22:61
යොහ 18:27
5 මතෙ 26:34
මාක් 14:30
ලූක් 22:34
යොහ 13:38
6 2කොරි 7:10

15 පරි.
7 ගීතා 2:2
ක්‍රියා 4:26
8 මතෙ 27:1
ලූක් 22:66
යොහ 18:28
ක්‍රියා 3:13
9 ගීතා 2:2
යොහ 18:33
10 මතෙ 27:11
ලූක් 23:3
11 මතෙ 27:12
12 මතෙ 27:13
යොහ 19:10
13 මතෙ 26:62
14 යෙසා 53:7
මතෙ 27:14
යොහ 19:9

කිරීම පිලාත්ගේ සිරිතක් විය.[1] 7 ඒ
කාලයේදී බරබ්බස් නම් තැනැත්-
තෙක් සිරභාරයේ සිටියේය. ඔහු හා
වෙනත් පිරිසක් සිරභාරයේ සිටි-
යේ ඔවුන් ආණ්ඩුවට විරුද්ධව කැර-
ලිගසා මිනී මරා තිබූ නිසාය.[2]
8 එහෙයින් සමූහයා පිලාත් වෙ-
තට ගොස් ඔහු සිරිත් පරිදි කරන
දේ ඔවුන් වෙනුවෙන් ඉටු කරන
මෙන් ඉල්ලා සිටියෝය. 9 එවිට
පිලාත්, "ඔබ කැමති මා යුදෙව්-
වරුන්ගේ රජුව නිදහස් කර දෙන-
වාටද"[3] කියා ඔවුන්ගෙන් ඇසුවේය.
10 ඔහු එවැනි දෙයක් ඇසුවේ
නායක පූජකයන් යේසුස්ව තමාට
භාර දුන්නේ[4] ඔහු ගැන ඔවුන්ට තිබූ
ඊර්ෂ්‍යාව නිසා[5] බව තේරුම්ගෙන සිටි
නිසාය. 11 නමුත් නායක පූජක-
යන්ගේ උසිගැන්වීම මත ඔහු වෙනු-
වට බරබ්බස්ව නිදහස් කර දෙන්න
කියා සමූහයා පිලාත්ගෙන් ඉල්ලා
සිටියෝය.[6] 12 පිලාත්, "එසේනම්
යුදෙව්වරුන්ගේ රජු කියා ඔබ හඳුන්-
වන මෙම තැනැත්තාට[7] මම මො-
නවාද කරන්නේ"[8] කියා ඔවුන්ගෙන්
නැවතත් ඇසුවේය. 13 නැවතත්
ඔවුහු කෑගසමින්, "ඔහුව කණුවක
ඇණ ගසා මරන්න"[9] කියා පැව-
සූහ. 14 නමුත් පිලාත්, "ඒ ඇයි?
ඔහු කළ වරද මොකක්ද" කියා
ඇසුවේය. නමුත් නැවතත් ඔවුහු,
"ඔහුව කණුවක ඇණ ගසා මරන්න"[10]
කියා තවත් හයියෙන් කෑගැසූහ.
15 එවිට පිලාත්, සමූහයාව සතුටු
කිරීමට කැමති වී[11] බරබ්බස්ව නිද-
හස් කර යේසුස්ට කසයෙන් තළන්න
කියා අණ කර, ඔහුව කණුවක ඇණ
ගසා මරණයට පත් කිරීම සඳහා භාර
දුන්නේය.[12]

16 එවිට හේවායෝ ඔහුව ආණ්-
ඩුකාරයාගේ මාලිගාවේ ඇතුල් මළු-
වට ගෙන ගියෝය. එහිදී ඔවුහු
මුළු හේවා පිරිසම එතැනට කැඳවා-
ගත්හ.[13] 17 ඔවුහු දම් පැහැති සළු-
වක් ඔහුට පළඳවා කටු අතුවලින්
ඔටුන්නක් සාදා ඔහුගේ හිස මත ඇමු-
වෝය.[1] 18 ඉන්පසු ඔවුහු, "යුදෙව්-
වරුන්ගේ රජ්ජුරුවෙනි, ඔබට සුබ
දවසක් වේවා"[2] කියා ඔහුට පැව-
සූහ. 19 ඔවුහු බට දණ්ඩකින් කිහිප
වතාවක්ම ඔහුගේ හිසට පහර දුන්
අතර ඔහුට කෙළ ගසා ඔහු ඉදිරි-
යෙහි දණ නමා වැඳ වැටුණෝය.[3]
20 එසේ කවටකම් කළ පසු ඔවුහු
දම් පැහැති සළුව ගලවා ඔහුගේම
පිට වස්ත්‍ර ඔහුට අන්දවා ඔහුව කණු-
වක ඇණ ගැසීම සඳහා ගෙන ගියහ.[4]
21 එසේ යන විට පාරේ ගමන් කර-
මින් සිටි සිරේනිය නම් නුවරේ උපන්
සීමොන් නම් කෙනෙකු ඔවුන්ට හමු
විය. ඇලෙක්සැන්ඩර්ගේ සහ රූෆස්-
ගේ පියා වූ ඔහු ජීවත් වූයේ පිටිසර
පළාතකයි. ඔවුහු ඔහුට යේසුස්ගේ
වධකණුව උසුලාගෙන යන්න කියා
බල කළෝය.[5]

22 එසේ ඔවුහු යේසුස්ව ගොල්-
ගොතා නම් ස්ථානයට ගෙනා-
වෝය. එම වචනය පරිවර්තනය කළ
විට එහි අර්ථය හිස්කබල යන්නයි.[6]
23 එහිදී ඔවුන් සුවඳ ලාටුවලින්
සෑදූ මත්ද්‍රව්‍යයක් වයින් සමඟ මිශ්‍ර
කර[7] ඔහුට බොන්න දෙන්න උත්සාහ
කළත් ඔහු එය ප්‍රතික්ෂේප කළේය.[8]
24 ස්වල්ප වේලාවකින් ඔවුහු ඔහුව
කණුවේ ඇණ ගැසූහ. ඉන්පසු ඔහුගේ
පිට වස්ත්‍ර[9] තමන් අතරේ බෙදාගැ-
නීම සඳහා ඔවුහු දාදු දැමූ අතර
පසුව ඒවා ඔවුන් අතරේ බෙදාගත්-
තෝය.[10] 25 ඔවුන් ඔහුව කණුවේ
ඇණ ගැසුවේ තුන්වෙනි පැයේදීය.*[11]
26 ඔහුට ඉහළින් "මේ යුදෙව්වරුන්-
ගේ රජුය"[12] කියා ඔහුට විරුද්ධව
කළ චෝදනාව[13] ලියා තිබිණ.
27 මේ අතර කොල්ලකාරයන් දෙදෙ-
නෙකුව ඔවුහු ඔහු දෙපස තිබූ කණු-
වල එල්ලූහ. එක් කෙනෙකු සිටියේ
ඔහුගේ දකුණු පැත්තෙහිය. අනික්
තැනැත්තා ඔහුගේ වම් පැත්තෙ-
හිය.[14] 28 —— 29 එම ස්ථානය
පසු කරගෙන යන අය තම හිස්

**15 පරි.**
1 මතෙ 27:15 ලූක් 23:17 යොහ 18:39
2 මතෙ 27:16
3 මතෙ 27:17 ලූක් 23:16
4 මතෙ 27:18
5 හිතෝ 27:4 මතෙ 21:38 ක්‍රියා 13:45
6 මතෙ 27:20 ක්‍රියා 3:14
7 ගීතා 2:6 යෙසා 9:6 යෙරෙ 23:5
8 මතෙ 27:22 ලූක් 23:20
9 ලූක් 23:21 යොහ 19:6
10 මතෙ 27:23 ලූක් 23:22 ක්‍රියා 3:13 ක්‍රියා 13:28
11 හිතෝ 29:25
12 මතෙ 27:26 යොහ 19:1
13 මතෙ 27:27

**2 තීරුව**
1 මතෙ 27:28
2 මතෙ 27:29 යොහ 19:3
3 මතෙ 27:30
4 මතෙ 27:31 යොහ 19:16
5 මතෙ 27:32 ලූක් 23:26
6 මතෙ 27:33 ලූක් 23:33 යොහ 19:17 හෙබ්‍රෙ 13:12
7 ගීතා 69:21
8 මතෙ 27:34
9 ගීතා 22:18
10 මතෙ 27:35 යොහ 19:23
11 මතෙ 27:45 ලූක් 23:44 යොහ 19:14
12 මතෙ 27:37 ලූක් 23:38 යොහ 19:19
13 මතෙ 27:29
14 මතෙ 27:38

මාක් **15:25*** එනම්, පෙ.ව. 9ට පමණ.

වනවනා ඔහුට නින්දා කරමින්[1]
මෙසේ කීවෝය. “දේවමාලිගාව කඩා
දමා දවස් තුනකින් ගොඩනඟන
බව ඔබ කිව්වා නේද?[2] **30** ඉතින්
ඔබට පුළුවන්නේ ඔය වධකණුවෙන්
බැහැලා එන්න.”[3] **31** එලෙසම
නායක පූජකයෝද නීතිය පිටපත්
කරන්නෝද ඔහුට කවටකම් කරමින්
තම තමන් අතරේ මෙසේ කියාගත්-
තෝය. “ඔහු අනුන්ව ගලවාගත්තා.
නමුත් තමන්ව ගලවාගන්න ඔහුට
බැහැ![4] **32** ඔහු ඊශ්‍රායෙලයෙහි රජු
වන ක්‍රිස්තුස් නේද? ඔහු දැන් වධක-
ණුවෙන් බැස ආවොත් අපි අනිවාර්ය-
යෙන්ම ඔහුව විශ්වාස කරනවා.”[5] ඔහු
සමඟ කණුවල එල්ලනු ලැබූ දෙදෙනා
පවා ඔහුට නිග්‍රහ කරමින් සිටියෝය.[6]
**33** හයවෙනි පැයේදී* මුළු පො-
ළොවම අන්ධකාරයෙන් වැසී ගියේය.
ඒ අන්ධකාරය නවවෙනි# පැය දක්වා
පැවතිණ.[7] **34** නවවෙනි පැයේදී
යේසුස් මහත් හඬකින් මෙසේ පැවසු-
වේය. “ඒලී, ඒලී, ලාමා සබක්තානි?”
ඔහු පැවසූ දෙයෙහි අර්ථය නම්,
“මාගේ දෙවියනි, මාගේ දෙවියනි,
ඔබ මාව අත්හැරියේ ඇයි”[8] යන්-
නයි. **35** ළඟ සිටගෙන සිටි අය-
ගෙන් සමහරෙකුට ඔහු පැවසූ දේ
ඇසුණු විට ඔවුහු, “අර බලන්න! ඔහු
එලියාට අඬගසනවා”[9] කියා පැවසූහ.
**36** එක්තරා තැනැත්තෙක් දුව ගොස්
ස්පොන්ජියක් හා සමාන දෙයක්
ගෙන එය ඇඹුල් වයින්වල පොඟවා,
බට දණ්ඩක ගසා ඔහුට බොන්න
දී,[10] “ඔහුට ඉන්න හරින්න! එලියා
ඇවිත් ඔහුව කණුවෙන් පහතට ගනී-
විද කියා බලමු”[11] කියා කීවේය.
**37** එවිට යේසුස් මහත් හඬකින්
කෑගසා අවසන් හුස්ම හෙළුවේය.[12]
**38** ඒ අවස්ථාවේදීම ශුද්ධස්ථානයේ
තිරය[13] ඉහළ පටන් පහළ දක්වා දෙ-
පළු වී ගියේය.[14] **39** ඔහු මිය යන
විට හමුදා නිලධාරියෙක් ඔහු ඉදිරියේ
සිටගෙන සිටියේය. සිදු වූ දේ දුටු
ඔහු, “ඇත්තෙන්ම මේ දෙවිගේ පුත්‍ර-
යාමයි”[1] කියා කීවේය.
**40** ස්ත්‍රීන් පිරිසක් යම් දුරක සිට
සිදු වන දේ බලාගෙන සිටියහ.[2] ඔවුන්
අතරේ මරියා මග්දලේනාද යාකොබ්-
ගේ* සහ යෝසෙස්ගේ මව වූ මරියාද
සලෝමිද සිටියහ.[3] **41** යේසුස් ගලී-
ලයේ සිටියදී ඔහු සමඟ ගොස්[4] ඔහුට
උපස්ථාන කරමින් සිටියේ මොවුන්ය.
මීට අමතරව යේසුස් සමඟ යෙරු-
සලමට ඇවිත් සිටි වෙනත් බොහෝ
ස්ත්‍රීහුද එතැනට පැමිණ සිටියහ.[5]
**42** ඒ සියල්ල සිදු වූයේ සූදා-
නම් කිරීමේ දවස නොහොත් සබ-
තට කලින් දවසේදීය. එදින හවස්
වරුවේ **43** මන්ත්‍රණ සභාවේ ප්‍රකට
සාමාජිකයෙකු වූ දෙවිගේ රාජ්‍යය
ගැන බලා සිටි අරිමාතිය නම් නුවරේ
උපන් යෝසෙප්[6] ධෛර්යය උපදවා-
ගෙන පිලාත් ඉදිරියට ගොස් යේ-
සුස්ගේ දේහය[7] භාරගැනීමට අවසර
ඉල්ලුවේය. **44** යේසුස් ඒ වන විටත්
මිය ගොස් ඇද්ද කියා දැනගැනී-
මට පිලාත්ට අවශ්‍ය වූ නිසා ඔහු
හමුදා නිලධාරියෙකුව කැඳවා යේ-
සුස් මේ වන විට මිය ගොස් ඇද්ද
කියා ඔහුගෙන් ඇසුවේය. **45** යේ-
සුස් මිය ගොස් ඇති බව හමුදා නිල-
ධාරියාගෙන් ස්ථිරව දැනගත් පසු ඔහු
යෝසෙප්ට යේසුස්ගේ දේහය භාරගැ-
නීමට අවසර දුන්නේය.[8] **46** අනර්ඝ
ලිනන් රෙදි මිලට ගත් යෝසෙප්, දේ-
හය කණුවෙන් පහතට ගෙන, එම රෙ-
දිවලින් එය ඔතා, පර්වතයක කැපූ
සොහොන් ගෙයක[9] දේහය තැන්-
පත් කළේය.[10] ඉන්පසු සොහොන්
ගෙයි දොරකඩට ඔහු ගලක් පෙරළා
තැබුවේය.[11] **47** මරියා මග්දලේනා
සහ යෝසෙස්ගේ මව වූ මරියා ඔහුව
තැන්පත් කළ ස්ථානය දෙස බලා-
ගෙන සිටියෝය.[12]

---

මාක් **15:33*** දහවල් 12ට පමණ. **33#** ප.ව. 3ට පමණ.

මාක් **15:40*** හෝ, “කුඩා යාකොබ්ගේ.” “කුඩා” යන්න භාවිත කර තිබෙන්නේ ඔහු සෙබදීගේ පුත් යාකොබ්ට වඩා මිටි හෝ බාල කෙනෙකු බව දැක්වීමටය.

---

**15 පරි.**
1 ගීතා 22:7; ගීතා 109:25; යෙසා 53:3
2 මතෙ 27:40; මාක් 14:58
3 ලූක් 23:35
4 මතෙ 27:41
5 මතෙ 16:4; මතෙ 27:42; රෝම 3:3
6 මතෙ 27:44; 1පේතෘ 2:23
7 මතෙ 27:45; ලූක් 23:44
8 ගීතා 22:1; මතෙ 27:46
9 මතෙ 27:47
10 ගීතා 69:21; මතෙ 27:48; යොහ 19:29
11 මතෙ 27:49
12 ගීතා 31:5; මතෙ 27:50; ලූක් 23:46; යොහ 19:30
13 නික් 26:31; හෙබ්‍රෙ 6:19; හෙබ්‍රෙ 10:20
14 මතෙ 27:51; ලූක් 23:45

**2 තීරුව**
1 මතෙ 27:54; ලූක් 23:47
2 ගීතා 38:11
3 මතෙ 27:56
4 ලූක් 8:2
5 ලූක් 23:49
6 මතෙ 27:57; යොහ 19:38
7 ද්වි 21:23
8 මතෙ 27:58
9 ක්‍රියා 13:29
10 යෙසා 53:9; මතෙ 27:59
11 මතෙ 27:60; ලූක් 23:53; යොහ 19:40
12 මතෙ 27:61; ලූක් 23:55

**16** සබත් දවසට[1] පසු දින මරියා
මග්දලේනාද[2] යාකොබ්ගේ
මව වූ මරියාද සලෝමීද ඔහු-
ගේ දේහයේ ගැල්වීම සඳහා සුවඳ
ද්‍රව්‍ය මිල දී ගත්හ.[3] **2** ඔවුහු සති-
යේ පළමුවෙනිදා[4] පාන්දරින්ම සො-
හොන් ගෙට ළඟා වූහ.[5] **3** "අපි
කාට කියලද සොහොන් ගෙයි දො-
රකඩ තබා තිබෙන ගල පෙරළා-
ගන්නේ" කියා එකිනෙකා අතරේ
කතා වෙමින් ඔවුහු පැමිණියෝය.
**4** නමුත් ඔවුහු එහි පැමිණි විට ඒ ගල
ඉතා විශාල එකක් වුවත් එය අහකට
පෙරළා තිබුණු ආකාරය දුටුවෝය.[6]
**5** ඔවුහු සොහොන් ගෙට ඇතුල් වූ
විට සුදු සළුවක් ඇඳ සිටි තරුණ-
යෙකු දකුණු පැත්තේ ඉඳගෙන සිටි-
නවා දැක මහත් සේ පුදුම වූහ.[7]
**6** ඔහු ඔවුන්ට මෙසේ කීවේය. "පුදුම
වෙන්න එපා. ඔබ සොයන්නේ කණු-
වක ඇණ ගසා මරා දැමූ[8] නාස-
රෙත් නුවරේ යේසුස්ව කියා මම
දන්නවා. ඔහුව මරණයෙන් නැගි-
ටුවා තිබෙනවා.[9] මේ බලන්න, ඔවුන්
ඔහුව තැන්පත් කළේ මෙම ස්ථා-
නයේයි![10] ඔහු දැන් මෙහෙ නැහැ.
**7** ඔබ ගොස් ඔහුගේ ගෝලයන්ට
සහ පේතෘස්ට මෙසේ කියන්න. 'ඔහු
ඔබට කලින් ගලීලයට යනවා.[11] ඔහු
ඔබට පැවසූ විදිහටම එහිදී ඔහුව
දකින්න පුළුවන් වෙයි.' "[12] **8** ඔවුහු
බියෙන් වෙවුලමින් මහත් පුදුමය-
කින් යුතුව සොහොන් ගෙයින් පිට-
තට ඇවිත් එතැනින් පලා ගියෝය.
බියපත් වූ ඔවුහු කිසිවෙකුට කිසිම
දෙයක් නොකීවෝය.[13]

## දීර්ඝ අවසානය

සමහර පුරාණ පිටපත්වල (ACD) සහ අනුවාදවල (VgSy$^{c,p}$) මතු දැක්වෙන දීර්ඝ අවසානයද එකතු කර තිබෙන නමුත් එය ඇතැම් (ℵBSy$^{s}$Arm) පිටපත් කිහිපයක දක්නට නැත.

**9** සතියේ පළමුවෙනි දින හිමිදිරි උදෑසන,
ඔහුව මරණයෙන් නැගිටුවනු ලැබූ පසු ඔහු
මුලින්ම පෙනී සිටියේ මරියා මග්දලේනා ඉදි-
රියෙහිය. මීට පෙරාතුව ඔහු ඇගෙන් භූතයන්
හත්දෙනෙකුව දුරු කර තිබිණ. **10** එවිට
ඇය ගොස් ඔහු සමඟ කලින් ඇසුරු කළ
අයට ඒ ගැන දැන්වූවාය. ඔවුන් ඒ අවස්ථා-
වේදී සිටියේ වැලපෙමින් සහ හඬමින්ය.
**11** ඔහු ජීවත්ව සිටින බවත් ඔහු තමා ඉදිරි-
යේ පෙනී සිටි බවත් ඇය පැවසුවද
ඔවුහු ඇය පැවසූ දේ විශ්වාස නොකළෝය.
**12** ඉන්පසු ඔවුන්ගෙන් දෙදෙනෙකු පිටිසර
ප්‍රදේශයකට ගමන් කරමින් සිටියදී යේසුස්
ගොස් ඔවුන් ඉදිරියේ වෙනස් ආකාරයකින්
පෙනී සිටියේය. මුලදී ඔහුව හඳුනාගැනීමට
ඔවුන්ට හැකි වූයේ නැත. **13** ඔවුන් ආපසු
ඇවිත් ඒ ගැන අනික් අයට දැන්වුවත්
ඔවුහු මොවුන්වත් විශ්වාස නොකළෝය.
**14** පසුව එකොළොස්දෙනා මේසයක් වටා
ඉඳගෙන සිටියදී ඔහු ඔවුන් ඉදිරියේ පෙනී
සිටියේය. මරණයෙන් නැගිටුවනු ලැබූ ඔහුව
දුටු අය පැවසූ දේ ඔවුන් විශ්වාස නොකළ
නිසා ඔහු ඔවුන් තුළ තිබූ විශ්වාසයේ මදිකම
ගැනත් සිත් දැඩිකම ගැනත් ඔවුන්ට තදින්
අවවාද කළේය. **15** ඉන්පසු ඔහු ඔවුන්ට
මෙසේ පැවසුවේය. "ලොව පුරා ගොස් මුළු
මිනිස් වර්ගයාටම ශුභාරංචිය ගැන දේ-
ශනා කරන්න. **16** විශ්වාසයක් ඇතුව බව්-
තීස්ම වන තැනැත්තාට ගැලවීම ලැබෙයි.
නමුත් විශ්වාසයක් නැති තැනැත්තාට දඬු-
වම් ලැබෙයි. **17** විශ්වාසයක් ඇති අයව
මෙම ලකුණුවලින් හඳුනාගත හැකියි. ඔවුන්
මාගේ නාමයෙන් භූතයන් දුරු කරයි. වෙනත්
භාෂාවලින් කතා කරයි. **18** ඔවුන් තම
දෑතින් සර්පයන්ව අල්ලයි. විස සහිත කිසි-
වක් බිව්වත් ඔවුන්ට එයින් කිසිදු හානියක්
නොවෙයි. ඔවුන් රෝගීන් මත අත් තබන
විට රෝගීන් සුවය ලබයි."
**19** ස්වාමීන් වන යේසුස් එලෙස ඔවුන්ට
කතා කළ පසු ඔහුව ස්වර්ගයට ඔසවාගනු
ලැබුවේය. ඉන්පසු ඔහු දෙවිගේ දකුණු පැත්-
තේ ඉඳගත්තේය. **20** ඔවුහු ගොස් සෑම
තැනම දේශනා කළෝය. ස්වාමීන්ද ඔවුන්
සමඟ සේවය කරමින් විවිධ ලකුණු සිදු කර-
මින් ඔවුන් දේශනා කළ පණිවිඩයට සහයෝ-
ගය දුන්නේය.

## කෙටි අවසානය

මාක් 16:8ට පසුව ඇතැම් පසුකාලීන අත්පිටපත් සහ අනුවාදවල පහත සඳහන් කෙටි අවසානයක් දක්නට තිබේ.

ඔවුහු තමන්ට අණ කළ සියල්ල පේතෘස් සමඟ සිටි අයට කෙටියෙන් විස්තර කළෝය. ඒ සියල්ල සිදු වූ පසු යේසුස්ම සදාකාලික ගැලවීම ගැන පළ වූ ශුද්ධ මෙන්ම යටපත් කළ නොහැකි වූ පණිවිඩය නැඟෙනහිර සිට බස්නාහිර දක්වා තම ගෝලයන් මාර්ගයෙන් පතළ කළේය.

**16 පරි.**
1 නික් 20:8
2 මතෙ 28:1
3 මාක් 14:8; ලූක් 23:56
4 ලූක් 24:1
5 යොහ 20:1
6 ලූක් 24:2
7 ලූක් 24:3; යොහ 20:11
8 මතෙ 28:5; ලූක් 24:4
9 මාක් 8:31; ලූක් 18:33; ක්‍රියා 4:10
10 මතෙ 28:6
11 මතෙ 26:32; මතෙ 28:7
12 මාක් 14:28
13 මතෙ 28:8; ලූක් 24:9

# ලූක්ගේ
## වාර්තාව

**1** ගරු තෙයොෆිලස්තුමනි, අප
කිසි සැකයක් නැතුව විශ්වාස
කරන දේවල් පිළිබඳව නිවැරදි තො-
රතුරු එකතු කර ඒවා වාර්තා කිරී-
මට[1] බොහෝදෙනෙක් උත්සාහ කර
ඇත. **2** දෙවිගේ ශුභාරංචියට සම්-
බන්ධ සෑම දෙයක්ම මුල සිටම[2] සියැ-
සින් දුටු අයත්[3] එය ප්‍රකාශ කළ අයත්[4]
ඒ පිළිබඳ තොරතුරු අපට දැන්වූහ.
**3** ගරු[5] තෙයොෆිලස්තුමනි,[6] මුල
සිටම සෑම තොරතුරක්ම නිවැරදි බව
සනාථ කරගත් මමද එම තොරතුරු
තර්කානුකූලව පෙළගස්වා[7] ඔබ වෙ-
නුවෙන් ලේඛනගත කිරීමට තීරණය
කළෙමි. **4** මෙම වාර්තාව ප්‍රයෝජ-
නයට ගෙන ඔබට උගන්වන ලද සෑම
දෙයක්ම නිවැරදි බව සහතික කරගැ-
නීමට ඔබට හැකි වනු ඇත.[8]

**5** හෙරොද් යුදයේ රජුව සිටි කාල-
යේදී,[9] අබියා නම් පූජක කාණ්ඩ-
යට[10] අයත් සෙකරියා නම් පූජකයෙක්
සිටියේය. ඔහුගේ බිරිඳගේ නම එලි-
සබෙත්ය. ඇය ආරොන්ගේ පෙළ-
පතින් පැවතෙන්නෙකි.[11] **6** ඔවුන්
යෙහෝවා දෙවිගේ[12] සියලු නීතිරීතිව-
ලට[13] අනුකූලව[14] නිර්දෝෂ ජීවිතයක්
ගත කිරීමට පියවර ගත් යුවළකි.[15]
ඔවුහු දෙවි ඉදිරියෙහි ධර්මිෂ්ඨ ජීවි-
තයක් ගත කළෝය.[16] **7** නමුත්
මහලු වියට පා තබා සිටි ඔවුන්ට දරු-
වන් සිටියේ නැත. එයට හේතුව නම්
එලිසබෙත් වඳ වී සිටීමයි.[17]

**8** මේ අතරතුරේදී දෙවි ඉදි-
රියෙහි සේවය කිරීමේ වාරය සෙක-
රියා අයත්ව සිටි පූජක කාණ්ඩයට[18]
ලැබිණ. **9** පූජකයන් චාරිත්‍රානුකූ-
ලව කළ සේවයට එකඟව යෙහෝවා
දෙවිගේ ශුද්ධස්ථානයට[19] ඇතුල් වී
සුවඳ ද්‍රව්‍ය ඔප්පු කිරීමේ වාරය[20]
ලැබී තිබුණේ සෙකරියාටය. **10** ඔහු
සුවඳ ද්‍රව්‍ය ඔප්පු කරන පැයේදී
රැස්ව සිටි සමූහයා යාච්ඤා කර-
මින් පිටත සිටියෝය.[1] **11** එවිට
සුවඳ ද්‍රව්‍ය ඔප්පු කරන පූජාසන-
යේ දකුණු පසින් යෙහෝවා දෙ-
විගේ දූතයෙක් සිටගෙන සිටිනවා
ඔහු දුටුවේය.[2] **12** එම දේවදූතයාව
දුටු සෙකරියා කැලඹී, අතිශයින්
බියපත් විය.[3] **13** එවිට දේවදූතයා
ඔහුට මෙසේ කීවේය. "සෙකරියා, බිය
නොවන්න. ඔබ කළ කන්නලව්වලට
දෙවි සවන් දී තිබෙනවා.[4] ඒ නිසා
ඔබේ බිරිඳ වන එලිසබෙත්ට පුතෙක්
ලැබෙයි. ඔහුට යොහන් යන නම
තබන්න.[5] **14** ඔහුගේ උපත ඔබේ
ජීවිතයට මහත් සතුටක් ගෙන දෙයි.
බොහෝදෙනෙක්ද ඔහුගේ උපත ගැන
ප්‍රීති වෙයි.[6] **15** යෙහෝවා දෙවි ඉදි-
රියෙහි ඔහු උතුම් කෙනෙක් වෙයි.[7]
නමුත් ඔහුට වයින්වත් මත්පැන්වත්
බොන්න තහනම්.[8] මව්කුසේ සිටම
දෙවිගේ බලය ඔහු තුළ ක්‍රියාත්-
මක වෙයි.[9] **16** ඔහු කරන සේවය
නිසා ඊශ්‍රායෙල්වරුන්ගෙන් බොහෝ-
දෙනෙක් ඔවුන්ගේ දෙවි වන යෙ-
හෝවා වෙතට නැවත හැරෙයි.[10]
**17** ඔහුගේ පැවරුම වන්නේ යෙ-
හෝවා දෙවි වෙනුවෙන්[11] සෙනඟක්
සූදානම් කිරීමයි.[12] ඒ සඳහා ඔහු
එලියා මෙන්[13] මහත් උද්‍යෝගයකින්
සේවය කරන අතර එලියාට ලැබුණු
බලයද ඔහුට ලැබෙයි. ප්‍රතිඵලයක්
ලෙස පියවරුන්ගේ සිත්[14] දරුවන්ගේ
සිත් හා සමාන වෙයි. අකීකරු අය
ප්‍රඥාවෙන් කටයුතු කරන ධර්මිෂ්ඨ-
යන් බවටත් හැරෙයි."

**18** සෙකරියා, දේවදූතයාට මෙසේ
කීවේය. "කොහොමද මම ඒ වගේ දෙ-
යක් විශ්වාස කරන්නේ? මමයි, මගේ
බිරිඳයි දැන් හොඳටම මහලුයි."[15]
**19** එවිට එම දේවදූතයා ඔහුට මෙසේ
පිළිතුරු දුන්නේය. "මගේ නම ගාබ්‍රි-

**1 පරි.**

**1** යොහ 20:31
**2** මාක් 1:1; 1යොහ 1:1
**3** යොහ 15:27; 1පේතෘ 5:1; 2පේතෘ 1:16
**4** ක්‍රියා 6:4; හෙබ්‍රෙ 2:3
**5** ක්‍රියා 24:3
**6** ක්‍රියා 1:1
**7** 1කොරි 14:40
**8** යොහ 20:31; ක්‍රියා 18:25; ගලා 6:6
**9** මතෙ 2:1
**10** 1ලේක 24:10
**11** ලෙවී 21:14
**12** ලෙවී 18:5; ලෙවී 20:8; ගීතා 119:1
**13** 1රාජා 9:4; 2රාජා 20:3; ගීතා 119:6
**14** හෙබ්‍රෙ 9:10
**15** යෝබ් 1:1
**16** උත් 7:1; පිලි 3:6
**17** උත් 18:11
**18** 1ලේක 24:19; 2ලේක 8:14; 2ලේක 31:2
**19** නික් 40:5
**20** නික් 30:7

**2 තීරුව**

**1** එළි 8:3
**2** ක්‍රියා 10:3
**3** විනි 6:22; දානි 10:8; ක්‍රියා 10:4; එළි 1:17
**4** දානි 10:12
**5** උත් 17:19; ලූක් 1:60
**6** ලූක් 1:58
**7** ලූක් 7:28
**8** ගණන් 6:3; විනි 13:4; මතෙ 11:18
**9** යෙරෙ 1:5; රෝම 9:11; ගලා 1:15
**10** මලා 4:6
**11** යෙසා 40:3
**12** 1සාමු 7:3; මලා 3:1
**13** මතෙ 11:14; මතෙ 17:10
**14** මලා 4:6
**15** උත් 17:17; උත් 18:11; රෝම 4:19

යෙල්.[1] මම සිටින්නේ දෙවි ඉදිරියෙහි-
මයි. දෙවි මාව ඔබ වෙතට එව්වේ මේ
ශුභාරංචිය ඔබට ප්‍රකාශ කරන්නයි.[2]
**20** නමුත් ඔබ මගේ වචන විශ්වාස
නොකළ නිසා මා පැවසූ දේවල් ඉටු
වන දවස දක්වා ඔබට කතා කරන්න
බැරි වෙයි.[3] මා පැවසූ මේ දේවල් නිය-
මිත කාලයේදී අනිවාර්යයෙන්ම ඉටු
වෙයි." **21** මේ අතර සෙකරියා එන
තෙක් බලා සිටි ජනයා[4] ඔහු ශුද්ධස්-
ථානයේ සිට පැමිණෙන්න මෙතරම්
ප්‍රමාද වන්නේ ඇයි කියා කල්පනා
කරමින් සිටියෝය. **22** ඔහු පිට-
තට පැමිණි විට ජනයා සමඟ කතා
කරන්න ඔහුට නොහැකි විය. ඔහු ශුද්-
ධස්ථානයේ සිටින විට යම් ආශ්චර්ය-
වත් දර්ශනයක් දැක ඇති බව[5] ඔවුන්
තේරුම්ගත්තේ එවිටය. ඔහුට කතා
කරන්න බැරි වූ නිසා ඔහු ඔවුන්ට
සංඥා මාර්ගයෙන් යම් දේවල් දන්ව-
මින් සිටියේය. **23** ඔහු තමාට නියම
වී තිබූ සේවා කාලය නිම වන තෙක්[6]
එහි රැඳී සිට, පසුව තම නිවසට හැරී
ගියේය.

**24** ටික දවසකට පසු ඔහුගේ බිරිඳ
වූ එලිසබෙත් ගැබ්ගත් අතර[7] ඇය
මාස පහක් ගත වන තුරුම නිවසේ
රැඳී සිටියාය. ඇය මෙසේ පැවසුවාය.
**25** "යෙහෝවා දෙවි මොන තරම්
කරුණාවන්ත දෙවි කෙනෙක්ද! මෙ-
තෙක් කල් මිනිසුන්ගෙන් මට විඳින්න
සිදු වුණු නින්දාව දෙවි දැන් නැති
කළා."[8]

**26** ඇය ගැබ්ගෙන මාස හයක්
ගත වූ පසු දෙවි ගාබ්‍රියෙල් දේව-
දූතයාව[9] ගලීලයේ පිහිටි නාසරෙත්
නම් නුවරට යැව්වේය. **27** ඔහු ගියේ
මරියා[10] නම් කන්‍යාව[11] හමු වීමටය.
ඇය ඒ වන විට දාවිත්ගේ පෙළප-
තට අයත් යෝසෙප් නම් තැනැත්-
තෙකු හා විවාහ ගිවිසගෙන සිටියාය.
**28** ඔහු ඇය ඉදිරියට ගොස්, "ඔබට
සුබ දවසක්![12] ඔබ බොහෝ සෙයින්
ආශීර්වාද ලැබූ තැනැත්තියක්. මන්ද
යෙහෝවා දෙවි[13] ඔබ සමඟයි"[14] කියා
පැවසුවේය. **29** ඒ දේවල් ඇසූ ඇය
බොහෝ සෙයින් කැලඹී, ඔහු තමාට
මෙලෙස කතා කරන්නේ ඇයි කියා
කල්පනා කළාය. **30** එහෙයින් දේ-
වදූතයා ඇයට මෙසේ කීවේය. "මරියා,
බිය නොවන්න. ඔබ දෙවිගේ ආශීර්වා-
දය ලැබූ තැනැත්තියක්.[1] **31** දැන්
මා කියන දේට හොඳින් සවන් දෙන්න.
ඔබේ කුසේ දරුවෙක් පිළිසිඳගනියි.
ඔබට බිහි වෙන්නේ පුතෙක්.[2] ඔහුට
යේසුස් යන නම තබන්න.[3] **32** ඔහු
ඉතා ශ්‍රේෂ්ඨ කෙනෙක් වන අතර[4]
ඔහුව හඳුන්වනු ලබන්නේ මහෝත්-
තම දෙවිගේ පුත්‍රයා ලෙසයි.[5] යෙ-
හෝවා දෙවි ඔහුට ඔහුගේ පියා වූ
දාවිත්ගේ[6] සිංහාසනය[7] ලබා දෙයි.
**33** යාකොබ්ගේ පෙළපත කෙරෙහි
සදහටම රජකම් කරන ඔහුගේ රාජ්‍ය-
යට අවසානයක් නැහැ."[8]

**34** එවිට මරියා දේවදූතයාගෙන්
මෙසේ ඇසුවාය. "මම තවමත් පුරුෂ-
යෙක් සමඟ එකට ජීවත් වී
නැහැ.[9] කොහොමද මට මේ
වගේ දෙයක් වෙන්නේ?" **35** දේව-
දූතයා ඇයට මෙසේ පිළිතුරු දුන්-
නේය. "ඔබට මහෝත්තම දෙවිගේ
මහත් බලය ලැබෙයි.[10] දරුවා පිළි-
සිඳගන්නේ ඒ බලය ඔබ තුළ ක්‍රියාත්-
මක වන නිසයි. ඉපදෙන දරුවා ශුද්ධ
කෙනෙක්.[11] ඔහු දෙවිගේ පුත්‍රයායි.[12]
**36** ඔබ තවත් දෙයකුත් දැනගත
යුතුයි. ඔබේ නෑදෑයෙක් වන එලිස-
බෙත් වඳ ස්ත්‍රියක් කියා හැමෝම
පැවසුවා නොවේද?[13] නමුත් දැන්
ඇය මහලුව සිටියත් ඇගේ
කුසේ පුතෙක් පිළිසිඳගෙන තිබෙ-
නවා. දරුවා පිළිසිඳගෙන දැනට මාස
හයයි. **37** ඇත්තෙන්ම දෙවිට කළ
නොහැකි දෙයක් නැහැ."[14] **38** එවිට
මරියා මෙසේ පැවසුවාය. "මම යෙ-
හෝවා දෙවිගේ දාසියක් පමණයි.[15]
නමුත් ඔබ පැවසූ දේ එලෙසම සිදු
වේවා!" ඉන් අනතුරුව දේවදූතයා
පිටත්ව ගියේය.

**39** මරියා ඉක්මනින් සූදානම් වී
කඳුකරයේ පිහිටි යුදාහි එක්තරා නුව-
රක් බලා ගමන් කළාය. **40** එම

**1 පරි.**
**1** දානි 8:16, දානි 9:21, හෙබ්‍රෙ 1:14
**2** ලූක් 1:26
**3** එස 3:26, එස 24:27
**4** ගණන් 6:23
**5** 2කොරි 12:1
**6** 1ලේක 9:25
**7** මතෙ 1:18
**8** උත් 30:23, 1සාමු 1:11
**9** දානි 8:16, ලූක් 1:19
**10** මතෙ 1:18, ලූක් 2:5
**11** යෙසා 7:14
**12** මතෙ 26:49, මාක් 15:18, යොහ 19:3
**13** යෙරෙ 1:19
**14** විනි 5:24

**2 තීරුව**
**1** හිතෝ 12:2
**2** උත් 16:11, විනි 13:3, ගලා 4:4
**3** මතෙ 1:21, ලූක් 2:21
**4** පිලි 2:10, 1තිමෝ 6:15
**5** මතෙ 27:54, යොහ 1:49
**6** යෙසා 11:1, යෙසා 11:10, මතෙ 1:1
**7** 2සාමු 7:12, ගීතා 132:11, යෙසා 9:7, යෙරෙ 23:5
**8** දානි 2:44, දානි 7:14, හෙබ්‍රෙ 1:8
**9** යෙසා 7:14, මතෙ 1:25
**10** මතෙ 1:18, මතෙ 1:20
**11** යොහ 6:69, යොහ 10:36
**12** මතෙ 14:33, යොහ 1:34, යොහ 20:31, රෝම 1:4
**13** උත් 11:30, ගීතා 113:9
**14** උත් 18:14, ගීතා 115:3, යෙරෙ 32:17, සෙක 8:6, මතෙ 19:26
**15** 1සාමු 1:11

නුවරට ගිය ඇය සෙකරියාගේ නිවසට
ගොස් එලිසබෙත්ව හමු වී ඇයට සුබ
පැතුවාය. **41** මරියා එලිසබෙත්ට
සුබ පැතූ විගස ඇගේ කුසේ සිටි
දරුවා දඟලන්න පටන්ගත්තේය. ඒ
අවස්ථාවේදී එලිසබෙත් තුළ දෙවි-
ගේ බලය ක්‍රියාත්මක වී, **42** ඇය
මහත් හඬින් මෙසේ කීවාය. “සිය-
ලුම ස්ත්‍රීන් අතරින් ඔබට දෙවි-
ගේ ආශීර්වාද ලැබේවා! ඔබේ කුසේ
සිටින දරුවාටත් ආශීර්වාද ලැබේවා![1]
**43** මගේ ස්වාමීන්ගේ[2] මව අද මා
ළඟට ආවා. මට ලැබුණේ මොන
තරම් වටිනා වරප්‍රසාදයක්ද! **44** මේ
බලන්න! ඔබ මට සුබ පැතූ ගමන්ම,
මගේ කුසේ සිටින දරුවා මහත්
ප්‍රීතියෙන් දඟලන්න පටන්ගත්තා.[3]
**45** යෙහෝවා දෙවි පැවසූ දේවල්[4]
අනිවාර්යයෙන්ම ඉටු වෙනවා.[5] ඔබ
ඒවා විශ්වාස කළ නිසා ඔබත් සන්-
තෝෂවත් කෙනෙක්.”

**46** එවිට මරියා මෙසේ කීවාය.
“මම කැමතියි යෙහෝවා දෙවිට
ප්‍රශංසා කරන්න.[6] **47** මගේ ගැල-
වුම්කරු වන දෙවි නිසා[7] මගේ
හිතට දැනෙන ප්‍රීතියට සීමාවක් නැති
තරම්.[8] **48** මන්ද ඔහුගේ දාසිය වන
මම පහත් කෙනෙක් වුණත්[9] ඔහු
මාව සුළු කළේ නැහැ. ඒ නිසා අද
දවසේ පටන් බිහි වන හැම පරම්-
පරාවක්ම මහත් ආශීර්වාදයක් ලැබූ
තැනැත්තියක් හැටියට මාව සල-
කයි.[10] **49** බලවත් තැනැත්තාණන්
මා වෙනුවෙන් කළේ මොන තරම්
ශ්‍රේෂ්ඨ දෙයක්ද! ඔහුගේ නාමය ශුද්-
ධයි.[11] **50** ඔහුට ගරුබිය දක්වන
අයට ඔහු සදහටම දයාව පෙන්වයි.[12]
**51** ඔහුගේ මහත් බලයෙන් ඔහු පුදු-
මසහගත ක්‍රියා කර[13] නපුරු චේත-
නාවකින් ක්‍රියා කරන උඩඟු අයව
විසුරුවාහැර තිබෙනවා.[14] **52** ඔහු
බලවතුන්ව සිංහාසනවලින් ඉවත්
කර[15] යටහත් අයව උසස් කර තිබෙ-
නවා.[16] **53** දෙවි කුසගින්නෙන් සිටි
අයව හොඳ දේවලින් තෘප්තිමත්
කර[17] ධනවතුන්ව හිස් අතින් යවා
තිබෙනවා.[1] **54** ඔහු තම සේවකයා
වන ඊශ්‍රායෙල්[2] ජාතියව අමතක
කර නැහැ. ඔවුන්ට පිහිට වූ ඔහු,
එසේ කර තිබෙන්නේ ඔවුන්ට දයාව
පෙන්වීමටයි.[3] **55** ඒ නිසා ඔහු අපේ
මුතුන්මිත්තන්ට පොරොන්දු වූ විදි-
හට ආබ්‍රහම්ටත් ඔහුගේ පෙළපතටත්
ඔහු සදහටම දයාව පෙන්වා තිබෙ-
නවා.”[4] **56** එලිසබෙත් සමඟ මාස
තුනක් පමණ නැවතී සිටි මරියා, ඉන්-
පසු තම නිවස බලා ගියාය.

**57** නියමිත කාලය පැමිණි විට
එලිසබෙත්ට පුතෙක් උපන්නේය.
**58** යෙහෝවා දෙවි ඇයට මහත්
දයාවක් පෙන්වූ බව[5] ඇගේ අසල්-
වැසියන්ට සහ නෑදෑයන්ට ආරංචි වූ
විට ඔවුහු ඇවිත් ඇය සමඟ ප්‍රීති
වූහ.[6] **59** දරුවා ඉපදීමෙන් පසු අට-
වෙනි දවසේදී දරුවාගේ චර්මච්ඡේද-
නය කිරීමේ චාරිත්‍රය සිදු කිරීම සඳහා
ඔවුහු පැමිණියෝය.[7] ඔවුන් සූදා-
නම් වූයේ දරුවාට තම පියාගේ නම
එනම්, සෙකරියා යන නම තැබීම-
ටයි. **60** නමුත් දරුවාගේ මව,
“එහෙම කරන්න එපා! ඔහුට යො-
හන් යන නම තබන්න” කියා පැව-
සුවාය. **61** ඔවුහු එය අසා, “ඔබේ
නෑදෑයන් අතරවත් ඒ වගේ නමක්
තිබෙන කෙනෙක් නැහැනේ” කියා
ඇයට කීවෝය. **62** එහෙයින් ඔවුහු
දරුවාට දිය යුතු නම කුමක්ද කියා
පියාගෙන් දැනගැනීමට සංඥා යො-
දාගෙන ඔහුගෙන් විමසූහ. **63** ඔහු
ලෑල්ලක් ඉල්ලාගෙන, “දරුවාගේ නම
යොහන්”[8] කියා එහි ලීවේය. සියලුදෙ-
නාම එය දැක මවිතයට පත් වූහ.
**64** ඒ මොහොතේම ඔහුට කතා කිරී-
මේ හැකියාව ලැබුණු අතර[9] ඔහු දෙ-
විට ප්‍රශංසා කරන්න පටන්ගත්තේය.
**65** යුදයේ මුළු කඳුකර පළාත පුරාම
මේ පිළිබඳව ආරංචිය පතළ විය.
ඔවුන් අවට ප්‍රදේශයේ විසූ සියලුදෙනා
තුළ බියක් ඇති විය. **66** ඒ ආරංචිය
ඇසූ සියලුදෙනාම ඒ සියල්ල සිතට
ගෙන,[10] “මේ කුඩා දරුවා මොන
වගේ කෙනෙක් වේවිද” කියා පැවසු-

**1 පරි.**

1 ද්වි 28:4; ලූක් 11:27
2 මතෙ 3:11
3 යොහ 3:29
4 උත් 18:14; උත් 21:1
5 හෙබ්‍රෙ 11:11
6 1සාමු 2:1; ගීතා 34:2
7 2සාමු 22:3; යෙසා 43:3; තිත 1:3; යූද් 25
8 හබ 3:18
9 1සාමු 1:11; ගීතා 138:6
10 ලූක් 11:27
11 ගීතා 71:19; ගීතා 111:9; යෙසා 57:15
12 නික් 20:6; ගීතා 103:17
13 ගීතා 89:10; යෙසා 40:10; යෙසා 52:10
14 2සාමු 22:28; දානි 4:37; 1පේත 5:5
15 යෝබ් 12:19; යෙසා 22:19; යෙසා 40:23
16 1සාමු 2:6
17 1සාමු 2:5; ගීතා 34:10; ගීතා 107:9

**2 තීරුව**

1 යෙසා 65:13
2 යෙසා 44:21
3 ගීතා 98:3; යෙසා 41:8; යෙරෙ 31:3
4 උත් 17:19; මීකා 7:20; ගලා 3:16
5 ගීතා 113:9; ගීතා 116:5
6 ලූක් 1:14; රෝම 12:15
7 උත් 17:12; ලෙවී 12:3; පිලි 3:5
8 ලූක් 1:13
9 ලූක් 1:20
10 ලූක් 2:19

වෝය. ඇත්තෙන්ම යෙහෝවා දෙවි-
ගේ බලය[1] ඒ දරුවාට ලැබිණ.
**67** ඒ අවස්ථාවේදී දරුවාගේ පියා
වූ සෙකරියා තුළ දෙවිගේ බලය ප්‍රබ-
ලව ක්‍රියාත්මක වූ නිසා[2] ඔහු මෙම
අනාවැකිය පැවසුවේය.[3] **68** “ඊශ්‍රා-
යෙල්හි දෙවි[4] වන යෙහෝවාට ප්‍රශංසා
වේවා! මන්ද ඔහු තම ජනයාට අනු-
කම්පා කර[5] ඔවුන්ට මිදීම සලසා
දී තිබෙනවා.[6] **69** ඔහු තම සේව-
කයා වූ දාවිත්ගේ පෙළපතින්, අප
වෙනුවෙන් ශ්‍රේෂ්ඨ ගැලවුම්කරුවෙක්*
පත් කර තිබෙනවා.[7] **70** ඔහු ඒ
දේ කරන්නේ පුරාණයේ සිට තම
ශුද්ධ අනාගතවක්තෘවරුන් ප්‍රකාශ
කළ දේවල් ඉටු කරමිනුයි.[8]
**71** අපේ සතුරන්ගේ සහ අපට වෛර
කරන සියල්ලන්ගේ අතින් අප ගැල-
වෙන ආකාරය ගැන[9] ඔහු පැවසුවා.
**72** ඔහු එසේ කළේ අපගේ මුතුන්-
මිත්තන්ව අමතක නොකර ඔවුන්
වෙනුවෙන් දයාව පෙන්වා ඇති බවත්
තම ශුද්ධ ගිවිසුම අමතක කර නැති
බවත් පෙන්වීමටයි.[10] **73** එම ගිවි-
සුම නම් ඔහු අපේ පියා වූ ආබ්‍ර-
හම්ට දිවුරා කළ පොරොන්දුවයි.[11]
**74** අපේ සතුරන් අතින් අපව මුදා-
ගත් පසු[12] ඒ පොරොන්දුවට එකඟව
කිසිම බියක් සැකක් නැතුව ඔහුට
පරිශුද්ධ සේවයක් පිරිනැමීමේ වර-
ප්‍රසාදය ඔහු අපට ලබා දෙයි.[13]
**75** එවිට අපට දිවි ඇති තුරා ඔහු
ඉදිරියේ ධර්මිෂ්ඨව හා විශ්වාසවන්-
තකමින් ඒ සේවය ඉටු කරන්න
හැකි වෙයි.[14] **76** මගේ කුඩා දරුව!
ඔබව හඳුන්වන්නේ මහෝත්තම දෙ-
විගේ අනාගතවක්තෘවරයෙක් ලෙ-
සයි. මන්ද යෙහෝවා දෙවි වෙනුවෙන්
මාර්ගය කලින්ම සූදානම් කරන්නේ
ඔබයි.[15] **77** එසේ කරමින් ගැලවීම
ලැබිය හැක්කේ පව්වලට සමාව ලබා-
ගැනීමෙන් බව ඔබ ඔහුගේ ජනයාට
අවබෝධ කර දෙයි.[16] **78** ඔවුන්ට
සමාව ලබාගත හැක්කේ අපේ දෙවි-
ගේ අතිමහත් දයානුකම්පාව නිසයි.
දෙවිගෙන් ලැබෙන මේ දයානුකම්-
පාව[1] අලුත් දිනක් උදා වන විට හිරු-
ගෙන් නැඟෙන ආලෝකය වගෙයි.[2]
**79** ප්‍රතිඵලයක් ලෙස අන්ධකාරයෙහි
හා මරණ සෙවණෙහි සිටින අය එළිය
දකියි.[3] එලෙසම අපටත් සමාදානය
නමැති මඟ දිගේ ඉදිරියටම ගමන්
කිරීමට අවස්ථාව උදා වෙයි.”
**80** කුඩා දරුවා ශාරීරිකව මෙන්ම
මානසිකව පිරිපුන් මිනිසෙකු ලෙස
හැදී වැඩුණේය.[4] ඊශ්‍රායෙල් දේශයේ
වැසියන් වෙනුවෙන් තම සේවය ප්‍රසිද්-
ධියේ ආරම්භ කරන තෙක් ඔහු සිටියේ
කිසි මිනිසෙකු නොසිටි පාළු තැන්-
වලය.

**2** ඒ කාලයේදී තම අධිරාජ්‍යය යට-
තේ* සිටි සියලුදෙනාම ලියාප-
දිංචි විය යුතු බව ඔගස්ටස් සීසර්
වෙතින් නියෝගයක් නිකුත් විය.[5]
**2** (සිරියාවේ ආණ්ඩුකාර කිරිනියස්
යටතේ සිදු කළ මුල්ම ලියාපදිංචි
කිරීම සිදු වූයේ ඒ කාලයේදීය.)
**3** ලියාපදිංචි වීම සඳහා[6] සියලුදෙනා-
ටම තමන් උපන් ගමට යෑමට සිදු
විය. **4** යෝසෙප්ද දාවිත්ගේ පෙළ-
පතින් පැමිණි කෙනෙක් වූ නිසා[7] ඔහු
ගලීලයේ පිහිටි නාසරෙත් නුවරින්
පිටත් වී යුදයේ පිහිටි දාවිත්ගේ නුව-
රට ගියේය. එම නුවර හඳුන්වන්නේ
බෙත්ලෙහෙම ලෙසයි.[8] **5** මරියා
සමඟ[9] ඔහු එහි ගියේ ලියාපදිංචි වීම
සඳහාය. ඒ වන විට යෝසෙප් ඇය
සමඟ විවාහ වී සිටි අතර[10] ඇය තම
දරුවාව ප්‍රසූත කිරීමේ කාලය ළඟා වී
තිබිණ.[11] **6** ඔවුන් එහි සිටියදී දරු-
වාව ප්‍රසූත කිරීමේ දිනය උදා වූ අතර,
**7** ඇය තම කුලුඳුල් පුත්‍රයාව[12] මෙ-
ලොවට බිහි කළාය. ඇය දරුවාව
රෙදි පටිවලින් ඔතා ගවමඩුවක තිබූ
ගවඔරුවක තැබුවාය.[13] එසේ දරුවා
ගවමඩුවක ඉපදුණේ නවාතැන්වල
කිසිම ඉඩක් නොතිබුණු නිසාය.
**8** මේ අතර එම ප්‍රදේශයේම

ලූක් **1:69*** මූ.අ., “ගැලවීම ලබා දෙන අඟක්.”

ලූක් **2:1*** එනම්, ලොව පුරා.

**1 පරි.**
**1** උත් 39:2
ගීතා 80:17
**2** ගණන් 11:25
2සාමු 23:2
**3** 2පේතෘ 1:21
**4** 1රාජා 1:48
ගීතා 41:13
ගීතා 72:18
ගීතා 106:48
**5** ද්වි 7:6
ගීතා 135:4
**6** ගීතා 111:9
ලූක් 7:16
**7** 1සාමු 2:10
ගීතා 132:17
**8** යෙරෙ 23:5
දානි 9:24
**9** ගීතා 106:10
**10** උත් 17:7
ලෙවී 26:42
ද්වි 4:31
ද්වි 7:12
ගීතා 105:8
ගීතා 106:45
**11** උත් 22:16
මීකා 7:20
හෙබ්‍රෙ 6:13
**12** යෙරෙ 30:8
රෝම 6:22
**13** යෙරෙ 30:9
හෙබ්‍රෙ 9:14
**14** ගලා 4:4
**15** යෙසා 40:3
මලා 3:1
මතෙ 3:3
**16** මාක් 1:4

**2 තීරුව**
**1** යෙසා 11:1
**2** ගීතා 97:11
**3** ගීතා 107:10
යෙසා 9:2
යෙසා 49:9
යෙසා 59:9
මතෙ 4:16
ක්‍රියා 26:18
**4** ලූක් 2:40

**2 පරි.**
**5** දානි 11:20
**6** රෝම 13:1
**7** මතෙ 1:16
**8** 1සාමු 16:1
මීකා 5:2
මතෙ 2:6
**9** ලූක් 1:27
**10** මතෙ 1:25
ලූක් 1:27
**11** මතෙ 1:18
**12** මතෙ 1:25
**13** යෙසා 53:2

එඬේරු රාත්‍රියේ එළිමහනේ මාරු-
වෙන් මාරුවට තම බැටළු රැළවල්
රැකබලා ගනිමින් සිටියහ. **9** යෙ-
හෝවා දෙවිගේ දූතයෙක්[1] එකව-
රම ඔවුන් ළඟ සිටගත්තේය. ඔවුන්
සිටි තැන යෙහෝවා දෙවිගේ තේජ-
සින්[2] ආලෝකවත් වූ නිසා ඔවුන් තුළ
මහත් බියක් ඇති විය. **10** නමුත් ඒ
දේවදූතයා ඔවුන්ට මෙසේ කීවේය.
“බිය නොවන්න. මම ආවේ ඔබට
ශුභාරංචියක් කීමටයි. ඒ ශුභාරං-
චිය සියලු ජාතීන්ට මහත් ප්‍රීතියක්
ගෙන දෙයි.[3] **11** මන්ද අද දාවිත්-
ගේ නුවරෙහි[4] ඔබට ගැලවුම්කරුවෙක්
ඉපදී සිටිනවා.[5] ස්වාමීන් වන ක්‍රිස්තුස්
කියන්නේ ඔහුටයි.[6] **12** ගවමඩුවක
තිබෙන ගවඔරුවක රෙදි පටිවලින්
ඔතා ඇති ළදරුවෙක් ඔබට සො-
යාගත හැකි වෙයි. ඔබට තිබෙන
සාක්ෂිය එයයි.” **13** ඒ මොහොතේදී
ඒ දේවදූතයාට ස්වර්ගීය සේනාවෙන්
මහත් දේවදූත සමූහයක් එකතු වූහ.[7]
ඔවුහු දෙවිට ප්‍රශංසා කරමින් මෙසේ
කීවෝය.[8] **14** “ස්වර්ගයේ සිටින දෙ-
විට සියලුම ප්‍රශංසා හා ගෞරවය
ලැබේවා![9] මිහිපිට දෙවිගේ අනුමැතිය
ලැබූ මිනිසුන්ට[10] සමාදානය වේවා!”[11]
**15** එම දේවදූත සමූහය ඔවුන් වෙ-
තින් පිටත් වී ස්වර්ගයට ගිය පසු
එඬේරු එකිනෙකා අතරේ මෙසේ
කතා කරගත්තෝය. “අපි දැන්ම
බෙත්ලෙහෙමට ගොස් යෙහෝවා
දෙවි[12] අපට දැනුම් දී ඇති මේ සිද්-
ධිය දැක බලා ගනිමු.” **16** ඔවුහු
විගස මරියාවත් යෝසෙප්වත් ගවඔ-
රුවේ නිදා සිටි ළදරුවාවත් බලන්න
ගියෝය. **17** ඔවුහු කුඩා දරුවාව
දුටු විට ඔහු ගැන දේවදූතයා තමන්ට
පැවසූ දේ ඔවුන්ට දැන්වූහ. **18** එම
එඬේරුන් දැන්වූ දේවල් ඇසූ සියලු-
දෙනා මවිතයට පත් වූහ. **19** ඒ සෑම
දෙයක් ගැනම ගැඹුරින් කල්පනා කර
බැලූ මරියා ඒවායෙහි වැදගත්කම තම
සිතෙහි තබාගත්තාය.[13] **20** ඉන්ප-
සුව තමන්ට පැවසූ සෑම දෙයක්ම ඇසූ
දුටු එඬේරු ඒ සම්බන්ධයෙන් දෙවිට
ප්‍රශංසා හා ගෞරවය දෙමින් තමන්
සිටි ස්ථානයට නැවත හැරී ගියහ.
**21** දරුවාගේ චර්මච්ඡේදනය කිරී-
මේ චාරිත්‍රය[1] සිදු කළ යුතු අටවෙනි
දවස[2] උදා විය. එදින දරුවාට යේසුස්
යන නම තබන ලදි.[3] එය ඔහු පිළි-
සිඳගැනීමටත් කලින් දේවදූතයා ඔහු
සඳහා දුන් නම විය.[4]
**22** මෝසෙස්ට දෙන ලද නීති-
යේ නියම කර තිබූ ආකාරයට පවිත්‍ර
වීම සඳහා නියමිත වූ දවස[5] පැමි-
ණියේය. ඔවුහු ඒ සඳහා යෙරු-
සලමට පැමිණෙන විට යේසුස්වත්
රැගෙන ඇවිත් යෙහෝවා දෙවි ඉදි-
රියේ පෙනී සිටියෝය.* **23** එසේ
කළේ “සෑම කුලුඳුල් පිරිමි දරුවෙ-
කුම යෙහෝවා දෙවි වෙනුවෙන් වෙන්
කර තිබෙනවා”[6] කියා යෙහෝවා දෙ-
විගේ නීතියෙහි ලියා ඇති නිසාය.
**24** එමෙන්ම යෙහෝවා දෙවිගේ නීති-
යේ සඳහන් ආකාරයට, “කොබෙයි-
යන් දෙදෙනෙකු හෝ පරෙවි පැටවුන්
දෙදෙනෙකු”[7] පූජාවක් ලෙස ඔප්පු
කළ යුතු විය. එහෙයින් ඔවුහු ඒ දේ
කිරීමටත් පියවර ගත්තෝය.
**25** මේ කාලයේදී සිමියොන් නම්
මිනිසෙක් යෙරුසලමෙහි සිටියේය.
ඔහු ඊශ්‍රායෙල් ජනයාට සැනසිල්ල
ලැබෙන තෙක් බලා සිටි[8] ධර්මිෂ්ඨ,
දේවගරුබියෙන් ක්‍රියා කළ මිනිසෙකි.
ඔහු තුළ දෙවිගේ බලය ක්‍රියාත්මක
විය. **26** තමාගේ මරණයට කලින්
යෙහෝවා දෙවි එවන ක්‍රිස්තුස්ව
දකින්න ඔහුට අවස්ථාවක් ලැබෙන
බව[9] දෙවි තම බලය මාර්ගයෙන්
ඔහුට එළිදරව් කර තිබිණ. **27** ඒ
අනුව දෙවි තම බලයෙන් ඔහුට
මඟ පෙන්වූ නිසා[10] ඔහු දේවමාලි-
ගාවට ආවේය. නීතියේ නියම කර
තිබූ චාරිත්‍රය*[11] ඉටු කිරීමට දෙමාපි-
යන් කුඩා දරුවාව ඇතුළට ගෙන
ආ විට, **28** සිමියොන් දරුවාව තම

**2 පරි.**
**1** හෙබ්‍රෙ 1:14
**2** ලෙවී 9:6
**3** උත් 12:3; ක්‍රියා 13:48
**4** 1සාමු 20:6
**5** යෙසා 9:6; යෙසා 19:20
**6** ක්‍රියා 2:36; පිලි 2:11
**7** ගීතා 103:21
**8** උත් 28:12; දානි 7:10; හෙබ්‍රෙ 1:14; එළි 5:11
**9** ගීතා 148:1; මාක් 11:10
**10** ගීතා 30:5; යෙසා 61:2; ලූක් 19:38
**11** යෙසා 57:19; කොලො 1:20
**12** ගීතා 111:2
**13** උත් 37:11; ලූක් 1:66; ලූක් 2:51

**2 තීරුව**
**1** උත් 17:10
**2** උත් 17:12; ලෙවී 12:3; ගලා 4:4
**3** මතෙ 1:21
**4** ලූක් 1:31
**5** ලෙවී 12:2
**6** නික් 13:2; නික් 22:29; නික් 34:19; ගණන් 3:13; ගණන් 8:17
**7** ලෙවී 1:14; ලෙවී 5:7; ලෙවී 12:8
**8** ගීතා 119:166; යෙසා 40:1; යෙසා 49:13
**9** ලූක් 9:20
**10** ක්‍රියා 8:29
**11** ලෙවී 12:6

---

**ලූක් 2:22*** එසේ කළේ ඔහුව යෙහෝවා දෙවිගෙන් මුදවාගැනීමටය. ගණන් 18:15, 16 බලන්න. **27*** එනම්, කුලුඳුල් පිරිමි දරුවෙකු සඳහා ඉටු කළ යුතු චාරිත්‍රය.

අතට ගෙන දෙවිට ප්‍රශංසා කරමින්
මෙසේ කීවේය. **29** “විශ්වයේ පාල-
කයාණෙනි, ඔබ මට පොරොන්දු වූ දේ
අද ඉටු වෙලා. මට දැන් සැනසිල්-
ලේ මිය යන්න පුළුවන්.[1] **30** මිනිස්
වර්ගයාට ගැලවීම සලසා දීම සඳහා
ඔබ එවූ තැනැත්තාව මගේ ඇස්
දෙකෙන්ම දැකගන්න මට පුළුවන්
වුණා.[2] **31** ඔබ ඒ ශුභාරංචිය සියලු
ජනයාට දැනුම් දෙන්න පියවර ගෙන
තිබෙනවා.[3] **32** ඒ තැනැත්තා අඳු-
රෙහි[4] සිටින ජාතීන්ට[5] එළියක්[6] වන
අතර ඔහු නිසා ඔබේ සෙනඟ වන
ඊශ්‍රායෙල්ට මහත් ආලෝකයක් උදා
වෙයි.” **33** යේසුස් ගැන පැවසූ ඒ
දේවල් අසා ඔහුගේ පියා සහ මව පුදුම
වූහ. **34** මේ අතර ඔවුන්ට ආශීර්-
වාද කළ සිමියොන්, දරුවාගේ මව වූ
මරියාට මෙසේ කීවේය. “මෙය මතක
තබාගන්න. මේ දරුවා නිසා[7] ඊශ්‍රා-
යෙල්හි බොහෝදෙනෙක් වැටී[8] ආපසු
නැඟිටියි. නමුත් ඔහු නින්දාවට ලක්
වෙයි.[9] **35** ප්‍රතිඵලයක් ලෙස බො-
හෝදෙනෙකුගේ සිත්වල ඇති දේ
අනාවරණය වෙයි.[10] (ඇත්තෙන්ම
ඔහු නිසා දිග කඩුවක් ඔබේ හදවත
පසාරු කරගෙන යයි.)”[11]

**36** මේ අතර ආෂේර් ගෝත්‍රයට
අයත් ෆානුඑල්ගේ දුව වූ ආනා
නම් අනාගතවක්තෘවරියක් සිටියාය.
(මහලු වියේ සිටි මෙම ස්ත්‍රිය වැන්දඹු-
වක් වූයේ තරුණ වියේදීමය. ඇයට
තම ස්වාමිපුරුෂයා සමඟ විවාහ ජීවි-
තය ගත කරන්න ලැබුණේ අවුරුදු
හතක් පමණි. **37** දැන් මේ වැන්දඹු-
වගේ[12] වයස අවුරුදු අසූහතරකි.) එක
දවසක්වත් අතපසු නොකර නමස්-
කාරය සඳහා ඇය දේවමාලිගාවට
පැමිණියාය. ඇය නිරාහාරව සිටිමින්
කන්නලව් කරමින් දිවා රෑ දෙකෙ-
හිම දෙවිට නමස්කාර කළ ස්ත්‍රියකි.[13]
**38** යෝසෙප් සහ මරියා දේවමාලිගා-
වේ සිටියදී ඇය ඔවුන් ළඟට ඇවිත්
දෙවිට ස්තුති කළාය. ඉන්පසුව දෙවි
යෙරුසලමට ගැලවීම ලබා දෙන තුරු
බලාගෙන සිටි සියලුදෙනාටම[14] ඇය
ඒ දරුවා ගැන කතා කරන්න පටන්-
ගත්තාය.

**39** යෙහෝවා දෙවිගේ නීතියේ
සඳහන් ආකාරයට[1] ඔවුහු සියලු කට-
යුතු අවසන් කළ පසු ගලීලයේ පිහිටි
තම නුවර වූ නාසරෙත් බලා ගියහ.[2]
**40** ඒ දරුවා හොඳින් ලොකු මහත් වී
වැඩුණේය.[3] ඔහුගේ ප්‍රඥාවද දිනෙන්
දින වැඩි විය. දෙවිගේ කරුණාවද[4]
ඔහුට නොඅඩුව ලැබිණ.

**41** ඔහුගේ දෙමාපියෝ සෑම අවු-
රුද්දකදීම පාස්කු උත්සවය සඳහා
යෙරුසලමට යෑමට පුරුදුව සිටියහ.[5]
**42** ඔහුට වයස අවුරුදු දොළහක් වූ
විටදීද ඔවුහු සිරිත් පරිදි[6] එම උත්ස-
වය සඳහා ගොස්, **43** උත්සවයෙහි
අවසානය දක්වාම එහි නතර වී සිටි-
යෝය. ඔවුන් නැවත තම නිවෙස්
බලා යන ගමනේදී යේසුස් යෙරු-
සලමෙහි නතර වී සිටි බව ඔහු-
ගේ දෙමාපියෝ දැන සිටියේ නැත.
**44** ඔවුන් සිතුවේ ගමන් කරන පිරිස
අතර ඔහුත් සිටිනවා කියායි. දව-
සක දුරක් ගමන් කළ පසු[7] ඔහු
නැති බව දැනගත් ඔවුහු නෑදැයන්
හා දන්නා හඳුනන අය අතරේ මහත්
වෙහෙසක් දරා ඔහුව සෙව්වෝය.
**45** ඔහුව සොයාගැනීමට නොහැකි
වූ නිසා ඔවුහු නැවත යෙරුසලමට
ගොස් එහිදීත් ඔහුව සෙවීමට මහත්
සේ වෙහෙස වූහ. **46** ඔවුන් ඔහුව
සොයාගත්තේ දවස් තුනකට පසුවය.
ඒ වන විට ඔහු සිටියේ දේවමාලිගා-
වෙහි[8] ගුරුවරුන් සමඟය. ඔහු ඔවුන්ට
සවන් දෙමින් ඔවුන්ගෙන් විවිධ ප්‍රශ්න
අසමින් සිටියේය. **47** ඔහුට තිබුණු
අවබෝධය ගැන හා ඔහු පිළිතුරු
දුන් ආකාරය ගැන ඔහුට සවන්
දෙමින් සිටි සියලුදෙනා කොතරම්
පුදුම වුණාද කිවහොත් ඔවුන්ට එය
අදහාගැනීමටවත් නොහැකි විය.[9]
**48** ඔහුගේ දෙමාපියෝ ඔහුව දැක
මවිතයට පත් වූහ. ඔහුගේ මව,
“පුතේ, ඇයි ඔයා අපිට මේ වගේ දෙ-
යක් කළේ? තාත්තයි මමයි ඔයාව
හොයන්න කොයි තරම් මහන්සි

**2 පරි.**

**1** උත් 46:30; යෙසා 57:2
**2** යෙසා 52:10; ලූක් 3:6; ක්‍රියා 4:12
**3** යෙසා 40:5; යෙසා 42:1
**4** යෙසා 25:7
**5** යෙසා 11:10; යෙසා 42:6; යෙසා 49:6; ක්‍රියා 13:47; ක්‍රියා 26:23
**6** යෙසා 9:2; යෙසා 60:1; මතෙ 4:16
**7** යෙසා 53:10
**8** යෙසා 8:14; හොෂෙ 14:9; 1කොරි 1:23; 1පේතෘ 2:8
**9** ක්‍රියා 28:22; 1පේතෘ 2:12
**10** 1කොරි 11:19
**11** යොහ 19:25
**12** 1තිමෝ 5:5
**13** ක්‍රියා 26:7
**14** යෙසා 52:9; විලා 3:26; මාක් 15:43; ලූක් 2:25

**2 තීරුව**

**1** ලෙවී 12:6
**2** මතෙ 2:23; ලූක් 1:26
**3** ලූක් 1:80; ලූක් 2:52
**4** යෙසා 11:2
**5** නික් 23:14; ද්වි 16:16
**6** නික් 34:23
**7** 1රාජා 19:4
**8** මතෙ 26:55
**9** ගීතා 119:99; මතෙ 7:28; මාක් 1:22; යොහ 7:15

වුණාද! අපි හිටියේ ලොකු හයකින්”
කියා ඔහුට කීවාය. **49** එවිට ඔහු
මෙසේ පිළිතුරු දුන්නේය. “මාව හො-
යන්න මේ තරම් මහන්සි වුණේ ඇයි?
මගේ පියාණන්ගේ ගෘහයේ මා සිටිය
යුතුයි[1] කියා ඔබ දැනගෙන සිටියේ
නැද්ද?” **50** නමුත් ඔහු පැවසූ දෙ-
යෙහි නියම අර්ථය අවබෝධ කර-
ගන්න ඔවුන්ට හැකි වුණේ නැත.[2]

**51** ඉන්පසු යේසුස් ඔවුන් සමඟ
නාසරෙත් නුවර බලා පිටත් විය. ඔහු
දිගටම ඔවුන්ට කීකරු වී සිටියේය.[3]
ඔහුගේ මව මේ සියලුම සිදුවීම් ඇගේ
සිතෙහි තබාගත්තාය.[4] **52** යේසුස්
ප්‍රඥාවෙන්[5] සහ උස මහතින්ද දෙවි
සහ මිනිසුන් ඉදිරියෙහි හොඳ නමක්
දිනාගනිමින්ද වැඩුණේය.[6]

**3** එය ටයිබීරියස් සීසර්ගේ පාලන
සමයෙහි පහළොස්වෙනි අවුරුද්-
දයි. ඒ වන විට යුදයෙහි ආණ්ඩු-
කාරයා වූයේ පොන්තියුස් පිලාත්ය.
ගලීලයේ දේශාධිපති ලෙස කටයුතු
කළේ හෙරොද්ය.[7] ඔහුගේ සහෝ-
දරයා වූ පිලිප් ඉතුරය ප්‍රදේශයෙහි
සහ ට්‍රකොනීටස්හි දේශාධිපති වශ-
යෙන් කටයුතු කළේය. අබිලේනි-
යෙහි දේශාධිපති වූයේ ලිසානියස්ය.
**2** ප්‍රකට පූජකයන් ලෙස සිටියේ
කායෆස් සහ නායක පූජක වූ අන්-
නස්ය.[8] ඒ කාලයේදී පාළුකරයේ සිටි[9]
සෙකරියාගේ පුත් යොහන්ට දෙවි-
ගෙන් පණිවිඩයක් ලැබිණ.[10]

**3** ඔහු යොර්දාන් ගඟ අවට පිහිටි
මුළු ප්‍රදේශය පුරා සංචාරය කර-
මින් ජනතාවට දේශනා කළේය. ඔහු
ඔවුන්ට පැවසුවේ පව්වලට සමාව
ලබාගැනීම සඳහා තම පසුතැවිල්ල
සංකේතවත් කරමින් බව්තීස්ම විය
යුතු බවය.[11] **4** අනාගතවක්තෘ යෙ-
සායාගේ ලියවිල්ලෙහි සඳහන් වචන
ඔහු මගින් එලෙස ඉටු විය. එහි සඳ-
හන් වූයේ මෙයයි. “සවන් දෙන්න!
‘ජනයෙනි, යෙහෝවා දෙවිගේ මඟ
එළි පෙහෙළි කර සූදානම් කරන්න!
ඔහුගේ මාවත් සමතලා කරන්න’[12]
කියා යමෙක් පාළුකරයේ හඬ නඟන්-
නේය. **5** සෑම නිම්නයක්ම පස්ව-
ලින් පිරවිය යුතුයි. සියලුම කඳු හා
හෙල්ද සමතලා කළ යුතුයි. වංගු
සහිත මාර්ග කෙළින් කර රළු බිම්
සමතලා තැන් බවට පත් කළ යුතුයි.[1]
**6** දෙවි ගැලවීම සලසා දෙන ආකාර-
යද සියලුදෙනා දකින්නෝය.’ ”[2]

**7** විශාල පිරිසක් බව්තීස්ම වීම
සඳහා ඔහු ළඟට පැමිණියෝය. එහෙ-
යින් ඔහු ඔවුන්ට මෙසේ පැවසුවේය.
“පොළොඟුන්ගෙන් පැවතෙන්නෙනි.[3]
දෙවිගේ උදහසින් පලා යන්න
අවශ්‍යයි කියා ඔබට පෙන්වා දුන්-
නේ කවුද?[4] **8** ඔබ ඇත්තටම පසු-
තැවිලි වී ඇති බව ඔබේ ක්‍රියාවලින්
ඔප්පු කර පෙන්වන්න.[5] ‘අපේ පියා
ආබ්‍රහම්’ කියා පැවසුවත් එය ඔබට
වාසියක් කියා සිතන්න එපා. දෙ-
විට අවශ්‍ය නම් මේ ගල්වලින් වුණත්
ආබ්‍රහම්ට දරුවන් ලබා දෙන්න ඔහුට
බලය තිබෙනවා. **9** ගහ කපා දැමී-
මට සියලුම කටයුතු සූදානම්. දැනට-
මත් පොරොවක් එහි මුල ළඟ තබා
තිබෙනවා. හොඳ පල නොදරන සෑම
ගසක්ම කපා ගින්නෙහි දමනු ලබ-
නවා.”[6]

**10** ඔහු වෙතට පැමිණි සමූහයා,
“අප කළ යුත්තේ කුමක්ද”[7] කියා ඔහු-
ගෙන් ඇසුවෝය. **11** ඔහු ඔවුන්ට
පිළිතුරු දුන්නේ මෙසේයි. “කෙනෙ-
කුට ඇතුල් වස්ත්‍ර දෙකක් ඇත්-
නම් ඒ වැඩිපුර එක නැති කෙනෙකුට
දිය හැකියි. කෑම ඇති තැනැත්-
තාටත් ඒ අයුරින්ම කළ හැකියි.”[8]
**12** බදු එකතු කරන්නෝ පවා බව්-
තීස්ම වීමට පැමිණ, “ගුරුතුමනි, අප
කළ යුත්තේ කුමක්ද”[9] කියා ඔහු-
ගෙන් ඇසූහ. **13** ඔහු පිළිතුරු දුන්-
නේ මෙසේයි. “නියමිත බද්ද පමණක්
එකතු කරන්න. වැඩිපුර අය කරන්න
එපා.”[10] **14** හමුදා සේවයේ යෙදී සිටි
අයද, “අප කළ යුත්තේ කුමක්ද”
කියා ඔහුගෙන් ඇසුවෝය. එවිට ඔහු
ඔවුන්ට පැවසුවේ මෙයයි. “කාටවත්
හිරිහැර කරන්න එපා. කිසි කෙනෙ-
කුට විරුද්ධව බොරු චෝදනා එල්ල

**2 පරි.**
1 ගීතා 26:8
ගීතා 27:4
හිතෝ 20:11
යොහ 2:16
2 ලූක් 9:45
ලූක් 18:34
3 නික් 20:12
ද්වි 5:16
එෆී 6:1
කොලො 3:20
4 උත් 37:11
දානි 7:28
ලූක් 2:19
5 හිතෝ 2:2
හිතෝ 2:5
යෙසා 11:2
6 හිතෝ 3:4

**3 පරි.**
7 මතෙ 14:1
ලූක් 23:7
8 මතෙ 26:57
යොහ 18:13
යොහ 18:24
ක්‍රියා 4:6
9 ලූක් 1:80
10 යොහ 1:6
11 මතෙ 3:1
මාක් 1:4
ලූක් 1:77
ක්‍රියා 13:24
12 යෙසා 40:3
මතෙ 3:3
මාක් 1:3

**2 තීරුව**
1 යෙසා 40:4
2 ගීතා 98:2
යෙසා 40:5
යෙසා 52:10
ලූක් 2:30
ක්‍රියා 28:28
3 යෙසා 59:5
4 මතෙ 3:7
මතෙ 23:33
5 මතෙ 3:8
ක්‍රියා 26:20
6 මතෙ 3:10
මතෙ 7:19
යොහ 15:6
7 ක්‍රියා 2:37
ක්‍රියා 16:30
8 ක්‍රියා 10:2
2කොරි 8:14
1තිමෝ 6:18
යාකො 2:15
1යොහ 3:17
9 මතෙ 21:32
ලූක් 7:29
10 ලූක් 19:8
1කොරි 6:10

කරන්නත් එපා.[1] ඔබට ලැබෙන දෙ-
යින් සෑහීමට පත් වී සිටින්න.”[2]
**15** ජනතාව ක්‍රිස්තුස්ගේ පැමිණීම
ගැන අපේක්ෂාවෙන් සිටි නිසා ඔවුහු
යොහන් ගැන කල්පනා කරමින්,
“මොහු ක්‍රිස්තුස් වෙන්න බැරිද”[3] කියා
තර්ක කළෝය. **16** නමුත් යොහන්
සියලුදෙනාටම මෙසේ පිළිතුරු දුන්-
නේය. “මම ඔබව බව්තීස්ම කරන්නේ
වතුරෙන්. නමුත් මට වඩා බල-
වත් කෙනෙක් පැමිණෙනවා. ඔහු-
ගේ පාවහන්වල පටි ලිහා දමන්නවත්
මම වටින කෙනෙක් නොවෙයි.[4] ඒ
තැනැත්තා ඔබව බව්තීස්ම කරන්-
නේ දෙවිගේ බලයෙන් හා ගින්නෙ-
නුයි.[5] **17** දැනුත් ධාන්‍ය පොළන
කුල්ලක් ඔහුගේ අතේ තිබෙනවා.
ඔහු තමන්ගේ කමත හොඳින් පිරි-
සිදු කර ගබඩාවට තිරිඟු රැස් කරයි.[6]
නමුත් කිසිවෙකුට නිවිය නොහැකි
ගින්නකින් ඔහු දහයියා[7] සියල්ල දවා
දමයි.”[8]

**18** ජනතාවට වෙනත් ආකාරව-
ලින්ද බොහෝ අවවාද දුන් ඔහු
ඔවුන්ට ශුභාරංචිය දිගටම දේශනා
කළේය. **19** මේ අතර යොහන් දේ-
ශාධිපති වූ හෙරොද්ටද යම් අවවාද
දුන්නේය. ඔහු එසේ කළේ හෙරොද්
තම සහෝදරයාගේ බිරිඳ වූ හෙ-
රෝදියස් සම්බන්ධයෙන් කර තිබුණු
දේ සහ ඔහුගේ වෙනත් දුෂ්ට ක්‍රියා
නිසාය.[9] **20** පසුව හෙරොද් තමන්
කළ සියලු දුෂ්ට ක්‍රියාවලට අමතරව
යොහන්ව සිරගෙයි දැමීමටද පියවර
ගත්තේය.[10]

**21** සියලුදෙනාම බව්තීස්ම වූ
අවස්ථාවේදී යේසුස්ද[11] ඇවිත් බව්-
තීස්ම වුණේය. ඒ අවස්ථාවේදී ඔහු
යාච්ඤා කරමින් සිටි විට අහස විවර
විය.[12] **22** දෙවිගේ බලය පරෙවියෙ-
කුගේ ස්වරූපයෙන් ඔහු පිට බැස
ආවේය. එවිට “මාගේ ප්‍රේමණීය
පුත්‍රයා ඔබයි. මම ඔබව අනුමත
කළෙමි”[13] කියා පවසන හඬක්ද ස්වර්-
ගයෙන් නික්මුණේය.

**23** යේසුස් තම සේවය පටන්ගත්
විට[1] ඔහුගේ වයස අවුරුදු තිහක්
පමණ විය.[2] සියලුදෙනා පිළිගෙන
සිටියේ ඔහුගේ පියා[3] යෝසෙප්[4]
කියාය.

යෝසෙප්ගේ පියා හේලිය.
**24** හේලිගේ පියා මතට්ය.
මතට්ගේ පියා ලෙවීය.
ලෙවීගේ පියා මෙල්කිය.
මෙල්කිගේ පියා යනයිය.
යනයිගේ පියා යෝසෙප්ය.
**25** යෝසෙප්ගේ පියා මටතියස්ය.
මටතියස්ගේ පියා ආමොස්ය.
ආමොස්ගේ පියා නාහුම්ය.
නාහුම්ගේ පියා එස්ලිය.
එස්ලිගේ පියා නග්ගයිය.
**26** නග්ගයිගේ පියා මායත්ය.
මායත්ගේ පියා මටතියස්ය.
මටතියස්ගේ පියා සෙමියන්ය.
සෙමියන්ගේ පියා යෝසෙක්ය.
යෝසෙක්ගේ පියා යෝදාය.
**27** යෝදාගේ පියා යොවානන්ය.
යොවානන්ගේ පියා රේසාය.
රේසාගේ පියා සෙරුබාබෙල්ය.[5]
සෙරුබාබෙල්ගේ පියා ෂෙයල්ටි-
යල්ය.[6]
ෂෙයල්ටියල්ගේ පියා නේරිය.
**28** නේරිගේ පියා මෙල්කිය.
මෙල්කිගේ පියා අද්දිය.
අද්දිගේ පියා කෝසම්ය.
කෝසම්ගේ පියා එල්මාදම්ය.
එල්මාදම්ගේ පියා ඒර්ය.
**29** ඒර්ගේ පියා යේසුස්ය.
යේසුස්ගේ පියා එලියේසර්ය.
එලියේසර්ගේ පියා යෝරිම්ය.
යෝරිම්ගේ පියා මතට්ය.
මතට්ගේ පියා ලෙවීය.
**30** ලෙවීගේ පියා සිමියොන්ය.
සිමියොන්ගේ පියා යූදස්ය.
යූදස්ගේ පියා යෝසෙප්ය.
යෝසෙප්ගේ පියා යෝනාම්ය.
යෝනාම්ගේ පියා එලියාකිම්ය.
**31** එලියාකිම්ගේ පියා මේලියාය.
මේලියාගේ පියා මෙන්නාය.
මෙන්නාගේ පියා මත්තතාය.
මත්තතාගේ පියා නාතන්ය.[7]
නාතන්ගේ පියා දාවිත්ය.[8]

**3 පරි.**
1 නික් 23:1 නික් 23:7 ලෙවී 19:11 හිතෝ 6:19
2 1තිමෝ 6:8
3 යොහ 1:25
4 මාක් 1:7 ක්‍රියා 13:25
5 මතෙ 3:11 මාක් 1:8 ක්‍රියා 2:4
6 මීකා 4:12
7 ගීතා 1:4
8 මතෙ 13:30
9 මතෙ 14:3
10 මාක් 6:17
11 මතෙ 3:13 මාක් 1:9
12 මතෙ 3:16 මාක් 1:10
13 ගීතා 2:7 මතෙ 3:17 මාක් 1:11 යොහ 1:32 2පේත්‍ර 1:17

**2 තිරුව**
1 ක්‍රියා 10:38
2 ගණන් 4:3
3 මතෙ 13:55
4 මතෙ 1:16 ලූක් 1:35 ලූක් 4:22 යොහ 6:42
5 එස්රා 3:2
6 1ලේක 3:17 මතෙ 1:12
7 2සාමු 5:14
8 1සාමු 16:13 1ලේක 3:5 මතෙ 1:6

**32** දාවිත්ගේ පියා යෙස්සේය.[1]
යෙස්සේගේ පියා ඕබෙද්ය.[2]
ඕබෙද්ගේ පියා බෝවස්ය.[3]
බෝවස්ගේ පියා සල්මොන්ය.[4]
සල්මොන්ගේ පියා නාෂොන්ය.[5]
**33** නාෂොන්ගේ පියා අමිනදාබ්ය.[6]
අමිනදාබ්ගේ පියා ආනීය.[7]
ආනීගේ පියා හෙස්‍රොන්ය.[8]
හෙස්‍රොන්ගේ පියා පේරෙස්ය.[9]
පේරෙස්ගේ පියා යූදාය.[10]
**34** යූදාගේ පියා යාකොබ්ය.[11]
යාකොබ්ගේ පියා ඊසාක්ය.[12]
ඊසාක්ගේ පියා ආබ්‍රහම්ය.[13]
ආබ්‍රහම්ගේ පියා ටේරාය.[14]
ටේරාගේ පියා නාහෝර්ය.[15]
**35** නාහෝර්ගේ පියා සේරග්ය.[16]
සේරග්ගේ පියා රෙව්ය.[17]
රෙව්ගේ පියා පේලෙග්ය.[18]
පේලෙග්ගේ පියා ඒබර්ය.[19]
ඒබර්ගේ පියා ෂෙලාය.[20]
**36** ෂෙලාගේ පියා කායිනන්ය.
කායිනන්ගේ පියා ආර්පක්සද්ය.[21]
ආර්පක්සද්ගේ පියා ෂෙම්ය.[22]
ෂෙම්ගේ පියා නෝවාය.[23]
නෝවාගේ පියා ලාමෙක්ය.[24]
**37** ලාමෙක්ගේ පියා මෙතූසලාය.[25]
මෙතූසලාගේ පියා ඒනොක්ය.[26]
ඒනොක්ගේ පියා යාරද්ය.[27]
යාරද්ගේ පියා මහාලලියල්ය.[28]
මහාලලියල්ගේ පියා කායිනන්ය.[29]
**38** කායිනන්ගේ පියා ඒනොෂ්ය.[30]
ඒනොෂ්ගේ පියා සෙත්ය.[31]
සෙත්ගේ පියා ආදම්ය.[32]
ආදම්ගේ පියා දෙවිය.

**4** දෙවි තම බලයෙන් යේසුස්ට දුන්
මඟ පෙන්වීම්වලට එකඟව ඔහු
යෝර්දාන් ගඟ අසලින් පිටත් වී පාළු-
කරයට ගියේය. ඔහු තුළ දෙවිගේ
බලය ප්‍රබලව ක්‍රියාත්මක විය. පාළුක-
රයේ විවිධ ස්ථානවලට ගිය ඔහු,[33]
**2** දවස් හතළිහක්[34] එහි ගත කළේය.
යක්ෂයා ඔහුව වරදකට හසු කර-
ගන්න[35] උත්සාහ කළේ එහිදීය. ඒ
දවස් හතළිහ පුරාම ඔහු කිසිම ආහා-
රයක් නොගත් නිසා ඔහුට කුසගින්-
නක් දැනිණ. **3** එවිට යක්ෂයා, "ඔබ
දෙවිගේ පුත්‍රයෙකු නම් මේ ගල රොටි-
යක් කරන්න" කියා ඔහුට පැවසුවේය.
**4** නමුත් යේසුස් ඔහුට මෙසේ පිළිතුරු
දුන්නේය. "'මිනිසාගේ ජීවිතය රඳා
පවතින්නේ කෑම වේලක් මත පම-
ණක් නොවේ' කියා ලියා තිබෙනවා."[1]
**5** එවිට යක්ෂයා ඔහුව උස් තැන-
කට ගෙනැවිත් ලොව පුරා පිහිටුවා
ඇති සියලු රාජ්‍යයන් එක සැණින්ම
පෙන්වා, **6** ඔහුට මෙසේ කීවේය.
"මේ සෑම දෙයක්ම තිබෙන්නේ මගේ
බලය යටතේයි. එහි ගෞරවයත් තේ-
ජසත් හිමි වී තිබෙන්නේ මටයි.
මා කැමති කෙනෙකුට ඒවා දෙන්න
මට පුළුවන්.[2] දැන් ඒ දේවල් ඔබට
ලබා දෙන්න මම කැමතියි.[3] **7** එම-
නිසා ඔබ එක වරක්[4] මට නමස්කාර
කළොත් මේ සියල්ල ඔබට අයිති
වෙයි." **8** යේසුස් එවිට මෙසේ පිළි-
තුරු දුන්නේය. "'ඔබ නමස්කාර කළ
යුත්තේ ඔබේ දෙවි වන යෙහෝවා-
ටයි.[5] ඔබේ පරිශුද්ධ සේවය පිරිනැමිය
යුත්තේ ඔහුට පමණයි' කියා ලියා
තිබෙනවා."[6]
**9** ඉන්පසු ඔහු යේසුස්ව යෙරුසල-
මට ගෙන ගියේය. එහිදී ඔහුව දේවමා-
ලිගාවේ පවුර මුදුනට ගෙන ගොස්,[7]
"ඔබ දෙවිගේ පුත්‍රයෙකු නම් මෙතැ-
නින් පහතට පනින්න.[8] **10** මන්ද
ලියා තිබෙන්නේ මෙසේයි. 'ඔහු තම
දූතයන්ට ඔබව ආරක්ෂා කිරීමට
අණ දෙන්නේය.[9] **11** එවිට ඔබේ
පය කිසිවිටකත් ගලක නොවදින
පිණිස ඔවුහු සිය අත්වලින් ඔබව උසු-
ලනවා ඇත'"[10] කියා ඔහුට කීවේය.
**12** එවිට යේසුස් ඔහුට මෙසේ පිළි-
තුරු දුන්නේය. "'ඔබේ දෙවි වන
යෙහෝවා ඔබ වෙනුවෙන් මැදිහත්
වෙයිද නැද්ද කියා පරීක්ෂා නොකළ
යුතුයි' කියාද සඳහන් වී තිබෙනවා."[11]
**13** යේසුස්ව වරදකට හසු කරගන්න
යක්ෂයා දැරූ ඒ වෑයම එතැනින් අව-
සන් විය. ඔහු තවත් සුදුසු අවස්ථාවක්

**3 පරි.**
1 1සාමු 17:58, යෙසා 11:1, මතෙ 1:6
2 රූත් 4:17
3 රූත් 4:13
4 රූත් 4:21, මතෙ 1:5
5 ගණන් 1:7, 1ලේක 2:11, මතෙ 1:4
6 රූත් 4:20
7 1ලේක 2:10
8 රූත් 4:19
9 රූත් 4:18, 1ලේක 2:5
10 උත් 29:35, රූත් 4:12, 1ලේක 2:4, මතෙ 1:3
11 උත් 25:26, 1ලේක 2:1
12 උත් 21:3
13 උත් 11:27, 1ලේක 1:28, මතෙ 1:2
14 උත් 11:26
15 උත් 11:24
16 උත් 11:22
17 උත් 11:20, 1ලේක 1:25
18 උත් 11:18
19 උත් 11:16
20 උත් 11:14
21 උත් 11:12
22 උත් 11:10
23 උත් 5:29, උත් 5:32
24 උත් 5:25
25 උත් 5:21
26 උත් 5:19
27 උත් 5:16
28 උත් 5:12
29 උත් 5:9, 1ලේක 1:2
30 උත් 4:26, උත් 5:7, උත් 5:10, 1ලේක 1:1
31 උත් 5:4
32 උත් 5:1

**4 පරි.**
33 ලෙවී 16:21, මතෙ 4:1, මාක් 1:12
34 නික් 34:28, 1රාජා 19:8
35 හෙබ්‍රෙ 2:18

**2 තීරුව**
1 ද්වි 8:3
2 යොහ 12:31, යොහ 14:30, එෆී 2:2
3 එළි 13:2
4 දානි 3:5
5 නික් 20:3
6 ද්වි 6:13, ද්වි 10:20
7 මතෙ 4:5

8 මතෙ 4:6; 9 ගීතා 91:11; 10 ගීතා 91:12; 11 ද්වි 6:16; 1කොරි 10:9.

පැමිණෙන තෙක්[1] ඔහුගෙන් අහක්ව
ගියේය.
**14** ඉන්පසු දෙවි තම බලයෙන්
යේසුස්ට මඟ පෙන්වූ නිසා ඔහු නැව-
තත් ගලීලයට ගියේය.[2] ඒ අවට මුළු
ප්‍රදේශය පුරාම ඔහු ගැන යහපත්
දේවල් බොහොමයක් පැතිර ගියේය.[3]
**15** ඔහු ඔවුන්ගේ සිනගෝගවලදී
ඉගැන්වූ අතර සියලුදෙනා ඔහුට ගෞ-
රව කළෝය.[4]
**16** ඉන්පසු යේසුස් තමා ඇති-
දැඩි වූ නාසරෙත් නුවරට පැමිණි-
යේය.[5] සබත් දවසක් වූ එදින සුපුරුදු
පරිදි ඔහු සිනගෝගයට ඇතුල් වී,[6]
ශුද්ධ ලියවිල්ලෙන් කොටසක් කියවී-
මට සිටගත්තේය. **17** ඔහුගේ අතට
දෙනු ලැබුවේ අනාගතවක්තෘ යෙසා-
යාගේ ලියවිල්ලයි. ඔහු එය දිගහැර
මතු දැක්වෙන කොටස සොයා-
ගත්තේය. **18** “යෙහෝවා දෙවිගේ
බලය[7] මට ලැබී ඇත. මන්ද ඔහු
දිළිඳුන්ට ශුභාරංචිය ප්‍රකාශ කරන්න
මාව අභිෂේක කළේය. ඔහු මාව
එවා තිබෙන්නේ වහලුන්ට නිදහස
ලැබෙන බවත් අන්ධයන්ට නැවත
පෙනීම ලැබෙන බවත් දේශනා කිරී-
මට සහ තැළී පීඩිතව සිටින අයව
නිදහස් කිරීමටයි.[8] **19** එමෙන්ම
යෙහෝවා දෙවිගේ කරුණාවේ අවු-
රුද්ද ගැන දේශනා කිරීමටයි.”[9]
**20** ඔහු එය කියවීමෙන් පසු ලිය-
විල්ල අකුළා, එය නැවත සේවකයාට
දී ඉඳගත්තේය. ඒ අවස්ථාවේදී සින-
ගෝගයේ සිටි සියලුදෙනාම ඔහු දෙස
බලාගෙන සිටියේ මහත් උනන්දුව-
කිනි. **21** ඉන්පසු ඔහු, “ශුද්ධ ලිය-
විල්ලෙන් ඔබට ඇහෙන්න කියෙවූ එම
කොටස ඔබේ ඇස් ඉදිරිපිටම දැන් ඉටු
වෙනවා”[10] කියා ඔවුන්ට කීවේය.
**22** එවිට ඒ සියලුදෙනාම ඔහු
ගැන ප්‍රශංසාත්මක ලෙස කතා කර-
මින් ඔහු පැවසූ සිත්ගන්නා දේවල්
ගැන පුදුම වී,[11] “මොහු යෝසෙප්-
ගේ පුතෙක් නේද”[12] කියා ඇසුවෝය.
**23** එය අසා ඔහු මෙසේ පැවසු-
වේය. “ ‘වෛද්‍යතුමනි,[13] ඔබවම සුව
කරගන්න’ යන කියමන ඔබත් අසා
ඇති. සමහරවිට ඔබ එය මට අදාළ
කර, ‘කපර්ණවුමෙහි[1] ඔබ කළා කියා
අපට ආරංචි වූ දේවල්[2] ඇයි ඔබේම
ගම් පළාතෙත් කරන්නේ නැත්තේ’[3]
කියා ඔබ සිතනවා ඇති.” **24** ඔහු
මෙසේද පැවසුවේය. “ඇත්තෙන්ම මා
ඔබට කියන්නේ, කිසි අනාගතවක්-
තෘවරයෙකුට තමාගේම ගම් පළාතේ
පිළිගැනීමක් නැති බවයි. **25** උදා-
හරණයක් හැටියට එලියාගේ දවස්-
වලදී සිදු වූ දෙයක් ගැන ඔබට
මතක් කරන්න කැමතියි. අවුරුදු
තුනකුත් මාස හයක් පුරා ඊශ්‍රා-
යෙල් දේශයට වැසි වැටුණේ නැති
නිසා ඒ මුළු දේශය පුරාම මහත්
සාගතයක් ඇති වුණා. ඒ කාලයේදී
උපකාර අවශ්‍යව තිබූ වැන්දඹුවන්
බොහෝදෙනෙක් ඊශ්‍රායෙල් දේශයේ
සිටියා.[4] **26** නමුත් ඒ ස්ත්‍රීන්ගේ එක්
නිවසකටවත් යන්න කියා එලියාට
කිව්වේ නැහැ. ඒ වෙනුවට ඔහුව යැව්-
වේ සීදොන් දේශයේ සාරෆෙත් නුව-
රෙහි සිටි වැන්දඹුවකගේ නිවසටයි.[5]
**27** ඒ වගේම අනාගතවක්තෘ එලිෂා-
ගේ කාලයේදී ඊශ්‍රායෙලයෙහි ලාදුරු
රෝගීන් බොහෝදෙනෙක් සිටියත් ඒ
කිසි කෙනෙකුව සුව කරනු ලැබුවේ
නැහැ. ඒ වෙනුවට ඔහු පවිත්‍ර කළේ
සිරියාවේ සිටි නාමන්ව පමණයි.”[6]
**28** ඒ දේවල් ඇසූ සිනගෝගයේ සිටි
සියල්ලන් තුළ මහත් කෝපයක් ඇති
විය.[7] **29** ඔවුහු නැඟිට, ඉක්මනින්ම
ඔහුව නුවරින් පිටතට රැගෙන ගොස්
තම නුවර ගොඩනඟා තිබූ කන්-
දේ කෙළවරට ඔහුව ගෙන ගියෝය.
ඔවුන් එසේ කළේ ඔහුව එයින් පහ-
තට තල්ලු කර දැමීමේ අදහසිනි.[8]
**30** නමුත් ඔහු කෙසේ හෝ සෙනඟ
අතරින් ගැලවී එතැනින් ගියේය.[9]
**31** පසුව ඔහු ගලීලයේ පිහිටි නුව-
රක් වූ කපර්ණවුමට පැමිණි-
යේය.[10] ඔහු සබත් දවසේදී එහි
සිටි සියලුදෙනාට උගන්වමින් සිටි-
යේය. **32** එහිදීත් ඔහුට සවන් දෙ-
මින් සිටි අය ඔහු ඉගැන්වූ ආකාරය

**4 පරි.**
1 හෙබ්‍රෙ 4:15
2 මතෙ 4:12; යොහ 4:3
3 ක්‍රියා 10:37
4 යෙසා 52:13
5 මතෙ 2:23
6 ක්‍රියා 13:14; ක්‍රියා 17:2
7 යෙසා 61:1
8 යෙසා 42:3; මතෙ 12:20
9 යෙසා 58:6; යෙසා 61:2
10 මතෙ 5:17; 2කොරි 6:2
11 ගීතා 45:2; යෙසා 50:4; එෆී 4:29
12 මතෙ 13:54; මාක් 6:2; යොහ 6:42
13 මතෙ 8:7

**2 තීරුව**
1 මතෙ 4:13
2 මතෙ 9:12
3 මතෙ 13:57; මාක් 6:4; යොහ 4:44
4 1රාජා 17:9; 1රාජා 18:1; යාකො 5:17
5 1රාජා 17:10
6 2රාජා 5:14
7 ලූක් 2:34
8 මතෙ 21:38
9 යොහ 8:59; යොහ 10:39
10 මාක් 1:21

ගැන මවිතයට පත් වූහ.[1] මන්ද ඔහු
දෙවි මත රඳා සිටිමින් කතා කළේය.[2]
**33** මේ අතර යේසුස් සිනගෝගයේ
සිටි විට භූතයෙකු වැහී සිටි මිනිසෙක්[3]
මහත් හඬින් කෑගසා මෙසේ කීවේය.
**34** “නාසරෙත් නුවරින් ඇවිත් සිටින
යේසුස්,[4] ඔබ අපට කරදර කරන්නේ
ඇයි?[5] ඔබ ආවේ අපව විනාශ කරන්-
නද? ඔබ කවුද කියා මම හොඳටම
දන්නවා.[6] දෙවි විසින් එවා ඇති ශුද්ධ
තැනැත්තා ඔබයි.”[7] **35** නමුත් යේ-
සුස් ඒ මිනිසාට වැහී සිටි භූතයාට
තදින් අණ කරමින්, “නිහඬ වෙන්න.
ඔය මිනිසාගෙන් පිටතට එන්න” කියා
කීවේය. එවිට ඒ භූතයා රැස්ව සිටි
සියලුදෙනා ඉදිරියෙහිම ඒ මිනිසාව
බිම වැට්ටුවේය. නමුත් ඔහුට කිසි
හානියක් සිදු නොකර ඔහුගෙන් පිට-
තට ආවේය.[8] **36** එය දුටු සියලු-
දෙනා විස්මයට පත් වී, “මොනවාද
මොහු මේ කියන්නේ? ඔහු භූත-
යන්ට අණ දෙන්නේ මහත් අධිකාරි-
යක් හා බලයක් තිබෙන කෙනෙක්
වගෙයි. ඔහු අණ කළ විගස ඔවුන්
පිටතට එනවා” කියා එකිනෙකා අත-
රේ කතා වෙන්න පටන්ගත්තෝය.[9]
**37** එහෙයින් ඔහු ගැනත් ඔහු කළ
දේවල් ගැනත් ඒ අවට ප්‍රදේශය පුරාම
අස්සක් මුල්ලක් නෑර පැතිර ගියේය.[10]
**38** ඉන්පසු ඔහු සිනගෝගයෙන්
පිටත් වී, සීමොන්ගේ නිවසට පැමි-
ණියේය. සීමොන්ගේ බිරිඳගේ මවට
තද උණක් වැලඳී, ඇය දැඩි සේ
රෝගාතුරව සිටියාය. ඇය වෙනුවෙන්
යමක් කරන්න කියා ඔවුන් ඔහුගෙන්
ඉල්ලා සිටි නිසා,[11] **39** ඔහු ඇය
ළඟට ගොස් ඇගේ උණ රෝගය සුව
කළේය.[12] ඇය විගස නැඟිට, ඔවුන්ට
සංග්‍රහ කරන්න පටන්ගත්තාය.[13]
**40** හිරු බැස යද්දී අවට සිටි සියලු-
දෙනාම තමන් ළඟ සිටි රෝගීන්ව ඔහු
වෙතට ගෙන ආවෝය. විවිධ රෝග
වැලඳී සිටි ඒ සෑම කෙනෙකු පිටම
තම අත් තබමින් ඔහු ඔවුන්ව සුව
කළේය.[14] **41** භූතයෝද, “ඔබ දෙ-
විගේ පුත්‍රයායි”[15] කියා මොරගසමින්
බොහෝදෙනෙකුගෙන් පිටතට පැමි-
ණියෝය.[1] නමුත් ඔහු ඔවුන්ට තදින්
කතා කර ඔවුන්ව නිහඬ කළේය.[2]
ඔහු එසේ කළේ ඔහු ක්‍රිස්තුස්[3] බව
ඔවුන් දැන සිටි නිසාය.[4]
**42** පසු දින පාන්දරින්ම ඔහු පාළු
තැනකට ගියේය.[5] නමුත් සමූහයා
මහත් උත්සාහයක් දරමින් ඔහුව
සොයා ගොස් ඔහු සිටි තැනට පැමිණ,
තමන්ව අත්හැර නොයන්න කියා පව-
සමින් ඔහුව නවත්වාගැනීමට උත්-
සාහ දැරූහ. **43** නමුත් ඔහු ඔවුන්ට
මෙසේ පැවසුවේය. “දෙවිගේ රාජ්‍යය
ගැන ශුභාරංචිය වෙනත් නුවරව-
ලත් දේශනා කළ යුතුයි. මාව එවා
තිබෙන්නේ ඒ සඳහායි.”[6] **44** එහෙ-
යින් ඔහු යුදයේ නුවරවල සංචාරය
කරමින් එහි සිනගෝගවල දේශනා
කළේය.[7]

**5** දිනක් යේසුස් ගෙනසරෙත් විල
අසල සිටියදී,[8] විශාල සමූහයක්
දෙවිගේ වචනයට සවන් දෙමින් ඔහු
වටා එක් රොක්ව සිටියෝය. **2** විල
අසල ඔරු දෙකක් නවතා තිබෙනවා
ඔහු දුටුවේය. මසුන් අල්ලන්නෝ
ඒවායින් බැස, තම දැල් සෝද-
මින් සිටියහ.[9] **3** යේසුස් ඒ ඔරුව-
ලින් එකක් වූ සීමොන්ගේ ඔරුවට
නැඟ, ඔරුව ගොඩින් තරමක් ඈතට
ගෙන යන මෙන් ඔහුගෙන් ඉල්ලුවේය.
සීමොන් එසේ කළ විට ඔහු ඔරු-
වේ ඉඳගෙන සමූහයන්ට උගන්වන්න
පටන්ගත්තේය.[10] **4** ඔහු උගන්වා
අවසන් වූ පසු, “දැන් දියඹට ගොස්
දැල් හෙළන්න”[11] කියා සීමොන්ට
කීවේය. **5** සීමොන් මෙසේ පිළිතුරු
දුන්නේය. “ගුරුතුමනි, රෑ තිස්සේම
මාළු අල්ලන්න ගිය අපට එක මාළු-
වෙක්වත් අල්ලගන්න බැරි වුණා.[12]
ඒත් ඔබ කියන නිසා මම දැල් හෙ-
ළන්නම්.” **6** ඔවුන් එසේ කළ විට
දැල් ඉරෙන තරමටම මසුන් රාශි-
යක් අල්ලාගැනීමට ඔවුන්ට හැකි විය.
**7** එමනිසා ඔවුහු උපකාර පතමින්
අනික් ඔරුවේ සිටි තම හවුල්කරු-
වන්ට සංඥා කළෝය.[13] ඔවුන් ඇවිත්

**4 පරි.**
**1** මතෙ 7:28 යොහ 7:46
**2** තීත 2:15
**3** මාක් 1:23
**4** මතෙ 2:23 ලූක් 18:37 යොහ 19:19 ක්‍රියා 2:22
**5** මතෙ 8:29 ලූක් 8:28
**6** යාකො 2:19
**7** මාක් 1:24 ලූක් 1:35 ලූක් 4:41
**8** මාක් 1:26
**9** මාක් 1:27
**10** මාක් 1:28 ලූක් 5:15
**11** මතෙ 8:14 මාක් 1:30
**12** ගීතා 103:3 ක්‍රියා 28:8
**13** මතෙ 8:15 මාක් 1:31
**14** මතෙ 8:16 මාක් 1:32 ක්‍රියා 28:9
**15** මතෙ 8:29 මාක් 3:11

**2 තීරුව**
**1** මාක් 1:34
**2** මාක් 1:25 මාක් 3:12 ක්‍රියා 16:17 ක්‍රියා 16:18
**3** ලූක් 2:11 ලූක් 4:34
**4** ක්‍රියා 19:15
**5** මාක් 1:35
**6** ලූක් 8:1 යොහ 9:4 ක්‍රියා 10:38 රෝම 15:8
**7** මතෙ 4:23 මාක් 1:39

**5 පරි.**
**8** මතෙ 4:18 මාක් 1:16
**9** මතෙ 4:21
**10** මාක් 4:1
**11** යොහ 21:6
**12** යොහ 21:3
**13** යොහ 21:8

ඔරු දෙකම මසුන්ගෙන් පුරවාගත්
විට ඔරු දෙකම මසුන්ගේ බරට
ගිලෙන්න පටන්ගත්තේය. **8** එය
දුටු සීමොන් පේතෘස්,[1] යේසුස් ඉදිරි-
යේ වැටී, “ස්වාමීනි, මම පව්කාර-
යෙක්. ඔබ ළඟ සිටින්න තරම්වත්
මම වටින කෙනෙක් නෙවෙයි”[2] කියා
පැවසුවේය. **9** මන්ද දැලට හසු වූ
මසුන් ප්‍රමාණය දුටු ඔහුටත් ඔහු
සමඟ සිටි සියලුදෙනාටත් එය අදහා-
ගත නොහැකි විය. **10** සීමොන්ගේ
උදව්වට පැමිණි සෙබදීගේ පුත්‍රයන්
වූ[3] යාකොබ් සහ යොහන්ද පුදුම
වූහ. නමුත් යේසුස් සීමොන්ට මෙසේ
පැවසුවේය. “භය වෙන්න එපා. මෙ-
තැන් පටන් ඔබ අල්ලන්නේ මිනිසුන්-
වයි.”[4] **11** එවිට ඔවුහු ඔරු ගොඩට
ඇද දමා සෑම දෙයක්ම අත්හැර ඔහු
අනුව ගියහ.[5]

**12** තවත් අවස්ථාවක ඔහු එක්-
තරා නුවරකට ගියේය. එහි මුළු ශරී-
රය පුරාම ලාදුරු රෝගය පැතිර තිබූ
මිනිසෙක් සිටියේය. ඔහු යේසුස්ව දුටු
විගස දණින් වැටී, “ස්වාමීනි, ඔබ
කැමති නම් මාව පවිත්‍ර කරන්න
ඔබට පුළුවන්”[6] කියා ඉතා බැගෑපත්ව
පැවසුවේය. **13** එහෙයින් ඔහු තම
අත දිගු කර ඔහුව ස්පර්ශ කරමින්,
“මා කැමතියි. පවිත්‍ර වෙන්න” කියා
කීවේය. ඒ මොහොතේදීම ලාදුරු
රෝගය සුව වී, ඔහු පවිත්‍ර විය.[7]
**14** සිදු වූ දේ ගැන කාටවත් නොකි-
යන්න කියා ඔහු ඒ මිනිසාට පවසා,[8]
“දැන් ඔබ පූජකයා ඉදිරියට යන්න.[9]
මෝසෙස් අණ කළ විදිහට ඔබ පවිත්‍ර
වී ඇති බව පෙන්වීමට පූජාවක් ඔප්පු
කරන්න.[10] ඔබ සුව වී ඇති බවට මෙය
පූජකයන්ට සාක්ෂියක් වෙයි”[11] කියා
කීවේය. **15** නමුත් සිදු වූ දේ අස්-
සක් මුල්ලක් නැර සෑම තැනම පැතිර
ගියේය. එහෙයින් ඔහුට සවන් දීමටත්
තම ලෙඩ සුව කරගැනීමටත් විශාල
සමූහයක් ඔහු වෙනට එක් රොක්
වූහ.[12] **16** මේ අතරතුර ඔහු නිත-
රම පාළු ස්ථානවලට ගොස් යාච්ඤා
කිරීම සඳහා කාලය වැය කළේය.[13]

**5 පරි.**
**1** යොහ 21:7
**2** මතෙ 8:8
**3** මතෙ 4:21, මාක් 1:19
**4** මතෙ 4:19, මාක් 1:17
**5** මතෙ 4:20, මතෙ 6:33, මතෙ 19:27, මාක් 1:20, ලූක් 18:28, පිලි 3:8
**6** මතෙ 8:2, මාක් 1:40
**7** මතෙ 8:3, මාක් 1:42
**8** මාක් 7:36, ලූක් 8:56
**9** ලෙවී 13:49, ලෙවී 14:2
**10** ලෙවී 14:10, ලෙවී 14:20
**11** මතෙ 8:4, මාක් 1:44
**12** මතෙ 4:25, මාක් 3:7, යොහ 6:2
**13** මාක් 1:45

**2 තීරුව**
**1** ගීතා 103:3, මාක් 2:1
**2** මතෙ 9:2, මාක් 2:3
**3** මාක් 2:4
**4** මාක් 2:5
**5** මතෙ 9:3, මාක් 2:7
**6** ගීතා 32:5, ගීතා 103:3, ගීතා 130:4, යෙසා 1:18, යෙසා 43:25, දානි 9:9
**7** මතෙ 9:4, මාක් 2:8
**8** මතෙ 9:5, මාක් 2:9
**9** මතෙ 9:6, මාක් 2:11, යොහ 5:8

**17** දවසක් ඔහු උගන්වමින් සිටියදී
ගලීලයේ සහ යුදයේ සියලු ගම්ව-
ලින්ද යෙරුසලමෙන්ද පැමිණි පරිසි-
වරු* සහ නීතිය උගන්වන පිරිසක්
ඇවිත් ඔහු අසල ඉඳගෙන සිටියහ.
යෙහෝවා දෙවිගේ බලය ඔහු තුළ
ක්‍රියාත්මක වූ නිසා ඔහු ජනයාව සුව
කරමින් සිටියේය.[1] **18** එවිට අංශ-
භාග රෝගියෙකුව ඇඳක තබා උසු-
ලාගෙන ආ එක්තරා පිරිසක් ඔහුව
ඇතුළට ගෙන යන්නත් යේසුස් ඉදි-
රියෙහි තබන්නත් මඟක් සොයමින්
සිටියහ.[2] **19** නමුත් විශාල සමූහ-
යක් රැස්ව සිටි නිසා ඔහුව ඇතු-
ළට ගෙන ඒමට ඔවුන්ට මඟක්
තිබුණේ නැත. එහෙයින් ඔවුහු යේ-
සුස් සිටි නිවසේ වහලට නැග්ගෝය.
ඉන්පසු ඔවුහු වහලේ සෙවිලි ඉවත්
කර කුඩා ඇඳේ සිටි රෝගියාව
යේසුස් ඉදිරියෙහි සිටි අය අතරට
පහත් කළෝය.[3] **20** ඔහු ඔවුන්ගේ
විශ්වාසය දැක, “දැන් ඔබේ පව්ව-
ලට සමාව ලැබිලා”[4] කියා ඒ මිනිසාට
පැවසුවේය. **21** එවිට නීතිය පිටපත්
කරන්නෝ සහ පරිසිවරු, “බලන්න,
මොහු දෙවිට අපහාස කරනවා.[5] කවුද
මේ පුද්ගලයා? දෙවිට මිස පව්වලට
සමාව දෙන්න පුළුවන් වෙන කාටද”[6]
කියා පවසමින් තම තමන් අත-
රේ කතා කරන්න පටන්ගත්තෝය.
**22** ඔවුන් සාකච්ඡා කළ දේවල් තේ-
රුම්ගත් යේසුස් ඔවුන්ට මෙසේ පිළි-
තුරු දුන්නේය. “ඔබ මොනවාද මේ
කියන්නේ?[7] **23** වඩාත් පහසු ‘ඔබේ
පව්වලට සමාව ලැබී තිබෙනවා’
කියා කීමද? නැත්නම් ‘නැඟිට ඇවි-
දින්න’ කියා කීමද?[8] **24** පොළො-
වේදී පව්වලට සමාව දෙන්න මනුෂ්‍ය
පුත්‍රයාට අධිකාරියක් තිබෙනවා. ඒ
බව ඔබත් දැනගන්නවාට මා කැම-
තියි. . . .” ඉන්පසු ඔහු අංශභාග රෝ-
ගියාට, “නැඟිට, ඔබේ කුඩා ඇඳත්
රැගෙන ගෙදර යන්න”[9] කියා කීවේය.

**ලූක් 5:17*** යේසුස්ගේ කාලයේ සිටි ප්‍රසිද්ධ ආග-
මික නායකයන් පිරිසකි.

**25** ඒ මිනිසා එකවරම තමා එතෙක්
වැතිර සිටි ඇඳෙන් නැඟිට සියලු-
දෙනා ඉදිරියෙහි සිටගත්තේය. පසුව
ඔහු දෙවිට ප්‍රශංසා කරමින් ඇඳ
රැගෙන තම නිවස බලා ගියේය.[1]
**26** ප්‍රීතියෙන් ඉපිල ගිය[2] සියලුදෙනාද
දෙවිට ප්‍රශංසා කරන්න පටන්ගත්හ.
ඔවුන් තුළ යම් බියක්ද ඇති වූ අතර,
“අද නම් අපි දැක්කේ මොන තරම්
පුදුම දේවල්ද”[3] කියා පැවසූහ.
**27** ඒ දේවල් සිදු වූ පසු යේසුස්
එතැනින් පිටත්ව යද්දී ලෙවී නම්
බදු එකතු කරන්නෙකු බදු එකතු
කරන කාර්යාලයේ ඉඳගෙන සිටි-
නවා දුටුවේය. “මගේ අනුගාමික-
යෙක් වන්න”[4] කියා යේසුස් ඔහුට
කීවේය. **28** ඔහු සියල්ල අත්හැර[5]
යේසුස් අනුව ගියේය. **29** ඉන්පසු
ඔහු යේසුස් වෙනුවෙන් තම නිව-
සේදී විශාල භෝජන සංග්‍රහයක් පිළි-
යෙල කළේය. කෑමට ආරාධනා කළ
අය අතර බදු එකතු කරන්නන්
විශාල පිරිසක් සිටියෝය.[6] **30** එය
දුටු පරිසිවරු සහ ඔවුන්ගේම නිකායට
අයත්ව සිටි නීතිය පිටපත් කරන්-
නෝ යේසුස්ගේ ගෝලයන්ට මෙසේ
චෝදනා කළෝය. “ඔබ බදු එකතු
කරන්නන් හා පව්කාරයන් සමඟ
එකම මේසයේ ඉඳගෙන කන්නෙත්
බොන්නෙත් ඇයි?”[7] **31** ඊට පිළි-
තුරු වශයෙන් යේසුස් ඔවුන්ට මෙසේ
කීවේය. “රෝගීන්ට මිස[8] නිරෝගී
අයට වෛද්‍යවරයෙකුගෙන් වැඩක්
නැහැ.[9] **32** මා ආවේ පව්කාරයන්ට
පසුතැවිලි වෙන්න උපකාර කරන්න[10]
මිස ධර්මිෂ්ඨයන්ට උපකාර කරන්න
නොවෙයි.”

**33** ඉන්පසු ඔවුහු ඔහුට මෙසේ
පැවසූහ. “යොහන්ගේ ගෝලයන් නිත-
රම පාහේ දෙවිට කන්නලව්
කරමින් නිරාහාරව සිටිනවා. පරිසි-
වරුන්ගේ ගෝලයනුත් එහෙම කර-
නවා. නමුත් ඔබේ ගෝලයන් කමින්
බොමින් සිටිනවා.”[11] **34** එවිට යේ-
සුස් ඔවුන්ට මෙසේ කීවේය. “මනාලයා
තමන් සමඟ සිටින විට මනාල-
යාගේ මිතුරන්ට නිරාහාරව සිටින්න
කියා කියන්න පුළුවන්ද?[1] **35** නමුත්
මනාලයාව[2] ඔවුන්ගෙන් වෙන් කරනු
ලබන දවස් පැමිණෙනවා.[3] එවිට
ඔවුන් නිරාහාරව සිටියි.”[4]

**36** ඔහු ඔවුන්ට උපමාවක් කීවේය.
“කිසි කෙනෙක් අලුත් රෙදි
කැබැල්ලක් තබා පරණ වස්ත්‍රයක
ඉරුණු තැනක් මහන්නේ නැහැ.
එසේ කළොත් ඇල්ලූ අලුත් රෙදි
කැබැල්ල වස්ත්‍රයෙන් ඇදී ඉරුම
තවත් වැඩි වෙයි. එහෙම වෙන්නේ
අලුත් රෙදි කැබැල්ල පරණ වස්ත්‍ර-
යට සමාන නොවන නිසයි.[5] **37** ඒ
වගේම කිසි කෙනෙක් අලුත් වයින්
පරණ සම් භාජනවලට දමන්නේ
නැහැ. එසේ කළොත් අලුත් වයින්
නිසා සම් භාජන පැළී යයි.[6] වයි-
නුත් ඉහිරී නාස්ති වෙයි.[7] **38** අලුත්
වයින් දැමිය යුත්තේ අලුත් සම් භාජ-
නවලටයි. **39** යම් කෙනෙක් පරණ
වයින්වලට පුරුදු වී සිටිනවා නම්
අලුත් වයින්වලට ඔහු කැමති වන්-
නේ නැහැ. ‘පරණ වයින් හොඳයි’[8]
කියා පවසමින් ඔහු එයින් සෑහීමට
පත් වෙයි.”

**6** එක් සබත් දවසකදී ඔහු ධාන්‍ය
කෙත් මැදින් ගමන් කර-
මින් සිටියේය. ඔහු සමඟ ගිය ඔහු-
ගේ ගෝලයෝ ධාන්‍ය කරල් කඩා[9]
ඒවා අතින් පොඩි කර කෑවෝය.[10]
**2** එය දුටු පරිසිවරු පිරිසක්, “සබත්
දවසේදී[11] කිරීමට තහනම් දෙයක්
ඔබ කරන්නේ ඇයි”[12] කියා ඇසූහ.
**3** එවිට යේසුස් ඔවුන්ට මෙසේ පිළි-
තුරු දුන්නේය. “දාවිත් කළ දේ ගැන
ඔබ කවදාවත් කියවා නැද්ද?[13] තමා-
ටත් තමා සමඟ සිටි මිනිසුන්ටත් බඩ-
ගිනි වූ විට ඔහු මොනවාද කළේ?[14]
**4** ඔහු දෙවිගේ ගෘහයට ඇතුල් වී,
පූජකයන්ට මිස වෙන කිසිවෙකුට
කෑමට අවසර නොතිබුණු[15] පිදීමේ
රොටි[16] කෑවා. ඉන්පසු ඔහු සමඟ සිටි
මිනිසුන්ටත් ඉන් කොටසක් දුන්නා.”
**5** ඔහු මෙසේද පැවසුවේය. “සබත්
දවසේ කරන දේ ගැන තීරණය

**5 පරි.**
**1** මතෙ 9:7, මාක් 2:12, ක්‍රියා 4:21, ගලා 1:24
**2** මාක් 5:42, ක්‍රියා 3:10
**3** මතෙ 9:8
**4** මතෙ 9:9, මාක් 2:14
**5** ලූක් 5:11
**6** මතෙ 9:10, මාක් 2:15, ලූක් 15:1
**7** මතෙ 9:11, මාක් 2:16, ලූක් 15:2
**8** මතෙ 9:12, මාක් 2:17
**9** යෙසා 53:4
**10** මතෙ 9:13, 1තිමෝ 1:15
**11** මතෙ 9:14, මාක් 2:18, ලූක් 7:34

**2 තීරුව**
**1** මතෙ 9:15, මාක් 2:19, යොහ 3:29
**2** මතෙ 22:2, 2කොරි 11:2, එළි 19:7
**3** ලූක් 17:22
**4** යොහ 16:20
**5** මතෙ 9:16, මාක් 2:21
**6** යෝබ් 32:19
**7** මතෙ 9:17, මාක් 2:22
**8** යෙසා 25:6

**6 පරි.**
**9** ද්වි 23:25
**10** මතෙ 12:1, මාක් 2:23
**11** මතෙ 12:2, මාක් 2:24, යොහ 5:10
**12** නික් 20:10, ද්වි 5:14
**13** 1සාමු 21:4
**14** මතෙ 12:3, මාක් 2:25
**15** ලෙවී 24:9, මතෙ 12:4, මාක් 2:26
**16** 1සාමු 21:6

කරන්න සම්පූර්ණ බලය ඇත්තේ
මනුෂ්‍ය පුත්‍රයාටයි.”[1]
**6** තවත් සබත් දවසකදී[2] ඔහු සින-
ගෝගයකට ඇතුල් වී උගන්වන්න
පටන්ගත්තේය. දකුණු අත පණ නැති
මිනිසෙක් එහි සිටියේය.[3] **7** යේසුස්
ඒ මිනිසාව සබත් දවසේදී සුව කරයිද
කියා නීතිය පිටපත් කරන්නන් සහ
පරිසිවරුන් බලාගෙන සිටියේ[4] මහත්
ඕනෑකමිනි. ඔවුන් එසේ බලාගෙන
සිටියේ ඔහුට විරුද්ධව මොනයම් හෝ
චෝදනාවක් එල්ල කිරීමේ අදහසිනි.[5]
**8** යේසුස් ඔවුන් සිතාගෙන සිටි දේවල්
තේරුම්ගෙන[6] අතක් පණ නැති මිනි-
සාට, “නැඟිට, සෙනඟ මැදට එන්න”
කියා කීවේය. එවිට ඔහු නැඟිට,
සියලුදෙනා ඉදිරියේ සිටගත්තේය.[7]
**9** ඊළඟට යේසුස් මෙසේ කීවේය. “මම
කැමතියි ඔබෙන් ප්‍රශ්නයක් අසන්න.
සබත් දවසේදී කළ යුත්තේ මොන
වගේ දේවල්ද? හොඳ ක්‍රියාවන්ද[8]
නැත්නම් නරක ක්‍රියාවන්ද? ජීවිත-
යක් බේරාගැනීමද නැත්නම් එය නැති
කර දැමීමද?”[9] **10** ඔහු සියලුදෙනා
දෙස බලා ඒ මිනිසාට, “ඔබේ අත
දිගු කරන්න” කියා කීවේය. ඔහු අත
දිගු කළ විට ඔහුගේ අත සුව විය.[10]
**11** කෝපයෙන් දැවුණු ඔවුහු එතැන්
සිට යේසුස්ට කළ යුත්තේ කුමක්ද
කියා තම තමන් අතරේ කතා කර-
ගත්තෝය.[11]
**12** දිනක් යේසුස් යාච්ඤා කිරී-
මේ අදහසින් කන්දකට ගොස්[12] මුළු
රාත්‍රිය පුරාම දෙවිට යාච්ඤා
කළේය.[13] **13** උදෑසන වූ විට ඔහු
තම ගෝලයන්ව කැඳවා ඔවුන් අත-
රෙන් දොළොස්දෙනෙකුව තෝරා-
ගත්තේය. ඔහු ඔවුන්ව හැඳින්වූයේ
තම “නියෝජිතයන්”* ලෙසයි.[14] ඒ
අය නම්, **14** ඔහු පේතෘස්[15] යන
නමින්ද හැඳින්වූ සීමොන් සහ
සීමොන්ගේ සහෝදරයා වූ අන්ද්‍රෑය.
යාකොබ් සහ යොහන්ය.[16] පිලිප්[17]
සහ බාතොලමෙව්ය. **15** මතෙව්

---

**ලූක් 6:13*** හෝ, “යවනු ලැබූවන්.”

සහ තෝමස්ය.[1] අල්ෆෙවුස්ගේ පුත්
යාකොබ් සහ මහත් උද්‍යෝගය-
කින් දේවල් කිරීමට ප්‍රසිද්ධව සිටි
සීමොන්ය.[2] **16** යාකොබ්ගේ පුත්
යූදස් සහ පසු කාලයකදී යේසුස්ට
ද්‍රෝහි වූ යූදස් ඉස්කාරියෝත්[3] යන
අයයි.
**17** යේසුස් ඔවුන් සමඟ කන්දෙන්
යම් දුරක් බැස, බෑවුම් නැති සම-
තලා තැනක් වෙතට ගියේය. එතැ-
නට ඔහුගේ ගෝලයන්ගෙන් විශාල
පිරිසක්ද ආවෝය. ඔවුන්ට අමත-
රව මුළු යුදයෙනුත් යෙරුසලමෙනුත්
මුහුදුබඩ පළාත්වල පිහිටි තීර් සහ
සීදොන් නමැති පළාත්වලිනුත් විශාල
සෙනඟක් එහි සිටියෝය.[4] ඔවුන් පැමි-
ණියේ ඔහුට සවන් දීමටත් තම ලෙඩ
සුව කරගැනීමටත්ය.[5] **18** ඔහු භූත-
යන්ගේ හිරිහැරවලට ලක් වූ අයව
පවා භූතයන්ගේ ග්‍රහණයෙන් නිදහස්
කළේය. **19** රැස්ව සිටි සියලුදෙනා
උත්සාහ කළේ යේසුස්ව ස්පර්ශ කිරී-
මටයි.[6] මන්ද ඔහුව ස්පර්ශ කළ විට
ඔවුන් සියල්ලන්ටම සුවය ලැබිණ. ඒ
සඳහා යේසුස්ගේ ශක්තිය බොහෝ
සෙයින් වැය විය.[7]
**20** ඔහු තම ගෝලයන් දෙස බලා
ඔවුන්ට මෙසේ කීවේය.[8]
“ඔබ දිළිඳු වුණත් ඔබ සන්තෝෂ-
වත්.[9] මන්ද දෙවිගේ රාජ්‍යය හිමි වන්-
නේ ඔබටයි.
**21** “ඔබ දැන් කුසගින්නෙන් සිටි-
යත් ඔබ සන්තෝෂවත්.[10] මන්ද ඔබ
තෘප්තිමත් වෙයි.[11]
“ඔබ දැන් අඬුවත් ඔබ සන්තෝෂ-
වත්. මන්ද ඔබට සිනාසෙන්න කාල-
යක් එයි.[12]
**22** “මනුෂ්‍ය පුත්‍රයා නිසා මිනිසුන්
ඔබට වෛර කරයි.[13] ඔබව කොන්
කරයි. ඔවුන් ඔබට නින්දා කර ඔබ
ගැන අගුණ කියමින් ඔබේ හොඳ
නමට අගෞරව කරයි.[14] ඔබට එවැනි
දේවල් සිදු වුණත් ඔබ සන්තෝෂවත්.
**23** ඒ දේවල් සිදු වන විට ප්‍රීති වන්න.
ප්‍රීතියෙන් ඉපිල යන්න. මන්ද ස්වර්ග-
යෙහි ඔබට මහත් ත්‍යාගයක් තිබෙයි.

**6 පරි.**
1 මතෙ 12:8 මාක් 2:28
2 ලූක් 13:14 යොහ 9:16
3 මතෙ 12:10 මාක් 3:1
4 ලූක් 14:1
5 මාක් 3:2
6 ලූක් 5:22 යොහ 2:24
7 මාක් 3:3
8 මතෙ 12:11 යොහ 7:23
9 මාක් 3:4
10 මතෙ 12:13 මාක් 3:5
11 ගීතා 2:2 මතෙ 12:14 මාක් 3:6
12 මතෙ 6:6 මාක් 3:13
13 යෙසා 26:9 මතෙ 14:23
14 මාක් 3:14 යොහ 6:70
15 මතෙ 10:2
16 මාක් 3:17 ක්‍රියා 1:13
17 යොහ 14:8

**2 තීරුව**
1 යොහ 11:16
2 මාක් 3:18
3 මාක් 3:19
4 මතෙ 4:25
5 මාක් 3:7
6 මතෙ 14:36
7 මාක් 5:30
8 මතෙ 5:2
9 යෙසා 57:15 මතෙ 5:3 යාකො 2:5
10 යෙසා 55:1 මතෙ 5:6
11 ගීතා 107:9 යෙරෙ 31:25
12 යෙසා 61:3 මතෙ 5:11 එළි 21:4
13 මතෙ 5:10 යොහ 17:14 1පේතෘ 3:14
14 යොහ 16:2

කලින් සිටි අනාගතවක්තෘවරුන්ටත්
ඔවුන්ගේ මුතුන්මිත්තන් ඒ දේවල්ම
කළා.[1]
**24** “නමුත් ධනවත් වූ ඔබට අද්ද-
කින්න සිදු වන විපත මොන තරම්ද![2]
මන්ද ඔබ දැන් භුක්ති විඳින සැප සම්-
පත්වලට වඩා නව කිසිවක් ඔබට
ලැබෙන්නේ නැහැ.[3]
**25** “දැන් තෘප්තිමත් වී සිටින
ඔබට අද්දකින්න සිදු වන විපත
මොන තරම්ද! මන්ද ඔබට කුසගින්-
නෙන් සිටින්න සිදු වෙයි.[4]
“දැන් සිනාසෙමින් සිටින ඔබට අද්-
දකින්න සිදු වන විපත මොන තරම්ද!
මන්ද ඔබට හඬා වැලපෙන්න සිදු
වෙයි.[5]
**26** “සියලුදෙනා ඔබේ ගුණ වර්-
ණනා කළත් ඔබට අද්දකින්න සිදු
වන විපත මොන තරම්ද! මන්ද
ඒ සියලුදෙනාගේ මුතුන්මිත්තනුත්
බොරු අනාගතවක්තෘවරුන්ව ඒ හා
සමානව වර්ණනා කළා.[6]
**27** “සවන් දෙමින් සිටින ඔබට
යමක් කියන්න මම කැමතියි. එනම්
ඔබේ සතුරන්ට නොකඩවා ප්‍රේම
කරන්න.[7] ඔබට වෛර කරන අයට
යහපත් දේවල් කරන්න.[8] **28** ඔබට
ශාප කරන අයට දෙවිගේ ආශීර්-
වාද පතන්න. ඔබට නින්දා කරන
අය වෙනුවෙන් යාච්ඤා කරන්න.[9]
**29** යමෙක් ඔබේ එක් කම්මුලකට
ගැසුවොත්[10] ඔහුට අනික් කම්මුලත්
හරවන්න. යමෙක් ඔබේ පිට වස්-
ත්‍රය ගෙන ගියොත්[11] ඔහුට ඔබේ
ඇතුල් වස්ත්‍රය වුණත් දෙන්න පසුබට
නොවන්න. **30** ඔබෙන් යමක් ඉල්-
ලන සියල්ලන්ට එය දෙන්න.[12] ඔබට
අයිති දේවල් ඔබෙන් ගන්නා තැනැත්-
තාගෙන් ඒවා නැවත නොඉල්ලන්න.
**31** “අනුන් ඔබට කරනවාට ඔබ
කැමති දේ එලෙසින්ම ඔවුන්ටත්
කරන්න.[13]
**32** “ඔබට ප්‍රේම කරන අයටම ඔබ
ප්‍රේම කරනවා නම් එහි ඇති විශේ-
ෂත්වය කුමක්ද? පව්කාර මිනිසුන්
වුණත් තමන්ට ප්‍රේම කරන අයට
ප්‍රේම කරනවා.[1] **33** ඔබට යහපත්
දේවල් කරන අයටම ඔබ යහපත්
දේවල් කරනවා නම් එහි ඇති විශේ-
ෂත්වය කුමක්ද? පව්කාර මිනිසුන්
වුණත් එසේම කරනවා.[2] **34** ගත්
ණයක් ආපසු ගෙවා දමනවා කියා
ඔබට විශ්වාස කෙනෙකුට ඔබ පොලී
අය නොකර ණයක් දෙනවා නම්[3]
එහි ඇති විශේෂත්වය කුමක්ද? පව්-
කාර මිනිසුන් වුණත් ගත් ණයක්
ආපසු ගෙවා දමනවා කියා විශ්වාස
නවත් පව්කාර අයට පොලී අය නො-
කර ණය දෙනවා.[4] **35** නමුත් ඔබ
ඊට වඩා වෙනස් අය විය යුතුයි. නො-
කඩවා ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න.
යහපත් දේවල් කරන්න. පොලී අය
කරන්නේ නැතුව මුදල් දෙන්න.[5]
එම මුදල නැවත ඔහුගෙන් ලබා-
ගන්න හිතන්න එපා. එවිට ඔබට
මහත් ත්‍යාගයක් ලැබෙයි. එයින්
ඔබ මහෝත්තම දෙවිගේ පුත්‍රයන්
බව ඔප්පු වෙයි.[6] දෙවි පවා කෙ-
ළෙහි ගුණ නොදක්වන අයටත් දුෂ්-
ටයන්ටත් කාරුණිකව සලකනවා.[7]
**36** ඔබේ පියාණන් මෙන් ඔබත් දිග-
ටම දයාව දක්වන්න.[8]
**37** “තවදුරටත් අනුන්ව විනිශ්චය
කරන්න එපා. එවිට ඔබවත්
කොහොමටවත් විනිශ්චය කරන්නේ
නැහැ.[9] තවදුරටත් අනුන්ව හෙළාද-
කින්නත් එපා. එවිට ඔබවත් හෙළා-
දකින්නේ නැහැ. දිගටම අන් අයට
සමාව දෙන්න. එවිට ඔබටත් සමාව
ලැබෙයි.[10] **38** දීමට පුරුදු වන්න.
එවිට අන් අයත් ඔබට දෙයි.[11] ඔවුන්
ඔබට දෙන විට දෙන දේ සො-
ලවා, තද කර, පිරී ඉතිරී යන විදිහට
විශාල ප්‍රමාණයක් ඔබේ ඔඩොක්කුව-
ලට මැන දෙයි. ඔබ මනින මිම්මෙන්ම
ඔබටත් මැන දෙනු ලැබෙයි.”[12]
**39** ඉන්පසු ඔහු ඔවුන්ට උපමා
කිහිපයක් පැහැදිලි කරමින් මෙසේ
කීවේය. “අන්ධ මිනිසෙක් ගැන
සිතන්න. ඔහුට මඟ පෙන්වන්න
තවත් අන්ධ මිනිසෙකුට පුළුවන්ද?
එහෙම කළොත් දෙදෙනාම ගොස්

**6 පරි.**
1 2ලේක 36:16; මතෙ 5:12; ලූක් 11:47; ක්‍රියා 7:52
2 යාකො 5:1
3 මතෙ 6:2; ලූක් 16:25
4 යෙසා 65:13
5 හිතෝ 14:13
6 යොහ 15:19; යාකො 4:4; 1යොහ 4:5
7 මතෙ 5:44
8 නික් 23:4; හිතෝ 25:21; රෝම 12:20
9 ක්‍රියා 7:60; රෝම 12:14
10 මතෙ 5:39
11 මතෙ 5:40; 1කොරි 6:7
12 ද්වි 15:7; හිතෝ 3:27; හිතෝ 21:26; මතෙ 5:42
13 මතෙ 7:12

**2 තීරුව**
1 මතෙ 5:46; 1තිමෝ 5:8
2 මතෙ 5:47
3 ලෙවී 25:36; ද්වි 15:8
4 මතෙ 5:42
5 නික් 22:25; ලෙවී 25:37; ද්වි 23:20; ගීතා 37:26
6 ද්වි 14:29; මතෙ 5:45; 1යොහ 3:1
7 ක්‍රියා 14:17
8 මතෙ 5:48; එෆී 5:2; යාකො 2:13
9 මතෙ 7:1; රෝම 2:1; රෝම 14:10
10 යෙසා 58:6; මතෙ 6:14; මාක් 11:25
11 හිතෝ 19:17
12 මතෙ 7:2; මාක් 4:24

වළක වැටෙනවා නේද?[1] **40** දැන්
ගෝලයෙක් ගැන සිතන්න. ඔහු
තම ගුරුතුමාට වඩා උසස් වන්-
නේ නැහැ. නමුත් යම් කෙනෙ-
කුට හොඳින් උගන්වා තිබුණොත්
ඒ ගෝලයා තමාගේ ගුරුවරයාට
සමාන වෙයි.[2] **41** ඔබේ සහෝදර-
යාගේ ඇසේ තිබෙන රොඩ්ඩ දෙස
ඔබ බලා සිටින්නේ ඇයි? ඔබට ඔබේ
ඇසේ තිබෙන පරාලය පෙනෙන්නේ
නැද්ද?[3] **42** ඔබේම ඇසෙහි පරාල-
යක් තිබියදී ඔබේ සහෝදරයාට
'ඔබේ ඇසෙන් රොඩ්ඩ ඉවතට ගන්න
මට ඉඩ දෙන්න' කියා ඔබ කියන්-
නේ කොහොමද?[4] එය මොන තරම්
කුහකකමක්ද! මුලින්ම ඔබේ ඇසෙන්
පරාලය ඉවතට ගන්න.[5] එවිට ඔබේ
සහෝදරයාගේ ඇසෙන් රොඩ්ඩ ඉව-
තට ගන්න පුළුවන් කොහොමද කියා
ඔබට පැහැදිලිව පෙනෙයි.[6]
**43** "හොඳ ගසකින් නරක පල හට-
ගන්නේ නැහැ. ඒ වගේම නරක ගස-
කින් හොඳ පල ලැබෙන්නෙත් නැහැ.[7]
**44** ගසක පලවලින් එය මොන වගේ
ගසක්ද කියා දැනගත හැකියි.[8] උදා-
හරණයකට, මිනිසුන් කටු ගස්වලින්
අත්තික්කා ගෙඩි කඩාගන්නේවත්
කටු පඳුරකින් මිදිපොකුරු කපාගන්-
නේවත් නැහැ.[9] **45** යහපත් මිනි-
සෙක් තමාගේ සිතේ ගබඩා කර
තිබෙන යහපත් දේ පිටතට ගෙන
එයි.[10] නමුත් දුෂ්ට මිනිසෙක් තමා-
ගේ සිතේ දුෂ්ට දේවල් ගබඩා කර
ඇති නිසා ඔහු පිටතට ගෙනෙන්නේ
දුෂ්ට දෙයයි. ඇත්තෙන්ම කෙනෙකු-
ගේ මුවින් පිට වන්නේ ඔහුගේ සිත
තුළ පිරී ඇති දෙයයි.[11]
**46** "මා කියා තිබෙන දේ නොකර
ඔබ මට 'ස්වාමීනි! ස්වාමීනි' කියා
පවසන්නේ ඇයි?[12] **47** මා ළඟට
ඇවිත් මා පවසන දේවල් අසා පිළිප-
දින සෑම කෙනෙක්ම සමාන වන්නේ
කාටද කියා මම ඔබට දැන් කියා
දෙන්නම්.[13] **48** ඒ පුද්ගලයා ගෙ-
යක් ගොඩනඟන මිනිසෙකුට සමාන
කරන්න පුළුවන්. ඔහු ගල මතු වන
තෙක්ම පොළොව ගැඹුරට හාරා ඒ
ගල මත තම ගෙයි අත්තිවාරම
දමයි. ගංවතුර වේගයෙන් ගලා,[1] ඒ
ගෙට ගැසුවත් ඒ ගෙය කඩා වැටෙන්-
නේ නැහැ. එයට හේතුව ඒ ගෙය
සවිමත් ලෙස ගොඩනඟා තිබීමයි.[2]
**49** අනික් අතට අසා සිටියත් මා
කියන දේ පිළි නොපදින පුද්ගලයා[3]
අත්තිවාරමක් දමන්නේ නැතුව පො-
ළොව මතුපිට ගෙයක් ගොඩනඟන
මිනිසෙකුට සමාන කරන්න පුළුවන්.
ගංවතුර වේගයෙන් ගලා ඒ ගෙට ගැසූ
විගස එය කඩා වැටෙනවා. එහි විනා-
ශය[4] කොතරම්ද කිවහොත් ඉතුරු
වන්නේ එහි සුන්බුන් පමණයි."[5]

**7** තමාට සවන් දෙන්න පැමිණි
ජනයාට ඉගැන්වූ පසු යේසුස්
කපර්ණවුමට ගියේය.[6] **2** මේ අතර
එක්තරා හමුදා නිලධාරියෙක් සිටි-
යේය. ඔහු බොහෝ සෙයින් ආදරය
කළ දාසයෙක් අසනීප වී මරණා-
සන්නව සිටියේය.[7] **3** යේසුස් ගැන
ඒ හමුදා නිලධාරියාට ආරංචි වූ
විට තම දාසයාව සුව කරන ලෙස
ඉල්ලමින් ඔහු යුදෙව් වැඩිමහල්ලන්
අත යේසුස්ට පණිවිඩයක් යැව්වේය.
**4** ඒ පණිවිඩය සමඟ යේසුස් ළඟට
පැමිණි අය ඉතා බැගෑපත්ව ඔහුගෙන්
මෙසේ අයැද සිටියෝය. "ඔබේ කරු-
ණාව ලබන්න මේ මිනිසා ඇත්ත-
ටම සුදුසුයි. **5** ඔහු අපේ ජාතියටත්
හුඟක් ආදරෙයි.[8] ඔහු අපිට සින-
ගෝගයකුත් සාදා දුන්නා." **6** පණි-
විඩය ඇසූ පසු යේසුස් ඔවුන් සමඟ
ගියේය. නමුත් ඔවුන් හමුදා නිලධා-
රියාගේ නිවසට ටිකක් දුරින් සිටි-
යදී හමුදා නිලධාරියා තම මිතුරන්
කිහිපදෙනෙකු අත තවත් පණිවි-
ඩයක් එවා තිබිණ. ඔහු එවූ පණිවිඩය
මෙයයි. "මහත්මයාණෙනි, මගේ නිව-
සටම එන්න කරදර වෙන්න එපා.
මන්ද ඔබ වගේ කෙනෙක් මගේ වහල
යටට එන්න තරම් මම වටින කෙ-
නෙක් නෙවෙයි.[9] **7** මා ඔබව හමු
වෙන්න ආවේ නැත්තෙත් ඒ හේතුව
නිසයි. ඔබ එක වචනයක් කිව්වත්

**6 පරි.**
1 මතෙ 15:14 මතෙ 23:16
2 මතෙ 10:24 යොහ 13:16 යොහ 15:20
3 මතෙ 7:3
4 මතෙ 7:4
5 හිතෝ 18:17 රෝම 2:21
6 මතෙ 7:5
7 මතෙ 7:16
8 මතෙ 12:33
9 උත් 1:11
10 මතෙ 12:35
11 මතෙ 12:34
12 මතෙ 7:21 මතෙ 25:11 ලූක් 13:24 රෝම 2:13 යාකො 1:22
13 මතෙ 7:24

**2 තීරුව**
1 ක්‍රියා 14:22 2තිමෝ 3:12
2 ගීතා 125:1 මතෙ 7:25 2තිමෝ 2:19 1පේත්‍ර 1:5
3 යාකො 1:24
4 යෝබ් 8:13 හෙබ්‍රෙ 10:29 2පේත්‍ර 2:20
5 මතෙ 7:27

**7 පරි.**
6 මතෙ 8:5
7 මතෙ 8:6 යොහ 4:47
8 ක්‍රියා 10:2
9 මතෙ 8:8

ඇති. එයින්ම මගේ දාසයා සුව
වෙයි. 8 මාත් බලධාරීන් යටතේ
සේවය කරන මිනිසෙක්. මා යටතේත්
භේවායෝ සිටිනවා. මා කෙනෙ-
කුට ‘යන්න’ කියා පැවසුවොත් ඔහු
යයි. තවත් කෙනෙකුට ‘එන්න’ කියා
පැවසුවොත් ඔහු එයි. මගේ දාස-
යාට ‘මෙය කරන්න’ කියා කිව්වොත්
ඔහු එය කරයි.”[1] 9 ඒ වචනවලට
සවන් දුන් යේසුස් පුදුමයට පත් විය.
එහෙයින් ඔහු තමන් පසුපස එමින්
සිටි පිරිස දෙසට හැරී, “ඇත්තෙන්ම
මා ඔබට කියන්නේ, ඊශ්‍රායෙල් ජාති-
යේ කිසිවෙකු තුළවත් මෙතරම් විශ්-
වාසයක් මා දුටුවේ නැති බවයි.”[2]
10 හමුදා නිලධාරියාගේ පණිවිඩ-
කරුවෝ නැවතත් ඔහුගේ නිවසට
පැමිණි විට එම දාසයා සුව වී ඇති බව
දුටුවෝය.[3]

11 ඉන්පසු ඔහු නායින් නම් නුවර-
කට ගමන් කළේය. එම ගමනට ඔහු-
ගේ ගෝලයෝ සහ විශාල සමූහයක්
ඔහු සමඟ එක් වූහ. 12 යේසුස් ඒ
නුවරෙහි දොරටුව ළඟට පැමිණි විට
මිය ගොස් සිටි මිනිසෙකුගේ දේහය[4]
උසුලාගෙන යන ආකාරය ඔහු දුටු-
වේය. මිය ගොස් සිටියේ එක් වැන්දඹු-
වකගේ පුතෙක්ය. ඇයට සිටි එකම[5]
පුතා ඔහුය. නුවරින් පැමිණි විශාල
පිරිසක්ද ඇය සමඟ ගමන් කරමින්
සිටියෝය. 13 ඇය දුටු විගස යේ-
සුස්ට ඇය ගැන මහත් අනුකම්පා-
වක් ඇති විය.[6] “අඬන්න එපා”[7]
කියා ඔහු ඇයට කීවේය. 14 ඉන්-
පසු ඔහු දේහය තබා තිබූ යහනට
අත තැබූ විට එය උසුලාගෙන ගිය
අය නතර වූහ. එවිට ඔහු, “තරු-
ණය, දැන් නැඟිටින්න”[8] කියා කීවේය.
15 මිය ගොස් සිටි මිනිසා නැඟිට
කතා කරන්න පටන්ගත්තේය. යේ-
සුස් ඔහුව සිය මවට භාර දුන්නේය.[9]
16 එතැන සිටි සියලුදෙනාම බියට
පත් වී,[10] “අප අතරට උතුම් අනාග-
තවක්තෘවරයෙක්[11] ඇවිල්ලා” කියාද,
“දෙවි තම සෙනඟට මහත් අනුකම්පා-
වක් දක්වනවා”[12] කියාද පවසමින් දෙ-
විට ප්‍රශංසා කරන්න පටන්ගත්තෝය.
17 ඔහු කළ දේ ගැන ආරංචිය මුළු
යුදය පුරාත් ඒ අවටත් පැතිර ගියේය.

18 මේ අතර යොහන්ගේ ගෝ-
ලයෝ යොහන්ව හමු වී සිදු වූ
සියල්ල ඔහුට දැන්වූහ.[1] 19 එහෙ-
යින් යොහන් තම ගෝලයන්ගෙන්
දෙදෙනෙකුව කැඳවා, “එන්න සිටින
තැනැත්තා ඔබද? නැත්නම් අප වෙන
කෙනෙකු එන තුරු බලා සිටිය
යුතුද”[2] කියා යේසුස්ගෙන් ඇසීමට
ඔවුන්ව යැව්වේය. 20 ඔවුහු යේ-
සුස් වෙතට ගොස් මෙසේ පැවසූහ.
“ ‘එන්න සිටින තැනැත්තා ඔබද?
නැතහොත් අප වෙන කෙනෙකු එන
තුරු බලා සිටිය යුතුද’ කියා ඔබෙන්
අසාගෙන එන්න කියා යොහන් බව්-
තීස්ත අපට කිව්වා.” 21 ඒ පැයේදී
යේසුස් බොහෝදෙනෙකුගේ අසනීප[3]
සහ බරපතළ රෝග සුව කළේය.
ඔවුන්ට වැහී සිටි භූතයන්වත් දුරු
කළේය. අන්ධ මිනිසුන් බොහෝදෙ-
නෙකුට කරුණාව දක්වමින් ඔවුන්-
ටද ඔහු පෙනීම ලබා දුන්නේය.
22 ඉන්පසු ඔහු ඒ දෙදෙනාට මෙසේ
පිළිතුරු දුන්නේය. “යොහන් ළඟට
ගොස්[4] ඔබ ඇසූ දුටු දේ ඔහුට
කියන්න. අන්ධයන්[5] පෙනීම ලබන
බවත් කොර වී සිටි අය ඇවිදින
බවත් ලාදුරු රෝගීන්ව පවිත්‍ර කර
ඇති බවත් බිහිරි වී සිටි අයට දැන්
ඇසෙන බවත් මිය ගිය අයව නැවත
ජීවත් කරන බවත් දිළිඳුන්ට[6] ශුභාරං-
චිය[7] ගැන කියා දෙන බවත් කියන්න.
23 යමෙකුට මා ගැන සැකයක් නැත්-
නම්* ඒ තැනැත්තා සන්තෝෂවත්.”[8]

24 යොහන් එවූ අය එතැ-
නින් පිටත්ව ගිය පසු යේසුස්, යො-
හන් ගැන රැස්ව සිටි සමූහයාට
මෙසේ කීවේය. “ඔබ පාළුකරයට
ගියේ කුමක් බලන්නද? සුළඟින්
එහා මෙහා වැනෙන බට ගසක්
බලන්නද?[9] 25 ඔබ ගියේ කුමක්

**7 පරි.**
1 මතෙ 8:9
2 මතෙ 8:10; රෝම 3:2; රෝම 9:4
3 මතෙ 8:13
4 1රාජා 17:17; ලූක් 8:42
5 ලූක් 9:38
6 හෙබ්‍රෙ 4:15
7 ලූක් 8:52; යොහ 11:33
8 1රාජා 17:21; ලූක් 8:54; යොහ 11:43; ක්‍රියා 9:40
9 1රාජා 17:23; 2රාජා 4:36
10 ලූක් 1:65
11 ද්වි 18:15; ලූක් 24:19; යොහ 4:19; යොහ 6:14; යොහ 7:40; ක්‍රියා 7:37
12 නික් 4:31; ගීතා 106:4; ලූක් 1:68

**2 තීරුව**
1 මතෙ 11:2; යොහ 3:26
2 ගීතා 40:7; ගීතා 118:26; එස 21:27; සෙක 9:9; මලා 3:1; මතෙ 3:11
3 යෙසා 53:4
4 මතෙ 11:4
5 යෙසා 29:18; යෙසා 35:5; යෙසා 42:7
6 යෙසා 61:1; ශෙප 3:12; ලූක් 4:18; යාකො 2:5
7 මතෙ 11:5
8 යෙසා 8:14; මතෙ 11:6; ලූක් 2:34; යොහ 6:66
9 මතෙ 11:7

---

**ලූක් 7:23*** මූ.අ., “පය පැකිළී වැටෙන්නේ නැත්-
නම්.”

දකින්නද? වටිනා වස්ත්‍ර ඇඳ සිටින
මිනිසෙකුව දකින්නද?[1] අනර්ඝ වස්ත්‍ර
ඇඳ, සැප පහසු ජීවිතයක් ගත
කරන අය සිටින්නේ රජමාලිගා-
වලයි.[2] **26** ඇත්තටම ඔබ ගියේ
ඇයි? අනාගතවක්තෘවරයෙකුව දැක
බලා ගන්නද?[3] මා ඔබට කියන්නේ,
ඔහු අනාගතවක්තෘවරයෙකුටත් වඩා
උතුම් කෙනෙක් බවයි.[4] **27** මෙසේ
ලියා තිබෙන්නෙත් ඔහු ගැනයි. ‘මම
මාගේ පණිවිඩකරුව ඔබ ඉදිරියෙන්
යවමි.[5] ඔහු ඔබට කලින් ගොස් ඔබේ
මඟ සූදානම් කරයි!’[6] **28** මේ දේ
නම් කිව යුතුමයි. ස්ත්‍රීන්ගෙන් උපන්
අය අතරෙන් යොහන්ට වඩා උතුම්
කෙනෙක් නැහැ.[7] ඒ වුණත් දෙවි-
ගේ රාජ්‍යයට අයත් සුළු තැනැත්-
තෙක් වුණත් ඔහුට වඩා උතුම්.”[8]
**29** (යොහන් විසින් බව්තීස්ම කර
තිබූ[9] අයබදු එකතු කරන්නන් ඇතු-
ළුව රැස්ව සිටි සියලුදෙනා යේ-
සුස් පැවසූ දේ අසා දෙවි ධර්මිෂ්ඨ
කෙනෙක් බව ප්‍රකාශ කළෝය.[10]
**30** නමුත් යොහන් විසින් බව්තීස්ම
නොකරනු ලැබූ පරිසිවරු සහ නීතිය
ගැන මනා දැනුමක් ඇතුව සිටි අය
යොහන් මාර්ගයෙන් දෙවි ඔවුන්ට දුන්
අවවාද නොසලකාහැරියෝය.)[11]
**31** “මේ පරම්පරාවට අයත් මිනි-
සුන්ව මම සමාන කරන්නේ කාටද?
ඔවුන් කවුරුන් වගේද?[12] **32** ඔවුන්
වෙළඳපොළක ඉඳගෙන සෙල්ලම්
කරන කුඩා දරුවන්ට සමානයි. ‘අපි
ඔබට නළාව පිම්බත් ඔබ නැටු-
වේ නැහැ. අපි විලාප නැඟුවත් ඔබ
ඇඬුවේ නැහැ’[13] කියා ඔවුන් එකිනෙ-
කාට කියනවා. **33** ඒ විතරක් නෙ-
වෙයි යොහන් බව්තීස්ත රොටි කමින්
වයින් බොමින් අන් අය මෙන් තම
ජීවිතය ගත කළේ නැති නිසා ‘ඔහුට
භූතයෙක් ආවේශ වෙලා’[14] කියා ඔබ
කියනවා. **34** නමුත් මනුෂ්‍ය පුත්‍රයා
කමින් බොමින් සාමාන්‍ය විදිහට තම
ජීවිතය ගත කරන නිසා ‘මෙන්න,
කෑදර, වයින් බීමට ලොල් වූ මිනි-
සෙක් ඇවිත්. ඔහු බදු එකතු කරන්-

**7 පරි.**
1 මාක් 1:6
2 එස්ත 1:11; මතෙ 11:8
3 ලූක් 1:76
4 මතෙ 11:9
5 මලා 3:1
6 යෙසා 40:3; මතෙ 11:10; ලූක් 1:16; යොහ 1:23
7 ලූක් 1:15
8 මතෙ 11:11
9 මතෙ 3:6; ලූක් 3:12
10 මතෙ 3:15; මතෙ 21:32
11 ද්වි 32:28; ක්‍රියා 13:46; ක්‍රියා 20:27; රෝම 10:3
12 මතෙ 11:16
13 මතෙ 11:17
14 ගණන් 6:3; විනි 13:4; මතෙ 3:4; මාක් 1:6; ලූක් 1:15

**2 තීරුව**
1 මතෙ 11:19; ලූක් 5:30
2 1කොරි 1:24
3 යොහ 10:38
4 මතෙ 26:6; ලූක් 11:37
5 මතෙ 26:7; මාක් 14:3; යොහ 12:3
6 යොහ 4:19
7 ලූක් 15:2
8 මතෙ 18:28
9 ගීතා 32:1; ගීතා 103:3; යෙසා 1:18; මතෙ 18:27; ලූක් 7:47

නන්ගේද පව්කාරයන්ගේද මිත්‍රයෙක්’[1]
කියා ඔබ කියනවා. **35** කොහොම-
වුණත් ප්‍රඥාවන්තයෙක්[2] ධර්මිෂ්ඨයි
කියා ඔප්පු වන්නේ ඔහු කරන ක්‍රියාව-
ලිනුයි.”*[3]
**36** දිනක් එක් පරිසිවරයෙක් යේ-
සුස්ව කෑමකට ආරාධනා කළේය.
යේසුස් ඔහුගේ නිවසට ගොස්[4] කෑමට
ඉඳගත්තේය. **37** පව්කාර තැනැත්-
තියක ලෙස එම නුවරෙහි ප්‍රසිද්ධව
සිටි ස්ත්‍රියක් යේසුස් එම නිවසෙහි
කෑමකට ඇවිත් සිටින බව දැන-
ගෙන එතැනට ආවාය. ඇය පැමිණි-
යේ සුවඳ තෙල් අඩංගු ඇලබැස්ටර්[5]
බඳුනක් රැගෙනය. **38** ඔහුගේ පාද
ළඟ ඉඳ අඬන්න පටන්ගත් ඇය, ඇගේ
කඳුළුවලින් ඔහුගේ පාද තෙමා, තම
හිසකෙස්වලින් ඒ කඳුළු පිස දැමු-
වාය. ඉන්පසු ඇය ඔහුගේ පාද සිපග-
නිමින් ඒ මත සුවඳ තෙල් ආලේප
කළාය. **39** ඔහුට ආරාධනා කළ
පරිසිවරයා එය දැක තමාටම මෙසේ
කියාගත්තේය. “මොහු අනාගතවක්-
තෘවරයෙක් නම්[6] තමන්ට අත තබන්-
නේ කවුද කියාත් ඇය මොන වගේ
ස්ත්‍රියක්ද කියාත් දැන සිටිය යුතුයි.
ඇය පව්කාර ස්ත්‍රියක්.”[7] **40** නමුත්
යේසුස් ඔහුට මෙසේ පැවසුවේය.
“සීමොන්, මම කැමතියි ඔබට යමක්
කියන්න.” “ගුරුතුමනි, කියන්න” කියා
ඔහු පිළිතුරු දුන්නේය.
**41** “එක්තරා ණයහිමියෙකුට මිනි-
සුන් දෙදෙනෙක් ණය වෙලා සිටියා.
එක් කෙනෙකුට ගෙවන්න තිබුණු
ණය ඩිනාරි* පන්සියයයි.[8] අනික්
තැනැත්තාගේ ණය ඩිනාරි පන-
හක් පමණයි. **42** ඔවුන් දෙදෙනා-
ටම එම ණය ආපසු ගෙවන්න බැරි
වුණු නිසා ණයහිමියා කැමැත්තෙන්ම
ඔවුන් දෙදෙනාවම ණයෙන් නිදහස්
කළා.*[9] දැන් මේ ගැන හිතන්න.
ඔවුන් දෙදෙනාගෙන් ණයහිමියාට
වැඩියෙන් ආදරය කරන්නේ කවුද?”

---

**ලූක් 7:35*** මූ.අ., “ඔහුගේ දරුවන්ගෙනුයි.”
**41*** ග්‍රෑම් 3.85ක් බර රෝමානු රිදී කාසියක්.
**42*** හෝ, “සමාව දුන්නා.”

43 සීමොන් පිළිතුරු වශයෙන් මෙසේ
කීවේය. “වැඩියෙන් ණය වෙලා සිටි
තැනැත්තා විය යුතුයි.” යේසුස්,
“ඔබේ නිගමනය හරියි” කියා කීවේය.
44 ඉන්පසු ඔහු ඒ ස්ත්‍රිය දෙස බලා
සීමොන්ට මෙසේ කීවේය. “ඔබට මේ
ස්ත්‍රියව පෙනෙනවාද? මම ඔබේ නිව-
සට ආවත් ඔබ මගේ පාද සේදී-
මට වතුර ගෙනාවේ නැහැ.[1] නමුත්
මේ ස්ත්‍රිය ඇගේ කඳුළුවලින් මගේ
පාද තෙමා, ඇගේ හිසකෙස්වලින්
ඒ කඳුළු පිස දැමුවා. 45 ඔබ මාව
සිඹ පිළිගත්තේවත් නැහැ.[2] නමුත්
මේ ස්ත්‍රිය මා ඇතුළට පැමිණි පැයේ
පටන් මගේ පාද සිපගෙන මාව පිළි-
ගත්තා. 46 ඔබ මගේ හිසට තෙල්
ආලේප කළේ නැහැ.[3] නමුත් මේ
ස්ත්‍රිය ඇවිත් මගේ පාද සුවඳ තෙලින්
ආලේප කළා. 47 ඒ නිසා මම ඔබට
කියන මේ දේ හොඳින් මතක තබා-
ගන්න. මේ ස්ත්‍රිය බොහෝ පව් කර
තිබුණත් ඇයට සමාව ලැබෙනවා.[4]
ඒ නිසා ඇය මට වැඩියෙන් ප්‍රේමය
පෙන්වනවා. නමුත් ස්වල්ප වශයෙන්
පව් කර සමාව ලබන තැනැත්තා
අන් අයට වැඩියෙන් ප්‍රේමය පෙන්වන්-
නේ නැහැ.” 48 එහෙයින් යේසුස්
ඇයට මෙසේ කීවේය. “ඔබේ පව්ව-
ලට දැන් සමාව ලැබිලා.”[5] 49 එවිට
ඔහු සමඟ කෑමට ඉඳගෙන සිටි අය
ඔහු පැවසූ දේ අසා මෙසේ සිතූහ.
“පව්වලට සමාව දෙන්න තරම් හැකි-
යාවක් තිබෙන මේ මිනිසා කවුද?”[6]
50 යේසුස් නැවතත් එම ස්ත්‍රියට
මෙසේ කීවේය. “ඔබට දැන් සමාදාන-
යෙන් යන්න පුළුවන්.[7] ඔබේ විශ්වා-
සය නිසා ඔබට ගැලවීම ලැබුණා.”[8]

8 කෙටි කලකට පසු දෙවිගේ
රාජ්‍යය පිළිබඳ ශුභාරංචිය දේ-
ශනා කිරීමට[9] නුවරින් නුවරටත්
ගමින් ගමටත් ගිය යේසුස් එය සෑම
තැනම පතළ කළේය. ඔහුගේ මෙම
ගමනට ගෝලයෝ දොළොස්දෙනාද
2 ස්ත්‍රීන් බොහෝදෙනෙක්ද[10] සහ-
භාගි වූහ. ඔවුන් අතර භූතයන්-
ගෙන් නිදහස ලැබූ අයද අසනීපවලින්
සුවය ලැබූ අයද සිටි අතර භූතයන්
හත්දෙනෙකුගෙන් නිදහස ලැබූ මග්-
දලේනා යන නමින් ප්‍රසිද්ධ වූ මරි-
යාද,[1] 3 හෙරොද්ගේ වැඩ භාරව සිටි
කූසාගේ බිරිඳ වූ යොවානාද[2] සුසැනාද
තවත් කිහිපදෙනෙක්ද සිටියෝය. එම
ස්ත්‍රීහු තමන් සතු දේවලින් යේසුස්ට
සහ ඔහුගේ ගෝලයන්ට උපස්ථාන
කරමින් සිටියෝය.

4 සෑම නුවරක් පාසාම ඔහු සමඟ
ගිය පිරිසට විශාල සමූහයක් එකතු වූ
විට ඔහු උපමාවක් යොදාගෙන මෙසේ
පැවසුවේය.[3] 5 “වපුරන්නෙක් කෙ-
නක බීජ වපුරමින් සිටියා. ඔහු වපුර-
මින් සිටින අතරේදී ඉන් සමහර බීජ
මඟ දිගේ වැටී එහි යන එන අය-
ගේ පයට ඒවා පෑගුණා. කුරුල්ලනුත්
ඇවිත් ඒවා කා දැමුවා.[4] 6 තවත්
සමහර බීජ වැටුණේ ගල් තලා-
වක් මතයි. ඒවා පැළ වුණත් එහි
තෙතමනය නොතිබුණු නිසා වියළී
ගියා.[5] 7 තවත් සමහර බීජ වැටුණේ
කටු ගස් අතරේයි. ඒවා සමඟ කටු
ගස් හටගත් නිසා ඒවා කටු ගස්වලට
යට වී ගියා.[6] 8 තවත් සමහර බීජ
සරු පස මත වැටුණා. ඒවා වැඩුණු
පසු ඒවායින් සිය ගුණයක පලදාවක්
ලැබුණා.”[7] ඔහු ඒ දේවල් පවසා, “මා
පවසන දේට සවන් දී එය තේරුම්ගැ-
නීමට උත්සාහ කරන්න”[8] කියා හඬ
නඟා කීවේය.

9 ඔහුගේ ගෝලයෝ එම උප-
මාවෙහි අර්ථය ගැන ඔහුගෙන්
විමසුවෝය.[9] 10 එවිට ඔහු මෙසේ
කීවේය. “දෙවිගේ රාජ්‍යයේ පරිශුද්ධ
රහස් තේරුම්ගැනීමේ හැකියාව ඔබට
දී තිබෙනවා. නමුත් වෙනත් අයට
ඒවා උපමා විතරයි.[10] ඔවුන් බලා-
ගෙන සිටියත් ඔවුන්ට වැටහෙන්-
නේ නැහැ. ඔවුන් අසාගෙන සිටියත්
එහි නියම අර්ථය ඔවුන්ට අවබෝධ
වන්නේ නැහැ.[11] 11 උපමාවේ[12]
තේරුම මෙයයි. “බීජය කියන්නේ දෙ-
විගේ පණිවිඩයටයි.[13] 12 මඟ දිගේ
වැටුණු බීජවලට සිදු වන දෙයින් විස්-
තර කරන්නේ පණිවිඩයට සවන් දුන්-

7 පරි.
1 උත් 18:4
1තිමෝ 5:10
2 1කොරි 16:20
1පේත 5:14
3 ගීතා 23:5
ගීතා 45:7
4 ගීතා 51:1
යෙසා 43:25
යෙසා 44:22
ලූක් 7:42
1තිමෝ 1:14
5 මතෙ 9:2
මාක් 2:5
6 යෙසා 53:3
මතෙ 9:3
මාක් 2:7
ලූක් 5:21
7 1සාමු 1:17
යොහ 14:27
8 මතෙ 9:22
ලූක් 8:48
එෆී 2:8

8 පරි.
9 මතෙ 9:35
ලූක් 4:43
10 මතෙ 27:55
මාක් 15:40

2 තීරුව
1 මාක් 16:9
ලූක් 11:26
2 ලූක් 24:10
3 මතෙ 13:3
මාක් 4:1
4 මතෙ 13:4
මාක් 4:4
ලූක් 8:12
5 මතෙ 13:5
මාක් 4:5
ලූක් 8:13
6 මතෙ 13:7
මාක් 4:7
ලූක් 8:14
7 මතෙ 13:8
මාක් 4:8
ලූක් 8:15
8 මතෙ 11:15
මතෙ 13:9
මාක් 4:9
9 මතෙ 13:10
මාක් 4:10
10 ගීතා 78:2
මතෙ 13:35
මාක් 4:34
11 යෙසා 6:9
මතෙ 13:11
මාක් 4:11
12 මතෙ 13:18
මාක් 4:14
13 ක්‍රියා 20:32
1පේත 1:23

නත්[1] එය විශ්වාස නොකර ගැලවීම
නොලබන අයට සිදු වන දෙයයි.[2]
ඔවුන්ට ඒ දේ සිදු වන්නේ යක්-
ෂයා ඇවිත්[3] ඔවුන්ගේ සිත්වලින් ඒ
පණිවිඩය පැහැරගෙන යන නිසයි.
**13** ගල් තලාව මත වැටුණු බීජවලට
සිදු වන දෙයින් විස්තර කරන්නේ
පණිවිඩය අසා එය ප්‍රීතියෙන් පිළිගත්-
තත් ප්‍රශ්න ගැටලුවලට මුහුණ දෙන
විට එය අත්හැර යන අයට සිදු වන
දෙයයි.[4] ඒ දේ ඔවුන්ට සිදු වන්නේ
පණිවිඩය ඔවුන්ගේ සිත්වල මුල් ඇද
පිහිටා නැති නිසයි. **14** කටු ගස්
අතරේ වැටුණු බීජවලට සිදු වන දෙ-
යින් විස්තර කරන්නේ පණිවිඩය අසා,
මේ ජීවිතයේ මුහුණ දීමට සිදු වන
කරදර නිසාත් ධනයට හා විනෝද
වීමට තිබෙන ආශාව නිසාත් ගසා-
ගෙන යන අයට සිදු වන දෙයයි.[5]
ඔවුන් ඒ දේවලින් සම්පූර්ණයෙන්ම
යට වී යනවා. ඒ නිසා ඔවුන් කොහො-
මටවත් සාර්ථක ප්‍රතිඵල ලබන්නේ
නැහැ.[6] **15** සරු පසෙහි වැටුණු බීජ-
වලට සිදු වන දෙයින් විස්තර කරන්-
නේ, අවංක මෙන්ම යහපත් සිතකින්
පණිවිඩය අසා,[7] එය සිතෙහි තබා-
ගෙන විඳදරාගනිමින් පල දරන අයට
සිදු වන දෙයයි.[8]

**16** “කෙනෙක් පහනක් දැල්වූ පසු
එය බඳුනකින් වහන්නේවත් ඇඳක්
යට තබන්නේවත් නැහැ. ඒ වෙ-
නුවට ගෙට ඇතුල් වන අයට එහි
ආලෝකයෙන් ප්‍රයෝජන ලැබීමට
ඔහු එය පහන් රුකක් මත තබයි.[9]
**17** යම් දෙයක් සඟවා තැබුවත්[10]
එය කවදා හරි අනාවරණය වෙයි.
යමක් ඉතා පරෙස්සමින් රහසක්
ලෙස තබාගත්තත් එයත් කවදා
හරි හෙළි කරනු ලබයි.[11] **18** එහෙ-
යින් ඔබ හොඳින් සවන් දෙනවාද
කියා සිතා බලන්න. යම් අවබෝධ-
යක් ඇති තැනැත්තාගේ අවබෝධය
තවත් වැඩි වෙයි.[12] නමුත් අවබෝ-
ධයක් නැති තැනැත්තාට තමාට
තිබෙනවා කියා සිතින් මවාගත් අව-
බෝධය පවා අහිමි වෙයි.”[13]

**19** මේ අතර යේසුස්ගේ මවද
සහෝදරයන්ද[1] ඔහු වෙතට පැමි-
ණියත් විශාල සමූහයක් සිටි
නිසා ඔහුට ළං වෙන්නවත් ඔවුන්ට
නොහැකි විය.[2] **20** එහෙයින්, “ඔබේ
මවද ඔබේ සහෝදරයන්ද ඔබව මුණ-
ගැහෙන්න ඇවිත්”[3] කියා ඔහුට දැනුම්
දෙන ලදි. **21** ඔහු ඊට පිළිතුරු වශ-
යෙන් මෙසේ පැවසුවේය. “මගේ මව
සහ මගේ සහෝදරයන් හැටියට මම
සලකන්නේ දෙවිගේ පණිවිඩය අසා
එය පිළිපදින අයවයි.”[4]

**22** දිනක් යේසුස් තම ගෝලයන්
සමඟ රුවල් ඔරුවකට නැඟ, “අපි
විලෙන් එගොඩට යමු” කියා ඔවුන්ට
පැවසුවේය. එහෙයින් ඔවුහු ඔරුව
දියත් කළහ.[5] **23** ඔවුන් යමින් සිටි-
යදී යේසුස්ට නින්ද ගියේය. ඒ
අවස්ථාවේදී විල මතට චණ්ඩ මාරු-
තයක් හැමුවේය. ඔරුව වතුරෙන්
පිරෙන්න පටන්ගත් නිසා ඔවුන් සිටි-
යේ ඉතාමත් අවදානම් තත්වය-
කයි.[6] **24** ඔවුහු යේසුස් ළඟට ගොස්
ඔහුව අවදි කර, “ගුරුතුමනි, ගුරු-
තුමනි, අපිව ගිලෙන්නයි යන්නේ”[7]
කියා කීවෝය. ඔහු අවදි වී ඔරුවට
ගසාගෙන ආ රළ පහරට සහ සුළඟට
තදින් කතා කළේය.[8] එවිට නිශ්ච-
ලතාවක් ඇති විය. **25** පසුව ඔහු,
“ඔබේ විශ්වාසයට මොකද වුණේ”
කියා ඔවුන්ගෙන් ඇසුවේය. බියපත් වූ
ඔවුහු මවිත වී, “ඇත්තටම මේ කවුද?
ඔහු සුළඟට හා ජලයට පවා අණ දෙ-
නවා. ඒ විතරක් නෙවෙයි, ඒවාත්
ඔහුට කීකරු වෙනවා”[9] කියා එකිනෙ-
කාට කියාගත්තෝය.

**26** පසුව ඔවුහු එගොඩ තිබුණු ගෙ-
රසීනයන්ගේ පළාතෙහි ගොඩ බැස්-
සෝය. එම පළාත තිබුණේ ගලීල
මුහුදේ අනික් පැත්තෙහිය.[10] **27** ඔහු
ගොඩ බසිනවාත් සමඟම භූතයන්
වැහී සිටි මිනිසෙක් නුවරේ සිට
ඔහු ළඟට පැමිණියේය. ඔහු කාල-
යක් තිස්සේ ඇඳුමක්වත් ඇඳ සිටි-
යේ නැත. ඔහු ජීවත් වුණේ නිවසක
නොව සොහොන් ගෙවල් අවටය.[11]

**8 පරි.**
1 යාකො 1:23
2 මතෙ 13:19, මාක් 4:15, 1කොරි 1:21, 2කොරි 4:3
3 2කොරි 2:11
4 මතෙ 13:20, මාක් 4:16
5 මතෙ 19:23, 1තිමෝ 6:9, 2තිමෝ 3:4, 2තිමෝ 4:10
6 මතෙ 13:22, මාක් 4:18
7 ක්‍රියා 16:14
8 මතෙ 13:23, මාක් 4:20, හෙබ්‍රෙ 10:36, එළි 3:10
9 මතෙ 5:15, මාක් 4:21, ලූක් 11:33, පිලි 2:15
10 දේශ 12:14
11 මතෙ 10:26, මාක් 4:22, ලූක් 12:2, 1කොරි 4:5
12 මතෙ 25:23
13 මතෙ 13:12, මතෙ 25:29, මාක් 4:25, ලූක් 19:26

**2 තීරුව**
1 මතෙ 13:55, යොහ 7:5, ක්‍රියා 1:14
2 මතෙ 12:46, මාක් 3:31
3 මතෙ 12:47, මාක් 3:32
4 මතෙ 12:50, මාක් 3:35, යොහ 15:14
5 මතෙ 8:23, මාක් 4:36
6 මතෙ 8:24, මාක් 4:37
7 මතෙ 8:25, මාක් 4:38
8 ගීතා 65:7, මතෙ 8:26, මාක් 4:39
9 මතෙ 8:27, මාක් 4:41
10 මතෙ 8:28, මාක් 5:1
11 මාක් 5:2

**28** ඔහු යේසුස්ව දුටු විගස මහත්
හඬකින් කෑගසා යේසුස් ඉදිරියෙහි
දණින් වැටී මෙසේ කීවේය. "මහෝත්-
තම දෙවිගේ පුත් යේසුස්, ඔබ හා මා
අතර කිසිම ගනු දෙනුවක් නැහැ.[1]
මා ඔබෙන් බැගෑපත්ව ඉල්ලා සිටින්-
නේ මට වධ දෙන්න එපා කියායි."[2]
**29** (ඔහු එවැනි දෙයක් පැවසුවේ
භූතයාට පිටතට එන්න කියා යේ-
සුස් අණ කළ නිසාය. බොහෝ
කලක් පුරා එම භූතයා ඒ මිනි-
සාට ආවේශ වී සිටියේය.[3] ඒ මිනිසාව
මෙල්ල කිරීමට කිහිප අවස්ථාවක-
දීම ඔහුව දම්වැල්වලින් හා විලංගුව-
ලින් බැඳ තබා මුර යොදා තිබුණත්
ඔහු ඒ සියල්ල කඩා බිඳ දැමුවේය.
භූතයාගේ බලපෑම නිසා ඔහු ගැව-
සුණේ පාළු තැන්වලය.) **30** යේසුස්
ඔහුගෙන් මෙසේ ඇසුවේය. "ඔබේ නම
කුමක්ද?" ඒ මිනිසාට භූතයන් බො-
හෝදෙනෙකු ආවේශ වී සිටි නිසා
ඔහු, "සේනාංකය" කියා පිළිතුරු දුන්-
නේය.[4] **31** භූතයන් යේසුස්ගෙන්
අයැද සිටියේ[5] ඔවුන්ව අගාධයට[6] දමා
බැඳ නොතබන ලෙසටයි. **32** මේ
අතර කන්දක් මත විශාල ඌරු
රැළක්[7] කෑම කමින් සිටියහ. එහෙ-
යින් උන්ට වැහෙන්න අවසර දෙන්න
කියා භූතයන් යේසුස්ගෙන් බැගෑපත්ව
ඉල්ලා සිටි විට[8] ඔහු ඔවුන්ට එසේ
කිරීමට අවසර දුන්නේය. **33** භූත-
යෝ ඒ මිනිසාගෙන් පිට වී ඌරන්ට
වැහුණෝය. එවිට ඒ ඌරු රැළ වේග-
යෙන් දුව ගොස් ප්‍රපාතයකින් විලට
වැටී දියේ ගිලී මිය ගියෝය.[9] **34** එම
රැළ රැකබලා ගෙන සිටි අය සිදු වූ
දේ දැක එතැනින් දුව ගොස් නුව-
රෙහි වැසියන්ට හා පිටිසර පළාත්වල
සිටි අයටත් සිදු වූ දේ ගැන දැනුම්
දුන්නෝය.[10]

**35** සිදු වූ දේ දැකගැනීමට සෙනඟ
රැස් වූහ. ඔවුන් යේසුස් ළඟට පැමිණි
විට භූතයන්ගෙන් නිදහස් වූ මිනිසා
ඇඳුම් ඇඳගෙන හොඳ සිහිකල්පනා-
වෙන් යේසුස්ගේ පාමුල ඉඳගෙන සිටි-
නවා දුටුවෝය. එය දුටු විට ඔවුන්
තුළ බියක් ඇති විය.[1] **36** භූතයන්
ආවේශ වී සිටි එම මිනිසාට සිදු වූ දේ
දුටු අය ඔහු සුවය ලැබූ ආකාරය ගැන
ඔවුන්ට විස්තර කළෝය.[2] **37** එවිට
ගෙරසීනයන්ගේ පළාතේ සිටි සියලු-
දෙනාම අතිශයින් බියපත් වී[3] තම
පළාතෙන් අහක්ව යන්න කියා යේ-
සුස්ගෙන් ඉල්ලා සිටියෝය. එහෙ-
යින් යේසුස් ඔරුවට නැග්ගේය. ඔහු
එතැනින් පිටත්ව යෑමට සූදානම් වන
විට, **38** භූතයන්ගෙන් නිදහස් වූ ඒ
මිනිසා තමන්ටත් ඔහු සමඟ යෑමට
ඉඩ දෙන්න කියා ඔහුගෙන් අයැද සිටි-
යේය. නමුත් එයට ඉඩ නොදුන් යේ-
සුස් ඔහුට මෙසේ කීවේය.[4] **39** "දැන්
ඔබ ගෙදර යන්න. දෙවි ඔබ වෙනු-
වෙන් කළ දේ අමතක නොකර සිය-
ලුදෙනාටම කියන්න."[5] එහෙයින් ඔහු
එතැනින් පිටත් වී යේසුස් ඔහු වෙනු-
වෙන් කළ දේ මුළු නුවර පුරාම ප්‍රකාශ
කළේය.[6]

**40** යේසුස් නැවත පැමිණි විට
ඔහු එන තෙක් බලාපොරොත්තුවෙන්
සිටි සමූහයා[7] ඔහුව සාදරයෙන් පිළි-
ගත්හ. **41** එවිට යායිරස් නම් මිනි-
සෙක් යේසුස් ළඟට පැමිණියේය. ඔහු
සිනගෝගයේ නිලධාරියෙක් විය. ඔහු
යේසුස්ගේ පාමුල වැටී, තම නිවසට
පැමිණෙන මෙන් ඔහුගෙන් අයැද සිටි-
යේය.[8] **42** එයට හේතු වූයේ අවු-
රුදු දොළහක් පමණ වයසැති ඔහුගේ
එකම දුව මරණාසන්නව සිටීමයි.[9]

ඔහු එම ස්ථානයට යන විට ඔහු
වටා සිටි සමූහයා ඔහුගේ ඇඟේ
හැපෙමින් තෙරපෙමින් සිටියහ.[10]
**43** මේ අතර කිසිවෙකුටවත් සුව
කළ නොහැකි වූ[11] අවුරුදු දො-
ළහක් පුරා ලේ ගැලීම නිසා රෝ-
ගීව සිටි ස්ත්‍රියක්,[12] **44** පිටුපසින්
ඇවිත් ඔහුට ළං වී, ඔහුගේ වස්ත්‍රයේ[13]
වාටිය[14] ඇල්ලුවාය. ඇය එසේ කළ
වහාම ඇගේ ලේ ගැලීම නතර විය.[15]
**45** එවිට යේසුස්, "මාව ඇල්ලුවේ
කවුද"[16] කියා ඇසුවේය. තමන් එසේ
නොකළ බව අවට සිටි සියල්ලන්ම
පැවසූ විට පේතෘස් මෙසේ කීවේය.

8 පරි.
1 මාක් 1:24
2 මතෙ 8:29 මාක් 5:7 ලූක් 4:34
3 මාක් 9:21 ලූක් 13:16 යොහ 5:6
4 මාක් 5:9
5 මාක් 5:10
6 එළි 20:3
7 ලෙවී 11:7 ද්වි 14:8
8 මතෙ 8:31 මාක් 5:12
9 මතෙ 8:32 මාක් 5:13
10 මතෙ 8:33 මාක් 5:14

2 තීරුව
1 මතෙ 8:34 මාක් 5:15
2 මාක් 5:16
3 මාක් 5:17
4 මාක් 5:18 ලූක් 18:43
5 මාක් 5:19
6 මාක් 5:20
7 මාක් 5:21
8 මතෙ 9:18 මාක් 5:22
9 මතෙ 9:18 මාක් 5:23
10 මාක් 5:24
11 මතෙ 9:20 මාක් 5:25
12 ලෙවී 15:25
13 මතෙ 9:21 මාක් 5:27
14 ගණන් 15:38
15 ලෙවී 6:27
16 මාක් 5:30

“ගුරුතුමනි, බලන්න කොයි තරම්
සෙනඟක් ඔබ වටේ තෙරපි තෙරපී
ඉන්නවාද කියා!”[1] **46** නමුත් යේ-
සුස්, “කවුරු හරි කෙනෙක් මාව ඇල්-
ලුවා. මම එහෙම කියන්නේ මගේ
ශක්තිය[2] වැය වන බව මට දැනුණු
නිසයි”[3] කියා පැවසුවේය. **47** තමන්
කළ දේ තවදුරටත් සැඟවිය නොහැකි
බව තේරුම්ගත් ඒ ස්ත්‍රිය, භයෙන් වෙ-
වුලමින් ඔහු ළඟට ඇවිත් දණින් වැටී,
ඔහුව ඇල්ලීමට හේතුවත් තමන් ක්ෂ-
ණිකව සුවය ලැබූ ආකාරයත් සිය-
ලුදෙනා ඉදිරියෙහි හෙළි කළාය.[4]
**48** එවිට යේසුස් ඇයට මෙසේ පැවසු-
වේය. “දුවේ, ඔබ සුව වුණේ ඔබ තුළ
තිබෙන විශ්වාසය නිසයි.[5] සමාදාන-
යෙන් යන්න.”[6]

**49** යේසුස් කතා කරමින් සිටිය-
දීම, සිනගෝගයේ ප්‍රධාන නිලධා-
රියාගේ නිවසෙන් මිනිසෙක් ඇවිත්,
“ගුරුතුමාට තවත් කරදර කරන්න
එපා. ඔබේ දුව මිය ගියා” කියා ඔහුට
කීවේය.[7] **50** යේසුස්ට එය ඇසී,
“භය වෙන්න එපා. ස්ථිර විශ්වාසයක්
ඇතුව සිටින්න.[8] ඇයව බේරාගන්න
පුළුවන්” කියා ඔහුට පැවසුවේය.
**51** ඔහු නිවසට පැමිණි විට පේතෘස්,
යොහන්, යාකොබ් සහ දැරියගේ
පියාත් මවත් හැර වෙන කිසිවෙකුට
තමන් සමඟ ඇතුළට එන්න ඔහු ඉඩ
දුන්නේ නැත.[9] **52** ඒ අවස්ථාවේදී
සියලුදෙනාම ඇගේ වියෝව ගැන
හඬමින්ද ශෝකයෙන් පපුවට ගසා-
ගනිමින්ද සිටියෝය. එහෙයින් යේ-
සුස්, “අඬන්න එපා.[10] දැරිය මිය ගිහින්
නැහැ. ඇය නිදාගෙනයි සිටින්නේ”[11]
කියා ඔවුන්ට කීවේය. **53** ඇය මිය
ගොස් ඇති බව දැන සිටි ඔවුහු උපහා-
සාත්මක ලෙස ඔහුට සිනාසුණෝය.[12]
**54** නමුත් ඔහු ඇගේ අත අල්ලා,
“දුවේ, නැඟිටින්න”[13] කියා හඬ නඟා
කීවේය. **55** එවිට මිය ගොස් සිටි
ඇයට පණ ඇවිත්*[14] ඇය එකවරම
නැඟිට්ටාය.[1] ඉන්පසු යේසුස් කෑමට
යමක් ඇයට දෙන්න කියා පැවසු-
වේය.[2] **56** ඇගේ දෙමාපියෝ ප්‍රීති-
යෙන් ඉපිල ගියෝය. සිදු වූ දේ කිසි
කෙනෙකුට නොකියන්න කියා යේ-
සුස් ඔවුන්ට අවවාද කළේය.[3]

**9** යේසුස් ගෝලයන් දොළොස්දෙ-
නාව කැඳවා, සියලු භූතයන් දුරු
කිරීමටත් ලෙඩ රෝග සුව කිරීම-
ටත් බලය ඔවුන්ට ලබා දුන්නේය.[4]
**2** ඔහු දෙවිගේ රාජ්‍යය ගැන දේ-
ශනා කිරීමට හා රෝගීන්ව සුව කිරී-
මට ඔවුන්ව පිටත් කර යැවූ විට,
**3** ඔවුන්ට මෙසේ කීවේය. “ගමනට
කිසිම දෙයක් ගෙනි යන්න එපා. සැර-
යටියක්වත් කෑම මල්ලක්වත් රො-
ටිවත් රිදී කාසිවත් අමතර ඇතුල්
වස්ත්‍රයක්වත්* රැගෙන යන්න එපා.[5]
**4** යම් ප්‍රදේශයකට ගොස් නිවසකට
ඇතුල් වූ පසු එහි සිටින කෙනෙක්
ඔබව පිළිගත්තොත් එම නිවසේ
නවාතැන් ගන්න. එම ප්‍රදේශයේ
සේවය කර අවසන් වන තුරුම
එහි නැවතී සිටින්න.[6] **5** යම් කිසි
තැනක ජනයා ඔබව පිළිගන්නේ
නැත්නම් ඔබ එම නුවරින් පිට වී
යන විට[7] ඔබේ පාදවලින් දූවිලි ගසා
දමන්න.* එසේ කළ යුත්තේ ඔවුන්
ඔබව ප්‍රතික්ෂේප කළ බවට සාක්ෂි-
යක් ලෙසයි.”[8] **6** එවිට ඔවුහු තම
ගමන ආරම්භ කරමින් ඒ ප්‍රදේශය
පුරාම ගමින් ගමට ගොස් ශුභාරංචිය
ප්‍රකාශ කළෝය. එසේ යන අතරේ
ඔවුහු රෝගීන්වද සුව කළෝය.[9]

**7** සිදු වෙමින් තිබුණු ඒ සෑම දෙ-
යක් ගැනම දේශාධිපති හෙරොද්ට
ආරංචි වූ අතර ඔහු සිටියේ මහත්
කැලඹීමකිනි. මන්ද සමහරු යො-
හන් මරණයෙන් නැඟිට ඇති
බවත්,[10] **8** තවත් අය එලියා පැමිණ
ඇති බවත් තවත් සමහරු පුරා-
ණයේ සිටි අනාගතවක්තෘවරයෙකු
මරණයෙන් නැවත නැඟිට ඇති

**8 පරි.**
**1** මාක් 5:31
**2** ලූක් 5:17
**3** මාක් 5:32
**4** මාක් 5:33
**5** ලූක් 7:50
**6** 1සාමු 1:17, මතෙ 9:22, මාක් 5:34
**7** මාක් 5:35
**8** මාක් 5:36, යොහ 11:25, රෝම 4:17
**9** මාක් 5:37
**10** ලූක් 7:13
**11** මාක් 5:39, යොහ 11:11, ක්‍රියා 7:60, ක්‍රියා 13:36, 1කොරි 7:39
**12** මතෙ 9:24, මාක් 5:40
**13** මාක් 5:41, ලූක් 7:14, යොහ 11:43
**14** උත් 2:7, උත් 6:17, යෝබ් 33:4, දේශ 3:19, යෙසා 42:5, එළි 11:11

**2 තීරුව**
**1** මාක් 5:42
**2** මාක් 5:43
**3** මාක් 7:36, ලූක් 5:14

**9 පරි.**
**4** මතෙ 10:1, මාක් 3:14, මාක් 6:7
**5** මතෙ 10:10, මාක් 6:8, ලූක් 10:4
**6** මතෙ 10:11, මාක් 6:10, ලූක් 10:5, ලූක් 10:7
**7** ලූක් 10:10
**8** නෙහෙ 5:13, මතෙ 10:14, මාක් 6:11, ක්‍රියා 13:51
**9** මතෙ 11:1, මාක් 6:12
**10** මතෙ 14:2, මාක් 6:14, මාක් 8:28, ලූක් 9:19

**ලූක් 8:55*** හෝ, “ඇගේ ජීව බලය ඇයට නැවත ලැබී.”

**ලූක් 9:3*** මූ.අ., “වස්ත්‍ර දෙකක්.” **5*** මතෙ 10:14හි පාදසටහන බලන්න.

බවත් පවසමින් සිටියෝය. **9** එහෙ-
යින් හෙරොද් මෙසේ පැවසුවේය.
“යොහන්ගේ හිස ගසා දැමුවේ මමයි.[1]
ඒත් මේ පුද්ගලයා කවුද? මට ඔහු
ගැන බොහෝ දේවල් ආරංචි වෙනවා.”
එහෙයින් යේසුස්ව දැක බලා ගැනීමට
ආශාවක් ඔහු තුළ ඇති විය.[2]
**10** යේසුස්ගේ නියෝජිතයන්*
දොළොස්දෙනා ආපසු පැමිණි විට
තමන් කළ සියල්ල යේසුස්ට විස්තර
කළෝය.[3] එවිට ඔහු ඔවුන්ව කැඳවා-
ගෙන ඔවුන් සමඟ තනිව කාලය ගත
කිරීමට[4] බෙත්සයිදාව නම් නුවරට
ගියේය. **11** නමුත් එය දැනගත්
සමූහයා ඔහු පසුපස ගියෝය. ඔහු
ඔවුන්ව කාරුණිකව පිළිගෙන දෙවිගේ
රාජ්‍යය ගැන ඔවුන්ට කතා කරමින්[5]
ඔවුන් අතර විවිධ අසනීපවලින් පෙළී
සිටි අයව සුව කළේය.[6] **12** අඳුර
වැටීගෙන එද්දී දොළොස්දෙනා ඔහු
ළඟට ඇවිත්, “අපි ඉන්නේ පාළු තැන-
කයි. සෙනඟට දැන් යන්න දුන්නොත්
හොඳයි. එතකොට අවට ගම් පළාත්-
වලට ගොස් කෑම සහ නවාතැන් හො-
යාගන්න ඔවුන්ට පුළුවන් වෙයි” කියා
ඔහුට කීවෝය.[7] **13** නමුත් ඔහු,
“ඔවුන්ට මොනව හරි කන්න දෙන්න
ඔබට බැරිද”[8] කියා ඔවුන්ගෙන් ඇසු-
වේය. ඔවුහුද, “අප ළඟ තිබෙන්නේ
රොටි පහකුත් මසුන් දෙදෙනෙකුත්
පමණයි.[9] මේ විශාල සමූහයට කෑම
දෙන්න නම් අපිට ගිහිල්ලා කෑම
මිල දී ගන්න වෙයි”[10] කියා පිළි-
තුරු දුන්නෝය. **14** ඔවුන් සමඟ
සිටි සමූහයා අතර පුරුෂයන් පන්දහ-
සක් පමණ සිටියෝය.[11] එවිට යේසුස්
තම ගෝලයන්ට මෙසේ පැවසුවේය.
“සියලුදෙනාව පනස්දෙනා බැගින්
කණ්ඩායම්වලට බෙදා ඔවුන්ට
කෑමට ඉඳගන්න කියා කියන්න.”[12]
**15** ඔවුන් පැවසූ දේට කීකරු
වෙමින් සියලුදෙනාම ඉඳගත්තෝය.
**16** එවිට ඔහු රොටි පහත් මසුන් දෙ-
දෙනාත් ගෙන ස්වර්ගය දෙස බලා
යාච්ඤා කර, රොටි කැබලිවලට
කඩා, සමූහයා අතරේ බෙදා දීමට
ගෝලයන්ට දුන්නේය.[1] **17** සියලු-
දෙනාම කෑම කා තෘප්තිමත් වූහ.
ඉතුරු වූ කෑමවලින් කූඩ දොළහක්
පුරවාගැනීමටද ඔවුන්ට හැකි විය.[2]
**18** පසු අවස්ථාවක ඔහු තනිව
යාච්ඤා කරමින් සිටියදී, ඔහුගේ ගෝ-
ලයෝ ඔහු ළඟට පැමිණියෝය. එවිට
ඔහු, “සමූහයා මම කවුරුන් කියලද
කියන්නේ” කියා ඔවුන්ගෙන් ප්‍රශ්න
කළේය.[3] **19** ඔවුහු මෙසේ පිළිතුරු
දුන්හ. “සමහරුන් නම් ඔබට කියන්-
නේ යොහන් බව්තීස්ත කියලයි.
තවත් අය ඔබට එලියා කියාත්
තවත් සමහරුන් පුරාණයේ සිටි අනා-
ගතවක්තෘවරයෙක් නැවත ඇවිත්
කියාත් කියනවා.”[4] **20** එවිට ඔහු,
“ඔබ හිතන්නේ මම කවුරු කියාද”
කියා ඔවුන්ගෙන් ඇසුවේය. පේතෘස්
පිළිතුරු දෙමින්,[5] “දෙවි විසින් එවා
ඇති ක්‍රිස්තුස් ඔබයි”[6] කියා කීවේය.
**21** ඒ ගැන කිසිවෙකුට නොකියන්න
කියා[7] ඔවුන්ට තදින් අවවාද කළ
ඔහු, **22** ඔවුන්ට මෙසේ පැවසුවේය.
“මනුෂ්‍ය පුත්‍රයාට බොහෝ දුක් වේ-
දනාවලට මුහුණ දෙන්න සිදු
වෙයි. වැඩිමහල්ලන්, නායක පූජක-
යන් සහ නීතිය පිටපත් කරන්නන්
ඔහුව ප්‍රතික්ෂේප කරයි. ඉන්පසුව
ඔහුව මරා දමයි.[8] නමුත් තුන්වෙනි
දින ඔහුව නැවත නැඟිටුවයි.”[9]
**23** නැවතත් ඔහු සියලුදෙනාට
මෙසේ පැවසුවේය. “යමෙකු මා අනුව
එන්න කැමති නම් ඔහු තම ජීවිතය
දෙවිට කැප කර[10] තමන්ගේ වධක-
ණුව* රැගෙන දිගටම එනම්, දින-
පතා මා අනුව එන්න අවශ්‍යයි.[11]
**24** යමෙකු තම ජීවිතය ගලවාගන්න
කැමැත්තෙන් සිටියොත් ඔහුට එය
නැති වෙයි. නමුත් මා නිසා තම
ජීවිතය නැති කරගන්නාට එය ගල-
වාගන්න හැකි වෙයි.[12] **25** ඇත්-
තෙන්ම මිනිසෙකු මුළු ලෝකයම

**9 පරි.**
**1** මතෙ 14:3
මාක් 6:16
**2** ලූක් 23:8
**3** මාක් 6:30
**4** මතෙ 14:13
**5** ක්‍රියා 28:31
**6** මතෙ 14:14
මාක් 6:34
යොහ 6:2
**7** ගීතා 78:19
මතෙ 14:15
මාක් 6:35
යොහ 6:5
**8** 2රාජා 4:42
**9** ගණන් 11:22
ගීතා 78:19
**10** මතෙ 14:17
මාක් 6:38
යොහ 6:9
**11** මතෙ 14:21
මාක් 6:44
යොහ 6:10
**12** මතෙ 14:19
මාක් 6:39
1කොරි 14:40

**2 තීරුව**
**1** මාක් 6:41
යොහ 6:11
**2** 2රාජා 4:44
ගීතා 145:15
මතෙ 14:20
මාක් 6:43
යොහ 6:13
**3** මතෙ 16:13
මාක් 8:27
**4** මතෙ 16:14
මාක් 8:28
ලූක් 9:7
**5** මතෙ 16:15
මාක් 8:29
**6** මතෙ 16:16
ලූක් 4:41
යොහ 1:41
යොහ 6:69
**7** මතෙ 16:20
මාක් 8:30
**8** ගීතා 22:15
යෙසා 53:5
යෙසා 53:8
ආනි 11:22
**9** මතෙ 16:21
මාක් 8:31
ලූක් 17:25
**10** පිලි 3:8
**11** මතෙ 10:38
මතෙ 16:24
මාක් 8:34
ලූක් 14:27
**12** මතෙ 16:25
මාක් 8:35
යොහ 12:25
ක්‍රියා 20:24
එළි 2:10

ලූක් **9:10*** හෝ, “යවනු ලැබුවන්.”

ලූක් **9:23*** උපග්‍ර. 6 බලන්න.

ලබාගත්තත් ඔහුගේ ජීවිතය නැති
වුණොත් එයින් ඇති ප්‍රයෝජනය
කුමක්ද? එසේ නැත්නම් ඔහුට අන්
සියල්ල අහිමි වුණොත් එයින් ඇති
ප්‍රයෝජනය කුමක්ද?[1] **26** යමෙක්
මගේ ගෝලයෙක් වෙන්නත් මා
පවසන දේවල් පිළිගන්නත් ලැජ්ජා
වුණොත් මනුෂ්‍ය පුත්‍රයා තම පියා-
ණන්ගේ තේජසින් වැජඹෙමින්, ශුද්ධ
දේවදූතයන් සමඟ එන අවස්ථාවේදී ඒ
තැනැත්තාව පිළිගන්න මනුෂ්‍ය පුත්‍ර-
යාත් කැමති වන්නේ නැහැ.[2]
**27** ඇත්තෙන්ම මා ඔබට කියන්නේ,
දෙවිගේ රාජ්‍යය ගැන යමක් දකින්න
පෙර මෙතැන සිටගෙන සිටින්නන්-
ගෙන් සමහරදෙනෙක් කිසිවිටකත්
මරණය අද්දකින්නේ නැති බවයි.”[3]

**28** ඇත්තෙන්ම ඒ දේ පවසා දවස්
අටකට පමණ පසු පේතෘස්, යො-
හන් සහ යාකොබ් සමඟ යේසුස්
යාච්ඤා කිරීමට කන්දකට ගියේය.[4]
**29** ඔහු යාච්ඤා කරමින් සිටියදී ඔහු-
ගේ මුහුණේ පෙනුම[5] සම්පූර්ණයෙන්ම
වෙනස් විය. ඔහුගේ වස්ත්‍ර දිදුලන
සුදකින් බැබළුණේය.[6] **30** එවිට ඔහු
සමඟ මිනිසුන් දෙදෙනෙක් කතා කර-
මින් සිටියෝය. ඒ දෙදෙනා නම් මෝ-
සෙස් සහ එලියාය.[7] **31** ඔවුන්ගෙන්
මහත් තේජසක් විහිදුණු අතර අනා-
වැකිවල සඳහන් ආකාරයට යෙරුස-
ලමේදී ඔහු මෙලොවින් සමුගන්නා
ආකාරය ගැන ඔවුහු කතා කළෝය.[8]
**32** මේ අතර පේතෘස් සහ ඔහු සමඟ
සිටි දෙදෙනා නිදාගෙන සිටියෝය.
නමුත් ඔවුහු අවදි වූ විට යේසුස්ගේ
තේජස[9] සහ ඔහු සමඟ සිටි මිනි-
සුන් දෙදෙනාව දුටුවෝය. **33** එම
මිනිසුන් දෙදෙනා යේසුස්ගෙන් වෙන්
වී යද්දී පේතෘස් තමා පවසන්නේ
කුමක්ද කියා තේරුම් නොගෙන යේ-
සුස්ට මෙසේ කීවේය. “ගුරුතුමනි,
මේ අවස්ථාවේදී මෙතැන සිටින්න
ලැබීම අපට ලොකු සතුටක්. අපි
මෙහි කූඩාරම් තුනක්, එකක් ඔබ-
ටත් එකක් මෝසෙස්ටත් එකක් එලි-
යාටත් සාදන්නම්.”[10] **34** පේතෘස්
කතා කරමින් සිටියදී වලාකුළක්
ඇවිත් ඔවුන්ව වසාගත්තේය. ඒ දේ
සිදු වූ විට ඔවුන් තුළ මහත් බියක්
ඇති විය.[1] **35** එවිට, “මේ මගේ
පුත්‍රයාය. මා තෝරාගෙන තිබෙන්නේ
මොහුවයි.[2] මොහුට සවන් දෙන්න”[3]
කියා පැවසූ හඬක්[4] ඒ වලාකුළ අත-
රින් නික්ම ආවේය. **36** ඒ හඬ ඇසු-
ණායින් පසු ඔවුන් සමඟ සිටියේ
යේසුස් පමණි.[5] තමන් දුටු දේවල්
ගැන කිසි දෙයක් ඒ දවස්වලදී ඔවුහු
කා සමඟවත් කතා කළේ නැත.[6]

**37** ඊළඟ දින ඔවුන් කන්දෙන් බැස
ආ විට යේසුස්ව හමු වීමට විශාල පිරි-
සක් රැස්ව සිටියෝය.[7] **38** එවිට ඒ
පිරිස අතරින් මිනිසෙක් මහත් හඬ-
කින් මෙසේ කීවේය. “ගුරුතුමනි, මේ
ඉන්නේ මගේ එකම[8] පුතායි. අනේ
මගේ පුතාට අනුකම්පා කරන්න.[9]
**39** භූතයෙක්[10] ඔහුට ආවේශ වෙ-
නවා. එහෙම වෙද්දී ඔහු එකපාරටම
කෑගහලා පෙණ දමමින් බිම පෙරළෙ-
නවා. භූතයා මගේ දරුවාගෙන් ලෙ-
හෙසියෙන් පිට වෙන්නෙත් නැහැ. පිට
වුණායින් පස්සේ දරුවාට හොඳටම
තුවාලයි. **40** භූතයාව දුරු කරන්න
කියා ඔබේ ගෝලයන්ගෙන් ඉල්ලා
සිටියත් ඔවුන්ට ඒ දේ කරන්න බැරුව
ගියා.”[11] **41** එවිට යේසුස් මෙසේ
කීවේය. “ඔබ සියලුදෙනා තුළ කිසිම
විශ්වාසයක් නැහැ. ඔබ නොමඟ ගිය
පරම්පරාවක්.[12] මා ඔබ සමඟ තව
කොපමණ කල් සිටින්නද? ඔබ ගැන
තව කොපමණ කල් ඉවසන්නද?
ඔබේ පුතාව මෙහෙට ගෙනෙන්න.”[13]
**42** දරුවාව ගෙන එන විට භූතයා
ඔහුව බිම ඇමුවේය. එවිට දරුවා
තදින් ගැහෙන්න පටන්ගත්තේය.
නමුත් යේසුස් භූතයාට තදින් කතා
කර දරුවාව භූතයාගෙන් නිදහස්
කළේය. ඉන්පසු ඔහු දරුවාව ඔහුගේ
පියාට භාර දුන්නේය.[14] **43** ඒ අවස්-
ථාවේදී දෙවිගේ මහත් බලය[15] දුටු
සියලුදෙනා පුදුම වූහ.

යේසුස් කළ දේ දුටු සියලු-
දෙනා පුදුමයෙන් බලාගෙන සිටියදී

**9 පරි.**
1 ගීතා 49:6 මතෙ 16:26 මාක් 8:36 ක්‍රියා 1:18 එළි 18:7
2 මතෙ 10:33 මාක් 8:38 2තිමෝ 2:12
3 මතෙ 16:28 මාක් 9:1
4 මතෙ 17:1 මාක් 9:2
5 නික් 34:29
6 මතෙ 17:2 මාක් 9:3
7 2රාජා 2:11 මතෙ 17:3 මාක් 9:4
8 ලූක් 9:22 ලූක් 13:33
9 යොහ 1:14 2පේතෘ 1:16
10 මතෙ 17:4 මාක් 9:5

**2 තීරුව**
1 මතෙ 17:5 මාක් 9:7
2 ගීතා 2:7 යෙසා 42:1 2පේතෘ 1:17
3 ද්වි 18:15 මතෙ 3:17 ක්‍රියා 3:22
4 ලූක් 3:22 යොහ 12:28
5 මතෙ 17:8 මාක් 9:8
6 මතෙ 17:9 මාක් 9:9
7 මතෙ 17:14 මාක් 9:14
8 ලූක් 7:12
9 මතෙ 17:15 මාක් 9:17
10 මාක් 1:26
11 මතෙ 17:16 මාක් 9:18
12 ද්වි 32:5 ගීතා 78:8
13 මතෙ 17:17 මාක් 9:19
14 මාක් 9:20 ලූක් 7:15
15 ගීතා 147:5

ඔහු තම ගෝලයන්ට මෙසේ පැවසු-
වේය. **44** “මා දැන් කියන මේ දේවල්
හොඳින් සිතේ තබාගන්න. මන්ද
මනුෂ්‍ය පුත්‍රයාව මිනිසුන් අතට පාවා
දෙන්න නියමිතයි.”[1] **45** ඔහු පැවසූ
ඒ දේ තේරුම්ගැනීමට ඔවුන්ට නො-
හැකි විය. එයට හේතුව නම් ඒ වච-
නවල තේරුම අවබෝධ කරගැනීමේ
හැකියාව ඔවුන්ට ඒ අවස්ථාවේදී නො-
තිබීමයි. එමෙන්ම ඔහුගෙන් ඒ පිළි-
බඳව ප්‍රශ්න අසන්නත් ඔවුහු බිය වූහ.[2]
**46** තවත් අවස්ථාවක තමන් අත-
රේ උතුම්ම තැනැත්තා වන්නේ කවුද
කියා ඔවුන් අතරේ වාදයක් ඇති විය.[3]
**47** ඔවුන්ගේ සිතේ තිබෙන දේවල්
දැනගෙන සිටි යේසුස් කුඩා දරුවෙ-
කුව තමන් ළඟට කැඳවා,[4] **48** “මා
නිසා* යමෙකු මෙම කුඩා දරුවා
මෙන් සිටින කෙනෙකුව පිළිගත්-
තොත් ඔහු මාවත් පිළිගන්නවා කියා
පැවසිය හැකියි. මාව පිළිගන්නා පුද්-
ගලයා මාව පමණක් නොව මාව එවූ
තැනැත්තාවත් පිළිගන්නවා.[5] ඇත්-
තෙන්ම උතුම් වන්නේ[6] ඔබ සිය-
ලුදෙනා අතරේ නිහතමානීව සේවය
කරන තැනැත්තායි”[7] කියා ඔවුන්ට
කීවේය.
**49** එවිට යොහන්, “ගුරුතුමනි,
භූතයන් දුරු කරන මිනිසෙක් අපිට
හමු වුණා.[8] ඔහු එය කරන්නේ ඔබේ
නාමයෙන්. ඔහු අපට එකතු වුණේ
නැති නිසා[9] අපි ඔහු කරන දේ
නතර කරන්න උත්සාහ කළා”[10] කියා
කීවේය. **50** එවිට යේසුස් ඔහුට
මෙසේ කීවේය. “ඔහුව නතර කරන්න
එපා. මන්ද කෙනෙක් ඔබට විරුද්ධව
වැඩ කරන්නේ නැත්නම් ඇත්තටම
ඔහු සිටින්නේ ඔබට පක්ෂවයි.”[11]
**51** යේසුස් ස්වර්ගයට යෑමට දවස්
ළඟා වූ විට[12] ඔහු යෙරුසලම බලා
යෑමට කිසිම බියක් සැකක් නොමැ-
තිව පියවර ගත්තේය. **52** එහෙයින්
ඔහු තමන්ට කලින් පණිවිඩකරු-
වන් කිහිපදෙනෙකු යැව්වේය. ඔවුහු
ගොස් යේසුස්ට අවශ්‍ය දේවල් සූදා-
නම් කිරීමේ අදහසින් සමරිතානුවන්-
ගේ ගමකට ඇතුල් වූහ.[1] **53** නමුත්
යේසුස් පැමිණි විට ඔහුව පිළිගැනී-
මට ඔවුන් තුළ කැමැත්තක් තිබුණේ
නැත. එයට හේතුව වූයේ ඔහු යෙරුස-
ලම බලා යෑමට පියවර ගත් නිසාය.[2]
**54** එය දුටු යාකොබ් සහ යොහන් යන
ගෝලයෝ,[3] “ස්වාමීනි, අපි ස්වර්ග-
යෙන් ගින්නක් එවන මෙන් ඉල්ලා[4]
ඔවුන්ව විනාශ කර දමනවාට කැම-
තිද” කියා ඇසූහ. **55** නමුත් ඔහු
ඔවුන් දෙස බලා ඔවුන් පැවසූ දේ
ගැන ඔවුන්ට තදින් අවවාද කළේය.
**56** එතැනින් ඔවුහු වෙනත් ගමකට
ගියෝය.
**57** ඔවුන් මඟ දිගේ යද්දී, එක් මිනි-
සෙක් යේසුස්ට මෙසේ පැවසුවේය.
“මම කැමතියි ඔබ සමඟ ඕනෑම
තැනකට යන්න.”[5] **58** යේසුස් ඔහුට
මෙසේ කීවේය. “හිවලුන්ට ගුහා තිබු-
ණත් අහසේ කුරුල්ලන්ට ලගින්න
තැන් තිබුණත් මනුෂ්‍ය පුත්‍රයාට තම
හිස තබන්නවත් තැනක් නැහැ.”[6]
**59** පසුව ඔහු, “මගේ අනුගාමික-
යෙක් වන්න” කියා වෙන කෙනෙකුට
කීවේය. ඔහු මෙසේ පිළිතුරු දුන්-
නේය. “මගේ පියාව තැන්පත් කරන
තුරු මට කල් දෙන්න.”[7] **60** එවිට
යේසුස්, “මිය ගිය අයව තැන්පත්
කරන්න මිය ගිය අයටම ඉඩහ-
රින්න.[8] ඔබ ගොස් දෙවිගේ රාජ්‍යය
ගැන සෑම තැනම ප්‍රකාශ කරන්න”[9]
කියා ඔහුට කීවේය. **61** තවත් කෙ-
නෙක්, “ස්වාමීනි, මම කැමතියි ඔබව
අනුගමනය කරන්න. නමුත් මුලින්ම
මගේ නිවසේ සාමාජිකයන්ගෙන් සමු-
ගන්න මට අවසර දෙනවාද”[10] කියා
ඇසුවේය. **62** යේසුස් ඔහුට මෙසේ
කීවේය. “නඟුලකට අත තැබූ පසු[11]
ආපසු හැරී බලන කෙනෙක්[12] දෙවිගේ
රාජ්‍යයට සුදුසු කෙනෙක් නොවෙයි.”

**10** යේසුස් තවත් හැත්තෑදෙ-
නෙකුව තෝරාගෙන[13] තමා
යන්න සිටි සෑම නුවරකටම සහ ස්ථා-
නයකටම ඔවුන්ව දෙදෙනා බැගින්[14]

---

**ලූක් 9:48*** හෝ, “මාගේ නාමයෙන්.”

**9 පරි.**
1 මතෙ 17:22 මාක් 9:31 ලූක් 18:32
2 මාක් 9:32 ලූක් 2:50
3 මතෙ 18:1 මාක් 9:33 ලූක් 22:24
4 මතෙ 18:2 මාක් 9:36
5 මාක් 9:37 යොහ 12:44
6 හිතෝ 18:12 මතෙ 18:4 මතෙ 23:12
7 මතෙ 23:11 රෝම 12:10
8 ලූක් 10:17
9 මාක් 9:38
10 ගණන් 11:28
11 මතෙ 12:30 ලූක් 11:23 1කොරි 12:3 පිලි 1:18
12 මාක් 10:34 ක්‍රියා 1:2 1තිමෝ 3:16

**2 තීරුව**
1 ලූක් 10:33 ලූක් 17:16
2 යොහ 4:9
3 මාක් 3:17
4 1රාජා 18:38 2රාජා 1:10
5 මතෙ 8:19
6 මතෙ 8:20
7 මතෙ 8:21
8 එෆී 2:1 1තිමෝ 5:6
9 මතෙ 8:22
10 1රාජා 19:20 ලූක් 14:33
11 1කොරි 9:10 1කොරි 9:24
12 උත් 19:17 මතෙ 10:37 පිලි 3:13

**10 පරි.**
13 නික් 24:1 ගණන් 11:16
14 මාක් 6:7

තමන්ට කලින් යැව්වේය. 2 ඔහු
ඔවුන්ට මෙසේ පැවසුවේය. "අස්-
වැන්න[1] නම් විශාලයි. නමුත් වැඩ-
කරුවන්[2] සිටින්නේ ස්වල්පදෙනෙකු
පමණයි. එමනිසා අස්වැන්න නෙ-
ළීමට වැඩකරුවන්ව එවන්න කියා[3]
අස්වැන්නේ ස්වාමියාට කන්නලව්
කරන්න.[4] 3 දැන් යන්න. මා ඔබව
යවන්නේ වෘකයන් මැදට යවන
බැටළුවන් හා සමානවයි.[5] 4 පසුම්-
බියක්වත් කෑම මල්ලක්වත්[6] අම-
තර පාවහන්වත් ගෙන යන්න එපා.
මඟදී මුණගැසෙන අයට සුපුරුදු
ලෙස ආචාර කිරීමට කාලය නාස්ති
කරන්නත් එපා.[7] 5 ඔබ යම් නිව-
සකට ඇතුල් වූ විට මුලින්ම 'මේ
නිවසට සමාදානය ලැබේවා'[8] කියා
පවසන්න. 6 සමාදානයට කැමති
කෙනෙක් සිටී නම් ඔබ පැතූ සාමය
ඔහුට ලැබෙයි.[9] එහෙම නැත්නම්
ඔබේ සමාදානය නැති කර නොගෙන
එතැනින් පිටත් වෙන්න.[10] 7 ඔබ
නුවරකට ඇතුල් වූ පසු නවාතැන්
ගැනීමට නිවසක් සොයමින් තැනින්
තැන යන්න එපා.[11] ඔබව පිළි-
ගන්නා නිවසෙහි අය ඔබට ලබා දෙන
දේවල් කමින් බොමින්[12] එහිම නැවතී
සිටින්න.[13] යම් සේවයක් කරන පුද්ග-
ලයාට යමක් ලැබීම සුදුසුයි.[14]

8 "ඔබ යම් නුවරකට ගිය විට
එහි සිටින අය ඔබව පිළිගෙන
ඔබට කෑම සඳහා යමක් දෙන විට
එය කන්න. 9 එහි සිටින රෝ-
ගීන්ව සුව කරන්න.[15] ඒ වගේම 'දෙ-
විගේ රාජ්‍යය[16] ඔබ ළඟට පැමිණ
තිබෙනවා' කියා ඔවුන්ට කියන්න.
10 නමුත් ඔබ යම් නුවරකට ගිය විට
ඔවුන් ඔබව පිළිගන්නේ නැත්නම්[17]
එහි ප්‍රධාන වීථිවලට ගොස් මෙසේ
කියන්න. 11 'ඔබේ නුවරේ ගමන්
කරන විට අපේ පාදවල තැවරුණු
දූවිලි පවා අපි ගසා දමනවා.[18] එය
ඔබට විරුද්ධව සාක්ෂියක් වෙයි. දෙ-
විගේ රාජ්‍යය ළං වී ඇති බව මතක
තබාගන්න.' 12 නමුත් මම ඔබට
කියන්නේ, විනිශ්චය සිදු වන දවසේදී
එම නුවරට ලැබෙන දඬුවම සොදොම්
නුවරේ වැසියන් ලැබූ දඬුවමට වඩා
දරුණු වන බවයි.[1]

13 "කොරාසීනය,[2] බෙත්සයිදාව,[3]
ඔබට මොන තරම් දරුණු විපත-
කට මුහුණ දෙන්න සිදු වෙයිද! ඇත්-
තෙන්ම ඔබ තුළ සිදු වූ බලවත් ක්‍රියා
තීර් සහ සීදොන් යන නුවරවල සිදු
වුණා නම් එහි වැසියන් ගෝණි රෙදි
ඇඳ අළුවල ඉඳගෙන පසුතැවිලි වන්-
නේ මීට බොහෝ කලකට කලිනුයි.[4]
14 ඒ නිසා විනිශ්චය සිදු වන අවස්-
ථාවේදී, ඔබට ලැබෙන දඬුවම තීර්
සහ සීදොන්හි වැසියන්ට ලැබුණු දඬු-
වමට වඩා දරුණු වෙයි.[5] 15 කපර්-
ණවුම නුවර, අහස දක්වාම ඔබව
උසස් කරයි කියා ඔබ සිතුවාද?[6] ඔබව
මිනී වළ දක්වාම පහතට හෙළනු
ලබයි![7]

16 "ඔබට සවන් දෙන කෙනෙක්[8]
මටත් සවන් දෙයි. කෙනෙක් ඔබව
නොසලකාහැරියොත් ඔහු මාවත්
නොසලකාහරියි. මාව නොසලකාහ-
රින පුද්ගලයා නොසලකාහරින්නේ[9]
මාව එවූ තැනැත්තාණන්වයි."

17 පිටත්ව ගිය හැත්තෑදෙනා ප්‍රීති-
යෙන් ආපසු ඇවිත්, "ස්වාමීනි, අපි
ඔබේ නාමය භාවිත කළ විට භූත-
යන් පවා අපේ අණට කීකරු වුණා"[10]
කියා කීවෝය. 18 එය අසා ඔහු
ඔවුන්ට මෙසේ කීවේය. "සාතන් ස්වර්-
ගයෙන් පහතට කඩාගෙන වැටෙන
ආකාරය මට පේනවා.[11] එය හරි-
යට අහසින් අකුණු සැරයක් වැදෙනවා
වගෙයි. 19 මම ඔබට සර්පයන්ව[12]
සහ ගෝනුස්සන්ව[13] පාගා දමන්නත්
සතුරා සතු සම්පූර්ණ බලය මැඩප-
වත්වන්නත් බලය දෙනවා.[14] ඔබට
කිසිම දෙයකින් අනතුරක් සිදු වන්-
නේ නැහැ. 20 නමුත් ඔබ ප්‍රීති
විය යුත්තේ භූතයන් ඔබේ අණට
කීකරු වන නිසා නොවෙයි. දෙවි
ඔබේ නම්[15] ස්වර්ගයෙහි සටහන්
කර තිබෙන නිසයි." 21 ඒ පැයේදීම

15 නික් 32:32; ගීතා 69:28; යෙසා 4:3; දානි 12:1; පිලි 4:3; හෙබ්‍රෙ 12:23; එළි 3:5; එළි 13:8.

**10 පරි.**
1 මතෙ 9:37
2 1කොරි 3:9
3 යෙරෙ 3:15
4 2තෙස 3:1
5 මතෙ 10:16
6 මතෙ 10:9; ලූක් 9:3
7 2රාජා 4:29
8 1සාමු 25:6; මතෙ 10:12; ලූක් 9:4; යොහ 20:19
9 යාකො 3:18
10 1සාමු 25:10; 1පේත 4:14
11 එෆී 5:15
12 ද්වි 18:8; 1කොරි 10:27; ගලා 6:6
13 මතෙ 10:11
14 මතෙ 10:10; 1කොරි 9:11; 1කොරි 9:14; 1තිමෝ 5:18
15 ලූක් 9:2
16 දානි 2:44; මතෙ 3:2; රෝම 10:8
17 ලූක් 9:5
18 මතෙ 10:14; ක්‍රියා 13:51; ක්‍රියා 18:6

**2 තීරුව**
1 විලා 4:6; එස 16:48; මතෙ 11:24
2 මතෙ 11:21
3 ලූක් 9:10
4 එස 3:6
5 මතෙ 11:22
6 යෙරෙ 51:53
7 ගීතා 9:17; යෙසා 14:15; එස 26:20; මතෙ 11:23
8 මතෙ 10:40; මාක් 9:37; යොහ 5:23; යොහ 13:20
9 නික් 16:8; යොහ 12:48; යොහ 15:23; 1තෙස 4:8
10 ක්‍රියා 16:18
11 යොහ 12:31; යොහ 16:11; හෙබ්‍රෙ 2:14; එළි 12:8
12 මතෙ 23:33
13 එස 2:6
14 උත් 3:15; ගීතා 91:13

දෙවිගේ බලය යේසුස් තුළ ප්‍රබල
ලෙස ක්‍රියාත්මක වූ අතර ඔහු මහත්
ප්‍රීතියකින්[1] මෙසේ කීවේය. “ස්වර්-
ගයටත් පොළොවටත් ස්වාමීන් වන
පියාණෙනි, ඔබ මේ දේවල් ප්‍රඥාවන්-
තයන්[2] සහ බුද්ධිමතුන් ලෙස සල-
කන අයගෙන් සඟවා, බිළිඳුන් වැනි
අයට හෙළි කළ නිසා ඔබට ප්‍රසිද්ධියේ
ප්‍රශංසා කරන්න මම කැමතියි. පියා-
ණෙනි, එසේ සිදු වුණේ ඔබේ කැමැත්-
තට එකඟවයි. **22** මගේ පියාණන්
මට සෑම දෙයක්ම භාර දී තිබෙ-
නවා.[3] පුත්‍රයාව හොඳින් හඳුනාගෙන
සිටින්නේ පියාණන් පමණයි.[4] පියා-
ණන්ව හොඳින් හඳුනාගෙන සිටින්-
නෙත් පුත්‍රයා පමණයි.[5] ඒ වගේම
යමෙක් පියාණන්ව හඳුනාගන්නවාට
පුත්‍රයා කැමති නම් ඔහු ඒ පුද්ගලයාට
පියාණන් ගැන එළිදරව් කරයි.”

**23** තම ගෝලයන් පමණක් සිටි
අවස්ථාවකදී ඔහු ඔවුන්ට මෙසේ පැව-
සුවේය. “ඔබට මේ දේවල් දකින්න
ලැබෙන නිසා ඔබ ඉතා සන්තෝෂ-
වත් අයයි.[6] **24** මම එසේ කියන්-
නේ, බොහෝ අනාගතවක්තෘවරුන්
සහ රජවරුන් ඔබ දකින දේ
දකින්නත්[7] ඔබට ඇසෙන දේ අසා-
ගෙන සිටින්නත් ආශා කළ නිසයි.
නමුත් ඒ දේවල් අහන්න දකින්න
අවස්ථාවක් ඔවුන්ට ලැබුණේ නැහැ.”

**25** එවිට නීතිය ගැන මනා දැනු-
මක් ඇති මිනිසෙක්[8] ඇවිත්, “ගුරු-
තුමනි, සදාකාල ජීවනය ලබාගන්න
නම් මම මොනවාද කරන්න ඕනේ”[9]
කියා ඇසුවේය. ඔහු ඒ දේ ඇසුවේ
යේසුස්ගේ දැනුම පරීක්ෂා කිරීමටයි.
**26** යේසුස් ඔහුට මෙසේ කීවේය.
“නීතියේ ලියා තිබෙන්නේ මොන-
වාද?[10] ඔබ එය කියවද්දී තේරුම්-
ගත්තේ මොනවාද?” **27** එවිට ඔහු
මෙසේ පිළිතුරු දුන්නේය. “‘ඔබේ
දෙවි වන යෙහෝවාට ඔබේ මුළු හද-
වතින්ම ප්‍රේම කරන්න. ඔහු වෙනු-
වෙන් ඔබේ උපරිමය කරමින් ඔබේ
මුළු ජීවිතයම කැප කරන්න. නිතරම
ඔබේ මනසේ මුල් තැන හිමි විය යුත්-
තේ ඔහුටයි.’*[1] එසේම ‘ඔබට මෙන්
ඔබේ අසල්වැසියාට ප්‍රේම කරන්න.’ ”[2]
**28** එවිට යේසුස්, “ඔබේ පිළිතුර නිවැ-
රදියි. ‘ඔබ දිගටම ඒ දේ කළොත් ඔබ-
ටත් ජීවනය ලැබෙයි’ ”[3] කියා ඔහුට
කීවේය.

**29** නමුත් තමා ධර්මිෂ්ඨයෙක් බව
ඔප්පු කිරීමට කැමති වූ ඒ
මිනිසා, “ඇත්තටම මගේ අසල්වැසියා
කවුද”[4] කියා යේසුස්ගෙන් ඇසුවේය.
**30** යේසුස් ඊට පිළිතුරු දුන්නේ මෙ-
සේයි. “එක්තරා මිනිසෙක් යෙරුස-
ලමේ සිට යෙරිකෝව දක්වා බැස
යන පාර දිගේ ගමන් කරමින් සිටියා.
එසේ යන විට ඔහු කොල්ලකරුවන්
පිරිසකට හසු වුණා. එම කොල්ල-
කරුවන් ඔහුට හොඳටම පහර දී ඔහු-
ගේ වස්ත්‍ර හා ඔහු ළඟ තිබුණු හැම
දෙයක්ම පැහැරගෙන ගියා. ඔවුන්
ඔහුව අත්හැර දමා යන විට බරප-
තළ ලෙස තුවාල වූ ඔහු සිහි නැති
තත්වයකයි සිටියේ. **31** මේ අත-
රේ එම පාර දිගේ පූජකයෙක් ගමන්
කළා. තුවාල වී සිටි පුද්ගලයාව
දැක දැකත් පාරේ අනික් පැත්තට
මාරු වූ ඔහු, නොදැක්කා වගේ තම
ගමන ගියා.[5] **32** ඉන්පසුව ලෙවීවර-
යෙකුත් එම පාර දිගේ ආවා. ඔහුත්
එම පුද්ගලයාව දැක්කත් පාරේ අනික්
පැත්තට මාරු වී ගියා.[6] **33** එවිට
ඒ පාර දිගේ එක්තරා සමරිතානු-
වරයෙක්[7] පැමිණියා. තුවාලව සිටි
පුද්ගලයාව දුටු ඔහුට එම පුද්ගලයා
ගැන මහත් අනුකම්පාවක් ඇති වුණා.
**34** ඔහු ඒ මිනිසා ළඟට ඇවිත් ඔහුගේ
තුවාලවලට වයින් සහ තෙල් දමා
බැන්දා.[8] ඉන්පසු ඔහු ඒ මිනිසාව තම
බූරුවා පිට නංවා ඔහුව තානායමකට
ගෙන ගියා. ඔහු එහිදීත් ඔහුව හොඳින්
බලාගත්තා. **35** පසුවදා ඔහු තානා-
යම්කරුට ඩිනාරි* දෙකක් දී, ‘මේ
මිනිසාව හොඳින් බලාගන්න. මීට

**10 පරි.**
1 මතෙ 11:25
2 1කොරි 1:19; 1කොරි 2:6
3 මතෙ 28:18; යොහ 3:35
4 යොහ 10:15
5 යොහ 1:18; 2කොරි 4:6
6 මතෙ 13:16
7 1කොරි 2:9; 1පේතෘ 1:10
8 මතෙ 22:35
9 මතෙ 19:16; මාක් 10:17; ලූක් 18:18
10 ලෙවී 18:5

**2 තීරුව**
1 ද්වි 6:5; ද්වි 10:12; ද්වි 11:22; යොෂු 22:5; මාක් 12:30
2 ලෙවී 19:18; මතෙ 19:19; රෝම 13:9; ගලා 5:14; යාකො 2:8
3 ලෙවී 18:5; නෙහෙ 9:29; එස 20:11; යොහ 17:3; රෝම 10:5; ගලා 3:12
4 ලූක් 16:15
5 යෝබ 6:14
6 හිතෝ 27:10
7 යොහ 4:9
8 යෙසා 1:6

**ලූක් 10:27*** ග්‍රීක බසට අනුව ඔබේ මුළු හදවතින්ම, මුළු ජීවිතයෙන්ම, මුළු මනසින්ම හා මුළු ශක්තියෙන්ම ඔහුට ප්‍රේම කරන්න. **35*** ලූක් 7:41හි පාදසටහන බලන්න.

වැඩියෙන් ඔබට වියදම් වුණොත් මම
නැවත එන කොට එයත් ගෙවන්නම්’
කියා පැවසුවා. **36** දැන් ඔබ මට
මේ දේ කියන්න. කොල්ලකරුවන්ට
හසු වූ ඒ මිනිසාට අසල්වැසියෙක් වී
කටයුතු කළේ[1] ඒ පුද්ගලයන් තුන්-
දෙනාගෙන් කවුද?” **37** “ඔහුට දයාව
දැක්වූ තැනැත්තා”[2] කියා ඔහු පිළි-
තුරු දුන්නේය. එවිට යේසුස්, “ඔබත්
ගොස් ඒ දේම කරන්න”[3] කියා ඔහුට
පැවසුවේය.

**38** ඔහු ඔවුන් සමඟ එතැනින්
පිටත් වී එක්තරා ගමකට ගියේය.
එහිදී මාර්තා[4] නම් එක්තරා ස්ත්‍රි-
යක් ඔහුව ඇගේ නිවසට පිළිගත්-
තාය. **39** මේ ස්ත්‍රියට මරියා නම්
සහෝදරියක්ද සිටියාය. ඇය පුරුදු
වී සිටියේ ස්වාමීන්ගේ පාමුල ඉඳ-
ගෙන[5] ඔහු ඉගැන්වූ දේවලට සවන්
දීමටය. **40** මේ අතර මාර්තා ගෙද-
රදොරේ බොහෝ වැඩකටයුතුවල
නිරත වී සිටියාය. ඇගේ අවධා-
නය යොමු වී තිබුණේ ඒ දේව-
ලට පමණි.[6] එහෙයින් ඇය යේසුස්
ළඟට ඇවිත්, “ස්වාමීනි, බලන්නකෝ
මගේ සහෝදරිය දිහා. මට තනි-
යම මේ හැම දෙයක්ම කරන්න සිදු
වෙලා.[7] ඇවිත් මට උදව් කරන්න
කියා ඇයට කියන්න” කියා කීවාය.
**41** එවිට යේසුස් ඇයට මෙසේ පිළි-
තුරු දුන්නේය. “මාර්තා, මාර්තා, ඇයි
ඔබ මේ තරම්[8] කරදර වෙන්නේ?[9]
**42** බොහෝ දේවල් අවශ්‍ය නැහැ.[10]
ඇත්තටම එක දෙයක් තිබුණත් ඇති.
මරියා තෝරාගත්තේ වඩාත් හොඳ
දෙයයි.[11] එය කවදාවත් ඇයට අහිමි
වෙන්නේ නැහැ.”

**11** දිනක් යේසුස් එක්තරා ස්ථා-
නයක සිට යාච්ඤා කළ පසු
ඔහුගේ ගෝලයෙක් ඔහුට මෙසේ
කීවේය. “ස්වාමීනි, යොහන් ඔහුගේ
ගෝලයන්ට යාච්ඤා කරන්න ඉගැන්-
නුවා වගේ[12] අපටත් යාච්ඤා කරන්-
නේ කොහොමද කියා උගන්වන්න.”[13]

**2** ඔහු ඔවුන්ට මෙසේ කීවේය.
“යාච්ඤා කරන විට[14] මෙසේ කියන්න.
‘පියාණෙනි, ඔබේ නාමය සැමදා ශුද්-
ධව පවතීවා!*[1] ඔබගේ රාජ්‍යය පැමි-
ණේවා![2] **3** දිනපතා අපට අවශ්‍ය
වන ආහාර අපට ලබා දෙන්න.[3]
**4** අපේ පව්වලට සමාව දෙන්න.[4]
මන්ද අපට වැරදි කළ* සියලුදෙනාට
අපිත් සමාව දෙනවා.[5] වරදට පෙල-
ඹෙන්න අපට ඉඩ නොදෙන්න.’ ”[6]

**5** ඔහු ඔවුන්ට මෙසේද කීවේය.
“ඔබ අතරේ සිටින කෙනෙක් මධ්‍යම
රාත්‍රියේදී මිත්‍රයෙක් ළඟට ගොස්,
‘මට රොටි තුනක් ණයට දෙන්න.
**6** ගමනක් යන මගේ මිතුරෙක් මේ
දැන් මගේ ගෙදරට ආවා. ඔහුට
දෙන්න මා ළඟ කිසිම දෙයක් නැහැ’
කියා පැවසුවොත් කුමක් සිදු වෙ-
යිද? **7** ඒ මිතුරා ගේ ඇතුළේ සිට,
‘මට කරදර කරන්න එපා.[7] දැනට-
මත් දොරට අගුලු දමා තිබෙනවා.
මම ඉන්නේ මගේ කුඩා දරුවෝත්
එක්ක ඇඳේ නිදාගෙනයි. ඒ නිසා
නැඟිටලා ඔබට කිසිම දෙයක් දෙන්න
මට පුළුවන්කමක් නැහැ’ කියා පැව-
සිය හැකියි. **8** නමුත් ඒ පුද්ගලයා
අත්හරින්නේ නැතුව තම මිතුරා-
ගෙන් දිගටම ඉල්ලා සිටින නිසා
ඔහු නැඟිට අවශ්‍ය හැම දෙයක්ම
දෙයි. ඔහු එසේ කරන්නේ මිත්‍රකම
නිසා නොව ඒ පුද්ගලයාගේ දැඩි උත්-
සාහය නිසයි.[8] **9** දැන් මම ඔබට
කියන මේ දේ හොඳින් මතක තබා-
ගන්න. නොකඩවා ඉල්ලන්න.[9] එවිට
ඔබටත් ලැබෙයි. නොකඩවා සො-
යන්න.[10] එවිට ඔබටත් අවශ්‍ය දේ
සම්බ වෙයි. නොකඩවා දොරට තට්ටු
කරන්න. එවිට ඔබටත් එය විවෘත
කරනු ලැබෙයි. **10** මන්ද ඉල්ල-
මින් සිටින සියල්ලන්ට ලැබෙයි.[11]
සොයමින් සිටින සියල්ලන්ට සම්බ
වෙයි. දොරට තට්ටු කරමින් සිටින
සියල්ලන්ට විවෘත කරනු ලැබෙයි.
**11** උදාහරණයකට ඔබේ පුතෙක්[12]

**10 පරි.**
1 මතෙ 19:19
2 හිතෝ 14:21
හොෂෙ 6:6
මීකා 6:8
3 ලූක් 6:36
යොහ 13:17
එෆී 4:32
4 යොහ 12:2
5 ද්වි 33:3
ලූක් 8:35
ක්‍රියා 22:3
6 1කොරි 7:35
7 ලූක් 8:3
8 යොහ 6:27
9 1කොරි 7:32
10 මතෙ 4:4
11 මතෙ 6:33
යොහ 6:27

**11 පරි.**
12 ලූක් 5:33
13 යාකො 4:3
14 මතෙ 6:9

**2 තීරුව**
1 ලෙවී 22:32
ද්වි 32:3
ගීතා 145:21
යෙසා 5:16
යෙසා 8:13
යෙසා 29:23
එස 36:23
2 දානි 2:44
දානි 7:14
මතෙ 6:10
3 ගීතා 37:25
යෙසා 51:14
4 ගීතා 79:9
දානි 9:19
මතෙ 9:6
5 මතෙ 6:14
මාක් 11:25
එෆී 4:32
කොලො 3:13
6 මතෙ 6:13
ලූක් 22:46
1කොරි 10:13
යාකො 1:13
එළි 3:10
7 මතෙ 26:10
මාක් 14:6
8 ලූක් 18:5
9 රෝම 12:12
10 මතෙ 7:7
11 ගීතා 50:15
යෙරෙ 33:3
මාක් 11:24
යොහ 15:7
යාකො 1:6
1යොහ 3:22
1යොහ 5:14
12 මතෙ 7:9

**ලූක් 11:2*** හෝ, “ඔබේ නාමයට ඇති වී තිබෙන කැළැල ඉවත් කරනු ලැබේවා!” **4*** හෝ, “ණයව සිටින.”

ඔබෙන් මාළුවෙක් ඉල්ලුවොත්
මාළුවා වෙනුවට සර්පයෙක් දෙන්-
නේ ඔබෙන් කවුද? **12** ඔහු බිත්තර-
යක් ඉල්ලුවොත් ඔහුට ගෝනුස්සෙක්
දෙයිද? **13** ඔබ දුෂ්ට වුණත් ඔබේ
දරුවන්ට හොඳ තෑගි දෙන්න ඔබ
දන්නවා.[1] එසේනම් යමෙක් ස්වර්-
ගයෙහි සිටින පියාණන්ගෙන් ඔහු-
ගේ බලය ඉල්ලුවොත්[2] ඔහු ඊට වඩා
කොතරම් වැඩියෙන් ඔහුට ඒ දේ ලබා
දෙයිද!”

**14** දිනක් භූතයෙකු වැහී සිටි මිනි-
සෙකුව යේසුස්ට හමු විය. එම භූතයා
නිසා ඒ මිනිසාට කතා කිරීමට නො-
හැකි විය.[3] යේසුස් එම භූතයාව දුරු
කළ විට ඔහු කතා කළ අතර සමූ-
හයා ඒ දැක මවිත වූහ. **15** නමුත්
ඔවුන් අතරේ සිටි සමහරදෙනෙක්,
“ඔහු භූතයන් දුරු කරන්නේ භූතයන්-
ගේ පාලකයා[4] වන බෙල්සෙබුබ්ගේ*
බලයෙන්” කියා කීවෝය. **16** තවත්
සමහරු ඔහුගේ වරදක් අල්ලාගැ-
නීමේ අදහසින් අහසේ ආශ්චර්යවත්
ලකුණක්[5] පෙන්වන්න කියා ඔහු-
ගෙන් ඉල්ලුවෝය. **17** ඔවුන් සිතා-
ගෙන සිටි දේ තේරුම්ගත්[6] ඔහු
ඔවුන්ට මෙසේ කීවේය. “යම් රාජ්‍ය-
යක් තුළ භේද තිබෙනවා නම් එය
විනාශ වී යයි. ඒ වගේම යම් නිව-
සක සිටින අය අතරේ භේද ඇත්නම්
ඔවුන්ට එකට සිටිය නොහැකියි.[7]
**18** මම භූතයන්ව දුරු කරන්නේ
බෙල්සෙබුබ්ගේ බලයෙන් කියා ඔබ
කියනවා. නමුත් ඔහු තමන්ට පක්-
ෂව සිටින අයව භේද කරනවා නම්
කොහොමද ඔහුගේ රාජ්‍යය පවතින්-
නේ?[8] **19** මම බෙල්සෙබුබ්ගේ බල-
යෙන් භූතයන් දුරු කරනවා නම්
ඔබේ අනුගාමිකයන්[9] ඔවුන්ව දුරු
කරන්නේ කාගේ බලයෙන්ද? ඒ නිසා
ඔබ පවසන දේ වැරදියි කියා ඔවුන්ම
කියයි. **20** නමුත් මා භූතයන්ව දුරු
කරන්නේ දෙවිගේ බලයෙන්[10] නම්
මෙය මතක තබාගන්න. දෙවිගේ
රාජ්‍යය ඔබ අතර තිබුණත් ඊට
ඇතුල් වීමේ ප්‍රස්තාව දැන් ඔබ අහිමි
කරගෙන.[1] **21** අවිආයුධ අතැතිව
සිටින ශක්තිමත් මිනිසෙකු ගැන
සිතන්න.[2] ඔහු තම මාලිගාව මුර
කරද්දී ඔහු සතු සියල්ල සුරක්ෂි-
තයි. **22** නමුත් ඔහුට වඩා ශක්ති-
මත් කෙනෙක්[3] ඇවිත් ඔහුට පහර දී
ඔහුව පරාජය කළොත්[4] ඒ තැනැත්තා
මුලින්ම ඔහුට මහත් ශක්තියක් වූ
ඔහුගේ සියලු අවිආයුධ පැහැරගනියි.
පසුව කොල්ල කාගත් දේ අනුන්ට
බෙදා දෙයි. **23** කෙනෙක් මට පක්-
ෂව නොසිටියොත් ඔහු මට විරුද්-
ධව ක්‍රියා කරයි. කෙනෙක් මා සමඟ
මිනිසුන්ව රැස් කරන්නේ නැත්නම්
ඔහු කරන්නේ මගෙන් මිනිසුන්ව ඈත්
කිරීමයි.[5]

**24** “භූතයෙක් මිනිසෙකුගෙන් පිට
වී යද්දී ඔහු නවාතැනක් සොය-
මින් වියළි බිම්වල සැරිසරයි. නමුත්
ඔහුට නවාතැනක් හමු වන්නේ නැහැ.
එවිට ඔහු, ‘මා කලින් වාසය කළ
තැනට ආපසු යනවා’ කියා පවසයි.[6]
**25** ඔහු පැමිණෙන විට එතැන අතුගා
පවිත්‍ර කර සරසා තිබෙන ආකා-
රය දකියි. **26** එමනිසා ඔහු ගොස්
තමාට වඩා දුෂ්ට තවත් භූතයන්
හත්දෙනෙකුව කැඳවාගෙන[7] ඇවිත්
එයට ඇතුල් වී එහි වාසය කරයි. ඉන්-
පසු ඒ මිනිසාගේ තත්වය ඔහු කලින්
සිටි තත්වයට වඩා භයානක වෙයි.”[8]

**27** ඔහු ඒ දේවල් කියමින් සිටියදී,
සමූහයා අතරෙන් එක්තරා ස්ත්‍රියක්
හඬ නඟා, “ඔබව කුසේ දරා ඔබට කිරි
දුන් ස්ත්‍රිය මොන තරම් සන්තෝ-
ෂවත් කෙනෙක් විය යුතුද”[9] කියා
ඔහුට කීවාය. **28** නමුත් ඔහු ඇයට
මෙසේ කීවේය. “ඇත්තටම සන්තෝ-
ෂවත් වන්නේ දෙවි පවසන දේ අසා
එය පිළිපදින අයයි.”[10]

**29** විශාල සමූහයක් එක් රොක්
වෙමින් සිටියදී ඔහු මෙසේ කීවේය.
“මේ පරම්පරාව දුෂ්ට පරම්පරාවක්.
ඔවුන් සාක්ෂි වශයෙන් ආශ්චර්ය-

---

**ලූක් 11:15*** සාතන්ට භාවිත කරන තවත් නමකි.

**11 පරි.**
**1** 2කොරි 12:14
**2** යෙසා 44:3 යාකො 1:17
**3** මතෙ 9:32 මතෙ 12:22
**4** මතෙ 9:34 මාක් 3:22
**5** මතෙ 12:38 මාක් 8:11 1කොරි 1:22
**6** යොහ 2:25
**7** මතෙ 12:25 මාක් 3:24
**8** මාක් 3:26
**9** මාක් 9:38 ලූක් 9:49
**10** නික් 8:19 මතෙ 12:28

**2 තීරුව**
**1** ලූක් 17:21
**2** යෙසා 49:24 මතෙ 12:29 මාක් 3:27
**3** යෙසා 9:6 යෙසා 53:12 කොලො 2:15 1යොහ 4:4
**4** මතෙ 12:29 මාක් 3:27
**5** මතෙ 12:30 මාක් 9:40 ලූක් 9:50 යොහ 11:52
**6** මතෙ 12:43
**7** ලූක් 8:2
**8** මතෙ 12:45 යොහ 5:14 2පේතෘ 2:20
**9** ලූක් 1:28 ලූක් 1:48
**10** ද්වි 29:9 ගීතා 1:2 ගීතා 112:1 ගීතා 119:2 යෙසා 56:2 මතෙ 7:21 යාකො 1:25

වත් ලකුණක් සොයමිනුයි සිටින්නේ.[1]
නමුත් ඔවුන්ට ලකුණක් වශයෙන්
මා ඉදිරිපත් කරන්නේ යෝනාට
සිදු වූ දේ පමණයි.[2] **30** යෝනා[3]
නිනිවය නගරයේ වැසියන්ට සාක්ෂි-
යක් වූ ලෙසම මනුෂ්‍ය පුත්‍රයාත්
මේ පරම්පරාවට සාක්ෂියක් වෙයි.
**31** දෙවිගේ විනිශ්චය සිදු වන අවස්-
ථාවේදී මේ පරම්පරාවට අයත් මිනි-
සුන් සමඟ දකුණු දිශාවේ රැජිනවත්[4]
නැවත නැඟිටුවන විට ඔවුන් වර-
දකරුවන් බව ඇය පෙන්වා දෙයි.
මන්ද සලමොන්ගේ ප්‍රඥාව ඇසීමට
ඇය පැමිණියේ පොළොවේ ඈත කෙ-
ළවරක සිටයි. නමුත් බලන්න! සල-
මොන්ට වඩා උතුම් කෙනෙක්[5] ඔබ
අතරේම සිටියි. **32** දෙවිගේ විනිශ්-
චය සිදු වන අවස්ථාවේදී නිනිව-
යේ මිනිසුන් මේ පරම්පරාව සමඟ
නැඟිට මේ පරම්පරාව වරදකරුවන්
බව පෙන්වා දෙයි. මන්ද යෝනා
දේශනා කළ පසු ඔවුන් පසුතැවිලි
වුණා.[6] නමුත් බලන්න, යෝනාටත්
වඩා උතුම් කෙනෙක්[7] මෙහි සිටිනවා.
**33** කෙනෙක් පහනක් දැල්වූ විට ඔහු
එය සඟවා තබන්නේවත් බඳුනකින්
වසා තබන්නේවත් නැහැ. ඒ වෙනුවට
ඔහු එය පහන් රුකක් මත තබයි.[8]
එවිට ගෙට ඇතුල් වන සියලුදෙ-
නාටම එයින් ආලෝකය විහිදෙයි.
**34** ඔබේ ඇස ශරීරයට පහනක් හා
සමානයි. ඔබේ ඇස වෙනතකට
යොමු නොකර එකම දෙයක් කෙ-
රෙහි යොමු කර තැබුවොත් එයින්
ඔබේ මුළු ජීවිතයම ආලෝකවත්
වෙයි.[9] නමුත් එය වෙනතකට ගොස්
දුෂ්ට දේවලට යොමු වී ඇත්නම් ඔබේ
මුළු ජීවිතයම අඳුරු වෙයි. **35** එම-
නිසා සෝදිසියෙන් සිටින්න. සමහ-
රවිට ඔබව ආලෝකවත් කළ යුතු
ඔබේ ඇස ඔබට අඳුරක් ගෙන දිය
හැකියි.[10] **36** නමුත් ඔබේ ජීවිතයට
කිසි ලෙසකින්වත් අඳුර ඇතුල් වී
නැත්නම් ඔබ මුළුමනින්ම ආලෝක-
වත් වෙයි.[11] ඔබ හරියට ආලෝකය
විහිදුවන පහනක් හා සමාන වෙයි.”

**37** ඔහු ඒ දේවල් ගැන කතා
කළ පසු පරිසිවරයෙක් ඇවිත්
තමන් සමඟ කෑමක් ගැනීමට පැමි-
ණෙන මෙන් ඔහුගෙන් ඉල්ලුවේය.[1]
එහෙයින් ඔහු එම නිවසට ඇතුල්
වී කෑමට ඉඳගත්තේය. **38** යේ-
සුස් දවල් කෑමට කලින් තම අත්
සෝදා නොගත් බව දුටු ඒ පරිසිව-
රයා පුදුම විය.[2] **39** එවිට යේසුස්
ඔහුට මෙසේ කීවේය. “පරිසිවරුනි,
ඔබ කුසලානයත් දීසියත් පිටතින්
පවිත්‍ර කරන්න නම් අතපසු කරන්නේ
නැහැ. නමුත් ඔබේ හදවත්[3] දුෂ්ට-
කම්වලින් හා අන් අය සතු දේවල්
කොල්ල කෑමේ ආශාවෙන් පිරී තිබෙ-
නවා.[4] **40** ඔබ සිතන්නේ කොත-
රම් අසාධාරණ ලෙසද! පිට පැත්ත
සෑදූ තැනැත්තාමයි[5] ඇතුල් පැත්තත්
සෑදුවේ. **41** එසේනම් ඔබ දිළිඳුන්ට
යම් යහපතක් කරන විට[6] එය ඔබේ
හදවතින්ම කරන්න. එසේ කළොත්
අන් සෑම කාරණයකදීම ඔබ පවිත්‍ර
වෙයි. **42** පරිසිවරුනි, ඔබට මොන
තරම් දරුණු ප්‍රතිඵලවලට මුහුණ
දෙන්න සිදු වෙයිද! ඔබ මිංචිවලින්ද
අරුදවලින්ද අන් සියලුම පලා ගස්-
වලින්ද දසයෙන් කොටස දුන්නත්[7]
ඔබ යුක්තිය, දෙවිට ප්‍රේමය දැක්වීම
වැනි දේවල් සුළු කොට සලකනවා!
මුලින් සඳහන් කළ දේවල් කරන්න
අවශ්‍ය බව ඇත්තයි. නමුත් ඔබ බැඳී
සිටින්නේ දෙවෙනියට සඳහන් කළ
දේවල් කරන්නයි.[8] **43** පරිසිවරුනි,
ඔබට මොන තරම් දරුණු ප්‍රතිඵලව-
ලට මුහුණ දෙන්න සිදු වෙයිද! සිනා-
ගෝගවල ඉදිරි ආසනවල සිටින්නත්
වෙළඳපොළවල ඔබව ගෞරවයෙන්
පිළිගන්නවාටත් ඔබ කොතරම් කැම-
තිද![9] **44** ඔබට නම් ඉතා දරුණු
විපතකට මුහුණ දෙන්න සිදු වෙයි.
ඔබ ඇත්තටම ඇතුළත නොපෙ-
නෙන සොහොන් ගෙවල් හා සමානයි.
මිනිස්සු ඒවා තිබෙන තැනවත් නො-
දැන ඒවා මත ඇවිදිනවා.”[10]
**45** එවිට නීතිය ගැන මනා දැනු-
මක් ඇති[11] අයගෙන් කෙනෙක් ඔහුට

**11 පරි.**
**1** මතෙ 12:38 1කොරි 1:22
**2** මතෙ 16:4
**3** යෝනා 1:17 මතෙ 12:39
**4** 1රාජ 10:1 2ලේක 9:1
**5** යෙසා 9:6 පිලි 2:10
**6** යෝනා 3:5
**7** මතෙ 12:41
**8** මතෙ 5:15 මාක් 4:21 ලූක් 8:16
**9** මතෙ 6:22 ක්‍රියා 26:18 එෆී 1:18
**10** මතෙ 6:23
**11** මතෙ 28:3

**2 තීරුව**
**1** ලූක් 7:36 ලූක් 14:1
**2** මතෙ 15:2
**3** හිතෝ 26:24 යෙරෙ 4:14 තීත 1:15
**4** මතෙ 23:25
**5** මතෙ 23:26
**6** ලූක් 12:33 ක්‍රියා 3:3
**7** ලෙවී 27:30
**8** මතෙ 23:23 යොහ 7:24
**9** මතෙ 23:6
**10** මතෙ 23:27
**11** ලූක් 10:25

මෙසේ කීවේය. “ගුරුතුමනි, ඔබ
මේ දේවල් කියමින් අපට කරන්-
නේ මහත් නින්දාවක්.” **46** යේ-
සුස් මෙසේ පැවසුවේය. “නීතිය ගැන
මනා දැනුමක් ඇති ඔබටත් මොන
තරම් දරුණු ප්‍රතිඵලවලට මුහුණ
දෙන්න සිදු වෙයිද! ඔබ මිනිසුන්ට
උසුලන්න බැරි තරම් අමාරු බර
ඔවුන් පිට පැටෙව්වත් ඒවා උසුලන්න
ඔබේ ඇඟිල්ලක්වත් තබන්න කැමති
වන්නේ නැහැ![1]
**47** “ඔබට මොන තරම් දරුණු
විපතක් අත් වෙයිද! ඔබ අනාග-
තවක්තෘවරුන් වෙනුවෙන් සොහොන්
ගෙවල් හදුවත් ඔවුන්ව මරණයට
පත් කළේ ඔබේම මුතුන්මිත්තන්-
මයි![2] **48** ඔබේ මුතුන්මිත්තන් කළ
ඒ දේවල් ඔබ දැන සිටියත්
ඔබ ඒ ක්‍රියාවලට ඔබේ අනුමැතිය
දී තිබෙනවා.[3] මන්ද අනාගතවක්-
තෘවරුන්ව මරා දැමූ ඔබේ මුතුන්-
මිත්තන් වෙනුවෙන්[4] සොහොන්
ගෙවල් හදන්නේ ඔබයි. **49** එහෙ-
යින් දෙවි මහත් ප්‍රඥාවකින් මෙසේ
කීවේය.[5] ‘මම අනාගතවක්තෘවරුන්
සහ මගේ නියෝජිතයන්ව* ඔවුන්
වෙතට යවන්නෙමි. ඔවුහු ඔවුන්ගෙන්
සමහරෙකුව මරා සමහරෙකුට පීඩා
කරන්නෝය. **50** ඒ නිසා පොළො-
වේ දරුවන් බිහි වුණු දා* පටන් මේ
දක්වා මරා දැමූ සියලු අනාගතවක්-
තෘවරුන්ගේ ලේවලට[6] මේ පරම්පරාව
වන්දි ගෙවිය යුතුයි.[7] **51** මරා දැමූ
ආබෙල්[8] පටන් පූජාසනය හා දෙවිගේ
ගෘහය අතර මරනු ලැබූ[9] සෙකරියා[10]
දක්වා වගුරුවා ඇති සියලුදෙනාගේ
ලේවලට මේ පරම්පරාව වන්දි ගෙවිය
යුතුයි.’ ඇත්තෙන්ම මා ඔබට කියන්-
නේ, ඒ වන්දිය අය කරන්නේ මේ
පරම්පරාවෙන් බවයි.
**52** “නීතිය ගැන මනා දැනුමක්
ඇති මනුෂ්‍යයෙනි, ඔබට මොන තරම්
දරුණු ප්‍රතිඵලවලට මුහුණ දෙන්න
සිදු වෙයිද! මන්ද දෙවිගෙන් දැනුම
ලබාගැනීම සඳහා මඟ විවෘත කරන
දොරේ යතුර ඔබ පැහැරගෙන ගියා.[1]
ඔබ එයින් ඇතුල් වෙන්න පියවර
නොගත්තා පමණක් නොව ඒ තුළින්
යන්න කැමති අයටත් ඔබ බාධා
කළා!”[2]
**53** ඔහු එතැනින් පිටත්ව ගිය
විට නීතිය පිටපත් කරන්නෝ සහ
පරිසිවරු ඔහු වටා එක් රොක් වී
විවිධ දේවල් ගැන ප්‍රශ්න රැසක්
අසමින් ඔහුට බොහෝ සෙයින්
හිරිහැර කරන්න පටන්ගත්තෝය.
**54** ඔවුන් මාන බලමින් සිටියේ[3] ඔහු
පවසන දෙයක් කෙසේ හෝ අතකො-
ළුවක් කරගෙන ඔහුගේ යම් වරදක්
අල්ලාගැනීමටයි.[4]

**12** මේ අතරේ දහස් සංඛ්‍යාත
ජනකායක් රැස් වෙමින් සිටි-
යෝය. රැස් වූ සංඛ්‍යාව කොතරම්ද
කිවහොත් ඔවුන්ට තම පය තැබීමට-
වත් ඉඩක් නොතිබිණ. ඒ අවස්ථාවේදී
යේසුස් මුලින්ම තම ගෝලයන්ව අම-
තමින් මෙසේ කීවේය. “පරිසිවරුන්ගේ
කුහකකම්වලින් පරෙස්සම් වන්න.[5]
එය හරියට මුහුන් වගෙයි.[6] **2** දැන්
හොඳින් සඟවා තිබෙන කිසි දෙ-
යක් අනාවරණය නොකර තිබෙන්-
නේ නැහැ. දැන් රහසක්ව තිබෙන
කිසි දෙයක් හෙළි නොකර සිටින්-
නේ නැහැ.[7] **3** ඒ නිසා ඔබ අඳුරු
තැන්වලට වී රහසින් පවසන දේවල්
එළිමහනේ ඔබට අසන්න ලැබෙයි.
ඔබ නිවස තුළට වී රහසින් මුමුණන
දේ වහල්තලවලට ගොස් ප්‍රසිද්ධියේ
ප්‍රකාශ කරනු ලබයි.[8] **4** මගේ මිත්‍ර-
යනි,[9] මා කියන දේට සවන් දෙන්න.
සමහරුන් ඔබව මරා දමයි. ඔවුන්ට
කරන්න පුළුවන් එපමණයි. ඊට වඩා
වැඩි දෙයක් කරන්න ඔවුන්ට බැහැ.
එවැනි අයට භය වෙන්න එපා.[10]
**5** නමුත් ඔබ ඇත්තටම බිය විය යුත්-
තේ කාටද කියා මම කියන්නම්.[11]
ඒ ඔබේ ජීවිතය නැති කර දමන්න
පමණක් නොව ඔබව ගෙහෙන්නා-

**11 පරි.**
1 මතෙ 23:4
2 මතෙ 23:37
3 රෝම 1:32
4 ක්‍රියා 7:52 හෙබ්‍රෙ 11:37
5 හිතෝ 1:20 මතෙ 11:19
6 යෙසා 26:21 එළි 18:24
7 නික් 20:5 යෙරෙ 51:56
8 උත් 4:8
9 2ලේක 24:21
10 2ලේක 24:20

**2 තීරුව**
1 මලා 2:7
2 මතෙ 23:13 1තෙස 2:16
3 ගීතා 37:32
4 මාක් 12:13 ලූක් 20:20

**12 පරි.**
5 මතෙ 16:6 මාක් 8:15
6 1කොරි 5:8
7 දේශ 12:14 මතෙ 10:26 මාක් 4:22 ලූක් 8:17 1කොරි 4:5
8 මතෙ 10:27
9 යොහ 15:14
10 මතෙ 10:28 ක්‍රියා 20:24
11 ගීතා 119:120 හෙබ්‍රෙ 10:31

**ලූක් 11:49*** හෝ, “යවනු ලැබූවන්ව.”
**50*** මතෙ 25:34හි පාදසටහන බලන්න.

වට* නියම කරන්නත් බලය ඇති
තැනැත්තාටයි.[1] ඔබ ඇත්තෙන්ම
බිය විය යුත්තේ[2] ඒ තැනැත්තා-
ණන්ටයි. **6** ගේ කුරුල්ලන් පස්දෙ-
නෙකු මිල දී ගැනීමට අවශ්‍ය වන්නේ
සුළු වටිනාකමක් ඇති කාසි දෙ-
කක් පමණයි. නමුත් දෙවිට උන්ගෙන්
එකෙකුවත් අමතක වෙන්නේ නැහැ.[3]
**7** ඔබේ හැම කෙස්ගසක්ම[4] දෙවි
ගණන් කර තිබෙනවා. ඒ නිසා ඔබට
බිය වෙන්න හේතුවක් නැහැ. ගේ
කුරුල්ලන් බොහෝදෙනෙකුට වඩා
ඔබ වටිනවා.[5]

**8** “යමෙක් මිනිසුන් ඉදිරියෙහි මාව
පිළිගන්නවා නම්[6] මනුෂ්‍ය පුත්‍රයා වන
මමත් දේවදූතයන් ඉදිරියෙහි ඔහුව
පිළිගන්නා බව කියන්න කැමතියි.[7]
**9** නමුත් කෙනෙක් මිනිසුන් ඉදිරි-
යෙහි මාව ප්‍රතික්ෂේප කළොත්[8] මම
ඔහුවත් දේවදූතයන් ඉදිරියෙහි ප්‍රතික්-
ෂේප කරනවා.[9] **10** සමහරවිට කෙ-
නෙක් මනුෂ්‍ය පුත්‍රයාට විරුද්ධව
යමක් කියයි. ඔහු එසේ කිව්වත් ඔහුට
සමාව ලැබෙයි. නමුත් කෙනෙක් දෙ-
විගේ බලයේ ක්‍රියාකාරිත්වය දැක
දැකත් එයට විරුද්ධව අපහසාත්මකව
කතා කළොත් ඔහුට කිසි සමාවක්
නැහැ.[10] **11** මිනිසුන් විශාල පිරි-
සක් ඉදිරියට හෝ රජයේ නිලධා-
රීන් හා වෙනත් බලධාරීන් ඉදිරියට
හෝ ඔබව ගෙන ගියොත් ඔබ පැවසිය
යුත්තේ කුමක්ද කියාවත් ඔබ නිදොස්
බව ඔප්පු කර පෙන්වන්නේ කෙසේද
කියාවත් සිතා කනස්සලු වෙන්න
එපා.[11] **12** මන්ද ඒ පැයේදීම දෙවි
තම බලය ඔබට ලබා දී,[12] ඔබ පැව-
සිය යුතු දේ ඔබට කියා දෙයි.”[13]

**13** එවිට සමූහයා අතර සිටි කෙ-
නෙක් යේසුස්ට මෙසේ කීවේය. “ගුරු-
තුමනි, අපේ පියාගෙන් ලැබුණු
උරුමය මා සමඟ බෙදාගන්න
කියා මගේ සහෝදරයාට කියන්න.”
**14** ඔහු, “ඔබේ විනිශ්චයකාරයා
නැත්නම් ඔබ අතරේ දේපොළ බෙදා
දෙන තැනැත්තා ලෙස මාව පත්
කළේ කවුද”[1] කියා ඔහුගෙන් ඇසු-
වේය. **15** පසුව යේසුස් සියලුදෙනා-
ටම මෙසේ පැවසුවේය. “ඔබ දකින
දේවල් ගැන සෝදිසියෙන් සිටින්න.
විවිධ හේතු නිසා තණ්හාව ඇති වෙ-
නවා. එයින් පරෙස්සම් වන්න.[2] මන්ද
කෙනෙකුට කොතරම් දේවල් තිබු-
ණත් ඔහුට තිබෙන දේවලින් ඔහු-
ගේ ජීවිතය රැකගන්න ඔහුට බැහැ.”[3]
**16** ඉන්පසු ඔහු ඔවුන්ට මෙම උපමාව
විස්තර කළේය. “එක්තරා ධනව-
තෙක් සිටියා. ඔහුට අයිති ඉඩ-
මෙන් හොඳ අස්වැන්නක් ලැබුණා.
**17** ඒ නිසා ඔහු මෙහෙම හිතුවා.
‘මගේ අස්වැන්න රුස් කරන්න තැනක්
නැහැ. මම දැන් මොනවාද කරන්-
නේ? **18** මුලින්ම මට තිබෙන ගබ-
ඩාවන් මම කඩා දමනවා.[4] ඊටපස්සේ
මම ඊටත් වඩා විශාල ගබඩාවන් ගො-
ඩනඟනවා. එතකොට මට පුළුවන්
මගේ මුළු ධාන්‍ය අස්වැන්න සහ මගේ
අනිකුත් හැම සම්පතක්ම එහි රුස්
කර තබන්න.[5] **19** එතකොට අවු-
රුදු ගණනාවක් ජීවත් වෙන්න අවශ්‍ය
දේවල් ඇති තරම් මට තියෙයි.[6] මට
පුළුවන් වෙයි හොඳින් කා බී, ප්‍රීති
වෙමින් විවේක සුවයෙන් ඉන්න.’[7]
**20** නමුත් දෙවි ඔහුට මෙසේ පැව-
සුවා. ‘ඔබ ඉතා අඥාන කෙනෙක්!
අද රාත්‍රියේ ඔබේ ජීවිතය අවසන්
වෙයි.[8] එවිට ඔබ රුස් කළ මේ දේවල්
ලැබෙන්නේ කාටද?’[9] **21** තමාගේ
ජීවිතයේ මුල් තැන දෙවිට දෙ-
නවා වෙනුවට[10] තමාගේ සැප පහසුව
සඳහා වස්තු රුස් කරගන්නා තැනැත්-
තාට සිදු වන්නෙත් ඒ දේමයි.”

**22** එවිට යේසුස් තම ගෝලයන්ට
මෙසේ කීවේය. “ඒ නිසා මා ඔබට
කියන්නේ මෙයයි. කන්නේ මොන-
වාද කියා ඔබේ ජීවිත ගැනවත් අඳින්-
නේ මොනවාද කියා ඔබේ ශරීර
ගැනවත් තවදුරටත් කනස්සලු නො-
වන්න.[11] **23** කෑමට වඩා ජීවිතයත්
ඇඳුම්වලට වඩා ශරීරයත් වටිනවා.

**12 පරි.**
1 යෙසා 66:24; මතෙ 10:28
2 යෙසා 8:13; 1පේත්‍ර 2:17; එළි 14:7
3 ද්වි 22:6; මතෙ 10:29
4 1සාමු 14:45; 2සාමු 14:11; ලූක් 21:18; ක්‍රියා 27:34
5 මතෙ 10:31; ලූක් 12:24
6 රෝම 10:9
7 මතෙ 10:32; මාක් 8:38
8 ක්‍රියා 3:13
9 ලූක් 9:26; 2තිමෝ 2:12; 1යොහ 2:23
10 මතෙ 12:31; මාක් 3:29; 1යොහ 5:16
11 මතෙ 10:19; මාක් 13:11; ලූක් 21:14
12 1යොහ 2:27
13 නික් 4:12; ක්‍රියා 6:10; 1පේත්‍ර 5:7

**2 තීරුව**
1 යොහ 18:36; ක්‍රියා 7:27
2 නික් 20:17; ද්වි 5:21; හිතෝ 28:16; කොලො 3:5
3 1තිමෝ 6:7
4 යාකො 4:15
5 යාකො 4:16
6 හිතෝ 27:1
7 ගීතා 49:18; දේශ 11:9; ලූක් 16:19; යාකො 4:13; යාකො 5:5
8 හෙබ්‍රෙ 9:27
9 ගීතා 39:6; ගීතා 52:7; යෙරෙ 17:11; යාකො 4:14
10 මතෙ 6:20; 1තිමෝ 6:18; යාකො 2:5
11 මතෙ 6:25; රෝම 14:17; පිලි 4:6

**ලූක් 12:5*** යෙරුසලමෙන් පිටත කසළ පුලුස්සා දැමීම සඳහා භාවිත කළ ස්ථානය. උපග්‍ර. 2 බලන්න.

**24** කපුටන් ගැන ටිකකට සිතන්න.[1]
උන් බීජ වපුරන්නේවත් අස්වැන්න
නෙළාගන්නේවත් නැහැ. උන්ට අටු-
වක්වත් ගබඩාවක්වත් නැහැ. නමුත්
දෙවි උන්ව පෝෂණය කරනවා. ඒ
කුරුල්ලන්ට වඩා ඔබ කොතරම්
වටිනවාද![2] **25** කනස්සලු වීමෙන්
තම ආයු කාලය සුළු මොහො-
තකින්වත්* වැඩි කරගන්න ඔබ
අතරේ සිටින කාටවත් පුළුවන්ද?[3]
**26** ඉතින් ඔබට එවැනි සුළු දෙයක්-
වත් කරගන්න බැරි නම් අනිකුත්
දේවල් ගැන කනස්සලු වන්නේ ඇයි?[4]
**27** ලිලී මල් වැවෙන ආකාරය ගැන
ටිකක් සිතන්න.[5] ඒවා මහන්සි වී
වැඩ කරන්නේවත් තමන්ට ඇඳුම්
මසාගන්නේවත් නැහැ. නමුත් මා
ඔබට කියන්නේ, මේ මල්වල තිබෙන
අලංකාරය සලමොන් තම රාජකීය
තේජසින් යුතුව පැළඳ සිටි ඇඳුම්වල-
වත් නොතිබුණු බවයි.[6] **28** අද තිබී
හෙට දවා දමන තණබිමේ පැළෑටි
දෙවි එසේ සරසනවා නම් ඔහු කෙ-
රෙහි යම් විශ්වාසයක් ඇති ඔබව
පළඳවන්න ඔහු ඊටත් වඩා සතුටු
වන්නේ නැද්ද?[7] **29** ඒ නිසා කන
බොන දේ ගැනවත් අඳින පළඳින දේ
ගැනවත් සිතසිතා කනස්සලු වෙන්න
එපා.[8] **30** ලෝකයේ සිටින බොහෝ
මිනිසුන් මහත් උනන්දුවකින් හඹා
යන්නේ ඒ දේවල් පසුපසයි. නමුත්
ඒ සියල්ල ඔබට අවශ්‍ය බව ස්වර්-
ගයේ සිටින ඔබේ පියාණන් දන්නා
බව මතක තබාගන්න.[9] **31** එහෙ-
යින් ඔහුගේ රාජ්‍යයට නොකඩවා මුල්
තැන දෙන්න. එවිට අවශ්‍ය දේවල්
ඔබට දෙනු ලබයි.[10]

**32** "කුඩා රැළ[11] භය නොවන්න.[12]
මන්ද ඔබට රාජ්‍යය ලබා දෙන්න
ඔබේ පියාණන් තම අනුමැතිය දී
තිබෙනවා.[13] **33** ඔබ සතු දේවල්
විකුණා[14] දිළිඳුන් වෙනුවෙන් යම් යහ-
පතක් කරන්න.[15] එමගින් කිසිදා දිරා
නොයන පසුම්බිවල ස්වර්ගයේ වස්තු
රැස් කරගන්න ඔබට හැකි වෙයි.[1] ඒවා
කිසිදා නැති නොවෙයි. සොරුන්ට
කඩාවැද ඒවා සොරාගන්න බැහැ.
කාවන්ටත් ඒවා නාස්ති කර දමන්න
බැහැ. **34** ඔබේ වස්තුව කොතැනද
ඔබේ සිතත් එතැනමයි.[2]

**35** "සූදානම් වී සිට*[3] ඔබේ පහන්
දල්වා තබාගන්න.[4] **36** ඔබත්
විවාහ උත්සවයකට ගොස් ආපසු
පැමිණෙන ස්වාමියා[5] එන තෙක් බලා
සිටින දාසයන් හා සමානව සිටිය
යුතුයි.[6] ඒ දාසයන් බලා සිටින්-
නේ ස්වාමියා පැමිණ දොරට තට්ටු
කරන විට[7] දොර වහාම විවෘත කිරී-
මටයි. **37** ස්වාමියා පැමිණෙන විට
ඔවුන් සෝදිසියෙන් සිටි බව ඔහු
දැක්කොත්[8] ඒ දාසයන්ට කොතරම්
සතුටු විය හැකිද! ඇත්තටම මම
ඔබට කියන්නේ, ඒ ස්වාමියා සූදා-
නම් වී[9] ඔවුන්ට තම මේසය වටා
ඉඳගන්න කියා පවසා ඔවුන්
ළඟට ගොස් ඔවුන්ට ඇප උපස්-
ථාන කරන බවයි.[10] **38** ඔහු රාත්‍රි-
යේ දෙවෙනි රැකවල් යාමයේදී* හෝ
තුන්වෙනි රැකවල් යාමයේදී# හෝ
පැමිණ බලන විට ඔවුන් සෝදි-
සියෙන් සිටින ආකාරය දැක්කොත්
ඔවුන්ට කොතරම් සතුටු විය හැකිද![11]
**39** ඔබ මේ දේත් සිතට ගත යුතුයි.
එනම් යම් ගෙහිමියෙක් තම නිවසට
සොරෙක් එන පැය දැනගෙන සිටි-
යොත් ඔහු අවදිව සිටියි. තමාගේ
නිවසට කඩාවදින්න ඔහු ඉඩ තබන්-
නේ නැහැ.[12] **40** ඒ වගේම ඔබත්
නිතරම සූදානමින් සිටිය යුතුයි. මන්ද
මනුෂ්‍ය පුත්‍රයාත් එන්නේ ඔබ නොසි-
තන පැයකදීයි."[13]

**41** එවිට පේතෘස්, "ස්වාමීනි, ඔබ
මේ උපමාව කියන්නේ අපටද නැත්-
නම් සියලුදෙනාටමද" කියා ඇසුවේය.
**42** යේසුස් මෙසේ කීවේය. "ස්වාමියා
විසින් තම සේවක පිරිසට නියම වේ-
ලාවට[14] ඔවුන්ට නියමිත වූ ආහාර

**12 පරි.**

**1** යෝබ් 38:41 ගීතා 147:9
**2** මතෙ 6:26 ලූක් 12:7
**3** මතෙ 6:27
**4** මතෙ 6:34
**5** මතෙ 6:28
**6** 1රාජා 10:4 2ලේක 9:3 මතෙ 6:29
**7** මතෙ 6:30
**8** මතෙ 6:31
**9** 2ලේක 16:9 යෙසා 65:24 මතෙ 6:32 පිලි 4:19
**10** ගීතා 34:10 යෙසා 33:16 මතෙ 6:33 1තිමෝ 4:8
**11** යොහ 10:16
**12** යෙසා 41:14
**13** දානි 7:27 ලූක් 22:29 හෙබ්‍රෙ 12:28 යාකො 2:5 එළි 1:6
**14** මතෙ 19:21 ලූක් 18:22 ක්‍රියා 2:45 ක්‍රියා 4:34
**15** ලූක් 11:41 ලූක් 16:9

**2 තීරුව**

**1** මතෙ 6:20 1තිමෝ 6:19
**2** මතෙ 6:21
**3** නික් 12:11 1රාජා 18:46 හිතෝ 31:17 එෆී 6:14 1පේතෘ 1:13
**4** මතෙ 25:1 පිලි 2:15
**5** මතෙ 25:5
**6** මාක් 13:35
**7** එළි 3:20
**8** මතෙ 24:46 මතෙ 25:10
**9** යොහ 13:4
**10** මතෙ 20:28 2තිමෝ 4:8
**11** මාක් 13:35
**12** මතෙ 24:43 1තෙස 5:2 2පේතෘ 3:10 එළි 16:15
**13** මතෙ 24:44 මතෙ 25:13 මාක් 13:13 2පේතෘ 3:12 එළි 3:3
**14** මතෙ 24:45 මතෙ 25:21 ලූක් 19:17

---

ලූක් **12:25*** මූ.අ., "රියනකින්වත්."

ලූක් **12:35*** මූ.අ., "ඔබේ ඉඟටි බැඳගෙන."
**38*** එනම්, ප.ව. 9 සිට මධ්‍යම රාත්‍රිය දක්වාය.
**38#** එනම්, මධ්‍යම රාත්‍රියේ සිට පෙ.ව. 3 දක්වාය.

කොටස නොකඩවා ලබා දීමට ඔවුන්
කෙරෙහි පත් කරන විශ්වාසවන්ත
හා නුවණ ඇති[1] සේවකයා*[2] කවුද?
**43** ඔහුගේ ස්වාමියා පැමිණෙන විට
ඔහු තම වගකීම් හොඳින් ඉටු කරනවා
දැක්කොත් ඒ දාසයාට කොතරම්
සතුටු විය හැකිද![3] **44** ඇත්තෙන්ම
මා ඔබට කියන්නේ, ඒ ස්වාමියා
තමා සතු සියලු දේවල් බලා කියා
ගැනීම සඳහා ඔහුව පත් කරන බවයි.[4]
**45** නමුත් ඒ දාසයා, 'මගේ ස්වා-
මියා එන්න ප්‍රමාද වෙයි'[5] කියා සිත-
මින් නිවසේ සිටින මෙහෙකරුවන්ට
සහ මෙහෙකාරියන්ට තළමින් කා බී
වෙරි වී සිටියොත්,[6] **46** ඒ දාසයා-
ගේ ස්වාමියා, ඔහු බලාපොරොත්තු
නොවූ දවසක ඔහු නොදන්නා පැයකදී
ඇවිත්[7] ඔහුට ඉතා තදින් දඬුවම් කර
දෙවිට අවිශ්වාසවන්ත වූ අය සමඟ
සිටීමට නියම කරයි.[8] **47** එවිට තම
ස්වාමියා තමාගෙන් බලාපොරොත්තු
වූ දේ දැන දැනත් එය ඉටු කිරී-
මට සූදානම් නොවූ, කිසිවක් කිරීමට
පියවර නොගත් ඒ දාසයාට බො-
හෝ පහර ලැබෙයි.[9] **48** නොදැනු-
වත්කම නිසා[10] පහර ලැබීමට සුදුසු
දේවල් කළ දාසයාට පහර ලැබෙන්නේ
ස්වල්ප වශයෙනුයි.[11] මන්ද කෙනෙ-
කුට බොහෝ දේවල් භාර දෙන විට
ඔහුගෙන් වැඩියෙන් බලාපොරොත්තු
වෙනවා.[12] මිනිසුන් කෙනෙකුට බො-
හෝ දේවල් භාර දී යම් වගකීමක් ඉටු
කරන්න ඔහුව පත් කරන විටත් ඔහු-
ගෙන් සාමාන්‍යයට වඩා වැඩි යමක්
බලාපොරොත්තු වෙනවා.[13]

**49** "මා ආවේ පොළොවේ ගින්-
නක් අවුළන්නයි.[14] එය දැනටමත්
ඇවිළී තිබෙනවා නම් මට තව අවශ්‍ය
වන්නේ මොනවාද? **50** මා තවත්
ආකාරයකින් බව්තීස්ම විය යුතුයි. ඒ
බව්තීස්මය සිදු වන තුරු මා සිටින්-
නේ දැඩි පීඩනයකිනුයි![15] **51** මම
පොළොවට සාමය ගෙන දෙන්න
ආවා කියා ඔබ සිතනවාද? ඇත්ත-
ටම මම ආවේ භේද ඇති කරන්නයි.[1]
**52** මෙතැන් පටන් එකම නිවසේ
සිටින පස්දෙනෙකුගෙන් දෙදෙනෙ-
කුට විරුද්ධව තුන්දෙනෙක් සිටියි.
තුන්දෙනෙකුට විරුද්ධව දෙදෙනෙක්
සිටියි.[2] **53** පියා පුතාට විරුද්ධ
වෙයි. පුතා පියාට විරුද්ධ වෙයි. මව
දුවට විරුද්ධ වෙයි. දුව ඇගේ මවට
විරුද්ධ වෙයි. නැන්දම්මා ඇගේ ලේ-
ලිට විරුද්ධවත් ලේලි ඇගේ නැන්දම්-
මාට විරුද්ධවත් සිටියි."[3]

**54** ඉන්පසු ඔහු රැස්ව සිටි සමූහ-
යාට මෙසේ කීවේය. "සාමාන්‍යයෙන්
බස්නාහිර දෙසින් වලාකුළක් එනවා
ඔබ දකින විට ඔබ එවෙලේම, 'කුණා-
ටුවක් එනවා' කියා කියයි. ඉන්පසු
ඔබ පැවසූ දේම සිදු වෙයි.[4] **55** ඒ
වගේම දකුණු දෙසින් සුළඟක් හැමු-
වොත් 'දැඩි උණුසුමක් ඇති වෙයි'
කියා ඔබ කියයි. ඉන්පසු ඔබ පැවසූ
දේම සිදු වෙයි. **56** ඔබේ කුහක-
කම මොන තරම්ද! අහස සහ පො-
ළොව දෙස බලා සිදු වන වෙනස්කම්
තෝරා දෙන්න ඔබ දැනගෙන සිටි-
යත් මේ කාලයේ වැදගත්කම අව-
බෝධ කරගන්න ඔබට බැරි ඇයි?[5]
**57** ධර්මිෂ්ඨ දේ කුමක්ද කියා ඔබට
තේරුම්ගන්න බැරි ඇයි?[6] **58** යම්
කෙනෙක් ඔබට විරුද්ධව නඩුවක්
දමා ඇත්නම් ඒ නඩුවට යන්න කලින්
ඔහුව හමු වී ඒ ප්‍රශ්නය නිරවුල්
කරගැනීමට උත්සාහ කරන්න. එසේ
නොකළොත් ඔහු ඔබව විනිශ්චයකරු
ඉදිරියට ඇදගෙන ගොස් ඔබව වරද-
කරුවෙක් කරයි. විනිශ්චයකරු ඔබව
සිරගෙයි දැමීමට අධිකරණයේ නිල-
ධාරියාට භාර දිය හැකියි.[7] **59** මා
ඔබට කියන්නේ, අන්තිම සතය*
ගෙවා දමන තුරු ඔබට එතැනින් නිද-
හස් වෙන්න බැරි වන බවයි."[8]

# 13

ඒ අවස්ථාවේදී මිනිසුන් කිහි-
පදෙනෙක් යේසුස් වෙතට
පැමිණ පූජා ඔප්පු කරමින් සිටි

ලූක් **12:42*** හෝ, "නිවස භාර සේවකයා."

ලූක් **12:59*** හෝ, "ඉතා සුළු වටිනාකමක් ඇති කුඩා කාසිය."

**12 පරි.**
1 උත් 41:33; ද්වි 1:13
2 උත් 24:2; 1කොරි 4:2; 2තෙස 2:15; 1පේතෘ 4:10
3 මතෙ 24:46
4 මතෙ 24:47
5 මතෙ 24:48
6 මතෙ 24:49
7 මතෙ 24:50
8 මතෙ 24:51; එළි 21:8
9 ද්වි 25:2; යොහ 9:41; යාකො 1:22; යාකො 4:17
10 ලෙවී 5:17
11 1තිමෝ 1:13
12 මතෙ 25:29
13 යොහ 15:2
14 මතෙ 10:34
15 මතෙ 20:22; මාක් 10:38; යොහ 12:27

**2 තීරුව**
1 මීකා 7:6; මතෙ 10:34; යොහ 7:43; යොහ 9:16
2 මතෙ 10:36
3 මතෙ 10:35
4 මතෙ 16:2
5 මතෙ 16:3; ලූක් 19:42
6 ලූක් 21:30; 1කොරි 6:5
7 හිතෝ 25:8; මතෙ 5:25
8 මතෙ 18:34; මාක් 12:42

ගලීලයේ වැසියන්[1] පිරිසක්ව පිලාත්
විසින් මරා දැමූ ආකාරය ගැන ඔහුට
දැන්වූහ. **2** ඔහු ඔවුන්ට මෙසේ පිළි-
තුරු දුන්නේය. "ගලීලයේ සිට පැමිණි
ඒ අයට ඒ වගේ දෙයක් සිදු වුණේ
ඔවුන් ගලීලයේ සිටි අනික් වැසි-
යන්ට වඩා පව්කාරයන් වූ නිසාද?[2]
**3** නැහැ, එහෙම කියන්න බැහැ.
නමුත් ඔබ පසුතැවිලි වුණේ නැත්-
නම් ඔබත් ඔවුන් වගේ විනාශ වෙයි.[3]
**4** සිලෝම් පොකුණ ළඟ තිබුණු ටැඹ
කඩා වැටුණු විට දහඅටදෙනෙක් ඊට
යට වී මිය ගිය ආකාරය ඔබට මතක
ඇති. ඔවුන්ට ඒ දේ සිදු වුණේ යෙ-
රුසලමේ සිටින අන් සියලුම මිනි-
සුන්ට වඩා ඔවුන් පව්කාරයන් වූ
නිසාද? **5** නැහැ, එහෙම කොහො-
මටවත් කියන්න බැහැ. නමුත් ඔබ
පසුතැවිලි වෙන්නේ නැත්නම් ඔබත්
එලෙසම විනාශ වෙයි."[4]

**6** එවිට ඔහු මේ උපමාව කීවේය.
"එක්තරා මිනිසෙක් තම මිදිවත්තේ
අත්තික්කා ගසක් පැළ කළා.[5] කලක්
ගත වන විට ඔහු නිතර නිතර පැමිණ
ගස පල දරා තිබෙනවාද කියා සෝදිසි
කර බැලුවා.[6] නමුත් එහි පල තිබුණේ
නැහැ.[7] **7** පසුව ඔහු තම මිදිවත්තේ
වැඩ කරන්නාට මෙසේ පැවසුවා. 'මා
දැන් අවුරුදු තුනක්ම[8] මේ අත්තික්කා
ගහේ ගෙඩි එයි කියා බලා සිටියා.
ඒත් එක ගෙඩියක්වත් ආවේ නැහැ. ඒ
නිසා ගස කපා දමන්න![9] පලක් නැති
මේ ගස තියාගෙන වැඩක් නැහැ.'
**8** එවිට වැඩ කරන්නා පැවසුවේ මෙ-
යයි. 'ස්වාමීනි, අපි තව අවුරුද්දක්
බලමු.[10] මම ගස වටේ හාරා පොහොර
දමා එයට සාත්තු කරන්නම්. **9** ඒ
දේ කළ පසුත් එය පල දැරුවේ නැත්-
නම් එය කපා දමමු.' "[11]

**10** ඔහු සබත් දවසේදී එක් සිනා-
ගෝගයක උගන්වමින් සිටි විට,
**11** භූතයෙකුගේ බලපෑම නිසා[12] අවු-
රුදු දහඅටක් පුරා දුබල වී සිටි ස්ත්‍රී-
යක් පැමිණියාය. දෙකට නැමී සිටි
ඇයට කෙළින් සිටගැනීමටවත් හැකි-
යාවක් තිබුණේ නැත. **12** යේසුස්
ඇයව දුටු විට, "ඔබේ පීඩාවෙන් ඔබ
දැන් නිදහස්"[1] කියා ඇයට පවසා,
**13** ඇය පිට තම අත් තැබුවේය. ඒ
මොහොතේදීම ඇය කෙළින් වී[2] දෙ-
විට ප්‍රශංසා කරන්න පටන්ගත්තාය.
**14** යේසුස් ඒ සුව කිරීම සබත් දවසේදී
කළ නිසා සිනාගෝගයේ සිටි නිල-
ධාරියෙක් මහත් කෝපයකින් රැස්ව
සිටි සෙනඟට මෙසේ පැවසුවේය.
"වැඩ කරන්න සතියට දවස් හයක්ම
තිබෙනවා.[3] සබත් දවසක නැතුව
ඒ දවසක ඇවිත් සුව කරගන්න."[4]
**15** නමුත් යේසුස් ඊට මෙසේ පිළි-
තුරු දුන්නේය. "ඔබ කොතරම් කුහ-
කද![5] සබත් දවසේදී ගොනෙකුට හෝ
බූරුවෙකුට වතුර ටිකක් දෙන්න ඔබ
උන්ව ලිහා වතුර තිබෙන තැන-
කට උන්ව ගෙන යන්නේ නැද්ද?[6]
**16** දැන් මේ ගැන ටිකක් සිතන්න!
ආබ්‍රහම්ගේ දියණියක්[7] වන මේ ස්ත්‍රිය
අවුරුදු දහඅටක් තිස්සේ සාතන්ගේ
බැඳුම්වලින් සිර වී සිටියා. සබත් දව-
සේදී ඇයව නිදහස් කිරීමේ ඇති වරද
කුමක්ද?" **17** ඔහු ඒ දේ පැවසූ විට
ඔහුට විරුද්ධ වී සිටි සියලුදෙනා තුළ
මහත් ලැජ්ජාවක් ඇති විය.[8] නමුත්
රැස්ව සිටි සමූහයා ඔහු කළ සියලු
පුදුම දේවල් දැක ප්‍රීති වූහ.[9]

**18** ඉන්පසු ඔහු මෙසේ කීවේය.
"දෙවිගේ රාජ්‍යය කුමකට සමා-
නද? මට එය සමාන කළ හැක්-
කේ කුමකටද?[10] **19** එය මිනිසෙකු
තම වත්තෙහි පැළ කළ අබ ඇටය-
කට සමානයි. එය හොඳින් අතු ඉති
ලියලා ගසක් ලෙස වැඩුණා. අහ-
සේ කුරුල්ලන්[11] ඇවිත් එහි ලැගුම්
ගත්තා."[12]

**20** නැවතත් ඔහු මෙසේ කීවේය.
"මා දෙවිගේ රාජ්‍යය සමාන කරන්නේ
කුමකටද? **21** ස්ත්‍රියක් පිටි ඒකක
තුනක් ගෙන එයට මුහුන් මිශ්‍ර කරයි.*
මිශ්‍ර කළ එම මුහුන් නිසා මුළු පිටි
පිඩම පිපෙයි. දෙවිගේ රාජ්‍යයත් එම
මුහුන්වලට සමානයි."[13]

**13 පරි.**
1 ක්‍රියා 5:37
2 යොහ 9:2
3 ක්‍රියා 3:19
4 එස 18:30
5 යෙසා 5:1
6 හබ 3:17
මාක් 11:13
7 මතෙ 21:19
8 ලෙවී 19:23
9 යොහ 15:2
10 නික් 32:11
යෝවෙ 2:17
11 2පේතෘ 3:9
12 ක්‍රියා 16:16

**2 තීරුව**
1 යෙසා 61:1
ලූක් 4:18
2 ලූක් 4:39
3 නික් 20:9
නික් 23:12
නික් 35:2
4 ද්වි 5:14
මතෙ 12:10
මාක් 3:2
යොහ 5:16
5 මතෙ 23:28
ලූක් 12:1
6 ලූක් 14:5
7 ලූක් 19:9
8 1පේතෘ 3:16
9 ලූක් 9:43
10 මතෙ 13:31
මාක් 4:30
11 එස 17:23
එස 31:6
දානි 4:12
12 මතෙ 13:32
මාක් 4:32
13 මතෙ 13:33

**ලූක් 13:21*** මූ.අ., "ඒ තුළ මුහුන් සඟවා තබයි."

**22** ඉන්පසු ඔහු යෙරුසලම බලා යන ගමනේදී නුවරින් නුවරටත් ගමින් ගමටත් ගොස් ඒවායෙහි ඉගැන්වූවේය.[1] **23** මේ අතර එක්තරා මිනිසෙක් ඔහුගෙන් මෙසේ ඇසුවේය. “ස්වාමීනි, ගැලවීම ලැබෙන්නේ සුළු පිරිසකට විතරද?”[2] ඔහු අවට සිටි සියලුදෙනාට මෙසේ කීවේය. **24** “පටු දොරටුවෙන් ඇතුල් වීමට[3] දැඩි උත්සාහයක් දරන්න.[4] බොහෝදෙනෙකු ඇතුල් වෙන්න උත්සාහ කළත් ඔවුන්ට එයින් ඇතුල් විය නොහැකියි.[5] **25** මන්ද ගෙහිමියා නැඟිට, දොරට අගුලු දැමුවායින් පසු ඔබ දොරකඩ ළඟට ඇවිත් දොරට තට්ටු කරමින්, ‘මහත්මයාණෙනි, දොර අරින්න’[6] කියා පැවසුවත්, ‘ඔබ කොහේ සිට ආවාද කියාවත් මම දන්නේ නැහැ’[7] කියා ඔහු ඔබට කියයි. **26** එවිට ඔබ මෙසේ කියයි. ‘අපි ඔබ සමඟ එකට කෑවා, බිව්වා. ඔබ අපේ නුවරට ඇවිත් එහි ප්‍රධාන මංසන්ධිවල ඉඳගෙන අපට ඉගැන්නුවා නේද?’[8] **27** නමුත් ඔහු, ‘ඔබ කොහේ සිට ආවාද කියාවත් මම දන්නේ නැහැ. ඔබ සියලුදෙනාම අධර්මිෂ්ඨයි. කරුණාකර මෙහෙන් පිට වී යන්න’[9] කියා ඔබට කියයි. **28** එදාට ආබ්‍රහම්, ඊසාක්, යාකොබ් සහ සියලු අනාගතවක්තෘවරුන් දෙවිගේ රාජ්‍යයේ සිටිනවා ඔබ දකියි.[10] නමුත් ඔබ සිටින්නේ පිටතයි. එහිදී ඔබට අඬමින් හා දත්මිටි කමින් කල් ගෙවන්න සිදු වෙයි.[11] **29** පොළොවේ සියලු දිශාවලින්[12] පැමිණෙන ජනයා දෙවිගේ රාජ්‍යයට ඇතුල් වී එහි පිළියෙල කර ඇති මේසය වටා ඉඳගනියි.[13] **30** ඒ අනුව බලද්දී අන්තිමයන්ගෙන් කිහිපදෙනෙක් ප්‍රථමයන් බවටත් ප්‍රථමයන්ව සිටි කිහිපදෙනෙක් අන්තිමයන් බවටත් පත් වෙයි.”[14]

**31** එම පැයේදීම පරිසිවරුන් කිහිපදෙනෙක් ඇවිත් ඔහුට මෙසේ පැවසූහ. “හෙරොද් ඔබව මරන්න සොයනවා. ඒ නිසා මෙතැනින් ඉක්මනට පිට වී යන්න.” **32** යේසුස් ඔවුන්ට මෙසේ පැවසුවේය. “ගොස් ඒ කපටියාට*[1] මෙසේ කියන්න. ‘අදත් හෙටත් මේ පළාතේ මම භූතයන්ව දුරු කරමින් අසනීප වී සිටින අයව සුව කරනවා. තුන්වෙනි දවසේදී මගේ සියලුම වැඩකටයුතු මම නිමා කරනවා.’[2] **33** නමුත් අදත් හෙටත් අනිද්දාත් මගේ ගමන මා යා යුතුයි. මන්ද අනාගතවක්තෘවරයෙකු මරා දමනවා නම් ඒ සඳහා සුදුසුම තැන යෙරුසලමයි.[3] **34** යෙරුසලම, යෙරුසලම, අනාගතවක්තෘවරුන්ව මරා දැමූ,[4] තමන් වෙතට එවූ අයට ගල් ගැසූ[5] නුවර! කිකිළියක් තම පැටවුන්ව තම පියාපත් යටට එකතු කරගන්නා සේ[6] ඔබේ දරුවන්ව එකතු කරගන්න මා කී වරක් නම් කැමති වුණාද! නමුත් ඔබ ඊට කැමති වුණේ නැහැ![7] **35** බලන්න! ඔබට ඉතුරු වන්නේ පාළු වූ සියලුදෙනා අත්හැර දැමූ දේවමාලිගාවක් පමණයි.[8] එමෙන්ම ‘යෙහෝවා දෙවිගේ නාමයෙන් එන තැනැත්තාට ආශීර්වාද ලැබේවා’[9] කියා ඔබ කියන තුරු ඔබ මාව නැවත දකින්නේ නැහැ කියා මම ඔබට කියනවා.”

**14** යේසුස් සබත් දවසකදී පරිසිවරුන් අතර සිටි ප්‍රධානියෙකුගේ නිවසේ තිබූ භෝජන සංග්‍රහයකට ගියේය.[10] එහි සිටි සියලුදෙනාම ඔහු දෙස බලා සිටියේ මහත් විමසිල්ලකිනි.[11] **2** මේ අතර සිරුර ඉදිමී රෝගාතුරව* සිටි එක්තරා මිනිසෙක් ඔහු ඉදිරියෙහි සිටියේය. **3** ඔහුව දුටු යේසුස් නීතිය ගැන මනා දැනුමක් ඇති අයගෙන් සහ පරිසිවරුන්ගෙන් මෙසේ ඇසුවේය. “සබත් දවසේදී කෙනෙකුව සුව කිරීම නීතියට එකඟද නැද්ද?”[12] **4** නමුත් ඔවුහු ඊට පිළිතුරක් නොදුන්නෝය. එවිට ඔහු ඒ මිනිසාව අතින් අල්ලා ඔහුව සුව කර

**13 පරි.**

1 මතෙ 9:35, මාක් 6:6
2 මතෙ 7:14, මතෙ 19:25
3 මතෙ 7:13, පිලි 3:12
4 යෙසා 55:6
5 යොහ 7:34, රෝම 9:31, 1තිමෝ 6:12
6 මතෙ 25:11, ලූක් 6:46
7 ගීතා 32:6, යෙසා 55:6
8 මතෙ 7:22, තීත 1:16
9 ගීතා 6:8, මතෙ 7:23
10 මතෙ 8:11
11 යෙසා 65:14, මතෙ 8:12, මතෙ 13:42
12 උත් 28:14, ගීතා 107:3, යෙසා 49:12, යෙසා 59:19
13 ලූක් 14:15, ලූක් 22:16, ක්‍රියා 2:39, එළි 5:9
14 මතෙ 19:30, මාක් 10:31

**2 තීරුව**

1 ශෙප 3:3
2 හෙබ්‍රෙ 2:10
3 මතෙ 16:21
4 නෙහෙ 9:26, යෙසා 1:21
5 2ලේක 24:21
6 යෙසා 40:11
7 මතෙ 23:37
8 ලෙවී 26:31, 1රාජා 9:7, ගීතා 69:25, යෙසා 1:7, යෙරෙ 12:7, යෙරෙ 22:5, මීකා 3:12
9 ගීතා 118:26, මතෙ 21:9, මතෙ 23:39, ලූක් 19:38, යොහ 12:13

**14 පරි.**

10 ලූක් 7:36, ලූක් 11:37
11 ගීතා 37:32, යෙරෙ 20:10
12 මතෙ 12:10, ලූක් 6:9, ලූක් 13:15, යොහ 7:23

**ලූක් 13:32*** මූ.අ., “නරියාට.” **14:2*** මෙම රෝගය නිසා සිරුරේ තිබෙන වතුර එකතු වී මුළු සිරුරම ඉදිමෙයි.

පිටත් කර හැරියේය. **5** පසුව යේ-
සුස් ඔවුන්ගෙන් මෙසේ ඇසුවේය.
“සබත් දවසේදී ඔබේ පුතා හෝ ඔබට
අයිති ගොනෙකු ළිඳකට වැටුණොත්[1]
ඔබ මොනවාද කරන්නේ? ඔබ වහාම
ගොස් ඔහුව හෝ ඌව පිටතට ගන්-
නේ නැද්ද?”[2] **6** ඊට පිළිතුරු දීමට
ඔවුන්ට නොහැකි විය.[3]

**7** ඉන්පසුව භෝජන සංග්‍රහයට
ආරාධනා ලැබූ අය ප්‍රධානතම ආසන
තෝරාගන්නා ආකාරය දුටු යේ-
සුස් ඔවුන්ට මෙම උපමාව විස්තර
කළේය.[4] **8** “කෙනෙක් ඔබට විවාහ
උත්සවයකට ආරාධනා කළ විට
ප්‍රධානතම ආසනවල ඉඳගන්න එපා.[5]
සමහරවිට ඔබට වඩා වැදගත් කෙ-
නෙකුට ආරාධනාවක් ලැබී තිබෙන්න
පුළුවන්. **9** එවිට ආරාධනාව කළ
තැනැත්තා ඇවිත්, ‘මොහුට මේ ආස-
නය දෙන්න’ කියා ඔබට කිව්වොත්
ඔබට ලැජ්ජාවෙන් පහත්ම ආසනය
දක්වා යන්න සිදු වෙයි.[6] **10** එම-
නිසා ඔබට ආරාධනාවක් ලැබුණු විට
පහත්ම ආසනය තෝරාගන්න.[7] එහිදී
ඔබට ආරාධනා කළ මිනිසා ඇවිත්,
‘මුල් පෙළේ ආසනයකට යන්න’ කියා
ඔබට කියයි. එවිට සියලු අමුත්තන්
ඉදිරියෙහි ඔබට ගෞරවය ලැබෙයි.[8]
**11** උසස් වෙන්න උත්සාහ කරන
සියලුදෙනාම අවමානයට පත් වෙයි.
නමුත් නිහතමානී ලෙස කටයුතු
කරන තැනැත්තා ගෞරවයට පත්
වෙයි.”[9]

**12** ඊළඟට ඔහු තමන්ට ආරාධනා
කළ තැනැත්තාටද මෙසේ කීවේය.
“ඔබ දවල් කෑමක් හෝ සන්ධ්‍යා
භෝජනයක් හෝ පිළියෙල කරන
විට ඔබේ මිතුරන්ට, සහෝදරයන්ට,
නෑදෑයන්ට හෝ ධනවත් අසල්වැසි-
යන්ට ඒ සඳහා ආරාධනා කරන්න
එපා. සමහරවිට ඔවුනුත් පසු කලක
ඔබට ආරාධනා කරයි. එවිට එය
ඔබට කරන ගෙවීමක් හා සමාන
වෙයි. **13** නමුත් ඔබ භෝජන සංග්‍ර-
හයක් පිළියෙල කරන විට දිළිඳු, අබ්-
බගාත, කොර හා අන්ධ මිනිසුන්ට
ආරාධනා කරන්න.[1] **14** ඔබ කළ
සංග්‍රහය වෙනුවෙන් කිසිවක් දෙන්න
ඔවුන්ට හැකියාවක් නැති නිසා ඔබට
පුළුවන් සතුටු වන්න. මන්ද ධර්මිෂ්ඨ-
යන්ව නැවත නැඟිටුවන අවස්ථාවේදී
ඔබ කළ දේට ආශීර්වාද ලැබෙයි.”[2]

**15** ඒ දේවල් ඇසූ අමුත්තෙක්,
“දෙවිගේ රාජ්‍යයේදී භෝජනය-
කට සහභාගි වීමට ආරාධනා
ලබන තැනැත්තා සන්තෝෂවත් කෙ-
නෙක්”[3] කියා ඔහුට කීවේය.

**16** යේසුස් ඔහුට මෙසේ කීවේය.
“එක්තරා මිනිසෙක් විශාල සන්ධ්‍යා
භෝජනයක් පිළියෙල කළා. ඒ
සඳහා ඔහු බොහෝදෙනෙකුට ආරා-
ධනා කළා.[4] **17** සන්ධ්‍යා භෝජනය
ආරම්භ කිරීමට අවස්ථාව පැමිණි විට
ඔහු තම දාසයාව යවා, ‘එන්න,[5]
දැන් සියල්ල සූදානම්’ කියා ආරා-
ධිතයන්ට දැන්නුවා. **18** නමුත් ඒ
සියලුදෙනාම නැවිත් සිටීමට හේතු
මවන්න පටන්ගත්තා.[6] පළමුවෙනියා,
‘මම කෙතක් මිල දී ගත්තා. මට එය
බලන්න යන්න අවශ්‍යයි. මට සමා-
වෙන්න. මට එන්න විදිහක් නැහැ’[7]
කියා ඔහුට කිව්වා. **19** වෙන කෙ-
නෙක්, ‘මම ගොන්බාන පහක් මිල දී
ගත්තා. මම දැන් යන්නේ උන් වැඩට
හොඳද කියා බලන්නයි. ඒ නිසා සමා-
වෙන්න. මට එන්න විදිහක් නැහැ’[8]
කියා පැවසුවා. **20** තව කෙනෙක්,
‘මම මේ දැන් විවාහ වුණා.[9] ඒ නිසා
මට එන්න බැහැ’ කියා පැවසුවා.
**21** සිදු වූ දේ දාසයා ඇවිත් තම
ස්වාමියාට දැන්වූවා. එවිට ස්වාමියා
කෝපයෙන්, ‘දැන්මම නුවරේ ප්‍රධාන
වීථිවලටත් අතුරු පාරවලටත් යන්න.
එතැන සිටින දිළිඳු, අබ්බගාත, අන්ධ
සහ කොර මිනිසුන්ව මෙතැනට ගෙන
එන්න’[10] කියා තම දාසයාට පැවසුවා.
**22** ඉන්පසු දාසයා ඇවිත්, ‘ස්වාමීනි,
ඔබ අණ කළ දේ මම කළා. නමුත්
තවත් ඉඩ තිබෙනවා’ කියා පැව-
සුවා. **23** එවිට ස්වාමියා දාසයාට
පැවසුවේ මෙයයි. ‘මගේ නිවස පිරී
යන තරමටම සෙනඟ සිටිය යුතුයි.[11]

**14 පරි.**
1 නික් 23:5, ද්වි 22:4
2 මතෙ 12:11, ලූක් 13:15
3 මතෙ 22:46
4 මතෙ 23:6, ලූක් 11:43, ලූක් 20:46
5 හිතෝ 25:6
6 හිතෝ 25:7
7 මතෙ 23:12, ලූක් 18:14
8 හිතෝ 15:33, යාකො 4:10, 1පේතෘ 5:5
9 ගීතා 18:27, හිතෝ 29:23, මතෙ 23:12, යාකො 4:6

**2 තීරුව**
1 නෙහෙ 8:10, යෝබ් 31:16, හිතෝ 3:28
2 යොහ 5:29, යොහ 11:24, ක්‍රියා 24:15
3 ලූක් 13:29, එළි 19:9
4 මතෙ 22:2
5 හිතෝ 9:5
6 මතෙ 22:3
7 මතෙ 6:24, ලූක් 8:14, 1තිමෝ 6:9, 2තිමෝ 4:10
8 මතෙ 22:5
9 ද්වි 24:5, 1කොරි 7:33
10 මතෙ 22:9, මතෙ 28:19, ක්‍රියා 13:46, 1කොරි 1:26
11 2කොරි 5:20

ඒ නිසා පාරවල් හා දෙවැටවල් දිගේ
ගොස්[1] එහි සිටින අයටත් මගේ
නිවසට එන්න කියා බල කරන්න.
**24** මම මුලින් ආරාධනා කළ කිසිවෙ-
කුට මගේ සන්ධ්‍යා භෝජනය භුක්ති
විඳින්න මම කිසිම අවස්ථාවක් දෙන්-
නේ නැහැ.’ ”[2]

**25** විශාල සමූහයක් ඔහු සමඟ
ගමන් කරමින් සිටි අවස්ථාවකදී
ඔහු හැරී ඔවුන්ට මෙසේ පැවසුවේය.
**26** “කෙනෙකුට මා ළඟට එන්න
අවශ්‍ය නම් ඔහු තම පියාටත් මව-
ටත් බිරිඳටත් දරුවන්ටත් සහෝදර-
යන්ටත් සහෝදරියන්ටත් වඩා මට
ප්‍රේම කළ යුතුයි. ඇත්තෙන්ම ඔහු
තම ජීවිතයටත් වඩා මට ප්‍රේම කළ
යුතුයි.[3] එසේ නොකළොත් ඔහුට
මගේ ගෝලයෙක් වෙන්න බැහැ.[4]
**27** මගේ ගෝලයෙක් වෙන්න යමෙක්
කැමති නම් ඔහු තම වධකණුව* උසු-
ලාගෙන මා අනුව එන්න අවශ්‍යයි.
එසේ නොකළොත් ඔහුට මගේ ගෝ-
ලයෙක් වෙන්න බැහැ.[5] **28** උදාහර-
ණයකට මෙහෙම සිතන්න. ඔබ අතර
සිටින කෙනෙක් යම් ගොඩනැඟිල්-
ලක් සාදන්න අදහස් කරනවා. නමුත්
ඔහුට එය සම්පූර්ණයෙන්ම ගොඩ-
නඟා අවසන් කරන්න හැකි වෙයිද
කියා දැනගැනීමට මුලින්ම ඔහු ඒ
සඳහා යන වියදම ගණන් බලන්නේ
නැද්ද?[6] **29** එසේ කළේ නැත්නම්
ඔහුට හැකි වන්නේ එහි අත්තිවාරම
දමන්න පමණයි. එය සම්පූර්ණ කිරී-
මට ඔහුට හැකි වන්නේ නැහැ. එවිට
බලා සිටින සියලුදෙනාම ඔහුට සමච්-
චල් කරයි. **30** ‘මේ මිනිසා වැඩේ
පටන්ගත්තත් ඔහුට එය ඉවර කර-
ගන්න බැරි වුණා’ කියා ඔවුන් පවසයි.
**31** මේ උදාහරණය ගැනත් සිතන්න.
යම් රජෙක් තවත් රජෙකුට විරුද්ධව
යුද්ධයට සැරසෙනවා. දස දහස්දෙ-
නෙකුගෙන් යුත් තමාගේ හමුදාවට
විසි දහස්දෙනෙකුගෙන් යුත් සතුරු
හමුදාව සමඟ සටන් කළ හැකිද
කියා ඔහු යුද්ධයට යන්න කලින්
සාකච්ඡා කර බලන්නේ නැද්ද?[1]
**32** ඔහුට එම සටනට මුහුණ දෙන්න
බැරි වෙයි කියා ඔහු තේරුම්ගත්-
තොත් සතුරු හමුදාව දුර සිටිය-
දීම ඔහු තානාපතීන් පිරිසක් ඔවුන්
වෙතට යවා ඔවුන් සමඟ සමාදාන
වෙන්න පියවර ගනියි.[2] **33** එමනිසා
මෙය මතක තබාගන්න. කෙනෙකුට
තමා සතු සෑම දෙයක්ම අත්හැරිය
නොහැකි නම්[3] ඔහුට මගේ ගෝල-
යෙක් විය නොහැකියි.

**34** “ලුණු කොතරම් ප්‍රයෝජන-
වත්ද කියා සියලුදෙනාම දන්නවා.
නමුත් ලුණුවල ලුණු රසය නැති
වුණොත් ඒ නැති වූ රසය නැවත ලබා
දෙන්නේ කොහොමද?[4] **35** එය පස්
හැටියටවත් පොහොර හැටියටවත්
පාවිච්චි කරන්න බැහැ. ඒ නිසා මිනි-
සුන්ට සිදු වන්නේ ඒවා ඉවත දමන්-
නයි. මා පවසන දේට සවන් දී එය
තේරුම්ගැනීමට උත්සාහ කරන්න.”[5]

**15** යේසුස් ඉගැන්වූ දේවලට
සවන් දීම සඳහා සියලුම අය-
බදු එකතු කරන්නෝ*[6] සහ
ඔවුන් හා සමාන පව්කාරයෝ[7] ඔහු
ළඟට පැමිණියෝය. **2** එවිට පරිසි-
වරු සහ නීතිය පිටපත් කරන්නෝ
යන දෙපිරිස, “මේ මිනිසා පව්කාර-
යන්ව පිළිගෙන ඔවුන් සමඟ කැමත්
කනවා”[8] කියා තම තමන් අතරේ
කොඳුරමින් සිටියෝය. **3** එවිට ඔහු
ඔවුන්ට මේ උපමාව විස්තර කළේය.
**4** “මිනිසෙකුට බැටළුවන් සියදෙ-
නෙක් සිටිනවා කියා සිතන්න. උන්-
ගෙන් එකෙකු නැති වුණොත් ඔහු
සමඟ පාළු බිම්වල සිටින අනික් අනූ-
නවදෙනාට ඉන්න හැර, නැති වූ
බැටළුවාව සම්බ වන තුරු මහත්
වෙහෙසක් දරා සොයන්නේ නැද්ද?[9]
**5** එම මිනිසා ඌව සොයාගත් විට
ඔහු තුළ කොතරම් ප්‍රීතියක් ඇති
වෙයිද![10] ඌව කරේ තබාගෙන,

**14 පරි.**
1 මතෙ 22:10
2 මතෙ 21:43, මතෙ 22:8, හෙබ්‍රෙ 3:19
3 එළි 12:11
4 ද්වි 33:9, මතෙ 10:37, ලූක් 18:29, යොහ 12:25
5 මතෙ 16:24, මාක් 8:34, ලූක් 9:23, ගලා 6:14
6 හිතෝ 24:27, මතෙ 21:33

**2 තීරුව**
1 හිතෝ 20:18
2 යෙසා 33:7
3 මතෙ 19:27, ලූක් 9:62, පිලි 3:7
4 මතෙ 5:13, මාක් 9:50, කොලො 4:6
5 මතෙ 13:43, මාක් 4:9, එළි 2:29

**15 පරි.**
6 මතෙ 9:10, මාක් 2:15, ලූක් 5:29, ලූක් 19:2
7 1තිමෝ 1:15
8 මතෙ 9:11, ලූක් 5:30, ක්‍රියා 11:3
9 එස 34:11, මතෙ 18:12, ලූක් 19:10, 1පේතෘ 2:25
10 මතෙ 18:13

ලූක් **14:27*** උපග්‍ර. 6 බලන්න.

ලූක් **15:1*** ඔවුන් එදා සමාජය විසින් හෙළාදකිනු ලැබූ පිරිසකි.

6 ගෙදර ගොස් ඔහුගේ මිතුරන් සහ
අසල්වැසියන් කැඳවා, ‘මගේ නැති වූ
බැටළුවා සොයාගන්න මට පුළුවන්
වුණා. ඒ නිසා ඇවිත් මා සමඟ ප්‍රීති
වන්න’[1] කියා ඔවුන්ට කියයි. 7 ඒ
නිසා මේ දේ හොඳට මතක තබා-
ගන්න. පසුතැවිලි වීමේ අවශ්‍යතා-
වක් නැති ධර්මිෂ්ඨ අනූනවදෙනෙකු
ගැන[2] ප්‍රීති වෙනවාට වඩා පසුතැවිලි
වන එක පව්කාරයෙක් ගැන ස්වර්ග-
යේ සිටින දේවදූතයන් කොතරම් ප්‍රීති
වෙනවාද![3]

8 “එසේ නැත්නම් රිදී* කාසි දහ-
යක් ඇති ස්ත්‍රියක් ගැන සිතන්න.
ඇගේ එක රිදී කාසියක් හෝ නැති
වුණොත් ඇය පහනක් දල්වාගෙන,
ගේ අතුගා එය සම්බ වන තුරුම
මහත් වෙහෙසක් දරා එය සොයන්නේ
නැද්ද? 9 ඇය එය සොයාගත් විට
ඇගේ මිතුරියන්ට සහ අසල්වැසියන්ට
අඬගසා, ‘මගේ නැති වූ රිදී කාසිය
මට සම්බ වුණා. ඇවිත් මා සමඟ ප්‍රීති
වන්න’ කියා ඔවුන්ට පවසයි. 10 ඒ
නිසා මම ඔබට කියන්නේ, පසුතැවිලි
වන එක් පව්කාරයෙකු ගැන දෙවිගේ
දූතයන් ප්‍රීති වන බවයි.”[4]

11 යේසුස් මෙසේද කීවේය. “එක්-
තරා මිනිසෙකුට පුතුන් දෙදෙනෙක්
සිටියා.[5] 12 ඔවුන් දෙදෙනාගෙන්
බාලයා තම පියා ළඟට ඇවිත්,
‘තාත්තේ, ඔබේ දේපොළෙන් මට
අයිති කොටස දෙන්න’[6] කියා පැව-
සුවා. එවිට පියා තමා සතු සියලු
දේපොළ පුතුන් දෙදෙනාට බෙදා
දුන්නා.[7] 13 ටික කලකට පසු බාල
පුත්‍රයා තමා සතු දේ රැගෙන දුර රට-
කට ගියා. ඔහු එහිදී අනාචාරයේ යෙ-
දෙමින් ඉතා නරක ජීවිතයක් ගත
කර තමා සතු දේ නැති නාස්ති කර
දැමුවා.[8] 14 ඔහු සියල්ල නාස්ති
කළ පසු ඒ රට පුරාම මහත් සාගත-
යක් ඇති වුණා. එයින් ඔහු ඉතා අස-
රණ තත්වයකට පත් වුණා. 15 ඔහු
ඒ රටේ ජීවත් වූ කෙනෙකු ළඟට
ගොස් ඔහු යටතේ කුලී වැඩක් සොයා-
ගත්තා. ඔහුට සිදු වුණේ ඒ පුද්ගල-
යාට අයිති ඉඩම්වලට ගොස් එහි සිටි
ඌරන්ව බලාගැනීමටයි.[1] 16 ඔහුට
කෑමට කිසිවක් නොලැබුණු නිසා[2] ඔහු
තම කුසගින්න නිවාගත්තේ ඌරන්ට
දැමූ කෑමවලිනුයි.*

17 “තමාගේ අඥානකම තේරුම්-
ගත් ඔහු මෙසේ කල්පනා කළා. ‘මම
මෙතැන කන්න නැතුව මැරෙන්න
යනවා. නමුත් මගේ පියා ළඟ කුලී-
කරුවන් කීදෙනෙක් වැඩ කරනවාද!
ඔවුන් හැමෝටම ඕනෑ තරම් කෑම
තිබෙනවා. 18 මම තාත්තා ළඟට
දැන් ගියොත් හොඳයි.[3] ගිහින් මම
මෙහෙම කියනවා. “තාත්තේ, මම
මහ පව්කාරයෙක්. මම දෙවිටත්*
ඔබටත් විරුද්ධව බොහෝ වැරදි
කළා.[4] 19 ඔබේ පුතෙක් කියන්න-
වත් මම වටින්නේ නැහැ. ඔබ ළඟ
කුලීකරුවෙක් හැටියට වැඩ කරන්න
මට ඉඩ දෙන්න.”’ 20 එසේ සිතා
ඔහු තම පියා ළඟට ගියා. තම
පුතාව ඈත තියා දුටු පියා තුළ
මහත් අනුකම්පාවක් ඇති වී, ඔහු
ළඟට දුව ගොස් ඔහුව මහත් ආදර-
යකින් සිප වැළඳගත්තා. 21 එවිට
පුත්‍රයා, ‘තාත්තේ, මම මහ පව්කාර-
යෙක්. මම දෙවිටත් ඔබටත් විරුද්-
ධව බොහෝ වැරදි කළා.[5] ඔබේ
පුතෙක් කියා කියන්නවත් මම සුදුසු
නැහැ. ඔබ ළඟ කුලීකරුවෙක් හැටි-
යට වැඩ කරන්න මට ඉඩ දෙන්න’[6]
කියා ඔහුට පැවසුවා. 22 නමුත්
පියා තම දාසයන්ව කැඳවා ඔවුන්ට
මෙසේ කිව්වා. ‘ඉක්මනට ගිහින්
හොඳම සළුව ගෙනැවිත් මගේ පුතාට
අන්දවන්න.[7] ඔහුට පාවහන් දෙක-
කුත් දී ඔහුගේ ඇඟිල්ලට මුද්දකුත්
දමන්න.[8] 23 තර වස්සෙක්ව[9] මරා
හොඳ කෑමක් පිළියෙල කර අපි සතුටු
වෙමු. 24 මෙච්චර දවසක් මැරිල

15 පරි.
1 මතෙ 18:14; රෝම 12:15; 1පේතෘ 2:25
2 හිතෝ 30:12
3 එස 33:11; ලූක් 5:32
4 මතෙ 9:13; මාක් 2:17
5 මතෙ 21:28
6 ද්වි 21:17
7 හිතෝ 13:22
8 හිතෝ 29:3; ලූක් 15:30

2 තීරුව
1 ලෙවී 11:7
2 හිතෝ 23:21
3 එෆි 4:17; 1පේතෘ 4:3
4 2ලේක 7:14; ගීතා 32:5; හිතෝ 28:13; ලූක් 18:13; 1යොහ 1:9
5 ගීතා 51:4
6 2කොරි 7:10
7 සෙක 3:4
8 උත් 41:42; එස්ත 8:8
9 මතෙ 22:4

ලූක් 15:8* මූ.අ., “ඩ්‍රැක්මා කාසි.” එහි වටිනාකම එවකට සිටි කම්කරුවෙකු දිනකට ඉපයූ වැටුපෙන් හතරෙන් තුනකි.

ලූක් 15:16* හෝ, “කෙරටෝනියා ගසේ කරල්.” 18* එනම්, ස්වර්ගයටත්.

හිටිය මගේ පුතා දැන් ජීවත් වෙනවා.[1]
නැති වූ මගේ පුතා මට දැන් සම්බ
වුණා.’ ඉන්පසු ඔවුන් සියලුදෙනාම
එකට එක් වී සතුටු වුණා.

**25** “ඒ අවස්ථාවේ වැඩිමහල් පුතා[2]
සිටියේ කෙතේ වැඩ කරමිනුයි. ඔහු
නිවසට ළඟා වන විට ඔහුට සංගී-
තයේ හා නැටුම් ගැයුම්වල හඬක්
නිවස දෙසින් ඇහුණා. **26** ඔහු සේ-
වකයෙකුව කැඳවා එයට හේතුව
කුමක්ද කියා විමසූ විට, **27** සේව-
කයා ඔහුට මෙසේ පැවසුවා. ‘ඔබේ
සහෝදරයා[3] ගෙදර ඇවිල්ලා. ඔහු
කිසි අනතුරක් නැතුව ආපසු පියා
ළඟට ඇවිත් සිටින නිසා ඒ සතු-
ටට පියා[4] තර කළ වස්සෙක්ව මරා
කෑමකුත් පිළියෙල කළා.’ **28** ඒ දේ
ඇසූ වැඩිමහල් සහෝදරයාට කො-
තරම් කෝපයක් ඇති වුණාද කිය-
නවා නම් ගේ ඇතුළට යන්නවත් ඔහු
කැමති වුණේ නැහැ. ඒ නිසා ඔහුගේ
පියා පිටතට ඇවිත් ඔහුට ඇතුළට
එන්න පෙරැත්ත කළා.[5] **29** නමුත්
ඔහු පියාට මෙසේ පැවසුවා. ‘මම
මෙච්චර අවුරුදු ගණනාවක් තිස්සේ
තාත්තා වෙනුවෙන් දාසයෙක් වගේ
වැඩ කළා. මම එක දවසක්වත්
තාත්තාගේ කැමැත්තට විරුද්ධව
වැඩ කළේ නැහැ. ඒත් මගේ යාළු-
වෝ එක්ක කාලා විනෝද වෙන්න
එක එළු පැටියෙක්වත් තාත්තා දුන්-
නේ නැහැ.[6] **30** හැබැයි වේශ්‍යාවන්
එක්ක ඉඳලා තාත්තාට අයිති දේවල්
නාස්ති කර දැමූ[7] පුතා[8] ආවා විතරයි,
තාත්තා තර කළ වස්සෙක්ව මරා
ඔහු වෙනුවෙන් හොඳ කෑමකුත් පිළි-
යෙල කළා.’[9] **31** එවිට පියා ඔහුට
පැවසුවේ මෙයයි. ‘පුතේ, ඔබ හැම-
දාම සිටියේ මා ළඟමයි. මට තිබෙන
හැම දෙයක්ම අයිති වන්නේ ඔබ-
ටයි.[10] **32** ඇත්තටම මේ අවස්ථා-
වේදී අපි කොතරම් සතුටු වෙන්න
ඕනේද! මෙච්චර දවසක් ඔබේ සහෝ-
දරයා හිටියේ මැරිලා. දැන් ඔහු ජීවත්
වෙනවා. නැති වූ ඔබේ සහෝදරයාව
දැන් සම්බ වුණා.’ ”[11]

**15 පරි.**
1 යොහ 5:25
රෝම 6:13
එෆි 2:1
එෆි 2:5
එළි 3:1
2 හෙබ්‍රෙ 12:23
3 යොහ 10:16
4 යෙසා 25:6
5 මතෙ 20:11
6 මතෙ 20:12
7 හිතෝ 29:3
8 එළි 7:13
9 එළි 7:14
10 යොහ 17:10
රෝම 8:17
11 ලූක් 15:24

**2 තීරුව**

**16 පරි.**
1 උත් 15:2
උත් 24:2
2 1කොරි 4:2
3 මතෙ 18:23
මතෙ 25:19
1පේතෘ 4:5
4 මතෙ 24:50
5 හිතෝ 19:6
6 හිතෝ 19:8

**16** ඉන්පසු යේසුස් තම ගෝල-
යන්ට මෙසේද කීවේය. “එක්-
තරා ධනවත් මිනිසෙක් තම නිවසේ
වැඩකටයුතු සේවකයෙකුට භාර දී
තිබුණා.[1] ඒ සේවකයා තමන්ගේ දේ-
පොළ නැති නාස්ති කර දමනවා
කියා ඒ මිනිසාට දැනගන්න ලැබුණා.[2]
**2** ඒ නිසා ඔහු ඒ සේවකයාව කැඳවා,
‘ඔබට විරුද්ධව චෝදනාවක් තිබෙ-
නවා. ඒ නිසා ඔබට දී තිබෙන සියලු
වගකීම් මම නැවත ගන්නවා. සෑම
දෙයක්ම මට ආපසු භාර දෙන්න’[3]
කියා ඔහුට පැවසුවා. **3** එවිට සේව-
කයා මෙසේ සිතුවා. ‘මගේ ස්වාමියා[4]
මට පැවරූ සියලුම වගකීම්වලින් මාව
පහ කරන්න යන නිසා මම දැන් මො-
නවද කරන්නේ? බිම කොටා වගා
කරන්න තරම් ශක්තියක් මට නැහැ.
අනික මට හිඟා කන්නත් බැහැ.
**4** මට හොඳ අදහසක් ආවා. ඒ අනුව
කටයුතු කළොත් මගේ වගකීම් මට
අහිමි වුණත් මිනිස්සු මාව ඔවුන්ගේ
නිවෙස්වලට පිළිගනීවි.’[5] **5** ඉන්පසු
ඔහු තම ස්වාමියාට ණය වී සිටි අයව
එක් එක් කෙනා බැගින් කැඳවා පළමු
තැනැත්තාගෙන්, ‘ඔබ මගේ ස්වාමි-
යාට කොච්චරක් ණයද’ කියා ඇසුවා.
**6** ඔහු පිළිතුරු වශයෙන්, ‘ඔලීව
තෙල් බාත්* සියයක්’ කියා පැවසුවා.
එවිට සේවකයා, ‘ඔබේ ගනු දෙනුව
සඳහන් ලියවිල්ල ගෙන ඉක්මන් කර
පනහක් කියා ලියාගන්න’ කියා ඔහුට
කිව්වා. **7** ඊළඟට ඔහු තව කෙ-
නෙකුගෙන්, ‘ඔබ කොච්චරක් ණයද’
කියා ඇසුවා. ඔහු පැවසුවේ, ‘තිරිඟු
කෝර්* සියයක්’ කියායි. ‘ඔබේ ගනු
දෙනුව සඳහන් ලියවිල්ලේ අසූවක්
කියා ලියාගන්න’ කියා සේවකයා
ඔහුට කිව්වා. **8** නිවස භාරව සිටි
සේවකයා අධර්මිෂ්ඨ කෙනෙක් වුණත්
ඔහු ඥානවන්තව කටයුතු කළ නිසා[6]
ඔහුගේ ස්වාමියා ඔහුට ප්‍රශංසා කළා.
ඇත්තෙන්ම ආලෝකයේ දරුවන්ට

---

ලූක් **16:6*** මිනුම් ඒකකයකි. බාත් එකක් ලීටර්
22ක් පමණ වේ. **7*** මිනුම් ඒකකයකි. කෝර්
එකක් තිරිඟු කිලෝග්‍රෑම් 170ක් පමණ වේ.

වඩා මෙම සමාජයේ ජීවත් වන
අයට තැනට සුදුසු නුවණින් ක්‍රියා
කරන ආකාරය ගැන අවබෝධයක්
තිබෙනවා.[1]
**9** “මම ඔබට කියන්නේ, මෙලො-
වේදී ඔබ උපයන ධනයෙන්*[2] මිතු-
රන් ඇති කරගන්න[3] කියායි. ඔබ
එසේ කළොත් එම ධනය ඔබට අහිමි
වූ විට ඔබට සදාකාලික වාසස්ථාන-
යක් ලබා දිය හැකි ඒ මිතුරන් ඔබව
සාදරයෙන් පිළිගනීවි.[4] **10** ඉතා සුළු
කාරණයකදී විශ්වාසවන්තව කටයුතු
කරන තැනැත්තා බැරෑරුම් කාරණාව-
ලදීත් විශ්වාසවන්තව කටයුතු කරයි.
ඉතා සුළු කාරණයකදී වංක ලෙස
කටයුතු කරන තැනැත්තා බැරෑරුම්
කාරණාවලදීත් වංක ලෙස කටයුතු
කරයි.[5] **11** ඒ නිසා ඔබ උපයාගත්
ධනය පාවිච්චි කරන ආකාරයෙන් ඔබ
විශ්වාසවන්ත කෙනෙක් බව ඔප්පු
වන්නේ නැත්නම් ඔබට සැබෑ වූ ධනය
භාර දෙන්නේ කවුද?[6] **12** ඔබ වෙ-
නත් කෙනෙකුට අයත් දේවල් විශ්වා-
සවන්තව රැකබලා ගත්තේ නැත්නම්[7]
ඔබට හිමි ත්‍යාගය දෙන්නේ කවුද?
**13** නිවසක වැඩ කරන කිසිම සේවක-
යෙකුට ස්වාමිවරුන් දෙදෙනෙකු වෙ-
නුවෙන් වැඩ කරන්න බැහැ. මන්ද
ඔහු එක් කෙනෙකුට වෛර වී අනික්
තැනැත්තාට ප්‍රේම කරන්න පෙල-
ඹෙයි. නැතහොත් ඔහු එක් කෙනෙ-
කුට ඇලුම් වී අනික් තැනැත්තාව
හෙළාදකියි. ඒ හා සමානව දෙවිට
සේවය කරන අතරම ඔබට මුදල් පසු-
පස හඹා යන්න බැහැ.”[8]
**14** යේසුස් පැවසූ මේ සියල්ලට
සවන් දෙමින් සිටි පරිසිවරු, මුදලට
කෑදර අය වූ නිසා ඔහුව සමච්චලයට
ලක් කළෝය.[9] **15** එහෙයින් ඔහු
ඔවුන්ට මෙසේ කීවේය. “ඔබ මිනිසුන්
ඉදිරියේ ධර්මිෂ්ඨයි කියා මවාපෑවත්[10]
ඔබේ සිත්වල ඇත්තටම තිබෙන්-
නේ මොනවාද කියා දෙවි දන්නවා.[11]

**ලූක් 16:9*** මූ.අ., “අධර්මිෂ්ඨකමින් උපයාගත් ධනයෙන්.”

**16 පරි.**
**1** යොහ 12:36; එෆී 5:8; 1තෙස 5:5
**2** මතෙ 19:21; ලූක් 12:20; 1තිමෝ 6:17
**3** දේශ 11:1; ලූක් 19:8
**4** මතෙ 25:34; යොහ 14:2
**5** මතෙ 25:21; ලූක් 19:17
**6** එෆී 3:8; එළි 3:18
**7** ලූක් 12:48; 1කොරි 4:2
**8** මතෙ 6:24
**9** යෙසා 53:3
**10** මතෙ 6:2; මතෙ 23:28; ලූක් 10:29; ලූක් 18:9
**11** 1සාමු 16:7; 1ලේක 28:9; 2ලේක 6:30; හිතෝ 15:11; ක්‍රියා 1:24

**2 තීරුව**
**1** 1පේතෘ 5:5
**2** මතෙ 11:13
**3** මතෙ 11:12
**4** ගීතා 102:26; හෙබ්‍රෙ 1:11
**5** මතෙ 5:17
**6** මතෙ 5:18
**7** මතෙ 5:32; මතෙ 19:9; මාක් 10:11
**8** මතෙ 13:34
**9** මතෙ 23:5
**10** රෝම 7:4
**11** යෙසා 63:16; මතෙ 8:11
**12** යොහ 1:18

ඇත්තෙන්ම මිනිසුන් වැදගත් කියා
සලකන දේවල් දෙවිට පිළිකුලක්.[1]
**16** “නීතියේ සඳහන් දේවල් සහ
අනාගතවක්තෘවරුන් පැවසූ දේවල්
යොහන්ගේ කාලය දක්වා ප්‍රකාශ
කළා.[2] එතැන් පටන් ශුභාරංචි-
යක් ලෙස ප්‍රකාශ කරන්නේ දෙවි-
ගේ රාජ්‍යය ගැනයි. හැම ජාතියකටම
අයත් මිනිසුන් එහි ආශීර්වාද ලබාගැ-
නීමට මහත් වෑයමක් දරනවා.[3]
**17** ඇත්තෙන්ම මා ඔබට කියන්නේ,
අහස හා පොළොව පහව ගියත්[4] නීති-
යේ සඳහන් සෑම දෙයක්ම අනිවාර්ය-
යෙන් ඉටු වන බවයි.[5] එහි ඇති සෑම
අකුරකින් අංශුමාත්‍රයක් වුණත්[6] ඉතා
වැදගත් බව මතක තබාගන්න.
**18** “තම බිරිඳව දික්කසාද කර
වෙනත් ස්ත්‍රියක්ව විවාහ කරගන්නා
පුරුෂයා අනාචාරයේ* යෙදෙනවා.
තම පුරුෂයාගෙන් දික්කසාද වූ ස්ත්‍රි-
යක්ව යම් කෙනෙක් විවාහ කර-
ගත්තොත් ඔහුද අනාචාරයේ යෙදෙන
කෙනෙක් ලෙස සැලකිය යුතුයි.[7]
**19** “එක්තරා ධනවත් මිනිසෙක්[8]
සිටියා. ඔහු පුරුදු වී සිටියේ මිල අධික
දම් පැහැති වස්ත්‍ර හා ලිනන් රෙදි-
වලින් මැසූ ඇඳුම් අඳින්නයි.
සුඛෝපභෝගී ජීවිතයක් ගත කළ
ඔහු දිනපතාම කල් ගෙව්වේ මහත්
ප්‍රීතියකින්.[9] **20** මේ අතර ලාසරුස්
නම් හිඟන්නෙකුව නිතිපතාම ඔහු-
ගේ දොරටුව අසලට ගෙනැවිත් තබනු
ලැබුවා. ඔහුගේ ඇඟ පුරාම වණ හට-
ගෙන තිබුණා. **21** ඔහු සිතාගෙන
සිටියේ තමාට ධනවතාගේ මේස-
යෙන් වැටෙන දේවලින් තම කුස-
ගින්න නිවාගත හැකි බවයි. මේ අතර
බල්ලෝ පවා ඇවිත් ඔහුගේ වණ
ලෙව කෑවා. **22** යම් කලක් ගත වූ
පසු එම හිඟන්නා මිය ගියා.[10] එවිට
දේවදූතයන් ආබ්‍රහම්[11] අසලම*[12] සිටී-
මට ඔහුව රැගෙන ගියා.

**ලූක් 16:18*** මූ.අ., “පරදාර සේවනයේ.” මෙය භාවිත කරන්නේ විවාහක පුරුෂයෙකු හෝ ස්ත්‍රියක අනාචාරයේ යෙදීම විස්තර කිරීමටය. **22*** මූ.අ., “ආබ්‍රහම්ගේ ළපැත්තේ.”

“මේ අතර ධනවතාත් මිය ගිය[1]
නිසා ඔහුවත් තැන්පත් කරනු ලැබුවා.
**23** මිනී වළෙහි දුක් විඳිමින් සිටි
ඔහු[2] ඉහළ බැලූ විට දුර ඈත සිටි
ආබ්‍රහම්වත් ඔහු අසලම සිටින ලාස-
රුස්වත් දුටුවා. **24** ඔහු හඬ නඟා
මෙසේ පැවසුවා. ‘ආබ්‍රහම්, මගේ පියා-
ණෙනි,[3] මට අනුකම්පා කරන්න.
මම මේ ගිනි ජාලාවේ සිටින්නේ
මහත් වේදනාවෙන්.[4] ඒ නිසා ලාස-
රුස්ගේ ඇඟිල්ල වතුරේ තවරා මගේ
දිව සිසිල් කිරීමට[5] ඔහුව මා ළඟට
එවන්න.’ **25** එවිට ආබ්‍රහම් මෙසේ
පිළිතුරු දුන්නා. ‘දරුව, ඔබ ජීව-
තුන් අතර සිටියදී ඔබ ගත කළ
සැපවත් ජීවිතය ඔබට මතක නැද්ද?
නමුත් ලාසරුස් ගත කළේ ඉතා දුක්-
බර ජීවිතයක්. දැන් ඔහුට සැනසීම
ලැබිලා. නමුත් දැන් ඔබ සිටින්නේ
මහත් වේදනාවකිනුයි.[6] **26** ඒ විත-
රක් නොවෙයි, ඔබත් අපත් අතර ඇති
පරතරය[7] ඉතා විශාලයි.[8] ඒ නිසා ඔබ
ළඟට එන්න අප කැමති වුණත් ඒ දේ
කරන්න බැහැ. ඒ වගේම ඔබ සිටින
තැනින් කිසිවෙකුට අප සිටින තැනට
එන්නත් බැහැ.’[9] **27** ඔහු ඊට මෙසේ
පිළිතුරු දුන්නා. ‘එසේනම් පියා-
ණෙනි, ලාසරුස්ව මගේ පියාගේ
ගෘහයට යවන මෙන් මම ඔබෙන් ඉල්-
ලනවා. **28** මට සහෝදරයන් පස්-
දෙනෙක් සිටිනවා. ඔහු ඔවුන්ව
හොඳින් දැනුවත් කළොත් ඔවුන්ට
මේ වධ වේදනා විඳින ස්ථානය
උරුම වෙන්නේ නැහැ.’ **29** නමුත්
ආබ්‍රහම් මෙසේ පැවසුවා. ‘ඔවුන්ට
මෝසෙස්[10] සහ අනාගතවක්තෘව-
රුන්[11] සිටිනවා. ඔවුන්ට පුළුවන්
ඒ අයට සවන් දෙන්න.’[12] **30** එවිට
ඔහු, ‘ආබ්‍රහම්, මගේ පියාණෙනි,
එහෙම වෙන්නේ නැහැ. නමුත් මිය
ගිය කෙනෙක් ඔවුන් ළඟට ගියොත්
ඔවුන් අනිවාර්යයෙන්ම පසුතැවිලි
වෙයි’ කියා පැවසුවා. **31** නමුත්
ආබ්‍රහම් පිළිතුරු දුන්නේ මෙසේයි.
‘මෝසෙස්ට[13] සහ අනාගතවක්තෘව-
රුන්ට ඔවුන් සවන් දෙන්නේ නැත්-
නම් කෙනෙක් මරණයෙන් නැඟිට්ටත්
ඔහුව විශ්වාස කිරීමට ඔවුන් පෙල-
ඹෙන්නේ නැහැ.’ ”

**17** ඉන්පසු යේසුස් තම ගෝ-
ලයන්ට මෙසේ කීවේය.
“ඕනෑම කෙනෙක් වරදකට පෙල-
ඹෙන්න* පුළුවන්.[1] නමුත් වර-
දක් කිරීමට අන් අයව පොලඹවන
තැනැත්තාට දරුණු ප්‍රතිඵලවලට
මුහුණ දෙන්න සිදු වෙයි.[2] **2** යම්
කෙනෙක් නිසා මේ කුඩා අයගෙන්
එක් කෙනෙක් හෝ වැටී ගියොත්*[3]
විශාල ඇඹරුම් ගලක් ඔහුගේ බෙල්-
ලේ එල්ලා ඔහුව මහ මුහුදට තල්ලු
කිරීම වඩාත් හොඳයි.[4] **3** ඒ නිසා
ඔබ පරෙස්සම් විය යුතුයි. ඔබේ
සහෝදරයා පාපයක් කළොත් ඔහුට
තදින් අවවාද කරන්න.[5] ඔහු පසුතැ-
විලි වුණොත් ඔහුට සමාව දෙන්න ඔබ
සූදානම්ව සිටිය යුතුයි.[6] **4** ඔහු දව-
සකට හත් වතාවක් වුණත් ඔබට
විරුද්ධව වැරදි කළ හැකියි. නමුත් ඒ
හත් වතාවම ඔහු ඔබ ළඟට ඇවිත්,
‘මට සමාවෙන්න’ කියා පැවසුවොත්
ඔබ ඔහුට සමාව දිය යුතුයි.”[7]
**5** එවිට යේසුස්ගේ නියෝජිතයන්*
දොළොස්දෙනා ඔහුට මෙසේ පැවසූහ.
“අප තුළ තිබෙන විශ්වාසය තවත්
ශක්තිමත් කරන්න.”[8] **6** එවිට යේ-
සුස් ඔවුන්ට පැවසුවේ මෙයයි. “ඔබට
අබ ඇටයක් තරම්වත් විශ්වාසයක්
තිබුණත් ඇති. එවිට මේ මල්බෙරි
ගසට, ‘මෙතැනින් ඉවත් වී මුහුදේ
පැළ වෙන්න’ කියා ඔබ පැවසුවොත්
ඒ ගස ඔබට කීකරු වෙයි.[9]
**7** “සීසාමින් හෝ සතුන් රැකබලා
ගනිමින් ඔබට සේවය කරන දාස-
යෙක් සිටිනවා කියා සිතන්න. ඒ
සේවකයා වැඩ අවසන් කර පැමිණි
වහාම, ‘ඇවිත් කෑමට ඉඳගන්න’
කියා ඔබ ඔහුට කියයිද? **8** ඒ වෙනු-
වට ඔබ, ‘මගේ රෑ කෑමට මොනව හරි

**16 පරි.**
1 රෝම 7:6
2 ක්‍රියා 5:33
3 යෙසා 51:2; මතෙ 3:9
4 ක්‍රියා 7:54
5 යෙසා 65:13
6 රෝම 11:22
7 1කොරි 1:23
8 ගීතා 36:6
9 2කොරි 6:14
10 එළි 18:18
11 1පේතෘ 1:10
12 ලූක් 24:27
13 යොහ 5:46

**2 තීරුව**

**17 පරි.**
1 1කොරි 11:19
2 මතෙ 26:24; යූද් 11; එළි 2:14
3 මතෙ 18:6; මාක් 9:42
4 එළි 18:21
5 හිතෝ 17:10; මාක් 8:33
6 ලෙවී 19:17; හිතෝ 19:11; මතෙ 18:15
7 යෙසා 55:7; මතෙ 6:12; මතෙ 18:22; කොලො 3:13; 1පේතෘ 4:8
8 මාක් 9:24; එෆී 2:8; හෙබ්‍රෙ 12:2
9 මතෙ 17:20; මතෙ 21:21; මාක් 9:23; මාක් 11:23

**ලූක් 17:1*** මතෙ 18:6හි පාදසටහන බලන්න. **2*** මතෙ 18:6හි පාදසටහන බලන්න. **5*** හෝ, “යවනු ලැබූවන්.”

පිළියෙල කරන්න. ඉන්පසු ලැස්ති වී
මා කා බී අවසන් වන තුරු මා ළඟ ඉඳ
මට අවශ්‍ය දේ සපයන්න. ඊටපස්-
සේ ඔබට පුළුවන් කන්න බොන්න’
කියා ඔහුට පවසයි. **9** ඒ දාසයා
තමාට පවරා තිබූ වැඩ කොටස කළා
කියා ස්වාමියා ඔහුට ස්තුති කරන්-
නේ නැහැ. **10** ඔබත් මේ දාසයා හා
සමාන බව මතක තබාගත යුතුයි.
ඔබට පවරා තිබෙන සෑම දෙයක්ම
කළ පසු, ‘අපි නිකම්ම නිකම් දාස-
යෝ පමණයි.[1] අපි මේ කළේ අප කළ
යුතු දේ විතරයි’ කියා පවසන්න.”

**11** යේසුස් යෙරුසලම බලා යන
විට ඔහු ගමන් කළේ සමාරිය සහ
ගලීලය මැදින්ය.[2] **12** ඔහු එක්තරා
ගමකට ඇතුල් වූ විට ලාදුරු රෝ-
ගීන්[3] දසදෙනෙක් ඔහු වෙතට පැමිණි-
යෝය. නමුත් ඔවුන් සිටියේ ඔහුට
මදක් දුරින්ය. **13** ඔවුහු මහත් හඬ-
කින්, “යේසුස්, ගුරුතුමනි, අපට
අනුකම්පා කරන්න”[4] කියා පැවසූහ.
**14** යේසුස් ඔවුන්ව දුටු විට, “ගොස්
පූජකයා ඉදිරියේ පෙනී සිටින්න”[5]
කියා ඔවුන්ට කීවේය. ඔවුහු ඒ සඳහා
පිටත්ව යන අතරතුරේදී එම රෝග-
යෙන් පවිත්‍ර වූහ.[6] **15** තමන් සුව වී
ඇති බව දුටු එක් කෙනෙක් මහත්
හඬින් දෙවිට ප්‍රශංසා කරමින්[7] නැවත
හැරී ඇවිත්, **16** යේසුස්ගේ පාමුල
වැටී[8] ඔහුට ස්තුති කළේය. ඔහු
සමරිතානු ජාතිකයෙකි.[9] **17** යේ-
සුස් ඔහුට මෙසේ කීවේය. “දහදෙනාම
සුව වුණා නේද? එසේනම් අනික් නව-
දෙනා කොහේද? **18** වෙනත් ජාති-
යකට අයත් ඔබ හැර වෙන කවුරුත්
දෙවිට ප්‍රශංසා කරන්න ආවේ නැද්ද?”
**19** එවිට යේසුස්, “ඔබ සුව වුණේ
ඔබේ විශ්වාසය නිසයි.[10] දැන් ඔබට
යන්න පුළුවන්” කියා ඔහුට කීවේය.

**20** දෙවිගේ රාජ්‍යය පැමිණෙන්නේ
කවදාද කියා පරිසිවරුන් යේසුස්-
ගෙන් විමසූ විට[11] ඔහු ඔවුන්ට මෙසේ
පිළිතුරු දුන්නේය. “දෙවිගේ රාජ්‍යය
පැමිණෙන්නේ සියලුදෙනාටම පැහැදි-
ලිව දැකිය හැකි ආකාරයකින් නො-
වෙයි. **21** ‘මෙන්න එය මෙතැනයි’
හෝ ‘එතැනයි’[1] කියා කිසි කෙනෙක්
පවසන්නෙත් නැහැ. ඇත්තටම දෙවි-
ගේ රාජ්‍යය තිබෙන්නේ ඔබ අතරෙ-
හියි.”[2]

**22** ඉන්පසු ඔහු තම ගෝලයන්ට
මෙසේ කීවේය. “මනුෂ්‍ය පුත්‍රයා
පැමිණ සිටින කාලයේදී එක දව-
සක් හෝ ජීවත් වෙන්න ඔබ ආශා
වුණත් ඒ දේ කරන්න ඔබට හැකි
වන්නේ නැහැ.[3] **23** මිනිස්සු ඔබට,
‘අන්න එතැනට ගොස් බලන්න’ හෝ
‘මෙන්න මෙහෙ ඇවිත් බලන්න’[4]
කියා පවසයි. ඒ වුණත් ඔබ නොයා
යුතුයි. ඔවුන් පසුපස යන්න එපා.[5]
**24** අකුණු ගසද්දී[6] විදුලි සැරය අහසේ
එක් දිශාවක සිට අනික් දිශාව දක්වා
විහිදී යන ආකාරය ඔබ දැක ඇති.
මනුෂ්‍ය පුත්‍රයා[7] එළිදරව් වන අවස්-
ථාවේදීත් එලෙසම වෙයි. **25** නමුත්
මුලින්ම ඔහුට බොහෝ වේදනා අද්ද-
කින්න සිදු වන අතර මේ පරම්පරාව
විසින් ඔහුව ප්‍රතික්ෂේප කරනු ලබයි.[8]
**26** මනුෂ්‍ය පුත්‍රයා පැමිණෙන කාල-
යේ සිදු වන දේවල්[9] නෝවාගේ කාල-
යේ සිදු වූ දේවලට සමාන වෙයි.[10]
**27** නෝවා නැවට ඇතුල් වූ දවස
දක්වා ඔවුන් සිටියේ කමින්, බොමින්,
විවාහ වෙමින්, විවාහ කර දෙමිනුයි.
එවිට ජලගැල්ම ඇවිත් ඔවුන් සියල්-
ලන්ව විනාශ කළා.[11] **28** ලොත්ගේ
කාලයෙත් ඒ හා සමාන දෙයක් සිදු
වුණා.[12] ඔවුන් කමින්, බොමින්, මිල
දී ගනිමින්, විකුණමින්, වගා කට-
යුතු කරමින්, ගෙවල් ගොඩනඟමින්
සිටියා. **29** නමුත් ලොත් සොදොම්
නුවරින් පිටතට ආ දවසේදී අහ-
සෙන් ගිනිද ගෙන්දගම්ද වැටී සිය-
ලුදෙනා විනාශ වුණා.[13] **30** මනුෂ්‍ය
පුත්‍රයා එළිදරව් වීමට නියමිත දවසේ-
දීත් එවැනිම දෙයක් සිදු වෙයි.[14]

**31** “එදින වහල්තලයේ සිටින්නා
පහතට ඇවිත් තම නිවසෙහි
තිබෙන බඩු බාහිරාදිය ගැනීමට
ගෙට ඇතුල් නොවිය යුතුයි. එසේම
කෙතෙහි සිටින තැනැත්තා තමා

**17 පරි.**
**1** යෝබ් 22:3 ගීතා 16:2 රෝම 3:12 රෝම 11:35 1කොරි 9:16
**2** ලූක් 9:51 යොහ 4:4
**3** ලෙවී 13:46 මතෙ 8:2
**4** මතෙ 9:27 මතෙ 20:30
**5** ලෙවී 13:2 ලෙවී 13:49 ලෙවී 14:2 ද්වි 24:8 මතෙ 8:4 ලූක් 5:14
**6** 2රාජා 5:14
**7** ගීතා 50:15 ගීතා 103:1
**8** මතෙ 8:2
**9** 2රාජා 17:24 යොහ 4:9
**10** මතෙ 9:22 මාක් 5:34 ලූක් 7:50
**11** මතෙ 24:3

**2 තීරුව**
**1** මතෙ 24:23 මාක් 13:21
**2** මතෙ 12:28 මතෙ 21:5
**3** මතෙ 9:15 ලූක් 5:35 යොහ 8:56
**4** මතෙ 24:23 මාක් 13:21 ලූක් 21:8
**5** 1යොහ 4:1
**6** මතෙ 24:27
**7** දානි 7:13
**8** මාක් 8:31 මාක් 9:31 ලූක් 9:22
**9** මතෙ 24:37
**10** උත් 6:5
**11** උත් 7:7 මතෙ 24:38
**12** උත් 19:15
**13** උත් 19:24
**14** මතෙ 24:30 මාක් 13:26 1කොරි 1:7 කොලො 3:4 2තෙස 1:7 2තෙස 2:8 එළි 1:7

දමා ගිය දේවල් ගැනීමට ආපසු
හැරී නොයා යුතුයි. **32** ලොත්ගේ
බිරිඳට සිදු වූ දේ කිසිවිටකත් අමතක
කරන්න එපා.[1] **33** යමෙක් තම ජීවි-
තය රැකගැනීමට මොන තරම් උත්-
සාහ කළත් ඔහුට එය නැති වෙයි.
නමුත් තම ජීවිතය අහිමි කරගන්-
නාට එය නැවත හිමි වෙයි.[2] **34** මා
කියන දේට සවන් දෙන්න. ඒ රාත්‍රි-
යේදී මිනිසුන් දෙදෙනෙක් එකම ඇඳේ
නිදාගෙන සිටියි. එක් කෙනෙකුව
ගෙන යනු ලබයි. අනික් තැනැත්තාව
අත්හරිනු ලබයි.[3] **35** ස්ත්‍රීන් දෙදෙ-
නෙක් එකම ඇඹරුම් ගලේ අඹර-
මින් සිටියි. එක් කෙනෙකුව ගෙන
යනු ලබයි. අනික් තැනැත්තියව
අත්හරිනු ලබයි."[4] **36** —— **37** ඒ
සියල්ල අසා සිටි ඔවුහු, "ස්වාමීනි, මේ
දේවල් සිදු වන්නේ කොහේදීද" කියා
ඔහුගෙන් ඇසුවෝය. ඔහු ඔවුන්ට
මෙසේ පිළිතුරු දුන්නේය. "යම් තැන-
කට රාජාලීන් රැස් වන විට මළ
කුණත් තිබෙන්නේ[5] එතැන බව වට-
හාගන්න."[6]

**18** නිතරම යාච්ඤා කිරීමේ
අවශ්‍යතාව ගැනත් අධෛර්-
යය නොවී සිටීමේ අවශ්‍යතාව[7]
ගැනත් යේසුස් ඔවුන්ට උපමාවකින්
**2** මෙසේ විස්තර කළේය. "එක්තරා
නුවරක විනිශ්චයකරුවෙක් සිටියා.
දෙවිට ගරුබිය නොදැක්වූ ඔහු, මිනි-
සුන්ටවත් කිසි ගෞරවයක් දැක්වූ-
යේ නැහැ. **3** මේ අතර ඒ නුවරේ
සිටි වැන්දඹුවක් ඔහු ළඟට නිතර
ගොස්,[8] 'මගේ නඩුවට සාධාරණය
ඉටු කර දෙන්න' කියා දිගින් දිග-
ටම පැවසුවා. **4** යම් කාලයක් යන
තුරු ඔහු ඒ ගැන කිසි පියවරක්
ගන්න කැමති වුණේ නැහැ. නමුත්
පසුව ඔහු මෙසේ සිතාගත්තා. 'මම
කිසි මිනිසෙකුට ගෞරවය නොදක්-
වන, දෙවිටවත් ගරුබිය නොදක්වන
කෙනෙක්. **5** නමුත් මේ වැන්දඹුව
ඇවිත් නිතර නිතර මට කරදර කරන
නිසා[9] මම ඇයට සාධාරණය ඉටු කර
දිය යුතුයි. එහෙම නොකළොත් ඇය
දිගින් දිගටම ඇවිත් මට එපා වන
තරමට කරදර කරයි.'"[1] **6** එවිට
යේසුස් මෙසේ කීවේය. "ඒ විනිශ්ච-
යකරු අධර්මිෂ්ඨ කෙනෙක් වුණත්
ඔහු පැවසූ දේ අමතක කරන්න එපා!
**7** දැන් බොහෝ ඉවසිලිවන්තව කට-
යුතු කරන දෙවි ගැන සිතන්න.[2] දිවා
රෑ දෙකේම ඔහු තෝරාගත් සේවක-
යන් ඔහුට කන්නලව් කරන විට දෙවි
ඔවුන් වෙනුවෙන් සාධාරණය ඉටු කර
දෙන්නේ නැද්ද?[3] **8** ඔහු ඔවුන් වෙ-
නුවෙන් ඉක්මනින්ම සාධාරණය ඉටු
කර දෙන බව ස්ථිරයි.[4] නමුත් මනුෂ්‍ය
පුත්‍රයා පැමිණෙන විට එවැනි විශ්වාස-
යක් තිබෙන අයව ඔහුට මේ පොළො-
වේදී හමු වෙයිද?"

**9** මේ අතර තමන් ඉතා ධර්මිෂ්-
ඨයි කියා සිතමින්[5] අන් සියලුදෙනාව
පහත් කර සැලකූ[6] පිරිසක් සිටියෝය.
යේසුස් ඔවුන්ට මේ උපමාව පැවසු-
වේය. **10** "මිනිසුන් දෙදෙනෙක්
යාච්ඤා කිරීමට දේවමාලිගාවට ගියා.
එක් කෙනෙක් පරිසිවරයෙක්. අනික්
පුද්ගලයා බදු එකතු කරන්නෙක්.
**11** පරිසිවරයා නැඟිට[7] නිහඬව මෙසේ
යාච්ඤා කරන්න පටන්ගත්තා.[8] 'දෙ-
වියනි, මම ඔබට ස්තුති කරන්න
කැමතියි. අන් අය වගේ මම පව්කාර-
යෙක් නොවෙයි. විශේෂයෙන්ම මෙ-
තැනට ඇවිත් සිටින මේ බදු එකතු
කරන්නාට වඩා මම කොයි තරම්
වෙනස්ද! මම කවදාවත් අන් අයගේ
දේවල් අයුතු ලෙස ගන්නේ නැහැ. මම
අධර්මිෂ්ඨකම් කරන්නේ නැහැ. අනා-
චාරයේ* යෙදී නැහැ.[9] **12** ඒ වගේම
මම සතියට දෙවතාවක් නිරාහාරව
සිටිනවා. උපයන හැම දෙයකින්ම
මම දහයෙන් කොටසක් අනිවාර්ය-
යෙන්ම දෙනවා.'[10] **13** නමුත් ඔහුට
තරමක් දුරින් සිටගෙන සිටි බදු
එකතු කරන්නා අහස දෙස බලන්න-
වත් අකමැතිව තම පපුවට ගසාග-
නිමින්[11] පැවසුවේ, 'අනේ දෙවියනි,

**17 පරි.**
1 උත් 19:26
2 මතෙ 10:39; මතෙ 16:25; මාක් 8:35; ලූක් 9:24; යොහ 12:25
3 මතෙ 24:40
4 මතෙ 24:41
5 යෝබ් 39:30
6 මතෙ 24:28

**18 පරි.**
7 ගීතා 55:16; රෝම 12:12; එෆී 6:18; පිලි 4:6; කොලො 4:2; 1තෙස 5:17
8 ලූක් 11:8
9 ලූක් 11:7

**2 තීරුව**
1 විනි 16:16
2 2පේත්‍ර 3:9; එළි 6:10
3 1සාමු 24:12; යෙසා 40:27; යෙරෙ 20:12
4 හබ 2:3; හෙබ්‍රෙ 10:37
5 හිතෝ 30:12; ලූක් 10:29
6 යෙසා 65:5
7 ගීතා 135:2
8 යෙසා 1:15
9 එළි 3:17
10 මතෙ 23:23
11 යෙරෙ 31:19; ලූක් 23:48

**ලූක් 18:11*** මූ.අ., "පරදාර සේවනයේ." මෙය භාවිත කරන්නේ විවාහක පුරුෂයෙකු හෝ ස්ත්‍රියක අනාචාරයේ යෙදීම විස්තර කිරීමටය.

පව්කාරයෙක් වන මට අනුකම්පා
කරන්න'[1] කියායි. **14** මේ මිනිසා
තමාගේ නිවසට හැරී ගියේ ඒ පරිසි-
වරයාට වඩා ධර්මිෂ්ඨ කෙනෙක්
හැටියටයි[2] යන කාරණය මතක
තබාගන්න. උසස් වෙන්න උත්සාහ
කරන කෙනෙකුව පහත් කරනු ලබයි.
නමුත් නිහතමානීව සේවය කරන
කෙනෙකුව උසස් කරනු ලබයි."[3]

**15** මේ අතර මිනිසුන් කිහිපදෙ-
නෙක් තම කුඩා දරුවන්ව* යේ-
සුස් ළඟට රැගෙන ආවෝය. ඔවුන්
එසේ කළේ යේසුස් ඔවුන් පිට අත්
තබා ඔවුන්ට ආශීර්වාද කරයි යන
බලාපොරොත්තුවෙනි. එය දුටු ගෝ-
ලයෝ ඔවුන්ට තදින් කතා කළෝය.[4]
**16** නමුත් යේසුස් එම දරුවන්ව
තමන් ළඟට ගෙන තම ගෝලයන්ට
මෙසේ කීවේය. "එහෙම කරන්න එපා.
මේ කුඩා දරුවන්ට මා ළඟට එන්න
ඉඩහරින්න. මන්ද දෙවිගේ රාජ්‍යය
අයිති වන්නේ මේ දරුවන් වගේ සිටින
අයටයි.[5] **17** ඇත්තෙන්ම මා ඔබට
කියන්නේ, කෙනෙක් කුඩා දරුවෙක්
මෙන් වී දෙවිගේ රාජ්‍යය පිළිගත යුතු
බවයි. එසේ නොකළොත් ඊට ඇතුල්
වෙන්න ඔහුට බැරි වෙයි."[6]

**18** එවිට එක්තරා පාලකයෙක්,
"යහපත් ගුරුතුමනි, සදාකාල ජීවනය
උරුම කරගන්න නම් මම මොන-
වාද කරන්න ඕනේ"[7] කියා ඔහුගෙන්
ඇසුවේය. **19** යේසුස් ඔහුට පිළිතුරු
දුන්නේ මෙසේයි. "ඔබ මට යහපත්
කියා පවසන්නේ ඇයි? යහපත් කියා
හැඳින්විය හැක්කේ එක් කෙනෙකුව
පමණයි. ඒ දෙවියි.[8] **20** 'අනාචාර-
යේ* නොහැසිරෙන්න,[9] මිනී නො-
මරන්න,[10] සොරකම් නොකරන්න,[11]
බොරු සාක්ෂි නොදෙන්න,[12] ඔබේ
පියාටත් මවටත් ගෞරව කරන්න'[13]
යන ආඥා ගැන ඔබ හොඳින් දන්නවා
ඇති."[14] **21** එවිට ඔහු, "මම ඒ සෑම
දෙයක්ම කුඩා කාලයේ පටන්ම පිළි-

**ලූක් 18:15*** මූ.අ., "ළදරුවන්ව." **20*** ලූක් 18:11හි පාදසටහන බලන්න.

පදිනවා"[1] කියා පැවසුවේය. **22** එය
ඇසූ යේසුස් ඔහුට මෙසේ පැවසු-
වේය. "ඔබ තව එක දෙයක් කළ
යුතුයි. ඔබට අයිති හැම දෙයක්ම
විකුණා එයින් ලැබෙන මුදල දිළිඳුන්
අතර බෙදා දෙන්න. එසේ කළොත්
ඔබට ස්වර්ගයෙහි වස්තු රැස් කරන්න
පුළුවන් වෙයි. ඉන්පසු ඇවිත් මගේ
අනුගාමිකයෙක් වෙන්න."[2] **23** ඔහු
ඉතා ධනවත් කෙනෙකු වූ නිසා යේ-
සුස් පැවසූ දේවලට සවන් දුන් පසු ඔහු
තුළ මහත් දුකක් ඇති විය.[3]

**24** යේසුස් ඔහු දෙස බලා මෙසේ
කීවේය. "මුදල් ඇති අයට දෙවිගේ
රාජ්‍යයට ඇතුල් වීම මොන තරම්
අමාරු දෙයක්ද![4] **25** ධනවතෙකුට
දෙවිගේ රාජ්‍යයට ඇතුල් වෙනවාට
වඩා ඔටුවෙකුට ඉඳිකටුවක සිදුරෙන්
ඇතුල් වීම පහසුයි."[5] **26** මේ දේව-
ලට සවන් දෙමින් සිටි අය, "එසේ-
නම් ගැලවීම ලැබිය හැක්කේ කාටද"
කියා ඔහුගෙන් ඇසූහ. **27** ඔහුද,
"මිනිසුන්ට කරන්න බැරි දේවල් දෙ-
විට කරන්න පුළුවන්"[6] කියා පිළිතුරු
දුන්නේය. **28** එවිට පේතෘස් මෙසේ
පැවසුවේය. "බලන්න! අපේ හැම දෙ-
යක්ම අත්හැර අපි ඔබ අනුව ආවා."[7]
**29** ඔහු එයට මෙසේ පිළිතුරු දුන්-
නේය. "ඇත්තෙන්ම මා ඔබට කියන
මේ දේ මතක තබාගන්න. දෙවිගේ
රාජ්‍යය වෙනුවෙන් කෙනෙක් තමා-
ගේ ගෙවල් දොරවල් හෝ භාර්යාව
හෝ සහෝදරයන් හෝ දෙමාපියන්
හෝ දරුඇරියන් හෝ අත්හැර ඇත්-
නම්[8] **30** ඔහුට මේ කාලයේදී ඊට
වඩා බොහෝ වැඩියෙනුත් මතු පැමි-
ණෙන කාලයේදී* සදාකාල ජීවනයත්
ලැබෙයි."[9]

**31** ඉන්පසු ඔහු ගෝලයන් දො-
ළොස්දෙනාව පැත්තකට අඬගසා
මෙසේ කීවේය. "අපි දැන් මේ යන්නේ
යෙරුසලමටයි. එවිට මනුෂ්‍ය පුත්‍රයා
ගැන අනාගතවක්තෘවරුන් ලියූ හැම

**ලූක් 18:30*** හෝ, "සමාජ ක්‍රමයේදී." ග්‍රීක බසින්, එඕනි.

**18 පරි.**
1 ගීතා 51:3
2 1සාමු 16:7
යෙසා 66:2
මතෙ 21:31
3 යෙසා 2:11
මතෙ 23:12
යාකො 4:6
1පේත 5:5
4 මතෙ 19:13
මාක් 10:13
5 1කොරි 14:20
1පේත 2:2
6 මතෙ 18:3
මාක් 10:15
7 මතෙ 19:16
මාක් 10:17
ලූක් 10:25
8 මතෙ 19:17
මාක් 10:18
9 නික් 20:14
ද්වි 5:18
10 නික් 20:13
ද්වි 5:17
11 නික් 20:15
ද්වි 5:19
12 නික් 20:16
ද්වි 5:20
13 නික් 20:12
ද්වි 5:16
එෆී 6:2
14 රෝම 13:9

**2 තීරුව**
1 මතෙ 19:20
මාක් 10:20
2 මතෙ 6:20
මතෙ 19:21
මාක් 10:21
ලූක් 12:33
1තිමෝ 6:19
3 මතෙ 19:22
මාක් 10:22
4 හිතෝ 11:28
මතෙ 19:23
1තිමෝ 6:9
5 මතෙ 19:24
මාක් 10:25
6 උත් 18:14
යෙරෙ 32:17
සෙක 8:6
මාක් 14:36
7 මතෙ 19:27
8 ද්වි 33:9
මාක් 10:29
9 මතෙ 19:29
මාක් 10:30
එළි 2:10

දෙයක්ම[1] ඉටු වෙයි.[2] **32** ඔහුව වෙ-
නත් ජාතීන්ගේ අතට භාර දෙයි.
ඔහුට කවටකම් කරයි.[3] ඔහුට නින්දා
කරමින්[4] කෙළ ගසයි.[5] **33** ඉන්පසු
ඔවුන් ඔහුට කසයෙන් තළා[6] අන්-
තිමේදී මරණයට පත් කරයි.[7] ඒ
වුණත් තුන්වෙනි දවසේදී ඔහු නැවත
නැඟිටිනවා.”[8] **34** නමුත් ඔහු පැවසූ
දේවල් තේරුම්ගන්න ගෝලයන්ට
නොහැකි විය. එයට හේතුව වූයේ ඒ
අවස්ථාවේදී ඒ වචන අවබෝධ කර-
ගැනීමට තරම් හැකියාවක් ඔවුන්ට
නොතිබීමයි.[9]

**35** යේසුස් යෙරිකෝවට ළඟා
වෙද්දී, එක්තරා අන්ධ මිනිසෙක්
පාර අයිනේ ඉඳගෙන සිඟමන් ඉල්ල-
මින් සිටියේය.[10] **36** සමූහයක් තමා
අසලින් යන බව තේරුම්ගත් ඒ
අන්ධ මිනිසා ඔවුන්ගෙන් තොරතුරු
විමසුවේය. **37** ඔවුහුද, “දැන් ඔබ
අසලින් යන්නේ නාසරෙත් නුවරින්
පැමිණි යේසුස්” කියා ඔහුට දැන්වූහ.[11]
**38** එවිට ඔහු, “දාවිත්ගේ පුත් යේ-
සුස්, මට අනුකම්පා කරන්න”[12] කියා
මහත් හඬින් කෑගැසුවේය. **39** යේ-
සුස්ට ඉදිරියෙන් ගමන් කළ සමූ-
හයා ඔහුට නිශ්ශබ්ද වෙන්න කියා
තදින් අවවාද කළත් ඔහු, “දාවිත්-
ගේ පුත්‍රය, මට අනුකම්පා කරන්න”[13]
කියා තවත් වැඩියෙන් කෑගැසුවේය.
**40** එවිට යේසුස් නැවතී, ඒ මිනිසාව
තමන් ළඟට රැගෙන එන්න කියා
ඉල්ලා සිටියේය.[14] ඒ මිනිසා යේසුස්
ළඟට පැමිණි විට යේසුස් ඔහුගෙන්
මෙසේ ඇසුවේය. **41** “ඔබ කැමති
මා ඔබ වෙනුවෙන් කුමක් කර-
නවාටද?”[15] ඔහුද, “ස්වාමීනි, මගේ
ඇස් පාදන්න”[16] කියා ඔහුට කීවේය.
**42** එවිට යේසුස්, “ඔබේ ඇස්වලට
දැන් පෙනීම ලැබෙයි. ඒ ඔබේ විශ්-
වාසය නිසයි”[17] කියා ඔහුට පැවසු-
වේය. **43** ඒ මොහොතේදීම ඔහුට
පෙනීම ලැබිණ.[18] පසුව ඔහු දෙ-
විට ප්‍රශංසා කරමින්[19] යේසුස් පසුපස
යන්න පටන්ගත්තේය. මෙම සිද්-
ධිය දුටු සමූහයාත් දෙවිට ප්‍රශංසා
කළෝය.

**19** යේසුස් යෙරිකෝවට[1] ඇතුල්
වී, ඒ හරහා ගමන් කරමින්
සිටියේය. **2** එම නුවරෙහි එක්තරා
ධනවත් මිනිසෙක් සිටියේය. ඔහු-
ගේ නම සකෙවුස්ය. සකෙවුස් බදු
එකතු කරන අයගේ ප්‍රධානියෙක්
විය. **3** යේසුස්ව දැක බලා ගැනී-
මට ඔහු උනන්දුවෙන් සිටියත්[2] රැස්ව
සිටි සමූහයා නිසා ඔහුට එය කළ
නොහැකි විය. මන්ද සකෙවුස් මිටි
කෙනෙක් වූයේය. **4** යේසුස් එක්-
තරා පාරක් දිගේ යන බව දැන-
ගත් ඔහු කල්තියාම එතැනට දුව
ගොස් ඔහුව දැක බලා ගැනීමට හැකි
වන ලෙස පාර අසල තිබූ අත්-
තික්කා ගසකට නැග්ගේය. **5** යේ-
සුස් ඒ අසලින් ගිය විට ඔහු සකෙවුස්
දෙස බලා, “සකෙවුස් ඉක්මන් කර
බිමට බහින්න. මම කැමතියි අද ඔබේ
ගෙදර නවතින්න” කියා පැවසුවේය.
**6** ඔහු වහාම ගසෙන් බැස මහත් ප්‍රීති-
යකින් යේසුස්ව තම නිවසට පිළි-
ගත්තේය. **7** සිදු වූ දේ දුටු අය
කොඳුරමින්[3] මෙසේ කියන්න පටන්-
ගත්තෝය. “ඔහු දැන් ගියේ පව්කාර
මිනිසෙකුගේ නිවසටයි.” **8** සකෙ-
වුස් සියලුදෙනා ඉදිරියේ නැඟිට යේ-
සුස්ට මෙසේ පැවසුවේය. “ස්වාමීනි,
බලන්න! මා සතු දෙයින් භාගයක්
මම දිළිඳුන්ට දෙනවා. මා කවුරු
හරි කෙනෙකුට විරුද්ධව බොරු චෝ-
දනා ඉදිරිපත් කර[4] ඔහුගෙන් අයුතු
ලෙස යමක් අරගෙන තිබෙනවා නම්
මම කැමතියි ඔහුට අහිමි වූ ඒ දේ
මෙන් හතර ගුණයක් නැවත ගෙ-
වන්න.”[5] **9** ඊට සවන් දුන් යේසුස්
ඔහුට මෙසේ කීවේය. “අද මේ නිවසට
ගැලවීම ලැබිලා. මේ මිනිසාත් ආබ්‍ර-
හම්ගේ පුත්‍රයෙක් කියා මතක තබා-
ගන්න.[6] **10** මනුෂ්‍ය පුත්‍රයා ආවේ,
නැති වූ අයව සොයා ඔවුන්ව ගලවා-
ගැනීමටයි.”[7]

**11** යේසුස්ගේ ගෝලයන් ඒ දේව-
ලට සවන් දෙමින් සිටියදී, ඔහු

**18 පරි.**

**1** ගීතා 16:10
ගීතා 22
ගීතා 34:20
ගීතා 41:9
ගීතා 69:21
යෙසා 53
මීකා 5:1
සෙක 9:9
සෙක 11:12
සෙක 13:7
**2** මතෙ 16:21
මාක් 10:32
**3** ගීතා 22:7
මතෙ 27:2
ක්‍රියා 3:13
**4** යෙසා 53:5
**5** යෙසා 50:6
**6** යෙසා 53:5
**7** යෙසා 53:7
**8** යෝනා 1:17
මතෙ 20:19
මාක් 10:34
ලූක් 9:22
**9** මාක් 9:32
යොහ 10:6
**10** මතෙ 20:29
මාක් 10:46
**11** මාක් 10:47
**12** මතෙ 20:30
ලූක් 17:13
**13** මතෙ 20:31
මාක් 10:48
**14** මාක් 10:49
**15** මතෙ 20:32
**16** මතෙ 20:33
මාක් 10:51
**17** මතෙ 20:34
ලූක් 7:50
ලූක් 17:19
**18** මාක් 10:52
**19** ලූක් 5:26
ක්‍රියා 4:21
ගලා 1:24

**2 තීරුව**

**19 පරි.**

**1** මතෙ 20:29
**2** යොහ 6:24
යොහ 12:21
**3** මතෙ 9:11
ලූක් 5:30
ලූක් 15:2
**4** නික් 20:16
ලූක් 3:14
**5** නික් 22:1
ලෙවී 6:5
2සාමු 12:6
**6** මතෙ 15:24
ලූක් 13:16
ක්‍රියා 3:25
**7** එස 34:16
මතෙ 9:13
මතෙ 10:6
ලූක් 15:4
රෝම 5:8
1තිමෝ 1:15

තවත් උපමාවක් පැවසුවේය. ඔහු
ඒ අවස්ථාවේදී සිටියේ යෙරුසල-
මට නුදුරින්ය. මෙම උපමාව පැව-
සීමට හේතුව වූයේ ඔහු එහි ගිය
වහාම දෙවිගේ රාජ්‍යයේ පාලනය
ආරම්භ වෙයි කියා ගෝලයන් සිතූ
නිසාය.[1] **12** එහෙයින් ඔහු මෙසේ
කීවේය. “එක්තරා වංශවත් මිනිසෙක්
සිටියා. ඔහු ආපසු පැමිණීමේ අද-
හසින් දුර රටකට ගියා. ඔහු එහි
ගියේ ඔහුගේ රජකම ලබාගැනීම සඳ-
හායි.[2] **13** පිටත්ව යෑමට පෙර ඔහු
තම දාසයන් දසදෙනෙකුව කැඳවා
ඔවුන්ට මීනා* දහයක් දී, ‘මා එන
තුරු මෙයින් වෙළඳාම් කරන්න’[3]
කියා පැවසුවා. **14** මේ අතර ඔහුගේ
රට වැසියන් ඔහුට වෛර කළ නිසා[4]
ඔහු ගිය පසු, ‘මොහු අපේ රජ වෙන-
වාට අපි කැමති නැහැ’[5] යන පණිවි-
ඩය තානාපතීන් පිරිසක් අත දන්වා
යැව්වා.

**15** “කලක් ගත වී ඔහු තම රජ-
කම ලබාගෙන නැවත පැමිණියා.
පසුව ඔහු රිදී මුදල් භාර දුන් දාස-
යන්ව කැඳෙව්වා. ඔහු එසේ කළේ
තමන් භාර දුන් මුදල්වලින් ඔවුන්
ව්‍යාපාර කටයුතුවල නිරත වෙමින්
උපයාගත් දේ සෝදිසි කර බැලීම සඳ-
හායි.[6] **16** පළමුවෙනි දාසයා ඉදිරි-
යට ඇවිත්, ‘ස්වාමීනි, ඔබ මට දුන්
මීනා එකෙන් මට පුළුවන් වුණා මීනා
දහයක් උපයන්න’[7] කියා පැවසුවා.
**17** එවිට ඔහු, ‘ඔබ ඉතා යහපත්
දාසයෙක්! මට ඔබ ගැන ඉතාමත්
සතුටුයි. ඔබ ඉතා සුළු කාරණා-
යකදී විශ්වාසවන්තව කටයුතු කළ
නිසා නුවරවල් දහයක් පාලනය කිරී-
මට මම ඔබව පත් කරනවා’[8] කියා
ඔහුට කිව්වා. **18** ඊළඟට දෙවෙනි
දාසයා ඇවිත්, ‘ස්වාමීනි, ඔබ මට දුන්
මීනා එකෙන් මට පුළුවන් වුණා මීනා
පහක් උපයන්න’[9] කියා පැවසුවා.
**19** එවිට ඔහු, ‘මම ඔබට නුවරවල්
පහක් භාර දෙනවා’[1] කියා ඔහුට
කිව්වා. **20** නමුත් තවත් දාසයෙක්
ඇවිත් මෙසේ පැවසුවා. ‘ස්වාමීනි,
මෙන්න ඔබ මට දුන් මීනා එක.
මම එය රෙදිකඩක ඔතා තබා-
ගෙන සිටියා. **21** ඔබ සැරපරුෂ
කෙනෙක් වන නිසාත් ඔබ වපුරන්-
නේ නැති තැන්වලින් කපාගන්නා
මුදල් තැන්පත් නොකරන තැන්ව-
ලින් මුදල් ලබාගන්නා කෙනෙක් වන
නිසාත් මට ඔබ ගැන බියක් ඇති
වුණා.’[2] **22** එවිට ස්වාමියා ඔහුට
මෙසේ කිව්වා. ‘ඔබ ඉතා දුෂ්ට
දාසයෙක්! මම ඔබට විනිශ්චයක්
දෙන්නේ ඔබේම කටින් පිට වූ වච-
නවලිනුයි.[3] මම සැරපරුෂ කෙනෙක්
බවත් මම මුදල් තැන්පත් නොකරන
තැන්වලින් මුදල් ලබාගන්නා කෙ-
නෙක් බවත් වපුරන්නේ නැති තැන්ව-
ලින් කපාගන්නා කෙනෙක් බවත් ඔබ
දැන සිටියා නම්,[4] **23** ඔබ මගේ රිදී
මුදල් බැංකුවක තැන්පත් නොකළේ
ඇයි? එසේ කළා නම් මට පොලියක්
සමඟම ඒ මුදල ආපසු ලබාගන්න
තිබුණා.’[5]

**24** “ඉන්පසුව ළඟ සිටගෙන සිටි
අයට ඔහු මෙසේ පැවසුවා. ‘ඔහුගෙන්
මීනා එක ගෙන මීනා දහයක් ඇති
තැනැත්තාට දෙන්න.’[6] **25** නමුත්
පිරිසක්, ‘ස්වාමීනි, ඔහුට දැනට-
මත් මීනා දහයක් තිබෙනවා’ කියා
ඔහුට පැවසුවා. **26** ‘මා දැන් කියන
දේට හොඳින් සවන් දෙන්න. යමෙ-
කුට ඇත්නම් ඔහුට තවත් වැඩි-
යෙන් දෙනු ලබයි. නමුත් යමෙකුට
කිසිවක් නැත්නම් ඔහුට තිබෙන දේ
පවා ඔහුගෙන් ගනු ලබයි.[7] **27** මා
රජ වෙනවාට අකමැති මගේ සතුරන්
කොහේද? ඔවුන්ව මෙතැනට ගෙනැ-
වින් මා ඉදිරියෙහිම මරා දමන්න.’ ”[8]

**28** යේසුස් ඒ දේවල් පැවසූ පසු
ඔහු යෙරුසලමට නැඟ යන මාර්ගය
දිගේ අන් අයට ඉදිරියෙන්ම ගමන්
කළේය.[9] **29** ඔහු ඔලීව කන්ද යන
නමින් හැඳින්වූ කන්ද[10] මත පිහිටි
බෙත්පාගය සහ බෙතානිය නම් නුව-

**19 පරි.**
**1** මතෙ 24:33, ලූක් 17:20, ක්‍රියා 1:6, 2තෙස 2:2
**2** මතෙ 25:14, මාක් 13:34, යොහ 18:36
**3** මතෙ 25:15
**4** යොහ 1:11
**5** ගීතා 2:2, මතෙ 23:37
**6** මතෙ 25:19
**7** මතෙ 25:20
**8** මතෙ 25:21, ලූක් 16:10, එළි 2:26
**9** මතෙ 25:22

**2 තීරුව**
**1** මතෙ 25:23
**2** මතෙ 25:24
**3** 2සාමු 1:16, මතෙ 12:37
**4** මතෙ 25:26
**5** ද්වි 23:20, මතෙ 25:27
**6** මතෙ 25:28
**7** මතෙ 13:12, මතෙ 25:29, මාක් 4:25, ලූක් 8:18
**8** උත් 3:15, ගීතා 2:9, යෙසා 60:12, 1කොරි 15:25, 2තෙස 1:9, එළි 19:15
**9** මාක් 10:32, ලූක් 9:51
**10** යොහ 8:1, ක්‍රියා 1:12

**ලූක් 19:13*** මීනා එකක් එවකට සිටි කම්කරුවෙකුගේ මාස තුනක වැටුපට සමානය. රිදී මුදල් වර්ගයක් වූ එහි වටිනාකම ඩ්‍රැක්මා සියයකි.

රවල් ළඟට ගොස් තම ගෝලයන් දෙදෙනෙකුව යවමින්,[1] **30** ඔවුන්ට මෙසේ පැවසුවේය. “ඔබට පෙනෙන අර ගමට යන්න. ඔබ එයට ඇතුල් වූ විට කිසි මිනිසෙකු මේ වන තුරු ඉදගෙන නැති බූරු නාම්බෙක් බැඳ තබා ඇති ආකාරය ඔබ දකියි. ඌව ලිහා මෙතැනට ගෙනෙන්න.[2] **31** කවුරු හරි කෙනෙක්, ‘ඔබ ඌව ලිහන්නේ ඇයි’ කියා ඔබෙන් ඇසුවොත්, ‘ස්වාමීන්ට ඌව අවශ්‍ය වී තිබෙනවා’[3] කියා ඔහුට කියන්න.” **32** ඒ ගෝලයන් දෙදෙනා පිටත්ව ගොස් යේසුස් පැවසූ ලෙසම ඌව සොයාගත්හ.[4] **33** නමුත් ඔවුන් බූරු නාම්බාව ලිහමින් සිටියදී අයිතිකරුවෝ ඇවිත්, “ඔබ මේ බූරු නාම්බාව ලිහන්නේ ඇයි”[5] කියා ඔවුන්ගෙන් ඇසූහ. **34** ඔවුහු, “ස්වාමීන්ට ඌව අවශ්‍යයි”[6] කියා පිළිතුරු දුන්හ. **35** ඔවුහු බූරු නාම්බාව යේසුස් ළඟට ගෙනැවිත් ඌ මත තම පිට වස්ත්‍ර දැමුවෝය. ඉන්පසු ඔවුන්ගේ උපකාරයෙන් යේසුස් ඌ පිට ඉඳගත්තේය.[7]

**36** ඔහු ඌ පිට ගමන් කරද්දී,[8] රැස්ව සිටි අය තම පිට වස්ත්‍ර මඟ දිගේ එළුවෝය.[9] **37** ඔලීව කන්දෙන් බැස එන පාරට ඔහු ළඟා වූ විට රැස්ව සිටි ඔහුගේ ගෝලයන් සමූහය ප්‍රීති වෙමින් තමන් දැක තිබූ සියලු බලවත් ක්‍රියා මතකයට නඟමින් දෙවිට මහත් හඬින් ප්‍රශංසා කරන්න පටන්ගත්තෝය.[10] **38** ඔවුන් පැවසුවේ මෙසේයි. “යෙහෝවා දෙවිගේ නාමයෙන් එන රජාණන්ට ආශීර්වාද ලැබේවා![11] ස්වර්ගයට සාමයද ඉතා උසස් වූ තැන්වල වාසය කරන දෙවිට ගෞරවයද ලැබේවා!”[12] **39** නමුත් සමූහයා අතරේ සිටි පරිසිවරුන් කිහිපදෙනෙක්, “ගුරුතුමනි, ඔබේ ගෝලයන්ට තදින් අවවාද කරන්න”[13] කියා ඔහුට කීවෝය. **40** නමුත් ඔහු, “ඔවුන් නිහඬ වී සිටියොත් ඔවුන් වෙනුවට ගල්[14] මහත් හඬින් කෑගසයි” කියා පිළිතුරු දුන්නේය.

**19 පරි.**
1 මතෙ 21:1 මාක් 11:1
2 මතෙ 21:2 මාක් 11:2
3 ගීතා 50:10 මතෙ 21:3 මාක් 11:3
4 මතෙ 21:6 මාක් 11:4 ලූක් 22:13
5 මාක් 11:5
6 මාක් 11:6
7 2රාජා 9:13 මතෙ 21:7 මාක් 11:7 යොහ 12:14
8 සෙක 9:9
9 මතෙ 21:8 මාක් 11:8
10 මතෙ 21:9
11 යෙසා 62:11
12 ගීතා 118:26 මාක් 11:9 ලූක් 2:14
13 මතෙ 21:15 යොහ 12:19
14 හබ 2:11 මතෙ 3:9

**2 නිරුව**
1 ගීතා 119:136 යෙරෙ 9:1 ලූක් 23:28 යොහ 11:35
2 ද්වි 28:52 ද්වි 32:29
3 යෙසා 6:10 මතෙ 13:14 මාක් 4:12 ක්‍රියා 28:26 රෝම 11:8
4 යෙරෙ 6:6
5 ලූක් 21:20
6 යෙසා 29:3
7 ද්වි 28:57 ආනි 9:26
8 ගීතා 137:9 මීකා 3:12 ලූක් 23:28
9 මතෙ 24:2 මාක් 13:2 ලූක් 21:6
10 හොෂෙ 9:7 මීකා 7:4 ලූක් 1:68 1පේතෘ 2:12
11 මතෙ 21:12 මාක් 11:15
12 යෙසා 56:7
13 යෙරෙ 7:11 මතෙ 21:13 මාක් 11:17 යොහ 2:16
14 මාක් 11:18 යොහ 7:19 යොහ 18:20

**41** පසුව යේසුස් නුවරට ළඟා විය. එය දැක ඔහුට ඒ ගැන මහත් දුකක් ඇති විය. ඔහු හඬමින්,[1] **42** මෙසේ කීවේය. “මේ කාලයේදී ඔබට සමාදානය ලබාගත හැකි ආකාරය තේරුම්ගන්නයි තිබුණේ.[2] නමුත් දැන් ප්‍රමාද වැඩියි. ඒ ප්‍රස්තාව ඔබේ ඇස් ඉදිරිපිටම ඔබට අහිමි වෙලා.[3] **43** ඉදිරියේදී ඔබේ සතුරන් ඇවිත් ඔබව වට කරයි. උල් කළ කණුවලින්[4] ඔවුන් ඔබ වටා[5] විශාල වැටක්[6] සාදා සෑම පැත්තෙන්ම ඔබට ප්‍රහාර එල්ල කරයි.[7] **44** ඔවුන් ඔබවත් ඔබේ දරුවන්වත් පොළොවේ ගසා මරා දමයි.[8] ඔවුන් ඔබේ නුවර සහමුලින්ම විනාශ කරයි. එහි සෑම ගලක්ම බිමට හෙළනු ලබනවා.[9] ඒ සියල්ල ඔබට සිදු වන්නේ ඔබව සෝදිසියට ලක් කළ කාලයේදී ඔබ මුරණ්ඩු ලෙස ක්‍රියා කළ නිසයි.”[10]

**45** ඉන්පසු ඔහු දේවමාලිගාවට ඇතුල් වී, එහි වෙළඳාම් කරමින් සිටි අයව පිටතට එළවා දමන්න පටන්ගෙන,[11] **46** “‘මගේ ගෘහය හඳුන්වනු ලබන්නේ යාච්ඤා ගෘහයක් ලෙසයි’[12] කියා ලියා තිබුණත් ඔබ එය කොල්ලකාරයන්ගේ ගුහාවක් බවට පත් කර තිබෙනවා”[13] කියා ඔවුන්ට පැවසුවේය.

**47** ඔහු දිනපතාම දේවමාලිගාවේ ඉගැන්වූවේය. නායක පූජකයන්, නීතිය පිටපත් කරන්නන් සහ වෙනත් ප්‍රධානීන් මාන බලමින් සිටියේ ඔහුව කෙසේ හෝ මරා දැමීමටය.[14] **48** නමුත් විශාල සමූහයක් ඔහුට එක් රොක් වී ඔහුට උනන්දුවෙන් සවන් දී සිටි නිසා[15] ඔහුට විරුද්ධව කළ යුතු දේ කුමක්ද කියා ඔවුන්ට සිතාගැනීමට නොහැකි විය.

**20** දිනක් යේසුස් දේවමාලිගාවේ සිටි සෙනඟට උගන්වමින් හා ශුභාරංචිය ප්‍රකාශ කරමින් සිටියදී නායක පූජකයෝද නීතිය පිටපත් කරන්නෝද වැඩිමහල්ලන් සමඟ

**15** මාක් 12:37; ලූක් 21:38.

ඔහු ළඟට ඇවිත්,[1] **2** “ඔබට මේ
දේවල් කරන්න අවසර තිබෙනවාද?
කවුද ඔබට ඒ සඳහා අවසර දුන්නේ”[2]
කියා ඔහුගෙන් ඇසුවෝය. **3** ඔහු
මෙසේ පිළිතුරු දුන්නේය. “මමත්
කැමතියි ඔබෙන් ප්‍රශ්නයක් අසන්න.
මට මේ දේ කියන්න.[3] **4** යොහන්
මිනිසුන්ව බව්තීස්ම කළේ දෙවි-
ගේ අවසරයෙන්ද නැත්නම් මිනිසුන්-
ගේ අවසරයෙන්ද?”[4] **5** ඔවුහු තම
තමන් අතරේ මෙසේ කතා කර-
ගත්හ. “අප ‘දෙවිගේ අවසරයෙන්’
කියා කිව්වොත්, ‘ඔබ ඔහුව විශ්-
වාස නොකළේ ඇයි’ කියා ඔහු
අපෙන් අසයි.[5] **6** නමුත් අප, ‘මිනි-
සුන්ගේ අවසරයෙන්’ කියා පැවසු-
වොත් මිනිස්සු ඇවිත් අපට ගල්
ගසයි.[6] මන්ද සියලුදෙනාම සිතාගෙන
සිටින්නේ යොහන්[7] අනාගතවක්තෘ-
වරයෙක්[8] කියායි.” **7** එහෙයින් එම
ප්‍රශ්නයට පිළිතුර තමන් නො-
දන්නා බව ඔවුහු පැවසූහ. **8** යේ-
සුස්ද, “එසේනම් මම මේ දේවල්
කරන්නේ කාගේ අවසරයෙන්ද කියා
මමත් ඔබට කියන්නේ නැහැ”[9] කියා
ඔවුන්ට කීවේය.

**9** ඉන්පසු ඔහු ජනයාට මෙම උප-
මාව විස්තර කළේය. “මිදිවත්තක්
වැවූ එක්තරා මිනිසෙක් සිටියා.[10] ඔහු
වැවිලිකරුවන් පිරිසකට එය බද්-
දට දී දිගු කාලයකට පිටරට ගියා.[11]
**10** පලදාව නෙළන කාලය පැමිණි
විට මිදිවත්තේ පලදාවෙන් යමක්
ලබාගැනීමට[12] ඔහු ඒ වැවිලිකරු-
වන් වෙතට[13] දාසයෙකුව යැව්වා.[14]
නමුත් වැවිලිකරුවන් ඔහුට තළා
ඔහුව ආපසු යැව්වේ හිස් අතිනුයි.[15]
**11** ඔහු තවත් දාසයෙකුව ඔවුන්
වෙතට යැව්වා. ඔවුන් මේ දාසයා-
ටත් නින්දිත ලෙස සලකා ඔහුට
තළා ඔහුවත් යැව්වේ හිස් අතිනුයි.[16]
**12** ඔහු තුන්වෙනි වතාවටත් දාසයෙ-
කුව යැවූ විට[17] ඔවුන් ඔහුට තුවාල
කර පිටතට ඇද දැමුවා. **13** මේ
දේත් ආරංචි වූ පසු මිදිවත්තේ අයිති-
කරු, ‘මම දැන් මොනවාද කරන්නේ?
මම මගේ ප්‍රේමණීය පුත්‍රයාව ඔවුන්
වෙතට යවනවා.[1] සමහරවිට ඔවුන්
ඔහුට ගරු කරයි’ කියා පැවසුවා.
**14** නමුත් වැවිලිකරුවන් ඔහුව දුටු
විට තම තමන් අතරේ කතා කරගනි-
මින්, ‘මේ ඉන්නේ උරුමක්කාරයා.
අපි මොහුව මරා දමමු. එතකොට
ඔහුගේ උරුමය අපටයි අයිති වන්-
නේ’ කියා පැවසුවා.[2] **15** එසේ කියා
ඔවුන් ඔහුව අල්ලාගෙන මිදිවත්තෙන්
පිටතට ඇද දමා[3] මරා දැමුවා.[4] දැන්
මිදිවත්තේ අයිතිකරු ඔවුන්ට කුමක්
කරයිද?[5] **16** ඔහු ඇවිත් ඒ වැවිලික-
රුවන්ව විනාශ කර මිදිවත්ත වෙනත්
මිනිසුන් පිරිසකට භාර දෙයි.”[6]

මෙයට සවන් දුන් අය, “ඒ වගේ දෙ-
යක් කවදාවත් සිදු නොවේවා” කියා
පැවසූහ. **17** නමුත් යේසුස් ඔවුන්
දෙස බලා මෙසේ කීවේය. “එසේ-
නම්, ‘ඉදි කරන්නන් ඉවත දැමූ ඒ
ගල[7] ප්‍රධාන ගල වී ඇත’[8] කියා
ලියා තිබෙන දෙයින් අදහස් කරන්නේ
කුමක්ද? **18** එම ගල පිට යම් කෙ-
නෙක් වැටුණොත් ඔහු සුනුවිසුනු වී
යයි.[9] එය යමෙකු පිට වැටුණු විටද[10]
එය ඔහුව සුනුවිසුනු කර දමයි.”[11]

**19** යේසුස් එම උපමාව කිව්වේ
තමන් ගැන බව වටහාගත්[12] නීතිය
පිටපත් කරන්නෝ සහ නායක පූජ-
කයෝ ඒ පැයේදීම ඔහුව අල්ලාගැ-
නීමට මඟක් සෙවූහ. නමුත් ඔවුන්
රැස්ව සිටි සෙනඟට බියෙන් සිටි
නිසා ඔවුන්ට කිසිම දෙයක් කරන්න
බැරි විය. **20** යේසුස් කරන දේවල්
හොඳින් බලා සිටි ඔවුහු, යම් පිරි-
සකට රහසින් මුදල් ගෙවා ඔවුන්ව
යේසුස් ළඟට යැවූහ. ඔවුන්ගේ අද-
හස වූයේ ඔහු පවසන යම් දෙයකින්
ඔහුගේ වරදක් අල්ලාගෙන[13] ඔහුව
බලධාරීන්ට සහ ආණ්ඩුකාරයා අතට
භාර දීමටයි.[14] එම පිරිසට තමන්
ධර්මිෂ්ඨයි කියා මවාපෑමට උපදෙස්
දී තිබිණ. **21** එහෙයින් ඔවුහු ගොස්
යේසුස්ට මෙසේ පැවසූහ. “ගුරුතුමනි,
ඔබ නිවැරදි ආකාරයට කතා කරන
කෙනෙක් බවත් ඔබේ ඉගැන්වීම් නිවැ-

**20 පරි.**
1 මතෙ 21:23
2 මාක් 11:28
ක්‍රියා 4:7
ක්‍රියා 7:27
3 මතෙ 21:24
මාක් 11:29
4 මාක් 11:30
5 මතෙ 21:25
මාක් 11:31
6 මතෙ 14:5
7 මතෙ 11:9
ලූක් 7:29
8 මතෙ 21:26
මාක් 11:32
9 මතෙ 21:27
මාක් 11:33
10 ගීතා 80:8
සල 8:11
යෙසා 5:1
යෙරෙ 2:21
11 මතෙ 21:33
මාක් 12:1
12 මතෙ 21:34
මාක් 12:2
13 ක්‍රියා 7:52
14 2රාජා 17:13
2ලේක 36:15
15 1තෙස 2:15
හෙබ්‍රෙ 11:36
16 මතෙ 21:36
මාක් 12:4
17 නෙහෙ 9:29

**2 තීරුව**
1 මතෙ 17:5
යොහ 3:16
2 මතෙ 21:38
මාක් 12:7
3 හෙබ්‍රෙ 13:12
4 ක්‍රියා 3:15
5 මතෙ 21:40
6 මතෙ 21:41
මාක් 12:9
7 ගීතා 118:22
1පේතෘ 2:7
8 යෙසා 28:16
මතෙ 21:42
මාක් 12:10
9 යෙසා 8:15
10 දානි 2:35
දානි 2:44
11 ගීතා 2:9
යෙසා 8:14
මතෙ 21:44
12 මතෙ 21:45
මාක් 12:12
13 ලූක් 11:54
14 මතෙ 22:15
මාක් 12:13

රදි බවත් ඔබ කාගෙවත් පැත්ත නොා-
ගෙන කතා කරන බවත් දෙවි කියා දී
තිබෙන මාර්ගය සත්‍යය පදනම් කර-
ගෙන උගන්වන බවත් අපි දන්නවා.[1]
**22** ඒ නිසා සීසර්ට බදු ගෙවිය යුතුද
නැද්ද කියා අපට කියන්න පුළුවන්ද?”[2]
**23** නමුත් යේසුස් ඔවුන්ගේ කපටිකම
අවබෝධ කරගෙන ඔවුන්ට මෙසේ
කීවේය.[3] **24** “මට ඩිනාරි කාසියක්*
දෙන්න. මෙහි තිබෙන රූපයත් නමත්
කාගේද?” “සීසර්ගේ”[4] කියා ඔවුහු
පිළිතුරු දුන්නෝය. **25** “එසේනම්
සීසර්ට අයිති දේ සීසර්ටත්[5] දෙවිට
අයිති දේ දෙවිටත් දෙන්න”[6] කියා
ඔහු ඔවුන්ට පැවසුවේය. **26** ඒ අනුව
යේසුස් පැවසූ දේ නිසා සියලුදෙනා
ඉදිරියේ ඔහුගේ යම් වරදක් අල්ලාගැ-
නීමට ඔවුන් දැරූ උත්සාහය අසාර්-
ථක විය. ඔවුහු ඔහුගේ එම පිළිතුරෙන්
පුදුම වී නිහඬව සිටියෝය.[7]
**27** නමුත් මිය ගිය අය නැවත
නැඟිටින්නේ නැති බව කියන සද්-
දුසිවරුන්ගෙන්* කිහිපදෙනෙක් ඔහු
ළඟට ඇවිත්[8] ඔහුගෙන් ප්‍රශ්නයක්
ඇසුවෝය. **28** ඔවුන් පැවසුවේ මෙ-
යයි. “ගුරුතුමනි, ‘මිනිසෙක් දරුවන්
නැතුව මිය ගියොත් ඔහුගේ සහෝද-
රයා[9] ඔහුගේ බිරිඳව විවාහ කර-
ගෙන තම සහෝදරයාගේ නමින්
දරුවන් බිහි කළ යුතුයි’[10] කියා මෝ-
සෙස්ට දෙන ලද නීතියේ සඳහන්
වී තිබුණා.[11] **29** එක්තරා පවුලක
සහෝදරයන් හත්දෙනෙක් සිටියා.
පළමුවෙනියා ස්ත්‍රියක් සමඟ විවාහ
වුණත් ඔහු දරුවන් නැතුව මිය
ගියා.[12] **30** දෙවෙනියා ඇයව විවාහ
කරගත්තත් ඔහුත් දරුවන් නැතුව
මිය ගියා. **31** ඉන්පසු තුන්වෙනි-
යාද ඇයව විවාහ කරගත්තා. නමුත්
ඔහුත් මිය ගියා. එලෙස හත්දෙනාම
ඇයව විවාහ කරගත්තත් ඒ හත්-
දෙනාම දරුවන් නැතුව මිය ගියා.[13]
**32** අන්තිමේදී ඒ ස්ත්‍රියත් මිය ගියා.[14]
**33** හත්දෙනාම ඇයව විවාහ කරගත්
නිසා නැවත නැඟිටීමේදී ඇය කාගේ
බිරිඳ වෙයිද?”[1]
**34** එවිට යේසුස් ඔවුන්ට මෙසේ
කීවේය. “පවතින මේ සමාජයේ ජීවත්
වන අය* නම් විවාහ වෙනවා.[2]
**35** නමුත් මතු පැමිණෙන කාල-
යේදී*[3] නැවත නැඟිටීමක්[4] ලබා
ජීවත් වීමට සුදුසුකම් ලබන අය[5]
විවාහ වෙන්නේ නැහැ. **36** ඇත්-
තෙන්ම ඔවුන් නැවත මිය යන්නෙත්
නැහැ.[6] ඔවුන් දේවදූතයන් හා සමාන
වෙයි. නැවත නැඟිටීමක් ලබන නිසා
ඔවුන් දෙවිගේ දරුවන් වෙනවා.[7]
**37** මිය ගිය අය නැවත නැඟිටින
බව මෝසෙස් පවා පැහැදිලි කළා.
කටු පඳුර අසල සිද්ධියේ[8] යෙහෝවා
දෙවිව හඳුන්වා තිබුණේ, ‘ආබ්‍ර-
හම්ගේද ඊසාක්ගේද යාකොබ්ගේද
දෙවි’ ලෙසයි.[9] **38** මෙයින් පැහැදිලි
වන්නේ ඔහු මිය ගොස් ඇති අයගේ
දෙවි නොව ජීවත් වන අයගේ දෙවි
බවයි. මන්ද ඔවුන් මිය ගොස් සිටියත්
දෙවි ඔවුන්ව සලකන්නේ ජීවත් වන
අය හැටියටයි.”[10] **39** එවිට නීතිය
පිටපත් කරන්නන් අතරින් කිහිපදෙ-
නෙක්, “ගුරුතුමනි, ඔබ පැවසූ දේවල්
නිවැරදියි” කියා කීවෝය. **40** ඉන්-
පසු කිසි කෙනෙකුට ඔහුගෙන් නව
එක ප්‍රශ්නයක්වත් අසන්න ධෛර්යය
තිබුණේ නැත.
**41** යේසුස් ඔවුන්ට මෙසේ කීවේය.
“ක්‍රිස්තුස් දාවිත්ගේ පුත්‍රයා කියා පව-
සන්නේ කුමන පදනමක් මතද?[11]
**42** මන්ද දාවිත්, ගීතාවලියෙහි
කියන්නේ මෙයයි. ‘යෙහෝවා දෙවි
මාගේ ස්වාමීන්ට මෙසේ කීවේය.
“මාගේ දකුණු පැත්තේ ඉඳගන්න.
**43** මා ඔබේ සතුරන්ව ඔබේ පා පුටුව
ලෙස තබන තුරු එසේ සිටින්න.”’[12]
**44** දාවිත් ඔහුට ‘ස්වාමීන්’ කියා පව-
සනවා නම් ඔහු දාවිත්ගේ පුත්‍රයා වන්-
නේ කොහොමද?”

**20 පරි.**
1 ලෙවී 19:15; මතෙ 22:16; මාක් 12:14
2 මතෙ 22:17
3 හිතෝ 26:24; මතෙ 22:18; මාක් 12:15
4 මතෙ 22:20; මාක් 12:16
5 රෝම 13:7; තිත 3:1; 1පේතෘ 2:13
6 මතෙ 22:21; මාක් 12:17; ලූක් 23:2
7 මතෙ 22:22
8 මතෙ 22:23; මාක් 12:18; ක්‍රියා 23:8
9 උත් 38:8
10 මතෙ 22:24; මාක් 12:19
11 ද්වි 25:5
12 මතෙ 22:25
13 මාක් 12:21
14 මතෙ 22:27

**2 තීරුව**
1 මතෙ 22:28; මාක් 12:23
2 උත් 1:28; ලූක් 17:27
3 එෆි 1:21; හෙබ්‍රෙ 1:2; හෙබ්‍රෙ 6:5; 2පේතෘ 3:13
4 යොහ 5:29; ක්‍රියා 24:15
5 එළි 3:4
6 එළි 21:4
7 මතෙ 22:30; මාක් 12:25; යොහ 5:29
8 නික් 3:2
9 නික් 3:6; නික් 6:3
10 මතෙ 22:32
11 මතෙ 22:42; මාක් 12:35
12 ගීතා 110:1; ක්‍රියා 2:34

**ලූක් 20:24*** ලූක් 7:41හි පාදසටහන බලන්න. **27*** යේසුස්ගේ කාලයේ සිටි ප්‍රසිද්ධ ආගමික නායකයන් පිරිසකි.

**ලූක් 20:34*** මූ.අ., “පවතින මේ සමාජයේ දරුවන්.” **35*** මූ.අ., “ඒ සමාජ ක්‍රමයේදී.”

**45** ඉන්පසු සියලුදෙනාම අසා-
ගෙන සිටියදී ඔහු තම ගෝලයන්ට
මෙසේ කීවේය.[1] **46** “නීතිය පිටපත්
කරන්නන්ගෙන් පරෙස්සම් වන්න.
ඔවුන් විශේෂ සළු ඇඳගෙන එහා
මෙහා ඇවිදීමටත් වෙළඳපොළවලදී
ආචාර ලබන්නත් කැමැත්තෙන් සිටි-
නවා. ඔවුන් සිනගෝගවලදී ඉදිරි
ආසනවල සහ සන්ධ්‍යා භෝජනව-
ලදී ප්‍රධානතම ස්ථානවල සිටින්නත්
කැමතියි.[2] **47** ඔවුන් අනුන් ඉදිරි-
යේ මවාපෑමක් කරමින් දීර්ඝ යාච්ඤා
ඉදිරිපත් කළත් වැන්දඹුවන්ගේ ඉඩ-
කඩම් දේපොළ පැහැරගන්නවා.[3] ඒ
නිසා ඔවුන්ට ලැබෙන්නේ වඩාත් බර-
පතළ විනිශ්චයක්.”[4]

**21** යේසුස් අවට බැලූ විට
ධනවතුන් තම පරිත්‍යාග
මුදල් බඳුන්වලට දමනවා දුටුවේය.[5]
**2** මේ අතර එක්තරා දිලිඳු වැන්දඹු-
වක්ද ඇවිත් ඉතා සුළු වටිනාකමක්
ඇති කුඩා කාසි දෙකක් එහි දම-
නවා[6] දුටු ඔහු, **3** මෙසේ කීවේය.
“ඇත්තෙන්ම මා ඔබට කියන්නේ,
මේ වැන්දඹුව දුප්පත් වුණත් ඇය
අන් සියලුදෙනාටම වඩා වැඩියෙන්
දැමූ බවයි.[7] **4** මන්ද සියලුදෙනාම
පරිත්‍යාග කළේ තමන්ට වැඩි-
පුර තිබුණු දෙයිනුයි. නමුත් ඇයට
අගහිඟකම් තිබුණත් තම ජීවිතය
ගෙන යෑමට තිබුණු සියල්ලම ඇය
දැම්මා.”[8]

**5** පසු අවස්ථාවකදී දේවමාලිගාව
මිල අධික ගල්වලින් හා දෙවිට පිදූ
විවිධ දේවලින් අලංකාරවත් කර තිබූ
අන්දම ගැන සමහරු කතා කර-
මින් සිටියෝය.[9] **6** එවිට ඔහු, “ඔබ
දකින මේ දේවල් සියල්ල නැති වී
යන කාලයක් ඉදිරියට එයි. එදාට
මෙහි තිබෙන සෑම ගලක්ම බිමට
හෙළනු ලබනවා”[10] කියා පැවසුවේය.
**7** එවිට ඔවුහු ඔහුගෙන් මෙසේ ප්‍රශ්න
කළෝය. “ගුරුතුමනි, ඔබ පැවසූ ඒ
දේ ඇත්තටම සිදු වන්නේ කවදාද? ඒ
වගේම මේ සියල්ල සිදු වීමට නියමිත
කාලය දැනගන්න කුමක් හෝ ලකු-
ණක් තිබෙනවාද?”[1] **8** ඔහු මෙසේ
කීවේය. “කිසිම දෙයකින් නොමඟ
යන්න එපා.[2] මන්ද ‘මම ක්‍රිස්තුස්’
කියාත් ‘නියමිත කාලය ඇවිල්ලා’[3]
කියාත් පවසමින් බොහෝදෙනෙක්
මගේ නාමයෙන් එයි. ඔවුන් පසුපස
යන්න එපා. **9** ඒ වගේම ඔබට යුද්ධ
කෝලහල ගැන අසන්න ලැබෙයි. ඒ
වුණත් භය වෙන්න එපා.[4] මන්ද ඒ
දේවල් මුලින්ම සිදු විය යුතුයි. නමුත්
අවසානය ඒ අවස්ථාවේදීම පැමි-
ණෙන්නේ නැති බව මතක තබා-
ගන්න.”

**10** ඔහු ඔවුන්ට මෙසේද කීවේය.
“ජාතියක් තවත් ජාතියකට විරුද්-
ධවත්[5] රාජ්‍යයක් තවත් රාජ්‍යයකට
විරුද්ධවත්[6] යුද්ධ කරයි. **11** මහත්
භූමිකම්පාත් ඇති වෙයි. ඒ වගේම එක්
තැනක් පාසා තවත් තැනක වසං-
ගතද ආහාර හිඟකම්ද ඇති වෙයි.[7]
මිනිස්සු බිහිසුණු දේවල් දකින අතර
ඔවුන් අහසෙහි* සිදු වන පුදුමාකාර
ලකුණුද දකියි.[8]

**12** “නමුත් ඒ සියල්ලට කලින්
මිනිසුන් ඔබව අල්ලාගෙන සිනගෝ-
ගවලටත් සිරගෙවල්වලටත් භාර දී
ඔබට පීඩා කරයි.[9] ඔබ මගේ නාමය
දරන නිසා ඔබව රජුන් සහ ආණ්ඩුකා-
රයන් ඉදිරියට ඇදගෙන යනු ලබයි.[10]
**13** එයින් ඔබට සාක්ෂි දරන්න ප්‍රස්-
තාවක් උදා වෙයි.[11] **14** ඔබ නිදොස්
බව ඔප්පු කර පෙන්වන්නේ කෙසේද
කියා සිතමින් කරදර වෙන්න එපා.[12]
**15** මන්ද ඒ අවස්ථාවේදී මම ඔබට
ප්‍රඥාවන්තව කතා කරන්න හැකියාව
ලබා දෙනවා. ඒ නිසා ඔබ පවසන දේ-
වලට විරුද්ධව දේවල් කියන්න ඔබට
විරුද්ධව නැඟී සිටින අයට කොහො-
මටවත් බැරි වෙයි.[13] **16** ඔබේ දෙ-
මාපියන්,[14] සහෝදරයන්, නෑදෑයන්
හා මිතුරන් පවා ඔබව පාවා දෙයි.
ඔවුන් ඔබෙන් සමහරදෙනෙකුව මර-
ණයටත් පත් කරයි.[15] **17** ඔබ මගේ

**20 පරි.**
1 මතෙ 23:1 මාක් 12:38
2 මතෙ 23:6 මාක් 12:39
3 යෙසා 10:2 2තිමෝ 3:6
4 මාක් 12:40

**21 පරි.**
5 මාක් 12:41
6 මාක් 12:42
7 මාක් 12:43 2කොරි 8:12
8 මතෙ 22:37 මාක් 12:44
9 මතෙ 24:1 මාක් 13:1
10 1රාජා 9:7 1රාජා 9:8 යෙරෙ 7:14 මීකා 3:12 මතෙ 24:2 මාක් 13:2 ලූක් 19:44

**2 තීරුව**
1 මතෙ 24:3 මාක් 13:4
2 එෆී 5:6 2තෙස 2:3 2තිමෝ 3:13 1යොහ 4:1 එළි 12:9
3 මතෙ 24:5 මාක් 13:6
4 හිතෝ 3:25 මතෙ 24:6 මාක් 13:7
5 එළි 6:4
6 මතෙ 24:7 මාක් 13:8
7 ක්‍රියා 11:28 එළි 6:8
8 එළි 6:12
9 මතෙ 10:17 මාක් 13:9 යොහ 16:2
10 මතෙ 24:9 මාක් 13:9 ක්‍රියා 25:23 එළි 2:10
11 පිලි 1:28
12 ලූක් 12:11
13 මාක් 13:11 ක්‍රියා 6:10
14 2තිමෝ 3:3
15 මීකා 7:6 මතෙ 24:10 මාක් 13:12 ක්‍රියා 7:59

---

**ලූක් 21:11*** මෙහි භාවිත කර ඇති ග්‍රීක වචනය “ස්වර්ගය” සඳහාත් භාවිත කෙරේ.

නාමය දරන නිසා සියලුදෙනා ඔබට වෛර කරයි.[1] **18** ඒ වුණත් ඔබේ එක කෙස්ගසකටවත්[2] හානියක් සිදු වන්නේ නැහැ. **19** ඔබ විඳදරාගෙන සිටියොත් ඔබට ගැලවීම ලැබෙයි.[3]

**20** "සේනාවන් ඇවිත් යෙරුසලම වටා කඳවුරු බැඳගෙන සිටින ආකාරය[4] ඔබ දකින විට යෙරුසලමේ විනාශය ළඟා වී ඇති බව ඔබ දැනගත යුතුයි.[5] **21** යුදයේ සිටින අය කඳුවලට පලා යා යුතුයි. යෙරුසලම තුළ සිටින අය නුවරින් ඉවත් විය යුතු අතර ගම්බද පළාත්වල සිටින අය නුවරට ඇතුල් වීමෙන් වැළකී සිටිය යුතුයි.[6] **22** මන්ද ලියා තිබෙන සියල්ල ඉටු වීම සඳහා ඒ දවස්වලදී දෙවි තම විනිශ්චය ක්‍රියාත්මක කරයි.[7] **23** ඒ දවස්වලදී ගැබිනි මව්වරුන්ටත් කිරි දෙන මව්වරුන්ටත් මහත් දුෂ්කරතා ඇති වෙයි![8] දැඩි අසීරුතාවලට මුහුණ දෙන්න සිදු වන දේශයේ වැසියන්ට දෙවිගෙන්ද දඬුවම් ලැබෙයි. **24** ඔවුන් කඩු පහර කා මැරී වැටෙයි. ඔවුන්ව සෑම ජාතියක් වෙතටම වහලුන් ලෙස ගෙන යනු ලබයි.[9] යෙරුසලම වෙනත් ජාතීන් විසින් පාගා දමනු ලබයි. එම ජාතීන් සඳහා නියමිත වූ කාලය[10] නිම වන තුරු ඒ දේ දිගටම සිදු වෙයි.

**25** "මේ අතර ඉර,[11] සඳ හා තාරකාවල ලකුණු දකින්න ලැබෙයි. මුහුද[12] කැලඹී[13] එයින් මහත් ඝෝෂාවක් හටගන්නා නිසා පොළොවේ ජාතීන් ගැලවීමට කිසි මඟක් නොදකිමින් දැඩි වේදනා අද්දකියි. **26** ඒ අතරතුර ලොවට සිදු වෙන්න යන දේවල් ගැන මිනිසුන් නිතරම කල්පනා කරමින් සිටින නිසාත්[14] ඔවුන්ට දැනෙන බිය නිසාත් ඔවුන් ක්ලාන්ත වී ඇද වැටෙයි.[15] මන්ද අහසේ තිබෙන සියලු බලයන් සොලවනු ලබයි.[16] **27** එවිට මනුෂ්‍යා පුත්‍රයා[17] බලයෙන්ද මහත් තේජසකින්ද වලාකුළක එන ආකාරය දැකගන්න ඔවුන්ට හැකි වෙයි.[18] **28** නමුත් ඒ දේ සිදු වෙන්න පටන්ගන්නා විට ඔබ ධෛර්යය උපදවාගෙන නැඟිටින්න. ඔබේ හිස් ඔසවන්න. මන්ද ඔබේ ගැලවීම ළඟයි."

**29** යේසුස් ඊළඟට ඔවුන්ට මෙම උපමාව විස්තර කළේය. "අත්තික්කා ගස ගැනත් අනිකුත් ගස් ගැනත් කල්පනා කර බලන්න.[1] **30** එම ගස්වල දලු ලියලා ඇති විට ගිම්හානය ළඟ බව ඔබ දන්නවා.[2] **31** එලෙසම ඔබ මේ දේවල් සිදු වෙනවා දකින විට දෙවිගේ රාජ්‍යය ළඟ බව දැනගන්න.[3] **32** ඇත්තෙන්ම මා ඔබට කියන්නේ, සියල්ල සිදු වන තුරු මේ පරම්පරාව පහව යන්නේ නැති බවයි.[4] **33** අහස පොළොව පහව ගියත්[5] මා පැවසූ වචන පහව යන්නේ නැහැ.[6]

**34** "ඔබ ගැන හොඳ අවධානයකින් සිටින්න. එසේ නොකළොත් අධික[7] කෑමෙන් හා බීමෙන් නැතහොත් එදිනෙදා ජීවිතයේ ඇති වන කරදර නිසා[8] ඔබේ සිත් බර විය හැකියි. එවිට හදිස්සියේම ඔබ නොසිතූ මොහොතක ඒ දවසට මුහුණ දෙන්න ඔබට සිදු වෙයි.[9] **35** එවිට එම දවස ඔබට උගුලක් වෙයි.[10] පොළොව පුරා ජීවත් වන සෑම කෙනෙකුටම ඒ දවසට මුහුණ දෙන්න සිදු වෙයි.[11] **36** එමනිසා අවදිව සිටින්න.[12] නිතරම දෙවිට කන්නලව් කරමින් සිටින්න.[13] එවිට අනිවාර්යයෙන්ම පැමිණෙන ඒ සියල්ලෙන් ගැලවී මනුෂ්‍යා පුත්‍රයා ඉදිරියෙහි පෙනී සිටීමට ඔබට හැකි වෙයි."[14]

**37** එලෙස ඔහු දිවා කාලයේදී දේවමාලිගාවේ ඉගැන්වූවේය.[15] රාත්‍රි කාලයේදී ඔලීව කන්ද කියා හැඳින්වූ කන්දෙහි පිහිටි එක්තරා ස්ථානයක ඔහු නවාතැන් ගත්තේය.[16] **38** සියලුම ජනයා[17] ඔහුට සවන් දීම සඳහා දේවමාලිගාවට උදෑසනින්ම ආවෝය.

# 22

පාස්කු උත්සවය[18] එනම්, මුහුන් නොදැමූ රොටි උත්සවය පැවැත්වීමේ කාලය ළඟා විය.

**21 පරි.**
**1** මතෙ 10:22 මාක් 13:13
**2** 1සාමු 14:45 මතෙ 10:30 ලූක් 12:7
**3** 2ලේක 15:7 රෝම 5:3 හෙබ්‍රෙ 10:36 2පේතෘ 1:6
**4** ලූක් 19:43
**5** දානි 9:26 මතෙ 23:38 මතෙ 24:15
**6** මතෙ 24:16 මාක් 13:14
**7** ද්වි 32:35 ද්වි 32:43 යෙරෙ 5:29 හොෂෙ 9:7
**8** මතෙ 24:19 මාක් 13:17 ලූක් 19:44 ලූක් 23:28
**9** ද්වි 28:64 ගීතා 79:1 යෙසා 63:18 දානි 9:27 සෙක 12:3
**10** එස 21:26 එස 21:27 දානි 4:25
**11** එළි 6:12
**12** යෙසා 57:20 එළි 17:15
**13** මතෙ 24:29 මාක් 13:24
**14** යෝවෙ 2:10 යෝවෙ 2:30
**15** ශෙප 1:17
**16** යෙසා 34:4 2පේතෘ 3:10
**17** දානි 7:13
**18** මතෙ 24:30 මාක් 13:26 එළි 1:7

**2 නීරුව**
**1** මතෙ 24:32 මාක් 13:28
**2** මතෙ 24:33
**3** මාක් 13:29
**4** මතෙ 24:34 මාක් 13:30
**5** මතෙ 5:18
**6** මතෙ 24:35 මාක් 13:31 එළි 3:14
**7** යෙසා 5:11
**8** මතෙ 6:25 1තිමෝ 6:8
**9** හිතෝ 11:4 යෙසා 5:13 රෝම 13:13
**10** 1තෙස 5:3
**11** 1තෙස 5:2 2පේතෘ 3:10
**12** මතෙ 25:13 මාක් 13:33
**13** රෝම 12:12 එෆී 6:18 1පේතෘ 4:7

**14** මතෙ 24:42; මාක් 13:35; 1කොරි 16:13; 1පේතෘ 5:8; එළි 6:17; එළි 16:15; **15** ලූක් 19:47; **16** යොහ 8:1; **17** මාක් 12:37; ලූක් 19:48; **22 පරි.** **18** නික් 12:3; ලෙවී 23:5; යොහ 13:1; 1කොරි 5:7.

**2** මේ අතර ජනතාවට බියෙන් සිටි[1]
නායක පූජකයෝ සහ නීතිය පිට-
පත් කරන්නෝ යේසුස්ව මරා දැමීමට
උපක්‍රමයක් සොයමින් සිටියෝය.[2]
**3** ඒ අවස්ථාවේදී දොළොස්දෙනා-
ගෙන් කෙනෙක් වූ[3] යූදස් ඉස්කා-
රියොත් සාතන්ගේ බලපෑමට හසු
විය. **4** එහෙයින් ඔහු නායක පූජක-
යන්ව සහ දේවමාලිගාවේ ප්‍රධානීන්ව
හමු වී යේසුස්ව ඔවුන්ට පාවා දීමට
උපක්‍රමයක් ගැන සාකච්ඡා කළේය.[4]
**5** ඒ ගැන මහත් සේ සතුටු වූ ඔවුහු,
ඔහුට රිදී මුදල් දීමට එකඟ වූහ.[5]
**6** ඔහු තමාට ලබා දෙන මුදලට
එකඟ වී සෙනඟ නැති වේලාවක යේ-
සුස්ව ඔවුන් අතට පාවා දීමට සුදුසු
අවස්ථාවක් පැමිණෙන තෙක් බලා
සිටියේය.[6]

**7** පාස්කු යාගය පූජා කරන මුහුන්
නොදැමූ රොටි උත්සවය පවත්-
වන දිනය උදා විය.[7] **8** යේසුස්ද,
"ගොස් අප සඳහා පාස්කු භෝජනය
සූදානම් කරන්න"[8] කියා පේතෘස්ට
සහ යොහන්ට පැවසුවේය. **9** එවිට
ඔවුහු, "ඒ සඳහා අප සූදානම් කළ
යුත්තේ කොයි වගේ තැනක්ද" කියා
ඔහුගෙන් ඇසූහ. **10** යේසුස් ඔවුන්ට
මෙසේ කීවේය.[9] "ඔබ නුවරට ඇතුල්
වූ විට වතුර පිරුණු මැටි භාජනයක්
උසුලාගෙන යන මිනිසෙක් ඔබට හමු
වෙයි. ඔහු සමඟ ගොස් ඔහු යන නිව-
සට ඇතුල් වෙන්න.[10] **11** එම නිව-
සේ අයිතිකරුට මෙහෙම කියන්න.
'"මගේ ගෝලයන් සමඟ පාස්කු භෝ-
ජනය ගැනීමට මට වෙන් කළ කාම-
රය කොතැනද" කියා අපේ ගුරුතුමා
ඔබෙන් අසන්න කිව්වා.'[11] **12** එවිට
ඒ මිනිසා අවශ්‍ය දේවල් සහිතව පිළි-
යෙල කර ඇති විශාල උඩුමහල් කාම-
රයක් ඔබට පෙන්වයි. ඔබ භෝජනය
සූදානම් කළ යුත්තේ එතැනයි."[12]
**13** ඔවුන් පිටත්ව ගිය විට යේසුස්
ඔවුන්ට පැවසූ ලෙසම සෑම දෙයක්ම
සිදු විය. ඔවුහු පාස්කුව සඳහා අවශ්‍ය
සෑම දෙයක්ම සූදානම් කළෝය.[13]

**22 පරි.**
**1** මතෙ 21:46
මතෙ 26:4
මාක් 14:2
ලූක් 20:19
**2** ලූක් 9:22
**3** මතෙ 26:14
මාක් 14:10
යොහ 6:70
යොහ 13:2
යොහ 13:27
ක්‍රියා 1:17
**4** යොහ 13:18
**5** සෙක 11:12
මතෙ 26:15
1තිමෝ 6:10
යූද් 11
**6** මතෙ 26:16
මාක් 14:11
**7** නික් 12:14
නික් 12:18
ලෙවී 23:6
ද්වි 16:2
මතෙ 26:17
මාක් 14:12
**8** නික් 12:8
**9** 1සාමු 10:3
**10** මතෙ 26:18
මාක් 14:13
**11** මාක් 14:14
**12** මාක් 14:15
**13** මතෙ 26:19
මාක් 14:16
ලූක් 19:32

**2 තීරුව**
**1** මතෙ 26:20
මාක් 14:17
**2** ලූක් 13:29
ලූක් 14:15
**3** 1කොරි 10:16
1කොරි 11:25
**4** එළි 19:9
**5** නික් 12:8
නික් 12:20
ද්වි 16:3
1කොරි 10:17
1කොරි 11:23
**6** හෙබ්‍රෙ 10:10
1පේත්‍ර 2:24
**7** යොහ 6:51
1කොරි 10:16
**8** මතෙ 26:26
මාක් 14:22
1කොරි 11:24
**9** මාක් 14:23
1කොරි 10:16
**10** ගීතා 50:5
මතෙ 26:28
මාක් 14:24
හෙබ්‍රෙ 2:16
හෙබ්‍රෙ 9:14
1පේත්‍ර 1:19
**11** යෙරෙ 31:31
යෙරෙ 32:40
2කොරි 3:6
හෙබ්‍රෙ 7:22
හෙබ්‍රෙ 8:8

**14** නියමිත වේලාව පැමිණි විට
යේසුස්ද තම නියෝජිතයෝද* මේ-
සය වටා ඉඳගත්තෝය.[1] **15** එවිට
ඔහු ඔවුන්ට මෙසේ පැවසුවේය. "වධ
විඳින්න කලින් ඔබ සමඟ මේ පාස්කු
භෝජනයට සහභාගි වෙන්න මා තුළ
තිබුණේ මහත් ආශාවක්. **16** මන්ද
දෙවිගේ රාජ්‍යයේදී පාස්කුවේ නියම
අර්ථය ඉටු වන තුරු මම පාස්කු
භෝජනයට නැවත සහභාගි වෙන්-
නේ නැහැ."[2] **17** ඊළඟට ඔහු කුස-
ලානයක් ගෙන[3] දෙවිට ස්තුති කර
මෙසේ කීවේය. "මෙය එකිනෙකා අත
යවන්න. **18** මන්ද දෙවිගේ රාජ්‍යය
පැමිණෙන තුරු[4] මම නැවත වයින්
බොන්නේ නැහැ."

**19** ඉන්පසුව යේසුස් රොටියක්
ගෙන[5] දෙවිට ස්තුති කර, එය කඩා
ඔවුන්ට දෙමින් මෙසේ කීවේය. "මෙ-
යින් නියෝජනය වන්නේ ඔබ වෙනු-
වෙන් මා පූජා කරන්න යන[6] මගේ
ශරීරයයි.[7] මාව සිහි කිරීමට මේ දේ
නොකඩවා කරන්න."[8] **20** ඊළඟට
භෝජනය* ගත් අවස්ථාවේදී කළ
ආකාරයටම ඔහු කුසලානයක්[9] ගෙන
ඔවුන් අතට දෙමින් මෙසේ කීවේය.
"මේ කුසලානයෙන් නියෝජනය වන්-
නේ ඔබ උදෙසා වගුරුවනු ලබන
මගේ රුධිරයයි.[10] අලුත් ගිවිසුම[11]
ස්ථිර වන්නේ මගේ රුධිරය මාර්ගයෙ-
නුයි.[12]

**21** "නමුත් බලන්න, මේ මේසයේ[13]
මාව පාවා දෙන තැනැත්තාත් සිටි-
නවා.[14] **22** මන්ද තමාට නියම කර
තිබෙන ගමන යන්න මනුෂ්‍ය පුත්‍රයාට
සිදු වෙයි.[15] නමුත් ඔහුව පාවා දෙන
තැනැත්තාට දරුණු විපතකට මුහුණ
දෙන්න සිදු වෙයි."[16] **23** එවිට ඔවුහු
මේ කවුරුන් ගැනද පවසන්නේ

**12** නික් 24:8; සෙක 9:11; මතෙ 26:28; 1කොරි 11:25; හෙබ්‍රෙ 9:18; **13** මතෙ 26:21; යොහ 13:21; **14** ගීතා 41:9; **15** යෙසා 53; දානි 9:26; ක්‍රියා 4:28; 1පේත්‍ර 1:11; **16** මතෙ 26:24.

ලූක් **22:14*** හෝ, "යවනු ලැබූ අයද." **20*** හෝ, " 'සන්ධ්‍යා භෝජනය' නැත්නම් පාස්කුව."

කියා තම තමන් අතරේ සාකච්ඡා
කළෝය.[1]
24 මේ අතරතුරේදී ඔවුන් අතර
ඉතා උණුසුම් විවාදයක් ඇති
විය. ඔවුන් වාද කරමින් සිටියේ
ඔවුන් අතරේ උතුම් තැනැත්තා කවුද
යන්න පිළිබඳවයි.[2] 25 එවිට යේ-
සුස් ඔවුන්ට මෙසේ කීවේය.
“සාමාන්‍යයෙන් රජවරුන් මිනිසුන්ව
පාලනය කරන්නේ දරුණු විදිහටයි.
එමෙන්ම මිනිසුන් බලධාරීන්ට ගරු
නම්බු නාම පවා ලබා දෙනවා.[3]
26 නමුත් ඔබ එවැනි අයට වඩා
වෙනස් අය විය යුතුයි.[4] ඔබ අත-
රේ සිටින උතුම්ම තැනැත්තා සුළු
සේවකයෙක් මෙන්ද[5] ප්‍රධානියා ලෙස
ක්‍රියා කරන තැනැත්තා අනුන් වෙනු-
වෙන් සේවය කරන කෙනෙක් මෙන්ද
විය යුතුයි.[6] 27 ඇත්තටම වඩාත්
උතුම් වන්නේ කවුද? කෑමට ඉඳගෙන
සිටින පුද්ගලයාද? නැත්නම් සේවය
කරමින් සිටින පුද්ගලයාද? අනිවාර්ය-
යෙන්ම උතුම් වන්නේ කෑමට ඉඳ-
ගෙන සිටින පුද්ගලයායි. නමුත් ඔබ
වෙනුවෙන් සේවය කරන්න ඉදිරිපත්
වුණේ මමයි.[7]
28 “ඒත් විවිධ දුෂ්කරතාවලට මා
මුහුණ දුන් විට මාව අත්හරින්නේ
නැතුව[8] මා සමඟම සිටියේ ඔබයි.[9]
29 ඒ නිසා මගේ පියාණන් මා සමඟ
රාජ්‍යයක් සඳහා[10] ගිවිසුමක් ඇති
කළා සේම[11] මම ඔබ සමඟ ගිවිසු-
මක් ඇති කරනවා. 30 එයින් මගේ
රාජ්‍යයට හවුල් වී[12] මගේම මේසයේ
එකට කා[13] බී සිංහාසනවල ඉඳ[14] ඊශ්‍රා-
යෙල් දේශයෙහි ගෝත්‍ර දොළහ විනිශ්-
චය කිරීමට ඔබට අවස්ථාව ලැබෙයි.
31 “සීමොන්, මට සවන් දෙන්න
සීමොන්! තිරිඟු පොළනවා වගේ
සාතන්[15] ඔබ සියලුදෙනාවත් පො-
ළන්න ඉල්ලා තිබෙනවා.[16]
32 නමුත් ඔබේ විශ්වාසය දුර්වල
නොවීමට මම ඔබ වෙනුවෙන් දෙ-
විට කන්නලව් කර තිබෙනවා.[17] ඔබ
නැවත ශක්තිමත් වූ පසු ඇවිත් ඔබේ
සහෝදරයන් තුළ තිබෙන විශ්වා-
සය ශක්තිමත් කරන්න.”[1] 33 එවිට
පේතෘස්, “ස්වාමීනි, ඔබ වෙනුවෙන්
ඕනෑම දෙයකට මුහුණ දෙන්න මම
සූදානම්. හිරගෙට යන්න විතරක්
නෙමෙයි මැරෙන්න වුණත් මම ලෑස්-
තියි” කියා ඔහුට කීවේය.[2]
34 නමුත් යේසුස් මෙසේ පිළිතුරු
දුන්නේය. “පේතෘස්, මම දැන් කියන
දේට හොඳින් ඇහුම්කන් දෙන්න.
කුකුළෙකු හඬලන්න කලින් ඔබ මාව
හඳුනන්නේ නැහැ කියා අද තුන් වතා-
වක්ම කියනවා.”[3]
35 ඉන්පසු ඔහු ඔවුන්ට මෙසේ
පැවසුවේය. “පසුම්බියක්වත් කෑම
මල්ලක්වත් පාවහන්වත් නැතුව මම
ඔබව යැව්වත්[4] ඔබට කිසිම දෙයකින්
හිඟයක් තිබුණාද?” ඔවුහු, “නැහැ”
කියා පිළිතුරු දුන්නෝය. 36 එවිට
ඔහු ඔවුන්ට මෙසේ කීවේය. “නමුත්
මෙතැන් පටන් තත්වය ඊට වඩා
වෙනස්. යම් කෙනෙකුට පසුම්බි-
යක් හා කෑම මල්ලක් ඇත්නම්
ඔහු ඒවා රැගෙන යා යුතුයි. කඩු-
වක් නැත්නම් තමාගේ පිට වස්ත්‍රය
විකුණා කඩුවක් මිල දී ගත යුතුයි.
37 මන්ද ‘ඔහුව නීතිය නොතකන
පව්කාරයෙකු මෙන් ගණන් ගනු ලැබු-
වේය’[5] කියා මා සම්බන්ධයෙන් ලියා
තිබෙන දේ ඉටු විය යුතුයි. ඇත්-
තෙන්ම ඒ දේවල් දැන් ඉටු වෙනවා.”[6]
38 එවිට ඔවුහු, “ස්වාමීනි, මෙන්න
අපිට කඩු දෙකක්ම තිබෙනවා” කියා
කීවෝය. ඔහුද, “එය ප්‍රමාණවත්”
කියා ඔවුන්ට පිළිතුරු දුන්නේය.
39 යේසුස් පිටත් වී පුරුදු පරිදි
ඔලීව කන්දට ගියේය. ඔහු පසු-
පස ගෝලයෝද ගියෝය.[7] 40 ඔහු
එතැනට ගොස්, “ඔබ යම් වරදකට
හසු නොවී සිටින්න නම් නොකඩ-
වාම යාච්ඤා කරන්න”[8] කියා ඔවුන්ට
කීවේය. 41 ඉන්පසු ඔහු එතැනින්
ටික දුරක් තනිව ඇවිද ගොස්* දණින්
වැටී යාච්ඤා කරන්න පටන්ගත්තේය.

**22 පරි.**
1 මතෙ 26:22; මාක් 14:19; යොහ 13:22
2 මාක් 9:34; ලූක් 9:46
3 මතෙ 20:25; මාක් 10:42
4 1පේතෘ 5:3
5 ලූක් 9:48
6 මතෙ 20:26; මාක් 10:43; ලූක් 9:48
7 මතෙ 20:28; යොහ 13:4; පිලි 2:7
8 යොහ 6:67
9 රෝම 8:17; හෙබ්‍රෙ 4:15
10 දානි 7:27; ලූක් 12:32; 2තිමෝ 2:12; හෙබ්‍රෙ 12:28; යාකො 2:5; එළි 1:6
11 ගීතා 110:4
12 ලූක් 13:29; යොහ 17:24
13 ලූක් 12:37; එළි 19:9
14 මතෙ 19:28; 1කොරි 6:2; එළි 2:26; එළි 3:21; එළි 20:6
15 2කොරි 2:11; 1පේතෘ 5:8
16 ආමො 9:9; මතෙ 26:31; මාක් 14:27
17 යොහ 17:15; හෙබ්‍රෙ 7:25; 1යොහ 2:1

**2 තීරුව**
1 යෙසා 35:3
2 මතෙ 26:33; මාක් 14:29; යොහ 13:37
3 මතෙ 26:34; මාක් 14:30; ලූක් 22:61; යොහ 13:38
4 මතෙ 10:9; මාක් 6:8; ලූක් 9:3
5 යෙසා 53:12
6 ලූක් 18:31
7 මතෙ 26:30; මාක් 14:26; යොහ 18:1
8 මතෙ 26:41; මාක් 14:38; ලූක් 22:46

**ලූක් 22:41*** මූ.අ., “ගලක් ගැසිය හැකි තරම් දුරකට ගොස්.”

**42** ඔහු පැවසුවේ මෙයයි. "පියා-
ණෙනි, ඔබ කැමති නම් මේ කුස-
ලානය* මගෙන් ඉවත් කරන්න. ඒ
වුණත් සිදු විය යුත්තේ මා
කැමති දේ නොව[1] ඔබේ කැමැත්-
තයි."[2] **43** එවිට ස්වර්ගයෙන් දේ-
වදූතයෙක් පැමිණ ඔහුව ශක්තිමත්
කළේය.[3] **44** ඔහුගේ සිතට දැනුණු
මහත් වේදනාව නිසා ඔහු වඩාත්
ඕනෑකමින් යාච්ඤා කළේය.[4] ඔහුගේ
දහඩිය ලේ බිංදු මෙන් වී පොළොවට
වැටිණ.[5] **45** ඔහු යාච්ඤා කළ පසු
නැඟිට තම ගෝලයන් ළඟට ගියේය.
මහත් ශෝකයකින් සිටි ඔවුන්, විඩා-
බර වී නිදා සිටිනවා දුටු විට,[6]
**46** "ඔබ නිදා සිටින්නේ ඇයි? යම් වර-
දක් කිරීමට පෙලඹීමක් ඇති නොවීම
සඳහා නැඟිට නොකඩවාම යාච්ඤා
කරන්න"[7] කියා ඔහු ඔවුන්ට කීවේය.
**47** ඔහු ඔවුන් සමඟ කතා කර-
මින් සිටියදීම පිරිසක් ඔවුන් ළඟට
ආවෝය. ඔවුන් ඉදිරියෙන්ම පැමිණි-
යේ දොළොස්දෙනාගෙන් එක් කෙ-
නෙක් වූ යූදස්ය.[8] ඔහු යේසුස්
ළඟට ඇවිත් යේසුස්ව සිඹගත්තේය.[9]
**48** එවිට යේසුස්, "යූදස්, ඔබ මනුෂ්‍ය
පුත්‍රයාව පාවා දෙන්නේ මෙලෙසද"[10]
කියා ඔහුගෙන් ඇසුවේය. **49** යේ-
සුස් වටා සිටි ඔහුගේ ගෝලයෝ සිදු
වන දේ දුටු විට, "ස්වාමීනි, අපි කඩු-
වෙන් පහර දෙන්නද"[11] කියා ඇසූහ.
**50** ඒ සමඟම ඔවුන් අතරේ සිටි කෙ-
නෙක් උත්තම පූජකයාගේ දාසයාට
කඩුවෙන් පහර දුන්නේය. එවිට ඒ
දාසයාගේ දකුණු කන කැපී ගියේය.[12]
**51** නමුත් යේසුස් මැදිහත් වෙමින්,
"දැන් ඇති. නතර කරන්න" කියා
ඔවුන්ට අණ කළේය. ඉන්පසු ඔහු ඒ
දාසයාගේ තුවාල වූ කන ස්පර්ශ කර
සුව කළේය.[13] **52** යේසුස් තමාව
රැගෙන යෑමට පැමිණි නායක පූජ-
කයන්ටද දේවමාලිගාවේ ප්‍රධානීන්-
ටද වැඩිමහල්ලන්ටද මෙසේ කීවේය.
"ඔබ කඩු මුගුරු රැගෙන මාව අත්අ-
ඩංගුවට ගන්න ආවේ මා සොරෙක්
කියා හිතාගෙනද?[1] **53** මම හැමදාම
දේවමාලිගාවේ[2] උගන්වමින් සිටියා.
නමුත් ඔබ මාව අත්අඩංගුවට ගත්තේ
නැහැ.[3] කොහොමවුණත් දැන් තමයි
ඔබට අවස්ථාවක් ලැබී තිබෙන්නේ.[4]
මේ තමයි අන්ධකාරය[5] රජ කරන
වේලාව."[6]

**54** එවිට ඔවුහු යේසුස්ව අත්-
අඩංගුවට ගෙන උත්තම පූජකයා-
ගේ[7] නිවසට ගෙන ආවෝය.[8] මේ
අතර පේතෘස් මදක් දුරින් ඔවුන්
පසුපස ගියේය.[9] **55** ඔහු උත්තම
පූජකයාගේ නිවසෙහි මළුවට පැමිණි
විට පිරිසක් එහි ගිනිමැලයක් දල්වා
ඒ අසල ඉඳගෙන සිටිනවා දුටුවේය.
ඔහුද ඔවුන් අතරේ ඉඳගත්තේය.[10]
**56** පේතෘස් ගිනිමැලය අසල ඉඳ-
ගෙන සිටිනවා දුටු එක්තරා සේවි-
කාවක් ගිනිමැලයෙන් විහිදුණු එළිය
ආධාරයෙන් ඔහු දෙස හොඳින් බලා,
"මේ මිනිසාත් යේසුස් සමඟ සිටියා"[11]
කියා පැවසුවාය. **57** නමුත් ඔහු
එය ප්‍රතික්ෂේප කරමින්,[12] "මම ඔහුව
හඳුනන්නේ නැහැ"[13] කියා පිළිතුරු
දුන්නේය. **58** කෙටි වේලාවකින්
පසු තව කෙනෙක් ඔහුව දැක,
"ඔබත් ඔවුන්ගෙන් එක් කෙනෙක්
නේද" කියා ඇසුවේය. නමුත් පේ-
තෘස්, "නැහැ, ඔබට වැරදිලා"[14] කියා
කීවේය. **59** පැයක් පමණ ගත වූ
පසු තවත් මිනිසෙක් ඇවිත්, "මේ
මිනිසාත් යේසුස් සමඟ සිටියා. ඒ
ගැන නම් කිසි සැකයක් නැහැ.
ඒ විතරක් නොවෙයි ඔහු ගලීල-
යේ වැසියෙක්"[15] කියා තරයේම කියා
සිටියේය. **60** නමුත් පේතෘස්, "ඔබ
මොනවා කියනවාද කියලා මට නම්
තේරෙන්නේ නැහැ" කියා කීවේය.
ඔහු කතා කරමින් සිටියදීම කුකු-
ළෙක් හැඬලුවේය.[16] **61** එවිට යේ-
සුස් හැරී පේතෘස් දෙස බැලුවේය.
"කුකුළා හඬලන්න කලින් ඔබ අද
මාව හඳුනන්නේ නැහැ කියා තුන්
වතාවක් කියනවා" කියා යේසුස්
පැවසූ වචන පේතෘස්ට මතක් වුණේ

**22 පරි.**
**1** මතෙ 26:39 මාක් 14:39
**2** මතෙ 6:10 මාක් 14:36 යොහ 5:30 යොහ 6:38
**3** 1රාජා 19:5 යෙසා 49:8 ආනි 10:18 මතෙ 4:11
**4** යොහ 12:27 හෙබ්‍රෙ 5:7
**5** යෙසා 53:7 යෙසා 53:10 ලූක් 12:50
**6** මතෙ 26:40 මාක් 14:37
**7** මතෙ 26:41 මාක් 14:38 ලූක් 22:40
**8** මතෙ 26:47 මාක් 14:43 යොහ 18:2
**9** 2සාමු 20:9
**10** මතෙ 26:48 මාක් 14:45
**11** ලූක් 22:36
**12** මතෙ 26:51 මාක් 14:47 යොහ 18:10
**13** යොහ 18:11

**2 තීරුව**
**1** මතෙ 26:55 මාක් 14:48
**2** ලූක් 19:47
**3** යොහ 7:30
**4** යොහ 12:27
**5** කොලො 1:13
**6** යොහ 19:11
**7** මතෙ 26:57
**8** යෙසා 53:7 ක්‍රියා 8:32
**9** මතෙ 26:58 මාක් 14:54 යොහ 18:15
**10** යොහ 18:18
**11** මතෙ 26:69 මාක් 14:67
**12** හිතෝ 29:25
**13** මතෙ 26:70 මාක් 14:68
**14** මතෙ 26:71 මාක් 14:69 යොහ 18:25
**15** මතෙ 26:73 මාක් 14:70 යොහ 18:26
**16** මතෙ 26:74 මාක් 14:71 යොහ 18:27

ලූක් **22:42*** මතෙ 26:39හි පාදසටහන බලන්න.

එවිටයි.[1] **62** ඔහු පිටතට ගොස්
මහත් ශෝකයකින් හැඬුවේය.[2]
**63** මේ අතර යේසුස්ව අත්අඩං-
ගුවට ගත් අය ඔහුට පහර
දෙන්නත්[3] ඔහුට කවටකම් කරන්-
නත්[4] පටන්ගත්තෝය.[5] **64** ඔවුහු
ඔහුගේ මුහුණ වසා ඔහුට මෙසේ
කීවෝය. “ඔබ අනාගතවක්තෘව-
රයෙක් නම් ඔබට පහර දුන්නේ
කවුද කියා කියන්න.”[6] **65** එමෙන්ම
ඔවුහු ඔහුට විරුද්ධව අපහාසාත්මක
දේවල්[7] බොහොමයක් කීවෝය.
**66** උදෑසන වූ විට නායක පූජක-
යන් සහ නීතිය පිටපත් කරන්නන්
ඇතුළු වැඩිමහල්ලන්ගෙන් සමන්විත
මුළු මන්ත්‍රණ සභාව එකට රැස් වූහ.[8]
ඔවුහු යේසුස්ව ඔවුන් රැස් වන ශාලා-
වට ඇදගෙන ගොස් ඔහුට මෙසේ
කීවෝය.[9] **67** “ඔබ ක්‍රිස්තුස් නම්[10]
අප ඉදිරියේ ඒ බව කියන්න.” යේ-
සුස් ඔවුන්ට මෙසේ පිළිතුරු දුන්-
නේය. “මම ඒ දේ ඔබට කිව්වත්
ඔබ එය කොහොමටවත් විශ්වාස
කරන්නේ නැහැ.[11] **68** මම ඔබෙන්
ප්‍රශ්න ඇසුවත් ඔබ ඒවාට පිළි-
තුරු දෙන්නෙත් නැහැ.[12] **69** කො-
හොමවුණත් මෙතැන් පටන් මනුෂ්‍ය
පුත්‍රයා[13] බලවත් දෙවිගේ දකුණු පැත්-
තේ[14] ඉඳගෙන සිටියි.”[15] **70** එය
අසා සියලුදෙනාම, “එසේනම් ඔබ දෙ-
විගේ පුත්‍රයාද” කියා ඇසුවෝය. යේ-
සුස් ඔවුන්ට මෙසේ කීවේය. “ඒ මමයි
කියා ඔබ අසන ප්‍රශ්නයෙන්ම පැහැදි-
ලියි.”[16] **71** එවිට ඔවුහු, “ඔහු පැවසූ
දේවල් සියලුදෙනාටම දැන් ඇහුණා
නේද?[17] අපට තවත් සාක්ෂි අවශ්‍ය
නැහැ”[18] කියා පැවසූහ.

**23** ඒ මුළු සභාවම නැඟිට යේ-
සුස්ව පිලාත් ඉදිරියට ගෙන
ගියෝය.[19] **2** ඔවුහු යේසුස්ට විරුද්-
ධව චෝදනා එල්ල කරමින්,[20] “මේ
මිනිසා අපේ ජාතිය අතර භේද
ඇති කරනවා.[21] ඔහු සීසර්ට බදු
ගෙවීම තහනම් කරනවා.[22] තමා
ක්‍රිස්තුස් කියාත් තමා රජ කෙ-
නෙක් කියාත් ප්‍රකාශ කරන ආකා-
රය අපට ඇහුණා”[1] කියා පැවසුවෝය.
**3** එවිට පිලාත්, “ඔබ යුදෙව්වරුන්ගේ
රජද” කියා ඔහුගෙන් ප්‍රශ්න කළේය.
“එයට පිළිතුර ඔබේ ප්‍රශ්නයෙන්ම
පැහැදිලියි”[2] කියා යේසුස් උත්තර
දුන්නේය. **4** පිලාත් නායක පූජ-
කයන්ට හා රැස්ව සිටි සමූහයාට
මෙසේ කීවේය. “මේ මිනිසා අපරාධ-
කාරයෙක් කියා මට නම් පෙනෙන්-
නේ නැහැ.”[3] **5** නමුත් ඔවුහු, “ඔහු
යුදා දේශය පුරාම නොයෙක් දේවල්
උගන්වමින් ජනයාව උසිගන්වනවා.
ඔහු පටන්ගත්තේ ගලීලයෙන්. දැන්
ඔහු මේ ප්‍රදේශයටත් ඇවිල්ලා” කියා
තරයේම කියා සිටියෝය. **6** ඔවුන්
පැවසූ දේ අසාගෙන සිටි පිලාත් ඔහු
ගලීලයේ වැසියෙක්ද කියා ඇසුවේය.
**7** යේසුස් හෙරොද්ගේ පාලනය යට-
තේ පවතින පළාතක වැසියෙක් බව[4]
දැනගත් පිලාත්, ඒ දිනවල යෙරුසල-
මට පැමිණ සිටි හෙරොද් වෙතට ඔහුව
යැව්වේය.

**8** හෙරොද් බොහෝ කාලයක් පුරා
යේසුස්ව දැක බලා ගැනීමට ආශා-
වෙන් සිටි නිසා[5] යේසුස්ව දුටු විට ඔහු
ඉමහත් සේ සතුටු විය. ඊට හේතු
වූයේ යේසුස් ගැන බොහෝ දේවල්
ඔහුට ආරංචි වී තිබීමයි.[6] එහෙයින්
යේසුස් විසින් කරනු ලබන යම් හාස්-
කමක් දැකගැනීමටත් ඔහු ආශාවෙන්
සිටියේය. **9** හෙරොද් යේසුස්ගෙන්
බොහෝ ප්‍රශ්න ඇසුවත් ඔහුට යේසුස්-
ගෙන් කිසි පිළිතුරක් ලැබුණේ නැත.[7]
**10** නමුත් නායක පූජකයෝද නීතිය
පිටපත් කරන්නෝද නිතර නිතර
නැඟිට ඔහුට විරුද්ධව දැඩි ලෙස චෝ-
දනා එල්ල කළෝය.[8] **11** එවිට හෙ-
රොද්, තම මුර සෙබළුන් සමඟ එකතු
වී ඔහුට අවමන් කළේය.[9] ඉන්පසු
යේසුස්ට දිදුලන වස්ත්‍රයක් පළඳවා
ඔහුව සමච්චලයට ලක් කර[10] නැව-
තත් ඔහුව පිලාත් වෙතට යැව්වේය.
**12** එදින සැහෙන කාලයක් පුරා සතු-
රන් වූ හෙරොද් සහ පිලාත්[11] මිත්‍ර වූහ.

**22 පරි.**
1 මතෙ 26:75 මාක් 14:72
2 යෙසා 66:2 එස 7:16 1කොරි 10:12 2කොරි 7:10
3 යෙසා 50:6 යෙසා 53:5
4 ගීතා 22:7
5 මතෙ 26:67 මාක් 14:65
6 මතෙ 26:68
7 ගීතා 44:16 යෙසා 51:7
8 ගීතා 2:2 ක්‍රියා 4:26
9 මතෙ 27:1 මාක් 15:1
10 මතෙ 26:63 මාක් 14:61 යොහ 10:24
11 යොහ 3:12 යොහ 8:45
12 ලූක් 20:7
13 දානි 7:13 එළි 1:7
14 ගීතා 110:1
15 මතෙ 26:64 මාක් 14:62 ක්‍රියා 2:33 ක්‍රියා 7:55 රෝම 8:34 කොලො 3:1 හෙබ්‍රෙ 1:3
16 මතෙ 27:11 මාක් 15:2
17 මතෙ 26:65 මාක් 14:63
18 ද්වි 17:6

**23 පරි.**
19 මතෙ 27:2 මාක් 15:1 යොහ 18:28
20 1රාජා 21:10 ගීතා 35:11
21 යොහ 12:19 ක්‍රියා 24:5
22 හිතෝ 25:18 මාක් 12:17

**2 තීරුව**
1 යොහ 1:49 යොහ 18:36
2 මතෙ 27:11 1තිමෝ 6:13
3 යොහ 18:38 හෙබ්‍රෙ 7:26 1පේතෘ 2:22
4 ලූක් 3:1
5 ලූක් 9:9
6 මතෙ 14:1 මාක් 6:14
7 ගීතා 39:1 යෙසා 53:7
8 ක්‍රියා 25:7
9 යෙසා 53:3 ලූක් 9:22
10 ගීතා 22:7

11 ක්‍රියා 4:27.

13 ඉන්පසු පිලාත් නායක පූජක-
යන්, පාලකයන් සහ ජනයාව කැඳවා,
14 ඔවුන්ට මෙසේ කීවේය. “ඔබ
මේ මිනිසා මා ළඟට ගෙනාවේ
ඔහු ජනයාව කැරැල්ලකට උසිගන්-
වන කෙනෙක් කියා මට පවසමිනුයි.
හැබැයි, ඔබ සියලුදෙනා ඉදිරියෙහිම
මම ඔහුව සෝදිසි කර බැලුවත් මම
කියන්නේ ඔහුට විරුද්ධව ඔබ එල්ල
කරන චෝදනාවලට කිසිම පදන-
මක් නැති බවයි.[1] 15 ඇත්තෙන්ම
හෙරොද්ටත් බැරි වුණා ඔහුගේ යම්
වරදක් සොයාගන්න. මොහුව ආපසු
අප ළඟට එවා තිබෙන්නේ ඒ නිසයි.
ඇත්තෙන්ම මේ මිනිසා මරණ දඬු-
වම ලබන්න තරම් කිසිම දෙයක් කර
නැහැ.[2] 16 ඒ නිසා මම ඔහුට දඬුව-
මක් දී[3] නිදහස් කරන්න කැමතියි.”
17 —— 18 එවිට ඔවුහු රැස්ව සිටි
මුළු සමූහයා සමඟ එක හඬින්,
“මොහුව මරා දමන්න.[4] අපට බරබ්-
බස්ව නිදහස් කර දෙන්න”[5] කියා
පැවසූහ. 19 (බරබ්බස් යනු නුව-
රෙහි සිදු කළ යම් කැරලිගැසීමක්
නිසාත් මිනී මැරුමක් නිසාත් සිර-
ගත වූ මිනිසෙකි.) 20 නමුත් යේ-
සුස්ව නිදහස් කිරීමට කැමැත්තෙන්[6]
සිටි පිලාත් නැවතත් රැස්ව සිටි
සමූහයාට කතා කළේය. 21 එවිට
ඔවුහු, “ඔහුව කණුවක ඇණ ගසා
මරන්න! ඔහුව කණුවක ඇණ ගසා
මරන්න”[7] කියා කෑගසන්න පටන්-
ගත්තෝය. 22 තුන්වෙනි වතාව-
ටත් ඔහු ඔවුන්ගෙන් මෙසේ ඇසුවේය.
“ඇයි? මේ මිනිසා කළ වරද මො-
කක්ද? මරණයට පත් කරන්න තරම්
කිසි වරදක් ඔහු කර නැහැ. මම
කැමතියි ඔහුට දඬුවමක් දී ඔහුව
නිදහස් කරන්න.”[8] 23 එවිට ඔවුහු
පෙරටත් වඩා උස් හඬකින් කෑගසා
ඔහුව කණුවක ඇණ ගසා මරා
දමන්න කියා තරයේම ඉල්ලා සිටි-
යෝය. ඔවුන් කෑගසමින් කොත-
රම් බලපෑමක් කළාද කිවහොත්
පිලාත් තම උත්සාහය අත්හැරි-
යේය.[9] 24 එහෙයින් පිලාත් ඔවුන්-
ගේ ඉල්ලීම ඉටු කරන ලෙස තීන්දු
කළේය.[1] 25 ආණ්ඩුවට විරුද්ධව
කැරලිගසා, මිනී මරා සිරභාරයේ සිටි
මිනිසාව නිදහස් කරන ලෙස සමූහයා
ඉල්ලා සිටි නිසා පිලාත් ඔහුව නිදහස්
කර[2] යේසුස්ව ඔවුන්ගේ කැමැත්තට
එකඟව මරා දැමීමට භාර දුන්නේය.[3]
26 ඔවුහු යේසුස්ව රැගෙන යද්දී,
සිරේනිය නම් නුවරේ උපන් සීමොන්
නමැති කෙනෙකු ඔවුන්ට හමු විය.
ඔහු ජීවත් වූයේ පිටිසර පළාත-
කයි. යේසුස්ගේ වධකණුව රැගෙන
යෑමට ඔවුහු එය ඔහු පිට තැබුවෝය.
ඔහු වධකණුව රැගෙන යේසුස්ට පිටු-
පසින් ගියේය.[4] 27 යේසුස් පසුපස
විශාල සමූහයක් ගමන් කරමින් සිටි-
යෝය. ඔවුන් අතර සිටි ස්ත්‍රීහු ශෝක-
යෙන් තම පපුවට ගසාගනිමින් හඬා
වැලපෙමින් පැමිණියෝය. 28 යේ-
සුස් එම ස්ත්‍රීන් දෙස බලා ඔවුන්ට
මෙසේ කීවේය. “යෙරුසලමේ දූව-
රුනි, මා නිසා හඬන්න එපා. ඒ වෙ-
නුවට ඔබටයි ඔබේ දරුවන්ටයි සිදු
වෙන්න යන දේ ගැන හඬා වැල-
පෙන්න.[5] 29 මන්ද ඉදිරියේදී ඉතා
අසීරු කාලයක් එයි. එදාට මිනිස්සු,
‘දරුවන් බිහි නොකළ, දරුවෙකුට
කිරි නොදුන් වඳ ස්ත්‍රියට සතුටු විය
හැකියි’[6] කියා පවසයි. 30 ඒ කාල-
යේදී ඔවුහු කඳු ළඟට ගොස්, ‘අප
පිට වැටෙන්න’ කියාත් හෙල්වලට,
‘අපව වසාගන්න’[7] කියාත් පවසයි.
31 මන්ද ගස හොඳට වැඩී තිබෙන
විට ඔවුන් මෙසේ හඬා වැලපෙනවා
නම් එය වියළී යන විට ඔවුන් මොනව
නොකරයිද?”[8]

32 යේසුස් සමඟ මරණයට පත්
කිරීම සඳහා අපරාධකරුවන් දෙ-
දෙනෙකුවද රැගෙන යන ලදි.[9]
33 ඔවුන් හිස්කබල[10] යන නමින්
හඳුන්වා ඇති ස්ථානයට පැමිණි විට
යේසුස්වත් අපරාධකරුවන්වත් කණු-
වල එල්ලන ලදි. ඔවුහු එක් කෙ-
නෙකු ඔහුගේ දකුණු පැත්තෙහිද
එක් කෙනෙකු ඔහුගේ වම් පැත්තෙහිද
සිටින සේ එල්ලුවෝය.[11] 34 [[මේ

23 පරි.
1 යොහ 18:38
2 ක්‍රියා 23:29
3 මතෙ 27:26 යොහ 19:1
4 යෙසා 49:7
5 මතෙ 27:20 මාක් 15:11 යොහ 18:40
6 මතෙ 27:22 මාක් 15:12 යොහ 19:12
7 මාක් 15:13 යොහ 19:6
8 මතෙ 27:23 මාක් 15:14
9 නික් 23:2 යොහ 19:15

2 තීරුව
1 මාක් 15:15 යොහ 19:16
2 හිතෝ 17:15
3 මතෙ 27:26
4 මාක් 15:21 යොහ 19:17
5 ද්වි 28:57 යෙරෙ 9:19 මාක් 13:17 ලූක් 19:44
6 මතෙ 24:19 ලූක් 21:23
7 යෙසා 2:19 හොෂෙ 10:8 එළි 6:16
8 හිතෝ 11:31 යෙරෙ 25:29 එස 20:47 1පේතෘ 4:17
9 යෙසා 53:12 මතෙ 27:38
10 මතෙ 27:33
11 යොහ 19:18

අතර යේසුස්, “පියාණෙනි, ඔවුන්ට
සමාව දෙන්න.[1] මන්ද ඔවුන් කරන
දේ ගැන ඔවුන්ට අවබෝධයක් නැහැ”
කියා පැවසුවේය.]] ඉන්පසු යේසුස්-
ගේ වස්ත්‍ර තමන් අතරේ බෙදාගැනී-
මට ඔවුහු ආදු දැමුවෝය.[2] **35** රැස්ව
සිටි සමූහයා සිදු වන දේ බලා-
ගෙන සිටියෝය.[3] ආගමික නායක-
යෝ ඔහුට නින්දා කරමින්, “ඔහු
අනුන්ව නම් ගැලෙව්වා. නමුත් ඔහු
දෙවිගේ තෝරාගත් තැනැත්තා[4] වන
ක්‍රිස්තුස් නම් ඔහුට තමන්ව ගල-
වාගන්නත් හැකියාව තිබිය යුතුයි”[5]
කියා පැවසුවෝය. **36** හේවායෝ
පවා ඔහු ළඟට ඇවිත් ඔහුට කව-
ටකම් කරමින්[6] ඇඹුල් වයින් දී,[7]
**37** “ඔබ යුදෙව්වරුන්ගේ රජු නම් ඔබ
ඔබවම ගලවාගන්න” කියා කීවෝය.
**38** ඔහුට ඉහළින්, “මේ යුදෙව්වරුන්-
ගේ රජුය”[8] කියා සඳහන් කළ සටහ-
නක්ද කණුවේ තබා තිබිණ.

**39** එසේම එල්ලනු ලැබූ එක් අප-
රාධකරුවෙක් ඔහුට නින්දා කරමින්,[9]
“ඔබ ක්‍රිස්තුස් නේද? ඔබට ගැල-
වෙන්න බැරිද? ඔබත් ගැලවී අපිවත්
ගලවාගන්න” කියා කීවේය. **40** ඊට
පිළිතුරු වශයෙන් අනික් අපරාධක-
රුවා ඔහුට තදින් මෙසේ කීවේය. “මේ
මිනිසාට සමාන දඬුවමක් ඔබට ලැබි-
ලත් ඔබට දෙවි සඳහා කිසි ගරුබියක්
නැද්ද?[10] **41** අපට ලැබුණු විනිශ්-
චය සාධාරණයි. අපට දැන් ලැබිලා
තිබෙන්නේ අප කළ දේවලට ලැබිය
යුතු දඬුවමයි. නමුත් මේ මිනිසා කිසි
වරදක් කර නැහැ.”[11] **42** ඊළඟට
ඔහු යේසුස්ට මෙසේ පැවසුවේය. “යේ-
සුස්, ඔබේ රාජ්‍යයට ඔබ ඇතුල් වන
විට මාව අමතක කරන්න එපා.”[12]
**43** එවිට යේසුස්, “ඔබ මා සමඟ[13]
පාරාදීසයේ[14] සිටින බවට අද මම
ඔබට සහතිකවම පොරොන්දු වෙ-
නවා” කියා ඔහුට කීවේය.

**44** හයවෙනි පැයේදී* පමණ මුළු
පොළොවම අන්ධකාරයෙන් වැසී
ගියේය. ඒ අන්ධකාරය නවවෙනි
පැය* දක්වා පැවතිණ.[1] **45** මන්ද
හිරුගෙන් කිසි එළියක් විහිදු-
ණේ නැත. ඉන්පසු ශුද්ධස්ථානයේ
තිරය[2] දෙකට මැදින් ඉරී ගියේය.[3]
**46** එවිට යේසුස්, “පියාණෙනි, මගේ
ජීවිතය ඔබේ අතේ”[4] කියා මහත්
හඬින් පවසා තම අවසන් හුස්ම හෙ-
ළුවේය.[5] **47** සිදු වූ දේ දුටු හමුදා
නිලධාරියා දෙවිට ගෞරවය දෙමින්,
“ඇත්තටම මේ මිනිසා ධර්මිෂ්ඨ කෙ-
නෙක්”[6] කියා පැවසුවේය. **48** යේ-
සුස්ට සිදු වන දේ දැක බලා ගැනීමට
බොහෝදෙනෙක් පැමිණ සිටි අතර
මේ දේවල් දුටු විට ඔවුහු පපුවට ගසා-
ගනිමින් තම නිවෙස් බලා ගියෝය.
**49** යේසුස්ව දැන හඳුනා ගෙන සිටි
සියලුදෙනා සිටියේ මදක් ඈතින්ය.[7]
ගලීලයේ සිට ඔහු සමඟ පැමිණි ස්ත්‍රී-
හුද සිදු වන දේ සිටගෙන බලාගෙන
සිටියෝය.[8]

**50** මේ අතර මන්ත්‍රණ සභාවේ
සාමාජිකයෙකු වූ යෝසෙප් නම් මිනි-
සෙක් සිටියේය. ඔහු යහපත් සහ ධර්-
මිෂ්ඨ තැනැත්තෙක් විය.[9] **51** ඔහු
මන්ත්‍රණ සභාව කුමන්ත්‍රණය කළ
දේට සහ ඔවුන් යේසුස්ට විරුද්-
ධව ගත් ක්‍රියාමාර්ගයට තම අනුමැ-
තිය දී තිබුණේ නැත.[10] යෝසෙප්
යුදෙව්වරුන්ගේ නුවරක් වූ අරිමාති-
යෙන් පැමිණි අතර දෙවිගේ රාජ්‍යය
ගැන බලා සිටි කෙනෙකි.[11] **52** ඔහු
පිලාත් ළඟට ගොස් යේසුස්ගේ දේ-
හය භාරගැනීමට අවසර ලබාගත්-
තේය.[12] **53** ඔහු දේහය කණුවෙන්
පහතට ගෙන[13] අනර්ඝ ලිනන් රෙදිව-
ලින් ඔතා, ඒ දක්වා කිසිවෙකුව තැන්-
පත් නොකළ,[14] පර්වතයක කපන
ලද සොහොන් ගෙයක තැන්පත්
කළේය.[15] **54** එදින සූදානම් වීමේ
දවස* විය.[16] නමුත් සවස් වූ නිසා
සබත් දවසේ[17] ආරම්භයට තව වැඩි
වේලාවක් නොතිබිණ. **55** ගලීලයේ

**23 පරි.**
1 ක්‍රියා 7:60
2 ගීතා 22:18
යෙසා 53:12
මතෙ 27:35
මාක් 15:24
3 සෙක 12:10
4 මතෙ 27:42
මාක් 15:31
5 ගීතා 22:8
6 ගීතා 22:7
7 ගීතා 69:21
8 මතෙ 27:37
මාක් 15:26
යොහ 19:19
9 මතෙ 26:68
මතෙ 27:44
මාක් 15:32
10 යෙරෙ 5:3
11 1පේතෘ 1:19
12 ලූක් 1:32
13 යොහ 5:29
ක්‍රියා 24:15
14 යෙසා 11:6
යෙසා 35:1
යෙසා 65:17
එළි 21:1

**2 තීරුව**
1 ආමො 8:9
මතෙ 27:45
මාක් 15:33
2 නික් 26:31
නික් 36:35
3 හෙබ්‍රෙ 10:20
4 ගීතා 31:5
ක්‍රියා 7:59
5 මතෙ 27:50
6 මතෙ 27:54
7 ගීතා 38:11
ගීතා 88:8
8 මතෙ 27:55
මාක් 15:40
ලූක් 8:2
9 මතෙ 27:57
මාක් 15:43
යොහ 19:38
10 උත් 37:21
11 මාක් 15:43
ලූක් 2:25
12 මතෙ 27:58
13 ද්වි 21:23
14 මතෙ 27:59
මාක් 15:46
15 යෙසා 53:9
16 නික් 12:6
මතෙ 27:62
මාක් 15:42
යොහ 19:42
17 නික් 20:10
ද්වි 5:14

---

**ලූක් 23:44*** එනම්, දහවල් 12ට පමණ.

**ලූක් 23:44*** එනම්, ප.ව. 3ට පමණ. **54*** මතෙ 27:62හි පාදසටහන බලන්න.

සිට යේසුස් සමඟ පැමිණි ස්ත්‍රීහු සො-
හොන් ගෙය ළඟට ගොස්[1] ඔහුගේ දේ-
හය තැන්පත් කර තිබූ ආකාරය දැක
බලා ගත්තෝය.[2] **56** ඉන්පසු ඔවුහු
සුවඳ ද්‍රව්‍ය සහ සුවඳ තෙල්[3] සූදානම්
කිරීමට ආපසු හැරී ගියෝය. නමුත්
නීතියේ සඳහන් ආකාරයට ඔවුහු
සබත් දවසේදී[4] කිසි වැඩක් නොක-
ළෝය.

**24** සතියේ පළමුවෙනි දිනේදී
එම ස්ත්‍රීහු තමන් සූදානම්
කළ සුවඳ ද්‍රව්‍ය රැගෙන පාන්දරින්ම
සොහොන් ගෙට ගියෝය.[5] **2** නමුත්
සොහොන් ගෙයින් ගල අහකට පෙ-
රළා තිබෙන ආකාරය[6] ඔවුන්ට දැක-
ගත හැකි විය. **3** ඔවුන් ඇතුළට
ගිය විට ස්වාමීන් වන යේසුස්ගේ දේ-
හය එහි දක්නට ලැබුණේ නැත.[7]
**4** එහෙයින් ඔවුහු බොහෝ සෙයින්
කලබල වූහ. ඒ මොහොතේදීම දීප්ති-
යෙන් බැබළෙන වස්ත්‍ර පැළඳ සිටි
පුද්ගලයෝ දෙදෙනෙක් ඔවුන් ළඟ
සිටගත්තෝය.[8] **5** එම ස්ත්‍රීන් කො-
තරම් බිය වූවාද කිවහොත් ඔවුහු
තම හිස ඔසවා බැලුවේවත් නැත.
එවිට ඒ පුද්ගලයෝ ඔවුන්ට මෙසේ
කීවෝය. “ජීවමාන වූ තැනැත්තාව
ඔබ මිය ගිය අය අතරේ සො-
යන්නේ ඇයි? **6** [[ඔහු දැන් මෙ-
හෙ නැහැ. මන්ද ඔහුව මරණයෙන්
නැඟිටුවා තිබෙනවා.]][9] ඔහු ගලීල-
යේ සිටියදී ඔබට පැවසූ දේ මතකද?[10]
**7** මනුෂ්‍ය පුත්‍රයා පව්කාර මිනිසුන්ගේ
අතට පාවා දෙනු ලබන බවත් ඔහුව
කණුවක ඇණ ගසා මරා දමනු ලබන
බවත් තුන්වෙනි දවසේ ඔහුව මරණ-
යෙන් නැඟිටුවනු ලබන බවත් ඔහු
පැවසුවා.”[11] **8** යේසුස් පැවසූ දේවල්
එවිට ඔවුන්ට සිහි විය.[12] **9** එහෙ-
යින් ඔවුහු සොහොන් ගෙයින් පිටත් වී
ගෝලයන් එකොළොස්දෙනාවත් අන්
සියලුදෙනාවත් හමු වී සිදු වූ සියලු
දේවල් දැන්වූහ.[13] **10** ඒ ස්ත්‍රීන් නම්
මග්දලාවේ මරියා, යොවානා[14] සහ
යාකොබ්ගේ මව වූ මරියාය. ඔවුන්
සමඟ සිටි අනිකුත් ස්ත්‍රීහුද[15] යේ-
සුස්ගේ නියෝජිතයන්* එකොළොස්දෙ-
නාට ඒ ගැන කීවෝය. **11** නමුත්
එම ස්ත්‍රීන් පැවසූ දේවල් විශ්වාස
නොකළ[1] ඔවුහු ඒවා විකාර දේවල්
ලෙස සලකා ප්‍රතික්ෂේප කළෝය.
**12** [[නමුත් පේතෘස් සොහොන්
ගෙය ළඟට දුවගෙන ගියේය. ඔහු එය
අසලට ගොස් එබී බැලූ විට රෙදි පටි
පමණක් තිබෙනවා දුටුවේය. එහෙ-
යින් ඔහු සිදු වී තිබූ දේ ගැන පුදුම වෙ-
මින් පිටත් වී ගියේය.]]
**13** එදිනම ගෝලයන් දෙදෙනෙක්
යෙරුසලමෙන් සැතපුම් හතක් පමණ
දුරින් පිහිටි එම්මාවුස් නම් ගම බලා
ගමන් කරමින් සිටියෝය. **14** එම
ගමන අතරවාරයේදී ඔවුහු සිදු වූ
සෑම දෙයක් ගැන[2] කතාබහ කරමින්
සිටියහ.
**15** ඔවුන් කතාබහ කරමින් යද්දී
යේසුස්ද ඔවුන්ගේ ගමනට එක්
විය.[3] **16** නමුත් ඔහුව හඳුනාගැනී-
මට ඔවුන්ට නොහැකි විය.[4]
**17** ඔහු ඔවුන්ගෙන් මෙසේ ඇසුවේය.
“ඔබ මෙතරම් වේලාවක් කතා කර-
මින් යන්නේ මොනව ගැනද?” එවිට
ශෝකයෙන් සිටි ඔවුහු නතර වූහ.
**18** ක්ලෙයෝපස් නම් තැනැත්තා
ඔහුට මෙසේ පිළිතුරු දුන්නේය. “ඔබ
කතා කරන්නේ හරියට පිට ගමකින්
ඇවිත් කිසි කෙනෙක් එක්ක කතා-
බහ නොකර තනියෙන් වාසය කරන
කෙනෙක් වගෙයි. මේ දිනවල යෙ-
රුසලමේ සිදු වූ දේවල් ගැන ඔබට
ආරංචි වුණේ නැද්ද?” **19** එවිට
ඔහු, “මොන දේවල්ද” කියා ඔවුන්-
ගෙන් ඇසුවේය. ඔවුහු ඔහුට මෙසේ
කීවෝය. “අපි කතා කළේ නාස-
රෙත් නුවරින් පැමිණි යේසුස් ගැනයි.[5]
ඔහු පුදුම දේවල් කළ අනාගත-
වක්තෘවරයෙක්.[6] ඒ වගේම බල-
වත් ලෙස ඉගැන්වූ ගුරුවරයෙක්. ඔහු
දෙවි හා මිනිසුන් ඉදිරියෙහි බොහෝ
ගෞරවය ලැබුවා. **20** නමුත් අපේ
නායක පූජකයන් සහ පාලකයන්

**23 පරි.**
1 යොහ 5:28
2 මතෙ 27:61; මාක් 15:47
3 මතෙ 26:7
4 නික් 16:29; නික් 20:8; නික් 31:15; ද්වි 5:12

**24 පරි.**
5 මතෙ 28:1; මාක් 16:1; යොහ 20:1
6 මාක් 16:4
7 මාක් 16:5
8 විනි 13:6; මතෙ 28:5; ක්‍රියා 1:10
9 මතෙ 28:6; මාක් 16:6
10 මතෙ 28:7; මාක් 16:7
11 යෝනා 1:17; මතෙ 16:21; මාක් 8:31; ලූක් 9:22; ක්‍රියා 17:3
12 යොහ 2:22
13 මතෙ 28:8
14 ලූක් 8:3
15 ලූක් 8:2

**2 තීරුව**
1 උත් 45:26
2 ලූක් 9:22
3 මතෙ 18:20
4 යොහ 20:14; යොහ 21:4
5 මතෙ 2:23; මතෙ 21:11
6 ද්වි 18:18; ලූක් 7:16; යොහ 3:2; යොහ 6:14; ක්‍රියා 2:22

**ලූක් 24:10*** හෝ, “යවනු ලැබූවන්.”

ඔහුට මරණ දණ්ඩනය නියම කර
ඔහුව කණුවක එල්ලා මරා දැමුවා.[1]
**21** අප සිතාගෙන සිටියේ ඊශ්‍රායෙල්
සෙනඟට ගැලවීම ලබා දෙන්න නිය-
මිත තැනැත්තා ඔහු කියායි.[2] ඇත්-
තෙන්ම ඒ හැම දේම වෙලා තවම
දවස් තුනක්වත් ගත වෙලා නැහැ.
**22** ඒ විතරක් නෙවෙයි, අප අතර
සිටි ස්ත්‍රීන් කිහිපදෙනෙක්[3] අපට පුදුම
හිතෙන දෙයක් කිව්වා. ඔවුන් උදේ
පාන්දරින්ම සොහොන් ගෙය ළඟට
ගිය විට, **23** ඔහුගේ දේහය එහි
තිබුණේ නැහැ කියා ඔවුන් පැවසුවා.
ඉන්පසු මහත් තේජසකින් බැබළෙන
දේවදූතයන් ඇවිත් යේසුස් ජීවත්
වෙනවා කියා පැවසූ බවත් ඔවුන්
අපට කිව්වා. **24** ඒ නිසා අප අතර
සිටි කිහිපදෙනෙක් සොහොන් ගෙය
බලන්න ගියා.[4] එම ස්ත්‍රීන් පැවසූ
ආකාරයටම එය තිබුණේ හිස්වයි.
ඔවුන්ට එහි යේසුස්ව දකින්න ලැබු-
ණේ නැහැ.”

**25** එවිට ඔහු ඔවුන්ට මෙසේ
කීවේය. “ඔබට කිසිම දෙයක්
තේරුණේ නැද්ද? අනාගතවක්තෘව-
රුන් පැවසූ දේවල්[5] විශ්වාස කරන්න
ඔබ මැළි වන්නේ ඇයි? **26** ක්‍රිස්-
තුස් තේජසට පත් වෙන්න නම්[6] ඒ
සැම දුකක්ම ඔහුට අනිවාර්යයෙන්ම
විඳින්න සිදු වෙනවා.”[7] **27** එවිට
ඔහු මෝසෙස් පැවසූ දේවලින් පටන්-
ගෙන[8] සියලු අනාගතවක්තෘවරුන්[9]
ඇතුළුව මුළු ශුද්ධ ලියවිල්ලෙහි තමන්
ගැන සඳහන් දේ ඔවුන්ට පැහැදිලි කර
දුන්නේය.

**28** යම් වේලාවක් ගත වූ පසු
ඔවුන් යෑමට අදහස් කළ ගමට ඔවුහු
ළඟා වූහ. නමුත් තමන්ට තව දුර
ගමන් කළ යුතු බව යේසුස් ඔවුන්ට
දැන්වූ විට, **29** ඔවුහු ඔහුට මෙසේ
පෙරැත්ත කළෝය. “දැන් හොඳටම
හවස් වී ඇති නිසා අපත් සමඟ නැවතී
සිටින්න.” එහෙයින් ඔහු ඔවුන් සමඟ
නැවතී සිටීමට නිවසකට ඇතුල්
වුණේය. **30** ඔහු ඔවුන් සමඟ කෑමට
ඉඳගෙන සිටියදී, ඔහු රොටියක් ගෙන

**24 පරි.**
1 ලූක් 23:1 ක්‍රියා 3:13 ක්‍රියා 13:27
2 ක්‍රියා 1:6
3 මතෙ 28:8 ලූක් 24:10
4 ලූක් 24:12 යොහ 20:3
5 ගීතා 22 යෙසා 53 යොහ 20:27
6 යොහ 20:9 පිලි 2:9 හෙබ්‍රෙ 2:9 1පේත්‍ර 1:11
7 ක්‍රියා 17:3 1කොරි 15:3
8 උත් 3:15 උත් 22:18 උත් 49:10 ගණන් 21:9 ද්වි 18:15
9 යෙසා 7:14 යෙසා 9:6 යෙරෙ 23:5 එස 34:23 දානි 9:24 මීකා 5:2 මලා 3:1 යොහ 1:45 ක්‍රියා 10:43 ක්‍රියා 26:22

**2 තීරුව**
1 මතෙ 14:19 මතෙ 15:36 මාක් 6:41
2 යොහ 20:19
3 1කොරි 15:5
4 ලූක් 9:16
5 මතෙ 14:26
6 1යොහ 1:1
7 1කොරි 15:50
8 උත් 45:26
9 යොහ 21:5

දෙවිට ස්තුති කර එය කඩා ඔවුන්
අතට දුන්නෝය.[1] **31** එවිට ඔවුහු
ඔහුව හඳුනාගත්හ. ඒ මොහොතේම
යේසුස් ඔවුන් අතරින් අතුරුදහන්
වී ගියේය.[2] **32** ඔවුහු එකිනෙකාට
මෙසේ පැවසූහ. “අප පාර දිගේ එන
විට ඔහු අපට ශුද්ධ ලියවිල්ලේ දේවල්
කොතරම් හොඳින් පැහැදිලි කර දුන්-
නාද! ඔහු කතා කළ විට අපේ සිත්
මොන තරම් සතුටකින් පිරී ගියාද!”
**33** එහෙයින් ඔවුහු ඒ පැයේදීම එකො-
ළොස්දෙනාවත් ඔවුන් සමඟ සිටි අය-
වත් හමු වීමට නැවත යෙරුසලම
බලා ගියෝය. ඔවුන්ව හමු වූ විට,
**34** “ස්වාමි වූ යේසුස් ඇත්තටම මර-
ණයෙන් නැවත නැඟිටලා! සීමො-
නුත් ඔහුව දැක්කා”[3] කියා එතැන සිටි
අයද ඔවුන්ට කියන්න පටන්ගත්හ.
**35** එවිට ඔවුහුද, ඔවුන් තම ගමන
යන අතරතුරේදී සිදු වූ දේවල් ගැන
හා යේසුස් ඔවුන් සමඟ කෑම ගන්නා
අතරේ රොටි කැඩූ විට[4] ඔවුන් ඔහුව
හඳුනාගත් ආකාරය ගැන විස්තර
කළෝය.

**36** ඔවුන් ඒ දේවල් ගැන කතා
කරමින් සිටියදී යේසුස් ඔවුන් අතරට
ඇවිත්, [[“ඔබට සමාදානය වේවා”
කියා කීවේය.]] **37** නමුත් ඔවුන්
බියෙන් වෙළී සිටි නිසා[5] ඔවුන් සිතු-
වේ තමන් දේවදූතයෙක් දුටු බවයි.
**38** එහෙයින් ඔහු ඔවුන්ට මෙසේ
කීවේය. “ඔබ කලබල වී සිටින්-
නේ ඇයි? ඔබ සැකයෙන් බලන්-
නේ ඇයි? **39** මගේ අත් පා
දෙස බලන්න. මේ මා බව තේරුම්-
ගන්න. මාව අල්ලා බලන්න.[6] මටත්
තිබෙන්නේ ඇට මස් නහරවලින්
යුත් ශරීරයක්.[7] දේවදූතයෙකුට මෙ-
වැනි ශරීරයක් නැහැ.” **40** [[මෙසේ
පැවසුවායින් පසු ඔහු තම අත් පා
ඔවුන්ට පෙන්වූවේය.]] **41** පුදුමය-
කින් හා මහත් ප්‍රීතියකින් සිටි නිසා
ඔවුන් දුටු දේ ඔවුන්ට විශ්වාස කරන්-
නවත් නොහැකි විය.[8] ඒ අවස්ථාවේදී
යේසුස් ඔවුන්ගෙන් මෙසේ ඇසුවේය.
“ඔබ ළඟ කෑමට යමක් තිබෙනවාද?”[9]

42 එවිට ඔවුහු පිලිස්සූ මාළු කැබැල්-
ලක් ඔහුට දුන්නෝය.[1] 43 යේසුස්
සියලුදෙනා ඉදිරියෙහිම එය කෑවේය.[2]
44 ඉන්පසු යේසුස් ඔවුන්ට මෙසේ
පැවසුවේය. "මා ඔබ සමඟ සිටි-
යදී ඔබට පැවසූ දේවල් ඔබට
මතක ඇති.[3] එනම් මෝසෙස්ට දෙන
ලද නීතියෙත් අනාගතවක්තෘවරුන්-
ගේ ලියවිලිවලත්[4] ගීතාවලියෙත්[5] මා
ගැන ලියා තිබෙන සියල්ල ඉටු
විය යුතු බවයි." 45 ශුද්ධ ලිය-
විල්ලේ සඳහන් දේවල නියම අර්-
ථය අවබෝධ කරගැනීමට[6] ඔවුන්ට
උපකාර කළ ඔහු, 46 ඔවුන්ට
මෙසේ කීවේය. "ශුද්ධ ලියවිල්ලේ ලියා
තිබුණු ආකාරයට ක්‍රිස්තුස් දුක් විඳ
මිය ගියත් තුන්වෙනි දවසේදී මරණ-
යෙන් නැඟිටිය යුතුයි.[7] 47 ඒ වගේම
ඔහුව පිළිගෙන පසුතැවිලි වන සිය-
ලුදෙනාගේ පව්වලට සමාව ලැබෙ-
නවා.[8] මේ දේවල් යෙරුසලමෙන්
පටන්ගෙන[9] සියලු ජාතීන්ට දේශනා
කරන්න අවශ්‍යයි.[1] 48 මේ සෑම දෙ-
යකටම සාක්ෂිකරුවන්[2] වුණේ ඔබයි.
49 මගේ පියාණන් ඔබට ලබා දෙන
බවට පොරොන්දු වූ දේ මම ඔබට
සහතිකවම දෙනවා. නමුත් දෙවිගේ
බලය ඔබට ලැබෙන තුරු[3] නුවරෙහිම
රැඳී සිටින්න."
50 යේසුස් ඔවුන් සමඟ බෙතා-
නිය දක්වා ගොස් තම අත් ඔසවා
ඔවුන්ට ආශීර්වාද කළේය.[4] 51 ඔහු
ඔවුන්ට ආශීර්වාද කරමින් සිටිය-
දීම ඔහු ඔවුන්ගෙන් සමුගත්තේය.
මෙසේ යේසුස්ව ස්වර්ගයට ඔසවාගනු
ලැබීය.[5] 52 එසේ සිදු වූ විට ඔහු
ඉදිරියේ දණින් වැටුණු ඔවුන් යෙරුස-
ලමට ආපසු හැරී ගියේ මහත් ප්‍රීතිය-
කිනි.[6] 53 ඉන්පසු ඔවුහු නිරතුරුව
දෙවිට ප්‍රශංසා කරමින් දේවමාලිගා-
වෙහි කාලය ගත කළෝය.[7]

24 පරි.
1 යොහ 21:13
2 ක්‍රියා 10:41
3 මතෙ 16:21 ලූක් 9:22 යොහ 5:39
4 ලූක් 24:27
5 ගීතා 2:2 ගීතා 16:10 ගීතා 27:12 ගීතා 69:9 ගීතා 78:2 ගීතා 118:22 ගීතා 132:11
6 යොහ 12:16
7 යෙසා 53:5 හොෂෙ 6:2 යෝනා 1:17 මාක් 9:31
8 ක්‍රියා 5:31 ක්‍රියා 13:38
9 ක්‍රියා 4:2 ක්‍රියා 5:28

2 තීරුව
1 උත් 22:18 1කොරි 15:12 ගලා 3:14 1තිමෝ 3:16
2 යොහ 15:27 ක්‍රියා 1:8

3 යෝවෙ 2:28; යොහ 14:16; ක්‍රියා 1:4; ක්‍රියා 2:4; 4 ද්වි 33:1; 5 ක්‍රියා 1:9; 6 යොහ 14:28; යොහ 16:22; ක්‍රියා 1:10; ක්‍රියා 1:12; 7 ක්‍රියා 2:46.

# යොහන්ගේ

## වාර්තාව

1 බොහෝ කලකට ඉහතදී එනම්,
අන් සියල්ල සෑදීමට පෙර*[1] 'වච-
නය'# නමැති තැනැත්තා[2] සිටියේය.
ඔහු සිටියේ දෙවි සමඟය.[3] 'වචනය'
නමැති එම තැනැත්තා දෙවිට සමා-
නකමක් ඇති බලවත් කෙනෙකි.△[4]
2 සියල්ල සාදන විට[5] ඔහු සිටියේ
දෙවි සමඟය.[6] 3 දෙවි සෑම දෙයක්ම
සෑදුවේ ඔහු මාර්ගයෙන්ය.[7] ඔහු නො-
මැතිව කිසිම දෙයක් සාදනු ලැබුවේ
නැත.
ඔහු මාර්ගයෙන් සෑදූ ඒ සෑම දෙ-
යකටම, 4 ජීවනය ලබා දුන්නෙත්
ඔහුමය.[1] මිනිසුන්ගේ අඳුරු ජීවිතයට
ආලෝකය ලැබුණෙත් ඔහුගේ ජීවිතය
මගිනි.[2] 5 ඒ ආලෝකය අන්ධකා-
රයෙහි දිගටම බැබළෙයි.[3] එහෙ-
යින් එම ආලෝකය වෙළාගෙන එය
නිවා දැමීමට අන්ධකාරයට හැකියා-
වක් නැත.
6 යොහන් නම් මිනිසෙක් සිටි-
යේය.[4] ඔහුව දෙවි විසින් එවනු ලැබු-
වේ දෙවි වෙනුවෙන් කතා කිරීමටය.[5]
7 ඔහු පැමිණ ආලෝකය ගැන[6]
සාක්ෂි දැරුවේය.[7] ඔහු එසේ කළේ

**යොහ 1:1*** මූ.අ., "පටන්ගැන්මේදී." **1#** මෙහිදී, 'වචනය' යන්න යේසුස්ට පදවි නාමයක් ලෙස භාවිත කෙරේ. ඔහුව එලෙස හඳුන්වන්නේ දෙවිගේ වචනය හෙවත් පණිවිඩය ප්‍රකාශ කරන ප්‍රධානතම තැනැත්තා ඔහු වන නිසාය.—යොහ 1:14ද එළි 19:13ද බලන්න. **1△** උපග්‍ර. 5 බලන්න.

1 පරි.
1 හිතෝ 8:22 කොලො 1:15 එළි 3:14
2 යොහ 12:50 එළි 19:13
3 හිතෝ 8:30 යොහ 17:5
4 යෙසා 9:6 යොහ 1:18 යොහ 10:35 පිලි 2:6
5 උත් 1:1 මීකා 5:2
6 උත් 1:26 උත් 3:22
7 යොහ 1:10 1කොරි 8:6 කොලො 1:16 හෙබ්‍රෙ 1:2

2 තීරුව
1 යොහ 5:26 ක්‍රියා 3:15 1යොහ 1:2 1යොහ 5:11

2 යොහ 8:12; 3 යොහ 3:19; යොහ 12:35; 4 මතෙ 3:1; ලූක් 1:13; 5 ලූක් 3:2; 6 මතෙ 3:11; 7 යෙසා 40:3; යොහ 5:33.

සියලු ආකාරයේ මිනිසුන් තුළ විශ්වා-
සයක් ඇති කිරීමටය.[1] **8** නමුත් ඒ
ආලෝකය ඔහු නොවෙයි.[2] ඔහුව එවා
තිබුණේ ඒ ආලෝකය ගැන සාක්ෂි
දැරීමට පමණි.[3]

**9** සියලු ආකාරයේ මිනිසුන්ව[4]
ආලෝකවත් කරන[5] ඒ සැබෑ ආලෝ-
කය[6] ලොවට පැමිණිය යුතු කාලය
ළඟා විය. **10** එහෙයින් ඔහු* මේ
ලෝකයට පැමිණියේය.[7] ඔහු මාර්-
ගයෙන් මුළු ලෝකයම සාදා තිබු-
ණත්[8] එහි වෙසෙන ජනයා ඔහුව
හඳුනාගත්තේ නැත. **11** ඔහු තමා-
ගේම දේශයට ගියත් එහි ජනතාව
ඔහුව පිළිගත්තේ නැත.[9] **12** නමුත්
ඇතැම් අය ඔහුව පිළිගෙන[10] ඔහු
කෙරෙහි තම විශ්වාසය තැබූ නිසා[11]
දෙවිගේ දරුවන් වීමේ අයිතිය ඔහු
ඔවුන්ට ලබා දුන්නේය.[12] **13** එහෙ-
යින් ඒ අය දෙවිගේ දරුවන් ලෙස
උපන්නෝය. එය සිදු වූයේ ඔවුන්ගේ
පෙළපත නිසාවත් ඔවුන්ගේ දෙමාපි-
යන් නිසාවත් ඔවුන්ගේ සිතේ පහළ වූ
යම් අදහසක් නිසාවත් නොව දෙවි
ඔවුන්ව තෝරාගත් නිසාය.[13]

**14** ‘වචනය’ නමැති එම
තැනැත්තා මිනිසෙක් වී[14] අප අත-
රේ ජීවත් විය. එසේ ජීවත් වෙද්දී
ඔහුගේ තේජස දැකගැනීමට අපට
හැකි විය. අප දුටු ඒ තේජස එකම
පුතෙකු*[15] තම පියාගෙන් ලබන
තේජසට සමානය. ඒ නිසා ඔහු
මහත් කරුණාවෙන් පිරී සිටි අතර
නිතරම සත්‍යය කතා කළේය.[16]
**15** (ඔහු ගැන ඉතා ප්‍රබල සාක්-
ෂියක් දැරූ තැනැත්තා යොහන්ය.
“මට පසුව එන තැනැත්තා මට
කලින් සිටි නිසා ඔහු මට වඩා
ශ්‍රේෂ්ඨයි” කියා ඇත්තටම පැවසූ-
වේ යොහන්ය.)[17] **16** අප සියලුදෙ-
නාටම ඔහුගෙන් නොඅඩුව[18] මහත්
කරුණාව ලැබිණ. මන්ද ඔහු මහත්
කරුණාවෙන් පිරී සිටින්නේය.[19]
**17** නීතිය දෙනු ලැබුවේ මෝසෙස්
මාර්ගයෙනි.[1] නමුත් මහත් කරුණාව[2]
සහ සත්‍යය[3] ලැබුණේ යේසුස් ක්‍රිස්-
තුස් මාර්ගයෙනි. **18** කිසි මිනිසෙක්
දෙවිව කිසිදාක දැක නැත.[4] නමුත්
මිනිසුන්ට දෙවි කවුද කියා පැහැදිලි
කර දී තිබෙන්නේ[5] පියාණන් සමීප-
යෙහිම[6] සිටින ඔහුට සමානකමක්
ඇති ඔහුගේ එකම පුත්‍රයාය.[7]

**19** යුදෙව්වරුන්ගේ නායකයන්
යෙරුසලමේ සිටි පූජකයන්ව සහ
ලෙවීවරුන්ව යොහන් වෙතට යවා,
“ඔබ කවුද” කියා ඔහුගෙන් ඇසූ විට[8]
ඔහු දුන් සාක්ෂිය මෙයයි. **20** “මම
ක්‍රිස්තුස් නොවෙයි” කියා ඔහු නො-
සඟවාම ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේය.[9]
**21** එවිට ඔවුහු, “එහෙමනම් ඔබ
කවුද? ඔබ එලියාද”[10] කියා ඔහු-
ගෙන් ඇසූහ. එවිට ඔහු, “මම එලියා
නොවෙයි” කියා පිළිතුරු දුන්නේය.
“එන්න සිටින අනාගතවක්තෘවරයා
ඔබද”[11] කියාත් ඔවුහු ඇසුවෝය.
එයටත් ඔහු, “නැහැ” කියා පිළි-
තුරු දුන්නේය. **22** එහෙයින් ඔවුහු,
“එහෙමනම් ඔබ කවුද? අපව එවූ
අයට අප පිළිතුරක් දිය යුතුයි.
ඔබ ගැන ඔබට කියන්න තිබෙන්-
නේ මොනවාද”[12] කියා ඔහුගෙන්
ඇසූහ. **23** ඔහු මෙසේ පිළිතුරු
දුන්නේය. “අනාගතවක්තෘ යෙසායා
පැවසූ දේ ඔබට මතකද? ඔහු කිව්-
වේ, ‘යෙහෝවා දෙවිගේ මඟ සමතලා
කරන්න’ කියා යමෙක් පාළුකර-
යේ සිට හඬ නඟන්නේය කියායි.
ඒ තැනැත්තා මමයි.”[13] **24** යොහන්
වෙතට එවූ ඒ අය පරිසිවරුන්ය.*
**25** ඔවුහුද, “ඔබ ක්‍රිස්තුස්වත් එලි-
යාවත් එන්න සිටින අනාගතවක්-
තෘවරයාවත් නොවෙයි නම් ඇයි
ඔබ මිනිසුන්ව බව්තීස්ම කරන්නේ”[14]
කියා ඔහුගෙන් ඇසූහ. **26** යොහන්

**1 පරි.**
**1** ක්‍රියා 19:4
**2** යොහ 1:20; ක්‍රියා 13:25
**3** යොහ 5:36
**4** ක්‍රියා 13:47
**5** යොහ 9:39; යොහ 12:46
**6** මතෙ 4:16; යොහ 3:19; 1යොහ 2:8
**7** යොහ 1:14
**8** යොහ 1:3
**9** ලූක් 19:14
**10** රෝම 9:27
**11** ගලා 3:26
**12** රෝම 8:16; 2කොරි 6:18; එෆී 1:5; 1යොහ 3:1
**13** යොහ 3:3; යාකො 1:18; 1පේතෘ 1:23; 1යොහ 3:9
**14** පිලි 2:7; 1තිමෝ 3:16; හෙබ්‍රෙ 2:14; 1යොහ 4:2; 2යොහ 7
**15** යොහ 3:16; 1යොහ 4:9
**16** එෆී 4:21
**17** ලූක් 3:16; යොහ 8:58; කොලො 1:17
**18** කොලො 1:19; කොලො 2:3; කොලො 2:9
**19** එෆී 1:6

**2 තීරුව**
**1** නික් 31:18; ද්වි 4:44; යොහ 7:19
**2** රෝම 3:24; රෝම 6:14
**3** යොහ 8:32; යොහ 14:6; යොහ 18:37; 2කොරි 1:20
**4** නික් 33:20; යොහ 6:46; 1යොහ 4:12
**5** මතෙ 11:27; ලූක් 10:22; 1යොහ 3:2
**6** හිතෝ 8:30; යොහ 13:23
**7** යොහ 1:1
**8** ලූක් 3:15
**9** යොහ 3:28; ක්‍රියා 13:25
**10** මලා 4:5; මතෙ 11:14; මතෙ 17:10; මාක් 9:13
**11** ද්වි 18:15; යොහ 6:14; යොහ 7:40; ක්‍රියා 3:22
**12** ලූක් 3:16
**13** යෙසා 40:3; මතෙ 3:3; ලූක් 1:17; ලූක් 1:76; ලූක් 7:27; යොහ 3:28; **14** මතෙ 21:25.

---

**යොහ 1:10*** එනම්, “වචනය” නමැති තැනැත්තා. **14*** එනම්, දෙවි විසින් සෑදූ එකම පුත්‍රයා.

**යොහ 1:24*** යේසුස්ගේ කාලයේ සිටි ප්‍රසිද්ධ ආගමික නායකයන් පිරිසකි.

මෙසේ පැවසුවේය. “මම බව්තීස්ම
කරන්නේ වතුරෙන්. නමුත් ඔබ තව-
මත් හඳුනාගෙන නැති[1] කෙනෙක් ඔබ
අතරෙහිම[2] සිටිනවා. **27** මට පසුව
එන තැනැත්තා ඔහුයි. මම ඔහුගේ
පාවහන්වල පටි ගලවන්න තරම්වත්
සුදුසු කෙනෙක් නොවෙයි.”[3] **28** ඒ
දේවල් සිදු වූයේ යොහන් මිනිසුන්ව
බව්තීස්ම කරමින් සිටි යෝර්දාන්
ගඟෙන්[4] එගොඩ පිහිටි බෙතානිය
නම් නුවරෙහිය.

**29** ඊළඟ දින තමා ළඟට යේසුස්
එනවා දුටු යොහන් මෙසේ කීවේය.
“බලන්න, මේ සිටින්නේ ලෝක-
යෙන්[5] පාපය නැති කර දමන[6] දෙවි-
ගේ බැටළු පැටවායි![7] **30** මට පසුව
එන තැනැත්තෙක් ගැන මම කිව්වා
ඔබට මතක ඇති. ඔහු මට කලින්
සිටි නිසා[8] ඔහු මට වඩා ශ්‍රේෂ්-
ඨයි කියාත් මම පැවසුවා. මා පැවසු-
වේ මේ තැනැත්තා ගැනයි. **31** මේ
වන තුරු මමත් ඔහුව හඳුනාගෙන
සිටියේ නැහැ. නමුත් මම මිනි-
සුන්ව වතුරෙන් බව්තීස්ම කළේ ඔහු
ගැන ඊශ්‍රායෙලය පුරාම ප්‍රසිද්ධ කිරී-
මටයි.”[9] **32** එවිට යොහන් ඒ සම්-
බන්ධයෙන් තමන්ට ලැබුණු සාක්ෂි
ගැන මෙසේ කීවේය. “දෙවිගේ බලය
පරෙවියෙක් වගේ ස්වර්ගයෙන් බැස
ඇවිත් ඔහුට ලැබුණු ආකාරය මම
දැක්කා.[10] **33** මමත් ඔහුව හඳුනා-
ගෙන සිටියේ නැහැ. නමුත් මිනිසුන්ව
වතුරෙන් බව්තීස්ම කිරීමට මාව එවූ
තැනැත්තා[11] මට මෙහෙම කිව්වා.
‘යම් කෙනෙකුට මගේ බලය ලැබෙ-
නවා ඔබ දැක්කොත් මගේ බලයෙන්
අන් අයව බව්තීස්ම කරන්නේ එම
තැනැත්තා බව මතක තබාගන්න.’[12]
**34** ඒ දේ සිදු වෙනවා මම දැක්කා. ඒ
නිසා මේ තැනැත්තා දෙවිගේ පුත්‍රයා
බවට මම සාක්ෂි දෙනවා.”[13]

**35** ඊළඟ දින යොහන් තම ගෝ-
ලයන් දෙදෙනෙකු සමඟ සිටියදී,
**36** යේසුස් ඔවුන් අසලින් යනවා දැක,
“මේ සිටින්නේ දෙවිගේ බැටළු පැට-
වායි”[14] කියා කීවේය. **37** එම ගෝ-
ලයන් දෙදෙනා ඔහු කී දේ අසා යේසුස්
පසුපස ගියහ. **38** යේසුස් හැරී ඔවුන්
තමන් පසුපස එනවා දැක, “ඔබට
මොනවද ඕනේ” කියා ඔවුන්ගෙන්
ඇසුවේය. ඔවුහුද, “රබ්බි, ඔබ නැවතී
සිටින්නේ කොහේද” කියා ඔහුගෙන්
ඇසූහ. (රබ්බි යන වචනයේ අර්ථය
ගුරුතුමාය.) **39** එවිට ඔහු, “ඇවිත්
බලන්න”[1] කියා ඔවුන්ට කීවේය.
එහෙයින් ඔවුහු ගොස් ඔහු නැවතී
සිටින තැනට පැමිණියෝය. ඔවුන්
එතැනට පැමිණියේ දහවෙනි පැයේදී*
පමණය. ඔවුන් එදින ගත කළේ ඔහු
සමඟය. **40** යොහන් කී දේ අසා
යේසුස් පසුපසින් ගිය දෙදෙනාගෙන්
එක් තැනැත්තෙක් වූයේ සීමොන්
පේතෘස්ගේ සහෝදරයා වූ අන්ද්‍රෑය.[2]
**41** ඔහු මුලින්ම තම සහෝදරයා වූ
සීමොන් ළඟට ගොස්, “අපට මෙසි-
යස්ව හමු වුණා”[3] කියා පැවසුවේය.
(මෙසියස් යන වචනයේ අර්ථය ක්‍රිස්-
තුස්ය.)[4] **42** අන්ද්‍රෑ සීමොන්ව යේ-
සුස් ළඟට ගෙන ගියේය. යේසුස් ඔහු
දෙස බලා[5] මෙසේ පැවසුවේය. “ඔබ
යොහන්ගේ පුත්[6] සීමොන්[7] නේද? මෙ-
තැන් පටන් ඔබව හඳුන්වන්නේ සීෆස්
කියායි.” (ග්‍රීක බසින් සීෆස් යනු පේ-
තෘස්ය.)[8]

**43** ඊළඟ දින යේසුස් ගලීලය බලා
ගමන් කිරීමට අදහස් කළේය. මේ
අතර ඔහුට පිලිප්ව[9] මුණගැසුණු විට
“මගේ අනුගාමිකයෙක් වන්න”[10] කියා
ඔහුට කීවේය. **44** පිලිප් යනු අන්ද්‍රෑ
සහ පේතෘස් වාසය කළ බෙත්ස-
යිදා නුවරේ[11] වැසියෙකි. **45** පිලිප්
නතානියෙල්ව[12] හමු වී, “අපිට නාස-
රෙත් නුවරින් පැමිණි යේසුස්
නම් කෙනෙක්ව හමු වුණා. ඔහු-
ගේ පියා යෝසෙප්.[13] මෝසෙස්ට
දෙන ලද නීතියෙන්[14] අනාගතවක්-
තෘවරුන්ගේ ලියවිලිවලත්[15] සඳහන්
තැනැත්තා ඔහුයි” කියා කීවේය.

**1 පරි.**
**1** යෙසා 53:2
**2** ලූක් 17:21
**3** මතෙ 3:11
ක්‍රියා 13:25
**4** මතෙ 3:6
**5** යොහ 6:51
1යොහ 2:2
1යොහ 4:14
**6** යෙසා 53:11
1කොරි 15:3
හෙබ්‍රෙ 9:14
1පේතෘ 2:24
1යොහ 3:5
**7** නික් 12:3
යෙසා 53:7
1කොරි 5:7
1පේතෘ 1:19
එළි 5:6
**8** යොහ 1:15
යොහ 8:58
කොලො 1:17
**9** යෙසා 40:3
මලා 3:1
ලූක් 1:76
ක්‍රියා 19:4
**10** මතෙ 3:16
මාක් 1:10
ලූක් 3:22
**11** ලූක් 3:2
**12** මතෙ 3:11
ක්‍රියා 1:5
ක්‍රියා 2:4
**13** මතෙ 3:17
යොහ 5:33
**14** ක්‍රියා 8:32
එළි 5:12

**2 තීරුව**
**1** මතෙ 8:20
2කොරි 8:9
**2** මතෙ 4:18
**3** දානි 9:25
යොහ 11:27
**4** යොහ 4:25
**5** යොහ 2:25
**6** මතෙ 16:17
යොහ 21:15
**7** මතෙ 10:2
ක්‍රියා 15:14
**8** මතෙ 16:18
මාක් 3:16
ලූක් 6:14
**9** මතෙ 10:3
**10** මතෙ 9:9
එළි 14:4
**11** මාක් 8:22
යොහ 12:21
**12** මතෙ 10:3
ලූක් 6:14
**13** මතෙ 1:16
මතෙ 13:55
ලූක් 2:4
**14** උත් 3:15
උත් 22:18
උත් 49:10
ද්වි 18:18
යොහ 5:46

**15** යෙසා 9:6; යෙරෙ 33:15; එස 34:23; මීකා 5:2; සෙක 6:12; මලා 3:1.

යොහ **1:39*** එනම්, ප.ව. 4ට පමණ.

**46** නමුත් නතානියෙල්, “නාසරෙත්
නුවරින් කොහොමද යහපත් කෙ-
නෙක් එන්නේ”[1] කියා පැවසුවේය.
එවිට පිලිප්, “ඔබම ඇවිත් බලන්න”
කියා ඔහුට කීවේය. **47** නතානි-
යෙල් තමා ළඟට එනවා දුටු යේසුස්,
“මෙන්න, සැබෑ ඊශ්‍රායෙල් ජාතික-
යෙක්. ඔහු තුළ කිසි වංචාවක් නැහැ”
කියා පැවසුවේය.[2] **48** එවිට නතා-
නියෙල්, “ඔබ කොහොමද මා ගැන
දන්නේ” කියා ඔහුගෙන් ඇසුවේය.
යේසුස් මෙසේ පිළිතුරු දුන්නේය.
“පිලිප් ඔබට අඬගසන්නත් කලින් මම
ඔබව දැක්කා. ඔබ සිටියේ අත්තික්කා
ගසක් ළඟයි.” **49** එවිට නතානි-
යෙල්, “ගුරුතුමනි, දෙවිගේ පුත්‍රයා
ඔබයි.[3] ඊශ්‍රායෙල්හි රජ[4] ඔබයි.” කියා
පැවසුවේය. **50** යේසුස් මෙසේ පිළි-
තුරු දුන්නේය. “ඔබ මාව විශ්වාස
කරන්නේ ඔබ අත්තික්කා ගසක් ළඟ
සිටිනවා මා දුටු බව පැවසූ නිසාද?
නමුත් ඊටත් වඩා ශ්‍රේෂ්ඨ දේවල්
දකින්න ඔබට හැකි වෙයි.” **51** ඔහු
මෙසේද කීවේය. “ඇත්තෙන්ම මම
ඔබ සියලුදෙනාටම කියන්නේ, ස්වර්-
ගය විවෘත වී, එයින් දෙවිගේ දූතයන්
ඇවිත්[5] මනුෂ්‍ය පුත්‍රයා ළඟට බැස එන
ආකාරයත් නැවතත් ඔවුන් ස්වර්ග-
යට නැඟ යන ආකාරයත් දැකගන්න
ඔබට හැකි වන බවයි.”[6]

**2** තුන්වෙනි දින, ගලීලයේ පිහිටි
කානා නුවරෙහි[7] විවාහ උත්සව-
යක් පවත්වන ලදි. යේසුස්ගේ මවද[8]
එයට සහභාගි වූවාය. **2** එම විවාහ
උත්සවයට යේසුස්ටත් ඔහුගේ ගෝ-
ලයන්ටත් ආරාධනා කර තිබිණ.

**3** එම උත්සවය අතරතුරේදී වයින්
හිඟ වූ විට, “වයින් ඉවරයි” කියා
යේසුස්ගේ මව[9] ඔහුට දැන්වූවාය.
**4** එවිට යේසුස් තම මවට මෙසේ
පැවසුවේය. “ඒ ගැන මට කියන්නේ
ඇයි?[10] මගේ නියමිත වේලාව තව-
මත් පැමිණ නැහැ.”[11] **5** නමුත් ඔහු-
ගේ මව සංග්‍රහ කරමින් සිටි අයට
මෙසේ කීවාය. “ඔහු මොනවා හරි
කරන්න කිව්වොත් ඒ දේ කරන්න.”[12]
**6** යුදෙව්වරුන් පනවා තිබූ නීති-
රීතිවලට අනුව පවිත්‍ර වීම සඳහා[1]
අවශ්‍ය වතුර පිරවීමට ගලින් සෑදූ
වතුර භාජන හයක් එහි තබා තිබිණ.
ඒ එක් භාජනයකට විශාල බාල්දි
දෙකක හෝ තුනක හෝ වතුර ප්‍රමා-
ණයක් දැමීමට හැකි විය. **7** යේ-
සුස් ඔවුන්ට මෙසේ පැවසුවේය. “මේ
භාජනවලට වතුර පුරවන්න.” ඔවුහු
ඒවායේ කට ළඟටම වතුර පිරෙව්-
වෝය. **8** එවිට යේසුස්, “දැන් එයින්
ටිකක් ගෙන උත්සවයේ වැඩකට-
යුතු අධීක්ෂණය කරන තැනැත්-
තාට දෙන්න” කියා ඔවුන්ට කීවේය.
ඔවුහු එසේ කළෝය. **9** උත්සව-
යේ වැඩකටයුතු අධීක්ෂණය කරන
තැනැත්තා වයින් බවට හරවා තිබුණු
වතුර[2] ගෙන එහි රස බැලුවේය.
සංග්‍රහ කරමින් සිටි අය සිදු
වූ දේ දැන සිටියත් ඔහු ඒ
ගැන කිසිවක් දැන සිටියේ නැත.
එහෙයින් ඔහු මනමාලයාට අඬගසා,
**10** “සාමාන්‍යයෙන් මිනිසුන් මුලින්ම
පිළිගන්වන්නේ හොඳම වයින්.[3] බාල
වයින් දෙන්නේ අමුත්තන් මත් වන
තුරු බීවායින් පසුවයි. ඒත් ඔබ දැන්
තමයි හොඳ වයින් දෙන්නේ” කියා
ඔහුට කීවේය. **11** ගලීලයේ පිහිටි
කානා නුවරේදී යේසුස් කළ ඒ දෙය
ඔහු කළ බොහෝ ආශ්චර්යයන්වල
පළමුවැන්නයි. එයින් ඔහු සතු මහත්
බලය සියලුදෙනාටම දැකගත හැකි
විය.[4] ඔහුගේ ගෝලයෝද ඔහු කෙ-
රෙහි තව තවත් විශ්වාස කරන්න
පටන්ගත්තෝය.

**12** ඉන්පසු ඔහුද ඔහුගේ මව සහ
සහෝදරයෝද[5] ඔහුගේ ගෝල-
යෝද කපර්ණවුම නුවර[6] බලා ගමන්
කළෝය. නමුත් ඔවුහු එහි බොහෝ
දවස් නැවතී සිටියේ නැත.

**13** යුදෙව්වරුන්ගේ පාස්කු උත්ස-
වය[7] ළඟා වූ විට යේසුස් යෙරුස-
ලම බලා ගමන් කළේය.[8] **14** ඔහු
දේවමාලිගාවට ගිය විට මිනිසුන්
එහි විවිධ සතුන් එනම්, ගවයන්,
බැටළුවන් හා පරෙවියන්[9] විකුණමින්

**1 පරි.**
1 යොහ 7:41
2 යොහ 2:25
3 ලූක් 1:32
4 සෙඛ 9:9, මතෙ 27:11, යොහ 12:13
5 ගීතා 104:4, මතෙ 4:11, ලූක් 22:43
6 උත් 28:12, දානි 7:13

**2 පරි.**
7 යොහ 4:46, යොහ 21:2
8 ලූක් 2:51
9 ක්‍රියා 1:14
10 යොහ 19:26
11 මතෙ 26:2, යොහ 7:6, යොහ 12:23
12 උත් 41:55

**2 තීරුව**
1 මාක් 7:3, යොහ 3:25
2 යොහ 4:46
3 ලූක් 5:39
4 යෙසා 9:1, යොහ 1:14
5 මතෙ 12:46, මතෙ 13:55, මාක් 3:31, ලූක් 8:19, ක්‍රියා 1:14, 1කොරි 9:5, ගලා 1:19
6 මතෙ 4:13
7 නික් 12:14, ගණන් 28:16, ද්වි 16:1, යොහ 11:55, යොහ 12:1
8 යොහ 5:1
9 ලෙවී 1:14

සිටින ආකාරයද මුදල් මාරු කරන්-
නන් ඉඳගෙන සිටින ආකාරයද ඔහුට
දැකගත හැකි විය. **15** ලණුවලින්
කසයක් සාදාගත් ඔහු, බැටළුවන්ව
හා ගවයන්ව විකුණමින් සිටි සිය-
ලුදෙනාව දේවමාලිගාවෙන් පිටතට
එළවා දමා මුදල් මාරු කරන්නන්ගේ
කාසි බිමට හළා ඔවුන්ගේ මේසද පෙ-
රළා දැමුවේය.[1] **16** ඔහු පරෙවියන්
විකුණමින් සිටි අයට මෙසේ පැවසු-
වේය. "මේ දේවල් මෙහෙන් ඉවත්
කරන්න! මගේ පියාණන්ගේ ගෘහය
වෙළඳපොළක්[2] හැටියට යොදාගන්න
එක ඔබ දැන්මම නතර කළ යුතුයි."[3]
**17** එවිට, "ඔබගේ ගෘහය කෙරෙහි
මට ඇති ළැදියාව මොන තරම්ද! එය
මා තුළ ඇවිළෙන ගින්නක් මෙනි"[4]
කියා ලියා තිබෙන දේ ඔහුගේ ගෝල-
යන්ට මතක් විය.

**18** එවිට යුදෙව්වරු, "ඔබට මේ
වගේ දේවලුත් කරන්න අයිතියක්
තිබෙනවා කියා ඔප්පු කරන්න ඔබ
මොන වගේ ලකුණක්ද අපට දෙන්-
නේ"[5] කියා ඔහුගෙන් ඇසූහ.
**19** යේසුස් මෙසේ පිළිතුරු දුන්නේය.
"මේ දේවමාලිගාව කඩා දමන්න.[6]
එතකොට දවස් තුනකින් මම එය
නැවත ගොඩනඟනවා." **20** එවිට
යුදෙව්වරු, "මේ දේවමාලිගාව ගොඩ-
නඟන්න අවුරුදු හතළිස්හයක්ම ගත
වුණා. ඔබ එය දවස් තුනකින් ගොඩ-
නඟන්නේ කොහොමද" කියා ඇසූහ.
**21** නමුත් දේවමාලිගාව ගැන සඳහන්
කරමින් ඔහු කතා කළේ තමාගේ ශරී-
රය ගැනයි.[7] **22** යේසුස් පැවසූ ඒ දේ
ඔහුගේ ගෝලයන්ට මතක් වුණේ[8]
ඔහුව මරණයෙන් නැවත නැඟිටුවනු
ලැබූ පසුවයි. එවිට ශුද්ධ ලියවිල්ලේ
සඳහන් වී තිබූ දේවල්ද යේසුස් පැවසූ
දේවල්ද ඔවුහු විශ්වාස කළෝය.

**23** පාස්කු උත්සවය පවත්වන
කාලයේ[9] යේසුස් යෙරුසලමෙහි සිදු
කළ ආශ්චර්යයන් දැක[10] බොහෝ-
දෙනෙක් ඔහුව පිළිගෙන ඔහුව විශ්-
වාස කළෝය.[11] **24** නමුත් යේසුස්
ඒ සියලුදෙනාව හොඳින් හඳුනාගත්
නිසා ඔවුන්ව සම්පූර්ණයෙන්ම විශ්-
වාස කළේ නැත.[1] **25** ඒ අය ගැන
දැනගැනීමට අන් අයගෙන් කිසි තො-
රතුරක් යේසුස්ට අවශ්‍ය වූයේද නැත.
එයට හේතුව වූයේ යේසුස්ට මිනිසුන්-
ගේ සිත්වල තිබෙන දේ තේරුම්ගත
හැකි වූ නිසාය.[2]

**3** යුදෙව්වරුන්ගේ පාලකයෙක් වූ
නිකදේමස්[3] නම් පරිසිවරයෙක්
සිටියේය. **2** ඔහු රාත්‍රියේදී[4] යේ-
සුස්ව හමු වීමට ඇවිත්, "ගුරුතු-
මනි,[5] ඔබ දෙවි විසින් එවා
ඇති[6] ගුරුවරයෙක් බව අපි දන්නවා.[7]
මන්ද කෙනෙකුට දෙවිගේ ආශීර්වා-
දය නැත්නම්[8] ඔබ කරනවා වගේ
මහත් ලකුණු කරන්න ඒ තැනැත්-
තාට බැහැ"[9] කියා කීවේය. **3** යේ-
සුස් ඔහුට මෙසේ පිළිතුරු දුන්නේය.[10]
"ඇත්තෙන්ම මා ඔබට කියන්නේ,
කෙනෙකුට දෙවිගේ රාජ්‍යය දකින්න
කැමති නම්[11] ඔහු අලුත් උපතක්[12]
ලැබිය යුතු බවයි." **4** එවිට නිකදේ-
මස්, "කොහොමද මිනිසෙක් මහලු වී
සිටියදී ඉපදෙන්නේ? ඔහුට දෙවෙනි
වරටත් තම මවගේ කුසට ඇතුල් වී
ඉපදෙන්න පුළුවන්ද" කියා යේසුස්-
ගෙන් ඇසුවේය. **5** යේසුස් මෙසේ
පිළිතුරු දුන්නේය. "ඇත්තෙන්ම මම
ඔබට කියන්නේ, කෙනෙක් මුලින්ම
වතුරෙන්[13] බව්තීස්ම වී දෙවිගේ බලය
ලබාගෙන[14] අලුත් ජීවිතයක් ඇරඹිය
යුතු බවයි. එය ඔහු අලුත් උප-
තක් ලබනවා හා සමානයි. එසේ
නොවුණොත් ඔහුට දෙවිගේ රාජ්‍යයට
ඇතුල් විය නොහැකියි. **6** මිනිසෙ-
කුගෙන් උපන් කෙනෙක් මිනිසෙක්.
නමුත් දෙවිගේ බලය ලබා ඉප-
දෙන තැනැත්තා දෙවිගේ දරුවෙක්.[15]
**7** කෙනෙක් එලෙස අලුත් උපතක්
ලැබිය යුතුයි[16] කියා මම ඔබට පැවසූ
දේ ගැන පුදුම වෙන්න එපා. **8** උදා-
හරණයකට සුළඟ[17] ගැන හිතන්න.
ඕනෑම දිශාවකට හමන්න සුළඟට
පුළුවන්. එහි ශබ්දය කොයි කාටත්

**2 පරි.**
**1** මතෙ 21:12; මාක් 11:15; ලූක් 19:45
**2** යෙරෙ 7:11; මතෙ 21:13; මාක් 11:17; ලූක් 19:46
**3** ගීතා 93:5; ලූක් 2:49
**4** ගීතා 69:9
**5** මතෙ 12:38; මතෙ 16:1; යොහ 4:48; යොහ 6:30
**6** මතෙ 26:61; මතෙ 27:40; මාක් 14:58
**7** මතෙ 12:6; මතෙ 16:21; ලූක් 24:7; 1කොරි 6:19
**8** ලූක් 24:8; යොහ 12:16; යොහ 14:26; යොහ 20:9
**9** යොහ 4:45
**10** යොහ 7:31
**11** යොහ 11:48

**2 නිරුව**
**1** යොහ 6:15
**2** මතෙ 9:4; මාක් 2:8; යොහ 1:48; යොහ 6:64; එළි 2:23

**3 පරි.**
**3** යොහ 7:50; යොහ 19:39
**4** යොහ 12:42
**5** යොහ 1:38
**6** යොහ 7:16; යොහ 8:28
**7** මතෙ 7:29; යොහ 7:46
**8** යොහ 14:11; ක්‍රියා 2:22; ක්‍රියා 10:38
**9** යොහ 2:11
**10** ක්‍රියා 2:28
**11** 1කොරි 15:50
**12** යොහ 1:13; 2කොරි 5:17; ගලා 6:15; 1පේතෘ 1:3; 1පේතෘ 1:23; 1යොහ 3:9
**13** මතෙ 28:19; ක්‍රියා 8:36; ක්‍රියා 10:47; ක්‍රියා 19:5
**14** මතෙ 3:11; යොහ 1:33; ක්‍රියා 1:5; ක්‍රියා 10:45; ක්‍රියා 11:16; ක්‍රියා 19:6; 1කොරි 12:13
**15** 1කොරි 15:44

**16** 1පේතෘ 1:3; 1පේතෘ 1:23; **17** දේශ 11:5.

ඇහෙනවා. නමුත් එය ආවේ කො-
හෙන්ද කියාවත් එය යන්නේ මොන
දිශාවටද කියාවත් ඔබ දන්නේ නැහැ.
දෙවිගේ බලය ලබා ඉපදෙන අය
ගැනත් පැවසිය හැක්කේ එයමයි.”[1]
**9** නිකදේමස් මෙසේ කීවේය. “ඒ
වගේ දෙයක් සිදු වෙන්නේ කො-
හොමද?” **10** යේසුස් ඔහුට මෙසේ
පිළිතුරු දුන්නේය. “ඔබ ඊශ්‍රායෙල-
යෙහි ගුරුවරයෙක් නේද? මේ දේවල්
ගැන ඔබ දන්නේ නැද්ද?[2] **11** ඇත්-
තෙන්ම මම ඔබට කියන්නේ, අපි
කතා කරන්නේ අප දන්නා දේවල්
ගැනයි. ඒ වගේම අපි සාක්ෂි දරන්නේ
අප දුටු දේවල් ගැනයි.[3] නමුත් කොත-
රම් සාක්ෂි ඉදිරිපත් කළත් ඔබ ඒවා
පිළිගන්නේ නැහැ.[4] **12** මා ඔබට
මේ පොළොවට සම්බන්ධ දේවල්
ගැන කියන විට ඔබ විශ්වාස කරන්-
නේ නැත්නම් මා ඔබට ස්වර්ගය
හා සම්බන්ධ දේවල් ගැන කිව්වොත්
ඔබ විශ්වාස කරයිද?[5] **13** මේ වන
තුරු කිසිම මනුෂ්‍යයෙක් ස්වර්ගයට
ගිහිල්ලා නැහැ.[6] ස්වර්ගයෙන් පැමිණි[7]
එකම තැනැත්තා මනුෂ්‍ය පුත්‍රයා
පමණයි.[8] **14** මෝසෙස් පාළුකරයේ
කණුවක සර්පයෙකුව එල්ලා තැබුවා
සේම[9] මනුෂ්‍ය පුත්‍රයාවත් එල්ලා
තබනු ලබනවා.[10] **15** එසේ වන්නේ
ඔහුව විශ්වාස කරන සෑම කෙනෙ-
කුටම සදාකාල ජීවනය ලබා දීම
සඳහායි.[11]
**16** “දෙවි මුළු ලෝකයටම කොත-
රම් ප්‍රේම කළාද[12] කියනවා නම් ඔහු
තමාගේ එකම පුත්‍රයාව* ඔවුන් වෙනු-
වෙන් ලබා දුන්නා.[13] එසේ කළේ ඔහු
කෙරෙහි විශ්වාසය තබන[14] සෑම කෙ-
නෙක්ම විනාශ නොවී[15] ඔවුන්ට සදහ-
ටම ජීවත් වීමේ ප්‍රස්තාව ලබාගැනීම
සඳහායි.[16] **17** දෙවි තම පුත්‍රයාව
ලෝකයට එව්වේ, ඔහු මාර්ගයෙන්
ලෝකයේ සිටින අයව විනිශ්වය කිරී-
මට නොව[17] ඔහු මාර්ගයෙන් ඔවුන්ට

**යොහ 3:16*** එනම්, දෙවි විසින්ම සෑදූ එකම පුත්‍රයාව.

**3 පරි.**
1 යොහ 14:17 ක්‍රියා 2:2 රෝම 8:16 1කොරි 2:11
2 යොහ 9:30
3 යොහ 8:26
4 යොහ 3:32 1කොරි 2:14
5 ලූක් 22:67
6 ක්‍රියා 2:34 හෙබ්‍රෙ 9:8
7 යොහ 6:38 යොහ 8:23 යොහ 8:42 1කොරි 15:47 එෆී 4:9
8 යොහ 1:51
9 ගණන් 21:9
10 යොහ 8:28 ගලා 3:13
11 යොහ 3:36 යොහ 20:31
12 1යොහ 4:10 1යොහ 4:19
13 උත් 22:2 උත් 22:16 රෝම 5:8 රෝම 8:32 1යොහ 4:9
14 යොහ 1:12 යොහ 12:44 එෆී 4:5 පිලි 1:29 2තිමෝ 3:15
15 මතෙ 25:46
16 යොහ 6:40 යොහ 20:31 රෝම 6:23 1යොහ 5:13
17 යොහ 12:47 2කොරි 5:19

**2 තීරුව**
1 ලූක් 19:10 1කොරි 15:22 1තිමෝ 1:15 1යොහ 2:2 1යොහ 4:14
2 යොහ 5:24 රෝම 8:1
3 මතෙ 10:33 හෙබ්‍රෙ 10:29
4 යොහ 1:5
5 යොහ 1:9 යොහ 8:12 යොහ 9:5 යොහ 12:46
6 යෝබ් 24:13 යෙසා 5:20 යොහ 12:48
7 1කොරි 6:9 ගලා 5:19 1පේතෘ 4:3
8 එෆී 5:13
9 යොහ 12:36 යොහ 12:46 1යොහ 1:7

ගැලවීම ලබා දීමටයි.[1] **18** ඔහු කෙ-
රෙහි විශ්වාසය තබන තැනැත්-
තාව විනිශ්වය කරන්නේ නැහැ.[2]
නමුත් කිසි විශ්වාසයක් නොදක්වන
තැනැත්තාට දැනටමත් විනිශ්වයක්
ලැබී හමාරයි. එසේ වන්නේ ඔහු දෙවි-
ගේ එකම පුත්‍රයාව* පිළිගන්නේවත්
ඔහු කෙරෙහි විශ්වාසය තබන්නේ-
වත් නැති නිසයි.[3] **19** ලෝකයට[4]
ආලෝකය[5] පැමිණියත් මිනිසුන් එය
ප්‍රතික්ෂේප කළා. මන්ද ඔවුන්ගේ
ක්‍රියා දුෂ්ට නිසා ඔවුන් වැඩි ඇල්-
මක් දක්වන්නේ ආලෝකයට වඩා
අන්ධකාරයටයි.[6] ඔවුන්ට විනිශ්ව-
යක් ලැබෙන්නේ ඒ හේතුව නිසයි.
**20** පිළිකුල් දේවල් කරන පුද්ගලයා[7]
ආලෝකය ප්‍රතික්ෂේප කරනවා. ඔහු
කරන දේවල් වැරදි බව හෙළි වෙ-
නවාට ඔහු අකමැති නිසා[8] ඔහු
ආලෝකය අසලටවත් එන්නේ නැහැ.
**21** නමුත් යහපත් දේවල් කරන
තැනැත්තා ආලෝකය සොයාගෙන
එනවා.[9] ඔහු එසේ පැමිණෙන්නේ
තමා දෙවිගේ කැමැත්තට එකඟව
ක්‍රියා කර ඇති බව එමගින් පැහැදිලි
වන නිසයි.”
**22** එම සිද්ධියෙන් පසු යේසුස්
තම ගෝලයන් සමඟ යුදයේ පිටිසර
පළාත්වලට ගොස් ඔවුන් සමඟ යම්
කාලයක් ගත කළේය. එහිදී කිහි-
පදෙනෙකුව බව්තීස්ම කරන ලදි.[10]
**23** ඒ අතරතුරේදී සාලිම් ළඟ පිහිටි
ඒනොන් නම් ස්ථානයෙහි බොහෝ
වතුර තිබුණු නිසා[11] යොහන්[12] තමන්
ළඟට පැමිණි මිනිසුන්ව බව්තීස්ම
කරමින් සිටියේය.[13] **24** ඒ වන
විටත් යොහන්ව සිරභාරයට ගෙන
තිබුණේ නැත.[14]
**25** මේ අතර යොහන්ගේ ගෝ-
ලයන් හා යුදෙව්වෙකු අතරේ
පවිත්‍ර වීමේ චාරිත්‍රය ගැන විවාදයක්

**10** යොහ 3:26; යොහ 4:2; **11** මාක් 1:10; ක්‍රියා 8:36; **12** මතෙ 3:1; **13** මතෙ 3:6; **14** මතෙ 14:3; ලූක් 3:20.

**යොහ 3:18*** යොහ 3:16හි පාදසටහන බලන්න.

හටගත්තේය.[1] **26** ඉන්පසු ඔවුහු
යොහන් ළඟට ඇවිත්, “ගුරුතුමනි,
ඔබ යොර්දාන් ගඟෙන් එගොඩ සිටි
විට ඔබ සමඟ සිටි යම් කෙනෙක්
ගැන ඔබ සාක්ෂි දැරුවා[2] මත-
කද? දැන් බලන්න, ඔහුත් මිනිසුන්ව
බව්තීස්ම කරනවා. ඒ නිසා සියලු-
දෙනාම ඔහු ළඟට යනවා”[3] කියා
ඔහුට කීවෝය. **27** යොහන් මෙසේ
පිළිතුරු දුන්නේය. “කෙනෙකුට
දෙවිගේ අනුමැතිය ලැබෙන්නේ නැත්-
නම් ඔහුට කිසිම දෙයක් කරන්න
බැහැ.[4] **28** මම ක්‍රිස්තුස් නොවෙයි[5]
කියා පැවසුවා ඔබට මතක ඇති.
ඔබ සියලුදෙනා එයට සාක්ෂිකරුවෝ.
ඇත්තෙන්ම මාව එවා තිබෙන්නේ ඒ
තැනැත්තාට කලින් එන පුද්ගලයා
හැටියටයි.[6] **29** මනාලිය අයිති වන්-
නේ මනාලයාටයි.[7] නමුත් අසලින්
සිටින මනාලයාගේ මිත්‍රයා ඔහුගේ හඬ
අසා මහත් සේ ප්‍රීති වෙයි. මමත් දැන්
ප්‍රීතියෙන් පිරී සිටින්නේ ඒ නිසයි.[8]
**30** ඔහුට සිටින ගණන වැඩි වෙයි. මා
ළඟ සිටින ගණන නම් දිගටම අඩු වී
යයි.”

**31** ඉහළින් පැමිණෙන තැනැත්තා
අන් සියලුදෙනාට වඩා ශ්‍රේෂ්ඨයි.[9]
පොළොවේ සිටින තැනැත්තා පො-
ළොවේ කෙනෙකු වන නිසා ඔහු
කතා කරන්නේ පොළොවේ දේවල්
ගැන පමණයි.[10] නමුත් ස්වර්ගයෙන්
පැමිණෙන තැනැත්තා අන් සියලු-
දෙනාටම වඩා ශ්‍රේෂ්ඨයි.[11] **32** ක්‍රිස්-
තුස් තමන් ඇසූ දුටු දේ ගැන
සාක්ෂි දරන නමුත්[12] කිසි මිනිසෙක්
ඔහුගේ සාක්ෂිය පිළිගන්නේ නැහැ.[13]
**33** නමුත් ඔහුගේ සාක්ෂිය පිළිගන්නා
තැනැත්තා දෙවි සත්‍යය කතා කරන
කෙනෙකු බව සහතිකවම පිළිගනී.*[14]
**34** මන්ද දෙවි විසින් එවන ලද
තැනැත්තා කතා කරන්නේ දෙවි පව-
සන දේවල්ය.[15] එසේ වන්නේ දෙවි
තම බලය ඔහුට නොඅඩුව ලබා
දෙන නිසාය.[1] **35** පියාණන් තම
පුත්‍රයාට ප්‍රේම කරන අතර[2] ඔහුගේ
අතට සෑම දෙයක්ම භාර දී තිබේ.[3]
**36** පුත්‍රයා කෙරෙහි විශ්වාසය තබන[4]
තැනැත්තාට සදහටම ජීවත් වීමේ
ප්‍රස්තාව ලැබෙයි.[5] නමුත් පුත්‍රයාට
අකීකරු වන තැනැත්තා සමඟ දෙවි
උදහස් වන අතර[6] ඔහුට ජීවනයද
අහිමි වෙයි.[7]

**4** යොහන් තම ගෝලයන් ලෙස
බව්තීස්ම කළ අයගේ සංඛ්‍යා-
වට වඩා වැඩි පිරිසක් යේසුස්ගේ
ගෝලයන් ලෙස බව්තීස්ම වන බව[8]
පරිසිවරුන්ට ආරංචි විය. ඔවුන්ට
එය ආරංචි වූ බව යේසුස් දැන-
ගත්තේය. **2** ඇත්තෙන්ම බව්තීස්ම
කළේ යේසුස් නොව ඔහුගේ ගෝ-
ලයන්ය. **3** යේසුස් යුදයෙන් පිටත්
වී නැවත ගලීලය බලා ගියේය.
**4** නමුත් ඔහු ගමන් කළේ සමා-
රිය හරහාය.[9] **5** ඔහු සමාරියේ පිහිටි
සිකාර් නම් නුවරට පැමිණියේය.
එය පිහිටා තිබුණේ යාකොබ් තම
පුත් යෝසෙප්ට දුන් ඉඩම අසලය.[10]
**6** යාකොබ්ගේ ළිඳ[11] ලෙස හඳුන්වන
ළිඳක් එහි තිබිණ. යේසුස් ගමනින්
වෙහෙසට පත්ව සිටි නිසා ඔහු එම
ළිඳ අසල ඉඳගත්තේය. එය හයවෙනි
පැය පමණ විය.*

**7** මේ අතරතුරේදී සමාරියේ ස්ත්‍රි-
යක් වතුර ගැනීමට එතැනට පැමිණි-
යාය. එවිට යේසුස්, “මට බොන්න
වතුර ටිකක් දෙන්න පුළුවන්ද” කියා
ඇගෙන් ඇසුවේය. **8** (ඒ අවස්ථා-
වේදී ඔහුගේ ගෝලයන් ආහාර මිල දී
ගැනීම සඳහා නුවරට ගොස් තිබිණ.)
**9** එවිට සමරිතානු ස්ත්‍රිය, “ඔබ යුදෙව්
කෙනෙක් නේද? සමරිතානු ස්ත්‍රි-
යක් වන මගෙන් ඔබ කොහො-
මද බොන්න වතුර ඉල්ලන්නේ” කියා
ඔහුගෙන් ඇසුවාය. (ඇය එසේ පැවසු-
වේ සමරිතානුවරුන් හා යුදෙව්වන්
අතර කිසිම ගනු දෙනුවක් නොතිබූ
නිසාය.)[12] **10** යේසුස් ඇයට මෙසේ

**3 පරි.**
1 මාක් 7:3
2 යොහ 1:7
යොහ 1:34
3 යොහ 6:65
4 යොහ 19:11
හෙබ්‍රෙ 5:4
යාකො 1:17
5 යොහ 1:20
ක්‍රියා 13:25
6 යෙසා 40:3
මලා 3:1
මතෙ 11:10
ලූක් 1:17
7 මතෙ 22:2
2කොරි 11:2
එෆී 5:25
එළි 21:9
8 ලූක් 1:44
9 යොහ 8:23
10 1යොහ 4:5
11 මතෙ 3:11
12 යොහ 8:26
යොහ 15:15
13 යෙසා 53:2
යොහ 1:11
යොහ 3:11
14 රෝම 3:4
1යොහ 5:10
15 යොහ 7:16

**2 තීරුව**
1 යොහ 1:16
2 යොහ 5:20
යොහ 15:9
3 මතෙ 11:27
මතෙ 28:18
ලූක් 10:22
යොහ 17:2
4 හබ 2:4
රෝම 1:17
5 යොහ 3:16
යොහ 6:47
හෙබ්‍රෙ 5:9
6 රෝම 2:8
එෆී 5:6
හෙබ්‍රෙ 10:27
7 2තෙස 1:8
1යොහ 5:12

**4 පරි.**
8 යොහ 3:22
9 ලූක් 9:52
10 උත් 33:19
උත් 48:22
යොශු 24:32
11 යොහ 4:12
12 2රාජා 17:24
එස්රා 4:3
ලූක් 9:52
ක්‍රියා 10:28

**යොහ 3:33*** මූ.අ., “පිළිගෙන ඊට තම මුද්‍රාව තබයි.”

**යොහ 4:6*** එනම්, දහවල් 12ට පමණ.

පිළිතුරු දුන්නේය. “දෙවි නොමිලේ
දෙන දීමනාව[1] කුමක්ද කියාත්, ‘මට
බොන්න වතුර ටිකක් දෙන්න’ කියා
ඔබට පවසන්නේ කවුද[2] කියාත් ඔබ
දැනගෙන සිටියා නම් ඔබ ඔහුගෙන්
ජීවනදායක වතුර ඉල්ලයි. එවිට ඔහු
ඔබට ඒ වතුර දෙයි.”[3] **11** ඇය ඔහුට
මෙසේ කීවාය. “මහත්මයාණෙනි,
ඔබට වතුර අදින්න බාල්දියක්වත්
නැහැ. ළිඳත් ගැඹුරුයි. ඔබට මේ
ජීවනදායක වතුර ලැබෙන්නේ කො-
හෙන්ද? **12** මේ ළිඳ අපට ලැබුණේ
අපේ මුතුන්මිත්තෙක් වන යාකොබ්-
ගෙන්. මේ ළිඳ හාරලා තමයි ඔහු-
ටයි, ඔහුගේ පුතුන්ටයි ඔහුට අයිති
සතුන්ටයි අවශ්‍ය වතුර ලබාගත්-
තේ. ඔබ ඔහුටත් වඩා උතුම් කෙ-
නෙක්ද?”[4] **13** යේසුස් ඇයට මෙසේ
පිළිතුරු දුන්නේය. “මේ වතුර බොන
සියලුදෙනාටම ආපසු පිපාසය ඇති
වෙනවා. **14** නමුත් මා දෙන වතුර
බොන කිසිවෙකුට කිසි කලක නැවත
පිපාසය ඇති වෙන්නේ නැහැ.[5] මා
ඔහුට දෙන වතුර නිසා ඔහු තුළ
වතුර උනන දිය උල්පතක් සෑදෙයි.[6]
එයින් උනන වතුරෙන් සදාකාල ජීව-
නය ලැබෙයි.”[7] **15** ඒ ස්ත්‍රිය ඔහුට
මෙසේ පැවසුවාය. “මහත්මයාණෙනි,
මට ඒ වතුර දෙන්න පුළුවන්ද? එවිට
මට නැවත පිපාසය ඇති වෙන්නේ
නැහැ. මට නැවතත් මේ ස්ථානයට
ඇවිත් වතුර අදින්න අවශ්‍ය වන්නෙත්
නැහැ.”

**16** යේසුස් ඇයට මෙසේ පැව-
සුවේය. “ගොස් ඔබේ ස්වාමිපුරු-
ෂයා කැඳවාගෙන මෙතැනට එන්න.”
**17** ඇය, “මට ස්වාමිපුරුෂයෙක්
නැහැ” කියා පිළිතුරු දුන්නාය. යේසුස්
ඇයට මෙසේ කීවේය. “‘මට ස්වා-
මිපුරුෂයෙක් නැහැ’ කියා, **18** ඔබ
කියන දේ ඇත්ත. කලින් ඔබට ස්වා-
මිපුරුෂයන් පස්දෙනෙක් සිටියා. දැන්
ඔබ සමඟ සිටින තැනැත්තා ඔබේ
ස්වාමිපුරුෂයා නොවෙයි.” **19** ඒ
ස්ත්‍රිය ඔහුට මෙසේ කීවාය. “මහත්ම-
යාණෙනි, මට නම් හිතෙන්නේ
ඔබ අනාගතවක්තෘවරයෙක් කියායි.[1]
**20** අපේ මුතුන්මිත්තන් නමස්කාර
කළේ මේ කන්දේදීයි.[2] නමුත් යුදෙව්-
වන් කියන්නේ ජනයා දෙවිට නමස්-
කාර කළ යුත්තේ යෙරුසලමේදී
කියායි.”[3] **21** යේසුස් ඇයට මෙසේ
කීවේය. “මා කියන මේ දේ විශ්වාස
කරන්න. එනම් ඔබ සියලුදෙනා පියා-
ණන්ට කරන නමස්කාරය[4] මේ කන්-
දේදීවත් යෙරුසලමේදීවත් නොකරන
කාලයක් එනවා.[5] **22** ඔබ නමස්-
කාර කරන්නේ හරියට කාරණා තේ-
රුම්ගෙන නොවෙයි.[6] නමුත් අපේ
නමස්කාරය පදනම් වී තිබෙන්නේ
නිවැරදි අවබෝධය මතයි. මන්ද
ගැලවෙන ආකාරය මුලින්ම එළිදරව්
කළේ යුදෙව්වරුන්ටයි.[7] **23** නමුත්
සැබෑ නමස්කාරකයන් දෙවි ලබා
දෙන මහ පෙන්වීමට[8] හා දෙවි එළිද-
රව් කරන සැබෑ දැනුමට එකඟව[9]
දෙවිට නමස්කාර කරන කාලයක්
පැමිණෙනවා. ඒ කාලය දැනටමත්
පැමිණ තිබෙනවා. ඇත්තෙන්ම පියා-
ණන් තමන්ට නමස්කාර කිරීම සඳහා
සොයමින් සිටින්නේ එවැනි අය-
වයි.[10] **24** දෙවි නොපෙනෙන දෙවි
කෙනෙක්.*[11] ඔහු සිටින්නේ ස්වර්ග-
යේයි. දෙවිට නමස්කාර කරන අය
ඔහුට නමස්කාර කළ යුත්තේ ඔහු
ලබා දෙන මහ පෙන්වීමට# හා
ඔහු එළිදරව් කරන සැබෑ දැනු-
මට එකඟවයි.”[12] **25** එවිට ඒ ස්ත්‍රිය
ඔහුට මෙසේ කීවාය. “ක්‍රිස්තුස්,[13]
ඒ කියන්නේ මෙසියස්[14] අනිවාර්-
යයෙන්ම පැමිණෙන බව මම දන්-
නවා. ඒ තැනැත්තා පැමිණි විට
කිසිම දෙයක් නොසඟවා සෑම දෙ-
යක්ම අපට ප්‍රකාශ කරයි.” **26** එවිට
යේසුස්, “දැන් ඔබත් සමඟ කතා කර-
මින් සිටින මමයි ඒ තැනැත්තා”[15]
කියා ඇයට පැවසුවේය.

**27** ඒ අවස්ථාවේදී එම ස්ථානයට

**4 පරි.**
**1** එෆී 2:8
**2** යෙසා 9:6; යොහ 4:26
**3** යෙසා 12:3; යෙරෙ 2:13; සෙක 13:1; සෙක 14:8; යොහ 7:37
**4** මතෙ 12:41; ලූක් 11:31; යොහ 8:53
**5** යොහ 6:35; යොහ 7:38
**6** යෙසා 58:11
**7** රෝම 6:23; 1යොහ 5:20

**2 තීරුව**
**1** ලූක් 7:16; ලූක් 7:39; යොහ 9:17
**2** ද්වි 11:29
**3** ද්වි 12:5; 1රාජා 9:3; 2ලේක 7:12; ගීතා 122
**4** මලා 1:11
**5** මාක් 14:58; හෙබ්‍රෙ 9:11
**6** 2රාජා 17:29; 2රාජා 17:33
**7** යෙසා 2:3; රෝම 9:4
**8** යොහ 14:17; රෝම 8:4; 2කොරි 4:18; 2කොරි 5:7; පිලි 3:3
**9** යොෂු 24:14; 1සාමු 12:24; ගීතා 25:5; ගීතා 86:11; මාක් 7:7
**10** 2ලේක 16:9
**11** 2කොරි 3:17; 1තිමෝ 1:17; හෙබ්‍රෙ 11:27
**12** රෝම 12:1
**13** යොහ 11:27
**14** ද්වි 18:18; දානි 9:25; යොහ 1:41
**15** යොහ 9:37

---

යොහ **4:24*** මූ.අ., “ග්‍රීක භාෂාවෙහි දෙවිව විස්තර කිරීමට නියුමා යන වචනය භාවිත කර ඇත.” උපග. 3 බලන්න. **24#** මූ.අ., “ඔහුගේ බලයෙන්.”

පැමිණි ඔහුගේ ගෝලයෝ යේසුස්
ස්ත්‍රියක සමඟ කතා කරමින් සිටි-
නවා දැක පුදුම වූහ. නමුත් “ඔබ
ඇය සමඟ කතා කරන්නේ ඇයි”
කියාවත්, “ඔබට මොනවාද අවශ්‍ය”
කියාවත් ඇසීමට කිසිවෙක් ඉදිරිපත්
වූයේ නැත. **28** තම වතුර භාජ-
නය එතැන තබා නුවරට ගිය ඒ
ස්ත්‍රිය, එහි සිටි පුරුෂයන්ව හමු වී
මෙසේ කීවාය. **29** “මා කළ හැම
දෙයක්ම මට පැවසූ මිනිසෙක් මට හමු
වුණා. ඇවිත් බලන්න. සමහරවිට ඔහු
ක්‍රිස්තුස් විය හැකියි.”[1] **30** නුවරින්
පිටත් වූ ඔවුහු, යේසුස්ව හමු වීමට
ආවෝය.

**31** මේ අතර යේසුස්ගේ ගෝ-
ලයෝ, “ගුරුතුමනි,[2] කෑම ටිකක්
කන්න” කියා ඔහුගෙන් ඉල්ලා සිටි-
යහ. **32** නමුත් ඔහු, “ඔබ නො-
දන්නා කෑම වර්ගයක් මා ළඟ
තිබෙනවා” කියා ඔවුන්ට කීවේය.
**33** එහෙයින්, “වෙන කවුරු හරි ඔහුට
කෑමට මොනව හරි ගෙනාවද” කියා
ගෝලයෝ තම තමන් අතරේ විම-
සීමට පටන්ගත්හ. **34** එවිට යේ-
සුස් ඔවුන්ට මෙසේ කීවේය. “මාව
එවූ තැනැත්තාගේ කැමැත්ත කිරී-
මත්[3] ඔහු මට දුන් කාර්යය සම්-
පූර්ණ කිරීමත්[4] මම සලකන්නේ
මගේ කෑම ලෙසයි.[5] **35** සාමාන්‍ය-
යෙන් ඔබ කියන්නේ අස්වැන්න නෙ-
ළන්න තව මාස හතරක් තිබෙන
බවයි. නමුත් මම දැන් ඔබට කියන්-
නේ, ඔබේ ඇස් ඇර බලන්න කියායි.
අස්වැන්න නෙළන කාලය දැන්-
මම ඇවිත්. කරල් පැසී තිබෙන
හැටි බලන්න.[6] **36** අස්වැන්න නෙ-
ළන තැනැත්තාට මේ වන විටත්
කුලියක් ලැබෙනවා. ඔහු නෙළ-
මින් සිටින්නේ සදාකාල ජීවනයට
මඟ පාදන පලදාවක්.[7] ඒ නිසා වපු-
රන තැනැත්තාටයි[8] අස්වැන්න නෙ-
ළන තැනැත්තාටයි එකවරම ප්‍රීති විය
හැකියි.[9] **37** ඇත්තෙන්ම වපුරන්-
නේ එක් කෙනෙක්. නමුත් අස්වැන්න
නෙළන්නේ තවත් කෙනෙක් යන
කීමත් සැබෑ වී තිබෙනවා. **38** මන්ද
අස්වැන්නක් නෙළීමට මම ඔබව යව-
නවා. නමුත් වපුරන්න වෙහෙසුණේ
ඔබ නොව වෙනත් අයයි.[1] ඔවුන්-
ගේ වෙහෙසින් ප්‍රයෝජන ලබන්නේ
ඔබයි.”

**39** මේ අතරේ ඒ නුවරෙහි සිටි
සමරිතානුවන් බොහෝදෙනෙක් ඔහු
කෙරෙහි විශ්වාසය තැබූහ.[2] ඔවුන්
එසේ කළේ, “මා කළ හැම දෙයක්ම
ඔහු මට පැවසුවා”[3] කියා ඒ ස්ත්‍රිය ඔහු
ගැන සාක්ෂි දුන් නිසාය. **40** ඔහුව
හමු වීමට පැමිණි සමරිතානුවරු,
තමන් සමඟ නැවතී සිටින්න කියා
ඔහුගෙන් ඉල්ලා සිටියෝය. එහෙ-
යින් ඔහු දවස් දෙකක් එහි නැවතී
සිටියේය.[4] **41** ඒ හේතුවෙන් තවත්
බොහෝදෙනෙක් ඔහු පැවසූ දේ අසා
ඔහු කෙරෙහි විශ්වාසය තැබූහ.[5]
**42** ඔවුහු ඒ ස්ත්‍රියට මෙසේ කීවෝය.
“දැන් අපි ඔහුව විශ්වාස කරන්නේ ඔබ
පැවසූ දේවල් නිසා නොවෙයි. අපිම
ඇසූ දේවලින්[6] මේ මිනිසා ලෝකයේ
ගැලවුම්කරු බව අපට දැන් හොඳටම
විශ්වාසයි.”[7]

**43** ඒ දවස් දෙක ගෙවී ගිය පසු
ඔහු එතැනින් පිටත් වී ගලීලය
බලා ගියේය.[8] **44** (අනාගතවක්තෘ-
වරයෙකුට තමාගේම රටේදී කිසිම
ගෞරවයක් නොලැබෙන බව[9] යේ-
සුස් කලින් පවසා තිබිණ.) **45** ඔහු
ගලීලයට ගිය විට ගලීලයේ වැසි-
යෝ ඔහුව පිළිගත්තෝය. ඔවුන් එසේ
කළේ උත්සවය සඳහා යෙරුසලමට
ගිය විට[10] යේසුස් එහිදී කළ සෑම දෙ-
යක්ම ඔවුන් දුටු නිසාය.[11]

**46** ඉන්පසු ඔහු ගලීලයේ පිහිටි
කානා නම් නුවරට[12] නැවත ගියේය.
ඔහු වතුර වයින් බවට පත් කළේ එම
නුවරේදීය.[13] රජුගේ සේවකයෙක් එහි
සිටියේය. කපර්ණවුමෙහි සිටි ඔහු-
ගේ පුතා අසනීපයකින් පසු විය.[14]
**47** යේසුස් යුදයෙන් පිටත් වී ගලීල-
යට ඇවිත් සිටින බව ඔහුට ආරංචි වූ
විට ඔහු යේසුස් ළඟට ගොස් මරණා-
සන්නව සිටි තම පුතාව සුව කරන්න

**4 පරි.**
1 ද්වි 18:15; යොහ 7:26
2 යොහ 1:38
3 යොහ 5:30; යොහ 6:38
4 යොහ 5:36; යොහ 17:4; යොහ 19:30
5 මතෙ 4:4
6 මතෙ 9:37
7 රෝම 6:22
8 හිතෝ 11:18
9 දානි 12:3; 1කොරි 3:8; 2යොහ 8

**2 තීරුව**
1 ක්‍රියා 10:43; 1පේතෘ 1:12
2 එස 16:53; රෝම 10:17
3 යොහ 4:29
4 මතෙ 10:11; ක්‍රියා 10:48
5 යොහ 10:27
6 යොහ 17:8
7 යෙසා 49:6; මතෙ 1:21; යොහ 1:29; ක්‍රියා 13:23; 1තිමෝ 1:15; 1යොහ 4:14
8 යොහ 4:40
9 මතෙ 13:57; මාක් 6:4; ලූක් 4:24
10 ද්වි 16:16
11 යොහ 2:23
12 යොහ 21:2
13 යොහ 2:1; යොහ 2:11
14 මතෙ 8:5

කියා ඔහුගෙන් ඉල්ලා සිටියේය.
**48** නමුත් යේසුස්, “ඔබ සියලුදෙනාම
විශ්වාසය ඇති කරගන්නේ ලකුණු[1]
සහ පුදුම දේවල්[2] දුටුවොත් පමණයි”
කියා ඔහුට කීවේය. **49** එවිට රජුගේ
එම සේවකයා, “ස්වාමීනි, මගේ කුඩා
දරුවා මැරෙන්න කලින් එන්න” කියා
ඔහුගෙන් ඉල්ලා සිටියේය. **50** යේ-
සුස් ඔහුට මෙසේ කීවේය. “ඔබ දැන්
යන්න.[3] ඔබේ පුතා සුව වෙලා.”[4] ඒ
මිනිසා යේසුස් පැවසූ දේ විශ්වාස
කරමින් එතැනින් පිටත්ව ගියේය.
**51** ඔහු තම නිවස බලා යද්දී ඔහුගේ
දාසයෝ මඟදී ඔහුව හමු වී, ඔහුගේ
දරුවා සුව වී ඇති බව[5] ඔහුට දැන්වූහ.
**52** තම දරුවා සුව වුණේ මොන
පැයේදීද කියා ඔහු ඔවුන්ගෙන් විමසූ
විට ඔවුහු, “ඊයේ හත්වෙනි පැයේදී*
ඔහුගේ උණ[6] බැස්සා” කියා ඔහුට
කීවෝය. **53** “ඔබේ පුතා දැන් සුව
වෙලා” කියා යේසුස් තමාට පැවසුවේ
ඒ පැයේදී[7] බව ඔහු එවිට තේරුම්-
ගත්තේය. ඔහුද ඔහුගේ නිවසේ සිටි
සියලුදෙනාද යේසුස් කෙරෙහි විශ්වා-
සය තැබූහ.[8] **54** එය යේසුස් යුද-
යෙන් පිටත් වී ගලීලයේ සිදු කළ
දෙවෙනි ලකුණ විය.[9]

**5** ඉන්පසු යුදෙව්වරුන්ගේ උත්සව-
යක්[10] සඳහා යේසුස් යෙරුසලම
බලා ගමන් කළේය. **2** යෙරුසල-
මේ බැටළු දොරටුව[11] අසල හෙබ්‍රෙව්
බසින් බෙත්සාතා නමින් හැඳින්වූ
පොකුණක් තිබිණ. එම පොකුණ
වටා කුලුනු සහිත සක්මන් මළු
පහක්* ඉදි කර තිබිණ. **3** ඔත්ප-
ළව සිටි විශාල පිරිසක් මේ මළුව-
ලට වී සිටියෝය. ඔවුන් අතර විවිධ
අසනීපවලින් පෙළුණු අයද අන්ධ
අයද අත පය පණ නැති අයද
සිටියෝය. **4** —— **5** ඔවුන් අතර
අවුරුදු තිස්අටක් පුරා රෝගීව සිටි
එක්තරා මිනිසෙක් සිටියේය. **6** ඒ
මිනිසා ඔත්පළව සිටින ආකාරය යේ-
සුස් දුටුවේය. ඔහු බොහෝ කාලයක්
පුරා අසනීපව සිටි බව[1] දැන සිටි යේ-
සුස්, “ඔබ කැමතිද සුව වෙන්න”[2]
කියා ඔහුගෙන් ඇසුවේය. **7** අසනී-
පව සිටි ඒ මිනිසා මෙසේ පිළිතුරු
දුන්නේය. “මහත්මයාණෙනි, වතුර
කැලඹෙන විට පොකුණට බහින්න
මට උදව් කරන්න කවුරුත් නැහැ.
මම යන්න උත්සාහ කරන විට
මට කලින් තවත් කෙනෙක් වතුරට
බහිනවා.” **8** එවිට යේසුස්, “නැඟිට,
ඔබේ යහනත් රැගෙන ඇවිදින්න”[3]
කියා ඔහුට කීවේය. **9** ඒ මොහො-
තේදීම ඒ මිනිසා සුව වී, තම යහනත්
රැගෙන ඇවිදින්න පටන්ගත්තේය.

මේ සියල්ල සිදු වූයේ සබත් දවස-
කය.[4] **10** එහෙයින් යුදෙව්වරු සුවය
ලැබූ ඒ මිනිසාට මෙසේ කීවෝය. “අද
සබත් දවස කියා ඔබ දන්නේ නැද්ද?
මේ විදිහට ඔබේ යහන උසුලාගෙන
යෑම නීති විරෝධීයි.”[5] **11** නමුත්
ඔහු, “‘ඔබේ යහන රැගෙන ඇවි-
දින්න’ කියා මට කිව්වේ මාව සනීප
කළ තැනැත්තායි” කියා ඔවුන්ට
පිළිතුරු දුන්නේය. **12** “ඔබට, ‘එය
රැගෙන ඇවිදින්න’ කියා පැවසුවේ
කවුද” කියා ඔවුහු ඔහුගෙන් ඇසු-
වෝය. **13** නමුත් ඒ මිනිසා තමාව
සුව කළේ කවුද කියා දැන සිටියේ
නැත. එමෙන්ම ඒ ස්ථානයේ විශාල
සෙනඟක් සිටි නිසා යේසුස් එතැනින්
ඉවත්ව ගොස් තිබිණ.

**14** ටික වේලාවකට පසු යේසුස්
ඔහුව දේවමාලිගාවේදී මුණගැසුණු
අතර, “දැන් ඔබට සුවය ලැබිලා.
පව් කිරීමෙන් වැළකී සිටින්න. ඔබ
එසේ කළේ නැත්නම් වඩා දරුණු දෙ-
යක් ඔබට සිදු විය හැකියි” කියා
ඔහුට කීවේය. **15** එවිට ඒ මිනිසා
ගොස් තමාව සනීප කළේ යේසුස්
බව යුදෙව්වරුන්ට කීවේය. **16** යේ-
සුස් මේ දේවල් සබත් දවසේදී කළ
නිසා යුදෙව්වරු යේසුස්ට චෝදනා
එල්ල කළෝය.[6] **17** නමුත් යේ-
සුස් ඔවුන්ට පිළිතුරු දුන්නේ මෙ-
සේයි. “මගේ පියාණන් මේ දක්වා වැඩ

**4 පරි.**
1 මතෙ 16:1
යොහ 2:18
1කොරි 1:22
2 ක්‍රියා 4:30
3 මතෙ 8:13
මාක් 7:29
4 1රාජා 17:23
5 මාක් 7:30
6 මතෙ 8:15
ක්‍රියා 28:8
7 මතෙ 8:13
8 ක්‍රියා 11:14
ක්‍රියා 18:8
9 යොහ 2:11

**5 පරි.**
10 නික් 12:14
ද්වි 16:1
ද්වි 16:16
යොහ 2:13
යොහ 6:4
11 නෙහෙ 3:1
නෙහෙ 12:39

**2 තීරුව**
1 ලූක් 13:11
2 ගීතා 72:13
යෙසා 53:3
3 මතෙ 9:6
මාක් 2:11
ලූක් 5:24
ක්‍රියා 3:7
4 යොහ 9:14
5 නික් 20:10
නෙහෙ 13:19
යෙරෙ 17:21
මතෙ 12:2
ලූක් 6:2
6 මතෙ 12:14
යොහ 15:20

---

යොහ **4:52*** එනම්, ප.ව. 1ට පමණ. **5:2*** හෝ, “කුලුනුවලින් සැදුණු විවෘත ප්‍රදේශ.”

කරමින් සිටිනවා. මමත් දිගටම වැඩ
කරනවා."[1] **18** යුදෙව්වන්ට ඒ වචන
ඇසුණු විට ඔවුහු යේසුස්ව මරා දැමී-
මට තව තවත් මං සෙව්වෝය.[2] එසේ
වූයේ ඔහු සබත් දවසේ නීතිය කඩ
කරනවා කියා ඔවුන් සිතූ නිසා පම-
ණක් නොව දෙවි තමාගේම පියාණන්
බව පවසමින්[3] ඔහු දෙවිට සමාන
වීමට උත්සාහ කරන බවත්[4] ඔවුන්
සිතූ නිසාය.

**19** යේසුස් ඔවුන්ට මෙසේද
කීවේය. "ඇත්තෙන්ම මම ඔබට
කියන්නේ, පුත්‍රයාට තනි කැමැත්-
තෙන් කිසිම දෙයක් කළ නොහැකි
බවයි. ඔහු තම පියාණන් කරන
දේවල් බලාගෙන[5] ඒ දේවල් එලෙසම
ඉටු කරයි. ඒ නිසා පියාණන් යම් දෙ-
යක් කළොත් පුත්‍රයාත් ඒ දේම කරයි.
**20** පියාණන්ට තම පුත්‍රයා සඳහා
ඇත්තේ ඉමහත් ආදරයක්.[6] ඒ නිසා
තමන් කරන සෑම දෙයක්ම පුත්‍රයාට
පෙන්වා දෙනවා. ඒ විතරක් නො-
වෙයි, ඔබ දුටු දේවලට වඩා ශ්‍රේෂ්ඨ
දේවලුත් කරන්න පියාණන් පුත්‍රයාට
කියා දෙනවා. ඒවා දැක ඔබ පුදුමයට
පත් වෙයි.[7] **21** පියාණන් මිය ගිය
අයට ජීවනය දී නැවත නැඟිටුවනවා[8]
වගේම පුත්‍රයාත් තමන් කැමති අයට
ජීවනය ලබා දෙනවා.[9] **22** මීට අම-
තරව පියාණන් කිසිවෙකුව විනිශ්චය
කරන්නේ නැහැ. ඔහු එම විනිශ්-
චය කිරීමේ වගකීම පවරා තිබෙන්-
නේ තම පුත්‍රයාටයි.[10] **23** පියාණන්
එසේ කළේ සියලුදෙනා තමාට ගෞ-
රව කරනවා වගේම තම පුත්‍රයාටත්
ගෞරව කරනවා දැකීමටයි.[11] ඒ නිසා
කෙනෙක් පුත්‍රයාට ගෞරව කරන්-
නේ නැත්නම් ඒ තැනැත්තා පුත්‍රයාව
එවූ පියාණන්ටත් ගෞරව කරන්නේ
නැහැ.[12] **24** ඇත්තෙන්ම මම ඔබට
කියන්නේ, මා පවසන දේවලට සවන්
දී මා එවූ තැනැත්තාව විශ්වාස කරන
පුද්ගලයාට සදාකාල ජීවනය හිමි වන
බවයි.[13] ඔහුට විනිශ්චයක් ලැබෙන්-
නේ නැති අතර ඔහු මරණයෙන් මිදී
අලුත් ජීවිතයක් ලබයි.[14]

**25** "ඇත්තෙන්ම මම ඔබට කියන්-
නේ, දෙවිගේ පුත්‍රයාගේ හඬ[1] මිය
ගිය අයට[2] ඇසෙන කාලය පැමි-
ණෙන බවයි. එය දැනටමත් පැමිණ
තිබෙනවා. ඔහු පවසන දේ සිතට
ගන්නා අය ජීවත් වෙයි.[3] **26** මන්ද
ජීවනය ලබා දීමේ බලය පියාණන්ට
තිබෙනවා.[4] ඒ වගේම ඔහු ජීවනය
ලබා දීමේ බලය පුත්‍රයාටත් දී තිබෙ-
නවා.[5] **27** පියාණන් ඔහුට විනිශ්චය
කිරීමේ බලයත් දී තිබෙන්නේ[6] ඔහු
මනුෂ්‍ය පුත්‍රයා[7] වන නිසයි. **28** මේ
ගැන පුදුම වෙන්න එපා. මන්ද සො-
හොන් ගෙවල්වල*[8] සිටින සියලුදෙ-
නාටම ඔහුගේ හඬ ඇසෙන කාලය
පැමිණෙනවා. **29** ඒ කාලයේදී යහ-
පත් දේ කරන අය ජීවනය සඳහා
නැවත නැඟිටීමක්[9] ලබන අතර පිළි-
කුල් දේවල් කරන අය විනිශ්චයක්
සඳහා නැවත නැඟිටීමක්[10] ලබනවා.
**30** මම මගේම කැමැත්තට අනුව
කිසිම දෙයක් කරන්නේ නැහැ. මම
විනිශ්චය කරන්නේ මගේ පියාණන්
කියන ආකාරයටමයි. ඒ නිසා මගේ
විනිශ්චය සාධාරණයි.[11] මන්ද මම
උත්සාහ කරන්නේ මගේම කැමැත්ත
කරන්න නොව මා එවූ තැනැත්තාගේ
කැමැත්ත කිරීමටයි.[12]

**31** "මා ගැන සාක්ෂි දරන්න
සිටින්නේ මා පමණක් නම්[13]
මගේ සාක්ෂිය සැබෑ වන්නේ නැහැ.[14]
**32** ඒ නිසා මා ගැන සාක්ෂි දරන්න
තව කෙනෙක් සිටිනවා. ඔහු මා
ගැන ලබා දෙන සාක්ෂිය[15] සැබෑ
බව මම හොඳටම දන්නවා. **33** ඔබ
මිනිසුන්ව යොහන් ළඟට යැව්වා
නේද? ඔහු මා ගැන සැබෑ
සාක්ෂියක් දැරුවා.[16] **34** මා මේ දේ
කියන්නේ මට මිනිසෙකුගේ සාක්-
ෂිය අවශ්‍ය නිසා නොවෙයි. මා එසේ
කියන්නේ ඔබේම ගැලවීම සඳහායි.[17]
**35** කොහොමනමුත් ඒ මිනිසා දැල්-
වෙන, බැබළෙන පහනක් හා සමාන

**5 පරි.**
1 උත් 2:3; යොහ 9:4; යොහ 14:10
2 යොහ 7:1; යොහ 7:19
3 යොහ 10:38; යොහ 14:28
4 පිලි 2:6
5 යොහ 5:30; යොහ 8:28; යොහ 12:49
6 මතෙ 3:17; යොහ 3:35; යොහ 10:17; 2පේතෘ 1:17
7 ලූක් 8:25; යොහ 6:11; යොහ 6:19
8 2රාජා 4:34; හෙබ්‍රෙ 11:35
9 ලූක් 7:14; ලූක් 8:54; යොහ 11:25; එළි 1:18
10 නික් 18:13; මතෙ 11:27; ක්‍රියා 10:42; ක්‍රියා 17:31; 2කොරි 5:10; 2තිමෝ 4:1
11 යොහ 3:35; පිලි 2:10
12 ලූක් 10:16
13 යොහ 3:16; යොහ 6:40; යොහ 8:51
14 1යොහ 3:14

**2 තීරුව**
1 යොහ 10:27
2 මතෙ 8:22
3 රෝම 6:13; එෆී 2:5
4 ගීතා 36:9; ක්‍රියා 17:28
5 යොහ 11:25; එළි 1:18
6 යොහ 5:22; 2තිමෝ 4:1
7 දානි 7:13
8 යෝබ් 14:13; යෙසා 25:8; යෙසා 26:19; එළි 20:12
9 දානි 12:2; එළි 20:12
10 2පේතෘ 2:9; එළි 20:15
11 යෙසා 11:4
12 මතෙ 26:39; යොහ 4:34; යොහ 6:38
13 ද්වි 19:15
14 යොහ 8:14
15 මතෙ 3:17; මාක් 9:7; යොහ 12:30; 1යොහ 5:9
16 යොහ 1:15; යොහ 1:32
17 යොහ 11:42

යොහ **5:28*** මූ.අ., "සිහි වීම සඳහා සාදන ලද සොහොන් ගෙවල්වල."

වුණා. කෙටි කලකට ඔබත් ඔහු-
ගෙන් විහිදුණු ආලෝකය ලබා බො-
හෝ සෙයින් ප්‍රීති වෙන්න කැමැත්තක්
දැක්වුවා.[1] **36** නමුත් යොහන් මා
ගැන දැරූ සාක්ෂියට වඩා ප්‍රබල සාක්-
ෂියක් මා ළඟ තිබෙනවා. ඒ මගේ
පියාණන් මට ඉටු කරන්න කියා පවරා
දුන් වැඩකටයුතුයි. මා දැන් කර-
මින් සිටින්නේ මට පැවරූ ඒ දේව-
ලුයි.[2] පියාණන් මාව එවූ බවට මා
ළඟ තිබෙන සාක්ෂිය එයයි. **37** මීට
අමතරව මාව එවූ පියාණන්ම මා ගැන
සාක්ෂි දරා තිබෙනවා.[3] ඔබ කව-
දාවත් ඔහුගේ හඬ ඇසුවේවත් ඔහු-
ගේ රූපය දුටුවේවත් නැහැ.[4] **38** ඒ
වගේම ඔහු පැවසූ දේවල් ඔබේ සිතේ
රැඳුණේවත් නැහැ. එයට හේතුව ඔහු
විසින් එවූ තැනැත්තාව ඔබ විශ්වාස
නොකළ නිසයි.

**39** "ඔබ ශුද්ධ ලියවිල්ල සොයා
බලන්නේ[5] එමගින් ඔබට සදාකාල
ජීවනය ලබාගන්න පුළුවන් කියා
සිතාගෙනයි. ඒ ලියවිලිවල මා පිළි-
බඳවත් සාක්ෂි තිබෙනවා.[6] **40** ජීව-
නය ලබාගන්න මාව පිළිගන්න
අවශ්‍ය වුණත් මාව පිළිගන්න ඔබ
තුළ කැමැත්තක් නැහැ.[7] **41** මිනි-
සුන්ගේ ගෞරවය ලබන්න මා තුළ
ආශාවක් නැහැ.[8] **42** නමුත් ඔබ
තුළ දෙවි සඳහා ප්‍රේමයක් නැති බව
මට හොඳටම පැහැදිලියි.[9] **43** මා
මගේ පියාණන්ගේ නාමයෙන් පැමිණ
සිටියත්[10] ඔබ මාව පිළිගන්නේ නැහැ.
නමුත් වෙන කෙනෙක් තමාගේම
බලයෙන් තම ගෞරවය උදෙසා පැමි-
ණියා නම් ඔබ ඔහුව පිළිගන්නවා.
**44** එකම දෙවිගෙන් ලැබෙන ගෞර-
වය සොයන්නේ නැතුව[11] එකිනෙ-
කාගෙන් ගෞරවය ලබන්නයි[12] ඔබ
උත්සාහ කරන්නේ. ඒ නිසා ඔබට
මා ගැන විශ්වාසයක් ඇති වන්-
නේ කොහොමද? **45** මා පියාණන්ට
ඔබ ගැන චෝදනාවක් එල්ල කර-
නවා කියා සිතන්න එපා. දැනට-
මත් ඔබට විරුද්ධව චෝදනා එල්ල
කරන කෙනෙක් සිටිනවා. ඒ ඔබ
මහත් සේ විශ්වාස කරන මෝසෙස්.[1]
**46** ඇත්තෙන්ම ඔබ මෝසෙස්ව විශ්-
වාස කළා නම් ඔබ මාවත් විශ්-
වාස කරනවා. මන්ද මෝසෙස් මා
ගැනත් ලියා තිබෙනවා.[2] **47** ඔහු
ලියූ දේවල් ඔබ විශ්වාස කරන්නේ
නැත්නම්[3] මා පවසන දේවල් ඔබ විශ්-
වාස කරන්නේ කොහොමද?"

**6** ඉන්පසු යේසුස් ගලීල මුහුද
එනම්, ටයිබීරියස් මුහුද හරහා
ගොස් ගොඩ බැස්සේය.[4] **2** විශාල
සමූහයක් යේසුස් අසනීප වී සිටි
අයව ආශ්චර්යවත් ලෙස සුව කරන
ආකාරය දැක ඔහු පසුපසම ගමන්
කළෝය.[5] **3** යේසුස් කන්දකට
නැඟ,[6] තම ගෝලයන් සමඟ එහි ඉඳ-
ගත්තේය. **4** ඒ කාලයේදී යුදෙව්ව-
රුන්ගේ උත්සවයක් වූ පාස්කුව[7] ළඟා
වී තිබිණ. **5** තමා ළඟට විශාල
සමූහයක් පැමිණෙන ආකාරය දුටු
යේසුස්, ෆිලිප්ට මෙසේ කීවේය. "මේ
අයට කන්න දෙන්න අපි රොටි
මිල දී ගන්නේ කොහෙන්ද?"[8] **6** ඒ
අවස්ථාවේදී තමා කරන්න යන දේ
යේසුස් දැන සිටි නිසා ඔහු ඒ ප්‍රශ්-
නය ෆිලිප්ගෙන් ඇසුවේ ඔහුව සෝ-
දිසි කර බැලීම සඳහාය. **7** ෆිලිප්
ඔහුට මෙසේ පිළිතුරු දුන්නේය.
"අපි ඩිනාරි* දෙසීයක් වියදම් කළත්
යන්තමින් හෝ ඔවුන්ගේ කුස පුර-
වන්න තරම්වත් අවශ්‍ය රොටි ප්‍රමා-
ණය අපට මිල දී ගන්න බැරි වෙයි."[9]
**8** එවිට ඔහුගේ ගෝලයෙක් වූ අන්ද්‍රෑ
එනම්, සීමොන් පේතෘස්ගේ සහෝද-
රයා ඔහුට මෙසේ කීවේය. **9** "අපි
ළඟ දැනට තිබෙන්නේ මේ කුඩා
පිරිමි ළමයා ළඟ තිබෙන බාර්ලි රොටි
පහයි[10] කුඩා මසුන් දෙන්නයි විත-
රයි. නමුත් මෙච්චර සෙනඟකට මේ
ටිකෙන් මොනවා කරන්නද?"[11]

**10** යේසුස් මෙසේ පැවසුවේය.
"සියලුදෙනාටම කෑමට ඉඳගන්න
කියා කියන්න."[12] එම ස්ථානයේ

**5 පරි.**

**1** මතෙ 3:5
මතෙ 13:20
මාක් 6:20
2පේතෘ 1:19
**2** මතෙ 11:5
යොහ 3:2
යොහ 7:31
යොහ 10:25
**3** මතෙ 17:5
මාක් 1:11
යොහ 8:18
යොහ 12:30
1යොහ 5:9
**4** ද්වි 4:12
යොහ 1:18
යොහ 6:46
1තිමෝ 1:17
1යොහ 4:12
**5** යෙසා 8:20
ලූක් 11:52
ක්‍රියා 17:11
2තිමෝ 3:15
1පේතෘ 1:10
**6** ද්වි 18:15
**7** යෙසා 53:3
යොහ 1:11
**8** 1තෙස 2:6
**9** 1යොහ 4:20
**10** නික් 3:15
**11** 1කොරි 4:5
**12** යොහ 12:43

**2 තීරුව**

**1** ද්වි 31:26
යොහ 7:19
රෝම 2:12
**2** උත් 3:15
උත් 49:10
ද්වි 18:15
ලූක් 24:44
යොහ 1:45
ක්‍රියා 26:22
**3** ලූක් 16:31

**6 පරි.**

**4** මතෙ 14:13
ලූක් 9:10
**5** මාක් 6:33
ලූක් 9:11
යොහ 2:23
**6** මතෙ 15:29
**7** යොහ 2:13
යොහ 5:1
**8** මතෙ 14:14
මාක් 6:35
ලූක් 9:12
**9** මාක් 6:37
**10** 2රාජා 4:42
**11** මතෙ 14:17
මාක් 6:38
ලූක් 9:13
**12** උත් 18:4

---

යොහ **6:7*** ග්‍රෑම් 3.85ක් බර රෝමානු රිදී කාසියක්.

තණකොළ හොඳින් වැඩී තිබූ නිසා
ඔවුන්ට එහි ඉඳගැනීමට පහසු විය.
රැස්ව සිටි සෙනඟ අතර පුරුෂ-
යන් පන්දහසක් පමණ සිටියෝය.[1]
**11** යේසුස් එම රොටි ගෙන දෙ-
විට ස්තුති කර, ඉඳගෙන සිටි අය
අතරේ ඒවා බෙදා දුන්නේය. එලෙ-
සම කුඩා මසුන්ද ඔවුන්ට ඇති තරම්
බෙදා දුන්නේය.[2] **12** ඔවුන් කෑම
කා තෘප්තියට පැමිණි විට[3] ඔහු තම
ගෝලයන්ට මෙසේ කීවේය. “කිසිම
දෙයක් අපතේ යවන්න එපා. ඉතුරු වී
ඇති කෑම එකතු කරන්න.” **13** එම
බාර්ලි රොටි පහෙන් ඉතුරු වූ කැබලි
ටික එකතු කරගත් විට ඔවුන්ට කූඩ
දොළහක් පුරවාගත හැකි විය.[4]

**14** යේසුස් සිදු කළ ආශ්චර්යයන්
දුටු ජනයා, “ලෝකයට එන්න සිටින
අනාගතවක්තෘ මොහු තමයි”[5] කියා
පැවසූහ. **15** ඔවුන් එකතු වී ඔහුව
අල්ලාගෙන රජකමට පත් කිරීමට
අදහස් කරගෙන සිටින බව තේරුම්-
ගත් යේසුස්, එතැනින් පිටත් වී[6] නැව-
තත් තනිව කන්දට ගියේය.

**16** සවස් වූ විට ඔහුගේ ගෝ-
ලයෝ ගලීල මුහුද අසලට ගොස්,[7]
**17** ඔරුවකට නැග්ගෝය. ඔවුහු
කපර්ණවුම බලා පිටත් වූහ. අඳුර
වැටී තිබුණු ඒ මොහොත වන විටත්
යේසුස් ඔවුන් වෙතට ඇවිත් සිටි-
යේ නැත. **18** මේ අතරතුරේදී තද
සුළඟක් හැමූ නිසා ගලීල මුහුද කැල-
ඹෙන්න පටන්ගත්තේය.[8] **19** ඔවුන්
කිලෝමීටර් පහක් හයක් පමණ ඔරුව
පැදගෙන ගිය පසු යේසුස් දිය මත
ඇවිදිමින් ඔරුව ළඟට එනවා දුටු විට
ඔවුන් තුළ මහත් බියක් ඇති විය.[9]
**20** එවිට යේසුස්, “භය වෙන්න එපා.
මේ මමයි”[10] කියා ඔවුන්ට පැවසුවේය.
**21** එවිට යේසුස්ව ඔරුවට නග්ගවා-
ගන්න ඔවුන් කැමති වූ අතර වැඩි වේ-
ලාවක් නොගොස් තම ගමනාන්තය
දක්වා පැමිණීමට ඔවුන්ට හැකි විය.[11]

**22** පසු දින එගොඩට වී බලාගෙන
සිටි සමූහයා එක කුඩා ඔරුවක් පම-
ණක් එහි තිබුණු බවත් එම ඔරුවට
යේසුස් නැග්ගේ නැති බවත් ඔහු-
ගේ ගෝලයන් එයට නැඟ එතැනින්
පිටත් වී ගිය බවත් දැනගත්තෝය.
**23** මේ අතර ටයිබීරියස් නම් නුවරේ
සෙනඟක් ඔරුවල නැඟ, යේසුස් දෙ-
විට ස්තුති කර සමූහයට රොටි කෑමට
දුන් ස්ථානය අසලට පැමිණියෝය.
**24** යේසුස්වත් ඔහුගේ ගෝලයන්වත්
එහි නොසිටින බව තේරුම්ගත් සමූ-
හයා ඔවුන් පැමිණි කුඩා ඔරුවලම
නැඟ, යේසුස්ව සොයමින්[1] කපර්ණවු-
මට ගියෝය.

**25** ඔවුහු එගොඩ වී යේසුස්ව හමු වූ
විට, “ගුරුතුමනි,[2] ඔබ මෙහි ආවේ
කොයි වෙලාවේද” කියා ඔහුගෙන්
ඇසූහ. **26** යේසුස් ඔවුන්ට මෙසේ
පිළිතුරු දුන්නේය. “ඇත්තෙන්ම ඔබ
මාව සොයන්නේ ඔබ යම් ලකුණු දුටු
නිසා නොව රොටි කා තෘප්තියට පත්
වූ නිසයි.[3] **27** නැති වී යන මෙවැනි
ආහාර වෙනුවෙන් ඔබ වෙහෙසෙන්න
එපා.[4] ඒ වෙනුවට මනුෂ්‍ය පුත්‍රයා
ඔබට ලබා දෙන කිසිදා නැති වී නො-
යන සදාකාල ජීවනයට මඟ පාදන
ආහාර ලබාගන්න උත්සාහ කරන්න.[5]
මන්ද පියාණන්ගේ එනම්, දෙවිගේ
අනුමැතිය තිබෙන්නේ මනුෂ්‍ය පුත්‍ර-
යාටයි.”[6]

**28** එහෙයින් ඔවුහු, “දෙවිගේ අනු-
මැතිය ලබන්න අප කළ යුත්-
තේ කුමක්ද” කියා ඔහුගෙන් ඇසූහ.
**29** යේසුස් මෙසේ පිළිතුරු දුන්නේය.
“දෙවිගේ අනුමැතිය ලබන්න නම් ඔහු
එවූ තැනැත්තා[7] කෙරෙහි විශ්වාසය
තබන්න අවශ්‍යයි.”[8] **30** එවිට ඔවුහු
ඔහුට මෙසේ කීවෝය. “ඔබව විශ්වාස
කරන්න නම් අපට ලකුණක් හැටියට
ඔබ යම් දෙයක් කරන්න අවශ්‍යයි.
ඔබ මොන වගේ දෙයක්ද කරන්නේ?[9]
**31** උදාහරණයකට සිතන්න පාළුක-
රයේ මන්නා[10] ආහාරයට ගත් අපේ
මුතුන්මිත්තන් ගැන. ලියා තිබෙන
ආකාරයටම ‘ඔහු ඔවුන්ට කන්න
ස්වර්ගයෙන් ආහාර ලබා දුන්නා.’ ”[11]
**32** එහෙයින් යේසුස් ඔවුන්ට මෙසේ
කීවේය. “ඇත්තෙන්ම මම ඔබට

**6 පරි.**

**1** 2රාජා 4:43
මතෙ 14:19
මතෙ 14:21
මාක් 6:39
මාක් 6:44
ලූක් 9:14
**2** 2රාජා 4:44
මාක් 6:41
ලූක් 9:16
**3** මාක් 6:42
**4** මතෙ 14:20
මාක් 6:43
ලූක් 9:17
**5** ද්වි 18:15
ද්වි 18:18
යෙසා 9:6
ලූක් 24:19
ක්‍රියා 3:22
**6** මතෙ 14:23
මාක් 6:45
යොහ 17:16
යොහ 18:36
යාකො 1:27
යාකො 4:4
**7** මතෙ 14:22
මාක් 6:47
**8** මතෙ 8:24
මතෙ 14:24
මාක් 6:48
**9** මතෙ 14:26
මාක් 6:49
**10** මතෙ 14:27
මාක් 6:50
**11** මතෙ 14:34
මාක් 6:51

**2 තීරුව**

**1** මාක් 1:37
**2** යොහ 1:38
**3** යොහ 6:11
**4** හබ 3:17
**5** යොහ 4:14
යොහ 17:3
රෝම 6:23
**6** ගීතා 22:8
මතෙ 3:17
ක්‍රියා 2:22
2පේතෘ 1:17
**7** යොහ 7:29
යොහ 8:42
**8** ක්‍රියා 16:31
1යොහ 3:23
**9** මතෙ 12:38
මාක් 8:12
යොහ 2:18
1කොරි 1:22
**10** නික් 16:15
ගණන් 11:7
නෙහෙ 9:15
යොහ 6:49
1කොරි 10:3
**11** ගීතා 78:24
ගීතා 105:40

කියන මේ දේ මතක තබාගන්න.
ස්වර්ගයෙන් ඔබට ආහාර ලබා දුන්-
නේ මෝසෙස් නොවෙයි. එසේම
ස්වර්ගයෙන් ඔබට සැබෑ ආහාරය
ලබා දෙන්නෙත් මගේ පියාණන්.[1]
**33** දෙවි ලබා දෙන ඒ සැබෑ ආහා-
රය නම් ස්වර්ගයෙන් ඇවිත් ලෝක-
යට ජීවනය ලබා දෙන තැනැත්තායි."
**34** එවිට ඔවුහු, "ස්වාමීනි, අපට ඒ
ආහාරය හැමදාටම දෙන්න"[2] කියා
ඔහුට කීවෝය.

**35** යේසුස් ඔවුන්ට මෙසේ කීවේය.
"ජීවනය ලබා දෙන ආහාරය මමයි.
මා ළඟට එන තැනැත්තාට කිසිදාක
බඩගින්නක් ඇති වන්නේ නැහැ. මා
කෙරෙහි විශ්වාසය තබන තැනැත්-
තාට කිසිදාක පිපාසයක් දැනෙන්-
නේද නැහැ.[3] **36** නමුත් මම කලින්
ඔබට පැවසූ ලෙස ඔබ මාව දුටුවත්
ඔබ මාව විශ්වාස කරන්නේ නැහැ.[4]
**37** පියාණන් මට භාර දෙන සෑම කෙ-
නෙක්ම මා ළඟට එයි. මා ළඟට
එන අයව මම කොහෙත්ම ප්‍රතික්-
ෂේප කරන්නේ නැහැ.[5] **38** මන්ද
මම ස්වර්ගයෙන් ආවේ[6] මගේ
කැමැත්ත ඉටු කිරීමට නොව මාව
එවූ තැනැත්තාගේ කැමැත්ත ඉටු
කිරීමටයි.[7] **39** මාව එවූ තැනැත්-
තාගේ කැමැත්ත නම් ඔහු මට භාර
දුන් සියලුදෙනාගෙන් කිසි කෙනෙක්ව
නැති කර නොගෙන අන්තිම දව-
සේදී මා ලවා ඔවුන් සියලුදෙනා-
වම නැවත නැඟිටුවීමයි.[8] **40** මගේ
පියාණන්ගේ කැමැත්ත නම් පුත්‍රයාව
දැක ඔහු කෙරෙහි විශ්වාසය තබන
සෑම කෙනෙකුටම සදාකාල ජීවනය
ලබා දීමයි.[9] මම අන්තිම දවසේදී
ඔවුන්ව නැවත නැඟිටුවනවා."[10]

**41** "ස්වර්ගයෙන් පැමිණි ආහාරය
මමයි"[11] කියා යේසුස් පැවසූ නිසා
යුදෙව්වරු ඔහුට විරුද්ධව කොඳු-
රන්න පටන්ගත්තෝය. **42** ඔවුහුද,
"මේ යෝසෙප්ගේ පුත් යේසුස් නේද?[12]
අපි ඔහුගේ පියාවත් මවවත් හොඳින්
හඳුනනවා. එසේනම් 'මම ස්වර්ග-
යෙන් ආවා' කියා ඔහු කියන්නේ

**6 පරි.**
1 යොහ 3:16
2 යොහ 4:15
3 යොහ 4:14; යොහ 7:37; එළි 22:17
4 යොහ 6:64
5 මතෙ 11:28; යොහ 17:6
6 යොහ 3:13; යොහ 8:23; යොහ 8:42
7 මතෙ 26:39; යොහ 5:30
8 යොහ 5:28; යොහ 17:12; රෝම 6:5
9 යොහ 10:28
10 දානි 12:13; යොහ 11:24; ක්‍රියා 17:31; 1තෙස 4:16; එළි 20:12
11 යොහ 6:33
12 ලූක් 3:23

**2 තීරුව**
1 මතෙ 13:55; මාක් 6:3; ලූක් 4:22
2 යොහ 6:65; 2තෙස 2:13
3 යොහ 11:24
4 යෙසා 54:13; යෙරෙ 31:34; මීකා 4:2
5 1තෙස 4:9
6 මතෙ 11:27; ලූක් 10:22; යොහ 1:18
7 නික් 33:20
8 යොහ 3:16
9 යොහ 6:33
10 යොහ 6:31
11 හෙබ්‍රෙ 10:10
12 යොහ 1:14; 1යොහ 4:2
13 යොහ 6:27; යොහ 6:33
14 ක්‍රියා 20:28; රෝම 3:25
15 එළි 20:4; එළි 20:5

කොහොමද" කියා එකිනෙකා අත-
රේ කතා වූහ.[1] **43** යේසුස් ඔවුන්ට
මෙසේ කීවේය. "කොඳුරන එක නතර
කරන්න. **44** කෙනෙක් මා ළඟට
එන්නේ මාව එවූ මගේ පියාණන්
ඔහු තුළ ඒ සඳහා ආශාවක් ඇති
කළොත් පමණයි.[2] අවසාන කාල-
යේදී මම ඔහුව නැවත නැඟිටුවනවා.[3]
**45** 'යෙහෝවා දෙවි ඔවුන් සියලු-
දෙනාටම උගන්වයි'[4] කියා අනාග-
තවක්තෘවරුන්ගේ ලියවිලිවල ලියා
තිබෙනවා. පියාණන්ට සවන් දී ඉගෙ-
නගත් සියලුදෙනාම එන්නේ මා ළඟ-
ටයි.[5] **46** දෙවි විසින් එවා ඇති මා
හැර[6] වෙන කිසි මිනිසෙක් මගේ පියා-
ණන් වන දෙවිව දැක නැහැ.[7] ඔහුව
දැක තිබෙන්නේ මා පමණයි. **47** ඒ
නිසා මම ස්ථිරවම කියන්නේ, මාව
විශ්වාස කරන තැනැත්තාට සදාකාල
ජීවනය හිමි වන බවයි.[8]

**48** "ජීවනය ලබා දෙන ආහාරය
මමයි.[9] **49** පාළුකරයේ සැරිසරමින්
සිටි ඔබේ මුතුන්මිත්තන් මන්නා[10]
ආහාරයට ගත්තත් ඔවුන් සියලුදෙ-
නාම මහලු වී මිය ගියා. **50** නමුත්
ස්වර්ගයෙන් පැමිණෙන සැබෑ ආහා-
රය කන කිසි කෙනෙකු මිය යන්-
නේ නැහැ. **51** ස්වර්ගයෙන් පැමිණි
ඒ ජීවනදායක ආහාරය මමයි. කෙ-
නෙක් එම ආහාරය කෑවොත් ඔහු
සදාකල් ජීවත් වෙනවා. ඇත්තටම
මා ලබා දෙන ආහාරය නම් ලෝක-
යට ජීවනය ලබා දීම සඳහා[11] මා පූජා
කරන මගේ ශරීරයයි."[12]

**52** එවිට යුදෙව්වන් අතර උණු-
සුම් විවාදයක් ඇති විය. "මේ මිනිසා,
අපට කන්න ඔහුගේ ශරීරය දෙන්-
නේ කොහොමද" කියා ඔවුහු පැවසූහ.
**53** එහෙයින් යේසුස් ඔවුන්ට මෙසේ
කීවේය. "ඇත්තෙන්ම මම ඔබට
කියන්නේ, ඔබ මනුෂ්‍ය පුත්‍රයාගේ ශරී-
රය කෑමට ගන්නේවත්[13] ඔහුගේ රුධි-
රය බොන්නේවත්[14] නැත්නම් ඔබට
ජීවනය හිමි වන්නේ නැති*[15] බවයි.

යොහ **6:53*** මූ.අ., "ඔබ තුළ ජීවනයක් නැති."

**54** මගේ ශරීරය කෑමට ගෙන මගේ
රුධිරය බොන තැනැත්තාට සදා-
කාල ජීවනය ලැබෙයි. මම අන්තිම
දවසේදී ඔහුව නැවත නැඟිටුවනවා.[1]
**55** මගේ ශරීරය සැබෑ ආහාරයක්.
මගේ රුධිරය සැබෑ බීමක්. **56** මගේ
ශරීරය කෑමට ගෙන මගේ රුධිරය
බොන තැනැත්තා මා සමඟ එකට
බැඳී සිටිනවා. මමත් ඔහු සමඟ එකට
බැඳී සිටිනවා.[2] **57** මාව එව්වේ ජීව-
මාන[3] පියාණන්. මා ජීවත් වන්නේ
ඔහු නිසයි. ඒ වගේම මගේ ශරීර-
යෙන් පෝෂණය වන තැනැත්තා මා
නිසා ජීවත් වෙයි.[4] **58** ස්වර්ගයෙන්
පැමිණි ආහාරය එයයි. ඒ ආහාරය මිය
ගොස් ඇති ඔබේ මුතුන්මිත්තන් කෑ
ආහාරයට වඩා වෙනස්. ස්වර්ගයෙන්
පැමිණි ආහාරය කන තැනැත්තා
සදහටම ජීවත් වෙයි."[5] **59** ඔහු ඒ
දේවල් පැවසුවේ කපර්ණවුමෙහි සෙ-
නඟ රැස්ව සිටි ශාලාවේ උගන්වමින්
සිටියදීය.

**60** ඒ දේවල් අසාගෙන සිටි ඔහු-
ගේ ගෝලයන්ගෙන් බොහෝදෙනෙක්
මෙසේ පැවසූහ. "මෙය මහ පුදුම
කතාවක්. මේ වගේ දේවල් අසාගෙන
ඉන්න පුළුවන් කාටද?"[6] **61** තමන්
පැවසූ දේවල් ගැන තම ගෝලයන්
කොඳුරමින් සිටි බව තේරුම්ගත් යේ-
සුස් ඔවුන්ට මෙසේ පැවසුවේය. "මා
පැවසූ දේවල් නිසා ඔබ තුළ කම්පන-
යක්[7] ඇති වෙනවා නම්, **62** මනුෂ්‍ය
පුත්‍රයා කලින් සිටි තැනට නැඟ
යනවා ඔබ දැක්කොත් ඔබට මො-
නව වෙයිද?[8] **63** ජීවනය ලැබෙන්-
නේ කෙනෙක් දෙවිගේ මඟ පෙන්වීමට
යටත් වුණොත් පමණයි.[9] මිනිසුන්
තමාගේම උත්සාහයෙන් කරන දේ-
වලින් කිසි ප්‍රයෝජනයක් ඔවුන්ට
ලැබෙන්නේ නැහැ. මා පැවසූ මේ
දේවල් ඔබට පැවසුවේ දෙවිගේ මඟ
පෙන්වීමට එකඟවයි.[10] එයින් ජීව-
නය ලැබෙයි.[11] **64** නමුත් ඔබ අත-
රේම මේ දේවල් විශ්වාස නොකරන
අයත් සිටිනවා." යේසුස් එසේ පැවසු-
වේ විශ්වාස කරන්නේ නැති අය කවු-
රුන්ද කියාත් තමාව පාවා දෙන්නේ
කවුද කියාත් ඔහු ඒ අවස්ථාවේ සිටම
දැන සිටි නිසාය.[1] **65** ඔහු තවදුර-
ටත් මෙසේ පැවසුවේය. "මා වෙතට
එන්න පියාණන් කෙනෙකුට අවසර
දුන්නොත් මිස[2] අන් කිසිවෙකුට මා
වෙතට එන්න බැරි බව මා ඔබට පැව-
සුවේ ඒ නිසයි."

**66** ඒ නිසා යේසුස්ගේ ගෝල-
යන්ගෙන් බොහෝදෙනෙක් තමන්
කලින් අත්හැර ආ දේවලට ආපසු
හැරී ගියෝය.[3] ඔහු සමඟ සිටී-
මට ඔවුන් තුළ තවදුරටත් කැමැත්-
තක් නොතිබිණ.[4] **67** එවිට යේසුස්
දොළොස්දෙනා දෙස බලා, "ඔබත්
යන්න කැමතිද" කියා ඇසුවේය.
**68** සීමොන් පේතෘස්[5] ඔහුට මෙසේ
පිළිතුරු දුන්නේය. "ස්වාමීනි, අප
කා ළඟට යන්නද?[6] සදාකාල ජීව-
නයට මඟ පාදන වදන් පවසන්නේ
ඔබ පමණයි.[7] **69** දෙවි එවා ඇති
ශුද්ධ තැනැත්තා ඔබ බව[8] අපි දන්-
නවා. එය අපට හොඳටම විශ්වා-
සයි." **70** එවිට යේසුස් ඔවුන්ට
මෙසේ කීවේය. "මම දොළොස්දෙ-
නෙක්ව තෝරාගත්තා.[9] ඒත් ඒ දො-
ළොස්දෙනාගෙන් කෙනෙක් අපහාස
කරන්නෙක්."[10] **71** යේසුස් ඒ අවස්-
ථාවේදී කතා කරමින් සිටියේ සීමොන්
ඉස්කාරියොත්ගේ පුත් යූදස් ගැනය.
මන්ද යූදස් දොළොස්දෙනාගෙන් කෙ-
නෙක් වුවත් ඔහු පසුව යේසුස්ව පාවා
දුන්නේය.[11]

**7** යුදෙව්වන් යේසුස්ව මරන්න
සොයමින් සිටි නිසා[12] ඔහු යූදය
අවට ප්‍රදේශවල ගමන් නොකර ගලී-
ලය අවට පමණක් ගමන් කළේය.
**2** මේ අතර පැල් උත්සවය[13] ලෙස
හඳුන්වන යුදෙව්වරුන්ගේ උත්ස-
වය ළඟා විය. **3** එහෙයින් ඔහුගේ
සහෝදරයෝ[14] ඔහුට මෙසේ කීවෝය.
"ඔබ කරන ක්‍රියා යූදයේ සිටින ඔබේ
ගෝලයන්ටත් දකින්න සැලැස්විය
යුතුයි. ඒ නිසා දැන් ඔබ යූදයට
යන්න. **4** සාමාන්‍යයෙන් කෙනෙ-

6 පරි.
1 යොහ 6:40
1කොරි 15:52
1තෙස 4:16
2 යොහ 14:23
යොහ 15:4
1යොහ 3:24
3 යෙරෙ 10:10
දානි 6:26
2කොරි 3:3
1තෙස 1:9
4 යොහ 5:26
1කොරි 15:22
5 යොහ 6:51
6 මතෙ 11:6
යොහ 6:66
7 මතෙ 13:21
8 යොහ 3:13
යොහ 6:38
යොහ 8:23
ක්‍රියා 1:9
එෆී 4:8
9 1කොරි 15:45
2කොරි 3:6
ගලා 6:8
10 1කොරි 2:13
11 ද්වි 8:3
ගීතා 119:50
මතෙ 4:4
පිලි 2:16

2 තීරුව
1 මතෙ 9:4
යොහ 2:24
යොහ 13:11
2 යොහ 6:44
3 ලූක් 9:62
4 මතෙ 11:6
යොහ 6:60
5 මතෙ 16:16
මාක් 8:29
6 එළි 14:4
7 යොහ 6:63
යොහ 17:3
ක්‍රියා 5:20
8 මාක් 1:24
ලූක් 9:20
9 ලූක් 6:13
යොහ 15:16
10 ලූක් 22:3
යොහ 13:18
11 මතෙ 26:14
යොහ 12:4

7 පරි.
12 මාක් 9:30
යොහ 5:18
13 ලෙවී 23:34
14 මතෙ 12:46
මාක් 6:3
ලූක් 8:19
යොහ 2:12
ක්‍රියා 1:14
ගලා 1:19

කුට ප්‍රසිද්ධ වෙන්න අවශ්‍ය නම්
ඔහු රහසින් දේවල් නොකර එළි-
පිටම කළ යුතුයි. ඔබ බොහෝ
දේවල් කරන නිසා ගොස් ලෝ-
කයටම ප්‍රසිද්ධ වෙන්න.” **5** ඇත්-
තෙන්ම ඔහුගේ සහෝදරයන්ට[1] ඔහු
කෙරෙහි විශ්වාසයක් තිබුණේ නැත.[2]
**6** එහෙයින් යේසුස් ඔවුන්ට මෙසේ
කීවේය. “මගේ නියමිත වේලාව තවම
පැමිණ නැහැ.[3] නමුත් ඔබට නම්
ඕනෑම වේලාවක යන්න පුළුවන්.
**7** ලෝකයේ සිටින මිනිසුන් ඔබට
වෛර කරන්නේ නැහැ. නමුත් මම
ඔවුන්ගේ දුෂ්ට ක්‍රියා එළිපිට ප්‍රකාශ
කරන නිසා[4] ඔවුන් මට වෛර කර-
නවා. **8** ඒ නිසා ඔබට පුළුවන්
උත්සවයට යන්න. මගේ නියමිත වේ-
ලාව[5] තවම ඇවිත් නැති නිසා[6] මම
දැන්මම උත්සවයට යන්නේ නැහැ.”
**9** ඔහු ඒ දේවල් ඔවුන්ට පැවසූ පසු
ගලීලයෙහිම නැවතී සිටියේය.

**10** නමුත් ඔහුගේ සහෝදරයන්
උත්සවයට ගිය පසු ඔහුද ගියේය.
ඔහු ගියේ ප්‍රසිද්ධියේ නොව රහසින්ය.[7]
**11** උත්සවය පවත්වද්දී යුදෙව් ජන-
තාව ඔහුව සොයන්න පටන්ගෙන,[8]
“ඒ මිනිසා කොහේද” කියා ඇසූහ.
**12** සමූහයා අතරේ ඔහු ගැන බො-
හෝ කතා පැතිරිණ.[9] සමහරු, “ඔහු
යහපත් මිනිසෙක්” කියාත් තවත්
සමහරු, “නැහැ, ඔහු ඇත්ත-
ටම සමූහයාව නොමඟ යවනවා”
කියාත් පැවසූහ. **13** නමුත් යුදෙව්-
වන්ට* ඇති බිය නිසා[10] කිසිවෙක් ඔහු
ගැන ප්‍රසිද්ධියේ කතා නොකළෝය.

**14** උත්සවය මැද හරියේදී යේසුස්
දේවමාලිගාවට ගොස් උගන්වන්න
පටන්ගත්තේය.[11] **15** එහෙයින්
යුදෙව්වරු පුදුම වී, “මේ මිනිසා
පාසැල්වල ඉගෙනගෙනත් නැහැ.[12]
එහෙමනම් ඔහුට මෙතරම් දැනු-
මක් තිබෙන්නේ කොහොමද”[13]
කියා කීවෝය. **16** යේසුස් ඔවුන්ට
මෙසේ පිළිතුරු දුන්නේය. “මා උගන්-
වන්නේ මගේ අදහස් නොව මාව එවූ
තැනැත්තාගේ අදහස්.[1] **17** යමෙක්
දෙවිගේ කැමැත්ත කරන්න ආශා-
වෙන් සිටිනවා නම් මා උගන්වන දේ
මගේම අදහස්ද නැත්නම් දෙවිගේ
අදහස්ද කියා තේරුම්ගන්න ඔහුට
පුළුවන්.[2] **18** ඇත්තෙන්ම තමා-
ගේ අදහස් ඉදිරිපත් කරන පුද්ග-
ලයා උත්සාහ කරන්නේ තමාටම
ගෞරවය ලබාගන්නයි. නමුත්
තමා එවූ තැනැත්තාට ගෞරවයක්
ගෙන දෙන්න උත්සාහ කරන පුද්-
ගලයා[3] සැබෑ කෙනෙක් වන අතර
ඔහු තුළ කිසි බොරුවක් වංචාවක්
නැහැ. **19** නීතිය ඔබට ලබා දුන්-
නේ මෝසෙස් නේද?[4] නමුත් ඔබ
අතරින් කිසි කෙනෙක් ඒ නීති-
යට කීකරු වන්නේ නැහැ. ඔබ
මාව මරන්න උත්සාහ කරන්නේ
ඇයි?”[5] **20** සමූහයා පිළිතුරු දෙ-
මින්, “ඔබට භූතයෙක් වැහිලාද?[6]
ඔබව මරන්න උත්සාහ කරන්නේ
කවුද” කියා ඇසූහ. **21** එවිට යේ-
සුස් ඔවුන්ට මෙසේ පිළිතුරු දුන්-
නේය. “මම එක දෙයයි කළේ.[7]
ඒත් ඔබ ඒ දේ ගැන පුදුම වෙ-
නවා. **22** මෝසෙස් මඟින් ඔබට
නියම කළ චර්මච්ඡේදනය වීමේ පිළි-
වෙත[8] ගැන සිතා බලන්න. ඇත්ත-
ටම එය මෝසෙස් පටන්ගත් දෙයක්
නොව එය අපේ මුතුන්මිත්තන්-
ගේ කාලයේ පටන් පවතින පිළිවෙ-
තක්.[9] කොහොමවුණත් ඔබ සබත්
දවසේදී වුණත් මිනිසෙකුව චර්මච්-
ඡේදනය කරනවා. **23** එසේ කරන්-
නේ මෝසෙස්ට දෙන ලද නීතිය කඩ
නොකිරීමටයි. ඔබ එසේ මිනිසෙකුව
සබත් දවසකදී චර්මච්ඡේදනය කර-
නවා නම් සබත් දවසකදී මා මිනිසෙ-
කුව සම්පූර්ණයෙන්ම සුව කළාට[10]
ඔබ මා සමඟ මෙතරම් කෝපයකින්
සිටින්නේ ඇයි? **24** ඒ නිසා පිට-
තින් දේවල් දෙස බලා තවදුරටත්
විනිශ්චය කරන්න එපා. ධර්මිෂ්ඨක-
මින් විනිශ්චය කරන්න.”[11]

**7 පරි.**
1 මතෙ 13:55 ලූක් 8:20
2 මාක් 3:21
3 යොහ 2:4 යොහ 7:30
4 යොහ 3:19 යොහ 15:19
5 මතෙ 26:45
6 යොහ 8:20
7 මතෙ 10:16
8 යොහ 11:56
9 මතෙ 21:46 ලූක් 7:16 යොහ 6:14 යොහ 9:16
10 යොහ 9:22 යොහ 12:42 යොහ 19:38
11 ලූක් 19:47
12 මතෙ 13:54 මාක් 6:2 ලූක් 2:47 ක්‍රියා 4:13
13 ලූක් 4:16

**2 තීරුව**
1 යොහ 3:34 යොහ 8:28 යොහ 12:49 යොහ 14:10 එළි 1:1
2 යොහ 8:47
3 යොහ 5:41 යොහ 8:50
4 නික් 24:3 ද්වි 33:4 ක්‍රියා 7:38 ගලා 3:19
5 මතෙ 12:14 මාක් 3:6
6 යොහ 8:48 යොහ 10:20
7 යොහ 5:16
8 ලෙවී 12:3
9 උත් 17:10 උත් 21:4 රෝම 4:11 පිලි 3:5
10 යොහ 5:9
11 ද්වි 1:16 හිතෝ 24:23 යෙසා 11:3 මතෙ 23:23

**යොහ 7:13*** එනම්, යුදෙව් ආගමික නායක-යන්ට.

**25** එවිට යෙරුසලමෙහි වාසය කළ අයගෙන් සමහරදෙනෙක් මෙසේ පැවසූහ. “ඔවුන් මරන්න සොයන්නේ මේ මිනිසාව නේද?[1] **26** ඒත් බලන්න! ඔහු ප්‍රසිද්ධියේ කතා කරමින්[2] සිටියත් කවුරුත් කිසිම දෙයක් ඔහුට කියන්නේ නැහැ. මෙසේ සිදු වන්නේ ඔහු ක්‍රිස්තුස් බව පාලකයන් තේරුම්ගෙන සිටින නිසාවත්ද?[3] **27** ඒත් එහෙම කියන්නේ කොහොමද? මේ මිනිසා ආවේ කොහෙන්ද කියා අපි හොඳටම දන්නවා.[4] නමුත් ක්‍රිස්තුස් ගැන කියා තිබෙන්නේ ඔහු එන විට ඔහු කොතැනින් ආවාද කියා කිසිම කෙනෙක් දැන නොගන්නා බවයි.”[5] **28** දේවමාලිගාවෙහි උගන්වමින් සිටි යේසුස්, ඒ දේවල් අසා හඬ නඟා මෙසේ පැවසුවේය. “මා කවුද කියාත් මා පැමිණියේ කොහෙන්ද කියාත් ඔබ දන්නවා.[6] මම ආවේ මගේම කැමැත්ත ඉටු කරන්න නොවෙයි.[7] මම ආවේ මාව එවූ තැනැත්තා නිසයි. ඔහු සැබෑ පුද්ගලයෙක්.[8] නමුත් ඔබ ඔහුව හඳුනන්නේ නැහැ.[9] **29** මම නම් ඔහුව හොඳින් හඳුනනවා.[10] මන්ද මම ඇවිත් සිටින්නේ ඔහුගේ නියෝජිතයෙක් ලෙසයි. මාව එව්වේ ඔහුයි.”[11] **30** එහෙයින් ඔවුහු ඔහුව අල්ලාගන්න උත්සාහ කළෝය.[12] නමුත් නියම වේලාව පැමිණ නොතිබුණු නිසා[13] කිසි කෙනෙකුට ඔහු පිට අත තබන්නවත් නොහැකි විය. **31** මේ අතර සමූහයාගෙන් බොහෝදෙනෙක් ඔහු කෙරෙහි විශ්වාසය තැබූහ.[14] ඔවුහුද, “බලන්න, ඔහු කොතරම් ලකුණු සිදු කරනවාද![15] ඔහු ක්‍රිස්තුස්ම විය යුතුයි” කියා පැවසූහ.

**32** සමූහයා ඔවුනොවුන් අතරේ මේ දේවල් කතා කරනවා පරිසිවරුන්ට ඇසිණ. එහෙයින් ඔවුහු නායක පූජකයන් සමඟ එකතු වී ඔහුව අල්ලාගැනීමට නිලධාරීන් පිරිසක්ව යැව්වෝය.[16] **33** එවිට යේසුස් මෙසේ කීවේය. “මම ඔබ සමඟ සිටින්නේ තව කෙටි කාලයකට පමණයි. ඉන්පසුව මාව එවූ තැනැත්තා ළඟට මම යනවා.[1] **34** එවිට ඔබ කොතරම් සෙව්වත්[2] මාව සොයාගන්න ඔබට බැරි වෙයි. මන්ද මා සිටින තැනට ඔබට එන්න බැහැ.”[3] **35** එහෙයින් යුදෙව්වරු ඔවුනොවුන් අතරේ මෙසේ කියාගත්හ. “අපට සොයාගන්න බැරි වන විදිහට මේ මිනිසා කොහේද යන්න හදන්නේ? ඔහු ග්‍රීකවරුන් අතරේ ජීවත් වන යුදෙව්වරුන් ළඟට[4] ගොස් එහි සිටින ග්‍රීකවරුන්ටත් උගන්වන්න අදහස් කරනවාවත්ද? **36** ‘ඔබ කොතරම් සෙව්වත් මාව සොයාගන්න ඔබට බැරි වෙයි. මන්ද මා සිටින තැනට ඔබට එන්න බැහැ’ කියා ඔහු කිව්වේ ඇයි? මොකක්ද ඒ කතාවේ තේරුම?

**37** උත්සවයේ විශේෂිතම දවස වන එහි අවසන් දවසේදී,[5] යේසුස් සියලුදෙනා ඉදිරියේ නැඟිට හඬ නඟා මෙසේ කීවේය. “යම් කෙනෙකුට පිපාසය ඇත්නම්[6] ඔහුට පුළුවන් මා ළඟට ඇවිත් ඒ පිපාසය සන්සිඳුවා ගන්න. **38** ශුද්ධ ලියවිල්ලේ සඳහන් ආකාරයට මා කෙරෙහි විශ්වාසය තබන තැනැත්තා[7] තුළින් ‘ජීවනදායක දිය දහරා ගලා එයි.’ ”[8] **39** ඔහු මෙසේ පැවසුවේ ඔහු කෙරෙහි විශ්වාසය තැබූ අයට දෙවිගේ බලය ලැබීමට නියමිත වූ නිසාය. ඒ වන තුරු යේසුස්ට තම ස්වර්ගික තේජස හිමි වී නොතිබුණු නිසා[9] දෙවිගේ බලය ඔවුන්ට ලබා දී තිබුණේ නැත.[10] **40** ඔහු පැවසූ දේවල් අසාගෙන සිටි සමූහයා අතරින් සමහරෙක්, “ඔහු අනිවාර්යයෙන්ම එන්න සිටින අනාගතවක්තෘවරයා විය යුතුයි”[11] කියා පැවසූහ. **41** තවත් සමහරු, “ඔහු තමයි ක්‍රිස්තුස්”[12] කියා පැවසූ අතර ඇතැම් අය මෙසේ ඇසූහ. “ක්‍රිස්තුස්[13] එන්නේ ගලීලයෙන්ද?[14] **42** ශුද්ධ ලියවිල්ලේ කියා තිබෙන්නේ ක්‍රිස්තුස් දාවිත්ගේ පෙළපතින්[15] හා දාවිත්ගේ ගම[16] වන බෙත්ලෙහෙමෙන්[17] එනවා කියා නොවෙයිද?” **43** එලෙස සමූහයා අතර ඔහු ගැන

**7 පරි.**

1 යොහ 5:18
2 මතෙ 26:55 යොහ 18:20
3 යොහ 7:48
4 මතෙ 13:55
5 උත් 49:10 මීකා 5:2 හෙබ්‍රෙ 7:3
6 මාක් 6:3 යොහ 8:14
7 යොහ 8:42
8 යොහ 8:26
9 යොහ 8:55
10 මතෙ 11:27 යොහ 1:18 යොහ 10:15
11 හෙබ්‍රෙ 3:1
12 මාක් 11:18 ලූක් 19:47
13 ලූක් 22:53 යොහ 8:20
14 යොහ 2:23 යොහ 8:30 යොහ 10:42 යොහ 11:45
15 මීකා 5:4 යොහ 11:47
16 යොහ 11:57

**2 තීරුව**

1 යොහ 13:33 යොහ 16:16
2 යොහ 8:21
3 යොහ 8:22
4 යෙසා 11:12 ක්‍රියා 17:10 1පේත 1:1
5 ලෙවී 23:36
6 යෙසා 55:1 යොහ 4:14 යොහ 6:35 එළි 22:17
7 ද්වි 18:15
8 නික් 17:6 ගණන් 20:8 හිතෝ 18:4 යොහ 4:14 1කොරි 10:4
9 යොහ 12:16 යොහ 13:32 1තිමෝ 3:16
10 යෙසා 44:3 යෝවෙ 2:28 යොහ 16:7 ක්‍රියා 2:17
11 ද්වි 18:18 යොහ 1:21 යොහ 6:14 ක්‍රියා 3:22
12 යොහ 6:69
13 යොහ 4:42 යොහ 7:52
14 යොහ 1:46
15 2ලේක 13:5 ගීතා 89:4 ගීතා 132:11 යෙරෙ 23:5
16 1සාමු 16:1
17 මීකා 5:2 මතෙ 2:5 ලූක් 2:4

යම් මතභේදයක් ඇති විය.[1] 44 මේ
අතරේ කිහිපදෙනෙකු ඔහුව අල්ලාගැ-
නීමට මාන බලමින් සිටියත් ඔවුන්ට
කිසිවක් කිරීමට නොහැකි විය.

45 ඉන්පසු නිලධාරීන් පිරිස
නායක පූජකයන් සහ පරිසිවරුන්
ළඟට ආපසු ගියෝය. “ඔහුව මෙ-
හෙට ගෙනාවේ නැත්තේ ඇයි” කියා
ඔවුහු එම පිරිසගෙන් ඇසූහ. 46 එම
පිරිස මෙසේ පිළිතුරු දුන්නෝය. “ඒ
වගේ උගන්වන්න පුළුවන් මිනිසෙකුව
නම් අපි කවදාවත් දැකලා නැහැ.”[2]
47 එවිට පරිසිවරු මෙසේ පැවසූහ.
“ඔබත් මුළා වෙලාද? 48 ටිකක්
හිතලා බලන්න. පාලකයන් හා පරි-
සිවරුන් අතරින් එක් කෙනෙක්වත්
ඔහු කෙරෙහි විශ්වාසය තබා තිබෙ-
නවාද?[3] 49 නීතිය ගැන කිසිම
අවබෝධයක් නැති මේ සමූහයා දේ-
වශාපයට ලක් විය යුතු පිරිසක්!”[4]
50 එවිට ඔවුන්ගෙන් කෙනෙකු වූ,
කලින් අවස්ථාවක යේසුස්ව හමු
වීමට ගිය නිකදේමස් ඔවුන්ට මෙසේ
කීවේය. 51 “අපේ නීතියට අනුව
මිනිසෙකුව විනිශ්චය කරන්න කලින්
අප ඔහුට සවන් දී[5] ඔහු කරන
දේවල් ගැන සොයා බැලිය යුතුයි.
මේ අවස්ථාවේදීත් අප කළ යුත්-
තේ ඒ දේම නොවෙයිද?” 52 ඔවුහු
පිළිතුරු වශයෙන්, “ඔබත් ගලීල-
යේ වැසියෙක් නේද? ගලීලයෙන්
කිසිම අනාගතවක්තෘවරයෙකු[1] පැමි-
ණෙනවාද නැද්ද කියා ශුද්ධ ලියවිල්-
ලෙන් සොයා බලන්න” කියා ඔහුට
කීවෝය.*

8 12 යේසුස් නැවතත් ඔවුන්ට
මෙසේ පැවසුවේය. “ලෝකයේ
ආලෝකය මමයි.[2] මාව අනුගම-
නය කරන තැනැත්තාට අන්ධකාර-
යේ ගමන් කරන්න සිදු වන්නේ
නැහැ.[3] මන්ද ඔහුට ජීවනයට
මඟ පෙන්වන ආලෝකය ලැබෙයි.”
13 එවිට පරිසිවරු, “ඔබට තිබෙන්-
නේ ඔබේ සාක්ෂිය විතරයි. ඒ
නිසා ඔබ දෙන සාක්ෂිය පිළිගන්න
බැහැ” කියා කීවෝය. 14 යේසුස්
ඊට මෙසේ පිළිතුරු දුන්නේය. “මට
මගේ සාක්ෂිය පමණක් තිබුණත් ඒ
සාක්ෂිය[4] සැබෑවක් ලෙස ඔබ පිළි-
ගත යුතුයි. මන්ද මම කොහෙන්
ආවාද කියාත් මම යන්නේ කොතැන-
ටද කියාත් මම හොඳින් දන්නවා.[5]

**7 පරි.**

1 යොහ 9:16 යොහ 10:19
2 උත් 49:21 මතෙ 7:29 ලූක් 4:22 ලූක් 20:39
3 යොහ 12:42 ක්‍රියා 6:7
4 ගලා 3:10
5 ද්වි 1:16 ද්වි 17:8 හිතෝ 18:13

**2 තීරුව**

1 යෙසා 9:1 මතෙ 4:15

**8 පරි.**

2 යෙසා 9:2 යෙසා 49:6 මතෙ 4:16 යොහ 1:5 යොහ 12:35
3 මීකා 3:6 යොහ 12:46 1පේතෘ 2:9 1යොහ 2:8
4 යොහ 5:31
5 යොහ 7:28 යොහ 13:3 යොහ 16:28

* ℵBSy[s] යන අත්පිටපත්වල, 53වන පදයේ සිට 8වන පරිච්ඡේදයේ 11වන පදය දක්වා කොටස දක්නට නැත. (විවිධ ග්‍රීක පිටපත් සහ අනුවාදවල යම් වෙනස්කම් දක්නට ලැබුණත්) ඒ පදවල මතු දැක්වෙන තොරතුරු ඇත.

53 ඉන්පසු ඔවුහු තම තමන්ගේ නිවෙස් බලා ගියෝය.

8 යේසුස් එතැනින් පිටත් වී ඔලීව කන්දට ගියේය. 2 ඊළඟ දින උදෑසනින්ම ඔහු නැවතත් දේව-
මාලිගාවට පැමිණියේය. විශාල සෙනඟක් ඔහු වටා එක් රොක් වූ අතර ඔහු ඉඳගෙන ඔවුන්ට
උගන්වන්න පටන්ගත්තේය. 3 එවිට නීතිය පිටපත් කරන්නෝ සහ පරිසිවරු අනාචාරයේ යෙදී
හසු වූ ස්ත්‍රියකව සියලුදෙනා ඉදිරියට ගෙනැවිත්, 4 යේසුස්ට මෙසේ කීවෝය. “ගුරුතුමනි, මේ ස්ත්‍රිය
අනාචාරයේ යෙදිලා අපට හසු වුණා. 5 මෙවැනි ස්ත්‍රීන්ට ගල් ගසා මරා දමන්න කියා මෝසෙස් මගින්
අපට දුන් නීතියේ නියම කර තිබෙනවා. ඒ ගැන ඔබට කියන්න තිබෙන්නේ කුමක්ද?” 6 ඔවුන් එසේ
ඇසුවේ ඔහුගේ යම් වරදක් අල්ලාගෙන ඔහුට විරුද්ධව චෝදනා එල්ල කිරීමේ අදහසිනි. නමුත් යේසුස්
බිමට නැමී, තම අතින් වැලිවල යමක් ලියන්න පටන්ගත්තේය. 7 ඔවුන් ඔහුගෙන් දිගින් දිගටම මේ
ගැන අසද්දී ඔහු නැඟිට, “ඇයට මුල්ම ගල් පහර ගැසිය යුත්තේ ඔබ අතර සිටින අයගෙන් කිසිම පාප-
යක් නොකළ තැනැත්තායි” කියා ඔවුන්ට කීවේය. 8 ඉන්පසු ඔහු නැවතත් බිමට නැමී, පොළොව
මත ලියන්න පටන්ගත්තේය. 9 යේසුස් පැවසූ දේ අසාගෙන සිටි ඔවුහු, වැඩිමහල්ලන්ගෙන් පටන්-
ගෙන එක් එක් කෙනා බැගින් එතැනින් පිටත්ව ගියෝය. අවසානයේදී එතැන ඉතුරු වූයේ ඔහු සහ
ඔවුන් ඉදිරියේ සිටි ස්ත්‍රිය පමණි. 10 යේසුස් කෙළින් වී, “කොහේද ඔවුන් ගියේ? ඔබට දඬුවමක් නියම
කරන්න කිසිම කෙනෙක් සිටියේ නැද්ද” කියා ඇගෙන් ඇසුවේය. 11 “මහත්මයාණෙනි, කිසිවෙක් මට
මොකුත් කළේ නැහැ” කියා ඇය පැවසුවාය. එවිට යේසුස් ඇයට මෙසේ කීවේය. “මමත් ඔබට කිසි දඬු-
වමක් නියම කරන්නේ නැහැ. ඔබට දැන් යන්න පුළුවන්. මෙතැන් පටන් තවත් පව් කරන්න එපා.”

නමුත් මම ආවේ කොහෙන්ද කියාවත්
යන්නේ කොතැනටද කියාවත් ඔබ
දන්නේ නැහැ. **15** ඔබ විනිශ්චය
කරන්නේ මිනිසුන්ගේ මිම්මෙනුයි.[1]
මම කිසිම කෙනෙකුව විනිශ්චය
කරන්නේ නැහැ.[2] **16** මා විනිශ්චය
කළොත් මගේ විනිශ්චය සාධාරණයි.
මන්ද මම එසේ කරන්නේ තනිව
නොව මාව එවූ පියාණන් සමඟයි.[3]
**17** ඔබේම නීතියේ, ‘මිනිසුන් දෙදෙ-
නෙකුගේ සාක්ෂිය අවශ්‍යයි’[4] කියා
සඳහන් වී තිබෙනවා. **18** මට මගේ
සාක්ෂිය තිබෙනවා වගේම මාව එවූ
පියාණන්ද මා ගැන සාක්ෂි දර-
නවා.”[5] **19** එහෙයින් ඔවුහු, “ඔබේ
පියා සිටින්නේ කොහේද” කියා ඔහු-
ගෙන් අසන්න පටන්ගත්හ. යේසුස්
පිළිතුරු දෙමින්, “ඔබ මාවත් මගේ
පියාණන්වත් හඳුනන්නේ නැහැ.[6] ඔබ
මාව හඳුනාගෙන සිටියා නම් මගේ
පියාණන්වත් ඔබ හඳුනාගන්නවා”[7]
කියා පැවසුවේය. **20** දේවමාළිගා-
වේ උගන්වමින් සිටි ඔහු, ඒ දේවල්
පැවසුවේ භාණ්ඩාගාරයේ[8] මුදල් බඳුන්
තබා ඇති ස්ථානයේදීය. ඔහුගේ නිය-
මිත වේලාව[9] ඒ වන තුරු පැමිණ
නොතිබූ නිසා කිසි කෙනෙක් ඔහුව
අල්ලාගත්තේ නැත.[10]

**21** එහෙයින් ඔහු නැවතත් ඔවුන්ට
මෙසේ කීවේය. “මම පිටත් වී යනවා.
ඔබ මාව සෙව්වත්[11] මා යන තැනට
ඔබට එන්න බැහැ. ඔබ තවමත්
පව්කාරයන් වන නිසා ඔබට මිය
යන්න සිදු වෙයි.”[12] **22** එහෙයින්
යුදෙව්වරු, “‘මා යන තැනට ඔබට
එන්න බැහැ’[13] කියා ඔහු පවසන්නේ
ඇයි? ඔහු දිවි නසාගන්නද යන්නේ”
කියා ඇසූහ. **23** ඔහු ඔවුන්ට මෙසේ
කීවේය. “ඔබ ඇවිත් සිටින්නේ පො-
ළොවෙන්. මම ඇවිත් සිටින්නේ ඉහ-
ළින්.[14] ඔබ අයිති මේ ලෝකයටයි.[15]
මම මේ ලෝකයට අයිති නැහැ.[16]
**24** ඔබට මිය යන්න සිදු වන බව මා
ඔබට කිව්වේ ඒ නිසයි.[17] ඔබ තවමත්
පව්කාරයන්. එන්න සිටින තැනැත්තා
මා බව ඔබ විශ්වාස කරන්නේ නැත්-
නම් පව්කාරයන් ලෙස ඔබට මිය
යන්න සිදු වෙනවා.”[1] **25** එහෙයින්
ඔවුහු, “ඔබ කවුද” කියා ඔහුගෙන්
ඇසූහ. යේසුස් ඔවුන්ට මෙසේ කීවේය.
“ඔබ සමඟ මෙසේ කතා කිරීමේ
ඇති පලේ කුමක්ද? **26** ඔබ ගැන
කියන්න බොහෝ දේවල් තිබෙනවා.
මට විනිශ්චය කරන්න සිදු වන
බොහෝ දේවලුත් තිබෙනවා. ඇත්-
තෙන්ම මම ඔබට පවසමින් සිටින්-
නේ මාව එවූ තැනැත්තා මට
පැවසූ දේවලුයි.[2] ඔහු සැබෑ කෙ-
නෙක්.” **27** නමුත් යේසුස් ඔවුන්ට
කතා කරමින් සිටියේ පියාණන්
ගැන බව ඔවුන්ට වැටහුණේ නැත.
**28** එහෙයින් යේසුස් මෙසේ කීවේය.
“ඔබ මනුෂ්‍ය පුත්‍රයාව[3] එල්ලා තබන
දවසේදී[4] එන්න සිටි තැනැත්තා මා
බව තේරුම්ගනියි.[5] ඒ වගේම මම
මගේම කැමැත්තට අනුව කිසිම දෙ-
යක් කළේ නැති බවත්[6] පියාණන්
මට ඉගැන්වූ ආකාරයටම මම ඔබට
දේවල් කියා දුන් බවත්[7] ඔබට වැට-
හෙයි. **29** මාව එවූ තැනැත්තා මා
සමඟ නිරතුරුවම සිටියි. මගේ එකම
ආශාව ඔහුට ප්‍රසන්න දේවල් කිරීමයි.[8]
ඒ නිසා ඔහු මාව අත්හරින්නේ නැහැ.”
**30** ඔහු ඒ දේවල් පැවසූ විට බො-
හෝදෙනෙක් ඔහු කෙරෙහි විශ්වාසය
තැබූහ.[9]

**31** යේසුස් තමාව විශ්වාස කළ
යුදෙව්වන්ට තවදුරටත් මෙසේ පැව-
සුවේය. “ඔබ මා උගන්වන දේවල්
පිළිපදිනවා නම්[10] ඇත්තෙන්ම ඔබ
මගේ ගෝලයෝ වෙනවා. **32** ඔබට
සත්‍යය ගැන අවබෝධයක් ලැබෙයි.[11]
ඒ සත්‍යය ඔබට නිදහස ලබා දෙ-
නවා.”[12] **33** එවිට සෙසු අය මෙසේ
පිළිතුරු දුන්නෝය. “අපි ආබ්‍රහම්-
ගේ දරුවෝ.[13] අපි කවදාවත් කාට-
වත් දාසයන් වුණේ නැහැ.[14]
‘ඔබට නිදහස ලැබෙනවා’ කියා
ඔබ කියන්නේ ඇයි?” **34** යේසුස්
ඔවුන්ට මෙසේ කීවේය. “ඇත්තෙන්ම
මම ඔබට කියන්නේ, පව් කරන
සෑම කෙනෙක්ම පාපයට දාසයෙක්

**8 පරි.**
1 1සාමු 16:7; යොහ 7:24
2 ලූක් 12:14; යොහ 3:17
3 යොහ 14:10; යොහ 16:32
4 ද්වි 17:6; ද්වි 19:15; මතෙ 18:16; 2කොරි 13:1; හෙබ්‍රෙ 10:28
5 යොහ 5:37; 2පේතෘ 1:17; 1යොහ 5:9
6 යොහ 16:3
7 මතෙ 11:27; යොහ 14:7
8 මාක් 12:41
9 යොහ 7:8
10 යොහ 7:30
11 යොහ 7:34; යොහ 13:33
12 යොහ 8:24
13 යොහ 7:35
14 යොහ 3:31; යොහ 16:28; කොලො 3:1
15 යොහ 15:19; යොහ 17:6; 1යොහ 4:5
16 යොහ 18:36
17 එස 18:4

**2 තීරුව**
1 ගීතා 51:5; යෙසා 58:1
2 යොහ 7:28; යොහ 18:20
3 දානි 7:13; මතෙ 26:64
4 ගණන් 21:9; යොහ 3:14; යොහ 12:32; ගලා 3:13
5 මතෙ 27:54
6 යොහ 5:19; යොහ 5:30
7 යොහ 3:11
8 හිතෝ 8:13; යොහ 4:34; යොහ 14:10; හෙබ්‍රෙ 1:9
9 යොහ 7:31; යොහ 10:42; යොහ 11:45
10 යොහ 5:38; යොහ 15:7
11 යොහ 17:17; යොහ 18:37
12 ගීතා 119:45; ලූක් 4:18; රෝම 6:14; රෝම 6:22; හෙබ්‍රෙ 2:15; යාකො 1:25
13 මතෙ 3:9
14 ලෙවී 25:42

වන බවයි.[1] **35** සාමාන්‍යයෙන් දාස-
යෙක් තමා වැඩ කරන නිව-
සෙහි හැමදාම රැඳී සිටින්නේ නැහැ.
නමුත් ඒ නිවසේ පුත්‍රයා එසේ නො-
වෙයි. ඔහු හැමදාටම නිවසෙහි රැඳී
සිටියි.[2] **36** ඒ නිසා පුත්‍රයා ඔබව
නිදහස් කළොත් ඔබට සැබෑ නිදහ-
සක් ලැබෙයි.[3] **37** ඔබ ආබ්‍රහම්ගේ
දරුවන් බව මම දන්නවා. නමුත් මා
උගන්වන දේවල් ඔබ පිළිගන්න අක-
මැති නිසා ඔබ උත්සාහ කරන්නේ
මාව මරා දමන්නයි.[4] **38** මම ඔබට
කියා දෙන්නේ[5] මගේ පියාණන් සමඟ
මා සිටින විටදී මා දුටු දේවලුයි.[6] ඔබ
කරන්නෙත් ඔබේ පියාගෙන් ඇසූ දේ-
වලුයි.” **39** ඔවුහු පිළිතුරු දෙමින්,
“අපේ පියා ආබ්‍රහම්”[7] කියා ඔහුට
කීවෝය. එවිට යේසුස් ඔවුන්ට මෙසේ
කීවේය. “ඔබ ආබ්‍රහම්ගේ දරුවන්
නම්[8] ආබ්‍රහම් ක්‍රියා කළා වගේ ක්‍රියා
කරන්න. **40** ඒ වෙනුවට ඔබ උත්-
සාහ කරන්නේ දෙවිගෙන් ඇසූ සත්‍යය
ගැන ඔබට කියා දුන් මිනිසෙකු වන
මාව[9] මරා දමන්නයි. ආබ්‍රහම් කිසි-
දාක එලෙස ක්‍රියා කළේ නැහැ.[10]
**41** ඔබ කරන්නේ ඔබේ නියම පියා
කරන ක්‍රියායි.” එවිට ඔවුහු, “අපි
අවජාතක දරුවෝ නොවෙයි. අපට
සිටින්නේ එක පියෙක්.[11] ඒ අපේ දෙවි
පියාණෝයි” කියා ඔහුට කීවෝය.

**42** යේසුස් ඔවුන්ට මෙසේ කීවේය.
“ඔබේ පියා දෙවි නම් ඔබ අනිවාර්ය-
යෙන්ම මට ප්‍රේම කරනවා.[12] මන්ද
මම මෙහි ඇවිත් සිටින්නේ දෙවිගෙන්
පැමිණි කෙනෙක් හැටියටයි.[13] මම
ආවේ මගේම කැමැත්ත නිසා නො-
වෙයි. ඒ තැනැත්තා මාව එවූ නිසයි.[14]
**43** මා කියන දේ ඔබට නොතේරෙන්-
නේ මා කියා දෙන දේවල් ඔබ පිළි-
ගන්න අකමැති නිසයි.[15] **44** ඔබේ
පියා යක්ෂයායි.[16] ඔබ කැමති වන්නේ
ඔබේ පියාගේ ආශාවන් ඉටු කිරීම-
ටයි.[17] ඒ තැනැත්තා නොමඟ ගිය දා
සිට මිනී මරුවෙක්.[18] ඔහු වංචාවෙන්
පිරී ඇති නිසා ඔහු සත්‍යයට ඇලී සිටි-
යේ නැහැ. ඔහු තුළ බලපවත්වන්නේ
බොරුවයි. ඒ නිසා ඔහු පවසන්නේ
බොරු පමණයි. මන්ද ඔහු බොරුකා-
රයෙක්. බොරුවේ පියායි.[1] **45** ඒත්
මා සත්‍යය පවසන නිසා ඔබ මාව
විශ්වාස කරන්නේ නැහැ.[2] **46** මා
පව් කර තිබෙන බව ඔප්පු කරන්න
පුළුවන් ඔබෙන් කාටද?[3] මා සත්‍යය
කතා කරනවා නම් ඔබ මාව විශ්-
වාස නොකරන්නේ ඇයි? **47** දෙවිට
පක්ෂව සිටින තැනැත්තා දෙවි පව-
සන දේවලට සවන් දෙයි.[4] ඔබ සවන්
නොදෙන්නේ ඔබ දෙවිට පක්ෂව කට-
යුතු නොකරන නිසයි.”[5]

**48** එවිට යුදෙව්වරු, “ඔබ සමරිතා-
නුවරයෙක්[6] කියාත් ඔබට භූතයෙක්
වැහී තිබෙනවා[7] කියාත් අපි කියන්-
නේ නිකමටද” කියා ඔහුට පැවසූහ.
**49** යේසුස් මෙසේ පිළිතුරු දුන්නේය.
“මට භූතයෙක් වැහිලා නැහැ. මම
මගේ පියාණන්ට ගෞරව කරනවා.[8]
නමුත් ඔබ මට අගෞරව කරනවා.
**50** මම මගේම ගෞරවය සොයන්නේ
නැහැ.[9] නමුත් මට ගෞරවය ලබා
දීමට මහත් ආශාවෙන් කෙනෙක් බලා
සිටිනවා. ඒ ගැන තීරණයක් දෙන්නේ
ඔහුයි.[10] **51** ඇත්තෙන්ම මම ඔබට
කියන්නේ, කෙනෙක් මා පවසන
දේවල් පිළිපදිනවා නම් ඔහු කවදාවත්
මරණය අද්දකින්නේ නැති බවයි.”[11]
**52** යුදෙව්වරු ඔහුට මෙසේ කීවෝය.
“ඔබට භූතයෙකු වැහී සිටින බව
දැන් නම් අපට හොඳටම පැහැදිලියි.[12]
ආබ්‍රහම් විතරක් නොවෙයි,[13] සෑම
අනාගතවක්තෘවරයෙක්ම මිය ගියා.[14]
නමුත් ඔබ කියන්නේ, ‘කෙනෙක්
ඔබ පවසන දේවල් පිළිපදිනවා නම්
ඔහු කවදාවත් මිය යන්නේ නැහැ’[15]
කියායි. **53** දැන් මිය ගොස් සිටින
අපේ පියා වූ ආබ්‍රහම්ට වඩා ඔබ උතුම්
කෙනෙක්ද?[16] සෑම අනාගතවක්තෘව-
රයෙක්ම මිය ගියා.[17] ඔබ කවුරුන්
කියාද ඔබ සිතාගෙන සිටින්නේ?”

**8 පරි.**
**1** හිතෝ 5:22, රෝම 6:6, රෝම 6:16, රෝම 7:14, 2පේත 2:19
**2** උත් 21:10, උත් 25:6, ගලා 4:30
**3** ගලා 5:1
**4** යොහ 7:19
**5** යොහ 14:10
**6** යොහ 5:19
**7** උත් 26:4, මතෙ 3:9, යොහ 8:33
**8** රෝම 2:28, රෝම 9:8, ගලා 3:7, ගලා 3:29
**9** යොහ 8:26
**10** රෝම 4:12
**11** ද්වි 32:6, යෙසා 63:16, යෙසා 64:8, මලා 1:6, මලා 2:10
**12** යොහ 16:27, 1යොහ 5:1
**13** යොහ 13:3
**14** යොහ 3:16, යොහ 5:19, ගලා 4:4
**15** රෝම 8:7
**16** මතෙ 4:1, මතෙ 13:39, 1පේත 5:8, එළි 12:9
**17** උත් 3:15, මතෙ 12:34, ක්‍රියා 13:10
**18** 1යොහ 3:8

**2 තීරුව**
**1** උත් 3:4, 2කොරි 11:3, එළි 12:9
**2** ලූක් 22:67, යොහ 6:64
**3** 2කොරි 5:21, හෙබ්‍රෙ 4:15, හෙබ්‍රෙ 7:26, 1පේත 2:22, 1යොහ 3:5
**4** යොහ 18:37, 1යොහ 4:6
**5** යොහ 10:26
**6** යොහ 4:9
**7** මතෙ 12:24, යොහ 7:20, යොහ 10:20, යොහ 15:18
**8** මලා 1:6
**9** යොහ 5:41, යොහ 7:18
**10** උත් 18:25, ගීතා 26:1, යෙසා 33:22, ක්‍රියා 17:31, රෝම 3:6

**11** යොහ 5:24; යොහ 11:26; 1කොරි 15:54; එළි 20:6; **12** යොහ 10:20; **13** උත් 25:8; **14** සෙක 1:5; ක්‍රියා 2:29; හෙබ්‍රෙ 11:13; **15** මතෙ 16:28; **16** යොහ 4:12; **17** මතෙ 23:29.

**54** යේසුස් මෙසේ පිළිතුරු දුන්නේය.
“මම මටම ගෞරවය ලබාගන්න උත්-
සාහ කරනවා නම් ඒ ගෞරවයෙන්
ඇති වැඩක් නැහැ. මාව ගෞරවයට
පත් කරන්නේ මගේ පියාණන්,[1] ඒ
කියන්නේ ඔබ ඔබේ දෙවි කියා හඳුන්-
වන තැනැත්තායි. **55** ඔබ එසේ
පැවසුවත් ඔබ ඔහුව හඳුනාගෙන
නැහැ.[2] නමුත් මම ඔහුව හොඳින් හඳු-
නාගෙන සිටිනවා.[3] මා ඔහුව හඳුනා-
ගෙන නැහැයි කියා පැවසුවොත් මම
ඔබ වගේ බොරුකාරයෙක් වෙනවා.
නමුත් මම ඔහුව හඳුනාගෙන සිටි-
නවා. ඒ වගේම ඔහු පවසන දේවලුත්
මම පිළිපදිමින් සිටිනවා.[4] **56** ඔබේ
පියා වූ ආබ්‍රහම්, මා කරන දේවල් දැක
බලා ගැනීමට මහත් ආශාවකින් බලා
සිටි කෙනෙක්.[5] ඇත්තටම ඔහු ඒ
දේවල් දැක්කා හා සමානයි. එයින්
ඔහු මොන තරම් ප්‍රීතියක් ලැබුවාද!”[6]
**57** එවිට යුදෙව්වරු, “තවම අවු-
රුදු පනහක්වත් නැති ඔබ ආබ්‍රහම්ව
දැක්කා කියා කියන්නේ කොහො-
මද” කියා ඔහුගෙන් ඇසූහ. **58** යේ-
සුස් ඔවුන්ට මෙසේ පැවසුවේය. “මම
ඇත්තෙන්ම ඔබට කියන්නේ, ආබ්‍රහම්
ජීවත් වෙන්නත් කලින් මම ජීවත්ව
සිටි බවයි.”[7] **59** එවිට ඔවුහු ඔහුට
ගල් ගසන්න ගල් අතට ගත්තෝය.[8]
නමුත් යේසුස් සැඟවී දේවමාලිගා-
වෙන් පිටතට ගියේය.

**9** යේසුස් ගමන් කරමින් සිටියදී,
උපතින්ම අන්ධ වී සිටි මිනිසෙ-
කුව දුටුවේය. **2** එවිට ඔහුගේ ගෝ-
ලයෝ, “ගුරුතුමනි,[9] මේ මිනිසා අන්ධ
වී ඉපදුණේ කවුරු කළ පාපයක්
නිසාද? පව් කළේ[10] ඔහුද නැත්නම්
ඔහුගේ දෙමාපියන්ද”[11] කියා ඔහුගෙන්
ඇසූහ. **3** යේසුස් මෙසේ පිළිතුරු
දුන්නේය. “මේ මිනිසාවත් ඔහුගේ දෙ-
මාපියන්වත් පව් කළේ නැහැ. නමුත්
මේ වගේ දෙයක් සිදු වී තිබෙන්නේ
දෙවිට කළ හැකි දේ ඔහු තුළින්
දැකගැනීමට හැකි වීම සඳහායි.[12]
**4** තවමත් පවතින්නේ දිවා කාලයයි.
ඒ කාලයේදී මාව එවූ තැනැත්තා
පැවරූ වැඩ කොටස අප කළ යුතුයි.[1]
මන්ද කිසිවෙකුට වැඩ කළ නොහැකි
රාත්‍රිය[2] පැමිණෙයි. **5** මා ලෝක-
යේ සිටින තුරු ලෝකයේ ආලෝකය
හැටියට සිටින්නේ මමයි.”[3] **6** ඒ
දේවල් පැවසූ පසු ඔහු බිමට කෙළ
ගසා මැටි පිඩක් සෑදුවේය. ඉන්-
පසු ඔහු එම මැටි පිඩ ඒ මිනිසාගේ
ඇස් මත තබා,[4] **7** “දැන් සිලෝම්
පොකුණට[5] ගොස් ඔබේ ඇස් දෙක
සෝදාගන්න”[6] කියා ඔහුට කීවේය.
(සිලෝම්හි තේරුම, ‘ගලා එන දිය
උල්පත’ යන්නයි.) ඔහු ගොස් ඇස්
දෙක සෝදාගෙන[7] ආපසු පැමිණි විට
ඔහුට පෙනීම ලැබී තිබිණ.[8]

**8** එවිට අසල්වැසියෝද ඔහු
හිඟන්නෙකු බව දැන සිටි අයද, “මේ
අතන ඉඳගෙන හිඟා කෑ මිනිසා නේද”
කියා ඇසූහ.[9] **9** “මේ ඔහු තමයි”
කියා තවත් සමහරු කීවෝය. තවත්
කිහිපදෙනෙක්, “නැහැ, මේ ඔහු නො-
වෙයි. මේ ඔහු වගේ වෙනත් කෙ-
නෙක්” කියා පැවසූහ. එවිට ඒ මිනිසා,
“මම තමයි ඒ මිනිසා” කියා කීවේය.
**10** එවිට ඔවුහු, “ඔබට පෙනීම ලැබු-
ණේ කොහොමද”[10] කියා ඔහුගෙන්
ඇසූහ. **11** ඔහු මෙසේ පිළිතුරු දුන්-
නේය. “යේසුස් කියන මිනිසා ඇවිත්
මැටි පිඩක් සාදා මගේ ඇස්වල
තවරා, ‘සිලෝම් පොකුණට ගොස්[11]
ඔබේ ඇස් දෙක සෝදාගන්න’ කියා
මට කිව්වා. මම ගොස් ඇස් දෙක
සෝදාගත්තා. ඊටපස්සේ මට පෙ-
නීම ලැබුණා.” **12** එවිට ඔවුහු, “ඒ
මිනිසා දැන් කොහේද ඉන්නේ” කියා
ඔහුගෙන් ඇසූහ. “මම දන්නේ නැහැ”
කියා ඔහු පිළිතුරු දුන්නේය.

**13** ඉන්පසු ඔවුහු කලින් අන්ධව
සිටි ඒ මිනිසාව පරිසිවරුන් ළඟට
ගෙන ගියහ. **14** යේසුස් මැටි පිඩක්
සාදා එම මිනිසාට පෙනීම ලබා
දී තිබුණේ[12] සබත් දවසකදීය.[13]
**15** පරිසිවරු ඔහුට පෙනීම ලැබු-
ණේ කෙසේද කියා[14] ඔහුගෙන් ප්‍රශ්න
කළෝය. “ඔහු මගේ ඇස් මත මැටි
පිඩක් තැබුවා. මම ඇස් දෙක සෝදා-

**8 පරි.**
1 යොහ 5:41 යොහ 13:32 ක්‍රියා 3:13
2 යොහ 7:28
3 යොහ 7:29
4 මතෙ 17:5
5 ලූක් 10:24
6 මතෙ 13:17 හෙබ්‍රෙ 11:13 1පේතෘ 1:11
7 හිතෝ 8:22 යොහ 17:5 පිලි 2:6 කොලො 1:17 1යොහ 2:13
8 යොහ 10:31 යොහ 11:8

**9 පරි.**
9 යොහ 1:38
10 ලූක් 13:2
11 නික් 20:5 එස 18:19
12 මතෙ 11:5 යොහ 11:4

**2 තීරුව**
1 යොහ 4:34 යොහ 11:9
2 යෝබ් 10:21 දේශ 9:10
3 යෙසා 49:6 යෙසා 61:1 යොහ 1:5 යොහ 8:12
4 මාක් 8:23
5 2රාජා 20:20 2ලේක 32:30
6 2රාජා 5:10
7 2රාජා 5:14
8 යෙසා 42:7
9 ක්‍රියා 3:10
10 යොහ 9:15
11 යොහ 9:7
12 යොහ 9:6
13 ලූක් 13:14 යොහ 5:9
14 යොහ 9:10

ගත් විට මට පෙනීම ලැබුණා” කියා
ඔහු ඔවුන්ට කීවේය. **16** එවිට පරි-
සිවරුන්ගෙන් සමහරෙක්, “ඔහු සබත්
දවස පවත්වන්නේ නැහැ. එහෙම-
නම් කොහොමද ඔහු දෙවි එවූ මිනි-
සෙක් කියා කියන්නේ”[1] කියා පැවසූහ.
නමුත් තවත් සමහරු, “ඒ මිනිසා පව්-
කාරයෙක් නම් ඔහු මෙවැනි ලකුණු
සිදු කරන්නේ කොහොමද”[2] කියා
ඇසූහ. එහෙයින් ඔවුන් අතරේ මත-
භේදයක් ඇති විය.[3] **17** ඔවුහු නැව-
තත් අන්ධ මිනිසාට මෙසේ පැවසූහ.
“දැන් ඔබ කියන්නේ ඒ මිනිසා ඔබට
පෙනීම ලබා දුන්නා කියලයි. ඉතින්
ඔහු ගැන මොනවාද ඔබට කියන්න
තිබෙන්නේ?” “ඔහු අනාගතවක්තෘව-
රයෙක්”[4] කියා ඒ මිනිසා පිළිතුරු
දුන්නේය.

**18** නමුත් ඒ මිනිසා කලින් අන්ධව
සිටි බව යුදෙව් ආගමික නායකයෝ
විශ්වාස කළේ නැත. එහෙයින් ඔවුහු
ඒ මිනිසාගේ දෙමාපියන්ව කැඳෙව්-
වෝය. **19** එවිට ඔවුහු ඔහුගේ
දෙමාපියන්ගෙන් මෙසේ ඇසුවෝය.
“අන්ධ වී ඉපදුණා කියා ඔබ කියන
ඔබේ පුතා මොහුද? එසේනම් දැන්
ඔහුගේ ඇස් පෙනෙන්නේ කොහො-
මද?” **20** එවිට ඔහුගේ දෙමාපියෝ
මෙසේ පිළිතුරු දුන්නෝය. “මේ අපේ
පුතා තමයි. ඔහු උපතින්ම අන්ධව
සිටියා. **21** නමුත් අපි දන්නේ නැහැ
ඔහුට පෙනීම ලැබුණේ කොහොමද
කියලා. ඔහුට පෙනීම ලබා දුන්නේ
කවුද කියාවත් අපි දන්නේ නැහැ. ඔහු
යමක් කමක් තේරෙන වයසේ ඉන්න
කෙනෙක්. ඒ නිසා ඒ ගැන ඔහුගෙන්ම
අහන්න. ඔහුට පුළුවන්කමක් තිබෙ-
නවා ඒ ගැන කියන්න.” **22** ඔහු-
ගේ දෙමාපියන් එසේ පැවසුවේ ඔවුන්
යුදෙව් ආගමික නායකයන්ට බියෙන්
සිටි නිසාය.[5] මන්ද යමෙකු යේසුස්ව,
ක්‍රිස්තුස් හැටියට පිළිගත්තොත් ඒ
තැනැත්තාව සිනගෝගයෙන් නෙරපා
දැමීමට[6] ඒ වන විට යුදෙව් ආග-
මික නායකයන් තීරණය කර තිබිණ.
**23** ඔහුගේ දෙමාපියන්, “ඔහු යමක්
කමක් තේරෙන වයසේ කෙනෙක්. ඒ
නිසා ඒ ගැන ඔහුගෙන්ම අහන්න”
කියා පැවසුවේ ඒ නිසාය.

**24** එහෙයින් ඔවුහු කලින් අන්-
ධව සිටි මිනිසාව දෙවෙනි වරටත්
කැඳවා, “ඒ මිනිසා පව්කාරයෙක් කියා
අපට ස්ථිරයි. ඒ නිසා දෙවි ඉදිරි-
යේම ඇත්ත කියන්න”[1] කියා ඔහුට
කීවෝය. **25** ඔහු මෙසේ පිළිතුරු
දුන්නේය. “ඔහු පව්කාරයෙක්ද නැද්ද
කියා නම් මම දන්නේ නැහැ. නමුත්
මට එක දෙයක් පැහැදිලිව කියන්න
පුළුවන්. මම කලින් අන්ධ වෙ-
ලයි සිටියේ. නමුත් දැන් මට පේ-
නවා.” **26** එවිට ඔවුහු, “ඔහු ඔබට
මොනවාද කළේ? ඔහු ඔබේ ඇස්ව-
ලට පෙනීම ලබා දුන්නේ කොහො-
මද” කියා ඔහුගෙන් ඇසූහ. **27** ඔහු
ඔවුන්ට පිළිතුරු දෙමින්, “මම ඒ දේ
කලිනුත් ඔබට කිව්වා. ඒත් ඔබ කවු-
රුත් අසාගෙන සිටියේ නැහැ. මට
ආයෙත් ඒ දේ කියන්න කියා පව-
සන්නේ ඇයි? ඔබටත් ඕනේ ඔහුගේ
ගෝලයන් වෙන්නද” කියා ඇසුවේය.
**28** එය ඇසූ ඔවුහු ඔහුට නින්දා
කරමින් මෙසේ කීවෝය. “ඔබ නම් ඒ
මිනිසාගේ ගෝලයෙක්. නමුත් අපි
මෝසෙස්ගේ ගෝලයෝ. **29** දෙවි
මෝසෙස්ට කතා කළා කියා අපි
දන්නවා.[2] නමුත් මේ මිනිසා ගැන-
වත් ඔහු කොහෙන් ආවාද කියාවත්
අපි කිසිම දෙයක් දන්නේ නැහැ.”[3]
**30** එවිට ඒ මිනිසා මෙසේ පිළිතුරු
දුන්නේය. “ඔබ පවසන මේ දේවල්
ගැන හිතද්දී මට පුදුම හිතෙනවා.[4]
ඔහු මට පෙනීම ලබා දුන්නා. ඒ නිසා
ඔහු ආවේ කොහෙන්ද කියා ඔබ දන්-
නේ නැහැ කියා පවසන්නේ කොහො-
මද? **31** දෙවි පව්කාරයන්ට සවන්
නොදෙන බව අපි කවුරුත් දන්නා දෙ-
යක්.[5] දෙවි සවන් දෙන්නේ ඔහුට
ගරුබිය දක්වමින් ඔහුගේ කැමැත්ත
කරන අයටයි.[6] **32** උපතින් අන්ධ
කෙනෙකුට කවුරු හරි කෙනෙක් පෙ-
නීම ලබා දුන්නා කියා අපි කවදාවත්
අහලා නැහැ. **33** ඉතින් මේ මිනිසා

**9 පරි.**
1 නික් 20:10
2 යොහ 3:2
3 ලූක් 12:51, යොහ 7:12, යොහ 7:43, යොහ 10:19
4 ද්වි 18:22, යොහ 4:19
5 හිතෝ 29:25, යොහ 7:13, යොහ 19:38, යොහ 20:19
6 යොහ 12:42, යොහ 16:2

**2 තීරුව**
1 යොෂු 7:19
2 ගීතා 103:7
3 යොහ 8:14
4 යොහ 3:10
5 ගීතා 66:18, හිතෝ 28:9, යෙසා 1:15, එස 8:18, මීකා 3:4, සෙක 7:13
6 ගීතා 34:15, හිතෝ 15:29, ක්‍රියා 10:35

දෙවිගෙන් පැමිණියේ නැත්නම්[1] ඔහුට
මේ වගේ දෙයක් කරන්න පුළුවන්
කොහොමද?” **34** ඔවුහු, “ඔබ ඉප-
දුණේම මහ පව්කාරයෙක් හැටියටයි.[2]
දැන් අපිටත් උගන්වන්න හදනවාද”
කියා පවසමින් ඔහුව සිනගෝගයෙන්
නෙරපා දැමූහ![3]

**35** යුදෙව් ආගමික නායකයන්
ඔහුව නෙරපා දැමූ බව යේසුස්ට
ආරංචි විය. යේසුස්ට ඔහුව මුණ-
ගැසුණු විට, “ඔබට මනුෂ්‍ය පුත්‍රයා[4]
ගැන විශ්වාසයක් තිබෙනවාද” කියා
ඔහුගෙන් ඇසුවේය. **36** ඒ මිනිසා,
“මහත්මයාණෙනි, මම කැමතියි ඔහු
කෙරෙහි විශ්වාසය තබන්න. ඔහු
කවුද කියා මට කියන්න” කියා පිළි-
තුරු දුන්නේය. **37** යේසුස් ඔහුට
මෙසේ කීවේය. “ඇත්තෙන්ම ඔබ
ඔහුව දැක තිබෙනවා. දැන් ඔබ සමඟ
කතා කරන්නෙත් ඒ තැනැත්තායි.”[5]
**38** එවිට ඒ මිනිසා, “ස්වාමීනි, මට
ඔබ කෙරෙහි විශ්වාසයක් තිබෙ-
නවා” කියා පවසමින් යේසුස් ඉදි-
රියේ දණින් වැටුණේය.[6] **39** එවිට
යේසුස් මෙසේ කීවේය. “මා මේ ලෝ-
කයට ආවේ පෙනීම නැති අයට පෙ-
නීම ලබා දෙන්න[7] හා පෙනීම ඇති
අය අන්ධයන් බව පෙන්වන්නයි.[8]
මම ආවේ එම විනිශ්චයට පදනමක්
ලබා දෙන්නයි.”[9] **40** ඔහු සමඟ සිටි
පරිසිවරුන්ගෙන් සමහරදෙනෙකුට ඒ
දේවල් ඇසී, “ඔබ කියන්නේ අපි අන්-
ධයි කියාද”[10] කියා ඔහුගෙන් ඇසූහ.
**41** යේසුස් ඔවුන්ට මෙසේ කීවේය.
“ඔබ අන්ධ වී සිටියා නම් ඔබ තුළ
කිසි පාපයක් නැහැ. නමුත් දැන්,
‘අපට පේනවා’[11] කියා ඔබ පවසන
නිසා ඔබ තුළ පව්කාරකම[12] පවති-
නවා.”

**10** “ඇත්තෙන්ම මම ඔබට
කියන්නේ, බැටළු ගාලට
දොරටුවෙන් ඇතුල් නොවී[13] වෙන
තැනකින් ඇතුල් වන තැනැත්තා
සොරෙක්ද කොල්ලකරුවෙක්ද වන
බවයි.[14] **2** දොරටුවෙන්[15] ඇතුල්
වන්නේ බැටළුවන්ගේ[16] එඬේරායි.[17]
**3** දොරටු පාලකයා[1] ඔහුට දොර
අරියි. බැටළුවන්[2] ඔහුගේ හඬට
කීකරු වෙනවා. ඔහු තම බැටළුවන්ට
නම් කියා හඬගසා උන්ව පිටතට
ගෙන යයි. **4** තමන්ට අයිති සියලු-
දෙනාවම පිටතට ගත් පසු ඔහු උන්ට
ඉදිරියෙන් ගමන් කරයි. බැටළුවන්
ඔහුගේ හඬ හඳුනන නිසා[3] උන් ඔහු
පසුපස යනවා.[4] **5** උන් නාඳුනන
කෙනෙක් පසුපස කොහොමටවත්
යන්නේ නැහැ. නාඳුනන කෙනෙක්-
ගේ හඬ හඳුනන්නේ නැති නිසා[5] උන්
ඔහුගෙන් පලා යනවා.”[6] **6** යේසුස්
එම උදාහරණය ඔවුන්ට පැවසුවත්
ඔහු පැවසූ දේවල අර්ථය ඔවුන්ට
තේරුණේ නැත.[7]

**7** යේසුස් නැවතත් ඔවුන්ට මෙසේ
කීවේය. “ඇත්තෙන්ම මම ඔබට
කියන්නේ, බැටළුවන් ඇතුල් වන
දොරටුව මම[8] බවයි. **8** වෙස් වලා-
ගෙන පැමිණ ඒ මමයි කියා
පෙන්වන්න හදන සියලුදෙනා සො-
රුන් හා කොල්ලකරුවන්.[9] නමුත්
බැටළුවන් ඔවුන්ට කීකරු වන්නේ
නැහැ.[10] **9** දොරටුව මමයි.[11] මා
තුළින් ඇතුල් වන අයට ගැලවීම
ලැබෙයි. ඔවුන් ඇතුළටත් පිටතටත්
යන අතර ඔවුන්ට සරු තණබිම් හමු
වෙයි.[12] **10** සොරා[13] එන්නේ බැට-
ළුවන්ව සොරකම් කරන්නත් උන්ව
මරා විනාශ කරන්නත් පමණයි.[14]
මා ඇවිත් සිටින්නේ ඔවුන්ට ජීව-
නය එනම්, සදහටම ජීවත් වීමේ
අවස්ථාව ලබා දෙන්නයි. **11** උතුම්
එඬේරා මමයි.[15] මම මගේ ජීවි-
තය බැටළුවන් උදෙසා දෙනවා.[16]
**12** කුලියට වැඩ කරන[17] තැනැත්තා
එඬේරෙක් නොවෙයි. බැටළුවන් ඔහුට
අයිති නැහැ. ඒ නිසා ඔහු වෘකයෙක්
එනවා දැක්කොත් බැටළුවන් අත්හැර
පලා යයි. එවිට වෘකයා ඇවිත් උන්ව
අල්ලාගනියි. මුළු රැළම ඒ මේ අත
විසිර යයි.[18] **13** ඒ වගේ දෙයක් සිදු
වන්නේ ඔහු කුලියට වැඩ කරන්-
නෙක්[19] වන නිසයි. ඔහුට බැටළු-
වන් ගැන කිසි තැකීමක් නැහැ.[20]

**9 පරි.**

**1** යොහ 3:2
යොහ 5:36
**2** යොහ 9:2
**3** යොහ 9:22
යොහ 16:2
**4** 1යොහ 5:13
**5** යොහ 4:26
**6** 1සාමු 25:23
මතෙ 8:2
මතෙ 9:18
**7** ලූක් 4:18
යොහ 12:46
**8** යෙසා 29:14
මතෙ 11:25
මතෙ 13:13
යොහ 3:19
ක්‍රියා 28:26
රෝම 1:28
2පේතෘ 1:9
**9** යොහ 12:47
**10** මතෙ 15:14
රෝම 2:19
එළි 3:17
**11** හිතෝ 26:12
2කොරි 4:4
**12** යොහ 15:22

**10 පරි.**

**13** යොහ 10:7
**14** මතෙ 7:15
**15** යොහ 10:9
**16** මාක් 14:27
ලූක් 12:32
**17** මතෙ 26:31
යොහ 10:11

**2 තීරුව**

**1** මලා 3:1
ලූක් 1:17
යොහ 3:28
**2** යොහ 10:27
**3** එළි 3:20
**4** මතෙ 4:20
මතෙ 9:9
එළි 14:4
**5** ගලා 1:8
කොලො 2:8
**6** එළි 2:2
**7** යොහ 16:25
**8** යොහ 14:6
**9** යෙරෙ 23:1
එස 34:2
**10** ක්‍රියා 5:36
**11** එෆී 2:18
**12** යොහ 21:17
**13** යෝබ් 24:14
මතෙ 7:15
**14** ක්‍රියා 20:29
2පේතෘ 2:1
**15** එස 34:23
මතෙ 9:36
**16** 1සාමු 17:35
යෙසා 53:7
හෙබ්‍රෙ 13:20
**17** යෝබ් 7:2
සෙක 11:16
**18** ක්‍රියා 20:29
**19** 1පේතෘ 5:2
**20** මාක් 12:40

**14** උතුම් එඬේරා මමයි. මම මගේ
බැටළුවන්ව හඳුනනවා.[1] මගේ බැට-
ළුවනුත් මාව හඳුනනවා.[2] **15** එය
හරියට පියාණන් මාවත් මම පියා-
ණන්වත් හඳුනාගෙන සිටිනවා[3] හා
සමානයි. මම මගේ ජීවිතය වුණත්
බැටළුවන් උදෙසා දෙනවා.[4]

**16** “මේ ගාලට අයිති නැති[5] වෙ-
නත් බැටළුවන්ද[6] මට සිටිනවා. මම
උන්ටද මඟ පෙන්විය යුතුයි. එවිට
උන් මගේ හඬට කීකරු වෙනවා.[7]
උන් සියලුදෙනාම එක එඬේරෙක්
යටතේ සිටින එක රැළක් වෙයි.[8]
**17** මගේ පියාණන් මට ප්‍රේම කරන්-
නේ[9] මම මගේ ජීවිතය වුණත් දෙන්න
කැමති නිසයි.[10] නමුත් මට එය
නැවත ලැබෙයි. **18** කිසි මිනිසෙක්
මගේ ජීවිතය මගෙන් උදුරාගන්නේ
නැහැ. මම එය දෙන්නේ මගේම
කැමැත්තෙනුයි. එසේ කිරීමට මට
අයිතියක් තිබෙනවා. ඒ වගේම එය
නැවත ලබාගන්නත් මට අයිතියක්
තිබෙනවා.[11] එසේ කිරීමට මට ආඥා
කර තිබෙන්නේ[12] මගේ පියාණන්.”

**19** යේසුස් පැවසූ ඒ දේවල් නිසා
නැවතත් යුදෙව්වන් අතරේ මතභේ-
දයක් ඇති විය.[13] **20** බොහෝදෙ-
නෙක්, “ඔහුට සවන් දෙන්නේ
ඇයි? ඔහුට භූතයෙකු වැහිලා.[14] ඔහු-
ගේ සිහිවිකල් වෙලා” කියා පැවසූහ.
**21** නමුත් තවත් සමහරු, “භූතයෙක්
ආවේශ වී සිටින කෙනෙක් කොහො-
මද මේ වගේ දේවල් උගන්වන්නේ?
භූතයෙකුට පුළුවන්ද අන්ධයන්ට පෙ-
නීම ලබා දෙන්න” කියා කීවෝය.

**22** මේ අතර යෙරුසලමෙහි කැප
කිරීමේ උත්සවය* පවත්වන දවස
උදා විය. එය ශීත කාලය විය.
**23** එදා යේසුස් දේවමාලිගාවේ සල-
මොන්ගේ සක්මන් මළුවෙහි*[15] ඇවිදි-
මින් සිටියේය. **24** එවිට යුදෙව්වරු
ඔහුව වට කරගෙන, “ඇයි ඔබ
කිසිම දෙයක් කෙළින්ම කියන්නේ

**යොහ 10:22*** එනම්, හනුකා යන උත්සවය. **23*** හෝ, “කුලුනුවලින් සැදුණු විවෘත ප්‍රදේශයෙහි.”

නැත්තේ? ඔබ ක්‍රිස්තුස් නම්[1] ඒ
බව කෙළින්ම කියන්න”[2] කියා ඔහුට
කීවෝය. **25** යේසුස් ඔවුන්ට මෙසේ
පිළිතුරු දුන්නේය. “මම මීට කලින්
ඔබට ඒ ගැන කිව්වා. ඒත් ඔබ මාව
විශ්වාස කළේ නැහැ. මගේ පියාණන්-
ගේ නාමයෙන් මා කරන දේවල්ම
මා වෙනුවෙන් සාක්ෂියක් වෙයි.[3]
**26** නමුත් ඔබ මගේ බැටළුවන් නො-
වන නිසා ඔබ මාව විශ්වාස කරන්-
නේ නැහැ.[4] **27** මගේ බැටළුවන්[5]
මගේ හඬට කීකරු වෙනවා. මම
ඔවුන්ව හොඳින් හඳුනනවා. ඔවුන්ද
මා අනුව එනවා.[6] **28** මම ඔවුන්ට
සදාකාල ජීවනය දෙනවා.[7] ඔවුන්
කිසි කලක විනාශ වෙන්නේ නැහැ.[8]
ඒ වගේම කිසිම කෙනෙක් ඇවිත්
මගේ අතින් ඔවුන්ව උදුරාගෙන යන්-
නෙත් නැහැ.[9] **29** මගේ පියාණන්[10]
මට භාර දී තිබෙන මේ බැටළු-
වන් අන් හැම දෙයකටම වඩා මට
වටිනවා.[11] කිසිම කෙනෙකුට ඔවුන්ව
පියාණන්ගේ අතින් උදුරාගන්න
බැහැ.[12] **30** මගේ පියාණන් සහ මම
පූර්ණ එකඟතාවකින් සිටිනවා.”[13]

**31** යුදෙව්වරු නැවතත් ඔහුට
ගසන්න ගල් අතට ගත්හ.[14] **32** යේ-
සුස් ඔවුන්ට මෙසේ කීවේය. “පියා-
ණන් මට කරන්න කියා අණ කළ
යහපත් ක්‍රියා බොහොමයක් මම ඔබ
ඉදිරියේ කළා. දැන් ඔබ මට ගල්
ගසන්න හදන්නේ මා කළ මොන
ක්‍රියාව නිසාද?” **33** “අප ඔබට ගල්
ගසන්නේ ඔබ කළ යහපත් ක්‍රියා
නිසා නොවෙයි. ඔබ දෙවිට අප-
හාස කළ නිසයි.[15] ඔබ මිනිසෙක්.
නමුත් ඔබ උත්සාහ කරන්නේ දෙවි
කෙනෙක් හැටියට පෙනී සිටින්නයි”[16]
කියා යුදෙව්වරු ඔහුට පිළිතුරු දුන්-
නෝය. **34** එවිට යේසුස් ඔවුන්ට
මෙසේ කීවේය. “ඔබේ ශුද්ධ ලියවිලි-
වල*[17] ලියා ඇති දේ ඔබට මතක
නැද්ද? එක් අවස්ථාවකදී දෙවි පැවසු-
වේ, ‘“ඔබ දෙවිවරුය”[18] කියා මම

**යොහ 10:34*** මූ.අ., “නීතියේ.”

**10 පරි.**
**1** යොහ 10:27
**2** 1යොහ 5:20
**3** මතෙ 11:27
**4** මතෙ 20:28
යොහ 15:13
1යොහ 3:16
**5** ලූක් 12:32
යොහ 10:1
**6** ගීතා 45:14
මතෙ 25:33
එළි 7:9
**7** උත් 49:10
**8** එස 34:23
එස 37:24
1පේතෘ 5:4
**9** යොහ 17:23
**10** යෙසා 53:12
පිලි 2:8
හෙබ්‍රෙ 2:9
හෙබ්‍රෙ 12:2
**11** යොහ 2:19
ක්‍රියා 2:24
**12** යොහ 14:31
**13** ලූක් 12:51
යොහ 7:12
යොහ 9:16
**14** මතෙ 11:18
මාක් 3:30
ලූක් 7:33
**15** ක්‍රියා 3:11
ක්‍රියා 5:12

**2 තීරුව**
**1** මතෙ 26:63
**2** මාක් 8:30
**3** යොහ 3:2
යොහ 5:36
යොහ 10:38
යොහ 14:10
ක්‍රියා 2:22
**4** යොහ 6:64
යොහ 8:47
1යොහ 4:6
**5** ලූක් 15:6
යොහ 10:3
**6** මතෙ 4:20
මතෙ 9:9
එළි 14:4
**7** යොහ 5:24
යොහ 17:2
**8** යොහ 6:37
**9** යොහ 18:9
**10** යොහ 14:28
**11** යොහ 17:2
**12** යොහ 17:24
1පේතෘ 1:5
**13** යොහ 10:38
යොහ 17:11
යොහ 17:21
**14** යොහ 8:59
**15** ලෙවී 24:16
මතෙ 9:3
මතෙ 26:65
**16** යොහ 5:18
පිලි 2:6
**17** යොහ 15:25
**18** ගීතා 82:6
1කොරි 8:5

කීවෙමි' කියායි. 35 ශුද්ධ ලියවිල්-
ලේ සඳහන් දෙයක් කොහොමටවත්
ප්‍රතික්ෂේප කරන්න බැහැ.[1] එම අවස්-
ථාවේදී දෙවි, 'දෙවිවරුන්'[2] කියා
හැඳින්වූයේ තමා විසින් හෙළාදැක
තිබූ අයවයි. 36 නමුත් පියාණන්
මාව ශුද්ධ කෙනෙක් හැටියට විශේෂ-
යෙන්ම තෝරාගෙන ලෝකයට එවා
තිබෙනවා. එසේනම් මම දෙවිගේ
පුත්‍රයා කියා පැවසූ නිසා[3] 'ඔබ දෙ-
විට අපහාස කරනවා' කියා ඔබ
මට කියන්නේ ඇයි? 37 මම මගේ
පියාණන්ගේ ක්‍රියා[4] කරන්නේ නැත්-
නම් මාව විශ්වාස කරන්න එපා.
38 නමුත් මා ඒවා කරනවා නම්
ඔබ මාව විශ්වාස නොකළත් අඩුම
තරමින් මා කරන ක්‍රියාවන් විශ්වාස
කරන්න.[5] ඔබ එසේ කළොත් පියා-
ණන් මා සමඟ එකට බැඳී සිටිනවා
වගේම මමත් පියාණන් සමඟ එකට
බැඳී සිටින බව ඔබට වැටහෙයි."[6]
39 එවිට ඔවුහු නැවතත් ඔහුව අල්ලා-
ගන්න උත්සාහ කළෝය.[7] නමුත් යේ-
සුස් ඔවුන් අතින් ගැලවී ගියේය.[8]

40 ඉන්පසු ඔහු යොර්දාන් ගඟෙන්
එගොඩ වී යොහන් මුලින් බව්-
තීස්ම කරමින් සිටි ස්ථානයට[9] ගොස්
එහි නැවතී සිටියේය. 41 බොහෝ-
දෙනෙක් ඔහු ළඟට ඇවිත් මෙසේ
කීවෝය. "යොහන් එක පුදුම දෙයක්-
වත් කළේ නැහැ. නමුත් මේ මිනිසා
ගැන යොහන් පැවසූ සෑම දෙයක්ම
දැන් සැබෑ වෙලා."[10] 42 එහිදී බො-
හෝදෙනෙක් ඔහු කෙරෙහි විශ්වාසය
තැබූහ.[11]

**11** මේ අතර මරියා සහ ඇගේ
සහෝදරිය වූ මාර්තා[12] ජීවත්
වූ බෙතානිය නම් නුවරේ විසූ
ලාසරුස් නම් මිනිසෙක් අසනීප වී
සිටියේය. 2 යේසුස්ට සුවඳ තෙල්[13]
ආලේප කර තම හිසකෙස්වලින් ඔහු-
ගේ පාද පිස දැමූ ස්ත්‍රිය[14] මරියායි.
අසනීපව සිටි ලාසරුස් ඇගේ සහෝ-
දරයා විය. 3 ලාසරුස්ගේ සහෝද-
රියෝ, "ස්වාමීනි, ඔබේ හිතවත්
මිත්‍රයා[15] අසනීපයෙන් සිටිනවා" කියා
යේසුස්ට දන්වා යැවූහ. 4 යේසුස්ට
එම පණිවිඩය ලැබුණු විට, "මේ අසනී-
පයේ අවසාන ප්‍රතිඵලය මරණය නො-
වෙයි. එයින් දෙවිට මහත් ගෞරවයක්
ගෙන දෙයි.[1] එසේම මනුෂ්‍ය පුත්‍රයා-
ටත් ගෞරවය ලැබෙයි" කියා ඔහු
කීවේය.

5 යේසුස් මාර්තාටද ඇගේ සහෝ-
දරියටද ලාසරුස්ටද බොහෝ සෙයින්
ප්‍රේම කළේය. 6 නමුත් ලාසරුස්
අසනීපයෙන් සිටින බව යේසුස්ට
ආරංචි වුණත් ඔහු තමන් සිටි ස්ථා-
නයේ දවස් දෙකක්ම නැවතී සිටි-
යේය. 7 ඉන්පසු, "අපි නැවත
යුදයට යමු" කියා ඔහු ගෝලයන්ට
කීවේය. 8 ගෝලයෝද, "ගුරුතු-
මනි,[2] ඔබ නැවතත් එතැනට යන්න
හදන්නේ ඇයි? ළඟදී නේද යුදෙව්ව-
රුන් ඔබට ගල් ගසන්න හෙව්වේ"[3]
කියා ඔහුගෙන් ඇසූහ. 9 එවිට යේ-
සුස් ඔවුන්ට මෙසේ කීවේය. "දවල්
කාලයට තිබෙන්නේ පැය දොළ-
හක් පමණයි. කෙනෙක් දවල් කාල-
යේ ඇවිද්දොත්[4] ඔහුට මේ ලෝකයේ
ආලෝකය දකින්න ලැබෙයි. ඒ නිසා
කිසිම දෙයක ඔහුගේ පය හැප්පෙන්-
නේ නැහැ. 10 නමුත් කෙනෙක්
රාත්‍රියේදී ඇවිද්දොත්[5] ඔහු යම් දේ-
වල හැප්පෙයි. ඊට හේතුව ඔහුට මඟ
පෙන්වන්න කිසි ආලෝකයක් නැති
වීමයි."

11 ඒ දේවල් පැවසූ පසු ඔහු
ඔවුන්ට මෙසේද කීවේය. "අපේ මිත්‍ර
ලාසරුස් නිදාගෙන සිටියි. මම දැන්
යන්නේ ඔහුව නින්දෙන් අවදි කරන්-
නයි."[6] 12 එවිට ගෝලයෝ, "ස්වා-
මීනි, ඔහු නිදාගෙන සිටිනවා නම් ඔහු
සනීප වී නැඟිටියි" කියා කීවෝය.
13 යේසුස් කතා කරමින් සිටියේ ඔහු-
ගේ මරණය ගැනයි. නමුත් ඔවුන්
සිතුවේ ලාසරුස් නිදාගෙන විවේක
ගන්නා බවයි. 14 එමනිසා යේසුස්
ඔවුන්ට පැහැදිලිවම මෙසේ කීවේය.
"ලාසරුස් ඇත්තටම මැරිලා.[7]
15 ඒ අවස්ථාවේදී මම එතැන නො-
සිටි එක ගැන සතුටු වෙනවා. මන්ද

**10 පරි.**
1 මතෙ 5:17; ලූක් 16:17
2 ගීතා 82:1
3 ලූක් 1:35; යොහ 5:18
4 යොහ 5:36
5 යොහ 14:10
6 යොහ 17:21
7 යොහ 7:30
8 ලූක් 4:30
9 යොහ 1:28
10 යොහ 1:29; යොහ 3:30
11 යොහ 8:30; යොහ 11:45

**11 පරි.**
12 ලූක් 10:38
13 මතෙ 26:7; මාක් 14:3; යොහ 12:3
14 ලූක් 7:38
15 යොහ 11:36

**2 තීරුව**
1 යොහ 9:3
2 යොහ 1:38
3 යොහ 8:59; යොහ 10:31
4 යොහ 9:4
5 යෙසා 5:20; යොහ 12:35; 1යොහ 2:11
6 ගීතා 13:3; මතෙ 9:24; ක්‍රියා 7:60; 1කොරි 15:6; 1කොරි 15:51
7 දේශ 9:5

දැන් මා කරන්න යන දෙයින් ඔබේ
විශ්වාසය ශක්තිමත් වෙයි. අපි දැන්
එහෙට යමු.” **16** එවිට නිවුන් දරුවා
ලෙස හැඳින්වූ තෝමස්, සෙසු ගෝල-
යන්ට මෙසේ කීවේය. “මැරෙන්න සිදු
වුණත් අපි ඔහු සමඟ යමු.”[1]

**17** යේසුස් පැමිණි විට ලාසරුස්ගේ
දේහය සොහොන් ගෙයි තබා දවස්
හතරක් ගත වී තිබුණු බව[2] දැන-
ගත්තේය. **18** බෙතානිය පිහිටා
තිබුණේ යෙරුසලම අසලය. එනම්
කිලෝමීටර් තුනක පමණ දුරකිනි.
**19** තම සහෝදරයාගේ වියෝව
නිසා මාර්තා සහ මරියාව සැනසී-
මට[3] යුදෙව්වරුන් බොහෝදෙනෙක්
ඔවුන්ගේ නිවසට ඇවිත් සිටියෝය.
**20** යේසුස් එන බව මාර්තා දැනගත්
විට ඇය ඔහුව හමු වීමට ගියාය.
නමුත් මරියා[4] දිගටම තම නිවසටම වී
සිටියාය. **21** මාර්තා යේසුස්ව හමු
වී ඔහුට මෙසේ කීවාය. “ස්වාමීනි, ඔබ
මෙහි සිටියා නම් මගේ සහෝදරයා
මැරෙන්නේ නැහැ.[5] **22** ඒ වුණත්
ඔබ දෙවිගෙන් ඉල්ලන ඕනෑම දෙ-
යක්[6] දෙවි ඔබට දෙන බව මම
දන්නවා.” **23** යේසුස් ඇයට මෙසේ
කීවේය. “ඔබේ සහෝදරයා අනිවාර්-
යයෙන්ම නැඟිටියි.”[7] **24** මාර්තාද,
“නැවත නැඟිටීම සිදු වීමට නිය-
මිත කාලයේදී[8] ඔහු නැඟිටින බව
මම දන්නවා” කියා ඔහුට කීවාය.
**25** එවිට යේසුස් ඇයට මෙසේ
කීවේය. “නැවත නැඟිටීමත් ජීවන-
යත් ලැබීමට මඟ මමයි.[9] මා කෙ-
රෙහි විශ්වාසය තබන තැනැත්තා
මිය ගියත් ඔහුට නැවත ජීවනය
ලැබෙයි.[10] **26** ජීවත්ව සිටින ඕනෑම
කෙනෙක් මා කෙරෙහි විශ්වාසය
තැබුවොත් ඔහු කිසි කලක මිය යන්-
නේ නැහැ.[11] ඔබ මේ දේ විශ්වාස කර-
නවාද?” **27** ඇයද, “ස්වාමීනි, මට
එය විශ්වාසයි. ඔබ දෙවිගේ පුත් ක්‍රිස්-
තුස් බවත් ලෝකයට එන්න සිටින
තැනැත්තා[12] ඔබ බවත් මම විශ්-
වාස කරනවා” කියා ඔහුට කීවාය.
**28** ඉන්පසු ඇය ඇගේ සහෝදරිය
වූ මරියා ළඟට ගොස්, “ගුරුතුමා[1]
ඇවිත් සිටිනවා. ඔහු ඔබටත් එන්න
කියනවා” කියා රහසින් පැවසුවාය.
**29** මරියාට මෙය දැනගන්න ලැබුණු
විට ඇය ඉක්මනින්ම නැඟිට ඔහුව
හමු වීමට ගියාය.

**30** යේසුස් ඒ වන තුරු ගමට
ඇතුල් වී සිටියේ නැත. ඔහු ඒ
අවස්ථාවේදී සිටියේ මාර්තා ඔහුව
හමු වූ ස්ථානයෙහිය. **31** මරියාව
සැනසීමට ඇය සමඟ නිවසෙහි සිටි
යුදෙව්වරු,[2] ඇය ඉක්මනින් නැඟිට
නිවසින් පිටත් වී යනවා දුටු විට ඇය
හඬා වැලපෙන්න සොහොන් ගෙය[3]
ළඟට යනවා කියා සිතා ඇය පසුපස
ගියෝය. **32** යේසුස් සිටි ස්ථානයට
පැමිණි මරියා, ඔහු ළඟට ගොස් ඔහු-
ගේ පාමුල වැටී, “ස්වාමීනි, ඔබ මෙහි
සිටියා නම් මගේ සහෝදරයා මැරෙන්-
නේ නැහැ”[4] කියා ඔහුට පැවසුවාය.
**33** ඇයද ඇය සමඟ පැමිණි යුදෙව්ව-
රුන්ද හඬා වැලපෙමින් සිටිනවා දුටු
යේසුස්ට මහත් ශෝකයක් දැනිණ.
ඔහු මහත් වේදනාවකින්,[5] **34** “ඔබ
ඔහුව තැන්පත් කර තිබෙන්නේ කො-
හේද” කියා ඇසුවේය. “ස්වාමීනි,
ඇවිත් බලන්න” කියා ඔවුහු ඔහුට
කීවෝය. **35** එවිට යේසුස්ගේ දෑස්
කඳුළින් පිරී ගියේය.[6] **36** යුදෙව්වරු
එය දැක, “බලන්න, ලාසරුස්ට ඔහු
කොයි තරම් ආදරේද”[7] කියා පැවසූහ.
**37** මේ අතර සමහරදෙනෙක් මෙසේ
කීවෝය. “එදා අර අන්ධ මිනිසාට පෙ-
නීම ලබා දුන්නේ[8] මේ මිනිසා නො-
වෙයිද? ඔහුට බැරි වුණාද මේ මරණය
වළක්වන්න?”

**38** මහත් වේදනාවකින් සිටි යේ-
සුස්, සොහොන් ගෙය ළඟට පැමි-
ණියේය.[9] සොහොන් ගෙය හැටියට
භාවිත කර තිබුණේ ගුහාවක්ය.
ඊට ගලක්ද[10] හේත්තු කර තිබිණ.
**39** යේසුස්, “ගල අහකට ගන්න”[11]
කියා කීවේය. එවිට මිය ගොස් සිටි
තැනැත්තාගේ සහෝදරිය වූ මාර්තා
යේසුස්ට මෙසේ කීවාය. “ස්වාමීනි,
ඔහු දැන් මැරිලා දවස් හතරක්ම ගත

**11 පරි.**

**1** යොහ 11:8
**2** මතෙ 8:28; යොහ 5:28
**3** 1ලේක 7:22; යෝබ් 2:11
**4** ලූක් 10:39
**5** යොහ 11:32
**6** යොහ 9:31
**7** 1තෙස 4:14
**8** යෙසා 26:19; දානි 12:2; යොහ 5:29; ක්‍රියා 24:15; හෙබ්‍රෙ 11:35; එළි 20:12
**9** යොහ 1:4; යොහ 14:6; කොලො 3:4; 1යොහ 1:2; එළි 1:18
**10** යොහ 5:24
**11** යොහ 8:51
**12** මලා 3:1; යොහ 4:42; යොහ 6:14

**2 තීරුව**

**1** මතෙ 23:8; යොහ 13:13
**2** යොහ 11:19
**3** යොහ 11:17
**4** යොහ 11:21
**5** යොහ 13:21
**6** ලූක් 19:41; රෝම 12:15; හෙබ්‍රෙ 4:15
**7** යොහ 11:3
**8** යොහ 9:6
**9** මතෙ 8:28; යොහ 5:28
**10** මතෙ 27:60; මාක් 15:46
**11** මාක් 16:3; යොහ 20:1

වෙලා නිසා හොඳටම ගඳ ගහනවා
ඇති.” **40** යේසුස්ද, “ඔබ විශ්වාස
කළොත් දෙවි කොතරම් ශ්‍රේෂ්ඨද
කියා ඔබ දකින බව[1] මම ඔබට
කිව්වා නේද” කියා ඇයට පැවසු-
වේය. **41** එවිට පිරිසක් ගල අහකට
ගත්තෝය. යේසුස් ස්වර්ගය දෙස
බලා[2] මෙසේ කීවේය. “පියාණෙනි,
ඔබ දැන් මගේ ඉල්ලීම ඉටු කළ නිසා
මම ඔබට ස්තුති කරන්න කැමතියි.[3]
**42** ඔබ මගේ ඉල්ලීම් කිසිදාක ප්‍රතික්-
ෂේප නොකරන බව මට ස්ථිරයි. ඒත්
මම මේ දේ හඬ නඟා කිව්වේ අවට
සිටින මේ සමූහයා තුළ විශ්වාස-
යක් ඇති කරන්නයි.[4] එවිට ඔබ මාව
එවා ඇති බව ඔවුන් විශ්වාස කරයි.”[5]
**43** ඔහු ඒ දේවල් පැවසූ පසු, “ලාස-
රුස්, පිටතට එන්න”[6] කියා මහත්
හඬින් කීවේය. **44** එවිට මිය ගොස්
සිටි ඒ මිනිසා පිටතට ආවේය. ඔහුගේ
අත් පා රෙදි පටිවලින් ඔතා තිබුණු
අතර[7] ඔහුගේ මුහුණද රෙදිකඩකින්
ඔතා තිබිණ. “ඔහුගේ රෙදි පටි ගලවා
ඔහුට යන්න හරින්න” කියා යේසුස්
ඔවුන්ට කීවේය.

**45** මරියාව බලන්න පැමිණි
යුදෙව්වරුන් බොහෝදෙනෙක් යේසුස්
කළ දේ දැක ඔහු කෙරෙහි විශ්වා-
සය තැබූහ.[8] **46** නමුත් සමහරදෙ-
නෙක් එතැනින් පිටත් වී පරිසිවරුන්
ළඟට ගොස් යේසුස් කළ දේවල් ගැන
ඔවුන්ට කීවෝය.[9] **47** එවිට නායක
පූජකයෝ සහ පරිසිවරු මුළු මන්-
ත්‍රණ සභාවම* රැස් කරවා[10] මෙසේ
කීවෝය. “මේ මිනිසා බොහෝ පුදුම-
සහගත දේවල් කරනවා. අපි මො-
නවාද කරන්නේ?[11] **48** ඔහුට මේ
දේවල් කරන්න අපි ඉඩ දුන්නොත්
සියලුදෙනාම ඔහු කෙරෙහි විශ්වාසය
තබන්න පටන්ගනියි.[12] එවිට රෝමව-
රුන් ඇවිත්[13] අපේ දේවමාළිගාවත්[14]
අපේ ජාතියත් අපෙන් උදුරාගනියි.”
**49** නමුත් ඔවුන් අතරේ සිටි එක්
අයෙක් එනම්, ඒ අවුරුද්දේ උත්-
තම පූජකයා ලෙස කටයුතු කළ
කායාෆස්[1] ඔවුන්ට මෙසේ කීවේය.
“ඔබට කිසිම දෙයක් තේරෙන්නේ
නැහැ. **50** මුළු ජාතියම විනාශ වී
යනවා වෙනුවට[2] සියල්ලන් වෙනු-
වෙන් එක මිනිසෙක් මිය යෑම[3] කො-
තරම් හොඳද! ඒ වගේ දෙයක් සිදු වීම
ඔබට වාසිදායක බව ඔබට තේරෙන්-
නේ නැද්ද?” **51** ඇත්තටම මෙය
ඔහුම සිතා පැවසූ දෙයක් නොවෙයි.
ඒ අවුරුද්දේ උත්තම පූජකයා ලෙස
කටයුතු කළ ඔහු පැවසූ දේ එනම්,
යේසුස් ජාතිය උදෙසා මිය යා යුතුයි
යන්න අනාවැකියක් විය. **52** ඇත්-
තටම ඔහුගේ මරණය ඒ ජාතිය
උදෙසා පමණක් නොව විසිරී ගිය
දෙවිගේ දරුවන්ව[4] එකට රැස් කිරී-
මටද[5] මඟ පෑදුවේය. **53** එහෙයින්
එදා පටන් ඔවුහු ඔහුව මරා දැමීමට
කුමන්ත්‍රණය කළෝය.[6]

**54** යේසුස් තවදුරටත් යුදෙව්ව-
රුන් අතරේ[7] ප්‍රසිද්ධියේ පෙනී සිටි-
යේ නැත.[8] නමුත් ඔහු එතැනින්
පිටත් වී පාළුකරය අසල පිහිටි
ප්‍රදේශයෙහි එෆ්‍රායිම් නම් නුවරකට[9]
ගොස් ගෝලයන් සමඟ එහි නැවතී
සිටියේය. **55** මේ අතර යුදෙව්ව-
රුන්ගේ පාස්කු උත්සවයද[10] ළඟා වෙ-
මින් තිබිණ. පිටිසර ප්‍රදේශවල සිටි
බොහෝදෙනෙක් පාස්කුවට කලින්
යෙරුසලමට එක් රොක් වෙමින්
සිටියෝය. ඔවුන් කලින්ම පැමිණී-
යේ නීතියේ සඳහන්ව තිබූ ආකා-
රයට තමන්වම පවිත්‍ර කරගැනීම
සඳහාය.[11] **56** එසේ පැමිණි ඔවුහු
යේසුස්ව සොයන්න පටන්ගත්හ. දේ-
වමාළිගාව අවට සිටි ඔවුහු, “මො-
කක්ද ඔබ හිතන්නේ? ඔහු මෙවර
උත්සවයට නැවිත් සිටියිද” කියා එකි-
නෙකාගෙන් ඇසූහ. **57** මේ අතර
යේසුස්ව අත්අඩංගුවට ගැනීම සඳහා
ඔහු සිටින තැන යමෙකු දැනගත්-
තොත් එය හෙළි කළ යුතු බවට
නායක පූජකයන් හා පරිසිවරුන් අණ
දී තිබිණ.

**11 පරි.**
**1** යොහ 9:3
**2** මතෙ 14:19 මාක් 7:34
**3** 1යොහ 5:14
**4** යොහ 12:30
**5** යොහ 6:29 යොහ 17:8
**6** ලූක් 7:14
**7** මතෙ 27:59 යොහ 20:7
**8** යොහ 2:23 යොහ 10:42 යොහ 12:11
**9** ලූක් 16:31
**10** ගීතා 2:2
**11** ගණන් 14:11 යොහ 7:31 යොහ 12:37 ක්‍රියා 4:16
**12** යොහ 12:19
**13** දානි 9:26 ක්‍රියා 28:17
**14** මතෙ 24:15 ක්‍රියා 6:13

**2 තීරුව**
**1** මතෙ 26:3 ලූක් 3:2 ක්‍රියා 4:6
**2** ලූක් 2:34
**3** යොහ 18:14
**4** යෙසා 49:6 යාකො 1:1 1යොහ 2:2
**5** යොහ 17:21 ගලා 3:28 එෆී 2:14 එෆී 3:6
**6** මතෙ 26:4 මතෙ 26:59 යොහ 5:18
**7** යොහ 7:1
**8** මතෙ 10:23 ක්‍රියා 12:17
**9** 2සාමු 13:23 2ලේක 13:19
**10** නික් 12:14 ද්වි 16:1 යොහ 2:13 යොහ 5:1 යොහ 6:4 යොහ 12:1
**11** 2ලේක 30:17

**යොහ 11:47*** එනම්, සැන්හෙඩ්‍රිනය.

**12** පාස්කු උත්සවයට දවස් හය-
කට කලින් යේසුස් බෙතා-
නියට පැමිණියේය.[1] යේසුස් විසින්
මරණයෙන් නැඟිටුවනු ලැබූ ලාස-
රුස්[2] පදිංචිව සිටියේ එහිය.
**2** එහෙයින් යම් පිරිසක් ඔහු වෙ-
නුවෙන් සන්ධ්‍යා භෝජනයක් පිළි-
යෙල කළෝය. සියලුදෙනාට සංග්‍රහ
කරමින්[3] සිටියේ මාර්තාය.[4] යේ-
සුස් සමඟ කෑමට ඉඳගෙන සිටි අය
අතර ලාසරුස්ද සිටියේය.[5] **3** එවිට
මරියා ඉතා මිල අධික, පිරිසිදු,
සුවඳැති ජටාමාංස තෙල්[6] රාත්තල-
ලක්* ගෙන, එය යේසුස්ගේ පාද-
වල ආලේප කර ඇගේ හිසකෙස්වලින්
ඔහුගේ පාද පිස දැමුවාය.[7] ඒ තෙල්-
වල සුවඳ මුළු නිවසම පුරාම විහිදී
ගියේය. **4** නමුත් ඔහුගේ එක් ගෝ-
ලයෙක් එනම්, ඔහුව පාවා දීමට සිටි
යූදස් ඉස්කාරියොත්[8] මෙසේ කීවේය.
**5** “මේ සුවඳ තෙල[9] ඩිනාරි තුන්-
සියයකට විකුණා දිළිඳුන්ට දෙන්න
තිබුණා[10] නේද? ඇයි එහෙම කළේ
නැත්තේ?” **6** ඔහු ඒ දේ පැවසු-
වේ දිළිඳුන් ගැන සැලකිල්ලක් දැක්වූ
නිසා නොව ඔහු සොරෙකු වූ නිසාය.[11]
මුදල් පෙට්ටිය භාරව සිටි ඔහු,[12] එහි
දැමූ මුදල් තමාගේ ප්‍රයෝජනය සඳහා
ගැනීමට පුරුදු වී සිටියේය. **7** එවිට
යේසුස් මෙසේ කීවේය. “ඇයට ඉන්න
දෙන්න. මාව තැන්පත් කරන දවස
ළඟ නිසා මේ දේ කරන්න ඇයට ඉඩ-
හරින්න.[13] **8** දිළිඳු අය ඔබ සමඟ
හැමදාම සිටිනවා.[14] නමුත් මම ඔබ
සමඟ හැමදාම ඉන්නේ නැහැ.”

**9** යුදෙව්වරුන්ගෙන් විශාල සමූහ-
යක් යේසුස් එහි සිටින බව දැනගෙන
එතැනට එක් රොක් වූහ. ඔවුන් එහි
පැමිණියේ ඔහුව හමු වීමට පමණක්
නොව ඔහු විසින් මරණයෙන් නැඟි-
ටුවා තිබූ ලාසරුස්වත් දැකගැනීම-
ටය.[15] **10** ඒ ගැන ආරංචි වූ නායක
පූජකයෝ ලාසරුස්වත් මරා දැමීමට
කුමන්ත්‍රණ කළෝය.[16] **11** ඔවුන්
එසේ කළේ ලාසරුස්ව දැකීමට එතැ-
නට ගිය යුදෙව්වරුන් බොහෝදෙ-
නෙකු යේසුස් කෙරෙහි විශ්වාසය
තැබූ නිසාය.[1]

**12** පසුවදා උත්සවයට පැමිණ
සිටි විශාල සමූහයාට යේසුස් යෙ-
රුසලමට එන බව ආරංචි විය.
**13** එහෙයින් ඔවුහු තාල ගස්වල අතු[2]
කපා ඒවාත් රැගෙන ඔහුව හමු වීමට
ගියෝය. එවිට ඔවුහු, “ඔහුට ආරක්-
ෂාව ලැබේවා![3] යෙහෝවා දෙවිගේ
නාමයෙන්[4] එන තැනැත්තාට එනම්,
ඊශ්‍රායෙලයෙහි රජාණන්ට[5] ආශීර්වාද
වේවා” කියා කෑගසන්න පටන්ගත්හ.[6]
**14** යේසුස්ට ගමන් කිරීම සඳහා බූරු
නාම්බෙකුව[7] සොයාගත් විට ඔහු ඌ
පිට හිඳගත්තේය. එය එසේ සිදු
වූයේ මෙසේ ලියා තිබෙන දේ ඉටු
වීමක් ලෙසය. **15** “සියොන් දියණි-
යෙනි, බිය නොවන්න. බලන්න! ඔබේ
රජ බූරු නාම්බෙකු පිට[8] නැඟී එන්-
නේය.”[9] **16** ඔහුගේ ගෝලයන් මේ
දේවල් මුලින් සැලකිල්ලට නොගත්[10]
නමුත් යේසුස් තේජසට පත් වූ විට[11]
මේ දේවල් ලියා තිබුණේ ඔහු ගැන
බවත් ජනතාව මේ දේවල් ඔහුට කළ
බවත් ඔවුන්ට මතක් විය.[12]

**17** මේ අතර යේසුස් ලාසරුස්ව[13]
මරණයෙන් නැඟිටුවා සොහොන් ගෙ-
යින් පිටතට කැඳවූ අවස්ථාවේදී ඔහු
සමඟ සිටි සමූහයා තමන් දුටු දේ
ගැන පවසමින් සිටියහ.[14] **18** එහෙ-
යින් මේ ආශ්චර්යය[15] යේසුස් කළ බව
දැනගත් සෙනඟ, ඔහුව සොයාගෙන
ගියෝය. **19** එය දුටු පරිසිවරු,[16]
“බලන්න, අපේ හැම සැලසුමක්ම
අසාර්ථකයි! මුළු ලෝකයම ඔහු පසු-
පස යනවා”[17] කියා ඔවුනොවුන් අත-
රේ කතා කරගත්තෝය.

**20** මේ අතර පාස්කු උත්සවය
සැමරීමට පැමිණි අය අතර ග්‍රීක-
වරුන් කිහිපදෙනෙක්ද[18] සිටියෝය.
**21** එම පිරිස ගලීලයේ බෙත්සයිදා
නුවරේ වැසියෙකු වූ පිලිප් ළඟට
ඇවිත්,[19] “මහත්මයාණෙනි, අපි කැම-
තියි යේසුස්ව හමු වෙන්න”[20] කියා

**12 පරි.**
1 මාක් 11:1
2 යොහ 11:1
යොහ 11:43
3 මතෙ 27:55
මාක් 15:41
4 ලූක් 10:40
5 මතෙ 26:6
මාක් 14:3
6 සල 1:12
මතෙ 26:7
7 ලූක් 7:38
යොහ 11:2
8 මතෙ 26:47
මාක් 14:10
ලූක් 22:48
යොහ 13:29
ක්‍රියා 1:16
9 මතෙ 26:8
මාක් 14:4
ලූක් 7:46
10 මතෙ 19:21
මාක් 14:5
11 නික් 20:15
හිතෝ 26:25
12 යොහ 13:29
13 මතෙ 26:12
මාක් 14:8
යොහ 19:40
14 ද්වි 15:11
මතෙ 26:11
මාක් 14:7
15 යොහ 11:43
16 හිතෝ 1:16
ලූක් 16:31

**2 තීරුව**
1 යොහ 7:31
යොහ 11:45
2 මතෙ 21:8
මාක් 11:8
එළි 7:9
3 ගීතා 118:25
4 ගීතා 118:26
5 යොහ 1:49
6 මතෙ 21:9
මාක් 11:9
7 1රාජා 1:33
මතෙ 21:7
මාක් 11:7
ලූක් 19:35
8 සෙක 9:9
9 1රාජා 1:34
10 ලූක් 18:34
11 යොහ 7:39
12 ලූක් 24:45
යොහ 14:26
13 යොහ 11:1
යොහ 11:43
14 මතෙ 21:15
ලූක් 19:37
15 යොහ 4:54
16 ලූක් 19:39
17 යොහ 3:26
යොහ 11:48
ක්‍රියා 5:28
18 ක්‍රියා 17:4
19 යොහ 1:44
20 ලූක් 19:3
ලූක් 23:8

යොහ **12:3*** ග්‍රෑම් 327ක් පමණ.

පැවසූහ. **22** පිලිප් ඒ ගැන අන්ද්‍රෑට
කීවේය. එහෙයින් අන්ද්‍රෑ සහ පිලිප්
ගොස් යේසුස්ට ඒ ගැන පැවසුවෝය.
**23** යේසුස් ඔවුන්ට මෙසේ කීවේය.
“මනුෂ්‍ය පුත්‍රයාව තේජසට පත්
කරන්න නියමිත වේලාව දැන්
ඇවිත් තිබෙනවා.[1] **24** ඇත්තෙන්ම
මම ඔබට කියන මේ දේට සවන්
දෙන්න. තිරිඟු බීජයක් පැළ වෙන්න
නම් එය පසට දමන්න අවශ්‍යයි.
එවිට බීජය මැරී[2] එයින් පැළයක් හට-
ගෙන මහත් පලදාවක් ලැබෙයි. ඒ
දේ සිදු වන්නේ නැත්නම් තිබෙන්-
නේ බීජයක් පමණයි. **25** තමාගේ
ජීවිතයට තිබෙන ආශාව නිසා එය
රැකගන්න උත්සාහ කරන අයට එය
නැති වෙයි. නමුත් මේ ලෝකයේ
තමන් ගත කරන ජීවිතයට තිබෙන
ආශාව අත්හරින්න වුණත් සූදානම්
අයට[3] තම ජීවිතය රැකගත හැකියි.
ඔවුන්ට සදාකාල ජීවනය ලැබෙයි.[4]
**26** කෙනෙක් මට සේවය කරන්න
කැමති නම් ඔහු මාව අනුගමනය කළ
යුතුයි. මා සිටින තැන මගේ සේවක-
යාත් සිටියි.[5] කෙනෙක් මට සේවය
කරනවා නම් මගේ පියාණන්ගෙන්
ඔහුට ගෞරවය ලැබෙයි.[6] **27** මගේ
සිත දැන් කැලඹිලා.[7] ඉතින් මම
මොනවා කියන්නද? පියාණෙනි, මට
සිදු වෙන්න යන දෙයින්* මාව ගල-
වන්න[8] කියා කියන්නද? ඒත් මා ඒ
දෙයට මුහුණ දිය යුතුමයි. **28** පියා-
ණෙනි, ඔබගේ නාමය ගෞරවයට
පත් කරන්න!” එවිට ස්වර්ගයෙන්
හඬක්[9] ඇවිත්, “මම එය ගෞරවයට
පත් කළෙමි. නැවතත් එය ගෞරව-
යට පත් කරන්නෙමි”[10] කියා කීවේය.
**29** ඒ අවට සිටි සමූහයාට ඒ
හඬ ඇසී අහස ගිගුරුම් දුන්නා
කියා ඔවුහු පැවසූහ. තවත් සමහ-
රුන් පැවසුවේ, “දේවදූතයෙක් ඔහුට
කතා කළා” කියාය. **30** එවිට යේ-
සුස් ඔවුන්ට මෙසේ කීවේය. “මේ හඬ
ආවේ මා වෙනුවෙන් නොව ඔබ සියලු-

**12 පරි.**
1 යොහ 13:32
යොහ 17:1
2 මතෙ 16:21
රෝම 14:9
1කොරි 15:36
3 මතෙ 10:28
එළි 12:11
4 මතෙ 16:25
මාක් 8:35
ලූක් 9:24
5 යොහ 14:3
යොහ 17:24
1තෙස 4:17
6 1සාමු 2:30
හිතෝ 27:18
7 ගීතා 6:3
මතෙ 26:38
මාක් 14:34
8 ලූක් 12:50
ලූක් 22:42
හෙබ්‍රෙ 5:7
9 මතෙ 3:17
මතෙ 17:5
මාක් 1:11
මාක් 9:7
ලූක් 3:22
ලූක් 9:35
2පේතෘ 1:17
10 යොහ 17:1

**2 තීරුව**
1 යොහ 11:42
2 යොහ 14:30
යොහ 16:11
ක්‍රියා 26:18
2කොරි 4:4
එෆී 2:2
1යොහ 5:19
3 ලූක් 10:18
එළි 12:9
4 යොහ 8:28
5 රෝම 5:18
හෙබ්‍රෙ 2:9
6 යොහ 18:32
ක්‍රියා 5:30
7 ගීතා 89:36
ගීතා 110:4
යෙසා 9:7
8 යොහ 3:14
යොහ 20:9
9 දානි 7:13
10 යෙරෙ 13:16
11 යොහ 11:10
12 එෆී 5:8
13 රෝම 10:16
14 යෙසා 53:1
15 නික් 4:21

දෙනා වෙනුවෙනුයි.[1] **31** මේ ලෝ-
කය දැන් විනිශ්චයට ලක් වෙනවා.
මේ ලෝකයේ පාලකයාව[2] නෙරපා
දමනු ලබනවා.[3] **32** නමුත් මාව
එල්ලා තබන විට[4] සියලු ආකාර-
යේ මිනිසුන්ව මා වෙතට ඇදගන්න
මට හැකි වෙයි.”[5] **33** යේසුස් ඇත්-
තටම ඒ දේ පැවසුවේ ඔහු කවර අන්-
දමේ මරණයක් අද්දකිනවාද කියා
පැහැදිලි කිරීමටය.[6] **34** එවිට සමූ-
හයා ඔහුගෙන් මෙසේ විමසුවෝය.
“ශුද්ධ ලියවිල්ලෙන් අපි අසා තිබෙන්-
නේ ක්‍රිස්තුස් සදහටම ජීවත් වන
බවයි.[7] එසේනම් මනුෂ්‍ය පුත්‍රයාව
එල්ලා තැබිය යුතුයි[8] කියා ඔබ
කියන්නේ ඇයි? මේ මනුෂ්‍ය පුත්‍රයා
කවුද?”[9] **35** යේසුස් ඔවුන්ට පිළි-
තුරු දුන්නේ මෙසේය. “ඔබ අත-
රේ ආලෝකය පවතින්නේ තව ටික
කාලයකට පමණයි. ඒ නිසා අන්ධකා-
රයෙන්[10] පරාජය නොවෙන්න නම්
ඔබට ආලෝකය තිබෙද්දී ඇවිදින්න.
අන්ධකාරයේ ඇවිදින තැනැත්තා
තමා යන්නේ කොහේද කියා
දන්නේ නැහැ.[11] **36** ආලෝකය
තිබෙන තාක් කල් ඒ ආලෝකය කෙ-
රෙහි විශ්වාසය තබන්න. එතකොට
ඔබට පුළුවන් වෙයි ආලෝකයේ දරු-
වන් වෙන්න.”[12]
යේසුස් මේ දේවල් පවසා එතැනින්
පිටත් වී ඔවුන්ගෙන් සැඟවුණේය.
**37** මන්ද ඔහු ඔවුන් ඉදිරියෙහි කො-
තරම් ලකුණු සිදු කළත් ඔවුහු ඔහු
කෙරෙහි විශ්වාසය තැබුවේ නැත.
**38** එසේ සිදු වූයේ අනාගතවක්තෘ
යෙසායා පැවසූ වචන ඉටු වීම සඳ-
හාය. එනම්, “යෙහෝවා දෙවියනි, අප
ඇසූ දේ කෙරෙහි විශ්වාසය තැබු-
වේ කවුද?[13] යෙහෝවා දෙවිගේ මහත්
බලය දකින්න සැලැස්වූවේ කාටද?”[14]
**39** ඔවුන්ගේ අවිශ්වාසයට හේතුව
යෙසායා නැවතත් පැහැදිලි කළේ
මෙලෙසය. **40** “ඔහු ඔවුන්ගේ ඇස්
අන්ධ කර තිබේ. ඔහු ඔවුන්ගේ
සිත් දැඩි කර තිබේ.[15] එසේ කළේ
ඔවුන් තම ඇස්වලින් නොදැක, තම

---

යොහ **12:27*** මූ.අ., “මේ පැයෙන්.”

සිත්වලින් තේරුම් නොගන්නා පිණි-
සය. ඒ නිසා සුවය ලැබීමටවත් ඔවුහු
මා වෙතට හැරී එන්නේ නැත.”[1]
41 යෙසායා ඒ දේවල් පැවසුවේ ක්‍රිස්-
තුස් ගැනය. මන්ද ඔහු ක්‍රිස්තුස්ගේ
තේජස දුටුවේය.[2] 42 ඇත්තෙන්ම
යුදෙව්වරුන්ගේ නායකයන් බොහෝ-
දෙනෙක් යේසුස් කෙරෙහි විශ්වාසය
තැබූහ.[3] නමුත් ඔවුන් ඒ ගැන ප්‍රසිද්ධි-
යේ කිසිවක් නොපැවසුවේ, පරිසිව-
රුන් ඔවුන්ව සිනගෝගයෙන් නෙරපා
දමයි කියා බිය වූ නිසාය.[4] 43 ඔවුන්
ඇත්තටම ප්‍රිය කළේ දෙවිගේ අනුමැ-
තිය ලබනවාට වඩා මිනිසුන්ගේ ප්‍රශං-
සාව ලැබීමටය.[5]

44 යේසුස් හඬ නඟා මෙසේ
කීවේය. “මා කෙරෙහි විශ්වාසය
තබන තැනැත්තා මා කෙරෙහි පම-
ණක් නොව මාව එවූ තැනැත්තා
කෙරෙහිද විශ්වාසය තබයි.[6]
45 එමෙන්ම මාව දකින තැනැත්තා
මාව එවූ තැනැත්තාවත් දකියි.[7]
46 මම ආලෝකයක් හැටියට ලෝ-
කයට ආවේ[8] මා කෙරෙහි විශ්වාසය
තබන අය තවදුරටත් අන්ධකාරයේ
නොසිටීම සඳහායි.[9] 47 කෙනෙක්
මා පවසන දේවල් අසා ඒවා පිළිප-
දින්නේ නැත්නම් මම ඔහුව විනිශ්-
චය කරන්නේ නැහැ. මන්ද මම
ආවේ ලෝකය විනිශ්චය කරන්න
නොව[10] එයට ගැලවීම ලබා දෙන්-
නයි.[11] 48 නමුත් මාව පිළි නො-
ගෙන මා පවසන දේවල් ප්‍රතික්ෂේප
කරන තැනැත්තාව විනිශ්චය කිරී-
මට කෙනෙක් සිටිනවා. එයට පදනම
සපයන්නේ මා පැවසූ දේවල්මයි.[12]
විනිශ්චය සිදු වන කාලයේදී මාව
පිළි නොගන්නා තැනැත්තාව එම පද-
නම මත විනිශ්චයට ලක් කරයි.
49 මන්ද මා කතා කරන විට මම ඉදි-
රිපත් කරන්නේ මගේ අදහස් නො-
වෙයි. මන්ද මාව එවූ පියාණන් මා
කිව යුතු දේ මට පැහැදිලිවම අණ
කර තිබෙනවා.[13] 50 ඔහු අණ කළ
දේවල් සදාකාල ජීවනයට මඟ පාදන
බවත් මම දන්නවා.[14] එමනිසා මම
පවසන දේවල් පියාණන් මට කියා දුන්
ආකාරයටම මම පවසනවා.”[1]

13 තමා මෙලොවින් සමුගෙන
පියාණන් ළඟට යන්න[2] නිය-
මිත කාලය පැමිණ[3] ඇති බව යේසුස්
පාස්කු උත්සවයට කලින්ම දැන සිටි-
යේය. ලෝකයේ සිටි තමාට හිත-
වත් වූ අයට ඔහු බොහෝ සෙයින්
ප්‍රේම කළේය.[4] ඇත්තෙන්ම ඔහු අව-
සානය දක්වා ඔවුන්ට මහත් සේ
ප්‍රේම කළේය. 2 මේ අතරතුරේදී
යේසුස්ව පාවා දීමේ අදහස[5] යක්-
ෂයා මේ වන විටත් සීමොන්ගේ
පුත් යූදස් ඉස්කාරියොත්ගේ[6] සිතට
ඇතුල් කර තිබිණ. ඔවුන් සන්ධ්‍යා
භෝජනයට සහභාගි වෙමින් සිටි-
යදී, 3 පියාණන් තමන්ට සියල්ල
භාර දී ඇති බවත්[7] තමා දෙවිගෙන්
පැමිණි බවත් තමා නැවතත් දෙවි
ළඟට යන බවත්[8] දැන සිටි යේ-
සුස්, 4 මේසයෙන් නැඟිට, තම පිට
වස්ත්‍රය ගලවා තබා තුවායක් ගෙන
එය තම ඉණ වටා බැඳගත්තේය.[9]
5 ඉන්පසු ඔහු බේසමකට වතුර වත්
කොට ගෝලයන්ගේ පාද සෝදන්-
නත්[10] තම ඉණ වටා බැඳගෙන
සිටි තුවායෙන් ඔවුන්ගේ පාද පිස
දමන්නත් පටන්ගත්තේය. 6 ඔහු
සීමොන් පේතෘස් ළඟටද ආවේය.
“ස්වාමීනි, ඔබ මගේ පාදත් සෝදන්න
ආවාද”[11] කියා පේතෘස් ඔහුගෙන් ඇසු-
වේය. 7 යේසුස් ඔහුට පිළිතුරු දුන්-
නේ මෙසේය. “මම කරන දේ ඔබට
දැන් තේරෙන්නේ නැහැ. නමුත් පසුව
ඔබට එය තේරෙයි.”[12] 8 එවිට පේ-
තෘස්, “ඔබට කවදාවත් මගේ පාද
සෝදන්න මම ඉඩ දෙන්නේ නැහැ”
කියා ඔහුට කීවේය. යේසුස් ඔහුට පිළි-
තුරු දෙමින්, “මා ඔබේ පාද සේදුවේ
නැත්නම්[13] ඔබ හා මා අතර කිසි සම්-
බන්ධයක් නැහැ” කියා පැවසුවේය.
9 එවිට සීමොන් පේතෘස්, “ස්වාමීනි,
මගේ පාද විතරක් නොවෙයි, මගේ
අත් දෙකත් හිසත් සෝදන්න” කියා
කීවේය. 10 යේසුස් ඔහුට මෙසේ
කීවේය. “කෙනෙක් වතුරෙන් නාගෙන

**12 පරි.**

1 යෙසා 6:10
මතෙ 13:14
මාක් 4:12
ක්‍රියා 28:27
2 යෙසා 6:1
3 යොහ 19:38
4 හිතෝ 29:25
යොහ 7:13
යොහ 9:22
යොහ 16:2
5 යොහ 5:44
රෝම 2:29
6 මතෙ 10:40
මාක් 9:37
1පේතෘ 1:21
7 යොහ 14:9
8 යොහ 3:19
යොහ 8:12
යොහ 9:5
9 යොහ 12:35
10 යොහ 3:17
යොහ 5:45
යොහ 8:15
11 යොහ 3:16
12 ද්වි 18:19
13 ද්වි 18:18
යොහ 8:38
යොහ 14:10
14 යොහ 6:40
යොහ 17:2

**2 තීරුව**

1 යොහ 3:34

**13 පරි.**

2 යොහ 16:28
යොහ 17:11
3 මතෙ 26:2
යොහ 12:23
යොහ 17:1
4 යොහ 15:9
යොහ 17:9
ගලා 2:20
එෆී 5:2
1යොහ 3:16
5 මතෙ 26:16
මතෙ 26:24
මාක් 14:11
6 මතෙ 15:19
ලූක් 22:3
යොහ 13:27
ක්‍රියා 1:25
7 මතෙ 11:27
ක්‍රියා 2:36
1කොරි 15:27
හෙබ්‍රෙ 2:8
8 යොහ 16:28
9 පිලි 2:7
10 උත් 18:4
ලූක් 7:44
11 ලූක් 9:48
1පේතෘ 5:3
12 යොහ 13:12
13 ගීතා 51:2
1කොරි 6:11
එෆී 5:26
තීත 3:5
හෙබ්‍රෙ 10:22

සිටිනවා නම්[1] ඔහුගේ මුළු ශරීරයම
පවිත්‍රයි. ඒ නිසා ඔහුගේ පාද සේදුවත්
ඇති. ඔබ නම් පවිත්‍රයි. නමුත් සෑම
කෙනෙක්ම පවිත්‍ර නැහැ.” **11** “සෑම
කෙනෙක්ම පවිත්‍ර නැහැ” කියා ඔහු
පැවසුවේ ඒ වන විට තමාව පාවා
දෙන තැනැත්තා කවුද කියා ඔහු දැන
සිටි නිසාය.[2]
**12** මෙසේ යේසුස් ඔවුන්ගේ පාද
සෝදා අවසන් වූ පසු තම පිට වස්ත්‍ර
ඇඳගෙන නැවතත් මේසය අසල ඉඳ-
ගත්තේය. එවිට ඔහු ඔවුන්ට මෙසේ
කීවේය. “මම ඔබ වෙනුවෙන් කළ මේ
දේ ඔබට තේරුණාද? **13** ඔබ මට
කියන්නේ, ‘ගුරුතුමනි’[3] සහ ‘ස්වා-
මීනි’[4] කියායි. මම ඔබේ ගුරුතුමා හා
ස්වාමීන් වන නිසා ඔබ එහෙම කියන
එකත් හරියි.[5] **14** ඔබේ ස්වාමීන්
සහ ගුරුතුමා වන මම ඔබේ පාද සේ-
දුවා නම්[6] ඔබත් එකිනෙකාගේ පාද
සේදිය යුතුයි.[7] **15** මා ඔබට කළා
වගේ ඔබත් කළ යුතුයි. ඔබට අනුග-
මනය කරන්න මම තබන ආදර්ශය
එයයි.[8] **16** ඇත්තෙන්ම මම ඔබට
කියන්නේ, දාසයෙක් තමාගේ ස්වා-
මියාට වඩා උතුම් නොවන බවයි.
එවන ලද තැනැත්තාත් ඒ වගේමයි.
ඔහුත් ඔහුව එවූ තැනැත්තාට වඩා
උතුම් වන්නේ නැහැ.[9] **17** ඔබ මේ
දේවල් දැන සිටින නිසා ඔබ ඒවා පිළි-
පැද්දොත් ඔබට සතුටු විය හැකියි.[10]
**18** නමුත් මම කතා කරන්නේ ඔබ
සියලුදෙනා ගැන නොවෙයි. මා තෝ-
රාගත් අය කවුද කියා මම දන්නවා.[11]
ශුද්ධ ලියවිල්ලේ සඳහන් දේත් ඉටු
විය යුතුයි.[12] එහි පවසන්නේ, ‘මගේම
කෑම කෑ තැනැත්තා මට ද්‍රෝහී
වී ක්‍රියා කළේය’[13] කියායි. **19** මම
මේ දේවල් ඔබට දැන්ම එනම්,
ඒවා සිදු වෙන්නත් කලින් කියන්-
නේ[14] ඒ දේ සිදු වන විට එන්න
සිටින තැනැත්තා මම බව ඔබට
විශ්වාස කරන්න පුළුවන් වෙන්නයි.
**20** ඇත්තෙන්ම මම ඔබට කියන්නේ,
මා යවන ඕනෑම කෙනෙක්ව පිළි-
ගන්නා තැනැත්තා මාවත් පිළිගන්නා
බවයි.[1] ඒ වගේම කෙනෙක් මාව පිළි-
ගත්තොත් ඔහු ඇත්තටම මාව එවූ
තැනැත්තාවත් පිළිගන්නවා.”[2]
**21** ඒ දේවල් පැවසූ පසු යේ-
සුස් සිතින් කැලඹී කිසිවක් නො-
සඟවා මෙසේ පැවසුවේය. “මම
ඇත්තෙන්ම ඔබට කියන්නේ, ඔබ
අතරේ සිටින කෙනෙක් මාව පාවා
දෙනවා කියායි.”[3] **22** ඔහු එසේ
පැවසුවේ කවුරුන් ගැනද කියා සිත-
මින් ගෝලයෝ කලබල වී, එකි-
නෙකා දෙස බලන්න පටන්ගත්හ.[4]
**23** මේ අතර යේසුස්ගේ එක් ගෝල-
යෙකු හාන්සි වී සිටියේ ඔහු අසලින්-
මය. යේසුස් ඔහුට බොහෝ සෙයින්
ප්‍රේම කළේය.[5] **24** සීමොන් පේතෘස්
හිසෙන් ඔහුට සංඥා කර මෙසේ ඇසු-
වේය. “ඔහු කා ගැනද මේ කතා
කරන්නේ?” **25** එවිට ඔහු යේසුස්-
ගේ ළයට හේත්තු වී, “ස්වාමීනි,
ඒ කවුද”[6] කියා ඔහුගෙන් ඇසු-
වේය. **26** යේසුස් මෙසේ පිළිතුරු
දුන්නේය. “ඒ මා රොටි කැබැල්-
ලක් පොඟවා දෙන තැනැත්-
තායි”[7] කියා පැවසුවේය. ඉන්පසු ඔහු
රොටි කැබැල්ලක් පොඟවා, සීමොන්
ඉස්කාරියොත්ගේ පුත් යූදස්ට දුන්-
නේය. **27** රොටි කැබැල්ල කෑ ඔහු,
ඒ මොහොතේම සාතන්ගේ බලපෑ-
මට හසු විය.[8] එහෙයින් යේසුස්,
“ඔබට කරන්න තිබෙන දේ ඉක්මනින්
ගොස් කරන්න” කියා ඔහුට කීවේය.
**28** නමුත් කෑම ගැනීම සඳහා මේසය
වටා ඉඳගෙන සිටි කිසි කෙනෙක් යේ-
සුස් ඒ දේ ඔහුට පැවසුවේ කවර හේ-
තුවකටද කියා දැන සිටියේ නැත.
**29** යූදස් මුදල් පෙට්ටිය භාරව සිටි
නිසා[9] සමහරුන් සිතාගෙන සිටි-
යේ යේසුස් ඔහුට, “උත්සවය සඳහා
අපට අවශ්‍ය දේවල් මිල දී ගන්න”
කියා පැවසූ බව හෝ දිළිඳුන්ට යමක්
දෙන්න කියා ඔහුට පැවසූ බවයි.[10]
**30** යූදස් රොටි කැබැල්ල කෑමෙන්
පසු විගස එතැනින් පිට වී ගියේය. ඒ
අවස්ථාව වන විට අඳුර වැටී තිබිණ.[11]
**31** යූදස් පිට වී ගිය පසු යේසුස්

**13 පරි.**
1 2කොරි 7:1, එෆී 4:22
2 යොහ 6:64
3 යොහ 1:38
4 ලූක් 2:11, ක්‍රියා 10:36
5 මතෙ 23:8, 1කොරි 8:6, පිලි 2:11
6 ලූක් 22:27
7 මතෙ 20:26, ලූක් 9:48, ලූක් 22:26, රෝම 12:10, ගලා 5:13, 1පේතෘ 5:5
8 මතෙ 23:3, පිලි 2:5, 1පේතෘ 2:21, 1යොහ 2:6
9 මතෙ 10:24, ලූක් 6:40, යොහ 15:20
10 මතෙ 7:24, ලූක් 11:28, යාකො 1:25
11 යොහ 15:16, එෆී 1:4, 2තෙස 2:13, 2තිමෝ 2:10
12 යොහ 17:12
13 ගීතා 41:9, මතෙ 26:23
14 මතෙ 24:25, යොහ 14:29, යොහ 16:4

**2 තීරුව**
1 මතෙ 22:3, ගලා 4:14
2 මතෙ 10:40, මතෙ 25:40
3 මතෙ 26:21, මාක් 14:18, ලූක් 22:21, යොහ 6:70, ක්‍රියා 1:16
4 මතෙ 26:22, ලූක් 22:23
5 යොහ 19:26, යොහ 20:2
6 යොහ 21:20
7 මතෙ 26:23
8 ගීතා 109:6, ලූක් 22:3
9 යොහ 12:6
10 මතෙ 19:21
11 මතෙ 26:20

මෙසේ කීවේය. "මනුෂ්‍ය පුත්‍රයා තේජ-
සට පත් වන අවස්ථාව දැන් ඇවිත්
තිබෙනවා.[1] එයින් දෙවිත් ගෞරවයට
පත් වෙයි. **32** ඔහුව තේජසට පත්
කරන්නේ දෙවියි.[2] දෙවි ඒ දේ ඉතා
ඉක්මනින්ම කරයි. **33** මගේ ආදර-
ණීය දරුවෙනි,[3] මම ඔබ සමඟ සිටින්-
නේ තව කෙටි කාලයකට පමණයි.
ඔබ මාව සොයයි. නමුත්, 'මා යන
තැනට එන්න ඔබට බැහැ'[4] කියා
යුදෙව්වරුන්ට මා කලින් පැවසූ ලෙ-
සම දැන් ඔබටත් කියන්න කැමතියි.
**34** මම දැන් ඔබට අලුත් ආඥාවක්
දෙන්න කැමතියි. එනම් ඔබ එකිනෙ-
කාට ප්‍රේම කළ යුතුයි. මම ඔබට
ප්‍රේම කළා වගේ[5] ඔබත් එකිනෙකාට
ප්‍රේම කරන්න.[6] **35** ඔබ අතරේ ප්‍රේ-
මය ඇත්නම්[7] ඔබ මගේ ගෝලයන්
බව සියලුදෙනාම දැනගනියි."

**36** සීමොන් පේතෘස් ඔහුගෙන්
මෙසේ ඇසුවේය. "ස්වාමීනි, ඔබ යන්-
නේ කොහේද?" එවිට යේසුස්, "මා
යන තැනට දැන්මම ඔබට එන්න
බැහැ. නමුත් පසු අවස්ථාවක ඔබ
එනවා"[8] කියා පිළිතුරු දුන්නේය.
**37** පේතෘස් ඔහුට මෙසේ කීවේය.
"ස්වාමීනි, මට දැන්මම ඔබ පසු-
පස එන්න බැරි ඇයි? ඔබ උදෙසා
මගේ ජීවිතය වුණත් දෙන්න මම
ලෑස්තියි."[9] **38** එවිට යේසුස් මෙසේ
කීවේය. "මා උදෙසා ඔබේ ජීවිතය
වුණත් දෙන්න ඔබ කැමතිද? ඇත්-
තෙන්ම මම ඔබට කියන්නේ, කුකු-
ළෙකු හඬලන්න කලින් ඔබ මාව
හඳුනන්නේ නැහැ කියා තුන් වතා-
වක්ම කියන බවයි."[10]

**14** "ඔබේ සිත් කලබල කර-
ගන්න එපා.[11] දෙවි කෙරෙහි
විශ්වාසය තබන්න.[12] මා කෙරෙ-
හිත් විශ්වාසය තබන්න.[13] **2** මගේ
පියාණන්ගේ ගෘහයෙහි වාසය සඳහා
බොහෝ ස්ථාන තිබෙනවා.[14] එසේ
නැත්නම් මම ඔබ සමඟ ඒ ගැන
කතා කරන්නේ නැහැ. මම ඔබ
සඳහා ස්ථානයක් සූදානම් කරන්න[15]
යන්නේ එය සැබෑවක් වන නිසයි.

**13 පරි.**
1 යොහ 12:23 යොහ 14:13
2 යොහ 7:39 යොහ 17:1
3 හෙබ්‍රෙ 2:13
4 යොහ 7:34 යොහ 8:21
5 යොහ 15:9 එෆි 5:2
6 ලෙවී 19:18 යොහ 15:12 1තෙස 4:9 යාකො 2:8 1පේතෘ 1:22 1යොහ 3:14
7 රෝම 13:8 1කොරි 13:8 ගලා 6:2 1යොහ 4:20
8 යොහ 14:3 2පේතෘ 1:14 එළි 14:4
9 මතෙ 26:33 මාක් 14:29 ලූක් 22:33
10 මතෙ 26:34 මාක් 14:30 ලූක් 22:34 යොහ 18:27

**14 පරි.**
11 යොහ 14:27
12 මාක් 11:22 1පේතෘ 1:21
13 එෆි 1:13
14 ලූක් 16:9
15 ලූක් 12:32 කොලො 1:5 1පේතෘ 1:4

**2 තීරුව**
1 ක්‍රියා 1:11
2 යොහ 17:24 රෝම 8:17 1කොරි 15:23 පිලි 1:23 1තෙස 4:16 2තිමෝ 4:8 හෙබ්‍රෙ 10:19
3 1තෙස 4:17
4 යොහ 11:16
5 යොහ 13:36
6 යොහ 10:9 රෝම 5:2 එෆි 2:18 හෙබ්‍රෙ 10:20
7 යොහ 1:17 රෝම 15:8 එෆි 4:21 කොලො 2:17
8 යොහ 1:4 යොහ 6:63 යොහ 17:3 රෝම 6:23 එළි 2:10
9 ක්‍රියා 4:12
10 මතෙ 11:27 යොහ 1:18 යොහ 8:19 1යොහ 4:12

**3** මා ගොස් ඔබට ස්ථානයක් සූදානම්
කරනවා නම් මම නැවත එන බව[1]
මතක තබාගන්න. එවිට මම ඇවිත්
ඔබව මගේ නිවසට පිළිගන්නවා.[2] ඒ
අනුව මා සිටින තැන ඔබටත් සිටිය
හැකියි.[3] **4** දැනටමත් මා යන ස්ථා-
නයට පැමිණිය යුතු මාර්ගය ඔබ දන්-
නවා."

**5** එවිට තෝමස්[4] ඔහුට මෙසේ
කීවේය. "ස්වාමීනි, ඔබ යන්නේ කො-
හේද කියා අපි දන්නේ නැහැ.[5] අපි
කොහොමද ඒ මාර්ගය දන්නේ" කියා
ඇසුවේය.

**6** යේසුස් ඔහුට මෙසේ කීවේය.
"මාර්ගයත්[6] සත්‍යයත්[7] ජීවනයත්[8]
මමයි. මා තුළින් මිස කිසිවෙකුට
පියාණන් ළඟට යා නොහැකියි.[9]
**7** ඔබ මාව හඳුනනවා නම් ඔබට
මගේ පියාණන්වත් හඳුනාගන්න පුළු-
වන්. ඇත්තෙන්ම මේ මොහොතේ
පටන් ඔබ ඔහුව හඳුනනවා. එමෙන්ම
ඔබ ඔහුව දුටු බවත් කියන්න
පුළුවන්."[10]

**8** පිලිප් ඔහුට මෙසේ පැවසුවේය.
"ස්වාමීනි, අපට පියාණන්ව පෙන්-
නන්න. අපට ඒ ඇති."

**9** යේසුස් ඔහුට මෙසේ කීවේය.
"පිලිප්, මම මෙතරම් කලක් ඔබ
සියල්ලන් සමඟ කාලය ගත කර තිබි-
යදීත් ඔබ මාව හඳුනන්නේ නැද්ද?
මාව දැක ඇති තැනැත්තා පියා-
ණන්වත් දැක තිබෙනවා.[11] එසේනම්
'අපට පියාණන්ව පෙන්නන්න'[12] කියා
ඔබ කියන්නේ ඇයි? **10** මම පියා-
ණන් සමඟ එකට බැඳී සිටින බවත්
පියාණන් මා සමඟ එකට බැඳී සිටින
බවත්[13] ඔබ විශ්වාස කරන්නේ නැද්ද?
මම ඔබ සැමට කියා දෙන දේවල්
මගේම දේවල් නොවෙයි. මා සමඟ
එකට බැඳී සිටින පියාණන් තමන්ට
අවශ්‍ය දේ මා තුළින් ඉටු කරයි.[14]
**11** මම පියාණන් සමඟ එකට බැඳී

**11** යොහ 5:19; යොහ 8:28; කොලො 1:15; හෙබ්‍රෙ 1:3; **12** යොහ 12:45; **13** යොහ 10:38; යොහ 17:21; **14** යොහ 7:16; යොහ 8:28; යොහ 12:49.

සිටින බවත් පියාණන් මා සමඟ එකට
බැඳී සිටින බවත් මම කියන විට එය
විශ්වාස කරන්න. එසේත් නැත්නම්
මා සිදු කරන ක්‍රියාවන් දෙස බලා විශ්-
වාසයක් ඇති කරගන්න.[1] **12** ඇත්-
තෙන්ම මම ඔබට කියන්නේ, මා
කෙරෙහි විශ්වාසය තබන තැනැත්-
තාත් මා කරන ක්‍රියා කරන බවයි.
ඇත්තෙන්ම දැන් මම පියාණන් ළඟට
යන නිසා[2] ඒ තැනැත්තා මීටත් වඩා
මහත් ක්‍රියා කරයි.[3] **13** ඔබ මගේ
නාමයෙන් මොනව හරි දෙයක් ඉල්ලු-
වොත් මම එය ඉටු කර දෙනවා. එවිට
පුත්‍රයා මාර්ගයෙන් පියාණන්ව ගෞර-
වයට පත් වෙයි.[4] **14** ඔබ ඕනෑම
දෙයක් මගේ නාමයෙන් ඉල්ලුවොත්
මම එය ඉටු කර දෙනවා.

**15** "ඔබ මට ප්‍රේම කරනවා නම්
මම ආඥා කළ දේවල් ඔබ
පිළිපදිනවා.[5] **16** මම පියාණන්ගෙන්
තවත් ඉල්ලීමක් කරනවා. එවිට ඔබේ
උපකාරයට ඔහු යමක් එවයි. ඒ
දේ ඔබට සැමදා උපකාරයක් වෙයි.[6]
**17** එය නම් සත්‍යය එළිදරව් කරන
ඔහුගේ බලයයි.[7] එය ලබාගැනීමට
ලෝකයට නොහැක්කේ[8] එහි ක්‍රියා-
කාරිත්වය දකින්නවත් තේරුම්ගන්න-
වත් ලෝකයට බැරි නිසයි. නමුත්
ඔබ ඒ ගැන දන්නවා. මන්ද එය
ඔබට දැන් තිබෙන අතර එය ඔබ
තුළ ක්‍රියාත්මක වෙනවා.[9] **18** මම
දැන් ඔබෙන් වෙන් වුණත්[10] මම නැව-
තත් ඔබ ළඟට එනවා. **19** තව
ටික දවසකින් පසු ලෝකය මාව
තවත් දකින්නේ නැහැ.[11] නමුත් ඔබ
මාව දකිනවා.[12] මන්ද මම ජීව-
මාන කෙනෙක්. ඒ නිසා ඔබත් දිග-
ටම ජීවත් වෙයි.[13] **20** එදාට මම
පියාණන් සමඟ එකට බැඳී සිටින
බවත් මම ඔබ සමඟත් ඔබ මා
සමඟත් එකට බැඳී සිටින බවත් ඔබට
වැටහෙයි.[14] **21** කෙනෙක් මම ආඥා
කරන දේවල් පිළිගෙන ඒවා පිළිපදි-
නවා නම් මට ප්‍රේම කරන්නේ ඒ
තැනැත්තායි.[15] ඒ වගේම මට ප්‍රේම
කරන තැනැත්තාට මගේ පියාණන්
ප්‍රේම කරන අතර මමත් ඔහුට ප්‍රේම
කරනවා. ඒ විතරක් නොවෙයි, මම
කවුද කියා ඔහුට පැහැදිලිවම පෙන්වා
දෙනවා."

**22** එවිට යූදස් ඉස්කාරියෝත්
නොව අනික් යූදස්[1] ඔහුගෙන් මෙසේ
ඇසුවේය. "ස්වාමීනි, ඔබ ලෝකයට
එළිදරව් වෙන්නේ නැතුව අපට පම-
ණක් එළිදරව් වෙනවා කියා පවසන්-
නේ මොන හේතුවක් නිසාද?"[2]

**23** යේසුස් ඔහුට මෙසේ පිළිතුරු
දුන්නේය. "කෙනෙක් මට ප්‍රේම කර-
නවා නම් ඔහු මා පවසන දේ පිළිපදි-
නවා.[3] මගේ පියාණන්ද ඔහුට ප්‍රේම
කරන අතර අපි දෙදෙනා ඔහු ළඟට
ඇවිත් ඔහු සමඟ වාසය කරනවා.[4]
**24** මට ප්‍රේම නොකරන තැනැත්තා
මා පවසන දේ පිළිපදින්නේ නැහැ. මා
ඔබට පැවසූ දේවල් මගේම අදහස්
නොවෙයි. ඒවා මාව එවා ඇති පියා-
ණන් පැවසූ දේවල්.[5]

**25** "මම මේ දේවල් ඔබට පැවසුවේ
ඔබ සමඟ සිටියදීමයි. **26** නමුත්
ඔබේ උපකාරයට පියාණන් මගේ
නාමයෙන් ඔහුගේ බලය ඔබට ලබා
දෙයි. ඒ බලය මාර්ගයෙන් ඔබ
සැම දෙයක්ම ඉගෙනගන්නා අතර
මා ඔබට පැවසූ සියල්ල මතක-
යට නඟන්නත් ඔබට හැකි වෙයි.[6]
**27** මම ඔබට තබා යන්නේ සමාදාන-
යයි. මගේ සමාදානය ඔබට දෙනවා.[7]
මා ඔබට දෙන සමාදානය ලෝකය
ලබා දෙන සමාදානයට වඩා වෙනස්.
ඒ නිසා ඔබේ සිත් කලබල කරගන්න
එපා. ඒ වගේම ඔබේ සිත් තුළ බියක්
ඇති කරගෙන පසුබසින්නත් එපා.
**28** මම යන බවත් නැවත ඔබ ළඟට
එන බවත් මම ඔබට පැවසූ බව ඔබට
මතක ඇති. ඔබ මට ප්‍රේම කර-
නවා නම් මම පියාණන් ළඟට යන
නිසා ඔබ ඒ ගැන ප්‍රීති විය යුතුයි.
මන්ද පියාණන් මට වඩා උතුම්.[8]
**29** මම මේ දේවල් සිදු වෙන්නත්
කලින් ඔබට පවසා[9] ඔබව දැනුවත්
කරන්නේ මේ දේවල් සිදු වන විට
ඔබ තුළ විශ්වාසයක් ඇති කරන්-

**14 පරි.**
1 යොහ 5:36
2 ක්‍රියා 2:33
3 මතෙ 21:21, ක්‍රියා 1:8, ක්‍රියා 2:41, කොලො 1:23
4 යොහ 15:16, යොහ 16:23
5 යොහ 13:34, යොහ 15:10, යාකො 1:22, 1යොහ 5:3
6 ලූක් 24:49, යොහ 15:26, යොහ 16:7, ක්‍රියා 1:5, ක්‍රියා 2:4, රෝම 8:26
7 මතෙ 10:20, යොහ 16:13, 1කොරි 2:12, 1යොහ 2:27
8 1කොරි 2:14
9 ගලා 4:6
10 මතෙ 28:20
11 මතෙ 23:39
12 යොහ 16:16, යොහ 17:24
13 1කොරි 15:22
14 යොහ 10:38, යොහ 17:21
15 1යොහ 2:5, 1යොහ 5:1

**2 තීරුව**
1 ලූක් 6:16, ක්‍රියා 1:13
2 යොහ 7:4, ක්‍රියා 10:41
3 යොහ 15:10
4 1යොහ 2:24, එළි 3:20
5 යොහ 5:19, යොහ 7:16, යොහ 12:49
6 ලූක් 24:49, යොහ 15:26, යොහ 16:13, 1යොහ 2:27
7 යොහ 16:33, එෆී 2:14, පිලි 4:7, කොලො 3:15, 2තෙස 3:16
8 යොහ 20:17, 1කොරි 11:3, 1කොරි 15:28, පිලි 2:6
9 යොහ 13:19, යොහ 16:4

නයි. **30** මම ඔබ සමඟ තවත් බො-
හෝ දේවල් කතා කරන්නේ නැහැ.
මන්ද ලෝකයේ පාලකයා[1] එනවා.
නමුත් මාව යටත් කරගන්න ඔහුට
කිසි බලයක් නැහැ.[2] **31** මම පියා-
ණන්ට ප්‍රේම කරන බව මුළු ලෝක-
යම දැනගත යුතුයි. පියාණන් මට
අණ කර ඇති දේවල්[3] මම කරන්නේ
ඒ නිසයි. දැන් අපි මෙතැනින් යමු.

**15** "සැබෑ මිදිවැල මමයි.[4] මගේ
පියාණන් එහි වැවිලිකරුයි.[5]
**2** පල නොදරන සෑම අත්තක්ම මට
සම්බන්ධ වී තිබුණත් ඔහු ඒවා ඉවත්
කරනවා.[6] නමුත් පල දරන සෑම අත්-
තකින්ම වැඩි පලදාවක් ලබාගැනී-
මට[7] ඔහු ඒවා පවිත්‍ර* කරනවා.[8]
**3** මා ඔබට පැවසූ දේවල් ඔබ
ඇසූ නිසා ඔබ දැනටමත් පවිත්‍රයි.[9]
**4** මා සමඟ එකට බැඳී සිටින්න.
එවිට මමත් ඔබ සමඟ එකට බැඳී
සිටිනවා.[10] අත්තක් මිදිවැලට සම්-
බන්ධ වී තිබුණොත් මිස තනිව එයට
පල දරන්න බැහැ. ඒ හා සමානව ඔබ
මා සමඟ එකට බැඳී සිටින්නේ නැත්-
නම් ඔබටත් පල දැරීමට නොහැ-
කියි.[11] **5** මමයි මිදිවැල. එහි අතු
ඔබයි. කෙනෙක් මා සමඟත් මම ඔහු
සමඟත් එකට බැඳී සිටියොත් ඔහුට
බොහෝ පල දරන්න හැකි වෙයි.[12]
මන්ද මා සමඟ සම්බන්ධ නොවී
ඔබට කිසිම දෙයක් කරන්න බැහැ.
**6** අත්තක් කපා ඉවත් කරනු ලැබූ
විට ඒ අත්ත වියළී යයි. මිනිසුන් ඒ
අතු එකතු කර ගින්නට දමා සම්පූර්-
ණයෙන්ම පුලුස්සා දමයි.[13] මා සමඟ
එකට බැඳී නොසිටින තැනැත්තා-
ටත් සිදු වන්නේ ඒ දේමයි. **7** ඔබ
මා සමඟ එකට බැඳී සිට මා පැවසූ
දේවල් ඔබේ සිත්වල තබාගත්තොත්
ඔබට පුළුවන් ඔබ කැමති ඕනෑම දෙ-
යක් ඉල්ලන්න. එවිට ඔබ ඉල්ලූ දේ
ඉටු වෙයි.[14] **8** දිගටම බොහෝ පල
දරන්න. ඔබ මගේ ගෝලයන් බවත්
ඔප්පු කරන්න. ඔබ එසේ කළොත්
මගේ පියාණන්ට මහත් ගෞරවයක්
ලැබෙයි.[1] **9** පියාණන් මට ප්‍රේම
කරන අතර[2] මමත් ඔබට ප්‍රේම කර-
නවා. එමනිසා මගේ ප්‍රේමය ලබන්න
වටිනා අය හැටියට නිරතුරුවම ක්‍රියා
කරන්න. **10** මම මගේ පියාණන්
ආඥා කර ඇති දේවල් පිළිපදින
නිසා[3] මම නිරතුරුවම ඔහුගේ ප්‍රේමය
ලබනවා. ඒ වගේම ඔබත් මා ආඥා
කළ දේවල් පිළිපදිනවා නම්[4] මමත්
ඔබට නිරතුරුවම ප්‍රේම කරනවා.

**11** "මම මේ දේවල් ඔබ සමඟ
කතා කළේ මා තුළ ඇති ප්‍රීතිය
ඔබත් සම්පූර්ණයෙන්ම අද්දකින-
වාට මම කැමති නිසයි.[5] **12** මගේ
ආඥාව මෙයයි. එනම් මා ඔබට ප්‍රේම
කළා වගේම ඔබත් එකිනෙකාට ප්‍රේම
කරන්න.[6] **13** කෙනෙක් තම මිත්‍ර-
යන් උදෙසා තම ජීවිතය දෙනවා
නම් ඊට වඩා උතුම් ප්‍රේමයක් තවත්
නැහැ.[7] **14** මා ඔබට අණ කරන
දේ ඔබ කරනවා නම්[8] මම ඔබව
සලකන්නේ මගේ මිත්‍රයන් ලෙසයි.
**15** මම මෙතැන් පටන් ඔබට දාසයන්
කියා අමතන්නේ නැහැ. මන්ද තම
ස්වාමියා කරන දේවල් ගැන දාසයෙ-
කුට කිසි අවබෝධයක් නැහැ. නමුත්
මම ඔබව සලකන්නේ මගේ මිත්‍ර-
යන් හැටියටයි.[9] මගේ පියාණන් මට
කියා දුන් සෑම දෙයක්ම මම ඔබට
කියා දුන්නේ ඒ නිසයි.[10] **16** ඔබ
මාව තෝරාගත්තා නොවෙයි. මමයි
ඔබව තෝරාගත්තේ. ඒ වගේම ඔබව
පත් කළේ දිගින් දිගටම පල දැරී-
මටයි.[11] ඔබේ පල සදහටම පැව-
තිය යුතුයි. ඔබ එසේ කළොත් මගේ
නාමයෙන් ඔබ පියාණන්ගෙන් ඉල්-
ලන ඕනෑම දෙයක් ඔහු ඔබට ලබා
දෙයි.[12]

**17** "මම ඔබට මේ දේවල් කිරී-
මට අණ කරන්නේ එකිනෙකාට ප්‍රේම
කරන්න ඔබට හැකි වීම සඳහායි.[13]
**18** ලෝකය ඔබට වෛර කළොත්

යොහ **15:2*** එනම්, කප්පාදු.

**11** මතෙ 28:19; රෝම 1:13; පිලි 1:22; **12** යොහ 14:13; **13** යොහ 13:34; 1යොහ 3:23.

**14 පරි.**
1 යොහ 12:31
යොහ 16:11
2 යොහ 16:33
3 යොහ 10:18
යොහ 12:49
යොහ 15:10
පිලි 2:8
1යොහ 5:3

**15 පරි.**
4 යෙසා 4:2
5 ගීතා 80:8
යෙරෙ 2:21
1කොරි 3:9
6 මතෙ 15:13
හෙබ්‍රෙ 6:8
7 2පේතෘ 1:8
8 එෆී 5:26
තිත 2:14
1යොහ 1:7
1යොහ 1:9
9 යොහ 13:10
යොහ 17:17
ක්‍රියා 15:9
1පේතෘ 1:22
10 යොහ 6:56
1කොරි 12:27
කොලො 2:19
11 ගලා 2:20
එෆී 2:21
1යොහ 2:6
12 හිතෝ 11:30
හොෂෙ 14:8
යොහ 15:16
ගලා 5:22
13 එස 15:4
මතෙ 3:10
රෝම 11:20
හෙබ්‍රෙ 6:4
හෙබ්‍රෙ 6:8
1යොහ 2:19
14 මතෙ 7:7
යොහ 16:23

**2 තීරුව**
1 මතෙ 5:16
යොහ 13:35
පිලි 1:11
2 යොහ 3:35
3 යොහ 13:34
යොහ 14:15
1යොහ 2:5
4 යොහ 8:29
5 යොහ 16:24
යොහ 17:13
1යොහ 1:4
6 මාක් 12:31
යොහ 13:34
1තෙස 4:9
1පේතෘ 4:8
7 යොහ 10:11
රෝම 5:7
එෆී 5:2
1යොහ 3:16
8 මතෙ 12:50
යොහ 14:23
9 ලූක් 12:4
10 ක්‍රියා 20:27

ඔබට වෛර කරන්න කලින් එය මට වෛර කළ බව ඔබ හොඳටම දන්නවා.[1] **19** ඔබ මේ ලෝකයේ මිනිසුන්ට සමානව සිටියා නම් ඔවුන් ඔබට ඇලුම් කරයි. මන්ද ලෝකයේ සිටින මිනිසුන් තමන්ගේ පැත්තේ සිටින අයට ඇලුම් කරනවා.[2] නමුත් ඔබ මේ ලෝකයේ මිනිසුන්ට සමාන නොවන නිසාත්[3] මම ඔබව ඔවුන් අතරින් තෝරාගෙන තිබෙන නිසාත් ඔවුන් ඔබට වෛර කරනවා.[4] **20** දාසයෙක් තම ස්වාමියාට වඩා උතුම් නොවන බව මා ඔබට පැවසුවා. ඒ දේ අමතක කරන්න එපා. ඔවුන් මට පීඩා කළා නම් ඔබටත් පීඩා කරයි.[5] ඔවුන් මා පැවසූ දේ පිළිපැද්දා නම් ඔවුන් ඔබ පවසන දේත් පිළිපදියි. **21** නමුත් මාව එවූ තැනැත්තාව ඔවුන් හඳුනන්නේ නැති නිසාත් ඔබ මගේ නාමය දරන නිසාත් ඔවුන් ඔබට විරුද්ධව ඒ හැම දෙයක්ම කරනවා.[6] **22** මා ඇවිත් ඔවුන්ට කිසි දෙයක් කියා දුන්නේ නැත්නම් ඔවුන් පව්කාරයන් වන්නේ නැහැ.[7] නමුත් මා ඇවිත් ඔවුන්ට හැම දෙයක්ම කියා දුන් නිසා ඔවුන්ගේ නිදහසට කිසිවක් කියන්න ඔවුන්ට නොහැකියි.[8] **23** මට වෛර කරන තැනැත්තා මගේ පියාණන්ටත් වෛර කරනවා.[9] **24** වෙන කිසිවෙකු විසින් නොකළ ක්‍රියා මා ඔවුන් අතරේ කළේ නැත්නම්[10] ඔවුන් පව්කාරයන් වන්නේ නැහැ.[11] නමුත් දැන් ඔවුන් මගේ ක්‍රියා දැක මටත් මගේ පියාණන්ටත් වෛර කරනවා.[12] **25** මේ දේ සිදු වී තිබෙන්නේ, 'ඔවුන් කිසි හේතුවක් නැතුව මට වෛර කළා'[13] කියා ඔවුන්ගේ නීතියේ ලියා තිබෙන වචන ඉටු විය යුතු නිසයි. **26** මම ඔබේ උපකාරය සඳහා පියාණන්ගේ බලය ඔබට ලබා දෙනවා.[14] ඒ බලය මගින් ඔබට සත්‍යය එළිදරව් වෙයි. පියාණන්ගෙන් ඔබට ලැබෙන ඒ බලය මගින් මා ගැන සාක්ෂි ලැබෙයි.[15] **27** ඒ වගේම ඔබ මුල සිටම මා සමඟ සිටි නිසා ඔබත් මා ගැන සාක්ෂි දැරිය යුතුයි.[1]

**16** "මම මේ දේවල් ඔබට පැවසුවේ ඔබ පාපයට ඇද වැටෙනවා*[2] දකින්න අකමැති නිසයි. **2** මිනිසුන් ඔබව සිනගෝගවලින් නෙරපා දමයි.[3] ඇත්තෙන්ම ඔබව මරණයට පත් කරන අය එසේ කිරීමෙන් තමන් දෙවිට මහත් සේවයක් කළ බව සිතන කාලයක් එයි.[4] **3** ඔවුන් ඒ දේවල් කරන්නේ ඔවුන් පියාණන්වත් මාවත් නාඳුනන නිසයි.[5] **4** ඒ වුණත් මම මේ දේවල් දැන්මම ඔබට කියන්නේ, මේ දේවල් සිදු වන කාලය පැමිණෙන විට මම ඒ ගැන පැවසූ බව ඔබට මතක් වීම සඳහායි.[6]

"මම මුලින්ම ඔබට මේ දේවල් ගැන නොකිව්වේ ඒ වන විට මම ඔබ සමඟ සිටි නිසයි. **5** දැන් මාව එවූ තැනැත්තා ළඟට යන්න කාලය ඇවිත් තිබෙනවා.[7] නමුත් 'ඔබ යන්නේ කොහේද' කියා ඔබෙන් එක් කෙනෙක්වත් මගෙන් අසන්නේ නැහැ. **6** මම මේ දේවල් ගැන ඔබට කතා කළ නිසා ඔබේ සිත් ශෝකයෙන්[8] බර වෙලා. **7** කොහොමවුණත් මගේ පිටත්ව යෑම ඔබට ප්‍රයෝජනවත් වෙයි. මම මේ කියන දේ සත්‍යයක්. මන්ද මම පිටත්ව ගියේ නැත්නම් ඔබේ උපකාරයට ලැබිය යුතු දේ[9] ඔබට ලැබෙන්නේ නැහැ. නමුත් මම පිටත්ව ගියොත් මම අනිවාර්යයෙන්ම ඒ දේ ඔබේ උපකාරය සඳහා ලබා දෙනවා. **8** ඒ උපකාරය ලැබෙන විට සියලුදෙනාටම පාපය ගැනත් ධර්මිෂ්ඨකම ගැනත් දෙවිගේ විනිශ්චය ගැනත් ඉතා පැහැදිලි අවබෝධයක් ලැබෙයි.[10] **9** මුලින්ම පැහැදිලි අවබෝධයක් ලැබෙන්නේ පාපය ගැනයි.[11] එය පැහැදිලි වන්නේ ලෝකයේ මිනිසුන්

**15 පරි.**

1 මතෙ 10:22, ලූක් 19:14, යොහ 17:14, 1යොහ 3:13
2 1යොහ 4:5
3 යොහ 17:14, යාකො 4:4
4 ලූක් 6:22, 1පේතෘ 4:4
5 මතෙ 5:11, මතෙ 10:22, මතෙ 24:9, 2තිමෝ 3:12, 1පේතෘ 2:21
6 යොහ 16:3
7 යොහ 9:41
8 මතෙ 11:21, රෝම 1:20, යාකො 4:17
9 යොහ 5:23, 1යොහ 2:23
10 මතෙ 11:23, යොහ 7:31, යොහ 11:47
11 යොහ 9:41
12 නික් 20:5, යොහ 5:42
13 ගීතා 35:19, ගීතා 69:4, ලූක් 23:22
14 ලූක් 24:49, යොහ 14:26
15 1යොහ 5:6

**2 තීරුව**

1 ලූක් 1:2, ලූක් 24:48, ක්‍රියා 1:8, ක්‍රියා 2:22, ක්‍රියා 5:32, 1පේතෘ 5:1

**16 පරි.**

2 මතෙ 11:6
3 යොහ 9:22
4 මතෙ 24:9, ක්‍රියා 8:1, ක්‍රියා 12:2, ක්‍රියා 26:11
5 යොහ 8:19, යොහ 15:21, රෝම 10:2, 1කොරි 2:8
6 යොහ 13:19, යොහ 14:29
7 යොහ 7:33, යොහ 13:3
8 මතෙ 17:23, යොහ 14:1, යොහ 16:22
9 යොහ 14:16, යොහ 14:26, යොහ 15:26, ක්‍රියා 2:33
10 යොහ 12:48, ක්‍රියා 24:25

11 යොහ 15:22; රෝම 3:20; රෝම 7:9.

යොහ **16:1*** මූ.අ., "ඔබේ පය පැකිළී වැටෙනවා."

මා කෙරෙහි විශ්වාසයක් නොත-
බන නිසයි.[1] **10** ඉන්පසු ධර්මිෂ්ඨ-
කම ගැන[2] පැහැදිලි අවබෝධයක්
ලැබෙයි. එය පැහැදිලි වන්නේ මම
පියාණන් ළඟට යන නිසයි. එසේම
ඔබ තවදුරටත් මාව දකින්නේ නැහැ.
**11** ඊළඟට දෙවිගේ විනිශ්චය ගැන[3]
සාක්ෂි ලැබෙයි. එනම් මේ ලෝකයේ
පාලකයාව විනිශ්චය කර ඇති බවයි.[4]

**12** "ඔබට කියන්න තව බො-
හෝ දේ මට තිබුණත් ඒවා දරා-
ගන්න දැන් ඔබට බැහැ.[5] **13** නමුත්
ඔබට සත්‍යය එළිදරව් කරන දෙවිගේ
බලය[6] ලැබෙන විට සත්‍යය ගැන
වඩාත් පූර්ණ අවබෝධයක් ලබාගැ-
නීමට ඔබට මහ පෙන්වීම් ලැබෙයි.
නමුත් මේ බලය ස්වාධීනව ක්‍රියා
කරන බලයක් නොවෙයි. එමගින්
එළිදරව් වන්නේ ප්‍රකාශ කළ යුතු බව
දෙවි තීරණය කරන දේවල් පමණයි.
එමනිසා ඉදිරියේදී සිදු වන දේවල්
ගැන ඔබට දැනගන්න ලැබෙයි.[7]
**14** මා ලබා දෙන මහ පෙන්වීම්
ඔබට ලැබෙන්නෙත් එහි ක්‍රියාකාරිත්-
වය තුළිනුයි.[8] එයින් මාවද ගෞර-
වයට පත් වෙයි.[9] **15** ඇත්තෙන්ම
මා ලබා දෙන මහ පෙන්වීම් ඔහුගේ
බලයේ ක්‍රියාකාරිත්වය තුළින් ඔබට
ලැබෙයි කියා මම කියන්නේ පියා-
ණන් සතු සියල්ල මා සතු නිසයි.[10]
**16** කෙටි කලකින් ඔබ මාව තවත්
දකින්නේ නැහැ.[11] නමුත් ඉන් ටික
කලකට පසු ඔබ මාව නැවතත්
දකියි."

**17** එහෙයින් ඔහුගේ ගෝලයන්
කිහිපදෙනෙක් තම තමන් අතරේ
මෙසේ කතා වුණෝය. "'කෙටි කල-
කින් ඔබ මාව තවත් දකින්නේ නැහැ'
කියාත් 'ඉන් ටික කලකට පසු ඔබ
මාව නැවතත් දකියි' කියාත් ඔහු
කියන්නේ ඇයි? ඒ වගේම 'මම පියා-
ණන් ළඟට යනවා' කියාත් ඔහු කිය-
නවා. ඔහු කියන දෙයෙහි තේරුම
මොකක්ද?" **18** එමෙන්ම ඔවුහු,
"'කෙටි කලකින්' කියා ඔහු කියන්-
නේ ඇයි? ඔහු මොනව ගැනද මේ
කතා කරන්නේ කියා අපට නම්
තේරෙන්නේ නැහැ" කියා පැවසූහ.
**19** ඔවුන්ට තමාගෙන් අසන්න යම්
ප්‍රශ්න ඇති බව දැනගෙන සිටි යේසුස්[1]
ඔවුන්ට මෙසේ කීවේය. "ඔබ එකි-
නෙකා අතර කතා වෙන්නේ මොනව
ගැනද? තව කෙටි කලකින් ඔබ මාව
තවත් දකින්නේ නැහැ, නමුත් ඉන්
ටික කලකට පසු ඔබ මාව නැවතත්
දකියි කියා මම පැවසූ දේ ගැනද?
**20** ඇත්තෙන්ම මම ඔබට කියන මේ
දේට සවන් දෙන්න. ඔබ බොහෝ
සෙයින් හඬා වැලපෙයි. ඒ වේලා-
වේදී ලෝකය නම් ප්‍රීති වෙයි. ඒත්
මුලින් ඔබ ශෝක වුණත්[2] පසුව ඒ
ශෝකය ප්‍රීතියට හැරෙයි.[3] **21** මේ
උදාහරණය ගැන සිතන්න. සාමාන්‍ය-
යෙන් දරුවෙක් බිහි කරන්න සිටින
ස්ත්‍රියක් සිටින්නේ මහත් වේදනා-
වකින්.[4] ඒ ඇගේ දරුවා මෙලොව
එළිය දකින්න නියමිත වේලාව ඇවිත්
තිබෙන නිසයි. නමුත් දරුවා ලැබු-
ණායින් පසු ඇයට විඳින්න සිදු
වුණු වේදනාව ඇයට මතක් වෙන්නේ
නැහැ. ඇයට දැනෙන්නේ ප්‍රීතියක්
පමණයි. ඒ ඇගේ දරුවා මෙලොවට
බිහි වී ඇති නිසයි. **22** දැන් ඔබත්
සිටින්නේ ශෝකයෙන්. නමුත් අපි
නැවත හමු වන බව මතක තබා-
ගන්න. එවිට ඔබේ සිත් ප්‍රීතියෙන් පිරී
යයි.[5] කිසිවෙකුටවත් ඒ ප්‍රීතිය ඔබෙන්
සොරාගන්න බැහැ. **23** ඒ දවසේදී[6]
ඔබට මගෙන් කිසි දෙයක් විමසන්න
අවශ්‍ය වන්නේ නැහැ. ඇත්තෙන්ම
මම ඔබට කියන්නේ, ඔබ පියාණන්-
ගෙන් ඉල්ලන ඕනෑම දෙයක්[7] ඔහු
මගේ නාමයෙන් ඔබට දෙන බවයි.[8]
**24** මේ වන තුරු ඔබ මගේ නාමයෙන්
කිසිම දෙයක් ඉල්ලා නැහැ. දැන් ඉල්-
ලන්න. එවිට ඔබට ලැබෙයි. ඔබ අද්-
දකින ප්‍රීතියද පිරී ඉතිරී යයි.[9]

**25** "මම මේ දේවල් ඔබට පැහැ-
දිලි කළේ උදාහරණවලිනුයි.[10] නමුත්
මම ඔබට උදාහරණවලින් නැවතත්

**16 පරි.**
1 යොහ 5:38 1තෙස 2:15
2 යෙසා 42:6 දානි 9:24 රෝම 4:25 රෝම 5:18
3 යෙසා 42:1 මතෙ 12:18 යොහ 3:18
4 යොහ 12:31 යොහ 14:30
5 මාක් 4:33 1කොරි 3:1
6 යොහ 16:7
7 ක්‍රියා 11:28 ක්‍රියා 16:6 ක්‍රියා 21:11 1තිමෝ 4:1
8 යොහ 15:26 1යොහ 2:27
9 1යොහ 4:2
10 මතෙ 11:27 යොහ 3:35 යොහ 17:10
11 යොහ 7:33 යොහ 14:19

**2 තීරුව**
1 යොහ 2:25
2 ලූක් 5:35
3 මතෙ 28:8 ලූක් 24:41 යොහ 20:20
4 උත් 3:16 යෙසා 26:17
5 ලූක් 24:52 1පේතෘ 1:8
6 යොහ 14:20
7 පිලි 4:6 1පේතෘ 5:7
8 යොහ 14:13 යොහ 15:16 1යොහ 5:14
9 යොහ 15:11 1යොහ 1:4
10 මතෙ 13:34 යොහ 10:6

කතා නොකරන කාලයක් එයි. ඒ
කාලයේදී මම පියාණන් ගැන
ඔබට පැහැදිලි ලෙස දන්වනවා.
**26** ඒ කාලයේදී පියාණන්ගෙන් යම්
ඉල්ලීමක් කරන්න අවශ්‍ය නම් එය
මගේ නාමයෙන් ඔබට කරන්න පුළු-
වන්. එවිට ඔබ වෙනුවෙන් පියාණන්ට
කතා කරන්න මට සිදු වන්නේ නැහැ.
**27** මන්ද ඔබ මට බොහෝ සෙයින්
ආදරය කළ නිසාත්[1] මම පියාණන්-
ගේ නියෝජිතයා[2] හැටියට පැමිණියා
කියා ඔබ විශ්වාස කළ නිසාත් පියා-
ණන්ට ඔබ ගැන තිබෙන්නේ මහත්
ආදරයක්. **28** මම ලෝකයට ආවේ
පියාණන් ළඟ සිටයි. දැන් මම මේ
ලෝකයෙන් සමුගෙන නැවතත් පියා-
ණන් ළඟට යනවා.”[3]

**29** එවිට ඔහුගේ ගෝලයෝ මෙසේ
කීවෝය. “දැන් ඔබ උදාහරණ යොදා-
ගෙන කිසිම දෙයක් පැවසුවේ
නැති නිසා අපට සියල්ල පැහැදිලි
වුණා. **30** ඔබ සෑම දෙයක්ම දන්නා
බවත්[4] ඔබෙන් ප්‍රශ්න කරන්න කිසි-
වෙකුට අවශ්‍ය නැති බවත් අපි දන්-
නවා.[5] ඒ නිසා ඔබ දෙවිගෙන් පැමිණි
බව අපට විශ්වාසයි.”[6] **31** යේසුස්
ඔවුන්ට මෙසේ පිළිතුරු දුන්නේය.
“ඔබ තුළ දැන් විශ්වාසයක් තිබෙ-
නවා. **32** නමුත් ඔබ සියලුදෙනාම
තම තමාගේ නිවෙස්වලට විසිරී
යනවා.[7] ඔබ මාව තනි කර දමනවා.
ඇත්තෙන්ම ඒ දේ සිදු වන වේලාව
අත ළඟයි. කොහොමවුණත් පියා-
ණන් මා සමඟ සිටිනවා.[8] ඒ නිසා මම
තනි වන්නේ නැහැ. **33** මම ඔබට
මේ දේවල් කිව්වේ මා මාර්ගයෙන්
ඔබට සමාදානය ලබා දෙන්නයි.[9]
ඔබට මේ ලෝකයෙන් නොයෙකුත්
පීඩා ඇති වෙයි. නමුත් කිසි දෙයකට
අධෛර්යය වෙන්න එපා. මම ලෝක-
යෙන් ජය ගත්තා.”[10]

**17** යේසුස් ඒ දේවල් පැවසූ පසු
ඔහු ස්වර්ගය දෙස බලා[11] දෙ-
විට මෙසේ යාච්ඤා කළේය. “පියා-
ණෙනි, සියල්ල සිදු වීමට වේලාව
ඇවිත් තිබෙනවා. මම ඔබෙන් ඉල්-
ලන්නේ ඔබේ පුත්‍රයාව තේජසට
පත් කරන්න කියායි. එවිට ඔබට
ගෞරවය ගෙන දෙන්න ඔබේ පුත්‍ර-
යාට හැකි වෙයි.[1] **2** මන්ද ඔබ
මුළු මිනිස් වර්ගයාවම ඔහු යටතට
පත් කර තිබෙනවා.[2] එමනිසා ඔබේ
පුත්‍රයාට ඔබ භාර දුන් සියලුදෙනා-
ටම[3] ඔහු මාර්ගයෙන් සදාකාල ජීව-
නය ලැබෙයි.[4] **3** සදාකාල ජීවනය
ලබාගැනීමට[5] ඔවුන් කළ යුතු දේ
නම් එකම සැබෑ දෙවි[6] වන ඔබ-
වත් ඔබ එවූ තැනැත්තා වන යේසුස්
ක්‍රිස්තුස්වත්[7] දැන හඳුනා ගැනීමයි.*[8]
**4** ඔබ මට කරන්න දුන් වැඩ කො-
ටස සම්පූර්ණ කිරීමෙන්[9] පොළො-
වෙහිදී මම ඔබට මහත් ගෞරවයක්
ගෙන දුන්නා.[10] **5** දැන් පියාණෙනි,
මම ඔබෙන් ඉල්ලා සිටින්නේ මාව
තේජසට පත් කරන්න කියායි. ඔබ
සමඟ සිටීමටත් ලෝකය පවතින්න
කලින් මම ඔබ සමඟ සිටියදී ඔබ මට
ලබා දී තිබුණු තේජස නැවත ලබන්-
නත් මම කැමතියි.[11]

**6** “ඔබ ලෝකයෙන් මට භාර දුන්
මිනිසුන්ට මම ඔබේ නාමය ප්‍රකාශ
කළා.[12] ඇත්තෙන්ම ඔවුන් අයිති ඔබ-
ටයි. නමුත් ඔබ ඔවුන්ව මට භාර
දුන්නා. ඔවුන් ඔබ පැවසූ දේවල් පිළි-
පැද්දා. **7** ඔබ මට භාර දුන් සියල්ල
මට ලැබුණේ ඔබගෙන් බව ඔවුන්
දැන් දන්නවා. **8** ඔවුන් ඒ බව දන්-
නේ ඔබ මට කියා දුන් දේවල්
මම එලෙසින්ම ඔවුන්ට කියා දුන්
නිසයි.[13] ඔවුන් ඒ දේවල් පිළිගෙන
මා ඔබේ නියෝජිතයා ලෙස පැමිණි
බව[14] ඇත්තටම තේරුම්ගෙන සිටි-
නවා. ඔබ මාව එවූ බව ඔවුන්ට විශ්-
වාසයි.[15] **9** මම ඔබට ඔවුන් ගැන
කන්නලව් කරනවා. මම කන්නලව්
කරන්නේ මේ ලෝකයේ සිටින අය
ගැන නොවෙයි.[16] ඔබ මට භාර දුන් ඒ
අය ගැනයි. මන්ද ඔවුන් අයිති වන්-
නේ ඔබටයි. **10** ඔබට අයිති සෑම

**16 පරි.**
1 යොහ 14:21
2 යොහ 3:13
යොහ 17:8
3 1රාජා 8:49
ගීතා 11:4
යොහ 13:3
හෙබ්‍රෙ 9:24
4 යොහ 21:17
5 යොහ 2:25
6 යොහ 17:8
7 සෙක 13:7
මතෙ 26:31
මතෙ 26:56
මාක් 14:27
8 යොහ 8:29
9 යොහ 14:27
එපී 2:14
10 ක්‍රියා 14:22
1තෙස 3:4
1යොහ 4:4
1යොහ 5:4
එළි 3:21

**17 පරි.**
11 මතෙ 14:19
මාක් 7:34
යොහ 11:41

**2 තීරුව**
1 යොහ 12:23
යොහ 13:32
2 දානි 7:14
මතෙ 28:18
1කොරි 15:25
පිලි 2:10
හෙබ්‍රෙ 2:8
3 යොහ 6:37
4 යෙසා 53:11
යොහ 4:14
යොහ 6:27
5 ලූක් 10:25
6 1කොරි 8:4
1තෙස 1:9
1යොහ 5:20
7 යොහ 5:37
8 එපී 4:13
පිලි 1:9
1තිමෝ 6:20
2පේතෘ 3:18
9 යොහ 4:34
10 යොහ 13:31
යොහ 14:13
11 යොහ 1:1
යොහ 8:58
කොලො 1:15
12 ගීතා 22:22
යොහ 10:29
ක්‍රියා 15:14
හෙබ්‍රෙ 2:12
13 යොහ 6:68
යොහ 8:28
යොහ 12:49
යොහ 14:10
14 යොහ 16:27
හෙබ්‍රෙ 3:1
15 යොහ 16:30
16 1යොහ 5:19

යොහ **17:3*** මෙය නිරතුරුවම කළ යුතු දෙයකි.

දෙයක්ම ඔබ මට භාර දී තිබෙනවා.
මට තිබෙන සෑම දෙයක්ම ඔබට
අයිතියි.[1] මම ඔවුන් ගැන මෙසේ
කන්නලව් කරන්නේ ඔවුන් මට ගෞ-
රව කර ඇති නිසයි.

**11** “මම ලෝකයෙන් සමුගෙන ඔබ
ළඟට එනවා. නමුත් ඔවුන් සිටින්-
නේ ලෝකයේ.[2] ඒ නිසා ශුද්ධ වූ
පියාණෙනි, ඔවුන්ව රැකබලා ගන්න.[3]
ඔබේ නාමය වෙනුවෙන් ඒ දේ
කරන්න. මමත් සියල්ල කළේ ඔබේ
නාමය වෙනුවෙනුයි. එවිට අප දෙ-
දෙනා අතර පූර්ණ බැඳීමක් තිබෙනවා
වගේ ඔවුන් අතරත් පූර්ණ බැඳීමක්
ඇති වෙයි.[4] **12** ඔබේ නාමය වෙනු-
වෙන් ක්‍රියා කරන මම ඔවුන් සමඟ
සිටියදී ඔවුන්ව ආරක්ෂා කළා.[5] ඒ
ඔබේ නාමය නිසයි. මම ඔවුන්ව රැක-
බලා ගත්තා. විනාශ වන තැනැත්තා
හැර[6] ඔවුන්ගෙන් එක් කෙනෙකුට-
වත් හානියක් වුණේ නැහැ.[7] ඒ දේ
සිදු වුණේ ශුද්ධ ලියවිල්ලේ සඳ-
හන් දේ ඉටු වීමටයි.[8] **13** නමුත් මට
දැන් ඔබ ළඟට පැමිණීමට කාලය
ඇවිත් තිබෙනවා. මම මෙහි සිටි-
යදී මේ දේවල් ගැන කතා කරන්-
නේ මා අද්දකින ප්‍රීතිය ඔවුන්ටත්
සම්පූර්ණයෙන්ම ලැබෙනවා දකින්න
මම කැමති නිසයි.[9] **14** ඔබ පැවසූ
දේවල් මම ඔවුන්ට කියා දී තිබෙනවා.
නමුත් ලෝකය ඔවුන්ට වෛර කර-
නවා.[10] එයට හේතුව මම මේ ලෝක-
යේ මිනිසුන්ට සමාන නොවී සිටිනවා
වගේම ඔවුනුත් මේ ලෝකයේ මිනි-
සුන්ට සමාන නොවී සිටින නිසයි.[11]

**15** “මම ඔබෙන් ඉල්ලන්නේ,
ඔවුන්ව ලෝකයෙන් ඉවතට ගන්න
කියා නොවෙයි. නමුත් දුෂ්ටයාගේ
බලපෑමෙන් ඔවුන්ව ආරක්ෂා කරන්න
කියායි.[12] **16** මම මේ ලෝකයේ
මිනිසුන්ට සමාන නොවී සිටිනවා
වගේම[13] ඔවුනුත් මේ ලෝකයේ මිනි-
සුන්ට සමාන නොවී සිටිනවා.[14]
**17** ඔබ පවසන දේ[15] සත්‍යයයි.[16] ඒ
සත්‍යය මගින් ඔවුන්ව ශුද්ධව තබා-
ගන්න.*[1] **18** ඔබ මාව ලෝකයට
එවූ ලෙසම මමත් ඔවුන්ව ලෝකයට
යවනවා.[2] **19** මම ඔවුන් වෙනුවෙන්
මගේ ශුද්ධකම රැකගත්තා. ඔවුන්ටත්
තම ශුද්ධකම රැකගත හැකි වෙයි.[3]
එසේ කළ හැක්කේ සත්‍යයට ඇලී
සිටීමෙනුයි.

**20** “මම ඔබට කන්නලව් කරන්-
නේ ඔවුන් ගැන පමණක් නොවෙයි.
නමුත් ඔවුන් පවසන දේවල් නිසා
මා කෙරෙහි විශ්වාසය තබන අය[4]
ගැනත් ඔබට කන්නලව් කරනවා.
**21** පියාණෙනි, ඔබ මා සමඟත් මම
ඔබ සමඟත් එකට බැඳී සිටින්නා සේ[5]
ඔවුන් සියලුදෙනා අතරත් එකඟතා-
වක් ඇති වෙයි.[6] ප්‍රතිඵලයක් ලෙස
ඔවුන් අප සමඟද එකට බැඳී සිටියි.[7]
ඒ වගේම ඔබ මාව එවූ බව විශ්වාස
කරන්නත් ලෝකයට හැකි වෙයි.[8]
**22** ඔබ මට ගෞරවය ගෙන දුන්
ආකාරයටම මම ඔවුන්ටත් ගෞරවය
දී තිබෙනවා. එවිට අප අතර බැඳී-
මක් තිබෙනවා වගේම ඔවුන් අතරත්
බැඳීමක් ඇති වෙයි.[9] **23** මම ඔවුන්
සමඟත් ඔබ මා සමඟත් එකට බැඳී
සිටිනවා. එමගින් ඔවුන් අතර සැබෑ
සමඟියක් හා එකමුතුකමක් දක්-
නට ලැබෙයි.[10] එයින් ඔබ මාව එවූ
බවත් ඔබ මට ප්‍රේම කළ ආකා-
රයටම ඔවුන්ටත් ඔබ ප්‍රේම කරන
බවත් ලෝකයට දැනගත හැකි වෙයි.
**24** පියාණෙනි, ඔබ මට දී තිබෙන අය
වෙනුවෙන් මම ඉල්ලීමක් කරනවා.
ඔවුනුත් මා සමඟ සිටිනවා දකින්න
මම කැමතියි.[11] පොළොවේ[12] දරුවන්
බිහි වීමට කලින්*[13] ඔබ මට ප්‍රේම
කළ නිසා මට දී ඇති තේජස ඔවුන්ට
එවිට දැකගත හැකි වෙයි. **25** ධර්-
මිෂ්ඨ[14] පියාණෙනි, ලෝකය නම්
ඔබව හඳුනාගෙන නැහැ.[15] නමුත් මම
ඔබව හොඳින් හඳුනාගෙන සිටිනවා.
ඒ වගේම ඔබ මාව එවූ බව ඔවු-
නුත් හොඳින් දන්නවා.[16] **26** ඔබ

**17 පරි.**
**1** යොහ 16:15
**2** යොහ 13:1
**3** 1පේතෘ 1:5, යූද් 24
**4** යොහ 10:30, යොහ 17:21
**5** යොහ 6:39, යොහ 10:28, 1යොහ 5:18
**6** මාක් 14:21, හෙබ්‍රෙ 10:27
**7** යොහ 18:9
**8** ගීතා 41:9, ගීතා 109:8, ක්‍රියා 1:20
**9** යොහ 15:11
**10** 1යොහ 3:13
**11** යොහ 8:23, යොහ 15:19, යාකො 4:4
**12** මතෙ 6:13, 2තෙස 3:3, 1යොහ 5:18
**13** යොහ 18:36
**14** කොලො 1:13
**15** පිලි 2:16
**16** ගීතා 12:6, ගීතා 119:151, ගීතා 119:160, යාකො 1:18

**2 තීරුව**
**1** ක්‍රියා 15:9, එෆී 5:26, 1තෙස 5:23, 2තෙස 2:13, 1පේතෘ 1:22
**2** යොහ 20:21
**3** 1තෙස 4:7, හෙබ්‍රෙ 10:10
**4** රෝම 10:17, 1යොහ 1:3
**5** යොහ 10:38, යොහ 14:10
**6** රෝම 12:5, 1කොරි 1:10, ගලා 3:28, 1යොහ 1:7
**7** 1කොරි 6:17
**8** යොහ 17:8
**9** යොහ 14:20, යොහ 17:11, 1යොහ 1:3, 1යොහ 3:24
**10** 1කොරි 6:17
**11** ලූක් 22:30, යොහ 12:26, 1තෙස 4:17
**12** යොහ 17:5
**13** උත් 4:1, හෙබ්‍රෙ 4:3
**14** යෙරෙ 50:7, රෝම 3:26
**15** 1යොහ 3:1
**16** මතෙ 11:27, යොහ 8:55, යොහ 15:21

යොහ **17:17*** එනම්, ඔවුන්ව දෙවි වෙනුවෙන්ම තබාගන්න. **24*** මතෙ 25:34හි පාදසටහන බලන්න.

මට දැක්වූ ප්‍රේමය ඔවුන් තුළ තිබීම-
ටත් මා ඔවුන් සමඟ එකට බැඳී
සිටීම සඳහාත්[1] මම ඔබේ නාමය ගැන
ඔවුන්ට දැනුම් දුන්නා.[2] ඒ ගැන ඉදිරි-
යටත් දැනුම් දෙනවා.”

**18** ඒ දේවල් පැවසූ පසු යේ-
සුස් තම ගෝලයන් සමඟ
කිද්‍රොන් නිම්නය[3] හරහා ගොස් උය-
නකට පැමිණියේය. ඔහුද ඔහුගේ
ගෝලයෝද ඒ උයනට ඇතුල් වූහ.[4]
**2** යේසුස් තම ගෝලයන් සමඟ
අවස්ථා කිහිපයකදීම එම ස්ථානයේදී
කාලය ගත කළ නිසා ඔහුව පාවා
දීමට සිටි යූදස්ද ඒ ස්ථානය ගැන දැන
සිටියේය.[5] **3** එහෙයින් යූදස්, හේවා
පිරිසක්ද නායක පූජකයන්ගේ සහ
පරිසිවරුන්ගේ නිලධාරීන්ද සමඟ එම
ස්ථානයට ගියේය. ඔවුන් එම ස්ථා-
නයට පැමිණියේ පන්දම්, පහන් හා
ආයුධ රැගෙනය.[6] **4** තමාට මුහුණ
දීමට සිදු වන සියල්ල ගැන දැන
සිටි යේසුස්[7] ඉදිරියට ගොස්, “ඔබ
සොයන්නේ කාවද” කියා ඔවුන්ගෙන්
ඇසුවේය. **5** ඔවුහුද, “අපි සොයන්-
නේ නාසරෙත් නුවරින් පැමිණි යේ-
සුස්වයි”[8] කියා පිළිතුරු දුන්නෝය.
“ඒ මමයි” කියා යේසුස් ඔවුන්ට
කීවේය. ඒ අවස්ථාවේදී ඔහුව පාවා
දුන් යූදස්ද[9] එතැනට පැමිණි පිරිස
සමඟ සිටියේය.

**6** “ඒ මමයි” කියා යේසුස් පැවසූ
විට ඒ පිරිස පස්සෙන් පස්සට ගොස්[10]
බිම ඇද වැටුණෝය. **7** එහෙයින්
යේසුස් නැවතත්, “ඔබ සොයන්නේ
කාවද” කියා ඔවුන්ගෙන් ඇසුවේය.
ඔවුහුද, “නාසරෙත් නුවරින් පැමිණි
යේසුස්වයි” කියා පිළිතුරු දුන්නෝය.
**8** එවිට යේසුස් මෙසේ පැවසුවේය. “ඒ
මම කියා දැන් ඔබට කිව්වා නේද?
ඔබ හොයන්නේ මාව නම් මේ අයට
යන්න දෙන්න.” **9** ඔහු ඒ දේ පැවසු-
වේ, “ඔබ මට භාර දුන් අයගෙන්
එක් කෙනෙකුටවත් හානියක් වුණේ
නැහැ”[11] කියා ඔහු පැවසූ දේ ඉටු
වීමටයි.

**10** එවිට කඩුවක් බැඳගෙන සිටි
සීමොන් පේතෘස් එය පිටතට ඇද,
උත්තම පූජකයාගේ දාසයාට පහර
දුන්නේය. ප්‍රතිඵලයක් ලෙස ඔහුගේ
දකුණු කන කැපී ගියේය.[1] ඒ දාසයා-
ගේ නම මැල්කස්ය. **11** නමුත් යේ-
සුස් පේතෘස්ට මෙසේ කීවේය.
“ඔය කඩුව නැවතත් කොපුවේ දමා-
ගන්න.[2] පියාණන් මට බොන්න දී
ඇති කුසලානයෙන්* මම අනිවාර්ය-
යෙන්ම පානය කළ යුතුයි.”[3]

**12** එවිට හේවා පිරිසද සෙන්-
පතිද යුදෙව්වරුන්ගේ නිලධාරීහුද
එකතු වී යේසුස්ව අල්ලා ඔහුගේ අත්
බැන්දෝය. **13** ඔහුව මුලින්ම ගෙන
ගියේ අන්නස් වෙතටය. එයට හේතුව
වූයේ අන්නස් ඒ අවුරුද්දේ උත්තම
පූජකයාව සිටි කායෆස්ගේ[4] භාර්යාව-
ගේ පියා වූ නිසාය. **14** සියල්ලන්
වෙනුවෙන් එක මිනිසෙකු මිය යෑම
ප්‍රයෝජනවත් වන බව යුදෙව්වරුන්ට
කලින් පැවසුවේ කායෆස්ය.[5]

**15** මේ අතර සීමොන් පේතෘස් සහ
තවත් ගෝලයෙක් යේසුස් පසුපස
ගියෝය.[6] උත්තම පූජකයා ඒ ගෝල-
යාව දැන සිටි නිසා ඔහුද යේසුස්
සමඟ උත්තම පූජකයාගේ නිවසෙහි
ඇතුල් මළුවට ගියේය. **16** නමුත්
පේතෘස් සිටියේ දොරකඩ අසලය.[7]
එහෙයින් උත්තම පූජකයා දැන සිටි
අනික් ගෝලයා පිටතට ගොස් දො-
රටු පාලිකාවට කතා කර, පේතෘස්ව
ඇතුළට ගෙන ආවේය. **17** එවිට
දොරටු පාලිකාව ලෙස සිටි සේවිකාව
පේතෘස්ගෙන් මෙසේ ඇසුවාය. “ඔබත්
මේ මිනිසාගේ ගෝලයෙක් නේද?”
ඔහුද, “නැහැ” කියා පිළිතුරු දුන්-
නේය.[8] **18** එය ශීත රාත්‍රියක් විය.
ඒ නිසා දාසයෝද නිලධාරීහුද ගිනිමැ-
ලයක් වටා[9] සිටගෙන ගිනි තපිමින්
සිටියෝය. පේතෘස්ද ඔවුන් සමඟ ගිනි
තපිමින් සිටියේය.

**19** මේ අතර නායක පූජකයා

**17 පරි.**
1 යොහ 15:9; රෝම 8:39; එපී 3:17
2 ද්වි 32:3; මතෙ 6:9; යොහ 17:6

**18 පරි.**
3 2සාමු 15:23
4 මතෙ 26:36; මාක් 14:32
5 ලූක් 22:39
6 මතෙ 26:47; මාක් 14:43; ක්‍රියා 1:16
7 යොහ 13:3
8 මතෙ 2:23; මාක් 1:24; මාක් 10:47; මාක් 14:67
9 ලූක් 22:47
10 යොහ 7:46
11 යොහ 6:39; යොහ 17:12

**2 තීරුව**
1 මතෙ 26:51; මාක් 14:47; ලූක් 22:50
2 මතෙ 26:52; ලූක් 22:51; යොහ 18:36
3 මතෙ 20:22; මතෙ 26:42
4 මතෙ 26:57; ලූක් 3:2; යොහ 18:24; ක්‍රියා 4:6
5 යොහ 11:50
6 මතෙ 26:58; මාක් 14:54; ලූක් 22:54
7 මතෙ 26:69; මාක් 14:66
8 මාක් 14:68; යොහ 18:25
9 යෙරෙ 36:22

යොහ **18:11*** මතෙ 26:39හි පාදසටහන බලන්න.

යේසුස්ගේ ගෝලයන් ගැනත් ඔහුගේ
ඉගැන්වීම් ගැනත් යේසුස්ගෙන් ප්‍රශ්න
කළේය. **20** යේසුස් ඔහුට මෙසේ
පිළිතුරු දුන්නේය. “මම සෑම දෙයක්ම
ඉගැන්වූයේ ප්‍රසිද්ධියේයි. මම නිත-
රම ඉගැන්වූයේ යුදෙව්වරුන් සියලු-
දෙනා එක් රැස් වන සිනගෝගයකදී
නැත්නම් දේවමාලිගාවේදීයි.[1] මම
කිසිම දෙයක් රහසින් කිව්වේ නැහැ.
**21** ඔබ මගෙන් මේ ප්‍රශ්න අසන්නේ
ඇයි? මා පැවසූ දේවල් අසාගෙන සිටි
අයගෙන් අහලා බලන්න. මා කතා
කළ දේවල් ගැන ඔවුන් දන්නවා.”
**22** ඔහු ඒ දේවල් පැවසූ විට ළඟ සිට-
ගෙන සිටි එක් නිලධාරියෙක් යේසුස්-
ගේ කම්මුලට පහර දී,[2] “ඔබ නායක
පූජකයාට පිළිතුරු දෙන්නේ මෙ-
හෙමද” කියා ඇසුවේය. **23** යේසුස්
ඔහුට මෙසේ පිළිතුරු දුන්නේය. “මා
කී දේ වැරදි නම් ඒ වරද මොකක්ද
කියලා මට කියන්න. නමුත් මම
පැවසූ දේවල වරදක් නැත්නම් ඔබ
මට පහර දෙන්නේ ඇයි?” **24** එවිට
අන්නස් අත් බැඳ සිටි යේසුස්ව උත්-
තම පූජකයා වූ කායඵාස් වෙතට යැව්-
වේය.[3]

**25** මේ අතරේ සීමොන් පේතෘස්
සිටගෙන ගිනි තපිමින් සිටියේය.
එවිට ඔහු සමඟ සිටි අය, “ඔබත් ඔහු-
ගේ ගෝලයෙක් නේද” කියා ඔහුගෙන්
ඇසූහ. ඔහුද, “නැහැ” කියා පවසමින්
ඔවුන් පැවසූ දේ ප්‍රතික්ෂේප කළේය.[4]
**26** ඒ පිරිස අතර උත්තම පූජකයාගේ
තවත් දාසයෙක් සිටියේය. ඔහු පේ-
තෘස් විසින් පහර දී කන කපා දැමූ
මිනිසාගේ නෑදැයෙකි.[5] ඔහු පේතෘස්ව
දැක, “ඔබ ඔහු සමඟ උයනේ සිටිනවා
මම දැක්කා” කියා ඔහුට පැවසුවේය.
**27** නමුත් පේතෘස් නැවතත් ඔවුන්
පැවසූ දේ ප්‍රතික්ෂේප කළේය. ඒ මො-
හොතේම කුකුළෙක් හැඬලුවේය.[6]

**28** ඉන්පසු ඔවුහු යේසුස්ව කාය-
ඵාස් සිටි තැනින් ආණ්ඩුකාරයාගේ
මාලිගාවට ගෙන ගියෝය.[7] එය සිදු
වූයේ හිමිදිරි උදෑසනය. නමුත් ඔවුහු
ආණ්ඩුකාරයාගේ මාලිගාවට ඇතුල්
නොවූහ. එයට හේතුව පාස්කු භෝජ-
නයට සහභාගි වීමට සිටි ඔවුන්, එසේ
කිරීමෙන් තමන් අපවිත්‍ර වෙයි කියා
සිතූ නිසාය.[1] **29** එහෙයින් පිලාත්
ඔවුන් වෙනුවෙන් පිටතට ඇවිත්, “ඔබ
මේ මිනිසාට විරුද්ධව නඟන චෝ-
දනාව මොකක්ද”[2] කියා ඇසුවේය.
**30** ඔවුහු මෙසේ පිළිතුරු දුන්නෝය.
“මේ මිනිසා වරදකරුවෙක් නොවෙයි
නම් අප ඔහුව ඔබට භාර දෙන්-
නේ නැහැ.” **31** එහෙයින් පිලාත්,
“ඔහුව ගෙන ගොස් ඔබේ නීතියට
අනුව ඔහුව විනිශ්චය කරන්න”[3] කියා
ඔවුන්ට කීවේය. යුදෙව්වරුද, “අපට
කිසිම කෙනෙක් මරණයට පත් කිරීම
තහනම්”[4] කියා කීවෝය. **32** ඒ දේ
සිදු වූයේ යේසුස් තම මරණය ගැන
පැවසූ දේ ඉටු වීම සඳහාය.[5]

**33** එහෙයින් ආණ්ඩුකාර පිලාත්
නැවතත් තම මාලිගාවට ඇතුල් වී
යේසුස්ව තමන් ළඟට කැඳවා, “ඔබ
යුදෙව්වරුන්ගේ රජද”[6] කියා ඔහුගෙන්
ඇසුවේය. **34** යේසුස් මෙසේ පිළි-
තුරු දුන්නේය. “ඔබ එහෙම අහන්නේ
ඔබට එහෙම හිතෙන නිසාද? නැත්-
නම් වෙනත් අය මා ගැන ඔබට යම්
දේවල් පැවසූ නිසාද?”[7] **35** පිලාත්ද,
“මම යුදෙව්වෙක්ද? ඔබව මට භාර
දුන්නේ ඔබේම ජාතියේ මිනිසුන් හා
නායක පූජකයනුයි.[8] ඔබ මොන-
වාද කළේ” කියා ඇසුවේය. **36** යේ-
සුස් මෙසේ පිළිතුරු දුන්නේය.[9]
“මගේ රාජ්‍යය මේ ලෝකයට කිසිම
ආකාරයකින් සම්බන්ධ නැහැ.[10] මගේ
රාජ්‍යය මේ ලෝකයට සම්බන්ධ වී
තිබුණා නම් මා යටතේ සිටි අය මා
වෙනුවෙන් සටන් කර[11] මාව යුදෙව්-
වරුන්ගේ අතට හසු වෙන්න ඉඩ
දෙන්නේ නැහැ. නමුත් මගේ රාජ්‍යය
මේ ලෝකයට කිසිම ආකාරයකින්
සම්බන්ධ නැහැ.” **37** එවිට පිලාත්,
“එසේනම්, ඔබ රජෙක්ද” කියා ඔහු-
ගෙන් ඇසුවේය. යේසුස් මෙසේ පිළි-
තුරු දුන්නේය. “මම රජෙක් කියා ඔබ
අසන ප්‍රශ්නයෙන්ම පැහැදිලියි.[12] මා
ඉපදුණෙත් මේ ලෝකයේ මිනිසුන්

**18 පරි.**
**1** මතෙ 26:55 ලූක් 4:15 ලූක් 19:47 යොහ 7:14
**2** යෙසා 50:6 මතෙ 5:39 යොහ 19:3 ක්‍රියා 23:2
**3** මතෙ 26:57
**4** මතෙ 26:69 මාක් 14:69 ලූක් 22:58
**5** යොහ 18:10
**6** මතෙ 26:74 මාක් 14:72 ලූක් 22:60 යොහ 13:38
**7** මතෙ 27:2 මාක් 15:1 ලූක් 23:1 ක්‍රියා 3:13

**2 තීරුව**
**1** ක්‍රියා 10:28
**2** ලූක් 23:2
**3** යොහ 19:6 ක්‍රියා 18:15
**4** යොහ 19:10
**5** මතෙ 20:19 යොහ 3:14 යොහ 12:32
**6** මතෙ 27:11 යොහ 12:13
**7** යොහ 18:29
**8** යොහ 1:11
**9** 1තිමෝ 6:13
**10** යෙසා 9:6 දානි 2:44 දානි 7:14
**11** මතෙ 26:53 යොහ 18:11
**12** මතෙ 26:64 මතෙ 27:11

අතරට පැමිණියෙන් සත්‍යය ගැන
සාක්ෂි දැරීමටයි.[1] සත්‍යයට පක්-
ෂව සිටින සියලුදෙනාම[2] මගේ
හඬට සවන් දෙනවා."[3] **38** පිලාත්ද,
"සත්‍යය? ඒ මොකක්ද" කියා ඔහු-
ගෙන් ඇසුවේය.

පිලාත් ඉන්පසුව නැවතත් පිටත
සිටි යුදෙව්වරුන් වෙතට ගොස්
ඔවුන්ට මෙසේ කීවේය. "මොහු වරද-
කරුවෙක් කියා මට නම් පෙනෙන්-
නේ නැහැ.[4] **39** පාස්කු කාලයේදී
සාමාන්‍යයෙන් සිරිතක් හැටියට මම
එක මිනිසෙක්ව නිදහස් කරනවා.[5]
ඒ නිසා මම යුදෙව්වරුන්ගේ රජුව
නිදහස් කරනවාට ඔබ කැමතිද?"
**40** එවිට ඔවුහු නැවතත්, "මේ මිනි-
සාව නිදහස් කරන්න එපා. බරබ්බස්ව
නිදහස් කරන්න" කියා කෑගැසුවෝය.
ඔවුන් නිදහස් කරන්න කියා කියූ
බරබ්බස් නම් මිනිසා කොල්ලකරු-
වෙකි.[6]

**19** එවිට පිලාත් යේසුස්ට කස-
යෙන් තැළීමට අණ දුන්-
නේය.[7] **2** හේවායෝද කටුවලින්
ඔටුන්නක් සාදා, එය ඔහුගේ
හිස මත තබා දම් පැහැති වස්ත්‍ර-
යක් ඔහුට ඇන්දුවෝය.[8] **3** ඉන්පසු
ඔවුහු ඔහු ළඟට ඇවිත්, "යුදෙව්-
වරුන්ගේ රජ්ජුරුවෙනි, ඔබට සුබ
දවසක් වේවා" කියා පවසමින් ඔහු-
ගේ කම්මුලට පහර දුන්හ.[9] **4** එවිට
පිලාත් නැවතත් පිටතට ගොස්,
"මෙන්න මම නැවතත් ඔහුව ඔබ ඉදි-
රියට ගෙනෙනවා. ඇත්තෙන්ම ඔහු
තුළ කිසි වරදක් මට පෙනෙන්නේ
නැහැ"[10] කියා ඔවුන්ට කීවේය. **5** ඒ
අවස්ථාවේදී කටු ඔටුන්නක් පැළඳ-
ගෙන දම් පැහැති වස්ත්‍රයක් ඇඳ-
ගෙන සිටි යේසුස් පිටතට ආවේය.
එවිට පිලාත්, "බලන්න! මේ තමයි ඒ
මිනිසා" කියා සියලුදෙනාට කීවේය.
**6** නමුත් නායක පූජකයෝ හා නිල-
ධාරීහු ඔහුව දුටු විට, "ඔහුව කණු-
වක ඇණ ගසා මරා දමන්න! ඔහුව
කණුවක ඇණ ගසා මරා දමන්න"[11]

**18 පරි.**
1 යොහ 1:14; යොහ 1:17; යොහ 14:6
2 යොහ 8:32; 1යොහ 3:19; 1යොහ 4:6
3 යොහ 8:46
4 මතෙ 27:24; ලූක් 23:4; යොහ 15:25
5 මතෙ 27:15; මාක් 15:6
6 ගණන් 35:31; ලූක් 23:19; ක්‍රියා 3:14

**19 පරි.**
7 යෙසා 50:6; මතෙ 20:19; මතෙ 27:26; මාක් 15:15; ලූක් 18:33
8 මතෙ 27:29; මාක් 15:17; ලූක් 23:11
9 යෙසා 53:3
10 ලූක් 23:4; යොහ 18:38; 2කොරි 5:21
11 නික් 23:7; මතෙ 27:22; මාක් 15:13; ලූක් 23:21

**2 තීරුව**
1 යොහ 18:31; ක්‍රියා 3:13
2 මතෙ 26:63; යොහ 5:18
3 ලෙවී 24:16
4 යෙසා 53:7; මතෙ 27:12; මතෙ 27:14; ක්‍රියා 8:32
5 ලූක් 23:9
6 උත් 45:8; දානි 4:17; ලූක් 22:53; යොහ 7:30; යොහ 10:18; රෝම 13:2; එළි 13:7
7 ලූක් 23:2; ක්‍රියා 17:7

කියා කෑගැසූහ. පිලාත් ඔවුන්ට මෙසේ
කීවේය. "මට නම් ඔහුගේ කිසි වර-
දක් පෙනෙන්නේ නැහැ. ඔහුව කණු-
වක ඇණ ගසා මරා දමන්න ඔබට
අවශ්‍ය නම් ඔබම ඔහුව ගෙන ගොස් ඒ
දේ කරන්න."[1] **7** යුදෙව්වරු ඔහුට
මෙසේ පිළිතුරු දුන්නෝය. "තමා දෙ-
විගේ පුත්‍රයා කියා ඔහු පවසා තිබෙ-
නවා.[2] අපේ නීතියට[3] අනුව එය මරණ
දණ්ඩනය ලැබිය යුතු වරදක්."

**8** පිලාත්ට ඒ දේ ඇසුණු විට ඔහු-
ගේ බිය තවත් වැඩි විය. **9** තම
මාලිගාවට නැවතත් ඇතුල් වූ ඔහු,
"ඔබ ආවේ කොහෙන්ද" කියා යේ-
සුස්ගෙන් ඇසුවේය. නමුත් යේසුස්
ඔහුට කිසි පිළිතුරක් දුන්නේ නැත.[4]
**10** එවිට පිලාත්, "ඔබ මට කිසි-
වක් කියන්නේ නැද්ද?[5] ඔබව නිද-
හස් කර හරින්නත් ඔබව කණුවක
ඇණ ගසා මරා දමන්නත් මට බලය
තිබෙන බව ඔබ දන්නේ නැද්ද" කියා
යේසුස්ට පැවසුවේය. **11** යේසුස්ද,
"ඔබට ඉහළින් ඒ සඳහා අවසර ලබා
දී තිබුණේ නැත්නම් මට විරුද්ධව
කිසිම පියවරක් ගන්න ඔබට බලයක්
නැහැ.[6] නමුත් ඔබට මාව භාර දුන්
මිනිසාගේ පාපය ඊටත් වඩා බරපත-
ළයි" කියා ඔහුට පිළිතුරු දුන්නේය.

**12** එහෙයින් ඔහුව නිදහස් කිරීමට
කැමැත්තෙන් සිටි පිලාත් ඒ සඳහා
මහක් සෙවීමට උත්සාහ කළේය.
නමුත් යුදෙව්වරු, "ඔබ මේ මිනි-
සාව නිදහස් කර හැරියොත් ඔබ
සීසර්ගේ මිත්‍රයෙක් වන්නේ නැහැ.
රජෙක් හැටියට පත් වෙන්න උත්-
සාහ කරන ඕනෑම කෙනෙක් වැඩ
කරන්නේ සීසර්ට විරුද්ධවයි"[7] කියා
කෑගසමින් පැවසූහ. **13** ඒ වචන
ඇසූ පිලාත් යේසුස්ව පිටතට ගෙ-
නාවේය. ඔහු හෙබ්‍රෙව් බසින් ගබ්-
බතා ලෙස හඳුන්වන ගල් අතුරා
ඇති ස්ථානයේ තිබූ විනිශ්චයාස-
නයක ඉඳගත්තේය. **14** ඒ දේ සිදු
වූයේ හයවෙනි පැයේදී* පමණය.

---

යොහ **19:14*** එනම්, දහවල් 12ට පමණ.

එදින පාස්කුව සඳහා සූදානම් වීමේ
දවස විය.[1] “බලන්න, ඔබේ රජ”
කියා පිලාත් යුදෙව්වරුන්ට කීවේය.
**15** නමුත් ඔවුහු කෑගසමින්, “ඔහුව
මරා දමන්න! මරා දමන්න! ඔහුව
කණුවක ඇණ ගසා මරා දමන්න”
කියා පැවසූහ. “මම ඔබේ රජුව
කණුවක ඇණ ගසා මරා දමනවාට
ඔබ කැමතිද” කියා පිලාත් ඔවුන්-
ගෙන් ඇසුවේය. නායක පූජකයෝ
පිළිතුරු දෙමින්, “අපට සීසර් හැර
වෙන කිසි රජෙක් නැහැ”[2] කියා පැව-
සූහ. **16** එවිට පිලාත් ඔහුව කණු-
වක ඇණ ගසා මරණයට පත් කිරීම
සඳහා භාර දුන්නේය.[3]

එවිට හේවායෝ යේසුස්ව භාර-
ගත්හ. **17** යේසුස් වධකණුව රැගෙන
ගියේය.[4] ඔහු එය රැගෙන හෙබ්‍රෙව්
බසින් ගොල්ගොතා ලෙස හැඳින්වූ[5]
හිස්කබල නම් ස්ථානයට ගියේය.[6]
**18** හේවායන් ඔහුව කණුවේ ඇණ
ගසා එල්ලා තැබුවේ එතැනය.[7] එහි
තවත් මිනිසුන් දෙදෙනෙකුවද කණු-
වල එල්ලන ලදි. මැදින් එල්ලා තැබු-
වේ යේසුස්වය.[8] එක් කෙනෙක් ඔහුගේ
දකුණු පසින්ද අනික් තැනැත්තා
ඔහුගේ වම් පසින්ද එල්ලන ලදි.
**19** පිලාත් වධකණුවේ සවි කිරීම
සඳහා සටහනක්ද පිළියෙල කළේය.
එහි ලියා තිබුණේ, “යුදෙව්වරුන්ගේ
රජු වන නාසරෙත් නුවරේ යේසුස්”[9]
කියාය. **20** යේසුස්ව කණුවේ ඇණ
ගසා තිබූ ස්ථානය නුවරට කිට්ටු-
වෙන් පිහිටා තිබුණු නිසා[10] යුදෙව්ව-
රුන්ගෙන් බොහෝදෙනෙක් ලියා තිබූ
ඒ දේ කියෙව්වෝය. එය හෙබ්‍රෙව්,
ලතින් සහ ග්‍රීක යන භාෂාවලින් ලියා
තිබිණ. **21** නමුත් යුදෙව්වරුන්ගේ
නායක පූජකයෝ පිලාත්ට මෙසේ
කීවෝය. “ ‘යුදෙව්වරුන්ගේ රජ’ කියා
ලියන්න එපා. ‘මම යුදෙව්වරුන්ගේ
රජු’ කියා ඔහු පැවසූ බව ලියන්න.”
**22** එවිට පිලාත්, “මම ලියූ දේ වෙනස්
කරන්නේ නැහැ” කියා පැවසුවේය.

**23** යේසුස්ව කණුවේ ඇණ ගැසූ
හේවායෝ, ඔහුගේ පිට වස්ත්‍ර ගෙන
එක් හේවායෙකුට එක් කොටසක්
බැගින් කොටස් හතරකට බෙදාගත්-
තෝය. ඔවුහු ඔහුගේ ඇතුල් වස්ත්‍ර-
යද ගත්හ. ඒ වස්ත්‍රයට මූට්ටුවක්
තිබුණේ නැත. එය උඩ සිට පහ-
ළට මුළුමනින්ම එකට වියා තිබිණ.[1]
**24** එහෙයින් ඔවුහු එකිනෙකාට
මෙසේ කීවෝය. “අපි එය ඉරන්නේ
නැතුව එය අයිති වෙන්නේ කාටද
කියා තීරණය කරන්න ආදු දමමු”
කියා කීවෝය. මෙයින්, “ඔවුහු මාගේ
පිට වස්ත්‍ර තමන් අතරේ බෙදාගෙන
මාගේ ඇඳුම් සඳහා ආදු දැමුවෝය”[2]
කියා ශුද්ධ ලියවිල්ලේ සඳහන් දේ ඉටු
විය. ඒ හේවායන් කටයුතු කළ ආකා-
රය ශුද්ධ ලියවිල්ලේ සඳහන් ලෙසම
සිදු විය.

**25** යේසුස්ගේ වධකණුව අසල
ඔහුගේ මව,[3] ඔහුගේ මවගේ සහෝද-
රිය, ක්ලෝපස්ගේ භාර්යාව වූ මරියා[4]
සහ මරියා මග්දලේනා[5] යන අය
සිටගෙන සිටියහ. **26** එවිට යේසුස්
ඔහුගේ මවද ඇය අසල තමා ප්‍රේම
කළ ගෝලයාද[6] සිටිනවා දැක, “මේ
සිටින්නේ ඔබේ පුතා” කියා තම මවට
කීවේය. **27** ඉන්පසු ඔහු ඒ ගෝල-
යාට මෙසේ පැවසුවේය. “මේ සිටින්-
නේ ඔබේ මව!” පසුව ඒ ගෝලයා
ඇයව තම ගෙදරට ගෙන ගොස් බලා-
ගත්තේය.

**28** ඒ දේවලින් පසු යේසුස්, දැන්
සියල්ල ඉටු වී තිබෙන බව දැන ශුද්ධ
ලියවිල්ලේ සඳහන් තවත් දෙයක් ඉටු
කරමින් “මට තිබහයි”[7] කියා කීවේය.
**29** එම ස්ථානයෙහි ඇඹුල් වයින්ව-
ලින් පිරුණු බඳුනක් තිබිණ. එහෙයින්
ඔවුහු ස්පොන්ජියකට සමාන දෙයක්
ගෙන එය ඇඹුල් වයින්වලින් පොඟවා
ඉඳල් ඉරිඟු* බට දණ්ඩක ගසා එය
ඔහුගේ මුවට ළං කළෝය.[8] **30** යේ-
සුස් ඒ ඇඹුල් වයින් ස්වල්පයක් ගත්
පසු, “ඔබ පැවසූ සෑම දෙයක්ම මම
ඉටු කළා”[9] කියා පවසමින් තම හිස
නමා අවසන් හුස්ම හෙළුවේය.[10]

**19 පරි.**
1 මතෙ 27:62 යොහ 19:31
2 උත් 49:10 ද්වි 17:15
3 නික් 23:2 ආනි 9:27 මතෙ 27:26 මතෙ 27:31 මාක් 15:15 ලූක් 23:24
4 උත් 22:6 මතෙ 27:32
5 මතෙ 27:33 මාක් 15:22
6 ලෙවී 16:27 හෙබ්‍රෙ 13:12
7 යොහ 3:14 ක්‍රියා 5:30 2කොරි 5:21 ගලා 3:13
8 යෙසා 53:9 ලූක් 23:33
9 මතෙ 27:37 මාක් 15:26 ලූක් 23:38
10 හෙබ්‍රෙ 13:12

**2 තීරුව**
1 මතෙ 27:35 මාක් 15:24 ලූක් 23:34
2 ගීතා 22:18
3 ලූක් 2:34
4 මතෙ 27:61
5 මතෙ 27:56 මාක් 15:40 ලූක් 23:49
6 යොහ 13:23 යොහ 21:7 යොහ 21:20
7 ගීතා 22:15
8 ගීතා 69:21 මතෙ 27:48 මාක් 15:36 ලූක් 23:36
9 යොහ 17:4
10 ගීතා 104:29 යෙසා 53:12 මතෙ 27:50 මාක් 15:37 ලූක් 23:46

යොහ **19:29*** හිසොප් යනුවෙන්ද හැඳින්වේ.

31 එදා සබතට සූදානම් වීමේ
දවස විය.[1] සබත් දවසේදී වධ-
කණු මත මළ සිරුරු එල්ලා තිබෙ-
නවා දැකීමට යුදෙව්වරුන් අකමැති
වූ නිසා[2] ඔවුහු ඔවුන්ගේ කකුල් කඩා,
එතැනින් මළ සිරුරු ඉවත් කිරීමට
පිලාත්ගෙන් අවසර ලබාගත්තෝය.
(ඒ සබත් දවස මහ සබත් දවසක්
විය.)[3] 32 ඒ අනුව භේවායන් කිහි-
පදෙනෙක් ඇවිත් යේසුස් අසල කණු-
වක එල්ලා තැබූ මුල් තැනැත්තාගේ
කකුල්ද ඉන්පසු අනික් තැනැත්තා-
ගේ කකුල්ද කැඩුවෝය. 33 ඔවුහු
යේසුස්ගේ කකුල් කැඩීමට ඔහු ළඟට
ගිය විට ඔහු ඒ වන විටත් මිය
ගොස් ඇති බව දුටු නිසා ඔහුගේ
කකුල් කැඩුවේ නැත. 34 නමුත්
එක් භේවායෙක් හෙල්ලයකින් ඔහුගේ
ළයට පහළින් පිහිටි පෙදෙසට ඇන්-
නේය.[4] එවිට එතැනින් ලේත් වතු-
රත් පිටතට ආවේය. 35 මේ සෑම
දෙයක්ම වාර්තා කරන්නේ ඇසින්
දුටු සාක්ෂිකරුවෙකු විසිනි. ඔහු-
ගේ සාක්ෂිය සැබෑය. තම සාක්-
ෂිය සැබෑ බව ඔහුටද විශ්වාසය.
එමනිසා ඔබටත් එය විශ්වාස කළ
හැකිය.[5] 36 ඇත්තෙන්ම ඒ දේවල්
සිදු වූ විට, “ඔහුගේ එක ඇටයක්-
වත් බිඳිනු නොලබන්නේය”[6] කියා
ශුද්ධ ලියවිල්ලේ සඳහන් දේ ඉටු විය.
37 ශුද්ධ ලියවිල්ලේ තවත් ස්ථාන-
යක, “ඔවුන් තම හෙල්ලයෙන් තුවාල
කළ තැනැත්තා දෙස බලන”[7] බවද
සඳහන් වී තිබේ.

38 මෙම සිද්ධීන්වලින් පසු අරිමා-
තියේ උපන් යෝසෙප්, යේසුස්ගේ දේ-
හය ගෙන යෑමට පිලාත්ගෙන් අවසර
ඉල්ලුවේය. ඔහු යුදෙව්වරුන්ට* ඇති
බිය නිසා[8] රහසින් යේසුස්ගේ ගෝල-
යෙකුව සිටි කෙනෙකි. පිලාත් ඔහුට
ඒ සඳහා අවසර දුන් විට[9] ඔහු ඇවිත්
යේසුස්ගේ දේහය රැගෙන ගියේය.[10]
39 මුල්ම වතාවේදී රාත්‍රියක යේසුස්ව
හමු වීමට පැමිණි නිකදේමස්ද සුවඳ
ලාටු සහ අගිල් රාත්තල් සියයක්*
පමණ රැගෙන ආවේය.[1] 40 ඔවුහු
යේසුස්ගේ දේහය ගෙන යුදෙව්වරුන්-
ගේ සිරිතට අනුව තැන්පත් කිරීම
සඳහා සූදානම් කළෝය. ඒ සඳහා දේ-
හය සුවඳ ද්‍රව්‍ය සමඟ රෙදි පටිවලින්
ඔතන ලදි.[2] 41 ඔහුව කණුවේ ඇණ
ගැසූ ස්ථානයෙහි උයනක් තිබිණ. ඒ
උයනෙහි එතෙක් කිසිවෙකුව තැන්-
පත් කර නොතිබුණු අලුත් සොහොන්
ගෙයක්ද තිබිණ.[3] 42 එදා යුදෙව්-
වරුන්ගේ සූදානම් වීමේ දවස වූ
නිසාත්[4] සොහොන් ගෙය ළඟපාතක
තිබූ නිසාත් ඔවුහු යේසුස්ව එහි තැන්-
පත් කළෝය.

**20** සතියේ පළමුවෙනිදා උදා
විය.[5] එළිය වැටෙන්නත්
කලින් මරියා මග්දලේනා සොහොන්
ගෙය ළඟට ගියාය. සොහොන් ගෙ-
යින් ගල ඉවත් කර තිබූ ආකාරය
ඇයට දැකගත හැකි විය.[6] 2 එහෙ-
යින් ඇය දුව ගොස් සීමොන් පේතෘස්-
වද යේසුස් බොහෝ සෙයින් ප්‍රේම කළ
අනික් ගෝලයාවද[7] හමු වී ඔවුන්ට
මෙසේ කීවාය. “කවුරු හරි අපේ ස්වා-
මීන්ව සොහොන් ගෙයින් ඉවත් කර
තිබෙනවා.[8] ඔහුව කොහේ තැන්පත්
කළාද කියා අපි දන්නේ නැහැ.”
3 එවිට පේතෘස්[9] සහ ඒ අනික්
ගෝලයාද සොහොන් ගෙය දෙසට
ගියෝය. 4 ඔවුන් දෙදෙනාම එකට
දුවන්න පටන්ගත්තත් අනික් ගෝ-
ලයා පේතෘස්ට වඩා වේගයෙන් දුව
ගොස් ඔහුට පළමුවෙන් සොහොන්
ගෙය ළඟට පැමිණියේය. 5 ඔහු එබී
බැලූ විට එහි රෙදි පටි බිම තිබෙන
ආකාරය දුටුවේය.[10] නමුත් ඔහු ඇතු-
ළට ගියේ නැත. 6 ඔහු පසුපසින්
පැමිණි සීමොන් පේතෘස් සොහොන්
ගෙය ඇතුළටම ගියේය. ඔහු එම රෙදි
පටි දුටු අතර,[11] 7 යේසුස්ගේ හිසට
දමා තිබූ රෙදිකඩ, රෙදි පටි සමඟ
නොව වෙනම තැනක අකුළා තිබෙන

**19 පරි.**
1 මතෙ 27:62 යොහ 19:14
2 ද්වි 21:23
3 ලෙවී 23:7
4 යෙසා 53:5 සෙක 12:10 මතෙ 27:49 යොහ 20:25 එළි 1:7
5 යොහ 20:31 යොහ 21:24 1යොහ 1:1
6 නික් 12:46 ගණන් 9:12 ගීතා 34:20
7 සෙක 12:10 එළි 1:7
8 හිතෝ 29:25 යොහ 7:13 යොහ 9:22
9 මතෙ 27:58 මාක් 15:43 ලූක් 23:50
10 ද්වි 21:23

**2 තීරුව**
1 2ලේක 16:14 ලූක් 23:56 යොහ 7:50
2 යොහ 20:7
3 යෙසා 53:9 ක්‍රියා 13:29
4 මතෙ 27:62 යොහ 19:14

**20 පරි.**
5 ලෙවී 23:11 1කොරි 15:20
6 මතෙ 28:1 මාක් 16:1 ලූක් 24:1
7 යොහ 13:23 යොහ 19:26 යොහ 21:24
8 යොහ 19:41
9 ලූක් 24:12
10 යොහ 19:40
11 යොහ 11:44

යොහ **19:38*** යොහ 7:13හි පාදසටහන බලන්න.

යොහ **19:39*** කිලෝග්‍රෑම් 32.7ක් පමණ.

ආකාරයද දුටුවේය. 8 ඉන්පසු සො-
හොන් ගෙය ළඟට පළමුවෙන් පැමිණි
අනික් ගෝලයාද ඇතුළට ගියේය.
ඔහු දුටු දේ නිසා ඔහු තුළ තිබූ
සැකය නැති විය. 9 ඒ වන තුරු
ශුද්ධ ලියවිල්ලේ සඳහන් ආකාරයට
යේසුස් මරණයෙන් නැවත නැඟිටිය
යුතු බව ඔවුහු වටහාගෙන සිටියේ
නැත.[1] 10 ඉන්පසු එම ගෝලයෝ
නැවත තම නිවෙස් බලා ගියෝය.

11 කෙසේවෙතත් සොහොන් ගෙය
ළඟ සිටි මරියා ඉන් පිටත සිටගෙන
හඬමින් සිටියාය. ඇය මෙසේ හඬ-
මින් සොහොන් ගෙය තුළට එබී බැලූ
විට, 12 යේසුස්ගේ දේහය තැන්පත්
කර තිබූ ස්ථානයේ සුදු වස්ත්‍ර පැළඳ
සිටි දේවදූතයන් දෙදෙනෙකු[2] ඉඳ-
ගෙන සිටින ආකාරය දුටුවාය. එක්
කෙනෙක් ඔහුගේ හිස තැබූ පැත්තෙහි
සිටි අතර අනික් තැනැත්තා ඔහු-
ගේ පාද තිබුණු පැත්තෙහිද සිටියේය.
13 එවිට ඔවුහු, “ඔබ හඬන්නේ ඇයි”
කියා ඇගෙන් ඇසුවෝය. “කවුරු හරි
මගේ ස්වාමීන්ව අරගෙන ගිහිල්ලා.
ඔවුන් ඔහුව දැන් කොහේ තැන්-
පත් කළාද කියා මම දන්නේ නැහැ”
කියා ඇය ඔවුන්ට පිළිතුරු දුන්නාය.
14 ඉන්පසු ඇය හැරී බැලූ විට යේසුස්
සිටගෙන සිටිනවා දුටුවාය. නමුත්
ඒ යේසුස් බව ඇය වටහාගත්තේ
නැත.[3] 15 යේසුස්, “ඔබ හඬන්නේ
ඇයි? ඔබ සොයන්නේ කාවද”[4] කියා
ඇගෙන් ඇසුවේය. ඔහු උයනේ සේව-
කයෙකු කියා සිතූ ඇය, “මහත්මයා-
ණෙනි, ඔබ ඔහුව ගෙන ගියා නම්
ඔහුව තැන්පත් කළේ කොහේද කියා
මට කියන්න. එතකොට මට පුළුවන්
ඔහුව රැගෙන යන්න” කියා ඔහුට
කීවාය. 16 එවිට යේසුස්, “මරියා”[5]
කියා ඇයට පැවසුවේය. ඇය හැරී
ඔහුට හෙබ්‍රෙව් බසින්, “රබ්බෝනි”[6]
(එනම්, “ගුරුතුමනි”) කියා කීවාය.
17 යේසුස් තමාව අල්ලාගෙන සිටි
ඇයට මෙසේ කීවේය. “මම දැන්මම
පියාණන් ළඟට යන්නේ නැහැ. ඒ
නිසා මාව දැන් අතහරින්න. දැන් මෙ-
තැනින් පිටත් වී මගේ සහෝදරයන්
ළඟට ගිහින්,[1] ‘මම මගේ පියාණන් හා
ඔබේ පියාණන් ළඟටත්[2] මගේ දෙවි[3]
හා ඔබේ දෙවි ළඟටත් යනවා’[4] කියා
ඔවුන්ට කියන්න.” 18 පසුව මරියා
මග්දලේනා ගෝලයන්ව හමු වී, “මම
අපේ ස්වාමීන්ව දැක්කා” කියා පවස-
මින් යේසුස් ඇයට පැවසූ සියල්ල
ඔවුන්ට දැන්වූවාය.[5]

19 සතියේ පළමුවෙනි දවස වූ
එදින සවස් වූ විට[6] යුදෙව්වරුන්ට*
බියෙන් සිටි ගෝලයෝ[7] තමන් සිටි
ස්ථානයේ දොරවල්වලට අගුලු දමා-
ගෙන සිටියෝය. නමුත් යේසුස් එතැ-
නට ඇවිත්[8] ඔවුන් මැද සිටගෙන,
“ඔබට සමාදානය වේවා”[9] කියා
ඔවුන්ට කීවේය. 20 ඉන්පසු ඔහු
තම අත්ද ළයට පහළින් ඇති පෙදෙ-
සද ඔවුන්ට පෙන්වූවේය.[10] එවිට ගෝ-
ලයෝ ස්වාමීන්ව දැකීම නිසා ප්‍රීති
වූහ.[11] 21 යේසුස් නැවතත් ඔවුන්ට
මෙසේ කීවේය. “ඔබට සමාදානය
වේවා! පියාණන් මාව එවූ ආකා-
රයටම[12] මමත් ඔබව යවනවා.”[13]
22 ඉන්පසු ඔහු ඔවුන් මතට හුස්ම
හෙළා ඔවුන්ට මෙසේ කීවේය. “ඔබට
දෙවිගේ බලය ලැබෙයි.[14] 23 ඒ
අනුව ඔබ ඕනෑම කෙනෙකුගේ පව්-
වලට සමාව දුන්නොත්[15] ඔවුන්ට
සමාව ලැබෙයි. නමුත් ඔබ යම් කෙ-
නෙකුගේ පව්වලට සමාව නොදුන්-
නොත් ඔවුන්ට සමාවක් ලැබෙන්නේ
නැහැ.”[16]

24 යේසුස් පැමිණි ඒ අවස්ථා-
වේදී, දොළොස්දෙනාගෙන් කෙනෙකු
වූ නිවුන් දරුවා ලෙස හැඳින්වූ තෝ-
මස්[17] ඔවුන් සමඟ සිටියේ නැත.
25 එහෙයින් අනික් ගෝලයෝ ඔහුව
හමු වූ විට, “අපි ස්වාමීන්ව දැක්කා”
කියා ඔහුට කීවෝය. නමුත් ඔහු, “මම
ඒ දේ විශ්වාස කරන්නේ[18] ඔහුගේ
අත්වල ඇණ සලකුණු දැක, ඔහුගේ
ළයට පහළින් ඇති පෙදෙසට මගේ

**20 පරි.**
1 ගීතා 16:10 යෙසා 53:10 මතෙ 16:21 යොහ 2:22 ක්‍රියා 2:27 1කොරි 15:4
2 මාක් 16:5 හෙබ්‍රෙ 1:14 එළි 19:14
3 ලූක් 24:16 ලූක් 24:31 යොහ 21:4
4 යොහ 1:38
5 යොහ 10:3
6 මාක් 10:51 යොහ 1:38

**2 තීරුව**
1 ගීතා 22:22 මතෙ 12:50 මතෙ 25:40 මතෙ 28:10 රෝම 8:29 හෙබ්‍රෙ 2:11
2 යොහ 14:28 යොහ 16:28
3 1කොරි 11:3 එෆී 1:17 කොලො 1:3
4 උත් 17:7 හෙබ්‍රෙ 11:16
5 මතෙ 28:10 ලූක් 24:10
6 ලූක් 24:1
7 යොහ 9:22
8 1කොරි 15:5
9 මතෙ 10:12 ලූක් 10:5 ලූක් 24:36
10 යොහ 19:34 1යොහ 1:1
11 යොහ 16:22
12 යෙසා 61:1 යොහ 5:36
13 මතෙ 28:19 යොහ 17:18 2තිමෝ 2:2
14 ලූක් 1:67 ලූක් 2:25 ක්‍රියා 2:2 ක්‍රියා 2:4
15 මතෙ 16:19
16 ක්‍රියා 13:11
17 යොහ 11:16
18 2කොරි 5:7

යොහ **20:19*** යොහ 7:13හි පාදසටහන බලන්න.

අත තබා බැලුවාට පසුව විතරයි”[1]
කියා ඔවුන්ට කීවේය.

**26** දවස් අටකට පසු යේසුස්ගේ
ගෝලයෝ නැවතත් නිවසක රැස්ව
සිටියෝය. ඒ අවස්ථාවේදී තෝමස්ද
ඔවුන් සමඟ සිටියේය. එම නිවසේ
දොරවල්වලට අගුලු දමා තිබුණත්
යේසුස් ඇවිත් ඔවුන් මැද සිට-
ගෙන, “ඔබට සමාදානය වේවා”[2] කියා
කීවේය. **27** ඊළඟට ඔහු තෝමස්ට
මෙසේ කීවේය. “ඇවිත් ඔබේ අත් දෙ-
කෙන්ම මගේ අත් අල්ලා බලන්න.
ඔබේ අත මගේ ළයට පහළින් ඇති
පෙදෙසටත් තබා බලන්න.[3] දැන්
අවිශ්වාස කරන්නේ නැතුව විශ්වාස
කරන්න” කියා කීවේය. **28** තෝ-
මස් පිළිතුරු දෙමින්, “මගේ ස්වාමීනි,
මගේ දෙවියනි”*[4] කියා ඔහුට කීවේය.
**29** යේසුස් ඔහුට මෙසේ කීවේය. “ඔබ
විශ්වාස කරන්නේ මාව දුටු නිසාද?
ඒත් දකින්නේ නැතුව විශ්වාස කරන
අය කොතරම් සන්තෝෂවත්ද!”[5]

**30** ඇත්තෙන්ම මේ ලියවිල්ලෙහි
ලියා නැති වෙනත් බොහෝ පුදුම දේ-
වල්ද යේසුස් තම ගෝලයන් ඉදිරි-
යෙහි සිදු කළේය.[6] **31** නමුත් මේ
දේවල් ලියා තිබෙන්නේ[7] යේසුස් දෙවි-
ගේ පුත්‍රයා බවත් ක්‍රිස්තුස් බවත් ඔබට
විශ්වාස කිරීමට හැකි වීම සඳහාය. ඒ
විශ්වාසය නිසා[8] ඔබට ඔහුගේ නාමය
මාර්ගයෙන් ජීවනය ලබාගත හැකිය.

**21** එම සිද්ධියෙන් පසු, ටයි-
බීරියස් මුහුද අසල යේසුස්
නැවතත් ගෝලයන් ඉදිරියේ පෙනී
සිටියේය. සිදු වූ දේ පිළිබඳ විස්-
තර මතු දැක්වේ. **2** ඒ අවස්ථා-
වේදී සීමොන් පේතෘස්ද නිවුන් දරුවා
ලෙස හැඳින්වූ තෝමස්ද[9] ගලීලයේ
පිහිටි කානා නම් නුවරින් පැමිණි
නතානියෙල්ද[10] සෙබදීගේ පුත්‍ර-
යෝ[11] සහ යේසුස්ගේ ගෝලයන් වූ
තවත් දෙදෙනෙක්ද එකට සිටියෝය.
**3** සීමොන් පේතෘස්, “මම යනවා මාළු
අල්ලන්න” කියා ඔවුන්ට කීවේය. ඔවු-
හුද, “අපිත් ඔබ සමඟ එනවා” කියා
පවසා ඔරුවට නැග්ගෝය. නමුත් ඒ
මුළු රාත්‍රිය පුරාම ඔවුන්ට එක් මාළු-
වෙක්වත් අල්ලාගැනීමට හැකි වූයේ
නැත.[1]

**4** ඊළඟ උදෑසන එළිය වැටෙද්දීම
යේසුස් මෙගොඩ සිටගෙන සිටියේය.
නමුත් ඒ යේසුස් බව ගෝලයෝ
හඳුනාගත්තේ නැත.[2] **5** එවිට යේ-
සුස්, “දරුවෙනි, ඔබට කන්න මුකුත්
නැහැ නේද” කියා ඔවුන්ගෙන් ඇසු-
වේය. ඔවුහුද, “නැහැ” කියා ඔහුට
පිළිතුරු දුන්හ. **6** යේසුස්ද, “ඔරු-
වේ දකුණු පැත්තෙන් දැල හෙ-
ළන්න. එවිට ඔබට මාළු ටිකක්
අල්ලගන්න පුළුවන් වෙයි”[3] කියා
ඔවුන්ට කීවේය. ඔවුන් දැල හෙළූ
විට දැලට හසු වූ මසුන් ප්‍රමාණය
කොතරම්ද කිවහොත් ඔවුන්ට තවදු-
රටත් ඒ දැල ඇදගැනීමට නොහැකි
විය.[4] **7** එහෙයින් යේසුස් බොහෝ
සෙයින් ප්‍රේම කළ ගෝලයා,[5] “ඒ අපේ
ස්වාමීන්” කියා පේතෘස්ට කීවේය.[6]
එහි සිටියේ ස්වාමීන් බව සීමොන්
පේතෘස්ට දැනගන්න ලැබුණු විට
ඔහු තම සිරුර වැසෙන සේ වස්ත්‍ර-
යක් දමාගෙන වතුරට පැන්නේය.
**8** නමුත් කුඩා ඔරුව ගොඩබිමෙන්
මීටර් සියයක්* පමණ දුරින් තිබුණු
නිසා අනික් ගෝලයෝ ඔරුව පදවා-
ගෙන ආවෝය. ඔවුහු මසුන්ගෙන් පිරී
තිබුණු දැලද ඇදගෙන ආවෝය.

**9** ඔවුහු ගොඩ බැස්ස විට එහි
අඟුරු දල්වා[7] ඒ මත මසුන්
තිබෙන බවද ඒ අසල රොටි ඇති
බවද දුටුවෝය. **10** යේසුස් ඔවුන්ට
මෙසේ කීවේය. “ඔබ දැන් ඇල්ලූ
මාළුන් කිහිපදෙනෙක්ව රැගෙන
එන්න.” **11** එහෙයින් සීමොන් පේ-
තෘස් ඔරුවට නැඟ, ලොකු මසුන්
එකසිය පනස්තුන්දෙනෙකුගෙන් පිරී
තිබුණු ඒ දැල ගොඩට ඇද්දේය. එප-
මණ මසුන් ප්‍රමාණයක් සිටියත් දැල

**20 පරි.**
1 යොහ 19:34
2 යොහ 20:19
3 1යොහ 1:1
4 යෙසා 9:6; යොහ 1:1; යොහ 1:18; යොහ 14:28; යොහ 20:17; යොහ 20:31
5 2කොරි 5:7; 1පේතෘ 1:8
6 යොහ 21:25
7 ලූක් 1:4
8 යොහ 3:15; යොහ 5:24; 1පේතෘ 1:9; 1යොහ 5:13

**21 පරි.**
9 යොහ 11:16; යොහ 20:24
10 යොහ 1:45
11 මතෙ 4:21

**2 තීරුව**
1 ලූක් 5:5
2 ලූක් 24:16; යොහ 20:14
3 ලූක් 5:4
4 ලූක් 5:6
5 යොහ 13:23; යොහ 19:26; යොහ 20:2
6 මතෙ 14:29
7 1රාජා 19:6

---

යොහ **20:28*** එනම්, යෙහෝවා දෙවි වෙනුවෙන් කතා කරන ඔහුගේ ප්‍රධාන නියෝජිතයා.

යොහ **21:8*** මූ.අ., “අඩි 300ක්.”

ඉරුණේ නැත. 12 “එන්න, කෑම
ටිකක් කමු”[1] කියා යේසුස් ඔවුන්ට
කීවේය. මේ තම ස්වාමීන් බව ඔවුන්
දැන සිටි නිසා, “ඔබ කවුද” කියා ඔහු-
ගෙන් අසන්න ගෝලයන්ගෙන් කිසි-
වෙකුට ධෛර්යයක් තිබුණේ නැත.
13 යේසුස් ඔවුන් ළඟට ඇවිත් ඔවුන්ට
රොටි[2] සහ මසුන් දුන්නේය. 14 එය
යේසුස්ව මරණයෙන් නැඟිටුවනු ලැබූ
පසු ඔහු තම ගෝලයන් ඉදිරියේ පෙනී
සිටි තුන්වෙනි අවස්ථාවය.[3]

15 ඔවුන් තම ආහාරය ගත් පසු
යේසුස් සීමොන් පේතෘස්ට කතා කර,
“යොහන්ගේ පුත් සීමොන්, මේ දේව-
ලට වඩා ඔබ මට ප්‍රේම කරනවාද”[4]
කියා ඇසුවේය. ඔහුද, “ඔව් ස්වා-
මීනි! මගේ හිතේ ඔබ ගැන කොයි
තරම් ආදරයක් තිබෙනවාද කියා
ඔබ දන්නවා”[5] කියා ඔහුට කීවේය.
එවිට යේසුස්, “මගේ බැටළු පැටවුන්ව
පෝෂණය කරන්න”[6] කියා ඔහුට
කීවේය. 16 යේසුස් දෙවෙනි වතා-
වටත්, “යොහන්ගේ පුත් සීමොන්,
ඔබ මට ප්‍රේම කරනවාද”[7] කියා ඔහු-
ගෙන් ඇසුවේය. පේතෘස්ද, “ඔව් ස්වා-
මීනි! මගේ හිතේ ඔබ ගැන කොයි
තරම් ආදරයක් තිබෙනවාද කියා ඔබ
දන්නවා” කියා ඔහුට කීවේය. එවිට
යේසුස්, “මගේ කුඩා බැටළුවන්ව
රැකබලා ගන්න”[8] කියා ඔහුට කීවේය.
17 ඔහු තුන්වෙනි වතාවටත්, “යො-
හන්ගේ පුත් සීමොන්, ඔබට මා ගැන
ආදරයක් තිබෙනවාද” කියා ඔහු-
ගෙන් ඇසුවේය. යේසුස් තුන්වෙනි
වතාවටත්, “ඔබට මා ගැන ආදර-
යක් තිබෙනවාද” කියා තමාගෙන්
ඇසූ නිසා පේතෘස් තුළ දුකක් ඇති
විය. එහෙයින් ඔහු, “ස්වාමීනි, ඔබ
සෑම දෙයක්ම දන්නවා.[9] මගේ හිතේ
ඔබ ගැන කොයි තරම් ආදරයක්
තිබෙනවාද කියාත් ඔබ දන්නවා”
කියා ඔහුට කීවේය. එවිට යේසුස්
ඔහුට මෙසේ කීවේය. “මගේ කුඩා
බැටළුවන්ව පෝෂණය කරන්න.[10]
18 ඇත්තෙන්ම මම ඔබට කියන මේ
දේ මතක තබාගන්න. ඔබ තරුණ-
යෙක්ව සිටියදී ඔබ කැමති ආකාර-
යට ඇඳුම් ඇඳගෙන ඔබ කැමති
තැන්වල ඇවිදින්න ගියා. නමුත්
ඔබ මහලු වන විට වෙන කෙනෙක්
ඔබට අත් දිගහරින්න කියා පවසමින්
ඔබට ඇඳුම් අන්දවා[1] ඔබ යන්න
කැමති නැති තැනකට ඔබව ගෙන
යයි.”[2] 19 යේසුස් ඒ දේ පැවසුවේ
පේතෘස් දෙවිට ගෞරවයක් ගෙන දෙ-
මින්[3] මරණයට පත් වන ආකාරය
පැහැදිලි කිරීමටය.[4] ඉන්පසුව, “දිග-
ටම මාව අනුගමනය කරන්න”[5] කියා
යේසුස් ඔහුට කීවේය.

20 පේතෘස් හැරී බැලූ විට යේසුස්
බොහෝ සෙයින් ප්‍රේම කළ ගෝ-
ලයා[6] තමා පසුපස එනවා දුටුවේය.
සන්ධ්‍යා භෝජනයේදී යේසුස් අස-
ලින්ම හාන්සි වී, “ස්වාමීනි, ඔබව
පාවා දෙන්නේ කවුද” කියා ඇසු-
වේ ඔහුය. 21 පේතෘස් ඔහුව දුටු
විට, “ස්වාමීනි, මේ මිනිසාට මොනව
වෙයිද” කියා යේසුස්ගෙන් ඇසුවේය.
22 යේසුස් ඔහුට මෙසේ කීවේය. “ඔබ
ඒ ගැන කරදර වෙන්න එපා. සමහර-
විට මා එන තුරු ඔහුට ඉන්න සිදු
වෙයි.[7] නමුත් ඔබ දිගටම මාව අනුග-
මනය කරන්න.” 23 යේසුස් පැවසූ
ඒ දේ නිසා එම ගෝලයා මිය යන්නේ
නැති බව සහෝදරයන් අතර ප්‍රචාරය
විය. නමුත් යේසුස්, “ඔබ ඒ ගැන කර-
දර වෙන්න එපා. සමහරවිට මා එන
තුරු ඔහුට ඉන්න සිදු වෙයි”[8] කියා
පැවසුවා මිස ඔහු මිය යන්නේ නැති
බව පැවසුවේ නැත.

24 මේ දේවල් ගැන සාක්ෂි දරන්-
නෙත් මේ දේවල් ලියා තැබුවෙත්
ඉහත සඳහන් ඒ ගෝලයාය.[9] ඔහු
දෙන සාක්ෂිය සැබෑවක් බව සියලුදෙ-
නාම පිළිගනිති.[10]

25 ඇත්තෙන්ම යේසුස් කළ
තවත් බොහෝ දේ ඇත. ඒ පිළිබඳ
සෑම විස්තරයක්ම ලිවීමට උත්සාහ
කළොත් ඒ ලියවිලි ගබඩා කිරීමට
මුළු ලෝකයම ප්‍රමාණවත් නොවන
බව සිතමි.[11]

**21 පරි.**
1 ක්‍රියා 10:41
2 ලූක් 24:30
3 යොහ 20:19; යොහ 20:26
4 යොහ 21:12
5 මතෙ 26:33; යොහ 17:26
6 ලූක් 22:32; ක්‍රියා 20:28; 1පේතෘ 5:2
7 යොහ 14:21
8 ගීතා 95:7; මතෙ 10:6; ක්‍රියා 1:15; ක්‍රියා 2:14; හෙබ්‍රෙ 13:20; 1පේතෘ 2:25
9 මාක් 2:8; යොහ 2:24; යොහ 2:25; යොහ 16:30
10 යොහ 10:3; යොහ 10:16

**2 තීරුව**
1 ක්‍රියා 21:11
2 ක්‍රියා 12:3
3 පිලි 1:20
4 2පේතෘ 1:14
5 මතෙ 19:28; යොහ 12:26; එළි 14:4
6 යොහ 13:23; යොහ 20:2
7 මතෙ 16:27; මතෙ 25:31; 1කොරි 4:5; එළි 1:10; එළි 22:20
8 එළි 1:1; එළි 1:9
9 යොහ 13:23; යොහ 19:26; යොහ 20:2; යොහ 21:7
10 යොහ 19:35; 3යොහ 12
11 යොහ 20:30

# යේසුස්ගේ නියෝජිතයන්ගේ ක්‍රියා

**1** හිතවත් තෙයොෆිලස්,[1] මම
මුලින් සකස් කළ වාර්තාවේ
යේසුස් කළ ක්‍රියා හා ඔහු
ඉගැන්වූ දේවල්ද,[2] **2** ඔහු තෝරා-
ගත් නියෝජිතයන්ට* දෙවිගේ බලය
මාර්ගයෙන් මඟ පෙන්වීම් ලබා දුන්
ආකාරයද[3] අන්තිමට ඔහුව ස්වර්ග-
යට ඔසවාගනු ලැබූ ආකාරයද ඇතු-
ළත් කළෙමි.[4] **3** ඔහු වධ විඳ මිය
ගිය පසු දවස් හතළිහක් පුරා විටින්
විට තම නියෝජිතයන් ඉදිරියේ පෙනී
සිටියේය. එහෙයින් තමා ජීවමානව
සිටින බවට ඔහු ඉතා පැහැදිලි සාක්ෂි
බොහොමයක් සැපයූ අතර[5] දෙවිගේ
රාජ්‍යය පිළිබඳව ඔවුන්ට බොහෝ
දේවල් කියා දුන්නේය.[6] **4** යේසුස්
ඔවුන් සමඟ රැස්ව සිටි අවස්ථාව-
කදී ඔවුන්ට මෙසේ පැවසුවේය. "යෙ-
රුසලමට වී බලාගෙන සිටින්න.[7]
එවිට මා ඔබට පැවසූ ලෙස පියා-
ණන් පොරොන්දු වූ ඒ දේ ඔබට ලබා
දෙයි.[8] **5** යොහන්, බව්තීස්ම කළේ
වතුරෙන්. නමුත් වැඩි දවසක් යෑමට
කලින් ඔබව දෙවිගේ බලයෙන් බව්-
තීස්ම කරනු ලබනවා."[9]

**6** ඔවුන් එකට රැස් වූ තවත් අවස්-
ථාවක, "ස්වාමීනි, ඔබ ඊශ්‍රායෙල් දේ-
ශයට රාජ්‍යයක් ආපසු ලබා දෙන්නේ
මේ කාලයේදීද"[10] කියා යේසුස්ගෙන්
ඇසූහ. **7** යේසුස් ඔවුන්ට මෙසේ
කීවේය. "ඒ දේවල් සිදු වීමට නිය-
මිත කාල වකවානු[11] නියම කරන්-
නේ පියාණන්.[12] ඒවා දැනගැනීමේ
අයිතිය ඔබට දී නැහැ. **8** නමුත්
ඔබට දෙවිගේ බලය ලැබුණු විට
ඔබ ශක්තිමත් වෙයි.[13] ප්‍රතිඵලයක්
ලෙස ඔබ යෙරුසලමෙහිද[14] මුළු යුද-
යෙහිද සමාරියෙහිද[15] පොළොවේ දුර
ඈත කෙළවරවලද[16] මා ගැන සාක්ෂි
දරයි."[17] **9** යේසුස් ඒ දේවල් කී පසු
ඔවුන් බලා සිටියදීම ඔහුව ඉහ-
ළට ඔසවාගනු ලැබූ අතර[1] වලාකුළ-
කින් වැසී ඔවුන්ට නොපෙනී ගියේය.[2]
**10** ඔවුන් අහස දෙස බලාගෙන සිටි-
යදී[3] සුදු වස්ත්‍ර ඇඳ සිටි[4] මිනිස්සු
දෙදෙනෙක් ඔවුන් ළඟ සිටගෙන,
**11** "ගලීලයේ මනුෂ්‍යයෙනි, ඔබ මෙ-
තැන සිටගෙන අහස දෙස බලා
සිටින්නේ ඇයි? අහසට ඔසවාගනු
ලැබූ මේ යේසුස්, ස්වර්ගයට යනවා
ඔබ දුටු ආකාරයෙන්ම[5] නැවත පැමි-
ණේවි" කියා කීවෝය.

**12** ඒ අවස්ථාවේදී ඔවුන් සිටියේ
ඔලීව කන්ද ලෙස හැඳින්වූ කන්ද-
කය. ඉන්පසු ඔවුහු සැතපුම් භාග-
යක් පමණ දුරින්*[6] තිබූ යෙරුසලමට
නැවත ගියෝය.[7] **13** පසුව ඔවුහු
තමන් නැවතී සිටි උඩුමහල් කාමර-
යට[8] ගියෝය. එසේ ගිය අය නම්
පේතෘස් සහ යොහන්ද යාකොබ් සහ
අන්දෘද පිලිප් සහ තෝමස්ද බාතො-
ලමෙව් සහ මතෙව්ද අල්ෆෙවුස්ගේ
පුත් යාකොබ්ද උද්‍යෝගයකින් දේවල්
කිරීමට ප්‍රසිද්ධව සිටි සීමොන් සහ
යාකොබ්ගේ පුත් යූදස් යන අයයි.[9]
**14** ඔවුන් සමඟ ඇතැම් ස්ත්‍රීන්ද[10]
යේසුස්ගේ මව වූ මරියාද ඔහුගේ
සහෝදරයන්ද සිටි අතර[11] ඔවුහු
සියලුදෙනාම මහත් ඕනෑකමින් නො-
කඩවා එකට යාච්ඤා කරමින් සිටි-
යෝය.[12]

**15** එකසිය විසිදෙනෙකු පමණ
රැස්ව සිටි අවස්ථාවක පේතෘස් සියලු-
දෙනා ඉදිරියේ නැඟිට, මෙසේ
කීවේය. **16** "සහෝදරයෙනි, සෑම
දෙයක්ම සිදු වී තිබෙන්නේ ශුද්ධ ලිය-
විල්ලේ සඳහන් වූ දේවල් ඉටු වීම-
ටයි.[13] යේසුස්ව අත්අඩංගුවට ගත්
අයට සහයෝගය දුන්[14] යූදස් ගැන[15]

**1 පරි.**
**1** ලූක් 1:3
**2** ලූක් 3:23
**3** මතෙ 28:20, ලූක් 6:13, යොහ 15:16
**4** එෆී 4:10, 1තිමෝ 3:16, 1පේතෘ 3:22
**5** මතෙ 28:9, යොහ 20:19, 1කොරි 15:6
**6** ලූක් 24:27
**7** ලූක් 24:49
**8** යොහ 14:16, ක්‍රියා 2:33
**9** යෝවෙ 2:28, මතෙ 3:11, මාක් 1:8
**10** යෙසා 1:26, දානි 7:27, මීකා 4:8, ලූක් 19:11, ලූක් 24:21
**11** දානි 2:21, දානි 7:25, ලූක් 21:24
**12** ද්වි 29:29, මතෙ 24:36
**13** ක්‍රියා 4:33
**14** ක්‍රියා 5:28
**15** ක්‍රියා 8:14
**16** කොලො 1:23
**17** යෙසා 43:10, ලූක් 24:48, යොහ 15:27

**2 තීරුව**
**1** යොහ 6:62
**2** ලූක් 24:51
**3** 1පේතෘ 3:22
**4** මතෙ 28:3, ලූක් 24:4
**5** දානි 7:13, මතෙ 26:64, එළි 1:7
**6** නික් 16:29, යොහ 11:18
**7** ලූක් 24:52
**8** ක්‍රියා 9:37
**9** මතෙ 10:2, මාක් 3:16
**10** ලූක් 23:49
**11** මතෙ 13:55, යොහ 7:5, ගලා 1:19
**12** කොලො 4:2, 1තෙස 5:17
**13** යොහ 13:18
**14** යොහ 18:3
**15** ගීතා 41:9, ගීතා 55:12, ලූක් 22:47

**ක්‍රියා 1:2*** හෝ, "යවනු ලැබූවන්ට."

**ක්‍රියා 1:12*** මූ.අ., "සබත් දවසේදී යුදෙව්වෙකුට ගමන් කළ හැකි දුරකින්."

කලකට පෙර දාවිත් දෙවිගේ බලය
මාර්ගයෙන්[1] කතා කර තිබුණා.
**17** යූදස් අපේ කණ්ඩායමේ සාමාජි-
කයෙක් වූ අතර[2] ඔහු අප සමඟ සේව-
යෙන් යෙදුණා.[3] **18** (මේ මිනිසා
තම අධර්මිෂ්ඨ ක්‍රියාවලට ලැබුණු
කුලියෙන්[4] පිට්ටනියක් මිල දී ගත්-
තේය.[5] ඔහු වැටුණු විට ඔහුගේ හිස
පොළොවේ වැදී,[6] මහත් ශබ්දයකින්
ඔහුගේ බඩ පැළී ඔහුගේ බඩවැල්
සියල්ලම පිටතට විසි විය.* **19** එම
සිද්ධිය යෙරුසලමේ සියලු වැසියන්-
ටද ආරංචි වූ අතර ඒ පිට්ටනිය
හෙබ්‍රෙව් බසින් අකෙල්දමා යනුවෙන්
හැඳින්වේ. එහි අර්ථය ලේ පිට්ටනිය
යන්නය.) **20** ගීතාවලිය පොතෙහි,
‘ඔහුගේ නවාතැන පාළු වේවා! එහි
කිසි වැසියෙක් නොසිටීවා’[7] කියාද,
‘අන් අයව රැකබලා ගන්නා කෙනෙකු
ලෙස ඔහුට හිමි වී තිබුණු වගකීම්
වෙන කෙනෙකුට ලැබේවා’[8] කියාද
ලියා තිබෙනවා. **21** එමනිසා අප
කළ යුතු දෙයක් තිබෙනවා. එනම්
ස්වාමීන් වන යේසුස් අප අතරේ සිටි
කාලය පුරාම අප සමඟ සිටි අය අත-
රින්,[9] **22** එක් කෙනෙකුව තෝරා-
ගත යුතුයි. ඒ පුද්ගලයා, යොහන්
යේසුස්ව බව්තීස්ම කළ දා පටන්[10]
යේසුස් අපෙන් සමුගෙන ස්වර්ගයට
ගිය දවස දක්වා අප සමඟ සිටි[11]
කෙනෙකු විය යුතුයි. එවිට යේසුස්-
ගේ නැවත නැඟිටීම ගැන අප සමඟ
සාක්ෂි දැරීමට ඔහුටත් හැකියි.”[12]

**23** ඉන් අනතුරුව ඔවුහු දෙදෙනෙ-
කුගේ නම් යෝජනා කළෝය. ඒ ජස්-
ටස් යන වාසගම දැරූ බාසබස් ලෙස
හැඳින්වූ යෝසෙප් සහ මතියස් යන
අයවයි. **24** එවිට ඔවුහු යාච්ඤා
කරමින් මෙසේ කීවෝය. “යෙහෝවා
දෙවියනි, සියල්ලන්ගේ සිත් දන්නේ
ඔබයි.[13] මේ මිනිසුන් දෙදෙනා අතරින්
ඔබ තෝරාගෙන තිබෙන්නේ කාවද
කියා අපට පෙන්වන්න. **25** නො-
මඟ ගිය යූදස් අත්හැරිය මේ සේවය
සහ නියෝජිතයෙකු වීමේ වරප්‍රසා-
දය[1] ලබන්නේ ඔහුයි.” **26** ඉන්පසු
ඔවුහු ඒ දෙදෙනාගෙන් කෙනෙකුව
තෝරාගැනීමට දාදු දැමූහ.[2] දාදුව
වැටුණේ මතියස්ටය. එහෙයින් යේ-
සුස්ගේ නියෝජිතයන් එකොළොස්-
දෙනාට[3] ඔහුව එකතු කරන ලදි.

**2** පෙන්තකොස්ත උත්සවය[4]
පැවති දවසේදී ඔවුහු සියලුදෙ-
නාම එක තැනක රැස්ව සිටියෝය.
**2** එවිට තද සුළඟක් හමන්නා සේ
ශබ්දයක් අහසින් ඇසිණ. ඒ ශබ්දය
සියලුදෙනා ඉඳගෙන සිටි නිවස පුරාම
පැතිර ගියේය.[5] **3** එවිට ගිනිදලු[6]
බෙදී ගොස් ඒවා සෑම කෙනෙකුගේම
හිසට ඉහළින් දැල්වෙනවා ඔවුන්ට
දැකගත හැකි විය. **4** ඒ මොහො-
තේ පටන් ඒ සියලුදෙනා තුළ දෙවිගේ
බලය ක්‍රියාත්මක විය.[7] දෙවිගේ බලය
ඔවුන් තුළ එසේ ක්‍රියාත්මක වූ නිසා
සියලුදෙනාම විවිධ භාෂාවලින් කතා
කරන්න පටන්ගත්තෝය.[8]

**5** ඒ කාල සීමාවේදී සියලු දේශ-
වලින් පැමිණි දේවගරුබියෙන් ක්‍රියා
කළ[9] යුදෙව් පුරුෂයෝ[10] යෙරුසල-
මෙහි නැවතී සිටියෝය. **6** එම ශබ්-
දය ඇසුණු විට විශාල සමූහයක්
එතැනට එක් රොක් වූහ. ගෝල-
යන් පිරිස තමන්ට තේරෙන භාෂාව-
ලින් කතා කරන ආකාරය එම
සමූහයාට ඇසුණු විට ඔවුහු පුදුම-
යට පත් වූහ. **7** එවිට ඔවුහු මෙසේ
පැවසූහ. “ඇත්තෙන්ම මෙය මහ පුදු-
මයක්! ගලීලයේ වැසියන්[11] කොහො-
මද අපේ භාෂාවෙන් කතා කරන්නේ?
**8** ඔවුන් කතා කරන්නේ අපි එක්
එක් කෙනාගේ මව් භාෂාවෙන්. ඔවුන්
කියන දේ අපිට හොඳට තේරෙ-
නවා. එහෙම වෙන්නේ කොහොමද?
**9** පාර්තියන්වරුන්ද මේදියවරුන්[12]
සහ ඒලාම්වරුන්ද[13] මෙසපොතේමි-
යාවේ, යූදයේ[14] සහ කපදෝසියේ[15]
වැසියන්ද පොන්තසයේ[16] සහ ආසියා
ප්‍රදේශයේ[17] වැසියන්ද, **10** ෆ්‍රිජියේ[18]
සහ පම්ෆිලියේද[19] ඊජිප්තුවේ සහ

**ක්‍රියා 1:18*** පෙනෙන විදිහට මෙහි සඳහන් වන්-
නේ යූදස් සිය දිවි හානි කරගත් ආකාරය ගැනයි.
මතෙ 27:5 බලන්න.

**1 පරි.**
**1** මාක් 12:36
**2** ලූක් 6:16 යොහ 6:71
**3** මතෙ 10:4
**4** සෙක 11:12 මතෙ 26:15 2පේතෘ 2:15
**5** මතෙ 27:5
**6** ගීතා 55:23
**7** ගීතා 69:25
**8** ගීතා 109:8 1තිමෝ 3:1
**9** යොහ 15:27
**10** මතෙ 3:13 ක්‍රියා 10:37
**11** ලූක් 24:51
**12** මතෙ 28:6 මාක් 16:6 ක්‍රියා 1:9
**13** 1සාමු 16:7 1ලේක 28:9 යෙරෙ 11:20 ක්‍රියා 15:8

**2 තීරුව**
**1** යොහ 6:70
**2** හිතෝ 16:33
**3** මතෙ 28:16

**2 පරි.**
**4** ලෙවී 23:16 ද්වි 16:9
**5** ක්‍රියා 4:31
**6** මාක් 1:8
**7** යොහ 14:26 ක්‍රියා 6:3 1පේතෘ 1:12
**8** ක්‍රියා 10:46 1කොරි 12:10
**9** ක්‍රියා 22:12
**10** නික් 23:17
**11** මාක් 14:70 ක්‍රියා 1:11
**12** 2රාජා 17:6
**13** දානි 8:2
**14** මතෙ 24:16 මාක් 1:5
**15** 1පේතෘ 1:1
**16** ක්‍රියා 18:2
**17** ක්‍රියා 13:1 1පේතෘ 1:1
**18** ක්‍රියා 16:6 ක්‍රියා 18:23
**19** ක්‍රියා 13:13 ක්‍රියා 15:38

සිරේනිය දෙසට පිහිටි ලිබියාවට
අයත් ප්‍රදේශවල වැසියන්ද රෝම-
යේ සිට තාවකාලිකව ඇවිත් සිටින
යුදෙව්වරුන් සහ යුදෙව් ආගමට
හැරුණු අයද,[1] **11** ක්‍රීට්වරුන්[2] සහ
අරාබිවරුන්ද[3] වන අපිට, දෙවිගේ
බලවත් ක්‍රියා ගැන අපේම භාෂාවලින්
ඔවුන් කතා කරන ආකාරය ඇහෙ-
නවා.” **12** ඔවුහු සියලුදෙනාම පුදු-
මයෙන්, “කොහොමද මේ වගේ දෙයක්
වෙන්නේ” කියා එකිනෙකා අතරේ
කතා කළෝය. **13** නමුත් තවත්
පිරිසක් ඔවුන්ට සමච්චල් කරමින්,
“ඔවුන් වයින්වලින් මත් වෙලාද කො-
හේද”[4] කියා පැවසූහ.

**14** එවිට පේතෘස් එකොළොස්-
දෙනා[5] සමඟ නැඟිට හඬ නඟා
ඔවුන්ට මෙසේ කීවේය. “යුදයේ පුරුෂ-
යෙනි, යෙරුසලමේ සියලු වැසියෙනි,[6]
මම කියන දේට සවන් දෙන්න. ඔබ
මේ දේ දැනගත යුතුයි. **15** මෙය
දවසේ තුන්වෙනි පැයයි.* එමනිසා
මේ අය වෙරි වී සිටිනවා කියා පැවසීම
සාධාරණ නැහැ.[7] **16** දැන් මේ ඉටු
වී තිබෙන්නේ අනාගතවක්තෘ යෝ-
වෙල් මාර්ගයෙන් කියනු ලැබූ දෙ-
යයි. **17** ‘දෙවි මෙසේ කියන්නේය.
“අන්තිම දවස්වලදී මම සියලු ජන-
යාට මාගේ බලය ලබා දෙන්නෙමි.[8]
එවිට ඔබේ පුත්‍රයෝද ඔබේ දූවරුද
අනාවැකි කියනු ඇත. ඔබේ තරුණ-
යෝ දර්ශන දකිනු ඇත. ඔබේ මහල්-
ලෝද සිහින දකිනු ඇත.[9] **18** මම
මාගේ දාසයන් හා දාසීන්ට පවා
ඒ දවස්වලදී මාගේ බලය ලබා
දෙන්නෙමි. එවිට ඔවුහු අනා-
වැකි කියන්නෝය.[10] **19** මම අහසේ
පුදුම දේවල් දකින්න සලස්වන්නෙමි.
පොළොවෙහිද පුදුම ක්‍රියා සිදු කරන්-
නෙමි. ලේ සහ ගිනිද දුම් වලාවක්ද
දක්නට ලැබේ.[11] **20** යෙහෝවා දෙ-
විගේ තේජවත් දවස පැමිණෙන්න
කලින්[12] හිරු[13] අඳුරු වන්නේය. සඳද
ලේ වන්නේය. **21** නමුත් යෙහෝවා
යන දෙවිගේ නාමය කියා අයැ-
දින සියලුදෙනාවම ගලවාගනු ලබන්-
නේය.”’[1]

**22** “ඊශ්‍රායෙල් පුරුෂයෙනි, මේ දේ
අසන්න. මම කැමතියි නාස-
රෙත් නුවරින් පැමිණි යේසුස්[2] නමැති
මිනිසා ගැන ඔබට කතා කරන්න.
දෙවි ඔහු මාර්ගයෙන් බලවත් ක්‍රියා,[3]
ආශ්චර්යයන් සහ ලකුණු ප්‍රසිද්ධි-
යේ සිදු කළ බව ඔබ සියලුදෙනා
හොඳින් දන්නවා.[4] ඒ දේවලින් ඔහු
දෙවි විසින් එවූ තැනැත්තෙක් බව
කාටත් පැහැදිලි වුණා. **23** සියල්ල
කලින්ම දන්නා දෙවි, තම අරමු-
ණට එකඟව ඒ මිනිසාව ඔබේ අතට
පත් වෙන්න ඉඩහැරියා.[5] ඔබ දුෂ්ට
මිනිසුන්ව යොදාගෙන ඔහුව කණුවක
ඇණ ගසා මරා දැම්මා.[6] **24** නමුත්
දෙවි ඔහුව මරණයේ ග්‍රහණයෙන් මුදා-
ගෙන[7] ඔහුව නැවත නැඟිට්ටෙව්වා.[8]
මරණයට ඔහුව බැඳ තබාගන්න
හැකි වුණේ නැහැ.[9] **25** දාවිත් ඔහු
ගැන පැවසුවේ මෙසේයි. ‘යෙහෝවා
දෙවි සැමවිටම මා ඉදිරියේ සිටි-
නවා කියා මම විශ්වාස කළෙමි. ඔහු
මාගේ දකුණු පැත්තේ සිටින නිසා
මම නොසැලී සිටිමි.[10] **26** එහෙයින්
මාගේ සිත සතුටු විය. මම ප්‍රීතියෙන්
ඉපිල ගියෙමි. මාගේ ජීවිතය ගැන මම
බලාපොරොත්තුවෙන් සිටින්නෙමි.[11]
**27** මන්ද ඔබ මාව මිනී වළෙහි දිග-
ටම තබන්නේ නැත. ඔබට පක්ෂපා-
තව සිටින තැනැත්තාට මිනී වළෙහි
කුණු වීමට ඔබ ඉඩහරින්නේ නැත.[12]
**28** ජීවනයට යන මාර්ග ඔබ මට
දන්වා ඇත. ඔබ ඉදිරියේ සිටින විට
මට සැමදා සතුට ලැබෙන්නේය.’[13]

**29** “පුරුෂයෙනි, සහෝදරයෙනි,
අපේ මුතුන්මිත්තෙක් වන දාවිත් ගැන
මම ඔබට දැන් යමක් කියන්න කැම-
තියි. ඔහු මිය ගිය බවත්[14] ඔහුව
තැන්පත් කර ඇති බවත් ඔහුගේ සො-
හොන් ගෙය අද දක්වා අප අතරේ
තිබෙන බවත් සියලුදෙනාම දන්-
නවා. ඒ ගැන කිසිවෙකුට සැකයක්
නැහැ. **30** ඔහු අනාගතවක්තෘවර-

**2 පරි.**
1 නික් 12:48; යෙසා 56:6
2 තීත 1:12
3 2ලේක 17:11
4 1සාමු 1:14
5 මතෙ 28:16
6 ක්‍රියා 7:2; ක්‍රියා 22:1
7 ක්‍රියා 26:25; 1තෙස 5:7
8 යෙසා 44:3; එස 36:27; සෙක 12:10
9 යෝවෙ 2:28
10 ගණන් 11:29; යෝවෙ 2:29; ක්‍රියා 21:4; 1කොරි 12:10
11 යෝවෙ 2:30
12 යෝවෙ 2:31; මාක් 13:24
13 මතෙ 24:29

**2 තීරුව**
1 යෝවෙ 2:32; රෝම 10:13
2 මතෙ 2:23
3 ලූක් 24:19; යොහ 5:36
4 යොහ 14:10; හෙබ්‍රෙ 2:4
5 ලූක් 24:44; යොහ 19:11; ක්‍රියා 4:28; 1පේතෘ 1:20
6 ලූක් 23:33; ක්‍රියා 5:30; ක්‍රියා 7:52
7 ගීතා 9:13
8 ගීතා 16:10; ක්‍රියා 3:15; රෝම 4:24; 1කොරි 6:14; කොලො 2:12; හෙබ්‍රෙ 13:20
9 යොහ 10:18
10 ගීතා 16:8
11 ගීතා 16:9
12 ගීතා 16:10; ක්‍රියා 13:35
13 ගීතා 16:11
14 1රාජා 2:10; ක්‍රියා 13:36

ක්‍රියා **2:15*** එනම්, පෙ.ව. 9ට පමණ.

යෙක් හැටියටත් කටයුතු කළා. ඒ නිසා ඔහුගේ පරම්පරාවෙන් පැමිණෙන තැනැත්තෙකුව ඔහුගේ සිංහාසනයේ ඉන්දවන බවට[1] දෙවි දිවුරා දුන් පොරොන්දුව ගැන ඔහු දැන සිටියා. **31** ඔහු ඒ දේවල් කලින්ම තේරුම්ගත් නිසා ක්‍රිස්තුස්ගේ නැවත නැඟිටීම ගැන ඔහු කතා කළා. ක්‍රිස්තුස්ව මිනී වළෙහි දිගටම තබන්නේ නැති බවත් ඔහුගේ ශරීරය මිනී වළේ කුණු වීමට ඉඩ නොදෙන බවත් ඔහු පැවසුවා.[2] **32** දෙවි දැන් නැවත නැඟිටුවා තිබෙන්නේ එම යේසුස්වයි. එය සත්‍යයක් බවට අපි සියලුදෙනාම සාක්ෂි දරනවා.[3] **33** දෙවි ඔහුව දැන් උසස් කර තිබෙන නිසා ඔහු දැන් ඉඳගෙන සිටින්නේ දෙවිගේ දකුණු පැත්තෙයි.[4] ඔහුගේ දෙවි පියාණන් ඔහුට පොරොන්දු වූ ලෙස ඔහුට තම බලයද ලබා දී තිබෙනවා.[5] ඒ බලය ඔහු අපටත් ලබා දී තිබෙනවා. ඔබ දැන් අසන දකින දේවලින් පැහැදිලි වන්නේ එයයි. **34** ඇත්තෙන්ම දාවිත් ස්වර්ගයට ගියේ නැහැ.[6] නමුත් ඔහු මෙසේ කිව්වා. 'යෙහෝවා දෙවි මාගේ ස්වාමීන්ට මෙසේ කීවේය. "මාගේ දකුණු පැත්තේ ඉඳගන්න.[7] **35** මා ඔබේ සතුරන්ව ඔබේ පා පුටුව ලෙස තබන තුරු එසේ සිටින්න."'[8] **36** ඒ නිසා මුළු ඊශ්‍රායෙල් ජාතියම දැනගත යුතු දෙයක් මම සඳහන් කරන්න කැමතියි. එනම් ඔබ කණුවක ඇණ ගසා මරා දැමූ ඒ යේසුස්ව,[9] දෙවි දැන් ස්වාමීන් සහ ක්‍රිස්තුස් හැටියට පත් කර තිබෙනවා!"[10]

**37** ඔහු පැවසූ දේ ඇසූ විට හදවත පැලෙන තරම් වේදනාවක් ඔවුන්ට දැනිණ.[11] එවිට ඔවුහු පේතෘස්ගෙන් සහ යේසුස්ගේ අනික් නියෝජිතයන්ගෙන්,* "පුරුෂයෙනි, සහෝදරයෙනි, අපි දැන් මොනවාද කරන්න ඕනේ"[12] කියා ඇසූහ. **38** පේතෘස් ඔවුන්ට මෙසේ පිළිතුරු දුන්නේය. "ඔබ සියලුදෙනා පසුතැවිලි වෙන්න.[13] ඔබේ පව්වලට සමාව ලබාගැනීම සඳහා[1] යේසුස් ක්‍රිස්තුස්ව පිළිගෙන[2] බව්තීස්ම වෙන්න.[3] එවිට ඔබට දෙවිගේ බලය නමැති දීමනාව නොමිලේ ලැබෙයි.[4] **39** මන්ද ඒ පොරොන්දුව[5] ඔබටත් ඔබේ දරුවන්ටත් දුර බැහැර සිටින සියල්ලන්ටත් දී තිබෙනවා.[6] එනම් අපේ දෙවි වන යෙහෝවා විසින් කැඳවනු ලබන සියල්ලන්ට දී තිබෙනවා."[7] **40** ඉන්පසු ඔහු තවත් බොහෝ දේවල් පවසමින් කාරණා ප්‍රබලව ඒත්තුගන්වා, "මේ වංක පරම්පරාවෙන් ගැලවෙන්න"[8] කියා ඔවුන්ට අවවාද කළේය. **41** එහෙයින් ඔහු පැවසූ දේවල් මුළු හදවතින්ම පිළිගත් අය බව්තීස්ම වූහ.[9] එදින තුන්දහසක් පමණ දෙනෙක් ඔවුන්ට එකතු වූහ.[10] **42** ඉන්පසු ඔවුහු යේසුස්ගේ නියෝජිතයන් ඉගැන්වූ දේවලට හොඳ අවධානයක් දෙමින් තමන්ට තිබූ දේවල් එකිනෙකා අතරේ බෙදාගනිමින්,[11] එකට ආහාර ගනිමින් කාලය ගත කළෝය.[12] ඔවුහු යාච්ඤාවෙහිද නියැලී සිටියෝය.[13]

**43** යේසුස්ගේ නියෝජිතයන් බොහෝ ආශ්චර්යයන් සහ ලකුණු සිදු කළ අතර ඒවා දුටු සියලුදෙනා තුළ දෙවි කෙරෙහි ගරුබියක් ඇති විය.[14] **44** යේසුස්ගේ අනුගාමිකයන් බවට පත් වූ සියලුදෙනාම තමන් සතු සියලු දේවල් එකිනෙකා අතරේ බෙදාගත්තෝය.[15] **45** ඔවුහු තමන් සතු ඉඩම්ද වෙනත් දේවල්ද විකුණා,[16] ඉන් ලැබූ මුදල එකිනෙකාගේ අවශ්‍යතා පිරිමසාගැනීම සඳහා සියල්ලන් අතරේ බෙදා දුන්නෝය.[17] **46** ඔවුහු සෑම දිනකම දේවමාලිගාවෙහි එකට රැස් වූහ.[18] ඔවුන් ආහාර ගත්තේ එකිනෙකාගේ නිවෙස්වලය. ඔවුහු මහත් ප්‍රීතියෙන් එකට කල් ගෙවූහ.[19] අවංක සිතින්, **47** දෙවිට ප්‍රශංසා කළ ඔවුහු, සියලුදෙනාගේ ප්‍රසාදයට ලක් වූහ.[20] මේ අතර යෙහෝවා දෙවිගේ ආශීර්වාදයෙන්[21] ගැලවීමේ මඟට ඇතුල් වූ බොහෝ පිරිසක් ඔවුන්ට දිනපතා එකතු වූහ.[22]

**2 පරි.**
1 2සාමු 7:12, ගීතා 89:4, ගීතා 132:11
2 ගීතා 16:10, ක්‍රියා 13:35, ක්‍රියා 13:37
3 ලූක් 24:48, ක්‍රියා 1:8, ක්‍රියා 3:15
4 රෝම 8:34, පිලි 2:9, 1පේතෘ 3:22
5 යොහ 14:26, ක්‍රියා 1:4
6 යොහ 3:13
7 ගීතා 110:1
8 උත් 3:15, ලූක් 20:43, 1කොරි 15:25, හෙබ්‍රෙ 10:13
9 යොහ 19:6, ක්‍රියා 4:10
10 මතෙ 28:18, යොහ 3:35, ක්‍රියා 5:31
11 2සාමු 24:10, ගීතා 73:21
12 ලූක් 3:10, ක්‍රියා 16:30
13 ලූක් 24:47, ක්‍රියා 17:30, ක්‍රියා 26:20

**2 තීරුව**
1 යෙසා 44:22, මතෙ 26:28, එෆී 1:7
2 පිලි 2:9, එළි 19:16
3 මතෙ 28:19
4 ක්‍රියා 8:20
5 යෝවෙ 2:28
6 යෙසා 57:19, එෆී 2:17
7 යෝවෙ 2:32
8 ද්වි 32:5, ගීතා 78:8, ගලා 1:4, පිලි 2:15
9 ක්‍රියා 8:12, ක්‍රියා 18:8
10 යෙසා 60:22, ක්‍රියා 4:4, ක්‍රියා 5:14
11 පිලි 1:5
12 ක්‍රියා 2:46
13 ක්‍රියා 1:14
14 ක්‍රියා 5:12, ක්‍රියා 19:17
15 ක්‍රියා 4:32
16 මතෙ 19:21
17 යෙසා 58:7, ක්‍රියා 4:34
18 ලූක් 24:53
19 දේශ 9:7
20 රෝම 14:18
21 ගීතා 115:14, 1කොරි 3:7
22 ක්‍රියා 5:14, ක්‍රියා 11:21, ක්‍රියා 11:24

**ක්‍රියා 2:37*** හෝ, "යවනු ලැබූවන්ගෙන්."

**3** දිනක් පේතෘස් සහ යොහන්
යාච්ඤා කිරීම සඳහා වෙන් කළ
පැය වන නවවෙනි පැයේදී*[1] දේ-
වමාලිගාවට ගියෝය. **2** මේ අතර
උපන් දා සිට කොරව සිටි
මිනිසෙකුව[2] එක්තරා පිරිසක් විසින්
උසුලාගෙන එනු ලැබීය. ඔවුහු ඔහුව
දිනපතා එසේ උසුලාගෙන ඇවිත් දේ-
වමාලිගාවේ අලංකාර දොරටුව[3] ලෙස
හැඳින්වූ දොරටුව අසල තැබුවෝය.
එහිදී ඔහු දේවමාලිගාවට ඇතුල් වෙ-
මින් සිටි අයගෙන් සිඟමන්* ඉල්ලී-
මට පුරුදු වී සිටියේය.[4] **3** පේතෘස්
සහ යොහන් දේවමාලිගාවට ඇතුල්
වන විට තමාට යමක් දෙන්න* කියා
ඔහු ඔවුන්ගෙන් ඉල්ලා සිටියේය.[5]
**4** එවිට ඔහු දෙස හොඳින් බැලූ[6] පේ-
තෘස් සහ යොහන්, "අප දිහා බලන්න"
කියා ඔහුට කීවේය. **5** ඔහු, ඔවුන්-
ගෙන් යමක් ලබාගැනීමේ බලාපො-
රොත්තුවෙන් ඔවුන් දෙස බලාගෙන
සිටියේය. **6** ඒ මොහොතේදී පේ-
තෘස් මෙසේ කීවේය. "රන් රිදී මා ළඟ
නැහැ. නමුත් මට තිබෙන දේ ඔබට
මම දෙනවා.[7] නාසරෙත් නුවරෙන්
පැමිණි[8] යේසුස් ක්‍රිස්තුස්ගේ නාම-
යෙන් නැඟිට ඇවිදින්න!"[9] **7** එසේ
කියා පේතෘස් ඔහුගේ දකුණු අත
අල්ලා[10] ඔහුට නැඟිටින්න උපකාර
කළේය. ඒ මොහොතේදීම ඔහුගේ
යටි පතුල්ද වළලුකර අස්ථිද සවි-
මත් විය.[11] **8** එවිට ඔහු උඩ පනි-
මින්[12] ඇවිදින්න පටන්ගත්තේය. උඩ
පනිමින් ඇවිද ආ ඔහු දෙවිට ප්‍රශංසා
කරමින් ඔවුන් සමඟ දේවමාලිගා-
වට ඇතුල් වූයේය.[13] **9** ඔහු ඇවි-
දින ආකාරයත් දෙවිට ප්‍රශංසා කරමින්
සිටින ආකාරයත් සියලුදෙනාගේ අව-
ධානයට ලක් විය.[14] **10** මොහු දේ-
වමාලිගාවේ අලංකාර දොරටුව[15]
අසල ඉඳගෙන සිඟමන්* ඉල්ලමින්
සිටි මිනිසා බව හඳුනාගත් ඔවුහු,
ඔහුට සිදු වූ දේ ගැන පුදුම වෙමින්
ප්‍රීතියෙන් ඉපිල ගියෝය.[1]
**11** ඒ මිනිසා පේතෘස්ට සහ යො-
හන්ට යන්න නොදී අල්ලාගෙන
සිටියදී පුදුමයට පත් වී සිටි මුළු සෙ-
නඟ සලමොන්ගේ සක්මන් මළුව*[2]
ලෙස හැඳින්වූ ස්ථානයේ සිටි ඔවුන්
වෙතට දුවගෙන ආවෝය. **12** එය
දුටු පේතෘස් සෙනඟට මෙසේ කීවේය.
"ඊශ්‍රායෙල්වරුනි, ඔබ අප කළ දේ
ගැන පුදුම වන්නේ ඇයි? ඔහු ඇවි-
දින්නේ අපේ බලය නිසාවත් අපේ
මහත් භක්තිය නිසාවත් නොවෙයි.[3] ඒ
නිසා අප දිහා පුදුමයෙන් බලන්න
එපා. **13** ආබ්‍රහම්ගේද ඊසාක්ගේද
යාකොබ්ගේද දෙවි වූ[4] අපේ මුතුන්-
මිත්තන්ගේ දෙවි තමන්ගේ සේව-
කයා[5] වන යේසුස්ව දැන් තේජසට
පත් කර තිබෙනවා.[6] නමුත් මො-
නවාද ඔබ කළේ? පිලාත් ඔහුව
නිදහස් කරන්න තීරණය කළත්[7]
ඔබ ඔහුව පිලාත් ඉදිරියේම ප්‍රතික්-
ෂේප කර මිනිසුන්ගේ අතට පාවා
දුන්නා.[8] **14** ඔබ ඒ ශුද්ධ මෙන්ම
ධර්මිෂ්ඨ තැනැත්තාව ප්‍රතික්ෂේප
කළා.[9] ඔහු වෙනුවට මිනී මරුවෙ-
කුව[10] නිදහස් කරන්න කියා ඉල්ලා,
**15** ජීවනය ලබා දීමට පත් කර
ඇති ප්‍රධාන තැනැත්තාව[11] මරණ-
යට පත් කළා. නමුත් දෙවි ඔහුව
මරණයෙන් නැවත නැඟිටුවා තිබෙ-
නවා. අපි එයට සාක්ෂිකරුවෝ.[12]
**16** අපි මේ මිනිසාව සුව කළේ ඔහු-
ගේ නාමයෙනුයි. ඒ කියන්නේ ඔහු-
ගේ නාමය කෙරෙහි අපට තිබෙන
විශ්වාසය නිසයි ඔබ දන්නා හඳු-
නන මේ මිනිසාට සුවයක් ලැබුණේ.
ඇත්තෙන්ම ඔබ සියල්ලන් ඉදිරියේ
මේ මිනිසාට සම්පූර්ණ සුවයක් ලබා
දෙන්න අපට හැකි වුණේ යේසුස් කෙ-
රෙහි අපට තිබෙන විශ්වාසය නිසායි.
**17** සහෝදරයෙනි, ඔබේ පාලකයන්
මෙන්[13] ඔබත් ක්‍රියා කළේ නොදැ-

**3 පරි.**
1 ක්‍රියා 10:30
2 යොහ 9:1 ක්‍රියා 14:8
3 ක්‍රියා 3:10
4 යොහ 9:8
5 ලූක් 11:41
6 ක්‍රියා 14:9
7 2කොරි 6:10
8 මතෙ 2:23 ක්‍රියා 4:10
9 ක්‍රියා 3:16
10 මතෙ 9:25 ලූක් 6:6
11 මතෙ 8:15 යොහ 5:8 ක්‍රියා 9:34 ක්‍රියා 14:10
12 යෙසා 35:6
13 යොහ 5:14
14 ක්‍රියා 4:21
15 යොහ 9:8 ක්‍රියා 3:2

**2 තීරුව**
1 මාක් 5:42
2 යොහ 10:23 ක්‍රියා 5:12
3 2කොරි 3:5
4 නික් 3:6 මතෙ 22:32
5 යෙසා 52:13 යෙසා 53:11
6 යොහ 7:39 පිලි 2:9
7 මතෙ 27:21 ලූක් 23:14
8 ක්‍රියා 2:23 ක්‍රියා 5:30
9 1යොහ 2:1
10 මතෙ 27:20 ලූක් 23:18
11 ක්‍රියා 5:31 හෙබ්‍රෙ 2:10
12 ලූක් 24:48 ක්‍රියා 1:8 ක්‍රියා 2:32
13 1කොරි 2:8

**ක්‍රියා 3:1*** එනම්, ප.ව. 3ට පමණ. **2*** එනම්, දයාවෙන් කරන පරිත්‍යාග. **3*** එනම්, දයාන්විතව යමක් පරිත්‍යාග කරන්න. **10*** එනම්, දයාවෙන් කරන පරිත්‍යාග.

**ක්‍රියා 3:11*** හෝ, "කුලුනුවලින් සැදුණු විවෘත ප්‍රදේශය."

නුවත්කමින්.[1] **18** නමුත් ක්‍රිස්තුස්
වධ විඳිය යුතුයි කියා දෙවි
සියලු අනාගතවක්තෘවරුන් මාර්ග-
යෙන් කල්තියාම දැන්වූ දේවල් එලෙ-
සම ඉටු වී තිබෙනවා.[2]

**19** “දැන් පසුතැවිලි වෙන්න.[3] ඔබ
ගත කරන ජීවිතය වෙනස් කර-
ගෙන*[4] පව්වලට සමාව ලබා-
ගන්න.#[5] එසේ කරනවා නම් ඔබට
යෙහෝවා දෙවිගෙන් මහත් සහන-
යක්[6] ලැබෙන අතර, **20** ඔහු ඔබ
උදෙසා පත් කළ ක්‍රිස්තුස් නම් යේ-
සුස්ව ඔබ වෙනුවෙන් එවයි.
**21** පුරාණ කාලයේ විසූ තම ශුද්ධ
අනාගතවක්තෘවරුන්ගේ මුවින් දෙවි
පැවසූ ලෙස[7] සියල්ල නැවත පිහි-
ටුවීමට නියමිත කාලය පැමිණෙන
තුරු[8] ඔහු ස්වර්ගයේ සිටිය යුතුයි.[9]
**22** ඇත්තෙන්ම මෝසෙස් මෙසේ
පැවසූ ආකාරය ඔබට මතක ඇති.
‘යෙහෝවා දෙවි ඔබේ සහෝදරයන්
අතරින් ඔබ උදෙසා මා වැනි අනාග-
තවක්තෘවරයෙකුව පත් කරයි.[10] ඔහු
ඔබට පවසන සියල්ලට ඔබ සවන් දිය
යුතුයි.[11] **23** ඇත්තෙන්ම ඒ අනාග-
තවක්තෘවරයාට යමෙක් සවන් නො-
දුන්නොත් ඒ තැනැත්තාව සෙනඟ
අතරින් සහමුලින්ම විනාශ කරනු
ලබයි.’[12] **24** සාමුවෙල් පටන් සෑම
අනාගතවක්තෘවරයෙක්ම මේ කාලය
ගැන පැහැදිලිව ප්‍රකාශ කළා.[13]
**25** ඔබ පැවතෙන්නේ[14] එදා සිටි එම
අනාගතවක්තෘවරුන්ගෙනුයි. දෙවි
ඔබේ මුතුන්මිත්තන් සමඟ කළ ගිවි-
සුමේ සඳහන් පොරොන්දුවල උරු-
මක්කාරයන් ඔබයි. ඒ අනුව දෙවි
ආබ්‍රහම්ට මෙසේ පැවසුවා. ‘ඔබෙන්
පැවතෙන තැනැත්තා මාර්ගයෙන්
පොළොවේ සියලු පවුල් ආශීර්වාද
ලබන්නෝය.’[15] **26** දෙවි තම සේව-
කයාව පත් කළ පසු ඔහුව මුලින්ම
එව්වේ ඔබ ළඟටයි.[16] එසේ කළේ
ඔබ සියලුදෙනාව තම තමන්ගේ දුෂ්ට
ක්‍රියාවලින් මුදාගෙන ඔබට ආශීර්වාද
ලබා දීම සඳහායි.”

**4** ඔවුන් දෙදෙනා ජනයාට කතා
කරමින් සිටියදී නායක පූජ-
කයෝද දේවමාලිගාවේ වැඩකටයුතු
බලා කියා ගත් ප්‍රධානියාද[1] සද්දුසිව-
රුද*[2] ඔවුන් වෙතට කඩාවැදුණෝය.
**2** ඒ වන විට ඔවුන් දෙදෙනා ජනයාට
උගන්වමින්ද යේසුස්ගේ නැවත නැඟි-
ටීම උදාහරණයකට ගෙන මිය ගිය
අයට නැවත නැඟිටීමක් ඇති බව
පැහැදිලිව ප්‍රකාශ කරමින්ද සිටි නිසා
ඔවුහු කුපිතව සිටියෝය.[3] **3** ඔවුහු
ඔවුන්ව අල්ලාගත් අතර සවස් වී
තිබූ නිසා පසුවදා වන තුරු ඔවුන්ව
අත්අඩංගුවේ තබාගත්හ.[4] **4** නමුත්
පැවසූ දේවලට සවන් දී සිටි අයගෙන්
බොහෝදෙනෙකු ඒවා විශ්වාස කළ
අතර[5] ගෝලයන්ට එකතු වූ පුරු-
ෂයන්ගේ ගණන පන්දහසක් දක්වා
වැඩි විය.[6]

**5** පසුවදා යෙරුසලමේදී යුදෙව්
පාලකයන්ගේද වැඩිමහල්ලන්ගේද
නීතිය පිටපත් කරන්නන්ගේද රැස්වී-
මක් පවත්වන ලදි.[7] **6** (මෙම රැස්වී-
මට නායක පූජකයා වූ අන්නස්ද[8]
කායෆස්ද[9] යොහන්ද ඇලෙක්සැන්-
ඩර්ද නායක පූජකයාගේ නෑදෑයෝද
සහභාගි වූහ.) **7** ඔවුහු යේසුස්ගේ
එම නියෝජිතයන්* දෙදෙනාව තමන්
ඉදිරියට ගෙනැවිත්, “ඔබ මේ දේ
කළේ කාගේ අවසරයෙන්ද? කාගේ
නාමයෙන්ද”[10] කියා ඇසූහ. **8** එවිට
පේතෘස් තුළ දෙවිගේ බලය ප්‍රබලව
ක්‍රියාත්මක වී[11] ඔහු මෙසේ කීවේය.

“පාලකයෙනි, වැඩිමහල්ලෙනි,
**9** අද ඔබ අපෙන් ප්‍රශ්න කරන්-
නේ ඇවිදින්න බැරි මිනිසෙකුට යහ-
පත් ක්‍රියාවක් කළ නිසාද?[12] නැත්නම්
ඔහුව සුව කළේ කොහොමද කියා
දැනගැනීමටද? එහෙමනම්, **10** මේ
මිනිසා ඔබ ඉදිරියේ සුවය ලබා

---

**ක්‍රියා 3:19*** මූ.අ., “හැරී.” **19#** එනම්, පව් මකාගන්න.

**ක්‍රියා 4:1*** යේසුස්ගේ කාලයේ සිටි ප්‍රසිද්ධ ආගමික නායකයන් පිරිසකි. **7*** හෝ, “යවනු ලැබූවන්.”

---

**3 පරි.**

**1** ලූක් 23:34 යොහ 16:3 1තිමෝ 1:13
**2** ගීතා 22:16 ගීතා 118:22 යෙසා 50:6 යෙසා 53:8 දානි 9:26 ලූක් 22:15
**3** ක්‍රියා 2:38
**4** එස 33:11 එෆී 4:22 1පේතෘ 4:3
**5** එස 33:16 1යොහ 1:7
**6** යෙසා 28:12
**7** යෙසා 1:26
**8** මතෙ 17:11
**9** ගීතා 110:1
**10** ද්වි 18:15 ද්වි 34:10
**11** ද්වි 18:18 ක්‍රියා 7:37
**12** ද්වි 18:19
**13** ලූක් 24:27 ක්‍රියා 10:43
**14** රෝම 9:4
**15** උත් 22:18 ගලා 3:8
**16** ක්‍රියා 13:46 රෝම 1:16

**2 තීරුව**

**4 පරි.**

**1** ලූක් 22:4
**2** ක්‍රියා 23:8
**3** ක්‍රියා 4:33 ක්‍රියා 17:18
**4** ලූක් 21:12
**5** 1තිමෝ 3:16
**6** ක්‍රියා 2:41 ක්‍රියා 6:7
**7** මාක් 13:9
**8** ලූක් 3:2 යොහ 18:13
**9** මතෙ 26:57 ලූක් 3:2 යොහ 11:49
**10** මතෙ 21:23 මාක් 11:28 ලූක් 20:2
**11** ක්‍රියා 7:55
**12** ක්‍රියා 3:7

සිටගෙන සිටින්නේ, ඔබ කණුවක
ඇණ ගසා මරා දැමූ[1] නමුත් දෙවි
මරණයෙන් නැඟිටෙවූ[2] නාසරෙත්
නුවරින් පැමිණි යේසුස් ක්‍රිස්තුස්ගේ
නාමයෙනුයි.[3] ඒ බව ඔබ සියලුදෙ-
නාත් මුළු ඊශ්‍රායෙලයේ ජනතාවත්
දැනගත යුතුයි. **11** මේ යේසුස්, ‘ඉදි
කරන්නන් වන ඔබ විසින් කිසි වැද-
ගැම්මකට නැතැයි සලකනු ලැබූ
ගලයි. එය දැන් ප්‍රධාන ගල වී
තිබෙනවා.’[4] **12** ඇත්තෙන්ම වෙන
කිසිවෙකු තුළින් ගැලවීම ලබාගත
නොහැකියි. මන්ද අපව ගැලවීමට[5]
ඔහු මිස වෙනත් කිසි කෙනෙකුව*[6]
දෙවි අප අතරින් තෝරාගෙන නැහැ.”
**13** පේතෘස් සහ යොහන් නිර්-
භීත ලෙස කතා කරනවා දුටු ඔවුහු
පුදුම වූහ. ඊට හේතුව ඔවුන් දෙ-
දෙනා වැඩිදුර අධ්‍යාපනයක් නො-
ලැබූ, සාමාන්‍ය මිනිසුන්[7] බව ඔවුන්
දැන සිටීමය. එහෙයින් ඒ මිනිසුන් දෙ-
දෙනා යේසුස් සමඟ ඇසුරු කළ අය
බව ඔවුන්ට අවබෝධ විය.[8] **14** ඒ
අවස්ථාවේදී එතැන සුවය ලැබූ මිනි-
සාද සිටි නිසා[9] ඔවුන් පැවසූ දෙයට
විරුද්ධව කිසිවක් කියන්න ඔවුන්ට
නොහැකි විය.[10] **15** එහෙයින් ඔවුහු
රැස්ව සිටි ශාලාවෙන් ඔවුන්ට පිට-
තට යන්න කියා අණ කර තම
තමන් අතරේ, **16** මෙසේ සාකච්ඡා
කළෝය. “අපි මේ මිනිසුන්ට මොන-
වාද කරන්නේ?[11] ඇත්තෙන්ම ඔවුන්
කළේ පුදුමසහගත ක්‍රියාවක්. යෙරු-
සලමේ සියලු වැසියන් අතරත් එය
ප්‍රසිද්ධ වෙලා.[12] ඒ නිසා එහෙම දෙ-
යක් සිදු වුණේ නැහැ කියා කියන්න
අපට බැහැ. **17** හැබැයි මේ දේ ජන-
තාව අතර තවත් පැතිරෙන එක
නම් නවත්වන්න ඕනේ. ඒ නිසා
අපි ඔවුන්ට තර්ජනය කර ඒ නාම-
යෙන් කිසිම කෙනෙකුට නැවත කතා
කරන්න එපා කියා කියමු.”[13]
**18** ඉන්පසු ඔවුහු ඔවුන්ව කැඳවා,
කොතැනකවත් යේසුස් ගැන කිසිවක්
කතා කරන්නවත් ඔහු ගැන උගන්-
වන්නවත් එපා කියා අණ කළෝය.
**19** නමුත් පේතෘස් සහ යොහන්
ඔවුන්ට මෙසේ පිළිතුරු දුන්නෝය.
“දෙවිට සවන් දෙනවාට වඩා ඔබට
සවන් දීම දෙවි ඉදිරියෙහි හරිද කියා
ඔබම තීරණය කරන්න. **20** නමුත්
අප ඇසූ දුටු දේ ගැන කතා කරන එක
නතර කරන්න නම් අපට බැහැ.”[1]
**21** ඉන්පසු ඔවුහු ඔවුන්ට තවත් තර්-
ජනය කර ඔවුන්ව නිදහස් කළෝය.
ඔවුන් එසේ කළේ ඔවුන්ට දඬුවම්
කිරීමට කිසිම පදනමක් සොයාගත
නොහැකි වූ නිසාය. එමෙන්ම සිදු
වූ දේ ගැන ජනතාව දෙවිට ප්‍රශංසා
කරමින් සිටි නිසා ඔවුහු ජනතාවට
බියෙන් වෙන කිසිවක් නොකළෝය.[2]
**22** එසේ ආශ්චර්යවත් ලෙස සුවය
ලැබූ මිනිසා වයසින් අවුරුදු හතළිහ-
කට වඩා වැඩි කෙනෙකි.
**23** ඔවුහු නිදහස් වූ පසු අනිකුත්
ගෝලයන් වෙතට ගොස්[3] නායක පූජ-
කයන් සහ වැඩිමහල්ලන් ඔවුන්ට
පැවසූ සියල්ල දැන්වූහ. **24** එය ඇසූ
ඔවුහු එකට එකතු වී දෙවිට මෙසේ
යාච්ඤා කළෝය.[4]
“විශ්වයේ පාලකයාණෙනි,[5] අහ-
සත් පොළොවත් මුහුදත් එහි ඇති
සියල්ලත් සෑදුවේ ඔබයි.[6] **25** අපේ
මුතුන්මිත්තෙක් වන ඔබේ සේව-
කයා වූ දාවිත් ඔබේ බලය ලබා
එහි මඟ පෙන්වීම ඇතුව පැවසූ
දෙයක්[7] අපේ මතකයට නැඟෙයි.
එනම්, ‘සියලු ජාතීන් කැලඹී සිටින්-
නේ මන්ද? ජනයා පලක් නැති
දේවල් ගැන කල්පනා කරමින් සිටින්-
නේ මන්ද?[8] **26** යෙහෝවා දෙවිටත්
ඔහුගේ අභිෂේක ලත් තැනැත්තාටත්
විරුද්ධව පොළොවේ රජවරු නැඟී
සිටියෝය. පාලකයෝද එකට රැස්
වූහ.’[9] **27** ඇත්තටම සිදු වුණේ ඒ
දෙයයි. මන්ද හෙරොද් සහ පොන්ති-
යුස් පිලාත්[10] යන දෙදෙනාම, වෙ-
නත් ජාතීන් හා ඊශ්‍රායෙල්හි ජනතාව
සමඟ මේ නගරයේදී රැස් වුණේ
ඔබ අභිෂේක කළ[11] ඔබේ ශුද්ධ

**4 පරි.**
**1** ක්‍රියා 2:36
**2** ක්‍රියා 2:24, ක්‍රියා 5:30
**3** මතෙ 2:23, ක්‍රියා 3:6
**4** ගීතා 118:22, යෙසා 28:16, මතෙ 21:42, 1පේතෘ 2:7
**5** යොහ 1:12, යොහ 14:6, 1තිමෝ 2:5
**6** මතෙ 1:21, ක්‍රියා 10:43, පිලි 2:9
**7** මතෙ 11:25, 1කොරි 1:27
**8** යොහ 7:15
**9** ක්‍රියා 3:11
**10** ලූක් 21:15
**11** යොහ 11:47
**12** ක්‍රියා 3:9
**13** ක්‍රියා 5:40

**2 තීරුව**
**1** ක්‍රියා 5:29, 2පේතෘ 1:16
**2** ලූක් 22:2, ක්‍රියා 5:26
**3** ක්‍රියා 12:12
**4** ගීතා 55:16
**5** එළි 6:10
**6** නික් 20:11, නෙහෙ 9:6, ගීතා 146:6, එළි 10:6
**7** 2සාමු 23:2
**8** ගීතා 2:1
**9** ගීතා 2:2
**10** ලූක් 23:12
**11** ගීතා 45:7, ක්‍රියා 10:38

ක්‍රියා **4:12*** මූ.අ., “නාමයක්.”

සේවක[1] යේසුස්ට විරුද්ධව නැඟී
සිටින්නයි. **28** ඒ සෑම දෙයක්ම සිදු
විය යුතුයි කියා ඔබ කලින්ම තීරණය
කර තිබුණා.[2] ඒවා සිදු වුණේ ඔබේ
මහත් බලයෙන් හා ඔබේ කැමැත්තට
එකඟවයි. **29** යෙහෝවා දෙවියනි,
ඔවුන් කරන තර්ජන දෙස බලන්න.[3]
ඔබේ දාසයන්ට කිසිම බියක් සැකක්
නැතුව ඔබ පවසන දේවල් දිග-
ටම කතා කරන්න හැකියාව ලබා
දෙන්න.[4] **30** ඔබේ මහත් බලයෙන්
සුව කිරීම් නොකඩවා කරන්න. ඒ
වගේම ඔබේ ශුද්ධ සේවකයා[5] වන
යේසුස්ගේ නාමයෙන්[6] දිගටම ආශ්-
චර්යයන් සහ ලකුණු සිදු කරන්න
කියාත්[7] අපි ඔබෙන් ඉල්ලනවා.”

**31** ඔවුන් දෙවිට මෙසේ කන්නලව්
කළ පසු ඔවුන් රැස්ව සිටි ස්ථා-
නය දෙදරුම් කැවේය.[8] එවිට සිය-
ලුදෙනා තුළම දෙවිගේ බලය ඉතා
ප්‍රබල ලෙස ක්‍රියාත්මක වී[9] ඔවුහු දෙවි
පැවසූ දේවල් නිර්භීතව කතා කරන්න
පටන්ගත්තෝය.[10]

**32** විශ්වාසයක් ඇතුව සිටි සියලු-
දෙනාම එකමුතුව සමඟියෙන් කට-
යුතු කළෝය.[11] ඔවුහු තමන් සතු
දේවල් එකිනෙකා අතරේ බෙදාගත්
නිසා[12] තමාට අයිති දෙයක් තමා-
ගේ කියා කිසිවෙක් පැවසුවේ නැත.
**33** මේ අතර යේසුස්ගේ නියෝජි-
තයෝ තම ස්වාමීන් වන යේසුස්-
ගේ නැවත නැඟිටීම ගැන ඉතා
ප්‍රබල ලෙස නොකඩවා සාක්ෂි දර-
මින් සිටියෝය.[13] එමෙන්ම සියලු-
දෙනාටම දෙවිගේ මහත් කරුණාව
නොඅඩුව ලැබිණ. **34** ඇත්තෙන්ම
අඟහිඟකම් ඇති කිසිවෙක් ඔවුන් අත-
රේ සිටියේ නැත.[14] මන්ද ගෙවල් දො-
රවල් වතුපිටි අයිති සියලුදෙනා ඒවා
විකුණා, එයින් ලැබූ මුදල් ගෙනැ-
විත්, **35** නියෝජිතයන්ට භාර දුන්-
නෝය.[15] එවිට අවශ්‍යතා ඇති අය
අතරේ එම මුදල් නිසි ලෙස බෙදා
දෙන ලදි.[16] **36** මේ අතර යෝසෙප්
නම් මිනිසෙක් සිටියේය. සයිප්‍රස් දූප-
තේ වැසියෙකු වූ ඔහු ලෙවීවරයෙකු වූ
අතර නියෝජිතයන් ඔහුට බාර්නබස්[1]
යන වාසගම දී තිබිණ. එහි තේරුම
නම් ‘සැනසිල්ලේ පුත්‍රයාය’ යන්නයි.
**37** ඉඩමක් අයිතිව සිටි ඔහු, එය
විකුණා එයින් ලබාගත් මුදල් නියෝ-
ජිතයන්ට භාර දුන්නේය.[2]

**5** අනනියස් නම් මිනිසෙක්ද සිටි-
යේය. ඔහුගේ බිරිඳගේ නම සෆී-
රාය. ඔවුන් දෙදෙනාද තමන්ට අයිති
වූ ඉඩමක් විකුණුවෝය. **2** අනනි-
යස් ඒ මුදලින් කොටසක් තමන්
ළඟ තබාගත් අතර ඒ ගැන ඔහු-
ගේ බිරිඳද දැන සිටියාය. ඔහු ඉතුරු
මුදල ගෙනැවිත් යේසුස්ගේ නියෝජි-
තයන්ට* භාර දුන්නේය.[3] **3** නමුත්
පේතෘස් මෙසේ කීවේය. “අනනියස්,
ඔබ මේ වගේ දෙයක් කරන්න පෙ-
ලඹුණේ ඇයි? ඇයි ඔබ සාතන්ට
ඔබේ සිත පාලනය කරන්න ඉඩ
දුන්නේ?[4] දෙවිගේ බලයේ ක්‍රියාකා-
රිත්වය[5] දැක දැකත් දෙවිට බොරු
කර[6] ඒ ඉඩම විකුණා ලබාගත් මුද-
ලින් කොටසක් රහසින් තබාගත්තේ
ඇයි? **4** ඒ ඉඩම ඔබට අයිති දෙ-
යක්. එය ඔබ සතු දේපොළක්. විකුණූ
පසුත් කැමති විදිහට එම මුදල්
පාවිච්චි කරන්න ඔබට අයිතියක්
තිබුණා. එහෙම තිබියදීත් මේ වගේ
දෙයක් කරන්න ඔබේ සිත පෙලඹු-
ණේ කොහොමද? ඔබ බොරු කළේ[7]
මිනිසුන් වන අපිට නොවෙයි, දෙවි-
ටයි.”[8] **5** එවිට ඒ වචනවලට සවන්
දෙමින් සිටි අනනියස් බිම ඇද වැටී
මිය ගියේය.[9] ඒ සිදුවීම ගැන ආරංචි වූ
සියලුදෙනා තුළ මහත් බියක් ඇති
විය.[10] **6** පසුව තරුණයන් කිහිපදෙ-
නෙක් ඔහුගේ මළ සිරුර රෙදිවලින්
ඔතා,[11] පිටතට උසුලාගෙන ගොස්
තැන්පත් කළෝය.

**7** සිදු වූ දේ නොදැන පැය තුන-
කට පමණ පසු ඔහුගේ බිරිඳ එතැනට
පැමිණියාය. **8** පේතෘස්, “ඔබ දෙ-
දෙනා ඉඩම විකුණුවේ මේ මුදලටද”
කියා ඇගෙන් ඇසුවේය. “ඔව්, අපට

**4 පරි.**
1 ක්‍රියා 3:13; හෙබ්‍රෙ 7:26
2 යෙසා 53:10; ලූක් 24:44; ක්‍රියා 2:23; 1පේත 1:20
3 යෙසා 37:17
4 යෙසා 58:1; ක්‍රියා 19:8
5 ක්‍රියා 3:26
6 ක්‍රියා 3:16
7 ක්‍රියා 2:43; ක්‍රියා 5:12
8 ක්‍රියා 2:2
9 ක්‍රියා 2:4
10 1තෙස 2:2
11 යොහ 17:21; පිලි 1:27
12 ක්‍රියා 2:44
13 ක්‍රියා 1:22; ක්‍රියා 4:2
14 ද්වි 15:4; ක්‍රියා 2:45; 1යොහ 3:17
15 ක්‍රියා 5:2
16 ක්‍රියා 6:1

**2 තීරුව**
1 ක්‍රියා 11:22; ක්‍රියා 12:25
2 හිතෝ 3:9; ලූක් 12:33

**5 පරි.**
3 ක්‍රියා 4:35
4 ලූක් 22:3
5 ගණන් 30:2; දේශ 5:4; ක්‍රියා 5:9
6 ගීතා 101:7; ගීතා 119:118; එෆී 4:25; කොලො 3:9; එළි 21:8
7 ද්වි 23:23
8 1සාමු 2:25
9 1පේත 4:17
10 ක්‍රියා 2:43; ක්‍රියා 5:11
11 යොහ 19:40

ක්‍රියා **5:2*** හෝ, “යවනු ලැබූවන්ට.”

ලැබුණේ එච්චරයි” කියා ඇය පැවසු-
වාය. **9** එවිට පේතෘස් ඇයට මෙසේ
කීවේය. “ඇයි ඔබ දෙදෙනා යෙහෝවා
දෙවිගේ බලයේ ක්‍රියාකාරිත්වය දැක
දැකත් ඔහුට බොරු කරන්න හැදු-
වේ?[1] ඔබේ ස්වාමිපුරුෂයාව තැන්පත්
කළ අය ඔබවත් පිටතට උසුලාගෙන
යන්න ඇවිත්.” **10** ඒ මොහොතේ-
දීම ඇය ඔහු ඉදිරියේ බිම ඇද වැටී මිය
ගියාය.[2] තරුණයෝ ඇතුළට පැමිණි
විට ඇය මිය ගොස් සිටිනවා දැක
ඇයවත් පිටතට උසුලාගෙන ගොස්
ඇගේ ස්වාමිපුරුෂයා ළඟ තැන්පත්
කළෝය. **11** ඒ සිද්ධිය ගැන ආරංචි
වූ සියලුදෙනාද මුළු සභාවද බොහෝ
සෙයින් බියට පත් වූහ.

**12** යේසුස්ගේ නියෝජිතයෝ
ජනයා අතරේ බොහෝ ලකුණුද ආශ්-
චර්යයන්ද සිදු කළෝය.[3] ඔවුන් සිය-
ලුදෙනාම නිතර එකට හමු වූයේ
සලමොන්ගේ සක්මන් මළුවෙහිය.*[4]
**13** ඔවුන් හා එක් වීමට තරම් ධෛර්-
යයක් නොතිබුණු යම් පිරිසක් සිටි-
යත්[5] පොදුවේ ජනතාව ගෝලයන්ට
මහත් සේ ප්‍රශංසා කළෝය.[6] **14** මීට
අමතරව ස්වාමීන්ව විශ්වාස කළ පුරු-
ෂයන්ගේ හා ස්ත්‍රීන්ගේ ගණන දිගටම
වැඩි විය.[7] **15** මේ අතර බොහෝදෙ-
නෙක් රෝගාතුරව සිටි අයව කුඩා
ඇඳන්වල තබා ඔවුන්ව වීථි දිගේ
තැබුවෝය. ඔවුන් බලාපොරොත්තු
වූයේ පේතෘස් ඔවුන්ව පසු කරගෙන
යන විට අඩුම තරමින් ඔහුගේ සෙ-
වණැල්ලවත් රෝගාතුරව සිටි අය
මත වැටෙයි කියාය.[8] **16** එමෙන්ම
යෙරුසලම අවට පිහිටි නුවරවලින්
විශාල පිරිසක් රෝගීන්වද භූතයන්-
ගෙන් හිරිහැර විඳින අයවද උසුලා-
ගෙන ආවෝය. ඒ සියලුදෙනාව සුව
කරන ලදි.

**17** එවිට උත්තම පූජකයාද ඔහුට
පක්ෂව සිටි සද්දුසිවරුන්ගේ නිකායට
අයිති සියලුදෙනාද මහත් ඊර්ෂ්‍යාව-
කින් පෙළඹී,[9] **18** එම නියෝජිත-
යන්ව අල්ලා සිරගෙයි දැමූහ.[1]
**19** නමුත් රාත්‍රියේදී යෙහෝවා දෙවි-
ගේ දූතයා[2] සිරගෙයි දොරවල්
විවෘත කර[3] ඔවුන්ව පිටතට ගෙනැ-
විත් මෙසේ කීවේය. **20** “දැන් ඔබ
දේවමාලිගාවට ගොස් ඉදිරියේදී ලැබී-
මට නියමිත ජීවිතය[4] හා සම්බන්ධ
සියලු දේවල් ගැන ජනයාට නොක-
ඩවා කියන්න.” **21** එම වචනවලට
සවන් දුන් ඔවුහු, උදෑසනින්ම දේවමා-
ලිගාවට ඇතුල් වී ජනයාට උගන්-
වන්න පටන්ගත්තෝය.

මේ අතර උත්තම පූජකයා සහ
ඔහු සමඟ සිටි අය පැමිණ මුළු
මන්ත්‍රණ සභාවද ඊශ්‍රායෙල් ජාතියේ
වැඩිමහල්ලන් සමූහයද රැස් කරවා,[5]
සිරභාරයට ගත් නියෝජිතයන්ව සිර-
ගෙයින් රැගෙන ඒමට මිනිසුන්ව
යැව්වෝය. **22** නමුත් ඒ නිලධාරීන්
එහි ගිය විට ඔවුන් සිරගෙයි නැති
බව ඔවුන්ට පෙනී ගියේය. එහෙයින්
ඔවුහු ආපසු පැමිණ, **23** “අපි සිර-
ගෙට ගිය විට එහි අගුලු දමා තිබුණා.
ඒ වගේම දොරවල් ළඟ මුරකරුවන්ද
සිටියා. ඒත් දොරවල් විවෘත කළ
විට කවුරුවත් එහි හිටියේ නැහැ”
කියා දැනුම් දුන්හ. **24** දේවමාලි-
ගාවේ වැඩකටයුතු භාරව සිටි ප්‍රධානි-
යාද නායක පූජකයෝද සිදු වූ දේ
අසා මේ දේවල් කොතැනින් කෙ-
ළවර වෙයිද කියා සිතමින් දෙගිඩි-
යාවෙන් සිටියෝය.[6] **25** එවිට එක්
මිනිසෙක් ඇවිත් ඔවුන්ට මෙසේ
දැනුම් දුන්නේය. “ඔබ සිරගෙයි දැමූ
මිනිසුන් දේවමාලිගාවට ගිහින් ජන-
යාට උගන්වනවා.”[7] **26** එවිට දේව-
මාලිගාවේ වැඩකටයුතු භාරව සිටි
ප්‍රධානියා ඔහුගේ අනෙකුත් සේවක-
යන් සමඟ ගොස් ඔවුන්ට කිසි හිරි-
හැරයක් නොකර ඔවුන්ව රැගෙන
ආවේය. ඔවුන් එසේ කළේ ජනයා
තමන්ට ගල් ගසයි කියා බිය වූ
නිසාය.[8]

**27** ඔවුහු ඔවුන්ව ගෙනැවිත් මන්-
ත්‍රණ සභාව රැස් වන ශාලාවේ සිටෙව්-
වෝය. උත්තම පූජකයා ඔවුන්ගෙන්

**5 පරි.**
**1** නික් 17:2
ගීතා 95:9
මතෙ 4:7
ලූක් 4:12
1කොරි 10:9
**2** ක්‍රියා 5:5
**3** ක්‍රියා 4:30
ක්‍රියා 6:8
ක්‍රියා 7:36
ක්‍රියා 14:3
ක්‍රියා 15:12
රෝම 15:19
2කොරි 12:12
**4** යොහ 10:23
ක්‍රියා 3:11
**5** යොහ 19:38
**6** ක්‍රියා 2:47
**7** ක්‍රියා 6:7
**8** මතෙ 9:21
මතෙ 14:36
මාක් 6:56
**9** හිතෝ 27:4
මතෙ 27:18

**2 තීරුව**
**1** ලූක් 21:12
ක්‍රියා 4:3
**2** ගීතා 34:7
ක්‍රියා 12:7
හෙබ්‍රෙ 1:14
**3** ක්‍රියා 16:26
**4** යොහ 6:68
**5** ක්‍රියා 4:5
**6** ක්‍රියා 4:1
**7** ක්‍රියා 4:20
**8** මතෙ 14:5
ලූක් 20:19

ක්‍රියා **5:12*** ක්‍රියා 3:11හි පාදසටහන බලන්න.

මෙසේ ප්‍රශ්න කළේය. **28** "ඒ නාම-
යෙන් තවදුරටත් උගන්වන්න එපා
කියා අපි පැහැදිලිවම නුඹලාට අණ
කළා.[1] ඒත් බලන්න! නුඹලා උගන්වා
ඇති දේවල් යෙරුසලම පුරාම
පැතිරිලා.[2] ඒ මිනිසාගේ ලේවලට අප
වග කිව යුතුයි කියමින් ඒ වරද නුඹලා
කොහොමහරි අප පිට පටවන්න උත්-
සාහ කරනවා."[3] **29** එවිට පේතෘස්
සහ අනික් නියෝජිතයෝ මෙසේ පිළි-
තුරු දුන්නෝය. "අප කීකරු විය
යුත්තේ මිනිසුන්ට නොව දෙවිටයි.[4]
**30** අපේ මුතුන්මිත්තන්ගේ දෙවි, ඔබ
කණුවක එල්ලා මරා දැමූ[5] යේ-
සුස්ව නැවත නැඟිටුවා තිබෙනවා.[6]
**31** දෙවි දැන් ඔහුව උසස් කර තිබෙ-
නවා. ඔහු සිටින්නේ දෙවිගේ දකුණු
පැත්තෙයි.[7] මිනිසාට ජීවනය ලබා
දීමට පත් කර ඇති ප්‍රධාන නැනැත්-
තාත්[8] ගැලවුම්කරුත්[9] ඔහුයි. ඊශ්‍රා-
යෙල් ජනයාට පසුතැවිලි වෙන්නත්[10]
තම පව්වලට සමාව ලබාගන්නත්[11]
හැකි වන්නේ ඔහු මාර්ගයෙනුයි.
**32** ඒ දේවල් සම්බන්ධයෙන් අපි
සාක්ෂිකරුවෝ.[12] එලෙසම දෙවි තම
බලය මගින්ද ඒ සඳහා සාක්ෂි ලබා දී
තිබෙනවා.[13] ඒ බලය ඔහු ලබා දී
තිබෙන්නේ පාලකයාණන් ලෙස ඔහුව
පිළිගෙන ඔහුට කීකරු වන සියලු-
දෙනාටයි."

**33** ඔවුන්ට එය ඇසුණු විට ඔවුන්
තුළ මහත් කෝපයක් ඇති විය. ඒ
නිසා ඔවුන් අදහස් කළේ යේසුස්-
ගේ නියෝජිතයන්ව මරා දැමීමටය.[14]
**34** නමුත් එක් පරිසිවරයෙක්* එනම්,
සියලුදෙනා ඉතා ගෞරවයෙන් සැලකූ
නීතිය උගන්වන කෙනෙකු වූ ගමාලි-
යෙල්[15] මන්ත්‍රණ සභාවේ සිටි සියලු-
දෙනා ඉදිරියේ නැඟිට, ඒ මිනිසුන්ව
ටික වේලාවකට පිටතට ගෙන යන්න
කියා අණ කළේය.[16] **35** ඉන්පසු
ඔහු මෙසේ පැවසුවේය. "ඊශ්‍රායෙල්
පුරුෂයෙනි,[17] මේ මිනිසුන්ට ඔබ
කරන්න සිතාගෙන සිටින දේ ගැන
පරෙස්සම් වෙන්න. **36** ඔබට මත-
කද මීට ටික කලකට කලින් තියු-
ඩස් තමා වැදගත් කෙනෙක් කියා
පවසමින්[1] පැමිණි ආකාරය? මිනිස්සු
හාරසියදෙනෙක් විතර ඔහුගේ පක්-
ෂයට බැඳුණා.[2] නමුත් ඔහුව මරා
දමනු ලැබූ අතර ඔහුගේ පක්ෂ-
යේ සිටි සියලුදෙනාම විසිරී ගොස්
අතුරුදහන් වෙලාම ගියා. **37** පසුව
ලියාපදිංචි වීම[3] සිදු කළ කාල-
යේදී ගලීලයෙන් යූදස් කියන කෙ-
නෙක් ආවා. ඔහු පස්සෙන් මිනිසුන්
විශාල පිරිසක් ගියා. නමුත් ඒ මිනි-
සාත් මිය ගිය පසු ඔහුගේ පක්-
ෂයේ සිටි සියලුදෙනාම විසිරී ගියා.
**38** ඉතින් මම දැන් කියන්නේ, මේ
මිනිසුන්ගේ වැඩකටයුතුවලට මැදි-
හත් වෙන්න එපා කියලයි. පවතින
තත්වයට අනුව ඔවුන්ට ඉන්න ඉඩහ-
රින්න. (මන්ද මේ මිනිසුන් කරන්න
අදහස් කරන දේවල් ඔවුන්ගේම අද-
හසක් නම් එය කවදාවත් සාර්ථක
වෙන්නේ නැහැ.[4] **39** නමුත් ඒ දේ
පිටුපස සිටින්නේ දෙවි නම්[5] ඔබ මො-
නව කළත් ඔවුන්ව නවත්වන්න ඔබට
බැරි වෙයි.)[6] ඔබ පරෙස්සම් වුණේ
නැත්නම් ඔබ දෙවිට විරුද්ධව සටන්
කරන අය විය හැකියි."[7] **40** ඔහු
පැවසූ දේවල් පිළිගත් ඔවුහු, යේසුස්-
ගේ නියෝජිතයන්ව කැඳවා ඔවුන්ට
තළා,[8] යේසුස්ගේ නාමයෙන්[9] තවදුර-
ටත් කතා නොකරන්න කියා නියෝග
කර ඔවුන්ව නිදහස් කළෝය.

**41** යුදෙව් මන්ත්‍රණ සභාවෙන් පිට-
තට පැමිණි ඔවුහු, යේසුස්ගේ නාමය
නිසා නින්දා විඳින්න ලැබීම කො-
තරම් උතුම් වරප්‍රසාදයක්ද[10] කියා
සිතමින් ප්‍රීතියෙන්[11] පිටත්ව ගියෝය.
**42** ඔවුහු තම ඉගැන්වීම් කටයුතු සහ
ක්‍රිස්තුස් එනම්, යේසුස් පිළිබඳ ශුභා-
රංචිය[12] ප්‍රකාශ කිරීමේ කාර්යය නතර
කළේ නැත.[13] දිනපතාම ඔවුහු දේව-
මාලිගාවේදීත් ගෙයින් ගෙටත් ගොස්[14]
එම කාර්යය ඉටු කළෝය.

**5 පරි.**
1 ක්‍රියා 4:18
2 යොහ 12:19
3 මතෙ 27:25; ක්‍රියා 3:15
4 1සාමු 15:22; දානි 3:18; යොහ 14:15; ක්‍රියා 4:19
5 ක්‍රියා 2:23; ක්‍රියා 10:39; ගලා 3:13; 1පේතෘ 2:24
6 ක්‍රියා 2:24; ක්‍රියා 13:30
7 ක්‍රියා 2:33; පිලි 2:9
8 ක්‍රියා 3:15
9 මතෙ 1:21; හෙබ්‍රෙ 2:10
10 ක්‍රියා 2:38
11 යෙසා 53:11; ලූක් 24:47; ක්‍රියා 10:43; ක්‍රියා 13:38
12 ලූක් 24:48; ක්‍රියා 1:8; ක්‍රියා 1:22
13 යොහ 15:26
14 ක්‍රියා 7:54
15 ක්‍රියා 22:3
16 ක්‍රියා 4:15
17 ක්‍රියා 2:22

**2 තීරුව**
1 ක්‍රියා 8:9
2 ක්‍රියා 21:38
3 ලූක් 2:2
4 ගීතා 127:1; හිතෝ 21:30; මතෙ 15:13
5 යෙසා 26:12; රෝම 8:31
6 යෙසා 8:10
7 ක්‍රියා 26:14
8 මතෙ 10:17; මාක් 13:9; ලූක් 20:10; ක්‍රියා 22:19
9 ක්‍රියා 4:18
10 ක්‍රියා 9:16
11 මතෙ 5:12; ක්‍රියා 16:25; රෝම 5:3; 2කොරි 12:10; පිලි 1:29; හෙබ්‍රෙ 10:34; 1පේතෘ 4:13
12 2කොරි 10:14
13 ක්‍රියා 2:46; ක්‍රියා 4:31; ක්‍රියා 18:5
14 ක්‍රියා 20:20

**ක්‍රියා 5:34*** යේසුස්ගේ කාලයේ සිටි ප්‍රසිද්ධ ආගමික නායකයන් පිරිසකි.

**6** ගෝලයන්ගේ ගණන වැඩි වෙ-
මින් පැවති ඒ කාලයේදී ග්‍රීක බස
කතා කරන[1] යුදෙව් ගෝලයෝ හෙ-
බ්‍රෙව් බස කතා කරන යුදෙව් ගෝ-
ලයන්ට විරුද්ධව චෝදනා නඟන්න
පටන්ගත්තෝය. එම චෝදනාවට
හේතුව නම් දිනපතා සියලුදෙනා අත-
රේ ආහාර බෙදා දෙනු ලැබූ විට ග්‍රීක
බස කතා කරන වැන්දඹුවන්ව නොස-
ලකාහැරීමය.[2] **2** එහෙයින් යේසුස්-
ගේ නියෝජිතයෝ* දොළොස්දෙනා,
ගෝලයන් සියලුදෙනාව තමන් ළඟට
කැඳවා මෙසේ කීවෝය. "දෙවි පවසා
ඇති දේවල් ගැන ඉගැන්වීමේ කාර්-
යය නතර කර මේසවල ඉඳගෙන
සිටින අයට කෑම බෙදා දීමට අපේ
කාලය වැය කිරීම හරි නැහැ.[3] **3** ඒ
නිසා සහෝදරයෙනි, මේ අත්‍යවශ්‍ය
කාර්යය සඳහා ඔබ අතරේ හොඳ
නමක් දිනාගෙන ඇති පුරුෂයන් හත්-
දෙනෙකුව සොයාගන්න.[4] ඔවුන් දෙ-
විගේ මහ පෙන්වීම්වලට අනුව
කටයුතු කරන* ප්‍රඥාවන්ත අය විය
යුතුයි.[5] **4** එවිට යාච්ඤාව සඳහාත්
දෙවි පවසා ඇති දේවල් ඉගැන්වී-
මේ කාර්යය සඳහාත් අපගේ සම්-
පූර්ණ කාලය වැය කරන්න අපට හැකි
වෙයි."[6] **5** සියලුදෙනාම එම යෝජ-
නාවට එකඟ වූ නිසා ඔවුහු ඒ කාර්-
යය සඳහා ශක්තිමත් විශ්වාසයක්
ගොඩනඟා ගෙන ඇති දෙවිගේ මහ
පෙන්වීම්වලට අනුව නිතරම කට-
යුතු කළ[7] මිනිසෙකු වූ ස්තේපන්-
වද පිලිප්,[8] ප්‍රොකරස්, නිකානොර්,
තිමොන්, පාමිනස් සහ කලින් යුදෙව්
ආගමට හැරී සිටි අන්තියෝකියේ
විසූ නිකලායස්වද තෝරාගත්තෝය.
**6** ඔවුන්ව නියෝජිතයන් ඉදිරියට
ගෙනාවෝය. නියෝජිතයෝ ඔවුන්
වෙනුවෙන් යාච්ඤා කර ඔවුන් මත
තම අත් තැබුවෝය.[9]
**7** දෙවිගේ පණිවිඩය සියලුදෙනා
අතරේ දිගටම පැතිර ගිය අතර[10] යෙ-
රුසලමේ සිටි ගෝලයන්ගේ ගණනද
දිගින් දිගටම වැඩි විය.[1] පූජකයන්
විශාල පිරිසක්ද[2] යේසුස්ගේ අනුගාමි-
කයෝ වූහ.[3]
**8** ස්තේපන් තුළින් සියලුදෙනා-
ටම දෙවිගේ මහත් කරුණාවත් බල-
යත් දැකගත හැකි විය. ඔහු ඔවුන්
අතරේ මහත් ලකුණුද ආශ්චර්ය-
යන්ද සිදු කරමින් සිටියේය.[4] **9** මේ
අතර ස්තේපන් සමඟ විවාද කිරී-
මට 'නිදහස ලැබූවන්ගේ සිනගෝ-
ගය' ලෙස හැඳින්වූ සිනගෝගයෙන්
පිරිසක්ද සිරේනියෙන් හා ඇලෙක්-
සැන්ඩ්‍රියාවෙන් පිරිසක්ද[5] සිලීසියා-
වෙන්[6] සහ ආසියාවෙන් පිරිසක්ද
පැමිණියෝය. **10** නමුත් ඔහු ප්‍රඥා-
වෙන්[7] හා දෙවිගේ මහ පෙන්වීම්ව-
ලට එකඟව කතා කළ දේට විරුද්ධව
කිසිම දෙයක් කීමට ඔවුන්ට නොහැකි
විය.[8] **11** එවිට ඔවුහු රහසින් මිනි-
සුන් කිහිපදෙනෙකුව කැඳවා, "ඔහු
මෝසෙස්ටත් දෙවිටත් විරුද්ධව අප-
හාසාත්මක දේවල් කියනවා අපිට
ඇහුණා"[9] කියා පැවසීමට ඔවුන්ව පෙ-
ලඹුවෝය.[10] **12** ඉන්පසු ඔවුහු ජන-
තාවද වැඩිමහල්ලන්වද නීතිය
පිටපත් කරන්නන්වද උසිගන්වා, හදි-
සියෙන්ම ඔහු වෙතට කඩාවැද ඔහුව
බලෙන් අල්ලාගෙන යුදෙව් මන්-
ත්‍රණ සභාව ඉදිරියට ගෙන ගියෝය.[11]
**13** එහිදී ඔවුන් බොරු සාක්ෂිකරු-
වන්ව ඉදිරිපත් කළ අතර[12] ඔවුහු
මෙසේ පැවසූහ. "මේ මිනිසා මේ ශුද්ධ
ස්ථානයටත් නීතියටත් විරුද්ධව දිග-
ටම කතා කරනවා.[13] **14** ඔහු
කියන්නේ නාසරෙත් නුවරින් පැමිණි
යේසුස් කියන තැනැත්තා මේ ස්ථා-
නය කඩා දමා මෝසෙස් අපට දුන්
චාරිත්‍ර වාරිත්‍ර සියල්ල වෙනස් කර-
නවා කියලයි."
**15** එවිට මන්ත්‍රණ සභාවේ අසුන්-
ගෙන සිටි සියලුදෙනා ඔහු දෙස
බැලුවෝය.[14] ඔහුගේ මුහුණ දේවදූත-
යෙකුගේ මුහුණ මෙන් දිස් වූ ආකාරය
ඔවුන්ට දැකගත හැකි විය.[15]

**6 පරි.**
1 ක්‍රියා 9:29
2 ක්‍රියා 4:35; 1තිමෝ 5:3; යාකො 1:27
3 නික් 18:18
4 ද්වි 1:13
5 ක්‍රියා 6:10; ක්‍රියා 16:2; 1තිමෝ 3:7
6 ක්‍රියා 2:42
7 ක්‍රියා 11:24
8 ක්‍රියා 21:8
9 ද්වි 34:9; ක්‍රියා 8:17; ක්‍රියා 13:3; ක්‍රියා 14:23; 1තිමෝ 4:14; 1තිමෝ 5:22; 2තිමෝ 1:6
10 ක්‍රියා 12:24; ක්‍රියා 19:20

**2 තීරුව**
1 ක්‍රියා 2:47
2 යොහ 12:42; ක්‍රියා 15:5
3 රෝම 16:26
4 ක්‍රියා 2:43
5 ක්‍රියා 18:24
6 ක්‍රියා 23:34
7 ලූක් 21:15; ක්‍රියා 6:3
8 යෙසා 54:17; ලූක් 21:15
9 1රාජා 21:10; මතෙ 26:59
10 නික් 23:1; ලෙවී 19:16
11 ලූක් 22:66
12 ද්වි 5:20; හිතෝ 19:28
13 යෙරෙ 26:11; ක්‍රියා 21:28
14 මතෙ 10:17
15 විනි 13:6

**ක්‍රියා 6:2*** හෝ, "යවනු ලැබුවෝ." **3*** මූ.අ., "දෙවිගේ බලයට මුළුමනින්ම යටත් වන."

**7** එවිට උත්තම පූජකයා, “මේ
කියන දේවල් ඇත්තද” කියා ඇසු-
වේය. **2** ස්තේපන් මෙසේ කීවේය.
“සහෝදරයෙනි, පියවරුනි, මට සවන්
දෙන්න. අපේ මුතුන්මිත්තා වූ ආබ්‍රහම්
හාරාන් නුවරෙහි පදිංචි වීමට කලින්[1]
මෙසපොතේමියාවේ සිටි කාලයේදී
අපගේ තේජවත් දෙවි[2] ඔහුට දර්ශ-
නය වී, **3** ‘ඔබේ දේශයෙන් පිට වී
යන්න. ඔබේ නෑදෑයන්ව අත්හැර මා
ඔබට පෙන්වන දේශයට යන්න’[3] කියා
පැවසුවා. **4** එවිට ඔහු කල්දිවරුන්-
ගේ දේශයෙන් පිට වී හාරාන්හි පදිංචි-
යට ගියා. ඔහුගේ පියා මිය ගිය පසු[4]
එතැනින්ද ඔහුගේ පදිංචිය මාරු කර,
අප සියලුදෙනාම දැන් ජීවත් වන මේ
දේශයට පැමිණෙන්න කියා දෙවි ඔහුට
මඟ පෙන්නුවා.[5] **5** ඒ අවස්ථාවේදී
දෙවි මේ දේශයේ බිම් අඟලක්වත්[6]
ඔහුට දුන්නේ නැහැ. නමුත් ඒ වන
විට දරුවෙකු නොසිටි ඔහුට,[7] දෙවි
පොරොන්දු වුණේ ඔහුටත් ඔහුගෙන්
පැවතෙන්නන්ටත්[8] මෙම දේශය උරු-
මයක් ලෙස පසුව දෙන බවයි.[9] **6** ඒ
වගේම ඔහුගෙන් පැවතෙන්නන් වෙ-
නත් රටක[10] විදේශිකයන් වන බවත්[11]
එහි ජනයා ඔවුන්ව වහලුන් ලෙස
තබාගෙන අවුරුදු හාරසියයක් පුරා
ඔවුන්ට හිරිහැර කරන බවත්[12] දෙවි
පැවසුවා. **7** ‘ඔවුන්ව වහල් කර-
ගෙන සිටින ඒ ජාතියට මම දඬුවම්
කරනවා’[13] කියාත්, ‘ඒ දේවල් සිදු වූ
පසු ඔවුන් ඒ දේශයෙන් නිදහස් වී මේ
දේශයේදී මට නමස්කාර කරනවා’[14]
කියාත් දෙවි පැවසුවා.

**8** “ඒ වගේම දෙවි චර්මච්ඡේද-
නය වීමේ පිළිවෙත ඇතුළත්
ගිවිසුමක්[15] ආබ්‍රහම් සමඟ ඇති කර-
ගත්තා. ඔහුගේ පුත් ඊසාක් ඉපදුණේ
ඉන්පසුවයි.[16] ඒ අනුව ඔහුව අට-
වන දවසේදී චර්මච්ඡේදනය කළා.[17]
ඊසාක්ගේ පුතා යාකොබ්. ඒ වගේම
යාකොබ්ට පුතුන් දොළොස්දෙනෙක්
හිටියා. අපේ ගෝත්‍ර දොළහේ ප්‍රධා-
නීන් වුණේ ඔවුනුයි.[18] **9** මේ අතර
අපේ ගෝත්‍රවල ප්‍රධානීන් යෝසෙප්ට
ඊර්ෂ්‍යා කළ නිසා[1] ඔවුන් ඔහුව ඊජිප්-
තුවේ වැසියන්ට විකුණුවා.[2] නමුත්
දෙවිගේ ආශීර්වාදය ඔහුට නිතරම
ලැබුණා.[3] **10** දෙවි සියලු පීඩාවලින්
ඔහුව ගැලවූ අතර ඔහුට ප්‍රඥාව
ලබා දී ඊජිප්තුවේ රජු වූ පාරා-
වෝගේ ප්‍රසාදය දිනාගන්නත් අවස්-
ථාව උදා කළා. පාරාවෝ ඊජිප්තුව
හා තම ගෙයි වැසියන් සියලුදෙනාවම
පාලනය කිරීමට පත් කළේ ඔහුවයි.[4]
**11** ඒ කාලයේදී මුළු ඊජිප්තුවේත්
කානාන් දේශය පුරාත් සාගතයක්
ඇති වුණා. ඒ සාගතය ඉතා දරුණු
එකක් වූ නිසා අපේ මුතුන්මිත්ත-
නුත් කෑම සොයාගැනීමට නොහැකිව
පීඩා වින්දා.[5] **12** නමුත් ඊජිප්තු-
වේ ආහාර තිබෙන බව යාකොබ්ට
ආරංචි වී[6] ඔහු මුල්ම වතාවට අපේ
මුතුන්මිත්තන්ව ඒ දේශයට යැව්වා.[7]
**13** ඔවුන් දෙවෙනි වතාවට ඊජිප්-
තුවට පැමිණි අවස්ථාවේදී යෝසෙප්
තම සහෝදරයන්ට තමා කවුද කියා
හෙළි කළා.[8] පාරාවෝ යෝසෙප්-
ගේ පවුලේ තොරතුරු දැනගත්තේ
එවිටයි.[9] **14** පසුව යෝසෙප් මිනි-
සුන්ව යවා තම පියා වූ යාකොබ්-
වත් ඔහුගේ සියලු නෑදෑයන්වත්
කානාන් දේශයෙන් ගෙන්වාගත්තා.[10]
ඒ අනුව හැත්තෑපස්දෙනෙකුගෙන්
යුත් පිරිසක් ඊජිප්තුවට ගියා.[11]
**15** යාකොබ් ඉන්පසුව පදිංචි වුණේ
ඊජිප්තුවෙයි.[12] ඔහු මිය ගියේ එම දේ-
ශයේදීයි.[13] අපේ මුතුන්මිත්තනුත් එම
දේශයෙහි මිය ගියා.[14] **16** නමුත්
ඔවුන් සියලුදෙනාවම තැන්පත් කළේ
ෂීකෙම් නුවරෙහියි.[15] ඔවුන්ව තැන්-
පත් කළේ ෂීකෙම් නුවරෙහි ජීවත් වූ
හාමෝර්ගේ පුත්‍රයන්ගෙන් ආබ්‍රහම් රිදී
කාසිවලට මිල දී ගත්[16] සොහොන්
ගෙය තුළයි.[17]

**17** “කාලයක් ගත වූ පසු දෙවි
ආබ්‍රහම්ට දුන් පොරොන්දුව ඉටු වීමේ
කාලය ළඟා වුණා. ඒ වන විට ඊජිප්-
තුවේ සිටි ඊශ්‍රායෙල් ජනයා බොහෝ
සෙයින් වර්ධනය වී තිබුණා.[18] **18** ඒ
කාලයේදී ඊජිප්තුව පාලනය කළේ

**7 පරි.**
1 උත් 11:31
උත් 15:7
නෙහෙ 9:7
2 ගීතා 29:3
3 උත් 12:1
4 උත් 11:32
හෙබ්‍රෙ 11:8
5 උත් 12:4
6 ද්වි 2:5
7 උත් 12:7
උත් 13:15
8 උත් 48:4
ද්වි 32:49
නෙහෙ 9:24
9 උත් 17:8
නික් 6:8
10 නික් 12:40
11 උත් 15:13
ගීතා 39:12
1පේතෘ 2:11
12 උත් 15:13
13 උත් 15:14
14 නික් 3:12
15 උත් 17:10
16 උත් 21:1
17 උත් 21:4
ලෙවී 12:3
ලූක් 2:21
18 උත් 29:32

**2 තීරුව**
1 උත් 37:11
2 උත් 37:28
උත් 45:4
ගීතා 105:17
3 උත් 39:2
4 උත් 41:40
උත් 41:41
උත් 41:46
ගීතා 105:21
5 උත් 41:54
උත් 42:5
6 උත් 42:2
7 උත් 42:6
8 උත් 45:1
9 උත් 45:16
10 උත් 45:9
11 උත් 46:27
ද්වි 10:22
12 උත් 46:29
ද්වි 26:5
13 උත් 49:33
14 නික් 1:6
15 උත් 50:13
16 උත් 23:16
17 නික් 13:19
යොෂු 24:32
18 නික් 1:7

යෝසෙප් ගැන නොදන්නා වෙනත්
රජෙක්.[1] **19** ඒ රජ කපටි ලෙස තම
බලය යොදාගෙන අපේ ජාතියට දුෂ්-
ටකම් කළා.[2] ඔහු අපේ පියවරුන්ට
බල කළේ තම දරුවන් ඉපදුණු මො-
හොතේම ඔවුන්ව අත්හැර දමන්න
කියායි. ඔහුගේ අදහස වුණේ ඔවුන්ව
නැති කර දමන්නයි.[3] **20** මෝසෙස්
ඉපදුණේ ඒ කාලයේදීයි.[4] ඔහු දෙවිට
ඉතා පියකරු දරුවෙක්.[5] ඔහුට කිරි දී
මාස තුනක් පුරා ඔහුව රැකබලා ගත්-
තේ ඔහුගේ පියාගේ නිවසේ තබාගෙ-
නයි. **21** නමුත් දරුවාව තවදුරටත්
සඟවා තබාගැනීමට බැරි බව තේ-
රුම්ගත් ඔවුන්ට ඔහුව අත්හැර දමා
යන්න සිදු වුණා. පසුව පාරාවෝ-
ගේ දුව ඔහුව රැගෙන ඔහුව ඇති-
දැඩි කළේ ඇගේම පුතෙක් ලෙසයි.[6]
**22** ඒ නිසා ඊජිප්තුවරුන් ලැබූ දැනුම්
සම්භාරය ලබාගන්න මෝසෙස්ටත්
හැකි වුණා.[7] ඔහු දැනුමෙන් හා ක්‍රියා-
වෙන් ඉතා දක්ෂ කෙනෙක්.[8]

**23** “ඔහුට අවුරුදු හතළිහ සම්-
පූර්ණ වෙද්දී තම සහෝදරයන් වන
ඊශ්‍රායෙල්වරුන් ගැන සොයා බලන්න
හිතුණා.[9] **24** ඊජිප්තු ජාතිකයෙක්
තම ජාතියට අයත් කෙනෙකුට අයුතු
ලෙස සලකද්දී ඔහු ඊජිප්තු ජාතික-
යාට පහර දී පීඩා වින්ද තැනැත්තා
වෙනුවෙන් සාධාරණය ඉටු කළා.[10]
**25** දෙවි තමන්ව යොදාගෙන තම
සහෝදරයන්ට ගැලවීම සලසා දෙන
බව ඔවුන් අවබෝධ කරගනියි කියා
ඔහු සිතුවත්[11] ඒ දේ ඔවුන් අව-
බෝධ කරගත්තේ නැහැ. **26** පසු-
වදා ඔවුන් අතරේ ආරවුලක් සිදු වෙද්දී
ඔහු ඔවුන් ළඟට ගොස් ඔවුන්ව සමා-
දාන කරන්න උත්සාහ කරමින්,[12]
‘ඔබ දෙදෙනා සහෝදරයෝ නේද?
ඉතින් ඇයි මේ වගේ අසාධාරණ විදි-
හට එකිනෙකාට සලකන්නේ’ කියා
ඇසුවා.[13] **27** නමුත් තමා සමඟ සිටි
තැනැත්තාට අසාධාරණ ලෙස සල-
කමින් සිටි පුද්ගලයා, මෝසෙස්ව
පැත්තකට තල්ලු කර මෙසේ ඇසුවා.
‘අපේ පාලකයා හා විනිශ්චයකාරයා
හැටියට ඔබව පත් කළේ කවුද?[1]
**28** ඔබ ඊයේ ඊජිප්තු ජාතිකයාව මරා
දැමූ විදිහට අද මාවත් මරා දමන්-
නද හදන්නේ?’[2] **29** ඒ කතාව අසා
බියට පත් වූ මෝසෙස් එතැනින්
පලා ගියා. පසුව ඔහු මිදියන් දේශ-
යට ඇවිත් එහි විදේශිකයෙකු ලෙස
ජීවත් වෙමින්[3] දරුවන් දෙදෙනෙකුගේ
පියෙක් බවටත් පත් වුණා.[4]

**30** “එහි අවුරුදු හතළිහක් ජීවත් වූ
පසු මෝසෙස් සීනයි කන්ද අවට පාළු-
කරයෙහි සිටියදී එහි තිබූ කටු පඳුරක්
ගිනි ගත්තා. එහි දේවදූතයෙක් සිටි-
නවා ඔහු දැක්කා.[5] **31** පුදුමයට පත්
ඔහු,[6] සිදු වන දේ ගැන සොයා බැලීමට
එතැනට ළං වූ විට ඔහුට ඇසුණේ යෙ-
හෝවා දෙවිගේ කටහඬයි. **32** ‘ඔබේ
මුතුන්මිත්තන්ගේ දෙවි මමය. ආබ්‍ර-
හම්ගේ, ඊසාක්ගේ සහ යාකොබ්ගේද
දෙවිත් මමය’[7] කියා දෙවි පැවසුවා.
එය අසා මෝසෙස් කොතරම් බියට
පත් වුණාද කිවහොත් ඒ ගැන තවත්
සොයා බලන්න ඔහු තුළ ධෛර්ය-
යක් තිබුණේ නැහැ. **33** එවිට යෙ-
හෝවා දෙවි ඔහුට මෙසේ පැවසුවා.
‘ඔබ සිටගෙන සිටින්නේ ශුද්ධ භූමිය-
කයි. ඒ නිසා ඔබේ පාවහන් ගල-
වන්න.[8] **34** ඊජිප්තුවේ සිටින මගේ
සෙනඟට මුහුණ දෙන්න සිදු වන
අසාධාරණකම් මම දුටුවෙමි.[9] ඔවුන්
සුසුම්ලන ආකාරයත් මට ඇසිණ.[10]
එමනිසා මම ඔවුන්ව ගලවාගන්-
නෙමි.[11] ඒ සඳහා මම දැන් ඔබව ඊජිප්-
තුවට යවන්නෙමි.’[12] **35** නමුත් ඊට
කලින් ඔවුන් ඔහුව ප්‍රතික්ෂේප කර-
මින්, ‘ඔබව අපේ පාලකයා හා විනිශ්-
චයකාරයා හැටියට පත් කළේ කවුද’[13]
කියා ප්‍රශ්න කර තිබුණා. ඒ මෝසෙස්-
වම තමයි දෙවි ඔවුන් වෙනුවෙන් පාල-
කයෙක් හා මිදුම්කරුවෙක් හැටියට
ඔවුන් ළඟට යැව්වේ.[14] ඔහුට ඒ පැව-
රුම ලැබුණේ කටු පඳුරේ ඔහු ඉදිරියේ
පෙනී සිටි දේවදූතයා මාර්ගයෙනුයි.
**36** ඒ මිනිසා ඊජිප්තුවේදීත්[15] රතු මුහු-
දේදීත්[16] ඒ වගේම අවුරුදු හතළි-
හක් පුරා පාළුකරයේ සැරිසරද්දීත්[17]

**7 පරි.**
1 නික් 1:8
2 නික් 1:10
3 නික් 1:22
4 නික් 2:2
5 හෙබ්‍රෙ 11:23
6 නික් 2:5; නික් 2:10
7 1රාජා 4:30
8 නික් 11:3; ලූක් 24:19
9 නික් 2:11
10 නික් 2:12
11 හෙබ්‍රෙ 11:26
12 උත් 13:8
13 නික් 2:13

**2 තීරුව**
1 ක්‍රියා 7:35
2 නික් 2:14
3 නික් 2:15
4 නික් 2:22; නික් 18:3
5 නික් 3:2; යෙසා 63:9
6 නික් 3:3
7 උත් 50:24; නික් 3:6; මාක් 12:26; ලූක් 20:37
8 නික් 3:5; යොෂු 5:15
9 නික් 3:7; ද්වි 26:7
10 නික් 2:24
11 නික් 3:8
12 නික් 3:10
13 නික් 2:14; ක්‍රියා 7:27
14 නික් 4:19
15 නික් 7:3; නික් 8:5; නික් 9:10; ගීතා 105:27
16 නික් 14:21; නික් 15:5; හෙබ්‍රෙ 11:29
17 නික් 16:35; ගණන් 14:33

බොහෝ පුදුම දේවල් සහ ආශ්චර්ය-
යන් සිදු කරමින් ඊශ්‍රායෙල්වරුන්ට මඟ
පෙන්නුවා.[1]
**37** “‘දෙවි ඔබේ සහෝදරයන් අත-
රින් ඔබ උදෙසා මා වැනි අනා-
ගතවක්තෘවරයෙකුව පත් කරයි’[2]
කියා ඊශ්‍රායෙල්වරුන්ට පැවසුවේ ඒ
මෝසෙස්මයි. **38** ඊශ්‍රායෙල් සෙනඟ
සමඟ[3] පාළුකරයෙහි සිටියේ ඔහුයි.[4]
සීනයි කන්දේදී දේවදූතයා සමඟත්[5]
සිටියේ ඔහුයි. දේවදූතයා ඔහුට කතා
කළ පසු මෝසෙස් අපේ මුතුන්-
මිත්තන් සමඟ ඒ තොරතුරු බෙදා-
ගත්තා. ඒ වගේම ඔබට ලබා දීම
සඳහා දෙවිගේ ශුද්ධ පණිවිඩය භාර
දුන්නෙත් ඔහුටයි.[6] **39** නමුත් ඔහුට
කීකරු වෙන්න අකමැති වූ අපේ
මුතුන්මිත්තන් ඔහුව ප්‍රතික්ෂේප කර[7]
නැවත ඊජිප්තුවට යන්න සිතා,[8]
**40** ‘ඊජිප්තු දේශයෙන් අපිව පිට-
තට ගෙනා මෝසෙස්ට මොනවා
වුණාද කියා අපි දන්නේ නැහැ.[9]
අපට මඟ පෙන්වන්න කවුරු හරි
අවශ්‍යයි. ඒ සඳහා දෙවිවරුන්ව අපට
සාදා දෙන්න’ කියා ආරොන්ට පැව-
සුවා. **41** ඔවුන් ඒ අවස්ථාවේදී වස්-
සෙක් සාදා,[10] ඒ රූපයට පූජාවක්
ඔප්පු කරමින් තමන් සෑදූ ඒ රූපය
ඉදිරියේ විනෝද වුණා.[11] **42** දෙවි
ඔවුන්ගෙන් ඉවත් වී ඉර සඳ හා තාර-
කාවන්ට නමස්කාර කරන්න ඔවුන්ට
ඉඩහැරියා.[12] ඇත්තටම ඒ ගැන අනා-
ගතවක්තෘවරුන්ගේ පොතේ සඳහන්
වන්නේ මෙසේයි.[13] ‘ඊශ්‍රායෙල් ජන-
යෙනි, ඔබ පාළුකරයේ ගෙවූ අවුරුදු
හතළිහ පුරා සත්ව පූජා හා වෙ-
නත් පූජා ඔප්පු කළේ මට නොවේ.[14]
**43** ඒ වෙනුවට ඔබ යන යන තැන
රැගෙන ගියේ මෝලොක්ගේ කූඩාරම[15]
හා රේෆන් දෙවියාගේ තාරකාවයි.[16]
නමස්කාරය සඳහා ඔබ සාදාගත්තේ
එම දෙවිවරුන්ගේ රූපයි. එහෙයින්
මම ඔබව දුර ඈත පිහිටි බැබිලෝනි-
යට පිටුවහල් කරන්නෙමි.’[17]
**44** “මීට අමතරව අපේ මුතුන්-
මිත්තන්ට පාළුකරයේදී දෙවිගේ
සාක්ෂි ඇතුළත් කූඩාරමක් තිබුණා.
මෝසෙස් එය සෑදුවේ දෙවි ඔහුට
පෙන්වා දුන් සැලැස්මට අනුවයි.[1]
**45** අපේ මුතුන්මිත්තන්ගේ දරුවනුත්
එම කූඩාරම භාවිත කළා. ඉන්ප-
සුව යොෂුවාගේ ප්‍රධානත්වයෙන්[2]
ඔවුන් වෙනත් ජාතීන්ට අයිති වී තිබූ
මේ දේශයේ පදිංචි වීමට පැමිණි අතර[3]
දෙවි ඒ ජාතීන්ව අපේ මුතුන්මිත්තන්-
ගේ දරුවන් ඉදිරියේම පන්නා දැමුවා.[4]
ඔවුන් මෙහි පදිංචි වෙද්දී ඒ කූඩාරමත්
මේ දේශයට රැගෙන ආවා. ඒ කූඩා-
රම දාවිත්ගේ කාලය දක්වාම භාවි-
තයට ගත්තා. **46** දාවිත්ට දෙවිගේ
අනුමැතිය ලැබුණු නිසා[5] යාකොබ්ගේ
දෙවි වෙනුවෙන් වාසස්ථානයක්[6] ගො-
ඩනැඟීමේ වරප්‍රසාදය තමාට ලබා
දෙන මෙන් ඔහු දෙවිගෙන් ඉල්ලා
සිටියා. **47** නමුත් දෙවිට ගෘහයක්
ගොඩනැඟුවේ සලමොන්.[7] **48** ඒ
වුණත් මහෝත්තම දෙවි මිනිසුන්
සාදන ගෘහවල වාසය නොකරන
බව අප මතක තබාගත යුතුයි.[8]
ඒ ගැන එක් අනාගතවක්තෘවර-
යෙක් පවසන්නේ මෙසේයි. **49** ‘ඔබ
මා සඳහා සාදන්නේ කෙබඳු ගෘහ-
යක්ද? එසේ නැතහොත් මට විවේක
ගැනීමට ස්ථානයක් සාදන්නේ කො-
තැනද[9] කියා යෙහෝවා දෙවි අසයි.
මන්ද ස්වර්ගය මාගේ සිංහාසනයය.[10]
පොළොව මාගේ පා පුටුවය.[11] **50** ඒ
සෑම දෙයක්ම සෑදුවේ මාගේ දෑතින්
නොවේද?’[12]
**51** “ඔබ සියලුදෙනාම මුරණ්ඩු
සෙනඟක්. ඔබේ සිත් ඔබ දැඩි කර-
ගෙන.[13] කිසි දෙයකට සවන් දෙන්න
ඔබ කැමති නැහැ.* ඔබ දෙවිගේ
බලයේ ක්‍රියාකාරිත්වය දැක දැකත්
එය සැමවිටම ප්‍රතික්ෂේප කරන සෙ-
නඟක්. ඔබ ක්‍රියා කරන්නේ
ඔබේ මුතුන්මිත්තන් ක්‍රියා කළ විදි-
හටමයි.[14] **52** ඔබේ මුතුන්මිත්තන්
සෑම අනාගතවක්තෘවරයෙකුටම පීඩා

**7 පරි.**
**1** නික් 12:41
**2** ද්වි 18:15
ක්‍රියා 3:22
**3** ද්වි 5:27
**4** නික් 19:3
**5** ද්වි 5:4
යෙසා 63:9
ක්‍රියා 7:53
ගලා 3:19
හෙබ්‍රෙ 2:2
**6** නික් 21:1
ද්වි 9:10
රෝම 3:2
1පේතෘ 4:11
**7** ගණන් 14:3
**8** නික් 16:3
**9** නික් 32:1
නික් 32:23
**10** නික් 32:4
ද්වි 9:16
**11** නික් 32:6
ගීතා 106:19
**12** ගීතා 81:12
රෝම 1:24
2තෙස 2:11
**13** 2රාජා 17:16
යෙරෙ 7:18
**14** ආමො 5:25
**15** 1රාජා 11:7
**16** ද්වි 4:19
ආමො 5:26
**17** යෙරෙ 25:11
යෙරෙ 29:10
ආමො 5:27

**2 තීරුව**
**1** නික් 25:40
හෙබ්‍රෙ 8:5
**2** ද්වි 3:28
ද්වි 31:3
යොෂු 3:14
**3** උත් 17:8
නෙහෙ 9:24
**4** යොෂු 23:9
යොෂු 24:18
**5** ගීතා 89:20
**6** 2සාමු 7:2
1ලේක 22:7
ගීතා 132:5
**7** 1රාජා 6:1
1ලේක 17:12
2ලේක 3:1
**8** යෙසා 66:1
ක්‍රියා 17:24
**9** යෙසා 66:1
**10** ගීතා 11:4
මතෙ 5:34
**11** මතෙ 5:35
**12** හෙබ්‍රෙ 3:4
**13** ලෙවී 26:41
ද්වි 10:16
**14** යෙසා 1:4
යෙසා 63:10
යෙරෙ 6:10

---

**ක්‍රියා 7:51*** මූ.අ., “ඔබට ඇත්තේ චර්මච්ඡේදනය නොවූ සිත් සහ කන්.”

කළා.[1] ඇත්තෙන්ම ඔවුන් ධර්මිෂ්ඨ
තැනැත්තාගේ පැමිණීම ගැන කලින්
දැන්වූ අයව[2] මරා දැමුවා.[3] දැන්
ඔබ කළේ එම තැනැත්තාව
පාවා දී මරා දැමීමයි.[4] **53** දේවදූත-
යන් මාර්ගයෙන් ලබා දුන්[5] නීතිය
ඔබ භාරගත්තත් එය පිළිපදින්න ඔබ
අපොහොසත් වුණා.”

**54** ඒ දේවල් ඔවුන්ට ඇසුණු විට
ඔවුන් තුළ කොතරම් කෝපයක් ඇති
වූවාද[6] කිවහොත් ඔවුහු ඔහුට විරුද්-
ධව කෝපයෙන් දත්මිටි කෑවෝය.[7]
**55** ඒ අවස්ථාවේදී ස්තේපන් තුළ දෙ-
විගේ බලය ප්‍රබල ලෙස ක්‍රියාත්මක
විය. ඔහු අහස දෙස බැලූ විට දෙවි-
ගේ තේජසත් දෙවිගේ දකුණු පැත්තේ
යේසුස් සිටින ආකාරයත් දුටුවේය.[8]
**56** එවිට ඔහු, “මේ බලන්න! අහස*
විවර වෙලා![9] මනුෂ්‍ය පුත්‍රයා[10] දෙවිගේ
දකුණු පැත්තේ සිටිනවා[11] මට පේ-
නවා” කියා කීවේය. **57** එය ඇසූ
ඔවුහු සියලුදෙනාම මහත් ශබ්දයකින්
කෑගසා, දෑත්වලින් තම කන් වසා-
ගෙන,[12] ඔහු වෙතට පැන, **58** ඔහුව
ඇල්ලා නුවරින් පිටතට ඇදගෙන
ගොස්[13] ඔහුට ගල් ගසන්න පටන්-
ගත්තෝය.[14] ඔහුට ගල් ගැසුවේ ඔහුට
විරුද්ධව සාක්ෂිකරුවන් ලෙස පෙනී
සිටි අයයි.[15] ඔවුහු තමන්ගේ වස්ත්‍ර
සාවුල් නම් තරුණයෙකුගේ පාමුල
තැබූහ.[16] **59** ඔවුන් දිගින් දිගටම
ගල් ගසද්දී ස්තේපන් මහත් ඕනෑක-
මින්, “යේසුස් මගේ ස්වාමීනි, මගේ
ජීවිතය ඔබට භාරයි”[17] කියා පැවසු-
වේය. **60** ඉන්පසු ඔහු දණින් වැටී,
“යෙහෝවා දෙවියනි, මේ පාපය සඳහා
ඔවුන්ට දඬුවම් කරන්න එපා”[18] කියා
මහත් හඬින් කෑගැසුවේය. එසේ පව-
සමින් ඔහු මිය ගියේය.

**8** ස්තේපන්ව එලෙස මරා දැමී-
මට සාවුල්ගේ සහයෝගයද
ලැබිණ.[19]

ඒ දවසේ සිට යෙරුසලමෙහි පිහිටි
සභාවට දැඩි පීඩා පැමිණියේය.[20]
යේසුස්ගේ නියෝජිතයන්* හැර අන්
සියලුදෙනාම යුදයේ සහ සමාරි-
යේ පළාත් පුරා විසිරී ගියෝය.[1]
**2** නමුත් දේවගරුබියෙන් ක්‍රියා කළ
මිනිසුන් කිහිපදෙනෙක් ස්තේපන්-
ගේ මළ සිරුර ගෙන ගොස් සො-
හොන් ගෙයක තැන්පත් කළ අතර[2]
සියලුදෙනාම ඔහු ගැන මහත් සේ
වැලපුණෝය.[3] **3** මේ අතර සාවුල්
සභාවට විරුද්ධව ඉතා කුරිරු ආකාර-
යකින් ක්‍රියා කරන්න පටන්ගත්තේය.
ඔහු ගෙයක් ගෙයක් පාසා ගොස් පුරු-
ෂයන්වද ස්ත්‍රීන්වද පිටතට ඇදගෙන
ඇවිත් ඔවුන්ව සිරගෙට භාර දුන්-
නේය.[4]

**4** නමුත් පීඩාව නිසා දේශය පුරාම
විසිරී ගිය අය ඔවුන් ගිය ගිය තැන්-
වල දෙවිගේ පණිවිඩය ඇතුළත් ශුභා-
රංචිය ප්‍රකාශ කළෝය.[5] **5** පිලිප්
ඔවුන්ගෙන් එක් අයෙකි. ඔහු සමා-
රිය නම් නුවරට ගොස්[6] එහි සිටි
අයට ක්‍රිස්තුස් ගැන දේශනා කළේය.
**6** එක් රැස් වූ සමූහයා පිලිප් පැවසූ
දේවලට සවන් දෙමින් ඔහු සිදු කළ
පුදුමසහගත දේවල් දුටුවෝය. සිය-
ලුදෙනාම ඔහුට ඉතා කිට්ටු අව-
ධානයක් දුන්නෝය. **7** එහි සිටි
බොහෝදෙනෙකුට භූතයන් ආවේශ වී
සිටි අතර[7] ඒ භූතයෝ මහත් හඬකින්
කෑගසා පිටතට ආවෝය. අංශභාග
රෝගීන්[8] හා කොර වූ බොහෝදෙනෙ-
කුටද සුවය ලැබිණ. **8** ප්‍රතිඵලයක්
ලෙස ඒ නුවරේ සිටි සියලුදෙනා තුළ
මහත් ප්‍රීතියක් ඇති විය.[9]

**9** ඒ නුවරෙහි සීමොන් නම් මිනි-
සෙක් සිටියේය. ඔහු මන්තර ගුරු-
කම්වල යෙදී සිටි කෙනෙකි.[10] ඔහු
තමා ඉතා බලවත් කෙනෙක් බව
කියමින් සමාරියේ වැසියන්ව විස්ම-
යට පත් කළේය.[11] **10** ඔහු සියලුම
තරාතිරම්වල සිටි අයගේ පිළිගැනී-
මට ලක් විය. ඔවුන් ඔහු ගැන පැව-
සුවේ මෙසේය. “මේ මිනිසා තමයි
‘දෙවියන්ගේ බලය.’ ඒ බලය කොයි

**7 පරි.**
1 2ලේක 36:16
2 ක්‍රියා 3:14
1යොහ 2:1
3 මතෙ 23:31
4 යෙසා 53:8
5 ක්‍රියා 7:38
ගලා 3:19
හෙබ්‍රෙ 2:2
6 ක්‍රියා 5:33
7 ගීතා 35:16
ගීතා 112:10
8 ගීතා 110:1
මතෙ 26:64
9 එස 1:1
මතෙ 3:16
යොහ 1:51
10 දානි 7:13
11 රෝම 8:34
එෆි 1:20
කොලො 3:1
12 සෙක 7:11
ලූක් 16:24
13 1රාජා 21:13
හෙබ්‍රෙ 13:12
14 ලෙවී 24:16
මතෙ 23:37
15 ද්වි 17:7
යොහ 16:2
16 ක්‍රියා 8:1
ක්‍රියා 22:20
17 ගීතා 31:5
18 මතෙ 5:44

**8 පරි.**
19 ක්‍රියා 7:58
20 ක්‍රියා 11:19

**2 තීරුව**
1 මතෙ 10:23
2 මතෙ 14:12
3 උත් 50:10
4 ක්‍රියා 9:1
ක්‍රියා 22:4
ක්‍රියා 26:10
1කොරි 15:9
ගලා 1:13
පිලි 3:6
5 යෙසා 52:7
ක්‍රියා 11:19
6 ක්‍රියා 1:8
7 මතෙ 10:1
මාක් 6:7
8 ක්‍රියා 9:33
9 යොහ 4:42
10 ක්‍රියා 13:6
11 ක්‍රියා 5:36

**ක්‍රියා 7:56*** හෝ, “ස්වර්ගය.”

**ක්‍රියා 8:1*** හෝ, “යවනු ලැබූවන්.”

තරම් ශ්‍රේෂ්ඨද!” **11** සෑහෙන කාල-
යක් පුරා ඔහු විවිධ මන්තර ගුරු-
කම් කර ඔවුන්ව විස්මයට පත් කර
තිබුණු නිසා සියලුදෙනාම පුරුදු වී
සිටියේ ඔහු පවසන දෙයක් එක-
වර පිළිගැනීමටය. **12** නමුත් දෙ-
විගේ රාජ්‍යය සහ යේසුස් ක්‍රිස්තුස්
පිළිබඳ ශුභාරංචිය ප්‍රකාශ කරමින්
සිටි[1] පිලිප්ට සවන් දුන් ඔවුහු, ඔහුව
විශ්වාස කරන්න පටන්ගත්තෝය.
එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ පුරු-
ෂයෝ හා ස්ත්‍රීහු බව්තීස්ම වූහ.[2]
**13** සීමොන්ද යේසුස්ගේ අනුගාමික-
යෙක් වී බව්තීස්ම විය. ඉන්පසු ඔහු
නිතරම සිටියේ පිලිප් සමඟය.[3] පිලිප්
සිදු කරන පුදුම දේවල් සහ ආශ්චර්ය-
යන් දැක ඔහු පුදුමයට පත් වූයේය.
**14** සමාරියේ වැසියන් දෙවිගේ
පණිවිඩය පිළිගෙන තිබෙන බව යෙ-
රුසලමේ සිටි නියෝජිතයන්ට ආරංචි
වූ විට[4] ඔවුහු පේතෘස්වද යොහන්වද
ඔවුන් වෙතට යැව්වෝය. **15** ඔවුහු
එතැනට ගිය විට එහි සිටි අය-
ටද දෙවිගේ බලය ලබා දෙන්න කියා
යාච්ඤා කළෝය.[5] **16** ඒ වන තුරු
ඔවුන් ස්වාමීන් වන යේසුස් පමණක්
පිළිගෙන බව්තීස්ම වූ නිසා කිසි කෙ-
නෙකුට දෙවිගේ බලය ලැබී තිබුණේ
නැත.[6] **17** නමුත් පේතෘස් සහ යො-
හන් රැස්ව සිටි අය පිට අත් තැබූ විට[7]
ඔවුන්ට දෙවිගේ බලය ලැබිණ.
**18** යේසුස්ගේ නියෝජිතයන් තම
අත් යම් කෙනෙකු පිට තැබූ විගස
ඔහුට දෙවිගේ බලය ලැබුණු ආකා-
රය දුටු සීමොන් ඔවුන්ට මුදල් දීමට
පොරොන්දු වෙමින්,[8] **19** “මටත් මේ
බලය දෙන්න. එතකොට මටත් පුළු-
වන් ඕනෑම කෙනෙකු පිට අත් තබා
ඔහුට දෙවිගේ බලය ලබා දෙන්න”
කියා පැවසුවේය. **20** පේතෘස් එම
ඉල්ලීමට පිළිතුරු දුන්නේ මෙසේය.
“ඔබේ මුදල් ඔබ සමඟම විනාශ
වේවා! ඔබ හිතුවාද දෙවිගෙන් නො-
මිලේ ලැබෙන මේ දීමනාව මුදල්
දී ගන්න පුළුවන් දෙයක් කියා?[9]
**21** ඔබේ සිත අවංක නැති බව දෙවිට
පේනවා.[1] ඒ නිසා මේ සේවයට කිසිම
ආකාරයකින්වත් සම්බන්ධ වෙන්න
ඔබට බැහැ. **22** ඔබේ මේ දුෂ්ටකම
ගැන පසුතැවිලි වන්න. ඔබ කරන්න
සිතූ මේ දුෂ්ට දේ ගැන යෙහෝවා දෙ-
විට කන්නලව් කරන්න.[2] සමහරවිට
ඔබට සමාව ලැබෙයි. **23** ඔබේ සිත
විෂ සහිත දේවලින් පිරිලා.[3] ඔබ අධර්-
මිෂ්ඨකමට වහල් වෙලා.”[4] **24** එවිට
සීමොන් මෙසේ පිළිතුරු දුන්නේය.
“සහෝදරයෙනි, ඔබ පැවසූ කිසිම දෙ-
යක් මට වෙනවාට මම කැමති නැහැ.
ඒ නිසා මා වෙනුවෙන් යෙහෝවා දෙ-
විට කන්නලව් කරන්න.”[5]
**25** ඒ මුළු ප්‍රදේශය පුරාම යෙ-
හෝවා දෙවිගේ පණිවිඩය ගැන පව-
සමින් සම්පූර්ණ සාක්ෂියක් දැරූ
පසු ඔවුහු නැවත යෙරුසලම බලා
ගියෝය. ඒ යන අතරතුරේදීත් ඔවුහු
සමරිතානුවන්ගේ ගම් බොහොමයක
ශුභාරංචිය ප්‍රකාශ කළෝය.[6]
**26** මේ අතර යෙහෝවා දෙවිගේ
දූතයෙක්[7] පිලිප්ට මෙසේ කීවේය.
“දැන් දකුණු දෙසට ගොස් යෙරුසල-
මේ සිට ගාසා දක්වා දිව යන පාරට
යන්න.” (මෙම පාර පාළු පාරකි.)
**27** එහෙයින් ඔහු ඒ දෙසට ගියේය.
එවිට එම පාරේ ඉතියෝපියානු[8] නිල-
ධාරියෙකු[9] ගමන් කරනවා ඔහු දුටු-
වේය. ඒ තැනැත්තා ඉතියෝපියානු
ජනතාවගේ රැජින වූ කන්දසී යටතේ
සේවය කළ ඇගේ මුළු වස්තුව භාරව
සිටි උසස් නිලධාරියෙකි. නමස්-
කාරය සඳහා යෙරුසලමට ගොස්,[10]
**28** නැවත තම රට බලා යමින් සිටි
ඔහු, තම අශ්ව රථයේ ඉඳගෙන අනා-
ගතවක්තෘ යෙසායාගේ ලියවිල්ල හඬ
නඟා කියවමින් ගියේය.[11] **29** එවිට
දෙවි තම බලය යොදාගෙන පිලිප්ට
මෙසේ දැනුම් දුන්නේය.[12] “ඒ අශ්ව
රථයට ළං වෙන්න.” **30** පිලිප් ඔහු
ළඟට දුව ගොස් එම නිලධාරියා
අනාගතවක්තෘ යෙසායාගේ ලියවිල්ල
හඬ නඟා කියවන ආකාරය අසා,
“ඔබ කියවන දේ ඔබට ඇත්ත-
ටම වැටහෙනවාද” කියා ඇසුවේය.

**8 පරි.**
1 ලූක් 8:1
2 මතෙ 28:19; ක්‍රියා 18:8
3 ක්‍රියා 6:5
4 ක්‍රියා 11:1
5 මතෙ 16:19
6 ක්‍රියා 10:48; ක්‍රියා 19:2
7 ක්‍රියා 6:6; ක්‍රියා 19:6; 2තිමෝ 1:6
8 මීකා 3:11; 1තිමෝ 6:5
9 මතෙ 10:8; ක්‍රියා 10:45

**2 තීරුව**
1 ගීතා 78:37; එෆී 5:5
2 යෙසා 55:7; දානි 4:27
3 ද්වි 29:18
4 හෙබ්‍රෙ 12:15
5 නික් 8:8; ගණන් 21:7; 1රාජා 13:6; යාකො 5:16
6 මතෙ 9:35; ක්‍රියා 1:8
7 ගීතා 34:7; හෙබ්‍රෙ 1:14; එළි 14:6
8 යෙරෙ 13:23; ශෙප 3:10
9 යෙසා 56:4
10 2ලේක 6:32; යොහ 12:20
11 ක්‍රියා 17:11
12 ක්‍රියා 10:19

**31** එවිට ඔහු, “කාගෙවත් මඟ පෙන්-
වීමක් නැතුව මේ දේවල් මම කො-
හොමද තේරුම්ගන්නේ” කියා පවසා,
රථයට නැඟ තමා සමඟ ඉඳගන්න
කියා පිලිප්ගෙන් බැගෑපත්ව ඉල්ලා
සිටියේය. **32** ඔහු ශුද්ධ ලියවිල්-
ලෙන් හඬ නඟා කියවමින් සිටි
කොටස මතු දැක්වේ. “ඔහුව ගෙන
ගියේ මරන්න ගෙන යන බැටළු-
වෙකු මෙනි. බැටළු පැටවෙකු තම
ලොම් කපන්නා ඉදිරියෙහි නිහඬව
සිටින්නා සේ ඔහුද නිහඬව සිටියේය.[1]
**33** ඔහුව අවමානයට පත් කළ අවස්-
ථාවේදී ඔහුට සාධාරණ විනිශ්චයක්
ලැබුණේ නැත.[2] ඔහුගේ පෙළපතේ
විස්තර ගැන සොයා බලන්නේ කවුද?
මන්ද ඔහු මේ පොළොවෙන් තුරන්
වනු ඇත.”[3]

**34** එම නිලධාරියා පිලිප්ගෙන්
මෙසේ ඇසුවේය. “අනාගතවක්තෘව-
රයා මෙසේ පවසන්නේ කා ගැනද?
ඔහු කතා කරන්නේ තමන්
ගැනද නැත්නම් වෙනත් කෙනෙක්
ගැනද? ඔබට පුළුවන්ද මට මේ
දේ පැහැදිලි කර දෙන්න?” **35** පිලිප්
ශුද්ධ ලියවිල්ලේ සඳහන් එම
පදයෙන් පටන්ගෙන[4] ඔහුට යේසුස්
පිළිබඳ ශුභාරංචිය ප්‍රකාශ කළේය.[5]
**36** ඔවුහු පාරේ යද්දී ප්‍රමාණවත්
ජලය ඇති තැනකට පැමිණියෝය.
එවිට එම නිලධාරියා, “මෙන්න වතුර
තිබෙන තැනක්! මට දැන් බව්-
තීස්ම වෙන්න මොකක්ද තිබෙන
බාධාව”[6] කියා පැවසුවේය. **37** ——
**38** එහෙයින් ඔහු අශ්ව රථය නවත්-
වන්න කියා අණ කළේය. ඉන්පසු
පිලිප් සහ එම නිලධාරියා වතුරට
බැස්සෝය. පිලිප් ඔහුව එතැනදී බව්-
තීස්ම කළේය. **39** ඔවුන් ජලයෙන්
ඉවතට පැමිණි විට යෙහෝවා දෙවි-
ගේ බලය පිලිප් මත නැවත ක්‍රියාත්-
මක වී ඔහු වහාම එතැනින් පිටත්
වී ගියේය.[7] ඒ නිසා නිලධාරියා
ඔහුව නැවත දුටුවේ නැත. නමුත්
ඔහු මහත් ප්‍රීතියකින් තම රට බලා
ගියේය. **40** පිලිප් ඊළඟට ගියේ අෂ්-
දොද් නුවර වෙතටය. ඔහු ඒ ප්‍රදේශය
පුරාම ගමන් කර සිසේරිය නම් නුවර
දක්වා යන තුරු[1] සෑම නුවරකම ශුභා-
රංචිය ප්‍රකාශ කළේය.[2]

**9** මේ අතර වියරු වැටුණු කෙ-
නෙකු මෙන් සාවුල් ස්වාමීන්-
ගේ ගෝලයන්ට[3] දිගටම දරුණු ලෙස
තර්ජන එල්ල කරමින් සිටියේය. ඔහු-
ගේ එකම ඉලක්කය වූයේ ඔවුන්ව
මරා දැමීමය.[4] එහෙයින් ඔහු උත්තම
පූජකයා වෙතට ගොස්, **2** දමස්ක-
යේ ඇති සිනගෝගවලට ඉදිරිපත්
කළ හැකි ලිපි කිහිපයක් ලියා දෙන
මෙන් ඔහුගෙන් ඉල්ලා සිටියේය.
සාවුල්ගේ අදහස වුණේ, ‘ස්වාමීන්-
ගේ මාර්ගයට’*[5] අයත් පුරුෂයන්ව හා
ස්ත්‍රීන්ව ඔහුට හසු වුණොත් එම ලිපි-
වල අවසරයෙන් ඔවුන්ව අල්ලා බැඳ
යෙරුසලමට ගෙන ඒමය.

**3** ඔහු තම ගමන අරඹා දමස්ක-
යට ළඟා වන විට එකවරම අහසින්
පැමිණි ආලෝකයක් ඔහු වටා විහිදී
ගියේය.[6] **4** ඔහු බිම ඇද වැටුණු
විට, “සාවුල්, සාවුල්, ඔබ මට පීඩා
කරන්නේ ඇයි”[7] කියා පවසන හඬක්
ඔහුට ඇසිණ. **5** ඔහු, “ස්වාමීනි,
ඔබ කවුද” කියා ඇසුවේය. එවිට ඒ
හඬ මෙසේ කීවේය. “මම යේසුස්.
ඔබ පීඩා කරන්නේ මටයි.[8] **6** දැන්
නැඟිට[9] නුවරට ඇතුල් වන්න. ඉන්ප-
සුව ඔබ කළ යුතු දේ ඔබට දැන-
ගන්න ලැබෙයි.” **7** සාවුල් සමඟ
ගමන් කරමින් සිටි අය[10] ගල් ගැසී[11]
සිදු වන දේ බලාගෙන සිටියෝය.
ඔවුන්ට යම් කටහඬක් ඇසුණත්[12] ඒ
කවුද කියා ඔවුන්ට පෙනුණේ නැත.
**8** පසුව සාවුල් නැඟිට්ටේය. ඔහුගේ
ඇස් ඇරී තිබුණත් ඔහුට කිසිවක් පෙ-
නුණේ නැත.[13] එහෙයින් ඔවුහු ඔහුව
අතින් අල්ලාගෙන දමස්කයට රැගෙන
ගියෝය. **9** දවස් තුනක් පුරා ඔහුට
කිසිවක් නොපෙනුණු අතර[14] ඔහු

**8 පරි.**
1 යෙසා 53:7; 1පේතෘ 2:23
2 මතෙ 26:59
3 යෙසා 53:8; දානි 9:26; පිලි 2:8
4 ක්‍රියා 18:28; 2තිමෝ 3:16
5 මතෙ 13:52
6 ක්‍රියා 10:47
7 1රාජා 18:12

**2 තීරුව**
1 ක්‍රියා 21:8
2 ලූක් 9:6

**9 පරි.**
3 ක්‍රියා 8:3; ගලා 1:13; 1තිමෝ 1:13
4 ක්‍රියා 22:4; ක්‍රියා 26:11
5 ක්‍රියා 9:14; ක්‍රියා 11:26; ක්‍රියා 22:4; ක්‍රියා 24:14
6 ක්‍රියා 22:6
7 1කොරි 15:8
8 මතෙ 25:40
9 ක්‍රියා 9:11
10 ක්‍රියා 22:9; ක්‍රියා 26:13
11 දානි 10:7
12 ක්‍රියා 22:9
13 ක්‍රියා 22:11
14 ක්‍රියා 13:11

**ක්‍රියා 9:2*** ‘මාර්ගය’ යන්න භාවිත කර තිබෙන්-
නේ ක්‍රිස්තියානීන් අනුගමනය කරන ජීවිතය හා
ඔවුන් පිළිපදින ඉගැන්වීම් විස්තර කිරීමටය.

කිසිම දෙයක් කෑවේවත් බිව්වේවත්
නැත.
**10** දමස්කයේ අනනියස් නම් ගෝ-
ලයෙක් සිටියේය.[1] ස්වාමීන් වන යේ-
සුස් ඔහුට දර්ශනය වී, “අනනියස්”
කියා ඇමතුවේය. ඔහු, “ඇයි මාගේ
ස්වාමීනි” කියා පිළිතුරු දුන්නේය.
**11** ස්වාමීන් ඔහුට මෙසේ පැවසුවේය.
“දැන් ඔබ ‘කෙළින් වීථියට’ ගොස්
යූදස්ගේ නිවසෙන් ටාසස් නම් නුව-
රෙන් පැමිණි සාවුල් නම් මිනිසෙකු
ගැන විමසන්න.[2] ඔහු එහි යාච්ඤා
කරමින් සිටින ආකාරය ඔබ දකියි.
**12** ඔහු දර්ශනයක් දැක තිබෙනවා.
ඒ දර්ශනයේ අනනියස් නම් මිනිසෙක්
ඇවිත් තමා මත අත් තබා තමාට
නැවත පෙනීම ලබා දෙන ආකා-
රය ඔහු දැක තිබෙනවා.”[3] **13** එවිට
අනනියස් මෙසේ පැවසුවේය. “ස්වා-
මීනි, ඒ මිනිසා ගැන මට බොහෝ
දේවල් ආරංචි වී තිබෙනවා. ඔහු යෙ-
රුසලමේදී ඔබේ ශුද්ධ තැනැත්තන්ට
බොහෝ දුෂ්ටකම් කර තිබෙනවා.
**14** ඔහු මෙහෙ ආවේත් ඔබේ නාම-
යෙන් කන්නලව් කරන සියලුදෙ-
නාව සිරගෙයි දමන්නයි. ඔහු ඒ
සඳහා නායක පූජකයන්ගෙන් අවස-
රත් ලබාගෙන.”[4] **15** නමුත් ස්වා-
මීන් ඔහුට මෙසේ කීවේය. “ඔබ ගොස්
ඔහුව හමු වෙන්න. මම මේ මිනිසාව
විශේෂ අරමුණක් සඳහා තෝරාගෙන
තිබෙනවා.[5] ඔහු මගේ නාමය ගැන
ජාතීන්ටත්[6] රජවරුන්ටත්[7] ඊශ්‍රායෙල්-
වරුන්ටත් ප්‍රකාශ කරයි. **16** මගේ
නාමය නිසා ඔහුට කොතරම් දුක්
විඳින්න සිදු වෙනවාද කියා මම ඔහුට
පැහැදිලි කරන්නම්.”[8]
**17** එහෙයින් අනනියස් ගොස් එම
නිවසට ඇතුල් වී සාවුල් පිට අත්
තබා ඔහුට මෙසේ කීවේය. “මගේ
සහෝදර සාවුල්, මාව ඔබ ළඟට එව්-
වේ පාරේ ගමන් කරද්දී ඔබට දර්ශ-
නය වූ ස්වාමීන් වන යේසුස්. ඒ ඔබට
නැවත පෙනීම ලබා දී ඔබට දෙවිගේ
බලය ලබා දෙන්නයි.”[9] **18** ඒ මො-
හොතේදීම ඔහුගේ ඇස්වලින් කොර-
පොතු හා සමාන යමක් වැටී ඔහුට
පෙනීම ලැබිණ. එවිට සාවුල් නැඟිට
බව්තීස්ම විය. **19** ඉන්පසු ඔහු කෑම
කා ප්‍රාණවත් විය.[1]
ඔහු දමස්කයේ සිටි ගෝලයන්
සමඟ දවස් කිහිපයක්ම ගත කළේය.[2]
**20** ඔහු නොපමාව යේසුස් දෙවිගේ
පුත්‍රයා බව සිනගෝගවල දේශනා
කරන්න පටන්ගත්තේය.[3] **21** ඔහුට
සවන් දෙමින් සිටි සියලුදෙනා පුදුම වී
මෙසේ පැවසූහ. “යේසුස්ගේ අනුගාමි-
කයන් වූ* අයට යෙරුසලමේදී දරුණු
විදිහට පීඩා කළේ මේ මිනිසා නේද?[4]
ඔහු මෙතැනට ආවේ ඔවුන්ව අල්ලා
බැඳ නායක පූජකයන් ළඟට ගෙන
යෑමේ අදහසින්ද කියා කවුද දන්-
නේ?”[5] **22** නමුත් සාවුල් තව තවත්
උද්‍යෝගයෙන් දේවසේවයෙහි නිරත
විය. යේසුස් යනු ක්‍රිස්තුස් බවට වූ
කාරණය තර්කානුකූලව ඔප්පු කර
පෙන්වා දුන් ඔහු, දමස්කයේ සිටි
යුදෙව්වරුන්ව සම්පූර්ණයෙන්ම නිහඬ
කළේය.[6]
**23** දවස් කිහිපයක් ගත වූ පසු
යුදෙව් නායකයෝ ඔහුව මරා දැමීමට
කුමන්ත්‍රණය කළෝය.[7] **24** නමුත්
ඔවුන්ගේ කුමන්ත්‍රණය සාවුල්ට
ආරංචි විය. කෙසේවෙතත් ඔහුව
අල්ලා මරා දැමීමේ අදහසින් ඔවුහු
රෑ දවල් දෙකේදීම නුවරේ දොරටුවල
රැක සිටියෝය.[8] **25** එහෙයින් ඔහු-
ගේ ගෝලයෝ රාත්‍රියේදී ඔහුව විශාල
කූඩයක දමා පවුරේ හිදැසකින් පහ-
ළට බැස්සුවෝය.[9]
**26** එතැනින් ඔහු යෙරුසලමට
ගිය විට[10] ගෝලයන්ව මුණගැසෙන්න
උත්සාහ කළත් ඒ සියලුදෙනාම ඔහුට
බිය වූහ. මන්ද ඔහු ගෝලයෙකු බව
විශ්වාස කිරීමට ඔවුන්ට නොහැකි
විය. **27** ඒ අවස්ථාවේදී ඔහුගේ
උපකාරයට පැමිණියේ බානබස්ය.[11]
එහෙයින් බානබස් ඔහුව නියෝජි-
තයන්* ළඟට ගෙන ගොස් සාවුල්

**9 පරි.**
1 ක්‍රියා 22:12
2 ක්‍රියා 11:25, ක්‍රියා 21:39, ක්‍රියා 22:3
3 ක්‍රියා 9:17
4 1කොරි 1:2, 2තිමෝ 2:22
5 ක්‍රියා 13:2, රෝම 1:1, 1තිමෝ 1:12
6 රෝම 1:5, ගලා 2:7, 1තිමෝ 2:7
7 ක්‍රියා 25:22, ක්‍රියා 26:1, ක්‍රියා 27:24
8 ක්‍රියා 20:23, ක්‍රියා 21:11, 2කොරි 11:23, කොලො 1:24, 2තිමෝ 1:12
9 ක්‍රියා 13:52, ක්‍රියා 22:13

**2 තීරුව**
1 ගීතා 104:15
2 ක්‍රියා 26:20
3 ගලා 1:16
4 ක්‍රියා 8:3, ගලා 1:13, ගලා 1:23
5 ක්‍රියා 9:2
6 ක්‍රියා 17:3, ක්‍රියා 18:28
7 ක්‍රියා 20:3, ක්‍රියා 23:12, 2කොරි 11:23
8 2කොරි 11:32
9 යොෂු 2:15, 1සාමු 19:12, 2කොරි 11:33
10 ගලා 1:18
11 ක්‍රියා 4:36

**ක්‍රියා 9:21*** මූ.අ., “මේ නාමය කෙරෙහි විශ්වාසය තැබූ.” **27*** හෝ, “යවනු ලැබූවන්.”

ගමන් කරන අතරේ ස්වාමීන්ව දුටු
ආකාරයත්[1] ස්වාමීන් ඔහුට කතා කළ
ආකාරයත්[2] සාවුල් දමස්කයේ සිටි
කාලයේදී[3] යේසුස්ගේ නාමයෙන් නිර්-
භීතව කතා කළ ආකාරයත් ඔවුන්ට
විස්තර කර දුන්නේය. **28** ඉන්පසු
යෙරුසලමෙහි කිසි හිරිහැරයක් නො-
විඳ ඔවුන් සමඟ ජීවත් වූ ඔහු,
ස්වාමීන්ගේ නාමයෙන් ඉතා නිර්භී-
තව කතා කළේය.[4] **29** මේ අතර
ග්‍රීක බස කතා කළ යුදෙව්වන් සමඟද
ඔහු කතා කළේය. එහිදී ඔවුන් සමඟ
විවාදයක් ඇති විය. එහෙයින් ඔවුහු
අවස්ථා කිහිපයකදීම ඔහුව මරා දැමී-
මට තැත් කළෝය.[5] **30** සහෝදර-
යන්ට ඒ ගැන ආරංචි වූ විට ඔවුහු
ඔහුව සිසේරියට ගෙනැවිත් එතැනින්
ටාසස් බලා පිටත් කර යැවූහ.[6]

**31** පසුව යුදය, ගලීලය සහ සමා-
රිය පුරාම ව්‍යාප්ත වී තිබූ සභාවට[7]
ඉතා සාමකාමී කාල පරිච්ඡේදයක්
උදා විය. සියලුදෙනාම යෙහෝවා දෙ-
විට ගරුබිය දක්වමින්,[8] දෙවි ලබා
දුන් බලයෙන් මහත් සැනසීමක් ලැබූ
අතර[9] ඔවුන්ගේ විශ්වාසයද තව
තවත් ශක්තිමත් විය. ඔවුහු ගණ-
නින්ද නොකඩවා වැඩි වූහ.

**32** මේ අතර පේතෘස් විවිධ පළාත්-
වල ගමන් කරමින් සිටියදී ලිද්දාවේ
වාසය කරමින් සිටි ශුද්ධ තැනැත්-
තන්වද ඔහුට හමු විය.[10] **33** ඔහු එහි
සිටියදී අනීයස් නම් මිනිසෙකු හමු
වීමට ඔහුට අවස්ථාව ලැබිණ. අනී-
යස් අංශභාග රෝගියෙකි. ඔහු අවු-
රුදු අටක් පුරා ඕත්පළව සිටියේය.
**34** ඒ අවස්ථාවේදී පේතෘස් ඔහුට
මෙසේ පැවසුවේය.[11] "අනීයස්, යේසුස්
ක්‍රිස්තුස් ඔබව දැන් සුව කරනවා.[12]
නැඟිට ඔබේ ඇඳ පිළියෙල කරන්න."
ඒ වචන ඇසූ වහාම ඔහු නැඟිට්ටේය.
**35** ලිද්දාවේ සහ ෂාරොන් තැනිතලා-
වේ[13] ජීවත් වූ සියලුදෙනාම ඔහුව දැක
ස්වාමීන් කෙරෙහි විශ්වාස කරන්න
පටන්ගත්තෝය.[14]

**36** මේ අතර යේසුස් කෙරෙහි
විශ්වාසය තැබූ තබිතා නම් ස්ත්‍රි-
යක් යොප්පාවේ[1] සිටියාය. ග්‍රීක බසින්
ඇගේ නම දොර්කස් විය. ඇය බො-
හෝ යහපත් දේවල් කළ ස්ත්‍රියකි.[2] ඒ
වගේම ඇය නිතරම අනුන්ට කරු-
ණාව දක්වමින් නොයෙකුත් දේවල්
ඔවුන්ට තෑගි කළ තැනැත්තියකි.
**37** නමුත් ඇය අසනීප වී මිය ගියාය.
එවිට ඔවුහු ඇගේ මළ සිරුර නහවා,
එය උඩුමහල් කාමරයක තැබුවෝය.
**38** යොප්පාව පිහිටා තිබුණේ ලිද්දා-
වට නුදුරින්ය.[3] එමනිසා පේතෘස් ලිද්-
දාවේ සිටින බව ගෝලයන්ට ආරංචි වූ
විට ඔවුහු, "ප්‍රමාද නොවී, අප වෙ-
තට එන්න" කියා ඔහුගෙන් ඉල්ලා
සිටීමට දෙදෙනෙකුව ඔහු වෙතට
යැවූහ. **39** එහෙයින් පේතෘස් ඔවුන්
සමඟ පැමිණියේය. ඔහු පැමිණි විට
ඔවුහු ඔහුව උඩුමහල් කාමරයට ගෙන
ගියෝය. එවිට සියලු වැන්දඹුවෝද
ඔහු ළඟට ඇවිත් හඬමින්, දොර්කස්
ජීවතුන් අතර සිටියදී ඔවුන් වෙනු-
වෙන්[4] මසා දුන් වස්ත්‍ර[5] බොහොමයක්
ගෙනැවිත් ඔහුට පෙන්වූහ. **40** ඒ
අවස්ථාවේදී පේතෘස් සියලුදෙනාවම
පිටතට යැව්වේය.[6] ඔහු දණ නමා
යාච්ඤා කර දොර්කස්ගේ මළ සිරුර
දෙස බලා, "තබිතා නැඟිටින්න" කියා
කීවේය. තම දෑස් විවෘත කර අවට
බැලූ ඇය, පේතෘස්ව දැක නැඟිට්-
ටාය.[7] **41** පේතෘස් ඇයට තම අත
දී සිටගන්න උපකාර කළ පසු[8] ශුද්ධ
තැනැත්තන් හා වැන්දඹුවන්ට අඬ-
ගසා ඇය ජීවත් වන බව ප්‍රකාශ
කරමින් ඔවුන් ඉදිරියට ඇයව ගෙනා-
වේය.[9] **42** එම සිද්ධිය පිළිබඳ ආරං-
චිය යොප්පාව පුරාම පැතිර ගිය අතර
බොහෝදෙනෙක් ස්වාමීන්ව විශ්වාස
කරන අය බවට පත් වූහ.[10] **43** පේ-
තෘස් දවස් කිහිපයක්ම යොප්පාවේ
නතර වී සිටියේය.[11] ඔහු සිටියේ සම්
පදම් කරන තැනැත්තෙකු වූ සීමොන්
සමඟය.[12]

# 10

සිසේරියේ කොර්නේලියස්
නම් මිනිසෙක් සිටියේය. ඔහු
ඉතාලි හමුදා ඒකකය[13] ලෙස හැඳින්වූ
හමුදා ඒකකයේ නිලධාරියෙකු වූ

**9 පරි.**
1 1කොරි 9:1
2 ක්‍රියා 9:4; ක්‍රියා 22:7
3 ක්‍රියා 9:20
4 ක්‍රියා 4:29
5 2කොරි 11:26
6 ක්‍රියා 11:25; ගලා 1:21
7 ක්‍රියා 8:1
8 ගීතා 86:11
9 යොහ 14:16
10 ක්‍රියා 9:38
11 මතෙ 10:8
12 ක්‍රියා 3:6; ක්‍රියා 4:10
13 1ලේක 5:16
14 ක්‍රියා 11:21

**2 තීරුව**
1 2ලේක 2:16
2 1තිමෝ 2:10
3 ක්‍රියා 9:32
4 යෙසා 32:8
5 මතෙ 5:40
6 මාක් 5:40; ලූක් 8:51
7 මතෙ 9:25; ලූක් 7:15; යොහ 11:43
8 ක්‍රියා 3:7
9 1රාජා 17:23
10 යොහ 11:45
11 මාක් 6:10
12 ක්‍රියා 10:6; ක්‍රියා 10:32

**10 පරි.**
13 ක්‍රියා 27:1

අතර,[1] **2** ඔහුද ඔහුගේ නිවසේ විසූ සියලුදෙනාද දෙවිට ගරුබියෙන්[2] හා මහත් භක්තියකින් සිටි[3] පිරිසක් වූහ. ජනතාවට බොහෝ දේවල් පරිත්‍යාග කිරීමට පුරුදුව සිටි[4] ඔහු, නිරතුරුවම දෙවිට යාච්ඤා කළ කෙනෙකි.[5] **3** දවසේ නවවෙනි පැයේදී*[6] පමණ දෙවිගේ දූතයෙක්[7] ඔහු ඉදිරියේ දර්ශනය වී,[8] "කොර්නේලියස්" කියා ඔහුව ඇමතුවේය. **4** ඔහු දූතයා දෙස බලා, "ඇයි ස්වාමීනි" කියා බියෙන් ඇසුවේය. ඒ දේවදූතයා ඔහුට මෙසේ කීවේය. "දෙවි ඔබේ යාච්ඤා[9] හා දයාන්විත ක්‍රියා ගැන සතුටු වෙනවා. ඔහු ඒ දේවල් අමතක කරන්නේ නැහැ.[10] **5** ඒ නිසා දැන්මම මිනිසුන් කිහිපදෙනෙකුව යොප්පාවට යවන්න. එහි පේතෘස් යන වාසගම දරන සීමොන් නම් පුද්ගලයෙක් සිටිනවා. ඔහුව කැඳවාගෙන එන්න කියා ඔවුන්ට කියන්න. **6** ඔහු නවාතැන් ගෙන සිටින්නේ සීමොන් නමැති සම් පදම් කරන්නෙකුගේ නිවසෙයි. එය තිබෙන්නේ මුහුද අසලයි."[11] **7** තමාට කතා කළ දේවදූතයා පිටත්ව ගිය වහාම, ඔහු තම නිවසෙහි වැඩ කරන සේවකයන් දෙදෙනෙකුවද ඔහුට කාලයක් පුරා සේවය කළ අය අතරින්[12] දෙවිට මහත් භක්තියකින් සිටි හේවායෙකුවද කැඳවා, **8** සිදු වූ සියල්ල ඔවුන්ට පවසා ඔවුන්ව යොප්පාවට යැව්වේය.[13]

**9** පසුවදා ඔවුහු නුවරට ළඟා වූහ. මේ අතර නිවසේ සිටි පේතෘස් හයවෙනි පැයේදී* පමණ යාච්ඤා කිරීමේ අදහසින්[14] වහල්තලයට නැග්ගේය.[15] **10** ඒ අතරතුරේදී ඔහුට මහත් කුසගින්නක් ඇති විය. නිවසේ සිටි අය කෑම පිළියෙල කරමින් සිටියදී ඔහු දර්ශනයක් දුටුවේය.[16] **11** ඔහු දුටුවේ අහස විවර වී[17] විශාල ලිනන් ඇතිරිල්ලක් හා සමාන යම් දෙයක් පොළොවට පහත් කරනු ලබන ආකාරයයි. එහි කොන් හතර අහස දෙසට එසවී තිබිණ. **12** පොළොවේ ජීවත් වන සියලු ආකාරයේ සිව්පාවෝද බඩ ගා යන සත්තුද කුරුල්ලෝද එහි සිටියෝය.[1] **13** එවිට, "පේතෘස්, නැඟිටින්න! උන්ව මරා කන්න"[2] කියා පවසන හඬක් ඔහුට ඇසිණ. **14** නමුත් පේතෘස්, "ස්වාමීනි, මම කවදාවත් කිසිම අපවිත්‍ර දෙයක්වත් දූෂිත දෙයක්වත් කාලා නැහැ.[3] ඒ නිසා මට නම් ඒ දේ කොහොමටවත් කරන්න බැහැ" කියා පිළිතුරු දුන්නේය. **15** එවිට දෙවෙනි වතාවටත් ඒ හඬ ඔහුට මෙසේ කීවේය. "දෙවි පවිත්‍ර කර ඇති දේ අපවිත්‍රයි කියා තවදුරටත් කියන්න එපා."[4] **16** ඒ හඬ තුන්වෙනි වතාවටත් ඒ දේම පැවසුවේය. ඉන්පසු එම ඇතිරිල්ල අහස දෙසට ඔසවාගනු ලැබීය.[5]

**17** පේතෘස් තමන් දුටු දේ ගැන තේරුම්ගැනීමට නොහැකිව ව්‍යාකූලව සිටියේය. ඒ මොහොතේදීම කොර්නේලියස් විසින් එවන ලද මිනිස්සු සීමොන්ගේ නිවස සොයාගෙන ඇවිත් එහි ගේට්ටුව ළඟ සිටගෙන සිටියෝය.[6] **18** එවිට ඔවුහු හඬ නඟා, පේතෘස් යන වාසගම දරන සීමොන් නමැති තැනැත්තෙකු මෙහි නවාතැන් ගෙන සිටිනවාද කියා ඇසූහ. **19** පේතෘස් තමා දුටු ඒ දර්ශනය ගැන කල්පනා කරමින් සිටියදී දෙවි තම බලයෙන්[7] ඔහුට මෙසේ කීවේය. "මිනිස්සු තුන්දෙනෙක් ඔබව සොයාගෙන ඇවිත්. **20** ඒ නිසා නැඟිට, පහළ තට්ටුවට ගොස් ඔවුන්ව සැක නොකර ඔවුන් සමඟ යන්න. ඔවුන්ව එවා තිබෙන්නේ මමයි."[8] **21** එහෙයින් පේතෘස් පහළ තට්ටුවට බැස ඒ මිනිසුන් ළඟට ගොස්, "ඔබ සොයන තැනැත්තා මමයි. ඔබ මාව සොයාගෙන ආවේ ඇයි" කියා ඇසුවේය. **22** ඔවුහු මෙසේ කීවෝය. "අපිව එව්වේ කොර්නේලියස් නම් හමුදා නිලධාරියයි. ඔහු ධර්මිෂ්ඨ,

ක්‍රියා **10:3*** එනම්, ප.ව. 3ට පමණ. **9*** එනම්, දහවල් 12ට පමණ.

**10 පරි.**
**1** මතෙ 8:5
**2** හිතෝ 14:2
**3** ක්‍රියා 8:2 ක්‍රියා 22:12
**4** ලූක් 7:5 ක්‍රියා 8:21
**5** මතෙ 7:7
**6** ක්‍රියා 3:1
**7** ලූක් 1:11
**8** ක්‍රියා 9:10
**9** ගීතා 65:2 හිතෝ 15:8
**10** හිතෝ 15:29 ආනි 10:12 යොහ 9:31 1පේතෘ 3:12
**11** ක්‍රියා 9:43 ක්‍රියා 10:32
**12** මතෙ 8:9
**13** ක්‍රියා 11:13
**14** ආනි 6:10 1තෙස 5:17
**15** ද්වි 22:8
**16** ක්‍රියා 11:5 ක්‍රියා 22:17
**17** එස 1:1 ක්‍රියා 7:56 එළි 19:11

**2 තීරුව**
**1** ක්‍රියා 11:6
**2** ක්‍රියා 11:7
**3** ලෙවී 11:4 ලෙවී 11:13 ලෙවී 20:25 ද්වි 14:3 ද්වි 14:19 එස 4:14
**4** මතෙ 15:11 ක්‍රියා 10:28 රෝම 14:14 1තිමෝ 4:4 තිත 1:15
**5** ක්‍රියා 11:10
**6** ක්‍රියා 11:11
**7** ක්‍රියා 13:2 ක්‍රියා 15:28 ක්‍රියා 16:6 ක්‍රියා 20:23
**8** ක්‍රියා 11:12

දෙවිට ගරුබිය දක්වන මනුෂ්‍යයෙක්.[1]
මුළු යුදෙව් ජාතියම ඔහු ගැන හොඳ
කියනවා.[2] ඔහුට ශුද්ධ දේවදූත-
යෙක් දර්ශනය වී කිව්වා ඔබව ඔහු-
ගේ නිවසට කැඳවාගෙන ඔබ කියන
දේවලට ඇහුම්කන් දෙන්න කියලා.”
**23** එවිට පේතෘස් ඔවුන්ට ඇතුළට
එන්න කියා ආරාධනා කර ඔවුන්ට
සංග්‍රහ කළේය.

පසුවදා ඔහු ඔවුන් සමඟ ගියේය.
යොප්පාවේ සිටි සහෝදරයන් කිහි-
පදෙනෙක්ද ඔහු සමඟ පිටත් වූහ.
**24** පේතෘස් සිසේරියට ගියේ පසු-
වදාය. ඒ වන විට කොර්නේලියස්
තමාගේ නෑදෑයන්වද කිට්ටු මිත්‍රයන්-
වද තම නිවසට ආරාධනා කර ඔවුන්
එන තුරු බලා සිටියේය. **25** පේ-
තෘස් නිවසට ඇතුල් වූ විගස කොර්-
නේලියස් ඉදිරියට පැමිණ, ඔහුගේ
පාමුල වැඳ වැටුණේය. **26** නමුත්
පේතෘස් ඔහුව නැඟිටුවා, “නැඟි-
ටින්න. මමත් ඔබ හා සමාන මිනි-
සෙක්”[3] කියා කීවේය. **27** පේතෘස්
ඔහු සමඟ ටිකක් කතා කර ඇතු-
ළට ගිය විට බොහෝදෙනෙකු එහි
රැස්ව සිටිනවා දැක, **28** ඔවුන්ට
මෙසේ කීවේය. “වෙනත් ජාතියකට
අයත් කෙනෙකු ළඟට යන්නවත් ඔහු
සමඟ කතාබහ කරන්නවත් යුදෙව්-
වෙකුට සම්පූර්ණයෙන්ම තහනම් දෙ-
යක් කියා ඔබ හොඳින් දන්නවා.[4]
නමුත් කිසිම මිනිසෙක් දූෂිතයි කියා
හෝ අපවිත්‍රයි කියා හෝ කියන්න
එපා කියා දෙවි මට දැන් පෙන්වා
තිබෙනවා.[5] **29** ඒ නිසා මට මෙ-
හෙට එන්න කියා පැවසූ විට මම ආවේ
කැමැත්තෙන්මයි. මම දැන් කැමතියි
දැනගන්න ඔබ මට මෙහෙට එන්න
කිව්වේ ඇයි කියා.”

**30** එවිට කොර්නේලියස් මෙසේ
කීවේය. “දවස් හතරකට කලින් හරිය-
ටම මේ පැයේදීම එනම්, නවවෙනි
පැයේදී*[6] මම මගේ නිවසෙහි යාච්ඤා
කරමින් සිටියා. එවිට දීප්තිමත් වස්ත්‍ර
ඇඳ සිටි මිනිසෙක්[1] මා ඉදිරි-
පිට සිටගෙන, **31** මෙහෙම කිව්වා.
‘කොර්නේලියස්, දෙවි ඔබේ යාච්ඤා-
වට සවන් දී තිබෙනවා. ඒ වගේම
ඔබ දයාන්විත ලෙස අනුන්ට කළ
පරිත්‍යාගත් ඔහුට අමතක වී නැහැ.[2]
**32** දැන් යොප්පාවට මිනිසුන් කිහිප-
දෙනෙකුව යවා, පේතෘස් යන වාස-
ගම දරන සීමොන්ව[3] කැඳවාගෙන
එන්න කියා ඔවුන්ට කියන්න. ඔහු
නවාතැන් ගෙන සිටින්නේ මුහුද
අසල තිබෙන සීමොන් නම් සම්
පදම් කරන්නෙකුගේ නිවසෙහියි.’[4]
**33** ඉතින් වහාම ඔබව කැඳවාගෙන
එන්න මම මිනිසුන් කිහිපදෙනෙකුව
යැව්වා. ඔබ මෙහි පැමිණීම ගැන මට
සතුටුයි. දැන් දෙවි ඉදිරියෙහි මෙහි
රැස්ව සිටින අපි සියලුදෙනාම සූදානම්
වී සිටින්නේ යෙහෝවා දෙවි ඔබට
අණ කළ සියල්ල ඇසීමටයි.”[5]

**34** එවිට පේතෘස් මෙසේ කීවේය.
“දෙවි සියල්ලන්ටම එක හා සමානව
සලකන බව මට දැන් හොඳට තේරෙ-
නවා.[6] **35** මන්ද කෙනෙක් මොන
ජාතියකට අයත් වුණත් ඔහු දෙ-
විට ගරුබිය දක්වමින් ධර්මිෂ්ඨව
ක්‍රියා කළොත් දෙවි ඔහුව පිළිගන්-
නවා.[7] **36** යේසුස් ක්‍රිස්තුස් මාර්ග-
යෙන් ලැබෙන සාමයේ ශුභාරංචිය
ගැන ප්‍රකාශ කිරීමට[8] දෙවි ඊශ්‍රායෙල්-
වරුන්ට පණිවිඩයක් යැව්වා.[9] ඒ ශුභා-
රංචිය නම් ක්‍රිස්තුස් සියලුදෙනාගේම
ස්වාමීන් වන බවයි.[10] **37** බව්තීස්ම
වීමේ අවශ්‍යතාව ගැන යොහන් දේ-
ශනා කළ පසු ගලීලයේ පටන් මුළු
යුදය පුරාම ප්‍රසිද්ධ වූ දේ ගැන ඔබ
දන්නවා.[11] **38** ඒ නාසරෙත් නුවරින්
පැමිණි යේසුස් ගැනයි. දෙවි ඔහුව
තම බලයෙන් අභිෂේක කර[12] ඔහුට
මහත් බලයක්ද ලබා දුන්නා. ඉන්පසු
යේසුස් දේශය පුරාම ගමන් කරමින්
යහපත් ක්‍රියා කළ අතර යක්ෂයාගේ
පීඩා හා හිරිහැරවලට ලක් වූ සිය-
ලුදෙනාටම සුවයක් ගෙන දුන්නා.[13]
ඔහු ඒ දේවල් කළේ දෙවිගේ ආශීර්වා-
දය ඔහුට තිබුණු නිසයි.[14] **39** ඔහු

---

ක්‍රියා **10:30*** ක්‍රියා 10:3හි පාදසටහන බලන්න.

**10 පරි.**

**1** ක්‍රියා 10:1
**2** ක්‍රියා 22:12
**3** ලූක් 4:8; ක්‍රියා 14:15; එළි 19:10; එළි 22:9
**4** යොහ 4:9; යොහ 18:28
**5** ක්‍රියා 10:45; ක්‍රියා 15:8; එෆී 3:6
**6** ක්‍රියා 11:13

**2 තීරුව**

**1** මතෙ 28:3; ක්‍රියා 1:10
**2** ආනි 10:12; හෙබ්‍රෙ 6:10
**3** ක්‍රියා 10:18
**4** ක්‍රියා 9:43
**5** ක්‍රියා 10:42
**6** ද්වි 10:17; 2ලේක 19:7; යෝබ් 34:19; රෝම 2:11; ගලා 2:6
**7** රෝම 2:13; 1කොරි 12:13; ගලා 3:28
**8** යෙසා 52:7; නාහු 1:15
**9** ගීතා 107:20; ගීතා 147:18
**10** ආනි 7:14; මතෙ 28:18; රෝම 14:9; එෆී 1:20; එළි 19:16
**11** ලූක් 4:14
**12** යෙසා 11:2; යෙසා 42:1; යෙසා 61:1; මතෙ 3:16; හෙබ්‍රෙ 1:9
**13** ලූක් 13:16
**14** යොහ 3:2

යුදෙව්වරුන්ගේ රට පුරාත් යෙරුසල-
මෙහිත් කළ සෑම දෙයක්ම අපි අපේ
ඇස්වලින්ම දැක තිබෙනවා. නමුත්
ඔවුන් ඔහුව කණුවක ඇණ ගසා*
මරා දැමුවා.[1] **40** ඒ වුණත් දෙවි
ඔහුව තුන්වෙනිදා නැඟිටුවා, මිනි-
සුන් ඉදිරියේ පෙනී සිටීමට අවස්ථාව
උදා කර දුන්නා.[2] **41** නමුත් හැම
කෙනෙක්ම ඔහුව දැක්කේ නැහැ.
ඔහුව දැක්කේ අපි විතරයි. ඔහු මරණ-
යෙන් නැඟිටුණු පසු අපි ඔහු සමඟ
එකට ආහාරත් ගත්තා.[3] දෙවි කල්ති-
යාම අපව විශේෂයෙන්ම පත් කළේ
ඔහු ගැන සාක්ෂි දරන්නයි.[4] **42** ඒ
වගේම ජීවත් වන අයගේ හා මිය
ගිය අයගේ විනිශ්චයකරු ලෙස දෙවි
පත් කර ඇති තැනැත්තා[5] තමා බව
ජනයාට දේශනා කර[6] ඒ ගැන සම්-
පූර්ණ සාක්ෂියක් දරන්න යේසුස් අපට
අණ කළා. **43** ඔහු කෙරෙහි විශ්-
වාසය තබන සියලුදෙනාටම ඔහුගේ
නාමයෙන් තම පව්වලට සමාව ලබා-
ගත හැකියි.[7] ඒ ගැන සියලුම අනාග-
තවක්තෘවරුන් සාක්ෂි දරනවා.”[8]

**44** පේතෘස් ඒ දේවල් ගැන කතා
කරමින් සිටියදීම දෙවිගේ පණිවිඩයට
සවන් දෙමින් සිටි සියලුදෙනාටම දෙ-
විගේ බලය ලැබිණ.[9] **45** සිදු වූ ඒ දේ
පේතෘස් සමඟ පැමිණි චර්මච්ඡේදිත
සහෝදරයන්ට අදහාගත නොහැකි
විය. එයට හේතුව දෙවි නොමිලේ
ලබා දෙන දීමනාව වන ඔහුගේ බලය
වෙනත් ජාතීන්ටත් ලැබෙන ආකාරය
ඔවුන් දැකීමය.[10] **46** ඔවුන් වෙනත්
භාෂාවලින් කතා කරන ආකාර-
යත් දෙවිට ප්‍රශංසා කරන ආකාර-
යත් ඔවුන්ට ඇසිණ.[11] එවිට පේතෘස්
මෙසේ කීවේය. **47** “අපිට ලැබුණා
වගේ මේ අයටත් දැන් දෙවිගේ බලය
ලැබී තිබෙනවා. ඔවුන්ව වතුරෙන්
බව්තීස්ම කරන්න බැහැ කියා කාටද
කියන්න පුළුවන්?”[12] **48** එහෙයින්
පේතෘස් ඔවුන් යේසුස් ක්‍රිස්තුස්ව පිළි-
ගෙන ඇති බවට සාක්ෂියක් ලෙස
ඔවුන්ව බව්තීස්ම කරන්න කියා අණ
කළේය.[1] ඉන්පසු ඔවුන් සමඟ දවස්
කිහිපයක්ම ගත කරන ලෙස ඔවුහු
ඔහුගෙන් ඉල්ලා සිටියෝය.

**11** වෙනත් ජාතීන්ද දෙවිගේ
පණිවිඩය පිළිගත් බව
යුදයෙහි සිටි යේසුස්ගේ නියෝජි-
තයන්ට* සහ ඔහුගේ අනිකුත් අනුගා-
මිකයන්ට# ආරංචි විය.[2] **2** පේතෘස්
යෙරුසලමට පැමිණි විට චර්මච්-
ඡේදනය වීමේ පිළිවෙතට පක්ෂව
සිටි අය[3] ඔහු සමඟ වාද කරන්න
පටන්ගත්තෝය. **3** ඔවුන් චෝදනා
කරමින් කියා සිටියේ ඔහු චර්මච්ඡේද-
නය නොවූ කෙනෙකුගේ නිවසකට
ගොස් ඔහු සමඟ ආහාර ගත් බවයි.
**4** එවිට පේතෘස් සිදු වූ දේවල් විස්තර
කරමින් ඔවුන්ට මෙසේ කීවේය.

**5** “මම දිනක් යොප්පා නුවරේ
යාච්ඤා කරමින් සිටියදී දර්ශනයක්
දැක්කා. මම දැක්කේ විශාල ලිනන්
ඇතිරිල්ලක් හා සමාන යම් දෙ-
යක් පොළොවට පහත් කරනු ලබන
ආකාරයයි. එහි කොන් හතර අහස
දෙසට එසවී තිබුණා. එය තබා
තිබුණේ මා ළඟින්මයි. **6** මම එහි
ඇතුළට එබී බැලූ විට පොළො-
වේ ජීවත් වන සිව්පාවුන්ද වනයේ
සතුන්ද බඩ ගා යන සතුන්ද කුරුල්-
ලන්ද එහි සිටින ආකාරය දැක්කා.[4]
**7** ඉන්පසු මට මෙසේ කියනවා
ඇසුණා. ‘පේතෘස් නැඟිටින්න! උන්ව
මරා කන්න.’[5] **8** නමුත් මම, ‘ස්වා-
මීනි, මම කවදාවත් කිසිම අපවිත්‍ර
දෙයක් කාලා නැහැ. ඒ නිසා මට ඒ
දේ කොහොමටවත් කරන්න බැහැ’[6]
කියා පැවසුවා. **9** එවිට නැවතත්
අහසින් පැමිණි ඒ හඬ මට මෙසේ
පැවසුවා. ‘දෙවි පවිත්‍ර කර ඇති දේ
අපවිත්‍රයි කියා තවදුරටත් කියන්න
එපා.’[7] **10** එයාකාරයට තුන් වතා-
වක් ඒ හඬ ඇසුණු පසු මා ඉදිරි-
යේ තිබූ ඇතිරිල්ල අහසට ඔසවාගනු

**10 පරි.**
1 ක්‍රියා 2:23; ගලා 3:13
2 යෝනා 1:17; යෝනා 2:10; ක්‍රියා 2:24; 1කොරි 15:4
3 ලූක් 24:30; යොහ 21:13
4 යොහ 14:22
5 යොහ 5:22; ක්‍රියා 17:31; රෝම 14:9; 2කොරි 5:10; 2තිමෝ 4:1; 1පේතෘ 4:5
6 මතෙ 28:19; ක්‍රියා 1:8
7 රෝම 10:11; ගලා 3:22
8 යෙසා 53:11; යෙරෙ 31:34; එස 34:23; දානි 9:24; ලූක් 24:27; එළි 19:10
9 ක්‍රියා 4:31; ක්‍රියා 8:15
10 ගලා 3:14
11 ක්‍රියා 2:4; ක්‍රියා 19:6
12 මතෙ 3:11; ක්‍රියා 8:36; ක්‍රියා 11:17

**2 තීරුව**
1 මතෙ 16:19; ක්‍රියා 2:38; ක්‍රියා 19:5

**11 පරි.**
2 සෙක 2:11; ලූක් 2:32; ක්‍රියා 14:27
3 ක්‍රියා 10:45; ගලා 2:12
4 ක්‍රියා 10:12
5 ක්‍රියා 10:13
6 එස 4:14; මතෙ 15:11; ක්‍රියා 10:14
7 ක්‍රියා 15:9

**ක්‍රියා 10:39*** මූ.අ., “එල්ලා.”

**ක්‍රියා 11:1*** හෝ, “යවනු ලැබූවන්ට.” **1#** මූ.අ., “සහෝදරයන්ට.”

ලැබුවා.[1] 11 ඒ වේලාවේදීම මාව
හමු වෙන්න මිනිසුන් තුන්දෙනෙක්
අපි නතර වී සිටි නිවසට ඇවිත්
හිටියා. ඔවුන් පැමිණ සිටියේ සිසේ-
රියෙන්.[2] 12 එවිට දෙවි තම බල-
යෙන්[3] මට දැනුම් දුන්නා සැක
නොකර ඔවුන් සමඟ යන්න කියා.
ඉතින් මම දැන් මා සමඟ සිටින මේ
සහෝදරයන් හයදෙනාත් සමඟ ඒ
මිනිසාගේ නිවසට ගියා.[4]

13 "ඒ මිනිසා නිවසේ සිටින විට
දේවදූතයෙක් ඇවිත්, 'යොප්පාවට
මිනිසුන් කිහිපදෙනෙකුව යවා පේ-
තෘස් යන වාසගම දරන සීමොන්ව
කැඳවාගෙන එන්න'[5] කියා පැවසූ
බව ඔහු අපට විස්තර කළා. 14 'ඒ
තැනැත්තා ඔබටත් ඔබේ නිවසේ
සිටින සියලුදෙනාටත් ගැලවීම ලබා-
ගත හැකි ආකාරය ගැන පැහැදිලි කර
දෙයි'[6] කියාත් ඔහුට පවසා තිබුණා.
15 නමුත් මා ඔවුන්ට කතා කරන්න
පටන්ගත් විටම, මුලින්ම අපටත්
ලැබුණා සේම ඔවුන්ට දෙවිගේ බලය
ලැබුණා.[7] 16 එවිට අපේ ස්වාමීන්
වන යේසුස් පැවසූ දෙයක් මට මතක්
වුණා. ඔහු කිව්වේ, 'යොහන් බව්-
තීස්ම කළේ වතුරෙන්.[8] නමුත් ඔබව
දෙවිගේ බලයෙන් බව්තීස්ම කරනු
ලබනවා'[9] කියායි. 17 ස්වාමීන් වන
යේසුස් ක්‍රිස්තුස් කෙරෙහි විශ්වාසය
තැබූ අපට[10] නොමිලේ ලබා දුන් දීම-
නාවම දෙවි ඔවුන්ටත් දුන්නා නම් දෙ-
විට හරස් වෙන්න මම කවුද?"[11]

18 ඒ දේවල් ඇසූ පසු ඔවුහු සිදු වූ
දේ පිළිගෙන,[12] දෙවිට ප්‍රශංසා කර-
මින්,[13] "දෙවි වෙනත් ජාතීන්ට අයත්
මිනිසුන්ටත් පසුතැවිලි වී ජීවනය
ලබාගැනීමේ ප්‍රස්තාව උදා කර ඇති
බව අපට පැහැදිලියි"[14] කියා පැවසූහ.

19 ස්තේපන්ගේ මරණයෙන් පසු
හටගත් පීඩාව නිසා බොහෝදෙ-
නෙක් ෆිනීෂියාව,[15] සයිප්‍රසය[16] සහ
අන්තියෝකිය දක්වා විසිර ගියෝය.[17]
නමුත් ඔවුන් යුදෙව්වරුන්ට මිස
වෙනත් කිසිම කෙනෙකුට දෙවි-
ගේ පණිවිඩය ගැන කතා කළේ

**11 පරි.**
1 ක්‍රියා 10:16
2 ක්‍රියා 10:17
3 යොහ 16:13
ක්‍රියා 10:19
4 ක්‍රියා 10:23
ක්‍රියා 15:7
5 ක්‍රියා 10:30
6 ක්‍රියා 16:30
7 ක්‍රියා 2:4
8 මතෙ 3:11
මාක් 1:8
ලූක් 3:16
ක්‍රියා 1:5
9 යෙසා 44:3
යෝවේ 2:28
යොහ 1:33
ක්‍රියා 2:17
10 ක්‍රියා 15:8
ගලා 3:2
11 දානි 4:35
ක්‍රියා 10:47
12 ක්‍රියා 21:14
13 ලූක් 2:20
ක්‍රියා 13:48
ක්‍රියා 14:27
14 යෙසා 11:10
ක්‍රියා 17:30
ක්‍රියා 20:21
රෝම 10:12
රෝම 15:9
15 ක්‍රියා 21:2
16 ක්‍රියා 21:3
17 ක්‍රියා 8:1

**2 තීරුව**
1 මතෙ 10:6
2 ක්‍රියා 6:1
ක්‍රියා 9:29
3 මාක් 13:10
එෆී 3:8
4 ලූක් 1:66
5 ක්‍රියා 2:47
ක්‍රියා 9:35
6 ක්‍රියා 4:36
7 හෙබ්‍රෙ 12:15
8 3යොහ 4
9 ක්‍රියා 13:43
ක්‍රියා 14:22
10 ක්‍රියා 2:47
ක්‍රියා 4:4
ක්‍රියා 5:14
ක්‍රියා 9:31
11 ක්‍රියා 21:39
12 ක්‍රියා 9:30
13 ක්‍රියා 9:2
14 ක්‍රියා 13:1
ක්‍රියා 15:32
1කොරි 12:28
එෆී 4:11
15 ක්‍රියා 21:10
16 මතෙ 24:7
ලූක් 4:25

නැත.[1] 20 ඔවුන් අතරින් සයිප්‍ර-
සයෙන් සහ සිරේනියෙන් පැමිණි කිහි-
පදෙනෙක් අන්තියෝකියට ඇවිත්,
ග්‍රීක බස කතා කළ ජනතාවට[2]
ස්වාමීන් වන යේසුස් ගැන ශුභාරංචිය
ප්‍රකාශ කරන්න පටන්ගත්තෝය.[3]
21 ඔවුන්ට යෙහෝවා දෙවිගේ උප-
කාරය[4] ලැබුණු අතර බොහෝදෙ-
නෙක් ස්වාමීන්ව විශ්වාස කරමින්
ඔහුගේ අනුගාමිකයෝ වූහ.[5]

22 සිදු වූ දේ ගැන යෙරුසලමෙහි
පිහිටි සභාවට ආරංචි වූ විට ඔවුහු
බානබස්ව[6] අන්තියෝකියට යැව්-
වෝය. 23 ඔහු එහි ගිය විට දෙවි-
ගේ මහත් කරුණාව ඔවුන්ට ලැබී
ඇති බව දැක[7] ප්‍රීති වූයේය.[8] ඉන්ප-
සුව ස්ථිර අධිෂ්ඨානයකින් ස්වාමීන්ට
විශ්වාසවන්තව සිටින්න කියා ඔහු
ඔවුන් සියලුදෙනාටම දිරිගැන්වීය.[9]
24 බානබස් ඉතා යහපත් මිනිසෙකි.
ඔහු තුළ දෙවිගේ බලය ප්‍රබලව
ක්‍රියාත්මක වූ අතර ඔහුට ශක්තිමත්
විශ්වාසයක්ද තිබිණ. ඔහුගේ උප-
කාරයෙන් විශාල පිරිසක් ස්වාමීන්ව
විශ්වාස කරන්න පටන්ගත්තෝය.[10]
25 ඉන්පසු ඔහු සාවුල්ව සෙවීමට
ටාසස් බලා ගියේය.[11] ඔහු එහි අස්සක්
මුල්ලක් නෑර සාවුල්ව සෙවූ අතර,[12]
26 ඔහුව හමු වූ විට ඔහු සමඟම අන්-
තියෝකියට ආවේය. ඉන්පසු ඔවුහු
අවුරුද්දක් පුරාම සභාවෙහි සිටි අය
සමඟ රැස් වී විශාල පිරිසකට ඉගැන්-
වූහ. ගෝලයන්ව ක්‍රිස්තියානීන් කියා
මුලින්ම හැඳින්වීමට පටන්ගත්තේ[13]
අන්තියෝකියේදීය. එසේ වූයේ දෙවි-
ගේ මඟ පෙන්වීමට එකඟවය.

27 ඒ කාලයේදී යෙරුසලමේ
සිට අන්තියෝකියට අනාගතවක්-
තෘවරුන්[14] කිහිපදෙනෙක්ද පැමිණි-
යෝය. 28 ඉන් එක් කෙනෙකුගේ
නම අගබස්ය.[15] ලොව පුරාම මහත්
සාගතයක් ඇති වන බව දෙවි-
ගේ බලය මාර්ගයෙන් දැනගත් ඔහු,
ඒ ගැන සියල්ලන්ට දැන්වූවේය.[16]
එම සාගතය ක්ලෝදියස්ගේ කාල-
යේදී ඇති විය. 29 එවිට ගෝල-

යෝ තමන්ට හැකි පමණින්[1] යුදයේ
වෙසෙන සහෝදරයන්ට යම් සහ-
නාධාර යැවීමට[2] තීරණය කළෝය.
**30** ඔවුහු එම සහනාධාර බාර්නබස්
සහ සාවුල් අත[3] වැඩිමහල්ලන් වෙ-
තට යැවූහ.

**12** ඒ කාලය වන විට හෙරොද්
රජ, සභාවේ සමහරුන්ට
හිංසා පීඩා කරන්න පියවර ගත්තේය.[4]
**2** ඔහු යොහන්ගේ සහෝදරයා වූ
යාකොබ්ව[5] කඩුවෙන් මරා දැමුවේය.[6]
**3** තමා කළ දෙයින් යුදෙව්වන් සතුටු
වූ බව දුටු ඔහු,[7] පේතෘස්වද අත්-
අඩංගුවට ගත්තේය. (ඒ දේවල් සිදු
වූයේ මුහුන් නොදැමූ රොටි උත්සවය
පැවැත්වූ කාලයේදීය.)[8] **4** ඔහු පේ-
තෘස්ව සිරගෙයි දැමූ අතර[9] ඔහුගේ අද-
හස වූයේ පාස්කු උත්සවයෙන් පසුව
පේතෘස්ව ජනතාව ඉදිරියට ගෙන
ඒමය.[10] එමනිසා හේවායන් හතර-
දෙනෙකුගෙන් යුත් මුර කණ්ඩායම්
හතරක් ඔහුව මුර කිරීමට යොදවන
ලදි. එහි අරමුණ වූයේ ඔහුව මාරු-
වෙන් මාරුවට මුර කිරීමය. **5** පේ-
තෘස් සිරභාරයේ සිටියදී සභාව ඔහු
වෙනුවෙන් මහත් උනන්දුවෙන් දෙවිට
යාච්ඤා කරමින් සිටියෝය.[11]
**6** හෙරොද් ඔහුව ජනතාව ඉදිරි-
යට ගෙන ඒමට සූදානම් වූ දිනට
පෙර දින රාත්‍රියේදී පේතෘස් සිරකු-
ටිය තුළ නිදාගෙන සිටියේය. දම්වැල්
දෙකකින් බැඳ සිටි ඔහු සිටියේ හේවා-
යන් දෙදෙනෙකු මැදය. එසේම සිර-
ගෙය මුර කිරීමටත් එහි දොරටු අසල
මුරකරුවෝ සිටියෝය. **7** ඒ අවස්-
ථාවේදී යෙහෝවා දෙවිගේ දූතයෙක්
පැමිණ ඔහු ළඟ සිටගත්තේය.[12] එවිට
සිරකුටිය පුරාම දීප්තිමත් ආලෝක-
යක් විහිදී ගියේය. ඔහු පේතෘස්ගේ
ඉණ මත අත තබා ඔහුව අවදි කර,[13]
"ඉක්මනින් නැඟිටින්න" කියා පැවසු-
වේය. ඒ අවස්ථාවේදී ඔහුගේ දම්වැල්
ඔහුගේ අත්වලින් ගැලවී ගියේය.[14]
**8** "ඔබේ පාවහන් දමාගෙන සූදා-
නම් වන්න" කියා දේවදූතයා[15] ඔහුට
කීවේය. ඔහු එසේ කළේය. එවිට
දේවදූතයා, "ඔබේ පිට වස්ත්‍රය දමා-
ගෙන[1] මා පස්සේ එන්න" කියා ඔහුට
පැවසුවේය. **9** ඔහු පිටත් වී දේවදූ-
තයා පසුපස ගියේය. නමුත් මෙය
සැබෑවටම සිදු වන දෙයක් බව ඔහු
තේරුම්ගෙන සිටියේ නැත. ඔහු සිතු-
වේ තමන් දකින දේවදූතයා හා
සිදු වන දේවල් දර්ශනයක් බවය.[2]
**10** ඔවුන් පළමු මුරපොළ සහ දෙ-
වෙනි මුරපොළ පසු කරගෙන ගොස්
නුවරට යන යකඩ දොරටුව අස-
ලට පැමිණි විට එය ඉබේම විවෘත
විය.[3] ඔවුන් සිරගෙයින් පිටත් වී වීථි-
යක් දිගේ ගමන් කරන විට දේ-
වදූතයා ඉවත්ව ගියේය. **11** එවිට
මෙය සැබවින්ම සිදු වන දෙයක් බව
පේතෘස්ට වැටහුණු අතර ඔහු මෙසේ
සිතූහ. "යෙහෝවා දෙවි මා වෙනුවෙන්
ඔහුගේ දූතයෙක්ව එවූ බව දැන් මට
තේරෙනවා.[4] ඔහු එසේ කළේ හෙ-
රොද්ගේ අතිනුත් යුදෙව් ජනතාව මට
කරන්න සිතාගෙන සිටි සෑම දෙයකි-
නුත් මාව බේරාගන්නයි."[5]
**12** පේතෘස් ඒ දේවල් තේරුම්ගත්
පසු මාක් යන වාසගම දැරූ යොහන්-
ගේ[6] මව වූ මරියාගේ නිවසට ගියේය.
ඒ අවස්ථාවේදී බොහෝදෙනෙක් එහි
රැස් වී යාච්ඤා කරමින් සිටියෝය.
**13** ඔහු එහි ප්‍රධාන දොරටුව අස-
ලට ගොස් දොරට තට්ටු කළ විට ඒ
කවුද කියා බැලීමට රෝදා නම් සේවි-
කාවක් ආවාය. **14** ඇය පේතෘස්ගේ
කටහඬ හඳුනාගත්තත් ඇයට ඇති වූ
ප්‍රීතිය නිසා ඇය දොර විවෘත නොකර
නිවස තුළට දුවගෙන ගියේ පේතෘස්
දොරටුව අසල සිටින බව සියලුදෙනා-
ටම දැන්වීමටය. **15** "ඔබට පිස්සු"
කියා එහි සිටි අය ඇයට පැවසුවත්
ඇය තරයේම කියා සිටියේ ඒ පේතෘස්
බවය. "ඒ පේතෘස් වෙනුවෙන් පෙනී
සිටින දේවදූතයෙක්" කියා ඔවුහු පැව-
සූහ.[7] **16** නමුත් පේතෘස් දොරටුව
ළඟ සිට දිගටම තට්ටු කළේය. ඔවුහු
දොර විවෘත කළ විට ඒ පේතෘස්
බව දැක පුදුම වූහ. **17** නමුත් ඔහු
ඔවුන්ට නිහඬ වෙන්න කියා අතින්

**11 පරි.**
1 2කොරි 8:12
2 ලෙවී 25:35; හිතෝ 3:27; ක්‍රියා 24:17; රෝම 15:26; 1කොරි 16:1; ගලා 2:10
3 ක්‍රියා 12:25; ගලා 2:1

**12 පරි.**
4 යොහ 15:20; ක්‍රියා 4:3
5 මතෙ 4:21
6 මතෙ 20:23; ලූක් 11:49
7 ක්‍රියා 24:27
8 නික් 12:15; නික් 23:15; ලෙවී 23:6
9 ලූක් 21:12; ක්‍රියා 5:18
10 නික් 12:11
11 2කොරි 1:11; එෆී 6:18; 1තෙස 5:17; යාකො 5:16
12 ගීතා 34:7; හෙබ්‍රෙ 1:14
13 1රාජා 19:7
14 ක්‍රියා 16:26
15 ක්‍රියා 5:19

**2 තීරුව**
1 මාක් 10:50
2 ක්‍රියා 11:5
3 ක්‍රියා 16:26
4 ගීතා 34:7; දානි 3:28; දානි 6:22; හෙබ්‍රෙ 1:14
5 2පේතෘ 2:9
6 ක්‍රියා 13:5; ක්‍රියා 15:37; කොලො 4:10
7 උත් 48:16; මතෙ 18:10

සංඥා කර,[1] යෙහෝවා දෙවි ඔහුව
සිරගෙයින් නිදහස් කළ ආකාරය විස්-
තර කළේය. “මේ දේවල් යාකොබ්ට[2]
සහ සහෝදරයන්ට දන්වන්න” කියා
පවසා ඔහු එතැනින් පිටත් වී වෙන
තැනකට ගමන් කළේය.
**18** ඊළඟ උදෑසන[3] පේතෘස්ට සිදු
වූ දේ ගැන හේවායන් අතර මහත්
කලබලයක් ඇති විය. **19** හෙරොද්[4]
ඔහුව සෙවීමට මහත් වෑයමක් දැරු-
වත් ඔහුව සොයාගැනීමට හැකි වූයේ
නැත. ඔහු මුරකරුවන්ව තමන් ඉදිරි-
යට කැඳවා ඔවුන්ගෙන් ප්‍රශ්න කළ
පසු ඔවුන්ට දඬුවම් නියම කළේය.[5]
ඉන්පසු ඔහු යුදයෙන් පිටත් වී සිසේරි-
යට ගොස් එහි යම් කාලයක් ගත
කළේය.
**20** ඒ කාලයේදී හෙරොද්, තීර්
සහ සීදොන්හි වැසියන් සමඟ කෝප-
යෙන් සිටි නිසා ඔහු සිතාගෙන සිටි-
යේ ඔවුන්ට විරුද්ධව යුද්ධ කිරීමටය.
එවිට එම නුවරවලින් දූත පිරිසක්
ඇවිත් රජුගේ මන්දිරයේ වාසය කළ
සියලුදෙනාව බලා කියා ගත් බ්ලස්-
ටස් නම් තැනැත්තා මාර්ගයෙන්
සාමය සඳහා ඉල්ලීමක් කළෝය.
ඔවුන් එසේ කළේ ඔවුන්ගේ ප්‍රදේශයට
හෙරොද් රජුගේ ප්‍රදේශයෙන් ආහාර
සපයනු ලැබූ නිසාය.[6] **21** ඔවුන්ව
ඇමතීමට විශේෂ දවසක් යොදාගත්
හෙරොද්, එදින රාජකීය වස්ත්‍රවලින්
සැරසී විනිශ්චයාසනයෙහි අසුන්ගෙන
රැස්ව සිටි පිරිසට ප්‍රසිද්ධියේ ඇම-
තුවේය. **22** එවිට රැස්ව සිටි අය,
“මෙය නම් මිනිසෙකුගේ කටහඬක්
වෙන්න බැහැ. මෙය දෙවි කෙනෙ-
කුගේ කටහඬක් විය යුතුයි”[7] කියා
පැවසූහ. **23** ඒ අවස්ථාවේදී ඔහු ඒ
ගෞරවය දෙවිට දුන්නේ නැත.[8] එම-
නිසා යෙහෝවා දෙවිගේ දූතයෙක්
විගස ඇවිත් ඔහුට පහර දුන්නේය.[9]
එවිට ඔහුගේ සිරුර පුරාම පණුවන්
ගසා ඔහු මිය ගියේය.
**24** මේ අතර යෙහෝවා දෙවිගේ
පණිවිඩය[10] සියලුදෙනා අතරේ දිගටම
පැතිර ගියේය.[11]

**25** බානබස්[1] සහ සාවුල්, යෙරුස-
ලමෙහි සිටි සියලුදෙනාට සහනාධාර
බෙදා දුන් පසු[2] මාක් යන වාසගම
දැරූ යොහන් සමඟ[3] අන්තියෝකියට
නැවත ගියෝය.

# 13

අන්තියෝකියේ පිහිටි සභා-
වේ අනාගතවක්තෘවරුද[4]
ගුරුවරුද සිටියෝය. ඔවුන් නම් බාන-
බස්, නීගර් යන නමින්ද හැඳින්වූ සිමි-
යොන්, සිරේනිය නම් නුවරින් පැමිණි
ලූෂස්,[5] දේශාධිපති වූ හෙරොද් සමඟ
අධ්‍යාපනය ලැබූ මනායින් සහ සාවුල්
යන අයයි. **2** ඔවුහු යෙහෝවා දෙ-
විට ප්‍රසිද්ධියේ සේවය කරමින්[6] නිරා-
හාරව සිටීමටද කාලය ගත්තෝය.
එවැනි අවස්ථාවකදී දෙවිගේ බල-
යෙන් ඔවුන්ට මෙවැනි මඟ පෙන්-
වීමක් ලැබිණ. “සියලුදෙනා අතරින්
බානබස්ව සහ සාවුල්ව මම කැඳෙව්-
වේ විශේෂ කාර්යයක් භාර දීම සඳ-
හායි. ඒ වෙනුවෙන් ඔවුන්ව වෙන් කර
තබන්න.”[7] **3** ඉන්පසු ඔවුහු නිරා-
හාරව සිට යාච්ඤා කර ඔවුන් පිට අත්
තබා,[8] ඔවුන්ව පිටත් කර යැව්වෝය.
**4** දෙවිගේ මඟ පෙන්වීමෙන්
එලෙස යවනු ලැබූ එම පුරුෂයෝ
සිලූෂියට ගොස් එතැන් සිට සයිප්‍ර-
සය බලා නැවකින් ගමන් කළෝය.
**5** ඔවුහු සලමිසය නම් නුවරට ගොඩ
බැස යුදෙව්වරුන්ගේ සිනගෝගවල
දෙවිගේ පණිවිඩය ප්‍රකාශ කළෝය.
ඔවුන් එසේ සේවය කරද්දී ඔවුන්ගේ
සහයට සිටියේ යොහන්ය.[9]
**6** මුළු දූපත පුරාම සංචාරය කළ
ඔවුන් පාෆස් නම් නුවරට පැමිණි විට
බාර්-යේසුස් නම් මිනිසෙකුව ඔවුන්ට
හමු විය. යුදෙව් ජාතිකයෙකු වූ ඔහු,
විවිධ මන්තර ගුරුකම් කරන බොරු
අනාගතවක්තෘවරයෙකි.[10] **7** ඔහු
සිටියේ එම දූපතේ ආණ්ඩුකාරයා
වූ සර්ජියස් පාවුලස් සමඟය. සර්ජි-
යස් පාවුලස් ඉතා බුද්ධිමත් මිනිසෙකි.
ඔහු දෙවිගේ පණිවිඩය ඇසීමට මහත්
ආශාවක් දැක්වූ නිසා බානබස් සහ
සාවුල්ට තමා වෙතට එන්න කියා
ආරාධනා කළේය. **8** නමුත් මන්-

**12 පරි.**
1 ක්‍රියා 13:16; ක්‍රියා 19:33
2 මතෙ 13:55; ක්‍රියා 15:13; ක්‍රියා 21:18; 1කොරි 15:7; ගලා 1:19; ගලා 2:9
3 ක්‍රියා 5:21
4 ක්‍රියා 12:6
5 ක්‍රියා 16:27
6 1රාජා 5:9; එස 27:17
7 එස 28:2; යූද් 16
8 යෙසා 42:8; 1කොරි 1:29
9 2සාමු 24:17; 2ලේක 32:21
10 යෙසා 55:11; ක්‍රියා 6:7; ක්‍රියා 19:20
11 කොලො 1:6

**2 තීරුව**
1 ක්‍රියා 4:36
2 ක්‍රියා 11:29
3 ක්‍රියා 13:5; ක්‍රියා 15:37

**13 පරි.**
4 ක්‍රියා 11:27; ක්‍රියා 15:32; 1කොරි 12:28; එෆී 4:11
5 ක්‍රියා 11:20
6 එෆී 3:7; 1තිමෝ 2:7
7 ක්‍රියා 9:15; හෙබ්‍රෙ 5:4
8 ක්‍රියා 14:23; 1තිමෝ 4:14; 2තිමෝ 1:6
9 ක්‍රියා 12:25
10 මතෙ 24:24

තර ගුරුකම් කළ එලිමස්* ඔවුන්ට
විරුද්ධ විය.[1] (එලිමස් යන නමෙහි
තේරුම මන්තර ගුරුකම් කරන්නා
යන්නයි.) ඔහුගේ ඉලක්කය වූයේ
ආණ්ඩුකාරයා ඇති කරගත් විශ්වාසය
කෙසේ හෝ බිඳ දැමීමය. 9 පාවුල්
යන නමින්ද හැඳින්වූ සාවුල් තුළ දෙ-
විගේ බලය ප්‍රබල ලෙස ක්‍රියා කරන්න
පටන්ගත් විට ඔහු එලිමස් දෙ-
සම බලා, 10 මෙසේ කීවේය. "ඔබ
මහා ප්‍රෝඩාකාරයෙක්! ඔබ දුෂ්ටක-
මින් පිරුණු යක්ෂයාගේ පුත්‍රයෙක්![2]
ඔබ ධර්මිෂ්ඨකමට එරෙහි වූ සතු-
රෙක්! ඔබ උත්සාහ කරන්නේ යෙ-
හෝවා දෙවිගේ යහපත් මඟ පෙන්වීම්
අවුල් කර දමන්නයි. 11 ඔබට දැන්
සිදු වෙන්න යන දේ ගැන මම කියන්-
නම්. යෙහෝවා දෙවි ඔබට දැන් පහර
දෙන නිසා ඔබ අන්ධයෙක් වෙනවා.
ඔබට කාලයක් යන තුරු හිරු එළිය
දකින්න බැරි වෙනවා." ඒ මොහො-
තේදීම ගන මීදුමක් හා සමාන දෙ-
යකින් තමා වැසී ඇති බව ඔහුට
දැනිණ. ඔහුගේ දෑස්ද අඳුරු විය.
තමන්ට මඟ පෙන්වන ලෙස ඉල්ල-
මින් ඔහු ඒ මේ අත ගියේය.[3] 12 සිදු
වූ දේ දුටු ආණ්ඩුකාරයා,[4] යෙහෝවා
දෙවි ගැන ඉගෙනගත් දේවලින් පුදුම-
යට පත් වී යේසුස්ගේ අනුගාමික-
යෙක් විය.

13 පාවුල් සමඟ සිටි දෙදෙනා
ඔහු සමඟම පාෆස් නුවරින් නැව-
කට ගොඩ වී, පම්ෆිලිය පළාතේ
පිහිටි පර්ගා නම් නුවරට ගියෝය.[5]
නමුත් එතනදී යොහන්[6] ඔවුන්ව අත්-
හැර නැවත යෙරුසලමට ගියේය.[7]
14 ඉන්පසු ඔවුහු පර්ගා නුවරින් පිටත්
වී පිසිදිය ප්‍රදේශයේ පිහිටි අන්තියෝ-
කියට ගොස් සබත් දවසේදී සිනගෝ-
ගයට ඇතුල් වී[8] එහි අසුන්ගත්තෝය.
15 නීතියෙන් හා අනාගතවක්තෘව-
රුන්ගේ ලියවිලිවලින් කොටසක්
ප්‍රසිද්ධියේ කියවූ[9] ඒ සිනගෝග-
යේ සිටි නිලධාරීහු,[1] ඔවුන්ව කැඳවා
ඔවුන්ට මෙසේ කීවෝය. "සහෝදර-
යෙනි, රැස්ව සිටින අයට යම් දිරිගැන්-
වීමක් ලබා දෙන්න ඔබ කැමති නම්
ඔබට පුළුවන් දැන් කතා කරන්න."
16 එහෙයින් පාවුල් නැඟිට, සියලුදෙ-
නාටම නිශ්ශබ්ද වන්න කියා තම
අතින් සංඥාවක් කර[2] කතා කරන්න
පටන්ගත්තේය.

"ඊශ්‍රායෙල් ජනයෙනි, දෙවිට ගරු-
බිය දක්වන අන් සියල්ලෙනි,[3] මා දැන්
කියන දේට සවන් දෙන්න. 17 ඊශ්‍රා-
යෙල්වරුන්ගේ දෙවි අපේ මුතුන්-
මිත්තන්ව තෝරාගත් පසු ඊජිප්තු
දේශයේ විදේශිකයන් හැටියට යම්
කාලයක් වාසය කරන්න ඔවුන්ට
සිදු වුණා. ඉන්පසු දෙවි ඔවුන් සිටි
ඒ පහත් තත්වයෙන් ඔවුන්ව නඟා
සිටුවා, තම මහත් බලය යොදාග-
නිමින්* ඒ දේශයෙන් ඔවුන්ව නිද-
හස් කළා.[4] 18 එතැන් පටන් ඔහු
අවුරුදු හතළිහක් පුරා[5] ඔවුන් ක්‍රියා
කළ ආකාරය ඉවසගෙන සිටියා.
19 ඊළඟට කානාන් දේශයේ ජාතීන්
හතක් විනාශ කිරීමෙන් පසු, ඔහු ඒ
ජාතීන්ට අයත් වූ ප්‍රදේශ ඔවුන්ට උරු-
මයක් ලෙස බෙදා දුන්නා.[6] 20 ඒ
සෑම දෙයක්ම සිදු වූයේ අවුරුදු හාර-
සිය පනහක පමණ කාලයක් අතරතු-
රේදීයි.

"ඉන්පසු ඔහු අනාගතවක්තෘ සාමු-
වෙල් සිටි කාලය දක්වා ඔවුන් වෙනු-
වෙන් විනිශ්චයකරුවන්ව පත් කළා.[7]
21 පසුව ඔවුන් කියා සිටියේ තමන්ට
රජෙකු අවශ්‍ය බවයි.[8] එවිට දෙවි
ඔවුන් වෙනුවෙන් බෙන්ජමින් ගෝත්‍ර-
යට අයත් කෙනෙකු වූ කිෂ්ගේ පුත්
සාවුල්ව රජු හැටියට පත් කළා.[9]
ඔහු පාලනය කළේ අවුරුදු හත-
ළිහයි. 22 දෙවි ඔහුව පාලනයෙන්
ඉවත් කළ පසු[10] සෙනඟ වෙනු-
වෙන් දාවිත්ව රජු හැටියට පත්
කළා.[11] 'යෙස්සේගේ පුත් දාවිත්[12]

---

ක්‍රියා 13:8* මොහු 6වෙනි පදයේ සඳහන් බාර්-යේසුස්ය.

ක්‍රියා 13:17* මූ.අ., "තම බලවත් හස්තය පාමින්."

---

**13 පරි.**
1 2තිමෝ 3:8
2 මතෙ 13:38, යොහ 8:44, 1යොහ 3:8
3 ක්‍රියා 9:8
4 ක්‍රියා 19:38
5 ක්‍රියා 15:38
6 ක්‍රියා 12:12
7 ක්‍රියා 15:38
8 ක්‍රියා 16:13, ක්‍රියා 17:2, ක්‍රියා 18:4, ක්‍රියා 19:8
9 ක්‍රියා 15:21

**2 තීරුව**
1 මාක් 5:22
2 ක්‍රියා 12:17, ක්‍රියා 21:40, ක්‍රියා 26:1
3 ක්‍රියා 13:26
4 නික් 6:6, නික් 14:8, ද්වි 7:6
5 නික් 16:35, ගණන් 14:34, ද්වි 2:7
6 ද්වි 7:1, යොෂු 14:2
7 විනි 2:16, 1සාමු 3:20
8 1සාමු 8:5
9 1සාමු 10:21, 1සාමු 11:15
10 හොෂෙ 13:11
11 1සාමු 16:12, 2සාමු 2:4, ගීතා 89:20
12 1සාමු 16:1

මාගේ සිත සතුටු කරන මිනිසෙකු[1]
බව මට පෙනේ. ඔහු ක්‍රියා කරන්-
නේ මා කැමති ආකාරයටයි'[2] කියා
දෙවි දාවිත් ගැන පැවසුවා. **23** දෙවි
තමන් පොරොන්දු වූ දේ ඉටු කරමින්
ඒ මිනිසාගේ පෙළපතින්[3] ඊශ්‍රායෙල්
දේශයට ගැලවුම්කරුවෙකු හඳුන්වා
දුන්නා.[4] ඒ යේසුස්. **24** ඔහු පැමි-
ණෙන්න කලින්,[5] යොහන්[6] මුළු ඊශ්‍රා-
යෙල් ජනතාවට ප්‍රසිද්ධියේ දේශනා
කළා. ඔහු දේශනා කළේ පසුතැවිලි වී
ඒ බව බව්තීස්ම වීමෙන් පෙන්වන්න
කියායි. **25** යොහන් තමාට පවරා
තිබුණු සේවය ඉටු කරන විට ඔහු
මේ දේත් පැවසුවා. 'ඔබ හිතන්නේ
මා කවුරුන් කියාද? පොරොන්දු වූ ඒ
තැනැත්තා මම නොවෙයි. නමුත් මට
පස්සේ එන්නේ ඔහුයි. ඇත්තටම මම
ඔහුගේ පාවහන් ගලවන්න තරම්වත්
වටින්නේ නැති කෙනෙක්.'[7]

**26** "සහෝදරයෙනි, ආබ්‍රහම්ගේ
පෙළපතට අයත් සියල්ලෙනි, දෙ-
විට ගරුබිය දක්වන අන් සියල්ලෙනි,
ගැලවීම ලබාගත හැකි ආකාරය
පිළිබඳ පණිවිඩය ලබා දී තිබෙන්-
නේ අපටයි.[8] **27** නමුත් යෙරුසල-
මේ වැසියන් සහ ඔවුන්ගේ පාලකයන්
ඒ තැනැත්තාව පිළිගත්තේ නැහැ.[9]
ඔවුන් ඔහුට කළ දෙයින් ඉටු වුණේ
අනාගතවක්තෘවරුන් ඔහු ගැන පවසා
තිබූ දේවල්මයි.[10] ඇත්තටම ඒ දේවල්
ඔවුන් සෑම සබත් දවසකම කිය-
වනවා. **28** ඔහුව මරණයට පත්
කරන්න කිසිම හේතුවක් නොති-
බුණත්[11] ඔවුන් පිලාත්ගෙන් ඉල්ලා
සිටියේ ඔහුව මරා දමන්න කියායි.[12]
**29** ඔහු ගැන ලියා තිබුණු සෑම දෙ-
යක්ම ඉටු වූ පසු,[13] ඔහුව වධක-
ණුවෙන් පහතට ගෙන[14] සොහොන්
ගෙයක තැන්පත් කරනු ලැබුවා.[15]
**30** නමුත් දෙවි ඔහුව මරණයෙන්
නැඟිට්ටෙව්වා.[16] **31** ඉන්පසු දවස්
කිහිපයක් පුරාම ඔහු විටින් විට දර්-
ශනය වුණා. ඔහු දර්ශනය වුණේ
ඔහු සමඟ කලින් ගලීලයේ සිට යෙ-
රුසලමට ගිය අයටයි. ඒ අය දැන්
ජනතාවට ඔහු ගැන සාක්ෂි දරමින්
සිටිනවා.[1]

**32** "අපි දැන් ඔබට මේ කතා
කරන්නේ දෙවි අපේ මුතුන්මිත්තන්ට
දුන් පොරොන්දුව ගැනයි.[2] එය
ශුභාරංචියක්. **33** ඒ ශුභාරංචිය නම්
ඔවුන්ගේ දරුවන් වන අපට ඒ පො-
රොන්දුව ඉටු කර දී ඇති බවයි.
ඔහු එසේ කර තිබෙන්නේ යේ-
සුස්ව නැවත නැඟිටුවීමෙනුයි.[3] දෙ-
වෙනි ගීතිකාවේ සඳහන් ආකාරයට,
'ඔබ මාගේ පුත්‍රයාය. මෙදින මම
ඔබේ පියා වෙමි' කියා දෙවි පවසන්-
නේ ඒ නිසයි.[4] **34** දෙවි ඔහුව මර-
ණයෙන් නැවත නැඟිට්ටෙව්වේ ඔහුව
නැවත කිසිදාක විනාශ කළ නො-
හැකි ආකාරයකිනුයි. ඒ බව, 'මම
දාවිත්ට දක්වන සදාතනික ප්‍රේ-
මය ඔබ සැමට අනිවාර්යයෙන්ම
පෙන්වන්නෙමි' යන වචනවලිනුත්
සනාථ වෙනවා.[5] **35** මීට අමතරව
තවත් ගීතිකාවක, 'ඔබට පක්ෂපාතව
සිටින තැනැත්තාට මිනී වළෙහි කුණු
වීමට ඉඩහරින්නේ නැත'[6] කියා සඳ-
හන් වෙනවා. **36** දාවිත්[7] නම් තමා
ජීවත් වූ කාලය පුරා දෙවිගේ අරමුණට
එකඟව ජීවත් වී මිය ගියා. ඉන්පසු
ඔහුව ඔහුගේ මුතුන්මිත්තන් මෙන්
තැන්පත් කරනු ලැබුවා. ඔහුගේ ශරී-
රයද කුණු වී ගියා.[8] **37** නමුත් දෙවි
නැවත නැඟිටෙවූ තැනැත්තා මිනී
වළෙහි කුණු වීම අද්දුටුවේ නැහැ.[9]

**38** "ඉතින් සහෝදරයෙනි, මේ දේ
දැනගන්න. අපි දැන් ඔබට ප්‍රකාශ
කරමින් සිටින්නේ ඒ තැනැත්තා
මාර්ගයෙන් පව්වලට සමාව ලබා-
ගත හැකි බවයි.[10] **39** මෝසෙස්ට
දෙන ලද නීතිය මාර්ගයෙන්
ඔබෙන් කිසිම කෙනෙකුට නිදොස්
අය වෙන්න බැරි වුණා.[11] ඊට වෙ-
නස්ව ඒ තැනැත්තා කෙරෙහි විශ්වා-
සය තබන සෑම කෙනෙක්ම නිදොස්
කෙනෙක් බව ප්‍රකාශ කරනු ලබ-
නවා.[12] **40** එමනිසා අනාගතවක්-
තෘවරුන්ගේ පොතේ සඳහන් දේ ඔබ
සම්බන්ධයෙන් සැබෑ නොවීමට පිය-

**13 පරි.**
1 1සාමු 13:14
2 යෙසා 44:28
3 2සාමු 7:12
යෙසා 11:1
4 ලූක් 1:32
ලූක් 1:69
රෝම 11:26
5 මතෙ 1:21
6 මතෙ 3:1
ලූක් 16:16
7 මතෙ 3:11
ලූක් 3:16
8 මතෙ 10:6
ලූක් 24:47
9 යොහ 16:3
ක්‍රියා 3:17
10 ගීතා 22:16
ගීතා 41:9
යෙසා 53:7
සෙක 11:12
11 මතෙ 26:60
ලූක් 23:15
යොහ 19:4
12 මතෙ 27:22
යොහ 19:15
13 ලූක් 18:31
යොහ 19:36
14 යොහ 19:40
15 මතෙ 27:60
16 මතෙ 28:6
ක්‍රියා 2:24

**2 තීරුව**
1 මතෙ 28:16
ක්‍රියා 1:3
ක්‍රියා 3:15
1කොරි 15:6
2 උත් 12:3
ක්‍රියා 13:23
රෝම 4:13
3 රෝම 1:4
4 ගීතා 2:7
හෙබ්‍රෙ 1:5
හෙබ්‍රෙ 5:5
5 යෙසා 55:3
6 ගීතා 16:10
ක්‍රියා 2:31
7 ක්‍රියා 2:34
8 1රාජා 2:10
ක්‍රියා 2:29
9 ක්‍රියා 2:27
10 දානි 9:24
ලූක් 24:47
ක්‍රියා 5:31
ක්‍රියා 10:43
11 රෝම 8:3
හෙබ්‍රෙ 7:19
හෙබ්‍රෙ 10:1
12 යෙසා 53:11
රෝම 3:28
රෝම 5:18

වර ගන්න. **41** එහි සඳහන් වන්නේ
මෙයයි. ‘අනුන්ට නින්දා කරන්නෙනි,
බලන්න. ඔබ දකින දේ ගැන පුදුම
වී මා ඉදිරියෙන් සඳහටම නොපෙනී
යන්න. මන්ද ඔබ ජීවත් වන කාල-
යේදී මම යමක් කරන්නෙමි. ඔබ ඒ දේ
කිසි ලෙසකින්වත් විශ්වාස කරන්නේ
නැත. යමෙකු ඔබට ඒ පිළිබඳව සිය-
ලුම විස්තර ලබා දුන්නත් ඔබ එය
විශ්වාස කරන්නේ නැත.’ ”[1]

**42** ඉන්පසු ඔවුන් එතැනින් පිටත්
වී යන විට ඔවුන් කතා කළ
කාරණා ගැන ඊළඟ සබත් දවසේදීද
පැමිණ කතා කරන මෙන් රැස්ව සිටි
අය ඔවුන්ගෙන් ඉල්ලීමක් කළෝය.[2]
**43** සිනගෝගයේ රැස්ව සිටි සමූ-
හයා විසිර ගිය පසු යුදෙව්වන් බො-
හෝදෙනෙක්ද යුදෙව් ආගමට හැරී
දෙවිට නමස්කාර කළ බොහෝදෙ-
නෙක්ද පාවුල් සහ බානබස් පසුපස
ගියෝය.[3] එහෙයින් ඔවුහු දෙදෙනා
ඔවුන්ට කතා කරමින් දෙවිගේ මහත්
කරුණාව නොකඩවා ලබාගැනීමට[4]
ඔවුන්ට උනන්දු කළෝය.[5]

**44** ඊළඟ සබත් දවසේදී යෙහෝවා
දෙවිගේ පණිවිඩය ඇසීමට නුවරේ
සිටි සියලුදෙනාම පාහේ රැස් වූහ.[6]
**45** රැස්ව සිටි සමූහයා දුටු යුදෙව්වරු
ඊර්ෂ්‍යාවෙන් පිරී,[7] පාවුල් පවසමින්
සිටි දේවලට විරුද්ධව අපහාසාත්මක
ලෙස කතා කළෝය.[8] **46** එවිට
පාවුල් සහ බානබස් නිර්භීතව මෙසේ
කීවෝය. “මුල්ම පියවර ලෙස දෙවිගේ
පණිවිඩය ලබා දෙන්න සිදු වුණේ
ඔබටයි.[9] නමුත් ඔබ එය ප්‍රතික්ෂේප
කර[10] තමන් සදාකාල ජීවනය ලබා-
ගන්න තරම් සුදුසු අය නොවන බව
පෙන්වා ඇති නිසා අපි දැන් ඒ දේ
ලබා දෙන්නේ වෙනත් ජාතීන්ටයි.[11]
**47** ඇත්තෙන්ම යෙහෝවා දෙවි අපිට
මෙලෙස අණ කර තිබෙනවා. ‘මම
ජාතීන්ට ආලෝකය දීම සඳහා ඔබව
පත් කළෙමි.[12] එසේ කළේ ඔබ මාර්ග-
යෙන් පොළොවේ ඈත කෙළවර දක්-
වාම වෙසෙන ජනයාට ගැලවීම ලබා
දීම සඳහාය.’ ”[13]

**48** ඒ දේවල් වෙනත් ජාතීන්ට
අයත් අයද අසාගෙන සිටි අතර ඔවුහු
මහත් ප්‍රීතියකින් යෙහෝවා දෙවිගේ
පණිවිඩය ප්‍රශංසාවට පත් කළෝය.[1]
එසේ සදාකාල ජීවනයට මඟ පාදන
සත්‍යය පිළිගැනීමට කැමති වූ සිය-
ලුදෙනාම යේසුස්ගේ අනුගාමිකයෝ
බවට පත් වූහ.[2] **49** යෙහෝවා දෙ-
විගේ පණිවිඩය ඒ ප්‍රදේශය පුරාම පතු-
රුවන ලදි.[3] **50** නමුත් යුදෙව්වරු[4]
එකතු වී දෙවිට නමස්කාර කළ සමා-
ජයේ ඉහළ පෙළේ ස්ත්‍රීන්වද නගර-
යේ ප්‍රධානීන්වද පාවුල් සහ බානබස්ට
විරුද්ධව උසිගැන්වූහ. එහෙයින් ඔවුහු
පාවුල්ට සහ බානබස්ට පීඩා එල්ල
කර[5] ඔවුන්ව තම ප්‍රදේශයේ මායිම්-
වලින් පිටතට එළවා දැමුවෝය.
**51** ඔවුහු පිටත් වී යද්දී තම පාද-
වලින් දූවිලි ගසා දමා,*[6] ඉකෝ-
නිය නුවර බලා ගියෝය. **52** නමුත්
ගෝලයෝ දිගටම ප්‍රීතියෙන්[7] හා දෙ-
විගේ බලයෙන් ශක්තිමත් වී සිටි-
යෝය.

**14** ඉකෝනියට[8] පැමිණි පාවුල්
සහ බානබස් යුදෙව්වරුන්-
ගේ සිනගෝගයට ඇතුල් වී[9] රැස්ව
සිටි අයට ඉගැන්වූහ. ඔවුන් කො-
තරම් හොඳින් ඉගැන්නුවාද කිව-
හොත් යුදෙව්වරුන් සහ ග්‍රීකවරුන්
විශාල පිරිසක්[10] යේසුස්ගේ අනුගා-
මිකයෝ බවට පත් වූහ. **2** නමුත්
ඔවුන් පැවසූ දේවල් විශ්වාස
නොකළ යුදෙව්වරු, වෙනත් ජාතීන්ට
අයත් අයව උසිගන්වා[11] ඔවුන්ගේ
මනස් තුළට වැරදි අදහස් දමා
ඔවුන් ගැන වැරදි වැටහීමක් ඇති
කළෝය.[12] **3** එහෙයින් ඔවුහු එහි
සෑහෙන කාලයක් නැවතී සිටියෝය.
දේශනා කිරීමට යෙහෝවා දෙවි-
ගෙන් තමන්ට අවසර ලැබී ඇති
බව සිහියේ තබාගනිමින් ඔවුහු නිර්-
භීතව කතා කළෝය. ඔවුන් දෙවි-
ගේ මහත් කරුණාව පිළිබඳ පණිවිඩය
ගැන කතා කරද්දී දෙවින් ඒ සඳහා

**13 පරි.**
1 හබ 1:5
2 ක්‍රියා 18:4
3 ක්‍රියා 17:4
4 ක්‍රියා 11:23, තිත 2:11
5 ක්‍රියා 14:22
6 ක්‍රියා 12:24
7 හිතෝ 27:4
8 ක්‍රියා 14:2, ක්‍රියා 17:5
9 මතෙ 10:6, ක්‍රියා 3:26, රෝම 1:16
10 මතෙ 22:8, ලූක් 7:30
11 යෙසා 55:5, ලූක් 2:32, ක්‍රියා 18:6, රෝම 10:19
12 යෙසා 42:6
13 යෙසා 49:6, ක්‍රියා 1:8

**2 තීරුව**
1 යෙසා 39:5, යෙසා 66:5, ක්‍රියා 11:18, 2තෙස 1:12
2 රෝම 8:29
3 ක්‍රියා 15:36
4 ක්‍රියා 14:2, ක්‍රියා 14:19
5 මතෙ 23:34, ක්‍රියා 17:5, 2තිමෝ 3:11
6 මතෙ 10:14, ලූක් 9:5, ක්‍රියා 18:6
7 මතෙ 5:12, 1තෙස 1:6

**14 පරි.**
8 2තිමෝ 3:11
9 ක්‍රියා 13:5
10 ක්‍රියා 17:4
11 ක්‍රියා 13:45
12 රෝම 15:31

ක්‍රියා **13:51*** මතෙ 10:14හි පාදසටහන බලන්න.

සාක්ෂි ලබා දුන්නේය. ඔහු එසේ
කළේ ඔවුන්ට පුදුමසහගත දේවල්
හා ආශ්චර්යයන් සිදු කිරීමට බලය
ලබා දීමෙනි.[1] **4** කෙසේනමුත් නුව-
රේ වැසියන් අතර භේදයක් ඇති
විය. සමහරුන් යුදෙව්වන්ගේ පැත්ත
ගත් අතර තවත් සමහරුන් සිටි-
යේ යේසුස්ගේ නියෝජිතයන්ට* පක්-
ෂවය. **5** මේ අතර වෙනත් ජාතීන්ට
අයත් කිහිපදෙනෙක් යුදෙව්වන් සහ
ඔවුන්ගේ පාලකයන් සමඟ එකතු
වී පාවුල්ට හා බානබස්ට හිරිහැර
කර ගල් ගැසීමට සූදානම් වූහ.[2]
**6** ඔවුන්ට ඒ දේ ගැන ආරංචි වූ විට
ඔවුහු ලිකෝනිය, ලිස්ත්‍රාව සහ දර්බය
යන නුවරවලටද ඒ අවට පිහිටි ප්‍රදේ-
ශයටද පලා ගොස්,[3] **7** එහි ශුභාරං-
චිය නොකඩවා ප්‍රකාශ කළෝය.[4]

**8** ලිස්ත්‍රාවේ එක්තරා කොර මිනි-
සෙක් සිටියේය. උපන් දා සිට ඔහු ඒ
ආබාධයෙන් පෙළුණු නිසා[5] ඔහු කව-
දාවත් ඇවිද තිබුණේ නැත. **9** ඒ
මිනිසා පාවුල් පැවසූ දේවලට මහත්
උනන්දුවකින් සවන් දෙමින් සිටියේය.
ඔහු දෙස හොඳින් බැලූ පාවුල්ට තේ-
රුම් ගියේ සුවය ලැබීමට තරම් විශ්-
වාසයක්[6] ඒ මිනිසාට තිබෙන
බවය. **10** එමනිසා, "නැඟිට කෙ-
ළින් සිටගන්න" කියා පාවුල් මහත්
හඬින් ඔහුට කීවේය. ඔහු එකව-
රම නැඟිට, ඇවිදින්න පටන්ගත්-
තේය.[7] **11** පාවුල් සිදු කළ දේ දුටු
සමූහයා මහත් හඬින් කෑගසා, "දෙ-
විවරුන්[8] මිනිසුන්ගේ වෙස් අරගෙන
අප අතරට ඇවිත්" කියා ලිකෝනි-
යේ බසින් කියන්න පටන්ගත්තෝය.
**12** ඔවුන් බානබස්ව හැඳින්වූයේ
සියුස් ලෙසය. කතා කිරීමට පාවුල්
පෙරමුණ ගත් නිසා ඔවුහු ඔහුව හර්-
මීස් ලෙස හැඳින්වූහ. **13** නුවර අස-
ළම සියුස්ගේ දේවස්ථානයක් පිහිටා
තිබුණු අතර එහි පූජකයා ගොනුන්ද
මල් මාලාද රැගෙන නුවරේ දොර-
ටුව අසලට පැමිණියේය. ඔහුට අවශ්‍ය
වූයේ රැස්ව සිටි සමූහයා සමඟ එක් වී
බානබස්ට සහ පාවුල්ට පූජා ඔප්පු
කිරීමටය.[1]

**14** යේසුස්ගේ නියෝජිතයන් වන
බානබස් සහ පාවුල් ඒ දේ ගැන දැන-
ගත් විට ඔවුහු තම වස්ත්‍ර ඉරාගෙන
සමූහයා මැදට දිව ගොස් හඬ නඟා,
**15** මෙසේ කීවෝය. "මිත්‍රයෙනි, ඔබ
මේ දේවල් කරන්නේ ඇයි? අපත් ඔබ
හා සමාන දුර්වලකම් ඇති[2] මිනිස්සු.[3]
අප ඔබට ශුභාරංචිය ප්‍රකාශ කරන්-
නේ, ඔබ මේ වගේ නිෂ්ඵල දේව-
ලින් ඉවත් වී[4] ජීවමාන දෙවි වෙතට
හැරීම සඳහායි.[5] අහසත් පොළො-
වත් මුහුදත් ඒවායේ තිබෙන සියල්-
ලත් සෑදුවේ ඔහුයි.[6] **16** අතීතයේ
නම් දෙවි සෑම ජාතියකටම තමන්ට
කැමති දේ කරන්න ඉඩ දුන්නා.[7]
**17** ඒ වුණත් ඒ කාලයේදීත් ඔහු බො-
හෝ යහපත් දේවල් කරමින්[8] තමා
සිටින බවට සාක්ෂි ලබා දුන්නා. ඔහු
එසේ කළේ ඔබට වැසි ලබා දීමෙන්,[9]
සරු අස්වනු ලබා දීමෙන්, කෑමට
අවශ්‍ය තරම් ආහාර ලබා දීමෙන්
සහ ඔබේ සිතට සතුට ගෙන දෙන
දේවල් ලබා දීමෙනුයි."[10] **18** ඔවුන්
ඒ දේවල් සමූහයාට පැවසුවත් ඔවුන්ට
පූජා ඔප්පු කිරීමට සමූහයා ගත් උත්-
සාහය නතර කිරීම පහසු දෙයක් වූයේ
නැත. ඒ සඳහා ඔවුන්ට මහත් වෙහෙ-
සක් දැරීමට සිදු විය.

**19** නමුත් පසුව අන්තියෝකි-
යෙන්ද ඉකෝනියෙන්ද යුදෙව්වරුන්
පිරිසක් ඇවිත් එම සමූහයාව තමන්-
ගේ පැත්තට නම්මාගත්තෝය.[11]
එහෙයින් ඔවුහු පාවුල්ට ගල් ගසා
ඔහු මිය ගොස් ඇති බව සිතා නුව-
රින් පිටතට ඇද දැමුවෝය.[12]
**20** නමුත් ගෝලයන් ඇවිත් ඔහු වටා
එකතු වූ විට ඔහු නැඟිට්ටේය. ඉන්-
පසු ඔහු නුවරට ඇතුල් විය. පසු-
වදා ඔහු බානබස් සමඟ දර්බය
බලා පිටත්ව ගියේය.[13] **21** ඔවුන් ඒ
නුවරෙහි දේශනා කළ විට සෑහෙන
පිරිසක් යේසුස්ගේ ගෝලයන් බවට
පත් වූහ.[14] ඉන්පසු ඔවුහු ලිස්ත්‍රාව-

**14 පරි.**
1 ක්‍රියා 5:12 ක්‍රියා 19:11 හෙබ්‍රෙ 2:4
2 ක්‍රියා 14:19 1තෙස 2:2 2තිමෝ 3:11
3 මතෙ 10:23
4 1කොරි 1:17
5 ක්‍රියා 3:2
6 මතෙ 9:28
7 යෙසා 35:6 ක්‍රියා 3:8
8 ක්‍රියා 12:22 ක්‍රියා 28:6

**2 තීරුව**
1 දානි 2:46
2 යාකො 5:17
3 ක්‍රියා 10:26
4 ද්වි 32:21 1සාමු 12:21 යෙරෙ 10:15
5 1තෙස 1:9
6 උත් 1:1 නික් 20:11 ගීතා 33:6 ගීතා 146:6 ක්‍රියා 4:24
7 ද්වි 18:14 ක්‍රියා 17:30
8 ක්‍රියා 17:27 රෝම 1:20
9 ගීතා 65:10 ගීතා 147:8 යෙරෙ 5:24 මතෙ 5:45
10 ගීතා 145:16
11 ක්‍රියා 17:13
12 2කොරි 6:9 2කොරි 11:25 2තිමෝ 3:11
13 ක්‍රියා 16:1
14 මතෙ 28:19

**ක්‍රියා 14:4*** හෝ, "යවනු ලැබූවන්ට."

ටද ඉකෝනියටද අන්තියෝකියටද
නැවත ගියෝය. **22** එහිදී ඔවුහු,
"දෙවිගේ රාජ්‍යයට ඇතුල් වෙන්න
නම් අපි බොහෝ පීඩාවලට මුහුණ
දෙන්න අවශ්‍යයි"[1] කියා පවසමින්
ගෝලයන්ට තම විශ්වාසය දුර්වල
කරගන්නේ නැතුව එය ශක්තිමත්ව
තබාගැනීමට දිරිගැන්වූහ.[2] **23** මීට
අමතරව සෑම සභාවකම සිටින ගෝ-
ලයන්ට උපකාර කිරීම සඳහා ඔවුහු
වැඩිමහල්ලන්ව පත් කළෝය.[3] නිරා-
හාරව සිටිමින් යාච්ඤා කළ ඔවුහු,[4]
යෙහෝවා දෙවි කෙරෙහි විශ්වාසය
තැබූ වැඩිමහල්ලන්ව දෙවිගේ රැකව-
රණය යටතට භාර කළෝය.[5]

**24** ඊළඟට ඔවුහු පිසිදිය ප්‍රදේ-
ශය මැදින් ගොස් පම්ෆිලිය පළාතට
පැමිණ,[6] **25** පර්ගාහිදී දෙවිගේ පණි-
විඩය ගැන කතා කළ පසු අත්ත-
ලීය නම් නුවරට ගියෝය. **26** ඔවුහු
එතැනින් නැවතත් අන්තියෝකිය
බලා යාත්‍රා කළෝය.[7] දෙවි තම
මහත් කරුණාවෙන් ඔවුන්ට මේ සේ-
වය මුලින්ම භාර දී තිබුණේ එහිදීය.
එහෙයින් ඔවුන් නැවත එතැනට ගියේ
තම සේවය සම්පූර්ණයෙන්ම ඉටු කළ
පසුවය.[8]

**27** ඔවුහු එතැනට ගිය විට සභාවේ
සියලුදෙනාව රැස් කරවා, දෙවි ඔවුන්
මාර්ගයෙන් සිදු කළ බොහෝ දේවල්
ගැනත් දෙවි වෙනත් ජාතීන්ට අයත්
අයට පවා සත්‍ය ඉගැන්වීම් පිළිගැනී-
මට මඟ විවෘත කර ඇති බවත්[9] පැව-
සුවෝය.[10] **28** ඔවුහු එම ගෝලයන්
සමඟ සෑහෙන කාලයක් එහි නැවතී
සිටියෝය.

**15** මේ අතර යුදයෙන් කිහි-
පදෙනෙක් ඇවිත්,[11] "ඔබ
මෝසෙස්ගේ චාරිත්‍රයට එකඟව[12] චර්-
මච්ඡේදනය වුණේ නැත්නම්[13] ඔබට
ගැලවීම ලබාගත නොහැකියි" කියා
පවසමින් සහෝදරයන්ට වැරදි අදහස්
ඉගැන්වූවෝය. **2** එවිට පාවුල් සහ
බානබස් ඔවුන් සමඟ එකඟ නොවූ
නිසා ඔවුන් අතර උණුසුම් විවාද-
යක් හටගත්තේය. එහෙයින් පාවුල්ව,
බානබස්ව සහ තවත් සහෝදරයන්
කිහිපදෙනෙකුව යෙරුසලමට යැවීම
සඳහා සැලසුම් යොදන ලදි. එසේ
කළේ එහි සිටින නියෝජිතයන්* සහ
වැඩිමහල්ලන්ව හමු වී ඇති වූ විවාදය
ගැන සාකච්ඡා කිරීම සඳහාය.[1]

**3** ඔවුන්ව ඇරලවීමට සභාවේ
සහෝදරයෝ ඔවුන් සමඟ යම් දුරක්
ගියෝය.[2] ඉන්පසු එම සහෝදරයන්-
ගෙන් සමුගත් ඔවුහු, ෆිනීෂියාව හා
සමාරිය මැදින් ගමන් කළෝය. එසේ
ගමන් කරන අතරතුරේදී ඔවුහු වෙ-
නත් ජාතීන්ද දෙවි වෙතට හැරෙන
ආකාරය ගැන හමු වූ සහෝදර-
යන්ට පැවසූහ.[3] එය ඇසූ සියලුදෙනා
තුළ ඇති වූයේ ඉමහත් සතු-
ටකි.[4] **4** ඔවුන් යෙරුසලමට ගිය
විට සභාවද නියෝජිතයෝ සහ වැඩි-
මහල්ලෝද ඔවුන්ව සාදරයෙන් පිළි-
ගත්තෝය.[5] එවිට දෙවි ඔවුන් ලවා
සිදු කළ සියලු දේවල් ගැන ඔවුහු
ඔවුන්ට පැවසූහ.[6] **5** යෙරුසලමේ
රැස්ව සිටි පිරිස අතර කලින් පරි-
සිවරුන්ගේ නිකායට අයත්ව සිටි
යේසුස්ගේ අනුගාමිකයන් කිහිපදෙ-
නෙක් සිටියෝය. ඔවුන් තම අසුන්ව-
ලින් නැඟිට කියා සිටියේ, 'වෙනත්
ජාතීන්ට අයත් අයව චර්මච්ඡේදනය
කර[7] මෝසෙස්ට දෙන ලද නීතිය
පිළිපැදීමට ඔවුන්ට අණ කිරීම අවශ්‍ය"
බවයි.[8]

**6** එහෙයින් ඒ කාරණය ගැන
සාකච්ඡා කිරීමට[9] නියෝජිතයෝ සහ
වැඩිමහල්ලෝ රැස් වූහ. **7** ඒ පිළි-
බඳව ඔවුන් ඉතා දීර්ඝ ලෙස සාකච්ඡා
කළ පසු[10] පේතෘස් නැඟිට මෙසේ
කීවේය. "මගේ සහෝදරයෙනි, ඔබ
හැමෝම දන්නවා වෙනත් ජාතීන්ට
අයත් මිනිසුන්ටත් ශුභාරංචියට සවන්
දී එය විශ්වාස කරන්න දෙවි අවස්ථා-
වක් ලබා දී ඇති බව. ඒ සඳහා මුල් වී
ක්‍රියා කරන්න දෙවි ඔබ අතරින් තෝ-
රාගත්තේ මාවයි.[11] **8** දෙවි සියලු-
දෙනාගේ සිත්වල තිබෙන දේ

**14 පරි.**
1 මතෙ 10:38 යොහ 15:19 රෝම 8:17 1තෙස 3:4
2 ක්‍රියා 11:23
3 තීත 1:5
4 ක්‍රියා 13:3
5 ක්‍රියා 20:32
6 ක්‍රියා 13:13
7 ක්‍රියා 13:1
8 1කොරි 15:10
9 ක්‍රියා 11:18 1කොරි 16:9
10 ක්‍රියා 15:4 ක්‍රියා 21:19

**15 පරි.**
11 ගලා 2:12
12 උත් 17:10 නික් 12:48 ලෙවී 12:3
13 ගලා 5:2

**2 තීරුව**
1 ක්‍රියා 11:30 ක්‍රියා 16:4 ගලා 2:1
2 රෝම 15:24 1කොරි 16:6
3 ක්‍රියා 13:4 ක්‍රියා 14:27
4 ක්‍රියා 11:18
5 ක්‍රියා 21:17
6 ක්‍රියා 21:19
7 ක්‍රියා 11:2
8 නික් 12:48
9 හිතෝ 13:10 හිතෝ 15:22
10 මාක් 9:16 ක්‍රියා 15:2
11 ක්‍රියා 10:34 ක්‍රියා 11:17

ක්‍රියා **15:2*** හෝ, "යවනු ලැබූවන්."

දන්නවා.[1] ඔහු තම බලය අපට
ලබා දුන්නා වගේම ඔවුන්ටත් එය
ලබා දුන්නා.[2] දෙවි ඔවුන්ව පිළි-
ගත් බවට එය ප්‍රබල සාක්ෂියක්.
**9** ඒ වගේම ඔවුන් තැබූ විශ්වාසය
නිසා දෙවි ඔවුන්ගේ හදවත්ද පවිත්‍ර
කළා.[3] එසේ කිරීමෙන් ඔහු පෙන්වා
දුන්නේ ඔවුන් හා අප අතර කිසි
වෙනසක් නැති බවයි.[4] **10** එහෙම-
නම් අපේ මුතුන්මිත්තන්ටවත් අප-
ටවත් උසුලන්න බැරි වූ බරක්[5]
එම ගෝලයන් මත පැටවීමෙන්[6]
ඔබ දෙවිට විරුද්ධව ක්‍රියා කරන්න
උත්සාහ කරන්නේ ඇයි? **11** ඇත්-
තටම අපි විශ්වාසයෙන් බලා සිටින්-
නේ අපේ ස්වාමීන් වන යේසුස්ගේ
මහත් කරුණාව මාර්ගයෙන් ගැලවීම
ලබාගැනීමටයි.[7] වෙනත් ජාතීන්ට
අයත් අයටත් තිබෙන්නේ ඒ විශ්වාස-
යමයි."[8]

**12** ඒ දේවල් පැවසූ විට රැස්ව
සිටි සියලුදෙනාම නිහඬ වී බානබස්
සහ පාවුල්ට සවන් දුන්නෝය. වෙ-
නත් ජාතීන්ට අයත් මිනිසුන් අතර
දෙවි ඔවුන් මාර්ගයෙන් කළ නොයෙ-
කුත් පුදුමාකාර ක්‍රියාවන් හා ආශ්-
චර්යයන් පිළිබඳව අසා සිටි අයට
ඔවුහු විස්තර සැපයූහ.[9] **13** ඔවුන් ඒ
විස්තර සැපයූ පසු යාකොබ් මෙසේ
පැවසුවේය. "මගේ සහෝදරයෙනි,
මට සවන් දෙන්න.[10] **14** මීට කලින්
සිමියොන්[11] අපට හොඳින් පැහැදිලි
කළේ වෙනත් ජාතීන්වල මිනිසුන්ව
තෝරාගැනීමට දෙවි මුල් වතාවට
පියවර ගත් ආකාරයයි. දෙවි එසේ
කළේ තම නාමය දැරීමට සෙනඟක්
ඔවුන් අතරින්ද තෝරාගැනීමටයි.[12]
**15** ඒ දේ අනාගතවක්තෘවරුන් පැවසූ
දේවලටත් එකඟයි. එක් ස්ථානයක
මෙසේ ලියා තිබෙනවා. **16** 'මේ
දේවලට පසු මම නැවත පැමිණ
බිඳ වැටී ඇති දාවිත්ගේ ගෘහය
නැවත ගොඩනඟන්නෙමි. නටබුන්
වී ඇති එය නැවත ඉදි කර ස්ථිර
කරන්නෙමි.[13] **17** මා එසේ කරන්-
නේ ඉතුරු වූ සියලුදෙනා සියලු
ජාතීන්වල මිනිසුන් සමඟ එකතු වී
යෙහෝවා දෙවිට ළං වී ඔහුගේ මඟ
පෙන්වීම් පතන පිණිසය. මේ මිනි-
සුන් මාගේ නාමය දරන සෙනඟකි.
මෙසේ පවසන්නේ මේ සියලු දේ සිදු
කරන යෙහෝවා දෙවිය.[1] **18** පුරා-
ණයේ[2] තීරණය කළ මේ දේවල් ඉටු
කරන්නේ ඔහුය.' **19** ඒ නිසා මගේ
නිගමනය නම් දෙවි වෙතට හැරී එන
වෙනත් ජාතීන්ට අයත් අයට අන-
වශ්‍ය ප්‍රශ්න ඇති කිරීම සුදුසු නොවන
බවයි.[3] **20** ඒ වෙනුවට ඔවුන් දේ-
වතා රූප මගින් අපවිත්‍ර වී ඇති දේව-
ලින්,[4] වේශ්‍යාකමින්,*[5] බෙල්ල මිරිකා
මැරූ සතුන්ගේ මස් ආහාරයට ගැනී-
මෙන්[6] සහ ලේවලින්[7] වැළකී සිටීම
අවශ්‍ය බව ඔවුන්ට ලියා දැන්විය
යුතුයි. **21** ඒ දේවල් මෝසෙස් විසි-
නුත් සඳහන් කර තිබෙනවා. ඒවා
සෑම නුවරකම ඇති සිනගෝගවල
සෑම සබත් දවසකම ශබ්ද නඟා කිය-
වනු ලබනවා.[8] එය බොහෝ කාලයක
පටන් කරන දෙයක්."

**22** එවිට නියෝජිතයන්, වැඩිම-
හල්ලන් සහ රැස්ව සිටි මුළු සභාවම
තීරණය කළේ පාවුල් සහ බාන-
බස් සමඟ සුදුසුකම් ඇති පුරුෂයන්ව
අන්තියෝකියට යැවීම සුදුසු බවයි.
ඒ සඳහා ඔවුන් තෝරාගත්තේ තම
සහෝදරයන් අතරේ පෙරමුණ ගෙන
ක්‍රියා කළ දෙදෙනෙකු වන බාසබස්
නමින් හැඳින්වූ යූදස්ව[9] සහ සීලස්වය.
**23** ඔවුන් අත ලිපියක් යවනු ලැබූ
අතර එහි මෙසේ සඳහන් විය.

"ඔබේ සහෝදරයන් වන නියෝජි-
තයන් සහ වැඩිමහල්ලන් වෙතිනි.
අන්තියෝකියේද[10] සිරියාවේද සිලී-
සියාවේද[11] සිටින වෙනත් ජාතීන්ට
අයත් සහෝදරයෙනි, ඔබ සැමට අපේ
සුබ පැතුම්! **24** ඔබ අතරේ සිටින
සමහරදෙනෙකු නොයෙකුත් දේවල්
පවසා ඔබ තුළ කැලඹීමක් ඇති කර
ඔබේ සිත් අවුල් කිරීමට උත්සාහ

**15 පරි.**
1 1ලේක 28:9; යෙරෙ 11:20; ක්‍රියා 1:24
2 ක්‍රියා 10:44; ක්‍රියා 11:15
3 ගලා 2:16; 1පේතෘ 1:22
4 ගලා 3:28
5 ගලා 3:10
6 ගලා 5:1
7 යෙසා 53:11; යොහ 1:17; ගලා 2:16
8 මතෙ 20:28
9 රෝම 15:19
10 ක්‍රියා 12:17
11 ක්‍රියා 11:13; 2පේතෘ 1:1
12 යෙසා 55:5; 1පේතෘ 2:9
13 ආමො 9:11

**2 තීරුව**
1 ආමො 9:12
2 යෙසා 45:21
3 ක්‍රියා 15:10
4 උත් 35:2; නික් 20:3; එස 20:30; 1කොරි 8:7; 1කොරි 10:14
5 1කොරි 6:9; කොලො 3:5; 1තෙස 4:3
6 ලෙවී 17:13
7 උත් 9:4; ලෙවී 3:17; ලෙවී 7:26; ලෙවී 17:10; ලෙවී 19:26; ද්වි 12:23; ද්වි 15:23; 1සාමු 14:32
8 ක්‍රියා 13:15; 2කොරි 3:15
9 ක්‍රියා 1:23
10 ක්‍රියා 11:26
11 ගලා 1:21

**ක්‍රියා 15:20*** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න.

කරන බව අපට ආරංචි විය.[1] නමුත්
ඒ සම්බන්ධයෙන් අපි ඔවුන්ට කිසි
මඟ පෙන්වීමක් දී නැත.[2] **25** එම-
නිසා ඒ දේවල් සම්බන්ධයෙන් අප
ඒකමතික තීරණයකට[3] එළඹී ඇති
බව ඔබට දන්වන්න කැමැත්තෙමු.
එලෙසම අපේ ප්‍රේමණීය සහෝදරයන්
වන බානබස් සහ පාවුල්[4] සමඟ තවත්
පුරුෂයන් දෙදෙනෙකුව ඔබ වෙතට
එවීම සුදුසු බවත් අපට පෙනී ගියේය.
**26** බානබස් සහ පාවුල් අපේ ස්වා-
මීන් වන යේසුස් ක්‍රිස්තුස් වෙනුවෙන්
තම ජීවිත පවා අනතුරේ තැබූ පුරුෂ-
යෝය.[5] **27** යූදස් සහ සීලස් යන
දෙදෙනාව අප එවන්නේ[6] මෙම ලිපියේ
සඳහන් දේවල් ඔබට දැනුම් දීම සඳ-
හාය.[7] **28** දෙවිගේ බලයේ උපකාර-
යෙන්[8] අප තීරණය කළේ ඔබ මතට
අනවශ්‍ය බරක් පැටවීම සුදුසු නොවන
බවයි.[9] ඔබ වැළකී සිටිය යුත්තේ මේ
අත්‍යවශ්‍ය දේවලින් පමණි. **29** ඒවා
නම් දේවතා රූපවලට පූජා කළ දේ-
වලින්,[10] ලේවලින්,[11] බෙල්ල මිරිකා
මැරූ සතුන්ගේ මස් ආහාරයට ගැනී-
මෙන්[12] සහ වේශ්‍යාකමින්ය.*[13] ඔබ ඒ
දේවලින් නිරතුරුවම වැළකී සිටීම
අවශ්‍යය. ඔබ සැලකිලිමත් වෙමින් ඒ
දේවලින් වැළකී සිටීමට උත්සාහ දර-
නවා නම්[14] එයින් ඔබට යහපතක් සිදු
වනු ඇත. ඔබ සැමට අපගේ සුබ
පැතුම්!"

**30** යවනු ලැබූ පිරිස අන්තියෝ-
කියට ගොස් සියලුදෙනාව රැස් කර
ඔවුන්ට එම ලිපිය භාර දුන්නෝය.[15]
**31** ඔවුහු එය කියවා, එයින් දිරිගැන්-
වීම් ලබා ප්‍රීතිමත් වූහ.[16] **32** ඉන්පසු
අනාගතවක්තෘවරුන්[17] ලෙසද සේ-
වය කළ යූදස් සහ සීලස්, සහෝද-
රයන්ට බොහෝ දේවල් පැහැදිලි
කර ඔවුන්ව දිරිගන්වා ශක්තිමත්
කළෝය.[18] **33** ඔවුන් යම් කාලයක්
එහි ගත කළ පසු සහෝදරයෝ
ඒ පුරුෂයන්ව නැවත ඔවුන් පැමිණි
තැනට සතුටින් පිටත් කර යැව්-

ක්‍රියා **15:29*** ක්‍රියා 15:20හි පාදසටහන බලන්න.

15 පරි.
1 ක්‍රියා 15:1
2 ගලා 2:4
තීත 1:10
3 ක්‍රියා 1:14
4 2පේත 3:15
5 ක්‍රියා 13:50
1කොරි 15:30
2කොරි 11:23
පිලි 2:29
6 1තෙස 1:1
1පේත 5:12
7 ක්‍රියා 16:4
8 යොහ 16:13
ක්‍රියා 5:32
9 මතෙ 23:4
10 උත් 35:2
නික් 20:3
නික් 34:15
එස 20:30
1කොරි 8:1
1කොරි 10:14
11 උත් 9:4
ලෙවී 3:17
ලෙවී 7:26
ලෙවී 17:10
ද්වි 12:16
ද්වි 12:23
1සාමු 14:32
12 ලෙවී 17:13
13 උත් 39:9
1කොරි 6:9
එෆී 5:5
කොලො 3:5
1තෙස 4:3
1පේත 4:3
14 ක්‍රියා 21:25
15 ක්‍රියා 11:26
16 හිතෝ 15:30
17 ක්‍රියා 11:27
ක්‍රියා 13:1
18 ක්‍රියා 13:15
ක්‍රියා 18:23

2 තීරුව
1 1කොරි 16:11
2 ක්‍රියා 13:1
3 2කොරි 11:7
4 2කොරි 11:28
5 කොලො 4:10
2තිමෝ 4:11
6 ක්‍රියා 13:13
7 ක්‍රියා 4:36
ක්‍රියා 13:4
8 ක්‍රියා 11:20
9 ක්‍රියා 15:27
10 ක්‍රියා 14:26
එෆී 3:7
11 ක්‍රියා 16:5

16 පරි.
12 ක්‍රියා 14:6
2තිමෝ 3:11
13 ක්‍රියා 19:22
රෝම 16:21
1කොරි 4:17
1තෙස 3:2
1තිමෝ 1:2

වෝය.[1] **34** —— **35** නමුත් පාවුල්
සහ බානබස් අන්තියෝකියෙහි තව-
දුරටත් රැඳී සිටියෝය.[2] ඔවුහු එහි
උගන්වමින් සිටි අතර තවත් බො-
හෝදෙනෙකු සමඟ එකතු වී, යෙ-
හෝවා දෙවිගෙන් ලැබුණු ශුභාරංචිය
ප්‍රකාශ කළෝය.[3]

**36** දවස් කිහිපයකට පසු පාවුල්
බානබස්ට මෙසේ පැවසුවේය. "අපි
යෙහෝවා දෙවිගේ පණිවිඩය මීට
කලින් ප්‍රකාශ කළ සෑම නුවරකම
සිටින සහෝදරයන්ව හමු වී ඔවුන්
ගැන සොයා බලමු."[4] **37** බානබස්-
ගේ කැමැත්ත වූයේ මාක් යනුවෙන්
හැඳින්වූ යොහන්වද ඒ සඳහා රැගෙන
යැමටය.[5] **38** නමුත් පාවුල්ගේ අද-
හස වූයේ ඔහු ඒ සඳහා සුදුසු නොවන
බවය. එයට හේතුව ඔවුන් පම්පිලියේ
සිටියදී ඔහු ඔවුන් සමඟ කළ සේවය
අතරමඟදී නතර කර ඔවුන්ව අත්හැර
යැමය.[6] **39** මේ කාරණය සම්බන්-
ධයෙන් පාවුල් සහ බානබස් අතර
බහින් බස් වීමක් ඇති වූ නිසා ඔවුහු
එකිනෙකාගෙන් වෙන් වූහ. බාන-
බස්[7] මාක්ව රැගෙන සයිප්‍රසය බලා
නැවෙන් ගමන් කළේය.[8] **40** පාවුල්
තෝරාගත්තේ සීලස්වය.[9] යෙහෝවා
දෙවිගේ මහත් කරුණාව[10] පාවුල්ට
ලැබෙන ලෙස සහෝදරයන් යාච්ඤා
කළ පසු ඔහුද පිටත්ව ගියේය.
**41** ඔහු සිරියාව සහ සිලීසියාව පුරා
ගොස් එහි පිහිටා තිබූ සභාවන් ශක්-
තිමත් කළේය.[11]

**16** එතැන් සිට පාවුල් දර්බ-
යටත් ඉන්පසු ලිස්ත්‍රාවටත්
ගියේය.[12] එහි තිමෝති නම් ගෝ-
ලයෙක් සිටියේය.[13] යුදෙව් ස්ත්‍රියක්
වූ ඔහුගේ මව යේසුස්ගේ අනුගාමි-
කයෙක් වූ අතර ඔහුගේ පියා ග්‍රීක
ජාතිකයෙකි. **2** තිමෝති ලිස්ත්‍රා-
වෙහි සහ ඉකෝනියෙහි සහෝදර-
යන් අතර හොඳ නමක් දිනාගෙන
සිටි කෙනෙකි. **3** පාවුල් තමා යන
ගමන්වලට ඔහුව රැගෙන යැමට
කැමති බව කියා සිටියේය. ඒ පළාත්-
වල යුදෙව්වරුන් සිටි නිසා ඔහු

මුලින්ම කළේ ඔහුව චර්මච්ඡේදනය
කිරීමය.[1] එයට හේතු වූයේ අවට
සියලුදෙනා ඔහුගේ පියා ග්‍රීක ජාති-
කයෙකු බව දැන සිටීමය. **4** ඔවුහු
නුවරෙන් නුවරට ගොස් යෙරුසල-
මේ සිටි නියෝජිතයන්* හා වැඩිම-
හල්ලන් තීරණය කළ දේ ගැන
නුවරවල සිටි සහෝදරයන්ව දැනු-
වත් කළෝය.[2] **5** ප්‍රතිඵලයක් ලෙස
සභාවල සිටි සියලුදෙනාගේ විශ්වාසය
ශක්තිමත් වූ අතර[3] එහි සිටි අයගේ
ගණනද දිනෙන් දින වැඩි විය.

**6** ඉන්පසු ඔවුහු ෆ්‍රිජිය සහ ගලා-
තිය ප්‍රදේශය මැදින් ගියෝය.[4]
එයට හේතුව නම් ආසියා පළාතට
ගොස් ශුභාරංචිය ගැන කතා නොක-
රන ලෙස දෙවි තම බලය මාර්ග-
යෙන් ඔවුන්ට මඟ පෙන්වා තිබීමය.
**7** ඉන්පසු ඔවුන් මිසියාවට ගොස්
එතැන් සිට බිතිනියට යන්න උත්-
සාහ කළ විටද[5] යේසුස් දෙවිගේ
බලය මාර්ගයෙන් එතැනට නො-
යන ලෙස මඟ පෙන්වීය. **8** එමනිසා
ඔවුහු මිසියාව පසු කර ත්‍රෝවසට
ගියෝය.[6] **9** පාවුල්ට එදින රාත්‍රි-
යේදී දර්ශනයක් පෙනිණ.[7] ඔහු දුටුවේ
මැසිඩෝනියානු මිනිසෙකු, “මැසි-
ඩෝනියාවට ඇවිත් අපට උපකාර
කරන්න” කියා ඔහුගෙන් බැගෑපත්ව
ඉල්ලා සිටි ආකාරයයි. **10** ඔහු ඒ
දර්ශනය දුටු පසු අප තේරුම්ගත්තේ
මැසිඩෝනියාවට ගොස්[8] එහි ශුභාරං-
චිය ප්‍රකාශ කිරීමට දෙවි අපට මඟ
පෙන්වන බවයි. එහෙයින් මැසිඩෝනි-
යාව බලා යැමට අපි සැලසුම් කළෙමු.

**11** අපි ත්‍රෝවසේ සිට නැවෙන්
ගමන් කර කෙළින්ම සැමොත්‍රෙ-
සයට ගියෙමු. පසුවදා අප ගියේ
නෙයපොලිසයටය. **12** එතැනින්
අප ගමන් කළේ මැසිඩෝනියානු
ප්‍රදේශයේ ප්‍රධාන නුවරද[9] රෝම-
යේ යටත් විජිතයක්ද වූ ෆිලිප්පිය-
ටය.[10] අපි ඒ නුවරෙහි දින කිහිපයක්ම
නැවතී සිටියෙමු. **13** සබත් දවසේදී
අපි නුවරේ දොරටුවෙන් පිට ගලා
ගිය ගඟක් අසලට ගියෙමු. අප එතැ-
නට ගියේ යාච්ඤාව සඳහා වෙන් කළ
ස්ථානයක් එහි ඇති බව සිතූ නිසාය.
අපි එතැන ඉඳගෙන එහි පැමිණ සිටි
ස්ත්‍රීන්ට කතා කරන්න පටන්ගත්-
තෙමු. **14** සවන් දෙමින් සිටි අය
අතරේ තියතීරා නුවරින් පැමිණි[1]
ලිදියා නම් ස්ත්‍රියක් සිටියාය. ඇය
දම් පැහැති රෙදි අලෙවි කරන දෙ-
විට නමස්කාර කරන තැනැත්තියකි.
පාවුල් පවසමින් සිටි දේ පිළිගැනී-
මට යෙහෝවා දෙවි ඇගේ හදවත
තුළ මහත් පෙලඹීමක් ඇති කළේය.[2]
**15** ප්‍රතිඵලයක් ලෙස ඇයද ඇගේ
නිවසේ සිටි සියලුදෙනාද බව්තීස්ම
වූහ.[3] ඉන්පසු ඇය මෙසේ ඉල්ලා
සිටියාය. “මම යෙහෝවා දෙවිට විශ්-
වාසවන්ත කෙනෙක් කියා ඔබ සිත-
නවා නම් මගේ නිවසට ඇවිත් නතර
වෙන්න.”[4] ඇය අපට කොතරම් පෙ-
රැත්ත කළාද කිවහොත් අපට එම
ආරාධනාව ප්‍රතික්ෂේප කළ නොහැකි
විය.[5]

**16** දිනක් අප යාච්ඤා කරන ස්ථා-
නයට යද්දී තරුණ සේවිකාවක් අපට
හමු විය. ඇයට භූතයෙකු වැහී සිටි
නිසා[6] ඇයට පේන කීමේ හැකියා-
වක් තිබිණ.[7] එම හැකියාව නිසා
ඇගේ ස්වාමිවරු ඇය මාර්ගයෙන්
බොහෝ මිල මුදල් උපයාගත්තෝය.[8]
**17** එම තරුණිය පාවුල් හා අප පසුප-
සම එමින්, “මේ මිනිස්සු මහෝත්-
තම දෙවිගේ සේවකයෝයි. ඔවුන්
ඔබට ප්‍රකාශ කරන්නේ දෙවි ඔබට
ගැලවීම ලබා දෙන ආකාරය ගැනයි”
කියා කෑගැසුවාය.[9] **18** ඒ දේ දින
කිහිපයක් පුරාම සිදු විය. අන්තිමේදී
පාවුල්ට එය තවදුරටත් ඉවසිය නො-
හැකි වූ නිසා[10] ඔහු ඇය දෙසට හැරී
භූතයාට මෙසේ කීවේය. “යේසුස් ක්‍රිස්-
තුස්ගේ නාමයෙන් මම ඔබට අණ
කරන්නේ, මේ තරුණියගෙන් පිටතට
එන්න කියායි.”[11] ඒ මොහොතේදීම
එම භූතයා ඇගෙන් පිටතට ආවේය.[12]

**19** තමන් මිල මුදල් උපයාගත්

---

**ක්‍රියා 16:4*** හෝ, “යවනු ලැබූවන්.”

**16 පරි.**
1 1කොරි 9:20
2 ක්‍රියා 15:28
3 ක්‍රියා 15:41
4 ක්‍රියා 18:23, ගලා 4:13
5 1පේතෘ 1:1
6 2කොරි 2:12, 2තිමෝ 4:13
7 යෝබ් 33:15, ක්‍රියා 9:10, 2කොරි 12:1
8 2කොරි 1:16, 2කොරි 2:13
9 ක්‍රියා 20:6
10 පිලි 1:1, 1තෙස 2:2

**2 තීරුව**
1 එළි 1:11
2 ලූක් 24:45, 1කොරි 3:7
3 ක්‍රියා 16:33, ක්‍රියා 18:8
4 මතෙ 10:11, රෝම 12:13, ගලා 6:6, හෙබ්‍රෙ 13:2
5 උත් 19:2, විනි 19:20, ලූක් 24:29
6 1සාමු 28:7
7 ලෙවී 19:31, ලෙවී 20:6
8 ක්‍රියා 19:24
9 මාක් 1:24, ලූක් 4:41
10 මාක් 1:25
11 මාක් 1:34, ලූක් 9:1, ලූක් 10:17
12 මතෙ 17:18

මාර්ගය නැති වී ඇති බව තේ-
රුම්ගත් එම තරුණියගේ ස්වාමි-
වරු,[1] පාවුල් සහ සීලස්ව අල්ලාගෙන
වෙළඳපොළේ* සිටි පාලකයන් වෙ-
තට ඇදගෙන ගියෝය.[2] **20** ඔවුහු
සිවිල් ආණ්ඩුකාරයන් වෙතට ඔවුන්ව
ගෙන ගොස් මෙසේ කීවෝය. "මේ
මිනිස්සු අපේ නුවර තුළ මහ කලබල-
යක් ඇති කරනවා.[3] ඔවුන් යුදෙව්වන්.
**21** රෝම චාරිත්‍ර වාරිත්‍රවලට අනුව
අපට පිළිගන්නවත් කරන්නවත් තහ-
නම් දේවල් කරන්න කියා ඔවුන්
උගන්වනවා."[4] **22** එවිට රැස්ව සිටි
මුළු සමූහයාද ඔවුන්ට විරුද්ධව කතා
කරන්න පටන්ගත්තෝය. එහෙයින්
සිවිල් ආණ්ඩුකාරයෝ ඔවුන්ගේ පිට
වස්ත්‍ර ඉරා ඉවත් කර ඔවුන්ට කෝ-
ටුවලින් තළන්න අණ කළෝය.[5]
**23** ඔවුහු ඔවුන්ට බොහෝ සෙයින්
පහර දුන් පසු[6] ඔවුන්ව සිරභාර-
යට නියම කළෝය. ඔවුන්ව භාර
දෙන විට ඔවුන් සිරගෙයි භාරක-
රුට පැවසුවේ ඔවුන්ව හොඳින්
මුර කරන්න කියාය.[7] **24** භාරක-
රුට එවැනි නියෝගයක් ලැබුණු නිසා
ඔහු ඔවුන්ව රැගෙන ගියේ සිරගෙයි
අභ්‍යන්තරයේ තිබූ සිරකුටියකටය.[8]
එහිදී ඔහු ඔවුන්ගේ පාද දඬුකඳන්වල
ගැසුවේය.[9]

**25** මධ්‍යම රාත්‍රියේදී පමණ[10]
පාවුල් සහ සීලස් යාච්ඤා කරමින්ද
දෙවිට ප්‍රශංසා ගී ගයමින්ද සිටි-
යෝය.[11] ඔවුන්ගේ හඬ සිරකරුවන්ටද
ඇසිණ. **26** හදිසියෙන්ම මහත් භූමි-
කම්පාවක් ඇති විය. සිරගෙයි අත්-
තිවාරම් පවා දෙදරුම් කෑවේය. මේ
අතර සියලුම දොරවල් එකවරම
විවෘත වූ අතර සියලුදෙනාට දමා තිබූ
විලංගුද ගැලවී ගියේය.[12] **27** නින්-
දෙන් අවදි වූ සිරගෙයි භාරකරු, සිර-
ගෙයි සියලු දොරවල් විවෘත වී ඇති
බව දුටුවේය. සිරකරුවන් පැන ගොස්
ඇති බව සිතූ ඔහු,[13] තම කඩුව
අතට ගෙන සිය දිවි හානි කර-
ගැනීමට සූදානම් විය.[1] **28** නමුත්
පාවුල්, "ඔය කරන්න යන දේ නවත්-
වන්න.[2] අපි සියලුදෙනාම මෙහි සිටි-
නවා" කියා මහත් හඬකින් කීවේය.
**29** එවිට ඔහු පහනක් ඉල්ලාගෙන
විගස ඇතුළට දිව ගොස් පාවුල් සහ
සීලස් ඉදිරියෙහි වෙවුලමින් දණින්
වැටුණේය.[3] **30** ඔහු ඔවුන්ව සිරගෙ-
යින් පිටතට ගෙන ගොස්, "මහත්ව-
රුනි, ගැලවීම ලබාගන්න නම් මම
මොනවාද කරන්න ඕනේ"[4] කියා
ඇසුවේය. **31** ඔවුහු මෙසේ පිළිතුරු
දුන්නෝය. "ස්වාමීන් වන යේසුස්ව
විශ්වාස කරන්න.[5] එවිට ඔබටත්
ඔබේ නිවසේ සිටින සියලුදෙනා-
ටත් ගැලවීම ලැබෙයි."[6] **32** ඉන්-
පසු ඔවුහු ඔහුටත් ඔහුගේ නිවසෙහි
සිටි සියලුදෙනාටත් යෙහෝවා දෙ-
විගේ පණිවිඩය ගැන කියා දුන්-
නෝය.[7] **33** ඔහු වහාම ඒ රාත්‍රියේම
ඔවුන්ව ගෙන ගොස් ඔවුන්ගේ තුවාල
වතුරෙන් සෝදා පිරිසිදු කළේය.
පසුව කල් නොදමා ඔහුද ඔහුගේ
පවුලේ සියලුදෙනාද බව්තීස්ම වූහ.[8]
**34** ඔහු ඔවුන්ව තම නිවසට ගෙන
ගොස් ඔවුන් වෙනුවෙන් කෑමක් පිළි-
යෙල කළේය. දෙවි ගැන විශ්වාසයක්
ඇති වූ නිසා ඔහුත් ඔහුගේ පවු-
ලේ සියලුදෙනාත් බොහෝ සෙයින්
සතුටු වූහ.

**35** පසුවදා උදෑසන සිවිල් ආණ්-
ඩුකාරයෝ,[9] "ඒ මිනිසුන්ව නිදහස්
කරන්න" කියා ආරක්ෂක නිලධාරීන්
අත පණිවිඩයක් යැවූහ. **36** එවිට
සිරගෙයි භාරකරු ඒ පණිවිඩය
පාවුල්ට දන්වමින් මෙසේ කීවේය.
"ඔබ දෙදෙනාව නිදහස් කර හරින්න
කියා සිවිල් ආණ්ඩුකාරයන් මිනි-
සුන්ව එවා තිබෙනවා. ඉතින් පිට-
තට ඇවිත් සමාදානයෙන් යන්න."
**37** එවිට ඒ ආරක්ෂක නිලධාරීන්ට
පාවුල් මෙසේ කීවේය. "ඔවුන්, රෝම-
යේ පුරවැසියන් වන අපිව[10] වරදකරු-
වන් බව ඔප්පු කරන්නේවත් නැතුව
සියලුදෙනා ඉදිරියේ තළා, සිරභාරයට

---

**ක්‍රියා 16:19*** මෙය මහජනයා එක් රැස් වූ ස්ථානයකි.

**16 පරි.**
1 ක්‍රියා 19:25
2 මතෙ 10:18; 2කොරි 6:5
3 1රාජා 18:17; ක්‍රියා 17:6
4 එස්ත 3:8
5 1තෙස 2:2
6 2කොරි 11:23
7 ලූක් 21:12; ක්‍රියා 5:23
8 ක්‍රියා 12:6; ක්‍රියා 12:10
9 ගීතා 105:18; යෙරෙ 20:2
10 ගීතා 42:8
11 එෆී 5:19; කොලො 3:16; යාකො 5:13
12 ක්‍රියා 4:31; ක්‍රියා 5:19; ක්‍රියා 12:7
13 1රාජා 20:39

**2 තීරුව**
1 ක්‍රියා 12:19
2 1තෙස 5:15
3 ක්‍රියා 10:25
4 ක්‍රියා 2:37
5 යොහ 3:16; යොහ 6:47
6 ක්‍රියා 11:14
7 ක්‍රියා 10:24
8 ක්‍රියා 8:12; ක්‍රියා 16:15
9 ක්‍රියා 16:20
10 ක්‍රියා 22:25; ක්‍රියා 23:27

නියම කළා. දැන් ඔවුන් හදන්-
නේ රහසින් අපව පිටත් කර හරින්-
නද? එහෙම කරන්න බැහැ. ඔවුන්ටම
ඇවිත් අපිව නිදහස් කරන්න කියා
කියන්න.” **38** එවිට ආරක්ෂක නිල-
ධාරීහු සිවිල් ආණ්ඩුකාරයන්ට එය
දැන්වූහ. එම මිනිසුන් රෝමයේ පුර-
වැසියන් බව ඔවුන් දැනගත් විට
ඔවුන් තුළ මහත් බියක් ඇති විය.[1]
**39** එහෙයින් ඔවුහු ඇවිත් ඔවුන්ගෙන්
සමාව ඉල්ලා ඔවුන්ව පිටතට ගෙ-
නාවෝය. නමුත් ඔවුහු තම නුවරින්
පිටත් වී යන මෙන් ඔවුන්ගෙන් ඉල්ලා
සිටියෝය. **40** සිරගෙයින් පිටතට
ආ පසු ඔවුන් ගියේ ලිදියාගේ නිවස-
ටය. එහිදී ඔවුහු සහෝදරයන්ව හමු වී
ඔවුන්ව දිරිගන්වා[2] නුවරින් පිටත් වී
ගියෝය.

**17** ඔවුහු අම්ෆිපොලිස් සහ
අපොලෝනිය යන නුවරවල්
හරහා ගමන් කර තෙසලෝනිකයට
ගියෝය.[3] එහි යුදෙව්වරුන්ගේ සින-
ගෝගයක් තිබිණ. **2** පාවුල් වෙ-
නදා මෙන්[4] සිනගෝගයට ඇතුල්
වී සබත් දවස් තුනක් පුරා
ඔවුන්ට ශුද්ධ ලියවිල්ල පදනම් කර-
ගෙන කාරණා තර්කානුකූලව පහදා
දුන්නේය.[5] **3** ක්‍රිස්තුස් වධ විඳිය
යුතු බව[6] සහ මරණයෙන් නැඟිටිය
යුතු බව[7] කලින්ම ශුද්ධ ලියවිල්ලේ
දක්වා තිබෙන ආකාරය ඔහු පැහැදි-
ලිව පෙන්නුවේය. ඔහු පැවසුවේ, “මම
ඔබට කතා කරන්නේ මෙහි සඳහන්
ක්‍රිස්තුස් ගැනයි.[8] ඔහු තමයි යේසුස්”
කියාය. **4** එය අසා සමහරදෙනෙක්
යේසුස්ගේ අනුගාමිකයන් වී[9] පාවුල්
සහ සීලස්ට එකතු වූහ.[10] එමෙන්ම
දෙවිට නමස්කාර කළ ග්‍රීකවරුන්
විශාල පිරිසක්ද සමාජයේ ඉහළ පෙ-
ළේ ස්ත්‍රීන් බොහෝදෙනෙක්ද එසේ
කළෝය.

**5** නමුත් යුදෙව්වරු ඔවුන්ට
ඊර්ෂ්‍යා කර[11] වෙළඳපොළට වී නික-
රුණේ කාලය ගත කරමින් සිටි අය
අතරින් මැර පිරිසක් එකතු කර-
ගෙන නගරයේ කෝලහලයක් ඇති
කළෝය.[1] ඉන්පසු ඔවුහු රැස්ව සිටි
සමූහයා ඉදිරියට පාවුල්ව සහ සීලස්ව
ගෙන ඒමේ අදහසින් ජේසන් නම්
සහෝදරයාගේ නිවසට කඩාවැදු-
ණෝය.[2] **6** ඔවුන්ව එහි සොයාගත
නොහැකි වූ විට ඔවුහු ජේසන්ව සහ
සමහර සහෝදරයන්ව නුවරේ පාලක-
යන් ඉදිරියට ඇදගෙන ගොස් කෑගස-
මින් මෙසේ කීවෝය. “මුළු ලෝකයම
පෙරළා දැමූ අර මිනිස්සු මෙහාටත්
ඇවිල්ලා.[3] **7** ඒ මදිවට මේ ජේසන්
ඔවුන්ට සහයෝගය දක්වනවා. ඔවුන්
සියලුදෙනාම කියන්නේ යේසුස් නම්
තවත් රජෙක් සිටිනවා කියායි.[4] ඒ
කියන්නේ ඔවුන් සීසර් අධිරාජ්‍යයාගේ
නියෝගවලට විරුද්ධව කැරලිගස-
නවා.”[5] **8** ඒ දේවල් නුවරේ වැසි-
යන්ට හා පාලකයන්ට ඇසුණු විට
ඔවුන් තුළ මහත් කැලඹීමක් ඇති
විය. **9** නමුත් ඔවුහු පසුව ජේසන්ව
සහ අනික් අයව ඇප මත නිදහස්
කළෝය.

**10** කළුවර වැටුණු විගස[6] සහෝද-
රයෝ පාවුල්ව සහ සීලස්ව බෙරීය
නුවරට යැව්වෝය. ඔවුහු එම නුව-
රට ගිය විට එහි තිබූ යුදෙව්වරුන්-
ගේ සිනගෝගයට ගියෝය. **11** එහි
සිටි අය තෙසලෝනිකයේ සිටි අයට
වඩා සාධාරණව හා පුළුල්ව සිතී-
මට හැකියාව තිබුණු පිරිසකි. මන්ද
ඔවුහු තමන් ඇසූ දේවල් සැබෑද
කියා බැලීමට[7] දිනපතාම ශුද්ධ ලිය-
විල්ල[8] හොඳින් පරීක්ෂා කර බැලු-
වෝය.[9] එහෙයින් ඔවුන් දෙවිගේ
පණිවිඩය පිළිගත්තේ මහත් උනන්දු-
වකිනි. **12** ප්‍රතිඵලයක් ලෙස සමා-
ජයේ ඉහළ පෙළේ සිටි[10] ග්‍රීක ජාතික
ස්ත්‍රීන් හා පුරුෂයන් ඇතුළු බො-
හෝදෙනෙක් යේසුස්ගේ අනුගාමික-
යෝ බවට පත් වූහ. **13** නමුත්
පාවුල් බෙරීය නුවරෙහි දෙවිගේ පණි-
විඩය ගැන ප්‍රකාශ කරන බව තෙ-
සලෝනිකයේ සිටි යුදෙව්වරුන්ට
ආරංචි වූ විට ඔවුහු ජනතාව
උසිගන්වා[11] කලබලයක් ඇති කිරී-
මේ අදහසින්[12] එතැනටත් ගියෝය.

**16 පරි.**
**1** ක්‍රියා 22:29
**2** ලූක් 22:32 2කොරි 1:4

**17 පරි.**
**3** 1තෙස 2:1
**4** ක්‍රියා 9:20 ක්‍රියා 13:14 ක්‍රියා 14:1 ක්‍රියා 18:4
**5** ක්‍රියා 18:19
**6** ගීතා 22:7 ගීතා 22:16 ගීතා 34:20 ගීතා 69:21 ගීතා 118:22 යෙසා 50:6 යෙසා 53:3 යෙසා 53:5
**7** ගීතා 16:10 ලූක් 24:46
**8** ක්‍රියා 18:28 ගලා 3:1
**9** ක්‍රියා 28:24
**10** ක්‍රියා 15:22 ක්‍රියා 15:40
**11** ක්‍රියා 13:45

**2 තීරුව**
**1** ක්‍රියා 16:20
**2** රෝම 16:21
**3** 1රාජා 18:17 ක්‍රියා 16:20
**4** ලූක් 23:2 යොහ 19:12
**5** එස්රා 4:12
**6** ක්‍රියා 9:25
**7** හිතෝ 14:15
**8** යොහ 5:39
**9** ලූක් 16:29
**10** ක්‍රියා 13:50
**11** ක්‍රියා 14:19 1තෙස 2:15
**12** ක්‍රියා 14:2

**14** එවිට සහෝදරයෝ වහාම පාවුල්ව
වෙරළබඩ තීරය දෙසට පිටත්
කර යැව්වෝය.[1] නමුත් සීලස් සහ
තිමෝති එහි නැවතී සිටියෝය.
**15** පාවුල්ව ඇරලීමට ගිය අය
ඇතන්ස් දක්වාම ඔහු සමඟ ගියෝය.
ඔවුන් ආපසු ඒමට පෙර පාවුල් ඔවුන්-
ගෙන් ඉල්ලා සිටියේ හැකි ඉක්මනින්
තමා වෙතට සීලස්ව හා තිමෝතිව[2]
එවන ලෙසය. ඉන්පසු ඔවුහු නැවත
ආවෝය.

**16** පාවුල් ඔවුන් පැමිණෙන තෙක්
ඇතන්ස් නුවරේ බලා සිටියදී ඒ නුවර
දේවතා රූපවලින් පිරී ඇති ආකාරය
දැක ඔහු තුළ මහත් පිළිකුලක් ඇති
විය.[3] **17** එවිට ඔහු සිනගෝගයේදී
යුදෙව්වරුන්ට සහ දෙවිට නමස්කාර
කළ වෙනත් අයටද දිනපතාම වෙ-
ළඳපොළෙහි ගැවසුණු අයටද[4] ශුද්ධ
ලියවිල්ලේ තොරතුරු තර්කානුකූ-
ලව පහදා දුන්නේය.[5] **18** නමුත්
දාර්ශනිකයන් කිහිපදෙනෙක් එනම්,
එපිකියුරිය සහ ස්ටොයික දර්ශන
අනුගමනය කළ කිහිපදෙනෙක්[6] ඔහු
සමඟ වාද කළෝය. “මේ මිනිසා
මොනව දොඩවනවාද”[7] කියා සමහරු
ඇසූහ. තවත් සමහරු මෙසේ පැවසු-
වෝය. “පෙනෙන විදිහට ඔහු වෙ-
නත් දෙවිවරුන් ගැන කතා කරනවා
වගෙයි.” ඔවුන් ඒ දේවල් පැවසුවේ ඔහු
යේසුස් ගැන සහ නැවත නැඟිටීම
පිළිබඳ ශුභාරංචිය ගැන ප්‍රකාශ කර-
මින් සිටි නිසාය.[8] **19** ඔවුහු ඔහුව
ඇරියොපගස් කන්දට* ගෙන ගොස්
මෙසේ කීවෝය. “සියලුදෙනාට ඔබ
කියා දෙන මේ අලුත් ඉගැන්වීම ගැන
අපට තවත් විස්තර දැනගන්න පුළු-
වන්ද?[9] **20** ඇත්තෙන්ම ඔබ කියා
දෙන සමහර දේවල් හරිම අමු-
තුයි. ඒ නිසා ඒ දේවල් ගැන වැඩි
විස්තර දැනගන්න අප කැමතියි.”[10]
**21** ඇතන්ස්හි වැසියන් හා එහි තාව-
කාලිකව නැවතී සිටි විදේශිකයන්
පුරුදු වී සිටියේ තමන්ට ලැබෙන
විවේක කාලයේදී නිතරම යම්
අලුත් දෙයක් ගැන කතාබහ කිරීමට
හෝ එවැනි දෙයකට සවන් දීමටය.
**22** ඇරියොපගස් කන්දෙහි මැද සිට-
ගත්[1] පාවුල්, ඔවුන්ට මෙසේ කීවේය.

“ඇතන්ස්හි පුරුෂයෙනි, දෙවි දේව-
තාවන් ගැන අන් අයට වඩා ඔබ තුළ
මහත් භක්තියක් ඇති බව මට පැහැ-
දිලියි.[2] එය ඔබ කරන හැම ක්‍රියාව-
කින්ම මම දුටුවා. **23** ඔබ මහත්
භක්තියෙන් සලකන දේවල් දිහා
හොඳින් බලමින් යද්දී මම එක පූජාස-
නයක් දැක්කා. එහි සඳහන් කර තිබු-
ණේ, ‘නාඳුනන දෙවි කෙනෙකුටය’
කියායි. මම දැන් ඔබට කියා දෙන්නේ
ඔබ මෙතෙක් නොදැන සිටියත් මහත්
භක්තියකින් සැලකූ ඒ දෙවි ගැනයි.
**24** ලෝකයත් එහි තිබෙන සියල්ලත්
සෑදූ ඒ දෙවි, ස්වර්ගයෙත් පොළො-
වෙත් ස්වාමීන් වන නිසා[3] ඔහු මිනි-
සුන් සාදා ඇති දේවස්ථානවල වාසය
කරන්නේ නැහැ.[4] **25** ඔහු සියලු
දෙයින් සම්පූර්ණ දෙවි කෙනෙක්. ඒ
නිසා ඔහුට මිනිසුන්ගේ ඇප උපස්-
ථාන අවශ්‍ය නැහැ.[5] මන්ද සියලුදෙ-
නාටම ජීවිතයත්[6] හුස්මත් අන් සියලු
දේත් දෙන්නේ ඔහුයි.[7] **26** ඔහු එක
මිනිසෙකුගෙන්[8] සියලුම ජාතීන් බිහි
කළා.[9] ඒ වගේම ඔවුන්ගෙන් මුළු පො-
ළෝතලයම ජනාවාස කළා.[10] මිනි-
සුන් වාසය කළ යුතු දේශ සීමා
ගැනත්[11] ඔවුන් එසේ වාසය කළ යුත්-
තේ කුමන කාල වකවානුවලද යන්න
ගැනත් තීරණය කරන්නේ ඔහුයි.[12]
**27** දෙවි එසේ කරන්නේ සියල්ලන්ම
දෙවි වෙතට හැරී ඔහුගේ මඟ පෙන්-
වීම් පැතීම සඳහායි.[13] ඇත්තෙන්ම
ඔවුන් ඒ සඳහා මහත් උත්සාහ-
යක් දැරුවොත් ඔහුට ළං වෙන්නත්
ඔවුන්ට හැකි වෙයි.[14] එයට හේතුව
ඔහු අපෙන් දුරස්ව සිටින කෙනෙක්
නොවන නිසයි. **28** අපේ ජීවිත-
යත් පැවැත්මත් අප කරන සෑම
දෙයක්මත් රඳා පවතින්නේ ඔහු
මතයි.[15] ඇත්තෙන්ම ඔබේ ඇතැම්

---

**ක්‍රියා 17:19*** මෙය පුරාණ ඇතන්ස් නුවරේ පිහිටි කුඩා කන්දකි. ශ්‍රේෂ්ඨාධිකරණය රැස් වූයේ එහි එක් ස්ථානයකය.

**17 පරි.**
**1** මතෙ 10:23
**2** ක්‍රියා 16:1; 1තෙස 3:2
**3** 2පේතෘ 2:8
**4** හිතෝ 1:20
**5** ක්‍රියා 13:5; ක්‍රියා 18:19
**6** 1කොරි 1:22; කොලො 2:8
**7** 1කොරි 4:13
**8** යොහ 5:29; යොහ 11:25; 1කොරි 15:12; එළි 20:6
**9** මාක් 1:27
**10** ක්‍රියා 2:12

**2 තීරුව**
**1** ක්‍රියා 17:34
**2** ක්‍රියා 17:16
**3** ගීතා 146:6; යෙසා 42:5; ක්‍රියා 4:24; ක්‍රියා 14:15
**4** 1රාජා 8:27; යෙසා 66:1; ක්‍රියා 7:48
**5** ගීතා 50:12
**6** උත් 2:7
**7** යෙසා 42:5
**8** උත් 5:2
**9** උත් 1:28
**10** ද්වි 32:8
**11** ද්වි 2:5; ද්වි 2:19; ද්වි 32:8; යෙසා 34:17
**12** ගීතා 74:17
**13** ද්වි 4:29; යෙසා 55:6
**14** ගීතා 145:18; යෙරෙ 23:23; රෝම 1:20
**15** යෙසා 42:5

කවිකාරයන්[1] ඒ ගැන පවසා තිබෙන්-
නේ “අපි ඔහුගේ දරුවෝ” වන බවයි.’
**29** “අප දෙවිගේ දරුවන් නම්[2]
රන්, රිදී හෝ ගල් යොදා මිනිසුන්
විසින් සාදා ඇති රූපයකට[3] දෙවිව
සමාන කිරීම සුදුසු දෙයක් වන්නේ
නැහැ.[4] **30** මිනිසා මෙතෙක් නො-
ඇනුවත්කමින් කළ දේ අමතක කර
දමන්න දෙවි කැමතියි.[5] ඒ නිසා දැන්
ඔහු මුළු මිනිස් වර්ගයාටම කියන්නේ,
පසුතැවිලි වන්න කියායි.[6] **31** එයට
හේතුව ධර්මිෂ්ඨ ලෙස මුළු මිනිස් වර්-
ගයාම විනිශ්චය කිරීමට ඔහු එක්තරා
දවසක් නියම කර තිබීමයි.[7] ඒ විනිශ්-
චය සිදු කරන්නේ ඔහු විසින්ම පත්
කර ඇති මිනිසෙකු විසිනුයි. ඒ වගේම
ඒ දේ අනිවාර්යයෙන් සිදු වන බවට
සාක්ෂියක් ලෙස දෙවි ඒ මිනිසාව මර-
ණයෙන් පවා නැවත නැඟිටුවා තිබෙ-
නවා.”[8]

**32** මිය ගිය අයගේ නැවත නැඟි-
ටීම ගැන පාවුල් කතා කරනවා
ඔවුන්ට ඇසුණු විට සමහරු ඔහුට
සමච්චල් කළෝය.[9] නමුත් තවත්
සමහරු, “ඔබ පැවසූ මේ දේවල් ගැන
තවත් විස්තර වෙනත් වේලාවක
අහන්න අපි කැමතියි” කියා පැවසු-
වෝය. **33** පසුව පාවුල් එම ස්ථාන-
යෙන් පිටත්ව ගියේය. **34** සමහරු
ඔහු සමඟ එකතු වී, යේසුස්-
ගේ අනුගාමිකයෝ බවට පත් වූහ.
ඔවුන් අතරේ ඇරියොපගස් අධිකරණ-
යේ විනිශ්චයකාරයෙකු වූ දියොනිසි-
යස්ද[10] දමරිස් නම් ස්ත්‍රියක්ද තවත්
කිහිපදෙනෙක්ද සිටියෝය.

**18** ඒ සිද්ධීන්වලට පසු
ඔහු ඇතන්ස්වලින් පිටත්
වී, කොරින්තියට ගියේය. **2** එහිදී
පොන්තස් නම් නුවරෙහි උපන්
අකිලා[11] නම් යුදෙව්වෙකුව සහ ඔහු-
ගේ භාර්යාව වූ ප්‍රිසිලාව ඔහුට
හමු විය. ඔවුන් ඉතාලියේ සිට එහි
පැමිණ[12] වැඩි දවසක් ගත වී තිබු-
ණේ නැත. ඔවුන් ඉතාලියෙන් පිටත්ව
ආවේ ක්ලෞදියස් අධිරාජයා[13] සියලු
යුදෙව්වරුන්ට රෝමයෙන් පිට වීමට
අණ කර තිබූ නිසාය. පාවුල් ඔවුන්ව
හමු වූ විට, **3** ඔවුන් තමා මෙන්
රැකියාව ලෙස කරන්නේ කූඩාරම්
සෑදීම බව දැනගත්තේය. ඒ නිසා
ඔහු ඔවුන්ගේ නිවසේ නැවතී සිටි-
යේය. ඔවුහු කූඩාරම් සෑදීමේ කාර්-
යයේ එකට නිරත වූහ.[1] **4** පාවුල්
සෑම සබත් දවසකදීම එහි සින-
ගෝගයට ගොස්[2] රැස්ව සිටි අයව
අමතා යුදෙව්වරුන්ටද ග්‍රීකවරුන්ටද
කාරණා නිවැරදිව අවබෝධ කරගෙන
විශ්වාසයක් ඇති කරගැනීමට උප-
කාර කළේය.

**5** සීලස්[3] සහ තිමෝති[4] මැසිඩෝ-
නියාවෙන් පැමිණි විට පාවුල් ඔවුන්
සමඟ එක්ව වෙහෙස මහන්සි නො-
බලා ඉතා උද්‍යෝගයෙන් දෙවිගේ
පණිවිඩය ගැන කතා කරන්න පටන්-
ගත්තේය. ඔහු යුදෙව්වන්ට පැහැ-
දිලි සාක්ෂි සපයමින් ඔප්පු කළේ
යේසුස් ඇත්තෙන්ම ක්‍රිස්තුස් බවය.[5]
**6** නමුත් ඒ මිනිසුන් දිගින් දිග-
ටම ඔහුට විරුද්ධව කතා කරමින්
ඔහුට නින්දා කළ නිසා[6] ඔහු තම
වස්ත්‍ර ගසා දමා,[7] “ඔබ සම්බන්ධ-
යෙන් මම නිදොස්.[8] ඔබේ ලේවලට[9]
වග කියන්න සිදු වන්නේ ඔබට-
මයි! මෙතැන් පටන් මම යන්නේ
වෙනත් ජාතීන්ට අයත් මිනිසුන්
වෙතටයි”[10] කියා ඔවුන්ට කීවේය.
**7** ඔහු එතැනින් පිටත් වී සිනගෝග-
යට යාබදව පිහිටි තිතියස් ජස්ටස්-
ගේ නිවසට ගියේය. එම පුද්ගලයා
දෙවිට නමස්කාර කරන කෙනෙකි.
**8** මේ අතරතුර සිනගෝගය භාරව
සිටි නිලධාරියා වූ ක්‍රිස්පස්ද[11] ඔහුගේ
නිවසේ සිටි සියලුදෙනාද ස්වාමීන්ව
පිළිගෙන ඔහුගේ අනුගාමිකයෝ වූහ.
ශුභාරංචියට සවන් දුන් කොරින්තියේ
වැසියන් බොහෝදෙනෙකු තුළද විශ්-
වාසයක් ඇති වී ඔවුහු බව්තීස්ම වූහ.
**9** මේ අතරේ එක් රාත්‍රියක පාවුල්
දර්ශනයක් දුටු අතර එහිදී ස්වාමීන්
ඔහුට මෙසේ පැවසුවේය.[12] “කිසි දෙ-
යකට භය වෙන්න එපා. නිර්භීතව
දිගටම කතා කරන්න. ඔබේ උත්සා-

**17 පරි.**
1 තීත 1:12
2 උත් 1:27
3 ද්වි 5:8
යෙසා 37:19
යෙසා 40:18
යෙසා 46:5
ක්‍රියා 19:26
4 යොෂු 22:22
ගීතා 50:1
යෙසා 46:9
5 ක්‍රියා 14:16
රෝම 3:25
රෝම 5:13
එෆී 4:18
6 ලූක් 24:47
7 ගීතා 96:13
ගීතා 98:9
යෙසා 2:4
යොහ 5:22
ක්‍රියා 10:42
8 යොහ 11:25
ක්‍රියා 2:24
ක්‍රියා 13:33
රෝම 6:5
9 1කොරි 1:23
10 ක්‍රියා 17:19

**18 පරි.**
11 ක්‍රියා 18:26
1කොරි 16:19
2තිමෝ 4:19
12 හෙබ්‍රෙ 13:24
13 ක්‍රියා 11:28

**2 තීරුව**
1 ක්‍රියා 20:34
1කොරි 4:12
1කොරි 9:15
1තෙස 2:9
2තෙස 3:10
2 මතෙ 4:23
ක්‍රියා 13:14
ක්‍රියා 17:2
3 ක්‍රියා 15:27
ක්‍රියා 17:14
4 ක්‍රියා 16:1
1තෙස 3:6
5 ක්‍රියා 17:3
ක්‍රියා 28:23
6 1පේතෘ 4:4
7 මතෙ 10:14
ක්‍රියා 13:51
8 එස 3:18
ක්‍රියා 20:26
9 1රාජා 2:37
එස 18:13
එස 33:4
10 ක්‍රියා 13:46
ක්‍රියා 28:28
රෝම 1:16
11 1කොරි 1:14
12 ලූක් 22:43
ක්‍රියා 23:11

හය අත්හරින්න එපා. **10** මම ඔබ
සමඟ සිටින බව නිතරම මතක තබා-
ගන්න.[1] ඔබට පහර කන්න සිදු වුණත්
එයින් ඔබේ ජීවිතයට අනතුරක් වෙන්-
නේ නැහැ. මන්ද මේ නුවරේ මට
එකතු වෙන තවත් බොහෝදෙනෙක්
සිටිනවා.” **11** එහෙයින් ඔහු ඔවුන්
අතරේ දෙවිගේ පණිවිඩය උගන්වමින්
එහි අවුරුද්දකුත් මාස හයක් ගත
කළේය.

**12** ගලියෝ, ඇකේයා පළාතේ
ආණ්ඩුකාරයාව[2] සිටියදී යුදෙව්-
වරු එකා මෙන් පාවුල්ට විරුද්-
ධව එකතු වී ඔහුව අල්ලාගෙන
විනිශ්චයාසනය ඉදිරියට ගෙනැවිත්,[3]
**13** මෙසේ කීවෝය. “මේ මිනිසා රජ-
යේ නීතියට විරුද්ධ වන ආකාරයකින්
දෙවිට නමස්කාර කරන්න කියා මිනි-
සුන්ව පොලඹවනවා.”[4] **14** පාවුල්
යමක් කියන්න සූදානම් වූ විට
ගලියෝ යුදෙව්වරුන්ට මෙසේ පැව-
සුවේය. “යුදෙව්වරුනි, මේ මිනිසා
මොනවා හරි අපරාධයක් හෝ වැරදි
දෙයක් හෝ කර තිබෙනවා නම්
මම ඔබ කියන දේට ඉවසිලිවන්-
තව සවන් දෙන්නම්. **15** නමුත් මේ
ප්‍රශ්නය, ඇතැම් වචන ගැන හෝ
ඇතැම් නාමයන් ගැන හෝ[5] ඔබේ
නීතිය ගැන හෝ[6] නම් ඒ දේවල්
විසඳාගැනීම ඔබේම වගකීමක්. ඊට
මැදිහත් වෙන්න මම කැමති නැහැ.”
**16** එසේ කියා විනිශ්චයාසනය ඉදිරි-
යේ සිටි ඔවුන්ව ඔහු වහාම විසුරුවා-
හැරියේය. **17** එවිට ඒ සියලුදෙනාම
එකතු වී සිනගෝගය භාරව සිටි
නිලධාරියා වූ සොස්තනේස්ව අල්ලා[7]
විනිශ්චයාසනය ඉදිරිපිටදීම ඔහුට
තැළුවෝය. නමුත් ගලියෝ ඒ දේ දැක
නිහඬව සිටියේය.

**18** පාවුල් දවස් ගණනාවක්ම තව-
දුරටත් එහි නැවතී සිටි පසු සහෝ-
දරයන්ගෙන් සමුගෙන, ප්‍රිසිලා සහ
අකිලා සමඟ එක්ව සිරියාව බලා
ගමන් කිරීමේ අදහසින් නැව් නැග්-
ගේය. ඔවුන් සෙන්ක්‍රෙයාය නුවරට[8]
පැමිණි විට පාවුල් තම හිසකෙස්
කොටට කපාගත්තේය.[1] ඔහු එසේ
කළේ ඔහු දෙවිට භාරයක් වී සිටි
නිසාය. **19** ඔවුන් එතැනින් පිටත් වී
එෆීසයට ගිය පසු පාවුල් ඔවුන් දෙ-
දෙනාව එහි නතර කර තනිව සින-
ගෝගයට ඇතුල් වී[2] යුදෙව්වරුන්ට
ශුද්ධ ලියවිල්ලේ තොරතුරු තර්කා-
නුකූලව පහදා දුන්නේය. **20** තවත්
කාලයක් නැවතී සිටින්න කියා ඔවුන්
ඔහුගෙන් ඉල්ලා සිටියත් ඔහු ඊට
එකඟ නොවී, **21** ඔවුන්ගෙන් සමු-
ගෙන[3] මෙසේ පැවසුවේය. “යෙහෝවා
දෙවි කැමති නම්[4] මට පුළුවන් වෙයි
ඔබව නැවත හමු වෙන්න.” ඉන්පසු
ඔහු එෆීසයේ සිට මුහුදින් ගමන් කර,
**22** සිසේරියට ගියේය. එතැනින් යෙ-
රුසලමට ගොස් එහි සභාවේ අයව
හමු වූ ඔහු, පසුව අන්තියෝකිය බලා
ගියේය.

**23** ඔහු එහි යම් කාලයක් ගත
කළ පසු එතැනින්ද පිටත් වී ගලාති
ප්‍රදේශය[5] හරහාද ෆ්‍රිජිය[6] නම් පළාත
හරහාද ගොස් තැනින් තැන සිටි
ගෝලයන් සියලුදෙනාව ශක්තිමත්
කළේය.[7]

**24** මේ අතර ඇලෙක්සැන්ඩ්‍රියා-
වේ උපන් අපොලොස් නම් යුදෙව්-
වෙක්[8] එෆීසයට පැමිණියේය. දක්ෂ
ලෙස කතා කිරීමේ හැකියාව තිබූ
ඔහුට ශුද්ධ ලියවිල්ල ගැන මනා දැනු-
මක්ද තිබිණ.[9] **25** ඒ වන විට යෙ-
හෝවා දෙවිගේ මාර්ගය ගැනත් ඔහුට
කියා දී තිබිණ. දෙවිගේ බලය ඔහු
තුළ ප්‍රබලව ක්‍රියාත්මක වූ නිසා[10]
ඔහු ඉතා උද්‍යෝගයෙන් කටයුතු කළ
අතර යේසුස් ගැන ඉතා නිවැරදිව
කතා කරමින් හා උගන්වමින් සිටි-
යේය. නමුත් ඔහු අවබෝධ කරගෙන
සිටියේ යොහන් සිදු කළ බව්තීස්මය[11]
ගැන පමණි. **26** ඔහු සිනගෝගයේදී
නිර්භීතව කතා කළේය. ප්‍රිසිලා සහ
අකිලා[12] ඔහුට සවන් දී තම නිව-
සට ආරාධනා කර ඔහුට දෙවිගේ
මාර්ගය ගැන වඩාත් නිවැරදි අවබෝ-
ධයක් ලබා දුන්නෝය. **27** අපො-
ලොස් ඇකේයාව ප්‍රදේශයට යන්න

**18 පරි.**
1 යෙරෙ 1:19; මතෙ 28:20
2 ක්‍රියා 13:7; ක්‍රියා 19:38
3 ක්‍රියා 16:19
4 ක්‍රියා 24:5
5 1තිමෝ 6:4
6 ක්‍රියා 23:29; ක්‍රියා 25:19
7 1කොරි 1:1
8 රෝම 16:1

**2 තීරුව**
1 ගණන් 6:18; ක්‍රියා 21:23
2 ක්‍රියා 13:14; ක්‍රියා 17:2
3 ක්‍රියා 21:6
4 රෝම 1:10; 1කොරි 4:19; යාකො 4:15
5 ගලා 1:2
6 ක්‍රියා 16:6
7 ක්‍රියා 14:22; ක්‍රියා 15:32
8 ක්‍රියා 19:1; 1කොරි 1:12; 1කොරි 3:6
9 1කොරි 4:6
10 රෝම 12:11
11 ක්‍රියා 19:3
12 රෝම 16:3; 1කොරි 16:19

කැමැත්තෙන් සිටි නිසා ඔහුව සාද-
රයෙන් පිළිගන්නා ලෙස එෆීසයේ
සිටි සහෝදරයෝ එහි සිටි ගෝල-
යන්ට දන්වා යැවූහ. ඔහුගේ පැමිණීම
දෙවිගේ මහත් කරුණාව අද්දකි-
මින්[1] විශ්වාසයක් ඇතුව සිටි අයට
මහත් උපකාරයක් විය.[2] **28** මන්ද
ඔහු යේසුස් ඇත්තටම ක්‍රිස්තුස් බව[3]
ශුද්ධ ලියවිල්ලෙන් පෙන්වා[4] දෙමින්
යුදෙව්වරුන් වැරදි බව සියලුදෙනා
ඉදිරියේ ඉතා ප්‍රබලව ඔප්පු කළේය.

**19** අපොලොස්[5] කොරින්තියේ
සිටියදී පාවුල් කඳුකරය
හරහා ගොස් එෆීසයට[6] ගියේය. එහිදී
ඔහුට ගෝලයන් කිහිපදෙනෙකුව හමු
වූ අතර, **2** “ඔබ යේසුස්ගේ අනුගා-
මිකයන් වූ විට ඔබට දෙවිගේ බලය
ලැබුණාද”[7] කියා ඔවුන්ගෙන් ඇසු-
වේය. ඔවුහු, “දෙවිගේ බලය ලැබෙන්-
නේ කොහොමද කියා අපි කවදාවත්
අසා නැහැ”[8] කියා ඔහුට කීවෝය.
**3** එවිට ඔහු, “එහෙමනම් ඔබ බව්-
තීස්ම වුණේ කොහොමද” කියා ඇසු-
වේය. “යොහන් තමයි අපිව බව්තීස්ම
කළේ”[9] කියා ඔවුහු පිළිතුරු දුන්-
නෝය. **4** පාවුල් මෙසේ කීවේය.
“යොහන් මිනිසුන්ව බව්තීස්ම කළේ
ඔවුන් පසුතැවිලි වී ඇති බව පෙන්වී-
මටයි.[10] ඔහු මිනිසුන්ට කිව්වේ තමාට
පසුව එන තැනැත්තාව[11] එනම්,
යේසුස්ව විශ්වාස කරන්න කියායි.”
**5** ඒ දේවල් ඇසූ විට ඔවුහු ස්වා-
මීන් වන යේසුස්ව පිළිගෙන බව්-
තීස්ම වූහ.[12] **6** ඉන්පසු පාවුල් ඔවුන්
මත අත් තැබූ විට[13] ඔවුන්ට දෙවිගේ
බලය ලැබුණු අතර ඔවුහු වෙනත්
භාෂාවලින් කතා කරන්නත් අනා-
වැකි කියන්නත් පටන්ගත්තෝය.[14]
**7** එහි පුරුෂයන් දොළොස්දෙනෙක්
පමණ සිටියෝය.

**8** ඔහු සිනගෝගයට ඇතුල් වී[15]
සියලුදෙනා ඉදිරියේ නිර්භීතව උගන්-
වමින් දෙවිගේ රාජ්‍යය පිළිබඳ
කාරණා[16] ඉතා පැහැදිලි ලෙසත්
නිවැරදි ලෙසත් අවබෝධ කර දුන්-
නේය. ඔහු කතා ඉදිරිපත් කර-
මින් එහි මාස තුනක් ගත කළේය.
**9** නමුත් සමහරුන් තුළ තිබූ මුරණ්-
ඩුකම නිසා ඒවා විශ්වාස කිරීමට පෙ-
ලඹුණේ නැත.[1] ඔවුන්, සියලුදෙනා
ඉදිරියේ ‘ස්වාමීන්ගේ මාර්ගය’[2] ගැන
අපහාසාත්මක දේවල් කියන්න පටන්-
ගත් විට පාවුල් ඔවුන්ගෙන් ඈත් වීමට
පියවර ගෙන[3] ගෝලයන්වද ඔවුන්-
ගෙන් ඈත් කළේය.[4] ඔහු ගෝලයන්
සමඟ තිරනස්ගේ සම්මන්ත්‍රණ ශාලා-
වේ දිනපතා රැස් වී ඔවුන්ට කතා
ඉදිරිපත් කළේය. **10** ඒ දේ අවුරුදු
දෙකක් පුරා සිදු විය.[5] ප්‍රතිඵලයක්
ලෙස ආසියා ප්‍රදේශයේ[6] යුදෙව්වරුන්
සහ ග්‍රීකවරුන් යන දෙපාර්ශ්වයම දෙ-
විගේ පණිවිඩය ගැන දැනුවත් වූහ.

**11** දෙවි පාවුල් මාර්ගයෙන් පුදුම
කරවන බලවත් ක්‍රියා දිගටම සිදු
කළේය.[7] **12** එහෙයින් ඔහු භාවිත
කළ රෙදිකඩ සහ වැඩවල නියැලෙද්දී
උඩින් පැළඳ සිටි වස්ත්‍ර අසනීප වී සිටි
අය ළඟට ගෙන ගිය පමණින්[8] ඔවුන්-
ගේ රෝග සුව වූ අතර භූතයෝද
ඔවුන්ගෙන් පිට වී ගියෝය.[9] **13** මේ
අතර තැනින් තැන සංචාරය කර-
මින් භූතයන් දුරු කළ යුදෙව්වන් පිරි-
සක්ද සිටියෝය.[10] ඔවුහුද ස්වාමීන්
වන යේසුස්ගේ නාමය භාවිත කරමින්
භූතයන්ව දුරු කළ අතර,[11] “පාවුල්
දේශනා කරන යේසුස්ගේ නාමයෙන්
පිට වෙන්න”[12] කියා පැවසීමට පුරු-
දුව සිටියහ. **14** ඒ දේ කරමින් සිටි-
යේ යුදෙව් ජාතික නායක පූජකයෙකු
වූ සීවා නම් තැනැත්තෙකුගේ පුත්‍ර-
යන් හත්දෙනෙකි. **15** ඔවුන් භූත-
යෙකු වැහී සිටි පුද්ගලයෙකුව සුව
කිරීමට ගිය අවස්ථාවකදී ඒ පුද්ග-
ලයාට වැහී සිටි භූතයා ඔවුන්ට
මෙසේ කීවේය. “මම යේසුස් ගැනත්[13]
පාවුල් ගැනත් දන්නවා.[14] ඒත් ඔබ
කවුද?” **16** එවිට එම භූතයා වැහී
සිටි මිනිසා ඔවුන්ගේ ඇඟට පැන,[15] ඒ
සියලුදෙනාවම බිම ඇමුවේය. එයින්
තුවාල ලැබූ ඔවුහු, ඇඳුම්ද නැතුව එම
නිවසින් පලා ගියෝය. **17** එෆීසයේ
විසූ සියලු යුදෙව්වරුන්ට සහ ග්‍රීක-

**18 පරි.**
1 එෆී 2:8
2 1කොරි 3:6
3 උත් 49:10
ද්වි 18:15
ගීතා 16:10
යෙසා 7:14
මීකා 5:2
මලා 3:1
ක්‍රියා 9:22
4 ලූක් 24:27
1කොරි 15:3
2තිමෝ 3:16

**19 පරි.**
5 ක්‍රියා 18:24
1කොරි 3:5
6 1කොරි 16:8
7 ක්‍රියා 2:38
8 ක්‍රියා 8:16
9 ක්‍රියා 18:25
10 මතෙ 3:11
මාක් 1:4
ක්‍රියා 1:5
11 යොහ 1:15
යොහ 1:30
12 ක්‍රියා 8:16
13 ක්‍රියා 8:17
14 ක්‍රියා 2:4
ක්‍රියා 10:46
1කොරි 12:10
15 ලූක් 4:16
ක්‍රියා 13:5
ක්‍රියා 17:2
16 ක්‍රියා 1:3
ක්‍රියා 28:23
ක්‍රියා 28:31

**2 තීරුව**
1 2තෙස 3:2
2 ක්‍රියා 9:2
ක්‍රියා 22:4
3 මතෙ 10:14
රෝම 16:17
4 තීත 3:10
2යොහ 10
5 ක්‍රියා 20:31
6 ක්‍රියා 20:18
2තිමෝ 1:15
7 ක්‍රියා 14:3
8 මාක් 6:56
ක්‍රියා 5:15
9 මතෙ 10:1
10 මතෙ 12:27
11 මාක් 9:38
ලූක් 9:49
12 ක්‍රියා 16:18
13 මතෙ 8:29
මාක් 1:24
ලූක් 4:34
14 ක්‍රියා 16:17
15 මතෙ 8:28

වරුන්ට එම සිද්ධිය ගැන ආරංචි වූ
විට සියලුදෙනාම බියපත් වූහ.[1] එයින්
ස්වාමීන් වන යේසුස්ගේ නාමය දිග-
ටම ප්‍රශංසාවට ලක් විය.[2] **18** යේ-
සුස්ගේ අනුගාමිකයන් බවට පත්
වූ බොහෝදෙනෙක් පැමිණ තමන්
කලින් කළ දේවල් ප්‍රසිද්ධියේ ප්‍රකාශ
කර තම වැරදි පිළිගත්තෝය.[3]
**19** ඔවුන් අතර සිටි මන්තර ගුරුකම්-
වල නියැලී සිටි[4] බොහෝදෙනෙක්
ගුරුකම් සඳහා භාවිත කළ පොත්
පත් ගෙනැවිත් සියලුදෙනා ඉදිරියෙහි
පුලුස්සා දැමුවෝය. එම පොත් පත්-
වල වටිනාකම ගණන් බැලූ විට ඒ
සියල්ල රිදී කාසි පනස්දහසක් වටිනා
බව අනාවරණය විය. **20** මෙසේ
යෙහෝවා දෙවිගේ පණිවිඩය සියලු-
දෙනා අතරේ දිගටම පැතිර ගියේය.
එය යටපත් කිරීමට කිසිවෙකුට නො-
හැකි විය.[5]

**21** එම සිද්ධියෙන් පසු තමා මැසි-
ඩෝනියාවට[6] සහ ඇකේයාවට ගොස්
ඉන් අනතුරුව යෙරුසලමට යා
යුතු බව[7] පාවුල් තීරණය කළේය.
එමෙන්ම යෙරුසලමට ගිය පසු රෝ-
මයටත් යා යුතුයි[8] කියා ඔහු තීරණය
කළේය. **22** එහෙයින් තමාට උප-
කාර කළ දෙදෙනෙකු වූ තිමෝති[9]
සහ එරස්ටස්ව[10] මැසිඩෝනියාවට
යැවූ ඔහු, ආසියා ප්‍රදේශයේ යම් කලක්
නැවතී සිටියේය.

**23** ඒ කාලයේදී ‘ස්වාමීන්ගේ මාර්-
ගයට’[11] විරුද්ධව උද්ඝෝෂණයක්
ඇති විය.[12] **24** මෙයට මුල් වූයේ
රිදීකරුවෙකු වූ දෙමේත්‍රියස් නම්
මිනිසෙකි. ඔහු ආටෙමිස්ගේ දේවා-
ලය හා සමාන කුඩා රිදී රූප සෑදූ
නිසා එයින් බොහෝදෙනෙකුට ඉම-
හත් ලාභ උපදවාගත හැකි විය.[13]
**25** ඔහු ඔවුන්වද ඒ හා සමාන කර්-
මාන්තවල යෙදී සිටි වෙනත් අය-
වද රැස් කරගෙන[14] මෙසේ කීවේය.
“සහෝදරයෙනි, මේ කර්මාන්තයෙන්
අපි කොතරම් දියුණු වෙලා තිබෙන-
වාද කියා ඔබ හොඳින් දන්නවා.[15]
**26** නමුත් දැන් පාවුල් කියන මනුෂ්‍ය-
යෙක් එෆීසයට ඇවිල්ලා.[1] ඔහු එෆීස-
යේ විතරක් නොවෙයි මුළු ආසියා
පළාතේ සිටින විශාල සමූහයක්ව වෙ-
නත් දෙයක් පස්සේ යන්න පොලඹවා
තිබෙනවා. ඔහු කියන්නේ මිනිසුන්
සාදන දෙවිවරුන්[2] ඇත්තටම දෙවි-
වරුන් නොවන බවයි. **27** මේ දේ
අපේ රැකියාවට විතරක් නොවෙයි,
උතුම් ආටෙමිස්[3] දේවතාවියගේ දේ-
වස්ථානයටත් මොන තරම් නින්දා-
වක්ද! මෙහෙම ගියොත් මුළු ආසියා
ප්‍රදේශයෙන් මුළු ලෝකය පුරාත්
ඇයට හිමි වී ඇති නමස්කාරය හා
මහත් ගෞරවය නැති වෙලාම යයි.”
**28** ඒ දේවල් ඇසූ ඒ මිනිස්සු කෝ-
පයෙන් පිරී, “එෆීසයේ වැසියන්ගේ
ආටෙමිස් දේවතාවිය සදා වැජඹේවා”
කියා පවසමින් කෑගසන්න පටන්ගත්-
තෝය.

**29** එවිට ඒ නුවර පුරාම විශාල
කෝලහලයක් ඇති විය. කෝපයට
පත් ජනයා එකතු වී ගායස් සහ
අරිස්තාකස්[4] යන දෙදෙනාව බල-
හත්කාරයෙන් රංග භූමියට ඇදගෙන
ගියෝය. මැසිඩෝනියානු ජාතිකයන්
වූ ඔවුන්, පාවුල් සමඟ ඔහුගේ ගමන්ව-
ලට හවුල් වූ දෙදෙනෙකි. **30** පාවුල්
රංග භූමියේ එකතු වී සිටි සමූහයා
අතරට යන්න සූදානම් වුවත් එසේ
යෑමට ගෝලයෝ ඔහුට ඉඩ දුන්-
නේ නැත. **31** පාවුල් සමඟ මිත්‍රව
සිටි උත්සව සහ ක්‍රීඩා සංවිධාය-
කයන් කිහිපදෙනෙක්ද ඔහුට පණි-
විඩ යැව්වෝය. ඔවුන්ද ඔහුගෙන්
ඉල්ලා සිටියේ රංග භූමියට ගොස්
ඔහුගේ ජීවිතය අනතුරට පත් කර
නොගන්නා ලෙසය. **32** රැස්ව සිටි
සමූහය වියවුල්ව සිටි නිසා සමහ-
රෙක් එක් දෙයක්ද අන් සමහරෙක්
තවත් දෙයක්ද කියමින් කෑගැසු-
වත්[5] තමන් එතැනට පැමිණියේ ඇයි
කියා ඔවුන්ගෙන් වැඩිදෙනා නො-
දැන සිටියෝය. **33** එහෙයින් සිදු වූ
දේ පැහැදිලි කිරීමට සමූහයා අතරින්
යුදෙව්වරු ඇලෙක්සැන්ඩර්ව තෝරා-
ගෙන ඉදිරියට තල්ලු කළෝය. එවිට

**19 පරි.**
1 ක්‍රියා 2:43; ක්‍රියා 5:5
2 2තෙස 1:12
3 මතෙ 3:6; යාකො 5:16
4 ද්වි 18:10; ආනි 2:2; ක්‍රියා 8:9
5 ක්‍රියා 6:7; ක්‍රියා 12:24; කොලො 1:6
6 1කොරි 16:5
7 ක්‍රියා 20:22; රෝම 15:25
8 ක්‍රියා 23:11; රෝම 1:15
9 ක්‍රියා 16:1
10 2තිමෝ 4:20
11 ක්‍රියා 9:2; ක්‍රියා 19:9; ක්‍රියා 22:4
12 2කොරි 1:8
13 ක්‍රියා 16:16
14 ගීතා 115:4
15 එළි 18:15

**2 තීරුව**
1 එෆී 1:1
2 ද්වි 4:28; 1ලේක 16:26; යෙසා 44:10; යෙරෙ 10:3; ක්‍රියා 17:29; 1කොරි 8:4
3 ක්‍රියා 19:34
4 ක්‍රියා 20:4; කොලො 4:10; ෆිලෙ 24
5 ක්‍රියා 21:34

ඇලෙක්සැන්ඩර් ජනතාවට නිහඬ වෙන්න කියා අතින් සංඥා කර තමන්ට යමක් කියන්න තිබෙන බව දැනුම් දුන්නේය. **34** නමුත් ඔහු යුදෙව්වෙකු බව තේරුම්ගත් ජනතාව, “එෆීසයන්ගේ ආටෙමිස් දේවතාවිය සදා වැජඹේවා”[1] කියා එක හඬින් කෑගසන්න පටන්ගත්තෝය. ඔවුහු එලෙස පැය දෙකක් පුරා කෑගැසුවෝය.

**35** අන්තිමේදී ඔවුන්ව සන්සුන් කිරීමට[2] හැකි වූයේ නගරාධිපතිටය. එවිට ඔහු ඔවුන්ට මෙසේ කීවේය. “එෆීසයේ මනුෂ්‍යයෙනි, උතුම් ආටෙමිස්ගේ දේවස්ථානයටත් අහසින් වැටුණු රූපයටත් හිමිකම් කියන්නේ එෆීසවරුන්ගේ නුවර බව මෙලොවෙහි නොදන්නා කෙනෙක් ඉන්නවාද? **36** මේ කාරණය ගැන කවුරුත් විවාද කරන්නේ නැහැ. ඒ නිසා ඔබ කලබල වෙන්නේ නැතුව සන්සුන් වෙන්න.[3] **37** ඇත්තෙන්ම ඔබ මෙහෙට ගෙනා මේ මිනිස්සු දේවස්ථාන කොල්ල කන අයවත් අපේ දේවතාවියට අපහාස කරන අයවත් නොවෙයි. **38** ඒ නිසා දෙමේත්‍රියස්ට[4] සහ ඔහු සමඟ සිටින වැඩකරුවන්ට යම් කෙනෙක් ගැන පැමිණිල්ලක් කරන්න තිබෙනවා නම් ආණ්ඩුකාරයන් ඇවිත්[5] නඩු අසන දවස්වලදී[6] ඒ ගැන පැමිණිලි කළ හැකියි. **39** ඒ වගේම මේ මිනිසුන්ට විරුද්ධව වෙනත් චෝදනා ඔබට තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් නිල රැස්වීමකදී තීරණයක් ගත හැකියි. **40** නමුත් අද මෙහෙ සිදු වුණු දේ රටේ නීතියට විරුද්ධයි. ඒ සඳහා දඬුවම් පවා ලැබෙන්න පුළුවන්. ජනතාව මේ වගේ රැස් වෙලා කලබලයක් ඇති කිරීමට කිසිම සාධාරණ හේතුවක් නැහැ.” **41** ඔහු ඒ දේවල් පවසා[7] රැස්ව සිටි සමූහයාව විසුරුවාහැරියේය.[8]

**20** කෝලාහලයට සම්බන්ධ සියලුදෙනා විසිර ගිය පසු පාවුල් ගෝලයන්ව කැඳවා ඔවුන්ව දිරිගැන්වීය. ඉන්පසු ඔහු ඔවුන්ගෙන් සමුගෙන[1] මැසිඩෝනියාව බලා පිටත්ව ගියේය.[2] **2** ඔහු ඒ පළාතට ගොස් එහි සිටි අය සමඟ බොහෝ දේවල් කතා කර ඔවුන්වත් දිරිගැන්වීය.[3] ඉන්පසු ඔහු ගියේ ග්‍රීසියටය. **3** ඔහු එහි මාස තුනක් ගත කළේය. නමුත් ඔහු සිරියාව බලා නැවෙන් ගමන් කිරීමට සැලසුම් යොදමින් සිටියදී, යුදෙව්වරුන් තමාට විරුද්ධව කුමන්ත්‍රණය කරමින්[4] සිටින බව ඔහුට ආරංචි විය. එහෙයින් ඔහු නැවතත් මැසිඩෝනියාව මැදින් යෑමට තීරණය කළේය. **4** බෙරීය නුවරේ වැසියෙක් වූ පිරස්ගේ පුත් සෝපතර්ද[5] තෙසලෝනිකයෙන් පැමිණි අරිස්තාකස්[6] සහ සෙකන්දස්ද දර්බයේ ජීවත් වූ ගායස්ද තිමෝතිද[7] ආසියා පළාතෙන් පැමිණි තිකිකස්[8] සහ ත්‍රොෆිමස්ද[9] ඔහු සමඟ ගියෝය. **5** ඔවුහු අපට කලින් ගොස් අප එන තුරු ත්‍රෝවස්හි[10] බලා සිටියෝය. **6** මුහුන් නොදැමූ රොටි උත්සවයේ[11] දවස් නිම වූ පසු අපි පිලිප්පියේ සිට මුහුදෙන් ගමන් කර දවස් පහකින් ත්‍රෝවස්හි[12] සිටි ඔවුන්ව හමු වූයෙමු. අපි එහි දවස් හතක් ගත කළෙමු.

**7** සතියේ පළමුවෙනි දවසේදී[13] සියලුදෙනාම කෑම ගැනීම සඳහා එකට රැස් වූහ. පාවුල් ඊළඟ දිනේදී පිටත් වීමට සිටි නිසා රැස්ව සිටි සියලුදෙනාට කතාවක් ඉදිරිපත් කළේය. එම කතාව මධ්‍යම රාත්‍රිය දක්වාම පැවතිණ. **8** අප සියලුදෙනාම රැස්ව සිටියේ උඩුමහල් කාමරයකය.[14] ආලෝකය ලබා දීම සඳහා එහි පහන් කිහිපයක්ම දල්වා තිබිණ. **9** පාවුල් තම කතාව ඉදිරිපත් කරද්දී ජනේලය මත යුතිකස් නම් තරුණයෙක් ඉඳගෙන සිටියේය. තද නින්දකට වැටුණු ඔහු, එම දෙවෙනි මහලේ ජනේලයෙන් පහතට වැටුණේය. පිරිසක් ගොස් ඔහුව ඔසවා බලද්දී ඔහු මිය ගොස් සිටියේය. **10** නමුත් පාවුල් පහළට ගොස් බිමට වැටී සිටි ඔහුව වැළඳගෙන[15] මෙසේ කීවේය. “දැන් කලබල වෙන්න එපා. ඔහු

**19 පරි.**
1 ක්‍රියා 19:28
2 හිතෝ 15:18
3 හිතෝ 14:29
4 ක්‍රියා 19:24
5 ක්‍රියා 13:7; ක්‍රියා 18:12
6 ක්‍රියා 17:34
7 දේශ 9:17
8 ක්‍රියා 19:32

**2 තීරුව**

**20 පරි.**
1 2කොරි 2:13
2 1කොරි 16:5; 1තිමෝ 1:3
3 රෝම 12:8
4 ක්‍රියා 23:16; ක්‍රියා 25:3; 2කොරි 11:26
5 රෝම 16:21
6 ක්‍රියා 27:2
7 ක්‍රියා 16:1
8 එෆී 6:21; කොලො 4:7; 2තිමෝ 4:12
9 ක්‍රියා 21:29; 2තිමෝ 4:20
10 ක්‍රියා 16:11
11 නික් 12:14; නික් 23:15
12 2තිමෝ 4:13
13 1කොරි 16:2
14 ක්‍රියා 1:13
15 1රාජා 17:21; 2රාජා 4:34

ජීවත් වෙනවා.”[1] 11 ඉන්පසු පාවුල්
උඩුමහලට ගොස් කෑම කා, අලු-
යම වන තුරුම කතා කර, පසුව
පිටත්ව ගියේය. 12 ඔවුහු ඒ තරු-
ණයාව ඔහුගේ නිවසට ඇරලුවෝය.
ඔහු මෙසේ ජීවතුන් අතර සිටීම සිය-
ලුදෙනාටම මහත් සැනසීමක් විය.

13 මේ අතර අපි නැව නවතා
තිබුණු තැනට ගොස් නැවට නැඟ
අසොස් බලා පිටත් වූයෙමු. නමුත්
පාවුල් අප සමඟ පැමිණියේ නැත.
ඔහුගේ උපදෙස් පරිදි අප බලාපො-
රොත්තු වූයේ ඔහුව අසොස්හිදී හමු වී
ඔහුවත් නැවට නංවාගැනීමටයි. ඔහු
එතැනට යන්න අදහස් කළේ පයින්ය.
14 අසොස්හිදී අපට ඔහුව මුණගැ-
සුණු අතර අපි ඔහුව නැවට නංවා-
ගෙන මිතුලේන නම් නුවරට ගියෙමු.
15 පසුවදා නැවතත් නැවට නැඟ-
ගත් අපි, එතැනින් පිටත් වී කියොස්
දූපත අසලට පැමිණ, ඊට පසුවදා
සාමොස් දූපතට ළඟා වූයෙමු. ඊළඟ
දවසේ අප ගියේ මිලේටස් නුවරටය.
16 පාවුල් අදහස් කරමින් සිටියේ
පෙන්තකොස්ත උත්සවය පවත්වන
දවසේදී කෙසේ හෝ යෙරුසලමෙහි
සිටීමටය.[2] එහෙයින් ඔහු ආසියා පළා-
තෙහි රැඳී සිටින්නේ නැතුව එෆී-
සය පසු කරගෙන[3] යෑමට තීරණය
කළේය.

17 නමුත් ඔහු මිලේටස් නුව-
රට පැමිණි විට එෆීසයට පණිවිඩයක්
යවා එහි සිටි සභාවේ වැඩිමහල්-
ලන්ට[4] තමාව හමු වීමට පැමිණෙන්න
කියා ආරාධනා කළේය. 18 ඔවුන්
පැමිණ ඔහුව හමු වූ විට ඔහු ඔවුන්ට
මෙසේ කීවේය. “ආසියා පළාතට[5] පය
තැබූ මුල් දවස පටන් මම සිටියේ ඔබ
සමඟයි[6] කියා ඔබ හොඳින්ම දන්-
නවා. 19 මම ස්වාමීන් වෙනුවෙන්
ඉතා නිහතමානීව[7] දාසයෙක් මෙන්[8]
කඳුළු සලමින් සේවය කළා. යුදෙව්-
වන් මට විරුද්ධව මොන තරම් පීඩා
හා ප්‍රශ්න ඇති කළාද![9] 20 නමුත්
ඔබට ප්‍රයෝජනවත් වන හැම දෙ-
යක්ම මම නොසඟවා කියා දුන්නා.
මම ප්‍රසිද්ධියේ සහ ගෙයින් ගෙට
ගොස්[1] ඔබට දිගටම ඉගැන්නුවා.[2]
21 මම යුදෙව්වරුන්ට හා ග්‍රීකව-
රුන්ට සම්පූර්ණ සාක්ෂියක් දැරුවා.[3]
පසුතැවිලි වී[4] දෙවි වෙතට හැරෙන්-
නත් අපේ ස්වාමීන් වන යේසුස්
කෙරෙහි විශ්වාසය ඇති කරගන්-
නත් අවශ්‍ය බව මම ඔවුන්ට කිව්වා.
22 දෙවිගේ බලයෙන් මට ලැබුණු
මඟ පෙන්වීම්වලට එකඟව[5] මම දැන්
ගමන් කරන්නේ යෙරුසලමටයි. එහිදී
මට මොනවා වෙයිද කියා මම දන්-
නේ නැහැ. 23 නමුත් මම නුව-
රක් නුවරක් පාසා ගමන් කරන විට
මට ඉදිරියේදී සිරදඬුවම් සහ නො-
යෙකුත් පීඩා විඳින්න සිදු වන බව[6]
දෙවි තම බලයෙන් නිතරම මට
ඇනුම් දෙයි.[7] 24 කොහොමවුණත්
මට වැදගත් වන්නේ මගේ ජීවිතය
නොවෙයි.[8] මගේ එකම ආශාව නම්
අවසානය දක්වා මා යා යුතු ගම-
නත් ස්වාමීන් වන යේසුස්ගෙන් මට
ලැබුණු[9] පැවරුමත්[10] සාර්ථකව නිම
කිරීමයි.[11] ඒ පැවරුම නම් දෙවිගේ
මහත් කරුණාව පිළිබඳ ශුභාරංචිය
ගැන සම්පූර්ණ සාක්ෂියක් දීමයි.[12]

25 “මට තවමත් මතකයි ඔබ අත-
රේ මම රාජ්‍යය ගැන දේශනා කළ
ආකාරය. මම හොඳින්ම දන්නවා
ඔබෙන් කිසිවෙකුටවත් මාව ආයෙත්
දකින්න ලැබෙන්නේ නැති බව.
26 මම සියලුදෙනාගේ ලෙයින් නිද-
හස්.[13] ඔබ සියලුදෙනාම එයට සාක්ෂි
දරයි. 27 දෙවිගේ කැමැත්ත ගැන
මම ඔබට කිසිම දෙයක් නොසඟවා
හැම දෙයක්ම හොඳින් අවබෝධ කර
දුන්නා.[14] 28 දැන් දෙවි තම බල-
යෙන් ඔබව පත් කර තිබෙන්නේ ඔහු-
ගේ සභාව[15] රැකබලා ගැනීමටයි.[16] ඒ
සභාව ඔහු මිල දී ගත්තේ තමාගේ
පුත්‍රයාගේ රුධිරයෙන්[17] කියා අමතක
කරන්න එපා. ඒ නිසා ඔබ ගැනත්[18]
මුළු රැළ ගැනත්[19] හොඳ අවධාන-
යකින් සිටින්න.[20] 29 මම ඔබෙන්
සමුගත් පසු රැළට කිසිම ආදර-
යක් නොදක්වන රෞද්‍ර වෘකයන්[21] හා

**20 පරි.**
1 මතෙ 9:24, මාක් 5:39, යොහ 11:40, ක්‍රියා 9:40
2 ක්‍රියා 21:4, ක්‍රියා 24:17
3 ක්‍රියා 18:21
4 ක්‍රියා 11:30
5 ක්‍රියා 16:6
6 ක්‍රියා 19:10
7 1කොරි 15:9, 1තෙස 2:6, 1පේතෘ 5:3
8 2කොරි 11:27
9 ක්‍රියා 9:24, ක්‍රියා 20:3

**2 තීරුව**
1 ක්‍රියා 5:42
2 මතෙ 28:20, ක්‍රියා 20:27, 2තිමෝ 4:2
3 ක්‍රියා 18:5
4 මාක් 1:15, ලූක් 24:47, ක්‍රියා 2:38
5 ක්‍රියා 19:21
6 ක්‍රියා 9:16
7 ක්‍රියා 21:4, ක්‍රියා 21:11
8 රෝම 8:35, 2කොරි 4:16
9 ගලා 1:1
10 2කොරි 4:1, 2කොරි 5:18
11 2තිමෝ 4:7
12 2කොරි 6:1
13 එස 33:8, ක්‍රියා 18:6, 2කොරි 7:2
14 මතෙ 28:20, යොහ 15:15
15 යොහ 21:15, එෆී 4:11, 1පේතෘ 5:2
16 1තිමෝ 3:1, තීත 1:5, හෙබ්‍රෙ 13:17
17 මතෙ 26:28, යොහ 6:54, 1යොහ 1:7
18 1තිමෝ 3:2
19 හිතෝ 27:23
20 කොලො 4:17, 1තිමෝ 4:16
21 යෙසා 56:11, මතෙ 7:15, 2තෙස 2:3, 2පේතෘ 2:1

සමාන පිරිසක් ඔබ අතරට එන බව
මම දන්නවා. **30** ඔබට උගන්වා
ඇති හැම දෙයක්ම ඔබ අතරම
සිටින සමහරුන් විකෘති කර පෙන්-
වයි.[1] ඔවුන්ගේ ඉලක්කය වන්නේ
ගෝලයන්ව ඔවුන්ගේ පසුපස රැගෙන
යෑමයි.[2]
**31** “ඒ නිසා හොඳ සිහිකල්පනා-
වෙන් සිටින්න. මම අවුරුදු තුනක්
තිස්සේ[3] දිවා රෑ කඳුළු සලමින් ඔබට
කොතරම් උපදෙස් හා අවවාද ලබා
දුන්නාද![4] ඒවා කවදාවත් අමතක
කරන්න එපා. **32** ඔබට දෙවිගෙ-
නුත් ඔහුගේ මහත් කරුණාව ගැන
උගන්වා ඇති දේවලිනුත් ආරක්ෂා-
වක් ලැබේවා කියා මම දැන් ප්‍රාර්-
ථනා කරනවා.[5] ඒ දේවල් ඔබට
මහත් ශක්තියක් වෙයි.[6] එවිට දෙවි
ශුද්ධ තැනැත්තන්* ලෙස තෝරා-
ගෙන ඇති අයට උරුම කර දෙන දේ
ඔබටත් උරුම වෙයි.[7] **33** මම කිසි
මිනිසෙකුගේ රන් රිදීවලට හෝ ඇඳුම්
පැළඳුම්වලට ආශා කළේ නැහැ.[8]
**34** මම මගේ අවශ්‍යතා ඉටු කර-
ගන්න[9] මගේම අත් දෙකෙන් වෙහෙස
මහන්සි වී වැඩ කළා. ඒ වගේම මා
සමඟ සිටි අයගේ අවශ්‍යතා සපුරන්-
නත් මට හැකි වුණා. ඒ බව ඔබ
හොඳින්ම දන්නවා. **35** මම ඒ හැම
දෙයක්ම කළේ යම් උපකාර අවශ්‍ය
අයට[10] වෙහෙස මහන්සිය නොබලා
උපකාර කිරීමේ අවශ්‍යතාව[11] ඔබට
පෙන්වා දීමටයි. ස්වාමීන් වන යේ-
සුස් පැවසූ දේ නිතරම මතක තබා-
ගන්න. ඔහු පැවසුවේ, ‘ලැබීමට වඩා
දීමෙන් වැඩි සන්තෝෂයක් ලැබෙ-
නවා’[12] කියායි.”
**36** ඔහු ඒ දේවල් පවසා ඔවුන් සිය-
ලුදෙනා සමඟ දණ ගසා[13]
යාච්ඤා කළේය. **37** ඉන්පසු සිය-
ලුදෙනා හඬා වැලපෙමින් පාවුල්ව
ආදරයෙන් සිඹ[14] වැලඳගත්තෝය.[15]
**38** ඔවුන්ට මෙතරම් දුකක් හා වේ-
දනාවක් දැනුණේ තමාව නැව-
තත් දකින්න නොලැබෙන බව[1] ඔහු
ඔවුන්ට පැවසූ නිසාය. ඉන්පසු ඔවුහු
ඔහුව ඇරලවීමට නැව නවතා තිබූ
තැනට ගියෝය.[2]

**21** අපි අකමැත්තෙන් වුවද
ඔවුන්ගෙන් සමුගෙන අපේ
ගමන ආරම්භ කළෙමු. අප කෙළින්ම
යාත්‍රා කළේ කොස් නම් දූපත වෙ-
තටය. පසුවදා රෝඩ්ස් නම් දූපත
වෙතටත් එතැනින් පටාරා නම් වරා-
යටත් යාත්‍රා කළෙමු. **2** එහි සිටියදී
ෆිනීෂියාව බලා යාත්‍රා කරන නැවක්
සොයාගැනීමට අපට හැකි වූ අතර
අපි ඒ නැවට නැඟ පිටත් වූයෙමු.
**3** අප සයිප්‍රස් දූපතට ළඟා වූ විට[3]
එම දූපත තිබුණේ අප ගමන්ගත්
නැවට වම් පැත්තෙනි. අපි එය පසු
කර දිගටම සිරියාව දෙසට යාත්‍රා
කර[4] තීර් නුවරෙන් ගොඩ බැස්සෙමු.
එහිදී නැවේ බඩුද ගොඩ බාන ලදි.[5]
**4** අපි එහි සිටි ගෝලයන්ව සො-
යාගෙන එහි දවස් හතක් නැවතී සිටි-
යෙමු. ඔවුන් පාවුල්ට නැවත නැවතත්
පැවසුවේ යෙරුසලමට යෑම සුදුසු දෙ-
යක් නොවන බවය. ඔවුන් එසේ පැව-
සීමට පෙලඹුණේ දෙවි තම බලය
මාර්ගයෙන් ඔවුන්ට අනාවරණය කළ
දේ නිසාය.[6] **5** ඒ දවස් හත නිම
වූ පසු අපි නැවතත් අපේ ගමන
ආරම්භ කළෙමු. ස්ත්‍රීන් සහ දරුවන්
ඇතුළුව ඔවුන් සියලුදෙනාම අපව
ඇරලවීමට නුවරින් පිටතට ආවෝය.
එහෙයින් අපි සියලුදෙනාම වෙරළෙහි
දණ ගසා[7] යාච්ඤා කර, **6** එකිනෙ-
කාගෙන් සමුගෙන[8] නැවට නැග්ගෙමු.
ඔවුහු තම තමන්ගේ නිවෙස් බලා හැරී
ගියෝය.
**7** අප තීර් සිට ආරම්භ කළ ගමන
නිම කළේ ටොලමැයිසය නුවරට
ළඟා වූ විටදීය. එහිදී අපි සහෝ-
දරයන්ව හමු වී ඔවුන් සමඟ දව-
සක් නැවතී සිටියෙමු. **8** පසුවදා
එතැනින් පිටත් වූ අපි, සිසේරියට
පැමිණ[9] එහි ශුභාරංචිය දේශනා කිරී-

**20 පරි.**
1 2තිමෝ 4:3
2 ගලා 4:17; 1තිමෝ 4:1; 1යොහ 2:19
3 ක්‍රියා 19:10
4 2කොරි 2:4; 1තෙස 2:11
5 ක්‍රියා 14:23
6 රෝම 16:25
7 ද්වි 33:3; එෆි 1:18; කොලො 1:12
8 1සාමු 12:3; මතෙ 10:8; 1කොරි 9:12; 2කොරි 7:2; තීත 1:7
9 ක්‍රියා 18:3; 1කොරි 4:12; 1තෙස 2:9
10 රෝම 15:1
11 එෆි 4:28; 1තෙස 4:11; 2තෙස 3:8
12 හිතෝ 19:17; මතෙ 10:8; ලූක් 6:38
13 ක්‍රියා 21:5
14 රෝම 16:16
15 උත් 45:14

**2 තීරුව**
1 ක්‍රියා 20:25
2 ක්‍රියා 15:3

**21 පරි.**
3 ක්‍රියා 15:39
4 ක්‍රියා 20:3
5 ක්‍රියා 27:10
6 ක්‍රියා 21:11; ක්‍රියා 21:12
7 එස්රා 9:5; ක්‍රියා 9:40; ක්‍රියා 20:36
8 ක්‍රියා 18:21
9 ක්‍රියා 18:22

**ක්‍රියා 20:32*** හෝ, “දෙවි සඳහා වෙන් කර ඇති තැනැත්තන්.”

මට ප්‍රසිද්ධ වූ පිලිප්ගේ නිවසේ නවා-
තැන් ගත්තෙමු. ඔහු, කෑම බෙදා
දීමට පත් කළ පුරුෂයන් හත්දෙනා-
ගෙන් එක් කෙනෙකි.[1] **9** අනාවැකි
කියන අවිවාහක දූවරු හතරදෙ-
නෙක් ඔහුට සිටියෝය.[2] **10** අප
එහි දවස් ගණනාවක් නැවතී සිටි-
යදී අගබස්[3] නම් අනාගතවක්තෘව-
රයෙක් යුදයේ සිට, **11** අපව හමු
වීමට ආවේය. ඔහු පාවුල්ගේ ඉණප-
ටිය ගෙන තමාගේ අත් පා එයින්
බැඳගෙන මෙසේ කීවේය. "දෙවි තම
බලය මාර්ගයෙන් පවසන්නේ මෙයයි.
'යුදෙව්වරුන් මෙම ඉණපටිය අයිති
පුද්ගලයාව යෙරුසලමේදී මෙයාකාර-
යෙන් බැඳ[4] වෙනත් ජාතීන්ට අයත්
මිනිසුන්ට භාර දෙයි.' "[5] **12** අපට
ඒ දේ ඇසුණු විට අපත් එහි සිටි
අයත් පාවුල්ගෙන් නැවත නැවතත්
ඉල්ලා සිටියේ යෙරුසලමට නොයන
ලෙසය.[6] **13** එවිට පාවුල් මෙසේ
කීවේය. "මෙහෙම අඬඅඬා හිටියොත්[7]
මමත් අධෛර්යය වෙයි.[8] භය වෙන්න
එපා. ස්වාමීන් වන යේසුස්ගේ නාමය
වෙනුවෙන් යෙරුසලමේදී මගේ අත්
පාවලට විලංගු දමනවාට පමණක්
නොවෙයි මැරෙන්න වුණත් මම සූදා-
නම්."[9] **14** ඔහු ගත් තීරණය වෙනස්
කළ නොහැකි බව තේරුම්ගත් අපි,
"යෙහෝවා දෙවිගේ කැමැත්ත[10] සිදු
වේවා" කියා පවසමින් නිහඬ වුණෙමු.

**15** ඒ දින කිහිපය ගෙවී ගිය පසු
අපි ගමන සඳහා සූදානම් වී, යෙරුස-
ලම බලා පිටත් වූයෙමු.[11] **16** සිසේ-
රියේ ගෝලයන් කිහිපදෙනෙක්ද[12] අප
සමඟ පැමිණ අතරමඟදී අප නවා-
තැන් ගැනීමට සිටි නාසන් නම්
පුද්ගලයෙකුගේ නිවසට අපව ගෙන
ගියෝය. සයිප්‍රස් දූපතෙන් පැමිණි
ඒ තැනැත්තා, මුලින්ම ගෝලයන්
වූ අයගෙන් එක් කෙනෙකි. **17** අප
යෙරුසලමට ගිය විට[13] සහෝදරයෝ
අපව සාදරයෙන් පිළිගත්තෝය.[14]
**18** පසුවදා පාවුල් අප සමඟ
යාකොබ්ව හමු වීමට ගියේය.[15] වැඩිම-
හල්ලෝ සියලුදෙනාම එහි සිටියෝය.
**19** ඔහු ඔවුන්ට සුබ පතා තමාගේ සේ-
වය මගින් දෙවි වෙනත් ජාතීන් අතරේ
කළ දේවල් ගැන[1] සවිස්තර වාර්තා-
වක් ඉදිරිපත් කළේය.[2]

**20** ඒ සියලු තොරතුරු අසාගෙන
සිටි ඔවුහු, දෙවිට ප්‍රශංසා කළෝය.
ඉන්පසු ඔවුහු ඔහුට මෙසේ කීවෝය.
"සහෝදරය, යුදෙව්වන් අතරේ යේ-
සුස්ගේ අනුගාමිකයන් දහස් ගණනක්
සිටින බව ඔබ දන්නවා. ඔවුන් නීති-
යට ඉතාමත් ළැදියි.[3] **21** නමුත්
ඔවුන්ට ආරංචි වී තිබෙන්නේ මෝ-
සෙස්ට දෙන ලද නීතියට විරුද්ධ දෙ-
යක් කිරීමට[4] ඔබ වෙනත් ජාතීන්
අතර සිටින සියලු යුදෙව්වන්ට උගන්-
වනවා කියායි. ඔවුන් සිතාගෙන
සිටින්නේ දරුවන්ව චර්මච්ඡේදනය
කිරීම අවශ්‍ය නැති බවත්[5] නීති-
යේ පිළිගත් පිළිවෙත් රැකීම අවශ්‍ය
නැති බවත් ඔබ උගන්වනවා කියායි.
**22** දැන් ඔබ පැමිණ ඇති බව ඔවුන්ට
කෙසේ හෝ ආරංචි වෙයි. ඒ නිසා
ඒ ගැන අපි මොනවාද කරන්නේ?
**23** අපි කැමතියි ඔබට යම් දෙ-
යක් යෝජනා කරන්න. දෙවිට භාර-
යක් වී සිටින මිනිසුන් හතරදෙනෙක්
අප සමඟ සිටිනවා. **24** ඒ මිනිසුන්
සමඟ ගොස්[6] චාරිත්‍රානුකූලව පවිත්‍ර
වෙන්න. ඔවුන්ගේ හිස් බූ ගෑමට[7]
අවශ්‍ය වියදම්ද දරන්න.[8] ඔබ එහෙම
කළොත් ඔබ ගැන පැතිර ඇති කට-
කතාවල කිසි සත්‍යයක් නැති බවත්
ඔබ යහපත් ලෙස හැසිරෙන, නීති-
යට එකඟව කටයුතු කරන කෙනෙක්
බවත් සියලුදෙනාටම දැනගන්න
ලැබෙයි.[9] **25** වෙනත් ජාතීන් අතර
සිටින යේසුස්ගේ අනුගාමිකයන්ට අප
දැනටමත් අපේ තීරණය දන්වා තිබෙ-
නවා. එනම් ඔවුන් දේවතා රූපව-
ලට පූජා කළ දේවලින්,[10] ලේවලින්,[11]
බෙල්ල මිරිකා මැරූ සතුන්ව ආහාර-
යට ගැනීමෙන්[12] සහ වේශ්‍යාකම්න්*[13]
දිගටම වැළකී සිටිය යුතු බවයි."

**21 පරි.**
1 ක්‍රියා 6:5
2 යෝවේ 2:28, ක්‍රියා 2:17, 1කොරි 11:5
3 ක්‍රියා 11:28
4 ක්‍රියා 20:23, ක්‍රියා 21:33
5 ක්‍රියා 9:16
6 මතෙ 16:22
7 ක්‍රියා 20:24
8 ද්වි 20:8
9 2කොරි 4:10, 2තිමෝ 4:6
10 1සාමු 3:18, මතෙ 26:42
11 රෝම 15:25
12 ක්‍රියා 18:22
13 ක්‍රියා 24:11
14 ක්‍රියා 15:4
15 ක්‍රියා 12:17, ක්‍රියා 15:13, ගලා 1:19, ගලා 2:9, යාකො 1:1

**2 තීරුව**
1 ක්‍රියා 15:12, රෝම 15:18
2 ක්‍රියා 11:4, ක්‍රියා 14:27
3 ක්‍රියා 15:1, ක්‍රියා 22:3, රෝම 10:2, ගලා 1:14
4 ක්‍රියා 6:14, ගලා 5:1
5 රෝම 2:28, 1කොරි 7:19
6 ගණන් 6:2
7 ගණන් 6:18, ක්‍රියා 18:18
8 ගණන් 6:14, ගණන් 6:15, ගණන් 6:17
9 1කොරි 9:20
10 උත් 35:2, නික් 34:15, ක්‍රියා 15:29
11 උත් 9:4, ලෙවී 3:17, ලෙවී 17:10, ද්වි 12:23, 1සාමු 14:32
12 ලෙවී 17:13
13 1කොරි 6:9, කොලො 3:5, 1තෙස 4:3, 1පේතෘ 4:3

**ක්‍රියා 21:25*** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න.

26 පසුවදා පාවුල් ඒ මිනිසුන් සමඟ
ගොස් ඔවුන් සමඟ තමාවද චාරිත්‍රානු-
කූලව පවිත්‍ර කරගත්තේය.[1] ඉන්පසු
ඔහු දේවමාලිගාවට ඇතුල් වී චාරි-
ත්‍රානුකූලව පවිත්‍ර වීම සඳහා වෙන්
කර ඇති දවස් නිම වන්නේ කව-
දාද කියාත්[2] ඔවුන් එක් එක් කෙනා
සඳහා[3] පූජාවක් ඔප්පු කළ යුතු දවස
කුමක්ද කියාත්[4] දැනුම් දුන්නේය.
27 එම චාරිත්‍රය සඳහා වෙන් කර
තිබූ දවස් හත[5] නිම වීමට ළං
වූ විට ආසියාවෙන් පැමිණි යුදෙව්-
වරු, පාවුල් දේවමාලිගාවේ සිටි-
නවා දුටුවෝය. එවිට ඔවුහු රැස්ව
සිටි මුළු සමූහයාව උසිගන්වා මහත්
කලබලයක් ඇති කර[6] ඔහුව අල්-
ලාගෙන, 28 මෙසේ කෑගැසුවෝය.
“ඊශ්‍රායෙල් ජනයෙනි, ඇවිත් උදව්
කරන්න! අපේ ජනතාවටත් නීතිය-
ටත් මෙම ස්ථානයටත් විරුද්ධව හැම
තැනම වැරදි ඉගැන්වීම් පතුරුවන්-
නේ මේ මිනිසායි.[7] ඒ මදිවට ඔහු
ග්‍රීකවරුන්වත් දේවමාලිගාව ඇතුළට
ගෙනැවිත් මේ ශුද්ධස්ථානය අප-
විත්‍ර කරනවා.”[8] 29 එම චෝදනාව
ඔහුට විරුද්ධව එල්ල කරනු ලැබු-
වේ එෆීසයේ වැසියෙකු වූ ත්‍රොෆිමස්[9]
කලින් අවස්ථාවකදී ඔහු සමඟ නුවරේ
සිටිනවා ඔවුන් දුටු නිසාය. නමුත්
පාවුල් ඔහුව දේවමාලිගාව තුළට ගෙ-
නාවේ නැත. 30 මුළු නුවර පුරාම
කෝලහලයක් ඇති වූ නිසා[10] සෙනඟ
එහෙ මෙහෙ දුවන්න පටන්ගත්තෝය.
කිහිපදෙනෙක් පාවුල්ව අල්ලා දේව-
මාලිගාවෙන් පිටතට ඇදගෙන ගිය
අතර[11] එසේ කළ වහාම දේවමාලිගා-
වේ දොරටු වසා දමන ලදි. 31 සෙ-
නඟ ඔහුව මරා දැමීමේ අදහසින් ඔහුට
පහර දෙන අතරතුරේදී, මුළු යෙරුස-
ලම පුරාම මහත් කෝලහලයක් හට-
ගෙන ඇති බව හමුදාපතිට ආරංචි
විය.[12] 32 ඔහු වහාම හේවායින් පිරි-
සක් සහ හමුදා නිලධාරීන් කිහිපදෙ-
නෙකුව රැගෙන කෝලහලය සිදු වූ
තැනට දිව ගියේය.[13] පාවුල්ට පහර
දෙමින් සිටි පිරිස හමුදාපතිව[14] හා
හේවායන්ව දුටු වහාම පාවුල්ට පහර
දීම නතර කළෝය.
33 ඉන්පසු හමුදාපති ඔවුන් ළඟට
ඇවිත් පාවුල්ව දම්වැල් දෙක-
කින් බැඳ තබන්න කියා[1] අණ කර
පාවුල් පිළිබඳ තොරතුරු සහ ඔහු
කළ දේ ගැන සමූහයාගෙන් විමසු-
වේය. 34 ඔවුන් අතරින් කිහිපදෙ-
නෙක් කෑගසමින් පරස්පර විරෝධී
දේවල් කියන්න පටන්ගත්තෝය.[2]
ඇති වූ කෝලහලය නිසා ඔහුට කිසි-
වක් නිවැරදි ලෙස දැනගත නො-
හැකි විය. එහෙයින් පාවුල්ව හමුදා
කඳවුරට රැගෙන යන්න කියා හමුදා-
පති අණ කළේය.[3] 35 නමුත් ඔහු
එහි පඩි පෙළ නඟින විට සමූහයා
කොතරම් දරුණු ලෙස ක්‍රියා කරන්න
පටන්ගත්තාද කිවහොත් පාවුල්ව
උසුලාගෙන යෑමට හේවායන්ට සිදු
විය. 36 මන්ද “ඔහුව මරා දමන්න”[4]
කියා කෑගසමින් ඔවුහු ඔවුන් පසුපසම
ගියෝය.
37 තමාව හමුදා කඳවුර ඇතුළට
ගෙන යන්න සූදානම් වූ විට පාවුල්
හමුදාපතිට මෙසේ කීවේය. “ඔබට
යමක් කියන්න මට අවසර තිබෙන-
වාද?” එවිට හමුදාපති මෙසේ පිළි-
තුරු දුන්නේය. “ඔබට ග්‍රීක බස කතා
කරන්නත් පුළුවන්ද? 38 මීට දවස්
කිහිපයකට කලින් කැරැල්ලක් ඇති
කර,[5] ඊටපස්සේ මැරයන් හාරදහසක්
සමඟ පාළුකරයට ගිය අර ඊජිප්තු
කැරලිකාරයා ඔබ නේද?” 39 එවිට
පාවුල් මෙසේ කීවේය. “නැහැ, මම
යුදෙව්වෙක්.[6] මම සිලිසියා නම් ප්‍රදේ-
ශයේ ටාසස්[7] නම් ප්‍රසිද්ධ නුවරේ
පුරවැසියෙක්. ඒ නිසා මම ඔබෙන්
බැගෑපත්ව ඉල්ලා සිටින්නේ මේ සමූ-
හයාට කතා කරන්න මට අවසර
දෙන්න කියායි.” 40 ඔහු අවසර දුන්
විට පාවුල් පඩි පෙළ මත සිටගෙන,
සෙනඟට අතින් සංඥාවක් කළේය.[8]
සියලුදෙනාම නිශ්ශබ්ද වූ විට ඔහු
සෙනඟට හෙබ්‍රෙව් බසින්[9] අමතා පැව-
සුවේ මෙසේය.

**21 පරි.**
1 ක්‍රියා 24:18, 1කොරි 9:20
2 ගණන් 6:5
3 ගණන් 6:21
4 ගණන් 6:19
5 ගණන් 6:9
6 ක්‍රියා 19:29
7 ක්‍රියා 24:5
8 ක්‍රියා 24:6
9 ක්‍රියා 20:4, 2තිමෝ 4:20
10 ක්‍රියා 17:5
11 ක්‍රියා 26:21
12 ක්‍රියා 21:27
13 ක්‍රියා 23:27
14 ක්‍රියා 23:26

**2 තීරුව**
1 ක්‍රියා 20:23, ක්‍රියා 21:11, එෆී 6:20
2 ක්‍රියා 19:32
3 ක්‍රියා 22:24
4 ලූක් 23:18, යොහ 19:15, ක්‍රියා 22:22
5 ක්‍රියා 5:36
6 පිලි 3:5
7 ක්‍රියා 9:11, ක්‍රියා 22:3
8 ක්‍රියා 13:16, ක්‍රියා 19:33
9 ක්‍රියා 26:14

**22** “සහෝදරයෙනි,[1] පියවරුනි,
මට සවන් දෙන්න. මම කැම-
තියි සිදු වී ඇති දේවල් ඔබට විස්තර
කරන්න.”[2] **2** (ඔහු හෙබ්‍රෙව් බසින්[3]
කතා කරනවා ඔවුන්ට ඇසුණු විට
දැඩි නිශ්ශබ්දතාවක් ඇති විය. ඔහු
පැවසුවේ මෙසේය.) **3** “මම යුදෙව්-
වෙක්.[4] මම සිලීසියා ප්‍රදේශයේ ටාසස්
නම් නුවරේ උපන් කෙනෙක්.[5]
මම අධ්‍යාපනය ලැබුවේ මේ නුවරේ
ගමාලියෙල්ගේ පාමුල ඉඳගෙනයි.[6]
අපේ මුතුන්මිත්තන්ගෙන් පැවතෙන
නීතිය අකුරටම පිළිපදින්න මට
ඉගැන්නුවා.[7] ඒ නිසා අද මෙහි
සිටින ඔබ සියලුදෙනාටම වගේ මටත්
දෙවි ගැන දැවෙන උද්‍යෝගයක්
තිබුණා.[8] **4** ඉතින් මම මේ, ‘මාර්-
ගය’ අනුගමනය කරන ස්ත්‍රීන් හා
පුරුෂයන් සියලුදෙනාටම පීඩා කළා.
ඔවුන්ව දම්වැල්වලින් බැඳ සිරගෙට
දැම්මා.[9] මට අවශ්‍ය වුණේ සියලුදෙ-
නාවම නැති කර දමන්නයි.[10] **5** මා
කළ දේවලට සාක්ෂි ඔබට උත්තම
පූජකයාගෙනුත් වැඩිමහල්ලන් සියලු-
දෙනාගෙනුත්[11] ලබාගන්න පුළුවන්.
දමස්කයේ සිටි ඔවුන්ගේ සෙසු සහෝ-
දරයන්ට පෙන්නන්න මම ඔවුන්ගෙන්
ලිපි කිහිපයකුත් ඉල්ලගත්තා.[12] ඒ
ලිපි ඉල්ලගත්තේ දමස්කයේ සිටි
අයව අල්ලාගැනීමට අවශ්‍ය අවස-
රය ලබාගන්නයි. මට අවශ්‍ය වුණේ
ඔවුන්ව දම්වැල්වලින් බැඳ යෙරුසල-
මට ගෙනැවිත් ඔවුන්ට දඬුවම් දීමටයි.
**6** “පසුව මම ඒ සඳහා දමස්ක-
යට ළඟා වෙමින් සිටියා. ඒ සිද්ධිය
වන විට ඉර මුදුන් වී තිබුණා. එකව-
රම අහසෙන් පැමිණි ප්‍රබල ආලෝ-
කයක් මා වටා විහිදී ගියා.[13] **7** ඒ
මොහොතේම මම බිම ඇද වැටුණා.
එවිට, ‘සාවුල්, සාවුල්, ඔබ මට
පීඩා කරන්නේ ඇයි’[14] කියා පව-
සන හඬක් මට ඇසුණා. **8** ‘ස්වා-
මීනි, ඔබ කවුද’ කියා මම ඇසූ
විට ඒ හඬ මට පැවසුවේ මෙ-
යයි. ‘මම නාසරෙත් නුවරේ යේසුස්.
ඔබ පීඩා කරන්නේ මටයි.’[15] **9** මා
සමඟ පැමිණි මිනිසුන්[1] ඒ ආලෝ-
කය දැක්කත් මට කතා කළ ඒ හඬ
ඔවුන්ට ඇහුණේ නැහැ.[2] **10** ‘ස්වා-
මීනි, මා කළ යුත්තේ කුමක්ද’[3] කියා
මම ඇසුවා. එවිට ස්වාමීන් මට පැව-
සුවේ මෙයයි. ‘දැන් නැඟිට දමස්ක-
යට යන්න. ඔබට කරන්න තිබෙන
දේවල් ගැන එහිදී ඔබට දැනගන්න
ලැබෙයි.’[4] **11** ඒ ආලෝකය කො-
තරම් දීප්තිමත්ව බැබළුණාද කිය-
නවා නම් මට වෙන කිසි දෙයක්
පෙනුණේ නැහැ. මා සමඟ සිටි අය
මගේ අතින් අල්ලගෙන තමයි මාව
දමස්කයට ගෙනාවේ.[5]
**12** “නීතිය හොඳින් පිළිපැද්ද ඉතා
භක්තිවන්ත මිනිසෙක් වූ අනනියස්
එහි සිටියා. ඔහු එහි සිටි සියලු-
දෙනා අතර හොඳ නමක් දිනා-
ගෙන තිබුණු කෙනෙක්.[6] **13** ඔහු
මා ළඟට ඇවිත්, ‘මගේ සහෝ-
දර සාවුල්, දැන් ඔබේ පෙනීම ඔබට
නැවත ලැබෙයි’[7] කියා මට කිව්වා.
ඒ මොහොතේම මට පෙනීම ලැබුණු
නිසා ඔහුව දැකගන්න මට හැකි
වුණා. **14** ඉන්පසු ඔහු මට මෙ-
හෙම කිව්වා. ‘අපේ මුතුන්මිත්තන්ගේ
දෙවි[8] ඔහුගේ කැමැත්ත ගැන දැනුම්
දෙන්න ඔබව තෝරාගෙන තිබෙ-
නවා.[9] ඒ වගේම ධර්මිෂ්ඨ තැනැත්-
තාව[10] දකින්නත්[11] ඔහුගේ කටහඬ
අසන්නත්[12] ඔබව තෝරාගෙන තිබෙ-
නවා. **15** එසේ කළේ ඔබ ඔහු වෙ-
නුවෙන් සාක්ෂිකරුවෙක් වන නිසයි.
ඒ නිසා ඔබ ඇසූ දුටු දේ ගැන
සියලු මිනිසුන්ට දැනුම් දිය යුතුයි.[13]
**16** ඉතින්, ඔබ තවත් ප්‍රමාද වන්නේ
ඇයි? නැඟිට, බව්තීස්ම වී[14] යේසුස්-
ගේ නම කියා කන්නලව් කරන්න.[15]
ඔබේ පව්වලට සමාව ලබාගෙන
පවිත්‍ර වෙන්න.’[16]
**17** “ඉන්පසු මා නැවත යෙරුස-
ලමට ගියා.[17] දවසක් මම දේව-
මාලිගාවේ යාච්ඤා කරමින් සිටියදී
දර්ශනයක් දැක්කා.[18] **18** මම දැක්-
කේ ස්වාමීන්වයි. ඔහු මට මෙසේ
පැවසුවා. ‘ඉක්මනින් යෙරුසලමෙන්

**22 පරි.**
1 ක්‍රියා 7:2
2 පිලි 1:7
1පේතෘ 3:15
3 ක්‍රියා 21:40
4 ක්‍රියා 26:5
රෝම 11:1
5 ක්‍රියා 21:39
ක්‍රියා 23:34
6 ක්‍රියා 5:34
7 ක්‍රියා 26:5
8 ගලා 1:14
පිලි 3:6
9 ක්‍රියා 26:10
10 ක්‍රියා 8:3
ක්‍රියා 9:2
1තිමෝ 1:13
11 ක්‍රියා 4:23
12 ක්‍රියා 9:2
13 ක්‍රියා 9:3
ක්‍රියා 26:13
14 ක්‍රියා 9:4
ක්‍රියා 26:14
15 යොහ 18:5
ක්‍රියා 9:5
ක්‍රියා 26:15

**2 තීරුව**
1 ආනි 10:7
2 ක්‍රියා 9:7
3 ලූක් 3:10
ක්‍රියා 16:30
4 ක්‍රියා 26:16
5 ක්‍රියා 9:8
6 ක්‍රියා 10:22
1තිමෝ 3:7
7 ක්‍රියා 9:17
8 ක්‍රියා 3:13
ක්‍රියා 5:30
9 ක්‍රියා 9:15
ගලා 1:15
10 ක්‍රියා 3:14
හෙබ්‍රෙ 7:26
11 1කොරි 9:1
1කොරි 15:8
12 1කොරි 11:23
ගලා 1:12
13 ක්‍රියා 4:20
ක්‍රියා 23:11
ක්‍රියා 26:16
14 ක්‍රියා 9:18
15 ක්‍රියා 10:43
16 යෙසා 1:16
1කොරි 6:11
තීත 3:5
හෙබ්‍රෙ 10:22
1යොහ 1:7
එළි 1:5
17 ක්‍රියා 9:26
ගලා 1:18
18 2කොරි 12:1

පිට වෙන්න. මන්ද මා ගැන ඔබ
සාක්ෂි දැරුවත් ඔවුන් එය පිළිගන්-
නේ නැහැ.'[1] **19** එවිට මම මෙහෙම
කිව්වා. 'ස්වාමීනි, මා සිනගෝග-
යක් සිනගෝගයක් පාසා ගොස් ඔබ
කෙරෙහි විශ්වාසය තැබූ අයව[2] සිර-
ගත කළ බවත්[3] ඔවුන්ට හොඳටම
තැළූ බවත් ඒ අය හොඳින්ම දන්-
නවා. **20** ඒ වගේම ඔබේ සාක්ෂි-
කරු වූ ස්තේපන්ගේ ලේ[4] වැගිරවූ විට
මමත් එතැනට වී ඔහුව මරා දමන්න
හවුල් වූ අයගේ වස්ත්‍ර ආරක්ෂා කර-
ගෙන සිටියා. ඔවුන් කළ දේට මම
සහයෝගය දුන්නා.'[5] **21** ඒ වුණත්
ස්වාමීන් මට පැවසුවේ මෙයයි. 'මම
ඔබව දුර බැහැර සිටින ජාතීන් වෙතට
යවනවා.[6] ඒ නිසා දැන් යන්න සූදා-
නම් වෙන්න.'"

**22** ඒ වන තුරු ඔහුට සවන් දෙමින්
සිටි සමූහයා මහත් හඬකින් මෙසේ
කියන්න පටන්ගත්තෝය. "මේ
වගේ මිනිසෙක් තවත් ජීවත් වෙන්න
සුදුසු නැහැ. ඔහුව මරා දමන්න!"[7]
**23** ඔවුහු කෑගසමින්ද තමන්ගේ පිට
වස්ත්‍ර ගලවා විසි කරමින්ද දූවිලි
ඉහළට විසි කරමින්ද සිටියෝය.[8]
**24** මේ අතර පාවුල්ව හමුදා කඳවුරට
ගෙන යන ලෙස අණ කළ හමුදා-
පති, ඔහුට කසයෙන් තළා ඔහු ගැන
විභාග කළ යුතු බව කීවේය. ඔහුට
අවශ්‍ය වූයේ සෙනඟ පාවුල්ට විරුද්ධව
එලෙස කෑගසමින්[9] සිටියේ ඇයි කියා
දැනගැනීමටය. **25** පාවුල්ට කස-
යෙන් පහර දීමට ඔවුන් ඔහුගේ දෑත්
ඔසවා ඔහුව බැඳ ඇමූ විට ඔහු තමන්
අසල සිටි හමුදා නිලධාරියාට මෙසේ
පැවසුවේය. "වරදකරුවෙක් හැටියට
ඔප්පු කර නැති රෝම පුරවැසියෙ-
කුට[10] මෙහෙම කසයෙන් තළන්න
ඔබට නීතියෙන් අවසර තිබෙනවාද?"
**26** එය ඇසූ හමුදා නිලධාරියා හමු-
දාපති වෙතට ගොස්, "මේ මිනිසා
රෝම පුරවැසියෙක්. ඒ නිසා අපි දැන්
මොනවද කරන්නේ" කියා ඇසුවේය.
**27** හමුදාපති ඔහු ළඟට ඇවිත්, "මට
කියන්න, ඔබ රෝම පුරවැසියෙක්ද"[11]
කියා ඔහුගෙන් ඇසුවේය. ඔහු, "ඔව්"
කියා පිළිතුරු දුන්නේය. **28** එවිට
හමුදාපති, "මම නම් මගේ පුරවැසිකම
ලබාගත්තේ විශාල මුදලක් ගෙවලයි"
කියා පැවසුවේය. එවිට පාවුල්, "මම
උපන් දා ඉඳලම රෝම පුරවැසියෙක්"[1]
කියා පිළිතුරු දුන්නේය.

**29** ඒ දේ ඇසූ වහාම ඔහුට වධ
හිංසා දී ඔහුගෙන් ප්‍රශ්න ඇසීමට සූදා-
නම්ව සිටි පිරිස ඔහුගෙන් ඉවත් වී
ගියෝය. රෝම පුරවැසියෙකු වූ[2] ඔහුව
දම්වැල්වලින් බැඳ තැබූ නිසා හමුදා-
පති තුළද බියක් ඇති විය.

**30** යුදෙව්වරුන් ඔහුට විරුද්ධව
එල්ල කරමින් සිටියේ කවර අන්දමේ
චෝදනාවක්ද කියා නිසි ලෙස දැන-
ගැනීමට හමුදාපතිට අවශ්‍ය විය. ඒ
නිසා ඔහු ඊළඟ දිනයේදී පාවුල්ගේ
දම්වැල් ඉවත් කර, නායක පූජක-
යන්ට හා මුළු මන්ත්‍රණ සභාවට රැස්
වෙන්න කියා අණ කළේය. ඔවුන් රැස්
වූ විට ඔහු පාවුල්ව ඔවුන් ඉදිරියට ගෙ-
නාවේය.[3]

**23** පාවුල් මන්ත්‍රණ සභාවේ සිය-
ලුදෙනා දෙස හොඳින් බැලු-
වේය. ඉන්පසු ඔහු මෙසේ කීවේය.
"සහෝදරයෙනි, මෙදින දක්වා මා
කටයුතු කර ඇති ආකාරය දෙස
බලද්දී දෙවි ඉදිරියේ මට සම්පූර්-
ණයෙන්ම නිදොස් හෘදය සාක්ෂියක්
ඇති බව[4] මට කියන්න පුළුවන්."
**2** එය ඇසූ උත්තම පූජක අන-
නියස්, ඔහුගේ කටට පහරක් ගසන
ලෙස[5] ඔහු ළඟ සිටගෙන සිටි අයට
අණ කළේය. **3** එවිට පාවුල් ඔහුට
මෙසේ කීවේය. "හුණු ගා සුදු කළ
බිත්තියක්[6] හා සමාන කුහකයෙක්
වන ඔබට දෙවි පහර දෙයි. නීති-
යට අනුව මාව විනිශ්චය කිරීමට
ඉඳගෙන සිටින ඔබ,[7] ඒ නීතියම උල්-
ලංඝනය කරමින්[8] මට පහර දෙන්න
කියාත් අණ කරනවාද?" **4** ඔහු ළඟ
සිටගෙන සිටි අය, "දෙවිගේ උත්තම
පූජකයාට ඔබ කතා කරන්නේ ඔහො-
මද" කියා ඔහුගෙන් ඇසූහ. **5** එවිට
පාවුල්, "සහෝදරයෙනි, ඔහු උත්තම

---

**22 පරි.**
1 ක්‍රියා 9:29
2 මතෙ 10:17
3 ක්‍රියා 8:3
4 ක්‍රියා 7:58
5 ක්‍රියා 8:1; 1තිමෝ 1:15
6 ක්‍රියා 9:15; ක්‍රියා 13:2; රෝම 1:5; රෝම 11:13; ගලා 2:7; 1තිමෝ 2:7
7 ක්‍රියා 21:36; ක්‍රියා 23:14; ක්‍රියා 25:24
8 2සාමු 16:13
9 ක්‍රියා 21:34
10 ක්‍රියා 16:37; ක්‍රියා 23:27
11 ක්‍රියා 23:27

**2 තීරුව**
1 ක්‍රියා 16:37
2 ක්‍රියා 16:38; ක්‍රියා 25:16
3 මතෙ 10:17; ලූක් 21:12

**23 පරි.**
4 ක්‍රියා 24:16; 2කොරි 1:12; 2තිමෝ 1:3; හෙබ්‍රෙ 13:18; 1පේතෘ 3:16
5 1රාජා 22:24; යෙරෙ 20:2; යොහ 18:22
6 මතෙ 23:27
7 ලෙවී 19:15
8 ද්වි 25:1; යොහ 7:51

පූජකයා බව මම දැන සිටියේ නැහැ.
මන්ද, ‘ඔබ අතරේ සිටින අධිපති-
යෙකු ගැන ඔබ අවමන්සහගත ලෙස
කතා නොකළ යුතුයි’[1] කියා ලියා
තිබෙනවා” කියා පැවසුවේය.

**6** මන්ත්‍රණ සභාවේ එක් කොට-
සක් සද්දුසිවරුන්ගේ ආගමික නිකා-
යට[2] අයිති බවත් අනික් කොටස
පරිසිවරුන්ගේ නිකායට අයිති බවත්
පාවුල් වටහාගත් විට ඔහු ඔවුන්ට
මෙසේ ශබ්ද නඟා පැවසුවේය.
“සහෝදරයෙනි, මමත් පරිසිවරුන්-
ගේ නිකායට අයිති කෙනෙක්.[3] මගේ
පියාත් පරිසිවරයෙක්. අද ඔබ මාව
වැරදිකරුවෙක් කරන්න හදන්නේ[4]
මම නැවත නැඟිටීම ගැන විශ්වාස
කරන නිසයි.”[5] **7** ඔහු ඒ දේ පැවසූ
නිසා පරිසිවරුන් සහ සද්දුසිවරුන්
අතරේ ආරවුලක් හටගෙන[6] ඔවුහු
භේද වූහ. **8** මන්ද සද්දුසිවරුන්ගේ
නිකායේ සිටින්නන්[7] නැවත නැඟිටී-
මක්වත් දේවදූතයන් හා වෙනත්
නොපෙනෙන බලවේගයන්වත් නැති
බව[8] පැවසුවත් පරිසිවරුන්ගේ නිකා-
යේ සිටින අය ප්‍රසිද්ධියේම පවසන්නේ
ඒ සියල්ලම පවතින බවය. **9** එවිට
කෑගසමින්[9] සිටි ඔවුන්ගේ හඬ තවත්
උත්සන්න විය. පරිසිවරුන්ගේ නිකා-
යට අයත්ව සිටි නීතිය පිටපත් කරන්-
නන් කිහිපදෙනෙක් නැඟිට ඉතා
සැරපරුෂ ලෙස මෙසේ කීවෝය. “මේ
මිනිසා කිසිම වරදක් කර ඇති බව
අපට නම් පෙනෙන්නේ නැහැ.[10] සම-
හරවිට නොපෙනෙන යම් ජීවියෙක්
නැත්නම් දේවදූතයෙක් ඔහුට කතා
කරන්න ඇති.”[11] **10** ආරවුල තව
තවත් උග්‍ර අතට හැරුණු විට ඔවුන්
පාවුල්ට දරුණු ලෙස පහර දී ඔහුව
මරා දැමීමට පවා ඉඩකඩ ඇති බව
හමුදාපතිට වැටහිණ. එසේ ඔහු බිය වූ
නිසා තම හේවා පිරිසට අණ කළේ[12]
පාවුල් සිටි තැනට ගොස් ඔහුව හමුදා
කඳවුරට ගෙන යන ලෙසය.[13]

**11** නමුත් එදින රාත්‍රියේදී ස්වාමීන්
පාවුල් ඉදිරියේ දර්ශනය වී,[14] “කිසි
දෙයකින් අධෛර්යය වෙන්න එපා.[15]
ඇත්තෙන්ම ඔබ යෙරුසලමේදී මා
ගැන ඉතා හොඳ සාක්ෂියක් දී තිබෙ-
නවා.[1] ඔබට රෝමයේදීත් මෙවැනි
සාක්ෂියක් දරන්න සිදු වෙයි”[2] කියා
කීවේය.

**12** ඊළඟ උදෑසන යුදෙව්වරුන්
පිරිසක් එකට එකතු වී පාවුල්ට විරුද්-
ධව කුමන්ත්‍රණය කළෝය.[3] ඔවුන්
තීරණය කළේ ඔහුව මරා දමන තුරු
නොකා නොබී සිටීමටය.[4] ඒ සම්බන්-
ධයෙන් ඔවුහු දිවුරුමක්ද කළෝය.[5]
**13** එම කුමන්ත්‍රණයට හවුල් වී දිවු-
රුම් දුන් පුරුෂයන්ගේ ගණන හතළි-
හකටත් වඩා වැඩි විය. **14** ඔවුහු
නායක[6] පූජකයන් සහ වැඩිමහල්-
ලන් වෙතට ගොස් මෙසේ කීවෝය.
“පාවුල්ව මරා දමන තුරු කෑම නොකා
සිටීමට අපි දිවුරුමක් කර තිබෙනවා.
**15** එමනිසා ඔබත් මන්ත්‍රණ සභා-
වේ සාමාජිකයනුත් හමුදාපතිව හමු වී
පාවුල්ගෙන් තවත් තොරතුරු වඩාත්
නිවැරදිව දැනගැනීමට අපට අවශ්‍ය
බව කියන්න.[7] ඒ සඳහා ඔහුව ඔබ
රැස් වන තැනට ගෙනා යුතු බවත්
කියන්න. ඔහු යන අතරතුරේදී අපි
මඟ රැකගෙන සිටිනවා. එවිට ඔහුව
මරා දමන්න අපට පුළුවන් වෙයි.”[8]

**16** එසේ මඟ රැක සිටීමට අදහස්
කළ අයගේ සැලසුම් ගැන පාවුල්-
ගේ සහෝදරියගේ පුත්‍රයාට ආරංචි
විය.[9] එහෙයින් ඔහු හමුදා කඳවු-
රට ගොස් පාවුල්ව හමු වී ඔහුට ඒ
ගැන දැන්නුවේය. **17** එවිට පාවුල්,
හමුදා නිලධාරීන්ගෙන් එක් කෙනෙ-
කුව කැඳවා, “හමුදාපතිට දන්වන්න
යම් තොරතුරක් මේ තරුණයා ළඟ
තිබෙනවා. ඒ නිසා ඔහුව හමුදා-
පති ළඟට ගෙන යන්න” කියා පැව-
සුවේය. **18** එහෙයින් ඒ නිලධාරියා
ඔහුව හමුදාපති වෙතට ගෙන ගොස්
මෙසේ පැවසුවේය. “පාවුල් නම් සිර-
කරුවා මාව ළඟට කැඳවා, ඔබට
දන්වන්න යමක් මේ තරුණයා ළඟ
තිබෙනවා කියා පැවසුවා. ඔහු ඉල්ලා
සිටියේ මේ තරුණයාව ඔබ වෙතට
ගෙන යන්න කියායි.” **19** හමුදාපති

**23 පරි.**
1 නික් 22:28; දේශ 10:20
2 ක්‍රියා 4:1
3 ක්‍රියා 26:5; පිලි 3:5
4 ක්‍රියා 28:20
5 ක්‍රියා 24:21
6 මතෙ 22:23
7 මාක් 12:18
8 ලූක් 20:27
9 මතෙ 8:29
10 ලූක් 23:4; ක්‍රියා 25:25
11 ක්‍රියා 22:7; ක්‍රියා 22:17
12 ක්‍රියා 21:32
13 ක්‍රියා 22:24
14 ක්‍රියා 27:23
15 ක්‍රියා 18:9; ක්‍රියා 27:24

**2 තීරුව**
1 ක්‍රියා 20:21
2 ක්‍රියා 28:23; ක්‍රියා 28:30; රෝම 1:15
3 ක්‍රියා 25:3
4 ගීතා 31:13
5 ක්‍රියා 23:21
6 දේශ 5:8
7 ක්‍රියා 23:20
8 ක්‍රියා 25:3
9 ක්‍රියා 9:24

ඔහුව අතින් අල්ලාගෙන පැත්ත-
කට ගෙන ගොස්,[1] “ඔබට කියන්න
තිබෙන්නේ කුමක්ද” කියා ඔහුගෙන්
විමසුවේය. **20** ඔහු මෙසේ කීවේය.
“යුදෙව්වන් පිරිසක් එකඟතාවකට
ඇවිත් ඔබව හමු වීමට අදහස් කර-
ගෙන සිටිනවා. ඔවුන් එන්නේ හෙට
මන්ත්‍රණ සභාව ඉදිරියට පාවුල්ව
ගෙන එන්න කියා ඔබෙන් ඉල්ලා
සිටීමටයි. පාවුල් ගැන තවත් තො-
රතුරු නිවැරදිව දැනගන්න අවශ්‍ය
නිසා ඔහුව ගෙන එන්න කියා ඔවුන්
ඔබට කියයි.[2] **21** නමුත් ඔවුන්ගේ
අදහස ඒ දේ කරන්න නොවෙයි.
දැනටමත් මිනිසුන් හතළිස්දෙනෙ-
කුට වැඩි පිරිසක් ඔහුව මරා දැමී-
මේ අදහසින් මඟ රැකගෙන සිටිනවා.[3]
ඔහුව මරා දමන තුරු ඔවුන් කන්නේ-
වත් බොන්නේවත් නැතුව සිටිනවා
කියා දිවුරුමකුත් කර තිබෙනවා.[4]
දැන් ඔවුන් බලාගෙන සිටින්නේ ඔබ
පාවුල්ව ගෙන එන තුරුයි. ඒ නිසා
ඔවුන් කරන ඉල්ලීමට කොහොමට-
වත් එකඟ වෙන්න එපා.” **22** එවිට
හමුදාපති, “ඔබ මේ දේවල් මට දැන්වූ
බව වෙන කාටවත් කියන්න එපා”
කියා තරුණයාට අවවාද කර ඔහුව
පිටත් කර යැව්වේය.

**23** ඉන්පසු ඔහු හමුදා නිලධාරීන්
දෙදෙනෙකුව කැඳවා මෙසේ කීවේය.
“සිසේරියට යෑම සඳහා හේවායන්
දෙසීයක්ද අසරුවන් හැත්තෑවක්ද
හෙල්ල අතැතිව සිටින දෙසියදෙ-
නෙක්වද වහාම සූදානම් කරන්න.
ඔවුන් පිටත් විය යුත්තේ අද රාත්‍රි-
යේ තුන්වෙනි පැයේදීයි.* **24** පාවුල්
සඳහාත් අශ්වයෙක් සූදානම් කරන්න.
එවිට කිසිම කරදරයක් නැතුව ඔහුව
ආණ්ඩුකාර ෆීලික්ස් වෙතට ගෙන
යන්න ඔවුන්ට හැකි වෙයි.” **25** ඔහු
ෆීලික්ස්ට මෙවැනි ලිපියක්ද පිළියෙල
කළේය.

**26** “ක්ලෝදියස් ලිසියස් වෙතින්
අතිගරු ආණ්ඩුකාර ෆීලික්ස්[5] වෙත-
ටය. ඔබතුමන්ට සුබ පැතුම්!
**27** මා ඔබතුමන් වෙතට එවන
මේ මිනිසාව යුදෙව්වරු අල්ලාගෙන
මරා දමන්න උත්සාහ කළෝය. ඔහු
රෝම පුරවැසියෙකු බව මා දැන-
ගත් නිසා[1] හේවායන් පිරිසක් සමඟ
වහාම පැමිණ ඔහුව බේරාගත්තෙමි.[2]
**28** ඔවුන් ඔහුට විරුද්ධව චෝදනා
කිරීමට හේතුව දැනගැනීම සඳහා මම
ඔහුව ඔවුන්ගේ මන්ත්‍රණ සභාව[3] ඉදි-
රියටත් රැගෙන ගියෙමි. **29** ඔහුට
එල්ල කර තිබුණු චෝදනා ඔවුන්ගේ
නීතියට සම්බන්ධ දෙයක් බව එවිට
මට හෙළි විය.[4] නමුත් මරණ දණ්-
ඩනය හෝ සිරදඬුවමක් හෝ ලැබී-
මට තරම් කිසි චෝදනාවක් ඔහුට
විරුද්ධව එල්ල වී නැති බව මට
වැටහිණ.[5] **30** නමුත් මේ මිනිසාට
විරුද්ධව කුමන්ත්‍රණයක්[6] දියත් කර
තිබෙන බව මට ආරංචි වූ නිසා මා
සිතුවේ වහාම ඔහුව ඔබතුමන් වෙතට
එවීම සුදුසු බවය. එහෙයින් ඔබතු-
මන් ඉදිරියට ඇවිත් ඔහුට විරුද්ධව
තම චෝදනා ඉදිරිපත් කරන ලෙස
පැමිණිලිකරුවන්ට නියෝග කරන්-
නෙමි.”[7]

**31** ඒ අනුව එම හේවායෝ[8]
තමන්ට අණ කළ ලෙස පාවුල්ව
රැගෙන රාත්‍රියෙහි අන්තිපත්‍රිස නුවර
දක්වා ආවෝය. **32** පසුවදා ඔහු
සමඟ අසරුවන් පිරිස ගිය අතර හේ-
වායන් කණ්ඩායම නැවත තම හමුදා
කඳවුර බලා ආවෝය. **33** අසරුවන්
පිරිස සිසේරියට ඇතුල් වී,[9] ආණ්-
ඩුකාරයාට ලිපිය භාර දී පාවුල්වද
ඔහු ඉදිරියට ගෙනාවෝය. **34** එවිට
ආණ්ඩුකාරයා ලිපිය කියවා, පාවුල්
පැමිණියේ කුමන පළාතෙන්ද කියා
විමසූ විට ඔහු සිලීසියාවෙන්[10] පැමිණි
බව දැනගත්තේය.[11] **35** “ඔබට
විරුද්ධව චෝදනා කරන අය[12] පැමිණි
පසු මම ඔබේ නඩුව සම්පූර්ණ-
යෙන්ම විභාග කරනවා” කියා පවසා
ඔහු පාවුල්ව හෙරොද්ගේ ප්‍රීටෝරියානු
මාලිගාවේ ආරක්ෂාව යටතේ රඳවා
තැබීමට අණ කළේය.

---

ක්‍රියා **23:23*** එනම්, ප.ව. 9ට පමණ.

**23 පරි.**
1 ක්‍රියා 23:16
2 ක්‍රියා 23:15
3 ගීතා 10:9 හිතෝ 1:16 යෙසා 59:7 ක්‍රියා 9:23 2කොරි 11:26
4 ක්‍රියා 23:12
5 ක්‍රියා 24:3

**2 තීරුව**
1 ක්‍රියා 16:37 ක්‍රියා 22:25
2 ක්‍රියා 21:33
3 ක්‍රියා 22:30
4 ක්‍රියා 18:15 ක්‍රියා 24:5 ක්‍රියා 25:19
5 ක්‍රියා 26:31
6 ක්‍රියා 23:16 ක්‍රියා 25:3
7 ක්‍රියා 24:8 ක්‍රියා 25:5 ක්‍රියා 25:11
8 ක්‍රියා 23:23
9 ක්‍රියා 8:40
10 ක්‍රියා 6:9 ක්‍රියා 21:39
11 ක්‍රියා 22:3
12 ක්‍රියා 24:1 ක්‍රියා 25:16

**24** දින පහකට පසුව උත්තම
පූජක අනනියස්ද[1] සම-
හර වැඩිමහල්ලන්ද ටෙර්ටුලස් නම්
නීතිඥයෙක්ද පැමිණ පාවුල්ට විරුද්-
ධව ආණ්ඩුකාරයා ඉදිරියේ[2] චෝදනා
ඉදිරිපත් කළෝය.[3] **2** ටෙර්ටුලස්ව
කැඳවනු ලැබූ විට ඔහු පාවුල්ට විරුද්-
ධව තිබූ චෝදනා ඉදිරිපත් කරමින්
මෙසේ කීවේය.

“අතිගරු ෆීලික්ස් ආණ්ඩුකාරතු-
මනි, ඔබේ පාලනය යටතේ අපි මහත්
සාමයක් අද්දකින බව[4] මා මෙහිදී සඳ-
හන් කරන්න කැමතියි. මීට අමතරව
ඔබේ දුර දක්නා නුවණ නිසා මේ
ජාතිය වෙනුවෙන් බොහෝ ප්‍රතිසංස්-
කරණ කටයුතු සිදු වන බවත් අපට
පෙනී යනවා. **3** අතිගරු[5] ආණ්ඩු-
කාරතුමනි, ඒ දේවල් කවදා කොතැ-
නක සිදු වුණත් අප ඒවා පිළිගන්නේ
හද පිරි කෘතඥතාවකිනුයි. **4** කෙ-
සේනමුත් ඔබේ වටිනා කාලය තවත්
නාස්ති කිරීමට මා තුළ කැමැත්තක්
නැහැ. එමනිසා මම බැගෑපත්ව ඉල්ලා
සිටින්නේ අපට කෙටි වේලාවකට
ඉවසිලිවන්තව සවන් දෙන්න කියායි.
**5** මේ මිනිසා මහ කරදරකාරයෙක්[6]
බව අපට පෙනී ගියා. ඔහු ලොව පුරා
සිටින සියලුම යුදෙව්වරුන් අතර ආර-
වුල් සහ භේද ඇති කරනවා.[7] ඔහු
නාසරෙත් නුවරෙන් බිහි වුණු නිකා-
යේ ප්‍රධාන නියෝජිතයෙක්.[8] **6** ඔහු
දේවමාලිගාව අපවිත්‍ර කරන්නත් උත්-
සාහ කළා.[9] ඒ අවස්ථාවේදී තමයි
අපි ඔහුව අත්අඩංගුවට ගත්තේ.
**7** —— **8** අප ඔහුට විරුද්ධව එල්ල
කරන සියලු චෝදනාවල ඇත්ත
නැත්ත ඔහුව විභාග කිරීමෙන් ඔබතු-
මන්ටත් දැනගන්න පුළුවන්.”

**9** ඔහු එසේ පැවසූ පසු අනික්
යුදෙව්වරුද එකතු වී එම චෝදනා-
වලට පදනමක් ඇති බව කියන්න
පටන්ගත්තෝය. **10** එවිට ආණ්ඩු-
කාරයා පාවුල් දෙස බලා ඔහුට කතා
කරන්න කියා තම හිසෙන් සංඥා කළ
විට පාවුල් මෙසේ පිළිතුරු දුන්නේය.

“ඔබතුමන් මේ දේශයේ අවුරුදු
ගණනාවක් පුරා විනිශ්චයකරුවෙකු
ලෙස කටයුතු කර ඇති බව මම
හොඳින් දන්නවා. ඒ නිසා මගේ පැත්-
තෙනුත් තොරතුරු ඉදිරිපත් කරන්න
මම ඉතාමත් සතුටුයි.[1] **11** මම
නමස්කාරය සඳහා[2] යෙරුසලමට
පැමිණියේ දවස් දොළහකට ඉහතදී
බව ඔබතුමන්ට දැනගන්න පුළුවන්.
**12** මේ අය මාව දේවමාලිගාවේ[3]
දකින අවස්ථාවේදී මම කිසි කෙ-
නෙකු සමඟ වාද කරමින් සිටියේ-
වත් නුවරේ හා සිනගෝගවල සිටි
සෙනඟව උසිගන්වමින්[4] සිටියේවත්
නැහැ. **13** ඒ විතරක් නොවෙයි,
ඔවුන් දැන් මට විරුද්ධව එල්ල කරන
චෝදනා ඔප්පු කරන්නත් ඔවුන්ට
බැහැ.[5] **14** නමුත් මම එක දෙයක්
පිළිගන්න කැමතියි. එනම් මම දැන්
ජීවත් වන්නේ ඔවුන් ‘ආගමික නිකා-
යක්’ කියා හඳුන්වන කණ්ඩායමේ
සාමාජිකයෙක් ලෙසයි. මගේ මුතුන්-
මිත්තන්ගේ දෙවිට[6] මම නමස්කාර
කරන්නේ ඒ විදිහටයි. ඒ වගේම අපේ
නීතියේ සහ අනාගතවක්තෘවරුන්
විසින් ලියූ සෑම දෙයක්ම මම විශ්-
වාස කරනවා.[7] **15** ධර්මිෂ්ඨ අය[8]
වගේම අධර්මිෂ්ඨ අයත්[9] නැවත
නැඟිටින බව[10] මට විශ්වාසයි.[11] දෙවි
ඒ දේ කරන බවට මට බලාපො-
රොත්තුවක් තිබෙනවා. මට විතරක්
නොවෙයි මෙහි සිටින සියලුදෙනා-
ටත් ඒ බලාපොරොත්තුව තිබෙනවා.
**16** ඒ නිසා මා නිතරම උත්සාහ
කරන්නේ දෙවිට හා මිනිසාට විරුද්-
ධව කිසි වරදක් නොකිරීමටයි. මා
එවැනි කිසි වරදක් කර නැති බව
මට දෙවි ඉදිරියේ කියන්න පුළුවන්.[12]
**17** ඉතින් අවුරුදු ගණනාවකට පසු
මම ආවේ මගේ ජාතියේ අයට සහ-
නාධාර ලබා දෙන්න සහ දෙවිට
පූජා ඔප්පු කරන්නයි.[13] **18** ඔවුන්
මාව සොයාගත්තේ මම චාරිත්‍රානුකූ-
ලව පවිත්‍ර වී දේවමාලිගාවේ කටයුතු
කරමින් සිටින විටයි.[14] මම සිටියේ
සමූහයක් සමඟවත් කෝලහලයක්
ඇති කරමින්වත් නොවෙයි. නමුත්

**24 පරි.**
1 ක්‍රියා 23:2
2 ක්‍රියා 23:26
3 ක්‍රියා 25:2; ක්‍රියා 25:15
4 ගීතා 12:2; ගීතා 55:21; හිතෝ 26:28
5 ක්‍රියා 23:26
6 මතෙ 5:11; ක්‍රියා 16:20; ක්‍රියා 17:6
7 ලූක් 23:2; ක්‍රියා 19:40
8 මතෙ 2:23; ක්‍රියා 28:22
9 ක්‍රියා 21:28

**2 තීරුව**
1 1පේතෘ 3:15
2 ක්‍රියා 21:26
3 ක්‍රියා 25:8
4 ක්‍රියා 21:28
5 ක්‍රියා 25:7
6 නික් 3:15; ක්‍රියා 3:13; ක්‍රියා 26:22; 2තිමෝ 1:3
7 ද්වි 18:18; ක්‍රියා 28:23; රෝම 3:21
8 ලූක් 14:14; හෙබ්‍රෙ 11:35
9 ලූක් 23:43
10 යෙසා 26:19; දානි 12:2; මතෙ 22:31; යොහ 5:28; යොහ 11:25; එළි 20:12
11 ක්‍රියා 23:6
12 දානි 6:5; ක්‍රියා 23:1; 1කොරි 4:4; හෙබ්‍රෙ 13:18
13 ක්‍රියා 11:29; 2කොරි 8:4
14 ක්‍රියා 21:26

ආසියා පළාතෙන් පැමිණි යුදෙව්-
වන් පිරිසක් එහි සිටියා. **19** ඇත්-
තෙන්ම ඔවුන් ඔබතුමන් ඉදිරියේ
පෙනී සිටිය යුතුයි. එවිට මට විරුද්-
ධව යම් චෝදනාවක් ඇතොත් එය
ඔබට ඉදිරිපත් කරන්න ඔවුන්ට පුළු-
වන්.[1] **20** එසේ නැත්නම් මම මන්-
ත්‍රණ සභාව ඉදිරියේ පෙනී සිටි
විට මට කළ චෝදනාවලින් ඔප්පු
කළේ කුමන එකද කියා මෙහි සිටින
අයට දැන් සඳහන් කරන්න පුළු-
වන්. **21** ඔවුන්ට මා ගැන කියන්න
තිබෙන්නේ එක දෙයක් විතරයි. ඒ
මම ඔවුන් අතරේ සිටියදී පැවසූ දෙ-
යක් ගැනයි. එනම්, ‘අද ඔබ මාව
වැරදිකරුවෙක් කරන්න හදන්නේ මම
නැවත නැඟිටීම ගැන විශ්වාස කරන
නිසයි’[2] කියා මම ඔවුන්ට පැවසූ දේ
ගැනයි.”

**22** නමුත් ‘ස්වාමීන්ගේ මාර්ගය’[3]
ගැන ෆීලික්ස්ට[4] සෑහෙන අවබෝධ-
යක් තිබුණු නිසා ඔහු නඩුව කල් දමා,
“හමුදාපති ලිසියස්[5] පැමිණි විට මේ
කාරණය ගැන මම තීන්දුවක් දෙන්-
නම්” කියා පැවසුවේය. **23** එසේම
මේ මිනිසාව නැවත සිරගෙට දැම්මත්
ඔහුට තරමක නිදහසක් ලබා දෙන්න
කියාත් ඔහුගේ මිතුරන්ට ඇවිත් ඔහුට
යම් උපකාර ලබා දීමට නිදහස ලබා
දෙන්න කියාත්[6] ෆීලික්ස් හමුදා නිල-
ධාරියාට අණ කළේය.

**24** දවස් කිහිපයකට පසු ෆීලික්ස්,[7]
තම යුදෙව් ජාතික[8] භාර්යාව වූ
ද්‍රුසිලා සමඟ පැමිණියේය. එහෙ-
යින් ඔහු පාවුල්ව කැඳවා, ක්‍රිස්-
තුස් යේසුස්ව විශ්වාස කිරීම ගැන
ඔහු පැවසූ දේවලට සවන් දුන්නේය.[9]
**25** පාවුල් ඔවුන් සමඟ කතා කළේ
ධර්මිෂ්ඨකම,[10] තමාව පාලනය කර-
ගැනීම[11] සහ මතු පැමිණෙන විනිශ්-
චය[12] ගැනය. ඒ දේවල් අසා ෆීලික්ස්
තුළ යම් බියක් ඇති වූ නිසා,
“දැන් යන්න. නැවත පැමිණිය යුතු
දවස මම ඔබට පසුව දන්වන්නම්”
කියා ඔහු පැවසුවේය. **26** මේ අතර
පාවුල් තමාට යම් මුදලක් ලබා
දෙයි කියා ෆීලික්ස් බලාපොරොත්තු
විය.[1] ඒ අදහසින් ඔහු නිතර පාවුල්ව
කැඳවා ඔහු සමඟ කතාබහේ යෙදී
සිටියේය.[2] **27** අවුරුදු දෙකක් ගත
වූ පසු ෆීලික්ස්ගේ නිලයට පෝර්කියස්
ෆෙස්ටස් පත් විය. ඒ වන විටත් පාවුල්
සිටියේ සිරභාරයේය. මන්ද ෆීලික්ස්
යුදෙව්වරුන්ගේ ප්‍රසාදය ලබාගැනීමට
කැමති වූ නිසා[3] ඔහු තම නිලයෙන්
ඉවත්ව යන තුරුත් පාවුල්ව සිරභාර-
යේ තබාගත්තේය.

**25** ෆෙස්ටස්, පළාත් ආණ්ඩුකා-
රයා ලෙස පත් වී[4] දින තුන-
කට පසු සිසේරියේ සිට යෙරුසලම
බලා ගියේය.[5] **2** එවිට නායක පූජ-
කයෝ සහ යුදෙව්වරුන්ගේ ප්‍රධානි-
යෝ පාවුල්ට විරුද්ධව නඟා තිබුණු
චෝදනා ඔහුට ඉදිරිපත් කළෝය.[6]
ඔවුන් ඉල්ලා සිටියේ, **3** තමන්ගේ
මෙම පැමිණිල්ලට විශේෂ සැලකිල්-
ලක් දක්වමින් පාවුල්ව යෙරුසල-
මට ගෙන්වන ලෙසය. ඔවුන් එසේ
ඉල්ලා සිටියේ පාවුල් පැමිණෙන විට
මඟ රැක සිටින කණ්ඩායමක්[7] මාර්ග-
යෙන් ඔහුව මරා දැමීමේ අදහසිනි.
**4** නමුත් පාවුල්ව සිසේරියේ රඳවා
තබන බවත් තමා වැඩි කල් නො-
ගොස් එහි ආපසු යන බවත් ෆෙස්ටස්
ඔවුන්ට පැවසුවේය. **5** ඔහු මෙසේද
පැවසුවේය. “ඔබේ නායකයන්ට පුළු-
වන් මා සමඟ ඇවිත් ඒ මිනිසාට
විරුද්ධව යම් චෝදනාවක් ඇත්නම්
ඒවා එහිදී ඉදිරිපත් කරන්න.”[8]

**6** එහෙයින් ඔහු ඔවුන් අතරේ
දින අටක් හෝ දහයක් ගත කළ
පසු සිසේරියට ගියේය. ඊළඟ දින-
යේ විනිශ්චයාසනයේ අසුන්ගත් ඔහු,[9]
පාවුල්ව එතැනට රැගෙන එන්න කියා
අණ කළේය. **7** පාවුල් පැමිණි විට
යෙරුසලමේ සිට ආ යුදෙව්වන් ඔහුව
වට කරගෙන ඔහුට විරුද්ධව බරප-
තළ චෝදනා[10] රැසක් එල්ල කළත්
ඊට සාක්ෂි වශයෙන් කිසිම තොරතු-
රක් ඉදිරිපත් කරන්න ඔවුන්ට නො-
හැකි විය.

---

**24 පරි.**
1 ක්‍රියා 23:30; ක්‍රියා 25:16
2 ක්‍රියා 23:6; ක්‍රියා 28:20
3 ක්‍රියා 9:2; ක්‍රියා 19:9
4 ක්‍රියා 23:24
5 ක්‍රියා 23:26
6 ක්‍රියා 27:3
7 ක්‍රියා 23:24
8 ක්‍රියා 16:1
9 මතෙ 10:18; 1පේතෘ 3:15
10 රෝම 1:17; රෝම 3:22
11 ගලා 5:23; 2පේතෘ 1:6
12 මතෙ 12:18; යොහ 16:8; 2කොරි 5:10; එළි 20:12

**2 තීරුව**
1 නික් 23:8; ද්වි 16:19; ගීතා 26:10; හිතෝ 17:23; යෙසා 5:23
2 මාක් 6:20
3 හිතෝ 29:25; ලූක් 23:25; ක්‍රියා 25:9

**25 පරි.**
4 ක්‍රියා 24:27
5 ක්‍රියා 21:15
6 ක්‍රියා 24:1; ක්‍රියා 25:15
7 ගීතා 37:32; හිතෝ 1:16; ක්‍රියා 9:23; ක්‍රියා 14:5; ක්‍රියා 23:21; 2කොරි 11:26
8 ක්‍රියා 25:16
9 යොහ 19:13; ක්‍රියා 12:21; ක්‍රියා 25:17
10 මතෙ 5:11; ලූක් 23:2; ක්‍රියා 24:5

**8** නමුත් පාවුල් ඊට පිළිතුරු
වශයෙන් මෙසේ පැවසුවේය.
“මම යුදෙව්වරුන්ගේ නීතියට විරුද්-
ධවත් දේවමාලිගාවට විරුද්ධවත්[1]
සීසර්ට විරුද්ධවත් කිසිම පාපයක්
කර නැහැ.”[2] **9** ෆෙස්ටස් යුදෙව්ව-
රුන්ගේ සිත් දිනාගැනීමේ අදහ-
සින්,[3] “යෙරුසලමට ගොස් එහිදී මා
ඔබව විනිශ්චය කරනවාට ඔබ කැම-
තිද”[4] කියා පාවුල්ගෙන් ඇසුවේය.
**10** පාවුල් ඊට පිළිතුරු දුන්නේ මෙ-
සේය. “මම දැන් සිටින්නේ සීසර්-
ගේ විනිශ්චයාසනය ඉදිරියෙහියි.[5]
මාව විනිශ්චය කළ යුතු නියම
තැන මෙතැනයි. ඔබතුමන්ට පැහැදි-
ලිව ඔප්පු වී ඇති ආකාරයට යුදෙව්ව-
රුන්ට විරුද්ධව මම කිසිම වරදක්
කර නැහැ.[6] **11** නමුත් මරණ දණ්-
ඩනය ලැබීමට තරම් වරදක්[7] මා කර
ඇති බව ඔප්පු වුණොත්[8] එම දඬුව-
මින් ගැලවීමට මම උත්සාහ කරන්-
නේ නැහැ. මේ මිනිසුන් මට විරුද්ධව
එල්ල කරන චෝදනාවලට කිසිම
පදනමක් නැහැ. ඒ නිසා ඔවුන්ව
සතුටු කිරීමේ අදහසින් මාව ඔවුන්ට
භාර දෙන්න නීතියෙන් කිසි කෙනෙ-
කුට අවසර නැහැ. මම දැන් කියා
සිටින්නේ මට සීසර්ගෙන් තීන්දුවක්
අවශ්‍ය බවයි!”[9] **12** එවිට ෆෙස්ටස්
තම උපදේශක මණ්ඩලය සමඟ කතා
කළ පසු, “ඔබ සීසර්ගෙන් තීන්දුවක්
ඉල්ලා ඇති නිසා ඔබව සීසර් වෙතට
යවනවා” කියා කීවේය.

**13** දින කිහිපයක් ගෙවී ගිය පසු
ෆෙස්ටස්ව නිල වශයෙන් බැහැදැකී-
මට අග්‍රිපා රජ හා බර්නීස් සිසේරියට
ගියෝය. **14** ඔවුන් දින කිහිපයක්ම
එහි ගත කළ නිසා ෆෙස්ටස් පාවුල්ගේ
ප්‍රශ්නය ගැන රජුට දන්වමින් මෙසේ
කීවේය.

“ෆීලික්ස්ගේ කාලයේ පටන් නිද-
හස් නොකළ සිරකරුවෙක් මෙහි
සිටිනවා. **15** මම යෙරුසලමට ගිය
විට නායක පූජකයන් සහ යුදෙව්ව-
රුන්ගේ වැඩිමහල්ලන් ඔහුට විරුද්-
ධව චෝදනා එල්ල කරමින්[10] ඔහුට
දඬුවම් කරන්න කියා ඉල්ලා සිටියා.
**16** නමුත් මම ඔවුන්ට කිව්වේ චෝ-
දනා ලැබූ මිනිසාට තමාට විරුද්-
ධව චෝදනා කරන අය ඉදිරියේ ඒ
චෝදනා ගැන පිළිතුරු දීමට මුලින්ම
අවස්ථාවක් ලබා දිය යුතු බවයි.
එවැනි අවස්ථාවක් නොදී චෝදනා
කරන අයව සතුටු කිරීමට ඔහුව
ඔවුන්ට භාර දීම රෝම නීතියට පට-
හැනි බවත් මම පැහැදිලි කළා.[1]
**17** ඒ නිසා ඔවුන් මෙහෙ ආවා.
එවිට මම ප්‍රමාද නොවී ඊළඟ දව-
සේම විනිශ්චයාසනයෙහි ඉඳගෙන ඒ
මිනිසාව ඔවුන් ඉදිරියට ගෙන එන
ලෙස අණ කළා. **18** ඒ මිනිසා යම්
දුෂ්ට දේවල් කර තිබෙනවා කියා
මම සිතුවත් චෝදනා ඉදිරිපත් කළ
අය ඊට පිළිගත හැකි කිසි සාක්ෂියක්
ඉදිරිපත් කළේ නැහැ.[2] **19** ඔවුන්
අතර තිබෙන මතභේදයට හේතුව
නම් ඔවුන් තම දෙවිට කරන නමස්-
කාරය[3] හා යේසුස් කියන තැනැත්-
තායි. ඒ තැනැත්තා මිය ගියත්
පාවුල් තරයේ කියා සිටින්නේ ඔහු
ජීවත් වන බවයි.[4] **20** ඒ මතභේදය
ගැන මොන වගේ තීන්දුවක්ද දෙන්-
නේ කියා මම හරි හැටි නොදැන සිටි
නිසා යෙරුසලමට ගොස් එහිදී මෙම
කාරණය ගැන විනිශ්චයක් ලබන්න
තමන් කැමතිද කියා මම පාවුල්ගෙන්
ඇහුවා.[5] **21** නමුත් ඔහු ඉල්ලා සිටි-
යේ ශ්‍රීමත් අධිරාජ්‍යයාගෙන් තීන්දුවක්
ඔහුට අවශ්‍ය බවයි.[6] ඒ නිසා මම අණ
කළා ඔහුව සීසර් වෙතට යවන තෙක්
සිරභාරයේ තබන්න කියා.”

**22** එවිට අග්‍රිපා, “මමත් මේ මිනිසා
කියන දේට සවන් දෙන්න කැමතියි”[7]
කියා ෆෙස්ටස්ට කීවේය. “එසේනම්
හෙට ඔබට ඒ අවස්ථාව ලබා දෙන්න
මම පියවර ගන්නම්” කියා ඔහු පිළි-
තුරු දුන්නේය. **23** ඊළඟ දින අග්‍රිපා
සහ බර්නීස් මහත් හරසරින් ඇවිත්[8]
හමුදා නිලධාරීන් සහ නුවරේ වංශ-
වත් අය සමඟ රාජ සභාවට ඇතුල්
වූහ. එවිට ෆෙස්ටස්ගේ අණ පරිදි
පාවුල්ව ඔවුන් ඉදිරියට ගෙනෙන ලදී.

**25 පරි.**
1 ක්‍රියා 24:12
2 ක්‍රියා 28:17
3 ක්‍රියා 24:27
4 ක්‍රියා 25:20
5 ක්‍රියා 25:21 ක්‍රියා 26:32
6 ක්‍රියා 28:17
7 ක්‍රියා 23:29 ක්‍රියා 26:31
8 1පේතෘ 4:15
9 ක්‍රියා 25:21 ක්‍රියා 26:32 ක්‍රියා 28:19
10 ක්‍රියා 25:2

**2 තීරුව**
1 ක්‍රියා 25:5
2 ක්‍රියා 25:7
3 ක්‍රියා 18:15 ක්‍රියා 23:29
4 ක්‍රියා 22:8
5 ක්‍රියා 25:9
6 ක්‍රියා 25:11 ක්‍රියා 26:32 ක්‍රියා 28:19
7 ක්‍රියා 9:15
8 1පේතෘ 1:24 1යොහ 2:16

**24** ෆෙස්ටස් මෙසේ කීවේය. “අග්‍රිපා
රජ්ජුරුවනි, මෙහි අප සමඟ පැමිණ
සිටින සියලු මනුෂ්‍යයෙනි, යෙරුසල-
මේදීත් මෙහිදීත් විශාල යුදෙව් සමූ-
හයක් මා ඉදිරියට ඇවිත් චෝදනා
ඉදිරිපත් කළේ මේ මිනිසාට විරුද්ධ-
වයි. ඔවුන් කෑගසමින් කියා සිටියේ
ඔහුට මරණ දණ්ඩනය ලබා දිය යුතු
බවයි.[1] **25** නමුත් මට වැටහී ගියේ
ඔහු මරණ දණ්ඩනය ලබන්න තරම්
වරදක් කර නැති බවයි.[2] එමනිසා මේ
මිනිසා ශ්‍රීමත් අධිරාජ්‍යයාගේ තීන්දුව
ඉල්ලා සිටි විට[3] ඒ සඳහා ඔහුව එතු-
මාණන් වෙතට යවන්න මම තීර-
ණය කළා. **26** නමුත් එතුමාණන්ට
මම ලියා යවන්නේ කුමක්ද කියා
මම දන්නේ නැහැ. අග්‍රිපා රජ්ජුරු-
වනි, මොහුව විශේෂයෙන්ම ඔබතු-
මන් ඉදිරියට ගෙන එන්න මම අදහස්
කළේ ඒ නිසයි. මෙලෙස නඩු විභා-
ගයක් කළ පසු[4] මා ලිවිය යුතු
දේ ගැන යම් අදහසක් මට ලබා-
ගන්න හැකි වෙයි. **27** ඇත්තෙන්ම
සිරකරුවෙකුට විරුද්ධව ඇති චෝ-
දනා දන්වන්නේ නැතුව ඔහුව ශ්‍රීමත්
අධිරාජ්‍යයා වෙතට යැවීම ඥානවන්ත
දෙයක් නොවෙයි.”

**26** අග්‍රිපා[5] රජ පාවුල්ට මෙසේ
පැවසුවේය. “ඔබේ නිර්දෝෂ-
කම ඔප්පු කිරීම සඳහා කතා කරන්න
දැන් ඔබට අවසර තිබෙනවා.” එවිට
පාවුල් තම අත දිගු කර[6] මෙසේ
කීවේය.[7]

**2** “අග්‍රිපා රජ්ජුරුවනි, යුදෙව්වරුන්
මට විරුද්ධව එල්ල කර තිබෙන හැම
චෝදනාවකින්ම[8] මා නිදොස් බව
ඔප්පු කිරීම සඳහා අද ඔබතුමන් ඉදි-
රියේ කරුණු ඉදිරිපත් කිරීමට ලැබීම
ගැන මම සතුටු වෙනවා. **3** ඔබතු-
මන්ට යුදෙව්වරුන්ගේ සියලු චාරිත්‍ර
ගැනත් ඔවුන් අතර පවතින මතභේද
ගැනත් මනා අවබෝධයක් තිබෙන
බව මම දන්නවා.[9] ඒ නිසා මම ඔබතු-
මන්ගෙන් බැගෑපත්ව ඉල්ලා සිටින්-
නේ මට ඉවසිලිවන්තව සවන් දෙන්න
කියායි.

**4** “ඇත්තෙන්ම මගේ තරුණ
කාලයේ පටන්ම මා උපන් දේශ-
යෙත් ඉන්පසු යෙරුසලමේත් මා ගත
කළ ජීවිතය[1] ගැන සියලුම යුදෙව්-
වරුන් දන්නවා. **5** මාව ඒ කාල-
යේ පටන් හඳුනාගෙන සිටි ඔවුන්ට
පුළුවන් කැමති නම් ඒ ගැන
සාක්ෂි සපයන්න. මම යුදෙව් ආගම
අකුරටම පිළිපදින[2] පරිසිවරුන්ගේ
නිකායේ සාමාජිකයෙක්ව සිටියා.[3]
**6** නමුත් ඔවුන් දැන් මට විරුද්ධව
බොහෝ චෝදනා එල්ල කරනවා.
එයට හේතුව දෙවි අපේ මුතුන්-
මිත්තන්ට දුන් පොරොන්දුවේ ඉටු
වීම[4] ගැන මම බලාපොරොත්තු-
වෙන් සිටීමයි.[5] **7** මා විතරක් නො-
වෙයි, අපේ ගෝත්‍ර දොළහට අයත්
සියලුදෙනාත් ඒ පොරොන්දුවේ ඉටු
වීම අද්දකින්න බලාපොරොත්තුවෙන්
සිටිනවා. ඔවුන් දෙවිට මහත් උද්‍යෝ-
ගයෙන් දිවා රෑ දෙකේම සේවය
කරන්නේ ඒ නිසයි.[6] රජ්ජුරුවනි, ඒ
බලාපොරොත්තුවම මටත් තිබෙන
නිසයි යුදෙව්වරුන් මට විරුද්ධව
චෝදනා එල්ල කරන්නේ.[7]

**8** “මිය ගොස් ඇති අයව දෙවි
නැවත නැඟිටුවන බව විශ්වාස
කරන්න බැරි දෙයක් කියා ඔබ
සිතන්නේ ඇයි?[8] **9** මමත් කාලයක්
සිතාගෙන සිටියේ නාසරෙත් නුව-
රින් පැමිණි යේසුස්ගේ නාමය දරන
කණ්ඩායමට විරුද්ධව පුළුවන් තරම්
පීඩා කළ යුතු බවයි. **10** ඒ නිසා
මම යෙරුසලමේ සිටි විට ඔවුන්ට
පීඩා කළා. මම නායක පූජකයන්-
ගෙන් අවසර ලබාගෙන[9] ඒ ශුද්ධ
අයගෙන් බොහෝදෙනෙකුව සිරගෙ-
වල්වල දැම්මා.[10] ඔවුන්ව මරණ-
යට පත් කිරීමට තීරණය කරද්දී
මමත් ඒ සඳහා මගේ කැමැත්ත
දුන්නා. **11** හැම සිනගෝගයකදීම
මම ඔවුන්ට බොහෝ වාර ගණ-
නක් දඬුවම් කළා.[11] මම ඔවුන්ට බල
කළේ ක්‍රිස්තුස්ව ප්‍රසිද්ධියේ ප්‍රතික්-
ෂේප කරන්නයි. මම ඔවුන් කෙරෙහි

**25 පරි.**
**1** ක්‍රියා 22:22
**2** ක්‍රියා 23:29, ක්‍රියා 26:31
**3** ක්‍රියා 25:21
**4** ක්‍රියා 26:32

**26 පරි.**
**5** ක්‍රියා 25:13
**6** ක්‍රියා 13:16
**7** ක්‍රියා 24:10
**8** ක්‍රියා 24:5
**9** ක්‍රියා 25:26

**2 තීරුව**
**1** ගලා 1:13
**2** ක්‍රියා 22:3
**3** ක්‍රියා 23:6, පිලි 3:5
**4** උත් 3:15, ද්වි 18:15, 2සාමු 7:12, දානි 9:24, මලා 3:1
**5** ක්‍රියා 24:15
**6** ලූක් 2:37, රෝම 11:7
**7** ක්‍රියා 24:21
**8** 1රාජා 17:22, 2රාජා 4:35, හෙබ්‍රෙ 11:35
**9** ක්‍රියා 9:2, ක්‍රියා 9:14
**10** යොහ 16:2, ක්‍රියා 8:3, 1කොරි 15:9, ගලා 1:13, 1තිමෝ 1:13
**11** ක්‍රියා 22:19

ඇඩි කෝපයකින් සිටි නිසා වෙනත්
නුවරවලට පවා ගොස් ඔවුන්ට පීඩා
කරන්න පියවර ගත්තා.
**12** “ඉතින් ඒ සඳහා මම නායක
පූජකයන්ගේ අවසර ඇතුව දමස්කය[1]
බලා ගමන් කරමින් සිටියා. **13** රජ්-
ජුරුවනි, ඉර මුදුන් වන වේලාවේදී
පමණ අපි ගමන් කරද්දී අහ-
සින් හිරුරැස්වලටත් වඩා දීප්තිමත්
ආලෝකයක් මා වටාත් මා සමඟ
ගමන් කරමින් සිටි අය වටාත් විහිදී
ගියා.[2] **14** අප සියලුදෙනාම බිම ඇද
වැටුණා. එවිට, ‘සාවුල්, සාවුල්, ඔබ
මට පීඩා කරන්නේ ඇයි? එසේ කිරීම
දිගින් දිගටම කෙවිටට පයින් ගැසී-
මක් හා සමානයි. එයින් අනතුරක්
සිදු වන්නේ ඔබටයි’[3] කියා හෙබ්‍රෙව්
භාෂාවෙන් කියන හඬක් මට ඇහුණා.
**15** එවිට මම, ‘ස්වාමීනි, ඔබ කවුද’
කියා ඇසුවා. ස්වාමීන් පිළිතුරු දුන්-
නේ මෙසේයි. “මම යේසුස්. ඔබ පීඩා
කරන්නේ මටයි.[4] **16** දැන් නැඟි-
ටින්න.[5] මන්ද මම ඔබට මෙසේ දර්ශ-
නය වන්නේ විශේෂ හේතුවක් නිසයි.
මම ඔබව සේවකයෙක් සහ සාක්-
ෂිකරුවෙක් ලෙස තෝරාගන්නවා.[6]
ඒ, ඔබ දුටු හා ඉදිරියේදී මම ඔබට
දකින්න සලස්වන දේවල් ගැන ප්‍රකාශ
කිරීමටයි. **17** මම ඔබව මේ ජන-
තාව හා වෙනත් ජාතීන් අතරට
යවන විට ඔවුන් ඔබට විරුද්ධ වන
නිසා ඔවුන්ගෙන් ඔබව ගලවන්න
මට සිදු වෙනවා.[7] **18** ඒ අතරතුර
ඔබ ඔවුන්ගේ ඇස් පහදනවා.[8] එම-
ගින් අන්ධකාරයෙන්[9] ආලෝකය වෙ-
තටත්[10] සාතන්ගේ බලපෑමෙන් මිදී[11]
දෙවි වෙතටත් හැරෙන්න ඔවුන්ට
හැකි වෙනවා. එහි ප්‍රතිඵලයක් ලෙස
තම පව්වලට සමාව ලබාගන්නත්[12]
මා කෙරෙහි විශ්වාසය තැබීමෙන්
ශුද්ධ කරනු ලැබූ අය* සමඟ[13] උරුම-
යක් ලබාගන්නත්[14] ඔවුන්ට අවස්ථාව
උදා වෙනවා.’

**19** “අග්‍රිපා රජ්ජුරුවනි, ස්වර්ග-
යෙන් මා දුටු ඒ දර්ශනය මම නො-
සලකාහැරියේ නැහැ.[1] **20** ඒ නිසා
මම මුලින්ම දමස්කයටත්[2] ඊළඟට
යෙරුසලමටත්[3] පසුව මුළු යුදය
පුරාත් වෙනත් ජාතීන් වෙතටත්[4]
ගියා. මම එහි සිටි අයට පැව-
සුවේ පසුතැවිලි වී තම පසුතැ-
විල්ලට එකඟව ක්‍රියා කිරීමෙන් දෙවි
වෙතට හැරෙන්න අවශ්‍ය බවයි.[5]
**21** යුදෙව්වන් මාව දේවමාලිගාවේදී
අල්ලා මරා දමන්න තැත් කළේ
අන්න ඒ හේතුව නිසයි.[6] **22** නමුත්
මට දෙවිගේ උපකාරය ලැබුණු නිසා[7]
මෙදින දක්වා සෑම තරාතිරමකම
සිටින අයට සාක්ෂි දරන්න මට හැකි
වී තිබෙනවා. මම ඔවුන්ට පවසන්නේ
සිදු වන බවට අනාගතවක්තෘවරුන්[8]
සහ මෝසෙස්[9] පැවසූ දේවල් පමණයි.
**23** එනම් ක්‍රිස්තුස් වධ විඳිය යුතු
බවත්[10] මරණයෙන් නැවත නැඟිටු-
වනු ලබන පළමුවෙනියා ලෙස[11] ඔහු
මේ ජාතියට හා වෙනත් ජාතීන්ට[12]
ආලෝකයක් ලබා දෙන බවත්[13] මම
පැවසුවා.”
**24** පාවුල් තම නිර්දෝෂකම ඔප්පු
කිරීමට ඒ දේවල් පවසමින් සිටි-
යදී, ෆෙස්ටස් මහත් හඬකින්
මෙසේ පැවසුවේය. “පාවුල්, ඔබේ
සිහිය විකල් වෙලා![14] ඔබ ඕනෑවටත්
වඩා උගතෙක් වෙන්න ගිහින් ඔබේ
සිහිය දැන් නැති වෙලයි තියෙන්නේ.”
**25** නමුත් පාවුල්, “අතිගරු ෆෙස්-
ටස්තුමනි, මගේ සිහිය විකල් වෙලා
නැහැ. මම කියන දේවල් ඇත්තයි.
ඒවාට සාධාරණ පදනමකුත් තිබෙ-
නවා. **26** රජතුමන්ට මේ දේවල්
ගැන හොඳ අවබෝධයක් තිබෙන
නිසයි මම කිසි බියක් සැකක් නැතුව
එතුමන්ට මේවා ගැන කිව්වේ. මේ
කිසිම දෙයක් රහසින් සිදු වී නැති
නිසා මේවා අනිවාර්යයෙන්ම එතුමන්-
ගේ අවධානයට ලක් වී ඇති බව මම
දන්නවා.[15] **27** අග්‍රිපා රජ්ජුරුවනි,
ඔබතුමන් අනාගතවක්තෘවරුන්ව
විශ්වාස කරනවාද? ඔබතුමන්ට ඔවුන්

---

**ක්‍රියා 26:18*** හෝ, “දෙවි සඳහා වෙන් කර ඇති අය.”

**26 පරි.**
**1** ක්‍රියා 9:2
ක්‍රියා 22:5
**2** ක්‍රියා 9:3
ක්‍රියා 22:6
**3** ක්‍රියා 9:4
ක්‍රියා 22:7
**4** ක්‍රියා 9:5
ක්‍රියා 22:8
**5** එස 2:1
**6** ක්‍රියා 22:15
ගලා 1:12
1තිමෝ 1:12
**7** ක්‍රියා 22:21
රෝම 11:13
**8** යෙසා 35:5
යෙසා 61:1
**9** යෙසා 42:7
කොලො 1:13
**10** යෙසා 60:2
යොහ 8:12
2කොරි 4:6
**11** එෆි 2:2
**12** ලූක් 1:77
1යොහ 3:5
**13** ක්‍රියා 20:32
**14** එෆි 1:11

**2 තීරුව**
**1** ක්‍රියා 9:20
**2** ක්‍රියා 9:22
**3** ක්‍රියා 9:28
**4** ක්‍රියා 9:15
**5** එස 18:31
මතෙ 3:8
2කොරි 7:11
**6** ක්‍රියා 21:31
**7** 2කොරි 1:10
**8** යෙසා 9:6
යෙරෙ 23:5
යෙරෙ 33:15
එස 34:23
මීකා 5:2
මලා 3:1
ලූක් 24:27
ලූක් 24:44
රෝම 3:21
**9** උත් 3:15
උත් 49:10
ද්වි 6:4
ද්වි 18:18
යොහ 5:46
**10** ගීතා 22:7
ගීතා 22:16
ගීතා 35:19
යෙසා 50:6
යෙසා 53:5
**11** ගීතා 16:10
**12** ගීතා 18:49
යෙසා 11:10
යෙසා 52:15
**13** ලූක් 2:32
**14** 1කොරි 1:23
**15** යොහ 18:20

ගැන විශ්වාසයක් ඇති බව මම
දන්නවා."[1] 28 එවිට අග්‍රිපා පාවුල්ට
මෙසේ පැවසුවේය. "වැඩි වේලාවක්
යන්න කලින් ඔබ මාවත් ක්‍රිස්තියානි-
යෙක් කරයි." 29 පාවුල් එයට පිළි-
තුරු දුන්නේ මෙසේය. "දෙවි ඉදිරියේ
මගේ පැතුම නම් කවදා හෝ දව-
සක ඔබතුමන් පමණක් නොව අද මට
සවන් දෙමින් සිටින සියලුදෙනාම මා
මෙන් වේවා කියායි. නමුත් දැන් මට
සිදු වී තිබෙනවා වගේ ඔබේ අත් පාව-
ලට විලංගු වැටෙන්න කියා නම් මම
පතන්නේ නැහැ."

30 එවිට රජද ආණ්ඩුකාරයාද බර්-
නීස්ද ඔවුන් සමඟ ඉඳගෙන සිටි
මිනිස්සුද පිටත් වී යැමට සූදානම් වූහ.
31 ඔවුහු එතැනින් විසිර යද්දී, "මේ
මිනිසා මරණ දණ්ඩනය[2] හෝ සිරදඬු-
වමක් හෝ ලබන්න සුදුසු කිසිම දෙ-
යක් කළ කෙනෙක් නොවෙයි" කියා
එකිනෙකා අතරේ කතා වුණෝය.
32 මේ අතර අග්‍රිපා ෆෙස්ටස්ට මෙසේ
කීවේය. "මේ මිනිසා සීසර්ගෙන් තීන්-
දුවක් ඉල්ලා සිටියේ නැත්නම්[3] ඔහුව
නිදහස් කර හරින්න තිබුණා."

**27** ඒ අනුව පාවුල්ව සහ ඔහු
සමඟ සිටි අපව ඉතාලිය
බලා යාත්‍රා කරන නැවකින් පිටත්
කිරීමට[4] ෆෙස්ටස් තීරණය කළේය.
එහෙයින් පාවුල්ව සහ තවත් සිරකරු-
වන් පිරිසක්ව, ඔගස්ටස් බළඇණියේ
ජූලියස් නම් හමුදා නිලධාරියෙකුට
භාර දෙන ලදි. 2 අප යාත්‍රා කළේ
අද්‍රාමුත්තිය නම් වරායේ සිට පැමිණි
නැවකිනි. ආසියා පළාතේ වෙරළබඩ
තීරය දිගේ පිහිටි ස්ථාන කිහිපය-
කට ඒ නැව ගමන් කිරීමට නියමිතව
තිබිණ. අප සමඟ තෙසලෝනිකයේ
වැසියෙකු වූ මැසිඩෝනියානු ජාතික
අරිස්තාකස්ද[5] පැමිණියේය. 3 පසු-
වදා අප ගොඩ බැස්සේ සීදොන්වලය.
එහිදී ජූලියස් පාවුල්ට ඉතා කාරු-
ණිකව සලකා,[6] ඔහුට තම මිතුරන්
සමඟ කාලය ගත කිරීමට යම් නිදහ-
සක් ලබා දුන්නේය.[7]

4 අප එතැනින් පිටත් වී යාත්‍රා
කරන විට සුළඟ අපේ ගමනට බාධා
කළ නිසා ඒ සුළං මඟහැරීමට සයිප්‍රස්
දූපතේ අනික් පැත්තෙන් අපි යාත්‍රා
කළෙමු. 5 අප සිලීසියාව සහ පම්ෆි-
ලිය පසු කරමින් ගොඩ බැස්සේ ලිසි-
යාවේ පිහිටි මුරා නම් වරායෙහිය.
6 එහිදී හමුදා නිලධාරියා ඉතාලිය
බලා පිටත් වන ඇලෙක්සැන්ඩ්‍රියා-
වෙන්[1] පැමිණි නැවක් දැක අපව ඒ
නැවෙහි ගෙන යැමට පියවර ගත්-
තේය. 7 බොහෝ දුෂ්කරතා විඳි-
මින් දවස් කිහිපයක් ඉතා සෙමින්
යාත්‍රා කිරීමෙන් පසු අප ළඟා වූයේ
කනීදස නම් නුවරටය. සැඩ සුළං
නිසා නැව යාත්‍රා කිරීම අපහසු විය.
එහෙයින් අපි එම සුළං මඟහැරීමට
ක්‍රීට් දූපතේ සල්මොනය නම් තුඩුව
පසු කරගෙන යාත්‍රා කළෙමු. 8 අපි
දිගටම ඒ වෙරළබඩ තීරය දිගේ අමා-
රුවෙන් යාත්‍රා කළ අතර ලසේය නම්
නුවර අසල පිහිටා ඇති, 'සුබ වරාය'
ලෙස හැඳින්වූ වරායකට ළඟා වූයෙමු.

9 සෑහෙන කාලයකට පසු නැව-
තත් අපේ ගමන අරඹන විට යම් අන-
තුරුදායක තත්වයක් උද්ගත විය.
ඒ කාලය වන විට සමඟි කිරීමේ
දවස[2] වෙනුවෙන් නිරාහාරව සිටීමේ
කාල සීමාවත් අවසන් වී තිබිණ. එවිට
පාවුල් යෝජනාවක් ඉදිරිපත් කරමින්,
10 මෙසේ කීවේය. "අපි මේ ගමන
ගියොත් නැවේ බඩුවලට විතරක්
නොව අපේ ජීවිතවලටත් මහත් හානි-
යක් සිදු වෙයි."[3] 11 නමුත් හමුදා
නිලධාරියා පාවුල් පැවසූ දේ නො-
තකා නැවේ නියමුවා හා නැවේ අයිති-
කරු පැවසූ දෙයට සවන් දුන්නේය.
12 ශීත කාලය පැමිණෙන විට ඔවුන්
සිටි වරායේ නැවතී සිටීම යෝග්‍ය
නොවූ නිසා බහුතරයක් යෝජනා
කළේ එතැනින් පිටත් වී ෆීනික්ස් නම්
වරායට කෙසේ හෝ යා යුතු බවය.
ෆීනික්ස් යනු ක්‍රීට් දූපතේම පිහිටා
ඇති ඊසාන දෙසින් හා ගිනිකොන දෙ-
සින් ඇතුල් විය හැකි වරායකි.

13 එහෙයින් දකුණු දෙසින් මද
සුළඟක් හැමූ විට තම අරමුණ ඉටු

**26 පරි.**
1 ක්‍රියා 26:3
2 ක්‍රියා 23:29, ක්‍රියා 25:25
3 ක්‍රියා 25:11, ක්‍රියා 25:21, ක්‍රියා 28:19

**27 පරි.**
4 ක්‍රියා 25:12
5 ක්‍රියා 19:29, ක්‍රියා 20:4, කොලො 4:10
6 හිතෝ 19:22, ක්‍රියා 28:16
7 ක්‍රියා 24:23

**2 තීරුව**
1 ක්‍රියා 28:11
2 ලෙවී 16:29, ලෙවී 23:27
3 ක්‍රියා 27:21

කරගත හැකියයි සිතූ ඔවුහු නැංගුරම්
ඔසවා ක්‍රීට් දූපතේ වෙරළබඩ තීරය
දිගේ යාත්‍රා කළෝය. **14** නමුත්
වැඩි දවසක් යන්න මත්තෙන්, දූප-
තේ ඊසාන දිගින් චණ්ඩ මාරුතයක්*
හැමුවේය.[1] **15** නැව චණ්ඩ මාරුත-
යට හසු වී යාත්‍රා කළ ගමන් මඟෙන්
ගසාගෙන ගොස්, **16** කෞද යන
නමින් හැඳින්වූ කුඩා දූපතකට ළඟා
විය. ඒ දූපත ළඟින් යාත්‍රා කළ නිසා
ඒ සැඩ සුළඟ යම් දුරකට මඟහරින්න
අපට හැකි වුණත් නැවේ කුඩා බෝට්-
ටුව[2] රැකගැනීම සඳහා එය නැවේ
අවර තුළට ගැනීමට සැහෙන වෙ-
හෙසක් දරන්න සිදු විය. **17** ඔවුහු
එය නැව තුළට ගත් පසු නැවේ බඳ
වටා කඹ දමමින් නැව හොඳින් සවි
වන ලෙස බැන්දෝය. මේ අතර නැව
වැලි කණ්ඩිවල* ගැටෙයි යන බියෙන්
ඔවුහු නැවේ රුවල් බා, එය සුළඟ
හමන දෙසට ගසාගෙන යන්න ඉඩ-
හැරියෝය. **18** නමුත් චණ්ඩ මාරු-
තයට හසු වූ නැව, දරුණු ලෙස
ඒ මේ අත ගසාගෙන ගිය නිසා
නැවේ බර අඩු කිරීමට[3] එහි තිබූ බඩු
තොගයෙන් කොටසක් පසුවදා මුහුදට
විසි කළෝය. **19** තුන්වෙනිදා ඔවුහු
නැවේ තිබුණු කඹ ආදියද මුහුදට විසි
කළෝය.

**20** චණ්ඩ මාරුතය ඉතා දරුණු
ලෙස හැමූ අතර[4] දවස් කිහිපයක් යන
තුරු හිරුගේ ආලෝකයවත් තාරකා-
වක්වත් දැකගැනීමට අපට නොහැකි
විය. අපට එම කුණාටුවෙන් ගැල-
විය හැකියි යන බලාපොරොත්තුව
අපි සම්පූර්ණයෙන්ම අත්හැරියෙමු.
**21** දින කිහිපයක්ම නොකා නොබී
සිටියදී පාවුල් සියලුදෙනා මැද සිට-
ගෙන[5] මෙසේ කීවේය. "ක්‍රීට් දූප-
තෙන් යාත්‍රා නොකර, ඔබ මා පැවසූ
දේට කන් දුන්නා නම් මෙතරම්
අලාභහානියක් විඳින්න සිදු වෙන්-
නේ නැහැ.[6] **22** ඒ වුණත් කිසි කෙ-
නෙක් අධෛර්යයට පත් වෙන්න
එපා. කාගෙවත් ජීවිත නැති වෙන්-
නේ නැහැ. අපට නැති වෙන්නේ නැව
විතරයි. **23** මම මේ දේ කියන්නේ
අද රාත්‍රියේ මම සේවය කරන[1] මගේ
දෙවිගේ දූතයෙක්[2] මා ළඟ සිටගෙන,
**24** 'පාවුල්, කිසි දෙයකට භය වෙන්න
එපා. ඔබ සීසර් ඉදිරියේ පෙනී සිටිය
යුතුයි.[3] ඔබ සමඟ මේ නැවේ සිටින
සියලුදෙනා ඔබ නිසා දෙවිගේ කරු-
ණාව ලබා ඔවුන්ගේ ජීවිත බේරා-
ගනියි' කියා මට පැවසූ නිසයි.
**25** ඒ නිසා කිසි කෙනෙක් අධෛර්යය
වෙන්න එපා. මට දෙවි ගැන විශ්වා-
සයි.[4] මට පැවසූ ලෙසම සිදු වෙයි.
**26** අපි මේ විදිහට ගසාගෙන ගොස්
කොහේ හරි දූපතකට ළඟා වෙයි."[5]

**27** මුහුදේ ගත කළ දාහතරවන
රාත්‍රියේ අප සිටියේ ආද්‍රිය මුහුදේ
ඒ මේ අත විසි වෙමින්ය. මධ්‍යම
රාත්‍රියේදී පමණ අප ගොඩට ළඟා
වන බව නැවියෝ වටහාගත්තෝය.
**28** ඔවුහු ගැඹුර බැලූ විට එය බඹ විස්-
සක් බව දැනගත්හ. තව ටික දුරක්
ගොස් නැවතත් ගැඹුර බැලූ විට එය
බඹ පහළොවක් බව ඔවුහු දැනගත්හ.
**29** නැව ගල්පරවල හැපී අපට අන-
තුරක් සිදු වෙයි යන බියෙන් ඔවුහු
නැවේ අවරෙන් නැංගුරම් හතරක්
දමා උදැසන වන තුරු නොඉවසිල්-
ලෙන් බලා සිටියෝය. **30** මේ අතර
නැවෙන් පැන යෑමට මඟක් සොයමින්
සිටි නැවියෝ, නැවේ ඉදිරිපස කෙ-
ළවරින් නැංගුරම් දමන්න යන බව
බොරුවට අඟවමින් එහි තිබූ කුඩා
බෝට්ටුව මුහුදට පහත් කළෝය.
**31** එය දුටු පාවුල් හමුදා නිලධාරියාට
හා හේවායන්ට මෙසේ කීවේය. "මේ
මිනිසුන් නැවේම හිටියේ නැත්නම්
අපි කාටවත් බේරෙන්න ලැබෙන්නේ
නැහැ."[6] **32** එවිට හේවායෝ, කුඩා
බෝට්ටුවේ[7] ලණු කපා දමා එය මුහු-
දේ පාවී යන්න ඉඩහැරියෝය.

**33** උදැසන වේගන එද්දී පාවුල්
සියලුදෙනාටම යම් ආහාරයක් ගැනී-
මට දිරිගන්වා මෙසේ කීවේය. "ඔබ

**27 පරි.**
1 මාක් 4:37
2 ක්‍රියා 27:32
3 යෝනා 1:5
4 යෝනා 1:13
5 යෝනා 1:9
6 ක්‍රියා 27:10

**2 තීරුව**
1 රෝම 1:9; 2තිමෝ 1:3; හෙබ්‍රෙ 12:28
2 දානි 6:16; ක්‍රියා 5:19; ක්‍රියා 23:11; හෙබ්‍රෙ 1:14
3 ක්‍රියා 23:11; ක්‍රියා 25:11
4 ගණන් 23:19; රෝම 4:21; තීත 1:2
5 ක්‍රියා 28:1
6 ක්‍රියා 27:22
7 ක්‍රියා 27:16

**ක්‍රියා 27:14*** මෙම චණ්ඩ මාරුතය හැඳින්වූයේ යූරකිලෝ ලෙසය. **17*** මෙම වැලි කණ්ඩි හැඳින්වූයේ සර්ට්ස් යන නමිනි.

දවස් දාහතරක් තිස්සේ කිසිවක්
කාලා නැහැ. 34 දැන් මොනවා හරි
දෙයක් කන්න. එහෙම කියන්නේ
ඔබේ ආරක්ෂාව ගැන හිතලා. ඔබේ
එක කෙස්ගහකටවත්[1] කිසිම හානි-
යක් සිදු වෙන්නේ නැහැ.” 35 ඉන්-
පසු ඔහු රොටියක් ගෙන සියල්ලන්
ඉදිරියෙහි දෙවිට ස්තුති දීමෙන් පසු[2]
එය කඩා ආහාරයට ගත්තේය.
36 එවිට සියලුදෙනාම දිරිමත් වී කෑම
කෑවෝය. 37 නැවේ සිටි අප සියලු-
දෙනාගේ ගණන දෙසිය හැත්තෑහ-
යකි. 38 සියලුදෙනාම ඇති තරම්
කෑම කෑ පසු නැවේ ගබඩා කර තිබූ
තිරිඟු මුහුදට විසි කිරීමෙන් ඔවුහු
නැවේ බර තවත් අඩු කළෝය.[3]

39 උදෑසන වූ විට ඔවුන් ගොඩ-
බිමක් දුටුවත් එය කිසිවෙකුට හඳු-
නාගත නොහැකි විය. නමුත් ඔවුහු
වෙරළ තීරයක් සහිත බොක්කක් දුටු
නිසා නැව එම වෙරළ දෙසට හැකි
නම් ගෙන යෑමට[4] තීරණය කළෝය.
40 එහෙයින් ඔවුහු නැංගුරම් කපා
දමා ඒවා මුහුදට වැටෙන්න ඉඩහැ-
රියෝය. ඒ සමඟම සුක්කානම්වල
කඹ ලිහා, ඉදිරිපස රුවල සුළං හමන
දිශාවට ඔසවා, නැව වෙරළ දෙසට
යාත්‍රා කළෝය. 41 එවිට නැව දෙ-
පැත්තෙන්ම මුහුදෙන් වට වූ වැලි
කණ්ඩියක වැදුණේය. නැවේ ඉදි-
රිපස එම වැලි කණ්ඩියේ එරී හිර
විය. එවිට නැවේ අවරය රළ පහරට
හසු වී කැබලිවලට කැඩී බිඳී යන්න
පටන්ගත්තේය.[5] 42 ඒ අවස්ථාවේදී
සිරකරුවන් මුහුදට පැන ගැලවී යයි
කියා සිතූ හේවායෝ, සිරකරුවන්ව
මරා දැමීමේ අදහසින් ඔවුන්ව වට
කළෝය. 43 නමුත් පාවුල්ට කිසිම
අනතුරක් සිදු වෙනවාට අකමැති
වූ හමුදා නිලධාරියා, ඔවුන්ට ඒ
දේ කරන්න අවසර නොදුන්නේය.
ඒ වෙනුවට පිහිනීමට හැකි අයට
මුලින්ම මුහුදට පැන ගොඩබිම දෙසට
පිහිනා යන්න කියා ඔහු අණ කළේය.
44 ඉතුරු අයට ලෑලිවල ආධාරයෙන්
හෝ නැවේ තිබුණු යම් සුන්බුන් ආධා-
රයෙන් හෝ ගොඩට යන්න ඔහු අණ
කළේය. එසේ සියලුදෙනාම ගොඩබි-
මට ගිය අතර කාටවත් අනතුරක් සිදු
නොවීය.[1]

**28** කිසි කෙනෙකුටවත් අනතු-
රක් සිදු නොවීය. අප
පැමිණ ඇත්තේ මෝල්ටාව[2] නම් දූප-
තට බව දැනගත්තේ පසුවයි. 2 එම
දූපතේ වැසියන් කතා කළේ වෙ-
නත් භාෂාවකින්ය. එසේවුවත් ඔවුහු
අප බලාපොරොත්තු වූවාටත් වඩා
අපට ඉතා කාරුණිකව සැලකුවෝය.[3]
ඇද හැළුණු වැසි සහ ශීත කාල-
ගුණය නිසා[4] ඔවුහු ගිනිමැලයක්
ගසා අප සියල්ලන්වම සාදරයෙන්
පිළිගත්තෝය. 3 මේ අතර පාවුල්
දර මිටියක් ගෙන ගින්නට දැමූ
විට ගින්නේ උෂ්ණත්වයට දර මිටිය
තුළ සිටි පොළඟෙක් එළියට ඇවිත්
ඔහුගේ අතට දෂ්ට කරමින් අතේ
එල්ලුණේය. 4 ඒ විසකුරු සර්පයා
පාවුල්ගේ අතේ එල්ලී සිටිනවා දුටු
දූපතේ ජනතාව එකිනෙකාට මෙසේ
කීවෝය. “මේ මිනිසා මිනී මරු-
වෙක් විය යුතුයි. නැත්නම් මුහුදෙන්
බේරී ආ කෙනෙකුගේ ජීවිතයට මෙ-
හෙම හානියක් සිදු වෙන්නේ කොහො-
මද? මේක නම් ඔහු ලැබිය යුතුම
දඬුවමක්.” 5 නමුත් ඔහු අත ගසා
දමා ඒ විසකුරු සර්පයාව ගින්නට
දැමුවේය. ඔහුට කිසිම හානියක් සිදු
වූයේ නැත.[5] 6 සියලුදෙනාම සිතු-
වේ ඔහුගේ සිරුර ඉදිමෙයි කියා හෝ
ඔහු එකවරම මැරී වැටෙයි කියාය.
ඔවුන් බොහෝ වේලාවක් බලා සිටි-
යත් ඔහුට කිසිම හානියක් සිදු වී නැති
බව දුටු විට ඔහු දෙවියෙකුයයි ඔවුහු
කියන්න පටන්ගත්තෝය.[6]

7 එම දූපතේ ප්‍රධානියා වී සිටි-
යේ පබ්ලියස් නම් තැනැත්තෙකි. ඔහු
සතු ඉඩකඩම් කිහිපයක් ඒ අවට
තිබිණ. ඔහු අපව සාදරයෙන් පිළි-
ගෙන දවස් තුනක් අපගේ අවශ්‍යතා
සපයමින් අපට කාරුණිකව සැල-
කුවේය. 8 මේ අතර පබ්ලියස්ගේ
පියා උණෙන් සහ අතීසාරයෙන් පෙළී

**27 පරි.**
1 1සාමු 14:45 2සාමු 14:11 මතෙ 10:30 ලූක් 12:7
2 මතෙ 15:36 මාක් 8:6 යොහ 6:11 රෝම 14:6 1තිමෝ 4:4
3 යෝනා 1:5
4 ක්‍රියා 28:1
5 ක්‍රියා 27:22 2කොරි 11:25

**2 තීරුව**
1 ක්‍රියා 27:24

**28 පරි.**
2 ක්‍රියා 27:26
3 හිතෝ 19:22 ක්‍රියා 27:3
4 2කොරි 11:27
5 ලූක් 10:19
6 ක්‍රියා 14:11

ඇඳට වී සිටියේය. එහෙයින් පාවුල්
ඔහු ළඟට ගොස් යාච්ඤා කර ඔහු
පිට අත් තබා[1] ඔහුව සුව කළේය.[2]
**9** එම සිද්ධියට පසු ඒ දූපතේ අසනී-
පව සිටි තවත් අයද ඔහු ළඟට ඇවිත්
සුවය ලැබූහ.[3] **10** ඔවුහු අපට බො-
හෝ තෑගිබෝගද ලබා දුන් අතර අප
නැවත ගමනට සූදානම් වූ විට අපට
අවශ්‍ය වන දේවල්ද නැවකට පැටෙව්-
වෝය.

**11** එම නැව ශීත කාලය නිසා එම
දූපතේ නතර කර තිබූ නැවකි. මාස
තුනක් එම දූපතේ ගත කළ අපි,
එම නැවට නැඟ යාත්‍රා කළෙමු. ඒ
නැව පැමිණ තිබුණේ ඇලෙක්සැන්ඩ්‍රි-
යාවෙනි.[4] එහි, “සියුස්ගේ පුත්‍රයෝ”
යන නම දරන ලාංඡනයක්ද කැට-
යම් කර තිබිණ. **12** එතැන් සිට අප
ගියේ සිරකූසය නම් නුවර අසල පිහිටි
වරායටය. එහි දවස් තුනක් ගත කළ
පසු, **13** එතැනින් යම් දුරකට වක්‍රා-
කාර ගමන් මඟක් ඔස්සේ යාත්‍රා කළ
අපි, රෙජියම් නම් නුවරට ගියෙමු.
ඉන් දවසකට පසු දකුණු දෙසින්
සුළඟක් හැමූ නිසා දෙවෙනි දව-
සේදී අප ගොඩ බැස්සේ පුටෙයෝ-
ලිය නම් වරායෙහිය. **14** එහිදී අපට
සහෝදරයන්ව හමු වූ අතර ඔවුන්
සමඟ දවස් හතක් නැවතී සිටින
මෙන් ඔවුහු අපෙන් ඉල්ලා සිටියෝය.
පසුව අපි එතැනින් රෝමය දෙසට
ගමන් කළෙමු. **15** අප පැමිණෙන
බව ආරංචි වී, එහි සිටි සහෝදරයෝ
අපව හමු වීමට තුන් තානායම නම්
ස්ථානයට පැමිණියෝය. තවත් කිහි-
පදෙනෙක් අප්පියස්ගේ වෙළඳපොළ
දක්වාම ආවෝය. පාවුල් ඔවුන්ව දුටු
විට දෙවිට ස්තුති කළේය. මන්ද
ඔවුන්ව දැකීමෙන් ඔහු මහත් ධෛර්ය-
යක් ලැබුවේය.[5] **16** අන්තිමේදී අප
රෝමයට ඇතුල් වූ විට පාවුල්ට වෙ-
නම ස්ථානයක නතර වෙන්න අවසර
ලැබිණ.[6] ඔහුව මුර කිරීම සඳහා එක
භේවායෙකුව යොදන ලදි.

**17** තුන් දවසකට පසු පාවුල්
යුදෙව්වරුන්ගේ ප්‍රධානීන්ට පණිවිඩ-
යක් යවා, ඇවිත් තමාව හමු වන්න
කියා ඉල්ලා සිටියේය. ඔවුන් පැමිණි
විට ඔහු ඔවුන්ට මෙසේ කීවේය.
“මගේ සහෝදරයෙනි, මම ජනතාව-
ටවත් අපේ මුතුන්මිත්තන්ගේ චාරි-
ත්‍රවලටවත් විරුද්ධව කිසි දෙයක්
කළේ නැහැ.[1] ඒ වුණත් මාව සිර-
කරුවෙක් හැටියට යෙරුසලමෙන්
රෝමවරුන්ට භාර දෙනු ලැබුවා.[2]
**18** මාව විභාග කළ පසු[3] මරණ දණ්-
ඩනය ලබන්න වටින කිසිම දෙයක්
මා කර නැති බව[4] ඔවුන්ට පැහැදිලි වූ
නිසා ඔවුනුත් කැමති වුණේ මාව නිද-
හස් කරන්නයි.[5] **19** නමුත් යුදෙව්-
වරුන් දිගටම ඊට විරුද්ධව කතා
කළ නිසා මට සීසර්ගෙන් තීන්දු-
වක් අවශ්‍යයි කියා ඉල්ලා සිටින්න
සිදු වුණා.[6] මා ඒ දේ කළේ මගේ
ජාතියට විරුද්ධව කිසිම චෝදනාවක්
එල්ල කරන්න නොවෙයි. **20** මාව
ඇවිත් හමු වෙන්න කියා ඔබෙන්
ඉල්ලා සිටියේ ඒ හේතුව නිසයි.
මාව මේ දම්වැල්වලින් බැඳ තිබෙන්-
නේ[7] ඊශ්‍රායෙල්වරුන් බලාපොරොත්-
තුවෙන් සිටින තැනැත්තා නිසයි.”[8]
**21** එවිට ඔවුහු ඔහුට මෙසේ කීවෝය.
“ඔබ ගැන අපට යුදයෙන් ලිපි ලැබිලා
නැහැ. ඒ වගේම එහෙන් ඇවිත්
සිටින කිසිම කෙනෙක් ඔබ ගැන
කිසිම වැරදි දෙයක් අපට දැන්නුවේ-
වත් පැවසුවේවත් නැහැ. **22** කො-
හොමවුණත් හැම තැනම මිනිස්සු මේ
නිකායට[9] විරුද්ධව කතා කරන බව
අපි දන්නවා.[10] ඒ නිසා ඔබ ඒ ගැන
දරන අදහස් දැනගන්න අපි කැම-
තියි.”

**23** එහෙයින් ඔවුහු ඔහු සමඟ
කතාබහ කිරීමට දවසක් නියම කර-
ගත් අතර නියමිත දවසේ ඔහු
නවාතැන් ගත් ස්ථානයට විශාල
පිරිසක් පැමිණියෝය. එදින ඔහු
උදෑසන සිට සවස දක්වාම දෙවි-
ගේ රාජ්‍යය පිළිබඳ ඉතා පැහැදිලි
සාක්ෂියක් ඔවුන්ට ලබා දුන්නේය.[11]
මෝසෙස්ට දෙන ලද නීතියේ සඳ-
හන් දේවල්ද[12] අනාගතවක්තෘවරුන්

**28 පරි.**
1 මාක් 7:32, ක්‍රියා 19:11, 1කොරි 12:9
2 ලූක් 4:39
3 මතෙ 10:8
4 ක්‍රියා 27:6
5 2කොරි 1:4
6 ක්‍රියා 24:23

**2 තීරුව**
1 ක්‍රියා 24:12, ක්‍රියා 25:8
2 ක්‍රියා 21:33
3 ක්‍රියා 24:10
4 ක්‍රියා 23:9, ක්‍රියා 23:29, ක්‍රියා 25:25, ක්‍රියා 26:31
5 ක්‍රියා 26:32
6 ක්‍රියා 25:11, ක්‍රියා 26:32
7 එෆී 6:20, 2තිමෝ 1:16
8 ක්‍රියා 23:6, ක්‍රියා 26:6, තිත 2:13
9 ක්‍රියා 24:14
10 ලූක් 2:34, යොහ 15:19
11 ක්‍රියා 17:2, ක්‍රියා 26:22
12 උත් 3:15, උත් 22:18, උත් 49:10, ද්වි 18:18, ද්වි 32:43, යොහ 5:46

ලියූ දේවල්ද[1] යොදාගත් ඔහු, යේසුස්
ගැන ඉතා පැහැදිලි තර්ක ඉදිරිපත්
කළේය. **24** ඔහු පැවසූ දේවල් සම-
හරුන් විශ්වාස කළ අතර[2] තවත් අය
ඒ දේවල් විශ්වාස කිරීමට කැමැත්-
තක් දැක්වූයේ නැත.[3] **25** මතභේ-
දයක් ඇති වූ නිසා ඔවුන් එතැනින්
පිටත් වී යන්න සූදානම් වූ විට පාවුල්
මෙසේ කීවේය.

"දෙවි තම බලයෙන් අනාගත-
වක්තෘ යෙසායා මාර්ගයෙන් ඔබේ
මුතුන්මිත්තන්ට දැන්වූ දේ මේ
අවස්ථාවට හොඳින් ගැළපෙනවා.
**26** එහි සඳහන් වන්නේ මෙයයි. 'මේ
ජනතාවට ගොස් මෙසේ කියන්න.
"ඇහුම්කන් දෙන නිසා ඔබට ඇසේ.
නමුත් ඔබට කිසිවක් වැටහෙන්-
නේ නැත. බලන නිසා ඔබට පෙ-
නේ. නමුත් ඔබට කිසිවක් අවබෝධ
වන්නේ නැත.[4] **27** මන්ද මේ ජන-
යාගේ සිත් ඇඩි වී තිබේ. ඔවුහු
කන්වලින් ඇසුවත් ප්‍රතිචාරයක් නො-
දක්වති. ඔවුහු තම ඇස් පියාගෙන
සිටිති. එසේ වී තිබෙන්නේ ඔවුන් කිසි
කලෙක තම ඇස්වලින් නොදැක,
තම කන්වලින් නොඅසා, තම සිත්-
වලින් එහි හරය වටහා නොගන්නා
පිණිසයි. ඔවුහු කිසිවිටකත් හැරී එන්-
නේ නැත. ඒ නිසා ඔවුන්ට මාගෙන්
සුවයක්ද නොලැබෙයි." '[1] **28** එහෙ-
යින් ඔබ මේ දේ දැනගත යුතුයි.
දෙවි ගැලවීම ලබා දෙන මාර්ගය පිළි-
බඳ මේ පණිවිඩය වෙනත් ජාතීන්-
ටත් දන්වා තිබෙනවා.[2] ඔවුන් නම්
එයට අනිවාර්යයෙන්ම සවන් දෙයි."[3]
**29** ——

**30** පාවුල් තමාටම කියා කුලි-
යට ගත් නිවසක[4] අවුරුදු දෙකක්ම
වාසය කළේය. තමාව හමු වීමට
පැමිණි සියලුදෙනාව සාදරයෙන් පිළි-
ගත් ඔහු, **31** නිර්භීතව[5] හා මහත්
උද්‍යෝගයකින් දෙවිගේ රාජ්‍යය ගැන
දේශනා කරමින්ද ස්වාමීන් වන යේ-
සුස් ක්‍රිස්තුස් පිළිබඳව දේවල් උගන්ව-
මින්ද කාලය ගත කළේය. ඒ සඳහා
ඔහුට කිසිම බාධාවක් තිබුණේ නැත.

**28 පරි.**
**1** යෙසා 9:6
යෙසා 11:10
යෙසා 52:15
යෙරෙ 23:5
මීකා 5:2
සෙක 13:7
මලා 3:1
ලූක් 24:44
**2** ක්‍රියා 17:4
**3** ක්‍රියා 14:4
2තෙස 3:2
**4** යෙසා 6:9
යෙරෙ 5:31
එස 12:2
රෝම 11:8

**2 තීරුව**
**1** යෙසා 6:10
**2** ලූක් 3:6
ක්‍රියා 13:46
ක්‍රියා 22:21
රෝම 11:11
**3** ගීතා 67:2
ගීතා 98:3
යෙසා 11:10
**4** ක්‍රියා 28:16
**5** ක්‍රියා 26:26
එෆී 6:19

# රෝමවරුන්ට
## ලියූ ලිපිය

**1** මෙම ලිපිය ඔබට ලියන්නේ යේ-
සුස් ක්‍රිස්තුස්ගේ දාසයෙක්[1] සහ
දෙවිගේ ශුභාරංචිය ප්‍රකාශ කිරීමට
විශේෂයෙන්ම තෝරාගත්[2] නියෝජි-
තයෙකු*[3] ලෙස කැඳවනු ලැබූ[4] පාවුල්
වන මමය. **2** ශුද්ධ ලියවිල්ලෙහි
සඳහන් වී ඇති ආකාරයට දෙවි
ඒ ශුභාරංචිය ගැන අතීතයේ සිටි
තම අනාගතවක්තෘවරුන් මාර්ග-
යෙන්[5] පොරොන්දුවක් දුන්නේය.
**3** ඒ ශුභාරංචිය ඔහුගේ පුත්‍රයා පිළිබඳ-
වය. ඔහු මිනිසෙකු ලෙස[6] ඉපදුණේ
දාවිත්ගේ පෙළපතින්ය.[7] **4** නමුත්
දෙවිගේ අතිශුද්ධ බලයේ[1] ප්‍රබල ක්‍රියා-
කාරිත්වයෙන්[2] ඔහුව මරණයෙන්
නැවත නැඟිටුවනු ලැබූ විට[3] ඔහු
දෙවිගේ පුත්‍රයා බව තහවුරු විය.[4]
එසේය, අපේ ස්වාමීන් වන යේ-
සුස් ක්‍රිස්තුස් මාර්ගයෙන්, **5** මටත්
මහත් කරුණාවක් ලැබුණු අතර[5]
ඔහුගේ නියෝජිතයෙකු වීමේ ප්‍රස්තා-
වද ලැබිණ.[6] එමගින් සියලු ජාතීන්ට
අයත් මිනිසුන්ට[7] ඔහු කෙරෙහි විශ්වා-
සය තබා ඔහුට කීකරු වීමේ ප්‍රස්තාව
උදා විය. එයින් ඔහුගේ නාමය-

**1 පරි.**
**1** ගලා 1:10
**2** ගලා 3:8
**3** 1කොරි 15:9
**4** ක්‍රියා 9:15
ගලා 1:15
**5** ගණන් 12:6
ලූක් 1:70
තීත 1:2
**6** යොහ 1:14
ගලා 4:4
**7** 2සාමු 7:12
ලූක් 1:32
2තිමෝ 2:8

**2 තීරුව**
**1** ලූක් 11:13
එෆී 1:13
1තිමෝ 3:16
**2** 2කොරි 13:4

රෝම **1:1*** හෝ, "යවනු ලැබූවෙකු."

**3** ගීතා 16:10; ක්‍රියා 3:15; ක්‍රියා 13:33; **4** ගීතා 2:7; හෙබ්‍රෙ 1:5; **5** යොහ 1:16; එෆී 3:8; **6** 1තිමෝ 2:7; 2තිමෝ 1:11; **7** ක්‍රියා 15:14; ගලා 2:7.

ටද ගෞරවය ලැබෙයි. **6** එසේම
මේ ජාතීන් අතරෙන් යේසුස් ක්‍රිස්-
තුස්ට අයිති වන අය වීමට ඔබ-
වත් කැඳවා ඇත. **7** එහෙයින් දෙවි
බොහෝ සෙයින් ප්‍රේම කරන ශුද්ධ
තැනැත්තන් ලෙස[1] කැඳවනු ලැබූ[2]
රෝමයේ සිටින ඔබ සියලුදෙනා වෙ-
නට මම මෙසේ ලියමි.

අපේ පියාණන් වන දෙවිගෙන් හා
ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්ගෙන්[3]
ඔබ සියලුදෙනාටම මහත් කරුණා-
වත් සමාදානයත් ලැබේවා![4]

**8** මුලින්ම ඔබ සියලුදෙනා උදෙසා
යේසුස් ක්‍රිස්තුස් මාර්ගයෙන් මාගේ
දෙවිට ස්තුති කරන්න කැමැත්තෙමි.[5]
මන්ද ඔබ තුළ තිබෙන විශ්වාසය
ගැන ලොව පුරා සිටින සියලුදෙ-
නාම කතා කරති.[6] **9** දෙවිට හද
පත්ලෙන්ම පරිශුද්ධ සේවයක් පිරින-
මමින් ඔහුගේ පුත්‍රයා පිළිබඳ ශුභාරං-
චිය ප්‍රකාශ කරන මම, ඔබ ගැන
නිතරම මාගේ යාච්ඤාවලදී සඳහන්
කරන්නෙමි.[7] දෙවි ඊට සාක්ෂි දෙයි.[8]
**10** මා නිතරම කන්නලව් කරන්නේ
ඔබව හමු වීම දෙවිගේ කැමැත්ත
නම්[9] මට ඊට අවස්ථාවක් ලබා දෙන
ලෙසය. **11** ඇත්තෙන්ම ඔබව දැක-
ගැනීමට මා තුළ තිබෙන්නේ දැඩි
ආශාවකි.[10] මාගේ එකම ආශාව නම්
දෙවි සමඟ ඇති ඔබේ බැඳීම තවත්
ශක්තිමත් කිරීමට[11] ඔබට යම් දිරි-
ගැන්වීමක් ලබා දීමය. **12** අපට
එකිනෙකාව දිරිගැන්වීමටත්[12] එමගින්
හැකියාව ලැබේ. එවිට ඔබ මාගේ විශ්-
වාසයෙනුත් මා ඔබේ විශ්වාසයෙනුත්
දිරිගැන්වීමක් ලබනු ඇත.[13]

**13** සහෝදරයෙනි,[14] වෙනත් ජාතී-
න්ට අයත් අය අතර මට සාර්-
ථක ප්‍රතිඵල ලබන්න හැකි වූවා සේ
ඔබ අතරත් හොඳ ප්‍රතිඵල ලබන්න
මට අවශ්‍යය.[15] ඒ සඳහා ඔබව හමු
වීමට මා බොහෝ වර සැලසුම් යෙදු-
වත්[16] මේ වන තුරු එය ඉටු කර-
ගත නොහැකි වූ බව ඔබට දන්වන්න
කැමැත්තෙමි. **14** ග්‍රීකයන් හා ග්‍රීක-
යන් නොවන අයටද උගත්[17] මෙන්ම
උගත්කමින් අඩු අයටද මා ණය-
ගැතිය. **15** රෝමයේ සිටින ඔබ-
ටත්[1] ශුභාරංචිය ප්‍රකාශ කිරීමට මා
තුළ මහත් උනන්දුවක් තිබෙන්-
නේ ඒ නිසාය.[2] **16** මේ ශුභාරංචිය
ප්‍රකාශ කිරීමට මා තුළ කිසි ලැජ්-
ජාවක් නැත.[3] මන්ද මේ ශුභාරංචිය
තුළින් විශ්වාසයක් ඇති සියලුදෙ-
නාටම[4] එනම්, මුලින්ම යුදෙව්වන්-
ටද[5] එමෙන්ම ග්‍රීකයන්ටද*[6] ගැලවීම
ලබාගැනීමට ප්‍රස්තාව උදා වෙයි.
එයින් දෙවිගේ ශ්‍රේෂ්ඨ බලය ප්‍රකාශ
වේ.[7] **17** එමෙන්ම දෙවි තම ධර්මිෂ්-
ඨකම*[8] ශුභාරංචිය තුළින් එළිදරව්
කරන ආකාරය දැකගැනීමට විශ්වා-
සයක් ඇති අයට[9] හැකි වන අතර
ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ විශ්වාස-
යද තවත් ශක්තිමත් වේ. “ධර්මිෂ්ඨ
තැනැත්තා තම විශ්වාසය නිසා තම
ජීවිතය රැකගනු ඇත”[10] කියා ලියා
තිබෙන්නේ ඒ නිසාය.

**18** දෙවිට කිසි භක්තියක් නො-
දක්වන අධර්මිෂ්ඨ මිනිසුන්ගේ
සියලු ක්‍රියාවලට විරුද්ධව[11] දෙ-
විගේ උදහස[12] ස්වර්ගයෙන් ප්‍රකාශ
වනු ඇත. මන්ද ඔවුන්ගේ දුෂ්ට-
කම් නිසා[13] සත්‍යයද යටපත් වේ.[14]
**19** දෙවි ගැන දැනගත හැකි දේ
ඔවුන්ට පැහැදිලිය.[15] මන්ද දෙවි ඒ
සාක්ෂි ඔවුන්ට පැහැදිලිව ලබා දුන්-
නේය.[16] **20** දෙවිව නොපෙනුණත්[17]
ලෝකය සැදූ දා පටන්[18] ඔහුගේ බලය
හා ගුණාංග ගැන අවබෝධයක් ලබා-
ගැනීමට මිනිසාට පුළුවන. එය කළ
හැක්කේ දෙවි නිර්මාණය කර ඇති
දේවල් නිරීක්ෂණය කිරීමෙනි.[19] එම-
ගින් ඔහුගේ සදාතනික බලය[20] හා
ඔහු සැබවින්ම දෙවි බවට වූ කාර-
ණය[21] සියල්ලන්ටම පැහැදිලි වේ.
එහෙයින් දෙවිව පිළි නොගෙන සිටී-
මට ඔවුන්ට කිසිම සාධාරණ හේතු-
වක් නැත.[22] **21** ඔවුන් දෙවිව දැන
සිටියත් ඔහුව දෙවි ලෙස පිළිගෙන

**1 පරි.**
1 1කොරි 1:2
2 පිලි 3:14; 1තෙස 2:12; හෙබ්‍රෙ 3:1
3 1කොරි 1:3; ගලා 1:3
4 එපී 6:23
5 පිලි 1:3
6 රෝම 16:19; 1තෙස 1:8
7 1තෙස 3:10; 2තිමෝ 1:3
8 2කොරි 1:23; පිලි 1:8
9 ක්‍රියා 18:21; රෝම 15:32; යාකො 4:15
10 පිලි 1:8; පිලි 4:1; 1තෙස 2:17
11 රෝම 15:29
12 පිලි 2:1; 1තෙස 5:11; හෙබ්‍රෙ 10:25
13 ගලා 6:10; 1තිමෝ 4:10; 1පේතෘ 1:7
14 මාක් 3:35
15 යොහ 15:16; පිලි 4:17
16 රෝම 15:23
17 1කොරි 3:18

**2 තීරුව**
1 ක්‍රියා 19:21
2 මාක් 13:10
3 ගීතා 119:46; මාක් 8:38; 2තිමෝ 1:8
4 හෙබ්‍රෙ 11:6
5 ක්‍රියා 3:26
6 ක්‍රියා 18:6
7 1කොරි 1:18
8 රෝම 3:21
9 යොහ 3:36; පිලි 3:9
10 හබ 2:4; ගලා 3:11; හෙබ්‍රෙ 10:38
11 යෝබ් 24:13
12 රෝම 2:5; එපී 5:6
13 යොහ 8:44
14 රෝම 1:25
15 ක්‍රියා 14:17
16 ගීතා 19:1
17 1තිමෝ 1:17; හෙබ්‍රෙ 11:27
18 යෙසා 40:21
19 යෙසා 40:26; එළි 4:11
20 යෙරෙ 10:12; 2පේතෘ 1:3
21 ගීතා 103:19; යෙරෙ 10:10; එළි 15:3
22 ක්‍රියා 17:27; රෝම 3:2

රෝම **1:16*** එනම්, ග්‍රීක භාෂාව කතා කරන යුදෙව් නොවන අයද. **17*** හෝ, “තම ධර්මිෂ්ඨ ප්‍රමිති.”

ඔහුට ගෞරවය දුන්නේවත් ස්තුති
කළේවත් නැත.[1] ඒ වෙනුවට ඔවුන්-
ගේ මනස් නිරර්ථක දේවලින් පිරී ගිය
අතර[2] ඔවුන්ගේ අඥාන සිත්ද අන්ධ-
කාරයෙන් වැසී ගියේය.[3] **22** ඔවුන්
තමන් ඥානවන්තයන් බව තරයේ
කියා සිටියත් ඇත්තෙන්ම ඔවුහු අඥා-
නයෝ බවට පත් වූහ.[4] **23** එලෙසම
කිසිදා පහ වී නොයන දෙවිගේ තේජ-
සට[5] පිටු පාමින්, ඔවුහු දිරාපත් වී යන
මිනිසුන්ගේද කුරුල්ලන්ගේද සිව්පා-
වුන්ගේද බඩ ගා යන සතුන්ගේද[6]
රූපවලට[7] ගරුබුහුමන් දැක්වූවෝය.
**24** ඔවුන්ගේ සිත් තුළ අපවිත්‍ර
ආශාවන් තිබුණු නිසා දෙවි ඒ අප-
විත්‍ර දේවල් තුළම ඇලීගැලී සිටීමට
ඔවුන්ට ඉඩහැරියේය.[8] එයින් ඔවුහු
තම සිරුරුවලට[9] මහත් අගෞරවයක්
ගෙන දෙන අයුරින් හැසිරුණෝය.[10]
**25** එවැනි අය දෙවි පිළිබඳ සත්‍යය[11]
පිළි නොගෙන බොරු දේවල් පසුපස
ගොස්[12] සියල්ල සෑදූ තැනැත්තා වෙ-
නුවට ඒ තැනැත්තා විසින් සාදන ලද
දේවලට තම භක්තිය හා නමස්කාරය
පිරිනැමුවෝය. නමුත් ප්‍රශංසාව ලැබිය
යුත්තේ අපගේ සෑදූම්කරුට පමණි. ඒ
ප්‍රශංසාව සැමදා ඔහුට හිමි වේවා!
ආමෙන්.* **26** එසේ තම පිළිකුල්ස-
හගත ලිංගික ආශාවන්[13] තෘප්තිමත්
කරගැනීමට දෙවි ඔවුන්ට ඉඩහැ-
රියේය. එහෙයින් ඔවුන් අතර සිටි
ස්ත්‍රීහු ස්වාභාවික ලෙස ලිංගික සම්-
බන්ධකම් පවත්වනවා වෙනුවට අස්-
වාභාවික ලිංගික ක්‍රියාවල යෙදෙන්න
පටන්ගත්තෝය.[14] **27** එසේම පුරු-
ෂයන්ද ස්ත්‍රීන් සමඟ සම්බන්ධකම්
පවත්වනවා වෙනුවට[15] එකිනෙකා
කෙරෙහි කාමාශාවෙන් මත් වී පුරු-
ෂයෝ පුරුෂයන් සමඟ[16] අශික්ෂිත
ලිංගික ක්‍රියාවල යෙදෙන්න පටන්-
ගත්තෝය.[17] එවැනි වැරදිවලට[18]
අනිවාර්යයෙන්ම ඔවුහු නිසි ප්‍රතිඵල
ලබන්නෝය.[19]
**28** දෙවිව නිවැරදිව දැන හඳුනා
ගැනීමට ඔවුන් අකමැති වූ නිසා[1]
ඔවුන්ගේ මනස් දූෂිත වීමට දෙවි ඉඩ-
හැරියේය.[2] එහෙයින් ඔවුහු තම සිතේ
කැමැත්ත හැටියට නොහොබිනා දේ-
වල නියැලුණෝය.[3] **29** මන්ද ඔවුහු
සියලු ආකාර අධර්මිෂ්ඨකමින්ද[4]
දුෂ්ටකමින්ද[5] තණ්හාවෙන්ද[6] පව්-
කාරකමින්ද[7] පිරී සිටියෝය. ඔවුහු
ඊර්ෂ්‍යාවෙන්ද[8] මිනී මරු වෛරය-
කින්ද[9] අඬදබරවලින්ද[10] වංචා-
වෙන්ද[11] කුරිරු චේතනාවලින්ද[12] පිරී
සිටි අතර අනුන් ගැන කොඳුරන,[13]
**30** අපහාස කරන,[14] දෙවිට වෛර
කරන, කිසිවෙකුටවත් ගරු නොක-
රන,[15] උඩඟු,[16] පුරසාරම් දොඩන,[17]
දුෂ්ට උපා යොදන,[18] දෙමාපියන්ට
අකීකරු වන,[19] **31** අවබෝධයකින්
ක්‍රියා නොකරන,[20] පොරොන්දු කඩ
කරන,[21] තමාගේම පවුලේ අය
කෙරෙහිවත් කිසි සෙනෙහසක්
නැති,[22] අනුකම්පාවක් නොමැති අය[23]
ලෙස ක්‍රියා කරන්නෝය. **32** එවැනි
දේවල් කරන අය මරණය ලැබීමට
සුදුසු අය බව[24] දෙවි තීන්දු කර ඇත.
දෙවිගේ එම තීන්දුව ධර්මිෂ්ඨය. ඒ
තීන්දුව ගැන ඔවුන්ට පැහැදිලි අව-
බෝධයක් තිබුණත්[25] ඔවුහු ඒ දේවල
දිගටම නියැලෙනවා පමණක් නොව
එවැනි දේවල් කරන වෙනත් අයටද
තම පූර්ණ අනුමැතිය ලබා දෙති.[26]

**2** සහෝදරයෙනි, ඔබ ගැන කුමක්
කිව හැකිද? ඔබ අනුන්ව විනිශ්-
චය කරනවාද?[27] එසේ කරන්න ඔබ
කවුද? ඒ සඳහා ඔබට කිසි සාධාරණ
හේතුවක් නැත.[28] මන්ද ඔබත් ඒ හා
සමාන වැරදි කර තිබේ.[29] එහෙයින්
ඔබ අනුන්ව විනිශ්චය කළොත් ඔබේ
විනිශ්චයෙන් ඔබවත් වරදකරුවෙකු
ලෙස ඔප්පු වේ.[30] **2** ඉහත සඳහන්
දේවල් කරන අය දඬුවම් ලැබිය යුතුයි

රෝම **1:25*** එනම්, එසේම වේවා!

**1 පරි.**
1 ද්වි 4:8 ගීතා 50:23 ගීතා 147:19
2 මතෙ 23:28 තීත 1:14
3 උත් 6:5 මතෙ 9:4 මතෙ 13:15 ලූක් 5:22
4 මතෙ 23:17 2පේත 2:19
5 යෙරෙ 2:11 හොෂෙ 4:7 ක්‍රියා 17:29
6 ද්වි 4:17 එස 8:10
7 ද්වි 4:16 ගීතා 106:20 ක්‍රියා 14:15
8 ගීතා 81:12 ක්‍රියා 7:42 2කොරි 12:21 ගලා 5:19
9 1කොරි 6:18
10 ලෙවී 18:22 එෆී 5:12
11 මතෙ 4:10 යොහ 8:32 රෝම 2:8
12 ගීතා 10:4 ගීතා 14:1 මලා 3:14 යොහ 8:44 2තෙස 2:11 2තිමෝ 4:4
13 1තෙස 4:5
14 ලෙවී 18:23 යූද් 7
15 ලෙවී 18:22
16 උත් 19:5 ලෙවී 20:13 1කොරි 6:9
17 රෝම 6:21 එෆී 5:4
18 2පේත 2:19 යූද් 10
19 ද්වි 7:15 ගලා 6:7 2පේත 2:13

**2 තීරුව**
1 හෙබ්‍රෙ 10:26
2 රෝම 11:7 2කොරි 3:14
3 ගලා 5:19 2තිමෝ 3:2
4 1පේත 4:3
5 මාක් 7:22
6 ද්වි 5:21 2පේත 2:14
7 1පේත 2:16
8 තීත 3:3
9 යාකො 4:2 1යොහ 3:15
10 ගලා 5:20
11 1තෙස 2:3 1පේත 2:1
12 එෆී 4:31 1තිමෝ 5:13
13 හිතෝ 11:13
14 1පේත 2:1

**15** ගීතා 10:13; **16** 2තිමෝ 3:2; **17** හිතෝ 21:24; **18** ගීතා 140:2; **19** ද්වි 21:18; **20** ගීතා 32:9; රෝම 1:21; **21** 1තිමෝ 1:10; **22** ද්වි 28:54; 2තිමෝ 3:3; **23** යාකො 2:13; **24** ද්වි 22:21; 2තෙස 2:12; එළි 21:8; **25** ද්වි 4:8; **26** ගීතා 50:18; හොෂෙ 7:3; **2 පරි.** **27** රෝම 14:10; යාකො 4:11; **28** රෝම 2:9; රෝම 9:20; **29** රෝම 2:21; **30** මතෙ 7:5.

කියා විනිශ්චය කරන්නේ දෙවි බවත්
දෙවිගේ විනිශ්චය සාධාරණ බවත් අපි
දනිමු.[1]
3 සහෝදරයෙනි, එවැනි දේවල්
කරන අයව ඔබ විනිශ්චය කරන අත-
රම ඔබත් එවැනි දේවල් කරනවා නම්
දෙවි ලබා දෙන දඬුවමින් ඔබ නිද-
හස් වෙයි කියා[2] ඔබ සිතන්නේ කෙ-
සේද?[3] 4 එමෙන්ම දෙවි මෙතරම්
කාලයක් ඉවසා සිටීමත්[4] මෙතරම්
කරුණාවක්[5] හා බොහෝ ඉවසිලි-
වන්තකමක් දැක්වීමත්[6] ඔබ සුළු-
වට තකන්නේ ඇයි? දෙවි මෙතරම්
කරුණාවක් දක්වන්නේ ඔබට පසුතැ-
විලි වෙන්න උපකාර කිරීමට බව[7]
ඔබ නොදන්නා නිසාද? 5 නමුත්
ඔබේ හදවත් තුළ මුරණ්ඩුකම ඇති
නිසාත්[8] ඔබ තුළ කිසි පසුතැවිල්ලක්
නැති නිසාත්[9] ඔබට සිදු වන්නේ දෙවි-
ගේ උදහසට ලක් වෙන්නයි.[10] දෙවි
තම උදහස ප්‍රකාශ කරන්නේ තම
ධර්මිෂ්ඨ විනිශ්චය[11] ප්‍රකාශ කරන[12]
අවස්ථාවේදීය.[13] 6 එවිට ඔහු සෑම
කෙනෙකුට තම ක්‍රියාවලට අනුව
ප්‍රතිඵල දෙයි.[14] 7 විඳදරාගනිමින්
යහපත් දේවල් කරන අයට හිමි වන්-
නේ සදාකාල ජීවනයයි. එවැනි අය
මහත් උත්සාහයක් දරන්නේ ස්වර්-
ගීය තේජසත් ගෞරවයත් සමඟ
විනාශ කළ නොහැකි ජීවිතයක්[15] අත්
කරගැනීමටයි. 8 නමුත් දබර කර-
මින්,[16] සත්‍යය පිළි නොගෙන[17] අධර්-
මිෂ්ඨකමට ඇලී සිටින අය දෙවිගේ
උදහස හා කෝපය අද්දකිනු ඇත.[18]
9 ඇත්තෙන්ම හානිකර දේවල් කරන
සෑම කෙනෙක්ම දුක් පීඩා හා වේදනා
විඳිනු ඇත. මුලින්ම එසේ විනිශ්චය
කරනු ලබන්නේ යුදෙව්වරුන්වය.[19]
ඉන් අනතුරුව ග්‍රීකවරුන්වද*[20] එසේ
විනිශ්චය කරනු ලැබේ. 10 නමුත්
යහපත් දේ කරන[21] සියලුදෙනාටම
ස්වර්ගීය තේජසත් ගෞරවයත් සමා-
ධානයත් හිමි වේ. මුලින්ම ඒ ප්‍රස්-
තාව හිමි වන්නේ යුදෙව්වරුන්ටය.[22]
ඉන්පසු එය ග්‍රීකවරුන්ටද හිමි වේ.[1]
11 මන්ද දෙවි සියලුදෙනාටම එක හා
සමානව සලකන්නේය.[2]
12 දෙවිගේ නීතිය යටතේ නො-
සිටින අයට නීතියක් නොතිබුණත්
ඔවුන්ට අවසානයේදී මරණය හිමි
වේ.[3] අනික් අතට යමෙක් නීතිය යට-
තේ සිටියදීත් ඔහු වැරදි කරනවා
නම්[4] ඒ නීතියට අනුව ඔහුට විනිශ්-
චයක් ලැබේ.[5] 13 මන්ද දෙවි ධර්-
මිෂ්ඨයන් ලෙස සලකන්නේ නීතිය
අසාගෙන සිටින අයව නොවෙයි. ඔහු
ධර්මිෂ්ඨයන් ලෙස ප්‍රකාශ කරන්-
නේ[6] නීතියේ තිබෙන දේ පිළිප-
දින අයවයි.[7] 14 නීතියක් යටතේ
නොසිටින[8] වෙනත් ජාතීන්වල අය[9]
නීතියට ඇතුළත් දේවල් සහජයෙන්ම
කරන විට[10] ඔවුන්ට නීතියක් නො-
තිබුණත් තමන්ට නීතිය ගැන අව-
බෝධයක් ඇති බව එයින් පෙන්නුම්
කරති. 15 එයට හේතුව ඔවුන්ගේ
හෘදය සාක්ෂිය[11] ඔවුන්ට කතා කරන
නිසාය. ඔවුන් ඒ හඬට සවන් දී ඒ ගැන
කල්පනා කර බලන විට තමන් කළ
දේ හරිද වැරදිද කියා තේරුම්ගැනීමට
ඔවුන්ට පුළුවන.[12] ඒ අනුව නීතියට
පදනම සපයන ප්‍රමිති ඔවුන්ගේ හද-
වත්වල තැන්පත් වී ඇති බව ඔවුන්-
ගේ ක්‍රියාකලාපයෙන් ඔප්පු වේ.[13]
16 මා පවසන මේ දේවල් අවබෝධ
වන්නේ දෙවි, ක්‍රිස්තුස් යේසුස්ව යො-
දාගෙන මිනිසුන්[14] රහසිගතව තබා-
ගෙන ඇති[15] සෑම දෙයක්ම විනිශ්චය
කරන දවසේදීය.[16] මේ තොරතුරු මා
ප්‍රකාශ කරන ශුභාරංචියට අයත්ය.[17]
17 ඔබ යුදෙව් ජාතිකයෙක්ද?[18]
ඔබ නීතිය මත රඳා සිටිමින්[19] දෙවි
සමඟ ඔබට ඇති බැඳීම ගැන ආඩම්-
බර වන කෙනෙක්ද?[20] 18 යුදෙව්-
වෙකු ලෙස ඔබට දෙවිගේ කැමැත්ත
ගැන අවබෝධයක් තිබිය හැක.[21]
එමෙන්ම නීතිය ගැන ඔබට කියා දී

රෝම **2:9*** එනම්, යුදෙව් නොවන අයවද.

**2 පරි.**
1 යෙසා 11:3; 2තෙස 1:6
2 මතෙ 23:33; මාක් 12:40; 1තිමෝ 5:24
3 රෝම 2:17
4 රෝම 3:25
5 ගීතා 86:5; රෝම 11:22; එපී 1:7
6 නික් 34:6; යෙසා 30:18
7 2තිමෝ 2:25; 2පේතෘ 3:9
8 ද්වි 9:6; එස 3:7
9 1සාමු 6:6
10 ද්වි 32:35; හිතෝ 28:14
11 ක්‍රියා 17:31; එළි 11:18
12 2තෙස 1:7
13 එළි 6:17
14 යෝබ් 34:11; ගීතා 62:12; හිතෝ 24:12; එස 18:30; මතෙ 16:27; යොහ 5:29
15 1කොරි 15:53; එළි 20:6
16 පිලි 2:3
17 මතෙ 4:10; යොහ 8:44; ගලා 5:7
18 යෙසා 3:11; රෝම 1:18; කොලො 3:6; හෙබ්‍රෙ 10:27
19 ආමො 3:2
20 2තෙස 1:6
21 ගලා 5:22
22 යොහ 4:22; ක්‍රියා 13:46

**2 තීරුව**
1 ක්‍රියා 15:14
2 ද්වි 10:17; 2ලේක 19:7; ක්‍රියා 10:34
3 එපී 2:12; කොලො 2:13
4 රෝම 3:19
5 රෝම 7:9
6 ක්‍රියා 13:39; ගලා 3:11
7 ද්වි 30:14; එස 20:11; යාකො 1:22
8 ගීතා 147:20
9 ද්වි 26:19
10 ක්‍රියා 10:2
11 1කොරි 8:7; 1පේතෘ 3:16
12 උත් 4:13
13 ක්‍රියා 10:4
14 1පේතෘ 4:5
15 ලූක් 8:17; 1තිමෝ 5:25

**16** යොහ 5:22; ක්‍රියා 10:42; ක්‍රියා 17:31; **17** 2කොරි 5:10; 1පේතෘ 4:6; **18** රෝම 9:6; **19** මීකා 3:11; මතෙ 23:23; ලූක් 11:46; **20** යෙසා 45:25; යොහ 8:41; **21** ද්වි 4:8; ගීතා 143:10.

තිබෙන නිසා[1] මහත් ගෞරවයකින්
සැලකිය යුතු දේවල් මොනවාද කියා
ඔබ දන්නවා විය හැක. **19** එහෙ-
යින් ඔබ සිතාගෙන සිටින්නේ ඔබ
අන්ධයන්ට මඟ පෙන්වන්නන් වන
බවත්[2] අන්ධකාරයේ සිටින සියලුදෙ-
නාට ඔබ ආලෝකයක් වන බවත්ය.[3]
**20** එමෙන්ම ඔබ පෙනී සිටින්නේ
අඥාන අයව නිවැරදි කරන්නන්
ලෙසත්[4] ළාබාල අයට ගුරුවරුන්
ලෙසත්[5] නීතියේ සඳහන් වී ඇති
ආකාරයට දෙවි පිළිබඳ දැනුම*[6] හා
සත්‍යය පිළිබඳ මූලික අවබෝධ-
යක් ඇති අය ලෙසත්ය.[7] **21** කෙ-
සේවෙතත් වෙන අයට උගන්වන
ඔබ, ඔබ උගන්වන දේ පිළිපදින-
වාද?[8] "සොරකම් නොකරන්න"[9] කියා
අනුන්ට දේශනා කරන ඔබ, සොර-
කම් කරනවාද?[10] **22** "අනාචාරයේ*
නොහැසිරෙන්න"[11] කියා පවසන ඔබ,
අනාචාරයේ යෙදෙන කෙනෙක්ද? දේ-
වතා රූප ගැන මහත් පිළිකුලකින්
කතා කරන ඔබ, දේවස්ථානවලින්
අයුතු ලාභ ප්‍රයෝජන[12] ලබාගන්-
නවාද? **23** නීතිය ගැන ආඩම්බර-
යෙන් සිතන ඔබ, නීතියේ තිබෙන
දේවල් උල්ලංඝනය කිරීමෙන්[13] දෙ-
විට අගෞරව කරනවාද? **24** කලින්
ලියා තිබුණු ආකාරයට, "ඔබ කරන
දේවල් නිසා ජාතීන් අතරේ දෙවිගේ
නාමය අපහාසයට ලක් වී ඇත."[14]

**25** චර්මච්ඡේදනය වීමේ පිළිවෙ-
තෙන්[15] ප්‍රයෝජනයක් තිබෙන්නේ
ඔබ නීතියේ තිබෙන දේවල් පිළි-
පදිනවා නම් පමණි.[16] නමුත් ඔබ
නීතියේ තිබෙන දේවල් උල්ලංඝ-
නය කරනවා නම් ඔබ චර්මච්ඡේද-
නය වී සිටියත්[17] ඉන් කිසි පලක්
නැත.[18] **26** ඇත්තෙන්ම චර්මච්ඡේ-
දනය වීමේ පිළිවෙතට යටත් නොවූ[19]
කෙනෙක් නීතියේ සඳහන් ධර්මිෂ්ඨ
ප්‍රමිති[20] පිළිපදිනවා නම් ඔහුව චර්-
මච්ඡේදනය කළ කෙනෙකු ලෙස
සැලකිය යුතු නැද්ද?[1] **27** එමෙන්ම
යමෙක් කුඩා කාලයේ සිට චර්මච්ඡේ-
දනය වීමේ පිළිවෙතට යටත් නොවී
සිටියත් ඔහු නීතියේ සඳහන් දේවල්
පිළිපදිනවා නම් ඔහු ඔබව වරදක-
රුවෙකු ලෙස ඔප්පු කර පෙන්වයි.[2]
මන්ද ඔබට ලිඛිත නීති මාලාව ලැබී
තිබුණත් ඔබ චර්මච්ඡේදනය වී සිටි-
යත් ඔබ නීතිය උල්ලංඝනය කරන
කෙනෙකු වන නිසාය. **28** ඒ අනුව
කෙනෙකු සැබෑ යුදෙව්වෙකු වන්නේ
ඔහුගේ යම් බාහිර සුදුසුකම් නිසා
නොවෙයි.[3] ඔහුගේ චර්මච්ඡේදනයත්
ශාරීරිකව කරන බාහිර එකක් නො-
වෙයි.[4] **29** ඔහු සැබෑ යුදෙව්වෙක්
වන්නේ ඔහු හදවතින්ම යුදෙව්වෙකු
වන නිසාය.[5] ඔහුගේ චර්මච්ඡේදනයද
හදවතේ සිදු වන දෙයකි.[6] එවැනි දෙ-
යක් සිදු වන්නේ ලිඛිත නීති මාලා-
වක් මගින් නොව[7] දෙවිගේ බලයේ
ක්‍රියාකාරිත්වය නිසාය. එහෙයින් ඒ
මිනිසාට ප්‍රශංසාව[8] ලැබෙන්නේ මිනි-
සුන්ගෙන් නොව දෙවිගෙන්ය.[9]

**3** එසේනම් අන් අයට වඩා යුදෙව්-
වන්ට යම් වාසියක් තිබේද?[10]
චර්මච්ඡේදනය වීමේ පිළිවෙතේ යම්
ප්‍රයෝජනයක් තිබේද?[11] **2** එසේය,
සෑම අතින්ම තිබේ. ප්‍රධානතම දේ
නම් දෙවිගේ පරිශුද්ධ ප්‍රකාශයන් භාර
දෙනු ලැබුවේ ඔවුන්ටය.[12] **3** කෙ-
සේවෙතත් ඇතැම් යුදෙව්වන් තුළ
විශ්වාසයක් නැති බව සැබෑවකි.[13]
ඔවුන් තුළ විශ්වාසයක් නැති වූ
පමණින්[14] ඉන් දෙවි අවිශ්වාසවන්ත
කෙනෙකු බව ඔප්පු වේද?[15] **4** කිසි
ලෙසකින්වත් එලෙස සිදු වන්නේ
නැත! සෑම මිනිසෙකුම බොරුකාර-
යෙකු බව ඔප්පු වුවත්[16] දෙවි සත්‍ය-
වාදීය![17] "ඔබ පවසන දේ ධර්මිෂ්ඨ
බවත් ඔබට විරුද්ධව එල්ල කර
ඇති චෝදනාවලින් ඔබ නිදොස්
බවත් ඔප්පු වන්නේය"[18] කියා දෙවි
ගැන ලියා තිබෙන්නේ ඒ නිසාය.
**5** නමුත් සමහරුන් සිතන්නේ තම
අධර්මිෂ්ඨ ක්‍රියාවලින් වැදගත් කාර්ය-

---

රෝම **2:20*** හෝ, "සැලැස්මකට අනුව ලබා දෙන දැනුම." **22*** මූ.අ., "පරදාර සේවනයේ." මෙය භාවිත කරන්නේ විවාහක පුරුෂයෙකු හෝ ස්ත්‍රියක අනාචාරයේ යෙදීම විස්තර කිරීමටය.

**2 පරි.**
**1** රෝම 3:2
**2** යෙසා 42:7, මතෙ 15:14, මතෙ 23:16
**3** යෙසා 49:6
**4** 2රාජා 5:11
**5** යෙසා 42:6, මතෙ 15:26
**6** නික් 25:9, ක්‍රියා 7:44, හෙබ්‍රෙ 8:5, හෙබ්‍රෙ 10:1
**7** රෝම 1:25, කොලො 2:17
**8** මතෙ 23:3
**9** නික් 20:15, යොෂු 7:11
**10** මාක් 12:40
**11** ද්වි 5:18, 1කොරි 6:9
**12** මලා 3:8
**13** ගීතා 78:10
**14** යෙසා 52:5, එස 36:20
**15** උත් 17:10
**16** ගලා 5:3
**17** 1කොරි 7:19
**18** යෙරෙ 9:25, ගලා 5:6
**19** එෆී 2:11
**20** ක්‍රියා 10:2

**2 තීරුව**
**1** රෝම 4:10
**2** මතෙ 12:41
**3** යොහ 8:39, එළි 2:9
**4** යොහ 7:24, 1කොරි 7:19
**5** රෝම 9:6
**6** ද්වි 10:16, ද්වි 30:6, යෙරෙ 4:4, ක්‍රියා 7:51, පිලි 3:3
**7** රෝම 7:6
**8** 1කොරි 4:5
**9** යොහ 5:44

**3 පරි.**
**10** රෝම 9:4
**11** යොහ 4:22
**12** ද්වි 4:8, ගීතා 147:19, ක්‍රියා 7:38
**13** 2තෙස 3:2, හෙබ්‍රෙ 4:2
**14** 2තිමෝ 2:13
**15** ගණන් 23:19, යෙසා 55:11
**16** ගීතා 116:11, යෙරෙ 8:9, යෙරෙ 9:5
**17** 1රාජා 18:39, යොහ 3:33, යොහ 8:26
**18** ගීතා 51:4, ලූක් 7:29

යක් ඉටු වන බවය.[1] තම අධර්මිෂ්ඨ
ක්‍රියා නිසා දෙවිගේ ක්‍රියාවල ධර්මිෂ්ඨ-
කම කැපීපෙනෙන බව ඔවුහු පවසති.
එසේනම් දෙවි අපට දඬුවම් කරන
විට එය අසාධාරණයක්ද?[2] (මා මෙහිදී
සඳහන් කරන්නේ මිනිසුන් දරන මත-
යයි.)[3] **6** කිසි ලෙසකින්වත් එලෙස
නොසිතන්න! මන්ද දෙවි එසේ අසා-
ධාරණව කටයුතු කරන කෙනෙක්
නම් ඔහු ලෝකය විනිශ්චය කරන්නේ
කෙසේද?[4]
**7** තවත් සමහරුන් කියන්නේ
තමන් පවසන බොරුවලින් දෙවි-
ගේ සත්‍යවාදීකම වඩාත් කැපීපෙ-
නෙන බවත්[5] එයින් ඔහුට ගෞරවයක්
ලැබෙන බවත්ය. එසේනම් ඒ අයව
පව්කාරයන් ලෙස විනිශ්චය කිරීම
සාධාරණද? එය නිවැරදිද?[6] **8** එම-
නිසා, “නපුරු දේවල් කරන තරමට
අපට යහපත් ප්‍රතිඵල ලැබෙනවා”[7]
කියා ඔබට සිතෙන්න පුළුවන. අපත්
එවැනි අදහස් පතුරුවන බව පවස-
මින් සමහරු අපට බොරුවට චෝදනා
කරති.[8] කෙසේවෙතත් එවැනි අයට
දඬුවම් කරන විට[9] දෙවි යුක්තිය ඉටු
කරන්නේය.[10]
**9** එසේනම් අප කෙසේ සිතිය
යුතුද? යුදෙව්වන් හැටියට අප වඩාත්
උසස් තත්වයක සිටින බවද?[11] නැත.
කිසිසේත් නැත. මන්ද අප දැනටමත්
පැහැදිලි කළ ආකාරයට යුදෙව්වරුන්
හා ග්‍රීකවරුන්* යන දෙපාර්ශ්වයම
තම පව්කාර ස්වභාවයට හසු වී
සිටිති.[12] **10** ලියා තිබෙන මතු දැක්-
වෙන දේවලින් එය මනාව සනාථ
වේ. “කිසි ධර්මිෂ්ඨ මිනිසෙක් නැත.
එක් කෙනෙක්වත් නැත.[13] **11** හොඳ
වැටහීමකින් ක්‍රියා කරන කිසිවෙක්
නැත. දෙවිගේ මඟ පෙන්වීම් පතන
කිසිවෙක් නැත.[14] **12** සියලුදෙනාම
යහපතින් ඉවත් වී කිසි වැදගැම්ම-
කට නැති අය බවට පත්ව ඇත.
කරුණාවන්තකමින් ක්‍රියා කරන
කිසිවෙක් නැත. එක් කෙනෙක්වත්
නැත.”[1] **13** “ඔවුන්ගේ උගුර විවර
වී තිබෙන සොහොනක් හා සමා-
නය. ඔවුන්ගේ මුවින් නික්මෙන්-
නේ වංචනික දේවල්ය.”[2] “ඔවුන්ගේ
මුවින් පිට වන වචන සර්ප විෂ
මෙන් මාරාන්තිකය.”[3] **14** “ඔවුන්-
ගේ මුඛයෙන් නිතරම පිට වන්නේ
ශාප හා හිංසාවෙන් පිරුණු වදන්ය.”[4]
**15** “ඔවුහු ලේ වැගිර වීමට ඉක්මන්
වෙති.”[5] **16** “ඔවුන් නිතරම උත්-
සාහ කරන්නේ විනාශ කිරීමටත් වේ-
දනා ඇති කිරීමටත්ය.[6] **17** එසේම
ඔවුහු සමාදානයේ මඟ ප්‍රතික්ෂේප
කරති.”[7] **18** “දෙවි කෙරෙහි ඔවුන්ට
කිසිම ගරුබියක් නැත.”[8]
**19** නීතිය[9] භාර දෙනු ලැබුවේ
යුදෙව්වන්ට බව අපි දනිමු. එහෙයින්
ඔවුන්ගෙන් කෙනෙක් තමන් නිර්දෝ-
ෂයි කියා පවසන්න උත්සාහ කළත් ඒ
නීතිය නිසා ඔහු නිහඬ වනු ඇත.[10] ඒ
අනුව මුළු ලෝකයම[11] දෙවිගෙන් දඬු-
වම් ලැබීමට සුදුසු බව ඔප්පු වේ.[12]
**20** ඉන් පැහැදිලි වන්නේ නීතියේ
සඳහන් සෑම දෙයක්ම පිළිපැද්දත්
කිසි මිනිසෙකු දෙවි ඉදිරියේ ධර්-
මිෂ්ඨ කෙනෙකු ලෙස ප්‍රකාශ නො-
කරන බවයි.[13] ඇත්තෙන්ම නීතිය
උපකාරවත් වන්නේ[14] අපගේ පව්කාර
ස්වභාවය ගැන අපට පැහැදිලි අව-
බෝධයක් ලබාගැනීමටය.[15]
**21** ඒ අනුව දෙවි ඉදිරියේ ධර්-
මිෂ්ඨ කෙනෙකු ලෙස පෙනී සිටී-
මට නීතිය මත රඳා සිටීම අවශ්‍ය
වන්නේ නැත.[16] ඒ සඳහා දෙවි වෙ-
නත් මඟක් අපට උදා කර දී තිබේ.
ඒ මඟ ගැන නීතියෙන්[17] අනාගත-
වක්තෘවරුන් පැවසූ දේවලත්[18] එළිද-
රව් කර තිබිණ.[19] **22** දෙවි ඉදිරියේ
ධර්මිෂ්ඨ කෙනෙකු ලෙස පෙනී සිටී-
මට තිබෙන එම මඟ නම් යේසුස්
ක්‍රිස්තුස් කෙරෙහි විශ්වාසය තැබී-
මයි.[20] ඒ ප්‍රස්තාව විශ්වාසය තබන
සියලුදෙනාටම විවෘතය.[21] සියලුදෙ-
නාටම වෙනසක් නැතුව ඒ ප්‍රස්-
තාව ලැබේ.[22] **23** මන්ද සියලුම
මනුෂ්‍යයෝ පව් කර ඇත.[23] එහෙයින්

රෝම **3:9*** රෝම 1:16හි පාදසටහන බලන්න.

**3 පරි.**
**1** රෝම 1:17
පිලි 3:9
**2** උත් 18:25
**3** ගලා 3:15
**4** ගීතා 9:8
ගීතා 96:13
ගීතා 98:9
ක්‍රියා 17:31
**5** 1තිමෝ 2:7
**6** ක්‍රියා 24:20
**7** රෝම 6:1
**8** මතෙ 28:15
**9** මතෙ 23:38
**10** හෙබ්‍රෙ 2:2
**11** රෝම 11:17
**12** රෝම 3:23
ගලා 3:22
**13** ගීතා 14:1
හිතෝ 20:9
දේශ 7:20
**14** ගීතා 14:2
ගීතා 53:2

**2 තීරුව**
**1** ගීතා 14:3
ගීතා 53:3
**2** ගීතා 5:9
ගීතා 52:2
**3** ගීතා 58:4
ගීතා 140:3
මතෙ 12:34
යාකො 3:8
**4** ගීතා 10:7
යාකො 3:9
**5** හිතෝ 1:16
යෙසා 59:7
**6** යෙසා 59:7
**7** යෙසා 59:8
**8** උත් 20:11
ගීතා 36:1
ගීතා 112:1
හිතෝ 16:6
**9** ගලා 3:24
**10** ගීතා 63:11
**11** රෝම 5:13
**12** රෝම 2:12
ගලා 3:10
**13** ක්‍රියා 13:39
ගලා 3:11
**14** රෝම 7:9
**15** රෝම 7:13
ගලා 3:19
**16** ද්වි 32:4
රෝම 1:17
**17** ගණන් 21:9
ද්වි 18:18
**18** යෙසා 53:11
යෙරෙ 31:34
දානි 9:24
**19** හෙබ්‍රෙ 11:4
**20** යොහ 1:17
**21** යෙසා 59:20
**22** ගලා 3:28
**23** දේශ 7:20
රෝම 3:9

දෙවිගේ අතිශ්‍රේෂ්ඨ ගුණාංග පිළි-
බිඹු කිරීමට ඔවුහු අසමත් වෙති.[1]
**24** නමුත් දෙවිගේ මහත් කරුණා-
වෙන්[2] ඔවුන්ව ධර්මිෂ්ඨ අය ලෙස
ප්‍රකාශ කරනු ලැබේ. එය දෙවි නො-
මිලේ ලබා දෙන දීමනාවකි.[3] එය
ලබාගත හැකි වන්නේ ක්‍රිස්තුස් යේ-
සුස්ගේ ජීවිත පූජාව මාර්ගයෙනි.
අපගේ පව්කාර ස්වභාවයෙන් අපව
නිදහස් කිරීමට ඔහුගේ ජීවිතය වන්-
දියක් ලෙස ගෙවන ලදි.[4] **25** දෙවි
ක්‍රිස්තුස්ව එව්වේ මිනිසාට දෙවි සමඟ
සමාදාන වීමට මඟක් සලසන පූජා-
වක් ලෙසය.[5] ඒ සඳහා ඔවුන් ක්‍රිස්තුස්-
ගේ රුධිරය කෙරෙහි විශ්වාසය තැබීම
අවශ්‍ය විය.[6] දෙවි ඒ දේ කළේ තමන්
ධර්මිෂ්ඨ බව තහවුරු කිරීමටය. අතී-
තයේදී ඔහුගේ ධර්මිෂ්ඨකම පැහැදිලි
වූයේ ඔහු ඉවසිලිවන්තව ක්‍රියා කර-
මින්[7] මිනිසුන් කළ පාපවලට සමාව
දීමෙනි.[8] **26** මේ වර්තමාන කාල-
යේදී ඔහුගේ ධර්මිෂ්ඨකම පැහැදිලි
වන්නේ[9] යේසුස් කෙරෙහි විශ්වාසය
තබන මිනිසුන්ව ධර්මිෂ්ඨයන් ලෙස
ප්‍රකාශ කිරීමෙනි.[10]

**27** එසේනම් පුරසාරම් දෙඩීමට
කිසි පදනමක් තිබේද?[11] නැත. ඒ
සඳහා පදනමක් නැත්තේ අප පිළිප-
දින නීතිය[12] ක්‍රියා මත පද-
නම් වූ එකක් නොවන නිසාය.[13] ඒ
වෙනුවට අපට තිබෙන්නේ විශ්වාසය
මත පදනම් වූ නීතියකි.[14] **28** එසේ-
නම් මිනිසෙක් ධර්මිෂ්ඨ කෙනෙකු
බව ප්‍රකාශ කරන්නේ නීතියේ සඳ-
හන් දේවල් පිළිපැදීමෙන් නොව ඔහු
තුළ තිබෙන විශ්වාසය මාර්ගයෙනි.[15]
**29** එහෙයින් දෙවි යුදෙව්වරුන්ට පම-
ණක් අයිති දෙවි කෙනෙක්ද?[16]
ඔහු වෙනත් ජාතීන්වලට අයිති අය-
ගෙත් දෙවි වන්නේ නැද්ද?[17] එසේය,
ඔහු වෙනත් ජාතීන්ගේද දෙවි වන්-
නේය.[18] **30** දෙවි එකම දෙවි වන
නිසා[19] චර්මච්ඡේදනය වී[20] විශ්වාසය
තබන අයව ධර්මිෂ්ඨයන් ලෙස ඔහු
සලකන්නා සේම චර්මච්ඡේදනය වී
නැතත්[21] විශ්වාසය තබන අයවත්
ඔහු ධර්මිෂ්ඨයන් ලෙස සලකන්නේය.
**31** එසේනම් අපගේ විශ්වාසය නිසා
නීතිය කිසි තේරුමක් නැති දෙ-
යක් බවට පත් වේද?[1] නැත. ඇත්-
තෙන්ම අප මාර්ගයෙන් නීතිය තවත්
ස්ථිර වේ.[2]

**4** අපගේ මුතුන්මිත්තා වූ ආබ්‍ර-
හම්[3] ගැන කිව හැක්කේ කුමක්ද?
**2** ආබ්‍රහම් ධර්මිෂ්ඨයි කියා ප්‍රකාශ
කළ බව අපි දනිමු. දෙවි ඔහුව
ධර්මිෂ්ඨයෙකු ලෙස සැලකුවේ ඔහු
කළ ක්‍රියා නිසාද?[4] එය එසේනම්
තමා ගැන පුරසාරම් දෙඩීමට ඔහුට
පදනමක් තිබෙනු ඇත. නමුත් දෙ-
විගේ ප්‍රමිතියට අනුව පුරසාරම් දෙ-
ඩීමට ඔහුට කිසිම පදනමක් නැත.
**3** ශුද්ධ ලියවිල්ලේ ඔහු ගැන පවසන්-
නේ කුමක්ද? "ආබ්‍රහම් යෙහෝවා දෙවි
කෙරෙහි විශ්වාසය තැබුවේය. ඒ නිසා
ඔහුව ධර්මිෂ්ඨ කෙනෙකු ලෙස ගණන්
ගන්නා ලදි"[5] කියාය. **4** උදාහරණ-
යකට යම් රැකියාවක් කරන මිනිසෙකු
ගැන සිතන්න.[6] ඔහුට ඒ වෙනු-
වෙන් ගෙවීමක් කරන්නේ ඔහුට කරු-
ණාව පෙන්වමින් ලබා දෙන තෑග්ගක්
ලෙස නොවේ.[7] එය දෙනු ලබන්නේ
ඔහු කළ දේට යම් ගෙවීමක් කළ
යුතු නිසාය.[8] **5** අනික් අතට තමන්
කරන ක්‍රියා මත රඳා නොසිටින
කෙනෙකු ගැන සිතන්න. ඔහු පව්-
කාරයන්ව ධර්මිෂ්ඨයන් ලෙස ප්‍රකාශ
කරන තැනැත්තා කෙරෙහි විශ්වා-
සය තබන නිසා[9] ඔහුව ධර්මිෂ්ඨයෙකු
ලෙස සලකනු ලැබේ. ඒ අනුව කෙ-
නෙකුව ධර්මිෂ්ඨයෙකු ලෙස සලකන්-
නේ ඔහු කරන ක්‍රියා නිසා නොව
ඔහු තුළ තිබෙන විශ්වාසය නිසාය.[10]
**6** යම් තැනැත්තෙකුගේ ක්‍රියා පදන-
මක් කර නොගෙන දෙවි ඔහුව ධර්-
මිෂ්ඨයෙකු ලෙස සලකන ආකාරය
ගැන දාවිත්ද කතා කළේය. එවැනි
කෙනෙකුට මොන තරම් සන්තෝෂ-
යක් දැනේද යන්න ගැන ඔහු සඳහන්
කළේ මෙලෙසය. **7** "වරදට සමාව

**10** ක්‍රියා 13:39; ගලා 2:16; ගලා 2:17.

**3 පරි.**

**1** උත් 1:31; යෙසා 64:6
**2** එෆී 2:8
**3** රෝම 5:17; රෝම 6:23; එෆී 1:7
**4** මතෙ 20:28; 1කොරි 1:30; 1තිමෝ 2:6; 1පේතෘ 2:24
**5** යෙසා 53:11; 2කොරි 5:19; 1යොහ 2:2; 1යොහ 4:10
**6** ලෙවී 17:11; ක්‍රියා 13:39; එෆී 1:7
**7** ක්‍රියා 17:30; රෝම 2:4
**8** ක්‍රියා 13:38
**9** ගීතා 89:14; රෝම 5:18
**10** රෝම 8:33; 1කොරි 1:30; 1යොහ 1:9
**11** 1කොරි 1:29
**12** ක්‍රියා 13:39
**13** එෆී 2:9
**14** යෙරෙ 31:33; රෝම 1:17; රෝම 8:2
**15** ක්‍රියා 13:39; ගලා 2:16; යාකො 2:24
**16** ක්‍රියා 17:27
**17** ක්‍රියා 10:4
**18** යෙසා 54:5; රෝම 10:12; ගලා 3:14
**19** ද්වි 6:4; මාක් 12:29; 1කොරි 8:6; එෆී 4:6; 1තිමෝ 2:5
**20** 1කොරි 7:18
**21** ගලා 3:8

**2 තීරුව**

**1** මතෙ 5:17
**2** රෝම 8:4; රෝම 13:10

**4 පරි.**

**3** යෙසා 51:2; යොහ 8:39
**4** උත් 12:4; ද්වි 6:25
**5** උත් 15:6; ගලා 3:6; යාකො 2:23
**6** රෝම 9:32
**7** රෝම 11:6
**8** මතෙ 20:9; 1තිමෝ 5:18
**9** යොහ 6:29

ලැබූ තැනැත්තා සන්තෝෂවත්ය.[1]
ඔහු කළ පාප මකා දැමූ විට ඔහු සන්-
තෝෂවත්ය.[2] **8** යමෙකු කළ පාපය
යෙහෝවා දෙවි සිහියේ තබා නොගන්-
නේ නම් ඔහු සන්තෝෂවත්ය."[3]
**9** එවැනි සන්තෝෂයක් අද්දකින්-
නේ චර්මච්ඡේදනය වූ අය පමණක්ද?
චර්මච්ඡේදනය වී නැති අයටත්
එය අද්දැකිය නොහැකිද?[4] "ආබ්‍රහම්
දෙවි කෙරෙහි විශ්වාසය තැබූ නිසා
ඔහුව ධර්මිෂ්ඨ කෙනෙකු ලෙස ගණන්
ගන්නා ලදි"[5] කියා අප පැවසුවා ඔබට
මතක ඇති. **10** ඔහුව ධර්මිෂ්ඨ කෙ-
නෙකු ලෙස සැලකුවේ කුමන අවස්-
ථාවේදීද? ඔහුව චර්මච්ඡේදනය කළ
පසුද නැත්නම් එසේ කිරීමට පෙ-
රද?[6] ඇත්තෙන්ම එසේ සිදු වූයේ
ඔහු චර්මච්ඡේදනය වීමට කලින්ය.
**11** එසේනම් ඔහුව චර්මච්ඡේදනය
කළේ යමක් සංකේතවත් කිරීමටය.[7]
එනම් ඔහුගේ විශ්වාසය නිසා දෙවි
ඔහුව ධර්මිෂ්ඨ කෙනෙකු ලෙස සල-
කන බව සංකේතවත් කිරීමටය. චර්-
මච්ඡේදනය වීමට කලින් සිටම ඔහු
තුළ විශ්වාසය තිබිණ. ඒ අනුව චර්-
මච්ඡේදනය නොවී සිටියත් තම විශ්-
වාසය නිසා ධර්මිෂ්ඨයන් ලෙස ප්‍රකාශ
කරනු ලබන සියලුදෙනාගේම[8] පියා
බවට ඔහු පත් විය.[9] **12** එසේම චර්-
මච්ඡේදනය වී ඇති අයගේද පියා
ඔහුය. ඒ අනුව ඔහු චර්මච්ඡේදනය
වීමේ පිළිවෙතට යටත්ව සිටින අයගේ
පමණක් නොව චර්මච්ඡේදනය වීමට
කලින් සිටම ඔහු පෙන්වූ විශ්වාසය
අනුකරණය කරන අයගේද පියා වේ.[10]
**13** ආබ්‍රහම්ටත් ඔහුගේ පෙළප-
තටත් මුළු පොළොවම උරුම වන
බව දෙවි ඔහුට පොරොන්දු වුණේ
ඔහු නීතියට කීකරු වූ නිසා නො-
වේ.[11] ඔහු තුළ තිබූ විශ්වාසය හේතු-
වෙන් දෙවි ඔහුව ධර්මිෂ්ඨයෙකු ලෙස
සැලකූ නිසාය.[12] **14** උරුමක්කාර-
යන් බවට පත් වන්නේ නීතියට
ඇලී සිටින අය නම් විශ්වාසයක්
ඇතුව සිටීමෙන් කිසිදු පලක් නැත.
දෙවි දෙන පොරොන්දුවේ කිසි තේරු-
මක්ද නැත.[1] **15** ඇත්තටම නීතිය
තුළින් කෙනෙක් දෙවිගේ උදහසට
ලක් විය යුතු බව පෙන්වා දෙයි.[2]
එලෙසම නීතියක් දී තිබුණේ නැත්-
නම් ඒ තැනැත්තා වරදක් කළා කියා
තීරණය වන්නේ නැත.[3]
**16** ආබ්‍රහම් උරුමක්කාරයෙකු වන
බවට දෙවි පොරොන්දු වුණේ ඔහු තුළ
තිබූ විශ්වාසය නිසා බව පැහැදිලිය. ඒ
පොරොන්දුවෙන් දෙවිගේ මහත් කරු-
ණාව දැකගත හැකි විය.[4] එවැනි පො-
රොන්දුවක් දීමට හේතුව[5] ආබ්‍රහම්
තුළ තිබූ විශ්වාසය වන නිසා ඒ පො-
රොන්දුව ඔහුගෙන් පැවතෙන සියලු-
දෙනා[6] එනම්, නීතිය යටතේ සිටින
අය පමණක් නොව ආබ්‍රහම් මෙන්
විශ්වාසයක් ඇති සියලුදෙනා සම්බන්-
ධයෙන් සහතිකවම ඉටු වේ. (ඔහු අප
සියලුදෙනාගේම පියාය.[7] **17** මන්ද,
"මම ඔබව බොහෝ ජාතීන්ගේ පියෙකු
ලෙස පත් කළෙමි" කියා ලියා තිබේ.)[8]
එම පොරොන්දුව ඔහු විශ්වාස කළ
දෙවි විසින්ම තහවුරු කරන ලදි.
ඒ දෙවි, මිය ගොස් ඇති අයව
නැවත ජීවත් කරවන,[9] ඉටු වී නැති
දේවල් පවා ඉටු වී ඇති බවට ප්‍රකාශ
කරන දෙවිය.[10] **18** ආබ්‍රහම් බො-
හෝ ජාතීන්ගේ පියා වන බව[11] දෙවි
පවසද්දී එය සිදු වන දෙයක් ලෙස
නොපෙනුණත් ඔහුට ඒ ගැන බලා-
පොරොත්තුවක් මෙන්ම විශ්වාසයක්ද
තිබිණ.[12] එමනිසා "ඔබෙන් පැව-
තෙන අයත් එලෙසම වන්නේය"[13]
කියා දෙවි පැවසූ විට ඔහු එය
සිදු විය හැකි දෙයක් ලෙස විශ්වාස
කළේය. **19** ඒ වන විට තමාට අවු-
රුදු සියයක් වන නිසා[14] තමා දුබල
බවත්[15] සාරාට දරුවෙකු බිහි කරන්න
තරම් හැකියාවක් නැති බවත්[16] දැන
සිටියද ඔහු තුළ තිබූ විශ්වාසය දුර්-
වල වී ගියේ නැත. **20** එසේම දෙවි
දුන් පොරොන්දුව[17] ගැන සැක කරමින්
තම විශ්වාසය නැති කරගත්තේද
නැත.[18] ඒ වෙනුවට විශ්වාසයෙන්
ශක්තිමත් වූ ඔහු,[19] දෙවිට ගෞරවය
ගෙන දෙමින්, **21** දෙවි පොරොන්දු

**4 පරි.**

**1** ගීතා 85:2, යෙසා 43:25
**2** ගීතා 32:1
**3** ගීතා 32:2, 2කොරි 5:19
**4** රෝම 3:30
**5** රෝම 4:3
**6** 1කොරි 7:19
**7** උත් 17:1, උත් 17:11, ක්‍රියා 7:8
**8** උත් 15:6, ගලා 3:7
**9** ලූක් 19:9, රෝම 4:16
**10** ගලා 3:29
**11** උත් 12:3, උත් 17:6, උත් 18:18, උත් 22:17
**12** හෙබ්‍රෙ 11:8

**2 තීරුව**

**1** ගලා 3:18
**2** රෝම 3:20, රෝම 5:20, 2කොරි 3:7, ගලා 3:19
**3** රෝම 5:13
**4** රෝම 3:24
**5** රෝම 15:8, ගලා 3:22
**6** රෝම 9:8, ගලා 3:29
**7** රෝම 4:11
**8** උත් 17:5
**9** ආනි 12:13, ලූක් 20:37, එෆී 2:1, හෙබ්‍රෙ 11:19
**10** ලූක් 20:38, 1කොරි 1:28, 1පේතෘ 2:10
**11** උත් 17:6
**12** හෙබ්‍රෙ 11:17
**13** උත් 15:5
**14** උත් 17:17
**15** හෙබ්‍රෙ 11:12
**16** උත් 18:11, හෙබ්‍රෙ 11:11
**17** හෙබ්‍රෙ 6:13
**18** හෙබ්‍රෙ 3:19
**19** ගලා 3:9, හෙබ්‍රෙ 11:34

වී තිබූ දේ අනිවාර්යයෙන්ම ඉටු කරන
බවට පූර්ණ විශ්වාසයකින් සිටියේය.[1]
**22** 'ඔහුව ධර්මිෂ්ඨ කෙනෙකු ලෙස
ගණන් ගනු ලැබුවේ' ඒ නිසාය.[2]

**23** 'ඔහුව එලෙස ගණන් ගනු
ලැබූ' බව[3] ලියා තිබුණේ ඔහු
උදෙසා පමණක් නොව,[4] **24** අප
උදෙසාත්ය. මන්ද අපගේ ස්වාමීන්
වන යේසුස්ව මරණයෙන් නැඟිටෙවූ
තැනැත්තා කෙරෙහි අපටත් විශ්වාස-
යක් තිබේ.[5] එහෙයින් අපවත් ධර්-
මිෂ්ඨයන් ලෙස ගණන් ගනු ලැබේ.
**25** යේසුස්ව මරණයට නියම කරනු
ලැබුවේ අපගේ වැරදි උදෙසාය.[6]
එමෙන්ම ඔහුව නැවත නැඟිටුවනු
ලැබුවේ අපව ධර්මිෂ්ඨයන් ලෙස
ප්‍රකාශ කිරීම සඳහාය.[7]

**5** අප තුළ තිබෙන විශ්වාසය පද-
නම් කරගෙන[8] අපව දැන් ධර්-
මිෂ්ඨයන් ලෙස ප්‍රකාශ කර තිබෙන
නිසා අපගේ ස්වාමීන් වන යේසුස්
ක්‍රිස්තුස් මාර්ගයෙන් අපි දෙවි සමඟ
සමාදානය භුක්ති විඳිමු.[9] **2** අප
යේසුස් කෙරෙහි විශ්වාසය තබන
නිසා දෙවි වෙතට ළං වී[10] ඔහුගේ
මහත් කරුණාව අද්දැකීමට ප්‍රස්තාව
දැන් අපට උදා වී ඇත. එහෙයින්
දෙවි ඉදිරියේ තේජසට පත් වීමේ
බලාපොරොත්තුව ඇතුව[11] සිටින අපි
ඒ ගැන බොහෝ සෙයින් සතුටු
වෙමු. **3** ඇත්තෙන්ම අප පීඩාවන්ට
මුහුණ දෙමින් සිටියත් ප්‍රීතියෙන් සිටී-
මට අපට පුළුවන.[12] මන්ද පීඩාවලට
මුහුණ දෙන විට අප තුළ විඳදරාගැ-
නීමේ හැකියාව ඇති වේ.[13] **4** විඳ-
දරාගන්නා විට එය අපට දෙවිගේ
අනුමැතිය ලබාගැනීමට මඟ පාදයි.[14]
දෙවිගේ අනුමැතිය ලබාගන්නා විට
අප තුළ තිබෙන බලාපොරොත්-
තුව ශක්තිමත් වේ.[15] **5** ඒ බලා-
පොරොත්තුව නිසා අප තුළ කිසි
කලකිරීමක් ඇති වන්නේ නැත.[16]
එසේ වන්නේ දෙවි අපට ලබා දුන් තම
බලයේ ක්‍රියාකාරිත්වය තුළින්[17] අප-
ගේ හදවත්[18] දෙවිගේ ප්‍රේමයෙන් පිරී
ඇති නිසාය.[19]

**4 පරි.**
**1** ගීතා 115:3
හෙබ්‍රෙ 11:19
**2** උත් 15:6
යාකො 2:23
**3** පිලෙ 18
**4** රෝම 15:4
**5** ක්‍රියා 2:24
ක්‍රියා 13:30
1පේත 1:21
**6** යෙසා 53:12
මතෙ 20:28
**7** යෙසා 53:11
2කොරි 5:21

**5 පරි.**
**8** ක්‍රියා 13:39
රෝම 3:26
**9** යෙසා 32:17
ගලා 6:16
එෆී 2:14
**10** යොහ 10:9
2කොරි 5:18
එෆී 2:12
එෆී 3:12
හෙබ්‍රෙ 10:19
**11** රෝම 15:13
හෙබ්‍රෙ 3:6
**12** ක්‍රියා 5:41
පිලි 2:17
1පේත 3:14
1පේත 4:13
**13** ක්‍රියා 5:42
හෙබ්‍රෙ 10:36
**14** 2තිමෝ 2:15
යාකො 1:12
**15** පිලි 1:20
**16** යොෂු 21:45
**17** එෆී 1:13
තීත 3:5
**18** 2කොරි 1:22
ගලා 4:6
**19** 1යොහ 2:5
2යොහ 6

**2 තීරුව**
**1** එෆී 2:5
**2** මතෙ 20:28
**3** ගීතා 49:8
**4** මතෙ 12:35
**5** යොහ 15:13
**6** යෙසා 53:12
1පේත 3:18
**7** යොහ 3:16
එෆී 2:4
1යොහ 4:10
**8** ක්‍රියා 13:39
ගලා 2:16
හෙබ්‍රෙ 9:14
**9** 1තෙස 1:10
1තෙස 5:9
**10** යෙසා 59:2
කොලො 1:21
**11** 2කොරි 5:18
කොලො 1:22
**12** ක්‍රියා 15:11
**13** 2කොරි 5:19
1යොහ 2:2

**6** ඇත්තෙන්ම අප අසරණව* සිටි
විට[1] ක්‍රිස්තුස් නියමිත කාලයේදී
පැමිණ දෙවිට කිසි භක්තියක් නො-
දක්වන මිනිසුන් උදෙසා මිය ගියේය.[2]
**7** සාමාන්‍යයෙන් ධර්මිෂ්ඨ කෙ-
නෙකු උදෙසා යමෙකු තම ජීවිතය
පරිත්‍යාග කරන්නේ කලාතුරකිනි.[3]
සමහර අවස්ථාවලදී ඉතා යහපත්[4]
කෙනෙකු වෙනුවෙන් තම ජීවිතය පුද
කිරීමට තරම් නිර්භීතකමක් යමෙකු
තුළ ඇති විය හැක.[5] **8** නමුත් අප
උදෙසා මිය යෑමට දෙවි ක්‍රිස්තුස්ව
එව්වේ අප පව්කාරයන් වී සිටියදීමය.[6]
දෙවි අප කෙරෙහි ඇති තම ප්‍රේමය
පෙන්නුම් කළේ එලෙසය.[7] **9** එහෙ-
යින් ක්‍රිස්තුස්ගේ රුධිරය මාර්ගයෙන්
අපව දැන් ධර්මිෂ්ඨයන් ලෙස ප්‍රකාශ
කර ඇත.[8] එමනිසා ඔහු මාර්ගයෙන්
දෙවිගේ උදහසින් අපට ගැලවිය හැකි
බව[9] වඩාත් නිසැකකමකින් පැවසී-
මට අපට පුළුවන. **10** ඇත්තෙන්ම
අප සිටියේ දෙවිගේ සතුරන් ලෙසය.[10]
නමුත් දෙවි සමඟ සමාදාන වීමේ ප්‍රස්-
තාව ඔහුගේ පුත්‍රයාගේ මරණය තුළින්
අපට උදා විය.[11] එහෙයින් දැන් දෙවි
සමඟ සමාදාන වී සිටින අපට ගැල-
වීම ලැබෙන බව වඩාත් නිසැකකම-
කින් පැවසීමට පුළුවන. එසේ වන්නේ
අප වෙනුවෙන් දිවි පිදූ යේසුස් දැන්
ජීවමානව සිටින නිසාය.[12] **11** එප-
මණක්ද නොව දෙවි සමඟ සමාදාන
වීමට[13] අපට උපකාර කළ අපගේ
ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් මාර්ග-
යෙන් දෙවි සමඟ අපට ඇති බැඳීම
ගැනත් අපි බොහෝ සෙයින් සතුටු
වන්නෙමු.

**12** එක් මිනිසෙකු[14] පව් කළ නිසා
මුළු මිනිස් වර්ගයාටම පව්කාර ස්ව-
භාවය* ඇතුල් විය. එහි ප්‍රතිඵලය

14 උත් 2:17; උත් 3:6; යෙසා 43:27.

**රෝම 5:6*** එනම්, පව්කාරයන්ව. **12*** මෙම පව්කාර ස්වභාවය නිසා දෙවිගේ පෞද්ගලිකත්වය, ප්‍රමිති සහ කැමැත්තට පටහැනි ඕනෑම ක්‍රියාවක් කිරීමට හෝ දෙවි සමඟ කෙනෙකුට තිබෙන මිත්‍රත්වය පලුදු කරන දේවල් කිරීමට හෝ පෙලඹිය හැක.

මරණයයි.[1] සියලුදෙනා තුළම මෙම
පව්කාර ස්වභාවය තිබෙන නිසා මර-
ණය සියලුදෙනාටම උරුම විය.[2]
**13** නීතිය ලබා දීමට පෙර සිටම
මිනිස් වර්ගයා පව්කාර ක්‍රියා කළෝය.
නමුත් නීතියක් නොතිබුණු නිසා
කළ පව්කාර ක්‍රියාවලට කිසිවෙක්
දඬුවම් ලැබුවේ නැත.[3] **14** එසේවු-
වත් ආදම්ගේ කාලයේ සිට මෝසෙස්-
ගේ කාලය දක්වා මරණය රජකම්
කළේය.[4] ආදම් කළ පාපයට සමාන
පව්කාර ක්‍රියා නොකළ අයට පවා
මරණය උරුම විය.[5] ඒ ආදම්, පැමි-
ණෙන්න සිටි තැනැත්තාට යම් සමා-
නකමක් දැරුවේය.[6]

**15** නමුත් එම පාපය නිසා හිමි
වූ දේට වඩා වෙනස් දෙයක් දෙවි
ලබා දුන් දීමනාව තුළින් හිමි වේ.
මන්ද එක මිනිසෙකු කළ වරදක් නිසා
බොහෝදෙනෙකුට මරණය හිමි විය.
නමුත් එක මිනිසෙකු[7] එනම්, යේ-
සුස් ක්‍රිස්තුස් පෙන්වූ මහත් කරුණාව
තුළින් දෙවි නොමිලේ ලබා දුන් දීම-
නාව හා ඔහු පෙන්වන මහත් කරු-
ණාව බොහෝදෙනෙකුට මිල කළ
නොහැකි ප්‍රයෝජන ලබා දෙයි.[8]
**16** ඇත්තෙන්ම එක මිනිසෙකු කළ
පාපයේ ප්‍රතිඵලවලට[9] වඩා නොමි-
ලේ ලැබුණු දීමනාවෙන්[10] අත් වන
ප්‍රතිඵල වෙනස් වේ. මන්ද එක
වරදකින් ලැබුණු දඬුවමේ ප්‍රතිඵ-
ලය[11] මිනිසුන් වරදකරුවන් ලෙස
තීන්දු වීමය.[12] නමුත් මිනිසුන් බො-
හෝ වැරදි කළත් දෙවි දෙන දීමනාවේ
ප්‍රතිඵලය නම් මිනිසුන්ව ධර්මිෂ්ඨ-
යන් ලෙස ප්‍රකාශ කිරීමය.[13] **17** එක
මිනිසෙකු කළ වරදින්[14] මරණය
රජකම් කරන්න පටන්ගත්තේය.[15]
නමුත් එක් කෙනෙකු තුළින් බො-
හෝදෙනෙක් මහත් කරුණාව ලැබු-
වෝය.[16] එමෙන්ම නොමිලේ ලැබෙන
දීමනාවක්[17] තුළින් ඔවුන්ව ධර්මිෂ්-
ඨයන් ලෙස ප්‍රකාශ කරනු ලැබීය.
එහි ප්‍රතිඵලය ඔවුන්ගේ ජීවිත නැවත
ඔවුන්ට උරුම වී රජවරුන් ලෙස
පාලනය කිරීමට හැකි වීමය.[18] ඒ
සියල්ලට මහ පැදුවේ එක මිනි-
සෙකු එනම්, යේසුස් ක්‍රිස්තුස් කළ
ක්‍රියාවයි.[1]

**18** ඒ අනුව එක මිනිසෙකු කළ
වරද නිසා සෑම තරාතිරමකටම අයත්
මිනිසුන්ව වරදකරුවන් බව ප්‍රකාශ
කරන ලදි.[2] එලෙසම එක ධර්මිෂ්ඨ
ක්‍රියාවක් තුළින්[3] සෑම තරාතිරමක-
ටම අයත් මිනිසුන්ව[4] ධර්මිෂ්ඨයන්
ලෙස ප්‍රකාශ කරනු ලබන අතර
ඔවුන්ට ජීවනය හිමි වෙයි.[5] **19** එක
මිනිසෙකු අකීකරු වූ නිසා[6] බොහෝ-
දෙනෙකුව වරදකරුවන් ලෙස ගණන්
ගනු ලැබීය. එලෙසම එක් කෙනෙ-
කුගේ කීකරුකම නිසා[7] බොහෝදෙ-
නෙකුව[8] ධර්මිෂ්ඨයන් ලෙස ගණන්
ගනු ලැබේ.[9] **20** නීතිය[10] හඳුන්වා
දුන් විට සියලුදෙනා අතින් කො-
තරම් වැරදි සිදු වෙනවාද කියා
තවත් තහවුරු විය.[11] මිනිසුන් පව්-
කාරයන් බව තහවුරු වුණත්[12] දෙවි-
ගේ මහත් කරුණාව[13] සියල්ලට වඩා
ප්‍රබලය. **21** එසේ වූයේ මිනිසුන්ගේ
පව්කාර ස්වභාවය සහ මරණය එකට
රජකම් කරනවා වෙනුවට[14] මහත්
කරුණාව[15] රජකම් කිරීම සඳහාය.
එහෙයින් අපගේ ස්වාමීන් වන යේසුස්
ක්‍රිස්තුස් මාර්ගයෙන් මිනිසුන්ව ධර්-
මිෂ්ඨයන් ලෙස ප්‍රකාශ කරනු ලැබේ.
එහි ප්‍රතිඵලය සදාකාල ජීවනයයි.[16]

**6** එම තොරතුරු අපට බලපෑ යුත්-
තේ කෙසේද? දෙවිගේ මහත්
කරුණාව වැඩි වැඩියෙන් ලැබෙයි
කියා සිතාගෙන දිගටම වැරදි
කිරීම සාධාරණද?[17] **2** නැත. කිසි-
විටකත් එලෙස නොසිතන්න. අප
තුළ තිබෙන පව්කාර ස්වභාවය මරා
දමා තිබෙනවා[18] කියා පැවසුවොත්
එය නිවැරදිය. එසේනම් අප ඒ ස්ව-
භාවය නැවතත් ඉස්මතු කරගෙන
දිගටම වැරදි දේ කරන්නේ කෙසේද?[19]
**3** අප ක්‍රිස්තුස් යේසුස් සමඟ එකට
බැඳී සිටින අය ලෙස බව්තීස්ම වී
ඇති බව ඔබ දැන සිටියේ නැද්ද?[20]
එහි ප්‍රතිඵලයක් ලෙස ඔහු අත්වින්දා

**5 පරි.**
**1** උත් 3:19 1කොරි 15:21
**2** ගීතා 51:5 එස 18:4 රෝම 3:23
**3** රෝම 4:15
**4** හෙබ්‍රෙ 2:15
**5** හොෂෙ 4:7 හොෂෙ 6:7
**6** 1කොරි 15:45
**7** යෙසා 53:11 හෙබ්‍රෙ 2:9
**8** මතෙ 20:28 තීත 3:4
**9** උත් 2:17 උත් 3:6
**10** රෝම 6:23
**11** උත් 3:17
**12** උත් 3:19 1කොරි 11:32
**13** රෝම 4:25
**14** රෝම 5:12
**15** රෝම 5:14
**16** 2කොරි 9:8
**17** රෝම 3:24 2කොරි 9:15 යාකො 1:17
**18** එළි 5:10 එළි 20:4

**2 තීරුව**
**1** 1පේත 3:18 එළි 1:5
**2** 1කොරි 15:21
**3** රෝම 4:25
**4** රෝම 1:16 ගලා 3:28 1තිමෝ 2:4
**5** යොහ 10:10 රෝම 3:25
**6** ගීතා 51:5 රෝම 5:12
**7** හෙබ්‍රෙ 5:8
**8** හෙබ්‍රෙ 2:10
**9** යෙසා 53:11
**10** රෝම 3:20
**11** ගලා 3:19
**12** යොහ 15:22
**13** 1තිමෝ 1:14
**14** 1කොරි 15:56
**15** යොහ 1:17
**16** යොහ 3:16 1යොහ 4:9

**6 පරි.**
**17** රෝම 3:8
**18** කොලො 2:20 1පේත 2:24
**19** හෙබ්‍රෙ 10:26
**20** 1කොරි 12:13 ගලා 3:27

හා සමාන මරණයකට මුහුණ දෙන්න
අපට සිදු වෙයි.[1] **4** එසේ බව්තීස්ම
වී ඇති අය ලෙස ඔහු අත්වින්දා
හා සමාන මරණයකට මුහුණ දෙන්න
අපට සිදු වන නිසා අප දැනටමත්
ඔහු සමඟ මිය ගොස් තැන්පත් කර
ඇති අය බව කිව හැකියි.[2] නමුත්
පියාණන් තම තේජවත් බලයෙන්
ක්‍රිස්තුස්ව මරණයෙන් නැඟිට්ටෙව්-
වේය.[3] එසේම අපටත් අලුත් ජීවිත-
යක් ගත කිරීමේ අවස්ථාව ඔහු ලබා
දී තිබේ.[4] **5** ඔහුට සමාන මරණයක්
අත්විඳින්න අපට සිදු වේ නම්[5] ඔහු හා
සමානව අපවද මරණයෙන් නැඟිටු-
වනු ලැබේ.[6] ඒ අයුරින් අපි ඔහු සමඟ
එකට බැඳී සිටින්නෙමු. **6** ඇත්-
තෙන්ම අපගේ පරණ පෞද්ගලිකත්-
වය ඔහු සමඟ වධකණුවේ ඇණ ගසනු
ලැබූ බව අප දන්නා නිසා[7] අපගේ පව්-
කාර ශරීරය අප කෙරෙහි තවදුරටත්
බල නොපැවැත්විය යුතුයි.[8] එහෙයින්
අප තවදුරටත් පාපයට වහල් වී නො-
සිටිය යුතුයි.[9] **7** මිය ගිය පුද්ගලයා
තම පාපයෙන් නිදහස් වී ඇති බව අප
පවසන්නේ ඒ නිසාය.[10]

**8** අප ක්‍රිස්තුස් සමඟ මිය ගොස්
ඇත්නම් අපගේ විශ්වාසය වන්නේ
ඔහු සමඟ අප ජීවත් වන බවය.[11]
**9** ක්‍රිස්තුස් මරණයෙන් නැවත නැඟි-
ටුවා ඇති නිසා[12] ඔහු නැවතත් මර-
ණය අද්දකින්නේ නැති බවද[13] අපි
දනිමු. මන්ද ඔහු කෙරෙහි බලපැවැත්-
වීමට මරණයට තවදුරටත් හැකියා-
වක් නැත. **10** ඔහු මිය ගියේ එක
වරක්ය. එසේ කළේ මිනිසුන්ගේ පව්-
කාර ස්වභාවය නැති කර දැමීමටය. ඒ
සඳහා ඔහුට නැවතත් මිය යන්න
සිදු වන්නේ නැත.[14] දැන් ඔහු ජීවත්
වෙයි. ඔහු ජීවත් වන්නේ දෙවි උදෙ-
සාය.[15] **11** ඒ හා සමානව ඔබත්
ඔබේ පව්කාර ස්වභාවය සම්බන්ධ-
යෙන් මිය ගොස් ඇති බවත්[16] ඔබ
යේසුස් ක්‍රිස්තුස් මාර්ගයෙන් දෙවි වෙ-
නුවෙන් ජීවත්ව සිටින බවත්[17] සැල-
කිල්ලට ගත යුතුයි.

**12** එහෙයින් ඔබේ පව්කාර ස්වභා-
වයට රජෙකු වී,[1] ඔබේ මැරෙනසුලු
ශරීරය පාලනය කිරීමට ඉඩ නො-
දෙන්න. එසේ ඉඩ දුන්නොත් එයින්
ඇති වන ආශාවන්ට ඔබ වහල් වනු
ඇත.[2] **13** මීට අමතරව ඔබේ වැරදි
ආශාවන් තෘප්තිමත් කරගැනීමට
ඔබේ ශරීරයේ අවයවයන් භාවිත නො-
කරන්න.[3] එසේ කළොත් ඒවා අධර්-
මිෂ්ඨ දේ කිරීමට යොදාගන්නා ආයුධ
හා සමාන වනු ඇත.[4] මිය ගිය ඔබ,
දැන් ජීවත් වන නිසා[5] මෙතැන් පටන්
දෙවිට භාර වෙන්න. එමෙන්ම ඔබේ
ශරීරයේ අවයවයන් ධර්මිෂ්ඨ දේවල්
කිරීම සඳහා යොදාගන්නා ආයුධ
ලෙස දෙවිට භාර දෙන්න.[6] **14** ඔබේ
පව්කාර ස්වභාවයට ඔබව පාලනය
කිරීමට ඉඩ නොදෙන්න. මන්ද තවදු-
රටත් ඔබ නීතිය යටතේ සිටින අය
නොවේ.[7] ඒ වෙනුවට ඔබ අද්දකි-
මින් සිටින්නේ දෙවිගේ මහත් කරු-
ණාවයි.[8]

**15** අප මේ දේවලින් තේරුම්ගන්-
නේ කුමක්ද? අප නීතිය යටතේ
සිටින අය නොව දෙවිගේ මහත්
කරුණාව අද්දකිමින් සිටින අය වන
නිසා[9] වැරදි කිරීමට අපට නිදහ-
සක් තිබෙන බවද?[10] නැත. කිසිවිට-
කත් එලෙස නොසිතන්න. **16** මෙය
හොඳින් තේරුම්ගන්න. ඔබ යමෙ-
කුට කීකරු වීමට එකඟ වී ඔහුට
යටත් වන විට ඔබ ඒ පුද්ගලයාගේ
දාසයෙක් වනු ඇත.[11] ඔබේ පව්කාර
ස්වභාවයට කීකරු වී[12] එයට දාස-
යෙකු වුණොත් එහි අවසන් ප්‍රතිඵ-
ලය මරණයයි.[13] නමුත් ඔබ දෙවිට
කීකරු වී ඔහුට දාසයෙක් වුණොත්[14]
දෙවි ඉදිරියේ ඔබ ධර්මිෂ්ඨ අය බවට
පත් වේ.[15] **17** ඔබ දෙවිට කොතරම්
ස්තුතිවන්ත විය යුතුද! මන්ද මීට
පෙර ඔබ සිටියේ ඔබේ පව්කාර ස්වභා-
වයට වහල්වය. නමුත් දැන් ඔබ ඔබට
භාර දුන් ඉගැන්වීම්වලට හදවතින්ම
කීකරු වන අය බවට පත් වී ඇත.[16]
**18** ඔබ ඔබේ පව්කාර ස්වභාවයට
වහල් නොවී සිටින නිසා[17] ඔබ දැන්
ධර්මිෂ්ඨකමට[18] දාසයන්ව සිටින බව

**6 පරි.**
1 මාක් 10:38; 1කොරි 15:29
2 මාක් 10:39; 2කොරි 4:10; කොලො 2:12
3 1කොරි 6:14; 2තිමෝ 2:11
4 2කොරි 5:17; ගලා 6:15; එෆී 3:16; කොලො 3:10; 1යොහ 3:14
5 පිලි 3:10; එළි 2:10
6 1කොරි 15:42; 1කොරි 15:49; එෆී 2:6
7 ගලා 5:24; කොලො 3:5
8 කොලො 2:11; කොලො 3:5
9 2කොරි 7:1; ගලා 5:1
10 යෙසා 40:2; ලූක් 23:41; ක්‍රියා 13:39
11 2තිමෝ 2:11
12 ක්‍රියා 13:34; 1කොරි 15:20
13 එළි 1:18
14 හෙබ්‍රෙ 9:28; 1පේතෘ 3:18
15 1පේතෘ 4:2
16 කොලො 3:3
17 1පේතෘ 2:24

**2 නිරුව**
1 උත් 4:7; ගීතා 119:133
2 යාකො 4:1
3 රෝම 7:5
4 1කොරි 6:15
5 රෝම 12:1
6 2කොරි 10:4; එෆී 6:17
7 රෝම 7:6; ගලා 5:18; කොලො 2:14
8 යොහ 1:17
9 රෝම 5:21
10 1කොරි 9:21
11 2පේතෘ 2:19
12 යොහ 8:34
13 එස 18:4; රෝම 6:23
14 හෙබ්‍රෙ 5:9
15 රෝම 1:17
16 2තිමෝ 1:13
17 යොහ 8:32; ගලා 5:1
18 1පේතෘ 2:24

පැවසිය හැක.[1] **19** නමුත් මා මේ
දේවල් ඔබට සරලව පැහැදිලි කර
දෙන්නේ වැරදි දේවල් කිරීමට ඔබ
තුළ නැඹුරුවාවක් තිබෙන නිසාය.[2]
ඔබ කලින් අපවිත්‍ර හා අධර්මිෂ්ඨ දේ-
වලට වහල් වී[3] ඔබේ අවයවවලින්[4]
දෙවිගේ නීතියට පටහැනි දේවල්
කළා සේම ඔබ දැන් ධර්මිෂ්ඨකමට
දාසයන් ලෙස ඔබේ ශරීරයේ අවයව-
යන් දෙවිට භාර දී ශුද්ධ වූ ක්‍රියාවල
නිරත විය යුතුයි.[5] **20** මන්ද ඔබ
ඔබේ පව්කාර ස්වභාවයට වහල්ව සිටි
කාලයේදී[6] ධර්මිෂ්ඨකම ඔබේ ස්වා-
මියා වී සිටියේ නැත.

**21** ඒ කාලයේදී ඔබ ලැබූ ප්‍රතිඵල[7]
මොනවාද? ඔබ කළ දේවල්[8] ගැන
සිතන විට ඔබට දැන් ඇති වන්-
නේ ලැජ්ජාවකි. මන්ද එවැනි ක්‍රියා-
වල අවසාන ප්‍රතිඵලය මරණය වේ.[9]
**22** නමුත් දැන් ඔබ තවදුරටත් ඔබේ
පව්කාර ස්වභාවයට වහල් නොවී දෙ-
විගේ දාසයන් බවට පත් වී සිටින
නිසා[10] ඔබ ශුද්ධය. ඔබ අද්දකින ප්‍රති-
ඵලය එයයි.[11] එය සදාකාල ජීවනයට
මඟ පාදන්නේය.[12] **23** ඇත්තෙන්ම
අපේ පව්කාර ස්වභාවයට ගෙවිය යුතු
කුලිය මරණයයි.[13] නමුත් අපේ ස්වා-
මීන් වන ක්‍රිස්තුස් යේසුස් මාර්ග-
යෙන්[14] දෙවි අපට ලබා දෙන තෑග්ග[15]
නම් සදාකාල ජීවනයයි.[16]

**7** සහෝදරයෙනි, (මා කතා කරන්-
නේ නීතිය ගැන අවබෝධයක්
ඇති අයටය.) මිනිසෙකු නීතියට
යටත් වන්නේ ඔහු ජීවත්ව සිටින
තුරු පමණි.[17] ඒ කාරණය ගැන
ඔබ දන්නේ නැද්ද? **2** උදාහරණ-
යක් ලෙස මෙසේ සිතන්න. විවා-
හක ස්ත්‍රියක් ඇගේ ස්වාමිපුරුෂයා
ජීවත්ව සිටින තුරු ඔහුට නීති-
යෙන් බැඳී සිටියි. නමුත් ස්වා-
මිපුරුෂයා මිය ගියොත් ඇය ඇගේ
ස්වාමිපුරුෂයාගේ නීතිවලින් නිද-
හස් වෙයි.[18] **3** ඇගේ ස්වාමිපුරුෂයා
ජීවත්ව සිටියදී ඇය වෙනත් පුරුෂ-
යෙකු සමඟ විවාහ වුණොත් ඇයව
අනාචාරයේ* යෙදෙන ස්ත්‍රියක් ලෙස
සලකනු ලැබේ.[1] නමුත් ස්වාමිපුරු-
ෂයා මිය ගියොත් ඇය ඔහුගේ නීතිව-
ලින් නිදහස්ය. එහෙයින් ඇය වෙනත්
පුරුෂයෙකු සමඟ විවාහ වුණත් ඇය
අනාචාරයේ යෙදෙන ස්ත්‍රියක් ලෙස
හඳුන්වන්නේ නැත.[2]

**4** මාගේ සහෝදරයෙනි, ඔබ
කලින් බැඳී සිටියේ නීතියටය. නමුත්
ක්‍රිස්තුස්ගේ ජීවිත පූජාව නිසා ඒ බැඳී-
මෙන් ඔබ නිදහස් වී ඇත.[3] ඔබ දැන්
අයිති වන්නේ මරණයෙන් නැවත
නැඟිටුවනු ලැබූ[4] ක්‍රිස්තුස්ටය.[5] එහෙ-
යින් දෙවි වෙනුවෙන් පල දැරීමට[6]
අපට මඟ සැලසී ඇත. **5** අප අප-
ගේම ආශාවන්ට අනුව ජීවත් වූ කාල-
යේදී[7] අප තුළ පව්කාර ආශාවන්
ඇති බව අපගේ ක්‍රියා තුළින් දක්නට
ලැබිණ. ඒ බව අප දැනගත්තේ නීතිය
තුළින්ය. එහි ප්‍රතිඵලයක් ලෙස අප
තුළ මරණයට හේතු වන පල තිබෙන
බව අපට වැටහිණ.[8] **6** නමුත් අප
බැඳී සිටි ඒ නීතියෙන් අපව නිදහස්
කර ඇති නිසා[9] ඒ නීතිය මිය ගියා
හා සමානය. දැන් අප නිදහස්ය.[10]
එසේ වූයේ අලුත් ආකාරයකින් දාස-
යන් ලෙස එකට බැඳී සිටීම සඳ-
හාය.[11] එනම් අතීතයේ මෙන් ලිඛිත
නීති මාලාවකට අනුව නොව[12] දෙවි-
ගේ බලය ලබා ඔහු වෙනුවෙන් ජීවත්
වීම සඳහාය.[13]

**7** නීතියේ යම් අඩුපාඩුවක් ඇති
බව ඉන් අදහස් කරනවාද?[14] කිසි-
සේත් නැත. ඇත්තෙන්ම නීතිය තිබු-
ණේ නැත්නම් වැරදි දේ කුමක්ද
කියා මට දැනගන්න ලැබෙන්නේ
නැත.[15] උදාහරණයක් ලෙස, “වෙ-
නත් කෙනෙකු සතු දේට තණ්හාවක්
ඇති කර නොගන්න”[16] කියා නීති-
යේ සඳහන් වී තිබුණේ නැත්නම්
තණ්හාව කියන්නේ කුමක්ද කියා
මට දැනගන්න ලැබෙන්නේ නැත.[17]
**8** ඒ ආඥාව මගින් එම වරද ගැන

**6 පරි.**
1 1කොරි 7:22
2 රෝම 7:23
3 1කොරි 6:15
4 මතෙ 18:8
5 රෝම 12:1
6 යොහ 8:34
7 යෙරෙ 12:13
8 ගලා 5:19
9 රෝම 8:6
10 රෝම 8:15
11 ගලා 5:22
12 1කොරි 9:25
13 උත් 2:17 එස 18:4
14 1තිමෝ 1:16 1යොහ 2:2 යූද් 21
15 රෝම 3:24
16 මතෙ 25:46 1පේතෘ 1:4

**7 පරි.**
17 රෝම 3:19
18 ගණන් 30:8 1කොරි 7:39

**2 තීරුව**
1 මතෙ 5:32 මතෙ 19:9 මාක් 10:12 ලූක් 16:18
2 1කොරි 7:9 1තිමෝ 5:14
3 රෝම 6:14 ගලා 2:19 කොලො 2:14
4 ක්‍රියා 5:30 2කොරි 5:15
5 ගීතා 45:10 2කොරි 11:2
6 ගලා 5:22 කොලො 1:10
7 ගලා 5:19
8 රෝම 6:21 යාකො 1:15
9 රෝම 10:4 එෆී 2:15 කොලො 2:14
10 ගලා 2:19
11 රෝම 12:11
12 ගලා 3:10 කොලො 2:14
13 2කොරි 3:6
14 රෝම 7:14
15 රෝම 3:20 ගලා 3:19
16 නික් 20:17 ද්වි 5:21 එෆී 5:3
17 මීකා 2:2 ක්‍රියා 20:33

රෝම **7:3*** මූ.අ., “පරදාර සේවනයේ.” මෙය භාවිත කරන්නේ විවාහක පුරුෂයෙකු හෝ ස්ත්‍රියක අනාචාරයේ යෙදීම විස්තර කිරීමටය.

මට පැහැදිලි අවබෝධයක් ලැබුණු
අතර[1] මා තුළ හැම අතින්ම එවැනි
තණ්හාවක් ඇති බවත් එය පව්කාර
දෙයක් බවත් මට තේරුම්ගත හැකි
විය. එහෙයින් නීතිය නොමැති නම්
පාපය කුමක්ද කියා අවබෝධ කර-
ගැනීමට මට හැකි වන්නේ නැත.[2]
**9** ඇත්තෙන්ම නීතිය නොතිබුණු
කාලයේ මා සිටියා නම් ජීවනය
ගැන බලාපොරොත්තුවක් තබාගැනී-
මට මට හැකියාව තිබිණ.[3] නමුත්
පසුව පැමිණි එම නීතිය තුළින්[4] මම
පව්කාර දේවල් කරන කෙනෙකු බව
තේරුම්ගත්තෙමි. එයින් මා මරණ-
යට සුදුස්සෙකු බව මටම පැහැදිලි
විය.[5] **10** එහෙයින් ජීවනයට මඟ
පැදිය යුතු වූ ඒ ආඥා[6] මා මරණයට
සුදුස්සෙකු බව මට අවබෝධ කර
දුන්නේය.[7] **11** මන්ද පාපය කුමක්ද
කියා මට අවබෝධ කර දුන්නේ නීති-
යයි. මා පව්කාර ආශාවලට හසු වී[8]
මරණයට සුදුස්සෙකු වූ බව ඉන් තහ-
වුරු විය. **12** නමුත් නීතිය ශුද්ධය.[9]
එහි ආඥාද ශුද්ධය, ධර්මිෂ්ඨය,[10] යහ-
පත්ය.[11]

**13** එසේනම් මා මරණයට සුදුස්-
සෙකු වූයේ මේ යහපත් නීතිය නිසාද?
නැත. කිසිවිටකත් එලෙස නොසි-
තන්න. මාව මරණයට සුදුස්සෙකු
කළේ මා තුළ තිබූ පව්කාර ස්ව-
භාවයයි. ඒ යහපත් නීතියෙන් සිදු
වූයේ මා කරන ඒ පව්කාර දේවල්
නිසා මට මරණය අත් වන බව මට
එළිදරව් කර දීම පමණි.[12] එහෙයින්
පව්කාර දේවල් කොතරම් බරපතළද
කියා නීතිය මාර්ගයෙන් තව තවත්
අවධාරණය කරන ලදි.[13] **14** නීතිය
දෙවිගෙන් ලද දෙයක්[14] බව අපි දනිමු.
නමුත් වැරදි දේවලට වහල් වී සිටින
මා දුර්වලය.[15] **15** ඇත්තෙන්ම මා
කරන්නේ කුමක්ද කියා මම දන්-
නේ නැත. මන්ද මා කරන්නේ මා
කරන්න කැමති දේ නොව මා පිළිකුල්
කරන දේමය. **16** නමුත් මා කරන්-
නේ මා කරන්න අකමැති දේ කියා
මට දැනේ නම්[16] ඉන් පැහැදිලි වන්නේ
නීතිය යහපත් දෙයක් කියා මා පිළි-
ගන්නා බවය.[1] **17** මා කරන දෙය
කරන්නේ මා නොව මා තුළ තිබෙන
පව්කාර ස්වභාවයයි.[2] **18** මන්ද මා
තුළ එනම්, වරදට නැඹුරු වූ මාගේ
ශරීරය තුළ කිසි යහපතක් වාසය
නොකරන බව මම දනිමි.[3] එහෙයින්
හොඳ දේ කිරීමට මා තුළ කැමැත්-
තක් ඇතත්[4] එය කිරීමට හැකියාවක්[5]
මා තුළ නැත. **19** මන්ද මා යහපත
කරන්න කැමති වුණත් මා අතින් සිදු
වන්නේ මා කරන්න අකමැති නපුරු
දේමයි.[6] **20** මා කරන්නේ මා අක-
මැති දේ නම් එය කරන්නේ මා නොව
මා තුළ වාසය කරන මාගේ පව්කාර
ස්වභාවයයි.[7]

**21** එහෙයින් මට පෙනී යන්නේ
මා යම් නීතියකට වහල් වී සිටින
බවය. එනම් මා හරි දේ කිරී-
මට කැමැත්තෙන් සිටියත්[8] මා තුළින්
ඉස්මතු වන්නේ වැරදි දේ කිරීමට
තිබෙන නැඹුරුවාවයි.[9] **22** ඇත්-
තෙන්ම මම දෙවිගේ නීතියට මුළු
හදවතින්ම[10] ඇලුම් කරන්නෙමි.[11]
**23** නමුත් මගේ මනසේ ඇති එම
නීතියට විරුද්ධව[12] සටන් කරන
තවත් නීතියක්[13] මගේ ශරීරය තුළ
තිබේ.[14] ඒ නීතිය මගේ ශරීරය
තුළ ක්‍රියාත්මක වේ. මම පාපය
නමැති එම නීතියට වහල් වී සිටිමි.[15]
**24** මා කොතරම් කාලකණ්ණි මිනි-
සෙක්ද! මගේ මරණයට හේතු වන මේ
ශරීරයෙන් මාව බේරාගන්නේ කවුද?[16]
**25** නමුත් මා දෙවිට කොතරම් ස්තු-
තිවන්ත විය යුතුද! මන්ද ඔහු අපගේ
ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් මාර්ග-
යෙන් මාව බේරාගන්නේය.[17] ඒ අනුව
මා මනසින් දාසයෙකු වී සිටින්නේ
දෙවිගේ නීතියටය.[18] නමුත් මගේ ශරී-
රය පාපය නමැති නීතියට තවමත්
වහල් වී සිටියි.[19]

**8** එහෙයින් ක්‍රිස්තුස් යේසුස් සමඟ
එකට බැඳී සිටින අය දෙවි ඉදි-
රියෙහි නිදොස්ය.[20] **2** මන්ද ඔවුන්
අලුත් නීතියකට[21] එනම්, දෙවිගේ
බලයේ ක්‍රියාකාරිත්වයට යටත්ය.[22]

**7 පරි.**
**1** රෝම 4:15 රෝම 5:20
**2** 1කොරි 15:56
**3** රෝම 11:1 හෙබ්‍රෙ 7:10
**4** හෙබ්‍රෙ 7:11
**5** 2කොරි 3:6
**6** ලෙවී 18:5 එස 20:11 ලූක් 10:28
**7** 2කොරි 3:7
**8** හෙබ්‍රෙ 3:13
**9** ගීතා 19:8 ගලා 3:21
**10** තිතෝ 2:9 රෝම 10:5
**11** ද්වි 4:8
**12** 1කොරි 15:56
**13** රෝම 5:13
**14** 1කොරි 10:4
**15** ගීතා 51:5 යොහ 8:34 රෝම 6:16
**16** ගීතා 51:3 ලූක් 18:13

**2 තීරුව**
**1** 1තිමෝ 1:8
**2** උත් 8:21
**3** උත් 6:5 යෙසා 64:6
**4** මතෙ 26:41
**5** යෝබ් 14:4
**6** යාකො 4:17
**7** දේශ 7:20
**8** ගීතා 34:14 1පේත්‍ර 3:11
**9** දේශ 7:29 යෙරෙ 17:9 ලූක් 5:22
**10** 2කොරි 4:16 එෆී 3:16 එෆී 4:23
**11** ගීතා 1:2
**12** ගලා 5:17
**13** යාකො 4:1
**14** රෝම 6:13
**15** යොහ 8:34
**16** රෝම 6:6 රෝම 8:10
**17** රෝම 6:17 1කොරි 15:57
**18** ගීතා 19:7 ගලා 5:18
**19** ගලා 5:17

**8 පරි.**
**20** කොලො 1:22 1යොහ 3:24
**21** යාකො 1:25
**22** ගලා 5:16

ඔබත් ඒ බලයේ ක්‍රියාකාරිත්වයට
යටත් වන නිසා ක්‍රිස්තුස් යේසුස්
සමඟ එකට බැඳී සිටින අය ලෙස
ඔබ ජීවමානය.[1] ප්‍රතිඵලයක් ලෙස
දැඩි නීතියක් සේ ක්‍රියා කරන පාප-
යේ හා මරණයේ ග්‍රහණයෙන්[2] ඔබ
නිදහස් වී ඇත.[3] **3** මිනිසුන්ගේ පව්-
කාර ස්වභාවය නිසා ඔවුන්ට නිදහස
ලබා දෙන්න නීතියට[4] හැකියාවක්
තිබුණේ නැත.[5] නමුත් දෙවි ඒ නිද-
හස ලබා දීමට තම පුත්‍රයාව එව්-
වේය.[6] ඒ අනුව පුත්‍රයා මිනිසෙකු
ලෙස පැමිණ[7] අපගේ පව්කාර ස්ව-
භාවය නැති කර දැමීමට[8] පියවර
ගත්තේය. එසේ කිරීමෙන් මිනිසුන්
තවදුරටත් තම පව්කාර ස්වභාවයට
වහල් නොවිය යුතු බව පෙන්නුම්
කළේය. **4** එහි ප්‍රතිඵලයක් ලෙස
අපගේම ආශාවන්ට යටත් නොවී දෙ-
විගේ බලයෙන් ලැබෙන උපකාරය
තුළින්[9] නීතියේ සඳහන් ධර්මිෂ්ඨ ප්‍රමි-
තිවලට එකඟව ජීවත් වීමට අපට
හැකියාව ලැබේ.[10] **5** මන්ද තමා-
ගේම ආශාවන්ට අනුව ක්‍රියා කරන
අයගේ මනස් යොමු වී තිබෙන්-
නේ වැරදි දේවලටය.[11] නමුත් දෙවි-
ගේ බලයේ උපකාරයෙන් ක්‍රියා කරන
අය තම මනස් යොමු කරන්නේ
දෙවි ප්‍රිය කරන දේවලටය.[12] **6** කෙ-
නෙක් තම මනස වැරදි ආශාවන්ට
යොමු කළොත් එය ඔහුගේ මරණ-
යට මඟ පාදයි.[13] නමුත් කෙනෙක්
තම මනස දෙවි ප්‍රිය කරන දේවලට
යොමු කළොත්[14] එයින් ඔහුට ජීවනය
හා සමාදානය හිමි වෙයි. **7** එසේම
කෙනෙක් වැරදි ආශාවන්ට තම මනස
යොමු කළොත් ඔහු දෙවිගේ සතු-
රෙක් වෙයි.[15] මන්ද එවැනි ආශා-
වන් දෙවිගේ නීතියට විරුද්ධය. ඒවා
කිසි ලෙසකින්වත් දෙවිගේ නීති-
යට එකඟ නැත.[16] **8** එහෙයින් තම
වැරදි ආශාවන්වල බලපෑමට හසු වන
අයට[17] දෙවිව සතුටු කළ නොහැක.

**9** නමුත් සැබවින්ම ඔබ තුළ දෙවි-
ගේ බලය ක්‍රියාත්මක වෙනවා නම්
ඔබ වැරදි ආශාවන්ට යටත් වන්නේ
නැත.[1] ඒ වෙනුවට ඔබ යොමු වන්නේ
දෙවි ප්‍රිය කරන දේවලටය.[2] එමෙන්ම
කෙනෙක් ක්‍රිස්තුස් සිතන ආකාරයට
සිතන්නේ නැත්නම්[3] ඔහු ක්‍රිස්තුස්-
ගේ අනුගාමිකයෙක් වන්නේ නැත.
**10** ඔබේ පව්කාර ස්වභාවය නිසා
ඔබේ ශරීරය මැරී තිබුණත් ක්‍රිස්තුස්
ඔබ සමඟ එකට බැඳී සිටිනවා නම්[4]
දෙවිගේ බලය මාර්ගයෙන් ඔබව ධර්-
මිෂ්ඨයෙකු ලෙස ප්‍රකාශ කරනු ලබයි.
එහෙයින් ඔබ ජීවමානයි කියා පැව-
සිය හැක.[5] **11** එමෙන්ම යේසුස්ව
මරණයෙන් නැඟිටෙවූ තැනැත්තාගේ
බලය ඔබ තුළ ක්‍රියාත්මක වෙනවා
නම් ක්‍රිස්තුස් යේසුස්ව මරණයෙන්
නැඟිටෙවූ ඒ තැනැත්තා[6] ඔබේ මැරෙ-
නසුලු ශරීරද ජීවත් කරවයි.[7] ඔහු
එසේ කරන්නේ ඔබ තුළ ක්‍රියාත්මක
වන ඔහුගේ බලය මාර්ගයෙනි.

**12** එසේනම් සහෝදරයෙනි, අප-
ගේම ආශාවන්ට යටත් වී වැරදි ක්‍රියා-
වල යෙදෙන්න සිදු වෙනවාමයි කියා
පැවසීමට කිසිදු පදනමක් නැත.[8]
**13** මන්ද දෙවිගේ බලයේ උපකාර-
යෙන් ඔබේ වැරදි ක්‍රියාවන් නසා දැමු-
වොත් ඔබ ජීවමාන වනු ඇත.[9] නමුත්
ඔබ ඔබේ වැරදි ආශාවන්ට යටත් වී
ජීවත් වුණොත් ඔබට නිසැකවම හිමි
වන්නේ මරණයයි.[10] **14** දෙවි තම
බලය මාර්ගයෙන් ලබා දෙන මඟ
පෙන්වීම්වලට යටත් වන අය දෙවි-
ගේ පුත්‍රයෝ වන්නෝය.[11] **15** දෙවි-
ගේ බලය අප තුළ ක්‍රියාත්මක වන
නිසා අපි තවදුරටත් බියෙන් වෙළී
සිටින වහලුන්ගේ තත්වයට පත් වන්-
නේ නැත.[12] ඇත්තෙන්ම ඒ බලය
නිසා[13] අපව දෙවිගේ පුත්‍රයන් ලෙස
පිළිගනු ලැබේ.[14] දෙවිට, “අබ්බා,[15]
පියාණෙනි” කියා පවසන්න අපට
හැකි වී තිබෙන්නේ ඒ බලයේ ක්‍රියා-
කාරිත්වය නිසාය. **16** එසේ දෙවි-
ගේ බලය[16] අප තුළ*[17] ක්‍රියාත්මක
වන නිසා[18] අප දෙවිගේ දරුවන් බව[19]

**8 පරි.**
**1** යොහ 5:24
**2** රෝම 7:9; 2කොරි 3:6
**3** යොහ 8:32; හෙබ්‍රෙ 10:14
**4** රෝම 3:20; හෙබ්‍රෙ 7:11
**5** හෙබ්‍රෙ 7:18
**6** 1යොහ 4:9
**7** යොහ 1:14; ගලා 4:4; හෙබ්‍රෙ 4:15
**8** 2කොරි 5:21
**9** ගලා 5:16; ගලා 5:18
**10** රෝම 3:31
**11** යොහ 3:6; ගලා 5:19
**12** 1කොරි 2:15; ගලා 5:22
**13** රෝම 6:21; හෙබ්‍රෙ 9:14
**14** ගලා 6:8
**15** ගීතා 5:4; යෙසා 59:2; කොලො 1:21; යාකො 4:4
**16** රෝම 7:14
**17** 1කොරි 3:3

**2 තීරුව**
**1** ගලා 5:25
**2** 1කොරි 3:16
**3** ගලා 4:6
**4** යොහ 15:4; 1යොහ 2:6; 1යොහ 3:6
**5** ගලා 2:20; 1පේතෘ 4:6
**6** ක්‍රියා 2:24; 1කොරි 6:14
**7** එෆී 2:5
**8** ගලා 5:19
**9** 1කොරි 9:27; ගලා 5:24; ගලා 6:8; එෆී 4:22; කොලො 3:5
**10** රෝම 8:6
**11** යොහ 1:12; යොහ 3:5; යොහ 3:8; හෙබ්‍රෙ 2:11
**12** හෙබ්‍රෙ 2:15
**13** 1කොරි 2:12; 2කොරි 1:22; 2තිමෝ 1:7
**14** ගලා 4:5
**15** ගලා 4:6
**16** යොහ 14:17; 1කොරි 2:10; තීත 3:6
**17** ක්‍රියා 17:16; රෝම 1:9; 1කොරි 2:11
**18** 1යොහ 5:7
**19** යොහ 1:12; ගලා 3:26; 1යොහ 3:2

රෝම **8:16*** ග්‍රීක බසින්, නියුමා. උපග්‍ර. 3 බලන්න.

අපගේ සිත්වලට නිසැකවම දැනේ.
**17** අප දරුවන් නම් අපි උරුමක්කා-
රයෝද වන්නෙමු. එනම් දෙවිගෙන්
උරුමයක් ලබන අය වන්නෙමු. ඒ
අනුව ක්‍රිස්තුස් සමඟ එකම උරුමයට
හිමිකම් කියන්න[1] අපට හැකි වේ.
ඒ සඳහා අප ඔහු මෙන් දුක් විඳිය
යුතුයි.[2] එසේ කළොත් ඔහු සමඟ අප-
ටද ස්වර්ගීය තේජස හිමි වනු ඇත.[3]

**18** මා සිතන ආකාරයට ඉදිරි-
යේදී අප තුළින් එළිදරව් වීමට නිය-
මිත ස්වර්ගීය තේජස හා සසඳන
විට[4] දැන් අප අද්දකින දුක් වේදනා[5]
කිසිත් නැති තරම්ය. **19** මන්ද දෙවි
සෑදූ සියල්ල*[6] මහත් ආශාවකින්
බලා සිටින්නේ[7] දෙවිගේ පුත්‍රයන්
ස්වර්ගීය තේජසින් එළිදරව් වීමට
නියමිත අවස්ථාව පැමිණෙන තුරුය.[8]
**20** මිනිස් වර්ගයාට නිෂ්ඵල ජීවි-
තයක් උරුම වුණේ[9] ඔවුන්ගේම
කැමැත්ත නිසා නොව එය දෙවි-
ගේ කැමැත්ත වූ නිසාය. නමුත්
ඒ සමඟම ඔවුන්ට බලාපොරොත්තු-
වක්ද දෙන ලදි.[10] **21** ඒ අනුව පාපය
හා මරණය නිසා දිරාපත් වී යන
මිනිස් වර්ගයාට[11] එම ග්‍රහණයෙන්
නිදහස් වී,[12] දෙවිගේ දරුවන් ලෙස
කියා නිම කළ නොහැකි නිදහසක්
භුක්ති විඳීමට අවස්ථාව උදා වනු
ඇත. **22** ඇත්තෙන්ම මුළු මිනිස්
වර්ගයාම මේ දක්වා එක්ව කෙඳිරිගා-
මින් හා වේදනා විඳිමින් සිටින බව
අපි දනිමු. **23** ඔවුන් පමණක් නොව
ඉදිරියේදී උරුම වන දේට සාක්ෂියක්
ලෙස*[13] දෙවිගේ බලය ලබා සිටින
අපිත් කෙඳිරිගාමින් සිටිමු.[14] මන්ද
යේසුස්ගේ ජීවිත පූජාව මඟින් අපගේ
ශරීරවලින් නිදහස් වී අපව දෙවිගේ
පුත්‍රයන් ලෙස භාරගන්නා තුරු අපත්
බලා සිටින්නේ මහත් උනන්දුව-
කිනි.[15] **24** අප ගැලවීම ලැබූ
විට අපට ඒ බලාපොරොත්තුව කෙ-
රෙහි විශ්වාසයක් ඇති විය.[16] නමුත්
බලාපොරොත්තු වන දේ ඉටු වන
විට එය තවදුරටත් බලාපොරොත්තු-
වක් නොවේ. මන්ද කෙනෙක් බලා-
පොරොත්තුවෙන් සිටි දෙයක් ඉටු
වුණොත් ඔහු ඒ ගැන තවදුර-
ටත් බලාපොරොත්තුවෙන් සිටිනවා
කියා පැවසිය හැකිද? **25** නමුත්
අප බලාපොරොත්තුවෙන්[1] සිටින දේ
තවමත් ඉටු වී නැති නිසා[2] අපි විඳද-
රාගෙන ඒ දෙස දිගටම බලා සිටිමු.[3]

**26** ඊට අමතරව අප දුර්වලව
සිටින විට[4] අපට උපකාර කිරීම සඳහා
දෙවි තම බලය[5] අපට ලබා දෙයි.
මන්ද යාච්ඤා කළ යුත්තේ කුමක්
ගැනද කියා අපට නොතේරෙන
අවස්ථා මතු විය හැක.[6] එවැනි අවස්-
ථාවලදී අපගේ හැඟීම් වචනවලට පෙ-
රළිය නොහැකි වුවත් දෙවිගේ බලයේ
ක්‍රියාකාරිත්වය තුළින්[7] ඒවා එළිදරව්
වෙයි. **27** එහෙයින් තම බලයෙන්
එළිදරව් වන දේ තේරුම්ගැනීමට[8]
සිත් සෝදිසි කර බලන දෙවිට[9] හැක.
එසේ වන්නේ ඒ බලය ශුද්ධ තැනැත්-
තන් වෙනුවෙන් මැදිහත් වී ඔවුන් වෙ-
නුවෙන් දෙවිගේ කැමැත්ත ඉටු කරන
නිසාය.[10]

**28** දෙවි තමන් කරන සෑම දෙ-
යක්ම මනා පිළිවෙළකින් සිදු වීමට
සලස්වන බව අපි දනිමු.[11] ඔහු එසේ
කරන්නේ තමන්ට ප්‍රේම කරන අය-
ගේ එනම්, දෙවිගේ අරමුණට එකඟව
කැඳවනු ලැබූ අයගේ යහපත උදෙ-
සාය.[12] **29** මන්ද තමන් මුලින්ම
පිළිගන්නා අය[13] තම පුත්‍රයාට සමාන
වන බව එනම්, තම පුත්‍රයාගේ ස්වරූ-
පයට[14] සමාන[15] වන බව දෙවි කල්-
තියාම අරමුණු කළේය.[16] එහෙයින්
සහෝදරයන් බොහෝදෙනෙකු අත-
රින්[17] ඔහුගේ පුත්‍රයා කුලුඳුලා[18] බවට
පත් විය. **30** ඒ අනුව තමන් කල්-
තියාම අරමුණු කළ දේට එකඟව[19]
තෝරාගත් අයව දෙවි කැඳෙව්වේය.[20]
එලෙස කැඳවූ අයව ඔහු ධර්මිෂ්ඨයන්

---

**රෝම 8:19*** විශේෂයෙන්ම මිනිස් වර්ගයා.
**23*** මූ.අ., “උරුමයේ පළමු පල ලෙස.”

**8 පරි.**

**1** ලූක් 12:32
ක්‍රියා 26:18
ගලා 3:29
එළි 21:7
**2** පිලි 1:29
කොලො 1:24
**3** 1කොරි 15:53
2තිමෝ 2:11
එළි 3:21
**4** 2කොරි 4:17
පිලි 3:8
**5** 1පේතෘ 4:13
**6** කොලො 1:23
හෙබ්‍රෙ 11:13
**7** හිතෝ 13:12
**8** 1යොහ 3:2
**9** උත් 3:19
ගීතා 51:5
දේශ 1:2
**10** උත් 3:15
ක්‍රියා 24:15
**11** 1තිමෝ 2:4
**12** යොහ 8:32
1කොරි 15:22
2පේතෘ 3:13
**13** පිලි 3:11
එළි 20:6
**14** 2කොරි 5:2
**15** ගලා 4:5
එෆී 1:5
1පේතෘ 1:4
එළි 21:7
**16** එෆී 1:13

**2 තීරුව**

**1** 1පේතෘ 1:3
**2** 2කොරි 5:7
**3** රෝම 5:4
**4** යොහ 14:16
යොහ 16:7
**5** යොහ 15:26
1කොරි 2:12
**6** ලූක් 11:1
**7** 2සාමු 23:2
**8** යොහ 6:63
යොහ 14:17
1කොරි 2:10
1කොරි 2:14
2තිමෝ 3:16
**9** යෙරෙ 11:20
ක්‍රියා 1:24
**10** 1පේතෘ 1:15
**11** ගීතා 145:17
යොහ 9:3
**12** රෝම 9:11
එෆී 1:11
2තිමෝ 1:9
**13** 1කොරි 15:23
**14** යොහ 17:23
රෝම 6:5
1කොරි 15:49
එෆී 4:24
**15** යොහ 13:15
**16** උත් 3:15
**17** මතෙ 25:40
හෙබ්‍රෙ 2:11
1යොහ 3:2
**18** ගීතා 89:27
හෙබ්‍රෙ 1:6
**19** එෆී 1:5
**20** පිලි 3:14; 1තෙස 2:12; හෙබ්‍රෙ 3:1.

ලෙසද ප්‍රකාශ කළේය.[1] ධර්මිෂ්ඨයන්
ලෙස ප්‍රකාශ කරනු ලැබූ අයව ඔහු
ගෞරවයටද පත් කළේය.[2]
**31** එසේනම් අපි ඒ දේවලින් වට-
හාගන්නේ කුමක්ද? දෙවි අපගේ
පැත්තේ නම් අපට විරුද්ධව
සිටිය හැක්කේ කාටද?[3] **32** ඔහු අප
සියල්ලන් උදෙසා[4] ඔහුගේ පුත්‍රයාව
පවා දීමට සතුටු විය.[5] ඔහු එත-
රම් මහත් දෙයක් කර ඇත්නම්
අන් සියල්ලත් අපට කාරුණිකව
ලබා දෙන්නේ නැද්ද?[6] **33** තමන්
තෝරාගත් අයව ධර්මිෂ්ඨයන් ලෙස
ප්‍රකාශ කරන්නේ[7] දෙවිම නම් ඔවුන්ට
විරුද්ධව චෝදනා එල්ල කළ හැක්-
කේ කාටද?[8] **34** ඔවුන් දඬුවම් ලැබී-
මට සුදුසුයි කියා පැවසිය හැක්කේ
කාටද? කිසිවෙකුට එසේ කළ නොහැ-
කියි. මන්ද ක්‍රිස්තුස් යේසුස් මිය ගොස්
මරණයෙන් නැවත නැඟිටුවනු ලැබූ
අතර ඔහු දෙවිගේ දකුණු පැත්තේ
සිට[9] අප වෙනුවෙන් දෙවිට කන්නලව්
කරයි.[10]
**35** ක්‍රිස්තුස් පෙන්වන ප්‍රේමයෙන්
අපව වෙන් කළ හැක්කේ කාටද?[11]
එයට පීඩා හෝ දුක් වේදනා හෝ
හිංසා හෝ කුසගින්න හෝ ඇඳුම්
නැතිකම හෝ උවදුරු හෝ කඩුව
හෝ හරස් වේවිද?[12] **36** ලියවිලිවල
සඳහන් වී ඇති ආකාරයට, “ඔබට
විශ්වාසවන්තව සිටින නිසා අප-
ගේ ජීවිතයේ සෑම දවසක්ම අවදා-
නම් සහිතය. අපව මරණයට නියම
කළ බැටළුවන් මෙන් ගණන් ගනු
ලැබේ.”[13] **37** නමුත් ඒ සියල්ලේදීම
අපට ප්‍රේම කළ තැනැත්තා මාර්ග-
යෙන් අපට සම්පූර්ණ ජයක් ලැබෙන
බව නිසැකයි.[14] **38** මන්ද මට එක
දෙයක් ගැන සම්පූර්ණ විශ්වාසයක්
ඇත. එනම් මරණයටවත් මේ ජීවිත-
යටවත්[15] දේවදූතයන්ටවත්[16] ආණ්ඩු-
වලටවත්[17] දැන් සිදු වන දේවලටවත්
ඉදිරියේදී සිදු වීමට තිබෙන දේව-
ලටවත් කුමන බලවේගයකටවත්,[18]
**39** උසස් දෙයකටවත් පහත් දෙයක-
ටවත් සාදා ඇති වෙනත් කිසි දෙයක-
ටවත් අපගේ ස්වාමීන් වන ක්‍රිස්තුස්
යේසුස් මාර්ගයෙන් ප්‍රකාශ වන දෙවි-
ගේ ප්‍රේමයෙන් අපව වෙන් කළ නො-
හැකි බවයි.[1]

**9** ක්‍රිස්තුස්ගේ අනුගාමිකයෙකු ලෙස
මා ඔබට පවසන දේවල් සැබෑය.[2]
මම බොරු නොකියමි.[3] දෙවිගේ බල-
යේ ක්‍රියාකාරිත්වයට එකඟව ක්‍රියා
කරන මගේ හෘදය සාක්ෂිය මා පව-
සන දේ සැබෑවක් බව සාක්ෂි දරයි.
**2** එහෙයින් මගේ සිතේ මහත් දුකක්
හා වේදනාවක් ඇති බව[4] පවසන
විට මාව විශ්වාස කරන්න. **3** ඇත්-
තෙන්ම දෙවිගෙන් ඈත්ව සිටින
මගේම ජාතියට අයත්[5] මගේ සහෝ-
දරයන්ට[6] උපකාර කිරීම වෙනුවෙන්
ක්‍රිස්තුස්ගෙන් ඈත් කර ඇති විනාශ-
යට නියමිත කෙනෙකු ලෙස වෙන්
කරනු ලබනවාට පවා මා කැම-
තිය. **4** මන්ද ඔවුන් ඊශ්‍රායෙල්ව-
රුන්ය.[7] පුත්‍රයන් ලෙස භාරගෙන
තිබුණේ ඔවුන්වය.[8] මහත් ගෞරවයක්
ලැබුවෙත්[9] ගිවිසුම්වලින් බැඳුණෙත්[10]
නීතිය ලැබුවෙත්[11] පරිශුද්ධ සේව-
යක් කිරීමේ ප්‍රස්තාව ලැබුවෙත්[12] දෙ-
විගේ පොරොන්දු ලැබුවෙත්[13] ඔවුන්ය.
**5** අපගේ මුතුන්මිත්තන්ගෙන්[14] පැව-
තෙන්නේ ඔවුන්ය. ඔවුන්ගේම දරු-
වෙකු ලෙස ක්‍රිස්තුස්ද බිහි වුණේය.[15] ඒ
සෑම දෙයක්ම එසේ සිදු කළ සියල්ලේ
අධිපතියාණන් වන දෙවිට[16] ප්‍රශංසාව
හිමි වේවා! ආමෙන්.
**6** ඔවුන් දෙවිගෙන් ඈත්ව සිටියත්
දෙවි පොරොන්දු වූ දේ ඉටු
නොවන බව සිතිය නොහැක.[17]
මන්ද උපතින්ම ඊශ්‍රායෙල්වරුන් වන
සියලුදෙනාම සැබෑ “ඊශ්‍රායෙල්වරු”
නොවෙති.[18] **7** එසේම ඔවුන් ආබ්‍ර-
හම්ගෙන් පැවත ආ පමණින් ඔවුහු
ඇත්තටම ඔහුගේ සැබෑ දරුවෝ
නොවෙති.[19] මන්ද, “‘ඔබට පො-
රොන්දු වූ තැනැත්තා’ පැවතෙන්-
නේ ඊසාක්ගෙන්ය”[20] කියා සඳහන් වී
ඇත. **8** ඉන් අදහස් වන්නේ ආබ්‍ර-
හම්ගෙන් පැවතෙන සියලුදෙනාම[21]
අනිවාර්යයෙන්ම දෙවිගේ දරුවන්

**8 පරි.**
1 රෝම 5:18; 1කොරි 6:11; තීත 3:7
2 2කොරි 3:7; 2කොරි 3:18; 2කොරි 4:6
3 ගීතා 118:6; 1යොහ 4:4
4 රෝම 3:25; 2කොරි 5:21; 1යොහ 4:9
5 යොහ 3:16
6 එෆී 2:4
7 ක්‍රියා 13:39; හෙබ්‍රෙ 10:17
8 යෙසා 50:8; කොලො 1:22
9 ගීතා 110:1
10 හෙබ්‍රෙ 7:25; 1යොහ 2:1
11 යොහ 15:10
12 2කොරි 4:9
13 ගීතා 44:22
14 යොහ 16:33
15 1කොරි 3:22
16 1පේත 3:22
17 එෆී 1:21
18 එෆී 6:12

**2 තිරුව**
1 2තෙස 3:5

**9 පරි.**
2 1තිමෝ 2:7
3 ගලා 1:20
4 රෝම 10:1
5 රෝම 16:7; රෝම 16:21
6 නික් 32:32
7 2කොරි 11:22; පිලි 3:5
8 නික් 4:22
9 ද්වි 26:19
10 ක්‍රියා 3:25; ක්‍රියා 7:8
11 නික් 24:12
12 ක්‍රියා 26:7; හෙබ්‍රෙ 9:1
13 ක්‍රියා 13:32; රෝම 4:13
14 ද්වි 10:15
15 මතෙ 1:17
16 ගීතා 103:19
17 ගණන් 23:19
18 මතෙ 23:38; රෝම 2:28; එළි 2:9
19 යොහ 8:39; ගලා 3:29
20 උත් 21:12; හෙබ්‍රෙ 11:18
21 යෙසා 57:4; ගලා 4:23

ලෙස සලකන්නේ නැති බවයි.[1] ඒ
අනුව සැබෑ දරුවන් ලෙස සලකන්නේ
පොරොන්දුව ලබන දරුවන්[2] පමණක්
බව පැහැදිලිය. **9** ඇත්තෙන්ම දෙවි
එදා ඒ පොරොන්දුව ලබා දුන්නේ
මෙසේ පවසමිනි. “ඒ කාලයේදී මම
නැවත පැමිණෙන්නෙමි. ඒ වන විට
සාරාට පුත්‍රයෙක් සිටීවි.”[3] **10** එවැනි
පොරොන්දුවක් දෙනු ලැබුවේ ඒ අවස්-
ථාවේදී පමණක් නොවේ. අපගේ
මුතුන්මිත්තා වන ඊසාක් මාර්ග-
යෙන් රෙබෙකාගේ කුස තුළ නිවුන්
දරුවන්[4] පිළිසිඳගත් අවස්ථාවේදීත්
එවැනිම පොරොන්දුවක් දෙන ලදි.
**11** ඒ දරුවන් දෙදෙනා ඉපදෙන්නත්
පෙර එනම්, ඔවුන් කිසි යහපතක් හෝ
වරදක් කරන්නත් පෙර දෙවි තෝරී-
මක් කළේය.[5] එයින් පැහැදිලි වූයේ
දෙවි යමෙකුව තෝරාගන්නේ ඔහු
කරන ක්‍රියා අනුව නොව දෙවි අරමුණු
කර ඇති දේට අනුව බවයි. එහෙයින්
කැඳවීම කරන්නේ දෙවිය.[6] **12** ඒ
අනුව දෙවි රෙබෙකාට මෙසේ පැවසු-
වේය. “වැඩිමලා බාලයාට දාසයෙක්
වන්නේය.”[7] **13** එසේම, “මම ප්‍රේම
කළේ යාකොබ්ටය. නමුත් ඒසව්ව
මම ප්‍රතික්ෂේප කළෙමි”[8] කියාද ලියා
තිබේ.

**14** මේ දේවල් සලකා බලද්දී දෙවි
අතින් යම් අසාධාරණයක් සිදු වී
ඇති බව අප සිතිය යුතුද?[9] නැත.
එලෙස කිසිවිටකත් නොසිතන්න.
**15** දෙවි මෝසෙස්ට පැවසූ දෙයින්
එය පැහැදිලි වේ. එනම්, “මා යමෙකුට
දයාව පෙන්වන්න කැමති නම් මම
ඔහුට දයාව පෙන්වමි. මා යමෙකුට
අනුකම්පාව පෙන්වන්න කැමති නම්
මම ඔහුට අනුකම්පාව පෙන්වමි”[10]
යනුවෙන්ය. **16** එහෙයින් දෙවිගේ
තේරීමට පදනම සපයන්නේ කෙනෙ-
කුගේ පෞද්ගලික ආශාව හෝ ඔහු
දරන වෑයම නොවේ. ඒ දේ තීරණය
කරන්නේ දයාව පෙන්වන[11] දෙවිය.[12]
**17** උදාහරණයකට දෙවි පාරාවෝට
පැවසූ දේ ශුද්ධ ලියවිල්ලෙහි මෙසේ
සඳහන් වේ. “මා මේ වන තුරු ඔබට
ජීවත් වන්න ඉඩහැරියේ ඔබට සිදු
වන දේ තුළින් මගේ බලය දැකගැනී-
මට හැකි වන පිණිසත් මගේ නාමය
පොළොවේ සිටින සියල්ලන් දැන-
ගන්නා පිණිසත්ය.”[1] **18** ඒ අනුව
ඔහු දයාව පෙන්වන්නේ ඔහු කැමති
තැනැත්තාටය.[2] නමුත් මුරණ්ඩු වන
තැනැත්තාට එසේ මුරණ්ඩු වීමට දෙවි
ඉඩහරියි.[3]

**19** මා දැන් පැවසූ දේවල් සලකා
බලන විට, “කිසි කෙනෙකුට දෙවි
අරමුණු කර ඇති දේට හරස් විය
නොහැකි නිසා[4] දෙවි මිනිසුන් කරන
දේවලට දොස් කියන්නේ ඇයි” කියා
ඔබට සිතෙන්න පුළුවන. **20** නමුත්
සහෝදරයෙනි,[5] දෙවිට විරුද්ධව එසේ
සිතන්න ඔබ කවුද?[6] “ඔබ මාව මේ
විදිහට හැදුවේ ඇයි”[7] කියා කුඹල්-
කරුගෙන් ඇසීමට මැටිවලින් අඹනු
ලැබූ බඳුනකට හැකිද? **21** එකම
මැටි පිඩෙන් එක බඳුනක් ගෞරව-
නීය කාර්යයක් සඳහාද තවත් එකක්
ගෞරවනීය නොවන කාර්යයක් සඳ-
හාද සෑදීමට[8] කුඹල්කරුට[9] අයිතියක්
නැද්ද? **22** ඇත්තෙන්ම දුෂ්ට මිනි-
සුන්ට විරුද්ධව තම උදහස ප්‍රකාශ
කර ඒ තුළින් තමා කොතරම් බල-
වත්ද කියා පෙන්වීමට දෙවිට හැකි-
යාව තිබිණ. එසේවුවත් ඔහු මහත්
ඉවසිල්ලක් පෙන්වමින් විනාශ කිරී-
මට සුදුසු බඳුන් හා සමාන ඒ පුද්ගල-
යන්ට විරුද්ධව තම උදහස ප්‍රකාශ
නොකර සිටියේය.[10] **23** දෙවි එසේ
කළේ දයාව ලැබීමට සුදුසු බඳුන් හා
සමාන පුද්ගලයන්ට[11] ඔහුගේ තේ-
ජස බහුලව[12] ලබා දීම සඳහාය. ඒ
පුද්ගලයන්ව තේජසට පත් කරන්න
ඔහු කල්තියාම පියවර ගත්තේය.[13]
**24** ඒ පුද්ගලයන් නම් අපය. අපව
ගෙන තිබෙන්නේ යුදෙව්වන් අතරින්
පමණක් නොවේ. වෙනත් ජාතීන්ට
අයත් මිනිසුන් අතරින්ද අපව ගෙන
තිබේ.[14] දෙවි එසේ කර ඇත්නම් ඒ
ගැන ප්‍රශ්න නැඟිය හැක්කේ කාටද?
**25** දෙවි හොෂෙයාගේ ලියවිල්ලෙහි
සඳහන් කළ දෙයින්ද එය සනාථ වේ.

**9 පරි.**
1 යොහ 1:13
2 යෙසා 54:1 ගලා 4:28
3 උත් 18:14
4 උත් 25:24
5 ගීතා 139:16
6 රෝම 8:28 හෙබ්‍රෙ 5:4
7 උත් 25:23
8 මලා 1:3 හෙබ්‍රෙ 12:16
9 ද්වි 32:4 2ලේක 19:6 යෝබ් 34:10
10 නික් 33:19
11 ද්වි 4:31 තීත 3:5
12 ගීතා 115:3

**2 තීරුව**
1 නික් 9:16
2 නික් 20:6
3 නික් 10:1 නික් 14:4
4 2ලේක 20:6 යෝබ් 23:13 දානි 4:35
5 රෝම 2:1
6 යෝබ් 40:2
7 යෙසා 29:16 යෙසා 45:9
8 2තිමෝ 2:20
9 යෙසා 64:8 යෙරෙ 18:6
10 1තෙස 5:9
11 ක්‍රියා 9:15
12 කොලො 1:27
13 පිලි 4:19
14 රෝම 11:13 එෆී 3:6

එනම්, "මට අයිති නැති සෙනඟකට[1]
මම, 'මාගේ සෙනඟ' කියා අමතන්-
නෙමි. ප්‍රේම නොකළ තැනැත්තියට
'ප්‍රේමණීය' තැනැත්තිය[2] කියාද පව-
සන්නෙමි. **26** 'ඔබව මාගේ සෙනඟ
ලෙස පිළි නොගන්නෙමි' කියා පැවසූ
ස්ථානයේදීම ඔවුන්ව, 'ජීවමාන දෙවි-
ගේ පුත්‍රයන්' ලෙස හඳුන්වනු ලැබේ"[3]
කියාද සඳහන් වේ.

**27** මීට අමතරව යෙසායා ඊශ්‍රා-
යෙල්වරුන් ගැන හඬ නඟා පැවසුවේ
මෙසේය. "ඊශ්‍රායෙල්වරුන්ගේ ගණන
මුහුදේ වැලි මෙන්[4] වුවත් ගලවා-
ගනු ලබන්නේ කුඩා පිරිසක් පමණි.[5]
**28** මන්ද යෙහෝවා දෙවි ප්‍රමාද
නොවී පොළොවේ වාසය කරන අයව
සම්පූර්ණයෙන්ම විනිශ්චය කරන්-
නේය."[6] **29** යෙසායා මෙවැනි අනා-
වැකියක්ද පැවසුවේය. "ස්වර්ගයේ
සේනාවල අධිපතියාණන් වන යෙ-
හෝවා දෙවිගේ[7] කරුණාව නිසා අප-
ගෙන් පැවතෙන්නෝ ඉතුරු වී සිටිති.
එසේ නැත්නම් අපි සොදොම් සහ
ගොමෝරාව මෙන් සහමුලින්ම නැති
වී යනු ඇත."[8]

**30** එයින් අප තේරුම්ගන්නේ
කුමක්ද? වෙනත් ජාතීන්ට අයත් අය
ධර්මිෂ්ඨ වීමට උත්සාහ නොකළත්
ඔවුහු දෙවි ඉදිරියෙහි ධර්මිෂ්ඨයන්
බවට පත් වූහ.[9] ඒ ඔවුන් තුළ තිබූ
විශ්වාසය නිසාය.[10] **31** නමුත් ඊශ්‍රා-
යෙල්වරු ඒ නීතිය තුළින් ධර්මිෂ්ඨ
වීමට උත්සාහ කළත් ඔවුන්ට එය
සම්පූර්ණයෙන්ම පිළිපැදීමට නො-
හැකි විය.[11] **32** ඒ කුමන හේතු-
වක් නිසාද? ඔවුන් ධර්මිෂ්ඨ වීමට
උත්සාහ කළේ ඔවුන්ගේ ක්‍රියාවලින්
පමණි. ඔවුන් තුළ විශ්වාසයක් තිබු-
ණේ නැත.[12] එහෙයින් ඔවුහු, "වැටීමට
හේතු වන ගල" නිසා ඇද වැටු-
ණෝය.[13] **33** එය සිදු වූයේ ලියවිලි-
වල සඳහන් ආකාරයටය. එනම්, "මම
සියොන්හි, ඔබේ වැටීමට හේතු වන
ගලක්ද[14] ඔබේ ඇද වැටීමට තුඩු දෙන
පර්වතයක්ද[15] තබන්නෙමි. නමුත් ඒ
මත විශ්වාසය තබන තැනැත්තාගේ
බලාපොරොත්තු කිසිදාක කඩ වන්-
නේ නැත."[1]

**10** සහෝදරයෙනි, මගේ එකම
ආශාව ඊශ්‍රායෙල්වරුන්ට
ගැලවීම ලැබෙනවා දැකීමයි.[2] ඒ
වෙනුවෙන් මම දෙවිට කන්නලව්
කරන්නෙමි. **2** මන්ද දෙවිට සේවය
කරන්න ඔවුන්ට මහත් උද්‍යෝගයක්
තිබෙන බව[3] මට ස්ථිරව කිව හැකිය.
නමුත් එම උද්‍යෝගය නිවැරදි
දැනුම මත පදනම් වූ එකක් නො-
වේ.[4] **3** ඔවුන්ට දෙවිගේ ධර්මිෂ්ඨ-
කම[5] ගැන දැනුමක් නැත. එහෙයින්
ඔවුන් උත්සාහ කරන්නේ තමන්-
ගේ ධර්මිෂ්ඨකම ඔප්පු කර පෙන්වීම-
ටය.[6] ප්‍රතිඵලයක් ලෙස ඔවුහු දෙවිගේ
ධර්මිෂ්ඨ ප්‍රමිතියට එකඟව ක්‍රියා
කරන්නේ නැත.[7] **4** මන්ද ක්‍රිස්තුස්-
ගේ මරණය තුළින් නීතිය අවලංගු
විය.[8] එහෙයින් දෙවි ඉදිරියේ ධර්මිෂ්ඨ
විය හැක්කේ විශ්වාසයක් ඇතුව සිටී-
මෙන් පමණි.[9]

**5** නීතියේ ධර්මිෂ්ඨ ප්‍රමිති පිළි-
පදින තැනැත්තා ඔහුගේ ජීවිතය
රැකගන්නා බව මෝසෙස් තම ලියවි-
ලිවල පැහැදිලි කළේය.[10] **6** එසේවු-
වත් ධර්මිෂ්ඨ කෙනෙකු වීමට
විශ්වාසයත් අවශ්‍ය බව එහි සඳ-
හන්ය. ඒ ගැන ලියා තිබෙන්නේ මෙ-
යයි. "ක්‍රිස්තුස්ව පොළොවට ගෙන
ඒම සඳහා,[11] 'ස්වර්ගයට නඟින්නේ
කවුද'[12] කියා ඔබේ සිතින් කියා
නොගන්න.[13] **7** එසේ නැතහොත්
ක්‍රිස්තුස්ව මරණයෙන් නැඟිටුවීමට,[14]
'අගාධයට බැස යන්නේ කවුද'[15]
කියාත් සිතින් කියා නොගන්න."
**8** එහි තවදුරටත් සඳහන් වන්නේ
කුමක්ද? "සියලුම වචන ඔබ ළඟම
තිබේ. ඒ වචන ඔබේ සිත තුළත්
දිව අගත් තිබේ"[16] කියාය. ඒ වචන
නම් අප දේශනා කරන[17] 'පණිවි-
ඩයයි.'[18] එය පිළිගැනීමට විශ්වාස-
යක් තිබිය යුතුයි. **9** 'ඔබේම දිව
අග තිබෙන ඒ වචන'[19] එනම්, යේ-
සුස් ස්වාමීන් බව[20] ඔබ ප්‍රසිද්ධියේ
ප්‍රකාශ කළ යුතුයි. එලෙසම දෙවි

**9 පරි.**
1 එෆී 2:12
2 හොෂෙ 2:23, මතෙ 21:43, 1පේත 2:10
3 හොෂෙ 1:10, ගලා 3:26
4 උත් 22:17, 1රාජ 4:20
5 යෙසා 10:22, රෝම 11:5
6 යෙසා 10:23
7 ගීතා 103:21
8 යෙසා 1:9, යෙරෙ 50:40
9 රෝම 10:20
10 රෝම 1:17, රෝම 4:11, පිලි 3:9
11 ගලා 2:21, ගලා 5:4
12 ගලා 2:16
13 ලූක් 20:18, 1කොරි 1:23
14 ගීතා 118:22, මතෙ 21:42, 1පේත 2:6
15 යෙසා 8:14

**2 තීරුව**
1 යෙසා 28:16, යෙසා 49:23

**10 පරි.**
2 රෝම 9:3
3 මතෙ 7:22, ක්‍රියා 21:20, ගලා 1:14, පිලි 3:6
4 එෆී 1:17
5 රෝම 1:17
6 ලූක් 16:15, ලූක් 18:9, පිලි 3:9
7 මතෙ 15:6, ලූක් 7:30
8 මතෙ 5:17, රෝම 7:6, එෆී 2:15, කොලො 2:14
9 ක්‍රියා 13:39, ගලා 3:24
10 ලෙවී 18:5, නෙහෙ 9:29, එස 20:11, ගලා 3:12
11 හෙබ්‍රෙ 8:1
12 ද්වි 30:12
13 ද්වි 9:4
14 මතෙ 27:64
15 ද්වි 30:13, එළි 20:1
16 ද්වි 30:14, යොහ 6:45, ක්‍රියා 16:14
17 2තිමෝ 4:2
18 ලූක් 8:15, 2කොරි 5:19
19 1කොරි 9:16
20 ක්‍රියා 16:31

ඔහුව මරණයෙන් නැඟිටෙවූ බව[1] ඔබ
ඔබේ මුළු හදවතින්ම පිළිගෙන ඒ
කෙරෙහි විශ්වාසය තැබිය යුතුයි. ඔබ
එසේ කළොත් ඔබව ගලවනු ලැබේ.[2]
**10** කෙනෙකු විශ්වාසය ඇති කර-
ගන්නේ ඔහුගේ හදවතින්ය.[3] ඒ විශ්-
වාසය නිසා ඔහු ධර්මිෂ්ඨයෙක් වෙයි.
නමුත් ඔහු ගැලවීම ලබන්නේ ඒ විශ්-
වාසය ගැන ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරී-
මෙනි.[4]

**11** මන්ද ශුද්ධ ලියවිල්ලෙහි සඳ-
හන් ආකාරයට, “ඔහු කෙරෙහි විශ්-
වාසය තබන[5] කිසි කෙනෙකුගේ
බලාපොරොත්තු කිසිදාක කඩ වන්-
නේ නැත.”[6] **12** යුදෙව්වන් හා ග්‍රීක-
යන්* අතර කිසි වෙනසක් නැත.[7]
සියල්ලන්ගේ ස්වාමීන් එක් කෙ-
නෙක්මය. ඔහු තමන්ට අයැදින
සියලුදෙනාටම එක හා සමානව බෝ-
හෝ ආශීර්වාද ලබා දෙන්නේය.[8]
**13** මන්ද, “යෙහෝවා යන දෙවි-
ගේ නාමය කියා අයැදින සියලුදෙ-
නාවම ගලවනු ලබන්නේය.”[9]
**14** නමුත් ඔවුන්ට ඔහු ගැන විශ්වා-
සයක් නැත්නම් ඔවුන් ඔහුට අයැ-
දින්නේ කෙසේද?[10] ඔවුන් ඔහු ගැන
අසා නැත්නම් ඔහු කෙරෙහි විශ්-
වාසය තබන්නේ කෙසේද? දේශනා
කරන්න කෙනෙක් නැත්නම් ඔවුන්
ඔහු ගැන අසා දැනගන්නේ කෙ-
සේද?[11] **15** ඔවුන්ව යවා නැත්නම්
ඔවුන් දේශනා කරන්නේ කෙසේද?[12]
ලියවිලිවල සඳහන් ආකාරයට, “යහ-
පත් දේවල් ගැන ශුභාරංචි ප්‍රකාශ
කරන අයගේ පාද කොතරම් අලංකා-
රද!”[13]

**16** නමුත් සියලුදෙනාම ඒ ශුභාරං-
චියට කීකරු වුණේ නැත.[14] මන්ද
යෙසායා මෙසේ කියන්නේය. “යෙ-
හෝවා දෙවියනි, අප පැවසූ දේවල්
කෙරෙහි විශ්වාසය තැබුවේ කවුද?”[15]
**17** විශ්වාසයක් ඇති වන්නේ පණි-
විඩයට සවන් දුන්නොත් පමණක්
බව ඉන් පැහැදිලි වේ.[16] ඒ පණි-
විඩයට සවන් දිය හැක්කේ යමෙකු
ක්‍රිස්තුස් ගැන කතා කරන විටය.[1]
**18** නමුත් මේ සම්බන්ධයෙන් මට
ප්‍රශ්නයක් මතු වේ. එනම් සවන්
දෙන්න ඔවුන්ට ප්‍රස්තාවක් ලැබුණේ
නැද්ද යන්නයි. ඇත්තෙන්ම ඔවුන්ට
ලැබිණ. මන්ද, “ඔවුන්ගේ හඬ පො-
ළෝතලය පුරාම පැතිර ගියේය.[2]
පොළොවේ කෙළවර දක්වා ඔවුන්
පැවසූ දේ අසන්න ලැබුණේය”[3] කියා
සඳහන් වී ඇත. **19** නමුත් මා නැව-
තත් අසන්නේ ඒ දේවල් ගැන ඊශ්‍රා-
යෙල්වරුන් දැනගෙන සිටියේ නැද්ද
යන්නයි.[4] ඇත්තටම ඔවුහු දැනගෙන
සිටියෝය. මන්ද මෝසෙස් මෙසේ
පැවසුවේය. “ඔබ වෙනුවට ජාති-
යක් ලෙස නොසැලකිය යුතු ජාතිය-
කට මම කරුණාව පෙන්වන්නෙමි.
එයින් ඔබ තුළ ඊර්ෂ්‍යාවක් ඇති වේ.
මම ඔබ වෙනුවට අනුවණයයි සැල-
කෙන ජාතියක් තෝරාගන්නෙමි.
එයින් ඔබ තුළ මහත් කෝපයක් ඇති
වේ.”[5] **20** එසේම යෙසායාද ඉතා
නිර්භීතව මෙසේ කියන්නේය. “මාව
හඳුනාගැනීමට නොවෙහෙසුණු අය
මාව හඳුනාගත්තෝය.[6] මාගෙන් මඟ
පෙන්වීම් නොපැතූ අය මට ළං වූහ.”[7]
**21** එසේවුවත් දෙවි ඊශ්‍රායෙල්වරුන්
ගැන මෙසේ පවසයි. “එකට එක
කියන[8] අකීකරු ජනතාවක්[9] වන ඔබ
දෙසට මාගේ අත් විහිදුවාගෙන දවස
පුරා බලා සිටියෙමි.”

# 11
මා දැන් අසන ප්‍රශ්නය
නම් දෙවි තම සෙ-
නඟව සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප
කළාද යන්නයි.[10] නැත. කිසිවිට-
කත් එසේ නොසිතන්න. මන්ද මාත්
ආබ්‍රහම්ගෙන් පැවතෙන ඊශ්‍රායෙල්
ජාතිකයෙකි.[11] මා අයත් වන්නේ
බෙන්ජමින් ගෝත්‍රයටය.[12] **2** එහෙ-
යින් දෙවි මුලින්ම පිළිගත් තම සෙ-
නඟව[13] ප්‍රතික්ෂේප කර ඇති බව කිව
නොහැක. එලියා ගැන ශුද්ධ ලිය-
විල්ලෙහි සඳහන් දේ ඔබට අමත-
කද? ඔහු ඊශ්‍රායෙල්වරුන්ට විරුද්ධව
දෙවිට මෙසේ කන්නලව් කළේය.[14]

**10 පරි.**
1 ක්‍රියා 3:15, රෝම 4:24, 1පේතෘ 1:21
2 මතෙ 10:32
3 1ලේක 28:9, 2තෙස 3:5
4 2කොරි 4:13, හෙබ්‍රෙ 13:15
5 යෙරෙ 17:7
6 යෙසා 28:16, රෝම 9:33
7 ක්‍රියා 15:9, ගලා 3:28, එෆී 2:14
8 1තිමෝ 6:17
9 යෝවෙ 2:32, ශෙප 3:9, ක්‍රියා 2:21
10 හෙබ්‍රෙ 11:6
11 ලූක් 19:40
12 මතෙ 28:20
13 යෙසා 52:7, නාහු 1:15, එෆී 6:15
14 2තෙස 1:8, හෙබ්‍රෙ 4:2, 1පේතෘ 4:17
15 යෙසා 53:1, යොහ 12:38
16 යොහ 4:42, යොහ 17:20

**2 තීරුව**
1 ගලා 3:2
2 මතෙ 24:14, ක්‍රියා 1:8
3 ගීතා 19:4
4 මතෙ 10:5, ක්‍රියා 2:14
5 ද්වි 32:21
6 රෝම 9:30
7 යෙසා 65:1
8 යෙසා 65:2
9 යෙරෙ 11:8, සෙක 7:12

**11 පරි.**
10 1සාමු 12:22, යෙරෙ 31:37, ආමො 9:8
11 ක්‍රියා 22:3, 2කොරි 11:22
12 පිලි 3:5
13 නික් 19:5, ගීතා 94:14
14 1රාජ 19:10

රෝම **10:12*** රෝම 1:16හි පාදසටහන බලන්න.

**3** "යෙහෝවා දෙවියනි, ඔවුන් ඔබේ
පූජාසන ගලවා දැමුවා. ඔබේ අනාග-
තවක්තෘවරුන්ව මරා දැමුවා. ඉතු-
රුව සිටින්නේ මා පමණයි. ඔවුන්
මාවද මරා දමන්න සොයනවා."[1]
**4** නමුත් දෙවි ඔහුට පිළිතුරු දුන්-
නේ කෙසේද?[2] දෙවි මෙසේ පැවසු-
වේය. "බාල් ඉදිරියේ දණ නොනැමූ[3]
මට විශ්වාසවන්ත වූ හත්දහස්දෙ-
නෙක් තවමත් ඊශ්‍රායෙල් දේශයේ
ජීවත් වෙති." **5** ඒ ආකාරයටම මේ
කාලයේදීත් කුඩා පිරිසක් ඉතුරුව
සිටිති.[4] ඔවුන්ව තෝරාගෙන තිබෙන්-
නේ[5] දෙවිගේ මහත් කරුණාව නිසාය.
**6** එසේ තෝරාගෙන තිබෙන්නේ[6]
ඔවුන්ගේ ක්‍රියා නිසා නොවේ.[7] ඔවුන්-
ගේ ක්‍රියා නිසා ඔවුන්ව තෝරාගෙන
තිබුණා නම් දෙවි පෙන්වන කරු-
ණාව මහත් කරුණාවක් ලෙස සැල-
කිය නොහැක.[8]

**7** එසේනම් අපට මේ ගැන කිව
හැක්කේ කුමක්ද? එනම් ඊශ්‍රායෙල්
ජාතිය මහත් ආශාවකින් ලබාගැනී-
මට උත්සාහ කළ දේ ඔවුන්ට ලබා-
ගත නොහැකි වූ බවය.[9] ඒ දේ
හිමි වූයේ ඔවුන් අතරින් තෝරාගත්
පිරිසකට පමණි.[10] සෙසු අය ක්‍රියා
කළේ මුරණ්ඩු ආකාරයටය.[11] **8** ඒ
අය ගැන ලියවිලිවල සඳහන් වී
තිබෙන්නේ මෙයයි. "දෙවි ඔවුන්ව තද
නින්දකට වැටෙන්න සලස්වා ඇත.[12]
එහෙයින් අද වන තුරුම ඔවුන් ඇසූ
දුටු මේ දේවල නියම අර්ථය තේ-
රුම්ගන්න තරම් ශක්තියක් ඔවුන්ට
දෙවිගෙන් ලැබී නැත."[13] **9** දාවිත්
පවා මෙසේ සඳහන් කළේය. "ඔවුන්
පිළියෙල කරගත් මේසය ඔවුන්ටම
උගුලක් වේවා! එය ඔවුන්ගේ වැටී-
මටත් දඬුවමටත් හේතුවක් වේවා![14]
**10** කිසිවක් දැකගැනීමට නොහැකි
වන සේ ඔවුන්ගේ ඇස් අඳුරු කරන්න!
ඔවුන්ගේ තුනටියේ ශක්තිය හීන වී
යෑමට සලස්වන්න!"[15]

**11** එසේනම් මා අසන්නේ, ඔවුන්-
ගේ වැටී යෑම ඔවුන්ව සහමුලින්ම
නැති වී යෑමට[16] හේතුවක් වුවාද යන්-
නයි. නැත. කිසිවිටකත් එසේ නො-
සිතන්න. නමුත් ඔවුන් ගත් වැරදි
පියවර[1] වෙනත් ජාතීන්ට අයත් මිනි-
සුන්ට ගැලවීමේ මඟ උදා කළේය.[2]
එය දුටු ඔවුන් තුළ ඊර්ෂ්‍යාවක් ඇති
විය.[3] **12** ඔවුන් ගත් වැරදි පියවර
නිසාත් එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්-
ගෙන් තෝරාගත හැකි ගණන අඩු වී
යන නිසාත් වෙනත් ජාතීන්ට අයත්
මිනිසුන්ට එය ආශීර්වාදයක් විය.[4]
කෙසේවෙතත් මුළු සංඛ්‍යාව එකතු
කරනු ලැබූ පසු ඊටත් වඩා බොහෝ
ආශීර්වාද ලබාගැනීමට එය මාර්ග-
යක් වනු ඇත.[5]

**13** මා දැන් කතා කරන්නේ
වෙනත් ජාතීන්ට අයත් මිනිසුන්
වන ඔබටය. ඇත්තෙන්ම වෙනත්
ජාතීන්ට අයත් මිනිසුන් වෙතට යවනු
ලැබූ[6] නියෝජිතයෙකු*[7] ලෙස මම
මට පවරා ඇති සේවය[8] මහත් ගෞ-
රවයකින් සලකමි.[9] **14** මා එසේ
කරන්නේ යම් විදිහකින් මගේම සෙ-
නඟ තුළ ඊර්ෂ්‍යාවක් ඇති කර ඔවුන්-
ගෙන් සමහරෙකුව[10] ගලවාගැනීම
සඳහාය.[11] **15** ඇත්තෙන්ම ඔවුන්ව
ප්‍රතික්ෂේප කිරීම[12] වෙනත් ජාතීන්ට
දෙවි සමඟ සමාදාන වීමට මඟ
පෑදුවේය.[13] නමුත් ඔවුන්ව නැවත
පිළිගත්තොත් ඔවුන්ට මරණයෙන්
ගැලවී ජීවනය ලබාගත හැකි වේ.
**16** මන්ද පළමු පල ලෙස[14] පිටි
පිඩෙන් ගත් මුල් කොටස ශුද්ධ නම්
මුළු පිටි පිඩම වන ඔවුන් ශුද්ධ විය
යුතුයි. එලෙසම මුල ශුද්ධයි කියා
සැලකේ නම්[15] එහි අතු හා සමාන
වන ඔවුන්ද ශුද්ධය.

**17** නමුත් ඔලීව ගසේ සමහර අතු
කපා ඉවත් කර වල් ඔලීව ගසකින්
ගත් ඔබව ඉතුරු වී තිබෙන අතු
අතර බද්ධ කර[16] ඒ ඔලීව ගසේ සාර-
වත් මුලෙහි[17] කොටස්කරුවන් කර
ඇත්නම්,[18] **18** කපා ඉවත් කළ ඒ
අතුවලට සිදු වූ දේ ගැන සතුටු නො-
වන්න. නමුත් ඔබ ඒවාට සිදු වූ දේ

**11 පරි.**
**1** 1රාජා 19:2
1රාජා 19:14
**2** ක්‍රියා 7:38
**3** 1රාජා 19:18
**4** යෙරෙ 3:14
රෝම 9:27
**5** රෝම 9:11
**6** එෆී 1:7
එෆී 2:8
**7** ගලා 2:16
එෆී 2:9
**8** ගලා 5:4
**9** යොහ 1:11
රෝම 9:31
**10** යොහ 1:12
රෝම 11:28
**11** 2කොරි 3:14
**12** යෙසා 29:10
**13** ද්වි 29:4
යෙරෙ 5:21
**14** ගීතා 69:22
**15** ගීතා 69:23
**16** 1කොරි 10:8
හෙබ්‍රෙ 4:11

**2 තීරුව**
**1** ගලා 6:1
**2** රෝම 11:19
**3** ද්වි 32:21
රෝම 10:19
**4** රෝම 9:23
කොලො 1:27
**5** රෝම 11:25
එළි 7:4
**6** ක්‍රියා 9:15
ගලා 1:16
එෆී 3:8
**7** 1කොරි 9:1
1කොරි 15:9
**8** ක්‍රියා 28:31
කොලො 1:23
1තිමෝ 1:12
**9** පිලි 1:12
2තිමෝ 4:5
**10** රෝම 9:3
**11** 1කොරි 9:22
1තිමෝ 4:16
**12** මතෙ 21:43
හෙබ්‍රෙ 8:13
**13** රෝම 5:11
2කොරි 5:19
**14** ගණන් 15:21
නෙහෙ 10:37
එස 44:30
**15** ලෙවී 11:44
1පේතෘ 1:16
**16** එෆී 2:11
එෆී 2:14
**17** විනි 9:9
**18** යෙරෙ 11:16

රෝම **11:13*** හෝ, "යවනු ලැබූවෙකු."

ගැන සතුටු වේ නම්[1] මුල පවතින්නේ
ඔබ නිසා නොව[2] ඔබ පවතින්නේ
මුල නිසා බව මතක තබාගන්න.[3]
**19** ඇතැම්විට, “අතු කපා ඉවත්
කළේ[4] මාව බද්ධ කිරීමටයි”[5] කියා
ඔබ පවසනවා විය හැක. **20** ඒ දේ
සිදු වූ බව ඇත්තයි! නමුත් ඔවුන්ව
කපා ඉවත් කරන ලද්දේ ඔවුන්ට
විශ්වාසයක් නොතිබුණු නිසා[6] බව
මතක තබාගන්න. ඔබ දිගටම එයට
සම්බන්ධ වී සිටින්නේ ඔබේ විශ්-
වාසය නිසාය.[7] එහෙයින් ඔබ ගැන
ඕනෑවට වඩා නොසිතන්න.[8] පරෙස්-
සම් වන්න.[9] **21** මන්ද දෙවි ගසේ
මුලින් තිබූ අතු කපා ඉවත් කළා
නම් ඔහුට ඔබවත් එලෙස කපා ඉවත්
කළ හැක.[10] **22** එහෙයින් දෙවි තම
කරුණාව පෙන්වූ ආකාරය[11] මෙන්ම
ඔහු දැඩි පියවර ගත් ආකාරය[12] සැල-
කිල්ලට ගන්න. එවැනි දැඩි පියවර
ගත්තේ වැටී ගිය අයට විරුද්ධවය.[13]
නමුත් ඔබට දෙවිගේ කරුණාව ලැබී
තිබේ. ඔබට එය දිගටම ලැබෙන්නේ
ඔහුගේ කරුණාව ලබන්න ඔබ සුදුසු
තත්වයක දිගටම සිටියොත් පමණි.[14]
එසේ නැතහොත් ඔබවත් කපා ඉවත්
කරනු ලැබේ.[15] **23** මීට අමතරව
මුලින් තිබූ අතු නැවතත් විශ්වාසයක්
ඇති පුද්ගලයන් බවට පත් වුවහොත්
ඔවුන්වද නැවත බද්ධ කරනු ලැබේ.[16]
මන්ද එසේ බද්ධ කිරීමට දෙවිට හැක.
**24** ඔබව වල් ඔලීව ගසින් කපා වත්-
තක වවනු ලබන ඔලීව ගසකට බද්ධ
කරනු ලැබුවා නම්[17] එම ඔලීව ගසේ
මුලින් තිබූ අතු නැවත ඒ ගසටම
බද්ධ කිරීම ඊටත් වඩා කොතරම්
පහසු වේද![18]

**25** සහෝදරයෙනි, මෙම පරිශුද්ධ
රහස ගැන ඔබ අවබෝධයක් ලබා-
ගන්නවාට මා කැමතිය.[19] ඔබ ඒ
ගැන අවබෝධයක් ලබා නොගත්-
තොත් ඔබ ඔබේම නුවණ මත රඳා
සිටිනු ඇත. ඒ පරිශුද්ධ රහස නම්
කැඳවනු ලබන වෙනත් ජාතීන්ට
අයත් මිනිසුන්ගේ සංඛ්‍යාව[20] සම්-
පූර්ණ වන තුරු[21] ඊශ්‍රායෙල්වරුන්-
ගෙන් කොටසක් තම සිත් දැඩි
කරගෙන සිටින බවය.[1] **26** එලෙස
මුළු ‘ඊශ්‍රායෙලයම’[2] ගලවනු ලැබේ.
ලියවිලිවල සඳහන් වන්නේ මෙයයි.
“මිදුම්කරු සියොන්හි සිට පැමිණ,[3]
දෙවිට අගෞරවයක් ගෙන දෙන ක්‍රියා
යාකොබ් අතරින් ඉවත් කරන්නේය.[4]
**27** මම ඔවුන්ගේ පාප ඉවත් කර
දැමූ විට[5] ඔවුන් සමඟ ගිවිසුමක් ඇති
කරගන්නෙමි.”[6] **28** ඔවුන් ශුභාරං-
චිය ප්‍රතික්ෂේප කළ නිසා ඔවුන් දෙවි-
ගේ සතුරන් වන බව ඇත්තය.[7] එයින්
ප්‍රයෝජන ලබන්නේ ඔබය. නමුත්
දෙවි ඔවුන්ගේ මුතුන්මිත්තන්ට දුන්
පොරොන්දුව හේතුවෙන් ඔවුන්ගෙන්
සමහරෙකුව තෝරාගනු ලබන නිසා
ඔවුහු දෙවිගේ හිතවත් මිතුරෝ වනු
ඇත.[8] **29** මන්ද දෙවි තමන් දුන්
දීමනා ගැන හෝ තමන් කැඳවූ අය
ගැන හෝ කනගාටු වන්නේ නැත.[9]
**30** කලක් ඔබ දෙවිට අකීකරු වී සිටි-
යත්[10] දෙවිගේ දයාව ලබන්න ඔබට
හැකියාව ලැබුණේ[11] ඔවුන් අකීකරු වූ
නිසාය.[12] **31** ඔවුන්ගේ අකීකරුකම
නිසා ඔබ දයාව ලැබුවා සේම ඔවුන්-
ටත් දැන් දයාව ලැබීමට අවස්ථාව
උදා වී ඇත.[13] **32** ඇත්තෙන්ම දෙවි
ඔවුන් සියලුදෙනාටම අකීකරු වී සිටී-
මට ඉඩහැරියේය.[14] ඔහු එසේ කළේ
ඔවුන් සියලුදෙනාටම දයාව පෙන්වීම
සඳහාය.[15]

**33** දෙවි ලබා දෙන ආශීර්වාද
කොතරම් ශ්‍රේෂ්ඨද![16] ඔහුගේ ප්‍රඥා-
වත්[17] දැනුමත්[18] කොතරම් පුළුල්ද!
ඔහු දේවල් තීරණය කරන ආකා-
රය සහ ඔහු අනුගමනය කරන
ක්‍රියාමාර්ග තේරුම්ගැනීම කොතරම්
අමාරුද![19] **34** ඇත්තෙන්ම, “යෙ-
හෝවා දෙවිගේ මනස තේරුම්ගත්තේ
කවුද?[20] එලෙසම ඔහුට ගුරුහරුකම්
දිය හැක්කේ කාටද?”[21] **35** “ඔහු-
ගෙන් යමක් ලබාගැනීමට මුලින්ම
ඔහුට යමක් දුන්නේ කවුද?”[22]
**36** මන්ද සියලු දේවල් සෑදුවේ ඔහුය.
ඒවා දිගටම පවතින්නේ ඔහු නිසාය.
එලෙසම ඒවා පවතින්නෙත් ඔහුගේ

**11 පරි.**

**1** 1කොරි 10:12
**2** යෙසා 37:31
**3** යෙසා 60:21
හෙබ්‍රෙ 2:11
**4** යොහ 15:6
**5** ක්‍රියා 15:14
**6** මතෙ 21:43
හෙබ්‍රෙ 3:19
හෙබ්‍රෙ 11:6
**7** ගලා 3:11
එෆී 2:8
**8** රෝම 12:16
**9** පිලි 2:12
**10** යොහ 15:2
**11** නික් 19:4
ලූක් 6:35
රෝම 2:4
**12** යූද් 5
**13** මතෙ 23:38
**14** 1කොරි 15:2
**15** මතෙ 25:30
මතෙ 25:46
**16** ක්‍රියා 2:38
**17** රෝම 11:17
**18** 2කොරි 3:16
**19** 1කොරි 4:1
එෆී 3:5
**20** එළි 7:3
**21** රෝම 11:12
එළි 7:4

---

**2 තීරුව**

**1** රෝම 11:7
2කොරි 3:14
**2** රෝම 2:29
රෝම 9:6
ගලා 3:29
ගලා 6:16
**3** ගීතා 14:7
**4** යෙසා 59:20
**5** යෙසා 27:9
යෙරෙ 31:33
හෙබ්‍රෙ 8:8
**6** යෙසා 59:21
**7** හෙබ්‍රෙ 4:6
**8** ද්වි 10:15
**9** ගණන් 23:19
**10** එෆී 2:2
එෆී 2:12
**11** ක්‍රියා 15:9
**12** ක්‍රියා 7:51
හෙබ්‍රෙ 3:8
**13** කොලො 1:22
**14** රෝම 3:9
**15** 1තිමෝ 1:16
1තිමෝ 2:4
හෙබ්‍රෙ 4:16
**16** රෝම 2:4
රෝම 9:23
**17** හිතෝ 2:6
හිතෝ 3:19
**18** ගීතා 139:6
**19** ගීතා 36:6
**20** 1කොරි 2:16
**21** යෙසා 40:13
දානි 4:35
**22** යෝබ් 41:11

අරමුණ උදෙසාය.[1] දෙවිට සදහටම
ප්‍රශංසාවත් ගෞරවයත් ලැබේවා![2]
ආමෙන්.

**12** එහෙයින් සහෝදරයෙනි, දෙවි
අපට මෙතරම් දයානුකම්පා-
වක් පෙන්වා ඇති නිසා මා ඔබෙන්
යටහත්ව ඉල්ලා සිටින්නේ මෙයයි.
එනම් ඔබේ ශරීර[3] ජීවමාන,[4] ශුද්ධ[5]
මෙන්ම දෙවිට පිළිගත හැකි[6] පූජා-
වක් ලෙස[7] ඔප්පු කරන්න කියායි. ඔබ
එසේ කළොත් බුද්ධිමත් ලෙස[8] දෙ-
විට පරිශුද්ධ සේවයක් පිරිනමන්න[9]
ඔබට හැකි වනු ඇත. **2** තවදුරටත්
අප ජීවත් වන මේ සමාජයේ රැල්-
ලට අනුව හැඩගැසීමෙන් වළකින්න.[10]
ඒ වෙනුවට ඔබේ පෞද්ගලිකත්වය
මුළුමනින්ම වෙනස් කරගෙන අලුත්
ආකාරයකින් සිතීමට පුරුදු වන්න.[11]
එසේ කිරීමෙන් දෙවිගේ යහපත් වූ
ප්‍රසන්න වූ සම්පූර්ණ කැමැත්ත[12]
කුමක්ද කියා හොඳින් වටහාගැනීමට
ඔබට හැකි වනු ඇත.[13]

**3** දෙවිගේ මහත් කරුණාව අද්ද-
කින මා, ඔබ සියලුදෙනාටම කියන්-
නේ තමන් ගැන වුවමනාවට වඩා
නොසිතන්න[14] කියාය. ඒ වෙනුවට
සාධාරණව සිතීමට පුරුදු වන්න.
එලෙසම හොඳ සිහිකල්පනාවෙන්
කටයුතු කරන්න.[15] දෙවි ඔබ එකි-
නෙකා තුළ ඇති කර තිබෙන[16]
විශ්වාසයට[17] එකඟව එසේ කිරීමට
වගබලා ගන්න. **4** උදාහරණයකට
එකම ශරීරයේ අවයව බොහොම-
යක් තිබුණත්[18] ඒ අවයව සියල්-
ලෙන් එකම කාර්යයක් සිදු වන්නේ
නැත. **5** අපද ඒ හා සමානය. බො-
හෝදෙනෙකු සිටියත් අපි සියලුදෙ-
නාම ක්‍රිස්තුස් සමඟ එකට බැඳී සිටින
එකම ශරීරයක් වන්නෙමු.[19] එහෙයින්
අපි එම ශරීරයේ එකිනෙකා මත රඳා
සිටින අවයවයන් වෙමු.[20] **6** ඒ අනුව
අපට විවිධාකාර දීමනා ලබා දී ඇත.[21]
ඒ ඔහුගේ මහත් කරුණාව නිසාය.[22]
එහෙයින් අපට අනාවැකි කීමේ හැකි-
යාව ලබා දී ඇත්නම් අප තුළ
ඇති කර තිබෙන විශ්වාසයට එකඟව

**11 පරි.**
1 1කොරි 8:6
2 ගලා 1:5
එළි 4:11

**12 පරි.**
3 ගීතා 110:3
1කොරි 6:20
4 රෝම 6:13
5 2කොරි 7:1
1පේතෘ 1:15
6 ලෙවී 22:19
7 හෙබ්‍රෙ 13:13
8 2තිමෝ 1:7
9 පිලි 3:3
හෙබ්‍රෙ 9:14
10 1පේතෘ 1:14
11 රෝම 7:25
එෆී 4:23
12 1තෙස 4:3
එළි 4:11
13 1තිමෝ 4:15
14 හිතෝ 16:18
1කොරි 4:6
ගලා 6:3
එෆී 4:2
1පේතෘ 5:5
15 තීත 2:6
1පේතෘ 4:7
16 එෆී 4:7
17 එෆී 2:8
18 1කොරි 12:12
19 කොලො 3:15
20 1කොරි 12:25
එෆී 4:25
21 1කොරි 12:4
එෆී 3:7
22 1පේතෘ 4:10

**2 තීරුව**
1 1පේතෘ 4:11
2 ගලා 6:6
3 1තිමෝ 5:17
4 2තිමෝ 4:2
5 ද්වි 15:11
හිතෝ 11:25
2කොරි 8:2
6 1තෙස 5:12
1පේතෘ 5:2
7 එෆී 4:32
8 1කොරි 13:4
9 1තිමෝ 1:5
යාකො 3:17
1පේතෘ 1:22
10 ගීතා 97:10
හිතෝ 8:13
11 ගීතා 34:14
හෙබ්‍රෙ 1:9
12 1තෙස 4:9
13 පිලි 2:3
14 ක්‍රියා 18:25
15 හිතෝ 13:4
16 රෝම 6:22
17 1තෙස 1:3
18 ක්‍රියා 14:22
19 පිලි 4:6
1තෙස 5:17
20 හිතෝ 3:27
1යොහ 3:17

අපි දිගටම අනාවැකි කියමු. **7** අපට
සේවයක් පිරිනැමීමේ ප්‍රස්තාව ලැබී
ඇත්නම් ඒ සේවය දිගටම ඉටු කරමු.[1]
එසේ නැතහොත් කෙනෙක් උගන්ව-
නවා නම්[2] ඔහු දිගටම තම ඉගැන්වී-
මේ කාර්යයෙහි නිරත විය යුතුයි.[3]
**8** කෙනෙක් උපදෙස් හා අවවාද ලබා
දෙනවා නම් ඔහු දිගටම එලෙස කළ
යුතුයි.[4] අනුන්ට අවශ්‍ය දේ ලබා
දෙන තැනැත්තා එය ත්‍යාගශීලීව
කළ යුතුයි.[5] අන් අය අතර පෙර-
මුණ ගන්නා තැනැත්තා[6] තම වගකීම
කඩිසරව ඉටු කළ යුතුයි. එලෙසම
අනුන්ට දයාව පෙන්වන තැනැත්තා[7]
එය සතුටින් කළ යුතුයි.

**9** ඔබට තිබිය යුත්තේ සැබෑ ප්‍රේම-
යකි.[8] එය පෙන්විය යුත්තේ කුහකක-
මින් තොරවය.[9] දුෂ්ට දේවල් පිළිකුල්
කරන්න.[10] අත් නැර යහපත් දේවලට
ඇලුම් වන්න.[11] **10** ඔබේ සහෝදර
ප්‍රේමයට[12] සාක්ෂියක් ලෙස එකිනෙ-
කාට ගැඹුරු ස්නේහය පෙන්වන්න.
එකිනෙකාට ගෞරවය පෙන්වීමේදී[13]
පෙරමුණ ගන්න. **11** දෙවිගේ බලය
ලබා උද්‍යෝගිමත් වන්න.[14] කම්-
මැළි නොවී[15] යෙහෝවා දෙවි වෙ-
නුවෙන් වෙහෙස මහන්සි වී වැඩ
කරන්න.[16] **12** ඔබට තිබෙන බලා-
පොරොත්තුව ගැන ප්‍රීති වන්න.[17]
පීඩා පැමිණෙන විට විඳදරාගන්න.[18]
නොකඩවාම යාච්ඤා කරන්න.[19]
**13** ශුද්ධ තැනැත්තන්ගේ අවශ්‍යතා
තේරුම්ගෙන ඔවුන් සමඟ ඒ අවශ්‍ය
දේවල් බෙදා හදා ගන්න.[20] නිත-
රම ආගන්තුක සත්කාරය පෙන්වී-
මට පුරුදු වන්න.[21] **14** ඔබට පීඩා
කරන්නන්ට නොකඩවාම දෙවිගේ
ආශීර්වාද ඉල්ලන්න.[22] ඔවුන්ට ශාප
නොකර[23] දිගටම දෙවිගේ ආශීර්-
වාද ඉල්ලන්න.[24] **15** ප්‍රීති වන අයත්
සමඟ ප්‍රීති වන්න.[25] හඬන අයත්
සමඟ හඬන්න. **16** තමන් ගැන
සිතන ආකාරයටම අනුන් ගැනත්

**21** 1පේතෘ 4:9; 3යොහ 8; **22** මතෙ 5:44; **23** යාකො 3:9; **24** ලූක් 6:28; 1කොරි 4:12; **25** ලූක් 1:58.

සිතන්න.[1] උඩඟු ලෙස නොසිතා[2]
නිහතමානීව ජීවත් වන්න.[3] ඔබ ඉතා
ඥානවන්තයි කියා නොසිතන්න.[4]
**17** කාටවත් නපුරට නපුර නො-
කරන්න.[5] සියලුදෙනාම යහපත්-
යයි සලකන දේවල්ම කරන්න.
**18** මිනිසුන් සමඟ සමාදානයෙන්
සිටීමට ඔබට පෞද්ගලිකව කළ
හැකි උපරිමය කරන්න.[6] **19** හිත-
වත් සහෝදරයෙනි, පළිගැනීමෙන්
වළකින්න.[7] ඒ වෙනුවට දෙවිට සෑම
දෙයක්ම භාර දී ඔහුට තම උද-
හස ප්‍රකාශ කිරීමට ඉඩ දෙන්න.[8]
මන්ද ලියවිලිවල සඳහන් ආකාර-
යට, “යුක්තිය ඉටු කිරීමේ අයිතිය
මා සතුය. දඬුවම් කරන්නේ මමය
කියා යෙහෝවා දෙවි පවසන්නේය.”[9]
**20** එහෙයින්, “ඔබේ සතුරා බඩගින්-
නෙන් සිටී නම් ඔහුට කන්න දෙන්න.
ඔහු පිපාසයෙන් සිටිනවා නම් ඔහුට
බොන්න යමක් දෙන්න.[10] යකඩ* මත
ගිනි අඟුරු ගොඩගසනවා හා සමානව
ඔහුගේ දැඩි සිත මොළොක් කිරීමට
ඔබට හැක.”[11] **21** නපුරු දේවලට
ඔබව පරාජය කරන්න ඉඩ නො-
දෙන්න. දිගටම යහපතින් නපුරු
දේවල් පරාජය කරන්න.[12]

**13** සියලුදෙනාම උසස් බලධා-
රීන්ට[13] යටත් විය යුතුයි.[14]
සියලුම බලතල[15] දෙවි සතු වන
නිසා[16] එම බලධාරීන්ට යම්
බලතල[17] ලබා දී තිබෙන්නේ දෙ-
විය.[18] **2** එහෙයින් යමෙක් බලධා-
රීන්ට විරුද්ධව ක්‍රියා කළොත්
ඔහු විරුද්ධ වන්නේ දෙවි පිහිටුවා
ඇති සැලැස්මටය. එසේ විරුද්ධ වන
අයට විනිශ්චයක් ලැබේ.[19] **3** ජන-
තාව සාමාන්‍යයෙන් පාලකයන්ට බිය
වෙති. එසේ බිය විය යුත්තේ යහපත්
දේවල් කරන අය නොව වැරදි දේවල්
කරන අයයි.[20] අධිකාරීන්ට බිය නොවී
සිටින්න ඔබ කැමතිද? එසේනම් දිග-
ටම යහපත් දේවල් කරන්න.[21] ඔබ
එසේ කළොත් ඔබ ඔවුන්ගේ පැසසු-

රෝම **12:20*** මූ.අ., “හිස.”

**12 පරි.**
**1** මතෙ 22:39; 1පේතෘ 3:8
**2** මාක් 10:42; ලූක් 22:24
**3** ලූක් 14:10; යොහ 13:14; එෆී 4:2; පිලි 2:3
**4** යෝබ් 37:24; හිතෝ 3:7; යාකො 3:13
**5** 1තෙස 5:15; 1පේතෘ 2:23; 1පේතෘ 3:9
**6** 2තිමෝ 2:24; හෙබ්‍රෙ 12:14; යාකො 3:18
**7** හෙබ්‍රෙ 10:30
**8** මතෙ 5:39
**9** ලෙවී 19:18; ද්වි 32:35; ගීතා 99:8; නාහු 1:2; හෙබ්‍රෙ 10:30
**10** හිතෝ 25:21
**11** හිතෝ 25:22
**12** නික් 23:4; මතෙ 5:44; ලූක් 6:27

**13 පරි.**
**13** 1පේතෘ 2:13
**14** තීත 3:1
**15** ලූක් 4:6; එළි 13:4
**16** යොහ 19:11
**17** මතෙ 22:21; ක්‍රියා 5:29; 1කොරි 11:3
**18** ද්වි 32:8; ක්‍රියා 17:26
**19** දේශ 8:4
**20** 1පේතෘ 2:14
**21** 1පේතෘ 3:13

**2 තීරුව**
**1** හෙබ්‍රෙ 13:21
**2** ගීතා 34:16
**3** යෙසා 10:5; යෙසා 45:1
**4** 1පේතෘ 2:19; 1පේතෘ 3:16
**5** රෝම 15:27
**6** මතෙ 22:21; මාක් 12:17; ලූක් 20:25
**7** හිතෝ 24:21
**8** 1පේතෘ 2:13; 1පේතෘ 2:17
**9** ගීතා 37:21
**10** කොලො 3:14; 1තිමෝ 1:5; 1යොහ 4:11
**11** ගලා 5:14; යාකො 2:8

මට ලක් වනු ඇත. **4** ඇත්තටම ඒ
අධිකාරීහු දෙවි වෙනුවෙන් වැදගත්
සේවයක් ඉටු කරති. ඒ ඔබේ යහපත
උදෙසාය.[1] කෙසේවෙතත් ඔබ වැරදි
දේවල් කරනවා නම්[2] ඔබ ඔවුන්ට බිය
විය යුතුයි. මන්ද දඬුවම් කිරීම සඳහා
බලතල* එම අධිකාරීන්ට දී තිබෙන්-
නේ හොඳ හේතු ඇතුවය. ඒ අනුව
වැරදි දේවල් කරන අයට විරුද්ධව
දෙවිගේ උදහස ප්‍රකාශ කිරීමට පත්
කර තිබෙන ඔවුහු,[3] දෙවි වෙනුවෙන්
වැදගත් සේවයක් ඉටු කරති.
**5** එහෙයින් ඔබ ඔවුන්ට අනිවාර්ය-
යෙන්ම යටත්ව සිටිය යුතුයි. එසේ
සිටිය යුත්තේ ඔවුන් දෙන දඬුව-
මට* ඔබ බිය වන නිසා පමණක්
නොව ඔබේ හෘදය සාක්ෂිය නිසාය.[4]
**6** ඔබ බදු ගෙවන්නෙත් ඒ නිසාය.
මන්ද එම බලධාරීහු තම රාජකා-
රිය ඉටු කරමින් මහජනයා සඳහා
දෙවි වෙනුවෙන් වටිනා සේවයක් ඉටු
කරති.[5] **7** සියලුදෙනාටම දිය යුතු
දේ දෙන්න. බදු දිය යුතු තැනැත්තාට
බදුද[6] වරිපනම් දිය යුතු තැනැත්-
තාට වරිපනම්ද දෙන්න. බිය විය
යුතු තැනැත්තාට බිය වන්න.[7] ගෞ-
රව කළ යුතු තැනැත්තාට ගෞරව
කරන්න.[8]
**8** කිසි කෙනෙකුට කිසි ලෙසකින්-
වත් ණය නොවන්න.[9] ඒ වෙනුවට
එකිනෙකාට ප්‍රේමය පෙන්වන්න. එය
ගෙවා නිම කළ නොහැකි ණයක්
හා සමානය.[10] මන්ද අනුන්ට ප්‍රේම
කරන තැනැත්තා නීතිය නිසි ලෙස
ඉටු කර ඇති බව පැවසිය හැක.[11]
**9** “අනාචාරයේ* නොහැසිරෙන්න.[12]
මිනී නොමරන්න.[13] සොරකම් නොක-
රන්න.[14] වෙනත් කෙනෙකු සතු දේට
තණ්හාවක් ඇති කර නොගන්න”[15]

**12** නික් 20:14; මලා 3:5; මතෙ 5:28; මතෙ 19:18; 1කොරි 6:9; **13** උත් 9:6; ද්වි 5:17; හිතෝ 6:17; **14** නික් 20:15; **15** නික් 20:17.

රෝම **13:4*** මූ.අ., “කඩුවක්.” **5*** මූ.අ., “ඔවුන්ගේ උදහසට.” **9*** මූ.අ., “පරදාර සේවනයේ.” මෙය භාවිත කරන්නේ විවාහක පුරුෂයෙකු හෝ ස්ත්‍රියක අනාචාරයේ යෙදීම විස්තර කිරීමටය.

යනාදි ආඥා සහ වෙනත් ආඥා ඇතු-
ළත් ඒ නීති මාලාවේ සඳහන් සියල්ල,
“ඔබට මෙන් ඔබේ අසල්වැසියාට
ප්‍රේම කරන්න”[1] යන වචන ස්වල්-
පය තුළ ගැබ් වී තිබේ. 10 ප්‍රේමය
පෙන්වන කෙනෙක්[2] තම අසල්වැ-
සියාට විරුද්ධව කිසි නපුරු දෙයක්
කරන්නේ නැත.[3] එහෙයින් නීතිය
නිසි ලෙස ඉටු කිරීමට ප්‍රේමය පෙන්-
වීම අත්‍යවශ්‍යය.[4]

11 අප සිටින්නේ කවර අන්දමේ
කාලයකද කියා ඔබ සියලුදෙනාම
දන්නවාට සැකයක් නැත. දැන් නිදි-
බර වීමට කාලයක් නොවේ. සියලු-
දෙනාම නින්දෙන් අවදි විය යුතුයි.[5]
මන්ද අප යේසුස්ව විශ්වාස කිරීමට
පටන්ගත් කාලයට වඩා දැන් අපි අප-
ගේ ගැලවීමට වඩාත් ළඟා වී සිටිමු.[6]
12 රාත්‍රිය බොහෝදුරට ගෙවී ගොස්
ඇත. අලුත් දිනක්[7] අත ළඟය.
එහෙයින් අන්ධකාරයට සම්බන්ධ
ක්‍රියා අපේ ජීවිතයෙන් බැහැර කර[8]
ආලෝකයේ ආයුධ පැළඳගනිමු.[9]
13 මිනිසුන් දිවා කාලයේදී හැසිරෙන
ආකාරයට අපිද විනීතව හැසිරෙමු.[10]
එහෙයින් සෝෂාකාරී උත්සව, බේබදු-
කම,[11] අනාචාරය, නින්දිත ක්‍රියා,[12]
අඬදබර[13] සහ ඊර්ෂ්‍යාව වැනි දේවලින්
ඈත් වී සිටිමු. 14 වැරදි ආශාවන්
තෘප්තිමත් කරගැනීමට කල්තියාම
සැලසුම් යොදනවා වෙනුවට[14] ඔබේ
මුළු හදවතින්ම ස්වාමීන් වන යේසුස්
ක්‍රිස්තුස්ගේ ගතිලක්ෂණ ආදර්ශයට
ගන්න.[15]

14 තමන් විශ්වාස කරන සත්‍ය
ඉගැන්වීම් ගැන එතරම්
පුළුල් අවබෝධයක් නැති කෙනෙ-
කුව[16] ප්‍රතික්ෂේප නොකරන්න. ඔහු-
ගේ සිතේ යම් ප්‍රශ්න මතු
වුණත්[17] ඔහුව විනිශ්චය නොකරන්න.
2 තමන් විශ්වාස කරන සත්‍ය ඉගැන්-
වීම් ගැන පුළුල් අවබෝධයක් ඇති
කෙනෙක් ඕනෑම දෙයක් කෑමට ගන්-
නවා විය හැකියි.[18] නමුත් එතරම්
පුළුල් අවබෝධයක් නැති කෙනෙකු
එළවළු පමණක් ආහාරයට ගන්-
නවා විය හැකියි. 3 ඕනෑම දෙ-
යක් ආහාරයට ගන්නා තැනැත්තා
එසේ නොකරන තැනැත්තාව හෙළා-
දැකීමෙන් වැළකී සිටිය යුතුයි.[1]
එලෙසම යම් දේවල් තෝරා බේරා
ආහාරයට ගන්නා තැනැත්තා සියලු
දේ ආහාරයට ගන්නා තැනැත්තාව
විනිශ්චය නොකළ යුතුයි. මන්ද දෙවි
ඒ තැනැත්තාව පිළිගෙන තිබේ.
4 ඔහුව විනිශ්චය කිරීමට ඔබ කවුද?[2]
ඔහු ඔබේ සේවකයෙකු නොව දෙවි-
ගේ සේවකයෙක්ය. ඔහුට තම අනු-
මැතිය ලබා දෙනවාද නැද්ද කියා
තීරණය කරන්නේ ඔහුගේ ස්වාමියා
වන දෙවිය.[3] ඇත්තෙන්ම ඔහුට දෙවි-
ගේ අනුමැතිය දිනාගත හැකියි. මන්ද
යෙහෝවා දෙවිගේ උපකාරය ඔහුට
තිබේ.[4]

5 ඇතැම්විට කෙනෙක් අන් සියලු
දවස්වලට වඩා එක දවසකට විශේෂ
වැදගත්කමක් දිය හැකියි.[5] තවත්
කෙනෙක් සියලුම දවස් එක හා සමා-
නව සලකනවා විය හැකියි.[6] නමුත්
සියලුදෙනාම තමන් කුමන දේ කළත්
සිතේ සැකයක් තබා නොගෙන එය
කළ යුතුයි. 6 යම් දවසකට විශේෂ
වැදගත්කමක් ලබා දෙන තැනැත්තා
එසේ කරන්නේ යෙහෝවා දෙවි වෙනු-
වෙනි. යමෙක් ආහාර ගන්නේ යෙ-
හෝවා දෙවිට ගෞරවය ලබා දීම
සඳහායි.[7] මන්ද ඒ අවස්ථාවේදී ඔහු
දෙවිට ස්තුති පුද කරයි.[8] අනික් අතට
යමෙක් ආහාර නොගෙන සිටින්නේ
යෙහෝවා දෙවිට ගෞරවය ලබා දීම
සඳහාය.[9] ඔහුද එවැනි අවස්ථාවලදී
දෙවිට ස්තුති පුද කරයි.[10] 7 ඇත්-
තෙන්ම අප කවුරුත් ජීවත් වන්නේ
අපගේම ගෞරවය උදෙසා නොවේ.[11]
කිසිවෙක් මිය යන්නේද තමාගේ
ගෞරවය උදෙසා නොවේ. 8 මන්ද
අප ජීවත් වන්නේ යෙහෝවා දෙ-
විගේ ගෞරවය උදෙසාය.[12] අපට
මිය යන්න සිදු වුණත් එසේ මිය
යන්නේ යෙහෝවා දෙවිගේ ගෞර-
වය උදෙසාය.[13] ඒ අනුව අප ජීවත්
වුණත් මිය ගියත් අප අයිති වන්නේ

13 පරි.
1 ලෙවී 19:18 මතෙ 19:19 මතෙ 22:39 ලූක් 10:36
2 1කොරි 13:4
3 ලූක් 6:31 2තිමෝ 2:24
4 මතෙ 22:40
5 ලූක් 21:36 1කොරි 15:34 1තෙස 5:6
6 යෙසා 56:1
7 එෆී 4:30
8 එෆී 5:11
9 2කොරි 6:7 එෆී 6:11 1තෙස 5:8
10 1පේතෘ 2:12
11 1පේතෘ 4:3
12 හිතෝ 21:27 එෆී 4:19
13 2කොරි 12:20 තීත 3:9
14 ගලා 5:16
15 1කොරි 11:1 ගලා 3:27 එෆී 4:24

14 පරි.
16 රෝම 15:1 1කොරි 8:11 1තෙස 5:14
17 1කොරි 8:7
18 උත් 9:3

2 තීරුව
1 කොලො 2:16
2 මතෙ 7:1 යාකො 4:12
3 1කොරි 4:4
4 යෙරෙ 35:19
5 ගලා 4:10
6 කොලො 2:16
7 ගීතා 92:1
8 මතෙ 15:36 1තිමෝ 4:4
9 ලෙවී 11:8 යෙරෙ 36:9
10 1කොරි 10:31
11 1කොරි 6:19
12 ගීතා 146:2 ගලා 2:19 1පේතෘ 4:2
13 එස්ත 4:16 ගීතා 116:15

යෙහෝවා දෙවිටයි.[1] **9** මන්ද ක්‍රිස්-
තුස් මිය ගියෙන් නැවත ජීවත්
වුණේත්[2] මිය ගිය අය[3] හා ජීවතුන්[4]
කෙරෙහි අධිපතිකම් කරන ස්වාමීන්
වීම සඳහාය.
**10** නමුත් ඔබේ සහෝදරයාව ඔබ
විනිශ්චය කරන්නේ මන්ද?[5] ඔබ ඔබේ
සහෝදරයාව පහත් කර සලකන්නේ
මන්ද? යම් දිනක අපි සියලුදෙනාම
දෙවිගේ විනිශ්චයාසනය[6] ඉදිරියේ
පෙනී සිටිනු ඇත. **11** ලියවිලිවල
සඳහන් වී ඇති ආකාරයට, "'සියලු
ජනයා මා ඉදිරියෙහි දණ නමන බවත්
සියලු ජනයා මාව දෙවි ලෙස එකහෙ-
ළාම පිළිගන්නා බවත්[7] ජීවමාන දෙවි
වන මම සහතිකවම පවසන්නෙමි'
කියා යෙහෝවා දෙවි කියන්නේය."[8]
**12** එහෙයින් අප කරන කියන දේවල්
ගැන අප සියලුදෙනාවම දෙවි විසින්
විනිශ්චය කරනු ලැබේ.[9]
**13** එමනිසා අපි තවදුරටත් එකි-
නෙකාව විනිශ්චය කිරීමෙන් වැළකී
සිටිමු.[10] එලෙසම වරදක් කිරීමට
සහෝදරයෙකුව[11] පෙලඹීමට*[12] හෝ
ඔහුව නොමඟ යැවීමට හෝ හේතු
වන කිසි දෙයක් නොකිරීමට අදි-
ටන් කරගනිමු.[13] **14** කිසිම දෙයක්
අපවිත්‍ර නොවන බව ස්වාමීන් වන
යේසුස්ගේ අනුගාමිකයෙකු ලෙස මම
ඉතා පැහැදිලිව තේරුම්ගෙන සිටිමි.[14]
යම් දෙයක් අපවිත්‍ර වන්නේ යම් කෙ-
නෙකු එය අපවිත්‍රයි කියා සැලකු-
වොත් පමණි.[15] **15** එහෙයින් ඔබ
කෑමට ගන්නා දෙය ඔබේ සහෝ-
දරයාට ප්‍රශ්නයක් නම් ඔබ ප්‍රේම-
යෙන් ක්‍රියා කරනවා කියා පැවසිය
නොහැක.[16] ක්‍රිස්තුස් ඔහු වෙනුවෙන්ද
මිය ගිය නිසා ඔබ කෑමට ගන්නා
දෙයින් ඔහු තුළ කලකිරීමක් ඇති
නොකරන්න.*[17] **16** ඔබ කරන දේ
වරදක් නොවුණත් යමෙකු ඒ ගැන
අගුණ කියන්න ඉඩ තිබෙන නිසා ඒ
දේ නොකරන්න. **17** මන්ද දෙවිගේ
රාජ්‍යයට[1] ඇතුල් වීමට නම් වැදගත්
වන්නේ ඔබ කන බොන දේ නොවේ.[2]
වඩාත් වැදගත් වන්නේ දෙවිගේ බලය
ඔබ තුළ ක්‍රියාත්මක වීමට ඉඩහැර
ධර්මිෂ්ඨකමින්,[3] සමාදානයෙන්[4] සහ
ප්‍රීතියෙන්[5] ක්‍රියා කිරීමය. **18** මන්ද
ක්‍රිස්තුස්ගේ දාසයෙකු ලෙස එසේ
ක්‍රියා කරන තැනැත්තෙකුට දෙවිගේ
අනුමැතිය ලැබෙන අතර ඔහු මිනි-
සුන්ගේ ප්‍රසාදයද දිනාගන්නේය.[6]
**19** ඒ අනුව සමාදානයට දායක
වන දේවල්ද[7] එකිනෙකාව ගොඩනං-
වන දේවල්ද[8] කිරීමට අපි දැඩි උත්-
සාහයක් දරමු. **20** තවදුරටත් කෑම
ටිකක් නිසා දෙවි ගොඩනඟා ඇති
දේවල් කඩා බිඳ නොදමන්න.[9] සෑම
දෙයක්ම පවිත්‍ර බව සැබෑය. නමුත්
කෙනෙක් කෑමට ගන්නා දෙයක් නිසා
තවත් කෙනෙක් නොමඟ යයි නම්
එය සුදුසු දෙයක් නොවේ.[10] **21** මස්
කෑමෙන් හෝ වයින් බීමෙන් හෝ වෙ-
නත් ඕනෑම දෙයක් කිරීමෙන් හෝ
ඔබේ සහෝදරයා තුළ තිබෙන විශ්-
වාසයට යම් හානියක් සිදු වේ නම්
එයින් වැළකී සිටීම වඩාත් හොඳය.[11]
**22** ඔබ ගොඩනඟා ගෙන තිබෙන
විශ්වාසයට අනුව ඔබ ගන්නා තීරණ
ඔබ හා දෙවි අතර තිබෙන දෙයක්
බව මතක තබාගන්න.[12] ඒ අනුව
යමෙක් යම් දෙයක් කිරීමට තීරණය
කර එය කළ පසු ඒ ගැන ඔහුගේ
සිත ඔහුට දොස් කියන්නේ නැත්නම්
ඔහුට ඒ ගැන සතුටු විය හැකියි.
**23** නමුත් ඔහු යම් සැකයකින් යමක්
කෑමට ගත්තොත් ඔහු වරදකරුවෙක්
බවට පත් වෙයි.[13] එසේ වන්නේ ඔහු
තමන් ගොඩනඟා ගෙන තිබූ විශ්වාස-
යට එය බලපාන අයුරු ගැන නො-
තකා ඒ කෑම ආහාරයට ගත් නිසාය.
ඇත්තෙන්ම තම විශ්වාසයට බලපායි
කියා නොතකා කරන සෑම දෙයක්ම
වරදක් ලෙස සැලකිය යුතුයි.[14]

**15** නමුත් සත්‍ය ඉගැන්වීම් ගැන
පුළුල් අවබෝධයක් ඇති අප
එතරම් පුළුල් අවබෝධයක් නැති

**14 පරි.**
1 1තෙස 4:14
2 යොහ 12:24
3 1තෙස 5:10; එළි 1:18
4 ක්‍රියා 10:36
5 ලූක් 6:37; රෝම 14:4
6 ක්‍රියා 10:42; ක්‍රියා 17:31; 2කොරි 5:10
7 යෙසා 45:23
8 යෙසා 49:18
9 දේශ 12:14; මතෙ 12:36; 2කොරි 5:10; 1පේත 4:5
10 මතෙ 7:1
11 1යොහ 2:10
12 මතෙ 17:27; මතෙ 18:6; 1කොරි 8:9; 1කොරි 10:32
13 පිලි 1:10
14 මතෙ 15:11; ක්‍රියා 10:15; 1තිමෝ 4:4
15 තීත 1:15
16 එෆී 5:2
17 1කොරි 8:11

**2 තීරුව**
1 මතෙ 6:33; ලූක් 17:20
2 1කොරි 8:8
3 2පේත 3:13
4 යොහ 14:27
5 මතෙ 25:21
6 2කොරි 8:21
7 මතෙ 5:9; රෝම 12:18
8 1කොරි 14:12; හෙබ්‍රෙ 10:24
9 රෝම 14:3; 1කොරි 8:11
10 1කොරි 8:9
11 රෝම 14:13; 1කොරි 8:13; 1කොරි 10:24
12 1කොරි 10:23
13 තීත 1:15
14 යාකො 4:17

---

**රෝම 14:13*** මූ.අ., "සහෝදරයෙකුට පය පැකිළී වැටීමට." **15*** එසේ කිරීම ඔහුගේ විශ්වාසයට හෝ සදාකාල ජීවිතයට බලපෑ හැක.

අයට තම දුර්වලකම්වලින් ගොඩ
ඒමට උපකාර කළ යුතුයි.[1] එහිදී අප-
ගේම සතුට ගැන සිතීම සුදුසු නැත.[2]
**2** අප සියලුදෙනාගේ උත්සාහය විය
යුත්තේ අපගේ අසල්වැසියාව සතුටු
කිරීමයි. ඒ සඳහා ඔහුගේ යහපත
ගැන සිතමින් ඔහුව ගොඩනැංවීමට
කටයුතු කරමු.[3] **3** ක්‍රිස්තුස් පවා
තමාගේම සතුට ගැන සිතුවේ නැත.[4]
ඔහු ගැන ලියවිලිවල සඳහන් වන්නේ
මෙසේය. “ඔබට නින්දා කළ අයගේ
නින්දා අපහාස මා පිට පැමිණියේය.”[5]
**4** අතීතයේ ශුද්ධ ලියවිලිවල එසේ
ලියා තිබෙන[6] සෑම දෙයකින්ම අපට
යමක් ඉගෙනගත හැක.[7] එමගින් අපි
විඳදරාගැනීමට ඉගෙනගනිමු.[8] එලෙ-
සම ශුද්ධ ලියවිල්ලෙන් සැනසිල්ලද[9]
අද්දකින්නෙමු. ඒ දේවල් බලාපො-
රොත්තුවක් ඇතුව සිටීමට අපට
උපකාරවත් වෙයි.[10] **5** ඔබට විඳ-
දරාගැනීමට උපකාරයත් සැනසිල්-
ලත් ලබා දෙන්නේ දෙවිය. එසේම
ක්‍රිස්තුස් යේසුස්ට තිබූ ආකල්පයම[11]
ඔබ තුළත් ඇති කරගැනීමට දෙවි
ඔබට උපකාර කරන බව මට විශ්වා-
සයි. **6** ඒ නිසා ඔබ සියලුදෙනාටම
එක්සත්ව[12] එක හඬින් අපගේ ස්වා-
මීන් වන යේසුස් ක්‍රිස්තුස්ගේ පියාණන්
මෙන්ම දෙවිද වන තැනැත්තාණන්ට
ප්‍රශංසාව සහ ගෞරවය ලබා දීමට
හැකි වනු ඇත.

**7** එහෙයින් ක්‍රිස්තුස් අපව පිළිගත්
ලෙසම[13] එකිනෙකාව පිළිගන්න.[14]
එසේ කිරීමෙන් දෙවිට ගෞරව-
යක් ගෙන දීමට ඔබට හැකි වේ.
**8** ඇත්තෙන්ම ක්‍රිස්තුස් චර්මච්ඡේ-
දනය වූ අය[15] වෙනුවෙන් වැදගත්
සේවයක් ඉටු කළේය.[16] ඔහු පැමිණි-
යේ දෙවි සත්‍යය කතා කරන කෙ-
නෙක් බව ඔප්පු කිරීමටත්[17] දෙවි
ඔවුන්ගේ මුතුන්මිත්තන්ට දුන් පො-
රොන්දු ඉටු වන බව තහවුරු කිරීම-
ටත්ය.[18] **9** එසේම වෙනත් ජාතීන්ට
අයත් මිනිසුන්[19] වෙනුවෙන්ද ඔහු සේ-
වයක් ඉටු කළේය. දෙවි ඔවුන්ට
එලෙස පෙන්වූ දයාව නිසා දෙ-

**15 පරි.**
**1** රෝම 14:1
ගලා 6:1
ගලා 6:2
1තෙස 5:14
**2** 1කොරි 10:24
**3** 1කොරි 9:22
පිලි 2:4
**4** මාක් 10:45
යොහ 5:30
ගලා 1:4
**5** ගීතා 69:9
**6** රෝම 4:23
1කොරි 10:11
**7** 2තිමෝ 3:16
2පේතෘ 1:19
**8** රෝම 5:4
**9** ගීතා 119:50
**10** 1කොරි 9:10
හෙබ්‍රෙ 3:6
1පේතෘ 1:10
**11** පිලි 2:5
**12** 1කොරි 1:10
2කොරි 13:11
පිලි 2:2
1පේතෘ 3:8
**13** යොහ 6:37
**14** පිලෙ 17
**15** මතෙ 15:24
යොහ 1:11
**16** මතෙ 20:28
**17** මීකා 7:20
**18** උත් 22:18
ගීතා 89:3
**19** රෝම 3:29

**2 තීරුව**
**1** රෝම 9:23
**2** 2සාමු 22:50
ගීතා 18:49
**3** ද්වි 32:43
**4** ගීතා 117:1
**5** යෙසා 11:1
එළි 5:5
**6** උත් 49:10
**7** යෙසා 11:10
මතෙ 12:21
**8** යෙසා 40:31
හෙබ්‍රෙ 6:11
**9** 1කොරි 8:7
පිලි 1:9
2පේතෘ 1:12
1යොහ 2:21
**10** 2තෙස 3:15
**11** 2පේතෘ 1:13
**12** රෝම 12:3
ගලා 1:15
එෆී 3:7
**13** රෝම 11:13
ගලා 2:7
ගලා 2:8
**14** මතෙ 4:23
මාක් 1:1
ක්‍රියා 20:24
එෆී 6:15
එළි 14:6
**15** 2කොරි 3:3

විට ප්‍රශංසාව හා ගෞරවය ලබා
දීමට ඔවුන්ටද අවස්ථාවක් උදා විය.[1]
ඔවුන් ගැන ලියවිලිවල සඳහන් දෙ-
යින් එය ඔප්පු වේ. “ජාතීන් ඉදිරියේ
මම ඔබව පිළිගන්නෙමි. ඔබේ නාම-
යට ප්‍රශංසා ගී ගයන්නෙමි”[2] කියාත්,
**10** තවත් අවස්ථාවක, “ජනයෙනි,
දෙවිගේ සෙනඟ සමඟ ප්‍රීති වන්න”[3]
කියාත් දෙවි පවසයි. **11** එහි මෙ-
ලෙසද සඳහන් වේ. “සියලු ජාතීන්ට
අයත් ජනයෙනි, යෙහෝවා දෙවිට
ප්‍රශංසා කරන්න. සියලු ජනයෙනි,
ඔහුව පැසසුමට ලක් කරන්න.”[4]
**12** මීට අමතරව යෙසායා පවසන්-
නේ මෙයයි. “යෙස්සේගේ පෙළපතින්
පැමිණෙන ‘මුල’[5] ජාතීන්ව පාල-
නය කිරීමට නැඟිටින්නේය.[6] ජාතීන්
බලාපොරොත්තු තබන්නේ ඔහු කෙ-
රෙහිය.”[7] **13** එහෙයින් මගේ ආශාව
නම් ඔබ ප්‍රීතියෙන් හා සමාදාන-
යෙන් පිරී සිටිනවා දැකීමය. ඒ සඳහා
ඔබට බලාපොරොත්තුවක් දෙන දෙවි
කෙරෙහි විශ්වාසය තැබීම අවශ්‍යය.
එවිට දෙවිගේ බලය ඔබ තුළ ප්‍රබලව
ක්‍රියාත්මක වන නිසා ඔබේ බලාපො-
රොත්තුව ගැන ස්ථිර විශ්වාසයකින්
සිටීමට ඔබට පුළුවන.[8]

**14** මාගේ සහෝදරයෙනි, ඔබ
ප්‍රමාණවත් දැනුමක් ලබා ඇති නිසා[9]
ඔබ සැබවින්ම යහපත් අය* බව
මට විශ්වාසයි. එහෙයින් එකිනෙ-
කාට උපදෙස් හා අවවාද ලබා දීමට
ඔබට පුළුවන.[10] **15** කෙසේවෙතත්
ඇතැම් කාරණා ගැන ඔබට සෘජුවම
සඳහන් කිරීමට මා සිතුවේ ඔබට සිහි-
ගැන්වීමක් ලෙසය.[11] මා එසේ කරන්-
නේ දෙවි මට පෙන්වා ඇති මහත්
කරුණාව නිසාය.[12] **16** මට ඒ කරු-
ණාව ලැබුණේ ක්‍රිස්තුස් යේසුස්ගේ
ප්‍රසිද්ධ සේවකයෙකු ලෙස සියලු
ජාතීන්ට[13] දෙවිගේ ශුභාරංචිය ප්‍රකාශ
කිරීමේ ශුද්ධ කාර්යය ඉටු කිරීම සඳ-
හාය.[14] එසේ කිරීමෙන් ඒ ජාතීන් දෙ-
විගේ බලයෙන් පවිත්‍ර කරනු ලැබූ[15]

රෝම **15:14*** එනම්, යහපත්කමින් පිරී සිටින අය.

ඔහුට පිළිගත හැකි[1] ත්‍යාගයක්[2] බවට
පත් විය හැකියි.
**17** එහෙයින් දෙවි වෙනුවෙන් මා
ඉටු කර ඇති සේවය දෙස බලන
විට[3] ක්‍රිස්තුස් යේසුස්ගේ අනුගාමික-
යෙකු ලෙස සතුටු වීමට මට පුළුවන.[4]
**18** මන්ද ක්‍රිස්තුස් මාව යොදාගෙන
වෙනත් ජාතීන්ට දෙවිට කීකරු වීම
සඳහා[5] උපකාර කළේය.[6] මෙහිදී
මා කතා කරන්නේ එම කාර්යයට
සම්බන්ධ දේවල් ගැන පමණි. ඊට
මා පැවසූ දේවල්ද[7] මා කළ දේවල්ද,
**19** මා සිදු කළ බලවත් ක්‍රියා හා
ආශ්චර්යයන්ද[8] දෙවිගේ බලයේ ප්‍රබල
ක්‍රියාකාරිත්වයද දායක විය. එහෙයින්
යෙරුසලමේ සිට ඉලිරිකම දක්වා
මුළු ප්‍රදේශය පුරාම[9] ක්‍රිස්තුස් ගැන
ශුභාරංචිය අත් නැර දේශනා කරන්න
මට හැකියාව ලැබිණ.[10] **20** වෙනත්
කෙනෙකු දැමූ අත්තිවාරමක් මත
ගොඩනැඟීම මගේ අරමුණ නොවූ
නිසා[11] ක්‍රිස්තුස් ගැන මේ වන විටත්
අසා ඇති ප්‍රදේශවල මා ශුභාරංචිය දේ-
ශනා කළේ නැත. **21** ඒ ගැන ලිය-
විලිවල මෙසේ සඳහන් වී තිබේ. “ඔහු
ගැන කිසිදු ආරංචියක් නොලැබූ අය
ඔහුව දකින්නෝය. අසා නැති අය
අසා තේරුම්ගන්නෝය.”[12]
**22** අවස්ථා කිහිපයකදීම මට
ඔබව හමු වීමට ආශාව තිබුණත් එසේ
කිරීමට නොහැකි වුණේ ඒ නිසාය.[13]
**23** නමුත් දැන් මා සේවය කරන
ප්‍රදේශවල ශුභාරංචිය දේශනා නො-
කළ පළාතක් නැති තරම්ය. මා
අවුරුදු කිහිපයක් පුරා ඔබව හමු
වීමට මහත් ආශාවකින් සිටින නිසා,[14]
**24** මා අදහස් කරන්නේ ස්පාඤ්ඤය
බලා යන ගමනේදී[15] ඇවිත් ඔබව
හමු වීමටය. මා ඔබ සමඟ සතු-
ටින් යම් කාලයක් ගත කර නැවත
යන විට ඔබ යම් දුරක් මාව ඇර-
ලවීමට[16] පැමිණෙයි කියා බලාපො-
රොත්තු වෙමි. **25** නමුත් මා දැන්
සූදානමින් සිටින්නේ යෙරුසලම බලා
පිටත් වී එහි සිටින ශුද්ධ තැනැත්-
තන්ට යම් උපකාර ලබා දීමටය.[17]

**26** ඇත්තෙන්ම මැසිඩෝනියාවේ සහ
ඇකේයා පළාතේ[1] සිටින අය තමන්
සතු දේවලින් යමක් සම්මාදම් ලෙස[2]
යෙරුසලමෙහි ශුද්ධ තැනැත්තන්
අතරෙහි සිටින අඟහිඟකම් ඇති අයට
ලබා දීමට කැමති වූහ. **27** ඔවුන්
එසේ කළේ මහත් සතුටකිනි. ඇත්-
තෙන්ම වෙනත් ජාතීන්ට අයත් ඔවුන්
යෙරුසලමේ සිටින අයට යම් ආකා-
රයකින් ණයගැතිය. මන්ද වෙනත්
ජාතීන්ට දෙවිගෙන් ආශීර්වාද ලැබු-
ණේ ඔවුන් නිසාය.[3] ඒ නිසා ඔවුන්ගේ
දෛනික අවශ්‍යතා සඳහා යමක් ලබා
දීම ඇත්තෙන්ම සුදුසුය.[4] **28** එහෙ-
යින් මා අදහස් කරන්නේ ඔවුන්
වෙනුවෙන් සම්මාදම් ලෙස ලැබුණු
දේ[5] ඔවුන්ට ලබා දී මා ඉටු කළ
යුතු කාර්යය නිම කිරීමටය. ඉන්පසු
ඇවිත් ඔබව හමු වීමට මට පුළුවන.
ඔබව හමු වී පසුව මම ස්පාඤ්ඤය
බලා යන්නෙමි.[6] **29** මගේ පැමිණීම
තුළින් ක්‍රිස්තුස්ගෙන් බොහෝ ආශීර්-
වාද ලැබීමට ඔබට හැකි වන බව මට
නිසැකයි.[7]
**30** සහෝදරයෙනි, අපගේ ස්වා-
මීන් වන යේසුස් ක්‍රිස්තුස් කෙරෙහි
ඔබ තුළ තිබෙන විශ්වාසයද දෙවිගේ
බලයේ ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක්
ලෙස ඔබ තුළ ඇති වී තිබෙන ප්‍රේම-
යද[8] මතක් කරමින් මා ඔබෙන් ඉල්ලා
සිටින්නේ මා වෙනුවෙන් යාච්ඤා කිරී-
මට වෑයම් කරන ලෙසය.[9] මන්ද
මමද එසේ යාච්ඤා කරමින් සිටිමි.
**31** දෙවිට සේවය නොකරන යුදයෙහි
සිටින අයගෙන් මාව බේරාගැනීම සඳ-
හාත්[10] මා කරන උපකාර සතුටින්
භාරගැනීමට[11] යෙරුසලමෙහි[12] සිටින
ශුද්ධ තැනැත්තන්ව පොළඹවන්න
කියාත් යාච්ඤා කරන්න. **32** ඔබව
හමු වීම දෙවිගේ කැමැත්ත නම්
එම ප්‍රීතිය අද්දැකීමට මට අවස්ථා-
වක් ලැබේ. ඒ අවස්ථාව ඔබ සැම-
ටත් මටත් ඉමහත් දිරිගැන්වීමක්[13] හා
ප්‍රීතියක් වෙනවාට සැකයක් නැත.
**33** සමාදානය ලබා දෙන දෙවි ඔබ
සියලුදෙනා සමඟ වේවා![14] ආමෙන්.

**15 පරි.**
1 රෝම 12:1
2 පිලි 2:17
3 හෙබ්‍රෙ 2:17 හෙබ්‍රෙ 5:1
4 පිලි 3:3
5 රෝම 16:26
6 මතෙ 28:20 2කොරි 3:5
7 1කොරි 2:4 2කොරි 13:3
8 ක්‍රියා 15:12 2කොරි 12:12
9 මතෙ 10:23
10 ක්‍රියා 21:19 2කොරි 10:13
11 2කොරි 10:15
12 යෙසා 52:15
13 රෝම 1:13
14 ක්‍රියා 19:21
15 රෝම 15:28
16 ක්‍රියා 15:3 1කොරි 16:6
17 ක්‍රියා 11:29 ක්‍රියා 19:21 ක්‍රියා 20:22 ක්‍රියා 24:17

**2 තීරුව**
1 2කොරි 9:2
2 1කොරි 16:1 2කොරි 8:4 2කොරි 9:12
3 රෝම 11:12
4 1කොරි 9:11 1කොරි 9:14 ගලා 6:6 හෙබ්‍රෙ 13:16
5 පිලි 4:17
6 රෝම 15:24
7 රෝම 1:11
8 පිලි 2:1
9 2කොරි 1:11 එෆී 6:18 කොලො 4:3 1තෙස 5:25
10 2තෙස 3:2
11 2කොරි 8:4
12 රෝම 15:26
13 1කොරි 16:18
14 මාක් 5:34 ලූක් 1:79 1කොරි 14:33 පිලි 4:9 1තෙස 5:23 හෙබ්‍රෙ 13:20

**16** සෙන්ක්‍රෙයාය නුවරෙහි
තිබෙන සභාවේ[1] සේවය
කරන[2] අපගේ සහෝදරි ෆීබිව
ඔබට හඳුන්වා දෙන්න කැමැත්තෙමි.
**2** ස්වාමීන්ගේ අනුගාමිකයෙකු වන
ඇයව ශුද්ධ තැනැත්තන්ට ඔබින
ආකාරයකින් සාදරයෙන් පිළිගන්න.[3]
ඇයට යම් අවශ්‍යතා ඇත්නම් ඒවා
ඉටු කර දෙන්න.[4] ඇත්තෙන්ම ඇය
බොහෝ සහෝදරයන්ටත් මටත් විවි-
ධාකාරවලින් උපකාර සපයා ඇත.

**3** ක්‍රිස්තුස් යේසුස්ගේ අනුගාමික-
යන් වන මගේ හවුල් සේවකයන්[5]
වන ප්‍රිස්කා සහ අකිලාට[6] මගේ සුබ
පැතුම් දෙන්න. **4** ඔවුහු මා වෙනු-
වෙන් බොහෝ අනතුරුවලට මුහුණ
දී ඇත.[7] ඇත්තෙන්ම මා පමණක්
නොව විවිධ ජාතීන්ට අයත් සභා
බොහොමයක් ඔවුන්ට ස්තුතිවන්ත
වෙති.[8] **5** ඔවුන්ගේ නිවසෙහි රැස්
වන සභාවේ සියලුදෙනාටද මා සුබ
පතන බව පවසන්න.[9] එමෙන්ම
ආසියා පළාතේ මුලින්ම[10] ක්‍රිස්තුස්ගේ
අනුගාමිකයන් බවට පත් වූ අයගෙන්
කෙනෙකු වන මගේ හිතවත් එපිනෙ-
ටස්ට සුබ පතන්න. **6** ඔබ වෙනු-
වෙන් බොහෝ වෙහෙස මහන්සි වී
වැඩ කළ මරියාටද මා සුබ පතන
බව පවසන්න. **7** මගේ නෑදෑයන්[11]
සහ මගේ හවුල් සිරකරුවන්ව සිටි[12]
අන්ද්‍රොනිකස් සහ ජූනියස්ටද සුබ
පතන්න. යේසුස්ගේ නියෝජිතයන්*
අතර හොඳ නමක් දිනාගෙන ඇති
ඔවුහු, මටත් වඩා වැඩි කාලයක් ක්‍රිස්-
තුස්ගේ අනුගාමිකයන් ලෙස[13] සේවය
කර ඇත.

**8** ස්වාමීන්ගේ අනුගාමිකයෙකු
වන මගේ හිතවත් අම්ප්ලියාටස්ට මා
සුබ පතන බව පවසන්න.[14] **9** ක්‍රිස්-
තුස්ගේ අනුගාමිකයෙකු වන අප-
ගේ හවුල් සේවක උර්බානස්ටද මගේ
හිතවත් ස්ටාකිස්ටද, **10** ක්‍රිස්තුස්-
ගේ අනුගාමිකයෙකු ලෙස අනුමැ-
තිය ලබා ඇති අපෙල්ලස්ටද මා
සුබ පතන බව පවසන්න.[1] අරිස්-
තොබියුලස්ගේ නිවසේ සිටින සියලු-
දෙනාටද, **11** මගේ නෑදෑයෙකු[2] වන
හෙරෝදියන්ටද නාසිසස්ගේ නිවසේ
සිටින ස්වාමීන්ගේ අනුගාමිකයන්ටද[3]
මගේ සුබ පැතුම් දෙන්න. **12** ස්වා-
මීන්ගේ අනුගාමිකයන් ලෙස බොහෝ
වෙහෙස මහන්සි වී සේවය කරන
ස්ත්‍රීන් වන ත්‍රිෆේනා සහ ත්‍රිෆෝසා-
ටද සුබ පතන්න. අපට ඉතා හිත-
වත් පර්සිස්ටද මගේ සුබ පැතුම්
දෙන්න. ඇය ස්වාමීන්ගේ අනුගාමික-
යෙකු ලෙස බොහෝ වෙහෙස මහන්සි
වී සේවය කර ඇත. **13** ස්වාමීන්
වෙනුවෙන් ඉතා විශිෂ්ට සේවයක් පිරි-
නමන රූෆස්ටද මගේම මව මෙන්
මා සලකන ඔහුගේ මවටද මගේ සුබ
පැතුම් දෙන්න. **14** අසින්ක්‍රිටස්ටද
ප්ලේගොන්ටද හර්මීස්ටද පත්‍රොබස්-
ටද හර්මස්ටද ඔවුන් සමඟ සිටින
සහෝදරයන්ටද මගේ සුබ පැතුම්
දෙන්න. **15** පිලොලගස් සහ ජූලි-
යාටද නේරියස් හා ඔහුගේ සහෝද-
රියටද ඔලිම්පස්ටද ඔවුන් සමඟ
සිටින ශුද්ධ තැනැත්තන් සියලුදෙ-
නාටද[4] මගේ සුබ පැතුම් දෙන්න.
**16** සහෝදර සෙනෙහසකින් එකිනෙ-
කාව සිඹගනිමින්[5] එකිනෙකාට සුබ
පතන්න. ක්‍රිස්තුස්ගේ සියලුම සභා
ඔබට සුබ පතති.

**17** සහෝදරයෙනි, ඔබට යම් දෙ-
යක් ගැන උනන්දු කිරීමට කැමැත්-
තෙමි. එනම් ඔබේ සහෝදරයන්
අතරේ භේද පතුරුවන අය ගැනත්[6]
ඔබ ඉගෙනගත් දේවලට පටහැනි
දේවල් පතුරුවමින් අන් අයගේ විශ්වා-
සයට හානියක් සිදු කරන අය ගැනත්[7]
සෝදිසියෙන් සිටින්න. එපමණක්ද
නොව ඔවුන් සමඟ ඇසුරු කිරීමෙන්
වළකින්න.[8] **18** එවැනි අය අපගේ
ස්වාමීන් වන ක්‍රිස්තුස්ගේ දාසයෝ
නොවෙති. ඔවුන් වහල් වී සිටින්නේ
තමන්ගේම ආශාවන්ටය.[9] එහෙයින්
ඔවුහු කනට මිහිරි වචන[10] හා චාටු
බස් දොඩමින්[11] අහිංසක අයව නො-
මඟ යවති. **19** ඔබේ කීකරුකම

---

රෝම **16:7*** හෝ, “යවනු ලැබූවන්.”

**16 පරි.**
1 ක්‍රියා 18:18
2 මතෙ 27:55 ලූක් 8:3 ක්‍රියා 2:18
3 පිලි 2:29 3යොහ 8
4 රෝම 12:13 1යොහ 3:17
5 1කොරි 3:9 කොලො 4:11
6 ක්‍රියා 18:2 ක්‍රියා 18:26 1කොරි 16:19 2තිමෝ 4:19
7 1යොහ 3:16
8 එෆී 5:20
9 1කොරි 16:19 කොලො 4:15 පිලෙ 2
10 1කොරි 16:15
11 රෝම 9:3 රෝම 16:11
12 කොලො 4:10
13 යොහ 17:21 පිලි 1:1
14 2තිමෝ 4:19

**2 තීරුව**
1 කොලො 4:15
2 රෝම 9:3
3 එෆී 6:21 කොලො 4:7
4 1කොරි 16:19
5 1කොරි 16:20 2කොරි 13:12 1තෙස 5:26 1පේතෘ 5:14
6 යූද් 19
7 මතෙ 7:15 රෝම 6:17
8 2තෙස 3:6 2තෙස 3:14 තීත 3:10 2යොහ 10
9 පිලි 3:19 යූද් 12
10 2පේතෘ 2:3 යූද් 16
11 කොලො 2:4 තීත 1:10

සියලුදෙනා අතරේ ප්‍රසිද්ධ වී ඇත.[1]
මා ඔබ ගැන ප්‍රීතියෙන් සිටින්නේ ඒ
නිසාය. කෙසේවෙතත් ඔබ යහපත්
දේවල නිරත වෙමින් ඥානවන්තව
කටයුතු කළ යුතුයි.[2] එලෙසම නපුරු
දේවලට හවුල් නොවන[3] නිර්දෝෂ අය
විය යුතුයි.[4] **20** තව ටික කලකින්
සමාදානය ලබා දෙන දෙවි[5] සාතන්ව
ඔබේ පාද යට දමා පොඩි කරන්-
නේය.[6] අපගේ ස්වාමීන් වන යේ-
සුස් ක්‍රිස්තුස්ගේ මහත් කරුණාව ඔබ
සැමට ලැබේවා![7]
**21** මගේ හවුල් සේවක තිමෝ-
තිද මගේ නෑදෑයන්[8] වන ලූෂස්ද ජේ-
සන්ද සොසිපතර්ද යන අය ඔබට සුබ
පතති.
**22** මේ ලිපිය ලිවීමෙන් සහාය වූ
ටර්තියස් වන මමද ඔබට මගේ ක්‍රිස්-
තියානි සුබ පැතුම් එවන්නෙමි.
**23** මට නවාතැන් පහසුකම් ලබා
දෙන, මුළු සභාවට රැස් වෙන්න
තැනක් ලබා දෙන ගායස්ද[9] ඔබට සුබ
පතන්නේය. නගරයේ[1] භාණ්ඩාගාරික
එරස්ටස්ද ඔහුගේ සහෝදර ක්වාටස්ද
ඔබට සුබ පතති. **24** ——
**25** මා ප්‍රකාශ කරන ශුභාරංචිය
තුළින් ඔබව ස්ථිර කළ හැක්-
කේ දෙවිටයි.[2] ඒ ශුභාරංචිය යේසුස්
ක්‍රිස්තුස් ගැන දේශනා කළ දෙ-
යට සම්බන්ධ වේ. එළිදරව් කරනු
ලබන පරිශුද්ධ රහස[3] එයයි. දෙවි
බොහෝ කාලයක් පුරා එය සඟවා
තැබුවේය. **26** නමුත් ශුද්ධ ලියවිල්-
ලෙහි සඳහන් අනාවැකි තුළින් ඒ
රහස සියලු ජාතීන්ට අනාවරණය කර
තිබේ.[4] සදහටම වාසය කරන දෙවි-
ගේ ආඥාවට එකඟව ඒ දේවල් එලෙස
අනාවරණය කළේ විශ්වාසයක් පෙන්-
වමින් දෙවිට කීකරු වීමට ඔවුන්ට
උපකාර කිරීම සඳහාය.[5] **27** ප්‍රඥා-
වෙන් ක්‍රියා කරන එකම තැනැත්තා-
ණන්[6] වන දෙවිට යේසුස් ක්‍රිස්තුස්[7]
තුළින් සදහටම ප්‍රශංසාවත් ගෞරව-
යත්[8] ලැබේවා! ආමෙන්.

**16 පරි.**
**1** රෝම 1:8
**2** කොලො 1:9
**3** යෙරෙ 4:22
1කොරි 14:20
**4** මතෙ 10:16
**5** රෝම 15:33
**6** උත් 3:15
හෙබ්‍රෙ 2:14
**7** 1කොරි 16:23
එළි 22:21
**8** රෝම 9:3
රෝම 16:7
**9** 1කොරි 1:14

**2 තීරුව**
**1** ක්‍රියා 19:35
**2** එෆී 3:20
යූද් 24
**3** එෆී 1:9
එෆී 3:9
කොලො 1:26
**4** 2තිමෝ 1:10
**5** ක්‍රියා 6:7
තීත 1:3
**6** රෝම 11:33
**7** හෙබ්‍රෙ 13:21
**8** ගලා 1:5

# කොරින්තිවරුන්ට
## ලියූ පළමුවෙනි ලිපිය

**1** මෙම ලිපිය ඔබට ලියන්නේ දෙ-
විගේ කැමැත්තට අනුව[1] යේසුස්
ක්‍රිස්තුස්ගේ නියෝජිතයෙකු*[2] ලෙස
කැඳවනු ලැබූ පාවුල් වන මමය.
මා සමඟ අපගේ සහෝදර සොස්-
තනේස්ද[3] සිටියි. **2** කොරින්තියේ[4]
තිබෙන දෙවිගේ සභාව වන ඔබට
මා ලියන්නේ මෙයයි. ක්‍රිස්තුස් යේ-
සුස් සමඟ එකට බැඳී සිටින ඔබ
සියලුදෙනාම ශුද්ධය.*[5] එහෙයින් අප-
ගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්-
ගේ නාමයෙන්[6] කන්නලව් කරන
සැම තැනකම වෙසෙන සියලුදෙනාව
මෙන්ම ඔබවත් ශුද්ධ තැනැත්තන්
ලෙස කැඳවා ඇත.[1] යේසුස් ඔවුන්ගේ
මෙන්ම අපගෙත් ස්වාමීන්ය.[2]
**3** අපගේ පියාණන් වන දෙවිගෙන්ද
ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්ගෙන්ද[3]
මහත් කරුණාවත්[4] සමාදානයත්[5]
ඔබට ලැබේවා!
**4** ක්‍රිස්තුස් යේසුස් තුළින්[6] දෙවි
ඔබට මහත් කරුණාවක් පෙන්වා
ඇති නිසා[7] ඒ ගැන මම නිතරම දෙ-
විට ස්තුති කරමි. **5** මන්ද යේසුස්
සමඟ එකට බැඳී සිටින ඔබට දෙවි
බොහෝ සෙයින් ආශීර්වාද කර ඇත.[8]

**1 පරි.**
**1** 2කොරි 1:1
කොලො 1:1
**2** ක්‍රියා 9:15
රෝම 1:1
1තිමෝ 2:7
**3** ක්‍රියා 18:17
**4** ක්‍රියා 18:1
**5** යොහ 17:19
1කොරි 6:11
හෙබ්‍රෙ 2:11
හෙබ්‍රෙ 9:14
**6** මතෙ 12:21
ක්‍රියා 4:12

**2 තීරුව**
**1** ආනි 7:27
1පේතෘ 1:15
**2** රෝම 3:22
එෆී 4:5

**3** 2පේතෘ 1:2; **4** තීත 2:11; **5** ගණන් 6:26; පිලි 4:7; **6** එෆී 1:7; එෆී 2:7; **7** යොහ 1:17; **8** 2කොරි 8:9; එෆී 3:19.

**1කොරි 1:1*** හෝ, "යවනු ලැබුවෙකු." **2*** හෝ, "දෙවි සඳහා වෙන් කර ඇති අයයි."

එහෙයින් දෙවිගේ පණිවිඩය ප්‍රකාශ
කිරීමට ඔබට හොඳ හැකියාවක් ලැබී
ඇති අතර ඔබ දැනුමෙන්ද පූර්ණ වී
ඇත.[1] **6** ඉන් පැහැදිලි වන්නේ ක්‍රිස්-
තුස් පිළිබඳ සාක්ෂිය[2] ඔබට හොඳින්ම
කාවැදී ඇති බවය. **7** එමනිසා අප-
ගේ ස්වාමීන් වන යේසුස් එළිදරව්
වන කාලය පැමිණෙන තුරු මහත්
ආශාවකින් බලා සිටින ඔබට,[3] කිසිම
දීමනාවකින් අඩුවක් අද්දකින්න සිදු
වන්නේ නැත.[4] **8** ඊට අමතරව අව-
සානය දක්වාම ස්ථිරව සිටීමට[5] දෙවි
ඔබට උපකාර කරනු ඇත. එයින් අප-
ගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්-
ගේ[6] දවසේදී[7] නිදොස්ව සිටීමට[8] ඔබට
හැකි වෙයි. **9** තම පුත්‍රයාද අපගේ
ස්වාමීන්ද වන යේසුස් ක්‍රිස්තුස් සමඟ
හවුල්කරුවන් වීමේ ප්‍රස්තාව[9] භුක්ති
විඳීම සඳහා ඔබව කැඳවූ දෙවි, තමන්
පැවසූ දේ ඒ අයුරින්ම ඉටු කරන විශ්-
වාසවන්ත දෙවි කෙනෙකි.[10]
**10** සහෝදරයෙනි, අපගේ ස්වා-
මීන් වන යේසුස් ක්‍රිස්තුස්ගේ
නාමයෙන්[11] ඔබෙන් යමක් ඉල්ලී-
මට කැමැත්තෙමි.[12] එනම් ඔබ පව-
සන දේවල් අතර එකඟතාවක් තිබිය
යුතු බවයි.[13] ඔබ අතර කිසි භේද-
යක් නොතිබිය යුතුයි.[14] ඔබ සිය-
ලුදෙනා අතර පූර්ණ එකමුතුකමක්
තිබිය යුතුයි. එසේ කළ හැක්කේ
එක හා සමාන ආකල්ප දැරීමෙන් හා
එක හා සමාන ආකාරයකින් කල්පනා
කිරීමට පුරුදු වීමෙනි.[15] **11** මගේ
සහෝදරයෙනි, මා ඒ දේ ඔබට පැවසු-
වේ ඔබ ගැන යමක් මට ආරංචි වී
ඇති නිසාය.[16] ඔබ අතර ආරවුල් සහ
මතභේද ඇති බව ක්ලෝයිගේ පවු-
ලේ අය මට දන්වා ඇත. **12** එනම්
සමහරුන්, "මා පාවුල්ගේ පැත්තේ"
කියාත් තවත් සමහරුන්, "මා අපො-
ලොස්ගේ පැත්තේ"[17] කියාත් වෙ-
නත් අය, "මා සීෆස්ගේ පැත්තේ"
කියාත් නැතහොත්, "මා ක්‍රිස්තුස්ගේ
පැත්තේ" කියාත් පවසන බව මට
ආරංචි විය. **13** එයින් පැහැදිලි වන්-
නේ ඔබ ක්‍රිස්තුස්ව කණ්ඩායම්වලට
බෙදාගෙන ඇති බවය.[1] ඔබ වෙනු-
වෙන් වධකණුවේ මිය ගියේ පාවුල්ද?
ඔබ බව්තීස්ම වුණේ[2] පාවුල්ගේ අනු-
ගාමිකයන් වීමටද? **14** ක්‍රිස්පස්[3] හා
ගායස්ව[4] හැර මම ඔබ අතරේ සිටින
වෙන කිසිවෙකුවත් බව්තීස්ම නොක-
ළෙමි. ඒ ගැන මම දෙවිට ස්තුතිවන්ත
වෙමි. **15** එහෙයින් මා බව්තීස්ම
වූයේ පාවුල්ගේ අනුගාමිකයෙකු වීමට
කියා කිසිවෙකුට පැවසිය නොහැක.
**16** මා ස්තෙෆනස්ගේ නිවසේ සිටින
අයව[5] බව්තීස්ම කළ බවද මට දැන්
මතක් වේ. නමුත් ඔවුන් හැර මා
වෙන කිසිවෙකුව බව්තීස්ම කළාද
කියා මට මතක නැත. **17** ක්‍රිස්තුස්
මාව යැව්වේ[6] බව්තීස්ම කිරීමට නොව
ශුභාරංචිය ප්‍රකාශ කිරීමටය. මා ශුභා-
රංචිය ප්‍රකාශ කළේ උගතුන්ගේ තර්ක
විතර්ක යොදාගෙන නොවේ.[7] එසේ
කළා නම් ක්‍රිස්තුස් වධකණුවක මරනු
ලැබූ බවට වූ කාරණය නිෂ්ඵල දෙයක්
ලෙස පෙනෙනු ඇත.
**18** මන්ද විනාශයට සුදුසු අය[8]
ක්‍රිස්තුස්ව වධකණුවක මරනු ලැබූ
බවට වූ පණිවිඩය සලකන්නේ
මෝඩ දෙයක් ලෙසය.[9] නමුත් ගැල-
වීම ලබන අපට[10] නම් ඒ පණි-
විඩය තුළින් දෙවිගේ බලය ප්‍රකාශ
වේ.[11] **19** ලියවිලිවල සඳහන් ආකා-
රයට, "මම ප්‍රඥාවන්තයන්ගේ ප්‍රඥාව
නැති කර දමන්නෙමි.[12] බුද්ධිම-
තුන්ගේ[13] බුද්ධිය පහ කරන්නෙමි"[14]
කියා දෙවි පවසා ඇත. **20** එසේ-
නම් ප්‍රඥාවන්තයන්, නීතිය පිටපත්
කරන්නන්,[15] මේ සමාජයේ[16] සිටින
වාදවිවාදවලට දක්ෂයන්[17] වැනි අය-
ගෙන් ඇති ප්‍රයෝජනය කුමක්ද? මේ
ලෝකයේ ප්‍රඥාව මෝඩකමක් බව
දෙවි ඔප්පු කර පෙන්වූයේ නැද්ද?[18]
**21** මේ ලෝකයේ ජනයා තම ප්‍රඥාව
මත රඳා සිටින නිසා[19] ඔවුහු දෙ-
විව දැන හඳුනා ගෙන නැත.[20] එහෙ-
යින් ලෝකයේ ජනයාට මෝඩ දෙයක්
ලෙස පෙනෙන[21] පණිවිඩයක් දේශනා
කර එය විශ්වාස කරන අයව පමණක්
බේරාගැනීම සුදුසු බව දෙවි තීරණය

**1 පරි.**
1 කොලො 1:9
2 ක්‍රියා 18:5; 2තිමෝ 1:8
3 ලූක් 17:30; 2තෙස 1:7; 1පේතෘ 1:7
4 හෙබ්‍රෙ 6:4
5 රෝම 14:4; 1තෙස 3:13; 2තෙස 3:3
6 1තෙස 5:23
7 1කොරි 4:5; 1කොරි 5:5; එළි 1:10
8 කොලො 1:22
9 යොහ 17:21; 1යොහ 1:3
10 ද්වි 7:9; යෙසා 49:7
11 2කොරි 13:10
12 2තෙස 3:6
13 2කොරි 13:11; පිලි 2:2
14 රෝම 16:17; එෆී 4:3
15 රෝම 15:5; 2කොරි 13:11
16 ලෙවී 5:1; 1කොරි 5:1
17 ක්‍රියා 18:24; 1කොරි 3:4; 1කොරි 3:21

**2 තීරුව**
1 එෆී 4:5
2 ක්‍රියා 2:38
3 ක්‍රියා 18:8
4 රෝම 16:23
5 1කොරි 16:15
6 ක්‍රියා 9:15
7 1කොරි 2:1
8 1යොහ 2:17
9 ක්‍රියා 17:18; 1කොරි 2:14
10 1කොරි 15:2
11 රෝම 1:16
12 ගීතා 33:10; 1කොරි 3:19
13 යෙරෙ 8:9; 1තිමෝ 6:20
14 යෙසා 29:14
15 යෙසා 33:18
16 එෆී 2:2
17 ක්‍රියා 17:18
18 යෝබ් 12:17; රෝම 1:22
19 කොලො 2:8
20 මතෙ 11:25; ලූක් 10:21
21 ක්‍රියා 17:19; 1කොරි 2:14; 1කොරි 3:18

කළේය. අප දෙවිගේ ප්‍රඥාව දකින්නේ
එලෙසය.
**22** යුදෙව්වරුන් ඉල්ලා සිටින්නේ
ඔවුන්ට ආශ්චර්යයන් පෙන්වන්න[1]
කියාය. ග්‍රීකවරුන් පවසන්නේ ඔවුන්ට
ප්‍රඥාව අවශ්‍යයි[2] කියාය. **23** නමුත්
අප දේශනා කරන්නේ වධකණුවක
ඇණ ගසා මරනු ලැබූ ක්‍රිස්තුස්
ගැනයි.[3] යුදෙව්වරු ඒ ගැන කෝප වී
එය පිළි නොගනිති.[4] වෙනත් ජාතීන්
එය සලකන්නේ මෝඩකමක් ලෙ-
සය.[5] **24** නමුත් යම් තැනැත්තෙක්
යුදෙව්වෙක් වුවත් ග්‍රීකයෙක් වුවත්
ඔහු දෙවි විසින් කැඳවනු ලැබූ කෙ-
නෙක් නම් දෙවිට තිබෙන බලය[6]
හා ප්‍රඥාව[7] ක්‍රිස්තුස් තුළින් ප්‍රකාශ
වන බව ඔහු විශ්වාස කරන්නේය.
**25** මන්ද දෙවි යොදාගන්නා අයව
මිනිසුන්ට මෝඩ අය ලෙස පෙනු-
ණත් මිනිසුන් ප්‍රඥාවන්තයි කියා සල-
කන අයට වඩා ඔවුන් ප්‍රඥාවන්තය.
එලෙසම දෙවි යොදාගන්නා දුර්වල
අය මිනිසුන් ශක්තිමත් ලෙස සලකන
අයට වඩා ශක්තිමත්ය.[8]
**26** සහෝදරයෙනි, මිනිසුන්[9] ප්‍රඥා-
වන්තයන් ලෙස සලකන බොහෝ-
දෙනෙකුවත්[10] ඉහළ තනතුරුවල
වැජඹෙන බොහෝදෙනෙකුවත්[11]
සමාජයේ ඉහළ පැළැන්තිවල සිටින
බොහෝදෙනෙකුවත් දෙවි කැඳවා
නැති බව ඔබ දෙස බැලීමෙන්ම
පැහැදිලි වේ. **27** ඒ වෙනුවට දෙවි
තෝරාගත්තේ මේ ලෝකයේ මිනි-
සුන් මෝඩයන් ලෙස සලකන අය-
වය.[12] එසේ කළේ ප්‍රඥාවන්තයන්ව
ලැජ්ජාවට පත් කිරීම සඳහාය. එසේම
දෙවි මේ ලෝකයේ මිනිසුන් දුර්ව-
ලයි කියා සලකන අයව තෝරාගත්-
තේ බලවත් අයව ලැජ්ජාවට පත්
කිරීම සඳහාය.[13] **28** ඊට අමතරව
මේ ලෝකයේ එතරම් වැදගත්කමක්
නැති අයවත් මිනිසුන් හෙළාදකින
අයවත් කිසිම පිළිගැනීමක් නැති අය-
වත් දෙවි තෝරාගත්තේය.[14] එසේ
කළේ මිනිසුන් වැදගත් ලෙස සල-
කන දේවල් නිෂ්ඵල දේවල් බව පෙන්-
වීම සඳහාය.[1] **29** දෙවි එසේ කළ
නිසා කිසි මිනිසෙකුට දෙවි ඉදි-
රියේ තමා ගැන පුරසාරම් දෙඩී-
මට හේතුවක් නැත.[2] **30** ඔබ
ක්‍රිස්තුස් යේසුස් සමඟ එකට බැඳී
සිටින්නේ දෙවි නිසාය. එසේම දෙවි-
ගෙන් ලැබෙන ප්‍රඥාවට මහත්[3] ධර්-
මිෂ්ඨ වීමට මහත්[4] ක්‍රිස්තුස්ය. අප
ශුද්ධ අය* වන්නෙත්[5] ඔහු නිසාය. ඊට
අමතරව අප නිදහස ලබා සිටින්-
නේ ඔහු අප වෙනුවෙන් ගෙවූ වන්දිය
නිසාය.[6] **31** එසේ වූයේ, "ආඩම්බර-
යෙන් කතා කරන තැනැත්තා යෙ-
හෝවා දෙවි ගැන ආඩම්බරයෙන්
කතා කළ යුතුයි"[7] කියා ලියවිල්ලෙහි
සඳහන් වී ඇති දේ ඉටු වීම සඳහාය.

**2** සහෝදරයෙනි, දෙවිගේ පරිශුද්ධ
රහස[8] ගැන ඔබට කියා
දෙන්න මා මුලින් පැමිණි අවස්ථා-
වේදී මම ඔබේ සිත් දිනාගැනීමට උග-
තුන් මෙන් නුහුරු නුපුරුදු භාෂාවක්[9]
භාවිත කළේ නැත. මම උගතෙකු
ලෙස පෙනී සිටින්න උත්සාහ කළෙත්
නැත. **2** මම ඔබට යේසුස් ක්‍රිස්තුස්
ගැනත්[10] ඔහු අප වෙනුවෙන් වධකණු-
වක මිය ගිය ආකාරය ගැනත් මිස
වෙන කිසිවක් ගැන කතා නොක-
ළෙමි. **3** ඇත්තෙන්ම මා ඔබ වෙ-
නට පැමිණි විට මා තුළ චකිතයක්
මෙන්ම බියක්ද තිබිණ.[11] **4** එහෙ-
යින් මා ඔබට කතා කළ විටත්
දේශනා කළ විටත් මගේ උගත්-
කම යොදාගෙන කිසිම දෙයක් ඔප්පු
කරන්න උත්සාහ කළේ නැත. ඒ වෙ-
නුවට මම දෙවිගේ බලය ඔබ තුළ
ප්‍රබලව ක්‍රියාත්මක වීම සඳහා අඩි-
තාලමක් දැමුවෙමි.[12] **5** ප්‍රතිඵලයක්
ලෙස ඔබ තුළ විශ්වාසයක් ඇති වූයේ
මිනිසුන්ගේ ප්‍රඥාව මත පදනම් වූ
තර්කවලින් නොව[13] දෙවිගේ බලය
ඔබ තුළ ක්‍රියාත්මක වූ නිසාය.[14]
**6** අප අවබෝධයෙන් ක්‍රියා කරන
අය සමඟ සිටින විට ගැඹුරු දේවල්

**1 පරි.**
1 මතෙ 12:38 ලූක් 11:29
2 ක්‍රියා 17:18
3 1කොරි 2:2
4 යෙසා 8:14
5 ක්‍රියා 17:32
6 මාක් 13:26
7 1කොරි 1:30 කොලො 2:3
8 2කොරි 13:4
9 රෝම 8:30
10 ක්‍රියා 4:13
11 යොහ 7:48 යාකො 2:5
12 ලූක් 16:8
13 මතෙ 11:25
14 රෝම 4:17

**2 තීරුව**
1 1කොරි 2:6
2 රෝම 3:27 1කොරි 4:7
3 යෙරෙ 23:5 එළි 5:12
4 රෝම 10:4 2කොරි 5:21
5 යොහ 17:19 හෙබ්‍රෙ 10:10
6 රෝම 3:24 කොලො 1:14
7 යෙරෙ 9:24 2කොරි 10:17

**2 පරි.**
8 එෆී 3:5 කොලො 2:2
9 1කොරි 1:17 2කොරි 10:10 2කොරි 11:6
10 ගලා 6:14 පිලි 3:8
11 2කොරි 10:1 ගලා 4:13
12 රෝම 15:19 1කොරි 4:20 1තෙස 1:5 2පේත 1:16
13 එෆී 1:17
14 2කොරි 4:7 2කොරි 6:7

**1කොරි 1:30*** හෝ, "දෙවි සඳහා වෙන් කර ඇති අය."

ගැන කතා නොකරනවාම නොවේ.[1]
නමුත් අප කතා කරන්නේ ළඟදීම
විනාශ වී යන[2] මේ සමාජය ගැන-
වත් එහි පාලකයන් ගැනවත්[3] වැදගත්
කියා සලකන ගැඹුරු දේවල් ගැනවත්
නොවෙයි.[4] **7** ඒ වෙනුවට අප කතා
කරන්නේ මේ සමාජය තුළ සිටින
බොහෝදෙනාගෙන් සඟවා ඇති දෙවි-
ගෙන් ලැබී ඇති ප්‍රඥාව ගැනයි. එය
පරිශුද්ධ රහසකි.[5] තේජසට පත් වීමට
බලාපොරොත්තුවෙන් සිටින අප වෙ-
නුවෙන් දෙවි ඒ දේවල් වෙන් කර
තැබුවේ මිනිස් සමාජයක් බිහි වීමටත්
පෙර සිටය.[6] **8** දෙවිගෙන් ලැබූ මේ
ප්‍රඥාව මේ සමාජයේ සිටින එක පාල-
කයෙකුටවත්[7] ලැබී නැත.[8] ඔවුන්ට
එය ලැබී තිබුණා නම් ඔවුන් අප-
ගේ තේජවත් ස්වාමීන්ව වධකණුවක
ඇණ ගසා මරා දමයිද?[9] **9** ශුද්ධ
ලියවිල්ලෙහි මෙවැනි දෙයක් සඳ-
හන් වී තිබෙන්නේ ඒ නිසාය. “දෙවි
තමන් ප්‍රේම කරන අය වෙනුවෙන්
සූදානම් කර ඇති දේවල් ගැන සිතන්-
නවත් කිසි කෙනෙකුට බැරිය. කිසිම
කෙනෙක් එවැනි දෙයක් ඇසුවේවත්
දුටුවේවත් නැත.”[10] **10** නමුත් දෙවි
තම බලය අපට ලබා දීමෙන්[11] ඒ
දේවල් අපට හෙළි කර ඇත.[12] ඔහුගේ
බලය[13] අපගේ සිත් තුළ ක්‍රියාත්මක
වන නිසා අපට දෙවි එළිදරව් කරන
ගැඹුරු කාරණා පවා[14] තේරුම්ගැනී-
මට හැකි වී තිබේ.

**11** පුද්ගලයෙක් කල්පනා කරන
දේ ඒ පුද්ගලයාගේ සිත* තුළ තිබෙ-
නවා[15] මිස ඒ ගැන වෙනත් කිසි-
වෙක් නොදනියි. දෙවි කල්පනා කරන
දේ සම්බන්ධයෙන්ද එය එසේමය.
එහෙයින් දෙවි කල්පනා කරන දේ-
වල්ද ඔහු කිරීමට අදහස් කරන
දේවල්ද දැනගත හැක්කේ දෙවිගේ
බලයෙන් පමණි.[16] **12** අප මේ ලෝ-
කයේ සිටින අයගේ බලපෑමට හසු
නොවී[17] දෙවිගේ බලය ලබා ඇති
නිසා[1] දෙවි ඉතා කාරුණිකව ඒ දේවල්
අපට එළිදරව් කර ඇත. දෙවි අප
වෙනුවෙන් සූදානම් කර ඇති දේවල්
අපට පැහැදිලිව අවබෝධ වී ඇත්තේ
ඒ නිසාමය.[2] **13** අප ඒ දේවල් දැන-
ගත්තේ අපගේම නුවණින්වත් යම්
මිනිසෙකු ඒවා ගැන අපට කියා දුන්
නිසාවත් නොවේ.[3] අප ඒ දේවල් අව-
බෝධ කරගත්තේ දෙවිගේ බලයේ
ක්‍රියාකාරිත්වය තුළින්ය.[4] ඒ දේවල්
අන් අයට පැහැදිලි කර දීමටද දෙවිගේ
බලය අපට උපකාර කරයි.[5]

**14** දෙවිගේ බලයේ උපකාරය
ඇතුව අවබෝධ කරගත හැකි දේවල්
තේරුම්ගැනීමට තම ආශාවන්ට හසු
වී සිටින කෙනෙකුට නොහැක. ඔහු ඒ
දේවල් දකින්නේ මෝඩ දේවල් ලෙ-
සය. ඒ දේවල් තේරුම්ගැනීමට දෙවි-
ගේ මහ පෙන්වීම අවශ්‍යය. නමුත්
ඔහුට ඒ මහ පෙන්වීම් නොමැති නිසා
ඒ දේවල වටිනාකම අවබෝධ කරගැ-
නීමද ඔහුට නොහැක.[6] **15** නමුත්
දෙවිගේ මහ පෙන්වීමට යටත් වන
පුද්ගලයා[7] එම ගැඹුරු දේවල් තේ-
රුම්ගනියි. කිසි මිනිසෙකුට ඒ පුද්ග-
ලයාව විනිශ්චය කළ නොහැකිය.[8]
**16** ඇත්තෙන්ම, “යෙහෝවා දෙවිගේ
මනස තේරුම්ගෙන[9] ඔහුට උගන්-
වන්න තරම් හැකියාවක් ඇති කෙ-
නෙක් සිටියිද?”[10] කෙසේවෙතත් අපට
ක්‍රිස්තුස්ගේ මනස[11] ගැන අවබෝධ-
යක් තිබේ.

**3** නමුත් සහෝදරයෙනි, ඔබ
ඔබේම ආශාවන්ට වහල්ව සිටි
නිසා දෙවිගේ මහ පෙන්වීම් ලබා-
ගැනීමට ආශාවෙන් සිටින අය සේ[12]
සලකා ඔබට කතා කරන්න මට
නොහැකි විය. ඔබ ක්‍රිස්තුස්ව අනුග-
මනය කළත් ඔබ හැසිරුණේ කුඩා
දරුවන් ලෙසයි.[13] **2** එහෙයින් ගන
ආහාර දිරවන්නේ නැති නිසා[14] මා
ඔබට ලබා දුන්නේ ගන ආහාර නොව
කිරිය. දැනුත් ගන ආහාර දිරවිය හැකි
තත්වයක ඔබ සිටින බව පැවසිය
නොහැක.[15] **3** මන්ද ඔබ තවමත්
සිටින්නේ ඔබේම පව්කාර ආශාවන්ට

**2 පරි.**
**1** 1කොරි 14:20
එෆී 4:13
හෙබ්‍රෙ 5:14
**2** 1කොරි 15:24
**3** මතෙ 20:25
**4** 1කොරි 3:20
2කොරි 1:12
1තිමෝ 6:20
**5** උත් 3:15
රෝම 16:25
එෆී 3:9
**6** කොලො 1:26
**7** යොහ 7:48
ක්‍රියා 13:27
**8** 1කොරි 1:18
2කොරි 3:14
**9** ක්‍රියා 4:10
ක්‍රියා 5:30
**10** යෙසා 64:4
**11** යොහ 14:26
1යොහ 2:27
**12** ද්වි 29:29
මතෙ 16:17
මාක් 4:11
එෆී 3:5
2තිමෝ 1:10
1පේත 1:12
**13** රෝම 8:26
**14** යෝබ් 11:7
රෝම 11:33
එෆී 3:18
**15** රෝම 1:9
රෝම 8:16
**16** යොහ 14:17
රෝම 8:27
**17** 1යොහ 4:3
1යොහ 5:19
එළි 16:14

**2 නිරුව**
**1** යොහ 15:26
**2** 1යොහ 4:6
**3** කොලො 2:8
1තිමෝ 6:20
2පේත 1:16
**4** යොහ 16:13
**5** හිතෝ 1:23
යොහ 6:63
**6** මතෙ 16:23
**7** රෝම 8:5
**8** 1කොරි 4:3
**9** රෝම 11:34
**10** යෙසා 40:13
**11** රෝම 15:5
පිලි 2:5

**3 පරි.**
**12** මතෙ 5:3
1කොරි 2:15
කොලො 1:9
යූද් 19
**13** 1කොරි 14:20
**14** හෙබ්‍රෙ 5:12
හෙබ්‍රෙ 5:14
**15** හෙබ්‍රෙ 5:13

**1කොරි 2:11*** ග්‍රීක බසින්, නියුමා. උපග්‍ර. 3 බලන්න.

වහල්වය.[1] ඔබ අතරේ ඊර්ෂ්‍යාව හා
අඬදබර ඇත.[2] එහෙයින් ඔබ ඔබේම
ආශාවන්ට වහල් වී සිටිනවා නො-
වේද? ඔබ හැසිරෙන්නේ මේ සමා-
ජයේ මිනිසුන් හැසිරෙන ආකාරයට
නොවේද?[3] **4** එක් කෙනෙක්, “මා
පාවුල්ගේ පැත්තේ” කියාත් තවත්
කෙනෙක්, “මා අපොලොස්ගේ පැත්-
තේ”[4] කියාත් පවසයි. එවැනි දේවල්
පැවසීමෙන් ඔබ පෙන්වන්නේ ඔබත්
මේ සමාජයේ මිනිසුන් හා සමානව
හැසිරෙනවා කියා නොවේද?

**5** ඇත්තටම අපොලොස් කවුද?[5]
පාවුල් කවුද? ඔවුන් ස්වාමීන් පැවරූ
සේවය ඉටු කරන සේවකයන් පමණි.[6]
ඔබ යේසුස්ගේ අනුගාමිකයන් වූයේ
ඔවුන් කළ ඒ සේවය නිසාය. **6** බීජ
පැළ කළේ මමය.[7] ඊට වතුර වත්
කළේ අපොලොස්ය.[8] නමුත් එය වර්-
ධනය වුණේ දෙවි නිසාය.[9] **7** එහෙ-
යින් ගෞරවය හිමි විය යුත්තේ
බීජ පැළ කළ තැනැත්තාටවත් ඊට
වතුර වත් කළ තැනැත්තාටවත්
නොව[10] වර්ධනය දුන් තැනැත්තා
වන දෙවිටය.[11] **8** ඇත්තෙන්ම බීජ
පැළ කරන තැනැත්තාත් ඊට
වතුර වත් කරන තැනැත්තාත් වැඩ
කරන්නේ එකම අරමුණක් සඳහාය.[12]
නමුත් ඔවුන්ට ප්‍රතිඵල ලැබෙන්නේ
එකිනෙකා දැරූ වෙහෙසට අනුවය.[13]
**9** අප දෙවිගේ හවුල් වැඩකරුවන්[14]
වන නිසා ඔබ සියලුදෙනා දෙවි විසින්
වගා කරනු ලබන ඔහුගේ කෙත[15] සහ
දෙවි විසින් ඉදි කරනු ලබන ඔහුගේ
ගොඩනැඟිල්ලය.[16]

**10** දෙවි මට පෙන්වූ මහත් කරු-
ණාව නිසා[17] ගොඩනැඟීමේ කට-
යුතු භාරව සිටින නුවණැති කෙනෙකු
ලෙස අත්තිවාරම දැමුවේ මමය.[18] ඒ
මත ගොඩනැඟුවේ තවත් කෙනෙකි.
යමෙක් එම අත්තිවාරම මත ගොඩ-
නැඟීම සිදු කරන විට එය සිදු කරන
ආකාරය ගැන ඔහු කල්පනාකාරී
විය යුතුයි.[19] **11** දමා තිබෙන අත්-
තිවාරම හැර වෙන කිසි අත්තිවාර-
මක් දැමීමට කිසිවෙකුට නුපුළුවන.[20]
ඒ අත්තිවාරම නම් යේසුස් ක්‍රිස්-
තුස්ය.[1] **12** කෙනෙක් එම අත්තිවා-
රම මත ගොඩනැඟීම සඳහා රන් හෝ
රිදී හෝ මැණික්ද තවත් කෙනෙක්
ලී හෝ පිදුරු හෝ ඉපනැලිද භාවිත
කළ හැක. **13** කෙසේවෙතත් විවිධ
පීඩා හා පරීක්ෂාවලට මුහුණ දීමට සිදු
වන විට එක් එක් පුද්ගලයා ගොඩ-
නැඟූ ආකාරය කෙසේද කියා පැහැදිලි
වේ. එය හොඳින්ම පැහැදිලි වන්-
නේ පීඩා නමැති ගින්න මාර්ගයෙනි.[2]
එම ගින්න තුළින් සියලුදෙනා ගොඩ-
නැඟූ දේ කොතරම් ශක්තිමත්ද කියා
හෙළි වනු ඇත. **14** යමෙක් ගොඩ-
නැඟූ දේට කිසි හානියක් සිදු නො-
වේ නම්[3] ඔහුට ත්‍යාගයක් ලැබේ.[4]
**15** නමුත් යමෙකු ගොඩනැඟූ දේ
පිලිස්සී ගියොත් ඔහුට අලාභ විඳින්න
සිදු වේ. කෙසේවෙතත් ඒ දේ ගොඩ-
නැඟූ තැනැත්තාව ගලවනු ලැබේ.[5]
නමුත් ඔහු ගින්නකින් ඉතා අමාරු-
වෙන් තම ජීවිතය පමණක් ගලවාගත්
කෙනෙකු හා සමාන වනු ඇත.[6]

**16** ඔබ සියලුදෙනා දෙවිගේ මාලි-
ගාව බවත්[7] දෙවිගේ බලය ඔබ තුළ
ක්‍රියාත්මක වන බවත් ඔබ දැන
සිටියේ නැද්ද?[8] **17** යමෙකු දෙවිගේ
මාලිගාව විනාශ කරනවා නම් දෙවි
ඔහුවද විනාශ කරනු ඇත.[9] මන්ද
දෙවිගේ මාලිගාව ශුද්ධය.[10] ඒ මාලි-
ගාව[11] සෑදී තිබෙන්නේ ඔබ සියලුදෙ-
නාගෙන්ය.[12]

**18** කිසි කෙනෙකු තමාව රවටා
නොගත යුතුයි. මන්ද තමාට මේ
සමාජයේ තැනක් තිබෙන නිසා තමා
ප්‍රඥාවන්තයෙකු කියා ඔබෙන් කෙ-
නෙක් සිතාගෙන සිටිනවා නම්[13]
ඔහුට වැරදී ඇත. සැබෑ ප්‍රඥාවන්ත-
යෙකු වීමට ඔහු මේ සමාජය ඉදිරි-
යේ මෝඩයෙකු විය යුතුයි.[14]
**19** මන්ද මේ ලෝකයේ තිබෙන
ප්‍රඥාව දෙවි සලකන්නේ මෝඩකමක්
ලෙසය.[15] ලියවිලිවල සඳහන් ආකාර-
යට, “දෙවි කපටි උපා යොදන ප්‍රඥා-
වන්තයන්ව ඔවුන් ඇටවූ උගුලටම
ඇද දමයි.”[16] **20** එලෙසම, “ප්‍රඥා-

**3 පරි.**

1 රෝම 8:7 ගලා 5:17
2 රෝම 13:13 2කොරි 12:20 ගලා 5:19
3 1පේත්‍ර 4:3
4 1කොරි 1:12 1කොරි 11:18
5 ක්‍රියා 18:24
6 2කොරි 3:6 කොලො 1:23 1තිමෝ 1:12
7 ක්‍රියා 18:4
8 ක්‍රියා 18:25 ක්‍රියා 18:28 ක්‍රියා 19:1
9 යෙසා 55:10 2කොරි 9:10
10 2කොරි 12:11 ගලා 6:3
11 රෝම 9:16 2කොරි 6:1
12 ගලා 3:28
13 රෝම 2:6 1කොරි 4:5 පිලි 2:13 එළි 22:12
14 1කොරි 3:6
15 මතෙ 13:38
16 එෆී 2:22 1පේත්‍ර 2:5
17 1කොරි 15:10
18 රෝම 15:20 හෙබ්‍රෙ 6:1
19 1පේත්‍ර 4:11
20 යෙසා 28:16 1පේත්‍ර 2:6

**2 තීරුව**

1 ගීතා 118:22 මතෙ 21:42 ක්‍රියා 4:11 එෆී 2:20
2 ආනි 11:35 සෙක 13:9 1පේත්‍ර 1:7 1පේත්‍ර 4:12
3 මතෙ 7:25
4 1කොරි 9:17
5 එස 3:19
6 යූද් 23
7 2කොරි 6:16 එෆී 2:21 1පේත්‍ර 2:5
8 රෝම 8:9 1කොරි 6:19
9 යෙසා 54:15 2තෙස 1:6
10 ගීතා 11:4
11 2කොරි 6:16
12 1පේත්‍ර 2:5
13 හිතෝ 3:7 ලූක් 16:8
14 ආනි 12:3 ආනි 12:10
15 1කොරි 1:20
16 යෝබ් 5:13 ලූක් 20:23

වන්තයන්ගේ තර්ක විතර්ක නිෂ්ඵල
දේවල් බව යෙහෝවා දෙවි දන්නේය”[1]
කියාද ලියා තිබේ. **21** එහෙයින්
කිසි කෙනෙකු මිනිසුන් ඉටු කරන
දේ ගැන ආඩම්බරයෙන් කතා නො-
කළ යුතුයි. මන්ද සෑම දෙයක්ම හා
සෑම කෙනෙක්ම අයිති වන්නේ ඔබ-
ටය.[2] **22** පාවුල් හෝ අපොලොස්
හෝ[3] සීෆස් හෝ වේවා, ලෝකය
හෝ ජීවිතය හෝ මරණය හෝ දැන්
තිබෙන දේවල් හෝ පැමිණෙන්න
තිබෙන දේවල්[4] හෝ වේවා, සියල්ල
අයිති ඔබටය. **23** ඔබ අයිති ක්‍රිස්-
තුස්ටය.[5] ක්‍රිස්තුස් අයිති දෙවිටය.[6]

**4** යමෙකු අපව සැලකිය යුත්තේ
ක්‍රිස්තුස් යටතේ වැඩ කරන සේ-
වකයන්[7] හා දෙවිගේ පරිශුද්ධ රහස්[8]
එළිදරව් කිරීමේ කාර්යය භාර දී ඇති
අය[9] ලෙසය. **2** යම් දෙයක් කෙ-
නෙකුට භාර දී ඇත්නම්[10] ඔහුගෙන්
බලාපොරොත්තු වන්නේ එය විශ්-
වාසවන්තව ඉටු කිරීමය.[11] **3** ඔබ
හෝ මිනිසුන්ගේ යම් අධිකරණයක්[12]
හෝ මා විශ්වාසවන්තව කටයුතු කර
තිබෙනවාද කියා මා ගැන විභාග
කළත් මම එය බැරෑරුම් දෙයක් ලෙස
නොසලකමි. මා ගැන එවැනි සෝදි-
සියක් මමවත් නොකරමි. **4** දැනු-
වත්ව මා අතින් කිසි වරදක් සිදු වී
නැති බව මට ස්ථිරයි.[13] මා එසේ
සිතුවත් එයින් මා ධර්මිෂ්ඨයෙකු බව
ඔප්පු වන්නේ නැත. මන්ද මාව සෝ-
දිසි කර බලන්නේ යෙහෝවා දෙවිය.[14]
**5** එහෙයින් නියමිත කාලයට කලින්
එනම්, ස්වාමීන් එන තුරු[15] කිසි දෙ-
යක් ගැන විනිශ්චය නොකරන්න.[16]
එදින ඔහු අන්ධකාරයේ සැඟවී ඇති
රහස් හෙළි කරනවා[17] පමණක් නොව
මිනිසුන්ගේ සිත් තුළ තිබෙන චේ-
තනා පවා එළිදරව් කරනු ඇත.[18]
එවිට සෑම කෙනෙක්ම තමාට ලැබිය
යුතු ප්‍රශංසාව දෙවිගෙන් ලබයි.[19]
**6** සහෝදරයෙනි, අපොලොස්වද
මාවද උදාහරණයකට ගෙන ඔබට
යමක් පැවසීමට කැමැත්තෙමි.[20] ඒ
ඔබේම යහපතටය. “ලියවිලිවල සඳ-
හන් වී ඇති දේ ඉක්මවා යමින්
ක්‍රියා නොකරන්න”[1] යන ප්‍රතිපත්-
තිය අපි අදාළ කරගන්නෙමු. ඔබත්
එහි ඇති වැදගත්කම තේරුම්ගන්-
නවා නම් තමන් අන් අයට වඩා
උතුම් කියා සිතමින්[2] අහංකාර වන්-
නේ නැත.[3] **7** ඔබ අන් අයට වඩා
උතුම් කියා සිතීමට[4] ඔබට තිබෙන
පදනම කුමක්ද? ඔබ සතු දේවල්
ඔබට ලැබුණේ දෙවිගෙන් නොවේද?[5]
එසේනම් ඔබ ඒ දේවල් දෙවිගෙන්
ලැබුණු දේවල් ලෙස නොසලකා[6] පුර-
සාරම් දොඩන්නේ ඇයි?[7]
**8** ඔබ ලබාගන්න ආශාවෙන් සිටි
සෑම දෙයක්ම ඔබ දැනටමත් ලබා-
ගෙන අවසන්ද? ඔබ දැනටමත් ධන-
වත්ද?[8] අප නැතුව ඔබ දැනටමත්
රජකම් කරන්න පටන්ගෙනද?[9] ඔබ
රජකම් කරන්න පටන්ගෙන තිබෙ-
නවා නම් මමද ඒ ගැන සතුටු
වන්නෙමි. මන්ද එවැනි දෙයක් සිදු
වුණා නම් අපටත් ඔබ සමඟම රජ-
කම් කිරීමට හැකි වේ.[10] **9** මට
නම් පෙනී යන්නේ මරණයට නියම
කර ඇති මිනිසුන් ලෙස[11] දෙවි අව-
සාන වශයෙන් සියලුදෙනා ඉදිරියේ
ප්‍රදර්ශනය කර ඇත්තේ නියෝජිත-
යන්* වන අපව බවය.[12] මන්ද රංග
භූමියක් මැද සිටින අය ලෙස[13] අපි
මිනිසුන්ගේද දේවදූතයන්ගේද[14] මුළු
මහත් මිනිස් වර්ගයාගේද[15] අවධාන-
යට ලක් වී සිටිමු. **10** අප ක්‍රිස්තුස්-
ගේ අනුගාමිකයන් වන නිසා අපව
මෝඩයන් ලෙස සලකනු ලැබුවත්[16]
ඔබ සිතන්නේ ඔබ ක්‍රිස්තුස්ව අනුගම-
නය කරන නුවණැත්තන්[17] කියාය.
අප දුර්වලය.[18] නමුත් ඔබ සිතන්-
නේ ඔබ ශක්තිමත් කියාය.[19] ඔබ
කීර්තිමත් අය ලෙස පෙනී සිටියත්[20]
අපව හෙළාදකිනු ලැබේ.[21] **11** මේ
අවස්ථාව වන තුරුම කුසට හරි

**3 පරි.**
1 ගීතා 94:11
2 2කොරි 4:15
3 1කොරි 1:12
4 රෝම 8:38
5 යොහ 17:9; 2කොරි 10:7
6 1කොරි 11:3

**4 පරි.**
7 ලූක් 1:2; 2කොරි 5:20
8 මතෙ 13:11; රෝම 16:25
9 ලූක් 12:42; 1කොරි 9:17; කොලො 1:25; තීත 1:7
10 උත් 24:2
11 උත් 39:9; ගලා 3:9; හෙබ්‍රෙ 3:5
12 මතෙ 10:17; 1පේතෘ 4:6
13 යෝබ් 27:6; ක්‍රියා 23:1; ක්‍රියා 24:16
14 හිතෝ 21:2; රෝම 14:10; හෙබ්‍රෙ 4:13
15 මලා 3:2; මතෙ 24:3; එළි 1:10
16 මතෙ 7:1
17 හිතෝ 10:9; මතෙ 10:26; ලූක් 8:17; 1තිමෝ 5:24
18 ලූක් 2:35; 1තෙස 2:4
19 යොහ 5:44; රෝම 2:29; 2කොරි 10:18
20 1කොරි 1:12; 1කොරි 3:22

**2 තීරුව**
1 1කොරි 1:31; 2යොහ 9; 3යොහ 9
2 2කොරි 12:20
3 රෝම 12:3
4 රෝම 12:6
5 යොහ 3:27; යාකො 1:17
6 1පේතෘ 4:10
7 ගලා 6:14
8 එළි 3:17
9 එළි 20:4; එළි 20:6
10 2තිමෝ 2:12; එළි 3:21
11 ගීතා 44:22; රෝම 8:36; 2කොරි 6:9; එළි 6:9
12 1කොරි 15:32
13 හෙබ්‍රෙ 10:33
14 එෆී 6:12; 1පේතෘ 1:12

**15** 2කොරි 2:16; **16** 1කොරි 3:18; **17** මතෙ 10:16; **18** 2කොරි 11:29; **19** 1කොරි 10:12; **20** ගලා 2:6; **21** යොහ 8:49.

**1කොරි 4:9*** හෝ, “යවනු ලැබූවන්.”

හැටි අහරක් නොමැතිවද[1] පිපා-
සයෙන්ද[2] ප්‍රමාණවත් ඇඳුම් නො-
මැතිවද[3] අඩන්තේට්ටම්වලට ලක්
වෙමින්ද[4] ඉඳුම්හිටුම් නොමැතිවද[5]
සිටීමට අපට සිදු වී ඇත. **12** අපි
නිතරම වෙහෙස මහන්සිය නො-
බලා[6] අපගේ අත්වලින් වැඩ කරන්-
නෙමු.[7] අපට නින්දා කරන විට
එසේ කරන අයට අපි ආශීර්වාද
කරන්නෙමු.[8] පීඩාවලට මුහුණ දෙන
විට අපි ඒවා දරාගෙන සිටින්නෙමු.[9]
**13** අපව අපකීර්තියට ලක් කරන විට
අපි කාරුණිකව කතා කරන්නෙමු.[10]
ලෝකයේ සිටින සියලුදෙනා මේ වන
තුරු අපව සලකන්නේ කුණු කසළ හා
සමානවය.[11]

**14** මා මේ දේවල් ගැන ලියන්නේ
ඔබව අපහසුතාවට පත් කිරීමේ අදහ-
සින් නොවේ. මා ඔබව සලකන්නේ
මගේම ආදරණීය දරුවන් ලෙසයි.[12]
මා ඔබට මෙලෙස අවවාද කරන්-
නේ ඒ නිසාය. **15** සමහරවිට ක්‍රිස්-
තුස් වෙනුවෙන් ඔබට උපදේශකයන්
දසදහස්දෙනෙකු සිටිය හැක.[13] නමුත්
ඔබට පියවරුන් බොහෝදෙනෙක්
නැත.[14] මන්ද ඔබට ශුභාරංචිය ප්‍රකාශ
කළ මම, ක්‍රිස්තුස් යේසුස් වෙනුවෙන්
ඔබට පියෙක් වුණෙමි.[15] **16** එහෙ-
යින් මා ඔබෙන් ඉල්ලා සිටින්නේ
මාව අනුකරණය කරන්න කියාය.[16]
**17** ඊට උපකාරයක් වශයෙන් මම
තිමෝතිව ඔබ වෙතට එවන්නෙමි.[17]
ස්වාමීන් වෙනුවෙන් විශ්වාසවන්තව
සේවය කරන ඔහු, මගේම දරුවෙක්
හා සමානය.[18] මා ක්‍රිස්තුස් යේසුස්
වෙනුවෙන් සේවය කරමින් සෑම සභා-
වකටම ගොස් උගන්වන විට මා කට-
යුතු කරන ආකාරය ගැන ඔහු ඔබට
පැහැදිලි කර දෙයි.[19]

**18** මා ඔබව හමු වීමට පැමි-
ණෙන්නේ නැතැයි කියා සිතාගෙන
සිටින ඇතැම් අය තම හිස් උදුම්-
මාගෙන සිටිති.[20] **19** එවැනි අය
කියන දේවල් දැනගැනීමට මම
කිසි ලෙසකින්වත් උනන්දු වන්නේ
නැත. කෙසේවෙතත් යෙහෝවා දෙවි
කැමති නම්[1] වැඩි කලක් යෑමට
කලින් ඔබව හමු වීමට මට හැකි
වෙයි. එවිට දෙවිගේ බලය ඔවුන් තුළ
ක්‍රියාත්මක වෙනවාද කියා දැනගැනී-
මට මට පුළුවන. **20** මන්ද යමෙ-
කුගේ ජීවිතය තුළින් දේවරාජ්‍යය
සැබෑ බව ඔප්පු වන්නේ ඔහු පව-
සන දේවලින් නොවේ. ඔහු තුළ දෙවි-
ගේ බලය ක්‍රියාත්මක වීම තුළිනි.[2]
**21** ඔබ කැමති වන්නේ මා කුමක්
සඳහා එනවාටද? කෝටුවක් රැගෙන
දඬුවම් කිරීමට එනවාටද?[3] නැත්නම්
ප්‍රේමයෙන් හා මෘදුකමින් ඔබ ළඟට
එනවාටද?[4]

**5** ඇත්තෙන්ම ඔබ අතරේ වේශ්‍යා-
කම්*[5] කරන කෙනෙකු සිටින
බව අපට ආරංචි වී ඇත. දෙවිට සේ-
වය නොකරන අය අතරේ පවා මෙ-
තරම් පිළිකුල්සහගත වේශ්‍යාකමක්
දක්නට නැත. මන්ද එක්තරා මිනි-
සෙක් තම පියාගේ භාර්යාව තමා-
ගේ භාර්යාව ලෙස තබාගෙන සිටියි.[6]
**2** ඔබ දැන් ඒ ගැන කරමින් සිටින්-
නේ කුමක්ද? සිදු වන දේ ගැන
ඔබ ආඩම්බරයෙන් සිටිනවාද?[7] ඇත්-
තෙන්ම ඒ ගැන ශෝක වී[8] ඒ දේ කර
ඇති මිනිසාව ඔබ අතරින් ඉවත් කර
දැමිය යුතුයි[9] කියා ඔබ සිතන්නේ
නැද්ද? **3** මා ඇත්තටම ඔබ සමඟ
නොසිටියත් මම සිතින් ඔබ සමඟ
සිටිමි. එහෙයින් ඔබ අතරේ සිටින
කෙනෙකු මෙන් ඒ ක්‍රියාව කළ මිනිසා
ගැන මා දැනටමත් විනිශ්චයක් කර
හමාරය.[10] **4** එහෙයින් යේසුස් ක්‍රිස්-
තුස් ඉදිරියේම මා ඔබට පවසන්නේ ඒ
මිනිසාව විනිශ්චය කළ යුතු ආකා-
රය ගැන මා දරන ආකල්පයම දර-
මින් අපගේ ස්වාමීන් වන යේසුස්ගේ
බලය ඇතුව ඔබ රැස් වන විට,[11]
**5** ඔබ ඒ මිනිසාව සාතන්ට භාර දිය
යුතු බවය.[12] එසේ කිරීමෙන් ඒ මිනි-
සාගේ පව්කාර බලපෑම නැති කර

**4 පරි.**
**1** පිලි 4:12
**2** 2කොරි 11:27
**3** රෝම 8:35
**4** ක්‍රියා 14:19, ක්‍රියා 23:2, 2කොරි 11:24
**5** මතෙ 8:20
**6** 1තෙස 2:9
**7** ක්‍රියා 18:3, ක්‍රියා 20:34, 2තෙස 3:8
**8** ගීතා 109:28, රෝම 12:14, 1පේතෘ 3:9
**9** මතෙ 5:44
**10** 1පේතෘ 2:23
**11** විලා 3:45
**12** 2කොරි 6:13
**13** ගලා 3:24
**14** 3යොහ 4
**15** ගලා 4:19, 1තෙස 2:11
**16** 1කොරි 11:1, පිලි 3:17, 1තෙස 1:6
**17** ක්‍රියා 19:22, පිලි 2:19, 1තෙස 3:2
**18** 2තිමෝ 1:2
**19** ලූක් 6:40, 2තිමෝ 1:13
**20** 1තිමෝ 3:6

**2 තීරුව**
**1** ක්‍රියා 18:21, යාකො 4:15
**2** 1කොරි 2:4, 1තෙස 1:5
**3** 2කොරි 10:8, 2කොරි 13:10
**4** ගලා 6:1

**5 පරි.**
**5** එෆී 5:3
**6** උත් 35:22, ලෙවී 18:8, ද්වි 22:30
**7** 1කොරි 4:18
**8** එස 9:4, 2කොරි 7:9
**9** 1කොරි 5:13, 2යොහ 10
**10** 1කොරි 6:3
**11** යොහ 20:23
**12** ක්‍රියා 26:18, 1තිමෝ 1:20

**1කොරි 5:1*** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න.

දැමිය හැකි අතර ස්වාමීන්ගේ දවස
දක්වා[1] සභාවේ යහපත් වාතාවරණ-
යක්[2] තබාගැනීමට හැකි වේ.

**6** ඇත්තෙන්ම ආඩම්බර වීම
සඳහා[3] ඔබට කිසි හේතුවක් නැත.
මුහුන් ටිකකින් මුළු පිටි පිඩම[4]
පිපෙන[5] බව ඔබ දන්නේ නැද්ද?
**7** එහෙයින් මුහුන් ඇති පරණ පිටි
පිඩ ඉවත් කර දමා අලුත් පිටි පිඩක්
බවට පත් වන්න.[6] ඇත්තෙන්ම අප-
ගේ පාස්කු යාගය[7] වන ක්‍රිස්තුස්ව[8]
පූජා කර ඇති නිසා[9] ඔබ මුහුන්වලින්
නිදහස් විය යුතුයි. **8** එහෙයින් අපි
එම උත්සවය[10] පරණ මුහුන් සහිතව[11]
එනම්, දුෂ්ටකම[12] හා නපුරුකම ඇති
අය සමඟ නොපවත්වා,[13] මුහුන් නො-
දැමූ රොටි වන අවංක හා සත්‍යවාදී
අය සමඟ සමරමු.[14]

**9** ඔබ තවදුරටත් වේශ්‍යාකම්*
කරන අය සමඟ ඇසුරු නොකළ යුතු
බව මා කලින් ඔබට ලියූ ලිපියක සඳ-
හන් කළෙමි. **10** මා එයින් අදහස්
කළේ මේ ලෝකයේ[15] සිටින සිය-
ලුම වේශ්‍යාකම් කරන අය සමඟ-
වත්[16] කෑදරකමින් ක්‍රියා කරන අය
සමඟවත් අනුන්ගේ දේ අයුතු ලෙස
ලබාගන්නා අය සමඟවත් රූප වන්ද-
නාවේ නිරත වන අය සමඟවත් ඔබේ
ආශ්‍රය නවතා දැමිය යුතු බව නො-
වේ. මන්ද එසේ කිරීමට නම් ඔබට
මේ ලෝකයෙන් සම්පූර්ණයෙන්ම
ඉවත් වීමට සිදු වේ.[17] **11** මා දැන්
ඔබට ලියන්නේ එවැනි දේවල් කරන
සහෝදරයන් ගැනය. එහෙයින් යම්
සහෝදරයෙක් වේශ්‍යාකම් කරන්-
නෙකු ලෙසද කෑදරකමින් ක්‍රියා කරන
කෙනෙකු[18] ලෙසද රූප වන්දනාවේ
නිරත වන කෙනෙකු ලෙසද අනුන්ට
නින්දා කරන්නෙකු ලෙසද බේබද්-
දෙකු ලෙසද[19] අනුන්ගෙන් අයුතු
ලෙස දේවල් ලබාගන්නෙකු ලෙසද
කටයුතු කරනවා නම් ඔබ තවදුරටත්
ඔහු සමඟ ආශ්‍රය නොකළ යුතුයි.[20]
එවැනි මිනිසෙකු සමඟ ඔබ එකට ඉඳ
ආහාර වේලක්වත් නොගත යුතුයි.
**12** ඇත්තෙන්ම සභාවට අයත් නො-
වන අයව විනිශ්චය කිරීම මගේ
කාර්යයක් නොවේ.[1] ඔබ විනිශ්චය
කළ යුත්තේ සභාව තුළ සිටින අය-
වයි.[2] **13** පිටත සිටින අයව විනිශ්-
චය කරන්නේ දෙවිය.[3] “එහෙයින් ඔබ
අතරින් ඒ දුෂ්ට මිනිසාව ඉවත් කර
දමන්න.”[4]

**6** ඔබෙන් යමෙකුට තවත් කෙ-
නෙකුට විරුද්ධව පැමිණිල්ලක්[5]
තිබෙන විට එය විසඳාගැනීමට ශුද්ධ
තැනැත්තන් ඉදිරියට යනවා වෙ-
නුවට[6] අධර්මිෂ්ඨ මිනිසුන් ඉදිරියට[7]
ගොස් නඩු කියන්න තරම් ඔබ එඩිතර
වුණේ කෙසේද? **2** ශුද්ධ තැනැත්-
තන්[8] වන ඔබ, අනාගතයේදී ලෝ-
කය විනිශ්චය කිරීමට සිටින අය[9]
බව දැන සිටියේ නැද්ද? ඔබ ඉදි-
රියේදී ලෝකය විනිශ්චය කරන්න
යනවා නම් ඔබ අතරේ ඇති සුළු සුළු
කාරණා[10] විභාග කිරීමට හැකියාවක්
ඔබට නැද්ද? **3** අනාගතයේදී අප
දේවදූතයන්ව පවා විනිශ්චය කරන
බව ඔබ දැන සිටියේ නැද්ද?[11] එසේ-
නම් අපට මේ ජීවිතයේ කාරණා ගැන
විනිශ්චය කළ නොහැකිද? **4** මේ
ජීවිතයට සම්බන්ධ යම් කාරණාවක්
විසඳාගැනීමට ඔබට සිදු වන විට[12] ඒ
සඳහා ඔබ විනිශ්චයකරුවන් ලෙස
පත් කරගන්නේ සභාවේ පිළිගැනී-
මක් නැති පිටස්තර මිනිසුන්වද?[13]
**5** මා මේ දේවල් කියන්නේ ඔබ තුළ
ඔබ ගැනම ලැජ්ජාවක් ඇති කිරීම
සඳහාය.[14] හොඳ විනිශ්චයක් ලබා
දීමට හැකියාවක් ඇති එක ප්‍රඥා-
වන්තයෙකුවත්[15] ඔබේ සහෝදරයන්
අතරින් ඔබට සොයාගත නොහැකිද?
**6** සහෝදරයෙක් තම සහෝදරයාට
විරුද්ධව නඩු කියන්නේ ඒ නිසාද?
නඩු විභාග කරන්නේ දෙවි ගැන කිසි
විශ්වාසයක් නැති අය බව ඔබට අම-
තකද?[16]

**7** ඇත්තෙන්ම එකිනෙකාට විරුද්-
ධව මෙලෙස නඩු කීමෙන් ඔබට සිදු
වන්නේ මහත් නින්දාවකි.[17] එහෙයින්

**5 පරි.**
**1** 1කොරි 1:8
**2** 1කොරි 7:34
**3** 1කොරි 3:21
යාකො 4:16
**4** ගලා 5:9
2තිමෝ 2:17
**5** දේශ 9:18
1කොරි 15:33
**6** ගලා 6:15
**7** යොහ 1:29
**8** 1පේත 1:19
**9** එළි 5:12
**10** නික් 13:7
**11** ද්වි 16:3
**12** 1පේත 4:3
**13** මතෙ 16:12
**14** යොහ 1:17
යොහ 17:17
**15** 1යොහ 2:17
**16** රෝම 1:28
1කොරි 6:9
එෆී 5:5
**17** යොහ 17:15
**18** එෆී 5:5
**19** ද්වි 21:20
1කොරි 6:10
ගලා 5:21
1පේත 4:3
**20** ගණන් 16:26
රෝම 16:17
2තෙස 3:6
2යොහ 10

**2 තීරුව**
**1** මාක් 4:11
**2** 1කොරි 6:5
**3** දේශ 12:14
**4** උත් 3:24
ද්වි 17:7
තීත 3:10
2යොහ 10

**6 පරි.**
**5** මතෙ 18:15
**6** 1කොරි 5:3
තීත 1:9
හෙබ්‍රෙ 13:17
**7** ක්‍රියා 18:17
**8** ලූක් 22:30
එළි 20:4
**9** 2පේත 3:7
**10** 1කොරි 4:3
**11** රෝම 16:20
**12** මතෙ 18:17
**13** හිතෝ 29:27
**14** 1කොරි 15:34
**15** ද්වි 1:13
1තිමෝ 3:2
**16** 2කොරි 6:15
**17** 2ලේක 19:8
ලූක් 12:13

**1කොරි 5:9*** 1කොරි 5:1හි පාදසටහන බලන්න.

සිදු වූ අසාධාරණය දරාගෙන
සිටීම සුදුසු වන්නේ නැද්ද?[1] සිදු
වූ පාඩුව ඔබට දරාගත නොහැකිද?[2]
**8** නමුත් ඔබ අතිනුත් අසාධාරණ-
කම් සහ වංචනික දේවල් සිදු වේ.
ඔබ එසේ කරන්නේ ඔබේම සහෝදර-
යන්ට විරුද්ධවය.[3]

**9** අධර්මිෂ්ඨ අයට දෙවිගේ රාජ්‍යය
උරුම වන්නේ නැති බව ඔබ දැන
සිටියේ නැද්ද?[4] කිසි ලෙසකින්වත්
මුළා නොවන්න. වේශ්‍යාකම්* කරන
අයටවත්[5] රූප වන්දනාවේ යෙදෙන
අයටවත්[6] අනාචාරයේ# හැසිරෙන
අයටවත්[7] සමලිංගික පුරුෂයන්ටවත්[8]
ස්ත්‍රීන් ලෙස හැසිරෙමින් සමලිංගික
ක්‍රියාවලට හවුල් වන පිරිමින්ටවත්,[9]
**10** සොරුන්ටවත් කෑදරකමින් ක්‍රියා
කරන අයටවත්[10] බේබද්දන්ටවත්[11]
නින්දා කරන අයටවත් අනුන්ගේ දේ
අයුතු ලෙස ගන්නා අයටවත් දෙවි-
ගේ රාජ්‍යය උරුම වන්නේ නැත.[12]
**11** ඇත්තෙන්ම ඔබෙන් සමහරදෙ-
නෙක් කලින් එවැනි දේවල යෙදී සිටි
අය වූහ.[13] නමුත් දැන් ඔබව සෝදා
පවිත්‍ර කර ඇත.[14] ඔබව දැන් ශුද්ධ
කර ඇත.*[15] අපගේ ස්වාමීන් වන
යේසුස් ක්‍රිස්තුස්ගේ නාමයෙන්ද[16] අප-
ගේ දෙවිගේ බලය ලබාගැනීමෙන්ද[17]
ඔබව ධර්මිෂ්ඨයන් ලෙස ප්‍රකාශ කර
ඇත.[18]

**12** ඕනෑම දෙයක් කිරීමට මට
අවසර තිබුණත් ඒ සියල්ල කිරී-
මෙන් යහපතක් වෙයි කියා පැවසිය
නොහැක.[19] ඕනෑම දෙයක් කිරී-
මට මට අවසර තිබුණත්[20] ඒ දේව-
ලට මාව පාලනය කිරීමට මම ඉඩ
දෙන්නේ නැත.[21] **13** කෑම තිබෙන්-
නේ උදරය සඳහාය. එලෙසම උදරය
තිබෙන්නේ කෑම සඳහාය.[22] නමුත්
දිනක දෙවි ඒ දෙකම අපගෙන් නැති
කර දමනු ඇත.[1] එලෙසම අප-
ගේ ශරීරය තිබෙන්නේ වේශ්‍යාකම*
සඳහා නොව ස්වාමීන්ට සේවය කිරීම
සඳහාය.[2] මන්ද ස්වාමීන් පැමිණියේ
ශරීරය වෙනුවෙන්ය.[3] **14** මිය ගොස්
සිටි ස්වාමීන්ව දෙවි තම බලයෙන්[4]
නැවත නැඟිටුවනු ලැබුවා[5] හා සමා-
නව ඔහු අපවත් නැවත නැඟිටුවයි.[6]

**15** ඔබේ ශරීර ක්‍රිස්තුස්ට[7] සම්-
බන්ධ වී තිබෙන අවයවයන්[8] බව
ඔබ දැන සිටියේ නැද්ද? එසේනම්
මා ක්‍රිස්තුස්ට සම්බන්ධ වී තිබෙන
අවයවයන් රැගෙන ඒවා ගණිකාවකට
සම්බන්ධ කරන්නද?[9] කිසි ලෙසකින්-
වත් එවැනි දෙයක් සිදු නොවිය යුතුයි.
**16** යමෙක් ගණිකාවක් සමඟ සම්-
බන්ධකම් පවත්වයි නම් ඔහුද ඇයද
එක ශරීරයක් හා සමාන වන බව
ඔබ දැන සිටියේ නැද්ද? මන්ද දෙවි
පවා කියන්නේ, “ඔවුහු දෙදෙනා එක්
කෙනෙකු මෙන් වන්නෝය”[10] කියාය.
**17** නමුත් ස්වාමීන් සමඟ එකට බැඳී
සිටින තැනැත්තා,[11] ඔහු සමඟ එක්-
සිත්ව සිටියි.[12] **18** වේශ්‍යාකම* වෙ-
තින් පලා දුවන්න.[13] වෙනත් පාප
මිනිසුන්ගේ ශරීරයට බලපාන්නේ
නැත. නමුත් වේශ්‍යාකම ශරීරයට
ඍජුවම බලපාන පාපයකි. එහෙයින්
එසේ කරන තැනැත්තා තම ශරීරයට
විරුද්ධව පව් කරයි.[14] **19** ඔබ සිය-
ලුදෙනාගෙන් සෑදෙන ශරීරය දේවමා-
ලිගාවක් බවත්[15] එය සෑදී තිබෙන්නේ
ඔබ එකිනෙකා තුළ දෙවිගේ බලය
ක්‍රියාත්මක වීමෙන් බවත්[16] ඔබ දැන
සිටියේ නැද්ද? එලෙසම ඔබේ අයිති-
කරු ඔබ නොවේ.[17] **20** මන්ද ඔබව
මිල දී ගත්තේ ඉතා වටිනා යමක්
දීමෙනි.[18] එහෙයින් ඔබේ ශරීරවලින්[19]
දෙවිට ගෞරවය ගෙන දෙන්න.[20]

**6 පරි.**
**1** හිතෝ 20:22
මතෙ 5:39
රෝම 12:17
1තෙස 5:15
1පේතෘ 3:9
**2** ගීතා 146:7
**3** 1තෙස 4:6
**4** එෆී 5:5
එළි 22:15
**5** එළි 21:8
**6** කොලො 3:5
**7** හෙබ්‍රෙ 13:4
**8** 1තිමෝ 1:10
**9** රෝම 1:27
**10** 1කොරි 5:11
**11** ද්වි 21:20
හිතෝ 23:20
1පේතෘ 4:3
**12** හෙබ්‍රෙ 12:14
1පේතෘ 4:18
**13** කොලො 3:7
තීත 3:3
**14** යොහ 13:10
ක්‍රියා 22:16
හෙබ්‍රෙ 10:22
**15** එෆී 5:26
2තෙස 2:13
**16** 1යොහ 2:12
**17** රෝම 8:33
**18** රෝම 5:18
**19** 1කොරි 10:23
**20** රෝම 6:14
**21** රෝම 6:16
**22** තීත 1:12

**2 තීරුව**
**1** රෝම 14:17
**2** 1තෙස 4:3
**3** කොලො 1:18
1තෙස 5:23
**4** එෆී 1:19
**5** ක්‍රියා 2:24
රෝම 6:4
එෆී 1:20
**6** රෝම 6:5
රෝම 8:11
2කොරි 4:14
**7** රෝම 12:5
එෆී 4:15
**8** 1කොරි 12:18
1කොරි 12:27
එෆී 5:30
**9** යාකො 4:4
**10** උත් 2:24
මතෙ 19:5
එෆී 5:31
**11** යොහ 17:21
**12** එෆී 4:3
එෆී 4:4
**13** උත් 39:12
1තෙස 4:3
**14** රෝම 1:24
රෝම 1:27
රෝම 6:12
**15** 1කොරි 3:16
2කොරි 6:16

**16** 1තෙස 4:8; **17** රෝම 14:8; **18** 1කොරි 7:23; හෙබ්‍රෙ 9:12; 1පේතෘ 1:18; **19** රෝම 12:1; 1කොරි 12:27; එෆී 4:12; **20** මතෙ 5:16.

**1කොරි 6:9*** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න. **9#** මූ.අ., “පරදාර සේවනයේ.” මෙය භාවිත කරන්නේ විවාහක පුරුෂයෙකු හෝ ස්ත්‍රියක අනාචාරයේ යෙදීම විස්තර කිරීමටය. **11*** හෝ, “දෙවි සඳහා වෙන් කර ඇත.”

**1කොරි 6:13*** 1කොරි 6:9හි පළමුවෙනි පාදසටහන බලන්න. **18*** 1කොරි 6:9හි පළමුවෙනි පාදසටහන බලන්න.

**7** මම දැන් ඔබ ලියා එවූ ප්‍රශ්න
ගැන යමක් පැවසීමට කැමැත්-
තෙමි. පුරුෂයෙකු ස්ත්‍රියකට අත
නැබීමෙන්*[1] වැළකී සිටිය යුතුයි.
**2** නමුත් වේශ්‍යාකම* සමාජය පුරා
පැතිර ඇති නිසා[2] සෑම පුරුෂයෙ-
කුටම භාර්යාවක්ද සෑම ස්ත්‍රියක-
ටම ස්වාමිපුරුෂයෙකුද සිටීම
සුදුසුය.[3] **3** ස්වාමිපුරුෂයා සහ භාර්-
යාව අඹුසැමියන් ලෙස එකිනෙකා-
ගේ අවශ්‍යතා* ඉටු කර දිය යුතුයි.[4]
**4** මෙහිදී භාර්යාවගේ ශරීරය ගැන
අයිතිය තිබෙන්නේ ඇයට නොව
ඇගේ ස්වාමිපුරුෂයාටය.[5] එලෙසම
ස්වාමිපුරුෂයාගේ ශරීරය ගැන අයි-
තිය තිබෙන්නේ ඔහුට නොව ඔහු-
ගේ භාර්යාවටය.[6] **5** එහෙයින් ඔබ
එකිනෙකාගේ එම අවශ්‍යතාව ගැන
සැලකිලිමත් වෙමින් එය ඉටු කර
දීමට වගබලා ගත යුතුයි.[7] යම් ලෙස-
කින් එම අවශ්‍යතා ඉටු කර නොදී-
මට තීරණය කළොත් මුලින්ම ඔබ
දෙදෙනා ඒ ගැන සාකච්ඡා කළ
යුතු අතර එයින් වැළකී සිටිය යුත්-
තේ යම් නිශ්චිත කාලයකට පමණි.[8]
එසේ වැළකී සිටින කාලය යාච්-
ඤාව සඳහා වෙන් කළ හැකි අතර
ඉන්පසු නැවත එක් වීමට ඔබට පුළු-
වන. එසේ නොකළොත් ඔබේ ආශා-
වන් පාලනය කරගැනීමට නොහැකි
වීම නිසා[9] ඔබ සාතන්ගේ පෙළඹීම්ව-
ලට හසු විය හැක.[10] **6** නමුත් මා
මේ දේවල් ඔබට පවසන්නේ ආඥා-
වක් ලෙස නොවේ.[11] කැමති නම් ඒ
උපදෙස් පිළිපැදීමට ඔබට පුළුවන.[12]
**7** ඇත්තටම සියලුදෙනාම මා සිටින
ආකාරයට සිටිනවාට මා කැමතිය.[13]
කෙසේවෙතත් දෙවි සෑම කෙනෙ-
කුටම ලබා දෙන දීමනා විවිධා-
කාරය.[14] එහෙයින් සමහරුන්ට එසේ
සිටිය හැකිය. තවත් සමහරුන්ට
එසේ සිටීම අපහසුය.
**8** මා දැන් අවිවාහක අයටත්[1]
වැන්දඹුවන්ටත් කියන්නේ, මා
සිටින ආකාරයට දිගටම සිටීම
ඔවුන්ට හොඳ බවය.[2] **9** කෙසේවෙ-
තත් ඔවුන්ට තම ආශාවන් පාල-
නය කරගැනීමට අපහසු නම්[3] ඔවුන්
විවාහ වීම වඩාත් සුදුසුය.[4] මන්ද
කාමාශාවෙන් දැවිදැවී සිටිනවාට වඩා
විවාහ වීම සුදුසුය.[5]
**10** විවාහක අයටද උපදෙස් කිහි-
පයක් දීමට කැමැත්තෙමි. නමුත්
මෙම උපදෙස් සැලකිය යුත්තේ
මගෙන් නොව ස්වාමීන්ගෙන් ලැබුණු
ඒවා ලෙසය.[6] භාර්යාවක් ඇගේ ස්වා-
මිපුරුෂයාව අත් නොහැරිය යුතුයි.[7]
**11** නමුත් ඇය ඔහුව අත්හරියි
නම් ඇය වෙනත් කෙනෙකු සමඟ
විවාහ වීමෙන් වැළකී සිටිය යුතුයි.
එසේ නැතහොත් ඇගේ ස්වාමිපුරු-
ෂයා සමඟ නැවත සමගි විය යුතුයි.
ස්වාමිපුරුෂයෙක්ද ඔහුගේ භාර්යාවව
අත් නොහැරිය යුතුයි.
**12** විවාහ වී සිටින අනිකුත් අය-
ටත් මා යමක් කියන්න කැමතිය.
මේ දේවල් මා පවසන දේවල් නොව
ස්වාමීන් පවසන දේවල් ලෙස සල-
කන්න.[8] සහෝදරයෙක් දෙවිට නමස්-
කාර නොකරන ස්ත්‍රියක් සමඟ විවාහ
වී සිටියත් ඔහු සමඟ ජීවත්
වෙන්න ඇය තුළ කැමැත්තක් ඇත්-
නම් ඔහු ඇයව අත් නොහැරිය යුතුයි.
**13** එලෙසම ස්ත්‍රියකට දෙවිට නමස්-
කාර නොකරන ස්වාමිපුරුෂයෙකු
සිටියත් ඇය සමඟ ජීවත් වෙන්න
ඔහු තුළ කැමැත්තක් ඇත්නම් ඇයත්
තම ස්වාමිපුරුෂයාව අත් නොහැ-
රිය යුතුයි. **14** මන්ද ස්වාමිපුරුෂයා
දෙවිට නමස්කාර නොකළත් ඔහුගේ
භාර්යාව නිසා ඔහුට ප්‍රයෝජන ලැබේ.
භාර්යාව දෙවිට නමස්කාර නොකළත්
දෙවිට නමස්කාර කරන තම ස්වාමිපු-
රුෂයා නිසා ඇයද ප්‍රයෝජන ලබයි.
ඒ හේතුව නිසාම ඔවුන්ගේ දරුවන්ව
ශුද්ධ අය ලෙස සලකනු ලැබේ.[9]

---

**1කොරි 7:1*** ඇතැම්විට විවාහ වී අඹුසැමියන් ලෙස ජීවත් වීම මින් අදහස් විය හැක. **2*** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න. **3*** එනම්, ලිංගික අවශ්‍යතා.

**7 පරි.**
1 උත් 20:6 ද්වි 22:28 හිතෝ 6:29
2 යෙරෙ 5:7 1තෙස 4:3
3 උත් 2:24 හිතෝ 5:19 හෙබ්‍රෙ 13:4
4 නික් 21:10 හොෂෙ 3:3 1කොරි 7:5 1පේතෘ 3:7
5 එෆී 5:24
6 එෆී 5:21
7 උත් 4:1 1සාමු 1:19 මතෙ 1:25 හෙබ්‍රෙ 13:4
8 නික් 19:15
9 1කොරි 9:25
10 2කොරි 2:11 1තෙස 3:5
11 1කොරි 7:25 2කොරි 8:8
12 මතෙ 19:8
13 1කොරි 9:5
14 මතෙ 19:11

**2 තීරුව**
1 1කොරි 7:27
2 1කොරි 9:5
3 1තෙස 4:4 1තිමෝ 5:11
4 1තිමෝ 5:14
5 1තෙස 4:5
6 මතෙ 5:32
7 යෙරෙ 3:20 මතෙ 19:6 මාක් 10:11 ලූක් 16:18
8 1කොරි 7:25
9 රෝම 11:16

එසේ නොවුණොත් ඔවුන්ගේ දරු-
වන්ව අපවිත්‍රයි කියා සලකනු ලැබේ.[1]
**15** කෙසේවෙතත් දෙවිට නමස්කාර
නොකරන පුද්ගලයා දෙවිට නමස්-
කාර කරන භාර්යාව හෝ ස්වාමිපුරු-
ෂයාව අත්හරින්න තීරණය කළොත්[2]
ඒ සඳහා ඉඩ දෙන්න. දෙවිට නමස්-
කාර කරන පුද්ගලයා ඔහු හෝ
ඇය සමඟ සමාදාන වීමට බැඳී
නැත. නමුත් එම පුද්ගලයාට දෙවි-
ගෙන් සමාදානය හිමි වේ.[3] **16** දෙ-
විට නමස්කාර කරන භාර්යාවක් තම
ස්වාමිපුරුෂයා සමඟ සිටීමෙන් සම-
හරවිට ඒ පුරුෂයාට එමගින් ගැල-
වීමට අවස්ථාවක් ලැබේ.[4] එලෙසම
දෙවිට නමස්කාර කරන පුරුෂයෙක්
තම භාර්යාව සමඟ සිටීමෙන් සමහර-
විට ඇයට එමගින් ගැලවීමට අවස්ථා-
වක් ලැබේ.[5]

**17** මෙම ආඥාව[6] මම සියලුම
සභාවන්ට ලබා දෙන්නෙමි. එනම්
සෑම කෙනෙකුම කටයුතු කළ යුත්-
තේ යෙහෝවා දෙවි තමන්ව කැඳ-
වන අවස්ථාවේදී සිටි ලෙසමය.[7]
**18** යමෙකුව කැඳවනු ලැබූ අවස්ථා-
වේදී ඔහු චර්මච්ඡේදනය වී සිටියා
නම්[8] දැන් චර්මච්ඡේදනය නොවූ කෙ-
නෙකු වීමට කිසි අවශ්‍යතාවක් නැත.
කෙනෙකුව කැඳවනු ලැබූ අවස්ථා-
වේදී ඔහු චර්මච්ඡේදනය නොවී සිටියා
නම්[9] දැන් ඔහුව චර්මච්ඡේදනය
කිරීමට කිසි අවශ්‍යතාවක් නැත.[10]
**19** කෙනෙක් චර්මච්ඡේදනය වුවත්[11]
නැතත්[12] වැදගත් වන්නේ එය නො-
වේ. වැදගත් වන්නේ දෙවිගේ ආඥා
පිළිපැදීමය.[13] **20** එමනිසා කෙනෙ-
කුව කැඳවනු ලැබූ අවස්ථාවේදී ඔහු
සිටි ලෙසම[14] ඔහුට දිගටම සිටිය
හැකිය.[15] **21** ඔබව කැඳවනු ලැබූ
අවස්ථාවේ ඔබ සිටියේ දාසයෙකු
ලෙසද? එසේනම් ඒ ගැන කරදර
නොවන්න.[16] නමුත් ඔබට නිදහස්
වීමට අවස්ථාවක් ලැබුණොත් එයින්
ප්‍රයෝජන ගන්න. **22** ඇත්තෙන්ම
ස්වාමීන්ගේ අනුගාමිකයෙකු ලෙස
යමෙකුව කැඳවනු ලැබූ අවස්ථාවේදී
ඔහු දාසයෙකු වී සිටියා නම් ඔහු
දැන් ස්වාමීන්ට අයිති නිදහස් කෙ-
නෙකු බව[1] මතක තබාගත යුතුයි.
එසේම යමෙකුව කැඳවනු ලැබූ අවස්-
ථාවේදී ඔහු නිදහස් කෙනෙකු ලෙස
සිටියා නම්[2] එතැන් සිට ඔහු ස්වා-
මීන්ගේ දාසයෙකු වන බව[3] මතක
තබාගත යුතුයි. **23** ඔබව මිල දී
ගත්තේ ඉතා වටිනා යමක් දීමෙනි.[4]
එහෙයින් තවදුරටත් මිනිසුන්ගේ දාස-
යන් ලෙස කටයුතු නොකරන්න.[5]
**24** සහෝදරයෙනි, යමෙකුව කැඳවනු
ලැබූ අවස්ථාවේදී ඔහු කවර තත්ව-
යක සිටියත්[6] ඔහු දිගටම එම තත්ව-
යෙහිම සිට දෙවි සමඟ තම බැඳීම
පවත්වාගත යුතුයි.

**25** අවිවාහකයන්* ගැන ආඥා-
වක් මට ස්වාමීන්ගෙන් ලැබී නැත.
නමුත් ස්වාමීන් මට පෙන්වූ දයාව
නිසා[7] විශ්වාසවන්තව සිටින්න මට
හැකි වී තිබේ.[8] විශ්වාසවන්තව සිටින
කෙනෙකු ලෙස යම් අදහස් කිහි-
පයක් ඉදිරිපත් කරන්න කැමැත්-
තෙමි.[9] **26** දැන් විවිධ දුෂ්කරතා
ඇති නිසා කෙනෙක් තමා සිටින
ලෙසම දිගටම සිටීම සුදුසු බව
මට සිතේ.[10] **27** නමුත් ඔබට භාර්-
යාවක් සිටී නම්[11] ඇගෙන් නිදහස්
වීමට උත්සාහ නොකරන්න.[12] ඔබට
භාර්යාවක් නැත්නම් තවදුරටත් භාර්-
යාවක් නොසොයන්න. **28** නමුත්
කෙනෙක් විවාහ වුණත් එය වර-
දක් කියා පැවසිය නොහැක.[13] එලෙස
අවිවාහකයෙක්* විවාහ වුණොත් ඒ
තැනැත්තා කිසි වරදක් කරන්නේ
නැත. නමුත් විවාහ වන අයට තම
ජීවිතයේ වෙනත් ආකාරයේ දුෂ්කර-
තාවලට මුහුණ දෙන්න සිදු වේ.[14] මා
මේ දේවල් පවසන්නේ ඔබ ඒ දුෂ්කර-
තාවලට මුහුණ දෙනවා දකින්න මා
අකමැති නිසාය.

**29** සහෝදරයෙනි, මා පවසන මේ
දේ මතක තබාගන්න. ඉතුරු

**7 පරි.**
1 එෆී 6:1
2 මලා 2:15
3 හෙබ්‍රෙ 12:14
4 1පේතෘ 3:1
5 යාකො 5:20
6 1කොරි 9:14
7 ගීතා 143:10; යෙසා 46:11; 1කොරි 7:7; 1කොරි 12:18
8 ක්‍රියා 21:20
9 ක්‍රියා 10:45; ගලා 5:2
10 ක්‍රියා 15:1; ක්‍රියා 15:24
11 රෝම 2:25
12 ගලා 6:15; කොලො 3:11
13 දේශ 12:13; යෙරෙ 7:23; ගලා 5:6; 1යොහ 5:3
14 එෆී 4:1
15 1කොරි 7:17
16 ගලා 3:28

**2 තීරුව**
1 යොහ 8:36; පිලෙ 16
2 එෆී 6:8
3 1පේතෘ 2:16
4 1කොරි 6:20; හෙබ්‍රෙ 9:12; 1පේතෘ 1:18
5 ගලා 4:9; ගලා 5:1
6 1කොරි 7:26
7 1තිමෝ 1:16
8 1තිමෝ 1:12
9 1කොරි 7:12
10 1කොරි 7:17
11 මතෙ 19:6
12 මලා 2:16; එෆී 5:33
13 හෙබ්‍රෙ 13:4
14 උත් 3:16

**1කොරි 7:25*** මු.අ., "කන්‍යාභාවයේ සිටින පුරු-ෂයන් සහ ස්ත්‍රීන්." **28*** 1කොරි 7:25හි පාදසට-හන බලන්න.

වී තිබෙන්නේ තව කෙටි කාලයක්
පමණි.[1] එහෙයින් විවාහ වී සිටින
අය තම විවාහ ජීවිතයට පමණක්
මුල් තැන දෙමින් කටයුතු කිරීමෙන්
වැළකී සිටිය යුතුයි.[2] **30** එලෙසම
හඬා වැලපෙන අය එසේ නොකරන
අය මෙන්ද ප්‍රීති වන අය ප්‍රීති නොවන
අය මෙන්ද දේවල් මිල දී ගන්නා අය
කිසිවක් අයිති නැති අය මෙන්ද සිටිය
යුතුයි. **31** මීට අමතරව මේ ලෝ-
කයේ තිබෙන දේවල් භුක්ති විඳින
අය[3] ඒවා උපරිම ලෙස භුක්ති නො-
විඳින අය මෙන්ද විය යුතුයි. මන්ද
මේ ලෝකයේ තිබෙන වාතාවරණය
වෙනස් වෙමින් පවතී.[4] **32** ඇත්-
තෙන්ම මාගේ කැමැත්ත වන්නේ
ඔබ පීඩා කරදරවලින් නිදහස්ව සිටි-
නවා දැකීමය.[5] අවිවාහක පුරුෂයෙකු
නිතරම උත්සාහ කරන්නේ ස්වා-
මීන්ව සතුටු කිරීමටය. එහෙයින් ඔහු
උනන්දු වන්නේ ස්වාමීන්ගේ සේවයට
සම්බන්ධ දේවල් ගැනය. **33** නමුත්
විවාහක පුරුෂයා තම භාර්යාවව
සතුටු කරන ආකාරය ගැන කල්-
පනා කරන නිසා[6] ඔහු එදිනෙදා ජීවි-
තයේ දේවල් ගැනත් කරදර වෙයි.[7]
**34** එහෙයින් ඔහුට නිතරම දෙපැත්-
තක් ගැන සිතීමට සිදු වේ. අවිවාහක
ස්ත්‍රියක් හෝ යෞවනියක් නිතරම
උත්සාහ කරන්නේ තම ශරීරයෙන්
හා මනසින් ශුද්ධව සිටීමටයි. එහෙ-
යින් ඇය උනන්දු වන්නේ ස්වාමීන්ගේ
සේවයට සම්බන්ධ දේවල් ගැනය.[8]
නමුත් විවාහක ස්ත්‍රිය තම ස්වාමිපුරු-
ෂයාව සතුටු කරන ආකාරය ගැන
කල්පනා කරන නිසා ඇය එදිනෙදා
ජීවිතයේ දේවල් ගැනත් කරදර වෙයි.[9]
**35** මා මේ දේවල් පවසන්නේ ඔබට
තහංචි දැමීමේ අදහසින් නොව ඔබේම
ප්‍රයෝජනය සඳහාය.[10] එනම් ඔබේ
සිත වෙනතකට යොමු නොකර ස්වා-
මීන්ට නොකඩවා සේවය කිරීමේ ප්‍රස්-
තාව ලබා දීම සඳහාය.[11]

**36** ඇතැම් අවස්ථාවලදී අවිවාහක
කෙනෙකුට තම ලිංගික හැඟීම් පාල-
නය කිරීම අපහසු බව* හැඟෙන්න
පුළුවන.[1] එසේම ඔහු යොවුන් විය
පසු කර සිටිනවා නම් නැතහොත්
තමා විවාහ විය යුතුයි කියා ඔහුට
හැඟෙනවා නම් විවාහ වීමට ඔහුට
නිදහස තිබේ. ඔහු වරදක් කරනවා
කියා පැවසිය නොහැක. එවැනි අයට
විවාහ විය හැක.[2] **37** නමුත් කෙ-
නෙක් විවාහ නොවී සිටීමට* අධිෂ්-
ඨාන කරගෙන සිටිය හැක. තමාට
විවාහ වීම සඳහා අවශ්‍යතාවක් නැති
බවත් තමාගේ හැඟීම් පාලනය කර-
ගැනීමට තමාට හැකි බවත් ඔහුට
සිතෙන නිසා තමා ගත් තීරණයට
ස්ථිරව ඇලී සිටීමෙන් ඔහුට යහප-
තක් සිදු වේ.[3] **38** ඒ අනුව කෙනෙක්
විවාහ වුණත්* එයින් ඔහුට යහපතක්
සිදු වේ.[4] නමුත් විවාහ නොවී සිටින
තැනැත්තාට ඊටත් වඩා යහපතක්
සිදු වේ.[5]

**39** භාර්යාවක් තම ස්වාමිපුරුෂයා
ජීවත්ව සිටින කාලය පුරා ඔහු හා
බැඳී සිටියි.[6] නමුත් ඇගේ ස්වාමිපුරු-
ෂයා මිය ගියොත් තමන්ට කැමති
කෙනෙකු සමඟ විවාහ වීමට ඇයට
නිදහස තිබේ. නමුත් ඒ තැනැත්තා
අනිවාර්යයෙන්ම ස්වාමීන්ගේ අනු-
ගාමිකයෙකු විය යුතුයි.[7] **40** මා
සිතන්නේ ඇය නැවත විවාහ වන්නේ
නැත්නම් ඇයට වැඩි සතුටක් භුක්ති
විඳිය හැකි බවය.[8] මේ දේවල් පවසන
මා තුළ දෙවිගේ බලය ක්‍රියාත්මක
වන බව මට විශ්වාසයි.[9]

**8** මා දැන් දේවතා රූපවලට පුදන
ආහාර ගැන[10] යමක් පැවසීමට
කැමතිය. ඇත්තටම මේ කාරණය
සම්බන්ධයෙන් අප සියලුදෙනාටම
දැනුම තිබේ.[11] නමුත් දැනුම
නිසා කෙනෙකු තුළ ඇති වන්නේ
අහංකාරය පමණි. ඇත්තෙන්ම අන්
අයව ගොඩනංවන්නේ දැනුම නොව

**7 පරි.**
1 මතෙ 24:33, රෝම 13:11, 1පේතෘ 4:7
2 ලූක් 14:26
3 1යොහ 2:16
4 2තිමෝ 3:13
5 ලූක් 10:41
6 1කොරි 7:4
7 ලූක් 14:20, 1තිමෝ 5:8
8 ලූක් 10:42, 1තිමෝ 5:5
9 හිතෝ 31:12
10 1කොරි 6:12
11 ලූක් 10:40

**2 තීරුව**
1 මතෙ 19:12
2 1කොරි 7:28
3 මතෙ 19:11
4 හෙබ්‍රෙ 13:4
5 1කොරි 7:32
6 රෝම 7:2
7 උත් 24:3, ද්වි 7:3, ද්වි 7:4, නෙහෙ 13:25, 2කොරි 6:14
8 1කොරි 7:26
9 1තෙස 4:8

**8 පරි.**
10 ක්‍රියා 15:20
11 රෝම 14:14, 1කොරි 8:10

**1කොරි 7:36*** මූ.අ., "තම කන්‍යාභාවය සම්බන්ධයෙන් නුසුදුසුව ක්‍රියා කරන බව." **37*** මූ.අ., "තම කන්‍යාභාවය රැකගැනීමට." **38*** මූ.අ., "විවාහ වීමෙන් තම කන්‍යාභාවය පරිත්‍යාග කළත්."

කෙනෙකු තුළ තිබෙන ප්‍රේමයයි.[1] **2** තමාට යම් දෙයක් ගැන දැනුමක් තිබෙනවා කියා කෙනෙකු සිතූ පමණින්[2] ඔහුට ඒ ගැන සම්පූර්ණ අවබෝධයක් තිබෙනවා කියා පැවසිය නොහැක.[3] **3** නමුත් යමෙක් දෙවිට ප්‍රේම කරන විට[4] දෙවි එවැනි කෙනෙකුව පිළිගනියි.[5]

**4** එසේනම් දේවතා රූපවලට පුදන දේවල් ආහාරයට ගැනීම ගැන[6] කතා කරමු. දේවතා රූපයක් යනු කිසි වැඩකට නැති දෙයක් බවත්[7] එකම දෙවි මිස වෙනත් දෙවි කෙනෙකු නැති බවත්[8] අපි දනිමු. **5** බොහෝ “දෙවිවරු”[9] සිටිති. එසේම ස්වර්ගයෙහි[10] හෝ පොළොවෙහි[11] හෝ සිටින සමහරුන්ව “දෙවිවරුන්” සහ “ස්වාමිවරුන්”[12] ලෙස සලකනු ලැබේ. **6** නමුත් අපට සිටින්නේ එක දෙවි කෙනෙක්ය.[13] එනම් පියාණන්ය.[14] සියල්ල සෑදුවේ ඔහුය. අපද ජීවත් වන්නේ ඔහු උදෙසාය.[15] එලෙසම සිටින්නේ එක ස්වාමීන් කෙනෙක්ය.[16] එනම් යේසුස් ක්‍රිස්තුස්ය.[17] දෙවි සියල්ල සෑදුවේ ඔහුව යොදාගෙනය.[18] අපට ජීවනය ලැබුණෙත් ඔහු නිසාය.

**7** නමුත් අප ලබා ඇති ඒ දැනුම සියලුදෙනාටම නැත.[19] එහෙයින් ආහාර ගන්නා විට සමහරුන් පුරුදු වී සිටින්නේ එම ආහාර දේවතා රූපවලට පිදූ ආහාරවලට යම් සම්බන්ධයක් ඇති බව සිතීමටය.[20] ඒ දේ සිදු වන්නේ ඔවුන්ගේ හෘදය සාක්ෂිය නිසි ලෙස පුහුණු කර නැති නිසාය. ඒ අනුව ඔවුන්ගේ හෘදය සාක්ෂිය ඔවුන්ට දොස් නඟන බව කිව හැක.[21] **8** අප යම් ආහාරයක් ගත්තත් නැතත් එය දෙවිගේ අනුමැතිය ලබාගැනීමට බලපාන්නේ නැති බව[22] මෙහිදී අප මතක තබාගත යුතුයි. අප යම් දෙයක් නොකා සිටියා කියා අපට කිසි පාඩුවක් වන්නේවත් යම් දෙයක් කෑ පමණින් අපට යම් වාසියක් ලැබෙන්නේවත් නැත.[23] **9** ඔබට ඒ සම්බන්ධයෙන් නිදහස තිබුණත් එම නිදහස අයුතු ලෙස පාවිච්චි නොකිරීමට වගබලා ගන්න. මන්ද ඔබ කරන දේ නිසා සත්‍ය ඉගැන්වීම් ගැන එතරම් පුළුල් අවබෝධයක් නැති කෙනෙකු ඔහුගේ ස්ථාවරයෙන් වැටී යෑමට පුළුවන.[1] **10** එවැනි කෙනෙක් ඔබ දේවාලයක් අසල ඉඳගෙන ආහාර ගන්නා ආකාරය දුටුවායයි සිතමු. එතැන ඉඳගෙන ආහාර ගැනීමේ වරදක් නොමැති බව දන්නා නිසා ඔබ එසේ කරනවා විය හැක. ඔබ එසේ කරන නිසා හෘදය සාක්ෂිය පවසන දේ නොසලකා දේවතා රූපවලට පිදූ ආහාර පවා කෑමට ගන්න ඔහු තුළ පෙලඹීමක් ඇති විය හැක.[2] **11** එලෙස ඔබට තිබෙන දැනුම නිසා දුර්වලව සිටින ඔබේ සහෝදරයාගේ විශ්වාසය විනාශ වී යයි. ඔහු වෙනුවෙනුත් ක්‍රිස්තුස් මිය ගිය බව මතක තබාගන්න.[3] **12** ඔබ ඔබේ සහෝදරයන්ට විරුද්ධව එලෙස වැරදි කරන විට පුළුල්ව නොසිතන ඔවුන් පෙලඹෙන්නේ ඔවුන්ගේ හෘදය සාක්ෂියට විරුද්ධව ක්‍රියා කිරීමටය.[4] එවිට ඇත්තටම ඔබ වරදක් කරන්නේ ක්‍රිස්තුස්ට විරුද්ධවය. **13** ඒ අනුව මා ගන්නා යම් ආහාරයක් නිසා මගේ සහෝදරයාට හානියක් සිදු වෙයි නම්[5] මම ඒ දේ නොකරන්නෙමි. මගේ සහෝදරයාට හානියක් සිදු වෙනවා දකින්න මා අකමැති නිසා නැවත කිසිදා මම මස් නොකන්නෙමි.[6]

# 9

මා කැමති දේ කිරීමට මට නිදහසක් තිබෙනවා නොවේද?[7] මා ස්වාමීන්ගේ නියෝජිතයෙක්* නොවේද?[8] මා අපගේ ස්වාමීන් වන යේසුස්ව දුටු කෙනෙක් නොවේද?[9] ස්වාමීන් වෙනුවෙන් මා කළ සේවයේ ප්‍රතිඵලය ඔබ නොවේද? **2** සමහරුන් සිතන්නේ මා අන් අය වෙනුවෙන් පත් කළ නියෝජිතයෙකු නොවන බවය. එසේවුවත් මාව ඔබ වෙනතට එවනු ලැබූ බව කිසිවෙකුට ප්‍රතික්ෂේප කළ නොහැක. මන්ද

**1කොරි 9:1*** හෝ, “යවනු ලැබුවෙක්.”

**8 පරි.**
1 1කොරි 8:13 1කොරි 13:5 එෆී 3:19
2 ගලා 6:3
3 1තිමෝ 6:4
4 1යොහ 4:8
5 නික් 33:12 නාහු 1:7
6 1කොරි 10:18
7 ද්වි 32:21 2රාජ 19:18 යෙසා 44:10 යෙරෙ 16:20
8 ද්වි 6:4 ද්වි 32:39 එෆී 4:6
9 ගීතා 82:1 යොහ 10:35
10 ගීතා 8:5 හෙබ්‍රෙ 2:7
11 ගීතා 82:6
12 ගීතා 136:3
13 1තිමෝ 2:5
14 මලා 2:10 මතෙ 23:9
15 ක්‍රියා 17:28 රෝම 11:36
16 එෆී 4:5
17 පිලි 2:11
18 යොහ 1:3 කොලො 1:16
19 රෝම 14:14 1කොරි 10:27
20 1කොරි 10:28
21 රෝම 14:23
22 රෝම 14:17
23 හෙබ්‍රෙ 13:9

**2 තීරුව**
1 රෝම 14:13 රෝම 14:20
2 එළි 2:14
3 මතෙ 20:28 රෝම 14:15
4 1කොරි 10:29
5 රෝම 14:15
6 මතෙ 18:6 රෝම 14:21 2කොරි 11:29

**9 පරි.**
7 ගලා 5:1
8 2කොරි 12:12 1තිමෝ 2:7
9 ක්‍රියා 9:5 1කොරි 15:8

මා ස්වාමීන් වෙනුවෙන් එවනු ලැබූ
නියෝජිතයෙකු බව සහතික කරන
‘මුද්‍රාව’ ඔබය.[1]
**3** මගේ සුදුසුකම් ගැන ප්‍රශ්න
කරන අයට මේ දේ පැවසීමට
කැමැත්තෙමි.[2] **4** අන් අය දෙන
කෑම බීම ලබාගැනීමට අයිතියක්
අපට නැද්ද?[3] **5** අනිකුත් නියෝ-
ජිතයන්, ස්වාමීන්ගේ සහෝදරයන්[4]
සහ සීෆස්[5] හා සමානව දෙවිට සේ-
වය කරන ස්ත්‍රියකව විවාහ කරගෙන[6]
ඇයව අපගේ ගමන්වලදී රැගෙන
යෑමට අපටත් අයිතියක් නැද්ද?
**6** රැකියාවක් නොකර සිටින්න අයිති-
යක් නැත්තේ[7] බාර්නබස්ට[8] හා මට
පමණද? **7** සාමාන්‍යයෙන් හේවා-
යෙකු සේවය කරන්නේ තමාගේම
වියදමින්ද? මිදිවත්තක් වවන පුද්ග-
ලයා එහි පලදාව භුක්ති විඳින්නේ
නැද්ද?[9] සත්ව රැළක් ඇති කර එය
බලාගන්නා පුද්ගලයාට රැළෙහි කිරිව-
ලින් කොටසක් ලැබෙන්නේ නැද්ද?[10]
**8** මා මේ දේවල් පවසන්නේ මිනි-
සුන් මේ සම්බන්ධයෙන් දරන
අදහස් පදනම් කරගෙන නොවේ.[11]
නීතියෙත්[12] මේ දේවල් ගැන යමක්
පවසා තිබේ. **9** ඇත්තෙන්ම, “ගව-
යෙක් කමතේ කරල් පාගන විට උගේ
කට බඳින්න එපා”[13] කියා මෝසෙස්ට
දෙන ලද නීතියේ ලියා තිබේ. දෙවි
සැලකිලිමත් වන්නේ ගවයන් ගැන
පමණක්ද? **10** එසේ නැත්නම් ඔහු
ඒ දේ පැවසුවේ අප ගැනත් සිතාගෙ-
නද? ඇත්තෙන්ම එය ලියන ලද්දේ
අප උදෙසාය.[14] මන්ද සීසාන මිනිසා
සීසෑමේ නිරත වන්නේ යමක් බලා-
පොරොත්තුවෙනි. එමෙන්ම කමතෙහි
වැඩ කරන මිනිසා එහි වැඩ කරන්-
නේද යමක් බලාපොරොත්තුවෙනි.[15]
**11** අප දෙවිගෙන් ලැබූ දේවල් ඔබ
අතරේ වපුරා ඇත්නම්[16] අපගේ ශාරී-
රික අවශ්‍යතා සඳහා ඔබෙන් යමක්
නෙළාගැනීම[17] අසාධාරණ දෙයක්ද?
**12** ඔබ අතරෙහි සිටින වෙනත් අයට
එසේ කිරීමට අයිතියක් ඇත්නම්[18]
අපට ඊටත් වඩා අයිතියක් තිබිය
යුතු නැද්ද? අපට ඒ සඳහා අයිති-
යක් තිබුණත් අපි ඔබෙන් කිසි දෙ-
යක් ලබාගත්තේ නැත.[1] ඒ වෙනුවට
අපි සෑම දෙයක්ම දරාගෙන සිටින්-
නෙමු. එසේ කරන්නේ ක්‍රිස්තුස් පිළි-
බඳ ශුභාරංචිය කිසි බාධාවක් නැතුව
පතළ කිරීම සඳහාය.[2] **13** දේවමා-
ලිගාවේ විවිධ පරිශුද්ධ කාර්යයන්
ඉටු කරන පුරුෂයන් එහි තිබෙන
ආහාර කෑමට ගන්නා බවත්[3] පූජා-
සනයේ සේවය කරන අයට[4] පූජා-
වෙන් යම් කොටසක් ලැබෙන බවත්
ඔබ දැන සිටියේ නැද්ද? **14** එලෙ-
සම ශුභාරංචිය ප්‍රකාශ කරන අය-
ටත් තම එදිනෙදා අවශ්‍යතා සඳහා
යමක් බලාපොරොත්තු විය හැකි බව[5]
ස්වාමීන් වන යේසුස් පවා සඳහන්
කළේය.[6]
**15** නමුත් මට ලැබිය යුතුව තිබූ
කිසිවක් මා ලබාගත්තේ නැත.[7]
මා දැන් මේ දේවල් ගැන සඳහන්
කරන්නේ ඒවා ලබාගැනීමේ අදහ-
සින් නොවේ. ඇත්තෙන්ම එසේ ලබා-
ගන්නවාට වඩා මා මිය යනවා නම්
හොඳය. මෙයාකාරයෙන් මා බියක්
සැකක් නැතුව පවසන ඒ දේ සැබෑ-
වක් නොවෙයි කියා කිසි කෙනෙකුට
පැවසිය නොහැක.[8] **16** කෙසේවෙ-
තත් මා ශුභාරංචිය ප්‍රකාශ කළත්[9] ඒ
ගැන ආඩම්බර වීමට මට කිසි හේතු-
වක් නැත. මන්ද ශුභාරංචිය ප්‍රකාශ
කිරීමට මම බැඳී සිටිමි.[10] ඇත්තෙන්ම
එසේ නොකළොත් එය මට මොන
තරම් දුකක්ද![11] **17** මා අකමැත්-
තෙන් වුවත් එය කළ යුතුයි. මන්ද
එය ඉටු කිරීමේ වගකීම මට භාර
දී තිබේ.[12] මා එය කැමැත්තෙන්ම
ඉටු කළොත්[13] මට යමක් ලැබේ.[14]
**18** එයින් මට ලැබෙන්නේ කුමක්ද?
ඒ, කිසි දෙයක් අය කරන්නේ නැතුව[15]
මා ශුභාරංචිය ප්‍රකාශ කළ බව පැවසී-
මට මට හැකි වීමයි. මා එසේ කරන්-
නේ මට හිමි බලතල අයුතු ලෙස
පාවිච්චි නොකිරීමේ අදහසිනි.
**19** එමනිසා මම ඔබෙන් කිසි
කෙනෙකුට බැඳී නැත. නමුත්

**9 පරි.**
1 2කොරි 3:2
2 1කොරි 4:3
3 ලූක් 10:8
4 මතෙ 13:55
ගලා 1:19
5 මතෙ 8:14
යොහ 1:42
6 මතෙ 19:11
7 ක්‍රියා 18:3
2තෙස 3:8
8 ක්‍රියා 13:2
9 ද්වි 20:6
හිතෝ 27:18
10 ද්වි 32:14
1පේතෘ 5:2
11 රෝම 3:5
12 ගීතා 19:7
13 ද්වි 25:4
1තිමෝ 5:18
14 රෝම 15:4
1කොරි 10:11
15 2තිමෝ 2:6
16 1කොරි 2:13
ගලා 1:11
17 රෝම 15:27
ගලා 6:6
පිලි 4:17
18 මතෙ 17:25
ලූක් 20:25

**2 තීරුව**
1 ක්‍රියා 20:34
2 2කොරි 6:3
2කොරි 11:7
3 ලෙවී 6:16
ගණන් 18:31
ද්වි 18:1
4 1කොරි 7:35
5 රෝම 15:27
ගලා 6:6
1තෙස 2:9
හෙබ්‍රෙ 13:16
6 මතෙ 10:10
ලූක් 10:7
7 ක්‍රියා 18:3
ක්‍රියා 20:34
1කොරි 4:12
2තෙස 3:8
8 2කොරි 11:10
9 එළි 22:17
10 යෙරෙ 20:9
ලූක් 17:10
11 එස 3:18
12 ගලා 2:7
එෆී 3:2
කොලො 1:25
13 1පේතෘ 5:2
14 1කොරි 3:14
15 2කොරි 11:7

මම කැමැත්තෙන්ම සියලුදෙනාගේ
දාසයා ලෙස කටයුතු කරන්නෙමි.[1]
එසේ කරන්නේ හැකි තරම් පිරිසක්
ක්‍රිස්තුස් වෙනට ගෙන ඒම සඳහාය.[2]
**20** එහෙයින් යුදෙව්වන්ව දිනාගැනීම
සඳහා මා යුදෙව්වන් සමඟ කටයුතු
කළේ ඔවුන්ට ගැළපෙන ආකාරය-
ටය.[3] මා නීතිය යටතේ නොසිටියත්[4]
නීතිය යටතේ සිටින අයව දිනාගැ-
නීම සඳහා මා ඔවුන් සමඟ කටයුතු
කළේ ඔවුන්ට ගැළපෙන ආකාරය-
ටය.[5] **21** එලෙසම මා දෙවිගේ නීති-
යටද ක්‍රිස්තුස්ගේ[6] නීතියටද යටත්ව
සිටියත්[7] නීතියක් යටතේ නොසි-
ටින අයව[8] දිනාගැනීම සඳහා මම
ඔවුන්ට ගැළපෙන අයුරින් කටයුතු
කළෙමි.[9] **22** සත්‍ය ඉගැන්වීම් ගැන
එතරම් පුළුල් අවබෝධයක් නැති
අයව දිනාගැනීමට මම ඔවුන්ට ගැළ-
පෙන අයුරින් කටයුතු කළෙමි.[10] ඒ
අනුව හැකි සෑම ආකාරයකින්ම කිහි-
පදෙනෙකුව හෝ බේරාගැනීමට මම
සෑම තරාතිරමකම පුද්ගලයන් වෙ-
නුවෙන් ඒ ඒ අයට ගැළපෙන අයු-
රින් කටයුතු කළෙමි.[11] **23** මා මේ
සියල්ල කරන්නේ ශුභාරංචිය වෙනු-
වෙන්ය.[12] එසේ කිරීමෙන් මේ ශුභාරං-
චිය සියලුදෙනාටම ප්‍රකාශ කරන්න
මට හැකියාව ලැබී තිබේ.

**24** ධාවන තරඟයකට බොහෝ-
දෙනෙකු සහභාගි වුණත්[13] ත්‍යාගය
ලැබෙන්නේ එක් කෙනෙකුට පම-
ණක් බව ඔබ හොඳින් දන්නා දෙ-
යකි.[14] ඔබට එම ත්‍යාගය අවශ්‍ය
නම් එය ලබාගත හැකි ආකාරය-
කින්[15] දුවන්න.[16] **25** ඊට අමතරව
ඕනෑම තරඟයකට සහභාගි වන කෙ-
නෙක් සෑම දෙයකදීම තමාව පාලනය
කරගැනීමට පියවර ගනියි.[17] ඔහු එසේ
කරන්නේ දිරා යන ඔටුන්නක් ලබා-
ගැනීමටය.[18] නමුත් අප එසේ කරන්-
නේ කිසිදා දිරා නොයන ඔටුන්නක්
ලබාගැනීමටය.[19] **26** එහෙයින් මා
දුවන්නේ[20] අරමුණක් ඇතුව මිස දෙගි-
ඩියාවෙන් නොවේ. එලෙසම මා පහර
දෙන්නේ ඉලක්කයට මිස නිකම්ම

**9 පරි.**
**1** ගලා 5:13
**2** 1පේත 3:1
**3** ක්‍රියා 16:3; ක්‍රියා 18:18
**4** රෝම 6:14
**5** ක්‍රියා 21:24; ක්‍රියා 21:26
**6** 1කොරි 7:22
**7** යොහ 13:34; ගලා 6:2
**8** රෝම 2:12
**9** ගලා 2:3
**10** රෝම 14:1; රෝම 15:1; 2කොරි 11:29
**11** ගලා 3:28
**12** ක්‍රියා 19:26; 1තෙස 2:8
**13** ගලා 5:7
**14** පිලි 3:14; කොලො 2:18
**15** මතෙ 10:22; මතෙ 24:13; 2තිමෝ 4:8
**16** ගලා 2:2; පිලි 2:16
**17** 2පේත 1:6
**18** 2තිමෝ 2:5
**19** යාකො 1:12
**20** හෙබ්‍රෙ 12:1

**2 තීරුව**
**1** 1කොරි 14:9
**2** රෝම 8:13; කොලො 3:5
**3** 2කොරි 13:6

**10 පරි.**
**4** නික් 13:21
**5** නික් 14:22
**6** හෙබ්‍රෙ 3:5
**7** නික් 16:15
**8** නික් 17:6; ගීතා 78:15
**9** ගණන් 20:11
**10** මතෙ 16:18; 1පේත 2:4
**11** යොහ 4:10; යොහ 4:25
**12** ගණන් 14:16; එස 20:15; යූද් 5
**13** ගණන් 14:29; හෙබ්‍රෙ 3:17
**14** ගණන් 11:34; ගීතා 106:14
**15** නික් 32:4
**16** නික් 32:6
**17** ගණන් 25:1; 2පේත 2:2
**18** ගණන් 25:9

සුළඟට පහර දෙන ආකාරයට නො-
වේ.[1] **27** ඒ අනුව මම මගේ ශරීරයට
දැඩි ලෙස පහර දෙමින්[2] වහලෙ-
කුව ඇදගෙන යන්නා සේ එය මගේ
පාලනයට යටත් කරගන්නෙමි. එසේ
කරන්නේ මා අන් අයට දේශනා කළ
පසු කිසි ලෙසකින්වත් මට දෙවිගේ
අනුමැතිය අහිමි නොවීම සඳහාය.[3]

**10** සහෝදරයෙනි, අපගේ මුතුන්-
මිත්තන්ට සිදු වූ දේ ඔබ අම-
තක කරනවාට මා කැමති නැත.
වලාකුළක් ඔවුන් සියලුදෙනාටම ඉහ-
ළින් පිහිටා තිබිණ.[4] එලෙසම ඔවුහු
මුහුද මැදින් ගමන් කර,[5] **2** ඒ වලා-
කුළ හා මුහුද මාර්ගයෙන් මෝසෙස්ව
අනුගමනය කළ අය ලෙස බව්-
තීස්ම වූහ.[6] **3** සියලුදෙනාම දෙවි-
ගෙන් ලැබූ ආහාරය භුක්ති වින්දෝය.[7]
**4** ඔවුහු දෙවිගෙන් ලැබූ ජලයද
පානය කළෝය.[8] ඔවුන් ජලය පානය
කළේ දෙවි ලබා දුන් පර්වතයෙන්ය.[9]
ඔවුන්ට ඒ පර්වතය[10] සෑමවිටම උප-
කාරයක් විය. ඒ පර්වතයෙන් නියෝ-
ජනය වූයේ ක්‍රිස්තුස්වය.[11] **5** නමුත්
ඒ අයගෙන් බොහෝදෙනෙකුට දෙ-
විගේ අනුමැතිය ලැබුණේ නැත.[12]
එහෙයින් ඔවුහු පාළුකරයේදීම මිය
ගියෝය.[13]

**6** එම සිදුවීම්වලින් අපට පාඩ-
මක් ඉගෙනගත හැකියි. ඔවුන් හානි-
කර දේවලට ආශා කළ ලෙස අපත්
හානිකර දේවලට ආශා කරන අය
නොවිය යුතුයි.[14] **7** ලියවිලිවල සඳ-
හන් ආකාරයට, "සෙනඟ ඉඳගෙන කා
බී විනෝද වීමට පටන්ගත්තෝය."[15]
ඒ අවස්ථාවේදී ඔවුන්ගෙන් සමහ-
රුන් කළා සේ අප රූපවලට වඳින
අය නොවිය යුතුයි.[16] **8** ඔවුන්ගෙන්
සමහරුන් වේශ්‍යාකම්* කළා සේ
අපත් වේශ්‍යාකම් නොකළ යුතුයි.[17]
එසේ කිරීමෙන් ඔවුන්ගෙන් විසිතුන්-
දහසක් එකම දවසෙහි මිය ගියෝය.[18]

**1කොරි 10:8*** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න.

**9** යෙහෝවා දෙවි තමන් වෙනුවෙන්
මැදිහත් වෙයිද කියා ඔවුන්ගෙන් සම-
හරුන් දෙවිව පරීක්ෂා කළා සේ[1]
අපිත් ඔහු අප වෙනුවෙන් මැදි-
හත් වෙයිද කියා පරීක්ෂා නොකරමු.[2]
එසේ කළ නිසා සර්පයන් ඔවුන්ට
දෂ්ට කළ අතර ඔවුහු මිය ගියෝය.[3]
**10** ඔවුන්ගෙන් සමහරදෙනෙකු මැසි-
විලි නැඟූ ලෙස ඔබත් මැසිවිලි නැඟී-
මෙන් වළකින්න.[4] එසේ කිරීමෙන්
ඔවුහු දේවදූතයෙකු අතින් විනාශ
වුණෝය.[5] **11** ඔවුන්ට සිදු වූ ඒ
දේවලින් අපට පාඩමක් ඉගෙනගත
හැක. ඒවා ලියනු ලැබුවේ මේ සමාජ-
යේ අවසාන කාලයේ ජීවත් වන අපට[6]
අනතුරු ඇඟවීමක් ලෙසය.[7]

**12** කෙනෙක් තමා ස්ථිරව සිටි-
නවා කියා සිතුවත් ඔහු වැටී යෑමට
ඉඩ තිබේ. එමනිසා ඔහු සෝදිසියෙන්
සිටිය යුතුයි.[8] **13** වැරදි දේවල් කිරී-
මට යම් පෙලඹීමක් ඔබ තුළ ඇති
වන විට අන් සියලු මිනිසුන් තුළත්
එවැනි පෙලඹීම් ඇති වන බව මතක
තබාගන්න.[9] නමුත් දෙවි විශ්වා-
සවන්තය.[10] එහෙයින් එවැනි පෙ-
ලඹීම්වලට සම්පූර්ණයෙන්ම හසු වී
ඒවායින් යටපත් වී යෑමට ඔහු ඉඩ
දෙන්නේ නැත.[11] මන්ද වැරදි දේවල්
කිරීමට පෙලඹීමක් ඔබ තුළ ඇති වන
විට එයින් ගොඩ ඒමට මඟක් ඔහු
සලසා දෙයි.[12] එමනිසා ඊට හොඳින්
මුහුණ දීමට ඔබට හැකි වේ.

**14** මාගේ ප්‍රේමණීය සහෝදර-
යෙනි, රූප වන්දනාවෙන්[13] පලා
දුවන්න.[14] **15** මා ඔබට කතා
කරන්නේ ඔබට හොඳ වටහාගැනී-
මේ හැකියාවක් තිබෙන බව සිතා-
ගෙනය.[15] එහෙයින් මා කියන දේ
ගැන ඔබටම තීරණයක් ගත හැකියි.
**16** අප දෙවිට ස්තුති කර අතිනත
යවන ස්තුති කිරීමේ කුසලානයෙන්[16]
අදහස් කරන්නේ කුමක්ද? එයින්
අප ක්‍රිස්තුස්ගේ රුධිරයෙන් ප්‍රයෝජන
ලබන ආකාරය අදහස් වන්නේ නැද්ද?
අප කඩා අතිනත යවන රොටියෙන්[17]
අදහස් කරන්නේ කුමක්ද? එයින්
ක්‍රිස්තුස්ගේ ශරීරයෙන් අප ප්‍රයෝ-
ජන ලබන ආකාරය අදහස් වන්-
නේ නැද්ද?[1] **17** එදා භාවිත කළේ
එක රොටියක්ය. අප සියලුදෙනා
ඒ එක රොටියෙන් කන නිසා[2] අප
බොහෝදෙනෙකු සිටියත්[3] අපගෙන්
සෑදෙන්නේ එකම ශරීරයයි.[4]

**18** උදාහරණයකට ඊශ්‍රායෙල් සෙ-
නඟ ගැන සලකා බලන්න.[5] එදා
ඔවුන් පූජා කළ දේ ඔවුන් ආහා-
රයට ගත් විට ඔවුන් පූජාසනයට
හවුල් වුණා කියා පැවසිය හැක.[6]
**19** මා එසේ පවසන්නේ දේවතා රූප-
යකට පූජා කළ දෙයකට හෝ දේවතා
රූපයකට යම් වටිනාකමක් තිබෙන
නිසාද?[7] **20** නැත. මා කියන්නේ
වෙනත් ජාතීන්ට අයත්ව සිටින මිනි-
සුන් යමක් පූජා කරන විට ඔවුන් ඒ
පූජාව කරන්නේ දෙවිට නොව භූත-
යන්ට බවය.[8] එහෙයින් ඔබ භූත-
යන් සමඟ හවුල් වෙනවාට මම
කැමති නැත.[9] **21** ඔබට යෙහෝවා
දෙවිගේ කුසලානයෙනුත්[10] භූතයන්-
ගේ කුසලානයෙනුත් බීමට නුපුළු-
වන. “යෙහෝවා දෙවිගේ මේසයට”[11]
සහ භූතයන්ගේ මේසයට යන දෙක-
ටම හවුල් වෙන්න ඔබට නුපුළුවන.
**22** එසේ කරනවා නම් අප එය කරන්-
නේ, “යෙහෝවා දෙවිව උදහස් කිරී-
මට” සිතාගෙනද?[12] එසේ කරන්නේ
අප ඔහුට වඩා බලවත්[13] කියා සිතා-
ගෙනද?

**23** ඕනෑම දෙයක් කිරීමට අවසර
තිබුණත් ඒ සෑම දෙයකින්ම ප්‍රයෝජ-
නයක් ලැබෙයි කියා කිව නොහැක.[14]
එලෙසම ඕනෑම දෙයක් කිරීමට අව-
සර තිබුණත්[15] ඒ සෑම දෙයකින්ම
අන් අය දිරිගැන්වීමක් ලබන බව කිව
නොහැක.[16] **24** සියලුදෙනා තමා-
ගේම සතුට ගැන නොසිතා[17] අන්
අයට ප්‍රයෝජනවත් වන දේ ගැන
සැලකිලිමත් විය යුතුයි.[18]

**25** මස් විකුණන ස්ථානයක
තිබෙන ඕනෑම දෙයක් කෑමට ගන්න
ඔබට පුළුවන.[19] නමුත් ඒ ගැන

**10 පරි.**
1 ගණන් 21:5
2 ද්වි 6:16
3 ගණන් 21:6
4 ගණන් 14:2
5 නික් 23:21; ගණන් 14:37
6 හෙබ්‍රෙ 9:26; 1පේතෘ 4:7
7 රෝම 15:4
8 හිතෝ 28:14; ලූක් 22:34; රෝම 11:20; ගලා 6:1
9 1පේතෘ 5:9
10 1තෙස 5:24; 2තෙස 3:3
11 ලූක් 22:32; 2පේතෘ 2:9
12 1සාමු 30:6; යෙසා 40:29; ක්‍රියා 27:44; පිලි 4:13
13 ද්වි 4:25; කොලො 3:5; 1යොහ 5:21
14 2කොරි 6:17
15 1කොරි 14:20
16 මතෙ 26:27; ලූක් 22:17
17 මතෙ 26:26; ලූක් 22:19

**2 තීරුව**
1 1කොරි 12:18
2 යොහ 6:33; යොහ 6:35
3 රෝම 12:5; 1කොරි 12:25
4 එෆී 4:4
5 රෝම 9:8
6 ලෙවී 7:15
7 1කොරි 8:4
8 ද්වි 32:17; ගීතා 106:37
9 යූද් 6
10 ගීතා 116:13
11 එස 41:22; මලා 1:12
12 නික් 34:14; ද්වි 32:21
13 යෝබ් 9:4
14 1කොරි 6:12
15 රෝම 6:14
16 රෝම 14:19; රෝම 15:2
17 1කොරි 10:33; 1කොරි 13:5; පිලි 2:21
18 පිලි 2:4
19 1තිමෝ 4:4

විමසීමෙන් වළකින්න. එවිට ඔබේ
හෘදය සාක්ෂියට එය බලපාන්නේ
නැත.[1] **26** මන්ද, "පොළොව හා
එහි ඇති සියල්ල[2] යෙහෝවා දෙ-
විට[3] අයිති" බව මතක තබාගන්න.
**27** දෙවිට නමස්කාර නොකරන කෙ-
නෙකුගෙන් ඔබට යම් ඇරයුමක්
ලැබුණොත් ඔබ එහි යෑමට කැමති
නම් එහි ගොස් ඔහු ඔබට පිළිගන්-
වන ඕනෑම දෙයක් කෑමට ගන්න
ඔබට පුළුවන.[4] කෑමට දෙන දේ
ගැන ප්‍රශ්න නොකරන්න. එවිට එය
ඔබේ හෘදය සාක්ෂියට බලපාන්නේ
නැත.[5] **28** නමුත් ඒ අතරවාරයේ
යමෙක් පැමිණ, "මෙය පූජාවකදී ඔප්පු
කළ දෙයක්" කියා ඔබට පැවසුවොත්
එය නොකා සිටින්න. එසේ නො-
කළොත් එය හෙළි කළ තැනැත්-
තාට මෙන්ම හෘදය සාක්ෂියටත් එය
බලපෑ හැකිය.[6] **29** මා "හෘදය සාක්-
ෂිය" කියා පවසන්නේ ඔබේ හෘදය
සාක්ෂිය ගැන නොව අනික් අයගේ
හෘදය සාක්ෂිය ගැනය. එහෙයින් මට
නිදහසක් තිබුණත් වෙන කෙනෙකු-
ගේ හෘදය සාක්ෂියට අනුව විනිශ්චයට
ලක් වෙන්න මා අකමැති නිසා මගේ
නිදහස පාවිච්චි නොකරමි.[7] **30** මා
දෙවිට ස්තුති කර යමක් කෑමට ගත්
පසු නින්දාවට ලක් වෙන්නත් මම
නොකැමැත්තෙමි.[8]

**31** ඒ අනුව ඔබ කෑවත් බීවත්
වෙන කිසිවක් කළත් සියල්ල දෙ-
විගේ ප්‍රශංසාව හා ගෞරවය වෙනු-
වෙන් කරන්න.[9] **32** යුදෙව්වන්ටවත්
ග්‍රීකයන්ටවත්* දෙවිගේ සභාවට අයත්
සියලුදෙනාටවත් හානියක් විය හැකි
දෙයක් කිරීමෙන් වැළකී සිටින්න.[10]
**33** මගේ උත්සාහය වන්නේ මගේම
වාසිය හෝ ප්‍රයෝජනය ගැන නොව[11]
වැඩිදෙනාගේ ප්‍රයෝජනයට හේතු වන
දේ ගැන සිතමින් සෑම දෙයකදීම සිය-
ලුදෙනාව සතුටු කිරීමයි.[12] මා එසේ
කරන්නේ ඔවුන්ව ගලවාගැනීම සඳ-
හාය. ඔබත් එසේම කරන්න.[13]

# 11

**11** මා ක්‍රිස්තුස්ව අනුකරණය
කරන ආකාරයටම ඔබත්
මාව අනුකරණය කරන්න.[1]

**2** සියලු කාරණාවලදී ඔබ මාව
සිහි කර මා ඔබට කියා දුන්
සෑම දෙයකටම තදින් ඇලී සිටින
නිසා[2] ඔබට ප්‍රශංසා කරන්න කැමැත්-
තෙමි. **3** නමුත් සෑම පුරුෂයෙකු-
ගේම හිස ක්‍රිස්තුස් බවත්[3] ස්ත්‍රියකගේ
හිස පුරුෂයා බවත්[4] ක්‍රිස්තුස්ගේ
හිස දෙවි බවත්[5] ඔබ දැනගන්න-
වාට මම කැමැත්තෙමි. **4** යම් පුරු-
ෂයෙක් තම හිස වසාගෙන යාච්ඤා
කළොත් එසේ නැතහොත් අනාවැකි
පැවසුවොත් ඔහු තම හිසට අගෞරව
කරයි.[6] **5** නමුත් තම හිස නොවසා
යාච්ඤා කරන හෝ අනාවැකි කියන
සෑම ස්ත්‍රියක්ම[7] ඇගේ හිසට අගෞරව
කරයි.[8] ඇත්තෙන්ම ඇය හිස මුඩු
කරගත් ස්ත්‍රියක් හා සමාන බව පැව-
සිය හැක.[9] **6** මන්ද ස්ත්‍රියක් තම
හිස වසාගන්නේ නැත්නම් ඇගේ හිස-
කෙස් කොටට කැපිය යුතුයි. නමුත්
හිසකෙස් කොටට කැපීම හෝ හිස
මුඩු කිරීම ස්ත්‍රියකට ලැජ්ජාවක්
නම්[10] ඇය තම හිස වසාගත යුතුයි.[11]

**7** නමුත් පුරුෂයෙකුට තම හිස
වසාගැනීම අවශ්‍ය වන්නේ නැත.
මන්ද ඔහුව සාදා ඇත්තේ දෙවි-
ගේ ගතිලක්ෂණ[12] හා තේජස[13] පිළි-
බිඹු කිරීමටය. අනික් අතට ස්ත්‍රියව
සෑදුවේ පුරුෂයාට ගෞරවයක් ගෙන
දීමටය.[14] **8** මන්ද මුල්ම මිනිසාව
සෑදුවේ ස්ත්‍රියකගේ ශරීරය යොදා-
ගෙන නොවේ. නමුත් මුල්ම ස්ත්‍රියව
සෑදුවේ පුරුෂයාගේ ශරීරය යො-
දාගෙනය.[15] **9** ඊට අමතරව දෙවි
පුරුෂයාව සෑදුවේ ස්ත්‍රිය වෙනුවෙන්
නොවේ. නමුත් ඔහු ස්ත්‍රියව සෑදුවේ
පුරුෂයා වෙනුවෙන්ය.[16] **10** එහෙ-
යින් ස්ත්‍රියක් තම ස්වාමිපුරුෂයා-
ගේ මූලිකත්වයට යටත් වන බව
පෙන්නුම් කිරීමට තම හිස වසාගත
යුතුයි.[17] දේවදූතයන් නිසාත් ඇය
එසේ කළ යුතුයි.[18]

**11** එලෙසම ස්වාමීන්ගේ අනුගාමි-

**10 පරි.**
1 රෝම 14:22
2 ගීතා 24:1
3 නික් 19:5; ද්වි 10:14
4 ලූක් 10:8
5 1කොරි 8:7
6 1කොරි 8:10
7 රෝම 14:16; 1කොරි 8:12
8 රෝම 14:6; 1තිමෝ 4:3
9 මතෙ 5:16; කොලො 3:17; 1පේතෘ 4:11
10 රෝම 14:13; 1කොරි 8:13; 2කොරි 6:3
11 රෝම 15:2; පිලි 2:4
12 1කොරි 9:22
13 1තෙස 2:16

**2 තීරුව**

**11 පරි.**
1 පිලි 3:17; 2තෙස 3:9
2 1කොරි 4:17; 2තෙස 2:15; 2තෙස 3:6
3 රෝම 14:9; එෆී 4:15; කොලො 2:10
4 උත් 3:16; එෆී 5:23; 1පේතෘ 3:1
5 1කොරි 15:27; 1කොරි 15:28
6 එෆී 4:15
7 යෝවෙ 2:28; ක්‍රියා 21:9
8 එෆී 5:23
9 යෙරෙ 7:29; 1කොරි 11:15
10 ද්වි 21:12
11 උත් 24:65
12 උත් 1:27; යාකො 3:9
13 රෝම 3:23
14 උත් 2:23
15 උත් 2:22
16 උත් 2:18
17 උත් 24:65
18 දේශ 5:6; 1කොරි 4:9

**1කොරි 10:32*** රෝම 1:16හි පාදසටහන බලන්න.

කයන් අතර පුරුෂයා නැතුව ස්ත්‍රිය-
ටවත් ස්ත්‍රිය නැතුව පුරුෂයාටවත්
පැවැත්මක් නැත.[1] **12** මන්ද මුල්ම
ස්ත්‍රියව සෑදුවේ පුරුෂයාගෙන් වුවත්[2]
පසුව පුරුෂයන් බිහි වන්නේ ස්ත්‍රිය
මාර්ගයෙන්ය.[3] නමුත් සියල්ල සෑදුවේ
දෙවිය.[4] **13** ස්ත්‍රියක් තම හිස වසා
නොගෙන දෙවිට යාච්ඤා කිරීම සුදු-
සුද කියා ඔබම තීරණය කරන්න.
**14** සාමාන්‍යයෙන් පුරුෂයෙකුට දිග
කෙස් වැටියක් ඇත්නම් එය ඔහුට
අගෞරවයක් බවත්, **15** ස්ත්‍රියකට
දිග කෙස් කලඹක් ඇත්නම් එය
ඇයට ගෞරවයක් බවත්[5] ඔබ දන්නේ
නැද්ද? ඇයට එවැනි කෙස් කලඹක්
දී ඇත්තේ හිස්වැස්මක් වෙනුවටය.[6]
**16** නමුත් යම් පුරුෂයෙක් එම සම්ම-
තයට පටහැනි දෙයක්[7] අනුගමනය
කරන්න උත්සාහ කරනවා නම්[8] එය
අනුමත කරන්න අපටවත් දෙවිගේ
කිසි සභාවකටවත් නුපුළුවන.

**17** ඉහත සඳහන් උපදෙස් අදාළ
කරගැනීම ගැන මම ඔබට ප්‍රශංසා
කරන්නේ නැත. මන්ද ඔබ එකට රැස්
වන විට යහපතට වඩා අයහපත සිදු
වන නිසාය.[9] **18** ඔබ සභාවක් ලෙස
රැස් වන විට ඔබ අතරේ භේද ඇති
බව මට ආරංචි වී ඇත.[10] එය විශ්-
වාස කිරීමට මට යම් හේතු තිබේ.
**19** සමහරවිට ඔබ අතරේ නිකායන්ද
තිබෙනවා විය හැක.[11] නමුත් ඔබ
අතරෙහි දෙවිගේ අනුමැතිය ඇති අය
කවුද කියා හෙළි වනු ඇත.[12]

**20** ස්වාමීන්ගේ සන්ධ්‍යා භෝජනය
සඳහා ඔබ එකට රැස් වන විට ඊට
ඔබින අයුරින් ඔබ සහභාගී වී නැත.[13]
**21** මන්ද එය පැවැත්වීමට පෙර සම-
හරෙක් තම රාත්‍රී ආහාරය ගෙනැ-
විත් කන්නෝය. ඒ නිසා ස්වාමීන්ගේ
සන්ධ්‍යා භෝජනය පවත්වන විට එක්
පිරිසක් බඩගිනිව සිටින අතර තවත්
පිරිසක් වෙරි වී සිටියි. **22** ඇත්-
තෙන්ම කෑමට හා බීමට ඔබටම
කියා ගෙවල් නැද්ද?[14] දෙවිගේ සභාවට
නින්දාවක් ගෙන දෙමින් කෑමට කිසි-
වක් නැති අයව[15] ඔබ අපහසුතාවට
පත් කරන්නේ මන්ද? මා ඔබට කුමක්
කියන්නද? ඔබට ප්‍රශංසා කරන්නද?
නමුත් ඒ කාරණය සම්බන්ධයෙන් මට
ඔබට ප්‍රශංසා කළ නොහැකිය.

**23** මන්ද මට ස්වාමීන් ලබා දුන්
මඟ පෙන්වීම් මම ඔබට ලබා දුන්-
නෙමි. එනම් ස්වාමීන් වන යේසුස්
අත්අඩංගුවට ගැනීමට පෙර රාත්‍රි-
යේදී[1] රොටියක් ගෙන, **24** යාච්ඤා-
වක් ඉදිරිපත් කර එය කඩා,[2] "මෙයින්
නියෝජනය වන්නේ ඔබ වෙනුවෙන්
මා පූජා කරන මාගේ ශරීරයයි.[3]
මාව සිහි කිරීමට[4] මේ දේ නොකඩවා
කරන්න" කියා කීවේය. **25** එසේම
ඔහු භෝජනය* ගත් පසු කුසලා-
නයකුත් ගෙන,[5] "මේ කුසලානයේ
තිබෙන දෙයින් නියෝජනය වන්-
නේ මගේ රුධිරයයි. 'අලුත් ගිවිසුම'[6]
වලංගු වන්නේ මගේ රුධිරය මාර්ග-
යෙනුයි.[7] ඔබ මාව සිහි කිරීම සඳහා
මේ දේ නොකඩවා කරන්න.[8] මේ දේ
කරන සෑම අවස්ථාවකදීම ඔබට මාව
සිහි වෙයි" කියා කීවේය. **26** ස්වා-
මීන් එන තාක් කල්[9] ඒ රොටිය කන,
ඒ කුසලානයෙන් බොන සෑම වතා-
වකදීම[10] ඔබ ඔහුගේ මරණය ගැන
ප්‍රකාශ කරනු ඇත.[11]

**27** එහෙයින් නුසුදුසු ලෙස රො-
ටිය කන හෝ ස්වාමීන්ගේ කුස-
ලානයෙන් බොන සෑම කෙනෙක්ම
ස්වාමීන්ගේ ශරීරයට හා රුධිරයට[12]
විරුද්ධව වරදකරුවෙක් වනු ඇත.[13]
**28** මුලින්ම කෙනෙක් තමාව සෝදිසි
කරගෙන තමා සුදුස්සෙක්ද කියා සහ-
තික කරගත යුතුයි.[14] ඉන්පසු ඔහුට
රොටියෙන් කන්නත් කුසලානයෙන්
බොන්නත් පුළුවන. **29** මන්ද කෙ-
නෙක් ස්වාමීන්ගේ ශරීරයෙන් අදහස්
වන දේ වටහා නොගෙන ඒ අවස්ථා-
වට සහභාගී වී කෑමෙන් හා බීමෙන්
තමාටම විරුද්ධව විනිශ්චයක් ලබාග-
නියි.[15] **30** ඔබ අතරේ සිටින බො-
හෝදෙනෙකුගේ විශ්වාසය දුර්වල වී

**11 පරි.**
1 උත් 2:24
2 උත් 2:21
3 උත් 3:16, යෝබ් 14:1
4 2කොරි 5:18
5 සල 7:5
6 යෙරෙ 13:18
7 රෝම 2:8
8 1තිමෝ 6:4
9 1කොරි 11:22
10 1කොරි 1:10, 1කොරි 3:3
11 ක්‍රියා 20:30, 1කොරි 1:12, ගලා 5:20, 1තිමෝ 4:1, 2පේතෘ 2:1
12 ද්වි 13:3, ලූක් 2:35, 1යොහ 2:19
13 ලූක් 22:19
14 1කොරි 11:34
15 යාකො 2:5

**2 තීරුව**
1 මතෙ 26:20, ලූක් 22:14
2 මතෙ 26:26, මාක් 14:22
3 රෝම 7:4, රෝම 12:5, 1කොරි 10:17, 1කොරි 12:27, එෆී 4:12
4 ලූක් 22:19
5 මතෙ 26:27, මාක් 14:23, 1කොරි 10:16
6 යෙරෙ 31:31, හෙබ්‍රෙ 8:8, හෙබ්‍රෙ 9:15
7 ලූක් 22:20, හෙබ්‍රෙ 9:14, හෙබ්‍රෙ 12:24, 1පේතෘ 1:2, 1පේතෘ 1:19
8 නික් 12:14, ගීතා 119:24, ගීතා 119:144
9 1තෙස 4:17
10 හෙබ්‍රෙ 9:25
11 එෆී 1:7, හෙබ්‍රෙ 9:15
12 හෙබ්‍රෙ 10:29
13 මාක් 3:29
14 2කොරි 13:5
15 රෝම 2:2

**1කොරි 11:25*** හෝ, "සන්ධ්‍යා භෝජනය." එනම්, පාස්කු භෝජනය.

තිබෙන්නෙත් ඔවුන් ලෙඩින් සිටින්-
නෙත් ඒ නිසාය. එමෙන්ම බො-
හෝදෙනෙකු මිය ගියා හා සමාන
තත්වයක* සිටින බවද කිව හැක.[1]
**31** අපගේ තත්වය කුමක්ද කියා
අප වටහාගත්තොත් අපව විනිශ්-
චය කරනු නොලැබේ.[2] **32** නමුත්
යෙහෝවා දෙවි අපව විනිශ්චය
කර[3] අපට හික්මවීම් ලබා දෙන්-
නේ[4] මේ ලෝකයට[5] ලැබෙන විනිශ්-
චයෙන් අපව ගලවාගැනීම සඳහාය.[6]
**33** එහෙයින් මාගේ සහෝදරයෙනි,
ඔබ එම භෝජනය සඳහා රැස් වෙද්දී[7]
කෑම ගැනීමට ඉක්මන් නොවන්න.
**34** යමෙකුට බඩගිනි නම් ඔහුට නිව-
සේදී යමක් කෑමට ගත හැකිය.[8] එවිට
ඔබ එසේ එකට රැස් වන අවස්ථාවේදී
ඔබට විනිශ්චයක් ලැබෙන්නේ නැත.[9]
මම ඔබ ළඟට පැමිණි පසු අනික්
කාරණා නිරවුල් කරන්නෙමි.

**12** දැන් සහෝදරයෙනි, දෙවි-
ගෙන් ලද දීමනා ගැන[10] ඔබ
යමක් දැනගන්නවාට කැමැත්තෙමි.
**2** ඔබ වෙනත් ජාතීන්ට අයත් මිනි-
සුන්ව* සිටියදී[11] ඔබ පෙලඹුණේ
ගොළු[12] රූපවලට[13] නමස්කාර කිරීම-
ටය. **3** එහෙයින් ඔබ යමක් දැන-
ගත යුතුයි. එනම් දෙවිගේ බලය
ඇතුව කතා කරන කිසිවෙකුට, “යේ-
සුස් ශාප ලද්දෙක්”[14] කියා පැවසිය
නොහැකි බවයි. එලෙසම, “යේසුස්
ස්වාමීන්” කියා පිළිගත හැක්කේ දෙ-
විගේ බලය ලැබූ කෙනෙකුට පමණි.[15]
**4** විවිධාකාර දීමනා තිබුණත්[16] ඒ
සියල්ල ලැබෙන්නේ දෙවිගේ බල-
යෙනි.*[17] **5** සියලුදෙනා විවිධාකාර
සේවාවන් ඉටු කළත්[18] සිටින්නේ
එකම ස්වාමීන්ය.[19] **6** සියලුදෙනා
විවිධාකාර වැඩකටයුතු ඉටු කළත්[20]
ඒ සියල්ල එසේ සිදු වීමට සලස්-
වන්නේ[21] එකම දෙවිය.[22] **7** දෙවිගේ
බලය සියලුදෙනා තුළ ක්‍රියාත්මක
වන්නේ යම් ප්‍රයෝජනවත් අරමු-
ණක් ඉටු කිරීමටය.[1] **8** උදාහරණ-
යක් ලෙස දෙවිගේ බලය මාර්ගයෙන්
කෙනෙකුට ප්‍රඥාවන්තව කතා කිරීමේ
හැකියාව ලැබේ.[2] එසේම එම බලය
මගින් තවත් කෙනෙකුට ආශ්චර්ය-
වත් ලෙස දැනුමක් ඇතුව කතා කිරී-
මේ හැකියාව ලැබේ.[3] **9** එම බලය
මගින් තවත් කෙනෙකුට විශ්වාසයද[4]
තවත් කෙනෙකුට සුව කිරීමේ දීම-
නාවද[5] ලැබේ. **10** තවත් කෙනෙ-
කුට බලවත් ක්‍රියා කිරීමටද[6] තවත්
කෙනෙකුට අනාවැකි කීමටද[7] තවත්
කෙනෙකුට දෙවිගේ මඟ පෙන්වීමෙන්
ප්‍රකාශ වී ඇති දේවල්[8] වටහාගැනීම-
ටද[9] තවත් කෙනෙකුට විවිධ භාෂා
කතා කිරීමටද[10] තවත් කෙනෙකුට ඒ
භාෂා තේරුම් කර දීමටද[11] හැකියාව
ලැබේ. **11** නමුත් ඒ සියලු දේවල්
සිදු වන්නේ එකම බලය විවිධාකා-
රව ක්‍රියාත්මක වන නිසාය.[12] එලෙස
දෙවිගේ කැමැත්තට එකඟව[13] සෑම
කෙනෙකුටම එම දීමනා නිසියාකාරව
බෙදා දෙනු ලැබේ.[14]

**12** මිනිස් ශරීරයේ අවයව බො-
හොමයක් තිබේ. අවයව බොහො-
මයක් තිබුණත් එය එකම ශරීරය
වේ.[15] ක්‍රිස්තුස්ගේ ශරීරය ගැනත්
එසේම පැවසිය හැක.[16] **13** මන්ද
අප යුදෙව්වරුන් වුවත් ග්‍රීකයන්*
වුවත් දාසයන්ව සිටියත් නිදහස්ව
සිටියත් අප සියලුදෙනාව බව්තීස්ම
කළේ එකම බලයේ ක්‍රියාකාරිත්වය
තුළින්[17] එක ශරීරයක් සෑදීමටය. ඒ
බලය අප සියලුදෙනාටම ලැබිණ.[18]

**14** ශරීරය සෑදී තිබෙන්නේ එක
අවයවයකින් නොවේ. එය අව-
යව බොහොමයකින් සෑදී තිබේ.[19]
**15** එහෙයින් පාදය, “මා අතක් නො-
වන නිසා මා ශරීරයේ කොටසක්
නොවෙයි” කියා පැවසූ පමණින් එය
ශරීරයේ කොටසක් නොවෙයි කියා
පැවසිය නොහැක.[20] **16** එමෙන්ම
කන, “මා ඇසක් නොවන නිසා මා

**1කොරි 11:30*** මූ.අ., “මරණය නමැති නින්දක සැතපී.” **12:2*** මින් අදහස් කරන්නේ දෙවි ගැන විශ්වාසයක් නැති අයයි. **4*** ග්‍රීක බසින්, නියුමා. උපග්‍ර. 3 බලන්න.

**1කොරි 12:13*** රෝම 1:16හි පාදසටහන බලන්න.

**11 පරි.**
**1** එෆී 5:14; 1තෙස 5:6
**2** එළි 3:3
**3** 2කොරි 5:10
**4** හිතෝ 3:11; හෙබ්‍රෙ 12:5
**5** 2පේතෘ 3:7
**6** 2පේතෘ 2:20
**7** මතෙ 26:26
**8** 1කොරි 11:22
**9** 1කොරි 11:29

**12 පරි.**
**10** 1කොරි 14:1; 1කොරි 14:37
**11** එෆී 2:12
**12** ගීතා 115:5; හබ 2:18
**13** 1කොරි 8:4; ගලා 4:8; 1තෙස 1:9; 1පේතෘ 4:3
**14** මාක් 9:39; 1යොහ 4:3
**15** මතෙ 16:17; 1යොහ 4:2
**16** හෙබ්‍රෙ 2:4; 1පේතෘ 4:10
**17** එෆී 4:4
**18** රෝම 12:7; එෆී 4:11
**19** එෆී 4:5
**20** ක්‍රියා 2:43
**21** 1පේතෘ 4:11
**22** එෆී 4:6

**2 තීරුව**
**1** 1කොරි 14:26; එෆී 4:7
**2** එෆී 1:17
**3** 1කොරි 14:6; 2කොරි 8:7
**4** 1කොරි 13:2; 2කොරි 4:13
**5** ක්‍රියා 3:7; ක්‍රියා 28:9
**6** හෙබ්‍රෙ 2:4
**7** රෝම 12:6
**8** 1යොහ 4:1
**9** 1කොරි 14:29
**10** ක්‍රියා 10:46; 1කොරි 14:18
**11** 1කොරි 14:26
**12** 1කොරි 12:6
**13** හෙබ්‍රෙ 2:4
**14** රෝම 12:3; 1කොරි 7:7; එෆී 4:7
**15** රෝම 12:5
**16** රෝම 7:4; 1කොරි 10:16; එෆී 4:12
**17** එෆී 4:5
**18** යොහ 4:14; යොහ 7:37; එළි 22:17
**19** එෆී 4:16
**20** එෆී 4:25

ශරීරයේ කොටසක් නොවෙයි” කියා
පැවසූ පමණින් එය ශරීරයේ කොට-
සක් නොවෙයි කියා පැවසිය නො-
හැක.[1] **17** මුළු ශරීරයම ඇසක් වූවා
නම් ඇසෙන්නේ කෙසේද? මුළු ශරී-
රයම කනක් වූවා නම් ගඳ සුවඳ
දැනෙන්නේ කෙසේද? **18** නමුත්
දෙවි තම කැමැත්ත පරිදි ශරීරයේ
සෑම අවයවයක්ම නියමිත තැන්වල
තබා ඇත.[2]

**19** ශරීරයේ තිබෙන සෑම අවයව-
යක්ම එක සමාන වූවා නම්[3] ශරීරයට
සිදු වන්නේ කුමක්ද? **20** බොහෝ
අවයවයන් තිබුණත්[4] ඇත්තේ එකම
ශරීරයයි. **21** එහෙයින් ඇසට, “මට
ඔබව අවශ්‍ය නැහැ” කියා අතට
කියන්නවත් හිසට, “මට ඔබව අවශ්‍ය
නැහැ” කියා පාදවලට කියන්නවත්
නුපුළුවන. **22** ඇත්තෙන්ම වඩා දුර්-
වලයි කියා සැලකෙන අවයවව-
ලින්[5] පවා අත්‍යවශ්‍ය කාර්යයන් සිදු
වේ. **23** එසේම වැදගත්කමින් අඩු-
යයි සලකන අවයවවලට පවා අපි
වැඩි ගෞරවයකින් සලකමු.[6] එලෙ-
සම යම් අවයව නිසා අපට ලැජ්ජා-
වක් දැනුණත් ඒ අවයවවලටද අපි
වැඩි ගෞරවයක් දෙමු. **24** වඩාත්
අලංකාර අවයවයන්ට එතරම් සැල-
කිල්ලක් අවශ්‍ය නැත. නමුත් වැදගත්-
කමින් අඩුයයි සලකන අවයවවලට
දෙවි වැඩි ගෞරවයක් දෙමින් මුළු
ශරීරය පුරාම එකමුතුකමක් ඇති
කළේය. **25** එසේ කළේ කිසි භේද-
යක් නැතුව ශරීරයේ අවයව සියල්ලට
එක සමාන සැලකිල්ලක් දැක්වීම සඳ-
හාය.[7] **26** ඒ අනුව එක අවයවයකට
වේදනාවක් ඇති වන විට අන් සිය-
ලුම අවයවවලටද ඒ වේදනාව දැනේ.[8]
එලෙසම එක් අවයවයකට යම් ගෞර-
වයක් හිමි වන විට[9] අන් සියලුම අව-
යවද එකට සතුටු වෙති.[10]

**27** දැන් ඔබ සියලුදෙනාත් එක
ශරීරයකි. ඒ ක්‍රිස්තුස්ගේ ශරීරයයි.
සෑම කෙනෙක්ම එහි අවයවයන් ලෙස
ඊට සම්බන්ධ වී සිටියි.[11] **28** ඒ අනුව
දෙවි සභාවේ විවිධ කාර්යයන් සඳහා
විවිධ අයව පත් කර ඇත.[1] එනම්
මුලින්ම නියෝජිතයන්වද*[2] දෙවෙ-
නුව අනාගතවක්තෘවරුන්වද[3] තුන්-
වෙනුව ගුරුවරුන්වද[4] පත් කර ඇත.
ඊළඟට බලවත් ක්‍රියා සඳහාද[5] සුව
කිරීම් සඳහාද[6] අගහිඟකම් ඇති අයට
උපකාර කිරීම සඳහාද[7] මඟ පෙන්වීම්
ලබා දීම සඳහාද[8] විවිධ භාෂා කතා
කිරීම සඳහාද[9] එකිනෙකාට දීමනා
ලබා දී ඇත. **29** එසේනම් සියලුදෙ-
නාම නියෝජිතයෝද? සියලුදෙනාම
අනාගතවක්තෘවරුද? සියලුදෙනාම
ගුරුවරුද? සියලුදෙනාම බලවත් ක්‍රියා
සිදු කරයිද? **30** සියලුදෙනාටම සුව
කිරීමේ දීමනාව ලබා දී තිබේද? සිය-
ලුදෙනාම වෙනත් භාෂාවලින් කතා
කරයිද?[10] සියලුදෙනාම භාෂාවන් තේ-
රුම් කර දෙයිද?[11] **31** කෙසේවෙ-
නත් දෙවිගෙන් වඩාත් උතුම් දීමනා
ලබාගැනීමට උද්‍යෝගයෙන් උත්සාහ
කරන්න.[12] නමුත් ඒ සියල්ලටම වඩා
උතුම් මාර්ගයක් ඔබට පෙන්වන්න
කැමැත්තෙමි.[13]

**13** මා මිනිසුන්ගේ හා දේවදූත-
යන්ගේ භාෂා කතා කළත්[14]
මා තුළ ප්‍රේමය නැත්නම් මගෙන් කිසි
පලක් නැත. එවිට මගේ හඬ පිත්-
තල තැටියකින් හෝ අත්තාළමකින්
නැඟෙන හඬට සමානය.[15] **2** මට
අනාවැකි කීමේ දීමනාව තිබුණත්[16]
මට සෑම පරිශුද්ධ රහසක් ගැනම අව-
බෝධයක් තිබුණත්[17] සියලු ආකාර
දැනුම තිබුණත්[18] මට කඳු ඉවත් කිරී-
මට තරම් ප්‍රබල විශ්වාසයක් තිබු-
ණත්[19] මා තුළ ප්‍රේමය නැත්නම් මා
කරන දෙයින් කිසිදු පලක් නැත.[20]
**3** මට අයිති සෑම දෙයක්ම මා
මහත් ආඩම්බරයකින් අනුන්ව පෝෂ-
ණය කිරීමට පරිත්‍යාග කළත්[21] මගේ
ජීවිතය දුන්නත්[22] මා තුළ ප්‍රේමය
නැත්නම්[23] මා කළ දෙයෙහි කිසි වටි-
නාකමක් නැත.

**4** ප්‍රේමයෙන් ක්‍රියා කරන පුද්-
ගලයා[24] බොහෝ ඉවසිලිවන්තය,[25]

**1කොරි 12:28*** හෝ, “යවනු ලැබූවන්වද.”

**12 පරි.**
**1** එෆී 5:30
**2** හිතෝ 20:12; 1කොරි 15:38
**3** රෝම 12:4; 1කොරි 12:14
**4** 1කොරි 12:14
**5** දේශ 9:15; රෝම 9:23; 1කොරි 1:26
**6** උත් 3:7; උත් 3:21; 2තිමෝ 2:20
**7** රෝම 12:10; එෆී 4:25
**8** ගලා 6:2; හෙබ්‍රෙ 13:3; 1පේතෘ 5:9
**9** රෝම 8:17
**10** රෝම 12:15; 1පේතෘ 3:8; 1පේතෘ 4:13
**11** රෝම 12:5; එෆී 1:23; කොලො 1:24

**2 තීරුව**
**1** 1කොරි 12:18
**2** එෆී 2:20
**3** ක්‍රියා 13:1
**4** එෆී 4:11
**5** ගලා 3:5
**6** ක්‍රියා 5:16
**7** ක්‍රියා 18:27
**8** රෝම 12:8; 1කොරි 3:10; හෙබ්‍රෙ 13:17
**9** ක්‍රියා 2:6
**10** 1කොරි 14:4
**11** 1කොරි 14:5
**12** 1කොරි 14:1
**13** 1කොරි 13:8

**13 පරි.**
**14** 1කොරි 14:18
**15** 2සාමු 6:5
**16** මතෙ 7:22; 1කොරි 14:3; එළි 19:10
**17** 1කොරි 4:1; එෆී 1:9
**18** 1කොරි 12:8
**19** මතෙ 17:20; ලූක් 17:6
**20** 1යොහ 4:20
**21** මතෙ 6:2
**22** රෝම 5:7
**23** 2කොරි 9:7
**24** රෝම 5:5; රෝම 13:10; 1යොහ 4:8
**25** 1තෙස 5:14; 2පේතෘ 3:15

කරුණාවන්තය.[1] ඔහු තුළ ඊර්ෂ්‍යා-
වක් නැත.[2] ඔහු තමා ගැන පුරසා-
රම් දොඩන්නේ නැත.[3] අහංකාරයෙන්
ක්‍රියා කරන්නේද නැත.[4] **5** ඔහු අවි-
නීතව හැසිරෙන්නේ නැත.[5] තමා-
ගේම වාසිය සොයන්නේ නැත.[6]
ඉක්මනින් කෝප වන්නේ නැත.[7]
ඔහු අමනාපයක් සිතේ තබාගන්නේ
නැත.[8] **6** ප්‍රේමයෙන් ක්‍රියා කරන
පුද්ගලයා අධර්මිෂ්ඨ දේවල් ගැන
ප්‍රීති වන්නේ නැත.[9] ඒ වෙනුවට
සත්‍යය ජය ගන්නා විට ඔහු ඒ ගැන
ප්‍රීති වෙයි.[10] **7** ඔහු සියල්ල ඉවසා
දරාගනියි.[11] සියල්ල විශ්වාස කරයි.[12]
සියල්ල ගැන බලාපොරොත්තුවෙන්
සිටියි.[13] සියල්ල විඳදරාගනියි.[14]

**8** ප්‍රේමය නමැති මෙම ගුණාං-
ගය සදාතනිකය.*[15] නමුත් අනාවැකි
කීමේ දීමනාව නැති වී යයි. වෙ-
නත් භාෂාවලින් කතා කිරීමේ දීමනා-
වද නැති වෙයි. දැනුම තිබුණත් එයද
නැති වනු ඇත.[16] **9** මන්ද අපට
පූර්ණ දැනුමක් නැත.[17] අප අනා-
වැකි පැවසුවත් එහි සියලුම තොර-
තුරු අඩංගු වී නැත.[18] **10** නමුත්
අපට පූර්ණ දැනුමක් ලැබෙන විටත්
සියලුම තොරතුරු හෙළි කරමින්
අනාවැකි පවසන විටත්[19] කලින් තිබූ
දැනුමත් කලින් පැවසූ අනාවැකිත්
නැති වී යනු ඇත. **11** මා කුඩා දරු-
වෙකුව සිටි කාලයේදී මා කතාබහ
කළෙත් යම් දේවල් ගැන සිතුවෙත්
අවබෝධ කරගත්තෙත් කුඩා දරු-
වෙකු ලෙසය. නමුත් මා දැන් වැඩිහි-
ටියෙකි.[20] එහෙයින් කුඩා දරුවෙකුට
තිබෙන ගතිලක්ෂණ මම අහක දමා
ඇත. **12** දැනට අප දකින දේ අපැ-
හැදිලිය. එය ලෝහ කැඩපතකින්
යමක් දෙස බලනවා හා සමානය.[21]
නමුත් ඉදිරියේදී පැහැදිලිව* දැක-
ගන්න අපට හැකි වනු ඇත.[22] දැනට
මට පූර්ණ අවබෝධයක් නැත. නමුත්
දෙවි මාව හොඳින් දැන හඳුනන
ආකාරයටම මටත් ඒ කාලයේදී
සියල්ල ගැන පැහැදිලි අවබෝධයක්
ලැබෙනු ඇත.[1] **13** දිගටම පවතින්-
නේ විශ්වාසය, බලාපොරොත්තුව හා
ප්‍රේමයයි. නමුත් ඒවායින් උතුම්ම
එක වන්නේ ප්‍රේමයයි.[2]

**14** එකිනෙකාට ප්‍රේමය පෙන්-
වන්න උපරිම උත්සාහයක්
දරන්න. ඒ අතරතුර නොකඩවාම
උද්‍යෝගයෙන් දෙවිගෙන් ලැබෙන
දීමනා ලබාගැනීමට වෑයම් කරන්න.[3]
එම දීමනා අතරින් අනාවැකි කීමේ
දීමනාව ලබාගැනීමට ඔබ උත්-
සාහ කරනවා නම් වඩාත් හොඳය.[4]
**2** මන්ද වෙනත් භාෂාවකින් කතා
කිරීමේ දීමනාව ඇති තැනැත්තා
කතා කරන්නේ මිනිසුන්ට නොව දෙ-
විටයි. ඔහු දෙවිගේ බලයෙන් පරි-
ශුද්ධ රහස් හෙළි කළත්[5] ඔහු පවසන
දේ කිසිවෙකුට වැටහෙන්නේ නැත.[6]
**3** නමුත් අනාවැකි කියන තැනැත්තා
තමා පවසන දෙයින් මිනිසුන්ව
ගොඩනංවයි,[7] දිරිගන්වයි, සනසවයි.
**4** වෙනත් භාෂාවකින් කතා කරන
තැනැත්තා ගොඩනංවන්නේ තමාව
පමණයි. නමුත් අනාවැකි කියන
තැනැත්තා මුළු සභාවම ගොඩනංවයි.
**5** ඔබ සියලුදෙනාම වෙනත් භාෂා-
වලින් කතා කරනවාට මා කැමති
වුවත්[8] මා වැඩි කැමැත්තක් දක්වන්-
නේ ඔබ අනාවැකි කියනවා දැකීම-
ටය.[9] ඇත්තෙන්ම අනාවැකි පවසන
තැනැත්තා වෙනත් භාෂාවලින් කතා
කරන තැනැත්තාට වඩා උතුම් දෙ-
යක් කරයි.[10] මන්ද වෙනත් භාෂාව-
ලින් කතා කරන තැනැත්තා තමා
පවසන දේ තේරුම් කර දෙන්නේ
නැත්නම් එයින් සභාවට ප්‍රයෝජන-
යක් ලැබෙන්නේ නැත. **6** සහෝද-
රයෙනි, මා යම් එළිදරව් වීමක්[11] හෝ
ආශ්චර්යවත් ලෙස යම් දැනුමක්[12]
හෝ යම් අනාවැකියක් හෝ යම්
ඉගැන්වීමක් හෝ ලබාගෙන ඒ ගැන
කතා කරන්නේ නැතුව වෙනත් භාෂා-
වලින් පමණක් කතා කළොත් ඔබට
මගෙන් ඇති ප්‍රයෝජනය කුමක්ද?

**13 පරි.**
1 එෆී 4:32
2 2කොරි 12:20 ගලා 5:26
3 හිතෝ 27:1
4 කොලො 2:18 1පේත 5:5
5 රෝම 13:13 1කොරි 14:40
6 1කොරි 10:24 පිලි 2:4
7 මතෙ 5:39 යාකො 1:19
8 එෆී 4:32 කොලො 3:13
9 රෝම 12:9
10 2කොරි 13:8
11 1පේත 4:8
12 ක්‍රියා 17:11
13 රෝම 8:25 රෝම 12:12
14 1කොරි 10:13 1තෙස 1:3
15 1යොහ 4:8
16 1කොරි 12:31
17 හිතෝ 4:18
18 2පේත 1:19
19 දානි 12:4 යොහ 1:51
20 එෆී 4:13 හෙබ්‍රෙ 6:1
21 හෙබ්‍රෙ 2:8
22 මතෙ 5:8 1යොහ 3:2 එළි 22:4

**2 තීරුව**
1 2කොරි 5:10 හෙබ්‍රෙ 4:13
2 මතෙ 22:37 රෝම 13:10

**14 පරි.**
3 1කොරි 12:1
4 රෝම 12:6 1තෙස 5:20
5 1කොරි 13:2
6 1කොරි 14:5
7 2කොරි 10:8
8 1කොරි 12:30
9 යෝවෙ 2:28 ක්‍රියා 2:17 ක්‍රියා 21:9
10 1කොරි 12:10
11 ගලා 1:12 ගලා 2:2
12 1කොරි 12:8 2කොරි 11:6

---

**1කොරි 13:8*** හෝ, "කිසි කලක පහව යන්නේ නැත." **12*** මූ.අ., "මුහුණට මුහුණ ලා."

**7** නිදසුනකට යම් නාදයන් නිකුත්
කරන[1] නළාව සහ වීණාව යන
සංගීත භාණ්ඩ ගැන සිතන්න. එම
සංගීත භාණ්ඩවලින් නිකුත් වන නාද-
යන් පැහැදිලිව ඇසෙන්නේ නැත්නම්
වාදනය කරන්නේ කුමන භාණ්-
ඩයද කියා පැහැදිලිව හඳුනාගත
හැක්කේ කෙසේද? **8** එලෙසම හො-
රණෑවෙන් පැහැදිලි ශබ්දයක් නිකුත්
වන්නේ නැත්නම් යුද්ධයට සූදානම්
විය යුතු බව දැනගන්නේ කෙසේද?[2]
**9** ඔබත් පහසුවෙන් තේරුම්ගත හැකි
වචනවලින් කතා කරන්නේ නැත්-
නම්[3] ඔබ කියන දේ තේරුම්ගත
හැකි වන්නේ කාටද? ඔබ පවසන
දේ තේරුම්ගත නොහැකි නම් ඔබ
සුළඟට කතා කරනවා හා සමානය.[4]
**10** ලොව පුරා භාෂාවන් රාශියක්
තිබුණත් ඒ ඒ භාෂාව ගැන දැනු-
මක් තිබෙන අයට ඒ භාෂාව පැහැ-
දිලිව වටහාගත හැක. **11** යමෙකු
කියන දේ මට තේරෙන්නේ නැත්-
නම් ඔහු මාව සලකන්නේ විදේශික-
යෙකු ලෙසය.[5] එලෙසම මාද ඔහුව
සලකන්නේ විදේශිකයෙකු ලෙසය.
**12** ඔබත් සභාවේ අයට දිරිගැන්වීමක්
දිය හැකි දීමනා ලබාගැනීමට උත්-
සාහ කරන්න.[6] මා එසේ කියන්නේ
දෙවිගෙන් ලැබෙන දීමනා ලබාගැනී-
මට ඔබ මහත් උද්‍යෝගයකින් කට-
යුතු කරන නිසාය.[7]

**13** වෙනත් භාෂාවකින් කතා
කරන තැනැත්තා තමා පවසන දේ
තේරුම් කර දීමට හැකියාව ලබා
දෙන මෙන්ද ඉල්ලමින් යාච්ඤා කළ
යුතුයි.[8] **14** මා වෙනත් භාෂාවකින්
යාච්ඤා කරන විට මා යාච්ඤා කරන්-
නේ දෙවිගේ බලයෙන් මට ලැබුණු
දීමනාව නිසාය.[9] නමුත් මටද එය තේ-
රුම්ගත නොහැකිය. **15** එසේනම්
මා කුමක් කළ යුතුද? දෙවිගේ බල-
යෙන් ලැබෙන දීමනාව උපකාරයෙන්
මම යාච්ඤා කරන්නෙමි. එලෙසම මට
තේරෙන භාෂාවෙන්ද යාච්ඤා කරන්-
නෙමි. දෙවිගේ බලයෙන් ලැබෙන
දීමනාව උපකාරයෙන් ප්‍රශංසා ගී
ගයන්නෙමි.[1] එලෙසම මට තේරෙන
භාෂාවෙන්ද ප්‍රශංසා ගී ගයන්නෙමි.[2]
**16** එසේ කළේ නැත්නම් කුමක් සිදු
වෙයිද? ඔබ දෙවිගේ බලයෙන් ලැබුණු
දීමනාවෙන් ප්‍රයෝජන ගෙන වෙනත්
භාෂාවකින් දෙවිට ස්තුති ප්‍රශංසා කර-
නවා කියා සිතන්න. එවිට එතැන
ඉඳගෙන සිටින සත්‍යය ගැන අවබෝ-
ධයක් නැති සාමාන්‍ය පුද්ගලයෙකුට
ඔබ කළ ස්තුති ප්‍රශංසාව වෙනුවෙන්
"ආමෙන්"*[3] කියා පැවසිය හැකිද?
ඔහුට එසේ පැවසිය නොහැක්කේ
ඔබ පවසන දේ ඔහුට නොතේරෙන
නිසාය. **17** ඔබ කොතරම් හොඳින්
දෙවිට ස්තුති ප්‍රශංසා කළත් එම
පුද්ගලයාට ඉන් කිසි ප්‍රයෝජනයක්
ලැබෙන්නේ නැත.[4] **18** දෙවිට ස්තු-
තිවන්ත වෙන්න මට ඔබ සියලුදෙ-
නාට වඩා වැඩි භාෂා ගණනකින් කතා
කිරීමට හැකියාව තිබේ.[5] **19** නමුත්
සභාවක සිටින විට වෙනත් භාෂා-
වකින් වචන දසදහසක් කතා කර-
නවාට වඩා හැමෝටම තේරෙන
භාෂාවෙන් වචන පහක් හෝ කතා කර
ඔවුන්ට යම් උපදෙස් ලබා දීමට මම
කැමැත්තෙමි.[6]

**20** සහෝදරයෙනි, කාරණා තේ-
රුම්ගැනීමට නොහැකි කුඩා දරුවන්
මෙන් නොවන්න.[7] ඒ වෙනුවට වැඩිහි-
ටියෙකු මෙන් තේරුම්ගැනීමේ හැකි-
යාව ඇතුව කටයුතු කරන්න.[8] නමුත්
නපුරු දේවල් ගැන අවබෝධයක්
නැති පුංචි දරුවන් හා සමාන වන්න.[9]
**21** නීතියෙහි මෙසේ ලියා තිබේ.
"'විදේශිකයන්ගේ දිවෙන්ද නාඳුනන
අයගේ තොල්වලින්ද[10] මම මේ ජන-
යාට කතා කරන්නෙමි.[11] එසේ කළත්
ඔවුහු මට සවන් නොදෙන්නෝය'
කියා යෙහෝවා දෙවි පවසයි."[12]
**22** ඉන් පැහැදිලි වන්නේ වෙනත්
භාෂාවලින් කතා කිරීමේ හැකියාව
ලකුණක් ලෙස දී තිබෙන බවයි.[13]
එය දී තිබෙන්නේ යේසුස් ගැන විශ්-
වාසයක් ඇති අය වෙනුවෙන් නොව

**14 පරි.**
1 යෝබ් 21:12
2 ගණන් 10:9; යෝබ් 39:25
3 1කොරි 14:19
4 1කොරි 9:26
5 2රාජා 18:26
6 1කොරි 14:4; 1කොරි 14:26
7 1කොරි 12:1; 1කොරි 12:7
8 1කොරි 12:10; 1කොරි 14:5
9 1කොරි 14:2

**2 තීරුව**
1 කොලො 3:16
2 ගීතා 47:7
3 2කොරි 1:20
4 1කොරි 14:26
5 1කොරි 14:6
6 1කොරි 14:4
7 ගීතා 119:99; එෆී 4:14; හෙබ්‍රෙ 5:13
8 පිලි 3:15; හෙබ්‍රෙ 5:14; 1පේතෘ 2:2
9 යෙරෙ 4:22; රෝම 16:19
10 ද්වි 28:49; යෙරෙ 5:15
11 යෙසා 28:11
12 යෙසා 28:12
13 ක්‍රියා 2:4

**1කොරි 14:16*** එනම්, එසේම වේවා!

විශ්වාසයක් නැති අය වෙනුවෙනි.[1]
නමුත් අනාවැකි පවසනු ලබන්නේ
විශ්වාසයක් නැති අය වෙනුවෙන්
නොව යේසුස් ගැන විශ්වාසයක් ඇති
අය වෙනුවෙන්ය.[2] **23** එහෙයින් මුළු
සභාව එක තැනකට රැස් වී සිය-
ලුදෙනාම වෙනත් භාෂාවලින් කතා
කරන්න පටන්ගත්තොත්[3] ඔවුන් අත-
රට පැමිණෙන සාමාන්‍ය ජනයා හෝ
දෙවි ගැන විශ්වාසයක් නැති අය සිදු
වන දේ දැක ඔබට සිහිවිකල් වී ඇති
බව පවසන්නේ නැද්ද? **24** නමුත්
ඔබ සියලුදෙනා අනාවැකි කියමින්
සිටියදී විශ්වාසයක් නැති කෙනෙක්
හෝ සාමාන්‍ය පුද්ගලයෙක් එතැනට
පැමිණියොත් ඔබ පවසන දේවලින්
ඔහු හික්මවීමක් ලබන අතර[4] තමාවම
සෝදිසි කර බැලීමටත් ඔහු තුළ පෙ-
ලඹීමක් ඇති වනු ඇත. **25** එවිට
ඔහුගේ සිතෙහි සැඟවී තිබෙන දේවල්
ඔහුටම වැටහෙන නිසා,[5] “ඇත්තෙන්ම
දෙවි ඔබ අතර සිටිනවා”[6] කියා ප්‍රකාශ
කරමින් ඔහු දණින් වැටී දෙවිට නමස්-
කාර කරනු ඇත.

**26** එසේනම් සහෝදරයෙනි, ඔබ
කුමක් කළ යුතුද? ඔබ එකට රැස්
වන විට එක් කෙනෙක් ගීතිකා-
වක් කියයි. තවත් කෙනෙක් උගන්-
වයි. වෙන කෙනෙක් තමාට එළිදරව්
කළ දෙයක් ගැන පවසයි. එලෙ-
සම තවත් කෙනෙක් වෙනත් භාෂාව-
කින් කතා කරයි. තවත් කෙනෙක්
ඒ පැවසූ දෙයෙහි අර්ථය තේරුම්
කර දෙයි.[7] එලෙස ඔබ කුමන දෙ-
යක් කළත් ඒ සියලු දේ එකිනෙකාව
දිරිගැන්වීමේ අරමුණින් කළ යුතුයි.[8]
**27** යමෙක් වෙනත් භාෂාවලින් කතා
කරන්න කැමති නම් එහි වරදක්
නැත. නමුත් දෙදෙනෙකුට හෝ තුන්-
දෙනෙකුට වඩා වැඩි පිරිසක් එසේ
නොකළ යුතුයි. එසේම ඔවුන් සියලු-
දෙනාම එකවර කතා නොකළ යුතුයි.
එක් වතාවකදී එක් කෙනෙක් පම-
ණක් කතා කළ යුතු අතර තවත්
කෙනෙක් ඒ දේවල් තේරුම් කර
දිය යුතුයි.[9] **28** නමුත් එසේ තේ-
රුම් කර දීමට කෙනෙක් නැත්නම්
ඔවුන් සභාවේ නිහඬව සිටීම වඩාත්
හොඳය. එවැනි අයට පෞද්ගලිකව
තම සිතින් දෙවිට කතා කළ හැකිය.[1]
**29** මීට අමතරව අනාගතවක්තෘව-
රුන් දෙදෙනෙකුට හෝ තුන්දෙනෙ-
කුට කතා කළ හැකිය.[2] පැවසූ දේවල
අර්ථය වටහාගැනීමට අන් අයට
පුළුවන.[3] **30** නමුත් යමෙක් අනා-
වැකි කියමින් සිටින විට එහි ඉඳ-
ගෙන සිටින කෙනෙකුට යම් එළිදරව්
වීමක් ලැබුණොත්[4] අනාවැකි කියමින්
සිටි තැනැත්තා නිහඬ විය යුතුයි.
**31** මන්ද සියලුදෙනාට ඉගෙනගැනීම
සඳහාත් සියලුදෙනාව දිරිගැන්වීම
සඳහාත්[5] එකිනෙකා මාරුවෙන් මාරු-
වට කතා කරමින් සියලුදෙනාටම
අනාවැකි පැවසිය හැක.[6] **32** අනා-
වැකි පැවසීමේ දීමනාව ඇති අය දෙවි-
ගේ බලයෙන් අනාවැකි පවසන විට
එය මනා පිළිවෙළකින් කළ යුතුයි.
**33** මන්ද දෙවි අවුල්සහගත දෙවි කෙ-
නෙකු නොව[7] සමාදානයේ දෙවි කෙ-
නෙක්ය.[8]

ශුද්ධ තැනැත්තන් සිටින සෑම
සභාවකම සිදු වන ලෙස, **34** ස්ත්‍රීන්
සභාවන්වලදී නිහඬව සිටිය යුතුයි.[9]
මන්ද ඔවුන්ට එහිදී කතා කිරීමට
අවසර දී නැත. නීතියේ පවා කියා
තිබෙන ලෙස[10] ඔවුන් යටත් වී සිටිය
යුතුයි.[11] **35** එහෙයින් යමක් දැන-
ගැනීමට ඔවුන්ට අවශ්‍ය නම් නිවසේදී
තම ස්වාමිපුරුෂයාගෙන් ඒ ගැන අසා
දැනගැනීමට ඔවුන්ට පුළුවන. මන්ද
සභාවක් අමතා කතා කිරීම ස්ත්‍රියකට
ලැජ්ජාවකි.[12]

**36** ඇත්තෙන්ම දෙවි තොරතුරු
හෙළි කරන්නේ ඔබ මාර්ගයෙන්ද?[13]
එසේ නැත්නම් එම තොරතුරු ලැබු-
ණේ ඔබට පමණක්ද?

**37** තමා අනාගතවක්තෘවරයෙකු
බවත් දෙවිගේ බලය නමැති දීම-
නාව තමාට ඇති බවත් ඇතැම්
අයට සිතිය හැක. කෙසේවෙතත්
මා ඔබට ලියන මේ දේවල් ඔවුන්ද
පිළිගත යුතුයි. මන්ද මා පවසන

**14 පරි.**
1 ක්‍රියා 2:13
2 ක්‍රියා 2:37
3 1කොරි 14:11
4 එෆී 5:13
5 දානි 2:47
6 යෙසා 45:14 සෙක 8:23
7 1කොරි 12:10
8 රෝම 14:19 2කොරි 12:19
9 1කොරි 14:5

**2 තීරුව**
1 1කොරි 14:4
2 ක්‍රියා 13:1 එෆී 4:11
3 1තෙස 5:21
4 1කොරි 12:10
5 හෙබ්‍රෙ 10:25
6 රෝම 12:6 1තෙස 5:20
7 1කොරි 14:40 ගලා 5:25 කොලො 2:5
8 රෝම 15:33
9 1තිමෝ 2:11 1තිමෝ 2:12
10 උත් 3:16
11 1කොරි 11:3 එෆී 5:22 කොලො 3:18 තීත 2:5 1පේතෘ 3:1
12 1කොරි 11:6
13 යෙසා 2:3

මේ දේවල් ස්වාමීන්ගේ ආඥාවන් වේ.[1]
**38** නමුත් යමෙක් මේ දේවල් පිළි-
ගන්නේ නැත්නම් ඔහුට සිදු වන්නේ
දිගටම නොදැනුවත්කමින් සිටීමටය.
**39** එහෙයින් මාගේ සහෝදරයෙනි,
අනාවැකි කීමේ දීමනාව ලබාගැ-
නීමට උද්‍යෝගයෙන් උත්සාහ
කරන්න.[2] නමුත් වෙනත් භාෂාවලින්
කතා කිරීම තහනම් නොකරන්න.[3]
**40** සෑම දෙයක්ම ඔබිනා ලෙසත් පිළි-
වෙළකටත් සිදු විය යුතුයි.[4]

**15** සහෝදරයෙනි, මා ඔබට
ප්‍රකාශ කළ[5] ශුභාරංචිය[6] ගැන
යම් කාරණයක් ඔබට මතක් කරන්න
කැමැත්තෙමි. ඔබ ඒ ශුභාරංචිය පිළි-
ගත්තා පමණක් නොව ඔබ ජීවත්
වෙමින් සිටින්නෙත් ඊට එකඟවය.[7]
**2** මගෙන් අසා දැනගත් ඒ ශුභාරංචි-
යට ඔබ තදින් ඇලී සිටියොත් එය
ඔබේ ගැලවීමට මඟ පාදනු ඇත.[8]
නමුත් ඔබ එසේ කරන්නේ නැත්නම්
ඔබ යේසුස්ගේ අනුගාමිකයන් බවට
පත් වුණත් එයින් කිසි පලක් නැත.[9]
**3** මන්ද මා මුලින්ම ඔබට පැව-
සුවේ මට භාර දුන් පණිවිඩයයි.[10]
එනම් ශුද්ධ ලියවිල්ලේ සඳහන් ආකා-
රයට ක්‍රිස්තුස් අපව පාපයෙන් නිදහස්
කිරීමට මිය ගිය බවත්,[11] **4** ඔහුව
නැන්පත් කළ බවත්[12] ඉන්පසු ශුද්ධ
ලියවිල්ලට අනුව[13] ඔහු තුන්වෙ-
නිදා[14] මරණයෙන් නැඟිටුවනු ලැබූ
බවත්ය.[15] **5** පසුව ඔහු සීෆස් ඉදිරි-
යේද[16] ඉන්පසු දොළොස්දෙනා ඉදි-
රියේද[17] පෙනී සිටියේය. **6** තවත්
අවස්ථාවක ඔහු සහෝදරයන් පන්සි-
යදෙනෙකුට වඩා වැඩි පිරිසක් ඉදි-
රියේ පෙනී සිටියේය. ඔවුන්ගෙන්
කිහිපදෙනෙකු දැනටමත් මිය ගොස්
ඇතත් වැඩිදෙනෙක් තවමත් ජීව-
තුන් අතර සිටිති.[18] **7** ඉන්පසු
ඔහු යාකොබ් ඉදිරියේද[19] පසුව ඔහු-
ගේ සියලු නියෝජිතයන්* ඉදිරියේද[20]
පෙනී සිටියේය. **8** අවසන් වශයෙන්
ඔහු පෙනී සිටියේ මා ඉදිරියෙහිය.[21] ඒ
අවස්ථාවේදී මා අඩු මාසයෙන් උපන්
දරුවෙකු හා සමාන විය.
**9** යේසුස්ගේ නියෝජිතයන් අත-
රින් සුළුම තැනැත්තා මමය.[1] මා
දෙවිගේ සභාවට පීඩා කළ නිසා[2]
නියෝජිතයෙකු කියා හැඳින්වීමටවත්
මා වටින්නේ නැත. **10** නමුත් අද
මා මේ තත්වයේ සිටින්නේ දෙවි-
ගේ මහත් කරුණාව නිසාය.[3] එසේ
දෙවි මට පෙන්වූ මහත් කරුණාව
නිෂ්ඵල වූයේ නැත.[4] මන්ද අන් සිය-
ලුදෙනාටම වඩා මම මහත් වෙහෙ-
සක් දරා සේවය කළෙමි.[5] නමුත් ඒ
දේ කළේ මගේ ශක්තියෙන් නොව
මට ලැබී ඇති දෙවිගේ මහත් කරු-
ණාව නිසාය.[6] **11** කෙසේනමුත් මා
දේශනා කළත් අනික් නියෝජිතයන්
ඔබට දේශනා කළත් වෙනසක් නැත.
මන්ද එහි ප්‍රතිඵලයක් ලෙස දැන් ඔබ
තුළ විශ්වාසයක් ඇති වී තිබේ.[7]
**12** ක්‍රිස්තුස්ව මරණයෙන් නැවත
නැඟිටුවා ඇති බව දේශනා කරනවා
නම්[8] මිය ගිය අයට නැවත නැඟිටී-
මක් නැති බව ඔබෙන් සමහරදෙනෙකු
පවසන්නේ කුමන පදනමක් මතද?[9]
**13** ඇත්තෙන්ම මිය ගිය අයට නැවත
නැඟිටීමක් නැත්නම් ක්‍රිස්තුස්ව මර-
ණයෙන් නැඟිටුවනු ලැබුවේද නැත.[10]
**14** ක්‍රිස්තුස්ව මරණයෙන් නැඟිටුවනු
ලැබුවේ නැත්නම් අප කරන දේශනා
සේවයෙන් කිසිදු පලක් නැත. අප-
ගේ විශ්වාසයෙන්ද කිසි පලක් නැත.[11]
**15** මිය ගිය අයට නැවත නැඟිටී-
මක් නැත්නම් දෙවි ක්‍රිස්තුස්ව මර-
ණයෙන් නැඟිටුවා ඇති බව පැවසිය
නොහැක.[12] එසේනම් දෙවි ඔහුව මර-
ණයෙන් නැඟිටුවා ඇති බවට[13] අප
දරන සාක්ෂියත්[14] දෙවිට විරුද්ධව
කරන බොරු සාක්ෂියක් බවට පත්
වේ.[15] **16** මිය ගිය අයව නැඟිටු-
වනු ලබන්නේ නැත්නම් ක්‍රිස්තුස්වද
මරණයෙන් නැඟිටුවා ඇති බව පැව-
සිය නොහැක. **17** ක්‍රිස්තුස්ව මරණ-
යෙන් නැඟිටුවා නැත්නම් ඔබ තුළ
තිබෙන විශ්වාසයෙහි කිසි පලක් නැති
අතර ඔබ තවමත් සිටින්නේ ඔබේ

**14 පරි.**
1 1යොහ 4:6
2 1කොරි 12:31; 1තෙස 5:20
3 1කොරි 14:27
4 1කොරි 14:33; කොලො 2:5

**15 පරි.**
5 ක්‍රියා 18:11
6 ගලා 1:11
7 රෝම 5:2
8 රෝම 1:16
9 ගලා 3:4
10 ගලා 1:12
11 ගීතා 22:15; යෙසා 53:8; යෙසා 53:12; දානි 9:26; 1පේතෘ 2:24
12 යෙසා 53:9; මතෙ 27:60
13 ගීතා 16:10; යෙසා 53:10; යෝනා 2:10
14 ලූක් 24:46
15 මතෙ 28:7
16 ලූක් 24:34
17 යොහ 20:26
18 මතෙ 28:17
19 ක්‍රියා 12:17
20 ක්‍රියා 1:2; ක්‍රියා 1:6
21 ක්‍රියා 9:4; 1කොරි 9:1

**2 තීරුව**
1 එෆී 3:8
2 ක්‍රියා 8:3; ගලා 1:13; 1තිමෝ 1:13
3 එෆී 4:7
4 2කොරි 6:1
5 2කොරි 11:23
6 පිලි 2:13
7 ක්‍රියා 18:10
8 ක්‍රියා 4:2; ක්‍රියා 17:31
9 මතෙ 22:23; ක්‍රියා 26:8
10 රෝම 10:7
11 1තෙස 4:14
12 ක්‍රියා 17:31; 1කොරි 6:14
13 ක්‍රියා 2:24; ක්‍රියා 4:10; ක්‍රියා 13:30
14 ක්‍රියා 1:22
15 ක්‍රියා 3:15

**1කොරි 15:7*** හෝ, "යවනු ලැබූවන්."

පාපවලට සමාවක් ලබා නොගෙ-
නය.[1] **18** එසේනම් ක්‍රිස්තුස් සමඟ
එකට බැඳී සිටි අය අතරින්[2] මිය ගිය
අය සදහටම අපගෙන් වෙන් වී ඇත.[3]
**19** ඇත්තෙන්ම අප ක්‍රිස්තුස් ගැන
බලාපොරොත්තු තබාගෙන සිටියත්
අපට තිබෙන බලාපොරොත්තුව මේ
ජීවිතය ගැන පමණක් නම්[4] අන් සිය-
ලුදෙනාටම වඩා අනුකම්පාව ලැබිය
යුත්තේ අපටය.

**20** නමුත් ක්‍රිස්තුස්ව දැන් මරණ-
යෙන් නැඟිටුවා අවසන්ය.[5] මිය ගිය
අය අතරින්[6] මුලින්ම*[7] නැඟිටුවනු
ලැබුවේ ඔහුවය. **21** මරණය පැමි-
ණියේ[8] එක් මිනිසෙකු මාර්ගයෙනි.
එලෙසම එක් මිනිසෙකු මාර්ගයෙන්
මිය ගිය අයගේ නැවත නැඟිටී-
මද[9] සිදු වේ. **22** ඇත්තෙන්ම ආදම්
නිසා සියලුදෙනාම මිය යති.[10] නමුත්
ක්‍රිස්තුස් නිසා සියලුදෙනාටම ජීව-
නය ලැබේ.[11] **23** සෑම කෙනෙකු-
වම නැවත නැඟිටුවනු ලබන්නේ
නිසි අනුපිළිවෙළකටය. පළමු පල
ලෙස මුලින්ම නැඟිටුවනු ලැබුවේ
ක්‍රිස්තුස්වය.[12] ඉන්පසු ක්‍රිස්තුස් පැමිණ
සිටින කාලයේදී*[13] නැවත නැඟි-
ටුවනු ලබන්නේ ඔහුට අයිති වී
සිටින අයවයි. **24** අවසානයේදී සිය-
ලුම පාලන, බලතල හා අධිකාරිය
හොබවන අයව නැති කර දැමූ පසු ඔහු
රාජ්‍යය තම දෙවි හා පියාණන් වන
තැනැත්තාණන්ට භාර දෙනු ඇත.[14]
**25** දෙවි සියලු සතුරන් ඔහුගේ පාද
යට දමන තුරු ඔහු රජකම් කළ
යුතුයි.[15] **26** ඉන්පසු අන්තිම සතුරා
වන මරණයද නැති කරනු ඇත.[16]
**27** මන්ද දෙවි, “ඔහුගේ පාදවලට
සියල්ල යටත් කළේය.”[17] නමුත්,
‘සියල්ල යටත් කර තිබේ’[18] කියා පව-
සන විට සියල්ල ඔහුට යටත් කර
දුන් තැනැත්තා ඔහුට යටත් වන්නේ
නැත.[19] **28** මන්ද සියල්ල පුත්‍රයාට
යටත් කළ පසු[20] පුත්‍රයාද තමන්ට
සියල්ල යටත් කර දුන් තැනැත්-
තාණන්ට යටත් වනු ඇත.[1] එසේ
කරන්නේ දෙවි සියලුදෙනාගේම එකම
පාලකයාණන් ලෙස කටයුතු කිරීම
සඳහාය.[2]

**29** මිය ගිය අයව නැඟිටුවන්නේ
නැත්නම් මිය ගිය අය වීමේ අරමුණින්
බව්තීස්ම වන අයට[3] ලැබෙන ප්‍රයෝ-
ජනය කුමක්ද? එසේම මිය ගිය අයව
නැඟිටුවන්නේ නැත්නම්[4] ඔවුන්ව මිය
ගිය අය වීමේ අරමුණින් බව්තීස්ම
කරන්නේ කුමන හේතුවකටද?[5]
**30** අපද සෑම මොහොතක් පාසාම
අපගේ ජීවිත අනතුරේ තබන්නේ
මන්ද?[6] **31** සහෝදරයෙනි, අපගේ
ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්ගේ අනු-
ගාමිකයෙකු ලෙස මා ඔබ ගැන ප්‍රීති
වන බව සත්‍යයක් වන්නා සේම[7] මා
දිනපතාම මරණය නමැති අවදාන-
මට මුහුණ දෙන බවද සත්‍යයකි.[8]
**32** මිය ගිය අයට නැවත නැඟිටී-
මක් නැත්නම් අන් මිනිසුන් මෙන්
එපීසයේ දරුණු වනසතුන් සමඟ
සටන් වැදීමෙන් මට ඇති ප්‍රයෝජ-
නය කුමක්ද?[9] එසේනම්, “අපි හෙට
මැරෙන නිසා අද කමු, බොමු” කියා
සිතාගෙන සිටීම වඩාත් හොඳය.[10]
**33** මුළා නොවන්න. නරක ආශ්‍රය
නිසා ඔබේ හොඳ පුරුදු නැති වී යයි.[11]
**34** අවදි වන්න.[12] නැවතත් ධර්මිෂ්ඨ
දේ කරමින් සිහිකල්පනාවෙන් කට-
යුතු කරන්න. පව්කාර ක්‍රියාවලින්
වැළකී සිටින්න. මන්ද ඔබ අතරේ
සිටින සමහරදෙනෙකුට දෙවි ගැන
දැනුමක් නැත.[13] මා මේ දේවල් ඔබට
පවසන්නේ ඔබට ඔබ ගැනම ලැජ්ජා-
වක් ඇති කිරීම සඳහාය.[14]

**35** නමුත්, “මිය ගිය අයව නැඟි-
ටුවනු ලබන්නේ කෙසේද? ඔවුන්ට
ලැබෙන්නේ කුමනාකාරයේ ශරීර-
යක්ද”[15] කියා සමහරු අසති.
**36** එතරම් පටු ආකාරයට නො-
සිතන්න! බීජ වපුරන විට සිදු වන
දේ ගැන කල්පනා කර බලන්න.
බීජයකින් පැළයක් හටගැනීමට පෙර
එය දිරාපත් වී මිය යා යුතුයි.[16]

---

**1කොරි 15:20*** මූ.අ., “පළමු පල ලෙස.”
**23*** පැමිණ සිටීම. ග්‍රීක බසින්, පරුසියා. උපග්‍ර. 7 බලන්න.

**15 පරි.**
**1** රෝම 4:25 හෙබ්‍රෙ 7:25
**2** ක්‍රියා 7:59
**3** 1කොරි 15:14
**4** යොහ 1:12
**5** 1පේතෘ 1:3
**6** ක්‍රියා 26:23
**7** ලෙවී 23:10 කොලො 1:18
**8** උත් 3:19
**9** යොහ 11:25
**10** රෝම 5:12
**11** රෝම 5:17 රෝම 6:23
**12** එළි 1:5
**13** මතෙ 24:3 මතෙ 25:31 1තෙස 4:16
**14** ගීතා 110:2 දානි 2:44
**15** ගීතා 110:1
**16** එළි 20:14
**17** ගීතා 8:6 එෆි 1:22
**18** හෙබ්‍රෙ 2:8
**19** 1පේතෘ 3:22
**20** පිලි 3:21

**2 තීරුව**
**1** යොහ 3:35 යොහ 14:28
**2** 1කොරි 3:23
**3** රෝම 6:4
**4** ක්‍රියා 17:31
**5** 1කොරි 12:13 ගලා 3:27
**6** රෝම 8:36 2කොරි 11:26
**7** 1තෙස 2:19
**8** 1කොරි 4:9
**9** 2කොරි 1:8
**10** යෙසා 22:13
**11** හිතෝ 13:20 1කොරි 5:6 2පේතෘ 2:2
**12** රෝම 13:11 එෆි 5:14
**13** 1තෙස 4:5
**14** 1කොරි 6:5
**15** 1යොහ 3:2
**16** යොහ 12:24

**37** එලෙසම ඔබ වපුරන විට ඔබ
වපුරන්නේ පැළ නොවේ. ඔබ වපු-
රන්නේ බීජයි.[1] ඒ බීජ තිරිඟු හෝ වෙ-
නත් යම් බීජ වර්ගයක් විය හැක.
**38** නමුත් දෙවි තමන් කැමති ආකාර-
යට[2] ඒ බීජ පැළ බවට පත් කරයි.[3]
එහෙයින් සෑම බීජයකින්ම ඊට ආවේ-
ණික වූ පැළයක් හටගනී. **39** ශරීර
ගැනත් ඒ හා සමාන දෙයක් පැව-
සිය හැක. සෑම ශරීරයක්ම එකිනෙ-
කට වෙනස්ය. මිනිසාට තිබෙන්නේ
එක් ආකාරයක ශරීරයකි. එලෙසම
ගවයන්, කුරුල්ලන් සහ මත්ස්‍යයන්
යනාදි ජීවීන්ට ඇත්තේද එකිනෙ-
කට වෙනස් ශරීරයන්ය.[4] **40** පො-
ළොවේ සිටින ජීවීන්ට නොයෙකුත්
ආකාරයේ ශරීර තිබෙනවා[5] වගේ
ස්වර්ගයේ සිටින ජීවීන්ටද යම් ආකා-
රයක ශරීර ඇති බව කිව හැකිය.[6]
ස්වර්ගයේ සිටින ජීවීන්ගේ අලංකා-
රය[7] එක් විදිහක්ය. පොළොවේ සිටින
ජීවීන්ගේ අලංකාරය තවත් විදිහක්ය.
**41** හිරුගෙන් නිකුත් වන ආලෝ-
කය[8] එක් විදිහක්ය. හඳේ ආලෝ-
කය[9] තවත් විදිහක්ය. තරුවලින්
නිකුත් වන ආලෝකය[10] ඊට වඩා
වෙනස්ය. ඇත්තෙන්ම සෑම තරුව-
කින්ම විහිදෙන ආලෝකයද එකිනෙ-
කට වෙනස්ය.

**42** මිය ගිය අයගේ නැවත නැඟිටී-
මත් එසේමය.[11] බීජයක් වපුරනු ලැබූ
පසු එය දිරාපත් වී යනවා වගේ පුද්ග-
ලයා මිය ගිය විටද ඔහු දිරාපත් වී යයි.
නමුත් ඔහුව නැවත නැඟිටුවනු ලැබූ
පසු ඔහු කිසිදා දිරා යන්නේ නැත.[12]
**43** බීජයක් වපුරනු ලැබූ පසු එය දිරා-
පත් වී යනවා වගේ ඔහු මිය ගිය
විටද ඔහුට කිසි ගෞරවයක් හිමි වන්-
නේ නැත.[13] නමුත් ඔහුව නැවත
නැඟිටුවනු ලබන විට ඔහුට ස්වර්-
ගීය තේජසක් හිමි වේ.[14] ඔහු මිය
යන විට ඔහුගේ දුර්වලකම පැහැ-
දිලි වේ.[15] නමුත් ඔහුව නැඟිටුවනු
ලබන විට ඔහු කොතරම් බලවත්ද
කියා පැහැදිලි වේ.[16] **44** මිය යන්-
නේ ලේ ඇට මස් නහර සහිත ශරීර-
යක් ඇති පුද්ගලයාය.[1] නමුත් නැවත
නැඟිටුවනු ලබන්නේ ස්වර්ගයේ ජීවත්
වීමට හැකි පුද්ගලයෙකු ලෙසටය.[2]
එසේනම් පොළොව මත සිටින මිනි-
සුන්ට ශරීරයක් තිබෙනවා වගේ ස්වර්-
ගයේ ජීවත් වන අයටද යම් ආකාරයක
ශරීර තිබේ. **45** ලියවිලිවල සඳහන්
ආකාරයට, “පළමුවෙනි මිනිසා වූ
ආදම් පොළොවේ සිටි ජීවමාන පුද්ග-
ලයෙක් විය.”[3] නමුත් අන්තිම ආදම්
ස්වර්ගයේ සිටින[4] ජීවනය ගෙන දෙන[5]
කෙනෙක් විය. **46** නමුත් මුලින්ම
කෙනෙක් ස්වර්ගයේ සිටින කෙනෙකු
ලෙස නොව මිනිසෙකු ලෙස ජීවත්
විය යුතුයි. ඔහු ස්වර්ගයේ සිටින
කෙනෙකු වන්නේ ඉන්පසුවය.[6]
**47** මුල් මිනිසාව සෑදුවේ භූමියෙන්
ගන්නා ලද දූවිල්ලෙනි.[7] නමුත් දෙ-
වෙනි මිනිසා පැමිණියේ ස්වර්ගයෙනි.[8]
**48** දූවිල්ලෙන් සාදනු ලැබූ සියලුදෙනා
දූවිල්ලෙන් සාදනු ලැබූ තැනැත්තාට[9]
සමානය. එලෙසම ස්වර්ගයට යන
අය[10] ස්වර්ගයෙන් පැමිණි තැනැත්-
තාට සමානය.[11] **49** ඒ අනුව දූවිල්-
ලෙන් සාදනු ලැබූ තැනැත්තාගේ
ස්වරූපයට අප සමාන වූ ලෙසම[12] ඉදි-
රියේදී ස්වර්ගයෙන් පැමිණි තැනැත්-
තාගේ ස්වරූපයටත් අප සමාන වනු
ඇත.[13]

**50** නමුත් සහෝදරයෙනි, යමක්
පැහැදිලි කිරීමට කැමැත්තෙමි. එනම්
ලේ ඇට මස් නහර සහිත ශරීරයක්
ඇති කෙනෙකුට දෙවිගේ රාජ්‍යයට
පිවිසිය නොහැකි බවය.[14] එලෙසම
දිරා යනසුලු ශරීරයක් ඇති කෙනෙ-
කුට කිසිදා නොදිරන කෙනෙකු බවට
පත් විය නොහැක.[15] **51** ඔබට පරි-
ශුද්ධ රහසක් කියන්න මා කැමතිය.
අපි සියලුදෙනාම මරණය නමැති
නින්දෙහි සැතපී සිටින්නේ නැත. ඒ
වෙනුවට අප සියලුදෙනාව වෙනස්
කරනු ලැබේ.[16] **52** ඒ වෙනස ඇසි-
පිය හෙළන සැණින් සිදු වේ. එය
සිදු වන්නේ අවසාන හොරණෑව පිඹිනු
ලබන අවස්ථාවේදීය. මන්ද ඒ හොර-
ණෑවේ හඬ[17] නිකුත් වන විට මිය

**15 පරි.**
1 උත් 1:11
2 1කොරි 12:18
3 උත් 1:12
4 උත් 1:28
5 උත් 2:7 හෙබ්‍රෙ 2:7
6 උත් 22:11 දානි 7:10
7 මතෙ 28:3 ලූක් 24:4
8 ගීතා 72:5
9 උත් 1:16
10 දානි 12:3
11 යොහ 12:25
12 රෝම 2:7
13 යොහ 17:14
14 කොලො 3:4
15 1කොරි 1:27
16 එළි 20:4

**2 නිරුව**
1 1කොරි 6:13
2 යොහ 14:3
3 උත් 2:7
4 1තිමෝ 3:16
5 යොහ 5:26
6 1පේතෘ 3:18
7 උත් 3:19
8 යොහ 3:13 යොහ 6:33
9 උත් 2:7
10 පිලි 3:21
11 පිලි 3:20
12 උත් 5:3
13 රෝම 8:29
14 යොහ 3:3
15 1පේතෘ 1:23
16 1තෙස 4:17
17 1තෙස 4:16

ගොස් සිටි අයව කිසිදා නොදිරන අය
ලෙස නැඟිටුවනු ලබයි. ඒ අවස්ථා-
වේදී අපවද වෙනස් කරනු ලැබේ.
**53** එහෙයින් දිරා යන ශරීරයකින්
සිටි තැනැත්තා කිසිදා නොදිරන කෙ-
නෙකු බවට පත් විය යුතුයි.[1] එලෙසම
මිය යනසුලු තැනැත්තා[2] අමරණීය
කෙනෙකු බවට පත් විය යුතුයි.
**54** එසේ දිරා යන ශරීරයකින් සිටින
ඒ තැනැත්තා කිසිදා දිරා නො-
යන කෙනෙකු බවට පත් වන විටත්
මිය යනසුලු ඒ තැනැත්තා අමර-
ණීය කෙනෙකු බවට පත් වන විටත්,
“මරණය[3] සදහටම ගිල දමනු ලබන්-
නේය”[4] කියා ලියා තිබෙන දේ ඉටු
වේ. **55** “මරණය, ඔබේ ජය කො-
තැනද? මරණය, ගෝනුස්සෙකු මෙන්
අනතුරු කරන ඔබේ විෂ තුඩ කො-
තැනද?”[5] **56** මරණයට හේතු වන
විෂ තුඩ නම්[6] අපගේ පව්කාර ස්වභා-
වයයි. අපගේ පව්කාර ස්වභාවය කො-
තරම් දරුණුද කියා පැහැදිලි වන්නේ
නීතිය මාර්ගයෙනි.[7] **57** නමුත් දෙ-
විට ස්තුති වේවා! මන්ද ඔහු අපගේ
ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් මාර්ග-
යෙන් අපට ජය ලබා දෙයි.[8]
**58** එහෙයින් මාගේ ප්‍රේමණීය
සහෝදරයෙනි, ස්ථිරව සිටින්න.[9]
නොසැලී සිටින්න. ස්වාමීන් වෙනු-
වෙන් ඔබ දරන වෙහෙස නිෂ්ඵල
නොවන බව දන්නා නිසා[10] ස්වා-
මීන් වෙනුවෙන් කරන සේවය වෙහෙස
මහන්සි නොබලා කරන්න.[11]

**16** ශුද්ධ තැනැත්තන් උදෙසා[12]
එකතු කරන ලද සම්මාදම්
ගැන[13] යමක් පවසන්න මා කැමතිය.
ඒ ගැන මා ගලාතියේ සභාවන්ට[14]
දුන් උපදෙස් ඔබටත් අනුගමනය කළ
හැක. **2** සෑම සතියකම පළමුවෙනි
දින ඔබ ළඟ තිබෙන දේවලට අනුව
තම තමන්ගේ නිවෙස්වලදී යමක්
වෙන් කර තැබීමට ඔබට පුළුවන. ඔබ
එසේ කළොත් මා පැමිණි විට සම්-
මාදම් එකතු කිරීමට අවශ්‍ය වන්-
නේ නැත. **3** යෙරුසලමට යැවීම
සඳහා ඔබ යෝජනා කරන පුරුෂ-
යන් කවුද කියා මට කලින්ම දන්වා
එවිය යුතුයි.[1] එවිට මා පැමිණි විට
ඔබ කාරුණිකව පරිත්‍යාග කරන දේ
ඔවුන් අත යැවීමට සැලසුම් යෙදිය
හැක. **4** මාත් එහි යෑම සුදුසුයි කියා
පෙනෙනවා නම් මමත් ඔවුන් සමඟ
එහි යන්නෙමි.
**5** මම මැසිඩෝනියාවට යෑමටද
බලාපොරොත්තු වන නිසා එහි ගොස්
පසුව ඔබ ළඟට එන්නෙමි.[2] **6** මා
අදහස් කරන්නේ ඔබ සමඟ යම් කාල-
යක් නැවතී සිටීමටය. සමහරවිට ශීත
කාලය අවසන් වන තුරු ඔබ සමඟ
සිටීමට මට හැකි වේ. මා පිටත්ව
යන විට මාව ඇරලවීමට[3] යම් දුරක්
මා සමඟ පැමිණීමට ඔබටත් පුළුවන.
**7** මා මැසිඩෝනියාවට නොගොස්
කෙළින්ම ඔබව හමු වීමට පැමිණි-
යොත් මට නතර විය හැක්කේ කෙටි
කලකට පමණි. නමුත් යෙහෝවා
දෙවි[4] කැමති නම්[5] මා අදහස් කරන්-
නේ ඔබ සමඟ යම් කාලයක් නතර වී
සිටීමටය.[6] **8** පෙන්තකොස්ත උත්-
සවය පවත්වන දවස දක්වා
මම එපීසයේ නැවතී සිටීමට[7] බලා-
පොරොත්තු වෙමි. **9** මන්ද සේවය
කිරීම සඳහා විශාල ප්‍රස්තාවක් මට
එහි විවෘත වී ඇත.[8] නමුත් බොහෝ-
දෙනෙක් ඊට විරුද්ධව සිටිති.
**10** සමහරවිට තිමෝති[9] ඔබ වෙ-
නට පැමිණීමට ඉඩ තිබේ. ඔහු
ඔබ සමඟ සිටින විට ඔහුව අපහසු-
තාවකට පත් වන අයුරින් කටයුතු
නොකරන්න. මන්ද ඔහුත් යෙහෝවා
දෙවි වෙනුවෙන් මා කරන සේවය
හා සමාන සේවයක් ඉටු කරයි.[10]
**11** එහෙයින් කිසි කෙනෙකු ඔහුව
පහත් කර නොසැලකිය යුතුයි.[11] ඔහු
මාව හමු වීමට පිටත්ව එන විට ඔහු-
ගේ ආරක්ෂාවට ඔහුව ඇරලවීමට යම්
දුරක් ඔහු සමඟ එන්න. මන්ද ඔහු එන
තුරු මම සහෝදරයන් සමඟ බලා
සිටින්නෙමි.
**12** සහෝදරයන් සමඟ ඔබව හමු
වීමට යන ලෙස අපගේ සහෝ-
දර අපොලොස්ගෙන්[12] මම අවස්ථා

**15 පරි.**
1 රෝම 2:7
2 රෝම 8:11; 2කොරි 5:4
3 එළි 20:6; එළි 21:4
4 යෙසා 25:8
5 හොෂෙ 13:14
6 රෝම 6:23
7 රෝම 3:20; රෝම 7:13
8 යොහ 3:16; ක්‍රියා 4:12; 1යොහ 5:4
9 කොලො 1:23; හෙබ්‍රෙ 3:14; 2පේත 3:17
10 2ලේක 15:7; 1කොරි 3:8; එළි 14:13
11 රෝම 12:11

**16 පරි.**
12 2කොරි 8:4
13 ක්‍රියා 24:17; රෝම 15:26
14 ගලා 1:2

**2 තීරුව**
1 2කොරි 8:19
2 ක්‍රියා 19:21; 2කොරි 1:16
3 ක්‍රියා 17:15; රෝම 15:24; 3යොහ 6
4 යාකො 4:15; 1යොහ 5:14
5 ක්‍රියා 18:21
6 ක්‍රියා 20:2
7 ක්‍රියා 19:1
8 ක්‍රියා 19:10
9 ක්‍රියා 16:1; පිලි 2:19
10 පිලි 2:20; 1තිමෝ 4:14
11 1තිමෝ 4:12
12 ක්‍රියා 18:24

කිහිපයකදීම ඉල්ලා සිටියෙමි. නමුත්
දැන්මම ඔබව හමු වීමට ඔහු තුළ අද-
හසක් නැත. ඉදිරියේදී ඔහුට අවස්ථා-
වක් ලැබෙන විට ඔහු පැමිණෙයි.
**13** අවදිව සිටින්න.[1] ඔබේ විශ්-
වාසය නැති කර නොගෙන ස්ථිරව
සිටින්න.[2] පුරුෂයන් මෙන් නිර්භීතව
කටයුතු කරන්න.[3] තව තවත් නිර්-
භීත වන්න.[4] **14** ඔබ කරන සෑම
දෙයක්ම ප්‍රේමයෙන් කිරීමට වගබලා
ගන්න.[5]
**15** සහෝදරයෙනි, ඔබට යම් දෙ-
යක් ගැන උනන්දු කිරීමට
කැමැත්තෙමි. ඇකේයාවෙහි මුලින්ම
යේසුස්ගේ අනුගාමිකයන් බවට පත්
වූයේ ස්තෙෆනස්[6] සහ ඔහුගේ නිව-
සේ සිටින අය බවත් ඔවුන් ශුද්ධ
තැනැත්තන්ට මහත් කැපවීමකින්
උපකාර කරන බවත් ඔබ නො-
දන්නවා නොවේ.[7] **16** එවැනි අයටද
ඔවුන්ට සහයෝගය දක්වමින් වෙ-
හෙසෙන සියලුදෙනාටද දිගටම
යටත්ව සිටින්න.[8] **17** මේ අවස්ථා-
වේදී ස්තෙෆනස්,[9] ෆෝටුනාටස් සහ
අකායිකස් මා ළඟ සිටීම* ගැන
මට මහත් ප්‍රීතියක් දැනේ. මන්ද
ඔබ නැති පාඩුව ඔවුහු පිරිමැසුවෝය.
**18** ඔවුන් මටත් ඔබටත් මහත් සහන-
යක් ගෙන දී ඇත.[1] එහෙයින් එවැනි
පුරුෂයන්ට ගෞරවයෙන් සලකන්න.[2]
**19** ආසියාවේ පිහිටා ඇති සභා-
වල සහෝදරයෝ ඔබට සුබ පතති.[3]
අකිලා සහ ප්‍රිස්කාද ඔවුන්ගේ නිව-
සෙහි රැස් වන සභාවේ[4] සියලුදෙ-
නාද ස්වාමීන්ගේ අනුගාමිකයන් වන
ඔබට මුළු හදවතින්ම සුබ පතති.
**20** මෙහි සිටින සියලු සහෝදරයෝද
ඔබට සුබ පතති. සහෝදර සෙනෙහ-
සකින් එකිනෙකාව සිඹගනිමින් එකි-
නෙකාට සුබ පතන්න.[5]
**21** පාවුල් වන මම, මගේම අතින්[6]
මගේ සුබ පැතුම් ඔබට ලියා එවන්-
නෙමි.
**22** යමෙකුට ස්වාමීන් කෙරෙහි
සෙනෙහසක් නැත්නම් ඒ තැනැත්තා
ශාප ලද්දෙක් වේවා![7] අපගේ
ස්වාමීනි, එන්න![8] **23** ස්වාමීන් වන
යේසුස්ගේ මහත් කරුණාව ඔබ සිය-
ලුදෙනාටම ලැබේවා! **24** ක්‍රිස්තුස්
යේසුස්ගේ අනුගාමිකයන් වන ඔබ
සියලුදෙනාටම මගේ ප්‍රේමය එවන්-
නෙමි.

**16 පරි.**
1 1තෙස 5:6
2 1කොරි 15:58 පිලි 1:27
3 ක්‍රියා 4:29
4 එෆී 6:10 කොලො 1:11
5 1කොරි 13:4 1පේතෘ 4:8
6 රෝම 16:5
7 2කොරි 8:4 හෙබ්‍රෙ 6:10
8 පිලි 2:29 1තෙස 5:12 1තිමෝ 5:17
9 1කොරි 1:16

**2 තීරුව**
1 2කොරි 7:13
2 පිලි 2:29
3 රෝම 16:5
4 පිලෙ 2
5 රෝම 16:16
6 2තෙස 3:17 පිලෙ 19
7 ගලා 1:8
8 එළි 22:20

**1කොරි 16:17*** පැමිණ සිටීම. ග්‍රීක බසින්, පරුසියා. උපග්‍ර. 7 බලන්න.

# කොරින්තිවරුන්ට

## ලියූ දෙවෙනි ලිපිය

**1** මෙම ලිපිය ඔබට ලියන්නේ
දෙවිගේ කැමැත්තට අනුව ක්‍රිස්-
තුස් යේසුස්ගේ නියෝජිතයෙකුව*[1]
සිටින පාවුල් වන මමය. මා සමඟ
අපගේ සහෝදර තිමෝතිද[2] සිටියි.
මෙය ලියන්නේ කොරින්තියේ පිහිටි
දෙවිගේ සභාවට සහ මුළු ඇකේයා
පළාතේ සිටින[3] ශුද්ධ තැනැත්තන්[4]
වෙතටය.
**2** අපගේ පියාණන් වන දෙවිගෙන්
සහ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්-
ගෙන් ඔබ සැමට මහත් කරුණාවත්
සමාදානයත් ලැබේවා![1]
**3** අපගේ ස්වාමීන් වන යේ-
සුස් ක්‍රිස්තුස්ගේ දෙවි සහ පියා-
ණන්[2] වන තැනැත්තාණන්ට ප්‍රශංසා
වේවා! මහත් දයාවක් පෙන්වන පියා-
ණන් ඔහුය.[3] සියලු සැනසිල්ලේ දෙවි

**1 පරි.**
1 1කොරි 1:1 1තිමෝ 1:1
2 ක්‍රියා 16:1 පිලි 2:20
3 1තෙස 1:8
4 කොලො 1:2

**2 තීරුව**
1 රෝම 1:7 එෆී 1:3 පිලි 1:2
2 යොහ 20:17 එෆී 4:6

**2කොරි 1:1*** හෝ, “යවනු ලැබූවෙකුව.”

**3** නික් 34:6; ගීතා 86:5; මීකා 7:18.

ඔහුය.[1] **4** අපගේ සියලු පීඩාවලදී
අපව සනසන්නේ ඔහුය.[2] දෙවිගෙන්
අප ලබන එම සැනසීම තුළින්[3]
ඕනෑම ආකාරයක පීඩාවක් විඳින
අයව සැනසීමට අපටත් හැකි වේ.[4]
**5** ක්‍රිස්තුස් උදෙසා අපට බොහෝ දුක්
වේදනා විඳින්න සිදු වුවත්[5] ක්‍රිස්තුස්
තුළින් අප ලබන සැනසිල්ල කියා
නිම කළ නොහැකිය.[6] **6** එහෙයින්
පීඩා විඳින්න අපට සිදු වුණත් එමගින්
ඔබට සැනසිල්ලක් ලැබෙයි. එලෙසම
ඔබේ ගැලවීමටද එය මහ පාදයි.[7]
අපට සැනසීම ලැබෙන විට එමගින්
ඔබටත් සැනසීමක් ලැබෙන අතර අප
විඳින දුක්ම ඔබට විඳින්න සිදු වන
විට ඒ සැනසීම තුළින් ඒවා විඳද-
රාගැනීමට ශක්තියද ඔබට ලැබේ.[8]
**7** එහෙයින් ඔබ ස්ථිරව සිටියි කියා
අපට විශ්වාසයි. අප එසේ කියන්නේ
අපට මෙන් දුක් විඳින්න ඔබට සිදු
වුණත් අප සැනසිල්ල ලැබුවා සේම
ඔබටත් එය ලබාගැනීමට හැකි වන
බව අප දන්නා නිසාය.[9]

**8** සහෝදරයෙනි, අප ආසියා ප්‍රදේ-
ශයේ සිටි කාලයේදී අපට මුහුණ
දෙන්න සිදු වූ පීඩා ගැන ඔබව දැනු-
වත් කිරීමට කැමැත්තෙමු.[10] අපට
දැනුණු පීඩනය කොතරම්ද කිව-
හොත් එය අපගේම ශක්තියෙන් දරා-
ගත නොහැකි විය. ඇත්තටම අපගේ
ජීවිත පවා තිබුණේ ඉතා අවදා-
නම් තත්වයකය.[11] **9** අපට හැඟු-
ණේ අප මරණ දණ්ඩනයට නියම
වී ඇති බවය. කෙසේවෙතත් එහි
ප්‍රතිඵලයක් ලෙස අප ගැනම විශ්වා-
සයක් තබනවා වෙනුවට මිය ගිය
අයට ජීවනය ලබා දෙන දෙවි[12] කෙ-
රෙහි විශ්වාසය තැබීමට අපට හැකි
විය.[13] **10** ඇත්තෙන්ම දෙවි මර-
ණය තරම් දරුණු විපතකින් පවා
අපව බේරාගත්තේය.[14] ඉදිරියේදීත්
ඔහු අප වෙනුවෙන් ඒ දේ නැව-
තත් කරයි කියා අපට විශ්වාසයි.[15]
**11** අප වෙනුවෙන් දෙවිට කන්නලව්
කිරීමෙන් අපට උපකාර කරන්න ඔබ-
ටත් හැකිය.[16] බොහෝදෙනෙකු දෙ-

**1 පරි.**
1 යෙසා 51:3 රෝම 15:5
2 ගීතා 23:4 2කොරි 7:6
3 රෝම 15:4 2තෙස 2:16
4 එෆී 6:22 1තෙස 4:18
5 1කොරි 4:11 කොලො 1:24
6 පිලි 2:1 2තෙස 2:16
7 එෆී 1:13
8 රෝම 8:17 1පේතෘ 3:17 1පේතෘ 4:16
9 රෝම 8:18 2තිමෝ 2:12
10 ක්‍රියා 19:22 ක්‍රියා 20:18
11 ක්‍රියා 19:23 1කොරි 15:32 1කොරි 16:9 2කොරි 11:23
12 හෙබ්‍රෙ 11:19
13 ගීතා 33:20 යෙරෙ 17:7 2කොරි 12:10
14 ගීතා 34:19 2පේතෘ 2:9
15 ගීතා 34:7 2තිමෝ 4:18
16 රෝම 15:30 පිලි 1:19 පිලෙ 22

**2 තීරුව**
1 ක්‍රියා 12:5
2 2කොරි 9:11
3 1කොරි 2:4
4 ක්‍රියා 23:1
5 1කොරි 4:14
6 පිලි 2:16 1තෙස 2:19
7 2කොරි 5:12
8 1කොරි 4:19
9 ක්‍රියා 20:2
10 1කොරි 16:5
11 ක්‍රියා 20:3
12 ක්‍රියා 17:15 රෝම 15:24 1කොරි 16:6
13 2කොරි 10:2
14 2කොරි 5:16

විට මහත් ඕනෑකමින් එසේ යාච්ඤා
කරන නිසා අපට දෙවිගේ කරුණාව
ලැබී ඇත.[1] එමනිසා අප වෙනුවෙන්
කළ දේ ගැන දෙවිට ස්තුති කරන්න
සියලුදෙනාටම හැකි වේ.[2]

**12** ඉතා සතුටින් යමක් පැවසී-
මට කැමැත්තෙමු. එනම් ලෝකයේ
සිටින මිනිසුන් අතරත් විශේෂයෙන්
ඔබ අතරත් අප ශුද්ධකමින් සහ
දෙවිගේ ප්‍රමිතියට අනුව අවංකක-
මින් කටයුතු කළ බවය. එලෙසම
අප රඳා සිටියේ මිනිසුන්ගේ ප්‍රඥාව
මත නොව[3] දෙවිගේ මහත් කරු-
ණාව මතය. අප දෙවි ඉදිරියේ ඒ
දේ පවසන්නේ නිදොස් හෘදය සාක්ෂි-
යකිනි.[4] **13** ඇත්තෙන්ම අප ඔබට
මෙසේ ලියන්නේ ඔබ හොඳින් දන්නා
සහ පිළිගන්නා දේවල් ගැන මිස
වෙනත් දේවල් ගැන නොවේ. මගේ
ආශාව වන්නේ ඔබ මේ දේවල් අවසා-
නය දක්වාම පිළිගන්නවා දැකීමයි.[5]
**14** අපගේ ස්වාමීන් වන යේසුස්ගේ
දවසේදී අපට ඔබ ගැන සතුටු වීමට
හැකි වන්නා සේම[6] ඔබටත් අප ගැන
සතුටු විය හැකියි.[7] ඔබ අතරින් යම්
පිරිසක් එයට එකඟ වෙයි කියා මට
විශ්වාසයි.

**15** එහෙයින් ඒ විශ්වාසය ඇතුව
මා අදහස් කරමින් සිටියේ[8] දෙ-
වෙනි වරටත් ඔබව හමු වීමට පැමිණ
ඔබට ප්‍රීති වීමට තවත් අවස්ථා-
වක් ලබා දීමටය.[9] **16** ඒ අනුව
ඔබ සමඟ කාලයක් ගත කර ඉන්-
පසු මැසිඩෝනියාව බලා යෑමටත්[10]
මැසිඩෝනියාවේ සිට නැවත පැමිණ
ඔබව හමු වීමටත්[11] මම අදහස් කර-
ගෙන සිටියෙමි. ඉන්පසු මා යුදය
බලා පිටත් වන විට මාව ඇරලවී-
මට[12] ඔබ යම් දුරක් මා සමඟ පැමි-
ණෙයි කියා බලාපොරොත්තුවෙන්
සිටියෙමි. **17** මගේ අදහස වුණේ
එයයි. එමනිසා මා නොසැලකිලිමත්
ලෙස ක්‍රියා කරන කෙනෙක් කියා
නොසිතන්න.[13] මා දේවල් කරන්-
නේ මගේම සතුට වෙනුවෙන්ද?[14]

මා එසේ කටයුතු කරනවා නම්
මා ඇත්තෙන්ම "එසේය" කියා පවසා,
එය "නැත" කියා වහාම වෙනස්
කරන බොරුකාරයෙකි.[1] **18** නමුත්
දෙවි විශ්වාසවන්ත කෙනෙක් වන්නා
සේම අප එසේය කියා පවසන දේ
නැත කියා වෙනස් නොකරන බව
ඔබට විශ්වාස කළ හැක. **19** මන්ද
සිල්වානස්, තිමෝති[2] සහ මා, දෙ-
විගේ පුත්‍රයා[3] වන ක්‍රිස්තුස් යේසුස්
ගැන දේශනා කළ විට අප එසේය
කියා පැවසූ දේවල්, නැත බවට
වෙනස් කළේ නැත. ඇත්තෙන්ම
එසේය කියා පැවසූ දේවල් එසේය
කියා තව තවත් තහවුරු වී තිබේ.[4]
**20** මන්ද දෙවි දී ඇති සෑම පොරොන්-
දුවක්ම[5] යේසුස් මාර්ගයෙන් එසේය*
වී තිබේ.[6] එහෙයින් අප යේසුස් තුළින්
දෙවිට "ආමෙන්"#[7] කියා පවසන්නේ
දෙවිට ගෞරවය ගෙන දීම සඳහාය.
**21** නමුත් ඔබ සහ අප ක්‍රිස්තුස්ට
අයිති බව සහතික කරන්නෙත් අපව
අභිෂේක කර තිබෙන්නෙත්[8] දෙවිය.
**22** අපට ඉදිරියේ ලැබෙන්න තිබෙන
දෙයට සාක්ෂියක් ලෙස[9] දෙවි ඔහුගේ
බලය අපට ලබා දී තිබේ. අපගේ
සිත් තුළ ක්‍රියාත්මක වන දෙවිගේ
බලය[10] සහතිකයක් සපයන 'මුද්‍රා-
වක්' හා සමානය.[11]
**23** මා කොරින්තියට පැමිණීම
ප්‍රමාද කරන්නේ ඔබට තවත් දුකක්
ඇති කරන්න මා අකමැති නිසාය.[12]
මා ඔබට කියන මේ දේ සැබෑ-
වක් නොවේ නම් මට විරුද්ධව
සාක්ෂි දරන්න කියා දෙවිගෙන් ඉල්ලා
සිටිමි.[13] **24** අප ඔබේ විශ්වාසයට
බලපෑම් කරන පාලකයන්[14] නොවන
බව මතක තබාගන්න. ඒ වෙනුවට
අපි ඔබේ ප්‍රීතියට දායක වන[15] ඔබ
සමඟ හවුලේ සේවය කරන අය වන්-
නෙමු.[16] මන්ද ඔබ ස්ථිරව සිටින්නේ[17]
ඔබ තුළ තිබෙන විශ්වාසය නිසා මිස
අප නිසා නොවේ.

---

**2කොරි 1:20*** එනම්, සැබෑ. **20#** එනම්, එසේම වේවා!

**1 පරි.**
1 මතෙ 5:37 යාකො 5:12
2 ක්‍රියා 18:5
3 ලූක් 1:35 ක්‍රියා 9:20
4 හෙබ්‍රෙ 13:8
5 උත් 3:15 උත් 17:7 උත් 49:10
6 රෝම 15:8
7 1කොරි 14:16 එළි 3:14
8 1යොහ 2:20 1යොහ 2:27
9 2කොරි 5:5 එෆී 1:14
10 රෝම 8:9 රෝම 8:23 1කොරි 12:13
11 එෆී 4:30
12 1කොරි 4:21
13 රෝම 1:9 පිලි 1:8
14 හෙබ්‍රෙ 13:17 1පේතෘ 5:3
15 රෝම 11:20
16 1කොරි 3:9 1යොහ 1:3
17 1කොරි 15:1

**2 තීරුව**

**2 පරි.**
1 රෝම 9:2
2 1කොරි 4:21
3 2කොරි 7:16
4 2කොරි 12:21
5 ගලා 5:10
6 ක්‍රියා 20:31
7 2කොරි 7:8
8 1කොරි 5:1
9 1තිමෝ 5:20
10 ලූක් 15:24
11 හෙබ්‍රෙ 12:12
12 රෝම 12:10 කොලො 1:4
13 2කොරි 10:6
14 යොහ 20:23

# 2
මගේ පැමිණීම ඔබේ දුකට හේතු-
වක් වන නිසා දැන්මම නො-
පැමිණීමට මම තීරණය කළෙමි.[1]
**2** මන්ද මා ඔබව දුකට පත්
කළොත්[2] දුකින් සිටින ඔබට මාව
සතුටට පත් කළ හැක්කේ කෙසේද?
**3** එහෙයින් මා මේ දේවල් ලියා එවන්-
නේ මා පැමිණි විට මට ප්‍රීතියක්
ගෙන දිය යුතු ඔබව[3] දැකීමෙන් මගේ
සිතට දුකක් ඇති නොවීම සඳහාය.[4]
මන්ද ඔබේ ප්‍රීතියටත් මගේ ප්‍රීතිය-
ටත් එකම දේ හේතු වන බව මම
දනිමි. ඒ ගැන කිසි සැකයක් නැත.[5]
**4** මහත් කනස්සල්ලකින්ද සිත් වේද-
නාවකින්ද බොහෝ කඳුළු සලමින්ද
මා ඔබට ලිව්වේ[6] ඔබව දුකට පත්
කිරීමට නොවේ.[7] ඔබ සඳහා මට ඇති
විශේෂ ප්‍රේමය ඔබ දැනගන්නවාට මා
කැමති වූ නිසාය.
**5** මා ඍජු ලෙස කතා කරන නිසා
මා සමඟ අමනාප නොවන්න. මේ දුක
ඇති වී තිබෙන්නේ යම් කෙනෙකු
නිසා නම්[8] ඔහු ඒ දුක ඇති කළේ මට
නොව යම් දුරකට ඔබ සියල්ලන්ටය.
**6** එවැනි කෙනෙකුට සහෝදරයන්
බොහෝදෙනෙකුගෙන් හික්මවීම් ලැබී
ඇත.[9] එම හික්මවීම් දැන් ප්‍රමාණ-
වත්ය. **7** එහෙයින් ඔබ දැන් ඔහුට
කාරුණිකව සමාව දී[10] ඔහුව සැනසිය
යුතුයි. එසේ කළේ නැත්නම්
එවැනි කෙනෙකුට දැනෙන අධික දුක
නිසා ඔහු සම්පූර්ණයෙන්ම කලකි-
රීමට පත් විය හැක.[11] **8** එමනිසා
මා ඔබට දැන් උනන්දු කරන්නේ
ඔහු සඳහා ඔබට තිබෙන ප්‍රේමය[12]
ඔහුට දැනෙන්න සලස්වන්න කියාය.
**9** මා මේ දේවල් ඔබට ලියන්නේ
ඔබ සියල්ලේදී කීකරුව කටයුතු කර-
නවාද[13] කියා දැනගැනීම සඳහාය.
**10** කෙනෙකු කළ යම් වරදකට ඔබ
සමාව දෙනවා නම් මමද ඔහුට
සමාව දෙමි.[14] ඇත්තෙන්ම මා කෙ-
නෙකු කළ වරදකට සමාව දී ඇත්-
නම් ක්‍රිස්තුස් ඉදිරියෙහි මා එසේ
කළේ ඔබට උපකාර කිරීමේ අර-
මුණෙනි. **11** එසේම සාතන් අපව

රවටා තමාගේ වාසියට යමක් අප
තුළින් ඉටු කර නොගැනීම සඳහාය.[1]
මන්ද ඔහු කොතරම් කපටි අන්දමින්
ක්‍රියා කරනවාද කියා අපි හොඳින්
දැන සිටිමු.[2]
**12** ක්‍රිස්තුස් ගැන ශුභාරංචිය
ප්‍රකාශ කිරීමට මා ත්‍රෝවසට ගිය
විට[3] ස්වාමීන් වෙනුවෙන් සේවය
කිරීමට මට යම් ප්‍රස්තාවක් විවෘත
වී තිබුණත්,[4] **13** මගේ සිතට කිසි
සහනයක් දැනුණේ නැත. ඒ මගේ
සහෝදර තීතස්ව[5] මුණගැසීමට නො-
හැකි වූ නිසාය. පසුව මම ඔවුන්ගෙන්
සමුගෙන මැසිඩෝනියාව බලා පිටත්
වුණෙමි.[6]
**14** දෙවිට ස්තුතිවන්ත වේවා!
මන්ද දෙවි අපව ක්‍රිස්තුස් සමඟ[7] නිත-
රම ජය පෙරහැරකින් ගෙන යන
අතර[8] තමන් පිළිබඳ දැනුම නමැති
සුවඳ අප මාර්ගයෙන් සෑම තැනම
පතුරුවයි.[9] **15** දෙවි ඉදිරියෙහි ක්‍රිස්-
තුස් පිළිබඳ ශුභාරංචිය රැගෙන යන
අප, ගලවනු ලබන අය අතරත් විනාශ
වන අය අතරත්[10] විහිදෙන මිහිරි
සුවඳක් හා සමානය.[11] **16** විනාශ
වන අයට නම් එය මරණය ගෙන
දෙන මරණීය සුවඳකි.[12] නමුත් ගල-
වනු ලබන අයට එය ජීවනය ගෙන
දෙන ජීවනදායක සුවඳකි. මේ සේ-
වය සඳහා නිසි සුදුසුකම් ලබා සිටින්-
නේ කවුද?[13] **17** ඒ අපය. මන්ද
බොහෝදෙනෙකු කරනවා වගේ[14] අපි
දෙවිගේ පණිවිඩය[15] විකුණා ජීවත්
වන අය නොවන්නෙමු. දෙවි විසින්
එවනු ලැබූ අය ලෙස අප සේවය
කරන්නේ අවංකකමින්ය. අප කතා
කරන්නේ දෙවි ඉදිරියෙහි පෙනී සිටින
ක්‍රිස්තුස්ගේ අනුගාමිකයන් ලෙසය.[16]

**3** අප කවුද කියාත් අපගේ සුදු-
සුකම් මොනවාද කියාත් ඔබට
නැවත පැහැදිලි කළ යුතුද?[17] එසේ
නැත්නම් ඇතැම් මිනිසුන්ට අවශ්‍ය
වන ආකාරයට ඔබට පෙන්වීමට
හෝ ඔබෙන් ලබාගැනීමට අපට
යම් සහතිකපත් අවශ්‍යද?[18] **2** අපට
තිබෙන සහතිකපත ඔබය.[19] ඔබ
පිළිබඳ වාර්තාව අපගේ හදවත්වල
ලියා ඇත. එමෙන්ම මෙම සහතික-
පත ගැන සියලුම මිනිසුන් දන්නා
අතර ඔවුහු එය කියවති.[1] **3** ඇත්-
තෙන්ම ඔබ ක්‍රිස්තුස්ගෙන් ලැබුණු
සහතිකපතක් හා සමානය. එය
ලියනු ලැබුවේ දේවසේවකයන් වන
අප විසිනි.[2] ලිවීම සඳහා භාවිත කළේ
තීන්ත නොව ජීවමාන දෙවිගේ බල-
යයි.[3] එය ලිව්වේ ගල් පුවරු මත
නොව[4] හදවත් නමැති පුවරු මතයි.[5]
**4** ක්‍රිස්තුස් මාර්ගයෙන් අපට දෙවි
ඉදිරියේ එය නිසැකවම පැවසිය
හැක.[6] **5** එහෙයින් අපට නිසි සුදු-
සුකම් ලබා දෙන්නේ දෙවිය.[7] එම
සුදුසුකම් අපගේ වෑයමෙන් ලබා-
ගත් දෙයක් නොවන නිසා ඒ සඳහා
අපට ගෞරවය හිමි විය යුතු නැත.[8]
**6** දෙවි අපට මෙසේ නිසි සුදුසුකම්
ලබා දී තිබෙන්නේ අලුත් ගිවිසු-
මක දේවසේවකයන් වීමටය.[9] එහෙ-
යින් අපි ලිඛිත නීති මාලාවකට
සම්බන්ධ වී සිටින දේවසේවකයන්
නොව[10] දෙවිගේ බලය ඇති දේවසේ-
වකයෝ වෙමු.[11] මන්ද ඒ ලිඛිත නීති
මාලාව කෙනෙකුව මරණයට සුදුස්-
සෙකු කරයි.[12] නමුත් දෙවිගේ බලය
ජීවනය ලබා දෙයි.[13]
**7** ගල්වල කොටන ලද[14] මරණය
ගෙන දෙන නීති මාලාව[15] ලබා
දුන් අවස්ථාවේදී පවා තේජසක් දැක-
ගත හැකි විය.[16] මෝසෙස්ගේ මුහු-
ණෙන්ද දැකගත හැකි වූ ඒ තේජස
මොන තරම්ද කිවහොත් ඔහු දෙස
බලා සිටීමට ඊශ්‍රායෙල්වරුන්ට නො-
හැකි විය.[17] නමුත් පසුව ඒ තේජස
නැති වී ගියේය. **8** එසේනම් දෙවි-
ගේ බලය ලබා දෙන විට[18] ඊටත්
වඩා තේජසක් තිබිය යුතු නොවේද?[19]
**9** මන්ද කෙනෙකුව මරණයට සුදුස්-
සෙකු බව ඔප්පු කරන නීති මාලාව[20]
ලබා දුන් විට පවා මහත් තේජ-
සක් දැකගත හැකි වී නම්[21] කෙ-
නෙකුව ධර්මිෂ්ඨ කරන විට[22] එය
ඊටත් වඩා මහත් තේජසක් ඇතුව
සිදු විය යුතුයි.[23] **10** ඇත්තෙන්ම

**2 පරි.**
1 ලූක් 22:31 එෆී 6:12 2තිමෝ 2:26
2 එෆී 6:11 1පේතෘ 5:8
3 ක්‍රියා 16:8 ක්‍රියා 20:6
4 1කොරි 16:9
5 ගලා 2:3 තීත 1:4
6 ක්‍රියා 16:9 2කොරි 7:5
7 එළි 14:4
8 ගීතා 68:7
9 ක්‍රියා 8:5
10 1කොරි 1:18
11 එෆී 5:2
12 යොහ 15:19 2කොරි 4:3 1පේතෘ 2:8
13 1කොරි 15:10
14 2කොරි 11:13
15 2කොරි 4:2
16 2කොරි 12:19

**3 පරි.**
17 2කොරි 5:12 2කොරි 10:12
18 ක්‍රියා 18:27
19 1කොරි 9:2

**2 තීරුව**
1 යොහ 5:36 යොහ 10:38
2 රෝම 15:16 1කොරි 3:5
3 යොහ 14:17
4 නික් 31:18 නික් 34:1
5 හිතෝ 3:3 හිතෝ 7:3 එස 11:19 එස 36:26
6 එෆී 3:12
7 නික් 4:15 පිලි 2:13 1යොහ 2:27
8 රෝම 15:18 1කොරි 2:7
9 හෙබ්‍රෙ 8:6 1යොහ 2:20
10 රෝම 13:9
11 රෝම 7:6
12 ගලා 3:10
13 යොහ 6:63
14 නික් 31:18 නික් 32:16
15 රෝම 7:10
16 නික් 34:29
17 නික් 34:30
18 ක්‍රියා 2:4 ගලා 3:5
19 හෙබ්‍රෙ 2:4 1පේතෘ 4:14
20 ද්වි 27:26
21 නික් 34:35
22 රෝම 3:21 2කොරි 5:18
23 2කොරි 4:6

කලක් තේජසින් යුතුව තිබුණු දෙ-
යෙහි තේජස දැන් නැති වී තිබේ.[1]
එසේ වූයේ නීතියෙහි තේජසට වඩා
උතුම් තේජසක් පැමිණ තිබෙන
නිසාය.[2] **11** නැති කර දැමීමට
නියමිත වූ දෙයට තේජසක් තිබුණා
නම්[3] දිගටම පවතින දෙයට ඊටත්
වඩා තේජසක් තිබිය යුතුයි.[4]

**12** ඒ සම්බන්ධයෙන් අපටත් බලා-
පොරොත්තුවක් තිබෙන නිසා[5] කිසි
බියක් සැකක් නැතුව මහත් නිද-
හසකින් යුතුව කතා කිරීමට අපට
පුළුවන. **13** මෝසෙස් මෙන් අප
වැස්මකින් අපගේ මුහුණ වසාගන්නේ
නැත.[6] ඔහුට එසේ කරන්න සිදු වූයේ
නැති වී යැමට නියමිත වූ දෙයක්
ලබා දුන් අවස්ථාවේදී තම මුහුණෙන්
දිස් වූ තේජස දෙස බලා සිටීමට ඊශ්‍රා-
යෙල්වරුන්ට නොහැකි වූ නිසාය.[7]
**14** ඔවුන්ගේ කල්පනා ශක්තිය මොට
වී තිබිණ.[8] ඔවුන් අද වන තුරුත්
පරණ ගිවිසුමෙන්[9] කියෙව්වත් ඔවුන්-
ගේ මනස්වලින් එම වැස්ම ඉවත්
වී නැති බව පැහැදිලියි. මන්ද එම
වැස්ම ඉවත් කළ හැක්කේ ක්‍රිස්-
තුස් මාර්ගයෙන් පමණි.[10] **15** ඇත්-
තෙන්ම අද වන තුරුත් මෝසෙස්ගේ
ලියවිලි කියවන විට[11] ඔවුන්ගේ සිත්-
වල වැස්මක් තිබේ.[12] **16** නමුත්
කෙනෙක් යෙහෝවා දෙවි වෙතට
හැරෙන විට ඒ වැස්ම ඉවත් කරනු
ලැබේ.[13] **17** යෙහෝවා දෙවි නො-
පෙනෙන දෙවි කෙනෙකි.[14] එලෙ-
සම යෙහෝවා දෙවිගේ[15] බලය[16] ඇති
තැන නිදහස ඇත.[17] **18** අප[18] කිසි-
වෙකුගේ මුහුණුවල වැස්මක් නැති
නිසා යෙහෝවා දෙවිගේ තේජස පිළි-
බිඹු කරන කැඩපත් හා සමාන වීමට[19]
අපට හැකි වී තිබේ. එසේ කරන
විට අප තව තවත් ඔහුගේ ස්ව-
රූපයට අනුව[20] හැඩගැසෙන අතර[21]
අපගෙන් පිළිබිඹු වන තේජසද තව
තවත් වැඩි වේ.[22] ඇත්තෙන්ම මේ
වෙනස සිදු වන්නේ නොපෙනෙන යෙ-
හෝවා දෙවි[23] කැමති ආකාරයටමය.

**3 පරි.**
**1** කොලො 2:15
**2** කොලො 2:17
**3** නික් 19:16; නික් 24:17
**4** හෙබ්‍රෙ 12:22
**5** 1පේතෘ 1:3
**6** නික් 34:33
**7** රෝම 10:4
**8** රෝම 11:7
**9** යෙසා 6:10; යොහ 12:40
**10** රෝම 7:6; එෆී 2:15
**11** ක්‍රියා 15:21
**12** රෝම 11:8
**13** නික් 34:34; රෝම 11:23; රෝම 11:26
**14** උත් 6:3; යොහ 4:24
**15** යෙසා 61:1
**16** ගලා 5:18
**17** රෝම 6:14; රෝම 8:15; ගලා 5:1; ගලා 5:13
**18** රෝම 8:30
**19** ගීතා 138:5; යෙසා 40:5; යෙසා 60:1
**20** එෆී 4:24; එෆී 5:1
**21** යොහ 1:12; ගලා 4:5
**22** රෝම 8:30; 1කොරි 13:12; 1පේතෘ 1:4; 1යොහ 3:2
**23** 2කොරි 4:6

**2 තීරුව**

**4 පරි.**
**1** ක්‍රියා 9:15
**2** රෝම 11:13; 1තිමෝ 1:12
**3** රෝම 6:21
**4** 2කොරි 2:17; 2කොරි 6:3; 2කොරි 8:20; ගලා 1:9
**5** 2කොරි 6:4
**6** 2කොරි 2:15
**7** යොහ 14:30; එෆී 2:2; 1යොහ 5:19
**8** 2කොරි 11:14
**9** කොලො 1:15; හෙබ්‍රෙ 1:3
**10** 1තිමෝ 1:11
**11** මතෙ 5:14
**12** යෙසා 60:2; යොහ 8:12
**13** 1කොරි 1:23
**14** මතෙ 20:27
**15** උත් 1:3
**16** 2පේතෘ 1:3
**17** 1පේතෘ 2:9

**4** දෙවි අපට දැක්වූ දයාව නිසා[1]
අපට මේ සේවය භාර දී තිබේ.[2]
අප අපගේ උත්සාහය අත් නොහැරී-
මට හේතුව එයයි. **2** හොර රහසේ
කරන ලැජ්ජාසහගත දේවල් අපි දැන-
ටමත් ප්‍රතික්ෂේප කර සිටිමු.[3] අප
කපටිකමින් නොහැසිරෙන අතර දේ-
වවචනය විකෘති කරන්නේද නැත.[4]
ඒ වෙනුවට සත්‍යය ප්‍රකාශ කිරී-
මෙන් අප දෙවි ඉදිරියේ සියලු මිනි-
සුන්ගේ අනුමැතිය ලබමින් ඔවුන්ට
යහපත් ආදර්ශයක් වෙමු.[5] **3** නමුත්
අප ප්‍රකාශ කරන ශුභාරංචිය වැස්ම-
කින් වැසී තිබෙන්නේ විනාශ වන අය-
ටය.[6] **4** විශ්වාසයක් නැති එවැනි
අයගේ මනස් මේ සමාජයේ දෙවියා[7]
අන්ධ කර ඇත.[8] එමනිසා දෙවිගේ
ස්වරූපයට සමානව සිටින[9] ක්‍රිස්තුස්
පිළිබඳ ශුභාරංචිය ගැන අප දේශනා
කළත් අප පතුරුවන ඒ ශ්‍රේෂ්ඨ ශුභා-
රංචියේ[10] ආලෝකය[11] තමන් අතරේ
බැබළෙන බව ඔවුන්ට පෙනෙන්නේ
නැත.[12] **5** ක්‍රිස්තුස් යේසුස් ස්වාමීන්
බවත්[13] අප යේසුස් උදෙසා සේවය
කරන ඔබේ දාසයන් බවත්[14] අපි දේ-
ශනා කරන්නෙමු. ඒ හැර අප දේ-
ශනා කරන්නේ අප ගැන නොවේ.
**6** මන්ද, “අන්ධකාරයෙන් ආලෝකය
බැබළෙන්න”[15] කියා පැවසුවේ දෙවිය.
ඒ දෙවිම ක්‍රිස්තුස්ගේ මුහුණ මාර්-
ගයෙන්[16] අපගේ සිත් තුළට තම
ආලෝකය විහිදුවා ඇත.[17] ප්‍රතිඵල-
යක් ලෙස අපගේ සිත් දෙවි පිළිබඳ
තේජවත් දැනුමෙන්[18] ආලෝකවත් වී
ඇත.

**7** අප සතු ඒ වස්තුව[19] අප දරන්-
නේ මැටි[20] භාජනවලය.[21] එයින්
පැහැදිලි වන්නේ අප සතු බලය[22] අප-
ගේම ශක්තියෙන් උපදවාගත් දෙයක්
නොව[23] දෙවිගෙන් ලද[24] සාමාන්‍යය
ඉක්මවූ බලයක් වන බවය. **8** අපව
සෑම ආකාරයකින්ම තළාපෙළා දැමු-
වත්[25] අපගේ ගමන ඉන් නතර

**18** යොහ 17:3; **19** 2කොරි 4:1; **20** ගීතා 8:4; යෙසා 64:8; 1කොරි 15:47; **21** ක්‍රියා 9:15; 1තෙස 4:4; **22** එෆී 1:19; **23** 2කොරි 12:9; පිලි 4:13; **24** 1කොරි 2:5; **25** 2කොරි 7:5.

වන්නේ නැත. අප කොතරම් ව්‍යා-
කූල වී සිටියත් අපට ගැලවීමට මඟක්
තිබෙන නිසා අපගේ බලාපොරොත්තු
සුන් වන්නේ නැත.[1] **9** අපට පීඩා
කළත් අපව අත්හැර දමා නැත.[2]
අපව බිමටම ඇද දැමුවත්[3] අපි විනාශ
වන්නේ නැත.[4] **10** අප කොතැන-
කට ගියත් යේසුස්ට මුහුණ දෙන්න
සිදු වූ අවදානම්වලට මුහුණ දෙන්න
අපටත් සිදු වේ.[5] එමගින් යේසුස්
ගත කළ ජීවිතය හා සමාන ජීවිත-
යක් අපටත්* ගත කිරීමට සිදු වන
බව සියලුදෙනාටම පැහැදිලි වේ.[6]
**11** මන්ද අපි යේසුස් නිසා නිරතුරු-
වම මරණයට මුහුණ දීමේ අවදානමක
සිටින්නෙමු.[7] එසේ වන්නේ යේසුස්
ගත කළ ජීවිතය අපගේ මිය යනසුලු
ශරීර තුළින්ද පිළිබිඹු වීම සඳහාය.[8]
**12** එහෙයින් අපට මරණයට මුහුණ
දෙන්න සිදු වුවත් එයින් ඔබට ජීවනය
හිමි වේ.[9]

**13** ලියවිලිවල සඳහන් වන්නේ,
“මා තුළ තිබෙන විශ්වාසය නිසා
කතා කළෙමි”[10] කියාය. අප කතා
කරන්නේ අප තුළත් එවැනිම විශ්-
වාසයක් තිබෙන නිසාය. **14** මන්ද
යේසුස්ව නැඟිටෙවූ තැනැත්තා යේ-
සුස් හා සමානව අප සියලුදෙනා-
වත් නැඟිටුවා අපව යේසුස් ඉදිරියට
ගෙනෙන බව අපි දනිමු.[11] **15** අප
සැම දෙයකටම මුහුණ දුන්නේ ඔබ
නිසාය.[12] එහි ප්‍රතිඵලයක් ලෙස බො-
හෝදෙනෙකු දෙවිට ස්තුති කිරීම
නිසා දෙවිගේ අතිමහත් කරුණාව
තව තවත් වැඩියෙන් ප්‍රකාශ වේ.
එයින් දෙවිට ප්‍රශංසාව සහ ගෞරවය
හිමි වේ.[13]

**16** අපගේ උත්සාහය අප අත්
නොහරින්නේ ඒ නිසාය. මන්ද අප
පිටාතරින් දිරාපත් වෙමින් ගියත්
අපගේ ඇතුළාන්තය[14] දිනෙන් දින
අලුත් වන බව නිසැකය. **17** අපට
මුහුණ දීමට සිදු වන්නේ සුළු පීඩා-
වන්ටය. ඒවා පවතින්නෙත් කෙටි
කලකටය.[1] නමුත් එහි ප්‍රතිඵලයක්
ලෙස අපට අතිමහත් මෙන්ම සදාකා-
ලික තේජසක් හිමි වේ.[2] **18** එහෙ-
යින් අප නිරතුරුව බලා සිටින්නේ
පෙනෙන දේවල් දෙස නොව නොපෙ-
නෙන දේවල් දෙසය.[3] මන්ද පෙනෙන
දේවල් පවතින්නේ කෙටි කාලය-
කටය.[4] නමුත් නොපෙනෙන දේවල්
සදාකාලිකය.[5]

**5** මිහිපිට වාසය කිරීමට අපට ලැබී
තිබෙන ශරීරය[6] කූඩාරමක් හා
සමානය.[7] ඒ කූඩාරම කඩා වැටෙන
විට[8] අපට දෙවිගෙන් ගොඩනැඟිල්-
ලක් ලැබෙන බව දනිමු. ඒ අලුත්
ගොඩනැඟිල්ල මිනිසුන්ගේ අත්වලින්
නොසෑදූ[9] ස්වර්ගයේ පිහිටි සදාකා-
ලික[10] නිවසකි. **2** නමුත් දැන් අපට
හිමි වී තිබෙන වාසස්ථානයේ අප
සිටින්නේ කෙඳිරිගාමින්ය.[11] එලෙසම
අප මහත් ආශාවකින් සිටින්නේ ස්වර්-
ගයෙන් අපට ලැබෙන දේ පැළඳගැ-
නීමටය.[12] **3** අප එය පැළඳගන්නා
විට අපි තවදුරටත් නිර්වස්ත්‍රව නො-
සිටිනු ඇත.[13] **4** ඇත්තෙන්ම මේ
කූඩාරමෙහි සිටින අප කනස්සල්-
ලට පත් වී කෙඳිරිගාමින් සිටින්නේ
මේ කූඩාරම ඇඳුමක් ඉවත දමන්නා
සේ අහක දැමීමට අපට අවශ්‍ය නිසා
නොවේ. ඒ වෙනුවට අපගේ මහත්
ආශාව නම් ස්වර්ගික දේ ලබාගැනී-
මය.[14] එසේ මිය යනසුලු දේ වෙනුවට
අපට ජීවනය හිමි වනු ඇත.[15] **5** ඒ
සඳහා අපව සූදානම් කළේ දෙවිය.[16]
එමෙන්ම අපට උරුමයක් වශයෙන්
ලැබෙන දේට සාක්ෂියක් ලෙස[17] ඔහු
තම බලය අපට දුන්නේය.[18]

**6** එහෙයින් අපි නිතරම ධෛර්ය-
යෙන් සිටිමු. මන්ද අප ස්වාමීන්ගෙන්
වෙන් වී සිටින්නේ අපගේ ශරීරය
නමැති වාසස්ථානයේ සිටින තුරු
පමණි.[19] **7** අප ඒ දේ ගැන දන්නේ
අප දකින දෙයින් නොව විශ්වාස-
යක් ඇතුව ගමන් කරන නිසාය.[20]
**8** එසේ මහත් ධෛර්යයක් ඇතුව
සිටින අපි, මෙම ශරීරය නමැති
වාසස්ථානයේ සිටිනවාට වඩා ස්වා-

**4 පරි.**
**1** ගීතා 7:1; 1කොරි 10:13
**2** හෙබ්‍රෙ 13:5
**3** ක්‍රියා 14:19
**4** එළි 2:10
**5** රෝම 8:38; පිලි 3:10; 1පේත 4:13
**6** ක්‍රියා 4:13
**7** රෝම 8:36; 1කොරි 4:9; 1කොරි 15:31
**8** 2කොරි 6:9
**9** 2කොරි 2:16
**10** ගීතා 116:10
**11** රෝම 8:11; 1කොරි 6:14
**12** 1කොරි 3:21
**13** 2තිමෝ 2:10
**14** රෝම 7:22; කොලො 3:10

**2 තීරුව**
**1** 1පේත 1:6
**2** මතෙ 5:12; රෝම 8:18
**3** රෝම 8:34; 2කොරි 5:7; හෙබ්‍රෙ 11:1
**4** ගීතා 37:10; යාකො 1:11
**5** අනි 7:27

**5 පරි.**
**6** දේශ 12:3; 2කොරි 4:7
**7** 2පේත 1:13
**8** 2පේත 1:14
**9** 1කොරි 15:48; 1කොරි 15:50; පිලි 3:21
**10** ලූක් 16:9
**11** රෝම 8:23
**12** රෝම 6:4; 1කොරි 15:48
**13** එළි 3:18
**14** 1කොරි 15:43; පිලි 1:21
**15** 1කොරි 15:53; 1පේත 1:4
**16** එෆී 2:10
**17** 2කොරි 1:22; එෆී 1:14
**18** රෝම 8:23; 1කොරි 12:13
**19** යොහ 14:3
**20** රෝම 8:24; 2කොරි 4:18

---

**2කොරි 4:10*** මූ.අ., “අපගේ ශරීරයටත්.”

මීන් සමඟ වාසය කිරීමට කැමැත්-
තෙන් සිටිමු.[1] **9** ඒ අනුව අප
කොතැනක සිටියත් එනම්, ඔහු අප
සමඟ සිටියත් නැතත්[2] අපගේ අධිෂ්-
ඨානය වන්නේ නිතරම ඔහුට පිළිගත
හැකි අය ලෙස සිටීමටය.[3] **10** මන්ද
අප සියලුදෙනාටම ක්‍රිස්තුස්ගේ විනිශ්-
චයාසනය ඉදිරියේ පෙනී සිටීමට සිදු
වනු ඇත.[4] එවිට තම ශරීරය නමැති
වාසස්ථානයේ සිටින විට කළ යහපත්
දේවලට හෝ නපුරු දේවලට අනුව
එකිනෙකාට ප්‍රතිඵල ලැබෙනු ඇත.[5]
**11** ස්වාමීන් සඳහා ගරුබියක්[6]
තිබිය යුතු බව අප තේරුම්ගෙන
සිටින නිසා අපට සවන් දෙන්න කියා
අපි මිනිසුන්ට උනන්දු කරන්නෙමු.[7]
අප කවර අන්දමේ අයද කියා දෙවි
හොඳින් දැන සිටියි. එලෙසම අප
කවර අන්දමේ අයද කියා ඔබත් අව-
බෝධ කරගෙන ඇති බව මට විශ්-
වාසයි.[8] **12** අප කවුරුන්ද කියාත්
අපගේ සුදුසුකම් මොනවාද කියාත්
නැවත ඔබට පැහැදිලි කර දෙනවා
නොවේ.[9] ඒ වෙනුවට අප ඔබට මේ
ලබා දෙන්නේ අප ගැන ආඩම්බ-
රයෙන් කතා කිරීමට පදනමක්ය.[10]
එමගින් අවංක හදවතක් ගැන කතා
කරනවාට වඩා[11] බාහිර දේවල් ගැන
පුරසාරම් දොඩන අයට[12] පිළිතුරක්
දීමට ඔබට හැකි වේ. **13** සමහ-
රවිට අප සිහිවිකල්ව කටයුතු කර-
නවා වගේ[13] ඔබට පෙනුණත් අප
එසේ කරන්නේ දෙවි වෙනුවෙන්ය.
අප සිහිකල්පනාවෙන් කටයුතු කර-
නවා නම්[14] එසේ කරන්නේ ඔබ වෙනු-
වෙන්ය. **14** මන්ද ක්‍රිස්තුස්ට ඇති
ප්‍රේමය අප තුළ මහත් පෙලඹීමක්
ඇති කරයි. සියලුදෙනා උදෙසා එක්
මිනිසෙකු මිය ගිය බව[15] අපි පිළි-
ගනිමු. එසේ වූයේ සියලුදෙනා ඒ
වන විටත් මිය ගොස් සිටි නිසාය.
**15** ඔහු මිය ගියේ ඔහුගේ මරණය
නිසා ජීවත් වන සියලුදෙනා තවදුර-
ටත් තමන් වෙනුවෙන් ජීවත් නොවී[16]
තමන් වෙනුවෙන් මිය ගොස් මරණ-
යෙන් නැඟිටුවනු ලැබූ තැනැත්තා[17]
වන ඔහු උදෙසා[1] ජීවත් වීම සඳහාය.
**16** එහෙයින් මෙතැන් පටන් මිනි-
සුන් බලන ආකාරයකින් අපි කිසි
මිනිසෙකු දෙස බලන්නේ නැත.[2]
අප කලින් ක්‍රිස්තුස් දෙස බැලුවෙත්
මිනිසුන් බලන ආකාරයකින් වුවත්[3]
අපි තවදුරටත් එසේ නොකර සිටිමු.[4]
**17** ඇත්තෙන්ම කෙනෙක් ක්‍රිස්තුස්
සමඟ එකට බැඳී සිටිනවා නම් ඔහු
අලුතින්ම බිහි වූ පුද්ගලයෙකු බව[5]
පැවසිය හැක. එහෙයින් පරණ දෙය
පහ වී ගොස් ඇති අතර[6] අලුත් දෙ-
යක් බිහි වී ඇත.[7] **18** මේ සෑම දෙ-
යක්ම සිදු වන්නේ දෙවි නිසාය. මන්ද
ක්‍රිස්තුස් මාර්ගයෙන් තමන් සමඟ
සමාදාන වීමට[8] මිනිසුන්ට මඟ සැල-
සුවේ ඔහුය. එමෙන්ම දෙවි මිනි-
සුන්ට තමන් සමඟ සමාදාන වීමට
ප්‍රස්තාව උදා කර දෙන සේවයක්ද
අපට භාර දුන්නේය.[9] **19** ඒ සේවය
මගින් ප්‍රකාශ කරන්නේ මිනිස් වර්-
ගයා[10] කළ වැරදිවලට දඬුවම් නොදී[11]
තමන් සමඟ සමාදාන වීමට[12] දෙවි
ක්‍රිස්තුස් මාර්ගයෙන්[13] මඟ උදා කර දී
ඇති බවය. එම සමාදාන වීමේ පණිවි-
ඩය[14] දෙවි භාර දුන්නේ අපටය.[15]
**20** එහෙයින් අපි[16] ක්‍රිස්තුස් වෙ-
නුවෙන්[17] තානාපතීන් ලෙස[18] ක්‍රියා
කරමින් සිටින්නෙමු. ක්‍රිස්තුස් වෙනු-
වෙන් එසේ පෙනී සිටින අය ලෙස
අප සියලුදෙනාගෙන් ඉල්ලා සිටින්-
නේ,[19] “දෙවි සමඟ සමාදාන වන්න”
කියාය. දෙවි එම ඉල්ලීම අප
මාර්ගයෙන් කරන බව[20] සැලකිල්ලට
ගන්න. **21** කිසිදා පාපයක් නො-
කළ ඒ තැනැත්තාව[21] අප වෙනුවෙන්
පාප පූජාවක් ලෙස[22] දෙවි ඉදිරිපත්
කළේය. එසේ කළේ ඔහු මාර්ගයෙන්
අපට දෙවි ඉදිරියේ ධර්මිෂ්ඨ වීමට[23]
මඟ උදා කර දීම සඳහාය.

**6** දෙවි සමඟ එකට වැඩ කරන
හවුල් සේවකයන් ලෙස[24] ඔබෙන්
යම් ඉල්ලීමක් කරන්න කැමැත්තෙමු.
එනම් දෙවි පෙන්වා ඇති මහත් කරු-
ණාව පිළිගන්න. එම මහත් කරුණාව

**5 පරි.**
1 පිලි 1:23
2 පිලි 1:24
3 ක්‍රියා 10:35
4 ක්‍රියා 17:31
5 කොලො 3:24 එළි 22:12
6 හෙබ්‍රෙ 10:31 1පේතෘ 1:17
7 ක්‍රියා 18:4
8 2කොරි 4:2
9 2කොරි 3:1 2කොරි 10:12
10 2කොරි 1:14
11 යෙරෙ 9:24
12 යෙරෙ 9:23 2කොරි 10:10
13 2කොරි 11:1 2කොරි 11:16
14 2කොරි 12:6
15 යෙසා 53:10 මතෙ 20:28 1තිමෝ 2:6
16 රෝම 14:7
17 ක්‍රියා 3:15

**2 තීරුව**
1 රෝම 6:11
2 මතෙ 12:50 2කොරි 7:1 1පේතෘ 4:6
3 මතෙ 23:39
4 යොහ 20:17
5 රෝම 6:4 ගලා 6:15
6 යෙසා 43:18 එෆී 4:22
7 එෆී 4:24
8 රෝම 5:10 එෆී 2:16 කොලො 1:20
9 ක්‍රියා 20:24
10 රෝම 5:6 රෝම 11:15 1යොහ 2:2
11 යෙසා 43:25 රෝම 4:25 රෝම 5:18
12 ගීතා 37:29 එළි 21:3
13 රෝම 3:24
14 ක්‍රියා 13:38
15 මතෙ 28:19
16 පිලි 3:20
17 මතෙ 25:40
18 එෆී 6:20
19 එළි 22:17
20 2කොරි 2:14
21 යොහ 8:46 හෙබ්‍රෙ 4:15 හෙබ්‍රෙ 7:26
22 ලෙවී 16:21 හෙබ්‍රෙ 9:28
23 ද්වි 21:23 රෝම 1:17

**6 පරි.**
24 මතෙ 28:20 2කොරි 5:20

ඔබට පෙන්වූයේ ඇයි කියා කිසිදා
අමතක නොකරන්න.[1] **2** මන්ද ඔහු
මෙසේ කියයි. “මගේ අනුමැතිය ඇති
කාලයකදී මම ඔබට සවන් දුන්නෙමි.
ගැලවීම ලබා දෙන දිනයේදී මම
ඔබට පිහිට වුණෙමි.”[2] ඇත්තෙන්ම
දෙවිගේ විශේෂ අනුමැතිය ඇති ඒ
කාලය දැන් උදා වී ඇත.[3] ගැලවීම
ලබා දෙන දිනයද දැන් උදා වී ඇත.[4]
**3** කිසිවෙකුටවත් අප නිසා අප-
හසුතාවකට ලක් වෙන්න අපි ඉඩ
තබන්නේ නැත.[5] අප එසේ කරන්නේ
කිසිවෙකු අපගේ සේවයට දෝෂාරෝ-
පණය නොකිරීම සඳහාය.[6] **4** එහෙ-
යින් දෙවිගේ සේවකයන් වීමට අපට
තිබෙන සුදුසුකම් අපි සෑම අයුරින්ම
ඔප්පු කර පෙන්වන්නෙමු.[7] එසේ
කරන්නේ බොහෝ දේ විඳදරාගැනී-
මෙන්ද පීඩාවලට මුහුණ දීමෙන්ද අග-
හිඟකම් ඇතුව සිටීමෙන්ද දුෂ්කරතා
අද්දකිමින්ද,[8] **5** පහර කෑම්වලින්ද
සිරගතවීම්වලින්ද[9] කෝලහලවලට
හසු වීමෙන්ද වෙහෙසීමෙන්ද නිදි
මැරීමෙන්ද කෑම හිඟකම්වලින්ද,[10]
**6** පවිත්‍ර ජීවිතයක් ගත කිරීමෙන්ද
දැනුම, බොහෝ ඉවසිලිවන්තකම[11]
හා කරුණාවන්තකම ඇතුව[12] කට-
යුතු කිරීමෙන්ද දෙවිගේ බලය ඇතුව
සිටීමෙන්ද කුහකකමින් තොර ප්‍රේම-
යක් ඇතුව සිටීමෙන්ද,[13] **7** සත්‍යය
කතා කිරීමෙන්ද දෙවිගේ බලවත්
ක්‍රියා තුළින්ද[14] දකුණතේ මෙන්ම
වමතේ තිබෙන ධර්මිෂ්ඨකමේ ආයුධ
මාර්ගයෙන්ද,[15] **8** ගෞරවය ලැබී-
මෙන් සහ අගෞරවය විඳීමෙන්ද
අපකීර්තිය සහ කීර්තිය ලැබීමද
යනාදියෙනි. එලෙසම අපව රැවටි-
ලිකරුවන් ලෙස සැලකුවත්[16] අපි
අවංකව කටයුතු කළෙමු. **9** මිනි-
සුන් අපව පිළි නොගත්තත් දෙවි
අපව පිළිගත්තේය.[17] අප මිය යෑමට
ආසන්න බව පෙනුණත් ඇත්තෙන්ම
අපි තවමත් ජීවත් වන්නෙමු.[18] දඬුවම්
ලැබිය යුතු අය ලෙස අපව සැලකු-
වත්[19] අපට මරණ දණ්ඩනය නියම
වූයේ නැත.[20] **10** අපව ශෝකයෙන්
සිටින අය ලෙස සැලකුවත් අපි නිත-
රම ප්‍රීතියෙන් සිටියෙමු. දිළිඳුන් ලෙස
අපව සැලකුවත් අපි බොහෝදෙනෙ-
කුව ධනවතුන් බවට පත් කළෙමු.
අපව කිසිවක් නැති අය ලෙස සැලකු-
වත් අපි සියල්ල සතු අය වන්නෙමු.[1]
**11** කොරින්තිවරුනි, අපි කිසිවක්
නොසඟවා සියල්ල විවෘතව ඔබට
ප්‍රකාශ කළෙමු.* අපගේ හදවත්වල
ඔබ වෙනුවෙන් ඇති ප්‍රේමය[2] තව
තවත් වැඩි වී ඇත.# **12** ඔබට සෙ-
නෙහස පෙන්වන්න අප අදිමදි නො-
කළත්[3] සෙනෙහස පෙන්වන්න ඔබ
අදිමදි කරන බව අපට පෙනේ.[4]
**13** මා දැන් ඔබට කතා කරන්-
නේ මගේම දරුවන්ට කතා කරනවා
හා සමානවය.[5] එහෙයින් ඔබත් ඔබේ
හදවත්වල ඇති ප්‍රේමය තව තවත්
වැඩි කරගන්න.*

**14** දෙවිට සේවය නොකරන අය
සමඟ බැඳීම් ඇති කර නොගන්න.*[6]
මන්ද ධර්මිෂ්ඨකම සහ අධර්මිෂ්-
ඨකම# අතර සම්බන්ධයක් තිබිය
හැකිද?[7] නැත්නම් ආලෝකය සහ
අන්ධකාරය අතර සමානකමක් තිබිය
හැකිද?[8] **15** එමෙන්ම ක්‍රිස්තුස් සහ
බෙලියල්* අතර එකමුතුකමක් තිබිය
හැකිද?[9] නැත්නම් දෙවිට සේවය
කරන්නෙකු හා දෙවිට සේවය නොක-
රන කෙනෙකු අතර බැඳීමක් තිබිය
හැකිද?[10] **16** දෙවිගේ මාලිගාව සහ
දේවතා රූප අතර සමානකමක් තිබිය
හැකිද?[11] මන්ද අපි ජීවමාන දෙ-
විගේ මාලිගාවක්[12] වන්නෙමු. එසේ
වන්නේ දෙවි පැවසූ ලෙසමය. මන්ද,
“මම ඔවුන් අතරේ වාසය කරන්-
නෙමි.[13] ඔවුන් අතරේ ගැවසෙන්-
නෙමි. මම ඔවුන්ගේ දෙවි වන්නෙමි.
ඔවුහු මාගේ සෙනඟ වන්නෝය”[14]
කියා දෙවි පවසා ඇත. **17** “ ‘එහෙ-

**6 පරි.**
**1** රෝම 2:4 හෙබ්‍රෙ 12:15
**2** යෙසා 49:8
**3** ලූක් 4:19
**4** යොහ 9:4 හෙබ්‍රෙ 3:13
**5** රෝම 14:13
**6** 1කොරි 9:22
**7** 2කොරි 4:2
**8** 2කොරි 11:23
**9** එළි 2:10
**10** 2කොරි 11:27
**11** එෆී 4:2 කොලො 3:13 1තෙස 5:14
**12** මීකා 6:8 එෆී 4:32
**13** රෝම 12:9 1තිමෝ 1:5
**14** 1කොරි 2:4
**15** 2කොරි 10:4 එෆී 6:11
**16** මතෙ 10:16
**17** ක්‍රියා 4:13 2කොරි 4:10
**18** 2කොරි 4:11
**19** ගීතා 118:18 හෙබ්‍රෙ 12:6
**20** ක්‍රියා 14:19 2කොරි 4:9

**2 තීරුව**
**1** ෆිලි 4:13 එළි 2:9
**2** 2කොරි 8:16
**3** 2කොරි 12:15
**4** 1පේත෭ 2:17 1යොහ 4:20
**5** 1කොරි 4:14
**6** නික් 23:32 ද්වි 7:3 1රාජ 11:4 1කොරි 7:39
**7** 1කොරි 5:11 යාකො 4:4
**8** එෆී 5:8
**9** මතෙ 4:10 එළි 12:7
**10** 1කොරි 10:21
**11** 1කොරි 10:14
**12** 1කොරි 3:16 1කොරි 6:19
**13** නික් 29:45 ලෙවී 26:11
**14** ලෙවී 26:12 එස 37:27 සෙක 8:8

---

**2කොරි 6:11*** මූ.අ., “ඔබ වෙනුවෙන් අපගේ මුඛය විවෘත වී ඇත.” **11#** මූ.අ., “හදවත් විශාල වී ඇත.” **13*** මූ.අ., “හදවත් තවත් විශාල කරගන්න.” **14*** මූ.අ., “නොගැළපෙන වියගහක් යටතට නොපැමිණෙන්න.” **14#** හෝ, “නීතියට විරුද්ධව ක්‍රියා කිරීම.” **15*** මූ.අ., “කිසි කමකට නැති පුද්ගලයෙක්.” සාතන් සඳහා භාවිත කෙරේ.

යින් ඔවුන් අතරින් පිටතට ඇවිත්
ඔවුන්ගෙන් වෙන් වන්න' කියා යෙ-
හෝවා දෙවි කියන්නේය. 'තවදුරටත්
අපවිත්‍ර දේවලට අත නොගසන්න.' "[1]
"'එවිට මම ඔබව පිළිගන්නෙමි.' "[2]
**18** "'මම ඔබට පියෙක් වන්නෙමි.[3]
ඔබ මට පුත්‍රයන්ද දූවරුන්ද වන්න-
හුය'[4] කියා සියලු බලැති[5] යෙහෝවා
දෙවි පවසන්නේය."

**7** ප්‍රේමණීය සහෝදරයෙනි, අපට
ඒ පොරොන්දු ලබා දී තිබෙන
නිසා[6] අපගේ මනස[7] සහ ශරීරය අප-
විත්‍ර කරවන සෑම දෙයකින්ම ඉවත් වී
අපි අපවම පවිත්‍ර කරගනිමු.[8] එලෙසම
දේවගරුබිය දක්වමින් අපගේ ශුද්ධ-
කම දිනෙන් දින පූර්ණ මට්ටමකට
ගෙනෙමු.[9]
**2** අපට ඔබේ හදවත්වල ඉඩක්
දෙන්න.[10] අප කාටවත් වරදක් නො-
කළ අතර කිසිම කෙනෙකුව
අප නොමඟ යවා නැත. කිසිවෙකු-
ගෙන් යම් වාසි ප්‍රයෝජන ගත්තේ-
වත් නැත.[11] **3** මා එසේ කියන්නේ
ඔබට නින්දා කිරීමේ අදහසින් නො-
වේ. මන්ද මා කලින් පැවසූ ලෙසම
අපට කුමක් සිදු වුවත් ඔබ වෙනුවෙන්
අපගේ හදවත්වල තිබෙන සෙනෙහස
කිසිදා නැති වන්නේ නැත.[12] **4** කිසි
බියක් සැකක් නැතුව මට ඔබ සමඟ
විවෘතව කතා කළ හැකියි. එලෙසම
මට ඔබ ගැන මහත් ආඩම්බරයක්ද
දැනේ.[13] එහෙයින් මට මහත් සැන-
සීමක් දැනෙන අතර[14] අපට මොන
තරම් පීඩා පැමිණියත් ඉමහත් ප්‍රීතිය-
කින් මගේ හදවත ඉපිල යයි.[15]
**5** ඇත්තෙන්ම අප මැසිඩෝනියා-
වට ගිය විට[16] අපට කිසි සහන-
යක් දැනුණේ නැත.[17] හැම අතින්ම
අපි පීඩා වින්දෙමු.[18] බොහෝදෙනෙකු
අපට පීඩා කළ අතර අප අතරේ සිටි
සහෝදරයන් ගැනද අපි බියෙන් සිටි-
යෙමු. **6** නමුත් තීතස් පැමිණ අප
සමඟ යම් කලක් සිටි* නිසා අධෛර්-
යයට පත් වී සිටින අයව සනසන
දෙවි[1] ඔහු මාර්ගයෙන් අපව සැනසු-
වේය. **7** ඔහුගෙන් අප සැනසිල්ලක්
ලැබුවේ ඔහු අප ළඟ සිටි* නිසා පම-
ණක් නොවේ. ඔහු ඔබ ගැන දැනගත්
දෙයින් සැනසිල්ලක් ලැබූ නිසා ඒ
සැනසිල්ල මගින් ඔහු අපවද සැනසු-
වේය. මන්ද ඔබ මාව දකින්න මහත්
ආශාවකින් සිටින බවත් ඔබ මහත්
දුකින් සිටින බවත් මා ගැන ඔබ
දක්වන අවංක උනන්දුව ගැනත් ඔහු
අපට දැන්වූ නිසා[2] මගේ ප්‍රීතිය තවත්
වැඩි විය.
**8** ඒ නිසා මගේ ලිපිය ඔබට යම්
දුකක් ගෙන දුන්නත්[3] මට ඒ ගැන
කනගාටුවක් දැනෙන්නේ නැත. (ඒ
ලිපිය කෙටි කලකට ඔබ තුළ දුකක්
ඇති කළ බව මම දනිමි.) මුලින් ඒ
ලිපිය ලිවීම ගැන මා කනගාටු වුවත්,
**9** මම දැන් ඒ ගැන සතුටු වෙමි. එසේ
සතුටු වන්නේ ඔබ නිකම්ම දුක් වූ
නිසා නොව ඔබේ දුක ඔබේ පසු-
තැවිල්ලට මඟ පෑදූ නිසාය.[4] මන්ද
ඔබ දෙවි ඉදිරියේ අවංකවම දුක්
වුණේය.[5] එහෙයින් අප නිසා ඔබට
අත් වූයේ යහපතක් මිස අයහප-
තක් නොවේ. **10** මන්ද කෙනෙක්
දෙවි ඉදිරියේ අවංකවම දුක් වෙ-
නවා නම් එය පසුතැවිල්ලටත් ඒ පසු-
තැවිල්ල ගැලවීමටත් මඟ පාදයි. ඒ
නිසා ඔබ කනගාටු නොවිය යුතුයි.[6]
අනික් අතට මේ ලෝකයේ මිනි-
සුන් මෙන් දුක් වීමෙන් කිසි පලක්
නැත. එසේ කළොත් එය විනාශයට
හේතු වේ.[7] **11** ඒ වෙනුවට දෙවි ඉදි-
රියේ අවංකවම දුක් වීමෙන් ඔබට
අත් වන ප්‍රතිඵල මොනවාද කියා
දැන් බලන්න.[8] මුලින්ම ඔබ යම් පිය-
වර ගැනීමට දැඩි වෑයමක් දැරූ අතර
ඇති වූ කැළැල නැති කිරීමටද මහත්
ආශාවක් ඔබ තුළ ඇති විය. එලෙ-
සම කලින් කළ වරද ගැන පිළිකු-
ලක්ද දෙවි සඳහා ගරුබියක්ද ඔබට

**6 පරි.**
**1** යෙසා 52:11 යෙරෙ 51:45 එළි 18:4
**2** එස 20:41 2කොරි 7:1
**3** 2සාමු 7:14
**4** යෙසා 43:6 හොෂෙ 1:10 යොහ 1:12
**5** එළි 1:8

**7 පරි.**
**6** 2කොරි 6:16 2පේතෘ 1:4
**7** සෙක 13:2 රෝම 12:1 1තිමෝ 1:5
**8** 1තිමෝ 3:9 1යොහ 3:3
**9** 2කොරි 1:12 එළි 14:7
**10** රෝම 12:10 2කොරි 6:12
**11** ක්‍රියා 20:33 2කොරි 12:17
**12** 2කොරි 6:12
**13** 1කොරි 1:4 2කොරි 1:14
**14** 2කොරි 1:4
**15** පිලි 2:17 පිලෙ 7
**16** ක්‍රියා 20:1
**17** 2කොරි 2:13
**18** 2කොරි 4:8

**2 තීරුව**
**1** 2කොරි 1:3
**2** හිතෝ 25:25
**3** 2කොරි 2:4 2කොරි 10:10
**4** යෙරෙ 31:19 ක්‍රියා 26:20
**5** ක්‍රියා 8:22
**6** ගීතා 32:5 මතෙ 26:75 1යොහ 1:9
**7** උත් 4:13 මතෙ 27:5 හෙබ්‍රෙ 12:17
**8** යෙරෙ 3:25 යෙරෙ 50:4 ක්‍රියා 2:37

**2කොරි 7:6*** පැමිණ සිටීම. ග්‍රීක බසින්, පරූසියා. උපග්‍ර. 7 බලන්න.

**2කොරි 7:7*** පැමිණ සිටීම. ග්‍රීක බසින්, පරූසියා. උපග්‍ර. 7 බලන්න.

ඇති වූ අතර වරද නිවැරදි කරගැ-
නීමට[1] අවංක ආශාවකින්ද උද්‍යෝ-
ගයෙන්ද ඔබ ක්‍රියා කර ඇත. ඒ
අනුව ඒ කාරණය සම්බන්ධයෙන් ඔබ
පවිත්‍ර වී ඇති බව සෑම පැත්ත-
කින්ම පැහැදිලිය. **12** ඇත්තෙන්ම
මා මේ දේවල් ගැන ඔබට ලියා
එව්වේ වරද කළ තැනැත්තා වෙනු-
වෙන්වත්[2] වරදින් පීඩා විඳි පුද්ගලයා
වෙනුවෙන්වත් නොවේ. ඒ වෙනුවට
අප පැවසූ දේවලට ඔබ කොතරම්
උනන්දුවකින් සවන් දෙනවාද කියා
දෙවි ඉදිරියේ පැහැදිලි වීම සඳහාය.
**13** අපට සැනසීමක් ලැබී තිබෙන්නේ
ඒ නිසාය.

නමුත් අප ලැබූ සැනසිල්ලට අම-
තරව තීතස් අද්දුටු ප්‍රීතිය දැක අපි
තවත් ප්‍රීතිමත් වුණෙමු. මන්ද ඔබ
සියලුදෙනා නිසා ඔහුට මහත් සහන-
යක් ලැබී ඇත.[3] **14** එහෙයින් මා
ඔබ ගැන ඔහුට ආඩම්බරයෙන් පැවසූ
දේවල් බොරු වූයේ නැති නිසා මම
ලැජ්ජාවට පත් වූයේ නැත. අප ඔබට
පැවසූ සියල්ල සැබෑ වූ ලෙසම අප
තීතස් ඉදිරියේ ඔබ ගැන ආඩම්බර-
යෙන් පැවසූ දේවල්ද සැබෑ බව ඔප්පු
වී තිබේ.[4] **15** මීට අමතරව ඔබ
කීකරු වූ ආකාරයත්[5] ඔහුව මහත්
ගෞරවයකින් පිළිගත් ආකාරයත්
ඔහුට මතක් වන විට ඔබ කෙරෙහි
ඔහුට ඇති සෙනෙහස තව තවත්
වැඩි වේ. **16** ඔබ නිසා මට මහත්
දිරිගැන්වීමක් ලැබෙයි කියා සිතමින්
මමද ප්‍රීතිමත් වෙමි.[6]

**8** දැන් සහෝදරයෙනි, දෙවිගේ
මහත් කරුණාව නිසා මැසිඩෝ-
නියාවේ පිහිටි සභාවන්වල සිදු වූ දේ
ගැන ඔබට යමක් පැවසීමට කැමැත්-
තෙමු.[7] **2** ඔවුන් සිටියේ දැඩි පීඩා
හා බොහෝ දුක් කම්කටොලුවලට
මුහුණ දෙමිනි. ඔවුන් කොතරම් දුගී
තත්වයක සිටියත් ඔවුහු මහත් ප්‍රීතිය-
කින් ත්‍යාගශීලීව කටයුතු කළෝය.[8]
**3** ඔවුහු තමන්ට හැකි උපරිමයෙන්
පරිත්‍යාගශීලී වූහ.[9] මා කිසි සැකයක්
නොමැතිව පවසන්නේ ඔවුන් තමන්ට
කළ හැකි දේටත් වඩා උපරිමයෙන්
කළ බවය. **4** එම සහෝදරයන් අප-
ගෙන් මහත් ඕනෑකමින් ඉල්ලා සිටි-
යේ ශුද්ධ තැනැත්තන්ට උපකාර
කිරීමේ සැලැස්මට දායක වීම සඳහා
යම් දේවල් පරිත්‍යාග කරන්න ඔවුන්-
ටත් අවස්ථාවක් ලබා දෙන ලෙසය.[1]
ඔවුන් එසේ කළේ කිසිවෙකුගේ බල
කිරීම මත නොව සිය කැමැත්තෙන්-
මය. **5** ඇත්තෙන්ම අප බලාපො-
රොත්තු වූවාටත් වඩා ඔවුහු
කළෝය. මන්ද දෙවිගේ කැමැත්තට
එකඟව ස්වාමීන් සහ අප වෙනුවෙන්
මහත් කැපවීමකින් කටයුතු කිරීමට
ඔවුහු පසුබට නොවූහ.[2] **6** එයින්
දිරිගැන්වීමක් ලැබූ අපි, ඔබ විසින්
කාරුණිකව පරිත්‍යාග කරන ලද සෑම
දෙයක්ම එකතු කිරීමට තීතස්ට[3]
උනන්දු කළෙමු. අප එසේ කළේ එම
එකතු කිරීමේ කටයුත්ත ඔබ අත-
රේ ආරම්භ කළ තැනැත්තා ඔහු වූ
නිසාය. **7** දැන් ඔබ සෑම පැත්ත-
කින්ම දියුණුවක් ලබා ඇති බව අපට
පෙනේ.[4] එනම් ඔබ තුළ ඇති විශ්වා-
සයද දැනුමද[5] ඔබේ උනන්දුවද වැඩි
වී ඇත. එසේම කතා කිරීමේ දක්ෂ-
තාව අතින්ද අප ඔබට පෙන්වූ ප්‍රේම-
යට සමාන ප්‍රේමයක් පෙන්වීමෙන්ද
ඔබ දියුණුවක් ලබා ඇත. දැන් අප
ඔබෙන් ඉල්ලා සිටින්නේ කාරුණි-
කව අනුන්ට පරිත්‍යාග කිරීම අතිනුත්
දියුණු වෙන්න කියාය.

**8** මා මේ දේවල් ඔබට පවසන්-
නේ නියෝගයක් ලෙස නොවේ.[6] මා
එසේ කළේ වෙනත් සහෝදරයන්
මේ කාරණය ගැන මහත් උනන්දුව-
කින් කටයුතු කරනවා වගේ ඔබත්
සැබෑ ප්‍රේමයක් ඇතුව කටයුතු කර-
නවාද කියා දැක බලා ගැනීමට
මට අවශ්‍ය නිසාය. **9** මන්ද අප-
ගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්
පෙන්වූ මහත් කරුණාව ගැන ඔබට
අවබෝධයක් ඇත. ඔහු කිසි දෙය-
කින් අඩුවක් නැතුව ඉතා පොහොසත්
තත්වයක සිටියත් ඔහු ඔබ වෙනු-
වෙන් දිළින්දෙක් විය.[7] එසේ කළේ

**7 පරි.**
**1** මතෙ 3:8; ක්‍රියා 26:20
**2** 1කොරි 5:5; 1කොරි 5:13
**3** උත් 45:27; 1කොරි 16:18
**4** 2කොරි 8:24
**5** 2කොරි 2:9; හෙබ්‍රෙ 13:17
**6** 2තෙස 3:4

**8 පරි.**
**7** රෝම 15:26
**8** රෝම 12:8
**9** මාක් 12:44; ක්‍රියා 11:29; 2කොරි 9:7

**2 තීරුව**
**1** රෝම 15:25; 1කොරි 16:1; 2කොරි 9:1
**2** රෝම 6:13
**3** 2කොරි 12:18
**4** 2කොරි 9:8
**5** 1කොරි 1:5
**6** 1කොරි 7:6
**7** මතෙ 8:20; ලූක් 9:58; පිලි 2:7

ඔහුගේ දිළිඳුකම තුළින් ඔබටත් පො-
හොසත් වීමට අවස්ථාව ලබා දීම
සඳහාය.[1]
**10** මේ සම්බන්ධයෙන් යම් අදහ-
සක් ඉදිරිපත් කරන්න කැමැත්තෙමි.[2]
මීට වසරකට පමණ පෙර ඔබ ආරම්භ
කළ මෙම කාර්යය අවසන් කිරීම
සැමදෙනෙකුටම ප්‍රයෝජනවත් වේ.[3]
එය ආරම්භ කළ අවස්ථාවේ ඒ සඳහා
ඔබ තුළ මහත් උනන්දුවක් තිබුණා
පමණක් නොව ඒ වෙනුවෙන් යම්
පියවර ගැනීමටත් ඔබ තුළ පෙලඹී-
මක් තිබුණා.[4] **11** එමනිසා දැන් ඒ
කාර්යය අවසන් කරන්න. එවිට ඔබ
මහත් උනන්දුවෙන් ආරම්භ කළ එම
කාර්යය සාර්ථකව නිම කිරීමට ඔබට
හැකි වේ. **12** සුදුසුම දේ වන්නේ
පුද්ගලයෙකු සිය කැමැත්තෙන් යමක්
දීමයි. එලෙසම කෙනෙකුගෙන් බලා-
පොරොත්තු වන්නේ තමාට නැති දේ
දීම නොව තමාට තිබෙන දෙයින්
දීමයි.[5] **13** මා අදහස් කරන්නේ අන්
අයට යම් සහනයක් සලසමින්[6] ඔබව
යම් අපහසුතාවකට පත් කරන්න
නොවේ. **14** නමුත් ඔබට වැඩිපුර
ඇති දෙයින් ඔවුන්ගේ හිඟකම පිරිමැ-
සීමට ඔබට පුළුවන. එවිට ඔවුන්ට
වැඩිපුර ඇති දෙයින් ඔබේ හිඟ-
කමද පිරිමැසෙයි. එසේ එකිනෙකා
එකිනෙකාගේ අඩුව පිරිමසන නිසා
සියල්ල සම සේ බෙදී යයි.[7] **15** ලිය-
විලිවල සඳහන් ආකාරයට, “බොහෝ
දේ ඇති තැනැත්තාට වැඩිපුර තිබු-
ණේවත් ස්වල්පයක් ඇති තැනැත්-
තාට හිඟයක් තිබුණේවත් නැත.”[8]
**16** ඔබ ගැන අපට තිබෙනවා හා
සමාන උනන්දුවක් තීතස් තුළත්
ඇති කිරීම ගැන අප දෙවිට කොතරම්
ස්තුතිවන්ත විය යුතුද![9] **17** මන්ද
අපගේ දිරිගැන්වීම නිසා ඔහු ඔබ
ළඟට එන්න කැමති වුණා පම-
ණක් නොව ඔහු මේ කාර්යය කිරීමට
මහත් උනන්දුවක් දක්වන අතර එසේ
කරන්නේ ඔහුගේම කැමැත්තෙන්ය.
**18** අපි ඔහු සමඟ තවත් සහෝ-
දරයෙකුව එවන්නෙමු. ඒ සහෝද-
රයා ශුභාරංචිය වෙනුවෙන් කරන
සේවය නිසා සියලුම සභාවල සිටින
අය ඔහුට ප්‍රශංසා කරති. **19** එප-
මණක්ද නොව සභාවේ සහෝදර-
යන් ඔහුව පත් කර තිබෙන්නේ[1]
අප සමඟ සංචාරය කර, කාරුණි-
කව පරිත්‍යාග කරනු ලබන දේ බෙදා
දීමේ කාර්යයට සහාය වීම සඳහාය.
එම කාර්යය මගින් ස්වාමීන්ට ප්‍රශංසා-
වක් හා ගෞරවයක් ලැබෙන අතර[2]
අන් අයට උපකාර කිරීමට අප මහත්
උනන්දුවකින් සිටින බවත් ඔප්පු වේ.[3]
**20** එසේ අප විසින් බෙදා දීමට නියා-
මිත මේ ත්‍යාගශීලී සම්මාදම් සම්-
බන්ධයෙන්[4] කිසි කෙනෙකුට අපට
විරුද්ධව චෝදනාවක් එල්ල කිරීමට
අපි ඉඩ තබන්නේ නැත.[5] **21** මන්ද
අපි, “යෙහෝවා දෙවි ඉදිරියේ පමණක්
නොව මිනිසුන් ඉදිරියෙහිත්[6] අවං-
කව කටයුතු කිරීම ගැන සැලකිලිමත්
වෙමු.”

**22** මීට අමතරව අපි ඔවුන් සමඟ
අපගේ තවත් සහෝදරයෙකුව එවන්-
නෙමු. ඔහුද බොහෝ කාරණාවලදී
උනන්දුවෙන් කටයුතු කරන කෙ-
නෙකු බව නිතරම ඔප්පු කර ඇත.
නමුත් ඔබ ගැන ඔහුට මහත් විශ්වා-
සයක් ඇති නිසා දැන් ඊටත් වඩා
ඔහු උනන්දුවකින් සිටියි. **23** තීතස්
ගැන යම් සැකයක් ඇත්නම් ඔහු මගේ
හවුල්කරුවෙකුද ඔබේ ප්‍රයෝජනය
සඳහා පත් කළ හවුල් සේවකයෙකුද[7]
වන බව සැලකිල්ලට ගන්න. එසේම
අපගේ එම සහෝදරයන් ගැන යම්
සැකයක් ඇත්නම් ඔවුන් සභාවන් වෙ-
නුවෙන් නියෝජිතයන්* ලෙස සේවය
කරන අයද ක්‍රිස්තුස්ට ගෞරවයක්
ගෙන දෙන අයද වන බව සැල-
කිල්ලට ගන්න. **24** එමෙන්ම ඔබට
සැබෑ ප්‍රේමයක් ඇති බවත්[8] අප ඔබ
ගැන මහත් ආඩම්බරයකින් ඔවුන්ට
පැවසූ දේවල් සැබෑ බවත්[9] ඔබ කට-
යුතු කරන ආකාරයෙන් පෙන්නුම්
කරන්න.

**2කොරි 8:23*** හෝ, “යවනු ලැබූවන්.”

**8 පරි.**
1 2කොරි 6:10
2 1කොරි 7:25
3 මතෙ 10:42
4 2කොරි 9:2; 1තිමෝ 6:18
5 ලෙවී 27:8; ද්වි 16:10; ද්වි 16:17; හිතෝ 3:27; මාක් 12:43; ලූක් 21:3
6 මාක් 12:44
7 2කොරි 9:12
8 නික් 16:18
9 2කොරි 12:18

**2 තීරුව**
1 1කොරි 16:3
2 2කොරි 4:15
3 2කොරි 9:2
4 1කොරි 16:1
5 2කොරි 6:3
6 හිතෝ 3:4; 1පේතෘ 2:12
7 පිලි 2:25
8 1පේතෘ 1:22; 1පේතෘ 2:17
9 2කොරි 7:14

**9** ශුද්ධ තැනැත්තන් වෙනුවෙන්
ලබා දෙන උපකාර[1] ගැන මා
ඔබට අමුතුවෙන් ලියා එවීමට අවශ්‍ය
නැත. **2** මන්ද දීමට කැමැත්තක්
ඔබට තිබෙන බව මම දනිමි. ඔබ
නිසා මුළු ඇකේයාවේම සිටින සහෝ-
දරයෝ මීට අවුරුද්දකට පෙර සිටම
තම පරිත්‍යාග ලබා දීමට සූදා-
නමින් සිටිති.[2] ඔවුන්ගෙන් වැඩිදෙ-
නෙකු ඒ සඳහා පෙලඹී තිබෙන්නේ
මේ කාරණය සම්බන්ධයෙන් ඔබ
දැක්වූ උද්‍යෝගය නිසා බව මම
මහත් ආඩම්බරයකින් මැසිඩෝනියා-
වේ සිටින සහෝදරයන්ට පැවසුවෙමි.
**3** අප ඔබ ගැන ආඩම්බරයකින්
පැවසූ ඒ දේවල් බොරුවක් බවට
පත් නොවී ඒවා එයාකාරයෙන්ම සිදු
වීම සඳහා මම මේ සහෝදරයන්ව
ඔබ වෙතට එවන්නෙමි. එවිට මා
පැවසූ ලෙසම ඔබට සූදානම්ව සිටී-
මට හැකි වනු ඇත.[3] **4** එසේ නැත්-
නම් මැසිඩෝනියාවේ සහෝදරයන්
මා සමඟ පැමිණි විට යම් විදිහකින්
හෝ ඔබ සූදානමින් නොසිටින බව
ඔවුන් දුටුවොත් අප ඔබ ගැන පැවසූ
දේ බොරුවක් වී ඇති නිසා අපටත්
ඔබටත් ලැජ්ජාවක් විඳින්න සිදු වේ.
**5** එහෙයින් ඔබ කලින් පොරොන්දු වූ
ඔබේ ත්‍යාගශීලී දීමනා සූදානම් කිරී-
මට සියලුදෙනාවම දිරිගැන්වීම සඳහා
කල් ඇතුව මෙම සහෝදරයන්ව එවීම
සුදුසුයි කියා මම සිතුවෙමි.[4] එවිට ඒ
දීමනා බල කිරීමක් නිසා දුන් දෙයක්
නොව මුළු හදවතින්ම දුන් යමක් වනු
ඇත.[5]

**6** නිර්ලෝභීව[6] වපුරන තැනැත්තා
බොහෝ දේ කපාගනියි. නමුත් ලෝ-
භකමින්[7] වපුරන තැනැත්තා
ස්වල්පයක් කපාගනියි. **7** මෙහිදී
කොපමණ ප්‍රමාණයක් දෙනවාද කියා
එකිනෙකා තම තමාගේ සිතින් තීර-
ණය කර ඒ අනුව දීම සුදුසුය.
අකමැත්තෙන්[8] හෝ වෙනත් කෙනෙ-
කුගේ බල කිරීම නිසා හෝ දීමෙන්
ප්‍රයෝජනයක් නැත. මන්ද දෙවි
ප්‍රේම කරන්නේ සතුටු සිතින් දෙන
තැනැත්තාටය.[1]

**8** එලෙසම තම මහත් කරුණාව
ඔබට බොහෝ සෙයින් ලබා දීමට දෙ-
විට පුළුවන. එහෙයින් ඔබට අවශ්‍ය
දේ නිතරම ලැබෙන අතර බොහෝ
යහපත් දේවල් කිරීම සඳහා අවශ්‍ය
දේද ඔබට බහුලව ලැබෙනු ඇත.[2]
**9** (එවැනි කෙනෙකු ගැන ලියවිලි-
වල සඳහන් වන්නේ, “ඔහු ත්‍යාගශී-
ලීව බෙදා දුන්නේය. ඔහු දිළිඳුන්ට
දුන්නේය. ඔහුගේ ධර්මිෂ්ඨකම සදහ-
ටම පවතින්නේය”[3] කියාය. **10** වපු-
රන්නා සඳහා බීජද කෑම සඳහා
ආහාරද බහුලව සපයා දෙන තැනැත්-
තාණන්[4] ඔබට වැපිරීම සඳහා බීජ
නොඅඩුව සපයා දෙයි. ඒ නිසා ඔහු
ඔබේ ධර්මිෂ්ඨ ක්‍රියාවලින් ඇති වන
ප්‍රතිඵල තව තවත් වැඩි කරයි.)[5]
**11** දෙවි ඔබට එසේ සෑම අතින්ම
ආශීර්වාද කරන්නේ ඔබටත් ත්‍යා-
ගශීලී වීමට විවිධ අවස්ථාවන් උදා
කර දීම සඳහාය. ත්‍යාගශීලී වීමට
අප දරන ඒ උත්සාහය තුළින් දෙ-
විට ස්තුති දීමට සියලුදෙනාම
පෙලඹෙති.[6] **12** මන්ද බොහෝදෙ-
නෙකුට ප්‍රයෝජනවත් වන මෙම
සේවය ඉටු කිරීමෙන් ශුද්ධ තැනැත්-
තන්ගේ අවශ්‍යතා[7] හොඳින් ඉටු කිරී-
මට හැකි වෙනවා පමණක් නොව
දෙවිට බොහෝ සෙයින් ස්තුති කිරී-
මටද එය හේතුවක් වේ. **13** ඇත්-
තටම එසේ උපකාර ලබා දීමෙන්
යමක් ඔප්පු වේ. එනම් ඔබ පවසන
ආකාරයටම ක්‍රිස්තුස් පිළිබඳ ශුභා-
රංචියට ඔබ යටත්ව සිටින බවත්[8]
ත්‍යාගශීලීව ශුද්ධ තැනැත්තන්ටත්
අන් සියලුදෙනාටත් පරිත්‍යාග කිරීමට
ඔබ කැමැත්තෙන් සිටින බවත්ය. ඒ
දේ තේරුම්ගන්නා සියලුදෙනා දෙවිට
ප්‍රශංසාව හා ගෞරවය ලබා දෙති.[9]
**14** එහෙයින් ඔබ වෙනුවෙන් දෙවිට
කන්නලව් කරන ඔවුහු, කිසිවකට
සම කළ නොහැකි දෙවිගේ මහත්
කරුණාව[10] අද්දකින ඔබව දැකීමටත්
මහත් ආශාවකින් සිටිති.

**9 පරි.**
1 රෝම 15:26, 1කොරි 16:1, 2කොරි 8:4, 2කොරි 9:12
2 2කොරි 8:10
3 2කොරි 8:6
4 2කොරි 9:2
5 යෙසා 32:8
6 හිතෝ 19:17, හිතෝ 22:9, දේශ 11:1, ලූක් 6:38
7 හිතෝ 11:24, ගලා 6:7
8 ද්වි 15:7, ද්වි 15:10, හිතෝ 22:8

**2 තීරුව**
1 නික් 22:29, 1ලේක 29:17, හිතෝ 11:25, ක්‍රියා 20:35, රෝම 12:8, හෙබ්‍රෙ 13:16
2 හිතෝ 28:27, මලා 3:10, එෆී 4:28, පිලි 4:19, තීත 2:14
3 ගීතා 112:9
4 ද්වි 30:9, යෙසා 55:10
5 හොෂෙ 10:12
6 2කොරි 1:11, 2කොරි 4:15
7 රෝම 15:27, 2කොරි 8:14, ගලා 6:6, පිලි 4:18
8 රෝම 6:17, 2කොරි 7:15
9 මතෙ 5:16, හෙබ්‍රෙ 13:16, යාකො 1:27, 1යොහ 3:17
10 ක්‍රියා 20:24

**15** දෙවි නොමිලේ ලබා දෙන,
කියා නිම කළ නොහැකි ඒ දීමනාව
ගැන ඔහුට ස්තුති වේවා![1]

# 10

පාවුල් වන මා ඔබ සමඟ
සිටින විට බියගුල්ලෙකු ලෙ-
සත්[2] ඔබ සමඟ නොසිටින විට
නිර්භීතව කතා කරන කෙනෙකු ලෙ-
සත්[3] ඔබ සිතන බව මම දනිමි.
නමුත් ක්‍රිස්තුස්ගේ මෘදුකම[4] සහ
කරුණාවන්තකම[5] පදනම් කරගෙන
ඔබෙන් ඉල්ලීමක් කිරීමට මා කැම-
තිය. **2** සමහරුන් කියා සිටින්නේ
අප කටයුතු කරන්නේ අපගේම ආශා-
වන් පිනවීමේ අදහසින් බවය. එවැනි
අය ඉදිරියේ නිර්භීතව කටයුතු කිරී-
මටත් ඔවුන්ට විරුද්ධව දැඩි පිය-
වර ගැනීමටත් සිදු වෙයි[6] කියා මට
සිතේ. නමුත් මා ඔබව හමු වූ විට
එවැනි දැඩි පියවර නොගැනීම සඳහා
දැන් සිටම වෙනස්කම් කරන මෙන්
ඔබෙන් ඉල්ලා සිටීමට කැමැත්තෙමි.
**3** මන්ද අප සාමාන්‍ය මිනිසුන් ලෙස
ජීවත් වුණත්[7] අප කරන යුද්ධයේදී
අප කටයුතු කරන්නේ අපගේ ආශා-
වන් පිනවීමට කටයුතු කරන මිනි-
සුන් ලෙස නොවේ.[8] **4** එසේම මෙම
යුද්ධයේදී අප භාවිත කරන 'ආයුධ'
සාමාන්‍ය මිනිසුන් භාවිත කරන
'ආයුධ' නොවේ.[9] ඒවා ඉතා බල-
වත්ය. මන්ද ඒවාට බලය ලැබෙන්නේ
දෙවිගෙන්ය.[10] එහෙයින් එම ආයුධ-
වලින් බලකොටු හා සමාන ඕනෑම
දෙයක් බිඳ හෙළිය හැක. **5** ඒවා
මගින් දෙවි පිළිබඳ දැනුමට විරුද්-
ධව මිනිසුන් ගෙනෙන තර්ක විතර්ක
හා ඔවුන් දරන සියලු උඩඟු ආකල්ප
අපි බිඳ දමමින් සිටින්නෙමු.[11] එලෙ-
සම සිරකරුවෙකුව මෙල්ල කරනවා
වගේ අපි මිනිසුන්ගේ සෑම සිතුවිල්-
ලක්ම මෙල්ල කර ඒවා ක්‍රිස්තුස්ට
කීකරු ඔහු සිතන ආකාරයට හැඩගැ-
සුණු සිතුවිලි බවට වෙනස් කරමින්
සිටින්නෙමු. **6** එමෙන්ම ඔබ සියලු-
දෙනාම කීකරු අය බව සම්පූර්ණ-
යෙන්ම ඔප්පු කළ පසුව[12] පවා යම්
කෙනෙක් දිගටම අකීකරු ලෙස ක්‍රියා
කරනවා නම් ඔහුට දඬුවම් දීමටත්
අපි සූදානමින් සිටින්නෙමු.[1]
**7** ඔබ දේවල් දෙස බලන්නේ මතු-
පිටින් පෙනෙන දේට අනුවය.[2] තමා
ක්‍රිස්තුස්ගේ අනුගාමිකයෙකු කියා
යමෙක් තමන් ගැන විශ්වාසයකින්
සිටිනවා නම් ඔහු යමක් සිතට ගත
යුතුයි. එනම් ඔහු මෙන් අපත් ක්‍රිස්-
තුස්ගේ අනුගාමිකයන් වන බවය.[3]
**8** ඔබව බිඳ දැමීමට නොව[4] ඔබව
ගොඩනැංවීමට ස්වාමීන් අපට දුන්
බලය ගැන මා පමණට වඩා ආඩම්-
බරයෙන් කතා කළත්[5] එසේ කතා
කිරීම ගැන මම ලැජ්ජා වන්නේ නැත.
**9** නමුත් ලිපි මගින් ඔබව බියපත්
කිරීමට මා උත්සාහ කරනවා කියා
ඔබ සිතනවාට මම සතුටු වන්නේ
නැත. **10** මන්ද සමහරුන් පවසන්-
නේ, "ඔහු ලියන ලිපි නම් බරපත-
ළයි, බලගතුයි. නමුත් ඔහු අප සමඟ
සිටින විට* ඔහුව පෙනෙන්නේ දුර්ව-
ලයෙකු ලෙසයි.[6] ඔහු කියන දේව-
ලත් කිසි හරයක් නැහැ"[7] කියාය.
**11** එසේ පවසන කෙනෙකු මේ දේ
සිතට ගත යුතුයි. එනම් අප ඔබෙන්
දුරස්ව සිටින විට ලිපි මාර්ගයෙන්
දැනුම් දෙන දේවල් අප පැමිණි විට ඒ
විදිහටම ක්‍රියාත්මක කරන බවයි.[8]
**12** නමුත් තමන්ට සුදුසුකම් ඇති
බව කියා සිටින අයගේ තත්වයට
පත් වෙන්නවත් ඔවුන් සමඟ අපව
සැසඳීමටවත් අපට කිසි ලෙසකින්-
වත් අවශ්‍ය නැත.[9] ඔවුන් තමන් ගැන
යම් නිගමනවලට පැමිණ තිබෙනවා
නම් ඒ ඔවුන්ගේම ප්‍රමිති හා මතව-
ලට අනුවයි. එයින් පැහැදිලි වන්-
නේ ඔවුන්ට කිසි අවබෝධයක් නැති
බවය.[10]

**13** අප කළ සේවය ගැන ආඩම්-
බරයෙන් කතා කිරීමට අපට හැකි
වුණත් අනවශ්‍ය ආකාරයකින් එසේ
නොකරන්නෙමු.[11] එහෙයින් අප කතා
කරන්නේ දෙවි අපට සේවය කිරීම

---

**2කොරි 10:10*** පැමිණ සිටීම. ග්‍රීක බසින්, පරූ-
සියා. උපග්‍ර. 7 බලන්න.

**9 පරි.**
1 යොහ 1:17; රෝම 3:24; රෝම 5:15; එෆී 3:7

**10 පරි.**
2 1කොරි 2:3
3 2කොරි 10:10
4 මතෙ 11:29
5 මතෙ 11:30
6 1කොරි 4:21; 2කොරි 13:2; 2කොරි 13:10
7 ගලා 2:20
8 රෝම 8:13; එෆී 6:12
9 මතෙ 26:52; රෝම 13:12; එෆී 6:13; 1තෙස 5:8; 1තිමෝ 1:18; 2තිමෝ 2:24
10 රෝම 8:14; 2කොරි 6:7
11 1කොරි 1:19; 1කොරි 3:19; 2තිමෝ 2:25
12 2කොරි 2:9; 2කොරි 7:15

**2 තීරුව**
1 1තිමෝ 1:20; හෙබ්‍රෙ 12:10
2 2කොරි 5:12
3 1යොහ 4:6
4 2කොරි 13:10; හෙබ්‍රෙ 13:17
5 2කොරි 12:6
6 2කොරි 10:1; ගලා 4:13
7 2කොරි 11:6
8 2කොරි 12:20; 2කොරි 13:2
9 2කොරි 3:1; 2කොරි 5:12
10 හිතෝ 25:27; හිතෝ 26:12; ගලා 6:3; ගලා 6:4
11 රෝම 12:3

සඳහා ලබා දී ඇති ප්‍රදේශයේ ඉටු කර-
ගැනීමට හැකි වූ දේ ගැන පමණි.
ඒ ප්‍රදේශයට ඔබත් ඇතුළත්ය.[1]
**14** ඇත්තෙන්ම අපට ලබා දී ඇති
ප්‍රදේශයෙන් පිට අපි කිසිවක් කරන්-
නේ නැත. අපට ලබා දී ඇති ප්‍රදේශ-
යට ඔබ ඇතුළත් වන නිසා ක්‍රිස්තුස්
පිළිබඳ ශුභාරංචිය ප්‍රකාශ කරමින්
ඔබේ ප්‍රදේශයට මුලින්ම පැමිණි-
යේ අපය.[2] **15** එහෙයින් අපට ලබා
දී ඇති ප්‍රදේශයෙන් පිට ගොස් එම
ප්‍රදේශවලදී වෙනත් අය දැරූ වෙ-
හෙස ගැන කතා කර ඒ ගෞර-
වය ලබාගැනීමට අපට වුවමනාවක්
නැත.[3] අපගේ එකම බලාපොරොත්-
තුව වන්නේ ඔබේ විශ්වාසය වැඩි
වෙනවා දැකීමය.[4] එවිට අපට ලබා
දුන් ප්‍රදේශයේ හොඳ ප්‍රතිඵල ලබා-
ගෙන ඔබ අතරෙහි හොඳ පිළිගැනී-
මක් ලබාගැනීමට අපට හැකි වේ.[5]
එහි ප්‍රතිඵලයක් ලෙස, **16** ඔබට
එපිටින් පිහිටි රටවලද ශුභාරංචිය දේ-
ශනා කිරීමේ අවස්ථාව අපට ලැබෙනු
ඇත.[6] එවිට වෙන කෙනෙකුට ලබා
දී ඇති ප්‍රදේශයේ ඔවුන් දැනට-
මත් ඉටු කර තිබෙන දේවල් ගැන
ආඩම්බරයෙන් කතා කරමින් ගෞර-
වයක් ලබාගැනීමට අපට අවශ්‍ය
වන්නේ නැත. **17** “නමුත් ආඩම්බ-
රයෙන් කතා කරන්නා, යෙහෝවා
දෙවි ගැන ආඩම්බරයෙන් කතා කළ
යුතුයි.”[7] **18** මන්ද අනුමැතිය ලබා-
ගන්නේ තමන්ගේම සුදුසුකම් ගැන
මහ ඉහළින් කතා කරන තැනැත්තා
නොව[8] යෙහෝවා දෙවි[9] සුදුසුයි කියා
සහතික කරන තැනැත්තාය.[10]

**11** මෙහිදී මා යම් දුරකට සීමාව
ඉක්මවා ආඩම්බරයෙන් කතා
කරනවා කියා ඔබට සිතිය හැක.
මා එසේ කරනවා නම් ඒ ගැන ඉව-
සන මෙන් ඔබෙන් ඉල්ලා සිටිමි.[11]
ඇත්තෙන්ම ඔබ මා ගැන ඉවසන
බව මට විශ්වාසයි. **2** දෙවි ඔබට
දක්වන සැලකිල්ලට සමාන ගැඹුරු
සැලකිල්ලක් මමත් ඔබට දක්වමි.[12]
මන්ද මා පෞද්ගලිකව පොරොන්දු
වුණේ එක් පුරුෂයෙකුට[1] එනම් ක්‍රිස්-
තුස්ට පමණක් ඔබව විවාහ කර දෙන
බවය.[2] එහෙයින් මගේ ආශාව වන්නේ
ඔබව නිර්මල[3] යුවතියක් ලෙස ඔහුට
භාර දීමටයි.[4] **3** නමුත් සර්පයා කප-
ටිකමින් ඒවව නොමඟ යැවූ අයු-
රින්ම[5] ඔබවත් නොමඟ යවයිද කියා
මම බියෙන් සිටිමි. එසේ වුණොත්
ඔබේ මනස් දූෂ්‍ය වී[6] ක්‍රිස්තුස්ට පෙන්-
විය යුතු ඔබේ අවංකකම සහ නිර්ම-
ලකම නැති වී යෑමට පුළුවන.[7]
**4** යමෙක් පැමිණ අප යේසුස් ගැන දේ-
ශනා කළ දෙයට වඩා වෙනස් දෙ-
යක් දේශනා කළොත්[8] එසේ නැත්නම්
ඔබ පිළිගත් ශුභාරංචියට වඩා වෙනස්
ශුභාරංචියක් ඔබට පැවසුවොත්[9] ඔබ
ඔහුව පිළිගන්නා බව මම දනිමි.[10]
එසේම ඔබ දැනටමත් සිතන ආකාර-
යට* වඩා වෙනස් ආකාරයකින් සිතී-
මට ඔහු ඔබට බලපෑම් කළොත්[11]
ඔබ ඔහුට හසු වන බවත් දනිමි.
**5** නමුත් ඔබ මහ ඉහළින් සල-
කන එම නියෝජිතයන්ට* වඩා[12] මා
කිසිම ආකාරයකින් පහත් කෙනෙකු
නොවන බව මට විශ්වාසයි.[13] **6** මා
කතා කිරීමට දක්ෂ කෙනෙක් නොවු-
ණත්[14] මා දැනුමෙන් අඩු කෙනෙකු
කියා කිසි ලෙසකින්වත් පැවසිය නො-
හැක.[15] මන්ද අප සෑම ආකාරයකින්ම
ඔබට ඒ දැනුම ලබා දී ඇත.[16]
**7** මා ගැනවත් නොසිතා[17] ඔබව
ගෞරවයට පත් කරමින් ඔබට දෙවි-
ගේ ශුභාරංචිය ගැන සතුටින් ප්‍රකාශ
කළේ ඔබෙන් කිසිවක් බලාපො-
රොත්තුවෙන් නොවේ.[18] එසේ කිරීම
වරදක්ද? **8** ඇත්තෙන්ම ඔබ වෙ-
නුවෙන් සේවය කිරීමට මා උපකාර
ලබාගත්තේ වෙනත් සභාවලිනි.[19]
එය මා ඔවුන්ගෙන් කොල්ල කෑවා
හා සමානය. **9** එසේ කිරීම නිසා
මා ඔබ සමඟ සිටි කාලයේදී මට
හිඟයක් ඇති වූ විට ඔබෙන් කිසි
කෙනෙකුටවත් බරක් වීමට මට සිදු

**10 පරි.**
1 ක්‍රියා 9:15, ගලා 2:8
2 1කොරි 3:10, 1කොරි 4:15
3 රෝම 15:20
4 2තෙස 1:3
5 1කොරි 9:1
6 ක්‍රියා 19:21, රෝම 15:24
7 යෙසා 65:16, යෙරෙ 9:24, 1කොරි 1:31
8 ලූක් 18:14
9 1සාමු 13:14, හිතෝ 29:26
10 රෝම 2:29, 1කොරි 4:5, 2තිමෝ 2:15

**11 පරි.**
11 2කොරි 5:13
12 පිලි 1:8

**2 තීරුව**
1 මාක් 2:19
2 එළි 21:2, එළි 21:9, එළි 22:17
3 එෆී 5:27, කොලො 1:28
4 ලෙවී 21:13, එෆී 5:23
5 උත් 3:4, 1තිමෝ 2:14
6 යොහ 8:44, 1තිමෝ 6:5, හෙබ්‍රෙ 13:9, 2පේතෘ 3:17, 2යොහ 8
7 1කොරි 6:15
8 ගලා 1:7
9 ගලා 1:8
10 පිලි 2:21, 2යොහ 10
11 1යොහ 4:3
12 2කොරි 12:11, ගලා 2:6
13 1කොරි 15:10, 2කොරි 11:23
14 නික් 4:10, 2කොරි 10:10
15 1කොරි 2:13
16 එෆී 3:4
17 1කොරි 2:3, 2කොරි 10:1
18 ක්‍රියා 18:3, 1කොරි 9:18
19 පිලි 4:10

**2කොරි 11:4*** හෝ, “දෙවි මඟ පෙන්වන ආකාරයට.” **5*** හෝ, “යවනු ලැබූවන්ට.”

වූයේ නැත.[1] මන්ද මැසිඩෝනියා-
වෙන් පැමිණි සහෝදරයෝ[2] මගේ
අඟහිඟකම් හොඳින් පිරිමැසුවෝය.
අවශ්‍ය වූ ප්‍රමාණයටත් වඩා දේවල්
මට ලැබිණ. මා අධිෂ්ඨාන කරගත්-
තේ කිසිම ආකාරයකින්වත් ඔබට
බරක් නොවීමටය. දැනුත් ඉදිරිය-
ටත් එසේ කිරීමට මම බලාපො-
රොත්තු වෙමි.[3] **10** ක්‍රිස්තුස් පිළිබඳ
සත්‍යය[4] මා තුළ තිබෙන තාක් කල්
මුළු ඇකේයා ප්‍රදේශයේම කිසි බියක්
සැකක් නොමැතිව ඒ ගැන ආඩම්-
බරයෙන් පැවසීමට මට පුළුවන.[5]
**11** මා ඔබට කිසි බරක් නොවී සිටී-
මට උත්සාහ කළේ මන්ද? ඒ ඔබට
තිබෙන ප්‍රේමය නිසාය. මා ඔබට
කොතරම් ප්‍රේම කරනවාද කියා දෙවි
දන්නේය.[6]

**12** මම දිගටම එලෙස කටයුතු
කරන්නෙමි.[7] මා එසේ කරන්නේ
තමා සතු තත්වය ගැන ආඩම්බර-
යෙන් කතා කරන අයව නිහඬ කිරීම
සඳහාය. එමගින් ඔවුන් අපට සමාන
බව කීමට ඔවුන්ට කිසිම පදනමක්
ලැබෙන්නේ නැත. **13** ඇත්තෙන්ම
එවැනි පුරුෂයෝ බොරු නියෝජි-
තයෝය. ඔවුහු අනුන්ව නොමඟ
යවමින්[8] ක්‍රිස්තුස්ගේ නියෝජිතයන්
ලෙස පෙනී සිටීමට උත්සාහ කරති.[9]
**14** අපි ඒ ගැන පුදුම විය යුතු නැත.
මන්ද සාතන් පවා ආලෝකය ලබා
දෙන දූතයෙකු ලෙස පෙනී සිටියි.[10]
**15** එහෙයින් ඔහුගේ සේවකයන් ධර්-
මිෂ්ඨකමින් සේවය කරන අය ලෙස
පෙනී සිටීමට උත්සාහ කිරීම ගැන අපි
පුදුම විය යුතු නැත.[11] නමුත් අවසා-
නයේදී ඔවුන්ගේ ක්‍රියා අනුව ඔවුන්ට
ප්‍රතිඵල ලැබේ.[12]

**16** මා නැවතත් පවසන්නේ මා
සීමාව ඉක්මවා ආඩම්බරයෙන් කතා
කරනවා කියා කිසි කෙනෙකු නොසි-
තිය යුතු බවය. නමුත් මා එවැනි කෙ-
නෙකු කියා ඔබට සිතෙනවා නම්
මදක් ඉවසන්න. මන්ද ඔවුන් හා
සමානව ආඩම්බරයෙන් කතා කිරීමට
මා දැන් සූදානම්ය.[13] **17** නමුත් මා

**11 පරි.**
1 2කොරි 12:13
2 පිලි 4:15
3 1තෙස 2:9
4 රෝම 9:1
5 1කොරි 9:15
6 2කොරි 6:11; 2කොරි 7:3; 2කොරි 12:15
7 1කොරි 9:12
8 ගීතා 101:7; ගීතා 119:118; ක්‍රියා 5:3; එෆි 4:14
9 රෝම 16:18; 2කොරි 2:17; 2පේතෘ 2:1
10 ගලා 1:8; 2තෙස 2:9
11 යොහ 8:44
12 මතෙ 16:27; රෝම 2:6; ගලා 5:10; පිලි 3:19; 2තිමෝ 4:14
13 2කොරි 10:8

**2 තීරුව**
1 1කොරි 3:21
2 පිලි 3:4
3 ගලා 2:4; ගලා 4:9; ගලා 5:1
4 පිලි 3:19
5 2කොරි 5:13; 2කොරි 12:11
6 ක්‍රියා 22:3
7 රෝම 11:1; පිලි 3:5
8 2කොරි 11:5
9 රෝම 11:13; 1කොරි 15:10
10 ක්‍රියා 16:24
11 ක්‍රියා 9:16; 2කොරි 6:4; 1පේතෘ 2:21

දැන් කතා කරන්නේ අපගේ ස්වා-
මීන්ව ආදර්ශයට ගෙන ඔහු කතා
කරන ආකාරයට නොවේ. මා දැන්
කතා කරන්නේ තමන් ගැන ඕනෑ-
වට වඩා විශ්වාසයක් තබන,
අසාධාරණ මිනිසුන් කතා කරන
ආකාරයටය.[1] **18** බොහෝදෙනෙකු
ආඩම්බරයෙන් කතා කරන්නේ මිනි-
සුන් වැදගත් ලෙස සලකන දේවල්
ගැන පමණි.[2] ඒ නිසා මමත් දැන්
එලෙස ආඩම්බරයෙන් කතා කරමි.
**19** ඔබ ඉතා සාධාරණව කටයුතු
කරනවා කියා සිතන නිසා අසාධාර-
ණව කටයුතු කරන අය ගැන ඔබ
කැමැත්තෙන්ම ඉවසනවා නොවේද?
**20** ඇත්තෙන්ම ඔබව තම අණසක
යටතේ තබාගන්නා අය ගැනත්[3] ඔබ
සතු දේවල් පැහැරගන්නා අය ගැනත්
විවිධ දේවල් ඔබෙන් උදුරාගෙන යන
අය ගැනත් ඔබට ඉහළින් සිටීමට
උත්සාහ කරන අය ගැනත් ඔබේ මුහු-
ණටම පහරගසන අය ගැනත් ඔබ
ඉවසන්නහුය.[4]

**21** සමහරුන් සිතන්නේ අපට
ඇති බලතල පාවිච්චි කිරීමට තරම්
ශක්තියක් අපට නැති බවයි. ඒ ගැන
පැවසීමටත් අපි ලැජ්ජා වෙමු.

නමුත් යමෙක් තමාට නිර්භීතව
ක්‍රියා කිරීමට හැකි බව පවසනවා නම්
මටත් එසේ නිර්භීතව ක්‍රියා කිරීමට
හැකි බව පැවසීමට කැමැත්තෙමි.
මා මෙලෙස පවසන්නේ සිහිකල්-
පනාවක් නැති කෙනෙකු මෙන්ය.[5]
**22** ඔවුන් හෙබ්‍රෙව් ජාතිකයන්ද? මාත්
එසේමය.[6] ඔවුන් ඊශ්‍රායෙල්වරුන්ද?
මාත් එසේමය. ඔවුන් ආබ්‍රහම්ගෙන්
පැවතෙන අයද? මාත් එසේමය.[7]
**23** ඔවුන් ක්‍රිස්තුස්ගේ සේවකයන්ද?
මා ඊටත් වඩා කැපීපෙනෙන ආකාර-
යකින් ඔහුට සේවය කර ඇති බව
සිහිවිකල් වූ කෙනෙකු මෙන් පවසමි.[8]
මා ඇරූ වෙහෙස ඔවුන්ට වඩා වැඩිය.[9]
මම ඔවුන්ටත් වඩා බොහෝ වතා-
වක් සිරගතව සිටියෙමි.[10] අධික ලෙස
පහර කැවෙමි. මා නොමැරී බේරුණු
අවස්ථා බොහෝය.[11] **24** අවස්ථා

පහකදී යුදෙව්වරුන් අතින් මම තිස්-
නව වතාවක් පහර කෑවෙමි.[1]
**25** මා කෝටුවලින් තැළුම් කෑ
අවස්ථා තුනකි.[2] එක් වරක් මට
ගල් ගසන ලදි.[3] අවස්ථා තුනකදී
මා ගමන්ගත් නැව මුහුදුබත් විය.[4]
මම ගැඹුරු මුහුදේ මුළු රැයකුත් දවා-
ලකුත් ගත කළෙමි. **26** මම බො-
හෝ දුර බැහැර පෙදෙස්වලට ගමන්
කළෙමි. ගංගා හරහා යන විටත් නුව-
රවලදීත්[5] පාළු පෙදෙස් හරහා යන
විටත් මුහුදු ගමන්වලදීත් මා විවිධ
උවදුරුවලට ලක් වූ අතර මංකොල්-
ලකාරයන්ගෙනුත්[6] මගේම ජාතියේ
අයගෙනුත්[7] වෙනත් ජාතීන්ට අයත්
අයගෙනුත්[8] බොරු සහෝදරයන්ගෙ-
නුත් මම බොහෝ පීඩාවලට
මුහුණ දුන්නෙමි. **27** මීට අමත-
රව මම බොහෝ වෙහෙස මහන්සි-
යෙන්ද නිතර නිදි මැරීමෙන්ද[9] කුසට
හරි හැටි අහරක් නොමැතිවද පිපාස-
යෙන්ද[10] බොහෝ අවස්ථාවලදී කෑම
ගැනීමට නොහැකි තත්වයක සිටි-
මින්ද[11] අධික ශීතලෙන්ද ඇඟට හරි
හැටි වස්ත්‍රයක් නොමැතිවද සිටියෙමි.

**28** එවැනි දේවලට අමතරව සියලු
සභාවන් ගැන සිතන විට මගේ සිතට
මහත් බරක් දැනේ. එය මට දැනෙන්-
නේ නිරතුරුවමය.[12] **29** යම් කෙ-
නෙකු දුර්වල වී සිටින විට[13] එය මගේ
සිතටත් දැනේ. යම් කෙනෙකු අපහසු-
තාවකට පත් වී නොමඟ යන විට ඒ
ගැන මට මහත් කෝපයක්ද දැනේ.

**30** අවශ්‍ය නම් තවත් ආඩම්බර-
යෙන් කතා කිරීමට මට පුළුවන.[14]
නමුත් මා කතා කරන්නේ මා දුර්-
වල වූ අවස්ථා ගැනය. **31** දැන් මා
පැවසූ දේවල් බොරු දේවල් නො-
වන බව ස්වාමීන් වන යේසුස්ගේ දෙවි
සහ පියාණන් වන සදහටම ප්‍රශංසා
ලැබිය යුතු තැනැත්තාණන් දන්-
නේය. **32** මා දමස්කයේ සිටියදී
අරෙතස් රජු යටතේ සිටි ආණ්ඩුකා-
රයා මාව අල්ලාගැනීමේ අදහසින් එම
නුවර පුරාම මුරකාවල් යෙදුවේය.[15]
**33** නමුත් මාව විශාල කූඩයක දමා

**11 පරි.**
1 ද්වි 25:3
2 ක්‍රියා 16:22
3 ක්‍රියා 14:19
4 ක්‍රියා 27:41
5 ක්‍රියා 13:50
6 ක්‍රියා 20:3
7 ක්‍රියා 23:10
8 ක්‍රියා 14:5
9 ක්‍රියා 20:31
10 1කොරි 4:11
11 2කොරි 6:5
12 2කොරි 2:4 කොලො 2:1
13 1කොරි 9:22
14 2කොරි 12:5
15 ක්‍රියා 9:24

**2 නිරූව**
1 ක්‍රියා 9:25

**12 පරි.**
2 ක්‍රියා 2:17 ක්‍රියා 22:17
3 එස 8:3
4 එස 3:14
5 එළි 1:3
6 2කොරි 11:30
7 2කොරි 10:8 2කොරි 11:16

පවුරේ කවුළුකින් පහතට බස්සවන
ලදි.[1] එසේ මම ඔහුගේ අතිනුත් බේරී
ගියෙමි.

**12** මා මෙලෙස ආඩම්බරයෙන්
කතා කළත් එයින් ඇත්ත-
ටම ප්‍රයෝජනයක් නැත. දැන් මම
ස්වාමීන්ගෙන් මට ලැබුණු ආශ්චර්-
යවත් දර්ශන[2] සහ විශේෂ පණිවිඩ
ගැන කතා කරන්නෙමි. **2** ක්‍රිස්තුස්
සමඟ එකට බැඳී සිටින පුරුෂයෙ-
කුට සිදු වූ දෙයක් ගැන පැවසීමට
මා කැමතිය. මීට වසර දහහතර-
කට කලින් ඔහුව ‘තුන්වෙනි’ ස්වර්-
ගයට ඔසවනු ලැබීය.[3] ඔහු තම
ශරීරය පිටින්ම එහි ගියාද නැත්නම්
දර්ශනයකින් එහි ගියාද කියා මම
නොදනිමි. ඒ දේ දන්නේ දෙවි පමණි.
**3** මා නැවතත් කියන්නේ එවැනි
පුරුෂයෙකුව මා හඳුනන බවය. ඔහු
තම ශරීරය පිටින්ම එහි ගියාද නැත්-
නම් දර්ශනයකින් එහි ගියාද[4] කියා
මම නොදනිමි. ඒ දේ දන්නේ දෙවි
පමණි. **4** ඔහුව ඔසවාගනු ලැබුවේ
පාරාදීසයකටය.[5] එහිදී මිනිසෙකුට
කියන්න අවසර නැති, පැවසීමට-
වත් නොහැකි වචන ඔහුට ඇසිණ.
**5** එවැනි මිනිසෙකු ගැන ආඩම්බ-
රයෙන් කතා කිරීමට මට පුළුවන.
නමුත් මා ගැනම මම ආඩම්බරයෙන්
කතා කරන්නේ නැත. ඒ වෙනුවට
මා කතා කරන්නේ මගේ දුර්වලකම්
ගැනය.[6] **6** ඉදිරියේදී ආඩම්බරයෙන්
කතා කිරීමට මට අවශ්‍ය වුණොත්[7]
මම හොඳ සිහිකල්පනාවෙන් සත්‍යය
කතා කරන්නෙමි. නමුත් දැන් මා
ඒ දේ කිරීමෙන් වැළකී සිටින්නේ
මා පවසන දේ ඇසීමෙන් හෝ මා
කරන දේ දැකීමෙන් හෝ මට වෙ-
නත් අයගෙන් අනවශ්‍ය ගෞරවයක්
ලබා නොගැනීම සඳහාය. **7** මට
අන් අයට වඩා බොහෝ පණිවිඩ එළි-
දරව් කරනු ලැබූ නිසා මා උත්තම-
යෙකු කියා කිසි කෙනෙකු නොසිතිය
යුතුයි.

ඇත්තෙන්ම මා ගැන මහ ඉහ-
ළින් සිතීමට මට කිසිම හේතුවක්

නැත.[1] මන්ද මගේ ශරීරයට ඇනී
තිබෙන කටුවක් හා සමාන පීඩා-
වකට[2] නිතරම මුහුණ දෙන්න මට
සිදු වී ඇත. සාතන්ගේ දූතයෙකු
හා සමානව ක්‍රියා කරන ඒ දෙ-
යින් මම නිතරම පහර ලබමි. මට ඒ
දේ විඳින්න සිදු වී තිබෙන්නේ මා
ගැන මහ ඉහළින් නොසිතීම සඳ-
හාය. **8** එය මගෙන් ඉවත් කරන
ලෙස මම ස්වාමීන්ගෙන් තුන් වතා-
වක්ම[3] මහත් ඕනෑකමින් ඉල්ලා සිටි-
යෙමි. **9** නමුත් ඔහු මට පැවසුවේ
මෙයයි. “මා ඔබට මේ වන තුරු
පෙන්වා ඇති මහත් කරුණාව ඔබට
ප්‍රමාණවත්ය.[4] මන්ද ඔබේ දුර්වලකම
තුළින් මගේ බලය සම්පූර්ණයෙන්ම
දැකගත හැකිය.”[5] එහෙයින් මම ඉතා
සතුටින් මගේ දුර්වලකම් ගැන ආඩම්-
බරයෙන් කතා කරන්නෙමි.[6] මන්ද
කූඩාරමකින් ආරක්ෂාවක් ලැබෙ-
නවා හා සමානව ක්‍රිස්තුස් තුළින්
ලැබෙන බලයෙන් මට ආරක්ෂාවක්
ලැබේ. **10** එමනිසා ක්‍රිස්තුස් වෙනු-
වෙන් මම ඉතා සතුටින් මගේ දුර්-
වලකම් ඉවසන්නෙමි. ඊට අමතරව
නින්දා අපහාසවලටත් අගහිඟකම්ව-
ලටත් විවිධ පීඩා හා දුෂ්කරතාවල-
ටත් මුහුණ දෙන්නෙමි. මන්ද මා එසේ
දුර්වල වී සිටින අවස්ථාවලදී මම බල-
වත් වන්නෙමි.[7]

**11** මා සීමාව ඉක්මවා ආඩම්බර-
යෙන් කතා කළේ එසේ කිරීමට ඔබ
මාව පෙළඹූ නිසාය.[8] ඔබ මගේ සුදුසු-
කම් ගැන මා වෙනුවෙන් කතා කර
තිබුණා නම් මට එසේ කතා කිරී-
මට සිදු වන්නේ නැත. මා වටිනා-
කමක් නැති කෙනෙකු වුවත්[9] ඔබ
මහ ඉහළින් සලකන[10] නියෝජිත-
යන්ට* වඩා කිසි ලෙසකින්වත් මා
පහත් කෙනෙකු බව කිසිවෙකුට කිව
නොහැක. **12** ඇත්තෙන්ම මා යේ-
සුස්ගේ නියෝජිතයෙකු බවට තිබෙන
සාක්ෂි ඔබ සියලුදෙනාම දැක ඇත.[11]
මම බොහෝ දේවල් විඳදරාගනිමින්[12]

**12 පරි.**
1 හිතෝ 16:18
2 ගලා 4:13
3 1පේත 5:7
4 ද්වි 3:26
5 යෙසා 40:29 හෙබ්‍රෙ 11:34
6 2කොරි 11:30
7 පිලි 4:13
8 2කොරි 12:1
9 2කොරි 11:23
10 2කොරි 11:5 එළි 2:2
11 1කොරි 9:2
12 2කොරි 6:4

**2 තීරුව**
1 ක්‍රියා 14:3 ක්‍රියා 15:12 රෝම 15:19
2 1කොරි 9:12 2කොරි 11:9
3 2කොරි 13:1
4 ක්‍රියා 20:33
5 1කොරි 4:14 ගලා 4:19
6 හිතෝ 13:22 හිතෝ 19:14
7 හිතෝ 11:30 2කොරි 1:6 පිලි 2:17 කොලො 1:24 1තෙස 2:8 හෙබ්‍රෙ 13:17
8 2කොරි 11:9
9 2කොරි 7:2
10 2කොරි 8:6 2කොරි 8:16
11 පිලි 1:27

ඔබ අතරෙහි ආශ්චර්යයන්, පුදුම
දේවල් සහ වෙනත් බලවත් ක්‍රියා
සිදු කළෙමි.[1] **13** ඇත්තෙන්ම අන්
සියලු සභාවන්ට වඩා ඔබට අඩුවක්
සිදු වූයේ එක දෙයක් ගැන පමණයි. ඒ
මා ඔබට බරක් නොවී සිටීමයි.[2] එය
වරදක් නම් මම ඔබෙන් එයට සමාව
අයැදිමි.

**14** දැන් මා ඔබව හමු වීමට අදහස්
කරමින් සිටින්නේ තුන්වෙනි වතා-
වටය.[3] මා පැමිණියත් ඔබට බරක්
වන්නේ නැත. මන්ද මට අවශ්‍ය වන්-
නේ ඔබ සතු දේවල් නොව[4] ඔබවය.
මා එසේ කියන්නේ සාමාන්‍යයෙන්
දරුවන්[5] තම දෙමාපියන් වෙනුවෙන්
ධනය රැස් කරනවා නොව දෙමාපියන්
තම දරුවන් වෙනුවෙන් ධනය රැස්
කරන නිසාය.[6] **15** ඇත්තෙන්ම මා
ඔබ වෙනුවෙන් මා සතු සෑම දෙයක්ම,
මගේ ජීවිතය පවා දීමට සතුටු වන්-
නෙමි.[7] මා තුළ ඔබ කෙරෙහි එතරම්
ප්‍රේමයක් තිබෙද්දී ඔබ තුළත් මා ගැන
එතරම් ප්‍රේමයක් තිබෙන්න තරම් මා
වටින්නේ නැද්ද? **16** ඒ කෙසේවෙ-
තත් මම ඔබට බරක් වූයේ නැත.[8]
නමුත් ඔබ කියන්නේ මා “කපටි”
කෙනෙකු බවත් මා ඔබව “උපාය-
ශීලීව” අල්ලාගත් බවත්ය.[9] **17** මා
ඔබ වෙතට එවූ අය ගැන සිතන්න.
ඔවුන් මාර්ගයෙන් මා ඔබගෙන් වාසි
ප්‍රයෝජන ලබාගත්තාද? **18** ඔබව
හමු වීමට මා තීතස්ට උනන්දු කළ
අතර ඔහු සමඟ තවත් සහෝදරයෙ-
කුවද එව්වෙමි. තීතස් ඔබගෙන් යම්
වාසි ප්‍රයෝජන ලබාගත්තේ නැති
බව මම හොඳටම දනිමි.[10] ඔහු කට-
යුතු කළේ මා කටයුතු කළ ආකාරය-
ටම නොවේද? අප දෙදෙනාම දැරුවේ
එකම ආකල්පයයි.[11]

**19** අප එසේ කියන්නේ අප නිදොස්
පුද්ගලයන් බව ඔප්පු කිරීමට කියා
ඔබ සිතනවාද? නැත. අප ක්‍රිස්තුස්-
ගේ අනුගාමිකයන් ලෙස මේ දේවල්
ගැන කතා කරන්නේ දෙවි ඉදි-
රියෙහිය. ප්‍රේමණීය සහෝදරයෙනි,
අප සෑම දෙයක්ම කරන්නේ ඔබව

**2කොරි 12:11*** හෝ, “යවනු ලැබූවන්ට.”

දිරිගැන්වීම සඳහාය.[1] **20** නමුත් මා
පැමිණෙන විට[2] මා ඔබෙන් බලා-
පොරොත්තු වෙනවාට වඩා වෙනස්
දෙයක් ඔබ තුළ දකින්න ලැබෙයි
කියා මට බියක් ඇත. එලෙසම ඔබ
මගෙන් බලාපොරොත්තු වන දේට
වඩා වෙනස් දෙයක් කිරීමට මටත්
සිදු විය හැක. ඔබ අතරෙහි අඬදබර,
ඊර්ෂ්‍යාව,[3] කෝපය, වාදවිවාද, කේ-
ලම්, කෙදිරීම්, අහංකාරය, කෝලහල
යනාදිය තිබිය හැකියි කියාත් මම බිය
වෙමි.[4] **21** ඇතැම්විට මා නැවත
පැමිණෙන අවස්ථාවේදී මගේ දෙවි
මට ලැජ්ජාවක් දැනෙන්න සැලැස්විය
හැක. එසේ විය හැක්කේ කලින් පව්-
කාර ජීවිතයක් ගත කළ අය[5] තමන්
කළ අපවිත්‍ර දේවල් ගැනවත් වේශ්‍යා-
කම,*[6] නින්දිත හැසිරීම[7] යනාදි
දේවල් ගැනවත් පසුතැවිලි වී නැති
නිසාය. එහෙයින් සමහරවිට මට බො-
හෝ සෙයින් ශෝක වීමට සිදු වෙයි.

**13** මෙය මා ඔබව හමු වීමට අද-
හස් කරගෙන සිටින තුන්-
වෙනි වතාවය.[8] “සෑම කාරණයක්ම
සාක්ෂිකරුවන් දෙදෙනෙකුගේ හෝ
තුන්දෙනෙකුගේ හෝ සාක්ෂිය මත
ස්ථිර කළ යුතුයි”[9] කියා මතක තබා-
ගන්න. **2** එහෙයින් මා දැන් ඔබෙන්
දුරස් වී සිටියත් මා පවසන දේවල්
සිතට ගන්න. දෙවෙනි වතාවටත් මා
ඔබ ළඟම සිටිමින් මේ දේවල් පව-
සනවා කියා සිතන්න. මා කලින්
පැවසූ ආකාරයට පව් කර ඇති අය-
ටත් අන් සියලුදෙනාටත් මා අනතුරු
අඟවන්නේ වැරදි දේවල් කරන අයට
මගෙන් හික්මවීමක් අනිවාර්යයෙන්ම
ලැබෙන බවය.[10] **3** මා එසේ කියන්-
නේ ක්‍රිස්තුස් මා තුළින් කතා කරන
බවට සාක්ෂි ඔබ සොයන නිසාය.[11]
එහෙයින් ක්‍රිස්තුස් ඔබ සමඟ කටයුතු
කරන විට දුර්වල ආකාරයකින් නොව
මහත් බලයකින් කටයුතු කරන බව

**12 පරි.**
1 1කොරි 10:33
2 2කොරි 10:2; 2කොරි 13:2
3 1කොරි 3:3
4 පිලි 2:3
5 1කොරි 5:1; 2කොරි 2:2
6 1කොරි 6:9; 1කොරි 6:13
7 රෝම 13:13; ගලා 5:19; එෆී 4:19; 2පේතෘ 2:2; යූද් 4

**13 පරි.**
8 2කොරි 12:14
9 ගණන් 35:30; ද්වි 19:15; මතෙ 18:16; යොහ 8:17
10 2කොරි 1:23; 2කොරි 10:2; 2කොරි 12:21
11 රෝම 15:18; 1කොරි 5:4

**2 තීරුව**
1 1කොරි 2:2
2 පිලි 2:7
3 රෝම 6:4
4 2තිමෝ 2:12; 1පේතෘ 3:18
5 1කොරි 1:18; 1කොරි 6:14
6 1කොරි 11:28; ගලා 6:4
7 රෝම 8:10
8 රෝම 1:9; පිලි 1:4; පිලි 1:9; කොලො 1:3; 1තෙස 1:2
9 ක්‍රියා 4:20; 1කොරි 13:6
10 1කොරි 4:10
11 1තෙස 3:10

ඔබට තේරෙයි. **4** ඔහුව වධකණු-
වක ඇණ ගසනු ලැබූ විට[1] ඔහු
යම් ආකාරයකින් දුර්වල තත්වයක*
සිටි බව[2] සැබෑය. නමුත් දෙවිගේ
මහත් බලය නිසා ඔහු දැන් ජීවමානව
සිටියි.[3] එලෙසම ඔහු කලින් දුර්වලව
සිටි ලෙසම අපත් දැන් දුර්වලව සිටි-
යත් අපි ඔහු සමඟ ඉදිරියේදී ජීවත්
වන්නෙමු.[4] එසේ වන්නේ ඔබ අතරත්
ක්‍රියාත්මක වන දෙවිගේ බලය මාර්-
ගයෙනි.[5]
**5** ඔබ විශ්වාස කරන සත්‍ය
ඉගැන්වීම්වලට ඔබ ඇලී සිටින-
වාද කියා නොකඩවා සෝදිසි කර
බලන්න. ඔබ කුමනාකාරයේ පුද්ගල-
යන්ද කියා නිරතුරුවම පරීක්ෂා කර
බලන්න.[6] යේසුස් ක්‍රිස්තුස් ඔබ සමඟ
එකට බැඳී සිටින බව ඔබට අව-
බෝධ වී නැද්ද?[7] නමුත් ඔබට දෙවිගේ
අනුමැතිය නැත්නම් ඔබට ක්‍රිස්තුස්
සමඟ එකට බැඳී සිටිය නොහැකියි.
**6** අපට දෙවිගේ අනුමැතිය තිබෙන
බව ඔබට දැනගත හැකි වෙයි කියා
මම සැබවින්ම බලාපොරොත්තු වෙමි.
**7** ඔබ අතින් කිසි වරදක් සිදු නො-
වන්න කියා ඉල්ලා අපි දැන් දෙ-
විට යාච්ඤා කරන්නෙමු.[8] අප
එසේ කරන්නේ දෙවිගේ අනුමැතිය
ඇති අය ලෙස පෙනී සිටීමට අපට
අවශ්‍ය නිසා නොව ඔබ යහපත කර-
නවා දැකීමට අපට අවශ්‍ය නිසාය.
**8** මන්ද සත්‍යය උදෙසා[9] මිස සත්‍ය-
යට විරුද්ධව අපට කිසි දෙයක් කළ
නොහැක. **9** ඔබ ශක්තිමත් විශ්වා-
සයක් ඇති අය ලෙස කටයුතු කරන
විට[10] ඔබට විරුද්ධව දැඩි පියවර
ගැනීමට අවශ්‍ය නොවන නිසා අපට
එය ඇත්තටම ප්‍රීතියක් බව මතක
තබාගන්න. අවශ්‍ය පැතිවලින් යම්
සකස් කිරීම් කරන්න ඔබට හැකියාව
ලැබෙන්න කියා අපි යාච්ඤා කරන්-
නෙමු.[11] **10** ඔබෙන් දුරස්ව සිටින
මා, මේ දේවල් ඔබට ලියා එවන්නේ
යම් හේතුවක් නිසාය. එනම් මා ඔබ

**2කොරි 12:21*** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න.

**2කොරි 13:4*** එනම්, ඔහු මිනිසෙකුව.

වෙතට පැමිණි පසු ස්වාමීන් මට දී
ඇති අධිකාරියට එකඟව දැඩි පියවර
ගැනීමට මට සිදු නොවීම සඳහාය.[1]
මන්ද ස්වාමීන් මට ඒ අධිකාරිය දුන්-
නේ ඔබව අධෛර්යය කිරීමට නොව
ගොඩනැංවීමටය.[2]

11 සහෝදරයෙනි, අවසන් වශ-
යෙන් මා ඔබට මෙම දිරිගැන්වීම්
ලබා දීමට කැමතිය. දිගටම ප්‍රීතියෙන්
සිටින්න. ඔබ සිතන ආකාරය නිරතු-
රුව සකස් කරගන්න. අන් අයගෙන්
ලබන සැනසිල්ල අගය කරන්න.[3]
එකඟතාවකින් කටයුතු කරන්න.[4]
සමාදානයෙන් ජීවත් වන්න.[5] ඔබ
එසේ කළොත් ප්‍රේමයද සමාදානයද[1]
ලබා දෙන දෙවි ඔබ සමඟ සිටිනු
ඇත. 12 සහෝදර සෙනෙහසකින්
එකිනෙකාව සිඹගනිමින් එකිනෙකාට
සුබ පතන්න.[2] 13 සියලුම ශුද්ධ
තැනැත්තෝ ඔබට තම සුබ පැතුම්
එවති.

14 ඔබ සැමට ස්වාමීන් වන යේ-
සුස් ක්‍රිස්තුස්ගේ මහත් කරුණාවද
දෙවිගේ ප්‍රේමයද අප සියලුදෙනා
හවුලේ භුක්ති විඳින දෙවිගේ බලයද
ලැබේවා![3]

**13 පරි.**
1 1කොරි 4:21
2කොරි 10:6
2 තීත 1:13
3 2කොරි 1:4
2කොරි 1:6
4 පිලි 2:2
5 1තෙස 5:13
යාකො 3:17
1පේතෘ 3:11
2පේතෘ 3:14

**2 තීරුව**
1 රෝම 15:33
1කොරි 14:33
1තෙස 5:23

2 රෝම 16:16; 1තෙස 5:26; 1පේතෘ 5:14; 3 පිලි 2:1.

# ගලාතිවරුන්ට

## ලියූ ලිපිය

1 පාවුල්[1] වන මම යේසුස් ක්‍රිස්-
තුස්ගේ නියෝජිතයෙක්*[2] වෙමි.
මාව ඔබ වෙතට එව්වෙත් මාව පත්
කළෙත් මිනිසුන් නොවේ. මාව පත්
කළේ යේසුස් ක්‍රිස්තුස්[3] සහ ඔහුව මර-
ණයෙන් නැඟිටෙවූ[4] දෙවි පියාණන්ය.[5]
2 මා සමඟ සිටින සියලුම සහෝදර-
යෝද[6] මමද ගලාතියේ තිබෙන සභා-
වන්ට මෙසේ ලියා එවන්නෙමු.[7]

3 අපගේ පියාණන් වන දෙවිගෙන්
සහ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්-
ගෙන් ඔබට මහත් කරුණාවත් සමා-
දානයත් ලැබේවා![8] 4 අපගේ දෙවි
හා පියාණන් වන තැනැත්තාගේ
කැමැත්ත පරිදි[9] යේසුස් අපගේ පව්
උදෙසා තම ජීවිතය දුන්නේය.[10] එසේ
කළේ දැන් පවතින දුෂ්ට සමාජයෙන්
අපව ගලවාගැනීමටය.[11] 5 දෙවිට
සදාකාලයෙන් සදාකාලයට සියලු
ප්‍රශංසාව සහ ගෞරවය හිමි වේවා![12]
ආමෙන්.*

6 නමුත් ක්‍රිස්තුස්ගේ මහත් කරු-
ණාව මාර්ගයෙන් ඔබව කැඳවූ[1]
තැනැත්තාණන්ගෙන්[2] ඔබ මෙතරම්
ඉක්මනින් අහක් වී වෙනත් ශුභා-
රංචියකට[3] සවන් දෙන්න පටන්ගත්-
තේ කෙසේද කියා මට සිතාගත
නොහැක. 7 ඇත්තටම ඔබ සවන්
දුන් ඒ දේ ශුභාරංචියක් නොවේ.
ඔබ අතරේ ප්‍රශ්න ඇති කරන පිරි-
සක් සිටිති.[4] ඔවුන්ගේ අදහස වන්නේ
ක්‍රිස්තුස් පිළිබඳ ශුභාරංචිය විකෘති
කර පෙන්වීමය.[5] 8 නමුත් අපෙන්
කෙනෙකු හෝ ස්වර්ගයේ දේවදූත-
යෙක් හෝ පැමිණ අප ප්‍රකාශ කළ
ශුභාරංචියට වඩා වෙනස් ශුභාරංචියක්
ඔබට ප්‍රකාශ කරනවා නම් ඔහුට ශාප
වේවා![6] 9 මා පැවසූ දේ නැවතත්
කියමි. එනම් ශුභාරංචියක් ලෙස ඔබ
පිළිගත් දේට වඩා වෙනස් දෙයක්[7]
ඔබට ප්‍රකාශ කරන ඕනෑම කෙනෙ-
කුට ශාප වේවා කියාය.

10 මා දැන් උත්සාහ කරන්නේ
මිනිසුන්ගේ අනුමැතිය ලබාගැනීම-
ටද? නැත්නම් දෙවිගේ අනුමැතිය

**1 පරි.**
1 ක්‍රියා 13:9
2 රෝම 1:5
තීත 1:1
3 ක්‍රියා 9:15
ක්‍රියා 26:16
ගලා 1:12
4 ක්‍රියා 2:24
5 ක්‍රියා 22:14
6 පිලි 4:21
7 1කොරි 16:1
8 1කොරි 1:3
ගලා 6:16
2යොහ 3
9 එස 33:11
1තිමෝ 2:4
10 තීත 2:14
1යොහ 2:2
11 යොහ 15:19
රෝම 12:2
12 රෝම 16:27

**2 තීරුව**
1 2කොරි 1:2
2 හෙබ්‍රෙ 3:6
3 2කොරි 11:4
ගලා 5:7
4 ගලා 5:10
5 ක්‍රියා 15:1
2කොරි 11:13
1තිමෝ 6:3
6 1කොරි 16:22
ගලා 5:12
7 ද්වි 12:32
හිතෝ 30:6

ගලා **1:1*** හෝ, “යවනු ලැබුවෙක්.” **5*** එනම්, එසේම වේවා!

ලබාගැනීමටද? මා උත්සාහ කරන්-
නේ මිනිසුන්ව සතුටු කිරීමටද?[1] මා
තවමත් මිනිසුන්ව සතුටු කරනවා
නම්[2] මා ක්‍රිස්තුස්ගේ දාසයෙකු කියා
පැවසිය නොහැක.[3] **11** සහෝදර-
යෙනි, මා ඔබට ඉතා පැහැදිලිව
යමක් කියන්න කැමතිය. එනම් මා
ශුභාරංචියක් ලෙස ප්‍රකාශ කළ දේ
මිනිසුන්ගෙන් ලද දෙයක් නොවන
බවය.[4] **12** මා එය මිනිසෙකුගෙන්
ලබාගත්තේවත් එය මට යම් කෙ-
නෙක් ඉගැන්වූවේවත් නැත. එය මට
එළිදරව් කළේ යේසුස් ක්‍රිස්තුස්ය.[5]

**13** මා කලින් යුදෙව් ආගම ඇදහූ
කාලයේදී කටයුතු කළ ආකාරය[6]
ඔබට ආරංචි වී ඇති බවට සැකයක්
නැත. මම ඉතා දරුණු ලෙස දෙවි-
ගේ සභාවට පීඩා කරමින්[7] එය නැති
කර දැමීමට පවා උත්සාහ කළෙමි.[8]
**14** මගේ පියවරුන්ගේ සම්ප්‍රදායන්[9]
සඳහා මට කොතරම් උද්‍යෝගයක්[10]
තිබුණාද කිවහොත් මගේ ජාතියට
අයත් මගේම වයසේ සිටි බොහෝ-
දෙනෙකුට වඩා මම යුදෙව් ආගම
තුළ මහත් දියුණුවක් ලබමින් සිටි-
යෙමි.[11] **15** නමුත් මට මෙලොව
එළිය දකින්න අවස්ථාවක් ලබා
දුන් දෙවි මහත් කරුණාවක් පෙන්-
වමින්[12] මාව කැඳෙව්වේය.[13] ඔහු
තීරණය කළේ, **16** මා මාර්ගයෙන්
තම පුත්‍රයා ගැන තොරතුරු හෙළි
කිරීම සුදුසු බවය.[14] එහෙයින් ඔහු
පිළිබඳ ශුභාරංචිය වෙනත් ජාතීන්ට
අයත් අයට ප්‍රකාශ කිරීම සඳහා
මාව තෝරාගන්නා ලදි.[15] එසේ තෝ-
රාගත් පසු මම ඉක්මනින්ම ගොස්
කිසි මිනිසෙකුගේ උපදෙස් පැතුවේ
නැත.[16] **17** එසේම මට කලින් යේ-
සුස්ගේ නියෝජිතයන් ලෙස පත් කර
තිබූ අයව[17] හමු වීමට මම යෙරුසල-
මටවත් නොගියෙමි. ඒ වෙනුවට මා
ගියේ අරාබියටය. ඉන්පසු මම නැවත
දමස්කයට ගියෙමි.[18]

**18** ඉන් වසර තුනකට පසු සීඵස්ව
හමු වීමට[19] මම යෙරුසලමට ගොස්[20]
ඔහු සමඟ දවස් පහළොවක් ගත
කළෙමි. **19** ඒ කාලයේදී නියෝ-
ජිතයන්ගෙන් වෙනත් කිසිවෙකුවත්
මට හමු වූයේ නැත. මට හමු
වුණේ ස්වාමීන්ගේ සහෝදරයා[1] වන
යාකොබ්ව[2] පමණි. **20** මා ඔබට
දැන් ලියා එවන මේ දේවල් බොරු
නොවේ.[3] දෙවි ඉදිරියෙහිම මා ඔබට
පවසන්නේ සත්‍යයක්ය.

**21** ඉන්පසු මම සිරියාවට සහ සිලී-
සියාවට අයත් පළාත්වලට ගියෙමි.[4]
**22** නමුත් ක්‍රිස්තුස් සමඟ එකට බැඳී
සිටින යුදයේ සභාවල සිටි අය ඒ වන
තුරු මාව දැන හඳුනා ගෙන සිටියේ
නැත.[5] **23** ඔවුන් දැනගෙන සිටියේ
වෙනත් සහෝදරයන් මා ගැන පවසා
තිබූ මේ දේ පමණි. එනම්, "කලින්
අපට පීඩා කළ මිනිසා[6] තමා නැති
කර දැමීමට උත්සාහ කළ ආගම ගැන
ශුභාරංචිය දැන් සියලුදෙනාටම ප්‍රකාශ
කරයි"[7] යන කාරණයයි. **24** එහෙ-
යින් මා නිසා ඔවුහු දෙවිට ගෞරවය
දුන්නෝය.[8]

**2** ඉන් අවුරුදු දහහතරකට පසු
මම බානබස් සමඟ,[9] තීතස්-
වද කැඳවාගෙන නැවත යෙරුසලමට
ගියෙමි.[10] **2** මා එසේ ගියේ යේසුස්
ක්‍රිස්තුස් මට යමක් එළිදරව් කළ
නිසාය.[11] මා එහි සිටින විට ප්‍රමු-
ඛත්වය ගන්නා අය ලෙස කවුරුත්
හොඳින් හඳුනන සහෝදරයන් කිහිප-
දෙනෙකුව පෞද්ගලිකවම හමු වී මා
දැනට වෙනත් ජාතීන්ට අයත් මිනි-
සුන් අතරේ ශුභාරංචිය ප්‍රකාශ කරන
ආකාරය ගැන පැහැදිලි කළෙමි.[12] මා
එසේ කළේ මා කරමින් සිටි සේ-
වය[13] හෝ කර තිබූ සේවය නිෂ්-
ඵල එකක් විය හැකි බවට බියක්[14]
මට දැනුණු නිසාය. **3** මා සමඟ සිටි
ග්‍රීක ජාතිකයෙකු වූ තීතස්[15] චර්-
මච්ඡේදනය වීමේ පිළිවෙතට යටත්
විය යුතුයි කියා කිසිවෙකු ඔහුට බල
කළේ නැත.[16] **4** නමුත් සහෝදර-
යන් බව බොරුවට මවාපාන අයගේ
බලපෑම නිසා[17] ඒ ගැන ප්‍රශ්නයක්
මතු විය. කාටත් හොරෙන් පැමිණි
ඔවුන්[18] සභාවට රහසින් රිංගාගත්තේ

**1 පරි.**
**1** 1තෙස 2:4
**2** යාකො 4:4
**3** රෝම 1:1
**4** 1තෙස 2:13
**5** රෝම 16:25; ගලා 2:2; එෆී 3:3
**6** ක්‍රියා 23:6; ගලා 2:14
**7** 1තිමෝ 1:13
**8** ක්‍රියා 8:3; ක්‍රියා 9:1; ක්‍රියා 22:4; ක්‍රියා 26:11
**9** මාක් 7:5
**10** පිලි 3:6
**11** ක්‍රියා 22:3
**12** රෝම 11:5; 1කොරි 15:10; එෆී 3:7
**13** 1කොරි 1:1; 1තෙස 2:12
**14** 2කොරි 4:6
**15** ක්‍රියා 9:15; රෝම 11:13
**16** මතෙ 16:17
**17** ක්‍රියා 2:42
**18** ක්‍රියා 9:19
**19** යොහ 1:42; 1කොරි 15:5
**20** ක්‍රියා 9:26

**2 තීරුව**
**1** මතෙ 13:55; 1කොරි 9:5
**2** ක්‍රියා 12:17
**3** රෝම 9:1
**4** ක්‍රියා 9:30
**5** යොහ 17:21; රෝම 16:7; 1කොරි 1:30; 1තෙස 2:14
**6** ගලා 1:13
**7** ක්‍රියා 8:3
**8** ක්‍රියා 21:20

**2 පරි.**
**9** ක්‍රියා 9:27
**10** ක්‍රියා 15:2
**11** 1කොරි 14:6
**12** ක්‍රියා 15:12
**13** ගලා 5:7
**14** පිලි 2:16; 1තෙස 3:5
**15** 2කොරි 2:13
**16** ක්‍රියා 16:3
**17** යෙසා 66:5
**18** ක්‍රියා 15:24; 2කොරි 11:26; යූද් 4

ක්‍රිස්තුස් යේසුස් සමඟ එකට බැඳී
සිටින අය ලෙස අප භුක්ති විඳින
නිදහසට යම් ආකාරයකින් හානි-
යක් කිරීමට මහත් සෙවීම සඳහාය.[1]
ඔවුන්ට අවශ්‍ය වුණේ අපව සම්පූර්ණ-
යෙන්ම නීතියට වහල් කර තබාගැනී-
මටය.[2] **5** අපි ඔවුන්ගේ බලපෑමට
කිසි ලෙසකින්වත් සුළු මොහොතකට
හෝ හසු වුණේ නැත.[3] අප එසේ කළේ
ශුභාරංචියට සවන් දී ඔබ ඉගෙනගත්
සත්‍යයෙන්[4] කිසි ලෙසකින්වත් අහක්
නොවී එයට ඇලී සිටීමට ඔබට උප-
කාර කිරීම සඳහාය.

**6** නමුත් ප්‍රමුඛත්වය ගන්නා
අය ලෙස කවුරුත් හොඳින් හඳු-
නන පුරුෂයන්[5] මාර්ගයෙන් මට
කිසිම අලුත් දෙයක් ලැබුණේ නැත.
ඔවුන් මීට කලින් යම් වරප්‍රසාද
ලබාගෙන සිටියත් වැදගත් වන්-
නේ එය නොවේ.[6] එසේ වන්නේ
දෙවි මිනිසුන්ව විනිශ්චය කරන්නේ
ඔවුන්ගේ පිටාතර පෙනුමට අනුව
නොවන නිසාය.[7] **7** යුදෙව්වන්ට*[8]
ශුභාරංචිය දීමේ කාර්යය පේතෘස්ට
භාර දුන් ලෙසම යුදෙව් නොවන
අයට#[9] එය දීමේ කාර්යය මට භාර
දී තිබුණු බව[10] ඔවුහු තේරුම්ගත්-
තෝය. **8** මන්ද වෙනත් ජාතීන්ට
අයත් අය වෙනුවෙන් සේවය කිරීමේ
වගකීම මට භාර දුන්නේ[11] යුදෙව්වන්
වෙනුවෙන් නියෝජිතයෙකු* ලෙස
කටයුතු කිරීමේ වගකීම පේතෘස්ට
භාර දුන් තැනැත්තාමය. **9** ඇත්-
තෙන්ම මා දෙවිගේ මහත් කරුණාව[12]
ලබා තිබුණු ආකාරය[13] සභාවේ කණු
හා සමානව සිටි[14] යාකොබ්ද[15] සීඵස්ද
යොහන්ද තේරුම්ගත් විට ඔවුහු
අතට අත දී මාව සහ බානබස්ව[16]
පිළිගත්තෝය.[17] ඒ අනුව අප වෙ-
නත් ජාතීන් වෙතට යා යුතු බවටත්
ඔවුන් යුදෙව්වන් වෙතට යා යුතු බව-
ටත් වූ කාරණයට ඔවුහු එකඟ වූහ.
**10** එසේම අප දිළිඳුන්වද සිහියේ
තබාගත යුතු බවත්[1] ඔවුහු අපට පැව-
සූහ. මාද මහත් උනන්දුවෙන් වැයම්
කරන්නේ ඒ දේ කිරීමටය.[2]

**11** නමුත් සීඵස්[3] අන්තියෝකි-
යට[4] පැමිණි විට ඔහු අතින්
වරදක් සිදු වූ බව ඉතා පැහැදි-
ලිව පෙනුණු නිසා[5] මම කෙළින්ම ඒ
ගැන ඔහුට කතා කළෙමි. **12** මන්ද
මුලින් ඔහු වෙනත් ජාතීන්ට අයත්
අය සමඟ එකට ආහාර ගනිමින්
සිටියත්[6] යාකොබ් වෙතින් පුරු-
ෂයන් කිහිපදෙනෙකු පැමිණි පසු[7]
ඔහු වෙනත් ජාතීන්ට අයත් අය-
ගෙන් ඈත් වී ඔවුන් සමඟ තවදුර-
ටත් ඇසුරු කිරීම නතර කළේය. ඔහු
එසේ කළේ චර්මච්ඡේදනයට පක්-
ෂව සිටි අයට[8] බියෙන් සිටි නිසාය.[9]
**13** අනික් යුදෙව්වරුද එම කුහක-
කමට හවුල් වූහ.[10] බානබස්[11] පවා
ඔවුන්ට හවුල් විය. **14** නමුත් ඔවුන්
ශුභාරංචිය තුළින් ඉගෙනගත් සත්‍ය
මාර්ගයට අනුව ක්‍රියා නොකරන බව
මා දුටු විට[12] මම ඔවුන් සියලුදෙනා
ඉදිරියෙහිම සීඵස්ට මෙසේ කීවෙමි.[13]
"ඔබ යුදෙව්වෙක් වුණත් යුදෙව්වෙක්
ලෙස ජීවත් වන්නේ නැතුව වෙ-
නත් ජාතීන්වල මිනිසුන් ජීවත් වන
ආකාරයට ජීවත් වෙනවා. එසේනම්
ඇයි ඔබ වෙනත් ජාතීන්වල මිනි-
සුන්ට යුදෙව් චාරිත්‍රවලට අනුව ජීවත්
වෙන්න කියා බල කරන්නේ?"[14]

**15** වෙනත් ජාතීන්වල සිටින පව්-
කාරයන් මෙන් නොව[15] අපි උපතින්ම
යුදෙව්වරුන් වන්නෙමු.[16] **16** නමුත්
ක්‍රිස්තුස් යේසුස් කෙරෙහි විශ්වාසය
තැබීමෙන් මිස[17] නීතියේ සඳහන්
සෑම දෙයක්ම පිළිපැද්ද පමණින් කිසි
මිනිසෙකු ධර්මිෂ්ඨ කෙනෙකු ලෙස
ප්‍රකාශ කරනු ලබන්නේ නැති බව
අපි දනිමු.[18] ඒ අනුව අපිද ධර්මිෂ්ඨ-
යන් ලෙස ප්‍රකාශ වීම සඳහා නීතියට
අනුව ක්‍රියා කරන්නේ නැත. ඒ වෙ-
නුවට අපි ක්‍රිස්තුස් යේසුස් කෙරෙහි
විශ්වාසය තබන්නෙමු.[19] මන්ද නීති-
යේ සඳහන් සෑම දෙයක්ම පිළිපැද්දා
කියා කිසි මිනිසෙකු දෙවි ඉදිරියේ

**2 පරි.**
**1** යොහ 8:32; යොහ 8:36; 2කොරි 3:17; ගලා 5:1; 1පේතෘ 2:16
**2** 2කොරි 11:20; ගලා 4:9
**3** ගලා 2:14
**4** යොහ 18:37; ගලා 4:16
**5** ගලා 2:9
**6** ගලා 2:14
**7** ද්වි 10:17; ක්‍රියා 10:34; රෝම 2:11
**8** ක්‍රියා 8:14
**9** ක්‍රියා 22:21; රෝම 11:13; 1තිමෝ 2:7
**10** 1තෙස 2:4
**11** ක්‍රියා 9:15; රෝම 1:5; කොලො 1:29
**12** රෝම 1:5; එෆී 3:8
**13** 2පේතෘ 3:15
**14** එෆී 2:20
**15** ක්‍රියා 15:13
**16** ක්‍රියා 13:2; ක්‍රියා 15:25
**17** 1යොහ 1:3

**2 තීරුව**
**1** ද්වි 15:8; 1කොරි 16:1
**2** ක්‍රියා 11:29
**3** යොහ 1:42
**4** ක්‍රියා 11:26; ක්‍රියා 15:35
**5** ලෙවී 19:17
**6** ක්‍රියා 10:28; ක්‍රියා 11:3; ක්‍රියා 15:28
**7** ක්‍රියා 12:17
**8** ක්‍රියා 21:20
**9** හිතෝ 29:25
**10** යාකො 3:17
**11** ක්‍රියා 15:39
**12** ක්‍රියා 10:15; ක්‍රියා 10:34; ගලා 3:28
**13** 1තිමෝ 5:20
**14** ක්‍රියා 15:10; ක්‍රියා 15:28; ගලා 1:13
**15** එෆී 2:12
**16** යොහ 8:39; රෝම 11:23
**17** රෝම 1:17; රෝම 3:22; යාකො 2:23
**18** ගීතා 143:2; ක්‍රියා 13:39; රෝම 8:33
**19** රෝම 5:17; 1කොරි 6:11; හෙබ්‍රෙ 7:19

---

**ගලා 2:7*** මු.අ., "චර්මච්ඡේදනය වූ අයට."
**7#** මු.අ., "චර්මච්ඡේදනය නොවූ අයට."
**8*** හෝ, "යවනු ලැබූවෙකු."

ධර්මිෂ්ඨ කෙනෙකු ලෙස ප්‍රකාශ
කරනු ලබන්නේ නැත.[1] **17** නමුත්
අප ක්‍රිස්තුස් මාර්ගයෙන් ධර්මිෂ්ඨයන්
ලෙස ප්‍රකාශ කරනු ලැබීමට උත්සාහ
දැරීමෙන් පසුවත්[2] අපව පව්කාරයන්
ලෙස සලකනු ලැබේ නම්[3] ඉන් අදහස්
කරන්නේ ක්‍රිස්තුස් අපට පව් කිරී-
මට දිරිගන්වනවා කියාද?[4] නැත. කිසි
ලෙසකින්වත් එසේ නොසිතන්න.
**18** නමුත් මා වරක් කඩා දැමූ දේවල්
නැවත මා විසින්ම ගොඩනගනවා
නම්[5] ඉන් ඔප්පු වන්නේ මා වරදක-
රුවෙකු වන බවය.[6] **19** මා නීතිය
සම්බන්ධයෙන් මිය ගොස්[7] එයින්
නිදහස් වන නිසා දෙවි වෙනුවෙන්
ජීවත්ව සිටීමට දැන් මට පුළුවන.[8]
**20** ඒ අනුව ක්‍රිස්තුස් සමඟ මාවද
වධකණුවට ඇණ ගසා ඇති බව පැව-
සිය හැක.[9] එහෙයින් තවදුරටත්
ජීවත් වන්නේ මා නොව[10] මා සමඟ
එකට බැඳී සිටින ක්‍රිස්තුස්ය.[11] මන්ද
මා දැනට මිනිසෙකු ලෙස ගත
කරන මේ ජීවිතය[12] මා ඇත්තටම
ගත කරන්නේ මට ප්‍රේම කර මා
වෙනුවෙන් තම ජීවිතය පුද කළ දෙ-
විගේ පුත්‍රයා කෙරෙහි විශ්වාසය තබ-
මින්ය.[13] **21** දෙවි එලෙස පෙන්වා
ඇති මහත් කරුණාව මට නොසල-
කාහැරිය නොහැක.[14] මන්ද කෙනෙක්
ධර්මිෂ්ඨයෙකු වන්නේ නීතිය පිළිපැ-
දීමෙන් නම්[15] ක්‍රිස්තුස්ගේ මරණයෙන්
කිසි පලක් නැත.[16]

**3** ගලාතිවරුනි, ඔබ කටයුතු
කරන්නේ ඉතා අඥාන ලෙසයි.
ඔබව නොමඟ යැව්වේ කවුද?[17] මන්ද
මීට කලින් යේසුස් ක්‍රිස්තුස්ව වධක-
ණුවක එල්ලා මරනු ලැබූ ආකාරය
ඔබට ඉතා පැහැදිලිව තේරුම් කර දී
තිබිණ.[18] **2** මා ඔබෙන් යමක් දැන-
ගැනීමට කැමතිය. එනම් ඔබට දෙ-
විගේ බලය ලැබුණේ[19] ඔබ නීතිය
පිළිපැද්ද නිසාද[20] නැත්නම් ඔබ ශුභා-
රංචියට සවන් දී[21] විශ්වාසය ඇති
කරගත් නිසාද? **3** ඔබ මෙතරම්
අඥාන ලෙස කටයුතු කරන්නේ
ඇයි? දෙවිගේ බලයට එකඟව ගමන්
කරන්න ඔබ පටන්ගත්තත්[1] ඔබේ
ගමන ඔබ නිම කිරීමට උත්සාහ
දරන්නේ වරදට නැඹුරු මිනිසුන් මත
රඳා සිටීමෙන්ද?[2] **4** ඔබ බොහෝ
දුක් වින්දේ කිසිම හේතුවක් නැතු-
වද?[3] එසේ නොවන බව මට නිසැ-
කයි. **5** දෙවි තම බලය ඔබට ලබා
දෙන්නේත්[4] ඔබ අතරේ බලවත් ක්‍රියා
සිදු කරන්නේත්[5] ඔබ නීතිය පිළිප-
දින නිසාද? එසේ නැත්නම් ඔබ ශුභා-
රංචියට සවන් දී විශ්වාසයක් ඇතුව
සිටින නිසාද? **6** ආබ්‍රහම්ව සලකා
බලන්න. ඔහු “යෙහෝවා දෙවි කෙ-
රෙහි විශ්වාසය තැබුවේය. ඒ නිසා
ඔහුව ධර්මිෂ්ඨ කෙනෙකු ලෙස ගණන්
ගන්නා ලදි.”[6]

**7** එසේනම් ආබ්‍රහම්ගේ පුත්‍රයන්
වන්නේ[7] විශ්වාසයක් ඇති අයයි.[8]
ඔබ ඒ කාරණය දැන සිටිනවාට
කිසි සැකයක් නැත. **8** දෙවි වෙ-
නත් ජාතීන්ට අයත් මිනිසුන්ව
ධර්මිෂ්ඨයන් ලෙස ප්‍රකාශ කරන්-
නේ ඔවුන් ඇති කරගත් විශ්වාසය
නිසා බව ශුද්ධ ලියවිල්ලෙත් කල්ති-
යාම සඳහන් කර තිබිණ. එහෙයින්,
“සියලු ජාතීහු ඔබ මාර්ගයෙන් ආශීර්-
වාද ලබාගන්නෝය”[9] යන ශුභාරංචිය
ආබ්‍රහම්ට කලින්ම ප්‍රකාශ කරන ලදි.
**9** ඒ අනුව විශ්වාසයක් ඇතුව ක්‍රියා
කළ ආබ්‍රහම් ආශීර්වාද ලැබුවා හා
සමානව[10] දැනුත් විශ්වාසයක් ඇති
සියලුදෙනාටද ආශීර්වාද ලැබේ.[11]

**10** “නීතියේ සඳහන් දේවල් පිළිපැ-
දීමට උත්සාහ නොකරන තැනැත්-
තාට ශාප වේවා”[12] කියා නීතියේ
සඳහන් වේ. එසේනම් නීතිය පිළිපැ-
දීම මතම රඳා සිටින අය ශාපය-
කට ලක් වී සිටිති. **11** මීට අමතරව
නීතිය පිළිපැදීමෙන් පමණක් කිසිම
කෙනෙකු දෙවි ඉදිරියේ ධර්මිෂ්ඨ
කෙනෙකු ලෙස ප්‍රකාශ නොකරන
බවත් පැහැදිලිය.[13] මන්ද, “ධර්මිෂ්ඨ
තැනැත්තා ඔහුගේ ජීවිතය රැක-
ගන්නේ ඔහුගේ විශ්වාසය නිසයි”[14]
කියා සඳහන් වේ. **12** නමුත් නීතිය
පිළිපැදීමට පුද්ගලයෙකුට විශ්වාසය

**2 පරි.**
1 රෝම 3:20, ගලා 3:19
2 රෝම 5:1
3 1යොහ 3:9
4 රෝම 6:1
5 ගලා 5:2, කොලො 2:14
6 ගලා 5:4
7 රෝම 7:9
8 රෝම 6:11, හෙබ්‍රෙ 9:14
9 රෝම 6:6, ගලා 5:24, ගලා 6:14
10 1පේතෘ 4:2
11 යොහ 17:23
12 2කොරි 5:15
13 1තිමෝ 2:6
14 යොහ 1:17, රෝම 4:5
15 ගලා 3:21, හෙබ්‍රෙ 7:11
16 තීත 3:5

**3 පරි.**
17 ගලා 5:7
18 1කොරි 1:23
19 එෆී 1:13, හෙබ්‍රෙ 6:4
20 රෝම 3:20
21 රෝම 10:17

**2 තීරුව**
1 ගලා 4:9
2 හෙබ්‍රෙ 7:16
3 හෙබ්‍රෙ 10:36, 2යොහ 8
4 ක්‍රියා 10:44
5 1කොරි 12:10
6 උත් 15:6, රෝම 4:3, යාකො 2:23
7 යොහ 8:39, රෝම 4:16
8 රෝම 4:12
9 උත් 12:3, උත් 18:18, ක්‍රියා 3:25
10 ගලා 3:28, ගලා 3:29, හෙබ්‍රෙ 2:16
11 හෙබ්‍රෙ 13:7
12 ද්වි 27:26, යෙරෙ 11:3, ක්‍රියා 15:10, යාකො 2:10
13 ක්‍රියා 13:39, ගලා 2:16
14 හබ 2:4, හෙබ්‍රෙ 10:38

අවශ්‍ය වන්නේ නැත. මන්ද, “යමෙක්
ඒවා පිළිපදින්නේ නම් ඔහුගේ ජීවි-
තය රැකෙනු ඇත.”[1] **13** නීතියෙන්
ඇති වූ ශාපයෙන් අපව නිදහස්
කළේ[2] ක්‍රිස්තුස්ය. ඔහු එසේ කළේ
අප වෙනුවෙන් ශාපයට ලක් වී[3] අපව
මිල දී ගැනීමෙනි.[4] “කණුවක එල්ලා
තබන සෑම කෙනෙක්ම ශාප ලැබූ
කෙනෙකි”[5] කියා සඳහන් වී තිබෙන්-
නේ ඒ නිසාය. **14** එවැනි දෙයක් සිදු
වූයේ ආබ්‍රහම්ට පොරොන්දු වූ ආශීර්-
වාදය යේසුස් ක්‍රිස්තුස් මාර්ගයෙන්
සියලු ජාතීන්ට[6] ලබා දීමටය. එම-
නිසා අපගේ විශ්වාසය මගින්[7] අපට
පොරොන්දු වී තිබුණු දෙවිගේ බලය[8]
ලබාගැනීමට අපට අවස්ථාව ලැබිණ.

**15** සහෝදරයෙනි, සාමාන්‍ය ජීවි-
තයේ හොඳින් දන්නා උපමාවක්
භාවිත කිරීමට කැමැත්තෙමි. මිනි-
සුන් දෙදෙනෙකු යම් ගිවිසුමකට එළ-
ඹෙන විට එම ගිවිසුම වලංගු දෙයක්
බවට පත් වන නිසා කිසි කෙනෙක්
එය නොසලකාහරින්නේවත් එයට
අමතර කොන්දේසි එකතු කරන්-
නේවත් නැත.[9] **16** මෙය මතකයේ
තබාගෙන ආබ්‍රහම්[10] සහ ඔහු-
ගෙන් පැවතෙන තැනැත්තාට[11]
දෙවි දුන් පොරොන්දු ගැන සලකා
බලන්න. මෙහිදී දෙවි, “ඔබෙන් පැව-
තෙන තැනැත්තන්ට” කියා පවස-
මින් බොහෝදෙනෙකු ගැන සඳහන්
කරනවා වෙනුවට[12] “ඔබෙන් පැව-
තෙන තැනැත්තා”[13] කියා පව-
සයි. ඒ තැනැත්තා නම් ක්‍රිස්තුස්ය.[14]
**17** මා තවත් දෙයක්ද සඳහන්
කරන්න කැමතිය. එනම් දෙවි විසින්
කලින් වලංගු කරන ලද ඒ ගිවි-
සුම[15] ඊට අවුරුදු හාරසිය තිහකට
පසුව හඳුන්වා දුන් නීතිය[16] මගින්
අවලංගු නොවන බවය. මන්ද දෙවි
තමා දුන් පොරොන්දුව කඩ කරන්නේ
නැත.[17] **18** දෙවි උරුමයක් ලෙස
දෙන දේ ලබාගැනීමට නීතිය පිළිපැ-
දීම අත්‍යවශ්‍ය දෙයක් නම් එය තවදු-
රටත් පොරොන්දුවක් නිසා ලැබෙන
දෙයක් ලෙස සැලකිය නොහැක.[18]
ඇත්තෙන්ම දෙවි සිය කරුණාවෙන්
එය ආබ්‍රහම්ට දුන්නේ පොරොන්දුවක්
ලෙසයි.[1]

**19** එසේනම් නීතිය ලබා දුන්නේ
කුමන අරමුණකින්ද? පොරොන්දුවට
අමතරව එය දෙන ලද්දේ පොරොන්දු
වී තිබූ තැනැත්තා පැමිණෙන තුරු[2]
වැරදි දේවල් මොනවාද කියා පැහැදි-
ලිව පෙන්වා දීමටය.[3] දෙවි එම නීතිය
දේවදූතයන්ට දුන් අතර[4] ඔවුහු එය
මැදිහත්කරුවෙකු මාර්ගයෙන්[5] මිනි-
සුන්ට ප්‍රකාශ කළෝය. **20** නමුත්
පොරොන්දුව දුන් විට ඊට මැදිහත්ක-
රුවෙක් අවශ්‍ය වූයේ නැත. මන්ද ඒ
පොරොන්දුව දුන්නේ එක් කෙනෙක්ය.
ඒ දෙවිය.[6] **21** එසේනම් නීතිය දෙවි
දුන් පොරොන්දුවලට විරුද්ධව ක්‍රියා
කරනවාද?[7] නැත. කිසි ලෙසකින්-
වත් එසේ නොසිතන්න. මන්ද ජීවනය
දිය හැකි නීතියක් මිනිසුන්ට ලබා
දී තිබුණා නම්[8] ඒ නීතිය පිළිපැදී-
මෙන් පමණක් ඔවුන්ට ධර්මිෂ්ඨ වීමට
හැකියාව තිබෙනු ඇත.[9] **22** නමුත්
ශුද්ධ ලියවිල්ල[10] මගින් පැහැදිලි වූයේ
සියලුදෙනා පාපයට යටත්ව සිටින
බවය.[11] ඒ අනුව දෙවිගේ පොරොන්දු
ලැබීමට එකම මඟ යේසුස් ක්‍රිස්තුස්
කෙරෙහි විශ්වාසය තැබීම බව පැහැ-
දිලි විය.[12]

**23** නමුත් විශ්වාසය තැබීමට පද-
නම පැමිණෙන තුරු[13] නීතිය අපව
මුරකරුවෙකු සේ ආරක්ෂා කළා[14]
කියා පැවසිය හැක. එහෙයින් එළිදරව්
වීමට නියමිත වූ ඒ පදනම පැමි-
ණෙන තෙක් අපි බලා සිටියෙමු.[15]
**24** ඒ අනුව නීතිය අපව ක්‍රිස්තුස්
ළඟට ගෙන යන අපගේ උපදේශ-
කයා බවට පත් වී තිබේ.[16] ක්‍රිස්තුස්
කෙරෙහි විශ්වාසය තැබීම හේතුවෙන්
අපව ධර්මිෂ්ඨයන් ලෙස ප්‍රකාශ කිරී-
මට[17] මඟ උදා විය. **25** නමුත් විශ්-
වාසය තැබීමට අවශ්‍ය පදනම දැන්
තිබෙන නිසා[18] තවදුරටත් අපට උප-
දේශකයෙක් අවශ්‍ය වන්නේ නැත.[19]

**3 පරි.**
**1** ලෙවී 18:5; ද්වි 30:16; නෙහෙ 9:29; රෝම 10:5
**2** යෙසා 35:10; මතෙ 26:28; තීත 2:14; හෙබ්‍රෙ 9:15
**3** ගණන් 21:9; යොහ 3:14; යොහ 19:31; ක්‍රියා 5:30
**4** 1කොරි 7:23
**5** ද්වි 21:23
**6** රෝම 4:9; එෆී 2:15
**7** ක්‍රියා 19:4; 1යොහ 2:6
**8** යෝවෙ 2:28
**9** හෙබ්‍රෙ 9:17
**10** උත් 12:1; උත් 12:7; උත් 13:15; උත් 17:7
**11** උත් 24:7; යෙසා 6:13; ගලා 3:29
**12** උත් 25:5; රෝම 9:7; රෝම 9:8
**13** උත් 22:18
**14** උත් 49:10; මතෙ 1:17
**15** රෝම 4:13
**16** නික් 12:41
**17** රෝම 4:14
**18** රෝම 11:6

**2 තීරුව**
**1** උත් 22:17
**2** යොහ 1:29; රෝම 10:4
**3** රෝම 3:20; රෝම 4:15; රෝම 7:12; රෝම 7:14
**4** ක්‍රියා 7:38; ක්‍රියා 7:53; හෙබ්‍රෙ 2:2
**5** නික් 20:19; ද්වි 5:5; යොහ 1:17; හෙබ්‍රෙ 9:15
**6** ද්වි 6:4
**7** 1තිමෝ 1:8
**8** රෝම 8:3
**9** රෝම 3:10; ගලා 2:21
**10** මතෙ 11:13
**11** රෝම 3:9
**12** රෝම 4:11
**13** ගලා 4:4
**14** කොලො 2:14
**15** රෝම 10:4
**16** මතෙ 5:17; හෙබ්‍රෙ 8:5
**17** ක්‍රියා 13:39; රෝම 5:1; රෝම 8:33
**18** කොලො 2:17

**19** ක්‍රියා 21:21; හෙබ්‍රෙ 8:6; හෙබ්‍රෙ 10:1.

**26** ඇත්තෙන්ම ඔබ සියලුදෙනා
ක්‍රිස්තුස් යේසුස් කෙරෙහි විශ්වාසය
තබන නිසා දෙවිගේ පුත්‍රයෝ වන්න-
හුය.[1] **27** මන්ද ක්‍රිස්තුස් සමඟ
එකට බැඳී සිටින අය ලෙස බව්තීස්ම
වූ ඔබ සියලුදෙනා[2] ක්‍රිස්තුස්ව පැළඳ-
ගෙන සිටින්නහුය.*[3] **28** එමනිසා
කෙනෙක් යුදෙව්වෙක්ද ග්‍රීකයෙක්ද[4]
දාසයෙක්ද නිදහස් පුද්ගලයෙක්ද[5]
පුරුෂයෙක්ද ස්ත්‍රියක්ද[6] යන්න වැද-
ගත් වන්නේ නැත. මන්ද ඔබ සියලු-
දෙනාම ක්‍රිස්තුස් යේසුස් සමඟ එකට
බැඳී සිටින එක පුද්ගලයෙකු හා සමා-
නය.[7] **29** මීට අමතරව ඔබ ක්‍රිස්-
තුස්ට අයිති අය නම් ඔබ ඇත්තටම
ආබ්‍රහම්ගෙන් පැවතෙන අයයි.[8] ඔහුට
දුන් පොරොන්දුවට ඔබත් උරුමක්කා-
රුවෝය.[9]

**4** මෙයාකාරයට සිතන්න. එනම්
උරුමය ලබන තැනැත්තා
සියල්ල කෙරෙහි ස්වාමියා වුවත් බාල
වියේදී ඔහු දාසයෙකු හා සමානය.[10]
**2** මන්ද ඔහු තම පියා නියම කර ඇති
දවස දක්වා වැඩෙන තුරු වැඩ බලන
තැනැත්තන් හා නිවස භාර වී සිටින
අය යටතේ සිටියි.[11] **3** එලෙසම අපි
කුඩා දරුවන් හා සමානව සිටියදී මේ
ලෝකයට සම්බන්ධ බොළඳ දේව-
ලට[12] වහල් වී සිටියෙමු. **4** නමුත්
නියමිත කාලය පැමිණි විට[13] දෙවි
තම පුත්‍රයාව එව්වේය.[14] ස්ත්‍රියක-
ගෙන් උපන් ඔහු[15] නීතියට යටත්
වී සිටියේ,[16] **5** නීතිය යටතේ සිටින
අයව[17] මිල දී ගෙන ඔවුන්ව නිදහස්
කිරීම සඳහාය.[18] එමගින් අපව පුත්‍ර-
යන් ලෙස භාරගැනීමට පදනමක් සප-
යන ලදි.[19]

**6** එසේනම් ඔබ පුත්‍රයන් වන නිසා
දෙවි තම පුත්‍රයාට දී ඇති බලය[20]
ඔබේ* හදවත් තුළත් ක්‍රියාත්මක
වීමට සලස්වා ඇත. ඒ බලය ඔබ තුළ
ක්‍රියාත්මක වන නිසා ඔබට, “අබ්බා,
පියාණෙනි”[21] කියා දෙවිට හඬගැසීමට
හැකි වී තිබේ. **7** ඒ අනුව ඔබ තව-
දුරටත් දාසයන් නොව පුත්‍රයන්ය. ඔබ
පුත්‍රයන් නම් දෙවි ඔබව උරුමක්කරු-
වන්ද කර ඇත.[1]

**8** නමුත් ඔබ දෙවිව නොදැන සිටි
කාලයේදී[2] ඔබ සිටියේ සැබවින්ම දෙ-
විවරුන් නොවන අයට වහල්වය.[3]
**9** දැන් ඔබ දෙවිව හඳුනාගෙන ඇත.
ඇත්තටම කිව යුත්තේ දෙවි ඔබව
පිළිගෙන ඇති බවයි.[4] එසේනම් දුර්-
වල,[5] කිසි වටිනාකමක් නැති බො-
ළඳ දේවලට[6] ඔබ නැවත හැරෙන්නේ
මන්ද? නැවතත් ඒ දේවලට වහල් වී
සිටීමට ඔබ කැමති වන්නේ කුමන
පදනමක් මතද?[7] **10** මා එසේ පව-
සන්නේ ඔබ දවස්ද[8] මාසද[9] විශේෂ
කාලවල්ද අවුරුදුද මහත් ඕනෑකම-
කින් සමරන නිසාය. **11** සමහරවිට
මා ඔබ වෙනුවෙන් දැරූ වෙහෙසින්
කිසි ප්‍රයෝජනවත් දෙයක් ඉටු වී
නැද්ද කියා මම බිය වෙමි.[10]

**12** සහෝදරයෙනි, මා ඔබෙන්
ඉල්ලා සිටින්නේ මා මෙන් කට-
යුතු කරන්න කියාය.[11] මන්ද මමත්
කලක් ඔබ හා සමානව සිටියෙමි.[12]
මා ඔබට මේ දේවල් පවසන්නේ
ඔබ මට විරුද්ධව වරදක් කර ඇති
නිසා නොවේ.[13] **13** මා පළමු වරට
ඔබට ශුභාරංචිය ප්‍රකාශ කළ අවස්-
ථාව ඔබට මතක ඇති. ඒ මා
අසනීප වී සිටි අවස්ථාවකදීය.[14]
**14** එදා ඔබට යම් අසීරුතාවකට
පත් වෙන්න සිදු වුවත් මගේ අසනී-
පය නිසා ඔබ මාව පිළිකුල් කළේ
නැත. ඔබ පිළිකුලින් කෙළ ගැසුවේ-
වත් නැත. ඒ වෙනුවට ඔබ මාව පිළි-
ගත්තේ දෙවිගෙන් පැමිණි දූතයෙකු
පිළිගන්නා ආකාරයටය.[15] එනම් ක්‍රිස්-
තුස් යේසුස්ව පිළිගන්නා ආකාරය-
ටය.[16] **15** ඔබට එදා තිබුණු ඒ
සතුට අද කොහේද?[17] මන්ද
එදා ඔබ මා වෙනුවෙන් ඔබේ ඇස්
පවා උගුලා දීමට සූදානමින් සිටි
බව කිසි සැකයක් නැතුව පවසමි.[18]

3 පරි.
1 හොෂෙ 1:10 යොහ 1:12 රෝම 8:14
2 ක්‍රියා 19:5 රෝම 6:3
3 රෝම 13:14 එෆි 4:24
4 රෝම 10:12
5 1කොරි 12:13 කොලො 3:11
6 ක්‍රියා 2:17 1පේතෘ 3:7
7 යොහ 17:21
8 යෙසා 54:1 රෝම 8:17 රෝම 9:7
9 ගලා 4:28

4 පරි.
10 ලූක් 2:51
11 උත් 24:3
12 කොලො 2:8 හෙබ්‍රෙ 9:10
13 උත් 3:15 උත් 49:10
14 මතෙ 3:17 යොහ 8:42
15 යොහ 1:14 1තිමෝ 3:16 හෙබ්‍රෙ 2:14
16 මතෙ 5:17
17 මතෙ 20:28
18 1කොරි 7:23 ගලා 3:13
19 යොහ 1:12 රෝම 8:23 2කොරි 6:18
20 යොහ 14:26 රෝම 5:5
21 මාක් 14:36 රෝම 8:15

2 තීරුව
1 රෝම 8:17 ගලා 3:29 එෆි 1:14
2 එෆි 2:12 1තෙස 4:5
3 රෝම 1:25 1කොරි 12:2 1තෙස 1:9
4 1කොරි 8:3
5 රෝම 8:3 හෙබ්‍රෙ 7:18
6 කොලො 2:20
7 2කොරි 11:20
8 රෝම 14:5
9 කොලො 2:16
10 ගලා 2:2 ගලා 5:4 1තෙස 3:5
11 ගලා 6:14
12 ගලා 1:14
13 2කොරි 2:5
14 ක්‍රියා 16:6
15 2සාමු 19:27
16 මතෙ 10:40 යොහ 13:20

ගලා **3:27*** එනම්, ක්‍රිස්තුස්ට සමාන වී ඇත. **4:6*** මූ.අ., “අපගේ.”

**17** එළි 2:4; **18** ගලා 6:11.

**16** එසේනම් අද මා ඔබේ සතුරෙකු
බවට පත් වී සිටින්නේ[1] මා ඔබ
සමඟ සත්‍යය කතා කරන නිසාද?[2]
**17** සමහරුන් මහත් උද්‍යෝගයකින්
උත්සාහ කරන්නේ ඔබව ඔවුන්ගේ
පැත්තට නම්මාගැනීමටයි.[3] ඔවුන්
එසේ කරන්නේ හොඳ චේතනාව-
කින් නොවේ. ඔවුන් උත්සාහ කරන්-
නේ ඔබව මගෙන් ඈත් කිරීමටය.[4]
**18** යම් කෙනෙක් ඔබේ යහපත වෙ-
නුවෙන් උනන්දු වෙනවා නම් එය
හොඳ දෙයකි.[5] එවැනි දෙයක් මා
ඔබ සමඟ සිටින විටදී පමණක්
නොව සෑම අවස්ථාවකම සිදු වෙ-
නවා නම්,[6] **19** මගේ ආදරණීය දරු-
වෙනි,[7] එය යහපත් දෙයකි. නමුත් මා
සිටින්නේ මහත් වේදනාවකිනි. ඔබ
ගැන මට දැනෙන වේදනාව මවකට
දැනෙන ප්‍රසව වේදනාව හා සමානය.
එය ඔබ ක්‍රිස්තුස් සිතන ආකාරයට
සිතන්න පුරුදු වන තුරුම තිබෙනු
ඇත.[8] **20** මේ අවස්ථාවේදී මට ඔබ
සමඟ සිටීමට හැකියාව තිබුණා නම්
මා කොතරම් සතුටු වෙනවාද![9] මන්ද
ඔබට සිදු වී තිබෙන දේ ගැන මට නිසි
අවබෝධයක් නැත.[10] නමුත් මා ඔබ
සමඟ සිටියා නම් මට ඔබ සමඟ
වඩාත් කාරුණික ලෙස කතා කිරීමට
හැකි වනු ඇත.

**21** නීතිය යටතේ සිටීමට මහත්
කැමැත්තක් දක්වන[11] අයගෙන්
යමක් ඇසීමට මා කැමතිය.
එනම් නීතියෙහි සඳහන් වී ඇති
දේ ඔබ ඇත්තටම දන්නවාද[12] යන්-
නයි. **22** උදාහරණයක් ලෙස ආබ්‍ර-
හම්ට පුත්‍රයන් දෙදෙනෙකු සිටි බව
එහි ලියා ඇත. එක් කෙනෙකු සේවි-
කාවකගෙන්[13] සහ අනික් කෙනා නිද-
හස් ස්ත්‍රියකගෙන්[14] ඔහුට ලැබිණ.
**23** සේවිකාව බිහි කළ දරුවා ඉපදු-
ණේ සාමාන්‍ය ආකාරයටය.[15] නමුත්
නිදහස් ස්ත්‍රිය බිහි කළ දරුවා උපන්-
නේ දුන් පොරොන්දුවක් නිසාය.[16]
**24** එම සිදුවීම්වලට සංකේතවත් අර්-
ථයක් තිබේ.[17] මන්ද එම ස්ත්‍රීන්
දෙදෙනාගෙන් ගිවිසුම් දෙකක් නියෝ-
ජනය වේ.[1] හාගර්ගෙන් නියෝජනය
වන්නේ සීනයි කන්දේදී කළ ගිවිසු-
මයි.[2] එම ගිවිසුම යටතේ බිහි වන
දරුවෝ දාසයෝ බවට පත් වෙති.
**25** එසේම හාගර්ගෙන් නියෝජනය
වන කන්ද අරාබියේ පිහිටි සීනයි
කන්දයි.[3] ඇය දැන් තිබෙන යෙ-
රුසලමට සමානය. මන්ද ඇයද ඇගේ
දරුවෝද දාසයෝය.[4] **26** නමුත්
නිදහස් ස්ත්‍රියගෙන් නියෝජනය වන්-
නේ ඉහළ තිබෙන යෙරුසලමය.[5]
ඇය නිදහස්ව සිටින අතර ඇය අපගේ
මවය.[6]

**27** මන්ද ලියවිලිවල මෙසේ සඳ-
හන් වේ. “දරුවන් බිහි නොකළ
වඳ ස්ත්‍රිය, ප්‍රීති වන්න. ප්‍රසව වේ-
දනා නොවිඳින ස්ත්‍රිය, නිහඬතාව
බිඳ හඬ නඟන්න. මන්ද ස්වාමිපුරු-
ෂයා ඇති තැනැත්තියගේ දරුවන්ට
වඩා අත්හරිනු ලැබූ ඒ ස්ත්‍රියට බො-
හෝ දරුවෝ සිටිති.”[7] **28** ඒ අනුව
සහෝදරයෙනි, ඊසාක් හා සමා-
නව අපිද දෙවිගේ පොරොන්දුවේ
ප්‍රතිඵලයක් ලෙස දරුවෝ බවට
පත් වුණෙමු.[8] **29** අතීතයේ දෙවි-
ගේ බලයේ උපකාරයෙන් උපන් දරු-
වාට සාමාන්‍ය ආකාරයට උපන්
දරුවා පීඩා කරන්න පටන්ගත්තා
සේම[9] දැනුත් සිදු වේ.[10] **30** නමුත්
ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් වන්නේ
කුමක්ද? “මේ සේවිකාවයි ඇගේ පුතා-
වයි මෙතැනින් එළවා දමන්න. මන්ද
සේවිකාවකගේ පුතෙක් නිදහස් ස්ත්‍රි-
යකගේ පුතා සමඟ එකට උරුමය
බෙදාගන්නේ නැත.”[11] **31** එහෙයින්
සහෝදරයෙනි, අප දාසියකගේ දරු-
වන් නොව[12] නිදහස් ස්ත්‍රියකගේ දරු-
වන් වන බව[13] මතක තබාගන්න.

**5** ක්‍රිස්තුස් අපව නිදහස් කළේ
එවැනි නිදහසක් ලබා දීමටය.[14]
එහෙයින් ස්ථිරව සිට[15] නැවතත් දාස-
යන් වී වියගහක් යටතට නො-
යන්න.[16]

**2** ඇත්තෙන්ම පාවුල් වන මා
ඔබට කියන්නේ ඔබ චර්මච්ඡේදනය

**4 පරි.**
1 හිතෝ 27:6, යෙසා 63:10, හෙබ්‍රෙ 12:6
2 යොහ 8:45, එෆී 4:15
3 රෝම 16:18, 2පේතෘ 2:3, 2පේතෘ 2:18
4 ක්‍රියා 20:30, පිලි 2:21
5 1කොරි 15:58, තීත 2:14
6 පිලි 2:12
7 1කොරි 4:15, 1තෙස 2:11, පිලෙ 10
8 හෙබ්‍රෙ 6:1
9 2යොහ 12
10 2කොරි 4:8, ගලා 6:2
11 රෝම 7:6, ගලා 5:1
12 ගලා 3:24
13 උත් 16:15
14 උත් 16:1, උත් 21:3
15 උත් 16:2, රෝම 9:8
16 උත් 17:16
17 1කොරි 10:11

**2 තීරුව**
1 හෙබ්‍රෙ 8:7
2 නික් 19:23
3 නික් 19:18, හෙබ්‍රෙ 12:18
4 යෙසා 61:1, යොහ 8:35
5 යෙසා 54:5, ගලා 4:31
6 උත් 3:15, යෙසා 54:13, පිලි 3:20, එළි 12:1
7 යෙසා 54:1
8 රෝම 9:8, ගලා 3:29
9 උත් 21:9, 2තිමෝ 3:12
10 ගලා 5:11, ගලා 6:12
11 උත් 21:10
12 රෝම 6:14
13 යොහ 8:36, ගලා 5:13

**5 පරි.**
14 යොහ 8:32, රෝම 6:18
15 1කොරි 16:13, පිලි 4:1
16 ක්‍රියා 15:10

වුවහොත්[1] ක්‍රිස්තුස් ඔබ වෙනුවෙන්
කර ඇති සෑම දෙයකින්ම ඔබට කිසි
ප්‍රයෝජනයක් නොලැබෙන බවය.
**3** මීට අමතරව මා එකහෙළාම පව-
සන්නේ කෙනෙක් චර්මච්ඡේදනය
වුවහොත් නීතියේ තිබෙන සෑම දෙ-
යක්ම ඉටු කිරීමට ඔහු බැඳී සිටින
බවය.[2] **4** යම් කෙනෙක් නීතිය පිළි-
පැදීමෙන් ධර්මිෂ්ඨ කෙනෙකු ලෙස
ප්‍රකාශ වීමට උත්සාහ කළොත්[3]
ඔහු ක්‍රිස්තුස්ගෙන් ඈත් වෙයි. එවැනි
කෙනෙක් ක්‍රිස්තුස්ගේ මහත් කරු-
ණාවෙන්ද ඉවත් වී යයි.[4] **5** අපත්
මහත් උනන්දුවකින් බලා සිටින්නේ
දෙවි ඉදිරියේ ධර්මිෂ්ඨ වීමටයි. ඒ
සඳහා අප තුළ දෙවිගේ බලය ක්‍රියාත්-
මක විය යුතු අතර අපට විශ්වාසයද
තිබිය යුතුයි.[5] **6** ක්‍රිස්තුස් යේසුස්
සමඟ එකට බැඳී සිටින අයට චර්-
මච්ඡේදනය වීම හෝ චර්මච්ඡේදනය
නොවීම වැදගත් වන්නේ නැත.[6] වැද-
ගත් වන්නේ ප්‍රේමයෙන් පෙලඹී[7] විශ්-
වාසයක් ඇතුව සිටීමය.[8]
**7** ඔබ සත්‍ය මාර්ගයෙහි ගමන්
කළ* ආකාරය පැසසිය යුතුයි.[9]
සත්‍යයට කීකරු වී සිටීමට ඔබට
බාධාවක් වුණේ කවුද?[10] **8** මෙලෙස
ක්‍රියා කිරීමට ඔබව පෙලඹවූයේ කවුද?
ඔබව කැඳවූ තැනැත්තාණන් එවැනි
පෙලඹීමක් ඔබ තුළ ඇති කළේ
නැත.[11] **9** මුහුන් ටිකකින් මුළු පිටි
පිඩම පිපෙයි.[12] **10** කෙසේවෙතත්
ඔබ අතරේ ස්වාමීන් සමඟ එකට
බැඳී සිටින අය[13] වෙනස් ආකාර-
යකින් නොසිතන බව මට විශ්වා-
සයි.[14] නමුත් ඔබ අතරේ ප්‍රශ්න ගැටලු
ඇති කරන තැනැත්තා[15] කවරෙකු
වුවත් ඔහුට අනිවාර්යයෙන්ම විනිශ්ච-
යක් ලැබේ.[16] **11** සහෝදරයෙනි, මා
තවමත් චර්මච්ඡේදනය ගැන දේශනා
කරනවා නම් මට පීඩා විඳින්න සිදු වී
තිබෙන්නේ මන්ද? ඇත්තෙන්ම මා
තවමත් චර්මච්ඡේදනය ගැන දේශනා
කරමින් සිටිනවා නම් මා ක්‍රිස්තුස්ගේ
වධකණුව[1] ගැන කතා කිරීම සම්-
බන්ධයෙන් කෙනෙක් කෝප වීමට*[2]
අවශ්‍ය වන්නේ නැත.[3] **12** ඔබව
වියවුල් කිරීමට උත්සාහ කරන අය[4]
චර්මච්ඡේදනය වීමේ නාමයෙන් තම
අවයවයන් කපා ඉවත් කර දැමුවොත්
වඩාත් හොඳයි කියා සිතමි.[5]
**13** සහෝදරයෙනි, ඔබව කැඳවනු
ලැබුවේ නිදහස් අය ලෙස සිටීම-
ටය.[6] නමුත් ඒ නිදහස ඔබේම ආශා-
වන් පිනවීමට භාවිත නොකරන්න.[7]
ඒ වෙනුවට ප්‍රේමයෙන් එකිනෙකා වෙ-
නුවෙන් වෙහෙස මහන්සි වී සේවය
කරන්න.[8] **14** මන්ද නීතියේ සඳ-
හන් සියල්ල, "ඔබට මෙන් ඔබේ
අසල්වැසියාට ප්‍රේම කරන්න"[9] යන
වචන ස්වල්පය පිළිපැදීමෙන් ඉටු කළ
හැකිය.[10] **15** නමුත් ඔබ එකිනෙ-
කාව රිදවමින් එකිනෙකාට නින්දා
කරනවා නම්[11] එකිනෙකාව නැති
කර දැමීමේ අවදානමක ඔබ සිටින
නිසා පරෙස්සම් වන්න.[12]
**16** මා ඔබට පවසන්නේ දිගටම
දෙවි තම බලයෙන් ලබා දෙන මහ
පෙන්වීම්වලට අනුව ජීවත් වන්න[13]
කියාය. ඔබ එසේ කළොත් ඔබේම
පව්කාර ආශාවන්ට අනුව ක්‍රියා
කරන්න ඔබ පෙලඹෙන්නේ නැත.[14]
**17** මන්ද පව්කාර ආශාවන් දෙවිගේ
බලයට විරුද්ධව ක්‍රියා කරන ආකාර-
යටම[15] දෙවිගේ බලයද පව්කාර ආශා-
වන්ට විරුද්ධව ක්‍රියා කරයි. ඒවා
නිතරම එකිනෙකට විරුද්ධව ක්‍රියා
කරන නිසා ඔබ කිරීමට කැමති
වන දේ කිරීමට ඔබට හැකි වන්-
නේ නැත.[16] **18** නමුත් ඔබ දෙවිගේ
බලයට යටත් වෙනවා[17] නම් නීතිය
යටතේ සිටීමට ඔබට අවශ්‍ය වන්නේ
නැත.[18]
**19** කෙනෙක් තම පව්කාර ආශා-
වන්වලට අනුව ක්‍රියා කරන
විට ඔහු හැසිරෙන ආකාරය පැහැ-

ගලා **5:7*** මූ.අ., "දුවමින් සිටි."

**17** රෝම 8:14; **18** රෝම 6:14; රෝම 8:2.

ගලා **5:11*** මූ.අ., "පය පැකිළී වැටීමට."

**5 පරි.**
**1** ක්‍රියා 15:1, ගලා 6:12
**2** රෝම 2:25, ගලා 3:10
**3** රෝම 3:20, රෝම 4:4, රෝම 9:31
**4** රෝම 11:6, හෙබ්‍රෙ 12:15
**5** රෝම 8:23
**6** 1කොරි 7:19, ගලා 2:3, ගලා 6:15, කොලො 3:11
**7** 1තෙස 1:3, 1තිමෝ 1:5
**8** රෝම 3:22, යාකො 2:18
**9** 1කොරි 9:24, ගලා 3:3
**10** රෝම 2:8, රෝම 6:17, 2කොරි 10:5
**11** ගලා 1:6
**12** ද්වි 17:7, 1කොරි 5:6, 1කොරි 15:33, 2තිමෝ 2:17, 2පේතෘ 2:2
**13** යොහ 17:21, ගලා 3:28
**14** 2කොරි 2:3
**15** ගලා 1:7
**16** 2කොරි 11:15

**2 තීරුව**
**1** පිලි 3:18
**2** 1කොරි 1:23
**3** යොහ 15:19
**4** ක්‍රියා 15:1
**5** ද්වි 23:1
**6** යොහ 8:36, රෝම 6:22
**7** 1කොරි 8:9, 1පේතෘ 2:16, 2පේතෘ 2:19
**8** 1කොරි 9:19
**9** ලෙවී 19:18, මතෙ 7:12, මතෙ 22:39, යාකො 2:8
**10** රෝම 13:8
**11** යාකො 3:14
**12** හිතෝ 24:29, යාකො 4:2
**13** රෝම 8:5, රෝම 8:13
**14** රෝම 6:12, 1පේතෘ 2:11
**15** රෝම 8:4
**16** රෝම 7:15, රෝම 7:19, රෝම 7:23

දිලිය.[1] වේශ්‍යාකම,*[2] අපවිත්‍රකම,#
නින්දිත හැසිරීම,△[3] **20** රූප වන්ද-
නාව, භූතවාදය,[4] සතුරුකම්, අඬද-
බර, ඊර්ෂ්‍යාව, හදිසි කෝපය, විවාද,
භේද, නිකායන්, **21** කුඩුකේඩුකම,
බේබදුකම,[5] සෝෂාකාරී උත්සවවලට
හවුල් වීම යනාදි දේවල් ඔහු තුළ දක්-
නට ලැබේ. මීට කලින් මා ඔබට අන-
තුරු ඇඟවූ ලෙසම මා දැනුත් ඔබට
අනතුරු අඟවන්නේ එවැනි දේවල්
කරන* අයට[6] දෙවිගේ රාජ්‍යය උරුම
නොවන බවය.[7]

**22** අනික් අතට කෙනෙකු තුළ
දෙවිගේ බලය ක්‍රියාත්මක වන විට[8]
ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, බොහෝ
ඉවසිලිවන්තකම, කරුණාවන්තකම,
යහපත්කම,[9] විශ්වාසය, **23** මෘදු-
කම, තමාව පාලනය කරගැනීම[10]
යන ගුණාංග* සියල්ල ඔහු තුළ දැක-
ගත හැකියි. එවැනි දේවල් වැර-
දියි කියා කිසි නීතියක සඳහන් වී
නැත.[11] **24** මීට අමතරව ක්‍රිස්තුස්
යේසුස්ට අයිති අය තම වැරදි ආශා-
වන්, තමන් තුළ ඇති වන තණ්හාව
මෙන්ම තෘෂ්ණාව සහමුලින්ම නැති
කර දමා ඇත.*[12]

**25** දෙවි තම බලයෙන් ලබා දෙන
මඟ පෙන්වීම්වලට අනුව අප ජීවත්
වෙනවා නම් දිගටම එසේ කිරීමට
උත්සාහ කරමු.[13] **26** අපි අහංකාර-
කමින් ක්‍රියා නොකරමු. එකිනෙකා
අතරේ තරඟකාරිත්වයක් ඇති කර-
මින්[14] එකිනෙකාට ඊර්ෂ්‍යා නො-
කරමු.[15]

**6** සහෝදරයෙනි, ඇතැම්විට යම්
කෙනෙක් නොදැනුවත්ව යම්
වැරදි පියවරක්[16] ගත හැකිය.
එවැනි අවස්ථාවලදී ශුද්ධ ලියවිල්-
ලට අනුව[17] සුදුසුකම් ලබා ඇති ඔබ
මෘදුකමින්[1] එවැනි කෙනෙකුව නිවැ-
රදි මාර්ගයට ගෙන ඒමට උත්සාහ
කරන්න. එසේ කරද්දී ඔබත් වරද-
කට පෙලඹිය හැකි නිසා[2] ඔබ ගැනත්
සෝදිසියෙන් සිටින්න.[3] **2** එකිනෙ-
කාට තනිව දරාගත නොහැකි දේවල්[4]
ඉසිලීමට දිගටම එකිනෙකාට උදව්
කරන්න. එසේ කිරීමෙන් ක්‍රිස්තුස්-
ගේ නීතිය ඉටු කරන්න.[5] **3** කෙ-
නෙක් තමා ඉතා වැදගත් කෙනෙක්
කියා සිතනවා නම් ඔහු රවටා-
ගන්නේ තමාවමය. මන්ද ඔහු තුළ
කිසිවක් නැත.[6] **4** සෑම කෙනෙක්ම
තමා කරන දේවල් ගැන සෝදිසියෙන්
සිටිය යුතුයි.[7] එවිට තමා කළ දේ
ගැන සතුටු වීමට ඔහුට පුළුවන. මෙ-
හිදී අන් අය සමඟ සැසඳීම් කිරීම
අවශ්‍ය වන්නේ නැත.[8] **5** මන්ද සෑම
කෙනෙක්ම තමාට පැවරී ඇති වග-
කීම ඉටු කළ යුතුයි.[9]

**6** දේවවචනයේ ඉගැන්වීම්වලට
සවන් දී ඒවා ඉගෙනගන්නා[10]
තැනැත්තා තමාට ඒ දේවල් උගන්-
වන තැනැත්තා සමඟ සියලුම යහ-
පත් දේවල්[11] බෙදා හදා ගත යුතුයි.[12]

**7** මුළා නොවන්න.[13] දෙවිව රැව-
ටීමට කිසි කෙනෙකුට නුපුළු-
වන.[14] මන්ද කෙනෙක් නෙළාගන්නේ
තමා වපුරන දෙයමයි.[15] **8** ඒ අනුව
තම ආශාවන් තෘප්තිමත් කරගැ-
නීමේ අදහසින් වපුරන තැනැත්තා
නෙළාගන්නේ විනාශය හා මර-
ණය පමණි.[16] නමුත් තම ජීවිතය
තුළ දෙවිගේ බලය ක්‍රියාත්මක වීමට
ඉඩ දීමෙන් වපුරන තැනැත්තා[17]
දෙවිගෙන් සදාකාල ජීවනය නෙළා-
ගනියි.[18] **9** එහෙයින් අපගේ උත්සා-
හය අත් නොහැර දිගටම යහපත්
දේ කරමු.[19] මන්ද අප විඩාවට පත්
වී හෙම්බත් වන්නේ නැත්නම් නිය-
මිත කාලයේදී ප්‍රතිඵල නෙළාගන්න
අපට හැකි වේ.[20] **10** එසේනම් අපට

**5 පරි.**
1 හිතෝ 20:11 1කොරි 3:3
2 1කොරි 5:9 එෆී 5:3 කොලො 3:5 එළි 2:20
3 ලෙවී 18:17 මාක් 7:22 එෆී 4:19 2පේතෘ 2:2 යූද් 4
4 ලෙවී 19:26 ලෙවී 19:31 ද්වි 18:11
5 ද්වි 21:20 යෙසා 5:11 1පේතෘ 4:3
6 රෝම 8:13 2කොරි 12:21
7 1කොරි 6:9
8 පිලි 1:11 කොලො 1:10
9 එෆී 5:9
10 යාකො 3:17
11 1තිමෝ 1:9
12 රෝම 6:6 1පේතෘ 2:11
13 රෝම 8:4
14 දේශ 4:4 1කොරි 4:7 ගලා 6:4
15 පිලි 2:3

**6 පරි.**
16 ලෙවී 4:2 මතෙ 18:15 රෝම 11:11
17 1කොරි 2:15

**2 තීරුව**
1 හිතෝ 15:1 1කොරි 4:21 කොලො 3:12 1තිමෝ 6:11 තීත 3:2
2 1කොරි 7:5 යාකො 3:2
3 1කොරි 10:12
4 රෝම 15:1 2කොරි 11:29 1තෙස 5:14
5 යොහ 13:34 යොහ 15:12 1යොහ 4:21
6 රෝම 12:3 1කොරි 8:2 2කොරි 3:5 2කොරි 12:11
7 1කොරි 11:28 2කොරි 13:5
8 ගලා 5:26
9 රෝම 14:4 2කොරි 5:10
10 ලූක් 1:4 ක්‍රියා 18:25
11 ගණන් 18:31 මතෙ 10:10 1කොරි 9:14

---

**ගලා 5:19*** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න. **19#** හෝ, "පිළිකුල්සහගත, පහත්, නොහොබිනා ක්‍රියා." **19△** හෝ, "කිසිම තැකීමක් හෝ පාලනයක් නොමැතිව හැසිරීම." **21*** එනම්, එවැනි දේවල් කිරීමට පුරුදු වී සිටින. **23*** මූ.අ., "පල." **24*** මූ.අ., "වධකණුවක ඇණ ගසා ඇත."

**12** ලෙවී 8:31; ලූක් 10:7; රෝම 15:27; 1කොරි 9:11; හෙබ්‍රෙ 13:16; **13** යාකො 1:16; **14** යෝබ් 13:9; **15** ලූක් 16:25; රෝම 2:6; **16** රෝම 8:6; **17** යොහ 6:63; රෝම 8:13; **18** යෙසා 3:10; **19** 2තෙස 3:13; **20** හෙබ්‍රෙ 3:14; හෙබ්‍රෙ 12:3; එළි 2:10.

ප්‍රස්තාව ලැබෙන සෑම අවස්ථාවක-
දීම[1] සියලුදෙනාටම, විශේෂයෙන්ම
අප හා සමාන විශ්වාසයක් ඇති අප-
ගේ සහෝදර සහෝදරියන්ට යහපත්
දේවල් කරමු.[2]
**11** මා ඔබට ලියා එවන මේ ලිපි-
යේ ඇති අත්අකුරු කොතරම් විශාලද
කියා බලන්න.[3]
**12** ඔබට චර්මච්ඡේදනය වීමට බල
කරන්නේ[4] මිනිසුන් බලන ආකාර-
යට අනුව බලන, අන් අයගේ අනුමැ-
තිය දිනාගැනීමට උත්සාහ කරන අය
බව පැහැදිලියි. ඔවුන් එසේ කරන්-
නේ ක්‍රිස්තුස් වන යේසුස්ගේ වධකණුව
ගැන දේශනා කිරීම නිසා ඇති වන
පීඩා මඟහැරීමට ඔවුන් කැමැත්තක්
දක්වන නිසාය.[5] **13** චර්මච්ඡේදනය
වන අය පවා නීතිය පිළිපදින්නේ
නැත.[6] නමුත් ඔබ චර්මච්ඡේදනය
වෙනවාට ඔවුන් කැමති වන්නේ ඉන්
ඔබේ පිටාතරය ගැන පුරසාරම් දෙ-
ඩීමට ඔවුන්ට හැකි වන නිසාය.
**14** අපගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්-
තුස්ගේ වධකණුව ගැන දේශනා කිරීම

**6 පරි.**
1 යොහ 9:4; කොලො 4:5
2 එෆී 2:19
3 1කොරි 16:21
4 ගලා 2:3
5 ගලා 5:11; පිලි 3:18
6 යාකො 2:10

**2 තීරුව**
1 ලූක් 14:27; 1කොරි 2:2
2 රෝම 6:6
3 ගලා 5:6
4 2කොරි 5:17; එෆී 2:10
5 ගීතා 125:5; ගීතා 128:6; රෝම 9:6
6 2කොරි 4:10; පිලි 3:10
7 යෙසා 3:24
8 2තිමෝ 4:22; පිලෙ 25

මිස[1] වෙන කිසි දෙයක් ගැන ආඩම්-
බරයෙන් කතා කරන්න මට කිසි
අවශ්‍යතාවක් නැත. මා මිනිස් වර්ග-
යාව දකින්නේ වධකණුවක ඇණ ගසා
ඇති අය ලෙසයි.[2] ඔවුන් මාව දකින්-
නෙත් වධකණුවක ඇණ ගසා ඇති
කෙනෙකු ලෙසයි. **15** මන්ද වැදගත්
වන්නේ කෙනෙකු චර්මච්ඡේදනය වී
සිටිනවාද නැද්ද යන්න නොව[3] දෙවි
යමෙකුව අලුතින් ජනිත කළාද නැද්ද
යන්නයි.[4] **16** එම ප්‍රමිතියට අනුව
ජීවත් වන සියලුදෙනාට එනම්, දෙවි-
ගේ ඊශ්‍රායෙලයට සමාදානයත් දයා-
වත් ලැබේවා![5]
**17** මෙතැන් පටන් කවරෙකු හෝ
මේ කාරණා සම්බන්ධයෙන් මට ප්‍රශ්න
ඇති නොකරන්න කියා ඉල්ලා සිටිමි.
මන්ද මා යේසුස්ගේ දාසයෙකු බවට[6]
සාක්ෂි සපයන ලකුණු මගේ ශරීරයේ
දක්නට ලැබේ.[7]
**18** සහෝදරයෙනි, යහපත් ආකල්-
පයක්[8] ඇතුව සිටින ඔබට අපගේ ස්වා-
මීන් වන යේසුස් ක්‍රිස්තුස්ගේ මහත්
කරුණාව ලැබේවා! ආමෙන්.

# එෆීසවරුන්ට
## ලියූ ලිපිය

**1** මෙම ලිපිය ඔබට ලියන්නේ දෙ-
විගේ කැමැත්තට එකඟව[1] යේ-
සුස් ක්‍රිස්තුස්ගේ නියෝජිතයෙකු*[2]
ලෙස සේවය කරන පාවුල් වන මමය.
මෙය ලියන්නේ එෆීසයේ සිටින ශුද්ධ
තැනැත්තන්ටය. එනම් ක්‍රිස්තුස් යේ-
සුස් සමඟ එකට බැඳී සිටිමින්[3] දෙවිට
විශ්වාසවන්තව සිටින අයටය.[4]
**2** අපගේ පියාණන් වන දෙවිගෙන්
සහ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්-
ගෙන් ඔබට මහත් කරුණාවත්[5] සමා-
දානයත්[6] ලැබේවා!
**3** අපගේ ස්වාමීන් වන යේසුස්

එෆී **1:1*** හෝ, “යවනු ලැබූවෙකු.”

**1 පරි.**
1 2කොරි 1:1
2 1කොරි 1:1
3 යොහ 15:4; යොහ 15:5
4 එළි 2:3
5 යොහ 1:17; රෝම 3:24; 1කොරි 1:4
6 යොහ 14:27

**2 තීරුව**
1 2කොරි 1:3
2 එෆී 2:6
3 ගලා 3:14
4 1පේතෘ 1:20
5 යෙසා 43:10; යොහ 17:24; යූද් 1
6 යාකො 2:5

ක්‍රිස්තුස්ගේ[1] පියාණන් වන දෙවිට
ප්‍රශංසා වේවා! මන්ද ක්‍රිස්තුස් සමඟ
එකට බැඳී සිටිමින් ස්වර්ගික වාසස්-
ථානවල සිටින අපට[2] ඔහු තම බලය
ලබා දී බොහෝ සෙයින් ආශීර්වාද
කර ඇත.[3] **4** පොළොවේ දරුවන්
බිහි වීමට කලින්ම*[4] දෙවි අපව ක්‍රිස්-
තුස් සමඟ එකට බැඳී සිටීමට තෝරා-
ගැනීමෙන්[5] එය පැහැදිලි වේ. එසේ
කළේ දෙවිට ප්‍රේමයක් ඇති අප,[6] ඔහු
ඉදිරියේ ශුද්ධව හා නිකැළැල්ව[7] සිටීම

7 එෆී 5:27; කොලො 1:22.

එෆී **1:4*** මතෙ 25:34හි පාදසටහන බලන්න.

සඳහාය. **5** යේසුස් ක්‍රිස්තුස් මාර්ග-
යෙන් තමාගේ පුත්‍රයන්[1] ලෙස අපව
පිළිගන්නා බව[2] දෙවි කලින්ම තීර-
ණය කළේය.[3] ඔහු ඒ දේ කළේ එය
තමාගේ කැමැත්තට එකඟ දෙයක්
මෙන්ම තමාට ප්‍රසන්න වූ දෙයක්
නිසාය.[4] **6** එමෙන්ම තම අතිමහත්
කරුණාව[5] සියලුදෙනාගේ ප්‍රශංසාවට
ලක් කිරීම සඳහාය.[6] එම මහත් කරු-
ණාව ඔහු තම ප්‍රේමණීය පුත්‍රයා[7]
මාර්ගයෙන් අපට මහත් ආදරයකින්
පෙන්වූවේය. **7** ඔහුගේ පුත්‍රයා තම
රුධිරය මාර්ගයෙන්[8] අප වෙනුවෙන්
වන්දියක් ගෙවා අපව නිදහස් කර
ඇත. දෙවි අප වෙනුවෙන් ත්‍යාගශී-
ලීව පෙන්වා ඇති ඒ මහත් කරුණාව
නිසා[9] අප කර ඇති වැරදිවලට සමාව
ලබාගැනීමට[10] අපට හැකි වේ.

**8** අපට ඒ මහත් කරුණාව ඉතා
ත්‍යාගශීලීව පෙන්වා ඇති දෙවි අපට
හොඳ ප්‍රඥාවක්ද[11] හොඳ සිහිබුද්ධි-
යක්ද ලබා දී ඇත. **9** එසේ කිරී-
මෙන් ඔහු පරිශුද්ධ රහසක්[12] වූ
තම කැමැත්ත ගැන අපව දැනුවත්
කළේය. ඒ පරිශුද්ධ රහස ඔහු කිරීමට
සතුටු වන දේ හා ඔහු අරමුණු කරන
දේට එකඟය.[13] **10** ඔහුගේ අරමුණ
ඉටු වීම සඳහා ඔහු නියමිත කාල
සීමාවක් පුරා දිව යන[14] යම් වැඩපිළි-
වෙළක්[15] ක්‍රියාත්මක කළේය. එම-
ගින් ස්වර්ගයෙහි[16] හා පොළොවෙහි[17]
තිබෙන සියල්ල නැවතත් ක්‍රිස්තුස්
යටතේ[18] එක්සත් කරනු ලැබේ.[19]
ඒ සියල්ල එක්සත් කරනු ලබන්-
නේ ක්‍රිස්තුස් යටතේය. **11** එලෙ-
සම ඔහු සමඟ එකට බැඳී සිටින අය
ලෙස අපට උරුමයක්ද[20] දෙවි ලබා
දී ඇත. මන්ද දෙවි අපව තෝරාගැ-
නීමට කලින්ම ඒ ගැන තීරණයක්
ගත් අතර ඔහු එසේ කළේ තමා-
ගේ අරමුණට එකඟවය. දෙවි ඒ සෑම
පියවරක්ම ගත්තේ තම කැමැත්තට
අනුවය.[21] **12** එසේ කළේ ක්‍රිස්තුස්
කෙරෙහි මුලින්ම බලාපොරොත්තු
තැබූ අප[22] දෙවිට ප්‍රශංසාවත් ගෞරව-
යත් ලබා දීම සඳහාය.[23] **13** දෙවි
ඔබව ගලවන ආකාරය පිළිබඳ ශුභා-
රංචිය[1] ඇතුළත් සත්‍ය ඉගැන්වීම්ව-
ලට[2] ඔබ සවන් දුන් පසු ඔබට
ක්‍රිස්තුස් ගැන බලාපොරොත්තුවක්
ඇති විය. එලෙසම ඔබට විශ්වාස-
යක් ඇති වූ පසු දෙවි පොරොන්දු
වූ ලෙස තම බලයෙන්[3] ඔබව මුද්‍රා
කළේය.[4] එසේ කළේ ක්‍රිස්තුස් මාර්ග-
යෙනි. **14** ඒ බලය අපට ඉදිරියේදී
උරුම වන දේට[5] සහතිකයකි.[6] දෙවි-
ගේ බලයෙන් ඔබව එලෙස මුද්‍රා කළේ
දෙවිගේ සෙනඟ[7] වෙනුවෙන් ගෙවා
ඇති වන්දිය[8] පදනම් කරගෙන ඔබට
නිදහස ලබා දීමටය. එයින් දෙවිට
සියලු ප්‍රශංසාව හා ගෞරවය හිමි වේ.

**15** ස්වාමීන් වන යේසුස් කෙරෙහි
ඔබට විශ්වාසයක් ඇති බවත් ඒ විශ්-
වාසය ඔබ සියලු ශුද්ධ තැනැත්තන්ට
සලකන ආකාරය මඟින් දැකිය හැකි
බවත් මට ආරංචි වී ඇති නිසා,[9]
**16** මම නිරතුරුවම ඔබ ගැන දෙවිට
ස්තුති කරමි. එලෙසම මම නිතරම
මගේ යාච්ඤාවලදී ඔබ ගැන සඳ-
හන් කරන්නෙමි.[10] **17** එසේ කරන්-
නේ ඔබට අපගේ ස්වාමීන් වන යේසුස්
ක්‍රිස්තුස්ගේ දෙවිගෙන් එනම්, තේ-
ජවත් පියාණන්ගෙන් බලය ලබාගැ-
නීම සඳහාය. ඔහු පිළිබඳ නිවැරදි
දැනුමක් ලබාගැනීම සඳහා[11] ඔහු
එළිදරව් කරන දේවල් අවබෝධ කර-
ගැනීමට එම බලය ඔබට උපකාර
කරනු ඇත. එමගින් ඔබ ප්‍රඥා-
වන්තයන් වනු ඇත.[12] **18** අන්ධ වූ
ඇස් පැහැදෙන ආකාරයටම[13] ඔබේ
සිත්වලට කාරණා හොඳින් අවබෝධ
කරගැනීමට[14] දෙවි ඔබට දැනටමත්
හැකියාව ලබා දී ඇත. එහෙයින්
කැඳවනු ලැබූ අය ලෙස ඔහු ඔබට
දී ඇති බලාපොරොත්තුව ගැනත්[15]
සියලුම ශුද්ධ තැනැත්තන්ට[16] උරුම-
යක් ලෙස ඔහු ලබා දෙන තේජවත්
සම්පත් ගැනත්[17] ඔබට පැහැදිලි අව-
බෝධයක් ලබා දෙන්න කියා යාච්ඤා
කරමි. **19** එසේම දෙවිව විශ්වාස
කරන අපට ඔහු තම අතිමහත්
බලය කොතරම් ශ්‍රේෂ්ඨ ආකාරයකින්

**1 පරි.**
1 රෝම 8:23
2 රෝම 8:15
රෝම 8:29
ගලා 4:5
3 2තෙස 2:13
1පේතෘ 1:2
4 රෝම 8:28
5 රෝම 3:24
6 යෙසා 43:21
7 යොහ 3:35
8 ක්‍රියා 20:28
රෝම 3:25
එළි 5:9
9 යොහ 1:16
10 ක්‍රියා 13:38
කොලො 1:14
කොලො 2:13
11 කොලො 1:9
12 රෝම 16:25
1කොරි 4:1
13 2තිමෝ 1:9
14 ලූක් 21:24
ක්‍රියා 1:7
15 යෙසා 32:1
එෆී 3:9
හෙබ්‍රෙ 3:6
එළි 20:6
16 1පේතෘ 1:4
17 යොහ 10:16
පිලි 2:10
18 1කොරි 15:28
කොලො 1:20
19 ගීතා 50:5
20 රෝම 8:17
එෆී 3:6
1පේතෘ 3:7
21 යෙසා 46:10
රෝම 8:28
22 යාකො 1:18
23 එෆී 3:21

**2 තීරුව**
1 1තිමෝ 2:4
2 කොලො 1:5
3 ගලා 3:2
4 2කොරි 1:22
එෆී 4:30
එළි 7:4
5 1පේතෘ 1:4
6 2කොරි 5:5
7 1පේතෘ 2:9
8 රෝම 8:23
කොලො 1:14
1තිමෝ 2:6
9 කොලො 1:4
10 රෝම 1:9
11 කොලො 1:9
1තිමෝ 2:4
12 හිතෝ 2:6
13 ලූක් 10:23
14 2කොරි 3:16
15 1පේතෘ 1:3
16 ද්වි 33:3
17 කොලො 1:27

විදහාපෙන්වා ඇද්ද[1] යන්න ගැන
ඔබට අවබෝධයක් ලබා දෙන්න
කියාත් ඉල්ලා යාච්ඤා කරමි. එම
බලය කොතරම් ශ්‍රේෂ්ඨද කියා එය
ක්‍රියාත්මක වී ඇති ආකාරයෙන්[2]
දැකිය හැක. **20** දෙවි ක්‍රිස්තුස්ව
මරණයෙන් නැඟිටුවා[3] ස්වර්ගීය ස්ථා-
නවල[4] තම දකුණු පැත්තෙහි[5] ඉඳගැ-
නීමට අවස්ථාව ලබා දුන්නේ එම
බලය මාර්ගයෙනි. **21** ඔහු සිටින ඒ
ස්ථානය ගෙවී යන මේ කාලයේදී
පමණක් නොව[6] ඉදිරියේදී[7] තිබෙන
සියලුම ආණ්ඩුවලටත් අධිකාරීන්-
ටත් බලධාරීන්ටත් පාලකයන්ටත්[8]
උසස් නාම දරන සියලුදෙනාටත්[9]
වඩා ඉහළින් පිහිටා ඇති ස්ථානයකි.
**22** එමෙන්ම දෙවි ඔහුගේ පාදවලට
සියල්ල යටත් කර[10] සභාවේ ප්‍රයෝ-
ජනය උදෙසා ඔහුව සියලු දේවල්
කෙරෙහි හිස ලෙස පත් කළේය.[11]
**23** සභාව ඔහුගේ ශරීරය වන අතර[12]
එය තුළ ඔහුගේ ගුණාංග පූර්ණ ලෙස
පිළිබිඹු වේ.[13] එලෙසම සෑම දෙයක්ම
සම්පූර්ණ වන්නේ ඔහු මාර්ගයෙනි.[14]

# 2

ඔබේ පව්කාර ස්වභාවය හා ඔබ
කළ වැරදි නිසා කලින් ඔබ
මැරී සිටියත්[15] ඔබව ජීවත් කළේ
දෙවිය. **2** කලක් ඔබ ඔබේ ජීවිතය
ගත කළේ මේ සමාජයේ සිටින අය
ජීවත් වන ආකාරයටය.[16] ඔබ හසු
වී සිටියේ මේ සමාජයේ සිටින මිනි-
සුන්ට බලපෑම් කරන තැනැත්තාගේ
බලපෑමටයි.[17] ඔහුගේ එම බලපෑම
අප හුස්ම ගන්නා වාතය මෙන් හාත්-
පස පැතිර පවතී. දෙවිට අකීකරු
සියලුදෙනා[18] එම බලපෑමට හසු වී
සිටිති.[19] **3** කලක් අපිද ඔවුන් සමඟ
අපගේ වැරදි ආශාවන් පිනවමින් කට-
යුතු කළෙමු.[20] අප කළ දේවලට
අපගේම ආශාවන් සහ සිතුවිලි බලපෑ-
වේය.[21] එහෙයින් අන් අය මෙන් අපිද
උපන් දා පටන් දෙවිගේ උදහස ලැබී-
මට සුදුසු අය වූයෙමු.[22] **4** නමුත්
දයාවෙන් පිරී දෙවි[23] අපට ඉම-
හත් ප්‍රේමයක් පෙන්වූ නිසා,[24] **5** අප
කළ වැරදි හේතුවෙන් අප මැරී සිටි-
යත්[1] ඔහු අපව ජීවත් කර ක්‍රිස්තුස්
සමඟ එකට බැඳී සිටින අය බවට
පත් කළේය. ඇත්තෙන්ම ඔබත්
ගැලවී ඇත්තේ දෙවිගේ මහත් කරු-
ණාව නිසාය.[2] **6** එහෙයින් ක්‍රිස්තුස්
යේසුස් සමඟ එකට බැඳී සිටින
අය ලෙස අප සියලුදෙනාවම ඉහළට
ඔසවා[3] ස්වර්ගීය ස්ථානවල[4] ක්‍රිස්-
තුස් සමඟ එකට සිටීමට දෙවි අපට
අවස්ථාව ලබා දුන්නේය. **7** ක්‍රිස්-
තුස් යේසුස් සමඟ එකට බැඳී සිටින
අපට[5] එලෙස දයාව පෙන්වීමෙන් තම
මහත් කරුණාව ඕනෑම ධන සම්භා-
රයකටත් වඩා කොතරම් ශ්‍රේෂ්ඨද[6]
කියා දෙවි පෙන්නුම් කළේය. ඒ බව
පැහැදිලි වන්නේ මතු කාලයේදීය.*[7]

**8** විශ්වාසයක් ඇතුව සිටින ඔබ,
ගැලවී ඇත්තේ එම මහත් කරුණාව
නිසාය.[8] නමුත් ඒ සියල්ල සිදු වන්නේ
ඔබේ උත්සාහය නිසා නොවේ.[9] එය
දෙවි ලබා දෙන දීමනාවකි.[10] **9** එම
ගැලවීම ඔබේ ක්‍රියාවන් හේතුවෙන්
ලැබෙන දෙයක් නොවන නිසා[11] කිසි
කෙනෙකුට ආඩම්බර වීමට කිසිම
පදනමක් නැත.[12] **10** මන්ද අපව
සෑදුවේ ඔහුය.[13] දෙවි අපව ක්‍රිස්තුස්
යේසුස් සමඟ එකට බැඳී සිටින අය
ලෙස[14] සෑදුවේ[15] යහපත් ක්‍රියා කිරී-
මට අපට හැකි වීම සඳහාය.[16] අප ඒ
දේවල් කළ යුතු බව දෙවි කල්තියාම
තීරණය කළේය.[17]

**11** එහෙයින් ඔබ උපතින් වෙනත්
ජාතීන්ට අයත්ව සිටි බව මතක
තබාගන්න.[18] මිනිසුන් විසින් “චර්-
මච්ඡේදනය” කරනු ලැබූ අය ඔබව
හැඳින්වූයේ “අචර්මච්ඡේදිත” අය ලෙ-
සය.[19] **12** ඒ කාලයේදී ඔබ ක්‍රිස්තුස්
ගැන දැන සිටියේ නැත.[20] එලෙ-
සම ඔබ ඊශ්‍රායෙල් ජාතියෙන් ඈත්ව[21]
සිටි විදේශිකයන් වූ නිසා පොරොන්දු-
වට සම්බන්ධ වූ ගිවිසුම්වලට ඔබ
කිසිම ආකාරයකින් සම්බන්ධ වී සිටි-

**1 පරි.**
**1** 2කොරි 13:4
**2** කොලො 1:29
**3** ක්‍රියා 2:24
**4** එෆී 2:6; හෙබ්‍රෙ 7:26
**5** ගීතා 110:1; ක්‍රියා 7:55
**6** 1කොරි 2:6
**7** හෙබ්‍රෙ 6:5
**8** 1කොරි 15:24; කොලො 2:10; හෙබ්‍රෙ 1:4
**9** ක්‍රියා 4:12; පිලි 2:9
**10** ගීතා 8:6
**11** මතෙ 28:18; එෆී 5:23; කොලො 1:18
**12** රෝම 12:5; එෆී 4:16
**13** රෝම 11:25
**14** කොලො 3:11

**2 පරි.**
**15** මතෙ 8:22; කොලො 2:13; 1තිමෝ 5:6; 1පේතෘ 4:6
**16** රෝම 12:2; එෆී 4:17
**17** යොහ 12:31
**18** මතෙ 13:38; කොලො 3:6; 1යොහ 2:16
**19** 1කොරි 2:12; යාකො 4:5
**20** 1කොරි 6:11
**21** මතෙ 26:41; 1පේතෘ 4:3
**22** යොහ 3:36
**23** ගීතා 145:9; යෙසා 54:10; රෝම 10:12
**24** රෝම 5:8; 1යොහ 4:9; 1යොහ 4:19

**2 තීරුව**
**1** කොලො 2:13
**2** යොහ 1:17
**3** කොලො 2:12
**4** එෆී 1:3; 1පේතෘ 1:4
**5** යොහ 17:21
**6** එෆී 1:7
**7** හෙබ්‍රෙ 6:5
**8** රෝම 4:16
**9** යොහ 6:44
**10** යොහ 1:12
**11** රෝම 3:20; යාකො 2:22
**12** 1කොරි 1:29
**13** 2කොරි 5:5
**14** එෆී 1:4
**15** ගලා 6:15
**16** කොලො 1:10
**17** එෆී 1:5
**18** 1කොරි 12:2

**19** යොෂු 5:3; **20** එෆී 4:18; **21** කොලො 1:21.

එෆී **2:7*** හෝ, “මතු පැමිණෙන ලෝක සමාජවලදීය.”

යේ නැත.[1] ඔබ මෙලොවෙහි ජීවත්
වෙමින් සිටියේ බලාපොරොත්තු-
වක් නැතුවය.[2] දෙවි ගැන දැනුමක්ද
නැතුවය.[3] **13** නමුත් ක්‍රිස්තුස් යේ-
සුස් සමඟ දැන් එකට බැඳී සිටින
ඔබ කලින් දෙවිගෙන් ඈත් වී සිටි-
යත් ක්‍රිස්තුස්ගේ රුධිරය[4] පදනම්
කරගෙන දැන් දෙවිට ළං වී සිටින්-
නහුය. **14** අපට සමාදානය ගෙන
දුන්නේ ක්‍රිස්තුස්ය.[5] කණ්ඩායම් දෙ-
කක් ලෙස වෙන්ව සිටි අයව[6] ඔහු
එක කණ්ඩායමක් බවට පත් කර[7]
ඇති අතර ඒ කණ්ඩායම් දෙක වෙන්
කර තැබූ[8] තාප්පයද[9] කඩා දැමු-
වේය. **15** ඒ කණ්ඩායම් දෙක අතර
සතුරුකමට හේතු වූ විවිධ අණප-
නත්වලින් යුත්[10] නීතිය[11] ඔහු තම
ශරීරය[12] පූජා කිරීම මගින් අහෝසි
කළේය. එසේ කිරීමෙන් ඔහු කණ්-
ඩායම් දෙක[13] තමා සමඟ එකට
බැඳී සිටින එක අලුත් ජාතියක්*[14]
ලෙස බිහි කර ඔවුන් අතරේ සමා-
දානය ඇති කළේය. **16** එමෙන්ම
ඔහු තම ජීවිතය වධකණුව[15] මත
පූජා කළ නිසා ඒ කණ්ඩායම් දෙක-
ටම දෙවි සමඟ සමාදාන වීමට[16] මඟ
පෑදුණේය. ප්‍රතිඵලයක් ලෙස කණ්ඩා-
යම් දෙක එක ජාතියක්*[17] බවට පත්
විය. මන්ද තම මරණයෙන් ඔහු ඔවුන්
අතර සතුරුකමක් ඇති කළ දෙය
නැති කළේය.[18] **17** ඔහු පැමිණ ළඟ
සිටින අයට මෙන්ම දුර සිටින ඔබ-
ටත්[19] සමාදානය පිළිබඳ ශුභාරං-
චිය ප්‍රකාශ කළේය.[20] **18** මන්ද ඔහු
මාර්ගයෙන් අපට එනම්, කණ්ඩායම්
දෙකටම[21] පියාණන් වෙතට ළං වීමේ
ප්‍රස්තාව ලැබේ.[22] ඒ දේ සිදු වන්නේ
දෙවිගේ බලය මාර්ගයෙනි.[23]

**19** එහෙයින් දැන් ඔබ අමුත්තන්[24]
හෝ විදේශිකයන්[25] හෝ නොවේ. ඒ
වෙනුවට ඔබ ශුද්ධ තැනැත්තන්[26]
සමඟ එක හා සමාන අයිතිවාසි-
කම් භුක්ති විඳින පුරවැසියෝය.[27]

එෆී **2:15*** මූ.අ., "මිනිසෙක්." **16*** මූ.අ., "ශරීර-යක්."

**2 පරි.**
1 රෝම 9:4
2 1තෙස 4:13
3 යෙසා 65:1
4 හෙබ්‍රෙ 10:19
5 කොලො 1:20
6 ලෙවී 20:26
7 ක්‍රියා 10:35
රෝම 11:24
කොලො 3:11
8 එෆී 2:12
9 කොලො 2:14
10 ද්වි 4:8
11 මාක් 7:28
12 රෝම 8:3
13 රෝම 2:10
14 1කොරි 12:12
15 හෙබ්‍රෙ 12:2
16 කොලො 1:22
17 ගලා 3:28
එෆී 4:4
18 ක්‍රියා 10:28
19 යෙසා 57:19
20 යෙසා 52:7
21 රෝම 10:12
22 හෙබ්‍රෙ 7:25
23 1කොරි 12:13
24 එෆී 2:12
25 හෙබ්‍රෙ 11:13
26 කොලො 1:12
27 පිලි 3:20

**2 තීරුව**
1 යෙසා 56:5
1තිමෝ 3:15
හෙබ්‍රෙ 3:6
2 එළි 21:14
3 1කොරි 12:28
4 1කොරි 3:10
5 යෙසා 28:16
6 කොලො 2:19
7 සෙක 6:12
1කොරි 3:16
1කොරි 6:19
8 යොහ 17:23
9 1පේතෘ 2:5

**3 පරි.**
10 1තෙස 2:16
2තිමෝ 4:17
11 එෆී 4:1
එෆී 6:20
12 1කොරි 9:17
කොලො 1:25
13 කොලො 1:26
14 1කොරි 4:1
එෆී 6:19
15 2කොරි 11:6
16 කොලො 1:26
17 මතෙ 16:17
එෆී 2:20
18 රෝම 11:25
රෝම 16:25
19 එෆී 2:16

ඔබ දෙවිගේ පවුලේ සාමාජිකයෝය.[1]
**20** මීට අමතරව ඔබව ගොඩනඟා
තිබෙන්නේ ක්‍රිස්තුස්ගේ නියෝජිත-
යන්*[2] හා අනාගතවක්තෘවරුන්ගෙන්[3]
සැදුණු අත්තිවාරමක් මතය.[4] ඒ අත්-
තිවාරමේ ප්‍රධාන ගල ක්‍රිස්තුස් යේ-
සුස්ය.[5] **21** ඔහු සමඟ එකට බැඳී
පවතින ඒ මුළු ගොඩනැඟිල්ලේ සියලු
කොටස් එකමුතුකමින් එකිනෙකා
සමඟ බැඳී පවතින නිසා[6] එය යෙ-
හෝවා දෙවි වෙනුවෙන් ඉදි කරනු
ලබන ශුද්ධ දේවමාලිගාවක් ලෙ-
සට ගොඩනැඟෙමින් පවතී.[7] **22** ඔහු
සමඟ එකට බැඳී සිටින[8] ඔබව එක
ගොඩනැඟිල්ලක් සේ ඉදි කරනු ලබන්-
නේ දෙවිට වාසය කිරීම සඳහාය. දෙවි
එසේ වාසය කරන්නේ තම බලය ඔබ
තුළ ක්‍රියාත්මක වීමට සැලැස්වීමෙනි.[9]

**3** එහෙයින් පාවුල් වන මම වෙනත්
ජාතීන්ට අයත්ව සිටින ඔබ වෙ-
නුවෙන්[10] සිරකරුවෙක්[11] වෙමි. මා
මෙලෙස සිටින්නේ ක්‍රිස්තුස් උදෙ-
සාය. **2** දෙවිගේ මහත් කරුණාව
ගැන ඔබට ප්‍රකාශ කිරීමේ වගකීම[12]
මට භාර දුන් බව ඔබ දැන සිටින-
වාට සැකයක් නැත. **3** මීට කලින්
මා ඔබට කෙටියෙන් ලියූ ලෙස
මට පරිශුද්ධ රහසක් එළිදරව් කරනු
ලැබීය.[13] **4** එහෙයින් මා ලියා එවන
මේ දේවල් ඔබ කියවන විට ක්‍රිස්-
තුස්ගේ පරිශුද්ධ රහස[14] ගැන මට
ඇති අවබෝධය[15] ඔබට තේරුම්ගත
හැක. **5** කලින් ජීවත් වූ පරම්ප-
රාවලට අයත් මිනිසුන්ට දෙවි මෙම
රහස[16] ගැන පැහැදිලිව එළිදරව් නො-
කළත් ඔහු දැන් තම ශුද්ධ නියෝජිත-
යන්ට* හා අනාගතවක්තෘවරුන්ට[17]
තම බලය මාර්ගයෙන් ඒ පිළිබඳ
තොරතුරු ඉතා පැහැදිලිව එළිදරව්
කර ඇත.[18] **6** ඒ රහස නම් වෙනත්
ජාතීන්ට අයත් අය හවුල් උරුමක්කා-
රයන් සහ එකම ශරීරයේ[19] අවයවයන්
වන බවත් ඔවුන්ද අප සමඟ ක්‍රිස්තුස්

එෆී **2:20*** හෝ, "යවනු ලැබූවන්." **3:5*** හෝ, "යවනු ලැබූවන්ට."

යේසුස් සමඟ එකට බැඳී සිටින අය
ලෙස දෙවිගේ පොරොන්දුවල ඉටු වීම
අද්දකින බවත්ය.[1] ඒ රහස එළිදරව්
වන්නේ ශුභාරංචිය ප්‍රකාශ කිරීමෙනි.
**7** මා එම පරිශුද්ධ රහස ප්‍රකාශ කරන
සේවකයෙකු[2] බවට පත් වුණේ දෙවි-
ගේ මහත් කරුණාව නිසාය. නොමි-
ලේ ලැබෙන ඒ මහත් කරුණාව මා
අද්දුටුවේ දෙවිගේ බලය ක්‍රියා කරන
ආකාරය පෙන්නුම් කිරීමටය.[3]

**8** එම මහත් කරුණාව[4] ශුද්ධ
තැනැත්තන්ගෙන් සුළුම තැනැත්-
තාටත් වඩා සුළු කෙනෙකු ලෙස
සැලකිය යුතු මට[5] පෙන්වන ලදි.
එසේ කළේ අසීමිත ධන සම්භාරයක්[6]
හා සමාන ක්‍රිස්තුස්ගෙන් ලැබෙන
ආශීර්වාද පිළිබඳ ශුභාරංචිය වෙ-
නත් ජාතීන්ට ප්‍රකාශ කිරීම සඳ-
හාය.[7] **9** එලෙසම සියලු දේ සෑදූ
දෙවි[8] බොහෝ කාලයකට පෙර සිට
සඟවා තැබූ ඒ පරිශුද්ධ රහසට[9]
අයත් වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන
ආකාරය[10] ගැන මිනිසුන්ට පැහැදිලිව
අවබෝධ කර දීම සඳහාය. **10** එහි
ප්‍රතිඵලයක් ලෙස දෙවි සභාව සමඟ
කටයුතු කරන ආකාරයෙන්[11] ස්වර්ග-
යේ තිබෙන පාලනවලටත් බලධා-
රීන්ටත්[12] දෙවිගේ මහත් ප්‍රඥාවේ
විවිධ පැති ගැන දැනුවත් වීමට[13]
අවස්ථාවක් උදා වී ඇත. **11** දෙවි
ඒ සියල්ල කිරීමට පියවර ගත්-
තේ ක්‍රිස්තුස්ව[14] එනම්, අපගේ ස්වා-
මීන් වන යේසුස්ව සම්බන්ධ කරගෙන
ඔහු ඇති කළ සදාකාලික අරමු-
ණට එකඟවය. **12** ක්‍රිස්තුස් කෙ-
රෙහි අපට විශ්වාසයක් තිබෙන නිසා
අපට ඔහු මාර්ගයෙන් කිසි බියක්
සැකක් නැතුව දෙවි සමඟ නිදහ-
සේ කතා කිරීමටත්* මහත් විශ්වාස-
යකින් යුතුව දෙවි වෙතට පිවිසීමේ
හැකියාවත්[15] ලැබී තිබේ. **13** එහෙ-
යින් මා ඔබෙන් ඉල්ලා සිටින්නේ ඔබ
වෙනුවෙන් මට විවිධ පීඩා විඳින්න සිදු
වුවත්[1] ඔබ දරන උත්සාහයන් අත්
නොහරින ලෙසය. මන්ද එහි අවසන්
ප්‍රතිඵලය වන්නේ ඔබ තේජසට පත්
වීමය.

**14** ඒ නිසා මම පියාණන්ට[2] මගේ
දණ නමමි.[3] **15** ස්වර්ගයේ වාසය
කරන සියලුදෙනාටම හා පොළොවේ
වෙසෙන සෑම පවුලකටම[4] නම ලැබී
ඇත්තේ[5] දෙවිගෙන්ය. **16** එහෙයින්
ඉමහත් තේජසක්[6] හිමි තැනැත්තා-
ණන් වන දෙවිගෙන් මා අයැද සිටින්-
නේ ඔබට ඔහුගේ බලය ලබා දී[7]
ඇතුළාන්තයෙන්ම ශක්තිමත් පුරුෂ-
යන්[8] බවට පත් වෙන්න ඔබට උප-
කාර කරන්න කියාය. **17** එලෙසම
ඔබ තුළ තිබෙන විශ්වාසය මාර්-
ගයෙන් ක්‍රිස්තුස්ගේ ආදර්ශය ඔබේ
හදවත්වල රඳවාගන්නත් ඔබ අතා-
රේ ප්‍රේමය පවත්වාගන්නත්[9] ඔබට
උපකාර කරන්න කියා මම ඉල්ලා
සිටිමි. මා තවදුරටත් ඉල්ලා සිටින්-
නේ ශක්තිමත් ගසක් සේ හොඳින්
මුල් ඇද[10] ක්‍රිස්තුස් නමැති ශක්ති-
මත් අත්තිවාරම මත පිහිටා සිටී-
මට[11] ඔබට හැකියාව ලබා දෙන්න
කියාය. **18** එමගින් දෙවි ඔබටත්
අන් සියලු ශුද්ධ තැනැත්තන්ටත්
එළිදරව් කරන සියලු දේවල දිගත්
පළලත් උසත් ගැඹුරත්[12] සම්පූර්ණ-
යෙන්ම වටහාගැනීමට[13] ඔබට හැකි
වනු ඇත. **19** එලෙසම සියලු දැනුම
අභිභවා යන ක්‍රිස්තුස් පෙන්වා ඇති
ප්‍රේමය[14] ගැන දැනගැනීමටද ඔබට
හැකි වෙයි. එහි ප්‍රතිඵලයක් ලෙස
දෙවි තුළ තිබෙන සියලු ගුණාංග ඔබට
ලැබෙන නිසා ඒවායින් ඔබ පූර්ණ වනු
ඇත.[15]

**20** අප තුළ ක්‍රියාත්මක වන බලය
මාර්ගයෙන්[16] අප ඉල්ලන ඕනෑම දෙ-
යකට වඩා වැඩියෙනුත් අපට සිතා-
ගත හැකි ඕනෑම දෙයකට වඩා
වැඩියෙනුත් දේවල් කිරීමේ හැකියාව
දෙවි සතුය.[17] **21** එහෙයින් සභාව
මගින්ද ක්‍රිස්තුස් යේසුස් මගින්ද සියලු
ප්‍රශංසාවත් ගෞරවයත් ඔහුට ලබා
දීම කොතරම් යෝග්‍යද! ජීවත් වන

---

එෆී **3:12*** හෝ, "ජනයා සමඟ නිදහසේ කතා කිරීමටත්."

**3 පරි.**
**1** ලූක් 24:49 ක්‍රියා 1:8 ගලා 3:14
**2** රෝම 12:7 කොලො 1:25
**3** රෝම 15:15
**4** 1තිමෝ 1:14
**5** 1කොරි 15:9
**6** කොලො 1:27
**7** ගලා 1:16
**8** යෙසා 40:28 කොලො 1:16 හෙබ්‍රෙ 1:2
**9** 1කොරි 2:7 එෆී 1:9
**10** එෆී 1:10 කොලො 1:18
**11** 1පේතෘ 1:12 1පේතෘ 2:9
**12** 1පේතෘ 3:22
**13** රෝම 11:33
**14** එෆී 1:11
**15** යොහ 14:6 රෝම 5:2 හෙබ්‍රෙ 4:16

**2 තීරුව**
**1** ක්‍රියා 14:22 2තිමෝ 2:10
**2** එෆී 1:3
**3** ක්‍රියා 20:36
**4** යෙසා 54:1
**5** යෙසා 54:5 යෙසා 62:2
**6** රෝම 9:23 පිලි 4:19
**7** රෝම 15:19
**8** රෝම 7:22 2කොරි 4:16
**9** යොහ 14:23
**10** කොලො 2:7
**11** කොලො 1:23
**12** රෝම 11:33
**13** යොහ 17:3 එෆී 1:18
**14** රෝම 8:35
**15** යොහ 1:16 කොලො 2:9
**16** කොලො 1:29
**17** මාක් 11:24 1කොරි 2:9

සෑම පරම්පරාවක් පුරාම සදහටම
එසේ සිදු වේවා![1] ආමෙන්.*

**4** ස්වාමීන්ගේ අනුගාමිකයෙකු
ලෙස සිරදඬුවම් විඳින[2] මා
ඔබෙන් ඉල්ලා සිටින්නේ ඔබේ කැඳ-
වීමට[3] ඔබින ආකාරයකින් ඔබේ
ගමන යන ලෙසය.[4] **2** ඒ අනුව
ඔබ නිතරම නිහතමානිකමින්,[5] මෘදු-
කමින්, බොහෝ ඉවසිලිවන්තකමින්[6]
සහ එකිනෙකාගේ දුර්වලකම් ප්‍රේම-
ණීය ලෙස දරාගනිමින්[7] සිටිය යුතුයි.
**3** එලෙසම දෙවිගේ බලය ඔබ අත-
රෙහි ක්‍රියාත්මක වීම මගින් ඔබ
අද්දකින එක්සත්කම රැකගැනීමටත්
සමාදානයෙන් ජීවත් වීමටත්* මහත්
වෑයමක් දැරිය යුතුයි.[8] **4** ඇත්තේ
එක ශරීරයක්ය.[9] ක්‍රියාත්මක වන්නේ
එක බලයක්ය.[10] එලෙසම කැඳවනු
ලැබූ ඔබ සියලුදෙනාටම ඇත්තේ එක
බලාපොරොත්තුවක්ය.[11] **5** සිටින්-
නේ එක ස්වාමියෙක්ය.[12] අපගේ විශ්-
වාසයට ඇත්තේ එක පදනමක්ය.[13]
ඇත්තේ එක බව්තීස්මයක්ය.[14]
**6** සියලුදෙනාටම සිටින්නේ එකම
දෙවි කෙනෙක්[15] සහ එකම පියා-
ණන්ය. සියලුදෙනාටම ඉහළින්
සිටින්නේ ඔහුය. එලෙසම සියලුදෙනා
මාර්ගයෙන් ක්‍රියා කරන්නේ ඔහුය.
සියලුදෙනා තුළ ක්‍රියා කරන්නේ ඔහු-
ගේ බලයය.

**7** ක්‍රිස්තුස් තුළින් නොමිලේ
ලැබුණු දීමනාව අපට බෙදා දී ඇති
ආකාරයට අනුව[16] අප සියලුදෙනාටම
දෙවිගේ මහත් කරුණාව ලැබී ඇත.[17]
**8** ඒ ගැන* මෙසේ පවසා ඇත. "ඔහු
ඉහළට නැඟ ගිය විට ඔහු වහලුන්ව
රැගෙන ගියේය. ඔහු පුරුෂයන්ව
තෑගි වශයෙන් දුන්නේය."[18] **9** 'ඔහු
නැඟ ගියේය'[19] කියා පැවසීමෙන් ඔහු
පහළ එනම්, පොළෝගැබෙහි සිටි
බව අදහස් වෙයි.[20] **10** ඒ අනුව ඉහ-
ළට[21] එනම්, මුළු මහත් ස්වර්ගයටත්
වඩා ඉහළටම[1] නැඟ ගියේ බැස ආ
තැනැත්තාමය. ඔහු එසේ කළේ සිය-
ලුම දේවල් ඔහු තුළින් සම්පූර්ණ වීම
සඳහාය.[2]

**11** එහෙයින් ඔහු සමහරුන්ව
නියෝජිතයන්* ලෙසද[3] සමහරුන්ව
අනාගතවක්තෘවරුන් ලෙසද[4] සමහ-
රුන්ව ශුභාරංචිය දේශනා කරන්නන්
ලෙසද[5] සමහරුන්ව එඬේරුන් ලෙ-
සද සමහරුන්ව ගුරුවරුන් ලෙසද[6]
සභාවට ලබා දුන්නේය. **12** එසේ
ඔවුහු ශුද්ධ තැනැත්තන්ව නිවැරදි
මාර්ගයට ගෙන ඒමටත්[7] අන් අය
වෙනුවෙන් සේවය කිරීමටත් ක්‍රිස්-
තුස්ගේ ශරීරය ගොඩනැඟීමටත් පිය-
වර ගනු ඇත.[8] **13** එහි ප්‍රතිඵලයක්
ලෙස අප විශ්වාස කරන දේ සම්බන්-
ධයෙන්ද දෙවිගේ පුත්‍රයා ගැන අපට
තිබෙන නිවැරදි දැනුම සම්බන්ධ-
යෙන්ද අප සියලුදෙනාටම එක්සත්ව
සිටීමට හැකියාව ලැබේ. එමගින් අපි
ක්‍රිස්තුස්ගේ පරිපූර්ණ පෞද්ගලිකත්ව-
යට ළඟා වන,[9] හොඳින් වැඩුණු[10] අව-
බෝධයෙන් ක්‍රියා කරන පුරුෂයෝ
වන්නෙමු. **14** එලෙසම අප තවදු-
රටත් කුඩා දරුවන් මෙන් කටයුතු
නොකළ යුතුයි. අප එසේ කට-
යුතු කළොත් අන් අයව වැරදි දේව-
ලට නොමඟ යැවීමේ අදහස ඇතුව
ඉතා සූක්ෂ්ම ලෙස කපටිකමින්[11]
විවිධ දේවල් උගන්වන[12] මිනිසුන්ට
අප හසු විය හැක. අපි සුළඟට
ඒ මේ අත ගසාගෙන යන[13] මුහුදේ
රළ මෙන් වනු ඇත. **15** ඒ වෙනුවට
අපි දිගටම සත්‍යය කතා කරමින්ද[14]
සියලු දේවල හිස ලෙස කටයුතු
කරන[15] ක්‍රිස්තුස්ව අනුගමනය කර-
මින්ද ප්‍රේමය ඇතුව අවබෝධයෙන්
ක්‍රියා කරන පුද්ගලයන් බවට පත්
වන තුරු වර්ධනය වෙමු.[16] **16** ක්‍රිස්-
තුස් මාර්ගයෙන් මුළු ශරීරයම[17] එකට
බැඳී පවතින අතර එහි සෑම අව-
යවයක්ම තමාට නියමිත වූ කාර්-
යයන් ඉටු කරමින් සහයෝගයෙන්

---

එපී **3:21*** එනම්, එසේම වේවා! **4:3*** මූ.අ., "එකමුතුකමට මඟ පාදන සමාදානය නමැති බැඳීම රැකීමටත්." **8*** හෝ, "ශුද්ධ ලියවිල්ලේ."

එපී **4:11*** හෝ, "යවනු ලැබූවන්."

**3 පරි.**
**1** හෙබ්‍රෙ 13:21

**4 පරි.**
**2** එපී 6:20 පිලෙ 9
**3** රෝම 8:30
**4** පිලි 1:27
**5** මතෙ 11:29 ක්‍රියා 20:19 රෝම 12:3 පිලි 2:3 1පේතෘ 5:5
**6** 2කොරි 6:6 1තෙස 5:14
**7** 1කොරි 13:4
**8** රෝම 15:6 1කොරි 1:10 පිලි 1:27 කොලො 3:15
**9** රෝම 12:5 එපී 2:16
**10** 1කොරි 12:4
**11** 1පේතෘ 1:3
**12** 1කොරි 8:6 1කොරි 12:5
**13** 2කොරි 4:13
**14** මතෙ 28:19
**15** 1කොරි 8:6 1කොරි 12:6
**16** රෝම 12:6 1කොරි 12:11 2කොරි 9:15
**17** රෝම 12:3
**18** ගීතා 68:18 1කොරි 12:28 එපී 4:11
**19** යොහ 3:13 ක්‍රියා 2:31
**20** මතෙ 12:40
**21** ක්‍රියා 1:9 1තිමෝ 3:16

**2 තීරුව**
**1** හෙබ්‍රෙ 4:14 හෙබ්‍රෙ 9:24
**2** කොලො 1:19
**3** මතෙ 10:2
**4** 1කොරි 12:28
**5** ක්‍රියා 21:8
**6** ක්‍රියා 13:1 යාකො 3:1
**7** 1කොරි 12:7
**8** 1කොරි 14:26
**9** කොලො 1:28
**10** 1කොරි 14:20
**11** 2කොරි 11:13
**12** කොලො 2:18 හෙබ්‍රෙ 13:9 1පේතෘ 2:1
**13** හෙබ්‍රෙ 6:19 යාකො 1:6
**14** 1යොහ 3:18
**15** 1කොරි 11:3 කොලො 1:18
**16** යාකො 1:4
**17** 1කොරි 12:27

ක්‍රියා කරයි. සෑම අවයවයක්ම එලෙස
තමාට නියම වූ කාර්යය නිසි ලෙස
ඉටු කරන විට මුළු ශරීරයේම වර්ධන-
යට එය දායක වෙයි. එසේ එකිනෙකා
අතර තිබෙන ප්‍රේමයෙන් මුළු ශරීරයම
ශක්තිමත්ව වැඩෙයි.[1]
**17** එහෙයින් මා ඔබට පවසන
මේ දේට සවන් දෙන්න. මා ස්වා-
මීන් ඉදිරියෙහි ඔබට උනන්දු කරන්-
නේ වෙනත් ජාතීන්ට අයත්
මිනිසුන්[2] පුහු ආකල්ප දරමින් තම
ජීවිතය ගත කරන්නා සේ[3] ඔබත්
ඔබේ ජීවිත ගත නොකළ යුතු
බවය. **18** ඔවුන්ගේ මනස අන්ධකා-
රයෙන් වැසී තිබෙන අතර[4] ඔවුහු
දෙවි ලබා දෙන ජීවනයෙන් ඈත් වී
සිටිති.[5] එසේ වන්නේ ඔවුන් නොදැනු-
වත්කමින්[6] සිටීමට උත්සාහ කරන
නිසාත් ඔවුන් තම සිත් දැඩි කර-
ගෙන තිබෙන නිසාත්ය.[7] **19** කිසිම
හැඟීමක් දැනීමක් නැති[8] ඔවුහු නින්-
දිත[9] ක්‍රියාකලාපයකට සම්පූර්ණ-
යෙන්ම වහල් වූහ. එහි ප්‍රතිඵලයක්
ලෙස ඔවුහු කෑදරකමින් යුතුව[10]
සියලු ආකාරයේ අපවිත්‍ර ක්‍රියාවල[11]
නිරත වූහ.
**20** නමුත් ඔබ ඉගෙනගෙන ඇති
ආකාරයට ක්‍රිස්තුස් එවැනි කෙනෙක්
නොවේ.[12] **21** ඔබ ඔහුට සවන් දී
ඔහුගෙන් ඉගෙනගත්තා නොවේද?[13]
මන්ද සත්‍යය ගැන දැනගැනී-
මට එකම මඟ[14] යේසුස්ය. **22** ඒ
අනුව ඔබ ඉගෙනගත් ලෙස ඔබේ
පරණ පෞද්ගලිකත්වය අහක දැමිය
යුතුයි.[15] මන්ද ඒ පෞද්ගලිකත්-
වය හැඩගැසී තිබෙන්නේ ඔබ කලින්
හැසිරුණු ආකාරයටය. ඒ කාලයේදී
ඔබ තුළ තිබූ මුළා කරවනසුලු ආශා-
වන් නිසා[16] ඔබ තව තවත් පිරිහීමට
ලක් විය.[17] **23** එසේනම් දැන් ඔබ
අලුත් පුද්ගලයන් වී අලුත් ආකාර-
යකින් සිතීමට පුරුදු විය යුතුයි.[18]
**24** එලෙසම ඔබ අලුත් පෞද්ගලි-
කත්වය[19] පැළඳගත යුතුයි.[20] එම
පෞද්ගලිකත්වය හැඩගසා ඇත්තේ[21]
දෙවිගේ කැමැත්තට එකඟවය. එවැනි
පෞද්ගලිකත්වයක් ඇති කෙනෙක්
ක්‍රියා කරන්නේ සැබෑ ධර්මිෂ්ඨකමින්[1]
සහ පක්ෂපාතකමින්ය.
**25** ඔබ දැන් සෑම වංචනික ක්‍රියා-
වක්ම අත්හැර දමා[2] ඇති නිසා ඔබ
එකිනෙකා තම අසල්වැසියා සමඟ
සත්‍යය කතා කළ යුතුයි.[3] එසේ කළ
යුත්තේ අප එකම ශරීරයට අයත් අව-
යවයන් වන නිසාය.[4] **26** ඔබ තුළ
කෝපයක් ඇති වුණත් පව් නො-
කරන්න.[5] ඉර බසින්න කලින් ඔබේ
කෝපය ඉවත් කරගන්න.[6] **27** යක්-
ෂයාට කිසි ඉඩක් නොදෙන්න.[7]
**28** සොරකම් කරන තැනැත්තා තව-
දුරටත් සොරකම් නොකළ යුතුයි.[8] ඒ
වෙනුවට ඔහු අගහිඟකම්වලින් පෙ-
ළෙන කෙනෙකුට යමක් දීමට හැකි
වන සේ[9] වෙහෙස වී තම අත්වලින්
යහපත් වැඩ කළ යුතුයි.[10] **29** ඔබේ
මුවින් කිසි අසභ්‍ය* වචනයක් පිට
වීමට ඉඩ නොදෙන්න.[11] ඒ වෙනුවට
සුදුසු අවස්ථාවලදී සවන් දෙන අයට
ප්‍රයෝජනවත් වන යම් දිරිගන්ව-
නසුලු දෙයක් ගැන කතා කරන්න.[12]
**30** මීට අමතරව දෙවිගේ බලයේ
ක්‍රියාකාරිත්වය දැක දැකත් ඊට විරුද්-
ධව ක්‍රියා කරමින් දෙවිට දුක් නො-
දෙන්න.[13] මන්ද ගෙවා ඇති වන්දිය
මාර්ගයෙන් නිදහස ලැබෙන දවස
පැමිණෙන තුරු[14] බලා සිටින ඔබව
මුද්‍රා කර තිබෙන්නේ[15] ඒ බලයෙනි.
**31** දැඩි වෛරය,[16] උදහස, කෝ-
පය, කෑගැසීම, නින්දාසහගත කතා[17]
මෙන්ම වෙනත් නපුරු දේවල් ඔබේ
ජීවිතයෙන් දුරස් කරන්න.[18] **32** ඒ
වෙනුවට එකිනෙකාට කරුණා-
වද[19] ඉමහත් දයානුකම්පාවද පෙන්-
වන්න.[20] එලෙසම දෙවි ක්‍රිස්තුස්
මාර්ගයෙන් ඔබට කැමැත්තෙන්ම
සමාව දුන් ලෙසම ඔබත් එකිනෙකාට
කැමැත්තෙන්ම සමාව දෙන්න.[21]

**4 පරි.**
**1** කොලෝ 2:19
**2** 1පේත 4:3
**3** රෝම 1:21
**4** ක්‍රියා 26:18
**5** ගලා 4:8; එෆී 2:12; කොලෝ 1:21
**6** ක්‍රියා 17:30
**7** රෝම 11:25
**8** රෝම 1:28
**9** 2කොරි 12:21; ගලා 5:19; යූද් 4
**10** යෙසා 56:11
**11** රෝම 1:26
**12** 1තෙස 4:4; හෙබ්‍රෙ 7:26
**13** 1තෙස 4:1
**14** යොහ 1:14
**15** රෝම 6:6; කොලෝ 3:9
**16** රෝම 7:23
**17** රෝම 8:13
**18** ගීතා 51:10; එස 11:19; එස 18:31; රෝම 12:2
**19** කොලෝ 3:10
**20** ගලා 3:27
**21** එෆී 2:10

**2 තීරුව**
**1** ගීතා 45:7; රෝම 1:17
**2** ක්‍රියා 5:2; කොලෝ 3:8
**3** සෙක 8:16; කොලෝ 3:9; එළි 21:8
**4** රෝම 12:5
**5** ගීතා 4:4
**6** ලෙවී 19:17; කොලෝ 3:13; 1පේත 4:8
**7** යාකො 4:7
**8** ද්වි 5:19
**9** ක්‍රියා 20:35
**10** 1තෙස 4:11; 2තෙස 3:10
**11** මතෙ 15:11; යාකො 3:10
**12** කොලෝ 4:6
**13** යෙසා 63:10; 2කොරි 6:1; 1තෙස 5:19
**14** රෝම 8:23
**15** එෆී 1:13
**16** යාකො 3:14
**17** කොලෝ 3:8
**18** තීත 3:2
**19** මීකා 6:8; 2කොරි 6:6
**20** කොලෝ 3:12; 1පේත 3:8

**21** මතෙ 6:14; මතෙ 18:35; මාක් 11:25; 2කොරි 2:10.

එෆී **4:29*** මූ.අ., "කුණු වූ."

**5** ඔබ දෙවිගේ ප්‍රේමණීය දරු-
වන් වන නිසා දෙවිව අනුකර-
ණය කරන්නන් වන්න.[1] **2** ක්‍රිස්තුස්
ඔබට ප්‍රේම කළා සේම[2] ඔබත් එකි-
නෙකාට ප්‍රේමය පෙන්වමින් ජීවත්
වන්න.[3] මන්ද ඔහු ඔබ වෙනුවෙන්
තම ජීවිතය දෙවිට පූජාවක් ලෙස
ඔප්පු කළේය.[4] එය දෙවිට මිහිරි
සුවඳක් හා සමානය.[5]

**3** වේශ්‍යාකම*[6] ගැනවත් ඕනෑම
ආකාරයක අපවිත්‍ර ක්‍රියා ගැනවත්
කෑදරකම[7] ගැනවත් ඔබ අතරේ කිසි-
සේත් සඳහන් නොකළ යුතුයි.[8] ඒවා
ශුද්ධ තැනැත්තන්ට සුදුසු නැත.[9]
**4** එලෙසම කිසිම ලැජ්ජාවක් බියක්
නොමැතිව හැසිරීම,[10] මෝඩ කතා
හෝ අසභ්‍ය[11] විහිළු සුදුසු නැත.
ඒ වෙනුවට දෙවිට ස්තුති කරමින්
සිටින්න.[12] **5** වේශ්‍යාකම් කරන
කෙනෙකුටවත්[13] අපවිත්‍ර ක්‍රියා කරන
කෙනෙකුටවත් කෑදරකමින් කටයුතු
කරන කෙනෙකුටවත්[14] (එනම් රූප
වඳින්නෙකුටවත්) ක්‍රිස්තුස්ගේ සහ
දෙවිගේ රාජ්‍යයෙහි කිසි උරුමයක්
නොලැබෙන බව[15] ඔබ හොඳින් අව-
බෝධ කරගෙන සිටිනවාට කිසි සැක-
යක් නැත.

**6** කිසි හරයක් නැති දේවල් පවසා
ඔබව රැවටීමට කිසිවෙකුට ඉඩ නො-
දෙන්න.[16] මන්ද අකීකරු වී ඉහත සඳ-
හන් දේවල් කරන අයට ඉදිරියේදී
දෙවිගේ උදහසට ලක් වීමට සිදු වේ.[17]
**7** එහෙයින් එවැනි අය සමඟ කිසි
ලෙසකින්වත් හවුල් නොවන්න.[18]
**8** කලක් අන්ධකාරයේ සිටියත්[19] දැන්
ඔබ ස්වාමීන් සමඟ එකට බැඳී සිටින
නිසා ඔබ දැන් සිටින්නේ ආලෝක-
යෙහිය.[20] එහෙයින් දිගටම ආලෝ-
කයේ දරුවන් ලෙස ඔබේ ජීවිතය
ගත කරන්න. **9** මන්ද ආලෝක-
යේ ප්‍රතිඵලයක් ලෙස කෙනෙකු තුළ
සෑම පැත්තකින්ම යහපත්කම, ධර්-
මිෂ්ඨකම සහ නිර්දෝෂකම දක්-
නට ලැබේ.[1] **10** ස්වාමීන්ට ප්‍රසන්න
වන්නේ කුමක්ද කියා නිතරම සොයා
බලා එය ඔබටම තහවුරු කර-
ගන්න.[2] **11** ඔවුන් සමඟ අන්ධකාර-
යට සම්බන්ධ[3] නිෂ්ඵල ක්‍රියාවල
තවදුරටත් හවුල් නොවී[4] ඒවා හෙළා-
දකින්න.[5] **12** මන්ද ඔවුන් රහසින්
කරන සමහරක් දේවල් ගැන කතා
කිරීම පවා පිළිකුලකි.[6] **13** ආලෝ-
කය මගින් සෑම නොහොබිනා ක්‍රියා-
වක් ගැනම පැහැදිලිව හෙළි කරනු
ලැබේ.[7] එසේ හෙළි කරනු ලබන
සෑම දෙයකම සැබෑ තත්වය ආලෝ-
කය මෙන් පැහැදිලිව දැකගත හැක.[8]
**14** "නිදා සිටින තැනැත්තෙනි, අවදි
වන්න.[9] මිය ගිය* තැනැත්තෙනි,
නැඟිටින්න.[10] එවිට ඔබට ක්‍රිස්තුස්-
ගෙන් ආලෝකය ලැබේ"[11] කියා සඳ-
හන් වන්නේ ඒ නිසාය.

**15** ඒ නිසා ඔබ ඉතා සෝදිසි-
යෙන් සිට අඥානයන් මෙන් නොව
ඥානවන්තයන් මෙන් ඔබේ ජීවි-
තය ගත කිරීමට වගබලා ගන්න.[12]
**16** අප නපුරු කාලයක ජීවත් වන
නිසා[13] ඔබට ලැබෙන සෑම අවස්ථාව-
කින්ම උපරිම ප්‍රයෝජන ගන්න.*[14]
**17** එහෙයින් තවදුරටත් අඥාන ලෙස
කටයුතු නොකර යෙහෝවා දෙවිගේ
කැමැත්ත[15] කුමක්ද කියා වටහාගැනී-
මට නිරතුරුවම උත්සාහ කරන්න.[16]
**18** වයින්වලින් වෙරි නොවන්න.[17]
මන්ද එය අශිෂ්ට ක්‍රියාවලට හේතු
වෙයි.[18] ඒ වෙනුවට දෙවිගේ බලය ඔබ
තුළ දිගටම ක්‍රියාත්මක වීමට ඉඩහරි-
මින්,[19] **19** එකිනෙකා සමඟ එකතු
වී ගීතිකා[20] ගයන්න. දෙවිට ප්‍රශංසා[21]
ඔප්පු කරමින් ගී ගයන්න.[22] එලෙසම
ඔබේ මුළු හදවතින්ද යෙහෝවා දෙ-
විට ප්‍රශංසා ගී ගයන්න.[23] **20** අප-
ගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්ගේ
නාමයෙන්, අපගේ දෙවි හා පියාණන්

**5 පරි.**

**1** මතෙ 5:48
ලූක් 6:36
**2** යොහ 13:34
1යොහ 3:23
**3** 1කොරි 16:14
**4** ගලා 2:20
හෙබ්‍රෙ 10:10
**5** නික් 29:18
2කොරි 2:15
**6** 2කොරි 12:21
**7** 1කොරි 5:11
**8** කොලො 3:5
**9** 1තෙස 4:3
**10** රෝම 1:28
**11** රෝම 1:27
කොලො 3:8
**12** 1තෙස 5:18
**13** ක්‍රියා 15:29
ගලා 5:19
**14** 1තිමෝ 3:8
තීත 1:7
**15** 1කොරි 6:9
ගලා 5:21
**16** කොලො 2:4
කොලො 2:8
**17** එෆී 2:2
**18** 2කොරි 6:14
**19** ක්‍රියා 26:18
1පේතෘ 2:9
**20** මතෙ 5:16
යොහ 12:36
1යොහ 2:9

**2 තීරුව**

**1** ගලා 5:22
**2** රෝම 12:2
පිලි 1:10
**3** රෝම 13:12
**4** යෙසා 52:11
රෝම 16:17
2තෙස 3:6
2තිමෝ 3:5
**5** හිතෝ 28:23
1තිමෝ 5:20
තීත 1:9
තීත 1:13
එළි 3:19
**6** රෝම 1:26
**7** යොහ 3:20
**8** 1කොරි 4:5
**9** යෙසා 26:19
රෝම 13:11
**10** එෆී 2:5
කොලො 2:13
**11** යොහ 8:12
2තිමෝ 1:10
**12** මතෙ 10:16
1තිමෝ 4:8
2තිමෝ 2:22
**13** 2තිමෝ 3:1
**14** කොලො 4:5
**15** රෝම 12:2
1තෙස 4:3
1තෙස 5:18
1පේතෘ 4:2
**16** ගීතා 143:10
හිතෝ 2:5
යොහ 7:17
**17** යෙසා 5:11
**18** හබ 2:15

**19** ක්‍රියා 2:4; **20** යාකො 5:13; **21** ක්‍රියා 16:25; **22** 1කොරි 14:15; කොලො 3:16; **23** ගීතා 33:2.

එෆී **5:3*** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න.

එෆී **5:14*** එනම්, මිය ගියා හා සමාන තත්වයක සිටින. **16*** මූ.අ., "කාලය මිල දී ගන්න."

වන තැනැත්තාණන්ට සැමවිටම සෑම
දෙයක් ගැනම ස්තුති කරන්න.[1]
**21** ක්‍රිස්තුස්ට ගැඹුරු ගෞරවයක්
දක්වන අය ලෙස එකිනෙකාට
යටත්ව සිටින්න.[2] **22** භාර්යාවන්
ස්වාමීන්ට යටත්ව සිටින්නා සේම
තම ස්වාමිපුරුෂයන්ටත් යටත්ව
සිටිය යුතුයි.[3] **23** මන්ද ක්‍රිස්තුස්
සභාව නමැති ශරීරයේ ගැලවුම්කා-
රයා සහ හිස වන්නා සේම[4] ස්වාමිපු-
රුෂයාද තම භාර්යාවගේ හිස ලෙස
කටයුතු කරයි.[5] **24** එලෙසම සභාව
ක්‍රිස්තුස්ට යටත්ව සිටින්නා සේම
භාර්යාවන්ද සියලු කාරණාවලදී තම
ස්වාමිපුරුෂයන්ට යටත් විය යුතුයි.[6]
**25** ස්වාමිපුරුෂයෙනි, ඔබේ භාර්යා-
වන්ට දිගටම ප්‍රේම කරන්න.[7] ක්‍රිස්-
තුස් සභාවට ප්‍රේම කර ඒ වෙනුවෙන්
තම ජීවිතය දුන් අයුරින්ම ඔබත්
ඔවුන්ට ප්‍රේම කරන්න.[8] **26** ඔහු
එසේ කළේ දේවවචනය නමැති වතු-
රෙන් එය සෝදා පිරිසිදු කර,[9] එය
ශුද්ධ වූ තත්වයකට පත් කිරීම
සඳහාය.[10] **27** එමෙන්ම තම සභාව
පැල්ලමක්වත් දෝෂයක්වත් වෙනත්
කිසි වරදක්වත් නැති, ශුද්ධ මෙන්ම
නිකැළැල්,[11] මහත් අලංකාරයකින්
බැබළෙන දෙයක් ලෙස[12] තමන් ඉදි-
රියේ තබාගැනීම සඳහාය.

**28** එයාකාරයෙන්ම ස්වාමිපුරුෂ-
යන්ද තම ශරීර ගැන සැලකිලි-
මත් වෙනවා වගේ තම භාර්යාවන්ට
ප්‍රේම කළ යුතුයි. තම භාර්යා-
වට ප්‍රේම කරන තැනැත්තා තමා-
ටම ප්‍රේම කරන බව කිව හැකියි.
**29** මන්ද කිසි මිනිසෙක් කිසිදාක
තමාගේම ශරීරයට වෛර කළේ
නැත. ඒ වෙනුවට ඔහු තම ශරී-
රයට අවශ්‍ය පෝෂණය සහ සැල-
කිල්ල මහත් ආදරයකින් ලබා
දෙයි.[13] එය ක්‍රිස්තුස් සභාව වෙනු-
වෙන් දක්වන සැලකිල්ලට සමාන
සැලකිල්ලක් විය යුතුයි. **30** මන්ද
අපි ක්‍රිස්තුස්ගේ ශරීරයට අයත් අව-
යව වන්නෙමු.[14] **31** “එහෙයින් මිනි-
සෙක් තම පියාගෙන්ද මවගෙන්ද
වෙන් වී, තම බිරිඳට ඇලුම් වන්-
නේය. ඔවුහු දෙදෙනා එක් කෙ-
නෙකු මෙන් වන්නෝය.”[1] **32** මා
දැන් කතා කරන්නේ ක්‍රිස්තුස් ගැනත්
සභාව ගැනත්ය.[2] ඇත්තෙන්ම එම
පරිශුද්ධ රහස[3] ශ්‍රේෂ්ඨය. **33** කෙ-
සේවෙතත් ඔබ එකිනෙකා තමාට
ප්‍රේම කරන ආකාරයටම තම භාර්-
යාවටද ප්‍රේම කළ යුතුයි.[4] එලෙසම
භාර්යාව තම ස්වාමිපුරුෂයාට ගැඹුරු
ගෞරවයක්[5] දැක්විය යුතුයි.

**6** දරුවෙනි, දෙවිගේ කැමැත්තට
එකඟව[6] ඔබේ දෙමාපියන්ට
කීකරු වන්න.[7] මන්ද දෙමාපියන්ට
කීකරු වීම දෙවි සලකන්නේ ධර්මිෂ්ඨ
දෙයක් ලෙසටයි.[8] **2** “ඔබේ පියා-
ටත් මවටත් ගෞරව කරන්න.”[9] පො-
රොන්දුවක් සමඟ දී ඇති පළමුවෙනි
ආඥාව එයයි.[10] ඒ පොරොන්දුව නම්,
**3** “එය ඔබේ යහපතට හේතු වෙයි.
එවිට පොළොවෙහි බොහෝ කාල-
යක් ජීවත් වෙන්න ඔබට පුළුවන”[11]
යන්නයි. **4** පියවරුනි, ඔබේ දරු-
වන් තුළ කෝපයක් ඇති වන අයුරින්
කටයුතු නොකරන්න.[12] ඒ වෙනු-
වට යෙහෝවා දෙවිගෙන් ලැබෙන
හික්මවීම් ලබා දීමෙන්ද[13] දෙවි
සිතන ආකාරයට සිතීමට ඉගැන්වී-
මෙන්ද[14] ඔවුන්ව නිරතුරුව ඇතිදැඩි
කරන්න.[15]

**5** දාසයෙනි, ඔබ ක්‍රිස්තුස්ට කීක-
රුව සිටින්නා සේම ඔබේ ස්වාමි-
වරුන් ලෙස කටයුතු කරන අයට
අවංක සිතින්ම ගැඹුරු ගෞරවයක්
දක්වමින්[16] කීකරු වන්න.[17] **6** මිනි-
සුන්ව සතුටු කරන අය මෙන්
මූණිච්චාවට නොව[18] ක්‍රිස්තුස්ගේ දාස-
යන් මෙන් මුළු හදවතින්ම දෙවිගේ
කැමැත්ත කරමින් කීකරු වන්න.[19]
**7** මිනිසුන්ට සේවය කරන ආකාරයට
නොව යෙහෝවා දෙවිට සේවය කරන
ආකාරයට[20] අවංක චේතනාවෙන් හා
උද්‍යෝගයෙන් සේවය කරන දාස-
යන් වන්න. **8** මන්ද යමෙක් දාස-
යෙක් වුවත් නැතත්[21] තමා කරන
යහපත් දේවලට අනුව ඔහුට ඒ සඳහා

**5 පරි.**
1 කොලො 3:17; 1තෙස 5:18
2 පිලි 2:3; 1පේතෘ 5:5
3 කොලො 3:18; තීත 2:5; 1පේතෘ 3:1
4 1කොරි 11:3
5 රෝම 7:2
6 1කොරි 14:34
7 1පේතෘ 3:7
8 ක්‍රියා 20:28; ගලා 1:4
9 යොහ 17:17
10 හෙබ්‍රෙ 13:12
11 2කොරි 11:2; එෆී 1:4; කොලො 1:22; හෙබ්‍රෙ 10:22; එළි 21:27
12 ගීතා 45:13; තීත 2:14
13 1කොරි 7:33
14 රෝම 12:5; 1කොරි 6:15; එෆී 1:23

**2 තීරුව**
1 උත් 2:24; මතෙ 19:5; 1කොරි 6:16
2 එෆී 3:6; හෙබ්‍රෙ 12:23
3 එෆී 1:9; එෆී 3:4; කොලො 1:26
4 කොලො 3:19
5 1පේතෘ 3:6

**6 පරි.**
6 යොහ 17:21
7 හිතෝ 1:8; හිතෝ 6:20; හිතෝ 23:22; කොලො 3:20
8 1පේතෘ 3:12
9 හිතෝ 23:22; මතෙ 15:4
10 නික් 20:12; හිතෝ 20:20
11 ද්වි 5:16
12 කොලො 3:21
13 හිතෝ 3:11; හිතෝ 13:24; හිතෝ 19:18; 2තිමෝ 3:16
14 ද්වි 4:9; ද්වි 6:7; ද්වි 6:20; හිතෝ 2:2; යෙසා 50:5
15 හිතෝ 22:6
16 පිලි 2:12
17 1තිමෝ 6:1; 1පේතෘ 2:18
18 කොලො 3:22
19 ලූක් 10:27
20 1කොරි 10:31
21 ගලා 3:28

යෙහෝවා දෙවි ප්‍රතිඵල දෙන බව
ඔබ දන්නහුය.[1] **9** එලෙසම ස්වාමි-
වරුනි, ඔබේ දාසයන් සමඟ කට-
යුතු කරන විට මේ දේවල් මතක
තබාගන්න. එනම් ඔවුන්ට තවදුර-
ටත් තර්ජනය නොකරන්න.[2] මන්ද
ඔබෙත් ඔවුන්ගෙත් ස්වාමියා[3] ස්වර්ග-
යෙහි සිටින බවත් ඔහු සියල්ලන්ටම
එක හා සමානව සලකන බවත්[4] ඔබ
දන්නහුය.

**10** අවසන් වශයෙන් මා ඔබෙන්
ඉල්ලා සිටින්නේ මෙයයි. ස්වා-
මීන්ගෙන් දිගටම බලය ලබාගෙන[5]
ශක්තිමත් වන්න.[6] **11** යක්ෂයාගේ
උපායන්වලට*[7] විරුද්ධව නොසැලී
ස්ථිරව සිටීම සඳහා දෙවි ලබා දෙන
මුළු යුද්ධායුධ කට්ටලයම පැළඳ-
ගන්න.[8] **12** මන්ද අපට තිබෙන
පොරබැදීම[9] ඇට මස් ලේ නහර සහිත
මිනිසුන්ට විරුද්ධව තිබෙන පොර-
බැදීමක් නොවේ. ඒ වෙනුවට අපට
පොරබැදීමට සිදු වී තිබෙන්නේ මේ
අන්ධකාර ලෝකයට අයත් පාලන
ක්‍රම,[10] බලධාරීන්[11] සහ ලෝක පාල-
කයන්ට[12] විරුද්ධවය. එනම් ස්වර්-
ගීය ස්ථානවල සිටින භූත[13]
සේනාවන්ට විරුද්ධවය. **13** එහෙ-
යින් දෙවි ලබා දෙන මුළු යුද්ධායුධ
කට්ටලයම පැළඳගන්න.[14] ඔබ එසේ
කළොත් නපුරු දවස පැමිණෙන විට
ඔවුන්ට විරුද්ධව සිටීමට ඔබට හැකි
වේ. එලෙසම කළ යුතු සෑම දෙයක්ම
නොපිරිහෙළා ඉටු කළ පසු නොසැලී
ස්ථිරව සිටීමටද ඔබට හැකි වේ.[15]

**14** එහෙයින් ඔබ ඔබේ ඉඟටිය
සත්‍යය[16] නමැති පටියෙන් බැඳගෙන[17]
ධර්මිෂ්ඨකම නමැති ළයවැස්ම[18]
ඇඳගෙන නොසැලී ස්ථිරව සිටින්න.
**15** එමෙන්ම පාවහන්[19] පැළඳගෙන
ගමනට සූදානම්ව සිටින්නා සේ සමා-
දානයේ ශුභාරංචිය[20] නිතරම දේ-
ශනා කිරීමට සූදානම්ව සිටින්න.
**16** සියල්ලට පළමුවෙන් විශ්වාසය
නමැති විශාල පලිහ[21] ඔබේ අතට
ගන්න. එයින් දුෂ්ටයා ඔබ දෙසට
විදින සියලුම ගිනිමය ඊතල නිවා
දැමීමට ඔබට හැකි වේ.[1] **17** ගැල-
වීම නමැති හිස්වැස්මද[2] දෙවිගේ බලය
තුළින් ලබා දී ඇති[3] කඩුවද[4] එනම්,
දේවවචනයද[5] අතට ගන්න. **18** ඒ
සමඟම දෙවි තම බලය තුළින් ලබා
දෙන මඟ පෙන්වීම් ඉල්ලා[6] සෑම අවස්-
ථාවකදීම ඔහුට යාච්ඤා කරන්න.[7]
හැකි සෑම ආකාරයකින්ම යාච්ඤා
කිරීමටත් කන්නලව් කිරීමටත් වග-
බලා ගන්න. ඒ කාරණය මනසේ
තබාගෙන නිරතුරුවම අවදිව සිටි-
මින් ශුද්ධ තැනැත්තන් වෙනුවෙන්
කන්නලව් කරන්න. **19** මා වෙනු-
වෙන්ද කන්නලව් කරන්න. එවිට මට
කතා කිරීමට සිදු වන විට ශුභාරංචි-
යේ පරිශුද්ධ රහස ගැන[8] කිසි බියක්
සැකක් නැතුව නිර්භීතව කතා කිරී-
මට[9] දෙවි මට උපකාර කරනු ඇත.[10]
**20** දම්වැල්වලින් බැඳ සිටින මම
ඒ ශුභාරංචිය වෙනුවෙන් තානාපති-
යෙකු[11] ලෙස කටයුතු කරමි. එහෙයින්
නිර්භීතකමින් කතා කිරීමට හැකියාව
ලබා දෙන මෙන් මා වෙනුවෙන් දෙවිට
කන්නලව් කරන්න. මන්ද මා ඒ ගැන
කතා කළ යුත්තේ එයාකාරයටය.[12]

**21** ප්‍රේමණීය සහෝදරයෙකු
මෙන්ම ස්වාමීන්ගේ විශ්වාසවන්ත
දේවසේවකයෙකුද වන තිකිකස්[13]
මගේ වැඩකටයුතු ගැන හා මගේ සුව
දුක් ගැන ඔබට සියලුම තොරතුරු
ලබා දෙයි.[14] **22** මා ඔහුව ඔබ වෙ-
තට එවන්නේ ඔබට අප ගැන තොර-
තුරු ලබා දී ඔබේ සිතට සහනයක්
ලබා දීමේ අරමුණෙනි.[15]

**23** පියාණන් වන දෙවිගෙන් හා
ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්ගෙන්
සමාදානයත් විශ්වාසය සමඟ ප්‍රේ-
මයත් සහෝදරයන් සියලුදෙනාටම
ලැබේවා! **24** අපගේ ස්වාමීන් වන
යේසුස් ක්‍රිස්තුස්ට කිසිදා වෙනස් නො-
වන ප්‍රේමයක් පෙන්වන සියලුදෙනාට
දෙවිගේ මහත් කරුණාව නොඅඩුව
ලැබේවා![16]

---

එෆී **6:11*** හෝ, "කපටි ක්‍රියාවලට."

**6 පරි.**
**1** ගීතා 24:5 කොලො 3:24
**2** ලෙවී 25:43
**3** 1කොරි 7:22
**4** 2ලේක 19:7
**5** එෆී 3:16
**6** 1කොරි 16:13
**7** ලූක් 4:13 2කොරි 10:5
**8** රෝම 13:12
**9** 2තිමෝ 4:7
**10** රෝම 8:38
**11** දානි 2:38
**12** දානි 2:39
**13** දානි 10:13 ක්‍රියා 17:22 2පේතෘ 2:4 එළි 16:14
**14** 2කොරි 6:7
**15** කොලො 2:7
**16** එෆී 5:9
**17** 1සාමු 25:13 යෙසා 11:5
**18** හිතෝ 4:23 යෙසා 59:17
**19** යෙසා 52:7
**20** ක්‍රියා 10:36 රෝම 10:15
**21** 1යොහ 5:4

**2 තීරුව**
**1** 1පේතෘ 5:9
**2** යෙසා 59:17 1තෙස 5:8
**3** යොහ 6:63
**4** යෙසා 49:2
**5** හෙබ්‍රෙ 4:12
**6** මතෙ 6:6 යූද් 20
**7** කොලො 4:2
**8** කොලො 1:23 කොලො 4:3
**9** 2කොරි 3:12 1තිමෝ 3:13 හෙබ්‍රෙ 3:6
**10** ක්‍රියා 4:29
**11** 2කොරි 5:20
**12** කොලො 4:4
**13** 2තිමෝ 4:12 තීත 3:12
**14** කොලො 4:7
**15** කොලො 4:8
**16** කොලො 4:18

# ෆිලිප්පිවරුන්ට
## ලියූ ලිපිය

1 ක්‍රිස්තුස් යේසුස්ගේ දාසයන්[1] වන
පාවුල් සහ තිමෝති මෙම ලිපිය
ලියන්නේ ක්‍රිස්තුස් යේසුස් සමඟ
එකට බැඳී සිටින සභාව රැකබලා
ගන්නන් සහ සහායක සේවකයන්[2]
ඇතුළු ෆිලිප්පියේ[3] සිටින සියලු ශුද්ධ
තැනැත්තන් වෙතටය.
2 අපගේ පියාණන් වන දෙවිගෙන්
සහ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්-
ගෙන් ඔබට මහත් කරුණාවත් සමා-
දානයත් ලැබේවා![4]
3 මට ඔබව සිහි වන සෑම මො-
හොතකම මම මගේ දෙවිට ස්තුති
කරමි.[5] 4 ඔබ සියලුදෙනා උදෙසා
මා දෙවිට කන්නලව් කරන සෑම
අවස්ථාවකදීම[6] මම එසේ කරමි.
මා ප්‍රීතියෙන් මගේ කන්නලව් ඔප්පු
කරන අතර, 5 ඔබ ශුභාරංචිය පිළි-
ගත් මුල් දවසේ පටන් මේ මො-
හොත වන තුරු ඒ වෙනුවෙන් ඔබ
කළ දේවල් ගැන[7] දෙවිට ස්තුති-
වන්ත වෙමි. 6 ඔබ අතරේ යහ-
පත් කාර්යයක් ආරම්භ කළ දෙවි,
යේසුස් ක්‍රිස්තුස්ගේ දවස[8] පැමිණෙන
විට ඒ කාර්යය සම්පූර්ණයෙන්ම අව-
සන් කරයි[9] කියා මට විශ්වාසයි.
7 ඔබ සියලුදෙනා තුළින් ඒ දේ
ඉටු වෙයි කියා සිතීම සුදුසුය. මන්ද
ඔබ මට හිතවත්ය.[10] ඔබ සියලුදෙනා
මා සමඟ[11] දෙවිගේ මහත් කරුණාව
භුක්ති විඳිමින් සිටින්නහුය. මගේ අත්
පාවලට විලංගු දමා තිබෙන අවස්-
ථාවලදී[12] පමණක් නොව ශුභාරංචිය
වෙනුවෙන් කතා කර[13] එය ප්‍රකාශ
කිරීමේ අයිතිය නීත්‍යානුකූලව[14] තහ-
වුරු කිරීමට සිදු වූ අවස්ථාවලදීද
ඔබේ සහාය මට ලැබිණ.
8 ඔබ සියලුදෙනාව දැක බලා
ගැනීමට මා තුළ කොතරම් ආශාවක්
තිබෙනවාද කියා දෙවි මා වෙනුවෙන්
සාක්ෂි දරයි. ඔබ සඳහා මට තිබෙන
සෙනෙහස[15] ක්‍රිස්තුස් යේසුස්ට අප
සඳහා තිබෙන සෙනෙහසට සමානය.
9 දෙවිගේ කැමැත්ත පිළිබඳ නිවැ-
රදි දැනුමක්[1] හා පූර්ණ අවබෝධයක්[2]
ඇතුව ඔබේ ප්‍රේමය තව තවත් වැඩි
වෙන්න[3] කියා මම ඔබ වෙනුවෙන්
නිරතුරුව යාච්ඤා කරමි. 10 එලෙ-
සම වඩා වැදගත් දේවල් මොනවාද
කියා පැහැදිලිව අවබෝධ කරගැනී-
මට[4] ඔබට හැකියාව ලබා දෙන්න
කියාත් යාච්ඤා කරමි. එවිට ක්‍රිස්තුස්-
ගේ දවස දක්වා නිදොස්ව සිටීමටත්[5]
අනුන්ගේ විශ්වාසයට හානි නොකර[6]
කටයුතු කිරීමටත් ඔබට හැකි වන
අතර, 11 යේසුස් ක්‍රිස්තුස් මාර්ග-
යෙන් ඔබේ ජීවිත ධර්මිෂ්ඨ ක්‍රියාවලින්
පූර්ණ කරගැනීමටත්[7] ඔබට හැකි වේ.
එමගින් දෙවිට ප්‍රශංසාවත් ගෞරවයත්
ලැබේ.[8]
12 සහෝදරයෙනි, මට අද්දැකීමට
සිදු වූ දේවල් ශුභාරංචියේ දියුණුවට
දායක වුවා මිස[9] එයින් කිසි අවා-
සියක් සිදු වී නැති බව ඔබ දැන-
ගන්නවාට කැමැත්තෙමි. 13 මට
විලංගු දමා තිබෙන්නේ[10] මා ක්‍රිස්තුස්-
ගේ අනුගාමිකයෙකු වන නිසා බව
මුළු ප්‍රීටෝරියානු ආරක්ෂක බළඇ-
ණියේ අය අතරත් අන් සියලුදෙනා
අතරත්[11] ප්‍රසිද්ධ වී ඇත.[12] 14 මා
සිරභාරයේ සිටියත් ස්වාමීන්ට සේවය
කරන සහෝදරයන්ගෙන් වැඩිදෙනෙ-
කුට එය මහත් දිරිගැන්වීමක් වී තිබේ.
ඒ නිසා දෙවිගේ පණිවිඩය ගැන නිර්-
භීතව කතා කිරීමට ඔවුහු තව තවත්
පෙලඹෙති.[13]
15 සමහරුන් ඊර්ෂ්‍යාවෙන් හා
තරඟකාරී ස්වභාවයකින්[14] ක්‍රිස්-
තුස් ගැන දේශනා කරන බව ඇත්-
තයි. නමුත් තවත් සමහරුන් සේවය
කරන්නේ පිරිසිදු චේතනාවකිනි.[15]
16 එවැනි අය ක්‍රිස්තුස් ගැන කතා
කරන්නේ ඔවුන් තුළ තිබෙන ප්‍රේ-
මය නිසාය. මන්ද මා මෙහි සිටින්නේ

**1 පරි.**
1 1කොරි 7:22
2 1තිමෝ 3:1, 1තිමෝ 3:8
3 ක්‍රියා 16:12
4 එෆී 1:2
5 රෝම 1:8
6 1තෙස 1:2
7 ෆිලි 1:27
8 1කොරි 1:8
9 ෆිලි 2:13
10 2කොරි 3:2
11 ෆිලි 4:14
12 එෆී 3:1, ෆිලි 1:13, කොලො 4:18, 2තිමෝ 1:8, ෆිලෙ 13
13 ක්‍රියා 24:10, ක්‍රියා 24:14, ෆිලි 1:16
14 ක්‍රියා 25:11
15 කොලො 3:12

**2 තීරුව**
1 යොහ 17:3, 2පේතෘ 3:18
2 1කොරි 10:15, හෙබ්‍රෙ 5:14
3 1තෙස 3:12
4 රෝම 12:2, එෆී 5:10
5 ෆිලි 2:15
6 රෝම 14:13, රෝම 14:21
7 යොහ 15:5, යාකො 3:18
8 එෆී 1:14
9 ෆිලි 1:14
10 එෆී 3:1
11 ෆිලි 4:22
12 ක්‍රියා 28:31
13 2තිමෝ 2:9
14 මතෙ 7:22, 2කොරි 12:20
15 1කොරි 9:17, 1කොරි 13:2

ශුභාරංචිය වෙනුවෙන් කතා කිරීමට[1]
බව ඔවුහු දනිති. **17** නමුත් ඊර්ෂ්‍යා-
වෙන් හා තරඟකාරී ස්වභාවයකින්[2]
දේශනා කරන අයට පිරිසිදු චේතනා-
වක් නැත. ඔවුන් දබරකාරීය. ඔවුන්
අදහස් කරමින් සිටින්නේ සිරභාරයේ
සිටින මට පීඩා හා ප්‍රශ්න ඇති කිරීම-
ටය.[3] **18** එසේනම් ඒ ගැන කරන්-
නේ කුමක්ද? කිසිවක් කිරීම අවශ්‍ය
නැත. මන්ද සමහරුන් වංක චේතනා-
වකින් කටයුතු කළත්[4] තවත් සමහ-
රුන් අවංක චේතනාවකින් කටයුතු
කළත් ඒ දෙයාකාරයෙන්ම ක්‍රිස්තුස්
ගැන ප්‍රසිද්ධ වන නිසා[5] මම ඒ ගැන
සතුටු වෙමි. ඇත්තෙන්ම ඒ ගැන සෑම
දිනකම සතුටු වන්නෙමි. **19** ඔබ
කරන කන්නලව් තුළින්[6] හා යේසුස්
ක්‍රිස්තුස් මාර්ගයෙන් මට දෙවිගෙන්
ලැබෙන බලය[7] මගින් මට නිදහස
ලැබෙන බව දනිමි. **20** එහෙයින්
මගේ මහත් ආශාව[8] මෙන්ම බලාපො-
රොත්තුව[9] වන්නේ කිසි ලෙසකින්වත්
ලැජ්ජා නොවී,[10] කිසි බියක් සැකක්
නැතුව කතා කරමින්[11] පෙර සේම
දැනුත් මගේ ජීවිතය තුළින්[12] ක්‍රිස්-
තුස්ව ප්‍රශංසාවට ලක් කිරීමය. මා
ජීවත් වුණත් මැරුණත් දිගටම එසේ
කරමි.[13]

**21** මා ජීවත් වන්නේ ක්‍රිස්තුස් වෙ-
නුවෙන් කැප වී සේවය කිරීමටය.[14]
මා මැරුණත්[15] එයින් අවාසියක් සිදු
නොවේ. **22** දැන් මා දිගටම මිහි-
පිට මිනිසෙකු ලෙස ජීවත් වුව-
හොත් මා කරන සේවයෙන් මට
තවත් ප්‍රතිඵල නෙළාගත හැකියි.[16]
නමුත් මා කරන තේරීම කුමක්ද කියා
ප්‍රසිද්ධ නොකරමි. **23** මට ඇති මේ
තේරීම් දෙක නිසා මට යම් පීඩන-
යක් දැනුණත්[17] මගේ එකම ආශාව
වන්නේ මේ ජීවිතයෙන් නිදහස් වී
ක්‍රිස්තුස් සමඟ සිටීමය.[18] ඇත්තෙන්ම
වඩාත් හොඳම දෙය වන්නේ එයයි.[19]
**24** නමුත් ඔබ නිසා තවදුරටත් මිනි-
සෙකු ලෙස මිහිපිට ජීවත් වීමට මට
අවශ්‍ය වී ඇත.[20] **25** මට ඒ දේ
හොඳින් අවබෝධ වී ඇති නිසා තවදු-
රටත් මිහිපිට සිටිය යුතුයි කියා කිසි
සැකයකින් තොරව පැවසිය හැක.
එමෙන්ම ඔබ දියුණුවක් ලබනවා
දැකීමටත්[1] ඔබ තුළ ඇති විශ්වාසයේ
ප්‍රතිඵලයක් ලෙස ඇති වන ප්‍රීතිය
දැකීමටත් මට අවශ්‍ය නිසා මම ඔබ
සියලුදෙනා සමඟ තවදුරටත් සිටින්-
නෙමි.[2] **26** මා නැවතත් පැමිණ ඔබ
ළඟ සිටින නිසා* ක්‍රිස්තුස් යේසුස්-
ගේ අනුගාමිකයන් ලෙස ඔබ අද්දකින
ප්‍රීතිය තව තවත් වැඩි වනු ඇත.

**27** නිතරම ක්‍රිස්තුස් පිළිබඳ ශුභා-
රංචියට ඔබින ආකාරයකින් හැසිරෙ-
න්න.[3] ඔබ එසේ කළොත් මා ඔබව
බැලීමට පැමිණියත් නැතත් ඔබ
සියලුදෙනාම එකඟතාවකින් සිතන
බවත් ශුභාරංචිය මත පදනම් වූ ඔබේ
විශ්වාසය රැකගැනීමට එකා මෙන්[4]
මහත් වෑයමක් දරන බවත් මට දැන-
ගත හැකි වෙයි. **28** එලෙසම ඔබට
විරුද්ධව සිටින අයට ඔබ කිසි ලෙස-
කින්වත් බිය නොවී සිටින බවත්[5]
මට දැනගත හැකි වෙයි. ඒ සියල්-
ලෙන් ඔප්පු වන්නේ ඔවුන් විනාශයට
ලක් වන බවත් ඔබට ගැලවීම අත්
වන බවත්ය.[6] ඊට සාක්ෂි සපයන්-
නේ දෙවිය. **29** ඔබට ක්‍රිස්තුස් කෙ-
රෙහි විශ්වාසය තැබීමේ වරප්‍රසාදය
පමණක් නොව[7] ඔහු වෙනුවෙන් දුක්
විඳීමේ වරප්‍රසාදයද[8] ලබා දී තිබේ.
**30** මන්ද මට විඳින්න සිදු වූ අසී-
රුතා ඔබ දුටු අතර[9] ඔබට ආරංචි වන
ආකාරයට තවමත් ඒ අසීරුතාවලට
මම මුහුණ දෙමින් සිටිමි.[10] එයාකාර
අසීරුතාවලට මුහුණ දෙන්න ඔබටත්
සිදු වී ඇත.

**2** ක්‍රිස්තුස්ගේ අනුගාමිකයෙකු වීම
ඔබට දිරිගැන්වීමක් වී ඇත්-
නම්[11] ප්‍රේමය නිසා ඔබට යම් සැන-
සීමක් ලැබී ඇත්නම් එලෙසම ඔබ
එකිනෙකා අතර ගැඹුරු සැලකිල්ල,[12]
සෙනෙහස[13] සහ දයානුකම්පාව ඇත්-
නම්, **2** මම සතුටු වන්නෙමි. නමුත්

පිලි **1:26*** පැමිණ සිටීම. ග්‍රීක බසින්, පරූසියා. උපග්‍ර. 7 බලන්න.

**1 පරි.**
1 පිලි 1:7
2 යාකො 3:14
3 2කොරි 11:28
4 ගලා 2:4
5 ලූක් 9:50
6 2කොරි 1:11
7 යොහ 15:26; 1පේතෘ 1:11
8 රෝම 8:19
9 රෝම 5:5
10 ගීතා 119:46; රෝම 1:16; 2තිමෝ 1:8
11 එෆී 6:20
12 2කොරි 4:10; කොලො 1:24
13 රෝම 14:8; 1පේතෘ 4:16
14 ගලා 2:20; ගලා 6:14
15 1තෙස 4:14; 2තිමෝ 4:8; එළි 14:13
16 යොහ 15:16
17 2කොරි 5:6
18 2තිමෝ 4:6
19 1කොරි 15:42; 2කොරි 5:8
20 ක්‍රියා 9:15; ක්‍රියා 20:29

**2 තීරුව**
1 රෝම 1:11; එෆී 4:12; 1තිමෝ 4:15
2 පිලෙ 22
3 එෆී 4:1; කොලො 1:10
4 ක්‍රියා 4:32; රෝම 15:6; 1කොරි 1:10; එෆී 4:3
5 1කොරි 16:9
6 ලූක් 21:19; 2තෙස 1:5
7 එෆී 2:8
8 ක්‍රියා 5:41; රෝම 5:3
9 ක්‍රියා 16:22; 1තෙස 2:2; 2තිමෝ 3:12
10 කොලො 1:24

**2 පරි.**
11 රෝම 1:12
12 2කොරි 13:14
13 පිලි 1:8; කොලො 3:12; 1පේතෘ 1:22

එකඟතාවකින් සිටීමටත්[1] එකිනෙ-
කාට එක හා සමාන ප්‍රේමයක් පෙන්-
වීමටත් එක ශරීරයක් සේ සමඟියෙන්
සිටීමටත් එක හා සමාන ආකාර-
යකින් කල්පනා කිරීමට පුරුදු වීම-
ටත්[2] ඔබ වගබලා ගන්නවා නම්
එයින් මගේ ප්‍රීතිය තවත් වැඩි වෙයි.
**3** කිසි දෙයක් දබරකාරී ස්වභාවය-
කින්වත්[3] අහංකාරකමින්වත්[4] නො-
කරන්න. ඒ වෙනුවට නිහතමානීව
අන් අය ඔබට වඩා උතුම් කියා[5]
සිතන්න. **4** ඔබේම කාරණා ගැන
පමණක් සිතමින් සිටිනවා වෙනු-
වට[6] එකිනෙකා කෙරෙහිත් පෞද්ග-
ලික සැලකිල්ල දක්වන්න.[7]

**5** එසේ ක්‍රියා කළ ක්‍රිස්තුස් යේසුස්
තුළ තිබුණු ආකල්පයම ඔබ තුළත්
තිබිය යුතුයි.[8] **6** ඔහු දෙවිට යම්
සමානකමක් දැරුවත්[9] තමන් දෙ-
විගේ තැන ගෙන දෙවිට සමාන
විය යුතුයි කියා කිසි ලෙසකින්-
වත් සිතුවේ නැත.[10] **7** ඒ වෙනු-
වට ඔහු තමා සතු සියල්ල අත්හැර
දාසයෙකු හා සමාන විය.[11] ඔහු
මෙලොවට පැමිණියේ මිනිසෙකු ලෙ-
සය.[12] **8** එපමණක්ද නොව ඔහු
මිනිසෙකු ලෙස සිටියදී[13] බොහෝ
සෙයින් යටහත්පහත් වූයේය. කොත-
රම් යටහත් වූවාද කිවහොත් මරණය
විඳීමට එනම්, වධකණුවක මරණයක්
විඳීමට[14] තරම් ඔහු දෙවිට කීකරු
වූයේය.[15] **9** දෙවි ඔහුව කලින් සිටි
තත්වයටත් වඩා උතුම් තත්වය-
කට පත් කළේ ඒ නිසාය.[16] එලෙ-
සම අන් සියලු නාමවලට වඩා උසස්
නාමයක්[17] දෙවි ඔහුට කාරුණිකව
ලබා දුන්නේය. **10** දෙවි එසේ කළේ
ස්වර්ගයෙහිද පොළොවෙහිද පො-
ළෝගැබෙහිද සිටින සියලුදෙනා යේ-
සුස්ගේ නාමය පිළිගෙන ඔහුට දණ
නැමීම සඳහාය.[18] **11** එලෙසම යේ-
සුස් ක්‍රිස්තුස් ස්වාමීන් බව[19] සියලුදෙ-
නාම ප්‍රසිද්ධියේ පිළිගැනීම සඳහාය.[20]
එයින් පියාණන් වන දෙවිට සියලු
ප්‍රශංසා සහ ගෞරවය හිමි වනු ඇත.[21]

**12** ඇත්තෙන්ම මගේ ප්‍රේමණීය
සහෝදරයෙනි, ඔබත් නිරතුරුවම
කීකරුකම පෙන්වා ඇත.[1] ඔබ එසේ
කළේ මා ඔබ ළඟ සිටියදී* පමණක්
නොවේ. මා ඔබෙන් ඈත්ව සිටි විටත්
ඔබ ඊටත් වඩා උනන්දුවකින් එසේ
කළහුය. දැනුත් ඔබ කරමින් සිටින්-
නේ එයයි. එහෙයින් දේවගරුබියක්
ඇතුව[2] ඔබ ගැන ඕනෑවට වඩා විශ්-
වාසයක් නොතබමින් ඔබේ ගැලවීම
ස්ථිර කරගැනීමට උත්සාහ කරන්න.
**13** මන්ද ඔබව ශක්තිමත් කරන්නේ
දෙවිය.[3] ඒ නිසා ඔහුට ප්‍රසන්න වන
දේ ඉටු කිරීමට ඔහු ඔබ තුළ ආශා-
වක් මෙන්ම පෙලඹීමක් ඇති කරයි.[4]
**14** ඔබ කුමන දේ කළත් මැසි-
විලි නැඟීමෙන්[5] හා වාදවිවාදවලින්[6]
වැළකී සිටින්න. **15** එවිට ඔබට
නිර්දෝෂ[7] මෙන්ම අවංක අය විය
හැක. වංක, නොමඟ ගිය මිනිස් පරම්-
පරාවක්[8] අතරේ ඔබ සිටියත් ඔබ දෙ-
විගේ නිකැළැල් දරුවන්[9] විය යුතුයි.
මෙලොවෙහි ඔබ බැබළෙන්නේ දැල්වූ
පහන් හා සමානවය.[10] **16** එහෙයින්
දිගටම දෙවිගේ ජීවනදායක පණිවි-
ඩය තදින් අල්ලාගෙන සිටින්න.[11] ඔබ
එසේ කළොත් ක්‍රිස්තුස්ගේ දවස පැමි-
ණෙන විට[12] දිවීමටත් සේවය කිරී-
මටත් මා දැරූ වෙහෙස නිෂ්ඵල
නොවූ බව දැනගැනීමෙන්[13] මට ප්‍රීති-
යෙන් ඉපිල යා හැකියි. **17** ඔබ තුළ
තිබෙන විශ්වාසය නිසා[14] මහජනයා
වෙනුවෙන් ඔබ කරන මෙම සේවය
පූජාවක් හා සමානය.[15] ඒ පූජාව වෙනු-
වෙන් පාන පූජාවක් ලෙස[16] මගේ ජීවි-
තය පුද කරන්න සිදු වුණත් මම එය
සතුටින් කරමි. මට දැනෙන සතුට[17]
ඔබ සියලුදෙනා සමඟ බෙදාගන්නෙමි.
**18** එලෙසම ඔබත් සතුටු වන්න. මා
සමඟ ප්‍රීති වන්න.[18]

**19** ස්වාමීන් වන යේසුස් කැමති
නම් වැඩි කලක් යෑමට මත්තෙන්

**2 පරි.**
**1** රෝම 15:5; 2කොරි 13:11; 1පේතෘ 3:8
**2** 1කොරි 1:10
**3** 2කොරි 12:20; පිලි 1:15; පිලි 1:17; යාකො 3:14
**4** ගලා 5:26
**5** මතෙ 23:11; එෆී 4:2; එෆී 5:21
**6** රෝම 12:10; 1කොරි 10:33; 1කොරි 13:5
**7** 1කොරි 10:24
**8** මතෙ 11:29; යොහ 13:15
**9** කොලො 1:15; හෙබ්‍රෙ 1:3
**10** යොහ 14:28
**11** යෙසා 53:3
**12** යොහ 1:14; රෝම 1:3
**13** හෙබ්‍රෙ 2:9; හෙබ්‍රෙ 10:5
**14** ද්වි 21:23; ගලා 3:13
**15** යෙසා 50:5; යොහ 10:17; හෙබ්‍රෙ 5:8
**16** යෙසා 52:13; ක්‍රියා 2:33; එෆී 1:21
**17** ක්‍රියා 4:12
**18** යොහ 5:23
**19** ක්‍රියා 2:36
**20** රෝම 10:9
**21** ගීතා 22:27

**2 නිරූව**
**1** රෝම 16:19
**2** 2කොරි 7:15; හෙබ්‍රෙ 12:28
**3** යෙරෙ 31:33; 2කොරි 3:5; හෙබ්‍රෙ 13:21
**4** 2ලේක 30:12; 1තෙස 4:8
**5** 1කොරි 10:10; 1පේතෘ 4:9
**6** 1තිමෝ 2:8
**7** 1කොරි 1:8; එෆී 5:27
**8** ද්වි 32:5; මතෙ 17:17; 1පේතෘ 2:12
**9** රෝම 8:16; එෆී 5:1
**10** මතෙ 5:14; එෆී 5:8; 1පේතෘ 2:9
**11** යොහ 6:68; හෙබ්‍රෙ 4:12
**12** 2කොරි 1:14; 1තෙස 2:19
**13** යෙසා 49:4; ගලා 2:2; 1තෙස 3:5
**14** 2කොරි 12:15

**15** හෙබ්‍රෙ 13:15; 1පේතෘ 2:5; **16** නික් 29:40; 2තිමෝ 4:6; **17** පිලි 1:18; **18** පිලි 3:1.

පිලි **2:12*** පැමිණ සිටීම. ග්‍රීක බසින්, පරූසියා. උපග්‍ර. 7 බලන්න.

ඔබ වෙතට තිමෝතිව එවීමට මම
අදහස් කරගෙන සිටිමි. එවිට ඔබ
ගැන තොරතුරු ඔහු මාර්ගයෙන් මට
ලැබෙන විට ඒවා අසා මට සතුටු
විය හැක.[1] **20** ඔහුට සමාන ගති-
ලක්ෂණ ඇති, ඔහු තරම් ඔබ ගැන
සැලකිලිමත් වන පුද්ගලයෙකු තවත්
මට නැති තරමය. ඔහු ඔබ වෙතට
පැමිණ ඔබ ගැන අවංක සැලකිල්-
ලක් දක්වයි[2] කියා මට විශ්වාසයි.
**21** අන් සියලුදෙනාම තම තමන්ට
වුවමනා දේ පසුපස හඹා යති.[3] ඔවුහු
ක්‍රිස්තුස් යේසුස්ට සේවය කිරීම ගැන
උනන්දු වන්නේ නැත. **22** නමුත්
ඔහු ඒ සේවය සඳහා කොතරම් සුදුසු
කෙනෙක්ද කියා ඔබටත් හොඳ අව-
බෝධයක් ඇත. පියෙකු සමඟ සිටින
දරුවෙක් මෙන්[4] ඔහු මා සමඟ ශුභාරං-
චිය වෙනුවෙන් මහත් කැප වීමකින්
යුතුව සේවය කළේය. **23** එහෙයින්
මට කුමක් සිදු වෙයිද කියා දැන-
ගත් වහාම ඔබ වෙතට එවීමට මා
අදහස් කරගෙන සිටින්නේ ඔහුවයි.
**24** ඇත්තෙන්ම ස්වාමීන් කැමති නම්
කෙටි කලකින් මටත් ඔබ වෙතට
ඒමට අවස්ථාවක් ලැබෙයි කියා මට
විශ්වාසයි.[5]

**25** නමුත් මගේ සහෝදරයා හා
හවුල් සේවක[6] මෙන්ම මගේ සෙසු සේ-
වායෙකු[7] වන එපප්‍රොදිතස්ව[8] දැන්
ඔබ වෙතට එවීම සුදුසුයි කියා
මට සිතේ. ඔබ ඔහුව මා වෙ-
තට එවා තිබුණේ මට උපකාර
කිරීම සඳහාය. **26** ඔහු ඔබ සියලු-
දෙනාව දැක බලා ගැනීමට මහත්
ආශාවකින් සිටියි. නමුත් ඔහු අස-
නීපයෙන් සිටි බව ඔබට ආරංචි
වූ නිසා ඔහු සිටින්නේ යම් කල-
කිරීමකිනි. **27** ඇත්තෙන්ම ඔහුගේ
අසනීප තත්වය කොතරම් බරප-
තළ වුවාද කිවහොත් ඔහු මර-
ණාසන්න තත්වයටම පැමිණියේය.
කෙසේවෙතත් දෙවි ඔහුට දයාව
දැක්වූවේය.[9] ඇත්තෙන්ම එමගින්
දෙවි මටත් දයාව දැක්වූවේය. එසේ
වූයේ නැත්නම් මගේ ශෝකය දරා-
ගත නොහැකි වන තරමට තවත්
වැඩි වනු ඇත. **28** එහෙයින් ඔබට
ඔහුව දැක, නැවත ප්‍රීති වීම සඳහා
මම ඔහුව ඉක්මනින්ම ඔබ වෙතට
එවන්නෙමි. එමගින් මගේ ශෝකයත්
අඩු වනු ඇත. **29** එහෙයින් ඔබ
සාමාන්‍යයෙන් ස්වාමීන්ගේ අනුගාමි-
කයන්ව සාදරයෙන් පිළිගන්නා ආකා-
රයට ඔහුවත් සාදරයෙන් පිළිගන්න.[1]
එවැනි පුරුෂයන්ට නිසි ගෞරවය දක්-
වන්න.[2] **30** මන්ද ස්වාමීන් වෙනු-
වෙන් සේවය කළ ඔහු, තම ජීවිතය
අනතුරේ හෙළමින් මරණයේ අබිය-
සට පවා පැමිණියේය.[3] එමගින් ඔබට
කිරීමට නොහැකි වූ දෙයක් ඔහු මා
වෙනුවෙන් කළේය.[4]

**3** මගේ සහෝදරයෙනි, අවසන්
වශයෙන් මා ඔබට කියන්-
නේ ස්වාමීන් සමඟ එකට බැඳී
සිටින අය ලෙස දිගටම ප්‍රීතියෙන්
සිටින්න[5] කියාය. එකම දේ නැවත
ලිවීමට සිදු වුණත් මම එය කරදරයක්
ලෙස සලකන්නේ නැත. එසේ ලියන්-
නේ ඔබේ ආරක්ෂාව සඳහාය.

**2** නින්දිත ක්‍රියාවල යෙදෙන,[6]
හානිකර දේවල් කරන සහ චර්මච්-
ඡේදනය කිරීමේ පිළිවෙතට පක්ෂව
සිටින අයගෙන්[7] පරෙස්සම් වන්න.
**3** සැබෑ ලෙස චර්මච්ඡේදනය කර
තිබෙන්නේ අපවය.[8] මන්ද අපි මිනි-
සුන් වැදගත් ලෙස සලකන දේවල්
කෙරෙහි අපගේ විශ්වාසය තබන්නේ
නැත.[9] ඒ වෙනුවට අප දෙවිට පරිශුද්ධ
සේවයක් කරන්නේ ඔහුගේම බලයේ
උපකාරයෙනි.[10] එලෙසම අප ආඩම්-
බර වන්නේ ක්‍රිස්තුස් යේසුස් ගැනය.[11]
**4** මිනිසුන් වැදගත් ලෙස සලකන
දේවල් ගැන යම් කෙනෙකුට ආඩම්බ-
රයෙන් කතා කළ හැකි නම් මටත්
එලෙස කතා කළ හැකිය.

මිනිසුන් වැදගත් ලෙස සලකන
දේවල් ගැන ආඩම්බරයෙන් කතා
කිරීමට යම් හේතු ඇති බව යමෙ-
කුට සිතිය හැක. නමුත් එවැන්-
නෙකුට වඩා මට ඒ සඳහා හේතු
ඇත.[12] **5** මා ඊශ්‍රායෙල් පෙළපතෙන්

**2 පරි.**
1 හිතෝ 25:25; 2කොරි 7:7
2 1කොරි 4:17; 1කොරි 16:10
3 1කොරි 10:24; ගලා 4:17; 2තිමෝ 4:10
4 1කොරි 4:17; 2තිමෝ 1:2
5 පිලි 1:25; පිලෙ 22
6 2කොරි 8:23
7 පිලෙ 2
8 පිලි 4:18
9 ගීතා 30:3; ගීතා 34:19

**2 තීරුව**
1 කොලො 4:10
2 1කොරි 16:18; 1තෙස 5:12
3 ක්‍රියා 20:24
4 1කොරි 16:17; පිලෙ 13

**3 පරි.**
5 2කොරි 13:11; පිලි 4:4; 1තෙස 5:16
6 එළි 22:15
7 රෝම 2:28; ගලා 5:2
8 ද්වි 10:16; යෙරෙ 4:4; රෝම 2:29; කොලො 2:11
9 2කොරි 11:18
10 ක්‍රියා 2:17; රෝම 8:26
11 ගලා 6:14; හෙබ්‍රෙ 9:14
12 2කොරි 11:22

පැමිණි බෙන්ජමින් ගෝත්‍රයට අයත්
කෙනෙකි.[1] මාව චර්මච්ඡේදනය කළේ
අටවෙනි දිනේදීය.[2] මා හෙබ්‍රෙව් ජාති-
කයෙකි. මගේ දෙමාපියෝද හෙබ්‍රෙව්
ජාතිකයෝය.[3] එලෙසම මා නීති-
යට ඇලී සිටි පරිසිවරුන්ගේ නිකායේ
සාමාජිකයෙකි.[4] **6** මා කොතරම්
උද්‍යෝගයකින් කටයුතු කළාද කිව-
හොත් මම සභාවට පීඩා කළෙමි.[5]
නීතියට කීකරු වීම අතින් මා ධර්මිෂ්-
ඨයෙකු වූ අතර අන් සියලු පැති-
වලින්ම නිර්දෝෂ කෙනෙක් ලෙස
මම නම් දරා සිටියෙමි. **7** නමුත්
මට වාසියක් ලෙස සැලකිය
හැකි ඒ දේවල් මම ක්‍රිස්තුස් වෙනුවෙන්
කැමැත්තෙන්ම අත්හැර දැමුවෙමි.[6]
**8** ඇත්තෙන්ම මගේ ස්වාමීන් වන
ක්‍රිස්තුස් යේසුස් පිළිබඳ මා ලබාගත්
දැනුම කොතරම් අනර්ඝද[7] කිවහොත්
මට තිබුණු සියල්ල මා සලකන්නේ
කිසි වටිනාකමක් නැති දේවල් හැටිය-
ටය. ඔහු වෙනුවෙන් මට සෑම දෙ-
යක්ම අහිමි වුවත් ඒ ගැන මට කිසි
දුකක් නොදැනෙන අතර එසේ අහිමි වූ
දේවල් මා සලකන්නේ කුණු ගො-
ඩක් ලෙසය.[8] මා ඒ සියල්ල කළේ
ක්‍රිස්තුස් සමඟ කිට්ටු බැඳීමක් ඇති
කරගෙන, **9** ඔහු සමඟ එකට බැඳී
සිටින කෙනෙකු ලෙස පිළිගනු ලැබීම-
ටය. ඒ අනුව නීතිය පිළිපැද මගේම
උත්සාහයෙන් ධර්මිෂ්ඨයෙකු වෙනවා
වෙනුවට[9] ක්‍රිස්තුස් කෙරෙහි විශ්වා-
සය තැබීමෙන්[10] මම ධර්මිෂ්ඨයෙක්
වෙමි. ඒ ධර්මිෂ්ඨකම පැමිණෙන්-
නේ දෙවිගෙනි. එයට පදනම විශ්වා-
සයයි.[11] **10** එමගින් ක්‍රිස්තුස්ව දැන
හඳුනා ගෙන ඔහුගේ නැවත නැඟි-
ටීම කොතරම් බලවත් දෙයක්ද[12]
කියා තේරුම්ගැනීමට හැකි වන අතර
ඔහු මෙන් දුක් විඳිනවා කීමෙන් අද-
හස් කරන්නේ කුමක්ද[13] කියා තේ-
රුම්ගැනීමටත් හැකි වේ. එහෙයින්
ඔහු අද්දැක්කා හා සමාන මරණයක්
අද්දැකීමට මම සතුටු වන්නෙමි.[14]
**11** ඇතැම්විට යම් ආකාරයකින් හෝ
මුලින්ම මරණයෙන් නැවත නැඟිටු-
වන අය අතර[1] සිටීමට අවස්ථාවක්
මට ලැබිය හැක.

**12** එයින් මා අදහස් කරන්නේ
මගේ ත්‍යාගය මා දැනටමත් ලබා-
ගෙන සිටිනවා කියාවත් මා පූර්ණ
තත්වයකට පත් වී සිටිනවා කියාවත්
නොවේ.[2] ඒ වෙනුවට ක්‍රිස්තුස් යේ-
සුස් මාව තෝරාගෙන මට ලබා දීමට
යන ඒ දේ[3] අත් කරගැනීම සඳහා[4]
මම දැඩි වෑයමක නිරත වී සිටිමි.[5]
**13** සහෝදරයෙනි, ඒ දේ මා අත් කර-
ගෙන ඇති බව මට තවමත් සිතන්-
නේ නැත. නමුත් මම එක දෙයක්
කරමි. එනම් මා අත්හැර දැමූ දේවල්
අමතක කර[6] ඉදිරියේ තිබෙන දේවල්
අත් කරගැනීමට මහත් වෑයමක්
දරමින් සිටිමි.[7] **14** මගේ ත්‍යාගය[8]
ලබාගැනීමේ අදහසින් මම දිගටම
දුවමින් සිටින්නෙමි.[9] ඒ ත්‍යාගය
නම් ස්වර්ගයට යෑම සඳහා යේසුස්
ක්‍රිස්තුස් මාර්ගයෙන් දෙවිගෙන් ලැබූ
කැඳවීමය.[10] **15** ඒ අනුව අවබෝධ-
යෙන් ක්‍රියා කරන අය ලෙස කටයුතු
කරන අපි සියලුදෙනාම,[11] ක්‍රිස්තුස්ට
තිබූ ආකල්පය ඇතුව[12] සිටිමු. ඔබට
තිබෙන ආකල්පය යම් පැතිවලින්
වෙනස් කරගත යුතු නම් තිබිය යුතු
නිවැරදි ආකල්පය කුමක්ද කියා දෙවි
ඔබට හෙළි කරනු ඇත. **16** මෙත-
රම් දුරකට ප්‍රගතියක් ලබාගැනීමට
අප යම් දේවල් කළා නම් ඒ දේවල ඒ
අයුරින්ම දිගටම නිරත වෙමු.[13]

**17** සහෝදරයෙනි, ඔබ සියලුදෙ-
නාටම මා කියන්නේ, මාව අනුකර-
ණය කරන්න[14] කියාය. එලෙසම අප
තැබූ ආදර්ශයට අනුව තම ජීවිත ගත
කරන අයවද සැලකිල්ලට ගන්න.[15]
**18** මන්ද ක්‍රිස්තුස් වධකණුවේ වින්ද
මරණය ගැන කිසිම අගය කිරී-
මක් නොදක්වමින් තම ජීවිත ගත
කරන බොහෝදෙනෙක් සිටිති.[16] මම
කලින් ඔවුන් ගැන කිහිප වතාවක්ම
සඳහන් කළ ලෙසම දැනුත් කඳුළු
සලමින් ඔවුන් ගැන සඳහන් කරමි.
**19** ඔවුන්ට අවසානයේදී අත් වන්නේ
විනාශය පමණි.[17] ඔවුන් දෙවියෙකු සේ

**3 පරි.**

1 රෝම 11:1
2 උත් 17:12; ලෙවී 12:3
3 2කොරි 11:22
4 ක්‍රියා 23:6; ක්‍රියා 26:5
5 ක්‍රියා 8:3; ක්‍රියා 9:1; ගලා 1:13
6 මතෙ 13:44
7 එෆී 4:13; 2පේත්‍රු 3:18
8 1කොරි 2:2
9 රෝම 3:20; රෝම 10:3
10 රෝම 4:5; රෝම 9:30; ගලා 2:16
11 රෝම 1:17; රෝම 3:21
12 1කොරි 15:22; 2කොරි 13:4
13 රෝම 8:17; 2කොරි 4:10; කොලො 1:24
14 රෝම 6:5

---

**2 තීරුව**

1 ලූක් 14:14; 1තෙස 4:16; එළි 20:6
2 හෙබ්‍රෙ 12:23
3 ක්‍රියා 9:15
4 1තිමෝ 6:12
5 ලූක් 13:24
6 ලූක් 9:62
7 1කොරි 9:24
8 2තිමෝ 4:8
9 හෙබ්‍රෙ 12:1
10 රෝම 8:30; හෙබ්‍රෙ 3:1
11 1කොරි 2:6; 1කොරි 14:20; හෙබ්‍රෙ 5:14
12 පිලි 2:5
13 ගලා 6:16
14 1කොරි 4:16; 2තෙස 3:9
15 පිලි 4:9; තීත 2:7; 1පේත්‍රු 5:3
16 ගලා 5:11; ගලා 6:12
17 2කොරි 11:15; 2පේත්‍රු 2:1

සලකන්නේ ඔවුන්ගේම ආශාවන්ය.*[1]
ඔවුන් යම් දේවල් ගැන ආඩම්බරයෙන්
කතා කළත් ඒ දේවල් ගැන ඔවුන්
ඇත්තෙන්ම ලැජ්ජා විය යුතුයි.[2]
ඔවුන්ගේ මනස් යොමු වී තිබෙන්නේ
මේ ජීවිතයේ තිබෙන නිෂ්ඵල දේවල-
ටය.[3] **20** නමුත් අපට ලැබී තිබෙන්-
නේ ස්වර්ගයෙහි[4] පුරවැසිභාවයයි.[5]
එහෙයින් ස්වර්ගයෙහි සිටින ගැල-
වුම්කරු වන ස්වාමීන් වන යේසුස්
ක්‍රිස්තුස්[6] පැමිණෙන තුරු අපි මහත්
ආශාවකින් බලා සිටිමු.[7] **21** සියලුම
දේවල් තමා යටතට ගැනීමේ බලය
ඔහු සතුය.[8] ඒ බලය යොදාගනිමින්[9]
ඔහු අපගේ දුර්වල ශරීර[10] ඔහුගේ තේ-
ජවත් ස්වභාවයට සමාන වන ආකාර-
යකින්[11] වෙනස් කරනු ඇත.

**4** මගේ ප්‍රේමණීය සහෝදරයෙනි,
ඔබව දැකීමට මම මහත් ආශාව-
කින් සිටිමි. මගේ ප්‍රීතියත් කිරුළත්[12]
ඔබය. ප්‍රේමණීය සහෝදරයෙනි, මා
සඳහන් කළ ආකාරයට ස්වාමීන්ගේ
අනුගාමිකයන් ලෙස නොසැලී ස්ථිරව
සිටින්න.[13]

**2** යුවෝදියාටත් සින්ටිකීටත් මා
උනන්දු කරන්නේ ස්වාමීන් සමඟ
එකට බැඳී සිටින අය ලෙස එකඟ-
තාවකින් සිටීමටය.[14] **3** එමෙන්ම ඒ
ස්ත්‍රීන්ට දිගටම උපකාර කරන ලෙස
සැබෑ හවුල් සේවකයන්[15] වන ඔබෙන්
ඉල්ලා සිටිමි. ක්ලෙමන්ට් සහ මා
සමඟ එකට සේවය කළ අනික් අය[16]
මෙන් ඔවුහු මා සමඟ උරෙන් උර
ගැටී[17] ශුභාරංචිය වෙනුවෙන් නිරතුරු-
වම වෙහෙස මහන්සි වී වැඩ කළෝය.
ඔවුන් සියලුදෙනාගේම නම්[18] ජීවන
ලියවිල්ලෙහි*[19] සටහන් වී ඇත.

**4** ස්වාමීන් ගැන නිරතුරුවම ප්‍රීති
වන්න.[20] මා නැවතත් කියන්නේ
ප්‍රීති වන්න[21] කියාය. **5** ඔබ සාධා-
රණ ලෙස කටයුතු කරන කෙ-
නෙකු බව[1] සියලුදෙනාටම පැහැදිලි
විය යුතුයි. ස්වාමීන් නිරතුරුවම ඔබ
ළඟ සිටින බව මතක තබාගන්න.[2]
**6** කිසි දෙයක් ගැන කනස්සලු නො-
වන්න.[3] ඒ වෙනුවට යාච්ඤාවෙන් හා
කන්නලව්වලින්[4] ඔබේ සියලු ඉල්-
ලීම් දෙවිට පවසන්න.[5] එමෙන්ම
ඔහුට ස්තුති කිරීමටද අමතක නො-
කරන්න. **7** එවිට ක්‍රිස්තුස් යේසුස්
තුළින් දෙවි ලබා දෙන සමාදානය[6]
අද්දැකීමට ඔබට පුළුවන. එය කිසිම
මිනිසෙකුට වටහාගත නොහැකි වූ
සමාදානයකි. ඒ සමාදානය ඔබේ හද-
වතටත්[7] මනසටත් ආරක්ෂාවක් වේ.

**8** එහෙයින් සහෝදරයෙනි, සැබෑ,
ගෞරවනීය, ධර්මිෂ්ඨ, පවිත්‍ර,[8] ප්‍රේ-
මයට දායක වන, ඔබින, නිර්මල
මෙන්ම ප්‍රශංසනීය දේවලට ඔබේ
මනස නිරතුරුවම යොමු කරන්න.[9]
**9** ඔබ මගෙන් ඉගෙනගත් දේවල්ද
පිළිගත් දේවල්ද ඇසූ දුටු දේවල්ද පිළි-
පදින්න.[10] එවිට සමාදානයේ දෙවි-
ගෙන්[11] ඔබට ආශීර්වාද ලැබේ.

**10** ඔබ නැවතත් මා ගැන සැලකි-
ලිමත් වන නිසා[12] ස්වාමීන්ගේ අනුගා-
මිකයෙකු ලෙස මට මහත් ප්‍රීතියක්
දැනේ. ඔබ ඇත්තටම මා ගැන
සැලකිලිමත් වී සිටියත් ඒ සැල-
කිල්ල පෙන්වීමට ඔබට ප්‍රස්තාවක්
ලැබුණේ නැත. **11** මා දැන් කතා
කරන්නේ මට ඇති හිඟකමක් ගැන
නොවේ. මන්ද මම කවර තත්ව-
යක සිටියත් ඉන් සෑහීමට පත් වීමට[13]
ඉගෙනගෙන සිටිමි. **12** සුළු ප්‍රමාණ-
යක් ඇතුව ජීවත් වීමටත්[14] බො-
හෝ දේවල් ඇතුව ජීවත් වීමටත් මම
දනිමි. මා කවර තත්වයක සිටියත්
කුමන දෙයකට මුහුණ දුන්නත් එනම්,
මා තෘප්තිමත්ව සිටියත් කුසගින්-
නෙන් සිටියත් බොහෝ දේවල් ඇතුව
සිටියත් අගහිඟකම්වලින් පෙළුණත්[15]
ඒ ඒ තත්වයන්ට අනුව හැඩගැසීමේ
රහස ඉගෙනගෙන සිටිමි. **13** මන්ද
මට බලය දෙන තැනැත්තාගෙන් සෑම

**3 පරි.**
**1** රෝම 16:18
**2** යූද් 13
**3** රෝම 8:5; 1කොරි 3:3; 2තිමෝ 3:4; යාකො 3:15
**4** යොහ 18:36; එෆී 2:6; කොලො 3:1
**5** එෆී 2:19
**6** 1කොරි 1:7; තීත 2:13
**7** 1තෙස 1:10; හෙබ්‍රෙ 9:28
**8** 1කොරි 15:27; හෙබ්‍රෙ 2:8
**9** එෆී 1:19
**10** 1කොරි 15:42
**11** රෝම 8:29; 1කොරි 15:49

**4 පරි.**
**12** 1තෙස 2:19
**13** පිලි 1:27
**14** රෝම 15:5; 1කොරි 1:10; 2කොරි 13:11; පිලි 2:2; 1පේතෘ 3:8
**15** මතෙ 11:29
**16** රෝම 16:3
**17** ලූක් 8:3
**18** ලූක් 10:20
**19** ගීතා 69:28
**20** ගීතා 64:10; ගීතා 104:34
**21** ද්වි 26:11; ගීතා 97:12; යෙසා 9:3; 1තෙස 5:16

**2 තීරුව**
**1** තීත 3:2; යාකො 3:17
**2** යාකො 5:8
**3** මතෙ 6:25; ලූක් 12:22; 1පේතෘ 5:7
**4** රෝම 12:12; යාකො 1:5
**5** ගීතා 145:18; යොහ 16:23
**6** යොහ 14:27; රෝම 5:1
**7** කොලො 3:15
**8** 2කොරි 11:3; 1තිමෝ 4:12; 1තිමෝ 5:2; 1පේතෘ 3:2
**9** ගලා 5:22; කොලො 3:2
**10** පිලි 3:17; කොලො 1:23
**11** රෝම 15:33; 1කොරි 14:33; හෙබ්‍රෙ 13:20
**12** 2කොරි 11:9
**13** 1තිමෝ 6:6; හෙබ්‍රෙ 13:5

පිලි **3:19*** මූ.අ., "බඩය." **4:3*** මෙය සැබෑ ලිය-
විල්ලක් නොවේ. ඉන් සංකේතවත් කරන්නේ සදා-
කාල ජීවනය ලබන අයව ලියවිල්ලක සටහන්
කර තිබෙනවා වගේ දෙවි විසින් සිහි කරනු ලබන
බවය.—එළි 3:5; 20:15 බලන්න.

**14** 1කොරි 4:11; 2කොරි 6:10; **15** 2කොරි 11:27.

දෙයකටම මුහුණ දීමට මට ශක්තිය
ලැබේ.[1]
14 නමුත් මට විඳීමට සිදු වූ
පීඩාවලදී[2] ඔබ ලබා දුන් උපකාර[3]
මම බොහෝ සෙයින් අගය කරමි.
15 ඇත්තෙන්ම පිලිප්පිවරුනි, මා
ශුභාරංචිය ප්‍රකාශ කිරීමට පටන්ගත්
කාලයේදී මැසිඩෝනියාවෙන් පිටත් වී
ගිය විට ඔබ හැර වෙන කිසි සභා-
වක් මට උපකාර කළේවත් මා
ලබා දුන් උපකාර පිළිගත්තේවත්
නැති බව ඔබ හොඳින් දන්නා කාර-
ණයකි.[4] 16 මා තෙසලෝනිකයේ
සිටියදී පවා ඔබ මගේ අවශ්‍යතා පිරි-
මැසීම සඳහා වරක් නොව දෙවරක්ම
මට යම් දේවල් එවූ ආකාරය මට මත-
කය. 17 මා ඒ දේවල් මතක් කරන්-
නේ ඔබෙන් තවත් තෑගි ලබාගැනීමේ
ආශාවෙන් නොවේ.[5] මට තිබෙන
එකම ආශාව වන්නේ ඔබ තව තවත්
දියුණු වෙනවා දැකීමය.[6] 18 මට
අවශ්‍ය සෑම දෙයක්ම දැන් තිබේ. ඔබ
එපප්‍රොදිතස්[7] අත මට එවූ දේවල් මට
දැන් ලැබී තිබෙන නිසා මට කිසි

4 පරි.
1 යෙසා 12:2
යෙසා 40:29
යොහ 15:5
2කොරි 4:7
2කොරි 12:9
2තිමෝ 4:17
2 එෆී 3:13
හෙබ්‍රෙ 10:33
3 පිලි 1:7
4 2කොරි 11:8
5 1කොරි 9:11
6 රෝම 15:28
7 පිලි 2:25

2 තීරුව
1 නික් 29:18
එස 20:41
2 හෙබ්‍රෙ 13:15
3 රෝම 9:23
එෆී 1:7
4 ගීතා 23:1
5 ද්වි 2:7
2කොරි 9:8
6 රෝම 16:27
ගලා 1:5
7 1තෙස 1:1
8 කොලො 4:18
9 පිලි 1:13
10 ගලා 6:18

අඩුපාඩුවක් නැත. ඒවා දෙවිට මිහිරි
සුවඳක්[1] හා ඔහුට ප්‍රසන්න මෙන්ම
පිළිගත හැකි පූජාවක්[2] හා සමානය.
19 එහෙයින් සියලුම තේජවත් සම්-
පත්වලින් පිරිපුන්[3] මගේ දෙවි[4] ඔබට
අවශ්‍ය වන සෑම දෙයක්ම ක්‍රිස්තුස්
යේසුස් මාර්ගයෙන් ඔබට ලබා දෙනු
ඇත.[5] 20 අපගේ දෙවි මෙන්ම පියා-
ණන්ට සියලුම ප්‍රශංසා සහ ගෞරවය
සදහටම ලැබේවා![6] ආමෙන්.*
21 ක්‍රිස්තුස් යේසුස් සමඟ එකට
බැඳී සිටින[7] සියලුම ශුද්ධ තැනැත්-
තන්ට මගේ සුබ පැතුම් දෙන්න.[8] මා
සමඟ සිටින සහෝදරයෝද ඔබට සුබ
පතති. 22 සියලුම ශුද්ධ තැනැත්-
තෝ, විශේෂයෙන්ම සීසර්ගේ මාලිගා
සංකීර්ණයේ සිටින අය ඔබට සුබ
පතති.[9]
23 යහපත් ආකල්පයක්[10] ඇතුව
සිටින ඔබට ස්වාමීන් වන යේ-
සුස් ක්‍රිස්තුස්ගේ මහත් කරුණාව
ලැබේවා!

පිලි **4:20*** එනම්, එසේම වේවා!

# කොලොස්සිවරුන්ට
## ලියූ ලිපිය

1 මෙම ලිපිය ඔබට ලියන්නේ දෙවි-
ගේ කැමැත්තට එකඟව[1] ක්‍රිස්-
තුස් යේසුස්ගේ නියෝජිතයෙකු* වන
පාවුල් සහ අපගේ සහෝදර තිමෝ-
තිය.[2] 2 මෙය ලියන්නේ කොලොස්-
සියේ සිටින ශුද්ධ තැනැත්තන්ට
මෙන්ම ක්‍රිස්තුස් සමඟ එකට බැඳී
සිටින[3] සියලුම විශ්වාසවන්ත සහෝද-
රයන්ටය.
අපගේ පියාණන් වන දෙවිගෙන්
ඔබට මහත් කරුණාවත් සමාදාන-
යත් ලැබේවා![4]

**කොලො 1:1*** හෝ, "යවනු ලැබුවෙකු."

1 පරි.
1 එෆී 1:1
2 1කොරි 4:17
3 යොහ 17:21
4 රෝම 1:7
ගලා 1:3

2 තීරුව
1 එෆී 1:16
2 1කොරි 1:4
පිලි 1:3
3 රෝම 15:25
පිලෙ 5
හෙබ්‍රෙ 6:10
4 1පේතෘ 1:4
5 එෆී 1:18
2තිමෝ 4:8
හෙබ්‍රෙ 6:19

3 අපි ඔබ වෙනුවෙන් යාච්ඤා
කරන සෑම අවස්ථාවකදීම[1] අප-
ගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්-
ගේ දෙවි පියාණන්ට ස්තුති
කරමු.[2] 4 මන්ද ක්‍රිස්තුස් යේසුස්
කෙරෙහි ඔබට තිබෙන විශ්වාසය
ගැනත් සියලු ශුද්ධ තැනැත්තන්
වෙනුවෙන් ඔබට තිබෙන ප්‍රේමය
ගැනත් අපට ආරංචි වී ඇත.[3] 5 ඔබ
එලෙස කටයුතු කරන්නේ ස්වර්-
ගයෙහි ඔබ සඳහා වෙන් කර ඇති දේ[4]
ගැන ඔබට තිබෙන බලාපොරොත්-
තුව නිසාය.[5] ඔබට එම බලාපො-
රොත්තුව ගැන මුලින්ම අසන්න

ලැබුණේ සත්‍යය එනම්, ශුභාරංචිය
ගැන ඔබට ප්‍රකාශ කරනු ලැබූ අවස්-
ථාවේදීය.[1] **6** ඔබට ලැබුණු ඒ ශුභා-
රංචිය දැන් මුළු ලොව පුරාම[2] පැතිර
යන බවත්[3] ඉන් බොහෝ යහපත්
ප්‍රතිඵල ලැබෙන බවත්[4] පැහැදිලියි.
දෙවිගේ මහත් කරුණාව[5] පිළිබඳ
සත්‍යය[6] ගැන අසා නිවැරදි අවබෝධ-
යක් ලබාගත් දවසේ පටන් ඔබ අත-
රත් ඒ ප්‍රතිඵල දක්නට ලැබේ. **7** ඒ
සත්‍යය ඔබ ඉගෙනගත්තේ එපප්‍රස්-
ගෙනි.[7] ඔහු අප වෙනුවෙන් ක්‍රිස්තුස්-
ගේ විශ්වාසවන්ත දේවසේවකයෙකු
ලෙස කටයුතු කරන, අප සමඟ
හවුලේ සේවය කරන ඉතා හිතවත්
දාසයෙකි. **8** දෙවිගේ බලයේ උප-
කාරය නිසා ඔබ තුළ ඇති වූ ප්‍රේමය[8]
ගැන අපට දැනුම් දුන්නේ ඔහුය.

**9** ඔබට තිබෙන විශ්වාසයත් ප්‍රේ-
මයත් ගැන අපට ආරංචි වූ දවසේ
පටන් අප ඔබ වෙනුවෙන් නිරතුරු-
වම යාච්ඤා කරන්නේ ඒ නිසාය.[9] අප
දිගටම ඉල්ලා සිටින්නේ ඔබට සිය-
ලුම ප්‍රඥාවත්[10] දෙවිගේ බලය මගින්
ලැබෙන වටහාගැනීමේ හැකියාවත්[11]
ලැබෙන්න කියාය. ඒ සමඟම දෙ-
විගේ කැමැත්ත පිළිබඳ පූර්ණ හා
නිවැරදි දැනුමක්[12] ඔබට ලැබෙන්න
කියාත් ඉල්ලා සිටිමු. **10** එවිට යෙ-
හෝවා දෙවිව[13] සියල්ලේදී සතුටු කර-
මින් ඔහුට ඔබින ආකාරයකින් ඔබේ
ජීවිතය ගත කිරීමට[14] ඔබට හැකි වේ.
එලෙසම සෑම යහපත් ක්‍රියාවක්ම කර-
මින්[15] හොඳ ප්‍රතිඵල ලැබීමටත් දෙවි
පිළිබඳ නිවැරදි[16] දැනුමෙන් වර්ධනය
වීමටත් ඔබට හැකි වේ. **11** දෙවි-
ගේ තේජවත් බලය මාර්ගයෙන් සෑම
දෙයක්ම කිරීමට අවශ්‍ය ශක්තිය
ඔබට ලැබෙන්න කියාද[17] ඉල්ලමින්
යාච්ඤා කරන්නෙමු. එවිට ඕනෑම
දෙයක් සාර්ථකව විඳදරාගැනීමටත්[18]
ඔබේ ප්‍රීතිය රැකගෙන බොහෝ ඉවසි-
ලිවන්තව කටයුතු කිරීමටත් ඔබට
හැකි වේ. **12** එමෙන්ම ආලෝකයේ
ගමන් කරන[19] ශුද්ධ තැනැත්තන්ට[20]
හිමි වන උරුමය[21] ලබාගැනීමට ඔබව
සුදුස්සන් බවට තීරණය කළ පියා-
ණන්ට ස්තුතිවන්ත වීමට පෙලඹීමක්
ඔබ තුළ ඇති වෙන්න කියා ඉල්ලා
යාච්ඤා කරන්නෙමු.

**13** දෙවි අපව අන්ධකාරයේ ග්‍රහ-
ණයෙන්[1] නිදහස් කර තම ප්‍රේ-
මණීය පුත්‍රයාගේ[2] රාජ්‍යය[3] යටතට
අපව රැගෙන ආවේය.[4] **14** ඔහුගේ
පුත්‍රයා ගෙවූ වන්දියෙන් අපට නිද-
හස එනම්, අපගේ පව්වලට සමාව
ලැබී තිබේ.[5] **15** නොපෙනෙන[6] දෙ-
විගේ සැබෑ ස්වභාවය පිළිබිඹු වන්-
නේ[7] ඔහු තුළින්ය. දෙවිගේ කුලුඳුල්[8]
නිර්මාණය ඔහුය. **16** මන්ද ස්වර්-
ගයෙහි හා පොළොවෙහි ඇති රාජ-
කීය නිලයන්, තනතුරු, පාලන ක්‍රම
හෝ අධිකාරීන්[9] ඇතුළු පෙනෙන හා
නොපෙනෙන අන් සියල්ල සෑදීමට
දෙවි හවුල් කරගත්තේ ඔහුවය.[10] දෙවි
ඔහුව යොදාගෙන[11] ඒ සෑම දෙයක්ම
සෑදුවේ ඔහු වෙනුවෙන්ය. **17** අන්
සියලු දේ සෑදීමට ප්‍රථමයෙන් සිටියේ
ඔහුය.[12] අන් සෑම දෙයක්ම නිර්මා-
ණය කිරීමට දෙවි හවුල් කරගත්තේ
ඔහුවය.[13] **18** ඔහු සභාව නමැති
ශරීරයේ හිසය.[14] සියලු දේවල ආරම්-
භය ඔහුය. ඔහු මරණයෙන් නැඟිටුණු
කුලුඳුලාය.[15] ඒ අනුව සියලු දේ-
වල පළමුවෙනියා ඔහුය.[16] **19** මන්ද
සෑම දෙයක්ම පූර්ණ ලෙස පිළිබිඹු
කිරීමට[17] ඔහුව යොදාගැනීම සුදුසු බව
දෙවි තීරණය කළේය. **20** එලෙසම
පොළොවෙහි හෝ ස්වර්ගයෙහි හෝ
ඇති අන් සියල්ල[18] තමන් සමඟ සමා-
දාන කිරීමට[19] ක්‍රිස්තුස්ව යොදාගැනීම
සුදුසු බවත් දෙවි තීරණය කළේය.
එම සමාදානය ඇති වූයේ[20] වධකණු-
වක් මත[21] ක්‍රිස්තුස් වැගිරෙවූ රුධිරය
මාර්ගයෙනි.[22]

**21** ඔබේ මනස් දුෂ්ට ක්‍රියාවලට
යොමු වී තිබූ නිසා[23] ඔබ කලක් දෙවි-
ගෙන් ඈත් වී[24] ඔහුගේ සතුරන්ව සිටි
බව සැබෑය. **22** නමුත් තම මිනිස්
ජීවිතය මරණය උදෙසා පරිත්‍යාග
කළ තැනැත්තා මාර්ගයෙන්[25] තමන්
සමඟ සමාදාන වීමට[26] දෙවි දැන්

**1 පරි.**
1 රෝම 10:17; එෆී 1:13
2 කොලො 1:23; 1තිමෝ 3:16
3 මාක් 4:8
4 යොහ 15:16
5 එෆී 3:2; තීත 2:11
6 2පේත 1:12
7 කොලො 4:12; පිලෙ 23
8 1පේත 1:22
9 එෆී 1:16; යාකො 5:16
10 1කොරි 2:7; කොලො 2:3
11 2තිමෝ 2:7; 1යොහ 5:20
12 පිලි 1:9
13 මීකා 4:5
14 එෆී 4:1
15 එෆී 2:10
16 එෆී 1:17; 2පේත 1:2; 2පේත 1:8
17 එෆී 3:16
18 රෝම 5:3
19 යෙසා 60:20
20 එෆී 2:19
21 ක්‍රියා 26:18; රෝම 8:17; එෆී 1:14

**2 තීරුව**
1 ලූක් 22:53; එෆී 2:2
2 හිතෝ 8:30
3 යොහ 18:36; හෙබ්‍රෙ 1:8
4 රෝම 11:24
5 එෆී 1:7
6 යොහ 4:24; 1තිමෝ 1:17
7 යොහ 10:30; යොහ 14:9; 2කොරි 4:4
8 එළි 3:14
9 එෆී 1:21
10 යොහ 1:3
11 යොහ 1:10; හෙබ්‍රෙ 1:2
12 යොහ 17:5
13 හෙබ්‍රෙ 1:3
14 එෆී 1:22
15 එළි 1:5
16 1කොරි 15:23
17 යොහ 1:16; කොලො 2:3
18 එෆී 1:10
19 2කොරි 5:19
20 එෆී 2:14
21 යෙසා 53:10; හෙබ්‍රෙ 12:2
22 ලෙවී 17:11
23 2කොරි 10:5
24 එෆී 2:12
25 හෙබ්‍රෙ 9:16
26 රෝම 5:10; එෆී 2:16

අවස්ථාව උදා කර තිබේ. ඔහු එසේ
කළේ ඔබට ශුද්ධ, නිකැළැල්[1] සහ
නිදොස් අය[2] ලෙස තමන් ඉදිරියේ
සිටීමට හැකි වීම සඳහාය. **23** ඒ
සඳහා ඔබ දිගටම ඔබට තිබෙන විශ්-
වාසය වර්ධනය කරගත යුතු අතර[3]
එම විශ්වාසය නමැති අත්තිවාරම
මත ස්ථිරව[4] පිහිටා සිටිය යුතුයි.[5] මීට
අමතරව අහස්තලය යට ජීවත් වන
මුළු මිනිස් වර්ගයා අතර[6] දේශනා
කරනු ලැබූ[7] මෙන්ම ඔබද ඇසූ ශුභා-
රංචිය[8] මගින් ඔබට ලැබුණු බලා-
පොරොත්තුවෙන් ඔබව ඉවත් කිරීමට
කිසි කෙනෙකුට ඉඩ නොදෙන්න.
පාවුල් වන මමද එම ශුභාරංචිය දේ-
ශනා කරන සේවකයෙක් බවට පත්
වූවෙමි.[9]

**24** ඔබ වෙනුවෙන් මට දුක් විඳීමට
සිදු වුණත් ඒ ගැන දැන් සතුටු වෙමි.[10]
මන්ද ක්‍රිස්තුස්ගේ ශරීරයේ එනම්,
ඔහුගේ සභාවේ[11] සාමාජිකයෙකු ලෙස
මා ඔහු වෙනුවෙන් තවමත් පූර්ණ
ආකාරයකින් දුක් විඳ නැතැයි[12] කියා
මට හැඟේ. **25** මා එම සභාව වෙ-
නුවෙන් සේවය කිරීමට[13] පටන්ගත්-
තේ දෙවි මට භාර දුන් වගකීම[14]
ඉටු කිරීම සඳහාය. ඒ අනුව මම ඔබ
වෙනුවෙන් දෙවිගේ පණිවිඩය ගැන
දේශනා කිරීමට උපරිම වෑයමක් දැරු-
වෙමි. **26** මා දේශනා කළේ යුග හා
පරම්පරා ගණනාවක් පුරා[15] සඟවා
තිබුණු පරිශුද්ධ රහස[16] ගැනය. නමුත්
දැන් එය ඔහුගේ ශුද්ධ තැනැත්තන්ට
හෙළි කර තිබේ.[17] **27** මෙම පරි-
ශුද්ධ රහසට[18] අයත් සියලු තේජ-
වත් සම්පත්[19] ගැන වෙනත් ජාතීන්
අතරේද දැනුම් දීමට දෙවි සතුටු
විය. ඒ රහස නම් ඔබ සමඟ එකට
බැඳී සිටින ක්‍රිස්තුස් පිළිබඳ රහ-
සයි.[20] එනම් ඔහු සමඟ තේජසට පත්
වීමේ බලාපොරොත්තුවයි.[21] **28** අප
සියලු ප්‍රඥාව යොදාගෙන[22] සියලු-
දෙනාට දැනුම් දෙන්නෙත්[23] උප-
දෙස් මඟ පෙන්වීම් ලබා දෙන්නෙත්
උගන්වන්නෙත් ඔහු ගැනය. අප
එසේ කරන්නේ සියලුදෙනාව ක්‍රිස්තුස්
සමඟ එකට බැඳී සිටින, අවබෝධ-
යෙන් ක්‍රියා කරන[1] අය ලෙස දෙ-
විට ඉදිරිපත් කිරීම සඳහාය. **29** මා
වෙහෙස මහන්සිය නොබලා වීර්යය
කරන්නේ[2] ඒ දේ ඉටු කිරීමටය. මා
එසේ කරන්නේ මා තුළ ක්‍රියාත්මක
වන[3] දෙවිගේ මහත් බලයේ උපකා-
රයෙනි.[4]

**2** ඔබ වෙනුවෙනුත් ලවෝදිසියේ
සිටින අය වෙනුවෙනුත්[5] මාව
පෞද්ගලිකව මුණගැසී නැති සියලු-
දෙනා වෙනුවෙනුත් මා මොන තරම්
මහත් සටනක යෙදෙනවාද[6] කියා
ඔබ දැනගන්නවාට කැමැත්තෙමි.
**2** මා එසේ කරන්නේ ඔවුන්ගේ සිත්
සැනසීමටත්[7] ඔවුන් ප්‍රේමයෙන් එකට
බැඳී සිටිනවා දැකීමටත්ය.[8] එවිට
ඔවුන්ට මහත් වස්තු සම්භාරයක්
වන සත්‍යය පිළිබඳ ඉතා පැහැදිලි
අවබෝධයක් ලබාගැනීමටත්[9] දෙවි-
ගේ පරිශුද්ධ රහස වන ක්‍රිස්තුස්[10]
පිළිබඳ නිවැරදි දැනුමක් ලබාගැ-
නීමටත් හැකි වේ. **3** වස්තුවක් හා
සමාන සියලුම ප්‍රඥාවත් දැනුමත්
සුරක්ෂිතව සඟවා ඇත්තේ ක්‍රිස්-
තුස් තුළය.[11] **4** මා එසේ කියන්-
නේ කිසිවෙකුගේ මුළා කරවනසුලු
තර්කවලින් ඔබ නොරවටෙන පිණි-
සය.[12] **5** මන්ද මා පෞද්ගලිකව
ඔබ සමඟ නොසිටියත් සිතින් ඔබ
සමඟ සිටිමි.[13] එහෙයින් ඔබ නිසි
පිළිවෙළකින් කටයුතු කරන ආකාර-
යත්[14] ක්‍රිස්තුස් කෙරෙහි ඔබේ විශ්වා-
සය කොතරම් ස්ථිරද කියාත් දකින
විට[15] මට මහත් ප්‍රීතියක් දැනේ.
**6** ඔබ ස්වාමීන් වන ක්‍රිස්තුස් යේ-
සුස්ව පිළිගෙන ඇති නිසා ඔහු සමඟ
එකට බැඳී සිටින අය ලෙස[16] ඔබේ
ජීවිතය ගත කරන්න. **7** ගසක් මුල්
අදිනවා වගේ ඔබට ඉගැන්වූ ආකා-
රයට ඔබත් ඔහු තුළ දිගටම මුල්
ඇද[17] ශක්තිමත්ව පිහිටා සිටින්න.
ඔහුව අත්තිවාරමක් ලෙස සලකා
ඔහු මත ඔබේ ජීවිතය දිගටම ගො-
ඩනඟන්න.[18] එලෙසම ඔබ විශ්වාස
කරන සත්‍ය ඉගැන්වීම් මත ස්ථිරව

**1 පරි.**

**1** එෆී 5:27; 2පේතෘ 3:14
**2** 1කොරි 1:8
**3** එළි 2:10
**4** 1කොරි 3:11; එෆී 3:17
**5** 1කොරි 15:58; හෙබ්‍රෙ 3:14
**6** රෝම 8:19
**7** මතෙ 24:14; 1තිමෝ 3:16
**8** රෝම 10:17
**9** 2කොරි 11:23; එෆී 3:8; 2තිමෝ 1:11
**10** එෆී 3:1; පිලි 3:10
**11** 1කොරි 10:17; එෆී 1:23
**12** ක්‍රියා 9:16
**13** එෆී 3:7
**14** ලූක් 16:2; 1කොරි 9:17; එෆී 3:2
**15** ලූක් 8:10; 1කොරි 2:7
**16** එෆී 3:5; එෆී 5:32
**17** රෝම 16:26
**18** එෆී 3:9
**19** රෝම 9:23; 2කොරි 4:6; එෆී 3:8
**20** එෆී 3:6; එෆී 3:17
**21** රෝම 8:18; 1තිමෝ 1:1
**22** 1කොරි 1:30; කොලො 3:16
**23** ක්‍රියා 20:20

**2 තීරුව**

**1** එෆී 4:13
**2** ලූක් 13:24
**3** එෆී 3:7
**4** පිලි 4:13

**2 පරි.**

**5** කොලො 4:16
**6** පිලි 1:30
**7** 2කොරි 1:6
**8** කොලො 3:14
**9** එෆී 3:18
**10** 1කොරි 2:1; 1කොරි 2:7; එෆී 3:6
**11** 1කොරි 1:30; 1කොරි 2:16
**12** රෝම 16:18; එෆී 5:6
**13** ක්‍රියා 17:16; 1කොරි 5:3
**14** 1කොරි 14:40
**15** 1කොරි 15:58; හෙබ්‍රෙ 3:14; 1පේතෘ 5:10
**16** යොහ 17:21
**17** එෆී 3:17
**18** එෆී 2:20

පිහිටා සිටින්න.[1] ඔබ දෙවිට ස්තුති
දෙන විට ඔබේ විශ්වාසය පිරී ඉතිරී යා
යුතුයි.[2]

**8** කෙසේවෙතත් ඔබ පරෙස්සම්
විය යුතුයි. නැත්නම් සතෙක් ගොදු-
රක් ඩැහැගෙන යන ආකාරයට[3] යම්
කෙනෙක් දර්ශන[4] සහ මුළා කරවන-
සුලු මෙන්ම හිස් මතිමතාන්තර[5] යො-
දාගෙන ඔබව ගොදුරු කරගත හැකියි.
ඒවාට පදනම සපයන්නේ මිනිසුන්ගේ
සම්ප්‍රදායන් හා මිනිස් සමාජයේ මූල-
ධර්මයන්ය.[6] නමුත් ඒවා ක්‍රිස්තුස්ගේ
ඉගැන්වීම්වලට පටහැනිය. **9** මන්ද
දෙවිගේ[7] ගතිලක්ෂණවල[8] මුළු පරාස-
යම පූර්ණ ලෙස පිළිබිඹු වන්නේ[9] ක්‍රිස්-
තුස් තුළින්ය. **10** එහෙයින් සියලුම
පාලනවල හා අධිකාරීන්ගේ හිස වන
ඔහු[10] පූර්ණ ලෙස පිළිබිඹු කරන ඒ දේ
ඔබටත් පිළිබිඹු කිරීමට හැකි වේ.
**11** ඔහු සමඟ ඔබට ඇති බැඳීම[11] නිසා
යම් ආකාරයකින් ඔබව චර්මච්ඡේද-
නය කර තිබෙන බව කිව හැක.[12]
නමුත් එය මිනිසුන් සිදු කරන චර්-
මච්ඡේදනය වීමේ පිළිවෙතට අනුව
කළ එකක් නොවේ. එය ශරීරයේ පව්-
කාර ක්‍රියාවන් ඉවත් කිරීම මගින්
සිදු කළ චර්මච්ඡේදනයකි.[13] ක්‍රිස්තුස්-
ගේ අනුගාමිකයන්ව චර්මච්ඡේදනය
කරනු ලබන්නේ එලෙසය. **12** ඔහුට
සමාන බව්තීස්මයකට යටත් වීමෙන්
ඔබත් ඔහු සමඟ මිය ගොස් තැන්පත්
කර ඇති බව කිව හැකියි.[14] එමෙන්ම
ඔහු සමඟ ඔබට ඇති බැඳීම නිසාත්
ඔහුව මරණයෙන් නැවත නැඟිටෙවූ
දෙවි[15] තම බලය යොදාගෙන ක්‍රියා
කරන ආකාරය[16] ගැන ඔබට තිබෙන
විශ්වාසය නිසාත්[17] ඔබවද ඔහු සමඟ
නැඟිටුවා තිබේ.[18]

**13** ඔබ වැරදි දේ කරමින් අචර්මච්-
ඡේදිතයන් ලෙස මැරී සිටියදී දෙවි
ඔබව ජීවත් කර ඔහු සමඟ හදව-
තින්ම බැඳී සිටින අය බවට පත්
කළේය.[19] ඔහු ඉතා කරුණාවන්තව
අපගේ සියලු වැරදිවලට සමාව දී,[20]
**14** විවිධ අණපනත්වලින් හා නියෝ-
ගවලින් සැදුණු,[21] අපට විරුද්ධව
සාක්ෂි දැරූ[1] ලිඛිත නීතිය[2] අවලංගු
කළේය.[3] ඔහු එම ලියවිල්ල යේසුස්
දුක් වින්ද වධකණුවෙහි[4] ඇණ ගසා[5]
නැති කර දැමුවේය. **15** එලෙසම
ඔහු එම වධකණුව මාර්ගයෙන් පාල-
කයන්ව සහ අධිකාරීන්ව[6] නිරුවත්
කර පරාජිතයන් ලෙස[7] ඔවුන්ව ප්‍රසිද්-
ධියේ පෙරහැරක ගෙන ගියේය.[8]

**16** එහෙයින් ඔබේ කෑම බීම ගැන-
වත්[9] උත්සවයක් ගැනවත්[10] අමාවක
දවසක්[11] නැතහොත් සබත් දව-
සක් ගැනවත්[12] ඔබව විනිශ්චය කිරී-
මට කිසිවෙකුට ඉඩ නොදෙන්න.[13]
**17** මන්ද ඒ දේවල්, පැමිණීමට තිබූ
සැබෑ දේ[14] වන ක්‍රිස්තුස්[15] පිළිබඳ
ඡායාවක් පමණි.[16] **18** නිහතමානි-
කම බොරුවට මවාපාන්නත් දේවදූ-
තයන්ට නමස්කාර කරන්නත් මහත්
කැමැත්තක් දක්වන කිසිම කෙනෙ-
කුට ඔබේ තෑග්ග[17] ඔබට අහිමි කිරී-
මට ඉඩ නොදෙන්න.[18] එවැනි අය
තමන්ට යම් දේවල් දර්ශනය වී ඇති
බව තරයේ කියා සිටිති.* ඔවුන්-
ගේ සිතුවිලි තම පව්කාර ආශාව-
ලින් පාලනය වන නිසා ඔවුහු තම
හිස උදුම්මාගෙන සිටිති. එසේ සිටී-
මට ඔවුන්ට කිසි සාධාරණ හේතුවක්
නැත. **19** ඔවුහු ශරීරයේ හිස වන
තැනැත්තාට විශ්වාසවන්තව සිටින්-
නේ නැත.[19] මුළු ශරීරයටම සෑම දෙ-
යක්ම ලැබෙන්නේ ඔහු මාර්ගයෙනි.
එමෙන්ම සන්ධි හා පේශීන් මාර්ග-
යෙන් මුළු ශරීරය සමඟියෙන් එකට
බැඳී පවතින්නේත්[20] දෙවි ලබා දෙන
වර්ධනය ලබමින් වර්ධනය වන්නේත්
ඔහු නිසාය.[21]

**20** ලෝකය[22] මූලධර්මයන්[23] ලෙස
සලකන දේවල් සම්බන්ධයෙන් ඔබ
ක්‍රිස්තුස් සමඟ මිය ගොස් ඇත්නම්[24]
මේ ලෝකයට අයත් කෙනෙකු මෙන්
එම අණපනත්වලට ඔබ තවදුරටත්

**2 පරි.**
**1** මතෙ 7:24 යූද් 20
**2** එෆී 5:20 1තෙස 5:18
**3** හෙබ්‍රෙ 13:9
**4** 1කොරි 2:13 2පේතෘ 1:16
**5** එෆී 5:6
**6** ගලා 4:3
**7** ක්‍රියා 17:29
**8** යොහ 1:16 රෝම 1:20
**9** එෆී 1:23 කොලො 1:19
**10** එෆී 1:21 කොලො 1:16 1පේතෘ 3:22
**11** මතෙ 5:19
**12** ද්වි 10:16 රෝම 2:29 පිලි 3:3
**13** රෝම 6:6
**14** රෝම 6:4 1කොරි 15:29
**15** ක්‍රියා 2:24
**16** එෆී 1:19
**17** එෆී 2:8
**18** එෆී 2:6 කොලො 3:1
**19** එෆී 2:1 එෆී 2:5 එෆී 2:13
**20** ක්‍රියා 2:38
**21** ද්වි 4:8 එෆී 2:15

**2 තීරුව**
**1** රෝම 7:10 ගලා 3:10
**2** නික් 34:27 ද්වි 31:24 2රාජා 23:2 එෆී 2:14 හෙබ්‍රෙ 7:18
**3** ක්‍රියා 3:19
**4** ගලා 3:13 හෙබ්‍රෙ 9:15 1පේතෘ 2:24
**5** යොහ 20:25
**6** එෆී 6:12
**7** 1යොහ 5:4 එළි 3:21
**8** ගීතා 68:24 2කොරි 2:14
**9** රෝම 14:17
**10** රෝම 14:6
**11** ගීතා 81:3
**12** ගලා 4:10
**13** රෝම 14:3
**14** යොහ 14:6 හෙබ්‍රෙ 9:23
**15** හෙබ්‍රෙ 9:11
**16** නික් 25:40 හෙබ්‍රෙ 8:5 හෙබ්‍රෙ 10:1
**17** පිලි 3:14
**18** රෝම 16:18 එෆී 5:6 2පේතෘ 2:14 1යොහ 2:26

**19** එෆී 1:22; **20** එෆී 2:21; **21** එෆී 4:16; **22** යොහ 17:16; 1යොහ 2:15; **23** ගලා 4:3; **24** ගලා 2:20.

**කොලො 2:18*** මූ.අ., “නැඟී සිටිමින්.” මිථ්‍යාදෘෂ්-ටික වතාවත්වල පවසන දෙයකි.

යටත් වී සිටීමට කැමති වන්නේ
මන්ද?[1] **21** "ස්පර්ශ නොකරන්න.
රස නොබලන්න.[2] අත නොගසන්න,"[3]
**22** යනාදි අණපනත් පනවා තිබෙන්-
නේ භාවිත කළ පසු ඉවත දමන දේව-
ලටය. ඒ අණපනත් වැදගත් වන්නේ
මිනිසුන්ට පමණි.[4] **23** බැලූ බැල්මට
එම අණපනත් රැකීම ඉතා ප්‍රඥාවන්ත
දෙයක් ලෙස පෙනේ. මන්ද ඔවුහු
තමන් විසින්ම සාදාගත් නමස්කාර
පිළිවෙතක් අනුගමනය කරමින් නිහ-
තමානිකම බොරුවට මවාපාමින් තම
ශරීරයට නොයෙකුත් වධ හිංසා පමු-
ණුවාගනිමින් කටයුතු කරති.[5] නමුත්
පව්කාර ආශාවන් පාලනය කිරීමට
විරුද්ධව තිබෙන සටනට එයින් කිසි
ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැත.[6]

**3** දෙවි ඔබව ක්‍රිස්තුස් සමඟ
ඉහළ තැන්වලට ඔසවා ඇත්-
නම්[7] ස්වර්ගයේ තිබෙන දේවල් ගැන
සොයමින් සිටින්න.[8] මන්ද ක්‍රිස්තුස්
දෙවිගේ දකුණු පැත්තෙහි ඉඳගෙන
සිටියි.[9] **2** ඔබේ මනස පොළොවේ
තිබෙන දේවලට නොව[10] ස්වර්ගයේ
තිබෙන දේවලට යොමු කර තබා-
ගන්න.[11] **3** ඇත්තෙන්ම ඔබ මිය
ගොස් ඇතැයි කියා පැවසිය හැක.[12]
එහෙයින් දෙවිගේ කැමැත්තට එකඟව
ඔබේ ජීවිතය[13] රැඳී තිබෙන්නේ ක්‍රිස්-
තුස්ගේ අතෙහිය.[14] **4** අපව ජීවත්
කරවන ක්‍රිස්තුස්[15] තම තේජවත් බල-
යෙන් පෙනී සිටින විට ඔබත් ඔහු
සමඟ තේජසින්[16] පෙනී සිටිනු ඇත.[17]
**5** එමනිසා වේශ්‍යාකම්* කිරීමට
හා අපවිත්‍ර ක්‍රියාවල යෙදීමට ඇති
ආශාවද කාමාශාවද[18] වෙනත් හානි-
කර ආශාද රූප නමස්කාරයක් හා
සමාන වන තණ්හාවද[19] සහමුලින්ම
ඔබේ# ශරීරයේ අවයවවලින්[20] නැති
කර△ දැමිය යුතුයි.[21] **6** ඒ දේවල්
කරන අයට විරුද්ධව දෙවිගේ උදහස
පැමිණෙනු ඇත.[22] **7** ඔබත් කලින්
සිටියේ ඒ දේවල් කරමිනි.[1] **8** ඇත්-
තෙන්ම ඔබ උදහස, කෝපය, අය-
හපත් ක්‍රියා, නින්දාසහගත කතා[2]
යනාදි සියලු දේවල් ඔබෙන් සම්පූර්-
ණයෙන්ම ඉවත් කර දැමිය යුතුයි.[3]
ඔබේ මුවින් කිසි අසභ්‍ය[4] කථා-
වක් පිට නොවිය යුතුයි. **9** එකිනෙ-
කාට බොරු නොකියන්න.[5] පරණ
පෞද්ගලිකත්වයත්[6] ඊට ආවේණික වූ
ක්‍රියාත් ඉවත් කර, **10** දෙවි ලබා
දෙන අලුත්[7] පෞද්ගලිකත්වය පැළඳ-
ගන්න. ඒ සඳහා නිවැරදි දැනුම
ලබාගෙන දෙවිගේ ගතිලක්ෂණව-
ලට එකඟව[8] ඔබේ පෞද්ගලිකත්වය
අලුත් කරගත යුතුයි. **11** ඒ අනුව
වැදගත් වන්නේ කෙනෙකු ග්‍රීකයෙක්ද
යුදෙව්වෙක්ද කියාවත් චර්මච්ඡේදි-
තද අචර්මච්ඡේදිතද කියාවත් විදේශි-
කයෙක්ද ස්කිතිය ජාතිකයෙක්ද*
කියාවත් දාසයෙක්ද නිදහස් පුද්ගල-
යෙක්ද[9] කියාවත් නොවේ. සැම දෙය-
කටම ක්‍රිස්තුස් සම්බන්ධ වී සිටින
අතර අපි සියලුදෙනා ඔහු සමඟ බැඳී
සිටිමු.[10]

**12** ඒ අනුව දෙවි තෝරාගත්[11]
ශුද්ධ, ප්‍රේමණීය අය ලෙස ඉම-
හත් දයානුකම්පාවකින්,[12] කරු-
ණාවන්තකමින්, නිහතමානිකමින්,[13]
මෘදුකමින්[14] සහ බොහෝ ඉවසි-
ලිවන්තකමින්[15] කටයුතු කරන්න.*
**13** අන් අය කරන දේ ගැන අමනා-
පයක් ඇති වීමට සාධාරණ හේතු
තිබෙන විටත්[16] ඔවුන් ගැන ඉව-
සන්න. නිතරම ඔවුන්ට මුළු
හදවතින්ම[17] සමාව දෙන්න. යෙ-
හෝවා දෙවි ඔබට මුළු හදවතින්ම
සමාව දී තිබෙන ආකාරයටම[18] ඔබත්
සමාව දෙන්න. **14** නමුත් ඒ සියල්-
ලට අමතරව ඔබ තුළ ප්‍රේමය තිබිය
යුතුයි.[19] මන්ද එක්සත්කමට දායක
වන හොඳම බැඳීම[20] එයයි.

**2 පරි.**
1 එෆී 2:15; කොලො 2:14
2 ලෙවී 7:23
3 ලෙවී 5:2
4 යෙසා 29:13; මතෙ 15:9
5 1තිමෝ 4:3
6 රෝම 13:14

**3 පරි.**
7 එෆී 2:6
8 මතෙ 6:33
9 ගීතා 110:1; 1පේතෘ 3:22
10 යොහ 3:31; 1යොහ 2:15
11 පිලි 3:20; පිලි 4:8; 1පේතෘ 1:13
12 රෝම 6:2
13 ගලා 2:20
14 යොහ 17:21
15 යොහ 11:25
16 1කොරි 15:43
17 2තිමෝ 4:8
18 1කොරි 6:18; එෆී 5:3; 2තිමෝ 2:22
19 නික් 20:17
20 මාක් 9:43
21 ගලා 5:24
22 රෝම 1:18; එෆී 5:6

**2 තීරුව**
1 1කොරි 6:11; එෆී 2:3; තීත 3:3
2 එෆී 4:31
3 1පේතෘ 2:1
4 එෆී 5:4
5 ගීතා 5:6; ගීතා 34:13; එෆී 4:25; එළි 21:8
6 එෆී 4:22
7 රෝම 12:2; එෆී 4:24
8 උත් 1:27; 1පේතෘ 1:16
9 ගලා 3:28
10 එෆී 1:23
11 1පේතෘ 2:9
12 පිලි 2:1
13 රෝම 12:16
14 තීත 3:2; 1පේතෘ 3:4
15 2කොරි 6:6; එෆී 4:2; 1තෙස 5:14
16 මතෙ 18:15
17 හිතෝ 19:11; එෆී 4:32; 1පේතෘ 4:8
18 යෙරෙ 31:34; මතෙ 6:14; මාක් 11:25
19 රෝම 13:10; 1යොහ 3:23
20 1කොරි 13:8; එෆී 4:3.

**කොලො 3:5*** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න. **5#** මූ.අ., "පොළොවෙහි තිබෙන ඔබේ." **5△** මූ.අ., "මරා."

**කොලො 3:11*** මෙය ඉතා පහත් ලෙස සැලකූ ජනතාව සඳහාද භාවිත කරන ලදි. **12*** මූ.අ., "පැළඳගන්න."

15 ඔබේ සිත් පාලනය කිරීමට[1]
ක්‍රිස්තුස් ලබා දෙන සමාදානයට[2] ඉඩ
දෙන්න. මන්ද දෙවි ඔබව කැඳවා
තිබෙන්නේ එක ශරීරයක් සේ සිටීම-
ටත්[3] සමාදානයෙන් සිටීමටත්ය.
ඔබ තුළ ස්තුතිවන්තකමද දක්නට
ලැබිය යුතුයි. 16 ක්‍රිස්තුස් ඉගැන්වූ
දේවල් ඔබේ ජීවිතය තුළ නිතරම
ක්‍රියාත්මක විය යුතුයි. එහි ප්‍රතිඵල-
යක් ලෙස ඔබට සියලු ප්‍රඥාව ලැබේ.[4]
ගීතිකාවලින්ද[5] දෙවිට ස්තුති ප්‍රශංසා
ඔප්පු කිරීමෙන්ද ඔහුට මියුරු ගීත[6]
ගයමින්ද එකිනෙකාට උගන්වා[7] මඟ
පෙන්වීම් ලබා දෙන්න. එසේ ඔබේ
මුළු හදවතින්ම යෙහෝවා දෙවිට ගී
ගයන්න.[8] 17 ඔබ කුමක් පැවසුවත්
කුමක් කළත්[9] ඒ සෑම දෙයක්ම පියා-
ණන් වන දෙවිට ස්තුති කරමින්[10]
ස්වාමීන් වන යේසුස්ව[11] සිහියේ තබා-
ගනිමින් කරන්න.

18 භාර්යාවෙනි, ඔබේ ස්වාමිපුරුෂ-
යන්ට යටත්ව සිටින්න.[12] මන්ද ක්‍රිස්-
තුස්ගේ අනුගාමිකයන් ලෙස එසේ
කිරීම සුදුසුය. 19 ස්වාමිපුරුෂයෙනි,
ඔබේ භාර්යාවන් සමඟ අධික
ලෙස කෝප නොවී[13] ඔවුන්ට දිග-
ටම ප්‍රේම කරන්න.[14] 20 දරුවෙනි,
සියලු කාරණාවලදී ඔබේ දෙමාපියන්ට
කීකරු වන්න.[15] මන්ද එසේ කිරීමෙන්
ස්වාමීන් සතුටු වෙයි. 21 පියවරුනි,
ඔබේ දරුවන් තුළ කෝපයක් ඇති
නොකරන්න.[16] මන්ද එසේ කිරීමෙන්
ඔවුන් තුළ කලකිරීමක් ඇති වේ.
22 දාසයෙනි, ඔබේ ස්වාමිවරුන් ලෙස
කටයුතු කරන අයට[17] සියලු කාරණා-
වලදී කීකරු වන්න. මිනිසුන්ව සතුටු
කරන අය මෙන් මුණිච්චාවට නොව[18]
අවංක සිතින් යෙහෝවා දෙවිට ගරු-
බිය දක්වන අය ලෙස[19] ඔවුන්ට
කීකරු වන්න. 23 ඔබ කුමක් කළත්
මිනිසුන්ට නොව යෙහෝවා දෙවිට
කරන්නා සේ[20] මුළු හදවතින්ම[21] එය
කරන්න. 24 මන්ද ඔබට උරුම වන
දේ ලැබෙන්නේ[22] යෙහෝවා දෙවි-
ගෙන්[23] බව ඔබ දන්නහුය. ස්වා-
මීන් වන ක්‍රිස්තුස් වෙනුවෙන්
වෙහෙස මහන්සි වී සේවය කරන්න.[1]
25 ඇත්තෙන්ම වැරදි දේ කරන
තැනැත්තාට තමා කළ වරදට ප්‍රති-
ඵල ලැබේ.[2] එවැනි කාරණාවලදී
දෙවි සියලුදෙනාටම එක හා සමානව
සලකයි.[3]

4 ස්වාමිවරුනි, ඔබටත් ස්වර්ග-
යෙහි ස්වාමියෙකු සිටින බව
මතක තබාගෙන[4] ඔබේ දාසයන්
සමඟ ධර්මිෂ්ඨ ලෙස හා සාධාරණ
ලෙස කටයුතු කරන්න.[5]

2 නොකඩවා යාච්ඤා කරන්න.[6]
යාච්ඤා කිරීමටත් දෙවිට ස්තුති
කිරීමටත් අමතක නොකරන්න.[7]
3 දේශනා කිරීමටත් ක්‍රිස්තුස් පිළිබඳ
පරිශුද්ධ රහස[8] ගැන කතා කිරීම-
ටත් අපට අවස්ථාවක් විවෘත කර
දෙන්න කියා[9] අප වෙනුවෙනුත් දෙ-
විට යාච්ඤා කරන්න.[10] මා සිරභාරයේ
සිටින්නේ[11] එසේ දේශනා කළ නිසාය.
4 එලෙසම මට ඒ පණිවිඩය පැහැදි-
ලිව ඉදිරිපත් කිරීමට හැකියාව දෙන
ලෙසත් ඉල්ලා යාච්ඤා කරන්න.[12]

5 සභාවෙන් පිටත සිටින අය සමඟ
කටයුතු කරද්දී ඥානවන්තව කට-
යුතු කරන්න.[13] ඔබට තිබෙන කාල-
යෙන් උපරිම ප්‍රයෝජන ගන්න.*[14]
6 නිතරම කාරුණිකව[15] කතා කිරීමට
පුරුදු වන්න. ඔබේ කතාව ලුණෙන්
රස කළ[16] ආහාරයකට සමාන විය
යුතුයි. එසේ කළොත් එකිනෙකාට
පිළිතුරු දිය යුතු අන්දම[17] ගැන
අවබෝධයෙන් ක්‍රියා කිරීමට ඔබට
හැකි වේ.

7 ස්වාමීන්ගේ අනුගාමිකයෙකු
වන මගේ ප්‍රේමණීය සහෝදර තිකි-
කස්[18] මගේ වැඩකටයුතු ගැන ඔබට
තොරතුරු ලබා දෙයි. ඔහු විශ්වාස-
වන්ත දේවසේවකයෙක් මෙන්ම මා
සමඟ හවුලේ සේවය කරන දාසයෙකි.
8 මා ඔහුව ඔබ ළඟට එවන්නේ අප
ගැන තොරතුරු ඔබට ලබා දී ඔබේ

3 පරි.
1 පිලි 4:7
2 යොහ 14:27
3 එෆී 2:15
4 1කොරි 2:7; කොලො 2:3
5 ද්වි 31:19; 1කොරි 14:26
6 එෆී 5:19
7 කොලො 1:28; තීත 2:1
8 1ලේක 16:23; ගීතා 30:4; ගීතා 147:7
9 1කොරි 10:31
10 1තෙස 5:18
11 එෆී 5:20
12 එෆී 5:22; 1පේතෘ 3:1
13 එෆී 4:31
14 එෆී 5:25; 1පේතෘ 3:7
15 හිතෝ 6:20; ලූක් 2:51; එෆී 6:1
16 එෆී 6:4
17 එෆී 6:5; තීත 2:9; 1පේතෘ 2:18
18 එෆී 6:6
19 හිතෝ 8:13; හිතෝ 22:4
20 ගීතා 9:1; මතෙ 22:37; රෝම 12:11
21 ලූක් 10:27
22 එෆී 1:14; හෙබ්‍රෙ 9:15; 1පේතෘ 1:4
23 එෆී 6:8

2 තීරුව
1 1කොරි 7:22; ගලා 1:10
2 රෝම 2:6; 1කොරි 3:8; ගලා 6:7
3 ද්වි 10:17; රෝම 2:11; 1පේතෘ 1:17

4 පරි.
4 එෆී 6:9
5 ලෙවී 25:43; ද්වි 15:13
6 ලූක් 18:1; රෝම 12:12; එෆී 6:18
7 කොලො 3:15; 1තෙස 5:18
8 එෆී 6:19
9 1කොරි 16:9
10 රෝම 15:30
11 පිලි 1:7
12 එෆී 6:20
13 මතෙ 10:16; 1තෙස 4:12; යාකො 3:13
14 එෆී 5:16
15 කොලො 3:16

---

**16** මතෙ 5:13; මාක් 9:50; **17** 1පේතෘ 3:15; **18** එෆී 6:21.

---

කොලො **4:5*** මූ.අ., "කාලය මිල දී ගන්න."

සිත් සැනසීම සඳහාය.[1] **9** ඔබේ
පළාතේම කෙනෙකු වන මගේ විශ්වා-
සවන්ත, ප්‍රේමණීය සහෝදර ඔනෙසි-
මස්වද[2] මම ඔහු සමඟ එවන්නෙමි.
මෙහි සිදු වන සියලු දේවල් පිළිබඳ
තොරතුරු ඔබට ඔවුන්ගෙන් දැනගත
හැකි වේ.

**10** මා සමඟ සිරභාරයේ සිටින
අරිස්තාකස්ද[3] බානබස්ගේ නෑදෑ-
යෙකු වන මාක්ද[4] ඔබට සුබ පැතුම්
එවති. (මාක් යම් දිනක ඔබ වෙ-
තට පැමිණියොත් අප ඔබට දී ඇති
මඟ පෙන්වීම්වලට අනුව ඔහුව සාදර-
යෙන් පිළිගන්න.)[5] **11** ජස්ටස් යන
නමින්ද හඳුන්වන යේසුස් ඔබට සුබ
පතයි. ඔවුන් සියලුදෙනාම චර්මච්ඡේ-
දනය වී ඇති අයයි. දෙවිගේ රාජ්‍යය
වෙනුවෙන් මට සහයෝගය දෙමින්
සේවය කරන්නේ ඔවුන් පමණි. ඇත්-
තෙන්ම ඔවුහු මට ඉමහත් ශක්තියක්
හා ධෛර්යයක් වී ඇත. **12** ක්‍රිස්-
තුස් යේසුස්ගේ දාසයෙකු වන ඔබේ
පළාතේම තවත් කෙනෙකු වන එප-
ෆ්‍රස්ද[6] ඔබට සුබ පතයි. ඔහු නිතරම
ඔබ වෙනුවෙන් මහත් උනන්දුවකින්
යාච්ඤා කරයි. ඔහුගේ ආශාව වන්නේ
ඔබ අවසානය දක්වා අවබෝධයෙන්
ක්‍රියා කරන අය ලෙසත්[1] දෙවිගේ
කැමැත්ත ගැන ස්ථිර විශ්වාසයකින්
සිටින අය ලෙසත් නොසැලී සිටිනවා
දැකීමය. **13** ඇත්තෙන්ම ඔහු ඔබ
වෙනුවෙනුත් ලවෝදිසියේ සිටින අය[2]
වෙනුවෙනුත් හියරපොලිසෙහි සිටින
අය වෙනුවෙනුත් මහත් වෙහෙසක්
දරන බව මම එකහෙළාම පවසමි.

**14** ලූක්[3] නම් ප්‍රේමණීය වෛද්‍ය-
වරයාද දේමස්ද[4] ඔබට සුබ පතති.
**15** ලවෝදිසියේ සිටින සහෝදරයන්-
ටද නිම්ෆාටද ඇගේ නිවසෙහි රැස්
වන සභාවටද[5] මගේ සුබ පැතුම් ලබා
දෙන්න. **16** මේ ලිපිය ඔබ අතරෙහි
කියෙවූ පසු ලවෝදිසියේ සභාවෙහිද
මෙය කියවීමට සැලසුම් යොදන්න.[6]
එසේම ලවෝදිසියෙන් ලැබෙන ලිපි-
යත් ඔබ අතරෙහි කියවීමටද සැලසුම්
යොදන්න. **17** "ස්වාමීන්ගේ අනුගා-
මිකයෙකු ලෙස ඔබ භාරගත් සේ-
වය නිසියාකාරව ඉටු කිරීමට වගබලා
ගන්න" කියා ආකිපස්ට[7] කියන්න.

**18** පාවුල් වන මම මගේම අතින්[8]
සුබ පැතුම් ලියා එවන්නෙමි. දැන්
මා සිටින්නේ සිරභාරයේ බව අම-
තක නොකරන්න.[9] ඔබ සැමට දෙවි-
ගේ මහත් කරුණාව ලැබේවා!

**4 පරි.**
1 එෆී 6:22
2 ෆිලෙ 10
3 ක්‍රියා 19:29 ක්‍රියා 20:4 ක්‍රියා 27:2 ෆිලෙ 24
4 ක්‍රියා 12:12 ක්‍රියා 15:37
5 රෝම 15:7
6 කොලො 1:7

**2 තීරුව**
1 1කොරි 15:58 කොලො 1:23
2 එළි 3:14
3 ලූක් 1:3 ක්‍රියා 1:1
4 ෆිලෙ 24
5 රෝම 16:5 1කොරි 16:19
6 1තෙස 5:27
7 ෆිලෙ 2
8 1කොරි 16:21 2තෙස 3:17
9 පිලි 1:7 ෆිලෙ 9 හෙබ්‍රෙ 13:3

# තෙසලෝනිකවරුන්ට

## ලියූ පළමුවෙනි ලිපිය

**1** මේ ලිපිය ලියන්නේ පාවුල්, සිල්-
වානස්[1] සහ තිමෝතිය.[2] මෙය
ලියන්නේ පියාණන් වන දෙවි සහ
ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් සමඟ
එකට බැඳී සිටින[3] තෙසලෝනිකව-
රුන්ගේ සභාව වෙතටය.

ඔබට දෙවිගේ මහත් කරුණාවත්
සමාදානයත් ලැබේවා![4]

**2** දෙවිට යාච්ඤා කරන විට අප
ඔබ ගැන සඳහන් කරන සෑම අවස්-
ථාවකදීම අපි දෙවිට ස්තුති
කරන්නෙමු.[1] **3** ඔබ තුළ තිබෙන
විශ්වාසය නිසා ඔබ කරන ක්‍රියාවන්ද[2]
ඔබේ ප්‍රේමය නිසා ඔබ දරන වෙහෙසද
අපගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්-
තුස් කෙරෙහි ඔබට ඇති බලාපො-
රොත්තුව නිසා ඔබේ විඳදරාගැනීමද[3]
අපි අපගේ දෙවි සහ පියාණන් වන
තැනැත්තා ඉදිරියෙහි නිරතුරුවම
මතක් කරන්නෙමු. **4** දෙවිගේ ප්‍රේ-
මය ලබන සහෝදරයෙනි, ඔහු ඔබව
තෝරාගත් බව[4] අප හොඳින් දන්නා

**1 පරි.**
1 ක්‍රියා 15:27 2තෙස 1:1 1පේතෘ 5:12
2 ක්‍රියා 16:1
3 යොහ 17:21
4 1තිමෝ 1:2

**2 තීරුව**
1 එෆී 1:16 2තෙස 1:11
2 හෙබ්‍රෙ 6:10
3 1පේතෘ 1:3
4 කොලො 3:12 2තෙස 2:13

කරුණකි. 5 මන්ද අප ඔබට ශුභා-
රංචිය දේශනා කළ විට පැවසූ දේවල්
නිකම්ම වචනවලට පමණක් සීමා
වූයේ නැත. එය ඔබ තුළ ප්‍රබල බල-
පෑමක් ඇති කළේය.[1] දෙවිගේ බලය
ඔබ අතරෙහි ප්‍රබලව ක්‍රියාත්මක වූ
නිසා ඔබ තුළ ස්ථිර විශ්වාසයක්
ඇති විය.[2] ඔබේ යහපත වෙනුවෙන්
අප කවර අන්දමේ සේවයක් කළාද[3]
කියා ඔබ හොඳින් දන්නහුය. 6 දෙ-
විගේ පණිවිඩය ලැබුණු ඔබට, බො-
හෝ පීඩාවලට මුහුණ දෙන්න සිදු
වුණත්[4] දෙවිගේ බලය නිසා ඔබ එය
ප්‍රීතියෙන් පිළිගෙන[5] අපවද ස්වාමීන්-
වද[6] අනුකරණය කරන අය[7] බවට
පත් වී ඇත. 7 එමෙන්ම මැසිඩෝ-
නියාවේ සහ ඇකේයාවේ සිටින යේ-
සුස්ගේ අනුගාමිකයන් සියලුදෙනාට
ඔබේ ආදර්ශය ප්‍රබල බලපෑමක් විය.
8 ඇත්තෙන්ම යෙහෝවා දෙවි-
ගේ පණිවිඩයේ හඬ[8] ඔබ මාර්ග-
යෙන් මැසිඩෝනියාවේද ඇකේයාවේද
පැතිර ගොස් තිබෙනවා පමණක්
නොව දෙවි කෙරෙහි ඔබට තිබෙන
විශ්වාසය[9] ගැනද සියලුදෙනාටම
ආරංචි වී ඇත.[10] ඒ හේතුව නිසා
අපට ඒ ගැන තවත් කතා කිරීමට
අවශ්‍ය නැත. 9 මන්ද අප මුලින්ම
ඔබ අතරට පැමිණි ආකාරය ගැනද
ඔබ ඔබේ දේවතා රූප අත්හැර[11] දෙවි
වෙතට හැරුණු ආකාරය ගැනද ඔවුහු
නිතරම කතා කරති. ඔබ එසේ කළේ
ජීවමාන[12] මෙන්ම සැබෑ[13] දෙවි කෙ-
නෙකු වෙනුවෙන් වෙහෙස මහන්සි
වී සේවය කිරීම සඳහාය. 10 එලෙ-
සම ඔබ දෙවි වෙතට හැරුණේ මර-
ණයෙන් නැඟිටුවනු ලැබූ[14] දෙවිගේ
පුත්‍රයා වන යේසුස් ස්වර්ගයෙන් පැමි-
ණෙන තුරු[15] බලා සිටීම සඳහාය.[16]
ඉදිරියේදී දෙවි තම උදහස වගුරුවන
විට අපව ගලවන්නේ ඔහුය.[17]

**2** ඇත්තෙන්ම සහෝදරයෙනි,
ඔබව හමු වීමට අප දැරූ වෑයම[18]
නිෂ්ඵල නොවූ බව[19] ඔබ හොඳින්
දන්නා කරුණකි. 2 (ඔබ දන්නා
පරිදි) අප පිලිප්පියේ සිටි විට[20] බො-
හෝ වධ වේදනාවලටත්[1] නින්දාවන්-
ටත් ලක් වීමට අපට සිදු විය.[2] නමුත්
ඉමහත් වෙහෙසක් දරමින් නිර්භීතව
ඔබට දෙවිගේ ශුභාරංචිය ගැන කතා
කිරීමට[3] අපි අපගේ දෙවිගෙන් උප-
කාර ලැබුවෙමු. 3 අප ඔබට ලබා
දෙන උපදෙස්, මඟ පෙන්වීම් පදනම්
වී තිබෙන්නේ බොරු හෝ වංචාසහ-
ගත දේවල් මත නොවේ. එලෙසම
අප ක්‍රියා කරන්නෙත් වංක චේතනා-
වෙන් නොවේ.[4] 4 ශුභාරංචිය අපට
භාර දීමට[5] තරම් අප සුදුසුයි කියා
දෙවි තීරණය කර ඇත. ඒ නිසා අප ඒ
ගැන කතා කරන්නේ මිනිසුන්ව සතුටු
කිරීමට නොව අපගේ සිත් සෝදිසි
කර බලන[6] දෙවිව සතුටු කිරීමටය.[7]
5 ඇත්තෙන්ම (ඔබ දන්නා පරිදි)
අප ඔබ සමඟ සිටි විට අප කිසිම
අවස්ථාවක චාටු බස් පැවසුවේවත්[8]
අපට යම් තණ්හාවක් තිබුණේවත්[9]
එය සැඟවීමට බොරු මවාපෑමක්[10]
කළේවත් නැත. ඒ ගැන දෙවි පවා
හොඳින් දැන සිටියි. 6 ඔබෙන් හෝ
අන් අයගෙන් එනම්, මිනිසුන්ගෙන්
අප ගෞරවය බලාපොරොත්තු වුණේ
නැත.[11] ක්‍රිස්තුස්ගේ නියෝජිතයන්*
ලෙස ඔබෙන් බොහෝ දේවල් බලා-
පොරොත්තු වෙමින් ඔබට බරක්
වීමට[12] අයිතියක් අපට තිබුණත් අපි
එසේ නොකළෙමු. 7 ඒ වෙනුවට
කිරි දෙන මවක් ඇගේම දරුවන්ව
ආදරයෙන් රැකබලා ගන්නා සේ[13] අපි
ඔබ අතරේ සිටියදී ඔබව ඉමහත්
සෙනෙහසකින් රැකබලා ගත්තෙමු.
8 එසේ ඔබ අපට ඉතා හිතවත් වූ
නිසා[14] ගැඹුරු සෙනෙහසක් ඇතුව[15]
ඔබට දෙවිගේ ශුභාරංචිය ලබා දීමට
පමණක් නොව ඔබ වෙනුවෙන් අප-
ගේ ජීවිත පවා දීමට[16] අපි සතුටු
වූයෙමු.
9 සහෝදරයෙනි, අප දැරූ වෙ-
හෙස ඔබට අමතක වී නැති
බව අපට නිසැකය. අපගේ වියහිය-
දම්වලින් ඔබෙන් කිසිවෙකුට බරක්

**1 පරි.**
1 1කොරි 2:4
2 කොලො 4:12
3 1කොරි 9:19
4 1තෙස 2:14
5 ක්‍රියා 13:52
6 1පේත්‍ර 2:21
7 1කොරි 11:1
පිලි 3:17
2තෙස 3:9
8 යෙසා 39:5
යෙසා 66:5
1පේත්‍ර 1:23
9 2තෙස 1:4
10 රෝම 1:8
රෝම 10:18
11 1කොරි 10:14
1කොරි 12:2
ගලා 4:8
1යොහ 5:21
12 ක්‍රියා 14:15
1තිමෝ 4:10
13 යොහ 17:3
1කොරි 8:4
14 ක්‍රියා 2:24
15 ක්‍රියා 1:11
16 තීත 2:13
17 1තෙස 5:2
2පේත්‍ර 3:12
එළි 6:17

**2 පරි.**
18 ක්‍රියා 17:1
2තෙස 3:8
19 ක්‍රියා 17:4
20 ක්‍රියා 16:12

**2 තීරුව**
1 ක්‍රියා 16:22
2 ක්‍රියා 16:37
3 ක්‍රියා 17:2
4 1තෙස 4:7
5 1තිමෝ 1:11
තීත 1:3
6 හිතෝ 17:3
යෙරෙ 11:20
1කොරි 4:5
7 ගලා 1:10
8 හිතෝ 28:23
හිතෝ 29:5
9 ක්‍රියා 20:33
කොලො 3:5
2පේත්‍ර 2:3
10 මාක් 12:40
11 යොහ 5:41
යොහ 5:44
12 2කොරි 11:9
2තෙස 3:8
2තෙස 3:10
13 1රාජා 3:26
14 යොහ 13:35
15 2කොරි 12:15
16 යොහ 15:13

**1තෙස 2:6*** හෝ, “යවනු ලැබූවන්.”

දැනෙනවාට අප අකමැති වූ නිසා[1]
රෑ දවල් වැඩ කරමින්[2] අපි ඔබට
දෙවිගේ ශුභාරංචිය දේශනා කළෙමු.
**10** යේසුස්ගේ අනුගාමිකයන් වන ඔබ
සමඟ අප කොතරම් විශ්වාසවන්තව,
ධර්මිෂ්ඨව සහ නිර්දෝෂීව[3] කටයුතු
කළාද යන්න ගැන ඔබත් දෙවිත්
හොඳින් දන්නහුය. **11** පියෙකු[4] තම
දරුවන්ට උපදෙස් මඟ පෙන්වීම්
දෙන ආකාරයට අප ඔබ එකිනෙකාට
කොතරම් උපදෙස් හා මඟ පෙන්-
වීම් දුන්නාද[5] කියාත් ඔබව කොත-
රම් සැනසුවාද කියාත් ඔබට සාක්ෂි
දරන්න කොතරම් වෙහෙසක් දැරුවාද
කියාත් ඔබ හොඳින් දන්නා දෙයකි.
**12** එසේ කළේ තම රාජ්‍යය ලබා දීම-
ටත්[6] තම තේජස ලබා දීමටත් ඔබව
කැඳවූ[7] දෙවිට ඔබින ආකාරයකින්
ඔබේ ජීවිතය දිගටම ගත කිරීමට
හැකි වීම සඳහාය.[8]

**13** ඇත්තෙන්ම අපි දෙවිට නො-
කඩවා ස්තුති කරමු.[9] මන්ද දෙ-
විගේ පණිවිඩය[10] අප ඔබට පැවසූ
විට ඔබ එය පිළිගත්තේ මිනිසුන්-
ගෙන් ලැබුණු දෙයක් ලෙස නොව[11]
දෙවිගෙන් ලැබුණු පණිවිඩයක් ලෙ-
සය. දෙවිට සේවය කරන ඔබේ
හදවත් තුළ ක්‍රියා කරන්නේ ඒ පණිවි-
ඩයේ තිබෙන බලයයි.[12] **14** සහෝ-
දරයෙනි, ක්‍රිස්තුස් යේසුස් සමඟ එකට
බැඳී සිටින යුදයේ තිබෙන දෙවිගේ
සභාවල සිටින අයව ඔබ අනුකර-
ණය කරන බව පැවසිය හැක. මන්ද
ඔවුන් යුදෙව්වරුන් අතින් විඳින දේ-
වල්ම දැන් ඔබටත් ඔබේම රට වැසි-
යන් අතින් විඳීමට සිදු වී ඇත.[13]
**15** ඒ යුදෙව්වරු ස්වාමීන් වන යේ-
සුස්වත්[14] අනාගතවක්තෘවරුන්වත්[15]
මරණයට පත් කළ අතර අපටද පීඩා
කළෝය.[16] ඔවුහු දෙවිව සතුටු නො-
කරන අතර සියලු මිනිසුන්ගේ යහප-
තට හේතු වන සියල්ලට විරුද්ධව
ක්‍රියා කරති. **16** මන්ද ඔවුන් උත්-
සාහ දරන්නේ වෙනත් ජාතීන්ට අයත්
අයට ගැලවීම ලබා දීම සඳහා[17] අප
කරන සේවයට හරස් වීමටය.[18] එසේ
ඔවුහු නිතරම බොහෝ පව්කාර ක්‍රියා-
වල නිරත වෙති.[1] නමුත් අන්තිමේදී
ඔහුගේ* උදහස ඔවුන් පිට වැගිරීමට
කාලය පැමිණෙයි.[2]

**17** සහෝදරයෙනි, අප ටික කල-
කට ඔබෙන් සමුගත් විට අපට නිත-
රම ඔබව මතක් විය. එහෙයින්
අපි ඔබේ මුහුණු දැක බලා ගැනී-
මට මහත් ආශාවෙන් සිටි අතර[3]
ඒ සඳහා පෙරටත් වඩා උත්සාහයක්
දැරුවෙමු. **18** පාවුල් වන මා ඇතු-
ළුව අප එක් වරක් නොව දෙවරක්ම
ඔබ ළඟට එන්න කැමැත්තෙන් සිටි-
යේ ඒ නිසාය. නමුත් සාතන් අපගේ
ගමනට බාධා කළේය. **19** අපගේ
ස්වාමීන් වන යේසුස් පැමිණ සිටින
විට*[4] ඔහු ඉදිරියෙහි අපගේ බලා-
පොරොත්තුවට පදනමත් ප්‍රීතිය හා
සතුටට හේතු වන කිරුළත් ඔබම
නොවේද?[5] **20** ඇත්තෙන්ම අපගේ
ගෞරවයත් ප්‍රීතියත් ඔබය.

**3** ඔබෙන් වෙන්ව සිටීම අපට
තවත් දරාගත නොහැකි වූ නිසා
අප පමණක් ඇතන්ස්හි නතර වී,[6]
**2** අපගේ සහෝදරයෙකුද ක්‍රිස්තුස්
පිළිබඳ ශුභාරංචියේ[7] දේවසේවකයෙ-
කුද වන තිමෝතිව[8] ඔබ වෙතට එවී-
මට තීරණය කළෙමු. අප එසේ කළේ
ඔබව සනසමින් ශක්තිමත් කර ඔබ
තුළ තිබෙන විශ්වාසය තවත් ස්ථිර
කිරීමටය. **3** එසේම ඔබ අද්දකින
පීඩාවලින් අධෛර්යය නොවීම සඳ-
හාය.[9] ඒ දේවලට අනිවාර්යයෙන්ම
මුහුණ දීමට සිදු වන බව ඔබ හොඳින්
දන්නා දෙයකි.[10] **4** ඇත්තෙන්ම අප
සියල්ලන්ටම පීඩා විඳින්න සිදු වන
බව[11] අපි ඔබ සමඟ සිටියදී කල්ති-
යාම ඔබට පැවසුවෙමු.[12] ඔබ දන්නා
පරිදි ඒ පීඩා විඳීමට අපට සිදු
වී ඇත.[13] **5** ඔබෙන් වෙන්ව සිටීම
තවත් දරාගත නොහැකි වූ නිසා
මා ඔහුව එව්වේ ඔබේ විශ්වාසවන්ත-
කම[14] ගැන දැනගැනීමටය. මන්ද වර-

**2 පරි.**
1 2කොරි 11:9; 2තෙස 3:8
2 ක්‍රියා 18:3; ක්‍රියා 20:34; 1කොරි 4:12
3 හෙබ්‍රෙ 13:18
4 1කොරි 4:15
5 ක්‍රියා 20:31
6 ලූක් 22:29
7 1තෙස 5:24; 2තෙස 1:11; 1පේතෘ 5:10
8 ගලා 5:16; එෆී 4:1; කොලො 1:10; 1පේතෘ 1:15
9 1තෙස 1:2
10 ක්‍රියා 11:1; හෙබ්‍රෙ 4:12
11 ගලා 1:11
12 පිලි 2:13
13 යොහ 15:19; ක්‍රියා 17:5
14 ක්‍රියා 2:23
15 මතෙ 5:12; ක්‍රියා 7:52
16 මතෙ 23:34; ක්‍රියා 21:13
17 රෝම 10:9
18 ලූක් 11:52; ක්‍රියා 13:50

**2 තීරුව**
1 උත් 15:16; මතෙ 23:32
2 රෝම 1:18
3 රෝම 1:11
4 1තෙස 3:13; 1තෙස 5:23
5 පිලි 4:1; 2තෙස 1:4

**3 පරි.**
6 ක්‍රියා 17:15
7 මතෙ 24:14; 2තෙස 1:8; එළි 14:6
8 ක්‍රියා 16:1; රෝම 16:21; 1කොරි 16:10
9 ක්‍රියා 14:22; එෆී 3:13
10 1කොරි 4:9; 1පේතෘ 2:21
11 ක්‍රියා 20:23
12 2තෙස 2:5
13 1තෙස 2:14
14 1තෙස 3:2

---

1තෙස 2:16* හෝ, "දෙවිගේ." 19* පැමිණ සිටීම. ග්‍රීක බසින්, පරූසියා. උපග. 7 බලන්න.

දට පොලඹවන්නා[1] යම් ආකාරයකින්
හෝ ඔබව වරදට පොලඹවයි කියා මා
තුළ යම් බියක් ඇති විය. එවැනි දෙ-
යක් සිදු වුණොත් අප ඔබ වෙනුවෙන්
දැරූ වෙහෙස අපතේ යනු ඇත.[2]

**6** මෑතකදී ඔබව බලා ආපසු
පැමිණි තිමෝති[3] ඔබේ විශ්වාස-
වන්තකම සහ ප්‍රේමය ගැන[4]
අපට තොරතුරු ලබා දුන්නේය.
ඔබව දැකීමට අප මහත් ආශාවෙන්
සිටිනවා වගේ ඔබත් අපව දැකී-
මට මහත් ආශාවෙන් සිටින බවත්[5]
ඔබ නිතරම අපව ආදරයෙන් මතක්
කරන බවත් ඔහු අපට දැන්වීය.
එය ඇත්තෙන්ම ප්‍රීතිමත් ආරංචි-
යකි. **7** සහෝදරයෙනි, අප බො-
හෝ අගහිඟකම්වලට හා පීඩාවලට
මුහුණ දුන්නත් ඔබේ විශ්වාසවන්-
තකම[6] ගැන දැනගන්න ලැබීමෙන්
අපට මහත් සැනසීමක් ලැබිණ.[7]
**8** ස්වාමීන්ගේ අනුගාමිකයන් ලෙස
ඔබ නොසැලී ස්ථිරව සිටීම[8] අපට
මහත් දිරිගැන්වීමකි. **9** ඔබ නිසා
අපට දෙවි ඉදිරියේ දැනෙන මේ මහත්
ප්‍රීතිය[9] ගැන අප දෙවිට කෙසේ ස්තුති
කරන්නද? **10** එලෙසම ඔබ සැම-
ගේ මුහුණු දැකීමටත් ඔබේ විශ්වා-
සය තවත් ශක්තිමත් කිරීමට යම්
උපකාර ලබා දීමටත්[10] අපි දිවා රෑ
දෙකේම මහත් උනන්දුවකින් දෙවිට
කන්නලව් කරමු.[11]

**11** ඔබව හමු වීමට අපගේ දෙවි
වන පියාණන්ද අපගේ ස්වාමීන් වන
යේසුස්ද[12] අපට මාර්ගය පහදා දෙයි
කියා අපි සිතන්නෙමු. **12** මීට අම-
තරව අප ඔබට ප්‍රේම කරන ආකා-
රයටම එකිනෙකා සඳහාත් අන්
සියලුදෙනා සඳහාත් ඔබට ඉමහත්
ප්‍රේමයක් පෙන්වන්න[13] හැකි වෙන්න
කියාත් ඇත්තෙන්ම ඒ ප්‍රේමයෙන් පිරී
යෑමට[14] ඔබට හැකියාව ලබා දෙන්න
කියාත් අපි ස්වාමීන්ගෙන් ඉල්ලමු.
**13** එවිට අපගේ ස්වාමීන් වන යේ-
සුස් තම සියලු ශුද්ධ තැනැත්තන්
සමඟ[1] පැමිණ සිටින විටදී*[2] ඔබේ
සිත් ශක්තිමත් කර අපගේ පියාණන්
වන දෙවි ඉදිරියෙහි ශුද්ධව හා නිර්-
දෝෂීව[3] සිටීමට ඔබට හැකියාව ලබා
දෙනු ඇත.

**4** සහෝදරයෙනි, හැසිරිය යුතු
ආකාරය ගැනත්[4] දෙවිව සතුටු
කළ යුතු ආකාරය ගැනත් ඔබ අප-
ගෙන් ඉගෙනගෙන ඇති අතර ඔබ
ඇත්තෙන්ම ක්‍රියා කරන්නේ ඊට
එකඟවය. අවසාන වශයෙන් අප
ස්වාමීන් වන යේසුස්ගේ නාමයෙන්
ඔබෙන් ඉල්ලා සිටින්නෙත් ඔබට
උනන්දු කරන්නෙත් වඩාත් හොඳින්
එලෙස ක්‍රියා කිරීමට උත්සාහ
කරන්න කියාය.[5] **2** මන්ද ස්වාමීන්
වන යේසුස්ගේ නාමයෙන් අප ඔබට
අණ කළ දේවල්[6] ගැන ඔබ නොදන්-
නවා නොවේ.

**3** දෙවි කැමති වන්නේ ඔබ ශුද්-
ධව* සිටිනවාටය.[7] එහෙයින් ඔබ
වේශ්‍යාකමින්# වැළකී සිටිය යුතුයි.[8]
**4** සෑම කෙනෙකුම තමාගේ ශරී-
රය ශුද්ධව[9] හා ගෞරවනීය ආකාරය-
කින් පාලනය කරගත යුතු අන්දම
ගැන දැන සිටිය යුතුයි.[10] **5** දෙවිව
හඳුනන්නේ නැති[11] ජාතීන් කරන්නා
සේ[12] කිසිවෙකු කාමාශාවෙන් දැවිදැවී
නොසිටිය යුතුයි.[13] **6** එවැනි ආශා-
වක් නිසා කිසිවෙකු තම සහෝද-
රයාට විරුද්ධව හානිකර දෙයක්
නොකළ යුතුයි.[14] මන්ද එය ඔහුට
විරුද්ධව කරන මහත් වරදකි. අප
කලින් ඔබට ඉතා පැහැදිලිව විස්තර
කළා සේ[15] යෙහෝවා දෙවි එවැනි
දේවල් කරන අයට දඬුවම් කරනු
ඇත.[16] **7** මන්ද දෙවි අපව කැඳෙව්-
වේ අපවිත්‍ර ලෙස හැසිරීමට නොව
ශුද්ධව සිටීම සඳහාය.[17] **8** එහෙ-
යින් ඒ දේවල් නොසලකාහරින
තැනැත්තා[18] නොසලකාහරින්නේ

**3 පරි.**
**1** මතෙ 4:3; 1කොරි 7:5; 2කොරි 11:3
**2** 1කොරි 15:58; ගලා 4:11; පිලි 2:16
**3** ක්‍රියා 18:5
**4** රෝම 13:8; යාකො 2:8; 1පේතෘ 1:22
**5** පිලි 1:8
**6** 2තෙස 1:4
**7** 2කොරි 7:6
**8** රෝම 11:20; 1කොරි 15:1; පිලි 4:1
**9** පිලි 2:2
**10** 2තෙස 1:3; යූද් 20
**11** 2තිමෝ 1:3
**12** 2තෙස 2:16
**13** 2තෙස 1:3
**14** 1තෙස 4:9; 2පේතෘ 1:7

**2 තීරුව**
**1** 1තෙස 2:19; 1තෙස 5:23; 2තෙස 2:1
**2** යාකො 5:8; 1යොහ 2:28
**3** 1කොරි 1:8; පිලි 1:10

**4 පරි.**
**4** කොලො 1:10; 1පේතෘ 2:12
**5** පිලි 1:27
**6** 1තිමෝ 6:13
**7** යොහ 17:19; එෆී 5:26; 2තෙස 2:13; 1පේතෘ 1:16
**8** 1කොරි 6:15; එෆී 5:3
**9** රෝම 6:19; 2තිමෝ 2:21
**10** කොලො 3:5; 2තිමෝ 2:22
**11** ගීතා 79:6; 1පේතෘ 4:3
**12** 1කොරි 5:10; එෆී 4:17
**13** 1කොරි 6:18; එෆී 5:5
**14** ද්වි 5:21; 1කොරි 6:8; 1කොරි 7:2
**15** ක්‍රියා 20:20; ක්‍රියා 28:23
**16** ගීතා 94:1; 2තෙස 1:8
**17** ලෙවී 11:44; 1කොරි 1:2; හෙබ්‍රෙ 12:14; 1පේතෘ 1:15
**18** ලූක් 10:16

---

**1තෙස 3:13*** පැමිණ සිටීම. ග්‍රීක බසින්, පරූසියා. උපග්‍ර. 7 බලන්න. **4:3*** හෝ, “දෙවි සඳහා වෙන් කර ඇති අය ලෙස.” **3#** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න.

මිනිසාව නොව තම බලය[1] ඔබට
ලබා දෙන දෙවිවය.[2]
**9** සහෝදර ප්‍රේමය[3] ගැන ඔබට
ලියන්න අවශ්‍යතාවක් නැත. මන්ද
එකිනෙකාට ප්‍රේම කරන්න කියා[4] දෙවි
ඔබට උගන්වා තිබේ.[5] **10** ඇත්-
තෙන්ම ඔබ මැසිඩෝනියාව පුරා
සිටින සියලු සහෝදරයන්ට ප්‍රේමය
දක්වන්නහුය. නමුත් සහෝදරයෙනි,
අප ඔබට උනන්දු කරන්නේ වැඩි වැඩි-
යෙන් එසේ කරන්න කියාය. **11** මීට
අමතරව අප ඔබට උපදෙස් දුන් ලෙස
සන්සුන් ජීවිතයක් ගත කිරීමටත්[6]
අනුන්ගේ වැඩකටයුතුවලට ඇඟිලි
නොගසා සිටීමටත්[7] ඔබේම ශ්‍රමයෙන්
වැඩ කිරීමටත්[8] දැඩි උත්සාහයක්
දරන්න. **12** එසේ කිරීමෙන් පොදු
ජනයා ඉදිරියේ[9] ගෞරවනීය ජීවිත-
යක් ගත කරමින්[10] කිසි දෙයකින් අඩු-
පාඩුවක් නොමැතිව සිටීමට[11] ඔබට
හැකි වේ.
**13** සහෝදරයෙනි, මරණය නමැති
නින්දෙහි සැතපී සිටින අයට සිදු
වන දේ ගැන ඔබ අවබෝධයෙන්
සිටිනවාට කැමැත්තෙමු.[12] එවිට කිසි
බලාපොරොත්තුවක් නැති වෙනත්
අය මෙන් ශෝකයෙන් සිටීමට ඔබට
සිදු වන්නේ නැත.[13] **14** යේසුස් මිය
ගොස් නැවත නැඟිටුණු බව අප විශ්-
වාස කරනවා නම්[14] මරණය නමැති
නින්දෙහි සැතපී සිටින යේසුස් සමඟ
එකට බැඳී සිටින අයවත් ඔහු සමඟ
සිටීමට දෙවි නැවත ජීවත් කරවන බව
අප විශ්වාස කළ යුතුයි.[15] **15** යෙ-
හෝවා දෙවි පවසන දේ[16] පදනම් කර-
ගෙන අප ඔබට කියන්නේ මෙයයි.
ස්වාමීන් පැමිණ සිටින කාලය*[17] අත-
රතුරේදී ජීවත්ව සිටින අප, මරණය
නමැති නින්දෙහි සැතපී සිටින අයට
කලින් නැඟිටින්නේ නැත. **16** මන්ද
ස්වාමීන්, දෙවිගේ හොරණෑව අතැ-
තිව[18] ස්වර්ගයෙන් බැස එයි.[19] ඒ
අවස්ථාවේදී අග්‍රදේවදූතයා[20] වන ඔහු-
ගේ හඬද ඔහු නිකුත් කරන අණද
ඇසෙයි. එවිට මුලින්ම නැඟිටුවනු
ලබන්නේ ක්‍රිස්තුස් සමඟ එකට බැඳී
සිටින මිය ගිය අයවයි.[1] **17** ඉන්පසු
ජීවතුන් අතර සිටින අපව[2] ස්වාමීන්ව
අහසේදී හමු වීම සඳහා[3] වලාකුළු
අතරට[4] ඔසවාගනු ලැබේ.[5] ඒ අනුව
අපි නිරතුරුවම ස්වාමීන් සමඟ සිටින්-
නෙමු.[6] **18** එහෙයින් මේ වදන්වලින්
එකිනෙකාව සනසවන්න.

**5** සහෝදරයෙනි, ඒ දේවල් සිදු
වීමට නියමිත කාල වකවානු[7]
ගැන ඔබට ලිවීම සඳහා කිසි අවශ්‍ය-
තාවක් නැත. **2** මන්ද යෙහෝවා
දෙවිගේ දවස[8] පැමිණෙන්නේ හරි-
යටම රාත්‍රියේ පැමිණෙන සොරෙකු
මෙන්[9] බව ඔබ හොඳින් දන්නා
කරුණකි. **3** ඒ අනුව ඔවුන්,[10]
“මෙන්න, සාමය[11] සහ සුරක්ෂිත-
භාවය උදා වෙලා” කියා පවසමින්
සිටින විට ගැබිනි මවකට ප්‍රසව වේද-
නාව ඇති වන්නා සේ[12] නොදැනුවත්-
වම හදිසි විනාශයකට[13] මුහුණ දීමට
ඔවුන්ට සිදු වේ. එයින් ඔවුන් කිසි
ලෙසකින්වත් ගැලවෙන්නේ නැත.[14]
**4** නමුත් සහෝදරයෙනි, ඔබ අන්-
ධකාරයෙහි සිටින අය නොවේ.[15]
එහෙයින් හිරු උදා වීමෙන් අවදානම-
කට ලක් වන සොරෙකු මෙන් ඔබ
ඒ දවසේදී අවදානමකට ලක් වන්-
නේ නැත.[16] **5** මන්ද ඔබ සියලු-
දෙනාම ආලෝකයේ දරුවෝ[17] සහ
දිවා කාලයේ පුත්‍රයෝය.[18] අප රාත්‍රි-
යටවත් අන්ධකාරයටවත් අයිති අය
නොවේ.[19]
**6** එහෙයින් සෙසු අය මෙන්[20] අපි
නිදාගෙන සිටිනවා වෙනුවට[21] අව-
දිව සිටිමින්[22] හොඳ සිහිකල්පනාවෙන්
සිටිමු.[23] **7** නිදාගෙන සිටින අය[24]
එසේ කිරීමට පුරුදු වී සිටින්නේ රාත්‍රි-
යේදීය.[25] බීමත්කමින් වෙරි වන අයද

**4 පරි.**
1 එස 37:14; 1යොහ 3:24
2 1කොරි 6:19
3 යොහ 13:34; යොහ 13:35; රෝම 12:10
4 1පේතෘ 1:22; 1යොහ 4:21
5 යෙසා 54:13; යොහ 6:45
6 2තෙස 3:12
7 රෝම 12:11; 1පේතෘ 4:15
8 1කොරි 4:12; එෆී 4:28; 2තෙස 3:10; 1තිමෝ 5:8
9 රෝම 12:17; 2කොරි 8:21
10 රෝම 13:13
11 යාකො 1:4
12 යොහ 11:11; ක්‍රියා 7:60; 1කොරි 15:6
13 1කොරි 15:32; එෆී 2:12
14 රෝම 14:9; 1කොරි 15:4
15 1කොරි 15:23; පිලි 3:21; 2තෙස 2:1; එළි 20:4
16 1තෙස 2:13; 1යොහ 4:2
17 මතෙ 24:30; 1කොරි 15:51
18 මතෙ 24:31
19 ක්‍රියා 1:11
20 යූද් 9

**2 තීරුව**
1 1කොරි 15:52
2 2තිමෝ 4:8
3 යොහ 12:26; යොහ 17:24; 2තෙස 2:1
4 මතෙ 26:64
5 ක්‍රියා 1:9; 2කොරි 5:8; පිලි 1:23
6 යොහ 14:3; එළි 20:6

**5 පරි.**
7 දානි 2:21; දානි 7:25; ක්‍රියා 1:7; රෝම 13:11
8 ශෙප 1:14
9 මතෙ 24:36; 2පේතෘ 3:10; එළි 3:3
10 යෙරෙ 8:9
11 යෙරෙ 8:11
12 ගීතා 48:6; හොෂෙ 13:13
13 ගීතා 37:10; 2තෙස 1:9

**1තෙස 4:15*** පැමිණ සිටීම. ග්‍රීක බසින්, පරූසියා. උපග. 7 බලන්න.

**14** හෙබ්‍රෙ 2:3; හෙබ්‍රෙ 12:25; **15** රෝම 13:12; කොලො 1:13; 1පේතෘ 2:9; **16** යෝබ් 24:14; **17** යොහ 12:36; **18** ක්‍රියා 26:18; රෝම 13:12; එෆී 5:8; **19** යොහ 8:12; **20** රෝම 13:11; 1කොරි 11:30; **21** එෆී 5:14; **22** මතෙ 24:42; **23** 1පේතෘ 5:8; **24** එෆී 5:14; **25** රෝම 13:13.

සාමාන්‍යයෙන් රාත්‍රියෙහි වෙරි වෙති.
8 නමුත් දිවා කාලයට අයිතිව සිටින
අපි, හොඳ සිහිකල්පනාවෙන් සිටිමු.
එමෙන්ම විශ්වාසය[1] සහ ප්‍රේමය ළය-
වැස්මක්[2] ලෙසද අප ලබන ගැලවීම
පිළිබඳ බලාපොරොත්තුව[3] හිස්-
වැස්මක්[4] ලෙසද පැළඳගෙන සිටිමු.
9 මන්ද දෙවි අපව තෝරාගත්තේ
ඔහුගේ උදහසට ලක් වීමට නො-
වේ.[5] ඒ වෙනුවට අපගේ ස්වාමීන් වන
යේසුස් ක්‍රිස්තුස් මාර්ගයෙන්[6] ගැලවීම
ලබාගැනීමටය.[7] 10 ඔහු අප වෙනු-
වෙන් මිය ගියේ[8] අප ජීවත්ව සිටියත්
මරණය නමැති නින්දෙහි සැතපී සිටි-
යත් ඔහු සමඟ ජීවත් වීමේ ප්‍රස්තාව
අපට ඉදිරියේදී ලබා දීම සඳහාය.[9]
11 එහෙයින් ඔබ දැනටමත් කරමින්
සිටින ආකාරයට[10] දිගටම එකිනෙ-
කාව සනසවමින් එකිනෙකාව ශක්ති-
මත් කරන්න.*[11]

12 සහෝදරයෙනි, ඔබ අතරෙහි
වෙහෙසී වැඩ කරන, ස්වාමීන් වෙනු-
වෙන් ඔබ අතරෙහි පෙරමුණ ගෙන
කටයුතු කරන,[12] ඔබට උපදෙස් හා
අවවාද ලබා දෙන අයව සුළු කොට
නොතකන්න කියා ඔබෙන් ඉල්ලා
සිටිමු. 13 එමෙන්ම ඔවුන් කරන
සේවය නිසා ඔවුන්ට ඉමහත් ප්‍රේම-
යකින් ගෞරවය දක්වන්න කියාත්
ඉල්ලා සිටිමු.[13] එමෙන්ම එකිනෙකා
සමඟ සමාදානයෙන් සිටින්න.[14]
14 එලෙසම සහෝදරයෙනි, නො-
හික්මුණු ආකාරයකින් කටයුතු
කරන අයට උපදෙස් හා අවවාද ලබා
දෙන්න කියාත්[15] කලකිරී සිටින අයව
සනසවන්න කියාත්[16] දුර්වල වී සිටින
අයට උපකාර කරන්න කියාත් සිය-
ලුදෙනා සමඟ බොහෝ ඉවසිලිවන්-
තකමින් කටයුතු කරන්න කියාත්[17]
ඔබට උනන්දු කිරීමට කැමැත්-
තෙමු. 15 කිසිවෙකුට තවත් කෙ-
නෙකුට විරුද්ධව එකට එක කිරීමට
ඉඩ නොතබන්න.[18] එකිනෙකාටත්
අන් සියලුදෙනාටත් නිතරම යහපත්
වූ දේවල් කිරීමටද වගබලා ගන්න.[1]
16 නිතරම ප්‍රීතියෙන් සිටින්න.[2]
17 නොකඩවා යාච්ඤා කරන්න.[3]
18 සෑම දෙයක් සඳහාම ස්තුති
දෙන්න.[4] ක්‍රිස්තුස් යේසුස් සමඟ එකට
බැඳී සිටින අය වන ඔබ සඳහා දෙවි-
ගේ කැමැත්ත එයයි. 19 ඔබ තුළ
දෙවිගේ බලය ක්‍රියාත්මක වීමට*
තිබෙන ප්‍රස්තාවට බාධා ඇති වීමට
ඉඩ නොදෙන්න.[5] 20 අනාවැකි කීම්
හෙළා නොදකින්න.[6] 21 සෑම දෙ-
යක්ම සෝදිසි කර බලා[7] යහපත් දේ
හඳුනාගෙන එය තදින් අල්ලාගන්න.[8]
22 සියලු ආකාර දුෂ්ටකමින් වැළකී
සිටින්න.[9]

23 සමාදානයේ දෙවි[10] ඔබව සම්-
පූර්ණයෙන්ම ශුද්ධ කරයි[11] කියා
ප්‍රාර්ථනා කරමු! සහෝදරයෙනි, අප-
ගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්
පැමිණ සිටින කාලයේදී* ඔබේ සිත්-
වල ආකල්පයද# සහාවක් ලෙස ඔබේ
පැවැත්මද ශරීරයක් හා සමාන වූ ඔබ
අතර ඇති බැඳීමද රැකගන්න. ඒ කිසි-
වක් තුළ කිසි දෝෂයක් හෝ කැළැ-
ලක් නොතිබිය යුතුයි.[12] 24 ඔබව
කැඳවන තැනැත්තා තම පොරොන්දු
විශ්වාසවන්තව ඉටු කරයි. අප කලින්
සඳහන් කළ දේවල්ද ඔහු අනිවාර්ය-
යෙන්ම ඉටු කරයි.

25 සහෝදරයෙනි, අප වෙනුවෙන්
දිගටම යාච්ඤා කරන්න.[13]

26 සියලු සහෝදරයන්ව සෙනෙහ-
සකින් සිඹගෙන ඔවුන්ට සුබ
පතන්න.[14]

27 මා ස්වාමීන් ඉදිරියේම ඔබට
කියන්නේ, මෙම ලිපිය සියලුම
සහෝදරයන් ඉදිරියෙහි කියවිය යුතු
බවයි.[15]

28 අපගේ ස්වාමීන් වන යේසුස්
ක්‍රිස්තුස්ගේ මහත් කරුණාව[16] ඔබට
ලැබේවා!

---

**1තෙස 5:11*** මූ.අ., "ගොඩනංවන්න."

**1තෙස 5:19*** මූ.අ., "ගින්නක් සේ දැල්වීමට." **23*** පැමිණ සිටීම. ග්‍රීක බසින්, පරූසියා. උපග්‍ර. 7 බලන්න. **23#** ග්‍රීක බසින්, නියුමා. උපග්‍ර. 3 බලන්න.

---

**5 පරි.**
**1** එෆී 6:16
**2** එෆී 6:14
**3** රෝම 8:24
**4** එෆී 6:17
**5** රෝම 9:22
**6** 2තිමෝ 2:10
**7** 2තෙස 2:13
**8** රෝම 5:8; 1කොරි 15:3
**9** 2කොරි 5:15; 1තෙස 4:17
**10** රෝම 15:14; 1තෙස 4:10
**11** යෙසා 35:3; රෝම 1:12; රෝම 15:2
**12** රෝම 12:8
**13** යෙසා 32:2; පිලි 2:29; 1තිමෝ 5:17; හෙබ්‍රෙ 13:7
**14** මාක් 9:50; 2කොරි 13:11; හෙබ්‍රෙ 12:14; 1පේතෘ 3:11
**15** ලෙවී 19:17; 2තිමෝ 4:2
**16** යෙසා 61:2; හෙබ්‍රෙ 12:12
**17** 1කොරි 13:4; ගලා 5:22; එෆී 4:2; කොලො 3:13
**18** හිතෝ 20:22; මතෙ 5:39; රෝම 12:19

**2 තීරුව**
**1** රෝම 12:17
**2** 2කොරි 6:10; පිලි 4:4
**3** ලූක් 18:1; රෝම 12:12
**4** එෆී 5:20; කොලො 3:17
**5** එෆී 4:30
**6** 1කොරි 14:1
**7** 1යොහ 4:1
**8** හෙබ්‍රෙ 10:23
**9** යෝබ් 2:3
**10** රෝම 15:33
**11** හෙබ්‍රෙ 2:11; 1පේතෘ 1:2
**12** 1කොරි 1:8
**13** රෝම 15:30
**14** රෝම 16:16; 1කොරි 16:20; 2කොරි 13:12
**15** කොලො 4:16; 2පේතෘ 3:15
**16** රෝම 16:20

# තෙසලෝනිකවරුන්ට

## ලියූ දෙවෙනි ලිපිය

1 මෙම ලිපිය ලියන්නේ පාවුල්,
සිල්වානස් සහ තිමෝතිය.[1]
මෙය ලියනු ලබන්නේ අපගේ පියා-
ණන් වන දෙවි සහ ස්වාමීන් වන යේ-
සුස් ක්‍රිස්තුස් සමඟ එකට බැඳී සිටින
තෙසලෝනිකවරුන්ගේ සභාව වෙ-
නටය.
2 පියාණන් වන දෙවිගෙන්ද ස්වා-
මීන් වන යේසුස් ක්‍රිස්තුස්ගෙන්ද
ඔබට මහත් කරුණාවත් සමාදාන-
යත් ලැබේවා![2]
3 සහෝදරයෙනි, ඔබ සියලුදෙනා-
ගේම විශ්වාසය තව තවත් ශක්ති-
මත් වන ආකාරය ගැනද[3] එකිනෙකා
සඳහා ඔබට තිබෙන ප්‍රේමය වැඩි
වන ආකාරය ගැනද[4] අපට ආරංචි වී
ඇත. ඔබ ගැන දෙවිට නිතරම ස්තුති
කළ යුත්තේ ඒ නිසාය.[5] 4 දෙවිගේ
සභාවන් අතරෙහි ඔබේ සභාව ගැන
පැවසීමට අපි ඉමහත් සේ සතුටු වන්-
නෙමු.[6] මන්ද ඔබ බොහෝ පීඩාවලට
හා දුෂ්කරතාවලට මුහුණ දෙමින් සිටි-
යත් ඔබ ඒවා විඳදරාගනිමින් ශක්ති-
මත් විශ්වාසයක් ඇතුව ක්‍රියා කරන
බව අපි දනිමු.[7] 5 එසේ ඔබ දෙවිගේ
රාජ්‍යය වෙනුවෙන් බොහෝ දුක් වින්-
දත්[8] එයට පිවිසෙන්න ඔබ සුදුස්සන්
බවට පත් වනු ඇත.[9] එයින් පැහැදිලිව
ඔප්පු වන්නේ දෙවි සෑම දෙයක්ම ධර්-
මිෂ්ඨ ලෙස විනිශ්චය කරන බවය.[10]
6 දෙවි ලබා දෙන එම විනිශ්-
චය ධර්මිෂ්ඨ එකක් වන්නේ ඔහු
ඔබට පීඩා කරන අයට ඔවුන් කළ
දේට අනුව ප්‍රතිඵල දෙන නිසාය.[11]
7 එමෙන්ම ස්වාමීන් වන යේසුස් තම
බලවත් දේවදූතයන් සමඟ[12] එළිදරව්
වන අවස්ථාවේදී[13] දැන් පීඩා විඳින
ඔබට අප සමඟම සහනය ලැබෙනු
ඇත. 8 ඇවිළෙන ගිනි ජාලාවක්
ඇතුව එළිදරව් වන ඒ අවස්ථා-
වේදී ඔහු දෙවිගේ විනිශ්චය ඉටු
කරනු ඇත.[1] එසේ කරන්නේ දෙවිව
දැන හඳුනා නොගෙන සිටින අයට[2]
හා අපගේ ස්වාමීන් වන යේසුස්
පිළිබඳ ශුභාරංචියට[3] කීකරු නො-
වන අයට[4] එරෙහිවය. 9 ඔවුන්ට
ලැබෙන දඬුවම[5] නම් සදාකාල විනා-
ශයයි.[6] ඔවුන්ව ස්වාමීන් ඉදිරියෙන්
තුරන් කරනු ලබන අතර ඔහුගේ
තේජවත් බලය නැවත දැකගැනී-
මට අවස්ථාවක් ඔවුන්ට නොලැබේ.[7]
10 යේසුස් තම ශුද්ධ තැනැත්තන්
සමඟ තේජසට පත් වීම සඳහා පැමි-
ණෙන ඒ දවසේදී[8] ඔහු කෙරෙහි විශ්-
වාසය තැබූ සියලුදෙනා ඔහු දෙස
මහත් ගෞරවයකින් බලනු ඇත.
ඇත්තෙන්ම ඔබත් ඒ අය අතර සිටිනු
ඇත. මන්ද අප දුන් සාක්ෂිය කෙරෙහි
ඔබ විශ්වාසය තැබූ බව අපි දනිමු.
11 ඔබව කැඳවූ දෙවි ඉදිරියේ
ඔබට අවසානය දක්වා සුදුස්සන්
ලෙස සිටීමට අවස්ථාව ලැබෙන්න
කියාත්[9] දෙවි තම බලයෙන් ඉටු කිරී-
මට අදහස් කරන සෑම යහපත් දෙ-
යක්ම සාර්ථකව ඉටු වෙන්න කියාත්
ඔබ විශ්වාසයක් ඇතුව කරන සෑම
දෙයක්ම ඔහුගේ ආශීර්වාදයෙන් සාර්-
ථක වෙන්න කියාත් අප යාච්ඤා
කරන්නේ ඒ නිසාය. 12 ඒ දේවල්
ඉටු වුණොත් අපගේ ස්වාමීන් වන
යේසුස්ගේ නාමයට මහත් ගෞරවයක්
ගෙන දෙන්න ඔබට හැකි වන අතර[10]
ඔහු සමඟ එකට බැඳී සිටින ඔබවද
තේජසට පත් වනු ඇත.[11] ඒ සියල්ල
සිදු වන්නේ අපගේ දෙවිගේ හා ස්වා-
මීන් වන යේසුස් ක්‍රිස්තුස්ගේ මහත්
කරුණාව නිසාය.[12]

2 නමුත් සහෝදරයෙනි, අපගේ
ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්
පැමිණ සිටින කාලය*[13] ගැනත් ඔහු

**1 පරි.**
1 2කොරි 1:19
2 රෝම 1:7
3 ලූක් 17:5 1තෙස 3:12
4 1තෙස 4:9 1පේතෘ 1:22
5 1තෙස 1:2
6 2කොරි 7:14 1තෙස 2:19
7 1තෙස 1:6 1තෙස 2:14 1පේතෘ 2:21
8 රෝම 8:17 2තිමෝ 2:12
9 ක්‍රියා 14:22
10 එළි 16:7
11 රෝම 12:19 එළි 6:10
12 මතෙ 25:31 මාක් 8:38 යූද් 14
13 ලූක් 17:30 1පේතෘ 1:7

**2 තීරුව**
1 හෙබ්‍රෙ 10:30
2 යොහ 3:19 රෝම 1:18
3 1පේතෘ 4:17
4 රෝම 2:8 හෙබ්‍රෙ 10:29
5 2පේතෘ 2:17 2පේතෘ 3:7
6 යූද් 13
7 යෙසා 2:21
8 රෝම 8:17
9 රෝම 8:30 2තිමෝ 1:9
10 යොහ 17:10 1පේතෘ 1:7
11 යොහ 17:21
12 1කොරි 1:4

**2 පරි.**
13 මතෙ 24:3

**2තෙස 2:1*** පැමිණ සිටීම. ග්‍රීක බසින්, පරූසියා. උපග්‍ර. 7 බලන්න.

සමඟ සිටීමට අපව එක් රැස් කරනු
ලැබීම[1] ගැනත් ඔබට යමක් කිව
යුතුයි. **2** සමහරවිට යෙහෝවා දෙ-
විගේ විනිශ්චය ඉටු වන දවස[2] ඇරඹී
ඇතැයි කියා දෙවිගෙන් එළිදරව්
වීමක් ලැබී ඇති බව[3] හෝ යම් පණි-
විඩයක් ලැබී ඇති බව[4] හෝ අප විසින්
ලියුමක් එවා ඇති බව[5] හෝ ආරංචි-
යක් පැතිර යා හැක. එවැනි ආරංචි
ලැබුණු විට ඉක්මන් වී ක්‍රියා නොක-
රන්න. ඔබේ මනස අවුල් කර නො-
ගන්න.

**3** කිසිවෙකුට කිසි ලෙසකින්වත්
නොරැවටෙන්න. මන්ද මුලින් මහ
කැරැල්ල*[6] ආරම්භ විය යුතුයි. පව්-
කාර මනුෂ්‍යයා[7] කවුද කියාත්
හෙළි විය යුතුයි.[8] විනාශයට නියමිත
තැනැත්තා[9] නම් ඔහුය. ඒ දවස පැමි-
ණෙන්නේ ඉන් අනතුරුවයි. **4** ඔහු
විරුද්ධකාරයෙකි.[10] "දෙවි" කෙනෙකු
ලෙස හඳුන්වනු ලබන ඕනෑම කෙ-
නෙකුට හෝ දේවත්වයේ ලා සල-
කන ඕනෑම දෙයකට විරුද්ධව ඔහු
නැඟී සිටියි. එහෙයින් ඔහු තමා
දෙවි කෙනෙකු ලෙස ප්‍රදර්ශනය වෙ-
මින් දෙවිගේ මාලිගාවෙහිම අසුන්-
ගෙන සිටියි.[11] **5** මා ඔබ සමඟ සිටි
විටදීද ඒ දේවල් ගැන ඔබට පැවසූ
බව[12] මතක නැද්ද?

**6** එහෙයින් දැනට ඔහුව මැඩ-
පැවැත්වීමට ක්‍රියා කරන්නේ කවු-
රුන්ද[13] කියා ඔබ දන්නහුය.[14] නමුත්
ඔහු කවුද කියා එළිදරව් වන්නේ
නියමිත කාලයේදීය.[15] **7** අභිරහ-
සක් වන එම පව්කාර බලපෑම දැන-
ටමත් ක්‍රියාත්මක වෙමින් පවතින
බව සැබෑය.[16] නමුත් එය අභිරහ-
සක්ව පවතින්නේ එම බලපෑම මැඩ-
පැවැත්වීමට ක්‍රියා කරන අය ඉවත්
වන තුරු පමණි.[17] **8** ඉන්පසු පව්-
කාර තැනැත්තා කවුද කියා හෙළි
වනු ඇත. ස්වාමීන් වන යේසුස්
තම මුවින් පිට කරන ප්‍රබල වචනව-
ලින්[1] ඔහුව නැති කර දමයි. ඔහුව
සහමුලින්ම විනාශ කරනු ලබන්නේ
යේසුස් පැමිණ සිටින බව*[2] සියලුදෙ-
නාටම පැහැදිලි වන අවස්ථාවේදීය.[3]
**9** පව්කාර තැනැත්තා දිගටම පව-
තින්නේ* සාතන්ගේ අණසක යටතෙ-
හිය.[4] ඔහු බොහෝ බලවත් ක්‍රියාද
මුළා කරවනසුලු ආශ්චර්යයන්ද අමු-
තුම ආකාරයේ ලකුණුද සිදු කරමින්,[5]
**10** මිනිසුන්ව නොමඟ යැවීමට සෑම
අධර්මිෂ්ඨ ක්‍රියාවක්ම කරයි.[6] ඒ දේ-
වලට හසු වන්නේ විනාශ වී යන
අයයි.[7] ඔවුන් ගැලවීමට මඟ පාදන[8]
සත්‍ය ඉගැන්වීම්වලට අවංක ඇල්-
මක් නොදක්වන නිසා[9] ඊට දඬුව-
මක් ලෙස ඒ දේ විඳීමට ඔවුන්ට සිදු
වේ. **11** ඔවුන් දිගටම එම බොරු
දේවල් විශ්වාස කරන්නේ ඔවුන් තුළ
එම මුළාකරවන බලපෑම ක්‍රියාත්-
මක වීමට දෙවි ඉඩහරින නිසාය.[10]
**12** එමනිසා ඔවුන් සියලුදෙනාවම
විනිශ්චයට ලක් වනු ඇත. මන්ද
ඔවුහු සත්‍ය ඉගැන්වීම් විශ්වාස නො-
කර[11] අධර්මිෂ්ඨ දේවලට ආශාවක්
දැක්වූහ.[12]

**13** නමුත් යෙහෝවා දෙවිගේ ප්‍රේ-
මය ලබා සිටින සහෝදරයෙනි, ඔබ
ගැන නිතරම දෙවිට ස්තුති දීමට
අපි බැඳී සිටින්නෙමු. මන්ද ඔබව
තම බලයෙන්[13] ශුද්ධ කිරීමෙන්*[14]
හා සත්‍ය ඉගැන්වීම් කෙරෙහි ඔබ
දැක්වූ විශ්වාසය පදනම් කරගෙන[15]
ඔබට ගැලවීම ලබා දීම සඳහා
දෙවි මුල සිටම ඔබව තෝරාගත්-
තේය.[16] **14** ඒ අරමුණ ඉටු කර-
ගැනීම සඳහා ඔහු ඔබව කැඳෙව්වේ
අප ප්‍රකාශ කරන ශුභාරංචිය මාර්ග-
යෙනි.[17] එහි ප්‍රතිඵලයක් ලෙස ඔබට
අපගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්-
තුස්ගේ තේජස හිමි වනු ඇත.[18]

**16** යොහ 6:44; රෝම 8:30; එෆී 1:4; **17** 1තෙස 2:12; **18** 1පේතෘ 5:10.

**2තෙස 2:3*** හෝ, "සත්‍ය නමස්කාරයෙන් ඉවත් වී යෑම."

**2තෙස 2:8*** පැමිණ සිටීම. ග්‍රීක බසින්, පරූසියා. උපග්‍ර. 7 බලන්න. **9*** පැමිණ සිටීම. ග්‍රීක බසින්, පරූසියා. උපග්‍ර. 7 බලන්න. **13*** හෝ, "දෙවි සඳහා වෙන් කිරීමෙන්."

**2 පරි.**
**1** මතෙ 24:31, 1තෙස 4:17
**2** යෙසා 13:6, ශෙප 1:14, 2පේතෘ 3:10
**3** 1යොහ 4:1
**4** එෆී 5:6
**5** 2තෙස 3:17
**6** මතෙ 13:25, 1තිමෝ 4:1, 2තිමෝ 2:18, 2තිමෝ 4:3, 2පේතෘ 2:1, 1යොහ 2:18
**7** මතෙ 7:15, මතෙ 13:41, මතෙ 24:24, ක්‍රියා 20:29, 2යොහ 7
**8** මතෙ 13:30
**9** 2පේතෘ 2:3
**10** ලූක් 11:23
**11** එස 28:2
**12** 1තෙස 3:4
**13** මතෙ 18:18
**14** 1කොරි 5:3, 3යොහ 10
**15** මතෙ 10:26, ලූක් 8:17, 1කොරි 4:5
**16** ක්‍රියා 20:29, 1කොරි 11:19, 1යොහ 2:18
**17** 2තිමෝ 4:6, 2පේතෘ 1:14

**2 තීරුව**
**1** යෙසා 11:4, එළි 19:15
**2** මලා 3:2, මාක් 8:38, 2තෙස 1:7
**3** 1තිමෝ 6:15, 2තිමෝ 4:1, 2තිමෝ 4:8
**4** යොහ 8:44, 2කොරි 11:3, එෆී 2:2
**5** මතෙ 24:24
**6** මතෙ 24:11, 2කොරි 11:13
**7** යෙරෙ 17:13, එළි 22:15
**8** 1තිමෝ 2:4
**9** මතෙ 24:12, යූද් 19
**10** මතෙ 24:5, 1තිමෝ 4:1, 2තිමෝ 4:4
**11** රෝම 1:25
**12** හිතෝ 1:32, රෝම 1:18, යූද් 4
**13** 1පේතෘ 1:2
**14** යොහ 17:17, 1කොරි 6:11, 1තෙස 4:7
**15** යොහ 8:32, කොලෝ 1:5, 1තිමෝ 4:3, 2යොහ 2

**15** එහෙයින් සහෝදරයෙනි, නො-
සැලී ස්ථිරව සිටින්න.[1] ඔබ ඉදිරිපිටම
පැවසූ දේවලින් හෝ අප වෙතින් ලැබූ
ලිපියක් මාර්ගයෙන් හෝ උගන්වනු
ලැබූ දේවලට තදින් ඇලී සිටින්න.[2]
**16** එලෙසම අපට ප්‍රේම කරන,[3]
මහත් කරුණාවක් පෙන්වීමෙන් සදා-
කාල සැනසිල්ලකුත් දීප්තිමත් බලා-
පොරොත්තුවකුත් ලබා දුන්[4] අපගේ
ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්ගෙන්
හා අපගේ පියාණන් වන දෙවිගෙන්,
**17** ඔබේ සිත්වලට සැනසීමද සෑම
යහපත් දෙයක් කිරීමට හා කීමට
ඔබට ශක්තියද ලබා දෙන්න කියා
ඉල්ලමු.[5]

**3** සහෝදරයෙනි, අවසාන වශ-
යෙන් ඔබෙන් ඉල්ලන්නේ යෙ-
හෝවා දෙවිගේ පණිවිඩය[6] අප
මාර්ගයෙන් ශීඝ්‍ර ලෙස පැතිරෙන්න
කියා[7] අප වෙනුවෙන් නොකඩවා
යාච්ඤා කරන්න[8] කියායි. එවිට ඔබ
එය ඉතා ගෞරවයෙන් පිළිගත්තා හා
සමානව සියලුදෙනාටත් එය පිළිගැ-
නීමට මඟ විවෘත වෙයි. **2** හිංසා-
කාරී දුෂ්ට මිනිසුන්ගෙන් ගැලවීමට[9]
අපට උපකාර කරන්න කියාත් ඉල්ල-
මින් යාච්ඤා කරන්න. මන්ද සිය-
ලුදෙනා තුළ විශ්වාසය නැත.[10]
**3** නමුත් ස්වාමීන් විශ්වාසවන්තය.
ඔහු ඔබව ශක්තිමත් කර දුෂ්ට-
යාගේ හානිකර බලපෑම්වලින් ඔබව
ආරක්ෂා කරයි.[11] **4** එලෙසම ස්වා-
මීන්ගේ අනුගාමිකයන් වන අප අණ
කරන දේවල් ඔබ කරන බවටත් දිග-
ටම ඒවා කරගෙන යන බවටත්[12]
අපට ඔබ ගැන විශ්වාසයක් තිබේ.[13]
**5** ඔබේ හදවත් නිසි මඟට යොමු වීම
සඳහා එනම්, දෙවිට ප්‍රේම කරන්-
නත්[14] ක්‍රිස්තුස් වෙනුවෙන් විඳදරාගැ-
නීමෙන් යුතුව කටයුතු කරන්නත්[15]
නිරතුරුවම ඔබට ස්වාමීන්ගේ උප-
කාර ලැබේවා!

**6** සහෝදරයෙනි, ස්වාමීන් වන
යේසුස් ක්‍රිස්තුස්ගේ නාමයෙන් ඔබට
යම් දෙයක් ගැන මඟ පෙන්වීමක්
දීමට කැමැත්තෙමු.[16] එනම් අපගෙන්
ඉගෙනගත් දේවලට අනුව කටයුතු
නොකරන,[1] නොහික්මුණු ආකාරය-
කින් ක්‍රියා කරන[2] සෑම සහෝද-
රයෙකුගෙන්ම ඔබ වෙන් වී සිටිය
යුතු බවයි.[3] **7** අපව අනුකරණය
කළ යුතු ආකාරය ගැන ඔබට
හොඳ අවබෝධයක් ඇත.[4] මන්ද අපි
ඔබ අතරේ නොහික්මුණු ආකාරය-
කින් ක්‍රියා කළේ නැත.[5] **8** කිසිවෙ-
කුගෙන් නොමිලේ කෑම කෑවේවත්
නැත.[6] ඒ වෙනුවට ඔබෙන් කිසිවෙ-
කුට බරක් වීමට අප අකමැති වූ
නිසා[7] අපි වෙහෙස මහන්සිය නො-
බලා[8] රෑ දවල් දෙකේම වැඩ කළෙමු.
**9** අප එසේ කළේ ඔබෙන් යමක්
බලාපොරොත්තු වීමට අපට අයි-
තියක් නැති නිසා නොවේ.[9] අපට
අවශ්‍ය වුණේ ඔබට ආදර්ශයක් වීම-
ටය.[10] **10** ඇත්තටම ඔබ සමඟ
සිටියදීත් අප ඔබට මඟ පෙන්වූයේ,[11]
“යමෙකු වැඩ කරන්න අකමැති නම්
ඔහු කෑම නොකා සිටිය යුතුයි”[12]
කියාය. **11** ඇත්තෙන්ම ඔබ අත-
රෙන් සමහරදෙනෙක් කිසි වැඩක්
නොකර, අනුන්ගේ වැඩකටයුතුවලට
ඇඟිලි ගසමින්,[13] නොහික්මුණු ආකා-
රයකින් හැසිරෙන බව[14] අපට ආරංචි
වී ඇත. **12** ස්වාමීන් වන යේසුස්
ක්‍රිස්තුස්ගේ අනුගාමිකයන් ලෙස අප
එවැනි අයට පවසන්නේත් උනන්දු
කරන්නේත් කාටවත් හිරිහැරයක්
නොකර යම් වැඩක් පළක් කරමින්
තමාගේ වෙහෙස මහන්සියෙන් උප-
යාගත් දෙයින් තම කුසගින්න නිවා-
ගන්න කියාය.[15]

**13** සහෝදරයෙනි, පසු නොබැස
නිතරම හරි දේ කරන්න.[16] **14** මේ
ලිපිය මාර්ගයෙන් අප ලබා දෙන මඟ
පෙන්වීම්වලට යමෙක් කීකරු වන්නේ
නැත්නම්[17] ඔහු ගැන විශේෂ සෝදිසි-
යකින් සිටින්න.[18] එලෙසම ඔහු සමඟ
තවදුරටත් ඇසුරු නොකරන්න.[19]
එවිට තමා කරන දේ ගැන ලැජ්ජා-

**2 පරි.**
**1** රෝම 12:9 1කොරි 15:58 1කොරි 16:13
**2** 1කොරි 11:2
**3** 1යොහ 4:10
**4** 1පේතෘ 1:3
**5** 1තෙස 3:13

**3 පරි.**
**6** යෙසා 38:4 ක්‍රියා 8:25 ක්‍රියා 15:35 1තෙස 1:8 1පේතෘ 1:25
**7** ක්‍රියා 19:20
**8** රෝම 15:30 1තෙස 5:25 හෙබ්‍රෙ 13:18
**9** යෙසා 25:4 2කොරි 1:8 එෆි 2:10
**10** ක්‍රියා 28:24 රෝම 10:16
**11** යොහ 17:15 1කොරි 10:13 2පේතෘ 2:9
**12** 1තෙස 4:11
**13** ගලා 5:10
**14** 1යොහ 5:3
**15** ලූක් 21:19 රෝම 5:3
**16** 1තෙස 4:2 1තිමෝ 6:17 තීත 1:5

**2 තීරුව**
**1** රෝම 16:17 1කොරි 11:2 2තෙස 2:15
**2** හිතෝ 24:30 1තෙස 5:14
**3** මතෙ 18:17 1කොරි 5:11 2තෙස 3:14 තීත 3:10
**4** 1කොරි 4:16 1තෙස 1:6
**5** 1තෙස 2:10
**6** ක්‍රියා 20:34
**7** 1කොරි 9:15 2කොරි 11:9 1තෙස 2:9
**8** ක්‍රියා 18:3 1කොරි 4:12
**9** මතෙ 10:10 1කොරි 9:6
**10** 1කොරි 11:1 පිලි 3:17
**11** 1තෙස 4:11
**12** හිතෝ 13:4 හිතෝ 20:4 රෝම 12:11 1තිමෝ 5:8
**13** 1තිමෝ 5:13 1පේතෘ 4:15
**14** 1තෙස 5:14
**15** එෆී 4:28
**16** ගලා 6:9

**17** 2තෙස 3:6; 2තිමෝ 2:18; **18** ලෙවී 19:17; රෝම 16:17; **19** රෝම 16:17; 1කොරි 5:11; තීත 3:10; 2යොහ 10.

වක් ඔහුට දැනෙන්න ඉඩ තිබේ.[1]
15 නමුත් ඔහුව සතුරෙකු මෙන් නො-
සලකන්න. දිගටම ඔහුව සහෝදර-
යෙකු ලෙස සලකා ඔහුට උපදෙස් හා
අවවාද ලබා දෙන්න.[2]
16 සමාදානය ලබා දෙන ස්වා-
මීන්ගෙන්ම ඔබට නොකඩවා සෑම
ආකාරයකින්ම සමාදානය ලැබේවා![3]
ඔබ සියලුදෙනාටම ස්වාමීන්ගේ
ආශීර්වාදය ලැබේවා!
17 පාවුල් වන මම සෑම ලිපියකම
කරනවා වගේ මගේම අත්අකුරින්[1]
සුබ පැතුම් ඔබට ලියා එවන්නෙමි.
18 ඔබ සියලුදෙනාටම අපගේ
ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්ගේ
මහත් කරුණාව[2] ලැබේවා!

**3 පරි.**
1 තීත 2:8
2 1තෙස 5:14
තීත 3:10
3 යොහ 14:27

**2 තීරුව**
1 1කොරි 16:21
කොලො 4:18
2 යොහ 1:16

# තිමෝතිට
## ලියූ පළමුවෙනි ලිපිය

1 මෙම ලිපිය ලියන්නේ අපට ගැල-
වීම සලසා දෙන[1] දෙවිගේද[2]
අපට බලාපොරොත්තුවක් ලබා
දෙන[3] ක්‍රිස්තුස් යේසුස්ගේද අණ යට-
තේ ක්‍රිස්තුස් යේසුස්ගේ නියෝජිත-
යෙකු*[4] ලෙස සේවය කරන පාවුල්ය.
2 මෙය ලියන්නේ සත්‍ය ඉගැන්වීම්ව-
ලට අවංක ළැදියාවක් ඇති දරුවෙකු[5]
වන ආදරණීය තිමෝතිටය.[6]
ඔබට පියාණන් වන දෙවිගෙන්ද
අපගේ ස්වාමීන් වන ක්‍රිස්තුස් යේසුස්-
ගෙන්ද මහත් කරුණාවත් දයාවත්
සමාදානයත් ලැබේවා![7]
3 මා මැසිඩෝනියාව බලා යෑමට[8]
සූදානම්ව සිටියදී ඔබට එෆීසයෙහි
නැවතී සිටීමට උනන්දු කළ බව
ඔබට මතක ඇති. මා දැනුත් ඔබට
උනන්දු කරන්නේ එහි නැවතී සත්‍ය
ඉගැන්වීම්වලට වඩා වෙනස් ඉගැන්-
වීම්[9] පතුරුවන සමහරුන්ට එසේ
නොකරන ලෙසට අවවාද කරන්න[10]
කියාය. 4 එලෙසම නිෂ්ඵල වූ[11]
අසත්‍ය කථාවලටත්[12] පෙළපත් ගැන
සොයා බැලීමටත් තම කාලය යොමු
නොකරන්න කියාත් ඔවුන්ට අවවාද
කරන්න. එවැනි දේවලින් කාලය කා
දමන ප්‍රශ්න ඉස්මතු වේ. එලෙසම
කෙනෙකුගේ විශ්වාසය ශක්තිමත්
කිරීමට අවශ්‍ය දෙවිගෙන් වූ කිසිවක්
එමගින් ලැබෙන්නේ නැත. 5 මා
එවැනි නියෝගයක් පනවන්නේ අප
පෙන්වන ප්‍රේමය[1] පවිත්‍ර හදවතකින්ද[2]
දෙවි ඉදිරියේ නිදොස් හෘදය සාක්ෂිය-
කින්ද[3] කිසිම කුහකකමක් නැති විශ්-
වාසයකින්ද[4] පෙන්විය යුතු නිසාය.
6 සමහරු ඒ දේවල් අත්හැර ගොස්
කිසි තේරුමක් නැති දේවල්[5] ගැන
සාකච්ඡා කිරීමට යොමු වී සිටිති.[6]
7 ඔවුන් නීතිය[7] උගන්වන්නන්[8] වීමට
කැමති වුවත් තමන් පවසන දේවල්
ගැන හෝ තමන් තරයේ ඉදිරිපත්
කරන මතයන් ගැන හෝ ඔවුන්ට කිසි
වැටහීමක් නැත.
8 යමෙකු නීතිය නිසි ලෙස යොදා-
ගන්නවා නම්[9] ඉන් යහපතක් සිදු
වන බව අපි දනිමු.[10] 9 නමුත් මේ
දේ මතක තබාගත යුතුයි. එනම්
නීතිය දෙනු ලැබුවේ ධර්මිෂ්ඨ මිනි-
සුන් උදෙසා නොවේ. එය තිබෙන්නේ
නීතිය නොතකන,[11] නොහික්මුණු[12]
තැනැත්තන්ටය. දෙවිට කිසි ගෞරව-
යක් නොදක්වන, පව්කාර, ද්‍රෝහීන්-
ටය.*[13] ශුද්ධ දේ සුළු කර සලකන
අයටය. තම පියා හෝ මව හෝ
වෙනත් අයව හෝ මරා දමන මිනී

**1 පරි.**
1 තීත 1:3
යූද් 25
2 ගලා 1:1
3 කොලො 1:27
4 රෝම 1:1
5 1කොරි 4:17
6 ක්‍රියා 16:1
පිලි 2:19
7 හෙබ්‍රෙ 4:16
2යොහ 3
8 ක්‍රියා 20:1
පිලි 2:24
9 ගලා 1:6
2යොහ 9
10 1තිමෝ 4:11
11 1තිමෝ 6:20
2තිමෝ 2:14
12 1තිමෝ 4:7
2තිමෝ 4:4
තීත 1:14

**2 තීරුව**
1 රෝම 13:8
ගලා 5:6
2 මතෙ 5:8
2තිමෝ 2:22
3 ක්‍රියා 23:1
ක්‍රියා 24:16
1තිමෝ 3:9
1පේතෘ 3:16
4 රෝම 12:9
2කොරි 6:6
යාකො 3:17
5 1තිමෝ 6:20
6 2තිමෝ 2:18
7 රෝම 3:19
8 යාකො 3:1
9 රෝම 7:14
හෙබ්‍රෙ 10:1
10 රෝම 7:12
11 ගලා 3:19
12 රෝම 2:21
13 2තිමෝ 3:2

---

**1තිමෝ 1:1*** හෝ, "යවනු ලැබූවෙකු."

**1තිමෝ 1:9*** මූ.අ., "කෙනෙකුට කිසි අව්‍යාජ ප්‍රේමයක් නොදක්වන."

මරුවන්ටය. **10** වේශ්‍යාකම්* කරන
අයට[1] හා සමලිංගික පුරුෂයන්ටය.
මිනිසුන්ව පැහැරගෙන යන අයට,
බොරුකාරයන්ට හා බොරු දිවුරුම්
ඉදිරිපත් කරන අයටය.[2] නිවැරදි
මෙන්ම ප්‍රයෝජනවත් ඉගැන්වීම්ව-
ලට[3] විරුද්ධව වෙනත් ඕනෑම දෙ-
යක් කරන සෑම කෙනෙකුටමය.[4]
**11** නමුත් ඔවුන් විරුද්ධ වී සිටින එම
ඉගැන්වීම් ප්‍රීතිමත්[5] දෙවිගෙන් ලැබුණු
තේජවත් ශුභාරංචියට එකඟය. ඒ
ශුභාරංචිය මටද භාර දී ඇත.[6]

**12** මට බලය දුන් අපගේ ස්වා-
මීන් වන ක්‍රිස්තුස් යේසුස්ට මම ස්තු-
තිවන්ත වෙමි. මා එසේ කරන්නේ
මට මෙම දේවසේවය පැවරීමෙන්[7]
ඔහු මා විශ්වාසවන්ත කෙනෙකු ලෙස
සැලකූ[8] නිසාය. **13** කලින් මා දෙ-
විට අපහාස කළ කෙනෙකි. මා
මිනිසුන්ට පීඩා කළ,[9] කිසි කෙනෙ-
කුටවත් ගරු නොකළ මිනිසෙකි.[10]
මා ඒ සියල්ල කළේ නොදැනුවත්ක-
මින්ය.[11] මට කිසි විශ්වාසයක් තිබු-
ණේ නැත. ඒ නිසා මට දයාව
පෙන්වන ලදි.[12] **14** මට ස්වාමීන්-
ගේ මහත් කරුණාව නොඅඩුව ලැබුණු
අතර[13] එමගින් මට ක්‍රිස්තුස් යේසුස්ට
බැඳී පවතින විශ්වාසයක්ද ප්‍රේමයක්ද
ලැබිණ.[14] **15** ක්‍රිස්තුස් යේසුස් මෙ-
ලොවට පැමිණියේ පව්කාරයන්ව ගල-
වාගැනීමටය.[15] එය විශ්වාස කළ යුතු
සම්පූර්ණයෙන්ම පිළිගත හැකි සත්‍ය-
යකි.[16] ඒ පව්කාරයන් අතරින් ප්‍රධාන-
තම පව්කාරයා මමය.[17] **16** නමුත්
මට දයාව පෙන්වනු ලැබුවේ[18] සදා-
කාල ජීවනය සඳහා[19] ක්‍රිස්තුස් යේසුස්
කෙරෙහි විශ්වාසය තබන අය වෙ-
නුවෙන් ආදර්ශයක් වීමටය.[20] එම-
ගින් ඔහු ප්‍රධානතම පව්කාරයා වූ මා
මාර්ගයෙන් තමන් කොතරම් ඉවසි-
ලිවන්තව කටයුතු කරනවාද යන්න
පෙන්නුම් කළේය.

**17** සදාකාලික රජ්ජුරුවන්[21] වන
කිසිදා නැති වී නොයන,[1] නොපෙ-
නෙන,[2] එකම දෙවිට[3] සදහටම සියලු
ප්‍රශංසාවත් ගෞරවයත් හිමි වේවා![4]
ආමෙන්.*

**18** මගේ පුත් තිමෝති, මේ උප-
දෙස් සහ මඟ පෙන්වීම්[5] මා භාර දෙන්-
නේ ඔබටය. එසේ කරන්නේ මීට පෙර
දෙවිගේ මඟ පෙන්වීම්වලට අනුව කෙ-
ළින්ම ඔබ ගැන පැවසූ අනාවැකිව-
ලට එකඟවය.[6] එලෙස පැවසූ දේවල්
යහපත උදෙසා ඔබ කරන යුද්ධයේදී
ඔබට සාර්ථකව සටන් කිරීමට උප-
කාරයක් වනු ඇත.[7] **19** එමෙන්ම
ඔබ ගොඩනඟා ගෙන තිබෙන විශ්-
වාසයද දෙවි ඉදිරියේ ඔබට තිබෙන
නිදොස් හෘදය සාක්ෂියද රැකගන්න.[8]
සමහරුන් එය රැකගැනීමට කිසි උත්-
සාහයක් ගන්නේ නැත.[9] ඒ නිසා
නැවක් මුහුදුබත් වන්නා සේම ඔවුන්
තුළ තිබෙන විශ්වාසයද විනාශ වී
ගොස් ඇත.[10] **20** එවැනි අය අතර
හිමනේයස්[11] සහ ඇලෙක්සැන්ඩර්[12]
සිටිති. මා ඔවුන්ව සාතන්ට භාර දී
ඇත.[13] එසේ කළේ ඔවුන්ට හික්මවී-
මක් ලබා දීමටය. සමහරවිට මින්පසු
දෙවිට අපහාස නොකිරීමටත් ඔවුන්
ඉගෙනගනු ඇත.[14]

**2** මා මුලින්ම සියලුදෙනාටම
උනන්දු කරන්නේ සියලු ආකාර-
යේ මිනිසුන් වෙනුවෙන්[15] දෙවිට කන්-
නලව්ද යාච්ඤාද[16] ඉල්ලීම්ද ස්තුති
දීම්ද කළ යුතු බවය. **2** රජවරුන්[17]
සහ උසස් නිලතල දරන සියලු-
දෙනා වෙනුවෙන්ද[18] එසේ කරන්න.
මන්ද අපගේ ආශාව වන්නේ දෙ-
විට පූර්ණ භක්තියක් ඇතුවද ගෞර-
වනීයවද සාමකාමී සන්සුන් ජීවිතයක්
ගත කිරීමය.[19] **3** එය අපට ගැල-
වීම සලසා දෙන දෙවි ඉදිරියෙහි[20]
යහපත් මෙන්ම ප්‍රසන්න දෙයකි.[21]
**4** ඔහුගේ කැමැත්ත නම් සෑම තරා-
තිරමකම සිටින මිනිසුන්[22] ගැලවීම

**1තිමෝ 1:10*** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න.

**1තිමෝ 1:17*** එනම්, එසේම වේවා!

**1 පරි.**
**1** රෝම 2:22
**2** ක්‍රියා 5:3; රෝම 1:31
**3** 2තිමෝ 1:13; තීත 1:9
**4** රෝම 2:23
**5** ගීතා 104:31
**6** ගලා 2:7; කොලො 1:25; 1තෙස 2:4
**7** ක්‍රියා 9:15; 2කොරි 3:6
**8** 1කොරි 4:2
**9** ක්‍රියා 8:3; ගලා 1:13; පිලි 3:6
**10** ක්‍රියා 9:1
**11** ක්‍රියා 3:17
**12** 1කොරි 7:25
**13** රෝම 5:20
**14** 2තිමෝ 1:13
**15** ලූක් 5:32; 2කොරි 5:19; 1යොහ 2:2
**16** 1තිමෝ 4:9
**17** ක්‍රියා 9:1; 1කොරි 15:9
**18** 2කොරි 4:1
**19** යූද් 21
**20** යොහ 6:40; යොහ 20:31
**21** ගීතා 10:16; ගීතා 29:10; ආනි 6:26; එළි 15:3

**2 තීරුව**
**1** රෝම 1:23
**2** යොහ 1:18; කොලො 1:15
**3** ද්වි 6:4; යෙසා 43:10; 1කොරි 8:4
**4** ගීතා 90:2
**5** 1තිමෝ 6:13
**6** ක්‍රියා 16:2
**7** 2තිමෝ 2:3
**8** 1තිමෝ 1:5
**9** හෙබ්‍රෙ 3:12; 2පේතෘ 2:1
**10** 1තිමෝ 6:9; 2පේතෘ 2:1
**11** 2තිමෝ 2:17
**12** 2තිමෝ 4:14
**13** 1කොරි 5:5; 1කොරි 5:13
**14** හිතෝ 11:9; ක්‍රියා 13:45

**2 පරි.**
**15** ගලා 3:28
**16** රෝම 12:12
**17** ක්‍රියා 26:27
**18** මතෙ 5:44; 1පේතෘ 2:14
**19** යෙරෙ 29:7
**20** යූද් 25
**21** රෝම 12:2
**22** රෝම 5:18; රෝම 9:24; 1තිමෝ 4:10.

ලැබීමත්[1] සත්‍යය[2] පිළිබඳව නිවැරදි
දැනුමක්[3] ලබාගැනීමත්ය. **5** ඇත්-
තේ එක දෙවි කෙනෙක්ය.[4] එමෙන්ම
දෙවි[5] සහ මිනිසුන් අතර[6] සිටින්නේ
එක මැදිහත්කරුවෙක්ය.[7] එනම් මිනි-
සෙකු වූ ක්‍රිස්තුස් යේසුස්ය.[8] **6** සිය-
ලුදෙනාව මුදවාගැනීමට[9] දිය යුතු
නියමිත වන්දිය ගෙවනු ලැබුවේ ඔහු-
ගේ ජීවිතය මාර්ගයෙනි. එහි ප්‍රති-
ඵල නියමිත කාලයේදී එළිදරව් වනු
ඇත. **7** දේශනා කරන්නෙකු ලෙසද
යේසුස්ගේ නියෝජිතයෙකු* ලෙසද[10]
මාව පත් කළේ ඒ ගැන සාක්ෂි දැරීම-
ටය.[11] මා වෙනත් ජාතීන්ට[12] විශ්වා-
සය[13] සහ සත්‍යය ගැන උගන්වන්නේ
ඒ නිසාය. මා පවසන්නේ බොරුවක්
නොව සැබෑවකි.[14]

**8** එහෙයින් ඔබ කුමන තැනක රැස්
වුණත් ඔබ අතර සිටින පුරුෂයන්
උදහසකින් තොරව,[15] වාදවිවාදවලට
පැටලෙන්නේ නැතුව[16] තම දෑත් පක්-
ෂපාතකමින්[17] ඔසවා දෙවිට යාච්ඤා
කරනවාට කැමැත්තෙමි. **9** එසේම
ස්ත්‍රීන් මනා පිළිවෙළකින් යුත් වස්ත්‍ර-
වලින් සැරසී සිටිය යුතු අතර ඔවුන්
තුළින් විනීතකමද[18] හොඳ සිහිකල්ප-
නාවකින් ක්‍රියා කරන ආකාරයද පිළි-
බිඹු විය යුතුයි. විශේෂ කොණ්ඩ
මෝස්තරවලින්ද රනින්ද මුතුවලින්ද
ඉතා මිල අධික වස්ත්‍රවලින්ද සැරසී
සිටිනවාට වඩා,[19] **10** දෙවිට ගැඹුරු
ගෞරවයක් හා භක්තියක් පෙන්-
වන ස්ත්‍රියකට[20] ඔබින ආකාරය-
කින් එනම්, යහපත් ක්‍රියාවලින් ඔවුන්
සැරසී සිටිය යුතුයි.[21]

**11** ස්ත්‍රියක් ඉගෙනගත යුත්තේ
නිශ්ශබ්දව හා පූර්ණ යටත්කමක්
ඇතුවය.[22] **12** ස්ත්‍රියකට ඉගැන්වී-
මේ කටයුතු කිරීමටවත්[23] පුරුෂයෙකු
කෙරෙහි යම් ආධිපත්‍යයක් දැරීමට-
වත්[24] මගෙන් අවසරයක් නැත. ඇය
නිශ්ශබ්දව සිටිය යුතුයි. **13** දෙවි
මුලින්ම සෑදුවේ ආදම්වය. ඒවව සෑදු-
වේ ඉන්පසුවය.[25] **14** එලෙසම ආදම්
රැවටුණේ නැත.[1] නමුත් ස්ත්‍රිය සම්-
පූර්ණයෙන්ම රැවටී[2] වරදට වැටු-
ණාය.[3] **15** දරුවන් බිහි කර මව්
පදවිය ලබාගැනීම ස්ත්‍රියකට ආරක්-
ෂාවකි.[4] නමුත් ඔවුන් දිගටම විශ්-
වාසයෙන්ද ප්‍රේමයෙන්ද දෙවි ඉදිරියේ
ශුද්ධවද* හොඳ සිහිකල්පනාවෙන්ද
සිටිය යුතුයි.[5]

**3** පවසන මේ දේවල් සැබෑය.[6]
යමෙක් සභාව රැකබලා ගන්-
නෙකු ලෙස වගකීම් දැරීමට*[7]
වෑයම් කරනවා නම් ඔහු කැමැත්-
තෙන් සිටින්නේ යහපත් සේවයක්
ඉටු කිරීම සඳහාය. **2** සභාව රැක-
බලා ගන්නා කෙනෙක් නිදොස් කෙ-
නෙකු[8] විය යුතුයි. ඔහුට සිටිය
යුත්තේ එක් භාර්යාවක් පමණි. ඔහු
සෑම දෙයකදීම තම සීමාව දැනගෙන
කටයුතු කරන,[9] හොඳ සිහිකල්පනා-
වෙන් වැඩ කරන,[10] තම වැඩකටයුතු
පිළිවෙළකට ඉටු කරන,[11] ආගන්-
තුක සත්කාරයට ළැදි,[12] ඉගැන්වී-
මට සුදුසුකම් ඇති[13] කෙනෙකු විය
යුතුයි. **3** ඔහු බීමත් වී දබරවලට
පැටලෙන්නේ නැති,[14] ගහගන්නෙකු
නොවන,[15] අසාධාරණ ලෙස කට-
යුතු නොකරන,[16] නිතරම ආරවුල්-
වලට පැටලෙන්නේ නැති,[17] මුදලට
ඇල්මක් නොදක්වන,[18] **4** තමාගේ
නිවසේ සිටින අයව හොඳින් හසු-
රුවන පුරුෂයෙකු විය යුතුයි.[19]
ඔහුගේ දරුවන් ඔහුට යටත් වෙ-
මින් ගෞරවනීයව හැසිරෙන අය
විය යුතුයි.[20] **5** (ඇත්තටම තමා-
ගේම නිවසේ සිටින අයව රැක-
බලා ගන්න යමෙකු දන්නේ නැත්නම්
ඔහු දෙවිගේ සභාව රැකබලා ගන්නේ
කෙසේද?) **6** ඔහු මෑතකදී දෙවිට

**2 පරි.**
**1** යෙසා 45:22 ක්‍රියා 17:30 1කොරි 12:13
**2** 2තිමෝ 2:25
**3** එෆී 1:17 පිලි 1:9
**4** ද්වි 6:4 රෝම 3:30 1කොරි 8:4
**5** ගලා 3:20
**6** 1කොරි 11:25 ගලා 3:29 එෆී 5:27 හෙබ්‍රෙ 2:16
**7** හෙබ්‍රෙ 8:6 හෙබ්‍රෙ 9:15 හෙබ්‍රෙ 12:24
**8** ක්‍රියා 4:12 රෝම 5:15 කොලො 2:13 2තිමෝ 1:10
**9** මතෙ 20:28 මාක් 10:45 කොලො 1:14
**10** රෝම 1:5 ගලා 2:8
**11** ක්‍රියා 9:15
**12** ගලා 1:16
**13** රෝම 3:22 ගලා 5:6
**14** රෝම 9:1
**15** ගලා 5:20 යාකො 1:20
**16** පිලි 2:14
**17** ගීතා 141:2
**18** යාකො 3:17
**19** 1පේතෘ 3:3
**20** හිතෝ 31:30 1පේතෘ 3:4
**21** ක්‍රියා 21:9
**22** එෆී 5:24
**23** 1කොරි 14:34
**24** උත් 3:16
**25** උත් 2:18 1කොරි 11:8

**2 තීරුව**
**1** උත් 3:6
**2** උත් 3:13
**3** 2කොරි 11:3
**4** 1තිමෝ 5:14
**5** 1තිමෝ 2:9

**3 පරි.**
**6** 2තිමෝ 2:11
**7** නික් 18:21 ද්වි 1:13 යෙරෙ 3:15 ක්‍රියා 20:28 තීත 1:5
**8** ලූක් 1:6 රෝම 16:19 පිලි 2:15 1තිමෝ 6:14
**9** හිතෝ 23:20
**10** රෝම 12:3 2කොරි 5:13 1පේතෘ 4:7

**11** රෝම 4:12; ගලා 5:25; පිලි 3:16; **12** ක්‍රියා 28:7; තීත 1:8; 1පේතෘ 4:9; **13** 1තිමෝ 5:17; 2තිමෝ 2:24; තීත 1:9; යාකො 3:1; **14** රෝම 13:13; **15** තීත 1:7; **16** පිලි 4:5; යාකො 3:17; **17** රෝම 12:18; යාකො 3:18; **18** හෙබ්‍රෙ 13:5; 1පේතෘ 5:2; **19** යොෂු 24:15; තීත 1:6; **20** එෆී 6:4.

**1තිමෝ 2:7*** හෝ, “යවනු ලැබූවෙකු.”

**1තිමෝ 2:15*** හෝ, “දෙවි සඳහා වෙන් කර ඇති අය ලෙසද.” **3:1*** හෝ, “රැකබලා ගන්නෙකුගේ වගකීම දැරීමට.”

සේවය කිරීමට පටන්ගත් කෙනෙකු*
නොවිය යුතුයි.[1] එසේ නොවුණොත්
ඔහු තුළ අහංකාරකම ඇති විය හැකි
අතර[2] යක්ෂයාට ලැබුණු විනිශ්චය
ඔහුටද ලැබිය හැක.[3] **7** එලෙසම
ක්‍රිස්තියානි සභාවට අයත් නොවන
අය ඉදිරියේද ඔහු හොඳ නමක් දිනා-
ගෙන සිටින කෙනෙකු විය යුතුයි.[4]
එසේ නොවුණොත් ඔහු නින්දාවට
ලක් විය හැකි අතර යක්ෂයාගේ උගු-
ලකටද හසු විය හැක.[5]

**8** එසේම සහායක සේවකයන්ද[6]
ගෞරවනීයව හැසිරෙන, දිව දෙකේ
කතා නොකියන, බොහෝ වයින්
බීමට ලොල් නොවූ, අයුතු ලෙස ලාභ
ලබාගැනීමට කෑදරකමින් කටයුතු
නොකරන අය විය යුතුයි.[7] **9** එලෙ-
සම ඔවුන් දෙවි ඉදිරියේ නිදොස් හෘදය
සාක්ෂියක් ඇතුව[8] දෙවිගේ පරිශුද්ධ
රහසක්[9] වන ක්‍රිස්තියානි ඉගැන්වීම්ව-
ලට ඇලී සිටින අය විය යුතුයි.

**10** මුලින්ම ඔවුන් සුදුස්සන්ද කියා
සෝදිසි කර බැලිය යුතුයි.[10] ඔවුන්ට
විරුද්ධව කිසි චෝදනාවක් එල්ල වී
නැත්නම්[11] ඔවුන්ට එවැනි සේවයක්
කළ හැක.

**11** එසේම ස්ත්‍රීන්ද ගෞරවනීයව
හැසිරෙන, කාටවත් නින්දා නොක-
රන,[12] සෑම දෙයකදීම තම
සීමාව දැනගෙන[13] කටයුතු කරන,
සියල්ලේදී විශ්වාසවන්තව කටයුතු
කරන[14] අය විය යුතුයි.

**12** සහායක සේවකයන්ටත් සිටිය
යුත්තේ එක භාර්යාවක් පමණි.[15]
ඔවුන් තම දරුවන්වද තම නිව-
සේ සිටින අයවද හොඳින් රැකබලා
ගන්නා අය විය යුතුයි.[16] **13** එසේ
හොඳින් සේවය කරන පුරුෂයන්ට
සියලුදෙනා ඉදිරියේ හොඳ නමක්
දිනාගැනීමටත්[17] කිසි බියක් සැකක්
නැතුව ක්‍රිස්තුස් යේසුස් කෙරෙහි ඇති
තම විශ්වාසය ගැන කතා කිරීමටත්[18]
හැකියාව ලැබේ.

**14** ළඟදීම ඔබව හමු වීමට මා
බලාපොරොත්තුවෙන් සිටියත්[1] මා
මේ දේවල් ඔබට ලියන්නේ, **15** මා
හදිසියේ ප්‍රමාද වුණොත් ඔබ දෙවිගේ
ගෘහය තුළ කටයුතු කළ යුත්තේ
කෙසේද කියා ඔබව දැනුවත් කිරී-
මටය.[2] මන්ද එය ජීවමාන දෙවිගේ
සභාවය. එය සත්‍යය උසුලන කණු-
වක්ද ආධාරකයක්ද වේ.[3] **16** ඇත්-
තෙන්ම දෙවිට භක්තිය දැක්වීම හා
බැඳී පවතින මෙම පරිශුද්ධ රහස[4]
ඉතා ශ්‍රේෂ්ඨය. ‘යේසුස් සියලුදෙනා
ඉදිරියේ පෙනී සිටියේ මිනිසෙකු ලෙ-
සය.[5] ඔහුව ධර්මිෂ්ඨ කෙනෙකු ලෙස
ප්‍රකාශ කළේ ස්වර්ගයෙහි ජීවත් විය
හැකි කෙනෙකු ලෙස* නැඟිටුවී-
මෙනි.[6] පසුව ඔහු ස්වර්ගයේ සිටින
අය ඉදිරියේ පෙනී සිටියේය.[7] ඔහු
ගැන සියලු ජාතීන්ට දේශනා කරනු
ලැබූ අතර[8] මිනිස්සු ඔහු කෙරෙහි විශ්-
වාසය තැබූහ.[9] ඔහුව මහත් තේජස-
කින් ස්වර්ගයට පිළිගනු ලැබීය.’[10]

**4** අනාගතයේ යම් යම් කාලවලදී[11]
ඇතැම් අය සත්‍ය ඉගැන්වීම්
අත්හැර යන බව[12] දෙවි තම බල-
යෙන් පැහැදිලිව එළිදරව් කර ඇත.
ඔවුන් එසේ නොමඟ යන්නේ දෙවි-
ගෙන් ලැබෙනවායයි සිතෙන මුළා
කරවනසුලු අදහස්වලට[13] හා භූත-
යන්ගේ ඉගැන්වීම්වලට[14] ඔවුන් සවන්
දෙන නිසාය. **2** එවැනි දෙයක් සිදු
වන්නේ කුහක මිනිසුන් පතුරුවන
බොරු මාර්ගයෙනි.[15] ඒ කුහක මිනි-
සුන්ගේ හෘදය සාක්ෂිය[16] කොතරම්
දැඩි වී ඇද්ද කිවහොත් එය යකඩය-
කින් හංවඩු ගසනු ලැබූ සමක් හා
සමානය. ඔවුන්ට කිසි හැඟීමක් දැනී-
මක් නැත. **3** ඔවුහු විවාහය තහ-
නම් කරති.[17] දෙවි ආහාර ලෙස සැපයූ
දේවල්[18] ආහාරයට නොගන්න කියාද
අණ කරති.[19] දෙවි ඒවා ලබා දුන්-

---

**18** උත් 9:3; **19** රෝම 14:3.

---

**1තිමෝ 3:6*** එනම්, සත්‍ය ඉගැන්වීම් අලුතින් පිළිගත් කෙනෙකු.

**1තිමෝ 3:16*** ග්‍රීක බසින්, නියුමා. උපග්‍ර. 3 බලන්න.

---

**3 පරි.**

**1** ක්‍රියා 8:13
1තිමෝ 5:22
**2** එස 28:17
ක්‍රියා 8:19
**3** ලූක් 8:31
ක්‍රියා 8:22
එළි 20:3
**4** ක්‍රියා 16:2
ක්‍රියා 22:12
2කොරි 8:21
1තෙස 4:12
**5** 2තිමෝ 2:26
**6** පිලි 1:1
**7** ක්‍රියා 6:3
තීත 1:7
1පේතෘ 5:2
**8** ක්‍රියා 24:16
1තිමෝ 1:5
1තිමෝ 1:19
2තිමෝ 1:3
1පේතෘ 3:16
**9** එෆී 3:3
එෆී 3:6
**10** 2කොරි 8:22
**11** දානි 6:5
1පේතෘ 2:12
**12** හිතෝ 11:13
1තිමෝ 5:13
**13** හිතෝ 23:20
**14** තීත 2:3
**15** 1තිමෝ 3:2
තීත 1:6
**16** 1තිමෝ 3:4
**17** ගීතා 15:1
**18** එෆී 6:19
හෙබ්‍රෙ 3:6

**2 තීරුව**

**1** පිලෙ 22
**2** එෆී 2:19
හෙබ්‍රෙ 3:6
**3** 2තිමෝ 2:2
**4** උත් 3:15
**5** යොහ 1:14
යොහ 18:37
පිලි 2:7
**6** 1පේතෘ 3:18
**7** 1පේතෘ 3:19
**8** කොලො 1:23
**9** කොලො 1:6
**10** ගීතා 2:6
මතෙ 24:30

**4 පරි.**

**11** 2තිමෝ 4:3
**12** 2තෙස 2:3
**13** 2තෙස 2:2
2පේතෘ 2:1
**14** 2කොරි 11:14
එළි 16:14
**15** ක්‍රියා 20:30
2තිමෝ 2:16
2පේතෘ 2:3
**16** ක්‍රියා 24:16
1තිමෝ 1:5
හෙබ්‍රෙ 10:22
**17** 1කොරි 7:36
1කොරි 9:5
හෙබ්‍රෙ 13:4

නේ විශ්වාසයක් ඇති,[1] සත්‍ය ඉගැන්-
වීම් ගැන නිවැරදි අවබෝධයක් ඇති
අයට ආහාර ලෙසය. ස්තුති යාච්ඤා-
වක් ඉදිරිපත් කළ පසු ඒවා ආහාරයට
ගැනීමට ඔවුන්ට පුළුවන. **4** මන්ද
දෙවි සෑදූ කිසිම දෙයක දෝෂයක්
නැත.[2] එහෙයින් යමක් වෙනුවෙන්
ස්තුති යාච්ඤාවක් කළ පසු[3] එය
ආහාරයට ගත හැක. ඒ දේ ප්‍රතික්-
ෂේප කිරීමට අවශ්‍ය නැත.[4] **5** මන්ද
දෙවි එය පවිත්‍රයි කියා පවසා ඇති
නිසාත් කෑමට පෙර ඒ වෙනුවෙන්
යාච්ඤාවක් ඉදිරිපත් කර ඇති නිසාත්
ඒ දේ පවිත්‍රය.

**6** ඒ අවවාද සහෝදරයන්ට ලබා
දීමෙන් ඔබ ක්‍රිස්තුස් යේසුස් වෙ-
නුවෙන් හොඳ දේවසේවකයෙකු වනු
ඇත. එලෙසම ඔබ සත්‍ය පණිවිඩ-
යෙන්ද ඔබ කිට්ටුවෙන් අනුගමනය
කර ඇති[5] යහපත් ඉගැන්වීම්ව-
ලින්ද[6] හොඳින් පෝෂණය වූ කෙ-
නෙකු වනු ඇත. **7** නමුත් ශුද්ධ
දේවලට පටහැනි, මහලු ස්ත්‍රීන් පතු-
රුවන බොරු කතා[7] ප්‍රතික්ෂේප
කරන්න. ඒ වෙනුවට දෙවි සඳහා
ඔබට තිබෙන භක්තිය වැඩි කර-
ගැනීමේ අරමුණින් පුහුණු වන්න.*[8]
**8** ක්‍රීඩකයෙකු පුහුණු වීම් කටයුතු-
වල යෙදුණත් ඔහුට එයින් ලැබෙන
ප්‍රයෝජන අල්පය. නමුත් දෙවි සඳහා
භක්තිය ඇති කරගන්නා කෙනෙක්[9]
සෑම අතින්ම ප්‍රයෝජන ලබයි.[10]
එමගින් ඔහුට දැන් භුක්ති විඳින
ජීවිතයේදීත් අනාගත ජීවිතයේදීත්
බොහෝ ආශීර්වාද ලබාගැනීමට මඟ
විවෘත වෙයි.[11] **9** එය විශ්වාසවන්ත
මෙන්ම සම්පූර්ණයෙන්ම පිළිගත යුතු
වූ කාරණයකි.[12] **10** අප බොහෝ
සේ වෙහෙස මහන්සි වෙමින් වීර්-
යය කරන්නේ ඒ සඳහාය.[13] මන්ද
සියලු ආකාරයේ මිනිසුන්ට[14] විශේෂ-
යෙන්ම විශ්වාසවන්ත අයට[15] ගැල-
වීම සලසා දෙන[16] ජීවමාන දෙවි
කෙනෙකු කෙරෙහි අපි බලාපො-
රොත්තු තබා සිටින්නෙමු.[1]

**11** මේ සියලු ආඥා,[2] උපදෙස් සහ
මඟ පෙන්වීම් දිගටම ලබා දෙන්න.[3]
**12** ඔබ තරුණයෙකු වූ පමණින් කිසි
කෙනෙකුට ඔබව සුළු කිරීමට ඉඩ
නොදෙන්න.[4] ඔබ කතා කරන ආකා-
රයෙන්ද ඔබේ හැසිරීමෙන්ද ඔබේ
ප්‍රේමයෙන්ද විශ්වාසයෙන්ද නිර්මල-
කමින්ද[5] දෙවිට විශ්වාසවන්තව සේ-
වය කරන අයට[6] ආදර්ශයක් වන්න.[7]
**13** මා එන තුරු ශුද්ධ ලියවිල්ල
ප්‍රසිද්ධියේ[8] කියවීම[9] ගැනද උපදෙස්
මඟ පෙන්වීම් ලබා දීම ගැනද ඔබ
උගන්වන ආකාරය ගැනද නිරතු-
රුවම සැලකිලිමත් වන්න. **14** ඔබ
ගැන පැවසූ අනාවැකිය නිසා[10] වැඩිම-
හල්ලන්ගේ මණ්ඩලය ඔබ පිට අත්
තැබීමෙන්[11] ඔබට ලබා දුන් දීම-
නාව[12] සුළුවට නොගන්න. **15** ඒ
දේවල් ගැන ගැඹුරින් කල්පනා කර
බලන්න.[13] ඒවා නිරතුරුවම ඔබේ
මනසෙහි තබාගන්න. එවිට ඔබ
දියුණු වන අන්දම[14] සියලුදෙනාටම
දැකගත හැකි වෙයි. **16** ඔබ ගැනත්
ඔබ උගන්වන දේ ගැනත්[15] නිරතුරු-
වම සැලකිලිමත් වන්න.[16] ඒ දේවලට
ඇලී සිටින්න. මන්ද එසේ කිරීමෙන්
ඔබටත් ඔබට සවන් දෙන අයටත්
ගැලවීම ලැබෙනු ඇත.[17]

**5** වැඩිහිටි පුරුෂයෙකුට[18] සැර-
පරුෂ අයුරින් කතා නොක-
රන්න. උපදෙස් දෙන විට එවැනි
කෙනෙකුව පියෙකු මෙන්ද තරු-
ණයන්ව තම සහෝදරයන් මෙන්ද,
**2** වැඩිහිටි ස්ත්‍රීන්ව[19] තම මව්ව-
රුන් මෙන්ද තරුණියන්ව පවිත්‍ර
සිතින් තම සහෝදරියන් මෙන්ද සල-
කන්න.[20]

**3** ඇත්තටම අගහිඟකම්වලින්
පෙළෙන වැන්දඹුවන්ව රැකබලා
ගන්න. ඔවුන්ට ගෞරවයෙන් සල-
කන්න.[21] **4** නමුත් යම් වැන්දඹුව-
කට දරු මුනුපුරන් ඇත්නම්, ඒ
දරු මුනුපුරන් මුලින්ම තම නිව-
සේ සිටින අයව රැකබලා ගැනීමට

**4 පරි.**
1 රෝම 14:17; 1කොරි 10:25
2 උත් 1:31
3 ක්‍රියා 27:35
4 ක්‍රියා 10:15
5 2තිමෝ 2:15; 2තිමෝ 3:14
6 තීත 2:1
7 1තිමෝ 6:20; තීත 1:14
8 2පේතෘ 1:7
9 රෝම 12:1; 1කොරි 10:31; එෆී 6:7
10 මතෙ 6:33; රෝම 8:28
11 යොහ 17:3
12 1තිමෝ 1:15
13 ලූක් 13:24
14 ගලා 3:28; 1තිමෝ 2:4
15 ගීතා 31:23
16 යූද් 25

**2 තීරුව**
1 1පේතෘ 1:3
2 1කොරි 14:37; 1කොරි 16:1; 1තෙස 4:11
3 1තිමෝ 6:3
4 1කොරි 16:11; තීත 2:15
5 ගලා 5:22; යාකො 3:17
6 කොලො 3:12
7 පිලි 3:17
8 ක්‍රියා 13:15
9 කොලො 4:16; 1තෙස 5:27
10 1තිමෝ 1:18
11 ක්‍රියා 6:6; ක්‍රියා 13:3
12 ක්‍රියා 19:6; 1කොරි 14:1
13 හිතෝ 15:28
14 පිලි 1:25
15 2තිමෝ 4:2; තීත 2:1
16 ක්‍රියා 20:28
17 රෝම 11:14; 1කොරි 9:22; 1පේතෘ 3:15

**5 පරි.**
18 ලෙවී 19:32; තීත 2:2
19 තීත 2:3
20 මාක් 3:35
21 1තිමෝ 5:16

**1තිමෝ 4:7*** මූ.අ., "පුහුණු වීම් කටයුතුවල නියැලෙන්න."

ඉගෙනගත යුතුයි.[1] එමගින් ඔවුන්ට
දෙවි සඳහා භක්තියක් ඇති බව
ඔප්පු වෙයි. එමනිසා ඔවුන් තම
දෙමාපියන්ගේද තම දෙමාපියන්ගේ
මාපියන්ගේද අවශ්‍යතා නිසි ලෙස
ඉටු කර දිය යුතුයි.[2] එවැනි දෙ-
යක් කිරීම දෙවි සලකන්නේ ප්‍රසන්න
දෙයක් ලෙසයි.[3] **5** ඇත්තටම අස-
රණව සිටින වැන්දඹුවක්[4] බලාපො-
රොත්තු තබන්නේ දෙවි කෙරෙහිය.[5]
එහෙයින් ඇය රෑ දවල් කන්නලව්
කරමින් ඔහුට නොකඩවා යාච්ඤා
කරයි.[6] **6** නමුත් විනෝදකාමී ජීවි-
තයක් ගත කිරීමට කැමැත්තක් දක්-
වන[7] වැන්දඹුවක් ජීවත්ව සිටියත් ඇය
මිය ගොස් සිටිනවා හා සමානය.[8]
**7** එවැනි අයට නිරතුරුවම එම ආඥා
ලබා දෙන්න.[9] එවිට නිදොස්ව සිටීමට
ඔවුන්ට එය උපකාරයක් වනු ඇත.[10]
**8** යමෙකු තමාගේම අයට,[11] විශේෂ-
යෙන්ම තම පවුලේ සාමාජිකයන්ට
අවශ්‍ය දේ ලබා දෙන්නේ නැත්නම්[12]
ඔහු සත්‍ය ඉගැන්වීම්[13] ප්‍රතික්ෂේප කර
ඇති කෙනෙකි.[14] ඇත්තෙන්ම ඔහු
දෙවිට සේවය නොකරන කෙනෙකු-
ටත් වඩා නරකය.

**9** උපකාර අවශ්‍ය අයගේ නාම
ලේඛනයට යම් වැන්දඹුවකව ඇතු-
ළත් කිරීමට නම් ඇය වයස අවුරුදු
හැටක් හෝ ඊට වැඩි, තම ස්වාමිපු-
රුෂයාට විශ්වාසවන්තව* සිටි කෙ-
නෙකු විය යුතුයි.[15] **10** ඇය යහපත්
ක්‍රියා කළ කෙනෙකු ලෙසද[16] ආදර්ශ-
වත් අයුරින් දරුවන් ඇතිදැඩි කළ
කෙනෙකු ලෙසද[17] ආගන්තුක සත්-
කාරශීලී කෙනෙකු ලෙසද[18] ශුද්ධ
තැනැත්තන්ගේ පාද සේදූ තැනැත්ති-
යක් ලෙසද[19] පීඩා විඳිමින් සිටි අයට
උපකාර කළ කෙනෙකු ලෙසද[20] බො-
හෝ යහපත් දේවල් කරමින් වෙහෙස
මහන්සි වූ කෙනෙකු ලෙසද[21] හොඳ
නමක් දිනාගෙන සිටින ස්ත්‍රියක් විය
යුතුයි.

**1තිමෝ 5:9*** මූ.අ., "එක ස්වාමිපුරුෂයෙකුගේ භාර්යාවකව."

**5 පරි.**
1 1තිමෝ 5:8
2 මතෙ 15:4
එෆී 6:2
3 හිතෝ 23:22
4 යාකො 1:27
5 යෙරෙ 49:11
1කොරි 7:34
6 ලූක් 2:37
ලූක් 18:1
7 කොලො 3:5
8 එෆී 2:1
කොලො 2:13
9 1තිමෝ 4:11
10 1තිමෝ 6:14
11 මතෙ 15:5
12 යෙසා 58:7
13 යූද් 3
14 තීත 1:16
15 1තිමෝ 3:2
16 ක්‍රියා 9:39
1තිමෝ 2:10
17 1තිමෝ 2:15
18 හෙබ්‍රෙ 13:2
1පේත 4:9
19 1සාමු 25:41
යොහ 13:5
යොහ 13:14
20 1තිමෝ 5:16
යාකො 1:27
21 හිතෝ 31:27

**2 තීරුව**
1 1කොරි 7:9
2 එළි 2:4
3 2තෙස 3:11
1තිමෝ 3:11
1පේත 4:15
4 1කොරි 7:9
5 1තිමෝ 2:15
6 තීත 2:8
7 1තිමෝ 5:10
8 ද්වි 15:11
1තිමෝ 5:5
යාකො 1:27
9 රෝම 12:8
හෙබ්‍රෙ 13:17
1පේත 5:2
10 1තෙස 5:12
හෙබ්‍රෙ 13:7
11 ක්‍රියා 28:10
12 ද්වි 25:4
1කොරි 9:9

**11** නමුත් නැවත විවාහ වීමට
කැමැත්තෙන් සිටින යෞවන වැන්-
දඹුවන්ව එම ලැයිස්තුවට ඇතුළත්
නොකරන්න. මන්ද ඔවුන්ගේ ආශා-
වන් පාලනය කරගත නොහැකි වන
විට ක්‍රිස්තුස් වෙනුවෙන් සේවය කිරී-
මට ඔවුන් තුළ තිබූ කැමැත්ත නැති
වී යයි.[1] **12** එවිට ඔවුන් කලින්
දෙවි කෙරෙහි විශ්වාසයක් ඇතුව
සැලසුම් කළ දේවලට අනුව දැන්
ක්‍රියා නොකරන නිසා ඔවුන් පො-
රොන්දු කඩ කරන අය බව ඔප්පු
වෙයි.[2] **13** ඔවුහු නිකරුණේ කාලය
ගත කරමින් ගෙයක් ගෙයක් පාසා
ගොස් තම කාලය නාස්ති කිරීමට
පුරුදු වී සිටිති. ඔවුන් කාලය නාස්ති
කරනවා පමණක් නොව කතා නො-
කළ යුතු දේ ගැන පවා කතා කරමින්,
ඕපාදූප කීමටත් අනුන්ගේ වැඩක-
ටයුතුවලට ඇඟිලි ගැසීමටත් පුරුදු
වී සිටිති.[3] **14** ඒ හේතු නිසා යෞ-
වන වැන්දඹුවන් විවාහ වී,[4] දරුවන්
බිහි කර[5] තම නිවසේ වැඩකටයුතු
බලා කියා ගන්නවාටත් අපට විරුද්-
ධව සිටින අයට අප ගැන නින්දා කිරී-
මට කිසිම හේතුවක් නොදෙන අයුරින්
කටයුතු කරනවාටත් මම කැමැත්-
තෙමි.[6] **15** දැනටමත් ඇතැම් වැන්-
දඹුවන් සාතන් පසුපස ගොස් ඇත.
**16** දෙවිට සේවය කරන ස්ත්‍රියකගේ
පවුලේ වැන්දඹුවන් සිටී නම් ඔවුන්ගේ
බර සභාවට දැරීමට ඉඩහරිනවා වෙ-
නුවට එය තමන්ගේ වගකීමක් ලෙස
සලකා ඔවුන්ට උපකාර කළ යුතුයි.[7]
එවිට කාගෙවත් සරණක් නැති වැන්-
දඹුවන්ට උපකාර කිරීමට සභාවට
හැකි වෙයි.[8]

**17** සභා වැඩකටයුතුවලදී හොඳින්
පෙරමුණ ගෙන ක්‍රියා කරන වැඩිම-
හල්ලන්,[9] විශේෂයෙන්ම දෙවි පවසන
දේවල් ගැන කතා කිරීමටත් ඉගැන්වී-
මටත් මහත් වෙහෙසක් දරන[10] වැඩි-
මහල්ලන් වැඩි ගෞරවයක් ලැබීමට
සුදුස්සන් බව සැලකිල්ලට ගන්න.[11]
**18** මන්ද, "ගවයෙක් කමතේ කරල්
පාගන විට උගේ කට බඳින්න එපා"[12]

කියාද, “කම්කරුවෙකුට තමන් කළ
කාර්යය වෙනුවෙන් කුලී ගෙවීම සුදු-
සුයි”[1] කියාද ශුද්ධ ලියවිල්ලේ සඳ-
හන් වී තිබේ.
19 වැඩිමහල්ලෙකුට
විරුද්ධව කරන චෝදනාවක් ගැන
යම් පියවරක් ගැනීමට නම් ඒ පිළි-
බඳව දෙදෙනෙකුගේ හෝ තුන්දෙ-
නෙකුගේ සාක්ෂි තිබිය යුතුයි. එසේ
නැතහොත් ඒ චෝදනාව පිළි නො-
ගත යුතුයි.[2]
20 පුරුද්දක් ලෙස පව්
කරන අයට[3] අවවාද[4] ලබා දිය යුත්-
තේ සියලුදෙනා ඉදිරියෙහිය. එසේ
කළ යුත්තේ අන් අයටත් අනතුරු
ඇඟවීමක් ලෙසය.[5]
21 දෙවිද ක්‍රිස්-
තුස් යේසුස්ද[6] දෙවි තෝරාගෙන ඇති
දේවදූතයන්ද ඉදිරියෙහි මා ඔබට
ඉතා බැරෑරුම් ලෙස අණ කරන්නේ
යම් තීරණයක් ගැනීමට පෙර සෑම
දෙයක් ගැනම හොඳින් සෝදිසි කර
බලන්න කියාය. එලෙසම කාගෙවත්
පැත්ත ගෙන කිසිවක් නොකරන්න
කියාය.[7]

22 කෙනෙකුව යම් වගකීමක්
සඳහා පත් කිරීමට*[8] ඉක්මන්
නොවන්න.[9] එලෙසම අනුන් කරන
පාපවලට හවුල් නොවන්න.[10] ඔබේ
පවිත්‍රකම රැකගන්න.[11]

23 ඔබ තවදුරටත් වතුර බීමෙන්
වළකින්න.* ඔබේ උදරාබාධය හේතු-
වෙන් ඔබ නිතරම අසනීප වන නිසා
වයින් ටිකක් බොන්න.[12]

24 සමහරුන් කරන පාප පැහැ-
දිලිව දැකගත හැකියි.[13] එම-
නිසා ඔවුන්ට වහාම දඬුවම් ලැබේ.
තවත් සමහරුන්ගේ පාප හෙළි වන්-
නේ යම් කලක් ගත වූ පසුවය.[14]
25 කෙනෙකු කරන යහපත් ක්‍රියාද
පැහැදිලිව දැකගත හැකි වන්නේ
එයාකාරයෙන්මය.[15] ඒවා වහාම දැක-
ගත නොහැකි වුවත් ඒවා සඳහටම
සඟවා තැබීමට නුපුළුවන.[16]

**6** දාසයන් ලෙස* සිටින සියලු-
දෙනා තම අයිතිකරුවන්ව
පූර්ණ ගෞරවයක් ලැබීමට වටිනා
අය ලෙස සැලකිය යුතුයි.[1] එසේ
කිරීමෙන් දෙවිගේ නාමය සහ සත්‍ය
ඉගැන්වීම් කිසි ලෙසකින්වත් දෝ-
ෂාරෝපණයට ලක් වන්නේ නැත.[2]
2 ඇතැම් දාසයන්ගේ අයිතිකරුවන්
දෙවිට නමස්කාර කරන අය නම්[3]
ඔවුන් සහෝදරයන් වන නිසා[4] ස්වාමි-
යෙකුට දිය යුතු ගෞරවය ඔවුන්ට දීම
අවශ්‍ය නැතැයි කියා සිතීමෙන් වැළකී
සිටිය යුතුයි.[5] ඒ වෙනුවට ඔවුන්
කරන සේවයෙන් ප්‍රයෝජන ලබන
අය දෙවිට සේවය කරන ප්‍රේමණීය
සහෝදරයන් වන නිසා ඔවුන් වැඩි
කැමැත්තකින් සේවය කළ යුතුයි.

එවැනි දේවල් ගැන දිගටම උගන්ව-
මින්[6] හා උනන්දු කරමින් සිටින්න.
3 යමෙක් මීට වඩා වෙනස්
දේවල් උගන්වමින්[7] අපගේ ස්වා-
මීන් වන යේසුස් ක්‍රිස්තුස්ගේ නිවැරදි
මෙන්ම ප්‍රයෝජනවත් වදන් සහ දෙ-
විට ගෞරවය ගෙන[8] දෙන ඉගැන්-
වීම් පිළිගන්නේ නැත්නම්,[9]
4 ඔහු
අහංකාරයෙන් ඉදිමී සිටින,[10] නිසි
අවබෝධයකින් කටයුතු නොකරන
කෙනෙකි.[11] ඔහු නිතරම වචන ගැන
මතභේද ඇති කරමින් වාදවිවාදව-
ලට පැටලෙන කෙනෙකි.[12] එසේම
එවැනි කෙනෙකු හොඳ සිහිකල්ප-
නාවෙන් කටයුතු කරන පුද්ගලයෙකු
නොවේ.[13] ඒ දේවලින් ඊර්ෂ්‍යාව,[14]
අඬදබර, නින්දිත[15] කතා හා ඉතා
නින්දාසහගත සැකයන් යනාදිය හට-
ගන්නා අතර,
5 සුළු සුළු කාරණා
ගැන උණුසුම් විවාදද ඇති වෙයි.
එවැනි විවාද ඇති වන්නේ දූෂිත
මනස් ඇති,[16] සත්‍යයෙන් දුරස් වී
ඇති[17] මිනිසුන් නිසාය. ඔවුන්ගේ
අදහස වන්නේ දෙවිට භක්තියෙන්

---

**1තිමෝ 5:22*** හෝ, “අත් තැබීමට.” **23*** ඇතැම්-විට ඔහුට එවැන්නක් පැවසුවේ ඔහුගේ අසනීප තත්වයට හේතු වූ අපවිත්‍ර ජලය පානය නොකිරීම සඳහාය.

**1තිමෝ 6:1*** මූ.අ., “දාසයන් ලෙස වියගහක් යටතේ.”

**16** 2කොරි 11:3; 2තිමෝ 3:8; යූද් 10; **17** පිලි 3:18; 2තිමෝ 4:4; තීත 1:14.

---

**5 පරි.**
**1** ලෙවී 19:13
මතෙ 10:10
ගලා 6:6
**2** ද්වි 19:15
මතෙ 18:16
2කොරි 13:1
හෙබ්‍රෙ 10:28
**3** 1කොරි 15:34
1යොහ 3:9
**4** හිතෝ 28:23
එෆී 5:11
තීත 1:9
තීත 1:13
එළි 3:19
**5** ද්වි 13:11
ගලා 2:14
**6** 2තිමෝ 4:1
**7** ලෙවී 19:15
යාකො 3:17
**8** 1තිමෝ 4:14
**9** ක්‍රියා 6:6
ක්‍රියා 14:23
1තිමෝ 3:6
**10** 2යොහ 11
එළි 18:4
**11** 1තිමෝ 4:12
1යොහ 3:3
**12** ලූක් 10:34
1තිමෝ 3:8
**13** හිතෝ 28:13
ගලා 5:19
**14** යොෂු 7:11
හෙබ්‍රෙ 4:13
**15** මතෙ 5:16
1තිමෝ 3:7
**16** මතෙ 10:26
ලූක් 12:2
1කොරි 4:5

**2 තීරුව**

**6 පරි.**
**1** රෝම 13:7
එෆී 6:5
කොලො 3:22
**2** රෝම 2:24
තීත 2:5
1පේතෘ 2:13
**3** එෆී 6:9
**4** පිලෙ 16
**5** කොලො 4:1
**6** 1තිමෝ 4:11
**7** හිතෝ 11:9
යෙරෙ 17:13
ගලා 1:7
**8** තීත 1:1
**9** 2තිමෝ 1:13
**10** හිතෝ 28:25
ගලා 6:3
1තිමෝ 3:6
**11** 1කොරි 8:2
**12** 2තිමෝ 2:14
තීත 1:10
තීත 3:9
**13** රෝම 1:28
තීත 3:11
**14** ගලා 5:21
**15** 2පේතෘ 2:11

සේවය කළොත් තමාට එයින් යම්
වාසි ප්‍රයෝජන ලබාගත හැකි
බවය.[1] **6** ඇත්තෙන්ම දෙවිට භක්-
තියෙන් සේවය කරන විට[2] ඉමහත්
ප්‍රයෝජන නෙළාගත හැකියි.[3] නමුත්
ඒ සඳහා කෙනෙකු තමාට තිබෙන දේ-
වලින් සෑහීමට පත්ව සිටිය යුතුයි.[4]
**7** මන්ද අප මෙලොවට කිසිවක් ගෙ-
නාවේ නැත. එයින් කිසිවක් ගෙන
යෑමටවත් නුපුළුවන.[5] **8** එහෙයින්
අපට කෑම බීම, ඇඳුම්පැළඳුම් සහ
ඉඳුම්හිටුම් ඇත්නම් අපි ඒ දේවලින්
සෑහීමට පත් වෙමු.[6]

**9** නමුත් පොහොසත් වීමට අදිටන්
කරගෙන සිටින අය වැරදි දේවල් කිරී-
මට පෙලඹෙනු ඇත.[7] ඔවුන් හසු වන්-
නේ උගුලකටය. ප්‍රතිඵලයක් ලෙස
ඔවුන් තුළ කිසි තේරුමක් නැති,
හානිකර ආශාවන් බොහොමයක් හට-
ගන්නා අතර[8] එයින් බොහෝදෙනෙ-
කුගේ ජීවිත සම්පූර්ණයෙන්ම නාස්ති
වී යයි.[9] **10** මන්ද සෑම හානිකර දෙ-
යකටම[10] මුල් වන්නේ[11] මුදල්වලට
තිබෙන ඇඩි ආශාවය.[12] සමහරුන් ඒ
ආශාව පසුපස හඹා ගොස් ඇති නිසා
ඔවුන් සත්‍ය මාර්ගයෙන් පවා අහක්ව
ගොස් ඇති අතර තමාටම පිහියකින්
ඇනගත් විට ඇති වන වේදනාවට
සමාන බොහෝ වේදනා අද්දැකීමට
ඔවුන්ට සිදු වී ඇත.[13]

**11** නමුත් ඔබ දෙවිට ළැදි මනුෂ්‍ය-
යෙකි. එහෙයින් ඒ දේවලින් පලා
යන්න.[14] ඒ වෙනුවට ධර්මිෂ්ඨකම,
දේවභක්තිය, විශ්වාසය, ප්‍රේමය, විඳ-
දරාගැනීම හා මෘදු ගුණය[15] ඇතුව
සිටීමට නිරතුරුවම වෑයම් කරන්න.
**12** සත්‍ය ඉගැන්වීම්වලට එකඟව විශ්-
වාසවන්තව කටයුතු කිරීම සඳහා
සටන් කරන්න.[16] එය යහපත් සට-
නකි. සදාකාල ජීවනය නමැති ප්‍රස්-
තාව තදින් අල්ලාගන්න. ඔබව
කැඳවනු ලැබුවේ ඒ සඳහාය. මන්ද
බොහෝදෙනෙකු ඉදිරියේ ඔබ තුළ
තිබෙන විශ්වාසය ගැන ඔබ ඉතා
කදිම සාක්ෂියක් ඉදිරිපත් කර තිබෙන
බව මතක තබාගන්න.[17]

**6 පරි.**
1 1කොරි 13:2; 1පේත්‍ර 5:2
2 රෝම 12:1; 1තිමෝ 3:16
3 2කොරි 4:18; පිලි 1:21
4 පිලි 4:11
5 යෝබ් 1:21; ගීතා 49:17
6 හිතෝ 30:8; හෙබ්‍රෙ 13:5
7 මතෙ 13:22; යාකො 5:1
8 හිතෝ 20:21; කොලො 3:5; තීත 1:7
9 හිතෝ 28:20; හිතෝ 28:22
10 ද්වි 16:19; එස 22:12
11 යාකො 1:15
12 මතෙ 6:24; ලූක් 12:34; හෙබ්‍රෙ 12:1
13 1තිමෝ 1:19
14 2තිමෝ 2:22
15 හිතෝ 15:1; මතෙ 5:5; ගලා 5:22; කොලො 3:12; 1පේත්‍ර 3:15
16 1කොරි 9:26; යූද් 3
17 හෙබ්‍රෙ 10:23

**2 තීරුව**
1 මතෙ 27:11
2 යෙසා 55:4
3 යොහ 18:36; යොහ 19:11
4 1තෙස 4:2
5 2තෙස 2:8; 2තිමෝ 4:1; 2තිමෝ 4:8
6 ආනි 7:14
7 ක්‍රියා 1:7
8 ආනි 2:44; එළි 17:14
9 එළි 19:16
10 හෙබ්‍රෙ 7:16; හෙබ්‍රෙ 7:25
11 ක්‍රියා 9:3; ක්‍රියා 22:6; එළි 1:16
12 මතෙ 25:37; යොහ 14:19; 1පේත්‍ර 3:18
13 යොහ 17:24
14 මාක් 10:23
15 හිතෝ 28:11
16 මතෙ 13:22
17 දේශ 5:19; මතෙ 6:33; යාකො 1:17
18 එෆී 4:28; යාකො 1:27
19 මතෙ 28:19; තීත 3:8

**13** සියලු දේවලට ජීවනය ලබා
දෙන දෙවි ඉදිරියෙහිත් පොන්තියුස්
පිලාත් ඉදිරිපිට[1] ඉතා කදිම සාක්ෂි-
යක්[2] ඉදිරිපත් කළ[3] ක්‍රිස්තුස් යේසුස්
ඉදිරියෙහිත් ඔබට කාරණා කිහිපයක්
ගැන යම් මහ පෙන්වීම් දීමට කැමැත්-
තෙමි.[4] **14** එනම් අපගේ ස්වාමීන්
වන යේසුස් ක්‍රිස්තුස් පෙනී සිටින
තුරු[5] මා ඔබට දුන් ආඥා රකි-
මින් ඔබට කැළැලක් නොවන අයු-
රින්ද කාගෙවත් චෝදනාවකට
ලක් නොවන අයුරින්ද ජීවත් වන්න
කියාය. **15** ප්‍රීතියෙන් සිටින බල-
වත් වූ ඒ එකම පාලකයා[6] එසේ පෙනී
සිටින්නේ නියමිත කාලයේදීය.[7] ඔහු
රජවරුන්ගේ රජය,[8] ස්වාමිවරුන්-
ගේ ස්වාමීන්ය.[9] **16** අමරණීයභාවය
සතු එකම තැනැත්තා ඔහුය.[10] කිසි-
වෙකුට ළඟා විය නොහැකි ආලෝක-
යක් තුළ ඔහු වාසය කරයි.[11] එසේ
සිටින ඔහුව කිසි මිනිසෙකු දැක
නැති අතර කිසි මිනිසෙකුට ඔහුව
දැකීමටද නොහැක.[12] ඔහුට ගෞරවය
ලැබේවා![13] ඔහුගේ මහත් බලය සදහ-
ටම පවතීවා! ආමෙන්.

**17** පවතින මේ සමාජයේ ධනය
රැස් කරගෙන සිටින අයට[14] අහංකාර
නොවී[15] සිටීමට අවවාද කරන්න.
එමෙන්ම අවිනිශ්චිත ධන සම්පත්
කෙරෙහි නොව[16] අපගේ ප්‍රයෝජ-
නය සඳහා කිසි අඩුවක් නැතුව සෑම
දෙයක්ම ත්‍යාගශීලීව සපයා දෙන
දෙවි[17] කෙරෙහි තම බලාපොරොත්තු
තැබීමට ඔවුන්ට මඟ පෙන්වන්න.
**18** එමෙන්ම යහපත් දේවල් කිරීම-
ටත්[18] යහපත් ක්‍රියාවලින් පොහො-
සත් වීමටත්[19] ත්‍යාගශීලී වීමටත්
අනුන් සමඟ බෙදාගැනීමට සූදා-
නම් වී සිටීමටත්[20] ඔවුන්ට අව-
වාද කරන්න. **19** එසේ කිරීමෙන්
අනාගතය සඳහා ස්ථිර අඩිතාල-
මක්[21] ගොඩනැඟීමේ කාර්යය වස්තු-
වක් ලෙස සලකා එය රැකගැනීමට[22]

---
**20** රෝම 12:13; 2කොරි 8:14; **21** ලූක් 6:48; 2තිමෝ 2:19;
**22** මතෙ 6:20.

ඔවුන්ට හැකි වන අතර සැබෑ ජීවිතය තදින් අල්ලාගැනීමටත් ඔවුන් සමත් වනු ඇත.[1]

**20** ආදරණීය තිමෝති, ඔබට මහත් විශ්වාසයකින් භාර දී ඇති දේවල් රැකගන්න.[2] නමුත් ශුද්ධ දේවලට එකඟ නොවන කිසි ප්‍රයෝජනයක් නැති බොරු කතාවලින්ද පරස්පර විරෝධී මතවලින් පිරී තිබෙන බොරු "දැනුමෙන්ද" අහක් වී සිටින්න.[1] **21** සමහරුන් එවැනි දැනුමක් ප්‍රදර්ශනය කිරීමට ගොස් සත්‍ය මාර්ගයෙන් පවා අහක්ව ගොස් ඇත.[2]

ඔබ සියලුදෙනාටම දෙවිගේ මහත් කරුණාව ලැබේවා!

**6 පරි.**
**1** ලූක් 16:9
**2** 2තිමෝ 3:14
2තිමෝ 4:5
තීත 1:9

**2 තීරුව**
**1** 1කොරි 2:13
1කොරි 3:19
කොලො 2:8
**2** 1තිමෝ 1:19

# තිමෝතිට
## ලියූ දෙවෙනි ලිපිය

**1** දෙවිගේ කැමැත්තට එකඟව[1] ක්‍රිස්තුස් යේසුස්ගේ නියෝජිතයෙකු* ලෙස සේවය කරන පාවුල් වන මම මෙම ලිපිය ලියමි. මා මෙසේ සේවය කරන්නේ ක්‍රිස්තුස් යේසුස් සමඟ එකට බැඳී සිටින අයට[2] දෙවි පොරොන්දු වී ඇති ජීවිතය[3] ගැන ප්‍රකාශ කිරීම සඳහාය. **2** මෙම ලිපිය ලියන්නේ ඉතා ප්‍රේමණීය පුත්‍රයෙකු වන තිමෝති වෙතටය.[4]

පියාණන් වන දෙවිගෙන් හා අපගේ ස්වාමීන් වන ක්‍රිස්තුස් යේසුස්ගෙන් ඔබට මහත් කරුණාව, දයාව හා සමාදානය ලැබේවා![5]

**3** මා දෙවිට කොතරම් ස්තුතිවන්ත වෙනවාද! මගේ මුතුන්මිත්තන් මෙන්[6] මා දෙවිට පරිශුද්ධ සේවයක් පිරිනමමින්[7] ඔහු ඉදිරියේ මගේ හෘදය සාක්ෂිය නිදොස්ව තබාගනිමින් සිටින අතර[8] මම රෑ දවල් ඔබ වෙනුවෙන් දිගටම දෙවිට කන්නලව් කරමි.[9] **4** ඔබේ කඳුළු මට සිහි වන විට ඔබව දැක බලා ගැනීමට මා තුළ ඇති ආශාව තවත් වැඩි වෙයි.[10] ඔබව දැකීම මගේ ප්‍රීතියට හේතු වන බව නිසැකය. **5** ඔබ කිසි කුහකකමක් නැතුව[11] අවංකව ගොඩනගා ගෙන ඇති විශ්වාසය මට මතක් වෙයි.[12] මුලින්ම එවැනි විශ්වාසයක් තිබුණේ ඔබේ ආච්චි වන ලොයිස්ට සහ ඔබේ මව වන යූනිස්ටය. දැන් එවැනි විශ්වාසයක් ඔබ තුළත් ඇති බව මට නිසැකයි.

**6** මා ඔබ පිට අත් තැබූ විට[1] ඔබට දෙවිගෙන් ලැබුණු දීමනාව[2] දිගටම උද්‍යෝගයෙන් භාවිත කිරීමට ඔබට මතක් කරන්නේ ඒ නිසාය. එය භාවිත කළ යුත්තේ ගින්නක දීප්තිය තව තවත් වැඩි කරන ආකාරයෙනි.[3] **7** මන්ද දෙවි තම බලය අපට ලබා දුන් විට අප තුළ ඇති වූයේ බියගුලුකමක් නොවේ.[4] ඒ වෙනුවට මහත් ශක්තියක්[5] හා ප්‍රේමයක් මෙන්ම හොඳ සිහිකල්පනාවෙන් කටයුතු කිරීමේ හැකියාවද අපට ලැබිණ.[6] **8** එහෙයින් අපගේ ස්වාමීන් ගැන සාක්ෂි දැරීම ගැනවත් ඔහු වෙනුවෙන් සිරකරුවෙකු වී සිටින[7] මා ගැනවත් ලැජ්ජා නොවන්න.[8] ඒ වෙනුවට දෙවි ලබා දෙන බලයේ උපකාරයෙන්[9] පසුබට නොවී ශුභාරංචිය වෙනුවෙන් දුක් විඳීමට සූදානම් වන්න.[10] **9** දෙවි අපව ගලවා[11] ශුද්ධ අය ලෙස කැඳෙව්වේ[12] අප කළ යම් ක්‍රියා පදනම් කරගෙන නොව[13] ඔහු අරමුණු කළ දේ හා ඔහු පෙන්වූ මහත් කරුණාව

**1 පරි.**
**1** යොහ 6:44
2කොරි 1:1
**2** යොහ 6:40
**3** යොහ 3:16
රෝම 2:7
1පේතෘ 1:4
**4** 1කොරි 4:17
**5** 1තිමෝ 1:2
2යොහ 3
**6** රෝම 11:1
**7** රෝම 1:9
රෝම 12:1
**8** ක්‍රියා 23:1
**9** 1තෙස 1:2
**10** 2තිමෝ 4:9
**11** 1තිමෝ 1:5
1තිමෝ 4:6
**12** ක්‍රියා 16:2

**2 තීරුව**
**1** ක්‍රියා 13:3
1තිමෝ 4:14
**2** ක්‍රියා 19:6
1කොරි 14:1
**3** රෝම 12:11
1තෙස 5:19
**4** රෝම 8:15
1තෙස 2:2
එළි 21:8
**5** ලූක් 24:49
ක්‍රියා 1:8
1කොරි 1:18
**6** එෆී 4:23
**7** එෆී 3:1
2තිමෝ 2:9
**8** රෝම 1:16
**9** 2කොරි 6:7
පිලි 4:13
කොලො 1:11
1පේතෘ 1:5
**10** කොලො 1:24
2තිමෝ 2:3
**11** ක්‍රියා 2:47
එෆී 2:5

**2තිමෝ 1:1*** හෝ, "යවනු ලැබූවෙකු."

**12** රෝම 8:28; එෆී 1:4; හෙබ්‍රෙ 3:1; **13** එෆී 2:8; තීත 3:5.

නිසාය. අපට ඒ මහත් කරුණාව
ක්‍රිස්තුස් යේසුස් මාර්ගයෙන් පෙන්-
වීමට ඔහු බොහෝ කලකට පෙර
පියවර ගත්තේය.[1] **10** ඒ කරුණාව
අපගේ ගැලවුම්කරු වන ක්‍රිස්තුස් යේ-
සුස් පෙනී සිටි අවස්ථාවේදී[2] ඉතා
පැහැදිලිව දැකගත හැකි විය. මරණය
නැති කර දැමූ ඔහු,[3] ශුභාරංචිය මාර්-
ගයෙන්[4] අපට ජීවනය[5] හා කිසිදා දිරා
නොයන ස්වභාවයක් හිමි වන ආකා-
රය[6] හෙළි කර ඇත.[7] **11** එසේම ඒ
ශුභාරංචිය දේශනා කිරීමට සහ ඒ වෙ-
නුවෙන් නියෝජිතයෙකු හා ගුරුවර-
යෙකු ලෙස කටයුතු කිරීමට මාවද
පත් කර ඇත.[8]

**12** ඒ හේතුව නිසා මා දුක් වින්-
දත්[9] ඒ ගැන ලැජ්ජා නොවෙමි.[10]
මන්ද මා විශ්වාස කරන දෙවිව
මා හොඳින් හඳුනාගෙන සිටින අතර
මා දෙවිට මහත් විශ්වාසයකින් භාර
දී ඇති දේ ඒ දවස පැමිණෙන
තුරු[11] රැකබලා ගැනීමට ඔහුට හැකි
බව[12] මා තුළ කිසි සැකයක් නැත.
**13** ඔබ මගෙන් අසා ඉගෙනගත් නිවැ-
රදි මෙන්ම ප්‍රයෝජනවත්[13] ඉගැන්-
වීම්වලට තදින් ඇලී සිටින්න. එහි
දක්නට තිබෙන රටාවෙන්* ඉව-
තට නොයන්න. එමෙන්ම ක්‍රිස්තුස්
යේසුස් කෙරෙහි විශ්වාසය තබා ඔහු
සඳහා ඔබේ ප්‍රේමය පෙන්වන්න.[14]
**14** ඔබට විශ්වාසයකින් භාර දී ඇති
ඒ අගනා දේ[15] අප සියලුදෙනා තුළ
ක්‍රියාත්මක වන දෙවිගේ බලය මාර්ග-
යෙන් රැකගන්න.[16]

**15** ඔබ දන්නා දෙයක් නම් ආසියා
ප්‍රදේශයේ[17] සිටින සියලුදෙනාම පාහේ
මගෙන් ඈත් වී ඇති බවය.[18] ඔවුන්
අතර ෆිගෙලස් සහ හර්මොජෙනිස්
සිටිති. **16** නමුත් ඔනෙසිෆරස්[19]
නොයෙක් අවස්ථාවලදී මට ඉමහත්
සැනසිල්ලක් ලබා දුන් අතර[20] මා දම්-
වැල්වලින් බැඳ සිටියා කියා ඔහු තුළ
ලැජ්ජාවක් ඇති නොවීය.[21] ඒ නිසා මා
ඉල්ලා සිටින්නේ ඔහු සහ ඔහුගේ නිව-
සේ සිටින සියලුදෙනාට ස්වාමීන්ගේ
දයාව ලැබෙන්න කියාය. **17** ඔහු
රෝමයට පැමිණි විට මාව සෙවී-
මට මහත් උත්සාහයක් දරා කෙසේ
හෝ මා සිටි තැන සොයාගත්තේය.[1]
**18** ඔහු එෆීසයේදී මා වෙනුවෙන් කළ
සෑම දෙයක් ගැනම ඔබ හොඳින් දන්-
නවාට සැකයක් නැත. යෙහෝවා
දෙවි තම විනිශ්චය ලබා දෙන දව-
සේදී[2] ඔහුට දෙවිගේ දයාව ලබාගැනීම
සඳහා[3] ස්වාමීන්ගේ උපකාරය ඔහුට
ලැබේවා!

**2** එහෙයින් මගේ පුත්‍රය,[4] ක්‍රිස්තුස්
යේසුස් සමඟ එකට බැඳී සිටීමේ
ප්‍රතිඵලයක් ලෙස ඔබ ලබන මහත්
කරුණාව තුළින්[5] දිගටම ශක්තිමත්
වන්න.[6] **2** එලෙසම බොහෝ සාක්-
ෂිකරුවන් ඉදිරියෙහි ඔබ මගෙන් අසා
දැනගත් දේවල්[7] විශ්වාසවන්ත පුරු-
ෂයන් අතරේ බෙදාගන්න. එවිට අන්
අයට ඉගැන්වීම සඳහා අවශ්‍ය සුදු-
සුකම් ලබාගැනීමට ඔවුන්ටද හැකි
වේ.[8] **3** ක්‍රිස්තුස් යේසුස්ගේ යහපත්
භේවායෙකු ලෙස[9] දුක් විඳීමට පසු-
බට නොවන්න.[10] **4** භේවායෙකු[11]
ලෙස සේවය කරන කිසිවෙක් තම
සේවයට අදාළ නැති ව්‍යාපාරික කට-
යුතුවලට සම්බන්ධ වන්නේ නැත.[12]
ඔහු එසේ සම්බන්ධ නොවන්නේ
තමාව භේවායෙකු ලෙස බඳවාගත්
තැනැත්තාගේ අනුමැතිය ලබාගැනීම
සඳහාය. **5** එලෙසම යම් තරඟාව-
ලියකට සහභාගි වී[13] ජය ලබන
කෙනෙකුට කිරුළු පළඳවන්නේ ඔහු
තරඟයේ නීතිරීතිවලට අනුව තරඟ
කළොත් පමණි. **6** මුලින්ම පල-
දාව භුක්ති විඳිය යුත්තේ ඒ සඳහා
මහන්සි වී ගොවිතැන් කළ තැනැත්-
තාය.[14] **7** මා පවසන දේවල් ගැන
නිරතුරුවම කල්පනා කර බලන්න.
සෑම දෙයක්ම වටහාගැනීමේ හැකි-
යාව[15] ඔබට අනිවාර්යයෙන්ම ස්වා-
මීන්ගෙන් ලැබෙනු ඇත.

**8** යේසුස් ක්‍රිස්තුස් දාවිත්ගේ පෙ-
ළපතින් පැමිණි කෙනෙකු බවත්[16]

**1 පරි.**
**1** 1පේතෘ 1:20
**2** යොහ 1:14
හෙබ්‍රෙ 2:9
**3** 1කොරි 15:54
හෙබ්‍රෙ 2:14
**4** රෝම 1:16
**5** යොහ 1:4
යොහ 5:24
1යොහ 1:2
**6** 1පේතෘ 1:4
**7** යොහ 1:9
**8** ක්‍රියා 9:15
එෆී 3:7
1තිමෝ 2:7
**9** ක්‍රියා 9:16
එෆී 3:1
1පේතෘ 4:19
**10** 2කොරි 4:2
**11** 2තිමෝ 4:8
**12** 1තිමෝ 6:20
**13** 1තිමෝ 6:3
තීත 1:9
**14** පිලි 4:9
2තිමෝ 2:2
2තිමෝ 3:14
**15** ගලා 2:7
1තිමෝ 4:14
**16** රෝම 8:11
**17** ක්‍රියා 19:10
**18** 2තිමෝ 4:10
**19** 2තිමෝ 4:19
**20** ෆිලෙ 7
**21** ක්‍රියා 28:20
එෆී 6:20

**2 තීරුව**
**1** ක්‍රියා 28:30
**2** ශෙප 2:3
**3** නික් 34:6
රෝම 9:15
එෆී 2:4

**2 පරි.**
**4** 1තිමෝ 1:2
**5** යොහ 1:17
**6** එෆී 6:10
**7** 2තිමෝ 1:13
2තිමෝ 3:14
**8** මතෙ 28:20
**9** 1තිමෝ 1:18
**10** 2තිමෝ 1:8
**11** ෆිලෙ 2
**12** 1කොරි 9:7
**13** 1කොරි 9:25
**14** 1කොරි 9:7
1කොරි 9:10
**15** කොලො 1:9
1යොහ 5:20
**16** ක්‍රියා 2:30
ක්‍රියා 13:23
රෝම 1:3

---

**2තිමෝ 1:13*** හෝ, “සැලැස්මෙන්” හෝ, “පිළිවෙළින්.”

ඔහුව මරණයෙන් නැඟිටුවනු ලැබූ
බවත්[1] මතක තබාගන්න. මා දේශනා
කරන ශුභාරංචියට එයද ඇතුළත්ය.[2]
**9** වරදකරුවෙකු ලෙස මගේ අත්
පාවලට විලංගු දමා තිබෙන්නෙත් මා
බොහෝ හිරිහැර විඳින්නෙත් ඒ ශුභා-
රංචිය නිසාය.[3] එසේවුවත් දෙවිගේ
පණිවිඩය බැඳ තැබීමට කිසිවෙකුට
නුපුළුවන.[4] **10** මා සැම දෙයක්ම
විඳදරාගෙන සිටින්නේ තෝරාගත්
අය වෙනුවෙනි.[5] එසේ කිරීමෙන් ක්‍රිස්-
තුස් යේසුස් සමඟ එකට බැඳී සිටී-
මෙන් ලැබෙන ගැලවීමද ඒ සමඟ
සදාකාල තේජස භුක්ති විඳීමේ ප්‍රස්-
තාවද ඔවුන්ටත් උදා වේ.[6] **11** මතු
දැක්වෙන මේ කාරණය විශ්වාසවන්-
තය.[7] එනම් අප ඔහු සමඟ මිය
ගියොත් අපි ඔහු සමඟ ජීවත් වන්-
නෙමු.[8] **12** අප දිගටම විඳදරාගෙන
සිටියොත් අපි ඔහු සමඟ රජකම්
කරන්නෙමු.[9] අප ඔහුව ප්‍රතික්ෂේප
කළොත්[10] ඔහු අපවද ප්‍රතික්ෂේප
කරයි. **13** අප දෙවිට අවිශ්වාස-
වන්ත වුවත් ඔහු දිගටම විශ්වා-
සවන්තව සිටියි.[11] මන්ද දෙවි තම
ප්‍රමිතිවලට විරුද්ධව කිසි ලෙසකින්-
වත් ක්‍රියා කරන්නේ නැත.

**14** ඒ දේවල් ඔවුන්ට නිතරම
මතක් කරමින්[12] වචන ගැන වාද
නොකරන ලෙස[13] ඔවුන්ට දෙවි ඉදි-
රියේ[14] ඉතා පැහැදිලිව පවසන්න.[15]
එවැනි වාදවලින් සවන් දෙන අයගේ
විශ්වාසය දුර්වල වී යන නිසා ඒවා-
යින් කිසි ප්‍රයෝජනවත් දෙයක් සිදු
වන්නේ නැත. **15** දෙවිගේ අනුමැ-
තිය ලබා ඇති[16] සේවකයෙකු ලෙස[17]
පෙනී සිටීම සඳහා ඔබට හැකි උපරි-
මය කරන්න. එලෙසම තමන් ඉටු
කරන සේවය ගැන ලැජ්ජා නො-
වන,[18] සත්‍යය අඩංගු දේවවචනය
නිසි ලෙස භාවිත කරන කෙනෙකු
වන්න.[19] **16** නමුත් ශුද්ධ දේවලට
එකඟ නැති හිස් කතාවලින් අහක් වී
සිටින්න.[20] මන්ද එවැනි දේවල් පතුරු-
වන අය දෙවිට තව තවත් අගෞරව-
යක් ගෙන දෙන අතර,[21] **17** ඔවුන්
පවසන දේවල් ශරීරය පුරා වේග-
යෙන් පැතිරෙන මාරාන්තික රෝග-
යක් මෙනි.[1] එවැනි අය අතර
හිමනේයස් සහ ෆිලේටස් සිටිති.[2]
**18** සත්‍ය ඉගැන්වීම්වලින් අහක්ව
ගොස් ඇති ඔවුහු,[3] නැවත නැඟිටීම
දැනටමත් සිදු වී ඇති බව පවස-
මින්[4] සමහරුන්ගේ විශ්වාසය නැති
කර දමමින් සිටිති.[5] **19** නමුත් දෙවි
පිහිටුවා ඇති අත්තිවාරම ස්ථිරය.[6] ඒ
මත මුද්‍රාවක් හා සමානව තිබෙන්-
නේ මෙම සහතිකයයි. එනම්, "තම
අනුමැතිය තිබෙන්නේ කාටද කියා
යෙහෝවා දෙවි දන්නේය"[7] සහ "යෙ-
හෝවා දෙවිගේ නාමය[8] සඳහන් කරන
සියලුදෙනා අධර්මිෂ්ඨකමට පිටු පෑ
යුතුයි"[9] යන්නය.

**20** විශාල නිවසක් ගැන සිතන්න.
එම නිවසේ විවිධාකාර බඳුන් රැසක්
තිබේ. එනම් රනින් හා රිදීයෙන් සෑදූ
ඒවා පමණක් නොව ලී සහ මැටිව-
ලින් සෑදූ ඒවාද තිබේ. සමහර බඳුන්
භාවිත කරන්නේ ගෞරවනීය අරමු-
ණක් උදෙසාය. තවත් ඒවා භාවිත
කරන්නේ එතරම් ගෞරවනීය අරමු-
ණක් උදෙසා නොවේ.[10] **21** යමෙක්
දෙවෙනුව සඳහන් කළ ඒවා හා
සමාන පුද්ගලයන්ගෙන් ඈත් වී සිටි-
යොත් ඔහුද ගෞරවනීය අරමුණක්
සඳහා භාවිත කරන බඳුනක් හා
සමාන වනු ඇත. එහෙයින් ඔහු ශුද්ධ*
මෙන්ම තම අයිතිකරුට ප්‍රයෝජ-
නයක් ගෙන දෙන සෑම යහපත්
දෙයක් සඳහාම සූදානම් වී සිටින
කෙනෙක් වනු ඇත.[11] **22** ඒ අනුව
යොවුන් වියට ආවේණික වූ ආශා-
වන් ඔබේ සිතින් පලවාහරින්න.[12] ඒ
වෙනුවට ධර්මිෂ්ඨකම,[13] විශ්වාසය,
ප්‍රේමය හා සමාදානය[14] යන දේවල්
ඔබේ ජීවිතයට එකතු කරගැනීමට
දැඩි වෑයමක් දරන්න. එලෙසම පිරි-
සිදු හදවතකින් ස්වාමීන්ට කන්නලව්
කරන අයට සමීපව සිටින්න.[15]

---

**2තිමෝ 2:21*** හෝ, "දෙවි සඳහා වෙන් කර ඇති."

**2 පරි.**
**1** ක්‍රියා 2:24, 1කොරි 15:4
**2** ක්‍රියා 28:31, රෝම 2:16
**3** ක්‍රියා 9:16, පිලි 1:7, 1පේතෘ 2:20
**4** කොලො 4:3
**5** මතෙ 22:14, 2කොරි 1:6, එෆී 3:13, කොලො 1:24
**6** කොලො 1:27, 2තෙස 2:14, 1පේතෘ 5:10
**7** 1තිමෝ 1:15
**8** රෝම 6:5, රෝම 6:8, 1තෙස 4:17
**9** එළි 3:21, එළි 20:4
**10** මතෙ 10:33, ලූක් 12:9
**11** 1තෙස 5:24, 2තෙස 3:3, එළි 3:14
**12** 2පේතෘ 1:12
**13** 1තිමෝ 1:4
**14** 2කොරි 12:3
**15** 2තිමෝ 4:1
**16** රෝම 14:18, 1තෙස 2:4
**17** 1තිමෝ 4:6
**18** තීත 2:8
**19** 2තිමෝ 4:2
**20** 1තිමෝ 4:7, 1තිමෝ 6:20
**21** 2තිමෝ 3:13

**2 තීරුව**
**1** 1කොරි 5:6
**2** 1තිමෝ 1:20
**3** 1තිමෝ 1:6
**4** 1කොරි 15:12
**5** 1තිමෝ 6:21
**6** යෙසා 28:16, හෙබ්‍රෙ 11:10
**7** ගණන් 16:5, 1කොරි 8:3
**8** යෙසා 26:13, ශෙප 3:9, ශෙප 3:12, රෝම 10:13
**9** ශෙප 3:13
**10** රෝම 9:21
**11** 2තිමෝ 3:17, තීත 3:1
**12** 1කොරි 6:18, එෆී 5:15
**13** 1තිමෝ 6:11
**14** 1පේතෘ 3:11
**15** ගලා 5:22, 1තිමෝ 1:5

**23** මීට අමතරව කිසි තේරුමක්
නැති මෝඩ ප්‍රශ්න අසන අයව ප්‍රතික්-
ෂේප කරන්න.[1] මන්ද ඒවාට සම්බන්ධ
වීමෙන් හටගන්නේ දබර පමණි.[2]
**24** ස්වාමීන්ගේ දාසයෙකු ලෙස සේ-
වය කරන කෙනෙකුට දබර කිරී-
මට අවශ්‍යතාවක් නැත.[3] ඒ වෙනුවට
ඔහු සියලුදෙනා සමඟ කටයුතු කළ
යුත්තේ මෘදුකමිනි.[4] ඔහු ඉගැන්වීමට
සුදුසුකම් ඇති,[5] නපුරු දේවල් සිදු
වන විට ඉවසාගෙන සිටීමට හැකියා-
වක් ඇති,[6] **25** යම් විරෝධතා එල්ල
කරන අයට මෘදුකමින් මඟ පෙන්වීම්
ලබා දීමට හැකියාවක් ඇති[7] කෙ-
නෙකු විය යුතුයි. සමහරවිට ඔවුන්ට
පසුතැවිලි වී[8] සත්‍යය පිළිබඳව නිවැ-
රදි දැනුමක් ලබාගැනීමට[9] දෙවි මඟ
සැලසිය හැක. **26** එහි ප්‍රතිඵලයක්
ලෙස ඔවුන්ට යක්ෂයාගේ උගුලෙන්
මිදී[10] නැවත පියවි සිහියට පැමි-
ණෙන්න හැකි වේ. මන්ද පණපිටින්
අල්ලාගත් සතුන් මෙන්[11] යක්ෂයා
තමාට කැමති දේ ඔවුන් ලවා ඉටු
කිරීමට ඔවුන්ව අල්ලාගෙන සිටියි.

**3** නමුත් අවසාන කාලයේදී[12] ඉතා
අසීරු, අනතුරු සහිත කාල-
යක් පැමිණෙන බව ඔබ දැනගත
යුතුයි.[13] **2** මන්ද මිනිස්සු තමන්
ගැනම සිතන, මුදලට ලොල් වී
සිටින, පුරසාරම් දොඩන, උඩඟු, දෙ-
විට අපහාස කරන, දෙමාපියන්ට
අකීකරු වන,[14] ස්තුතිවන්ත නො-
වන, ද්‍රෝහිකම් කරන අය[15] වනු
ඇත. **3** ඔවුහු තමන්ගේම අය කෙ-
රෙහිවත් කිසි සෙනෙහසක් නැති,[16]
කිසිම දෙයක් ගැන එකඟ නො-
වන,[17] නින්දා කරන,[18] තමන්වම
පාලනය කරගත නොහැකි, දරුණු,[19]
යහපත්කමට කිසි ඇල්මක් නො-
දක්වන,[20] **4** අනුන්ව පාවා දෙන,[21]
හිතුවක්කාර, අහංකාර,[22] දෙවිට වඩා
විනෝදයට ඇල්මක් දක්වන අය
වනු ඇත.[23] **5** මීට අමතරව මිනි-
සුන්ට පෙනෙන්න ඔවුන් දෙවි සඳහා
භක්තියකින් කටයුතු කළත්[24] ඔවුන්
ඇත්තටම ක්‍රියා කරන්නේ ඒ භක්ති-
යට පටහැනිවය.*[1] එවැනි අයගෙන්
අහක්ව සිටින්න.[2] **6** මන්ද ඔවුන්
අතරින් පැමිණෙන මිනිස්සු කපටික-
මින් අනුන්ගේ නිවෙස්වලට ඇතුල් වී[3]
එහි සිටින අයව නොමඟ යවති. ඔවුන්
තමන්ගේ ගොදුරු ලෙස හසු කරගන්-
නේ තම විශ්වාසය දුර්වල කරගෙන
ඇති ස්ත්‍රීන්වයි. එම ස්ත්‍රීන් නොයෙ-
කුත් පව්කාර ක්‍රියාවලට සම්බන්ධ වී,
විවිධාකාර වැරදි ආශාවන්ට හසු වූ
අයයි.[4] **7** ඔවුන් නිතරම ඉගෙනග-
නිමින් සිටියත් සත්‍යය පිළිබඳ නිවැ-
රදි දැනුමක් ලබාගැනීමට ඔවුන්ට
හැකි වී නැත.[5]

**8** යන්නෙස් සහ යම්බ්‍රෙස්[6] යන
දෙදෙනා මෝසෙස්ට විරුද්ධව ක්‍රියා
කළා සේම, ඒ මිනිස්සුද සත්‍ය ඉගැන්-
වීම්වලට විරුද්ධව ක්‍රියා කරති.[7]
ඔවුන්ගේ මනස් සම්පූර්ණයෙන්ම දූෂ්‍ය
වී ඇති අතර[8] සත්‍ය ඉගැන්වීම් පිළිප-
දින්නන් ලෙස ඔවුන්ට දෙවිගේ අනු-
මැතිය නැත.[9] **9** නමුත් ඔවුහු වැඩි
දුර යන්නේ නැත. මන්ද ඉහත සඳ-
හන් මිනිසුන් දෙදෙනාගේ මෝඩකම
සියලුදෙනා ඉදිරියේ පැහැදිලිව දැක-
ගත හැකි වූවා සේ ඔවුන්ගේ මෝඩක-
මද සියලුදෙනාටම ඉතා පැහැදිලිව
හෙළි වනු ඇත.[10] **10** නමුත් මා
ඉගැන්වූ දේවල්ද මා ජීවිතය ගත කළ
ආකාරයද[11] මා ජීවත් වීමට හේතුවද
මා ගොඩනඟා ගත් විශ්වාසයද මා
බොහෝ ඉවසිලිවන්තව කටයුතු කළ
ආකාරයද මා ප්‍රේමය දැක්වූ ආකාර-
යද මා විඳදරාගත් ආකාරයද හොඳින්
දැක බලා ගැනීමට ඔබට හැකි වී
ඇත. **11** එලෙසම මා අද්දුටු පීඩා,
දුක් කරදර සහ අන්තියෝකියේදී,[12]
ඉකෝනියේදී[13] හා ලිස්ත්‍රාවේදී[14] මට
විඳින්න සිදු වූ දේවල් ගැනද ඔබ දන්-
නෙහිය. ඒ සෑම පීඩාවකින්ම ස්වාමීන්
මාව ගලවාගත්තේය.[15] **12** ඇත්-
තෙන්ම ක්‍රිස්තුස් යේසුස්ගේ අනුගාමි-
කයන් ලෙස දෙවිට භක්තියක් ඇතුව

**2 පරි.**
1 1තිමෝ 1:4; 1තිමෝ 4:7; තිත 3:9
2 ක්‍රියා 23:9
3 තිත 1:7
4 1තෙස 2:7
5 1තිමෝ 3:2
6 මතෙ 5:39
7 හිතෝ 15:1; ලූක් 17:3; ගලා 6:1; තිත 3:2; 1පේතෘ 3:15
8 ක්‍රියා 11:18
9 1තිමෝ 2:4
10 2කොරි 2:11; 1තිමෝ 3:7
11 ගීතා 124:7; යොහ 13:27; ක්‍රියා 5:3; 1තිමෝ 1:20

**3 පරි.**
12 යෙරෙ 23:20; දානි 10:14; මතෙ 24:3; යූද් 18
13 1තිමෝ 4:1; 2පේතෘ 3:3
14 ද්වි 21:18; හිතෝ 30:17; එෆී 6:2
15 රෝම 1:30; 1තිමෝ 1:9
16 රෝම 1:31
17 රෝම 1:31
18 එස 22:9; තිත 2:3
19 මතෙ 8:28
20 මීකා 3:2
21 ක්‍රියා 7:52
22 1තිමෝ 6:4
23 පිලි 3:19; යූද් 19
24 මතෙ 7:15; මතෙ 7:22; 2තිමෝ 4:4

**2 තීරුව**
1 තිත 1:16
2 2කොරි 6:14; 2තෙස 3:6
3 තිත 1:11; 2පේතෘ 2:3; යූද් 4
4 1තිමෝ 5:11
5 1තිමෝ 4:3
6 නික් 7:11
7 ක්‍රියා 13:8
8 රෝම 1:28; 1තිමෝ 6:5
9 2තෙස 3:2
10 නික් 7:12; නික් 9:11
11 1කොරි 4:17; 2තිමෝ 1:13
12 ක්‍රියා 13:50
13 ක්‍රියා 14:5

**14** ක්‍රියා 14:19; **15** 2කොරි 1:10.

**2තිමෝ 3:5*** මූ.අ., “එහි බලයට විරුද්ධවය.”

තම ජීවිතය ගත කිරීමට ආශා-
වෙන් සිටින සියලුදෙනාටම අනිවාර්-
යයෙන්ම පීඩා විඳින්න සිදු වෙයි.[1]
**13** ඒ අතරේ දුෂ්ට මිනිසුන් සහ ප්‍රෝ-
ඩාකාරයන් තව තවත් නරක අතට
හැරෙමින් අනුන්ව නොමඟ යවන
අතර ඔවුහුද නොමඟ යනු ඇත.[2]

**14** නමුත් ඔබ, ඔබ ඉගෙනගෙන
මුළු සිතින් විශ්වාස කිරීමට පෙලඹුණු
දේවල් දිගටම පිළිපදින්න.[3] මන්ද ඒ
දේවල් ඔබට ඉගැන්වූ අයව සැක
කිරීමට ඔබට කිසි හේතුවක් නැත.[4]
**15** එසේම ඔබේ ළදරු කාලයේ
පටන්[5] ඔබ ශුද්ධ ලියවිල්ල ගැන
අවබෝධයක් ලබාගත් ආකාරය ඔබ
දන්නෙහිය. ක්‍රිස්තුස් යේසුස් කෙරෙහි
ඔබට තිබෙන විශ්වාසය[6] මෙන්ම ඔබ
ලබාගත් ඒ අවබෝධයද ඔබේ ගැලවී-
මට මඟ පාදනු ඇත.[7] **16** මුළු ශුද්ධ
ලියවිල්ලම ලියා තිබෙන්නේ දෙවිගේ
මඟ පෙන්වීම තුළිනි.[8] එය ඉගැන්වී-
මටත්[9] අවවාද කිරීමටත්[10] කාරණා
නිවැරදි කිරීමටත්[11] ධර්මිෂ්ඨකමින්
හික්මවීම් ලබා දීමටත්[12] ප්‍රයෝජන-
වත්ය. **17** එමගින් දෙවිට විශ්වාස-
වන්තව සිටින මිනිසා සියලු දේ
කිරීමට සමත් කෙනෙක්[13] එනම්, සෑම
යහපත් ක්‍රියාවක් කිරීම සඳහා සැදී
පැහැදී සිටින කෙනෙක්[14] වනු ඇත.

**4** මම ඔබට ඉතා බැරෑරුම් කාරණා-
යක් ගැන උපදෙස් දීමට කැමැත්-
තෙමි. මා ඒ දේ කරන්නේ දෙවි
ඉදිරියෙහි සහ තමා එළිදරව් වන
අවස්ථාවේදීත්[15] තම රාජ්‍යය මාර්ග-
යෙනුත්[16] ජීවත් වන අයවද මිය ගොස්
ඇති අයවද[17] විනිශ්චය කිරීමට නිය-
මිතව[18] සිටින ක්‍රිස්තුස් යේසුස් ඉදිරි-
යෙහිය. **2** දෙවිගේ පණිවිඩය ගැන
දේශනා කරන්න.[19] හොඳ වාතාවරණ-
යක් තිබුණත්[20] නැතත්[21] එම කාර්-
යයෙහි නොකඩවා උදාසීන නොවී
උද්‍යෝගයෙන් නිරත වන්න. බො-
හෝ ඉවසිලිවන්තකමින්[22] හා දක්ෂ
ලෙස ඉගැන්වීමෙන් අවවාද,[23] සෘජු
උපදෙස් සහ දිරිගැන්වීම් ලබා දෙන්න.
**3** මන්ද මිනිසුන් නිවැරදි මෙන්ම
ප්‍රයෝජනවත් ඉගැන්වීම් කිසි ලෙ-
සකින්වත් පිළි නොගන්නා කාලයක්
ඉදිරියේදී පැමිණෙයි.[1] ඒ කාලයේදී
ඔවුන් කැමති වන්නේ ඔවුන්ගේම
ආශාවන් පිනවන, ඔවුන්ගේ කන්වලට
මිහිරි දේවල් කියන ගුරුවරුන්ටය.[2]
**4** ඔවුහු සත්‍ය ඉගැන්වීම්වලට කන්
නොදී, එයින් ඉවත් වී බොරු කතා-
වලට හැරී යනු ඇත.[3] **5** නමුත්
ඔබ සෑම අවස්ථාවකදීම සිහිකල්ප-
නාවෙන් කටයුතු කරන්න.[4] නපුරු
දේවල් ඉවසා දරාගන්න.[5] ශුභාරං-
චිය දේශනා කරන කෙනෙකුගේ කාර්-
යයෙහි නිරත වන්න.[6] ඔබට පවරා
ඇති දේවසේවය සම්පූර්ණයෙන්ම ඉටු
කරන්න.[7]

**6** මා වත් කරනු ලබන වයින්
පූජාවක් හා සමානය.*[8] මා නිදහස
ලබන මොහොතද[9] ඉතා ආසන්නය.
**7** මම යහපත් සටනට සහභාගි
වූවෙමි.[10] එය අවසන් වන තුරුම
සටන් කළෙමි. මගේ ධාවන තරඟයද
නිම කළෙමි.[11] මම සත්‍ය ඉගැන්වීම්
පිළිපැද්දෙමි.[12] **8** ධර්මිෂ්ඨකම හිමි
කර දෙන ඔටුන්න මෙතැන් සිට මා
වෙනුවෙන්ම වෙන් කර තිබේ.[13] ධර්-
මිෂ්ඨ විනිශ්චයකරුවෙක්[14] වන ස්වා-
මීන් මට ඒ ඔටුන්න[15] තම විනිශ්චය
ඉටු කරන දවසේදී[16] ලබා දෙයි. එය
මට පමණක් නොව ඔහු එසේ එළිදරව්
වන අවස්ථාව එන තුරු මහත් ආශා-
වකින් බලා සිටින සියලුදෙනාටම හිමි
වනු ඇත.

**9** හැකි ඉක්මනින් මා සිටින
තැනට එන්න උත්සාහ දරන්න.[17]
**10** මන්ද පවතින සමාජයේ දේව-
ලට ඇලුම් වූ[18] දේමස්[19] මාව අත්-
හැර තෙසලෝනිකයට ගොස් ඇත.
ක්‍රෙසෙන්ස් ගලාතියටද[20] තීතස් දල්-
මතියාවටද ගොස් ඇත. **11** දැන්

**3 පරි.**
**1** මතෙ 16:24
යොහ 15:20
ක්‍රියා 14:22
**2** 2තෙස 2:11
1තිමෝ 4:1
**3** 2තිමෝ 1:13
**4** 2තිමෝ 2:2
**5** හිතෝ 22:6
ක්‍රියා 16:1
**6** යොහ 20:31
**7** හිතෝ 2:1
යොහ 5:39
**8** යොහ 14:26
2පේතෲ 1:21
**9** රෝම 15:4
**10** හිතෝ 3:12
යොහ 16:8
තීත 1:9
**11** 1කොරි 10:11
**12** හෙබ්‍රෙ 12:5
**13** 2තිමෝ 2:21
**14** 1තිමෝ 6:11

**4 පරි.**
**15** 1තිමෝ 6:15
1පේතෲ 5:4
**16** එළි 11:15
එළි 12:10
**17** යොහ 5:28
ක්‍රියා 10:42
**18** යොහ 5:22
ක්‍රියා 17:31
2කොරි 5:10
**19** මතෙ 28:20
ලූක් 9:2
ක්‍රියා 20:20
**20** ක්‍රියා 9:31
ක්‍රියා 28:31
**21** ක්‍රියා 8:4
**22** 2තිමෝ 2:25
**23** 1තිමෝ 5:20
තීත 1:9
තීත 1:13
තීත 2:15

**2 තීරුව**
**1** 1තිමෝ 1:3
1තිමෝ 1:10
1තිමෝ 4:1
**2** ක්‍රියා 17:21
**3** තීත 1:14
2පේතෲ 1:16
**4** 1තෙස 5:6
**5** 2තිමෝ 1:8
2තිමෝ 2:3
**6** රෝම 10:15
**7** රෝම 15:19
කොලො 1:25
**8** නික් 29:40
**9** පිලි 1:23
**10** 1කොරි 9:26
1තිමෝ 6:12
**11** පිලි 3:14
**12** ලූක් 11:28
යොහ 17:6
**13** 1කොරි 9:25
යාකො 1:12
**14** යොහ 5:22
**15** එළි 2:10

**16** 1පේතෲ 5:4; **17** 2තිමෝ 1:4; **18** රෝම 12:2;
**19** කොලො 4:14; පිලෙ 24; **20** ගලා 1:2.

**2තිමෝ 4:6*** පාවුල් මෙසේ පවසන්නේ සෙසු
ක්‍රිස්තියානීන් වෙනුවෙන් ඇපකැප වී සේවය කිරී-
මට තමන්ට තිබෙන ආශාව විස්තර කිරීමටය.

මා සමඟ සිටින්නේ ලූක් පමණි.
ඔබ පැමිණෙන විට මාක්වද රැගෙන
එන්න. මන්ද ඔහු මා වෙනුවෙන්
ඉතා වටිනා සේවයක් ඉටු කරයි.[1]
**12** මම තිකිකස්ව[2] එෆීසයට යැව්-
වෙමි. **13** ත්‍රෝවස්හිදී[3] කාපස් ළඟ
මා තබා ආ කබාය සහ ලියවිලි,
විශේෂයෙන්ම සම් ලියවිලි ඔබ මෙහි
එන විට රැගෙන එන්න.

**14** මට බොහෝ සෙයින් පීඩා
කළ කෙනෙකු වන්නේ ඇලෙක්සැන්-
ඩර්[4] නමැති තඹකරුවාය. ඔහු කළ
දේට ප්‍රතිඵල ඔහුට යෙහෝවා දෙ-
විගෙන්ම ලැබෙනු ඇත.[5] **15** ඔබත්
ඔහුගෙන් පරෙස්සම් වන්න. මන්ද ඔහු
අප පැවසූ දේවලට දැඩි විරෝධයක්
දැක්වූවේය.

**16** මට විරුද්ධව දමනු ලැබූ නඩුව
සඳහා පළමු වතාවට පෙනී සිටීමට
මට සිදු වූ විට කිසිවෙකු මා ළඟ සිටි-
යේ නැත. සියලුදෙනාම මාව අත්හැර
ගියෝය.[6] එසේවුවත් ඒ සඳහා ඔවුන්ට
දඬුවමක් නොලැබේවා![7] **17** නමුත්
ස්වාමීන් මා ළඟ සිටිමින්[8] මාව
බලවත් කළේය.[9] ප්‍රතිඵලයක් ලෙස
දේශනා කිරීමේ කටයුත්ත සම්පූර්-
ණයෙන්ම ඉටු කිරීමට මට හැකි
වූ අතර එයට සවන් දීමට සියලුම
ජාතීන්ට අවස්ථාවක් ලැබිණ.[1] මාව
සිංහයන්ගේ කටින්ද ගලවනු ලැබීය.[2]
**18** ස්වාමීන් මාව සෑම නපුරු දෙය-
කින්ම ගලවා[3] ස්වර්ගයේ පිහිටි තම
රාජ්‍යයට මාව ගෙන යමින් මට ගැල-
වීම ලබා දෙනු ඇත.[4] සියලුම ප්‍රශං-
සාවත් ගෞරවයත් ඔහුට සදහටම
ලැබේවා! ආමෙන්.*

**19** ප්‍රිස්කා[5] සහ අකිලාටද ඔනෙසි-
ෆරස්ගේ නිවසේ සිටින සියලුදෙනා-
ටද[6] මගේ සුබ පැතුම් දෙන්න.

**20** එරස්ටස්[7] කොරින්තියේ[8] නැව-
තුණේය. නමුත් ත්‍රොෆිමස්[9] අසනීප-
යෙන් සිටි නිසා මම ඔහුව මිලේටස්හි[10]
නවතා ආවෙමි. **21** ශීත කාලයට
කලින් මාව හමු වීමට උපරිම උත්සා-
හයක් දරන්න.

යුබියුලස් ඔහුගේ සුබ පැතුම් ඔබට
එවයි. පූදෙන්ස්ද ලීනස්ද ක්ලෝඩියාද
අන් සියලු සහෝදරයෝද මේ සමඟ
ඔබට සුබ පැතුම් එවති.

**22** යහපත් ආකල්පයක් ඇතුව
සිටින ඔබට ස්වාමීන්ගේ ආශීර්වාදය
නිරතුරුවම ලැබේවා![11] ඔහු පෙන්-
වන මහත් කරුණාව ඔබ සැම සමඟ
වේවා!

---

**2තිමෝ 4:18*** එනම්, එසේම වේවා!

**4 පරි.**
**1** ෆිලෙ 11
**2** එෆී 6:21; කොලො 4:7
**3** ක්‍රියා 16:8
**4** 1තිමෝ 1:20
**5** ගීතා 28:4; ගීතා 62:12; හිතෝ 24:12
**6** 2තිමෝ 1:15
**7** රෝම 4:8; 1කොරි 13:5
**8** ක්‍රියා 23:11; ක්‍රියා 27:23
**9** පිලි 4:13

**2 තීරුව**
**1** ක්‍රියා 9:15
**2** ගීතා 22:21; 1පේතෘ 5:8
**3** 2පේතෘ 2:9
**4** දානි 2:44; එළි 20:4
**5** රෝම 16:3
**6** 2තිමෝ 1:16
**7** ක්‍රියා 19:22
**8** 1කොරි 1:2
**9** ක්‍රියා 21:29
**10** ක්‍රියා 20:15
**11** ගලා 6:18; ෆිලෙ 25

# තීතස්ට
## ලියූ ලිපිය

**1** මෙම ලිපිය ලියන පාවුල්
වන මම දෙවිගේ දාසයෙකු[1]
හා යේසුස් ක්‍රිස්තුස්ගේ නියෝජිත-
යෙක්*[2] වෙමි. එසේ සේවය කරන
මා තුළද දෙවි තෝරාගත් අය[3] තුළ
තිබෙන විශ්වාසයට සමාන විශ්වා-
සයක් තිබේ. එලෙසම දේවභක්ති-
යෙන් ජීවත් විය යුතු ආකාරය[4]
පැහැදිලි කර දෙන සත්‍ය ඉගැන්-
වීම් පිළිබඳ[1] ඔවුන්ට තිබෙන නිවැරදි
දැනුමද[2] මා සතුය. **2** ඊට පදනම
වී තිබෙන්නේ කිසි බොරුවක් නො-
පවසන[3] දෙවි විසින් බොහෝ කල-
කට පෙර[4] පොරොන්දු වූ සදාකාල
ජීවනය[5] නමැති බලාපොරොත්තුවය.
**3** දෙවි තමා නියම කළ කාලයේදී
තම පණිවිඩය දේශනා සේවය තුළින්

---

**තීත 1:1*** හෝ, “යවනු ලැබූවෙක්.”

**4** යෙසා 53:11; රෝම 16:25; 2තිමෝ 1:9; **5** රෝම 5:21; රෝම 6:23.

**1 පරි.**
**1** රෝම 12:11; යාකො 1:1
**2** කොලො 1:1
**3** 2තිමෝ 2:10
**4** 1තිමෝ 6:3; 2පේතෘ 1:3

**2 තීරුව**
**1** යොහ 8:32; 3යොහ 4
**2** 2තිමෝ 2:25
**3** ගණන් 23:19; හෙබ්‍රෙ 6:18

එළිදරව් කළ අතර අපට ගැලවීම
සලසා දෙන ඔහු[1] ඒ සේවය මටද භාර
දුන්නේය.[2] 4 මා මෙම ලිපිය ලියන්-
නේ අප හා සමාන විශ්වාසයක් ඇති
සැබෑ පුත්‍රයෙකු[3] වන තීතස් වෙතටය.
පියාණන්[4] වන දෙවිගෙන්ද අපගේ
ගැලවුම්කරු[5] වන ක්‍රිස්තුස් යේසුස්-
ගෙන්ද ඔබට මහත් කරුණාවත් සමා-
දානයත් ලැබේවා!
5 මා ඔබව ක්‍රීට් දූපතෙහි[6] නවතා
ආවේ යම් හේතුවක් ඇතුවය. එමනිසා
මා ඔබට උපදෙස් දුන් ලෙස[7] නිසි
ලෙස සිදු නොවන දේවල් ඔබ නිවැරදි
කළ යුතු අතර සෑම නුවරක් නුව-
රක් පාසාම වැඩිමහල්ලන් පත් කළ
යුතුයි.[8] 6 එසේ පත් කරන පුරුෂ-
යන් චෝදනාවලින් නිදහස් අය[9] විය
යුතු අතර ඔවුන්ට සිටිය යුත්තේ එක්
භාර්යාවක් පමණි.[10] ඔවුන්ගේ දරුවන්
නොහික්මුණු ආකාරයකින් හැසිරෙන
හිතුවක්කාර දරුවන් නොවිය යුතු
අතර දෙවි කෙරෙහි විශ්වාසයක් ඇති
අය විය යුතුයි.[11] 7 මන්ද දෙවිගේ
සේවකයෙකු*[12] ලෙස සභාව රැක-
බලා ගන්නා කෙනෙකු චෝදනාව-
ලින් නිදහස් කෙනෙකු විය යුතුයි.[13]
ඔහු හිතුමතේට කටයුතු නොක-
රන,[14] ඉක්මනින් කෝප නොවන,[15]
බීමත් වී දබරවලට පැටලෙන්නේ
නැති,[16] ගහගන්නෙකු නොවන,[17]
අයුතු ලෙස ලාභ ලබාගැනීමට කෑද-
රකමින් කටයුතු නොකරන කෙ-
නෙකු[18] විය යුතුයි. 8 එලෙසම ඔහු
ආගන්තුක සත්කාරශීලී,[19] යහපත්ක-
මට ඇලුම් වී සිටින, හොඳ සිහිකල්ප-
නාවෙන් වැඩ කරන,[20] ධර්මිෂ්ඨ,
දෙවිට ළැදි,[21] තමාවම පාලනය
කරගත හැකි පුද්ගලයෙකු[22] විය
යුතුයි. 9 මීට අමතරව ඔහු දක්ෂ
ලෙස උගන්වමින් සත්‍ය පණිවිඩ-
යට තදින් ඇලී සිටින කෙනෙකුද[23]
විය යුතුයි. එසේ කිරීමෙන් නිවැරදි
මෙන්ම ප්‍රයෝජනවත් ඉගැන්වීම් යො-
දාගෙන උපදෙස් සහ මඟ පෙන්වීම්
ලබා දීමටත්[1] ඊට විරෝධය දක්වන
අයට අවවාද ලබා දීමටත්[2] ඔහුට
හැකියාවක් ලැබෙනු ඇත.
10 මන්ද නොහික්මුණු, කිසි තේ-
රුමක් නැති කතා කියන,[3] අන් අයව
නොමඟ යවන බොහෝදෙනෙක්
සිටිති. ඔවුන් අතර විශේෂයෙන්ම
සිටින්නේ චර්මච්ඡේදනය කිරීමේ පිළි-
වෙතට ඇලී සිටින අයයි.[4] 11 ඒ
මිනිසුන් අයුතු ලෙස යම් වාසි ප්‍රයෝ-
ජන ලබාගැනීමේ අදහසින් නුසුදුසු
දේවල් උගන්වා[5] බොහෝදෙනෙකු-
ගේ විශ්වාසයට දැඩි හානි සිදු කරන
නිසා සමහරුන් පවුල් පිටින්ම වැටී
ගොස් ඇත.[6] එමනිසා එවැනි දේවල්
කරන අයව සම්පූර්ණයෙන්ම නිශ්-
ශබ්ද කළ යුතුයි. 12 ඔවුන්ගේම
දිවැසිවරයෙකු* පැවසුවේ, “ක්‍රීට්ව-
රුන් කවදත් බොරුකාරයෝය. ඔවුහු
දරුණු[7] මෘගයෝය. කාලය කා දමන
කෑදරයෝය” කියාය.
13 ඒ කියමනෙහි යම් සැබෑවක්
ගැබ්ව ඇත. එහෙයින් නිරතුරුවම
ඔවුන්ට තදින් අවවාද කරන්න.[8] එසේ
කළොත් සත්‍ය ඉගැන්වීම් කෙරෙහි
ඔවුන්ට තිබෙන විශ්වාසයට කිසි
තර්ජනයක් එල්ල නොවන අතර,[9]
14 ඔවුන් යුදෙව් ප්‍රබන්ධ කථාවලට-
වත්[10] සත්‍ය ඉගැන්වීම්වලින් අහක්ව
යන[11] මිනිසුන් අණ කරන දේ-
වලටවත්[12] කන් දෙන්නේ නැත.
15 පවිත්‍ර අයට සියලු දේ පවිත්‍රය.[13]
නමුත් අපවිත්‍ර[14] මෙන්ම විශ්වාස-
යක් නැති අයට[15] කිසි දෙයක් පවිත්‍ර
නැත. ඔවුන්ගේ මනසත් හෘදය සාක්-
ෂියත්[16] අපවිත්‍රය. 16 තමන් දෙවිව
දන්නා බව ඔවුන් ප්‍රසිද්ධියේ කියා සිටි-
යත්[17] ඔවුන්ගේ ක්‍රියාවලින් ඔප්පු වන්-
නේ ඔවුන් දෙවිව ප්‍රතික්ෂේප කරන
බවය.[18] මන්ද ඔවුහු පිළිකුල්සහ-
ගත මෙන්ම අකීකරු පුද්ගලයන් වන
අතර කිසි යහපත් ක්‍රියාවක් කිරීමට
තරම් සුදුසු අය නොවෙති.[19]

---

තීත 1:7* හෝ, “නිවස භාර සේවකයෙකු.”

තීත 1:12* මොහු ක්‍රි.පූ. හයවෙනි සියවසේ විසූ එපිමෙනිදීස් නම් ක්‍රීට් ජාතික කවියෙකි.

---

**1 පරි.**
1 ක්‍රියා 9:15
2 1තෙස 2:4
3 1තිමෝ 1:2
4 රෝම 1:7
5 2පේත 1:11
6 ක්‍රියා 27:7
7 1තිමෝ 6:13
8 ක්‍රියා 14:23
9 1කොරි 1:8
10 1තිමෝ 3:2
11 1තිමෝ 3:4
12 1කොරි 4:2
1කොරි 9:17
13 1තිමෝ 3:10
14 2පේත 2:10
15 රෝම 12:19
යාකො 1:19
16 1තිමෝ 3:3
17 හිතෝ 23:35
18 1තිමෝ 3:8
19 1පේත 4:9
20 රෝම 12:3
1තිමෝ 3:2
තීත 2:2
21 එපි 4:24
1තිමෝ 2:8
22 ගීතා 119:101
2තිමෝ 2:24
යාකො 3:13
23 1තිමෝ 4:16
1තිමෝ 6:3
යාකො 3:1

**2 තීරුව**
1 1තිමෝ 1:10
2තිමෝ 1:13
2 හිතෝ 6:23
එපි 5:11
1තිමෝ 5:20
2තිමෝ 4:2
තීත 1:13
එළි 3:19
3 රෝම 16:18
1තිමෝ 1:6
4 ක්‍රියා 15:1
5 1තිමෝ 6:5
1පේත 5:2
6 2තිමෝ 3:6
7 තීත 3:2
8 2කොරි 13:10
එපි 5:11
තීත 1:9
9 තීත 2:2
10 1තිමෝ 4:7
2තිමෝ 4:4
2පේත 1:16
11 ගලා 4:9
2පේත 2:22
12 මතෙ 15:9
13 රෝම 14:14
14 මතෙ 15:11
ලූක් 11:39
15 2තෙස 3:2
16 1කොරි 8:7
1තිමෝ 1:5
17 පිලි 1:17
2තිමෝ 3:5
18 මතෙ 7:16
2තිමෝ 3:2
19 2තිමෝ 3:8

**2** නමුත් ඔබ, නිවැරදි මෙන්ම
ප්‍රයෝජනවත්[1] ඉගැන්වීම්වලට
එකඟ දේවල් ගැන නිරතුරුවම
කතා කරන්න. **2** වැඩිහිටි පුරුෂ-
යන්[2] තම සීමාව අවබෝධ කර-
ගෙන ක්‍රියා කරන, ගෞරවනීයව
හැසිරෙන,[3] හොඳ සිහිකල්පනාවෙන්
වැඩ කරන, ශක්තිමත් විශ්වාස-
යක්[4] හා නොසැලෙන ප්‍රේමයක් ඇති,
අධෛර්යය නොවී සියල්ල විඳදරා-
ගන්නා අය[5] විය යුතුයි. **3** එලෙසම
වැඩිහිටි ස්ත්‍රීන්[6] දෙවිට ගෞරවයක්
ගෙන දෙන ආකාරයකින් හැසිරෙන,
අනුන්ව අපහාසයට ලක් නොක-
රන,[7] බොහෝ වයින් පානයට ඇබ්-
බැහි නොවූ, යහපත් දේවල් උගන්වන
අය විය යුතුයි. **4** ඔවුන් එලෙස
කටයුතු කළොත් අසිහියෙන් ක්‍රියා
කරන තරුණ ස්ත්‍රීන්ට අවබෝධ-
යෙන් ක්‍රියා කිරීමට අවශ්‍ය උපකාර
ලබා දීමට හැකි වන අතර එමගින්
ඔවුන් තම ස්වාමිපුරුෂයන්ට ප්‍රේම
කිරීමටත්[8] තම දරුවන්ට ප්‍රේම කිරී-
මටත්,[9] **5** හොඳ සිහිකල්පනාවෙන්
වැඩ කිරීමටත් පවිත්‍ර චරිතයක් ඇතුව
සිටීමටත්[10] ගෙදරදොරේ වැඩකටයුතු
සාර්ථකව ඉටු කිරීමටත් යහපත්ක-
මින් ක්‍රියා කිරීමටත් තම ස්වාමිපුරුෂ-
යන්ට යටත්ව සිටීමටත්[11] පෙලඹෙනු
ඇත. එවිට කිසි කෙනෙකුට දෙවි-
ගේ පණිවිඩය නින්දාවට ලක් කිරීමට
අවස්ථාවක් ලැබෙන්නේ නැත.[12]

**6** එලෙසම තරුණයන්ට හොඳ
සිහිකල්පනාවෙන් කටයුතු කිරී-
මට නිරතුරුව උනන්දු කරන්න.[13]
**7** සෑම කාරණයකදීම ඔබ යහපත්
ක්‍රියාවල නිරත වෙමින් ආදර්ශයක්
වන්න.[14] ඔබ උගන්වන දේවල[15] කිසි
දෝෂයක් නොතිබිය යුතු අතර[16] ඔබ
ගෞරවනීයව හැසිරෙන, **8** කිසිම
චෝදනාවකට ලක් නොවන, ඔබින
ආකාරයකින් කතා කරන කෙනෙකු
බව පෙන්වන්න.[17] එවිට අපට විරුද්-
ධව සිටින අයට අප ගැන කිසි
නින්දාසහගත දෙයක් පැවසීමට පද-
නමක් නොලැබෙන නිසා ඔවුන් ලැජ්-
ජාවට පත් වනු ඇත.[1] **9** දාසයන්[2]
තම අයිතිකරුවන්ට සෑම දෙයක-
දීම යටත්ව සිටිය යුතුයි.[3] ඔවුන්
තම ස්වාමිවරුන්ව සතුටු කරන,
එකට එක නොකියන,[4] **10** සොර-
කම් නොකරන අය[5] විය යුතු අතර
සෑම කාරණකදීම විශ්වාසවන්තව
කටයුතු කරන අය විය යුතුයි.[6]
එසේ කිරීමෙන් අපට ගැලවීම සලසා
දෙන දෙවිගේ[7] ඉගැන්වීම්වල වටිනා-
කම පෙන්වීමට ඔවුන්ට හැකි වෙයි.

**11** මන්ද සෑම තරාතිරමකම
සිටින මිනිසුන්ට[8] ගැලවීම ගෙන
දෙන[9] දෙවිගේ මහත් කරුණාව[10] එළි-
දරව් වී ඇත.[11] **12** එමගින් අපට
කාවද්දනු ලබන්නේ අප දෙවිට අගෞ-
රවයක් ගෙන දෙන ක්‍රියා[12] හා පව්-
කාර ආශාවන්[13] ප්‍රතික්ෂේප කළ යුතු
බවත් පවතින මේ සමාජය තුළ[14]
හොඳ සිහිකල්පනාවෙන්, ධර්මිෂ්ඨ-
කමින් හා දේවභක්තියෙන්[15] ජීවත්
විය යුතු බවත්ය. **13** ඒ අතරතුරේදී
අපගේ ප්‍රීතිමත් බලාපොරොත්තුව[16]
ඉටු වන අවස්ථාවද ශ්‍රේෂ්ඨ දෙවි සහ
අපගේ ගැලවුම්කරු වන ක්‍රිස්තුස් යේ-
සුස් මහත් තේජසකින් පෙනී සිටින
අවස්ථාවද[17] පැමිණෙන තුරු අපි
බලාගෙන සිටිමු. **14** ක්‍රිස්තුස් තම
ජීවිතය පූජා කළේ[18] අප වෙනුවෙන්ය.
ඔහු එසේ කළේ අධර්මිෂ්ඨ ක්‍රියාවලට
වහල් වූ ජීවිතයකින් අපව නිදහස්
කර[19] තමා වෙනුවෙන්ම තෝරා-
ගත්,[20] යහපත් ක්‍රියා කිරීමට උද්‍යෝ-
ගයෙන් සිටින සෙනඟක් ලෙස[21] අපව
පවිත්‍ර කිරීම සඳහාය.[22]

**15** ඒ දේවල් ගැන දිගටම කතා
කරන්න. එලෙසම ඔබට ලබා දී
තිබෙන අධිකාරියට එකඟව උප-
දෙස්, මඟ පෙන්වීම් සහ අවවාද ලබා
දෙන්න.[23] ඔබව පහත් කර සැල-
කීමට[24] කිසි කෙනෙකුට ඉඩ නො-
දෙන්න.

**3** ආණ්ඩුවල බලධාරීන්ට කීක-
රුව[25] යටත්ව සිටීමටත්[26] ඕනෑම
යහපත් ක්‍රියාවක් කිරීමට සූදානම් වී

---

**2 පරි.**
1 1තිමෝ 4:16 2තිමෝ 1:13
2 1තිමෝ 5:1
3 1තිමෝ 3:8
4 තීත 1:13
5 මතෙ 24:13
6 1තිමෝ 5:2
7 1තිමෝ 3:11
8 1පේතෘ 3:1
9 එෆී 6:4
10 යාකො 3:17 1පේතෘ 3:2
11 උත් 3:16 1කොරි 14:34
12 1තිමෝ 6:1 2තිමෝ 2:15
13 රෝම 12:3 1පේතෘ 5:5
14 1තිමෝ 6:18
15 2තිමෝ 2:15
16 එෆී 6:24
17 කොලො 3:8 1තිමෝ 6:3

**2 තීරුව**
1 1පේතෘ 2:15
2 එෆී 6:5
3 1පේතෘ 2:18
4 1තිමෝ 6:1
5 එෆී 4:28
6 මතෙ 5:16 හෙබ්‍රෙ 13:18
7 1තිමෝ 2:3
8 ගලා 3:28 1තිමෝ 2:4
9 රෝම 5:18
10 යොහ 1:17
11 1තිමෝ 3:16
12 1තෙස 4:7
13 1යොහ 2:16
14 රෝම 12:2
15 1තිමෝ 6:6
16 1පේතෘ 1:13 1පේතෘ 1:21
17 හබ 3:3
18 මතෙ 20:28 1තිමෝ 2:6 1පේතෘ 1:19
19 ගලා 1:4 එෆී 1:7 කොලො 1:14
20 ද්වි 7:6 1පේතෘ 2:9
21 එෆී 2:10
22 හෙබ්‍රෙ 9:14
23 2තිමෝ 4:2
24 1තිමෝ 4:12

**3 පරි.**
25 දානි 6:5 මාක් 12:17 1පේතෘ 2:13
26 රෝම 13:1 හෙබ්‍රෙ 13:17

සිටීමටත්[1] ඔවුන්ට නිරතුරුවම සිහි-
ගැන්විය යුතුයි. **2** එලෙසම කිසි-
වෙකු ගැන නින්දාසහගත ලෙස කතා
නොකිරීමටත් නිතරම ආරවුල්වලට
පැටලෙන අය නොවීමටත්[2] සාධාර-
ණව කටයුතු කිරීමටත්[3] සියලුදෙනා
සමඟ නිතරම මෘදුකමින් කටයුතු
කිරීමටත්[4] ඔවුන්ට සිහිගන්වන්න.
**3** වරක් අප පවා කටයුතු කළේ
අඥාන හා අකීකරු අය ලෙසය. අප
නොමඟ ගොස් සිටි අතර විවිධාකාර
ආශාවන් හා තෘෂ්ණාවලට වහල් වී
සිටියෙමු. එමනිසා නොයෙක් ආකාර-
යේ නපුරු දේවල් කරමින් ඊර්ෂ්‍යා-
වෙන් කටයුතු කළ අපි, එකිනෙකාට
වෛර කරමින් පිළිකුල්සහගත ජීවිත-
යක් ගත කළෙමු.[5]

**4** නමුත් ගැලවීම සලසා දෙන[6]
අපගේ දෙවි මිනිසුන් වෙනුවෙන් කරු-
ණාව[7] සහ ප්‍රේමය පෙන්වූ විට,[8]
**5** ගැලවීමට මඟක් අපට ලැබිණ.
එය අප කළ[9] ධර්මිෂ්ඨ ක්‍රියා නිසා
ලැබුණු දෙයක් නොවේ.[10] ඔහු අපට
පෙන්වූ දයාව නිසා ලැබුණු දෙයකි.[11]
එහෙයින් අපව දියෙන් සෝදා පිරිසිදු
කරන්නා සේ[12] ඔහු අපව පවිත්‍ර කර
අපට අලුත් ජීවිතයක් ලබා දී[13] ඔහු-
ගේ බලයෙන් අපව අලුත් කළේය.[14]
**6** ඔහු ඒ බලය අපගේ ගැලවුම්කරු
වන යේසුස් ක්‍රිස්තුස් මාර්ගයෙන් අපට
ඉතා ත්‍යාගශීලීව ලබා දුන්නේය.[15]
**7** ඔහු එසේ කළේ තම මහත් කරු-
ණාවෙන්[16] අපව ධර්මිෂ්ඨයන් ලෙස
ප්‍රකාශ කළ පසු[17] සදාකල් ජීවත් වීමේ
බලාපොරොත්තුව[18] නමැති උරුමය
සතු පුද්ගලයන් වීමේ ප්‍රස්තාව[19] අපට
උදා කර දීම සඳහාය.

**8** ඉහත සඳහන් දේවල් සැබෑය.[20]
එහෙයින් ඒ දේවල් ගැන ඔබ නිසැක-
කමින් යුතුව නිරතුරුවම කතා කර-
නවාට කැමැත්තෙමි. එසේ කිරීමෙන්
දෙවි කෙරෙහි විශ්වාසය තබා සිටින
අය තම මනස් යහපත් ක්‍රියා වෙ-
නුවෙන් යොමු කර තබනු ඇත.[21]
එයින් සියලුදෙනාටම යහපතක් හා
ප්‍රයෝජනයක් සැලසෙයි.

**9** නමුත් කිසි තේරුමක් නැති
වාදවිවාදවලින්,[1] පෙළපත් ගැන
සොයා බැලීමට කාලය ගැනීමෙන්,[2]
අඬදබරවලින්,[3] නීතිය ගැන ඇති
වන මතභේදවලින් වැළකී සිටින්න.[4]
එවැනි දේවල් කිසි ප්‍රයෝජනයක්
නැති පුහු දේවල්ය. **10** යම් කෙ-
නෙක් ඔබ අතරෙහි බොරු ඉගැන්-
වීම් පතුරනවා නම්[5] ඔහුට එක්
වරක් පමණක් නොව දෙවරක් වුවත්
උපදෙස් සහ මඟ පෙන්වීම් ලබා
දෙන්න.[6] ඔහු ඒ දේ පිළිගන්නේ
නැත්නම් ඔහුව සම්පූර්ණයෙන්ම ඈත්
කරන්න.[7] **11** මන්ද එවැනි කෙ-
නෙක් නොමඟ ගොස් ඇති බවත් ඔහු
පව් කරන බවත් ඔහු කරන දෙයින්
ඔහු වරදකරුවෙකු කියා ඔප්පු වන
බවත් ඔබ දන්නෙහිය.[8]

**12** මා දැනට තීරණය කර
තිබෙන්නේ නිකපොලිසියෙහි ශීත
කාලය ගත කිරීමටය.[9] මම ඔබ
වෙතට ආටිමස්ව හෝ තිකිකස්ව[10]
එවන්නෙමි. ඉන්පසු ඔබ මා ළඟට
පැමිණීම සඳහා උපරිම උත්සාහ-
යක් දරන්න. **13** නීතිය ගැන මනා
දැනුමක් ඇති සේනස් සහ අපො-
ලොස් යෑමට සූදානම් වන ගමනට
අවශ්‍ය සෑම දෙයක්ම නොඅඩුව සපයා
දීමට වගබලා ගන්න.[11] **14** නමුත්
ඔවුන්ට අත්‍යවශ්‍ය දේ ලබා දීමෙන්
යහපත් දේවල් කිරීමට අපගේ සහෝ-
දරයනුත් ඉගෙනගත යුතුයි.[12] එවිට
ඔවුන් කරන සේවයෙන් හොඳ ප්‍රතිඵල
ලැබෙනු ඇත.[13]

**15** මා සමඟ සිටින සියලුදෙනාම
ඔවුන්ගේ සුබ පැතුම් ඔබට මේ සමඟ
එවති.[14] අපට මහත් සෙනෙහසක්
දක්වන සත්‍ය ඉගැන්වීම්වලට ඇලී
සිටින සියලුදෙනාට මගේ සුබ පැතුම්ද
ලබා දෙන්න.

ඔබ සියලුදෙනාටම දෙවිගේ මහත්
කරුණාව ලැබේවා![15]

**3 පරි.**
**1** කොලො 1:10
**2** 2තිමෝ 2:24
**3** පිලි 4:5
යාකො 3:17
**4** හිතෝ 15:1
ගලා 6:1
එෆී 4:2
1තිමෝ 6:11
2තිමෝ 2:25
1පේතෘ 3:15
**5** එෆී 2:1
**6** රෝම 2:4
1තිමෝ 2:3
**7** ලූක් 6:35
රෝම 11:22
එෆී 4:32
**8** තීත 2:11
**9** ද්වි 9:5
ආනි 9:18
රෝම 6:23
**10** රෝම 3:10
ගලා 3:21
**11** ගීතා 130:4
රෝම 5:15
රෝම 5:21
රෝම 11:22
**12** 1යොහ 1:7
1යොහ 2:2
එළි 1:5
එළි 7:14
**13** රෝම 5:18
**14** යොහ 3:5
රෝම 8:14
රෝම 8:23
2කොරි 5:17
හෙබ්‍රෙ 6:4
**15** ක්‍රියා 2:33
**16** රෝම 3:24
ගලා 2:16
**17** රෝම 5:1
රෝම 5:9
**18** රෝම 6:23
**19** රෝම 8:17
**20** 1තිමෝ 1:15
**21** 1තිමෝ 6:18

**2 තීරුව**
**1** 1තිමෝ 6:4
1තිමෝ 6:20
2තිමෝ 2:23
**2** 1තිමෝ 1:4
**3** රෝම 13:13
පිලි 2:3
**4** 1තිමෝ 1:7
**5** 1කොරි 11:19
එළි 2:6
**6** 2කොරි 13:2
2තිමෝ 4:2
**7** රෝම 16:17
2තෙස 3:6
2තෙස 3:14
2යොහ 10
**8** හෙබ්‍රෙ 6:6
**9** 1කොරි 16:6

**10** ක්‍රියා 20:4; එෆී 6:21; 2තිමෝ 4:12; **11** 1කොරි 9:14; ගලා 6:6; හෙබ්‍රෙ 13:16; **12** රෝම 15:27; 1කොරි 9:11; **13** කොලො 1:10; 2පේතෘ 1:8; **14** පිලි 4:21; **15** 1තෙස 5:28.

# පිලෙමොන්ට
## ලියූ ලිපිය

**1** මෙම ලිපිය ලියන්නේ ක්‍රිස්-
තුස් යේසුස් වෙනුවෙන් සිරකරුවෙකු
වී සිටින[1] පාවුල් සහ අපගේ සහෝ-
දර තිමෝතිය.[2] මෙය ලියන්නේ අප-
ගේ ප්‍රේමණීය හවුල් සේවකයෙකු වන
පිලෙමොන් වෙතටය.[3] **2** එලෙසම
අපගේ සහෝදරිය වන අපියා වෙත-
ටත් අප සමඟ ක්‍රිස්තුස්ගේ භේවායෙකු
වී සිටින[4] ආකිපස්[5] සහ ඔබේ නිවසෙහි
රැස් වන සභාව වෙතටත්ය.[6]

**3** අපගේ පියාණන් වන දෙවිගෙන්
හා ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්ගෙන්
ඔබ සියලුදෙනාටම මහත් කරුණා-
වත් සමාදානයත් ලැබේවා![7]

**4** මා දෙවිට යාච්ඤා කරන විට
ඔබ ගැන සඳහන් කරන සෑම අවස්ථා-
වකදීම මම නිරතුරුවම දෙවිට ස්තුති
කරමි.[8] **5** මන්ද ස්වාමීන් වන යේ-
සුස් කෙරෙහි ඔබට තිබෙන විශ්වා-
සය සහ සියලු ශුද්ධ තැනැත්තන්
සඳහා ඔබට තිබෙන ප්‍රේමය ගැන
මට නිතරම ආරංචි වේ.[9] **6** එලෙ-
සම අප සියලුදෙනාම ක්‍රිස්තුස්ට බැඳී
සිටීම හේතුවෙන් බොහෝ යහපත්
දේවල් භුක්ති විඳින බව ඔබ තේරුම්-
ගෙන ඇත. එහෙයින් අන් අයට මෙන්
ඔබටත් විශ්වාසයක් ඇති නිසා[10] ඒ
විශ්වාසය මගින් යහපත් දේ කිරීමට
පෙලඹීමක් ඔබ තුළ ඇති වෙන්න
කියා ප්‍රාර්ථනා කරමි. **7** සහෝද-
රය, ඔබ පෙන්වූ ප්‍රේමය නිසා ශුද්ධ
තැනැත්තන්ට මහත් සැනසීමක් හා
ධෛර්යයක් ලැබී ඇත.[11] එය මගේ
ඉමහත් ප්‍රීතියටත් සැනසිල්ලටත් හේ-
තුවකි.[12]

**8** ක්‍රිස්තුස්ගේ නාමයෙන් කිසි
බියක් සැකක් නැතුව ඔබ කළ යුතු
දේවල් ගැන පැවසීමට[13] මට නිදහස
තිබුණත්, **9** මම එසේ නොකරමි. ඒ
වෙනුවට මා සඳහන් කිරීමට යන මේ
කාරණයේදී ඔබට උනන්දු කරන්නේ
ඔබට තිබෙන ප්‍රේමය සැලකිල්ලට
ගෙන කටයුතු කිරීමටය.[1] එලෙසම
මා ක්‍රිස්තුස් යේසුස් වෙනුවෙන් සිර-
කරුවෙකු[2] වී සිටින වයසින් මුහු-
කුරා ගිය කෙනෙකු බව සැලකිල්ලට
ගන්නා ලෙසද ඉල්ලමි. **10** මා දැන්
උත්සාහ කරන්නේ මා දරුවෙකු සේ
සලකන[3] ඔනෙසිමස්[4] සම්බන්ධයෙන්
ඔබට යම් මඟ පෙන්වීමක් දීමටයි. මා
සිරභාරයේ සිටියදී මම ඔහුට පියෙකු
මෙන් සැලකුවෙමි.[5] **11** කලින් ඔහු-
ගෙන් ඔබට කිසි ප්‍රයෝජනයක් නො-
තිබුණත් දැන් ඔහු ඔබටත් මටත්
ප්‍රයෝජනවත් කෙනෙකු බවට පත් වී
ඇත.[6] **12** මම දැන් ඔහුව ඔබ වෙ-
තට එවන්නෙමි. ඔහු මගේ හදවතට
ඉතා සමීප කෙනෙකි.[7]

**13** මා ශුභාරංචිය හේතුවෙන් සිර-
භාරයේ සිටින මේ මොහොතේදී[8]
ඔබ වෙනුවට[9] ඔහුව තබාගෙන
මගේ වැඩකටයුතුවලට ඔහුගෙන් දිග-
ටම යම් උපකාරයක් ලබාගැනීමට
මම කැමැත්තෙමි. **14** නමුත් ඔබේ
කැමැත්ත නැතුව කිසිවක් කිරීමට මා
සතුටු නැත. ඔබ මේ සම්බන්ධයෙන්
යම් යහපත් දෙයක් කිරීමට පෙලඹු-
ණොත් එය සිදු විය යුත්තේ වෙනත්
කෙනෙකුගේ බල කිරීම නිසා නොව
ඔබේම කැමැත්තෙනි.[10] **15** සමහ-
රවිට ඔහු කලකට ඔබව අත්හැර
ගියේ සැමදා ඔබ සමඟ සිටීමට
විය හැක. **16** මෙතැන් පටන් ඔහුව
ඔබේ දාසයෙකු ලෙස නොව[11] ඔබේම
ප්‍රේමණීය සහෝදරයෙකු ලෙස[12] සැල-
කීමට අමතක නොකරන්න. මාත්
ඔහුව සලකන්නේ එලෙසය. ඔහුව
දාසයෙකු හා ස්වාමීන්ගේ අනුගාමි-
කයෙකු ලෙස[13] නැවත භාරගන්නා
විට ඒ දේ අමතක නොකරන්න.
**17** ඔබ මාව හවුල්කරුවෙකු ලෙස[14]
සලකා සාදරයෙන් පිළිගත් ලෙසම

1 එෆී 4:1
2 ක්‍රියා 16:1 හෙබ්‍රෙ 13:23
3 පිලි 2:25
4 2තිමෝ 2:3
5 කොලො 4:17
6 රෝම 16:5 1කොරි 16:19
7 රෝම 1:7
8 එෆී 1:16 1තෙස 1:2
9 එෆී 1:15 කොලො 1:4
10 ගලා 5:6
11 2තිමෝ 1:16 හෙබ්‍රෙ 6:10
12 2කොරි 7:13
13 1තිමෝ 6:13

**2 තීරුව**
1 2කොරි 8:8 ගලා 5:13
2 2තිමෝ 1:8
3 ගලා 4:19
4 කොලො 4:9
5 1කොරි 4:15
6 2තිමෝ 4:11
7 පිලෙ 20
8 එෆී 6:20 පිලි 1:7
9 පිලි 2:30
10 2කොරි 9:7 1පේතෘ 5:2
11 1කොරි 7:22
12 1තිමෝ 6:2
13 කොලො 3:22
14 2කොරි 8:23

ඔහුවද සාදරයෙන් පිළිගන්න.[1]
18 මීට අමතරව ඔහු අතින් ඔබට
යම් වරදක් සිදු වී ඇත්නම් හෝ ඔහු
ඔබට ණය වී සිටී නම් හෝ ඒ ණය
ගෙවීමට මම කැමැත්තෙමි. 19 මේ
දේ පාවුල් වන මා ලියන්නේ මගේම
අතින්ය.[2] ඒ නිසා ගෙවිය යුතු දේ
ගෙවා දැමීමට මම පොරොන්දු වෙමි.
ඇත්තටම ඔබේ ජීවිතය ගැන ඔබ මට
ණයගැතිව සිටින බව ඔබට මතක්
කර දීමට අවශ්‍ය නැත. 20 මගේ
සහෝදරය, අප හැමෝම ස්වාමීන්-
ගේ අනුගාමිකයන් වන නිසා ඔබෙන්
යම් උපකාරයක් බලාපොරොත්තු වීම
සුදුසු බව පෙනේ. එහෙයින් ක්‍රිස්තුස්-
ගේ අනුගාමිකයෙකු ලෙස මගේ සිත
සතුටු කරන ලෙස ඉල්ලමි.[3]
21 මා ඔබට මේ දේවල් ගැන
ලියන්නේ ඔබ ඊට එකඟව ක්‍රියා
කරන බවට විශ්වාසයක් ඇතුවය.
ඇත්තෙන්ම මා ඔබෙන් ඉල්ලන දේ-
ටත් වඩා ඔබ කරන බව මට
නිසැකය.[1] 22 ඊට අමතරව මට
නවාතැනක්[2] සූදානම් කරන ලෙසද
ඔබෙන් ඉල්ලමි. මන්ද ඔබ සියලුදෙ-
නාගේ යාච්ඤා නිසා[3] ඔබ වෙනුවෙන්
මට ළඟදීම නිදහස ලැබෙයි[4] කියා
මම බලාපොරොත්තු වෙමි.
23 ක්‍රිස්තුස් යේසුස් වෙනුවෙන් මා
සමඟ සිරභාරයේ සිටින එපෆ්‍රස්ද[5]
ඔබට සුබ පැතුම් එවයි. 24 එමෙන්ම
මා සමඟ හවුලේ සේවය කරන මාක්,
අරිස්තාකස්,[6] දේමස්[7] සහ ලූක් මේ
සමඟ ඔබට සුබ පැතුම් එවති.
25 යහපත් ආකල්පයක් ඇතුව
සිටින ඔබ සියලුදෙනාට ස්වාමීන්
වන ක්‍රිස්තුස්ගේ මහත් කරුණාව
ලැබේවා![8]

1 රෝම 15:7
2 ගලා 6:11
3 පිලෙ 12

**2 තීරුව**
1 පිලි 2:2
2 ක්‍රියා 28:23
3 ක්‍රියා 12:5
4 පිලි 2:24
5 කොලො 1:7 කොලො 4:12
6 ක්‍රියා 19:29 ක්‍රියා 27:2 කොලො 4:10
7 කොලො 4:14 2තිමෝ 4:10
8 ගලා 6:18

# හෙබ්‍රෙව්වරුන්ට
## ලියූ ලිපිය

1 බොහෝ කලකට පෙර දෙවි
අනාගතවක්තෘවරුන් මාර්ග-
යෙන්[1] විවිධ අවස්ථාවලදී[2] හා විවිධ
ආකාරවලින් අපගේ මුතුන්මිත්තන්ට
කතා කළේය. 2 මේ අවසාන කාල-
යේදී[3] ඔහු තම පුත්‍රයා මාර්ගයෙන්ද
අපට කතා කර ඇත.[4] දෙවි ඒ පුත්‍ර-
යාව සියලු දේවලට උරුමකම් කියන
තැනැත්තා ලෙස පත් කර ඇති
අතර[5] විශ්වයේ සියලුම දේ* සැදු-
වේ ඔහු මාර්ගයෙනි.[6] 3 දෙවිගේ
තේජස ඔහු තුළින් පිළිබිඹු වන
අතර[7] දෙවිගේ ගතිලක්ෂණ සියල්ල
ඔහු තුළින් සම්පූර්ණයෙන්ම දැක-
ගත හැක.[8] සෑම දෙයක්ම පවතින්-
නේ ඔහුගෙන් නික්මෙන බලගතු
වදන්වලට අනුවය.[1] අපව පාපයෙන්
පවිත්‍ර කිරීමට පියවර ගැනීමෙන් පසු[2]
ඔහු ස්වර්ගයෙහි[3] සිටින මහෝත්ත-
මයාණන්ගේ දකුණු පැත්තේ අසුන්-
ගත්තේය.[4] 4 දේවදූතයන්ටත් වඩා
ශ්‍රේෂ්ඨ නාමයක් ඔහුට හිමි වී ඇති
නිසා[5] සියලු දේවදූතයන්ටත් වඩා
බොහෝ සෙයින් ඔහු උතුම්ය.[6]
5 උදාහරණයක් ලෙස, “ඔබ මාගේ
පුත්‍රයාය. අද පටන් මම ඔබේ පියා
වෙමි”[7] කියාත් තවත් අවස්ථාවක,
“මම ඔහුට පියෙක් වන්නෙමි. ඔහු මට
පුත්‍රයෙක් වන්නේය”[8] කියාත් දෙවි
දේවදූතයන්ගෙන් කිසිවෙකුට කිසි-
දාක පවසා තිබේද? 6 නමුත් දෙවි

හෙබ්‍රෙ **1:2*** හෝ “සමාජ ක්‍රම.” ග්‍රීක බසින්, එඕනස්.

**1 පරි.**
1 නික් 24:3 යෙරෙ 7:25 එස 33:33 ලූක් 1:70 ක්‍රියා 3:21
2 ගණන් 12:8 යෙසා 1:2
3 ගලා 4:4 1පේත්‍රු 1:11 1පේත්‍රු 1:20
4 මතෙ 17:5 යොහ 3:17 යොහ 13:34
5 ගීතා 2:8 යොහ 16:15 රෝම 8:17
6 යොහ 1:3 1කොරි 8:6 කොලො 1:16
7 යොහ 1:14 යොහ 17:5
8 යොහ 1:1 කොලො 1:15

**2 තීරුව**
1 කොලො 1:17

**2** දානි 9:24; හෙබ්‍රෙ 9:26; 1පේත්‍රු 1:19; **3** ගීතා 33:13; එෆී 1:20; හෙබ්‍රෙ 8:1; යූද් 25; **4** ගීතා 110:1; ක්‍රියා 2:33; ක්‍රියා 7:55; රෝම 8:34; කොලො 3:1; **5** ක්‍රියා 4:12; පිලි 2:9; **6** එෆී 1:21; 1පේත්‍රු 3:22; **7** ගීතා 2:7; **8** 2සාමු 7:14; මාක් 1:11; ලූක් 9:35; 2පේත්‍රු 1:17.

තම කුලුඳුලාව[1] ජනාවාස වූ මේ පො-
ළොවට ඉදිරියේදී එවන විට, “දෙවි-
ගේ සියලු දූතයෝ[2] ඔහු ඉදිරියේ වැඳ
වැටිය යුතුයි”[3] කියා ඔහු පවසයි.
**7** මීට අමතරව දේවදූතයන් ගැන
ඔහු* පවසා ඇත්තේ මෙයයි. “ඔහු
තම දේවදූතයන්ව බලවත් කරන්-
නේය. ඔහුගේ සේවකයන් වන ඔවුන්ව
ඇවිළෙන ගින්නක් කරන්නේය.”[4]
**8** නමුත් පුත්‍රයාණන් ගැන පවසා
ඇත්තේ මෙයයි. “ඔබට සිංහාසනය
සදහටම හිමි කර දෙන්නේ ඔබේ
දෙවිය.[5] යුක්තිය නමැති රාජ යෂ්-
ටිය අතැතිව[6] ඔබේ රාජ්‍යයේ
බලය ඔබට හිමි වේ.[7] **9** ඔබ ධර්-
මිෂ්ඨකමට ප්‍රිය කර අධර්මිෂ්ඨක-
මට වෛර කළෙහිය. එහෙයින් ඔබේ
දෙවි ප්‍රීතිය නමැති තෛලයෙන් ඔබව
අභිෂේක කර[8] වෙනත් රජවරුන්ට*
වඩා වැඩි ප්‍රීතියක් ඔබට අත් කර
දුන්නේය.”[9] **10** එලෙසම, “ස්වාමීනි,
පටන්ගැන්මේදී ඔබ පොළොවේ අත්-
තිවාරම් දැමුවෙහිය. ඔබේ දෑත්වලින්
අහස නිර්මාණය කළෙහිය.[10] **11** ඒ
සියල්ල නැති වී ගියත් ඔබ සදහටම
පවතිනු ඇත. ඒවා වස්ත්‍රයක් මෙන්[11]
දිරාපත් වී යන්නේය. **12** ඔබ ඒවා
සළුවක් හා වස්ත්‍රයක් මෙන් ඔතන්-
නෙහිය.[12] ඒවා වෙනස් වී යයි. නමුත්
ඔබ කිසිදාක වෙනස් නොවන්නෙහිය.
ඔබේ පැවැත්මටද කෙළවරක් නැත”[13]
කියා පවසා තිබේ.
**13** “මාගේ දකුණු පැත්තේ ඉඳ-
ගන්න. මා ඔබේ සතුරන්ව ඔබේ
පා පුටුව ලෙස තබන තුරු එසේ
සිටින්න”[14] කියා දෙවි කවදා හෝ
කිසි දේවදූතයෙකුට පවසා තිබේද?
**14** ඔවුන් සියලුදෙනා ජනයා වෙනු-
වෙන් සේවය කිරීමට[15] යවනු ලැබූ
බලවත් දූතයන්[16] නොවේද? ඔවුන්ව
යවා තිබෙන්නේ ගැලවීම උරුම කර-
ගැනීමට සිටින අය වෙනුවෙන් සේවය
කිරීමට[17] නොවේද?

---

හෙබ්‍රෙ **1:7*** එනම්, දෙවි. **9*** එනම්, දාවිත්ගේ පෙළපතට අයත් අනිකුත් රජවරුන්ට.

**1 පරි.**
**1** යොහ 1:14 යොහ 3:18 රෝම 8:29 කොලො 1:15
**2** ගීතා 91:11 ලූක් 22:43 යොහ 20:12
**3** ද්වි 32:43 ගීතා 97:7
**4** ගීතා 104:4
**5** මතෙ 28:18 ක්‍රියා 2:30 එළි 3:21
**6** ගීතා 45:6
**7** උත් 49:10 ගණන් 24:17 ගීතා 2:9
**8** යෙසා 61:1 ලූක් 3:22 ලූක් 4:18 ක්‍රියා 4:27 ක්‍රියා 10:38
**9** ගීතා 45:7
**10** ගීතා 102:25
**11** යෙසා 51:6
**12** යෙසා 34:4 එළි 6:14
**13** ගීතා 102:26
**14** ගීතා 110:1 මතෙ 22:44 මාක් 12:36 ලූක් 20:42
**15** ගීතා 34:7 ගීතා 91:11 මතෙ 18:10 ලූක් 2:9 ලූක් 2:13 ක්‍රියා 5:19 ක්‍රියා 12:7
**16** ගීතා 104:4 ක්‍රියා 23:8
**17** මතෙ 19:29 මතෙ 25:34 යාකො 2:5

**2 තීරුව**

**2 පරි.**
**1** ලූක් 8:15 2තිමෝ 2:2
**2** ගීතා 73:2 හෙබ්‍රෙ 3:12 2පේත්‍රු 3:17 එළි 2:4
**3** ක්‍රියා 7:53 ගලා 3:19
**4** ද්වි 4:3 1කොරි 10:11 යූද් 5
**5** මාක් 1:14 යොහ 18:20
**6** ලූක් 1:2
**7** ලූක් 1:69
**8** මතෙ 11:23 මතෙ 22:5
**9** හෙබ්‍රෙ 10:29
**10** ක්‍රියා 2:22 1කොරි 2:4

**2** එහෙයින් අප ඇසූ දේවලට[1] වැඩි
අවධානයක් දීම අවශ්‍යය. අප
එසේ නොකළොත් නොසිතූ ලෙස
ක්‍රමක්‍රමයෙන් සත්‍ය ඉගැන්වීම්වලින්
ඉවත්ව ගොස් අප නොමඟ යෑමට
ඉඩකඩ ඇත.[2] **2** මන්ද දේවදූතයන්
මාර්ගයෙන් පවසන ලද සියල්ල[3]
කිසි වෙනසක් නොවී එලෙසම සිදු
විය. ඊට විරුද්ධව වරදක් හෝ අකී-
කරු ක්‍රියාවක් කළ සෑම කෙනෙ-
කුටම විරුද්ධව යුක්තියද ඉටු විය.[4]
අනික් අතට, **3** අපට ලැබෙන ගැල-
වීම ගැන මුලින්ම කතා කළේ අප-
ගේ ස්වාමීන්ය.[5] ඔහුට සවන් දුන්
අය එය සත්‍යයක් බව අපට සනාථ
කළෝය.[6] එසේනම් මෙතරම් ශ්‍රේෂ්ඨ
ගැලවීමක්[7] ගැන අප නොසැලකිලි-
මත්ව කටයුතු කළොත්[8] අපට දඬුවම්
නොලැබෙයි කියා පැවසිය හැක්කේ
කෙසේද?[9] **4** මන්ද දෙවි පවා ඊට
සාක්ෂි ලෙස බොහෝ ආශ්චර්යයන්,
ලකුණු සහ බලවත් ක්‍රියා[10] සිදු කර-
මින් තම කැමැත්තට එකඟව[11] තම
සේවකයන්ට තම බලය මාර්ගයෙන්
විවිධාකාර දීමනාද[12] ලබා දුන්නේය.
**5** අප කතා කරමින් සිටින පො-
ළොව එනම්, ඉදිරියේදී ජනාවාස වන
පොළොව[13] ඔහු භාර දුන්නේ දේවදූත-
යන්ට නොවේ. **6** ඒ සම්බන්ධයෙන්
සාක්ෂි දෙමින් කෙනෙක් වරක් මෙසේ
ලීවේය. “ඔබ මිනිසාව සිහි කිරීමට
තරම් ඔහු කවුද?[14] ඔබේ රැකවර-
ණය ලැබීමට තරම් මිනිසුන් වටීද?[15]
**7** ඔබ ඔහුව දේවදූතයන්ට වඩා බල-
යෙන් මදක් අඩු කෙනෙකු බවට පත්
කළෙහිය. ඔබ ගෞරවය සහ තේජස[16]
නමැති ඔටුන්න ඔහුට පැළඳෙව්වෙ-
හිය. ඔබ නිර්මාණය කළ සියල්ල ඔහු
යටතේ තැබුවෙහිය.[17] **8** ඔබ සියලු
දේවල් ඔහුගේ පාදවලට යටත් කළෙ-
හිය.”[18] දෙවි සියලු දේවල් ඔහුට යටත්
කර ඇති නිසා[19] ඔහුට යටත් නොවන

---

**11** 1කොරි 12:11; එෆී 1:9; එළි 4:11; **12** 1කොරි 12:4; **13** යෙසා 11:9; ක්‍රියා 17:31; 2පේත්‍රු 3:13; **14** යෝබ් 7:17; **15** ගීතා 8:4; ගීතා 144:3; **16** ගීතා 8:5; **17** උත් 1:26; උත් 9:2; **18** ගීතා 8:6; **19** මතෙ 28:18; 1කොරි 15:27; එෆී 1:22; පිලි 3:21.

කිසි දෙයක් නැත.[1] නමුත් සියලු
දේවල් ඔහුට යටත්ව පවතින බව
අප තවමත් දකින්නේ නැත.[2] **9** අප
දකින්නේ දේවදූතයන්ට වඩා බල-
යෙන් මදක් අඩු කෙනෙකු[3] බවට පත්
කළ යේසුස්වය. ඔහු තම ජීවිතය පුද
කළ නිසා[4] ඔහුට තේජස සහ ගෞර-
වය නමැති ඔටුන්න පළඳවා ඇත.[5]
ඔහු සෑම මිනිසෙකු වෙනුවෙන්ම මර-
ණයට පත් විය.[6] එසේ කළේ දෙවිගේ
මහත් කරුණාව සියලුදෙනාටම ලබා
දීම සඳහාය.

**10** සියලු දේවල් පවතින්නේ දෙවි
මාර්ගයෙනි.[7] ඒවා එලෙස පවතින්නේ
දෙවිගේ ගෞරවය උදෙසාය. එහෙ-
යින් පුත්‍රයන් බොහෝදෙනෙකුව තේ-
ජසට පත් කිරීම සඳහා[8] දෙවි ඔවුන්ට
ගැලවීම ලබා දීමට පත් කර ඇති
තැනැත්තාට[9] දුක් විඳීමට ඉඩ දීම
යෝග්‍ය දෙයක් බව දෙවි තීරණය
කළේය. එසේ කළේ එම තැනැත්තා-
වද සෑම අතින්ම සම්පූර්ණ කෙනෙකු
කිරීම සඳහාය.[10] **11** ශුද්ධ තත්වය-
කට පත් වන අයගෙන්* ඔවුන්ව ශුද්ධ
කරන තැනැත්තාගෙන්[11] පියාණන්
එක් කෙනෙක්මය.[12] එහෙයින් ඔවුන්ව
තම “සහෝදරයන්” කියා ඇමතී-
මට[13] යේසුස් ලැජ්ජා වන්නේ නැත.
**12** “මාගේ සහෝදරයන්ට මම ඔබේ
නාමය ප්‍රකාශ කරන්නෙමි. සභාව
මැදදී ඔබට ප්‍රශංසා ගී ගයන්නෙමි”[14]
කියා ඔහු පවසන්නේ ඒ නිසාය.
**13** එලෙසම ඔහු, “මම ඔහු කෙරෙහි
මාගේ විශ්වාසය තබමි”[15] කියාද,
“යෙහෝවා දෙවි මට දුන් දරුවන්
සමඟ මම සිටිමි”[16] කියාද පවසයි.

**14** එම ‘දරුවන්’ ලේ ඇට මස්
නහර* සහිත මිනිසුන් වන නිසා ඔහුද
ඒ හා සමාන මිනිසෙක් වූයේය.[17] එසේ
මිනිසෙකු ලෙස ඔහු වින්ද මරණය
මගින්[18] මරණය ගෙන ඒමට බලය
ඇති[19] යක්ෂයාව[20] නැති කර දැමීමට
ඔහු පියවර ගත්තේය.[21] **15** එලෙ-

හෙබ්‍රෙ **2:11*** හෝ, “දෙවි සඳහා වෙන් කර ඇති අයගෙන්.” **14*** මූ.අ., “ලේ සහ මස්.”

**2 පරි.**
**1** යොහ 13:3 ක්‍රියා 2:35 1පේත්‍ර 3:22
**2** ගීතා 110:1
**3** පිලි 2:7
**4** යෙසා 53:8 1පේත්‍ර 1:19 1යොහ 4:10 එළි 5:9
**5** දානි 7:14
**6** යෙසා 53:5 රෝම 5:17 1තිමෝ 2:6
**7** රෝම 11:36
**8** රෝම 8:19 2කොරි 6:18 1යොහ 3:2
**9** ක්‍රියා 5:31 1කොරි 8:6 හෙබ්‍රෙ 12:2
**10** ලූක් 24:26 හෙබ්‍රෙ 5:8
**11** යොහ 17:19 හෙබ්‍රෙ 10:14
**12** යොහ 1:13 යොහ 20:17
**13** මතෙ 12:50 රෝම 8:29
**14** ගීතා 22:22 ගීතා 40:9 ලූක් 4:21 ලූක් 19:42
**15** යෙසා 8:17
**16** යෙසා 8:18 යොහ 1:12 1යොහ 3:1
**17** මතෙ 11:19 යොහ 1:14 යොහ 11:11
**18** යෙසා 53:12 රෝම 6:5 රෝම 14:9
**19** යෝබ් 1:19 යෝබ් 2:6 එළි 6:9
**20** යොහ 8:44 යොහ 12:31 එළි 12:9
**21** උත් 3:15 ලූක් 10:18 1යොහ 3:8

**2 තිරුව**
**1** ගීතා 89:48 යෙසා 25:8 1කොරි 15:26
**2** යෙසා 25:7 රෝම 8:22
**3** රෝම 8:21
**4** ගලා 3:29 හෙබ්‍රෙ 9:15 එළි 14:4
**5** පිලි 2:7
**6** රෝම 5:10 2කොරි 5:18
**7** හෙබ්‍රෙ 5:1 හෙබ්‍රෙ 7:26
**8** රෝම 3:25 1යොහ 2:2 1යොහ 4:10

සම මරණයට බියෙන්[1] තම ජීවිත
කාලය පුරාම වහලුන් ලෙස සිටි
සියලුදෙනාව නිදහස් කිරීමටද[2] ඔහු
ක්‍රියා කළේය.[3] **16** මන්ද ඔහු ඇත්-
තටම පැමිණියේ දේවදූතයන්ට උප-
කාර කිරීමට නොව ආබ්‍රහම්ගෙන්
පැවතෙන අයට උපකාර කිරීමටය.[4]
**17** ඒ අනුව තම ‘සහෝදරයන්ට’ සෑම
ආකාරයකින්ම සමාන වීමට ඔහුට
සිදු විය.[5] ඔහු එසේ කළේ දයාවන්ත
මෙන්ම විශ්වාසවන්ත උත්තම පූජක-
යෙකු වී මිනිසුන්ගේ පාප වෙනුවෙන්[6]
දෙවි ඉදිරියේ පෙනී සිට[7] දෙවි සමඟ
නැවතත් සමාදාන වීමට මඟ පාදන[8]
පූජාවක් ඔප්පු කිරීමටය. **18** එසේ
ඔහු බොහෝ පීඩාවලට මුහුණ දෙමින්
දුක් විඳ ඇති නිසා[9] දැන් බොහෝ දුක්
පීඩාවලට මුහුණ දෙන අයට උපකාර
කිරීමටද ඔහුට පුළුවන.[10]

**3** එහෙයින් ස්වර්ගයට යෑම සඳහා
කැඳවීම[11] ලබා සිටින ශුද්ධ
සහෝදරයෙනි, දෙවි විසින් එවන
ලද,*[12] සියලුදෙනා ඉදිරියේ අප ප්‍රසිද්-
ධියේ පිළිගන්නා තැනැත්තා[13] සහ
උත්තම පූජක වන යේසුස් ගැන
හොඳින් කල්පනා කර බලන්න.
**2** ඔහු තමාව එසේ පත් කළ
තැනැත්තාට විශ්වාසවන්තව සිටි-
යේ[14] මෝසෙස්[15] දෙවිගේ ගෘහයේ
විශ්වාසවන්තව සේවය කළ ආකාරය-
ටමය.[16] **3** ගෘහයට වඩා[17] එය ඉදි
කළ තැනැත්තාට වැඩි ගෞරවයක්
ලැබෙන්නා සේම[18] මෝසෙස්ට වඩා
යේසුස්ට වැඩි ගෞරවයක් හිමි වේ.[19]
**4** ඇත්තෙන්ම සෑම ගෘහයක්ම සෑදී-
මට යම් කෙනෙකු සිටිය යුතු බව සිය-
ලුදෙනාම පිළිගනිති. එසේනම් සියලු
දේවල් සෑදූ තැනැත්තාණන් දෙවිය.[20]

**9** මතෙ 26:28; හෙබ්‍රෙ 4:15; **10** හෙබ්‍රෙ 7:25; එළි 2:10; එළි 3:10; **3 පරි.** **11** රෝම 8:30; 1කොරි 1:9; පිලි 3:14; 1තෙස 2:12; 2තිමෝ 1:9; 2පේත්‍ර 1:10; **12** යොහ 3:17; යොහ 7:29; **13** හෙබ්‍රෙ 8:1; හෙබ්‍රෙ 9:15; **14** යොහ 8:29; එළි 3:14; **15** ද්වි 34:10; **16** ගණන් 12:7; **17** 1කොරි 3:9; 1පේත්‍ර 2:5; **18** සෙක 6:12; මතෙ 16:18; **19** මතෙ 17:2; 2කොරි 3:9; **20** උත් 2:3; එෆී 3:9.

හෙබ්‍රෙ **3:1*** එනම්, දෙවිගේ නියෝජිතයා.

**5** මෝසෙස් එම තැනැත්තාගේ ගෘහ-
යේ සේවකයෙකු ලෙස[1] විශ්වාසවන්-
තව කටයුතු කළේය. ඔහු කළ සේවය
පසුව එළිදරව් වන දේවලට සාක්-
ෂියක් විය.[2] **6** නමුත් ක්‍රිස්තුස් එම
තැනැත්තාගේ ගෘහයේ විශ්වාසවන්-
තව කටයුතු කළේ පුත්‍රයෙකු ලෙසය.[3]
අපි එම තැනැත්තාගේ ගෘහය වන්-
නෙමු.[4] එසේ වන්නේ බියක් සැකක්
නැතුව කතා කිරීමට අපට තිබෙන
ප්‍රස්තාවත් අපගේ බලාපොරොත්තුව
ගැන ආඩම්බරයෙන් කතා කිරීමේ ප්‍රස්-
තාවත් අප අවසානය දක්වා පසු නො-
බැස අල්ලාගෙන සිටියොත් පමණි.[5]
**7** ඒ නිසා දෙවිගේ බලය මාර්ග-
යෙන්[6] මෙසේ ලියා ඇත. “අද ඔබ
සැම ඔහුගේ හඬට සවන් දිය යුතුයි.[7]
**8** නමුත් ඔබේ මුතුන්මිත්තන් පාළුක-
රයේදී[8] මා ඔවුන් වෙනුවෙන් මැදිහත්
වෙයිද කියා පරීක්ෂා කර[9] මාව දැඩි
ලෙස උදහසට පත් කළ අවස්ථා-
වේදී[10] මෙන් ඔබේ සිත් දැඩි කර නො-
ගන්න. **9** ඔවුන් අවුරුදු හතළිහක්
පුරා[11] මාගේ ක්‍රියා දැක තිබුණත්[12]
එහිදී මා ඔවුන් වෙනුවෙන් මැදි-
හත් වෙයිද කියා පරීක්ෂා කිරීමෙන්
ඔවුහු මට අභියෝග කළෝය. **10** ඒ
නිසා මට මේ පරම්පරාව ගැන පිළිකු-
ලක් ඇති වී, ‘ඔවුහු නිතරම සිතින්
මුළා වෙති.[13] ඔවුහු මට පිටු පා මා
පැවසූ දේවලට කීකරු නොවෙති’[14]
කියා කීවෙමි. **11** එහෙයින්, ‘මා
මෙන් විවේක ගැනීමට[15] අවස්ථාවක්
ඔවුන්ට නොලැබෙන්නේය’[16] කියා
ඔවුන් ගැන උදහසින් දිවුරා කීවෙමි.”
**12** සහෝදරයෙනි, ඔබ ජීවමාන
දෙවිව අත්හැරියොත් ඔබේ හදවත
විශ්වාසයක් නැති දුෂ්ට තත්වය-
කට පත් විය හැක.[17] එහෙ-
යින් පරෙස්සම් වන්න. **13** ඔබෙන්
ඕනෑම කෙනෙකු පාපයේ මුළා කර-
වන බලපෑමට[18] හසු වී තම සිත් දැඩි
කරගත හැකි නිසා ඒ සම්බන්ධයෙන්
එකිනෙකාට උපදෙස් හා මඟ පෙන්-
වීම් උනන්දුවෙන් ලබා දිය යුතුයි.[19]
“අද” කියා හැඳින්විය හැකි කාලයක්
තවමත් පවතී.[1] එම කාලය පවතින
තුරු එසේ කරන්න. **14** මන්ද අප
ඇත්තටම ක්‍රිස්තුස් සමඟ හවුල්කරු-
වන් වන්නේ,[2] අප මුලදී ඇති කර-
ගත් දැඩි විශ්වාසය අවසානය දක්වාම
ස්ථිර ලෙස රැකගත්තොත් පමණි.[3]
**15** අප එසේ කළ යුත්තේ, “අද ඔබ
සැම මාගේ හඬට සවන් දිය යුතුයි.[4]
නමුත් මාව දැඩි ලෙස උදහසට පත්
කළ අවස්ථාවේදී මෙන් ඔබේ සිත් දැඩි
කර නොගන්න”[5] යන වදන් අදාළ
වන මේ කාලයේදීය.
**16** සවන් දුන්නත් දෙවිව දැඩි
සේ උදහස් කළේ කවුරුන්ද?[6] ඔවුන්
මෝසෙස් යටතේ ඊජිප්තුවෙන් පිට-
තට පැමිණි සියලුදෙනාම නොවේද?[7]
**17** මීට අමතරව හතළිස් අවුරුද්-
දක් පුරා දෙවි උදහස් වූයේ කවු-
රුන් ගැනද?[8] පව් කර පාළුකරයේ මිය
ගිය අය ගැන නොවේද?[9] **18** තමන්
මෙන් විවේක ගැනීමට අවස්ථාවක්
නොලැබෙන බව ඔහු දිවුරා පැවසුවේ[10]
අකීකරු ලෙස ක්‍රියා කළ අයට නො-
වේද?[11] **19** ඒ අනුව ඔවුන්ට විශ්-
වාසයක් නොතිබුණු නිසා[12] දේශයට
ඇතුල් වීමේ ප්‍රස්තාව ඔවුන්ට අහිමි වී
ගිය බව අපට පැහැදිලිය.

**4** තමා මෙන් විවේක ගැනීමේ
අවස්ථාවක් ගැන දෙවි තම සෙ-
නඟට පොරොන්දු වී ඇති නිසා[13]
එය ලැබීමට නුසුදුසු අය නොවීමට
අපි වගබලා ගනිමු.[14] **2** මන්ද අප-
ගේ මුතුන්මිත්තන්ට මෙන්[15] අපටද
ශුභාරංචිය ප්‍රකාශ කර තිබේ.[16] නමුත්
පවසනු ලැබූ එම දේවලට ඔවුන් සවන්
දුන්නත් ඔවුන් එයින් කිසි ප්‍රයෝජන-
යක් ලැබුවේ නැත.[17] එසේ වූයේ එයට
සවන් දී කීකරු වූ අයට[18] සමාන විශ්-
වාසයක් ඔවුන්ට නොතිබූ නිසාය.[19]
**3** පොළොවේ දරුවන් බිහි වීමට
කලින්*[20] ඔහු තම වැඩකටයුතු නිම

**3 පරි.**
1 ද්වි 3:24
2 ද්වි 18:18
3 මතෙ 17:5
4 2කොරි 6:16 එෆී 2:19
5 රෝම 5:2 1තිමෝ 3:13 හෙබ්‍රෙ 6:11
6 2සාමු 23:2 ක්‍රියා 1:16
7 ගීතා 95:7
8 ගීතා 95:8
9 නික් 17:7
10 නික් 15:23
11 නික් 16:35 ගණන් 32:13 ද්වි 8:2 ගීතා 95:9
12 ගීතා 105:40
13 ගණන් 14:11 ගීතා 78:8
14 ද්වි 8:3 ගීතා 95:10
15 ගීතා 95:11
16 ගණන් 14:23
17 හෙබ්‍රෙ 2:1 හෙබ්‍රෙ 12:15
18 මාක් 4:19 2තෙස 2:10
19 1තෙස 5:11

**2 තීරුව**
1 ගීතා 95:7
2 එෆී 3:6 හෙබ්‍රෙ 6:4 හෙබ්‍රෙ 12:8
3 රෝම 11:22 2කොරි 3:4 1යොහ 3:14 එළි 2:10
4 ගීතා 95:7 යොහ 6:45
5 ගීතා 95:8
6 නික් 17:2
7 ගණන් 14:2 ගණන් 14:4
8 ගණන් 14:11 ද්වි 32:21
9 ගණන් 14:22 ගණන් 14:29 1කොරි 10:5 1කොරි 10:10 යුද් 5
10 ද්වි 1:34 ගීතා 106:26
11 ගණන් 14:30 ද්වි 1:35
12 හෙබ්‍රෙ 4:6

**4 පරි.**
13 උත් 2:3 නික් 20:11 හෙබ්‍රෙ 3:11
14 ගලා 5:4 හෙබ්‍රෙ 3:12 හෙබ්‍රෙ 12:15
15 නික් 19:5 ද්වි 32:1 ක්‍රියා 10:36

**16** මතෙ 4:23; ක්‍රියා 15:7; කොලො 1:23; **17** ද්වි 32:15; **18** යෙසා 10:22; **19** ද්වි 32:20; **20** යොහ 17:24; එෆී 1:4.

හෙබ්‍රෙ **4:3*** මතෙ 25:34හි පාදසටහන බලන්න.

කර තිබුණත්,[1] “‘මා මෙන් විවේක
ගැනීමට අවස්ථාවක්[2] ඔවුන්ට නො-
ලැබෙන්නේය’[3] කියා මම ඔවුන් ගැන
උදහසින් දිවුරා කීවෙමි”[4] කියා
ඔහු පැවසුවේය. එසේවුවත් විශ්වාස-
යක් ඇතුව සිටින අපට දෙවි මෙන්
විවේක ගැනීමට අවස්ථාව උදා වේ.
**4** මන්ද ඔහු එක් පදයක හත්වෙනි
දවස ගැන පවසා තිබෙන්නේ මෙ-
යයි. “දෙවි හත්වෙනි දවසේ සිට
තමන් කළ සියලු වැඩවලින් විවේක
ගත්තේය.”[5] **5** එමෙන්ම, “මා මෙන්
විවේක ගැනීමට අවස්ථාවක් ඔවුන්ට
නොලැබෙන්නේය”[6] කියාද ඔහු නැව-
තත් පවසා ඇත.

**6** ශුභාරංචිය මුලින්ම ඇසූ අය[7]
ඊට අකීකරු වූ නිසා ඔවුන්ට විවේක
ගැනීමේ අවස්ථාව අහිමි විය.[8] නමුත්
විවේක ගැනීමේ අවස්ථාව සමහරුන්
ඉදිරියේ තවමත් විවෘතව ඇත. ඇත්-
තෙන්ම, **7** ඊට දිගු කාලයකට පසු
දාවිත් ලියූ ගීතිකාවක ඔහු, “අද” කියා
පවසමින් නැවතත් එක්තරා දවසක්
වෙන් කර දක්වයි. කලින් පැවසූ ලෙ-
සම එහිදීත්, “අද ඔබ සැම ඔහුගේ
හඬට සවන් දිය යුතුයි.[9] එහෙයින්
ඔබේ සිත් දැඩි කර නොගන්න”[10] කියා
සඳහන් වෙයි. **8** ඔවුන්ට විවේක
ගැනීම සඳහා යොෂුවා[11] යම් ස්ථා-
නයක් වෙතට ඔවුන්ව ගෙන ගියා
නම්[12] දෙවි එහිදී වෙන දවසක් ගැන
කතා කරන්නේ නැත.[13] **9** ඒ අනුව
සබත් දවස මෙන් දෙවිගේ සෙනඟට
විවේක ගැනීම සඳහා තවත් අවස්ථා-
වක් ඇත.[14] **10** මන්ද යමෙක් දෙවි
මෙන් විවේක ගන්නවා නම්[15] දෙවි
තම වැඩකටයුතුවලින් විවේක ගත්
ලෙසම ඔහුද තම වැඩකටයුතුවලින්
විවේක ගෙන සිටියි.[16]

**11** එහෙයින් විවේක ගැනීමට
තිබෙන ඒ අවස්ථාව ලබාගැනීමට
අපි උපරිම උත්සාහයක් දරමු. මන්ද
එසේ නොකළොත් අපගේ මුතුන්-
මිත්තන්ගේ අවාදර්ශය අනුගමනය
කරමින් අපද අකීකරු අය බවට
පත් වනු ඇත.[17] **12** දෙවිගේ වදන්[18]
ජීවමානය,[1] බලවත්ය.[2] ඕනෑම දෙමු-
වහත් කඩුවකට වඩා තියුණුය.[3]
එය කොතරම් ගැඹුරට පසාරු කර-
ගෙන යනවාද කිවහොත් යමෙකුගේ
බාහිර ස්වභාවය[4] ඔහුගේ සැබෑ ඇතු-
ළාන්ත ස්වභාවයට*[5] වඩා කොතරම්
වෙනස්ද කියා පෙන්වීමටත් සන්ධිව-
ලින් ඇටමිදුලු වෙන් කර දැක්වීමටත්
එයට පුළුවන. එමගින් යමෙකුට තම
සිතේ සිතුවිලිද චේතනාද වටහාගත
හැක.[6] **13** දෙවි ඉදිරියෙහි කිසිවක්
සැඟවිය නොහැක.[7] අප ගණන් දිය
යුතු ඒ තැනැත්තාගේ ඇස් ඉදිරියෙහි
සියල්ල වැස්මක් නැතුව නිරාවරණය
වී තිබේ.[8]

**14** ස්වර්ගයට ගොස් ඇති දෙවිගේ
පුත්‍රයා වන යේසුස්[9] අපගේ ශ්‍රේෂ්ඨ
උත්තම පූජකයා ලෙස සිටින නිසා[10]
අපි දිගටම ඔහු කෙරෙහි අපගේ
විශ්වාසය ප්‍රකාශ කරමු.[11] **15** මන්ද
අපට සිටින්නේ අපගේ දුර්වල-
කම් ගැන අනුකම්පාවක් නොදැනෙන
උත්තම පූජකයෙකු නොවේ.[12] ඔහු
අප මෙන් සැම අතින්ම බොහෝ දුක්
පීඩාවලට මුහුණ දී ඇති කෙනෙකි.
නමුත් ඔහු කිසි පාපයක් නොකළ
උත්තම පූජකයෙකි.[13] **16** එමනිසා
මහත් කරුණාව පෙන්වන තැනැත්-
තාණන්ගේ සිංහාසනය වෙතට ළඟා
වී[14] කිසි බියක් සැකක් නොමැ-
තිව නිදහසේ ඔහුට යාච්ඤා කිරීමට[15]
අපට පුළුවන. එහෙයින් අපට උපකාර
අවශ්‍ය වේලාවේදීම ඔහුගේ දයාව හා
මහත් කරුණාව අපි ලබාගනිමු.[16]

**5** මන්ද උත්තම පූජකයා ලෙස
මිනිසුන් අතරින් කෙනෙකුව
තෝරාගන්නේ මිනිසුන් වෙනුවෙන්
දෙවිට සේවය කිරීම සඳහාය.[17] ඔහු
පරිත්‍යාග සහ පව් වෙනුවෙන් පූජා
දෙවිට ඔප්පු කරයි.[18] **2** තමාගේම
දුර්වලකම් ඔහුට නිරතුරුවම සිහි
වන නිසා නොදැනුවත්කමින් වැරදි

**4 පරි.**
**1** නික් 31:17
**2** ගීතා 95:11 හෙබ්‍රෙ 3:11
**3** ගණන් 14:23 ද්වි 1:35
**4** ද්වි 1:34
**5** උත් 2:2
**6** ගීතා 95:11
**7** ද්වි 32:1
**8** ගණන් 14:30 ද්වි 31:27
**9** ගීතා 95:7
**10** ගීතා 95:8
**11** නික් 24:13 ද්වි 1:38 ද්වි 31:7
**12** යොෂු 22:4
**13** යෙරෙ 6:16
**14** යෙසා 66:23 සෙක 14:16 මාක් 2:28
**15** උත් 2:2
**16** එළි 14:13
**17** ගීතා 95:11 රෝම 11:30 හෙබ්‍රෙ 3:17
**18** මතෙ 15:6 ක්‍රියා 11:1 1තෙස 2:13 1තෙස 4:15

**2 තීරුව**
**1** යෙරෙ 23:29 සෙක 4:6 යොහ 2:17 1පේතෘ 1:23
**2** 2කොරි 10:4
**3** යෙසා 49:2 එෆී 6:17
**4** මතෙ 16:26
**5** ක්‍රියා 17:16 රෝම 1:9 කොලො 2:5
**6** හිතෝ 21:2 හිතෝ 24:12 යොහ 12:48 1කොරි 4:5
**7** ගීතා 7:9 ගීතා 90:8 හිතෝ 15:11
**8** යෝබ් 31:14 ක්‍රියා 17:31 රෝම 2:16 රෝම 14:12
**9** මතෙ 26:63 මාක් 1:11 හෙබ්‍රෙ 1:2
**10** හෙබ්‍රෙ 7:26
**11** හෙබ්‍රෙ 3:1 හෙබ්‍රෙ 10:23
**12** යෙසා 53:4 යෙසා 61:1 හෙබ්‍රෙ 2:17
**13** 2කොරි 5:21 හෙබ්‍රෙ 7:26 1පේතෘ 2:22
**14** එෆී 2:18 හෙබ්‍රෙ 10:19
**15** එෆී 3:12
**16** හෙබ්‍රෙ 13:6

**5 පරි.** **17** නික් 40:13; **18** ලෙවී 5:6; හෙබ්‍රෙ 8:3.

හෙබ්‍රෙ **4:12*** ග්‍රීක බසින්, නියුමා. උපග්‍ර. 3 බලන්න.

කරන අය සමඟ අනුකම්පාවෙන් කටයුතු කිරීමට ඔහුට පුළුවන.[1] **3** ඔහු අතින්ද දුර්වලකම් සිදු වී ඇති නිසා සෙනඟ කරන පව් වෙනුවෙන් පූජා ඔප්පු කරනවා වගේ තමා අතින් සිදු වන පව් වෙනුවෙන්ද පූජා ඔප්පු කිරීමට ඔහුට සිදු වේ.[2]

**4** මීට අමතරව කෙනෙකුට එම ගෞරවනීය කාර්යය හිමි වන්නේ ඒ සඳහා ඔහු කැමැත්තෙන්ම සිටින නිසා නොවේ.[3] ආරොන්ව පත් කළා සේම[4] එම කාර්යය සඳහා දෙවි ඔහුව පත් කරන නිසාය.[5] **5** එසේම ක්‍රිස්තුස් උත්තම පූජකයෙකු වීමෙන්[6] තමාටම ගෞරවය සෙව්වේ නැත.[7] නමුත්, “ඔබ මාගේ පුත්‍රයාය. අද සිට මම ඔබේ පියා වෙමි”[8] කියා පැවසූ තැනැත්තා ඔහුව ගෞරවයට පත් කළේය.[9] **6** ශුද්ධ ලියවිල්ලේ වෙනත් තැනක සඳහන් ආකාරයට, “ඔබ මෙල්කිසදෙක් හා සමානව පූජකයෙක් ලෙස සදහටම සේවය කරන්නෙහිය”[10] කියාද දෙවි පවසයි.

**7** ක්‍රිස්තුස් මිනිසෙකු ලෙස ජීවත් වූ කාලයේදී තමාව මරණයෙන් ගැලවීමට හැකි තැනැත්තාණන් ඉදිරියේ බලවත් ලෙස[11] හඬා වැලපෙමින් කඳුළු සලමින් ඔහුට ඉල්ලීම් සහ කන්නලව් ඉදිරිපත් කළේය.[12] ඔහු දේවගරුබියෙන් කටයුතු කළ නිසා[13] දෙවි ඔහුට සවන් දුන්නේය. **8** ඔහු ඒ තැනැත්තාගේ පුත්‍රයා වුණත් විවිධාකාර දුක් පීඩා විඳ කීකරුකම ඉගෙනගත්තේය.[14] **9** ඔහු සෑම අතින්ම සම්පූර්ණ කෙනෙකු බවට පත් වූ පසුව[15] තමාට කීකරු වන සියලුදෙනාටම[16] සදාකාලික ගැලවීම ලබාගැනීමට මඟ සලසා දුන්නේය.[17] **10** මන්ද දෙවි ඔහුව පැහැදිලිව හඳුන්වා තිබෙන්නේ මෙල්කිසදෙක් හා සමාන උත්තම පූජකයෙකු ලෙසය.[18]

**11** ඔහු ගැන අපට බොහෝ දේවල් කීමට තිබුණත් ඒ දේවල් පැහැදිලි කර දීම ලෙහෙසි පහසු දෙයක් නොවේ. මන්ද ඔබේ තේරුම්ගැනීමේ හැකියාව* මොට වී තිබේ.[1] **12** මේ කාලයට අනුව ඔබ ගුරුවරුන් විය යුතුයි.[2] නමුත් දෙවිගේ ශුද්ධ පණිවිඩයට අයත්[3] මූලික දේවල්[4] ගැන නැවතත් මුල සිටම ඔබට ඉගැන්වීමට කෙනෙකු අවශ්‍ය බව පෙනේ. ඔබට දැන් අවශ්‍ය වී තිබෙන්නේ ගන ආහාර නොව කිරිය.[5] **13** මන්ද කිරි පමණක් බොන අය ළදරුවන් වන නිසා එවැනි අයට ධර්මිෂ්ඨකම පිළිබඳ පණිවිඩය ගැන අවබෝධයක් නැත.[6] **14** නමුත් ගන ආහාර ලබා දෙන්නේ අවබෝධයෙන් ක්‍රියා කරන අයටය. ඔවුහු තම වටහාගැනීමේ හැකියාව[7] භාවිත කරන නිසා හරි වැරැද්ද නිවැරදිව හඳුනාගැනීමට පුහුණු වී සිටිති.[8]

# 6

එහෙයින් අප ක්‍රිස්තුස්[9] පිළිබඳ මූලික[10] ඉගැන්වීම් පසු කර ඉදිරියට පැමිණ සිටින නිසා අවබෝධයෙන් ක්‍රියා කරන අය වීමට දැඩි උත්සාහයක් දරමු.[11] නැවතත් අත්තිවාරමක් දැමීම සඳහා අවශ්‍යතාවක් නැත.[12] එහෙයින් කලින් කළ නිෂ්ඵල ක්‍රියා ගැන පසුතැවිලි වීම,[13] දෙවි කෙරෙහි විශ්වාසය පෙන්වීම,[14] **2** විවිධ බව්තීස්මයන්,[15] අත් තැබීම,[16] මිය ගිය අයගේ නැවත නැඟිටීම,[17] අවසාන විනිශ්චය[18] යනාදි දේ ගැන නැවත ඉගෙනගත යුතු නැත. **3** එසේනම් දෙවිගේ උපකාරයෙන් අවබෝධයෙන් ක්‍රියා කරන අය වීමට අපි දැඩි උත්සාහයක් දරමු.[19]

**4** දෙවිගෙන් ආලෝකයද[20] දෙවිගෙන්* ලැබෙන දීමනාවද[21] දෙවිගේ බලයද,[22] **5** දෙවි පවසන අනර්ඝ දේද මතු පැමිණෙන කාලයේ* ආශීර්වාදද[23] රස බලා ඇති අය,[24] **6** සත්‍ය මාර්ගයෙන් ඉවත්ව

**5 පරි.**

**1** හෙබ්‍රෙ 2:18; හෙබ්‍රෙ 4:15
**2** ලෙවී 9:7; ලෙවී 16:6; මලා 2:7
**3** 2ලේක 26:18
**4** නික් 28:1
**5** යොහ 3:27
**6** හෙබ්‍රෙ 4:14
**7** යොහ 8:54
**8** ගීතා 2:7; ක්‍රියා 13:33
**9** යොහ 12:28
**10** ගීතා 110:4; හෙබ්‍රෙ 7:17
**11** මතෙ 26:39; යොහ 12:27
**12** ලූක් 22:44
**13** ලූක් 12:5
**14** මතෙ 26:39; යොහ 10:17; පිලි 2:8
**15** ලෙවී 8:33; හෙබ්‍රෙ 7:28
**16** යොහ 3:16
**17** යෙසා 45:17; යෙසා 49:6; යෙසා 53:11; ලූක් 1:69
**18** ගීතා 110:4

**2 තීරුව**

**1** 2පේත්‍රු 3:16
**2** එෆී 4:11
**3** ක්‍රියා 7:38; රෝම 3:2; 1පේත්‍රු 4:11
**4** හෙබ්‍රෙ 6:1
**5** 1කොරි 3:2
**6** 1කොරි 13:11; එෆී 4:14
**7** මාක් 7:18; එෆී 1:18
**8** යෙසා 7:15; රෝම 16:19; පිලි 1:10; 1තෙස 5:21

**6 පරි.**

**9** කොලො 1:27; 1තිමෝ 3:16
**10** 1කොරි 3:1; හෙබ්‍රෙ 5:12
**11** 1කොරි 13:11; 1කොරි 14:20; එෆී 4:13; පිලි 3:16; හෙබ්‍රෙ 5:14
**12** 1කොරි 3:10
**13** එෆී 4:22
**14** 1තෙස 1:8
**15** ක්‍රියා 19:4; රෝම 6:3
**16** ක්‍රියා 6:6; 1තිමෝ 5:22
**17** මතෙ 22:31; යොහ 5:29; යොහ 11:25

**18** ක්‍රියා 17:31; 2පේත්‍රු 3:7; එළි 20:12; **19** යාකො 4:15; **20** එෆී 1:18; හෙබ්‍රෙ 10:26; **21** ක්‍රියා 10:45; එෆී 3:7; යාකො 1:17; **22** ක්‍රියා 15:8; ගලා 3:5; හෙබ්‍රෙ 2:4; **23** 2කොරි 5:5; එෆී 1:14; **24** 1පේත්‍රු 2:3.

හෙබ්‍රෙ **5:11*** මූ.අ., “ඔබේ සවන් දීමේ හැකියාව.” **6:4*** මූ.අ., “ස්වර්ගයෙන්.” **5*** හෝ, “සමාජ ක්‍රමවල.” ග්‍රීක බසින්, එඕනොස්.

ගියොත්[1] පසුතැවිලි වීම සඳහා
ඔවුන්ව පියවි සිහියට ගත නො-
හැක.[2] මන්ද ඔවුන් කරන දේ දෙ-
විගේ පුත්‍රයාව නැවත වධකණුවක
ඇණ ගසා ඔහුව ප්‍රසිද්ධියේ නින්දාවට
පත් කිරීම හා සමානය.[3] **7** උදාහර-
ණයකට වැසි වැස නිතරම තෙත්
වන පොළොව ගැන සිතන්න. එලෙස
වැසි ඇද හැලීම නිසා වගා කටයුතු
කරන අයට හොඳ පලදාවක් නෙළා-
ගත හැකි වේ.[4] එහෙයින් එයට දෙවි-
ගේ ආශීර්වාද ලැබෙන බව පැවසිය
හැක. **8** නමුත් එයින් කටු පඳුරු
හා වල් පැළෑටි හටගනී නම් එය
ප්‍රතික්ෂේප කරනු ලබන අතර වැඩි
කල් නොගොස් වගා කටයුතු කරන
තැනැත්තාගේ ශාපයට එය ලක් වී[5]
අවසානයේදී පුලුස්සනු ලැබේ.[6]
**9** නමුත් ප්‍රේමණීය සහෝදරයෙනි,
එවැනි දේවල් ඔබට කීමට සිදු වුණත්
ඔබ වඩාත් හොඳ තත්වයක සිටින
බව අපට නිසැකය. ඒ තුළින් ගැල-
වීම ලබාගැනීමට ඔබට හැකියාවක්
තිබෙන බව අපට පෙනේ. **10** මන්ද
ඔබ කළ සේවය හා දෙවිගේ නාමය
කෙරෙහි ඔබ පෙන්වූ ප්‍රේමය අම-
තක කිරීමට තරම් දෙවි අධර්-
මිෂ්ඨ කෙනෙක් නොවේ.[7] ඔබ ශුද්ධ
තැනැත්තන් වෙනුවෙන් සේවය කර
තිබෙනවා[8] පමණක් නොව එසේ දිග-
ටම සේවය කරමින් සිටින ආකාරයද
පැහැදිලිව පෙනේ. **11** ඔබේ උනන්-
දුව දිගටම පවත්වාගන්න. එසේ
කිරීමෙන් ඔබේ බලාපොරොත්තුව[9]
සැබවින්ම ඉටු වන බවට අවසා-
නය දක්වාම[10] පූර්ණ නිසැකකමින්
සිටීමට[11] ඔබට පුළුවන. **12** ඒ නිසා
කම්මැලි නොවන්න.[12] විශ්වාසයකින්
හා ඉවසීමකින් කටයුතු කර පො-
රොන්දු වූ දේවල ඉටු වීම අද්දකින
අයව[13] අනුකරණය කරන්න.[14]
**13** දෙවි ආබ්‍රහම්ට පොරොන්දුව
දුන් විට[15] තමාට වඩා උතුම් කෙ-
නෙකු නැති නිසා තමාගේම නාම-
යෙන් දිවුරා,[16] **14** මෙසේ පැවසුවේය.
“මම ඔබට අනිවාර්යයෙන්ම ආශීර්වාද
කරන්නෙමි. මම ඔබෙන් පැවතෙන්-
නන්ව බොහෝ සෙයින් වැඩි කරන්-
නෙමි.”[1] **15** ආබ්‍රහම් ඉවසීමෙන්
කටයුතු කළ පසු ඔහුට ඒ පොරොන්-
දුව ලැබිණ.[2] **16** මිනිස්සු සාමාන්‍ය-
යෙන් පොරොන්දු දෙන්නේ තමන්ට
වඩා ශ්‍රේෂ්ඨ කෙනෙකුගේ නාමයෙන්
දිවුරමිනි.[3] ඔවුන් කළ දිවුරුම පො-
රොන්දුව ඉටු වන බව පිළිගැනී-
මට සහතිකයක් වන නිසා ඒ ගැන
මතු වන ඕනෑම සැකයක් දුරු වේ.[4]
**17** එලෙසම දෙවි තමන් කළ පො-
රොන්දුව දිවුරුමක් මගින් සහතික
කළේය. එසේ කළේ තම පොරොන්දු-
වට උරුමකම් කියන අයට[5] තම අර-
මුණ වෙනස් නොවන බව[6] වඩාත්
පැහැදිලිව තහවුරු කිරීම සඳහාය.
**18** ඒ අනුව දෙවි කිසි ලෙසකින්-
වත් බොරු නොකියන බව[7] ඔප්පු
කරන එම ක්‍රම දෙක* මාර්ගයෙන්
දෙවිගේ රක්ෂස්ථානයට පලා ඇවිත්
සිටින අපට මහත් දිරිගැන්වීමක් ලබා-
ගත හැකි අතර අප ඉදිරියේ තබා
ඇති බලාපොරොත්තුව තදින් අල්ලා-
ගැනීමටද අපට හැකි වේ.[8] **19** අපට
තිබෙන ඒ බලාපොරොත්තුව[9] අපගේ
ජීවිතය නමැති නැවට නැංගුරමක් හා
සමානය. එය ස්ථිරය. ඒ ගැන කිසි
සැකයක් තබාගත යුතු නැත. ඒ බලා-
පොරොත්තුව මාර්ගයෙන් අපට තිරය
පසු කරගෙන යා හැක.[10] **20** අපට
කලින් අප උදෙසා කෙනෙක් ඒ තිරය
පසු කර ඇතුල් වී ඇත.[11] ඒ මෙල්කිස-
දෙක් මෙන් සදහටම උත්තම පූජක-
යෙක් වී සිටින යේසුස්ය.[12]

**7** මෙල්කිසදෙක් යනු සාලම් නුව-
රෙහි රජුය. එමෙන්ම ඔහු
මහෝත්තම දෙවිගේ පූජකයෙකි.[13]
ආබ්‍රහම් රජවරුන්ව සම්පූර්ණයෙන්ම
පරාජය කර පැමිණි පසු ඔහු ආබ්‍ර-
හම්ව හමු වී ඔහුට ආශීර්වාද
කළේය.[14] **2** ආබ්‍රහම් තමන් සතු
සියල්ලෙන් දසයෙන් කොටසක් ඔහුට

හෙබ්‍රෙ **6:18*** එනම්, දෙවි දුන් පොරොන්දුව සහ කළ දිවුරුම.

**6 පරි.**
1 ගීතා 119:118; 2කොරි 11:13; හෙබ්‍රෙ 10:39; 1යොහ 2:19
2 මතෙ 12:32
3 හෙබ්‍රෙ 10:29
4 උත් 1:11
5 උත් 3:18
6 මතෙ 13:30
7 1තෙස 1:3; හෙබ්‍රෙ 10:32
8 රෝම 15:25; 2කොරි 8:4; 2තිමෝ 1:18
9 1පේතෘ 1:3
10 හෙබ්‍රෙ 3:14
11 කොලො 2:2
12 රෝම 12:11; එළි 2:4
13 1කොරි 11:1
14 හෙබ්‍රෙ 10:36; යාකො 5:10
15 රෝම 4:20
16 උත් 22:16; ගීතා 105:9; යෙසා 45:23; ලූක් 1:73

**2 නිරුව**
1 උත් 22:17
2 හෙබ්‍රෙ 11:17
3 නික් 22:11; යෙරෙ 12:16
4 උත් 31:53; උත් 47:31
5 ගලා 3:29
6 මලා 3:6
7 ගණන් 23:19; 1සාමු 15:29; තීත 1:2
8 රෝම 5:4; කොලො 1:5
9 1පේතෘ 1:3
10 ලෙවී 16:2; ලෙවී 16:12; යොහ 14:3; හෙබ්‍රෙ 9:7; හෙබ්‍රෙ 10:20
11 හෙබ්‍රෙ 4:14
12 ගීතා 110:4; හෙබ්‍රෙ 5:6

**7 පරි.**
13 උත් 14:18
14 උත් 14:19

වෙන් කර දුන්නේය.[1] මෙල්කිස-
දෙක් යන නමෙහි අර්ථය වන්නේ
“ධර්මිෂ්ඨකමේ රජු” යන්නයි. එලෙ-
සම සාලම් රජු[2] යනු “සමාදානයේ
රජුය.” **3** ඔහුගේ පියා හෝ මව හෝ
ඔහුගේ පෙළපත ගැන හෝ කිසි තොර-
තුරක් නැත. ඔහු ඉපදුණු දවස[3] හෝ
ඔහු මිය ගිය දවස ගැන හෝ කිසිවෙකු
දන්නේද නැත. දෙවිගේ පුත්‍රයාට
සමානව[4] ඔහු සදහටම පූජකයෙකි.[5]
**4** ඒ අනුව අපගේ මුතුන්මිත්තා
වන ආබ්‍රහම් කොල්ලයක් ලෙස
ලබාගත් හොඳම දේවලින් දසයෙන්
කොටසක් දුන් එම මිනිසා[6] කොතෙ-
රම් උතුම්ද කියා සලකා බලන්න.
**5** ඇත්තෙන්ම ලෙවීගේ පෙළපතින්
පූජක තනතුරට පත් වන අය[7] ජනයා-
ගෙන්[8] දසයෙන් කොටස ලබාගත යුතු
බවට ආඥාවක් දී තිබේ.[9] එය නීතියේ
සඳහන් වේ. එම ජනයා තමන්ගේම
සහෝදරයන් වුවත් ආබ්‍රහම්ගෙන්ම
පැවතෙන අය වුවත්[10] ඒ සියලුදෙනා-
ගෙන්ම ඔවුහු එම දසයෙන් කොටස
ලබාගනිති. **6** නමුත් එම මිනිසා
ලෙවීගේ පෙළපතට අයත් කෙනෙකු
නොවුණත්[11] ඔහු පොරොන්දු ලබා
තිබූ ආබ්‍රහම්ගෙන් දසයෙන් කොට-
සක් ගෙන[12] ඔහුට ආශීර්වාද
කළේය.[13] **7** මෙහිදී සුළු තැනැත්-
තාට උතුම් තැනැත්තාගේ ආශීර්වාද
ලැබුණු බවට කිසි සැකයක් නැත.[14]
**8** සාමාන්‍යයෙන් දසයෙන් කොටස
ලබා දෙන්නේ මිය යන මිනිසුන්ටය.[15]
නමුත් එම මිනිසාට ලබා දුන් දස-
යෙන් කොටස ගැන සලකා බලද්දී එය
ලබා දී තිබෙන්නේ දිගටම ජීවත්ව
සිටින බව ශුද්ධ ලියවිල්ලෙන් තහවුරු
වී ඇති කෙනෙකුටය.[16] **9** සාමාන්‍ය-
යෙන් දසයෙන් කොටස ලබන ලෙවී-
ගේ පෙළපත පවා ආබ්‍රහම් මාර්ගයෙන්
දසයෙන් කොටස ගෙවා ඇති බව පැව-
සිය හැක. **10** මන්ද මෙල්කිසදෙක්ට
ලෙවීගේ පෙළපතේ මුතුන්මිත්තා වන
ආබ්‍රහම්ව හමු වූ විට[17] ලෙවී ඒ වන
විටත් ඉපදී සිටියේ නැත.[18]
**11** පාපයෙන් තොර පරිපූර්ණ තත්-
වයක් ලබාගැනීමට[1] ලෙවීගේ ගෝ-
ත්‍රයට අයත් පූජකයන්ව පත් කර
තිබුණා නම්[2] ආරොන්ට වඩා වෙනස්
වූ මෙල්කිසදෙක් හා සමාන නවත්
පූජකයෙකු[3] අවශ්‍ය වන්නේ නැත.[4]
(ජනයාට දුන් නීතියේ එම පූජක-
යන් ඉටු කරන සේවයද ඇතුළත් කර
තිබිණ.)[5] **12** එසේනම් එම පූජක-
යන්ගේ සේවය අහෝසි කරන නිසා[6]
නීතියද අනිවාර්යයෙන්ම අහෝසි කළ
යුතුයි.[7] **13** ඉහත සඳහන් තොරතු-
රුවලින් අප විස්තර කරන මිනිසා
වෙනත් ගෝත්‍රයක සාමාජිකයෙකි.[8]
ඒ ගෝත්‍රයෙන් කිසිවෙකු පූජාසනය
අසල සේවය කර නැත.[9] **14** අපගේ
ස්වාමීන් යූදා ගෝත්‍රයෙන් පැමිණි බව
ඉතා පැහැදිලිය.[10] ඒ ගෝත්‍රයේ අය
පූජකයන් ලෙස සේවය කරන බව
මෝසෙස් සඳහන් කළේ නැත.
**15** ඒ සියල්ලෙන් පැහැදිලි වන්නේ
මෙල්කිසදෙක්ට සමාන[11] නවත් පූජ-
කයෙකුව පත් කරනු ලබන බවය.[12]
**16** එසේ ඔහුව පත් කරන්නේ නීති-
යේ සඳහන් ආඥාවලට අනුව ඔහු
යම් මිනිස් පෙළපතකින් පැමිණි නිසා
නොවේ.[13] ඒ දේ සිදු වන්නේ කිසි-
වෙකුට විනාශ කළ නොහැකි ජීවිත-
යක් භුක්ති විඳීමට ඔහුට මහ සලසන
බලය මාර්ගයෙනි.[14] **17** මන්ද ඔහු
ගැන ශුද්ධ ලියවිල්ලේ එක් ස්ථානයක
පවසන්නේ, “ඔබ මෙල්කිසදෙක් හා
සමානව පූජකයෙක් ලෙස සදහටම
සේවය කරන්නෙහිය”[15] කියාය.
**18** ඒ අනුව කලින් දී තිබූ ආඥා
දුර්වල වූ නිසාත්[16] ඒවායින් ප්‍රතිඵල-
යක් නෙළාගත නොහැකි වූ නිසාත්[17]
එය අවලංගු වන බව නිසැකය.
**19** මන්ද නීතිය මගින් කිසිවෙකුව
පාපයෙන් තොර පරිපූර්ණ තත්වය-
කට පත් කළේ නැත.[18] නමුත් වඩා
උතුම් බලාපොරොත්තුවක් මගින්[19] ඒ
දේ ඉටු වී ඇති අතර අප දෙවි වෙතට
ළඟා වන්නේ එමගිනි.[20] **20** එලෙ-
සම ඒ ගැන දිවුරුමක්ද දී ඇත.

**7 පරි.**
**1** උත් 14:20
**2** උත් 14:18; ගීතා 76:2
**3** හිතෝ 8:23
**4** මතෙ 16:16
**5** ගීතා 110:4
**6** උත් 14:20
**7** නික් 40:15; ගණන් 18:21
**8** ලෙවී 7:34
**9** ගණන් 18:26; ද්වි 14:28
**10** යොහ 8:33
**11** එස්රා 2:62
**12** උත් 14:20
**13** උත් 12:7; උත් 17:6; උත් 22:17; රෝම 4:13; ගලා 3:16
**14** හෙබ්‍රෙ 11:20
**15** ගණන් 18:21
**16** හෙබ්‍රෙ 7:3
**17** උත් 14:18
**18** නික් 1:5; රෝම 7:9

**2 තීරුව**
**1** රෝම 3:20; ගලා 2:21; හෙබ්‍රෙ 7:19; හෙබ්‍රෙ 9:9
**2** හෙබ්‍රෙ 10:1
**3** ගීතා 110:4
**4** යෙරෙ 31:31; හෙබ්‍රෙ 8:7
**5** ගලා 3:19
**6** හෙබ්‍රෙ 8:1
**7** රෝම 3:27; 1කොරි 9:21; ගලා 6:2; කොලො 2:14
**8** එළි 5:5
**9** ගණන් 18:7; 2ලේක 26:18
**10** උත් 49:10; යෙසා 11:1; මතෙ 1:3; ලූක් 3:33
**11** ගීතා 110:4
**12** හෙබ්‍රෙ 3:1; හෙබ්‍රෙ 7:26
**13** රෝම 7:14
**14** රෝම 6:9; 1තිමෝ 6:16; එළි 1:18
**15** ගීතා 110:4; හෙබ්‍රෙ 5:6; හෙබ්‍රෙ 6:20
**16** රෝම 8:3; ගලා 4:9
**17** හෙබ්‍රෙ 9:9; හෙබ්‍රෙ 13:9
**18** ක්‍රියා 13:39; ගලා 2:16; හෙබ්‍රෙ 10:1
**19** 1තිමෝ 1:1; හෙබ්‍රෙ 6:18; 1පේත්‍ර 1:3

**20** යොහ 14:6; රෝම 5:2; හෙබ්‍රෙ 4:16.

**21** (මන්ද මිනිසුන් පූජකයන් ලෙස
පත් වූයේ දිවුරා පොරොන්දුවක් වීම
මාර්ගයෙන් නොවේ. නමුත් දිවුරුමක්
මාර්ගයෙන් පූජකයෙකු වූ කෙනෙක්
සිටියි. ඔහු ගැන දිවුරා පොරොන්දු වූ
තැනැත්තාණන් ඔහු ගැන පවසන්-
නේ මෙයයි. “‘ඔබ පූජකයෙක් ලෙස
සදහටම සේවය කරන්නෙහිය’[1] කියා
යෙහෝවා දෙවි පොරොන්දු වුණේය.[2]
ඔහු ඒ ගැන කනගාටු නොවන්-
නේය.”) **22** එලෙසම යේසුස් වඩා
උතුම් ගිවිසුමක් සහතික කරයි.[3]
**23** පූජකයන් ලෙස බොහෝදෙනෙ-
කුට අනුපිළිවෙළින් සේවය කිරී-
මට සිදු විය.[4] එසේ වූයේ මරණය
නිසා[5] එක් කෙනෙකුට දිගටම පූජ-
කයෙකු ලෙස සේවය කිරීමට නො-
හැකි වූ නිසාය. **24** නමුත් ඔහු
සදහටම ජීවත්ව සිටින නිසා[6] වෙන
කිසි කෙනෙකු ඔහුගේ පූජක තන-
තුර ලබාගන්නේ නැත. **25** එහෙ-
යින් ඔහු මාර්ගයෙන් දෙවිට ළඟා
වන අයව සම්පූර්ණයෙන්ම ගලවාගැ-
නීමට ඔහුට පුළුවන. එසේ වන්නේ
ඔවුන් වෙනුවෙන් කන්නලව් කිරීමට
ඔහු සදහටම ජීවත්ව සිටින නිසාය.[7]
**26** ඇත්තෙන්ම අපට අවශ්‍ය වන්-
නේ එවැනි උත්තම පූජකයෙකි.[8]
මන්ද ඔහු විශ්වාසවන්ත,[9] අවංක,[10]
පවිත්‍ර කෙනෙකි.[11] ඔහු පව්කාර-
යන්ට වඩා හාත්පසින්ම වෙනස් කෙ-
නෙක්[12] වන අතර ඔහුගේ උතුම්කම
මුළු මහත් අහසටත් වඩා ඉහළය.[13]
**27** අනිකුත් උත්තම පූජකයන් කරන
ආකාරයට ඔහු දිනපතාම[14] තමන්
වෙනුවෙන්ද[15] ඉන්පසුව ජනයා වෙනු-
වෙන්ද[16] පූජා ඔප්පු කිරීමට අවශ්‍ය
නැත. (මන්ද ඔහු තම ජීවිතය සදහ-
ටම එක වරක්[17] පූජා කළේය.[18] ඒ
දේ නැවත වරක් කිරීමට අවශ්‍යතා-
වක් නැත.) **28** නීතිය මාර්ගයෙන්
උත්තම පූජකයන් ලෙස පත් කරනු
ලබන්නේ[19] දුර්වලකම් ඇති පුරුෂ-
යන්වය.[20] නමුත් ඉන්පසුව දෙවි දිවුරා
කරන පොරොන්දුව මාර්ගයෙන්[21] පත්
කරනු ලබන්නේ සදහටම පරිපූර්ණ
තත්වයකට පත් කර ඇති පුත්‍රයෙ-
කුවය.[1]

**8** මෙතෙක් පැහැදිලි කළ දේව-
ලින් ඉස්මතු වන ප්‍රධාන
කරුණ වන්නේ මෙයයි. එනම් අපට
සිටින උත්තම පූජකයා[2] ස්වර්ග-
යෙහි මහෝත්තමයාණන්ගේ සිංහාස-
නයේ දකුණු පැත්තේ අසුන්ගෙන,[3]
**2** මිනිසා විසින් නොව[4] යෙහෝවා
දෙවි විසින් ඉදි කරන ලද[5] සැබෑ කූඩා-
රමෙහි හා අතිශුද්ධස්ථානයෙහි ජනයා
වෙනුවෙන් සේවය කරන බවය.[6]
**3** සෑම උත්තම පූජකයෙකුවම පත්
කරන්නේ පරිත්‍යාග සහ පූජා ඔප්පු
කිරීම සඳහාය.[7] ඒ අනුව ඔහුටත්
ඔප්පු කිරීම සඳහා යමක් අවශ්‍ය විය.[8]
**4** ඔහු තවමත් පොළොවේ ජීවත්
වෙමින් සිටිනවා නම් ඔහු පූජක-
යෙක් වන්නේ නැත.[9] මන්ද නීතියට
අනුව පරිත්‍යාග ඔප්පු කරන පූජක-
යන් තවමත් සිටින නිසාය. **5** මෝ-
සෙස් කූඩාරම සෑදීමට පියවර ගත්
විට[10] ඔහුට ලැබුණු ආඥාව වූයේ,[11]
“ඔබට කන්දේදී පෙන්වන ලද සැලැස්-
මට අනුව සියල්ල සෑදීමට වගබලා
ගන්න”[12] කියාය. ඉන් පැහැදිලි වන්-
නේ ඉහත සඳහන් මිනිසුන් දෙවිට
තම සේවය ස්වර්ගයේ තිබෙන දේ-
වල ආකෘතියක්[13] සහ ඡායාවක්[14] හා
සමාන ස්ථානයක පිරිනමන බවයි.
**6** නමුත් ජනයා වෙනුවෙන් වඩාත්
උතුම් සේවයක් යේසුස්ට භාර දී ඇත.
ඒ නිසා ඔහු වඩාත් උතුම් ගිවිසුමක[15]
මැදිහත්කරු ලෙස කටයුතු කරන
අතර[16] එය නීත්‍යානුකූලව පිහිටුවා
තිබෙන්නේ කලින් දුන් පොරොන්දුව-
ලට වඩා උතුම් පොරොන්දු මතය.[17]
**7** මුල් ගිවිසුමේ කිසි අඩුවක් තිබු-
ණේ නැත්නම් දෙවෙනි ගිවිසුමක්
සඳහා අවශ්‍යතාවක් ඇති වන්-
නේ නැත.[18] **8** මන්ද දෙවි සෙනඟට
දොස් තබමින් මෙසේ පවසයි. “යෙ-
හෝවා දෙවි මෙසේ පවසන්නේය.

**7 පරි.**

**1** ගීතා 110:4
**2** හෙබ්‍රෙ 6:18
**3** යෙරෙ 31:31 මතෙ 26:28 1කොරි 11:25 හෙබ්‍රෙ 8:6 හෙබ්‍රෙ 9:15 හෙබ්‍රෙ 12:24
**4** 1ලේක 6:4
**5** ගණන් 20:28 යොෂු 24:33
**6** ලූක් 1:33 හෙබ්‍රෙ 7:16 හෙබ්‍රෙ 13:8
**7** රෝම 8:34 1තිමෝ 2:5 හෙබ්‍රෙ 9:24 1යොහ 2:1
**8** හෙබ්‍රෙ 4:15
**9** යෙසා 16:5 හෙබ්‍රෙ 3:2
**10** සෙක 9:9
**11** යෙසා 53:9 1පේත්‍ර 2:22
**12** යොහ 8:46
**13** එෆි 1:20 හෙබ්‍රෙ 4:14 1පේත්‍ර 3:22
**14** ගණන් 28:3
**15** ලෙවී 9:8
**16** ලෙවී 9:15
**17** රෝම 6:10
**18** හෙබ්‍රෙ 9:28 හෙබ්‍රෙ 10:14
**19** නික් 29:9
**20** ලෙවී 16:11
**21** ගීතා 2:7 ගීතා 110:4

**2 තීරුව**

**1** හෙබ්‍රෙ 2:10 හෙබ්‍රෙ 5:9

**8 පරි.**

**2** සෙක 6:13 හෙබ්‍රෙ 3:1 හෙබ්‍රෙ 7:26
**3** ගීතා 110:1 හෙබ්‍රෙ 1:3
**4** හෙබ්‍රෙ 9:11
**5** නික් 25:9 ගීතා 84:1 හෙබ්‍රෙ 3:4
**6** හෙබ්‍රෙ 9:8 හෙබ්‍රෙ 9:24
**7** හෙබ්‍රෙ 5:1
**8** යොහ 6:51 එෆි 5:2
**9** හෙබ්‍රෙ 7:14
**10** හෙබ්‍රෙ 9:9
**11** නික් 25:9
**12** නික් 25:40 නික් 26:30 ගණන් 8:4 ක්‍රියා 7:44
**13** හෙබ්‍රෙ 9:9 හෙබ්‍රෙ 9:24
**14** කොලො 2:17 හෙබ්‍රෙ 10:1

**15** 1කොරි 11:25; හෙබ්‍රෙ 7:22; හෙබ්‍රෙ 9:15; **16** 1තිමෝ 2:5; හෙබ්‍රෙ 12:24; **17** ගීතා 110:4; රෝම 8:17; **18** හෙබ්‍රෙ 7:11; හෙබ්‍රෙ 7:18.

‘මා ඊශ්‍රායෙල් සෙනඟ සහ යූදා සෙ-
නඟ සමඟ අලුත් ගිවිසුමක් ඇති
කරගන්නා කාලයක් ඉදිරියේදී පැමි-
ණෙයි.[1] **9** නමුත් එය ඔවුන්ගේ
මුතුන්මිත්තන්ව ඊජිප්තු දේශයෙන්
පිටතට ගෙන ඒමට මා ඔවුන්ගේ
අත අල්ලාගත් දවසේදී[2] ඔවුන් සමඟ
කළ ගිවිසුම මෙන් නොවෙයි.[3] මන්ද
ඔවුන් මාගේ ගිවිසුමට විශ්වාසවන්තව
සිටියේ නැත.[4] එහෙයින් මා ඔවුන්
ගැන තවදුරටත් සැලකිල්ල දැක්-
වූයේද නැත’ කියා යෙහෝවා දෙවි
පවසයි.”[5]

**10** “යෙහෝවා දෙවි තවදුරටත්
මෙසේ පවසන්නේය. ‘ඒ කාලයට පසු
මම ඊශ්‍රායෙල් සෙනඟ සමඟ ඇති
කරගන්නා ගිවිසුම මෙයයි. මම මගේ
නීති ඔවුන්ගේ සිත්වල තබමි. ඒවා
ඔවුන්ගේ හදවත්වල[6] ලියන්නෙමි.
මම ඔවුන්ව මාගේ සෙනඟ ලෙස පිළි-
ගෙන[7] ඔවුන්ගේ දෙවි වන්නෙමි.[8]

**11** “‘“යෙහෝවා දෙවිව දැන
හඳුනා ගන්න”[9] කියා ඉදිරියේදී එකි-
නෙකා තම තමාගේ අසල්වැසියාට-
වත් සහෝදරයාටවත් උගන්වන්නේ
නැත. මන්ද සුළුම තැනැත්තාගේ සිට
උතුම්ම තැනැත්තා දක්වා එනම්,
ඔවුන් අතරේ සිටින සියලුදෙනා මාව
හොඳින් දැන හඳුනා ගෙන සිටිනු
ඇත.[10] **12** ඔවුන් කළ අධර්මිෂ්ඨ
ක්‍රියා සඳහා මම ඔවුන්ට දයාව දක්-
වන්නෙමි. ඔවුන් කළ පව්[11] නැවත
කිසිදා සිහි නොකරන්නෙමි.’ ”[12]

**13** “අලුත් ගිවිසුමක්” කියා පැවසී-
මෙන් කලින් තිබූ ගිවිසුම ඔහු අවලංගු
කර තිබේ.[13] එසේ අවලංගු කර පහ වී
යෑමට නියමිතව තිබූ දේ දැන් තුරන්
වී යෑමට ආසන්නය.[14]

**9** කලින් වලංගු වූ ගිවිසුම යට-
තේ දෙවිට කළ සේවයට අදාළ
නීතිරීතිද[15] නමස්කාරය සඳහා පො-
ළොව මත ශුද්ධස්ථානයක්ද[16]
තිබිණ. **2** කූඩාරමක් ලෙස ඉදි කළ
එම ශුද්ධස්ථානයේ මුල් කාමරයෙහි[17]
පහන් රුකද[18] මේසයද[19] පුදන රො-
ටිද[20] දක්නට ලැබිණ. එය හඳුන්-
වනු ලැබුවේ “ශුද්ධස්ථානය” ලෙසය.[1]
**3** එම කූඩාරමේ දෙවෙනි තිරය පිටු-
පස[2] “අතිශුද්ධස්ථානය”[3] යනුවෙන්
හැඳින්වූ කාමරයක් තිබිණ. **4** එහි
රනින් සාදන ලද සුවඳ දුම් භාජන-
යක්ද[4] රන්වලින් ඇතුළත හා පිටත
සම්පූර්ණයෙන්ම ආලේප කරන ලද[5]
ගිවිසුම් පෙට්ටියද[6] තිබිණ. එම පෙට්-
ටියේ මන්නා දැමූ[7] රන් භාජනයද දලු
හටගත් ආරොන්ගේ සැරයටියද[8] ගිවි-
සුම ලියා තිබුණු ගල් පුවරුද තබන
ලදි.[9] **5** පෙට්ටිය මත මහත් තේ-
ජසකින් යුත් කෙරුබ්වරුන්ගේ රූප
දෙකක් තබා තිබූ අතර[10] ඒවා-
යේ සෙවණැල්ලෙන් පව්වලට සමාව
ලබාගන්නා ස්ථානයේ පිහිටි එම
පෙට්ටියේ පියන වැසී තිබිණ.[11] කෙ-
සේනමුත් ඒ දේවල් ගැන බොහෝ
විස්තර කතා කිරීමට මෙය සුදුසු
අවස්ථාවක් නොවේ.

**6** ඒ දේවල් එලෙස ඉදි කළ පසු
පූජකයෝ දෙවිට ඉටු කළ යුතු සේ-
වය සඳහා[12] ශුද්ධ කූඩාරමේ පළමු
කාමරයට නිතරම ඇතුල් වෙති.[13]
**7** නමුත් දෙවෙනි කාමරයට ඇතුල්
වන්නේ උත්තම පූජකයා පමණි.
ඒ අවුරුද්දකට එක් වතාවකි.[14] ඔහු
එයට ඇතුල් වන විට යම් ලේ ප්‍රමාණ-
යක් රැගෙන යන අතර[15] එම ලේ
තමා වෙනුවෙනුත්[16] සෙනඟ නොදැ-
නුවත්කමින් කළ පව් වෙනුවෙනුත්
ඔප්පු කරයි.[17] **8** මුලින් තිබූ ඒ ශුද්ධ
කූඩාරම පැවති කාලයේදී අතිශුද්ධස්-
ථානයට* පිවිසෙන මඟ[18] විවෘත වී
නොතිබූ බව[19] දෙවි තම බලය මගින්
පැහැදිලි කර ඇත. **9** එම කූඩා-
රම කලින් නියම කර තිබූ මෙම
කාලයේදී[20] සිදු වන දේවලට සංකේ-
තයක් වන අතර[21] මේ වන තුරු
පරිත්‍යාග සහ පූජා එහි ඔප්පු කරනු
ලැබේ.[22] කෙසේවෙතත් දෙවිට සේවය
කරන මිනිසාට දෙවි ඉදිරියේ සම්පූර්-
ණයෙන්ම[23] නිදොස් වූ හෘදය සාක්ෂි-

හෙබ්‍රෙ **9:8*** එනම්, ස්වර්ගයේ පිහිටි ශුද්ධස්ථාන-
යකට.

**8 පරි.**
**1** යෙරෙ 31:31
**2** නික් 12:51
**3** ද්වි 4:23
**4** ද්වි 32:15
**5** යෙරෙ 31:32
**6** එස 11:19
රෝම 2:29
**7** යෙරෙ 31:33
සෙක 8:8
හෙබ්‍රෙ 10:16
**8** 2කොරි 6:16
**9** හොෂෙ 2:20
**10** යෙසා 54:13
යොහ 6:45
**11** ගීතා 103:12
රෝම 11:27
**12** යෙරෙ 31:34
හෙබ්‍රෙ 10:17
**13** රෝම 10:4
හෙබ්‍රෙ 7:12
**14** මතෙ 23:38
එෆී 2:14
කොලො 2:14

**9 පරි.**
**15** ලෙවී 4:6
හෙබ්‍රෙ 9:9
**16** නික් 25:8
**17** නික් 26:33
**18** නික් 40:24
ගණන් 4:9
**19** නික් 40:22
**20** නික් 40:23

**2 තීරුව**
**1** නික් 26:33
**2** නික් 36:35
**3** නික් 26:34
**4** ලෙවී 16:12
එළි 8:3
**5** නික් 25:11
**6** නික් 40:21
**7** නික් 16:33
**8** ගණන් 17:10
**9** නික් 32:15
2ලේක 5:10
**10** නික් 25:22
ගණන් 7:89
**11** නික් 25:18
1ලේක 28:11
**12** ලෙවී 24:4
**13** ලෙවී 24:3
**14** ලෙවී 16:2
හෙබ්‍රෙ 9:25
**15** නික් 30:10
ලෙවී 16:14
**16** ලෙවී 16:6
**17** ලෙවී 16:15
**18** යොහ 14:6
**19** හෙබ්‍රෙ 10:20
**20** කොලො 2:17
හෙබ්‍රෙ 10:1
**21** හෙබ්‍රෙ 8:5
**22** ලෙවී 23:38
**23** ගලා 3:21
හෙබ්‍රෙ 7:11
හෙබ්‍රෙ 7:19
හෙබ්‍රෙ 8:6

යක් ලබා දීමට ඒවාට නුපුළුවන.[1]
**10** නමුත් එම පරිත්‍යාග සහ පූජාවන්
විවිධ කෑම[2] බීමවලට[3] මෙන්ම චාරි-
ත්‍රානුකූලව පවිත්‍ර වීමේ පිළිවෙත්ව-
ලට[4] පමණක් අදාළ වේ. ඒ අනුව එම
නීතික අවශ්‍යතා අදාළ වූයේ බාහිර
දේවලට පමණක් බව පැහැදිලිය.[5]
එලෙසම ඒවා පනවනු ලැබුවේ දෙවි-
ගේ අරමුණට එකඟව සෑම දෙයක්ම
නිවැරදි කිරීමට නියමිත කාලය පැමි-
ණෙන තුරුය.[6]

**11** නමුත් අප දැන් අද්දකිමින්
සිටින ආශීර්වාදවලට මඟ පෑදූ ක්‍රිස්-
තුස් උත්තම පූජකයෙකු ලෙස පැමිණි
විට[7] ඔහු ඇතුල් වූයේ මිනිසුන් නො-
සෑදූ මෙලොවෙහි තිබෙන දේවලට
සම්බන්ධයක් නැති වඩාත් ශ්‍රේෂ්ඨ
මෙන්ම පරිපූර්ණ කූඩාරම තුළටය.[8]
**12** ඔහු ඇතුල් වූයේ එළුවන්ගේවත්
වස්සන්ගේවත් ලේ රැගෙන නොව[9]
තමාගේම ලේ රැගෙනය.[10] එසේ ඔහු
එක් වරක් අතිශුද්ධස්ථානයට ඇතුල්
වී අපට සදාකාලික ගැලවීමක් ලබා
දුන්නේය.[11] ඒ නිසා ඒ දේ නැවත
කිරීමට ඔහුට සිදු වන්නේ නැත.
**13** මන්ද අපවිත්‍ර අය වෙනුවෙන්[12]
එළුවන්ගේ[13] සහ ගවයන්ගේ ලේද[14]
වැස්සියකගේ අළුද[15] ඔවුන් මත ඉසිනු
ලබන විට ඔවුන්ව නැවතත් පවිත්‍ර අය
ලෙස සැලකීමට[16] දෙවිට හැකි නම්,
**14** ක්‍රිස්තුස්ගේ ලෙයින්[17] ඊටත් වඩා
කොපමණ මහත් දෙයක් ඉටු වේද!
එලෙස ක්‍රිස්තුස් දෙවිගේ සදාකා-
ලික බලයේ ක්‍රියාකාරිත්වයට එකඟව
කැළැලක් රහිත තම ජීවිතය පුද
කර[18] අපගේ හෘදය සාක්ෂිය නිෂ්-
ඵල ක්‍රියාවලින්[19] පවිත්‍ර කර[20] අපට
ජීවමාන දෙවි වෙනුවෙන් පරිශුද්ධ
සේවයක් කිරීමේ අවස්ථාව[21] ලබා
දුන්නේය.

**15** ඔහු අලුත් ගිවිසුමක මැදිහත්-
කරුවෙකු වන්නේ ඒ නිසාය.[22] ඔහු
එසේ ක්‍රියා කරන්නේ කැඳවනු ලැබූ
අයට සදාකාලික උරුමයක් ලැබෙන
බවට වූ පොරොන්දුව ලබා දීම
සඳහාය.[23] ඒ සෑම දෙයකටම මඟ
විවෘත කළේ ඔහුගේ මරණයයි. ඒ
මරණය තුළින් ගෙවනු ලැබූ වන්දිය
මාර්ගයෙන්[1] ඔවුහු කලින් තිබූ ගිවි-
සුම යටතේ කළ වැරදිවලින්[2] නිදහ-
සක් ලබති. **16** මන්ද දෙවි සමඟ
ගිවිසුමක් තිබෙන විට[3] ඒ ගිවිසුමට
සම්බන්ධව සිටින පුද්ගලයා මිය ගිය
බව ඔප්පු විය යුතුයි. **17** එසේ වන්-
නේ ගිවිසුමක් වලංගු වීමට මරණ-
යක් සිදු විය යුතු නිසාය. එහෙයින්
ගිවිසුමට සම්බන්ධ වන පුද්ගලයා
ජීවත් වන තුරු ඒ ගිවිසුම ක්‍රියාත්මක
වන්නේ නැත. **18** කලින් පැවති
ගිවිසුම[4] ලේවලින් වලංගු කරනු ලැබු-
වේ ඒ නිසාය.[5] **19** මන්ද නීතියට
ඇතුළත් වූ සෑම ආඥාවක්ම මෝ-
සෙස් මුළු සෙනඟට පැවසූ පසු[6]
ඔහු වස්සන්ගෙත් එළුවන්ගෙත් ලේ
සමඟ වතුරද තද රතු පාට ලොම්ද
හිසොප්ද[7] ගෙන ගිවිසුම ලියා තිබුණු
ලියවිල්ල මතත් මුළු සෙනඟ මතත්
ඉසිමින්, **20** “දෙවි ඔබ සමඟ ඇති
කරගත් ඔබ කීකරු වීමට බැඳී සිටින
ගිවිසුම මේ ලේ මාර්ගයෙන් ස්ථිර
වෙයි” කියා පැවසුවේය.[8] **21** එසේම
ඔහු කූඩාරමටද[9] ජනයාට සේවය
කරන විට භාවිත කරන සියලු භාජ-
නවලටද ලේ ඉස්සේය.[10] **22** නීති-
යට අනුව සෑම දෙයක්ම පාහේ පවිත්‍ර
කරනු ලබන්නේ ලේ මාර්ගයෙනි.[11]
ඒ අනුව ලේ වැගිරීමක් සිදු වන්-
නේ නැත්නම්[12] පව්වලට සමාවක්
ලැබෙන්නේද නැත.[13]

**23** එමනිසා ස්වර්ගයේ තිබෙන දේ-
වල ආකෘතියක්[14] වන එම දේවල්
එලෙස පවිත්‍ර කිරීම අවශ්‍ය විය.[15]
නමුත් ස්වර්ගික දේවල් පවිත්‍ර කරනු
ලබන්නේ එම පූජාවලට වඩා උතුම්
පූජාවලිනි. **24** මන්ද ක්‍රිස්තුස් සැබෑ
දෙයෙහි ආකෘතියක්[16] වන මිනිසුන්
විසින් සාදන ලද[17] අතිශුද්ධස්ථානය-
කට ඇතුල් වූයේ නැත. ඒ වෙනුවට
ඔහු දැන් ස්වර්ගයට ඇතුල් වී[18] ඇති
අතර අප වෙනුවෙන් දෙවි ඉදිරියෙහිම
පෙනී සිටියි.[19] **25** නමුත් උත්තම
පූජකයාට සෑම අවුරුද්දක් පාසාම[20]

**9 පරි.**
**1** 1පේතෘ 3:21
**2** ලේවී 11:2
**3** ලේවී 10:9
ලේවී 11:34
**4** ලේවී 11:40
**5** ගණන් 19:13
**6** යෙසා 2:4
යොහ 1:17
හෙබ්‍රෙ 1:2
**7** හෙබ්‍රෙ 4:14
**8** හෙබ්‍රෙ 9:24
**9** මතෙ 20:28
1තිමෝ 2:6
හෙබ්‍රෙ 12:24
හෙබ්‍රෙ 13:20
**10** හෙබ්‍රෙ 8:3
**11** යෙසා 45:17
දානි 9:24
රෝම 11:27
හෙබ්‍රෙ 10:17
**12** ගණන් 19:17
**13** ලේවී 16:15
**14** ලේවී 16:6
**15** ගණන් 19:9
**16** ගණන් 19:19
**17** ලේවී 17:11
1පේතෘ 1:19
**18** එෆී 5:2
**19** 1කොරි 6:11
හෙබ්‍රෙ 6:1
**20** හෙබ්‍රෙ 10:2
1යොහ 1:7
**21** රෝම 12:1
පිලි 3:3
හෙබ්‍රෙ 12:28
**22** 1තිමෝ 2:5
හෙබ්‍රෙ 12:24
**23** රෝම 8:17

---

**2 තීරුව**
**1** මතෙ 20:28
ලූක් 22:20
**2** ගලා 3:13
**3** උත් 21:27
ගලා 3:15
**4** නික් 24:7
**5** නික් 24:6
**6** නික් 24:3
**7** ගණන් 19:6
**8** නික් 24:8
**9** ලේවී 16:16
**10** නික් 29:12
ලේවී 8:15
ලේවී 16:18
**11** ලේවී 17:11
**12** ලේවී 9:9
**13** එෆී 1:7
**14** හෙබ්‍රෙ 8:5
හෙබ්‍රෙ 9:9
**15** ලේවී 16:19
ලේවී 16:20
**16** කොලො 2:17
**17** හෙබ්‍රෙ 8:2
**18** හෙබ්‍රෙ 6:20
හෙබ්‍රෙ 9:12
හෙබ්‍රෙ 10:19
**19** ලේවී 16:15
යොහ 16:28
රෝම 8:34
**20** ලේවී 16:34

සතුන්ගේ ලේ* රැගෙන අතිශුද්ධස්ථා-
නයට ඇතුල් වීමට[1] සිදු වුණත් ක්‍රිස්-
තුස්ට බොහෝ වරක් තම ජීවිතය
පූජා කිරීමට අවශ්‍ය වන්නේ නැත.
**26** එසේ වුණා නම් පොළොවේ දරු-
වන් බිහි වුණු දා*[2] පටන් බොහෝ
වරක් දුක් විඳීමට ඔහුට සිදු වනු ඇත.
නමුත් පවතින මෙම සමාජයේ අව-
සාන කාල පරිච්ඡේදයේදී[3] මෙලොවට
පැමිණි ඔහු[4] තම ජීවිතය පූජා කිරී-
මෙන් පාපය පහ කර ඇත.[5] ඒ දේ
ඔහුට නැවත වරක් කිරීමට අවශ්‍ය
වන්නේ නැත.[6] **27** සාමාන්‍යයෙන්
මිනිසුන්[7] මිය යන්නේ එක් වරක්
පමණි. ඉන්පසුව ඔවුන්ට විනිශ්චයක්
තිබේ.[8] **28** එලෙසම ක්‍රිස්තුස් බො-
හෝදෙනෙකුගේ පව් ඉසිලීම සඳහා[9]
තම ජීවිතය එක් වරක්[10] පූජා කළේය.
ඒ දේ නැවත කිරීමට ඔහුට අවශ්‍ය
වන්නේ නැත. ඔහු නැවත දෙවෙනි
වරටත්[11] පැමිණෙන විට[12] ඔහු පැමි-
ණෙන්නේ පාපය සම්බන්ධයෙන් පිය-
වර ගැනීමට නොවේ.[13] ඒ වෙනුවට
ඔහු පැමිණෙන්නේ තම ගැලවීම සඳහා
ඔහු දෙස මහත් ඕනෑකමින් බලා
සිටින අය වෙනුවෙනි.[14]

**10** නීතිය සැබෑ දේ බව කිව
නොහැක. එය සැබෑ දෙයෙහි
ඡායාවක් පමණි.[15] එය අපට දෙනු
ලැබුවේ ඉදිරියේදී පැමිණෙන වඩාත්
හොඳ දේවල් පිළිබඳ යම් අදහසක්
අපට ලබා දීම සඳහාය. එහෙයින්
වසරක් වසරක් පාසා ඔප්පු කරනු
ලබන පූජාවලින් දෙවි වෙතට ළං
වන අයව පාපයෙන් තොර පරි-
පූර්ණ අය බවට පත් කිරීමට ඊට
නුපුළුවන.[16] **2** එවැනි දෙයක් කිරී-
මට හැකියාව තිබුණා නම් දෙවිට
නමස්කාර කරන අය තම පව්කා-
රකමින් සදහටම පවිත්‍ර වනු ඇත.
තමන් පව්කාරයන් කියා ඔවුන්ට කිසි
හැඟීමක්වත් නොතිබෙනු ඇත. පූජා
ඔප්පු කරන අයට තවදුරටත් පූජාවන්
ඔප්පු කිරීමට අවශ්‍ය වන්නේද නැත.[1]
**3** ඒ වෙනුවට වසරක් වසරක් පාසා
පූජා ඔප්පු කිරීමෙන් ඔවුන්ට සිහිගන්-
වන්නේ ඔවුන් පව්කාරයන් බවය.[2]
**4** ඒ අනුව ගවයන්ගේ සහ එළුවන්ගේ
ලේවලින් අපගේ පාප ඉවත් කිරීමට
හැකියාවක් නැති බව පැහැදිලිය.[3]

**5** එහෙයින් යේසුස් මෙලොවට
පැමිණි විට ඔහු දෙවිට මෙසේ පැව-
සුවේය. “ ‘ඔබ පූජාවලටත් යාග-
වලටත් කැමති වූයේ නැත.[4] ඒ
වෙනුවට ඔබ මා වෙනුවෙන් ශරීර-
යක් සූදානම් කළේය.[5] **6** දවන පූජා
සහ පාප පූජාවලට ඔබේ අනුමැ-
තිය ලැබුණේ නැත.’[6] **7** එවිට මම
මෙසේ කීවෙමි. ‘මෙන්න, මාගේ දෙවි-
යනි, ඔබේ කැමැත්ත කිරීමට මම
ඇවිත් සිටිමි.[7] (අකුළන ලද ලියවිල්-
ලේ මා ගැන ලියා ඇත.)’ ”[8] **8** ඒ
අනුව, “පූජාවලටවත් යාගවලටවත්
දවන පූජා සහ පාප පූජාවලටවත් ඔබ
කැමති වූයේ නැත. ඊට ඔබේ අනුමැ-
තිය ලැබුණේද නැත.”[9] නීතිය යටතේ
ඔප්පු කරන ලද පූජාවලට[10] දෙවි-
ගේ කැමැත්තක් නැති බව පැවසී-
මෙන් පසු, **9** ඔහුද, “මෙන්න, ඔබේ
කැමැත්ත කිරීමට මම ඇවිත් සිටිමි”[11]
කියා පවසයි. එසේ පැවසීමෙන් ඔහු
කලින් පැවති ක්‍රමය අවලංගු කර
අලුත් ක්‍රමයක් පිහිටුවයි.[12] **10** ඒ
අනුව දෙවිගේ “කැමැත්ත”[13] වන්නේ
යේසුස් ක්‍රිස්තුස්ගේ ජීවිතය පූජා කිරී-
මය.[14] එය ඔප්පු කරන්නේ එක් වරක්
පමණි.[15] එහි ප්‍රතිඵලයක් ලෙස අපව
පවිත්‍ර කර දෙවි සඳහා වෙන් කරනු
ලැබේ.[16]

**11** මීට අමතරව සෑම පූජකයෙකු-
ටම ජනයා වෙනුවෙන් එකම
පූජාව නැවත නැවතත් ඔප්පු කරමින්
තම සේවය දිනපතාම[17] කිරීමට සිදු
වේ.[18] එසේ කරන්නේ ඒ පූජාවලින්
පාපය සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමට
නොහැකි වන නිසාය.[19] **12** නමුත්
මේ මිනිසා පව් වෙනුවෙන් සද-
හටම එක පූජාවක් ඔප්පු කර,[20]
දෙවිගේ දකුණු පැත්තේ ඉඳගත්-

**9 පරි.**
1 ලෙවී 16:2
2 එෆී 1:4
3 මතෙ 24:3
1කොරි 10:11
හෙබ්‍රෙ 1:2
4 ගලා 4:4
1පේත්‍රු 1:20
5 යෙසා 53:12
දානි 9:24
1කොරි 5:7
6 හෙබ්‍රෙ 7:27
1පේත්‍රු 3:18
7 නික් 29:9
ලෙවී 16:11
හෙබ්‍රෙ 7:27
හෙබ්‍රෙ 7:28
හෙබ්‍රෙ 9:7
8 යොහ 17:1
9 යෙසා 53:12
1පේත්‍රු 2:24
10 රෝම 6:10
11 මතෙ 24:3
තීත 2:13
12 2තෙස 1:7
13 මතෙ 24:30
14 මතෙ 25:34
2තිමෝ 4:8

**10 පරි.**
15 කොලො 2:17
හෙබ්‍රෙ 8:5
16 හෙබ්‍රෙ 7:19
හෙබ්‍රෙ 9:9

**2 තීරුව**
1 ගලා 3:21
2 ලෙවී 16:30
ලෙවී 16:34
3 යෙසා 1:11
මීකා 6:7
4 ගීතා 50:8
ආමො 5:22
5 ගීතා 40:6
6 ගීතා 40:6
7 ගීතා 40:8
8 ගීතා 40:7
9 ගීතා 40:6
10 ලෙවී 17:5
11 ගීතා 40:8
යොහ 6:38
12 කොලො 2:14
හෙබ්‍රෙ 8:13
13 ගීතා 40:8
ගලා 1:4
14 එෆී 5:2
15 රෝම 6:10
හෙබ්‍රෙ 9:28
16 යොහ 17:19
1කොරි 6:11
හෙබ්‍රෙ 13:12
17 නික් 29:38
ගණන් 28:3
18 1සාමු 2:28
1ලේක 24:19
2ලේක 29:11
19 හෙබ්‍රෙ 7:18
හෙබ්‍රෙ 7:27
හෙබ්‍රෙ 10:1
20 හෙබ්‍රෙ 9:28

---

හෙබ්‍රෙ **9:25*** මූ.අ., “තම ලේ නොවන ලේ.”
**26*** මතෙ 25:34හි පාදසටහන බලන්න.

තේය.[1] **13** දැන් ඔහු බලා සිටින්-
නේ තම සතුරන්ව තම පා පුටුව
ලෙස යටත් කරන තුරුය.[2] **14** ඒ
අනුව පවිත්‍ර කර දෙවි සඳහා වෙන්
කර ඇති අය සදහටම පව්කාරක-
මින් තොර පරිපූර්ණ අය බවට පත්
වන්නේ[3] එක පූජාවක් මගින් පමණි.[4]
**15** එම කාරණය දෙවිගේ බලයේ
ක්‍රියාකාරිත්වය මාර්ගයෙන්[5] තහ-
වුරු වේ. මන්ද, **16** “යෙහෝවා දෙවි
මෙසේ පවසන්නේය. ‘ඒ කාලයට පසු
මම ඔවුන් සමඟ ඇති කරගන්නා
ගිවිසුම මෙයයි. මම මාගේ නීති
ඔවුන්ගේ හදවත්වල තබන්නෙමි.
ඒවා ඔවුන්ගේ සිත්වල ලියන්නෙමි.’ ”[6]
**17** එමෙන්ම දෙවි මෙසේද පවසා
ඇත. “මම ඔවුන් කළ වරද නො-
තකා ඔවුන් කළ පව් නැවත කිසිදා
සිහි නොකරන්නෙමි.”[7] **18** පව්වලට
සමාව ලැබී ඇත්නම්[8] එම පව් සඳහා
පූජාවක් තවදුරටත් අවශ්‍ය වන්නේ
නැත.[9]

**19** එහෙයින් සහෝදරයෙනි, යේ-
සුස්ගේ ලේ මාර්ගයෙන් අපට කිසි
බියක් සැකක් නැතුව අතිශුද්ධස්ථාන-
යට[10] ඇතුල් වීමට[11] අවස්ථාව උදා
වී ඇත. **20** ඒ අනුව තම ජීවිතය[12]
නියෝජනය කරන තිරය පසු කර-
ගෙන යැමෙන්[13] ජීවනයට මඟ පාදන
අලුත් මාර්ගයක් ඔහු අප වෙනුවෙන්
විවෘත කර දුන්නේය. **21** දෙවිගේ
ගෘහය භාරව සිටින ශ්‍රේෂ්ඨ පූජක-
යෙකු අපට සිටින නිසාත්,[14] **22** අප-
ගේ හදවත මෙන්ම පලුදු වූ* හෘදය
සාක්ෂියද[15] පවිත්‍ර කර තිබෙන නිසාත්
අපගේ ශරීරයද සෝදා පවිත්‍ර කර ඇති
නිසාත්[16] පවිත්‍ර මෙන්ම අවංක හදවත-
කින් හා නොසැලෙන විශ්වාසයකින්
දෙවි වෙතට ළං වෙමු. **23** කිසිම දෙ-
ගිඩියාවකින් තොරව[17] අපගේ බලා-
පොරොත්තුව ගැන[18] සියලුදෙනාටම
ප්‍රකාශ කරමු. මන්ද ඒ බලාපොරොත්-
තුව අපට දුන් තැනැත්තා විශ්වා-
සවන්ත කෙනෙකි.[19] **24** එලෙසම
අපි එකිනෙකා සඳහා උනන්දුවක් හා
සැලකිල්ලක් දක්වමින් ප්‍රේමය පෙන්-
වීමට හා යහපත් ක්‍රියා කිරීමට[1] එකි-
නෙකාව පොලඹවමු.[2] **25** සමහරුන්
පුරුදු වී සිටින ආකාරයට එකට රැස්-
වීම සඳහා අපට තිබෙන අවස්ථාවන්
අතපසු නොකිරීමටද අප වගබලා ගත
යුතුයි.[3] එලෙසම අපි එකිනෙකාව දිරි-
ගන්වමු.[4] ඒ මහත් දවස ළඟා වන බව
අපට පැහැදිලිව පෙනෙන නිසා වැඩි
වැඩියෙන් එසේ කරමු.[5]

**26** සත්‍ය ඉගැන්වීම් පිළිබඳ නිවැ-
රදි දැනුමක් ලබාගත් පසු[6] අප හිතා-
මතාම පව්කාර ක්‍රියාවල යෙදෙනවා
නම්[7] එවැනි පව්වලට සමාව ලබා-
ගැනීම සඳහා කිසි පූජාවක් නැත.[8]
**27** එවැනි අයට අපේක්ෂා කළ හැක්-
කේ දෙවිගේ විනිශ්චය පමණි.[9]
දෙවි තම ඇවෙන උදහසින් ඔවුන්ව
සම්පූර්ණයෙන්ම විනාශ කර දමනු
ඇත.[10] එහෙයින් ඒ දේ අපේක්ෂා-
වෙන් සිටින ඔවුන් නිරතුරුවම සිටින්-
නේ මහත් බියකිනි. **28** නිදසුනකට
මෝසෙස්ට දෙන ලද නීතිය යටතේ
පවා කෙනෙක් නීතියක් කඩ කළොත්
දෙදෙනෙකුගේ හෝ තුන්දෙනෙකුගේ
හෝ සාක්ෂිය මත[11] ඔහුට කිසි අනු-
කම්පාවක් නොපෙන්වා මරා දමනු
ලැබේ. **29** එසේනම් දෙවිගේ පුත්‍රයා
මාර්ගයෙන් ඉටු වන දේ සම්පූර්-
ණයෙන්ම නොසලකාහරින කෙනෙකු
ගැන සිතන්න. ඔහු කරන්නේ දෙ-
විගේ පුත්‍රයාව පාගා දමනවා හා
සමාන දෙයකි.[12] අලුත් ගිවිසුම වලංගු
කිරීමට වගුරුවනු ලැබූ, දෙවි ඉදි-
රියේ තමාව පවිත්‍ර කෙනෙකු කළ
ලේ ඔහු සුළු කොට සලකයි.[13] ඔහු
දෙවි තම මහත් කරුණාවෙන් ඔහුට
ලබා දුන් තම බලය සම්පූර්ණයෙන්
නොසලකාහැර එයට පිටු පාමින්
සිටින කෙනෙකි.[14] එවැනි කෙනෙ-
කුට ඊටත් වඩා කොතරම් බරපතළ
දඬුවමක් ලැබිය යුතුද![15] **30** මන්ද,
“යුක්තිය ඉටු කිරීමේ අයිතිය මා
සතුය. වරදකරුවන්ට දඬුවම් කිරී-
මේ අයිතිය ඇත්තේ මට පමණි”[16]

හෙබ්‍රෙ **10:22*** මූ.අ., “දුෂ්ට.”

**10 පරි.**
**1** රෝම 8:34, කොලො 3:1
**2** ගීතා 110:1, ක්‍රියා 2:35, 1කොරි 15:25
**3** හෙබ්‍රෙ 7:11, හෙබ්‍රෙ 7:19
**4** හෙබ්‍රෙ 9:28
**5** යෙරෙ 1:4
**6** යෙරෙ 31:33, හෙබ්‍රෙ 8:10
**7** යෙරෙ 31:34, හෙබ්‍රෙ 8:12
**8** යොහ 8:36
**9** යොහ 20:23
**10** හෙබ්‍රෙ 9:8, හෙබ්‍රෙ 9:24
**11** යොහ 14:6, රෝම 5:2
**12** යොහ 6:51, හෙබ්‍රෙ 6:20
**13** මතෙ 27:51
**14** සෙක 6:13, හෙබ්‍රෙ 3:6
**15** හෙබ්‍රෙ 13:18, 1යොහ 1:7
**16** එස 36:25, එෆී 5:26
**17** 1කොරි 15:58, කොලො 1:23
**18** හෙබ්‍රෙ 3:6, හෙබ්‍රෙ 6:19
**19** 1තෙස 5:24

**2 තීරුව**
**1** කොලො 3:23, 1තිමෝ 6:18
**2** හික් 25:2
**3** ද්වි 31:12, මතෙ 18:20, ක්‍රියා 2:42, ක්‍රියා 20:8
**4** යෙසා 35:3, රෝම 1:12
**5** රෝම 13:11, 2පේතෘ 3:12
**6** හෙබ්‍රෙ 6:4, 2පේතෘ 2:21
**7** යාකො 4:17, 1යොහ 5:16
**8** මතෙ 12:32
**9** ලූක් 19:27
**10** යෙසා 26:11, මාක් 3:29
**11** ද්වි 17:6
**12** මතෙ 7:6, පිලි 3:18, හෙබ්‍රෙ 6:6
**13** මතෙ 26:28, ලූක් 22:20
**14** එෆී 4:30
**15** 1පේතෘ 4:18
**16** ද්වි 32:35

කියාත්, “යෙහෝවා දෙවි වන මම
මාගේ සෙනඟව විනිශ්චය කරන්-
නෙමි”[1] කියාත් දෙවි පවසා ඇති බව
අපි දනිමු. **31** ඇත්තෙන්ම ජීවමාන
දෙවිගේ අතින් දඬුවම් ලැබීම මොන
තරම් දරුණු දෙයක්ද![2]

**32** ඔබ සත්‍යය පිළිබඳ දැනුමෙන්
ආලෝකවත් වූ පසු[3] මහත් පොර-
බැදීමක් කරමින් බොහෝ දුක් හිරි-
හැර විඳීමට සිදු වූ අතීත දවස්
සිහි කරන්න.[4] **33** සියලුදෙනා ඉදිරි-
යේ රංග භූමියක් මැද සිටින අය හා
සමානව[5] සමහර අවස්ථාවලදී ඔබ
නින්දා සහ පීඩාවලට ලක් වූ අතර
තවත් අවස්ථාවලදී එවැනි පීඩාවන්
අද්දුටු අයට ඔබ අතහිත දුන්නහුය.[6]
**34** සිරගෙයි සිටි අයට ඔබ අනුකම්-
පාව දැක්වූවා පමණක් නොව වඩා
උතුම්, කල් පවතින වස්තුවක් ඔබට
ඇති බව දැන සිටි නිසා[7] ඔබේ දේ-
පොළ වස්තුව යනාදිය කොල්ල කනු
ලැබුවත් ඔබ එය ප්‍රීතියෙන් දරාගෙන
සිටියහුය.[8]

**35** එහෙයින් පසුබසින්නේ නැතුව
දිගටම කිසි බියක් සැකක් නැතුව
කතා කරන්න.[9] මන්ද ඒ වෙනුවෙන්
ඔබට ඉමහත් ත්‍යාගයක් වෙන් කර
තිබේ.[10] **36** ඔබ දෙවිගේ කැමැත්ත
ඉටු කළ පසු[11] ඔහු දුන් පොරොන්දු-
වල ඉටු වීම අද්දැකීමට[12] ඔබ දිග-
ටම විඳදරාගත යුතුයි.[13] **37** මන්ද,
“ඉතා කෙටි කලකින්[14] පැමිණෙන
තැනැත්තා ප්‍රමාද නොවී පැමි-
ණෙනු ඇත.”[15] **38** “මගේ ධර්මිෂ්ඨ
තැනැත්තා විශ්වාසය නිසා තම ජීවි-
තය රැකගනු ඇත.”[16] නමුත්, “ඔහු
බිය නිසා දෙවිව අත්හරියි නම් ඔහු
ගැන මට කිසි සතුටක් ඇති වන්නේ
නැත.”[17] **39** අපි බිය නිසා දෙවිව
අත්හැර විනාශ වන අය නොවෙමු.[18] ඒ
වෙනුවට ජීවිතය රැකගැනීමට දායක
වන විශ්වාසයක් ඇති අය වෙමු.[19]

**11** විශ්වාසය[20] යනු තමන් බලා-
පොරොත්තු වන දේවල් ඉටු
වන බව කිසි ලෙසකින්වත් සැක
නොකිරීමයි.[1] එසේම තමන් විශ්-
වාස කරන දේ ඇසට නොපෙනු-
ණත් ඒවා සැබෑ බවට ස්ථිර සාක්ෂි
ඇති නිසා ඒවා නිසැකව පිළිගැ-
නීමයි.[2] **2** පුරාණයේ විසූ මිනිසුන්ට
එවැනි විශ්වාසයක් තිබුණු නිසා දෙවි
තමන්ව පිළිගත් බවට ඔවුන්ට දෙවි-
ගෙන් සාක්ෂි ලැබිණ.[3]

**3** දෙවිගේ අණ පරිදි[4] මුළු මහත්
විශ්වයම* සාදනු ලැබූ බව අප වට-
හාගන්නේ අප තුළ ඇති විශ්වාසය
නිසාය.[5] ඒ අනුව අප නොදකින දේව-
ලින් අප දකින සෑම දෙයක්ම බිහි වී
ඇති බව අපට වැටහෙයි.[6]

**4** ආබෙල් තුළ තිබූ විශ්වාසය
නිසා ඔහු කායින්ට වඩා වටිනා පූජා-
වක් දෙවිට ඔප්පු කළේය.[7] ඔහු තුළ
එවැනි විශ්වාසයක් තිබුණු නිසා ඔහු
දුන් පරිත්‍යාගය දෙවි පිළිගත් බවට
ඔහුට සාක්ෂියක් ලැබුණු අතර[8] ඔහු
ධර්මිෂ්ඨයෙකු බවටත් ඔහුට සාක්ෂි-
යක් ලැබිණ. ඔහු මිය ගියත් ඔහු තුළ
තිබූ විශ්වාසය ඔහු වෙනුවෙන් තව-
මත් කතා කරයි.[9]

**5** ඒනොක්[10] තුළ තිබූ විශ්වා-
සය නිසා ඔහුව දෙවි විසින් ගෙන
යන ලදි. එමනිසා ඔහු සාමාන්‍ය මර-
ණයක් අද්දුටුවේ නැත. දෙවි ඔහුව
ගෙන ගිය නිසා[11] ඔහුව සොයාගත
නොහැකි විය. නමුත් ඔහුව ගෙන
යෑමට කලින් තමා දෙවිව සතුටු කර
තිබූ බවට ඔහු සාක්ෂි ලැබුවේය.[12]
**6** ඇත්තෙන්ම යමෙකු තුළ දෙවි කෙ-
රෙහි විශ්වාසයක් නැත්නම්[13] ඔහුට
දෙවිව කිසි ලෙසකින්වත් සතුටු කළ
නොහැක.[14] මන්ද දෙවිට නමස්කාර
කිරීම සඳහා ඔහු වෙතට ළඟා වන
කෙනෙක් ඔහු ජීවමාන බවත්[15] දෙවි-
ගේ මඟ පෙන්වීම් මහත් උනන්දුව-
කින් පතන අයට[16] ඔහු ආශීර්වාද
කරන බවත්[17] විශ්වාස කළ යුතුයි.

**7** නෝවා[18] තුළ තිබූ විශ්වාසය
නිසා ඒ වන තුරු නුදුටු දේවල් ගැන

**10 පරි.**
1 ද්වි 32:36
2 හෙබ්‍රෙ 12:29
2පේතෘ 2:4
3 ක්‍රියා 26:18
2කොරි 4:6
හෙබ්‍රෙ 6:4
4 පිලි 1:29
2තිමෝ 3:12
5 1කොරි 4:9
6 පිලි 1:7
7 ලූක් 16:9
8 මතෙ 5:12
9 යොහ 18:20
1කොරි 15:58
10 මතෙ 10:32
11 ගලා 6:9
12 ගලා 3:29
කොලො 3:24
13 ලූක් 21:19
යාකො 5:11
14 යෙසා 26:20
15 හබ 2:3
2පේතෘ 3:9
16 හබ 2:4
යොහ 3:16
රෝම 1:17
17 හබ 2:4
1යොහ 2:19
18 2පේතෘ 2:20
19 1තෙස 5:9
1පේතෘ 1:9

**11 පරි.**
20 ලූක් 17:5
ලූක් 18:8
ගලා 3:11

**2 තීරුව**
1 හෙබ්‍රෙ 10:22
හෙබ්‍රෙ 11:13
2 රෝම 8:24
2කොරි 4:18
2කොරි 5:7
3 හෙබ්‍රෙ 11:39
4 ගීතා 33:6
2පේතෘ 3:5
5 කොලො 1:26
6 රෝම 1:20
7 උත් 4:5
8 උත් 4:4
9 උත් 4:10
මතෙ 23:35
10 උත් 5:22
යූද් 14
11 උත් 5:24
12 උත් 5:22
13 2තෙස 3:2
14 ගලා 2:16
15 යොහ 7:28
රෝම 10:14
හෙබ්‍රෙ 9:24
16 ශෙප 2:3
මතෙ 6:33
17 1සාමු 2:7
ගීතා 58:11
මතෙ 5:12
18 උත් 6:8

හෙබ්‍රෙ **11:3*** හෝ “සමාජ ක්‍රම.” ග්‍රීක බසින්, එඕනස්.

දෙවිගෙන් අනතුරු ඇඟවීමක් ලැබූ
විට[1] ඔහු දේවගරුබිය පෙන්වමින් තම
පවුලට අයත් අයගේ ගැලවීම සඳහා
නැවක් සෑදුවේය.[2] ඔහුට තිබූ විශ්වා-
සය නිසා එවකට පැවති ලෝකය දඬු-
වම් ලැබීමට සුදුසු බව ඔහු ඔප්පු කළ
අතර[3] එය ඔහුව ධර්මිෂ්ඨ කෙනෙකු
ලෙස සැලකීමට මඟ පෑදුවේය.[4]
**8** ආබ්‍රහම්[5] තුළ තිබූ විශ්වාසය
නිසා ඔහුව කැඳවනු ලැබූ විට තමාට
උරුමයක් ලෙස ලැබීමට නියමි-
තව තිබුණු ස්ථානයකට පිටත්ව
යෑමෙන් ඔහු තම කීකරුකම පෙන්-
නුම් කළේය. තමන් කොතැනට යන-
වාද කියා නොදැන සිටියත් ඔහු
පිටත්ව ගියේය.[6] **9** ඔහු තුළ තිබූ
විශ්වාසය නිසා ඔහු වෙනත් රටක
ජීවත් වන කෙනෙකු මෙන් තමාට
පොරොන්දු වූ දේශයෙහි විදේශික-
යෙකු ලෙස වාසය කළ අතර[7] එම
පොරොන්දුවට ඔහු සමඟ උරුම-
කම් කියන[8] ඊසාක්[9] සහ යාකොබ්[10]
සමඟ කූඩාරම්වල වාසය කළේය.[11]
**10** මන්ද ඔහු බලා සිටියේ සැබෑ
අත්තිවාරමක් ඇති නුවර[12] පිහිටුවන
තුරුය. ඒ නුවරෙහි නිර්මාතෘ සහ
සෑදුම්කරු දෙවිය.[13]
**11** සාරා[14] තුළ තිබූ විශ්වාසය
නිසා පොරොන්දුව දුන් තැනැත්-
තාණන් එය විශ්වාසවන්තව ඉටු
කරයි කියා ඇය දැන සිටි-
යාය.[15] වයස් සීමාව පසු කර සිටි-
යත්[16] දරුවෙකු පිළිසිඳගැනීමට ඇයට
හැකියාව ලැබිණ. **12** එහෙයින් මළ
කෙනෙකු හා සමාන වූ[17] එක් පුරු-
ෂයෙකුගෙන්[18] අහසේ තාරකා මෙන්
අසංඛ්‍යාත වූ, මුහුදු වෙරළේ වැලි
මෙන් ගණන් කළ නොහැකි තරම් වූ
දරුවෝ බිහි වූහ.[19]
**13** පොරොන්දු ඉටු වන අයුරු
ඔවුන්ට දැකගැනීමට නොහැකි
වුවත්[20] ඔවුහු සියලුදෙනාම විශ්වාසය-
කින් කටයුතු කළ අය ලෙස මිය
ගියෝය.[21] මන්ද ඒවා ඉටු වන අයුරු
ඔවුන් කලින්ම තේරුම්ගත් අතර[22]
ඒ ගැන බොහෝ සෙයින් ප්‍රීතිමත් වී
තමන් ජීවත් වූ ඒ දේශයෙහි ආගන්-
තුකයන් හා තාවකාලික පදිංචිකරු-
වන් ලෙස ජීවත් වූ බව ප්‍රසිද්ධියේ
ප්‍රකාශ කළෝය.[1] **14** එසේ පැවසී-
මෙන් ඔවුන් ඔප්පු කර පෙන්වූයේ
තමන්ට අයිති වීමට තිබෙන වාසස්-
ථානය ගැන ඔවුන් මහත් ඕනෑකම-
කින් බලා සිටින බවය.[2] **15** ඔවුන්
පිටත්ව ආ දේශය ගැන සිතමින් ළත
වූවා නම්[3] ආපසු එහි යෑමට ඔවුන්ට
ප්‍රස්තාව තිබිණ.[4] **16** නමුත් දැන්
ඔවුන් හා සමානව සිටින අය ඊටත්
වඩා උතුම් ස්ථානයක් එනම්, ස්වර්ග-
යට අයත් ස්ථානයක් අත් කරගැනී-
මට වෑයම් කරති.[5] එහෙයින් දෙවි
ඔවුන් ගැන ලැජ්ජා නොවන අතර
ඔවුන්ගේ දෙවි ලෙස හඳුන්වනු ලැබීම-
ටද සතුටු වෙයි.[6] මන්ද ඔහු ඔවුන් වෙ-
නුවෙන් නුවරක්[7] සූදානම් කර ඇත.
**17** ආබ්‍රහම් තුළ තිබූ විශ්වාසය
කොතරම් ශක්තිමත්ද කියා සෝදිසි
කරනු ලැබූ අවස්ථාවේදී[8] ඔහු ඊසාක්ව
පූජා කිරීමට වුවත් පසුබට වූයේ නැත.
ඊසාක් ගැන පොරොන්දු වී තිබූ දේවල්
ඔහු සතුටින් පිළිගෙන තිබුණත් ඔහු
තම එකම පුත්‍රයාව ඔප්පු කිරීමට
සූදානම් විය.[9] **18** ඔහු එසේ කළේ,
"'ඔබට පොරොන්දු වූ තැනැත්තා'
පැවතෙන්නේ ඊසාක්ගෙන්ය" කියා
ඔහුට පවසා තිබියදීමය.[10] **19** මන්ද
ඊසාක්ව මරණයෙන් පවා නැඟිටු-
වන්න දෙවිට හැකි බව ඔහු තේරුම්-
ගෙන සිටියේය.[11] ඇත්තෙන්ම ඔහුගේ
පුත්‍රයාව මරණයෙන් මුදා ඔහුට නැවත
භාර දෙනු ලැබූ අතර එයින් යමක්
සංකේතවත් කරන ලදි.[12]
**20** ඊසාක් තුළ තිබූ විශ්වාසය
නිසා පැමිණීමට නියමිත දේවල් පද-
නම් කරගෙන ඔහු යාකොබ්ට[13] සහ
ඒසව්ට[14] ආශීර්වාද කළේය.
**21** යාකොබ් තුළ තිබූ විශ්වා-
සය නිසා ඔහු මරණාසන්නව සිටි-
යදී[15] යෝසෙප්ගේ පුත්‍රයන් දෙදෙනාට
වෙන වෙනම ආශීර්වාද කර[16] තම
සැරයටිය ආධාරයෙන් නැමී දෙවිට
නමස්කාර කළේය.[17]

**11 පරි.**
1 උත් 6:13
2 උත් 6:14
3 උත් 6:22
4 රෝම 1:17, රෝම 3:22, ගලා 5:5, පිලි 3:9, 2පේතෘ 2:5
5 උත් 12:1, රෝම 4:11, රෝම 4:13
6 උත් 12:4, ක්‍රියා 7:2
7 උත් 23:4
8 උත් 17:6, උත් 26:3, උත් 28:13
9 උත් 21:3
10 උත් 25:26
11 උත් 12:8
12 යොහ 8:56, හෙබ්‍රෙ 13:14, එළි 21:2
13 හෙබ්‍රෙ 3:4
14 උත් 17:15
15 උත් 21:2
16 උත් 17:17
17 රෝම 4:19
18 උත් 21:5
19 උත් 22:17, 1රාජා 4:20
20 උත් 47:9
21 උත් 23:4
22 යොහ 8:56

**2 තීරුව**
1 1ලේක 29:15, ගීතා 39:12, එෆී 2:19, 1පේතෘ 2:11
2 හෙබ්‍රෙ 13:14
3 උත් 11:31
4 උත් 24:6
5 මතෙ 4:17, මතෙ 25:34, පිලි 3:20
6 නික් 3:15, මතෙ 22:32, ක්‍රියා 7:32
7 හෙබ්‍රෙ 12:22, එළි 21:2
8 උත් 22:1
9 උත් 22:9, යොහ 3:16
10 උත් 21:12, රෝම 9:7
11 රෝම 4:17
12 1කොරි 10:11, 1කොරි 15:20
13 උත් 27:27
14 උත් 27:39
15 උත් 47:29
16 උත් 48:20
17 උත් 47:31

**22** යෝසෙප් තුළ තිබූ විශ්වාසය
නිසා ඔහු ජීවිතයේ අවසන් කාලයට
පැමිණි විට ඊශ්‍රායෙල්වරුන් ඊජිප්තු-
වෙන් පිටත්ව යන අවස්ථාව[1] ගැන
සඳහන් කර තමාගේ ඇටකටු සම්-
බන්ධයෙන් කළ යුතු දේ ගැන ආඥා-
වක් දුන්නේය.[2]

**23** මෝසෙස්ගේ දෙමාපියෝද විශ්-
වාසයකින් යුතුව ක්‍රියා කළෝය.
එමනිසා ඔහුගේ උපතින් පසු ඔහු
ලස්සන දරුවෙකු බව දුටු ඔවුහු,[3]
රජුගේ ආඥාවට බිය නොවී[4] ඔහුව
මාස තුනක් සඟවාගෙන සිටියෝය.[5]
**24** මෝසෙස් තුළ තිබූ විශ්වාසය
නිසා ඔහු වැඩිහිටියෙකු වූ විට[6] පාරා-
වෝගේ දුවගේ පුත්‍රයා ලෙස හඳුන්-
වනු ලැබීම ප්‍රතික්ෂේප කළ අතර,[7]
**25** පව්කාර දේවල් කරමින් තාව-
කාලික සැප භුක්ති විඳිනවා වෙ-
නුවට දෙවිගේ සෙනඟ සමඟ හිංසා
පීඩා විඳීම තෝරාගත්තේය. **26** ඔහු
එසේ කළේ ඊජිප්තුවේ වස්තුවලට
වඩා අභිෂේක ලැබූ කෙනෙකු* ලෙස
නින්දා අපහාස විඳීම[8] උතුම් දෙයක්
ලෙස සැලකූ නිසාය. මන්ද තමාට
ලැබෙන ත්‍යාගය දෙස ඔහු ඕනෑකමින්
බලා සිටියේය.[9] **27** ඔහු තුළ තිබූ
විශ්වාසය නිසා ඔහු ඊජිප්තුව අත්හැර
ගියේය.[10] ඔහු එසේ කළේ රජුගේ කෝ-
පයට බිය වූ නිසා[11] නොව නොපෙ-
නෙන තැනැත්තාණන්ව දකිනවා හා
සමාන විශ්වාසයකින් ඔහු දිගටම ස්ථි-
රව සිටි නිසාය.[12] **28** තම විශ්වාස-
යට අනුව ක්‍රියා කළ ඔහු, පාස්කුව
පැවැත්වූ අතර[13] දේවදූතයා ඔවුන්ගේ
කුලුඳුලන්ව මරණයට පත් නොකිරීම
සඳහා[14] ඔහු උළුවහුවල ලේ තැවරීමට
පියවර ගත්තේය.[15]

**29** ඊශ්‍රායෙල්වරුන් තුළ තිබූ විශ්-
වාසය නිසා ඔවුහු වියළි බිමක ගමන්
කරන්නා සේ[16] රතු මුහුද මැදින්
ගමන් කළෝය. නමුත් ඊජිප්තුවරුන්
ඒ මැදින් යෑමට උත්සාහ කළ විට
මුහුද ඔවුන්ව ගිලගත්තේය.[17]

**30** ඔවුන් තුළ තිබූ විශ්වාසය නිසා
ඔවුන් දවස් හතක් පුරා යෙරිකෝ-
වේ පවුරු වටා ගමන් කළ පසු ඒවා
බිඳ වැටුණේය.[1] **31** ගණිකාවක් වූ
රාහබ්ද[2] විශ්වාසයකින් යුතුව ක්‍රියා
කළාය. ඇය ඔත්තුකාරයන්ව සාදර-
යෙන් පිළිගත් නිසා අකීකරුව ක්‍රියා
කළ අය සමඟ විනාශ නොවූවාය.[3]

**32** මා තව කුමක් කියන්නද?
මන්ද ගිඩියොන්ද[4] බාරාක්ද[5] සැම්-
සන්ද[6] යෙප්තාද[7] දාවිත්ද[8] සාමුවෙල්[9]
සහ අනිකුත් අනාගතවක්තෘවරුන්ද[10]
ගැන කීමට පටන්ගත්තොත් මට
කාලය මදි වෙයි. **33** ඔවුන් තුළ තිබූ
විශ්වාසය කොතරම්ද කිවහොත් ඔවුහු
රාජ්‍යයන් පවා පරාජය කළෝය.[11]
ධර්මිෂ්ඨකමින් ක්‍රියා කළෝය.[12] පො-
රොන්දු ලැබුවෝය.[13] එලෙසම සිංහ-
යන්ගේ කටවල් පියෙව්වෝය.[14]
**34** බලවත් ගින්නකින් පවා ගැල-
වුණෝය.[15] කඩු මුවහතින්ද බේරු-
ණෝය.[16] දුර්වලව සිටියත් බලවත්
වූ අතර[17] යුද්ධයේදී නිර්භීතව සටන්
කළෝය.[18] විදේශීය සේනා පලවාහැරි-
යෝය.[19] **35** එසේම ස්ත්‍රීන්ගේ දරු-
වන් මිය ගිය විට ඔවුන්ව නැවත
නැඟිටුවන ලදි.[20] තවත් අය ප්‍රති-
පත්ති පාවා දීමක් මගින් යම්
නිදහසක් ලබාගැනීමට තිබූ අවස්ථා
ප්‍රතික්ෂේප කළ නිසා බොහෝ වධ
හිංසාවලට ලක් වූහ. ඔවුන් එසේ ක්‍රියා
කළේ වඩාත් උතුම් නැවත නැඟිටී-
මක් ලබාගැනීම සඳහාය. **36** තවත්
සමහර අය සමච්චලයට ලක් වී කස
පහර ලැබූහ. ඔවුන්ගේ අත් පාව-
ලට විලංගු දමා[21] සිරගෙවල්වලදී පීඩා
කරන ලදි.[22] **37** ඔවුන්ට ගල්වලින්
ගසන ලදි.[23] ඔවුන් දැරූ ස්ථාවරය
අත්හැරීමට බල කරමින් ඔවුන්ට පීඩා
කරන ලදි.[24] ඔවුන්ව කියතෙන් දෙ-
කට ඉරනු ලැබීය. ඔවුහු කඩුවෙන්
මැරුම් කෑවෝය.[25] අඟහිඟකම්වලින්
පෙළෙමින් පීඩා[26] සහ වධ හිංසාද
විඳිමින්[27] බැටළු හම්[28] හා එළු හම්
ඇඳගෙන අසරණව[29] තැනින් තැන
ඇවිද්දෝය. **38** එවැනි අය මෙම

**11 පරි.**
1 උත් 50:24
2 උත් 50:25; නික් 13:19
3 ක්‍රියා 7:20
4 නික් 1:16; නික් 1:22
5 නික් 2:2
6 නික් 2:11
7 නික් 2:10; ක්‍රියා 7:21
8 ගීතා 69:9; රෝම 15:3
9 හෙබ්‍රෙ 10:34
10 නික් 12:51
11 නික් 10:28
12 යොහ 1:18; යොහ 4:24; 1තිමෝ 1:17
13 නික් 12:21
14 නික් 12:23
15 නික් 12:22
16 නික් 14:22
17 නික් 14:28

**2 තීරුව**
1 යොෂු 6:20
2 යොෂු 2:1
3 යොෂු 6:17
4 විනි 6:11
5 විනි 4:6
6 විනි 13:24
7 විනි 11:1
8 1සාමු 16:13
9 1සාමු 3:20
10 ක්‍රියා 3:24
11 විනි 7:22
12 උත් 15:6; හෙබ්‍රෙ 11:4
13 2සාමු 7:12
14 විනි 14:6; 1සාමු 17:34; දානි 6:22
15 දානි 3:23
16 2රාජා 6:15
17 විනි 16:28; 1රාජා 18:46
18 විනි 11:32; 2සාමු 23:8
19 විනි 4:16
20 1රාජා 17:22; 2රාජා 4:34
21 යෙරෙ 20:2
22 යෙරෙ 37:15
23 1රාජා 21:13; 2ලේක 24:21
24 1රාජා 22:24
25 1රාජා 18:4
26 1රාජා 19:2
27 යෙරෙ 38:6
28 2රාජා 1:8
29 1රාජා 19:5

---

හෙබ්‍රෙ **11:26*** මූ.අ., “ක්‍රිස්තුස්.”

ලෝකයට යහපත් වැඩිය. ඔවුහු පාළු
තැන්වලද කඳුවලද සැරිසරමින් ගුහා-
වලද[1] බිම්ගෙවල්වලද ජීවත් වූහ.
**39** ඔවුන් සියලුදෙනා තිබූ විශ්වා-
සය නිසා ඔවුන්ට දුන් පොරොන්දු
ඉටු වන බවට සාක්ෂි ලැබුණත් ඒවා-
යේ ඉටු වීම ඔවුන් දුටුවේ නැත.[2]
**40** එසේ වූයේ දෙවි අප සඳහා[3] වඩා
උතුම් දෙයක් දීමට[4] කල්තියාම තීර-
ණය කළ නිසාය. මන්ද අපට කලින්
ඔවුන්ට[5] පරිපූර්ණත්වය ලබා දීමට[6]
දෙවි අදහස් නොකළේය.[7]

**12** විශාල වලාකුළක් හා සමාන
මෙපමණ සාක්ෂිකරුවන්
සමූහයක්[8] අප වටා සිටින නිසා
අපට බරක් විය හැකි සෑම දෙ-
යක්ම[9] හා අපව පහසුවෙන් හසු
කරගන්නා පාපයද අහක දමමු.[10]
එලෙසම අප සහභාගි විය යුතු[11]
ධාවන තරඟය[12] විඳදරාගැනීමෙන්
යුතුව දුවමු.[13] **2** එසේ කරන අතර-
වාරයේදී අපගේ විශ්වාසයට ප්‍රධාන
ලෙස දායක වන[14] එය පූර්ණ තත්-
වයකට ගෙනෙන තැනැත්තා[15] වන
යේසුස් දෙස මහත් ඕනෑකමින් බලා
සිටිමු. මන්ද ඔහු තමාට තිබුණු
ප්‍රීතිමත් අපේක්ෂාව නිසා ලැජ්ජාව
නොතකා වධකණුවක මරණය පවා
වින්දේය.[16] එතැන් පටන් ඔහු දෙ-
විගේ සිංහාසනයේ දකුණු පැත්තේ
අසුන්ගෙන ඇත.[17] **3** ඒ නිසා එම
තැනැත්තා ගැන හොඳින් කල්පනා
කර බලන්න. පව්කාරයන් තමන්-
ටම බොහෝ හානි සිදු කරමින් ඔහුට
විරුද්ධව බොහෝ දේවල් පැවසුවත්
ඔහු ඒ සියල්ල විඳදරාගත්තේය.[18] ඔබ
ඔහු ගැන කල්පනා කර බැලිය යුත්-
තේ ඔබ වෙහෙසට පත් නොවී ඔබේ
උත්සාහය අත් නොහැරීම සඳහාය.[19]
**4** ඒ පාපයට විරුද්ධව සටන් කිරී-
මට ඔබට සිදු වුවත් ඔබේ සටන
ඔබේ ලේ වැගිරෙන තරමට දරුණු
වී නැත.[20] **5** නමුත් ඔබව පුත්‍රයන්
ලෙස සලකා[21] ඉතා උනන්දුවෙන්
ඔබට ලබා දුන් මහ පෙන්වීම් ඔබට
සම්පූර්ණයෙන්ම අමතක වී තිබේ.
එනම්, "මාගේ පුත්‍රය, යෙහෝවා දෙවි
ලබා දෙන හික්මවීම් සුළු නොක-
රන්න. ඔහු ඔබව නිවැරදි කරන විට
කල නොකිරෙන්න.[1] **6** මන්ද යෙ-
හෝවා දෙවි තමා ප්‍රේම කරන අයට
හික්මවීම් ලබා දෙන්නේය. ඇත්-
තෙන්ම තම පුත්‍රයෙකු ලෙස පිළි-
ගන්නා සෑම කෙනෙකුට ඔහු දඬුවම්
කරන්නේය."*[2]
**7** ඒ අනුව ඔබට විඳදරාගැනීමට
සිදු වන දේ ඔබට ලැබෙන හික්මවී-
මක් සේ සලකන්න.[3] දෙවි ඔබ සමඟ
කටයුතු කරන්නේ ඔබව පුත්‍රයන්
ලෙස සලකමින්ය.[4] මන්ද පියෙකුගේ
හික්මවීම් නොලබන පුතෙක් සිටීද?[5]
**8** සියලුදෙනා ලබා ඇති හික්මවීම්
ඔබට ලැබී නැත්නම් ඔබව සැල-
කිය යුත්තේ පුත්‍රයන් ලෙස නොව
අවජාතක දරුවන් ලෙසය.[6] **9** එප-
මණක්ද නොව අපට අවශ්‍ය හික්මවීම්
ලබා දීමට මිහිපිට අපට පියවරුන්
සිටි අතර[7] අපි ඔවුන්ට ගෞරව
කළෙමු. එසේනම් අපට තම බලයෙන්
අලුත් ජීවිතයක් ලබා දුන් පියාණන්ට
අප ඊටත් වඩා වැඩියෙන් යටත් වී
ජීවත් විය යුතු නැද්ද?[8] **10** ඔවුන්
තමන්ට හරියි කියා පෙනුණු දේ පද-
නම් කරගෙන අපට හික්මවීම් ලබා
දුන්නේ කෙටි කාලයකටය.[9] නමුත්
අපගේ ප්‍රයෝජනය සඳහා අපට හික්ම-
වීම් ලබා දෙන ඔහු, එසේ කරන්නේ
ඔහු මෙන් ශුද්ධ වීමට අපටද ප්‍රස්තාව
ලබා දීම සඳහාය.[10] **11** ඇත්තෙන්ම
හික්මවීම් ලැබෙන අවස්ථාවේදී එය
වේදනාකාරී දෙයක්[11] ලෙස මිස ප්‍රීති-
යට හේතුවක් ලෙස දැනෙන්නේ නැත.
නමුත් ඒ හික්මවීමෙන් පුහුණුව ලබන
අය සමාදානය අද්දකිති.[12] මන්ද එම-
ගින් ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීමට
ඔවුන්ට හැකියාව ලැබේ.[13]
**12** එහෙයින් පහතට වැටී ඇති
අත්ද[14] දුබල වී ඇති දණහිස්ද
ශක්තිමත් කරගන්න.[15] **13** එලෙසම

**11 පරි.**
**1** 1රාජා 18:4; 1රාජා 19:9
**2** උත් 22:18; උත් 49:10; හෙබ්‍රෙ 11:13
**3** රෝම 8:18; රෝම 9:27; රෝම 11:5; හෙබ්‍රෙ 10:19
**4** හෙබ්‍රෙ 2:3; හෙබ්‍රෙ 3:1; හෙබ්‍රෙ 7:22; එළි 20:6
**5** හෙබ්‍රෙ 11:32
**6** හෙබ්‍රෙ 7:11; හෙබ්‍රෙ 7:19
**7** යාකො 1:18; එළි 14:4

**12 පරි.**
**8** හෙබ්‍රෙ 11:39
**9** 1කොරි 9:26; පිලි 3:13; 1පේතෘ 2:1
**10** කොලො 2:8; 1තිමෝ 6:9; හෙබ්‍රෙ 3:12
**11** පිලි 3:14
**12** 1කොරි 9:24
**13** 1තිමෝ 6:12
**14** යොහ 14:6; ක්‍රියා 5:31; හෙබ්‍රෙ 2:10
**15** 1කොරි 1:8; පිලි 1:6
**16** පිලි 2:8
**17** ගීතා 110:1; හෙබ්‍රෙ 10:12
**18** මතෙ 27:39
**19** ගලා 6:9; 2තෙස 3:13
**20** ක්‍රියා 12:2; හෙබ්‍රෙ 10:32
**21** මතෙ 5:45

**2 තීරුව**
**1** හිතෝ 3:11
**2** හිතෝ 3:12
**3** හෙබ්‍රෙ 12:1
**4** 2සාමු 7:14; මතෙ 5:9; හෙබ්‍රෙ 2:10
**5** හිතෝ 13:24
**6** ද්වි 23:2
**7** හිතෝ 23:13
**8** ගණන් 16:22; යෙසා 42:5; මලා 1:6; යාකො 4:10
**9** හිතෝ 22:6
**10** ලෙවී 11:44; 1පේතෘ 1:15
**11** 2කොරි 4:17
**12** 1පේතෘ 1:6
**13** පිලි 1:11; යාකො 3:18
**14** යෝබ් 4:3; යෙසා 40:29; ලූක් 22:32

**15** යෙසා 35:3; හෙබ්‍රෙ 10:25.

හෙබ්‍රෙ **12:6*** මූ.අ., "තළන්නේය.

කොර වී ඇති පාදයක සන්ධිය
පනින්න ඉඩ දෙනවා වෙනුවට එය
සුව වීම සඳහා[1] ඔබේ පාදවලට
සෘජු මාවත් සාදාගන්න.[2] **14** සියලු-
දෙනා සමඟ සමාදානයෙන් සිටීමටද[3]
ශුද්ධව* සිටීමටද දැඩි උත්සාහයක්
දරන්න.[4] මන්ද ශුද්ධව නොසිටින
අයට ස්වාමීන්ව දැකගැනීමේ ප්‍රස්තාව
අහිමි වේ.[5] **15** එලෙසම ඉතා සෝ-
දිසියෙන් සිට දෙවිගේ මහත් කරු-
ණාව[6] කිසි කෙනෙකුටවත් අහිමි වීමට
ඉඩ නොදෙන්න. එසේ සිටිය යුත්-
තේ යම් විෂ සහිත මුලක්[7] ඔබ අත-
රින් හට නොගැනීම සඳහාය. මන්ද
එවැන්නක් හටගත්තොත් එයින් බො-
හෝ ගැටලු ඇති වන අතර එම-
ගින් බොහෝදෙනෙකු අපවිත්‍ර වනු
ඇත.[8] **16** එලෙසම වේශ්‍යාකමේ*
යෙදෙන කිසිවෙකුවත් කුලුඳුලා වශ-
යෙන් තමාට හිමි අයිතිවාසිකම් එක
කෑම වේලක් වෙනුවෙන් අහිමි කර-
ගත්[9] ඒසව්[10] හා සමානව පරිශුද්ධ
දේවල් අගය නොකරන කිසිවෙකු-
වත් ඔබ අතරේ නොසිටීම සඳහාය.
**17** මන්ද පසුව ආශීර්වාද ලබාගැනී-
මට ඒසව්ට මහත් කැමැත්තක් තිබු-
ණත්[11] ඔහුව ප්‍රතික්ෂේප කරනු ලැබූ
ආකාරය[12] ගැන ඔබ දන්නහුය. ඔහු
කඳුළු සලමින්[13] තමා ගත් තීර-
ණය වෙනස් කිරීමට දැඩි උත්සාහයක්
දැරුවත් එයට කිසි ඉඩක් ලැබුණේ
නැත.[14]

**18** ඔබ ළඟා වී සිටින්නේ ස්පර්ශ
කිරීමට හැකි,[15] ගින්නෙන් ඇවිළී
යන කන්දකටවත්[16] අඳුරු වලා-
කුළකටවත් ඝනාන්ධකාරයකටවත්
චණ්ඩ මාරුතයකටවත්,[17] **19** මහ
හොරණෑ ශබ්දයකටවත්[18] මහ හඬක-
ටවත්[19] නොවේ. ඒ හඬ ඇසූ සෙ-
නඟ තමන්ට තවත් කිසි වචනයක්
නොකියන ලෙස බැගෑපත්ව ඉල්ලා
සිටියෝය.[20] **20** මන්ද, "සතෙකු එම
කන්දට පය තැබුවොත් උඟුව ගල් ගසා
මැරිය යුතුයි"[1] කියා ලබා දී තිබුණු
ආඥාවට ඔවුහු බිය වූහ. **21** ඒ දර්ශ-
නය කොතරම් භයානක එකක් වූවාද
කිවහොත්, "මට මහත් භයක් දැනේ.
මම වෙවුලමින් සිටිමි"[2] කියා මෝ-
සෙස් පවා පැවසුවේය. **22** නමුත්
ඔබ ළඟා වී සිටින්නේ සියොන් කන්ද-
ටය.[3] ජීවමාන දෙවිගේ නුවර[4] වන
ස්වර්ගීය යෙරුසලමටය.[5] දේවදූතයන්
දසදහස් ගණනක්,[6] **23** එක් රැස් වී
සිටින ස්ථානය වෙතටය.[7] එමෙන්ම
ස්වර්ගයෙහි තම නම් ලියා ඇති[8]
කුලුඳුලන්ගේ සභාව වෙතටය.[9] එලෙ-
සම සියලුදෙනාගේ විනිශ්චයකරු[10]
මෙන්ම තම බලයෙන් ධර්මිෂ්ඨ අයට
අලුත් ජීවිතයක් ලබා දී[11] ඔවුන්ව
පූර්ණ තත්වයක් දක්වා ගෙන ආ[12]
විනිශ්චයකරු වන දෙවි වෙතටය.
**24** එමෙන්ම අලුත් ගිවිසුමක[13] මැදි-
හත්කරු[14] වන යේසුස් වෙතටය.
එලෙසම ඔහු අප මත ඉසිනු ලැබූ රුධි-
රය වෙතටය.[15] ඒ රුධිරය ආබෙල්-
ගේ රුධිරයට වඩා උතුම් ආකාරයකින්
කතා කරයි.[16]

**25** කතා කරන එම තැනැත්-
තාව ප්‍රතික්ෂේප නොකිරීමට වගබලා
ගන්න.[17] මන්ද පොළොවේදී දෙවිගේ
අනතුරු ඇඟවීම් දුන් තැනැත්තාව
ප්‍රතික්ෂේප කළ අය ගැලවුණේ නැත්-
නම්[18] ස්වර්ගයේ සිට කතා කරන
තැනැත්තාගෙන් අප අහක්ව ගියොත්
අපට ගැලවෙන්න කිසි ලෙසකින්-
වත් හැකියාවක් ලැබෙන්නේ නැත.[19]
**26** දෙවිගේ හඬ නිසා ඒ කාලයේදී
පොළොව දෙදරුම් කෑවේය.[20] නමුත්
දැන් ඔහු, "මම නැවත වරක් පො-
ළොව පමණක් නොව අහසත් කලඹ-
වන්නෙමි"[21] යන පොරොන්දුව දී ඇත.
**27** "නැවත වරක්" කියා පැවසීමෙන්
අදහස් කරන්නේ දෙදරුම් කන්නේ
නැති දේවල් පැවතීම සඳහා[22] දෙද-
රුම් කන දේවල් එනම්, දෙවි නොසෑදූ
දේවල් ඉවත් කරනු ලබන බවය.[23]

---

හෙබ්‍රෙ **12:14*** හෝ, "දෙවි සඳහා වෙන් කර ඇති අය ලෙස." **16*** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න.

**22** ගීතා 37:11; 2පේතෘ 3:13; එළි 21:10; **23** 2පේතෘ 3:10.

**12 පරි.**

**1** ගලා 6:1
යාකො 5:15
යූද් 23
**2** ගීතා 119:105
හිතෝ 4:26
**3** ගීතා 34:14
රෝම 12:18
රෝම 14:19
2තිමෝ 2:22
**4** රෝම 6:19
1තෙස 4:4
හෙබ්‍රෙ 10:10
**5** මතෙ 5:8
රෝම 8:8
**6** 2කොරි 6:1
ගලා 5:4
හෙබ්‍රෙ 3:12
**7** ද්වි 29:18
යොහ 13:2
ක්‍රියා 8:23
**8** යාකො 1:14
**9** උත් 25:34
**10** උත් 25:32
**11** උත් 27:31
**12** උත් 27:32
**13** උත් 27:34
**14** 2කොරි 7:10
හෙබ්‍රෙ 6:6
**15** නික් 19:12
**16** නික් 19:18
**17** නික් 19:16
**18** නික් 19:19
**19** ද්වි 4:12
**20** නික් 20:19

**2 තීරුව**

**1** නික් 19:13
**2** ද්වි 9:19
**3** එළි 14:1
**4** හෙබ්‍රෙ 11:10
හෙබ්‍රෙ 13:14
**5** මතෙ 26:29
එළි 21:2
**6** මතෙ 24:31
**7** දානි 7:10
**8** ගීතා 87:6
එළි 7:4
එළි 21:27
**9** 1කොරි 15:23
එළි 20:6
**10** උත් 18:25
ගීතා 94:2
යෙසා 33:22
**11** යොහ 3:5
හෙබ්‍රෙ 12:9
1පේතෘ 1:3
**12** හෙබ්‍රෙ 10:14
**13** මතෙ 26:28
ලූක් 22:29
**14** 1තිමෝ 2:5
හෙබ්‍රෙ 9:15
**15** 1පේතෘ 1:2
**16** මතෙ 23:35
**17** හෙබ්‍රෙ 2:3
**18** නික් 20:19
**19** හෙබ්‍රෙ 1:2
**20** නික් 19:18
**21** හග් 2:6

**28** ඒ අනුව කිසි ලෙසකින්වත් සෙල-
විය නොහැකි රාජ්‍යයක් අපට හිමි
වන නිසා[1] අපි දිගටම දෙවිගේ මහත්
කරුණාව ලබාගනිමු. එමගින් දෙවිට
ගැඹුරු ගෞරවයක් හා ගරුබියක් දක්-
වමින් ඔහුට පිළිගත හැකි ආකාරය-
කින් පරිශුද්ධ සේවයක් පිරිනැමීමට
අපට හැකි වේ.[2] **29** මන්ද අපගේ
දෙවි ඇවිළෙන ගින්නක් හා සමාන
වන්නේය.[3]

**13** දිගටම එකිනෙකාව සහෝ-
දරයන් ලෙස සලකා
ඔවුන්ට ප්‍රේම කරන්න.[4] **2** ආගන්-
තුක සත්කාරය දැක්වීමට අමතක
නොකරන්න.[5] මන්ද සමහරු නොදැ-
නුවත්වම දේවදූතයන්ට පවා සංග්‍රහ
කළෝය.[6] **3** සිරභාරයේ සිටින අය[7]
සමඟ ඔබවත් බැඳ තබා තිබෙ-
නවා කියා සිතා[8] ඔවුන්ගේද හිංසා
පීඩා විඳින වෙනත් අයගේද[9] දුක් පීඩා
අමතක නොකරන්න. මන්ද ඔබත්
තවමත් මිහිපිට ජීවත්ව සිටින්නහුය.
**4** විවාහය සියලුදෙනා ගෞරවයෙන්
සැලකිය යුතු දෙයකි. එලෙසම විවා-
හයට කිසිදු කැළැලක් සිදු වීමට
ඉඩ නොදිය යුතුයි.[10] මන්ද වේශ්‍යාක-
මෙහි* සහ අනාචාරයෙහි# යෙදෙන
සියලුදෙනාටම දෙවිගේ විනිශ්චය
ලැබේ.[11] **5** ඔබ තුළ මුදලට තිබෙන
ආශාව නැති කර දමන්න. ඒ බව ඔබ
ජීවත් වන ආකාරයෙන් පෙන්වන්න.[12]
ඔබට තිබෙන දේවල් ගැන[13] සෑහීමට
පත් වන්න.[14] මන්ද, “මා ඔබව කිසි
ලෙසකින්වත් අත්හරින්නේ නැත.
මම ඔබව කිසිදාක අසරණ නොක-
රන්නෙමි” කියා දෙවි පවසා ඇත.[15]
**6** එහෙයින් අපි ධෛර්යය උපද-
වාගෙන,[16] “මට උපකාර කරන්නේ
යෙහෝවා දෙවිය. මම බිය නොවන්-
නෙමි. මිනිසාට මට විරුද්ධව කළ
හැක්කේ කුමක්ද”[17] කියා පවසමු.

**7** ඔබ අතරෙහි පෙරමුණ ගෙන
කටයුතු කරන, ඔබට දෙවිගේ වදන්
ගැන කියා දෙන අයව අමතක නො-
කරන්න.[1] ඔවුන් හැසිරෙන ආකාරය
දෙසත් එයින් ඔවුන් ලබන යහපත්
ප්‍රතිඵල දෙසත් හොඳින් බලා ඔවුන්
තුළ තිබෙන විශ්වාසය[2] ආදර්ශයට
ගන්න.[3]
**8** යේසුස් ක්‍රිස්තුස් ඊයේත් අදත්
කවදත් එකම තැනැත්තාය.[4]
**9** විවිධාකාර, නුහුරු ඉගැන්වීම්ව-
ලින් ගසාගෙන නොයෑමට වගබලා
ගන්න.[5] මන්ද සිත ශක්තිමත් විය
යුත්තේ දෙවිගේ මහත් කරුණාවෙන්[6]
මිස ආහාරවලින් නොවේ.[7] ආහාරව-
ලට අනවශ්‍ය අවධානයක් ලබා දෙන
අය එයින් ප්‍රයෝජනයක් ලබා නැත.
**10** අපටද පූජාසනයක් ඇත. එහි
තිබෙන දේ කෑමට ශුද්ධ කූඩා-
රමෙහි සේවය කරන අයට අවසර
නැත.[8] **11** උත්තම පූජකයා පව්
උදෙසා සතුන්ගේ ලේ අතිශුද්ධස්ථා-
නයට ගෙන ගිය පසු එම සතුන්ගේ
මළ සිරුරු කඳවුරෙන් පිටත පුලුස්සා
දමනු ලැබේ.[9] **12** එලෙසම යේසුස්ද
තමාගේම ලෙයින්[10] ජනයාව ශුද්ධ
කිරීම සඳහා[11] වධ වින්දේ නුවරෙන්
පිටතය.[12] **13** එහෙයින් අපිද ඔහු
දැරූ නින්දාව දරාගෙන කඳවුරෙන්
පිටතට ගොස් ඔහු වෙතට යමු.[13]
**14** මන්ද සැමදා පවතින නුවරක්
අපට මෙහි නැත.[14] ඒ වෙනුවට අප
මහත් උනන්දුවකින් බලා සිටින්නේ
පැමිණීමට නියමිත නුවර දෙසය.[15]
**15** අපි නිතරම අපගේ මුවින් දෙවිට
කරන ප්‍රශංසාව,[16] පූජාවක් මෙන් ඔප්පු
කර[17] ඔහුගේ නාමය ගැන ප්‍රසිද්ධියේ
ප්‍රකාශ කරමු.[18] එලෙසම අපි ඒ දේ
යේසුස් මාර්ගයෙන් කරමු. **16** මීට
අමතරව යහපත් දේවල් කිරීමටත්[19]
අනුන් සමඟ ඔබ සතු දේවල් බෙදා
හදා ගැනීමටත් අමතක නොකරන්න.

**12 පරි.**
**1** මතෙ 16:18
**2** පිලි 2:12
1තිමෝ 2:2
**3** ද්වි 4:24
යෙසා 33:14

**13 පරි.**
**4** 1තෙස 4:9
1පේතෘ 1:22
**5** රෝම 12:13
1තිමෝ 3:2
**6** උත් 18:3
උත් 19:1
මතෙ 25:35
**7** මතෙ 25:36
කොලො 4:18
**8** රෝම 12:15
1පේතෘ 3:8
**9** 1කොරි 12:26
**10** උත් 49:4
හිතෝ 5:16
හිතෝ 5:20
මතෙ 5:28
**11** හිතෝ 6:32
1කොරි 5:9
1කොරි 6:9
1කොරි 6:18
ගලා 5:21
**12** 1තිමෝ 6:10
**13** පිලි 4:11
**14** හිතෝ 30:8
1තිමෝ 6:8
**15** ද්වි 31:6
ද්වි 31:8
**16** හෙබ්‍රෙ 10:39
යාකො 1:6
**17** ගීතා 56:11
ගීතා 118:6
දානි 3:17
ලූක් 12:4

**2 තීරුව**
**1** 1තිමෝ 5:17
හෙබ්‍රෙ 13:17
**2** හෙබ්‍රෙ 12:3
**3** 1කොරි 11:1
2තෙස 3:7
**4** එළි 1:17
**5** එෆී 4:14
කොලො 2:8
2තෙස 2:2
**6** යොහ 1:17
**7** රෝම 14:17
1කොරි 8:8
කොලො 2:16
**8** 1කොරි 9:13
1කොරි 10:18
**9** නික් 29:14
ලෙවී 16:27
**10** හෙබ්‍රෙ 9:14
හෙබ්‍රෙ 9:22
**11** යොහ 17:19
හෙබ්‍රෙ 10:29
**12** මතෙ 21:39
යොහ 19:17
**13** ක්‍රියා 7:58
රෝම 15:3
2කොරි 12:10
1පේතෘ 4:14

හෙබ්‍රෙ **13:4*** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න. **4#** මූ.අ., “පරදාර සේවනයෙහි.” මෙය භාවිත කරන්නේ විවාහක පුරුෂයෙකු හෝ ස්ත්‍රියක අනාචාරයේ යෙදීම විස්තර කිරීමටය.

**14** ලෙවී 23:42; 1පේතෘ 2:11; **15** ලූක් 16:9; හෙබ්‍රෙ 11:10; හෙබ්‍රෙ 12:22; එළි 3:12; එළි 21:2; **16** ගීතා 69:30; හොෂෙ 14:2; 1කොරි 9:16; **17** ලෙවී 7:12; 2ලේක 29:31; ගීතා 50:14; 1පේතෘ 2:5; **18** මතෙ 24:14; රෝම 10:9; **19** රෝම 12:13; තීත 1:8.

මන්ද එවැනි පරිත්‍යාග ගැන දෙවි
සතුටු වෙයි.[1]
**17** ඔබ අතරෙහි පෙරමුණ ගෙන
ක්‍රියා කරන අයට කීකරු වන්න.[2]
එලෙසම ඔවුන්ට යටත් වී සිටින්න.[3]
ඔබ එසේ කළොත් ඔවුන්ට තම
කාර්යය සුසුම්ලමින් නොව ප්‍රීතියෙන්
කිරීමට හැකි වේ. මන්ද ඔබ ගැන
ගණන් දිය යුතු අය ලෙස ඔවුහු ඔබ
ගැන සෝදිසියෙන් සිටිති.[4] තම කාර්-
යය සුසුම්ලමින් කිරීමට සිදු වුවහොත්
එයින් ඔබට හානියක් සිදු වේ.[5]
**18** අප සැම දෙයකදීම අවංකව
කටයුතු කිරීමට කැමති නිසා[6] දෙවි
ඉදිරියේ අවංක හෘදය සාක්ෂියක්
ඇති බව අපට විශ්වාසයි. එහෙයින්
අප වෙනුවෙන් නිරතුරුවම යාච්ඤා
කරන්න.[7] **19** මා ඔබට උනන්දු
කරන්නේ ඒ සම්බන්ධයෙන් විශේෂ-
යෙන්ම සැලකිලිමත් වීමටය. එවිට
වඩාත් ඉක්මනින් ඔබව හමු වීමට මට
අවස්ථාවක් ලැබිය හැක.[8]
**20** සදාකල් පවතින ගිවිසුමක්
වලංගු කළ රුධිරය ඉදිරිපත් කළ[9]
උතුම් බැටළු[10] එඬේරා[11] වන අපගේ
ස්වාමීන් වන යේසුස්ව මරණයෙන්
නැඟිටෙවූ[12] සමාදානයේ දෙවිගෙන්[13]
මම යමක් ඉල්ලමි. **21** එනම් ඔහු-
ගේ කැමැත්ත කිරීම සඳහා අවශ්‍ය
සැම යහපත් දෙයක්ම ඔබට සප-
යන්න කියාත් යේසුස් ක්‍රිස්තුස් මාර්-
ගයෙන් ඔහුට ප්‍රසන්න දේ කිරීමට
අපට මඟ සලසන්න කියාත් ඉල්ලමි.[1]
ඒ දෙවිට සදහටම සියලු ප්‍රශංසා හා
ගෞරවය හිමි වේවා![2] ආමෙන්.*
**22** සහෝදරයෙනි, වචන ස්වල්-
පයකින් මා මේ ලිපිය ඔබට ලියා
ඇති නිසා[3] දැන් මා ඔබට උනන්දු
කරන්නේ ඒ දිරිගැන්වීම්වලට ඉවසිලි-
වන්තව හොඳ අවධානයක් දෙන්න
කියාය. **23** අපගේ සහෝදර තිමෝ-
තිව[4] නිදහස් කර ඇති බව ඔබට දැන්-
වීමට කැමැත්තෙමි. ඔහු ඉක්මනින්
පැමිණියොත් මගේ අදහස වන්නේ
ඔහු සමඟ ඔබව හමු වීමට පැමිණීමයි.
**24** ඔබ අතරෙහි පෙරමුණ ගෙන
ක්‍රියා කරන සියලුදෙනාටත්[5] සිය-
ලුම ශුද්ධ තැනැත්තන්ටත් මගේ සුබ
පැතුම් ලබා දෙන්න. ඉතාලියෙහි[6]
සිටින සියලුදෙනාත් ඔබට සුබ පතති.
**25** ස්වාමීන්ගේ මහත් කරුණාව[7]
ඔබ සියලුදෙනාටම ලැබේවා!

**13 පරි.**
**1** පිලි 4:18
**2** 1තෙස 5:12 හෙබ්‍රෙ 13:24
**3** 1කොරි 16:16 එෆී 5:21 1පේතෘ 5:5
**4** ක්‍රියා 20:28
**5** යෙසා 35:10
**6** 2කොරි 1:12 1තෙස 2:10 තීත 2:10
**7** කොලො 1:9
**8** පිලෙ 22
**9** යෙසා 55:3 එස 37:26 සෙක 9:11
**10** ගීතා 79:13 යොහ 10:7
**11** 1පේතෘ 2:25 1පේතෘ 5:4
**12** ක්‍රියා 2:24
**13** රෝම 15:33

**2 තීරුව**
**1** පිලි 2:13 2තෙස 2:17
**2** රෝම 16:27
**3** 1පේතෘ 5:12
**4** 1තෙස 3:2
**5** යෙසා 1:26 හෙබ්‍රෙ 13:17 1පේතෘ 5:3
**6** ක්‍රියා 27:1
**7** 2තිමෝ 4:22

හෙබ්‍රෙ **13:21*** එනම්, එසේම වේවා!

# යාකොබ්
## ලියූ ලිපිය

**1** දෙවිගෙත් ස්වාමීන් වන යේ-
සුස් ක්‍රිස්තුස්ගෙත් දාසයෙක්[1]
වන යාකොබ්[2] විසින්, විසිරී සිටින[3]
ගෝත්‍ර දොළොස[4] වෙතට ලියන ලද
ලිපියකි.
ඔබ සැමට සුබ පැතුම්!
**2** මාගේ සහෝදරයෙනි, ඔබට
විවිධාකාර ප්‍රශ්න ගැටලුවලට මුහුණ
දීමට සිදු වන විට එය ප්‍රීතියක්
ලෙස සලකන්න.[5] **3** මන්ද එයින්
ඔබ තුළ තිබෙන විශ්වාසය සෝදි-
සියට ලක් වනු ඇත. එමගින් ඔබ
තුළ විඳදරාගැනීමේ හැකියාව ඇති
වන බව ඔබ හොඳින් දන්නා දෙයකි.[1]
**4** විඳදරාගැනීමෙන් ඉතා වැදගත්
කාර්යයක් ඉටු වෙයි. එයින් ඔබට
සැම පැත්තකින්ම අඩුපාඩුවක් නැති,[2]
නිර්දෝෂ, අවබෝධයෙන් ක්‍රියා කරන
කෙනෙකු බවට පත් විය හැක.[3]
**5** එහෙයින් තමාට ප්‍රඥාව අඩුයි

**1 පරි.**
**1** රෝම 12:11 කොලො 3:24 1තෙස 1:9
**2** මතෙ 13:55 ක්‍රියා 12:17 ගලා 1:19
**3** ක්‍රියා 2:5 ක්‍රියා 8:1 1පේතෘ 1:1
**4** යෙරෙ 31:31 ක්‍රියා 26:7
**5** මතෙ 5:12 ක්‍රියා 5:41 1පේතෘ 4:14

**2 තීරුව** **1** රෝම 5:3; 1පේතෘ 1:7; **2** මතෙ 5:48; **3** 1කොරි 14:20; එෆී 4:13.

කියා යමෙකුට හැඟෙනවා නම්[1] එය
ඔහුට නොකඩවා දෙවිගෙන් ඉල්ලිය
හැකියි.[2] ඔහුගේ ඉල්ලීමට අනිවාර්ය-
යෙන්ම පිළිතුරක් ලැබෙයි. මන්ද දෙවි
අදිමදි නොකර[3] සියල්ලන්ට ප්‍රඥාව
ත්‍යාගශීලීව ලබා දෙයි.[4] **6** නමුත්
ඉල්ලන[5] තැනැත්තා කිසි ලෙසකින්-
වත් සැක කරන්නේ නැතුව[6] විශ්වා-
සයෙන් යුතුව ඉල්ලිය යුතුයි. සැක
කරන පුද්ගලයා, සුළඟට ඒ මේ
අත ගසාගෙන[7] යන මුහුදු රැල්ල-
කට සමානය. **7** එවැනි මිනිසෙක්
තමාට යෙහෝවා දෙවිගෙන් කිසි-
වක් ලැබෙයි කියා කිසි ලෙසකින්වත්
නොසිතිය යුතුයි.[8] **8** මන්ද ඔහු දෙ-
ගිඩියාවෙන්[9] සිටින මිනිසෙකි. එවැනි
කෙනෙක් තමන් කරන කියන සියල්-
ලේදී අවිනිශ්චිතව කටයුතු කරයි.[10]

**9** දුගීව සිටින සහෝදරයා තමාට
ලැබී ඇති උතුම් වරප්‍රසාදය
ගැන සතුටු විය යුතුයි.[11] **10** ධන-
වත් සහෝදරයාට[12] කලින් හිමි වී තිබූ
තාන්නමාන්න නැති වුණත් ඔහුද
සතුටු විය යුතුයි. මන්ද ධනවතා
පහ වී යන්නේ කෙතක හටගන්නා
මලක් පරවී යන්නා සේය.[13] **11** හිරු
පායන විට එහි දැඩි රශ්මියෙන් සිය-
ලුම පැළෑටි මැලවී වියළී යයි. එහි මල්
කැකුළුද පරවී වැටෙයි. ඒවායේ අලං-
කාරයද පහ වී යයි. ඒ හා සමානව
බොහෝ වැඩකටයුතුවල යෙදී සිටි-
මින් ජීවත් වන ධනවතාද පහ වී
යයි.[14]

**12** විවිධ දුෂ්කරතා දිගටම විඳදරා-
ගෙන සිටින පුද්ගලයෙකුට ප්‍රීතියෙන්
සිටිය හැකියි.[15] එවැනි පුද්ගලයෙකුට
දෙවිගේ අනුමැතිය ලැබෙන අතර
එහි ප්‍රතිඵලයක් ලෙස ඔහුට ජීවන-
යේ ඔටුන්න උරුම වෙයි.[16] තමාට
නොකඩවා ප්‍රේම කරන අයට එය
ලබා දෙන බව යෙහෝවා දෙවි පො-
රොන්දු වී ඇත.[17] **13** දුෂ්කරතා අද්-
දකින විට[18] කිසි කෙනෙක්, “දෙවි
මාව වරදකට හසු කරගන්න උත්සාහ
කරනවා” කියා කිසිසේත් නොපැව-
සිය යුතුයි. දෙවි ඉතා පරිශුද්ධ දෙවි
කෙනෙක් බව මතක තබාගන්න.
නපුරු දේ කරන්න ඔහුව පෙලඹ-
වීමට කාටවත් බැරිය. ඔහුද නපුරු
දේ කරන්න කිසි කෙනෙකුව පොලඹ-
වන්නේ නැත. **14** කෙනෙක් නො-
මඟ ගොස් වරදට පෙලඹෙන්නේ
ඒ තැනැත්තා තුළ තිබෙන නුසු-
දුසු ආශාවන් නිසාය.[1] **15** ඒ ආශා-
වන් පාලනය කරගන්නේ නැත්නම්
ඔහු තුළ පව් කිරීමට පෙලඹීමක් ඇති
වෙයි.[2] ඔහු පව් කරන විට එහි ප්‍රතිඵ-
ලය මරණයයි.[3]

**16** එහෙයින් මාගේ ප්‍රේමණීය
සහෝදරයෙනි, මුළා නොවන්න.[4]
**17** සෑම යහපත් දීමනාවක්ම[5] හා
කිසිම අඩුපාඩුවක් නැති සෑම තෑග්-
ගක්ම පැමිණෙන්නේ ස්වර්ගයෙහි
සිටින දෙවිගෙන්ය.[6] අහසෙහි ඇති
ආලෝක වස්තුවල නිර්මාතෘ වන ඔහු
වෙතින් ඒ දේවල් බැස එයි.[7] සෙව-
ණැල්ලක් වෙනස් වන්නා සේ ඔහු
කිසිසේත් වෙනස් වන්නේ නැත.[8]
**18** ඒ අනුව දෙවි තම අරමුණට
එකඟව[9] අපට සත්‍යය පිළිබඳ පණිවි-
ඩය ලබා දීමෙන්[10] ඔහු සෑදූ අය අත-
රින් අපව යම් ආකාරයක පළමු පල
ලෙස ජනිත කළේය.[11]

**19** මාගේ ප්‍රේමණීය සහෝදර-
යෙනි, මේ දේ දැනගන්න. සෑම මිනි-
සෙක්ම ඇහුම්කන් දීමට ඉක්මන් විය
යුතුයි. කතා කිරීමට ප්‍රමාද විය
යුතුයි.[12] කෝප වීමටද ප්‍රමාද විය
යුතුයි.[13] **20** මන්ද කෝප වීමෙන්
මිනිසෙකුට දෙවිගේ ධර්මිෂ්ඨ ප්‍රමිතිව-
ලට අනුව කටයුතු කළ නොහැක.[14]
**21** එහෙයින් සෑම අපවිත්‍ර ක්‍රියාව-
කින්ම සහ කිසි වැදගැම්මකට නැති,
නපුරු දේවලින්ද දුරස් වී[15] දෙවිගේ
වදන් මෘදුකමින් පිළිගෙන ඒවා ඔබේ
හදවත් තුළ රෝපණය වීමට ඉඩහ-
රින්න.[16] එය ඔබේ ජීවිත ගැලවීමට
මඟ පාදයි.[17]

**22** ඔබ තුළ ඇති වන බොරු තර්ක
විතර්කවලින් ඔබවම රවටාගන්නා

**1 පරි.**
1 හිතෝ 2:3
2 1රාජා 3:9; මාක් 11:24; 1යොහ 3:22
3 මතෙ 7:11
4 හිතෝ 2:6; යොහ 15:7; 1යොහ 5:14
5 මතෙ 7:7
6 මතෙ 21:22; හෙබ්‍රෙ 11:6
7 එෆී 4:14
8 යෙසා 58:3; යාකො 4:3
9 යාකො 4:8
10 2පේතෘ 3:16
11 යෙසා 64:5; යාකො 2:5
12 1තිමෝ 6:17
13 යෙසා 37:27; යෙසා 40:6; 1පේතෘ 1:24
14 යෙසා 40:7; මතෙ 19:24
15 මතෙ 5:10; යාකො 1:2
16 2තිමෝ 4:8; 1පේතෘ 5:4; එළි 2:10
17 යාකො 2:5
18 හෙබ්‍රෙ 2:18; හෙබ්‍රෙ 4:15

**2 තීරුව**
1 උත් 3:6; ද්වි 32:5; යෙසා 44:20; 1යොහ 2:16
2 ගීතා 7:14
3 එස 18:4; රෝම 5:21; රෝම 7:11
4 ගලා 6:7
5 ගීතා 115:16; රෝම 6:23; 1කොරි 14:1
6 මතෙ 7:11; යොහ 3:27
7 ගීතා 136:7; යෙසා 45:7; යෙසා 60:20; එෆී 5:8; 1යොහ 1:5
8 මලා 3:6
9 යොහ 1:13; රෝම 8:28; 2තෙස 2:13
10 හෙබ්‍රෙ 4:12; 1පේතෘ 1:23
11 නික් 34:22; ලෙවී 23:17; එළි 14:4
12 හිතෝ 10:19; හිතෝ 17:27
13 දේශ 7:9; මතෙ 5:22
14 යාකො 3:18
15 කොලො 3:8; 1පේතෘ 2:1
16 මතෙ 13:23

17 හෙබ්‍රෙ 2:3; 1පේතෘ 1:9.

සවන් දෙන්නන් පමණක් නොවන්න.[1]
ඒ වෙනුවට දෙවිගේ වදන් පිළිපදින්-
නන් බවට පත් වන්න.[2] **23** ඇත්-
තෙන්ම කෙනෙක් දෙවිගේ වදන්
අසන්නෙකු මිස එය පිළිපදින්නෙකු
නොවේ නම්[3] ඔහුව සමාන කළ
හැක්කේ කාටද? ඔහුව කැඩපතකින්
තමාගේ මුහුණ දෙස බලන මිනිසෙ-
කුට සමාන කළ හැක. **24** මන්ද ඒ
මිනිසා තමන් දෙස බැලුවත් ඔහු එතැ-
නින් අහක්ව ගිය පසු තමන්ගේ පෙ-
නුම මොන වගේද කියා ඉක්මනින්ම
අමතක කර දමයි. **25** නමුත් කිසි
අඩුවක් නැති නිදහස ගෙන දෙන පරි-
පූර්ණ නීතිය ගැන හොඳින් සෝදිසි
කර බලා[4] දිගටම ඒ අනුව ජීවත් වන
තැනැත්තා, අසා අමතක කරන්නෙකු
නොව දෙවිගේ වදන් පිළිපදින්නෙක්
වෙයි.[5] ඒවා පිළිපැදීමෙන් ඔහු මහත්
සන්තෝෂයක්ද අද්දකියි.[6]

**26** තම නමස්කාරයට සම්බන්ධ
සෑම කටයුත්තක්ම තමන් නිසි ලෙස
ඉටු කරනවා කියා යමෙක් සිතාගෙන
සිටියත්[7] ඔහු තමාගේ දිව පාලනය
කරගන්නේ නැත්නම්[8] ඔහු ඇත්තටම
කරන්නේ තමාගේම සිත රවටාගැ-
නීමක්ය.[9] ඒ මිනිසාගේ නමස්කා-
රය නිෂ්ඵලය.[10] **27** අපගේ දෙවි සහ
පියාණන්ගේ මිම්මට අනුව කිසි කැළැ-
ලක් නැති[11] පවිත්‍ර[12] නමස්කාරයක
යෙදෙන්න නම් කෙනෙක් අනාථ දරු-
වන්[13] හා වැන්දඹුවන්[14] අද්දකින පීඩා-
වලදී ඔවුන්ව බලාගත යුතු අතර[15]
මේ ලෝකයේ දේවලින්[16] කිළිටි නොවී
සිටීමටත් වගබලා ගත යුතුයි.[17]

**2** මාගේ සහෝදරයෙනි, අපගේ
තේජවත් ස්වාමීන්[18] වන යේ-
සුස් ක්‍රිස්තුස්ගේ ඉගැන්වීම් පිළිප-
දින අතරම ඔබ ඇතැම් අයට විශේෂ
සැලකිල්ලක් දක්වමින් සිටිනවාද?[19]
**2** රන් මුදු හා අනර්ඝ වස්ත්‍ර පැළඳ
සිටින මිනිසෙකු හා කිළිටි වස්ත්‍ර
පැළඳ සිටින දිළිඳු මිනිසෙකු[20] ඔබ
රැස්ව සිටින ස්ථානයකට පැමිණි
විට,[21] **3** අනර්ඝ වස්ත්‍ර පැළඳ සිටින
තැනැත්තාට ඔබ විශේෂ සැලකිල්ලක්
දක්වමින්,[1] “ඔබ මෙහි හොඳ තැනක
ඉඳගන්න” කියා පැවසුවත් ඔබ දිළින්-
දාට පවසන්නේ, “මෙතනට වී සිට-
ගෙන සිටින්න” කියා හෝ, “මාගේ පා
පුටුව ළඟ ඉඳගන්න” කියාද? **4** ඔබ
අතරේ පන්ති භේද තිබෙනවා නො-
වේද?[2] ඔබ දුෂ්ට ආකාරයකින් තීරණ
ලබා දෙන[3] විනිශ්චයකරුවන් බවට
පත්ව සිටිනවා නොවේද?[4]

**5** මාගේ ප්‍රේමණීය සහෝදරයෙනි,
සවන් දෙන්න. දෙවි තෝරාගත්තේ
මේ ලෝකය විසින් දිළිඳු ලෙස සල-
කනු ලබන අයව නොවේද?[5] දෙවි
එවැනි අයව තෝරාගත්තේ ඔවුන්
තුළ ඇති විශ්වාසය මගින් ඔවුන්ව
ධනවත් කිරීම සඳහාය.[6] එසේම දෙ-
විට ප්‍රේම කරන අයට පොරොන්දු වූ
රාජ්‍යයේ උරුමයක් ලබා දීම සඳ-
හාය.[7] **6** නමුත් ඔබ දිළිඳු අයට
කිසි ගෞරවයක් දක්වන්නේ නැත.
එසේවුවත් ඔබට පීඩා කරමින්[8] ඔබව
උසාවිවලට ඇදගෙන යන්නේ ධනව-
තුන් නොවේද?[9] **7** ඔබ දරන උතුම්
නාමයට[10] අපහාස කරන්නෙත්
ඔවුන්ම නොවේද?[11] **8** ඇත්තෙන්ම
ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් වී ඇති
දේට අනුව, “ඔබට මෙන් ඔබේ අසල්-
වැසියාට ප්‍රේම කරන්න”[12] යන රාජ-
කීය නීතිය[13] ඔබ පිළිපදිනවා නම් ඔබ
කරන්නේ යහපත් දෙයකි. **9** නමුත්
ඔබ දිගටම ඇතැම් අයට විශේෂ සැල-
කිල්ලක් දක්වනවා නම්[14] ඔබ කරන්-
නේ පාපයකි. මන්ද නීතියෙහි සඳහන්
වී ඇති දේට අනුව[15] ඔබ වරදකරුවන්
බව පැහැදිලි වෙයි.

**10** කෙනෙක් මුළු නීතියම පිළි-
පැද්දත් එක් කාරණයකදී වැරදි පියව-
රක් ගන්නවා නම් ඔහු මුළු නීතියම
උල්ලංඝනය කර ඇති බව පැව-
සිය හැක.[16] **11** මන්ද ‘අනාචාර-
යේ* නොහැසිරෙන්න’[17] කියා පැවසූ

**1 පරි.**

1 2තිමෝ 3:13; තිත 3:3
2 ලෙවී 18:5; ද්වි 7:11; 1සාමු 15:22; මතෙ 7:21; රෝම 10:5; 1යොහ 3:7
3 ලූක් 6:46; යාකෝ 2:14
4 ගීතා 19:7; රෝම 8:2
5 ද්වි 30:14; මතෙ 7:24; යොහ 13:17
6 ලූක් 11:28
7 ලූක් 18:12
8 ගීතා 39:1; හිතෝ 12:18; හිතෝ 15:2; 1පේතෘ 3:10
9 එළි 3:17
10 ලූක් 18:14; එළි 3:16
11 1තිමෝ 1:5
12 යෙසා 1:16
13 ද්වි 14:29; ද්වි 27:19; යෝබ් 29:12; ගීතා 68:5
14 යෝබ් 29:13; යෙසා 1:17; 1තිමෝ 5:3
15 යෙසා 58:7
16 යාකෝ 4:4
17 1කොරි 5:7; එළි 18:4

**2 පරි.**

18 1කොරි 2:8
19 හිතෝ 24:23; මතෙ 22:16; 1තිමෝ 5:21; යාකෝ 3:17
20 1කොරි 1:26
21 හෙබ්‍රෙ 10:25

**2 තීරුව**

1 ලෙවී 19:15
2 ගලා 3:28
3 ද්වි 1:17
4 ලූක් 6:37
5 ගලා 2:10
6 එළි 2:9
7 ලූක් 22:29
8 ක්‍රියා 13:50
9 ක්‍රියා 18:12
10 යොහ 17:6
11 යෙසා 52:5; ලූක් 12:10
12 ලෙවී 19:18
13 මතෙ 22:39; රෝම 13:10
14 යාකෝ 2:1
15 ලෙවී 19:15; ගලා 3:19
16 ලෙවී 4:2; ද්වි 27:26; ගලා 3:10

---

17 නික් 20:14.

---

**යාකෝ 2:11*** මූ.අ., “පරදාර සේවනයේ.” මෙය භාවිත කරන්නේ විවාහක පුරුෂයෙකු හෝ ස්ත්‍රියක අනාචාරයේ යෙදීම විස්තර කිරීමටය.

තැනැත්තාම, 'මිනී නොමරන්න'[1]
කියාද පවසා ඇත. එහෙයින් ඔබ
අනාචාරයේ හැසිරුණේ නැතත් මිනී
මරනවා නම් ඔබ නීතිය උල්ලංඝනය
කරන කෙනෙකු බවට පත්ව ඇත.
**12** දැන් ඔබ නිදහස් ජනතාවක්ය.
එහෙයින් ඔබට නිදහස ගෙන දෙන
අලුත් නීතියට අනුව කතා කිරීම-
ටත් ක්‍රියා කිරීමටත් පුරුදු වන්න.
මන්ද ඔබව විනිශ්චය කරන්නේ එම
නීතියට අනුවය.[2] **13** දයාව නො-
පෙන්වන පුද්ගලයාට ලැබෙන්නේ
දයාවෙන් තොර විනිශ්චයකි.[3] මන්ද
විනිශ්චය කිරීමට වඩා දයාව පෙන්වීම
උතුම්ය.

**14** මාගේ සහෝදරයෙනි, තමාට
දෙවි කෙරෙහි විශ්වාසයක් ඇති බව
යමෙක් පැවසුවත්[4] ඔහු තමන්ගේ
ක්‍රියාවලින් එය පෙන්වන්නේ නැත්-
නම් එයින් ඇති ප්‍රයෝජනය
කුමක්ද?[5] එවැනි විශ්වාසයක් තිබූ
පමණින් ඔහුට ගැලවීම ලබාගත
හැකිද?[6] **15** සහෝදරයෙකුට හෝ
සහෝදරියකට හෝ ප්‍රමාණවත්
ඇඳුම් හා එදා වේල පිරිමසාගැනීමට
කෑම වේලක්වත් නැතුව සිටින විට,[7]
**16** ඔහුට හෝ ඇයට අවශ්‍ය දේ ලබා
නොදී, "හොඳින් ඇඳ පැළඳ කා බී
සතුටින් සිටින්න" කියා ඔබ අතරේ
සිටින කෙනෙක් පැවසුවොත් එයින්
ඇති ප්‍රයෝජනය කුමක්ද?[8] **17** ඒ
අනුව විශ්වාසය සමඟ ක්‍රියා දක්නට
නොලැබේ නම්[9] ඒ විශ්වාසය මිය ගිය
එකක් බව පැවසිය හැක.

**18** නමුත් යමෙක් ඊට විරෝධය
දක්වමින්, "ඔබට විශ්වාසය තිබේ.
මට ක්‍රියා තිබේ" කියා පැවසිය හැකියි.
ක්‍රියා නැතුව ඔබ තුළ තිබෙන විශ්-
වාසය මට පෙන්වන්න. මම මාගේ
ක්‍රියාවලින් මා තුළ තිබෙන විශ්වා-
සය ඔබට පෙන්වමි.[10] **19** ඇත්තේ
එක දෙවි කෙනෙකු බව ඔබ විශ්වාස
කරනවාට සැකයක් නැත.[11] එසේ
විශ්වාස කිරීම සුදුසු දෙයකි. නමුත්
භූතයන් පවා එය විශ්වාස කරන
බවත් ඒ විශ්වාසය නිසා ඔවුන් බියෙන්
වෙවුලන බවත් මතක තබාගන්න.[1]
**20** අඥානයෙනි, ක්‍රියාවලින් තොර
විශ්වාසයක් නිෂ්ඵල බව දැනගැනීමට
ඔබ කැමති නැද්ද? **21** අපගේ පියා
වූ ආබ්‍රහම්[2] ධර්මිෂ්ඨයෙකු බව ප්‍රකාශ
කරනු ලැබුවේ ඔහු තම පුත් ඊසාක්ව
පූජාසනයක් මත ඔප්පු කළ අවස්ථා-
වේදී නොවේද? එසේ වූයේ ඔහු කළ
ඒ ක්‍රියාව නිසා නොවේද?[3] **22** ඔහු
තුළ තිබූ විශ්වාසය ඔහුගේ ක්‍රියා
සමඟ දක්නට ලැබුණු බවත් ඔහු-
ගේ විශ්වාසය ඔහුගේ ක්‍රියාවලින් සම්-
පූර්ණ කරනු ලැබූ බවත් පැහැදිලිය.[4]
**23** ඒ අනුව, "ආබ්‍රහම් යෙහෝවා දෙවි
කෙරෙහි විශ්වාසය තැබුවේය. ඒ නිසා
ඔහුව ධර්මිෂ්ඨ කෙනෙකු ලෙස ගණන්
ගන්නා ලදී"[5] කියා ශුද්ධ ලියවිල්ලෙහි
සඳහන් වදන් ඒ අයුරින්ම ඉටු විය.
එලෙසම ඔහුව "යෙහෝවා දෙවිගේ
මිත්‍රයා" ලෙසද හඳුන්වනු ලැබීය.[6]

**24** මින් පැහැදිලි වන්නේ මිනිසෙ-
කුව ධර්මිෂ්ඨ කෙනෙකු ලෙස ප්‍රකාශ
කරනු ලබන්නේ[7] ඔහු තුළ තිබෙන
විශ්වාසය නිසා පමණක් නොව[8] ඔහු-
ගේ ක්‍රියාවලින්ද බවය.[9] **25** රාහබ්[10]
නම් ගණිකාව පණිවිඩකරුවන්ව සාද-
රයෙන් පිළිගෙන ඔවුන්ව වෙනත්
මඟකින් පිටත් කර යැවූ පසු ඇයව
ධර්මිෂ්ඨ තැනැත්තියක ලෙස ප්‍රකාශ
කරනු ලැබුවේ ඇගේ එම ක්‍රියාව නිසා
නොවේද?[11] **26** ඇත්තෙන්ම පණ
නැති ශරීරයක් මැරුණු ශරීරයකි.[12] ඒ
හා සමානව ක්‍රියාවන් නැති විශ්වාසය
මිය ගොස් ඇති විශ්වාසයකි.[13]

**3** මාගේ සහෝදරයෙනි, ගුරුව-
රුන් වන අපට වඩාත් බරප-
තළ විනිශ්චයක් ලැබෙන බව
දන්නා නිසා[14] ඔබ අතරෙන් බො-
හෝදෙනෙකු ගුරුවරුන් වීමට ඉක්-
මන් නොවිය යුතුයි.[15] **2** මන්ද අප
සියලුදෙනා අතින් නොයෙක් අවස්-
ථාවලදී වැරදි සිදු වෙයි.*[16] යමෙ-
කුට තම දිව පාලනය කරගැනීමට
හැකි නම්[17] මුළු ශරීරයම හොඳින්

**2 පරි.**
**1** ද්වි 5:17
**2** යාකො 1:25
**3** හිතෝ 21:13
යෙසා 3:11
මතෙ 5:7
මතෙ 6:15
ලූක් 6:36
**4** හෙබ්‍රෙ 11:1
**5** 1තෙස 1:3
තීත 3:8
යාකො 1:25
**6** 1කොරි 13:2
**7** යෝබ් 31:19
යෙසා 58:7
මතෙ 25:36
ලූක් 3:11
**8** ද්වි 15:7
1යොහ 3:17
**9** මතෙ 7:21
රෝම 12:13
1තිමෝ 5:4
හෙබ්‍රෙ 10:24
යාකො 1:27
**10** ගලා 5:6
යාකො 3:13
**11** ද්වි 6:4

**2 තීරුව**
**1** මතෙ 8:29
ලූක් 4:34
හෙබ්‍රෙ 10:27
හෙබ්‍රෙ 10:31
**2** රෝම 9:8
**3** උත් 22:9
උත් 22:12
**4** හෙබ්‍රෙ 11:17
**5** උත් 15:6
රෝම 4:3
ගලා 3:6
**6** 2ලේක 20:7
යෙසා 41:8
**7** රෝම 4:5
**8** රෝම 4:13
**9** යොහ 8:39
**10** යොෂු 2:1
**11** යොෂු 6:17
හෙබ්‍රෙ 11:31
**12** ගීතා 146:4
දේශ 12:7
**13** රෝම 10:10
යාකො 2:17

**3 පරි.**
**14** යෙසා 3:14
ලූක් 12:48
**15** 1කොරි 12:29
එෆී 4:11
**16** 1රාජා 8:46
හිතෝ 20:9
**17** මතෙ 12:37
1යොහ 1:8

යාකො **3:2*** මූ.අ., "පය පැකිළී වැටෙයි."

පාලනය කරන, කිසි වරදක් නොක-
රන පරිපූර්ණ මිනිසෙකු වීමට ඔහුට
පුළුවන.[1] **3** උදාහරණයකට අශ්ව-
යන්ව මෙල්ල කරගැනීමට[2] අප උන්ට
කටකලියා[3] දමන විට උන්ගේ මුළු
ශරීරයම මෙල්ල කර තබාගැනීමට
අපට පුළුවන. **4** නැවක් කොතරම්
විශාල වුණත් ඉතා කුඩා සුක්කානම-
කින් ඒ නැව තමන්ට කැමති දිශාව-
කට හරවාගන්න නියමුවාට හැක.[4]
නැව තද සුළඟකින් ගසාගෙන යන
විටදීද ඔහුට එය කළ හැක.

**5** එලෙසම දිවද කුඩා අවයව-
යකි. නමුත් එය ලොකුවට පුරසාරම්
දොඩයි.[5] ඉතා විශාල වනාන්ත-
රයකට පවා ගිනි තැබීමට අවශ්‍ය
වන්නේ මොන තරම් කුඩා ගිනිපුපු-
රක්ද! **6** දිවද ගින්නකි.[6] එය අධර්-
මිෂ්ඨකමින් පිරුණු අවයවයකි. එයින්
මුළු ශරීරයටම කැළැලක් ඇති වන
අතර[7] එයට කෙනෙකුගේ ජීවිතය
පවා විනාශ කර දැමිය හැකියි. එයින්
සිදු වන විනාශය ගෙහෙන්නාවේ* සිදු
වන විනාශයට සමානය. **7** මිනි-
සාට ඕනෑම වනසතෙකුව, කුරුල්ලෙ-
කුව, බඩ ගා යන සතෙකුව හෝ
මුහුදේ සැරිසරන සතෙකුව මෙල්ල
කළ හැකියි. එසේ මෙල්ල කර
තිබෙන බව කවුරුත් දන්නා දෙයකි.[8]
**8** නමුත් දිව මෙල්ල කිරීමට සමත්
මිනිසෙකු මෙලොවෙහි නැත. දිව
නොහික්මුණු, හානිකර දෙයක් වන
අතර එය මාරාන්තික විෂවලින් පිරී
තිබේ.[9] **9** එයින් අපි අපගේ පියා-
ණන්[10] වන යෙහෝවා දෙවිට ප්‍රශංසා
කරන අතරම,[11] "දෙවි හා සමාන
ගතිලක්ෂණ" ඇතුව සාදා ඇති මිනි-
සුන්ට[12] විරුද්ධව නපුරු දේවල්ද
පවසන්නෙමු.[13] **10** ඒ අනුව එකම
මුවින් ප්‍රශංසාවත් ශාපයත් පිට වෙයි.
මාගේ සහෝදරයෙනි, එවැනි
දේවල් සිදු වීම කිසි ලෙසකින්වත්
සුදුසු වන්නේ නැත.[14] **11** එකම දිය
උල්පතින්[1] මිහිරි මෙන්ම තිත්ත
දිය නික්මෙයිද? **12** මාගේ සහෝ-
දරයෙනි, අත්තික්කා ගසකට ඔලීව
පල දරන්නවත් මිදිවැලකට අත්-
තික්කා පල දරන්නවත් හැකිද?[2] ලුණු
මිශ්‍ර උල්පතකින් නැවුම් ජලය කිසිදා
නික්මෙන්නේ නැත.

**13** ඔබ අතරෙහි ප්‍රඥාවෙන් හා අව-
බෝධයෙන් ක්‍රියා කරන කෙනෙක්
සිටීද? එසේ සිටී නම් ඔහු ඒ බව
තම යහපත් හැසිරීමෙන්ද තමන්
තුළ තිබෙන ප්‍රඥාව නිසා ඇති වන
මෘදු ක්‍රියාවලින්ද ඔප්පු කර පෙන්-
විය යුතුයි.[3] **14** නමුත් ඔබේ සිත්-
වල දැඩි ඊර්ෂ්‍යාවක් තිබේද?[4] ඔබ
විවාදශීලී කෙනෙක්ද?[5] එසේනම් පුර-
සාරම් දෙඩීමට ඔබට නුපුළුවන.[6]
සත්‍යයට විරුද්ධව බොරු නොකි-
යන්න.[7] **15** ස්වර්ගයෙන් පැමිණෙන
ප්‍රඥාව තිබෙන කෙනෙකු තුළ එවැනි
දේවල් දක්නට නොලැබිය යුතුයි.[8]
එම ප්‍රඥාව නැති අය තුළ මෙලො-
වට සීමා වූ,[9] තිරිසන් ගති සහ භූත-
යන්ගේ ගතිලක්ෂණ දක්නට ලැබේ.[10]
**16** මන්ද ඊර්ෂ්‍යාව[11] ඇති විවාදශීලී
කෙනෙකු තුළ වියවුලද සියලු ආකාර
පිළිකුල් දේවල්ද දක්නට ලැබේ.[12]

**17** නමුත් ස්වර්ගයෙන් පැමිණෙන
ප්‍රඥාව[13] තිබෙන කෙනෙකු තුළ
මුලින්ම දක්නට ලැබෙන්නේ නිර්ම-
ලකමය.[14] එසේම ඔහු සාමකාමීය.[15]
ඔහු සාධාරණ ලෙස කටයුතු කරන,[16]
කීකරු වීමට සූදානම්, දයාවෙන් සහ
යහපත් ගතිගුණවලින් පිරී සිටින කෙ-
නෙකි.[17] ඔහු සියලුදෙනාටම එක හා
සමානව සලකයි.[18] ඔහු කුහකකමින්
තොර මිනිසෙකි.[19] **18** මීට අමත-
රව සමාදානය ඇති වන අයුරින් ක්‍රියා
කරන අය[20] එම සාමකාමී[21] වාතාවර-
ණය තුළ ධර්මිෂ්ඨකම[22] නමැති පල
නෙළාගනු ඇත.[23]

**4** ඔබ අතරේ තිබෙන වාදවිවාදව-
ලට හේතුව කුමක්ද?[24] ඔබ අත-
රේ දබර තිබෙන්නේ මන්ද? එවැනි
දේවල් සිදු වන්නේ ඔබේ බලවත්
ආශාවන් ඔබ තුළ ගැටුමක් ඇති

**3 පරි.**
1 යොහ 8:46
2 ගීතා 32:9
3 හිතෝ 26:3
4 ක්‍රියා 27:40
5 ගීතා 12:4
6 හිතෝ 16:27
මතෙ 12:36
7 ගීතා 39:1
මතෙ 15:11
මතෙ 15:18
මාක් 7:23
8 උත් 9:2
9 ගීතා 140:3
හිතෝ 12:18
හිතෝ 13:3
හිතෝ 18:7
රෝම 3:13
10 මලා 2:10
11 ගීතා 34:1
ගීතා 103:1
12 උත් 1:26
උත් 5:1
13 2සාමු 16:7
14 එෆී 4:29

**2 තිරුව**
1 එළි 21:6
2 මතෙ 7:16
3 මතෙ 7:24
ගලා 6:4
යාකො 2:18
4 රෝම 13:13
1කොරි 3:3
5 එෆී 4:31
6 1කොරි 13:4
7 1යොහ 2:21
8 1කොරි 2:7
9 රෝම 1:28
1කොරි 2:14
පිලි 3:19
10 1තිමෝ 4:1
11 හිතෝ 14:30
12 ගලා 5:20
13 1කොරි 2:6
14 රෝම 12:9
1තිමෝ 5:2
15 2කොරි 13:11
1තෙස 5:13
1පේත්‍රු 3:11
2පේත්‍රු 3:14
16 1තිමෝ 3:3
තීත 3:2
17 ගලා 5:22
18 යාකො 2:9
19 1පේත්‍රු 1:22
20 මතෙ 5:9
1පේත්‍රු 3:11
21 හෙබ්‍රෙ 12:11
22 හිතෝ 11:18
යෙසා 32:17
23 පිලි 1:11

**4 පරි.**
24 යාකො 3:14

**යාකො 3:6*** යෙරුසලමෙන් පිටත කසළ පුලුස්සා දැමීම සඳහා භාවිත කළ ස්ථානය. උපග්‍ර. 2 බලන්න.

කරන නිසා නොවේද?[1] **2** ඔබට
ආශාවන් තිබුණත් ඒවා ඉටු කරගැනී-
මට ඔබට නුපුළුවන. මිනී මැරීමට
තරම් වෛරයකින්[2] හා තණ්හාවකින්[3]
ඔබේ ආශාවන් ඉටු කරගැනීමට ඔබ
උත්සාහ කළත් ඔබට කිසි දෙයක්
ලැබෙන්නේ නැත. ඔබ දබර කරමින්[4]
වාදවිවාදවලට පැටලෙමින් සිටින්න-
හුය. නමුත් ඔබට කිසි දෙයක් නො-
ලැබේ. ඒ ඔබ දෙවිගෙන් ඉල්ලන්නේ
නැති නිසාය. **3** නමුත් ඔබ ඉල්ලු-
වත් ඔබට කිසි දෙයක් ලැබෙන්නේ
නැත. මන්ද ඔබ ඉල්ලන්නේ වැරදි
චේතනාවකිනි.[5] ඒ ඔබේම ආශාවන්
තෘප්තිමත් කරගැනීමේ අදහසිනි.[6]

**4** අනාචාරයේ යෙදෙන්නෙනි,[7]
ලෝකය සමඟ මිතුරුකම් පැවැත්-
වීම දෙවි සමඟ සතුරු වීමට හේතු
වන බව ඔබ දැන සිටියේ නැද්ද?[8] ඒ
අනුව කෙනෙකු ලෝකයේ අය සමඟ
මිත්‍ර වීමට කැමති නම්[9] ඔහු දෙවිගේ
සතුරෙක් වෙයි.[10] **5** “නොයෙකුත්
දේවල් සඳහා නිරතුරුවම ආශාවක්
ඇති වන්නේ[11] අප තුළ තිබෙන තණ්-
හාව හා ඊර්ෂ්‍යාව නිසාය” කියා ශුද්ධ
ලියවිල්ලෙහි සඳහන් වී ඇති දෙයට
කිසි හරයක් නැති බව ඔබ සිත-
නවාද? **6** නමුත් ඒ දේවලට වඩා
දෙවි පෙන්වන මහත් කරුණාව බල-
වත්ය.[12] “දෙවි උඩඟු අයට විරුද්ධව
සිටියත්[13] තම මහත් කරුණාව නිහ-
තමානී අයට පෙන්වන්නේය”[14] කියා
ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් වන්නේ ඒ
නිසාය.

**7** එහෙයින් දෙවිට යටත් වන්න.[15]
යක්ෂයාට විරුද්ධ වන්න.[16] එවිට ඔහු
ඔබ වෙතින් පලා යයි.[17] **8** දෙවිට
ළං වන්න. එවිට ඔහු ඔබට ළං වෙයි.[18]
පව්කාරයෙනි, ඔබේ දෑත් පිරිසිදු
කරගන්න.[19] දෙගිඩියාවෙන් සිටින්-
නෙනි,[20] ඔබේ සිත් පවිත්‍ර කර-
ගන්න.[21] **9** දුක් වන්න. වැලපෙමින්
හඬන්න.[22] සිනාසෙනවා වෙනුවට
වැලපෙන්න. ප්‍රීතියෙන් සිටිනවාට
වඩා කලකිරී සිටින්න.[23] **10** යෙ-
හෝවා දෙවි ඉදිරියේ යටහත්පහත්
වන්න.[1] එවිට ඔහු ඔබව උසස් කරනු
ඇත.[2]

**11** සහෝදරයෙනි, එකිනෙකාට
විරුද්ධව තවදුරටත් කතා නො-
කරන්න.[3] සහෝදරයෙකුට විරුද්-
ධව කතා කරන තැනැත්තා හෝ
තම සහෝදරයාව විනිශ්චය කරන
තැනැත්තා[4] හෝ කතා කරන්නේ
නීතියට* විරුද්ධවය. ඔහු තමන්ට
අවශ්‍ය අයුරින් නීතිය හදාගෙන
විනිශ්චයන් ලබා දෙයි. ඔබ නීතිය
ගැන එවැනි විනිශ්චයන් ලබා දෙ-
නවා නම් ඔබ නීතිය පිළිපදින්-
නෙකු නොව විනිශ්චයකරුවෙක්ය.[5]
**12** ඇත්තෙන්ම නීතිදායකයෙකු හා
විනිශ්චයකරුවෙකු ලෙස සිටින්නේ
එක් කෙනෙකු පමණි.[6] මිනිසුන්ව
ගලවාගැනීමටත් විනාශ කිරීමටත්
බලය තිබෙන්නේ ඔහුටය.[7] එසේනම්
ඔබේ අසල්වැසියාව විනිශ්චය කිරීමට
ඔබ කවුද?[8]

**13** “අද නැත්නම් හෙට අප අහ-
වල් නුවරට ගොස් එහි අවුරුද්දක්
ගත කර, වෙළඳාම් කර ලාභ ලබා-
ගමු” කියා පවසන ඔබ මේ දේට
සවන් දෙන්න.[9] **14** ඔබ එසේ පැව-
සුවත් හෙට දිනේදී ඔබට කුමක් සිදු
වේවිද කියා ඔබ දන්නේ නැත.[10] මන්ද
ඔබ ටික වේලාවකට පෙනී, ඉන්පසු
නොපෙනී යන මීදුමක් හා සමානය.[11]
**15** ඒ වෙනුවට ඔබ පැවසිය යුත්-
තේ මෙයයි. “එය යෙහෝවා දෙවිගේ
කැමැත්ත නම්[12] අපි ජීවත් වී මේ දේ
හෝ ඒ දේ හෝ කරමු.”[13] **16** නමුත්
ඔබ පුරසාරම් දොඩමින් ක්‍රියා කරන්-
නේ මොන තරම් අහංකාරකමින්ද![14]
එලෙස අහංකාර වීම දුෂ්ට දෙයකි.
**17** එහෙයින් යමෙකු හරි දේ කිරී-
මට දැනගෙනත් ඔහු ඒ දේ කරන්නේ
නැත්නම්[15] ඔහු කරන්නේ පාපයකි.[16]

**4 පරි.**

**1** රෝම 7:23; ගලා 5:17; 1පේතෘ 2:11
**2** 1යොහ 3:15
**3** කොලො 3:5
**4** මතෙ 5:22; යාකො 3:16
**5** යෙසා 1:15; සෙක 7:13
**6** මීකා 3:4; 1යොහ 3:22
**7** එස 16:15
**8** 2ලේක 19:2; යොහ 15:19; යොහ 17:14; 1යොහ 5:19
**9** ලූක් 6:26; ගලා 1:10
**10** යොහ 18:36; රෝම 8:7; 1යොහ 2:15
**11** උත් 8:21
**12** යොහ 1:16
**13** ගීතා 138:6; යෙසා 2:11
**14** හිතෝ 3:34; 1පේතෘ 5:5
**15** රෝම 10:3; හෙබ්‍රෙ 12:9; 1පේතෘ 2:17
**16** එෆී 4:27; එෆී 6:11
**17** මතෙ 4:10; මතෙ 4:11; ලූක් 4:13
**18** යෙසා 44:22; යෙසා 55:6
**19** යෙසා 1:16
**20** යාකො 1:8
**21** 1යොහ 3:3
**22** යෝවෙ 2:12
**23** ලූක් 6:25; එළි 3:17

**2 තීරුව**

**1** 2ලේක 7:14; 2ලේක 33:13; ගීතා 34:15; සෙක 4:10; 1පේතෘ 3:12
**2** හිතෝ 29:23; මතෙ 23:12
**3** ලෙවී 19:16; හිතෝ 17:9
**4** ලූක් 6:37
**5** මතෙ 7:1
**6** යෙසා 33:22
**7** මතෙ 10:28; යූද් 15
**8** රෝම 14:4
**9** හිතෝ 27:1; ලූක් 12:18
**10** යෝබ් 14:1; ගීතා 39:6; දේශ 6:12
**11** ගීතා 102:3; 1පේතෘ 1:24

**12** ගීතා 40:8; ගීතා 143:10; යොහ 4:34; ක්‍රියා 18:21; **13** ගීතා 34:2; හෙබ්‍රෙ 6:3; **14** ගීතා 52:7; යෙසා 47:10; **15** ලූක් 12:47; **16** යොහ 9:41; යොහ 15:22.

**යාකො 4:11*** මෙහි සඳහන් වන්නේ පොදුවේ දෙවි සපයා ඇති නීති ගැනය.

**5** ඉතින් ධනවතුනි,[1] සවන්
දෙන්න. ඔබ පිට පැමිණීමට නිය-
මිත දුක් වේදනා ගැන මොරගස-
මින් හඬන්න.[2] **2** ඔබ රැස් කරගෙන
ඇති දේවල් දිරා ගොස් ඇති අතර
ඔබේ වස්ත්‍ර කාවෝ කා දමා ඇත.[3]
**3** ඔබේ රන්ද රිදීද සම්පූර්ණයෙන්ම
විනාශ වී ඇත. ඉතුරු වී තිබෙන්නේ
මලකඩ පමණි. ඒ මලකඩ ඔබ කළ
දේට විරුද්ධව සාක්ෂියක් වන අතර
එය ඔබේ ශරීරයද කා දමනු ඇත.
ඇත්තෙන්ම ඔබ අවසාන කාලය
සඳහා[4] රැස් කර තිබෙන්නේ[5] ගින්දර
පමණි.[6] **4** මෙන්න, ඔබේ කෙත්ව-
තුවල අස්වැන්න නෙළූ අයට ඔබ
වැටුප් ගෙවා නැති නිසා[7] ඔවුහු ඔබට
විරුද්ධව මහත් හඬින් කෑගසන්-
නෝය.[8] එමෙන්ම අස්වැන්න නෙළූ
අයගේ මොරගැසීම්[9] ස්වර්ගීය සේ-
නාවල යෙහෝවා දෙවිගේ කන්වලට
වැටී ඇත.[10] **5** ඔබ මෙලොවෙහි
ගත කර තිබෙන්නේ ඉතා සැපවත්
ජීවිතයකි. ඔබ නිතරම ඔබේම ආශා-
වන් තෘප්තිමත් කරගැනීමට උත්සාහ
දරා ඇත.[11] මස් සඳහා තර කරන
සතුන් හා සමානව ඔබේ හදවත්
තර වී ඇත.[12] **6** ධර්මිෂ්ඨ තැනැත්-
තාව හෙළාදකිමින් ඔහුව මරා දැමීමට
තරම් වෛරයකින් ඔබ ඔහුට විරුද්-
ධව ක්‍රියා කර ඇත. එමනිසා ඔහු
ඔබට විරුද්ධවද ක්‍රියා කරයි.[13]
**7** එහෙයින් සහෝදරයෙනි, ස්වා-
මීන් පැමිණ සිටින කාලය*[14] එන තුරු
ඉවසිල්ලෙන් බලා සිටින්න. මුලින් ඇද
හැළෙන වැස්සත් පසුව ඇද හැළෙන
වැස්සත් ලැබෙන තෙක් ඉවසිල්ලෙන්
බලා සිටින ගොවියා ඉන්පසු භූමියෙන්
අනගි පලදාවක් ලැබෙන තුරු බලා
සිටියි.[15] **8** ඔබත් ඉවසිල්ලෙන් බලා
සිටින්න.[16] ඔබේ හදවත් ස්ථිර කර-
ගන්න. මන්ද ස්වාමීන් පැමිණ සිටින
කාලය* ළඟා වී ඇත.[17]
**9** සහෝදරයෙනි, එකිනෙකා ගැන
කලකිරීමෙන් වැළකී සිටින්න. මන්ද
එසේ වුවහොත් ඔබවත් විනිශ්-
චයට ලක් වෙයි.[1] විනිශ්චයකරු-
වාණන් දොරකඩ අසලම සිටින බව
මතක තබාගන්න.[2] **10** සහෝදර-
යෙනි, යෙහෝවා දෙවිගේ නාමයෙන්
කතා කළ[3] අනාගතවක්තෘවරුන්[4]
නපුරු දේවල් දරාගත් ආකාරයද[5]
ඔවුන් ඉවසූ ආකාරයද[6] ආදර්ශයට
ගන්න.[7] **11** මන්ද පීඩා විඳදරාගෙන
සිටින අය සන්තෝෂවත් කියා අපි
ප්‍රකාශ කරන්නෙමු.[8] යෝබ් විඳදරා-
ගත් ආකාරය ගැන ඔබ අසා ඇති
අතර[9] යෙහෝවා දෙවි ඔහුට ආශීර්වාද
කළ ආකාරය ගැනත් ඔබ දන්නහුය.[10]
ඉන් පැහැදිලි වන්නේ යෙහෝවා දෙවි
ගැඹුරු ස්නේහයක් ඇති ඉතා දයා-
වන්ත දෙවි කෙනෙකු බවය.[11]
**12** මාගේ සහෝදරයෙනි, ඔබ
විශේෂයෙන්ම නවතා දැමිය යුතු දෙ-
යක් වන්නේ දිවුරීමයි. එහෙයින් තව-
දුරටත් ස්වර්ගයේ නාමයෙන් හෝ
පොළොවේ නාමයෙන් හෝ වෙනත්
කිසි දෙයක් පදනම් කරගෙන හෝ
දිවුරීමෙන් වැළකී සිටින්න.[12] එසේය
කියා කිව යුතු අවස්ථාවලදී එසේය
කියාත් නැත කියා කිව යුතු
අවස්ථාවලදී නැත කියාත් පැවසීම
ප්‍රමාණවත්ය. එසේ නොකළොත් ඔබ
දෙවිගේ විනිශ්චයට ලක් වනු ඇත.[13]
**13** ඔබ අතරෙහි කෙනෙක් යම්
දුෂ්කරතාවලට මුහුණ දෙමින් සිටි-
නවාද? නොකඩවා යාච්ඤා කිරී-
මට ඔහුට පුළුවන.[14] යම් කෙනෙක්
සතුටින් සිටිනවාද? ඔහුට ගීතිකා
ගැයීමට පුළුවන.[15] **14** ඔබ අත-
රෙහි කෙනෙක් යම් අසනීපයකින්
සිටීද?*[16] එවැනි අවස්ථාවකදී ඔහු
සභාවෙහි සිටින වැඩිමහල්ලන්ව[17]
කැඳවිය යුතුයි. එවිට යෙහෝවා දෙවි-
ගේ නාමයෙන් ඔහුට තෙල් ආලේප
කරමින්[18] ඔහු වෙනුවෙන් යාච්ඤා
කිරීමට ඔවුන්ට පුළුවන. **15** විශ්-

**5 පරි.**
1 හිතෝ 11:28
2 ලූක් 6:24; ලූක් 18:25
3 යෝබ් 13:28; මතෙ 6:19; ලූක් 12:33
4 එස 7:19
5 රෝම 2:5
6 යෙසා 30:27
7 ලෙවී 19:13; යෙරෙ 22:13; මලා 3:5
8 ද්වි 24:15
9 ගීතා 9:12; ලූක් 18:7
10 යෙසා 5:9
11 යෙසා 22:13; ආමො 6:4; ලූක් 16:25; 1තිමෝ 5:6
12 යෙරෙ 12:3
13 හිතෝ 3:34
14 මතෙ 24:3
15 ද්වි 11:14; යෙරෙ 5:24; යෝවෙ 2:23; සෙක 10:1
16 හෙබ්‍රෙ 6:12
17 1තෙස 3:13

**2 තීරුව**
1 1කොරි 4:5
2 එළි 3:20
3 2ලේක 36:16
4 හෙබ්‍රෙ 11:39
5 මතෙ 5:12
6 හෙබ්‍රෙ 6:12
7 1කොරි 10:11
8 ගීතා 84:12; යාකො 1:4
9 යෝබ් 1:21
10 යෝබ් 42:10
11 ගීතා 103:8; ලූක් 6:36
12 ලෙවී 19:12; මතෙ 5:34
13 මතෙ 5:37; 2කොරි 1:17; 1තිමෝ 1:10
14 ගීතා 50:15
15 කොලො 3:16
16 මාක් 6:13
17 ක්‍රියා 20:28; ක්‍රියා 20:35; 1පේතෘ 5:2
18 ගීතා 141:5; යෙසා 61:3; ලූක් 10:34

**යාකො 5:7*** පැමිණ සිටීම. ග්‍රීක බසින්, පරූසියා. උපග්‍ර. 7 බලන්න. **8*** පැමිණ සිටීම. ග්‍රීක බසින්, පරූසියා. උපග්‍ර. 7 බලන්න.

**යාකො 5:14*** "අසනීපය" යන්න භාවිත කර තිබෙන්නේ සංකේතවත් ආකාරයකිනි.

වාසයකින් යුතුව ඉදිරිපත් කරන
යාච්ඤාව මගින් අසනීපයෙන් සිටින
පුද්ගලයා සනීප වන අතර[1] යෙහෝවා
දෙවි ඔහුව නැවත ශක්තිමත් කරයි.[2]
එලෙසම ඔහු යම් පාපයක් කර ඇත්-
නම් ඒවා සඳහාත් ඔහුට සමාව
ලැබේ.[3]
**16** එහෙයින් ඔබ කළ පාප ගැන
එකිනෙකාට විවෘතව කතා කරන්න.[4]
එසේම එකිනෙකා වෙනුවෙන් යාච්ඤා
කරන්න. එවිට ඔබට සුවයක් ලැබෙනු
ඇත.[5] ඇත්තෙන්ම ධර්මිෂ්ඨ කෙ-
නෙක් දෙවිට කන්නලව් කරන විට
එයින් ඉමහත් ප්‍රයෝජන නෙළාගත
හැක.[6] **17** එලියා අප හා සමාන
හැඟීම් ඇති මිනිසෙකි.[7] නමුත් වැසි
නොවස්සන්න කියා ඔහු වරක් මහත්
ඕනෑකමින් යාච්ඤා කළේය.[1] ප්‍රතිඵ-
ලයක් ලෙස දේශයට වසර තුනකුත්
මාස හයක් පුරා වැසි ඇද හැළුණේ
නැත. **18** ඔහු නැවතත් යාච්ඤා
කළ විට අහසින් වැසි වැස භූමියෙන්
පල හටගත්තේය.[2]
**19** මාගේ සහෝදරයෙනි, ඔබ
අතරෙහි කෙනෙක් සත්‍ය මාර්ගයෙන්
නොමඟ ගියොත් යම් කෙනෙක් ඔහුව
නැවත හරි මාර්ගයට ගන්නවා නම්,[3]
**20** එම පව්කාර තැනැත්තාගේ වර-
දින් ඔහුව ඉවතට හරවාගන්නා පුද්ග-
ලයා[4] පව් කළ තැනැත්තාගේ ජීවිතය
මරණයෙන් ගලවන බව තේරුම්-
ගන්න.[5] එසේම ඔහු කළ පාපවලට
නොඅඩුව සමාව ලබාගැනීමට ඔහුට
උපකාර කරන බවත් තේරුම්ගන්න.[6]

**5 පරි.**
**1** ෆිලි 1:19
**2** හොෂෙ 6:1; හොෂෙ 13:14
**3** යෙසා 33:24; මතෙ 9:2
**4** 2සාමු 12:13; ගීතා 32:5; හිතෝ 28:13; 1යොහ 1:9
**5** ද්වි 9:18; යොහ 9:31
**6** 1සාමු 12:18; 1රාජ 13:6
**7** ක්‍රියා 14:15

**2 තීරුව**
**1** 1රාජ 17:1
**2** 1රාජ 18:42; 1රාජ 18:45
**3** මතෙ 18:15
**4** ගලා 6:1
**5** ගීතා 56:13; ගීතා 116:8
**6** 1තිමෝ 4:16

# පේතෘස්
## ලියූ පළමුවෙනි ලිපිය

**1** යේසුස් ක්‍රිස්තුස්ගේ නියෝජිත-
යෙකු*[1] වන පේතෘස් විසින් මේ
ලිපිය ලියන්නේ පොන්තසය, ගලා-
තිය, කපදෝසිය,[2] ආසියාව සහ බිති-
නිය යන පළාත්වල විසිර සිටින[3]
තාවකාලික පදිංචිකරුවන්[4] වන
තෝරාගනු ලැබූ අය[5] වෙතටය.
**2** පියාණන් වන දෙවි කල්තියාම අර-
මුණු කළ ලෙස[6] ඔබව ඔහුගේ බල-
යෙන් ශුද්ධ කර* ඇති අතර[7] ඔබව
තෝරාගෙන තිබෙන්නේ කීකරු අය
වීමටය. ඒ සඳහා යේසුස් ක්‍රිස්තුස්ගේ
රුධිරයද[8] ඔබ මත ඉස ඇත.[9]
ඔබට දෙවිගේ මහත් කරුණා-
වත් සමාදානයත් වැඩි වැඩියෙන්
ලැබේවා![10]
**3** අපගේ ස්වාමීන් වන යේසුස්
ක්‍රිස්තුස්ගේ දෙවිද පියාණන්ද වන
තැනැත්තාණන්ට ප්‍රශංසා වේවා![11]
මන්ද යේසුස් ක්‍රිස්තුස්ව මරණයෙන්
නැවත නැඟිටුවීම මගින්[1] ඔහු තම
මහත් දයාවට එකඟව අපට අලුත්
උපතක්[2] දෙමින් අපට ස්ථිර බලාපො-
රොත්තුවක් දී ඇත.[3] **4** එම බලා-
පොරොත්තුවට අනුව අපට කිසිදා
දිරා නොයන, කැළැල් රහිත, කිසිදා
පරවී නොයන ජීවිතයකට උරුම-
කම් කීමට පුළුවන.[4] ඒ උරුමය ඔබ
වෙනුවෙන්ද ස්වර්ගයෙහි වෙන් කර
තිබේ.[5] **5** දෙවි තම බලයෙන් ඔබව
ආරක්ෂා කරන්නේ ඔබ තුළ විශ්වා-
සයක් තිබෙන නිසාය.[6] ඔහු එසේ
කරන්නේ අවසාන කාල පරිච්ඡේද-
යේදී[7] හෙළි කිරීමට නියමිත[8] ගැලවීම
ඔබට ලබා දීම සඳහාය.[9] **6** ඒ ගැන
ඔබ බොහෝ සෙයින් ප්‍රීති වෙනවාට
සැකයක් නැත. නමුත් කෙටි කලකට
විවිධ පීඩා හා දුෂ්කරතාවලට මුහුණ
දෙමින් යම් ශෝකයක් අද්දැකීමට

**1පේතෘ 1:1*** හෝ, “යවනු ලැබූවෙකු.” **2*** හෝ, “දෙවි සඳහා වෙන් කර.”

**1 පරි.**
**1** මතෙ 10:2
**2** ක්‍රියා 2:9
**3** යාකො 1:1
**4** යොහ 15:19; හෙබ්‍රෙ 11:13
**5** රෝම 1:7
**6** රෝම 8:29
**7** 2තෙස 2:13
**8** ලෙවී 17:11; 1පේතෘ 1:19
**9** ලෙවී 6:27; හෙබ්‍රෙ 12:24
**10** 2පේතෘ 1:2
**11** 2කොරි 1:3

**2 තීරුව**
**1** 1කොරි 15:20
**2** 1කොරි 15:44; 1පේතෘ 1:23
**3** එළි 20:6
**4** 1කොරි 15:53; 2තිමෝ 1:10; 1පේතෘ 5:4
**5** යොහ 14:2; එෆී 1:14; කොලො 1:5; 2තිමෝ 4:8
**6** 1කොරි 2:5
**7** මතෙ 24:30
**8** 1පේතෘ 1:7; **9** හෙබ්‍රෙ 9:28.

ඔබට සිදු වී ඇත.[1] **7** එයින් ඔබේ
විශ්වාසය කොතරම් අව්‍යාජ එකක්ද
කියා සෝදිසියට ලක් වෙයි.[2] එසේ
සෝදිසියට ලක් වීමෙන් ඔබේ විශ්-
වාසය රන්වලටත් වඩා බොහෝ
සෙයින් වටිනා දෙයක් බවට තහ-
වුරු විය හැක.[3] මන්ද රන් ගින්නෙන්
පවිත්‍ර කළත් යම් දිනක එය නැති
වී යයි. නමුත් ඔබේ විශ්වාසය එසේ
නොවේ. ඒ විශ්වාසය නිසා යේසුස්
ක්‍රිස්තුස් එළිදරව් වන අවස්ථාවේදී[4]
ඔබට ප්‍රශංසාවත් ගෞරවයත් තේජ-
සත් හිමි වනු ඇත. **8** ඔබ ක්‍රිස්තුස්ව
කිසිදාක දුටුවේ නැතත් ඔබට ඔහු
කෙරෙහි ප්‍රේමයක් ඇත.[5] දැන් ඔබට
ඔහුව නොපෙනුණත් ඔබට ඔහු කෙ-
රෙහි විශ්වාසයක් ඇති අතර වචනව-
ලින් විස්තර කළ නොහැකි තරම්
මහත් ප්‍රීතියක්ද ඔබ අද්දකින්නහුය.
**9** මන්ද ඔබේ විශ්වාසය නිසා ඔබේ
ජීවිතවලට අනිවාර්යයෙන්ම ගැලවීම
ලැබෙන බව ඔබට නිසැකය.[6]

**10** ඔබට ලැබෙන්න නියමිත
මහත් කරුණාව ගැන[7] අනාවැකි
පැවසූ අනාගතවක්තෘවරු[8] දැඩි උත්-
සාහයක් දරමින් ඔබට ලැබෙන ගැල-
වීම ගැන ඉතා උනන්දුවෙන් සෝදිසි
කර බැලුවෝය.[9] **11** දෙවිගේ බලය
ඔවුන් තුළ ක්‍රියාත්මක වී[10] ක්‍රිස්-
තුස් විඳින වධ හිංසාද[11] ඉන් අන-
තුරුව සිදු වන තේජාන්විත දේවල්
ගැනද[12] ඔවුන්ට සාක්ෂි ලැබුණු විට
ඒවා ක්‍රිස්තුස් තුළින්[13] හෙළි වන්-
නේ කවදාද යන්න ගැන[14] ඔවුහු දිග-
ටම සොයා බැලුවෝය. **12** ඒ දේවල්
ඔවුන්ට අදාළ වන දේවල් නොවන
බව ඔවුන්ට හෙළි කරන ලදි.[15] ඇත්-
තෙන්ම ඔවුන් ඒ දේවල් ගැන දැනුම්
දෙමින්[16] සේවය කළේ ඔබ වෙනු-
වෙනි. ඒ දේවල් දැන් ඔබට දැනුම් දී
ඇත. එසේ කර තිබෙන්නේ ස්වර්-
ගයෙන් එවූ දෙවිගේ බලය ඇතුව[17]
ඔබට ශුභාරංචිය ප්‍රකාශ කළ අය මාර්-
ගයෙනි. ඒ දේවල් ගැන අවබෝධයක්
ලබාගැනීමට දේවදූතයෝ පවා බො-
හෝ සෙයින් උනන්දු වෙති.[18]

**1 පරි.**
**1** 2කොරි 4:17
2තිමෝ 3:12
**2** ද්වි 8:16
යාකො 1:3
**3** හිතෝ 17:3
**4** 2තෙස 1:7
**5** යොහ 20:29
**6** රෝම 6:22
**7** ගීතා 84:11
**8** ආනි 2:44
හග් 2:7
සෙක 6:12
**9** මතෙ 13:17
**10** 2සාමු 23:2
**11** යෙසා 53:5
අපගේ සහෝදරයන් වෙනුවෙන් අපගේ
ජීවිතය වුණත් දීමටය.[11] **17** නමුත්
එදිනෙදා අවශ්‍යතා පිරිමසාගත හැකි
කෙනෙක්[12] තම සහෝදරයා අඟහිඟ-
කම්වලින් පෙළෙනවා දැක දැකත්[13]
ඔහුට අනුකම්පාවක් දැක්වීම ප්‍රතික්-
ෂේප කරයි නම්[14] එවැනි කෙනෙකු
තුළ දෙවි සඳහා ප්‍රේමයක් ඇති බව
පැවසිය හැක්කේ කෙසේද?[15] **18** ප්‍රිය
දරුවෙනි, අපගේ ප්‍රේමය[16] වචනවල-
ටත් කතාවටත් සීමා නොකරමු.[17] ඒ
වෙනුවට ක්‍රියාවෙන්[18] හා අවංකකමින්
ප්‍රේමය පෙන්වමු.[19]

**19** අප සත්‍ය ඉගැන්වීම්වලට අනුව
ජීවත් වන බව දැනගත හැකි වන්නේ
එලෙසය.[20] එමෙන්ම ඔහුගේ අනුමැ-
තිය ලබාගෙන අපගේ සිත් ස්ථිර කර-
ගැනීමට අපට පුළුවන. **20** මන්ද
අපගේ සිත් අපට දොස් නැඟුවත්[21]
අපට වඩා හොඳින් දෙවි අපගේ සිත්
ගැන දන්නා බවත් ඔහු සියලු දේ
දන්නා බවත් අපි දනිමු.[22] **21** ප්‍රේම-
ණීය සහෝදරයෙනි, අපගේ සිත් අපට
විරුද්ධව දොස් නඟන්නේ නැත්නම්
දෙවි සමඟ කිසි බියක් සැකක් නැතුව
කතා කිරීමට අපට හැකියාව ලැබේ.[23]
**22** එලෙසම අප ඔහුගේ ආඥා පිළිප-
දින නිසාත් ඔහුට ප්‍රසන්න දේ කරන

---

**1යොහ 3:9*** මූ.අ., “බීජය.”

**19** මතෙ 7:22; 1පේතෘ 1:22; **20** යොහ 18:37; **21** 2සාමු 24:10; මතෙ 26:75; ලූක් 18:13; **22** ලූක් 12:30; හෙබ්‍රෙ 4:13; **23** හෙබ්‍රෙ 4:16; 1යොහ 5:14.

**3 පරි.**
1 මතෙ 7:23 රෝම 4:15
2 1යොහ 5:17
3 ලෙවී 16:22 යෙසා 53:11 යොහ 1:29
4 යොහ 8:46 2කොරි 5:21
5 යොහ 15:4
6 රෝම 6:12 1පේතෘ 4:1
7 ගීතා 15:1 3යොහ 11
8 ද්වි 32:4 ගීතා 119:137 ගීතා 145:17
9 උත් 3:14 යොහ 8:44
10 හෙබ්‍රෙ 2:14
11 යොහ 16:33 කොලෝ 2:15 හෙබ්‍රෙ 2:14
12 1යොහ 5:18
13 1පේතෘ 1:23
14 1යොහ 2:29
15 1යොහ 4:8
16 1යොහ 1:1 1යොහ 2:7 2යොහ 5
17 යොහ 13:34
18 උත් 4:8
19 උත් 4:5 යූද් 11
20 උත් 4:4 හෙබ්‍රෙ 11:4

**2 තීරුව**
1 මතෙ 5:11 යොහ 15:18 2තිමෝ 3:12
2 යොහ 5:24 රෝම 8:2
3 1යොහ 2:10
4 යොහ 3:36
5 ලෙවී 19:17
6 මතෙ 5:21 එෆී 4:31
7 උත් 9:6
8 ගණන් 35:31 එළි 21:8 එළි 22:15
9 යොහ 3:16 යොහ 15:13 රෝම 8:32
10 යොහ 13:1
11 යොහ 13:15 රෝම 16:4 1තෙස 2:8
12 ලූක් 3:11
13 ද්වි 26:12 රෝම 12:13
14 ලෙවී 25:35 ද්වි 15:7 යාකො 2:16
15 යෙසා 58:7 1යොහ 4:20
16 1කොරි 13:4
17 රෝම 12:9
18 යාකො 1:22 යාකො 2:17

නිසාත්[1] අප ඉල්ලන ඕනෑම දෙයක්
අපට ඔහුගෙන් ලැබේ.[2] **23** ඇත්-
තෙන්ම ඔහුගේ ආඥාව පිළිපැදීමට
නම් අප ඔහුගේ පුත් යේසුස් ක්‍රිස්තුස්-
ගේ නාමය කෙරෙහි විශ්වාසය තැබිය
යුතු අතර[3] ඔහු අපට අණ කළ
ලෙස එකිනෙකාට ප්‍රේම කළ යුතුයි.[4]
**24** ඔහුගේ ආඥා පිළිපදින තැනැත්තා
ඔහු සමඟ එකට බැඳී සිටියි. ඔහුද එම
තැනැත්තා සමඟ එකට බැඳී සිටියි.[5]
ඔහු අප සමඟ එකට බැඳී සිටින බව
අප දැනගෙන සිටින්නේ[6] ඔහු අපට
ලබා දුන් ඔහුගේ බලය මාර්ගයෙනි.[7]

**4** ප්‍රේමණීය සහෝදරයෙනි, දෙ-
විගෙන් ලැබූ* බවට පව-
සන සෑම පණිවිඩයක්ම විශ්වාස
නොකරන්න.[8] එම පණිවිඩ ඇත්තටම
පැමිණෙන්නේ දෙවිගෙන්ද කියා සෝ-
දිසි කර බලන්න.[9] මන්ද මේ ලෝ-
කයට බොරු අනාගතවක්තෘවරුන්
බොහෝදෙනෙක් පැමිණ ඇත.[10]

**2** යම් පණිවිඩයක් දෙවිගෙන් ලැබී
තිබෙනවාද කියා ඔබට දැනගත
හැක්කේ[11] මෙලෙසය. ඒ පණිවිඩයේ
යේසුස් ක්‍රිස්තුස්ව පිළිගන්නා බව සඳ-
හන් වුණොත් එය දෙවිගෙන් පැමිණි
පණිවිඩයක් ලෙස සැලකිය යුතුයි.[12]
**3** නමුත් යම් පණිවිඩයක් දෙවිගෙන්
ලැබී ඇති බව පැවසුවත් යේසුස්ව
පිළි නොගන්නා බව එහි සඳහන් වුව-
හොත් එය දෙවිගෙන් පැමිණි පණි-
විඩයක් නොවේ.[13] ඇත්තෙන්ම එය
ක්‍රිස්තු-විරෝධියාගෙන් පැමිණි පණිවි-
ඩයකි. ඔහු පැමිණෙන බව ඔබ අසා
ඇති අතර[14] දැනටමත් ඔහු මේ ලෝ-
කයේ සැරිසරයි.[15]

**4** ප්‍රිය දරුවෙනි, දෙවිගේ මඟ
පෙන්වීම ලබා සිටින ඔබට එවැනි
අයට එරෙහි වී ජය ලබාගැනීමට හැකි
වී ඇත.[16] මන්ද ඔබ සමඟ එකට බැඳී
සිටින තැනැත්තාණන්[17] වන දෙවි
මේ ලෝකයට බලපෑම් කරන යක්ෂ-
යාට[18] වඩා ශ්‍රේෂ්ඨය.[19] **5** ඔවුහු මේ
ලෝකයේ බලපෑමට හසු වී සිටිති.[1]
එහෙයින් ඔවුන් කතා කරන්නේ මේ
ලෝකයට සම්බන්ධ දේවල් ගැනය.
පවතින මේ ලෝකයද ඔවුන්ට සවන්
දෙයි.[2] **6** අපි දෙවිගේ මඟ පෙන්වීමට
යටත්ව සිටිමු.[3] දෙවි පිළිබඳ දැනුම
ලබන තැනැත්තා අපට සවන් දෙයි.[4]
දෙවිගේ මඟ පෙන්වීමට යටත් නොවී
සිටින තැනැත්තා අපට සවන් දෙන්-
නේ නැත.[5] සැබෑ වන්නේ කවර පණි-
විඩයද කියාත් බොරු වන්නේ කවර
පණිවිඩයද කියාත් අප හඳුනාගන්නේ
එලෙසය.[6]

**7** ප්‍රේමණීය සහෝදරයෙනි, අපි
දිගටම එකිනෙකාට ප්‍රේම කරමු.[7]
මන්ද ප්‍රේමය[8] පැමිණෙන්නේ දෙවි-
ගෙන්ය. ප්‍රේම කරන සෑම කෙනෙක්ම
දෙවිගේ දරුවන් වන අතර[9] දෙවි පිළි-
බඳ දැනුමද ඔවුන්ට ලැබේ.[10] **8** එකි-
නෙකාට ප්‍රේම නොකරන තැනැත්තා
දෙවිව හඳුනාගෙන නැත. මන්ද දෙවි
ප්‍රේමයයි.*[11] **9** දෙවිගේ ප්‍රේමය කො-
තරම්ද කියා දැකගත හැකි වන්නේ[12]
ඔහු තම එකම පුත්‍රයා* මෙලොවට
එවීම මාර්ගයෙනි.[13] ඔහු එසේ කළේ
අපට ඔහු මාර්ගයෙන් ජීවනය ලබාගැ-
නීම සඳහාය.[14] **10** දෙවි එවැනි දෙ-
යක් කළේ අප ඔහුට ප්‍රේම කළ නිසා
නොව ඔහු අපට ප්‍රේම කළ නිසාය. ඔහු
අපට ප්‍රේමය පෙන්වූවේ අපගේ පව්-
වලට[15] සමාව ලබාගෙන ඔහු සමඟ
සමාදාන වීමට මඟ පාදන[16] පූජාවක්[17]
ලෙස තම පුත්‍රයාව එවීම මගිනි.

**11** ප්‍රේමණීය සහෝදරයෙනි, දෙවි
අපට එලෙස ප්‍රේම කර ඇත්නම් අපත්
බැඳී සිටින්නේ එකිනෙකාට ප්‍රේම කිරී-
මටය.[18] **12** කිසි කෙනෙක් දෙවිව
කිසිදා දැක නැත.[19] අප දිගටම එකි-
නෙකාට ප්‍රේම කළොත් දෙවි අප සමඟ
දිගටම සිටින අතර ඔහු පෙන්වන

**3 පරි.**

**1** යොහ 9:31
හෙබ්‍රෙ 13:21
**2** ගීතා 10:17
ගීතා 34:15
මතෙ 7:8
1පේතෘ 3:12
**3** යොහ 6:29
**4** යොහ 13:34
**5** යොහ 15:4
1යොහ 2:24
**6** යොහ 14:23
**7** රෝම 8:2
රෝම 8:9

**4 පරි.**

**8** ද්වි 18:21
2තෙස 2:2
1තිමෝ 4:1
**9** එළි 22:6
**10** මතෙ 24:24
එළි 16:14
**11** 2තිමෝ 3:16
එළි 22:6
**12** යොහ 1:14
1කොරි 12:3
එළි 19:10
**13** 2පේතෘ 2:1
1යොහ 2:22
**14** 2තෙස 2:7
1යොහ 2:18
**15** ක්‍රියා 20:30
**16** 1යොහ 5:4
**17** යොහ 17:21
**18** එෆී 2:2
එෆී 6:12
**19** 2ලේක 20:6

**2 තීරුව**

**1** 1යොහ 5:19
**2** යොහ 15:19
**3** 1යොහ 3:10
**4** යොහ 10:27
**5** යොහ 8:47
යොහ 14:17
**6** 1යොහ 4:1
**7** 1පේතෘ 1:22
**8** 1කොරි 13:13
**9** 1යොහ 3:6
1යොහ 3:9
1යොහ 4:16
**10** යොහ 17:3
**11** නික් 34:6
මීකා 7:18
1යොහ 4:19
**12** රෝම 5:8
**13** යොහ 1:14
**14** යොහ 3:16
රෝම 5:21
රෝම 8:32
1යොහ 5:11
**15** හෙබ්‍රෙ 2:17
හෙබ්‍රෙ 9:26
**16** රෝම 3:25
1යොහ 2:2
**17** 1කොරි 5:7
2කොරි 5:21

**18** මතෙ 18:33; යොහ 15:12; රෝම 13:8; 1යොහ 3:16; **19** නික් 33:20; යොහ 1:18; යොහ 4:24; යොහ 5:37; යොහ 6:46.

**1යොහ 4:1*** ග්‍රීක බසින්, නියුමා. උපග්‍ර. 3 බලන්න.

**1යොහ 4:8*** එනම්, ප්‍රේමයේ උල්පත දෙවිය. **9*** එනම්, දෙවි විසින්ම සැදූ එකම පුත්‍රයා.

ප්‍රේමය පූර්ණ ලෙස පෙන්වීමටත් අපට
හැකි වේ.[1] **13** අප ඔහු සමඟ එකට
බැඳී සිටින බවත්[2] ඔහු අප සමඟ එකට
බැඳී සිටින බවත්[3] අප දැනගන්නේ
ඔහු තම බලය අපට ලබා දී තිබෙන
නිසාය.[4] **14** ඊට අමතරව පියාණන්
තම පුත්‍රයාව මෙලොවට ගැලවුම්-
කරු ලෙස එවා ඇති බව[5] අප දැක
ඇති අතර[6] අපි ඊට සාක්ෂි දරන්නෙමු.[7]
**15** යේසුස් ක්‍රිස්තුස් යනු දෙවිගේ
පුත්‍රයා බව යමෙක් පිළිගත්තොත්[8]
දෙවි එවැනි කෙනෙකු සමඟ එකට බැඳී
සිටින අතර ඔහුද දෙවි සමඟ එකට
බැඳී සිටියි.[9] **16** දෙවි අපට පෙන්වන
ප්‍රේමය ගැන අපට අවබෝධයක් ලැබී
තිබෙනවා පමණක් නොව අපි ඒ ප්‍රේ-
මය ගැන විශ්වාසයෙන්ද සිටිමු.[10]

දෙවි ප්‍රේමයයි.[11] එලෙසම දිග-
ටම ප්‍රේමය පෙන්වන තැනැත්තා[12]
දෙවි සමඟ එකට බැඳී සිටියි. දෙ-
විද ඔහු සමඟ එකට බැඳී සිටියි.[13]
**17** ප්‍රේමය එලෙස පූර්ණ ආකාරය-
කින් පෙන්වීමට අපට හැකි වන
නිසා දෙවිගේ විනිශ්චය සිදු වන දව-
සේදී[14] අපට කිසි බියක් සැකක් නැතුව
කතා කිරීමට හැකියාව ලැබේ.[15] මන්ද
මෙලොවෙහි අපිද ක්‍රිස්තුස්ට සමානව
සිටින්නෙමු.[16] **18** ප්‍රේමය ඇති කෙ-
නෙකු තුළ කිසි බියක් නැත.[17] ප්‍රේමය
සම්පූර්ණ වන විට බිය දුරු වෙයි.[18]
මන්ද බිය පසුබෑමට හේතුවකි. ඇත්-
තෙන්ම බියෙන් සිටින පුද්ගලයා තුළ
ප්‍රේමය සම්පූර්ණයෙන් දැකගත නො-
හැක.[19] **19** අප අන් අයට ප්‍රේම
කරන්නේ දෙවි මුලින්ම අපට ප්‍රේම
කළ නිසාය.[20]

**20** යමෙක් "මම දෙවිට ප්‍රේම කර-
නවා" කියා පැවසුවත් ඔහු තම
සහෝදරයාට වෛර කරනවා නම්
ඔහු බොරුකාරයෙකි.[21] මන්ද කෙනෙ-
කුට තමා දකින සහෝදරයාට ප්‍රේම
කළ නොහැකි නම්[22] තමා නොද-
කින දෙවිට ප්‍රේම කරන්න ඔහුට කිසි
ලෙසකින්වත් නුපුළුවන.[23] **21** අපට
ඔහුගෙන් ලැබුණු ආඥාව නම්[24] දෙ-
විට ප්‍රේම කරන තැනැත්තා තමා-

**4 පරි.**
**1** 1යොහ 2:5
**2** යොහ 6:56 යොහ 15:4
**3** යොහ 14:21
**4** 1යොහ 3:24
**5** මතෙ 1:21 යොහ 3:17 යොහ 4:42 යොහ 12:47 ක්‍රියා 5:31
**6** 1යොහ 1:1
**7** 1යොහ 1:2
**8** රෝම 10:9 1යොහ 2:23
**9** 1යොහ 2:24
**10** යොහ 3:16
**11** 1යොහ 4:8
**12** මතෙ 22:37
**13** යොහ 17:21
**14** ක්‍රියා 17:31 2පේතෘ 3:7
**15** හෙබ්‍රෙ 4:16 1යොහ 2:28
**16** යොහ 17:16
**17** රෝම 8:15
**18** 2තිමෝ 1:7
**19** 1යොහ 2:5
**20** 1යොහ 4:10
**21** 1යොහ 2:4
**22** 1යොහ 3:17
**23** 1යොහ 3:2 1යොහ 4:12
**24** මතෙ 22:37

**2 තීරුව**
**1** මතෙ 22:39 යොහ 13:34 යොහ 15:12

**5 පරි.**
**2** 1පේතෘ 1:3
**3** යොහ 1:12 යොහ 3:3 1පේතෘ 1:23 1යොහ 3:9
**4** එළි 14:12
**5** යොහ 1:12 රෝම 8:14
**6** 1පේතෘ 1:22
**7** යොහ 14:23 2යොහ 6
**8** ද්වි 5:29 ද්වි 12:28
**9** ද්වි 30:11 මීකා 6:8
**10** 1යොහ 5:18
**11** යොහ 16:33
**12** එළි 12:11 එළි 15:2
**13** 2තිමෝ 4:7
**14** 1යොහ 4:4
**15** 1කොරි 15:57
**16** යොහ 20:31
**17** එෆී 6:16 1යොහ 3:23
**18** මතෙ 3:13

ගේ සහෝදරයාටද ප්‍රේම කළ යුතුයි
යන්නය.[1]

**5** යේසුස් යනු ක්‍රිස්තුස් බව විශ්වාස
කරන සෑම කෙනෙක්ම දෙවිගේ
දරුවෙකි.[2] තමාට එසේ ජීවනය ලබා
දුන් තැනැත්තාණන්ට ප්‍රේම කරන
සෑම කෙනෙක්ම ඔහුගේ අනිකුත් දරු-
වන්ටද ප්‍රේම කරයි.[3] **2** අප දෙවිට
ප්‍රේම කරමින් ඔහුගේ ආඥා පිළිපදින
විට[4] අපි ඔහුගේ දරුවන්ට[5] ප්‍රේම කරන
බව ඉන් දැනගන්නෙමු.[6] **3** මන්ද
දෙවිට ප්‍රේම කරනවා[7] කීමෙන් අදහස්
කරන්නේ ඔහුගේ ආඥා පිළිපැදීමය.[8]
ඔහුගේ ආඥා පිළිපැදීම බරක් නො-
වේ.[9] **4** මන්ද දෙවිගේ දරුවන් වන
සියලුදෙනාම[10] මේ ලෝකයෙන් ජය
ගෙන සිටිති.[11] මේ ලෝකයෙන් අප
ජය ගන්නේ[12] අප තුළ තිබෙන විශ්වා-
සය මාර්ගයෙනි.[13]

**5** මේ ලෝකයෙන්[14] ජය ගන්නේ[15]
යේසුස් දෙවිගේ පුත්‍රයා බව[16] විශ්-
වාස කරන තැනැත්තාය.[17] **6** වතුර
සහ රුධිරය මාර්ගයෙන් පැමිණි
තැනැත්තා නම් යේසුස් ක්‍රිස්තුස් වන
ඔහුය. ඔහු පැමිණියේ වතුර මාර්ග-
යෙන් පමණක් නොව[18] වතුරත් රුධිර-
යත් ඇතුවය.[19] ඊට සාක්ෂි දරන්නේ
දෙවිගේ බලයයි.[20] මන්ද දෙවිගේ බල-
යෙන් සැබෑ සාක්ෂියක් ලැබේ. **7** ඊට
සාක්ෂි දරන ක්‍රම තුනක් තිබේ. **8** ඒ
දෙවිගේ බලය,[21] වතුර[22] සහ රුධිර-
යයි.[23] ඒ ක්‍රම තුන අතරම එකඟතා-
වක් පවතී.[24]

**9** මිනිසුන් ලබා දෙන සාක්ෂිය
අප පිළිගන්නවා නම්[25] දෙවි ලබා
දෙන සාක්ෂිය ඊටත් වඩා ප්‍රබල
බව අප අමතක නොකළ යුතුයි.
මන්ද දෙවි දෙන සාක්ෂිය නම් ඔහු
තම පුත්‍රයා පිළිබඳව දී ඇති සාක්ෂි-
යයි.[26] **10** දෙවිගේ පුත්‍රයා කෙරෙහි
විශ්වාසය තබන තැනැත්තාට එම

**19** ක්‍රියා 20:28; එෆී 1:7; හෙබ්‍රෙ 9:22; 1පේතෘ 1:19; **20** මතෙ 3:16; යොහ 1:33; **21** ලූක් 3:22; ලූක් 4:18; යොහ 1:32; ක්‍රියා 10:38; **22** ලූක් 3:21; **23** හෙබ්‍රෙ 9:14; **24** මතෙ 18:16; 2කොරි 13:1; 1තිමෝ 3:16; **25** මාක් 15:39; යොහ 1:29; යොහ 1:32; **26** මාක් 1:11; ලූක් 9:35; යොහ 12:28.

සාක්ෂිය ලැබේ.[1] දෙවි කෙරෙහි විශ්-
වාසය නැති තැනැත්තා දෙවි තම
පුත්‍රයා ගැන දී ඇති සාක්ෂිය[2] කෙ-
රෙහි විශ්වාසය නොතබයි.[3] එමගින්
ඔහු දෙවිව බොරුකාරයෙකු කරයි.[4]
**11** දෙවි දී තිබෙන සාක්ෂිය නම් දෙවි
අපට සදාකාල ජීවනය දුන් බවට වූ
කාරණයයි.[5] අපට ඒ ජීවනය ඔහු-
ගේ පුත්‍රයාගෙන් ලැබේ.[6] **12** පුත්‍ර-
යාව පිළිගන්නා තැනැත්තාට ජීවනය
ඇත. දෙවිගේ පුත්‍රයාව පිළි නො-
ගන්නා තැනැත්තාට ජීවනය නැත.[7]

**13** දෙවිගේ පුත්‍රයාගේ නාමය කෙ-
රෙහි විශ්වාසය තබන ඔබට[8] මා
මේ දේවල් ලියන්නේ සදාකාල ජීව-
නය ඔබ සතු බව ඔබ දැනගන්න-
වාට මා කැමති නිසාය.[9] **14** අපට
තිබෙන ස්ථිර විශ්වාසය නම්[10] දෙවිගේ
කැමැත්තට එකඟව අප යමක් ඉල්ලා
යාච්ඤා කරන විට දෙවි ඒ සෑම දෙයක-
ටම සවන් දෙන බවයි.[11] **15** ඊට අම-
තරව අප කුමක් ඉල්ලුවත් ඔහු අපට
සවන් දෙන බව අප දන්නවා නම්[12] අප
ඔහුගෙන් ඒ දේවල් ඉල්ලූ නිසා ඒවා
අපට ලැබෙන බව අපි දනිමු.[13]

**16** මරණයට හේතු නොවන
පාපයක්[14] තම සහෝදරයා කර-
නවා යමෙකු දුටුවොත් ඔහු ඒ පුද්ග-
ලයා වෙනුවෙන් යාච්ඤා කළ යුතුයි.
එවිට ඒ පුද්ගලයාට ජීවනය දෙනු
ලැබේ.[15] මන්ද ඔහු අතින් සිදු වූයේ
මරණයට හේතු නොවන පාපයකි.[1]
මරණය ලැබිය යුතු පාපයක්ද තිබේ.
එවැනි පාපයක් කරන කෙනෙකු ගැන
යාච්ඤා කිරීම අවශ්‍ය නැති බව මම
එකහෙළාම පවසමි.[2] **17** සෑම අධර්-
මිෂ්ඨ ක්‍රියාවක්ම පාපය ලෙස සැලකිය
යුතුයි.[3] නමුත් මරණයට හේතු නො-
වන පාපයක්ද තිබේ.

**18** දෙවිගේ දරුවන් වන සෑම කෙ-
නෙකුම[4] පාපයේ නියැලී නොසිටින
බව අපි දනිමු. දෙවි විසින්ම බිහි
කළ තැනැත්තා*[5] ඔවුන්ව රැකබලා
ගනියි. එහෙයින් ඔවුන්ව අල්ලාගැ-
නීමට දුෂ්ටයාට නුපුළුවන.[6] **19** අප
දෙවිට යටත්ව සිටින බවත්[7] මේ
මුළු ලෝකයම දුෂ්ටයාගේ බලපෑමට
යටත්ව තිබෙන බවත් අපි දනිමු.[8]
**20** නමුත් දෙවිගේ පුත්‍රයා පැමිණ ඇති
බවත්[9] සැබෑ වූ තැනැත්තාණන් ගැන
දැනුම ලබාගැනීමට[10] ඔහු අපට වට-
හාගැනීමේ[11] හැකියාව දී ඇති බවත්
අපි දනිමු. සැබෑ වූ තැනැත්තාණන්-
ගේ පුත් යේසුස් ක්‍රිස්තුස් මාර්ගයෙන්
අපි ඔහු සමඟ එකට බැඳී සිටිමු.[12]
සැබෑ[13] දෙවි හා සදාකාල ජීවනය
ලබා දෙන තැනැත්තාණන් ඔහුය.[14]
**21** ප්‍රිය දරුවෙනි, දේවතා රූපවලින්
වැළකී සිටින්න.[15]

**5 පරි.**
1 රෝම 8:16
2 යොහ 5:37
3 1කොරි 15:15
4 යොහ 3:33
5 යොහ 17:3
6 යොහ 5:26
7 යොහ 3:36
8 යොහ 20:31 1යොහ 3:23
9 1යොහ 1:2
10 හෙබ්‍රෙ 4:16 1යොහ 3:21
11 හිතෝ 15:29 යොහ 9:31
12 යොහ 14:13
13 ලූක් 11:13
14 යෙසා 6:7 යෙරෙ 31:34 යාකො 5:15 1යොහ 1:9
15 යාකො 5:20

**2 තීරුව**
1 මතෙ 12:31 මාක් 3:29 ලූක් 12:10 හෙබ්‍රෙ 6:6 හෙබ්‍රෙ 10:26
2 2යොහ 11
3 1යොහ 3:4
4 1යොහ 5:1
5 කොලො 1:15 එළි 3:14
6 යොහ 17:15
7 යොහ 8:47
8 මතෙ 13:19 ලූක් 4:6 යොහ 12:31 හෙබ්‍රෙ 2:14
9 1තිමෝ 3:16
10 1කොරි 2:12
11 කොලො 1:9 2තිමෝ 2:7
12 යොහ 17:21
13 1තෙස 1:9
14 යොහ 17:3
15 1කොරි 10:14

**1යොහ 5:18*** පළමුවෙනි ඡේදයේ සඳහන් පරිදි, “දෙවි විසින්ම බිහි කළ තැනැත්තා” යනු දෙවිගේ පුත් යේසුස් ක්‍රිස්තුස්ය.

# යොහන්
## ලියූ දෙවෙනි ලිපිය

**1** වැඩිමහල්ලෙකු[1] වන මම, මා
ඇත්තටම ප්‍රේම කරන[2] තෝරාගත්
කාන්තාව[3] සහ ඇගේ දරුවන් වෙත
ලියමි. මා පමණක් නොව සත්‍ය
ඉගැන්වීම් ගැන දැනගත්[4] සියලුදෙ-
නාම ඔබට ප්‍රේම කරති. **2** අප එසේ
කරන්නේ අපගේ හදවත් තුළ සත්‍ය
ඉගැන්වීම් කාවැදී තිබෙන නිසාය.[1]
එම ඉගැන්වීම් අප සමඟ සදහටම පව-
තිනු ඇත.[2] **3** එවිට ඒ සත්‍ය ඉගැන්-
වීම් හා ප්‍රේමය සමඟ[3] පියාණන් වන
දෙවිගෙන්ද[4] පියාණන්ගේ පුත්‍රයා වන

1 1පේත්‍ර 5:1 3යොහ 1
2 1පේත්‍ර 1:22 1පේත්‍ර 2:17
3 1පේත්‍ර 5:13
4 යොහ 8:32 1යොහ 3:18

**2 තීරුව** 1 යොහ 8:31; 2 යොහ 17:17; 3 එෆී 4:15; 4 1තිමෝ 1:2; 2තිමෝ 1:2.

යේසුස් ක්‍රිස්තුස්ගෙන්ද අපට මහත්
කරුණාවත්[1] දයාවත් සමාදානයත්
ලැබෙනු ඇත.
**4** පියාණන්ගෙන් අපට ලැබුණු
ආඥාවට එකඟව[2] ඔබේ දරුවන්ගෙන්
සමහරදෙනෙකු[3] සත්‍ය ඉගැන්වීම්-
වලට එකඟව ජීවත් වන බව[4] මා
දැනගත් විට එයින් මට ඉමහත් ප්‍රීති-
යක් ඇති විය. **5** එහෙයින් තෝරා-
ගත් කාන්තාව වන ඔබෙන් මා ඉල්ලා
සිටින්නේ එකිනෙකාට ප්‍රේම කරන්න
කියාය.[5] මා ලියා එවන එම ආඥාව
ඔබට අලුත් ආඥාවක් නොව[6] මුල
පටන් අපට දී තිබුණු ආඥාවකි.[7]
**6** ප්‍රේමය පෙන්වීමෙන් අදහස් කරන්-
නේ[8] අප ඔහුගේ ආඥාවලට එකඟව
දිගටම ජීවත් වීමය.[9] මුල පටන් ඔබ
දැනගත් ආඥාව නම් ඔබ දිගටම
එලෙස ප්‍රේමය පෙන්විය යුතු බවය.[10]
**7** මන්ද යේසුස් ක්‍රිස්තුස් මිනිසෙකු
ලෙස පැමිණි බව පිළි නොගන්නා[11]
රැවටිලිකාරයෝ බොහෝදෙනෙක් මේ
ලෝකයේ සිටිති.[12] එවැනි අයව සැල-
කිය යුත්තේ රැවටිලිකාරයන්[13] සහ
ක්‍රිස්තු-විරෝධීන් ලෙසය.[14]
**8** අප වෙහෙස මහන්සි වී අත්
කරගත් දේවල් නැති කර නො-
ගැනීමට වගබලා ගන්න. එවිට ලැබිය
යුතු ත්‍යාගය කිසි අඩුවක් නැතුව
ඔබට හිමි වනු ඇත.[15] **9** යමෙක්
ක්‍රිස්තුස්ගේ ඉගැන්වීම්වලට ඔබ්බෙන්
ගොස්[1] ඒවාට විරුද්ධ වී අවිශ්වා-
සවන්තව කටයුතු කරනවා නම්[2]
ඔහුට දෙවිගේ අනුමැතිය නැත.[3]
නමුත් එම ඉගැන්වීම්වලට විශ්වා-
සවන්තව සිටින තැනැත්තාට
පියාණන්ගේ මෙන්ම පුත්‍රයාගේද අනු-
මැතිය ඇත.[4] **10** ඔබව හමු වීමට
පැමිණෙන කෙනෙකු එම ඉගැන්වීම්ව-
ලට එකඟව කටයුතු කරන්නේ නැත්-
නම් ඔහුව ඔබේ නිවෙස්වලට පිළි
නොගන්න.[5] ඔහු සමඟ කිසිවක් කතා
නොකරන්න.*[6] **11** මන්ද ඔහු සමඟ
කතා කරන පුද්ගලයා ඔහුගේ දුෂ්ට
ක්‍රියාවලට හවුල්කාරයෙක් වනු ඇත.[7]
**12** ඔබට කීමට බොහෝ දේ මට
තිබුණත් කඩදාසියෙන් සහ තීන්-
තෙන්[8] එසේ කිරීමට මා තුළ කැමැත්-
තක් නැත. එමනිසා ඔබ වෙතට
පැමිණ ඔබව මුණගැසී ඔබ සමඟ කතා
කිරීමට මම බලාපොරොත්තු වෙමි.[9]
එමගින් ඔබට මුළුමනින්ම[10] ප්‍රීතිය අද්-
දැකිය හැකි වෙයි.[11]
**13** තෝරාගත් තැනැත්තිය වන
ඔබේ සහෝදරියගේ දරුවෝද ඔබට
සුබ පතති.[12]

**1** හෙබ්‍රෙ 4:16
**2** එෆී 6:1
**3** 1යොහ 2:13
**4** 2කොරි 4:2
3යොහ 3
**5** යොහ 13:34
යොහ 15:12
1පේතෘ 4:8
**6** 1යොහ 2:7
**7** 1යොහ 1:1
**8** 1කොරි 13:4
**9** යොහ 14:15
1යොහ 2:5
1යොහ 5:3
**10** යොහ 14:21
**11** 1යොහ 4:2
**12** මතෙ 24:24
ක්‍රියා 20:29
2පේතෘ 2:1
1යොහ 2:18
එළි 2:2
**13** මතෙ 7:15
මතෙ 7:23
මතෙ 24:24
2තෙස 2:7
**14** ලූක් 11:23
1යොහ 2:22
1යොහ 4:3
යූද් 4
**15** යොහ 4:36
හෙබ්‍රෙ 10:35

**2 තීරුව**
**1** 1යොහ 2:22
**2** යොහ 15:6
1යොහ 2:27
**3** යොහ 14:6
3යොහ 9
**4** හෙබ්‍රෙ 3:14
1යොහ 2:23
**5** ද්වි 17:5
රෝම 16:17
1කොරි 5:11
2තෙස 3:6
2තෙස 3:14

**6** 1රාජා 13:16; ක්‍රියා 19:9; **7** 1තිමෝ 5:22; එළි 18:4; **8** 3යොහ 13; **9** 3යොහ 14; **10** 1යොහ 1:4; **11** යොහ 17:13; **12** 1පේතෘ 5:13.

**2යොහ 10*** මූ.අ., “ඔහුට ආචාර නොකරන්න.”

# යොහන්

## ලියූ තුන්වෙනි ලිපිය

**1** වැඩිමහල්ලෙකු[1] ලෙස සේවය
කරන මම, මා සැබවින්ම ප්‍රේම[2]
කරන ආදරණීය ගායස් වෙත ලියමි.
**2** ප්‍රේමණීය[3] සහෝදරය, ඔබ
නිරෝගී සෞඛ්‍යයක් ඇතුව සිටින
බවත්[4] කලින් මෙන් සෑම අතින්ම[5]
දියුණුවක් ලබමින් සිටින බවත්[6]
සිතමි. ඒ වෙනුවෙන් මම යාච්ඤාද
කරමි. **3** ඔබ සත්‍ය ඉගැන්වීම්ව-
ලට විශ්වාසවන්තව ඇලී සිටින බව
සහෝදරයන් ඇවිත් මට පැවසූ විට
මට ඒ ගැන ඉමහත් සතුටක් ඇති
විය. ඔබ දිගටම සත්‍ය ඉගැන්වීම්-
වලට එකඟව ජීවත් වන නිසා මම
ප්‍රීති වෙමි.[1] **4** මාගේ දරුවන් සත්‍ය
ඉගැන්වීම්වලට එකඟව දිගටම ජීවත්

**1** 1පේතෘ 5:1
2යොහ 1
**2** 1පේතෘ 1:22
1පේතෘ 2:17
**3** 1තිමෝ 6:2
ෆිලෙ 1
**4** ක්‍රියා 15:29
**5** 1කොරි 14:20
**6** 1කොරි 16:2

**2 තීරුව**
**1** 2යොහ 4

වන බව අසන්න ලැබීම තරම් සතුටක්
තවත් මට නැත.[1]
**5** ප්‍රිය සහෝදරය, සහෝදරයන්
නාඳුනන අය වුවත්[2] ඔවුන් වෙනු-
වෙන්[3] ඔබ ඉටු කරන දේවල් දෙස
බලද්දී ඔබ ඉතා විශ්වාසවන්ත සේව-
යක් ඉටු කරන බව පැහැදිලියි.
**6** ඔබ දක්වන ප්‍රේමය ගැන ඔවුන්
සභාව ඉදිරියෙහි සාක්ෂි දරා ඇත.
ඔවුන්ගේ ගමනට අවශ්‍ය උපකාර ලබා
දෙන්න. එලෙසම එය දෙවි සතුටු වන
ආකාරයකින් කරන ලෙසත් ඉල්ලමි.[4]
**7** මන්ද මේ ලෝකයේ සිටින අයගෙන්
කිසි දෙයක් නොලැබූ[5] ඔවුන්, පිටත්ව
ගොස් ඇත්තේ දෙවිගේ නාමය වෙ-
නුවෙන්ය. **8** එහෙයින් එවැනි අයව
සාදරයෙන් පිළිගැනීමට අපි බැඳී
සිටිමු.[6] එසේ කිරීමෙන් අපට සත්‍ය
මාර්ගයෙහි ඔවුන් සමඟ හවුල් සේවකා-
යන් විය හැක.[7]
**9** මා සභාවට යම් දෙයක් ගැන
ලිව්වත් සභාවේ සහෝදරයන් අතර
මුල් තැන ලබාගැනීමට කැමති[8]
දියොත්‍රෙෆස් අපෙන් ලැබෙන
කිසි දෙයක්[9] ගෞරවයෙන් පිළිගන්-
නේ නැත.[10] **10** එහෙයින් මා පැමි-
ණියොත් මම ඔහු කරන දේවල්
හෙළි කරන්නෙමි.[11] මන්ද ඔහු අප
ගැන නින්දාසහගත දේවල් නොක-
ඩවා පතුරුවමින් සිටියි.[12] එපමණක්ද
නොව ඔහු සහෝදරයන්ව ගෞරව-
යෙන් පිළිගන්නේ නැත.[13] එලෙසම
සහෝදරයන්ව පිළිගැනීමට ආශා-
වෙන් සිටින අයට[1] ඔහු බාධා කරන
අතර[2] ඔවුන්ව සභාවෙන් පිටමං කිරී-
මටත් උත්සාහ දරයි.[3]
**11** ප්‍රිය සහෝදරය, නපුරු දේවල්
ආදර්ශයට නොගෙන යහපත් දේවල්
ආදර්ශයට ගන්න.[4] යහපත් දේවල්
කරන තැනැත්තා දෙවිට යටත් කෙ-
නෙකි.[5] නමුත් නපුරු දේවල් කරන
තැනැත්තා දෙවිව දැන හඳුනා ගෙන*
නැත.[6] **12** දෙමේත්‍රියස්ට යහපත්
ගුණාංග ඇති බවට සියලු සහෝදර-
යන් සාක්ෂි දෙන අතර[7] ඔහු සත්‍ය
ඉගැන්වීම්වලට අනුව ජීවත් වන
ආකාරයෙන්ද එය පැහැදිලි වේ. ඇත්-
තෙන්ම ඊට අපද සාක්ෂි දරන අතර[8]
අප ලබා දෙන සාක්ෂිය සැබෑ බව ඔබ
දන්නවාට සැකයක් නැත.[9]
**13** ඔබට කීමට මට බොහෝ දේ
තිබුණත් තීන්තෙන් සහ පෑනෙන්[10]
ඔබට තවදුරටත් ඒ ගැන ලිවීමට
නොකැමැත්තෙමි. **14** ඉක්මනින්ම
ඔබව දකින්න මා බලාපොරොත්තු-
වෙන් සිටින නිසා මා පැමිණි පසු අපි
මුණගැසී කතා කරමු.[11]
ඔබට සමාදානය ලැබේවා![12]
මා සමඟ සිටින සහෝදරයෝ
ඔබට සුබ පතති.[13] සෑම සහෝදර-
යෙකුටම මාගේ සුබ පැතුම් ලබා
දෙන්න.[14]

**1** 1කොරි 4:15 2තිමෝ 1:2 තීත 1:4 පිලෙ 10
**2** හෙබ්‍රෙ 13:2
**3** මතෙ 25:38
**4** ක්‍රියා 20:38 තීත 3:13
**5** 1කොරි 9:12 1කොරි 9:15
**6** මතෙ 10:41 මතෙ 25:35 ක්‍රියා 17:7 පිලෙ 22 1පේතෘ 4:9
**7** රෝම 12:13
**8** මතෙ 20:27 ක්‍රියා 20:30 පිලි 2:3
**9** කොලො 4:16
**10** රෝම 12:10 හෙබ්‍රෙ 13:7 හෙබ්‍රෙ 13:17
**11** 1කොරි 4:19 2කොරි 13:2
**12** ගීතා 101:5 හිතෝ 6:19
**13** එෆී 6:21 පිලි 2:19 කොලො 4:7

**2 තීරුව**
**1** 2කොරි 7:15
**2** 2තිමෝ 4:15
**3** මතෙ 24:49
**4** රෝම 12:9 රෝම 13:3 1පේතෘ 3:11
**5** 1යොහ 3:6 1යොහ 3:9
**6** 1යොහ 3:10
**7** 1තිමෝ 3:7
**8** යොහ 19:35
**9** යොහ 21:24
**10** 2යොහ 12
**11** ගලා 4:20
**12** 1පේතෘ 5:14
**13** පිලි 4:22
**14** තීත 3:15

**3යොහ 11*** මූ.අ., "දැක."

# යූද්
## ලියූ ලිපිය

**1** මෙම ලිපිය ලියන්නේ යේසුස්
ක්‍රිස්තුස්ගේ දාසයෙකු හා යාකොබ්-
ගේ සහෝදරයෙකු[1] වන යූද්ය. මෙය
ලියනු ලබන්නේ පියාණන්[2] වන දෙවි
සමඟ එකට බැඳී සිටින අය ලෙස
ඔහුගේ ප්‍රේමය ලබන යේසුස් ක්‍රිස්-
තුස් සමඟ එකට බැඳී සිටීම සඳහා
ආරක්ෂා වී ඇති[1] දෙවි විසින් කැඳ-
වනු ලැබූ අය වෙතටය.[2]
**2** ඔබට දයාවත්[3] සමාදානයත්[4]
ප්‍රේමයත්[5] වැඩි වැඩියෙන් ලැබේවා![6]

**1** මතෙ 13:55 මාක් 6:3 ගලා 2:9 යාකො 1:1
**2** මතෙ 11:27 1යොහ 3:24

**2 තීරුව** **1** යොහ 6:39; යොහ 17:15; 2තිමෝ 1:12; 2තිමෝ 4:18; 1පේතෘ 1:5; **2** හෙබ්‍රෙ 3:1; **3** ගීතා 103:13; රෝම 9:16; තීත 3:5; **4** ගීතා 29:11; පිලි 4:7; කොලො 1:20; **5** රෝම 5:8; **6** 1පේතෘ 1:2.

**3** ප්‍රේමණීය සහෝදරයෙනි,[1] මාගේ
මහත් ආශාව වූයේ අප සියලුදෙනාටම
පොදුවේ ලැබෙන ගැලවීම ගැන ඔබට
ලිවීමය.[2] නමුත් ඔබ විශ්වාස කරන
සියල්ලට ඇලී සිටීම සඳහා මහත්
සටනක නිරත විය යුතුයි[3] කියා ඔබව
උනන්දු කිරීමට අවශ්‍ය බව මට පෙනී
ගියේය. ඔබ විශ්වාස කරන සියල්ල
ශුද්ධ තැනැත්තන්ට එකවරම එළි-
දරව් කරන ලදි.[4] එළිදරව් කිරීමට
තවත් දෙයක් නැත. මා දැන් ඔබට
ලියන්නේ ඔබ කළ යුතු ඒ සටන
ගැනය. **4** මන්ද අප අතරට යම් පිරි-
සක් රහසින් මෙන් ඇවිත් සිටිති.[5]
ඔවුහු දෙවිට කිසි ගෞරවයක් නො-
දක්වන මිනිස්සුය.[6] ඔවුන් පවසන්-
නේ අපගේ දෙවිගෙන් ලැබී තිබෙන
මහත් කරුණාව කෙනෙකුට නින්දිත
ක්‍රියාවල නිරත වීම සඳහා නිදහසට
හේතුවක් කරගත හැකි බවය.[7] අප-
ගේ එකම අයිතිකරු[8] සහ ස්වාමීන්[9]
වන යේසුස් ක්‍රිස්තුස්ට ඔවුහු ද්‍රෝහි
වෙති.[10] එහෙයින් බොහෝ කලකට
පෙර ශුද්ධ ලියවිල්ලේ සඳහන් වී ඇති
ආකාරයට[11] ඔවුන් විනිශ්චයට ලක්
විය යුතුයි.[12]
**5** ඔබ සෑම දෙයක් ගැනම දැන
සිටින බව මම දනිමි.[13] නමුත්
යෙහෝවා දෙවි ඊජිප්තු දේශ-
යෙන් සෙනඟක් ගලවාගත් පසුව[14]
පවා විශ්වාසයක් නොදැක්වූ අයව
විනාශ කළ ආකාරය ගැන ඔබට
නැවත සිහිගන්වන්න කැමැත්-
තෙමි.[15] **6** එලෙසම තමන්ට පවරා
තිබූ සේවා ප්‍රස්තාව රැකගන්නවා
වෙනුවට තමන්ට නියමිත වාසස්ථා-
නය[16] අත්හැර ගිය දේවදූතයන්ට සිදු
වූ දේද සිහිගන්වන්න කැමැත්තෙමි.
මහත් දවසේදී විනිශ්චය ලබන
තුරු[17] ඔවුන්ව සදාකාලික බැඳුම්ව-
ලින්[18] සනාන්ධකාරයෙහි බැඳ තබා
ඇත. **7** සොදොම් සහ ගොමෝ-
රාවේද ඒ අවට පිහිටි නුවරවල
සිටින අයද[19] කලින් සඳහන් කළ
අය මෙන් ඉවක්බවක් නොමැතිව
වේශ්‍යාකම්* කරමින් අස්වාභාවික
ලිංගික සම්බන්ධකම්වල නිරත වූහ.[1]
ඔවුන්ට දෙවිගෙන් දඬුවම් ලැබුණු
අතර ඔවුන්ට හිමි වූයේ සදාකාලික
විනාශය නමැති ගින්නය.[2] ඔවුන්ට
සිදු වූ දේ අපට අනතුරු ඇඟවීමකි.[3]
**8** එසේවුවත් රහසින් ඇවිත් සිටින
ඒ මිනිස්සු විකාර දේවල් දකිමින්[4]
තමන්වත් අනුන්වත් අපවිත්‍ර කරති.
තමන්ට ඉහළින් සිටින අයව නොස-
ලකාහරින ඔවුහු,[5] යම් තේජසක් හිමි
වී ඇති අය ගැන නින්දාසහගතව
කතා කරති.[6] **9** නමුත් මෝසෙස්-
ගේ මළ සිරුර[7] ගැන අග්‍රදේවදූත[8]
මිකායෙල්[9] සහ යක්ෂයා අතර මත-
භේදයක්[10] ඇති වූ විට ඔහු යක්ෂ-
යාට විරුද්ධව දැඩි විනිශ්චයක් දීමට
එඩිතර වූයේ නැත.[11] ඒ වෙනුවට,
“ඔබට යෙහෝවා දෙවිගෙන් නිය-
මිත විනිශ්චය ලැබෙයි”[12] කියා ඔහු
පැවසුවේය. **10** නමුත් ඒ මිනිස්සු
තමන්ට කිසි අවබෝධයක් නැති
සෑම දෙයක් ගැනම නින්දාසහගතව
කතා කරති.[13] තිරිසනුන් හා සමා-
නව ඔවුහු[14] තමන්ගේ සිතට හරියයි
දැනෙන සෑම දෙයකම නිරත වෙමින්
තමන්වම අපවිත්‍ර කරගනිති.[15]
**11** එවැනි අයට මොන තරම්
දරුණු විපතක් අත් වෙයිද! මන්ද
ඔවුහු කායින්ගේ ක්‍රියාකලාපය[16] අනු-
ගමනය කරන අතර යම් ගෙවීමක්
බලාපොරොත්තුවෙන් වැරදි මාර්-
ගයෙහි ගිය බාලාම් මෙන් කිසි
ඉවක්බවක් නැතුව කටයුතු කරති.[17]
එලෙසම ඔවුහු කෝරා[18] මෙන්
තමන්ට ඉහළින් යම් අධිකාරියක්
හොබවන අයට විරුද්ධව කතා කර

**1** රෝම 1:7
**2** නික් 19:6; යොහ 4:22; තීත 1:4; හෙබ්‍රෙ 2:3; 1පේත්‍ර 2:9; 2පේත්‍ර 1:1
**3** 2කොරි 11:4; ගලා 1:6; එෆී 6:11; 1තිමෝ 1:18; 1තිමෝ 6:12
**4** එෆී 3:5
**5** මතෙ 13:25; මතෙ 13:38; ගලා 2:4; 1යොහ 2:19
**6** 2තිමෝ 2:16; තීත 1:16
**7** හිතෝ 21:27; 2කොරි 12:21; ගලා 5:19; 2පේත්‍ර 2:14
**8** 1කොරි 6:20; 1කොරි 7:23; 2පේත්‍ර 2:1
**9** එෆී 4:5
**10** ක්‍රියා 20:30; 2තෙස 2:3; 2පේත්‍ර 2:1
**11** 1පේත්‍ර 2:8
**12** 2පේත්‍ර 3:7
**13** රෝම 15:4; 2පේත්‍ර 3:1
**14** නික් 12:41; ද්වි 17:16
**15** ගණන් 14:35; 1කොරි 10:5; හෙබ්‍රෙ 3:19
**16** උත් 6:4; 1පේත්‍ර 3:20; 2පේත්‍ර 2:4; එළි 12:7
**17** 1කොරි 6:3; 2පේත්‍ර 2:4; එළි 20:1
**18** ලූක් 8:31
**19** උත් 14:2; ද්වි 29:23

**2 තීරුව**

**1** උත් 19:5; ලෙවී 18:22; රෝම 1:26
**2** උත් 19:24; මතෙ 10:15; 2පේත්‍ර 2:6
**3** 1කොරි 10:11
**4** ද්වි 13:3; 2පේත්‍ර 2:1
**5** ද්වි 17:12; 2පේත්‍ර 2:10
**6** නික් 22:28; යොහ 17:22; 1තිමෝ 6:4; 1පේත්‍ර 4:14; 3යොහ 10
**7** ද්වි 34:6
**8** 1තෙස 4:16

**9** නික් 23:20; නික් 32:34; නික් 33:2; දානි 10:21; දානි 12:1; **10** දානි 10:13; **11** 2පේත්‍ර 2:11; **12** සෙක 3:2; **13** 1කොරි 2:14; යූද් 19; **14** 2පේත්‍ර 2:12; **15** රෝම 1:24; ගලා 6:8; එෆී 4:22; **16** උත් 4:5; උත් 4:8; 1යොහ 3:12; **17** ගණන් 22:32; ද්වි 23:5; 2පේත්‍ර 2:15; එළි 2:14; **18** ගණන් 16:3; ගණන් 16:32.

යූද් **7*** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න.

ඇත.[1] ඔවුන් විනාශ වී ඇත්තේ
ඒ නිසාය. **12** ඔබේ ප්‍රිය සාදයන්ව-
ලට[2] පැමිණ ඔබ සමඟ කමින් බො-
මින් සිටින ඔවුන්, දිය යට සැඟවී
තිබෙන ගල්පර හා සමානය. ඔවුහු
තම මඩිය තර කරගැනීමට බිය
නොවන එඬේරුය.[3] ඔවුන් සුළඟට[4]
එහෙ මෙහෙ ගසාගෙන යන හිස්
වලාකුළු හා සමානය.[5] එමෙන්ම නිසි
කලට පල නොදරන සහමුලින්ම*
මිය ගොස් ඇති උගුලා දමන ලද ගස්
හා සමානය.[6] **13** ඔවුන් කැලඹුණු
මුහුදක පෙණ දමන රළ පහර මෙනි.
මන්ද ඔවුහු ප්‍රසිද්ධියේම නින්දාසහ-
ගත දේවල් කරති.[7] ඔවුන් නියමිත
ගමන් මාර්ගයක් නැති තාරකා හා
සමානය. ඔවුන්ව සදහටම හෙළාද-
මනු ලබන්නේ ඝනාන්ධකාරයටය.[8]

**14** ආදම්ගේ පෙළපතින් පැමිණි
හත්වෙනියා වූ ඒනොක්,[9] ඔවුන්
ගැනත් අනාවැකි කියමින් මෙසේ
පැවසුවේය. "මෙන්න, යෙහෝවා
දෙවි තම දසදහස් ගණන් ශුද්ධ
දූතයන් පිරිවරාගෙන පැමිණියේය.[10]
**15** ඔහු පැමිණියේ සියලුදෙනාට
විරුද්ධව තම විනිශ්චය ඉටු කිරී-
මටය.[11] මන්ද ඔහුට කිසි ගෞ-
රවයක් නොදක්වන අය ඔහු ගැන
නොතකමින් බොහෝ දුෂ්ට ක්‍රියාවල
නිරත වූ අතර ඔහුට කිසි ගෞරව-
යක් නොදැක්වූ පව්කාරයෝ ඔහුට
විරුද්ධව ඉතාමත් නැතිගන්වනසුලු
දේවල් පැවසුවෝය."[12]

**16** ඒ මිනිසුන් පුරුදු වී සිටින්නේ
මැසිවිලි නැඟීමටය.[13] තම ජීවිතය
ගැන සෑහීමට පත් නොවී ඔවුහු නිත-
රම කොඳුරමින් සිටිති. ඔවුන් කට-
යුතු කරන්නේ තම පව්කාර ආශාවන්
තෘප්තිමත් කරගැනීමටය.[14] ඔවුහු
පුරසාරම් දොඩමින් සිටින අතර[15]
තමාට යම් වාසි ප්‍රයෝජන ලබාගැ-
නීමේ අදහසින් ඇතැම් පුද්ගලයන්ව
වර්ණනා කරති.[16]

**17** නමුත් ප්‍රේමණීය සහෝදර-
යෙනි, අපගේ ස්වාමීන් වන යේ-
සුස් ක්‍රිස්තුස්ගේ නියෝජිතයන්* මීට
පෙර පවසා ඇති දේවල් සිහියට
නඟන්න.[1] **18** ඔවුහු මෙසේ පැව-
සුවෝය. "අවසාන කාලයේදී සමච්-
චල් කරන්නෝ සිටින්නෝය. ඔවුන්
උත්සාහ කරන්නේ දෙවිට අගෞර-
වයක් ගෙන දෙන ඔවුන්ගේ ආශා-
වන් තෘප්තිමත් කරගැනීමටය."[2]
**19** භේද ඇති කරන්නෙත්[3] තිරිස-
නුන් මෙන් හැසිරෙන්නෙත් ඔවුන්ය.[4]
ඔවුන් තුළ දෙවිගේ බලය ක්‍රියා
කරන්නේ නැත.[5] **20** නමුත් ප්‍රේම-
ණීය සහෝදරයෙනි, ශුද්ධ වූ
සත්‍ය ඉගැන්වීම් නමැති අත්තිවාරම
මත[6] ඔබේ විශ්වාසය ගොඩනඟා-
ගන්න.[7] දෙවිගේ බලයෙන් ලැබෙන
මඟ පෙන්වීම්වලට එකඟව යාච්ඤා
කරන්න.[8] **21** එසේ කරමින් දිගටම
දෙවිගේ ප්‍රේමය ලබාගැනීමට උත්-
සාහ දරන්න.[9] ඒ අතරතුර ඔබට
සදාකාල ජීවනය ලබාගැනීමට මඟ
පාදන[10] අපගේ ස්වාමීන් වන යේ-
සුස් ක්‍රිස්තුස්ගේ දයාව ගැන අපේක්-
ෂාවෙන් සිටින්න.[11] **22** එලෙසම
සැකයෙන් සිටින අයට[12] දිගටම
දයාව පෙන්වන්න.[13] **23** ඔවුන්ව
විනාශය නමැති ගින්නෙන් ඉවතට
ඇද[14] ගලවාගන්න.[15] අනික් අය-
ටද නොකඩවා දයාව පෙන්වන්න.
මන්ද ඔවුහු පව්කාර ක්‍රියාවල නිරත
වීමෙන් තම වස්ත්‍ර අපවිත්‍ර කරගෙන
ඇත. නමුත් ඔබ ඔවුන්ට දයාව
පෙන්වන විට ඔවුන්ගේ අපවිත්‍ර වූ
වස්ත්‍රවලින් ඈත්ව සිටීමට වගබලා
ගත යුතුයි.[16]

**24** එහෙයින් පව් කිරීමෙන්* ඔබව
ආරක්ෂා කළ හැකි,[17] තම තේජස

---

**13** මතෙ 5:7; මතෙ 9:13; යාකො 2:13; **14** ආමො 4:11; සෙක 3:2; මතෙ 18:8; **15** රෝම 11:14; ගලා 6:1; යාකො 5:19; **16** හිතෝ 8:13; ගලා 5:19; එළි 3:4; **17** ගීතා 145:20.

---

යූද් **12*** මූ.අ., "දෙවරක්."

යූද් **17*** හෝ, "යවනු ලැබූවන්." **24*** මූ.අ., "පය පැකිළී වැටීමෙන්."

---

**1** 2තෙස 2:3
1තිමෝ 1:20
2තිමෝ 2:16
**2** 2තිමෝ 3:6
2පේතෘ 2:13
**3** එස 34:8
**4** එෆී 4:14
**5** 2පේතෘ 2:17
**6** මතෙ 15:13
**7** යෙසා 57:20
**8** හෙබ්‍රෙ 6:4
එළි 21:8
**9** උත් 5:22
**10** ද්වි 33:2
දානි 7:10
සෙක 14:5
හෙබ්‍රෙ 12:22
**11** ගීතා 149:7
එස 25:17
2තෙස 1:6
**12** මලා 3:13
මතෙ 12:36
**13** ගණන් 14:27
1කොරි 10:10
පිලි 2:14
**14** යාකො 4:3
2පේතෘ 2:18
**15** ගීතා 75:5
ගීතා 140:11
තීත 1:10
**16** ලෙවී 19:15
හිතෝ 28:21
යාකො 2:9

**2 තීරුව**

**1** 2පේතෘ 3:2
**2** ක්‍රියා 20:30
1තිමෝ 4:1
2තිමෝ 3:1
2පේතෘ 2:1
2පේතෘ 3:3
**3** ලූක් 11:23
රෝම 16:17
1කොරි 1:10
යාකො 3:16
3යොහ 10
එළි 2:15
**4** හොෂෙ 4:14
**5** 1කොරි 2:14
හෙබ්‍රෙ 12:16
**6** ගලා 5:22
කොලො 2:7
1තෙස 5:11
**7** ක්‍රියා 20:32
1කොරි 3:10
**8** ලූක් 11:13
රෝම 8:26
එෆී 6:18
**9** යොහ 15:10
රෝම 8:39
1යොහ 5:3
**10** තීත 3:7
1යොහ 1:2
1යොහ 2:25
**11** 2තිමෝ 1:18
තීත 3:5
**12** යාකො 1:6

ඉදිරියේ මහත් ප්‍රීතියක් ඇතුව
නිකැළැල් කෙනෙකු ලෙස[1] පෙනී
සිටීමට ඔබට උපකාර කළ හැකි
තැනැත්තාද වන, **25** අපට ගැල-
වීම සලසා දෙන[2] දෙවිට, අපගේ
ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් මාර්-
ගයෙන්[3] සියලු තේජසද[4] ගෞර-
වයද ශ්‍රේෂ්ඨත්වයද[1] බලයද[2] පෙර
මෙන්[3] දැනුත් සදහටත් ලැබේවා![4]
ආමෙන්.*[5]

**1** රෝම 8:33
එෆී 1:4
එෆී 5:27
ෆිලි 1:10
කොලො 1:22
**2** ලූක් 1:47
**3** මතෙ 20:28
යොහ 3:16
රෝම 5:8
1යොහ 4:9
4 ගීතා 29:1

**2 තීරුව** **1** එළි 11:17; **2** දානි 4:35; **3** ගීතා 90:2; **4** හබ 1:12; **5** රෝම 16:27.

යූද් **25*** එනම්, එසේම වේවා!

යොහන්ට කළ

# එළිදරව්වක්

**1** මෙය යේසුස් ක්‍රිස්තුස් විසින්
කරන ලද එළිදරව්වකි.[1] එම
එළිදරව්ව ඔහුට දෙනු ලැබුවේ දෙවි
විසිනි.[2] දෙවි එය ලබා දුන්නේ තව
කෙටි කලකින් සිදු වීමට නියමිත
දේවල්[3] තම දාසයන්ට පෙන්වීම සඳ-
හාය.[4] යේසුස් එම එළිදරව් කිරීම්
තම දේවදූතයෙකු මාර්ගයෙන්[5] යොහ-
න්ට[6] පෙන්වූයේ සංකේත යොදා-
ගෙනය.[7] **2** යොහන්, දෙවි දුන්
පණිවිඩය[8] සහ යේසුස් ක්‍රිස්තුස් දුන්
සාක්ෂිය[9] ඇතුළුව තමා දුටු සියල්ල
ගැන සාක්ෂි දැරුවේය. **3** මේ අනා-
වැකියේ සඳහන් දේවල් ශබ්ද නඟා
කියවන,[10] ඊට සවන් දෙන,[11] එහි
ලියා තිබෙන දේවල් පිළිපදින අයට[12]
ලැබෙන්නේ ඉමහත් සන්තෝෂයකි.[13]
මන්ද නියමිත කාලය ළඟය.[14]

**4** මෙම ලිපිය ලියන්නේ යො-
හන්ය. මෙය ලියන්නේ ආසියා පළා-
තේ පිහිටි සභා හත වෙතටය.[15]

"සිටින්නාවූ, සිටියාවූ, මතු පැමි-
ණෙන්නාවූ තැනැත්තාණන්ගෙන්"[16]
ඔබට මහත් කරුණාවත් සමා-
දානයත් ලැබේවා! එමෙන්ම ඔහු-
ගේ සිංහාසනය ඉදිරියෙහි ක්‍රියාත්මක
වන බලයන් හත* මාර්ගයෙන්ද,[17]
**5** "විශ්වාසවන්ත සාක්ෂිකරු" වූ,[18]
"මරණයෙන් නැඟිටුණු කුලුඳුලා" වූ,[1]
"පොළොවේ රජුන්ගේ පාලකයා" වූ[2]
යේසුස් ක්‍රිස්තුස්ගෙන්ද මහත් කරු-
ණාවත් සමාදානයත් ලැබේවා!

අපට ප්‍රේම කරන,[3] තම රුධිරය
මාර්ගයෙන්[4] අපගේ පාපවලින් අපව
නිදහස් කළ, . . . **6** රාජ්‍යයක් ලෙ-
සද[5] තම දෙවි සහ පියාණන් වෙ-
නුවෙන් පූජකයන් ලෙසද[6] කටයුතු
කිරීමට අපට මඟ සැලසූ තැනැත්තාට
. . . සියලු ප්‍රශංසාවත් ගෞරවයත් බල-
යත් සදහටම ලැබේවා![7] ආමෙන්.*

**7** බලන්න! ඔහු වලාකුළු අත-
රින් එන්නේය.[8] සෑම පුද්ගලයෙකු-
ගේම දෑසට ඔහුව පෙනෙනු ඇත.[9]
ඔහුට ඇන්න අයද ඔහුව දකින්-
නෝය.[10] ඔහු නිසා පොළොවේ සියලු
ගෝත්‍ර ශෝකයෙන් තම පපුවට ගසා-
ගන්නෝය. ඒ දේ අනිවාර්යයෙන්ම
සිදු වනු ඇත.[11] ආමෙන්.

**8** යෙහෝවා දෙවි මෙසේ පවසයි.
"ඇල්ෆා හා ඔමේගා[12] වන්නේ මමය.
සිටින්නාවූ, සිටියාවූ මතු පැමිණෙන්-
නාවූ[13] සියලු බලැති තැනැත්තා[14]
මමය."

එළි **1:4*** හෝ, "හත් ගුණයකින් ක්‍රියාත්මක වන බලය."

**1 පරි.**

**1** 1කොරි 14:6
ගලා 1:12
**2** දානි 2:28
යොහ 12:49
**3** එළි 1:19
**4** ආමො 3:7
එළි 7:3
එළි 22:6
**5** එළි 22:16
**6** මතෙ 10:2
මාක් 1:19
යොහ 21:20
**7** ක්‍රියා 2:22
**8** එළි 1:9
**9** එළි 22:20
**10** ගීතා 1:2
1තිමෝ 4:13
**11** එළි 22:18
**12** ලූක් 11:28
යාකො 1:22
**13** යොහ 13:17
**14** දානි 8:19
එළි 22:10
**15** එළි 1:11
**16** නික් 3:14
එළි 1:8
එළි 4:8
එළි 11:17
**17** එළි 4:5
**18** ගීතා 89:37
එළි 3:14

**2 තීරුව**

**1** කොලො 1:18
**2** ගීතා 89:27
1තිමෝ 6:15
එළි 19:16
**3** යොහ 15:9
**4** හෙබ්‍රෙ 9:14
1පේතෘ 1:19
1යොහ 1:7
**5** නික් 19:6
ලූක් 22:29

**6** 1පේතෘ 2:5; එළි 5:10; එළි 20:6; **7** 1තිමෝ 6:16; **8** දානි 7:13; මතෙ 26:64; මාක් 13:26; ක්‍රියා 1:11; 1තෙස 4:17; එළි 14:14; **9** එෆී 1:18; **10** මතෙ 27:49; **11** මතෙ 24:30; **12** යෙසා 48:12; එළි 21:6; එළි 22:13; **13** එළි 1:4; **14** උත් 17:1; නික් 6:3.

එළි **1:6*** එනම්, එසේම වේවා!

**9** යොහන් වන මම ඔබේ සහෝද-
රයා වන අතර යේසුස්ගේ අනුගාමික-
යෙකු ලෙසද[1] ඔබ සමඟ පීඩාවලට
මුහුණ දෙමින්[2] විඳදරාගනිමින් සිටින්-
නෙමි.[3] එලෙසම ඔබ සමඟ රාජ්‍යයේ
පාලනයට හවුල් වන්නෙමි.[4] පැට්-
මොස් නම් දූපතෙහි සිටීමට මට
සිදු වී තිබෙන්නේ දෙවි ගැන කතා
කළ නිසාත් යේසුස් ගැන සාක්ෂි
දැරූ නිසාත්ය.[5] **10** දෙවිගේ බලයේ
උපකාරයෙන්[6] ස්වාමීන්ගේ දවසෙහි[7]
සිටීමට මට අවස්ථාව ලැබිණ.[8] මට
පිටුපසින් හොරණෑවකට සමාන ප්‍රබල
කටහඬක් ඇසිණ.[9] **11** "ඔබ දකින
දේ ලියවිල්ලක සටහන් කර[10] එෆී-
සය,[11] ස්මර්ණාව,[12] පර්ගමම්,[13] තියා-
තීරා,[14] සාදිස්,[15] පිලදෙල්ෆියා[16] සහ
ලවෝදිසිය[17] යන ස්ථානවල පිහිටි
සභා හතට එය යවන්න"[18] කියා මට
පවසන ලදි.

**12** කටහඬ පැමිණි දෙසට මා
හැරුණු විට මම රන් පහන්
රුක් හතක් දුටුවෙමි.[19] **13** ඒ පහන්
රුක් අතරේ මනුෂ්‍ය පුත්‍රයෙකු වැනි
තැනැත්තෙක් සිටියේය.[20] ඔහු පැළඳ
සිටියේ පාද දක්වා දිග වස්ත්‍රයකි.
ඔහුගේ ළය වටා රන් පටියක් බැඳ
තිබිණ. **14** ඔහුගේ හිසකෙස් සුදු
ලොම් මෙන්ද[21] හිම මෙන්ද සුදුව
තිබිණ. ඔහුගේ ඇස් ගිනිසිළු මෙනි.[22]
**15** ඔහුගේ පාද උදුනක දැල්වෙන
ඉස්තරම් තඹ මෙන්ද[23] ඔහුගේ කට-
හඬ[24] බොහෝ දිය දහරාවල හඬ
මෙන්ද විය. **16** ඔහුගේ දකුණතෙහි
තාරකා හතක් දක්නට ලැබිණ.[25]
ඔහුගේ මුවින් තියුණු, දෙමුවහත්,
දිග කඩුවක් නික්මුණේය.[26] ඔහුගේ
මුහුණ මහත් දීප්තියකින් බැබළෙන
හිරුට සමානය.[27] **17** ඔහුව දුටු විට
මම මිය ගිය කෙනෙකු මෙන් ඔහුගේ
පාමුල ඇද වැටුණෙමි.

ඔහු තම දකුණත මා පිට තබා
මෙසේ කීවේය. "භය නොවන්න.[28] පළ-
මුවෙනියා[29] සහ අන්තිමයා මමය.[30]
**18** ජීවමාන තැනැත්තා මමය.[31]
බලන්න, මා මිය ගියත්[32] මම සදහටම
ජීවත් වන්නෙමි.[1] මරණයෙත්[2] මිනී
වළෙත් යතුරු[3] මා සතුය. **19** එහෙ-
යින් ඔබ දුටු දේවල්ද දැන් සිදු වන
දේවල්ද මේ දේවලට පසුව සිදු වන දේ-
වල්ද ලියාගන්න.[4] **20** මාගේ දකුණ-
තෙහි ඔබ දුටු තාරකා හතෙහිද[5] ඔබ
දුටු රන් පහන් රුක් හතෙහිද[6] අර්ථය
පරිශුද්ධ රහසකි. එම තාරකා හතෙන්
නියෝජනය වන්නේ සභා හතෙහි දූත-
යන්වය. පහන් රුක් හතෙන් සභා හත
නියෝජනය වෙයි.[7]

**2** "එෆීසයෙහි පිහිටි සභාවේ[8] දූත-
යාට[9] මෙසේ ලියන්න. තම දකු-
ණතෙහි තාරකා හත අතැතිව[10]
රන් පහන් රුක් හත අතරෙහි ඇවි-
දින තැනැත්තා[11] පවසන්නේ මෙයයි.
**2** 'ඔබ කරන ක්‍රියාවන්ද ඔබ දරන
වෙහෙසද ඔබ විඳදරාගන්නා ආකාර-
යද නපුරු මිනිසුන්ට ඔබ කිසි ලෙස-
කින්වත් කැමති නැති බවද දනිමි.[12]
එලෙසම යේසුස්ගේ නියෝජිතයන්*
නොවුවත් තමන් ඔහුගේ නියෝජි-
තයන් බව කියා සිටින අයව[13] ඔබ
සෝදිසි කර බලා,[14] ඔවුන් බොරුකා-
රයන් කියා තේරුම්ගත් බවත් දනිමි.
**3** ඔබ බොහෝ දේවල් විඳදරාගනි-
මින් සිටින්නහුය.[15] ඔබ මාගේ නාමය
වෙනුවෙන් බොහෝ දුෂ්කරතාවලට
මුහුණ දුන්නත්[16] ඔබ විඩාවට පත් වී
නැත.[17] **4** නමුත් ඔබේ යම් වරදක්
ගැන ඔබට කිව යුතුයි. ඔබ තුළ
මුලින් තිබුණු ප්‍රේමය දැන් නැති වී
ගොස් ඇත.[18]

**5** "'එහෙයින් ඔබෙන් නැති වී
ගියේ මොන වගේ දෙයක්ද කියා
සිතා බලා,[19] පසුතැවිලි වී, කලින්
කළ ක්‍රියාවල නැවත නිරත වන්න.
ඔබ එසේ නොකළොත් මම ඔබ
වෙතට එන්නෙමි.[20] ඔබ පසුතැවිලි

**1 පරි.**
**1** රෝම 8:17
**2** මතෙ 24:9 හෙබ්‍රෙ 10:33 එළි 2:10
**3** මතෙ 10:22 2තිමෝ 2:12
**4** ලූක් 12:32
**5** ක්‍රියා 1:8
**6** 1ලේක 28:12 මතෙ 22:43
**7** 1කොරි 1:8 1කොරි 5:5
**8** එස 40:2 2කොරි 12:2
**9** එළි 1:15
**10** හබ 2:2
**11** එෆී 1:1 එළි 2:1
**12** එළි 2:8
**13** එළි 2:12
**14** ක්‍රියා 16:14 එළි 2:18
**15** එළි 3:1
**16** එළි 3:7
**17** කොලො 4:16 එළි 3:14
**18** එළි 1:4
**19** 2ලේක 4:7 එළි 1:20
**20** දානි 7:13 එළි 14:14
**21** හිතෝ 20:29 දානි 7:9
**22** එළි 19:12
**23** එළි 2:18
**24** එළි 1:10
**25** එළි 1:20
**26** යෙසා 49:2
**27** මතෙ 17:2
**28** මතෙ 17:7
**29** ක්‍රියා 26:23 කොලො 1:18 එළි 1:5
**30** යොහ 5:21 යොහ 6:40 එළි 2:8
**31** ලූක් 24:5 1කොරි 15:45
**32** රෝම 5:6 1පේතෘ 3:18

**2 තිරුව**
**1** රෝම 6:9 1තිමෝ 6:16 හෙබ්‍රෙ 7:24
**2** යෝබ් 38:17 ගීතා 9:13
**3** යෙසා 38:10 මතෙ 16:18 යොහ 6:54 යොහ 11:25
**4** එළි 4:1 එළි 22:6
**5** එළි 1:16
**6** එළි 1:12
**7** මතෙ 5:16 පිලි 2:15

**2 පරි.** **8** ක්‍රියා 19:1; එෆී 1:1; **9** එළි 1:20; **10** එළි 1:16; **11** එළි 1:13; **12** යොහ 2:25; එළි 2:19; එළි 3:1; **13** ක්‍රියා 20:30; 2කොරි 11:13; **14** 1යොහ 4:1; **15** ලූක් 21:19; හෙබ්‍රෙ 12:1; **16** 1පේතෘ 4:14; **17** ගලා 6:9; **18** මතෙ 24:12; **19** ක්‍රියා 26:20; එළි 3:19; **20** එළි 2:16.

එළි **2:2*** හෝ, "යවනු ලැබූවන්."

නොවුණොත් ඔබේ පහන් රුක එය
තිබෙන තැනින් ඉවත් කරන්නෙමි.[1]
**6** නමුත් ඔබ තුළ මේ යහපත් දේ
දක්නට තිබේ. එනම් මා වෛර
කරන නිකලායස්ගේ නිකායේ ක්‍රියාව-
ලට[2] ඔබත් වෛර කිරීමය.[3] **7** දෙවි
තම බලයෙන්[4] සභාවන්ට දන්වන මේ
දේට සවන් දී එය තේරුම්ගැනීමට
උත්සාහ කරන්න. එනම් මම ජයගන්-
නාට[5] දෙවිගේ පාරාදීසයෙහි තිබෙන
ජීවන වෘක්ෂයෙන් කෑමට අවස්ථාව
ලබා දෙන්නෙමි.’[6]

**8** “ස්මර්ණාවෙහි පිහිටි සභාවේ
දූතයාට[7] මෙසේ ලියන්න. මිය ගියත්
නැවත ජීවත්ව සිටින,[8] ‘පළමුවෙනියා
සහ අන්තිමයා’[9] වන තැනැත්තා පව-
සන්නේ මෙයයි. **9** ‘ඔබ විඳින පීඩා
හා ඔබේ දිළිඳුකම මම දනිමි. නමුත්
ඔබ ධනවත්ය.[10] එලෙසම තමන්
යුදෙව්වන්[11] බව පැවසුවත් ඇත්-
තෙන්ම සාතන්ගේ සිනගෝගයක්[12]
වන අය දෙවිට විරුද්ධව කරන අපහා-
සය ගැනද දනිමි. **10** ඔබ විඳින්න
යන දේවල් ගැන බිය නොවන්න.[13]
යක්ෂයා[14] ඔබෙන් සමහරදෙනෙකුව
සිරභාරයට නියම කරයි. එමගින්
ඔබ පූර්ණ සෝදිසියකට ලක් වන
අතර[15] ඔබ විඳින පීඩා[16] දවස් දහයක්
පුරා පවතිනු ඇත. ඔබට මිය යන්න
සිදු වුණත් විශ්වාසවන්තව සිටින්න.[17]
එවිට මම ඔබට ජීවනය නමැති
ඔටුන්න දෙන්නෙමි.[18] **11** දෙවි තම
බලයෙන්[19] සභාවන්ට දන්වන මේ
දේට සවන් දී එය තේරුම්ගැනී-
මට උත්සාහ කරන්න.[20] එනම් ජය
ගන්නා[21] තැනැත්තා දෙවෙනි මර-
ණය කිසි ලෙසකින්වත් අද්දකින්නේ
නැත.’[22]

**12** “පර්ගමම්හි පිහිටි සභාවේ දූත-
යාට මෙසේ ලියන්න. තියුණු, දෙමුව-
හත්, දිග කඩුව ඇති තැනැත්තා[23]
පවසන්නේ මෙයයි. **13** ‘ඔබ වාසය
කරන්නේ කොතැනද කියා මම දනිමි.
එනම් සාතන්ගේ සිංහාසනය තිබෙන
තැනය. නමුත් ඔබ දිගටම මට
විශ්වාසවන්තව සිටින්නෙහිය.*[1] මා
කෙරෙහි ඔබ තබා තිබෙන විශ්වාසය
ඔබ නැති කරගත්තේ නැත.[2] ඔබ
මට ද්‍රෝහී වුණේද නැත. මට විශ්වා-
සවන්ත වූ මාගේ සාක්ෂිකරුවෙකු[3]
වන අන්තිපස්ව සාතන්ගේ වාසස්ථා-
නයක් වන ඔබේ නුවරෙහි මරා දැමූ
කාලයේදී[4] පවා ඔබ නොසැලී සිටි-
යෙහිය.

**14** “‘නමුත් ඔබේ යම් වැරදි ගැන
ඔබට කිව යුතුයි. ඔබ අත-
රෙහි බාලාම් ඉගැන්වූ දේවලට ඇලී
සිටින අය සිටිති.[5] ඔහු ඊශ්‍රායෙල්ව-
රුන්ව වරදට පෙලඹවීම සඳහා කළ
යුතු දේ බාලාක්ට[6] ඉගැන්වූ ආකා-
රය ඔබට මතක් විය යුතුයි. ඔහු
කළ දේ නිසා ඊශ්‍රායෙල්වරු රූපව-
ලට පූජා කළ දේවල් ආහාරයට ගනි-
මින් වේශ්‍යාකම්* කළෝය.[7] **15** ඊට
අමතරව නිකලායස්ගේ නිකායේ[8]
ඉගැන්වීම්වලට ඇලී සිටින අයද ඔබ
අතරෙහි සිටිති. **16** එහෙයින් පසු-
තැවිලි වන්න.[9] ඔබ පසුතැවිලි නොවු-
ණොත් මම ඉක්මනින් ඔබ වෙතට
පැමිණ මගේ මුවින් නික්මෙන දිග
කඩුවෙන්[10] ඔවුන්ට විරුද්ධව යුද්ධ
කරන්නෙමි.[11]

**17** “‘දෙවි තම බලයෙන් සභා-
වන්ට දන්වන මේ දේට සවන් දී එය
තේරුම්ගැනීමට උත්සාහ කරන්න.[12]
එනම් මම ජයගන්නාට[13] සඟවා
තිබෙන මන්නාවලින් කොටසක්
දෙන්නෙමි.[14] ඔහුට සුදු ගල් කැටයක්ද
දෙන්නෙමි. එහි අලුත් නාමයක්[15]
ලියා ඇති අතර ඒ නාමය දැන-
ගත හැක්කේ එය ලබන තැනැත්තාට
පමණි.[16] වෙන කිසිවෙකුට එය දැන-
ගත නොහැක.’

**18** “තියතීරාහි[17] පිහිටි සභාවේ
දූතයාට මෙසේ ලියන්න. ගිනිසිළු

**2 පරි.**
**1** එළි 1:20
**2** 1කොරි 11:19; එළි 2:15
**3** ගීතා 139:21
**4** මතෙ 11:15; එළි 2:17; එළි 2:29
**5** 1යොහ 5:4
**6** රෝම 2:7; එළි 2:10
**7** එළි 2:1
**8** රෝම 14:9
**9** එළි 1:17
**10** 2කොරි 6:10; 1තිමෝ 6:18; යාකො 2:5
**11** ක්‍රියා 13:45
**12** 2කොරි 11:14; එළි 3:9
**13** මතෙ 10:28
**14** 1පේතෘ 5:8
**15** 2කොරි 8:2; හෙබ්‍රෙ 2:18
**16** රෝම 8:35; හෙබ්‍රෙ 10:33
**17** 2තිමෝ 4:7
**18** රෝම 2:7; යාකො 1:12; එළි 20:4
**19** 1යොහ 4:2
**20** එළි 13:9
**21** 1යොහ 5:5
**22** එළි 20:6; එළි 20:14; එළි 21:8
**23** එළි 1:16; එළි 19:15

**2 තීරුව**
**1** මාක් 13:9; එළි 2:3
**2** ලූක් 12:8; යොහ 14:1; 1යොහ 2:23
**3** ක්‍රියා 1:8
**4** මතෙ 24:9
**5** ගණන් 22:6; ගණන් 31:16; 2පේතෘ 2:15; යූද් 11
**6** ගණන් 22:4
**7** ගණන් 25:2; ක්‍රියා 15:29; 1කොරි 5:9; 1කොරි 10:8; එෆී 5:5
**8** 2පේතෘ 2:1; එළි 2:6
**9** ක්‍රියා 3:19
**10** එළි 1:16
**11** යෙසා 11:4
**12** එළි 2:7
**13** 1යොහ 5:5; එළි 3:12
**14** නික් 16:15; නික් 16:31; ගීතා 78:24; යොහ 6:51; හෙබ්‍රෙ 9:4

**15** හිතෝ 22:1; එළි 3:12; **16** එළි 19:12; **17** ක්‍රියා 16:14.

එළි **2:13*** මු.අ., “මාගේ නාමය තදින් අල්ලා-ගෙන සිටින්නෙහිය.” **14*** එනම්, අවිවාහක-යෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙ-දීම. උපග්‍ර. 8 බලන්න.

වැනි ඇස්[1] හා ඉස්තරම් තඹ වැනි
පාද ඇති[2] තැනැත්තා වන දෙ-
විගේ පුත්‍රයා[3] පවසන්නේ මෙයයි.
**19** ‘ඔබේ ක්‍රියාද ඔබේ ප්‍රේමයද[4] ඔබ
තුළ තිබෙන විශ්වාසයද ඔබ කරන
සේවයද ඔබ විඳදරාගන්නා ආකාරයද
දනිමි. එලෙසම මෑතක සිට ඔබේ
ක්‍රියා[5] පෙරට වඩා හොඳ තත්වයක
පවතින බවද දනිමි.[6]

**20** “‘නමුත් ඔබේ යම් වරදක් ගැන
ඔබට කිව යුතුයි. ඔබ යෙසබෙල් නම්
ස්ත්‍රියට ඉඩ දී ඇත.[7] තමා අනාගත-
වක්තෘවරියක කියා පවසන ඇය,
මාගේ දාසයන්ට[8] වේශ්‍යාකම්* කිරීම-
ටත්[9] රූපවලට පූජා කර ඇති දේවල්
ආහාරයට ගැනීමටත්[10] උගන්වමින්[11]
ඔවුන්ව නොමඟ යවයි. **21** පසුතැ-
විලි වීමට මා ඇයට කාලය දුන්-
නත්[12] ඇගේ වේශ්‍යාකම ගැන
පසුතැවිලි වීමට ඇය තුළ කැමැත්-
තක් නැත.[13] **22** බලන්න, මම
ඇයව ඔත්පළ කරන්නෙමි. එලෙ-
සම ඇය සමඟ අනාචාරයේ* යෙ-
දෙන අය ඇය මෙන් තමන් කළ
ක්‍රියා ගැන පසුතැවිලි වන්නේ නැත්-
නම් ඔවුන්ටද දරුණු පීඩාවකින් පහර
දෙන්නෙමි. **23** ඇගේ දරුවන්ටද
මාරාන්තික වසංගතයකින් පහර දී
ඔවුන්ව මරා දමන්නෙමි. එවිට යමෙ-
කුගේ ඇතුළාන්ත හැඟීම් සහ සිතු-
විලි* සෝදිසි කර බලන තැනැත්තා
මා බව සියලු සභාවන් දැනගනු ඇත.
මම ඔබ එකිනෙකාට ඔබේ ක්‍රියා
අනුව ප්‍රතිඵල දෙන්නෙමි.[14]

**24** “‘නමුත්, “සාතන්ගේ ගැඹුරු
දේවල්”[15] ලෙස හඳුන්වනු ලබන
දේවල් ගැන අවබෝධයක් නැති, යෙ-
සබෙල්ගේ ඉගැන්වීම් පිළි නොප-
දින තියතීරාහි ඉතුරුව සිටින අය
වන ඔබට මා පවසන්නේ මෙයයි.
ඔබ පිට මා වෙන කිසි වගකී-
මක් පවරන්නේ නැත.[1] **25** ඔබ කළ
යුත්තේ මා පැමිණෙන තුරු ඔබ
සතු දේ තදින් අල්ලාගෙන සිටීම
පමණි.[2] **26** ජය ගනිමින්, අවසානය
දක්වා මා අණ කළ දේ පිළිප-
දින තැනැත්තාට[3] මෙලොවෙහි සිටින
ජාතීන්ට විරුද්ධව නැඟී සිටීමට මම
බලය දෙන්නෙමි.[4] **27** මාගේ පියා-
ණන් මට දුන් බලය ඔහුටද ලබා
දෙන්නෙමි. යකඩ දණ්ඩක් අතැතිව
සිටින එඬේරෙකු මෙන් ඔහු ජාතීන්ව
පලවාහරින අතර[5] මැටි භාජන මෙන්
ඔවුන්ව කැබලිවලට සුනුවිසුනු කරනු
ඇත.[6] **28** මම ඔහුට පහන් තාර-
කාවද දෙන්නෙමි.[7] **29** දෙවි තම
බලයෙන්[8] සභාවන්ට දන්වන දේට
සවන් දී එය තේරුම්ගැනීමට උත්සාහ
කරන්න.’[9]

**3** “සාදිස්හි පිහිටි සභාවේ දූතයාට[10]
මෙසේ ලියන්න. දෙවිගේ බල-
යන් හත[11] හා තාරකා හත[12] සතු
තැනැත්තා පවසන්නේ මෙයයි. ‘මම
ඔබේ ක්‍රියා දනිමි. ජීවමානයි කියා ඔබ
නම් දරා සිටියත් ඇත්තටම ඔබ මිය
ගොස් ඇත.[13] **2** මාගේ දෙවි ඉදිරි-
යේ ඔබ ඔබේ ක්‍රියා සම්පූර්ණයෙන්ම
ඉටු කර ඇති බව මා දැක නැත.[14]
එහෙයින් සෝදිසියෙන් සිටින්න.[15]
මරණාසන්නව සිටින ඉතුරු අයව*
ශක්තිමත් කරන්න.[16] **3** එසේම
ඔබට ලබා දුන් දේද[17] ඔබ ඇසූ
දේද දිගටම සිහියේ තබාගෙන, එය
නොකඩවා පිළිපදිමින්,[18] පසුතැවිලි
වන්න.[19] ඇත්තෙන්ම ඔබ අවදි වන්-
නේ නැත්නම්[20] මම සොරෙකු මෙන්
පැමිණෙන්නෙමි.[21] මා ඔබ වෙතට
පැමිණෙන්නේ කුමන පැයේද කියා
කිසි ලෙසකින්වත් දැනගැනීමට ඔබට
හැකි වන්නේ නැත.[22]

**4** “‘නමුත් තම වස්ත්‍ර අපවිත්‍ර කර
නොගත්[23] ස්වල්පදෙනෙක්[24] සාදිස්හි
සිටින ඔබ අතරෙහි සිටිති. ඔවුහු

**2 පරි.**

**1** එළි 1:14
එළි 19:12
**2** එළි 1:15
**3** යොහ 20:31
**4** හෙබ්‍රෙ 6:10
**5** යාකො 2:20
**6** පිලි 3:16
**7** 1රාජා 16:31
2රාජා 9:22
**8** එෆී 6:6
**9** ක්‍රියා 15:29
1කොරි 5:11
ගලා 5:19
එෆී 5:5
**10** එළි 2:14
**11** 1තිමෝ 2:12
**12** රෝම 2:4
**13** රෝම 2:5
එළි 21:8
**14** මතෙ 16:27
එළි 22:12
**15** ගීතා 64:6
යොහ 8:44
ක්‍රියා 13:10
1කොරි 4:5

**2 තීරුව**

**1** ක්‍රියා 15:28
**2** එළි 3:11
**3** මතෙ 28:20
**4** ගීතා 2:8
මතෙ 19:28
ලූක් 22:29
එළි 3:21
එළි 20:4
**5** එළි 12:5
එළි 19:15
**6** ගීතා 2:9
දානි 2:44
මීකා 4:13
**7** ගණන් 24:17
එළි 22:16
**8** 1යොහ 4:2
**9** එළි 2:7

**3 පරි.**

**10** එළි 2:1
**11** එළි 1:4
එළි 4:5
**12** එළි 1:16
**13** යාකො 2:26
**14** 2කොරි 6:1
**15** ලූක් 21:34
එෆී 5:15
1තෙස 5:6
**16** ලූක් 22:32
ක්‍රියා 18:23
**17** මතෙ 10:8
**18** ලූක් 21:36
පිලි 2:16
**19** මතෙ 3:8
2කොරි 7:11
**20** එෆී 5:14
**21** එළි 16:15
**22** මතෙ 24:42
ලූක් 12:39
**23** යාකො 1:27
**24** හිතෝ 10:7; හිතෝ 22:1; දේශ 7:1.

---

එළි **2:20*** එළි 2:14හි පාදසටහන බලන්න. **22*** මූ.අ., “පරදාර සේවනයේ.” මෙය භාවිත කරන්නේ විවාහක පුරුෂයෙකු හෝ ස්ත්‍රියක අනාචාරයේ යෙදීම විස්තර කිරීමටය. **23*** මූ.අ., “වකුගඩු සහ සිත්.”

එළි **3:2*** මූ.අ., “දේවල්.”

සුදු වස්ත්‍ර පැළඳ මා සමඟ ගමන්
කරන්නෝය.[1] මන්ද ඒ ගෞරවය
ලැබීමට ඔවුහු සුදුසුස්සෝය.[2] **5** ජය
ගන්නා[3] තැනැත්තාට එලෙස සුදු
වස්ත්‍ර පළඳවනු ලැබේ.[4] මම ඔහු-
ගේ නම ජීවන ලියවිල්ලෙන් කිසි
ලෙසකින්වත් මකා නොදමන්නෙමි.[5]
මාගේ පියාණන්[6] ඉදිරියෙහිත් ඔහුගේ
දූතයන් ඉදිරියෙහිත්[7] ඒ තැනැත්තා-
ගේ නාමය පිළිගන්නා බව ප්‍රකාශ
කරන්නෙමි. **6** දෙවි තම බලයෙන්[8]
සභාවන්ට දන්වන දේට සවන් දී එය
තේරුම්ගැනීමට උත්සාහ කරන්න.’

**7** “පිලදෙල්ෆියාවෙහි පිහිටි සභා-
වේ දූතයාට[9] මෙසේ ලියන්න.
කිසිවෙකුට වැසීමට නොහැකි අයු-
රින් දොරවල් විවෘත කර දෙන,
කිසිවෙකුට විවෘත කළ නොහැකි
අයුරින් දොරවල් වසා දමන ශුද්ධ[10]
මෙන්ම සැබෑ වූ,[11] දාවිත්ගේ යතුර[12]
සතු තැනැත්තා පවසන්නේ මෙයයි.
**8** ‘මම ඔබේ ක්‍රියා දනිමි.[13] බලන්න,
මා ඔබ ඉදිරියෙහි විවෘත වූ දො-
රක් තබා ඇත.[14] එය කිසිවෙකුට
වසා දැමිය නොහැක. ඔබට තිබෙන්-
නේ ස්වල්ප බලයක් බවත් ඔබ මා
පැවසූ දේවල් පිළිපැද්ද බවත් ඔබ
මට* ද්‍රෝහී නොවූ බවත් මම දනිමි.[15]
**9** බලන්න, තමන් යුදෙව්වන් බව
පැවසුවත්[16] සැබෑවටම එසේ නො-
වන,[17] සාතන්ගේ සිනගෝගයට අයත්
අයට මම මෙසේ කිරීමට සලස්වන්-
නෙමි. ඔවුන් ඇවිත් ඔබේ පාද ඉදිරි-
යෙහි දණින් වැටී[18] මා ඔබට ප්‍රේම
කළ බව දැනගනු ඇත. **10** මා විඳ-
දරාගත් ආකාරය[19] ගැන ඔබ අසා
ඇති දේට අනුව ඔබ විඳදරාගෙන
තිබෙන නිසා ඔබව සෝදිසියට ලක්
කරන පැයේදී මම ඔබව රැකබලා
ගන්නෙමි.[20] පොළොවෙහි සිටින සිය-
ලුදෙනාව සෝදිසියට ලක් කිරීම
සඳහා ඒ පැය මුළු මහත් පොළොව-
ටම බලපානු ඇත.[21] **11** මම ඉක්ම-
නින් එන්නෙමි.[22] ඔබ සතු දේ දිගටම
අල්ලාගෙන සිටින්න.[1] එවිට ඔබේ
ඔටුන්න ඔබෙන් පැහැරගැනීමට කිසි-
වෙකුටත් හැකි වන්නේ නැත.[2]

**12** “‘ජය ගන්නා තැනැත්තාව මම
මාගේ දෙවිගේ[3] මාලිගාවෙහි[4] කණු-
වක්[5] කරන්නෙමි. ඔහුව එයින් ඉවත්
කිරීමට කිසි දෙයකට නුපුළුවන. මම
මාගේ දෙවිගේ නාමයද මාගේ දෙවි
වෙතින් ස්වර්ගයෙන් බැස එන නව
යෙරුසලම[6] වන මාගේ දෙවිගේ නුව-
රෙහි නාමයද මාගේ අලුත් නාමයද
ඔහු මත ලියන්නෙමි.[7] **13** දෙවි තම
බලයෙන්[8] සභාවන්ට දන්වන දේට
සවන් දී එය තේරුම්ගැනීමට උත්සාහ
කරන්න.’

**14** “ලවොදිසියෙහි[9] පිහිටි සභා-
වේ දූතයාට මෙසේ ලියන්න.
විශ්වාසවන්ත,[10] සැබෑ[11] සාක්ෂික-
රුවා[12] වන දෙවිගේ මුල්ම නිර්-
මාණය[13] වූ ආමෙන්[14] යන නමින්
හඳුන්වන තැනැත්තා පවසන්නේ මෙ-
යයි. **15** ‘මම ඔබේ ක්‍රියා දනිමි.
ඔබ තුළ සිසිලසක්වත් උණුසුමක්-
වත් නැති බව දනිමි. ඔබ තුළ
සිසිලසක් තිබුණා නම් හෝ උණුසු-
මක් තිබුණා නම් හෝ මම ඒ
ගැන සතුටු වන්නෙමි. **16** නමුත්
ඔබ තුළ සිසිලසක්වත්[15] උණුසුමක්-
වත්[16] නොමැත. ඒ වෙනුවට ඔබ
ඇල්මැරී සිටින නිසා මම ඔබව
වමාරන්නෙමි. **17** “මා ධනවත්ය.[17]
මට ධනය ඇත. මට කිසි හිඟයක්
නැත” කියා ඔබ පැවසුවත් ඔබ කො-
තරම් දුක්ඛිත, අනුකම්පාවක් ලැබිය
යුතු තත්වයක සිටිනවාද කියාවත්
ඔබ කොතරම් දිළිඳු, අන්ධ[18] හා කිසි
වස්ත්‍රයක් නැති තත්වයක සිටිනවාද
කියාවත් ඔබ දන්නේ නැත. එහෙයින්,
**18** මා ඔබට දෙන අවවාදය මෙයයි.
ගින්නෙන් පවිත්‍ර වූ රන් මාගෙන් මිල
දී ගන්න.[19] එවිට ඔබට ධනවත් විය
හැක. මාගෙන් සුදු වස්ත්‍රද මිල දී
ගන්න. එවිට අන් අය ඔබේ නිරුවත්-
කම දැකීමෙන් ඔබට ඇති වන ලැජ්-

එළි **3:8*** මූ.අ., “මාගේ නාමයට.”

**19** යෝබ් 23:10; 1පේතෘ 1:7.

**3 පරි.**
**1** එළි 3:18
එළි 6:11
**2** එෆී 4:1
**3** 1යොහ 5:4
**4** එළි 4:4
එළි 19:8
**5** පිලි 4:3
එළි 21:27
**6** මතෙ 10:32
මාක් 8:38
**7** ලූක් 12:8
**8** 1යොහ 4:2
**9** එළි 2:1
**10** යොහ 6:69
ක්‍රියා 3:14
හෙබ්‍රෙ 7:26
**11** එළි 3:14
එළි 19:11
**12** යෙසා 22:22
ලූක් 1:32
**13** එළි 2:2
**14** 1කොරි 16:9
2කොරි 2:12
**15** මතෙ 25:21
**16** රෝම 2:28
එළි 2:9
**17** යොහ 8:44
**18** යෙසා 60:14
**19** ලූක් 8:15
ලූක් 21:19
2තිමෝ 2:12
හෙබ්‍රෙ 10:36
හෙබ්‍රෙ 12:3
**20** 2තෙස 3:3
2පේතෘ 2:9
**21** මතෙ 24:21
**22** එළි 2:16

**2 තීරුව**
**1** එළි 2:10
**2** යාකො 1:12
**3** මතෙ 27:46
යොහ 20:17
**4** 1කොරි 3:16
එෆී 2:21
1පේතෘ 2:5
**5** 2ලේක 3:17
**6** හෙබ්‍රෙ 12:22
එළි 21:2
**7** එළි 14:1
එළි 19:12
එළි 22:4
**8** 1යොහ 4:2
**9** කොලො 4:16
**10** හෙබ්‍රෙ 3:6
එළි 1:5
**11** යොහ 1:14
එළි 19:11
**12** යොහ 18:37
1තිමෝ 6:13
**13** හිතෝ 8:22
කොලො 1:15
**14** 2කොරි 1:20
**15** හිතෝ 25:13
හිතෝ 25:25
**16** ගීතා 69:9
2කොරි 9:2
**17** හොෂෙ 12:8
1කොරි 4:8
**18** 2පේතෘ 1:9

ජාව විඳීමට ඔබට සිදු වන්නේ නැත.[1]
එලෙසම මාගෙන් නේත්‍රාලේප මිල දී
ගන්න. ඒවා ඔබේ ඇස්වල ආලේප
කිරීමෙන්[2] ඔබට පැහැදිලිව දැකීමට
හැකි වනු ඇත.

**19** “ ‘මා අවවාද හා හික්මවීම් ලබා
දෙන්නේ මා ආදරයෙන් සලකන*
සියලුදෙනාටය.[3] එහෙයින් නැවතත්
ඔබේ උද්‍යෝගය ඇති කරගෙන ඔබ
කළ දේ ගැන පසුතැවිලි වන්න.[4]
**20** බලන්න, මා සිටින්නේ දොර-
කඩ අසලම[5] දොරට තට්ටු කරමින්ය.
යමෙක් මාගේ හඬ අසා දොර විවෘත
කරනවා නම්,[6] මම ඔහුගේ නිවසට
ඇතුල් වී ඔහු සමඟ සන්ධ්‍යා භෝජ-
නයට සහභාගි වන්නෙමි. ඔහුද මා
සමඟ කෑම කන්නේය. **21** මා ජය
ගෙන මාගේ පියාණන් සමඟ ඔහු-
ගේ සිංහාසනයෙහි[7] ඉඳගත් ආකාරය-
ටම[8] ජයගන්නාට[9] මා සමඟ මාගේ
සිංහාසනයෙහි ඉඳගැනීමට අවස්ථාව
ලබා දෙන්නෙමි.[10] **22** දෙවි තම
බලයෙන්[11] සභාවන්ට දන්වන දේට
සවන් දී එය තේරුම්ගැනීමට උත්සාහ
කරන්න.’ ”[12]

**4** ඒ දේවල්වලට පසු ස්වර්ගයෙහි
දොරක් විවෘත වී තිබෙනවා මම
දුටුවෙමි. මට ඇසුණු මුල් කටහඬ
හොරණෑවක හඬ මෙන් විය.[13] එම
කටහඬ, “මෙතැනට නැඟ එන්න.[14]
සිදු වීමට නියමිත දේවල් මම
ඔබට පෙන්වන්නෙමි”[15] කියා පවස-
නවා මට ඇසිණ. **2** එසැණින්ම දෙ-
විගේ බලය මා වටා ක්‍රියා කරන අයුරු
මට දැනිණ. බලන්න! ස්වර්ගයෙහි
පිහිටා තිබුණු[16] සිංහාසනයක් දක්නට
ලැබිණ.[17] ඒ සිංහාසනය මත කෙ-
නෙක් ඉඳගෙන සිටියේය.[18] **3** ඉඳ-
ගෙන සිටි තැනැත්තා, පෙනුමෙන්[19]
ජැස්පර් ගලක් මෙන්ද[20] අනර්ඝ රතු
පැහැති මැණිකක් මෙන්ද විය. සිංහා-
සනය වටා මරකත මැණිකක වර්ණ-
යෙන් යුත්[21] දේදුන්නක්[22] තිබිණ.

එළි **3:19*** මු.අ., “මා ස්නේහයක් දක්වන.” ග්‍රීක බසින්, ෆිලීඕ.

**3 පරි.**
1 එළි 16:15
2 ගීතා 19:8
3 හිතෝ 3:12
4 එළි 2:5; එළි 3:3
5 යාකො 5:9
6 ලූක් 12:36
7 යෙසා 66:1
8 හෙබ්‍රෙ 10:12
9 1යොහ 5:4; එළි 2:26; එළි 12:11
10 මතෙ 19:28; ලූක් 22:30
11 එළි 2:7
12 එළි 1:11

**4 පරි.**
13 නික් 19:16; එළි 1:10
14 උත් 28:12; එළි 11:12
15 දානි 2:28; එළි 1:1
16 ගීතා 11:4; ක්‍රියා 7:55
17 1රාජා 22:19; යෙසා 6:1
18 එස 1:26; දානි 7:9
19 1යොහ 1:5
20 එළි 21:11
21 නික් 28:17
22 උත් 9:13

**2 තීරුව**
1 එළි 3:21; එළි 20:4
2 එළි 1:6; එළි 4:10
3 1ලේක 24:1; 1ලේක 24:18; ලූක් 1:5
4 එළි 6:11; එළි 19:8
5 1පේත 5:4
6 යෝබ් 38:35; එස 1:13
7 නික් 19:16; නික් 20:18
8 නික් 25:31; නික් 40:24
9 එළි 1:4; එළි 5:6
10 නික් 30:18; 1රාජා 7:23
11 එස 1:5; එළි 4:9
12 2සාමු 17:10; හිතෝ 28:1; යෙසා 31:4
13 1රාජා 7:25; එළි 6:3
14 එළි 6:5
15 එළි 6:7
16 යෝබ් 39:29; එස 1:10
17 එළි 5:8
18 යෙසා 6:2

**4** එම සිංහාසනය වටා තවත්
සිංහාසන විසිහතරක්ද දක්නට
ලැබිණ. එමෙන්ම ඒ සිංහාසන මත[1]
වැඩිමහල්ලන්[2] විසිහතරදෙනෙක්[3]
ඉඳගෙන සිටින ආකාරයද මම දුටු-
වෙමි. ඔවුන් සුදු වස්ත්‍ර පැළඳ සිටි
අතර[4] ඔවුන්ගේ හිස් මත රන් ඔටුනු
දක්නට ලැබිණ.[5] **5** සිංහාසනයෙන්
විදුලි කෙටීම්ද[6] කටහඬවල්ද ගිගු-
රුම්ද[7] නික්මුණේය. සිංහාසනය ඉදි-
රිපිට පහන් හතක්[8] දල්වා තිබිණ.
ඒවායින් නියෝජනය වන්නේ දෙවිගේ
බලයන් හතයි.[9] **6** සිංහාසනය ඉදි-
රියෙහි වීදුරු මෙන් පැහැදිලි මුහුදක්[10]
දක්නට ලැබිණ. එය පෙනුමෙන් පළිඟු
හා සමානය.

සිංහාසනය අසලම ඒ වටා ජීවීහු
හතරදෙනෙක් සිටියෝය.[11] ඔවුන්-
ගේ සිරුරේ ඉදිරිපසින්ද පිටුපසින්ද
එනම්, සිරුර පුරාම ඇස් තිබිණ.
**7** මුල්ම ජීවියා සිංහයෙකු[12] හා සමා-
නය. දෙවෙනි ජීවියා වස්සෙකු[13] හා
සමානය. තුන්වෙනි ජීවියාට[14] මිනි-
සෙකුගේ මුහුණ හා සමාන මුහු-
ණක් තිබිණ. හතරවෙනි ජීවියා[15]
පියාසර කරමින් සිටින රාජාලියෙකු[16]
හා සමානය. **8** ජීවීන් හතරදෙනා-
ටම[17] පියාපත් හය බැගින් තිබිණ.[18]
ඒ පියාපත් යටි පැත්තේද උඩු පැත්-
තේද එනම්, පියාපත් පුරාම ඇස්
තිබිණ.[19] කිසි විවේකයක් නොගනි-
මින් ඔවුහු රෑ දවල් මෙසේ පවසති.
“සිටියාවූ, සිටින්නාවූ,[20] මතු පැමි-
ණෙන්නාවූ සියලු බලැති තැනැත්තා-
ණන්[21] වන යෙහෝවා[22] දෙවි ශුද්ධය,
ශුද්ධය, ශුද්ධය.”

**9** ඒ ජීවීන් සිංහාසනය මත ඉඳ-
ගෙන සිටින[23] සදහටම ජීවත් වන
තැනැත්තාණන්ට[24] ප්‍රශංසාවත් ගෞ-
රවයත් ස්තුතියත්[25] පුද කරන සෑම
මොහොතකම, **10** වැඩිමහල්ලෝ
විසිහතරදෙනාද[26] සිංහාසනය මත

**19** හිතෝ 15:3; එස 1:18; එස 10:12; හෙබ්‍රෙ 4:13; **20** නික් 3:14; එළි 1:4; **21** නික් 6:3; එළි 11:17; එළි 15:3; **22** යෙසා 6:3; ලූක් 1:49; **23** ගීතා 47:8; එළි 21:5; **24** ගීතා 90:2; දානි 4:34; දානි 12:7; **25** ගීතා 92:1; **26** එළි 5:8.

ඉඳගෙන සිටින තැනැත්තා ඉදිරියෙහි
දණින් වැටී, සදහටම ජීවත් වන එම
තැනැත්තාණන්ට නමස්කාර කරති.[1]
එලෙසම ඔවුහු තම ඔටුනු සිංහා-
සනය ඉදිරියට විසි කරමින් මෙසේ
පවසති. **11** "අපගේ බලසම්පන්න[2]
දෙවි වන යෙහෝවා, ඔබ සියලු ප්‍රශං-
සාවත්[3] ගෞරවයත්[4] ලැබීමට වටිනා
තැනැත්තාණන්ය. මන්ද සැම දෙ-
යක්ම සැදුවේ ඔබය.[5] ඒවා සැදුවෙත්
ඒවා දිගටම පවතින්නෙත්[6] ඔබේ
කැමැත්ත නිසාය.[7]"

**5** එවිට සිංහාසනය මත ඉඳගෙන
සිටින තැනැත්තාගේ[8] දකුණ-
තෙහි අකුළන ලද ලියවිල්ලක් තිබෙ-
නවා මම දුටුවෙමි. එම ලියවිල්ලේ
දෙපැත්තේම එනම්, ඇතුළත හා
පිටත යමක් ලියා තිබුණු අතර[9]
එය මුද්‍රා හතකින් තදින් මුද්‍රා කර
තිබිණ.[10] **2** එසේම ශක්තිමත් දේ-
වදූතයෙකු මහත් හඬකින් මෙසේ
ප්‍රකාශ කරනවා දුටුවෙමි. "මෙම ලිය-
විල්ලේ මුද්‍රා කැඩීමටත් එය දිග-
හැරීමටත් සුදුසු තැනැත්තා කවුද?"
**3** නමුත් එම ලියවිල්ල දිගහැරීම-
ටවත් එය බැලීමටවත් හැකි කිසිම
කෙනෙක් ස්වර්ගයෙහිත් පොළොවෙ-
හිත් පොළෝගැබෙහිත් සිටියේ නැත.
**4** ලියවිල්ල දිගහැරීමටවත් එය බැලී-
මටවත් සුදුසු කිසිවෙකු සොයාගත
නොහැකි වූ නිසා මම බොහෝ සෙ-
යින් හැඬුවෙමි.[11] **5** එවිට එක් වැඩි-
මහල්ලෙක් මට මෙසේ කීවේය. "ඔබේ
හැඬීම නවත්වන්න. බලන්න, දාවිත්-
ගේ[12] මුල[13] එනම්, යූදා ගෝත්‍රයෙන්
පැමිණි[14] සිංහයා ජය ගෙන ඇත.[15]
එහෙයින් ලියවිල්ලේ මුද්‍රා හත කැඩීම-
ටත් එය දිගහැරීමටත් ඔහුට පුළුවන."

**6** එවිට සිංහාසනය හා ජීවීන් හත-
රදෙනා අසලද[16] වැඩිමහල්ලන් මධ්‍ය-
යෙහිද[17] බැටළු පැටවෙකු[18] සිටගෙන
සිටිනවා දුටුවෙමි. එම බැටළු පැටවා-
ගේ පෙනුම මරා දමන ලද බැටළු
පැටවෙකුගේ පෙනුමට සමානය.[19] ඒ
බැටළු පැටවාට අං හතක්ද ඇස්
හතක්ද තිබිණ. ඒ ඇස්වලින් නියෝ-
ජනය වන්නේ මුළු පොළොව පුරාම
යවනු ලැබූ දෙවිගේ බලයන් හතයි.[1]
**7** බැටළු පැටවා පමා නොවී, සිංහාස-
නය මත ඉඳගෙන සිටින තැනැත්තා-
ගේ[2] දකුණතෙන් ලියවිල්ල ගත්තේය.
**8** බැටළු පැටවා අකුළන ලද ලිය-
විල්ල ගත් විට ජීවීන් හතරදෙ-
නාද වැඩිමහල්ලෝ විසිහතරදෙනාද[3]
බැටළු පැටවා ඉදිරියෙහි දණින් වැටු-
ණෝය. එම වැඩිමහල්ලන්ට කුඩා
වීණාවක් බැගින්ද[4] සුවඳ ද්‍රව්‍යයෙන්
පිරුණු රන් බඳුනක් බැගින්ද තිබිණ.
ඒ සුවඳ ද්‍රව්‍යයෙන්[5] නියෝජනය වන්-
නේ ශුද්ධ තැනැත්තන් ඉදිරිපත්
කරන යාච්ඤාය.[6] **9** ඔවුහු අලුත්
ගීතිකාවක්[7] ගයමින් මෙසේ කියති.
"ලියවිල්ල ගැනීමටත් එහි මුද්‍රා කැඩී-
මටත් සුදුසු තැනැත්තා ඔබයි. මන්ද
ඔබව මරා දමනු ලැබූ අතර ඔබේ
රුධිරයෙන්[8] ඔබ සැම ගෝත්‍රයකින්ම,
භාෂාවකින්ම, ජනතාවකින්ම සහ
ජාතියකින්ම මිනිසුන්ව දෙවි වෙනු-
වෙන්[9] මිල දී ගත්තෙහිය.[10] **10** ඔබ
ඔවුන්ට රාජ්‍යයක් ලෙසද[11] අපගේ
දෙවි සඳහා[12] පූජකයන් ලෙසද[13] සේ-
වය කිරීමට මඟ විවෘත කළෙහිය.
පොළොවේ රජකම[14] ඔවුන්ට භාර
දීමට නියමිතය."

**11** මා බැලූ විට සිංහාසනයද
ජීවීන්ද වැඩිමහල්ලන්ද වටා සිටි
දේවදූතයන් බොහෝදෙනෙකුගේ හඬ
මට ඇසිණ. ඔවුන්ගේ ගණන දසද-
හස් වර දසදහසක්ද[15] දහස් වර දහ-
සක්ද විය.[16] **12** ඔවුහු මහත් හඬින්
මෙසේ පවසති. "මරා දමනු ලැබූ
බැටළු පැටවා[17] සියලු බලයත් ධන-
යත් ප්‍රඥාවත් ශක්තියත් ගෞරවයත්
ප්‍රශංසාවත් ලැබීමට වටින්නේය."[18]

**13** එවිට ස්වර්ගයෙහිත් පොළො-
වෙහිත් පොළෝගැබෙහිත්[19] මුහුදෙ-
හිත් සිටින සියලු ජීවීන්ද ඒවායෙහි
තිබෙන සියල්ලද, "සිංහාසනය මත
ඉඳගෙන සිටින තැනැත්තාණන්ටත්[20]

**4 පරි.**
1 1ලේක 16:29; ගීතා 95:6; එළි 19:10
2 එළි 5:13; එළි 7:12; එළි 11:17; එළි 12:10
3 මතෙ 5:16; එළි 14:7
4 1තිමෝ 1:17
5 එෆී 3:9; එළි 10:6
6 උත් 2:3
7 මතෙ 6:10; මතෙ 26:39; 1පේතෘ 4:2; 1යොහ 2:17

**5 පරි.**
8 එළි 4:2
9 එස 2:10
10 යෙසා 29:11; දානි 12:9
11 මතෙ 24:36; ක්‍රියා 1:7
12 2සාමු 7:12; එළි 22:16
13 යෙසා 11:1; රෝම 15:12
14 උත් 49:9; හෙබ්‍රෙ 7:14
15 යොහ 16:33
16 එෆී 1:20
17 එෆී 1:22
18 යෙසා 53:7; යොහ 1:29; 1පේතෘ 1:19
19 යොහ 19:30; එළි 5:12

**2 තීරුව**
1 එළි 1:4
2 ගීතා 47:8; යෙසා 6:1
3 එළි 5:14; එළි 19:4
4 2ලේක 29:25; එළි 15:2
5 ගීතා 141:2; එළි 8:4
6 කොලො 4:2
7 ගීතා 33:3; ගීතා 144:9; යෙසා 42:10; එළි 14:3
8 මතෙ 26:28; හෙබ්‍රෙ 9:12; 1පේතෘ 1:19
9 එළි 14:4
10 1කොරි 6:20
11 ලූක් 12:32; ලූක් 22:29; හෙබ්‍රෙ 12:28
12 නික් 19:6; 1පේතෘ 2:9; එළි 20:6
13 එළි 1:6

**14** මතෙ 19:28; එළි 20:4; එළි 22:5; **15** ද්වි 33:2; හෙබ්‍රෙ 12:22; යූද් 14; **16** දානි 7:10; **17** යෙසා 53:7; එළි 5:6; **18** මතෙ 28:18; **19** පිලි 2:10; **20** 1රාජා 22:19; එළි 4:2.

බැටළු පැටවාටත්[1] සදහටම ප්‍රශංසා-
වත් ගෞරවයත්[2] තේජසත් ලැබේවා"[3]
කියා පවසන ආකාරය මට ඇසිණ.
**14** ජීවීන් හතරදෙනාද, "ආමෙන්"
කියා පැවසුවෝය. වැඩිමහල්ලෝද[4]
දණින් වැටී නමස්කාර කළෝය.[5]

**6** බැටළු පැටවා[6] මුද්‍රා හතෙන්
එකක් කඩනවා මම දුටුවෙමි.[7]
එවිට ජීවීන් හතරදෙනාගෙන් එක්
කෙනෙක්[8] ගිගුරුම් හඬකින් මෙන්,
"එන්න" කියා පවසනවා මට ඇසිණ.[9]
**2** බලන්න, මම සුදු පැහැති අශ්ව-
යෙකු[10] දුටුවෙමි. ඌ පිට ඉඳගෙන
සිටි තැනැත්තාට[11] දුන්නක් තිබිණ.[12]
ඔටුන්නක්ද ඔහුට දෙන ලදි.[13] ජය
අත් කරගැනීමට පිටත් වූ ඔහු,[14] සම්-
පූර්ණ ජයග්‍රහණයක් ලැබුවේය.[15]
**3** ඔහු දෙවෙනි මුද්‍රාව කැඩූ විට දෙ-
වෙනි ජීවියා,[16] "එන්න" කියා පවස-
නවා මට ඇසිණ. **4** එවිට තවත්
අශ්වයෙක් එනම්, ගිනි පැහැති අශ්-
වයෙක් පිටතට ආවේය. ඌ පිට
ඉඳගෙන සිටි තැනැත්තාට පොළො-
වෙන් සාමය තුරන් කිරීමට අවසර
දෙන ලදි. එහෙයින් මිනිස්සු එකිනෙ-
කාව මරා දමනු ඇත. මහත් කඩුවක්ද
ඔහුට දෙන ලදි.[17]
**5** ඔහු[18] තුන්වෙනි මුද්‍රාව කැඩූ විට
තුන්වෙනි ජීවියා,[19] "එන්න" කියා පව-
සනවා මට ඇසිණ. බලන්න! කලු
පැහැති අශ්වයෙකු මම දුටුවෙමි. ඌ
පිට ඉඳගෙන සිටි තැනැත්තා අතේ
තරාදියක් තිබිණ.[20] **6** එවිට මට
හඬක් ඇසිණ. එය ජීවීන් හතර-
දෙනා[21] අතරින් පැමිණි හඬක්
මෙන් විය.[22] ඒ හඬ, "තිරිඟු කිලෝ
එකක් ඩිනාරියකි.*[23] බාර්ලි කිලෝ
තුනක් ඩිනාරියකි. ඔලීව තෙල්වල-
ටත් වයින්වලටත් අනතුරක් නොක-
රන්න"[24] කියා පවසනවා මට ඇසිණ.
**7** ඔහු හතරවෙනි මුද්‍රාව කැඩූ
විට, "එන්න" කියා පවසන හතර-
වෙනි ජීවියාගේ හඬ[25] මට ඇසිණ.
**8** බලන්න! සුදුමැලි අශ්වයෙකු මම
දුටුවෙමි. ඌ පිට ඉඳගෙන සිටි
තැනැත්තාගේ නම මරණයයි. මිනී
වළද[1] ඔහු පසුපසින්ම ගියේය. පො-
ළොවෙන් හතරෙන් කොටසක් කෙ-
රෙහි තම අණසක පැතිරවීමට
ඔවුන්ට අවසර දෙන ලදි. එසේ කළේ
දිග කඩුවකින්ද[2] ආහාර හිඟකමින්ද[3]
මාරාන්තික වසංගතයෙන්ද පොළො-
වේ වනසතුන් ලවාද[4] මිනිසුන්ව මරා
දැමීමටය.
**9** ඔහු පස්වෙනි මුද්‍රාව කැඩූ විට
මරා දමනු ලැබූ[5] අයගේ රුධිරය[6] පූජා-
සනය යට තිබෙනවා[7] මම දුටුවෙමි.
ඔවුන්ව මරා දමා තිබුණේ දෙවි පව-
සන දේවල් පිළිපැද්ද නිසාත් ඔවුන්ට
පවරා තිබූ සාක්ෂි දැරීමේ කාර්යය[8]
ඔවුන් ඉටු කළ නිසාත්ය. **10** ඔවුහු
මහත් ශබ්දයකින් හඬ නඟා, "විශ්ව-
යේ පාලකයාණනි[9] වන ශුද්ධ දෙවි-
යනි, සැබෑ දෙවියනි,[10] පොළොවෙහි
වැසියන්ව විනිශ්චය කිරීමට[11] සහ
අපගේ ලේ වැගිරවීම[12] වෙනුවෙන්
ඔවුන්ට දඬුවම් කිරීමට ඔබ තව
කොපමණ කල් බලා සිටින්නෙහිද"
කියා පැවසුවෝය. **11** ඔවුන් සියලු-
දෙනාටම සුදු[13] වස්ත්‍රයක් දෙන ලදි.
එලෙසම ඔවුන් මෙන් මරනු ලැබීමට
සිටින ඔවුන්ගේ සෙසු දාසයන්ගේ[14]
හා සහෝදරයන්ගේ ගණනත් සම්-
පූර්ණ වන තුරු තව ටික කලක් බලා
සිටින්න කියා ඔවුන්ට කියන ලදි.
**12** ඔහු හයවෙනි මුද්‍රාව කඩනවා
මම දුටුවෙමි. එවිට මහත් භූමිකම්පා-
වක් සිදු විය. ඉර කලු පැහැගැන්වී
තිබිණ. එහි පැහැය සත්ව ලොම්ව-
ලින් සෑදූ ගෝණි රෙද්දක් මෙන්
විය.[15] සඳ මුළුමනින්ම ලේ මෙන් රතු
පැහැ විය.[16] **13** අත්තික්කා ගසක්
තද සුළඟකින් සෙලවී එහි අමු අත්-
තික්කා ගෙඩි වැටෙන්නා සේ අහසේ
තාරකා පොළොවට කඩා වැටුණේය.
**14** ලියවිල්ලක් අකුළන්නා සේ අහස
පහව ගියේය.[17] සෑම කන්දක්ම හා දූප-
තක්ම ඒවා තිබෙන තැන්වලින් ඉවත්

**5 පරි.**
1 යොහ 1:29; එළි 7:17
2 යොහ 5:23; 1තිමෝ 6:16
3 1පේත 4:11
4 එළි 7:11
5 මතෙ 4:10

**6 පරි.**
6 එළි 5:6
7 එළි 5:5
8 එළි 4:7
9 එළි 22:20
10 යෝබ් 39:25; හිතෝ 21:31; එළි 19:11
11 ගීතා 45:4
12 2රාජ 9:24
13 උත් 49:10; ගීතා 21:3; එස 21:27; දානි 7:14; එළි 14:14
14 ගීතා 110:2; එළි 12:7
15 එළි 16:14; එළි 17:14
16 එළි 4:7
17 දානි 11:40; මතෙ 24:7; ලූක් 21:10
18 එළි 6:1
19 එළි 4:7
20 එස 4:16
21 එළි 7:11
22 එළි 5:6
23 මතෙ 20:2
24 මාක් 13:8
25 එළි 4:7

**2 තීරුව**
1 එළි 20:13
2 යෙරෙ 15:3; ආමෝ 4:10
3 යෙරෙ 15:2; එස 5:17; ලූක් 21:11
4 ලෙවී 26:22; එස 14:21; එස 33:27
5 මතෙ 24:9; 1යොහ 3:12
6 ලෙවී 17:11; එළි 17:6
7 ලෙවී 4:7; එළි 8:3
8 මතෙ 24:14; යොහ 18:37; එළි 20:4
9 ක්‍රියා 4:24
10 1යොහ 5:20
11 ලූක් 18:7; හෙබ්‍රෙ 12:23; එළි 19:2
12 උත් 4:10; ද්වි 32:43
13 එළි 3:5; එළි 4:4

එළි **6:6*** ග්‍රෑම් 3.85ක් බර රෝමානු රිදී කාසියක්.

**14** මතෙ 24:9; ක්‍රියා 9:1; 2කොරි 1:8; **15** යෙසා 50:3; **16** යෝවෙ 2:31; මතෙ 24:29; ක්‍රියා 2:20; **17** යෙසා 34:4.

කරන ලදි.[1] **15** පොළොවේ රජව-
රුද උසස් තනතුරු හොබවන නිල-
ධාරීහුද සෙන්පතියෝද ධනවත්
අයද බලවන්තයෝද සියලු දාස-
යෝද සියලුම නිදහස් පුරවැසියෝද
ගුහාවලත් කඳු පර්වත අතරත් සැඟවු-
ණෝය.[2] **16** ඔවුහු කඳුවලටත් පර්-
වතවලටත් මෙසේ කීවෝය. “අප පිට
වැටෙන්න.[3] සිංහාසනය මත ඉඳගෙන
සිටින තැනැත්තාගෙන්ද[4] බැටළු පැට-
වාගේ උදහසින්ද අපව සඟවාගන්න.[5]
**17** මන්ද ඔවුන්ගේ උදහස ප්‍රකාශ
කිරීමේ[6] මහත් දවස[7] පැමිණ ඇත. ඊට
මුහුණ දිය හැක්කේ කාටද?”[8]

**7** ඉන්පසු දේවදූතයන් හතරදෙ-
නෙකු[9] පොළොවේ සතර කො-
නේ සිටගෙන සිටිනවා මම දුටුවෙමි.
පොළොවටත් මුහුදටත් කිසිම ගසක-
ටත් සුළං නොවදින පිණිස[10] ඔවුහු
පොළොවේ සතරදිග සුළං[11] තදින්
අල්ලාගෙන සිටියෝය. **2** එවිට මම
තවත් දේවදූතයෙකු දුටිමි. ඔහු ජීව-
මාන දෙවිගේ මුද්‍රාවක් අතැතිව[12]
නැඟෙනහිර දෙසින් නැඟී ආවේය.[13]
ඔහු පොළොවටත් මුහුදටත් අනතුරු
කිරීමට අවසර ලබා සිටි දේවදූත-
යන් හතරදෙනාට මහත් හඬකින්,
**3** “අපගේ දෙවිගේ දාසයන්ගේ නළල්-
වල[14] අප මුද්‍රා තබන තුරු[15] පොළො-
වටවත් මුහුදටවත් ගස්වලටවත් කිසි
අනතුරක් නොකරන්න” කියා කීවේය.
**4** මුද්‍රා කරනු ලැබූ අයගේ ගණන
සඳහන් කරනවා මට ඇසිණ. ඒ
එක්ලක්ෂ හතළිස්හාරදහසකි.[16] එසේ
මුද්‍රා කරනු ලැබූ අය ඊශ්‍රායෙල්වරුන්-
ගේ[17] සෑම ගෝත්‍රයකටම අයත්ව සිටි-
යෝය.[18]
**5** යූදා ගෝත්‍රයෙන්[19] දොළොස්-
දහසක්ද
රූබෙන් ගෝත්‍රයෙන්[20] දොළොස්-
දහසක්ද
ගාද් ගෝත්‍රයෙන්[21] දොළොස්දහ-
සක්ද,
**6** ආෂේර් ගෝත්‍රයෙන්[22] දොළොස්-
දහසක්ද

**6 පරි.**
1 එළි 16:20
2 යෙසා 2:10 යෙසා 2:19 එස 33:27
3 හොෂෙ 10:8 ලූක් 23:30
4 එළි 4:2
5 එළි 5:6
6 ශෙප 1:18 රෝම 2:5
7 ශෙප 1:14
8 යෝවෙ 2:11

**7 පරි.**
9 මතෙ 25:31
10 ගීතා 37:35
11 යෙරෙ 25:32
12 යොහ 6:27
13 එළි 16:12
14 මතෙ 24:31 එළි 9:4
15 2කොරි 1:22 එෆි 1:13 එෆි 4:30
16 එළි 14:1 එළි 14:3
17 රෝම 2:29 රෝම 9:6 ගලා 6:16
18 යාකො 1:1 එළි 21:12
19 උත් 49:10 1ලේක 5:2
20 උත් 49:3
21 උත් 49:19
22 උත් 49:20

**2 තීරුව**
1 උත් 49:21
2 උත් 41:51 එස 48:4
3 උත් 49:5
4 ගණන් 3:6
5 උත් 49:14
6 උත් 49:13
7 1ලේක 5:2
8 උත් 49:27
9 එළි 7:3
10 මතෙ 25:34 යොහ 10:16 එළි 22:17
11 උත් 22:18 යෙසා 2:2 යෙසා 60:3 එළි 15:4
12 ගීතා 117:1
13 යෙසා 66:18
14 එළි 7:14
15 ගීතා 11:4
16 ලෙවී 23:40 යොහ 12:13
17 එළි 4:2
18 ගීතා 3:8 ලූක් 1:69 තීත 2:10 යූද් 25
19 ක්‍රියා 4:12 එළි 5:6

නප්තලී ගෝත්‍රයෙන්[1] දොළොස්-
දහසක්ද
මනස්සේ ගෝත්‍රයෙන්[2] දොළොස්-
දහසක්ද,
**7** සිමියොන් ගෝත්‍රයෙන්[3] දො-
ළොස්දහසක්ද
ලෙවී ගෝත්‍රයෙන්[4] දොළොස්දහ-
සක්ද
ඉසකාර් ගෝත්‍රයෙන්[5] දොළොස්-
දහසක්ද,
**8** සෙබුලූන් ගෝත්‍රයෙන්[6] දො-
ළොස්දහසක්ද
යෝසෙප් ගෝත්‍රයෙන්[7] දොළොස්-
දහසක්ද
බෙන්ජමින් ගෝත්‍රයෙන්[8] දො-
ළොස්දහසක්ද මුද්‍රා කරන ලදි.[9]
**9** ඉන්පසු මම මහත් සමූහයක්[10]
දුටුවෙමි. බලන්න, එම සමූහය කිසි-
වෙකුට ගණන් කළ නොහැකි විය.
සියලු ජාතීහුද[11] ගෝත්‍රද ජනයාද[12]
සියලු භාෂා කතා කරන අයද[13] එම
සමූහයට අයත් වූහ. සුදු වස්ත්‍ර පැළඳ
සිටි[14] ඔවුහු සිංහාසනය ඉදිරියෙහිත්[15]
බැටළු පැටවා ඉදිරියෙහිත් සිටගෙන
සිටියෝය. ඔවුන් අත තාල ගස්-
වල අතු[16] තිබිණ. **10** ඔවුහු මහත්
හඬින් නොනවත්වා මෙසේ කියති.
“අපට ගැලවීම ලැබෙන්නේ සිංහාස-
නය මත ඉඳගෙන සිටින[17] අපගේ දෙ-
විගෙන්[18] හා බැටළු පැටවාගෙන්ය.”[19]
**11** සියලු දේවදූතයෝ[20] සිංහාස-
නයද වැඩිමහල්ලන්ද[21] ජීවීන් හතර-
දෙනාද[22] වටා සිටගෙන සිටියෝය.
ඔවුහු සිංහාසනය ඉදිරියෙහි වැඳ
වැටී දෙවිට නමස්කාර කරමින්,[23]
**12** මෙසේ කීවෝය. “ආමෙන්! ස්තු-
තිය ලැබීමට සුදුසු අපගේ බල-
සම්පන්න[24] දෙවිට සදහටම සියලු
ප්‍රශංසාවත් ගෞරවයත් ප්‍රඥාවත් තේ-
ජසත් හිමි වේවා! ආමෙන්.”[25]
**13** එවිට එක් වැඩිමහල්ලෙක්,[26]
“සුදු වස්ත්‍ර පැළඳ සිටින මේ අය[27]
කවුද? ඔවුන් ආවේ කොතැනින්ද”

---

**20** මතෙ 25:31; හෙබ්‍රෙ 12:22; **21** එළි 11:16; **22** එළි 14:3; **23** ගීතා 95:6; **24** එළි 4:11; **25** හෙබ්‍රෙ 13:21; 1පේතෘ 4:11; 1පේතෘ 5:11; **26** එළි 4:4; **27** එළි 7:9.

කියා මාගෙන් ඇසුවේය. 14 “මාගේ
ස්වාමීනි, එය දන්නේ ඔබයි” කියා
මම වහාම පිළිතුරු දුන්නෙමි. එවිට
ඔහු මට මෙසේ කීවේය. “ඔවුන් මහත්
පීඩාවෙන් බේරී එන අයයි.[1] ඔවුන්
තම වස්ත්‍ර සෝදා සුදු කරගෙන
තිබෙන්නේ[2] බැටළු පැටවාගේ රුධිර-
යෙනි.[3] 15 ඔවුන් දෙවිගේ සිංහාස-
නය ඉදිරියෙහි[4] සිටින්නේ ඒ නිසාය.
ඔවුහු දිවා රෑ දෙකෙහි ඔහුගේ දේව-
මාලිගාවෙහි ඔහුට පරිශුද්ධ සේව-
යක් පිරිනමමින් සිටිති.[5] සිංහාසනය
මත ඉඳගෙන සිටින තැනැත්තා[6]
ඔවුන්ව ආරක්ෂා කිරීමට තම
කූඩාරම ඔවුන්ට ඉහළින් විහිදුවයි.[7]
16 ඔවුන්ට කුසගින්න හෝ පිපා-
සය නැවතත් දැනෙන්නේ නැත. දැඩි
සූර්ය රශ්මියකින්වත් දැවෙන රස්නය-
කින්වත් ඔවුන් තවදුරටත් පීඩා විඳින්-
නේ නැත.[8] 17 මන්ද සිංහාසනය
අසල සිටින බැටළු පැටවා[9] එඬේරෙකු
මෙන් ඔවුන්ව රැකබලා ගෙන[10] ඔවුන්ව
ජීවන වතුර ඇති උල්පත්වලට ගෙන
යන්නේය.[11] දෙවිද ඔවුන්ගේ ඇස්ව-
ලින් සියලු කඳුළු පිස දමන්නේය.”[12]

**8** ඔහු[13] හත්වෙනි මුද්‍රාව[14] කැඩූ විට
ස්වර්ගයෙහි පැය භාගයක පමණ
නිහඬතාවක් ඇති විය. 2 එවිට
දෙවි ඉදිරියෙහි සිටගෙන සිටින දේවදූ-
තයන් හත්දෙනාව[15] දැකගැනීමට මට
හැකි විය. ඔවුන්ට හොරණෑ හතක්
දෙන ලදි.

3 එවිට සුවඳ ද්‍රව්‍ය දැමීම සඳහා
රන් භාජනයක් රැගෙන තවත් දේවදූ-
තයෙක් ඇවිත් පූජාසනය ළඟ සිට-
ගත්තේය.[16] ඔහුට සුවඳ ද්‍රව්‍ය විශාල
ප්‍රමාණයක් දෙන ලදි.[17] ඔහුට ඒවා
දෙනු ලැබුවේ සියලු ශුද්ධ තැනැත්-
තන්ගේ යාච්ඤා සමඟ සිංහාසනය
ඉදිරියෙහි තිබුණු රන් පූජාසනය මත
ඒවා ඔප්පු කිරීම සඳහාය. 4 සුවඳ
ද්‍රව්‍යවල දුම දේවදූතයාගේ අතින්
ශුද්ධ තැනැත්තන්ගේ යාච්ඤා[18] සමඟ
දෙවි ඉදිරියට නැඟ ගියේය. 5 එම
දේවදූතයා වහාම ඒ සුවඳ ද්‍රව්‍ය දමන
භාජනය රැගෙන පූජාසනයෙන් ගත්
ගින්නෙන්[1] එය පුරවා එම ගින්න
පොළොවට හෙළුවේය.[2] එවිට ගිගු-
රුම්ද[3] කටහඬවල්ද විදුලි කෙටීම්ද[4]
භූමිකම්පාවක්ද ඇති විය.[5] 6 හො-
රණෑ[6] හත[7] අතැතිව සිටි දේවදූතයෝ
හත්දෙනාද ඒවා පිඹීමට සූදානම් වූහ.

7 පළමුවෙනියා තම හොරණෑව
පිම්බේය. එවිට ලේ මිශ්‍ර හිම කැට
සහ ගිනි වර්ෂාවක්[8] ඇති වූ අතර
ඒවා පොළොවට හෙළන ලදි. පො-
ළොවෙන් තුනෙන් කොටසක් දැවී
ගියේය.[9] ගස්වලින් තුනෙන් කොට-
සක්ද දැවී ගියේය. සියලු පැළෑටිද[10]
දැවී ගියේය.

8 දෙවෙනි දේවදූතයාද තම හො-
රණෑව පිම්බේය. එවිට ගින්නෙන්
ඇවිළෙන මහා කන්දක්[11] වැනි දෙ-
යක් මුහුදට හෙළන ලදි.[12] මුහුදෙන්
තුනෙන් කොටසක් ලේ බවට පත්
විය.[13] 9 මුහුදේ සිටින පණ ඇති
සතුන්ගෙන් තුනෙන් කොටසක් මිය
ගියෝය.[14] නැව්වලින් තුනෙන් කො-
ටසක්ද මුහුදුබත් විය.

10 තුන්වෙනි දේවදූතයාද තම
හොරණෑව පිම්බේය. එවිට මහත්
තාරකාවක් ඇවිළෙන ගිනි පන්ද-
මක් මෙන් අහසෙන් වැටුණේය.[15]
එය ගංගාවලින් තුනෙන් කොටසක්
පිටද දිය උල්පත් පිටද වැටුණේය.[16]
11 ඒ තාරකාව තිත්ත පල* යන
නමින් හැඳින්වෙයි. වතුරෙන් තුනෙන්
කොටසක්ද තිත්ත විය. ඒ වතුර
තිත්ත වූ නිසා[17] මිනිසුන්ගෙන් බො-
හෝදෙනෙක් එය පානය කිරීමෙන්
මිය ගියෝය.

12 හතරවෙනි දේවදූතයාද තම
හොරණෑව පිම්බේය. එවිට ඉරෙන්
තුනෙන් කොටසක්ද හඳෙන් තුනෙන්
කොටසක්ද තාරකාවලින් තුනෙන්
කොටසක්ද පහර ලැබීය. එසේ
වූයේ ඒවායෙන් තුනෙන් කොටසක්
අඳුරු වීම සඳහාත්[18] දිවා කාලයෙන්

**7 පරි.**
1 මතෙ 24:21 මාක් 13:19
2 යෙසා 1:18 යොහ 1:29
3 හෙබ්‍රෙ 9:14 හෙබ්‍රෙ 9:22 1යොහ 1:7 එළි 1:5
4 ගීතා 11:4
5 මතෙ 4:10 ලූක් 2:37
6 එළි 4:2
7 ගීතා 15:1 එළි 21:3
8 ගීතා 121:6 යෙසා 49:10
9 එළි 5:6
10 මතෙ 25:32 යොහ 10:11
11 එළි 22:1
12 යෙසා 25:8 එළි 21:4

**8 පරි.**
13 එළි 6:1
14 එළි 5:1
15 එළි 15:1
16 නික් 30:1 එළි 9:13
17 එළි 5:8
18 ගීතා 141:2 ලූක් 1:10 1පේත 4:7

**2 තීරුව**
1 යෙසා 6:6
2 ලූක් 12:49
3 නික් 19:16 එළි 4:5 එළි 10:4 එළි 16:18
4 ගීතා 97:4
5 එළි 6:12
6 ලෙවී 25:9 ගණන් 10:2
7 එළි 8:7 එළි 8:8 එළි 8:10 එළි 8:12 එළි 9:1 එළි 9:13 එළි 11:15
8 නික් 9:23 යෝවෙ 2:30
9 ද්වි 4:24 ගීතා 97:3 හෙබ්‍රෙ 12:29
10 යෙසා 40:6
11 යෙරෙ 51:25
12 ගීතා 65:7 යෙසා 17:13 යෙසා 57:20
13 නික් 7:20
14 එළි 16:3
15 යෙසා 14:12 ලූක් 10:18 2කොරි 11:14
16 එළි 16:4

17 හිතෝ 25:26; ආමො 5:7; ආමො 6:12; 18 නික් 10:22.

එළි 8:11* තිත්ත විෂ ද්‍රව්‍යයක් සඳහා භාවිත කෙරේ.

තුනෙන් කොටසකට හා රාත්‍රියෙන්
තුනෙන් කොටසකට[1] ආලෝකය
නොලැබීම සඳහාත්ය.

**13** මා තවත් බැලූ විට අහස
මැද[2] පියාසර කරන රාජාලියෙකු[3]
මහත් හඬකින් මෙසේ කියනවා මට
ඇසිණ. “හොරණෑ පිඹීමට සූදානමින්
සිටින ඉතුරු දේවදූතයන් තුන්දෙනා-
ගේ හොරණෑ ශබ්ද නිසා[4] පොළො-
වේ වාසය කරන අයට මොන තරම්
දරුණු විපතකට මුහුණ දෙන්න සිදු
වේද! ඒ විපත මොන තරම් දරුණුද!
එය ඉතා දරුණුය.”[5]

**9** පස්වෙනි දේවදූතයාද තම හොර-
ණෑව පිම්බේය.[6] එවිට අහසෙන්
පොළොවට වැටුණු තාරකාවක්[7] මම
දුටුවෙමි. අගාධයේ[8] යතුරද[9] එයට*
දෙන ලදි. **2** වසා තිබූ ඒ අගාධය
ඔහු විවෘත කළේය. එවිට මහත් උදු-
නක දුමක්[10] හා සමාන දුමක්[11] ඒ
අගාධයෙන් නැඟී ආවේය. ඒ දුමෙන්
ඉරත් අවට පරිසරයත් අඳුරු විය.[12]
**3** ඒ දුමෙන් පළඟැටියෝ[13] පොළොව
මතට ආවෝය. පොළොවේ සිටින
ගෝනුස්සන්ට[14] තිබෙන බලය හා
සමාන බලයක් උන්ට දෙන ලදි.
**4** පොළොවේ පැළෑටිවලටත් කිසිම
ශාකයකටත් කිසිම ගසකටත් අන-
තුරු නොකර තම නළල්වල දෙවිගේ
මුද්‍රාව නැති මිනිසුන්ට පමණක් අන-
තුරු කරන්න කියා උන්ට අණ කරන
ලදි.[15]

**5** මාස පහකට ඔවුන්ට වධ දීමට[16]
එම පළඟැටියන්ට අවසර ලැබිණ.
නමුත් ඔවුන්ව මරා දැමීමට උන්ට
අවසර දුන්නේ නැත. ඔවුන්ට දැනෙන
වේදනාව මිනිසෙකුට ගෝනුස්සෙකු[17]
ඇන්න විට දැනෙන වේදනාව හා
සමාන විය. **6** ඒ දවස්වලදී මිනිසුන්
මිය යෑමට කැමැත්තෙන් සිටියත්[18]
මිය යෑමට ඔවුන්ට හැකි වන්නේ
නැත. මිය යෑමට ඔවුන් මහත් ආශා-
වකින් සිටියත් මරණය ඔවුන්ගෙන්
පලා යනු ඇත.

**7** පළඟැටියන්ගේ පෙනුම යුද්ධ-
යට සූදානමින් සිටින අශ්වයන්ට
සමානය.[1] උන්ගේ හිස් මත රන්
ඔටුනුවලට සමාන යමක් තිබිණ.
උන්ගේ මුහුණු පුරුෂයන්ගේ මුහුණු
හා සමාන විය.[2] **8** නමුත් ස්ත්‍රීන්ට
සමාන කෙස් කළඹක් උන් සතු විය.[3]
උන්ගේ දත් සිංහයන්ගේ දත් මෙනි.[4]
**9** උන් යකඩ ළයවැසුම් හා සමාන
ළයවැසුම්[5] පැළඳ සිටියෝය. උන්-
ගේ පියාපත්වල ශබ්දය යුද්ධය සඳහා
දිව යන අශ්ව රථ රාශියක ශබ්දයට
සමානය.[6] **10** උන්ට ගෝනුස්සන්ට
මෙන් වලිග සහ විෂ තුඩවල් තිබේ.[7]
උන්ගේ බලය තිබුණේ උන්ගේ වලි-
ගවලය. ඒ මාස පහක් පුරා මිනි-
සුන්ට අනතුරු කිරීමටය. **11** උන්ට
රජෙක් සිටියි. ඒ අගාධයේ දේවදූ-
තයාය.[8] හෙබ්‍රෙව් භාෂාවෙන් ඔහුගේ
නම අබද්දොන්ය. ග්‍රීක භාෂාවෙන් එය
අපොලියොන්ය.[9]

**12** එක විපතක් අවසන් වී ඇත.
බලන්න! ඉන්පසු තවත් විපත් දෙ-
කක්[10] පැමිණෙනු ඇත.

**13** හයවෙනි දේවදූතයා[11] තම
හොරණෑව පිම්බේය.[12] එවිට දෙවි ඉදි-
රියෙහි තිබෙන රන් පූජාසනයෙහි[13] අං
අතරින් මට හඬක් ඇසිණ.[14] **14** එම
හඬ හොරණෑව අතැතිව සිටි හය-
වෙනි දේවදූතයාට මෙසේ පැවසු-
වේය. “යුප්‍රටීස් නමැති මහ ගඟ
ළඟ[15] බැඳ සිටින[16] දේවදූතයන් හත-
රදෙනාව ලිහා දමන්න.”[17] **15** එවිට
නියමිත අවුරුද්ද, මාසය, දවස සහ
පැයේදී මිනිසුන්ගෙන් තුනෙන් කොට-
සක් මරා දැමීම සඳහා සූදානම් කරනු
ලැබූ දේවදූතයන් හතරදෙනාව ලිහා
දමන ලදි.

**16** අශ්වාරෝහක හමුදාවේ සේවා-
යන්ගේ ගණන විසිදහස් වර දසදහ-
සක් විය. ඒ ගණන ප්‍රකාශ කරනවා
මට ඇසිණ. **17** දර්ශනයේ මා දුටු
අශ්වයන්ද උන් පිට ඉඳගෙන සිටි
අයද මෙලෙසය. ඔවුහු ගිනි මෙන්
රතු පැහැති, හයසින්ත් මෙන් නිල්
පැහැති, ගෙන්දගම් මෙන් කහ පැහැති

**8 පරි.**
1 යෙසා 60:2
එෆී 6:12
කොලො 1:13
2 අදි 4:11
එළි 14:6
එළි 19:17
3 යෝබ් 39:29
4 එළි 8:2
5 එළි 9:12
එළි 11:14

**9 පරි.**
6 එළි 8:2
7 ගණන් 24:17
එළි 22:16
8 ලූක් 8:31
එළි 9:11
9 එළි 20:1
10 උත් 19:28
11 නික් 19:18
යෝවෙ 2:30
12 යෝවෙ 2:2
යෝවෙ 2:10
13 නික් 10:4
නික් 10:12
14 අදි 8:15
ලූක් 11:12
15 එළි 7:3
16 එළි 16:9
එළි 18:7
17 එළි 9:10
18 යෝබ් 3:21
එළි 6:16

**2 තීරුව**
1 යෝවෙ 2:4
2 යෝවෙ 2:6
3 1කොරි 11:15
එෆී 5:24
4 යෝවෙ 1:6
5 එෆී 6:14
1තෙස 5:8
2තිමෝ 2:3
6 යෝවෙ 2:5
2කොරි 10:4
7 එළි 9:5
8 එළි 9:1
එළි 20:1
9 ලූක් 4:34
එළි 19:15
10 එළි 8:13
11 එළි 8:6
12 එළි 11:15
13 එළි 8:3
14 එළි 1:12
15 උත් 2:14
එළි 16:12
එළි 17:15
16 ගීතා 102:20
ගීතා 137:1
ගීතා 142:7
යෙසා 42:7
යෙසා 49:9
17 ගලා 4:14

එළි **9:1*** මූ.අ., “ඔහුට.”

ළයවැසුම් පැළඳ සිටියෝය. අශ්-
වයන්ගේ හිස් සිංහයන්ගේ හිස්ව-
ලට සමානය.[1] උන්ගේ කටවල්වලින්
ගින්දරද දුම්ද ගෙන්දගම්ද[2] නික්-
මුණේය. **18** උන්ගේ කටවල්වලින්
නික්මුණු ගින්නෙන්ද දුමෙන්ද ගෙන්ද-
ගම්වලින්ද යුත් ප්‍රහාර තුනෙන් මිනි-
සුන්ගෙන් තුනෙන් කොටසක් මරනු
ලැබීය. **19** මන්ද ඒ අශ්වයන්ගේ
බලය තිබෙන්නේ උන්ගේ කටවල්ව-
ලත් උන්ගේ වලිගවලත්ය. උන්ගේ
වලිග සර්පයන්[3] හා සමානය. ඒවාට
හිස්ද තිබේ. ඒවායින් උන් අනතුරු
කරති.

**20** නමුත් ඒ පීඩාවලින් නො-
මැරී ඉතුරු වූ මිනිස්සු තමන් කළ
දේවල් ගැන පසුතැවිලි නොවූහ.[4]
ඔවුහු දිගටම භූතයන්ටද[5] ඇසීමට-
වත් දැකීමටවත් ඇවිදීමටවත් නො-
හැකි[6] රන්, රිදී, තඹ, ගල් සහ ලීවලින්
සෑදූ දේවතා රූපවලටද[7] නමස්කාර
කළෝය. **21** ඔවුහු තමන් කළ මිනී
මැරීම්[8] ගැනවත් භූතවාදී ක්‍රියා[9] ගැන-
වත් වේශ්‍යාකම්* ගැනවත් සොරකම්
ගැනවත් පසුතැවිලි නොවූහ.

**10** එවිට මම තවත් ශක්ති-
මත් දේවදූතයෙකු[10] වලා-
කුළක් පැළඳ[11] ස්වර්ගයෙන් බැස
එන ආකාරය දුටුවෙමි. ඔහුගේ හිස
මත දේදුන්නක් තිබුණු අතර ඔහු-
ගේ මුහුණ ඉර මෙන්ද[12] ඔහුගේ පාද[13]
ගිනිමය කණු මෙන්ද විය. **2** ඔහු-
ගේ අතේ දිගහරින ලද කුඩා ලියවිල්-
ලක් තිබිණ. ඔහු තම දකුණු පාදය
මුහුද මතද වම් පාදය පොළොව
මතද තබා,[14] **3** සිංහයෙකු ගොර-
වන්නා සේ[15] මහ හඬින් කෑගැසුවේය.
ඔහු කෑගැසූ විට ගිගුරුම් හතද[16] හඬ
නැඟුවේය.

**4** ඒ ගිගුරුම් හත කතා කළ
විට ඒ දේවල් ලිවීමට මම සූදානම්
වුණෙමි. නමුත්, "ගිගුරුම් හත පැවසූ
දේවල් මුද්‍රා කර තබන්න.[1] ඒවා නො-
ලියන්න" කියා පවසන හඬක් මට
ස්වර්ගයෙන් ඇසිණ.[2] **5** එවිට මුහුද
සහ පොළොව මත සිටගෙන සිටි-
නවා මා දුටු දේවදූතයා තම දකුණත
ස්වර්ගය දෙසට ඔසවා,[3] **6** ස්වර්ග-
යත් එහි තිබෙන දේවලුත් පොළො-
වත් එහි තිබෙන දේවලුත්[4] මුහුදත්
එහි තිබෙන දේවලුත් සෑදූ,[5] සදහටම[6]
ජීවත් වන[7] තැනැත්තාණන්ගේ නාම-
යෙන් දිවුරා මෙසේ පැවසුවේය. "තව-
දුරටත් කිසි ප්‍රමාදයක් සිදු නොවේ.[8]
**7** හත්වෙනි දේවදූතයා[9] ශබ්ද නඟන
දවස්වලදී මෙසේ සිදු වන්නේය. ඔහු
තම හොරණෑව පිඹීමට සූදානම් වන
විට[10] දෙවිගේ පරිශුද්ධ රහසට[11] ඇතු-
ළත් දේවල් සම්පූර්ණයෙන්ම ඉටු වනු
ඇත. දෙවි තම දාසයන් වන අනාග-
තවක්තෘවරුන්ට[12] ප්‍රකාශ කළ ශුභා-
රංචිය එයයි."

**8** එවිට ස්වර්ගයෙන් මට ඇසුණු
හඬ[13] නැවතත් මට මෙසේ පැවසු-
වේය. "ගොස්, මුහුද සහ පොළොව
මත සිටගෙන සිටින දේවදූතයාගේ
අතේ තිබෙන දිගහරින ලද ලිය-
විල්ල ගන්න."[14] **9** මමද දේවදූතයා
වෙතට ගොස් කුඩා ලියවිල්ල මට
දෙන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියෙමි.
ඔහුද, "එය රැගෙන කන්න.[15] එය
ඔබේ කටට මීපැණි මෙන් මිහිරි වෙයි.
නමුත් එය ඔබේ උදරය තිත්ත කරයි"
කියා මට පැවසුවේය. **10** මම දේව-
දූතයාගේ අතින් ඒ කුඩා ලියවිල්ල
රැගෙන කෑවෙමි.[16] එය මගේ කටට
මීපැණි මෙන්[17] මිහිරි වුවත් එය
කෑමෙන් පසු මගේ උදරය තිත්ත විය.
**11** එවිට මට මෙසේ පවසන ලදි. "ඔබ
ජනයා ගැනද ජාතීන් ගැනද විවිධ
භාෂා කතා කරන අය ගැනද බොහෝ
රජවරුන් ගැනද නැවතත් අනාවැකි
පැවසිය යුතුයි."[18]

**11** ඔහු මට සැරයටියක් හා
සමාන බට දණ්ඩක්[19] දෙ-
මින් මෙසේ පැවසුවේය. "නැඟිට දෙ-
විගේ මාලිගාවද[20] පූජාසනයද එහි
නමස්කාර කරන අයවද මනින්න.

**9 පරි.**
1 1ලේක 12:8, හිතෝ 28:1
2 ගීතා 11:6
3 යෙරෙ 8:17
4 ද්වි 31:29, යෙරෙ 5:3
5 ද්වි 32:17, ගීතා 106:37, 1කොරි 10:20
6 යෙසා 44:9, යෙරෙ 10:5, දානි 5:23
7 ගීතා 115:4, ගීතා 135:15
8 නික් 20:13
9 ගලා 5:20

**10 පරි.**
10 දානි 10:21, යූද් 9, එළි 12:7
11 දානි 7:13, එළි 1:7
12 මලා 4:2, මතෙ 17:2
13 එළි 1:15
14 හෙබ්‍රෙ 2:8
15 හිතෝ 20:2, එළි 5:5
16 නික් 19:16, එළි 4:5, එළි 11:19

**2 තීරුව**
1 දානි 12:4
2 එළි 10:8
3 දානි 12:7
4 උත් 14:19
5 නික් 20:11, නෙහෙ 9:6, ගීතා 146:6, ක්‍රියා 4:24
6 ගීතා 90:2, 1තිමෝ 1:17, එළි 4:9
7 යෙරෙ 10:10
8 යෙසා 46:13, එස 12:25, හබ 2:3
9 එළි 8:6
10 එළි 11:15
11 මාක් 4:11
12 ආමො 3:7
13 එළි 10:4
14 එළි 10:2
15 එස 2:8
16 යෙරෙ 15:16
17 ගීතා 119:103, එස 3:3
18 යෙරෙ 1:10

**11 පරි.**
19 එස 40:3
20 1කොරි 3:16, 2කොරි 6:16, එෆී 2:21, 1පේත 2:5, 1පේත 4:17

එළි **9:21*** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න.

**2** නමුත් දේවමාලිගාවේ ශුද්ධස්ථා-
නයෙන් පිටත පිහිටි මළුව[1] වෙනත්
ජාතීන්ට දී ඇති නිසා[2] එය මනින්නේ
නැතුව සම්පූර්ණයෙන්ම අත්හරින්න.
ඔවුහු මාස හතළිස්දෙකක් පුරා[3] ශුද්ධ
නුවර පාගා දමන්නෝය.[4] **3** මම
මාගේ සාක්ෂිකරුවන් දෙදෙනාට[5]
ගෝණි රෙදි ඇඳගෙන දවස් එක්ද-
හස් දෙසිය හැටක්[6] අනාවැකි කීමට
සලස්වන්නෙමි."[7] **4** ඔලීව ගස් දෙ-
කෙන්[8] හා පහන් රුක් දෙකෙන්[9]
ඔවුන්ව නියෝජනය වේ. ඔවුන් සිට-
ගෙන සිටින්නේ පොළොවේ ස්වාමීන්
ඉදිරියෙහිය.[10]

**5** යමෙක් ඔවුන්ට අනතුරු කිරී-
මට සූදානම් වුවහොත් ඔවුන්ගේ කට-
වල්වලින් ගින්දර පිට වී ඔවුන්ගේ
සතුරන්ව නාස්ති කර දමන්නේය.[11]
යමෙක් ඔවුන්ට අනතුරු කිරීමට
සූදානම් වුවහොත් ඒ තැනැත්තාව
මරා දමනු ලබන්නේ එයාකාරයටය.
**6** ඔවුන් අනාවැකි කියන කාලයේදී
වැසි නොවැසීම සඳහා[12] අහසේ කවුළු
වසා තැබීමට ඔවුන්ට බලය තිබේ.[13]
එලෙසම තමන් කැමති ඕනෑම අවස්-
ථාවක වතුර ලේ කිරීමේ බලයද[14]
සියලු ආකාර පීඩාවලින් පොළොවට
පහර දීමේ බලයද ඔවුන් සතුය.

**7** ඔවුන් තම සාක්ෂි දැරීමේ කාර්-
යය අවසන් කළ විට අගාධයෙන්
නැඟී එන මෘගයා[15] ඔවුන්ට විරුද්ධව
යුද්ධ කර ඔවුන්ව පරාජය කර ඔවුන්ව
මරා දමන්නේය.[16] **8** ඔවුන්ගේ මළ
සිරුරු මහත් නුවරේ ප්‍රධාන වීදියේ
දක්නට ලැබේ. ඒ නුවර නම් සංකේත-
වත් ලෙස සොදොම්[17] සහ ඊජිප්තුව
යනුවෙන් හඳුන්වනු ලබන ඔවුන්-
ගේ ස්වාමීන්ව වධකණුවක ඇණ
ගැසූ ස්ථානයයි.[18] **9** විවිධ ජනයන්-
ගෙන්ද ගෝත්‍රවලින්ද භාෂාවලින්ද
ජාතීන්ගෙන්ද පැමිණි මනුෂ්‍යයෝ[19]
ඔවුන්ගේ මළ සිරුරු දෙස දවස් තුන-
හමාරක් පුරා[20] බලා සිටිනු ඇත. එම
මළ සිරුරු සොහොන් ගෙයක තැන්-
පත් කිරීමට ඔවුහු ඉඩ දෙන්නේ නැත.
**10** ඒ අනාගතවක්තෘවරුන් දෙදෙනා
පොළොවේ වාසය කරන අයට වධ
දුන් නිසා පොළොවේ වාසය කරන
අය ඔවුන් ගැන ප්‍රීති වී[1] විනෝද වෙ-
මින් එකිනෙකාට තෑගි යවන්නෝය.[2]

**11** ඒ දවස් තුනහමාරට පසු[3] දෙවි
ලබා දෙන ජීව බලය ඔවුන් තුළට
ඇතුල් වී[4] ඔවුහු නැඟිට සිටියෝය.
ඔවුන්ව දුටු අය බොහෝ සෙයින්
බියපත් වූහ. **12** එවිට ස්වර්ගයෙන්
පැමිණි මහත් හඬක්,[5] "මෙතැනට
නැඟ එන්න"[6] කියා පවසනවා ඔවුන්ට
ඇසේ. ඔවුන් වලාකුළු අතරින් ස්වර්-
ගයට නැඟ ගිය අතර ඔවුන්ගේ
සතුරෝද ඔවුන්ව දුටුවෝය. **13** ඒ
පැයේදී මහත් භූමිකම්පාවක් ඇති විය.
ප්‍රතිඵලයක් ලෙස නුවරින් දහයෙන්
කොටසක්[7] කඩා වැටුණු අතර ඒ භූමි-
කම්පාවෙන් මිනිසුන් හත්දහසක් මිය
ගියෝය. ඉතුරු අය බියපත් වී ස්වර්ග-
යේ දෙවිට ගෞරවය දුන්නෝය.[8]

**14** දෙවෙනි විපත[9] අවසන්ය.
නමුත් බලන්න! තුන්වෙනි විපත ඉක්-
මනින් පැමිණෙනු ඇත.

**15** හත්වෙනි දේවදූතයා තම හො-
රණෑව පිම්බේය.[10] එවිට ස්වර්ගයෙහි
මහත් හඬවල් ඇසිණ. ඒ හඬවල් පැව-
සුවේ මෙයයි. "මෙලොවෙහි පාලනය
දැන් අපගේ ස්වාමීන්[11] හා ඔහුගේ
ක්‍රිස්තුස්[12] සතු වී ඇත. ඔහු සදාකාල-
යටම රජකම් කරන්නේය."[13]

**16** දෙවි ඉදිරියෙහි තම සිංහා-
සන මත ඉඳගෙන සිටින වැඩිම-
හල්ලෝ විසිහතරදෙනා[14] වැඳ
වැටී[15] දෙවිට නමස්කාර කරමින්,[16]
**17** මෙසේ පැවසුවෝය. "සියලු
බලැති තැනැත්තාද[17] සිටින්නාවූ[18]
සිටියාවූ තැනැත්තාද වන යෙහෝවා
දෙවියනි, ඔබ ඔබේ මහත් බලය
අතට ගෙන[19] රජකම් කරන්න පටන්-
ගත් නිසා[20] අපි ඔබට ස්තුති කරන්-
නෙමු.[21] **18** නමුත් ජාතීහු උදහස්
වූහ. ඔබද උදහස් වී ඇත. එලෙසම
මිය ගිය අයව විනිශ්චය කිරීමටත්

**11 පරි.**

**1** එස 40:17
**2** ලූක් 21:24
**3** එළි 13:5
**4** හෙබ්‍රෙ 12:22
එළි 21:2
**5** යොහ 8:17
**6** ගීතා 69:11
**7** ක්‍රියා 2:17
එළි 19:10
**8** සෙක 4:3
සෙක 4:11
**9** සෙක 4:12
මතෙ 5:14
**10** සෙක 4:14
**11** යෙරෙ 5:14
**12** 1රාජා 17:1
යාකො 5:17
**13** ලූක් 4:25
**14** උත් 9:4
නික් 7:19
ක්‍රියා 15:20
**15** එළි 13:1
**16** එළි 2:10
එළි 2:13
එළි 12:17
**17** යෙසා 1:10
**18** ලූක් 13:33
හෙබ්‍රෙ 13:12
**19** එළි 13:7
එළි 17:15
**20** එළි 11:11

**2 තීරුව**

**1** ගීතා 35:15
හිතෝ 24:17
**2** ලූක් 23:12
**3** එළි 11:9
**4** එස 37:5
**5** ගීතා 29:4
**6** ගීතා 50:5
ගීතා 147:2
එළි 4:1
**7** යෙසා 6:13
**8** යෙසා 26:16
**9** එළි 9:12
**10** එළි 8:6
**11** 1ලේක 29:11
ගීතා 22:28
ගීතා 97:1
දානි 4:17
දානි 4:34
එළි 12:10
**12** ගීතා 2:6
එස 21:27
දානි 7:13
ලූක් 1:33
ලූක් 22:29
2පේත්‍ර 1:11
**13** ගීතා 145:13
දානි 2:44
**14** එළි 4:10
එළි 14:3
**15** ගීතා 95:6
**16** එළි 7:11
**17** නික් 6:3
ආමො 4:13
එළි 16:7
**18** නික් 3:14
එළි 1:4
එළි 16:5

**19** නික් 9:16; යෝබ් 37:23; යෙසා 40:26; රෝම 9:17; එළි 4:11; **20** ගීතා 99:1; සෙක 14:9; එළි 19:6; **21** යෙසා 12:1.

ඔබේ දාසයන් වන අනාගතවක්තෘව-
රුන්ටද[1] ශුද්ධ තැනැත්තන්ටද ඔබේ
නාමයට ගරුබිය දක්වමින් සිටින
සියලු තරාතිරම්වල අයටද[2] ආශීර්-
වාද කිරීමටත්[3] පොළොව විනාශ කර
දමන අයව[4] විනාශ කර දැමීමටත්[5]
නියමිත කාලය පැමිණියේය.”
**19** එවිට ස්වර්ගයෙහි තිබෙන දෙ-
විගේ මාලිගාව[6] විවෘත කරනු ලැබීය.
ඔහුගේ ගිවිසුම් පෙට්ටිය[7] ඔහුගේ
මාලිගාවේ තිබෙන ආකාරය දක්නට
ලැබිණ.[8] එවිට විදුලි කෙටීම්ද කට-
හඬවල්ද ගිගුරුම්ද භූමිකම්පාවක්ද
මහ හිම කැට වර්ෂාවක්ද ඇති විය.

**12** ස්වර්ගයෙහි මහත් ලකුණක්[9]
දකින ලදි. එහි සූර්යයා-
ගෙන් සැරසී සිටි ස්ත්‍රියක්[10] සිටි-
යාය. ඇගේ පාද යට සඳද ඇගේ
හිස මත තාරකා දොළොසකින් යුත්
ඔටුන්නක්ද තිබිණ. **2** ඇය ගැබ්-
ගෙන සිටියාය. ප්‍රසව වේදනාවෙන්
සිටි ඇය, මහත් හඬකින් මොරගස-
මින් සිටියාය.[11]
**3** ස්වර්ගයෙහි තවත් ලකුණක්
දකින ලදි. බලන්න, හිස් හතක්ද
අං දසයක්ද හිස් මත ඔටුනු හතක්ද
ඇති ගිනි පැහැති මහා මකරෙකු
දක්නට ලැබිණ.[12] **4** ඌ තම වලි-
ගයෙන්[13] ස්වර්ගයෙහි පිහිටි තාර-
කාවලින් තුනෙන් කොටසක් ඇද[14]
පොළොවට හෙළාදැමුවේය.[15] ස්ත්‍රිය
දරුවා බිහි කළ විට ඇගේ දරුවාව කා
දැමීමේ අදහසින්[16] ඒ මකරා දරුවා
බිහි කිරීමට සිටි[17] ස්ත්‍රිය ඉදිරියෙහි
බලා සිටියේය.[18]
**5** ඇය බිහි කළේ පුතෙකුය.[19] ඔහු
යකඩ දණ්ඩකින්[20] සියලු ජාතීන්ව
පාලනය කිරීමට නියමිත කෙනෙකි.
ඇගේ දරුවා දෙවි වෙතටත් ඔහු-
ගේ සිංහාසනය වෙතටත් ඔසවාගනු
ලැබීය.[21] **6** ඉන්පසු ඒ ස්ත්‍රිය පාළු-
කරයට පලා ගියාය.[22] එහි ඇය සඳහා
ස්ථානයක් දෙවි විසින් සූදානම් කර
තිබිණ. එසේ කළේ ඇයව එක්දහස්
දෙසියය හැට දවසක්[23] එතැනදී පෝෂ-
ණය කිරීම සඳහාය.[24]

**7** ස්වර්ගයෙහි යුද්ධයක් ඇති විය.
මිකායෙල්[1] සහ ඔහුගේ දූතයෝ මක-
රාට විරුද්ධව යුද්ධ කළෝය. මකරා
සහ උගේ දූතයන් යුද්ධ කළත්,
**8** ඌ ජය ගත්තේ නැත. එතැන්
පටන් ඔවුන්ට ස්වර්ගයෙහි තිබුණු
ස්ථානය අහිමි විය. **9** එහෙයින් ඒ
මහත් මකරාව[2] පහතට හෙළනු ලැබු-
වේය. ඒ මකරා නම් යක්ෂයා[3] කියාද
සාතන්[4] කියාද හඳුන්වන මුළු පො-
ළොවම නොමඟ යවන[5] මුල් සර්-
පයාය.[6] ඔහුව පොළොවට හෙළන
ලදි.[7] ඔහුගේ දූතයෝද ඔහු සමඟ පහ-
තට හෙළනු ලැබුවෝය. **10** ඉන්පසු
ස්වර්ගයෙහි මහත් හඬක් මට ඇසිණ.
ඒ හඬ මෙසේ පැවසුවේය.
“බලන්න, අපගේ දෙවි මිනිසුන්ට
ගැලවීම ලබා දී ඇත.[8] ඔහුගේ බලය
තහවුරු වී ඇත.[9] ඔහුගේ රාජ්‍යයද
පිහිටුවා හමාරය.[10] ඔහුගේ ක්‍රිස්තුස්-
ගේ බලය මෙතැන් සිට ක්‍රියාත්-
මක වේ.[11] මන්ද අපගේ දෙවි ඉදිරියේ
අපගේ සහෝදරයන්ට විරුද්ධව දිවා
රෑ දෙකෙහි නොකඩවා චෝදනා එල්ල
කරන තැනැත්තාව පහතට හෙළා
ඇත.[12] **11** ඔවුහු බැටළු පැටවා-
ගේ රුධිරය නිසාද[13] තමන් සාක්ෂි
දැරූ පණිවිඩය නිසාද[14] ඔහුව පරා-
ජය කර ජය ගත්තේය.[15] ඔවුන්
මරණයේ අබියසට පවා පැමිණියත්
තම ජීවිත රැකගැනීමට ඔවුන් ක්‍රියා
කළේ නැත.[16] **12** ඒ නිසා ස්වර්-
ගයද එහි වාසය කරන සියල්ලන්ද
ප්‍රීති වන්න![17] නමුත් පොළොවටත්
මුහුදටත් මොන තරම් දරුණු විපත-
කට මුහුණ දෙන්න සිදු වේද![18] මන්ද
තමාට ඉතුරු වී ඇත්තේ ඉතා කෙටි

**11 පරි.**
**1** හොෂෙ 12:10 ආමො 3:7 මතෙ 2:23 ක්‍රියා 3:18 රෝම 1:2 හෙබ්‍රෙ 1:1 යාකො 5:10 1පේතෘ 1:10
**2** ගීතා 115:13 ක්‍රියා 26:22
**3** 1තෙස 4:16 හෙබ්‍රෙ 11:6 එළි 14:13
**4** උත් 6:11 ගීතා 53:1 යෙරෙ 6:28 යෙරෙ 51:25 ශෙප 3:7
**5** යෙසා 6:11 යෙරෙ 4:7 යෙරෙ 26:18 මීකා 3:12
**6** එළි 14:17
**7** 1රාජා 8:1 ගීතා 132:8
**8** හබ 2:20 හෙබ්‍රෙ 8:2 හෙබ්‍රෙ 9:11

**12 පරි.**
**9** එළි 1:1
**10** යෙසා 54:1 යෙසා 54:5 ගලා 4:26
**11** උත් 3:16
**12** එළි 12:9 එළි 20:2
**13** යෙසා 9:15
**14** උත් 6:2 යෝබ් 38:7 2කොරි 11:15
**15** 2පේතෘ 2:4 යූද් 6
**16** යෙරෙ 51:34
**17** යෙසා 66:9
**18** උත් 3:15
**19** එළි 11:15
**20** ගීතා 2:9 ගීතා 110:2 එළි 19:15
**21** ගීතා 2:6 ගීතා 110:1
**22** ගීතා 55:7
**23** එළි 11:3 එළි 12:14
**24** 1රාජා 19:6 හිතෝ 30:8

**2 තීරුව**
**1** දානි 10:13 දානි 12:1 යූද් 9
**2** එළි 12:3 එළි 20:2
**3** මතෙ 4:1 යොහ 8:44 හෙබ්‍රෙ 2:14 යාකො 4:7 1පේතෘ 5:8

**4** 1ලේක 21:1; යෝබ් 1:6; සෙක 3:2; මතෙ 4:10; යොහ 13:27; රෝම 16:20; 2තෙස 2:9; **5** 2කොරි 4:4; 2කොරි 11:14; එෆී 2:2; 1යොහ 5:19; **6** උත් 3:1; 2කොරි 11:3; එළි 12:14; **7** ලූක් 10:18; එළි 12:13; **8** ගීතා 118:14; ලූක් 1:69; රෝම 13:11; 2කොරි 6:2; හෙබ්‍රෙ 9:28; 1පේතෘ 1:5; **9** එළි 11:17; **10** එළි 11:15; **11** මතෙ 24:30; මතෙ 25:32; 2කොරි 5:10; එෆී 1:10; 1තෙස 4:16; **12** යෝබ් 1:9; සෙක 3:1; **13** 1පේතෘ 1:19; **14** ක්‍රියා 1:8; 2තිමෝ 1:8; එළි 1:9; එළි 19:10; **15** 1යොහ 2:14; **16** මතෙ 16:25; ලූක් 14:26; ක්‍රියා 20:24; **17** ක්‍රියා 7:53; හෙබ්‍රෙ 12:22; එළි 13:6; **18** එළි 8:13.

කාල පරිච්ඡේදයක් බව දැන සිටින[1]
යක්ෂයා, මහත් කෝපයෙන් ඔබ වෙ-
නට බැස ඇවිත් සිටියි.”[2]
**13** තමාව පොළොවට හෙළා ඇති
බව[3] මකරා දුටු විට ඌ පිරිමි දරුවා
බිහි කළ ඒ ස්ත්‍රියට පීඩා කළේය.[4]
**14** නමුත් මහත් රාජාලියෙකුගේ[5]
පියාපත් දෙකක් ඒ ස්ත්‍රියට දෙන ලදි.
එමගින් පාළුකරයෙහි ඇයට හිමි ස්ථා-
නයට පියඹා යෑමට ඇයට හැකි විය.[6]
ඇය සර්පයා වෙතින් ඉවත්ව ගිය පසු[7]
එක් කාලයකටත් කාලවල් දෙකක-
ටත් කාල භාගයකටත්[8] ඇයව පෝෂ-
ණය කරනු ලබන්නේ එතැනදීය.[9]
**15** එවිට සර්පයා තම කටින්
ගංගාවක් තරම් වූ ජල කන්දරාවක්
පිට කළේය.[10] එසේ කළේ එම ගංගා-
වෙන් ස්ත්‍රියව සම්පූර්ණයෙන්ම යට
කර දැමීමටය.[11] **16** නමුත් ඒ ස්ත්‍රි-
යගේ උපකාරයට පොළොව ක්‍රියාත්-
මක විය.[12] පොළොව තම කට ඇර
මකරා තම කටින් පිට කළ ගංගාව
ගිල දැම්මේය. **17** එවිට මකරා
ස්ත්‍රිය කෙරෙහි උදහස් වී[13] දෙවිගේ
ආඥා පිළිපදින, යේසුස් ගැන සාක්ෂි
දැරීමේ කාර්යය සතු[14] ඇගේ පෙළප-
තට අයත් ඉතුරු අයට විරුද්ධව යුද්ධ
කිරීමේ අදහසින් පිටත්ව ගියේය.

**13** ඌ මුහුද අසල වැල්ලේ සිටි-
යේය.[15]
එවිට මම අං දසයක්ද[16] හිස්
හතක්ද[17] ඇති මෘගයෙකු[18] මුහුදෙන්
මතු වන ආකාරය දුටුවෙමි.[19] උගේ
අං මත ඔටුනු දසයක්ද උගේ හිස්
මත දෙවිට අපහාසයක් ගෙන දෙන[20]
නම්ද සටහන් වී තිබිණ. **2** මා දුටු
මෘගයා දිවියෙකු වැනිය.[21] නමුත්
උගේ පාද වලසෙකුගේ පාද මෙන්ද[22]
උගේ කට සිංහයෙකුගේ[23] කට මෙන්ද
විය. මකරා[24] ඒ මෘගයාට තමාගේ
බලයත් තමාගේ සිංහාසනයත් මහත්
අධිකාරියත් දුන්නේය.[25]
**3** උගේ හිස්වලින් එකකට මරු
පහරක්[26] එල්ල වී තිබූ ආකාරය මට
පෙනිණ. නමුත් ඌට එල්ල වී තිබූ
මරු පහර පසුව සුව විය. මුළු පො-
ළොවම ගෞරවයෙන් යුතුව ඒ මෘගයා
පසුපස ගියේය. **4** මකරා, මෘගයාට
අධිකාරිය දුන් නිසා ඔවුහු මකරාට
නමස්කාර කළෝය. එසේම, “මෘග-
යාට සමාන කවුද? ඌට විරුද්ධව
යුද්ධ කළ හැක්කේ කාටද” යන වචන
පවසමින් ඔවුහු මෘගයාටද නමස්-
කාර කළෝය. **5** එලෙසම පුරසා-
රම් දෙඩීමට[1] හා දෙවිට අපහාස ගෙන
දෙන දේවල් පැවසීමට[2] හැකි කටක්
ඌට දෙන ලදි. මාස හතළිස්දෙ-
කකට[3] අධිකාරියද ඌට දෙන ලදි.
**6** එවිට ඌ දෙවිට අපහාස කිරීමටත්[4]
ඔහුගේ නාමයට සහ ඔහුගේ වාසස්-
ථානයට මෙන්ම ස්වර්ගයෙහි වාසය
කරන සියලුදෙනාට අපහාස කිරීම-
ටත් තම කට ඇරියේය.[5] **7** ශුද්ධ
තැනැත්තන්ට විරුද්ධව යුද්ධ කර
ඔවුන්ව පරාජය කිරීමටත්[6] ඌට අව-
සර ලැබිණ.[7] සියලු ගෝත්‍රයන්ද ජන-
යන්ද භාෂාවන්ද ජාතීන්ද කෙරෙහි
අධිකාරියත් ඌට දෙන ලදි. **8** පො-
ළොවෙහි වාසය කරන සියලුදෙනාද
ඌට නමස්කාර කරන්නෝය. මරා
දමනු ලැබූ[8] බැටළු පැටවාගේ ජීවන
ලියවිල්ලෙහි[9] ඔවුන් කිසිවෙකුගේ නම්
සටහන් වී නැත. එම ලියවිල්ල පිළි-
යෙල කර තිබෙන්නේ පොළොවේ
දරුවන් බිහි වූ දා* සිටය.[10]
**9** පවසනු ලබන දේට සවන් දී එය
තේරුම්ගැනීමට උත්සාහ කරන්න.[11]
**10** යමෙකු වහල්කමට නියම වී ඇත්-
නම් ඔහු වහල්කමට යනු ඇත.[12]
යමෙක් අන් අයව කඩුවෙන් මරා දම-
නවා නම් ඔහුවත් කඩුවෙන්
මරා දැමිය යුතුයි.[13] ඒ අනුව ශුද්ධ
තැනැත්තන්[14] අනිවාර්යයෙන්ම විඳ-
දරාගත යුතු අතර[15] ඔවුන් ස්ථිර විශ්-
වාසයකින්ද සිටිය යුතුයි.[16]
**11** මම තවත් මෘගයෙකු[17] දුටු-

**9** දානි 12:1; එළි 3:5; එළි 21:27; **10** එෆී 1:4; 1පේතෘ 1:20; **11** මතෙ 11:15; **12** සෙක 14:2; **13** උත් 9:6; මතෙ 26:52; **14** දානි 7:18; 1කොරි 6:2; එළි 20:6; **15** මතෙ 24:13; හෙබ්‍රෙ 10:36; හෙබ්‍රෙ 12:3; **16** එළි 2:10; **17** දානි 7:8; එළි 16:13; එළි 19:20.

එළි **13:8*** මතෙ 25:34හි පාදසටහන බලන්න.

**12 පරි.**
**1** දානි 8:19
මීකා 4:1
මතෙ 24:34
රෝම 16:20
2තිමෝ 3:1
2පේතෘ 3:3
**2** යෙසා 57:20
යෙසා 60:2
එළි 17:15
**3** ලූක් 10:18
**4** උත් 3:15
එළි 12:1
**5** නික් 19:4
යෙසා 40:31
**6** ගීතා 55:7
**7** උත් 3:1
2කොරි 11:3
**8** එළි 11:3
එළි 12:6
**9** මතෙ 4:4
ලූක් 12:42
**10** ගීතා 18:4
යෙසා 17:12
**11** දානි 11:40
**12** නිත 3:1
එළි 13:11
**13** උත් 3:15
**14** මතෙ 24:9
ක්‍රියා 1:8
එළි 1:9
එළි 6:9

**13 පරි.**
**15** යෙරෙ 5:22
**16** දානි 7:7
**17** එළි 13:3
**18** එළි 11:7
එළි 13:18
එළි 19:20
**19** යෙසා 57:20
දානි 7:2
හබ 1:14
එළි 17:15
එළි 21:1
**20** ගීතා 74:10
**21** දානි 7:6
**22** දානි 7:5
**23** දානි 7:4
**24** එළි 12:9
**25** ලූක් 4:6
**26** එළි 13:14

**2 තීරුව**
**1** දානි 7:8
**2** ලූක් 12:10
**3** එළි 11:2
එළි 11:3
**4** නික් 5:2
යෙසා 14:13
දානි 7:25
**5** එළි 12:12
**6** ලූක් 22:31
එළි 12:17
**7** යොහ 19:11
**8** යෙසා 53:7
මතෙ 27:50
එළි 5:6
එළි 5:12

වෙමි. ඌ මතු වූයේ පොළොවෙනි.[1]
ඌට බැටළු පැටවෙකුගේ අං දෙකක්
හා සමාන අං තිබිණ. නමුත් ඌ මක-
රෙකු මෙන් කතා කරන්න පටන්-
ගත්තේය.[2] **12** ඌ මුල් මෘගයා සතු
පූර්ණ අධිකාරිය ඒ මෘගයා ඉදිරියෙහිම
ක්‍රියාත්මක කරන්නේය.[3] මීට අමත-
රව ඌ, මාරක පහර ලබා සුව වූ
ඒ මුල් මෘගයාට[4] නමස්කාර කිරීමට
පොළොවටද එහි වාසය කරන අය-
ටද බල කරන්නේය. **13** එලෙසම
ඌ මිනිසුන් ඉදිරියෙහි අහසින් පො-
ළොවට ගිනි බස්වන තරමටම මහත්
ලකුණු සිදු කරන්නේය.[5]

**14** මෘගයා ඉදිරියෙහි ලකුණු සිදු
කිරීම සඳහා ඌට දෙන ලද අවස-
රය යොදාගෙන ඌ පොළොවේ වාසය
කරන අයව නොමඟ යවන්නේය. කඩු
පහර ලැබූ[6] නමුත් නැවත ජීවනය
ලැබූ මෘගයාගේ රූපයක් සෑදීමටද[7]
ඌ පොළොවේ වාසය කරන අයට
පවසන්නේය. **15** එලෙසම මෘගයා-
ගේ එම රූපයට පණ දීමටත් ඌට
අවසර දෙන ලදි. එහි ප්‍රතිඵලයක්
ලෙස මෘගයාගේ රූපයට කතා කිරී-
මේ හැකියාවද තම රූපයට කිසි ලෙ-
සකින් හෝ නමස්කාර නොකරන
සියලුදෙනාව මරණයට පත් කිරීමේ
හැකියාවද ඒ රූපයට ලැබේ.[8]

**16** ලොකු කුඩා, දුප්පත් පොහො-
සත්, දාස හා නිර්දාසයන් යන සියලු
තරාතිරම්වල මිනිසුන් තම දකුණ-
තෙහි හෝ තම නළලෙහි සලකුණක්
දමාගත යුතුයි[9] කියා ඌ ඒ සියලුදෙ-
නාට බල කරන්නේය.[10] **17** ඒ සල-
කුණ එනම්, මෘගයාගේ නම[11] හෝ
උගේ නමෙහි අංකය[12] හෝ ඇති
යමෙකුට මිස වෙන කිසිවෙකුට කිසි-
වක් මිල දී ගැනීමටවත් විකිණීමට-
වත් හැකියාවක් ලැබෙන්නේ නැත.
**18** යමෙකුට ප්‍රඥාව අවශ්‍ය වන්නේ
මෙහිදීය. බුද්ධිමත් තැනැත්තා මෘග-
යාගේ අංකය කුමක්ද කියා ගණන්
බැලිය යුතුයි. මන්ද එය මිනිසුන්ගේ
අංකයකි.[13] උගේ අංකය හයසිය හැට-
හය වේ.[14]

**13 පරි.**
**1** එළි 12:16
**2** දානි 7:8; එළි 16:13; එළි 20:2
**3** එළි 13:1
**4** එළි 13:3
**5** ද්වි 13:1; මතෙ 24:24
**6** එළි 13:3
**7** නික් 20:4; එළි 19:20; එළි 20:4
**8** ද්වි 29:17; 1රාජා 11:5; දානි 3:6; මතෙ 24:15
**9** එළි 14:9; එළි 16:2; එළි 19:20
**10** යෙරෙ 39:10; යෙරෙ 52:16
**11** එළි 14:11
**12** එළි 15:2
**13** දේශ 7:20; රෝම 3:23
**14** 1ලේක 20:6; දානි 3:1

**2 තීරුව**

**14 පරි.**
**1** යොහ 1:29; එළි 5:6; එළි 22:3
**2** ගීතා 2:6; හෙබ්‍රෙ 12:22; 1පේතෘ 2:6
**3** එළි 7:4
**4** එළි 3:12
**5** එළි 1:15
**6** 2ලේක 5:12; එළි 5:8
**7** එළි 4:6
**8** එළි 4:4; එළි 19:4
**9** ගීතා 33:3; ගීතා 98:1; ගීතා 149:1; එළි 5:9
**10** 1ලේක 6:31
**11** 1කොරි 6:20
**12** එළි 7:4; එළි 14:1
**13** යාකො 1:27
**14** 2කොරි 11:2; යාකො 4:4
**15** 1පේතෘ 2:21
**16** නික් 23:16; ලෙවී 23:15; යාකො 1:18
**17** 1කොරි 7:23; එළි 5:9
**18** හිතෝ 14:5; එළි 21:27
**19** එෆී 5:27; යූද් 24
**20** ද්වි 4:11; එළි 8:13; එළි 19:17

**14** බලන්න, බැටළු පැටවා[1]
සියොන් කන්ද මත[2] සිට-
ගෙන සිටින ආකාරය මම දුටුවෙමි.
ඔහු සමඟ එක්ලක්ෂ හතළිස් හාර-
දහස්දෙනෙක් සිටියෝය.[3] ඔවුන්ගේ
නළල් මත ඔහුගේ නාමයද ඔහුගේ
පියාණන්ගේ නාමයද ලියා තිබිණ.[4]
**2** එවිට ස්වර්ගයෙන් පැමිණි මහත්
ශබ්දයක් මට ඇසිණ. ඒ ශබ්දය
බොහෝ ජල ධාරාවල හඬ[5] මෙන්ද
මහත් ගිගුරුමක හඬ මෙන්ද
ප්‍රබල විය. මට ඇසුණු හඬ, කුඩා
වීණා[6] වයමින් ගායනා කරන පිරිසක-
ගේ හඬ හා සමාන විය. **3** ඔවුහු
සිංහාසනය ඉදිරියෙහිද ජීවීන් හත-
රදෙනා[7] සහ වැඩිමහල්ලන්[8] ඉදිරි-
යෙහිද අලුත් ගීතිකාවක් වැනි වූ
ගීතිකාවක්[9] ගායනා කරන්නෝය.[10]
නමුත් පොළොවෙන් මිල දී ගනු
ලැබූ[11] ඒ එක්ලක්ෂ හතළිස් හාරද-
හස්දෙනාට[12] මිස වෙන කිසිවෙකුට
ඒ ගීතිකාව ඉගෙනගත නොහැකිය.
**4** ඒ අය ස්ත්‍රීන්ගෙන් දූෂ්‍ය නොවූ
පිරිසකි.[13] ඇත්තෙන්ම ඔවුන් නිර්-
මලය.*[14] බැටළු පැටවා කොතැන-
කට ගියත් ඔවුහු දිගටම ඔහු පසුපස
යන්නෝය.[15] දෙවි සහ බැටළු පැටවා
වෙනුවෙන් පළමු පල ලෙස[16] මිනි-
සුන් අතරින් මිල දී ගෙන තිබෙන්නේ
ඔවුන්වය.[17] **5** ඔවුන්ගේ මුවින් කිසි
බොරුවක් පිට වූයේ නැත.[18] ඔවුන්
තුළ කිසි කැළැලක්ද නැත.[19]

**6** ඉන්පසු මම තවත් දේවදූතයෙකු
දුටුවෙමි. ඔහු පියාසර කරමින් සිටි-
යේ අහස මැදය.[20] පොළොවේ වාසය
කරන අයටත් සියලු ජාතීන්ටත් ගෝ-
ත්‍රවලටත් භාෂාවලටත් ජනයාටත්[21]
ප්‍රීතිමත් පණිවිඩයක් ලෙස ප්‍රකාශ
කිරීම සඳහා සදාකාල ශුභාරංචියක්
ඔහු සතු විය.[22] **7** ඔහු මහත් හඬ-
කින් පවසන්නේ මෙයයි. “දෙවිට ගරු-
බිය දක්වන්න.[23] ඔහුට නිසි ගෞරවය

**21** ක්‍රියා 1:8; කොලො 1:23; **22** මතෙ 24:14; මාක් 13:10;
**23** හිතෝ 8:13; මතෙ 10:28.

එළි **14:4*** මූ.අ., “කන්‍යාවෝය.”

දෙන්න.[1] මන්ද ඔහුගේ විනිශ්චය සිදු
කරන පැය පැමිණ ඇත.[2] එහෙයින්
අහසද පොළොවද මුහුදද දිය උල්-
පත්ද[3] සෑදූ තැනැත්තාණන්ට[4] නමස්-
කාර කරන්න.”
**8** ඉන්පසු දෙවෙනි වරට දේවදූත-
යෙක් ඇවිත් මෙසේ පැවසුවේය. “ඇය
වැටී ඇත! මහ බැබිලෝනිය[5] වැටී
ඇත![6] කෝපයත් තම වේශ්‍යාකමත්*
මුසු වූ[7] වයින් බීමට[8] සියලු ජාතීන්ට
බල කළ ඇය, වැටී ඇත!”
**9** ඒ දේවදූතයන්ට පසුව තුන්වෙනි
වරටත් දේවදූතයෙක් ඇවිත් මහත්
හඬින් මෙසේ කීවේය. “යමෙකු මෘග-
යාටත්[9] උගේ රූපයටත්[10] නමස්කාර
කළොත් තමාගේ නළලට හෝ අතට
හෝ උගේ සලකුණ දමාගත්තොත්,[11]
**10** දෙවිගේ උදහස නමැති කුසලාන-
යට වත් කර ඇති දෙවිගේ උදහස
නමැති අමිශ්‍ර වූ වයින් බීමට ඔහුට සිදු
වනු ඇත.[12] ශුද්ධ දේවදූතයන් ඉදි-
රියෙහිත් බැටළු පැටවා ඉදිරියෙහිත්
ගින්නෙන්ද ගෙන්දගම්වලින්ද[13] ඔහුට
වධ දෙනු ලැබේ.[14] **11** ඔවුන්ට වධ
දීමේ ප්‍රතිඵලයක් ලෙස නඟින දුම
සදහටම නැඟ යන්නේය.[15] මෘගයාට
හා උගේ රූපයට නමස්කාර කරන
අයටවත් උගේ නාමයෙහි සලකුණ[16]
දමාගන්නා අයටවත් දිවා රෑ දෙ-
කෙහි කිසි විවේකයක් ලැබෙන්නේ
නැත. **12** ඒ අනුව දෙවිගේ ආඥා
පිළිපදිමින්[17] යේසුස් කෙරෙහි විශ්වා-
සය දක්වන[18] ශුද්ධ තැනැත්තන් අනි-
වාර්යයෙන්ම විඳදරාගත යුතුයි.”[19]
**13** ඉන්පසු ස්වර්ගයෙන් පැමිණි
හඬක් මෙසේ පවසන ආකාරය මට
ඇසිණ. “මෙතැන් පටන්[20] ස්වාමීන්
සමඟ එකට බැඳී සිටින අය ලෙස
මිය යන අය[21] සන්තෝෂවත්ය.[22]
දෙවි තම බලයෙන් පැවසූ ලෙස බො-
හෝ සෙයින් වෙහෙසුණු ඔවුන්ට දැන්
විවේක ගත හැකිය. මන්ද ඔවුන් කළ
දේවල් පිළිබඳ වාර්තාව ඔවුන් සමඟම
පවතිනු ඇත කියා ලියන්න.”
**14** බලන්න, සුදු පැහැති වලා-
කුළක්ද ඒ වලාකුළ මත මනුෂ්‍ය
පුත්‍රයෙකු වැනි කෙනෙකු[1] ඉඳගෙන
සිටිනවාද මම දුටුවෙමි. ඔහුගේ හිස
මත රන් ඔටුන්නක්ද[2] ඔහුගේ අතෙහි
මුවහත් දෑකැත්තක්ද තිබිණ.
**15** එවිට තවත් දේවදූතයෙක් දේ-
වමාලිගාවෙන් පිටත් වී වලාකුළ මත
ඉඳගෙන සිටින තැනැත්තාට මහත්
හඬින් මෙසේ කියන්නේය. “ඔබේ
දෑකැත්ත යොදා අස්වැන්න නෙළා-
ගන්න.[3] මන්ද පොළොවේ අස්වැන්න[4]
හොඳින් පැසී තිබේ. එය නෙළීමට
පැය පැමිණ ඇත.”[5] **16** එවිට වලා-
කුළ මත ඉඳගෙන සිටි තැනැත්තා
තම දෑකැත්ත පොළොව දෙසට
යොමු කළේය. එවිට පොළොවේ අස්-
වැන්න නෙළන ලදි.
**17** තවත් දේවදූතයෙක්ද ස්වර්ග-
යෙහි තිබෙන දේවමාලිගාවෙන්[6] පිට-
තට ආවේය. ඔහු අතේද මුවහත්
දෑකැත්තක් තිබිණ.
**18** එවිට තවත් දේවදූතයෙක්
ආවේය. ඔහු පැමිණියේ පූජාසනය දෙ-
සින්ය. ගින්දර කෙරෙහි අධිකාරිය ඔහු
සතු විය.[7] මුවහත් දෑකැත්ත ඇතුව
සිටි දේවදූතයාට ඔහු මහත් හඬ-
කින් මෙසේ කීවේය. “ඔබේ මුවහත්
දෑකැත්තෙන් පොළොවේ මිදිවැලෙහි
ඇති මිදිපොකුරු කපා රැස් කරන්න.[8]
මන්ද එහි මිදි හොඳින් ඉදී තිබේ.”
**19** ඒ දේවදූතයාද[9] තම දෑකැත්ත
පොළොව දෙසට යොමු කර පොළො-
වේ මිදිවැල කපා,[10] දෙවිගේ උදහස
නමැති මහත් මිදි මඩින යන්ත්‍රයට
එය හෙළුවේය.[11] **20** ඒ මිදි මඩින
යන්ත්‍රයට දමා තිබූ මිදි පාගනු ලැබු-
වේ නුවරින් පිටතය.[12] මිදි මඩින යන්-
ත්‍රයෙන් පිටතට ගැලූ රුධිරය පර්ලොං
එක්දහස් හයසියයක්* දුරට,[13] අශ්-
වයන්ගේ කටකලියා තරම් ඉහළට
විහිදී ගියේය.[14]

එළි **14:8*** එනම්, අවිවාහකයෙකු හෝ විවාහකයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8 බලන්න.

එළි **14:20*** කිලෝමීටර් 300ක් පමණ.

**14 පරි.**
1 ගීතා 19:1
රෝම 11:36
යූද් 25
එළි 4:9
2 1පේත 4:17
2පේත 2:9
3 ක්‍රියා 14:15
4 නික් 20:11
ගීතා 124:8
ගීතා 146:6
5 එළි 17:18
එළි 18:2
6 යෙසා 21:9
යෙරෙ 51:8
එළි 18:21
7 එළි 17:2
එළි 18:3
8 යෙරෙ 51:7
9 එළි 13:1
10 එළි 13:15
11 එළි 13:16
12 ගීතා 75:8
එළි 11:18
එළි 16:19
13 එළි 21:8
14 එළි 20:10
15 මතෙ 25:46
2තෙස 1:9
එළි 19:3
16 එළි 13:16
එළි 16:2
එළි 20:4
17 දේශ 12:13
එළි 1:3
18 හෙබ්‍රෙ 10:38
19 එළි 13:10
20 1තෙස 4:16
21 රෝම 6:3
1කොරි 15:51
22 කොලො 3:3

**2 තීරුව**
1 දානි 7:13
මතෙ 25:31
ක්‍රියා 1:11
එළි 1:7
2 ගීතා 21:3
එළි 6:2
3 මාක් 4:29
4 මතෙ 13:39
5 යෝවෙ 3:13
6 එළි 11:19
7 එළි 20:9
8 ද්වි 32:32
9 මතෙ 13:39
එළි 9:11
10 යෙරෙ 12:10
11 එළි 19:15
12 හෙබ්‍රෙ 13:12
එළි 22:15
13 යෙරෙ 25:33
14 හිතෝ 21:31

**15** මම ස්වර්ගයෙහි තවත් ලකුණක් දුටුවෙමි.[1] එය ඉතා ප්‍රබල මෙන්ම විස්මයජනක ලකුණකි. දේවදූතයෝ හත්දෙනෙක්[2] පීඩා හතක්[3] අතැතිව සිටියෝය. ඒවායින් දෙවිගේ උදහස[4] අවසන් වන නිසා[5] ඒවා හඳුන්වනු ලබන්නේ අවසන් පීඩා ලෙසය.

**2** එවිට ගිනි මිශ්‍ර වූ වීදුරු මුහුදක්[6] හා සමාන දෙයක් මම දුටුවෙමි. ඒ වීදුරු මුහුද අසල[7] මෘගයාගෙන්ද උගේ රූපයෙන්ද[8] උගේ නමෙහි අංකයෙන්ද[9] ජය ලැබූ අය,[10] දෙවිගෙන් ලැබුණු කුඩා වීණා ඇතුව[11] සිටගෙන සිටියෝය. **3** ඔවුහු දෙවිගේ දාසයා වූ මෝසෙස්ගේ ගීතයද[12] බැටළු පැටවාගේ ගීතයද[13] ගයමින් මෙසේ කීවෝය.

“සියලු බලැති තැනැත්තා[14] වන යෙහෝවා දෙවියනි, ඔබේ ක්‍රියා කොතරම් ශ්‍රේෂ්ඨද! කොතරම් විස්මයජනකද![15] සදාකාල රජ්ජුරුවනි, ඔබ කරන සෑම දෙයක්ම ධර්මිෂ්ඨය,[16] විශ්වාසවන්තය.[17] **4** යෙහෝවා[18] දෙවියනි, ඔබට සැබවින්ම ගරුබිය නොදක්වන්නෙත්[19] ඔබේ නාමයට ගෞරව නොකරන්නෙත් කවුද?[20] මන්ද විශ්වාසවන්තකමින් පිරිපුන් එකම තැනැත්තා ඔබය.[21] ඔබේ ධර්මිෂ්ඨ අණපනත් පැහැදිලිව දක්නට ලැබෙන නිසා[22] සියලු ජාතීන් ඇවිත් ඔබ ඉදිරියෙහි නමස්කාර කරනු ඇත.”[23]

**5** ඉන්පසු සාක්ෂියක් සඳහා[24] ඉදි කර ඇති කූඩාරමේ අතිශුද්ධස්ථානය[25] ස්වර්ගයෙහි විවෘත කර තිබෙන ආකාරය[26] දැකගැනීමට මට හැකි විය. **6** එලෙසම පීඩා හත අතැතිව[27] සිටි දේවදූතයෝ හත්දෙනා[28] අතිශුද්ධස්ථානයෙන් පිටතට ආවෝය. ඔවුන් පිරිසිදු, දීප්තිමත් ලිනන් වස්ත්‍ර[29] පැළඳ සිටි අතර ඔවුන්ගේ ළය වටා රන් පටි බැඳ තිබිණ. **7** එවිට ජීවීන් හතරදෙනාගෙන්[30] එක් කෙනෙක් සදාකාලයටම ජීවත් වන[31] දෙවිගේ උදහසින් පිරුණු රන් බඳුන් හතක්[1] දේවදූතයන් හත්දෙනාට දුන්නේය. **8** දෙවිගේ තේජස නිසාත් ඔහුගේ බලමහිමය නිසාත් අතිශුද්ධස්ථානය දුමින් පිරී ගියේය.[2] දේවදූතයන් හත්දෙනාගේ පීඩා හත නිමා වන තුරු[3] අතිශුද්ධස්ථානයට ඇතුල් වීමට කිසිවෙකුට නොහැකි විය.

**16** එවිට අතිශුද්ධස්ථානයෙන් නික්මුණු මහත් හඬක්,[4] “ගොස්, දෙවිගේ උදහසින්[5] පිරුණු බඳුන් හත පොළොවට වත් කරන්න” කියා දේවදූතයන් හත්දෙනාට පවසන ආකාරය මට ඇසිණ.

**2** පළමුවෙනියා[6] ගොස් තම බඳුන පොළොවට වත් කළේය.[7] එවිට මෘගයාගේ සලකුණ දැරූ,[8] උගේ රූපයට නමස්කාර කරමින් සිටි[9] මිනිසුන්ගේ ශරීරවල දරුණු මාරාන්තික වණයක්[10] හටගත්තේය.

**3** දෙවෙනියා[11] තම බඳුන මුහුදට වත් කළේය.[12] එය මළ මිනිසෙකුගේ ලේ මෙන් විය.[13] එහෙයින් මුහුදේ සිටින සෑම ජීවියෙක්ම මිය ගියේය.[14]

**4** තුන්වෙනියා[15] තම බඳුන ගංගාවලටත් දිය උල්පත්වලටත් වත් කළේය.[16] එවිට ඒවා ලේ විය.[17] **5** වතුර කෙරෙහි බලය ඇති දේවදූතයා මෙසේ කියනවා මට ඇසිණ. “සිටින්නාවූ සහ සිටියාවූද[18] විශ්වාසවන්තකමින් පිරිපුන්[19] තැනැත්තා වන ඔබ, මේ තීරණ දී තිබෙන නිසා ඔබ ධර්මිෂ්ඨය.[20] **6** මන්ද ඔවුහු ශුද්ධ තැනැත්තන්ගෙත් අනාගතවක්තෘවරුන්ගෙත් ලේ වැගිරෙව්වෝය.[21] එහෙයින් ඔබ ඔවුන්ට බීම සඳහා ලේ දුන්නෙහිය.[22] එය ඔවුන්ට ලැබිය යුතු සුදුසු දඬුවමකි.”[23] **7** එවිට පූජාසනයෙන් හඬක් මෙසේ කියනවා මට ඇසිණ. “එසේය, සියලු බලැති තැනැත්තා[24] වන යෙහෝවා

**15 පරි.**

**1** එළි 1:1
**2** එළි 16:1
**3** ලෙවී 26:21
**4** ගීතා 7:11
**5** එළි 16:17
**6** 1රාජා 7:23
1රාජා 7:39
**7** එළි 4:6
**8** එළි 13:15
**9** එළි 13:18
**10** එළි 2:7
**11** එළි 5:8
**12** නික් 15:1
ද්වි 31:30
හෙබ්‍රෙ 3:5
**13** යොහ 1:29
ක්‍රියා 3:22
හෙබ්‍රෙ 2:12
**14** නික් 6:3
එළි 19:6
**15** නික් 15:11
ගීතා 92:5
ගීතා 111:2
ගීතා 139:14
**16** ද්වි 32:4
ගීතා 145:17
**17** යෙරෙ 10:10
1තිමෝ 1:17
**18** ගීතා 22:23
ගීතා 33:8
**19** යෙරෙ 10:7
**20** ගීතා 86:12
යොහ 12:28
**21** යෙරෙ 3:12
**22** යෙසා 2:4
**23** ගීතා 86:9
මලා 1:11
**24** ක්‍රියා 7:44
**25** හෙබ්‍රෙ 8:2
හෙබ්‍රෙ 9:11
**26** එළි 11:19
**27** එළි 15:1
**28** එළි 8:2
**29** දානි 10:5
**30** එළි 19:4
**31** ගීතා 90:2
1තිමෝ 1:17

**2 තීරුව**

**1** ගීතා 75:8
යෙරෙ 25:15
එළි 14:10
**2** නික් 40:34
1රාජා 8:11
යෙසා 6:4
එස 44:4
**3** ලෙවී 26:21
එළි 15:1

**16 පරි.**

**4** යෙසා 66:6
එළි 16:17
**5** ගීතා 69:24
ශෙප 3:8
**6** එළි 8:7
**7** එළි 20:11
**8** එළි 13:16
එළි 13:18

**9** එළි 13:15; එළි 19:20; **10** නික් 9:10; ද්වි 28:35; **11** එළි 8:8; **12** එළි 17:15; **13** නික් 7:20; **14** යෙසා 57:20; **15** එළි 8:10; **16** ගීතා 78:44; **17** නික් 7:20; **18** නික් 3:14; එළි 1:4; **19** ගීතා 145:17; යෙරෙ 3:12; එළි 15:4; **20** ද්වි 32:4; ගීතා 119:137; **21** උත් 9:5; ගීතා 79:3; මතෙ 23:35; **22** යෙසා 49:26; **23** එළි 18:20; **24** නික් 6:3.

දෙවියනි, ඔබ ලබා දෙන තීන්දු විශ්-
වාසවන්තය, ධර්මිෂ්ඨය.”[1]
**8** හතරවෙනියා[2] තම බඳුන සූර්-
යයා මතට වත් කළේය. එවිට
මිනිසුන්ව ගින්නෙන් දවාලීමට[3] සූර්-
යයාට අවසර ලැබිණ. **9** මිනිසුන්ව
දැඩි රස්නයකින් දවනු ලැබුවත් ඒ
පීඩා කෙරෙහි අධිකාරිය ඇති[4] දෙවි-
ගේ නාමයට ඔවුහු අපහාස කළෝය.[5]
ඔහුට ගෞරවය ගෙන දීම සඳහා ඔවුහු
පසුතැවිලි නොවූහ.[6]
**10** පස්වෙනියා තම බඳුන මෘගයා-
ගේ සිංහාසනය මතට වත් කළේය.[7]
එවිට උගේ රාජ්‍යය අඳුරෙන් වැසී
ගියේය.[8] වේදනාව නිසා ජනයා තම
දිව් විකාගත්තෝය. **11** තමන්ට
දැනුණු වේදනාව සහ තම ශරීරවල
ඇති වූ වණ නිසා ඔවුහු ස්වර්ග-
යේ දෙවිට අපහාස කළෝය.[9] එලෙ-
සම ඔවුන් කළ දේවල් ගැන ඔවුන්
තුළ පසුතැවිල්ලක් දක්නට ලැබුණේ
නැත.
**12** හයවෙනියා[10] තම බඳුන යුප්‍ර-
ටීස් නමැති මහ ගඟ මතට වත්
කළේය.[11] එවිට නැඟෙනහිරෙන් පැමි-
ණෙන රජුන් සඳහා මාර්ගය සූදානම්
කිරීමට[12] එහි වතුර සිඳී ගියේය.[13]
**13** මකරාගේ කටින්ද[14] මෘගයා-
ගේ කටින්ද[15] බොරු අනාගතවක්-
තෘවරයාගේ කටින්ද[16] මැඩියන් වැනි
වූ[17] අපවිත්‍ර, අද්භූත* පණිවිඩ තුනක්[18]
පිට වන අයුරු දැකගැනීමට මට හැකි
විය. **14** ඇත්තෙන්ම එම පණිවිඩ
පැමිණෙන්නේ භූතයන්ගෙනි.[19] එම
පණිවිඩ මාර්ගයෙන් පුදුම දේවල් සිදු
වෙයි.[20] එම පණිවිඩ මුළු ලොව පුරාම
සිටින[21] රජුන්ට ලැබෙන්නේය.[22] ප්‍රති-
ඵලයක් ලෙස සියලු බලැති දෙවිගේ[23]
මහත් දවසේදී[24] සිදු වන යුද්ධය සඳහා
ඔවුහු රැස් වන්නෝය.[25]
**15** “බලන්න, මා පැමිණෙන්නේ
සොරෙකු පැමිණෙන ආකාරයටය.[26]
සෝදිසියෙන් සිටිමින්,[27] තම වස්ත්‍ර
ආරක්ෂා කරගන්නා තැනැත්තා සන්-
තෝෂවත්ය. එසේ සිටීමෙන් ඔහුට
වස්ත්‍රයක් නොමැතිව ගමන් කිරීමට*
සිදු නොවන අතර සියලුදෙනා ඉදිරි-
යේ ලැජ්ජා වීමටද අවශ්‍ය වන්නේ
නැත.”[1]
**16** එම පණිවිඩ ලැබූ පසු ඔවුහු,
හෙබ්‍රෙව් බසින් හඳුන්වනු ලබන හර්--
මගෙදොන්[2] නමැති ස්ථානයට
රැස් වූහ.
**17** හත්වෙනියා තම බඳුන වාත-
යට වත් කළේය.[3] එවිට අතිශුද්ධස්-
ථානයේ සිංහාසනය වෙතින් මහත්
හඬක් පැමිණ,[4] “සියල්ල අවසන්ය”
කියා පැවසුවේය. **18** විදුලි කෙ-
ටීම්ද කටහඬවල්ද ගිගුරුම්ද ඇති
විය. පොළොවේ මිනිසුන් බිහි වූ
දා පටන් මේ වන තුරු සිදු නොවූ
ආකාරයක[5] මහත් භූමිකම්පාවක්ද
සිදු විය.[6] ඇත්තෙන්ම ඒ භූමිකම්-
පාව ඉතා දරුණු ලෙස පුළුල්ව විහිදී
ගියේය.[7] **19** මහත් නුවරද[8] කොටස්
තුනකට කැඩී ගියේය. ජාතීන්ට අයත්
නුවරවල්ද බිඳ වැටිණ. එලෙසම දෙවි
විසින් මහ බැබිලෝනියේ[9] ක්‍රියාද සිහි-
යට නඟන ලදි. එසේ සිහියට නැඟුවේ
ඇයට පානය කිරීම සඳහා දෙවිගේ
උදහසින් පිරුණු වයින් කුසලානය
ලබා දීමටය.[10] **20** සෑම දූපතක්ම
පලා ගියේය. කඳුවත් සොයාගත
නොහැකි විය.[11] **21** අහසෙන් මහත්
හිම කැට වර්ෂාවක්ද[12] මිනිසුන් පිට
වැටුණේය. ඒ එක් එක් හිම කැටයක
බර තලෙන්තයක්* පමණ විය. හිම
කැට වර්ෂාවෙන් පහර කෑ[13] මිනිස්සු
දෙවිට අපහාස කළෝය.[14] මන්ද ඒ
පීඩාව ඉතා දරුණු එකක් විය.

# 17
බඳුන් හත අතැතිව සිටි
දේවදූතයන් හත්දෙනාගෙන්
එක් කෙනෙක්[15] ඇවිත් මට මෙසේ

**16 පරි.**
1 ගීතා 19:9; ගීතා 119:137; එළි 19:2
2 එළි 8:12
3 යෙසා 49:10
4 රෝම 13:1
5 ගීතා 83:18
6 එළි 9:21; එළි 14:7
7 එළි 13:1
8 නික් 10:21; යෙසා 8:22; එෆී 4:18
9 එළි 16:21
10 එළි 9:13
11 ගීතා 137:1
12 යෙසා 44:28; යෙරෙ 51:57
13 යෙසා 44:27; යෙරෙ 50:38
14 එළි 12:3
15 එළි 13:1
16 එළි 13:11
17 ලෙවී 11:12
18 1යොහ 4:1
19 1තිමෝ 4:1
20 එළි 13:13
21 එළි 18:3; එළි 18:9
22 ගීතා 2:2
23 යෙසා 13:6; යෙරෙ 25:33; එස 30:3; යෝවෙ 1:15; යෝවෙ 2:11; ශෙප 1:15; 2පේතෘ 3:12
24 යෝවෙ 2:1
25 එස 38:16; එළි 19:19
26 1තෙස 5:2; 2පේතෘ 3:10
27 ලූක් 21:36

**2 තීරුව**
1 එළි 3:18
2 2ලේක 35:22; සෙක 12:11; එළි 19:19
3 එෆී 2:2; එෆී 6:12
4 යෙසා 66:6; එළි 16:1
5 දානි 12:1
6 එස 38:19
7 හෙබ්‍රෙ 12:26
8 එළි 17:18
9 එළි 18:2
10 යෙරෙ 25:15; එළි 15:7
11 එළි 6:14
12 යෝබ් 38:22; යෝබ් 38:23; යෙසා 28:2
13 නික් 9:24; එළි 11:19
14 එළි 16:9

**17 පරි.** 15 එළි 16:1.

එළි **16:13*** ග්‍රීක බසින්, නියුමා. උපග්‍ර. 3 බලන්න.

එළි **16:15*** මූ.අ., “නිරුවත්ව ගමන් කිරීමට.” ජිම්නොස් නම් ග්‍රීක වචනය, “යට ඇඳුම පමණක් පැළඳ සිටීම” වැනි අදහසක් ලබා දෙයි. **21*** කිලෝග්‍රෑම් 20.4ක් පමණ.

කීවේය. “එන්න. බොහෝ ජල ධාරා
මත ඉඳගෙන සිටින[1] මහා ගණි-
කාව පිට පැමිණෙන විනිශ්චය මම
ඔබට පෙන්වන්නෙමි.[2] **2** පොළො-
වේ රජවරු ඇය සමඟ වේශ්‍යා-
කම්* කළෝය.[3] එලෙසම පොළොවේ
වාසය කරන අය ඇගේ වේශ්‍යාකම
නමැති වයින්වලින් වෙරි වූහ.”[4]

**3** ඔහු දෙවිගේ බලයේ උපකා-
රයෙන්[5] මාව පාළුකරයකට ගෙන
ගියේය. එවිට මම ස්ත්‍රියක් දුටුවෙමි.
ඇය ඉඳගෙන සිටියේ හිස් හතක්ද[6] අං
දසයක්ද ඇති තද රතු පාට මෘග-
යෙකු[7] පිටය. ඒ මෘගයාගේ ඇඟ පුරාම
දෙවිට අපහාසයක් ගෙන දෙන නම්
පිරී තිබිණ.[8] **4** ඒ ස්ත්‍රිය දම් පාට[9]
සහ තද රතු පාට[10] වස්ත්‍ර පැළඳ,
රන්, මුතු මැණික්වලින් සැරසී සිටි-
යාය.[11] එමෙන්ම පිළිකුල් දේවලින්ද[12]
ඇය කළ වේශ්‍යාකම්වල* ප්‍රතිඵල-
යක් ලෙස සිදු වූ අපවිත්‍ර දේවලින්ද
පිරුණු[13] රන් කුසලානයක් ඇගේ
අතේ තිබිණ.[14] **5** ඇගේ නළලෙහි
නමක් ලියා තිබිණ. එනම්, “ගණිකා-
වන්ගේද පොළොවෙහි පිළිකුල් දේව-
ලද[15] මව වන මහ බැබිලෝනිය”[16]
යන නමයි. එහි අර්ථය අභිරහසකි.[17]
**6** ඒ ස්ත්‍රිය ශුද්ධ තැනැත්තන්ගේ ලෙ-
යින්ද[18] යේසුස්ගේ සාක්ෂිකරුවන්ගේ
ලෙයින්ද වෙරි වී සිටි බව[19] දැකගැනී-
මට මට හැකි විය.

ඇයව දුටු විට මම අතිශයින් පුදු-
මයට පත් වූවෙමි.[20] **7** එහෙයින් ඒ
දේවදූතයා මට මෙසේ කීවේය. “ඔබ
පුදුම වුණේ ඇයි? ස්ත්‍රිය පිළිබඳවත්[21]
ඇය ඉඳගෙන සිටින හිස් හත හා අං
දසය ඇති මෘගයා පිළිබඳවත්[22] අභි-
රහස ගැන මම ඔබට කියන්නෙමි.
**8** ඔබ දුටු මෘගයා කලින් සිටියේය.[23]
දැන් නැත. නමුත් ඌ ඉදිරියේදී අගා-
ධයෙන් පිටතට නැඟී ඒමට සූදානා-
මින් සිටියි.[24] එලෙසම ඌ විනාශ වනු
ඇත. ඒ මෘගයා කලින් සිටි අයුරුත්
ඌ නැති වී ගිය අයුරුත් ඉදිරියේදී
පැමිණෙන අයුරුත් පොළොවේ වාසය
කරන අය දකින විට ඔවුහු පුදුම වී
ඌට ගෞරවය දෙන්නෝය. නමුත්
පොළොවේ දරුවන් බිහි වූ දා* පටන්[1]
පිළියෙල කර තිබෙන ජීවන ලියවිල්-
ලෙහි[2] ඔවුන්ගේ නම් සටහන් වී නැත.

**9** “බුද්ධියත් ප්‍රඥාවත් අවශ්‍ය වන්-
නේ මෙහිදීය.[3] හිස් හතෙන්[4] කඳු
හතක් නියෝජනය වේ.[5] ස්ත්‍රිය ඉඳ-
ගෙන සිටින්නේ එම කඳු මතය.
**10** රජවරුන් හත්දෙනෙකුද එයින්
නියෝජනය වේ. පස්දෙනෙක් වැටී
ගොස් ඇත.[6] එක් කෙනෙක් දැන්
සිටියි.[7] අනික් තැනැත්තා තවමත්
පැමිණ නැත.[8] ඔහු පැමිණි විට ඔහු
පවතින්නේ කෙටි කලකට පමණි.[9]
**11** කලින් සිටි නමුත් දැන් නැති[10]
මෘගයාත් රජෙක්ය. එනම් අටවෙනි-
යාය. ඌ බිහි වන්නේ හත්දෙනා-
ගෙන්ය. ඌද විනාශ වනු ඇත.

**12** “ඔබ දුටු අං දසයෙන් තවමත්
රාජ්‍යයක් නොලැබූ රජවරුන් දහ-
දෙනෙකු නියෝජනය වේ.[11] නමුත්
මෘගයා සමඟ එක පැයක් රජව-
රුන් ලෙස පාලනය කිරීමට අධිකාරිය
ඔවුන්ට ලැබේ. **13** ඔවුන්ට ඇත්-
තේ එකම අදහසකි. එහෙයින් ඔවුහු
තමන් සතු බලයත් අධිකාරියත් මෘග-
යාට දෙන්නෝය.[12] **14** ඔවුහු බැටළු
පැටවාට විරුද්ධව යුද්ධ කරනු ඇත.[13]
නමුත් බැටළු පැටවා ස්වාමිවරුන්-
ගේ ස්වාමියා වන නිසාත් රජවරුන්-
ගේ රජු වන නිසාත්[14] ඔහු ඔවුන්ව
පරාජය කරනු ඇත.[15] එලෙසම ඔහු
සමඟ සිටින කැඳවනු ලැබූ, තෝරා-
ගනු ලැබූ, විශ්වාසවන්ත වූ අයත්
ඔවුන්ව පරාජය කරනු ඇත.[16]

**15** ඔහු මට මෙසේද කියයි. “ගණි-
කාව ඉඳගෙන සිටින ස්ථානයේ ඔබ
දුටු ජල ධාරාවලින් ජනයන්ද සමූ-
හයන්ද ජාතීන්ද විවිධ භාෂා
කතා කරන අයද නියෝජනය වේ.[17]

---

එළි **17:2*** එනම්, අවිවාහකයෙකු හෝ විවාහ-
කයෙකු ලිංගික දුරාචාරයේ යෙදීම. උපග්‍ර. 8
බලන්න. **4*** එළි 17:2හි පාදසටහන බලන්න.

එළි **17:8*** මතෙ 25:34හි පාදසටහන බලන්න.

---

**17 පරි.**

**1** යෙසා 57:20
යෙරෙ 51:13
එළි 17:15
එළි 19:2
**2** 1කොරි 6:15
යාකො 4:4
**3** යෙසා 47:5
යාකො 4:4
එළි 18:9
**4** යෙරෙ 51:7
එළි 14:8
එළි 18:3
**5** එස 37:1
එළි 1:10
**6** එළි 17:9
**7** එළි 13:15
**8** මාක් 3:29
**9** දානි 5:29
ලූක් 16:19
**10** මතෙ 27:28
**11** එළි 18:12
එළි 18:19
**12** ද්වි 29:17
යෙසා 66:3
**13** රෝම 1:24
**14** යෙරෙ 51:7
**15** එස 22:2
එළි 18:5
**16** එළි 19:2
**17** 2තෙස 2:7
**18** එළි 18:24
එළි 19:2
**19** එළි 6:9
**20** එස 28:19
**21** එළි 17:5
**22** එළි 17:3
**23** එළි 13:15
**24** එළි 20:1

**2 තීරුව**

**1** එළි 13:8
**2** නික් 32:32
ගීතා 69:28
පිලි 4:3
**3** මතෙ 24:15
යාකො 3:17
**4** එළි 17:7
**5** යෙරෙ 51:25
**6** යෙරෙ 46:2
යෙරෙ 51:11
දානි 8:20
දානි 8:21
ශෙප 2:13
**7** යොහ 19:15
**8** දානි 8:23
**9** එළි 13:11
එළි 19:20
**10** එළි 17:8
**11** දානි 7:24
**12** ගීතා 2:2
**13** යොහ 1:29
එළි 5:6
**14** මතෙ 28:18
ක්‍රියා 2:36
1තිමෝ 6:15
**15** එළි 19:15
**16** රෝම 16:20
**17** යෙසා 57:20
යෙරෙ 51:13

**16** ඔබ දුටු අං දසය[1] හා මෘගයා[2]
ගණිකාවට වෛර වී[3] ඇයව පාළු
කර, නිරුවත් කර, ඇගේ මස් මාංස
කා දමා ඇයව සහමුලින්ම ගින්නෙන්
දවන්නෝය.[4] **17** මන්ද දෙවි තමන්
අරමුණු කරන දේ ඉටු කිරීමට ඔවුන්-
ගේ මනස් තුළට යම් අදහසක් දමා
ඇත.[5] එහෙයින් ඔවුහු තමන් අද-
හස් කරන දේ ඉටු කරගැනීමට තම
රාජ්‍යය මෘගයාට ලබා දෙන්නෝය.[6]
එසේ කරන්නේ දෙවි පවසා ඇති
දේ ඉටු වන තුරුය.[7] **18** ඔබ දුටු
ස්ත්‍රියගෙන්[8] පොළොවේ රජවරුන්ව
පාලනය කරන මහත් නුවරක් නියෝ-
ජනය වේ.”[9]

# 18

ඒ දේවලට පසු මහත් අධි-
කාරියක් ඇති තවත් දේ-
වදූතයෙකු[10] ස්වර්ගයෙන් බැස එන
ආකාරය මට දැකගත හැකි විය. ඔහු-
ගේ තේජසින් පොළොව ආලෝකවත්
විය.[11] **2** ඔහු ප්‍රබල හඬකින් මෙසේ
කීවේය.[12] “ඇය වැටී ඇත. මහ බැබි-
ලෝනිය වැටී ඇත.[13] ඇය භූතයන්-
ගේ වාසස්ථානයක් බවටද සියලුම
දුගඳවල් හමන ස්ථානයක්[14] බවටද
සියලු අපවිත්‍ර මෙන්ම පිළිකුල්සහගත
කුරුල්ලන් ලගින ස්ථානයක්[15] බව-
ටද පත් වී ඇත! **3** මන්ද කෝප-
යත් ඇගේ වේශ්‍යාකමත්* මුසු වයින්
බීමෙන් සියලු ජාතීන් ඇයට ගොදුරු
වී ඇත.[16] පොළොවේ රජවරු ඇය
සමඟ වේශ්‍යාකම් කළෝය.[17] ඇය
අසීමිත සැප සම්පත් භුක්ති විඳිමින්
කිසි ලැජ්ජාවක් නැතුව ගත කළ ජීවි-
තය[18] නිසා පොළොවේ සංචාරක වෙ-
ළෙන්දෝ[19] ධනවත් වූහ.”

**4** ස්වර්ගයෙන් නික්මුණු තවත්
හඬක් මෙසේ පවසනවා මට ඇසිණ.
“මාගේ සෙනඟෙනි, ඇයව අත්හැර
පිටතට එන්න.[20] ඇගේ පාපවලට
ඇය සමඟ හවුල් වන්නවත්[21] ඇය
මුහුණ දෙන පීඩාවලට හසු වන්න-
වත් ඔබ කැමති නැත්නම් ඇයව අත්-
හැර පිටතට එන්න. **5** මන්ද ඇගේ
පාප ස්වර්ගය දක්වාම ගොඩගැසී
"යෙහෝවා" යන දෙවිගේ නාමය (හෙබ්‍රෙව්, יהוה, ය් හ් ව් හ්) මුල් වතාවට සඳහන් වන්නේ උත් 2:4හිය. දෙවිගේ නාමයට සුවිශේෂ අර්ථයක් ඇත. එයින් කියාපාන්නේ යෙහෝවා දෙවි තමන් අරමුණු කරන දේ ඉටු කිරීමට ඉතා ක්‍රියාශීලීව කටයුතු කරන බවයි. එමනිසා ඔහු තම පොරොන්දු අනිවාර්යයෙන්ම ඉටු කරන කෙනෙකු බව පැහැදිලිය.

ශුද්ධ ලියවිල්ලේ ශ්‍රේෂ්ඨ කර්තෘ වන දෙවිට කරන ලොකුම අගෞරවය වන්නේ ඔහුගේ එම අද්විතීය නාමය ශුද්ධ ලියවිල්ලෙන් ඉවත් කිරීමය. නූතන පරිවර්තකයන් බොහෝදෙනෙකු විසින් එම වරද සිදු කර ඇත. එම නාමය මුල් හෙබ්‍රෙව් ලියවිල්ලෙහි יהוה (ය් හ් ව් හ්) යන හෙබ්‍රෙව් අකුරුවලින් 6,828 වාරයක් සඳහන් වේ. මුල් පිටපත්වල අනුගමනය කළ ප්‍රමිතියටම ඇලී සිටිමින් මෙම පරිවර්තනයේද "යෙහෝවා" යන නාමය භාවිත කෙරේ. දෙවිගේ නාමය වෙනුවට "ස්වාමීන්වහන්සේ" හෝ "දෙවියන්වහන්සේ" වැනි යෙදුම් මෙහි භාවිත කර නැත්තේ එමනිසාය.

මුල් හෙබ්‍රෙව් පිටපත්වල දෙවිගේ නාමය සඳහා භාවිත කර ඇති හෙබ්‍රෙව් අක්ෂර හතර 6,828 වාරයක් දක්නට ලැබේ. ඊට "යෙහෝවා" යන නාමය යොදාගෙන සාදා ඇති තවත් නම් තුනක්ද ඇතුළත් වන අතර, (උත් 22:14; නික් 17:15; විනි 6:24) ගීතාවලිය පොතේ ගීතිකා කිහිපයක ඇති පෙර පදවල එම නාමය සඳහන් වන වාර හයද ඇතුළත්ය. (7, 18 [තුන් වාරයක්], 36, 102) මුල් හෙබ්‍රෙව් පිටපත්වල 6,828 වාරයක් සඳහන් වී ඇති "යෙහෝවා" යන නාමය මෙම පරිවර්තනයේද එම ස්ථානවලම සඳහන් වී ඇත. එය දක්නට නොලැබෙන්නේ විනි 19:18 යන පදයේ පමණි. ඇතැම්විට හෙබ්‍රෙව් පිටපත්වල එම නාමය එතැන යොදා තිබුණේ වැරදීමකින් විය හැක. මීට අමතරව මෙම පරිවර්තනයේ ද්වි 30:16, 2සාමු 15:20 සහ 2ලේක 3:1 යන පදවලද දෙවිගේ නාමය ඇතුළත් කර ඇත. ග්‍රීක සෙප්ටුඅජින්ට් පරිවර්තනයේ පිටපත් කිහිපයක් ඊට පදනම සපයයි. එලෙසම මෙම පරිවර්තනයේ යෙසා 34:16 සහ සෙක 6:8 යන පදවල "මා" වෙනුවට "යෙහෝවා" ලෙස නිවැරදිව යොදා ඇත. පුරාණයේ හෙබ්‍රෙව් ලියවිල්ල පිටපත් කළ සොෆෙරිම්වරුන් දෙවිගේ නාමය සඳහා භාවිත කළ හෙබ්‍රෙව් අක්ෂර හතර වෙනුවට ස්වාමීන් හෝ දෙවි ඇතුළත් කළ ස්ථාන 141ක් හෙබ්‍රෙව් ලියවිල්ලෙහි ඇත. මෙම පරිවර්තනයේ එම ස්ථානවලද "යෙහෝවා" යනුවෙන් සඳහන් කර තිබේ. ඒ අනුව මෙම පරිවර්තනයට ඇතුළත් හෙබ්‍රෙව් ලියවිලිවල "යෙහෝවා" යන නාමය 6,973 වාරයක් සඳහන් වී ඇත.

ක්‍රිස්තියානි ග්‍රීක ලියවිල්ලෙහි දෙවිගේ නාමය ඇතුළත් කළ යුතු ස්ථාන ගැන තීරණය කර ඇත්තේ ඉතා කල්පනාකාරීවය. එයට හේතුව වන්නේ මුල් පිටපත්වල නොමැති දේවල් ඇතුළත් කිරීම විශ්වාසවන්ත පරිවර්තකයෙකුගේ ලක්ෂණයක් නොවන නිසාය.

එමනිසා දෙවිගේ නාමය ඇතුළත් කළ යුතු ස්ථාන තීරණය කර තිබෙන්නේ හෙබ්‍රෙව් ලියවිල්ලෙන් ඒ සඳහා පදනමක් ලබා දී ඇත්නම් පමණි. එලෙසම ක්‍රිස්තියානි ග්‍රීක ලියවිල්ලේ හෙබ්‍රෙව් පරිවර්තනවල දෙවිගේ නාමය සඳහන් අවස්ථාද පදනමක් ලෙස භාවිත කර ඇත.

දෙවිගේ නාමය සඳහා භාවිත කර ඇති හෙබ්‍රෙව් අක්ෂර හතර හෙබ්‍රෙව් පිටපත්වල පමණක් නොව ග්‍රීක සෙප්ටුඅජින්ට් පරිවර්තනයේද ඒ අයුරින්ම ඇතුළත් කර ඇත. එමනිසා යේසුස් සහ ඔහුගේ ගෝලයන් හෙබ්‍රෙව් බසින් හෝ ග්‍රීක බසින් ශුද්ධ ලියවිල්ල කියෙවූ අවස්ථාවලදී එම නාමය ඒ පිටපත්වල දැකගැනීමට ඔවුන්ට හැකි විය. නිදසුනකට යේසුස් නාසරෙත් නුවරේ සිනගෝගයකට ගොස් එහිදී යෙසායාගේ ලියවිල්ලේ 61:1, 2 යන පද කියවන විට ඔහු දෙවිගේ නාමයද ශබ්ද නඟා පැවසුවේය. තම පියා වන යෙහෝවා දෙවිගේ නාමය ප්‍රසිද්ධ කිරීමට යේසුස්ට තිබූ දැඩි ආශාව පසු අවස්ථාවක තම පියාණන්ට යාච්ඤා කරන විට ඔහු පැවසූ දෙයින්ද තහවුරු වේ. ඔහු පැවසුවේ මෙයයි. “ඔබ ලෝකයෙන් මට භාර දුන් මිනිසුන්ට මම ඔබේ නාමය ප්‍රකාශ කළා. . . . මම ඔබේ නාමය ගැන ඔවුන්ට දැනුම් දුන්නා. ඒ ගැන ඉදිරියටත් දැනුම් දෙනවා.”—යොහ 17:6, 26.

ඒ අනුව මෙම පරිවර්තනයට ඇතුළත් ක්‍රිස්තියානි ග්‍රීක ලියවිල්ලෙහි දෙවිගේ නාමය 237 වාරයක් සඳහන් වේ. ඒ සෑම අවස්ථාවක්ම නිවැරදි බව හෙබ්‍රෙව් බසින් ඇති පරිවර්තන කිහිපයක්ම සාක්ෂි සපයයි.

# 1 ආ

## ක්‍රිස්තියානි ග්‍රීක ලියවිල්ලට දෙවිගේ නාමය ඇතුළත් කිරීම

“යෙහෝවා” යන දෙවිගේ නාමය නව ලොව පරිවර්තනයේ ක්‍රිස්තියානි ග්‍රීක ලියවිල්ලට ඇතුළත් කර ඇති ස්ථාන 237 මතු දැක්වේ. එසේ කිරීමට පදනම ඉංග්‍රීසි *NW Ref. Bi.*, යන පරිවර්තනයේ 1565, 1566 යන පිටුවලින් බලන්න.

මතෙව් 1:20, 22, 24; 2:13, 15, 19; 3:3; 4:4, 7, 10; 5:33; 21:9, 42; 22:37, 44; 23:39; 27:10; 28:2 මාක් 1:3; 5:19; 11:9; 12:11, 29, 29, 30, 36; 13:20; ලූක් 1:6, 9, 11, 15, 16, 17, 25, 28, 32, 38, 45, 46, 58, 66, 68, 76; 2:9, 9, 15, 22, 23, 23, 24, 26, 39; 3:4; 4:8, 12, 18, 19; 5:17; 10:27; 13:35; 19:38; 20:37; 42; යොහන් 1:23; 6:45; 12:13, 38, 38; ක්‍රියා 1:24; 2:20, 21, 25, 34, 39, 47; 3:19, 22; 4:26, 29; 5:9, 19; 7:31, 33, 49, 60; 8:22, 24, 25, 26, 39; 9:31; 10:33; 11:21; 12:7, 11, 17, 23, 24; 13:2, 10, 11, 12, 44, 47, 48, 49; 14:3, 23; 15:17, 17, 35, 36, 40; 16:14, 15, 32; 18:21, 25; 19:20; 21:14; රෝම 4:3, 8; 9:28, 29; 10:13, 16; 11:3, 34; 12:11, 19; 14:4, 6, 6, 6, 8, 8, 8, 11; 15:11; 1 කොරින්ති 1:31; 2:16; 3:20; 4:4, 19; 7:17; 10:9, 21, 21, 22, 26; 11:32; 14:21; 16:7, 10; 2 කොරින්ති 3:16, 17, 17, 18, 18; 6:17, 18; 8:21; 10:17, 18; ගලාති 3:6; එපීස 2:21; 5:17, 19; 6:4, 7, 8; කොලොස්සි 1:10; 3:13, 16, 22, 23, 24; 1 තෙසලෝනික 1:8; 4:6, 15; 5:2; 2 තෙ-

සලෝනික 2:2, 13; 3:1; 2 තිමෝති 1:18; 2:19, 19; 4:14; හෙබ්‍රෙව් 2:13; 7:21; 8:2, 8, 9, 10, 11; 10:16, 30; 12:5, 6; 13:6; යාකොබ් 1:7, 12; 2:23, 23; 3:9; 4:10, 15; 5:4, 10, 11, 11, 14, 15; 1 පේතෘස් 1:25; 3:12, 12; 2 පේතෘස් 2:9, 11; 3:8, 9, 10, 12; යූද් 5, 9, 14; එළිදරව් 1:8; 4:8, 11; 11:17; 15:3, 4; 16:7; 18:8; 19:6; 21:22; 22:5, 6.

හලෙලූයා යන යෙදුමෙහිද දෙවිගේ නාමය "යා" ලෙස කෙටියෙන් ඇතුළත් කර තිබේ. හලෙලූයා යන්නෙහි තේරුම වන්නේ, "ජනයෙනි, යෙහෝවා දෙවිට ප්‍රශංසා කරන්න" යන්නයි.—එළිදරව් 19:1, 3, 4, 6.

විශ්වාසවන්ත පරිවර්තකයෙකු මුල් පිටපතෙහි නැති කිසිවක් තම පරිවර්තනයට ඇතුළත් කරන්නේ නැත. ඒ අනුව ක්‍රිස්තියානි ග්‍රීක ලියවිල්ලට දෙවිගේ නාමය ඇතුළත් කළ යුතු ස්ථාන ගැන පරිවර්තන කණ්ඩායම තීරණය කර ඇත්තේ ඉතා සුපරීක්ෂාකාරීවය. ඒ සඳහා පදනමක් ලෙස හෙබ්‍රෙව් ලියවිල්ල සහ වෙනත් හෙබ්‍රෙව් පරිවර්තන භාවිත කර තිබේ. මෙම පරිවර්තනයෙහි යෙහෝවා යන දෙවිගේ නාමය සඳහන්ව ඇති සෑම අවස්ථාවකදීම අඩුම තරමින් එක හෙබ්‍රෙව් පරිවර්තනයකින් හෝ ඒ සඳහා පදනමක් තිබේ.

මුල් ක්‍රිස්තියානීන් ග්‍රීක බසින් සෙප්ටුඅජින්ට් පරිවර්තනයෙන් යම් උපුටා දැක්වීම් කළ විට ඔවුන් දෙවිගේ නාමය ඉවත් කළ බව සිතීමට පදනමක් නැත. ඊට ප්‍රබල සාක්ෂියක් මහාචාර්ය ජෝජ් හවඩ් ලියූ ලිපියක සඳහන් වේ. ඔහු පැවසුවේ, ආගමික නායකයන්ට "මිථ්‍යාදෘෂ්ටිකයන්ගේ" එනම් යුදෙව් ක්‍රිස්තියානීන්ගේ ලියවිලි විනාශ කිරීම මහත් ගැටලුවක් වූ බවයි. "එයට හේතුව එම ලියවිලිවල දෙවිගේ නාමය ඇතුළත් වී තිබීමයි. එම ලියවිලි විනාශ කළොත් දෙවිගේ නාමයත් විනාශ වන බව ඔවුහු නිගමනය කළෝය."

මහාචාර්ය හවඩ් මෙසේද පවසයි. "මුල් සියවසේ ක්‍රිස්තියානීන් අනුගමනය කළ පිළිවෙතට වඩා වෙනස්ව පසු කාලයකදී දෙවිගේ නාමය ශුද්ධ ලියවිල්ලෙන් ඉවත් කරන ලදි. ඒ වන තුරු යුදෙව්වරුන්ගේ දෙවි අන් සියලු දෙවිවරුන්ට වඩා අද්විතීය වූයේ ඔහුගේ නාමය භාවිත කළ නිසාය. නමුත් එම නාමය ඉවත් කිරීමෙන් ඒ අද්විතීයභාවය බොඳ වී ගියේය."

## 2 "ගෙහෙන්නාව" යනු කුමක්ද?

"ගෙහෙන්නා" යන වචනය ග්‍රීක වචනයකි. එය සෑදී තිබෙන්නේ ගෙහින්නොම් යන හෙබ්‍රෙව් වචනයෙනි. එහි තේරුම වන්නේ "හින්නොම් නිම්නය" යන්නයි. "හින්නොම් නිම්නය" ගැන යොෂු 18:16හි සඳහන් වෙයි. ග්‍රීක සෙප්ටුඅජින්ට් පරිවර්තනයේ ඒ සඳහා භාවිත කර තිබෙන්නේ "ගෙහෙන්නා" යන වචනයයි. එම වචනය ක්‍රිස්තියානි ග්‍රීක ලියවිල්ලෙහි 12 වාරයක් සඳහන් වේ. එම අවස්ථා මතු දැක්වේ. මතෙ 5:22, 29, 30; 10:28; 18:9; 23:15, 33; මාක් 9:43, 45, 47; ලූක් 12:5; යාකො 3:6.

අතීතයේ හින්නොම් නිම්නය භාවිත කළේ යෙරුසලමේ ඇති සියලු කැළි කසළ පුළුස්සා දමන ස්ථානයක් ලෙසය. එම ස්ථානයේ ගින්නක් තිබුණු

අතර එම ගින්න දිගටම ඇවිළීම සඳහා ඊට ගෙන්දගම් එකතු කරන ලදි. සතුන්ගේ මළ සිරුරු මෙන්ම සොහොන් ගෙයක තැන්පත් කිරීමට තරම්වත් නොවටිනා අය ලෙස සැලකූ, මරා දමන ලද අපරාධකාරයන්ගේ මළ සිරුරුද එයට දමන ලදි. එම මළ සිරුරු ගින්නට වැටුණොත් ඒවා සම්පූර්ණයෙන්ම පිලිස්සී යයි. ඒවා ගින්නට නොවැටී යම් වළක හෝ බෑවුමක රැඳුණොත් ඒ මළකුණු පණුවන් විසින් සම්පූර්ණයෙන්ම කා දමනු ලබයි. ඉතිරි වන්නේ ඇටසැකිලි පමණි.

මිය ගිය මිනිසුන්ට ගින්න හා නොමියෙන පණුවන් යොදාගෙන සදහටම වධ දීම සංකේතවත් කිරීමට ගෙහෙන්නාව යන වචනය යොදාගත නොහැක. මන්ද කිසිම සතෙකුව හෝ මිනිසෙකුව හෝ වධ දීමේ අරමුණින් පණ පිටින් ගෙහෙන්නාවට දැමුවේ නැත. එහි දමනු ලැබුවේ සොහොන් ගෙයක තැන්පත් කිරීමට තරම්වත් නොවටිනා අය ලෙස සැලකූ අපරාධකාරයන්ගේ සිරුරු පමණි. මිය ගිය කෙනෙකු සොහොන් ගෙයක තැන්පත් කිරීම ඔහුට නැවත නැඟිටීමක් ලැබෙන බවට සංකේතයකි. එහෙයින් යේසුස් ගෙහෙන්නාව භාවිත කළේ කෙනෙකුට සදාකාල විනාශයක් ලැබෙන බව පෙන්වීමටය. එවැනි කෙනෙකුව දෙවි සෑදූ මුළු මහත් විශ්වයෙන්ම සදහටම තුරන් කරනු ලැබේ. එය “දෙවෙනි මරණය” ලෙසද හැඳින්වේ. එය සදාකාලික දඬුවමකි.

# 3 “ආත්මය” යන වචනය භාවිත නොකිරීමට හේතු

බොහෝ සිංහල බයිබල් පරිවර්තනවල “ආත්මය” හා ඊට සමාන වචන දක්නට ලැබේ. එම වචන යොදාගෙන තිබෙන්නේ රුවා යන හෙබ්‍රෙව් වචනය සහ නියුමා යන ග්‍රීක වචනය පරිවර්තනය කිරීමටය. නමුත් එය නිවැරදි පරිවර්තනයක් නොවේ. එසේ පැවසීමට හේතු මතු දැක්වේ.

හෙබ්‍රෙව් ලියවිල්ලෙහි රුවා යන හෙබ්‍රෙව් වචනය 260 වාරයක් දක්නට ලැබේ. එය මුලින්ම දක්නට ලැබෙන්නේ උත් 1:2හිය. රුවා යන වචනය මූලිකවම භාවිත කරන්නේ “හුස්ම” යන අදහස විස්තර කිරීමටය. නමුත් ඒ වචනය වෙනත් දේවල් විස්තර කිරීමටද භාවිත කෙරේ. එයින් කුමක් විස්තර කළත් ඒ සෑම දෙයකටම පොදු ලක්ෂණ දෙකක් තිබේ. එනම් එය නොපෙනෙන දෙයක් වීමත් ප්‍රබල ක්‍රියාකාරිත්වයක් ඇති දෙයක් වීමත්ය. එය ඇසට නොපෙනෙන දෙයක් වුවත් එහි ප්‍රතිඵල පැහැදිලිව දැකගත හැක.

රුවා යන හෙබ්‍රෙව් වචනය සඳහා ක්‍රිස්තියානි ග්‍රීක ලියවිල්ලෙහි භාවිත කර තිබෙන්නේ නියුමා යන ග්‍රීක වචනයයි. එම වචනය එහි 334 වාරයක් දක්නට ලැබෙන අතර එය මුලින්ම සඳහන් වන්නේ මතෙ 1:18හිය. එම වචනය මෙම පරිවර්තනයේ “දෙවිගේ

බලය" ලෙස දක්වා ඇත. රුවා සහ නියුමා යන වචන දෙකම පරිවර්තනය කර ඇත්තේ එහි අවට පාඨ සම්බන්ධයේ දක්වා ඇති අදහස සැලකිල්ලට ගෙනය. එය විවිධාකාරව භාවිත කර ඇති ආකාරය මතු දැක්වේ.

**සුළඟ ලෙස**

උත් 8:1; නික් 10:13; 1රාජා 18:45; යොහ 3:8

**දෙවිගේ බලය ලෙස**

උත් 1:2; 41:38; ගණන් 11:25; විනි 6:34; 1සාමු 19:20; 2ලේක 24:20; යෙසා 11:2; එස 11:5; සෙක 4:6; මතෙ 1:18; 28:19; මාක් 1:8; ලූක් 1:67; 2:27; යොහ 14:26; ක්‍රියා 1:8; 2:33; රෝම 5:5; 8:15, 16; 2කොරි 13:14; එෆී 3:16; 4:4; 1තෙස 5:19; තීත 3:5; යූද් 20

**ජීවන හුස්ම හෙවත් ජීව බලය ලෙස**

උත් 6:17; යෝබ් 27:3; 34:14; ගීතා 146:4; දේශ 3:19; 12:7; යෙසා 42:5; ලූක් 8:55; 23:46

**නොපෙනෙන දෙවි ලෙස**

යොහ 4:24; 2කොරි 3:17, 18

**දේවදූතයන්, භූතයන් ඇතුළු වෙනත් නොපෙනෙන ජීවීන් ලෙස**

1රාජා 22:21; එස 3:12; 8:3; මතෙ 8:16; 10:1; මාක් 3:11; 3:30; 1කොරි 15:45; හෙබ්‍රෙ 1:7; 1පේතෘ 3:18

**ආකල්ප හා හැඟීම් ලෙස**

උත් 45:27; නික් 35:21; ගණන් 14:24; යෝබ් 17:1; 2රාජා 2:9, 15; හිතෝ 25:28; යෙසා 57:15; දානි 2:1; ලූක් 1:17; යොහ 11:33; 13:21; ක්‍රියා 17:16; 1කොරි 16:18; 2කොරි 2:13; 7:13; 1තෙස 5:23

**දෙවිගෙන් හෝ වෙනත් නොපෙනෙන කෙනෙකුගෙන් ලැබෙන බවට පෙනෙන පණිවිඩයක් ලෙස**

2තෙස 2:2; 1තිමෝ 4:1; 1යොහ 4:1

# 4 මුදල් සහ මිනුම්

මතු දැක්වෙන තොරතුරුවලට පදනමක් ලෙස බයිබලයේ තිබෙන සාක්ෂි සහ පුරාවිද්‍යාවෙන් සොයාගත් දේ භාවිත කර ඇත. මෙහි දක්වා තිබෙන අගයන් ආසන්න වශයෙන් ගණනය කළ ඒවා වේ.

වර්තමානයේ රන්වල හෝ රිදීවල අගය ගණනය කිරීමට ග්‍රෑම් එකක හෝ අවුන්සයක වටිනාකම කුමක්ද කියා සොයා එය නියමිත ග්‍රෑම් හා අවුන්ස ගණනින් වැඩි කරන්න.

"සැතපුම." ග්‍රීක බසින්, මිලියොන්. (මතෙ 5:41) මෙය රෝම සැතපුම විය හැක (සැතපුමක් රෝම අඩි 5,000යි; මීටර් 1,479.5යි; ඉංග්‍රීසි අඩි 4,854යි). ලූක් 24:13හි, යොහ 6:19හි සහ යොහ 11:18හි ග්‍රීක පිටපත්වල "ස්ටේඩියම්" යන මිනුම භාවිත කර ඇත (රෝම ස්ටේඩියා එකක් රෝම සැතපුමකින් 1/8ක් හෝ රෝම අඩි 625ක්, මීටර් 185ක් හෝ ඉංග්‍රීසි අඩි 606.75ක් වේ.) මෙම පරිවර්තනයේ ස්ටේඩියා වෙනුවට අඩි 5,280ක් දිග සැතපුම් හා කිලෝමීටර් භාවිත කර ඇත. නිදසුනකට ලූක් 24:13හි, "ස්ටේඩියා හැටක්" "සැතපුම් හතක් පමණ" දුරක් ලෙස දක්වා ඇත (එනම් කිලෝමීටර් 11ක් හෝ රෝම සැතපුම් 7.5 පමණි).

## හෙබ්‍රෙව් ලියවිල්ලෙහි සඳහන් මුදල් සහ මිනුම්

| | | | නවීන මිනුම |
|---|---|---|---|
| ගේරා 1ක් | = ෂෙකෙල් 1/20 | = ග්‍රෑ. 0.57 | = ට්‍රෝයි අවු. 0.01835 |
| බෙකා 1ක් (ෂෙකෙල් භාගය) | = ගේරා 10 | = ග්‍රෑ. 5.7 | = ට්‍රෝයි අවු. 0.1835 |
| ෂෙකෙල් 1ක් | = බෙකා 2 | = ග්‍රෑ. 11.4 | = ට්‍රෝයි අවු. 0.367 |
| මීනා (මෙනා) 1ක් | = ෂෙකෙල් 50 | = ග්‍රෑ. 570 | = ට්‍රෝයි අවු. 18.35 |
| තලෙන්ත 1ක් | = මීනා 60 | = කිලෝ. 34.2 | = ට්‍රෝයි අවු. 1101 |
| දරික් 1ක් (පර්සියානු රන් මිනුමක්) | | = ග්‍රෑ. 8.4 | = ට්‍රෝයි අවු. 0.27 |
| දරික් 1ක් (පර්සියානු රිදී මිනුමක්) (ෂෙකෙල් ලෙසද හැඳින්වේ) | | = ග්‍රෑ. 5.60 | = ට්‍රෝයි අවු. 0.18 |

## ග්‍රීක ලියවිල්ලෙහි සඳහන් ග්‍රීක හා රෝමානු මුදල්

| | | | නවීන මිනුම |
|---|---|---|---|
| ලෙප්ටන් 1ක් (තඹ හෝ ලෝකඩ යුදෙව් කාසියක්) | = ක්වොඩ්‍රන් 1/2 | | |
| ක්වොඩ්‍රන් 1ක් (තඹ හෝ ලෝකඩ රෝම කාසියක්) | = ලෙප්ටන් 2 | | |
| 1 අසේරියන් (රෝමයේ හා ඊට අයත් පළාත්වල තඹ හෝ ලෝකඩ කාසියක්) | = ක්වොඩ්‍රන් 4 | | |
| ඩිනාරි 1ක් (රෝමානු රිදී කාසියක්) | = අසේරියන් 16 | = ග්‍රෑ. 3.85 | = ට්‍රෝයි අවු. 0.124 |
| ඩ්‍රැක්මා1ක් (ග්‍රීක රිදී කාසියක්) | | = ග්‍රෑ. 3.40 | = ට්‍රෝයි අවු. 0.109 |
| ඩිඩ්‍රැක්මා 1ක් (ග්‍රීක රිදී කාසියක්) | = ඩ්‍රැක්මා 2 | = ග්‍රෑ.6.80 | = ට්‍රෝයි අවු. 0.218 |
| ටෙට්‍රාඩ්‍රැක්මා 1ක් (රිදී ස්ටේටර් කාසියක්) | = ඩ්‍රැක්මා 4 | = ග්‍රෑ. 13.6 | = ට්‍රෝයි අවු. 0.436 |
| මීනා 1ක් | = ඩ්‍රැක්මා 100 | = ග්‍රෑ. 340 | = ට්‍රෝයි අවු. 10.9 |
| තලෙන්ත 1ක් (රන් හෝ රිදී) | = මීනා 60 | = කිලෝ. 20.4 | = ට්‍රෝයි අවු. 654 |

## දියර මැනීම

| | | | |
|---|---|---|---|
| ලොග් 1ක් | = කැබ් 1/4 | = ලීටර් 0.31 | = පයින්ට් 0.66 (එ.ජ.) |
| කැබ් 1ක් | = ලොග් 4 | = ලීටර් 1.22 | = පයින්ට් 2.58 (එ.ජ.) |
| හින 1ක් | = කැබ් 3 | = ලීටර් 3.67 | = පයින්ට් 7.75 (එ.ජ.) |
| බාත් 1ක් | = හින 6 | = ලීටර් 22 | = ගැලුම් 5.81 (එ.ජ.) |
| කෝර්* 1ක් | = බාත් 10 | = ලීටර් 220 | = ගැලුම් 58.1 (එ.ජ.) |

*වියළි මිනුමක්ද වේ. එය එක හෝමර ඒකකයකට සමාන වෙයි.

## බර මැනීම

| | | | |
|---|---|---|---|
| කැබ් 1ක් | = ලොග් 4 | = ලීටර් 1.22 | = වියළි පයින්ට් 2.2 (එ.ජ.) |
| ඕමෙර 1ක් | = කැබ් 1 4/5 | = ලීටර් 2.2 | = වියළි කාර්තු 2 (එ.ජ.) |
| සෙයා 1ක් | = ඕමෙර 3 1/3 | = ලීටර් 7.33 | = වියළි කාර්තු 6.66 (එ.ජ.) |
| ඒපා 1ක් | = සෙයා 3 | = ලීටර් 22 | = වියළි කාර්තු 20 (එ.ජ.) |
| හෝමර (කෝර්) 1ක් | = ඒපා 10 | = ලීටර් 220 | = වියළි කාර්තු 200 (එ.ජ.) |

## දිග පළල මැනීම

| | | | |
|---|---|---|---|
| ඇඟිල්ලක් | = අල්ලකින් 1/4 | = සෙ.මී. 1.85 | = අඟල් 0.72 |
| අල්ලක් | = ඇඟිලි 4 | = සෙ.මී. 7.4 | = අඟල් 2.9 |
| වියතක් | = අල්ලවල් 3 | = සෙ.මී. 22.2 | = අඟල් 8.75 |
| රියනක් | = වියත් 2 | = සෙ.මී. 44.5 | = අඟල් 17.5 |
| දිග රියනක්* | = අල්ලවල් 7 | = සෙ.මී. 51.8 | = අඟල් 20.4 |
| දණ්ඩක් | = රියන් 6 | = මී. 2.67 | = අඩි 8.75 |
| දිග දණ්ඩක් | = දිග රියන් 6 | = මී. 3.11 | = අඩි 10.2 |
| බඹයක් | | = මී. 1.8 | = අඩි 6 |

*2ලේක 3:3හි සඳහන්, “අතීතයේ පාවිච්චි කළ” රියන විය හැක.

**5**

## යේසුස්—දෙවිට යම් සමානකමක් ඇති බලවත් පුද්ගලයෙක්
## යොහන් 1:1—“‘වචනය’ නමැති එම තැනැත්තා දෙවිට සමානකමක් ඇති බලවත් කෙනෙකි”
## ග්‍රීක බසින්, καὶ θεὸς ἦν ὁ λόγος
## *(කායි තෙඔස් එන් හෝ ලෝගොස්)*

| | | |
|---|---|---|
| 1808 | “වචනය නමැත්තා දෙවි කෙනෙක් හා සමාන විය” | *The New Testament, in An Improved Version, Upon the Basis of Archbishop Newcome's New Translation: With a Corrected Text*, London. |
| 1829 | “ලෝගොස් දෙවි කෙනෙක් හා සමාන විය” | *The Monotessaron*; or, *The Gospel History, According to the Four Evangelists*, Vol. 1, by John S. Thompson, Baltimore. |
| 1864 | “වචනය නමැත්තා දෙවි කෙනෙක් හා සමාන විය” | *The Emphatic Diaglott* ($J^{21}$, interlinear reading), by Benjamin Wilson, New York and London. |
| 1879 | “වචනය නමැති ඒ තැනැත්තා දෙවිට සමානකමක් ඇති කෙනෙක් විය”* | *La Sainte Bible*, Segond-Oltramare, Geneva and Paris. |
| 1928 | “වචනය නම් තැනැත්තා දේවත්වයේ ලා සැලකිය යුතු කෙනෙක් විය* | *La Bible du Centenaire*, Société Biblique de Paris. |
| 1935 | “වචනය නමැති තැනැත්තා දෙවි හා සමාන කෙනෙක් විය” | *The Bible—An American Translation*, by J. M. P. Smith and E. J. Goodspeed, Chicago. |
| 1950 | “ ‘වචනය’ නමැති එම තැනැත්තා දෙවිට සමානකමක් ඇති බලවත් කෙනෙකි” | *New World Translation of the Christian Greek Scriptures*, Brooklyn. |
| 1975 | “වචනය නමැත්තා දෙවි කෙනෙක් (දේවත්වයේ ලා සැලකිය යුතු කෙනෙක්) විය”# | *Das Evangelium nach Johannes*, by Siegfried Schulz, Göttingen, Germany. |
| 1978 | “ලෝගොස් දෙවිට සමාන ගතිලක්ෂණ ඇති කෙනෙක් විය”# | *Das Evangelium nach Johannes*, by Johannes Schneider, Berlin. |
| 1979 | “ලෝගොස් යනු දෙවිට සමාන කෙනෙකි”# | *Das Evangelium nach Johannes*, by Jürgen Becker, Würzburg, Germany. |

* ප්‍රංශ භාෂාවෙනි.
\# ජර්මන් භාෂාවෙනි.

එම වාක්‍යය අනුවාද කිහිපයක ඉහත සඳහන් ආකාරයට පරිවර්තනය කර ඇත.

ඉංග්‍රීසි, ප්‍රංශ හා ජර්මන් පරිවර්තන, ‘වචනය’ නමැති තැනැත්තාව සියලු බලැති දෙවි ලෙස දක්වා නැත්තේ මුල් පිටපත්වල සඳහන්ව ඇති ග්‍රීක වචනය එවැනි අදහසකට ඉඩ නොතබන නිසාය. ග්‍රීක බසින් වාක්‍යයක් තනද්දී එහි උක්තය හා ආඛ්‍යාතය එකම ස්වරූපයෙන් තිබෙන විට උක්තය හා ආඛ්‍යාතය එක හා සමානය. එවැනි සමානකමක් නැති විට උක්තය හා ආඛ්‍යාතය එක හා සමාන නොවේ. ඉහත සඳහන් වාක්‍යයෙහි උක්තය හා ආඛ්‍යාතය අතර එවැනි සමානකමක් දක්නට නැත. ඒ අනුව ‘වචනය’ නමැති තැනැත්තා යන කර්තෘව විස්තර කිරීමට භාවිත කර තිබෙන්නේ සියලු බලැති දෙවි සඳහා භාවිත කරන “හෝ තෙඔස්” යන යෙදුම් නොව “තෙඔස්” යන යෙදුම පමණි. වාක්‍යයක

ආඛ්‍යාතයක් "හෝ" යන කොටස රහිතව භාවිත කරන විට එය එම වාක්‍යයේ කර්තෘ පිළිබඳ විස්තරයක් පමණි. ඒ අනුව 'වචනය' නමැති තැනැත්තාව විස්තර කිරීමට "තෙඔස්" යන වචනය භාවිත කර ඇත්තේ ඔහු සියලු බලැති දෙවි කියා පැවසීමට නොවේ. ඒ වෙනුවට ඔහු දෙවිට සමාන ගතිලක්ෂණ ඇති ඉතා බලවත් කෙනෙකු බව විස්තර කිරීමටය.

ග්‍රීක පිටපත්වල ඒ හා සමාන උදාහරණ කිහිපයක්ම මාක් 6:49; 11:32; යොහන් 4:19; 6:70; 8:44; 8:48; 9:17; 10:1, 13, 33; 12:6; 18:37 යන පදවල දක්නට ලැබේ. ශුද්ධ ලියවිල්ලෙන් ලබාගත හැකි සෑම තොරතුරක්ම මෙම පරිවර්තනය නිවැරදි බව සනාථ කරයි.

ෆිලිප් බී. හානර් නම් ලේඛකයා එම නිගමනය තමන් ලියූ ලිපියක සනාථ කරයි. ඔහු පවසන්නේ "යොහන් 1:1හි සඳහන් තොරතුරු 'වචනය' නමැති තැනැත්තා සියලු බලැති දෙවි බව පෙන්නුම් කිරීමට කොහොමටවත් යොදාගත නොහැකි බවය."—Qualitative Anarthrous Predicate Nouns: Mark 15:39 and John 1:1," published in *Journal of Biblical Literature*, Vol. 92, Philadelphia, 1973, p. 85.

# 6 "වධකණුව"

යේසුස්ව හිස්කබල නම් ස්ථානයේදී මරා දැමීමට යොදාගත් දේ විස්තර කිරීමට මෙම පරිවර්තනයේ "වධකණුව" යන වචනය භාවිත කර තිබේ. (මතෙව් 27:40) මුල් ග්‍රීක පිටපත්වල ඒ සඳහා භාවිත කර තිබෙන්නේ ස්ටාව්රොස් යන වචනයයි. එම වචනයෙන් කුරුසය යන අදහස ලබා දෙන බවට කිසිම පදනමක් නැත. කුරුසය, ක්‍රිස්තුස් ජීවත් වූ කාලයට පෙර සියවස් ගණනාවක් පුරා මිථ්‍යා ආගමික සංකේතයක් ලෙස භාවිත කරන ලදි.

ස්ටාව්රොස් යන වචනය උගත් ග්‍රීකවරුන් භාවිත කළ සම්භාව්‍ය ග්‍රීක භාෂාවට අයත් වචනයකි. එහි අර්ථය වූයේ කණුවක් නැත්නම් ආධාරක කණුවක් යන්නයි. එම කණුව හරහා තවත් කණුවක් බැඳ තිබුණේ නැත. බයිබල් ලේඛකයන් යොදාගත් පොදු ජනයා භාවිත කළ ග්‍රීක භාෂාවේද (කීනි) ස්ටාව්රොස් යන වචනය ඒ අර්ථයෙන්ම භාවිත කරන ලදි. පේතෘස් සහ පාවුල් යන බයිබල් ලේඛකයෝ යේසුස්ව මරණයට පත් කළ ආකාරය ගැන විස්තර කරන විට තවත් ග්‍රීක වචනයක් වන ක්සිලොන් භාවිත කළෝය. එම වචනය ස්ටාව්රොස් යන වචනයේ අර්ථයට සමානයි. (ක්‍රියා 5:30; 10:39; 13:29; ගලාති 3:13; 1 පේතෘස් 2:24) ක්සිලොන් යන වචනය ග්‍රීක සෙප්ටුඅජින්ට් පරිවර්තනයේද භාවිත කර ඇත. (එස්රා 6:11) එහි එය භාවිත කර තිබෙන්නේ ක්‍රියා 5:30; 10:39හි ක්සිලොන් භාවිත කර ඇති අයුරින්මය.

ස්ටාව්රොස් යන වචනයේ අර්ථය ගැන විශාරදයෙකු වන ඩබ්.ඊ. වයින් පවසන්නේ මෙයයි. "ස්ටාව්රොස්

යන වචනය භාවිත කර තිබෙන්නේ අපරාධකරුවන්ව එල්ලා මරා දැමීමට භාවිත කළ කණුව විස්තර කිරීමටය. මුලින් එම වචනය භාවිත කළ ආකාරය ගැන සලකා බලන විට කෙළින් සිටවූ කණුවක් හරහා තවත් කණුවක් බැඳ තිබූ බවක් එයින් අදහස් නොවූ බව පැහැදිලිය. කුරුස සංකල්පය බිහි වූයේ පුරාණ කල්දිය (බැබිලෝනිය) දේශයේය. එය භාවිත කළේ තම්මුස් නම් දෙවියාගේ සංකේතයක් ලෙසය. එම සංකේතය කල්දිය දේශයේ හා ඊජිප්තුව ඇතුළුව අවට දේශවල භාවිත කරන ලදි. ක්‍රිස්තු වර්ෂ දෙසිය ගණන්වල මැද භාගය වන විට ක්‍රිස්තියානි සභාවන් ඇතැම් සත්‍ය ඉගැන්වීම්වලින් බැහැර වී තිබිණ. අන්‍යාගම්කයන්ව තම ආගමට බඳවාගෙන තම අණසක පැතිර වීමේ අදහසින් ඔවුහු ඇතැම් මිථ්‍යා ආගමික සංකේත හා විශ්වාසයන් ක්‍රිස්තියානි ආගමට එකතු කරගැනීමට කැමති වූහ. ඒ අනුව ඔවුන් තම්මුස්ගේ සංකේතය වූ කුරුසය ක්‍රිස්තුස්ගේ සංකේතයක් ලෙස හඳුන්වා දෙන ලදි."—*An Expository Dictionary of New Testament Words* (1966 reprint), Vol. I, p. 256.



ක්‍රෑක්ස් සිම්ප්ලෙක්ස්

ලතින් භාෂාවේ ඒ සඳහා භාවිත කළ වචනය ක්‍රෑක්ස් යන්නයි. ලූවිස් සහ ෂෝට් යන විශාරදයන් දෙදෙනා පිළියෙල කළ ලතින් ශබ්දකෝෂයට එකඟව ක්‍රෑක්ස් යන වචනය මුලින් භාවිත කළේ, "ගසක කඳක් හෝ අපරාධකරුවන්ව එල්ලා මරා දැමීම සඳහා භාවිත කළ කණුවක් හා සමාන ලීයෙන් සෑදූ දෙයක්" විස්තර කිරීමටය.

අපරාධකරුවන්ව මරා දැමීමට භාවිත කළ තනි කණුවක් සඳහා කෲක්ස් සිම්ප්ලෙක්ස් යන ලතින් යෙදුම භාවිත කරන ලදි. එහි රූප සටහනක් ජස්ටස් ලිප්සියස් (1547-1606) නම් ලේඛකයාගේ පොතක දක්නට ලැබේ. (පින්තූරය බලන්න.) කෲක්ස් යන වචනයට කුරුසය යන අර්ථය ලැබුණේ පසු කාලයකදීය.—*De cruce libri tres*, Antwerp, 1629, p. 19.

හේර්මාන් ෆුල්ඩා නම් ලේඛකයා එක් පොතක මෙසේ සඳහන් කරයි. "අපරාධකරුවන්ව ප්‍රසිද්ධියේ එල්ලා මරා දැමූ සෑම අවස්ථාවකදීම ගස් සොයාගත නොහැකි වූ නිසා කණුවක් භාවිත කරන ලදි. අපරාධකරුවන්ගේ අත් දෙක ඔසවා කණුවට බැඳ තබන ලදි. පාදද කණුවට බඳින ලදි. එසේ නැතහොත් ඔවුන්ව කණුවට ඇණ ගසන ලදි. ඉන්පසු එම කණුව වළක් හාරා පොළොවේ සිටවනු ලැබේ. යේසුස්ව මරා දමනු ලැබුවේද එයාකාරයටය. ඒ බවට සාක්ෂි එවකට අපරාධකරුවන්ව මරා දැමීමට භාවිත කළ ක්‍රම, යේසුස්ව මරා දැමූ ආකාරය ගැන තිබෙන අමතර වාර්තා සහ මුල් කාලයේ සිටි ක්‍රිස්තියානි නායකයන්ගේ අදහස් යනාදිය පරීක්ෂා කිරීමෙන් සොයාගත හැක."—*Das Kreuz und die Kreuzigung* (The Cross and the Crucifixion), by Hermann Fulda, Breslau, 1878, p. 109, 219, 220.

ස්විට්සර්ලන්තයේ බේසෙල් සරසවියේ මහාචාර්යවරයෙකු වූ පෝල් විල්හෙල්ම් ෂ්මිට් යේසුස්ගේ ඉතිහාසය ගැන ලියූ කෘතියක ස්ටාව්රොස් යන ග්‍රීක වචනය ගැන පුළුල් විග්‍රහයක් කළේය. එම පොතෙහි මෙසේ සඳහන් වේ. "ස්ටාව්රොස් යන වචනය භාවිත කළේ තනි කණුවක් හෝ ගසක කඳක් විස්තර කිරීමටය." යේසුස්ව මරා දැමූ ආකාරය ගැන එහි මෙසේද සඳහන් වේ. "සුවිශේෂවල තිබෙන වාර්තාවලට අනුව කසයෙන් තැළූ යේසුස්ව මරා දැමීම සඳහා රෝමවරුන් යොදාගත්තේ අපරාධකරුවන්ව මරා දැමීම සඳහා පොදුවේ භාවිත කළ ක්‍රමයයි. ඒ අනුව ඔවුහු යේසුස්ගේ ඇඳුම් ඉවත් කර ඔහුව කණුවක එල්ලා තැබුවෝය. ඊට පෙරාතුව යේසුස්ව තවත් නින්දාවට පත් කිරීමේ අදහසින් එම කණුව තමාව මරා දමන ස්ථානය වෙත ඇදගෙන යෑමට ඔවුහු ඔහුට බල කළෝය. අපරාධකරුවන්ව මරා දැමීමට තනි කණුවක් මිස වෙනත් කිසිවක් භාවිත නොකළ බව බාහිර මූලාශ්‍ර කිහිපයකින්ම පැහැදිලි වේ. නිදසුනකට වාරුස් නමැත්තාගේ අධීක්ෂණය යටතේ 2,000දෙනෙකුව එසේ මරා දමන ලදි. (Jos. Ant. XVII 10. 10), ක්වොඩ්‍රාටස් නමැත්තාද (Jewish Wars II 12. 6), ආණ්ඩුකාර ෆීලික්ස්ද (Jewish Wars II 15. 2 [13.2]), ටයිටස්ද (Jewish Wars VII. 1 [V 11. 1]) එසේ කළ බවට සාක්ෂි ඇත."—*Die Geschichte Jesu*, Vol. 2, Tübingen and Leipzig, 1904, pp. 386-394.

ඉහත සඳහන් කරුණුවලින් පැහැදිලි වන්නේ යේසුස්ව මරා දැමීමට කුරුසයක් භාවිත කළ බවට කිසිදු සාක්ෂියක් නැති බවය. ශුද්ධ වූ දේවවචනයට කිසිදු මිථ්‍යාදෘෂ්ටික අදහසක් ඇතුළත් නොකිරීම අපගේ ස්ථාවරයයි. ඒ අනුව ස්ටාව්රොස් සහ ක්සිලොන් යන වචන "වධකණුව" හෝ "කණුව" ලෙස පමණක් පරිවර්තනය කිරීමට තීරණය කර ඇත. මීට අමතරව තම ගෝලයන්ට මුහුණ දීමට සිදු වන වධ හිංසා හා ලැජ්ජාව විස්තර කිරීමටද යේසුස් ස්ටාව්රොස් යන වචනය භාවිත කළේය.—මතෙව් 16:24.

# 7

## ක්‍රිස්තුස් පැමිණ සිටින කාලය
## මතෙව් 24:3—ග්‍රීක බසින්, පරූසියා

1864 "ඔබේ පැමිණ සිටීමට ලකුණ" *The Emphatic Diaglott* (J[21]), by Benjamin Wilson, New York and London.

1897 "ඔබේ පැමිණ සිටීමට ලකුණ" *The Emphasised Bible*, by J. B. Rotherham, Cincinnati.

1903 "ඔබේ පැමිණ සිටීමට සලකුණ" *The Holy Bible in Modern English*, by F. Fenton, London.

1950 'ඔබ පැමිණ සිටින කාලයට ලකුණ' *New World Translation of the Christian Greek Scriptures*, Brooklyn.

පරූසියා යන වචනය ඉහත සඳහන් ආකාරයට පරිවර්තනය කර ඇති වෙනත් බයිබල් අනුවාද කිහිපයක් මතු දැක්වේ.

පරූසියා යන ග්‍රීක වචනය ක්‍රිස්තියානි ග්‍රීක ලියවිල්ලෙහි ස්ථාන 24ක දැකගත හැක. එම ස්ථාන මතු දැක්වේ. මතෙව් 24:3, 27, 37, 39; 1 කොරින්ති 15:23; 16:17; 2 කොරින්ති 7:6, 7; 10:10; පිලිප්පි 1:26; 2:12; 1 තෙසලෝනික 2:19; 3:13; 4:15; 5:23; 2 තෙසලෝනික 2:1, 8, 9; යාකොබ් 5:7, 8; 2 පේතෘස් 1:16; 3:4, 12; 1 යොහන් 2:28. එම වචනයෙන් සරලව අදහස් කරන්නේ යම් කෙනෙකු ළඟට පැමිණ "රැඳී සිටීම" යන්නයි.

පරූසියා යන වචනයට සම්බන්ධ තවත් ග්‍රීක ක්‍රියා පදයක් වන පරෙයිමි ක්‍රිස්තියානි ග්‍රීක ලියවිල්ලෙහි 24 වාරයක් දක්නට ලැබේ. එම ස්ථාන මතු දැක්වේ. මතෙව් 26:50; ලූක් 13:1; යොහන් 7:6; 11:28; ක්‍රියා 10:21, 33; 12:20; 17:6; 24:19; 1 කොරින්ති 5:3, 3; 2 කොරින්ති 10:2, 11; 11:9; 13:2, 10; ගලාති 4:18, 20; කොලොස්සි 1:6; හෙබ්‍රෙව් 12:11; 13:5; 2 පේතෘස් 1:9, 12; එළිදරව් 17:8.

පරූසියා යන වචනය "පැමිණීම" යන අර්ථය ඇති එලියුසිස් යන වචනයට වඩා වෙනස්ය. එම වචනය ග්‍රීක පිටපත්වල එක් වතාවක් එනම්, ක්‍රියා 7:52හි දක්නට ලැබේ. එම වචන දෙක එක හා සමාන අදහසක් ඇති වචන දෙකක් නොවේ. එක් මූලාශ්‍රයක මෙසේ සඳහන් වේ. "[පරූසියා සහ පරෙයිමි] යන වචන ක්‍රිස්තුස් මිනිසෙකු ලෙස පැමිණි අවස්ථාව විස්තර කිරීමටවත් ඔහු විනිශ්චය සඳහා නැවත පැමිණෙන අවස්ථාව විස්තර කිරීමටවත් භාවිත කරන්නේ නැත. එවැනි අදහසක් ක්‍රිස්තියානි ඉගැන්වීම්වලට හඳුන්වා දෙනු ලැබුවේ පසු කාලයේදීය. එනම් ජස්ටින් නම් දාර්ශනිකයා විසූ ක්‍රි.ව. දෙවෙනි සියවසට පසුවය. . . . මුල් ක්‍රිස්තියානි ඉගැන්වීම්වල එවැනි මතයක් කිසි ලෙසකින්වත් උගන්වා තිබුණේ නැත."—*Theological Dictionary of the New Testament*, Vol. V, p. 865.

ඉස්රේල් පී. වොරන් ඒ ගැන මෙසේ අදහස් පළ කළේය. "සාමාන්‍යයෙන් අප පුරුදු වී සිටින්නේ ක්‍රිස්තුස් 'දෙවෙනි වරට පැමිණීම,' හෝ ඔහුගේ 'නැවත පැමිණීම' ගැන කතා කිරීමටය. එහෙත් පරූසියා යන වචනය ඒ අර්ථයෙන් ශුද්ධ ලියවිල්ලෙහි භාවිත කර නැත. පරූසියා යන්න භාවිත කර තිබෙන්නේ ඉතා සුවිශේෂ වූ, කලින් සිදු නොවූ, නැවතත් සිදු නොවන කාල

පරිච්ඡේදයක් විස්තර කිරීමටය. එය භාවිත කරන්නේ යේසුස් මිනිසුන් ඉදිරියේ පෙනී සිටි අන් සියලු අවස්ථාවලට වඩා වෙනස් හා වැදගත් වූ කාල පරිච්ඡේදයක් විස්තර කිරීම සඳහාය. ඒ අනුව එය අද්විතීය කාල පරිච්ඡේදයක් ලෙස සැලකිය යුතුයි.—*The Parousia*, Portland, Maine (1879), pp. 12-15.

තවත් කෘතියක මෙසේ සඳහන් වේ. "උසස් නිලතල දරන කෙනෙක්, විශේෂයෙන්ම රජෙක් හෝ පාලකයෙක් තම අණසක යටතේ පවතින ප්‍රදේශය බැහැදැකීමට පැමිණ සිටින අවස්ථාව විස්තර කිරීමට පරූසියා යන වචනය භාවිත කරන ලදි." (*A Greek-English Lexicon of the New Testament and Other Early Christian Literature*, by W. Bauer, second English ed., by F. W. Gingrich and F. W. Danker, Chicago and London (1979), p. 63) මතෙව් 24:3; 1 තෙසලෝනික 3:13 සහ 2 තෙසලෝනික 2:1 වැනි පදවල පරූසියා යන වචනය භාවිත කර තිබෙන්නේ පවතින මෙම සමාජයේ අවසාන කාලයේදී ස්වර්ගයේ රජු ලෙස යේසුස් ක්‍රිස්තුස් පැමිණ සිටින කාල පරිච්ඡේදය විස්තර කිරීමටය.

## 8 "වේශ්‍යාකම" යන්නෙන් අදහස් කරන දේ මතෙව් 5:32

වේශ්‍යාකම යන වචනය පරිවර්තනය කර තිබෙන්නේ *පෝර්නියා* යන ග්‍රීක වචනයෙනි. එක් විශ්වකෝෂයක එම වචනය විස්තර කර තිබෙන්නේ, "*ගණිකා වෘත්තියේ නියැලීම, වේශ්‍යාකම් කිරීම, අනාචාරයේ යෙදීම හා සමාජය වැරදි දෙයක් ලෙස හෙළාදකින සියලුම ලිංගික සම්බන්ධකම්වල නියැලීම*" ලෙසය.—*A Greek-English Lexicon of the New Testament and Other Early Christian Literature*, by W. Bauer, second English ed., by F. W. Gingrich and F. W. Danker, Chicago and London (1979) p. 693.

මතෙව් 5:32හි සහ 19:9හි සඳහන් යේසුස්ගේ වදන් ගැන තවත් විශ්වකෝෂයක සඳහන් වන්නේ මෙයයි. "*පෝර්නියා* [πορνεία] යන වචනය භාවිත කර තිබෙන්නේ විවාහ සහකරු හෝ සහකාරිය නොවන වෙනත් ඕනෑම කෙනෙකු සමඟ ලිංගික සම්බන්ධකම්වල යෙදීම විස්තර කිරීමටය." ඉන් පැහැදිලි වන්නේ ශුද්ධ ලියවිල්ලෙහි පොර්නියා යන වචනය විවාහ වී සිටින අයටත් භාවිත කළ හැකි බවය. එෆීස 5:3, 5හි වදන් ගැන එහි මෙලෙසද සඳහන් වේ. "ලිංගික සම්බන්ධකම්වලින් වැළකී සිටීමට සෑම කෙනෙකුටම නොහැකි බව පාවුල් පිළිගනී. (1 කොරින්ති 7:7) ලිංගික සම්බන්ධකම්වලින් වැළකී සිටීමට නොහැකි තනිකඩ පුරුෂයෙක් වේශ්‍යාකම් කිරීමේ උගුලට හසු නොවීම සඳහා නීත්‍යානුකූලව විවාහ විය යුතුයි. එසේ කිරීමට දෙවි අනුමැතිය දී තිබේ. (1 කොරින්ති 7:2)" (*Theological Dictionary of the New Testament*, Vol. VI, p. 592, 594.) ඉන් පැහැදිලි වන්නේ ශුද්ධ ලිය-

වි‍ල්ලෙහි *පෝර්නියා* යන වචනය සමාජය වැරදි දෙයක් ලෙස හෙළාදකින සියලුම ලිංගික සම්බන්ධකම්වල නියැලෙන අවිවාහක කෙනෙකු සඳහාද යොදාගන්නා බවය.—1 කොරින්ති 6:9 බලන්න.

එෆීස 5:3හි සඳහන් දේ පදනමක් ලෙස යොදාගනිමින් *පෝර්නියා* යන වචනය විවිධාකාරව භාවිත කරන අන්දම ගැන තවත් පොතක මෙසේ සඳහන් වේ. "මෙම වචනය පොදුවේ භාවිත කරන්නේ සමාජය වැරදි දෙයක් ලෙස හෙළාදකින සියලුම ලිංගික සම්බන්ධකම් විස්තර කිරීමටය. එනම්, (1) පුරුෂයාට හෝ භාර්යාවට ද්‍රෝහි වීම. හොෂෙයා 2:2, 4 (සෙප්.), මතෙව් 5:32, 19:9, (2) අසම්මත විවාහයක්, 1 කොරින්ති 5:1, (3) වේශ්‍යාකම් කිරීම." (*Saint Paul's Epistle to the Ephesians*, London and New York, 1906, p. 76 by B. F. Westcott, coeditor of the Westcott and Hort Greek text.) එෆීස 5:3හි එය භාවිත කර තිබෙන්නේ අවිවාහක අය එවැනි ලිංගික සම්බන්ධකම්වල නියැලීම විස්තර කිරීමටය.

ක්‍රිස්තියානි ග්‍රීක ලියවිලිවල *පෝර්නියා* යන වචනය සංකේතවත් ආකාරයකින්ද භාවිත කර ඇත. "*කෙනෙක් යම් දුරකට හෝ සම්පූර්ණයෙන්ම සත්‍ය ඉගැන්වීම්වලින් ඉවත්ව ගියොත් එසේ නැත්නම් එකම සැබෑ දෙවි වන යෙහෝවාගෙන් ඉවත් වී බොරු දෙවිවරුන්ව අදහනවා නම් එයද පෝර්නියා ලෙස සැලකේ.* [2 රාජාවලිය 9:22; යෙරෙමියා 3:2, 9; හොෂෙයා 6:10.] එසේ වන්නේ දෙවි තම සෙනඟ සමඟ ඇති කරගත් බැඳීම විවාහයක් හා සමානව සලකනු ලැබූ නිසාය. එළිදරව් 14:8; 17:2, 4; 18:3; 19:2."—Lexicon Graecum Novi Testamenti, by F. Zorell, third ed., 1961, column 1106.

ග්‍රීක ලියවිල්ලෙහි *පෝර්නියා* යන වචනය මතු දැක්වෙන ස්ථාන 25හි දක්නට ලැබේ. මතෙව් 5:32; 15:19; 19:9; මාක් 7:21; යොහන් 8:41; ක්‍රියා 15:20, 29; 21:25; 1 කොරින්ති 5:1, 1; 6:13, 18; 7:2; 2 කොරින්ති 12:21; ගලාති 5:19; එෆීස 5:3; කොලොස්සි 3:5; 1 තෙසලෝනික 4:3; එළිදරව් 2:21; 9:21; 14:8; 17:2, 4; 18:3; 19:2.

මෙම පරිවර්තනයෙහි පොර්නෙව්වෝ යන ක්‍රියා පදය පරිවර්තනය කර තිබෙන්නේ "වේශ්‍යාකමෙහි නියැලී සිටීම" ලෙසය. එය 1 කොරින්ති 6:18; 10:8, 8; එළිදරව් 2:14, 20; 17:2; 18:3, 9 යන ස්ථාන අටෙහි දක්නට ලැබේ.

මෙම පරිවර්තනයෙහි එක්පොර්නෙව්වෝ යන ක්‍රියා පදය "ඉවක් බවක් නොමැතිව වේශ්‍යාකම්" කිරීම ලෙස පරිවර්තනය කර ඇත. එය තිබෙන්නේ යූද් 7හිය.

මෙම පරිවර්තනයෙහි පොර්නෙ යන නාම පදය "ගණිකාව" සහ "වේශ්‍යාව" ලෙසත් පරිවර්තනය කර තිබේ.—මතෙව් 21:31, 32; ලූක් 15:30; 1 කොරින්ති 6:15, 16; හෙබ්‍රෙව් 11:31; යාකොබ් 2:25; එළිදරව් 17:1, 5, 15, 16; 19:2.

මෙම පරිවර්තනයෙහි පොර්නොස් යන නාම පදය "වේශ්‍යාකම් කරන කෙනෙකු" සහ "වේශ්‍යාකමෙහි යෙදෙන කෙනෙකු" ලෙස පරිවර්තනය කර තිබේ.—1 කොරින්ති 5:9, 10, 11; 6:9; එෆීස 5:5; 1 තිමෝති 1:10; හෙබ්‍රෙව් 12:16; 13:4; එළිදරව් 21:8; 22:15. මෙම වචනය, "සමලිංගිකයෙක්, සමලිංගික ඇසුර සඳහා යොදාගන්නා තරුණයෙක්, වේශ්‍යාකම් කරන්නෙක්, රූප වඳින්නෙක්" ලෙසද විස්තර කර ඇත.—Greek-English Lexicon, by H. Liddell and R. Scott, 1968, p. 1450.

# 9 ක්‍රිස්තුස් හෙවත් අභිෂේක ලත් තැනැත්තා හෙබ්‍රෙව් බසින්, මෂියා. ග්‍රීක බසින්, ක්‍රිස්ටොස්

ක්‍රිස්තුස් යන වචනය පැමිණ තිබෙන්නේ ක්‍රිස්ටොස් යන ග්‍රීක වචනයෙනි. එම වචනය භාවිත කරනු ලැබුවේ මෂියා (මෙසියස්) යන හෙබ්‍රෙව් වචනය පරිවර්තනය කිරීමටය. එම වචනය භාවිත කරන්නේ කෙනෙකුව යම් විශේෂ පැවරුමකට පත් කිරීම හෝ අභිෂේක කිරීම සඳහා තෙල් ගැල්වීම හා තෙල් වත් කිරීම යන අදහස ලබා දීමටය. කෙනෙකුව යම් විශේෂ පැවරුමකට පත් කළ අවස්ථාවේදී ඔහුගේ හිස මත තෙල් වත් කළ විට ඒ තෙල් ඔහුගේ රැවුල දිගේ ගොස් කරපටිය දක්වා යයි. බයිබලය ලියූ කාලයේදී හෙබ්‍රෙව් ජාතිකයන් මෙන්ම වෙනත් ජාතිකයන්ද තම පාලකයන්ව උත්සවශ්‍රීයෙන් පත් කළේ ඒ අයුරිනි. තෙල් වත් කිරීමෙන් ඔවුන්ගේ පත්වීම වලංගු බව සනාථ විය.

ඇතැම් අවස්ථාවලදී පුද්ගලයෙකුගේ හිස මත තෙල් වත් කළේ නැතත් ඒ පුද්ගලයාව යම් විශේෂ කාර්යයක් සඳහා පත් කළ බව පිළිගන්නා ලදි. මන්ද ඒ පුද්ගලයාව එසේ පත් කළේ දෙවිය. නිදසුනකට මෝසෙස්ගේ හිසේ තෙල් වත් කළේ නැතත් ඔහුව විශේෂ කාර්යයක් සඳහා පත් කරන ලදි. යෙහෝවා දෙවි මෝසෙස්ව එසේ පත් කළේ තම අනාගතවක්තෘ හා නියෝජිතයා ලෙසත් ඊශ්‍රායෙල් ජාතියේ නායකයා සහ මිදුම්කරු ලෙසත්ය. එහෙයින් මෝසෙස්ට ක්‍රිස්තුස් හෝ අභිෂේක ලත් තැනැත්තා යන පදවියද ලබා දිය හැක. නාසරෙත් නුවරින් පැමිණි යේසුස්ද යෙහෝවා දෙවි විසින් පත් කරනු ලැබූ කෙනෙකි. ඔහුවද මෙසියස් හෝ ක්‍රිස්තුස් හෝ අභිෂේක ලත් තැනැත්තා ලෙස හෝ හඳුන්වන්නේ ඒ නිසාය. ඒ අනුව “ක්‍රිස්තුස්” යන්න නමක් නොවේ. එය කෙනෙකුට යම් පැවරුමක් හිමි වී ඇති බව දැක්වීමට භාවිත කරන වචනයකි. (මතෙව් 1:16; හෙබ්‍රෙව් 1:8, 9) යේසුස්ව පත් කළ විට ඔහුගේ හිස මතට තෙල් වත් කරනු ලැබුවේ නැත. ඒ වෙනුවට ඔහුට යෙහෝවා දෙවිගේ බලය විශේෂාකාරයෙන් ලැබිණ. (මතෙව් 3:16) ඒ අවස්ථාවේදී යෙහෝවා දෙවි ඔහුව රජු, අනාගතවක්තෘ සහ උත්තම පූජකයා ලෙස පත් කළේය. යෙහෝවා දෙවි විසින් අභිෂේක කරනු ලැබූ තැනැත්තා ලෙස ඔහුව හඳුන්වා තිබෙන්නේ ඒ නිසාය. ශුද්ධ ලියවිල්ලේ අනාගතවක්තෘ, උත්තම පූජක සහ රජු යන තනතුරු තුනම හොබවන එකම තැනැත්තා යේසුස් ක්‍රිස්තුස්ය.

යේසුස්ට සමානව ඔහුගේ අනුගාමිකයන්ගෙන් පිරිසකටද දෙවිගේ බලය විශේෂාකාරයෙන් ලබා දී තිබේ. ඒ නිසා ඔවුහු දෙවිගේ දරුවෝය. ඔවුන්ව හඳුන්වනු ලබන්නේ දෙවි විසින් අභිෂේක කරනු ලැබූ අය ලෙසය. (2 කොරින්ති 1:21) යේසුස්ගේ සහෝදරයන්ගෙන් සැදෙන එම කණ්ඩායමේ සාමාජිකයන්ව අභිෂේක කරනු ලබන්නේ යේසුස් ක්‍රිස්තුස් මාර්ගයෙනි. (ක්‍රියා 2:1-4, 32, 33) යේසුස් ක්‍රිස්තුස් සමඟ ස්වර්ගයෙහි පූජකයන් සහ රජවරුන් ලෙස කටයුතු කිරීමට ඔවුන්ව අභිෂේක කරන්නේ දෙවිය.

# 10 බයිබලයේ සඳහන් මාස

යුදෙව් දින දර්ශනයට අනුව මාසයක් ආරම්භ වන්නේ නව සඳ පෙනෙන දවසේය. (යෙසා 66:23) හෙබ්‍රෙව් බසින් “මාසය” සඳහා කෝඩෙෂ් යන වචනය භාවිත කෙරේ. එහි තේරුම “නව” යන වචනයට සම්බන්ධයි. (උත් 7:11) එසේම යෙරාක් යන වචනයද භාවිත කෙරේ. එහි තේරුම “අමාවක දෙකක් අතර කාලය” වේ.

| මාස — ආගමික | මාස — පොදු | කාලගුණය | ලැබෙන අස්වැන්න |
|---|---|---|---|
| 1වෙනි | 7වෙනි | වැසි හා දිය වී යන හිමෙන් යොර්දාන් ගඟ පිටාර ගලයි | හණ කැපීම. බාර්ලි අස්වනු නෙළීම ඇරඹේ |
| 2වෙනි | 8වෙනි | වියළි සමය ඇරඹේ. නිතරම පාහේ පැහැබර අහසක් | බාර්ලි අස්වනු නෙළීම. පහත් බිම්වල තිරිඟු නෙළීම |
| 3වෙනි | 9වෙනි | ගිම්හානය. වාතයෙහි තෙතමනය නැත. | තිරිඟු නෙළීම. මුල් වාරයේ අත්තික්කා. ඇපල් යම් ප්‍රමාණයක් |
| 4වෙනි | 10වෙනි | උෂ්ණත්වය වැඩි වේ. ඇතැම් පැතිවල අධික පිනි | මුල් වාරයේ මිදි. ගස් වැල්, උල්පත් වියළී යයි |
| 5වෙනි | 11වෙනි | උපරිම උෂ්ණත්වයක් | මිදි පල නෙළීම ඇරඹේ |
| 6වෙනි | 12වෙනි | දිගටම අධික උෂ්ණත්වයක් පවතී | රටඉඳි සහ අත්තික්කා නෙළීම |
| 7වෙනි | 1වෙනි | ගිම්හානය අවසන් වේ. මුල් වැසි ඇරඹේ | අස්වනු නෙළීම අවසන් වෙයි. සීසෑම ඇරඹේ |
| 8වෙනි | 2වෙනි | මඳ වැසි | තිරිඟු සහ බාර්ලි වැපිරීම. ඔලීව ගෙඩි කැඩීම |
| 9වෙනි | 3වෙනි | වැසි වැඩි වේ. මිදුණු පිනි. කඳුවල හිම | තණකොළ වැඩෙයි |
| 10වෙනි | 4වෙනි | ශීතල අධික වේ. වැහිබර කාලගුණයක්. කඳුවල හිම | පහත් බිම් සරු වෙයි. ධාන්‍ය, මල් හටගනී |
| 11වෙනි | 5වෙනි | ශීතල අඩු වේ. දිගටම වැසි | ආමන්ඩ් ගස්වල මල්. අත්තික්කා ගස්වල දලු ලියලයි |
| 12වෙනි | 6වෙනි | ගිගුරුම් සහ හිම කැට සහිත වැසි | කෙරටෝනියා ගස්වල මල්. පැඟිරි වර්ගයේ ගස්වල පල නෙළීම |
| 13වෙනි | | වසර 19ක කාල පරිච්ඡේදයක් ඇතුළත හත් වතාවක් වසරකට අමතර මාසයක් බැගින් එකතු කරන ලදි. එම මාසය හැඳින්වූයේ දෙවෙනි ආදාර් මාසය ලෙසයි | |




11
උත්පත්ති පොතට
සිතියමක්
කානාන් දේශය
නගර
ස්ථාන
කිලෝමීටර්
0 10 20 30 40 50
0 10 20 30
සැතපුම්
සීදොන්
දමස්කය
දාන්
ගිර්ගාෂිවරු
රේෆායිවරු
අෂ්ටෙරොත්-කර්නායිම්
කානානිවරු
යොර්දාන් ගඟ
සූසිවරු
හාම්
දොතාන්
මුරටැඹ,
ගලෙයෙද්
මහනායිම්
මහ මුහුද
හිවීයවරු
ෂීකෙම්
මොරේගේ
විශාල ගස්
පෙරිසිවරු
සුක්කොත්
පෙනුයෙල්
යබ්බොක් ඔය
ගිලියද්
ෂීලෝ
යොර්දාන්
දිස්ත්‍රික්කය
බෙතෙල්, ලුස්
ආයි
ආතද්, ආබෙල්-මිස්‍රායිම්
මෝරියා
යෙහෝවා-යයිරේ
ෂාවේ තැනිතලාව
සාලම්
යෙබූසිවරු
තිම්නාත්
බෙත්ලෙහෙම,
එෆ්‍රාත්
එනායිම්
අක්සිබ්
අදුල්ලාම්
එදෙර් ටැඹ
ෂෙරෙත්-ෂහර්
ෂාවේ-කිර්යාතයිම්
ගාසා
හිත්තීවරු
මම්රේ
හෙබ්‍රොන්,
කිර්යත්-අර්බා
මක්පේලාහි
ගුහාව
ලුණු මුහුද
ගෙරාර්
ගෙරාර් නිම්නය
කේනිවරු
ඒමිවරු
අමෝරිවරු
බෙයර්-ෂෙබා
ෂීබා
ගොමෝරාව?
සෙබොයිම්?
අද්මා?
සොදොම්?
සෝවර්, බෙලා?
සිද්දිම්
තැනිතලාව
මෝවබ්
රෙහොබොත්
නෙගෙබ් ප්‍රදේශය
කෙනිස්සිවරු
අමලෙක්වරු
හෝරිවරු
හසසොන්-තාමාර්?
ඊජිප්තු නිම්නය
බෙරෙද්
බෙයර්-ලහයි-රොයි
කාදෙෂ්, ඒන්-මිෂ්පාත්
සූර්
අරාබා නිම්නය
සේයර්
ඒදොම්
තේමාන්වරු


12
ඊශ්‍රායෙල් ගෝත්‍රවලට
අයත් ප්‍රදේශ
නගර ●
ස්ථාන □
කිලෝමීටර
0 10 20 30 40 50
0 10 20 30
සැතපුම්
ලෙබනොන් කඳු
සීදොන්
දමස්කය
සාරෆෙත්
හෙර්මොන් කන්ද
තීර
දාන්
(දාන්)
කෙදෙෂ්
නෆ්තලි
ආෂෙර්
මනස්සේ
කින්නෙරෙත් මුහුද
තාබෝර් කන්ද
ගෝලාන්
කර්මෙල් කන්ද
සෙබුලුන්
ඉසකාර්
ඒන්-දෝර්
මෙගිද්දෝ
ශුනෙම්
යෙස්‍රෙයෙල්
ගිල්බෝවා කන්ද
රාමොත්
දොතාන්
මනස්සේ
සමාරිය
තිර්ෂා
ඒබාල් කන්ද
ෂීකෙම්
ගෙරිසීම් කන්ද
යොර්දාන් ගඟ
යබ්බොක් ඔය
මහා මුහුද
එෆ්‍රායිම්
ශීලෝ
රාමා
ගාද්
යොප්පාව
රබ්බා
බෙතෙල්
ආයි
ගිල්ගාල්
දාන්
බෙන්ජමින්
යෙරිකෝව
එක්‍රොන්
ගිබියොන්
ගිබෙයා
නෙබෝ කන්ද
අම්මොන්
අෂ්දොද්
කිර්යත්-යෙයාරිම්
යෙරුසලම
බෙෂෙර්
ගාත්
බෙත්ලෙහෙම
අෂ්කෙලොන්
අදුල්ලාම්
රූබෙන්
යූදා
ගාසා
හෙබ්‍රොන්
ආර්නොන් ඔය
ඒන්-ගෙදී
ලුණු මුහුද
ශික්ලග්
(සිමියොන්)
බෙයර්-ෂෙබා
මෝවබ්
ඒදොම්
ඊජිප්තු නිම්නය


13
සාවුල්, දාවිත්, සලමොන්ගේ
එක්සත් ඊශ්‍රායෙල් රාජ්‍යය
නගර
ස්ථාන
කිලෝමීටර
0 10 20 30 40 50
0 10 20 30
සැතපුම්
ලෙබනොන් කඳු
සීදොන්
දමස්කය
හෙර්මොන් කන්ද
තීර්
ආබෙල්
දාන්
හාෂෝර්
කාබුල්
කින්නෙරෙත් මුහුද
කර්මෙල් කන්ද
ඒන්-දෝර්
ෂුනෙම්
මෙගිද්දෝ
අපෙක්
යෙස්‍රෙයෙල්
ගිල්බෝවා කන්ද
බෙත්-ෂෙයාන්
යොර්දාන් ගඟ
රොගේලීම්
රාමොත්-ගිලියද්
යාබෙෂ්-ගිලියද්
බෙසෙක්
තේබේෂ්
ආබෙල්-මෙහෝලා
මහනායිම්
සුක්කොත්
යබ්බොක් ඔය
මහා මුහුද
ෂෙරේදා
ෂීලෝ
රාමා
බාල්-හාෂෝර්
ඉහළ බෙත්-හෝරොන්
එෆ්‍රායින්
පහළ බෙත්-හෝරොන්
බෙතෙල්
බෙත්-ආවෙන්
රබ්බා
අම්මොන්
මික්මාෂ්
ගෙබා
ගිල්ගාල්
යෙරිකෝව
ගෙෂෙර්
රාමා
ගිබෙයා
ආයාලොන්
ගිබියොන්
නොබ්
කිර්යත්-යෙයාරීම්
යෙරුසලම
මේදෙබා
අෂේකා
සෝකෝ
ගාත්
එලාහ් තැනිතලාව
බෙත්ලෙහෙම
අෂ්කෙලොන්
අදුල්ලාම්හි ගුහාව
ලුණු මුහුද
කෙයිලා
සිරා
ඒන්-ගෙදී
ගාසා
හෙබ්‍රෝන්
සීප්
යෙෂිමෝන්
අරෝයේර්
බෙසෝර් ඔය
හෝරෙෂ්
කර්මෙල්
ආර්නොන් ඔය
යත්තීර්
මායොන්
සික්ලග්
එෂ්තෙමෝවා
බෝර්ආෂාන්
කබ්ෂෙයෙල්
බෙයර්-ෂෙබා
අරෝයේර්
ලුණු නිම්නය (?)
මෝවබ්
ඊජිප්තු නිම්නය
ඒදොම්


14
යේසුස් දේශනා කළ කාලයේදී පලස්තීනය
නගර ●
ස්ථාන □
කිලෝමීටර
0 10 20 30 40 50
0 10 20 30
සැතපුම්
අබිලේනිය
සීදොන්
දමස්කය
හෙර්මොන් කන්ද
තීර්
සිසේරිය ෆිලිප්පිය
ඉතුරය
තොලමැයිසය
ගලීලය
කොරාසීනය
කපර්ණවුම
බෙත්සයිදාව
කානා
ගලීල මුහුද
ටයිබීරියස්
නාසරෙත්
තාබෝර් කන්ද
කර්මෙල් කන්ද
නායීන්
ගදාරා
යොර්දානෙන් එගොඩ පිහිටි බෙතානිය(?)
සිසේරිය
පෙල්ලා
සාලිම්(?)
ඒනොන්(?)
සමාරිය
සිකාර්(?)
ගෙරිසීම් කන්ද
ගෙරාසා
සමාරිය
යොර්දාන් ගඟ
මහ මුහුද
යොප්පාව
අරිමාතිය
එෆ්‍රායිම්
එම්මාවුස්(?)
යෙරිකෝව
අෂ්දොද්
යෙරුසලම
බෙතානිය
බෙත්ලෙහෙම
යුදය
ලුණු මුහුද
ගාසා
හෙබ්‍රෝන්
ඉදුමය
බෙයර්-ෂෙබා
අරාබිය




15

ශුද්ධ කූඩාරම, නික්මයාම 26 බලන්න

# 16

## සලමොන්ගේ දේවමාලිගාව
## බිම් සැලැස්ම සහිතව



1 අතිශුද්ධස්ථානය—1රාජා 6:16, 20
2 උඩුමහලේ කුටි—1ලේක 28:11
3 ශුද්ධස්ථානය—2ලේක 5:9
4 ප්‍රවේශ ශාලාව—1රාජා 6:3; 2ලේක 3:4
5 යාකින්—1රාජා 7:21
6 බෝවස්—2ලේක 3:17
7 භෝජන ශාලා—1ලේක 28:12
8 තඹ පූජාසනය—2ලේක 4:1
9 ඇතුල් මළුව—1රාජා 6:36
10 තඹ භාජනයා—1රාජා 7:23
11 කරත්ත—1රාජා 7:27
12 ඇතුල් වන ස්ථානය—1රාජා 6:8
13 කුටි—1රාජා 6:5, 6, 10

# 17

## යේසුස් මිහිපිට ගත කළ ජීවිතයේ ප්‍රධාන සිද්ධීන්
### ශුභාරංචි වාර්තා සතර අනුපිළිවෙළින්

| කාලය | ස්ථානය | සිද්ධිය | මතෙව් | මාක් | ලූක් | යොහන් |
|---|---|---|---|---|---|---|
| | | **යේසුස්ගේ දේවසේවයට කලින්** | | | | |
| ක්‍රි.පූ. 3 | යෙරුසලම, දේවමාලිගාව | යොහන් බව්තීස්තගේ උපත ගැන සෙකරියාට පැවසීම | | | 1:5-25 | |
| ක්‍රි.පූ. 2 පමණ | නාසරෙත්; යුදය | යේසුස්ගේ උපත ගැන මරියාට පැවසීම, ඇය එලිසබෙත්ව බැලීමට යයි | | | 1:26-56 | |
| ක්‍රි.පූ. 2 | යුදයේ කඳුකර ප්‍රදේශය | යොහන් බව්තීස්තගේ උපත; ඔහු පාළුකරයේ ගත කළ ජීවිතය | | | 1:57-80 | |
| ක්‍රි.පූ. 2, ඔක්. 1 පමණ | බෙත්ලෙහෙම | යේසුස්ගේ උපත (සියල්ල ඇති වූයේ වචනය වන ඔහු මාර්ගයෙන්ය) ඔහු ආබ්‍රහම්ගෙන් හා දාවිත්ගෙන් පැවතෙන්නෙකි | 1:1-25 | | 2:1-7 | 1:1-5, 9-14 |
| | බෙත්ලෙහෙම අසලදී | දේවදූතයා ශුභාරංචිය දන්වයි; එඬේරු ළදරුවාව බැහැදකිති | | | 2:8-20 | |
| | බෙත්ලෙහෙම; යෙරුසලම | යේසුස්ව චර්මච්ඡේදනය කරයි (8වෙනි දින), දේවමාලිගාවේදී දෙවි ඉදිරියට ගෙනෙනු ලබයි (40වෙනි දින) | | | 2:21-38 | |
| ක්‍රි.පූ. 1 හෝ ක්‍රි.ව. 1 | යෙරුසලම; බෙත්-ලෙහෙම; නාසරෙත් | ජ්‍යෝතිඃ ශාස්ත්‍රඥයෝ; ඊජිප්තුවට පලා යෑම; ළදරුවන් මරණයට පත් කිරීම; යේසුස් නැවත පැමිණීම | 2:1-23 | | 2:39, 40 | |
| ක්‍රි.ව. 12 | යෙරුසලම | දොළොස් හැවිරිදි යේසුස් පාස්කු උත්සවයේදී; ගෙදර යෑම | | | 2:41-52 | |
| 29, වසන්ත කාලය | පාළුකරය, යොර්දානය | යොහන් බව්තීස්තගේ දේවසේවය | 3:1-12 | 1:1-8 | 3:1-18 | 1:6-8, 15-28 |
| | | **යේසුස්ගේ දේවසේවයේ පටන්ගැන්ම** | | | | |
| 29, සරත් කාලය | යොර්දාන් ගඟ | යේසුස්ගේ බව්තීස්මය සහ පත් කිරීම, ඔහු දාවිත්ගේ පෙළපතින් ඉපදුණත් දෙවිගේ පුත්‍රයායයි ප්‍රකාශ කරන ලදි | 3:13-17 | 1:9-11 | 3:21-38 | 1:32-34 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | යුදයේ පාළුකරය | යේසුස් නිරාහාරව සිටීම සහ ඔහුව හසු කරගැනීමට තැත් කිරීම | 4:1-11 | 1:12, 13 | 4:1-13 | |
| | යෝර්දානෙන් එගොඩ බෙතානිය | යොහන් බව්තීස්ත යේසුස් ගැන දුන් සාක්ෂිය | | | | 1:15, 29-34 |
| | යෝර්දාන් ගඟේ ඉහළ කෙළවර පිහිටි නිම්නය | යේසුස්ගේ පළමු ගෝලයෝ | | | | 1:35-51 |
| | ගලීලයේ කානා නුවර; කපර්ණවුම | යේසුස්ගේ පළමුවෙනි ප්‍රාතිහාර්යය; ඔහු කපර්ණවුමට යයි | | | | 2:1-12 |
| 30, පාස්කුව | යෙරුසලම | පාස්කු උත්සවය; වෙළඳුන්ව දේවමාලිගාවෙන් පලවාහරියි | | | | 2:13-25 |
| | යෙරුසලම | යේසුස් නිකදේමස් සමඟ කළ සාකච්ඡාව | | | | 3:1-21 |
| | යුදය; ඒනොන් | යේසුස්ගේ ගෝලයෝ බව්තීස්ම කරති; යොහන්ගේ ගෝලයන් අඩු වෙයි | | | | 3:22-36 |
| | ටයිබීරියස් | යොහන්ව සිරගත කිරීම; යේසුස් ගලීලයට යයි | 4:12; 14:3-5 | 1:14; 6:17-20 | 3:19, 20; 4:14 | 4:1-3 |
| | සමාරියේ සිකාර් | ගලීලයට යන ගමනේදී යේසුස් සමරිතානුවන්ට උගන්වයි | | | | 4:4-43 |

## යේසුස් ගලීලයේදී කළ දේවසේවය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ගලීලය | “ස්වර්ග රාජ්‍යය ළං වී තිබේ” කියා ඔහු දැන්වූ පළමුවෙනි අවස්ථාව | 4:17 | 1:14, 15 | 4:14, 15 | 4:44, 45 |
| | නාසරෙත්; කානා නුවර කපර්ණවුම | පිරිමි දරුවාව සුව කරයි; ලැබූ පැවරුම ගැන කියවයි; ප්‍රතික්ෂේප කරනු ලබයි; කපර්ණවුමේ වාසය කිරීමට යයි | 4:13-16 | | 4:16-31 | 4:46-54 |
| | ගලීල මුහුද, කපර්ණවුම අසල | සීමොන් සහ අන්ද්‍රෑටද යාකොබ් සහ යොහන්ටද ඇරයුම් කරයි | 4:18-22 | 1:16-20 | 5:1-11 | |
| | කපර්ණවුම | භූතාවේශ වූ තැනැත්තාවද පේතෘස්ගේ නැන්දම්මාවද තව බොහෝදෙනෙකුවද සුව කරයි | 8:14-17 | 1:21-34 | 4:31-41 | |
| | ගලීලය | ඇරයුම් කළ සතරදෙනා සමඟ ගලීලය වටා ගිය පළමුවෙනි ගමන | 4:23-25 | 1:35-39 | 4:42, 43 | |
| | ගලීලය | ලාදුරු රෝගියාව සුව කරයි; සමූහයෝ යේසුස් වෙනට රැස් වෙති | 8:1-4 | 1:40-45 | 5:12-16 | |
| | කපර්ණවුම | අංශභාග රෝගියාව සුව කරයි | 9:1-8 | 2:1-12 | 5:17-26 | |
| | කපර්ණවුම | මතෙව්ට ඇරයුම් කරයි; බදු එකතු කරන්නන් සමඟ ආහාර ගැනීම | 9:9-17 | 2:13-22 | 5:27-39 | |
| | යුදය | යුදයේ සිනගෝගවල දේශනා කරයි | | | 4:44 | |

| කාලය | ස්ථානය | සිද්ධිය | මතෙව් | මාක් | ලූක් | යොහන් |
|---|---|---|---|---|---|---|
| 31, පාස්කුව | යෙරුසලම | උත්සවයට යයි; මිනිසෙකුව සුව කරයි; පරිසිවරුන්ට බැණ වදියි | | | | 5:1-47 |
| | යෙරුසලමෙන් ආපසු පැමිණෙද්දී(?) | සබත් දවසේදී ගෝලයෝ ධාන්‍ය කරල් කඩති | 12:1-8 | 2:23-28 | 6:1-5 | |
| | ගලීලය; ගලීල මුහුද | සබත් දවසේදී අත සුව කරයි; මුහුදු වෙරළට යයි; සුව කරයි | 12:9-21 | 3:1-12 | 6:6-11 | |
| | කපර්ණවුම අසල කන්ද | නියෝජිතයන් ලෙස 12 දෙනාව තෝරාගනු ලැබේ | | 3:13-19 | 6:12-16 | |
| | කපර්ණවුම අසල | කන්ද උඩ දේශනාව | 5:1–7:29 | | 6:17-49 | |
| | කපර්ණවුම | හමුදා නිලධාරියාගේ මෙහෙකරුවාව සුව කරයි | 8:5-13 | | 7:1-10 | |
| | නායින් | වැන්දඹුවගේ පුත්‍රයාව නැඟිටුවයි | | | 7:11-17 | |
| | ගලීලය | සිරගෙයි සිටින යොහන් යේසුස් වෙතට ගෝලයන්ව යවයි | 11:2-19 | | 7:18-35 | |
| | ගලීලය | නුවරවල්වලට අප්‍රසාදය පළ කිරීම; බිළිඳුන්ට හෙළි කිරීම; වියගහ පහසුය | 11:20-30 | | | |
| | ගලීලය | පව්කාර ස්ත්‍රිය විසින් පාදවලට තෙල් ආලේප කිරීම; ණයකරුවන් පිළිබඳ උපමාව | | | 7:36-50 | |
| | ගලීලය | 12දෙනා සමඟ ගලීලයේ දේශනා කිරීමට ගිය දෙවෙනි ගමන | | | 8:1-3 | |
| | ගලීලය | භූතාවේශ වූ නැනැත්තාව සුව කිරීම; බෙල්සෙබුබ් සමඟ කටයුතු කරන බවට චෝදනා කිරීම | 12:22-37 | 3:19-30 | | |
| | ගලීලය | නීතිය පිටපත් කරන්නෝ සහ පරිසිවරු ලකුණක් සොයති | 12:38-45 | | | |
| | ගලීලය | ක්‍රිස්තුස් තම සහෝදරයන් ලෙස ගෝලයන්ව හඳුන්වයි | 12:46-50 | 3:31-35 | 8:19-21 | |
| | ගලීල මුහුද | වපුරන්නා පිළිබඳ, කිරිදි පිළිබඳ සහ වෙනත් උපමා; ඒවා පහදා දීම | 13:1-53 | 4:1-34 | 8:4-18 | |
| | ගලීල මුහුද | විලෙන් එගොඩට යද්දී කුණාටුව නිශ්වල කිරීම | 8:18, 23-27 | 4:35-41 | 8:22-25 | |
| | ගදාරා, ගලීල මුහුදෙන් ගිනිකොණට | භූතාවේශ වූ නැනැත්තන් දෙදෙනෙකුව සුව කිරීම; භූතයෝ ඌරන්ට වැහුණෝය | 8:28-34 | 5:1-20 | 8:26-39 | |
| | කපර්ණවුම විය හැක | යායිරස්ගේ දුව නැඟිටුවීම; ස්ත්‍රියව සුව කිරීම | 9:18-26 | 5:21-43 | 8:40-56 | |
| | කපර්ණවුම(?) | අන්ධ මිනිසුන් දෙදෙනෙකුව සහ භූතාවේශ වූ ගොළුවෙකුව සුව කරයි | 9:27-34 | | | |
| | නාසරෙත් | ඇතිදැඩි වූ නුවරට නැවත යයි නැවත ප්‍රතික්ෂේප කරනු ලබයි | 13:54-58 | 6:1-6 | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ගලීලය | ගලීලයේ තුන්වෙනි ගමන, නියෝජිතයන්ව යැවීමෙන් සේවය වඩාත් පුළුල් විය | 9:35–11:1 | 6:6-13 | 9:1-6 | |
| | ටයිබීරියස් | යොහන් බව්තීස්තගේ හිස කපා දැමීම; හෙරොද් තමා වැරදි බව දන්නා නිසා භය වී සිටියි | 14:1-12 | 6:14-29 | 9:7-9 | |
| 32, පාස්කුවට ළඟය (යොහ 6:4) | කපර්ණවුම(?); ගලීල මුහුදෙන් ඊසානට | නියෝජිතයෝ දේශනා කිරීමට ගිය ගමනින් ආපසු ඒම; 5,000කට කන්න දීම | 14:13-21 | 6:30-44 | 9:10-17 | 6:1-13 |
| | ගලීල මුහුදෙන් ඊසානට; ගෙනසරෙත් | යේසුස්ව රජකමට පත් කිරීමට වෑයමක්; ඔහු මුහුද මත ඇවිදියි; සුව කරයි | 14:22-36 | 6:45-56 | | 6:14-21 |
| | කපර්ණවුම | “ජීවනයට මඟ පාදන ආහාරය”; ගෝලයන්ගෙන් බොහෝදෙනෙක් ඔහුව අත්හැර යති | | | | 6:22-71 |
| 32, පාස්කුවට පසුව | කපර්ණවුම විය හැක | දේවවචනය අවලංගු කරන සම්ප්‍රදායන් | 15:1-20 | 7:1-23 | | 7:1 |
| | ෆිනීෂියාව; දෙකපොලිසය | තීර්, සීදොන් අසල; ඉන්පසු දෙකපොලිසයට; 4,000කට කන්න දීම | 15:21-38 | 7:24–8:9 | | |
| | මගදානය | සද්දුසිවරු සහ පරිසිවරු නැවතත් ලකුණක් සොයති | 15:39–16:4 | 8:10-12 | | |
| | ගලීල මුහුදෙන් ඊසානට; බෙත්සයිදාව | පරිසිවරුන්ගේ මුහුන් ගැන අනතුරු අඟවයි; අන්ධයාව සුව කරයි | 16:5-12 | 8:13-26 | | |
| | සිසේරිය පිලිප්පිය | යේසුස් මෙසියස්ය; මරණය, නැවත නැඟිටීම ගැන අනාවැකි කියයි | 16:13-28 | 8:27–9:1 | 9:18-27 | |
| | හෙර්මොන් කන්ද විය හැක | පේතෘස්, යාකොබ් සහ යොහන් ඉදිරියෙහි පෙනුම සම්පූර්ණයෙන්ම වෙනස් වීම | 17:1-13 | 9:2-13 | 9:28-36 | |
| | සිසේරිය පිලිප්පිය | ගෝලයන්ට සුව කිරීමට නොහැකි වූ භූතාවේශ වූ තැනැත්තාව සුව කරයි | 17:14-20 | 9:14-29 | 9:37-43 | |
| | ගලීලය | තම මරණය හා නැවත නැඟිටීම ගැන නැවත අනාවැකි කියයි | 17:22, 23 | 9:30-32 | 9:43-45 | |
| | කපර්ණවුම | බදු ගෙවීමට ආශ්චර්යවත් ලෙස මුදල් සපයයි | 17:24-27 | | | |
| | කපර්ණවුම | ස්වර්ග රාජ්‍යයේ උතුම්ම තැනැත්තා; ප්‍රශ්න විසඳාගැනීම; දයාව | 18:1-35 | 9:33-50 | 9:46-50 | |
| | ගලීලය; සමාරිය | පැල් උත්සවය සඳහා ගලීලයෙන් පිටත්ව යයි; දේවසේවය වෙනුවෙන් සියල්ල අත්හැරීම | 8:19-22 | | 9:51-62 | 7:2-10 |

| කාලය | ස්ථානය | සිද්ධිය | මතෙව් | මාක් | ලූක් | යොහන් |
|---|---|---|---|---|---|---|
| | | **යේසුස් පසු කාලයේදී යුදයේ කළ සේවය** | | | | |
| 32, පැල් උත්සවය | යෙරුසලම | පැල් උත්සවයේදී යේසුස් ප්‍රසිද්ධියේ කළ ඉගැන්වීම | | | | 7:11-52 |
| | යෙරුසලම | උත්සවයට පසුව ඉගැන්වීම; අන්ධ මිනිසාව සුව කරයි | | | | 8:12–9:41 |
| | යුදය විය හැක | දේශනා කිරීමට 70දෙනාව යැවීම; ඔවුන් ආපසු පැමිණීම, වාර්තාව | | | 10:1-24 | |
| | යුදය; බෙතානිය | අසල්වැසියෙකු ලෙස කටයුතු කළ සමරිතානුවෙකු ගැන කියයි; මාර්තා සහ මරියාගේ ගෙදර | | | 10:25-42 | |
| | යුදය විය හැක | ආදර්ශ යාච්ඤාව නැවත උගන්වයි; ඉල්ලීමේදී අඛණ්ඩ උත්සාහය | | | 11:1-13 | |
| | යුදය විය හැක | බොරු චෝදනා නිෂ්ප්‍රභ කරයි; පරම්පරාව දඬුවම් ලබන බව පෙන්වයි | | | 11:14-36 | |
| | යුදය විය හැක | පරිසිවරයා සමඟ කෑම, යේසුස් කුහකයන්ව හෙළාදකියි | | | 11:37-54 | |
| | යුදය විය හැක | දෙවිගේ සැලකිල්ල ගැන කතාව; විශ්වාසවන්ත සේවකයා | | | 12:1-59 | |
| | යුදය විය හැක | සබත් දවසේදී ස්ත්‍රියකව සුව කරයි; උපමා තුනක් | | | 13:1-21 | |
| 32, කැප කිරීමේ උත්සවය | යෙරුසලම | යේසුස් කැප කිරීමේ උත්සවයට පැමිණීම; උතුම් එඬේරා | | | | 10:1-39 |
| | | **යේසුස් පසු කාලයේදී යොර්දානෙන් නැඟෙනහිර කළ සේවය** | | | | |
| | යොර්දානෙන් එගොඩ | බොහෝදෙනෙක් යේසුස් කෙරෙහි විශ්වාසය තබති | | | | 10:40-42 |
| | පෙරයාව (යොර්දානෙන් එගොඩ) | යෙරුසලමට යන ගමනේදී, නුවරවල, ගම්වල උගන්වයි | | | 13:22 | |
| | පෙරයාව | ස්වර්ග රාජ්‍යයට ඇතුල් වීම; හෙරොද්ගේ තර්ජනය; ගෘහය පාළු කරනු ලැබීම | | | 13:23-35 | |
| | පෙරයාව විය හැක | යටහත්පහත්කම; සන්ධ්‍යා භෝජනය ගැන උපමාව | | | 14:1-24 | |
| | පෙරයාව විය හැක | ගෝලයෙකු වීමේ වගකීම | | | 14:25-35 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | පෙරයාව විය හැක | උපමා: නැති වූ බැටළුවා, නැති වූ කාසිය, නාස්තිකාර පුත්‍රයා | | | 15:1-32 | |
| | පෙරයාව විය හැක | උපමා: අධර්මිෂ්ඨ සේවකයා, ධනවතා සහ ලාසරුස් | | | 16:1-31 | |
| | පෙරයාව විය හැක | සමාව දීම සහ විශ්වාසය; කිසි කමකට නැති දාසයෝ | | | 17:1-10 | |
| | බෙතානිය | යේසුස් විසින් ලාසරුස්ව නැඟිටවීම | | | | 11:1-46 |
| | යෙරුසලම; එෆ්‍රායිම් | කායෆස් යේසුස්ට විරුද්ධව කළ කුමන්ත්‍රණය; යේසුස් අහක්ව යයි | | | | 11:47-54 |
| | සමාරිය; ගලීලය | සමාරිය සහ ගලීලය මැදින් ගමන් කරද්දී සුව කරයි, උගන්වයි | | | 17:11-37 | |
| | සමාරිය හෝ ගලීලය | උපමා: වැන්දඹුවගේ අඛණ්ඩ උත්සාහය, පරිසිවරයා සහ බදු එකතු කරන්නා | | | 18:1-14 | |
| | පෙරයාව | පෙරයාව හරහා යයි; දික්කසාදය ගැන උගන්වයි | 19:1-12 | 10:1-12 | | |
| | පෙරයාව | දරුවන්ව පිළිගෙන ඔවුන්ට ආශීර්වාද කරයි | 19:13-15 | 10:13-16 | 18:15-17 | |
| | පෙරයාව | ධනවත් තරුණයා; මිදිවත්තේ වැඩකරුවන් ගැන උපමාව | 19:16–20:16 | 10:17-31 | 18:18-30 | |
| | පෙරයාව විය හැක | තුන්වෙනි වතාවට යේසුස් තම මරණය සහ නැවත නැඟිටීම ගැන අනාවැකි කියයි | 20:17-19 | 10:32-34 | 18:31-34 | |
| | පෙරයාව විය හැක | යාකොබ් සහ යොහන් දේවරාජ්‍යය ගැන කළ ඉල්ලීම | 20:20-28 | 10:35-45 | | |
| | යෙරිකෝව | යෙරිකෝව මැදින් ගමන් කරද්දී, ඔහු අන්ධයන් දෙදෙනෙකුව සුව කරයි; සකෙවුස්ව බැහැදකියි මීනා දසය ගැන උපමාව | 20:29-34 | 10:46-52 | 18:35–19:28 | |
| | | **යේසුස් යෙරුසලමේදී අවසන් වරට කළ සේවය** | | | | |
| 33, නීසාන් 8 | බෙතානිය | පාස්කුවට දවස් හයකට පෙර බෙතානියට පැමිණෙයි | | | | 11:55–12:1 |
| නීසාන් 9 | බෙතානිය | ලාදුරු රෝගියෙකු වූ සීමොන්ගේ නිවසේ කෑම ගැනීම; මරියා යේසුස්ගේ පාදවලට තෙල් ආලේප කරයි; යේසුස්ව සහ ලාසරුස්ව දැකගැනීමට යුදෙව්වරු පැමිණෙති | 26:6-13 | 14:3-9 | | 12:2-11 |

| කාලය | ස්ථානය | සිද්ධිය | මතෙව් | මාක් | ලූක් | යොහන් |
|---|---|---|---|---|---|---|
| නීසාන් 9 | බෙතානිය-යෙරුසලම | ක්‍රිස්තුස් රජෙකු සේ යෙරුසලමට ඇතුල් වීම | 21:1-11, 14-17 | 11:1-11 | 19:29-44 | 12:12-19 |
| නීසාන් 10 | බෙතානිය-යෙරුසලම | පල නැති අත්තික්කා ගසට ශාප කිරීම; දෙවෙනි වතාවට දේවමාලිගාව පවිත්‍ර කිරීම | 21:18, 19, 12, 13 | 11:12-17 | 19:45, 46 | |
| | යෙරුසලම | නායක පූජකයෝ සහ ආගමික නායකයෝ යේසුස්ව නැති කර දැමීමට කුමන්ත්‍රණය කරති | | 11:18, 19 | 19:47, 48 | |
| | යෙරුසලම | ග්‍රීකවරු සමඟ සාකච්ඡා කිරීම; යුදෙව්වරුන්ගේ අවිශ්වාසය | | | | 12:20-50 |
| නීසාන් 11 | බෙතානිය-යෙරුසලම | පල නැතුව තිබූ අත්තික්කා ගස මැලවී තිබීම | 21:19-22 | 11:20-25 | | |
| | යෙරුසලම, දේවමාලිගාව | ක්‍රිස්තුස්ගේ අධිකාරියට අභියෝග කිරීම; පුත්‍රයන් දෙදෙනා ගැන උපමාව | 21:23-32 | 11:27-33 | 20:1-8 | |
| | යෙරුසලම, දේවමාලිගාව | දුෂ්ට වැවිලිකරුවන්, විවාහ උත්සවය ගැන උපමා | 21:33–22:14 | 12:1-12 | 20:9-19 | |
| | යෙරුසලම, දේවමාලිගාව | ඔහුව හසු කරගැනීමට බදු ගෙවීම, නැවත නැඟිටීම, ආඥාව ගැන ඇසූ ප්‍රශ්න | 22:15-40 | 12:13-34 | 20:20-40 | |
| | යෙරුසලම, දේවමාලිගාව | මෙසියස්ගේ පෙළපත ගැන යේසුස් ඇසූ ප්‍රශ්නයෙන් ඔවුන්ව නිශ්ශබ්ද කිරීම | 22:41-46 | 12:35-37 | 20:41-44 | |
| | යෙරුසලම, දේවමාලිගාව | ආගමික නායකයන්ව සහ පරිසිවරුන්ව හෙළාදැකීම | 23:1-39 | 12:38-40 | 20:45-47 | |
| | යෙරුසලම, දේවමාලිගාව | වැන්දඹුවගේ කුඩා සම්මාදම | | 12:41-44 | 21:1-4 | |
| | ඔලීව කන්ද | යෙරුසලමේ වැටීම ගැන අනාවැකි කීම; යේසුස් පැමිණ සිටීම; පවතින සමාජයේ අවසානය | 24:1-51 | 13:1-37 | 21:5-38 | |
| | ඔලීව කන්ද | කන්‍යාවන් දසදෙනා, තලෙන්ත, බැටළුවන් සහ එළුවන් පිළිබඳ උපමා | 25:1-46 | | | |
| නීසාන් 12 | යෙරුසලම | ආගමික නායකයෝ යේසුස්ව මැරීමට කුමන්ත්‍රණය කරති | 26:1-5 | 14:1, 2 | 22:1, 2 | |
| | යෙරුසලම | යේසුස්ව පාවා දීමට පූජකයන් හා යූදස් අතර ගනුදෙනුව | 26:14-16 | 14:10, 11 | 22:3-6 | |
| නීසාන් 13 (බ්‍රහස්පතින්දා පස්වරුව) | යෙරුසලම අසලදී හා ඇතුළතදී | පාස්කුව සැමරීමට කරන සැලසුම් | 26:17-19 | 14:12-16 | 22:7-13 | |
| නීසාන් 14 | යෙරුසලම | 12දෙනා සමඟ පාස්කු භෝජනයට සහභාගි වීම | 26:20, 21 | 14:17, 18 | 22:14-18 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | යෙරුසලම | යේසුස් තම නියෝජිතයන්ගේ පාද සෝදයි | | | | 13:1-20 |
| | යෙරුසලම | යූදස් ද්‍රෝහියෙකුයයි හැඳින්වීම ඔහුව එතැනින් යැවීම | 26:21-25 | 14:18-21 | 22:21-23 | 13:21-30 |
| | යෙරුසලම | මුල් වරට 11දෙනා සමඟ සන්ධ්‍යා භෝජනය පැවැත්වීම | 26:26-29 | 14:22-25 | 22:19, 20, 24-30 | [1කොරි 11: 23-25] |
| | යෙරුසලම | පේතෘස් ඔහුව නාඳුනනවායයි කියන බවටත් නියෝජිතයන් විසිරී යන බවටත් අනාවැකි කීම | 26:31-35 | 14:27-31 | 22:31-38 | 13:31-38 |
| | යෙරුසලම | උපකාරකයා; එකිනෙකා අතර ඇති ප්‍රේමය; පීඩා; යේසුස්ගේ යාච්ඤාව | | | | 14:1–17:26 |
| | ගෙත්සෙමනය | උයනේදී දැඩි වේදනාව; යේසුස්ව පාවා දීම, අත්අඩංගුවට ගැනීම | 26:30, 36-56 | 14:26, 32-52 | 22:39-53 | 18:1-12 |
| | යෙරුසලම | අන්නස්, කායෆස්, මන්ත්‍රණ සභාව ඉදිරියේ නඩු විභාගය; පේතෘස් ඔහුව නාඳුනනවායයි කියයි | 26:57–27:1 | 14:53–15:1 | 22:54-71 | 18:13-27 |
| | යෙරුසලම | ඔහුව පාවා දුන් යූදස් එල්ලී මැරෙයි | 27:3-10 | | [ක්‍රියා 1:18, 19] | |
| | යෙරුසලම | පිලාත් ඉදිරියේද ඉන්පසුව හෙරොද් ඉදිරියේද නැවතත් පිලාත් ඉදිරියේද පෙනී සිටියි | 27:2, 11-14 | 15:1-5 | 23:1-12 | 18:28-38 |
| | යෙරුසලම | ඔහුව නිදහස් කිරීමට පිලාත් උත්සාහ කළ පසු ඔහුව මරණයට භාර දීම | 27:15-30 | 15:6-19 | 23:13-25 | 18:39–19:16 |
| (සිකුරාදා, ප.ව. 3:00 පමණ) | ගොල්ගොතා, යෙරුසලම | වධකණුවක් මත යේසුස්ගේ මරණය, සහ ඊට සම්බන්ධ සිද්ධීන් | 27:31-56 | 15:20-41 | 23:26-49 | 19:16-30 |
| | යෙරුසලම | යේසුස්ගේ දේහය වධකණුවෙන් ඉවතට ගෙන තැන්පත් කිරීම | 27:57-61 | 15:42-47 | 23:50-56 | 19:31-42 |
| නීසාන් 15 | යෙරුසලම | පූජකයෝ සහ පරිසිවරු සොහොන් ගෙය රකවල් කිරීමට මුරකරුවන්ව යෙදීම | 27:62-66 | | | |
| නීසාන් 16 | යෙරුසලම හා ඒ අසල | යේසුස් නැවත නැඟිටීම සහ එදින සිද්ධීන් | 28:1-15 | 16:1-8 | 24:1-49 | 20:1-25 |
| | යෙරුසලම; ගලීලය | යේසුස් ක්‍රිස්තුස් පෙනී සිටි වෙනත් අවස්ථාවන් | 28:16-20 | [1කොරි 15:5-7] | [ක්‍රියා 1:3-8] | 20:26–21:25 |
| ඊයාර් 25 | ඔලීව කන්ද, බෙතානිය අසල | යේසුස් නැවත නැඟිට දවස් 40කට පසු ස්වර්ගයට යයි | [ක්‍රියා 1:9-12] | | 24:50-53 | |

# බයිබල් විෂයන්

## 1. අන්‍ය ආගම් සමඟ සම්බන්ධ වීම

### *අ. දෙවි එය අනුමත කරන්නේ නැත*

ඇත්තේ එකම මඟකි. එය පටුය. එය සොයාගන්නේ
ස්වල්පදෙනෙකි. ............................................ එෆී 4:4-6; මතෙ 7:13, 14
බොරු ඉගැන්වීම් සත්‍ය ඉගැන්වීම් බාල කරයි. ............. මතෙ 16:6, 12; ගලා 5:9
ඉන් ඈත්ව සිටීමට අණ කර තිබේ. ......... 2තිමෝ 3:5; 2කොරි 6:14-17; එළි 18:4

### *ආ. "හැම ආගමක්ම හොඳයි" යන මතය වැරදිය*

ඇතැම් අයට උද්‍යෝගයක් තිබුණත් එය දේවකැමැත්ත
මත පදනම් වී නැත. ....................................................... රෝම 10:2, 3
අයහපත් දෙයින් යහපත් දෙය දූෂ්‍ය වේ. .................. 1කොරි 5:6; මතෙ 7:15-17
බොරු ගුරුවරු හානිකරය. .......................... 2පේතෘ 2:1; මතෙ 12:30; 15:14
වෙනත් දෙවිවරුන්ට කරන නමස්කාරය දෙවි
දැඩි ලෙස හෙළාදකියි. ................................................... ද්වි 6:5, 14, 15

## 2. අවසාන කාලය

### *අ. "ලෝකාන්තිමය" යන්නෙහි අදහස*

පවතින සමාජයේ අවසානයයි. ................ මතෙ 24:3; 2පේතෘ 3:5-7; මාක් 13:4
පොළොවේ විනාශය නොව දුෂ්ට මිනිස් සමාජයේ අවසානයයි. ......... 1යොහ 2:17
අවසාන කාලය කෙළවර වන්නේ විනාශයෙනි. .......................... මතෙ 24:14
ධර්මිෂ්ඨ අය ගැලවෙති. පාරාදීස පොළොවක් බිහි වේ. ...... 2පේතෘ 2:9; එළි 7:14-17

### *ආ. අවසාන කාලයේ ලකුණු ගැන අවදියෙන් සිටිය යුතුයි*

දෙවි ලකුණු දුන්නේ අපට මඟ පෙන්වීම සඳහාය. ....... 2තිමෝ 3:1-5; 1තෙස 5:1-4
එහි බැරෑරුම්කම ලෝකයට නොවැටහේ. ............. 2පේතෘ 3:3, 4, 7; මතෙ 24:39
දෙවි ප්‍රමාද නැත. අපට අනතුරු අඟවයි. ................................... 2පේතෘ 3:9
හොඳ අවධානයකින් සිටීමෙන් ගැලවිය හැකියි. ........................ ලූක් 21:34-36

## 3. ආගම

### *අ. ඇත්තේ එක සැබෑ ආගමකි*

ඇත්තේ එකම මඟක් පමණි. ................................................ එෆී 4:5, 13
මිනිසුන්ට ක්‍රිස්තුස්ගේ ගෝලයන් වීමට උපකාර
කළ යුතුයි. ............................................ මතෙ 28:19; ක්‍රියා 8:12; 14:21
'පලවලින්' හඳුනාගත හැක. .............. මතෙ 7:19, 20; ලූක් 6:43, 44; යොහ 15:8
සාමාජිකයන් අතර ප්‍රේමය,
එකඟතාව ඇත. .......................... යොහ 13:35; 1කොරි 1:10; 1යොහ 4:20

### *ආ. බොරු ඉගැන්වීම්වලට කිසි තැනක් නැත*

යේසුස් එවැනි ඉගැන්වීම් හෙළාදුටුවේය. ................ මතෙ 23:15, 23, 24; 15:4-9
එසේ කළේ අන්ධ අයගේ ආරක්ෂාවටයි. .................................. මතෙ 15:14
සත්‍යය දැනගැනීම යේසුස්ගේ ගෝලයන් වීමට මඟ පෑදීය. ........... යොහ 8:31, 32

### ඇ. තමන් අදහන දේ වැරදි බව ඔප්පු වුණොත් කළ යුතු දේ

සත්‍යය නිදහස ලබා දෙයි. වැඩිදෙනා වැරදි බව ඔප්පු කරයි. ........ යොහ 8:31, 32
කලින් ඇදහූ දේ අත්හැර ගිය අය. ........................... යොෂු 24:15; 2රාජා 5:17
මුල් ක්‍රිස්තියානීහු තම මත වෙනස් කළහ. ............. ගලා 1:13, 14; ක්‍රියා 3:17, 19
පාවුල් තම ආගම වෙනස් කළේය. ........................................ ක්‍රියා 26:4-6
මුළු ලෝකයම මුළා වී ඇත. වෙනස් විය යුතුයි. ................ එළි 12:9; රෝම 12:2

### ඈ. "හැම ආගමක්ම හොඳයි" කියා පෙනුණත් එය දෙවිගේ අනුමැතියට සහතිකයක් නොවේ

ප්‍රමිතිය නියම කරන්නේ දෙවිය. ........................ යොහ 4:23, 24; යාකො 1:27
සෑම දෙයක්ම දේවකැමැත්තට එකඟ විය යුතුයි. ...................... රෝම 10:2, 3
ඇතැම් "යහපත් ක්‍රියා" ප්‍රතික්ෂේප විය හැකියි. ......................... මතෙ 7:21-23
'පලවලින්' හඳුනාගත හැක. ................................................. මතෙ 7:20

## 4. ආගමික උත්සව, උපන් දින

### අ. මුල් ක්‍රිස්තියානීන් උපන් දින, නත්තල පැවැත්වූයේ නැත

ඒවා පැවැත්වූයේ දෙවිට සේවය නොකළ අයයි. ............... උත් 40:20; මතෙ 14:6
යේසුස් මිය ගිය දිනය සැමරිය යුතුයි. ............. ලූක් 22:19, 20; 1කොරි 11:25, 26
සෝෂාකාරී උත්සව නුසුදුසුය. .................. රෝම 13:13; ගලා 5:21; 1පේතෘ 4:3

## 5. කුරුසය

### අ. යේසුස්ව වධකණුවක එල්ලුවේ ශාප ලද්දෙක් ලෙසය

යේසුස්ව එල්ලන ලද්දේ වධකණුවක
නැතහොත් ගසකය. .................................... ක්‍රියා 5:30; 10:39; ගලා 3:13
ක්‍රිස්තියානීහුද 'වධකණුවක්' රැගෙන යති. .................. මතෙ 10:38; ලූක් 9:23

### ආ. ඊට නමස්කාර නොකළ යුතුයි

යේසුස්ගේ වධකණුව ප්‍රදර්ශනය කිරීම නින්දාවකි. ..... හෙබ්‍රෙ 6:6; මතෙ 27:41, 42
කුරුස නමස්කාරය රූප වන්දනාවකි. .................... නික් 20:4, 5; යෙරෙ 10:3-5
යේසුස් දැන් ස්වර්ගයෙහිය. ............................... 1තිමෝ 3:16; 1පේතෘ 3:18

## 6. ක්‍රිස්තුස් නැවත පැමිණීම

### අ. මිනිසුන්ට පෙනෙන දෙයක් නොවේ

ලෝකය තමාව නැවත නොදකින බව ඔහු ගෝලයන්ට කීවේය. ....... යොහ 14:19
ස්වර්ගයට යන අයුරු දුටුවේ ගෝලයන් පමණි.
නැවත පැමිණීම ඊට සමානය. ........................................ ක්‍රියා 1:6, 10, 11
දැන් ස්වර්ගයෙහි සිටියි. .................................. 1තිමෝ 6:14-16; හෙබ්‍රෙ 1:3
නැවත පැමිණෙන්නේ දේවරාජ්‍යයේ රජු ලෙසය. ........................ දානි 7:13, 14

### ආ. එම අවස්ථාව අවබෝධ කරගැනීමට සාක්ෂි

ඔහු පැමිණ සිටින බව දැනගැනීමට ගෝලයෝ ලකුණක් ඉල්ලූහ. ........ මතෙ 24:3
ක්‍රිස්තියානීන් ඔහු පැමිණ සිටින බව 'දකින්නේ' අවබෝධයෙනි. ........... එෆී 1:18
ඔහු පැමිණ සිටින බවට සාක්ෂි රැසක් ඇත. ........................... ලූක් 21:10, 11
සතුරන් 'දකින්නේ' විනාශ වන විටය. ........................................... එළි 1:7

# 7. ගැලවීම

### *අ. දෙවි ගැලවීමට සපයන මඟ යේසුස්ගේ ජීවිත පූජාවයි*

ජීවනය යනු දෙවි තම පුත්‍රයා තුළින් දෙන තෑග්ගකි. ..... 1යොහ 4:9, 14; රෝම 6:23
ගැලවීමට එකම මඟ යේසුස්ගේ ජීවිත පූජාවය. ........................... ක්‍රියා 4:12
'මැරෙන මොහොතේදී පසුතැවිලි වුවත්'
එය ක්‍රියාවෙන් පෙන්විය නොහැක. .................................. යාකො 2:14, 26
ඒ සඳහා මහත් වෑයමක් දැරිය යුතුයි. .................. ලූක් 13:23, 24; 1තිමෝ 4:10

### *ආ. "අපිට ගැලවීම ලැබිලා" යන ප්‍රකාශය ශුද්ධ ලියවිල්ලට පටහැනිය*

දෙවිගේ බලයෙන් අභිෂේක කළ
අය පවා වැටී යා හැක. .................................. හෙබ්‍රෙ 6:4, 6; 1කොරි 9:27
ඊජිප්තුවෙන් ගැලවුණු බොහෝ ඊශ්‍රායෙල්වරු විනාශ වූහ. ...................... යූද් 5
ගැලවීම ඉබේම නොලැබේ. ......................... පිලි 2:12; 3:12-14; මතෙ 10:22
කලින් ජීවිතයට නැවත හැරෙන අයගේ තත්වය භයානකයි. ........ 2පේතෘ 2:20, 21

### *ඇ. "සියලුදෙනාම ගැලවෙයි" යන මතය ශුද්ධ ලියවිල්ලට පටහැනිය*

සමහරුන් පසුතැවිලි වන්නේ නැත. ...................................... හෙබ්‍රෙ 6:4-6
දුෂ්ටයන්ගේ මරණයෙන් දෙවි සතුටක් නොලබයි. ................. එස 33:11; 18:32
දෙවි ප්‍රේමණීය වුවත් වැරදි දේවලට ඉඩ නොදෙයි. ......................... හෙබ්‍රෙ 1:9
දුෂ්ටයන් විනාශ වනු ඇත. ............................ හෙබ්‍රෙ 10:26-29; එළි 20:7-15

# 8. ජීවිතය

### *අ. සදාකාල ජීවනය ලැබෙන්නේ කීකරු අයටය*

බොරු නොකියන දෙවි ජීවනය දීමට
පොරොන්දු වී තිබේ. ....................................... තීත 1:2; යොහ 10:27, 28
විශ්වාසයකින් ක්‍රියා කරන අයට සදාකාල ජීවනය ලැබේ. .......... යොහ 11:25, 26
කිසිවෙක් මිය යන්නේ නැත. ........... 1කොරි 15:26; එළි 21:4; 20:14; යෙසා 25:8

### *ආ. ස්වර්ගයේ ජීවිතයක් ලැබෙන්නේ ක්‍රිස්තුස්ගේ ශරීරයට අයත් අයට පමණි*

තේරීම කරන්නේ දෙවිය. ................................. මතෙ 20:23; 1කොරි 12:18
පොළොවෙන් තෝරාගන්නේ 1,44,000ක් පමණි. ....... එළි 14:1, 4; 7:2-4; 5:9, 10
යොහන් බව්තීස්ත පවා ඔවුන් අතර නැත. ................................ මතෙ 11:11

### *ඇ. "වෙනත් බැටළුවන්" නමැති අසංඛ්‍යාත පිරිසකට මිහිපිට ජීවනය දීමට පොරොන්දු වී ඇත*

යේසුස් සමඟ ස්වර්ගයෙහි සිටින්නේ සීමිත ගණනකි. ............ එළි 14:1, 4; 7:2-4
"වෙනත් බැටළුවන්" යේසුස්ගේ
සහෝදරයන් නොවේ. .................................. යොහ 10:16; මතෙ 25:32, 40
පොළොවෙහි බේරී ජීවත් වීමට විශාල පිරිසක් රැස් කර ඇත. ......... එළි 7:9, 15-17
තවත් පිරිසක්ව මිහිපිට නැවත නැඟිටුවනු ලබයි. ................... එළි 20:12; 21:4

## 9. ත්‍රිත්වය

### අ. පියාණන් වන දෙවි එක් කෙනෙකි. විශ්වයේ මහෝත්තමයාණන් ඔහුය

දෙවි පුද්ගලයන් තිදෙනෙකු
 නොවේ. ............................ ද්වි 6:4; මලා 2:10; මාක් 10:18; රෝම 3:29, 30
පුත්‍රයාට ආරම්භයක් ඇත.
 දෙවි කලින් සිටියේ තනිවය. .................. එළි 3:14; කොලො 1:15; යෙසා 44:6
දෙවි විශ්වයේ සදාතනික පාලකයාය. .......................... පිලි 2:5, 6; දානි 4:35
සියල්ලන්ටම වඩා දෙවිට ගෞරවය දිය යුතුයි. .......................... පිලි 2:10, 11

### ආ. පොළොවට ඒමට පෙරත් ඊට පසුවත් පුත්‍රයා පියාට යටත්ව සිටියි

පුත්‍රයා ස්වර්ගයේ කීකරුව සිටියේය. ඔහුව එව්වේ පියාය. ........ යොහ 8:42; 12:49
මිහිපිට කීකරුව සිටියේය.
 පියා ඔහුට වඩා උතුම්ය. ................................ යොහ 14:28; 5:19; හෙබ්‍රෙ 5:8
ස්වර්ගයෙහි ඔහුට බොහෝ බලතල ලැබුණත්
 ඔහු පියාට යටත්ය. ............................ පිලි 2:9; 1කොරි 15:28; මතෙ 20:23
යෙහෝවා දෙවි ක්‍රිස්තුස්ගේ හිස සහ
 ඔහුගේ දෙවිය. .................................... 1කොරි 11:3; යොහ 20:17; එළි 1:6

### ඇ. දෙවි සහ ක්‍රිස්තුස් අතර ඇති බැඳීම

ඔවුන් අතර නිතරම පූර්ණ එකඟතාවක් පවතී. .............. යොහ 8:28, 29; 14:10
පුරුෂයෙකු හා භාර්යාවක් අතර ඇති
 බැඳීමට සමානය. .......................................... යොහ 10:30; මතෙ 19:4-6
අනුගාමිකයන් අතරත් එවැනිම
 බැඳීමක් තිබිය යුතුයි. .................................. යොහ 17:20-22; 1කොරි 1:10
දෙවිට නමස්කාර කරන එකම ක්‍රමය ක්‍රිස්තුස් තුළින්ය. ............. යොහ 4:23, 24

### ඈ. දෙවිගේ බලය

එය පුද්ගලයෙකු නොවේ. ................ මතෙ 3:16; යොහ 20:22; ක්‍රියා 2:4, 17, 33
දෙවි සහ ක්‍රිස්තුස් සමඟ ස්වර්ගයේ සිටින
 පුද්ගලයෙකුද නොවේ. ........................................ ක්‍රියා 7:55, 56; එළි 7:10
එය ක්‍රියාත්මක වන්නේ දෙවිගේ
 මඟ පෙන්වීමට එකඟවය. ............................ ගීතා 104:30; 1කොරි 12:4-11
දෙවිට සේවය කරන අයට එය ලැබේ.
 ඔවුහු එයින් මඟ පෙන්වීම් ලබති. ........................ 1කොරි 2:12, 13; ගලා 5:16

## 10. දෙවිගේ බලය, ජීව බලය

### අ. දෙවිගේ බලයේ ක්‍රියාකාරිත්වය

එයට ඉතා ප්‍රබල ක්‍රියාකාරිත්වයක් ඇත. ............. ක්‍රියා 2:2, 3, 33; යොහ 14:17
සියල්ල සෑදීමට, බයිබලය ලිවීමට එය ක්‍රියාත්මක විය. .......... උත් 1:2; එස 11:5
එහි ක්‍රියාකාරිත්වයෙන් ඇතැම් අය
 අභිෂේක ලත් අය වෙති. .............................. යොහ 3:5-8; 2කොරි 1:21, 22
එයින් දෙවිගේ සෙනඟට මඟ පෙන්වීම් හා උපකාර ලැබේ. ............ ගලා 5:16, 18

### ආ. ජීව බලය

ජීවත් වීමට එය අත්‍යවශ්‍යය.
එය රැකගන්නේ හුස්ම ගැනීමෙනි. ........................ යාකො 2:26; යෝබ් 27:3
ජීව බලය ලබා දෙන්නේ දෙවිය. ................................. සෙක 12:1; දේශ 8:8
දෙවිට අයිති දෙයකි. ........................................................... දේශ 3:19-21
අපේ අනාගත ජීවිතය රඳා පවතින්නේ දෙවි මතයි. ........................ ලූක් 23:46

## 11. දුෂ්ටකම, ලෝක ව්‍යාප්ත දුක් වේදනා

### අ. ලොව පුරා සිදු වන ප්‍රශ්න ගැටලුවලට වග කිව යුත්තේ කවුද?

අද පවතින දුෂ්කරතාවලට හේතුව දුෂ්ට පාලනයන්ය. .......... හිතෝ 29:2; 28:28
ලෝකයේ පාලකයා දෙවිගේ සතුරාය. ...... 2කොරි 4:4; 1යොහ 5:19; යොහ 12:31
දුකට හේතුව යක්ෂයාය. ඔහුගේ කාලය කෙටිය. ........................ එළි 12:9, 12
යක්ෂයාව අගාධයට දමයි. එවිට සැබෑ සාමය උදා වේ. ......... එළි 20:1-3; 21:3, 4

### ආ. දුෂ්ටකමට ඉඩ දීමට හේතුව

කිසිවෙක් දෙවිට විශ්වාසවන්ත නොවන බවට
යක්ෂයා චෝදනා කළේය. ............................................ යෝබ් 1:11, 12
තම විශ්වාසවන්තකම ඔප්පු කිරීමට ප්‍රස්තාවක් ඇත. ...... රෝම 9:17; හිතෝ 27:11
යක්ෂයා බොරුකාරයෙකු බව පැහැදිලියි. දෙවි පියවර ගනියි. ............. යොහ 12:31
විශ්වාසවන්ත අයට සදාකාල ජීවනය ලැබේ. .............. රෝම 2:6, 7; එළි 21:3-5

### ඇ. කාලයට ඉඩ දීම දයාවන්ත දෙයකි

අනතුරු ඇඟවීමක් ලබා දීමට කාලය අවශ්‍යයි. .................. මතෙ 24:14, 37-39
දෙවි ප්‍රමාද නැත. දයාවන්තය. ............................ 2පේතෘ 3:9; යෙසා 30:18
සෝදිසියෙන් සිටීමට බයිබලය උපකාරයකි. ................. ලූක් 21:36; 1තෙස 5:4
ආරක්ෂා වීමට දෙවි පෙන්වන මඟ සොයන්න. ................ යෙසා 2:2-4; ශෙප 2:3

### ඈ. ලොව පුරා ඇති ගැටලුවලට විසඳුම මිනිසුන්ගෙන් නොවේ

මිනිසුන් සිටින්නේ බියෙනි. ව්‍යාකූලවය. ............. ලූක් 21:10, 11; 2තිමෝ 3:1-5
විසඳුම් ලබා දෙන්නේ දේවරාජ්‍යයෙන් පමණයි. ................ දානි 2:44; මතෙ 6:10
ජීවනය සඳහා එහි රජුට පක්ෂ වන්න. ................................ ගීතා 2:9, 11, 12

## 12. දේවසේවකයෝ

### අ. සියලුම ක්‍රිස්තියානීන් දේවසේවකයන් විය යුතුයි

යේසුස් දේවසේවකයෙක් විය. ............................ රෝම 15:8, 9; මතෙ 20:28
ක්‍රිස්තියානීහු ඔහුව ආදර්ශයට ගනිති. ..................... 1පේතෘ 2:21; 1කොරි 11:1
ඒ සඳහා දේශනා කළ යුතුයි. ............................ 2තිමෝ 4:2, 5; 1කොරි 9:16

### ආ. දේවසේවය සඳහා සුදුසුකම්

දෙවිගේ බලය සහ දැනුම අවශ්‍යයි. ...................... 2තිමෝ 2:15; යෙසා 61:1-3
ක්‍රිස්තුස්ව ආදර්ශයට ගත යුතුයි. ....................... 1පේතෘ 2:21; 2තිමෝ 4:2, 5
දෙවි තම බලයෙන් හා සංවිධානයෙන්
පුහුණුව ලබා දෙයි. ........................................ යොහ 14:26; 2කොරි 3:1-3

## 13. දෛවය

### අ. අපගේ ජීවිතය කලින් තීරණය කර නැත

දෙවිට පැහැදිලි අරමුණක් ඇත. ................................ යෙසා 55:11; උත් 1:28
සෑම කෙනෙකුටම පෞද්ගලිකව තීරණයක් ගත හැක. ........ යොහ 3:16; පිලි 2:12

## 14. නැවත නැඟිටීම

### අ. මිය ගිය අය ගැන දී ඇති පොරොන්දුවකි

මිය ගිය අයව නැවත නැඟිටුවනු ලැබේ. ............................... යොහ 5:28, 29
පදනම: යේසුස්ගේ නැවත නැඟිටීම. .................. 1කොරි 15:20-22; ක්‍රියා 17:31
ඇතැම් අයට නැවත නැඟිටීමක් නැත. ................................ මතෙ 12:31, 32
විශ්වාසයෙන් ක්‍රියා කරන අයට එය සහතිකවම ලැබේ. ................. යොහ 11:25

### ආ. නැවත නැඟිටීම, ස්වර්ගයේ හෝ පොළොවේ

මිනිසා ආදම් නිසා මිය යති.
යේසුස් නිසා ජීවනය ලබති. ............................ 1කොරි 15:20-22; රෝම 5:19
එකම ආකාරයේ නැවත නැඟිටීමක් නොවේ. .................. 1කොරි 15:40, 42, 44
ස්වර්ගයට නැවත නැඟිටුවන අය යේසුස් මෙනි. ....... 1කොරි 15:49; පිලි 3:20, 21
පොළොවෙහි සිටින්නේ යටත්වැසියන්ය. ................. එළි 20:4ආ, 5, 13; 21:3, 4

## 15. නිරය, අපාය

### අ. මරණයෙන් පසු වධ වේදනා නොලැබේ

යෝබ් මිය යෑම සැලකුවේ සහනයක් ලෙසයි. ............................ යෝබ් 14:13
මිය ගිය පසු කිසිවක් දැනෙන්නේ නැත. ....... ගීතා 6:5; දේශ 9:10; යෙසා 38:18, 19
යේසුස්ව මරණය නමැති නින්දෙන් නැඟිටුවන ලදි. ... ක්‍රියා 2:27, 31, 32; ගීතා 16:10
මරණය සදහටම නැති වෙයි. ............................................ එළි 20:13, 14

### ආ. ගින්න විනාශයේ සංකේතයකි

සදාකාල විනාශයක සංකේතයකි. ............................ මතෙ 25:41, 46; 13:30
පසුතැවිලි නොවන අයට සදාකාල විනාශයකි. ..................... හෙබ්‍රෙ 10:26, 27
සාතන්ව ගිනිවිලට හෙළීම සංකේතයකි. .......................... එළි 20:10, 14, 15

### ඇ. පොහොසතා හා ලාසරුස් ගැන කතාව උපමාවකි

ආබ්‍රහම් සංකේතයක් වන සේම ගින්නද සංකේතයකි. ................. ලූක් 16:22-24
ආබ්‍රහම් සමඟ ඉඳගැනීම හා අන්ධකාරය සංකේත වේ. ................ මතෙ 8:11, 12
මහ බැබිලෝනියේ විනාශය ගින්නෙන් දැවීමක්
ලෙස දක්වා ඇත. ......................................................... එළි 18:8-10, 21

## 16. පාපය

### අ. පාපය යනු

දෙවිගේ පරිපූර්ණ නීති උල්ලංඝනය කිරීමයි. ........................ 1යොහ 3:4; 5:17
මිනිසා තම සැදුම්කරු වන දෙවිට ගණන් දිය යුතුයි. .......... රෝම 14:12; 2:12-15
පාපය ගැන අවබෝධයක් ලැබුණේ නීතියෙනි. ................ ගලා 3:19; රෝම 3:20
සියලුදෙනාම පව්කාරයෝය. දෙවිගේ පරිපූර්ණ නීති
කඩ කරති. ...................................................... රෝම 3:23; ගීතා 51:5

*ආ. ආදම්ගේ පාපය නිසා සියල්ලන් දුක් විඳීමට හේතුව*

ආදම්ගෙන් සියල්ලන්ට පව්කාරකම, මරණය උරුම විය. ............ රෝම 5:12, 18
දෙවි මිනිසාට දයාව දැක්වීය. .................................. ගීතා 103:8, 10, 14, 17
ගැලවීමට මඟ යේසුස්ගේ ජීවිත පූජාවයි. .................................. 1යොහ 2:2
පාපය සහ යක්ෂයා කරන සෑම දෙයක්ම නැති කරනු ලැබේ. ............ 1යොහ 3:8

*ඇ. තහනම් පලය යනු අකීකරුකම මිස ලිංගික සම්බන්ධකම් පැවැත්වීම නොවේ*

පල කන්න එපා කියා පැවසුවේ ඒවව සෑදීමට පෙරය. .................. උත් 2:17, 18
දරුවන් බිහි කිරීමට ආදම් සහ ඒවට අණ ලැබිණ. .......................... උත් 1:28
දරුවන් දෙවිගෙන් ලැබෙන උරුමයකි. .................................. ගීතා 127:3-5
ඒව පව් කළේ සැමියා නැති විටකය. ....................... උත් 3:6; 1තිමෝ 2:11-14
පවුලේ මූලිකයා ලෙස ආදම් දෙවිගේ නීතියට පිටු පෑවේය. ........... රෝම 5:12, 19

*ඈ. සමාව ලබාගත නොහැකි පාපය යනු (මතෙ 12:32; මාක් 3:28, 29)*

අපට උරුම වූ පව්කාර ස්වභාවය නොවේ. .......... රෝම 5:8, 12, 18; 1යොහ 5:17
දෙවිට දුකක් ගෙන දුන්නත් සමාව ලබාගත හැක. ....... එෆී 4:30; යාකො 5:19, 20
හිතාමතා පාපයේ නියැලීම මරණයට මඟ පාදයි. ........................ 1යොහ 3:6-9
එවැනි අයට දෙවිගේ බලය අහිමි වේ. ඔවුන්ට සමාවක් නැත. .......... හෙබ්‍රෙ 6:4-8
එවැනි අය වෙනුවෙන් යාච්ඤා නොකළ යුතුයි. ...................... 1යොහ 5:16, 17

## 17. පොළොව

*අ. පොළොව සඳහා දෙවි අරමුණු කර ඇති දේ*

පරිපූර්ණ මිනිසුන් සඳහා පාරාදීස පොළොවක් සාදා තිබිණ. ...... උත් 1:28; 2:8-15
දෙවි අරමුණු කර ඇති දේ වෙනස් වී නැත. .................. යෙසා 55:11; 46:10, 11
ඉදිරියේදී සාමයෙන් පිරි පොළොවක්. ................ ගීතා 72:7; යෙසා 45:18; 9:6, 7
ඒ පාරාදීසය පිහිටුවන්නේ දේවරාජ්‍යයයි. .................. මතෙ 6:9, 10; එළි 21:3-5

*ආ. පොළොව කිසිදා විනාශ වන්නේ නැත*

පෘථිවිය කිසිදා විනාශ වන්නේ නැත. ............................ දේශ 1:4; ගීතා 104:5
නෝවාගේ කාලයේ විනාශ වූයේ දුෂ්ට මිනිසුන් පමණි. ....... 2පේතෘ 3:5-7; උත් 7:23
එදා සිදු වූ දේ අපේ කාලයටත් අදාළයි. ................................ මතෙ 24:37-39
දුෂ්ටයෝ විනාශ වෙති. “මහත් සමූහය”
බේරී ජීවත් වෙති. ........................................... 2තෙස 1:6-9; එළි 7:9, 14

## 18. බයිබලය

*අ. දේවවචනය දෙවිගේ මඟ පෙන්වීමෙන් ලියන ලදි*

මිනිස්සු දෙවි ලබා දුන් මඟ පෙන්වීම්වලට එකඟව ලියූහ. ........... 2පේතෘ 1:20, 21
එහි අනාවැකි අඩංගුය. ...... දානි 8:5, 6, 20-22; ලූක් 21:5, 6, 20-22; යෙසා 45:1-4
මුළු බයිබලයම දෙවිගේ මඟ පෙන්වීමෙන්
ලියූ ප්‍රයෝජනවත් පොතකි. .......................... 2තිමෝ 3:16, 17; රෝම 15:4

***ආ. අද දිනට ප්‍රයෝජනවත් මඟ පෙන්වීම් එහි අඩංගුය***

බයිබල් ප්‍රතිපත්තිවලට පිටු පෑම හානිකරය. .......................... රෝම 1:28-32
මිනිසුන්ගේ නුවණ මත රඳා සිටිය නොහැක. ........ 1කොරි 1:21, 25; 1තිමෝ 6:20
යක්ෂයාට විරුද්ධව සිටීමට අත්වැලකි. ............................ එෆී 6:11, 12, 17
මිනිසාට නිසි මඟ පෙන්වයි. ............. ගීතා 119:105; 2පේතෘ 1:19; හිතෝ 3:5, 6

***ඇ. සියලු ජනයා සඳහා පොතකි***

බයිබලය ලිව්වේ මැදපෙරදිගෙහිය. .................... නික් 17:14; 24:12, 16; 34:27
දෙවිගේ පොරොන්දු යුරෝපීය අයට පමණක් නොවේ. .... රෝම 10:11-13; ගලා 3:28
දෙවි සියල්ලන්ට එක හා
සමානව සලකයි. ......................... ක්‍රියා 10:34, 35; රෝම 5:18; එළි 7:9, 10

# 19. බයිබල් කාලගණිතය

***අ. (ක්‍රි.ව.) 1914: ජාතීන් සඳහා නියමිත වූ කාලයේ අවසානය***

ක්‍රි.පූ. 607දී දෙවිගේ නමින් කළ පාලනය අත්හිටුවන ලදි. ............. එස 21:25-27
ඒ පාලනය නැවත ඇරඹෙන තුරු, 'කාල සතක්' නිම විය යුතුයි. ... දානි 4:32, 16, 17
හත = 2 × කාලවල් 3 1/2 නැතහොත් 2 × දවස් 1,260. ....... එළි 12:6, 14; 11:2, 3
එක දවසකින් අවුරුද්දක් නියෝජනය වේ. [අවුරුදු 2,520] .... එස 4:6; ගණන් 14:34
ඒ කාලය අවසන් වන්නේ රාජ්‍යය පිහිටුවන විටය. ........ ලූක් 21:24; දානි 7:13, 14

# 20. බව්තීස්මය

***අ. ක්‍රිස්තියානියෙකු සඳහා අත්‍යවශ්‍යය***

යේසුස් ආදර්ශය තැබුවේය. ................................ මතෙ 3:13-15; හෙබ්‍රෙ 10:7
කැපවීමේ සංකේතයකි. ..................................... මතෙ 16:24; 1පේතෘ 3:21
තේරෙන වයසක සිටින අයට පමණි. .................... මතෙ 28:19, 20; ක්‍රියා 2:41
ජලයෙන් සම්පූර්ණයෙන්ම ගිල්විය යුතුයි. ................ ක්‍රියා 8:38, 39; යොහ 3:23

***ආ. පව් සෝදාහරින්නේ නැත***

යේසුස්ව බව්තීස්ම කළේ පව් සෝදාහැරීමට නොවේ. ............ 1පේතෘ 2:22; 3:18
පව් සෝදාහරින්නේ යේසුස්ගේ රුධිරයයි. .................................. 1යොහ 1:7

# 21. බොරු අනාගතවක්තෘවරු

***අ. ඔවුන් ගැන කලින්ම පවසා තිබිණ. නියෝජිතයන්ගේ කාලයේදීත් සිටියහ***

ඔවුන්ව හඳුනාගත හැකි අයුරු. ............................... ද්වි 18:20-22; ලූක් 6:26
ඔවුන් ගැන කලින්ම පවසා තිබිණ.
පලවලින් හඳුනාගත හැක. .................................. මතෙ 24:23-26; 7:15-23

# 22. මරණය

***අ. මරණයට හේතුව***

මිනිසාට පරිපූර්ණ ආරම්භයක්ද සදාකල් ජීවත් වීමේ
ප්‍රස්තාවක්ද දී තිබිණ. ........................................................ උත් 1:28, 31
අකීකරුකම මරණයට හේතු විය. ......................... උත් 2:16, 17; 3:17, 19
ආදම්ගේ සියලු දරුවන්ට පාපයත් මරණයත් උරුම විය. ................. රෝම 5:12

### ආ. මිය ගිය අයගේ තත්වය

මිය ගිය අයට කිසි හැඟීමක් දැනීමක් නැත. ............. දේශ 9:5, 10; ගීතා 146:3, 4
මිය ගිය අයට නැවත නැඟිටීමක් ලැබේ. ......... යොහ 11:11-14, 23-26; ක්‍රියා 7:60

### ඇ. මිය ගිය අය සමඟ කතා කළ නොහැක

මිය ගිය අය දෙවි සමඟ නොසිටිති. ........................ ගීතා 115:17; යෙසා 38:18
මිය ගිය අය සමඟ කතා කිරීමට තැත් නොකළ යුතුයි. ...... යෙසා 8:19; ලෙවී 19:31
කට්ටඩියන්වද සාස්තරකාරයන්වද
හෙළාදකින ලදි. ......................................... ද්වි 18:10-12; ගලා 5:19-21

## 23. මරියා

### අ. යේසුස්ගේ මව වූ මරියා "දේවමැණියෝ" නොවේ

දෙවිට ආරම්භයක් නැත. ..................................... ගීතා 90:2; 1තිමෝ 1:17
දෙවිගේ පුත්‍රයා මිහිපිට ජීවත් වූ විට මරියා ඔහුගේ මව විය. ................ ලූක් 1:35

### ආ. මරියා "සැමදා කන්‍යාවක්ව" සිටියේ නැත

ඇය යෝසෙප් සමඟ විවාහ විය. ................................ මතෙ 1:19, 20, 24, 25
ඇයට තවත් දරුවෝ සිටියෝය. ...................... මතෙ 13:55, 56; ලූක් 8:19-21
ඔහුගේ "සහෝදරයන්" ඔහුගේ ගෝලයන් නොවේ. ...................... යොහ 7:3, 5

## 24. මුතුන්මිත්තන්ට නමස්කාර කිරීම

### අ. මුතුන්මිත්තන්ට නමස්කාර කිරීම නිෂ්ඵලය

මුතුන්මිත්තන්ට කිසිවක් නොදැනේ. ...................................... දේශ 9:5, 10
මුල් මුතුන්මිත්තන් දෙදෙනා පව්කාරයෝය. .......... රෝම 5:12, 14; 1තිමෝ 2:14
එවැනි නමස්කාරයක් දෙවි හෙළාදකියි. ...................... නික් 34:14; මතෙ 4:10

### ආ. මිනිසුන්ට ගරු කළ හැක. නමුත් නමස්කාරය දෙවිට පමණි

වැඩිහිටියන්ට ගරු කළ යුතුයි. ......................... 1තිමෝ 5:1, 2, 17; එෆී 6:1-3
නමස්කාරය දෙවිට පමණි. .............................. ක්‍රියා 10:25, 26; එළි 22:8, 9

## 25. යක්ෂයා, භූතයෝ

### අ. යක්ෂයා නොපෙනෙන පුද්ගලයෙකි

ඔහු පුද්ගලයෙකි. මිනිසා තුළ තිබෙන නපුරු නැඹුරුවාව නොවේ. ...... 2තිමෝ 2:26
දේවදූතයන් මෙන් යක්ෂයාද පුද්ගලයෙකි. .................. මතෙ 4:1, 11; යෝබ් 1:6
ඔහු යක්ෂයා බවට පත් වුණේ වැරදි ආශාවන් නිසාය. ............... යාකො 1:13-15

### ආ. මේ දුෂ්ට ලෝකයේ පාලකයා යක්ෂයාය

ලෝකයේ දෙවියා ඔහුය. එය ඔහුගේ
අණසක යටතේ තිබේ. .......................... 2කොරි 4:4; 1යොහ 5:19; එළි 12:9
ඔහුට සිටීමට ඉඩහරින්නේ කළ
චෝදනාවලට පිළිතුරක් ලැබෙන තුරුය. .................... නික් 9:16; යොහ 12:31
ඉදිරියේදී අගාධයට නියම කරයි. පසුව විනාශ කරනු ලැබේ. ........ එළි 20:2, 3, 10

### ඇ. භූතයෝ යනු කැරලිකාර දේවදූතයෝය

ජලගැල්මට පෙර සාතන්ගේ පැත්ත ගත්හ. ........... උත් 6:1, 2; 1පේතෘ 3:19, 20
ඔවුහු ඉතා නින්දිත, අන්ධකාර තත්වයක සිටිති. ................. 2පේතෘ 2:4; යූද් 6
දෙවිට විරුද්ධව ක්‍රියා කරති. මිනිසුන්ට පීඩා කරති. .... ලූක් 8:27-29; එළි 16:13, 14
සාතන් සමඟ විනාශ කරනු ලැබේ. ......... මතෙ 25:41; ලූක් 8:31; එළි 20:2, 3, 10

### ඈ. භූතවාදය ප්‍රතික්ෂේප කළ යුතුයි

දේවවචනය එය තහනම් කරයි. .............. යෙසා 8:19, 20; ලෙවී 19:31; 20:6, 27
සාස්තර කීම භූතයන්ට සම්බන්ධ ක්‍රියාවකි. ......................... ක්‍රියා 16:16-18
විනාශයට මඟ පාදයි. ................................ ගලා 5:19-21; එළි 21:8; 22:15
ජ්‍යොතිඃ ශාස්ත්‍රය තහනම් කර ඇත. ..................... ද්වි 18:10-12; යෙරෙ 10:2

## 26. යාච්ඤාව

### අ. දෙවි පිළිගන්නා යාච්ඤා

දෙවි යාච්ඤාවලට සවන් දෙයි. ........................... ගීතා 145:18; 1පේතෘ 3:12
දිගටම අධර්මිෂ්ඨ දේ කළොත් යාච්ඤාවලට දෙවි සවන් නොදෙයි. .... යෙසා 1:15-17
යේසුස්ගේ නාමයෙන් යාච්ඤා කළ යුතුයි. ............ යොහ 14:13, 14; 2කොරි 1:20
දේවකැමැත්තට එකඟව යාච්ඤා කළ යුතුයි. ........................ 1යොහ 5:14, 15
විශ්වාසය අත්‍යවශ්‍යය. .................................................... යාකො 1:6-8

### ආ. එකම දේ නැවත කීම, මරියාට හෝ "ශුද්ධවන්තයන්ට" යාච්ඤා කිරීම නිෂ්ඵලය

දෙවිට යාච්ඤා කළ යුත්තේ යේසුස්ගේ නාමයෙනි. ...... යොහ 14:6, 14; 16:23, 24
එකම දේ නැවත කීමෙන් කිසි පලක් නැත. .................................. මතෙ 6:7

## 27. යෙහෝවා, දෙවි

### අ. දෙවිගේ නම

"දෙවි" නමක් නොවේ. යේසුස්ටත් නමක් ඇත. ......................... 1කොරි 8:5, 6
දෙවිගේ නම ශුද්ධව පවතින්න කියා යාච්ඤා කරමු. .................... මතෙ 6:9, 10
දෙවිගේ නම යෙහෝවාය. ............... ගීතා 83:18; නික් 6:2, 3; 3:15; යෙසා 42:8
පැරණි අනුවාදයෙහි නම
සඳහන් තැන්. ......................... නික් 6:2, 3; ගීතා 83:17; යෙසා 12:2; 26:4
යේසුස් ඒ නම ගැන ප්‍රකාශ කළේය. ........... යොහ 17:6, 26; 5:43; 12:12, 13, 28

### ආ. දෙවි සැබෑ පුද්ගලයෙකි

දෙවිව දුටුවොත් ජීවත් විය නොහැක. ......... නික් 33:20; යොහ 1:18; 1යොහ 4:12
දෙවිව විශ්වාස කිරීමට ඔහුව
දකින්නම අවශ්‍ය නැත. ....................... හෙබ්‍රෙ 11:1; රෝම 8:24, 25; 10:17
දෙවි සාදා ඇති දේවලින් ඔහුව හඳුනාගත හැක. ........... රෝම 1:20; ගීතා 19:1, 2
අනාවැකිවල ඉටු වීම දෙවි සැබෑ බවට සාක්ෂියකි. .................... යෙසා 46:8-11

### *ඇ. දෙවිගේ ගතිලක්ෂණ*

දෙවි ප්‍රේමයයි. ................ 1යොහ 4:8, 16; නික් 34:6; 2කොරි 13:11; මීකා 7:18
ප්‍රඥාවෙන් පූර්ණයි. ......................... යෝබ් 12:13; රෝම 11:33; 1කොරි 2:7
යුක්තිසහගත දෙවි කෙනෙකි. ................................. ද්වි 32:4; ගීතා 37:28
සියලු බලැති දෙවි කෙනෙකි. .......................... යෝබ් 37:23; එළි 7:12; 4:11

### *ඇ. සියලුදෙනාම සේවය කරන්නේ එකම දෙවිට නොවේ*

හොඳයි කියා පෙනුණත් නිවැරදි මඟ නොවිය හැක. ....... හිතෝ 16:25; මතෙ 7:21
ඇත්තේ මාර්ග දෙකයි.
ජීවනය කරා යන්නේ එකක් පමණි. ....................... මතෙ 7:13, 14; ද්වි 30:19
බොහෝ දෙවිවරුන් ඇතත් ඇත්තේ එකම
සැබෑ දෙවි කෙනෙකි. ..................................... 1කොරි 8:5, 6; ගීතා 82:1
සැබෑ දෙවිව දැනගැනීම අත්‍යවශ්‍යයි. ....................... යොහ 17:3; 1යොහ 5:20

## 28. යෙහෝවා දෙවිගේ සාක්ෂිකරුවෝ

### *අ. යෙහෝවා දෙවිගේ සාක්ෂිකරුවන්ගේ මූලාරම්භය*

නම ලබා දෙන්නේ යෙහෝවා දෙවිය. ................. යෙසා 43:10-12; යෙරෙ 15:16
ආබෙල් පටන් විශ්වාසවන්ත සාක්ෂිකරුවෝ සිටියෝය. ...... හෙබ්‍රෙ 11:4, 39; 12:1
යේසුස් විශ්වාසවන්ත සහ සැබෑ සාක්ෂිකරුය. .......... යොහ 18:37; එළි 1:5; 3:14

## 29. යේසුස්

### *අ. දෙවිගේ පුත්‍රයා හා දේවරාජ්‍යයේ රජුය*

දෙවිගේ කුලුඳුලාය.
සියල්ල සෑදීමට ඔහුව යොදාගන්නා ලදි. ............... එළි 3:14; කොලො 1:15-17
මිනිසෙක් ලෙස උපන්නේය. දේවදූතයන්ට වඩා පහත් විය. .... ගලා 4:4; හෙබ්‍රෙ 2:9
දෙවිගේ බලයෙන් ස්වර්ගයේ ජීවත් වීමට අලුත් උපතක් ලැබීය. ..... මතෙ 3:16, 17
පෙරට වඩා උසස් තත්වයක් ඔහුට දෙන ලදි. ............................ පිලි 2:9, 10

### *ආ. ගැලවීමට යේසුස් ක්‍රිස්තුස් කෙරෙහි විශ්වාසය අත්‍යවශ්‍යය*

ආබ්‍රහම්ට පොරොන්දු වූ තැනැත්තා ඔහුය. .................... උත් 22:18; ගලා 3:16
ඔහු උත්තම පූජකයාය.
ජීවිත පූජාව සපයන්නාය. ............ 1යොහ 2:1, 2; හෙබ්‍රෙ 7:25, 26; මතෙ 20:28
ජීවනය සඳහා දෙවි හා ක්‍රිස්තුස් ගැන
දැනගෙන ඔවුන්ට කීකරු විය යුතුයි. ......................... යොහ 17:3; ක්‍රියා 4:12

### *ඇ. යේසුස් කෙරෙහි විශ්වාසය පමණක් මදිය*

විශ්වාසය සමඟ ක්‍රියා අවශ්‍යය. ............................. යාකො 2:17-26; 1:22-25
ආඥාවලට කීකරු විය යුතුයි.
ඔහු කළ සේවය කළ යුතුයි. .......................... යොහ 14:12, 15; 1යොහ 2:3
ඔහුගේ නම භාවිත කිරීම පමණක් මදිය. ............................... මතෙ 7:21-23

## 30. යේසුස්ගේ ජීවිත පූජාව

### අ. යේසුස් තම ජීවිතය “සියලුදෙනා වෙනුවෙන්” පූජා කළේය

යේසුස් තම ජීවිතය පූජා කළේය. ......................................... මතෙ 20:28
ඔහු වැගිරෙවූ රුධිරයෙන් පව්වලට සමාව ලැබේ. .................... හෙබ්‍රෙ 9:14, 22
අවශ්‍ය වූයේ එක පූජාවක් පමණි. ............................ රෝම 6:10; හෙබ්‍රෙ 9:26
එයින් ප්‍රයෝජන ගැනීමට පියවර ගත යුතුයි. .............................. යොහ 3:16

### ආ. ආදම්ගේ ජීවිතයට සමාන ජීවිතයක්

ආදම් කලින් පව් රහිත කෙනෙකි. .................... ද්වි 32:4; දේශ 7:29; උත් 1:31
කැරලිගැසීම නිසා ඔහුටත් දරුවන්ටත් පව්කාර
ස්වභාවය හිමි විය. ...................................................... රෝම 5:12, 18
දරුවෝ අසරණය. මිදීමට ආදම්ට සමාන
කෙනෙක් අවශ්‍ය විය. ........................................... ගීතා 49:7; ද්වි 19:21
විසඳුම: පව් රහිත යේසුස්ගේ ජීවිත පූජාව. ......... 1තිමෝ 2:5, 6; 1පේතෘ 1:18, 19

## 31. රාජ්‍යය

### අ. දෙවිගේ රාජ්‍යය මිනිසා සඳහා කරන දේ

දේවකැමැත්ත ඉටු කරයි. ........................ මතෙ 6:9, 10; ගීතා 45:6; එළි 4:11
රජෙකු සහ නීති සහිත පාලනයකි. .................. යෙසා 9:6, 7; 2:3; ගීතා 72:1, 8
දුෂ්ටකම තුරන් කර ලොව පුරාම පාලනය කරයි. ............. දානි 2:44; ගීතා 72:8
දහස් අවුරුදු පාලනය මිනිසාට සැනසීමක් ගෙන දී
පාරාදීසය නැවත පිහිටුවයි. ........................................... එළි 21:2-4; 20:6

### ආ. ක්‍රිස්තුස්ගේ සතුරන් සිටියදීම රාජ්‍යයේ පාලනය ඇරඹේ

ක්‍රිස්තුස්ට බලා සිටීමට සිදු විය. ....................... ගීතා 110:1; හෙබ්‍රෙ 10:12, 13
බලය ලැබුණු විට සාතන්ට විරුද්ධව
යුද්ධ කරයි. ........................................ ගීතා 110:2; එළි 12:7-9; ලූක් 10:18
රාජ්‍යය පිහිටුවන විට පොළොවට දුක් පැමිණෙයි. ..................... එළි 12:10, 12
රාජ්‍යයට පක්ෂ බව දැන් සිටම ඔප්පු කළ යුතුයි. ...................... එළි 11:15-18

### ඇ. රාජ්‍යය සිත තුළ ඇති දෙයක් නොවේ. මිනිස් උත්සාහයක ප්‍රතිඵලයක් නොවේ

රාජ්‍යය පිහිටුවා තිබෙන්නේ ස්වර්ගයෙහිය. ...2තිමෝ 4:18; 1කොරි 15:50; ගීතා 11:4
පරිසිවරුන්ට පැවසූ දේ වරදවා වටහා නොගත යුතුයි. ............... ලූක් 17:20, 21
කොහෙත්ම මේ ලෝකයේ කොටසක් නොවේ. ... යොහ 18:36; ලූක් 4:5-8; දානි 2:44
ආණ්ඩු නැති කරනු ලැබේ. ....................................................... දානි 2:44

## 32. රුධිරය

### අ. ලේ ශරීරගත කිරීම දෙවිට කරන නින්දාවකි

ලේ එනම්, ජීවිතය ශුද්ධ දෙයකි.
එය දෙවිගේ ගිවිසුමෙන්ද පැහැදිලි වේ. .................................... උත් 9:4, 16
ලේ ආහාරයට ගැනීම නීතියේ තහනම් කර තිබිණ. ........... ලෙවී 17:14; 7:26, 27
එය ක්‍රිස්තියානීන්ටත් අදාළය. ................................ ක්‍රියා 15:28, 29; 21:25

### *ආ. ජීවිතය අනතුරේ තිබුණත් දෙවිගේ නීතිය කැඩීමට එය පදනමක් නොවේ*

වැදගත්ම දේ කීකරු වීමය. .................................. 1සාමු 15:22; මාක් 12:33
දෙවිගේ නීතියට වඩා ජීවිතයට මුල් තැන දීම හානිකරය. ............ මාක් 8:35, 36

## 33. රූප නමස්කාරය

### *අ. පිළිම, රූප භාවිතය දෙවිට කරන නින්දාවකි*

දෙවිට සමාන රූපයක්
සැදිය නොහැක. ..................... 1යොහ 4:12; යෙසා 40:18; 46:5; ක්‍රියා 17:29
රූප නමස්කාරයෙන් වැළකී සිටීමට
ක්‍රිස්තියානීන්ට අවවාද කර ඇත. ....................... 1කොරි 10:14; 1යොහ 5:21
දෙවිට නමස්කාර කිරීමට රූප අවශ්‍ය නැත. .............................. යොහ 4:24

### *ආ. රූප නමස්කාරය ඊශ්‍රායෙල් ජාතියට විනාශකාරී උගුලක් විය*

යුදෙව්වරුන්ට තහනම් කර තිබිණ. ....................................... නික් 20:4, 5
රූපවලට කිසිවක් කළ නොහැක. ........................................ ගීතා 115:4-8
විනාශකාරී උගුලක් විය. ......................... ගීතා 106:36, 40-42; යෙරෙ 22:8, 9

### *ඇ. රූප මගින් දෙවිට නමස්කාර කළ නොහැක*

දෙවි ඒ සඳහා කිසි අවසරයක් දුන්නේ නැත. .............................. යෙසා 42:8
"යාච්ඤා අසන තැනැත්තා" දෙවි පමණි. ................................ ගීතා 65:1, 2

## 34. විරුද්ධවාදිකම්, පීඩා

### *අ. විරුද්ධවාදිකම් එල්ල වීමට හේතු*

යේසුස්ට වෛර කරන ලදි.
විරුද්ධවාදිකම් ගැන කලින්ම පැවසීය. ............... යොහ 15:18-20; මතෙ 10:22
දෙවිගේ ප්‍රමිතිවලට ඇලී සිටින නිසා
ලෝකයේ දුෂ්ටකම පැහැදිලි වේ. ............................ 1පේතෘ 4:1, 4, 12, 13
මේ ලෝකයේ දෙවියා වන සාතන්
දේවරාජ්‍යයට විරුද්ධය. ....................................... 2කොරි 4:4; 1පේතෘ 5:8
ක්‍රිස්තියානියෙක් බියෙන් නොසිටියි.
දෙවි ඔහුව රැකබලා ගනියි. .............................. රෝම 8:38, 39; යාකො 4:8

### *ආ. දෙවිගෙන් තමාව ඈත් කිරීමට භාර්යාව පුරුෂයාට ඉඩ නොදිය යුතුයි*

කලින් අනතුරු අඟවා ඇත.
අනුන් ඔහුට වැරදි තොරතුරු දිය හැක. ................ මතෙ 10:34-38; ක්‍රියා 28:22
ඇය දෙවි සහ ක්‍රිස්තුස්ට පක්ෂව සිටිය යුතුයි. ....................... යොහ 6:68; 17:3
විශ්වාසවන්තව සිටීමෙන් ඔහුවත් ගලවාගත හැක. ..... 1කොරි 7:16; 1පේතෘ 3:1-6
පුරුෂයා මූලිකයා වුවත් නමස්කාරය ගැන
නීති පැනවිය නොහැක. ..................................... 1කොරි 11:3; ක්‍රියා 5:29

*ඇ. දෙවිට සේවය කිරීමෙන් තමාව වැළැක්වීමට පුරුෂයා තම භාර්යාවට ඉඩ නොදිය යුතුයි*

භාර්යාවටත් දරුවන්ටත් ප්‍රේම කළ යුතුයි.
ඔවුන්ගේ ගැලවීම ගැන සැලකිලිමත් විය යුතුයි. ........................ 1කොරි 7:16
තීරණ ගැනීමේ හා අවශ්‍යතා සැපයීමේ වගකීම ඇත. ...... 1කොරි 11:3; 1තිමෝ 5:8
සත්‍යය වෙනුවෙන් ස්ථිරව සිටින මිනිසාට
දෙවි ප්‍රේම කරයි. ................................................ යාකො 1:12; 5:10, 11
පවුලේ සාමය වෙනුවෙන් ස්ථාවරය අත්හරින්නා දෙවිගේ
අප්‍රසාදයට ලක් වෙයි. ...................................................... හෙබ්‍රෙ 10:38
පාරාදීසයේ සතුට ලැබීමට පවුලේ අයවළ ගෙන යා හැක. ................ එළි 21:3, 4

## 35. විවාහය

*අ. විවාහ බන්ධනය ගෞරවනීයව තිබිය යුතුයි*

ක්‍රිස්තුස් හා ඔහුගේ මනාලියට සමාන කර තිබේ. ........................ එෆී 5:22, 23
විවාහය කැළැල් නොකළ යුතුයි. ............................................ හෙබ්‍රෙ 13:4
වෙන් නොවිය යුතු බවට පවසා ඇත. ................................ 1කොරි 7:10-16
ශුද්ධ ලියවිල්ලෙන් දික්කසාදයට එකම පදනම පෝර්නියා. ............... මතෙ 19:9

*ආ. පවුලේ සියලුදෙනාම මූලිකත්වයට ගරු කළ යුතුයි*

මූලිකයා වන පුරුෂයා පවුලට ප්‍රේමය හා සැලකිල්ල දැක්විය යුතුයි. ... එෆී 5:23-31
යටත්ව සිටින භාර්යාව පුරුෂයාට ප්‍රේම කරයි.
කීකරු වෙයි. .................................................... 1පේතෘ 3:1-7; එෆී 5:22
දරුවන් කීකරු විය යුතුයි. .................................... එෆී 6:1-3; කොලො 3:20

*ඇ. දෙමාපියන්ගෙන් බලාපොරොත්තු වන දේ*

ප්‍රේමය පෙන්විය යුතුයි. කාලය, අවධානය දිය යුතුයි. ....................... තීත 2:4
දරුවන්ට හිරිහැර නොකළ යුතුයි. ........................................ කොලො 3:21
සෑම පැත්තකින්ම අවශ්‍ය දේ ලබා දිය යුතුයි. ............ 2කොරි 12:14; 1තිමෝ 5:8
නිසි පුහුණුවක් දිය යුතුයි. ...................... එෆී 6:4; හිතෝ 22:6, 15; 23:13, 14

*ඈ. ක්‍රිස්තියානියෙකු විවාහ විය යුත්තේ ක්‍රිස්තියානියෙකු සමඟ පමණි*

"ස්වාමීන්ගේ අනුගාමිකයෙකු
විය යුතුයි." .................................. 1කොරි 7:39; ද්වි 7:3, 4; නෙහෙ 13:26

*ඉ. සිටිය යුත්තේ එක භාර්යාවක් පමණි*

මුලදී පුරුෂයාට දුන්නේ එක් භාර්යාවක් පමණි. ..................... උත් 2:18, 22-25
යේසුස් නැවතත් එම ප්‍රමිතිය වලංගු කළේය. ........................... මතෙ 19:3-9
මුල් ක්‍රිස්තියානීහු එම ප්‍රමිතියට ඇලී සිටියහ. ...... 1කොරි 7:2, 12-16; එෆී 5:28-31

## 36. විශ්වයේ ආරම්භය

*අ. විද්‍යාව ඊට එකඟය. පරිණාමවාදය වැරදි බව ඔප්පු වෙයි*

ජීවීන් බිහි වූ අනුපිළිවෙළ විද්‍යාව පිළිගනියි. ................ උත් 1:11, 12, 21, 24, 25
'ඒ ඒ වර්ග' ගැන දෙවි නියම කළ දේ නිවැරදිය. ......... උත් 1:11, 12; යාකො 3:12

### ආ. "දවස්" පැය 24හි දවස් නොවේ

"දවස" යම් කාල පරිච්ඡේදයක් දැක්වීමටත් භාවිත කෙරේ. .................. උත් 2:4
ඉතා දිගු කාල පරිච්ඡේදයක් විය හැක. ........................ ගීතා 90:4; 2පේතෘ 3:8

## 37. සබත් දවස

### අ. ක්‍රිස්තියානීන්ට අදාළ නැත

යේසුස්ගේ මරණය නිසා නීතිය අවලංගුය. .................................... එෆී 2:15
ක්‍රිස්තියානීන්ට අදාළ නැත. ...................... කොලො 2:16, 17; රෝම 14:5, 10
සබත පැවැත්වූ අයව හෙළාදකින ලදි. .................... ගලා 4:9-11; රෝම 10:2-4
දෙවි මෙන් විවේක ගැනීමට විශ්වාසය හා කීකරුකම අවශ්‍යයි. ....... හෙබ්‍රෙ 4:9-11

### ආ. සබත අදාළ වූයේ පුරාණ ඊශ්‍රායෙල්වරුන්ට පමණි

මුල් වරට පැවැත්වූයේ ඊජිප්තුවෙන් නිදහස් වූ පසුවය. ....... නික් 16:26, 27, 29, 30
ඊශ්‍රායෙල්වරුන්ට පමණක් දෙන ලද ආඥාවකි. ..... නික් 31:16, 17; ගීතා 147:19, 20
නීතිය යටතේ සබත් වර්ෂද තිබිණ. .................... නික් 23:10, 11; ලෙවී 25:3, 4
ක්‍රිස්තියානීන්ට අදාළ නැත. ............................ රෝම 14:5, 10; ගලා 4:9-11

### ඇ. දෙවි මෙන් විවේක ගැනීම

ආරම්භ වූයේ සියල්ල සෑදීමෙන් පසුවය. .................... උත් 2:2, 3; හෙබ්‍රෙ 4:3-5
යේසුස් මිහිපිට සිටි කාලයේදී
එය නිම වී නොතිබිණ. ................................ හෙබ්‍රෙ 4:6-8; ගීතා 95:7-9, 11
ක්‍රිස්තියානීන් තමන් කැමති දේවල් කිරීමෙන් "විවේක" ගත යුතුයි. .... හෙබ්‍රෙ 4:9, 10
අවසන් වන්නේ දේවරාජ්‍යයේ කාර්යයන් නිම වන විටය. .......... 1කොරි 15:24, 28

## 38. සභාව

### අ. සභාව ක්‍රිස්තුස් මත ගොඩනඟා ඇත

දෙවි ගොඩනැඟිලිවල වාසය කරන්නේ නැත. ................. ක්‍රියා 17:24, 25; 7:48
සැබෑ සභාව සංකේතවත් දේවමාලිගාවකි. .............................. 1පේතෘ 2:5, 6
යේසුස් ප්‍රධාන ගලය. ඊළඟට නියෝජිතයෝ. ................................ එෆී 2:20
දෙවිට නමස්කාර කළ යුතු අයුරු. .......................................... යොහ 4:24

### ආ. සභාව පේතෘස් මත ගොඩනඟා නැත

යේසුස් එවැනි දෙයක් පැවසුවේ නැත. ...................................... මතෙ 16:18
"පර්වතය" යේසුස්ය. ...................................................... 1කොරි 10:4
පේතෘස් අත්තිවාරම ලෙස
හැඳින්වූයේ යේසුස්වය. ................................ 1පේතෘ 2:4, 6-8; ක්‍රියා 4:8-12

## 39. සාක්ෂි දැරීම

### අ. සියලුම ක්‍රිස්තියානීන් සාක්ෂි දැරිය යුතුයි

අනුමැතිය ලැබීමට නම් මිනිසුන් ඉදිරියෙහි
යේසුස්ව පිළිගත යුතුයි. ................................................... මතෙ 10:32
විශ්වාසය පෙන්වමින් දෙවිගේ වදන් පිළිපැදිය යුතුයි. ......... යාකො 1:22-24; 2:24
නවකයන්ද ගුරුවරුන් විය යුතුයි. ..................................... මතෙ 28:19, 20
ප්‍රසිද්ධියේ සාක්ෂි දැරීම ගැලවීමට මඟ පාදයි. ........................... රෝම 10:10

### *ආ. නැවත නැවත යැමත් නොකඩවා සාක්ෂි දැරීමත් අවශ්‍යයි*

අවසානය ගැන අනතුරු ඇඟවිය යුතුයි. .................................. මතෙ 24:14
යෙරෙමියා අවුරුදු ගණනාවක් එසේ කළේය. ............................ යෙරෙ 25:3
මුල් ක්‍රිස්තියානීන් මෙන් අපිද දිගටම සාක්ෂි දරමු. .......... ක්‍රියා 4:18-20; 5:28, 29

### *ඇ. අපගේ ගැලවීමට සාක්ෂි දැරීම අවශ්‍යයි*

අවසානය ගැන අනතුරු ඇඟවිය යුතුයි. ....................... එස 33:7, මතෙ 24:14
එසේ නොකළොත් අපි වරදකරුවෝය. ........................ එස 33:8, 9; 3:18, 19
පාවුල් සත්‍යය ගැන පූර්ණ සාක්ෂියක් දැරීය. .......... ක්‍රියා 20:26, 27; 1කොරි 9:16
සාක්ෂි දරන්නා සහ සවන් දෙන්නා ගැලවෙයි. ........... 1තිමෝ 4:16; 1කොරි 9:22

## 40. සිහි කිරීම, සත්ප්‍රසාද ලැබීම

### *අ. ස්වාමීන්ගේ සන්ධ්‍යා භෝජනය සිහි කිරීම*

වසරකට වරක් පාස්කු දිනයේදී පැවැත්වේ. ........... ලූක් 22:1, 17-20; නික් 12:14
සිහි කරන්නේ ක්‍රිස්තුස්ගේ ජීවිත පූජාවයි. ................. 1කොරි 11:26; මතෙ 26:28
සංකේත ගන්නේ ස්වර්ගයට යන අය පමණි. ............. ලූක් 22:29, 30; 12:32, 37
තමා ස්වර්ගයට යන බව දන්නා ආකාරය. ........................... රෝම 8:15-17

### *ආ. සත්ප්‍රසාද ලැබීම ශුද්ධ ලියවිල්ලට පටහැනිය*

පව් සමාව සඳහා ලේ වැගිරිය යුතුයි. ....................................... හෙබ්‍රෙ 9:22
අලුත් ගිවිසුමේ එකම මැදිහත්කරු යේසුස්ය. ............ 1තිමෝ 2:5, 6; යොහ 14:6
ක්‍රිස්තුස් ස්වර්ගයෙහිය. ඔහු පූජාවලට 'වැඩ සිටින්නේ' නැත. ......... ක්‍රියා 3:20, 21
ක්‍රිස්තුස්ගේ ජීවිතය නැවත ඔප්පු කිරීම අනවශ්‍යය. ....... හෙබ්‍රෙ 9:24-26; 10:11-14

## 41. සුව කිරීම, අන්‍ය භාෂා

### *අ. සැබෑ ප්‍රයෝජනයක් ගෙන දෙන සුව කිරීම*

දෙවිගෙන් ඈත් වීම දරුණු රෝගයකි. ................ යෙසා 1:4-6; 6:10; හොෂෙ 4:6
වැදගත්ම දේ දෙවිට නැවත ළං වීමයි. ......................... යොහ 6:63; ලූක් 4:18
පාප ඉවත් කරයි.
සන්තෝෂයත් ජීවනයත් ලබා දෙයි. ................. යාකො 5:19, 20; එළි 7:14-17

### *ආ. අසනීපවලින් සම්පූර්ණ සුවය ලැබෙන්නේ දේවරාජ්‍යයෙනි*

යේසුස් ලෙඩ සුව කළේය. දේවරාජ්‍යය ගැන දේශනා කළේය. ............. මතෙ 4:23
සදාකාලික සුවය දේවරාජ්‍යය යටතේ පමණි. ................. මතෙ 6:10; යෙසා 9:7
මරණය පවා නැති කරනු ලැබේ. ................ 1කොරි 15:25, 26; එළි 21:4; 20:14

### *ඇ. අද දින කරන සුව කිරීම්වලට දෙවිගේ අනුමැතිය නැත*

ගෝලයෝ තමන්වම සුව කරගත්තේ නැත. ........... 2කොරි 12:7-9; 1තිමෝ 5:23
නියෝජිතයන් විසූ කාලයෙන් පසු එම දීමනා නැති විය. ............ 1කොරි 13:8-11
සුව කිරීම් සිදු කිරීම දෙවිගේ අනුමැතිය තිබෙන
බවට සාක්ෂියක් නොවේ. ............................ මතෙ 7:22, 23; 2තෙස 2:9-11

### ඇ. වෙනත් භාෂාවලින් කතා කිරීම තාවකාලික දෙයක් පමණි

ලකුණක් ලෙස දෙන ලදි.
වඩා උතුම් දීමනා සෙවිය යුතුයි. ........................... 1කොරි 14:22; 12:30, 31
ආශ්චර්යවත් දීමනා තාවකාලිකය. .................................... 1කොරි 13:8-10
පුදුම ක්‍රියා කිරීම දෙවිගේ අනුමැතිය
ඇති බවට සාක්ෂියක් නොවේ. ................................. මතෙ 7:22, 23; 24:24

## 42. ස්වර්ගය

### අ. ස්වර්ගයට යන්නේ 1,44,000ක් පමණි

සීමිත සංඛ්‍යාවකි. ක්‍රිස්තුස් සමඟ රජකම් කිරීමටය. ................ එළි 5:9, 10; 20:4
පළමුවෙනියා යේසුස්ය. අන් අයව ඉන්පසුවය. .......... කොලො 1:18; 1පේතෘ 2:21
විශාල පිරිසක් පොළොවෙහි ජීවත් වනු ඇත. ................. ගීතා 72:8; එළි 21:3, 4
1,44,000දෙනා අද්විතීය වරප්‍රසාදයක් ලබති. ..................... එළි 14:1, 3; 7:4, 9

## 43. "හර්–මගෙදොන්" නමැති යුද්ධය

### අ. දුෂ්ටකම නැති කිරීම සඳහා දෙවි කරන යුද්ධයයි

සියලු ජාතීහු ඒ සඳහා රැස් වෙති. ......................................... එළි 16:14, 16
දෙවි සටන් කරන්නේ තම පුත්‍රයාව සහ
දූතයන්ව යොදාගෙනයි. ................................. 2තෙස 1:6-9; එළි 19:11-16
අපට බේරී ජීවත් විය හැකි අයුරු. .............................. ශෙප 2:2, 3; එළි 7:14

### ආ. දෙවිගේ ප්‍රේමයට මෙය පරස්පර විරෝධී නොවේ

දැන් පවතින ලෝකය ඉතා පිරිහුණු තත්වයක පවතී. ................. 2තිමෝ 3:1-5
දෙවි ඉවසිලිවන්තය. නමුත් යුක්තිය
ඉටු කිරීමට පියවර ගනියි. .............................. 2පේතෘ 3:9, 15; ලූක් 18:7, 8
ධර්මිෂ්ඨයන්ගේ යහපත වෙනුවෙන් දුෂ්ටයන්
නැති කර දැමිය යුතුයි. ...................................... හිතෝ 21:18; එළි 11:18

වැඩි විස්තර සඳහා **www.jw.org/si** වෙත පිවිසෙන්න. නැත්නම් පහත සඳහන් යෙහෝවා දෙවිගේ සාක්ෂිකරුවන්ගේ කාර්යාලයකට ලියන්න.


රෝමය
ඉතාලිය
පුතෙයෝලිය
රෙජියම්
සිසිලිය
සිරකූසය
මෝල්ටාව
මැසිඩෝනියාව
නෙයපොලිසය
පිලිප්පිය
අම්ෆිපොලිසය
තෙසලෝනිකය
බෙරීයය
ග්‍රීසිය
ඇතන්ස්
කොරින්තිය
ඇකේයාව
ක්‍රීට්
කෞද
මධ්‍යධරණී
පාවුල්ගේ ගමන්
පළමු ගමන (ක්‍රියා 13:1–14:28)
දෙවන ගමන (ක්‍රියා 15:36–18:22)
තුන්වන ගමන (ක්‍රියා 18:22–21:19)
රෝමයට ගිය ගමන (ක්‍රියා 23:11–28:31)
මහාමාර්ග
උ
සැ. 0
150
කි.මී. 0
150



කළු මුහුද
බිතිනිය
පොන්තසය
සැමොත්‍රේස්
ත්‍රෝවස
මිසියාව
අසොස්
පර්ගමම්
තියතීරා
සර්දිස්
ෆිලදෙල්ෆියා
මිතුලේන
කියොස්
ස්මර්ණාව
ආසියාව
එපීසය
සාමොස්
ලවොදිකිය
කොලොස්සිය
මිලේටස්
පැට්මොස්
කොස්
කනිදසය
රෝඩ්ස්
පටාරා
මුරා
ලිසියාව
අත්තලිය
පර්ගාය
පම්පිලිය
පිසිදිය
ෆ්‍රිජිය
ගලාතිය
කපදෝසිය
අන්තියෝකිය (පිසිදියේ)
ඉකෝනිය
ලිස්ත්‍රාව
ලිකෝනිය
දර්බය
තාසස්
සිලීසියාව
අන්තියෝකිය (සිරියාවේ)
සිලූකිය
සිරියාව
සලමිසය
සයිප්‍රසය
පාෆස්
මුහුද
සීදොන්
තීර්
දමස්කය
ටොලමැයිස්
සිසේරිය
පෙල්ලා
යොප්පා
ලිද්දාව
යෙරුසලම
ගාසාව
ඇලෙක්සැන්ඩ්‍රියාව
ඊජිප්තුව
bi12-SN